(මාණ්පුමිකු உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) 2014 සහ 2015 වර්ෂයන්හි කොළඹ කොටස් වෙළෙඳ පොළේ සමස්ත මිල දර්ශකයේ වර්ධන ප්‍රතිශතය සහ ශුද්ධ විදේශීය මිල දී ගැනීම් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොළඹ කොටස් වෙළෙඳ පොළේ සමස්ත මිල දර්ශකය පසු ගිය වසර තුළ පහත වැටීමෙන් ශ්‍රී ලංකා ආර්ථිකය සහ රජයේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ ආයෝජකයන්ගේ විශ්වාසය බිඳ වැටී ඇති බවත්;

(ii) කොළඹ කොටස් වෙළෙඳ පොළේ ශුද්ධ විදේශීය මිල දී ගැනීම් පසු ගිය වසර තුළ සෘණ අගයක් ගැනීමෙන් ශ්‍රී ලංකා ආර්ථිකය සහ රජයේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය බිඳ වැටී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் கொழும்பு பங்குச் சந்தையின் மொத்த விலைச் சுட்டெண்ணின் வளர்ச்சி வீதமும் தேறிய வெளிநாட்டு கொள்வனவும் தனித்தனியே யாதென்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (I) கொழும்பு பங்குச் சந்தையில் மொத்த விலைச் சுட்டெண் கடந்த ஆண்டில் வீழ்ச்சியடைந்ததன் காரணமாக இலங்கையின் பொருளாதாரம் மற்றும் அரசாங்கத்தின் பொருளாதாரக் கொள்கை தொடர்பில் முதலீட்டாளர்களின் நம்பிக்கை தகர்ந்து போயுள்ளது என்பதையும்;

(ii) கொழும்பு பங்குச் சந்தையில் தேறிய வெளிநாட்டு கொள்வனவுகள் கடந்த ஆண்டில் எதிர்மறைப் பெறுமானத்தை அடைந்ததால் இலங்கையின் பொருளாதாரம் மற்றும் அரசாங்கத்தின் பொருளாதாரக் கொள்கை தொடர்பில் முதலீட்டாளர்களின் நம்பிக்கை தகர்ந்துபோயுள்ளது என்பதையும் ;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House of the percentage of growth of the All Share Price Index of the Colombo Stock Exchange and the Net Foreign Purchases in the years 2014 and 2015, separately?

(b) Will he admit that-

(i) the investors have lost confidence in the economy of Sri Lanka and the economic policy of the Government as the All Share Price Index of the Colombo Stock Exchange has moved downwards within the last year; and

(ii) the foreign investors have lost confidence in the economy of Sri Lanka and the economic policy of the Government as Net Foreign Purchases of the Colombo Stock Exchange within last year indicated a minus value?

(c) If not, why?

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) වසර 2014දී කොටස් වෙළෙඳ පොළ සමස්ත මිල දර්ශකය සියයට 23.4කින් ඉහළ නැඟුණු අතර, වසර 2015දී එය සියයට 5.5කින් පහළ වැටුණි. වසර 2014දී වාර්තා වූ ශුද්ධ විදේශීය ගැනුම් ප්‍රමාණය රුපියල් බිලියන 21.1ක් වන අතර, 2015දී වාර්තා වූ ශුද්ධ ගැනුම් ප්‍රමාණය රුපියල් බිලියන ඍණ 5.3කි.

(ආ) (i) නැත.

(ii) නැත.

(ඇ) 2015දී කොටස් වෙළෙඳ පොළ පහළ යාමට ප්‍රධාන හේතු වන්නේ, ලෝක ආර්ථිකයේ ඇති වී තිබෙන ගැටලුකාරී තත්ත්වය, චීන ආර්ථිකයේ වර්ධන වේගය පහත යාම සහ ඇමෙරිකාවේ පොලී අනුපාතය ඉහළ යෑම හේතුවෙන් සංවර්ධනය වන රටවල කෙටි කාලීන ආයෝජන නැවත ගලා යෑමයි.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාව පමණක් නොවෙයි 2015දී ඉන්දියානු කොටස් වෙළෙඳ පොළ සියයට 5කින් පහත වැටුණා. ඒ වාගේම බංග්ලාදේශයේ කොටස් වෙළෙඳ පොළ සියයට 4.83කින් පහත වැටුණා. ඒ වාගේම චීනයේ ෂැංහයි කොටස් වෙළෙඳ පොළ 2015 ජූලි සහ අගෝස්තු මාසවලදී සියයට 30කින් පහළ ගියා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මතක් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. පසු ගිය රජය සමයේ කොටස් වෙළෙඳ පොළ හසුරුවනු ලැබුයේ රජයට සම්බන්ධ ඉතාම සීමිත පිරිසක් විසිනුයි. මොවුන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් කොටස් වෙළෙඳ පොළ පිළිබඳව විශ්වාසය නැති වී ගිය අතර, ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වීමට උත්සාහ කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපතිවරුන් වන තිලක් කරුණාරත්න සහ ඉන්ද්‍රානි සුගතදාස යන මහත්ම මහත්මීන්ට ඉල්ලා අස්වීමට සිදු වුණා.

ඒ වාගේම ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ හිටපු සභාපතිවරයකු වූ නාලක ගොඩහේවා මැතිතුමා "තාරුණ්‍යයට හෙටක්" සංවිධානයට නීතිවිරෝධීව මුදල් දීමේ චෝදනාව මත අත් අඩංගුවට ගෙන තිබෙනවා. මේ වාගේ ක්‍රියාකාරකම් නිසාත් පසු ගිය රජය සමයේ විශ්වාසය බිඳ වැටුණු බව මතක් කරන්න කැමැතියි.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. කොටස් වෙළෙඳ පොළ 2014 වසරේ සියයට 23ක වර්ධනයක් පෙන්වා 2015 වසරේ සියයට 5කින් පහත වැටෙන්න, ආයෝජකයන්ගේ විශ්වාසය බිඳ වැටෙන්න 2014ත් 2015ත් අතරතුර මොකක් හෝ දැවැන්ත කාරණයක් සිදු වුණාද? මොකද, 2014 වසරේ කොටස් වෙළෙඳ පොළ ලොකු වර්ධනයක් පෙන්වනවා. 2015 වන විට එක පාරටම කඩාගෙන වැටෙනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, මා හිතන විධියට ගරු මන්ත්‍රීතුමා මා දීපු උත්තරය අහගෙන ඉඳලා නැහැ. මා කරුණු ගණනාවක් එතුමාට සඳහන් කළා. ලංකාවේ පමණක් නොවෙයි, කලාපීය රටවලත් කොටස් වෙළෙඳ පොළ පහත වැටුණා කියලා මා එතුමාට පෙන්වා දුන්නා. විශේෂයෙන්ම ගෝලීය ආර්ථිකයේ ඇති වෙලා තිබෙන තත්ත්වය වාගේම ඇමෙරිකාවේ පොලිය ඉහළ යාමෙන් ඒ සංවර්ධිත රටවල මුදල් ආයෙමත් ඒ හරහා ගලා යාම පිළිබඳව මා සඳහන් කළ කරුණු මා හිතන විධියට එතුමා හරියට අහගෙන ඉඳලා නැහැ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම විදේශිකයන් මේ රටට එන කොට ඒ අයගේ සල්ලි හොරකම් කරනවා නම්, කූට ලේඛන හදනවා නම් ඒ විදේශිකයින් ඒ රටවල්වලට එන්නේ නැහැ. ඒ නිසා ඒ පිළිබඳවත් රජය කටයුතු කරලා තිබෙනවා. ඒ සුද්ගලයින් අපේ ආර්ථිකයට බලවත් හානියක් කරන බවයි අපට ප්‍රකාශ කරන්න තිබෙන්නේ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මෙයයි. කොටස් වෙළෙඳ පොළ බිඳ වැටීම ආරම්භ වුණු පෙබරවාරි මාසය වන විට කූට ලේඛන සාදා ආයෝජකයන්ගේ මුදල් වංචා කළ බවට පැමිණිලි කීයක් ඔබතුමා දන්නා ආකාරයට පොලීසියට වාර්තා වී තිබුණා ද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, මට ඒ ගැන හොයලා කියන්න පුළුවන්.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ඔබතුමා උත්තරේ දන්නේ නැතුව ද මේ ගරු සභාවට ඇවිල්ලා ප්‍රකාශයක් කරන්නේ?

ගරු කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ ප්‍රශ්නයට අදාළ පිළිතුර ලබා ගැනීමට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නොකර සිටින දවසක් අපට දැන ගන්න පුළුවන්ද? [බාධා කිරීම්]

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා කරපු එම ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්න කියලා මම මේ අවස්ථාවේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රීවරුන්ට අපහාස වන පරිදි කථා කිරීම යෝග්‍ය නැහැ. මම උදය ගම්මන්පිල මන්ත්‍රීතුමාගේ එම ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න නියෝග කරනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, එතුමාට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඒකයි වෙලා තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්න කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක හරි නැහැ. ඒ ප්‍රකාශය අයින් කර ගන්න. මම කොහොමටත්, හැන්සාඩ් වාර්තාවෙන් එම ප්‍රකාශය ඉවත් කරනවා. පාර්ලිමේන්තුව තුළ එවැනි චරිත ඝාතන කිරීම යෝග්‍ය නැහැ. ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමනි, ඔබතුමාත් උගත් පුද්ගලයෙකු වශයෙන් ඒක දැන ගන්න ඕනෑ.

ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව: විස්තර
சிரேஷ்ட பிரசைகள் கொடுப்பனவு : விபரம்
SENIOR CITIZENS' ALLOWANCE : DETAILS

438/'16

4. ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) 2016 වසර සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනා වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට නිකුත් කර තිබේ ද;

(ii) 2015 වර්ෂය සඳහා නිකුත් කළ මුදල කොපමණද;

(iii) 2016 වර්ෂය සඳහා නිකුත් කිරීමට නියමිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉල්ලුම් කර ඇති සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට එම දීමනාව ලබා දෙන්නේද;

(ii) එසේ නොවේ නම්, යම් සීමාකිරීමක් සිදුකර තිබේද;

(iii) එසේ නම්, ඒ මන්ද;

(iv) සීමා කිරීමක් සිදු කර නොමැති නම්, ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ඉල්ලුම් කරන ලද සියලු ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා එම දීමනාව ලබා දීමට කටයුතු කරනු ලබන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

සමූහ වලුවූට්ටල් මට්‍රුම් නලන්පුරි අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) 2016ஆம் ஆண்டுக்காக சிரேஷ்ட பிரசைகள் கொடுப்பனவுக்குப் போதிய நிதி ஏற்பாடுகள் பிரதேச செயலகங்களுக்கு வழங்கப்பட்டுள்ளதா;

(ii) 2015ஆம் ஆண்டுக்காக வழங்கப்பட்ட பணத் தொகை எவ்வளவு;

(iii) 2016ஆம் ஆண்டுக்காக வழங்க உத்தேசிக்கப் பட்டுள்ள பணத்தொகை எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) விண்ணப்பித்துள்ள அனைத்து சிரேஷ்ட பிரசைகளுக்கும் இக்கொடுப்பனவு வழங்கப் படுமா;

(ii) இன்றேல், ஏதேனும் வரையறைகள் செய்யப் பட்டுள்ளதா;

(iii) ஆமெனில், அது ஏன்;

(iv) வரையறைகள் செய்யப்படவில்லையாயின், போதிய நிதி ஏற்பாடுகளை ஒதுக்கீடு செய்து விண்ணப்பிக்கின்ற அனைத்து சிரேஷ்ட பிரசைகளுக்கும் இக்கொடுப்பனவை வழங்க நடவடிக்கை மேற்கொள்வாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Social Empowerment and Welfare:

(a) Will he inform this House-

(i) whether sufficient financial allocations have been issued to Divisional Secretariats for Senior Citizens' Allowances for the year 2016;

(ii) what amount was issued for the year 2015; and

(iii) what amount is to be issued for the year 2016?

(b) Will he also inform this House-

(i) whether the allowance concerned will be provided to all the senior citizens who have applied for it;

(ii) if not, whether any restrictions have been placed;

(iii) if so, why; and

(iv) if no restriction has been made, whether he will take action to provide sufficient allocations and grant this allowance for all the senior citizens who have applied for it?

(c) If not, why?

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) රු. 8,038,777,890/- (ඛ්ලියන 8.04)

(iii) රු. 9,265,920,000/- (ඛ්ලියන 9.27)

(ආ) (i) නැත.

(ii) ඔව්.

(iii) මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දීමනාව ලැබිය යුතු ප්‍රතිලාභීන් සංඛ්‍යාව තීරණය කොට ඇත.

(2016 ජනවාරි මාසය වන විට ලැබී ඇති තොරතුරු අනුව පොරොත්තු ලේඛනගත ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව 131,904)

(iv) ඉහත (ආ) ii පරිදි සීමා කිරීමක් සිදුකර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු ඛිජිත ෂෙරත්)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් මෙම දීමනාව ලබා දෙන්නේ අවුරුදු 70ට වැඩි, අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා. ගරු ඇමතිතුමනි, සුදුසුකම් තිබෙන සියලු දෙනාම ඉල්ලුම් කර තිබෙන නමුත් ඔවුන්ට මෙම මුදල නියමිත පරිදි ලබා දීලා නැහැ කියලා ඔබතුමාම පිළිගන්නවා.

මේ පිළිබඳව අවසාන වශයෙන් ගණනය කිරීම් කළේ කවදාද? ගරු ඇමතිතුමනි, ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනා සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම පසු ගිය අය වැයවලදී සම්මත වුණා. එවැනි තත්ත්වයක් තුළ, මේ මුදල කඩිනමින් ඒ අයට ලබා දෙන්න මැදිහත් නොවන්නේ මන්ද?

ගරු එස්.බී. දිසානායක මහතා
(මාණ්පුමිකු එස්.පි. දිසානායක්ක)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකුට ඕනෑ වෙලාවක ග්‍රාම නිලධාරි හරහා ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් මේ ගැන ඉල්ලීමක් කරන්න පුළුවන්. එතකොට, ඔවුන්ගේ ආදායම් මට්ටම බලලා, සුදුසුකම් බලලා, ඒ දීමනාව දිය යුතු නම් ඒ අය පොරොත්තු ලේඛනවලට ඇතුළත් කර ගන්නවා. අපි මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශයත් එක්ක කථා කර තිබෙනවා. ඉදිරි කාලයේදී අපට මේ සඳහා ප්‍රතිපාදන කොටසක් ලැබෙයි. ඒ අනුව අපට පොරොත්තු ලේඛනයේ ඉන්න අයටත් දීමනාව ලබා දෙන්න පුළුවන්.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු ඛිජිත ෂෙරත්)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන විධියට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මුදල් අමාත්‍යාංශයෙන් ලබා දීලා නැහැ. ඒ නිසා තමයි එම දීමනාව වෙලාවට දෙන්න බැරි වෙලා තිබෙන්නේ. සාමාන්‍ය ගණනය කිරීම්වලට අනුව මාසිකව 386,000ක පමණ පිරිසකට ලබා දිය යුතුව තිබෙනවා. ඇත්තටම ගත්තොත් ඒ ලබා දෙන මුදලත් ප්‍රමාණවත් නැහැ. රුපියල් 2,000ක් විතර තමයි කෙනෙකුට ලැබෙන්නේ. ඔබතුමා ඒ රුපියල් 2,000නුත් රුපියල් 100ක් ඔබතුමාගේ අමාත්‍යාංශයේ තිබෙන වෙනම අරමුදලකට බැර කර ගන්නවා. ඒක කොයි තරම් සාධාරණද? පසු ගිය අය වැයේදී අපි පාර්ලිමේන්තුවේ අනුමත කළා, සුදුසුකම් තිබෙන සෑම ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකුටම රුපියල් 2,000ක් දෙන්න. පාර්ලිමේන්තුවේ අනුමත කරපු දෙයක් අමාත්‍යවරයා විධියට ඔබතුමා කොහොමද වෙනස් කරන්නේ?

මේ ප්‍රශ්නය COPE එකේදීත් පැන නැඟිලා එතැනදීත් තීන්දුවක් අරගෙන තිබුණා, ඒ මුදල කපා ගන්න එක වැරදියි කියලා. ඒ පිළිබඳවත් ඔබතුමා දැනුවත් කර තිබෙනවා. ඒ තීන්දුවත් නොසලකමින් තවදුරටත් ඒ රුපියල් 100 කපා ගන්නේ කොහොමද, එහි නීත්‍යානුකූලභාවය මොකක්ද? එය අසාධාරණයි කියලා ඔබතුමා පිළිගන්නවාද?

ගරු එස්.බී. දිසානායක මහතා
(මාණ්පුමිකු එස්.පි. දිසානායක්ක)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, වැඩිහිටියන් පිළිබඳ තීන්දු තීරණ ගන්නා, වැඩිහිටියන් පිළිබඳ ජාතික සභාවක් තිබෙනවා. ලංකාවේ වැඩිහිටියන් සංවිධානගත වෙලා ඉන්න සංවිධානවල බොහෝ නියෝජිතයන් -ප්‍රධාන සංවිධානවල බොහෝ නියෝජිතයන්- මේ සභාවේ සාමාජිකත්වය දරනවා. ඒ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් වැඩිහිටි සභාව තමයි මේ යෝජනාව ඉස්සෙල්ලාම ගෙනාවේ. ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ගෙනන්නත් විශේෂ හේතුවක් තිබෙනවා.

සමෘද්ධි සහනාධාරය වශයෙන් රුපියල් 750, 650, 550 දෙන කොට, අපි ඒකෙන් රුපියල් 140ක අනිවාර්යය ඉතිරි කිරීමක් කරලා තමයි සමෘද්ධි බැංකු 1,074ක් හැදුවේ. ඒ වාගේම අපි ඒකෙන් රුපියල් 15ක් කපලා තමයි "සමාජ ආරක්ෂණ අරමුදල" හැදුවේ.

දරු උපතක්, අසනීපයක්, විවාහයක්, මළ ගෙදරක් වුණොත් අද ඒ අරමුදලෙන් විශේෂ දීමනාවක් ලබා දෙන අතර, සමෘද්ධි පවුල්වල අපොස (උසස් පෙළ) ඉගෙන ගන්නා දරුවන් 20,000කට මාසයකට රුපියල් 1,500 ගණනේ ශිෂ්‍යත්ව ලබා දෙනවා.

අපි පසු ගිය අවුරුදු 10 අරගෙන බැලුවොත් ගරු ඊලික්ස් පෙරේරා හිටපු අමාත්‍යතුමා හැම දාම වාගේ මේ වැඩිහිටි නිවාස අලුත්වැඩියා කිරීමට, අඩු පාඩු සැපයීමට මෙහෙම ආධාර මුදල් ඉල්ලා තිබෙනවා. නමුත්, අතීතයේ රුපියල් මිලියන 600ක් පමණ ඉල්ලුවාම මිලියන 6ක් පමණ තමයි හම්බ වෙලා තිබෙන්නේ. ඒක අද ඊයේ සිදු වුණු දෙයක් නොවෙයි, අවුරුදු 10ක්, 15ක් තිස්සේ සිදු වුණු දෙයක් බව පෙනෙනවා.

මතුගම වැඩිහිටි නිවාසයක් භාර පිරිසක් අදත් මාව හම්බ වන්න ආවා. ඔවුන් ඇවිල්ලා කිව්වා, "එතැන වැඩිහිටියන් 85 දෙනෙක් ඉන්නවා, වහල කඩා ගෙන වැටෙන්න ඔන්න මෙන්න වාගේ තිබෙන්නේ, ඒක හදලා දෙන්න" කියලා. ඇත්තෙන්ම මේ වැඩිහිටියන් ඔවුන්ට ලැබෙන දීමනාව ලබා ගන්න three-wheeler එකක් අරගෙන, එහෙම නැත්නම් මොකක් හරි වෙනත් වාහනයක් hire කර ගෙන, එහෙම නැත්නම් තව කෙනෙකුගේ ආධාරයෙන් තමයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, බැංකුවට, එහෙම නැත්නම් තැපැල් කන්තෝරුවට යන්නේ. මේ රුපියල් 100 කපා ගන්න කොට අපි තීන්දු කළා, වැඩිහිටියන්ට ලබා දෙන මේ මුදල අපේ සමෘද්ධි නිලධාරීන් ලවා ඔවුන්ගේ ගෙදරට ගිහිල්ලා දෙන්න. ඒ නිසා මේ හරහා වැඩිහිටි නිවාස සඳහා විශාල සේවයක් කරන්න, වැඩිහිටි ජාතික සභාවට සේවයක් කරන්න, ඒ අයට අරමුදල් ලබා දෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ අයගේ මුදල් පුළුවන් තරම් ගෙදරටම ගිහිල්ලා ලබා දීම හරහා මොවුන්ට ඒ රුපියල් 100ට වඩා ලාභයක් අපි ඇති කරලා තිබෙනවා.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු ඛිජිත ෂෙරත්)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, මගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. සාමාන්‍යයෙන් මාසයකට රුපියල් තුන්කෝටි අසූහය ලක්ෂයක පමණ මුදලක් එකතු වනවා. පාර්ලිමේන්තුවේ අය වැය යෝජනාවලදී කිව්වා, සුදුසුකම් තිබෙන සෑම ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකුටම රුපියල් 2,000ක් ලබා දෙනවා කියලා. රුපියල් 2,000ක් දෙනවා කියලා ඒකෙන් රුපියල් 100ක් කපාගෙන

[ගරු විජිත හේරත් මහතා]

ඔබතුමන්ලා වෙනම අරමුදලක් හදන එක සාධාරණ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන විධියට එවැනි සුබ සාධන කටයුතු කරන්න අවශ්‍යයි. ඒ සඳහා මුදල් අමාත්‍යාංශයෙන් වෙනම මුදල් ලබා ගෙන වෙනම අරමුදලක් පිහිටුවිය යුතුයි. නමුත්, දෙන්නම් කියපු රුපියල් 2,000න්, රුපියල් 100ක් කපා ගන්න එක කිසිසේත්ම නීත්‍යානුකූල නැහැ. මොකද, වැඩිහිටියන්ට දෙන්න කියලා අපි පාර්ලිමේන්තුවේ අනුමත කළේ රුපියල් 2,000ක්. ඔබතුමාට බලය තිබෙන්නේ මෙතැනින් අනුමත කරපු ඒ රුපියල් 2,000 ඒ අයට ලබා දෙන්නයි. මේ නිසා මෙතැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

දැන් සමෘද්ධිලාභීන් කියනවා, මීට අමතරව සමෘද්ධි සහනාධාරය දෙන කාණ්ඩ තුනෙනුත් රුපියල් සියය බැගින් කපා ගන්නවා කියලා. ගරු ඇමතිතුමනි, දැන් මේ වැඩිහිටියන්ට දෙන ආධාර මුදලට අමතරව සමෘද්ධි සහනාධාරයෙනුත් රුපියල් 100ක් කපා ගන්නවා නම්, අමාත්‍ය බලය පාවිච්චි කරලා මේ පාර්ලිමේන්තුවේ සම්මත කර ගත් අය දෙයට පටහැනිව කටයුතු කිරීමක් ඔබතුමාගෙන් සිද්ධ වනවා. මොකද, එම අරමුදලෙන් මේ කටයුත්ත ඒ විධියටම සිදු වෙනවාද කියන එකත් ප්‍රශ්නයක් විධියට මතු වෙලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුව අනුමත කළ යෝජනාවකට පටහැනි දෙයක් කරන්න වැඩිහිටි සභාවකට පුළුවන් වෙන්නේ කොහොමද? ඔබතුමාට එහෙම බලයක් තිබෙන්නේ කොහොමද? මේ පාර්ලිමේන්තුවෙන් අනුමත කළ දෙයකට එහා ගිහිල්ලා කටයුතු කරන්න ඇමතිවරයා විධියට ඔබතුමාට නීත්‍යානුකූල බලයක් නැහැ. එවැනි සුබ සාධන කටයුතු සඳහා වැඩිහිටි සභාවට අරමුදලක් අවශ්‍ය නම්, ඔබතුමා හරහා වෙනම අරමුදලකින් මුදල් වෙන් කර ගත යුතුව තිබෙනවා. ඒ නිසා කරුණාකර මේ රුපියල් සියය ලැබිය යුතු වැඩිහිටියන්ට නියමිත ආකාරයෙන් ලබා දෙන්න. ඒ වාගේම සමෘද්ධි සහනාධාරයෙන් රුපියල් සියයක් කප්පාදු කිරීම පිළිබඳවත් මා ඔබතුමාගෙන් කරුණු දැන ගන්න කැමැතියි.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව දිගින් දිගටම ලැබුණු කැබිනට් අනුමැතියන් තිබෙනවා. සමෘද්ධි සහනාධාරයෙන් එකතු කර ගත් සල්ලි තමයි අපි සමෘද්ධි බැංකුව හදන්න පාවිච්චි කළේ. අද එහි රුපියල් බිලියන 143ක් තිබෙනවා. ඒ වාගේම ඒකෙන්ම අඩු කර ගත් මුදලකින් තමයි සමාජ ආරක්ෂණ අරමුදල හැදුවේ. අපි අද එම අරමුදලෙන් අ.පොස. උසස් පෙළ හදාරන පාසල් දරුවන් 1,500 දෙනෙකු සඳහා මාසයකට රුපියල් 1,500 ගණනේ ලබා දෙනවා. අපි සමාජ ආරක්ෂණ සහනාධාරයෙන්ම ලබා ගත් රුපියල් 10කින් ආරම්භ කරපු නිවාස අරමුදලෙන් අද හැම මාසයකම රුපියල් ලක්ෂ දෙක ගණනේ පවුල් දෙසියයකට ලබා දෙනවා. ඒක ලොතරැයි ක්‍රමයකටයි ලබා දෙන්නේ, ගරු කථානායකතුමනි. මේ පාර්ලිමේන්තුව අනුමත කරපු; කැබිනට් මණ්ඩලය අනුමත කරපු විශේෂ පනත් මඟින් තමයි මේ අරමුදල් පාලනය වෙන්නේ. මේ වැඩිහිටි ජාතික සභාවත් පාර්ලිමේන්තු පනතකින් සම්මත කරපු ජාතික සභාවක්. ජනාධිපතිතුමා අමාත්‍යවරයාගේ නිර්දේශ මත තමයි ඒ ජාතික සභාව පත් කරන්නේ. හැම වැඩිහිටි නිවාසයකම අරමුදලක් හදන්න කියලා අපි කියා තිබෙනවා. මොකද, ඒවායේ තත්ත්වය ඉතාම කනගාටුදායකයි.

ගරු කථානායකතුමනි, ඩී.එස්. සේනානායක මැතිතුමා හදපු වැඩිහිටි නිවාසය අලුත්වැඩියා කරන්න කියලා ඔබතුමා විශේෂ ඉල්ලීමක් කළා. ඒ සඳහා රුපියල් මිලියන 28ක් වැය වෙනවා. අපි එහි වැඩ කටයුතු පටන් ගන්නවා. ලංකාව පුරා තිබෙන 306ක්වූ වැඩිහිටි නිවාසවල තත්ත්වය ඉතාම බේදනීයයි. එක පැත්තකින් මේ රුපියල් සියය කපා ගන්න කොට අපි ඒ මුදල් ගෙදරට ගෙන ගොස් දීලා ඔවුන්ට විශේෂ ලාභයක් ලබා දෙනවා. ඔවුන්ට ඒක ලාභයි. ඔවුන් රුපියල් දෙතුන්සියයක් වියදම් කරලායි මේක ගන්නේ. ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ හරහා වැඩිහිටි නිවාසවල තත්ත්වය ඉහළට ගෙනෙන්න අපට ඉඩකඩ ලැබෙනවා.

විදේශීය බැංකුවල ශ්‍රී ලාංකිකයන් සතු බැංකු ගිණුම්: විස්තර

வெளிநாடுகளிலுள்ள வங்கிகளில் இலங்கையர்களின் வங்கிக் கணக்குகள் : விபரம்

BANK ACCOUNTS OF SRI LANKANS IN BANKS OVERSEAS: DETAILS

443/'16

6. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ලෝකයේ විවිධ රටවල පවත්වාගෙන යන ලාංකිකයන් සතු බැංකු ගිණුම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ගිණුමෙහි ඇති වටිනාකම, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගිණුම් හිමියන් ශ්‍රී ලංකාවේ නීති උල්ලංඝනය කරමින් මුදල් තැන්පත් කර තිබේද;

(iv) එකී ගිණුම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එය සිදු කරන ආකාරය කවරේද;

(vi) රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් ඉහත කී සියලු ගිණුම්වල තොරතුරු ලබා ගැනීම සඳහා රජය විසින් අදාළ රාජ්‍යයන් හරහා ඉල්ලීම් කර තිබේද;

(vii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ස්විට්සර්ලන්තයේ HSBC බැංකුවේ ඇති ගිණුම් පිළිබඳව මා විසින් 2015.03.03 දින පාර්ලිමේන්තුවේදී කරන ලද විමසීමට පිළිතුරු වශයෙන්, ඒ සඳහා ක්‍රියා කිරීමට මූල්‍ය බුද්ධි අංශයට සම්බන්ධ නීති සංශෝධනය කරගත යුතු වන බවත්, මුදල් අමාත්‍යවරයා රීට ආසන්නම අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඒ සඳහා කටයුතු කරන බවත් පවසා සිටියේද;

(ii) එසේ නම්, එකී නීති සංශෝධනය කරනු ලැබ ඒ අනුව මේ වනවිට ගෙන ඇති පියවර සහ ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) உலகில் பல்வேறு நாடுகளிலும் பேணப்பட்டு வரும் இலங்கையர்களுக்குச் சொந்தமான வங்கிக் கணக்குகளின் எண்ணிக்கை யாது;

(ii) இந்த ஒவ்வொரு கணக்கிலுமுள்ள பெறுமதி, ஒவ்வொரு நாடுகளின்படி வெவ்வேறாக எவ்வளவு;

(iii) இக்கணக்குகளின் உரிமையாளர்கள் இலங்கையின் சட்டங்களை மீறி பணத்தை வைப்புச் செய்துள்ளனரா;

(iv) இக்கணக்குகள் தொடர்பாக சட்ட நடவடிக்கைகளை மேற்கொள்ள நடவடிக்கை எடுப்பாரா;

(v) ஆமெனில், அது செயற்படுத்தப்படும் முறை யாது;

(vi) இராஜதந்திர மட்டத்தில் மேற்குறிப்பிட்ட அனைத்து கணக்குகளினதும் தகவல்களைப் பெற்றுக்கொள்வதற்கு அரசாங்கம் உரிய நாடுகளினூடாக கோரிக்கை விடுத்துள்ளதா;

(vii) இன்றேல், ஏன்?

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சுவிற்சர்லாந்தில் H S B C வங்கியிலுள்ள கணக்குகள் தொடர்பாக என்னால் 2015.03.03ஆம் திகதி பாராளுமன்றத்தில் வினவப்பட்டதற்கு விடையாக, இது தொடர்பில் செயற்படுவதற்கு நிதிப் புலனாய்வுத் துறையுடன் தொடர்பான சட்டங்கள் திருத்தப்பட வேண்டுமெனவும், அதற்கு அண்மித்த அமைச்சரவைக் கூட்டத்தில் அதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படும் எனவும் நிதி அமைச்சரினால் கூறப்பட்டதா;

(ii) ஆமெனில், குறித்த சட்டங்கள் திருத்தப்பட்டு அதன் பிரகாரம் இதுவரை மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் மற்றும் அதன் முன்னேற்றம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா ?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the number of bank accounts maintained by the Sri Lankans in overseas banks;

(ii) the value of each account in respect of each country separately;

(iii) whether the holders of those bank accounts have deposited money violating the laws in Sri Lanka;

(iv) whether legal action will be taken with regard to those accounts;

(v) if so, the way in which it will be done;

(vi) whether the Government has made any requests at diplomatic level to get information on all those accounts through the relevant governments; and

(vii) if not, why?

(b) Will he also inform this House that-

(i) whether the Minister of Finance stated in his response to my question raised in this House on 03.03.2015 about the bank accounts in the HSBC in Switzerland, that action would be taken to amend the laws relating to the financial intelligence and necessary action would be taken in this regard in the next cabinet meeting; and

(ii) if so, the steps that have been taken and the progress achieved after the amendments were made?

(c) If not, why?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) මූල්‍ය බුද්ධි ඒකකයේ (මූ.බු.ඒ) බලතල සහ කාර්යයන් 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යන පනත් මගින් දක්වා ඇත.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මෙම ප්‍රශ්නයේ (අ) (i) සඳහා ලබා දෙන පිළිතුරු නිවැරදි එකද කියලා නැවත බලන්න.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු මන්ත්‍රීතුමනි, (අ) (i) සඳහා අදාළ පිළිතුර තමයි ලබා දෙන්නේ. මම පිළිතුරු දීලා අවසන් නැහැ. මම ඔබතුමාට ඒ ගැන විස්තරයක් මේ ලබා දෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා මෙම ප්‍රශ්නයේ (අ) (i) කොටසට අදාළ පිළිතුරද මේ ලබා දෙන්නේ?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ඔව්. මම තවම පිළිතුර ලබා දී අවසන් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, සම්පූර්ණ පිළිතුර ලබා දුන්නාට පසුව ප්‍රශ්න අහන එක යෝග්‍යයි නේද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මම එතුමාට උදව්වක් කරන්නයි හැදුවේ.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
උදවු අවශ්‍ය නැහැ. මම පිළිතුරු ලබා දෙන්නම්.

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

2006 අංක 6 දරන මුදල් ගනු-දෙනු වාර්තා කිරීමේ පනතේ සඳහන් නීති විරෝධී කටයුත්තක් හෝ 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත මගින් දක්වා ඇති වැරැදි සම්බන්ධයෙන් වන විමර්ශනයන් සඳහා පමණක් ශ්‍රී ලාංකිකයන්ගේ විදේශවල තිබෙන බැංකු ගිණුම්වල තොරතුරු රැස් කිරීමට මූල්‍ය බුද්ධි ඒකකයට බලතල ඇත. කෙසේ වෙතත්, විදේශවලින් තොරතුරු එක්රැස් කිරීමේදී එම රටේ නීති රෙගුලාසිවලට යටත්ව හා සිදු කරන විමර්ශන පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු අදාළ අධිකාරිය වෙත ලබා දීමෙන් පමණක් විදේශවලින් එම තොරතුරු ලබා ගත හැකිය.

විදේශවල ගිණුම් පවත්වාගෙන යන ශ්‍රී ලාංකිකයන් හෝ ඔවුන්ගේ නමට ඇති ගිණුම්වල ශේෂය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම හෝ සමීක්ෂණ පැවැත්වීමට මූල්‍ය බුද්ධි ඒකකයට බලයක් නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(ආ) (i) 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2015 වසර තුළදී සංශෝධනය කර නැත. මෙම පනත 2016 වසරේදී සංශෝධනය කිරීමට නියමිතය.

(ii) ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය සඳහා වන උපදේශන මණ්ඩලය 2015 මාර්තු 17 දින රැස් වූ අතර එහිදී මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම පිළිබඳව දැනට පවතින නීති (2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතද ඇතුළත්ව) සමාලෝචනය කිරීම සහ නව ගෝලීය තත්ත්වයන්ට අනුකූල වන පරිදි අවශ්‍ය සංශෝධන යෝජනා කිරීම සඳහා වූ කමිටුවක් පත් කරන ලදී.

මෙම කමිටුව පහත දැක්වෙන ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

1. නීතිපති දෙපාර්තමේන්තුව,
2. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව,
3. මූල්‍ය බුද්ධි ඒකකය,
4. මුදල් අමාත්‍යාංශය,
5. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, සහ
6. ශ්‍රී ලංකා පොලීසිය.

පසු ගිය මාස 8ක කාලය තුළ මෙම කමිටුව දෙවරක් රැස්වී ඇති අතර, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට යෝජිත සංශෝධන අවසන් අදියරේ පවතී.

එම සංශෝධනයන් සහිත නීති කෙටුම්පත, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් නැවත සමාලෝචනය කිරීමකින් අනතුරුව නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතය.

(ඇ) අදාළ නොවේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය මෙයයි. මූල්‍ය බුද්ධ අංශයට මේ කියන කරුණු සොයා බලන්නට බලයක් නැති බව තමයි ඔබතුමා කියන්නේ. ඒ වාගේම මූල්‍ය බුද්ධ අංශයට මෙම තොරතුරු සහ කරුණු සොයා බැලීමට බලයක් ලබා ගන්නා පිණිස දැනට පනත් කෙටුම්පතක් සකස් වෙමින් තිබෙන බව තමයි ඔබතුමා කියන්නේ. මා විමසන ප්‍රශ්නවලට තොරතුරු සපයා ගැනීමට එම පනත් කෙටුම්පතින් බලතල ලබා දී තිබෙනවා ද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, මා සඳහන් කළ පරිදි යෝජිත සංශෝධන අවසන් අදියරේ තමයි දැනට පවතින්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ කටයුතු තවම අවසන් කරලා නැහැ. එම කටයුතු අවසන් කළ වහාම ඔබතුමාට දැනුම් දෙන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒ පනත් කෙටුම්පතේ තිබෙන්නේ මොනවාද කියලා ඔබතුමා දන්නේ නැති බව මම පිළිගන්නම්. නමුත් අපි මෙහි විමසා තිබෙන තොරතුරු මූල්‍ය බුද්ධි අංශයට ලබා ගත හැකි වන විධියට ඔවුන් බැලගැන්වීමටද එම කෙටුම්පත හදන්නේ කියන එකයි මම අහන්නේ.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, ඒ නිසා තමයි "2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට ඇතුළත්ව" කියලා මම මගේ පිළිතුරේ සඳහන් කළේ. එතුමන්ලා ඒ සියලු කරුණු සමාලෝචනය කරලා තීන්දුවකට එන්න තමයි කටයුතු කරමින් යන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවසරය පරිදි මම ඔබතුමාගේ ප්‍රශ්නයට අවශ්‍ය පිළිතුර සඳහා උදව් කරන්නම්. ඔව්, ඒ සම්බන්ධයෙන් තිබෙන හිස්තැන් පුරවන්න තමයි අපි එවැනි ක්‍රියා ගේන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඔබතුමාට එහෙම පොරොන්දුවක් දෙන්න පුළුවන්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔව්, ඒක මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන එකක්. ඒක අඩංගු කර තිබෙනවා. ඒක කිසිසේත්ම අඩුවක් නොවෙයි. සියලු දේම එකට ගන්න කටයුතු කර තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඔබතුමා කියන හැටියට මේ කියන කරුණු කාරණා සෙවීමේ බලයත් මූල්‍ය බුද්ධි අංශයට ලබා දීම සඳහා ද මේ කෙටුම්පත් සංශෝධනය ගෙන එන්නේ?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි රාජ්‍ය ඇමතිතුමා කිව්වේ. මමත් ඒ කරුණු සනාථ කරනවා. ඒකට තවත් එකතු කරලා -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා ඒ කරුණු ස්ථිර කරලා කියනවාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මෙයයි. පසු ගිය දවස්වල අපි කවුරුත් බොහෝ කථා කළ දෙයක් තමයි, විවිධ රටවල හොර ගිණුම් තිබෙනවාය, ඒ උදව්ය තැන්පත් කරන ඒ මුදල් මේ රටේ නීතියට විරුද්ධව, අයථා ලෙස මේ රටින් පිට කරගත් මුදල්ය කියන එක. මේ මුදල විශාල මුදලක් බවට දැන් අපට හිතන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් පළ වූ ජනමාධ්‍ය ප්‍රකාශනත් අපට දකින්න ලැබී තිබෙනවා. අයථා ලෙස තැනින් තැන තැන්පත් කරපු මේ විශාල මුදල සොයා ගැනීම සඳහා අදාළ රාජ්‍යයන් හරහා ඉල්ලීම් කර තිබෙනවාද කියා මා අහලා තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමා එයට පිළිතුරු වශයෙන්, "අදාළ නොවේ" කියා කිව්වා. මා අහලා තිබෙන්නේ, "රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් ඉහත කී සියලු ගිණුම්වල තොරතුරු ලබා ගැනීම සඳහා රජය විසින් අදාළ රාජ්‍යයන් හරහා ඉල්ලීම් කර තිබේද?" කියලායි.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මට වාර්තා කර තිබෙන්නේ එතුමන්ලා ගත් උත්සාහය ගැනයි. මා හිතන හැටියට අපි දැන් ඒ පනත අලුතින් සංශෝධනය කරන්නේත් ඒ කටයුතු කර ගෙන යන්නයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
රජයක් හැටියට අපේ රජය යම් රටක රාජ්‍යයකින් -මා නම කියන්නේ නැහැ.- ඉල්ලීමක් කරනවා, "අපේ රටින් පිට වුණු අයථා මුදල් ඔබගේ රටේ බැංකු ගිණුම්වල තැන්පත් වී තිබෙන බවට අපට සැල වී තිබෙනවා. ඒ නිසා රාජ්‍යයකින් රාජ්‍යයකට ලබා දෙන උදව්වක් හැටියට ඒ පිළිබඳ තොරතුරු ලබා දෙන්න"යි කියා. එවැනි ඉල්ලීමක් කර තිබෙනවාද කියලායි මා අහන්නේ.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් වශයෙන්, මූල්‍ය බුද්ධි ඒකකය පැනමාවලින් එවැනි ඉල්ලීමක් කරලා තිබෙනවා. අපේ ශ්‍රී ලාංකිකයන්ගේ ගිණුම් මොනවා හෝ තිබෙනවා නම් ඒ පිළිබඳ තොරතුරු ලබා දෙන්න කියා ඉල්ලීමක් කරලා තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පැනමා රාජ්‍යයෙන්?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ඔව්, පැනමා රාජ්‍යයෙන්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
වෙනත් රාජ්‍යයන්ගෙන් ඉල්ලීම් කරලා නැද්ද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ඒ සම්බන්ධයෙන් සොයා බලා කියන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමා, ඒ වාර්තා පස්සේ ඉදිරිපත් කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු රාජ්‍ය ඇමතිතුමා ලබා දුන් පිළිතුර අනුව -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා. බොහොම ස්තුතියි.

ආනයනික මෝටර් රථ තක්සේරුව අඩු කිරීම : රාජ්‍ය අයභාරයට වූ අලාභය
இறக்குமதியான வாகனங்களின் குறைமதிப்பீடு: அரச வருமான இழப்பு
UNDERVALUATION OF IMPORTED MOTOR VEHICLES: LOSS OF STATE REVENUE

452/'16

8. ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) 2014 අගෝස්තු 15 දින ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 36,800ක් ලෙස තක්සේරු කර තිබූ TRJ 150W මාදිලියේ මෝටර් රථවල වටිනාකම, 2015 මාර්තු 23 දින වන විට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 27,944 (ජපන් යෙන් 3,375,000) දක්වා ඩොලර් 8836කින් අඩු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවට ආනයනය කර තිබූ වාහන 407කින් සිදුවී ඇති බදු අලාභය දළ වශයෙන් රුපියල් මිලියන 3000 පමණ වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම බදු අලාභය සම්බන්ධයෙන් වගකිව යුත්තේ කවුරුන්ද;

(ii) රාජ්‍ය අයභාරයට මෙවැනි අලාභයක් සිදුව ඇත්නම්, ඒ හා සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

(iii) කලින් පැවති තක්සේරුව අඩු කිරීම හේතුවෙන්, තීරුබදු සහන බලපත්‍රය යටතේ මේ දක්වා මෙරටට ආනයනය කරන ලද මෝටර් රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

නිති අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) 2014 ආගස්ට් 15ආම් තිකති ඉක්කිය අමෙරික්ක ටොලර් 36,800 එන මතිප්පීටු සෙය්‍යප්පට්ටිරුන්ත TRJ150W රක මෝට්ටාර් වාකනංකළින් පෙරුමති 2015 මාර්ච්සු 23ආම් තිකතියළවිල් ඉක්කිය අමෙරික්ක ටොලර් 27944 (යප්පානිය යෙන් 3,375,000) වරෙ 8836 ටොලර්කළිනාල් වීළ්ච්සියටෙන්තතන් කාරණමාක ඉලංකෙක්කු ඉරක්කුමති සෙය්‍යප් පට්ටිරුන්ත 407 වාකනංකළිනාල් ඒර්පට්ටුළ්ළ වරි වරුමාන ඉළප්පු අණ්ණළවාක රූපා 3000 මිල්ලියන්කළාකුම් එන්පතෙ අවර් අරිවාරා?

(ආ) (i) ඉන්ත වරි වරුමාන ඉළප්පු තොටර්පාක පොරුප්පුක් කූර වේණ්ටියවර්කළ් යාවර් එන්පතෙයුම්;

(ii) අරස වරුමානත්තිර්කු ඉව්වාරානතොරු ඉළප්පු ඒර්පට්ටිරුප්පින්, අතුපර්රි එටුක්කප්පටුම් නටවටික්කෙ යාතෙන්පතෙයුම්;

(iii) ඒර්කනවේ කාණප්පට්ට මතිප්පීටු කුරෙක්කප් පට්ටතන් විළෙවාක, තීර්වෙ වරිච් සලුකෙ උරිමත්තින් කීළ් ඉතුවරෙ නාට්ටුක්කු ඉරක්කුමති සෙය්‍යප්පට්ට මෝට්ටාර් වාකනංකළින් එණ්ණික්කෙ යාතෙන්පතෙයුම්;

අවර් ඉච්සපෙයිල් අරිවිප්පාරා?

(ඉ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Finance:

(a) whether he is aware that the tax revenue loss incurred through 407 vehicles imported to Sri Lanka as a result of the action to underestimate the value of the vehicle model TRJ 150W by US Dollars 8,836 from US Dollars 36,800 on 15th August 2014 to US Dollars 27,944 (3,375,000 Japanese Yen) on 23rd March 2015, is approximately Rs. 3,000 million?

(b) Will he inform this House -

(i) as to who should be held responsible regarding this tax revenue loss;

(ii) the measures that are taken pertaining to any loss that has incurred in the state revenue, if any; and

(iii) the number of motor vehicles imported to the country under the duty free permit as a result of the underestimation of prices from the previous valuation?

(c) If not, why?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) මෙම මාදිලියේ වාහන සඳහා නිෂ්පාදකයාගේ මිල පදනම් කොටගෙන මුලින්ම ඇමෙරිකානු ඩොලර් 32,000ක (FOB) මිල වට්ටෝකමක් ලබාදී තිබිණ. එහෙත් දේශීය නියෝජිතයින් මෙරටදී අය කරනු ලබන දේශීය ගාස්තුද මෙම මිලට ඇතුළත් කර මිල නියම කිරීමට තීරණය කර ඇමෙරිකානු ඩොලර් 36,800ක් (FOB) ලෙස මිල සංශෝධනය කරන ලදී. මෙම මාදිලියේ බහුතරයක් වාහන ආනයනය කරන ලද්දේ සහනදායී බලපත්‍ර මතයි. එකී බලපත්‍රවල බලපත්‍ර සීමාව වූයේ ඇමෙරිකන් ඩොලර් 35,000කි (CIF). මිල ඇමෙරිකානු ඩොලර් 36,800ක් දක්වා ඉහළ දැමීම නිසා ඉහත බලපත්‍ර මත ආනයනය කරන ලද වාහන සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් උදා විය. එබැවින් දේශීය නියෝජිතයන් විසින් ඉහත තීරණය අභියෝගයට ලක් කරමින් අධිකරණයේ නඩුවක් ගොනු කරන ලදී. එම නිසා 2015.02.10 දින නිකුත් කරන ලද ගැසට් අංක 1901/3 ප්‍රකාරව නිෂ්පාදකයාගේ මිල පදනම් කොට ගෙන ජපන් යෙන් 3,375,000 (FOB) ක් ලෙස මිල සංශෝධනය කිරීමට සිදු විය. (එහෙත් බලපත්‍රයේ සඳහන් උපරිම මිල සීමාව (CIF) වනුයේ ජපන් යෙන් 2,940,000කි)

එසේ නමුත් බලපත්‍රයේ සඳහන් වෙනත් මුදල් ඒකක උපයෝගි කර ගනිමින් සහ විවල්‍ය වන විනිමය අනුපාතයන්ට අනුව ගැළපීම් කරමින් බලපත්‍ර යටතේ ආනයනයන් සිදු කර ඇත. ඒ අනුව නිෂ්පාදන වට්ටෝකම වූ ජපන් යෙන් 3,375,000 එදින පැවති විනිමය අනුපාතයන්ට අනුව ගැළපීම් කළ විට එය ඇමෙරිකානු ඩොලර් 27,944.44කි.

මේ අනුව ඒ ඒ කාලවලදී පැවති ගැසට් නිවේදනවලට අනුකූලව කටයුතු කර ඇති අතර, කිසිදු අයුරකින් මිල ගණන් අවභාවිතයට ලක් කොට නොමැති **නිසාත්,** අදාළ වාහන සඳහා වූ නියමිත මිල වට්ටෝකම මත නීත්‍යානුකූලව බදු අය කරගෙන ඇති **නිසාත්** රජයට කිසිදු බදු අලාභයක් සිදු වී නොමැත.

පසුකාලීනව සියලුම මෝටර් රථවල මිල ගණන් 2015.10.18 දින සිට සංශෝධනය කරන ලද අතර TRJ 150W මාදිලියේ වාහනයක නව මිල වට්ටෝකම ජපාන යෙන් 3,640,200 (FOB)කි.

(ආ) (i) කිසිදු බදු අලාභයක් සිදුවී නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) වාහන 1,014ක් පමණ. (2015.03.24 දින සිට 2016.04.17 දක්වා)

(ඇ) පැන නොනඟී.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු අමාත්‍යතුමනි, තීරුබදු වෙනස් කිරීම් සඳහා මුදල් අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා මැදිහත් වීමක් හෝ උපදෙස් දීමක් සිදු කර තිබෙනවා ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් ඇමති නැත්නම් සංස්කෘතික ඇමතිද මෙම කටයුතු කරන්නේ? [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බුද්ධ ශාසන ඇමතිද මෙය කරන්නේ?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මෙය කරන ආකාරය පිළිබඳව, බදු තක්සේරු කිරීම පිළිබඳව - අඩුවෙන් තක්සේරු කරන්න කියා- ඔබතුමා රේගු දෙපාර්තමේන්තුවට නිර්දේශයක් කර තිබෙනවා ද කියායි මා ඇහුවේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සාමාන්‍ය නීතිය යටතේ එවැනි දෙයක් වුණාම අපි එය fine කරනවා. Fine කළාම එය අඩු කිරීමේ -mitigate කිරීමේ- බලය තිබෙන්නේත් අමාත්‍යතුමාටයි. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේ කිසිම පදනමක් නැතිව licence දී තිබුණා. බදු රහිතව ගෙනා එකට තමයි අපි පසුව බදු එකතු කිරීමක් කළේ. යම් විධියේ අධිබදු ප්‍රමාණයක් පනවා තිබුණා. ඒ දෙක අතර වෙනස market value එකට වඩා වැඩි වූ නිසාත්, ඒ අය ඉල්ලීමක් කළ නිසාත් විකුණන්න පුළුවන් මිලකට බදු එකතු කර තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එසේ කළේ, වාහන ආනයනකරුවන්ගේ සංගමය විසින් කරන ලද ඉල්ලීමක් අනුවද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සාමුහිකව සියලු දෙනා කිව්වා. උදාහරණයක් වශයෙන්, එළියේ වාහනයක මිල රුපියල් ලක්ෂ 30ක් කියාත්, මෙය රුපියල් ලක්ෂ 50ක් කියාත් සිතමු. එහෙම නම් එම වාහනය එළියට ගෙන යෑමේදී කිසිසේත් නිසි වටිනාකමක් නැහැ. Market value එකට අදාළව කළ ඉල්ලීම අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කළාට පසුව එතුමාගේ අදහස අපට යොමු කළා. අපි එය අනුමත කළා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු ඇමතිතුමනි, ජනාධිපතිතුමාත් ඔබතුමාත් සම්බන්ධ වෙලා මේ පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරන්න කමිටුවක් පත් කළා. එම කමිටුවේ වාර්තාව ලැබී තිබෙනවාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්. එක වතාවක් නොවෙයි. තුන්හතරපස් වතාවක් කථා කරලා, සොයා බැලුවා. අන්තිමට ඒ අයත් සමාව ඉල්ලා තිබුණා, වැරදි ගමනකයි ගිහින් තිබෙන්නේ කියා. ඒ ලැබෙන්න තිබුණු සල්ලි ප්‍රමාණයට වඩා මිලියන 150ක් අද ලැබී තිබෙනවා කියා තමයි අධ්‍යක්ෂ ජනරාල් අපට වාර්තා කර තිබෙන්නේ.

උතුරු පළාතේ පෙර පාසල් ගුරුවරුන්: විස්තර
வட மாகாண முன்பள்ளி ஆசிரியர்கள் : விபரம்
PRE-SCHOOL TEACHERS IN NORTHERN PROVINCE: DETAILS

563/'16

12.ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දිවයින පුරා පිහිටා තිබෙන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ පෙර පාසල් ළමුන් සඳහා නිසි පරිදි සකස් වූ අධ්‍යාපන ක්‍රමයක් තිබේද;

(iii) පෙර පාසල් ගුරුවරුන්ගේ වැටුප් ක්‍රමය අයත් වන කාණ්ඩය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උතුරු පළාතේ, විශේෂයෙන් කිළිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවල පිහිටා තිබෙන පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම පෙර පාසල්වලින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ ඇති පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ උගන්වන ගුරුවරුන්ට වැටුප් ගෙවන පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පාසල් යාමට නියමිත පෙර පාසල් ළමුන් සඳහා ආරක්ෂක හමුදාවලට සම්බන්ධ ගුරුවරුන්ට ඉගැන්විය හැකිද;

(ii) රටේ අනෙක් ප්‍රදේශවලත් මෙම ක්‍රමය ක්‍රියාත්මක වන්නේද;

(iii) පෙර පාසල් ළමුන්ගේ නිල ඇඳුමේ හමුදා ලාංඡන පළඳවා ඇති බව දන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්චරෙක් කේට්ට වීනා:

(அ) (i) நாடு முழுவதிலுமுள்ள முன்பள்ளிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இலங்கையில் முன்பள்ளிச் சிறார்களுக்கென உரிய முறையில் தயாரிக்கப்பட்ட கல்வி முறை யொன்று உள்ளதா என்பதையும்;

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

(iii) முன்பள்ளி ஆசிரியர்களுக்குரிய சம்பளத் திட்டம் எந்த வகுதியைச் சேர்ந்தது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) வடமாகாணத்தில் குறிப்பாக கிளிநொச்சி மற்றும் முல்லைத்தீவு மாவட்டங்களில் அமைந்துள்ள முன்பள்ளிகளின் எண்ணிக்கை யாதென் பதையும்;

(ii) மேற்படி முன்பள்ளிகளில் சிவில் பாதுகாப்புத் திணைக்களத்தின் கீழ் உள்ள முன்பள்ளிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) அவற்றில் கற்பிக்கும் ஆசிரியர்களுக்கு எந்த அடிப்படையில் சம்பளம் செலுத்தப்படுகின்றது என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) பாடசாலை செல்லவிருக்கும் முன்பள்ளிச் சிறார் களுக்கு பாதுகாப்புப் படைகளுடன் தொடர் புடைய ஆசிரியர்களினால் கற்பிக்க முடியுமா என்பதையும்;

(ii) நாட்டின் ஏனைய பிரதேசங்களிலும் இந்த முறை அமுலில் உள்ளதா என்பதையும்;

(iii) முன்பள்ளிச் சிறார்களின் சீருடையில் இராணுவச் சின்னம் அணிவிக்கப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state-

(i) the number of pre-schools located across the island;

(ii) whether there is a formal education system for pre-school children in Sri Lanka; and

(iii) the salary group under which the salary scheme of pre-school teachers is placed?

(b) Will he inform this House-

(i) the number of pre-schools in the Northern Province, especially in the Kilinochchi and Mullaitivu Districts;

(ii) these pre-schools, the number of pre-schools under the Department of Civil Security; and

(iii) the basis on which salaries are paid to the teachers teaching in them?

(c) Will he also inform this House whether-

(i) teachers associated with security forces can teach pre-school children who are about to commence school education;

(ii) this system is in operation in other parts of the country as well; and

(iii) he is aware that military insignias are affixed to uniforms of pre-school children?

(d) If not, why?

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)

(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சரின் சார்பில் இந்தக் கேள்விக்கான விடைகளை நான் அளிக்கின்றேன்.

(அ) (i) பதிவுசெய்யப்பட்டுள்ள ஆரம்பப் பாடசாலை களின் எண்ணிக்கை14,663.

(ii) இலங்கையில் ஆரம்பப் பாடசாலைகளுக்காக, மாகாண சபைகளில் ஆரம்பச் சிறுபராயக் கல்வி தொடர்பான பொறுப்புக்களை வகிக்கும் நிறுவனங்களினால் தயாரிக்கப்பட்ட கல்வி முறைகளே தற்போது அந்தந்த மாகாணங்களில் அறிமுகப்படுத்தப்பட்டுள்ளன. எனவே, முழு நாட்டுக்கும் பொதுவான ஆரம்பக் கல்விப் பாடசாலைகளின் கல்வி முறை கொண்ட ஆரம்பச் சிறுபராயக் கல்வி தொடர்பாகத் தேசியக் கல்விக் கொள்கையொன்று கல்வி அமைச்சினால் தயாரிக்கப்பட்டுத் தற்போது அதற்குத் தேசிய கல்வி ஆணைக் குழுவின் இணக்கம் பெறப்பட்டுள்ளது.

(iii) உள்ளூராட்சி நிறுவனங்களினால் நிர்வகிக் கப்படும் ஆரம்பப் பாடசாலைகளில் நிரந்தர சம்பளத்தைப் பெறும் ஆசிரியர்களின் சம்பள முறைமை அடங்கும் பிரிவு MNI - 2006 A ஆகும். அரச துறையல்லாத ஆரம்பப் பாடசாலைகளில் ஆசிரியர் ஒருவருக்காக உரிய சம்பள முறைமை இல்லை.

(ஆ) (i) வட மாகாணத்தில் அமைந்துள்ள பதிவுசெய்யப் பட்ட ஆரம்பப் பாடசாலைகளின் எண்ணிக்கை 1,581. கிளிநொச்சி மாவட்டத்தில் அமைந்துள்ள பதிவுசெய்யப்பட்ட ஆரம்பப் பாடசாலைகளின் எண்ணிக்கை 230. முல்லைத்தீவு மாவட்டத்தில் அமைந்துள்ள பதிவுசெய்யப்பட்ட ஆரம்பப் பாடசாலைகளின் எண்ணிக்கை 233.

(ii) கிளிநொச்சி மாவட்டத்தில் சிவில் பாதுகாப்புத் திணைக்களத்தின் கீழுள்ள ஆரம்பப் பாடசாலை களின் எண்ணிக்கை 163. முல்லைத்தீவு மாவட்டத்தில் சிவில் பாதுகாப்புத் திணைக் களத்தின் கீழுள்ள ஆரம்பப் பாடசாலைகளின் எண்ணிக்கை 95.

(iii) வட மாகாணக் கல்வி அமைச்சினால், வட மாகாண சபையின் அங்கீகாரம் பெற்று மாகாணக் கல்வி அமைச்சின்கீழ் பதிவு செய்யப்பட்டுள்ள ஆரம்பப் பாடசாலைகளின் ஆசிரியர்களுக்கான மாதாந்தக் கொடுப்பனவு செலுத்தப்படுகின்றது.

சிவில் பாதுகாப்புத் திணைக்களத்தின் கீழுள்ள ஆரம்பப் பாடசாலைகளில் சேவையாற்றுகின்ற ஆசிரியர்களுக்குச் சிவில் பாதுகாப்புத் திணைக் களத்தினால் சம்பளம் செலுத்தப்படுகின்றது.

(இ) (i) ஆரம்பப் பாடசாலைக் கல்வி தொடர்பாகத் தேசிய கல்விக் கொள்கை தற்போது அமுலில் இல்லையென்பதால் ஆரம்பப் பாடசாலை களுக்கு ஆசிரியர்களைச் சேர்த்துக்கொள்ள

அங்கீகரிக்கப்பட்ட ஒரு முறைமையில்லை. ஆரம்பச் சிறுபராயக் கல்வி தொடர்பாக முறையான பயிற்சிகளைப் பெற்றிருப்பின், பாதுகாப்புப் படையுடன் தொடர்புபட்ட ஆரம்பப் பாடசாலை ஆசிரியர்களினால் கற்பித்தலில் தடைகள் ஏற்படாது.

(ii) கிளிநொச்சி மற்றும் முல்லைத்தீவு மாவட்டங் களிலுள்ள 258 ஆரம்பப் பாடசாலைகள் உட்பட நாடெங்கிலுமுள்ள 600 ஆரம்பப் பாடசாலை களில் சிவில் பாதுகாப்புத் திணைக்களத்தின் கீழுள்ள ஆசிரியர்கள் சேவையாற்றுகின்றனர்.

(iii) ஆரம்பப் பாடசாலைப் பிள்ளைகளின் சீருடை யில் சிவில் பாதுகாப்புத் திணைக்களத்தின் உத்தியோகபூர்வ இலச்சினைகள் பொறிக்கப் படவில்லை. இருப்பினும் சிவில் பாதுகாப்புத் திணைக்களத்தின் கீழுள்ள ஆரம்பப் பாடசாலை களில் கல்வி கற்கும் பிள்ளைகளுடைய சீருடையில் அந்த ஆரம்பப் பாடசாலையின் அடையாளத்தின் இலச்சினையே பொறிக்கப் பட்டுள்ளது.

(ஈ) எழவில்லை.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, பாதுகாப்புத் திணைக் களத்தின் கீழுள்ள ஆரம்பப் பாடசாலைகளில் கல்வி கற்கும் மாணவர்களின் சீருடைகளில் இராணுவச் சின்னம் பொறிக்கப் பட்டிருப்பதை ஆதார பூர்வமாக -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, the Question is already there in the Order Paper. You may raise Supplementary Questions. You do not have to repeat the whole Question.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

இது சம்பந்தமாக ஏற்கெனவே எழுத்துமூலமாகவும் தகவல் தந்திருக்கின்றோம். பிள்ளைகள் இராணுவச்சின்னம் பொறிக் கப்பட்ட சீருடைகளை அணிந்துகொண்டு செல்கின்றார்கள். நாம் அதற்கான ஆதாரத்தைத் தருவதற்குத் தயாராக இருக்கின்றோம்.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

பாதுகாப்புத் திணைக்களத்தின் சின்னம் பொறிக்கப் படவில்லை என்றுதான் இங்கு சொல்லப்பட்டுள்ளது.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

நாம் ஆதாரத்தை உங்களுக்குத் தருகின்றோம்.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

ஆதாரத்தைக் கொடுத்தால் அதற்கான அடுத்தகட்ட நடவடிக்கையை நாங்கள் எடுக்கமுடியும்.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

ஏன், இந்த ஆரம்பப் பாடசாலைகள் பாதுகாப்புத் திணைக்களத்தின்கீழ் இருக்கவேண்டும்? இவற்றைக் கல்வித் திணைக்களத்தின்கீழ் கொண்டுவந்தால், அத்திணைக்களத்தின் மூலம் அந்த ஆசிரியர்களுக்கான சம்பளத்தை வழங்கலாம் தானே?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Shritharan, you ask the Question and the Hon. State Minister will reply. Then if you have any queries, you have three opportunities to raise your Supplementary Questions.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

விசேடமாக வட மாகாணத்திலே, கல்வித் திணைக்களங் களினால் எந்தவிதமான ஆரம்பப் பாடசாலைகளும் அங்கீகரிக் கப்படவில்லை. இவை மாகாண சபையின் கீழுள்ள பிரதேச சபைகளினாலும் சிவில் பாதுகாப்புத் திணைக்களத்தினாலும் தான் நடத்தப்பட்டு வருகின்றன.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Now you may ask your first Supplementary Question.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

My first Supplementary Question is - நாட்டிலே எங்கேயும் இல்லாதவாறு கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களில் மட்டும் ஏன், இவ்வாறான முன்பள்ளிகள் தொடர்ந்து இவ்வளவு காலமாக இராணுவ சிவில் பாதுகாப்புத் திணைக்களத்தின்கீழ் இருக்க வேண்டும்?

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

கடந்த காலங்களில் ஆரம்பிக்கப்பட்ட பாடசாலைகள் இன்னமும் தொடர்ந்து நடைபெறுகின்றன. இப்போது நாங்கள் சேர்ந்து பேசி இது தொடர வேண்டுமா, இல்லையா? என்ற முடிவை எடுக்கலாம்.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

யுத்தம் முடிவடைந்து ஏழு ஆண்டுகள் கடந்துவிட்டன. வடக்கு, கிழக்குக்கென மாகாண சபைகள் இருக்கின்றன. மாகாண சபைக்குக்கீழ் கல்வித் திணைக்களங்கள் செயற்படுகின்றன. வடக்கு மற்றும் கிழக்கு மாகாண கல்வி அமைச்சுக்களுக்கு வழங்கப்பட வேண்டிய இந்த விடயங்கள் ஏன், தொடர்ந்தும் இராணுவத்தின்கீழ் இருக்க வேண்டும்?

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

இது சம்பந்தமாக வட மாகாண சபையின் ஆட்சியாளர் களுடைய கவனத்திற்குக் கொண்டுவந்து அதற்கேற்ற நடவடிக் கையை எடுக்க முடியும். அந்த வகையில் அவர்களுடன் இந்தப் பிரச்சினையைப் பேசித் தீர்க்கலாமென்று நினைக்கின்றேன்.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
என்னுடைய 3ஆவது உப வினாவைக் கேட்கிறேன்.

இது தொடர்பாக நாங்கள் பல தடவை பேசியிருக்கிறோம். நான் ஜனாதிபதி அவர்களுக்கும் அது பற்றிக் கடிதம் எழுதியிருக்கிறேன். இதை உடனடியாக நீக்குமாறு ஜனாதிபதி யிடமிருந்து கடிதம் வந்திருந்தும்கூட இதுவரை இராணு வத்தின் பிடியிலிருந்து அந்தப் பாடசாலைகள் விடுவிக்கப் படவில்லை. இலங்கையிலே எங்கும் இல்லாதவாறு கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களில் மட்டும் இராணுவப் பிரசன்னத்தோடு இயங்குகின்ற இந்த பாடசாலைகளின் நடவடிக்கைகளைத் தயவுசெய்து உடன் நிறுத்தி, அவற்றை வடக்கு மாகாணக் கல்வி அமைச்சின்கீழ் கொண்டுவாருங்கள்! அதற்கான நடவடிக்கையை விரைவாக எடுங்கள்! அதற்குத் தேவையான கால அவகாசத்தைக் குறிப்பிடுங்கள்!

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

எங்களுடைய கௌரவ அமைச்சர் அவர்களுடனும் அதேபோல பிரதம அமைச்சர் அவர்களுடனும் பேசி இதற்கான நடவடிக்கையை எடுக்க முடியுமென்பதைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Taking into consideration the importance of the Question, you should give priority and sort it out early.

එස්. එම්. ජෙසීර් මහතා: ඉඩමක් ලබාදීම
திரு. எஸ்.எம். ஜெசீர் : காணி வழங்கல்
MR. S. M. JEZEER: PROVISION OF LAND

575/'16

13.ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) එස්. එම්. ජෙසීර් මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් මඩකලපුව, පොළොන්නරුව දුම්රිය රක්ෂිත ඉඩමේ (පූනානි, රිදීතැන්න ස්ථානයේ පිහිටි)දීර්ඝ කාලයක් සිට ජීවත්වන බවත්;

(ii) එම ඉඩම් කොටස, දුම්රිය දෙපාර්තමේන්තුවෙන්, දීර්ඝ කාලීන බදු ගිවිසුමක් යටතේ ලබා ගැනීම සඳහා ඔහු අයදුම්කර තිබෙන බවත් (ලිපිගොනු අංක දු.සා./දු.ර.ක.ඒ./නව බදුදීම/2012);

එතුමා දන්නෙහිද?

(ආ) ජීවත්වීමට ස්ථිර නිවසක් හෝ ඉඩමක් නොමැතිව අසරණව සිටින ජෙසීර් මහතාට නීත්‍යානුකූල ලෙස බදු ගිවිසුමකින් දුම්රිය රක්ෂිත ඉඩමේ කොටසක් ලබා දීම කෙරෙහි සලකා බලන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திரு. எஸ்.எம். ஜெசீர் மற்றும் அவரின் குடும்ப அங்கத்தவர்கள் மட்டக்களப்பு, பொலன்னறுவை புகையிரத ஒதுக்குக் காணியில் (புணானை, ரிதீதென்ன எனும் இடத்தில் அமைந்துள்ள) நீண்டகாலமாக வாழ்ந்து வருகின்றார்கள் என்பதையும்;

(ii) மேற்படி காணிப் பகுதியை, புகையிரத திணைக் களத்திலிருந்து, நீண்டகாலக் குத்தகை உடன்படிக்கையின்கீழ் பெற்றுக்கொள்வதற்கு இவர் விண்ணப்பித்துள்ளார் என்பதையும் (கோப்பு இலக்கம் து.சா./து.ர.க.ஏ./புதிய குத்தகை/ 2012);

அவர் அறிவாரா?

(ஆ) வாழ்வதற்கு நிரந்தர வீடு அல்லது காணி இன்றி அநாதரவாக உள்ள திரு. ஜெசீருக்கு சட்டபூர்வமாக குத்தகை உடன்படிக்கைமூலம் புகையிரத ஒதுக்குக் காணியில் ஒரு பகுதியை பெற்றுக்கொடுப்பது தொடர்பாக ஆராயப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Is he aware that-

(i) Mr. S.M. Jezeer resides in the railway reserved land in Batticaloa, Polonnaruwa with his family (in Punanai, Rideethenna) for a long period of time; and

(ii) he has applied to get the aforesaid plot of land from Department of Railways on a long term lease (File No.දු.සා./දු.ර.ක.ඒ./නව බදු දීම/2012) ?

(b) Will he inform this House whether it is considered to provide Mr. Jezeer who has been rendered helpless without having a land or permanent house to live, a part of the railway reserved land by a legal lease agreement?

(c) If not, why?

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) එස්.එම්. ජෙසීර් මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් මඩකලපුව, පොළොන්නරුව දුම්රිය රක්ෂිත ඉඩමේ දීර්ඝ කාලයක සිට ජීවත්වන බවක් වාර්තා වී නොමැත.

(ii) ව්‍යාපාර කටයුත්තකට බදු ලබා ගැනීම සඳහා 2012 වර්ෂයේදී අයදුම්කර ඇත.

(ආ) මෙවැනි ඉල්ලීමක් ඉදිරිපත් වී නොමැති අතර ජෙසීර් මහතාගෙන් ඉල්ලීමක් ලැබුණු පසුව ඒ පිළිබඳ සලකා බැලිය හැක.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14-142/'15 - (1), ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Public Enterprise Development)
ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවන වටය. ප්‍රශ්න අංක 5 - 440/'16 - (2), ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 - 446/'16 - (2), ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මාලදිවයිනෙහි බන්ධනාගාරගතව සිටින එම්. එම්. එම්. බිස්තාම් මහතා: ශ්‍රී ලංකාවේ බන්ධනාගාරයකට මාරු කරවා ගැනීම

மாலைதீவில் சிறைக்கைதியாயுள்ள திரு. எம்.எம்.எம். பிஸ்தாம் : இலங்கைச் சிறைக்கு மாற்றுதல்

MR. M. M. M. BISTHAM IMPRISONED IN MALDIVES : TRANSFER TO A SRI LANKAN PRISON

457/'16

9. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු එච්.එම්. සල්මාන් මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு எம்.எச்.எம். சல்மான் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. M.H.M. Salman)
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) ශ්‍රී ලංකා රජය හා මාලදිවයින රජය අතර සිරකරුවන් හුවමාරු කර ගැනීම සඳහා අත්සන් කරන ලද ගිවිසුම අනුව මාලදිවයිනෙහි සිරභාරයේ පසුවන එම්. එම්. එම්. බිස්තාම් නමැති පුද්ගලයා ශ්‍රී ලංකාවේ බන්ධනාගාරයකට මාරු කිරීම පිණිස ඉල්ලුම් කිරීම සම්බන්ධව (Case File No. 175/2009 - Court No. 194 JC - 2009) අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOJ/L2/2/3/12 හා 2014.05.30 දිනැති ලිපිය මඟින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙතින් වාර්තාවක් කැඳවන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී සිරකරු ශ්‍රී ලංකාවේ බන්ධනාගාරයකට මාරුකරවා ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(ii) එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்ற மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) இலங்கை அரசுக்கும் மாலைதீவு அரசுக்கு மிடையில் சிறைக் கைதிகளைப் பரிமாறிக் கொள்வதற்கெனக் கைச்சாத்திடப்பட்ட உடன்படிக்கையின்படி மாலைதீவில் சிறை வைக்கப்பட்டுள்ள எம்.எம்.எம். பிஸ்தாம் என்ற நபரை இலங்கையிலுள்ள சிறைச்சாலை யொன்றுக்கு மாற்றுவதற்கான கோரிக்கை சம்பந்தமாக (Case File No. 175/2009 - Court No. 194 JC-2009) நீதி அமைச்சின் செயலாளருடைய M O J / L 2 / 2 / 3 / 1 2ஆம் இலக்க மற்றும் 2014.05.30ஆம் திகதிய கடிதம் மூலம் வெளிநாட்டு அலுவல்கள் அமைச்சின் செயலாள ரிடமிருந்து அறிக்கை ஒன்று கோரப்பட்டுள்ள தென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கைதியை இலங்கையிலுள்ள சிறைச்சாலையொன்றுக்கு மாற்றும் செயற்பாடு தொடர்பில் எடுக்கப்பட்டுள்ள நடவடிக்கை யாதென்பதையும்;

(ii) அதன் தற்போதைய முன்னேற்றம் யாதென் பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Prisons Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs:

(a) Is he aware that a report was called from the Secretary to the Ministry of External Affairs by the letter number MOJ/L2/2/3/12 dated 30.05.2014 of the Secretary to the Ministry of Justice pertinent to the appeal made for the transfer of a person by the name of M.M.M. Bistham who is imprisoned in Maldives to a prison in Sri Lanka (Case File No.175/2009-Court No.194 JC-2009), as per the Exchange Treaty signed between the Governments of Sri Lanka and Maldives?

(b) Will he state -

(i) the steps taken in relation to the transferring process of the aforesaid prisoner to a prison in Sri Lanka; and

(ii) what its current progress is?

(c) If not, why?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்- சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)

(The Hon. D.M. Swaminathan - Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs)

Hon. Speaker, I **table*** the Answer.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(a) Not relevant to this Ministry.

(b) (i) The aforesaid prisoner, Mohamed Wasudha Mohamed Bistham and twelve other prisoners were brought to Sri Lanka on 12 April 2016.

(ii) The aforesaid 12 prisoners (above prisoner included) are presently at Welikada Prison.

(c) Not relevant.

රජයේ භාෂා පරිවර්තක සේවය : උසස් කිරීමේ විභාගය

அரசாங்க மொழிபெயர்ப்பாளர் சேவை : பதவி உயர்வுப் பரீட்சை

GOVERNMENT TRANSLATORS' SERVICE: PROMOTIONAL TEST

503/'16

10. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු චතුර සංදීප සේනාරත්න මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு சத்துர சந்தீப சேனாரத்ன சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Chathura Sandeepa Senaratne)

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රජයේ භාෂා පරිවර්තක සේවයේ විශේෂ පන්තියට උසස් කිරීමේ විභාගය 1999 වසරින් පසු මෙතෙක් පවත්වා නොමැති බවත්;

(ii) ඒ හේතුකොට ගෙන එකී විශේෂ පන්තියේ තනතුරු මේ වනවිට මුළුමනින්ම පුරප්පාඩු වී ඇති බවත්;

(iii) වසර 16කට වැඩි කාලයක් පුරා පවතින එකම උසස්වීමේ අවස්ථාවද අහිමි කිරීමෙන් නිලධාරීන්හට බලවත් අසාධාරණයක් සිදුවී ඇති බවත්; එතුමා දන්නෙහිද?

(ආ) (i) අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් 2006.01.01 දින සිට එම සේවයේ විශේෂ පන්තිය සේවා තත්ත්වයෙන් පහත හෙළන ලද බවත්;

(ii) ඒ අනුව, දීපව්‍යාප්ත සේවා මට්ටමේ තිබූ එම පන්තිය 2006 වසරේ සිට කළමනාකරණ සහකාර අධි පන්තියටද පහළින් ස්ථානගත කරන ලද බවත්;

(iii) එම තත්ත්වය නිලධාරීන් සේවය හැරයාමටත්, උග්‍ර නිලධාරී භීතියක් ඇති කිරීමටත් හේතුවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) උසස්වීමේ අවස්ථාව අහිමි වූ එම නිලධාරීන්ට ලබාදෙන සහනය කවරේද;

(ii) නව සේවා ව්‍යවස්ථා කෙටුම්පතෙන් විශේෂ පන්තිය සඳහා 2006 වසරට පෙර පැවති සේවා තත්ත්වය නැවත ලබාදීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම ප්‍රතිපාදනයන් වහා ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக மற்றும் முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்க மொழிபெயர்ப்பாளர் சேவையின் சிறப்பு வகுப்புக்கு பதவி உயர்வு அளிக்கும் பரீட்சை 1999ஆம் ஆண்டுக்குப் பின்னர் இதுவரை நடத்தப்படவில்லை என்பதையும்;

(ii) இதன் காரணத்தினால் மேற்படி சிறப்பு வகுப்புக்கான பதவிகள் இன்றளவில் முழுமை யாக வெற்றிடங்களாக உள்ளன என்பதையும்;

(iii) 16 ஆண்டுகளுக்கு மேல் நிலவும் ஒரே பதவி உயர்வு வாய்ப்பையும் இழக்கச் செய்துள்ளதன் மூலம் உத்தியோகத்தர்களுக்கு பெரும் அநீதி இழைக்கப்பட்டுள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) 06/2016ஆம் இலக்க பொதுநிருவாகச் சுற்றறிக்கையின்மூலம் 2006.01.01ஆம் திகதி யிலிருந்து மேற்படி சேவையின் சிறப்பு வகுப்பு சேவை நிலைமையிலிருந்து கீழிறக்கம் செய்யப் பட்டதென்பதையும்;

(ii) அதன் பிரகாரம், நாடளாவிய சேவை மட்டத்தி லிருந்த மேற்படி வகுப்பு 2006ஆம் ஆண்டி லிருந்து முகாமைத்துவ உதவியாளர் உயர் வகுப்பையும்விடக் குறைவான இடத்தில் வைக்கப்பட்டதென்பதையும்;

(iii) மேற்படி நிலைமையானது, உத்தியோகத்தர்கள் சேவையை விட்டுச்செல்வதற்கும், கடும் உத்தியோகத்தர் பற்றாக்குறையைத் தோற்றுவிப் பதற்கும் ஏதுவாகி உள்ளதென்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) பதவி உயர்வு வாய்ப்புகளை இழந்துள்ள மேற்படி உத்தியோகத்தர்களுக்கு வழங்கப்படும் நிவாரணம் யாதென்பதையும்;

(ii) புதிய சேவைப் பிரமாணக் குறிப்புகள்மூலம் சிறப்பு வகுப்புக்கு 2006ஆம் ஆண்டுக்கு முன்னர் காணப்பட்ட சேவை நிலையை மீண்டும் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை மேற்கொள் வாரா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி ஏற்பாடுகளை உடனடியாக அமுல்படுத்துவதற்கு நடவடிக்கை மேற்கொள் வாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Management:

(a) Is he aware that -

(i) the examination for the promotion of officers in the Government Translators' Service to the Special Grade of the Translators' Service has not been conducted after 1999;

(ii) owing to that, all positions of the said special grade have fallen vacant at present; and

(iii) these officers have been subjected to severe injustice for over 16 years as they have been deprived of the only promotional opportunity available to them?

(b) Will he admit that-

(i) the special grade of that service was downgraded with effect from 01.01.2006 by the Public Administration Circular of 06/2006;

(ii) accordingly this grade which was at the level of Island-wide Service was placed even below the supra grade of the Management Assistants' Service from 2006; and

(iii) this situation has resulted in officers vacating the service thereby creating a severe dearth of officers?

(c) Will he inform this House-

(i) the relief to be granted to those officers who lost promotion opportunities;

(ii) whether steps will be taken to grant this special grade of the service, the status that prevailed prior to 2006 through the new draft service minute; and

(iii) if so, whether those provisions will be implemented forthwith?

(d) If not, why?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006හි විධිවිධාන අනුව සැකසූ සේවා ව්‍යවස්ථා කෙටුම්පත නිරීක්ෂණ සඳහා 2013.11.18 දිනැතිව අමාත්‍ය මණ්ඩල කාර්යාලයට යොමු කර ඇත. තවද එහි නිරීක්ෂණ සැලකිල්ලට ගනිමින් සකසන ලද ව්‍යවස්ථා කෙටුම්පතෙහි සඳහන් වැටුප පිළිබඳව නිරීක්ෂණය ලබාගැනීම සඳහා ජාතික වැටුප් හා සංඛ්‍යා කොමිෂන් සභාවට 2014.07.07 දිනැතිව ඉදිරිපත් කර ඇත.

වැටුප් සම්බන්ධයෙන් ජාතික වැටුප් කොමිෂන් සභාවේ එකඟතාව ලබා ගත නොහැකි වීම හේතුවෙන් යෝජිත ව්‍යවස්ථා කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත 2015.06.26 දිනැතිව ද අමාත්‍ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව 2015.09.30 දිනැතිව ද යොමු කර ඇත. 2015.12.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් වැටුප පිළිබඳව වූ වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ යළි සලකා බලන ලෙස වැටුප් කොමිෂන් සභාව වෙත දන්වා ඇත. ඒ අනුව සේවා ව්‍යවස්ථාව අනුමත වීමෙන් පසු අදාළ උසස්වීම් විභාග පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

ඒ අනුව 06/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව රජයේ භාෂා පරිවර්තක සේවයේ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතින බැවින් එමඟින් උසස්වීම් ලබා දීමට අපේක්ෂා කරන බැවින් උසස්වීම් විභාග පවත්වා නැත.

(ii) විශේෂ පන්තියේ සිටි නිලධාරීන් විශ්‍රාම ගැනීමෙන් පසු එම පන්තිය පුරප්පාඩු වී ඇත.

(iii) ඉහත කරුණු හේතුවෙන් දැනට මෙම නිලධාරීන්ට උසස්වීම් අවස්ථා මහහැරී ඇත.

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

(ආ) (i) විශේෂ පන්තියේ සේවා තත්ත්වය පහත හෙළීමට කටයුතු කර නැත.

(ii) වැටුප් චක්‍රලේඛයක් මඟින් සේවා තත්ත්වය පහත හෙළීමක් සිදු නෙවේ.

(iii) නිලධාරි හිඟය හා නිලධාරීන් සේවය හැර යාමේ ගැටලුව මෙම සේවාවට පමණක් නොව දීප ව්‍යාප්ත නොවන බොහෝ සේවාවන්ට පවතින ගැටලුවකි. රාජ්‍ය ආංශයේ බඳවා ගැනීම කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අමාත්‍යාංශය අදහස් කර ඇත. ඇබෑර්තු ගණන් තැබීම විධිමත් කිරීම, විභාග නිශ්චිත කාලසටහන් මත පැවැත්වීම, විභාග ක්‍රම ඒකාබද්ධ කිරීම ආදිය විධිමත් කිරීමට කටයුතු අරඹා ඇත.

(ඇ) (i) 06/2006 චක්‍රලේඛය අනුව සේවා ව්‍යවස්ථාව සංශෝධනය කළ පසු ඒ යටතේ උසස්වීම් ලබා දීමට අපේක්ෂා කරයි.

(ii) නව සේවා ව්‍යවස්ථාව මඟින් සමස්ත භාෂා පරිවර්තක සේවය සඳහාම වඩා යහපත් තත්ත්වයක් ඇති කිරීමට පියවර ගෙන ඇත.

(iii) නව සේවා ව්‍යවස්ථාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කිරීමෙන් පසුව සේවා උසස්වීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 - 558/'16 - (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, වැරැදි අමාත්‍යාංශයකටයි මේ ප්‍රශ්නය යොමු කරලා තිබෙන්නේ. නිවැරැදි අමාත්‍යාංශයට යොමු කරන්න වෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නිවැරැදි අමාත්‍යාංශයට යොමු කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
පාඨලී චම්පික රණවක ඇමතිතුමාගේ අමාත්‍යාංශයටයි අදාළ වෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ඒක ඒ අමාත්‍යාංශයට යොමු කරන්න.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඊළඟට ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න. ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

දකුණු හා උතුරු මැද පළාත්වල දෙමළ පාසල්වල අඩු පාඩු
தெற்கு மற்றும் வட மத்திய மாகாண தமிழ்ப் பாடசாலைகளின் குறைபாடுகள்
LACK OF FACILITIES IN TAMIL SCHOOLS IN SOUTHERN AND NORTH CENTRAL PROVINCES

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ටක්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
කෞරව සභානායකර් අවර්කළේ, නිලෙයියර් කට්ටළෙ 23(2) ඉන්කීළ් කල්වි අමෙච්චර් අවර්කළිටම් එනතු කේල්වියෙක් කේට්ක අනුමතිත්තතර්කු නන්රි.

නාට්ටිල් වටක්කු, කිළක්කු, මලෙයකම්, කොළුම්පු පෝන්ර පකුතිකළිලුළ්ළ තමිළ්ප් පාටසාලෙකළ්මීතු සෙලුත්තප්පටුකින්ර අළවිලාන අවතානංකළෙ මේර්පටි පකුතිකළෙච් චාරාත තමිළ්ප් පාටසාලෙකළ් තොටර්පිල් අරසු සෙලුත්තුවතිල්ලෙ එන්ර ඔරු කුර්රච්චාට්ටු නිලවුකින්රතු. කුරිප්පාක නාට්ටින් තෙන් මර්රුම් වට මත්තිය මාකාණංකළිලුළ්ළ තමිළ්ප් පාටසාලෙකළ් තේසිය කල්වික් කොළ්කෙක්කු උට්පටාත පාටසාලෙකළාකක් කාණප්පටුවතාකක් කූර්ප්පටුකින්රතු.

තෙන් මාකාණත්තෙ එටුත්තුක්කොණ්ටාල්, මාත්තරෙ මාවට්ටත්තිල් ඉන්තු තමිළ්ප් පාටසාලෙකළුම්, තමිළ් මොළියෙයුම් කොණ්ටතාන ඉරු මොළිප් පාටසාලෙ ඔන්රුම් උළ්ළන. ඉවර්රිල් මොරවක්ක කල්වි වලයත්තිල් ඉයංකිවරුම් හන්ට්පෝට් තමිළ් විත්තියාලයම්, පේර්වලි තමිළ් විත්තියාලයම් මර්රුම් ඉරු මොළිප් පාටසාලෙයාන පුනිත මත්තියූස් පාටසාලෙ ආකියවර්රිල් කල්විප් පොතුත් තරාතරප් පත්තිර (උයර්තර) වකුප්පුක්කළිල් කලෙප් පිරිවු මට්ටුමේ උළ්ළතු.

ඉතේ කල්වි වලයත්තිලුළ්ළ එනසල්වත්ත තමිළ් විත්තියාලයම්, අනික්කන්ත තමිළ් විත්තියාලයම් මර්රුම් අක්කුරස්ස කල්වි වලයත්තිලුළ්ළ හසලන්තුව තමිළ් විත්තියාලයම් එන්පන කල්විප් පොතුත් තරාතරප් පත්තිර (සාතාරණ) තරම් වරෙයුළ්ළ පාටසාලෙකළාකුම්.

කාලි මාවට්ටත්තිල් උටුකම කල්වි වලයත්තිල් තල්කස්වෙල තමිළ් විත්තියාලයම්, තලංකා සරස්වති තමිළ් විත්තියාලයම් මර්රුම් එම්පිලිප්පිට්ටිය කල්වි වලයත්තිලුළ්ළ තිවිත්තුර තමිළ් විත්තියාලයම් එන්පනවුම් සාතාරණ තරම් වරෙයිලාන වකුප්පුකළෙක් කොණ්ට පාටසාලෙකළාකුම්.

වට මත්තිය මාකාණත්තෙප් පොරුත්තවරෙයිල්, පොන්නරුවෙ මාවට්ටත්තිල් තිම්පුලාකල කල්වි වලයත්තිල් 6 තමිළ්ප් පාටසාලෙකළ් අමෙන්තුළ්ළන. ඉතිල් 1895ආම් ආණ්ටු ආරම්පික්කප්පට්ට මන්නම්පිට්ටි තමිළ් මකා විත්තියාලයමුම් චෙනප්පිට්ටි තමිළ් මකා විත්තියාලයමුම් කල්විප් පොතුත් තරාතරප් පත්තිර උයර්තර වකුප්පිල් කලෙ මර්රුම් වර්ත්තකප් පාටප් පිරිවුකළෙක් කොණ්ට පාටසාලෙකළාක විළങ්කිනාලුම්, කලෙත් තුරෙප් පාටංකළිල් චිල පාටංකළ් මට්ටුමේ අංකු කර්පික්කප්පටුවතාකත් තෙරියවරුකින්රතු.

முத்துக்கல் தமிழ் வித்தியாலயம் மற்றும் சொருவில் தமிழ் வித்தியாலயம் என்பன சாதாரண தரம் வரையிலான பாடசாலைகளாகவுள்ள நிலையில், ரொட்டவெவ தமிழ் வித்தியாலயமும் சரஸ்வதி தமிழ் வித்தியாலயமும் ஆரம்பப் பாடசாலைகளாக உள்ளன. இப்பாடசாலைகள் அனைத்தும் கணிதம், விஞ்ஞானம் ஆகிய பாடங்களில் தகைமைபெற்ற ஆசிரியர்கள் இன்றியே நடத்தப்பட்டு வருவதாகக் கூறப்படுகின்றது.

அனுராதபுரத்தில் அமைந்துள்ள விவேகானந்தா தமிழ் மகா வித்தியாலயமானது உயர் தரத்தில் கலை மற்றும் வர்த்தகப் பாடப் பிரிவுகளைக் கொண்டதாக அமையப் பெற்றுள்ளது. ஆகவே, -

மேற்படி பாடசாலைகளிலுள்ள கணிதம், விஞ்ஞானம், ஆங்கிலம், வரலாறு, மொழி, சமயம் போன்ற பாடங்களுக்கான தகைமைவாய்ந்த ஆசிரியர்களுக்கான பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்கு எடுக்கப்படக்கூடிய நடவடிக்கைகள் குறித்துக் கூற முடியுமா?

அனுராதபுரம் விவேகானந்தா தமிழ் மகா வித்தியாலயத்திற்கென இந்து சமய அதிபர் ஒருவரை நியமிப்பதற்கும் மாணவர்களுக்கான விடுதி வசதிகளை ஏற்படுத்திக் கொடுப்பதற்கும் நடவடிக்கை எடுக்க முடியுமா?

இப்பாடசாலைக்கு மேலும் தமிழ் மாணவர்களை ஈர்க்கும் வகையில் மேற்கொள்ளப்படக்கூடிய திட்டங்கள் ஏதும் உண்டா என்பது குறித்து விளக்க முடியுமா?

குறிப்பாக, நீராவியடி போன்ற தமிழ் மக்கள் அதிகமாக வாழும் பகுதிகளில் போக்குவரத்து வசதிகளை உரிய முறையில் மேற்கொண்டால் அதிக மாணவர்கள் இப்பாடசாலையில் சேரக்கூடிய வாய்ப்புகள் உள்ளதாகக் கூறப்படுகின்றது.

மேல் குறிப்பிடப்பட்ட இரு மாகாணங்களிலுமுள்ள பாடசாலைகள் எதுவுமே தேசிய கல்விக் கொள்கைக்கு அமைவாகச் செயற்படுவதில்லை எனக் கூறப்படுகின்றது. இவ்விடயம் தொடர்பில் விளக்கம் அளிக்க முடியுமா?

பொலன்னறுவை மாவட்டத்திலுள்ள மன்னம்பிட்டி தமிழ் மகா வித்தியாலயத்தையும் மாத்தறை மாவட்டத்திலுள்ள பேர்வலி தமிழ் வித்தியாலயத்தையும் உயர்தர வகுப்புக்களில் கலை, கணிதம், வர்த்தகம், விஞ்ஞானம் ஆகிய பாடப் பிரிவுகளைக் கொண்ட தரமான பாடசாலைகளாகத் தரமுயர்த்துவதற்கு மேற்கொள்ளப்படக்கூடிய நடவடிக்கைகள் என்ன என்பது பற்றிக் கூற முடியுமா?

காலி மாவட்டத்திலுள்ள தலங்க/சரஸ்வதி தமிழ் வித்தியாலயத்தை, உயர்தர வகுப்பில் கலை, வர்த்தகப் பாடப் பிரிவுகளைக் கொண்ட பாடசாலையாகத் தரமுயர்த்த முடியுமா?

எனது இந்தக் கேள்விகளுக்கு கௌரவ அமைச்சர் அவர்கள் பதில் கூறுவார் என நான் எதிர்பார்க்கின்றேன். நன்றி.

ගරු වී.එස්. රාධාකිෂ්ණන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)

(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ உறுப்பினர் டக்ளஸ் தேவானந்தா அவர்களின் இந்த கேள்வி இன்றைய காலகட்டத்தில் முக்கியத்துவம் வாய்ந்ததாகும். விசேடமாக தமிழ் மொழிக் கல்விக்குப் பொறுப்பாக இருக்கின்ற எனக்கு, இந்த விடயங்கள் பற்றி ஓரளவுக்குப் பதில் சொல்ல முடியுமென்று நினைக்கின்றேன். மேலதிக விபரங்கள் தேவையாக இருந்தால் அவற்றைப் பேசித் தீர்த்துக்கொள்ள முடியுமென்பதையும் கௌரவ உறுப்பினருக்குக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

தென் மாகாணப் பிரதிக் கல்விப் பணிப்பாளரினால் அனுப்பப்பட்ட கடிதத்தில் தலங்கா சரஸ்வதி தமிழ் பாடசாலை சம்பந்தமாக கீழ்க்காணும் விடயங்கள் தெரிவிக்கப் பட்டிருக்கின்றன: 2014ஆம் ஆண்டு அப்பாடசாலையின் கலைப் பிரிவுக்குத் தகைமைபெற்ற மாணவர்களின் எண்ணிக்கை 10 ஆகும். 2015ஆம் ஆண்டு அப்பாடசாலையின் கலைப் பிரிவுக்கு தகைமைபெற்ற மாணவர்களின் எண்ணிக்கை 14 ஆகும். இப்பாடசாலையில் வர்த்தகப் பிரிவை ஆரம்பிப்பதற்குத் தேவையான மாணவர்கள் அங்கு இல்லை. இப்பாடசாலையில் க.பொ.த. உயர்தர பிரிவை ஆரம்பிப்பதற்குத் தேவையான பட்டதாரி ஆசிரியர்களும் அங்கு இல்லை. தென் மாகாண சபையினூடாக ஆசிரியர் நியமனங்கள் வழங்குவதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டிருக்கின்றன. அவ்வாறு நியமனங்களை வழங்கி, பாடசாலைக்கு கட்டிடங்களைப் பெற்றுக் கொடுத்ததன் பின்பு அங்கு கலைப் பிரிவு தொடங்கப்படும் என்பதைத் தெரிவித்துக்கொள்கின்றேன்.

விசேடமாக கௌரவ உறுப்பினர் அவர்களுக்கு நான் ஒன்றைத் தெரிவித்துக்கொள்ள வேண்டும். தென் மாகாணப் பாடசாலைகள் யாவும் - plantation - தோட்டப் பாடசாலைகள் என்ற பிரிவுக்குள் வருகின்றன. அண்மையிலே தோட்டப் பாடசாலைகளுக்கு க.பொ.த. உயர்தரத்தில் கல்வி கற்பிப்பதற்கு ஆசிரிய உதவியாளர்களை நியமிப்பதற்கு விண்ணப்பங்கள் கோரப்பட்டபோது தகைமையான விண்ணப்பங்கள் வந்து சேரவில்லை. வேறு மாவட்டங்களிலிருந்து ஆசிரியர்கள் அங்கு சென்று வேலை செய்வதற்கான வசதிகளும் இல்லை. அதன் காரணமாக அந்த மாவட்டத்தின் கல்வி நடவடிக்கை சற்றுப் பின்னடைந்திருப்பது எனக்கும் தெரிகின்றது. அந்த வகையில், அவற்றின் எதிர்கால நடவடிக்கைகளைத் திட்டமிட்டிருக்கிறோம் என்பதை உங்களுக்கு ஞாபகப்படுத்த விரும்புகின்றேன்.

அடுத்து, வட மத்திய மாகாண தமிழ்ப் பாடசாலைகள் தொடர்பாக எடுக்கப்பட்ட தீர்மானங்களைக் கூற விரும்புகின்றேன்.

வட மத்திய மாகாணத்தின் பொலன்னறுவை மாவட்டத்தில் குறிப்பிட்ட கல்வி வலயத்திற்குட்பட்ட தமிழ் பாடசாலைகளில் கணிதம், விஞ்ஞானம், ஆங்கிலம், வரலாறு, மொழி மற்றும் சமய பாடங்களுக்கான ஆசிரிய வெற்றிடங்களைக் கருத்திற்கொண்டு வட மத்திய மாகாண கல்வித் திணைக்களம் பட்டதாரி ஆசிரியர்களைச் சேர்த்துக்கொள்வதற்கு முன்னெடுத்த முயற்சிகள் கைகூடவில்லை. ஆதலால் மீண்டும் விண்ணப்பங்கள் கோரப்பட்டு யூலை மாதம் முடிவடைவதற்கு முன்னர் தேவையான ஆசிரியர்களை உள்வாங்கும் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. அத்துடன் புதிய நியமனங்களை வழங்கும்போது வட மத்திய மாகாணத்தில் நிலவும் தமிழ் மொழி ஆசிரியர் வெற்றிடங்களின்படி கல்வியியற் கல்லூரியில் போதனாவியலில் டிப்ளோமா பெற்ற பட்டதாரிகளுக்கு நியமனங்களை வழங்குவதற்கு எதிர்பார்க்கப்படுகின்றது. இவ்வருடத்தில் கல்வியற் கல்லூரிகளுக்கான பயிற்சியாளர்களை இணைத்துக் கொள்ளும்போது வெற்றிடங்கள் நிலவும் மாவட்ட செயலாளர் பகுதிகளைக் கருத்திற்கொண்டு நடவடிக்கை மேற்கொள்வதற்கும் உத்தேசிக்கப்பட்டுள்ளது. அதனூடாக எதிர்காலத்தில் தமிழ்ப் பாடசாலைகளுக்கு போதிய ஆசிரியர்களைப் பெற்றுக் கொள்வதற்கு இடமுண்டு. பட்டதாரி அல்லாத ஆசிரியர்களை ஆசிரிய சேவை அமைப்பின் பிரகாரம் இணைத்துக்கொள்வதற்கு உத்தேசித்திருப்பதுடன், அச்சந்தர்ப்பத்தில் இது குறித்து விசேட கவனம் செலுத்தப்படும் என்பதையும் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அநுராதபுரம் விவேகானந்தா பாடசாலையில் தற்பொழுது இஸ்லாமிய மாணவர்கள் 303 பேரும் இந்து மாணவர்கள் 60 பேரும் இருப்பதாக உறுதிப்படுத்தப்பட்டுள்ளது. இப் பாடசாலையில் மொத்தமாக 29 ஆசிரியர்கள் இருக்கிறார்கள். அதில் இந்து சமய ஆசிரியர்கள் 4 பேர் மட்டுமே கடமை புரிகின்றார்கள். இப்பாடசாலையில் அதிகமான முஸ்லிம் மாணவர்கள் கல்வி கற்பதனால் இஸ்லாமிய நேர அட்டவணைகளின்படி அது இயங்கி வருகின்றது. இஸ்லாமியர் ஒருவரே பாடசாலை அதிபராகவும் கடமை புரிகின்றார்.

[ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා]

இப்பாடசாலையில் தமிழ் மாணவர்களின் எண்ணிக்கை குறைவாக இருந்தபோதிலும், அவர்களுக்குத் தேவையான கல்வி வசதிகள் செய்துகொடுக்கப்பட்டுள்ளன. அதற்கும் மேலாக, அதிபர் சேவை தரம் IIIஇல் சித்தியடைந்த எந்தவொரு தமிழ் அதிபரும் இங்கு தெரிவுசெய்யப்படவில்லை என்பதும் தெரியவந்துள்ளது. இப்பாடசாலையில் தமிழ் மாணவர்களை அதிகளவில் சேர்த்துக் கொள்வதற்குத் தேவையான தகுந்த நடவடிக்கைகளை எடுப்பதற்கு, வட மத்திய மாகாண கல்வி அமைச்சின் செயலாளருக்கு ஆலோசனை வழங்கப்பட்டிருக்கின்றது.

நீராவியடிப் பிரதேசத்திலுள்ள மாணவர்களைக் கவர்வது தொடர்பாக வட மத்திய மாகாணக் கல்வி அமைச்சின் செயலாளருக்கு ஆலோசனை வழங்க எதிர்பார்க்கப் பட்டிருக்கின்றது.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

ஆசிரியர் பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்கு நீங்கள் ஒப்பந்த அடிப்படையில் தரம் வாய்ந்தவர்களை எடுக்கக்கூடியதாக இருந்தால் நல்லது.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

ஆசிரியர் பற்றாக்குறை என்பது, நாடு முழுவதிலுமுள்ள மாகாணப் பாடசாலைகளிலே ஒரு பெரும் குறையாகக் காணப்படுகின்றது. இதற்கு தற்பொழுது விசேட அனுமதி கிடைக்கப்பெற்றிருக்கின்றது. அதன் அடிப்படையில், முதலில் மாகாண சபைகள் மூலமாக பட்டதாரிகளை நியமிப்பதற்கும் போதாத பட்சத்தில் டிப்ளோமாதாரிகள் மற்றும் HND படித்தவர்களை நியமிப்பதற்கும் அதுவும் போதாத பட்சத்தில் Advanced Level - க.பொ.த உயர்தரம் படித்தவர்களை நியமிப்பதற்குமுரிய நடவடிக்கைகளைத் தற்பொழுது கல்வி அமைச்சு மேற்கொண்டு வருகின்றது.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා)
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. D.M. Swaminathan, are you going to make a Statement?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Sir, there was a question raised by the Hon. R. Sampanthan during the Debate on the Adjournment Motion on the10th of June, 2016. Can I table this reply?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Yes, if it is okay by the Hon. R. Sampanthan.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Hon. Leader of the Opposition, there was a question that you asked on the 10th of June, 2016 at the Debate on the Adjournment Motion. I am **tabling*** the reply for that.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Leader of the Opposition, is it okay if he tables that?

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

Sir, I am not aware of the fact that the Hon. Minister is responding today. The Hon. Minister can table it.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Thank you.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

Status of Families to be resettled.

- Since 2015 about 3,136 acres of Private lands under the State Authorities have been released for resettlement for IDPs in the Northern and Eastern Provinces and up to now and 1578 families comprising of 4046 persons were already resettled.
- In the Northern Province alone 7618 acres of Private lands that belongs to the IDPs are still under state authorities. Of this 5606 acres of private land is in the Jaffna District. The Thellipalai Divisional Secretary Division is identified as the most important area for resettlement.
- Total number of IDP families to be resettled in the Northern and Eastern Province is 12,505 families of which Northern Province accounts for 12096 families (96%).
- IDPs to be resettled in Jaffna District is 10,775 families of which 8,898 families are to be resettled in Thellipalai Divisional Secretary Division.

Status of the Families in Welfare Camps

There are 32 welfare camps in the Northern Province of which 31 camps are in the Jaffna District and one camp is in Vanuniya District. There are 1068 IDP families in the Welfare camps of which 641 families are landless families.

Action Taken

- Action has been taken and cabinet paper has been submitted to release 65 hectares of lands belongs to the KKS Cement Cooperation to resettle the landless of 400 displaced families in welfare centers in Jaffna District immediately.
- There were 97 displaced families in Poonthottam welfare center. 65 houses are being constructed in Sinnadappan village in Vavuniya district by the Gnanam Foundation voluntarily to resettle the families in Poonthoddam camp Another 32 IDP families are planned to be resettled in Parasamkulam Village. 32 Houses for these ID families will be provided by Gnanam Foundation on a Voluntary basis.
- Further 400 acres of lands is being identified by the Ministry of Defence to resettle the ID families.
- Ministry of Defence is working out to release the lands belongs to the families who are still living in the camps and with their friends and relatives with the collaboration of Ministry of Prison Reforms, Rehabilitation and Resettlement and Hindu Religious Affairs and in consultation with all the District Secretaries.
- We have advised the Ministry of Defence and the Ministry of Prison Reforms, Rehabilitation and Resettlement and Hindu Religious Affairs to work out a pragmatic plan of action to resettle all the IDPs in close collaboration with the District Secretary to release of lands for resettlement.

II. Structured Programmes to resettle IDP Families. Projects implementing by Ministry of Prison Reforms, Rehabilitation and Resettlement and Hindu Religious Affairs in 2016 given below

S/No	Title of the project	Unit Cost (Rs.)	Number of Units	Total Allocation (Rs.Mn)
1	**Construction of new houses** Resettled ID families - 9000 Returnee refugees - 630 ID families in Threatened villages - 400	800,000.00	10,030	8024.00
2	**Repair of Partly damaged Houses**	200,000.00	2,126	425.27
3	**Provision of Sanitation Facilities**	55,000.00	7,600	418.00
4	**Provision of Safe Drinking Water**			647.00
5	**Relocation Programme** Keppapilavu relocation programme - Rs 11.4 Mn Marrichchikatti and Mullikulam relocation programme, Mannar District - Rs 154.56 Mn Jaffna relocation programe - Rs 140.7 Mn			306.66
6	**Provision of Livelihood assistance for resettled ID families and Returnee Refugees**	100,000.00	12,050 families	1205.00
7	**High impact project –Northern Province** **1.** Construction of bridge cum causeway across sea between Kayts and Karainagar towns (Jaffna)	605.00		1846.65
	2.Construction of new passenger boat - 100 passengers capacity like Kumuthini boat (length - 17 meters; breadh - 4.8 meters; full height - 2.25 meters (Delft)	98.56		
	3. Construction of Jetty (Delft)	37.50		
	4. Reconstruction of jetty of geographically disadvantage island of Eluvaitivu (Kayts)	60.00		
	5. Seaweed Farming in the coastal area of Northern Province	5.50		
	6. Renovation of road from Velanai to Kayts (6.77Km)	827.30		
	7. Livelihood and income generating opportunities for Northern Province			
	7.1 Revitalizing the milk value addition and strengthening the liquid milk marketing network	24.20		
	7.2 Strengthening the capacity of Vathiri Leather (Karaveddi)	4.53		
	7.3 Strengthening the Kamarchchi Ambal Light Engineering Industry Kopay	7.08		
	8. Establishment of a proper clinical waste management system for state health sector	60.50		
	9. Establishment of a proper disposal system for human excreta in Jaffna District (Valikamam, Thenmarachchi and Vadamarachchi)	90.48		
	10. Systemize the collection and segregation of solid waste in Municipal Council area in Jaffna District.	26.00		
8	**Construction of infrastructure facilities in the resettled areas** (Internal roads, free electricity connections, community halls, pre-schools, health centers and other infrastructure facilities)			711.03
9	Providing drinking water facilities for ID families in border / threatened villages			155.00
10	Provision of resettlement assistance (dry ration) and for refugee returnees			16.00
11	Construction of Semi-Permanent Houses			12.39
12	Strengthening the Fishnet Production Capacity of the Northsea Limited			103.00
13	Conducting Mine Action activities in mine affected areas			20.00
14	Palmyrah based Livelihood Development Pogramme			160.00
	Total			**14,050.00**

In addition to above projects, the various projects are in pipe line. ADB funded Fisheries project to cover fishery harbors, Anchorages and landing sites which will help to improve the livelihood of IDP families. Total estimated cost of the Project is US $ 62 Mn.

III. Reconciliation

- 12,000 ex- combatants were socially integrated and assistance is being provided to enhance their income generating activities under the Livelihood Programme implementing by this Ministry.
- 35 Graduate ex- combatants are to be absorbed to the Government Graduate Scheme.
- Returnee Refugees from Tamil Nadu, India are being encouraged to repatriate to Sri Lanka by providing assistance with collaboration of UNHCR. (Free air ticket and allowance such as reintegration allowance of US$ 75 per person, transport allowance of US$ 19 per person and monetary nonfood allowance of US$ 75 per family).
- Further this Ministry has planned to provide Houses, livelihood assistance and resettlement assistance for Returnee Refugees under the Development Projects in 2016.
- Further Ministry of Reconciliation, ONUR Progrmme, The Ministry of National Co-Existence, Dialogue and Official Languages are also working for reconciliation.
- National Policy on Resettlement and Rehabilitation has been finalized and is being forwarded to the Cabinet of Ministers for approval.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා. [බාධා කිරීමක්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන අවස්ථාවේදී ඔබතුමා ප්‍රකාශ කළා, බැඳුම්කර නිකුත් කිරීමේ ගනු-දෙනුව පිළිබඳව විගණකාධිපතිතුමාගේ වාර්තාව ඔබතුමාට ලබා දී තිබෙනවාය කියා. එම වාර්තාව ඔබතුමා විසින් සභාගත කරනවාද, එසේ නැත්නම් එම වාර්තාව පිළිබඳව ඔබතුමා ගන්නා ඉදිරි ක්‍රියා මාර්ග මොනවාද, අවතීර්ණ වන්නේ කවර ආකාරයේ ක්‍රියාමාර්ගවලටද කියා මා දැනගන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මා මුලදී කිව්ව පරිදි සංක්ෂිප්ත වාර්තාව කෝප් කමිටුවේ සාමාජික මන්ත්‍රීවරුන් වෙත ලබා දී තිබෙනවා. තවත් රහස්‍ය තොරතුරු ඇතුළත් පිටු 1200ක පමණ දීර්ඝ වාර්තාවක් මට ලබා දී තිබෙනවා. එහි ඇතුළත් රහස්‍ය කරුණු සම්බන්ධයෙන් දැනටමත් මම කෝප් කමිටුවේ සභාපතිතුමා සමඟ කථා කර තිබෙනවා. ඉදිරි දින කිහිපය තුළ නීතිපතිතුමා සමඟ, ඒ වාගේම Auditor-General සමඟ සහ නව මහ බැංකු අධිපතිතුමා සමඟ මම මේ ගැන කථා කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව කෝප් කමිටුවේ සභාපතිතුමාගේත් අනුමැතිය ඇතිව, ඔබතුමන්ලාගේ දැන ගැනීම සඳහා සංක්ෂිප්ත වාර්තාවේ පිටපතක් පුස්තකාලයේ තබන්නත් පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දැන් සංක්ෂිප්ත වාර්තාවේ පිටපතක් කෝප් කමිටුවේ සභික මන්ත්‍රීවරු වෙතත් ලබා දී තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කෝප් කමිටුවේ සාමාජික මන්ත්‍රීවරුන්ට පමණයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඒ අයට පමණයි. නමුත් අනෙක් මන්ත්‍රීවරුන්ටත් එය ලබා දීමේ බරපතළ වැරැද්දක් මා දකින්නේ නැහැ. විගණකාධිපතිතුමා විසින් ඒ බැඳුම්කර ගනු-දෙනුව පිළිබඳව දීර්ඝ ලෙස කරුණු ඇතුළත් වාර්තාවක් ඔබතුමාට ලබා දී තිබෙනවා. මා හිතන විධියට පිටු -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පිටු 1200ක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

පිටු 1281ක පමණ දිග වාර්තාවක් ලබා දී තිබෙනවා. විගණකාධිපතිතුමා ඒ ගනු-දෙනුව පිළිබඳව විගණනයට භාජන කරලා එම වාර්තාව ඔබතුමා වෙත ලබා දී තිබෙනවා. එතකොට

[ගරු අනුර දිසානායක මහතා]

ඒක දැන් එතැනින් අවසන්ද? ඊට පස්සේ මොකක්ද වෙන්නේ? මොකද, ඒ වාර්තාව ඔබතුමාට භාර දුන්නාය කිව්වාම මා විශ්වාස කරන්නේ පාර්ලිමේන්තුවට භාර දුන්නා හා සමානයි කියන එකයි. ඒකයි මගේ අදහස. එහෙම නැතිව ඒ වාර්තාව භාර දෙන්නේ ඔබතුමා "කරු ජයසූරිය මහත්තයා" නිසා නොවෙයි, ගරු කථානායකතුමා නිසා නේ. මේ ගරු සභාවේ ප්‍රධානියා නිසා තමයි ඔබතුමාට ඒ වාර්තාව භාර දෙන්නේ. මේ ගරු සභාව නියෝජනය කරමින් තමයි ඔබතුමාට ඒ වාර්තාව ලැබී තිබෙන්නේ. ඒ නිසා ඒ වාර්තාව අපට ලැබෙන්නේ නැද්ද කියා මම දැනගන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කෝප් කමිටුවේ සෑම සාමාජිකයකුටම අපි ඒක ලබා දුන්නා. රහස්‍ය වාර්තාව නිකුත් කළ යුතුද නැද්ද කියන එක තමයි මම විගණකාධිපතිතුමා සමඟත්, නීතිපතිතුමා සමඟත්, නව මහ බැංකු අධිපතිතුමා සමඟත් සාකච්ඡා කර විමසන්න කටයුතු කර තිබෙන්නේ. මේ පරීක්ෂණයට කිසිම විධියක බාධාවක් නොවන ආකාරයට මේ සඳහා සහයෝගය දෙන්න කෝප් කමිටුවේ සභාපතිතුමාත් එකඟ වුණා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, දැන් ඒ වාර්තාව කෝප් කමිටුවට ඉදිරිපත් කළා විතරයි. කෝප් කමිටුවේ සාමාජිකයන් ඒ වාර්තාව පිළිගන්නවාද නැද්ද කියලා තවම ප්‍රකාශයක් කරලා නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කෝප් කමිටුවේ සාකච්ඡා කරලා නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ඒක පැහැදිලියි. That Report has only been tabled before the COPE. කවුරුවත් තවම මේ වාර්තාව පිළිගෙන නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ඒක නොවෙයි, එතුමා කියන්නේ. දැන් එම වාර්තාවේ පිටපත් කෝප් කමිටුවේ සාමාජිකයන් 25දෙනාට ලබා දුන්නා. මන්ත්‍රීවරු 225ටම නොවෙයි, අවශ්‍ය කෙනකුට බලන්න සංක්ෂිප්ත වාර්තාව ලබා දෙන්න පුළුවන්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
මේ වාර්තාව ඔබතුමාට දුන්නාම, ඔබතුමාට අධ්‍යයනය කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔව්. සාකච්ඡා කළාට පස්සේ තමයි මම ඒ වාර්තාව ගැන ඉදිරි පියවර ගන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
මොකක් හරි සාකච්ඡාවක් සිද්ධ වන විට, ඒ සාකච්ඡාව මුල සිටම අසා ගෙන සිටියාම තමයි ඒකට මැදිහත් වෙලා ඒ සාකච්ඡාවට අදාළ වන කරුණක් ඉදිරිපත් කරන්න පුළුවන් වන්නේ. ඒ සාකච්ඡාව කෙළවරේ නැඟිටලා හදිසියෙන් නැඟිට්ටා වාගේ කරුණු කියන්න ගියාම ඒ සාකච්ඡාවට කිසිසේත්ම සම්බන්ධ නොවන, ඒ සාකච්ඡාව මුළුමනින්ම වෙනස් අතකට යන අනවශ්‍ය පැටලිලි සහිත තත්ත්වයක් තමයි නිර්මාණය වන්නේ. කථානායකතුමා අද නිශ්චිත ලෙස මෙම පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළා, විගණකාධිපතිතුමා විසින් එතුමාට වාර්තාවක් ලබා දී තිබෙනවාය කියා. මා විමසුවේ ඒ වාර්තාව පිළිබඳව ගන්නා ඉදිරි ක්‍රියා මාර්ගය කවරේද කියන එකයි. මොකද, ගරු කථානායකතුමාට ඒ වාර්තාව භාර දෙන්නේ මුළු පාර්ලිමේන්තුවම නියෝජනය කරලා නේ. ඒක තමයි මම ඇහුවේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ඒ ඉදිරි ක්‍රියා මාර්ගය තීරණය වන්නේ කෝප් කමිටුවේ පිළිගැනීම හෝ නොපිළිගැනීම අනුවයි. ඉස්සරවෙලා මේ වාර්තාව කෝප් කමිටුවෙන් පිළිගන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ වාගේම මම උපදෙස් ලබා ගන්නවා, විගණකාධිපතිතුමාගෙනුත්, නීතිපතිතුමාගෙනුත්, Central Bank එකේ අලුත් Governorගෙනුත්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
මේ වාර්තාව ඇත්ත කියලා කෝප් කමිටුවෙන් පිළිගන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හරි, හරි. ඒක තමයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ඊට පස්සේ තමයි ඔබතුමාට ඊළඟ පියවරට යන්න පුළුවන් වන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හරි, හරි. ඒකේ බලපෑම තිබෙන්නේ කෝප් කමිටුවට. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මට හංගන්න දෙයක් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙතුමා කියන්නේ වෙන දෙයක්. මම කියපු දේ ඔබතුමාට තේරුණා නේ. මට ඒකට විතරක් උත්තරයක් ලැබුණාම ඇති.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හරි, හරි, ඔබතුමාට විතරයි ඔක්කොම තේරෙන්නේ. වෙන කාටවත් තේරෙන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, මෙතුමාට තේරුණා. මට ගරු කථානායකතුමාගෙන් උත්තරයක් ලැබුණොත් ඇති.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාට විතරයි ඔක්කෝම තේරෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කියන්නේ ඒක නොවෙයි. ගරු කථානායකතුමාගෙන් මම ප්‍රශ්නයක් ඇහුවා. සාධාරණ ප්‍රශ්නයක් මම ඇහුවේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, this is common sense. The Report has to be accepted by the COPE.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, sure. They are doing that.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
If they accept it, then you can go to the next step.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The COPE is doing a responsible job. I respect the views of the COPE.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, "කෝප්" එකට විගණන වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාව කෝප් කමිටුව තුළ සාකච්ඡා කරලා ඒකට ඉදිරි ක්‍රියා මාර්ග ගනීවි. හැබැයි, ඔබතුමා මේ ගරු සභාව හමුවේ අද ප්‍රකාශ කළා, ඔබතුමාට වාර්තාවක් ලබා දී තිබෙනවාය කියා. කෝප් කමිටුවේ එක නොවෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමාට පිළිගැන්වූවාට, "කෝප්" එක පිළිගන්න එපා යැ. It is common sense; මේක සාමාන්‍ය දැනීම. කෝප් සභාවට වාර්තාව පිළිගැන්වූවා විතරයි. තවම ඒක පිළි අරගෙන නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අන්තිමට කියා තිබෙනවා, රහස්‍යභාවය ජාතික මූල්‍ය ප්‍රතිපත්තිවලට -[බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Media එකට කථා කළා ඇති නේ. වාඩි වෙමු දැන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ. නැහැ. පොඩ්ඩක් ඉන්න. මගේ ප්‍රශ්නය-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය ඉවර කරමු, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
වාර්තාවක් ඉදිරිපත් කළ පලියට ඒක හරි ද? ඉස්සෙල්ලා ඒක හරිද වැරදිද කියා බලන්න ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක නොවෙයි, ගරු ඇමතිතුමා මම ඇහුවේ. විගණකාධිපතිතුමා විසින් ගරු කථානායකතුමාට පිටු එක් දහස් දෙසිය ගණනක වාර්තාවක් ලබා දී තිබෙනවා. එතුමා අද මේ ගරු සභාවේ ඒ බව ප්‍රකාශ කළා. ඒ වාර්තාව එතුමාට ලබා දුන්නේ, මේ ගරු සභාවේ ප්‍රධානියා හැටියට, කථානායකතුමා හැටියට. එතකොට මන්ත්‍රීවරයෙක් හැටියට අපට දැනගන්නට අයිතියක් තිබෙනවා, ඒ වාර්තාව සම්බන්ධයෙන් ගන්නා ඉදිරි ක්‍රියා මාර්ග මොනවාද කියා. ඒක ගරු කථානායකතුමා පැහැදිලි කළා. ඒ පැහැදිලි කිරීමට මගේ එකඟතාවක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අනවශ්‍ය පැත්තක් ගැන දැන් මේ කථා කරන්නට වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත
இறப்புக்களின் பதிவு (தற்காலிக ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்
REGISTRATION OF DEATHS (TEMPORARY PROVISIONS) (AMENDMENT) BILL

"2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2016 ජූලි 20 වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යයිද නියෝග කරන ලදී.

உள்நாட்டலுவல்கள் அமைச்சரின் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2016 யூலை 20, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்படவேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka, *on behalf of the Minister of Home Affairs;*

to be read a Second time upon Wednesday, 20th July, 2016 and to be printed and to be referred to the relevant Sectoral Oversight Committee.

සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත
விலங்குத் தீனி (திருத்தம்) சட்டமூலம்
ANIMAL FEED (AMENDMENT) BILL

" 1986 අංක 15 දරන සත්ව ආහාර පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

"පිළිගන්වන ලද්දේ ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය පී.හැරිසන් මහතා විසිනි.

2016 ජූලි 20 වන බදාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යයිද නියෝග කරන ලදී.

கிராமியப் பொருளாதார அலுவல்கள் பற்றிய அமைச்சர் மாண்புமிகு பீ. ஹரிசன் அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2016 யூலை 20, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.

Presented by the Hon. P. Harrison, Minister of Rural Economic Affairs;

to be read a Second time upon Wednesday, 20th July, 2016 and to be printed and to be referred to the relevant Sectoral Oversight Committee.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising this day do adjourn until 10.30 a.m. on Thursday 07th July 2016".

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

හෝමියෝපති පනත් කෙටුම්පත
ஓமியோபதி சட்டமூலம்
HOMOEOPATHY BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 2.25]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, " පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, 1970 අංක 7 දරන පනත තමයි හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මේ රටේ ස්ථාපනය කිරීමට - සංස්ථාගත කිරීමට- ගෙනා මුල්ම පනත. ඊට අවුරුදු 45කට පසුව, අද අලුතෙන් පැන නැඟී ඇති කරුණු, ඒවායේ ඇති විෂමතා සහ දුර්වලතා දුරැර මේ වෛද්‍ය ක්‍රමය දියුණු කර ගැනීම සඳහා අද දින මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ අලුත් පනත් කෙටුපතක්. 1970 අංක 7 දරන පනතේ ප්‍රධාන අරමුණු හතරක් තිබුණා. පළමුවන අරමුණ හෝමියෝපති ක්‍රමය වර්ධනය කිරීම සහ ඒ සඳහා උනන්දුවක් ඇති කිරීම.

දෙවැනි අරමුණ හෝමියෝපති වෘත්තිකයන් ලියා පදිංචි කිරීම. ඊළඟට හෝමියෝපති අධ්‍යාපනය දියුණු කිරීම. ඊළඟට හෝමියෝපති ඖෂධ සහ වෙනත් නිෂ්පාදනවල ප්‍රමිතිය ආරක්ෂා කිරීම. මේ හෝමියෝපති පනත අනුව, පළමුවන හෝමියෝපති සභාව 1979දී, එනම් මීට වසර 37කට කලින් ලංකාවේ පිහිටෙව්වා. අවුරුදු 37ක් ගත වුණත්, මේ අවුරුදු 37දී වැඩි කාලයක් ගත වී තිබෙන්නේ වෛද්‍ය සභාවක් නැතිවයි. 1979 සිට 1989 දක්වා ප්‍රථම වෛද්‍ය සභාව පත්කර තිබුණේ අමාත්‍යවරයා විසිනුයි. 1989 සිට 1998ට වෛද්‍ය සභාවක් තිබිලා නැහැ. 1998 සිට 2003 වනතුරු ඡන්දයෙන් පත් වී වෛද්‍ය සභාවක් තිබිලා තියෙනවා. 2003 සිට 2006 වන තුරු නැවතත් වෛද්‍ය සභාවක් තිබිලා නැහැ.

2006 ඉඳලා 2009 දක්වා අවුරුදු තුනක් ඒ වෛද්‍ය සභාව අහෝසි කර තිබුණා. 2011 සිට අද දක්වා තිබෙන්නේ අමාත්‍යාවරයා විසින් පත් කළ අතුරු පාලක කමිටුවක්. පසු ගිය අවුරුදු හතළිස්පහටම මේ හෝමියෝපති පනතට සංශෝධනයක් හෝ ඉදිරිපත් වෙලා නැහැ. මේ නිසා හෝමියෝපති අධ්‍යාපන ආයතන පිහිටුවීම, හෝමියෝපති ඖෂධ දියුණු කිරීම, පර්යේෂණ සහ අනෙකුත් දියුණු කිරීම් කිසිවක් සිදුවෙලා නැහැ. පළමුවන හෝමියෝපති රෝහල රජය විසින් වැලිසර ආරම්භ කරනු ලැබුවා. දැනට දවසකට රෝගීන් 150ක්, 200ක් පමණ ප්‍රතිකාර සඳහා මේ රෝහලට එනවා. විශේෂයෙන්ම සන්ධි ආබාධ, ඇදුම, ළමා හා කාන්තා රෝග සඳහා විශාල පිරිසක් මේ රෝහලෙන් ප්‍රතිකාර ගන්නවා.

ජර්මන් ජාතික Samuel Hahnemann කියන වෛද්‍යවරයා තමයි හෝමියෝපති වෛද්‍ය විද්‍යාව ආරම්භ කළේ. අපේ ශරීරයේ තිබෙන සියලුම රෝගාබාධවලට ප්‍රතිකාර මේ වෛද්‍ය ක්‍රමය තුළ අඩංගු වෙලා තිබෙනවා. බටහිර වෛද්‍ය විද්‍යාවේ ප්‍රතිකාර ක්‍රම අනුව, කෘත්‍රිම විධියට, බාහිරින් ඖෂධ මඟින් ලබාදෙන ප්‍රතිශක්තිකරණයක් තමයි තිබෙන්නේ. නමුත්, හෝමියෝපති ක්‍රමය තුළ වෙන්නේ, ලබා දෙන ඖෂධය මඟින් ශරීරයේ තිබෙන ස්වාභාවික ප්‍රතිශක්තිකරණය වැඩි දියුණු කරලා රෝගය මර්දනය කිරීමක්. ශාකවලින්, සත්ව කොටස්වලින්, ඒ වාගේම ලෝහවලින් හෝමියෝපති ඖෂධ හදනවා. ඒවා ඉතාම ස්වාභාවික ඖෂධ. ඒවායේ adverse effects මොනවත් නැහැ. ඒ නිසා ගර්භණී මව්වරුන්ට, කිරි දෙන මව්වරුන්ට, දරුවන්ට කිසිදු ප්‍රශ්නයක් නැතිව මේ ඖෂධ ලබා දිය හැකියි. මේ ඖෂධ ලාභදායී මෙන්ම පාවිච්චි කිරීමත් ඉතාම පහසුයි. මෙන්න මෙවැනි බොහෝ සාධක හෝමියෝපති වෛද්‍ය විද්‍යාවේ තිබෙනවා.

2005දී, එවකට හිටපු දේශීය වෛද්‍ය අමාත්‍ය තිස්ස කරල්ලියද්ද මහත්මයාත් නව පනතක් නීතිගත කිරීමට කැබිනට් අනුමැතිය ලබා ගත්තා. නමුත් එතුමාට කාලයක් තිබුණේ නැහැ ඒක පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරන්න. ඒ නිසා කාරණය පහුවෙලා ගියා. එදා ඒ වෛද්‍ය සභාවේ තිබුණු නොයෙකුත් අකර්මණ්‍යතා සහ දූෂණ නිසා, නව පනතක් කඩිනමින් ගෙන එන ලෙස 2011දී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙනුත් රජයෙන් ඉල්ලීමක් කළා.

1970 අංක 7 දරන හෝමියෝපති පනතේ නොයෙකුත් දුර්වලතා තිබුණා. ඒ අනුව ඇති වුණ විෂමතා තිබුණා. 2009දී නියමම හෝමියෝපති වෛද්‍යවරු 163යි ලියාපදිංචි වෙලා හිටියේ. නමුත් මේ පනතේ තිබුණ විෂමතා අනුව, ඒ වෛද්‍ය සභාවේ හිටපු අය, 50ක පමණ පිරිසක් පිටින් අරගෙන ලියා පදිංචි කරලා ඒ පිරිස 212ක් දක්වා වැඩි කළා. නමුත් ඒවාට විරුද්ධව ක්‍රියාකිරීමට තරම් නීතිමය තත්ත්වයක් මේ හෝමියෝපති පනතේ තිබුණේ නැහැ.

ඊළඟට, "මහින්ද රාජපක්ෂ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය" කියලා නාමික ආයතනයක් පිහිටුවලා, එහි දේශන දෙක තුනක් පවත්වලා, මුදල් අය කරලා සහතික ලබා දෙන්න පටන් ගත්තා. මෙන්න මෙවැනි විශාල අර්බුද ඇති වෙනකොට තමයි ඒ වෛද්‍ය සභාවලට විරුද්ධව එදා හිටපු ඇමතිවරු ක්‍රියා කළේ. හෝමියෝපති පනතට අද මේ ගෙනෙන සංශෝධන අනුව, මේ වෛද්‍ය සභාව සංස්ථාපිත ආයතනයක් වනවා. එහි සාමාජිකයන් 11 දෙනෙක් ඉන්නවා. එහි අමාත්‍යාංශ ලේකම්ගේ නියෝජිතයෙක් ඉන්නවා; භාණ්ඩාගාර නියෝජිතයෙක් ඉන්නවා; පනත් කෙටුම්පතේ 19 වන වගන්තිය යටතේ පත්කරනු ලබන විධායක අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා. මෙවැනි කෙනෙක් සිටිය යුතුද නැද්ද කියලා අපි සාකච්ඡා කරලා තීන්දුවක් ගන්නට ඕනෑ. ඒ වාගේම ඡන්දයකින් පත්වන වෘත්තිකයන් හතර දෙනෙක් ඉන්නවා. අමාත්‍යාවරයා පත් කරන තිදෙනෙක් ඉන්නවා. ඒ වාගේම මේ සභාවේ ධුර කාලය අවුරුදු 3යි; ගණ පූරණය හතයි. ඇත්තටම අපි මේක හැදුවේ බටහිර වෛද්‍ය සභාවට අනුගත වූ වෛද්‍ය සභාවක් නිර්මාණය කිරීම සඳහායි. මෙහි පරමාර්ථ වශයෙන් තිබෙනවා, මහජන සෞඛ්‍ය වර්ධනය-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මෙහි පරමාර්ථ වශයෙන්, හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව මහජන සෞඛ්‍ය වර්ධනය, හෝමියෝපති ආයතන පිහිටුවා පවත්වාගෙන යෑම හා නියාමනය, හෝමියෝපති ඖෂධ ආනයනය, ගබඩා කිරීම, විකිණීම හා බෙදා හැරීම නියාමනය, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීම, පර්යේෂණ කිරීම සහ හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම ප්‍රවර්ධනය කිරීම ආදිය ඇතුළත් වනවා.

පනත් කෙටුම්පතේ 16 වන වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍ය සභාවට පහත කාරණා සම්බන්ධයෙන් එනම්, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්, හෝමියෝපති ඖෂධවේදීන්, හෝමියෝපති හෙදියන් සහ හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම සඳහා බලතල, ඒ වාගේම හෝමියෝපති වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධ වෛද්‍ය සුදුසුකම් පිළිගැනීම, හෝමියෝපති ආයතන අධීක්ෂණය කිරීම සහ නියාමනය, හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව රෝග සඳහා ප්‍රතිකාර කිරීමට අවශ්‍ය සේවා සැපයීම, රෝහල්, බෙහෙත් ශාලා, ඔසුහල් සහ ඒ සම්බන්ධ ආයතන පිහිටුවා පවත්වාගෙන යෑම, හෝමියෝපති වෛද්‍ය විද්‍යාල සහ අනෙකුත් හෝමියෝපති ආයතන මඟින් සපයනු ලබන පුහුණු පාඨමාලා, විභාග සහ රෝහල් පිළිබඳ ප්‍රමිති නියම කිරීම සහ පවත්වාගෙන යෑම, සභාවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා රීති සැදීම සහ සභාවේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මණ්ඩල සහ කමිටු පිහිටුවීම ආදී බලතලවලින් සමන්විත වනවා. සභාවේ ලේකම් ලෙස රෙජිස්ට්‍රාර්වරයකු හා කාර්යය ඉටු කිරීමට වෙනත් නිලධාරීන් සහ සේවා නියුක්තිකයන් 18 වන වගන්තිය ප්‍රකාරව පත් කරන්න පුළුවන්. ඒ වාගේම 21 වන වගන්තිය යටතේ, සභාවේ පරිපාලනය හා සම්බන්ධව ඇති වියදම් පියවා ගැනීම සම්බන්ධව සඳහන් වන අතර, 41 වන වගන්තිය යටතේ හෝමියෝපති අරමුදල පිළිබඳව සඳහන් වෙනවා.

ඒවාගේම, 22 වන වගන්තිය යටතේ, හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් හෝ හෝමියෝපති ආයතනයක් පිහිටුවීම සම්බන්ධව සඳහන් වන අතර, 23 වන වගන්තිය යටතේ, හෝමියෝපති වෛද්‍ය සුදුසුකම් පිළිගැනීම සම්බන්ධව දැක්වෙනවා. 25 වන

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

වගන්තිය යටතේ, වෛද්‍ය පරීක්ෂකවරුන් පත් කළ හැකි අතර, වෛද්‍ය විද්‍යාල හෝ වෙනත් හෝමියෝපති ආයතන පරීක්ෂා කිරීම ඔවුන්ගේ කාර්යභාරය වෙනවා. 30 වන වගන්තිය යටතේ, වෛද්‍යවරුන් ලියාපදිංචියට අදාළ හෝමියෝපති ලේඛනය පිළිබඳව සඳහන් වෙනවා.

1970 අංක 7 දරන පනතට අනුකූලව පවත්වා ගෙන යන පොදු ලේඛනය මෙම පනත යටතේ පවත්වාගෙන යන ලේඛනයක් ලෙස සැලකෙනවා. එම ලේඛනයේ සඳහන් තැනැත්තන් වසර 5කට වරක් ලියාපදිංචිය අලුත් කළ යුතු අතර, හෝමියෝපති ලේඛනය සාක්ෂි ආඥාපනත යටතේ ප්‍රසිද්ධ ලේඛනයක් සේ සැලකෙනවා. 31 වන වගන්තිය යටතේ, හෝමියෝපති වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය වන සුදුසුකම්ද, 32 වන වගන්තිය යටතේ, ලියාපදිංචිය සිදු කළ හැකි විශේෂ අවස්ථා පිළිබඳව ද සඳහන් වන අතර, ඊට අදාළ ලිඛිත පරීක්ෂණ පිළිබඳ විස්තරද සඳහන් වනවා.

ඊ ළඟට 33 වන වගන්තිය යටතේ, හෝමියෝපති ඖෂධවේදීන්ගේ ලේඛනය පවත්වාගෙන යෑම පිළිබඳව සඳහන් වනවා. 45 වන වගන්තිය යටතේ, සභාව රේගු හා වෙනත් බදු ආදියෙන් නිදහස් බව දක්වා තිබෙනවා. 47 වන වගන්තිය යටතේ, ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම හා විකිණීමට අදාළ වූ ඒකක ලියාපදිංචිය සම්බන්ධව දක්වා තිබෙනවා. 48 වන වගන්තිය යටතේ, සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමට අදාළව විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලතල පිළිබඳව සඳහන් වෙනවා.

පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළව අමාත්‍යවරයා විසින් නියෝග පැනවිය යුතු ක්ෂේත්‍ර 49 වන වගන්තියෙහි සඳහන් වෙනවා. 54 වන වගන්තිය යටතේ, පද සම්බන්ධයෙන් අර්ථ නිරූපණ සඳහන් වෙනවා.

මේ පනතේ අඩංගු විශේෂ කරුණු කිහිපයක් තිබෙනවා. එනම්,

1. විෂයභාර අමාත්‍යවරයාගේ හෝ ලේකම්වරයාගේ, මහා භාණ්ඩාගාරයේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයෙක්ද සහිතව ඡන්දයෙන් පත්වන වෛද්‍යවරුන්ගෙන් සමන්විත වෛද්‍ය සභාවක් ස්ථාපනයට ප්‍රතිපාදන සැලසෙනවා.

   එදා ඒ විධියට නිලධාරීන් හිටියේ නැහැ; බැඳීමක් රජයට තිබුණේ නැහැ. වෛද්‍යවරු විතරයි මෙතැන හිටියේ.

2. ප්‍රථම වෛද්‍ය සභාව 1970 අංක 7 දරන පනත අනුව වසර 10ක කාලසීමාවකට බලපැවැත්වුවද, මෙම නව පනත මඟින් ස්ථාපිත ප්‍රථම වෛද්‍ය සභාවේ කාලසීමාව වසර දෙකයි.

3. වෛද්‍ය සභාවේ ධුර කාලය වසර තුනක් (පෙර පනතට අනුව වසර 5යි) දක්වා අඩු කර ඇති අතර, එක් පුද්ගලයකුට වාර දෙකකට වඩා ධුර කාලයක් දැරිය නොහැකි වේ. පවතින පනත අනුව එකම පුද්ගලයා නැවත නැවත නිලවරණය මඟින් පත්ව තම ඒකාධිකාරය පවත්වාගෙන යෑම නව පනත මඟින් වළක්වා තිබෙනවා.

4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතේ වෛද්‍ය විද්‍යාල පිහිටුවීම, විදේශ සුදුසුකම් පිළිබඳ පැහැදිලි අර්ථ කථනයක් දක්වා තිබෙනවා.

5. මේ වන විට ලියාපදිංචිය නොලබා හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ දිගු කාලීනව යෙදෙන වෛද්‍යවරුන් ලෙස සමාජයේ පෙනී සිටින පුද්ගලයන්ට තම හැකියාවන්ට අනුකූල වන පරිදි ලිඛිත විභාග වාර 02ක් තුළ පවත්වා සුදුසුකම් අනුව ඔවුන්ට නෛතික ලියාපදිංචිය ලබා දී ඔවුනට ගෞරවනීය ලෙස වෛද්‍ය වෘත්තියේ යෙදීමට ප්‍රතිපාදන සලසා ද ඇත. එසේ සුදුසුකම් නොලබන පුද්ගලයන්ට හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ නොයෙදීමට නීති මඟින් කටයුතු කිරීමට ප්‍රතිපාදන පැවතීම.

6. ලියාපදිංචි නොමැතිව හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම හා හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපන ආයතන පවත්වා ගෙන යාම, ආදී නීති විරෝධී කටයුතු සඳහා නීතිමය ප්‍රතිපාදන පැවතීම.

7. හෝමියෝපති ඖෂධවේදීන් හෝමියෝපති ආයතන, ඩිස්පැන්සරි වෛද්‍ය සභාව යටතේ ලියාපදිංචිය සිදු කර, නියාමනයට ප්‍රතිපාදන පැවතීම.

මේ වන විට සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින හෝමියෝපති වෛද්‍ය සභාව, රේඛීය අමාත්‍යාංශ හරහා ලබා දෙන ප්‍රතිපාදනවලින් නඩත්තු වන ආයතනයක්. හෝමියෝපති වෛද්‍ය ක්ෂේත්‍රයේ කටයුතු විධිමත් කර එම වෛද්‍ය ක්‍රමය ව්‍යාප්ත කරමින් සාර්ථකව පවත්වා ගෙන යාම සඳහා හෝමියෝපති වෛද්‍ය සභාව හා අමාත්‍යාංශය අතර සෘජු සම්බන්ධතාවක් ඇති කිරීමටත්, හෝමියෝපති ක්‍රමය සඳහා රජය වෙන් කරන ප්‍රතිපාදන වඩාත් විනිවිදභාවයෙන් යුතුව හෝමියෝපති සංවර්ධනය සඳහා යෙදවීමටත් පවතින හෝමියෝපති පනත පරිච්ඡින්න කර ප්‍රමාණවත් බලය සහිත නෛතික රාමුවක් ඇති කිරීමටත් නව පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ නොයෙකුත් වෛද්‍ය ක්‍රම බලපැවැත්වෙනවා. ඒ වාගේම බටහිර වෛද්‍ය විද්‍යාව, ආයුර්වේදය, අපේ පාරම්පරික වෛද්‍ය ක්‍රමය, සිද්ධ වෛද්‍ය ක්‍රමය, යුනානි වෛද්‍ය ක්‍රමය, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සහ චීන කටු චිකිත්සාව යනාදී වෛද්‍ය ක්‍රමත් මේ අතර වනවා. මේ සියලුම වෛද්‍ය ක්‍රම දියුණු කරලා ඒ කෙරෙහි අවබෝධයකින් යුක්තව ඉදිරියට ගෙන යාම තමයි ඉතාම වැදගත් කියලා මා හිතනවා. මෙම හෝමියෝපති වෛද්‍ය විද්‍යාව ජර්මනිය ඇතුළු යුරෝපා රටවල ඉතාමත්ම ප්‍රචලිත කාලපරිච්ඡේදයක් තිබුණා. ඒ වාගේම චීන කටු චිකිත්සාව, චීනයේ පමණක් නොවෙයි බටහිර යුරෝපය ඇතුළු බොහෝ රටවල අද ඉතාමත්ම දියුණු තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. ඒ වාගේම ආයුර්වේද වෛද්‍ය විද්‍යාව ඉන්දියාවේ බොහෝ ප්‍රචලිත වෙලා තිබෙනවා. සමහර ප්‍රාන්තවල වැඩිපුරම ප්‍රතිකාර සඳහා යොදා ගනු ලබන්නේ මෙම ආයුර්වේද වෛද්‍ය ක්‍රමයයි.

විශේෂයෙන්ම කේරළ ප්‍රාන්තයේ සියයට 80ක් පමණ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළින් ප්‍රතිකාර ලබා ගන්නවා. උතුරු කොරියාව ගත්තොත්, උතුරු කොරියාවේ සියයට 80ක්, 90ක් පමණ තිබෙන්නේ කොරියානු වෛද්‍ය ක්‍රමය. බටහිර වෛද්‍ය ක්‍රමය තිබෙන්නේ ඉතාමත්ම අල්ප වශයෙන්. ඔවුන්ට ඖෂධ ඇත්තෙත් නැහැ. නමුත්, ඒ රටවල ජනතාව එම වෛද්‍ය ක්‍රම මඟින් විශාල සේවයක් ලබා ගන්නවා. එමඟින් ඔවුන්ට නිරෝගී ශරීර සෞඛ්‍යයක් ලැබෙනවා. උතුරු කොරියානු ජනතාව ඉතාමත්ම පුෂ්ටිමත් ලෙස නිරෝගී ජීවිත ගත කරනවා. ඔවුන්ගේ සෞඛ්‍ය සම්බන්ධ සංඛ්‍යාලේඛන බැලුවොත් ඉතාමත්ම ඉහළ සෞඛ්‍ය මට්ටමක පවතිනවා. එකම ප්‍රශ්නය ලෙස තිබෙන්නේ, ලෝක සෞඛ්‍යය සංවිධානයට ඔවුන්ගේ සෞඛ්‍ය දත්ත නිවැරදිදැයි පරීක්ෂා කර ගන්න නොහැකිවීමයි. කෙසේ නමුත්, සෞඛ්‍ය සම්බන්ධයෙන් ඔවුන් ඉතාමත්ම ඉහළ මට්ටමක සිටිනවා. අපි බොහොම විවෘත මනසකින් මේ දෙස බලන්නට ඕනෑ. එකම වෛද්‍ය විද්‍යාවක් පමණක් නොවෙයි අවශ්‍ය වන්නේ. මොකද, බටහිර වෛද්‍ය විද්‍යාවට හඳුනා ගන්නට බැරි රෝග ප්‍රතිකාර ක්‍රම

අනෙක් වෛද්‍ය ක්‍රම මඟින් හදුනා ගන්නට හැකිවෙලා තිබෙනවා. එම නිසා ලබන වසරේ මැද භාගය වන විට, ඒ ඒ රටවල රාජ්‍ය නායකයන්ගේ සහ සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ සහභාගීත්වයෙන් ජාත්‍යන්තර සම්මේලනයක් මේ රටේ පැවැත්වීමට අපි බලාපොරොත්තු වනවා. ඒ මඟින් මේ සියලුම විකල්ප වෛද්‍ය ක්‍රම ගැන අප රටේ පමණක් නොවෙයි, ලෝකය පුරා මීට වඩා විශාල ලෙස උනන්දුවක් ඇති කිරීමටත්, ඒ විකල්ප වෛද්‍ය ක්‍රම රටේ ජන සෞඛ්‍යය සඳහා යොදවා ගැනීමටත් මෙමඟින් අපේක්ෂා කෙරෙනවා.

මම ගිය වසරේ කේරළයේදී ඉන්දියානු අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා හමු වුණු අවස්ථාවේ ලංකාවේ එවැනි ජාත්‍යන්තර සම්මේලනයක් පැවැත්වීම ගැන මගේ අදහස එතුමාට කිව්වා. එය ඉතාම සාර්ථක සම්මේලනයක් කරන්නට ලබා දිය හැකි සහයෝගය, මූල්‍යමය ආධාර පවා එතුමා ලබා දෙන්නම් කියලා කිව්වා. මෙම විකල්ප වෛද්‍ය ක්‍රම ගැන අප තව තවත් අවබෝධය ලබා ගන්නට ඕනෑ. එහි එක පියවරක් වශයෙන් තමයි අද මෙම හෝමියෝපති පනත් කෙටුම්පත ගරු සභාවට ඉදිරිපත් කරලා සම්මත කරගෙන මේ වෛද්‍ය සභාව පිහිටුවන්නට අපි කටයුතු කරන්නේ.

මම හිතන විධියට මේ සම්බන්ධයෙන් දැනට රජයට විරුද්ධව ඉදිරිපත් කරපු නඩු 17ක් පමණ ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබෙනවා. ඒ නඩු ප්‍රතික්ෂේප කළ බවත් මට ආරංචි වුණා. ඔවුන් මෙවැනි තත්ත්වයකට පත් වෙලා එක එක්කෙනා කුළල් කා ගත්තා මිසක්, හෝමියෝපති වෛද්‍ය විද්‍යාව එතරම් දියුණු කිරීමක් පසුගිය කාලයේ සිදු වුණේ නැහැ. එම නිසා තමයි අපි ඒ සියලුම පාර්ශ්වයන් එක්ක සාකච්ඡා කරලා මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. මෙම හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ලංකාවේ ඉතාමත්ම ජනප්‍රිය වෛද්‍ය ක්‍රමයක් බවට පත් කිරීමට අප සූදානම් බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ඇමතිතුමනි, මෙය ඉතාම කාලෝචිත වැඩක්. ප්‍රතිශතයක් විධියට බලනවා නම්, විශාල පිරිසක් මෙම වෛද්‍ය ක්‍රමයෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා ඇදෙන අවස්ථාවක්. ඒ නිසා මෙය ලොකු ගෞරවයකට පාත්‍ර වන කටයුත්තක් විධියට සලකන්නට පුළුවන්.

[2.40 p.m.]

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

Mr. Deputy Speaker, Homoeopathic treatment is something which is prevalent in this country for a long time. As a matter of fact, amongst the systems of medical treatment, Ayurvedic treatment has been practised in Sri Lanka over the centuries and native physicians have been quite famous. It prevails also in a big way in India. Unfortunately, we do not have a Homoeopathic school or a university in Sri Lanka and many persons who practise Homoeopathy in Sri Lanka, either go to India to qualify themselves or they practise along with senior practitioners over a period of time and by such practice they acquire a certain knowledge which enables them to practise the profession by themselves and that I believe is one of the methods by which people are registered as Homoeopathic doctors.

With regard to this Bill, I have been met by some Homoeopathic doctors who have requested me to bring these matters to the notice of the Minister particularly because, I think, the people in the profession, the Homoeopathic practitioners, feel that the management of this subject must be not entirely but substantially under their control and their influence. They seem to take the view that rather than allow the bureaucrats or persons appointed by Ministers to handle matters pertaining to this subject, these matters should be in fact handled by the Homoeopathic Medical Council which will be the best body that can handle these issues.

In this context, they have referred me to the fact that four persons are ex-officio members of the Homoeopathic Medical Council; four members are elected by registered practitioners of Homoeopathy and three members are appointed by the Minister – of whom at least two shall be registered practitioners of Homoeopathy. When they discussed this matter with me they told me perhaps that the present Minister would be very considerate and would take their views into consideration when making the appointments but that need not be the case all the time and they would like -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

Even the Ceylon Medical Council has the same composition. There are appointees by the Minister, there are government officials plus the representatives of the profession.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

The point I am making, Sir, is that while only four members are elected by the registered practitioners of Homoeopathy, there are four ex-officio members and three persons appointed by the Minister, which makes the elected members who are registered practitioners of Homoeopathy a minority. They seem to think that that should not be the case. So, I would like the Minister to kindly give his consideration to this matter.

The other point that was raised with me is that currently the Executive Director, which is an important position, is a senior public officer appointed again by the Minister. They seem to take the view that this Executive Director should be appointed by the Homoeopathic Medical Council rather than the appointment being made by the Minister because if the appointment is made by the Council, the Council will be more considerate.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

Hon. Member, that is why I mentioned in my speech that whether we should have an Executive Director or not. I do not mind even doing away with the Executive Director, because there is no such person even in the Sri Lanka Medical Council.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

I will be thankful if the Minister considers that and if the appointment is made by the Homoeopathic Medical Council. It is the view of the Homoeopathic doctors that the Executive Director would be a person who will be more amenable to functioning in line with the thinking of Homoeopathic doctors and that will be good for the progress of the profession.

The other matter I want to raise, Sir, is the question of an Interim Council. An Interim Council is to function for two years and that, many people feel, is a very long term during which much mischief can happen. When the Interim Council was functioning earlier, I have been informed that there were many irregular acts committed by that Interim Council which had not been remedied and subsequently those became a part of the system - consequences of those actions became a part of the system. So, the Homoeopathic doctors feel that if an Interim Council is considered by the Minister to be absolutely necessary that Council should not function for anything more than maximum six months by which time the Homoeopathic Medical Council should become functional and should be able to perform its functions.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

Earlier, the Interim Council was functioning for five years. That is why we have reduced it to two years.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

Why do we want something interim for five years? Why do we want something interim for two years? An interim arrangement is intended to be a temporary arrangement to enable the permanent arrangement to become functional and surely the Homoeopathic Medical Council can be set up in a matter of two weeks or in a matter of two months. If the Interim Council functions for two years, the fear of the Homoeopathy doctors is that many irregular things can happen.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

How many meetings can the Council hold within six months? Normally, the Sri Lanka Medical Council holds meetings once a month. So, what can we do? There are a lot of things to do. Actually -

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

Anyway, I would urge you to kindly consider the question of whether an Interim Council should function for a period of two years or whether you should not think in terms of it functioning for a lesser period.

Sir, the other matter I want to raise is that during the situation of war that prevailed in the country over a long period of time, particularly in the Northern and the Eastern parts of the country, many persons were not able to even sit for the exams on legislation and many persons were not able to avail themselves of opportunities that would normally have been available to them if there was no conflict. Therefore, the Homoeopathy doctors take the view that there should be some arrangement, some device by which the disadvantages that these people have been subjected to as a result of the conflict situation could be rectified and remedied in some way.

Sir, these are matters that I would like to bring to the notice of the Hon. Minister and I request him to kindly give his attention to these matters also and try to accommodate whatever can be accommodated.

Thank you.

[අ.භා. 2.51]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෝමියෝපති පනත් කෙටුම්පත මෙම ගරු සභාවේදී විවාදයට ගනු ලබන අවස්ථාවේදී ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා ඉතාමත්ම සතුටු වෙනවා. ගරු රාජිත සේනාරත්න සෞඛ්‍ය අමාත්‍යතුමාට මා ස්තුතිවන්ත වෙනවා, කාලාන්තරයක් තිස්සේ අපි බලාපොරොත්තුවෙන් සිටි මේ පනත් කෙටුම්පත එළිදැක්වීම සඳහා ගන්නා ලද උත්සාහය පිළිබඳව.

විශේෂයෙන්ම අද ලෝක සෞඛ්‍ය සංවිධානය මට්ටම්නුත් විකල්ප වෛද්‍ය ක්‍රමයක් - alternative system of medicine - පිළිබඳව විශාල උනන්දුවක් දක්වනවා. එක් අවස්ථාවකදී සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම ලෝකයේ පැත්තකට කරලා තිබුණා. ඒවා ගණන් ගත්තේ නැහැ. බටහිර වෛද්‍ය ක්‍රමය පමණක් සුදුසු වෛද්‍ය ක්‍රමයක් හැටියට බොහෝ අය කල්පනා කළා. නමුත් මේ තත්ත්වය දැන් ක්‍රම ක්‍රමයෙන් වෙනස් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ලෝකයේ මේ පිළිබඳව ඉහළම මට්ටමේ කටයුතු කරන ලෝක සෞඛ්‍ය සංවිධානය, WHA62.13 දරන World Health Assembly Resolution on Traditional Medicine යටතේ මේ විකල්ප වෛද්‍ය ක්‍රම පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා පැවැත්වුවා. මේ සාකච්ඡාවලදී ජනතාවට මුල් තැන ලබා දෙමින්, ජනතාවගේ වෛද්‍ය අවශ්‍යතාවන් සපුරාලීම සඳහා සෑම රටක්ම

මේ විකල්ප වෛද්‍ය ක්‍රම භාවිත කිරීමේ තිබෙන යෝග්‍යතාව පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා පැවැත්වුවා. එහිදී විශේෂයෙන්ම ඒ විකල්ප වෛද්‍ය ක්‍රම පිළිබඳව; ඒවා නියමානුකූල කිරීම, ඒවායින් අනිසි ප්‍රතිඵල ඇතිවීම වැළැක්වීම කියන කාරණා පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කළා. ඒ අනුව මෙවැනි විකල්ප වෛද්‍ය ක්‍රම ප්‍රචලිත කිරීම තුළින් ජනතාවට වඩාත් පහසුවට, ලාභයට, කරදරයක් නැතිව තමන්ට රිසි පරිදි වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා තිබෙන අවස්ථාව පුළුල් කිරීම තමයි ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් සම්මත කරන ලද එම යෝජනාවේ හරය වුණේ. එම නිසා මේ යෝජනාව සම්මත කිරීමත් සමඟම අප්‍රිකාව, ආසියාකරයේ සහ ලෝකයේ විවිධ රටවල සාම්ප්‍රදායික වශයෙන් පවත්වාගෙන එන ලද වෛද්‍ය ක්‍රමයන් පිළිබඳව විශාල උනන්දුවක් ඇති වුණා.

විශේෂයෙන්ම ලංකාවේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳව කථා කරද්දී, අපේ රටට ආයුර්වේද ප්‍රතිකාර ලබා ගැනීම සඳහා සංචාරකයන් එන්නේ තායිලන්තයට යන අරමුණ වාගේ අරමුණක් සඳහා නොවෙයි. ඊට වඩා පුළුල් අරමුණු සඳහා අපේ රටට සංචාරකයන් එනවා. ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න සංචාරකයන් අපේ රටට එනවා. සමහර රටවලට බටහිර වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට යනවා වාගේම, ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න, කටු චිකිත්සාව ලබා ගන්න, මේ විධියට අද අපේ රටට සංචාරකයන් එන තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විකල්ප වෛද්‍ය ක්‍රමයන්හි තිබෙන වටිනාකම මේ තුළින් පෙනෙනවා. අද ජනතාවට අලුත් යමක් අවශ්‍ය වෙලා තිබෙනවා. අලුත් ක්‍රමවේදයන් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ නිසා ඒවා හඹාගෙන යන විශාල ජන කොට්ඨාසයක් ඉන්නවා.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳව කල්පනා කිරීමේදී, ජර්මනියෙන් බිහි වුණු මේ වෛද්‍ය ක්‍රමය කාලාන්තරයක් තිස්සේ විකාශනය වෙලා, ජනතාව අතර ජනප්‍රියතාවට පත් වෙලා, ලෝකයේ විවිධ රටවල් තුළ ව්‍යාප්ත වෙලා ගියා. ඒ තුළින් පෙනෙන්නේ, ඒ වෛද්‍ය ක්‍රමය මඟින් විශාල සහනයක් රෝගී ජනතාවට ලැබුණු බවයි. එහෙම ලැබුණේ නැත්නම් වෛද්‍ය ක්‍රමයක් පවත්වාගෙන යාමට පුළුවන්කමක් නැහැ. මොකද, වෛද්‍ය ක්‍රමයක් ප්‍රචලිත වෙන්නේ, ඒක ජනප්‍රිය වෙන්නේ ඒ ක්‍රමය තුළින් යම් ප්‍රතිලාභයක් ජනතාවට ලැබෙනවා නම් පමණයි.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මේ ආකාරයෙන් අපි පිළිගනු ලබන වෛද්‍ය ක්‍රමයක් ලෙස දැන් ලොව පුරා ස්ථාපිත වෙලා ඉවරයි. මේ ස්ථාපිතවීම තුළින් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ වෛද්‍ය ක්‍රම භාවිත කරන පුද්ගලයන් ඒ වෛද්‍ය ක්‍රමය අනුවම ප්‍රතිකාර කරන්නේ නැති බව ඔබතුමා දන්නවා. ඒ නිසා අද අපට සිදු වෙනවා, මේක regulate කරන්න; මෙය නිසි මාර්ගයට ගන්න; ඒ සඳහා අවශ්‍ය නීති-රීති පනවන්න; විශේෂයෙන්ම හෝමියෝපති වෛද්‍යවරුන් බිහි කිරීම සඳහා විද්‍යායතන සකස් කරන්න; ඒවායේ ප්‍රමිතිය කුමක්ද යන්න පිළිබඳව නීති - රීති සකස් කරන්න.

අද බොහෝ විට අපි ලංකාවේ බිහි කරනු ලබන බටහිර වෛද්‍යවරුන්ගේ තත්ත්වය පිළිබඳව, ඔවුන්ගේ දැනුමේ ප්‍රමාණය පිළිබඳව, බටහිර වෛද්‍ය විද්‍යාව පිළිබඳව සාකච්ඡාවට භාජනය වෙනවා. අද හුහාක් තැන්වල සිදු වෙන උද්ඝෝෂණත් පදනම් වෙලා තිබෙන්නේ මේවා උඩයි. ආයුර්වේද වෛද්‍යවරු පිළිබඳවත් එහෙමයි. අද ආයුර්වේද වෛද්‍යවරුන් ලියා පදිංචි කිරීම පිළිබඳව පවතින නීති-රීති රෙගුලාසි බැලුවොත්, සමහර අය අවුරුදු 5ක් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට ගිහිල්ලා ඒ අධ්‍යාපනය ලබලා උපාධියක් ගන්නවා. සමහර අය වෙනත් ආකාරයන්ගෙන් ඒ උපාධිය ලබා ගන්නවා. සමහර අය පාරම්පරිකව ඒ උපාධිය ලබා ගන්නවා. ඒ නිසා අද මේ ක්ෂේත්‍රයේ ගැටීම් රාශියක් තිබෙනවා. හෝමියෝපති පනත් කෙටුම්පත යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කළ වෛද්‍ය ආයතනයකින් පමණයි උපාධිය ලබා ගන්න පුළුවන් වන්නේ. මම හිතනවා, ඒක ඉතාම ප්‍රගතිශීලී පියවරක්; ඒක ඉතාම වැඩදායක පියවරක් කියා. ඒ තුළින් මේ අංශයෙන් හොඳ දැනුමක් තිබෙන වෛද්‍යවරුන් බිහි වෙනවා. මීට පෙර මෙහෙම සිදු වුණේ නැහැ. ඒ නිසා අපි ඉතාම සන්තෝෂ වෙනවා, එවැනි සඳහනක් මේ පනත් කෙටුම්පතට ඇතුළත් වීම පිළිබඳව. මේ හරහා හොඳ වෛද්‍යවරුන් බිහි කරලා, මේ වෛද්‍ය ක්‍රමය ශක්තිමත් ලෙස පවත්වා ගෙන යාමට අපට පුළුවන් වෙනවා.

අද වෛද්‍ය සේවාව දෙස බැලුවාම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍ය සේවාව වෙනුවෙන් වැය කරනු ලබන මුදල ජනතාවට ලොකු ප්‍රශ්නයක් බව පෙනෙනවා. අද පෞද්ගලික රෝහලකට ගියාම මොන තරම් විශාල මුදලක් වැය කරන්න වෙනවාද? ඒ මුදල වැය කරන්න පුළුවන් වෙන්නේ කීයෙන් කී දෙනෙකුටද? ඒ වැය කරන මුදලට සමානුපාතික සේවයක් පාරිභෝගිකයාට ලැබෙනවාද කියන ප්‍රශ්නය මතු වෙනවා. ඒ නිසා මෙවැනි විකල්ප වෛද්‍ය ක්‍රම සඳහා යාමට බොහෝ අය කැමැතියි. මේ තුළින් බටහිර වෛද්‍ය ක්‍රමයට තිබෙන තදබදයත් අඩු වෙන්න පුළුවන්. අන්න ඒ තද බදයත් අපි නැති කර ගන්න ඕනෑ. මොකද, මෙතැන තිබෙන්නේ ඉල්ලුම හා සැපයුම අතර - demand and supply අතර- සටනක් නේ. ඒ නිසා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළින් හොඳ ආයුර්වේද වෛද්‍යවරුන් හරහා ජනතාවට යම් සහනයක් සලසා දෙන්න අපට පුළුවන් නම්, ඒ පැත්තට යම් රෝගීන් ප්‍රමාණයක් අද්දා ගන්න පුළුවන් නම්, යම් රෝගීන් ප්‍රමාණයක් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හරහා ඒ පැත්තට අද්දා ගන්න පුළුවන් නම්, බටහිර වෛද්‍ය ක්‍රමය තුළ තිබෙන තදබදය අඩු වෙනවා. නමුත් ලංකාවේ එක ප්‍රශ්නයක් තිබෙනවා. මම සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කරපු නිසා ඒ ගැන දන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා චීනයට ගියොත් පෙනේවි, චීනයේ රෝහල්වල දේශීය වෛද්‍යවරුන්, බටහිර වෛද්‍යවරුන් දෙගොල්ලන්ම එකම වාට්ටුවේ ඉන්න රෝගීන්ට සත්කාර කරන බව. බටහිර වෛද්‍යවරයාට බැරි වුණු දෙයක් තිබෙනවා නම්, දේශීය වෛද්‍යවරයා ගෙන්වලා රෝගියාව පෙන්වනවා. ලංකාවේ එහෙම කළොත් මේ දෙගොල්ලන් ඔළු පලා ගනීවි. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට අවශ්‍ය වන්නේ වෛද්‍ය ක්‍රමයක එල්ලිලා ඉන්න නොවෙයි. ජනතාවට සේවය ලබා දෙන්න පුළුවන් මොන පැත්තෙන්ද, ඒ සෑම පැත්තකින්ම සේවය ලබා දෙන්න ඕනෑ. මේ සඳහා කොච්චර අණපනත් නීති - රීති ගෙනාවත් වැඩක් නැහැ, වෛද්‍යවරුන්ගේ ආකල්ප වෙනස් වෙන්නේ නැත්නම්. එම නිසා වෛද්‍යවරුන්ගේ ආකල්පත් වෙනස් වෙන්න ඕනෑ; ජනතාවගේ ආකල්පත් වෙනස් වෙන්න ඕනෑ.

අපි දැන් ජාතික සංහිඳියාව ගැන කථා කරනවා. මම හිතන විධියට වෛද්‍ය ක්ෂේත්‍රයන් තුළත් සංහිඳියාවක් ඇති කරන්න ඕනෑ. මම සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදී බටහිර වෛද්‍යවරු හා ආයුර්වේද වෛද්‍යවරු අතර විශාල වැටුප් පරතරයක් තිබුණු බව මට මතකයි. මම ඒ වැටුප් තලයන් සමාන කළා. ආයුර්වේද වෛද්‍යවරුන්ට විශාල පිළිගැනීමක් ඇති වුණා. විශේෂයෙන්ම මෙන්න මේ ක්‍රමවේදය ශ්‍රී ලංකා වෛද්‍ය ක්ෂේත්‍රය තුළට ගෙන එන්න ඕනෑ. කටු චිකිත්සාවෙන් කෙනෙක් සුවපත් කරන්න අපට පුළුවන් නම්, බටහිර වෛද්‍යවරයාත් ඒ කටු චිකිත්සාව පිළිගන්න ඕනෑ. ඇන්ටන් ජයසූරිය මහත්මයා කටු චිකිත්සාවෙන් මොන තරම් රෝගීන් ප්‍රමාණයක් සුවපත් කළාද? මේක බටහිර වෛද්‍ය ක්‍රමයේ කොටසක්ද, ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ කොටසක්ද කියලා එතුමා බැලුවේ නැහැ. එතුමා ළඟට ආපු රෝගීන් බැලුවේත් නැහැ, බටහිර ක්‍රමයට සුවපත් කරනවාද,

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ආයුර්වේද ක්‍රමයට සුවපත් කරනවාද, කටු විකිත්සාවට අනුව සුවපත් කරනවාද කියලා. අන්න එවැනි පුළුල් දැක්මක් අපට අවශ්‍යයි. ඒ නිසා මම විශ්වාස කරනවා, මේ පනත් කෙටුම්පත එළි දැකීමත් සමඟම අද පවතින තත්ත්වය වෙනස් වෙයි කියලා.

මේ ක්ෂේත්‍රය තුළ විවිධ චෝදනා තිබුණා. විවිධ ඒකාධිකාරයන් තිබුණා. ඒ ඒකාධිකාරයන් බිඳ දමලා අපේ වර්තමාන සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාට මෙය ඉදිරියට ගෙන යන්න හැකියාව ලැබේවා, විශේෂයෙන්ම මේ රටේ ජනතාවට සුවසෙත සැදීමේ ක්‍රියාවලියට මේ පනත උපයෝගී වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පිළිබඳව අමාත්‍යතුමාට නැවත වතාවක් මාගේ ස්තුතිය පුද කරමින්, මාගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.03]

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමා හෝමියෝපති පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මම හිතන විධියට හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳව ලංකාවේ උදාසීන ආකල්පයක් තමයි තිබෙන්නේ. අමාත්‍යතුමා කිව්වා වාගේම විවිධ කණ්ඩායම්වල කුළල් කා ගැනීම් මිසක් එහි ප්‍රගමනයක් අපට පසු ගිය කාලයේ දකින්න ලැබුණේ නැහැ. මේ අවස්ථාවේදී සෞඛ්‍ය අමාත්‍යතුමා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම රටට ඉතා අත්‍යවශ්‍ය කාරණයක් කියා මා හිතනවා. ඒ කාර්යය මා ඉතාම අගය කරනවා.

1796 වසරේදී තමයි හෝමියෝපති වෛද්‍ය ක්‍රමය තහවුරු වුණේ. ඒකට ඊටත් පෙර ඉතිහාසයක් තිබෙනවාය කියලා සාමාන්‍යයෙන් කියනවා. මේ වෛද්‍ය ක්‍රමය සැමුවෙල් හනිමාන් ඇති කළාට පස්සේ 1800 ගණන්වල මැද භාගය වන විට විවිධ රෝගාබාධවලට ප්‍රතිකර්ම කිරීමේ ක්‍රමයක් හැටියට ඉදිරියට ආවා. වසංගත රෝගවලට මෙම වෛද්‍ය ක්‍රමයෙන් ප්‍රතිකාර කරන්න බැහැ කියන එක අද දක්වාම පවතින ප්‍රවාදයක්. නමුත් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය විකල්ප වෛද්‍ය ක්‍රමයක් හැටියට ජනතාව අතර ව්‍යාප්ත වුණා.

එපමණක් නොවෙයි, විසිවන සියවසේ අග භාගය වන විට විවිධ සොයා ගැනීම් ඔස්සේ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය විශාල ප්‍රවර්ධනයකට ලක් වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් අපේ ශරීරයේ පවතින මූලික රෝගාබාධවලට -දියවැඩියාව, පිළිකා, ගැස්ට්‍රයිටිස් වාගේ මූලික රෝගවලට- ඉතාම සාර්ථක ප්‍රතිකාර ක්‍රමයක් හැටියට හෝමියෝපති ප්‍රතිකාර ක්‍රමය එංගලන්තය, ඇමෙරිකාව වැනි රටවල ඉතා ඉහළ පිළිගැනීමක් තිබෙනවා. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේදී රසායනික බෙහෙත් යොදා ගන්නවාද එහෙම නැත්නම් සම්පූර්ණයෙන්ම ශාකමය ඖෂධ පමණක්ද භාවිත කරන්නේ කියන එක සම්බන්ධයෙනුත් ලෝකයේ මතවාදයක් පවතිනවා. සමහර අය අද වන විට මෙය සම්පූර්ණයෙන්ම ශාකමය ඖෂධ පමණක් භාවිත කරන මට්ටමට දියුණු කරලා තිබෙනවා. ඒ අනුව බලන විට මේ වෛද්‍ය ක්‍රමය නව වෛද්‍ය ක්‍රමයක්; ප්‍රවේශය වෙනස්. ඒ වාගේම විවිධ ලෙඩ රෝග සඳහා ප්‍රතිකාර කරන තරගකාරී වෛද්‍ය ක්‍රමයක් හැටියටත් අද මෙම වෛද්‍ය ක්‍රමය ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. මෙම වෛද්‍ය ක්‍රමයේ ප්‍රගමනය ඇති කිරීම සඳහා වැදගත් පියවරක් තමයි අපි අද මේ තබා තිබෙන්නේ.

මෙම වෛද්‍ය ක්‍රමය ඉදිරියට ගෙන යෑම සම්බන්ධයෙන් කරුණු කීපයක් වෙත මුලින්ම අවධානය යොමු කරන්න මම කැමැතියි. මට පෙර කථා කළ මන්ත්‍රීතුමා කිව්වා වාගේ අද ඉන්දියාවේ විශ්වවිද්‍යාල, ඒ වාගේම ඩිප්ලෝමා සහතික දෙන මධ්‍යස්ථාන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ලංකාණ්ඩුවෙන් ලබා දෙන ශිෂ්‍යත්ව හැටියට අපි වර්ෂයකට ලංකාවේ ශිෂ්‍යයින් දහදෙනෙක් ඉන්දියාවට යවා පුහුණුකර ඔවුන්ව හෝමියෝපති වෛද්‍යවරුන් හැටියට ලංකාවට කැඳවා ගන්නවා. අපි අවුරුදු ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති නිසා යම් කිසි විධියකින් හෝමියෝපති විෂයය සම්බන්ධ ප්‍රවීණත්වයක් ලබපු වෛද්‍යවරු යම් සංඛ්‍යාවක් අපට ඒ මඟින් බිහි කර ගන්න පුළුවන්කම ලැබුණා.

මේ වෛද්‍ය ක්‍රමය ඉතා දුෂ්කර තත්ත්වයන් යටතේ පවත්වා ගෙන ආ ඉතා ප්‍රවීණ කණ්ඩායමක් ලංකාවේ සිටියා. ඒ වාගේම මේ වෛද්‍ය ක්‍රමය ඉතා වංචා සහගත විධියට පාවිච්චි කරන, අනිසි විධියට පාවිච්චි කරන කණ්ඩායමකුත් ලංකාවේ ඉන්නවා. මේ වෙනුවෙන් රජයේ කිසිම අනුග්‍රහයක් නැති වුණත්, මේ වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය සඳහා ලංකාව තුළ යම් යම් විශිෂ්ට සේවාවක් කරපු පුද්ගලයනුත් සිටින බව මා මතක් කරන්න ඕනෑ.

අපේ -විශේෂයෙන්ම ආණ්ඩුවේ- ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් අපි ඉදිරිපත් කළා, මේ විකල්ප වෛද්‍ය ක්‍රම -විශේෂයෙන්ම ආයුර්වේද වෛද්‍ය ක්‍රමය- රෝහල්වල භාවිත කරන වෛද්‍ය ක්‍රමයක් හැටියට බටහිර වෛද්‍ය ක්‍රමයත් එක්ක, ඒ ක්‍රම දෙකම, එක ළඟ අත් හදා බලනවා කියන එක. මේ ක්‍රමය දැන් බොහෝ රටවල අත් හදා බලනවා. විශේෂයෙන්ම ඉන්දියාවේ මේ ක්‍රමය තුළින් ඉතාමත් සාර්ථක ප්‍රතිඵල ලබා ගෙන තිබෙනවා. කොරියාව තමන්ගේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය සහ බටහිර වෛද්‍ය ක්‍රමය කියන ක්‍රම දෙකෙන්ම එකම රෝහලේ ප්‍රතිකාර කරන තත්ත්වයට අද රටේ රෝහල් ගෙනැල්ලා තිබෙනවා. ඒකෙන් ඔවුන් ජනතාවගේ නිරෝගිතාව සඳහා හොඳ උත්තර සොයා ගෙන තිබෙනවා.

අපේ රටේ හෝමියෝපති වෛද්‍ය ක්‍රමයෙන් ප්‍රතිකාර කරන රෝහල් තිබෙන්නේ ඉතාම අඩු ප්‍රමාණයක්. එක රෝහලක් තිබෙනවා, කොළඹ දිස්ත්‍රික්කයේ. නමුත්, ඒවා නවීන පහසුකම්වලින් සපිරි රෝහල් බවට පත් වෙලා නැහැ. අපට ඉදිරි කාලය තුළ මේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා මේ රෝහල්වල යටිතල පහසුකම්වල වර්ධනය සඳහා යම් කිසි කාර්ය භාරයක් කරන්න සිද්ධ වනවා.

මා මුලින් කී කාරණය ගැන අවධානය යොමු කළොත්, දැනට පවතින සෑම විශ්වවිද්‍යාලයකම Homoeopathy Faculty එකක් පටන් ගන්න ගරු ඇමතිතුමාට පුළුවන්කම තිබෙනවා. අපට ඒක අත්‍යවශ්‍යයි. මුලින් ඩිප්ලෝමා සහතික දෙන ආයතනයක් හැටියට ඒක පටන් ගන්න අපට පුළුවන්. ඒකෙන් අපට සාර්ථක ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

විශේෂයෙන් මම යම් යම් කාරණාවලදී ඉන්දියාව සමඟ සමීපව වැඩ කරන නිසා හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පෞද්ගලිකව මමත් පාවිච්චි කරලා තිබෙනවා. මගේ යාළු මිත්‍රයින්ටත් මම හෝමියෝපති බෙහෙත් දීලා තිබෙනවා. විශේෂයෙන්ම මෙය ගැස්ට්‍රයිටිස් රෝගයට ඉතාම සාර්ථක ප්‍රතිකාර ක්‍රමයක් හැටියට හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම දණහිස් ආබාධවලට, arthritis කියන රෝගයට, මෙම ක්‍රමයෙන් ඉතාම සාර්ථක ප්‍රතිඵල දෙන බවට ඉන්දියාවේත්, විශේෂයෙන්ම ලංකාවේදී මගේත් ඒ සම්බන්ධයෙන් අත් දැකීම් තිබෙනවා.

අපේ පන්සලේ සෑම සෙනසුරාදා දිනකම අපි සායනයක් පවත්වනවා. ඒ සායනයේදී අනුරාධපුරය, පොළොන්නරුව ආදී

ප්‍රදේශවල සිටින වකුගඩු රෝගීන්ට අපි සම්පූර්ණයෙන් නොමිලේ බෙහෙත් දෙනවා. ඒ වාගේම අනික් අයටත් බෙහෙත්වලට පමණක් ඉතා සුළු මුදලක් අය කරමින් ප්‍රතිකාර කරන සායනයක් අපේ පන්සලේ පවත්වනවා.

විශේෂයෙන්ම අපි මේ සායනය ආරම්භ කළේ වකුගඩු රෝග සඳහා පීඩාවට පත් වූ අයට පිහිටවීම සඳහායි. දැනට අපි රෝගීන් 300 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවකට ප්‍රතිකාර කරලා තිබෙනවා. එහිදී අපි පරිස්සමෙන් බලාගත් රෝගීන් සියයකට වැඩි පිරිසක් අද සුවය ලබන තත්ත්වයට පත් වෙලා ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව ළඟ විධිමත් වාර්තා තිබෙනවා. අපි හෝමියෝපති ක්‍රමය යටතේ ප්‍රතිකාර කළේ විධිමත් වාර්තා තබා ගෙනයි.

දැනට විශේෂයෙන්ම ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත්, හෝමියෝපති වෛද්‍ය ක්‍රමයත් ලංකාව පුරා පැතිරී යන වකුගඩු රෝගයට ප්‍රතිකර්මයක් හැටියට යොදා ගන්න පුළුවන් බව තමයි අපේ විශ්වාසය. විශේෂයෙන්ම දැන් පවතින බටහිර වෛද්‍ය ක්‍රමය යටතේ වකුගඩු රෝගයට කිසිම ප්‍රතිකාරයක් නැහැ. ඒකේ තිබෙන ක්‍රියැටිනින් මට්ටම වැඩි කරන්න කිසිම ක්‍රමයක් නැහැ. අපට වේදනා නාශක දෙන්න පුළුවන්. ඊට පස්සේ අනිවාර්යයෙන්ම ඒ රෝගියාට වකුගඩුවක් බද්ධ කරන්න වනවා. නැත්නම් අවුරුදු තුන, හතරක් ලේ සුද්ද කළාට පස්සේ ඒ රෝගියා මරණය කරා ගමන් කරනවා. මේ වාගේ රෝග බොහොමයක් තිබෙනවා.

කාලයක් HIV වෛරසය කළමනාකරණය කරලා ඒ රෝගීන්ට හොඳින් ජීවත් විය හැකි පරිදි එය පවත්වා ගෙන යන්න පුළුවන් ප්‍රමාණයට බටහිර වෛද්‍ය ක්‍රමය දැන් දියුණු වෙලා තිබෙනවා. නමුත්, HIV ආසාදනයට ලක් වූ අය සම්පූර්ණයෙන් සුවපත් කරන වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයක් තවම සොයා ගෙන නැහැ. මේ සම්බන්ධයෙනුත් විශේෂයෙන්ම හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේත්, ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේත් විකල්ප තිබෙන බව දැන් සොයා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම ලංකාවේ තිබෙන කැඩුම් බිඳුම් වෙදකම, දකුණු ඉන්දියාව පදනම් කර ගත් සිද්ධ වෙදකම, ඒ වාගේම යුනානි වෛද්‍ය ක්‍රමය කියන මේ සෑම වෛද්‍ය ක්‍රමයේම ඒ ඒ රෝගාබාධ සඳහා විශේෂතා තිබෙනවා. ආසියානු කලාපයෙන්ම, කැඩුම් බිඳුම් වෙදකමේ ඉතා විශිෂ්ටයන් ලංකාවේ තවමත් ඉන්නවා කියලායි මම හිතන්නේ. ඒ විධියට ඒ ඒ වෛද්‍ය ක්ෂේත්‍රවල තිබෙන විශිෂ්ටතා හඳුනා ගෙන මේ වෛද්‍ය ක්‍රම අපට ප්‍රයෝජනයට ගන්න පුළුවන්ය කියන එක තමයි අපේ අදහස. එහිදී ඉක්මනින්ම මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයක් ආරම්භ කරන්නට අපට ශක්තියක් නැති නිසා මුලින්ම ඩිප්ලෝමා උපාධියකින් පටන් ගන්නා පීඨයක් ආරම්භ කළොත්, හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ වෛද්‍යවරුන් විශාල සංඛ්‍යාවක් බිහි කර ගන්නට පුළුවන්කම ලැබේවි කියලා මම හිතනවා.

දැනට හෝමියෝපති වෛද්‍ය ක්‍රමය නීති විරෝධී මට්ටමින් පවත්වාගෙන යන ජාවාරම්කාර ව්‍යාපාරිකයින් මේ පනත් කෙටුම්පත සම්මත කරගත් පසුව යම්කිසි ආකාරයකින් නවත්වන්නට පුළුවන් වෙයි. පසුගිය කාලයේ අපේ හෝමියෝපති වෛද්‍ය සභාව යම්කිසි ආකාරයකින් නිෂ්ක්‍රීය වෙලා අතුරු පාලක සභාවලින් තමයි පවත්වාගෙන ගියේ. මම හිතන්නේ ඒක හොඳ ක්‍රියාවක් නොවෙයි කියලායි. මේ පනත් කෙටුම්පතෙන් පසුව ඉක්මනින්ම හෝමියෝපති වෛද්‍ය සභාව විධිමත්ම පිහිටුවා ගත යුතුයි කියලා මම කල්පනා කරනවා.

ගරු ඇමතිතුමනි, මෙහි ප්‍රවර්ධනයට හේතු වෙන කරුණු කිහිපයක් සම්බන්ධයෙන් මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි. විශේෂයෙන්ම 9වන වගන්තිය සංශෝධනය වන විධිය ගැන බලමු. පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය අවුරුදු 3කින් අවසන් වනවා. නමුත් නිල බලයෙන් පත් වන අයට ඕනෑම කාලයක් ඉන්නට පුළුවන්. ඒ කියන්නේ අමාත්‍යාංශ මට්ටමින් පත් කරන අයට ඕනෑ කාලයක් ඉන්න පුළුවන්. මම හිතනවා, දෙවරකට වඩා මේ ධුර කාලයේ ඉන්න හොඳ නැහැ කියලා. මොකද, එකම කණ්ඩායමක් එක දිගට ඉන්නා විට මේකේ යම්කිසි ආධිපත්‍යයක් පවත්වනවා. මේ සභාව අවුරුදු 3ක කාලයයි තිබෙන්නේ. අවුරුදු 3කින් විසුරුවා හැරලා සියලු දෙනාම අලුතෙන් නම් කිරීම සුදුසුයි. එවිට ඒ පත් කළ පිරිසම ආයෙත් පත් කරන්නත් පුළුවන්කම තිබෙනවා. මම ඒ සංශෝධනය ඉදිරිපත් කරන්නට කැමැතියි:

"කාර්ය මණ්ඩල වැටුප් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත වැටුප් තලයන්හි අවමයන්ට යටත්ව පවත්වා ගත යුතුය."

සියලුම තනතුරු, -රෙජිස්ට්‍රාර් ඇතුළු සියලුම තනතුරු- ආණ්ඩුවේ යම්කිසි පටිපාටියකට අනුව ආපු අයගෙන් පත් කර ගැනීම තමයි මට පෙනෙන ආකාරයට මේකේ තිබෙන්නේ. එහි ගැටලුවක් නැහැ. නමුත් "වැටුප් තලයන් පිළිබඳ තිබෙන 17(ii) වගන්තියට, කාර්ය මණ්ඩල වැටුප් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත වැටුප් තලයන්හි අවමයන්ට යටත්ව පවත්වා ගත යුතුය" කියලා මම යෝජනා කරලා තිබෙනවා.

18වෙනි වගන්තිය මෙසේ සංශෝධනය විය යුතුයි කියලා මම යෝජනා කරනවා:

"18 (1) වෛද්‍ය සභාව සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් වන්නේය".

මා හිතන විධියට ඒක ඔබතුමාට තීරණය කරන්නට පුළුවන්. සංඛ්‍යාව 18ක්ද 20ක්ද කියලා මම දන්නේ නැහැ. එහෙම නොවුණොත්, තාවකාලිකව පත් වුණොත්, අවුරුදු 4න් 5න් අයින් වුණොත් ඒක ප්‍රශ්නයක් බවට පත් වෙනවා. ඒ නිසා "වෛද්‍ය සභාව සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් වන්නේය" යන්න සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

ගරු ඇමතිතුමනි, 19වෙනි වගන්තිය සඳහා මම යෝජනාවක් කරන්නට කැමැතියි. විධායක අධ්‍යක්ෂවරයෙක් පත් කිරීම පිළිබඳව යෝජනා කරලා තිබෙනවා. ඊට අදාළ ආනුෂංගික කරුණු ගණනාවක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මා හිතන්නේ ඒ සඳහා විධායක අධ්‍යක්ෂවරයෙක් පත් කළාට පසුව, - හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ විශේෂඥතාවක් තිබෙන කෙනෙකු තමයි අපි සභාපති ලෙස පත් කරන්නේ.- සභාපතිවරයාට ඉහළින් විධායක අධ්‍යක්ෂවරයා ඉන්න බවක් දැනෙනවා. වෛද්‍ය කවුන්සිලයේත් - අපේ දැනට තිබෙන වෛද්‍ය සභාවේත්- නැති නිසා "විධායක අධ්‍යක්ෂවරයා" කියන එක ඉවත් කරනවා නම් වඩා සුදුසුයි කියා මා හිතනවා. එසේ නොවේ නම් අඩුම තරමින් ඒකට වෛද්‍යවරයෙකුම පත් කිරීම සුදුසුයි කියා මා යෝජනා කරන්න කැමැතියි.

19. (2) (අ) වන වගන්තිය " 'යම් ප්‍රමාණයක්' යන්න ඉවත් කොට 'සභාව විසින් නිශ්චිත කරන ලද....' " යනුවෙන් සංශෝධනය විය යුතු යැයි මා යෝජනා කරනවා. එය 19වන වගන්තියේ තිබෙනවා නම් පමණයි අදාළ වෙන්නේ. 19වන වගන්තියේ නැත්නම් ඉතිරි සංශෝධන දෙක අදාළ වෙන්නේ නැහැ. 31.(ආ) වගන්තිය යටතේ "එසේ නමුත් සීමාවාසික ශිෂ්‍යයන් සඳහා පුහුණුවීමටත්, යම් රෝගයකට විශේෂඥතාවය ඇති විදේශික වෛද්‍යවරුන් සඳහා තාවකාලික ලියා පදිංචිය දිය හැකිය." යනුවෙන් සඳහන් විය යුතු යැයි මා යෝජනා කරනවා. ඒ කියන්නේ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ඉගැන්වීමේදීත්, රෝහලක් පවත්වා ගෙන යනවා නම් එහිදීත් විදේශීය වෛද්‍යවරුන්ගේ සහාය ලබා ගන්න අපට සිද්ධ වෙනවා. ඒ නිසා ඒ සඳහා තාවකාලික ලියා පදිංචියක් ලබා දෙන්න කියා මා ඉල්ලා

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

සිටිනවා. එසේ නොමැතිව යම් කිසි වෛද්‍යවරයෙක් ලංකාවට පැමිණියොත්, පනතට අනුව ඔහු නීති විරෝධී වෙනවා. මම එය 31.(1) වන වගන්තිය යටතේ යෝජනා කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පතට මේ සුළු සංශෝධන කිහිපය සිදු කර ගන්න පුළුවන් නම්, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ඉතා හොඳින් තහවුරු කර ගන්න අපිට පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා. අද අපට වැළැඳී තිබෙන ලෙඩ රෝග ගැන කල්පනා කර බැලුවොත්, වසංගත රෝගවලට වඩා වේගයෙන් විශේෂයෙන්ම ආහාර රටාව නිසා හැදෙන රෝග බහුල වී තිබෙන බව පෙනී යනවා.

ගරු සෞම්‍ය ඇමතිතුමනි, නීරෝගීමත් ජනතාවක් බිහි කර ගැනීමේදී මොන වෛද්‍ය ක්‍රමයකටත් වඩා විශේෂයෙන්ම අපි කාරණා කිහිපයකට අවධානය යොමු කරන්න ඕනෑය කියා මා විශ්වාස කරනවා. පළමුවැනි කරුණ තමයි, නිවැරදි ආහාර රටාව. එය ඇති කිරීමේ වගකීම තිබෙන්නේත් ඔබතුමා යටතේමයි කියා මා හිතනවා. විශේෂයෙන්ම අද පිට රටින් ගෙන්වන ආහාරවල තත්ත්වය පිළිබඳව ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට palm oil පිළිබඳ ප්‍රශ්නය පෙන්වා දෙන්න පුළුවන්. අද වනවිට පිටකොටුවේ කඩවලට තොග පිටින් -ලීටර් 10, 15- palm oil විකුණා තිබෙනවා. එම පුද්ගලයා බිලියන ගණනක් රේගුවෙන් ලාභ ලබා ගෙන තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේවා ආහාරයට ගත්තා නම් මිනිසුන් අනිවාර්යයෙන්ම හෘදය රෝග හැදිලා මිය යනවා. මේ තෙල්වල සියයට පහකට අඩුවෙන් අන්තර්ගත විය යුතු ද්‍රව්‍ය සියයට විසිපහකටත් වැඩියෙන් තිබෙන බව දැන් වරායෙන් සොයා ගෙන තිබෙනවා. නමුත් මේ දූෂිත පුද්ගලයන් තවම නිදැල්ලේ සිටිනවා. සාමාන්‍ය මිනිසුන් එදිනෙදා මේ ආහාර පාන ගන්නවා. අපි වුණත් මහ තොටේ යනකොට මේ ආහාර පාන ගන්නවා. ඒ නිසා මේ තෙල් -palm oil- සම්පූර්ණයෙන් අපේ ශරීරගත වී තිබෙනවා. ඒක උග්‍ර විසක්.

අපි රජයක් හැටියට තීරණය කර තිබෙනවා, වස විසෙන් තොර ආහාර රටාවකට ජනතාව ගෙන යන්න ඕනෑය කියා. ඒ නිසා අපි පසු ගිය කාලයේ ග්ලයිෆොසේට් මෙරටට ගෙන්වීම නැවැත්වුවා. ග්ලූෆොසිනේට් සම්බන්ධයෙන් ජාත්‍යන්තරයෙන් එල්ල වූ විවිධ බලපෑම් නිසා ඔවුන්ට ලියන්න සිද්ධ වුණා, ජාන විකෘතිවීමටත්, විශේෂයෙන්ම ගබ්සාවීමටත් මේ ග්ලූෆොසිනේට් නැත්නම් වෙළෙඳ පොළට ආ බස්ටා බලපෑ බව. නමුත් ග්ලයිෆොසේට්වලටත් වඩා භයානක ග්ලූෆොසිනේට් ආපසු වෙළෙඳ පොළට ගෙනැවිත් දැම්මා. ජනාධිපතිතුමා විසින් ඒවා ගෙන්වීම නවත්වනු ලැබුවා. ඒ සම්බන්ධයෙන් ගන්නා ප්‍රතිපත්ති ඉතා වැදගත්. මොකද, අප අද දියවැඩියා රෝගය, බඩ දැවිල්ල - ගැස්ට්‍රයිටිස් රෝගය- වාගේම විශේෂයෙන්ම වකුගඩු රෝගය වැනි රෝගාබාධවලට ලක් වෙලා සිටින්නේ, ලංකාවේ එවැනි රෝගාබාධ ඇති වෙලා තිබෙන්නේ ප්‍රධාන වශයෙන්ම මේ ආහාර රටාව නිසායි; අප පරිභෝජනය කරන ආහාර විස වීම නිසායි. ආහාර භෝග වර්ග වගා කරන කොටත්, විශේෂයෙන්ම ආහාර කල් තබා ගන්නා කොටත් පාවිච්චි කරන විස වර්ග පිළිබඳව අප කථා කළ යුතුයි.

මම ගරු ඇමතිතුමාට කියනවා, ලංකාවට ගෙන්වන ඇපල් පිළිබඳව විශේෂ පරීක්ෂණයක් කරන්න කියා. මගේ මේසය උඩ ඇපල් ගෙඩියක් තබා බලන්න. මාස හයක් ගියත් ඒක නරක් වෙන්නේ නැහැ. මොන විධියටද ඒවා ආරක්ෂා කරලා තිබෙන්නේ, ලෝකයේ පවතින මොන ප්‍රමිතියකට අනුවද ඒවා ආරක්ෂා කරලා තිබෙන්නේ කියන ප්‍රශ්න අද අපි සාකච්ඡා කර බලන්න ඕනෑ. ඒ නිසා මම මේ අවස්ථාවේදී වස විසෙන් තොරව වගා කිරීම සම්බන්ධවත්, නිවැරදි ආහාර රටා පිළිබඳවත් අපේ විශේෂ අවධානය යොමු කරවනවා.

මම ගරු ඇමතිතුමාට අනතුරු ඇඟවීමක් කරන්නත් කැමැතියි. ලෝකයේ දැවැන්ත ජාත්‍යන්තර සමාගමක් හාල්වලට විටමින් දමන්න කියා අලුතින් සංකල්පයක් ගෙන යනවා. මේ විටමින් කොම්පැනි, ලෝකයේ දැවැන්ත ජාත්‍යන්තර සංවිධාන. ඔවුන්ගේ බලාපොරොත්තුව වන්නේ, අපේ මිනිසුන්ට රක්තහීනතාව තිබෙනවා, ප්‍රශ්න තිබෙනවා කියා ආපසු මේ හාල්වලට විටමින් දමන බිස්නස් එක පටන් ගන්නා වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමයි. කිසිම අවසරයකින් තොරව වෙබ් අඩවියක් පටන් අරගෙන, ලංකාව මධ්‍යස්ථානයක් හැටියට එම වෙබ් අඩවියේ පළ කර තිබෙනවා.

අපි දැනට ගෙන්වන පරිප්පු වර්ග සම්බන්ධවත් අපේ අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම GM විධියට හදපු පරිප්පු ලංකාවේ තිබෙනවාද, නැද්ද කියා සොයා බලන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, අපි දැන් විවිධ විධියට පරිප්පු ආනයනය කරනවා. මිනිස්සු ගන්නේ ලස්සන ඇට තිබෙන පරිප්පු. නමුත් ඒවා GMද, නැද්ද කියා සොයා බලන්න ඕනෑ. ඒ වාගේම අපි කන විවිධ ආහාර වර්ග GMද, නැද්ද කියන එක පිළිබඳවත් සොයා බලන්න ඕනෑ. මොකද, GM food ගෙනෙනවාද, නැද්ද කියන එක සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් තිබෙනවා. මා දන්නා හැටියට අප අත්සන් කළ වෙළෙඳ ගිවිසුම් අනුව අප එකඟ වෙලා තිබෙනවා, GM food ගෙනෙන්න මගේ දැනුම අනුවයි මම ඒ ගැන කිව්වේ. මම දන්නේ නැහැ, හරිද කියා. නමුත් රටක් හැටියට අපට අයිතියක් තිබෙනවා, ජනතාවට අයිතියක් තිබෙනවා, එම ආහාර GMද, නැද්ද කියා දැනගන්න. ඒ නිසා ජාන විකිරණය කරන ලද ආහාර වර්ග හඳුනාගන්න නම් අනිවාර්යයෙන්ම එම භාණ්ඩයේ ඒ ගැන සඳහන් වෙලා තිබෙන්න ඕනෑ.

වැදගත්ම කාරණය හැටියට මිනිසුන්ගේ දිවි පැවැත්ම ගැන මම සඳහන් කරන්න ඕනෑ. අද පාසල් අධ්‍යාපන රටාවේ තිබෙන උදේ ආහාර නොගෙන, කිරි එකක් විතරක් බීලා ඉස්කෝලේ යන ක්‍රමය, ඒ වාගේම ආහාර ගන්න වෙලාවන්වල තිබෙන අවධිමත් භාවය නිසා අද ජනතාව විශාල වශයෙන් රෝගී වෙලා සිටිනවා.

ඊළඟට, වැඩි වශයෙන් රෝගාබාධ ඇති වන්නේ පාසල් අධ්‍යාපනයේ ඉඳලා ව්‍යායාම පද්ධතියක් හඳුනා නොගැනීම නිසායි. අද එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් පිළිගෙන තිබෙනවා, සෞම්‍ය සම්පන්න මනුස්සයෙකු බිහි කිරීමට යෝග අභ්‍යාස හේතු වන බව. ඒ නිසා විශේෂයෙන්ම පාසල් අධ්‍යාපනයට ව්‍යායාම පද්ධතියක් හඳුන්වා දීලා, හැම මනුස්සයෙකුම කාර්ය ශූර මනුස්සයෙකු බවට අපි පත් කරන්න ඕනෑ. අද අපට නිසි පරිදි ව්‍යායාම නැතිකම විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අපි ලෙඩ වුණාට පස්සේ කොන්ක්‍රීට් පථවල ඇවිද්දායි කියලා කිසිම ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. ශරීරයේ තැන්පත් වුණු කැල්සියම් අයින් කර ගන්න මනුස්සයෙකුට දවසකට කොන්ක්‍රීට් පථවල කිලෝමීටර් 20ක්, 30ක් ඇවිදින්න වනවා. ඒක ලෙහෙසි කටයුත්තක් නොවෙයි. අවුරුදු හතළිහ, හතළිස් පහ වුණාම ඇඟේ තැන්පත් වුණු, අක්මාවේ තැන්පත් වුණු මේදය අයින් කරන එක ලෙහෙසි කටයුත්තක් නොවෙයි. විශේෂයෙන්ම රෝගාබාධ වළක්වා ගැනීමේදී ව්‍යායාම ඉතාම අත්‍යවශ්‍ය කාරණයක්.

ඊළඟට, වැඩි වශයෙන් රෝගාබාධ ඇති වන්නේ මිනිසුන්ගේ මානසික ආතතිය නිසායි. මිනිසුන්ගේ මානසික ආතතිය නැති කරන රසාස්වාදන සංස්කෘතියක් අපි ඇති කරන්න ඕනෑ. ඒක යහපත් රසාස්වාදන සංස්කෘතියක් විය යුතුයි. ඒ වාගේම සමාජ

ප්‍රශ්න විසඳෙන සංස්කෘතියක් අපි ඇති කරන්න ඕනෑ. ඒ සියල්ල තුළ තමයි නිරෝගි ජනතාවක් බිහි කරන්නඅපට පුළුවන් වන්නේ.

ප්‍රධාන වශයෙන්ම මේ පනත් කෙටුම්පතින් අප සාකච්ඡා කරන්නේ, අපි කොහොමද ලෙඩ වුණු මිනිසුන්ව සනීප කරන්නේ කියලායි. බටහිර වෛද්‍ය ක්‍රමය සාර සංග්‍රහ වෛද්‍ය ක්‍රමයක් නොවෙයි. හැබැයි, අපි පිළිගන්න ඕනෑ බටහිර වෛද්‍ය ක්‍රමය තුළ විද්‍යාත්මක ක්‍රම සහ තාක්ෂණය ඉතා ඉක්මනින් පාවිච්චි කරන්න පුළුවන්කම තිබෙන බව. ඒ මඟින් කෙනෙකුගේ ශරීරයේ ඕනෑම ඉන්ද්‍රියකට සිදු වුණු හානිය ඉතා ඉක්මනින් දැනගන්න පුළුවන්කම තිබෙනවා. ඒකට අත්‍යවශ්‍ය කරන රසායනික ඖෂධ වෙන් වෙන්ව හදුනා ගන්න පුළුවන්කමත් තිබෙනවා. ඒ නිසා ක්ෂණික ප්‍රතිකර්ම ක්‍රමයක් හැටියට බටහිර වෛද්‍ය ක්‍රමය ආධිපත්‍යයට පත් වෙලා තිබෙනවා. හැබැයි, දැන් දියුණු ලෝකයම කල්පනා කරනවා, බටහිර වෛද්‍ය ක්‍රමය විද්‍යාත්මක වෛද්‍ය ක්‍රමයක්ද කියලා. ඒක තාක්ෂණික වෛද්‍ය ක්‍රමයක් හැටියට ලෝකයේ ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා.

මීට අවුරුදු 50කට කලින් ලංකාව අරගෙන බැලුවොත්, අපේ කුඩා කාලයේ අප පළමුවෙන්ම ගියේ අපේ ගමේ තිබුණු බෙහෙත්ශාලාවට. ඒ කියන්නේ, අපේ ගමේ ආයුර්වේද වෛද්‍යවරයෙක් හිටියා. ඒ වෛද්‍යවරයා ළඟටයි ගියේ. එතැනට ගිහිල්ලා ලෙඩේ සනීප කර ගන්න බැරි වුණොත් තමයි අපි රෝහලට යන තත්ත්වයට පත් වුණේ. ඒ නිසා අපේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත්, ඒ වාගේම හෝමියෝපති, යුනානි හා සිද්ධ කියන විකල්ප වෛද්‍ය ක්‍රම සියල්ලම ලංකාව තුළ සමගාමී අන්තර් සම්බන්ධයකින් යුතුව පවත්වාගෙන යෑම අවශ්‍ය වනවා.

මා හිතන හැටියට ගරු ඇමතිතුමනි, ඔබතුමා දීර්ඝ කාලයක් තිස්සේ මේ ගැන කල්පනා කළා. ඔබතුමාට උචිත අමාත්‍යාංශයක් අද ලැබිලා තිබෙනවා. ඒ නිසා ඉක්මනින්ම මේ සියලු වෛද්‍ය ක්‍රම එක තැනක හමුවන වැඩසටහනක් සකස් කර ගන්න පුළුවන් වෙයි. එහෙම කළොත්, බටහිර වෛද්‍යවරුන් මේ වෛද්‍ය ක්‍රම ඉගෙන ගන්න නම්‍යශීලි වුණොත්, ඉතා සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකියි. ඉන්දියාව ගත්තොත්, ඉන්දියාව ඉතා සාර්ථක ලෙස අත් හදා බැලීම් කර තිබෙනවා. ඔවුන් බටහිර වෛද්‍යවරුන්, බටහිර වෛද්‍ය අධ්‍යාපනයෙන් පසුව දේශීය වෙදකම හදාරන්න විශේෂ ගෙවීමක් කරලා යොමු කර තිබෙනවා. ඔවුන්ට ඒ නිසා පර්යේෂණ නිශ්චිත විධියට කරන්න පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ නිසා පසුගිය අවුරුදු 20 ඇතුළේ ඉන්දියාවේ ආයුර්වේදයේ අලුත් ප්‍රගමනයක් ඇති වුණා. විශේෂයෙන්ම අපට පෙනෙනවා රසායනික බෙහෙත් නිෂ්පාදනය වාගේම, හිමාලයෙන් ලබා ගන්නා දේශීය ඖෂධ යොදා ගන්නා අති දැවැන්ත කොම්පැනි අද ඉන්දියාවේ බිහි වෙලා තිබෙන බව. ඒකට හේතු වුණේ, ඔවුන් ආයුර්වේදය සම්බන්ධයෙන් දක්වපු, විකල්ප වෛද්‍ය ක්‍රම පිළිබඳව දක්වපු විශේෂ උනන්දුවයි. අපත් ඉතා ඉක්මනින් ඒ ක්‍රමයට යන්න වනවා. මොකද, රසායනික බෙහෙත් මතම අපට යැපෙන්න බැහැ.

අපේ පරිසරයේ තිබෙන මූලික බෙහෙත් පිළිබඳව අපට දැනුම ලැබෙන්නේ ඉවකින්. අපි දන්නවා බල්ලන්, බළලුන් ආදී සතුන් ගස්වල කොළ කන්නේ ඒ සතුන්ට තිබෙන ඉවක් නිසා කියලා. අපේ ස්වභාව ධර්මයේ හැදෙන ගස් කොළන් තමයි අපට උචිතම ඖෂධය කියලා ලෝකය දැන් පිළිගෙන තිබෙනවා. දැන් අලුතෙන් අත් හදා බැලීම් කර ගෙන යනවා, ඉන්කා මායාවරුන් වාගේ පැරණි ශිෂ්ටාචාරවල ජනතාව ඖෂධ ලෙස ගත්තේ මොනවාද යන්න සම්බන්ධයෙන් ඒ පිළිබඳව ඇමෙරිකාව වාගේ රටවල පැරණි ගෝත්‍රික ජනතාවගේ ඖෂධීය පරිහරණය පිළිබඳ විශේෂ පර්යේෂණ ආයතන හා විශ්වවිද්‍යාලවලිනුත් අත් හදා බැලීම් කරන්න පටන් ගෙන තිබෙනවා. දැන් නම් අපේ වැදි ජනතාවත් රෝහල්වලිනුයි බෙහෙත් ගන්නේ. නමුත්, ඉතිහාසය ගත්තොත් ඒ කිසි කෙනෙක් රෝහල්වලින් බෙහෙත් ගත්තේ නැහැ. කැලේ තිබෙන අල, කොළ කාලා තමයි ලෙඩ රෝග සුවපත් කර ගත්තේ. එහෙම නම් ඔවුන්ගේ, පාරම්පරික ජනතාවගේ, ගැමි ජනතාවගේ අත් දැකීම් ඔස්සේ ඔවුන් ලබා ගත් බෙහෙත් මොනවාද?

ඉන්දියාව ගත්තොත්, ඒ වාගේම ශ්‍රී ලංකාව ගත්තොත් විශාල ශිෂ්ටාචාර පැවැති රටවල්. ඊළඟට අපට හමුවන විශාලතම ශිෂ්ටාචාරය වන්නේ, චීන ශිෂ්ටාචාරය. සංවිධිත ශිෂ්ටාචාරයක් හැටියට චීන ශිෂ්ටාචාරය දීර්ඝ කාලයක් පැවතුණා. ඒ දැවැන්ත ශිෂ්ටාචාර දෙකේම -ඉන්දියානු හා චීන- අයට වෛද්‍ය ක්‍රමය පිළිබඳව විශාල අත් දැකීම් තිබෙනවා. ඒ නිසා චීන කටු චිකිත්සා ක්‍රම වෙන්න පුළුවන්, චීන ඖෂධ ක්‍රම වෙන්න පුළුවන්, ඒවාත් ප්‍රවලිත කිරීමට අපි යම්කිසි ඉඩක් ලබා ගත යුතුයි කියලා මම මේ අවස්ථාවේදී කල්පනා කරනවා. ඒ නිසා සංශෝධන සහිතව මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන් ප්‍රගමණයක් ලබා ගන්න පුළුවන් කියා මා විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.24]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1970 අංක 7 දරන හෝමියෝපති පනත අවුරුදු 46කට පස්සේ වෙනස් කරලා, නව පනත් කෙටුම්පතක් ගෙන එන වෙලාවේ ඒ සම්බන්ධයෙන් අදහස් කීපයක් එකතු කරන්න ලැබීම ගැන සතුටු වෙනවා.

මෙම පනත් කෙටුම්පතේ මූලික අරමුණු බවට පත් වෙලා තිබෙන්නේ හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවීම, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් සහ හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම, හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම හා නියාමනය, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම, පෝෂණය කිරීම සහ නියාමනය, හෝමියෝපති බෙහෙත් වර්ග, ඖෂධ සහ අනෙකුත් හෝමියෝපති පිළියෙල කිරීම, නිෂ්පාදනය, ආනයනය, ගබඩා කිරීම, විකිණීම සහ බෙදාහැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීමයි. ඒවා තමයි ප්‍රධාන කාර්යයන්.

ලෝකයේ විවිධ වෛද්‍ය ක්‍රම තිබෙනවා. එක් එක් කාලවලදී ඒ වෛද්‍ය ක්‍රම සොයා ගෙන තිබෙන්නේම ජනතාවගේ ජීවිත සුවපත් කරන්නතට සහ ජනතාවට වඩා හොඳ ජීවිතයක් උරුම කර දෙන්නටයි. දැන් අපේ රට ගත්තොත්, අපේ ප්‍රමුඛ වෛද්‍ය ක්‍රමය බවට පත් වෙලා තිබෙන්නේ බටහිර වෛද්‍ය ක්‍රමයයි. ඒ හැර තිබෙන සියලුම වෛද්‍ය ක්‍රම විකල්ප වෛද්‍ය ක්‍රම හැටියට හඳුන්වනවා. ඒ යටතේ, දේශීය වෛද්‍ය ක්‍රමයට අයත් ආයුර්වේද, සිද්ධ, යුනානි වාගේම හෝමියෝපති, ඇලෝපති, චීන කටු චිකිත්සාව වැනි සියලුම දේවල් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බටහිර වෛද්‍ය ක්‍රමය පැමිණෙන්න පෙර, මේ විවිධ වෛද්‍ය ක්‍රම ඉතාම දක්ෂ ආකාරයට අත්හදා බැලූ රටක් තමයි අපේ රට. 1666දී ලංකාවට ඇවිල්ලා වසර 19යි, මාස 6යි, දින 14ක් සිරගත වෙලා හිටපු රොබට් නොක්ස් ඔහුගේ "එදා හෙළ දිව" පොතේ කියනවා, මේ රටේ තිබුණු එවැනි වෛද්‍ය ක්‍රම ගැන. ඔහු මෙහෙම කියනවා:

"මේ රටේ එක් විශේෂයක් ඇත. එනම් රටේ හැමෝම වෙද්දුය. මේ රටේ ඒ සඳහා වෙන වෙනම නම් දැරූ විශේෂ වෛද්‍යවරු හෝ ශල්‍ය වෛද්‍යවරු හෝ නැත්තාහ. කෂාය, බෙහෙත් ගැන හා කැපුම්, කෙටුම්, පෑස්සුම් ගැන කොයි කාටත් සාමාන්‍ය පළපුරුද්දක් ඇත්තේය. ඔවුන් ඔසු පිළියෙල කරන්නේ ගස්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

වැල්වල කොළ පොතු ආදියෙනි. වමනය කරවීමටත්, විරේකය කරවීමටත්, අලුත් වණ සුව කර ගැනීමටත්, ඇස් රුදා ආදිය සනීප කර ගැනීමටත් ඔවුහු ගස්වල කොළ පොතු පාවිච්චි කරන්නාහ."

විශේෂයෙන් ශල්‍ය වෛද්‍යවරුන් හෝ විශේෂ වෛද්‍යවරුන් නොසිටියාට, මේ රටේ හැමෝම වෙද්දු කියලා තමයි එදා රොබට් නොක්ස් සඳහන් ඒ වාගේම අපේ දක්ෂකම් ගැනත් එතුමා මෙහෙම කියනවා:

"උගුල් ඇටවීමටත්, හන්දි වෙදකමටත් ඔවුන් තරම් දක්ෂයෝ මුළු ලෝකයේම නැත්තෝය. බතකුත්, මාළු දෙකකුත් උදවු වන්නට කලියෙන් ඔහුට පත්තුවක් ගල්වා බිඳුණු හන්දියක් ප්‍රකෘතිමත් කළ හැකිය."

එහෙම වෛද්‍ය ක්‍රම තිබුණු රටක් තමයි, මේ රට. ලෝකයේ ප්‍රවණතාව ගත්තත්, ලෝක සෞඛ්‍ය සංවිධානය මීට වසරකට කලින් සමීක්ෂණයක් කරලා මේ විකල්ප වෛද්‍ය ක්‍රම සඳහා ජනතාවගේ තිබෙන නැඹුරුව පිළිබඳ වාර්තාවක් එළිදැක්වුවා. ඒ අනුව ඔවුන් කියනවා, ප්‍රංශ ජනතාවගෙන් සියයට 75ක්, කැනඩාවේ සියයට 70ක්, ඕස්ට්‍රේලියාවේ සියයට 48ක්, ඇමෙරිකා එක්සත් ජනපදයේ සියයට 42ක් පමණ විකල්ප වෛද්‍ය ක්‍රම සඳහා යොමුවන, පෙළඹෙන ප්‍රවණතාවක් තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි කලින් කිව්වා වාගේම, මේ කවර වෛද්‍ය ක්‍රමයක් ගත්තත් ඒ සියල්ලේම අරමුණ බවට පත්වෙලා තිබෙන්නේ ජනතාව නීරෝගිමත් කිරීමයි. අපි විවිධ නම් දමා ගෙන හිටියාට, මේ බොහෝ වෛද්‍ය ක්‍රමවේදවල යම් යම් සමානකම් තිබෙනවා. ඒ නිසා ජනතාව සුවපත් කරන්න, ජනතාවගේ ජීවිත නහාසිටුවන්න තිබෙන මේ වෛද්‍ය ක්‍රම අනිවාර්යෙන්ම නියාමනය කළ යුතු වනවා. ඒ වෛද්‍ය සේවාවන්හි නිරත වන අය පුහුණු කරන්න, ඔවුන්ගේ පුහුණුවට අදාළ යම් යම් තත්ත්ව පිළිබඳව අගයන්න, ඒ ආයතන පිළිබඳව සොයා බලන්න, ඒ ඒ වෛද්‍ය ක්‍රමවල තිබෙන ඖෂධ, ප්‍රතිකාර ක්‍රම පිළිබඳව සොයා බලන්න යනාදී සියලු කාරණා සම්බන්ධයෙන් යම් නියාමන පද්ධතියක් අවශ්‍ය කරනවා. ඒ සඳහා තමයි මෙන්න මේ වෛද්‍ය සභාවක් වුවමනා කරන්නේ. ඒ නිසා අපි හිතනවා, මේ කවර හෝ වෛද්‍ය සභා ස්වාධීන, අපක්ෂපාතී වන තරමට, ඒ වෛද්‍ය සභා වෘත්තීයභාවයක් සහිත වන තරමට ඒවායෙන් ජනතාවට සෙත සැලසීම වඩාත් වැඩි වෙනවා කියලා. ඒ අනුව තමයි අද අපි බහුලව භාවිත කරන බටහිර වෛද්‍ය ක්‍රමය එංගලන්තයේ General Medical Council අපට ගෙනැත් දුන්නේ. ඔවුන්ගේ අරමුණු මොනවාද කියලා එංගලන්තයේ වෛද්‍ය සභාව බොහොම පැහැදිලිව කියා තිබෙනවා: "We are not to protect doctors. Their interests are protected by others. Our job is to protect the public." එංගලන්ත වෛද්‍ය සභාවේ අභිප්‍රාය වෛද්‍යවරුන් ආරක්ෂා කිරීම නොවෙයි. වෛද්‍යවරුන් ආරක්ෂා කරන්න ඕනෑ තරම් කට්ටිය ඉන්නවා. ඒ නිසා ඔවුන්ගේ අභිප්‍රාය තමයි ජනතාව ආරක්ෂා කිරීම. එතැනින් එහාට ගිහිල්ලා ඔවුන් කියනවා, "We are independent of Government and the medical profession and accountable to Parliament" කියලා. ඔවුන් වග කියන්නේ රජයට නොවෙයි, ඔවුන් වග කියන්නේ වෛද්‍ය වෘත්තිකයාට නොවෙයි, ඔවුන් වග කියන්නේ පාර්ලිමේන්තුවටයි. ඔවුන් කියනවා, "Our powers are given to us by Parliament through the Medical Act 1983." ඒ නිසා එංගලන්ත වෛද්‍ය සභාවේ තේමාව බවට පත්වෙලා තිබෙන්නේ, "ජනතාව ආරක්ෂා කිරීම සහ ජනතාව නියෝජනය කරන ජනතා පරමාධිපත්‍ය පිළිබිඹු කෙරෙන පාර්ලිමේන්තුවට වග කීම"යි.

අපි මෑත කාලයේදී එක් එක් අය අතේ තිබුණු බලය මේ පාර්ලිමේන්තුවට ප්‍රදානය කළා; පාර්ලිමේන්තුවට අරගත්තා. පොලිස්පතිවරයා අතේ තිබුණු බලයෙන් කොටසක් අරගෙන ස්වාධීන පොලිස් කොමිසමට භාර දුන්නා. ඒ වාගේම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත් කිරීමේ බලයෙන් කොටසක් අරගෙන අධිකරණ සේවා කොමිසමට දුන්නා. රාජ්‍ය සේවයේ නිලධාරීන් පත් කිරීමේ බලය අරගෙන රාජ්‍ය සේවා කොමිසමට දුන්නා. ඒ වාගේම අපි හිතනවා, මෙවැනි ආයතන ස්වාධීන කරන්නත්, අපක්ෂපාතී කරන්නත්, ඒවායේ වෘත්තීයම හැකියා වැඩි කරන්නත් -බලයක් සහිත ආයතන හැටියට- පාර්ලිමේන්තුව යටතට පත් විය යුතුයි කියලා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉදිරිපත් කර තිබෙන හෝමියෝපති පනත තුළ සඳහන් කර තිබෙන හෝමියෝපති වෛද්‍ය සභාවේ ස්වාධීනත්වය සහ අපක්ෂපාතීත්වය එතරම් දුරට ආරක්ෂා කරනවාද කියන එක පිළිබඳව සැකයක් තිබෙනවා. මා එහෙම කියන්නේ මේ නිසායි. 1970 අංක 7 දරන හෝමියෝපති පනත මඟින් හෝමියෝපති සභාවක් පිහිටෙව්වා. ඒ හෝමියෝපති සභාවට හෝමියෝපති වෛද්‍යවරුන්ගේ ඡන්දයෙන් පත්වන 7දෙනෙක් තේරී පත්වෙලා සිටියා. එය 2009 දක්වා ක්‍රියාත්මක වුණා. 2009දී එවකට සිටි ඇමතිවරයා වන තිස්ස කරල්ලියද්ද ඇමතිතුමා එය විසිරුවා හැරියා. එය විසිරුවා හැරියාට පස්සේ ඒ හෝමියෝපති සභාවේ සිටි වෛද්‍යවරු ශ්‍රේෂ්ඨාධිකරණය තුළ මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩුවක් ගොනු කළා. ඒ නඩුව අවුරුදු 7කට ආසන්න කාලයක් අහලා, 2016 මාර්තු මාසයේ 31වැනි දා තමයි තීන්දුව ලබා දුන්නේ. ඒ තීන්දුවෙන් කියන්නේ මොකක්ද? ඒ තීන්දුවෙන් මෙහෙම කියැවෙනවා.

"අමාත්‍යවරයා වැරදි ලෙස ක්‍රියාකර ඇති බවටත්, පෙත්සම්කරුවන්ට එරෙහිව නඟන ලද චෝදනා සම්බන්ධයෙන් පෙත්සම්කරුවන්ට තේරුම් කරදී නොතිබීම සහ පෙත්සම්කරුවන් සභාවෙන් ඉවත් කිරීමට පෙර ඔවුන්ට ඇහුම් කන් නොදීම අත්තනෝමතික සහ හිතුවක්කාර ක්‍රියාවක් වන බවත්, ඒ අනුව, 'ස්වාභාවික නීතියේ රීතියට සහ එක් එක් පාර්ශ්වයන්ට කන් දෙනු' යන රීතියට අනුව ක්‍රියාකර නොමැති බවටත් තීරණය කරමි."

අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරලා තිබෙනවා, එවකට හිටපු ඇමතිවරයා හෝමියෝපති සභාව විසුරුවා හැරීම අත්තනෝමතික බලතල පාවිච්චි කිරීමක් කියලා. ඔහු කිසිම ආකාරයකින් ඒ සභාවේ හිටපු අයට සවන් දීලා නැහැ. ඒ විතරක් නොවෙයි, එම තීන්දුවෙන් මෙහෙමත් කියනවා:

"ඒ අනුව සභාවට සාමාජිකයන් පත් කිරීමට අමාත්‍යවරයාටම අයිතියක් නොමැත."

ඇමතිවරයා කළේ ඒ සභාව විසුරුවා හැරලා, ඊට පස්සේ ඔහුට සිතැඟි පරිදි Interim Committee එකක් පත් කිරීමයි. ශ්‍රේෂ්ඨාධිකරණය පැහැදිලිව කියලා තිබෙනවා, අමාත්‍යවරයාට එහෙම ඒ සභාව තෝරන්න බලයක් නැහැ. ඒ වෛද්‍යවරුන්ට හැකියාවක් නැත්නම් පමණක් ඇමතිවරයාට මැදිහත් වෙන්න පුළුවන් කියලා. එම තීන්දුවේ මේ විධියට සඳහන් වෙනවා;

"පනතින් අමාත්‍යවරයාට ප්‍රදානය කර ඇති අමාත්‍යවරයාගේ බලතල අමාත්‍යවරයා විසින් ඉක්මවා කටයුතු කර ඇති බවට තීරණය කරමි. පනත පැනවීමට හේතුකාරක වූ ඉලක්ක කරා ළඟාවීම පිණිස පනතින් ලබාදී ඇති බලතල අමාත්‍යවරයා විසින් අනිසි ලෙස භාවිත කර ඇත. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 සහ 14(1)(උ) ව්‍යවස්ථාවලින් සහතික කරන ලද පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් 1වන සහ 2වන වගඋත්තරකරුවන් විසින් කඩකර ඇති බවට තීරණය කරමි."

එසේ තීරණය කරලා විතරක් නවතින්නේ නැහැ. මෙම අවස්ථානුගත කරුණු අනුව සභාවට අලුතින් පත් කළ සාමාජිකයන්ගේ පත්කිරීම් ශූන්‍ය කරලා බලරහිත කරලා තිබෙනවා. ඒ බව මේ විධියට සඳහන් වෙනවා:

"එම සාමාජිකයන් වර්තමානය වන විට සිය ධුර දැරීම නතර වී ඇති වුවද, ඔවුන්ගේ එම පත්කිරීම් එම පත්කිරීම් කළ දින සිට අවලංගු කිරීමට නියෝග කරමි. ඒ විතරක් නොවෙයි, මූලික අයිතිවාසිකම් කඩ කිරීම නිසා එක් එක් තැනැත්තාට - පෙත්සම්කරුවන්ට- රජය විසින් රුපියල් 250,000 මුදලක් බැගින් වන පරිදි වන්දි ගෙවිය යුතු බවට තව දුරටත් තීරණය කරමි."

අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය ඒ වෙලාවේ හිටපු අමාත්‍යවරයා විසින් කරන ලද අත්තනෝමතික බලය පාවිච්චි කිරීම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්ය කියලා බොහොම පැහැදිලි තීන්දුවක් දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, පෙත්සම්කරුවන්ට රුපියල් ලක්ෂ දෙකහමාර බැගින් ගෙවන්න රජයට නියම කර තිබෙනවා. අපි මේ තීන්දුව අනුව කටයුතු කරනවා නම්, මේ හෝමියෝපති සභාව මීට වඩා ප්‍රජාන්ත්‍රවාදී කළ යුතුව තිබුණා. හෝමියෝපති වෛද්‍යවරුන්ගේ සංයුතිය මීට වඩා නිර්මාණය කළ හැකිව තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක රාජිත සේනාරත්න ඇමතිතුමා සම්බන්ධයෙන් විතරක් වන ප්‍රශ්නයක් නොවෙයි. කවුරු අමාත්‍යවරයා වුණත්, ඒ හෝමියෝපති වෛද්‍ය සභාවේ වැඩි බලයක් ඇමතිවරයාට ලැබෙනවා නම්, එය මේ අයගේ ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කිරීමක්. ඒ විතරක් නොවෙයි. මෙම හෝමියෝපති වෛද්‍ය සභාව පත් කරනකොට නිල බලයෙන් හතර දෙනෙක් පත් වෙනවා. ඇමතිවරයා තුන් දෙනෙක් පත් කරනවා. හෝමියෝපති වෘත්තිකයන් අතරින් හතර දෙනෙකු පත්වෙනවා. ඔක්කොම එකොළොස් දෙනෙක් පත් වෙනවා.

මෙම පනත් කෙටුම්පතේ 4(1) උප වගන්තිය යටතේ සඳහන් වනවා, "අමාත්‍යවරයා හට නිල බලයෙන් පත් වූ සාමාජිකයන් හැර වෙනත් ඕනෑම සාමාජිකයකු හේතු දක්වා ධුරයෙන් ඉවත්කළ හැකි ය" කියලා. නිල බලයෙන් පත් වන සාමාජිකයන් හතර දෙනා හැර වෙනත් ඕනෑම කෙනෙකු හේතු දක්වා ඉවත් කරන්න පුළුවන් කියලා එහි සඳහන් වෙනවා. එක පැත්තකින් මෙහි සංයුතිය ගැනත්, අනෙක් පැත්තෙන් සාමාජිකයන් ඉවත් කිරීමට ඇති බලය ගැනත් කියැවෙනවා. ඒ විතරක් නොවෙයි, අපේ (පූජ්‍ය) ගරු අතුරලියේ රතන හාමුදුරුවන් වහන්සේ කිව්වා වාගේ මේ විධායක අධ්‍යක්ෂ වරයා හරහා ගොඩනැඟෙන බලය විසින් අමාත්‍යවරයාට අභිමතානුසාරී බලයක් පැවරෙනවා. මෙවැනි කටයුත්තකදී, විශේෂයෙන්ම වෛද්‍ය සභාවක් පවත්වාගෙන යාමේදී එය එතරම් සුදුසු කාරණාවක් නොවෙයි කියලායි අපි හිතන්නේ. මොකද, වෛද්‍ය සභාවක් ස්වාධීන වන තරමට එයින් ජනතාවට සැලසෙන සේවය වැඩියි.

දැන් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඉතිහාසයේ යම් යම් සම්ප්‍රදායයන් අනුව, ඉතිහාසයේ අප ගත කළ කාල පරිච්ඡේදයන් අනුව, යම් ස්වාධීනත්වයක් හිමිකර ගෙන තිබුණු වෛද්‍ය සභාවල වුවත් බලය සීමා කරන්න ඒ ඒ අවස්ථාවල බලයට පත් වන ආණ්ඩු කටයුතු කර තිබෙනවා. එයට හොඳම නිදසුනක් තමයි ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මුහුණ දෙන අර්බුදය. මමත්, ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාත් දෙදෙනාම ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සාමාජිකයන්. ඔබතුමාත් දන්නවා ඇති, 2011 වර්ෂයේදී එවකට සිටි උසස් අධ්‍යාපන ඇමතිවරයා එක්තරා වෙලාවක ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට තර්ජනය කළ බව. මාලබේ පිහිටි SAITM නීති විරෝධී පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට පිළිගැනීම් ලබා දීම සඳහා උත්සාහ කර, ඒ උත්සාහයට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව එරෙහි වෙනකොට ඔහු තර්ජනය කළා. එවකට හිටපු උසස් අධ්‍යාපන අමාත්‍යවරයා ප්‍රකාශ කළා, "රජයේ පිළිවෙතට පටහැනි තීරණයක් දුන්නොත් වෛද්‍ය සභාව විසුරුවා හරිනවා" කියලා. වෛද්‍ය සභාව තිබෙන්නේ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න නොවෙයි. එංගලන්තයේ වෛද්‍ය සභාව පැහැදිලිව කියන කාරණය ඒකයි. ඔවුන් පැහැදිලිව කියනවා, "We are not here to protect doctors. Our job is to protect the public" කියලා. මහජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන්, මහජනතාවගේ අභිලාෂයන් අනුවයි වෛද්‍ය සභාව කටයුතු කරන්නට ඕනෑ. ඒක සමහර වෙලාවට යම් යම් ආණ්ඩුවල ප්‍රතිපත්ති එක්ක ගැටෙන්න පුළුවන්. එහෙම ගැටෙනකොට තමයි අපට ජනතාව වෙනුවෙන් ඉදිරිපත් වෙන වෛද්‍ය සභාවක් වුවමනා කරන්නේ.

ඒ විතරක් නොවෙයි, ඉතිහාසයේ එක්තරා අවස්ථාවක වෛද්‍ය සභාවේ සාමාජිකයකු වූ වෛද්‍ය ලලන්ත රණසිංහගේ දෙහිවල ගෙදරට බෝම්බ ප්‍රහාරයක් පවා එල්ල වුණා. වෛද්‍ය සභාවක සාමාජිකයකුට එහෙම තර්ජනයක් එල්ල වුණු ඉතිහාසයේ පළමුවන අවස්ථාව එයයි. ඒ බලපෑම් නිසාම ඉතාම කෙටි කාලයක් ඇතුළතදී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සභාපති ධුරය දරපු මහාචාර්ය ලලිතා මෙන්ඩිස් හා වෛද්‍ය එච්.එච්.ආර්. සමරසිංහ යන අයට ඉල්ලා අස් වන්නට පවා සිද්ධ වුණා. එක්තරා අවස්ථාවක එම වෛද්‍ය සභාවේ රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් සිටි Dr. Nonisට මොරටුව කටුබැද්දේදී ප්‍රහාරයක් එල්ල වුණා. මේ වෛද්‍ය සභාවේ සාමාජිකයන් ඉලක්ක කර ගෙන මෙවැනි grenade ප්‍රහාරයන් එල්ල කිරීම, බිය ගන්වා සේවයෙන් ඉවත්වන්නට සැලැස්වීම් සිද්ධ වෙලා තිබෙනවා. එවැනි දේවල් සිද්ධ වෙලා තිබෙන්නේ ඇමතිවරයාට වුවමනා තාලයට පාලනය කර ගත හැකි ශ්‍රී ලංකා වෛද්‍ය සභාවක් නොතිබීම නිසායි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සභාපතිවරයා වන මහාචාර්ය කාලෝ පොන්සේකා මැතිතුමා දැනුත් කියන්නේ, ඔවුන්ගේ ස්වාධීනත්වයට එරෙහිව කොහෙන් හෝ යම් තීන්දුවක්, යම් නියෝගයක් ආවොත් ඉල්ලා අස් වනවා කියායි. ඒ නිසා දැන් අපට එක් පැත්තකින් සතුටු වන්න පුළුවන් විධියේ ස්වාධීනත්වයක් ආරක්ෂා කර ගත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ වෛද්‍ය සභාවේ සංයුතිය ගත්තොත්, එහි සාතිශය බහුතරය වෛද්‍යවරුන් බව ඔබතුමා දන්නවා. තමන්ගේ ක්ෂේත්‍රයේ වෘත්තිකයන් ඒ තුළ හිඳීම මඟින් ඒ ක්ෂේත්‍රයේ ගරුත්වය, ස්වාධීනත්වය ආරක්ෂා කරගන්න උදව්වක් ලැබෙනවා. ඊට සාපේක්ෂව මේ හෝමියෝපති සභාවේ සංයුතිය සමඟ සන්සන්දනය කළොත්, මේ නිසා ඇමතිවරයාට තිබෙන බලය ආණ්ඩුවට වුවමනා ආකාරයට පාවිච්චි කරන්න පුළුවන්කම ලැබෙනවා කියලා මා හිතනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් අමාත්‍යවරයා හැටියට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේත් එම බලයම මට තිබෙනවා නේ. එතැනත් පත්වීම් දෙන්න පුළුවන් නේ. එතැනත් රජයේ නිලධාරීන් ඉන්නවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ජනාධිපතිවරයා තමයි සභාපතිවරයා පත් කරන්නේත්. නමුත්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සිටින විසිපස් දෙනා අතර කොයි තරම් වෛද්‍යවරු ඉන්නවාද, වෘත්තියට සම්බන්ධ අය කොයි තරම් ඉන්නවාද කියා ඔබතුමාම දන්නවා. මෙතැනදී ඇමතිවරයා

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ඔබතුමා වන්න පුළුවන්; වෙනත් කෙනෙක් වන්නත් පුළුවන්. ඔබතුමාගේ කාලයේදී ඒ බලතල පාවිච්චි නොකළා කියමු කෝ. හැබැයි වෙන ඕනෑම කෙනෙක් ඔතැනට ආවාට පසුව, පනතින් ඔහොම බලයක් අත්පත් කරදීලා තිබෙනවා නම්; අප ඒකට එකඟ වෙලා තිබෙනවා නම්, ඒ ඇමතිවරයාට වුවමනා කාලයට අනාගතයේදී එය වැරැදි ආකාරයට පාවිච්චි කරන්න පුළුවන්. පොඩ්ඩක් හිතන්න, පසු ගිය කාලයේදී හෝමියෝපති සභාව තිබිලා, එය ඇමතිවරයාට ඕනෑ විධියට පාවිච්චි කරගන්න පුළුවන්කම තිබුණා නම්, සමහර විට ඒලියන්ත වයිට් රටේ නීත්‍යානුකූලව ලියා පදිංචි වෛද්‍යවරයෙක් වෙන්නත් ඉඩකඩ තිබුණා, ගරු ඇමතිතුමනි. එවැනි දේවල් වැළැක්විලා තිබෙනවා. ඒ වාගේම දැන් මේ ඇති වෙලා තිබෙන තත්ත්වය බලන්න. මේ ආණ්ඩුවේ යම් යම් ප්‍රතිපත්ති නිසා වෛද්‍ය අධ්‍යාපනය, පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇති කිරීම වැනි කාරණාවලදී අධික බලයක් තිබෙන සභාවක් මහින් ඇමතිවරයාට ඒවා හසුරුවා ගැනීමේ අවස්ථාවක් ලැබෙනවා.

අනෙක් කාරණය තමයි, මේ විධායක අධ්‍යක්ෂවරයාගේ ප්‍රශ්නය. මා දන්නා හැටියට හෝමියෝපති පොදු ලේඛනයේ දැනට ලියා පදිංචිව සිටිනවා, 163කට ආසන්න ප්‍රමාණයක්. [බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ලියා පදිංචි වෛද්‍යවරුන් සිටියේ 163යි. නමුත් පිටින් ගෙනැවිත් 212ක් ලියා පදිංචි කළා. ඒ වාගේ දේවල් කළා.

අනෙක් කාරණය, මහින්ද රාජපක්ෂ හෝමියෝපති විද්‍යාපීඨය කියලා එකක් හැදුවා. එහි දේශන දෙක තුනක් දීලා, සල්ලි ගත්තා. ඒ වාගේ දේවල් මෙතැනින් නවතිනවා. මොකද මෙහි කියා තිබෙනවා, සනාතන සභාවේ සහ UGC එකේ මහ පෙන්වීම යටතේ විතරයි මීට පසුව එවැනි පීඨයක් හදන්න පුළුවන් වන්නේ කියලා. මෙම පනත් කෙටුම්පතින් ඒ සියල්ලටම නීති - රීති ගෙනැවිත් තිබෙනවා. කවුද ඉන්නේ කියන එක නොවෙයි වැදගත් වන්නේ. ඒ සියලු දේවල් නියමානුකූල කර තිබෙනවා. කොයි විධියටද මෙවා හදන්න පුළුවන් කියා regulations දමලා තිබෙනවා. කාටවත් ඕනෑ විධියට ඒවා කරන්න බැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, මෙම පනත් කෙටුම්පතේ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් හෝ හෝමියෝපති ආයතනයක් පිහිටුවීම පිළිබඳව සඳහන් වන 22 (1) වගන්තියේ තිබෙනවා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ සභාවේ පූර්ව අනුමැතියක් නොමැතිව එහෙම ආයතනයක් පිහිටුවන්න බැහැය කියා. මා හිතන විධියට එය අතිශය වැදගත්. මොකද ඔබතුමාට මතක ඇති, එක වරක් -2014 ජනවාරි මාසයේ 31වැනි දා- අපේ විශ්වවිද්‍යාල පනතේ තිබුණු වගන්තියකුත් වෙනස් කරගත්තා, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වැනි ආයතනවලින් උපාධි ප්‍රදානය කරන ආයතන පිහිටුවීමේදී අනුකූලතා සහතිකයක් ලබාගැනීම අනිවාර්ය නොවන බවට. ඕනෑ නම් ලබාගන්න පුළුවන්. එදා එක වචනයයි වෙනස් කළේ; "shall" වෙනුවට "may" කළා. නමුත්, එයින් UGC එකට පමණක් බලයක් ලැබෙනවා, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් අහන්නේ නැතිව ඕනෑ නම් වෛද්‍ය උපාධි ප්‍රදානය කරන ආයතනයක් පටන් ගන්න. එවැනි වගන්ති යොදා ගැනීම හොඳයි. කොහොම වුණත් මා කියන්න අදහස් කළ කාරණය මෙයයි. ඔබතුමා කියන විධියට ලියා පදිංචි පොදු ලේඛනයේ ඉන්න 163යි, තාවකාලික ලේඛනයේ ඉන්න 212යි, ලියා පදිංචි නොමැති 17යි කියන මෙහි සිටින සියලු ප්‍රමාණය සලකා බැලීමේදී මේ ආයතනයට විධායක අධ්‍යක්ෂවරයකුගේ වුවමනාවක් තිබෙනවාද කියන ප්‍රශ්නය මතු වෙනවා. මා හිතන විධියට අපේ ගරු රතන හාමුදුරුවෝත් ඒ ප්‍රශ්නය මතු කළා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මගේ මුල්ම කථාවේදී කිව්වා මේක අනවශ්‍යයි කියා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි. බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

ඊළඟ කාරණය මේකයි. අපි මේ අතුරු පාලක කමිටුව අරගෙන බලමු. හෝමියෝපති සභාව පිහිටුවන තුරු එයට අවුරුදු දෙකක කාලයක් ලබා දී තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ අවුරුදු දෙකක කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. 2009දී හෝමියෝපති සභාව විසුරුවා හැරලා මේ අතුරු පාලක සභාව ක්‍රියාත්මක වුණා. මා දන්නා විධියට එම කාලය තුළ ලියා පදිංචි කළ හැත්තෑඅටක් විතර ප්‍රමාණයක් ඉන්නවා. ඒ සම්බන්ධයෙන් විවිධ චෝදනා තිබෙනවා. අපි හෝමියෝපති සභාවක් නීත්‍යානුකූලව පිහිටුවන්න යන වෙලාවේදි අතුරු පාලක සභාවට වසර දෙකක වාගේ කාලයක් තිබෙන්නේ ඇයි කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා යෝජනා කරන්නේ මේ කාලය පුළුවන් තරම් අඩු කරන්න කියලායි.

30.(2)(1) වගන්තියේ මෙහෙම සඳහන් වෙනවා:

"...1970 අංක 7 දරන හෝමියෝපති පනතේ 25 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලැබූ පොදු හෝමියෝපති ලේඛනය මෙම පනත යටතේ පවත්වා ගනු ලැබූ සහ තබා ගනු ලැබූ ලේඛනයන් සැලකිය යුතු අතර එකී ලේඛනය නම ඇතුළත් කර ඇති සෑම තැනැත්තෙකු ම මෙම පනත යටතේ ලියාපදිංචි වූවකු ලෙස සැලකිය යුතුය."

1970 අංක 7 දරන පනත ක්‍රියාත්මක වෙලා ඒ පොදු ලේඛනය නියාගෙන හිටපු අයට මේ සැලකිල්ල කළාට කමක් නැහැ. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දීලා තිබෙනවා. 2009 ඒක විසුරුවා හැරීමම වැරැදියි. ඒ නිසා ඒ අතුරු පාලක කමිටුවට පත් කරපු එකත් වැරැදියි. ඒ නිසා මම යෝජනා කරන්නේ, 1970 අංක 7 දරන පනතෙන් ලියාපදිංචි වෙච්ච -2009 ඔක්තෝබර් 20 දක්වා, ඒ කියන්නේ ඒ සභාව තිබෙන කල් ලියාපදිංචි වෙච්ච- අයට පමණක් මේ අවස්ථාව දෙන්න කියලායි. අතුරු පාලක මණ්ඩලය නීති විරෝධීයි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය සඳහන් කරලා තිබෙද්දී කිසිම යුක්ති සහගතභාවයක් නැහැ, ඒ අතර කාලයේදී ලියාපදිංචිය දීපු අය ලියාපදිංචි වූවන් සේ සලකන්න. කොහොම වුණත් මේකේ තිබෙන අඩු පාඩුකම් සංශෝධනය කරගන්න අපි උපරිම මහන්සි වෙමු.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හදාරන්න අපට ඉන්දියාවෙන් වසරකට ශිෂ්‍යත්ව 10ක් ලැබෙනවා කියලා තමයි ආරංචිය තිබෙන්නේ. නමුත් මේ ශිෂ්‍යත්ව 10 උපරිම ආකාරයට ප්‍රයෝජනයට ගන්නවාද කියන ප්‍රශ්නයත් තිබෙනවා. සමහර අවුරුදුවල පස් දෙනයි, හය දෙනයි මේ ශිෂ්‍යත්ව සඳහා අපෙන් ගිහිල්ලා තිබෙන්නේ. නමුත් අපි හෝමියෝපති සභාවක් නීත්‍යානුකූලව හදලා යම් විධිමත්භාවයකට පත් කරන්න යන වෙලාවේදී, ඉන්දියාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට එහෙම නැත්නම් පාකිස්තානයේ විශ්වවිද්‍යාලවලට අපේ රටේ දරුවන්ට යන්න

තිබෙන අවස්ථාව පුළුල් කිරීම සඳහා ඒ අවස්ථාව ටික දෙනෙකුට සීමා කරන්නේ නැතුව මේ රටේදී තෝරා ගැනීම සඳහා යම් ක්‍රමවේදයක් හදන්න කියලා මා ඉල්ලා සිටිනවා.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අදාළ ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා අපි නීති සකස් කර ගෙන යනවා. නිෂ්පාදනයට යම් ක්‍රියා මාර්ග ප්‍රමාණයක්, නිෂ්පාදන ක්‍රමවේදයක්, ඒ සඳහා ආයතන පද්ධතියක් රට තුළ ස්ථාපනය කරන්න කියලා ඉල්ලනවා. ඒ වාගේම අපි හැම දාම මේ කාරණය ගැන කථා කරනවා. අපට වෛද්‍ය ක්‍රම ගණනාවක් තිබෙනවා. ලෝකයේ ඉදිරියට යන කාලයේ හැටියට, තාක්ෂණය දියුණු වෙන කාලයේ හැටියට අපි හිතනවා, මේ සියලු වෛද්‍ය ක්‍රමවල සාරයන් උකහා ගන්නා ලද අපේම වෛද්‍ය ක්‍රමයක් හදා ගන්න පුළුවන් නම් හොඳයි කියලා. හැම රෝහලකම මේක කරන්න බැරි වෙයි. නමුත් යම් අත්හදා බැලීමක් හැටියට දියවැඩියාව, හෘදයාබාධ වැනි රෝගවලට, අස්ථි බිඳීම්, සර්ප විෂ ආදී රෝගවලට මේ වෛද්‍ය ක්‍රම කිහිපයම ඒකාබද්ධ කරන ලද යම් පර්යේෂණ මධ්‍යස්ථාන -ප්‍රතිකාර මධ්‍යස්ථාන- හදන්න අපට පුළුවන් නම් හොඳයි.

මම ඔබතුමාට මේ කාරණය යෝජනා කර සිටිනවා. මෙවැනි ක්‍රමයක් අනුගමනය කරන්න පුළුවන් හොඳම තැනක් තමයි නැඟඩ, කැන්දකඩුව රෝහල් පරිශ්‍රය. දැනුත් එතැන ආයුර්වේද හා බටහිර වෛද්‍ය ක්‍රමයන් දෙපැත්තේ ක්‍රියාත්මක වෙනවා. නමුත් මෙවැනි පර්යේෂණ මධ්‍යස්ථානයන් අපට රට පුරා ඇති කරන්න පුළුවන් නම්, සමහර රෝග සඳහා අපේම වෙච්ච ශ්‍රී ලාංකික වෛද්‍ය ක්‍රමයක් ගොඩ නහා ගන්න පුළුවන්. අපි දැන් යම් විධිමත් කිරීමක් මේ ආයතන තුළ කරගෙන යනවා. එය විධිමත් කිරීම තවදුරටත් ඉස්සරහට අරගෙන යන්න මේ කියන ලද සංශෝධනත් සලකා බලන්න කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.48]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්තුතිවන්ත වෙනවා, අවස්ථාව ලබා දීම ගැන. විශේෂයෙන්ම හෝමියෝපති වෛද්‍ය ක්‍රමය 18වැනි සියවසේ එනම්, වසර 200කට පමණ ඉහත ජර්මන් ජාතික බටහිර වෛද්‍යවරයෙකු වූ සැමුවෙල් හනිමාන් වෛද්‍යවරයා විසින් සොයා ගන්නා ලද වෛද්‍ය ශිල්පයක්. ඒ වාගේම මේක ශ්‍රී ලංකාවේ වඩා ප්‍රචලිතව නොපැවතුණත් ඉන්දියාව වාගේ රටවල ප්‍රචලිතව පවතිනවා. ඉන්දියාවේ හෝමියෝපති උපාධි දෙන විද්‍යාල 180ක් විතර තිබෙනවා. ඒ වාගේම පශ්චාත් උපාධි දෙන විද්‍යාල 32ක් විතර තිබෙනවා. පාකිස්ථානයේ තිබෙනවා, 72ක් විතර. ඒ වාගේම ජර්මනිය, ප්‍රංශය, ඇමෙරිකාව, නෝර්වේ රාජ්‍ය වැනි රටවල හෝමියෝපති වෛද්‍ය විද්‍යාල ක්‍රියාත්මක වෙන අතර මහා බ්‍රිතාන්‍යයේ ජන ගහනයෙන් සියයට 25ක් පමණ මෙම වෛද්‍ය ක්‍රමය භාවිතා කරනවා, මේ වෛද්‍ය ශිල්පය ප්‍රයෝජනයට ගන්නවා කියන එක වාර්තා වෙනවා. බොහෝ යුරෝපීය වෛද්‍යවරු බටහිර වෛද්‍ය උපාධිය ලබා ගත්තාට පස්සේ අතුරු වෛද්‍ය දැනුමක් වශයෙන් හෝමියෝපති විද්‍යාව පිළිබඳව විශේෂ පුහුණුවක් ලබා ගන්නවා. ඒ වාගේම ආසියානු රටවල මෙම ක්‍රමය උපාධියක් වශයෙන් භාවිත කරලා, ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා ක්‍රියාත්මක වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම ඉතා ප්‍රචලිතව නොතිබුණත්, ශ්‍රී ලංකාවේ අංග සම්පූර්ණ රජයේ හෝමියෝපති රෝහලක් වැලිසර පිහිටා තිබෙනවා. මෙම රෝහල ප්‍රචලිතව නැහැයි කියන්නේ, මෙම රෝහල මගේ දිස්ත්‍රික්කයේ පිහිටා තිබුණත්, ගම්පහ දිස්ත්‍රික්කය තුළ මෙවැනි රෝහලක් තිබෙනවාය කියලා මමත් නිවැරැදිව දැන ගෙන සිටියේ නැති නිසායි. මෙම රෝහල පී. දයාරත්න මැතිතුමා සෞඛ්‍ය, පෝෂණ සහ ශුභසාධන ඇමතිවරයා වශයෙන් සිටියදී 2003 දී ආරම්භ කරපු රෝහලක්. 2010 වර්ෂයේදී වැලිසර හෝමියෝපති රෝහලේ බාහිර රෝගීන් 28,000ක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා, 2011 වර්ෂයේදී බාහිර රෝගීන් 24,000ක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා, 2012 වර්ෂයේදීත් බාහිර රෝගීන් 24,000ක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා, 2013 වර්ෂයේදී බාහිර රෝගීන් 22,000ක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා, 2014 වර්ෂයේදීත් බාහිර රෝගීන් 22,000ක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා, 2015 වර්ෂයේදී බාහිර රෝගීන් 23,000ක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. වෛද්‍ය සභාවක් පිහිටුවා තිබෙනවා. ඒ වෛද්‍ය සභාව මහිනුත් දෙහිවල, මොනරාගල, පාලමුනෙයි, මාතලේ, තෝලංගමුව, කුරුණෑගල, පරකඩුව යන ස්ථාන 7හි හෝමියෝපති වෛද්‍ය සායන පවත්වා ගෙන යනවා. 2013 වර්ෂයේදී මේ වෛද්‍ය සායනවලින් රෝගීන් 56,289ක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා, 2014 වර්ෂයේදී මේ වෛද්‍ය සායනවලින් රෝගීන් 50,000ක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා, 2015 වර්ෂයේදී මේ වෛද්‍ය සායනවලින් රෝගීන් 57,000ක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා. මුළු ලංකාවේම බැලුවොත් වසරකට 75,000ක්, 80,000ක් වැනි ප්‍රමාණයක් මේ වෛද්‍ය ක්‍රමය මඟින් තමන්ගේ ශරීර සෞඛ්‍යය නිසි ලෙස සකස් කරගෙන තිබෙනවාය කියන එක විශේෂයෙන්ම කියන්න ඕනෑ.

වැලිසර හෝමියෝපති රෝහල පිළිබඳවත් ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. රෝගීන් 20දෙනකුට නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමේ හැකියාවක් වැලිසර රෝහලේ තිබෙනවා. එය ඉතාම අංග සම්පූර්ණ, නවීන ගොඩනැඟිලිවලින් සමන්විත හොඳ රෝහලක්. ප්‍රශ්නයකට තිබෙන්නේ ඒ රෝහලේ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නැති නිසා රෝහලේ කටයුතු සියයට 10ක්වත් ක්‍රියාත්මක වන්නේ නැති එකයි. වෛද්‍යවරුන් 6දෙනකු සිටිය යුතුව තිබුණත් ඒ රෝහලේ ඉන්නේ වෛද්‍යවරු දෙදෙනායි. ඒ වෛද්‍යවරුන් දෙදෙනාගෙන් එක් වෛද්‍යවරයෙක් දීර්ඝ කාලයකට නිවාඩු ගිහින් තිබෙනවා. අනික් වෛද්‍යවරයා සාමාන්‍ය නිවාඩුවක් ගත්තොත්, රෝහලේ වෛද්‍යවරයෙක් නැහැ. කාර්ය භාර වෛද්‍ය නිලධාරිනියට තමයි ඒ ඔක්කොම බර ඇදගෙන, බාහිර රෝගී අංශයේත්, නේවාසික අංශයේත් කටයුතු කරගෙන යන්න වෙලා තිබෙන්නේ. මේ කාරණය කෙරෙහි දැඩි සැලකිල්ලක් යොමු වන්න ඕනෑය කියලා අපි දකිනවා. ඒ වාගේම cadre එක අනුව වැලිසර රෝහලට -ලංකාවේ තිබෙන එකම හෝමියෝපති රෝහලට- හෙද නිලධාරීන් 4දෙනකු සිටිය යුතු වුණත්, රාජකාරී කරන්නවත් එකම හෙද නිලධාරියකුවත් නැති රෝහලක් වශයෙන් මේ රෝහල වාර්තාගත වන බව අපි දන්නවා. ඖෂධවේදීන් එක් කෙනකු සිටිය යුතු වුණත්, ඒ රෝහලේ ඖෂධවේදීන් එක් කෙනකුවත් නැහැ. මේ හේතු මත ඒ රෝහල ඉතා අමාරුවෙන් තමයි පවත්වාගෙන යන්නේ. ඒ නිසා විශේෂයෙන්ම මේ ගැන අවධානය යොමු කරන්න ඕනෑ.

ලංකාවේ තිබෙන එකම හෝමියෝපති රෝහල වන වැලිසර රෝහල පිළිබඳව අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා. ඒ රෝහලේ හෙද නිලධාරීන් නැතත්, කම්කරුවන් හා උපස්ථායකයින් 13දෙනෙක් ඉන්නවා. ඒ රෝහලේ ලෙඩුන් සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් කම්කරුවන් සහ උපස්ථායකයන් ඉන්නවා. වර්තමානයේ ඒ රෝහලේ සිටින කාර්ය භාර වෛද්‍ය නිලධාරිනිය විශේෂයෙන් මහන්සි වෙලා, ලොකු කැප වීමක් කරලා, තමන්ගේ ඇහේ හයියෙන් වාගේ තමයි මේ රෝහල පවත්වා ගෙන යන්නේ. මා හිතන හැටියට වර්තමානයේ සෞඛ්‍ය සේවාව ගැන විශේෂ අවධානයක් යොමු කරන වෙලාවක, ගරු ඇමතිතුමා ඒ ගැන කටයුතු කරන වෙලාවක මේ ගැන විශේෂ

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

අවධානයක් යොමු කළොත්, එය ඉතා වටිනවා. ගරු අමාත්‍යතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා, මේ වෛද්‍ය ක්‍රමය ගැන මේ තාක් දුරට අවධානය යොමු කිරීම පිළිබඳව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, මේ රටේ නිදහස් අධ්‍යාපනය තිබුණත් අපට නිදහස් අධ්‍යාපනයක් ලැබුණු යුගයක් නැහැයි කියලා. මොකද, පවුලක දෙමවුපියන් උපයා ගන්නා සල්ලිවලින් වැඩිම ප්‍රමාණයක් වියදම් කරන්නේ තමන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙනුයි. ඒ වාගේම නිදහස් සෞඛ්‍යයක් තිබෙනවාය කියා කිව්වත්, ජ්‍යෝෂ්ඨ පුරවැසියෙකු, වැඩිහිටියෙකු තමන්ට ලැබෙන මුදල්වලින් වැඩි ප්‍රමාණයක් වියදම් කරන්නේ තමන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා අදාළ බෙත් හේත් ලබාගැනීම සඳහායි.

ඉතින් ඒ යුගය නිමා කර කොහොමද, අපි නිදහස් අධ්‍යාපනය රැක දෙන්නේ; නිදහස් සෞඛ්‍ය රැක දෙන්නේ කියා තමයි වත්මන් රජය දැඩිව වෙහෙසෙන්නේ. අපි දන්නවා, නිදහස් සෞඛ්‍ය සේවයක් ලබා දීම සඳහා වර්තමානයේදී රජය ඉතා විශාල මුදල් ප්‍රමාණයක් ඖෂධවලට වියදම් කරන බව. නමුත් එයත් ප්‍රමාණවත් නැහැ. ඒ වාගේම පුද්ගලයන් දෙස බැලුවත්, ඔවුන් තමන්ට ලැබෙන ලැබීම්වලින් විශාල ප්‍රමාණයක් ඖෂධ මිලදී ගැනීම සඳහා වැය කරනවා. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ විශේෂත්වය තමයි එහි ඖෂධ මිල වැඩි නැහැ. බොහොම ලාභයට ඖෂධ මිලදී ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ නිසා අපේ සෞඛ්‍ය සේවය සඳහා යන වියදම අඩු කර ගන්නට එක පැත්තකින් එය උත්තරයක් වෙනවා. තව පැත්තකින් උත්තරයක් තිබෙනවා, මේක පහසුයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට වඩා හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ බෙත්හේත් ගැනීම පහසුයි. ඒ වාගේම තවත් විශේෂත්වයක් තිබෙනවා. මේ වෛද්‍ය ක්‍රමයේ අතුරු ආබාධ නැහැ කියා ලොකු පිළිගැනීමක් තිබෙනවා. මේ ක්‍රමය ශක්තිමත් කරන්න පුළුවන් නම්, එය අපේ කාලීන අවශ්‍යතාවක් කියලා මම හිතනවා.

අවුරුදු 46කට පසුව හෝමියෝපති පනතට සංශෝධන ගෙන ඒමට කටයුතු කිරීම ගැන විශේෂයෙන්ම ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. අපට නිදහස ලැබෙන්න ඉස්සෙල්ලා සිටම හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මේ රටේ ක්‍රියාත්මක වුණා. අපේ රට යටත්විජිතයක්ව තිබූ යුගයේත් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ක්‍රියාත්මක වුණා. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය රජය පිළිගන්නා වෛද්‍ය ක්‍රමයක් විධියට සැකසීමට ගරු ඩඩ්ලි සේනානායක අග්‍රාමාත්‍යවරයාගේ රජය විසින් 1970 පෙබරවාරි 12 වෙනිදා එකී පනත පාර්ලිමේන්තුවේ සම්මත කර ගත්තා. නමුත් ඒ පනත ක්‍රියාත්මක කරන්න ලැබුණේ නැහැ.

1970දී පනත් කෙටුම්පත සම්මත කර ගත්තත්, එය ක්‍රියාත්මක වුණේ ගරු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා බලයට පත්වීමෙන් පසු 1979දීයි. ඒ වන තුරු පනත ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා. හේතුව, ඩඩ්ලි සේනානායක රජය 1970 විසුරුවා හැරීමයි. ඒ නිසා මේ පනත ක්‍රියාත්මක කර ගැනීමට ඒ කාලයේ හැකියාවක් තිබුණේ නැහැ. බොහෝ අඩු පාඩු තිබුණත්, 1970දී හෝමියෝපති වෛද්‍ය ක්‍රමය රජයේ පිළිගැනීමට ලක් වුණා. නමුත් ප්‍රශ්නය වුණේ, ඒ පනතේ ගොඩක් අඩු පාඩු තිබීමයි. ඒ නිසා තමයි ගරු අමාත්‍යතුමා මේ පිළිබඳ දැඩි ලෙස අධ්‍යයනය කරලා, අවුරුදු 46කට පසු අලුත් පනත් කෙටුම්පතක් වෛද්‍ය ක්‍රමය සම්බන්ධයෙන් ගෙනෙනු ලබන්නේ. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය තුළ වෛද්‍යවරයාගේ සහායකයාටත් ඒ කියන්නේ වෛද්‍යවරයා ළඟ උපස්ථාන කිරීමට සිටි කෙනාටත් වෛද්‍යවරයෙකු වෙන්න සමහර වෙලාවට පුළුවන්කම තිබුණා. ඒ සඳහා විශ්වවිද්‍යාලයකට ගිහිල්ලා නැත්නම් ක්‍රමවත් අධ්‍යාපනයක් ලබා එන්න ඕනෑ වුණේ නැහැ. අන්න ඒ වාගේ අඩු පාඩු නිසා මේ වෛද්‍ය ක්‍රමය කඩා වැටුණු බවට අපේ දැඩි විශ්වාසයක් තිබෙනවා. මොකද, හෝමියෝපති වෛද්‍යවරයෙකු ළඟ සිටි ඉගෙන නොගත් ගෝලයාටත් ඒ වෛද්‍යවරයා සමඟ ටික දවසක් වැඩ කරලා, වෛද්‍යවරයෙකු වෙන්න පුළුවන්කම තිබුණා. ඒ වාගේ ක්‍රමවේදයක් තමයි තිබුණේ. ඒ හින්දාම ජනතාව අතර, මේ වෛද්‍ය ක්‍රමය නරකයි කියන පැත්තකට යොමු වෙලා තිබුණා. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය කිව්වාම, ඒක ගබසා කිරීම සඳහා යොදා ගන්නා වෛද්‍ය ක්‍රමයක් වාගේ අදහසක් ආවා. ඒ, මේ සම්බන්ධව ක්‍රමානුකූලව කටයුතු නොකිරීම නිසයි.

විශේෂයෙන්ම අද මේ පනත් කෙටුම්පත මඟින් සුවිශේෂ අවස්ථා උදා කරලා තිබෙනවා. එකක් තමයි ගරු අමාත්‍යතුමාගේ මැදිහත්වීමක් වෛද්‍ය සභාව වෙත තිබීම නිසා එයට වටිනාකමක් ලැබීම මැදිහත්කමක් නැතිවීම හොඳයි කියා ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා මීට පෙර ප්‍රකාශ කළා. නමුත් හෝමියෝපති වෛද්‍ය සභාව ගොඩනඟන්න තිබෙන දෙයක්. බටහිර වෛද්‍ය විද්‍යාවේ තිබෙන වෛද්‍ය සභාව ගොඩනැගිච්ච දෙයක්. ඒක ආරක්ෂා කරන්නයි -maintain කරන්නයි- තිබෙන්නේ. නමුත් හෝමියෝපති වෛද්‍ය සභාව ගොඩනැඟිය යුතු දෙයක් නිසා, එය අමාත්‍යතුමාගේ මැදිහත්වීම තුළ පිහිටුවන එක හොඳයි. අමාත්‍යතුමාට එහිදී කරන්න ගොඩක් දේවල් තිබෙනවා. වෛද්‍ය සභාව ගොඩ නැඟීමට අතපෙවීමක් කරන්න තිබෙනවා. මොකද, මේ වෛද්‍ය ක්‍රමය ගොඩනඟන්න අවශ්‍ය නිසා. කොහොම වුණත්, අපි මොනවා කිව්වත්, හෝමියෝපති රෝහල වෙනුවෙන්, හෝමියෝපති වෛද්‍ය සභාව වෙනුවෙන් ඒ වාගේම හෝමියෝපති ක්‍රමය සංවර්ධනය කිරීම වෙනුවෙන් 2014දී නිටපු සෞඛ්‍ය අමාත්‍යතුමා -වර්තමාන ජනාධිපතිතුමා- රුපියල් මිලියන 32ක් වියදම් කරලා තිබෙනවා. ඒ වාගේම 2015දී හෝමියෝපති වෛද්‍ය විද්‍යාව දියුණු කිරීමේ කටයුතු සඳහා වර්තමාන සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේ මැදිහත්වීම මත රුපියල් මිලියන 65ක් වියදම් කරලා තිබෙනවා. ඒ වාගේම 2016දී තවත් රුපියල් මිලියන 65ක් වියදම් කරනවා කියා ඇස්තමේන්තු ගත කර තිබෙනවා. අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආශීර්වාදය තුළ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා අවුරුදු 46කට පසුව, නිදා සිටි, පැත්තකට වැටිලා වාගේ තිබුණු සහ විනාශ වෙමින් තිබූ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශක්තිමත් කිරීමට ගත් පියවර ගැන විශේෂයෙන්ම අපි ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ පවතින ක්‍රමයට, එහෙම නැත්නම් නීරෝගීමත් ජනතාවක් නිර්මාණය කරන්න යන උත්සාහයට ඖෂධ මිල හරහට වැටිලා තිබෙනවා. ඒ වාගේම අතුරු ආබාධ ඇති වෙලා තිබෙනවා. එක ලෙඩක් හොඳ කරන්නට බෙහෙත් දෙන විට තවත් ලෙඩක් හැදෙනවා; අපි බලාපොරොත්තු නොවුණු ලෙඩක් හැදෙනවා. ඒ වාගේ අතුරු ආබාධ තිබෙනවා. සමහර ලෙඩවලට බෙහෙත් කරන්නට අමාරුයි. මේ සියල්ලටම පිළියමක් වශයෙන් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අපට හඳුන්වා දෙන්නට පුළුවන්. මොකද, ඉතාමත්ම ලාභදායී බෙහෙත් සොයා ගන්නට පුළුවන් වෛද්‍ය ක්‍රමයක්; ලෙහෙසියෙන් බෙහෙත් සොයා ගන්න පුළුවන් වෛද්‍ය ක්‍රමයක්. දැනට ශ්‍රී ලංකාවේ හෝමියෝපති වෛද්‍යවරුන් 270ක් පමණ සිටිනවා. නමුත් වර්තමානය වන විට ලියා පදිංචි වෙලා සිටින්නේ වෛද්‍යවරුන් 150ක් වාගේ සංඛ්‍යාවක් පමණයි. මෙයිනුත් 50 දෙනෙකු පමණ මේ වන විට මිය ගොස් තිබෙනවා. එවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ.

මෙම පනත් කෙටුම්පත මඟින් වෛද්‍යවරුන් බිහිවීම ක්‍රමවත් කරලා තිබෙනවා. වෛද්‍යවරයා කියන්නේ සුවිශේෂී පුද්ගලයෙක්, ජනතාවගේ ජීවිතත් සමඟ බැඳුණු පුද්ගලයෙක්. වෛද්‍යවරයා

අපේ ජීවිතය ගැන ලොකු වගකීමක් ගන්නවා. අන්න ඒ වගකීම තේරුම් අරගෙන මේ පනත් කෙටුම්පත නිර්මාණය කරලා තිබෙනවා. ආවාට ගියාට වෛද්‍යවරුන් වෙන්නට බැහැ. ඒ සඳහා පිළිගත් අධ්‍යාපන ආයතනයකින් අධ්‍යාපනය ලබාගෙන එන්නට ඕනෑ. ජනතාවගේ ජීවිතය සැහැල්ලුවට ගන්නට බැහැ. ඒ වාගේම ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමා පනත් කෙටුම්පත හඳුන විට තවත් පැත්තක් ගැන හිතලා තිබෙනවා. මෙතෙක් කල් වෛද්‍ය වෘත්තියේ නියැලී සිටි සුදුසුකම් නැති වෛද්‍යවරුන්ටත් අවස්ථාවක් දෙනවා විභාගයකට පෙනී ඉඳලා හෝ පුළුවන් නම් මේ ක්‍රමවේදයට ඇතුළත් වෙන්න කියලා. ඒ අයත් නොසලකා හැරලා නැහැ. නමුත් ඉදිරියේදී ඒ ආකාරයේ වෛද්‍යවරුන් බිහිවීම නවත්වලා තිබෙනවා. මම හිතනවා ඒක හොඳ ක්‍රමයක් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ක්‍රමවේදය එන විට අපි ලොකු ගැටලුවකට මුහුණ දෙනවා. අපේ රටේ හෝමියෝපති වෛද්‍යවරුන් නිර්මාණය කරන ආයතනයක් නැහැ. ඉස්සර වාගේ වෛද්‍යවරයා පස්සෙන් ගිය කෙනාට මේ පනත් කෙටුම්පත යටතේ වෛද්‍යවරයෙක් වෙන්නට බැහැ. ඒ සඳහා අධ්‍යාපන ක්‍රමවේදයක් තිබෙනවා. එහෙම නම් ඒ අධ්‍යාපනය ලබා දෙන ආයතන අපේ රටේ හදන්නට ඕනෑ. කඩිනමින් අපට ඒ කටයුතු කරන්නට සිදු වෙලා තිබෙනවා. කොහොමද අපි වෛද්‍යවරුන් බිහි කරන ක්‍රමවේදයක් නිර්මාණය කරන්නේ? දැන් අපට ඉන්දියාවෙන් සහ පාකිස්තානයෙන් අවුරුද්දකට වතාවක් දස දෙනෙකුට පමණ රාජ්‍ය මට්ටමින් ශිෂ්‍යත්වයක් එනවා. වෛද්‍යවරුන් දස දෙනෙකු පමණ පුහුණු කිරීම සඳහා, අවශ්‍ය සහතික ලබා දීම සඳහා, අවශ්‍ය අධ්‍යාපනය ලබාදීම සඳහා අවස්ථාවක් දීලා තිබෙනවා. නමුත් ඊට අමතරව අපට ක්‍රමවේදයක් නැහැ. පාකිස්තානයේ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් තිබෙනවා. ඉන්දියාවේ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් තිබෙනවා. මහා බ්‍රිතාන්‍යයේ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් තිබෙනවා. ප්‍රංශයේ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් තිබෙනවා. ජර්මනියේ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් තිබෙනවා. මේ රටවලට අපේ අය ගිහින් සල්ලි ගෙවලා ඉගෙන ගෙන එන්න ඕනෑ ක්‍රමවේදයක් තමයි නිර්මාණය වෙන්නේ. අපේ ගරු අමාත්‍යතුමා කඩිනමින් හොඳ පියවරක් ගත්තා. ඒ පියවරෙන් අපිට බාධාවක් වෙන්නට බැහැ. ඒක රුකුලක් වෙන්නට ඕනෑ. ඒ නිසා කඩිනමින් හෝමියෝපති වෛද්‍යවරු බිහි කිරීමේ අධ්‍යාපන ආයතන ශ්‍රී ලංකාව තුළ බිහි කරන්නට අපට සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්න විශේෂ කාරණයක් තිබෙනවා. මේ පනත් කෙටුම්පතේ පොඩි ප්‍රශ්නයක් තිබෙනවා කියලා මතයක් නිර්මාණය වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා ඒක නිවැරදි කරනවා නම් හොඳයි.

1970 අංක 7 දරන පනතේ -පසුගිය පනතේ- 20වෙනි වගන්තියෙන් වෛද්‍ය සභාවේ අවශ්‍යතාව මත අද වාගේම ලේඛකාධිකාරි, සායන වෛද්‍යවරුන්, කාර්ය මණ්ඩල පත් කර ගැනීම සහ වැටුප් ගෙවීම ආදී දේවල් සම්බන්ධ බලතල වෛද්‍ය සභාවට පවරා තිබුණා. ඒවා කරන්නට බැහැ. මොකද, ඒ මුදල් වෛද්‍ය සභාවට ලැබෙන්නේ නැහැ. බටහිර වෛද්‍ය විද්‍යාවට අයත් වෛද්‍ය සභාව සායන පවත්වන්නේ නැහැ. ඒවා රජයෙන් කරනවා. ඒ අයට තිබෙන්නේ බලාගන්න එක විතරයි. නමුත් හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ සායන පැවැත්වීම, පඩි නඩි ගෙවීම ආදී සියල්ලම වෛද්‍ය සභාවට පවරා තිබෙනවා. වෛද්‍ය සභාවට වෛද්‍ය සායන පැවැත්වීම වාගේ දේවල් කරන්නට බැරි නිසා, කාර්යාල නඩත්තු කරන්නට බැරි නිසා විශේෂයෙන්ම ඒ අය පසුගිය කාලයේ ඉල්ලීමක් කරලා, 2011 වර්ෂයේදී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 විධිවිධාන අනුව තනතුරු නාමයන් සහ වැටුප් ක්‍රමයක් සහිතව හෝමියෝපති වෛද්‍ය සභාව සඳහා 19 දෙනෙකුගෙන් යුත් ස්ථිර කාර්ය මණ්ඩලයක් අනුමත කළා. දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ, හෝමියෝපති වෛද්‍ය සභාවේ, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාව ඇතිව මෙම කාර්ය මණ්ඩලය අනුමත කර ඇති බව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් එවකට දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී තිබෙනවා. ඒ වාගේම 2012දී හෝමියෝපති වෛද්‍ය සභාවේ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කරමින් මේ අය බඳවා ගෙනත් තිබෙනවා.

2016 තවත් සායන 7ක් -දැනට සායන 7ක් තිබෙනවා.- පවත්වන්න කියලා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් 29දෙනකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබෙනවා. දැන් මෙතැන ගැටලුවක් තිබෙනවා. මොකද, මේ පනත් කෙටුම්පතින් කියනවා, කාර්ය මණ්ඩලය සඳහා වැටුප්, වේතන හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම වෛද්‍ය සභාවේ වගකීමක් කියලා. එතකොට මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. මෙහි සඳහන් වන විධියට මේ ගොල්ලන්ගේ වැටුප් ගැන තීරණය කරන්නේ වෛද්‍ය සභාව ද, නැත්නම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ද? ඒ ගැන ගැටලුවක් තිබෙනවා. මොකද, වෛද්‍ය සභාව කිව්වොත්, "වැටුප 1,000යි" කියලා, එහෙම නැත්නම් "අද වැටුප දෙන්න බැහැ, හරි යන්නේ නැහැ" කියලා කිව්වොත් ඒ පුද්ගලයාගේ අයිතිවාසිකම් නැති වෙලා යනවා ද? එතකොට වෛද්‍ය සභාවට පුළුවන් ද, වැටුප් තීරණය කරන්න කියන එක ගැන ප්‍රශ්නයක් ඇති වෙනවා. මොකද, මේ පනත් කෙටුම්පතේ 17වැනි වගන්තියේ (1) (ii) යටතේ පැහැදිලිව කියනවා,-[බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඒකට තමයි සංශෝධනය ගෙනෙන්නේ. වැටුප් පිළිබඳ තීරණ ගැනීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ලබා දෙන්න කියලයි-

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

තව ප්‍රශ්නයක් තිබෙනවා. එනම්, මේ පනත් කෙටුම්පතේ 18වැනි වගන්තිය යටතේ මෙසේ සඳහන් වීමයි:

"(1) සභාව විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව -

(අ) සභාවේ ලේකම්වරයා ලෙස ද කටයුතු කරනු ලැබිය යුතු රෙජිස්ට්‍රාර්වරයකු;

(ආ) මේ පනත යටතේ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් සහ සේවා නියුක්තිකයන්,

පත් කරනු ලැබිය යුතුය."

ගරු ඇමතිතුමනි, වර්තමානයේ ඉන්නවා, කලින් පත් කරපු 19දෙනකු ස්ථිර සේවකයන් වශයෙන්. එතකොට ඇමතිවරයා වෙනස් වෙන කොට, අවුරුදු දෙකෙන් දෙකට සභාව වෙනස් වෙන කොට මේ අයත් අලුතින් පත් කළ යුතු ද? ඒ ගොල්ලන්ගේ කාලය කොච්චර ද? දැන් ඉන්න අයට මොකද වෙන්නේ? සේවය ස්ථිරයි කියලා හිතා ගෙන 19දෙනකුගෙන් යුත් සේවක කණ්ඩායමක් වර්තමානයේ වැඩ කරනවා. දැන් මේ පනත් කෙටුම්පතින් කියනවා, "සභාව විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, සභාවේ ලේකම්වරයා ලෙස ද කටයුතු කරනු

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ලැබිය යුතු රෙජිස්ට්‍රාර්වරයකු, මේ පනත යටතේ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් සහ සේවා නියුක්තිකයන්, පත් කරනු ලැබිය යුතුය" කියලා. එතකොට වර්තමානයේ ඉන්න අයගේ සේවය අනතුරේදී කියලා ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඒ සේවකයින් එහෙමම ඉන්නවා. සේවකයන්ට ප්‍රශ්නයක් නැහැ. නමුත්, පුද්ගලයකු ස්ථිර ලෙස රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් තියන්න බැහැ. මොකද, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේත් අවුරුදු පහකට වතාවක් රෙජිස්ට්‍රාර්වරයකු පත් වෙනවා. සේවකයින්ගේ ප්‍රශ්නයක් නැහැ.[බාධා කිරීමක්] ඒ අය පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ඒ අය සාමාන්‍ය අයනේ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)

ගරු ඇමතිතුමනි, එතකොට කලින් කලට එන අමාත්‍යවරයා හා පත්වන වෛද්‍ය සභාව අනුව වෛද්‍යවරු වෙනස් කරාවි ද?

ස

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

එහෙම වෙනස් කරන්න බැහැ. ඒ අයට දිගටම කටයුතු කරගෙන යන්න පුළුවන්. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේත් රෙජිස්ට්‍රාර්වරයා අවුරුදු පහකට වතාවක් පත් වෙනවා. අනෙක් නිලධාරීන් ටික ඒ විධියටම කටයුතු කරගෙන යනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)

ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ දොස්තරවරු සායන පවත්වන්නේ නැහැ නේ. නමුත්, මේකේ එහෙම කාර්ය මණ්ඩලයක් ඉන්නවා. දැන් පවත්වන සායන හත handle කරන්නේත් මේ වෛද්‍ය සභාවෙනුයි. එතකොට ඒ සායන හත පවත්වන වෛද්‍යවරුන්ට සහ කාර්ය මණ්ඩලයටත් තමන්ගේ සේවාව ස්ථිර නැහැයි කියලා හිතාගෙන වැඩ කරන්න සිද්ධ වෙනවා. එතකොට මේ ක්ෂේත්‍රය තුළ කඩා වැටීමක් සිද්ධ වෙනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒක ගැන මා බලලා කියන්නම්.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)

ඔබතුමා කියන විධියට රෙජිස්ට්‍රාර්වරයා වෙනස් වුණත් ප්‍රශ්නයක් නැහැ. සභාවට පත් කරන වෛද්‍යවරුනුත් අවුරුදු දෙකෙන් දෙකට වෙනස් වෙනවා. ඒකේ ප්‍රශ්නයකුත් නැහැ. නමුත්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට වඩා මේකේ වෙනසක් තිබෙනවා. ගම්වල සායන 7ක් පවත්වනවා. ඒ වෛද්‍යවරු සහ ඒ කාර්ය මණ්ඩලයේ හෙදියන් මේ වෛද්‍ය සභාව යටතේයි වැඩ කරන්නේ. දැන් තව 29දෙනෙක් අලුතින් අනුමත කර තිබෙනවා, තවත් සායන 7ක් පවත්වන්න. ඒ අයට ස්ථිරත්වයක් නැහැ. අමාත්‍යවරයා වෙනස් වෙන කොට වෛද්‍යවරයා වෙනස් වේවි; හෙද නිලධාරිනුත් වෙනස් වේවි. අන්න එහෙම ප්‍රශ්නයක් පැන නඟිනවා. ගරු ඇමතිතුමනි, ඒ සඳහා සංශෝධනයක් ගෙනෙන්න. "ඒ කාර්ය මණ්ඩලය ස්ථිර කාර්ය මණ්ඩලයක් වන්නේය" කියලා සංශෝධනය කරන්නට පුළුවන් නම් මා හිතනවා, ඒ ප්‍රශ්නය විසඳෙනවා කියලා. ගරු ඇමතිතුමනි, පිළිතුරු දීම සහ නිවැරදි කිරීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමා. You have twenty minutes. Before he starts, will an Hon. Member propose the Hon. Lucky Jayawardana to the Chair?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
I propose that the Hon. Lucky Jayawardana do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

[ப.ப. 4.08]

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(මාණ්පුමිකු சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஹோமியோபதி மருத்துவப் பேரவையைத் தாபித்தல் தொடர்பான ஒரு சட்டமூலத்தை இங்கே சமர்ப்பித்த கௌரவ அமைச்சர் அவர்களுக்கு என்னுடைய பாராட்டுக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த ஹோமியோபதி வைத்திய முறையானது 19ஆம் நூற்றாண்டில் பிரபல்யம் பெற்று தொடர்ந்து கடைப்பிடிக்கப்பட்டு வந்திருக்கிறது. டாக்டர் சாமுவேல் ஹானிமன் 1800ஆம் ஆண்டு இவ்வைத்திய முறையினை உலகிற்கு அறிமுகப்படுத்தினார். இந்த வைத்திய முறையானது பாதுகாப்பானதெனவும் பயனுறுதி வாய்ந்த முறைகளைப் பயன்படுத்தி நோய்களைக் குணப்படுத்த ஏற்றதெனவும் நாங்கள் பார்க்கின்றோம்.

ஆனால், வடக்கு, கிழக்கைப் பொறுத்தவரையில் அங்கே இந்த ஹோமியோபதி வைத்திய முறையோ, இதற்கான வைத்தியசாலைகளோ அல்லது அதற்கான வைத்தியர்களோ இல்லாத ஒரு நிலைமைதான் இருக்கின்றது. ஆகவே, இந்தச் சட்டமூலத்தினூடாக எதிர்காலத்திலே ஹோமியோபதி வைத்திய முறையை, அதாவது எந்தவித பக்கவிளைவுகளும் இல்லாத இந்த வைத்திய முறையை வடக்கிலும் கிழக்கிலும் ஏற்படுத்திக் கொடுப்பதோடு இதற்கான பயிற்சிகளும் வழங்கப்பட வேண்டும். குறிப்பாக வடக்கு, கிழக்கிலே பாரம்பரிய வைத்தியர்கள் நிறையப்பேர் இருக்கின்றார்கள். அவர்களுக்கு இந்தப் பயிற்சிகளை வழங்கி இந்தத் துறையில் ஈடுபடுத்தவேண்டும்.

அத்தோடு இன்று அங்கு இயங்குகின்ற ஆயுர்வேத வைத்தியசாலைகளில் சில பற்றாக்குறைகள் மற்றும் பல தேவைகள் இருக்கின்றன. குறிப்பாக இந்த வைத்திய சாலைகளுக்குக் கடந்த காலங்களிலே ஒதுக்கப்பட்ட நிதி மிகமிகக் குறைவாகவே இருக்கின்றது. வட மாகாணத்திலே பம்பைமடு ஆயுர்வேத வைத்தியசாலை மிகச் சிறப்பான சேவையை ஆற்றிக்கொண்டிருக்கின்றது. ஆனாலும், அங்கிருக்கின்ற சில குறைபாடுகளை சுகாதார அமைச்சர் அவர்களின் கவனத்திற்குக் கொண்டுவரும்படி அங்கு சேவையாற்றுகின்ற வைத்தியர்கள் என்னிடம் கோரியிருக்கின்றார்கள். குறிப்பாக, அவ்வைத்திய சாலைக்கு 24 மணிநேரம் இயங்கக்கூடிய generator ஒன்றும் அம்புலன்ஸ் வாகனமொன்றும் தேவை. அத்துடன், மசாஜ் சிகிச்சைக்கான கட்டிட வசதிகள், மூலிகைத் தோட்ட விரிவாக்கம் போன்றவை மேற்கொள்ளப்படவேண்டியுள்ளன. அவ்வாறே வடக்கிலும் கிழக்கிலும் உள்ள ஏனைய ஆயுர்வேத வைத்திய சாலைகளிலும் இப்படியான தேவைகளைப் பூர்த்தி செய்துதரும்படி கேட்டிருக்கிறார்கள்.

மேலும், மட்டக்களப்பு மாவட்ட உறுப்பினர் கௌரவ சீனித்தம்பி யோகேஸ்வரன் அவர்கள், சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர் அவர்களின் கவனத்திற்குக் கொண்டுவரும்படி ஒரு விடயத்தைக் குறிப்பிட்டிருக்கின்றார். அதாவது, மட்டக்களப்பில் மத்திய அரசின் கீழுள்ள போதனா வைத்தியசாலையில் சிற்றூழியர் நியமனங்களுக்கு அம் மாவட்டத்தைச் சேர்ந்தவர்களை நியமிக்காது வெளிமாவட்டத்தைச் சேர்ந்தவர்கள் நியமிக்கப்பட்டுள்ளார்கள். குறிப்பாக, பொலன்னறுவை மாவட்டத்திலிருந்து பலர் நியமிக்கப் பட்டுள்ளார்கள். மட்டக்களப்பு மாவட்டத்தில் ஆயிரக்கணக்கான இளைஞர்கள் வேலைவாய்ப்பின்றி இருக்கும்போது வெளி மாவட்டத்தைச் சேர்ந்தவர்களை அரசாங்கம் ஏன், நியமிக்க வேண்டும்? இங்கு தமிழ் பேசும் இனத்தவர்கள் இருப்பதால் இப்பாகுபாடா? என்ற கேள்வி எழுகின்றது. தற்போது கடமையாற்றும் வெளிமாவட்டத்தைச் சேர்ந்தவர்கள் பிற்பகல் 2.00 மணியுடன் வேலையை முடித்துக்கொண்டு வெளியேறுவதால் நோயாளர்கள் பாதிக்கப்படுகிறார்கள். எனவே, மட்டக்களப்பு மாவட்டத்தில் தொழிலின்றிக் கஷ்டப்படும் இளைஞர், யுவதிகளை அங்கு சிற்றூழியர் உட்பட்ட ஏனைய பதவிகளுக்கு நியமிக்க முன்வரவேண்டுமென்று கௌரவ சீனித்தம்பி யோகேஸ்வரன் அவர்கள் வேண்டுகோள் விடுத்திருக்கின்றார். ஆகவே, அவருடைய இந்த வேண்டுகோளை அமைச்சர் அவர்கள் கவனத்தில் எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

Hon. Member, you said that we have appointed people outside the District to the Batticaloa Hospital. We have not employed anybody. I do not know whether the previous Ministers have appointed. But, we have not appointed anybody. I do not know whether your hospital directors have taken them as temporary employees.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ அமைச்சர் அவர்களே, புதிதாக 50க்கு மேற்பட்ட இளைஞர்கள் அப்படி நியமிக்கப்பட்டிருப்பதாகவும் அதனை உங்களின் கவனத்திற்குக் கொண்டுவரும்படியும் கௌரவ உறுப்பினர் அவர்கள் குறிப்பிட்டுள்ளார்.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

You said that my Deputy Minister has appointed. To my knowledge, nobody has been appointed.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

நன்றி! அமைச்சர் அவர்களே, இவ்வாறான வெற்றிடங்களுக்கு ஆட்களை உள்வாங்கும்பொழுது அந்த மாவட்டத்தைச் சேர்ந்த தமிழ் இளைஞர்களுக்கு முன்னுரிமையைக் கொடுக்கும்படிதான் அவர் கேட்டிருக்கிறார்.

மேலும், மட்டக்களப்பிலும் ஏனைய மாவட்டங்களிலும் சித்த மருத்துவர்கள் தயாரிக்கும் மருந்துக்காக அபின் வழங்கப்படுவது இடைநிறுத்தப்பட்டிருப்பதாகவும் மருத்துவத் தேவைக்காக அதனை அவர்களுக்கு வழங்குவதற்கு நடவடிக்கை எடுக்கும்படியும் அவர் கேட்டிருக்கிறார்.

மேலும், கௌரவ அமைச்சர் அவர்களிடம் முக்கியமான ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். கடந்த மாதம் நான் இந்த விடயத்தைக் பிரதம அமைச்சர் அவர்களின் கவனத்திற்கும் கொண்டுவந்திருந்தேன். அதாவது, வடக்கிலும் கிழக்கிலும் போர் காரணமாக மாணவர்கள், வயோதிபர்கள் உட்பட பலர் தங்களுடைய தலையிலும் உடம்பிலும் மார்பிலும் shell pieces - 'ஷெல்' துகள்கள் அகற்றப்படாமல் அதனுடனேயே இருக்கிறார்கள். அவர்களுக்கான விசேட மேலதிக சிகிச்சையை வழங்குவதற்கு மாவட்ட வைத்தியசாலைகளில் இருக்கின்ற வசதிகள் குறைவாக இருக்கின்றன. சிலர் இந்தியாவிற்குச் சென்று பல இலட்சம் ரூபாய் பணத்தைச் செலவு செய்து அதற்கான சிகிச்சைகளைப் பெற்றுவருகிறார்கள். இந்தப் போரின் காரணமாக உறவினர், நண்பர்கள் இல்லாமல் பலர் இருக்கிறார்கள். பொருளாதார வசதியில்லாமல் பலர் இருக்கிறார்கள். அதைப் பற்றியதான ஒரு விழிப்புணர்வு இல்லாமல், நூற்றுக் கணக்கானவர்கள் தங்களுடைய உடம்பில் இருக்கின்ற குண்டுத் துகள்கள் மற்றும் 'ஷெல்' pieceகளை அகற்றமுடியாத நிலையில் இருக்கின்றார்கள். ஆகவே, இது தொடர்பில் கௌரவ பிரதம அமைச்சரின் கவனத்துக்குக் கொண்டுவந்த வேளையிலே, அவர் இது பற்றி உங்களோடு பேசி, அவர்களுக்கான சிகிச்சைகளை வழங்குவதற்கு உரிய நடவடிக்கைகளை எடுக்கும்படி கூறியிருந்தார். ஆகவே, நான் குறிப்பிடுவது என்னவென்றால், வடக்கு, கிழக்கில் இவ்வாறு பாதிக்கப்பட்டிருக்கின்றவர்கள் தொடர்பான ஒரு முழுமையான தரவை எடுக்கவேண்டி யிருக்கின்றது என்பதைத்தான். குறிப்பாக, நான் வட மாகாணத்தில் இருக்கின்ற ஐந்து மாவட்ட அரசாங்க அதிபர்களிடத்தில் இவ்வாறு யார், யார் பாதிக்கப் பட்டிருக்கின்றார்கள் என்பது தொடர்பிலான விபரங்களைக் கேட்டிருக்கின்றேன். இது தொடர்பான தகவல்களைப் பெறுவது எங்களுக்கு மிகச் சிரமமாக இருக்கின்றபடியால், தயவுசெய்து உங்களுடைய அமைச்சின்கீழ் இருக்கின்ற அதிகாரிகளைப் பணித்து, இது தொடர்பான முழுமையான விபரங்களை -யார், யார் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள்; அவர்களுக்கு என்ன மாதிரியான பாதிப்புக்கள் இருக்கின்றன; அவர்களுக்கு எவ்வாறான சிகிச்சைகளை அளிக்கவேண்டும் என்ற தகவல்களை- பெற்றுத்தருவதற்கும் அவர்களுக்கான சிகிச்சைகளை வழங்குவதற்கும் நீங்கள் நடவடிக்கை எடுக்கவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

Hon. Member, there are two things I have to tell you. One is, if you can submit us a list of the disabled people who need transplants, I can even arrange for them to get their surgeries done in other hospitals where there are facilities. So, you have to provide me with a list of the patients either through the GAs or other officers responsible.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

The second matter is about opium. Opium was not imported to the country for the last four years till 2015, because there was a problem in India. So, I discussed with the Indian Government and the Indian High Commissioner about this matter. We have started importing opium again, removing all the barriers. Now, it is available. If the Ayurvedic doctors in your area want opium, we can supply that. We are opening our new stall on the 7th of this month, the day after tomorrow. So, we can supply opium even through that outlet to your doctors.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் ஆரம்பத்தில் குறிப்பிட்டதுபோல், பாதிக்கப்பட்டவர்களுடைய விபரங்களை - பெயர்ப் பட்டியலை நான் அந்தந்த மாவட்ட அரசாங்க அதிபர், உதவி அரசாங்க அதிபர் ஊடாக எடுத்து, உங்களுக்குத் தருகின்றேன்.

அதேபோல், நீங்கள் மாவட்டங்கள் தோறும் இருக்கின்ற வைத்தியசாலைகளில் "ஒசுசல" எனப்படும் அரச மருந்தகக் கூட்டுத்தாபனத்தின் விற்பனை நிலையங்களை அமைக்கவேண்டும். ஏனென்றால், சாதாரண ஏழை மக்கள் வெளியில் அதிக விலைகொடுத்து மருந்துகளை வாங்குகின்றார்கள். ஆகவே, ஒவ்வொரு மாவட்ட வைத்தியசாலையிலும் ஓர் இடத்தை ஒதுக்கி, அதனை அமைத்துக்கொடுத்தால் ஏழை மக்களுக்கு மிகவும் பிரயோசனமாக இருக்கும். இது நீண்டகாலமாக இருக்கின்ற ஒரு பாரிய பிரச்சினையாக இருக்கின்றது. ஆகவே, நீங்கள் இதனை வடக்கு, கிழக்கு மாகாணங்களில் இருக்கின்ற வைத்திய சாலைகளில் அமைத்துக்கொடுக்க வேண்டுமென்று நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

Hon. Member, an outlet of ayurvedic products will be opened in Jaffna on the 7th of this month. So, we can provide all the ayurvedic products you need through that outlet. We will open some more outlets in the Eastern Province also in the future.

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

நன்றி.

அடுத்து, மிக முக்கியமான விடயமொன்றை நான் இச்சபையின் கவனத்துக்குக் கொண்டுவர வேண்டியிருக்கின்றது. அதாவது, வட மாகாண புகையிரதக் கடவைகளிலே கடமையாற்றும் காவலாளிகள் -200க்கும் மேற்பட்ட பணியாளர்கள் - கடந்த ஐந்து நாட்களாக வேலைநிறுத்தம் செய்துவருகின்றார்கள். அவர்கள் சுமார் நான்கு வருடங்களாக 250 ரூபாய் என்ற மிகக் குறைந்த நாளாந்தச் சம்பளத்தில் பணியாற்றிக் கொண்டிருக்கின்றார்கள். இதனால், அவர்களுடைய குடும்பங்கள் பொருளாதார ரீதியில் மிகவும் கஷ்டமான நிலையை - நெருக்கடியை எதிர்நோக்கியிருக்கின்றன.

கடந்த வருடங்களில் புகையிரதக் கடவை போக்குவரத்தில் 23 மரணங்கள் இடம்பெற்றிருக்கின்றன; 30க்கும் அதிகமான விபத்துக்கள் இடம்பெற்றிருக்கின்றன. ஆகவே, இன்றைக்கு வடக்கிலே புகையிரத நிலையங்களில் தற்காலிகமாக நியமிக்கப்பட்டிருக்கின்ற காவலாளிகளின் வேலைநிறுத் தத்தினால், உயிர் ஆபத்துக்கள், விபத்துக்கள் ஏற்படக்கூடிய ஒரு மிகமோசமான நிலைமை இருக்கின்றது. ஆகவே, அரசாங்கம், அதாவது போக்குவரத்து அமைச்சு தற்காலிகமாக நியமிக்கப்பட்டிருக்கின்ற இந்த ஊழியர்களுக்கு நிரந்தரமான நியமனத்தைப் புகையிரதத் திணைக்களத்தினூடாக வழங்கவேண்டும்; அவர்களுக்கான சரியான ஊதியத்தையும் கொடுக்கவேண்டும். கடந்த நான்கு வருட காலத்திலே இந்த ஊழியர்களுக்கு வெறுமனே நாளொன்றுக்கு 250 ரூபாய் சம்பளம்தான் வழங்கப்பட்டுள்ளது. இவர்கள் தற்போது அரச ஊழியர்களாகவும் இல்லாமல் தனியார் துறை ஊழியர்களாகவும் இல்லாமலிருக்கின்றார்கள். அதற்கப்பால் இவர்களுக்கு EPF, ETF போன்ற கொடுப்பனவுகளுக்கான பதிவுகள் எதுவுமே செய்யப்படவில்லை. இவர்கள் தங்களுடைய கஷ்டமான நிலையினை மனித உரிமை ஆணைக்குழுவிடம் முறையிட்டும்கூட எந்தவிதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லை. அத்துடன் மேதகு ஜனாதிபதி அவர்களுக்கு முறையிட்டு ஒன்றரை வருடங்கள் கடந்த நிலையிலும் இந்த விடயங்கள் கவனத்திலெடுத்துக் கொள்ளப்படவில்லையென்று தெரிவித்திருக்கின்றார்கள். ஆகவே, போக்குவரத்து என்பது மிகவும் ஆபத்து நிறைந்த ஒன்றாக இருக்கின்ற இந்தக் காலத்திலே, இந்தத் தற்காலிக காவலாளிகளின் பணிப் புறக்கணிப்பு என்பது இன்னும் விபத்துக்களையும் ஆபத்துக்களையும் ஏற்படுத்தக்கூடிய ஒரு நிலைமையைத் தோற்றுவிக்கும் என்பதால் அரசாங்கம் உடனடியாக இந்த ஊழியர்களின் கோரிக்கைகளை நிறைவேற்ற முன்வரவேண்டுமென்று கேட்டுக்கொள்கிறேன்.

மேலும் இன்னுமொரு முக்கியமான விடயத்தையும் கூறலாமென்று நினைக்கின்றேன். அதாவது, வடக்கிற்கான விசேட பொருளாதார வர்த்தக மையத்தை அமைப்பது தொடர்பில் ஒரு சர்ச்சை எழுந்திருக்கின்றது. ஆனால், 15.06.2010 அன்று கௌரவ அமைச்சர் றிசாட் பதியுதீன், வட மாகாண ஆளுநர் சந்திரசிறி ஆகியோரின் தலைமையில் நடைபெற்ற வவுனியா மாவட்ட ஒருங்கிணைப்புக்குழுக் கூட்டத்திலே இந்தப் பொருளாதார வர்த்தக மையத்தை ஓமந்தையில் அமைப்பதற்கான தீர்மானம் எடுக்கப்பட்டு, அதற்குரிய காணிகள் நில அளவை செய்யப்பட்டு, அதற்கான சகல ஏற்பாடுகளும் பூர்த்தி செய்யப்பட்டன. இந்த நிலையிலே, அண்மைக்காலங்களில் அன்றைய அத்தீர்மானத்தை மீறுகின்ற வகையில் இது மதவாச்சிக்குக் கொண்டுசெல்லப்பட வேண்டும்; அநுராதபுரம் கொண்டுசெல்லப்பட வேண்டும் என்பது போன்ற பல கோரிக்கைகள் எழுந்திருக்கின்றன. ஆகவே, மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் எடுக்கப்படுகின்ற தீர்மானங்கள் நடைமுறைப்படுத்தப்படக்கூடியவையாக இருக்க வேண்டும். அங்கே எடுக்கப்படுகின்ற தீர்மானங்களை அக்கூட்டத்துக்குத் தலைமைதாங்குகின்ற அமைச்சரோ அல்லது மாவட்ட பாராளுமன்ற உறுப்பினர்களோ மீறினால் அது கேள்விக்குறியாக்கப்படுவது மட்டுமல்லாமல் மக்கள் மத்தியில் நம்பிக்கையை இழக்கவும் செய்கின்றது. ஆகவே, எதிர் காலத்திலாவது மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களில் எடுக்கப்படுகின்ற தீர்மானங்களை நடைமுறைப்படுத்த வேண்டும். அதனூடாகத்தான் மக்களுக்கு சரியான பணிகளைச் செய்ய முடியும். அந்த வகையிலே ஓமந்தையிலே பொருளாதார மத்திய நிலையத்தை அமைப்பதாக 15.06.2010ஆம் திகதி எடுக்கப்பட்ட தீர்மானத்தை நடைமுறைப்படுத்துவதற்கு அரசாங்கம் முழுமையான ஒத்துழைப்பை வழங்க வேண்டும். அந்த இடத்தில் அதை அமைப்பதற்காகத் தயாரிக்கப்பட்ட வரைபடங்கள் மற்றும் காணிக்கான சகல ஆவணங்களும் என்னிடம் இருக்கின்றன. எனவே, அரசாங்கம் அதனை வேறு இடத்துக்கு மாற்றாமல் அதே இடத்தில் நடைமுறைப்படுத்துவதற்கு உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

இதற்கப்பால், யுத்த காலத்திலே கொத்தணிக் குண்டுகள் வீசப்பட்டதற்கான ஆதாரபூர்வமான சான்றுகள் எதுவும் இல்லையென்றும் மக்கள் முறைப்பாடுகளை மட்டுந்தான் தெரிவித்திருக்கிறார்களென்றும் காணாமற்போனோரைக் கண்டறியும் ஜனாதிபதி ஆணைக்குழுவின் தலைவர் பரணகம அவர்கள் தெரிவித்திருக்கிறார். மேலும், கொத்துக் குண்டுகள் வீசப்பட்டாலும் அது சர்வதேச சட்டத்துக்கு முரணானதல்லவென்றும் அவர் தெரிவித்திருக்கிறார். அவருடைய கூற்றிலிருந்து கொத்துக் குண்டுகள் வீசப்பட்டதற்கான வாய்ப்புக்கள் இருந்திருக்கிறதென்பது தெரியவருகின்றது. ஐக்கிய நாடுகள் மனித உரிமைகள் ஆணையகம் இந்த விடயம் தொடர்பாக சர்வதேச தரம் வாய்ந்த பக்கச் சார்பற்ற விசாரணையைக் கோரியிருக்கிறது. உண்மையிலேயே நல்லிணக்கத்தைக் கொண்டு வருவதற்கு இந்த அரசாங்கத்துக்கு விருப்பம் இருக்குமானால் இதுகுறித்துப் பக்கச் சார்பற்ற விசாரணையை நடத்தி நாட்டிலுள்ள மக்கள் அனைவருக்கும் உண்மையைத் தெரியப்படுத்த வேண்டும்.

திருகோணமலையிலே 'கோட்டா முகாம்' என்ற பெயரில் இராசிய வதைமுகாம் ஒன்று இயங்கிவந்ததாக நாங்கள் ஏற்கெனவே தெரிவித்தபோது, அதற்கு மறுப்புத் தெரிவிக்கப்பட்டது. பின்னர் ஐக்கிய நாடுகள் சபையின் அதிகாரிகளினால் அது உறுதிப்படுத்தப்பட்டது. ஆகவே, உண்மையான நல்லிணக்கத்தை ஏற்படுத்துவதற்கு இந்த விடயங்கள் தொடர்பாக அரசாங்கம் பக்கச்சார்பற்ற முறையில் விசாரணையை நடத்த வேண்டும்.

மேலும், சாலாவ இராணுவ முகாம் குண்டுவெடிப்பிலே பாதிக்கப்பட்டவர்களுக்கு மாதந்தோறும் ஐம்பதாயிரம் ரூபாய் வழங்கப்படுகின்றது; அவர்களது வீடுகளும் திருத்தப்படுகின்றன. ஆனால், வடக்கைப் பொறுத்தவரை, போரினால் பாதிக்கப் பட்டிருக்கின்ற எங்களுடைய மக்களுக்கு வீடு திருத்துவதற்காக ஓரிலட்சம் ரூபாய் கடனாக வழங்கப்படுகின்றது. ஏற்கெனவே வறுமையின் பிடியிலிருக்கின்ற இந்த நாட்டை மீட்பதற்காக வறுமை நிலையில் இருக்கின்ற மக்களிடமிருந்தே வட்டி அறவிடப்படுவது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகும். இராணுவ முகாம் குண்டுவெடிப்பினால் பாதிக்கப்பட்ட மக்களுடைய வீடுகளைத் திருத்திக் கொடுத்து, மாதாந்தம் ஒரு தொகைப் பணமும் வழங்குவதுபோல, போரினால் பாதிக்கப் பட்டிருக்கின்ற மக்களுக்கு வெறுமனே கடன் அடிப்படையில் வீடுகளைத் திருத்துவதற்குப் பணம் வழங்காமல், இலவசமாக அதனை வழங்கவேண்டுமென்று கேட்டு, என்னுடைய உரையை நிறைவுசெய்கின்றேன்.

[අ.භා. 4.28]

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)

(The Hon. (Dr.) Ramesh Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවීම සඳහා වාගේම, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් මේ රටේ වෛද්‍යවරු හැටියට ලියාපදිංචි කිරීම සඳහාත්, ඒ කටයුතු නියාමනය සඳහාත් ඉදිරිපත් කෙරෙන මේ පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන්න ලැබීම සතුටට කරුණක්.

1970 වර්ෂයේ හෝමියෝපති පනත් කෙටුම්පතක් සම්මත කළත්, ඊට අවුරුදු 45කට පස්සේ ඉදිරිපත් කරන මේ නව පනත හරහා එම හෝමියෝපති වෛද්‍ය වෘත්තිය හා සම්බන්ධ කටයුතු හොඳින් නියාමනය වෙලා මේ වෘත්තිය වැදගත් විධියට ඉෂ්ට කරගෙන යන්න මෙයින් අවස්ථාවක් ලැබෙන බව මා සඳහන් කරන්න කැමැතියි. ඒ නිසා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම හොඳ කාරණයක් හැටියට අපි සඳහන් කරනවා.

ජර්මානු රටේ ආරම්භ වුණු මේ වෛද්‍ය ක්‍රමය ලංකාවේ ප්‍රචලිත නොවුණත්, පාකිස්තානය සහ ඉන්දියාව වැනි රටවල ඉතා ප්‍රචලිතව පවතිනවා. අපි දන්නා විධියට ඉන්දියාවේ වෛද්‍යවරු ලක්ෂ තුනකට ආසන්න පිරිසකුත්, පාකිස්තානයේ එක්ලක්ෂ පනස්දහසකට වඩා වැඩි වෛද්‍යවරු පිරිසකුත් මේ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ඉතාම ජෘවුල ලෙස ඉන්දියානු ජනතාව ඇතුළු මේ අර්ධද්වීපයේ ජනතාවගේ ප්‍රතිකාර සඳහා භාවිත කරනවා. මෙහි වැදගත්ම ලක්ෂණය හැටියට අපි දකින්නේ, මේ වෛද්‍ය ක්‍රමයේදී භාවිත වන ඖෂධ සඳහා පාවිච්චි කරන සංඝටක අංශු මාත්‍ර වශයෙන් පාවිච්චි කරන නිසා, ඒ හා බැඳෙන අනෙකුත් පරිබාහිර හානිකර තත්ත්ව -adverse effects- ඉතාම අවම බවට වෛද්‍යවරු අතර මතයක් තිබීමයි. මේ වෛද්‍ය ක්‍රමය තුළ සර්වාංග රෝග, ළමා රෝග, කාන්තා රෝග වාගේම, දීර්ඝ කාලීන රෝග වන දියවැඩියාව, හන්දිපත් අමාරු ඇතුළු රුමැටික් ආබාධ සඳහා ප්‍රතිකාර ලබා දීමේ ක්‍රම රාශියක් තිබෙන බව අපි දන්නවා.

මේ හා සම්බන්ධ තවත් කරුණක් මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරන්න මම සතුටුයි. ලංකාවට ප්‍රබල ගැටලුවක්ව පවතින ඩෙංගු වැනි රෝග තත්ත්වයන්ට ඉතාම සාර්ථකව ප්‍රතිකාර කරන්නත් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මේ රටේ භාවිත කරන වෘත්තිකයින් පසු ගිය කාලයේ කටයුතු කළ බව ඔවුන්ට ගෞරවයක් වශයෙන් මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සඳහා ලියාපදිංචි වූ වෛද්‍යවරු 180ත් - 200ත් අතර පිරිසක් තමයි අපි දන්නා විධියට දැනට ඉන්නේ. ඉන්දියාවේ හෝ පාකිස්තානයේ විශ්වවිද්‍යාලවල වසර හතරක හෝ පහක උපාධි පාඨමාලාවක්, එහෙම නැත්නම් ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා මේ සුදුසුකම ආයතනිකව ලබා ඊට අදාළ සහතික ලබා ගෙන මේ වෘත්තියේ නිරත වන පිරිසට අමතරව තවත් 400ක්, 500ක් වාගේ පිරිසක් අත් දැකීම් උපයෝගී කර ගෙන හෝමියෝපති වෛද්‍යවරු හැටියට කටයුතු කරන බව අපි දන්නවා. මේ සියලු දෙනාම එකම හෝමියෝපති වෛද්‍ය සභාවක් යටතේ ලියාපදිංචි කිරීම සඳහා ප්‍රධාන වශයෙන් මේ පනත් කෙටුම්පත හරහා කටයුතු කරනවා. එහිදී අපි සැලකිල්ලට ගත යුතු කාරණයක් තිබෙනවා. ආයතනිකව සුදුසුකම් ලබාගත් අය වෛද්‍යවරුන් හැටියට ලියාපදිංචි කිරීමේ කිසිම ගැටලුවක් පැන නහින්නේ නැහැ. වසර පහකට නොඅඩු අත් දැකීම් සහිත, භාවිතය හරහා ලියාපදිංචි කරන පිරිසට අයදුම් කරලා ලිඛිත පරීක්ෂණයකට පෙනී සිට සුදුසුකම ලබා ගැනීමේ අවස්ථාව මේ පනත් කෙටුම්පත හරහා ලබා දීලා තිබෙනවා. හැබැයි, මෙහිදී ආයතනිකව සුදුසුකම් ලබාගත් වෛද්‍යවරු විසින් මතු කරනු ලබන කාරණයක් තිබෙනවා. 1970 වර්ෂයේ සම්මත කළ පනත අනුව, ආයතනික සුදුසුකම් ලත් හෝමියෝපති වෛද්‍යවරු සහ අත් දැකීම් හරහා සුදුසුකම් ලත් හෝමියෝපති වෛද්‍යවරු යනුවෙන් කොටස් දෙකකට ශ්‍රේණිගත කරලා තිබුණා. මේ නව පනත හරහා මේ සියලුම දෙනා එක් කොටසකට එකතු කිරීම තුළින්, අවුරුදු හතරක් පහක් විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය ලබා, එහෙම නැත්නම් වෙනත් පාඨමාලාවක් හදාරා සුදුසුකම් ලබා ගත් පුද්ගලයන්ට කිසියම් අඩු ලුහුඬුකමක් වනවාද කියන කාරණය සම්බන්ධයෙන් දැනට මේ වෛද්‍ය උපාධිය ලබා ගෙන තිබෙන වෛද්‍යවරු අතර මතයක් තිබෙනවා. ඒ නිසා ඒ කරුණ කෙරෙහිත් මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි.

මේ කරුණ සැලකිල්ලට ගෙන, පුහුණුව හරහා, අත් දැකීම් හරහා වෛද්‍ය වෘත්තියේ දැනට නිරත වෙලා ඉන්න පිරිස ලියාපදිංචි කිරීමේදී, ඒ අදාළ විභාගයට පෙනී සිටීමෙන් පසු ඔවුන් වෙනම කොටසක් හැටියට ලියා පදිංචි කරනවා නම්, එය වඩාත් සාධනීය තත්ත්වයක්ය කියන කාරණය මම සඳහන් කරන්න කැමැතියි. ඔවුන් සඳහා වන ඒ ලිඛිත පරීක්ෂණයට මේ පනත්

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

කෙටුම්පත අනුව අවස්ථා තුනකදී පෙනී සිටින්න පුළුවන්. එලෙස අවස්ථා තුනක් ලබා දීම හොඳයි. හැබැයි, අවස්ථා තුනකට පෙනී සිටීම සඳහා එක් අයදුම් පත්‍රයක් පමණක් යොමු කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා අපි යෝජනා කරනවා. එහෙම නැත්නම්, ඔවුන් පළමුවෙනි වතාවේ අයදුම් පත්‍රය යොමු කරලා අවස්ථා තුනකදී මේ පරීක්ෂණය අසමත් වුණොත්, නැවත වතාවක් අවුරුදු තුනකට පස්සේ තවත් අයදුම් පත්‍රයක් යොමු කරලා තවත් තුන් වතාවක් අඛණ්ඩව විභාගයට පෙනී සිටීමේ ක්‍රමයක් ඇතිවන්න පුළුවන්. මේ පනත් කෙටුම්පතින් ඒ කාරණය පැහැදිලි වෙලා නැහැ. ඒ නිසා ඒ අයදුම් පත්‍රය එක් වතාවක් පමණක් ඉදිරිපත් කරන්න අවස්ථාව සලසන්න කියලා අපි යෝජනා කරනවා. එක් වතාවක් ඉදිරිපත් කරන එම අයදුම්පත්‍රය ඔස්සේ අවස්ථා තුනක් විභාගයට පෙනී සිටින්නට අවස්ථාව ලබා දෙන්න කියලා අපි යෝජනා කරනවා. එහෙම කළොත් ඉහත කී තත්ත්වය මඟහරවා ගන්න පුළුවන් වෙයි.

මේ වෛද්‍ය සභාව පිහිටුවීමේ මූලික අරමුණ ඉතාම හොඳයි. ඒ ගැන අපි සතුටු වනවා. ඒ අරමුණු හරහා රජය නියෝජනය කරන්න විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ, මුදල් අමාත්‍යාංශයේ මහත්වරු මේ සභාවට පත් වෙනවා. ඒ වාගේම, මේ වෛද්‍ය සභාවට ලියාපදිංචි වෛද්‍යවරුන් අතරින් හතරදෙනෙකුත්, ඇමතිතුමා විසින් පත් කරන තවත් නියෝජිත මහත්වරුන් තුන්දෙනෙකුත් පත් වෙනවා. ඒ නියෝජිත මහත්වරුන් තුන්දෙනා අතරින් දෙදෙනෙකු පමණයි වෛද්‍යවරුන් හැටියට පත්වීමට දැනට යෝජනා කර තිබෙන්නේ. ඒ නිසා ඇමතිතුමා පත් කරන නියෝජිත මහත්වරු තුන්දෙනාමත් ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයන් අතරින් තෝරා ගන්නය කියන ඉල්ලීම අපි කරනවා. එතකොට ඒ නියෝජිතයන් දසදෙනා අතරින් හත්දෙනෙක්ම වෛද්‍යවරුන් වෙනවා. ඒ අනුව ඒ කටයුතු නියාමනය වඩාත් හොඳින් කර ගෙන යෑමේ අවස්ථාව ඔවුන්ට ලැබෙනවාය කියන කාරණයත් මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමැතියි.

අපේ අරමුණ, හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවීම හරහා වඩාත් සක්‍රිය, වඩාත් විනිවිද පෙනෙන සුළු යාන්ත්‍රණයක් සහිත හෝමියෝපති වෛද්‍ය ක්‍රමයක් මේ රටේ ස්ථාපනය කිරීමයි. ඒ හරහා, දැනට මේ රටේ ක්‍රියාත්මක නොවන උපාධි ප්‍රදානය කරන ආයතනයක් හෝ ඩිප්ලෝමා ප්‍රදානය කරන ආයතනයක් ස්ථාපනය කරලා, හෝමියෝපති වෛද්‍ය විද්‍යාව මේ රටේ දරුවන්ට ඉගෙන ගැනීමට අවස්ථාව සලසන්න හැකි වෙනවා නොඅනුමානයි.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හරහා දැනටමත් විශාල පිරිසක් ප්‍රතිකාර ලබන බව අපි දන්නවා. දවසකට 250ක පමණ පිරිසක් වැලිසර තිබෙන සායනයෙන් ප්‍රතිකාර ලබනවා. ලංකාව පුරාම විවිධ ප්‍රදේශවල මේ සායන ස්ථාපනය කරලා මේ වෛද්‍ය සේවාව ජනතාවට ලබා දෙන්න පුළුවන්. අපේ අරමුණ විය යුත්තේ ලංකාවේ ඉතාම ප්‍රචලිතව පවතින බටහිර වෛද්‍ය විද්‍යාව වාගේම, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව වාගේම, හෝමියෝපති වෛද්‍ය විද්‍යාව සහ චීන කටු චිකිත්සාව ඇතුළු එකී වෛද්‍ය ක්‍රම සියල්ලත් එකට එකතු කර ප්‍රධාන නගරවල මේ වෛද්‍ය මධ්‍යස්ථාන බිහි කිරීමයි. මේ සියලුම වෛද්‍ය ක්‍රමවල හොඳම ප්‍රතිඵල එකතු කර රෝගීන්ට ප්‍රතිකාර ලබා දෙන්න පුළුවන් මධ්‍යස්ථාන බිහි කරන්න පුළුවන් නම්, යම් දවසක අපට ලබන්න පුළුවන් ජයග්‍රහණය එයයි කියා මා හිතනවා. දියවැඩියාව, හෘදය අකරණීය රෝග, අධිරුධිර පීඩන තත්ත්ව වැනි සමහර රෝග බටහිර වෛද්‍ය විද්‍යාව අනුව නිට්ටාවට සුව කරන්න බැහැ කියලා අපි දන්නවා. නමුත්, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හරහා, චීන කටු චිකිත්සාව හරහා, එහෙම නැත්නම් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හරහා එවැනි රෝගත් සුව කළ අවස්ථා සමහර වේලාවට අපි දැකලා තිබෙනවා. ඒ නිසා මේ සියලුම වෛද්‍ය ක්‍රම එකට එකතු කර භාවිත කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා නම් එය ඉතාම හොඳයි කියන කාරණය සඳහන් කරන්නට කැමැතියි.

මේ පනත් කෙටුම්පත පිළිබඳව නැවත වතාවක් සඳහන් කළ යුතු කරුණක් තිබෙනවා. ඒ තමයි අප සඳහන් කළ පරිදි හෝමියෝපති වෛද්‍යවරුන් හැටියට දැනට ලියා පදිංචි දෙසියයක පිරිසට අමතරව පන්සියයක පමණ පිරිසක් සිටින එක. ඊට අමතර කාරණයකුත් සඳහන් කරන්නට අවශ්‍යයි. බටහිර වෛද්‍ය ක්‍රමය සඳහා ලියා පදිංචි නොවුණු, නමුත් බටහිර වෛද්‍ය ක්‍රමය ගම් මට්ටමේදී භාවිත කරමින් රෝගීන්ට ප්‍රතිකාර කරන විශාල පිරිසක් අද ලංකාව පුරාම ඉන්නවා. ඇත්තටම බටහිර වෛද්‍යවරුන් විසිදහසක පමණ පිරිසක් තමයි ලංකාවේ ඉන්නේ. ලියා පදිංචි නොවී, සුදුසුකම් නොමැතිව, බටහිර වෛද්‍ය ක්‍රමය භාවිත කරන 15,000කට, 20,000කට ආසන්න පිරිසක් අප දැනුවත්ව ලංකාව පුරා ඉන්නවා; ලියා පදිංචි වෛද්‍යවරුන්ගේ ගණනටම ඉන්නවා. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට අදාළව තිබෙන්නේත් ඒ තත්ත්වයමයි. ලියා පදිංචියක් නොමැතිව ආයුර්වේද වෛද්‍ය ක්‍රමය භාවිත කරමින් ප්‍රතිකාර කරන අතිවිශාල පිරිසක් ඉන්නවා. ඒ නිසා මේ කටයුතු විධිමත් කිරීම සඳහා ශක්තිමත් නියාමනයක්, යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන්නට අවශ්‍යයි කියා මා හිතනවා. වෛද්‍යවරුන් හැටියට පෙනී සිටින මෙවැනි පුද්ගලයන් හඳුනා ගන්නට, ඔවුන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්නට සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් වරින් වර කටයුතු කරන බව මා දන්නවා. නමුත් එය ප්‍රමාණවත් නැහැ කියන කාරණය සඳහන් කරන්න අවශ්‍යයි. ඒ අඩුපාඩුව මේ හෝමියෝපති පනත් කෙටුම්පත හරහා ආවරණය කෙරෙනවා.

ආංශික අධීක්ෂණ කාරක සභා අවස්ථාවේදී, මේ පනත් කෙටුම්පතට සංශෝධනයක් අපි යෝජනා කර තිබෙනවා. ඒ තමයි, මේ පනත් කෙටුම්පත සම්මතවීමෙන් පසු, හෝමියෝපති වෛද්‍යවරයකු හැටියට සුදුසුකම් නැති අයෙකුට සුදුසුකම් ලබා ගන්න අවස්ථාව ලබා දීම. ඊට පසුවත් සුදුසුකම් නොමැතිව හෝමියෝපති වෛද්‍ය ක්‍රමය භාවිත කරනවා නම්, ඔහුට ලබා දෙන දඬුවම හැටියට මෙහි සඳහන් කර තිබෙන්නේ රුපියල් 50,000ක දඩයක් සහ මාස හයක් නොඉක්මවන සිරදඬුවමක් ලබා දිය යුතු බවයි. නමුත් රුපියල් 50,000ක දඩ මුදලක් කියන්නේ විශාල මුදලක් නොවෙයි. ඒ නිසා අඩු ගණනේ රුපියල් ලක්ෂ දෙකකවත් දඩයකට යටත් කරන්නය කියන සංශෝධනයක් අපි ඉදිරිපත් කර තිබෙනවා. රුපියල් පනස්දාහක දඩය ප්‍රමාණවත් දඬුවමක් නොවන නිසා අඛණ්ඩව මේ කටයුත්ත කර ගෙන යන්නට පුළුවන්කම තිබෙන නිසායි අපි ඒ යෝජනාව කළේ.

අද සම්මත වන මේ පනත් කෙටුම්පත හරහා හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ වෛද්‍යවරුන් හඳුනා ගන්නවා වාගේම, ආයුර්වේද වෛද්‍යවරුන් හඳුනා ගන්නවා වාගේම, ඉතාම හොඳ යාන්ත්‍රණයක් හරහා බටහිර වෛද්‍ය ක්‍රමය භාවිත කරන නිල වශයෙන් හඳුනා ගත් පිරිසක්ද ඉන්නවා. එම නිල වශයෙන් පිළිගත් පිරිසට අමතරව මේ කාර්යයේ යෙදෙන අනෙකුත් පුද්ගලයන් හඳුනා ගෙන, ප්‍රතිකාර කිරීමේ අවස්ථාව ඔවුන්ගෙන් පැත්තකට කරලා, නිල වශයෙන් සුදුසුකම් නිබෙන පිරිසට පමණක් ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය කරන වටපිටාව සකස් කර දිය යුතුයි කියලා මම සඳහන් කරනවා.

හෝමියෝපති වෛද්‍ය සභාව පිළිබඳව කථා කිරීමේදී මම තවත් කරුණක් සඳහන් කරන්න කැමැතියි. හෝමියෝපති වෛද්‍ය සභාව නීත්‍යානුකූලව සංස්ථාගත කරන්න, පනත්ගත කරන්න කටයුතු කරන මේ වෙලාවේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිබඳවත් ලංකාව පුරාම කථා වෙනවා. එයට හේතුව තමයි මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පිළිබඳ කාරණය

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතාම ඉහළ මට්ටමේ කීර්තියක් දිනා ගෙන, ඉතාම හොඳ කටයුතු රාශියක් කර ගෙන හිටපු ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිබඳව පසු ගිය කාලයේදී ජනතාව අතර යම් කිසි මට්ටමක සැකයක් ඇති කරන්න මේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය සම්බන්ධයෙන් මතු වුණු කරුණු හේතු වුණා. වෛද්‍යවරයකු හැටියට මේ රටේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇති වීම ගැන මා කිසිසේත් විරුද්ධ නැහැ. ඒවා ඇති කළ යුතුයි. ලංකාවේ දරුවන් විශාල පිරිසක් රුපියල් ලක්ෂ හැට-හැත්තෑව, සියය-දෙසියය වියදම් කරලා වෛද්‍ය විද්‍යාව හදාරන්න පිට රටවලට යනවා, මේ රටේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් නැති නිසා. නමුත් SAITM - South Asian Institute of Technology and Medicine - කියන ආයතනය වෛද්‍ය විද්‍යාව හදාරන්න ඇති කරපු ආයතනයක් නොවෙයි. ඔවුන් රුසියානු වෛද්‍ය විද්‍යාලයක් සමඟ සම්බන්ධතා ඇති කර ගනිමින් තමයි ඒ වෛද්‍ය විද්‍යාලය පටන් ගත්තේ. හැබැයි අද වන විට ඒ තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් වෙලා, වෛද්‍ය සභාවේ අනුමැතිය නැතිව වෛද්‍ය විද්‍යාව හදාරන්න දරුවන්ට අවස්ථාව දීලා තිබෙනවා. අද ඔවුන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට විරුද්ධව ඒ දරුවන් උසාවි යවනවා, සායනික අවස්ථා ලබා දෙන්නය කියලා. එහෙම නැත්නම් වෛද්‍ය සභාවට විරුද්ධව උසාවි යවනවා, SAITM එක පිළිගත් ආයතනයක් බවට පත් කරන්නය කියලා. ඒ සඳහා වෛද්‍ය සභාව බොහොම පැහැදිලිව කොන්දේසි ඉදිරිපත් කරලා තිබෙනවා. "ඔබ මෙන්න මේ නියාමනයන්ට යටත් විය යුතුයි, එතකොට ඔබව පිළිගන්න අපට පුළුවන්" කියන කොන්දේසිය වෛද්‍ය සභාවෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි අපි යෝජනා කරනවා, වෛද්‍ය සභාව SAITM ආයතනය පිළිගන්නා තත්ත්වයට එනකල් ඒ දරුවන්ට අසාධාරණයක් නොවීම සඳහා එය ආරම්භක අවස්ථාවේ තිබුණු ආකාරයට රුසියානු වෛද්‍ය විද්‍යාලයට හෝ වෙනත් වෛද්‍ය විද්‍යාලයකට අනුබද්ධ කරලා පිට රට වෛද්‍ය උපාධියක් අර ගෙන එන දරුවෙකුට වාගේම ඒ දරුවන්ටත් Act 16 වාගේ කඩ ඉම් විභාගයකට සම්බන්ධ වෙන්න අවස්ථාව ලබා දෙන්න කියලා. එහෙම කිරීමෙන් පමණයි මේ ගැටලුව විසඳන්න පුළුවන් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාස පහකට ආසන්න කාලයක් තිස්සේ සියලුම වෛද්‍ය පීඨවල දරුවන් අඛණ්ඩ උපවාසයක් කරනවා. අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය ඇතුළු විශ්වවිද්‍යාල සිසු දරුවන් සෑම කෙනෙක්ම සතිපතා පාරට බහිනවා. අද වෛද්‍යවරු අඛණ්ඩ අරගළයක යෙදෙනවා. මම හිතන විධියට ඒ සියල්ල කරන්නේ SAITM ආයතනයේ සිටින දරුවන්ට විරුද්ධව නොවෙයි. මේ රටේ වෛද්‍යවරු ඇතුළු වෛද්‍ය කාර්ය මණ්ඩල දීර්ඝ කාලයක් තිස්සේ ආරක්ෂා කර ගෙන සිටි මේ රටේ වෛද්‍ය විද්‍යාලයේ ගුණාත්මකභාවය වෙනුවෙනුයි. දකුණු ආසියාකරයේ රටවල් අතුරෙන් අපේ රටේ පුද්ගල ආයු කාලය, මාතෘ මරණ, ළදරු මරණ අනුපාත ඇතුළු සියල්ලම ඉතාම ඉහළ ශ්‍රේෂ්ඨ මට්ටමකට ගෙන යන්න පුළුවන් වුණේ ඒ වෛද්‍ය විද්‍යාවේ ගුණාත්මකභාවය අපට ආරක්ෂා කර ගන්න පුළුවන් වුණු නිසයි. ඒ නිසා තමයි ලෝකයේ සිදු කරන ඉතාම ඉහළ මට්ටමේ සංකීර්ණ ශල්‍යකර්ම පවා අපේ රටේ සිදු කරන්න පුළුවන් වුණේ. බෝ වන රෝග ඇතුළු තවත් රෝග ගණනාවක් එන්නත් මඟින් වළක්වා ගැනීම වැනි කරුණු පිළිබඳව ඉතාම ඉහළ තත්ත්වයක් අපේ රටට ලබා ගන්න පුළුවන් වුණේ වෛද්‍ය විද්‍යාවේ ගුණාත්මකභාවය අපි ආරක්ෂා කර ගත් නිසයි.

මේ SAITM ආයතනයේ ඉගෙන ගන්නා දරුවන් සම්බන්ධයෙන් අපට කිසි ගැටලුවක් නැහැ. ඔවුන්ට සාධාරණය ඉෂ්ට කරන්න අවශ්‍යයි. ඒ සාධාරණය ඉෂ්ට කරන්න තිබෙන හොඳම ක්‍රමය වන්නේ කඩ ඉම් විභාගයක් හරහා ඒ දරුවන් වෛද්‍ය ක්ෂේත්‍රයට යොමු කිරීමය කියන කාරණය මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. ඒ වෙනුවෙන් වෛද්‍යවරු අරගළයක් කරනවා. එහිදී විශාල පිරිසක් මතු කරන්න හදන තර්කයක් තිබෙනවා, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අත්තනෝමතිකව ඔවුන්ගේ බලය පාවිච්චි කරලා රෝගීන්ව අසරණ කරන්න හදනවාය කිය. ඒ තමයි එක දවසක් රෝගීන් අසරණ වෙන බව ඇත්ත. හැබැයි මෙවැනි නියාමනයකින් තොරව කටයුතු සිදු වෙන්න පටන් ගත්තොත් අඛණ්ඩව දීර්ඝ කාලයක් තිස්සේ මේ රටේ ජනතාවට අසරණ වෙන්න සිදු වෙනවා. ඒ මඟින් වැඩිපුරම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන්නේ මේ රටේ පොදු මහජනතාවගේ කියන කාරණයත් මම සඳහන් කරන්න කැමැතියි. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා අපි ඉතාම කාරුණිකව ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ තවත් කාරණයක් පිළිබඳව මම සඳහන් කරන්න කැමැතියි. පසු ගිය අය වැය යෝජනාවලදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ යෝජනා හරහා පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථාන පළාත්බදව පිහිටුවීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා හොඳ යෝජනාවක් ඉදිරිපත් කළා. එහිදී මාතර ප්‍රදේශයේ පිළිකා මධ්‍යස්ථානයක් ඇති කිරීමට එතුමා යෝජනා කළා. දැනට ලංකාවේ සිටින පිළිකා සඳහා ප්‍රතිකාර කරන, පිළිකා පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් Sri Lanka College of Oncologists ආයතනය හරහා ඉල්ලීමක් කර තිබෙනවා, ඒ මධ්‍යස්ථාන විවිධ ස්ථානවල හිතුමතේ ඉදි කරන්න එපා කියලා.

විශේෂයෙන්ම මාතර ඉදි කිරීමට යන පිළිකා ප්‍රතිකාරක මධ්‍යස්ථානය, දකුණු පළාතේ රෝගීන්ට ඉතාම ශක්තිමත්, සාර්ථක සේවාවක් සපයන මධ්‍යස්ථානයක් ලෙස ගාල්ලේ පිළිකා රෝහලට අනුබද්ධවම ස්ථාපනය කරන්න කියා පිළිකා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් දැනටමත් ඉල්ලීමක් කර තිබෙනවා. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලා මේ සඳහා මුදල් වෙන් කිරීම හොඳයි. එය ඉතාම වටිනා කාර්යයක්. අද ලංකාවේ පිළිකා රෝගීන් අතිවිශාල ප්‍රමාණයක් අපට හමු වෙනවා. එයට පරිසර සාධක රැසක් බලපානවා; ආහාරමය කරුණු රැසක් බලපානවා. ඒ එක්කම විකිරණ ඇතුළු විවිධ හේතූන් නිසා පිළිකා රෝගි තත්ත්වය අපේ රටේ ඉතාම විශාල ලෙස පැතිරෙනවා. ඒ නිසා මෙකී ප්‍රතිකාර මධ්‍යස්ථාන ඇති කිරීම, විශේෂඥ සේවා සැපයීම ඉතාම හොඳයි. හැබැයි, පිළිකා රෝගය සඳහා ප්‍රතිකාර කරන මෙකී මධ්‍යස්ථාන ගම් මට්ටමෙන්, නගර මට්ටමෙන් සෑම දිස්ත්‍රික්කයකම තිබෙන්න අවශ්‍ය නැහැ. එහෙම තිබුණොත් ඒ සඳහා දරන්න වන වියදම විශාලයි. ස්කෑන් යන්ත්‍ර ඇතුළු විවිධ උපකරණ සඳහා කෝටි ගණන් මුදල් වැය වනවා. එය එක ස්ථානයක සිට කළමනාකරණය කිරීම තමයි පහසු. ඒ නිසා පළාතකට හොඳ එක මධ්‍යස්ථානයක් තිබීම ඉතාම වටිනවා.

මීට අවුරුදු 20කට පමණ කලින් මහරගම පිළිකා ආයතනය විතරයි මේ රටේ තිබුණේ. ලංකාවේම රෝගීන් ප්‍රතිකාර සඳහා මහරගමට ආවා. හැබැයි අද තත්ත්වය ඊට වඩා වෙනස් වෙලා තිබෙනවා. අද රෝගීන්ගේ සංඛ්‍යාව ඉතාම විශාල නිසා පළාත්බද මට්ටමින් මේ මධ්‍යස්ථාන අවශ්‍ය වෙලා තිබෙනවා. දිස්ත්‍රික්ක වශයෙන් මෙය විමධ්‍යගත කරන්න අවශ්‍ය නැහැ. පළාත් මට්ටමින් මෙකී මධ්‍යස්ථාන ඇති කරලා අවශ්‍ය සේවය ලබා දෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපනය කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත අපි අගය කරන බව මා නැවත වතාවක් සඳහන් කරනවා. අපි සංශෝධන කිහිපයකුත් යෝජනා කර තිබෙනවා. ඒ යෝජනා සියල්ලත් සැලකිල්ලට ගෙන වඩාත් ඵලදායි හෝමියෝපති වෛද්‍ය සේවාවක් මේ රටේ ජනතාවට ලබා දෙන්න හැකි වේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.44]

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවීම සඳහා ද, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් සහ හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචි කිරීම සඳහා ද, හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම හා නියාමනය කිරීම සඳහා ද, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම ඇතුළු කාර්යයන් සඳහා අද දින මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පිළිබඳව විශේෂයෙන් අපේ සෞඛ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ගැන කථා කරන මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, මෙය වසර 200ක් පමණ පැරණි වෛද්‍ය ක්‍රමයක් බව. අප බටහිර වෛද්‍ය විද්‍යාව හැදෑරුවත් වෛකල්පිත වෛද්‍ය ක්‍රම විධියට අද අපේ රටේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය, චීන කටු චිකිත්සාව, හෝමියෝපති වෛද්‍ය විද්‍යාව, යුනානී ක්‍රම ආදිය තිබෙනවා. විශේෂයෙන් බටහිර වෛද්‍ය ක්‍රමය හැදෑරුවත්, බටහිර වෛද්‍යවරුන් වුණත් අප ආශීර්වාදාත්මකව හැම වෙලේම බලාපොරොත්තු වන දෙය තමයි නීරෝගි බව. මේ රටේ තිබෙන ඕනෑම වෛද්‍ය ක්‍රමයකින් අප බලාපොරොත්තු වන්නේ නීරෝගි බවයි. එය තමයි අපේ අරමුණ. වෛකල්පිත වෛද්‍ය ක්‍රමයක් විධියට හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අනුගමනය කරන පිරිසක් අද අපේ ලංකාවේ සිටිනවා. විශේෂයෙන්ම පසු ගිය කාලයේ 1970 අංක 7 දරන හෝමියෝපති පනත ගෙනැල්ලා එය ක්‍රියාත්මක කිරීමේදී, බටහිර වෛද්‍යවරුන් විධියට සමාජයේ නොයෙකුත් ආකාරයට හෝමියෝපති වෛද්‍යවරුන් හරහා මෙම වෛද්‍ය වෘත්තිය පාවිච්චි කරන බව අපි දැක්කා. ඒ නිසා එතැනදී අපි දුටු එම දුර්වලතාවත් සමඟ සෞඛ්‍ය අමාත්‍යතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු වීම කාලෝචිතයි.

අවුරුදු 200ක් පැරණි මේ වෛද්‍ය ක්‍රමය ජර්මන් ජාතික ඇලොපති වෛද්‍ය සැමුවෙල් හනිමාන් මහත්මා තමයි ඉස්සර වෙලාම ලොවට හඳුන්වා දී තිබෙන්නේ. මේ වෛද්‍ය ක්‍රමය ගැන කථා කරන කොට, ලංකාවේත් 1906 ඉඳලාම හෝමියෝපති වෛද්‍ය ක්‍රමය භාවිත කර තිබෙන බව කිව යුතුයි. ඉන් අනතුරුව, Dr. C.V.S. Corea මැතිතුමාත් සමඟ මූලික රෝහලක දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිවරයෙක් 1954දී මේ ක්‍රියාවලියට එකතු වෙලා තිබෙනවා. මෙහිදී අප දැකපු කාරණයක් තිබෙනවා. මේ වෛද්‍ය ක්‍රමයෙහි අපේ බටහිර වෛද්‍ය ක්‍රමයට වඩා සරල බවක් තිබෙන නිසා ජනතාව මෙයට කැමැතිද, ජනතාව මෙය ඉල්ලනවාද සමහර වෙලාවට අපට හිතෙනවා.

බටහිර වෛද්‍ය ක්‍රමයට අනුව අපි රෝගය සඳහා ප්‍රතිකාර කරනවා මිසක් රෝග නිධානයට නොවෙයි ප්‍රතිකාර කරන්නේ. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හරහා රෝගියාට ප්‍රතිකාර කිරීමේදී නිවාරණය ඉලක්ක කරගෙන ඒ රෝග නිධානයට ප්‍රතිකාර කිරීම තමයි සිද්ධ වෙන්නේ. මේ සරල ක්‍රමය භාවිත කිරීමේදී කුඩා ප්‍රමාණයේ ඖෂධ මාත්‍රාවන් තමයි භාවිත කරන්නේ. මේ ඖෂධ නිෂ්පාදනය සඳහා ශාක, සත්ත්ව හා ලෝහ වැනි අමුද්‍රව්‍ය තමයි භාවිත කරන්නේ. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය භාවිත කරන වෛද්‍යවරුන්ගේ විශ්වාසයක් තිබෙනවා, මේ ක්‍රමයේ අතුරු ආබාධ නැහැ කියලා. මොකද, අපිට ඇති වෙලා තිබෙන ප්‍රශ්නත් එක්ක බටහිර වෛද්‍ය වෘත්තිකයන් විධියට අපි දන්නවා, යම් රෝගයක් සඳහා දිගුකාලීනව ප්‍රතිකාර ගන්න කොට, බෙහෙත් ද්‍රව්‍යයක් ගන්න කොට ඒකෙන් ඇති වෙන පසු විපාක හා අතුරු ආබාධ පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් රෝග නිවාරණය කිරීමට ප්‍රතිකාර සඳහා විශාල මුදලක් මේ කාලයේදී වෙන් කර තිබෙනවා. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේදී මේ ඖෂධ අංශුමාත්‍ර ප්‍රමාණයෙන් භාවිත කරන කොට සරල ක්‍රමයක් විධියට ජනතාව ඒ දේ ඉල්ලනවා නම්, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට කරන්න තිබෙන්නේ පනත සංශෝධනය කරලා, ව්‍යාජ විධියට මෙය භාවිත කරන වෛද්‍යවරුන් නියාමනය කිරීමයි. මම හිතන විධියට අපේ ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් හොඳ අදහස් හා යෝජනා ගෙනාවා. අපි මේ පනත ගැන ආංශික අධීක්ෂණ කාරක සභාවේදී කථා කළා.

1970දී ගෙනාපු පනතේ තිබෙන යම් යම් දුර්වල තැන් හරහා ව්‍යාජ විධියට ලියා පදිංචි වෙච්ච අය අදත් අපේ ගම්වල මේ ප්‍රතිකාර ක්‍රමය අනුගමනය කරන ආකාරය අපි දැකලා තිබෙනවා. ඒ නිසා අපට ලොකු ගැටලුවක් වෙලා තිබෙන දෙයක් තමයි, සමහර වෙලාවට ඒ ගොල්ලන් හෝමියෝපති වෛද්‍යවරු කියලා ලියා පදිංචි වෙලා බටහිර වෛද්‍ය ක්‍රමය භාවිත කරන එක. ඒ නිසා වෛද්‍ය සභාව විධියට Sri Lanka Medical Council එකේ ලියා පදිංචි වුණ වෛද්‍යවරුන්ට වාගේම ජනතාවට ඒකෙන් ලොකු අසාධාරණයක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අද ඉදිරිපත් කරන පනත් කෙටුම්පතේ තිබෙන මේ සංශෝධනත් එක්ක ආංශික අධීක්ෂණ කාරක සභාවේදී යෝජනා කළ පරිදි මේ වාගේ ව්‍යාජ විධියට මේ ප්‍රතිකාර ක්‍රමය යොදා ගන්නා පිරිස නීතියේ රැහැනට අසු කරගන්න අවධානය යොමු කරන එක වඩාත් හොඳයි කියලා මම හිතනවා. ඒ සඳහා වැටලීම් අංශයක් "සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් හරහා ක්‍රියාත්මක විය යුතුයි" කියන කාරණය අපි ආංශික අධීක්ෂණ කාරක සභාවට ඉදිරිපත් කළා. මොකද, අපි දන්නවා ගම්වල මේ වන විට ව්‍යාජ වෛද්‍යවරුන් විධියට පෙනී සිටිමින් මෙම ප්‍රතිකාර ක්‍රම හරහා බටහිර වෛද්‍ය ක්‍රමය කරනවා කියා. ඒ නිසා අද දින මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී වඩාත්ම අවධානය යොමු කරන්න ඕනෑ වන්නේ, මෙම ව්‍යාජ වෛද්‍යවරුන් නීතිය හමුවට ගෙන ඒමේ පියවර සම්බන්ධයෙනුයි.

මම හිතන්නේ, ඒ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා පනත් කෙටුම්පතේ යෝජනා කරලා තිබෙන්නේ පනස්දාහක දඩයක් නියම කළ යුතු බවටයි. මමත් මෙම අවස්ථාවේදී ගරු සභාවට කියා සිටින්නේ, මේ සඳහා ලක්ෂ දෙකක් පමණ දඩයක්, එහෙම නැත්නම් අවුරුදු දෙකක සිර දඬුවමකට යටත් කළ යුතු යැයි මේ පනත සංශෝධනය කළ යුතුය කියලායි. මොකද, මේක ජීවිතත් එක්ක කරන ලොකු අරගලයක්. අපට පොදු ජනතාව සම්බන්ධයෙන් තිබෙන්නේ ලොකු වගකීමක්. බටහිර වෛද්‍ය විද්‍යාව හදාරන්න වෛද්‍ය පීඨවලට ඇතුළත් වෙලා අවුරුදු 5ක් කිස්සේ බොහොම අමාරුවෙන් අධ්‍යයනය කරන දෙයක්. එම නිසා ඒ පිළිබඳව අවධානය යොමු කිරීම ඉතාමත් වැදගත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ඉගෙනීමේ කටයුතු සම්බන්ධයෙන් ඉන්දියාවේ පුහුණු කිරීමේ ආයතනයක් ආරම්භ කරලා තිබෙනවා. හැබැයි, මේ වන කොට ඒ පුහුණුව සඳහා ගිය ශිෂ්‍ය ශිෂ්‍යාවන් කියන දෙයක් තමයි,"අවස්ථා 10ක් තිබුණත් ඒ අවස්ථා 10 සඳහා සියලුම සුදුසුකම් සපුරලා තිබුණත්, 5 දෙනෙක් පමණයි පසු ගිය වතාවේ තෝරලා යවලා තිබෙන්නේ" කියන එක. ගරු ඇමතිතුමනි, ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. වෙනත් රටකින් අපට ප්‍රදානය කරන ප්‍රදානයන්ගෙන් අපේ රටට ලබා ගන්න පුළුවන් ප්‍රතිලාභ අපි ලබා ගත්තොත් හෝමියෝපති වෛද්‍ය වෘත්තිය ප්‍රචලිත කරන්න පුළුවන් වනවා. නමුත් ඒ දරුවන්ගේ

අධ්‍යාපන කාලය අවුරුදු 5කින් අවසන් කරලා ලංකාවට එනකොට ඔවුන්ගේ රැකියාවේ ස්ථීරභාවය ගැනත් ඔවුන්ට අවිනිශ්චිත බවක් තිබෙනවා. එම නිසා ඒ ගැනත් විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෛද්‍ය විද්‍යාව ඉගෙනීම සඳහා තෝරා ගන්නා නිර්ණායකයන් යටතේ තෝරා පත් කර ගැනීමේදී ජීව විද්‍යාව තෝරා ගත් අවම සුදුසුකම් තිබෙන දරුවන්ට ඒ සඳහා අවස්ථාව තිබෙනවා. ඒ අනුව, නිසියාකාරව ප්‍රමිතියකට අනුව ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෝරා ගැනීමේ ක්‍රම වේදයක් ඇති කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඖෂධ ගැනත් කථා කරන්න ඕනෑ වනවා. ඖෂධ මෙරටට ආනයනය කිරීමේදී ප්‍රමිතිකරණය ගැනත් අවධානය යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. ඒ වාගේම අපේ රටේ ශාඛ සහ සත්ව කොටස් මඟින් අවශ්‍ය ඖෂධ නිෂ්පාදනය කිරීමේ හැකියාව තිබෙනවා. ඒ අනුව ලංකාවේ මෙම නිෂ්පාදනයන් ඇති කිරීම සඳහා අවධානය යොමු කරවන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බටහිර වෛද්‍ය ක්‍රමයට සමගාමීව ආයුර්වේද වෛද්‍ය ක්‍රමය, චීන කටු චිකිත්සාව හා හෝමියෝපති වෛද්‍ය ක්‍රමය එකම රෝහලකදි ලබා ගන්න පුළුවන් නම් එයින් ජනතාවට වඩාත් පහසුවක් ලැබෙනවා. ජනතාව තුළ අප කෙරෙහි විශ්වාසයක් ගොඩ නැඟිලා තිබෙන මේ වෙලාවේ ජනතාව සහ රෝගීන් ආරක්ෂා කිරීමයි අප කළ යුත්තේ. ඒ සඳහා මේ පනත් කෙටුම්පත තුළින් එය නියාමනය කරලා නිසි පියවර ගන්න ඕනෑ. ඒ වාගේම මෙම වෛද්‍ය ක්‍රමයන් වැරැදි විධියට භාවිත කරනවා නම් ඔවුන්ව නීතිය හමුවට ගෙන එන්න කියලාත් මේ ගරු සභාවේදී මම යෝජනා කරනවා.

[අ.භා. 4.54]

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය)

(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் இராஜாங்க அமைச்சர்)

(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of City Planning and Water Supply)

අද ඉතාමත් වැදගත් පනත් කෙටුම්පතක් දෙවනවර කියැවීම සඳහා ඉදිරිපත් කරන දවසක්. මේ රටේ ප්‍රධාන වශයෙන්ම භාවිත වන්නේ, බටහිර වෛද්‍ය ක්‍රමයයි. මේ රටේ බටහිර වෛද්‍ය ක්‍රමයේ ගුණාත්මකභාවය තබා ගන්න, බටහිර වෛද්‍ය ක්‍රමය ව්‍යාප්ත කරන්න වෛද්‍ය සභාව ලොකු කාර්ය භාරයක් කරනවා. බටහිර වෛද්‍ය ක්‍රමය වාගේම ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත් අපේ ශ්‍රී ලාංකීය ජනතාව තුළ ඉතාමත්ම ප්‍රචලිතයි. ඒ සඳහාත් වෛද්‍ය සභාවක් පිහිටුවලා ඒ තුළින් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න ලොකු කාර්ය භාරයක් කරනවා. ජනතාවගේ රෝගවලට ප්‍රතිකාර ගන්නා ක්‍රමයක් හැටියට මේ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය වැදගත් වනවා. එහි ගුණාත්මකභාවය රඳා පවත්වා ගන්න, නියාමනය කරන්න නීති රෙගුලාසි පැනවීම වැදගත් වනවා. මොකද, අද කිසිම සුදුසුකමක් නැති බොහෝ පුද්ගලයන් රෝගීන්ට ප්‍රතිකාර කරනවා අපි දකිනවා. ඒ නිසා රෝගීන්ගේ ජීවිත අඩාල වෙනවා. මට කලින් කථා කළ ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මන්ත්‍රීතුමාත්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියත් ඒ බව ප්‍රකාශ කළා. අපි පුවත් පත්වලින් දැක්කා, කිසිම සුදුසුකමක් නැති පුද්ගලයන් රෝහල්වලට ගිහින් විශේෂඥ වෛද්‍යවරු හැටියට ප්‍රතිකාර කරනවා. මෙලෙස ප්‍රතිකාර කිරීම ජනතාවගේ ජීවිතත් එක්ක කරන සෙල්ලමක්. ඒ නිසා ඉතාම තදින් නීති පනවලා, ඔවුන්ව නීතියේ රැහැනට හසු කරවා ගැනීම වැදගත් බව මා මුලින්ම සඳහන් කරන්න ඕනෑ.

සමහර අය ආයුර්වේද වෛද්‍ය සභාවක ලියා පදිංචි වෙලා පළපුරුද්දෙන් බටහිර වෛද්‍ය ක්‍රමය හරහා රෝගීන්ට ප්‍රතිකාර කරනවා. එවැනි ක්‍රම අපි නවත්වන්න ඕනෑ. මොකද, ජනතාවගේ ජීවිතයේ ගුණාත්මකභාවය පවත්වා ගන්න, ඔවුන්ගේ නීරෝගිකම ආරක්ෂා කර ගන්න අවශ්‍යයයි. ඒ කිසිම පුහුණුවක් නැති අය එවැනි ප්‍රතිකාර කිරීම අපි නවත්වන්න ඕනෑ. විශේෂයෙන්ම steroid වැනි ප්‍රතිකාර ගත්තාම, ඒකෙන් ලෙඩේ නවතිනවා. නමුත්, දීර්ඝ කාලීනව දුන්නාම විශාල ලෙස අහිතකර තත්ත්වයන් ඇති වන්න පුළුවන්. හෝමියෝපති ක්‍රමය ගත්තාම එහි සංකල්පය තමයි, "සමාන දැයෙන් සමාන දැ නැසීම" කියන අර්ථය. ඒ නියමය පදනම් කරගෙන ප්‍රචලිත වුණ චිකිත්සක ක්‍රමයක් දහඅටවන සියවසේ ආරම්භ කරලා තිබෙන්නේ ජර්මානු ජාතික සැමුවෙල් හනිමාන් කියන මහත්මයා. ඔහුට පෙර හිපොක්‍රොටිස් සහ පැරසෙල්ස් මෙම නියමය පිළිබඳව දැන ගෙන සිටිය බව ඉතිහාසයේත් තිබෙනවා. නමුත්, එය ප්‍රායෝගිකව ක්‍රියාවට නන්වන ලද්දේ හනිමාන් කියන ජර්මන් ජාතික වෛද්‍යවරයා විසින්.

මෙය සුවිශේෂී වෛද්‍ය ක්‍රමයක්. එදිනෙදා වැලඳෙන රෝග තත්ත්වවලට, නිදන්ගත රෝගවලට මෙමඟින් ප්‍රතිකාර කරනවා. හැබැයි, අද අපේ රටේ මෙය ප්‍රචලිත ක්‍රමයක් නොවෙයි. බටහිර වෛද්‍ය ක්‍රමය, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය වැරදුණාම තමයි සමහර අය හෝමියෝපති ක්‍රමය හොයාගෙන යන්නේ. නමුත්, අපි ජනතාව තුළ මෙය ප්‍රචලිත කළොත් අවශ්‍ය ජනතාව එම ප්‍රතිකාර සොයාගෙන යයි. හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ ප්‍රතිකාර කරන්න ඖෂධ 3,000කට වැඩි සංඛ්‍යාවක් තිබෙන බව කියනවා. ඖෂධ ලෙස යොදා ගන්නේ ස්වභාව ධර්මයේ තිබෙන ගස් වැල්, මුල්, මල්, අල, ගෙඩි, පාෂණ වර්ග හා කාන්දම් බලය කියන ද්‍රව්‍ය බව. ඒ තොරතුරු හොයන කොට අපි දැක්කා. මේක පිළිගත් වෛද්‍ය ක්‍රමයක් හැටියට ලෝකයේ රටවල පාවිච්චි කරනවා. විශේෂයෙන්ම ඉන්දියාව වාගේ රටවල, බ්‍රිතාන්‍ය, ප්‍රංශය, ජර්මනිය හා පාකිස්තානය වාගේ රටවල රෝහල් හරහා සායන මඟින් මේ ප්‍රතිකාර ක්‍රමය මහ ජනතාවට ලබා ගන්න අවශ්‍ය කරන පහසුව සලසා තිබෙනවා. ඒ වාගේම මූලික උපාධි, පශ්චාත් උපාධි ලබා දෙන විශ්වවිද්‍යාල අනුබද්ධිත හෝමියෝපති වෛද්‍ය විද්‍යාල 250ක් විතර ඉන්දියාවේ තිබෙනවා කියලා අපට දැන ගන්න තිබෙනවා.

1970 අංක 7 දරන හෝමියෝපති පනතේ විධිවිධානවලට අනුකූලව තමයි 1979දී හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර තිබෙන්නේ. නමුත්, හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කිරීමේදී ගැටලුවක් මතු වී තිබෙනවා. හෝමියෝපති වෛද්‍ය සභාවට අමාත්‍යතුමාගේ නියෝජිතයෙක් පත් වෙලා නැහැ. වෛද්‍ය සභාවට පත් කරලා තිබෙන්නේ, හෝමියෝපති වෛද්‍යවරුන්ගෙන් පත් වුණු කීපදෙනෙක්. ඒ නිසා අමාත්‍යාංශයට කිසිම නෛතික බලයක් මේ වෛද්‍ය සභාව කෙරෙහි තිබිලා නැහැ. ඒ වාගේම හෝමියෝපති වෛද්‍ය සභාවට භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. ප්‍රතිපාදනවලට වගකීම තිබෙන්නේ අමාත්‍යාංශයේ ලේකම්තුමාට වුණත් ලේකම්තුමාගේ නියෝජිතයෙක් නැති නිසා නොයෙකුත් අර්බුදකාරී තත්ත්වයන් තිබෙනවා. ඒ නිසා තමයි අලුත් රෙගුලාසි පනවන්න අද කටයුතු කර තිබෙන්නේ.

1987 වන තෙක් හෝමියෝපති වෛද්‍ය සභාව පත් කර තිබෙනවා. නැවත මේ වෛද්‍ය සභාව පත් කර තිබෙන්නේ 1998දී එවකට ගරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ මැදිහත් වීමෙන්. වෛද්‍ය සභාව සක්‍රිය කරලා, ඒ වෛද්‍ය සභාව විසින් වැලිසර හෝමියෝපති රෝහලක් ඒ කාලයේ ඉදිකර තිබෙනවා. නිදහස් සායන ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙනවා. ලෝක සෞඛ්‍ය

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

සංවිධානයේ ආධාර යටතේ හෝමියෝපති වෛද්‍යවරුන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය සඳහා වැඩමුළු, පාඨමාලා හා සම්මන්ත්‍රණ පවත්වා තිබෙනවා. ඒ කාලයේ ලොකු කාර්ය භාරයක් කර තිබෙනවා. ඒ වාගේම එවකට තිබුණු සංකල්පයක් තමයි, "සුව උදාන" වැඩසටහන. ඒ යටතේ මහජනතාවට මෙම වෛද්‍ය ක්‍රමය පිළිබඳව දැනුම, අවබෝධය හා ප්‍රතිකාර ලබා දී තිබෙනවා. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලෝක සෞඛ්‍ය සංවිධානය සහ JICA ආයතනය සමඟ එක්ව සෞඛ්‍ය සේවාවන් විධිමත් කිරීම සඳහා සෑදූ විසි අවුරුදු සැලැස්මේ ව්‍යාපෘතියට හෝමියෝපති වෛද්‍ය ක්‍රමයත් ඇතුළත් කර තිබෙනවා. විශේෂයෙන්ම ස්විස් ජාතික විශේෂඥ වෛද්‍ය සිසිල් ස්වීමර් මහත්මිය යටතේ මෙය ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ වාගේම 1978 වර්ෂයේදී ලියා පදිංචිය සඳහා අයදුම් කර, විභාග ගාස්තු ගෙවා විභාගවලට පෙනී සිටීමට අවස්ථාව නොලද සියලුම අයදුම්කරුවන්ට විභාග පවත්වා එයින් සමත්වූවන් ලියා පදිංචි කර තිබෙනවා. දැනට වෛද්‍ය සභාව ක්‍රියාත්මක වන්නේ නැහැ.

රජය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිගෙන අවුරුදු 46ක් ගත වෙලා තිබුණත්, වෛද්‍ය සභාව ස්ථාපිත කරලා ගත වී තිබෙන්නේ වසර 37යි. ඒ වාගේම තමයි, හෝමියෝපති වෛද්‍යවරුන් ලෙස අධ්‍යාපනය ලැබීමට පිළිගත් ආයතනයක් ලංකාවේ ක්‍රියාත්මක වන්නේ නැහැ. හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කළත් එහි ගුණාත්මකභාවය පිළිබඳව ප්‍රශ්න තිබෙනවා.

අවසන් වතාවට හිටපු වෛද්‍ය සභාව මේ වෛද්‍ය විද්‍යාලයෙන් පිට වුණු 200කට පමණ සහනිකය ලබා දීලා තිබෙනවා. නමුත් මෙහි පුහුණුව පිළිබඳව ගැටලුවක් තිබෙනවා. අද මේ දෙවැනි වර කියවීමට ඉදිරිපත් කර තිබෙන හෝමියෝපති පනත් කෙටුම්පත මඟින් ඒ සියලුම දේවල් නිවැරදි කරන්න පුළුවන් වෙයි කියා මා හිතනවා. මට කලින් කථා කළ ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මියත් කිව්වා, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ගැන හැදෑරීමට ඉන්දියාවට යෑම සඳහා අවුරුද්දකට ශිෂ්‍යත්ව දහයක් ලැබෙනවා කියා. නමුත් ඒකෙනුත් උපරිම ප්‍රයෝජන ලබා නැහැ කියා තමයි, අපට තොරතුරු ලැබී තිබෙන්නේ. දැනට වෛද්‍යවරුන් 270ක් වෛද්‍ය සභාවේ ලියා පදිංචි වී සිටිනවා. එයින් 150ක් විතර ලියා පදිංචිය අලුත් කර තිබෙනවා. 50ක් විතර මිය ගොස් තිබෙනවා. ඒ වාගේම වැලිසර හෝමියෝපති රෝහලේ දැනට වෛද්‍යවරුන් තිදෙනෙක් සේවය කරනවා. එහි බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ගැනීම සඳහා රෝගීන් 150ක් විතර එනවා. ඒ වාගේම පිට පළාත්වල සායන හතක් ක්‍රියාත්මක වෙනවා. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා.

මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන් පසුව හෝමියෝපති වෛද්‍ය සභාවක් පිහිටුවනවා වාගේම වෛද්‍ය වෘත්තිකයන්, හෝමියෝපති ඖෂධවේදීන් ලියා පදිංචි කිරීම සිදු කෙරෙනවා. හෝමියෝපති ආයතන ලියා පදිංචි කරලා, නියාමනය කරලා මේ ක්‍රමය ප්‍රවර්ධනය කරන්න, පෝෂණය කරන්න කටයුතු කරනවා. ඒ වාගේම ඖෂධ වර්ග පිළියෙල කරන්න, ආනයනය කරන්න අවශ්‍ය ඒ සියලුම විධි විධාන, නීති - රීති මේ පනත් කෙටුම්පත හරහා හඳුන්වා දීලා තිබෙනවා. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය දියුණු කරන්න, එහි ගුණාත්මකභාවය වැඩිදියුණු කරන්න එය ලොකු පිටිවහලක් වෙයි කියා මා විශ්වාස කරනවා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි එක තැනකින් මේ සේවාවන් සලසනවා නම් වඩාත් හොඳයි කියා මමත් විශ්වාස කරනවා. අපි පළාත් මට්ටමින් හෝ රෝහලක බටහිර වෛද්‍ය ක්‍රමය වේවා, හෝමියෝපති වේවා, චීන කටු වේවා, ආයුර්වේද වේවා මේ කියන ලද හැම සේවාවක්ම ලබා දෙනවා නම් ජනතාවට පුළුවන් තමුන්ට අවශ්‍ය සේවාව ලබා ගන්න. යම් කිසි ප්‍රතිකාර ක්‍රමයක් ගැන ජනතාව තුළ විශ්වාසයක් ඇති වුණොත්, ජනතාව ඒ ප්‍රතිකාර ක්‍රමය සොයා ගෙන යනවා. ඒ නිසා අපි ඒ සඳහා ඉඩ කඩ ලබා දිය යුතුයි. අපිට අඩු ගණනේ model එකක් හෝ ආරම්භ කරන්න පුළුවන් නම් එය ඉතා හොඳයි කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෞඛ්‍ය සේවාව විමධ්‍යගත විෂයක්. ඒ නිසා පළාත් සභා හා පළාත් පාලන ආයතන හරහාත් එම සායන පවත්වන්න අපට පුළුවන් වෙනවා. ඒ එක්කම අපි සන්තෝෂ වෙනවා, අලුතින් පත් වන වෛද්‍ය සභාවට අමාත්‍යාංශ ලේකම්තුමාගේ නියෝජිතයෙක්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයෙකු, භාණ්ඩාගාරයේ නියෝජිතයකු, හෝමියෝපති වෛද්‍යවරුන්ගෙන් සමන්විත පිරිසක් සහ ගරු අමාත්‍යතුමාටත් තුන් දෙනෙක් පත් කරන්න පුළුවන් වීම ගැන. එසේ අමාත්‍යතුමා පත් කරන තුන් දෙනාම හෝමියෝපති වෛද්‍යවරුන් වෙනවා නම් ඒක ඉතාම හොඳයි කියා මමත් යෝජනා කරනවා.

ඒ එක්කම හෝමියෝපති පනතට අදාළ නොවුණත්, පෞද්ගලික රෝහල් පිළිබඳවත් අපි මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අපි ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, පෞද්ගලික රෝහල්වල බාහිර ප්‍රතිකාර අංශයෙන් ප්‍රතිකාර ලබා ගන්නා රෝගීන් වැටි එකෙන් නිදහස් කිරීම පිළිබඳව. අද පෞද්ගලික රෝහල්වල නේවාසිකව ප්‍රතිකාර ගන්න අයට විශාල මුදලක් මේ වැටි එක හරහා ගෙවන්න සිද්ධ වෙනවා. අපි ඉල්ලීමක් කරනවා. මොකද, පෞද්ගලික රෝහල්වලට යන්නේ මේ රටේ ඇති හැකි ජනතාව පමණක් නොවෙයි. නැති බැරි, අහිංසක ජනතාවත් පෞද්ගලික රෝහල්වලට යනවා. ඒ නිසා පෞද්ගලික රෝහල්වලට යන රෝගීන් වැටි එකෙන් නිදහස් කරලා දෙන්න පුළුවන් නම්, ඒක ඉතාමත්ම හොඳ දෙයක් බව අපි මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

ඩෙංගු රෝගය ගැනත් මේ අවස්ථාවේදී යමක් කියන්න ඕනෑ. පසු ගිය දිනවල ඇදහැලුණු වර්ෂාවත්, එම වර්ෂාව හේතුවෙන් ඇති වුණු ගංවතුරත් නිසා අද සමහර දිස්ත්‍රික්කවල ඩෙංගු රෝගය වසංගත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කොළඹ අවට ප්‍රදේශවල රෝහල්වල අද ඩෙංගු රෝගීන් විශාල වශයෙන් ඉන්නවා. ඩෙංගු රෝගය වැළැක්වීම සඳහා අපි කණ්ඩායම් වශයෙන් ගෙවල්වලට ගිහිල්ලා මදුරු කීටයන් බෝවන තැන් පිළිබඳව සොයා බලනවා. මෙතැනදී ප්‍රධාන ගැටලුවක් හැටියට අපි දකින්නේ, කසළ කළමනාකරණයේ තිබෙන ගැටලුයි. අද කසළ කළමනාකරණය විධිමත්ව සිදු නොවීම නිසා අපේ ගම්වල, අපේ ප්‍රදේශවල, නගරවල ඩෙංගු මදුරු කීටයන් බෝවන තැන් විශාල වශයෙන් දකින්නට තිබෙනවා.

විශේෂයෙන්ම ඩෙංගු රෝගය මර්දනයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, පළාත් පාලන ආයතන වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශය එකතු වෙලා කසළ කළමනාකරණයට විධිමත් වැඩ පිළිවෙළක් ඉතා ඉක්මනින් හඳුන්වා දීම වැදගත් වෙනවා. මොකද, දිරන කසළ වෙනම, ප්ලාස්ටික් බෝතල් වෙනම ආදී වශයෙන් ගෙදරදීම කසළ තෝරලා ලබා දීම තුළින් ඒවා ප්‍රතිචක්‍රීයකරණය -recycle- සඳහා යොමු කර වන්න පුළුවන්. එම ක්‍රමය හඳුන්වාදීම ඉතාමත්ම වැදගත් වෙනවා.

දිස්ත්‍රික් මහ රෝහල්වල Dengue High Dependency Unit එකක් හදන්න පුළුවන්. මීගමුව රෝහලේ හොඳ Dengue High

Dependency Unit එකක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ලංකාවේ ඇති හොඳම Unit එක තිබෙන්නේ මීගමුව රෝහලේ. ඒ වාගේම ගොතටුව IDH රෝහලේ හොඳ Unit එකක් තිබෙනවා අපි දැක්කා. මේ අවස්ථාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයට කරන ගරු කිරීමක් හැටියට මම මේ කාරණයත් කියන්න ඕනෑ. ඩෙංගු රක්තපාත රෝගය හැදිලා මගේ පුතා ගොතටුව රෝහලේ නැවතී සිටියා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෙද කාර්ය මණ්ඩලයෙන්, ඒ වෛද්‍යවරුන්ගෙන් ඉතාමත් හොඳ සේවාවක් ලැබුණා. ඒ වාගේම පසුවදාම පළාතේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා ගෙදරට ඇවිල්ලා බැලුවා. ඊළඟ දවසේ ධූමායනය කළා. ඉතාමත්ම කාර්යක්ෂම සෞඛ්‍ය සේවාවක් ලංකාවේ තිබෙනවා. සෞඛ්‍ය සේවාව හැම වෙලාවේම විවේචනයට ලක්වන සේවාවක්. ඒ දේවල් නොමිලයේ කාර්යක්ෂම කර දුන්නා. ඒ නිසා ඔවුන්ට කරන ගෞරවයක් හැටියටයි මම ඒ කාරණය මෙතැනදී ප්‍රකාශ කළේ.

ඩෙංගු රෝගය තුරන් කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් කසළ කළමනාකරණයත් එක්කම හඳුන්වා දෙන්න ඕනෑ කියන එක මතක් කරන්න ඕනෑ. ඒ වාගේම මහජන සෞඛ්‍ය වෛද්‍යවරුන්ට, ඒ කියන්නේ ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්ට අයිති තනතුරු ටික ඔවුන්ට ලබා දෙන්න කියා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම ඩෙංගු රෝග මර්දන ඒකකයේ ගැටලුවක් තිබෙනවා. පරිපාලනය සම්බන්ධයෙන් කථා කළොත්, ඩෙංගු රෝගය පිළිබඳව කිසිම දැනුමක් නැති කෙනෙක් තමයි අධ්‍යක්ෂවරයෙක් විධියට අද එහි කටයුතු කරන්නේ. මේ නිසාත් රෝගය බෝ වීම වැළැක්වීම කළමනාකරණය කිරීමේදී ගැටලු මතුවෙනවා. ඒ නිසා පරිපාලන කටයුතු කරන විශේෂඥ වෛද්‍යවරුන් ඔවුන්ට අදාළ රෝහල් කළමනාකරණය සඳහා යොදවන්න. නමුත්, විශේෂඥ වෛද්‍යවරුන්ට අයිති තනතුරුවලට ඒ ප්‍රජා වෛද්‍ය විශේෂඥ වෛද්‍යවරුන් පත් කරන්න කියන ඉල්ලීම අපි මේ අවස්ථාවේ කරනවා. මොකද, ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන් තමයි මාතෘ සහ ළමා සෞඛ්‍ය සායනවල, වසංගත රෝග නිවාරණ ඒකකවල, ඒ වාගේම මැලේරියා මර්දන ස්ථානවල, බරවා මර්දන වගේ ස්ථානවල ස්ථානගතව සිටිය යුත්තේ. හැබැයි, ඒ සම්බන්ධයෙන් කළමනාකරණය පිළිබඳ පරිපාලන විශේෂඥවරුන් පත් කළාට, ඔවුන්ට ඒ තාක්ෂණ දැනුම හා අත් දැකීම නැහැ. එම නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන ලෙස අපි මේ අවස්ථාවේදී සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මා ඊට වඩා දෙයක් මේ සම්බන්ධයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

අද ඉතාමත්ම හොඳ පනත් කෙටුම්පතක් පිළිබඳවයි අපි විවාද කරමින් සිටින්නේ. බටහිර හා ආයුර්වේද වෛද්‍ය ක්‍රමවලට අමතරව මේ රටේ පිළිගත් වෛද්‍ය ක්‍රමයක් වන හෝමියෝපති වෛද්‍ය ක්‍රමය විධිමත් කරන්න; නියාමනය කරන්න; එහි ගුණාත්මකභාවය වැඩි කරන්න, ඒ වාගේම ඒ කෙරෙහි ජනතාව අතර විශ්වාසය ඇති කරවන්න නීති රීති පනවලා ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම පිළිබඳව ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා (ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා)
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா - பிரதேச அபிவிருத்தி அமைச்சர்)
(Field Marshal Hon. Sarath Fonseka - Minister of Regional Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩ්වඩ් ගුණසේකර මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා කථා කරන්න.

[ප.ව. 5.10]

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையின் மருத்துவத்துறை வரலாற்றிலே மிக முக்கிய மானதொரு சட்டமூலத்தை நிறைவேற்ற இருக்கின்ற இந்தச் சந்தர்ப்பத்திலே எனக்கும் ஒருசில வார்த்தைகள் பேசுவதற்கான வாய்ப்பைத் தந்தமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இலங்கையிலுள்ள பல்வேறு மருத்துவ முறை களிலே பாரம்பரிய மருத்துவ முறையொன்றாக ஓமியோபதி மருத்துவமுறை காணப்படுகின்றது. இதனை ஒழுங்கு படுத்தப்பட்ட ஒரு சட்ட வரையறைக்குள் கொண்டுவந்து, தரமான முறையில் மேற்கொள்வதற்குரிய ஓர் ஏற்பாடாக இந்தச் சட்டமூலம் காணப்படுகின்றது. கடந்த காலங்களில் பல தடவைகள் இதனை ஒழுங்குபடுத்துவதற்குரிய பல்வேறுபட்ட நடவடிக்கைகள் எடுக்கப்பட்டிருக்கின்றன. அந்தவகையில், இன்றைய சூழலுக்கேற்றவாறு இதனை மறுசீரமைத்து, ஓமியோபதிசார் மருத்துவப் பேரவை ஒன்றினைத் தாபிப் பதையும்; அது சார்ந்த மருத்துவப் பதிவுகளை மேற் கொள்வதையும்; அதுசார்ந்த கற்றலுக்குரிய நிலையங்களை ஒழுங்குபடுத்துவதையும் இந்தச் சட்டமூலம் பிரதான இலக்காகக் கொண்டிருக்கின்றது.

இங்குள்ள மருத்துவ முறைகளைப் பார்க்கின்றபோது ஆங்கில மருத்துவமுறை பரவலாக அங்கீகரிக்கப்பட்ட ஒரு முறையாக இருக்கின்றது. அத்துடன், ஆயுர்வேத மருத்துவம் இன்னுமொரு முறையாகக் காணப்படுகின்றது. மேலும், ஓமியோபதி, ஏனைய சீன வைத்திய முறைகள் என்பனவும் பிரயோகத்தில் காணப்படுகின்றன. இலங்கையின் மருத்துவத் துறையினையும் சுகாதார சேவையினையும் நோக்குகின்ற போது, அதனை நகரப்புறங்களில் காணப்படுகின்ற நிலைமை, கிராமப்புறங்களில் காணப்படுகின்ற நிலைமை மற்றும் தோட்டப்புறங்களில் காணப்படுகின்ற நிலைமையென்ற வகையில் பகுப்பாய்வு செய்து பார்க்க முடியும். அந்த வகையில் இந்த நாட்டின் சுகாதார வைத்திய வசதிகள் தொடர்பாக நகரப் புறங்களிலுள்ள, கிராமப் புறங்களிலுள்ள மற்றும் தோட்டப் புறங்களிலேயுள்ள நிலைமைகள் பற்றிச் சற்றுச் சீர்தூக்கிப் பார்க்கவேண்டியிருக்கின்றது.

[ගරු වේලු කුමාර් මහතා]

இன்றைய நிலைமையில் சுகாதார சேவையில் நகரப் புறங்களிலே பல்வேறு வசதிவாய்ப்புகள் ஏற்படுத்தப் பட்டிருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. அந்தவகையில் அது வளர்ச்சியடைந்துகொண்டு செல்கின்ற போக்கினைக் காட்டினாலும், கிராமப் புறங்களிலும் தோட்டப் புறங்களிலும் அது மிகவும் பின்தங்கிய நிலையிலேயே இருக்கின்றதென்பதை இந்த இடத்திலே சுட்டிக்காட்ட விரும்புகின்றேன். குறிப்பாக இன்று இந்த விவாதத்திலே கலந்துகொண்டவர்கள், ஒவ்வொரு மருத்துவத் துறையிலும் போலியான வைத்தியர்களினது செயற்பாடுகள், போலியான வைத்திய நிலையங்களினது செயற்பாடுகள், தரமற்ற வைத்திய நிலையங்களின் செயற்பாடுகள், தரமற்ற மருந்துப் பொருட்களின் பாவனை என்பவை மிகுந்த அச்சுறுத்தலாக இருக்கின்றன என்ற விடயத்தை மீண்டும் மீண்டும் குறிப்பிட்டிருந்தார்கள். இதற்குப் பிரதான காரணம், ஒவ்வொரு மருத்துவ முறைகளையும் அல்லது இந்த ஒவ்வொரு துறைகளையும் கட்டுப்படுத்தி வழிநடத்தக்கூடிய சரியான சட்டங்கள், விதிமுறைகள் மற்றும் ஒழுங்குமுறைகள் கடந்த காலத்திலே ஒழுங்குபடுத்தப்படாமல் இருந்தமையாகும். அந்த வகையிலே சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சினால் எடுக்கப்பட்டிருக்கின்ற இந்தப் பிரவேசமானது காலத்தின் தேவையை நிறைவேற்றக்கூடியதாகக் காணப்படு கின்றது. அந்த வகையில் இந்த ஓமியோபதி மருத்துவ முறையானது இந்தச் சட்டமூலத்தின்மூலமாக ஒழுங்குபடுத்தப் பட்ட ஒரு முறைமையின்கீழ் கொண்டு வரப்படுகின்றது. இதன்மூலம் இனிவரும் காலங்களிலே பதிவு செய்யப்பட்ட வைத்திய நிலையங்களில் பதிவுசெய்யப்பட்ட தரமான வைத்தியர்கள் என்ற அங்கீகாரத்தோடு எந்தவிதத் தயக்கமு மின்றி இவர்களின் சேவையைப் பெற்றுக் கொள்வதற்குரிய அடித்தளம் இடப்படுகின்றது என்பதனை நான் இங்கு கூறிவைக்க வேண்டும். இந்தத் துறையை ஒழுங்குபடுத்தியது போலவே சம்பந்தப்பட்ட ஏனைய துறைகளும் அவற்றுக்கு ஏற்ற வகையிலே ஒழுங்குபடுத்தப்பட வேண்டிய, அவற்றின் தரமும் உயர்த்தப்பட வேண்டிய தேவை இருக்கின்றது.

குறிப்பாக நாங்கள் ஒரு விடயத்தை எடுத்துக்காட்ட வேண்டும். அதாவது, முதலிலே நான் குறிப்பிட்டதுபோல நகரப் பகுதிகளிலே உள்ள அரச வைத்தியசாலைகளாக இருக்கலாம், தனியார் வைத்தியசாலைகளாக இருக்கலாம், அவற்றிலே தரமான சேவைகளைப் பெறுவதற்குரிய வசதி வாய்ப்புகள் இன்று கிட்டியிருக்கின்றது. ஆனால், பல கிராமப் புறங்களிலிருக்கின்ற வைத்தியசாலைகள் மிகப் பின்தங்கிய நிலையிலே மிகுந்த குறைபாடுடையவைகளாக, குறிப்பாக தேவையான வைத்தியர்களை, தாதிமாரை, தேவையான மருந்துப் பொருட்களைக் கொண்டிராத நிலைமையிலே காணப்படுகின்றன.

இன்று இலங்கையின் வைத்தியத்துறையை - சுகாதார சேவையை நாங்கள் நோக்கும்போது தோட்டப்புறங்களின் சுகாதார சேவை விசித்திரமான ஒரு நிலையில் இருப்பதைக் காணலாம். இந்தத் தோட்டப்புறங்களிலே இருக்கின்ற வைத்திய நிலையங்கள் - medical centres தோட்ட நிர்வாகத் தினால் நடத்தப்பட்டு வருகின்றவையாகவே காணப்படு கின்றன. அந்த வைத்திய நிலையங்களிலே நோயாளிகளைப் பரிசோதனை செய்து மருந்துகளை வழங்குவதற்காக இருப்பவர்கள் வைத்தியர்கள் அல்லர். அதாவது எந்தவித வைத்தியத் தகைமையும் அற்றவர்களே வைத்தியர்கள் என்பதாகக் காட்டப்பட்டு, அவர்களே அங்கு வைத்தியப் பரிசோதனைகளை மேற்கொள்பவர்களாகவும் மருந்துகளை வழங்குபவர்களாகவும் இருக்கின்றார்கள். அவர்கள் Estate Medical Assistants - EMA என அழைக்கப் படுகின்றார்கள். அவர்களுடைய தகைமை சாதாரண மருந்துப்பொருள் விற்பனை நிலையங்களில் - pharmacy களில் தொழில்புரிவதற்கு அங்கீகரிக்கப்பட்ட pharmacists களின் தகைமை அடிப்படையிலானதாக இருக்கின்றது. அந்தவொரு தகைமையை மட்டும் உடையவர்களே தோட்டப்புறங்களில் 'வைத்தியர்கள்' என்ற பாத்திரத்தை வகிக்கின்றவர்களாக இருக்கின்றார்கள்.

இது இன்னொரு வகையிலே போலி வைத்தியர்களை உருவாக்குவதற்குரிய ஓர் அடித்தளத்தை - ஆரம்பத்தை ஏற்படுத்தக்கூடியது என்பதனையும் இந்த இடத்திலே நான் ஞாபகப்படுத்த வேண்டும். ஒரு சாதாரண தகைமையின் அடிப் படையில் - pharmacist என்ற தகைமையோடு - தோட்டத்திலே இருக்கின்ற மக்களுக்கான மருந்துகளை வழங்குவதற்குச் சம்பந்தப்பட்டவர்களுக்கு அங்கீகாரம் இருக்கின்றது என்றால், அந்த நபர்கள் நகரத்திற்கு வந்து ஒரு medical centre - ஒரு மருத்துவ நிலையத்தை வைத்து நோயாளிகளுக்கு மருந்துகளை வழங்க முற்படுவதிலே என்ன தவறு இருக்கின்றது? என்றுகூட கேள்வி எழுப்ப வேண்டிய நிலைமை ஏற்படுகின்றது. ஆகவே, இது ஒரு பிழையான அடித்தளத்தை ஏற்படுத்தியிருக்கின்றது.

கடந்த காலத்தில் இருந்த சூழ்நிலைகள் - நிலைமைகள் இதற்குக் காரணமாக இருந்திருக்கலாம். ஆனால், இன்று உலகம் வளர்ச்சியடைந்திருக்கின்றது; நாடு வளர்ச்சியடைந் திருக்கின்றது; எங்களுடைய மருத்துவத் தேவைகள் அல்லது மருத்துவ வசதிகள் விரிவாக்கம் பெற்றுக் காணப்படுகின்றன. இவ்வாறான ஒரு சூழலிலே அடிப்படை மருத்துவத் தகைமை அற்றவர்களையே 'மருத்துவர்கள்' என மக்கள் கூட்டமொன்றுக்குக் காட்ட முற்படுவதென்பது மிக மோசமான ஒரு குறிகாட்டி என்பதை இங்கு நான் தெரிவிக்க வேண்டும். அந்த வகையில் இலங்கையின் வைத்திய, சுகாதார சேவைகளின் தரம் ஒருபுறம் உச்ச நிலைமைக்குச் சென்றாலும் மறுபுறம் கிராம, தோட்டப்புறங்களில் அது மிக மோசமான நிலைமையில் காணப்படுகின்றது. குறிப்பாகத் தோட்டப் புறங்களின் நிலைமை மிக மோசமாக இருக்கின்றது என்பதனை நான் இந்த அவையிலே கூறிவைக்க வேண்டும். இந்த நிலைமை மாற்றமடைய வேண்டும். இந்த நிலைமையிலிருந்து நாங்கள் மீள வேண்டும். ஆகவே இந்தத் தோட்ட வைத்தியசாலைகளை அரசு பொறுப்பேற்று, அவற் றுக்கு அரச அங்கீகாரம்பெற்ற தகைமையுடைய வைத்தி யர்களை உள்வாங்கி, அவற்றை முறையாக நடத்துவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். அதற்குரிய காலகட்டம் இன்று உதயமாகியிருக்கின்றது என்பதனை நான் இந்த இடத்திலே ஞாபகப்படுத்த விரும்புகின்றேன்.

இங்கே ஏற்கெனவே பேசிய உறுப்பினர்களின் பேச்சுக்க ளிலிருந்து ஒரு விடயத்தை என்னால் அவதானிக்கக்கூடியதாக இருந்தது. அதாவது, வைத்தியசாலைகளிலே ஊழியர்களை உள்வாங்குகின்றபோது, குறிப்பாக தமிழ் மொழி பேசுகின்ற பிரதேசங்களில் சிற்றூழியர்களை, தாதிமார்களை உள்வாங்கு கின்றபோது, அந்த மொழியைப் புரிந்துகொள்ள முடியாதவர் களைச் சேர்த்துக்கொள்வதனால், அங்குள்ளவர்கள் மொழி ரீதியாக பாரிய நெருக்கடியை எதிர்நோக்குகின்றார்கள். இவ்வாறு கடந்த காலத்தில் தமிழ் மொழி பேசக்கூடிய ஊழியர்கள் உள்வாங்கப்படாதிருந்தமை பாரிய நெருக்கடியை ஏற்படுத்தி யிருக்கின்றது. ஒரு நோயாளி தன்னுடைய பிரச்சினையை - தன்னுடைய தேவையை, தான் நோய்வாய்ப்பட்டிருக்கின்ற நிலையில் சரியாக வெளிப்படுத்திக் கொள்ள முடியாத - எடுத்துக்கூற முடியாத ஒரு பரிதாபகரமான நிலைக்குத் தள்ளப்படுகின்றார். இதற்கு முற்றுப்புள்ளி வைக்கவேண்டிய நிலைக்கு இன்று நாங்கள் வந்திருக் கின்றோம். இனிவரும் காலங்களிலே இந்த இலங்கை வைத்திய சேவை தொடர்பான பல்வேறு வகுதிகளுக்கும் உரிய உள்வாங்கல்களைச் செய்கின்றபோது - பல்வேறு மட்ட ஊழியர்களை உள்வாங்குகின்றபோது தமிழ் மொழியைப் பேசக்கூடியவர்கள் உட்பட அனைத்து சமூகங்களைச் சேர்ந்த ஊழியர்களும் உள்வாங்கப்பட வேண்டும் என்பதனையும் இங்கு நான் குறிப்பிட விரும்புகின்றேன். இவ்வாறான செயற்பாடுகளின்மூலமே எங்களுடைய சுகாதாரத்துறையைத் தலைநிமிர்த்த முடியும். அதனை நவீன பிரவேசத்துக்குள் எங்களால் கொண்டு வரக்கூடியதாக இருக்கும். அதைவிடுத்து, குறிப்பிட்ட ஒரு நகரப் பகுதியில் அல்லது ஒரு பிரதேசத்தில் பல்வேறு வசதிகளைக் கொண்ட வைத்தியசாலையை அமைத்துவிட்டால் ஒட்டுமொத்தச் சுகாதாரத்துறையுமே ஓர் அபிவிருத்தி நிலையை - ஒரு மேம்பாட்டு நிலையை அடைந்துவிடுமென்று கூறமுடியாது. எனவே, நாங்கள்

එடුත්තුක්කාට්ටියතුපෝල තෝට්ටත්තුරෙයිලේ ඉරුක්කින්ර, කිරාමප්පුරත්තිලේ ඉරුක්කින්ර සුකාතාර මර්රුම් මරුත්තුවප් පිරච්සිනෙකළෙයුම් ඉනංකණ්ටු අවර්රෛත් තීර්ප්පතන් මූලමාක ඉතෛවිට සුපිට්සමාන නිලෛක්කු එංකළාල් පයණම් සෙය්යක්කූටියතාක ඉරුක්කුම්.

ඉන්රෛය අරසාංකමානතු සුකාතාරත්තුරෛ තොටර්පාක මිකුන්ත ඊටුපාට්ටුටන් කවනම් සෙලුත්ති වරුකින්රතු. අතර්කුප් පොරුප්පාන අමෛච්චර් අවර්කළ් ඉන්තත් තුරෛයිනතු මුන්නේර්රත්තුක්කාකත් තන්නෛ අර්ප්පණිත්තුච් සෙයර්පට්ටු වරුවතෛ නාංකළ් කාණක්කූටියතාක ඉරුක්කින්රතු. වෛත්තියත්තුරෛයින් මේම්පාට්ටුක්කාක ඉත්තකෛය ඔරු චට්ටමූලත්තිනෛ අවර් ඉන්ත අවෛයිල් මුන්වෛත්තිරුක් කිරාර්. අන්ත වකෛයිලේ ඉංකේ කොණ්ටුවරප්පට්ටිරුක්කින්ර ඕමියෝපති චට්ටමූලමුම් ඉලංකෛයිනුටෛය වෛත්තියත් තුරෛයිලේ ඔරු මෛල්කල්ලාක කාණප්පටුම් එන්ර වකෛයිල් අවරතු ඉන්තච් සෙයර්පාට්ටුක්කු එනතු පාරාට්ටුක්කළෛත් තෙරිවිත්තුක්කොණ්ටු සන්තර්ප්පම් තන්තතර්කු මීණ්ටුම් නන්රි කූර්, විටෛපෙරුකින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේ ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

[අ.භා. 5.22]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1970 අංක 7 දරන හෝමියෝපති පනත සංශෝධනය කිරීමටයි අද මේ පනත් කෙටුම්පත ගෙනැවිත් තිබෙන්නේ. නමුත් වෙනත් පනත් කෙටුම්පත්වල පළමුවැනි පිටුවේම සඳහන් වෙලා තිබෙනවා කරන සංශෝධනයේ බලපෑම කුමක්ද කියලා. "සංශෝධනයේ බලපෑම යනු මෙසේය" කියා මේ පනත් කෙටුම්පතේ සඳහන් කර නැහැ. එවැනි දෙයක් තිබුණා නම් -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මේක අලුත් පනත් කෙටුම්පතක්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
සම්පූර්ණයෙන්ම අලුත් පනත් කෙටුම්පතක්. 1970 පනත පරිච්ඡින්න කිරීමකුත් ඇතිවයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනු ලබන්නේ. එතකොට මෙන්න මෙහෙම ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේක ඔබතුමාගේ කාලයට පෙර කෙටුම්පත් කරන ලද පනත් කෙටුම්පතක් බවයි කරුණු දක්වන අය මට කියන්නේ.

දෙවැනි කාරණය නම්, මේ පනත් කෙටුම්පත ගෙන එනු ලැබූ ආකාරයයි. එක්තරා විධියකට ඇමතිතුමාගේ යම් තීරණ පිළිබඳව 2016 මාර්තු 31වැනි දා අධිකරණය විසින් නියෝගය දෙනු ලැබූ පසු වහාම මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නට යෙදුණාය කියන එක තමයි කියන්නේ. ඒ අනු පිළිවෙළ බැලුවාම පෙනෙනවා, එක්තරා විධියකට අර ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවට කිසියම් වූ ආකාරයක කන්දිමක් නොකරමින්, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව ක්‍රියාත්මක නොකරමින් වහාම අලුත් පනතක් කෙටුම්පතක් හැටියට ඉදිරිපත් කර තිබෙන බව. මේක තමයි ඒ අය පෙන්වන කරුණ. මම මේ ගැන සොයා බැලුවාම ඇත්තටම පෙනුණා, 2016 මාර්තු 31වැනි දා තීන්දුව දී තිබුණත්, ඇමතිතුමා ඉතාමත්ම වැරදි සහගත ලෙස ක්‍රියාත්මක වුණාය කියලා. ඉන් පසුව 2016 අප්‍රේල් මාසයේ 12වැනි දා මේ පනත් කෙටුම්පත ගැසට් කරනවා. මාර්තු 31වැනි දා නඩු තීන්දුව දෙනවා. නමුත් නඩු තීන්දුව ක්‍රියාත්මක වීමක් නැහැ. ඒ වෙනුවට සිද්ධ වන්නේ අප්‍රේල් මාසයේ 12වැනි දා මේ පනත් කෙටුම්පත ගැසට් කිරීමයි. ඊට පසුව අප්‍රේල් මාසයේ 18වැනි දා ඒක නිකුත් කරලා, එය ජූනි මාසයේ 7වැනි දා මේ ගරු සභාවට ඉදිරිපත් කරලා, ජූලි මාසයේ 5වැනි දා -අද- දෙවැනිවර කියැවීමට ගන්නවා. මෙහි තිබෙන කරුණු අනුව සුප්‍රීම් උසාවියේ නඩු තීන්දුවත් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමත් අතර තිබෙන ඉතා සමීප කාල පරාසයෙන් පෙන්නුම් කරන්නේ මෙය සුප්‍රීම් උසාවියේ නඩු තීන්දුව මහහැර යාමට ගනු ලැබූ පියවරක් බවයි.

හොඳයි, එසේ වුණත් අපි මේ පනත් කෙටුම්පත අරගෙන බැලුවාම පෙනෙනවා, මේක කලින් කෙටුම්පත් කළ පනතයි කියා. නමුත් ඒ දවස්වල හෝමියෝපති වෛද්‍යවරුන් විසින් ගෙන එනු ලැබූ විරෝධතාවන් නිසා මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර අත් හිටුවා තිබෙනවා. ඒ විරෝධතාවන්ට පදනම් වූ එක කාරණයක් තමයි, මේ පනත් කෙටුම්පතින් ඇමතිතුමාට ලබා දී තිබෙන බලය, හෝමියෝපති වෛද්‍යවරුන්ගේ වෛද්‍ය සභාවට තේරී පත් වන මන්ත්‍රීවරුන්ගේ බලය ඉක්මවා යනවාය කියන එක.

Then, Clause 46.(1), under “complaints made against the Council” states, I quote:

> “Where the Minister is of the opinion that the Council is not complying with any of the provisions of this Act or upon receipt of a complaint against the Council, he may refer that non compliance or the complaint to the Secretary.....”

Then, the Secretary will give a report back to the Minister and the Secretary will direct the Council to act according to what the Secretary thinks is right.

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

Council එක මොන මතයක් දැරුවත්, අවසාන වශයෙන් ඇමතිතුමාගේ මතය කවුන්සිලයේ මතයට පටහැනිව, ඊට උඩින් ක්‍රියාත්මක වෙන්නට නියමිතයි. හෝමියෝපති කවුන්සිලයක් ඡන්දයෙන් පත්වෙලා, ඒ කවුන්සිලයේ තීන්දුවක් ඇමතිතුමාගේ තීන්දුවත් එක්ක පටහැනි වුණු හැටියේ, ඒ කවුන්සිලයට නියමයක් එනවා, "මේක ක්‍රියාත්මක කරපන්" කියලා. ඒක ඔවුන් කළ යුතුයි කියා මෙහි නියම කර තිබෙනවා. මේ කාරණය, ඔවුන් විරෝධය දක්වන එක කාරණයක්. දෙවැනි කාරණය උපාධිධාරින් -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඇමතිගේ appointees ලා ඉන්නවා. මට පුළුවන් තීන්දුවක් ගන්න, අපි එහෙම කරන්නේ නැති වුණාට.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

එසේ කළත්, එය නොකර ඉන්න කවුන්සිලයට ඇති අයිතිය පිළිබඳව තමයි ගැටලුව තිබෙන්නේ.

අනෙක් අතට, සාධාරණ හේතු මත හා දැක්විය හැකි හේතු මත ඒ කවුන්සිලයෙන් ඉවත්වීමක් වෙන්නේ නැහැ. දැන් Medical Council එක කියනවා වාගේ, ඔවුන් ඇමතිවරයාගේ උපදෙස්වලට පටහැනිව හේතු දැක්වීමක් කරලා තිබෙනවා අනන්තවත් වාරවල.

දෙවන කාරණය තමයි, ලියා පදිංචි වෙන්න පුළුවන් හෝමියෝපති උපාධිධාරින්ට විතරයි කියන නියමය. යම් යම් ගුරුවරුන් යටතේ හෝමියෝපති වෛද්‍ය විද්‍යාව ඉගෙනගෙන, විවිධ තැන්වල හොමියෝපති වෛද්‍ය වෘත්තියේ නියැලෙන විශාල පිරිසක් ලංකාවේ ඉන්නවා. ඒ අතර ව්‍යාජ උදවියත් ඉන්නවා. ව්‍යාජ උදවියගෙන් අනෙක් අය තෝරා බේරා ගන්න කටයුතු කරලා, ඔවුන්ට යම් කිසි පරීක්ෂණයක් පවත්වාලා, යම් කිසි පුහුණුවක් ලබා දීලා -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

පනතේ ඒක තියෙනවා. ඒ ගොල්ලන්ට ඉඩ දෙනවා, විභාගය සමත් වුණොත් ඒ නියම තත්ත්වයට එන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒක උපාධිධාරින්ට පමණක් තිබෙන නියමයක්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

නැහැ, නැහැ. අනෙක් Clause එකේ තියෙනවා, ඉතිරි අයටත්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

උපාධිධාරින් නොවන අයට දෙවරක් විභාගයට ඉන්න පුළුවන්?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

පුළුවන්. විභාගයෙන් සමත් වුණොත් registration එක දෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒ දෙවාරයෙන් පස්සේ ඒ ගොල්ලන්ට ඒ හිමිකම නැතිවෙලා යනවා. විභාගය දෙවරකට පමණක් සීමා කිරීම ඒ ගොල්ලන්ගේ එක දුක්ගැනවිල්ලක්. එසේ දෙවරකට සීමා නොකරන ලෙස ඒ ගොල්ලන්ගේ ඉල්ලීමක් තිබෙනවා.

ඊළඟට ඒ අය සංශෝධන ගණනාවක් යෝජනා කර තිබෙනවා, ඉදිරිපත් කරන්න කියලා. මම ඒ සංශෝධන අද ඉදිරිපත් කර තිබෙනවා. ඔබතුමා මේ වෙනකොට ඒ සංශෝධන දැකලා ඇති. එක සංශෝධනයක් තමයි, මේ නියෝජිතයන් ඡන්දයෙන් පත්වන ක්‍රමය. ඒ ඡන්දය ලේකම්ගේ කැමැත්ත අනුව ක්‍රියාත්මකවන ඡන්දයක් හැටියට තමයි මේ කෙටුම්පතේ තිබෙන්නේ. ලේකම් තමයි ඒ ඡන්දය ක්‍රියාත්මක කරන්නේ. දැන් මේ වෛද්‍යවරු කියන්නේ, 1997 නියෝගවල තිබුණ විධියට මේ ඡන්දය පවත්වන්න කටයුතු සලස්වන්නය කියලායි. එසේ කරනවා නම්, වඩා සාධාරණව ඡන්දයක් පැවැත්වෙයි කියලා ඒ ගොල්ලන්ට විශ්වාස කරන්න පුළුවන්ලු. දැන් තිබෙන හැටියට මේ ඡන්දය ලේකම්වරයාගේ කැමැත්තට, අභිමතයට යටත්වයි, ඔහුගේ වුවමනාවේ හැටියටයි සිද්ධ වෙන්නේ. ලේකම් එහි අවසාන බලධරයා බවට පත්වීම, අවසාන වශයෙන් ඇමතිවරයාගේ බලය කවුන්සිලය මත පිහිටුවීමක් වෙනවාය කියන එක තමයි එමගින් කියන්නේ.

ඊළඟ කාරණය මෙකයි. කවුරුන් හෝ ඉවත් කරනවා නම්, ඒ ඉවත් කරන්නේ කිසියම් වූ හේතුවක් දක්වමින්ය - on assigned reasons -කියලා පනත් කෙටුම්පතේ සඳහන් වනවා. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය දක්වපු කාරණයට සැලකීමක් කරලා, ඒ අයට කියන්නට තිබෙන දේ, ඔවුන්ගේ නිදහසට කියන්නට තිබෙන දේ, ඔවුන්ගේ නිවැරැදිභාවයට කියන්නට තිබෙන දේ කීමට අවස්ථාවක් සලසා දීමක් ගැන ඒ වගන්තියේ අවසානයේ හෝ කොතැනක හෝ සඳහන් කරලා නැහැ. ඒ නිසා තමයි මා ඒ ගැන සංශෝධනයක් ඉදිරිපත් කරන්නේ.

එහෙම ඉවත් කරනවා නම්, සභාව මඟින් ඒ ගොල්ලන්ට චෝදනා පත්‍රයක් දෙන්න ඕනෑ. චෝදනා පත්‍රයක් දීලා, සාධාරණ, ස්වාධීන පරීක්ෂණයක් පවත්වලා, ඒ පරීක්ෂණයෙන් ඔවුන් වරදකරුවන් වනවා නම්, ඒ කාරණය මත ඔවුන් ඉවත් කිරීමේ බලයක් ඇමතිතුමාට ලබා දිය යුතුයි කියන එක සාධාරණ බවයි ඔවුන්ගේ මතය. ඒ වාගේම අපේ මතයත් ඒකයි.

ඊළඟට, ඡන්දය පවත්වන ආකාරය පිළිබඳ ප්‍රශ්නයත් එක්ක, මණ්ඩලයේ - Council - බලය පිළිබඳ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම බැඳිලා තිබෙනවා. ඡන්දය පැවැත්වීම සඳහා ඉදිරිපත් කර තිබෙන විධි ක්‍රමය තුළ, හෝමියෝපති වෛද්‍යවරුන්ගේ බහුතර කැමැත්ත අනුව එය සිද්ධ වීම පිළිබඳව සහතිකයක් නැති බව ඒ වෛද්‍යවරුන්ගේ මතයයි. බැලූ බැල්මට මටත් එය පෙනී යනවා. ඒ නිසා, අමාත්‍යතුමා විසින් ඒ වෛද්‍යවරුන් විමසා මේ කටයුතු කළා නම් හොඳයි කියන එකයි මගේ අදහස. මේ ගැන කරුණු කියන අයට ඔබතුමා හමු වීමට අවස්ථාවක් දීලා, ඒ අයගේ අදහසුත් එකතු කරගෙන, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඔවුන් දැක්වූ විරෝධතාද සැලකිල්ලට ගෙන, එදා -රාජිත සේනාරත්න ඇමතිතුමාත්, මමත් සිටිය අපේ ආණ්ඩුවේ- තිස්ස

කරල්ලියද්ද හිටපු ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ එයට දැක්වූ විරෝධයටත් හේතු විමසා බලා, ඒ හේතුත් පදනම් කරගෙන මේ ගැන අවසන් තීරණයක් ගැනීම සුදුසුයි කියලායි මා කල්පනා කරන්නේ.

ගරු ඇමතිතුමනි, මේ පනත් කෙටුම්පත අදම තුන්වන වර කියවා අවසන් කිරීමට ඔබතුමා දැඩි වුවමනාවක් දක්වන්නේ නැත්නම්, අද දින දෙවන වර කියවා, තුන්වන වර කියැවීම සඳහා ඉදිරි දිනයකට කල් තැබුවොත්, ඒ සඳහා අපට අවස්ථාවක් ලබා ගන්න පුළුවන්. මා දන්නේ නැහැ, ඇමතිතුමා ඒ ගැන දරන ආකල්පය කුමක්ද කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, අපි ඒ කාරණය පිළිගෙන කටයුතු කරනවා. අතුරලියේ රතන ස්වාමීන් වහන්සේත් සංශෝධන දීලා තිබෙනවා. "විධායක අධ්‍යක්ෂවරයා" කියන කොටස ඉවත් කරන්න කියලා මා මුලදීම කිව්වා. මා අද තමයි ඇත්තටම ඒක දැක්කේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
විධායක අධ්‍යක්ෂවරයෙක් පත් නොකර ඉන්න ඔබතුමා එකඟද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක මා දැනගෙන හිටියේ නැහැ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
විධායක අධ්‍යක්ෂවරයකු පත් කිරීමේ අවශ්‍යතාවක් නැහැ. මොකද, Sri Lanka Medical Council එකේත් විධායක අධ්‍යක්ෂවරයෙක් නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Registrar කෙනෙක් විතරයි නේ ඕනෑ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
Sri Lanka Medical Council එක විධියේ Council එකක් හෝමියෝපති එකටත්, ආයුර්වේදයටත් හදන්න කියලා තමයි මා instructions දුන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක හොඳයි. මා විධායක අධ්‍යක්ෂ ජනරාල්වරයා ගැන කථා කරන්නයි මේ හැදුවේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මගේ මුල් කථාවේදීම ඒක කිව්වා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඇත්තටම මගේ සංශෝධනයක් තිබෙනවා. "විධායක අධ්‍යක්ෂවරයා" යන්න සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමටත්, රෙජිස්ට්‍රාර්වරයාගෙන් පමණක් Council එකේ කටයුතු කරගෙන යෑමටත් ඔබතුමා එකඟ නම් ඒ ගැන මගේ සතුටක්, ප්‍රශංසාවක් පළ කරන්න ඕනෑ. ඒ විධායක අධ්‍යක්ෂවරයා ඇත්තටම කවුන්සිලය අභිභවා යනවා. ඔබතුමා දැන් ඉවත් කරන්න එකඟ වෙලා තිබෙන නිසා ඒ ගැන කථා කිරීම අවශ්‍ය නැහැ.

ඊළඟට, ලියාපදිංචි කිරීමේ ක්‍රියාදාමය හා වෙනත් බොහෝ දේ ගැන ඔබතුමා රෙගුලාසි හදනවා ඇතියි කියා අපි බලාපොරොත්තු වනවා. දැනට ශිෂ්‍යත්ව ලබාගෙන ඉන්දියාවට යන අපේ රටේ දරුවන් ලංකාවට ආවාම ඔවුන්ට රජයේ රැකියාවක් ලැබෙන්න ඕනෑ. ඒ අය එන්නේ උපාධියකුත් ලබාගෙනයි. එහෙම ආපු 270දෙනකු පමණ දැනට රැකියා නැතුව ඉන්නවා. මා හිතන හැටියට ඔබතුමා ඒ සඳහා රජයේ ප්‍රතිපාදන ලබා ගත යුතුයි. ශිෂ්‍යත්වයක් ලබාගෙන ඉන්දියාවට ගිහින් උපාධියක් ලබාගෙන ලංකාවට ආවාට පස්සේ ඔවුන්ට යම්කිසි ආකාරයක පත්වීමක් ලබා දීමට හැකියාවක් නැත්නම්, මේ ශිෂ්‍යත්ව ලබා දීමේ තේරුමකුත් නැහැ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමනි, මම ආයුර්වේද උපාධිධාරීන් 700දෙනාටම පත්වීම් දෙන්න කැබිනට් අනුමැතිය ගත්තා. ඒක තමයි ලංකාවේ ආයුර්වේද උපාධිධාරීන්ට තිබුණු ලොකුම ප්‍රශ්නය. ඊට පසුව මේ අයගේ ප්‍රශ්නයත් ඉදිරිපත් කරලා, ඔවුන් වෙනුවෙනුත් යමක් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ අය වෙනුවෙනුත් යමක් කරන්න, ගරු ඇමතිතුමනි.

Sri Lanka Medical Council එක SAITM එක පිළිගන්නේ නැති තත්ත්වයක් තුළ ඔබතුමා එහි බලය මේ විධියට තමන් අතට ගන්නේ හෝමියෝපති කවුන්සලය හරහාවත් SAITM එකේ උදව්ය ලියා පදිංචි කිරීමේ යටි අරමුණක් තිබෙන නිසාය කියා ඒ අය තුළ සැකයක් තිබෙනවා. මේ ඔබතුමාට කියන්නේ ඒ අය තුළ තිබෙන සැකය ගැනයි. ඔබතුමාගේ කථාවේදී ඒ සැකය දුරු කරමින් කථා කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මම එහෙම කරන්නේ කොහොමද, ගරු මන්ත්‍රීතුමනි?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මෙතුමන්ලා තුළ තිබෙන සැකයක් ගැනයි මම මේ කිව්වේ. ඒ අයට මේ රටේ වෛද්‍ය වෘත්තියේ නියැළෙන්නට යම්කිසි අවකාශයක් ලබාදෙන්න ඔබතුමා යම් උපක්‍රමයක් යොදාවි කියා ඔවුන් හිතනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඕනෑ නම් Sri Lanka Medical Council එක භරහා SAITM එකට මේ registration එක දෙන්න මට ප්‍රතිපාදන තිබෙනවා. ඔබතුමා ඒක දන්නවා නේ. SLMC Regulationsවල තිබෙනවා, directive එක දෙන්න මට පුළුවන් බව. ඔබතුමා දැක්කා නේ, මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහත්මයා කර තිබුණු ප්‍රකාශය.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්, මම දැක්කා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

"රාජිත සේනාරත්න ඇමතිතුමා මගේ දීර්ඝකාලීන මිත්‍රයෙක්, අදත් ඒ මිත්‍රත්වය තිබෙනවා, අද වනතුරු මේ පිළිබඳව ඉහියක් හෝ කර නැහැ" කියා එතුමා කියා තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒක තමයි. එහෙම වුණොත්, එතුමා එම සංගමයේ ඉන්නේ නැහැ කියලාත් කියා තිබෙනවා. මේක ලොකු ප්‍රශ්නයක්; මේ රටේ ඇමිණි ඇමිණී තිබෙන ප්‍රශ්නයක්. මේ ගැටලුව අවසන් කර ගන්න තිබෙන විධිය මේකයි. ගරු ඇමතිතුමනි, දැනට වෛද්‍ය සංගමයත් එක්ක ඔබතුමාගේ පරස්පරතාවක් තිබෙනවා. මේ පරස්පරතාව දුරු කරගන්න ඕනෑ. වෛද්‍ය සංගමයයි, ඔබතුමායි ඉතා සමීපව එකට එකතු වෙලා වැඩ කරන්න ඕනෑ. ඔබතුමා ශිෂ්‍යයා කාලයේ වෛද්‍ය ශිෂ්‍ය සහ දන්ත වෛද්‍ය ශිෂ්‍ය කියන අංශ දෙකේම ශිෂ්‍ය නායකයා නේ. වෘත්තීය සමිති එක්ක වැඩ කරලා ඔබතුමාට තරම් හුරුවක් වෙන කාටවත් නැහැ. ඒ නිසා ඔබතුමා වෛද්‍ය සංගමය එක්ක වැඩ කරන්නත් ඕනෑ, වෛද්‍ය සංගමය යෝජනා කරන -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙන සියලුම වෘත්තීය සමිති මාත් එක්ක වැඩ කරනවා. වෛද්‍ය සංගමයත් වැඩ කරනවා. වෙන වෙන දේවල් ඔළුවේ තියාගෙන ඉන්න කොටසකුත් වෛද්‍ය සංගමයේ ඉන්නවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය කියන්නේ, වෘත්තීය සමිතියක් හැටියට මේ රටේ ඉතාම බලවත්, ඒ වාගේම යම් බුද්ධිමත් තලයක ඉන්නා වූ පිරිසකගෙන් සැදුම් ලත් සංගමයක්. ඒ නිසා ඔබතුමා මේ සංගමයත් එක්ක එකහත්වයකට ඇවිත් වැඩ කරන්න ඕනෑ. SAITM එක ආණ්ඩුවට අරගෙන, ඒ මඟින් මේ අයට යම්කිසි ආකාරයක සහනයක් වන වැඩ පිළිවෙළක් යොදලා, මේ අර්බුදය ඉවර කරන්න කියා ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. මේ ප්‍රශ්නය නිසා අපේ ශිෂ්‍යයෝ තැන් තැන්වල දිගටම පිකටින් කරගෙන යනවා. ඔවුන් හැම දාම වතුර පහරවල්, බැටන් පහරවල්, කඳුළු ගෑස් පහරවල් කාලා විසිරී යනවා. මේ විධියට දිගටම අපට යන්න පුළුවන්කමක් නැහැ. මම හිතන විධියට රජයේ වෛද්‍ය සංගමයේ උපදේශය පිළිගැනීම මේ කාරණය විසඳීමට තිබෙන මාවතයි. මෙය විසඳීමට කටයුතු නොකිරීමෙන් අනවශ්‍ය ලෙස මේ ප්‍රශ්නය දිග් ගස්සා ගැනීමක් සිදු වෙනවා.

ගරු ඇමතිතුමනි, මෙතැන අප කවුරුත් දන්නා එක්තරා කාරණයක් තිබෙනවා. පෞද්ගලික අංශයේ වෛද්‍ය විද්‍යාල ඇති කර ගැනීමට තිබෙන අයිතිය සඳහා දීර්ඝ කාලයක් මුළුල්ලේ සටන් කරන ව්‍යාපාරික ප්‍රජාවක් ඉන්නවා. ඔවුන් උත්සාහ කරන්නේ මේ රටේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල, විශ්වවිද්‍යාල ඇති කරගෙන ඒවා තමන්ගේ ප්‍රධාන ව්‍යාපාර ආයතන කරගන්නයි. නමුත්, එම විද්‍යාල සඳහා බඳවා ගැනීමේ පටිපාටියේදී මුදල් ගෙවන්න පුළුවන් අයව තමයි ඒවාට බඳවා ගන්නේ. එතකොට හිත්වලට ලොකු වේදනාවක් එනවා, මුදල් තිබෙන අය බඳවා ගැනීමත්, මුදල් නැති අය බඳවා නොගැනීමත් ගැන.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඔය විරුද්ධ වන කට්ටිය 2015 ජනවාරි 8වැනි දායින් පසුව ඔය විරෝධය පළ කරන්නේ ඇයි? මීට කලින් -ඔය ආයතන පිහිටුවන කොට, Sri Lanka Medical Council එකට ඔය යෝජනාව ඉදිරිපත් වෙන කොට- නේ, විරුද්ධ වෙන්න තිබුණේ. කාලෝ ෆොන්සේකා මහත්මයා Sri Lanka Medical Council එකට ගෙනාවේම මොකටද? අප දන්නවා නේ. මේක බොරුවක් නොවෙයි නේ. මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහත්මයා මටත් කථා කළා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දිගටම මේ විරෝධය තිබුණා නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

එතුමා ගෙනාවෙත් මේ දේවල් කර ගන්න නේ. පූර්වයෙන් අවශ්‍ය වන කටයුතු ටික සකස් කරලා තමයි මේ දේවල් කළේ. එතකොට ඒ රජයේ ජනාධිපතිවරයා ඇතුළු සියලු කට්ටිය සිටියේ කොහේද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු ඇමතිතුමනි, ඔය කරුණු ඔබතුමාගේ කථාවේදී කිව්වොත් හොඳයි. මොකද, මගේ වෙලාව නේ යන්නේ. මා කිව්වේ, මේ ප්‍රශ්නය දිග්ගැස්සුණු ප්‍රශ්නයක් කියලායි. අර කලිනුත් කිව්වා වාගේ, ඔබතුමා අර්බුද විසඳන ඇමතිවරයෙක්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මගේ අමාත්‍යාංශයේ විෂය පථයට නොවෙයි නේ මෙය අයත්ව තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මා හිතන හැටියට, ඒක තමයි එක ප්‍රශ්නයක්ව තිබෙන්නේ. නමුත් එය ඔබතුමාගේ විෂය පථයට ඇතුළත් කර ගත හැකියි, එය රජයේ වෛද්‍ය විද්‍යාලයක් බවට පත් කර ගැනීම මඟින්. එතකොට ඒ අය එන්නේ ඔබතුමාගේ විෂය පථයට අයත් රජයේ රෝහල්වලටයි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
උසස් අධ්‍යාපන අමාත්‍යාංශයටයි අයිති.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක හරි. එතකොට ඒ අය clinical practice සඳහා ඔබතුමාගේ රෝහල්වලට එනකොට ඔබතුමාටත් අයිති වනවා නේ. Clinical practice නිසා නේ මේ ඔක්කෝම හුටපටය ඇති වෙලා තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එය පිළිගත්තොත් විතරයි නේ-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක තමයි. පිළිගැනීමේ ප්‍රශ්නයට ඔබතුමා මැදිහත් වීම සුදුසුයි, මෙය වෛද්‍ය වෘත්තියට සම්බන්ධ කාරණයක් වන නිසා. වෛද්‍ය වෘත්තියට සම්බන්ධ නැති නීතිඥයකු කොහොමද මේ ප්‍රශ්නය විසඳන්නේ? මහාමාර්ග හා උසස් අධ්‍යාපන කියන අංශ දෙක එකට පටලවායි දීලා තිබෙන්නේත්. එතුමාගේ නීතිඥ වෘත්තියේ දැනුමින් මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නය විසඳන්න ඔබතුමා, එතුමාට උදව්වක් කරන්න ඕනෑ කියලා මා හිතනවා.

ගරු ඇමතිතුමනි, ඊළඟට මා කියා සිටින්නේ මෙම පනත් කෙටුම්පතෙහි සඳහන් වෛද්‍ය සභාවේ ඔබතුමාට ඇති බලය ගැනයි. මෙය ඔබතුමා හදපු පනත් කෙටුම්පතක් නොවෙයි. නමුත් ඔබතුමා මේ පනත හාර ගත්තා; හදා වඩා ගත්තා. මේ පනතේ දැන් තිබෙන ඡන්ද ක්‍රමය සම්පූර්ණයෙන් අත්තනෝමතික ඡන්ද ක්‍රමයක්. ඒ වාගේම වෛද්‍ය සභාවෙන් ඉවත් කිරීමේ බලය ඔබතුමා ලබාගෙන තිබෙනවා. කිසියම් හෝ පදනමක් නැතිව, චෝදනා පත්‍රයක් විභාග කිරීමක් නැතිව එය කළ හැකියි.

අනෙක් අතට, ඔබතුමා මෙම පනත් කෙටුම්පතේ 46වන වගන්තිය යටතේ ගන්නා වූ ක්‍රියා මාර්ග සඳහා ඊට අවශ්‍ය කරන වෙනත් මතයක් විමසා බැලීමට තිබෙන්නා වූ ඒ මූලික සිද්ධාන්තය ස්වභාවික යුක්තියේ ඇතුළත් වන විධියට මේ පනත් කෙටුම්පතේ අදාළ තැන් සංශෝධනය කරන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලනවා. කාරක සභා අවස්ථාවේදී සංශෝධන කීපයක් ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වනවා. නමුත් මෙම පනත් කෙටුම්පත තුන්වන වර කියවීම ඉදිරියට කල් තබා මේ පිළිබඳව දුක්ගැනවිලි ඉදිරිපත් කර තිබෙන, පැමිණිලි ඉදිරිපත් කර තිබෙන හෝමියෝපති සංගම්වල නියෝජිතයන් සමඟ ඔබතුමා සාකච්ඡා කළොත් හොඳයි කියලා මම නැවතත් කියනවා. මේ විවාදය කල් තබා, සාකච්ඡා කිරීමෙන් පසුව තුන්වන වර කියවීම සඳහා කටයුතු කරන්න කියලා මම නැවත වරක් ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමනි, මේ කරුණුවලට ඇහුම් කන් දීලා ඔබතුමාගේ අවසාන කථාවේදී යම් තීරණයක් ඉදිරිපත් කරාවි කියලා මා බලාපොරොත්තු වනවා.

අවසාන වශයෙන්, මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, 891/2009 අංකය දරන, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව කියවා බලන්න කියා. ඒ නඩු තීන්දුව කොයි තරම් බරපතළ ලෙස ඇමතිවරයාගේ ක්‍රියා කලාපය දෝෂ දර්ශනයට ලක් කර තිබෙනවාද කියන එක එහි අවසාන ඡේද තුනහතරෙන් පෙන්නුම් කරනවා. ඇමතිවරයාට අත්තනෝමතික බලයක් නොතිබිය යුතුය කියන කාරණය එහි මූලික වශයෙන් පෙන්වා දී තිබෙනවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන මූලික අයිතිවාසිකම්, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන රාජ්‍ය ප්‍රතිපත්ති ආදි වූ කරුණු ඇසුරින් තමයි අභිමතය කියන එක යොදාගත හැකි වන්නේ කියන කාරණය ශ්‍රේෂ්ඨාධිකරණය ඉතා බැරෑරුම්ව සඳහන් කර තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය දුන් මේ තීන්දුව ක්‍රියාත්මක කරනවා වෙනුවට, එය ක්‍රියාත්මක කිරීමට පෙර ඔබතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ඒ තරම්ම හොඳ සම්ප්‍රදායක් නොවෙයි කියලායි මා කියන්නේ. මේ නඩුව ඉදිරිපත් කර තිබෙන්නේ 2009 දියි. නමුත් මේ නඩුව අහන්නේ 2016දියි. මේකත් හොඳ තත්ත්වයක් නොවෙයි. 2009 දී පවරපු නඩුවක් 2016දියි විභාගයට ගන්නේ. කුමක් නිසාද ඒ ප්‍රමාදය සිදු වුණේ කියන කාරණය ගැනත් වෛද්‍යවරුන්ගේ අදහසක් තිබෙනවා, වුවමනාවෙන්ම මේ නඩු විභාගය කල් දමා ගත්තාය කියලා.

නීතිපති දෙපාර්තමේන්තුව ආණ්ඩුවේ නියෝජිත ආයතනය හැටියට යම් යම් බොරු හේතු ඉදිරිපත් කිරීම නිසා මේ නඩුව ඇහෙන එක කල් දමා ගනිමින් ක්‍රියාත්මක වුණා කියලා චෝදනාවක් තිබෙනවා. අන්තිමට ඒ නඩුව විභාග කරලා තීන්දුව දෙන්නේ 2016 මාර්තු මාසයේ 31වැනි දා. මේක බරපතළ ප්‍රශ්නයක්. මේ කාරණය ඊටත් වඩා බරපතළයි. ඒ නඩු තීන්දුව දීලා ඉවර වෙන කොටම ඔබතුමා ගෙනෙනවා මේ පනත් කෙටුම්පත. මාර්තු මාසයේ නඩු තීන්දුව දෙන්නේ. අප්‍රේල් 12වැනි දා මේ පනත් කෙටුම්පත ගැසට් කරන්නේ. මේ නඩු තීන්දුවට ප්‍රතිවිරුද්ධව, මේ නඩු තීන්දුව අභියෝගයට ලක් කරමින්, මේ නඩු තීන්දුව ක්‍රියාත්මක නොකිරීමට තමයි ඔබතුමා මේ ක්‍රියාමාර්ගය අරගෙන තිබෙන්නේ. මේ ක්‍රියාමාර්ගය ගැනීම ප්‍රජාතන්ත්‍රවාදීද, නීතියේ ආධිපත්‍යයට ගරු කිරීමක්ද, යහ පාලනයේ මූලික සිද්ධාන්තයක්ද කියන කරුණු අපි කවුරුත් විමසනවා. අද මේ රටේ බුද්ධිමතුන් අතුරින් ප්‍රශ්න මතු වෙනවා. Coal tender එක ගැන ප්‍රශ්න මතු වෙනවා. මහ බැංකුවේ බැඳුම්කර පිළිබඳව ලැබී තිබෙන අවසාන තීරණ ගැන දැන් මේ රටේ කථා වෙනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මහ බැංකුව සම්බන්ධයෙන් ගත්තු තීරණය හොඳ නැද්ද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳයි කියලායි මම කියන්නේ. ඒක ගැන කථා වෙනවාය කියන එකයි මම කිව්වේ. ඒ වාගේම යහ පාලනයට අයිතිද, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවකට අනියම් ලෙස අභියෝග කිරීම?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මොකක්ද නඩු තීන්දුවේ තිබෙන්නේ?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නඩු තීන්දුව මම කියවන්නම්. මෙන්න නඩු තීන්දුව.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නඩු තීන්දුවේ තිබෙන්නේ ඉවත් කිරීම වැරදියි කියලායි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඉවත් කිරීම වැරැදියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අලුතින් Interim Council එකක් පත් කිරීම වැරැදියි කියලාද කියන්නේ?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, නැහැ. ඇමතිතුමා අත්තනෝමතික ලෙස තමන්ගේ අභිමතය භාවිත කිරීම වැරැදියි. ඒ වාගේම මේ උදව්යට තමන්ගේ කරුණු කීමට අවස්ථාවක් නොදීම වැරැදියි. ඒ අය ඉවත් කිරීම නවත්වන්න සභාවක් පවත්වන්න කියලා උසාවිය තීන්දුව දීලා තිබෙන්නේ. ඉවත් කිරීම වැරැදියි; සභාව වලංගුයි. සභාව පවත්වන්න. ඔබතුමා ඒක කළේ නැහැ නේ. සභාවේ වලංගුභාවය නැවත ඇති කරන්න කියලා උසාවිය කියලා තිබෙනවා. ඒක කරනවා වෙනුවට ඔබතුමා කළේ අලුත් පනත් කෙටුම්පතක් ගෙනාපු එක.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ තීන්දුවේ තිබෙනවාද සභාව පවත්වන්න කියලා?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නඩු තීන්දුවේ තිබෙන්නේ අයින් කරපු හැටි වැරැදියි, නමුත් Interim Council එක පිළිගන්නවා කියන එකයි. අලුතෙන් පත් කරපු Interim Council එක Supreme Court එක පිළිගන්නවා නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මොකක්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එදා හිටපු ඇමතිතුමා අලුතෙන් Interim Council එකක් පත් කළා නේ. Supreme Court එක ඒක challenge කරලා නැහැ. ඒක පිළිඅරගෙනයි තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Interim Council එක නොවෙයි ප්‍රශ්නය. මේ අය ඉවත් කිරීම වැරැදියි. මේ අය ඒ සභාවේ සාමාජිකයන් හැටියට සිටිය යුතුයි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඉවත් කිරීම වැරැදියි කියලා නොවෙයි. ඉවත් කළ ක්‍රමවේදය වැරැදියි කියලායි තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ. ඉවත් කිරීමම වැරැදියි කියලායි තිබෙන්නේ. මම මේක කියවන්නම්. මේකේ highlight කරලා තිබෙන ටික මම කියවන්නම්. මට තිබෙන වෙලාව තුළ මේක කියවලා ඉවර කරන්නම්.

The Supreme Court Determination states, I quote:

"I hold that the Minister has acted wrongly in thus removing the members of the Council arbitrarily, and capriciously as the Petitioners were not appraised of the accusations against them, and not heard them before such removal and thus the rule of natural justice, audi alteram partem was not adhered to.

Accordingly, the Minister on his own does not have a right to appoint members to the Council.

…. I find that there is no authority for the Minister to appoint members all of a sudden the way he thinks fit …

I hold that the Minister has acted ultra vires his powers granted to him by the Act. He has abused the powers given by the Act in reaching the goals for which the Act was enacted.

I hold that the fundamental rights of the Petitioners enshrined in Articles 12, and 14(1)g have been infringed…

.... I declare that the removal of the Petitioners from the membership of the Homeopathic Council is null and void. I hold that the appointments of the 4th to 10th Respondents as members of the Council are null and void. Therefore I make order to cancel the said appointments with effect from the date of appointment, even though they have all ceased to hold office by now."

ඒ ඔබතුමාගේ සාමාන්‍ය සම්ප්‍රදාය නොවෙයි. අධිකරණයක් තීන්දුවක් දුන්නාට පස්සේ ඒ අධිකරණයේ තීන්දුවට කෙළින්ම පහර වදින හැටියට පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනැල්ලා, දින දහයක්, දොළහක් ඇතුළත ගැසට් කරලා ඉදිරිපත් කිරීම සාමාන්‍ය විධියට ඔබතුමා කරන දෙයක් නොවෙයි. මේ නම්, ඔබතුමා ඉන්න ආණ්ඩුවේ ඇමති ධුරයේ වරදක්; ඒ ඇමති ධුරයේ ආභාසයේ බලපෑම නිසා වුණ දෙයක්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
කිසිම බලපෑමක් නැහැ. මම ඒ දිනවලම කිව්වා, Ayurvedic Medical Council එක, Homoeopathic Medical Council එක -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එහෙමනම් අර විධියට කරමු. තුන්වැනි වර කියවීම කල් දමලා -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
Sri Lanka Medical Council එක විධියට හදලා - [බාධා කිරීමක්]

ඒ අනුව මේ අය මට දුන්නා. ඔය නඩුව ඇහුවාය කියන කාල පරිච්ඡේදයේ මම රෝගාතුර වෙලායි හිටියේ. මම එන අවස්ථාවේ මෙය ලැහැස්ති කර තිබුණා. ඒ අනුව මම ක්‍රියා කළා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

ඒ වුණත් ඔබතුමා මේ නඩු තීන්දුව දිහා බැලිය යුතුව තිබුණා. මේ නඩු තීන්දුව දිහා බලලා තමයි ඔබතුමා මේ පනත් කෙටුම්පත ගැසට් කළ යුතුව තිබුණේ. ඒත් කමක් නැහැ. මම මේ කියන්නේ දැන් වෙච්ච දේවල් වුණා. නමුත් ඒක විය යුතුව තිබුණේ නැහැ. මා දන්නා විධියට ඔබතුමා නොවෙයි එය කළේ. ඒකයි මම කියන්නේ. අපි කථා-බහ කරපු දෙන්නා හැටියට මේවා ගැන හිතන විධිය ගැන, ක්‍රියා කරන විධිය ගැන බැලුවාම මම දන්නවා.

කෙසේ නමුත්, තුන්වැනි වර කියවීම කල් දමලා ඒ අයත් එක්ක කථා බස් කරන ලෙස මම නැවතත් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. සාමාන්‍යයෙන්, ලිච්ඡවි පාලන ක්‍රමයේ මූලික දේ "සම්මුතිය." [බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

නිතරම අරගල කරනවා මිසක් කිසිම දියුණුවක් -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

නැහැ, නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා එක්වරක් ඔවුන්ට ඇහුම් කන් දීලා, මේ පනත් කෙටුම්පතේ තිබෙන -

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

කථා බහ කළා. කථා කළාම මේ සභාවේ තිබෙන සංයුතියයි - අරවයි මේවායි - මිස, හෝමියෝපති ක්‍රමය දියුණු කිරීමක් ගැන ඒ අයට වුවමනාවක් නැහැ. ඒ අය කියන්නේ මේක නිකම් සමුපකාර ඡන්දය වාගේ කරලා බලය අරගෙන කටයුතු කිරීමක් වාගේ දෙයක්. [බාධා කිරීමක්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

ඔබතුමාට තමයි තිබෙන්නේ මේවා දියුණු කිරීමේ වගකීම.

හෝමියෝපති වෛද්‍යවරුන්ට මේ ගැන කැක්කුමක් තිබෙනවා, මේ හෝමියෝපති ක්‍රමය ඉදිරියට ගෙන යාම ගැන. ඔවුන්ගේ පැවැත්ම නේ ඒක.

ඒ වෙනුවට, මේ තිබෙන්නා වූ බලතලවල යම් කිසි වෙනසක් කරමින් ඔබතුමා මේ හෝමියෝපති වෛද්‍යවරුන්ගේ සංගමය පත් කිරීමේදී මීට වඩා, - මීට වඩා නොවෙයි - ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමට වුවමනා වැඩ පිළිවෙළ යොදන මෙන් ඉල්ලනවා.

මම නැවතත් කියා සිටින්නේ, තුන්වැනි වර කියවීම කල් දමා මේ සඳහා එක අවස්ථාවක් ලබා දෙන්න පුළුවන් නම් මේවා බෙරුම් කර ගන්න පුළුවන් බවයි. එසේ නොවෙනවා නම් ඒක අවාසනාවක්; ඒක ඔබතුමාගේ කීර්තිමත් ජීවිතයේ එක්තරා නරක අවස්ථාවක් බව කියමින්, මගේ කථාව අවසන් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

විනා විවාදයේ, ඒකමතිකව පිළිගනු ලැබිණි.
අතන්පටි, සභාව විසින් දෙවන වර කියවීම සඳහා පිළිගන්නා ලදී.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

තීරණය කරන ලදී.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Rajitha Senaratne.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]

කුලුගෙදරේ සාකච්ඡා කරන ලදී.
[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[MR. PRESIDING MEMBER in the Chair.]

1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 1 ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවීම.)

வாசகம் 2.-(ஓமியோபதிசார் மருத்துவப் பேரவையினைத் தாபித்தல்.)

CLAUSE 2.- (*Establishment of the Homoeopathic Medical Council.*)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(i) "2 වන පිටුවේ, '2 වන සහ 3 වේළි ඉවත් කරන්න'".

(3) (අ) (i) ඉවත් කරනවා.

(ii) "2 වන පිටුවේ, 17 වන වේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

"යුතු සාමාජිකයින් පස් දෙනකු"

(3) (ආ)හි නියෝජනය 4 සිට 5 දක්වා වැඩි කරනවා. ඒ කියන්නේ, විධායක අධ්‍යක්ෂවරයා වෙනුවට ඡන්දයෙන් එන තවත් වෛද්‍යවරයෙකු පත් කිරීමට බලතල දෙනවා.

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

2 වන වගන්තිය, සංශෝධිකාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

2ආම් වාරකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause2, as amended, ordered to stand part of the Bill.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

තුන්වන වගන්තිය සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

3 වන වගන්තිය.- (සභාවේ සාමාජිකයකු ලෙස තෝරාගැනීමට හෝ පත් කරනු ලැබීමට ඇති නුසුදුසුකම්.)

வாசகம் 3.-(பேரவையின் உறுப்பினர் ஒருவராகத் தேர்ந்தெடுக்கப்படுவதற்கு அல்லது நியமிக்கப்படுவதற்கான தகைமையீனம்.)

CLAUSE 3.- (*Disqualification for being elected or appointed as a member of the Council.*)

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

3වන වගන්තිය ඉවත් කොට, එය මෙසේ සංශෝධනය විය යුතුය කියා අප අදහස් කරනවා.

"අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන්ගේ මණ්ඩලය සමන්විත විය යුත්තේ නිල බලයෙන් පත් වන සාමාජිකයන් හතරදෙනෙකුද, ඒ ඇරුණු විට ඡන්ද විමසීමකින් වෛද්‍යවරුන් විසින් තෝරා පත් කරනු ලබන වෛද්‍යවරුන් වන සාමාජිකයින් හතරදෙනෙකුද, ඇමතිවරයා විසින් පත් කරන සුදුසු සාමාජිකයන් තුන්දෙනෙකුද විය යුතුය. නිල බලයෙන් පත් වන සභිකයන්ට ඡන්දය දීමේ බලයක් නොතිබිය යුතුය."

මෙය තමයි, මගේ සංශෝධනය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

එම සංශෝධනයට අපට එකඟ වන්න බැහැ. මොකද, අනෙක් සභාවලත් - Sri Lanka Medical Council එකෙත් - නිල බලයෙන් පත් වන අයට ඡන්දය දීමේ අයිතිය තිබෙනවා. අනෙක් සියලුම ඒවායේ සංඛ්‍යාවන් ඔබතුමන් කියූ ආකාරයටයි තිබෙන්නේ.

3 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3ආම් වාරකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 3 ordered to stand part of the Bill.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

4 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීමට ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

4 වන වගන්තිය.-(සාමාජිකයින් ධුරයෙන් ඉවත් කිරීම.)

வாசகம் 4.-(உறுப்பினர்களைப் பதவியிலிருந்து அகற்றுதல்.)

CLAUSE 4.- (*Removal of the Members from office.*)

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන වගන්තිය ඉවත්කොට එය මෙසේ සංශෝධනය කරන්න:-

'අමාත්‍යවරයා හට නිල බලයෙන් පත් වූ හෝ ඔහු විසින් පත් කරනු ලබන සාමාජිකයන් හැර අනෙකුත් සාමාජිකයෙකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කළ හැකි ය. එසේ වුවද එබඳු සාමාජිකයන් සම්බන්ධයෙන් වුවද වෛද්‍ය සභාව විසින් ඉදිරිපත් කරනු ලබන චෝදනා පත්‍රයක් මත කරනු ලබන සාධාරණ අපක්ෂපාති පරීක්ෂණයකින් පසුව පමණක් එය විය යුතු ය.' "

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

අමාත්‍යවරයා හට නිල බලයෙන් පත් වූ සාමාජිකයන් හැර වෙනත් ඕනෑම සාමාජිකයකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කළ හැකි ය.

ගරු මන්ත්‍රීතුමා යෝජනා කළ පරිදි වෛද්‍ය සභාවෙන් එසේ චෝදනා පත්‍රයක් ලබා දීම සිදු කළ නොහැක්කේ වෛද්‍ය සභාව නියෝජනය වන්නේ ද එම සාමාජිකයන් මඟින්ම වන නිසායි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

ඔබතුමා එක් සාමාජිකයෙක් ඉවත් කරන්න යනවා නම්, අපි මෙතැනදී envisage කරන්නේ ඒ යම් පුද්ගලයෙක් ඉවත් කරන වේලාවක් නේ. ඒ වෙලාවේදී වෛද්‍ය සභාව විසින් ඔහුට චෝදනා පත්‍රයක් ලබා දීලා, ඒ ගැන පරීක්ෂණයක් කරලා එය සිදු කරන්න කියන එකයි අපේ ඉල්ලීම වන්නේ. කොහොම වුණත් වෛද්‍ය සභාව දෙන චෝදනා පත්‍රයක් මත-

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, එවැනි ක්‍රමවේදයක් අනික් Medical Councils වලත් නැහැ. ඒකයි ප්‍රශ්නය.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

එහෙම නම් මගේ සංශෝධනය මා මෙසේ ඉදිරිපත් කරනවා:

වෛද්‍ය සභාව විසින් දෙනු ලබන චෝදනා පත්‍රයක් උඩ නොවෙයි නම්, අඩු ගණනේ ඔබතුමා යම් ආකාරයකින් ලබා දෙන චෝදනා පත්‍රයක් විභාග කිරීමෙන් පසුව සිදු කරන්නක් බවට එය පත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඔබතුමාගේ ඔය සංශෝධනයේ ආකාරයටම කළ හැකියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"3 වන පිටුවේ, 17 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'හැර වෙනත් ඕනෑම සාමාජිකයකු යම් විමර්ශනයකින් පසු හේතු දක්වා ධූරයෙන් ඉවත් කළ'"

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 4, as amended, ordered to stand part of the Bill.

5 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

5ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 5 ordered to stand part of the Bill.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

6 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීමට ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

6 වන වගන්තිය.- (2(3) (ආ) වගන්තියේ කාර්යය සඳහා සාමාජිකයන් තෝරා ගැනීම.)

வாசகம் 6.- (பிரிவு 2(3)(ஆ) என்பதன் நோக்கத்திற்காக உறுப்பினர்களைத் தேர்ந்தெடுத்தல்.)

CLAUSE 6.- (*Election of the members for the purpose of section 2 (3) (b).*)

ගරු වාසුදේව නානායක්කාර මහතා

(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)

(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"6 වන වගන්තිය ඉවත්කොට එයට පහත සඳහන් සංශෝධනය ආදේශ කරන්න:-

'ඡන්දය පැවැත්විය යුතු ආකාරය 1997 හෝමියෝපති සභාව තෝරාපත් කිරීමේ නියෝගයන්ට අනුව හෝ ඊට සමාන නියෝගයන් මත රහස් ඡන්දයකින් තෝරාපත් කර ගත යුතු ය.' "

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

හෝමියෝපති වෛද්‍ය සභාව ඡන්දයෙන් පත් කළ යුතු ආකාරය පිළිබඳ ඉදිරියේදී නියෝග සකස් කර ඉදිරිපත් කිරීමට නියමිතයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා

(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)

(The Hon. Vasudeva Nanayakkara)

ඒ අවස්ථාවේදී ඔබතුමා ඒ නියෝග ගන්න.

6 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 6 ordered to stand part of the Bill.

7 සහ 8 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

7ஆம், 8ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது

Clauses 7 and 8 ordered to stand part of the Bill.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

9 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීමට ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි.

9 වන වගන්තිය.- (සභාවේ සාමාජිකයන්ගේ ධූර කාලය)

வாசகம் 9.- (பேரவையின் உறுப்பினர்களின் பதவிக்காலம்.)

CLAUSE 9.- (*Term of office of the members of the Council.*)

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)

(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"සභාවේ නිල බලයෙන් පත් වන සෑම සාමාජිකයෙකුම තමාගේ ධූරය ප්‍රකාරව දෙවරක් පමණක් ධූරය දැරිය යුතු ය."

'ධූරය දරන තාක්කල්' යන්න වෙනුවට 'දෙවරක් පමණක් දැරිය යුතුය' යනුවෙන් සංශෝධනය විය යුතුයි.

ස්ථිර සාමාජිකයන්ට ඕනෑම කාලයක් ඉන්න පුළුවන්. ඒ නිසා අනිත් සාමාජිකයන් ඉවත්වෙනවා වාගේ එම සාමාජිකයන් ද ඉවත් වෙන්න ඕනෑ. ඒ නිසා මම ඒ වගන්තිය දෙවරක් පමණක් දැරිය හැකිය යනුවෙන් සංශෝධනය කරනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

එහිදී එවැනි තත්ත්වයක් ඇති වෙන්නේ නැහැ. මොකද, "නිල කාලය දෙවරක් යන්න" නිල බලයෙන් පත්වන නියෝජිතයන්ට අවශ්‍ය වන්නේ නැහැ. මොකද, එවැනි නිලධාරින් ස්ථාන මාරුවීම් ලැබ ඉවත්වීම් සිදුවේ.

Sri Lanka Medical Council එකේත් සිටින මේ වාගේ *ex-officio* කට්ටිය, එයාගේ *ex-officio* තනතුර තිබෙනතාක් ඉන්නවා. සමහර වෙලාවට ඔහු වෙනත් තනතුරකට එතැනින් ඉවත් වෙලා යනවා. එතකොට ඔහුගේ නිල කාලය ඉවරයි.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මම හිතන විධියට නිල බලයෙන් පත් නොවූ වෛද්‍ය සභාවේ අය වාර්ෂිකව අවුරුදු තුනෙන් තුනට ඉවත් වෙනවා. නමුත් නිල බලයෙන් පත්වෙන අයට ඕනෑ තරම් කාලයක් ඉන්න පුළුවන්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
Sri Lanka Medical Council එකෙත් එහෙමයි. නිල බලයෙන් පත්වෙන කට්ටිය දිගටම ඉන්නවා. ඒ ගොල්ලන් සිටින කාලයේ අවසන් දිනයක් කියලා නැහැ. ඒ ගොල්ලන් ඉවත්වෙන්නේ ඒ තනතුරෙන් ඉවත් වුණාමයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ලේකම් කිව්වොත් එක්කෙනෙක්ම නොවෙයි. ඊළඟට වෙනත් ලේකම් කෙනෙක් එන්න පුළුවන්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එතකොට සමහර වෙලාවට අවුරුදු තුනක් යන්නෙත් නැහැ. අවුරුද්දෙන් ඔහු වෙනත් තැනකට ගියාට පසු මේ තැනට වෙනත් කෙනෙක් පත් වෙනවා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මම හිතුවේ, එකම ධුරයක එක්කෙනෙක් දීර්ඝ කාලයක් සිටිනකොට ආධිපත්‍යයක් එනවා කියායි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එහෙම සිදුවෙන්නේ නැහැ.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
බොහොම ස්තුතියි.

9 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

9ආම් වාසකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.

Clause 9 ordered to stand part of the Bill.

10 සිට 14 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

10ආම් වාසකත්තිලිරුන්දු 14ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.

Clauses 10 to 14, ordered to stand part of the Bill.

15 වන වගන්තිය.- (සභාවේ අරමුණු.)
வாசகம் 15.- (பேரவையின் குறிக்கோள்கள்.)
CLAUSE 15.- (*Objects of the Council*.)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"7 වන පිටුවේ, 13 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඉ) රජයේ හෝමියෝපති ශික්ෂණ රෝහල හැර' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

15 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

15ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 15, as amended, ordered to stand part of the Bill.

16 වන වගන්තිය.- (සභාවේ බලතල.)
வாசகம்16.- (பேரவையின் தத்துவங்கள்.)
CLAUSE 16.- (*Powers of the Council*.)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඇත්තටම මේවා එදා කමිටුවේදී ඉදිරිපත් කළ සංශෝධන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

" 8 වන පිටුවේ, (1)'10 වන පේළියේ සිට 13 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' (ඇ) (i) මේ පනත යටතේ හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හෝ ආයතන නියාමනය කිරීමේ කාර්යය සඳහා එම හෝමියෝපති වෛද්‍ය විද්‍යාල සහ ආයතන විසින් අවම ප්‍රමිති පවත්වාගෙන යනු ලබන බවට තහවුරු කිරීම පිණිස එම විද්‍යාල සහ ආයතන අධීක්ෂණය කිරීම, ඒවාට ඇතුළු වීම, පරීක්ෂා කිරීම, සෝදිසි කිරීම සහ විමර්ශනය කිරීම සඳහා; සහ

(ii) ලියාපදිංචි හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයකු විසින් පමණක් හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ නියැලෙන බව සහ එම ආයතන නියෝග මඟින් නියම කරනු ලබන අවම ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාකරනු ලබන බව තහවුරු කිරීම පිණිස හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ නියැලෙන ආයතන අධීක්ෂණය කිරීම, ඒවාට ඇතුළු වීම, පරීක්ෂා කිරීම, සෝදිසි කිරීම හා විමර්ශනය කිරීම සඳහා,

වෛද්‍ය පරීක්ෂකවරුන් පත් කිරීම; ' ; "

(2) '27 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනයට සම්බන්ධ අධ්‍යයන පාඨමාලා, විභාග, කාර්ය මණ්ඩලය, උපකරණ, නවාතැන්, පුහුණුව, රෝහල්, අනෙකුත්

වෛද්‍ය පහසුකම් පිළිබඳව සහ හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම සම්බන්ධව අවම ප්‍රමිති නියම කිරීම සහ පවත්වා ගෙන යාම'''

"9 වන පිටුවේ, 26 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ජ) සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන යම් කොන්දේසිවලට යටත්ව කලින් කල යම් නිලධරයකු හෝ කමිටුවක් වෙත යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය පැවරීම'''

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
තිරුත්තංගළ් විටුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Amendments put, and agreed to.

16 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
16ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 16, as amended, ordered to stand part of the Bill.

17 වන වගන්තිය.- (රීති සෑදීම සඳහා සභාව සතු බලතල)

வாசகம் 17.- (விதிகளை ஆக்குவதற்குப் பேரவைக்குள்ள தத்துவம்.)

CLAUSE 17.- (*Power of the Council to make rules*.)

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාර්ය මණ්ඩලයේ වැටුප් සම්බන්ධව 17 වන වගන්තියේ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"කාර්ය මණ්ඩල වැටුප් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත වැටුප් තලයන්හි අවමයන්ට යටත්ව පවත්වාගෙන යා යුතුයි."

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අදාළ කාර්ය මණ්ඩලය සඳහා අනුමත වැටුප් පිහිටුවීමට කටයුතු කළ හැකිය.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"10 වන පිටුවේ, 6 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව විමසා කාර්ය මණ්ඩලය සඳහා වැටුප්, වේතන හෝ වෙනත්'"

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

17 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
17ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 17, as amended, ordered to stand part of the Bill.

18 වන වගන්තිය.- (සභාවේ රෙජිස්ට්‍රාර්වරයා සහ වෙනත් නිලධරයන් සහ සේවා නියුක්තිකයන්.)

வாசகம் 18.- (பேரவையின் பதிவாளர் மற்றும் வேறு அலுவலர்கள்.)

CLAUSE 18.- (*Registrar and other officers and employees of the Council*.)

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 18(1) වගන්තියට මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"වෛද්‍ය සභාව සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් වන්නේය."

මොකද, තාවකාලික පත්වීම් කළොත් ඒ අය ඉවත් වෙනවා. ඉන් පසුව හෝමියෝපති වෛද්‍ය සභාවේ ප්‍රවර්ධනයට එය හානියක් වන නිසා මේ සංශෝධනය ගෙන එනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මේකේ රෙජිස්ට්‍රාර් තනතුර ස්ථිර කරන්නට බැහැ. අවුරුදු 5කට වරක් එය පත් කිරීම කරනවා. අනෙක් කාර්ය මණ්ඩලය ස්ථිරව ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"10 වන පිටුවේ, 23 වන පේළිය ඉවත් කොට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) හේතු දක්වා කලින් ධුරයෙන් ඉවත් කළ හොත් මිස වසර පහක කාල සීමාවක් සඳහා සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කරනු ලැබිය යුතු'"

"11 වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු ය'"

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

18 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
18ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 18, as amended, ordered to stand part of the Bill.

19 වන වගන්තිය. - (විධායක අධ්‍යක්ෂවරයා පත් කිරීම.)

வாசகம் 19. - (நிறைவேற்றுப் பணிப்பாளரின் நியமனம்.)

CLAUSE 19.- (*Appointment of the Executive Director*.)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

19 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඉදිරිපත් නොකරමි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

19 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඒක අවශ්‍ය වෙන්නේ නැහැ නේද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

දැන් අවශ්‍ය නැහැ. මොකද, 2(3)(අ)(i) වගන්තිය ඉවත් කිරීමෙන් විධායක අධ්‍යක්ෂ ධුරය සම්පූර්ණයෙන් ඉවත් කිරීමටත්, ඉන් පුරප්පාඩු වන වෛද්‍ය සභාවේ සාමාජික ධුරය වෙනුවෙන් 2 (3)(ආ) යටතේ ඡන්දයෙන් තේරී පත් වන හෝමියෝපති වෛද්‍යවරුන් සංඛ්‍යාව 4 සිට 5 දක්වා වැඩි කිරීමට එකඟ වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"11 වන පිටුවේ. 4 වන පේළියේ සිට 21 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

19 වන වගන්තිය පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.
19ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 19 ordered to be left out of the Bill.

20 වන වගන්තිය. - (අධ්‍යක්ෂවරයාගේ කර්තව්‍යයන්)

வாசகம் 20.- (பணிப்பாளரின் பணிகள்.)

CLAUSE 20.- (*The functions of the Director*.)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"11 වන පිටුවේ, 22 වන පේළියේ සිට 28 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න."

"12 වන පිටුවේ, 1 වන සහ 2 වන පේළි ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

20 වන වගන්තිය පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.
20ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 20 ordered to be left out of the Bill.

21 සිට 29 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
21ஆம் வாசகத்திலிருந்து 29ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 21 to 29 ordered to stand part of the Bill.

30 වන වගන්තිය.- (හෝමියෝපති ලේඛනය.)

வாசகம் 30.- (ஓமியோபதிசார் மருத்துவத் தொழிலாளர்களின் பதிவேடு.)

CLAUSE 30.- (*Register of Homoeopathy*.)

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේක වෛද්‍යවරුන්ගේ ඉල්ලීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 30 වන වගන්තියට මා පහත සඳහන් සංශෝධනය එකතු කරන ලෙස ඉල්ලා සිටිනවා:

"1970 අංක 7 දරන හෝමියෝපති පනත යටතේ නීත්‍යානුකූලව නිල වශයෙන් පත් වූ හෝමියෝපති වෛද්‍ය සභාවෙන් අවසන් වරට ප්‍රකාශිත ගැසට් නිවේදනයේ සඳහන් (පොදු හා සාමාන්‍ය) පුද්ගලයන් පමණක් ලියා පදිංචි වෛද්‍යවරුන් හැටියට මෙම පනත යටතේද සැලකිය යුතුය."

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

1970 අංක 7 දරන හෝමියෝපති පනතේ 25වෙනි වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන පොදු හෝමියෝපති ලේඛනය එලෙසම නව පනත යටතේත් පවත්වාගෙන යනු ලැබේ. දැනට ලියා පදිංචිය නොමැති අය සඳහා හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයෙකු ලෙස ලියා පදිංචි වීමට පනතේ 32වෙනි වගන්තිය යටතේ ප්‍රතිපාදන සලසා ඇත.

30 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

30ආම් වාසකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 30 ordered to stand part of the Bill.

31 වන වගන්තිය.- (හෝමියෝපති වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වීම සඳහා වන සුදුසුකම්.)

வாசகம் 31.- (ஓமியோபதிசார் மருத்துவத் தொழிலராகப் பதிவுசெய்யப்படுவதற்கான தகைமைகள்.)

CLAUSE 31. - (*Qualifications for registration as a Homoeopathic practitioner.*)

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 31 වන වගන්තියට මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"31. (ආ) වන වගන්තිය මෙලෙස සංශෝධනය විය යුතුය:

'එසේ නමුත් සීමාවාසික ශිෂ්‍යයන් සඳහා පුහුණු වීමටත් යම් රෝගයකට විශේෂඥතාව ඇති විදේශික වෛද්‍යවරුන් සඳහා තාවකාලික ලියාපදිංචිය දිය හැකිය.' "

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

31. (ආ) විදේශික වෛද්‍යවරුන් සඳහා තාවකාලිකව ලියාපදිංචි කිරීම සඳහා 31.(4) වගන්තිය හඳුන්වා දීමටත් 31.(1) වගන්තියේ (ආ) හැර අනෙකුත් සියලු සුදුසුකම් සහිත වගන්ති අදාළ විය යුතුය.

තාවකාලික ලියාපදිංචියේ කාලසීමාව මාස තුනක් ද හයක් ද යන්න පිළිබඳව නියෝග සකස් කළ යුතුය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"22 වන පිටුවේ, 15 වන පේළියට ඉක්බිනිවම පහත සඳහන් කොටස ඇතුළත් කරන්න:

'(4). (1)(ආ) උප වගන්තියේ කුමක් සඳහන් වුව ද, 31 වන වගන්තියේ අනෙකුත් විධිවිධානවලට යටත්ව සහ සභාව විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් නියම හා කොන්දේසි මත ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් තැනැත්තකුට තාවකාලික ලියාපදිංචිය ප්‍රදානය කළ හැකි ය.'"

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

31 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

31ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 31, as amended, ordered to stand part of the Bill.

32 සිට 39 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

32ஆம் வாசகத்திலிருந்து 39ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 32 to 39 ordered to stand part of the Bill.

40 වන වගන්තිය.- (ලියාපදිංචි නොවූ හෝමියෝපති වෘත්තිකයකු ලියාපදිංචි හෝමියෝපති වෘත්තිකයකු බවට ඇඟවීම හෝ වාසි සඳහා හෝමියෝපති වෘත්තිකයකු ලෙස වෘත්තියේ යෙදීම වරදක් වන බව.)

வாசகம் 40.- (பதிவு செய்யப்பட்டவோர் ஓமியோபதிசார் தொழிலராகப் பாவனை செய்தல் அல்லது பதிவு செய்யப்படாதிருந்து ஓமியோபதிசார் தொழிலரொருவராக ஆதாயத்திற்காகத் தொழில்புரிதல் தவறொன்றாதல்.)

CLAUSE 40. - *(Pretence to be a registered Homoeopathic Practitioner, or practicing for gain as a Homoeopathic Practitioner when not registered, to be an offence.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"26 වන පිටුවේ, 15 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'පසු රුපියල් දෙලක්ෂයකට නොඅඩු දඩයකට හෝ වසරක්' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

40 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

40ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 40, as amended, ordered to stand part of the Bill.

41 සිට 48 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

41ஆம் வாசகத்திலிருந்து 48ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 41 to 48 ordered to stand part of the Bill.

49 වන වගන්තිය.- (නියෝග.)

வாசகம் 49.- (ஒழுங்குவிதிகள்.)

CLAUSE 49. - *(Regulations.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"31 වන පිටුවේ, 5 වන පේළියේ සිට 10 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'හිමිකම් ලැබීම පිණිස හේතු වන යම් සුදුසුකමක් ප්‍රදානය කිරීමේ හෝ පිරිනැමීමේ කාර්යය සඳහා යම් හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක හෝ වෙනත් ආයතනයක හැදෑරිය යුතු අධ්‍යයන පාඨමාලා, විභාග, කාර්ය මණ්ඩලය, උපකරණ,

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

නවානැන් පහසුකම් පුහුණුව සහ වෙනත් පහසුකම්වලට අදාළ ප්‍රමිතීන් ද ඇතුළුව හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනය සහ හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම පිළිබඳ අවම ප්‍රමිතීන් : "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විධික්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

49 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

49ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.
Clause 49, as amended, ordered to stand part of the Bill.

50 සහ 51 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

50 ආම්, 51 ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු
Clauses 50 and 51, ordered to stand part of the Bill.

52 වන වගන්තිය.- (ඉවත් කිරීම සහ ව්‍යාවර්ථන.

வாசகம் 52. – (நீக்கமும் பேணல்களும்)

CLAUSE 52. – (*Repeal and Savings.)*

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"32 වන පිටුවේ, 28 වන පේළියට ඉක්බිනිවම පහත සඳහන් කොටස ඇතුළත් කරන්න:

'(ඉ) ඉවත් කරන ලද පනත යටතේ සභාව සඳහා පත් කළ මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ දී සභාවේ සේවයේ යෙදෙන සියලු නිලධරයන් සහ සේවකයන් මෙම පනත යටතේ සභාවේ නිලධරයන් හා සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර ඔවුන් එවැනි නියම සහ කොන්දේසි මත දිගටම සේවයේ නියුක්ත කළ යුතු ය.'"

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විධික්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

52 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

52ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.
Clause 52, as amended, ordered to stand part of the Bill.

53 වන වගන්තිය.- (හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව.)

வாசகம் 53.- (இடைக்கால ஓமியோபதிசார் மருத்துவப் பேரவை.)

CLAUSE 53. - (*The interim Homoeopathic medical Council*.)

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 53 වන වගන්තියට මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

'53 වන වගන්තියේ, (1) (2) වගන්ති ඉවත් කොට පහත සඳහන් සංශෝධනය ඇතුළත් කරන්න:

'ඡන්දයකින් තෝරාපත් කරගත් වෛද්‍ය සභාවක් විසින් මෙම පනත ක්‍රියාත්මක කරනතුරු දැනට තිබෙන වෛද්‍ය සභාව පවත්වාගෙන යා යුතුය.' "

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

දැනට හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය භාරය අතුරු පාලක කමිටුව මඟින් සිදු කරන බැවින් සභාවේ කර්තව්‍ය ඉටු කළ යුත්තේ අතුරු පාලක කමිටුව මඟිනි. අතුරු පාලක කමිටුවේ කාල සීමාව මාස හයකට සීමා කිරීම, නියෝග සෑදීම වැනි ඉදිරි කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන බැවින් අවුරුදු දෙකක කාල සීමාවකට බලපැවැත්වීම සුදුසුය.

ගරු මන්ත්‍රීතුමනි, ඉස්සෙල්ලා තිබුණේ අතුරු කමිටුව අවුරුදු පහකටයි. ඒක තමයි මේ අවුරුදු දෙකකට අඩු කර තිබෙන්නේ.

53 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

53ආම් වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.

Clause 53, ordered to stand part of the Bill.

54 සහ 55 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

54ආම්, 55ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.
Clauses 54 and 55 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

චට්ටමාකු වාසකමුම් තලෛප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටදු.
චට්ටමූලම් තිරුත්තංකළුටන් අරික්කෛ චෙය්‌යප්පට්ටදු.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

විනා විධුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
අදන්පඩි, චට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්‌රාම්මුරෛයාක මදිප්පිඩප්පට්ටු නිරෛවේර්‌ත්‌රප්පට්ටදු.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තැබීමේ යෝජනාව, ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය.

විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් මුහුණපාන ගැටලු
மாற்றுத்திறனாளிகள் எதிர்நோக்கும் பிரச்சினைகள்
PROBLEMS FACED BY PERSONS WITH SPECIAL NEEDS

[பி.ப. 6.12]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இப் பிரேரணையைச் சமர்ப்பிப்பதற்கு அனுமதியளித்தமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. MUJIBUR RAHUMAN *left the Chair and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)

"இலங்கையிலே இயலாமையுடன் கூடிய நபர்களுக்காக வழங்கப்படும் உதவிகள், வசதிகள், சலுகைகள் மற்றும் அவர்களுக்கான உரிமைகள் என்பன முழுமையாக வழங்கப் படுவதில்லையென்ற காரணத்தினால், அவற்றை வழங்க உரிய நடவடிக்கை எடுக்கவேண்டும்" என்ற பிரேரணையை நான் இங்கு முன்வைக்கின்றேன். அதிலும் குறிப்பாக வடக்கு, கிழக்கிலே 30 வருடகால யுத்தத்தின் விளைவாக இயலாமை யுடன் கூடியவர்களாக உருவாகியிருப்பவர்களுக்கான அடிப் படை வசதிகள்கூட இன்னமும் செய்து கொடுக்கப்படாமையை இங்கே சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

1948ஆம் ஆண்டின் அனைத்துலக மனித உரிமைப் பிரகடனத்தின் பிரகாரம் 1975ஆம் ஆண்டு இயலாமையுடன் கூடிய ஆட்களுக்கான உரிமைகள் பிரகடனம் உருவாக்கம் செய்யப்பட்டது. இதனடிப்படையிலே, 1996ஆம் ஆண்டின் அங்கவீனமுற்ற ஆட்களின் உரிமைகள் பாதுகாப்புச் சட்டம்மீது இலங்கை அக்கறை செலுத்தியது. ஆனாலும், 2007ஆம் ஆண்டில்தான் அப்பொழுது சமூக சேவை அமைச்சராக இருந்த, தற்போது பாராளுமன்ற உறுப்பினராக இருக்கின்ற கௌரவ டக்ளஸ் தேவானந்தா அவர்கள் அந்தப் பிரகடனத்திலே கையொப்பமிட்டார். ஆனால், 2016ஆம் ஆண்டுதான் அது இலங்கையால் ஏற்றுக்கொள்ளப்பட்டது. வ்வாறு ஏற்றுக் கொள்ளப்பட்ட அந்தப் பிரகடனமானது "1996ஆம் ஆண்டின் 28ஆம் இலக்க அங்கவீனமுற்ற ஆட்களின் உரிமைகள் பாதுகாப்புச் சட்டம்" என்ற வகையிலே ஏற்றுக்கொள்ளப் பட்டிருந்தாலும் இது ஓர் எழுத்துமூலமான சட்டமாகவே இலங்கையில் இருந்துவருகின்றது. இங்கு கூறப்பட்டுள்ள இந்த இயலாமையுடன் கூடிய நபர்களுக்காக வழங்கப்படவேண்டிய வசதிகள் அல்லது அவர்களுக்குரிய உதவிகள் எதுவும் நடைமுறையில் இல்லாமை இங்கே சுட்டிக்காட்டத்தக்கது. உதாரணமாக இந்தச் சட்டத்தின் 13வது பிரிவின் 'ஊ' பகுதியிலே, அங்கவீனமுற்ற ஆட்கள் தொடர்பிலும் அவர்களுக்குக் கிடைக்கக்கூடியதாக இருக் கின்ற சேவைகள் பற்றியும் சரியான புள்ளிவிபரங்களைப் பேணுதல் வேண்டுமென்று குறிப்பிடப் பட்டிருக்கின்றது. ஆனால், யுத்தம் முடிவடைந்து 7 வருட காலம் நிறைவடைந்த பின்பும் இவ்வாறான ஒரு சரியான புள்ளிவிபரம் வடக்கு, கிழக்கிலே திரட்டப்படாமை இங்கே சுட்டிக்காட்டப்பட வேண்டும்.

அதுமட்டுமல்ல, அந்த 13ஆவது பிரிவின் 'ஒ' எனும் பகுதியில் "அங்கவீனமுற்ற ஆட்களுக்குச் சிறந்த வாழ்க்கைத் தரத்தை உறுதிசெய்தல் வேண்டும்" என்று குறிப்பிடப் பட்டிருக்கின்றது. ஆனால், யுத்தத்தின் விளைவாக அங்கவீன முற்றவர்களுக்குரிய அடிப்படை வசதிகள்கூட இன்னும் செய்துகொடுக்கப்படாமை மிகவும் வேதனைக்குரிய ஒரு விடயமாகும். இடுப்புக்குக்கீழ் இயங்காமல் 7 வருடங்களுக்கும் மேலாகப் படுக்கையில் இருப்பவர்களுக்குக் கட்டில்கூட வழங்கப்படாமை, அவர்களுக்குரிய வசதியான கழிப்பறைகள் அமைத்துக் கொடுக்கப்படாமை போன்றவை இங்கு சுட்டிக்காட்டப்பட வேண்டிய விடயங்களாகும். இதனிலும் மேலாக அப்பிரிவின் 'ஔ' எனும் பகுதியில் "அங்கவீனமுற்ற ஆட்களுக்குத் தங்குமிட வசதியளித்துப் பராமரிப்பதற்கும் அத்தகைய ஆட்களுக்கு கல்வி மற்றும் தொழிற்பயிற்சி வழங்குவதற்கும் நிறுவனங்கள் தாபிக்கப்படுதல் வேண்டும்" என்றும் குறிப்பிடப்பட்டிருக்கின்றது.

யுத்தம் முடிவடைந்து 7 வருடங்களாகி விட்டன. நல்லாட்சி அரசும் ஏற்படுத்தப்பட்டிருக்கின்றது. இந்த ஏழு வருட காலத்திலே இயலாமையுடன் கூடிய நபர்கள் விசேடமாக கவனிக்கப்படவில்லை. அவர்களுக்கு வசதியான வீடுகளோ, விசேட கல்வித் தேவைகளோ, தங்குமிட வசதிகளோ அமைத்துக் கொடுக்கப்படாமை இங்கே சுட்டிக்காட்டப்பட வேண்டிய

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය]

විடயங்களாக இருக்கின்றன. அதுமட்டுமல்ல, 17.10.2006ஆம் திகதிய 1467/15 ஆம் இலக்க வர்த்தமானி அறிவுறுத்தலுக்கு அமையவும், திருத்தப்பட்ட 18.09.2009ஆம் திகதிய 1619/24ஆம் இலக்க அதிவிசேட வர்த்தமானி அறிவித்தலுக்கு அமையவும், 17.06.2013ஆம் திகதிய உச்ச நீதிமன்ற வழக்கு இலக்கம் எப்.ஆர் 221/2009 இன் கீழ் வழங்கப்பட்ட தீர்ப்பின் பிரகாரமும் "சகல பொதுக்கட்டிடங் களிலும் இயலாமையுடன்கூடிய நபர்களுக்கான அணுகு வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்பட வேண்டும்" என்று கூறப்பட்டிருக்கின்றது. ஆனால், வடக்கு - கிழக்கு பகுதிகளிலே இன்றும் மிகவும் முக்கிய பொதுக்கட்டிடங்களாக இருக்கின்ற வங்கிகளிலேகூட இத்தகைய வசதிகள் செய்துகொடுக்கப் படவில்லை. அங்கு இயலாமையுடன் கூடிய நபர்கள், சக்கர நாற்காலியில் சுழன்றுகொண்டிருப்பவர்கள் மற்றும் கோல் களின் உதவியுடன் நடப்பவர்கள் தமது காசுப் பரிமாற் றங்களைச் செய்துகொள்ள முடியாதிருக்கின்றனர். அந்த வகையிலே, பொதுக் கட்டிடங்களில் அவர்களுக்கான அணுகு வசதிகள் செய்துகொடுக்கப்படாமை சட்டப்படி குற்றமாகும்.

மேலும், பொதுப் போக்குவரத்துச் சேவைகளில் இயலாமை யுடன் கூடிய நபர்கள் இலகுவாகப் பயணம் செய்வதற்கு உரிய வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்படுவதில்லை. இங்கு ஒரு விடயத்தை நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். கிளிநொச்சி பகுதியிலே சக்கர நாற்காலியின் உதவியோடு வாழ்க்கையை நடத்திக் கொண்டிருக்கும் ஒருவர், பொதுப் போக்குவரத்து பஸ்ஸிலே தன்னுடைய பயணத்தை மேற்கொண்டபொழுது அந்த நபருக்கும் அவர் பாவிக்கும் சக்கர நாற்காலிக்கும் 'டிக்கெற்' போட்டு பணம் அறவிட்டமையானது மிகவும் வேதனைக்குரிய ஒரு விடயமாகும். அதுமட்டுமல்ல, இயலாமையுடன்கூடிய நபர்களுக்கு அரசினால் மூவாயிரம் ரூபாய் வழங்கப்படுகின்றது. ஆயினும் இது அங்கிருக்கின்ற அனைவருக்கும் வழங்கப்படுவதில்லை. ஒரு குடும்பத்தில் 3 - 4 அல்லது அதற்கு மேற்பட்ட நபர்கள் இயலாமையுடன் கூடியவர்களாக இருந்தபொழுதும் அவர்களுக்கும் அந்த பணம் வழங்கப்படாமை மிகவும் வேதனைக்குரிய விடயமாகும். இறுதி யுத்தத்திலே மோசமாகப் பாதிக்கப்பட்ட மாவட்டம்தான் முல்லைத்தீவு. அந்த இறுதி யுத்தத்தில் முள்ளிவாய்க்கால், அம்பலவன்பொக்கணை போன்ற பகுதிகளிலே பெரும் பாலானோர் படுகாயமுற்றனர். ஆனால், முல்லைத்தீவு மாவட்டத்திலே இயலாமையுடன்கூடிய நபர்களுக்கான புனர் வாழ்வு மையமொன்று இதுவரை தாபிக்கப்படாமை இங்கு சுட்டிக் காட்டப்படவேண்டிய ஒரு விடயமாக இருக்கின்றது. இத்தகையவர்களுக்கு அடிப்படை வசதிகளைப் பெற்றுக் கொடுப்பதற்காகப் புலம்பெயர் உறவுகளிடம் நாம் கையேந்த வேண்டிய ஒரு நிலை இருக்கின்றது. அவர்களுக்கான வசதியுடன் கூடிய கழிப்பறையை அமைத்துக் கொடுப்பதற்கும் அவர்களுக்குரிய வாழ்வாதாரங்களைப் பெற்றுக்கொடுப் பதற்கும் புலம்பெயர் உறவுகள் உதவிவருகின்றனர். இருந்தும், அவர்களின் தேவையை முற்றாகப் பூர்த்திசெய்ய முடியாத நிலையில், அவர்களது வாழ்க்கை மிகவும் மோசமான நிலையில் தொடர்கின்றது.

இதுமட்டுமல்ல, இந்த யுத்தத்திலே பாதிக்கப்பட்ட மக்களுக்கான உதவிகள் வழங்கப்படவில்லை என்பதற்கப்பால், இந்த நாட்டின் எதிர்க்கட்சித் தலைவரும் எமது தமிழ்த் தேசியக் கூட்டமைப்பின் தலைவருமாகிய சம்பந்தன் ஐயாவிற்குரிய உத்தியோகபூர்வ வதிவிடம் இன்னும் வழங்கப்படாமை இங்கே குறிப்பிடப்படவேண்டிய ஒன்று. எமது தலைவருக்கே வதிவிடத்தை வழங்குவதற்குரிய நடவடிக்கையை எடுக்காத இந்த அரசு, இந்த யுத்தத்திலே பாதிக்கப்பட்ட மக்களுக்கு வீடுகளை வழங்குவதற்கோ, அவர்களது தேவைகளைப் பூர்த்தி செய்வதற்கோ அல்லது அவர்களுக்கான வசதிகளைச் செய்து கொடுப்பதற்கோ எவ்வாறு முன்வரப்போகின்றது? என்பதுதான் இங்கு ஒரு வினாவுக்குரிய விடயமாக இருக்கின்றது.

இன்று கரும்புலிகள் தினம்! எமது மண்ணின் விடிவுக்காக, தமிழினத்தின் விடிவுக்காகத் தமது சவப்பெட்டிக்குத் தாமே ஆணியடித்து, தம்முடைய உடலில் குண்டுகளைத் தாங்கி வெடிக்கவைத்துச் சிதறியவர்கள் அந்தக் கரும்புலிகள். அவர்களுடைய தியாகங்களுக்காக, அவர்களுடைய ஆத்ம விமோசனத்திற்காக, இன்று வாழ்ந்துகொண்டிருக்கின்ற இந்த இயலாமையுடன்கூடிய நபர்கள்மீது மனச்சாட்சியோடு கவனம் செலுத்த வேண்டுமென்று இந்த அரசை நான் கேட்டுக்கொள்கின்றேன்.

அரசியல் கைதிகளாக வாடுகின்றவர்களில் 'மகசீன்' சிறையில் இருக்கின்ற உறவுகளைப் பார்ப்பதற்காக இன்று காலையில் நான் சென்றிருந்தேன். அந்த உறவுகளைப் பார்க்கின்றபொழுது மிகவும் வேதனையாக இருந்தது. தம்மை விடுவிப்பதற்குப் பல்வேறு விதமான எதிர்ப்பு நடவடிக்கைகளைத் தாம் மேற்கொண்டபொழுதும் இதுவரை தமக்கு ஒரு விடிவும் கிடைக்காமையைப் பற்றி அவர்கள் மிகவும் வேதனையோடு சுட்டிக்காட்டினார்கள். ஒன்றில் தமக்குப் புனர்வாழ்வு அளிக்கப்பட வேண்டும், இல்லையேல் தாம் பிணையில் செல்வதற்கு அனுமதியளிக்கப்பட வேண்டும், அதுவும் இல்லையேல் தம்முடைய வழக்குகள் எப்பொழுது விசாரணைக்கு எடுத்துக் கொள்ளப்படும், அவை எவ்வாறு தீர்க்கப்படும் என்ற விடயங்களையாவது தங்களுக்குத் தெரியப்படுத்த வேண்டும் என்ற கருத்துக்களை மிகவும் வேதனையோடு அவர்கள் முன்வைத்தனர். ஆகவே, இவர்களின் விடுதலை தொடர்பாக கூடிய விரைவில் நடவடிக்கை எடுக்கப்பட வேண்டும்.

இறுதியாக, யுத்தத்தின் காரணமாக மாற்றுத்திறனாளி களாக்கப்பட்ட நபர்களுக்கான வசதிவாய்ப்புக்களை வழங்குவதற்கு இந்த அரசு உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டும். அவ்வாறு நடவடிக்கை எடுப்பதற்குக் கிராம மட்டத்திலிருந்து மேல் மட்டம் வரை விசேட திட்டங்கள் வகுக்கப்பட வேண்டும். அவர்கள்மீதான உளவியல், உடல் ரீதியான தாக்கங்களுக்குப் பரிகாரம் வழங்குவதற்கு அப்பால், அந்தக் குடும்பங்களைச் சேர்ந்த உறுப்பினர்களும் ஒரு நல்லிணக்கத்தோடு ஒரு நல்ல சூழ்நிலையில் வாழ்வதற்கேற்ற வசதிகளைச் செய்துகொடுக்க வேண்டும். எனவே, இந்த அரசிடம் நான் கேட்டுக் கொள்வது எழுத்தில் மட்டும் சட்டத்தை உருவாக்காமல், உருவாக்கியிருக்கின்ற சட்டங் களை அமுல்படுத்தக்கூடிய வகையில் செயற்பட வேண்டும் என்பதைத்தான். ஆகவே, யுத்தத்திலிருந்து மீண்டிருக்கின்ற எமது மக்களுக்கு ஒரு நல்லிணக்க வாழ்வை ஏற்படுத்துவதற்கு வசதி செய்து கொடுக்க வேண்டும் என்ற வகையிலான எனது பிரேரணையை முன்மொழிந்து அமர்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා.

[பி.ப. 6.25]

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராஜா அவர்கள் முன் மொழிந்த இந்த ஒத்திவைப்புநேரப் பிரேரணையை அடியேன் வழிமொழிந்து இந்தச் சபையின்கண் சில விடயங்களைக் கொண்டுவருகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

Will an Hon. Member propose the Hon. Bimal Ratnayake to the Chair?

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්ඩලික නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
I propose that the Hon. Bimal Ratnayake do now take the Chair.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(මාණ්ඩලික (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair, and* THE HON. BIMAL RATNAYAKE *took the Chair.*

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
கௌரவ உறுப்பினர் திருமதி சாந்தி ஸ்ரீஸ்கந்தராஜா அவர்கள் இங்கு குறிப்பிட்டதுபோன்று, கடந்த காலத்தில் வடக்கு, கிழக்கில் ஏற்பட்ட யுத்த சூழலினால் எமது ஆயிரக்கணக்கான உறவுகள் அங்கவீனர்களாக மற்றும் விசேட தேவைக்குரியவர்களாக, வலுவிழந்தவர்களாக வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். அது தவிர வடக்கு, கிழக்கிலே இயற்கையின் நிமித்தமாக பல அங்கவீனர்கள், வலுவிழந் தவர்கள் காணப்படுகின்றார்கள். ஆகவே, அவர் கூறியது போன்று இந்த நாட்டிலே சட்டங்கள் இயற்றப்படுகின்றபோது அந்தச் சட்டங்கள் -

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණක් පැහැදිලි කරන්න මොහොතක කාලයක් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ශාන්ති ශ්‍රීස්කන්දරාසා ගරු මන්ත්‍රීතුමිය සභාව කල් තැබීමේ යෝජනාවේදී සඳහන් කළා, විපක්ෂ නායකතුමාට නිවසක් ලබා දීලා නැහැ කියලා. එතුමාට නිවසක් ලබා දීලා තිබෙනවා. ඒක දෙමහල් ගොඩනැඟිල්ලක්. එතුමාට ඒක අපහසු නිසා තනිමහල් නිවසක් තමයි එතුමා ඉල්ලන්නේ. එතුමාට නිවසක් ලබා නොදී නැහැ. ඒ නිසා එතුමියගේ ඒ චෝදනාව වැරදියි කියලා මා මතක් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

ගරු මන්ත්‍රීතුමනි, මූලාසනයේ සිටින නිසායි මා මේ කාරණය කියන්නේ. දැන් ගරු සභාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නේ සුළු පිරිසක්. ගරු මන්ත්‍රීතුමිය මේ කල් තැබීමේ යෝජනාවෙන් ඉදිරිපත් කරන්නේ ඉතාම වැදගත් සංවේදී ප්‍රශ්නයක්. ඒ නිසා මේ යෝජනාවට පිළිතුරු දීමට ගරු අමාත්‍යවරයෙක් සම්බන්ධ කර ගැනීමට ආණ්ඩු පක්ෂයෙන් උත්සාහ කරන්නය කියන ඉල්ලීම මූලාසනය වශයෙන් මා මේ අවස්ථාවේදී කරනවා.

ගරු සීනිතම්බි යෝහේස්වරන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீங்கள் இந்த கௌரவ சபையில் தற்போது எடுத்துக்கூறிய விடயம் மிகவும் வரவேற்கக்கூடியதாகும். ஏனென்றால், நாங்கள் எதிர்க் கட்சியிலிருந்து பேசும்போது முன்னே உள்ள கதிரைகளெல்லாம் வெறும் கதிரைகளாகவே இருக்கின்றன. தற்போதுகூட ஒரேயொரு உறுப்பினர்தான் இருக்கின்றார். ஆளும் தரப்பு எப்போதும் எதிர்க்கட்சியின் பிரேரணைகளுக்கும் கேள்விகளுக்கும் பதிலளிக்கக்கூடிய வல்லமையோடு இருக்க வேண்டும். ஆகவே, இந்த நல்ல கருத்தைக் கூறியமைக்கு இந்தச் சபையிலே நான் உங்களை மனமாரப் பாராட்டுகின்றேன்.

இதேவேளையில், எங்களுடைய சகோதர உறுப்பினர் அவர்கள் "கௌரவ எதிர்க்கட்சித் தலைவர் இரா. சம்பந்தன் ஐயா அவர்களுக்கு ஒரு மாடி வீடு வழங்கப்பட்டிருக்கின்றது" என்று கூறினார். அவர் எப்போது பாராளுமன்ற உறுப்பினராக வந்து அமர்ந்துகொண்டாரோ, அந்தக் காலம் தொடக்கம் இருந்துவருகின்ற வீடுதான் தற்போதும் அவர் வசிக்கும் வீடு. ஆனால் அவருக்கு ஓர் எதிர்க்கட்சித் தலைவர் என்ற அந்தஸ்துக்குரிய உத்தியோகபூர்வ வீடு இதுவரை வழங்கப் படவில்லை. ஆகவே, அவ்வாறானதொரு வீடு வழங்கப்பட வேண்டும் என்பதைத்தான் நாங்கள் கேட்கின்றோம். அவர் வயது முதிர்ந்தவர் என்றபடியால் இலகுவாகச் சென்று அந்த வீட்டில் வசிக்கக்கூடிய வகையில் அந்த வீடு வழங்கப்பட வேண்டும். அதைக் கேட்பது தவறல்ல, அதற்குச் சரியான நடவடிக்கை எடுப்பதுதான் நன்று.

இன்று வடக்கு, கிழக்கிலே பலர் சிறப்புத் தேவைக்குரியவர் களாக இருந்துகொண்டிருக்கிறார்கள். கௌரவ உறுப்பினர் இங்கு கூறியதைப்போன்று அவர்களின் தேவைகள் இதுவரை கவனிக்கப்படாத நிலையில் இருக்கின்றது. ஒரு நாடு அபிவிருத்தியடைய வேண்டுமாக இருந்தால், அந்த நாட்டில் மக்கள் நலன் நன்றாகப் பேணப்பட வேண்டும். அதிலும் சிறப்புத் தேவைக்குரியவர்களுக்கான - நாங்கள் இவர்களை 'அங்கவீனர்கள்' என்றுகூடக் குறிப்பிடுவதில்லை; 'மாற்றுத் திறனாளிகள்' அல்லது 'விசேட தேவைக்குரியவர்கள்' என்றுதான் குறிப்பிடுகின்றோம் - அடிப்படை வசதிகள் மேற்கொள்ளப்பட வேண்டும்; இவர்களுக்கேற்ற வசதிகள் செய்து கொடுக்கப்பட வேண்டும்.

கடந்த அரசாங்கக் காலத்திலே வடக்கு, கிழக்கில் சேவையாற்றிய சர்வதேச தொண்டர் நிறுவனங்கள் திருப்பியனுப்பப்பட்டன என்பது உங்களுக்குத் தெரியும். ஆனால், இந்த நிறுவனங்கள் பல இவ்வாறு பாதிக்கப்பட்ட வர்களுக்கு முன்பு சேவையாற்றியிருந்தன. இந்நிறுவனங்களை இந்த நாட்டைவிட்டு அனுப்பியதால் இவ்வாறானவர்களின் தேவைகளைக் கவனிப்பதற்குப் போதுமான வசதிகள் இல்லை; அவர்கள் மிகுந்த கஷ்டத்தை அனுபவிக்கின்றார்கள். எங்களுடைய உறுப்பினர் அவர்கள் கூறியதைப்போன்று அவர்களில் சிலருக்கு 3,000 ரூபாய் வழங்கப்படுகின்றது. ஆனால், எல்லோருக்கும் இவ்வாறான நிதி வழங்கப்பட வேண்டும். உதாரணமாக, வெளிநாடுகளில் இவ்வா றானவர்கள் இருப்பார்களாகவிருந்தால் அவர்களை வீட்டோடு வைத்துப் பராமரிப்பதற்கு அந்த அரசாங்கங்கள் போதுமான நிதியை வழங்குகின்றன. எமது நாட்டில் அவ்வாறு வழங்க முடியாவிட்டாலும் இயன்றளவு நிதியை வழங்க வேண்டும். அவ்வாறு விசேட தேவைக்குரியவர்களைப் பராமரிப்பதற்கும், அதேவேளையில் அவர்கள்மூலம் என்னென்ன தொழில்களை மேற்கொள்ள முடியுமோ, அவற்றுக்கான பயிற்சிகளை வழங்கி அவர்களைத் தொழிலில் ஈடுபடுத்துவதற்கும் நடவடிக்கை எடுக்கப்பட வேண்டும். அவ்வாறான செயற்பாடுகள் முன்னெடுக்கப்படும் பட்சத்தில் நாங்கள் எங்களுடைய அபிவிருத்திப் பாதையிலே முன்னோக்கிச் செல்லுகின்றோம் என்பது உறுதியாக்கப்படும்.

[ගරු සිරිතමබි යෝහේස්වරන් මහතා]

වඩක්කු, කිළක්කිල් ඉව්වාරානවර්කළ් මිකවුම් කස්ටමාන නිලෙයිල් ඉරුක්කිරාර්කළ්. අංකු ඔව්වොරු පිරදේස සෙයලක රීදියාක මාර්රුත්තිරනාලිකළ් එන්රු සොල්ලප්පටුකින්ර විසේට තේවෙක්කුරියවර්කළ් සංකංකළෙ උරුවාක්කි තංකළුක්කාන උදවිකළෙවේණ්ටි පුලම්පෙයර් උරවුකළිටම් කෙයේන්ති නිර්කින්රාර්කළ්. ආකවේ, අරසු ඉවර්කළ් විටයත්තිල් කවනම් සෙලුත්ත වේණ්ටුම්. අණ්මෙයිල්කූට මට්ටක්කළප්පු මාවට්ටත්තිල් කිරාන් පිරදේස සෙයලාළර් පිරිවිල් 380 පේර් ඉව්වාරු ඉරුක්කිරාර්කළ් එන්රු පිරදේස සෙයලකත්තින් සමූකසේවෙ අදිකාරියින් අර්ික්කෙයිල් තෙරිවික්කප්පට්ටිරුක්කින්රදු. ඉව්වාරු ඔව්වොරු පිරදේස සෙයලකප් පිරිවිලුම් මාර්රුත්තිරනාලිකළ් මික අදිකමාක ඉරුක්කිරාර්කළ්. කටන්තකාල යුත්තම් අතනෙ විතෙත්තිරුක් කින්රදු. අවර්කළ් වටක්කු, කිළක්කිල් මාත්තිරමල්ල, අප්පාලුම් ඉරුක්කිරාර්කළ්. ආකවේ අවර්කළෙ විසේටමාකක් කවනික්ක වේණ්ටුම්. අවර්කළින් අටිප්පටෙත් තේවෙකළෙප් පූර්ත්තිසෙය්ය වේණ්ටුම්; අවර්කළෙප් පරාමරිප්පවර්කළුක්කු ඒර්ර වසතිකළෙප් පෙර්රුක්කොටුක්ක වේණ්ටුම්. ඉතු අරසාංකත්තින් තලෙයාය කටමෙයාකුම්.

ඉන්ත වකෙයිලේ පාර්ක්කුම්පෝදු ඉන්රු සිලර් කල්වි රීදියාක තනියාර් ඉටංකළිල් සෙන්රු කල්වි පයින්රිරුක් කිරාර්කළ්. අවර්කළදු තරත්තිර්කේර්ර වකෙයිලේ අවර්කළුක්කු වේලෙවාය්ප්පුකළ් වළංකප්පට වේණ්ටුම්. අණ්මෙයිලේ සමූක වළුවූට්ටල් මර්රුම් නලන්පුරි අමෙච්චර් කෙළරව එස්.පි. දිසානායක්ක අවර්කළ් ඉව්වාරු විසේට තේවෙක්කුරියවර්කළ් සිලරුක්කුත් තොළිලිනෙ වළංකුවදාක ඔරු සෙය්තියෙ වෙළියිට්ටිරුන්දාර්; අදෙයිට්ටු නාංකළ් මකිල්ච්චියටෙකින්රෝම්. ආනාල් වටක්කු, කිළක්කිලේ ඉන්ත යුත්තත්තින් කොරූරත්තිනාල් පලර් ඉව්වාරු වළුවිළන්දු, වාල්වාතාරත්තෙක් කට්ටියෙළුප්ප මුටියාත නිලෙයිල් අංකවීනර්කළාක - විසේට තේවෙක්කුරියවර්කළාක ඉරුන්දු කොණ්ටිරුක්කිරාර්කළ් එන්පදු උංකළ් එල්ලෝරුක්කුම් තෙරියුම්. ආකවේ, අවර්කළුක්කුම් අව්විතමාන තොළිල් වාය්ප්පුක්කළෙ ඒර්ප්පටුත්තුවතර්කු අමෙච්චර් අවර්කළ් මුන්වරවේණ්ටුම්. වටක්කු, කිළක්කිලේ විසේටමාක අන්තත් තිට්ටත්තෙක් කොණ්ටුවන්දු, අංකු පාතිප්පුර්රිරුක්කින්ර එංකළ් උරවුකළුක්කු නීංකළ් ක෈කොටුක්කවේණ්ටුම් එන්පතනෙත්තාන් එංකළදු සකෝතරි ඇන්තච් සපෙයිලේ ඔරු පිරේරණෙයාක මුන්වෙත්තු උරෙයාර්රිනාර්. ඇන්රු උංකළ් මුන්නිලෙයිල් ඇන්ත ඔත්තිවෙප්පුප් පිරේරණෙයෙයුක් කොණ්ටුවන්දිරුක්කින්ර සකෝතරියුම් ඔරු විසේට තේවෙක්කුරියවරාක ඉරුක්කිරාර්. අතන් කාරණමාක, අතන් වලියෙ උණර්න්තවරාකත්තාන් අවර් ඉතනෙ ඇන්තච් සපෙයිලේ මුන්වෙත්තිරුක්කින්රාර්. ආකවේ, ඇන්තච් සපෙ ඉතිලේ කූටිය කවනම් සෙලුත්තවේණ්ටුම්. අරස තරප්පිනර් ඉතිල් කූටිය ආර්වම් කාට්ටවේණ්ටුම්. එංකළදු ඔව්වොරු පිරදේස සෙයලකංකළුක්කුම් අරිවිත්තු, අන්තන්තප් පිරදේස සෙයලකප් පිරිවුකළිල් උළ්ළ විසේට තේවෙයුටෙයෝර් යාර් යාර් එන්ර විපරංකළෙප් පෙර්රුක්කොණ්ටු අවර්කළුක්කු එන්නෙන්න වසතිකළෙච් සෙය්යවේණ්ටුමෝ, අතර්කේර්ර උරිය වසතිකළෙච් සෙය්තු කොටුක්කවේණ්ටුම්.

ඇන්තක් කණක්කෙටුප්පෙච් සෙය්වදු ඉප්පෝදු මිකවුම් ඉලකුවාක ඉරුක්කුම්. කාරණම්, ඔව්වොරු පිරදේස සෙයලකප් පිරිවිලුම් අවර්කළුක්කුරිය සංකංක්කළ් ඉරුක්කින්රන. ආකවේ, අවර්රින්මූලම් අවර්කළෙ ඉනංකණ්ටු, අවර්කළින් තේවෙකළුක්කේර්රවකෙයිල් අවර්කළුක්කු උදවිකළෙච් සෙය්යවේණ්ටුම්. සිල කුටුම්පංකළිලේ ඉරණ්ටු - මූන්රු පිල්ලෙකළ්කූට විසේට තේවෙක්කුරියවර්කළාකප් පටුක්කෙ යිලේ ඉරුක්කින්රාර්කළ්. ඉව්වාරානවර්කළින් තායාරාල් අන්තප් පිල්ලෙකළෙ එව්වාරු පරාමරික්ක මුටියුම්? අවර්කළුක්කු වළංකප්පටුකින්ර 3,000 රූපාය් පෝදුමානදා? අදුකූට එල්ලෝරුක්කුම් වළංකප්පටුවදිල්ලෙ. ආකවේ, අවර්කළින් නිලෙයෙ අරියවේණ්ටුම්. අවර්කළ් නිලෙක් කේර්රතාක අන්තප් පණත්තොකෙ වළංකප්පට වේණ්ටුම්. අවර්කළුක්කාන ඉතර වසතිකළ් ඒර්පටුත්තික් කොටුක්කප්පට වේණ්ටුම්. අව්වාරු චෙය්යුම්පෝදුතාන් එංකළ් නාට්ටෙ නාංකළ් මුන්නෝක්කික් කොණ්ටුසෙල්ලලාම්.

ඉන්රු උංකළුක්කුත් තෙරියුම් වටක්කු, කිළක්කිලේ නටෙපෙර්ර යුත්තම් තොටර්පාන චෙය්තිකළ් ඉ.නා.සපෙ වරෙ චෙන්රු, අදුපර්රිප් පාරිය මුරෙයිලේ විසාරණෙකළ් මුන්නෙටුක්කප්පට වේණ්ටුමෙන්ර නිලෙයිරුක්කින්රදු. අන්ත වකෙයිලේ, ඇන්ත අරසාංකම් වටක්කු, කිළක්කිල් එන්තළවුක්කුක් කවනම් සෙලුත්තුකින්රතෝ, අන්තළවුක්කු ඇන්ත අරසාංකත්තින්මීදු ඒර්පටුත්තප්පටුකින්ර තාක්කම් කුරෙයලාම්. නීංකළ් අන්තළවුක්කු වටක්කු, කිළක්කු මක්කළින් මනංකළිල් ඉටම් පිටික්කවේණ්ටුම්; අතර්කාන මුයර්චිකළෙච් චෙය්යවේණ්ටුම්. ඉව්වාරු පාතික්කප්පට්ටවර්කළුක්කු උදවි චෙය්යවේණ්ටුම්. අංකිරුක්කින්ර ඉළෙඤර් යුවතිකළුක්කු වේලෙ වාය්ප්පුක්කළෙ ඒර්පටුත්ත වේණ්ටුම්. ඉව්වාරු අවර්කළින් මනංකළෙච් කොළ්ළෙ කොළ්කින්රපෝදු, ඇන්ත නාට්ටුක්කෙතිරාක වන්දිරුක්කින්ර තීර්මානත්තෙක් කූට නීංකළ් මුරියටික්කලාම්. ආනාල්, "ඇන්ත නාට්ටෙ මීට්ටෝම්" එන්රු චොන්න කටන්තකාල අරසාංකම් තමිල් මක්කළින් මනංකළිල් ඉටම් පිටික්කවිල්ලෙ. ඉන්රෙය ඇන්ත අරසාංකම් පෙරුම්පාලුම් තමිල් පේචුම් මක්කළින් වාක්කුකළිනාල්තාන් ආට්චික්කු වන්දිරුක්කින්රදු. ආකවේ, අතනෙක් කවනත්තිර් කොණ්ටු නීංකළ් ඉනියාවදු ඉව්වාරු පාතික්කප් පට්ටිරුක්කින්ර, විසේට තේවෙක්කුරියවර්කළාක ඉරුක්කින්ර, වාල්වාතාරත්තිර්කුක් කෂ්ටප්පටුකින්ර වළුවිළන්ත එංකළ් උරවුකළුක්කු උදව මුන්වාරුංකළ්! එන්ර නල්ල අළෛප්පිනෙ උංකළුක්කු ඇන්තච් සපෙයිලේ වේණ්ටු කෝළාක විටුත්තු, එනදු උරෙයෙය නිර්රෙවුචෙය්කින්රේන්. නන්රි.

[අ.භා. 6.46]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මන්ත්‍රීතුමිය විසින් ගෙනෙන ලද යෝජනාව ඉතාමත්ම ඵලදායි හා කාලෝචිත යෝජනාවක් වශයෙන් මා හඳුන්වනවා. විශේෂයෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශ පමණක් නොවෙයි, මුළු රටම නියෝජනය වන පරිදි මෙම යෝජනාව ඉදිරිපත් කළා නම් තමයි ඇත්තටම මේ යෝජනාවේ වටිනාකම ඉස්මතු වෙන්නේ කියන කාරණය මා එතුමියට පැහැදිලි කර දෙන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය කුමන නමකින් පැවතුණත්, යුද්ධය කුමන නමකින් විග්‍රහ කළත් ඒක ඉතාමත්ම විනාශකාරියි; ඉතාමත්ම කුරිරුයි; අවමන් සහගතයි. ලෝකයේ කොතැනක යුද්ධයක් ඇති වුණත් අපි එය අවඥාවෙන් බැහැර කළ යුතු වාගේම, අපි එය ප්‍රතික්ෂේප කරනවා. මොකද, හේතුව? ලෝකයේ කොහේ යුද්ධ ඇති වුණත් ජයග්‍රහණය ලබන්නේ යුද්ධය පටන් ගත් පාලකයෝයි. අතීතයේ තිබුණු සෑම යුද්ධයකිනුත්, වර්තමානයේ තිබිය හැකි යුද්ධවලිනුත්, අනාගතයේ ඇති විය හැකි යුද්ධවලිනුත් ජයග්‍රහණය ලබන්නේ ඒ ඒ රටවල ජීවත්වන සාමාන්‍ය ජනතාව නොවෙයි, යුද්ධය පටන් ගත් පාලකයෝයි. විශේෂයෙන්ම ඒ නිසා තමයි අපි මේ කුරිරු යුද්ධය ප්‍රතික්ෂේප කරන්නේ. කුමන ජාතියක් නියෝජනය කළත් ජනතාව හැම දාම යුද්ධයෙන් පරාදයි. යුද්ධය ආරම්භ කරපු පාලකයන් තමයි යුද්ධයෙන් ජයග්‍රහණය ලබන්නේ. ඒ වාගේම අසහනයට, අවමානයට, දුකට, කනගාටුවට පත් වන්නේ පාලකයෝ නොවෙයි, සාමාන්‍ය පුරවැසියෝයි. ඒ නිසා සිය පැවැත්ම ආරක්ෂා කර ගැනීම සඳහා පාලකයන් නිතා මතාම ඇති කරපු යුද අතීතයක් තමයි අපට දකින්නට තිබෙන්නේ.

නිස් අවුරුද්දක් පමණ පැවැති ඒ කුරිරු යුද්ධය නිසා මුළු රටේම ජන ජීවිතය, ඒ වාගේම රටේ ආර්ථිකය වසර 50කට,

100කට වඩා ආපස්සට ගිය බව මා විශේෂයෙන් මේ මොහොතේ මතක් කරන්නට ඕනෑ. අපේ ජාතික ආර්ථිකය ගොඩනැඟිය නොහැකි තත්ත්වයට පත් වුණා වාගේම, යුද්ධය ආරම්භ කරපු පාලකයන් ජාතික ආරක්ෂාව ඉතාමත්ම ඉහළින් ලබා ගෙන ඒ වකවානුව තුළ තමන්ගේ පවුල් ආරක්ෂා කරගෙන ජීවත් වුණු හැටිත්, රටේ ඉන්න බැරි නම් පිට රටවලට ගිහින් මාස ගණන් මහජන මුදල්වලින් ඒ අය ආරක්ෂා වුණු හැටිත් අපට මතක් වනවා. යුද්ධය පිළිබඳව අද මේ කථා කරන පාලකයෝ එදා හැසිරුණේ කොහොමද කියලා මතක් වෙද්දි අපේ ඇස් දෙකට කඳුළු එනවා. එදා පැවැති යුද්ධය නිසා සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ කියන සියලුම ජනතාවගේ ජන ජීවිතය මුළුමනින්ම විනාශ මුඛයට පත් වුණු බව අපි දන්නවා. රටේ ජාතික ආර්ථිකයට පණ පොවාපු සෑම අවස්ථාවක්ම මුළුමනින්ම විනාශ වුණා. ඒ වාගේම යුද්ධයට සම්බන්ධ වුණු යුද සෙබළු -යුද, ගුවන්, නාවික, විශේෂ කාර්ය බළකාය, සිවිල් ආරක්ෂක බළකාය සහ පොලීසිය- පමණක් නොවෙයි, ජාති භේදයකින් තොරව සාමාන්‍ය ජනතාව මහා දරුණු විධියට ඒ යුද්ධයෙන් බැට කෑවා වාගේම අනාථභාවයට, ආබාධිත තත්ත්වයට පත් වුණු බව අපි දැක්කා.

මෙන්න මේ අය පිළිබඳව එදා පාලකයෝ තමන්ගේ බලය ලබා ගන්නා අවස්ථාවලදී; බලයට පත්වන අවස්ථාවලදී නොයෙකුත් පොරොන්දු දුන්නා. ඒ අයට නැවත වතාවක් ජීවිතය දෙනවා, ආබාධිත සෙබළුන්ට පණ දෙනවා, ඒ වාගේම වැන්දඹු බිරියන්ගේ ජීවිත ආරක්ෂා කරනවා, ඒ ගොල්ලන්ගේ පවුල් සුරක්ෂිත කරනවාය කියලා එදා පාලකයෝ මහා ලොකු පම්පෝරි ගැහුවා. නමුත්, ඒ මිනිස්සුන්ගේ ඡන්දයෙන් බලයට පත් වුණාට පසුව ඒ සියල්ල අමතක කරලා කිසිම ආකාරයකින් මේ රටේ යුද්ධයක් නොතිබුණු විධියට තමයි අද මේ රටේ පාලකයෝ ජීවත් වන්නේ. යුද්ධය නිසා සෙබළු වාගේම, පක්ෂ භේදයකින්, ජාති භේදයකින් තොරව රට පුරාම ජීවත් වුණු සාමාන්‍ය ජනතාව මහා විනාශයකට පත් වුණු බව අපි කියන්න ඕනෑ. ඒ සමහර අය මිය ගියා, සමහරුන් ආබාධිත වුණා. ඒ වාගේම ඔවුන්ගේ ගෙවල් දොරවල් විනාශ වුණා. මේ නිසා අදත් ඒ මිනිස්සුන්ට ජීවිතයක් නැහැ. ඔවුන්ට හිතාගන්න දෙයක් නැහැ. අවිනිශ්චිතව අනාගතයට මුහුණ දෙමින් අද ඒ අය ජීවත් වනවා.

විශේෂයෙන්ම උතුරු නැඟෙනහිර ප්‍රදේශවල යුද්ධය නිසා තමන්ගේ ස්වාමිපුරුෂයා අහිමි වුණු වැන්දඹු කාන්තාවෝ දහස් ගණනක් අද ඉන්නවා. ඒ අයට ජීවිතයක් නැහැ. තමන්ගේ ස්වාමිපුරුෂයා මිය ගියාට පස්සේ ඒ මුළු පවුලම අනාථයි. තමන්ගේ බිරිඳ මිය ගියාට පස්සේ ඒ මුළු පවුලම අනාථයි. මේ තත්ත්වය උතුරු නැඟෙනහිරට විශේෂයි. ඒ වාගේම විවිධ අවස්ථාවල බෝම්බ පුපුරා යෑම නිසා, සමූහ මිනිස් ඝාතන නිසා අපේ රටේ විවිධ පළාත්වලත් මේ විධියේ දූ දරුවෝ, වැඩිහිටියෝ, තරුණ තරුණියෝ අනාථභාවයට පත් වුණා වාගේම, ඒ අයගේ ජීවිත විනාශ වුණා. නමුත්, පසු ගිය වකවානුවේ රජයන් බලයට පත්වන කොට කිව්වේ, මේ ආබාධිත සෙබළුන්ට, ආබාධිත ජනතාවට, යුද්ධයෙන් විනාශ වුණු මිනිස්සුන්ට ජීවිතය දෙන්න, ජීවත් කරවන්න දිය හැකි උපරිම සහන, උපරිම සහයෝගය ලබා දෙනවා කියලායි. ඒ අයට ගෙවල් දොරවල් ලබා දෙනවා කිව්වා. ඒ වාගේම යුද්ධයෙන් අනාථ වුණු තරුණ තරුණියන්ට රැකියා ලබා දෙනවා, ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න උදව් උපකාර කරනවාය කියලා කිව්වා. මේ දේවල් ගැන මහා ලොකුවට මේ පාලකයෝ කථා බහ කළා. ඔවුන් එලෙස කථා බහ කළාට ඔවුන්ගේ ක්‍රියා පිළිවෙළ ගැන බැලුවාම මොකුත් නැහැ කියලා අපි දන්නවා. ඒ නිසා යුද්ධයෙන් පරාජය වුණු අමිහිරි වේදනාව දැනි දැනී ඒ මිනිස්සු අද මැරී මැරී ජීවත් වනවා. ඒ මිනිස්සුන්ට වෙන ජීවිතයක් නැහැ. ඒ නිසා මේ මොහොතේ පාලකයන් තමන්ගේ අතීතය මතක් කර ගෙන, තමන් බලයට පත් කරපු ඒ අභිංසක ජනතාව ගැන මීට වඩා තමන්ගේ අවධානය යොමු කරමින්, ඒ අයට ජීවත් වන්න; ජීවිතය ගත කරන්න; ජීවිතය සුරක්ෂිත කර ගන්න අවශ්‍ය පදනම සකස් කරන්න ඕනෑය කියන එක විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
විශේෂයෙන්ම උතුරු නැඟෙනහිර පළාත්වල ඉන්න ද්‍රවිඩ පුරවැසියන්, ඒ වාගේම සිංහල පුරවැසියන්, ඒ වාගේම මුස්ලිම් පුරවැසියන්, බර්ගර් පුරවැසියන්, මැලේ පුරවැසියන් කියන මේ හැම කෙනෙකුටම අනාගතයක් නැහැ කියලා අපි දන්නවා. ඔවුන්ට බලාපොරොත්තුවකුත් නැහැ. බලාපොරොත්තු තියන්න පුළුවන් විධියට අද මේ රජයන් ක්‍රියාත්මක වන්නේත් නැහැ. අතීතය මුළුමනින්ම අමතක කර දමා ඒ මිනිස්සු කොන් කරලා; වෙන් කරලා; හුදකලා කරලා; තමන්ගේ වගකීම් පැහැර හැරලා අද පාලකයෝ පාලන බලය කර ගෙන යනවා. ඒ නිසා අපි මේ පාලකයන්ගෙන් මේ මොහොතේ විශේෂ ඉල්ලීමක් කරනවා. යුද්ධය නිසා ජීවිත අහිමි වුණු, ආබාධිත වුණු පුද්ගලයන් ගැන මීට වඩා සැලකිල්ලක් දක්වා ඒ හැම කෙනාටම පක්ෂ භේදයකින්, ජාති භේදයකින් තොරව ජීවත්වීමේ අයිතිය තහවුරු කරලා; ජීවත් වන්න පුළුවන් පදනම සකස් කරලා; ඒ අයට ජීවිතය දෙන්න වග කීමෙන් යුතුව කටයුතු කරන්න කියන බල කිරීම මේ මොහොතේ කරමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.46]

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාම පැහැදිලි කළ පරිදි මේ යෝජනාව ඉතාම සංවේදී යෝජනාවක්. මේ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වනවා. අපි මේ යෝජනාව උතුරට සීමා කළ යුතු නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමනි, මූලාසනය වශයෙන් මේ සඳහා සාධනීය මැදිහත්වීමක් කළ යුතුය කියලා මම හිතුවා.

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
ඔව්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මමත්, ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මන්ත්‍රීතුමියත්, ජිනීවා නගරයේ පැවැතුණු අන්තර් පාර්ලිමේන්තු සංගමයේ රැස්වීමකට ගියා. මේ ගරු මන්ත්‍රීතුමිය උගත් කාන්තාවක්, යුද්ධයෙන් පීඩාවට පත් වුණු කෙනෙක් හැටියට එතුමිය මුහුණ දීපු අත් දැකීම් ගැන

[ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා]

විනාඩියක් ඇතුළත වචන කිහිපයක් කිව යුතුයි කියලා මම හිතුවා. එතුමියට වෙන් කරලා තිබුණු කාමරයේ සමහර පහසුකම් පවා පාවිච්චි කිරීමට එතුමියට අපහසුතාවක් ඇති වුණා. ඒ නිසා අවසානයේ දී එතුමියට වෙන් කරපු හෝටල් කාමර පවා වෙනස් කරන්න සිදු වුණා. අපි දන්නවා, එතුමිය අපෙන් අනුකම්පාව බලාපොරොත්තු වන්නේ නැහැ කියලා. එතුමිය උගත් පෞරුෂයක් ඇති ගරු මන්ත්‍රීවරියක්. නමුත්, එතුමිය මුහුණ දුන් තත්ත්වය සම්බන්ධයෙන් අපි කණ්ඩායමක් වශයෙන් අසරණ වුණා. මගේ අදහස නම්, මේ ප්‍රශ්නය සංවේදී නිසාම ගරු ඇමතිවරුන්ගේ පැත්තෙන් මේ සම්බන්ධව වැඩි වගකීමකින් කටයුතු කරනවා නම් හොඳයි කියලායි.

ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමනි, දැන් මම ඔබතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙනවා. මගේ ඒ වචන කීපය ඉදිරිපත් කරන්න ගිය කාලය ඔබතුමාගේ වෙලාවෙන් මම අඩු කරන්නේ නැහැ.

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)

මම හිතන්නේ අපේ නියෝජ්‍ය ඇමතිතුමාත් උත්තර දේවි. ගරු ඇමතිතුමාත් මඟ එනවා. ඇත්තටම, ඔබතුමාට මූලාසනය ලබා දීලා මම ආවේ ඒ සම්බන්ධයෙන් කථා කරන්න ඕනෑ නිසායි. ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ යෝජනාව මට පැහැදිලිවම අහන්න ලැබුණේ -ශ්‍රවණය කරන්න ලැබුණේ- සිංහල භාෂාවෙන්. මම මූලාසනයේ ඉඳන් ඔබතුමියගේ කථාවට ඇහුම්කන් දෙන විට තමයි මටත් මේ යෝජනාව පිළිබඳව ගැඹුරින්ම සංවේදීතාව දැනුණේ. ඉතින්, ඒ ගැන කථා කරන්න ඕනෑකම මටත් ඇති වුණා. අපි මේ රටේ පුරවැසියෝ. එහෙම නැතිව යාපනයේද, මඩකලපුවේද, ත්‍රිකුණාමලයේද කියලා අදාළ නැහැ. යුද්ධයක් පැවැතුණා. ඒ යුද්ධයෙන් විවිධ අන්දමේ තාඩන පීඩන, ආපදාවන්වලට ලක් වෙච්ච පිරිසක් ඒ පැතිවල හිටියා. මැරුණු පුද්ගල සංඛ්‍යාව ගත්තාම ලක්ෂයක් මැරුණාය, හැටදාහක් මැරුණාය, හමුදාවේ මෙච්චරක් මැරුණාය කිය කියා අද ගණන් හිලවු කියනවා. මේවා ඡන්දයට market කරපු ඒවා බවට පත් වුණා මිසක්, ඒ කාලයේ ඒ කවුරු වෙනුවෙන්වත් පිරිසරණක් වුණේ නැහැ ගරු මන්ත්‍රීතුමියනි. ඒ නිසා සිංහල ද, දෙමළ ද, මුස්ලිම්ද, වෙනත් ජාතියක්ද, වෙනත් භාෂා කථා කරන අයද කියන එක ගැන නොවෙයි, මේ රටේ පුරවැසියන් විධියට රටක් ලෝකයක් දියුණු කරන්න අවශ්‍ය නම් අප මනුෂ්‍යයන් හැටියට කටයුතු කරන්න ඕනෑ වනවා.

ගරු මන්ත්‍රීතුමියනි, ඇයි මෙවැනි යුද්ධයක් අපට ඇති වුණේ? මම මෙය දකින්නේ යුද්ධය නිසාම සිදු වූ දෙයක් හැටියටයි. යුද්ධය සිදු නොවුණා නම් මේ දේ වෙන්නේ නැහැ. අපේ සිංහල කථා කරන මිනිසුන් එදා උදේ හවා යාපනයට ගිහින් තම ව්‍යාපාර කළා. ද්‍රවිඩ අය මෙහි ඇවිත් ව්‍යාපාර කළා. මෙය කොහේවත් නැති මිනිසුන්ගේ යටි කුටිටු වැඩක්. බොරු ජාති වාදයක්; බොරු ජාති හිතෛෂිභාවයක් ඇති කර ගෙන තමන්ගේ බඩ ගෝස්තරය රැක ගන්න හදා ගත්ත දෙයක් නිසා තමයි අවසානයේදී මේ අයුරින් යුද්ධයක් බවට පරිවර්තනය වුණේ. මේ යුද්ධය හේතුවෙන් 2001 වසරේ අපේ රජය පැවැති කාලයේදී රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා අපේ රටට සාම යෝජනාවක් ගෙනාවා. ඒ සාම යෝජනාව -සටන් විරාම ගිවිසුම- ගෙන ඒම නිසා අපට තරම් වෙන කාටවත් අපහාස ලැබුණේ නැහැ. රට පාවා දෙනවා; කොටින්ට රට දෙනවා; දෙමළ ජනතාවට රට දෙනවා; වාගේ කථා තමයි කියන්න හැදුවේ.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මන්ත්‍රීතුමියනි, සාම යෝජනා සමයේදී ජීවත් වෙච්ච අය ඒ සාම යෝජනාව ගෙන ගියේ කොහොමද කියලා දන්නවා. මේ ගැටුණු පිරිසත් එක්ක අපි සාම සාකච්ඡා පවත්වලා පළමුවැනි පියවරට විතරයි අපිට යන්න පුළුවන්කම ලැබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතැනදී එල්ටීටීඊ සංවිධානයට එක කොටසකුත්, ශ්‍රී ලංකා හමුදාවට එක කොටසකුත් දීලා පළමුව ආයුධ බිම තියලා සාම සාකච්ඡා පටන් ගත්තා.

2001 අපේ ආණ්ඩු කාලයේදී අපි යාපනයට ගියාම දැක්කා, ඒ මිනිස්සුන්ගේ මුහුණුවල තිබුණු සතුට. කුඩා දරුවන්ගේ ඉඳලා හැම කෙනෙකුගේම මුහුණුවල පුදුම සතුටකුයි තිබුණේ. ඒ සාම යෝජනාව අපි ඉදිරියට අරගෙන ගියා නම්, නිරායුධව කිසිම කරදරයක්, කලබලයක් නැතිව අපට මේ රට බෙරා ගන්න තිබුණා. ඒ තත්ත්වය අවස්ථාවාදී දේශපාලන ක්‍රියා මාර්ග නිසා අපට නැති වුණා. පසුව මේ රටේ යුද්ධයක් ඇති වුණා. යුද්ධය මේ රටේ ජනතාවගෙන් ඡන්දය ගන්න marketing method එකක් බවට පරිවර්තනය කර ගෙන තමයි තිබුණේ. විවිධ දේවල් කියන්න ගත්තා. 2005 ජනාධිපතිවරණයේදී අපව පරාජය කරන්නට එදා මහින්ද රාජපක්ෂ ජනාධිපති අපේක්ෂකයා ඇතුළු කණ්ඩායම උතුරට ගිහින් එල්ටීටීඊ සංවිධානයට සල්ලි දුන්නා. එල්ටීටීඊ සංවිධානයට සල්ලි දීලා ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඡන්දය පාවිච්චි කිරීම වැළැක්වූවා. ආයුධ ඉස්සුවේ නැතත්, එහෙම අමානුෂික තත්ත්වයට පත් කරලා තමයි එදා ජන බලය -මහජන මතය- නැති කරලා පටන් ගත්තේ. ඒ ආපු ගමනේ ප්‍රතිඵලයක් විධියටයි 2009 දක්වා මේ රටේ යුද්ධයක් ඇති වුණේ. මගේ මේ කථාව කවුරු හරි අහගෙන හිටියොත් කියාවි, මම කොටි සංවිධානයට පක්ෂව කථා කරනවා කියලා. අපි කවදාකවත් යුදවාදී අය නොවෙයි. අපි යුද්ධය හෙළා දකින අයයි.

යුද්ධයක් තිබුණු නිසා ඇති වෙච්ච ආපදාවන් බලන්න. දැන් යුද්ධය වෙලා හමාරයි. යුද්ධය අවසන් වෙලා 2015 වෙනකම් මේ රටේ පසු ගිය ආණ්ඩුව තිබුණා. ඒ ආණ්ඩුව තිබුණ කාලයේ මොනවාද කළේ? ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මන්ත්‍රීතුමියනි, පසු ගිය ආණ්ඩුව කළේ යුද්ධය විකුණාගෙන කාපු එක විතරයි. ඔබතුමිය බුද්ධිමත් කෙනෙක් හැටියට ඒ තිබුණු ගැටලු පිළිබඳවත්, පසු ගිය රජය කරපු දේවල් පිළිබඳවත් අපිට වඩා ගැඹුරින් දන්නවා.

2015 ජනවාරි 8වැනිදා අපි මේ රට බාර ගත්තාට පස්සේ තමයි, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාත් මේ ප්‍රශ්නවලට හරි හැටි මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අපි එතුමන්ලා එක්ක කරන සාකච්ඡාවලදී කොයි වෙලාවකවත් උතුර, දකුණ, නැගෙනහිර කියා බෙදා වෙන් කරලා කථා කරන්න එතුමන්ලා කිසිම වෙලාවක අපිට ඉඩ තියලා නැහැ. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ කථාව අහගෙන ඉන්න ගමන් මැදදී මම point of Order එකක් අරගෙන කථා කළේ ඒකයි.

විපක්ෂ නායකතුමාට නිල නිවාසයක් ලබා දීම සම්බන්ධයෙන් ඊයේ ගරු ජනාධිපතිතුමායි, අග්‍රාමාත්‍යතුමායි මතක් කළා. මොකද, දැන් එතුමාට ලබා දී තිබෙන නිල නිවස පැරණි නිසා එහි උඩ තට්ටුවට නැඟීමේ අපහසුතාවක් තිබෙනවා. එම නිසා මීට වඩා හොඳ තනි මහල් නිල නිවසක් ලබා දෙන්න කියන එක අගමැතිතුමායි, ජනාධිපතිතුමායි ඊයේ මතක් කළා. ඒ කාරණා දන්නා නිසා තමයි ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියව නිවැරදි කරන්න මම කථා කළේ. අපි පත් කර ගත්ත යහ පාලන ආණ්ඩුවට මේ ප්‍රශ්න කෙටි කාලීනව විසඳා ගන්න බැහැ. ඒ තරම් විශාල වශයෙන් යාපනය පැත්ත විනාශ වෙලා තිබෙනවා. උතුරු පැත්ත ගොඩාක් විනාශ වෙලා තිබෙනවා. නැගෙනහිර පැත්තත් විනාශ වෙලා තිබෙනවා. ඒ නිසා අපි ඒ අයට සහමුලින්ම උදවු කළ යුතුව තිබෙනවා. අද විදේශ මුදල්වලින්, විදේශ ආධාරවලින් වාගේම අපේ රටේ සමාජ සේවා ආයතනවලිනුත්, මේ ඇමතිතුමන්ලාගේ උදව්වලිනුත් මේ කටයුතු කළ යුතුව තිබෙනවා. ඒ නිසා මේක වර්ෂයකින් ඉවර කරන්න පුළුවන් කටයුත්තක් නොවෙයි.

ඔබතුමිය දන්නවා, අද විපක්ෂ නායකතුමා හැටියට මේ පාර්ලිමේන්තුවට ආර්. සම්පන්දන් මැතිතුමා පත් කර ගැනීමම ලෝකය මොන තරම් අපව පිළිගන්නා තත්ත්වයට පත් වුණාද කියලා. ඒකට හේතුවක් තිබෙනවා. අද අපට මේ රට ඒ තත්ත්වයට පත් කරන්න පුළුවන් වුණේ දකුණේ නායකයන්ට මේ පිළිබඳව සංවේදීව බලන්න පුළුවන්වීමේ ප්‍රතිඵලයක් හැටියටයි. 2015 ජනවාරි 8වැනිදා පත්වූ මේ යහ පාලන ආණ්ඩුව කිසිවිටෙකවත් පක්ෂග්‍රාහීව, ජාතිවාදීව හෝ වර්ගවාදීව කටයුතු කරන්නේ නැහැ. මේ රටේ උතුරේ සිට දකුණ දක්වා ඉන්න සෑම කෙනෙක්ම එක හා සමානව පිළිගන්නා තත්ත්වයට පත් කිරීමට තමයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේත් යහ පාලන ආණ්ඩුව සූදානමින් සිටින්නේ කියන එක අපි මතක් කරන්න ඕනෑ.

මම නැවතත් කියනවා, මේ සියලුම ප්‍රශ්නවලට හේතුව තමයි යුද්ධය ඇතිවීම කියලා. යුද්ධය ඇති වුණාට පස්සේ අපිට ඒක නවත්වා ගන්න බැහැ. මිනිසුන් අතර වෛරය ඇති වුණා. මිනිස්සු කැලෑවට ගියා. ඒ අය ලෝකය දැක්කේ නැහැ. ඒ අය දැකපු එකම දේ අවි ආයුධ පමණයි. අවි ආයුධයෙන් දිනන්න ඔවුන්ගේ මානසිකත්වය හැදුණා. නමුත්, ඒ යුද්ධය නැති කරලා අපි සාම යෝජනාව -සටන් විරාම ගිවිසුම- ගෙනෙන කොට අපට මොන තරම් අපහාස, උපහාස කරලාද අපේ ආණ්ඩුව එදා පෙරළා දැම්මේ. එහෙම නොවුණා නම්, අද ඔය කිසිවෙකුගේවත් ජීවිත හානියට පත් නොවී මේ ප්‍රශ්නය විසඳා ගන්න තිබුණා. උතුරේ පමණක් නොවෙයි, දකුණේ පවුල්වල හමුදාවේ අයත් මොන තරම් ආබාධවලට ලක් වුණාද? යුද්ධය නිසා ආබාධවලට ලක් වුණු අය අද කොපමණ ඉන්නවාද? යුද්ධයට ගිහිල්ලා තමන්ගේ කෙනෙක් මිය ගිය පවුල් මොන තරම් තිබෙනවාද? අද වැන්දඹු කාන්තාවන් කොපමණ ඉන්නවාද? තමන්ගේ දූවා දරුවන් යුද්ධයට ගිහිල්ලා මැරුණාට පසුව අතරමං වුණු දෙමව්පියන් කොපමණ ඉන්නවාද? ගරු මන්ත්‍රීතුමියනි, ඒ තත්ත්වයට මේ රට පත් කළේ ඔබලාවත් අපිවත් නොවෙයි. අතරමැද හිටපු අවස්ථාවාදී මිනිසුන් නිසයි මේ රට ඒ තත්ත්වයට පත් වුණේ. ඒ සඳහා අපට අද වන්දි ගෙවන්න සිදු වෙලා තිබෙනවා. රජයක් හැටියට එයට මුහුණ දෙන්න අපි සූදානම්. උතුර, යාපනය, නැහෙනහිර, මඩකලපුව, මුස්ලිම්, දෙමළ, සිංහල කියලා වෙන් නොකර එකා වාගේ එක පවුලක් හැටියට නැඟී සිටියේ නැත්නම් මේ රට දියුණු කරන්න අපට බැහැ. අද මේ රට පත් වෙලා තිබෙන ආර්ථික අර්බුදයට හේතුවත් ඒකයි. ඒ නිසා අපි මේ රට ගොඩ නඟා ගන්න අවශ්‍යයි.

තවත් එහාට ගත්තොත් දේශපාලන වශයෙන් මේ රටේ මිනිස්සු මොන තරම් බැට කෑවාද? ඔබතුමිය මතක් කළ විධියටම පසු ගිය අවුරුදු විස්ස තුළ තුවාල වුණු, ගෙවල් කඩා ගත්තු, ගිනි තියලා විනාශ කරපු, බොරු චෝදනා දමලා රැකියාවලින් ඉවත් කරපු එක්සත් ජාතික පාක්ෂිකයන් ඉන්නවා. අද ඒ ගොල්ලන්ගේ දේපළ උකස් වෙලා තිබෙනවා. ඒ තත්ත්වයට පසු ගිය දේශපාලනය බලපෑවා. ගරු මන්ත්‍රීතුමියනි, ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා සහ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ප්‍රමුඛ අපේ රජය ඒ සියල්ලම සමනය කරලා, කිසිවෙකු සමඟ වෛරයක් ඇති කර ගන්නේ නැතුව, හැම පුද්ගලයෙකුටම දෙපයින් නැඟිටින්න පුළුවන් මට්ටමට මේ රට ගෙන යන බව මතක් කරමින්, මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, මාගේ වචන ස්වල්පය නිමා කරනවා.

[අ.භා. 6.54]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

අද දින සභාව කල් තබන අවස්ථාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීනි, ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මැතිතුමිය ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් අදහස් කිහිපයක් පළ කිරීමට ලැබීම සතුටට කරුණක් බව මා ප්‍රකාශ කරන්න කැමැතියි. මේ තත්ත්වය ඇති වීමට මූලික හේතුව වූ යුද්ධය ඇති වීමට හේතුව ගැනවත්, යුද්ධය නිසා සිදු වුණු හානිය ගැනවත් අද කථා කරලා වැඩක් නැහැ. උතුරු නැහෙනහිර විතරක් නොවෙයි, මුළු රටේම අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. හැබැයි ශ්‍රී ලංකාවේ විතරක් නොවෙයි, ඔබතුමිය මීට මොහොතකට ඉස්සර වෙලා මතක් කළ පරිදි මානව හිමිකම් ගැන කථා කරන ජිනීවා නුවර හෝටල්වලත් ඒ තත්ත්වයම තිබෙනවා. ආබාධිත උදවියට පරිහරණය කරන්න පුළුවන් විධියට හෝටල් කාමර සැකසිලා නැහැ කියන ගැටලුව එහෙත් තිබෙනවා. මෙහෙත් ඒ තත්ත්වය තිබෙනවා. අපි මේ යහ පාලන ආණ්ඩුව පිහිටුවන අවස්ථාවේදී සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් යන සියලුම ජාතීන්ගෙන් අපට විශාල සහයෝගයක් ලැබුණා. අපි කවදාවත් ඒ ලැබුණු සහයෝගය අමතක කරන්නේ නැහැ.

නිවාස ප්‍රශ්නය ගැන කථා කළා. රැකියා ප්‍රශ්නය ගැන කථා කළා. අද වන විට අපි නිවාස සංකීර්ණ හදන්න, උදා ගම්මාන හදන්න කටයුතු කර තිබෙනවා; කටයුතු කරමින් ඉන්නවා. අනාගතයේදීත් ඒ විධියට කටයුතු කරනවා. උතුරු නැහෙනහිර කියලා වෙනසක් නැහැ, අවශ්‍ය ඉඩම් සහ අවශ්‍ය සැලසුම් ඉදිරිපත් වුණු වහාම ඒ ගම්මාන ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඒ ගැන කිසි සැකයක් නැහැ.

ඉදිරි වර්ෂ පහ තුළදී අපි රැකියා ලක්ෂ දහයක් ලබා දෙනවා. රැකියා ලක්ෂ දහය ලබා දෙනකොට අපි මේ ආබාධිත තත්ත්වයට පත් වුණු උදවිය අමතක කරන්නේ නැහැ. ඒ අය අමතක කරන්න අවශ්‍යතාවකුත් නැහැ. රටේ හැම ප්‍රදේශයකටම මේ තත්ත්වය බලපෑවා වාගේම උප්පත්තියෙන්ම ආබාධිත තත්ත්වයට පත් වුණු අයත් ඉන්නවා. මෙතෙක් කල් ඉස්මතු වුණේ නැති වුණාට, යුදමය තත්ත්වයත් එක්ක ඒ ගැනත් කථා කරන්න පටන් ගත්තා.

විශේෂයෙන්ම පසු ගිය කාලයේ ගොඩනැඟිලි හදන කොට ඒ වාගේ අයට නොගැළපෙන විධියේ ආකෘති, සැලැස්ම -plan- අනුමත කරන්න එපා කියලා චක්‍රලේඛ නිකුත් වුණා, ප්‍රාදේශීය සභා මට්ටමෙන් එහෙම නැත්නම් නගර සභා මට්ටමෙන්. හැබැයි, ඒවා කොයි තරම් දුරට ක්‍රියාත්මක වුණාද කියන කාරණය සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. විශේෂයෙන්ම රාජ්‍ය ගොඩනැඟිලි හදනකොට ඒ සැලසුම්වලට අනුකූලව හදන්නේ නැත්නම්, ඒ සැලසුම් අනුමත කළ යුතු නැහැ.

අද පොදු ප්‍රවාහන සේවය ගත්තාමත් මේ ගැටලුව බරපතළ විධියට තිබෙනවා. නමුත් මම ඔබතුමියට මතක් කරන්න ඕනෑ, අපට ලැබුණේ හැම අතින්ම බංකොලොත් වුණු රටක් බව. පොදු ප්‍රවාහන සේවයට මේ වාගේ උදවිය සඳහා විශේෂ පහසුකම් ඇතුළත් කරලා ඒවා අදාළ විධියට නවීකරණය කරන්න අපට හැකියාවක් තිබුණේ නැහැ. බස්රිය ගත්තත්, දුම්රිය ගත්තත්, ත්‍රිරෝද රථ ගත්තත් ඒවා අදාළ විධියට නවීකරණය කිරීමේ හැකියාවක් තවම අපට නැහැ.

ඉදිරියේදී අපි අනිවාර්යයෙන්ම ඒ කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අපි සැදී පැහැදී ඉන්නවා. අපි ඒවා අමතක කර නැහැ. මෙතැනදී කථා කළ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වා, "මේ රජය බලයට පත් වෙනකොට පණ දෙන්න කථා කළා" කියා. අපි කවදාවත් ජීවිතය අහිමි වුණු උදවියට පණ දෙන්න කථා කළේ නැහැ. පණ දෙන්න පුළුවන් කියා අප විශ්වාස කරන්නේත් නැහැ. හැබැයි, ඒ උදවියගේ පවුල්වලට වුණු හානිය අවම කිරීමට සහ සහන සලසන්න අපට හැකියාව තිබෙනවා. ඒ වාගේ මැරුණු මිනිසුන්ට පණ දෙනවා කියා පහළ මට්ටමේ දේශපාලනයක් කරන්න යහ පාලන ආණ්ඩුව කිසි සේත්ම ලැහැස්ති නැහැ කියන එක මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කියන්න ඕනෑ.

[ගරු වන්දිම ගමගේ මහතා]

ජනතාවට සහන සැපයීමේදී විවිධ හේතු සාධක බලපාන බව අපි විශේෂයෙන් කියන්න ඕනෑ. මේ ගරු සභාවේදී කියැවුණා, පසු ගිය කාලයේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන, ස්වේච්ඡා සංවිධාන ඒ පළාත්වලින් ඉවත් කළාය කියා. ඒක ඇත්ත. ඒ පළාත්වලින් එම ආයතන, සංවිධාන ඉවත් කරලා ඒ "රාජපක්ෂ රෙජීමය" පාලන යුගයේදී උතුරු හා නැඟෙනහිර පළාත්වල ජීවත් වුණු ජනතාවට ලබා ගන්න තිබුණු සහන නැති කළ අවස්ථා තිබුණා. ඒ වාගේම සුළු ජාතිකයන්ගෙන් පළි ගන්නා ස්වරූපයක් තිබුණා. ඒ වාගේම අන්‍ය ආගමිකයන්ගෙන් පළි ගන්නා ස්වරූපයක් තිබුණා. යහ පාලන ආණ්ඩුව කවදාවත් එහෙම කරන්නේ නැහැ. අපි හැම දාම සුළු ජාතික තමුන්නාන්සේලා වාගේම සියලුම ආගම්වල ජනතාව එක්ක සහජීවනයෙන් කටයුතු කරන්න බැඳී සිටිනවා.

එදා තමුන්නාන්සේලා අපේ වචනය විශ්වාස කර විශාල වශයෙන් අපට ජයග්‍රහණ ලබා දුන්නා. අපි ඒවා කවදාවත් අමතක කරන්නේත් නැහැ. අද අපට තිබෙන ගැටලුව වන්නේ, රටේ තිබෙන බංකොලොත්භාවයයි. තමුන්නාන්සේලාගේ මේ අවශ්‍යතා එකවර ඉටු කර ගන්න බැරිකම මිසක්, අපි මේවා කිසි සේත් අමතක කර නැහැ.

අපි විශේෂයෙන්ම විපක්ෂ නායකතුමාගේ නිල නිවාසයේ ප්‍රශ්නය ගැන කථා වුණා. ඒ ගැන අදහස් පළ වුණා. ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා කිව්වා වාගේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් විශේෂයෙන්ම විපක්ෂ නායකතුමාගේ නිල නිවසේ ගැටලුව ගැන ආණ්ඩු පක්ෂ කණ්ඩායම් රැස්වීමේදී සාකච්ඡා කළා. ඒ ප්‍රශ්නයත් ඉතා ඉක්මනින් විසඳන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අපි කවදාවත් තමුන්නාන්සේලා හෝ මේ රටේ අන්‍ය ආගමිකයන් හෝ මේ රටේ සුළු ජාතිකයන් හෝ අමතක කරන ආණ්ඩුවක් නොවන බවත් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

පිළිතුරු කථාව, නියෝජ්‍ය අමාත්‍ය ගරු රන්ජන් රාමනායක මහතා.

[අ.භා. 7.01]

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment and Welfare)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීනි, ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මැතිනිය විසින් 2016.07.05 දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. අද ගරු ඇමතිවරයා කල්තැබීමේ යෝජනාවට පිළිතුරු දීම මට පවරා ඉතාම පෞද්ගලික කටයුත්තකට ගිහින් තිබෙනවා. ඒ කල්තැබීමේ යෝජනාවට පිළිතුරු දෙන්නට මා බලාපොරොත්තු වෙනවා.

ශ්‍රී ලංකාවේ පැවැති දශක තුනක යුද්ධයෙන් හා අනෙකුත් හේතු නිසා විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් බවට පත්වූවන් නොසලකා හැරීමේ කටයුතු දිගටම සිදු වෙනවා. මෙම තත්ත්වය නිසා යුද්ධයෙන් ආබාධිත තත්ත්වයට පත් වූ උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත් වෙන විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සිය ජීවනෝපාය කටයුතු හා අනෙකුත් සමාජ කටයුතු කිරීමට නොහැකි තත්ත්වයට පත් වී සිටිනවා. දීර්ඝ කාලයක් තිස්සේ පවතින මේ ගැටලුවට කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතුව ඇතැයි මම මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා. ඒ සම්බන්ධයෙන් ඉතා වැදගත් අදහස් කිහිපයක් ඉදිරිපත් වුණා. අපි ඒ සියලු දේවල් පිළිගන්නවා. ගරු ශ්‍රීස්කන්දරාසා මැතිනියනි, මේ සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් ඉතාම දීර්ඝ list එකක් තිබෙනවා. මට එය සභාගත කරන්න පුළුවන්. ඕනෑ නම් කියවන්නත් පුළුවන්. මම එම කරුණුවලින් කොටසක් කියවන්නම්.

උතුරු නැඟෙනහිර පළාත්වල දශක තුනක් පැවති යුද්ධයෙන් හා අනිකුත් හේතූන් නිසා විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් බවට පත්වූවන් සඳහා සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයෙන් ඉටුකළ කාර්ය භාරය

උතුරු පළාත
යාපනය, කිලිනොච්චි, මුලතිව් හා වවුනියා දිස්ත්‍රික්ක

ඉටුකළ කාර්ය භාරය	2009	2010	2011	2012	2013	2014	2015	2016
රු. 3000/- ආබාධිත දීමනාව ලබාදීම	රු. මිලියන 7.38	7.992	41.6	41.6	61.2	61.2	158.1	3.82 ජනවාරි සිට මාර්තු දක්වා
පුද්ගලයින් සංඛ්‍යාව	205	222	1,156	1,156	1,700	1,701	4,392	4,163
ආබාධිත සහිත තැනැත්තන්ට වෛද්‍ය ආධාර ලබාදීම	-	-	-	-	135,600	469,760	381,666	71,602
ආධාර ලබාදුන් පුද්ගලයින් සංඛ්‍යාව	-	-	-	-	10	44	32	4
ආබාධිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබාදීම	660,000	660,000	38,000	4,685,000	575,000	3,135,000	1,100,000	200,000
නිවාස ආධාර ලබාදුන් පුද්ගලයින් සංඛ්‍යාව	14	15	1	113	8	38	12	8
ස්වයං රැකියා ආධාර	750,000	810,000	1,310,000	2,853,000	2,085,560	2,105,500	4,341,500	575,000
ස්වයං රැකියා ආධාර ලබාදුන් සංඛ්‍යාව	75	80	131	154	85	89	205	27
අධ්‍යාපනය සඳහා ආධාර							1,690	59,988
ආධාර ලබාදුන් පුද්ගලයින් සංඛ්‍යාව							1	6

නැගෙනහිර පළාත
ත්‍රිකුණාමල, මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්කය

ඉටුකළ කාර්ය භාරය	2009	2010	2011	2012	2013	2014	2015	2016
රු. 3000/- ආබාධිත දීමනාව ලබාදීම	40.87	11.37	55.08	55.08	81	81	143.28	34.83
පුද්ගලයින් සංඛ්‍යාව	302	316	1,530	1,530	2,250	2,250	3,980	3,871
ආබාධිත සහිත තැනැත්තන්ට වෛද්‍ය ආධාර ලබාදීම	-	-	-	129,958	202,198	270,880	442,079	98,300
ආධාර ලබාදුන් පුද්ගලයින් සංඛ්‍යාව	-	-	-	9	13	19	33	6
ආබාධිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබාදීම	6,312,000	8,552,500	3,408,000	10,912,000	1,950,000	5,256,175	6,700,000	6,500,000
නිවාස ආධාර ලබාදුන් පුද්ගලයින් සංඛ්‍යාව	172	145	58	109	17	47	60	65
ස්වයං රැකියා ආධාර	560,000	580,000	446,000	670,000	510,000	990,000	680,000	120,000
ස්වයං රැකියා ආධාර ලබාදුන් සංඛ්‍යාව	56	54	45	37	21	44	32	5
අධ්‍යාපනය සඳහා ආධාර							91,330	42,804
ආධාර ලබාදුන් පුද්ගලයින් සංඛ්‍යාව							12	6

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මැතිනියනි, මේ file එකේ තව ගොඩක් විස්තර තිබෙනවා. ඒ සියල්ලම කියවන්න අවශ්‍යද? නැත්නම් සභාගත කරන්නද? Shall I table it?

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
Okay.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාල වේලාව ගත වන නිසා මම ඉතිරි ලේඛන **සභාගත*** කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.05ට, අද දින සභා සම්මතිය අනුව, 2016 ජූලි මස 07 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 7.05 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க 2016 யூலை 07, வியாழக்கிழமை மு. ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 7.05 p.m. until 10.30 a.m. on Thursday, 7th July, 2016, pursuant to the Resolution of Parliament of this Day.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

245 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 245 - இல. 2
Volume 245 - No. 2

2016 ජූලි 07 වන බ්‍රහස්පතින්දා
2016 யூலை 07, வியாழக்கிழமை
Thursday, 07th July, 2016

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :
වතු කම්කරුවන් මුහුණ දෙන ප්‍රශ්න
ඔඩ්ඩුසුඩාන් සඳහා වෙනම ප්‍රාදේශීය සභාවක් පිහිටුවීම

කොළඹ සහ මහ කොළඹ ප්‍රදේශවල ජල සැපයුම හදිසියේ බිඳ වැටීම:
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

වරප්‍රසාද:
2016 ජූනි 24වන දින "දිවයින", "රිවිර" සහ "මව්බිම" වාර්තා

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

කල් තැබීමේ යෝජනාව:
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ගිවිසුම් කොන්දේසි

பிரதான உள்ளடக்கம்

மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
தோட்டத் தொழிலாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்
ஒட்டுசுட்டானுக்கென தனியான பிரதேச சபையை நிறுவுதல்

கொழும்பு மற்றும் பாரிய கொழும்புப் பிரதேசங்களில் திடீர் நீர் விநியோகத் தடை:
நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சரின் கூற்று

சிறப்புரிமை :
2016 யூன் 24ஆந் திகதிய 'திவயின', 'ரிவிர' மற்றும் 'மவ்பிம' அறிக்கைகள்

இலங்கை தேசிய ஆராய்ச்சிப் பேரவைச் சட்டமூலம் :
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
சர்வதேச நாணய நிதியக் கடன் உடன்படிக்கை நிபந்தனைகள்

PRINCIPAL CONTENTS

QUESTIONS POSED TO HON. PRIME MINISTER

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Problems Faced by Plantation Workers
Establishment of a Separate Pradeshiya Sabha for Odduchudan

SUDDEN INTERRUPTION OF WATER SUPPLY IN COLOMBO AND GREATER COLOMBO AREAS:
Statement by Minister of City Planning and Water Supply

PRIVILEGE:
"Divaina" "Rivira" and "Mawbima" Reports of 24th June 2016

NATIONAL RESEARCH COUNCIL OF SRI LANKA:
Read a Second and the Third time, and passed as amended

ADJOURNMENT MOTION:
Conditions of IMF Loan Agreement

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 ජූලි 07වන බ්‍රහස්පතින්දා
2016 யூலை 07, வியாழக்கிழமை
Thursday, 07th July, 2016

ප. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2016 ජූලි මස 07වන බ්‍රහස්පතින්දා එනම්, අද දින අපර භාග 4.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)

ගරු කථානායකතුමනි, මම 2015 වර්ෂය සඳහා තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ (131 වන අධිකාරය වූ) 39 වන වගන්තිය යටතේ නියෝග.- [කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, මම 2015 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2012 - 2013 වර්ෂය සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ව්‍යාපාර සහ වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග - [සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Education and Human Resources Development on the Bill entitled, "National Research Council of Sri Lanka" referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Disaster Management)

Hon. Speaker, I present the following petitions:

(1) A petition from Mr. H.T. Ranjan of Gananketa, Welpalla; and

(2) A petition from Mrs. Sumana Jayatilake of No. 78/2, Old Road, Nawala.

ගරු වජීර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) වංචාවල, මීගොඩ, "ගොඩවත්ත" යන ලිපිනයෙහි පදිංචි ඒ.පී.ඒ. ශ්‍රියාවති මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) වතුගෙදර, ඇල්පිටිය පාර, නොමැති. 181/1 දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ. ජීනදාස මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) අලව්ව, හපුගහගෙදර, "සිරිලක් නිවස" යන ලිපිනයෙහි පදිංචි පී. තිලකරත්න මහාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) කහව, කැරලියන්ගොඩ, ජයවර්ධන මාවත යන ලිපිනයෙහි පදිංචි ටයිටස් ත්‍රිමාවිතාන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) හසලක, D ඇළ, අංක 68 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්.එල්.බී. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) වෙළම්බොඩ, රංගොඩ, නොමැති. 62 දරන ස්ථානයෙහි පදිංචි ඊ.ජේ.ජී. මංගලරත්න ආරියවංශ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) දන්තුරේ, වැවේවත්ත, නොමැති. 442 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ජී. සමරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නිහාල් ගලප්පත්ති මහතා - පැමිණ නැත.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - පැමිණ නැත.

ගරු රංජිත් අලුවිහාරේ මහතා
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හය පිළිගන්වමි.

(1) හඳුන්ගමුව, ගැඹුරුඔය යන ලිපිනයෙහි පදිංචි ඊ.එම්.ඩබ්ලිව්.ජී.ඩබ්ලිව්.කේ. ඒකනායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අකුරම්බොඩ, කිරිඔරුව, 62/2 දරන ස්ථානයෙහි පදිංචි ජී.එස්.සී. ගල්හේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මහනුවර, අලවතුගොඩ, අරඹේපොල, නොමැති. 84/2 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්.ටී.සී. රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) ගලේවෙල, බඹරකටුපොත, නොමැති. 65 දරන ස්ථානයෙහි පදිංචි අයි.කේ. ගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) ඇල්කඩුව, මාතලේ පාර, 58 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.බී.වී.එම්.ආර්.යූ.එන්.ටී.බී. අලුවිහාරේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(6) ගලේවෙල, ජයතිලක මාවත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. රණසිංහ බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් අට පිළිගන්වමි.

(1) මාතර, වල්ගම, කරුවලගස් මාවත, නොමැති. 28 දරන ස්ථානයෙහි පදිංචි සී.ඩී. මොහොට්ටි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතර, උයන්වත්ත, දෙවන හරස් පාර, නොමැති. 6/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩී.කේ. රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මාතර, හිත්තැටිය බටහිර, නොමැති. 331/15 දරන ස්ථානයෙහි පදිංචි එච්.එච්.එස්. ශ්‍රේෂන් ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) මාතර, උෆරුගමුව, වේහැල්ල, "මෙත්සාන්" යන ලිපිනයෙහි පදිංචි කේ.ජී. රංජිත් වනරාජා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) මාතර, වල්ගම, සුනන්ද මාවත, නොමැති. 121 දරන ස්ථානයෙහි පදිංචි කේ.වී.ඩී.ආර්. ඩයස් මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(6) වැලිගම, පැලෑන පොකුණුවත්ත, "වාසනා" යන ලිපිනයෙහි පදිංචි පී.බී. ටෙනිසන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) බෙන්ගමුව, සැනසුම්ගොඩ යන ලිපිනයෙහි පදිංචි එස්.බී. ලීලාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(8) මාලබේ, පිට්ටුගල, කහන්තොට පාර, නො. 130/2 දරන ස්ථානයෙහි පදිංචි වයි.යූ.එස්. පීරිස් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා - පැමිණ නැත.

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) මාතලේ, කොටුවේගෙදර පාර, 23/11 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්.එස්. සේනානායක මහත්මයගෙන් ලැබුණු පෙත්සම;

(2) දඹුල්ල, කණ්ඩලම, ආරච්චුල හංදිය, නො. 177/1 දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඩබ්ලිව්. කුමාරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මාතලේ, කළුදැවල, පළමු පටුමග, අංක 51 දරන ස්ථානයෙහි පදිංචි එස්.එම්.එම්. හාරිස් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) මාතලේ, අකුරම්බොඩ, මහයායවත්ත, අංක 207 බී දරන ස්ථානයෙහි පදිංචි උදය ජානක හල්ලලුව මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු අග්‍රාමාත්‍යතුමාට ප්‍රශ්න යොමු කරන අවස්ථාව. පළමුවන ප්‍රශ්නය විමසන්නේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමායි.

ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න
பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
QUESTIONS POSED TO HON. PRIME MINISTER

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය ඇසීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පහත සඳහන් ප්‍රශ්න අහනවා:

1. ඉන්දියානු ධීවරයන් උතුරු මුහුදු තීරයේ නීති විරෝධී මසුන් ඇල්ලීමේ කටයුතුවල නිරත වන බව දන්නවාද?

2. ඒ හේතුවෙන් ලාංකීය ධීවරයන්ට ගැටලු රාශියකට මුහුණ දීමට සිදුවී ඇති බව පිළිගන්නේද?

3. මෙම ගැටලුව විසඳීම පිළිබඳව ඉන්දියානු රජය සමඟ රාජ තාන්ත්‍රික ලෙස කටයුතු කර තිබේද? එසේ නම් එහිදී එකඟ වූ කරුණු කවරේද?

4. මෙම ගැටලු නිරාකරණය කිරීම සඳහා උතුරු මුහුදු තීරයේ කලාප වශයෙන් -ඒ කියන්නේ මුහුදු තීරයේ ප්‍රදේශ වශයෙන් හෝ- දින වශයෙන් ඉන්දියානු ධීවරයන්ට මසුන් ඇල්ලීම සඳහා අවසර ලබා දීමට යම් සාකච්ඡාවක් ආරම්භ කොට තිබේද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
ශ්‍රී ලංකාවට අයත් උතුර හා නැඟෙනහිර මුහුදු සීමාවන්හි විශේෂයෙන්ම කන්කසන්තුරේ සිට කල්පිටිය දක්වාත්, කන්කසන්තුරේ සිට ත්‍රිකුණාමලය දක්වාත් වන මුහුදු ප්‍රදේශයන්හි ඉන්දියානු ධීවර ට්‍රෝලර් යාත්‍රා මඟින් නීති විරෝධී bottom trawling ක්‍රමයට මසුන් මැරීම සිදු කරනු ලැබේ. ශ්‍රී ලංකා නාවික හමුදාවේ මුර සංචාරක යාත්‍රා සහ රේඩාර් පද්ධතියෙන් ලබා ගත් දත්ත අනුව මාසයකට යාත්‍රා දාහක් පමණ මෙම ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා මුහුදු තීරයට පැමිණෙනු ලැබේ. අප රටේ මුහුදු සීමාව තුළ සිදුවන මෙම අනවසර ධීවර කටයුතු නිසා උතුරු හා නැඟෙනහිර ප්‍රදේශයන්හි ජීවත් වන සුළුපන්න ධීවර කාර්මිකයන්ගේ ජීවනෝපායට ඉතාම බරපතළ ලෙස මෙය බලපා ඇති අතර ඔවුන් ඉතාම අසරණ තත්ත්වයකට පත්ව ඇත.

ඉන්දියානු ධීවරයන් විසින් සිදු කරනු ලබන bottom trawling පන්න ක්‍රමයේදී මුහුදු පතුලේ සිටින සියලුම ජීවීන් හා මුහුදු පරිසරයට හිතකර සියලු දේ විනාශ වන අතර, මත්ස්‍ය සම්පත් මෙන්ම ජෛව විවිධත්වයටද මෙමඟින් සෘජුවම තර්ජනයක් එල්ල වී ඇත. ඉන්දියානු ධීවරයන්ගේ මෙම අනවසර ධීවර කටයුතු පිළිබඳව ගරු විදේශ කටයුතු ඇමතිතුමා විසින් ගරු ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යතුමිය සමඟ සාකච්ඡා කොට ඇති අතර ඊට අමතරව ශ්‍රී ලංකාවේ නාවික හමුදාව විසින් ඉන්දියානු නාවික හමුදා සහ ඉන්දියානු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ අර්ධ වාර්ෂිකව, වාර්ෂිකව අන්තර් ජාතික මුහුදු සීමාවේදී පවත්වනු ලබන සාකච්ඡාව, මාණ්ඩලික කථිකාවත සහ ආරක්ෂා සාකච්ඡා තුළදීද මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලබයි.

තවද, ඉන්දියානු මධ්‍යම රජය සහ ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිතුමා ඇතුළු ශ්‍රී ලංකාවේ නිලධාරීන් සහභාගි වන දෙරට ඒකාබද්ධ කමිටු සාකච්ඡා මෙම මාසයේදී නැවතත් ආරම්භ කිරීමට නියමිත අතර, එහිදී මේ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරනු ඇත. එමෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුමන්තිරන් මැතිතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද industrial bottom trawling ක්‍රමය සම්පූර්ණයෙන්ම තහනම් කිරීමට ගෙනෙන ලද යෝජනාවද සම්මත වූ අතර, ඒ හා සම්බන්ධ ගැසට් නිවේදනය පළ කිරීමට ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිතුමා විසින් කටයුතු කරනු ඇත. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිතුමා විසින් ඉන්දීය ධීවර යාත්‍රා සඳහා මෙරට මුහුදු තීරය තුළ මසුන් ඇල්ලීමට අවසර ලබා දීමක් සිදු කර නොමැති අතර, මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට යෝජිත පනත් අනුව මෙරට මුහුදු සීමාව තුළ අනවසර හා නීති විරෝධී මසුන් ඇල්ලීමේදී රුපියල් මිලියන එකහමාරේ සිට රුපියල් මිලියන පහළොව දක්වා දඩයකට යටත් කිරීමට අවකාශය ලැබෙනු ඇත.

මේ ප්‍රශ්නයට විසඳුමක් හොයා ගන්නත් අපි සාකච්ඡා කරනවා. අපේ විසඳුම අනුව bottom trawling ක්‍රමයට ඉඩ දෙන්නේ නැහැ. ඒක යම් කිසි කාල සීමාවක් තුළ නවත්වන්න ඕනෑ කියලා තිබෙනවා. ඒක කරන්නේ කොහොමද කියන එකත්,

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ඒ සම්බන්ධව ගන්නා පියවර පිළිබඳවත් සාකච්ඡා කර ගෙන යනවා. දෙපැත්තෙන්ම බලන්නේ මේ වැඩ කටයුත්ත ඉක්මනින් අවසන් කරන්නයි. තමිල්නාඩු ප්‍රාන්තයේ ඡන්දය නිසා මාස කිහිපයක් මේ ගැන සාකච්ඡා කරන්න බැරි වුණා. දැන් ඒ ඡන්දය ඉවරයි. අලුත් ඇමතිවරයෙක් ඉන්නවා. ඒ ඇමතිවරයා සමඟත් සාකච්ඡා කරන්න අපට සිදු වෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් සාකච්ඡා වට කිහිපයක් පවත්වා තිබෙනවා. කමිටු ගණනාවක් පිහිටුවලා තිබෙනවා. විවිධ වර්ගයේ තීන්දු අරගෙන තිබෙනවා.

ගරු අග්‍රාමාත්‍යතුමනි, මේ වනවිටත් එම ප්‍රදේශවල ධීවර ජනතාවගේ ජීවිකාව මුළුමනින්ම විනාශයට පත් කරමින් සහ මුහුදු පත්ලේ තිබෙන සම්පත් පවා විනාශ කරමින් මේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතිනවා. අපි කොපමණ සාකච්ඡා කළත්, අදත් මෙය සිද්ධ වෙමින් පවතින දෙයක් බවට පත්වෙලා තිබෙනවා. නිල වශයෙන් අවසන් එකඟතාව නොවුණත්, ආරක්ෂක ලේකම්වරයා උතුරේ පැවති සාකච්ඡාවලදී ප්‍රකාශ කර තිබෙනවා, මෙම ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා එක්කෝ ඉන්දියානු ධීවරයන්ට මාළු ඇල්ලීමට යම් කලාපයක් ලබා දීමට හෝ ඉන්දියානු ධීවරයන්ට මාළු ඇල්ලීමට යම් නිශ්චිත දින ගණනක් ලබා දිය යුතුයි කියලා. ඒ කාරණය 4 වන ප්‍රශ්නය හැටියට මම අහනවා.

ගරු අග්‍රාමාත්‍යතුමනි, ඉන්දියානු ධීවරයන්ට මාළු ඇල්ලීම සඳහා කලාප වශයෙන් ලබා දීමේ හෝ දින වශයෙන් ලබා දීමේ යම් තීරණයකට හෝ සාකච්ඡාවකට ආණ්ඩුවක් හැටියට පැමිණ තිබෙනවාද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඒ පිළිබඳව අපි තවම ස්ථිර නිගමනයක් කරලා නැහැ. මේ කාරණය පිළිබඳව උතුරේ ධීවර ජනතාව සමඟ සාකච්ඡා කරන්නත්, ඉන්දීය ධීවරයන් සමඟ සාකච්ඡා කරන්නත් බලාපොරොත්තු වනවා. මම හිතන විධියට යෝජනා කිහිපයක් ලංකාව පැත්තෙන් කර තිබෙනවා. ඒ තමයි වෙනම කලාපයක් වෙන් කරනවාද එහෙම නැත්නම් දින කිහිපයක් දෙනවාද කියන එකයි. සමහර යෝජනා ඉන්දියාව පැත්තෙන් ඇවිල්ලා තිබෙනවා. සමහර ඒවා අපේ පැත්තෙන් ඇවිල්ලා තිබෙනවා. අපි bottom trawling ක්‍රමය අවසන් කරන්න ඕනෑ. අපි ඒ ස්ථාවරයේ තමයි ඉන්නේ. ඒ සඳහා අපි ක්‍රියාත්මක වන්නේ කොහොමද කියන කාරණය ගැන තමයි දැන් සාකච්ඡා කර ගෙන යන්නේ. කොහොම වුණත් අපි කරන කටයුත්තකට උතුරේ අපේ ධීවරයන්ගේ එකඟත්වය ලබා ගන්න තිබෙනවා. ඉන්දියානු ධීවරයන්ට මෙහාට ඇවිල්ලා තමන් කැමැති විධියට මාළු ඇල්ලීමේ අයිතිය අපි දෙන්නේ නැහැ, අපිට දෙන්නත් බැහැ. දැනට මම හිතන්නේ ඒ ලේකම්තුමාගෙනුත්, ධීවර අමාත්‍යාංශයෙනුත්, පළාත් සභා ඇමතිවරයාගෙනුත් විවිධ යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. නමුත් තවම ඒ එකක් ගැනවත් එකඟත්වයකට පැමිණ නැහැ. අපි කියලා තිබෙන්නේ මේක මේ අවුරුද්ද තුළදී අවසන් කරන්නට පියවර ගනිමු කියලායි. මොකද, මේක මීට වඩා ඇදගෙන යන්නට බැහැ. ඒක අපි පිළිගෙන තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අගමැතිතුමනි, කවර තීරණයකට, සාකච්ඡාවකට එළඹුණත් අපේ රටේ මුහුදු සීමාව අපේ රටේ ධීවර කර්මාන්තය සඳහා තිබෙන වැදගත්ම සම්පතයි. ඒ සම්පත බෙදා ගැනීම සඳහා තීරණයකට එළඹීමට මේ පාර්ලිමේන්තුවටවත් හැකියාවක් තිබෙනවා කියලා මම විශ්වාස කරන්නේ නැහැ. අපේ සම්පත ඉන්දියානු රජයත් සමඟ අපි බෙදා ගන්නේ කොහොමද? එක එක අයගේ ඔළුවල ඒ යෝජනා තිබුණාට, මේ රටේ එවැනි යෝජනාවක් නම් සාර්ථක වීමට ඉඩ කඩ ලබා නොදිය යුතුයි.

ගරු අගමැතිතුමනි, දැන් ඔබතුමාගෙන් අහන ප්‍රශ්නයේදී පැන නඟින්නේ මෙයයි. ආම්පන්න ක්‍රමය එක ගැටලුවක්. නමුත් ආම්පන්න ක්‍රමයට වඩා ප්‍රධාන ගැටලුව තමයි අපට හිමි මුහුදු තීරයේ ධීවර සම්පත විනාශ කරමින් අත් පත් කර ගැනීම. ඒක නීති විරෝධී ක්‍රියාවක්. නීති විරෝධී ක්‍රියාවක් වාගේම ඒ නීති විරෝධී ක්‍රියාව වන්නේ ඉතාමත්ම විනාශකාරී ආම්පන්න ක්‍රමයක්. එම නිසා ආම්පන්න ක්‍රමය පිළිබඳව එකඟතාවකට පැමිණීම විතරක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ, මේ නීති විරෝධී ක්‍රියාමාර්ගය නතර කළ යුතුයි කියන එක තමයි අප විසින් ගත යුතු තීරණය කියලා අපි විශ්වාස කරන්නේ.

විශේෂයෙන්ම උතුරේ ජනතාවගේ ජීවනෝපාය වර්ධනය කර ගැනීමට උතුරට වෙන කර්මාන්ත ගියේ නැහැ. 2009 සිට මේ දක්වා උතුරට කර්මාන්තයක් ගියේ නැහැ, වෙන යෝජනාවන් ගියේ නැහැ. ඔවුන්ට තිබුණු එකම සම්පත මුහුදු සම්පත. ඒ සම්පතෙන් තමයි තමන්ගේ ජීවිකාව සකස් කර ගන්නේ. එම නිසා විශේෂ අවධානයක් යොමු කොට -තමිල්නාඩුවේ මැතිවරණය ඒ ගොල්ලන්ගේ කාරණයක් ගරු අගමැතිතුමනි. මේක අපේ ප්‍රශ්නයක්.- අපේ ප්‍රශ්නය විසඳීම සඳහා මීට වඩා වේගවත්ව කටයුතු කිරීම සඳහා ඔබතුමා අනුගමනය කරන ක්‍රියා මාර්ගය මොකක්ද කියලා දැන ගන්නට කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

අපි දැනට අත් අඩංගුවට අරගෙන තිබෙන ධීවර බෝට්ටු ආපහු යවන්නේ නැහැ. මම හිතන්නේ දැනට ධීවර බෝට්ටු 130ක් හෝ 140ක් අපේ අත් අඩංගුවේ තිබෙනවා කියලායි.

ඒවා ආපසු දෙන්න කිසිම අදහසක් නැහැ. ඕනෑම රටක සාමාන්‍යයෙන් කරන්නේ ධීවරයින් සමඟ බෝට්ටුත් අත් අඩංගුවට ගන්න එකයි. සමහර රටවල ධීවරයින් සහ බෝට්ටු ආපසු එවනවා. ලංකාවේ කරන්නේ ධීවරයින් පමණක් ආපසු යවන එකයි. බෝට්ටු අපි තියාගෙන ඉන්නවා. අපෙන් අහලා තිබෙනවා, ධීවර බෝට්ටු ආපසු දෙන්න පුළුවන්ද කියලා. අපි කියනවා, "ධීවර බෝට්ටු දෙන්න බැහැ. ඕනෑ නම් ධීවරයින් පමණක් ආපසු එවන්නම්" කියලා. මේකත් මේ ප්‍රශ්නය විසඳන්න එක අත්දමකින් අපි ගන්නා පියවරක්. ඒත් මේක අවසන් කරන්න ඕනෑ. එහිදී අනෙකුත් පැතිවලින් අපට විවිධ අදහස් එනකොට ඒවාත් ඉදිරිපත් කරලා ධීවරයින්ගේ ප්‍රතිචාර ලබා ගන්නයි අපට තිබෙන්නේ. කැමැති නම් කැමැතියි කියන්න පුළුවන්. අකැමැතියි නම් අකැමැතියි කියන්න පුළුවන්. අන්තිමට බලන්නේ, උතුරේ ධීවරයිනුත් කැමැති වන යම් කිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්නයි. ඒ ගොල්ලන් විරුද්ධ වුණොත් අපට මේක කරන්න බැහැ නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ඇත්තටම මෙතැන තිබෙන්නේ, එක ධීවරයකු මහ වැරදීමකින් සීමා මායිම් පැනලා ඇවිත් මාළු ඇල්ලීමක් නොවෙයි. ට්‍රෝලර් යාත්‍රා විශාල ප්‍රමාණයක් වේගවත්ව

කඩා පැනලා, මත්ස්‍ය සම්පත පැහැර ගැනීමකුයි මෙතැන සිද්ධ වෙන්නේ. එහේ ඉන්න අපේ නාවික හමුදාවේ ප්‍රමාණය කිසි සේත්ම ප්‍රමාණවත් නැහැ, එම ට්‍රෝලර් යාත්‍රා සියල්ල අත් අඩංගුවට ගන්න. එහෙම නම් වෙඩි තැබීමක් සමඟ යුද්ධයක් ආරම්භ කරන්න වෙනවා. ඒ එන ට්‍රෝලර් යාත්‍රා ප්‍රමාණයත්, ඒවායේ වේගයත්, ඔවුන් කරන මහා විනාශය සහ පැහැර ගැනීමත් එක්ක බලනකොට අනිවාර්යයෙන්ම එතැනින් තමයි ඒක කෙළවර වන්නේ. ඒ නිසා ඉඳ හිට බෝට්ටුවක්, දෙකක් අත් අඩංගුවට ගැනීමෙන් මේක විසඳෙන්නේ නැහැ.

අපි දන්නවා ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයම ඉන්දියාවටත් පාකිස්තානයේ මුහුදු තීරයත් එක්ක පැන නැඟුණු බව. හැබැයි, ඒ වෙලාවේ ඉන්දියාව මුහුදු තීරයේ කිලෝමීටර පහක area එකක් නම් කර ඒ මුහුදු තීරයෙන් එහාට ඉන්දියානු ධීවරයන්ට යන්න දුන්නේ නැහැ. ඒ ප්‍රදේශයේ මාළු අල්ලන හැම ධීවර යාත්‍රාවක්ම ඉන්නේ කොහේද කියලා බලාගන්න පුළුවන් උපකරණ සවි කර තිබෙනවා. ඉන්දියානු වෙරළ ආරක්ෂක හමුදාව විශේෂ මැදිහත් වීමක් කරනවා, පාකිස්තානු මුහුදු තීරයට ඉන්දියානු ධීවරයන් යාම වැළැක්වීමට. ඒක කරන්නේ පාකිස්තානයෙන්ම නොවෙයි. තමන්ගේ මුහුදු තීරය ආරක්ෂා කර ගැනීම සඳහා පාකිස්තානයට වැඩ පිළිවෙළක් තිබෙන අතර, ඉන්දියානු වෙරළ ආරක්ෂක හමුදාව තමන්ගේ ධීවරයන් පාකිස්තානු මුහුදු කලාපයට යාම වළක්වා ගැනීම වෙනුවෙන් විවිධ උපක්‍රම අනුගමනය කරනවා. පාකිස්තානයට එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරන ඉන්දියාව, ලංකාවට මෙවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න හේතුව කවරේද කියලා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මට කියන්න පුළුවන් ලංකා ආණ්ඩුව ගැන විතරයි. [බාධා කිරීමක්] යටවෙලා නැහැ. මේ කලාපය පාකිස්තානයට වඩා වෙනස්. මොකද, සාම්ප්‍රදායිකව හා ඓතිහාසිකව දෙපැත්තේම ඉන්න අය පෝක් සමුද්‍ර සන්ධියට ආසන්න මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදිලා තිබෙනවා. ඒ කාලයේ ට්‍රෝලර් යාත්‍රා තිබුණේ නැහැ; විශාල බෝට්ටු තිබුණේ නැහැ. ඒ පැත්තේ ඉන්න අය මේ පැත්තට ආවා, මේ පැත්තේ ඉන්න අය ඒ පැත්තට ගියා. 1983ට කලින් මේ පැත්තේ අයගේ දරුවන් ඒ පැත්තේ සිටියා, ඒ පැත්තේ ඉන්න අයගේ ගැහැනු මේ පැත්තේ සිටියා. අන්න එවැනි සම්බන්ධයක් තමයි තිබුණේ. දැන් තත්ත්වය වෙනස්. නවීකරණය නිසා විශාල බෝට්ටු අරගෙන අපේ මුහුදු සීමාවට කඩා පනින එක ප්‍රශ්නයක්.

ඒ අතරතුරේදී කච්චතීව් ගිවිසුම එනකොට ඉන්දියානු ධීවරයන්ගේ සමහර අයිතිවාසිකම් අපි පිළිගෙන තිබෙනවා. නමුත් දැන් මේ තත්ත්වය නවත්වන්න ඕනෑ. දැන් දෙපැත්තේම අය පිළිගෙන තිබෙනවා, මේ සම්බන්ධයෙන් යුද්ධයකට යන්න බැහැ කියලා. මේ අවුරුද්ද තුළදී විසඳුමක් අරගන්න ක්‍රියා කරන නිසා මම කරුණු ගැන කියන්න යන්නේ නැහැ. ඒ වුණත් මම දන්නවා, දැනට හොඳ සාකච්ඡාවක් සිදු වෙනවා කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මට තව වැදගත් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මේක ඉතාම වැදගත් ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අතුරු ප්‍රශ්න තුනයි අහන්න අවස්ථාව තිබෙන්නේ. තව ප්‍රශ්නයක් ඇහුවොත් ඒකට පිළිතුරු දෙන්න ගරු අගමැතිතුමා කැමැතිද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

කමක් නැහැ. "කවුද ළමයි, කවුද ගැහැනු" කියලා අහන්න එපා. අනෙක් ප්‍රශ්නවලට මම පිළිතුරු දෙන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම මේ ප්‍රශ්නයෙන් අවසන් කරනවා, ගරු කථානායකතුමනි. එම ට්‍රෝලර් යාත්‍රාවලින් ඒ ගොල්ලන්ගේ බිරින්දෑවරු හෝ කාන්තාවන් බලන්න එනවා නම් අපට ප්‍රශ්නයක් නැහැ ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්] ඔවුන් එන්නේ අපේ සම්පත සූරාකන්න. හැබැයි, දැන් තිබෙන ප්‍රශ්නය ගත්තොත් ලංකාව හා ඉන්දියාව අතර තිබෙන ඓතිහාසික සබඳතාවට වඩා ඉන්දියාව සහ පාකිස්තානය අතර තිබෙන ඓතිහාසික සබඳතාව වැඩියි. මහා භාරතයෙන් පාකිස්තානය වෙන්වෙලා අවුරුදු 60යි. ඒ නිසා ඔවුන්ට අපටත් වඩා දිගු ඓතිහාසික සබඳතාවක් තිබෙන්නේ. දිගු ඓතිහාසික සබඳතාවක් කියන්නේ, මෑත කාලය දක්වාම එන ඓතිහාසික සබඳතාවක් තිබෙනවා. එවැනි සබඳතාවක් තිබියදීත් ඉන්දියානු රජය පාකිස්තානු මුහුදු තීරයට තමන්ගේ ධීවරයන් යෑම වැළැක්වීම සඳහා GPS උපකරණ සවි කරමින්, සෑම බෝට්ටුවක්ම නිරීක්ෂණය කරන තත්ත්වයක් ඇති කර තිබියදී අපේ මුහුදු තීරයේදී පමණක් අපේ සම්පත පැහැර ගැනීම සඳහා ඔවුන්ට ඉඩ කඩ ලබා දීමෙන් පෙනෙන්නේ මේ භූ දේශපාලනයේ යම් සැලකිය යුතු බලපෑමක් හා සබඳතාවක් ඒ පිළිබඳව තිබෙන බවයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

නැහැ ගරු මන්ත්‍රීතුමනි, මම එයට එකඟ වන්නේ නැහැ. ඉන්දියාවයි, පාකිස්තානයයි අතර ඓතිහාසික සබඳතාවක් තිබෙනවා කිව්වාට, ඒ පැත්තේ ඉන්න මුස්ලිම් මිනිසුන් ඉන්දියාවට ගියත්, මේ පැත්තේ ඉන්න හින්දු මිනිසුන් පාකිස්තානයට ගියත් දැන් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා.

ඇත්ත වශයෙන්ම මෙතැන සිදු වුණේ මේකයි. මේ පෝක් සමුද්‍ර සන්ධිය දෙපැත්තේම හිටපු ධීවර ජනතාව පෘතුගීසීන් ආවාම කතෝලිකයන් බවට පත් වුණා. එහි අවට මුස්ලිම් අය සිටියා, මෙහේ හිටියා හින්දු අය. මේ කතෝලික සම්බන්ධතාව හැදුණේ එහෙමයි. එකම පල්ලියේ ඔවුන්ගේ තිබෙන සම්බන්ධතාව අනුව තමයි එහෙම තත්ත්වයක් ඇති වුණේ. තිබුණ තත්ත්වයට වඩා වෙනසක් වුණේ, මේ යුද්ධය අවසන් වුණාට පසුව අලුතෙන් මිනිසුන් ඇවිල්ලා trawlers අරගෙන විශාල business එකක් කරන්න බැලුවා, සාම්ප්‍රදායක අයිතිය තුළින් රිංගලා ඇවිත්. ඒ සාම්ප්‍රදායක අයිතිය වෙන එකක්. ඒක අපි දන්නවා. මේ තත්ත්වය අපට පිළිගන්න බැහැ. අපි දැන් මේ වෙනුවෙන් ක්‍රියාත්මක කරන්නයි හදන්නේ. යුද්ධයක් නැතිව අපට මේ ප්‍රශ්නය විසඳා ගන්න ඕනෑ නිසා සාකච්ඡා කර ගෙන යනවා. මම හිතන්නේ, යම් කිසි සාර්ථක විසඳුමක් අපට මේ සඳහා සොයා ගන්න පුළුවන් වෙයි. අපි කිව්වා, මේ ප්‍රශ්නය අපට තියා ගෙන ඉන්න බැහැ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඉන්දියාවේ හිටපු ජනාධිපති අබ්දුල් කලාම් මැතිතුමාගේ නෑදෑයෝ ඉන්නේ පුත්තලමෙයි, මන්නාරම පැත්තෙයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
බෝට්ටුවෙන්ද ඇවිල්ලා තිබෙන්නේ?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔව්. ඒ අය බෝට්ටුවෙන් ඇවිල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට මට ඉඩ ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත්, අගමැතිතුමාටත් ස්තූතියි.

පසු ගිය දිනවල ජල ගැලීමේ විපත්, නාය යාමේ විපත් සහ යුද අවි පිපිරීමේ විපත් නිසා හානියට පත් වූ බඩු භාණ්ඩ, දේපළ, නිවාස සඳහා රජය ලබා දීමට පොරොන්දු වූ සහන එනම්, බඩු භාණ්ඩ සඳහා මුදල්, නිවාස ඉදිකර ගැනීම සඳහා මුදල්, අනතුරුදායක බෑවුම්වල ඇති නිවාස සඳහා විකල්ප ඉඩම් මේ වන තුරුත් එකී විපතට පත් වැසියන් හට ලබාදී නොමැති අතර, සුළු පිරිසකට පමණක් විනාශ වූ බඩු භාණ්ඩ සඳහා පමණක් යම් මුදලක් ලබා දී ඇති බවට වැසියන් අපට පැමිණිලි කර ඇත. ඒ පිළිබඳව ඔබතුමාගේ පිළිතුර කුමක්ද?

මේ පිළිබඳ උදාහරණ වශයෙන් අංගොඩ, ගොඩැල්ල මාවත සහ කඩුවෙල වෙලේහංදිය යන ප්‍රදේශවල වාසය කරන පවුල් එක්දහසකට වැඩි පිරිසක් මෙහිලා සඳහන් කරමි. මේ වන තුරු ඔවුන්ට බඩු භාණ්ඩ සම්බන්ධයෙන්වත්, අත්තිකාරම් වශයෙන්වත් කිසිදු දෙයක් ලබා දී නැති බව ඔවුන් පවසනවා. ගරු අග්‍රාමාත්‍යතුමනි, ඒ ගැන ඔබතුමා කියන්නේ කුමක්ද?

තවද, නාය යාමට හා නාය යාමේ අනතුරට ලක් වූ කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කවල එම ජනයා වර්ෂාව නැවතීමත් සමඟ එකී අනතුරුදායක නිවාසස්ථානවලට ආපසු ගොස් ඇත. නැවත තද වර්ෂාවක් ඇති වුවහොත් මෙම පවුල් නැවතත් භීතියට පත්ව ආරක්ෂිත ස්ථානවලට යා යුතුය. රත්නපුර දිස්ත්‍රික් ආපදා කමිටුව මෙම පවුල් සඳහා දීමට විකල්ප ඉඩම් හඳුනාගෙන ඇති බව අපට දන්වා තිබුණත්, එම ඉඩම්වල භුක්තිය රජයට ගැනීම නොකෙරෙමින් ඇත. ඉහත කී සහන කටයුතු රජය පොරොන්දු වූ පරිදි එකී විපතට පත් වූ මිනිසුන්ට ලබා දෙන්නේ කවදාද?

ගරු අගමැතිතුමනි, මෙම ප්‍රශ්නවලට ඔබතුමාගේ පිළිතුර අවශ්‍යයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
පසු ගිය දිනවල බලපෑ ගංවතුර හා නාය යාම් ආපදා තත්ත්වය හේතුවෙන් විපතට පත් ජනතාවට සහන සැලසීමට අවශ්‍ය උපදෙස්, මාර්ගෝපදේශ හා ආකෘති පත්‍ර යන සියල්ලම දිස්ත්‍රික් ලේකම්වරු වෙත ලබා දී ඇත. එම උපදෙස් අනුව හානියට පත් වූ නිවාස, බඩු භාණ්ඩ ඇතුළු දේපළ සඳහා සහන සැලැස්වීමට අවශ්‍ය ප්‍රතිපාදන ඒ ඒ දිස්ත්‍රික්කවල ලේකම්වරු විසින් ඉල්ලා ඇති අතර, පහත පරිදි එක් එක් දිස්ත්‍රික්කයන් සඳහා මේ වන විට ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කර ඇත.

කොළඹ දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 109යි.

ගම්පහ දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 152යි.

පුත්තලම දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 9යි.

කෑගල්ල දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 20යි.

රත්නපුරය දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 4යි.

කළුතර දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 6යි.

මීට අමතරව විවිධ ආධාර සෘජුවම ලබා දී ඇත.

කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කවල නාය යාමෙන් හා ගංවතුරෙන් විපතට පත් ජනතාවට නිවාස ඉදි කිරීම සඳහා විකල්ප ඉඩම් හඳුනා ගැනීම සහ ඒවා පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර, තාවකාලික විසඳුමක් ලෙස විපතට පත් ජනතාව කුඩාරම් සහ තාවකාලික රැඳවුම් මධ්‍යස්ථානවල පදිංචි කර ඇත.

විකල්ප ඉඩම් සොයා ගැනීමේදී ප්‍රශ්නයක් තිබෙනවා. සමහර ඉඩම් පෞද්ගලික වතු සමාගම්වලින් ලබා ගන්න තිබුණා. ඒ සඳහා සමහර තැන්වල සේවය කරන පිරිසගේ විරුද්ධත්වයක් තිබුණා. ඒ වැඩ කටයුතු ශීඝ්‍රයෙන් අවසන් කරන්න අපි බලාපොරොත්තු වනවා. ප්‍රශ්න සහිත ඉඩම් ලබා දීලා මේ ගොල්ලන් ගෙන ගිහිල්ලා අනතුරුදායක තත්ත්වයක තබාගෙන ඉන්න අපිත් කැමැති නැහැ.

ඒ එක්කම කැලණි ගං මිටියාවතේ අයට මුදල් ගෙවා ගෙන යනවා. මේ පිළිබඳව මම කථා කළා. කඩුවෙල අයට ගෙවිය යුතු ඉතිරි මුදල් ටික අද හෙට වනකොට ගෙවා අවසන් කරනවා කියලා දැනුම් දීලා තිබුණා. හංවැල්ල, කඩුවෙල ප්‍රදේශවල සමහර අයටත් විකල්ප ස්ථාන ලබා දෙන්න තිබෙනවා. බස්නාහිර පළාතේ විකල්ප ස්ථාන ලබා ගන්නත් දැන් අපි ක්‍රියා කරගෙන යනවා. හැබැයි, ඒකට ටිකක් කල් යයි. මොකද, අලුත් බිම් සොයා ගෙන ඒවා අත් පත් කර ගන්න ඕනෑ නිසා.

එමෙන්ම සාලාව යුද හමුදා කඳවුරේ අවි ගබඩාව පිපිරීම හේතුවෙන් හානියට පත් නිවාස හා ව්‍යාපාරික ස්ථාන සඳහා රුපියල් 50,000 බැගින් දීමනා ගෙවීම සඳහා මේ වන විට රුපියල් මිලියන 18ක් කොළඹ දිස්ත්‍රික් කාර්යාලයට ලබා දී ඇත. එම ප්‍රතිපාදනවලින් නිවාස 276ක් හා ව්‍යාපාරික ස්ථාන 52ක් සඳහා රුපියල් 50,000 බැගින් දීමනා ලබාදී ඇත. මේ පිළිබඳව දැන් වන්දි ගෙවන්න ඇස්තමේන්තුව ලැබිලා තිබෙනවා. සමහර අය ඒ ඇස්තමේන්තු මුදලින් සෑහීමට පත් වෙන්නේ නැහැ. ඒ නිසා ඒ පිළිබඳව ගත යුතු ක්‍රියා මාර්ග දැන් සකස් කර ගෙන යනවා. ඒ ඒ ප්‍රදේශවල ප්‍රශ්න තිබෙනවා නම්, ඒ විශේෂ ප්‍රශ්න අපේ ආපදා කළමනාකරණ ඇමතිතුමාට යොමු කරන්න කියලා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. මම හිතන විධියට දැනට ශීඝ්‍රයෙන් මේ ප්‍රශ්න විසඳන්න එතුමා ක්‍රියාත්මක වෙනවා. එතුමා මේ හැම පළාතක් සම්බන්ධයෙන්ම ගත යුතු පියවර මොකක්ද කියලා හඳුනා ගෙනයි තිබෙන්නේ

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, "ශීඝ්‍රයෙන්" කියන වචනයට සාපේක්ෂ අර්ථයක් තමයි තිබෙන්නේ. සමහර වෙලාවට දුම්රියක් දුම්රිය

පොළ ඇතුළේ පැයට සැතපුම් 10ක වේගයෙන් ගියත් ඒක ශීඝ්‍රයෙන් යනවා කියලා කියනවා. ඒ නිසා මේ "ශීඝ්‍රයෙන්" කියන වචනයට යම් කාල පරාසයක නියමයක් අවශ්‍යව තිබෙනවා. ඒ කාල පරාසය නියමය කිරීමට නම්, අගමැතිතුමන්ට සැලකිය යුතු සැලැස්මක් මේ වෙනුවෙන් දමන්නත්, සැලකිය යුතු නිලධාරි පිරිසක් මේ සම්බන්ධයෙන් යොදවන්නත්, සිද්ධ වෙනවා. ඒ අනුව ප්‍රධානම කාරණය වන්නේ විකල්ප ඉඩම් ලබා ගැනීමයි.

ගරු අගමැතිතුමනි, ඔබතුමා කියන ආකාරයට විකල්ප ඉඩම් ලබා ගැනීම සඳහා ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය හරහා අපි ගමන් කරනවා නම්, ඒකට ගතවන කාලය කොයි තරම් ශීඝ්‍ර ද කියලා ඔබතුමා දන්නවා. ඒ මිනිස්සු එතෙක් කල් කූඩාරම්වල ඉන්නද, නැත්නම් අනතුරුදායක බෑවුම්වල ඉන්නද? ඉඩම් අත් පත් කර ගැනීමේ පනතේ එක වගන්තියක් තිබෙනවා, වහාම බුක්තිය ලබා ගත හැකි. අන්න ඒ වගන්තිය යටතේ වහාම බුක්තිය ලබා ගෙන අවශ්‍ය කටයුතු ආරම්භ කරන්න. මිනිසුන්ට නිවාස හදලා දෙන්න ගරු සජිත් ප්‍රේමදාස මහතා පුලුපුලා බලා ගෙන ඉන්නවා. ඒ කටයුතු එතුමාට භාර කරලා, ඒ අතරතුර පවරා ගැනීමේ ක්‍රියාවලිය කර ගෙන යාම ගැන ඔබතුමාගේ අදහස කුමක්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

පෞද්ගලික වැවිලි සමාගම් සතුව තිබෙන ඉඩම් අත් පත් කර ගැනීමේදී සම්පූර්ණයෙන්ම ඉඩම් අත් පත් කර ගැනීමේ පනතට අනුවම ක්‍රියා කරන්න උවමනා නැහැ. ඒවායේ තිබෙන කාර්යාල, සමහර විට ඒවායේ තිබෙන ගොඩනැඟිලි ඉවත් කරන්න, ඒවා මැනලා දෙන්න කල් ගත වෙනවා. ඒ කටයුතු ක්‍රියාත්මක කර ගෙන යනවා.

විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් ටික හඳුනා ගන්න තිබෙනවා. දෙන්න තිබෙන මුදල් ඔක්කෝම දැන් දීලා ඉවරයි. මූල්‍යමය වැඩ කටයුතු ටික අපි විගහට කළා. එහෙත් කොළඹ දිස්ත්‍රික්කයේ කොළොන්නාව, කඩුවෙල සහ අවිස්සාවේල්ල යන ප්‍රදේශවල ඉඩම් හඳුනා ගෙන ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න ටික කලක් ගත වෙනවා. එහෙත් අවුරුදු ගණන් ගත වෙන්නේ නැහැ. අපි ඒකට උවමනා කරන විසඳුම් ලබා දෙනවා. සමහර අය කොහොමත් තමන්ගේ නෑදෑ හිතවතුන් එක්ක ඉන්නවා. සමහර අය ආපසු යට වෙන තැන්වලට ගිහිල්ලා තිබෙනවා. එහෙත් අපි කියලා තිබෙනවා, එතැනින් ඉවත් වෙන්න වෙයි කියලා. සමහර අය තවම ඒ කූඩාරම් යට ඉන්නවා. ඒ කූඩාරම් යට ඉන්න සංඛ්‍යාව අඩු වෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අසන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු අග්‍රාමාත්‍යතුමා මම අහපු ප්‍රශ්නයට කෙළින්ම ඉලක්කගත කරලා පිළිතුරු දුන්නේ නැහැ. මම ඔබතුමාගෙන් ඇහුවේ, "ශීඝ්‍රයෙන්" කියන කාලයට කොච්චර කාලයක් යනවාද කියලායි. ඔබතුමා ඒකට ඍණ වශයෙන් පිළිතුරු දුන්නේ, "අවුරුදු ගණනක් යන්නේ නැහැ" කියලා. ඒ උත්තරය මගේ ප්‍රශ්නය මහ හැරීමක් බවයි මට පෙනෙන්නේ.

ගරු අගමැතිතුමනි, ප්‍රධාන වශයෙන් වතු ඉඩම් තිබෙන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ. ඒවායේ පරම අයිතිය තිබෙන්නේ ආණ්ඩුවට. ඒ වතුවල රන් කොටස් අයිතිය - golden share - ඇත්තේ ආණ්ඩුවට බැවින්, ආණ්ඩුවට ඒවායේ භුක්තිය ලබා ගැනීම සම්බන්ධයෙන් විශේෂ බලයක් තිබෙනවා. ඒ නිසා ඔවුන්ගේ මතු පිට තිබෙන වැවිල්ලට දිය හැකි වන්දිය කුමක්ද කියන එක ගැන තක්සේරුවක් කරමින්, ඒ ඉඩම්වල භුක්තිය ගැනීමට රජයට ක්‍රියා කිරීමට හැකි අතර, පෞද්ගලික ඉඩමක අත්පත් කර ගැනීමක් අවශ්‍ය වුණත්, වහාම භුක්තිය පවරා ගැනීමේ විශේෂ වගන්තිය යටතේ පවරා ගැනීමට පුළුවන්. ඔබතුමා ඒ සඳහා ක්‍රියා කරනවාද කියලායි මම අහන්නේ. මේ මිනිසුන් කොච්චර කාලයක් මේ විධියට ඉන්නද? නෑදෑ ගෙවල්වල කොච්චර කාලයක් ඉන්නද? කූඩාරම්වල කොච්චර කාලයක් ඉන්නද? ඒ අවශ්‍ය විකල්ප ඉඩම් හඳුනා ගෙනයි තිබෙන්නේ. දැන් තිබෙන්නේ ඒවායේ භුක්තිය ගැනීමයි. මේ සඳහා ඔබතුමා විශේෂ ක්‍රියාමාර්ගයක් ගත යුතුයි කියා මා හිතනවා. ඒ සම්බන්ධයෙන් මම ඔබතුමාගෙන් උත්තරයක් ඉල්ලා සිටිනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු එක අනුවයි, මමත් පිළිතුරු දුන්නේ. පෞද්ගලික වැවිලි සමාගම්වල ඉඩම් පවරාගන්න ඇත්ත වශයෙන්ම අපට ඉඩම් අත්පත් කර ගැනීමේ නීතිය යටතේ ක්‍රියා කරන්න වුවමනා නැහැ. රජයට අයිති වතු තමයි, පෞද්ගලික වැවිලි සමාගම්වලට දීලා තිබෙන්නේ. ඒවා හඳුනා ගන්න, සමහර විට ඒ තැන්වල තිබෙන වෙනත් ගොඩනැගිලි ඉවත් කරවා ගන්න ටිකක් කල් යනවා.

මේ වතු අරගෙන කොටස් හැටියට බෙදලා, එක් එක් පුද්ගලයන්ට දෙන්න තිබෙනවා. ඉඩම් හඳුනා ගත් පමණින් මේ කටයුත්ත අවසන් වෙන්නේ නැහැ. ඉතුරු වැඩ ටික අපි කරගෙන යනවා. අනික, කොළඹ රජයේ වතු නැහැ. කොළඹට ඉඩම් හොයන්න වෙන්නේ, පෞද්ගලික ඉඩම්වලින්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කලුඅග්ගල, -

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඒ අයට ඕනෑ තමන් හිටපු තැනයි. ඒ අයට ඕනෑ කලුඅග්ගල ඉඩම් නොවෙයි. කොළොන්නාවේ ඉන්න මිනිස්සු කලුඅග්ගලට යවන්න බැහැ. මමයි, ඇමතිවරු ගණනාවකුයි, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු ගණනාවකුයි කොළඹ දිස්ත්‍රික්කය තමයි නියෝජනය කරන්නේ. දේශපාලන පක්ෂ වශයෙන් ප්‍රශ්නයක් නොවන විධියට පුළුවන් තරම් විගහට අපි මේ කටයුත්ත කරනවා. මේ අවස්ථාව වනකොට අවශ්‍ය සල්ලි ලැබිලා තිබෙනවා. වැඩ කටයුත්ත කර ගන්න තමයි අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අවසාන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

කොස්ගම සාලාව කඳවුරේ සිදු වුණු පිපිරුම නිසා හානියට පත් වූ නිවැසියන් 800ක් පමණ ඉන්නවා, මගේ වාර්තා අනුව. රුපියල්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

50,000 මූලික අත්තිකාරම් සහිත වෙක්පත් දැනට ඒ 300 දෙනෙකුට පමණ දීලා තිබෙනවා. අනික් අයගේ වෙක්පත් ලියලා තිබෙනවා. නමුත් ඒවා නිකුත් කරන්නේ නැහැ, මුදල් නැහැ කියලා. ඔබතුමාගේ දැනගැනීම පිණිසයි මම මේ කාරණය කියන්නේ. මුදල් නැහැ කියලා ඒ ලියපු වෙක්පත් නිකුත් කරන්නේ නැතිව, -

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පොඩ්ඩක් ඔහොම ඉන්න. ඔබතුමා අගමැතිතුමා වුණාට, එහෙම බැහැ නේ.

ඒ වෙක්පත් නිකුත් නොකර තියාගෙන ඉන්නවා. මම වැරැදි නම්, මම වැරැදි බව ඔබතුමා කියන්න. මම ගිහිල්ලා මේ ගැන හොයා බැලුවා. මට ලැබුණු තොරතුරු අනුවයි මම කථා කරන්නේ. ඒ ඉරි තැලී ගිය බිත්ති මත විගවිගහට වහලවල් හදලා මේ ප්‍රශ්නය බේරන්න පුළුවන්ද කියලායි මම ඔබතුමාගෙන් අහන්නේ. අංගොඩ, ගොඩැල්ල ප්‍රදේශය සහ කඩුවෙල වෙලේහංන්දිය යන ප්‍රදේශ නිශ්චිත ප්‍රදේශ වශයෙන් මම ලියාගෙන තිබෙනවා. තවමත් රුපියල් 10,000 නොදුන්නු ගෙවල් 1,000ක් විතර තිබෙනවා, මම කිව්ව ඒ දෙපොළේ පමණක්.

අද පත්තරේ පළවෙලා තිබෙන තොරතුරු අනුව ඒ අදාළ නිලධාරීන් කියලා තිබෙනවා, "මේ මුදල් ගෙවන්න 15,000ක් විතර ඉන්නවා. තවම 6,000කටයි ගෙවලා තිබෙන්නේ" කියලා. ඒ මොකද? එක්කෝ ඒකට අවශ්‍ය කාර්ය මණ්ඩලය නැහැ. එහෙම නැත්නම් තමුන්නාන්සේලාට ඒ මුදල් සපයන්න බැහැ. මේ කාරණා දෙකින් කුමක් නිසාද මේ මුදල් ගෙවන්න බැරි කියන ප්‍රශ්නයට ඔබතුමාගෙන් මම උත්තරයක් ඉල්ලනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒ ඔක්කොම මුදල් එවලා තිබෙනවා. කාර්යාලවලට නිලධාරීන් පත්කර තිබෙනවා. අදාළ ඇමතිවරුන් දෙදෙනාම මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා. මා කොළඹ දිසාපතිතුමාට - දිස්ත්‍රික් ලේකම්තුමාට- කථා කළා, කොළොන්නාව ගැන අහන්න. අද හෙට වන කොට ඒ මුදල් ගෙවලා ඉවර වෙයි. මේ සති අන්තයේත් ලිව්වා. කොළොන්නාවේ නොවෙයි, කොළඹ ඕනෑ තැනකින් කණ්ඩායම් දමාගෙන ලියන්න කිව්වා. අපේ අමාත්‍යාංශවලින් හෝ අවශ්‍ය නිලධාරීන් දෙන්නම් කිව්වා. ඒ වැඩ කටයුතු දැන් ශීඝ්‍රයෙන් කරගෙන යනවා.

අනෙක් කාරණය, දැන් භයසිය ගණනකට මුදල් ලබා දීලා තිබෙනවා. සමහර විට ඒ මුදල් ගෙවීමේ ප්‍රමාදයක් වන්න පුළුවන්. මුදල් ඔක්කොම ලබා දීලායි තිබෙන්නේ. ගෙවල් හදලා තිබෙනවා. තවත් ගෙවල් හදන්න හමුදාවේ අය ලෑස්ති වෙලා ඉන්නවා. ඊයේ ජනාධිපතිතුමාටයි, මටයි හමුදාපතිතුමා හමු වුණා. ඒ කරන කටයුතුවල විස්තරයක් එතුමා දුන්නා. මා දන්නේ නැහැ, ඔබතුමාට මේ කරුණු කිව්වේ කවුද කියලා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
වැසියෝ කිව්වේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මමත් වැසියෙක්. මේ අපේ ඡන්ද දායකයෙක්.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
අපිත් වැසියෝ තමයි. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔබතුමාට ඒ ගොල්ලෝ වැසියෝ. මට ඒ ගොල්ලෝ ඡන්ද දායකයෝ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වැඩි ඡන්ද ගත්තේ අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔවුන් අපට ඡන්ද දායකයෝ. පක්ෂ භේදයකින් තොරව කොළඹ හැමදෙනාම මේ වැඩ කටයුත්ත කර ගෙන යනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මා අවසාන අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්න තුනම ඇහුවා. අවශ්‍ය නම් ගරු අගමැතිතුමාගේ එකඟත්වයෙන් ඒ ප්‍රශ්නය අහන්න පුළුවන්. ගරු අගමැතිතුමා පිළිතුරු දෙන්න කැමැතිද?

ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)
වැඩක් නැහැ, වැඩක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමාගෙන් මා අහන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කැමැති නැහැ. [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට විතරයි ඒ අවස්ථාව දෙන්නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමනි, මේ කටයුතු කර ගෙන යන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] ගරු සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමා ඉඳගන්න. ගරු අගමැතිතුමා පිළිතුරු දෙන්න කැමැතිද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉන්දු-ලංකා සම්බන්ධකම් ගැන ප්‍රශ්නයක් ඇහුවා. මෙතැන තිබෙන ඓතිහාසික සම්බන්ධය හා පාකිස්ථානය අතර තිබෙන සම්බන්ධය වෙනස් කියලා පෙන්වන්න මට වුවමනා වුණා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඇසූ හතරවන අතුරු ප්‍රශ්නයට පිළිතුරු දෙන එක මට කිසිම ප්‍රශ්නයක් වුණේ නැහැ. මා දන්නේ නැහැ, මේ ගහගන්නේ මොනවාටද කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අවසානයි.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ වීය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු අගමැතිතුමනි, මා ඔබතුමා වෙත යොමු කරන ප්‍රශ්නය මෙයයි.

ලෝකයේ නෞකා කර්මාන්තය බිඳ වැටී ඇති යුගයක අධික මිලක් ගෙවා ඉතාම විශාල කාණ්ඩයේ නෞකා දෙකක් මිලදී ගැනීමට පසු ගිය රජය සමයේ කටයුතු කර ඇත. ඒට අදාළව,

01. ශ්‍රී ලංකා නැව් සංස්ථාවට "Ceylon Breeze" සහ "Ceylon Princess" ලෙස නම් කරන ලද නෞකා දෙකක් මිලදී ගෙන තිබේද?
02. එම නෞකාවල නිෂ්පාදන වර්ෂය සහ මිලදී ගත් මිල ගණන් කවරේද?
03. එම නෞකාවන් සඳහා ණය පහසුකම් ලබා දුන් ආයතනයන් සහ ණය වාරිකයන් කොපමණද?
04. මෙම නෞකාවන් යොදා ගැනීමට බලාපොරොත්තු වන්නේ කුමන කාර්යයක් සඳහාද?

යන්න මෙම ගරු සභාවට දැනුම් දෙන්නේද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
පසු ගිය රජය සමයේ ශ්‍රී ලංකා නැව් සංස්ථාව හරහා "Ceylon Breeze" සහ "Ceylon Princess" ලෙස නම් කරන ලද නැව් දෙකක්, එක නැවක් ඇමෙරිකානු ඩොලර් මිලියන 35 බැගින් ඇමෙරිකානු ඩොලර් මිලියන 70ක මුදලකට මිලදී ගෙන තිබෙනවා. ඊට අමතරව එම නැව් දෙක සඳහා දොඹකර සහ බොයිලේරු සවි කිරීමට ඇමෙරිකන් ඩොලර් 456,310ක මුදලක් වැය කර තිබෙනවා. මේ නැව් දෙකේ නිෂ්පාදන කටයුතු ආරම්භ කර ඇත්තේ 2014 වසරේ වන අතර, 2016 වසරේ එම කටයුතු නිම කර තිබෙන බව මා වෙත වාර්තා කර තිබෙනවා. මෙම මිලදී ගැනීම සඳහා ණය මුදලක් මහජන බැංකුවෙන් ලබාගෙන ඇති අතර, එම ණය මුදල සඳහා වන අර්ධ වාර්ෂික පොලී වාරිකය ඇමෙරිකන් ඩොලර් මිලියන 2.4ක්, එනම් රුපියල් මිලියන 356කි. ඒ වාගේම මේ ණය සඳහා ගෙවිය සම්පූර්ණ අර්ධ වාර්ෂික ණය වාරිකය ඇමෙරිකන් ඩොලර් මිලියන 5.8ක් වනවා. එනම්, රුපියල් මිලියන 850ක පමණ මුදලක් අර්ධ වාර්ෂික ණය වාරිකය වශයෙන් ගෙවිය යුතුව තිබෙනවා.

මේ නැව් මිලදී ගැනීමේ අරමුණ ලෙස සඳහන් කර ඇත්තේ පුත්තලම ලක් විජය විදුලි බලාගාරය හා යෝජිත සාම්පූර් විදුලි බලාගාරය සඳහා අවශ්‍ය ගල් අඟුරු ප්‍රවාහනය කිරීමයි. නමුත්, නිරීක්ෂිත මෝසම් සුළං හේතුවෙන් පුත්තලමට ගල් අඟුරු ගොඩ බැමට හැකියාව ඇත්තේ වසරේ සැප්තැම්බර් මාසයේ සිට ඊළඟ වසරේ අප්‍රේල් මාසය දක්වා කාලය තුළ පමණයි. ඇත්ත වශයෙන්ම මේ සාම්පූර් විදුලිබල ව්‍යාපෘතියට කිසි විටක මේ නැව්වලින් ගල් අඟුරු ලබා ගන්නවා කියා ප්‍රකාශ කර නැහැ. ඒ නිසා දැන් නැව් සංස්ථාව විසින් එම නැව් නාවුක වෙළෙඳ පොළේ ව්‍යාපාරවල යෙදවීමට තීරණයක් ගෙන තිබෙනවා. ඒ අනුව "Ceylon Breeze" නෞකාව මේ වන විට දිනකට ඇමෙරිකන් ඩොලර් 7,970ක පමණ මුදලකට කුලී පදනම මත සේවයේ යොදවා ඇති බවත්, "Ceylon Princess" නෞකාව ජූලි මස 10වන දින සිට කුලී පදනම මත සේවයේ යෙදවීමට කටයුතු කර තිබෙන බවත් මා වෙත වාර්තා කර තිබෙනවා.

මෙම නැවක වර්තමාන වෙළඳ පොළ වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 20ක්, 21ක් පමණ වන බවට ගණන් බලා තිබෙනවා. ඒ නිසා මේ නැව් දෙක වහාම විකුණා දැමුවොත් සිදු විය හැකි පාඩුව ඇමෙරිකානු ඩොලර් මිලියන 30ක් පමණ වනවා. මේ නැව් දෙක සඳහා මහ ජන මුදල් විශාල ප්‍රමාණයක් වියදම් කර තිබෙන නිසා මේ නැව් වහාම විකුණා දමනවාද, නැතහොත් වඩාත් ඵලදායී අන්දමින් යොදා ගත හැකි ආකාරය කවරේද යන්න පිළිබඳව මා වෙත වාර්තා කරන ලෙසට දැනට අදාළ අංශවලට උපදෙස් ලබා දී තිබෙන බව මම සඳහන් කරන්න කැමැතියි. මේ නැව් දෙකට වියදම් කර තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 70යි. අද ඒ නැව් දෙකේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 40යි. එහෙම නම් ඇමෙරිකානු ඩොලර් මිලියන 30ක පාඩුවක් එතැනම තිබෙනවා.

ඊළඟට, operational profit or loss එක බැලුවාම, අවුරුද්දකට ඩොලර් මිලියන 7.5ක පාඩුවක් තිබෙනවා. මේ අනුව බැලුවාම අවුරුදු 4ක් යන කොට අලාභය නිසාත්, මිල අඩු

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

වීම නිසාත් මේ මිලියන 70 අපට සම්පූර්ණයෙන් නැති වනවා. මොකක්ද කරන්නේ කියා දැන් තීරණයක් ගන්න අපට සිදු වෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු අග්‍රාමාත්‍යතුමනි, අපේ ගම්වල කථාවක් තිබෙනවා, "බුදු පිළිම ගිලපු යකාට අග්ගලාවත් කජ්ජක්ද?" කියලා. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගමේ කෝටි 46,100ක් ගිලපු අයට මේ නැව් දෙක පොඩි දෙයක් වෙන්න ඇති. නමුත් මෙය රටට ලොකු හානියක්. මම හිතන විධියට මේ නැව් දෙක මිලදී ගැනීමේදී රුපියල් කෝටි 320ක විතර අලාභයක් කර තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමනි, සාමාන්‍යයෙන් නැව්වල තිබෙනවා, IMO number එකක්. International Maritime Organization එකෙන් number එකක් දෙනවා. නැවක් නිෂ්පාදන කටයුතු ආරම්භ කරද්දී, එසේ නිෂ්පාදන කටයුතු ආරම්භ කරන වර්ෂය තමයි මේ number එකේ මුලට එන්නේ. "Ceylon Breeze" කියන නෞකාවේ IMO number එකේ මුලට තිබෙන්නේ 97 කියලායි. ඒ වාගේම, "Ceylon Princess" නෞකාවේත් IMO number එකේ මුලට තිබෙන්නේ 97 කියලායි. ඒ නිසා 1997 වර්ෂයේ නිෂ්පාදනය කරපු පරණ නැව් දෙකක් repair කරලා හොර ගිවිසුමකින් ලංකාවට දුන්නාද, එහෙම නැත්නම් මෙතැන වෙනත් මහා දූෂණයක් ක්‍රියාත්මක වුණාද කියා පැහැදිලි සැකයක් ඇති වෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමනි, මේ සම්බන්ධව ඔබතුමා යම්කිසි කටයුත්තක් කරන්න බලාපොරොත්තු වනවාද කියා දැනගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඇත්ත වශයෙන්ම නැව් දෙකක් තිබෙන එක පුදුමයක්. සාමාන්‍යයෙන් නැව් දෙකක් තිබෙන්න ඕනෑත් නැහැ. ඒ තිබෙන නැව් දෙක අලුත් ඒවාද? පරණ ඒවා කියන එක මට කියන්න බැහැ. එහෙත් කරුණු තිබෙනවා නම් අපි ඒවා පොලීසියට දෙන්නම්, ඒ ගැන සම්පූර්ණයෙන් විභාග කර බලන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අගමැතිතුමනි, මම මේ කාරණය ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. මේ සා විශාල දූෂණයක් සිදු වුණා කියලා සැකයක් තිබෙන නිසා ඔබතුමා පොලීසියට ඒ සම්බන්ධව පරීක්ෂණ කිරීමට භාර දෙන්න කටයුතු කරන්න උපදෙස් දීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ නැව් යොදා ගෙන තිබෙන්නේ ගල් අඟුරු ගෙනෙන්න කියලා ඔබතුමා කිව්වා. හැබැයි අපට ලැබී තිබෙන තොරතුරු අනුව ගල් අඟුරු ටොන් එකකට ගෙවන මිලට වඩා අඩු මිලකට සේවය ලබා ගැනීමට නෞකා කර්මාන්තය තුළ නැව් හොයා ගන්න පුළුවන්. මේක නිකම් එක සාක්කුවකින් අරගෙන අනෙක් සාක්කුවට දානවා වාගේ වැඩක්. ඒ නිසා ගල් අඟුරු ප්‍රවාහනය පදනම් කරගෙන මේ නැව් භාවිත කරනවා නම් ඒක අපට සුදුසු නැහැ. අපට මේ නැව්වලින් ලාභ ලබන්න අවශ්‍ය වෙනවා. මේ ගල් අඟුරු ප්‍රවාහනයෙන් ඒක කර ගන්න බැරි වෙනවා. ඒ නිසා මේ නැව් වෙනත් කටයුත්තකට යොදා ගන්න බලාපොරොත්තු වෙනවාද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමනි, මේ නැව්වලින් ගල් අඟුරු ගෙන ගොස් ලාභයක් ලබා ගන්න බැහැ. මාස හයක් ගල් අඟුරු ගෙන යන්නේත් නැහැ. මේ නැව් අර ගත්තේ ලෝකයේ නැව් අතිරික්තයක් තිබෙන කාලයකයි. තවත් අවුරුදු පහකට, දහයකට නැව් අතිරික්තයක් තිබෙනවා. අපේ නැව් සංස්ථාවට මෙහෙම නැව් කුලියට දෙන්න හැකියාවක් නැහැ. නමුත් අපට ඒක දෙන්න සිදු වෙලා තිබෙනවා. දැන් අපට තීරණය කරන්න වෙයි, අලාභය දිහා බලලා මේ නැව් තියා ගන්නවාද නැත්නම් මේ නැව් විකුණනවාද කියලා. අනෙක ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය කියන්න කැමැතියි. මේක දකුණු සාක්කුවෙන් වම් සාක්කුවට ගියේත් නැහැ; වම් සාක්කුවෙන් දකුණු සාක්කුවට ගියේත් නැහැ. ජනතාවගේ සාක්කුවෙන් අරගෙන වෙන එක්කෙනෙකුගේ සාක්කුවට ගිහින් තිබෙන්නේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අගමැතිතුමනි, ඒ ණයත්, මේ ණයත් හැර රාජපක්ෂවරු රටට බරක් වෙච්ච තවත් ණය තිබේද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමනි, හැම තැනම ඒ ණය තිබෙනවා. දැනටම අපි සහතික කරලා තිබෙන ණය ඩොලර් ට්‍රිලියන 1.3ක් තිබුණා. එක එක රටවලින් අරගෙන තිබෙන විදේශ ණය යොදවලා තිබෙන ඒවා දිහා බැලුවාම, ඒවායේ මිල දිහා බැලුවාම මම මේ ණය ගැන අලුතෙන් කියලා වැඩක් නැහැ. මේ ඔක්කෝම පව් අපට ගෙවන්න සිදු වෙලායි තිබෙන්නේ. මේ පව් ටික ගෙවලාත් රට ඉදිරියට ගිහින් රැකියා දෙන්නත් දැන් ක්‍රියා කර ගෙන තිබෙනවා. අපි ආපහු මේ සංවර්ධන ව්‍යාපාරය අත් හරින්නේ නැහැ. මේ ප්‍රශ්නයෙන් ගොඩ එන්න පක්ෂ ගණනාවක් එකතු වෙලා ජාතික ආණ්ඩුවක් ඇති කර ගෙනයි තිබෙන්නේ. මේ තිබුණු ණය ප්‍රමාණය ඒ විධියට ගියා නම් අපේ රටේ ආර්ථිකය කඩා වැටෙනවා.

2015 ජන්දයට ගියෙත් මේ ණය බර එක්ක මොනවාද කරන්නේ කියන එක දැනගත්තේ නැති නිසායි. 2015 අපි ස්ථාවරභාවයක් ඇති කර ගෙන, 2016 වන විට මේ ණය ගෙවන්න විවිධ ක්‍රියා මාර්ග ගැනීමට තිබෙනවා. අපට රජයේ ආදායම් වැඩි කරන්න සිදුවී තිබෙනවා. හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටු පොළ බදු දීලා ඒ මුදල ආපසු ලබා ගන්න සිදු වෙනවා. ඒ එක්කම වැඩසටහන් කිහිපයක් අපි ක්‍රියාත්මක කර ගෙන යනවා. අපේ කාරක සභා තිබෙන නිසා, අපි ගත යුතු පියවර කුමක්ද කියලා ඒ කාරක සභාවලට දැනුම් දෙන්නම්. මා හිතන්නේ, රාජපක්ෂ ණයට යට වුණු මේ රටේ ආර්ථිකය බේරා ගන්නා ක්‍රමය කුමක්ද කියා, ඊළඟ මාස දෙක තුළදී අපට මේ සභාව එක්ක සාකච්ඡා කරන්න හැකි වෙයි. මේ රටේ ජනතාවට අනාගතයක් දෙන්න; තරුණයන්ට අනාගතයක් දෙන්න අපට වුවමනායි. තව අවුරුදු විස්සක් ණය ගෙවන්න, තවත් එය ඉදිරියට ඇදගෙන ණය ගැනීමේ කිසිම ප්‍රයෝජනයක් නැහැ. අපි තීරණයක් අරගෙනයි ඉදිරියට යන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අගමැතිතුමාගෙන් අසන අවසාන ප්‍රශ්නය, ගරු එම්.එච්.එම්. සල්මාන් මැතිතුමා.

සභාව ආරම්භ කර දැනට විනාඩි තිහක් පමණ ගතවී තිබෙනවා.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)
Mr. Deputy Speaker, the Question I pose to the Hon. Prime Minister is: Sri Lanka acceded to the First Optional Protocol of the International Covenant on Civil and Political Rights - ICCPR - in October, 1997 and became a State Party to the Protocol. In the same year the President of Sri Lanka made a declaration to the effect that the Government of Sri Lanka recognizes the competence of the Human Rights Committee to receive and consider communications from Sri Lankan citizens.

However, at present it appears that the Government of Sri Lanka is neither responding to the communications brought to its attention by the Human Rights Committee nor taking any action in response to views expressed by it.

In my view, assurances of good governance must include at a minimum responding to communications that are brought to the attention of Sri Lanka by the Human Rights Committee in terms of the Optional Protocol and also taking necessary action which the Government of Sri Lanka deems appropriate upon a consideration of views expressed by the Human Rights Committee.

Thank you.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Mr. Deputy Speaker, Sri Lanka has been a Party to the First Optional Protocol to the International Covenant on Civil and Political Rights - ICCPR - since 1997. The Government led by His Excellency President Maithripala Sirisena took immediate measures, following the Presidential Election in January 2015, to give effect to all the pledges that we had given to the people of Sri Lanka during the Presidential Election. Good governance, rule of law and human rights, transparency and accountability remain the cornerstones of the National Unity Government's policy and vision. In our view, this is, first and foremost, the duty that the Government owes to our people.

In keeping with this policy and vision, the Government advised the Office of the High Commissioner for Human Rights in January 2016, of continued participation in the communications procedure of the UN Human Rights Committee.

It is our firm belief that engaging with all human rights mechanisms including the UN Human Rights Committee established under the ICCPR constitutes the correct approach.

In view of the Government, the basis for Sri Lanka's participation in the communications procedure of the UN Human Rights Committee continues to remain and accordingly, the Government has the political will and the ability to consider the opinions of the UN Human Rights Committee and convey its observations and/or responses to the Committee, in terms of our policy of openness and constructive cooperation with UN Human Rights mechanisms.

The Government intends to devise a timeline and an appropriate approach for responding to the pending communications from the Human Rights Committee since we do not see any bar to doing so as a voluntary State party to that Treaty.

At the executive and administrative level, the Government is solely responsible for implementing plans and programmes that it has pledged to take forward in the advancement of welfare of the people of Sri Lanka. In the policy vision of the Government, the conception of "welfare" includes the protection and promotion of the rights and freedoms of all Sri Lankans and it is our view, therefore, that implementing the obligations assumed by Sri Lanka in the human rights and other arenas strengthens the rights and freedoms of the people, thereby creating a conducive atmosphere for pursuit of economic development and prosperity. The Executive, both the President and Cabinet is answerable to Parliament. The Cabinet is also collectively responsible to Parliament.

Unlike the USA, there is no strict separation of the Executive and Parliament in our Constitution. This is a hybrid Constitution which retains Parliamentary power of control over the Executive under Article 4 of the Constitution.

I hold the firm view that responding to communications from the Human Rights Committee also flows from the fundamentals of our international engagement; that is projecting Sri Lanka as a responsible nation in the international arena and pursuing action towards achieving the said goal is accordingly in order.

The Government, therefore, reconfirms the continued validity and applicability of the Optional Protocol to the International Covenant on Civil and Political Rights for Sri Lanka and is firmly committed to implement its provisions.

With regard to the Singarasa case, the Supreme Court had agreed that the Government of Sri Lanka had set out the correct legal position when it stated in its response to the HRC as follows: "The Constitution of Sri Lanka and

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

the prevailing legal regime do not provide for release or retrial of a convicted person after his conviction is confirmed by the highest appellate court, the Supreme Court of Sri Lanka. Therefore, the State does not have the legal authority to execute the decision of the Human Rights Committee to release the convict or grant a retrial. The Government of Sri Lanka cannot be expected to act in any manner which is contrary to the Constitution of Sri Lanka."

If that was indeed the correct legal position, the application to the Supreme Court could have been dismissed on that ground alone. Instead, the Court went on to consider the constitutionality of the accession to the Optional Protocol.

The Court stated that the non-self-executory nature of the ICCPR rights in Sri Lanka and the unavailability of the pleaded relief under existing law of Sri Lanka sufficiently disposed of the case for the pioneer. However, the Chief Justice, with the other judges concurring, proceeded to make pronouncements denying the constitutional competence of the President of the Republic to accede to the Optional Protocol of the ICCPR. These pronouncements are *obiter dicta* - being unnecessary for the Determination of the Singarasa's application - and do not serve as binding authority on the relevant questions.

Then with regard to the ICCPR, the Parliament of Sri Lanka acceded to the ICCPR in 1980 under the Government of President J.R. Jayewardene. I was a Member of that Cabinet. The negotiation began when I was the Deputy Minister of Foreign Affairs.

It is correct to state that Sri Lanka has been a party to the First Optional Protocol to the International Covenant on Civil and Political Rights since 1997. This was entered into by the President and agreed by me as the Leader of the Opposition. There was Parliamentary unanimity that the First Optional Protocol should be entered into.

At the very outset, however, I wish to point out that it is a fallacy to assume that this Protocol vests the United Nations Human Rights Committee with any kind of judicial power. All that the Committee can do is to inquire into any complaint it has received and express its views thereon. It is left to the host country to decide on the course of action thereafter.

In Sri Lanka, it is a decision that has to be taken by the Cabinet of Ministers - a Cabinet which is ultimately responsible to Parliament in terms of the Article 42 of the Constitution. Parliament in turn, it should be remembered, is the ultimate repository of the legislative power of the people by Article 4(a) and the judicial power of the people in terms of Article 4(c) of the Constitution.

Such action by the Cabinet, in which the President is the Head, can in no way be seen as a usurpation of Parliament's powers as some have sought to make out, since as mentioned above, Parliament controls the Executive.

The pronouncement of the Supreme Court in what has popularly come to be known as the "Singarasa case" that accession to the Optional Protocol of the ICCPR needs a two-thirds majority of Parliament and also approval at a Referendum is nothing but a perverted interpretation of the Constitution.

In my view, it is nothing but an attempt by the judiciary to usurp the powers of both Legislature and the Executive.

The *obiter dicta* of the Supreme Court violates Articles 3, 4 and 27(2)(a) of the Constitution.

Article 3 states, I quote:

"In the Republic of Sri Lanka sovereignty is in the People and is inalienable. Sovereignty includes the powers of government, fundamental rights..."

Fundamental Rights come under Article 3. It can be taken away only through a Constitutional Amendment and a Referendum.

Article 4(c) states, I quote:

"the judicial power of the People shall be exercised by Parliament...."

Then, Article 4(d) states, I quote:

"the fundamental rights which are by the Constitution declared and recognized shall be respected, secured and advanced by all the organs of government and shall not be abridged, restricted or denied, save in the manner and to the extent hereinafter provided;..."

Then, Article 27 (2) (a) states, I quote:

"the full realization of the fundamental rights and freedoms of all persons;"

So, Article 3 read together with Article 4 (d) and Article 27 (2) (a) can only be varied or restricted by a Constitutional amendment referred to and then approved by people at a Referendum. It cannot be done through a judicial decision. The Court does not even have to exercise the judicial power of the people. The Parliament has it and the Court does it on its behalf.

Therefore, the Supreme Court does not have the power to violate the basic tenets of the Constitution; which the Supreme Court has been unfortunately doing in the last decade. It is very unfortunate that it was trying to override the powers of Parliament and to lock up Members of Parliament and so on. That was an unfortunate period of Sri Lanka's political history.

The judicial power of the people is not exercised by the Supreme Court, but by Parliament through the Courts and directly by Parliament, and a decision of this nature can only become law if passed in Parliament by a two-thirds majority of the total membership of the House and moved by a Referendum. The court that has followed the *obiter dicta* has violated the Constitution. It is a judicial coup against Parliament and the sovereignty of the people.

Instead of confining itself to the matters before it, the Court has meandered into a totally irrelevant area and made pronouncements on the Constitutional competence of the President to accede to the Optional Protocol. This, I believe, is something that should be left to the Hon. Speaker of Parliament in this instance. I would ask the Hon. Speaker, after necessary consultation, to give his Ruling on this matter raised by the Hon. Member and the Statement made by me.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you like to ask Supplementary Questions?

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)
I would like to thank the Hon. Prime Minister for the very detailed Answer.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You can ask three Supplementary Questions.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Let the Hon. Member finish his Questions. He is on his feet.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)
I must first thank the Hon. Prime Minister for the detailed Answer and also for correctly setting out the Constitutional provisions covering this subject matter.

Sir, I have one Supplementary Question to raise. In relation to the Answer given by the Hon. Prime Minister, I want to ask whether the Government considers taking action in response to the views expressed by the Human Rights Committee and in respect of communications made by the Human Rights Committee before and after the Singarasa case, which was reported in Sri Lanka Law Reports.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Certainly, we shall do so.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Dinesh Gunawardena.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
As the Hon. Prime Minister has today given a view or an opinion and requested the Chair to make a Ruling on a very important judgment in relation to the Constitution of Sri Lanka which had been delivered by the Supreme Court, we would like to have a Debate on what the Hon. Prime Minister replied to the House. I hope that the Hon. Prime Minister agrees to this because this is a very serious issue on which-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You can take it up at the Party Leaders' Meeting.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I hope that the Hon. Prime Minister agrees with it. I can take it up at the Party Leaders' Meeting. But, I hope that the Hon. Prime Minister agrees to have a Debate on what he has stated in the House before the Hon. Speaker gives a Ruling.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Hon. Deputy Speaker, I have laid down the procedure. The Speaker should give the Ruling after necessary consultation and that necessary consultation can be the expression of views by the Members of the House and the Speaker can, then, give the Ruling. It need not be a Debate. It is a Session where we have Sittings separately on this issue. I am all for it. Finally, I am happy that the Hon. Member agreed with me that the jurisdiction for this rests with the Parliament and not with the Supreme Court. So, all I am trying to do is to take away the Supreme Court acting as a dictator and to bring it into Parliament.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

Mine is a very fundamental issue. How can Article 3, Article 4 (d) and Article 27 (2) (a) be run off by an *obiter dicta* of the Supreme Court? We are all being made prisoners and our rights are taken away. I think it will be very interesting to have that Debate because we have to reverse this trend. We know what happened; we know how the Members were taken away from this House. -[*Interruption*.] Yes, the Hon. Anura Bandaranaike, as the Speaker, has given a Ruling. So once it was given as a Ruling, you cannot have the Supreme Court trying to get around the Hon. Anura Bandaranaike's Ruling in other ways. It may be that they are in breach of privilege of the House. If the Speaker rules that the House is supreme, then we will have to decide as to what should be done for those who are in breach of privilege.

Look at the number of jobs that were lost because of this. If we had had this by now, we would have had far more jobs in the country. Look at Bangladesh and Sri Lanka. In 2005, we were exporting to the value of US Dollars 3 billion and they were exporting to the value of US Dollars 5 billion. Today, they are exporting to the value of US Dollars 25 billion. Where are we? We should have had at least exports worth US Dollars 15 billion. අපිට ගිහින් ණය ගන්න ඕනෑ නැහැ, ණයවලට යට වෙන්නට ඕනෑ නැහැ. මේවා කළාට වැඩක් නැහැ. මේ නිසා ලංකාවේ කොපමණ රැකියා නැති වුණාද, විදේශ විනිමය නැති වුණාද? මේ කළ දේ ජාතික අපරාධයක්. මම හිතන්නේ අපි මේ සභාවේ දවසක් හෝ වෙන් කරගෙන මේ ගැන කථා කරන්නට ඕනෑ කියලායි. [බාධා කිරීමක්] කවුද කළේ? [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
අපි මේ සම්බන්ධව ගරු කථානායකතුමාගේ අදහස අරගෙන-[බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පක්ෂ නායක රැස්වීමේදී - [බාධා කිරීමක්] ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශයක් කළා පාර්ලිමේන්තුවේදී- [*Interruption*.] This is very important.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Hon. Dinesh Gunawardena, you raised a point of Order and made an appeal. The Hon. Prime Minister said that he has no problem with that. Now, the matter is before the Hon. Speaker.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
We will decide the date and the time.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
Hon. Prime Minister is proposing that we get the Hon. Speaker to give a Ruling and thereafter to have a Debate. What we are requesting from you is not that. Now, you come to Parliament and make a new opinion on a judgment delivered 20 years ago. That is a procedure which has never been followed by any Prime Minister. So I am only asking you to give us a Debate before the Hon. Speaker gives a Ruling.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මේක විවාදයක් කර ගන්නට අවශ්‍ය නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
Hon. Deputy Speaker, the procedure is, the Hon. Speaker will listen to the opinion of the House before he gives the Ruling and that opinion of the House can be in a public Sitting of the House on a date agreed. If you want, you can have half-a-day; a full day; one hour or two days. I never said to have a Ruling and go for a Debate. The actual word for this is not Debate. You get the opinion of the House where Members express their views and then the Hon. Speaker gives the Ruling. It is not a question of vote. That is all that I have asked for and I have not said this after 20 years, -මේක හැම දාම කිව්ව දෙයක්.- and that was confirmed at the last Presidential Election. The powers of Parliament cannot be taken away by the Supreme Court as and when they like it. That is all I am saying. There are some judges in the lower court who still think that that is happening.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එක කරුණක් විතරයි මතු කරන්නේ. ගරු අගමැතිතුමා කිව්වා, එකී නඩුවේ-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඒ කරුණ පිළිබඳව අපි ආයේ කථා කිරීම සුදුසු නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ, ඒ කරුණ පිළිබඳව නොවෙයි. ගරු අගමැතිතුමා කිව්වේ එකී නඩුවේ obiter dictum එකක් හැටියටයි කිව්වේ කියලා. ඒක obiter dictum එකක්ද, ratio decidendi එකක්ද කියන එක අගමැතිතුමාගේ අර්ථ කථනය අනුව අපට භාර ගන්නට බැහැ. ඒක ඒ විධියට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකළ යුතුයි.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර ඉඩම් : සීමා ලකුණු කිරීම
வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்தின் வனாந்தரக் காணிகள் : எல்லை நிர்ணயம்
FOREST LANDS UNDER DEPARTMENT OF WILDLIFE CONSERVATION: DEMARCATION

156/'15

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම වනාන්තරයන්හි නම් කවරේද;

(iii) එක් එක් වනාන්තරයන්හි විශාලත්වය වෙන් වෙන් වශයෙන් අක්කර කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) උක්ත වනාන්තරයන්හි සීමා මායිම් ලකුණු කර තිබේද;

(ii) එසේ නම්, එම සීමා නිර්ණය කිරීම සිදු කරනු ලැබූ දිනය කවරේද;

(iii) නො එසේ නම්, සීමා නිර්ණය කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ(ii)හි සඳහන් වනාන්තර තුළ මේ වනවිට නිවාස, සංචාරක හෝටල් හෝ වෙනත් ඉදි කිරීම් කර තිබේද;

(ii) එසේ නම්, එම ඉදිකිරීම් හේතුවෙන් වනාන්තරයට සිදු වන බලපෑම පිළිබඳව අධ්‍යයනයක් සිදු කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

වලුවාතාර අපිවිරුත්දි மற்றும் வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்துக்குச் சொந்தமான வனாந்தரக் காணிகளின் பரப்பளவு எவ்வளவு;

(ii) இவ்வனாந்தரங்களின் பெயர்கள் யாவை;

(iii) ஒவ்வொரு வனாந்தரத்தினதும் பரப்பளவு ஏக்கர்களில் வெவ்வேறாக எவ்வளவு;

என்பதை அவர் சபையில் சமர்ப்பிப்பாரா?

(ஆ) (i) குறிப்பிட்ட வனாந்தரங்களின் எல்லைகள் அடையாளமிடப்பட்டுள்ளனவா;

(ii) ஆமெனில், இவ்வெல்லை நிர்ணயம் மேற்கொள்ளப்பட்ட திகதி யாது;

(iii) இன்றேல், எல்லைகளை நிர்ணயிப்பதற்கு நடவடிக்கை மேற்கொள்வாரா;

(iv) ஆமெனில், அத்திகதி யாது;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) மேலே அ (ii) இல் குறிப்பிடப்பட்ட வனாந்தரங்களினுள் தற்போது வீடுகள், சுற்றுலா ஹோட்டல்கள் அல்லது வேறு நிர்மாணிப்புகள் உள்ளனவா;

(ii) ஆமெனில், மேற்படி நிர்மாணிப்புகள் காரணமாக வனாந்தரத்துக்கு ஏற்படும் தாக்கங்கள் பற்றிய ஆய்வொன்று செய்யப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Sustainable Development and Wildlife:

(a) Will he table-

(i) the extent of forest lands that comes under the Department of Wildlife Conservation;

(ii) the names of aforesaid forests; and

(iii) separately, the extent of each forest, in acres?

(b) Will he inform this House -

(i) whether boundaries of aforesaid forests have been demarcated;

(ii) if so, the date on which aforesaid demarcation was done;

(iii) if not, whether measures will be taken to demarcate the aforesaid forests; and

(iv) if so, the aforesaid date?

(c) Will he also inform this House-

(i) whether there are houses, tourist hotels or other constructions, within the forests that were mentioned in aforesaid (a) (ii) above; and

(ii) if so, whether a study has been conducted, on the environmental impact caused by aforesaid constructions?

(d) If not, why?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු භූමි ප්‍රමාණය ජාතික උද්‍යාන, ස්වභාව රක්ෂිත, දැඩි ස්වභාව රක්ෂිත, අභය භූමි සහ අලි මංකඩ ලෙස වර්ගීකරණය කර ඇත. ඒ අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 1,093,327.4කි. (අක්කර - 2,701,638.66)

මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 14ක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට තිබෙනවා.

(ii) සහ (iii) ඔව්. ඇමුණුම 01 මඟින් දැක්වේ.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

එය දීර්ඝ වාර්තාවක්. එය මේ අවස්ථාවේ කියන්න වේලාවක් නැහැ. ඒ නිසා මම එය **සභාගත*** කරමි.

(ආ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කර ඇති ඇතැම් රක්ෂිතවල මායිම් සලකුණු කර ඇති අතර, මායිම් සලකුණු කර නොමැති අනෙකුත් රක්ෂිතවල මායිම් සලකුණු කරමින් පවතින අතර සමහර රක්ෂිතවල මායිම් සලකුණු කිරීමට නියමිතය.

(ii) ඇමුණුම 02 මඟින් දැක්වේ.- **සභාගත*** කරමි.

(iii) ඔව්.

(iv) කඩිනමින් සිදු කිරීමට පියවර ගනු ලැබේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලයේ හිතුවක්කාරී විධියටත්, දේශපාලනිකවත් වනජීවී ප්‍රදේශවල පවා පදිංචි කිරීම් කර තිබෙනවා. වනජීවී සම්බන්ධ නීතිය, ඒ පනත බොහොම බලවත්. ඒ තුළ ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න යන ගැසට් එකත් වෙනස් කරන්නයි යන්නේ. දැන් අපි සමීක්ෂණ කරගෙන යනවා. සීගිරිය වාගේ ප්‍රදේශවල යම් යම් තැන්වල සමීක්ෂණ කරලා සාධාරණ ලෙස ඉවත් කිරීම් කටයුතු කරන එක අපි අගය කරනවා. දිසා ලේකම්තුමන්ලාත් එකතු වෙලා ඒ කටයුතු කරනවා.

කැබිනට් මණ්ඩලය අනුමත කළා, අලිමංකඩවල් අරින්න කියලා. හම්බන්තොට අපේ නිලධාරියකු හදිසි අනතුරකින් මිය ගොස් තිබෙනවා. ආදාහනය තිබෙන්නේ අද. වනජීවී කලාපයට නොවෙයි, ඒ නිලධාරියා ගියේ. ඇඹිලිපිටියේ ඉඳලා හම්බන්තොට පැත්තට එන මහවැලි කලාපයේ සතුන් විශාල ලෙස ඝාතනය කරනවා, වස දීලා. ඝාතනය කරලා තංගල්ල පැත්තේ, කතරගම පැත්තේ හෝටල්වලට ගෙන යනවා. මෙවැනි තත්ත්වයක් තුළ කැබිනට් මණ්ඩලය අනුමත කළා, අලි මංකඩවල් ඔක්කෝම අරින්න කියලා. මුදල් ඇමතිතුමා මුදලුත් දීලා තිබෙනවා, වන්දි ගෙවීම සඳහා. ඉඩම් කොමසාරිස් ජනරාල්තුමා එක්ක සාකච්ඡා කරලා ඒ කටයුතු කර ගෙන යනවා. ඒක දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක්. මොකද, මේ සම්බන්ධයෙන් ප්‍රශ්න එනවා. ඒ නිසා කඩිනමින් පියවර ගන්නා බව සඳහන් කරනවා.

(ඇ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති ජාතික රක්ෂිත තුළ පිහිටි (දැඩි ස්වභාව රක්ෂිත, ජාතික උද්‍යාන, ස්වභාව රක්ෂිත, අලිමංකඩ) ඉඩම් රජයේ ඉඩම් වන අතර ඒවා තුළ නිවාස, සංචාරක කර්මාන්තයට අදාළ හෝටල් හෝ වෙනත් ඉදි කිරීම් සඳහා අවසර නොමැත.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති අභය භූමි තුළ රජයේ ඉඩම් මෙන්ම පෞද්ගලික ඉඩම් ද පැවතිය හැක. ඒ අනුව රජය සතු ඉඩම්වල සංවර්ධන කාර්යයන් සිදු කිරීමට අවසර ලබා නොදෙන අතර, අභය භූමිය තුළ ඇති පෞද්ගලික ඉඩම් සඳහා යම් සංවර්ධන ක්‍රියාවන් සිදු කිරීම සඳහා විධිමත් පාරිසරික ඇගයීමක් සිදු කර එහි නිර්දේශ අනුව අවසර ලබා දීම සලකා බලනු ලබයි. එම පෞද්ගලික ඉඩම් තුළ නිවාස හා වෙනත් ඉදිකිරීම් පවතී.

(ii) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති ජාතික රක්ෂිත තුළ වෙනත් පාර්ශ්වයන් සඳහා කිසිදු ආකාරයේ ඉදිකිරීම් සිදු කිරීමට අවසර ලබා නොදේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති අභය භූමි තුළ ඇති පෞද්ගලික ඉඩම්වල යම් සංවර්ධන කාර්යයක් සිදු කරන්නේ නම් ඒ සඳහා පාරිසරික බලපෑම් ඇගයීමක් සිදු කරනු ලබයි.

(ඈ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කාලය ගැනත් සලකමින් මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහනවා. ගරු ඇමතිතුමා ලබාදුන් පිළිතුර ගැන මම සෑහීමකට පත්වෙනවා. නමුත් මේ කථා කරන මොහොත වන විටත් ඉතාම කනගාටුදායක සිද්ධියක් සිදු වෙනවා. මේක ඔබතුමාටත් සෘජුව අදාළයි. කැබිලිත්ත පූජා භූමිය වට්ටාරම පන්සලට හෝ එහි නායක හාමුදුරුවන්ට භාරදීලා තිබෙනවාද? මොකද, නායක හාමුදුරුවෝ පිං පෙට්ටිය සවි කරනවා; සිවුරු ටික අරගෙන යනවා; පඬුරු ටික අරගෙන යනවා. කොන්ක්‍රීට් දාලා හැම තැනම පිං පෙට්ටි සවි කරලා තිබෙනවා. කැබිලිත්ත පූජා භූමිය වට්ටාරම විහාරස්ථානය සතු දේපළක් කියලා හිතාගෙනයි කටයුතු කරන්නේ. ඒක වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩමක්. මොන පදනම මතද, ඒ කටයුත්ත කරන්නේ කියලායි මම අහන්නේ. ඒ වාගේම එය නතර කරන්න ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කැබිලිත්ත පූජා භූමිය කියන්නේ පෞද්ගලිකව කාටවත් අයිති භූමියක් නොවෙයි. ඒක Block II කොටසේ තිබෙන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමියක්. පන්සල්වලට හෝ කිසිම කෙනෙකුට ඒ භූමියේ අයිතියක් නැහැ. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය පුද කරනවා. Block II කොටසේ කුඹුක්කන් ඔයෙන් එගොඩ භූමිය අයත් වෙන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවටයි. Block II කොටසේ ගහෙන් මෙගොඩ කොටස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටයි අයත් වන්නේ. ඒක අපට අයත් ප්‍රදේශයක්. එහි කිසිම දෙයක් කරන්න කාටවත් අනුමැතිය දීලත් නැහැ, ඒ සඳහා කාටවත් අයිතියකුත් නැහැ.

මට මේ ආරංචිය ලැබුණා. ඊයේ මමත් හිටියේ කතරගම. මම පාන්දර 4ට කතරගමට ගිහිල්ලා අදාළ නිලධාරීන් ඒ ස්ථානයට යැව්වා. අද උදේ කථා කරලා බලන කොටත් ඒ නිලධාරීන් ඇවිල්ලා හිටියේ නැහැ. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න මම ඒ නිලධාරීන්ට බලය දුන්නා. ඒ හාමුදුරුවෝ මගේ නම විකුණලාලු ඒ කටයුතු කරනවා කියන්නේ. මම කිසිම වෙලාවක,- [බාධා කිරීමක්] හුහක් හාමුදුරුවෝ මට ආදරෙයි. ඒ අය මට හොඳට සලකනවා. පූජාවන් කරනවා, අලි ගැන කටයුතු කරනවා. මම යවපු නිලධාරීන් තවම ආපසු ඇවිල්ලා නැහැ. එම භූමියේ තිබෙන එවැනි දේ ඉවත් කරන්න කියලා මම ඒ අයට කිව්වා. එක එක ස්වාමීන්වහන්සේලාට හෝ කිසිම කෙනෙකුට ඒ කටයුතු කිරීමට ඉඩ නොදීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට බලය තිබෙනවා. කතරගම දෙවියන්ගේ අඩවිය විධියට ඒ ස්ථානයෙන් ඒ සියලු දේ ඉවත් කරන්න මගේ නිලධාරීන් හමුදාවත් එක්ක දැන් ක්‍රියාත්මක වෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අමාත්‍යතුමාගේත්, ඒ වාගේම ගාමිණී විජිත් විජයමුණි සොයිසා අමාත්‍යතුමාගෙත් අනුදැනුම සහ නිර්දේශයට යටත්වයි මේ කටයුත්ත කරන්නේ කියායි ඒ ස්වාමීන්වහන්සේ සඳහන් කරන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, මීට පෙර වාචිකව හෝ ලිඛිතව ස්වාමීන්වහන්සේට එවැනි අවසරයක් ඔබතුමා දීලා තිබෙනවාද කියලා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
කාටවත් අයිතියක් නැහැ. ලිඛිතව දීලාත් නැහැ; වාචිකවත් නැහැ.

එක අවස්ථාවක මෙහෙම දෙයක් වුණා. යාල රක්ෂිතයේ සේවය කළ නිලධාරියෙක් ඉවත් කළා. ඔහු කුමන රක්ෂිතයේ ඉන්දැද්දී හිටපු ජනාධිපතිතුමාගේ කට්ටියකගේ උපදෙස් පරිදි කැබිලිත්ත දේවාලයේ තිබුණු කතරගම දෙවියන්ගේ, ගණ දෙවියන්ගේ, කඩවර දෙවියන්ගේ පින්තූර සියල්ලම පොහොර බෑග්වල දාලා ඔහුගේ office එකේ තියලා තිබෙනවා. එතකොට අපි හිටියේ විපක්ෂයේයි. පිස්සු නිලධාරියෙක් තමයි ඒක කළේ. හිටපු ජනාධිපතිතුමාගේ ගල් පහනක් පමණක් එතැන තිබුණා කියලා කිව්වා. මම එදා මේ ගරු සභා ගැබේ ඉඳලා ගාමිණී විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමාගෙන් ඇහුවා, "ඔබතුමා ඒ නිලධාරියා ලවා ඔය වැඩය කෙරෙව්වේ මොකද?" කියලා. එතුමා කිව්වා, "නැහැ, නැහැ, නිලධාරීන් කරන්නේ, දේශපාලකයෝ නොවෙයි" කියලා. මම කිව්වා, "මම දෙන්නේ තුන් මාසයයි, ආණ්ඩුවට, නායකයන්ට වෙන දේ බලන්න" කියලා. ඒ වාගේම පාලම කඩලා ගියා. හිටපු ජනාධිපතිතුමාට එන්න බැරිව මැදි වුණා. එතුමාට එන්න chopper එකක් ගන්න වුණා. විශාල ශාපයක් වුණා. එගොඩ මෙගොඩ යන්න cables දාලා තිබුණා. ඒ cables කැඩිලා තිබුණා. ඊයේ පෙරේදා Commander of the Army ගිහිල්ලා ඒ ඔක්කෝම ගලවලා ආපහු ගෙනිච්චා. එවැනි තත්ත්වයක් වුණ නිසා මම කියනවා,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නිලධාරියාට මොකද වුණේ?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔහු යාලට ඇවිල්ලා,- [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, ඔය විධියට ප්‍රශ්න අහන්න ගියොත් අපට අද හැන්දෑව වන තුරුම මේ විධියටම තමයි යන්න වෙන්නේ. ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුරු ලබා දීමේ කාලය දැන් අවසන් වනවා. [බාධා කිරීම්]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
දෙවියෝ කෝප කර ගන්න එපා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔව්. දෙවියෝ කෝප කර ගන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. කැබිලිත්ත ගැන ප්‍රශ්නය අපට පැහැදිලියි. එහෙමනම් අපට ඊළඟ ප්‍රශ්නයට යන්න වෙනවා. බොහොම ස්තුතියි, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ නේ. මට තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න ඕනෑ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
තුන්වන අතුරු ප්‍රශ්නය අහනවාලු.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් ප්‍රශ්න හතරකට පමණ එකපාර පිළිතුරු ලබා දුන්නා නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ තුන්වන අතුරු ප්‍රශ්නය ඉක්මනට අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මයික් එක දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
තුන්වන අතුරු ප්‍රශ්නයද?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හරි, හරි. තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, මාගේ මෙම තුන්වන අතුරු ප්‍රශ්නයට ඔබතුමා නිරවුල්ව සහ පැහැදිලි පිළිතුරක් ලබා දෙන්න. වනජීවී

[ගරු බුද්ධික පතිරණ මහතා]

සංරක්ෂණ දෙපාර්තමේන්තුව තමුන්ගේ රක්ෂිත භූමිවල නියමිත පරිදි ආරක්ෂිත මුරපොළවල් ඇති නොකිරීම ගැටලුවක් වෙලා තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයේ, කිරල කැලේ රක්ෂිතයේ කුණු ගොඩ දවසින් දවස, සතිපතා වැඩි වෙනවා. ඔබතුමාට කිසිම ගැටලුවක් නැතිව නිලධාරීන් 6දෙනෙක් යොදවලා මේ කිරල කැලේ රක්ෂිතයට ආරක්ෂාව ලබා දෙන්න පුළුවන්. මේ කුණු ගිය සතියට කලින් සතියට වඩා ගිය සතියේ වැඩියි; ගිය සතියට වඩා මේ සතියේ වැඩියි; මේ සතියට වඩා ලබන සතියේ වැඩි වෙනවා. මාතර නගරයේ ඉවත් කරන සියලු අප ද්‍රව්‍ය ගෙනැත් දාන්නේ කිරල කැලේටයි. මෙවැනි තත්ත්වයක් තිබෙනවා.

අනෙක් පැත්තෙන් ඔබතුමාගේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති කැලෑව වේගයෙන් අඩු වෙනවා. කැලේ සතුන් නගරයට එනවා, නැත්නම් ගමට එනවා. ඉතින් මානව සංවර්ධනය නැත්නම් ආර්ථික සංවර්ධනයත් වුවමනායි. හැබැයි, තිරසාර සංවර්ධනයක් කරායි යා යුතුව තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, කැලේ දවසින් දවස අඩු වෙනවා. මම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති කොටස ගැන නොවෙයි කියන්නේ. ඔබතුමාට අයිති කොටස ගැනයි මම කියන්නේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති කැලය අඩු වෙන්න ඔබතුමා ඉඩ දෙන්නේ ඇයි?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු මන්ත්‍රීතුමා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අවුරුදු 15කින්, 20කින් නිලධාරීන් බඳවාගෙන නැහැ. වර්ග කිලෝ මීටර් 1600 ගණනක් තිබෙනවා. අලි වැටවල්වලට කම්බි ගහන්න රුපියල් මිලියන 10,000ක් යනවා. දැනට රුපියල් මිලියන 3,500ක් ගිහින් තිබෙනවා. තව ගහන්න තිබෙනවා. එක නිලධාරියෙකුට කිලෝමීටර් 500ක් විතර බලන්න තිබෙනවා. මහවැලි කලාපයේ අපේ නිලධාරියෙක් බේදනීය ලෙස ඝාතනය වුණා. මම එහේ ගිහිල්ලා පාන්දර 5ට කොළඹට ආවේ. මම නිලධාරීන් 1,500 ගණනක් ඉල්ලා තිබෙනවා. එම ඉල්ලීම කැබිනට් මණ්ඩලයට ගිහින් තිබෙනවා. ඒක අනුමත වෙන්න ඕනෑ. කමිටුවේ සභාපති ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමායි. එතුමා හිටියේ නැහැ. ඒක අනුමත වෙන්නේ නැතුව මට කරන්න බැහැ. නමුත්, ජනතාවටත් අයිතියක් තිබෙනවා; දේශපාලනඥයන්ටත් අයිතියක් තිබෙනවා. ඔබතුමන්ලාත් ඒ බලය පාවිච්චි කරන්න. පාවිච්චි කරලා, පරිසරය ආරක්ෂා කර ගන්න සහාය වෙන්න. වගකීම නිලධාරි පිටම දාන්න එපා. දේශපාලනඥයන් හා ජනතාවත් ඒ වගකීම භාරගෙන ක්‍රියා කරන්න. මම පරිසරය ආරක්ෂා කරපු මිනිහෙක්; වයඹ පළාත් සභාවට ප්‍රඥප්තියක් ගෙනාපු කෙනෙක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, පිළිතුර පැහැදිලියි.

රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීම : විස්තර
அரச பல்கலைக்கழகங்களில் மாணவர் சேர்ப்பு: விபரம்
RECRUITMENT OF STUDENTS TO STATE UNIVERSITIES:DETAILS

420/'16

2. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා නිකුත් කරන ලද අත් පොතේ සඳහන් ආකාරයට, ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල එක් එක් පාඨමාලා සඳහා 2010, 2011, 2012, 2013, 2014 සහ 2015 වර්ෂවලදී බඳවා ගැනීමට නියමිත වූ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වර්ෂවලදී ඉහත පාඨමාලා සඳහා සත්‍ය වශයෙන්ම බඳවාගත් සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් පාඨමාලා සඳහා නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් බඳවාගෙන ඇත්නම්, ඒ සඳහා හේතු කවරේද;

(iv) එක් එක් පාඨමාලා සඳහා නියමිත ප්‍රමාණයට වඩා වැඩියෙන් බඳවාගෙන ඇත්නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு பல்கலைக்கழக அனுமதி தொடர்பாக வெளியிட்டுள்ள கையேட்டில் குறிப்பிட்டுள்ளதன் பிரகாரம், இலங்கையின் அரச பல்கலைக்கழகங்களின் ஒவ்வொரு பாடநெறிக்கும், 2010, 2011, 2012, 2013, 2014 மற்றும் 2015ஆம் ஆண்டுகளில் சேர்த்துக்கொள்ள உத்தேசித்திருந்த மாணவர் எண்ணிக்கை தனித்தனியாக எவ்வளவென்பதையும்;

(ii) மேற்படி ஆண்டுகளில் குறிப்பிட்ட பாடநெறிகளுக்கு உண்மையாகவே சேர்த்துக் கொள்ளப்பட்ட மாணவர் எண்ணிக்கை தனித்தனியாக யாதென்பதையும்;

(iii) ஒவ்வொரு பாடநெறிக்கும் உத்தேச எண்ணிக்கைக்கு குறைவாக சேர்த்துக் கொள்ளப்பட்டிருப்பின், அதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(iv) ஒவ்வொரு பாடநெறிக்கும் உத்தேச எண்ணிக்கைக்கு அதிகமாக சேர்த்துக் கொள்ளப்பட்டிருப்பின், அதற்கான காரணங்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House-

(i) the number of students that had been specified to be enrolled for each course of study at State universities in Sri Lanka in the years 2010, 2011, 2012, 2013, 2014 and 2015 separately, according to the Handbook issued by the University Grants Commission pertaining to the university admission;

(ii) the actual number of students that were enrolled for such courses of study in the years concerned;

(iii) if the number of students enrolled had been lower than the number specified for each course, the reason for it; and

(iv) if number of students enrolled had been higher than the number specified for each course, the reason for it?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඇමුණුමෙහි තීරු අංක 03, 05, 07, 09, 11 හා 13 යටතේ දක්වා ඇත.

(ii) 2010 සිට 2014 දක්වා වර්ෂවලට අදාළව සත්‍ය වශයෙන්ම බඳවා ගත් සිසුන් සංඛ්‍යාව ඇමුණුමෙහි තීරු අංක 04, 06, 08, 10 හා 12 යටතේ දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමා, එක වර්ෂයකවත් කියන්න පුළුවන්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ලොකු table එකක් තිබෙන්නේ.

2010 වර්ෂය ගත්තොත් වෛද්‍ය විද්‍යා අධ්‍යයන පාඨමාලාවට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව 1,165යි. ලියා පදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 1,165යි.

භෞතික විද්‍යා අධ්‍යන පාඨමාලාවට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව 1,735යි. ලියා පදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 1,593යි. මේ, 2010 වර්ෂයේ.

(ii) 2010 සිට 2014 දක්වා වර්ෂවලට අදාළව සත්‍ය වශයෙන්ම බඳවා ගත් සිසුන් සංඛ්‍යාව ඇමුණුමෙහි තීරු අංක 04, 06, 08, 10 හා 12 යටතේ දක්වා ඇත.

2015 වර්ෂය සඳහා බඳවා ගැනීමට නියමිත සිසුන් සංඛ්‍යාව ඇමුණුමෙහි තීරු අංක 13 යටතේ දක්වා ඇති අතර, මෙතෙක් සිසුන් බඳවා ගෙන නොමැති බැවින් ලියා පදිංචි සිසුන් සංඛ්‍යාව සඳහන් කළ නොහැක.

(iii) විශේෂයෙන්ම විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ වන සමහර පාඨමාලා සඳහා තෝරා ගනු ලබන සිසුන් නියමිත ලෙස පාඨමාලාවට ලියා පදිංචි නොවීමත්, පුරප්පාඩු පිරවීම සඳහා අවස්ථා කිහිපයකදී සිසුන් තෝරා ගනු ලැබුවද, එම සිසුන් ද නියමිත කාල වකවානු තුළ ලියා පදිංචිය ලබා නොගැනීමත් සමහර පාඨමාලා සඳහා සිසුන් අඩුවෙන් බඳවා ගැනීමට හේතු වී ඇත.

(iv) ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් ලබා දුන්, SC.FR. No.418/2012 දරන නඩුවේ තීන්දුව මත 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා අතිරේක සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීම.

2012 වර්ෂයේ විෂය නිර්දේශ දෙකක් යටතේ සිසුන් බඳවා ගැනීම.

2013 වර්ෂයේ දී සිවුවන වතාවටත් අපොස (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට සිසුන්ට අවස්ථාව ලබා දීම.

(ආ) පැන නොනඟී.

සභාමේසය මත තබන ලද ඇමුණුම:
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

විශ්වවිද්‍යාල ප්‍රවේශ ඇමුණුම
ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල වල එක් එක් පාඨමාලාව සඳහා බඳවාගැනීමට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව
සහ ලියාපදිංචි වන ලද ශිෂ්‍ය සංඛ්‍යාව අ.පොස. (උ/පෙළ) වර්ෂය අනුව

තීරු අංක 01	තීරු අංක 02	තීරු අංක 03	තීරු අංක 04	තීරු අංක 05	තීරු අංක 06	තීරු අංක 07	තීරු අංක 08	තීරු අංක 09	තීරු අංක 10	තීරු අංක 11	තීරු අංක 12	තීරු අංක 13
		2010		2011		2012		2013		2014		2015
අනු අංකය	අධ්‍යන පාඨමාලාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව
01	වෛද්‍ය විද්‍යාව	1165	1165	1175	1332	1220	1210	1220	1246	1240	1240	1260
02	දන්ත ශල්‍ය විද්‍යාව	80	79	80	114	80	78	80	81	80	80	80
03	පශු වෛද්‍ය විද්‍යාව	100	83	100	76	100	81	100	70	100	85	80
04	කෘෂිකර්මය	670	549	520	492	530	450	610	492	610	553	575
05	ආහාර විද්‍යාව හා පෝෂණය	100	67	110	62	110	97	110	67	110	72	110
06	ඖෂධීය විද්‍යාව	1145	1017	1210	1094	1255	1030	1375	1050	1410	1067	1265
07	ව්‍යවහාරික විද්‍යාව(ඖෂධීය විද්‍යාව)	170	98	170	102	185	101	210	121	210	119	210
08	ඉංජිනේරු විද්‍යාව	1265	1265	1315	1575	1470	1449	1490	1498	1510	1505	1658
09	ඉංජිනේරු විද්‍යාව - (EM)	50	49	50	60	50	46	50	53	50	45	50
10	ඉංජිනේරු විද්‍යාව - (TM)	50	49	50	72	50	54	50	49	50	54	50
11	ප්‍රමාණ සමීක්ෂණය	100	99	100	111	100	93	125	114	125	123	125
12	පරිගණක විද්‍යාව	240	210	240	262	260	205	300	241	300	248	335
13	භෞතික විද්‍යාව	1735	1593	1745	1356	1805	1705	1945	1456	1960	1721	1900
14	මැනුම් විද්‍යාව	60	54	60	84	60	59	60	40	80	77	80
15	ව්‍යවහාරික විද්‍යාව (භෞතික විද්‍යාව)	320	288	345	288	385	361	415	326	415	328	445
16	කළමනාකරණය	3440	3569	3505	3901	3525	3606	3635	3606	3795	3782	3855
17	දේපල කළමනාකරණය හා තක්සේරුකරණය	60	61	60	95	60	79	60	70	60	59	60
18	වාණිජ්‍යය	470	469	520	592	530	564	580	589	635	638	645
19	කලා	4800	4520	4900	7015	5025	5112	5375	5337	5525	5842	5550
20	කලා (SP)- ජනමාධ්‍ය	75	72	75	85	75	74	75	67	80	76	80
21	කලා (SAB)	200	204	200	287	200	221	200	185	225	228	225
22	කළමනාකරණ අධ්‍යයන - (TV)	150	184	150	268	150	147	175	177	175	173	200
23	වාස්තු විද්‍යාව	55	56	55	92	55	55	55	55	55	55	55
24	නිර්මාණවේදය	50	51	50	36	50	46	50	36	60	47	60

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

තීරු අංක 01	තීරු අංක 02	තීරු අංක 03	තීරු අංක 04	තීරු අංක 05	තීරු අංක 06	තීරු අංක 07	තීරු අංක 08	තීරු අංක 09	තීරු අංක 10	තීරු අංක 11	තීරු අංක 12	තීරු අංක 13
		2010		2011		2012		2013		2014		2015
අනු අංකය	අධ්‍යන පාඨමාලාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව
25	නීතිය	350	348	350	444	350	360	350	364	350	345	350
26	තොරතුරු තාක්ෂණය	100	155	150	196	200	162	200	186	200	189	200
27	කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය	50	50	50	65	50	46	50	42	50	53	50
28	රාජ්‍ය කලමනාකරණය (විශේෂ)	75	75	75	119	75	92	75	83	75	74	75
29	සන්නිවේදන අධ්‍යයනය	50	52	50	57	50	40	75	57	75	69	100
30	නාගර හා ග්‍රාම නිර්මාණය	50	51	50	83	50	68	50	64	50	47	50
31	සාමය හා ගැටුම් නිරාකරණය	35	36	35	38	35	30	35	33	35	32	35
32	ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	270	284	270	210	270	239	280	243	300	251	300
33	යුනානී වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	50	29	50	51	50	51	60	45	60	53	60
34	විලාසිතා නිර්මාණය හා නිපැයුම් ප්‍රවර්ධනය	40	42	40	48	40	37	40	41	40	39	40
35	ආහාර විද්‍යාව හා තාක්ෂණය	90	71	90	89	95	64	130	88	160	107	150
36	සිද්ධ වෛද්‍ය විද්‍යාව	70	55	70	59	70	64	100	95	100	96	100
37	භෞද	205	183	205	186	205	119	205	121	225	175	225
38	තොරුතුරු සහ සන්නිවේදන තාක්ෂණය	230	214	150	139	150	129	150	126	150	141	150
39	කෘෂිකර්ම තාක්ෂණය සහ කළමනාකරණය	200	173	200	149	200	143	200	169	200	170	200
40	කලා (SP) - ප්‍රසංග කලා	75	71	75	91	75	74	75	71	80	82	80
41	සෞඛ්‍ය ප්‍රවර්ධන	50	30	50	39	50	38	50	21	50	19	50
42	ඖෂධ විද්‍යාව	105	75	105	83	105	60	110	80	120	87	120
43	වෛද්‍ය රසායනාගාර විද්‍යාව	100	93	100	98	100	65	105	101	115	87	115
44	චිකිරණ ශිල්පය	35	22	35	44	35	35	45	49	45	29	45
45	භෞත චිකිත්සා	60	58	60	77	60	49	60	68	60	55	60
46	පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය	50	34	50	48	50	41	50	35	50	37	50
47	පහසුකම් කළමනාකරණය	50	48	50	76	50	50	50	49	50	47	50
48	ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය	50	50	50	64	50	57	50	48	55	53	55
49	අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව	60	54	60	51	60	40	60	47	60	47	60
50	කාර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය ශිල්ප	60	58	60	67	90	76	90	57	90	71	90
51	සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ	50	48	50	54	50	37	50	42	50	46	50
52	පරිගණනය හා කළමනාකරණය	50	49	50	84	50	70	50	62	50	49	50
53	ධීවර සහ සාගර විද්‍යාව	60	48	60	51	60	46	60	40	60	34	60

තීරු අංක 01	තීරු අංක 02	තීරු අංක 03	තීරු අංක 04	තීරු අංක 05	තීරු අංක 06	තීරු අංක 07	තීරු අංක 08	තීරු අංක 09	තීරු අංක 10	තීරු අංක 11	තීරු අංක 12	තීරු අංක 13
		2010		2011		2012		2013		2014		2015
අනු අංකය	අධ්‍යන පාඨමාලාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව
54	ඉස්ලාමී අධ්‍යයන	150	147	150	141	200	174	200	147	250	184	250
55	විද්‍යාව සහ තාක්ෂණය	50	42	50	55	55	51	60	53	60	61	60
56	පරිගණක විද්‍යාව සහ තාක්ෂණය	50	50	50	67	55	53	60	57	60	59	60
57	ව්‍යවසායකත්වය හා කළමනාකරණය	50	53	50	57	55	56	65	56	65	70	65
58	සත්ත්ව පාලන විද්‍යාව	50	40	50	47	55	46	60	56	60	57	60
59	සංගීතය	315	339	315	335	375	372	405	371	405	356	410
60	නැටුම්	300	371	300	305	334	332	334	323	334	321	339
61	චිත්‍ර සහ නිර්මාණ	30	28	30	14	30	26	30	22	30	28	35
62	නාට්‍ය හා රංග කලා	70	49	70	98	86	72	86	58	86	68	86
63	දෘශ්‍ය සහ තාක්ෂණික කලා	50	52	50	48	50	51	50	44	50	53	50
64	අපනයන කෘෂිකර්මය	50	37	50	45	55	46	60	60	60	59	60
65	කේ තාක්ෂණය සහ අගය වැඩිකිරීම	50	43	50	31	55	48	60	56	60	48	60
66	කාර්මික තොරතුරු තාක්ෂණය	50	47	50	41	55	54	60	56	60	64	60
67	ඔනිෂ් සමීපත් සහ තාක්ෂණය	50	43	50	34	55	49	60	54	60	48	60
68	ව්‍යාපාර තොරතුරු පද්ධති (විශේෂ)	50	51	50	82	50	71	50	54	50	49	50
69	කළමනාකරණය හා තොරුතුරු තාක්ෂණය (SEUSL)	80	75	80	99	90	90	90	113	110	102	120
70	ආගනාණය සහ තොරතුරු පද්ධති	80	85	80	38	80	98	80	48	100	84	100
71	ශාරීරික අධ්‍යාපනය	35	39	35	18	50	55	50	48	50	35	50
72	ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය	35	35	65	71	80	90	90	88	90	87	90
73	කථන හා ශ්‍රවන විද්‍යාව	50	48	50	82	50	61	50	62	50	44	50
74	අරාබි භාෂාව	100	104	100	86	150	153	150	145	200	211	200
75	දෘශ්‍ය කලා	70	154	70	93	100	97	100	97	100	95	100
76	සත්ත්ව පාලන සහ මත්ස්‍ය විද්‍යාව	50	45	50	38	50	41	50	35	50	30	50
77	ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය	60	49	60	57	60	39	60	26	60	29	60
78	ජලජ සම්පත් තාක්ෂණය	50	41	50	36	55	42	60	64	60	55	60
79	කාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම	50	52	50	27	55	38	60	67	60	54	60
80	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිලිබඳ කළමනාකරණය	50	47	50	57	55	47	65	68	65	64	65
81	තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය	50	53	50	75	100	109	100	110	100	96	100

නීරු අංක 01	නීරු අංක 02	නීරු අංක 03	නීරු අංක 04	නීරු අංක 05	නීරු අංක 06	නීරු අංක 07	නීරු අංක 08	නීරු අංක 09	නීරු අංක 10	නීරු අංක 11	නීරු අංක 12	නීරු අංක 13
		2010		2011		2012		2013		2014		2015
අනු අංකය	අධ්‍යන පාඨමාලාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව
82	සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය	100	111	100	107	100	105	120	134	120	116	120
83	කෘෂි සම්පත් කළමනාකරණය සහ නාක්ෂණය	-	-	150	172	150	130	150	141	150	141	150
84	කෘෂි ව්‍යාපාර කළමනාකරණය	-	-	50	68	50	48	50	48	50	44	50
85	හරිත තාක්ෂණය	-	-	50	66	50	42	50	25	50	30	50
86	තොරතුරු පද්ධති	-	-	80	104	80	69	100	91	100	92	100
87	භූමි නිර්මාණවේදය	-	-	50	49	50	38	50	39	50	36	50
88	පරිවර්තන අධ්‍යයනය	-	-	-	-	-	-	75	43	75	71	75
89	මිලැක්කාංග ඉංජිනේරු විද්‍යාව	-	-	-	-	-	-	50	44	50	48	50
90	සිනමා හා රූපවාහිනී අධ්‍යයන	-	-	-	-	-	-	-	-	50	49	50
91	ව්‍යාපෘති කළමනාකරණය	-	-	-	-	-	-	-	-	50	42	50
92	ඉංජිනේරු තාක්ෂණවේදය	-	-	-	-	-	-	-	-	-	-	775
93	ජෛවපද්ධති තාක්ෂණවේදය	-	-	-	-	-	-	-	-	-	-	625
94	තොරතුරු සන්නිවේදන තාක්ෂණය	-	-	-	-	-	-	-	-	-	-	425
95	භෞතික විද්‍යා - තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය	-	-	-	-	-	-	-	-	-	-	100
96	සාගර සහ මිරිදිය විද්‍යාව	-	-	-	-	-	-	-	-	-	-	50
97	ආහාර ව්‍යාපාර කළමනාකරණය	-	-	-	-	-	-	-	-	-	-	50
98	ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීම	-	-	-	-	-	-	-	-	-	-	50
	එකතුව	21495	20737	22110	25054	23125	22198	24540	22556	25395	23981	27603

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

මට අතුරු ප්‍රශ්න කිහිපයක් අහන්න බැරි වෙයි. මොකද, ඇමුණුම තිබෙන නිසා. කොහොම වුණත් ඔය ලේඛනය බැලුවොත් පෙනෙනවා, විශේෂයෙන් ජීව විද්‍යා සහ භෞතික විද්‍යා විෂය ධාරාවන්ට සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවෙන් බඳවා ගෙන තිබෙනවාය කියන එක. අපේ රටේ වසරකට උපදින දරුවන්ගෙන් සියයට හයයි විශ්වවිද්‍යාලයට යන්න වරම් ලබන්නේ. උසස් පෙළ විභාගය සමත් වීම සඳහා වාර තුනක් ලබා දෙන්නේ අපේ රටේ සිටින දක්ෂතම, විශිෂ්ටතම, හැකියාවන් සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නයි.

නමුත්, පළමු වතාවේ උසස් පෙළ විභාගය සමත් වෙලා විශ්වවිද්‍යාලයට සුදුසුකම් ලබා ගෙන, ඊ ළඟ වතාවේ උසස් පෙළ විභාගයට ලියලා පළමු වතාවට වඩා වැඩි සුදුසුකම් ලබා ගත්තොත් ඒ අයට දෙවැනි වතාවේ විභාගය සමත් වූ ඉහළ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාලයට එන්න තිබෙන අවස්ථාව අහිමි වනවා. ඒ පළමුවන වතාවේදී ඔවුන් රුපියල් 50ක් දීලා ඉල්ලුම් කර තිබෙන නිසා. ගරු ඇමතිතුමනි, ඒක ඔබතුමාත් දන්නවා. ඒකෙන් දක්ෂයන්ට විශ්වවිද්‍යාලයට එන්න තිබෙන ඉඩකඩ ඇහිරෙනවා විතරක් නොවෙයි, ඒ පාඨමාලාවල පුරප්පාඩු ගණනාවකුත් ඇතිවනවා. ඔබතුමා ඔය සංඛ්‍යා ලේඛන ඔක්කෝම කිව්වා නම්, ඒ තත්ත්වය බලාගන්න තිබුණා. ඇත්තටම ගත්තොත් ඒක ජාතික අපරාධයක්. මෙන්න මේ ක්‍රමවේදය නිසා ඒ දරුවන්ට අහිමි වන අවස්ථාව ලබා දෙන්න අමාත්‍යාංශය කටයුතු කරන්නේ නැත්තේ ඇයි?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම හිතන විධියට මේ ප්‍රශ්නය ගැන අපි සාකච්ඡා වට ගණනාවක් පැවැත්වුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රතිඵල ආවාම ශිෂ්‍යයන් ලියා පදිංචි වෙන්න ඕනෑ. අපි හිතුමු උසස් පෙළ විද්‍යා විෂය ධාරාවෙන් පළමු වතාවට ශිෂ්‍යයෙක් උසස් පෙළ විභාගයට ඉදගන්නවා කියලා. ඊට පස්සේ ප්‍රතිඵල ආවාම ලියා පදිංචි නොවී සිටීමට ඒ අයට අවස්ථාවක් තිබෙනවා. එසේ ලියා පදිංචි නොවී ඉඳලා, ඒ අයට දෙවන වතාවට විභාගයට පෙනී සිටින්න පුළුවන්. නමුත් ලියා පදිංචි වුණොත් දෙවෙනි වතාවේ ප්‍රතිඵල අනුව විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමට බැහැ. That is the reason. Once the A/L results are announced, a student of the Science stream is given the option of registering and entering the Science Faculty. But, if he registers on the strength of the results of the second time, he can enter the Medical Faculty. ඒකයි වෙන්නේ. ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටි කාලයේත් මේ ක්‍රමය තමයි තිබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක ශිෂ්‍යයන් ගන්න ඕනෑ තීන්දුවක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ තීන්දුව ඒ ශිෂ්‍යයා ගන්න ඕනෑ. ශිෂ්‍යයෙකුට හිතුණොත් "දෙවැනි වතාවට විභාගයට පෙනී සිට වෛද්‍ය විද්‍යාලයට ඇතුළුවීමට මට පුළුවන්" කියා, එසේ නම් ඒ ශිෂ්‍යයා ලියා පදිංචි නොවී සිටිය යුතුයි. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවෙනි අතුරු ප්‍රශ්නය.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු අනුර දිසානායක මන්ත්‍රීවරයා සමඟ අපි මේ කාරණය ගැන වට ගණනාවක් සාකච්ඡා කෙරුවා. අපි මේ ක්‍රමවේදය වෙනස් කිරීමට උත්සාහයක් ගත්තා. මේ ක්‍රමවේදයේ වෙනසක් ඇති කරන්න ඕනෑ කියලා ඔබතුමන්ලා කියනවා නම් සියලු පක්ෂ ඒකරාශි වෙලා අපි ඒ ගැන සාකච්ඡා කරන්න සූදානම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

මේ ප්‍රශ්නය, කැබිලිත්ත ගැන හෝ දෙවියන් ගැන හෝ ප්‍රශ්නයක් නොවෙයි. ශිෂ්‍යයන්ගේ වාසනාව, අවාසනාව මත

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

නොවෙයි, ඒ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලයට යන එක තීන්දු කරන්න ඕනෑ. විශ්වවිද්‍යාලවලට ශිෂ්‍යයන් බඳවා ගන්නවා කියන්නේ එය ජාතික අවශ්‍යතාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමාගේ අදහස හොඳම දරුවා විශ්වවිද්‍යාලයට එන්නේ නැහැ කියන එකයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳම දරුවාට හොඳම පාසල වාගේ හොඳම විශ්වවිද්‍යාලයත් දෙන්න ඕනෑ; හොඳම පාඨමාලාව දෙන්න ඕනෑ. නමුත් දැන් වෙලා තිබෙන්නේ,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
තුන්වෙනි අතුරු ප්‍රශ්නය.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
නැහැ, නැහැ. තවම ප්‍රශ්නය අහනවා. අමාත්‍යාංශයේ ප්‍රමාදයක් නිසා, ඒ කියන්නේ ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාදය, recorrectionවල තිබෙන ප්‍රමාදය නිසා නේ ශිෂ්‍යයන්ට මේ අසාධාරණය සිද්ධ වෙන්නේ. ඒ නිසා ශිෂ්‍යයන්ගේ luck එක මත එය තීරණය කරන්නේ නැතුව, chance එක මත තීරණය කරන්නේ නැතුව මේ සඳහා ක්‍රමවේදයක් හදන්න කියලායි අපි කියන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Luck එක නොවෙයි, ශිෂ්‍යයෙක් විද්‍යා විෂය ධාරාවෙන් උසස් පෙළ විභාගයට පෙනී සිටියාම ඊට පසුව ඒ ළමයාට ප්‍රතිඵල එනවා. එතකොට ඒ ළමයා තීරණයක් ගන්න ඕනෑ මම මේකට යනවාද- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න.

එහෙම නැත්නම් දෙවන වතාවට විභාගයට පෙනී ඉදලා මීට වඩා හොඳ ප්‍රතිඵල අරගෙන වෛද්‍ය විද්‍යාලයට යනවාද කියලා. ඒක ශිෂ්‍යයාගේ තීරණය. අපට ඒ තීරණයට මැදිහත් වෙන්න බැහැ නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ මූලික පැහැදිලි කිරීම නිවැරදියි. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට අදාළවයි මම මේ ප්‍රශ්නය අහන්නේ. ශිෂ්‍යයෙක් පළමුවැනි වතාවට විභාගය ලිව්වාම, ඔහුගේ ප්‍රතිඵල ලබා දෙන්නේත්, ඊට පස්සේ කඩඉම් ලකුණු - cut-off points - ලබා දෙන්නේත් මාස ගණනක් ගිහිල්ලා. සමහර විට අවුරුද්දක් විතර ගිහිල්ලා තමයි ලබා දෙන්නේ. ඒ cut-off point එක එනතුරු කිසිම ශිෂ්‍යයෙකුට හැකියාවක් නැහැ, ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමනි,

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ලියා පදිංචි වෙන්න?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, ලියා පදිංචි වෙන්න පුළුවන්. ඒත් තමන් හදාරන පාඨමාලාව මොකක්ද කියලා හඳුනා ගන්න බැහැ. මේකයි තිබෙන ප්‍රශ්නය. මාස තුනක් ඇතුළත ළමයින්ගේ ප්‍රතිඵල සහ cut-off points දෙනවා නම්, අපි මේ ප්‍රශ්නය මතු කරන්නේ නැහැ. ළමයෙකුට ලියා පදිංචි නොවී, දෙවැනි වතාවේ විභාගය ලියනවාද කියලා තීන්දු කරන්න වෙන්නේ ඔහු විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමට සුදුසුකම් ලැබුවා නම් විතරයි. දැන් වෙලා තිබෙන්නේ මේකයි. ළමයින් මේ කරුණු සම්බන්ධයෙන් අන්ධයි. ළමයින්ට සහ ඔබතුමා ඇතුළු අපි කාටවත් බැහැ, අපේ cut-off-point එක අනුව ලියාපදිංචි වෙන්න. ඒ නිසා ළමයි ලියා පදිංචි වෙනවා. මොකද, ඔවුන්ට වෙනත් අවස්ථාවක් නැති නිසා. මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒක ඔබතුමා කියන විධියට ප්‍රතිපත්තියත් එක්ක තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. උසස් අධ්‍යාපන හිටපු අමාත්‍ය ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා මේ කාරණය දන්නවා.

මෙන්න මේකයි මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය. සරලව මම කියන්නම්. යම්කිසි ශිෂ්‍යයෙක් පළමුවැනි වතාවට විභාගය ලියලා විශ්වවිද්‍යාලයක් සඳහා ලියා පදිංචි වුණත්, දෙවැනි වතාවේත් විභාගයට ලියලා ඒ ප්‍රතිඵල එන තුරුත් ඒ ලියා පදිංචි වූ පාඨමාලාව පටන් අරගෙන නැත්නම්, දෙවැනි වතාවේ ප්‍රතිඵල මත ඉහළ පාඨමාලාවකට ඇතුළත්වීමට ඒ ශිෂ්‍යයාට අවස්ථාව ලබාදීමෙන් කිසිදු ශිෂ්‍යයෙකුගේ අයිතිවාසිකම් නැති වෙන්නේ නැහැ. අනෙක, මේ ක්‍රමවේදය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පනතේ රෙගුලාසියක් මත පදනම් වෙලා හදන දෙයක්. අඩුම ගණනේ මේ ක්‍රමවේදය පාර්ලිමේන්තුවේ පනතක තිබෙන වගන්තියක්වත් නොවෙයි, ගරු ඇමතිතුමනි. මේ පිළිබඳව මා නැවත කියන්නම්. පළමුවැනි වතාවේ ප්‍රතිඵල මත ශිෂ්‍යයෙක් ලියා පදිංචි වුණාට පස්සේ, ඒ ශිෂ්‍යයා දෙවැනි වතාවේ විභාගය ලියලා ප්‍රතිඵල එනතුරුත් first shy එකේ course එක පටන් අරගෙන නැත්නම්, ඒ දෙවැනි වතාවේ ප්‍රතිඵල මත ඒ ශිෂ්‍යයාට හෝ ශිෂ්‍යාවට ඉහළ පාඨමාලාවකට ඇතුළත් වෙන්න ඉඩ දෙන්න. ඒ හරහා කිසිම මානව හිමිකම් උල්ලංඝනය වීමක් හෝ අනෙකුත් ළමයින්ට අසාධාරණයක් හෝ වෙන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ඒ ගැන සාකච්ඡා කරන්න සූදානම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම හොඳයි, ගරු ඇමතිතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We are agreeable to discuss. So, we will discuss. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු ඒ තර්කයේ හරයක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, මාත් එක්ක සාකච්ඡා කරනවාට වඩා වැදගත් වන්නේ ඔබතුමා මේ ස්ථාවරය පිළිගෙන උසස් අධ්‍යාපන ගරු ඇමතිවරයා වශයෙන් මේ ප්‍රශ්නයට මැදිහත් වෙන එකයි. මට මේ ගැන තව කරුණු කියන්න පුළුවන්. නමුත් මේ ක්‍රමවේදය ඔබතුමාගේ ස්ථාවරය බවට පත් කරගන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙලා තිබෙන්නේ මේකයි. විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙන අවස්ථාවලදී අපි අත් පොතක් හදලා, ඒක ප්‍රසිද්ධ කළා.

ඊට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු ගණනාවක් විභාග වුණා. ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වුණු නඩු සියල්ලම ආවරණය වන විධියට තමයි මේ අත්පොත හදලා තිබෙන්නේ. මේකේ යම් වෙනසක් කළොත් -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
රෙගුලාසි ගැන නේ එතුමා කිව්වේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේකේ එක වෙනස් කිරීමක් කළොත් විශාල ඵල විපාක ප්‍රමාණයක් ලැබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයට ආයෙත් නඩු ගණනාවක් එන්න පුළුවන්. ඒකයි මම කියන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒකට ඔබතුමා බය වෙන්න එපා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නඩුවලට බය වෙන්නේ නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපට ප්‍රශ්නය වැදගත්. නමුත් කාලය පිළිබඳ ප්‍රශ්නයකුත් තිබෙනවා. ඒ නිසා අවසාන වශයෙන් අවස්ථාවක් දෙන්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම ස්තුතියි. ගරු ඇමතිතුමනි, -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කියන්නේ, ශිෂ්‍යයෙක් ලියා පදිංචි වුණාට පසුව, ඊළඟ වතාවේ අ.පොස. උසස් පෙළ විභාගයට පෙනී ඉඳලා, ඒ ප්‍රතිඵල ආවාට පසුව ඒ අනුව පාඨමාලාවකට ඇතුළත් වෙන්න අවස්ථාව ලබා දෙන්න කියලා නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ. හැම විටම ඒ අවස්ථාව දෙන්න බැහැ. ඒකෙන් අනෙක් ළමයින්ගේ අවස්ථාව නැති වෙනවා. අපි කියන්නේ මේකයි. පළමුවන වතාවේ විභාගය ලියලා, ඒ ප්‍රතිඵල මත යම් ශිෂ්‍යයෙක් පාඨමාලාවකට ලියා පදිංචි වෙලා සිටියදීම දෙවැනි වතාවේදීත් විභාගය ලියනවා කියමු. නමුත් කලින් ලියා පදිංචි වුණු පාඨමාලාව පටන් ගෙන නැත්නම්, අන්න එවැනි අවස්ථාවලදී පමණක් second shy එකේ ප්‍රතිඵල මත හෝ third shy එකේ ප්‍රතිඵල මත වෙනත් පාඨමාලාවකට ලියාපදිංචි වෙන්න අවස්ථාව දෙන්න. එතකොට ඒ ළමයා ඒ second shy එකේ ප්‍රතිඵල මත, විද්‍යාපීඨයෙන් Medical Faculty එකට ගියාම පුරප්පාඩුවක් ඇති වෙනවා නේ. ගරු ඇමතිතුමනි, ඒ පුරප්පාඩුව computer system එකෙන් පෙන්වනවා. ඒ බව එස්.බී. දිසානායක ඇමතිතුමා දන්නවා. ඒ පුරප්පාඩුව පුරවන එක පරිපාලනමය ප්‍රශ්නයක් විතරමයි. UGC එකේ ඉන්න නිලධාරීන්ගේ මානසිකත්වය මොකක්ද කියන්න මම දන්නේ නැහැ. ඒ නිසායි අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, ඔබතුමාගේ ස්ථාවරය බවට මේ ක්‍රමය පත් කර ගන්න කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ඒ ගැන අවධානය යොමු කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඒ සම්බන්ධයෙන් විශේෂ, ඉක්මන් තීරණයක් ගන්න කියන එකයි එතුමා කියන්නේ. ඒක ඉතා වැදගත්.

ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව: අඩුකිරීම
மூத்த பிரஜைகளுக்கான கொடுப்பனவு: குறைக்கப்பட்டமை
SENIOR CITIZENS' ALLOWANCE : REDUCTION

460/'16

4. ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ ජාතික පුනර්ජීවන වැඩසටහන අනුව, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, වයස අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ලබාදුන් රුපියල් 2000ක මාසික දීමනාව, නව රජය බලයට පත්වීමෙන් පසුවත් 2015 වර්ෂය පුරා අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබුවේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 වර්ෂයේදී,

(i) එම දීමනාව ලබාදුන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සංඛ්‍යාව;

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

(ii) එම දීමනාව ලබාදීම සඳහා වැය වූ මුදල;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2016 වර්ෂය ආරම්භවීමත් සමඟ උක්ත රුපියල් 2000 මාසික දීමනාව, රුපියල් 1900 දක්වා අඩුකර ඇති බව පිළිගන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

සමූහ වලුවූට්ටල් මට්රුම් නලන්පුරි අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) මහින්ද චින්තනය අනාගත දැක්ම, දේශීය මීළඟ පියවර වැඩපිළිවෙළ යටතේ, මුතුන්මිත්තන්ට සඳහා වන දේශීය සභාව සහ දේශීය මුතුන්මිත්තන් ලේකම් කාර්යාලය විසින් 70 වයස සම්පූර්ණ කළ මුතුන්මිත්තන්ට 2015 වසර තුළ දී නිරන්තරයෙන් ලබා දුන් දීමනාව නව රජය බලයට පත්වීමෙන් පසුවද ලබා දුන්නේද යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 වසර තුළ දී,

(i) මෙම දීමනාව ලබා දුන් මුතුන්මිත්තන් සංඛ්‍යාව

(ii) මෙම දීමනාව ලබා දීම සඳහා වැය වූ මුදල

දිස්ත්‍රික්ක වශයෙන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2016 වර්ෂය ආරම්භවීමත් සමඟ උක්ත රුපියල් 2000 මාසික දීමනාව, රුපියල් 1900 දක්වා අඩුකර ඇති බව පිළිගන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

asked the Minister of Social Empowerment and Welfare:

(a) Will he inform this House whether the monthly allowance of Rs. 2,000/- granted to the senior citizens over 70 years of age by the National Council for Elders and National Secretariat for Elders under the National Re-awakening Programme of the Mahinda Chintana Vision for Future, was carried out continuously throughout the year 2015 even after the new Government came into power?

(b) Will he also inform this House in relation to the year 2015 in each district separately -

(i) the number of senior citizens who were granted that allowance; and

(ii) the amount spent for granting that allowance?

(c) Will he further inform this House whether he accepts the fact that the above-mentioned allowance of Rs. 2,000/- has been reduced to Rs. 1,900/- since the beginning of 2016?

(d) If not, why?

ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා)

(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சர்)

(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment and Welfare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ඔව්.

අදාළ දීමනාව 2015 වර්ෂය පුරා අඛණ්ඩව ගෙවීම සිදු කර ඇත.

(ආ) 2015 වර්ෂයේදී,

(i) එම දීමනාව ලබා දුන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සංඛ්‍යාව 386,080

(ii) එම දීමනාව ලබා දීම සඳහා වැය වූ මුදල රු.8,038,777,890.00 (බිලියන 8.04)

දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වැය වූ මුදල
කොළඹ	16,685	359,829,740.00
ගම්පහ	29,153	634,396,000.00
කළුතර	25,691	515,988,000.00
මහනුවර	24,977	538,278,450.00
මාතලේ	10,844	228,365,000.00
නුවරඑළිය	16,913	302,390,000.00
ගාල්ල	22,967	406,114,000.00
මාතර	19,551	385,493,000.00
හම්බන්තොට	11,247	197,757,000.00
යාපනය	18,279	425,990,000.00
මන්නාරම	2,533	58,163,000.00
වවුනියාව	3,197	73,804,000.00
මුලතිව්	2,933	65,018,000.00
කිලිනොච්චිය	3,467	79,663,000.00
මඩකලපුව	11,429	267,576,000.00
අම්පාර	14,192	280,784,500.00
ත්‍රිකුණාමලය	5,496	125,076,000.00
කුරුණෑගල	36,856	795,450,000.00
පුත්තලම	15,332	336,813,000.00
අනුරාධපුරය	17,633	374,228,000.00
පොළොන්නරුව	4,953	85,744,000.00
බදුල්ල	23,015	509,106,000.00
මොණරාගල	10,235	196,848,000.00
රත්නපුරය	23,544	476,741,200.00
කෑගල්ල	14,958	319,279,000.00
එකතුව	386,080	8,038,777,890.00

(ඇ) ඔව්.

1. 386,080ක් වැඩිහිටි ආධාර ගන්නා නමුත් 131,000ක් පොරොත්තු ලේඛනයේ සුදුසුකම් ලබා සිටී.
2. තවත් ලක්ෂ ගණනාවක් නිවාස ආධාර, අක්ෂි ආධාර, අත්වාරු, රෝදපුටු ආදිය ඉල්ලා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.
3. වැඩිහිටි නිවාස 306ක් දිවයින පුරා ඇති අතර, ඒවායේ තත්ත්වය ඉතාම ශෝචනීයය.
4. තවත් වැඩිහිටි නිවාස 100ක් පමණ අලුතින් ඉදි කිරීමට ඉල්ලීම් පවතී.

වැඩිහිටි නිවාස ප්‍රමාණවත් ලෙස නොමැතිකම

නිසා වැඩිහිටියන් විශාල පිරිසක් පොරොත්තු ලේඛනවල සිටී. එම සංඛ්‍යාව 30,000 ඉක්මවා ඇත. මේ තත්ත්වය නිසා ආධාර අවශ්‍ය, ආධාර නොලබන අයගේ අවශ්‍යතා යම් තරමකට ඉටු කිරීමටත්, ඊට අමතරව පහත ඉල්ලීම් ඉටු කිරීමටත් ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාවෙන් මාසිකව රුපියල් 100ක මුදලක් වෙන් කොටගෙන වැඩිහිටියන් වෙනුවෙන් සමාජ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීමට කටයුතු සිදු කර ඇත.

1. අසරණ වූ වැඩිහිටියන් වෙනුවෙන් වැඩිහිටි නිවාස ඉදි කිරීම සහ ඒවා පවත්වා ගෙන යෑම.
2. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර ලබා දීම.
3. ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබලගැන්වීම සඳහා ආධාර ලබා දීම.
4. අසරණ වූ වැඩිහිටියන් වෙනුවෙන් අවශ්‍ය හදිසි ශල්‍යාකර්ම සඳහා මුදල් ආධාර ලබා දීම.
5. පිළිකා තත්ත්ව, වකුගඩු රෝග තත්ත්ව වැනි සුව කිරීමට අපහසු රෝගී වැඩිහිටියන් වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිකාර සඳහා මුදල් ආධාර ලබා දීම.
6. සෞඛ්‍ය ආරක්ෂණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.
7. වැඩිහිටියන් වෙනුවෙන් ස්වයං රැකියා ආධාර ලබා දීම සහ ඒ තුළින් ඔවුන් නිෂ්පාදනය කරන දෑ අලෙවි කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දීම.
8. වැඩිහිටියන් වෙනුවෙන් චාරිකා සංවිධානය කිරීම.
9. ජාතික සංවර්ධනයේ කොටස්කරුවන් කිරීමට වැඩිහිටියන් සඳහා මෙම අරමුදල මගින් සැලසුම් සකස් කර කටයුතු කිරීම.
10. ඇතැම් වැඩිහිටි නිවාසවල ඉතා අඩු දීමනා යටතේ සේවය කරන සේවකයන්ගේ ගැටලු සලකා බලා අවශ්‍යම අයට කිසියම් අමතර දීමනාවක් ලබා දීමට කටයුතු කිරීම.
11. නොමිලේ පවත්වා ගෙන යන වැඩිහිටි නිවාසවල තත්ත්වය උසස් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(ඈ) අදාළ නොවේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමා වැඩිහිටියන්ට මෙවැනි බොහෝ සත්කාර්යයන් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාවෙන් මාසිකව රුපියල් 100ක් අඩු කර ගෙන, එය ඵලදායී ලෙස යොදවනවා නම් ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ; ඒක හොඳයි. මේ රැස් කර ගත් රුපියල් 100න් කරන ලද ඒ සත්කාර්යයන් පිළිබඳ වාර්තාවක් වෙනත් අවස්ථාවකදී මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි.

ඒ වාගේම, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට අද තවත් ප්‍රධාන ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, අය වැය යෝජනාවලින් නිර්දේශිත, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා වන සියයට පහළොවේ පොලිය ගෙවීමේ චක්‍රලේඛය මේ වනතෙක් මූල්‍ය සමාගම්වලට නිකුත් වෙලා නැහැ. ඒ සඳහා අය වැයෙන් රුපියල් මිලියන 1,500ක් වෙන්කර තිබෙනවා. සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා, හඬක් නහන්න බැරි මේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ අවධානය යොමු කරවා, මෙම කටයුත්ත කරන්න මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටින්න කැමැතියි.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, මම දන්න විධියට වැඩිහිටියන්ගේ ගිණුම්වල තැන්පත් මුදලට සියයට 15ක පොලිය එකතු වෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූල්‍ය සමාගම්වල - finance companiesවල -තැන්පතුවලට මේ සියයට 15ක පොලිය එකතු වෙන්නේ නැහැ.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
අපි දන්න විධියට වැඩිහිටියන්ගේ ගිණුම්වලට ලංකා බැංකුව, මහජන බැංකුව වැනි බැංකුවල සියයට 15ක පොලියක් එකතු වෙනවා. එහෙම නැහැ කියලා ඔබතුමන්ලා කියනවා නම් මම ඒ ගැන හොයා බලන්නම්.

ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් කියන්න කැමැතියි. ඇත්තටම මේ අය බැංකුවට, එහෙම නැත්නම් තැපැල් කන්තෝරුවට, AGA Office එකට මේ වැඩිහිටි දීමනාව ගන්න යන්නේ three-wheeler එකක්, නැත්නම් වෑන් එකක් කථා කර ගෙනයි. හැබැයි, අපි දැන් ක්‍රමවේදයක් හදාගෙන යනවා, මේ අයගේ ගෙදරටම ඒ මුදල ගිහිල්ලා දෙන්න. එතකොට මේ අයට ලාබයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාතුමා වශයෙන් මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. මේ වනකොට රජයේ සියලුම අංශවල ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා, "රාජ්‍ය නිලධාරි තන්ත්‍රය වැඩ කරන්නේ නැහැ" කියලා. ඔවුන්ට බයක් තිබෙනවා, වැඩ කිරීම තුළින් තමන්ට FCID එකට යන්න වෙයිද කියලා. ඒ බය දැන් උග්‍ර තත්ත්වයකට පත්වෙලා තිබෙනවා.

අද දින "දිවයින" පුවත් පතේ මෙසේ සඳහන් වෙනවා:

"ඇත්ත කී නිසා මා දඩස්ගා මාරු කළා. දඩල්ලගේ කියයි"

මේ රජයේ පවතින යහ පාලන විරෝධී ප්‍රතිපත්තිය ගැන විවේචනය කළාය කියලා ජනාධිපති ලේකම්තුමා, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාව වහාම මාරු කරනවා. රාජ්‍ය නිලධාරීන් ඔක්කොම අද බියපත් වෙලා සිටිනවා. මොකද, සාලාව කඳවුර පිළිබඳ ප්‍රශ්නයේදී මුදල් නොලැබෙන්නේ, ගංවතුර ප්‍රශ්නයේදී මුදල් නොලැබෙන්නේ රාජ්‍ය නිලධාරීන්ගේ, -

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
තමුන්නාන්සේ මකුණාගේ කථාව ප්‍රයෝජනයට ගනිමින් තමයි ඒ ප්‍රශ්නය ඇහුවේ. මේ කාරණය පිළිබඳව මට උත්තරයක්

[ගරු එස්.බී. දිසානායක මහතා]

දෙන්න අමාරුයි. නමුත් වැඩිහිටි දීමනා හා ආබාධිත දීමනා ඔවුන්ගේ ගෙවල්වලටම ගෙන ගිහින් දෙන්න අවශ්‍ය කටයුතු කරමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, we will proceed without the lunch break.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මා ඔබතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කර වනවා. ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ පවා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ඒ අවස්ථාව තිබෙනවාය කියලා මෙතුමා කිව්වා. ගරු මුදල් ඇමතිතුමාත් මේ අවස්ථාවේ මේ ගරු සභාවේ ඉන්නවා. ඇත්තටම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට තමන්ගේ තැන්පතු සඳහා සියයට 15ක පොලියක් ලබා ගන්න ලංකා බැංකුව හා මහජන බැංකුව තවම අවස්ථාව දීලා නැහැ. ඒ අය කියන්නේ චක්‍රලේඛ ඇවිල්ලා නැහැ කියලායි. 2016 අවුරුද්දේ අය වැයෙන් පසුව තවම මේ කටයුත්ත ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා මුදල් ඇමතිතුමාගේ අවධානය ඒ කාරණය කෙරෙහි මා යොමු කරවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට ඒ ගැන පැහැදිලි කර ගන්න වෙනත් අවස්ථාවක් ලබා ගන්න වෙනවා.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
මම මේ කාරණය ගැන සොයා බලන්නම්.

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මට කථා කරන්න අවසර ලබා දෙනවා නම්, එතුමාට උත්තරයක් ලබා දෙන්න මට පුළුවන්. ඔය ප්‍රශ්නය තිබුණේ ජූනි මාසයට පෙරයි. ඊට පසුව අපි එම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා සියයට 15ක පොලියක් ලබා දෙන්න කටයුතු කර තිබුණා. Finance companies තුළින් guarantee එකක් දීලා මේ කටයුත්ත කරන්න හැදුවාම එහි යම් අවදානම් තත්ත්වයක් තිබෙන බව අපට පෙනුණා. ඒ නිසා අපි ඒ කටයුත්ත කරන්න කැමැති වුණේ නැහැ. දැන් ඒ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සියලු දෙනාම තමන්ගේ ලක්ෂ 10ක් දක්වා තැන්පතු සඳහා සියයට 15ක පොලියක් ලබා ගන්නවා. එහෙම සිදු වන්නේ නැත්නම්, එය සිදු නොවන්නේ කොහේද කියන එක ගැන අපව දැනුවත් කරන්න. එතකොට අපි ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්නම්. [බාධා කිරීමක්] සියලුම බැංකුවලින් නොවෙයි. Bank of Ceylon සහ People's Bankවලින් ගෙවනවා.

ශ්‍රී ලංකා රජයේ විදේශ ණය ප්‍රමාණය: විස්තර
இலங்கை அரசாங்கத்தின் வெளிநாட்டுக் கடன்கள் : விபரம்
FOREIGN DEBT OF GOVERNMENT OF SRI LANKA: DETAILS

474/'16

5. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015.01.01 දිනට සහ 2015.12.31 දිනට ශ්‍රී ලංකා රජයේ විදේශ ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015.01.01 දිනට සහ 2015.12.31 දිනට ඇමෙරිකානු ඩොලරය සහ ශ්‍රී ලංකා රුපියල අතර විනිමය අනුපාතය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 වසර තුළ දී ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව, රුපියලේ අගය පිරිහීම හේතුවෙන්, 2015.12.31 දිනට පැවති ශ්‍රී ලංකාවේ විදේශ ණය ප්‍රමාණය රුපියල් කොපමණකින් ඉහළ ගොස් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015.01.01ஆம் திகதியில் உள்ளவாறு மற்றும் 2015.12.31ஆம் திகதியில் உள்ளவாறு இலங்கை அரசாங்கத்தின் வெளிநாட்டுக் கடன்களின் அளவு அமெரிக்க டொலர்களில் தனித்தனியாக எவ்வளவென்பதையும்;

(ii) 2015.01.01ஆம் திகதியில் உள்ளவாறு மற்றும் 2015.12.31ஆம் திகதியில் உள்ளவாறு அமெரிக்க டொலருக்கும் இலங்கை ரூபாவிற்கும் இடையி லான செலாவணி வீதம் தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iii) 2015ஆம் ஆண்டில் அமெரிக்க டொலருக்கு ஒப்பீட்டளவில், ரூபாவின் பெறுமதி வீழ்ச்சி யடைந்தமையின் காரணமாக, 2015.12.31ஆம் திகதியன்று காணப்பட்ட இலங்கையின் வெளி நாட்டுக் கடனின் அளவு எவ்வளவு ரூபாய்களால் அதிகரித்துள்ளதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House-

(i) separately the foreign debt of the Sri Lankan Government as at 01.01.2015 and 31.12.2015 in US Dollars;

(ii) separately the exchange rate between the US Dollar and Sri Lankan Rupee as at 01.01.2015 and 31.12.2015; and

(iii) the rupee value of the increase in Sri Lanka's foreign debt as at 31.12.2015 as a result of the depreciation of the rupee against the US Dollar during the year 2015?

(b) If not, why?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i)

දිනය	විදේශ ණය (ඇ.ඩො. මිලියන)
2015.01.01	23,748
2015.12.31	24,601

(ii)

දිනය	විනිමය අනුපාතය (රු)*
2015.01.01 දිනට	131.09
2015.12.31 දිනට	144.06

* බර තැබූ සාමාන්‍ය විනිමය අනුපාතය අනුව

(iii) 2015 වසර තුළදී ඇමෙරිකානු ඩොලරය ඇතුළු ප්‍රධාන විදේශීය මුදල්වලට සාපේක්ෂව, රුපියලේ අගය අවප්‍රමාණය හේතුවෙන් 2015.12.31 දිනට පැවති ශ්‍රී ලංකාවේ විදේශ ණය ප්‍රමාණය රුපියල් බිලියන 228.7කින් ඉහළ ගොස් ඇත.

මේක ඇති වෙලා තිබෙන්නේ මීට පෙර ආණ්ඩුවෙන් රුපියල් වෙනුවට Dollar loans අරගෙන තිබෙන නිසා.

(ආ) පැන නොනඟී.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු මුදල් අමාත්‍යතුමා සඳහන් කළා, රුපියල පිරිහීම නිසා පමණක් 2015 වසර තුළ අපේ ණය බර රුපියල් බිලියන 228.7කින් වැඩිවෙලා කියලා. මුදල් අමාත්‍යතුමනි, රුපියල පිරිහීම වළක්වමින් රුපියලේ ස්ථායීතාව ඇති කර ගැනීම සඳහා ඔබතුමා ගනු ලබමින් තිබෙන වැඩ පිළිවෙළ කුමක්ද?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අපි ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර දෙකක් තිබෙනවා. එකක් තමයි මීට පෙර පැවැති ආණ්ඩුව අර ගෙන තිබෙන අධික ණය ප්‍රමාණය - කෙටි කාලීන ණය සහ දීර්ඝ කාලීන ණය - අඩු පොලියට ගත් ණය ලෙසට පරිවර්තනය කර ගෙන යනවා. ඔබතුමන්ලා සියලු දෙනාම කොච්චර ශබ්ද කළත්, අපට ලැබුණු ආදායම මදි වුණා, ණය සහ පොලිය ගෙවන්න. අපට ලැබුණේ එවැනි ආර්ථිකයක් සහිත රටක්. අපි දැන් ඒ තත්ත්වය නිවැරදි කර ගෙන යනවා.

දෙවැනි පියවර තමයි අපි පුළුවන් තරම් ඩොලර් ප්‍රමාණයක් මේ රටට ගෙනෙන්න කටයුතු කරනවා කියන එක. මොකද, යුරෝපයේ, මැද පෙරදිග රටවල, ජපානයේ negative return එකක් තිබෙනවා. ඒ කියන්නේ ඉතිරි කිරීම් ඇති කරන්න නම් බැංකුවලට ගෙවන්න තිබෙනවා. අපි ලංකාව මූල්‍ය කේන්ද්‍රස්ථානයක් කරනවා.

තුන්වැනි එක විධියට අපි CIFC - Colombo International Financial Centre - එකක් ඇති කරනවා. ලෝකයේ ජනගහනයෙන් තුනෙන් එකක් ඉන්දියාව, බංග්ලාදේශය, පකිස්තානය වැනි රටවලයි සිටින්නේ. ඒ රටවල අය ගිහිල්ලා ආයෝජනයන් කරන්නේ ඩුබායි සහ සිංගප්පූර්වලයි. ඒ නිසා අපි මේ රට මූල්‍ය කේන්ද්‍රස්ථානයක් බවට පත් කර ගැනීමට කටයුතු කර ගෙන යනවා. ඒ තුළින් එම ආයෝජකයන් මේ රටට ඇවිල්ලා යම් විධියක speculate කරන්න කැමැත්තක් දක්වනවා.

හතරවැනි කාරණය, අපි temporary resident permits .ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. ජපානයේ වයස අවුරුදු 65ට වැඩි අය සීතල කාලයට ලංකාවට ඇවිල්ලා ජීවත් වෙන්න කැමැත්තක් දක්වා තිබෙනවා. වීසා දෙන්න පුළුවන්ද කියලා ඒගොල්ලන් අහලා තිබෙනවා. අපි කියා තිබෙනවා, US Dollars මිලියනයකට වැඩි ප්‍රමාණයක් හෝ ලක්ෂ තුනකට වැඩි ප්‍රමාණයක් ගෙනෙනවා නම්, ඒ ගැන සොයලා බලලා කටයුතු කරන්න පුළුවන් කියලා. එවැනි පියවරයන් තමයි අපි අනුගමනය කරන්නේ. ඒ නිසා මම හිතන විධියට මේ කරුණු තුන හතර තුළින් අපට සුවිශේෂ වෙනසක් ඇති කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

අපේ විදේශ ණයත් එක්ක විදේශ සංචිතවල පිරිහීමක් ගැන වාර්තා වෙනවා, ගරු අමාත්‍යතුමනි. රටට දැන ගැනීම සඳහා ඔබතුමාට කියන්න පුළුවන්ද මේ වන විට අපේ විදේශ විනිමය සංචිත මාස කීයක ආනයන ආවරණය කිරීමට ප්‍රමාණවත්ද කියලා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දැනට අපට මාස හතරකට ආවරණය කිරීමට හැකියාව තිබෙනවා. මේකේ භයානක තත්ත්වය තිබෙන්නේ මාස දෙකයි. ඊට වඩා හුඟාක් වැඩියෙන් තිබෙනවා. අපට පෙනෙනවා "Brexit" එක වුණාට පස්සේ; ලෝකයේ අර්බුදයක් ඇති වුණාට පස්සේ ලංකාවට වාසියක් තිබෙන බව. මේ සුමාන දෙක තුළ US Dollars මිලියන 250ක් විතර වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ දැනට විදේශ විනිමය සංචිතය සියයට 6.1යි. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, your mike is not on. ගරු මුදල් ඇමතිතුමාගේ mike එක දෙන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමාට ප්‍රථම අපේ ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා හොඳ අදහසක් ඉදිරිපත් කර තිබෙනවා. පැනමා ගිණුම්, ස්විට්සර්ලන්තයේ තිබුණු ගිණුම් අපි සෝදිසි කරනවාද කියලා එතුමා ඇහුවා. පැනමා ප්‍රශ්නය ආවාට පස්සේ අපි අනිවාර්යයෙන්ම මේ 165ටම එවන්න බැලුවා. ඒකේ තිබෙන සමහර නම් ව්‍යාජ ඒවා. සමහර ඒවා ගැන කියා තිබෙනවා, "ඔව් files දෙකක්, තුනක්, හතරක් තිබෙනවා" කියලා. ඒවා අපි ඉදිරියට ගෙන යනවා. ස්විට්සර්ලන්තයට ලිව්වාම ඒගොල්ලෝ අපට කිව්වා, මේ සම්බන්ධයෙන් කිසිම disclose එකක් කරන්න බැහැයි කියලා. ගරු මන්ත්‍රීතුමා හොඳ ප්‍රශ්නයක් ඉදිරිපත් කළා, පිට රටවල තිබෙන බැංකු ගිණුම් ගැන විස්තර ඉදිරිපත් කරන්න කියලා ආණ්ඩුවක් වශයෙන් ඉල්ලීමක් කරන්න බැරි ඇයි කියලා. ඒ සම්බන්ධයෙන් මම ජනාධිපතිතුමා සහ අගමැතිතුමා එක්කත් කථා කරලා, එහි තිබෙන වාසි අවාසි ගැනත් කල්පනා කර බලා කටයුතු කරනවා. අපි අපේ අවංකභාවය ඒ තුළින් පෙන්වන්නම්. ඒක හොඳ අදහසක්. හැබැයි, මතක තියා ගන්න, අද ඉන්දුනීසියාව, තායිලන්තය, මැලේසියාව යන රටවල් ඕනෑකමින්ම ලෝකයේ ඩොලර් පස්සේ දුව ගෙන යන බව. කිසිම උත්තරයක් අහන්නේ නැතිව දැන් ඉන්දුනීසියාවේ අවුරුදු 15කට amnesty එකක් දීලා තිබෙනවා. අපේ වාගේ රටක ඒ වාගේ දේවල් අනුගමනය කරන එක හරි අමාරුයි.

Amnesty එකෙන් අපට එන්නේ නරක නාමයක්. මින් පසුව කවදාවත් අපි ඒ වචනය පාවිච්චි කරන්නේ නැහැ. ඊට පෙර 2004 දී හොඳ දෙයක් කරලා ලොකු අවනම්බුවක් ඇති වුණා. හැබැයි අපි ඒකට යම් විධියකින් tax එකක් impose කරලා, ඒ තත්ත්වය නැති කරන්න අපි උනන්දු වුණා. ඒක තමයි අපි කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 6 -504/'16- (2), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ හා බුද්ධශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Buddhasasana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති 6ක කාලයක් ඉල්ලා සිටිනවා. පොලිස් දෙපාර්තමේන්තුවෙන් සහ නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඒ පිළිබඳව තොරතුරු ලබා ගැනීමට තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු ඇමතිතුමනි, සති 6කින් පිළිතුර ඉදිරිපත් කරන්න පුළුවන්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
I will definitely give an answer within six weeks.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down

තේ සහ රබර් මිල පහත වැටීම : විස්තර

தேயிலை மற்றும் இறப்பர் விலைகளில் வீழ்ச்சி : விபரம்

DECLINE IN PRICE OF TEA AND RUBBER: DETAILS

513/'16

7. ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසු ගිය අවුරුදු 15 තුළ දක්නට ලැබුණු අඩුම මිලට තේ සහ රබර් මිල ගණන් පහත වැටී ඇති බවත්;

(ii) සමස්ත තේ අපනයනවලින් සියයට 80ක් සපුරාලනු ලබන්නේ කුඩා තේ වතු හිමියන් විසින් බව සහ පසු ගිය මාස 6 තුළ තේ අපනයනය තුළින් ලැබූ ඉපයීම් සියයට 21කින් පහත වැටී ඇති බවත්;

(iii) නිෂ්පාදන ක්‍රියාවලිය තුළ අත්විඳින ලද අලාභ හේතුවෙන් සමහර කුඩා තේ වතුහිමියන් තේ නිෂ්පාදනය අතහැරදමා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පසු ගිය මැතිවරණ ව්‍යාපාරය තුළදී පොරොන්දු වූ ආකාරයට අමු දළු කිලෝග්‍රෑම් එකක් සඳහා රු.90/-ක් සහ ෂීට් රබර් කිලෝග්‍රෑම් එකක් සඳහා රු. 350/-ක් ගෙවීමට;

(ii) මෙම කර්මාන්ත ආරක්ෂා කරගැනීම සඳහා කුඩා තේ වතු හිමියන්ට ඔවුන්ගේ ඉඩම් ඇපයට තබාගෙන හෙක්ටයාරයට රුපියල් මිලියනයක සහනදායී දිගු කාලීන ණය මුදලක් නාමික පොලියක් මත අවුරුදු 10න් ආපසු අයකර ගන්නා පදනමින් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීමට රජය කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த 15 வருடங்களாக தேயிலை, இறப்பர் ஆகியவற்றின் விலைகள் மிகக் குறைந்த அளவிற்கு வீழ்ச்சி கண்டுள்ளன என்பதையும்;

(ii) மொத்த தேயிலை ஏற்றுமதியில் 80% இற்கு தேயிலை சிறுபற்று நில உரிமையாளர்களே பொறுப்பாகத் திகழ்கின்றனர் என்பதையும், கடந்த 06 மாதங்களில் தேயிலை ஏற்றுமதி வருவாய் 21% வீழ்ச்சி கண்டுள்ளது என்ப தையும்;

(iii) இந்த நடவடிக்கையில் ஏற்பட்ட நட்டத்தின் காரணமாக தேயிலை சிறுபற்று நில உரிமை யாளர்கள் சிலர் தேயிலை உற்பத்தியைக் கைவிட்டுள்ளனர் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ)(i) அண்மைய தேர்தல் பிரசாரத்தின்போது வாக்குறுதி அளித்ததன் பிரகாரம் ஒரு கிலோ தேயிலைக் கொழுந்திற்கு ரூபாய் 90/- உம் ஒரு கிலோ சீற் இறப்பருக்கு ரூபாய் 350/- உம் அரசாங்கம் செலுத்துமா என்பதையும்;

(ii) இந்தக் கைத்தொழில்களைப் பாதுகாக்கும் நோக்குடன் தேயிலை சிறுபற்று நில உரிமை யாளர்களது காணிகளைப் பிணையுறுதியாக வைத்துக்கொண்டு, சாதாரண வட்டி வீதத்தில் 10 வருடக் காலப் பகுதியினுள் கழிக்கக் கூடியவாறு, ஒரு ஹெக்டயர் காணிக்கு ஒரு மில்லியன் ரூபாயை நீண்டகால சலுகை அடிப்படையிலான கடனாக வழங்குவதற்கு அவசியமான நடவடிக்கைகளை அரசாங்கம் மேற்கொள்ளுமா என்பதையும்

அவர் இச் சபையில் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Will he accept that -

(i) tea and rubber prices have come down to the lowest during the last 15 years;

(ii) tea smallholders are responsible for 80 *per cen*t of the total tea exports and the tea export earnings have come down by 21*per cent* during the last 06 months; and

(iii) some tea smallholders have abandoned the tea production due to losses incurred in the production process;

(b) Will he inform this House whether the Government -

(i) pays Rs. 90 per kilogramme of Green Leaf and Rs. 350 per kilogramme of Sheet Rubber as promised by them during their recent election campaign; and

(ii) takes necessary steps to offer a long-term concessionary loan of Rs. 1 million per hectare for tea smallholders on a nominal interest rate to be deducted in 10 years with the view of saving the industries by keeping their land as collateral;

(c) If not, why?

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා (වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லக்ஷ்மன் வசந்த பெரேரா - பெருந்தோட்டக் கைத்தொழில் பிரதி அமைச்சர்)

(The Hon. Lakshman Wasantha Perera - Deputy Minister of Plantation Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පසු ගිය අවුරුදු 15 තුළ දක්නට ලැබුණු අඩුම මිලට තේ සහ රබර් මිල ගණන් පහත වැටී නොමැත.

1. තේ ක්ෂේත්‍රය

2012 වසරේ සිට කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝවක සාමාන්‍ය මිල (රු.)

වර්ෂය	2012	2013	2014	2015	2016 මැයි
කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝවක සාමාන්‍ය මිල (රු.)	391.64	444.42	461.86	402.14	447.81

ඉහත වගුවේ ඇතුළත් දත්තවලට අනුව, 2013 හා 2014 වර්ෂවලට සාපේක්ෂව 2015 වර්ෂයේ මිල පහත වැටීමක් සිදු වී ඇත. 2016 මැයි මාසය සලකන වි තේ කිලෝවක සාමාන්‍ය අගය රුපියල් 447ක් දක්වා වර්ධනය වී ඇත.

2. රබර් ක්ෂේත්‍රය

2009 වසරේ සිට කොළඹ රබර් වෙන්දේසියේ රබර් කිලෝවක මිල (රු.)

වර්ෂය	2009	2010	2011	2012	2013	2014	2015	2016 අප්‍රේල්
කොළඹ රබර් වෙන්දේසියේ රබර් කිලෝවක මිල (රු.) (RSS 3)	194.76	390.63	492.45	395.13	360.70	268.50	235.18	230.50

2011 වර්ෂයේ සිට රබර් කිලෝවක් සඳහා වන මිලෙහි අඩුවීමක් ඉහත වගුවේ ඇතුළත් දත්ත සලකා බැලීමේදී පෙනී යයි.

(ii) ශ්‍රී ලංකාවේ සමයස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 73ක දායකත්වයක් 2015 වර්ෂයේදී කුඩා තේ වතු හිමියන් විසින් ලබා දී ඇත. ඒ අනුව, 2015 වර්ෂයේ සමස්ත තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 328.7ක් වන අතර, කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 240කි.

2015 දෙසැම්බර් සිට 2016 මැයි දක්වා වන මාස 6ක කාලය තුළ තේ අපනයන ආදායම රුපියල් මිලියන 88,130.00ක් (අසූඅටදහස් එකසිය තිහක්) වන අතර ඊට පෙර මාස 6ක කාලය වන 2015 ජූනි සිට නොවැම්බර් දක්වා වන කාලය තුළ තේ අපනයන ආදායම රුපියල් මිලියන 93,285.30කි. (අනූතුන්දහස් දෙසිය අසූපහයි දශම තුනකි.) ඒ අනුව සියයට 5.53ක ප්‍රතිශතයකින් පසු ගිය මාස 06 තුළ අපනයන ආදායම අඩු වී ඇත.

(iii) අලාභ හේතුවෙන් කිසිදු කුඩා තේ වතු හිමියකු තේ නිෂ්පාදනය අතහැර දමා ඇති බව වාර්තා වී නොමැත.

2015 වර්ෂයේ අමු තේ දළු කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 55.08ක් වන අතර 2016 වර්ෂයේ

[ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා]

පසු ගිය මාස 05ක අමු දළු කිලෝවක් සඳහා ලැබී ඇති මිලෙහි සාමාන්‍ය වටිනාකම රුපියල් 60.25කි. ඒ අනුව අමු තේ දළු කිලෝවක් සඳහා රුපියල් 5.17ක ලාභයක් කුඩා තේ වතු හිමියන් වෙත ලැබී ඇත.

(ආ) (i) රජයේ දින සියය වැඩසටහන යටතේ අමු තේ දළු කිලෝග්‍රෑම් එකක් සඳහා සහ රබර් කිලෝග්‍රෑම් එකක් සඳහා සහනික මිලක් ගෙවීම සිදු කරන ලදී. ඒ අනුව එම සහනාධාර ක්‍රමය 2015 අප්‍රේල් 01 සිට සැප්තැම්බර් 30 දක්වා ක්‍රියාත්මක කර ඇත. ඒ යටතේ කුඩා තේ වතු හිමියන් සඳහා රුපියල් බිලියන 6.64ක්ද, කුඩා රබර් වතු හිමියන් සඳහා රුපියල් බිලියන 2.05ක්ද රජය මඟින් සහනාධාර වශයෙන් ප්‍රදානය කර ඇත.

(ii) යෝජිත පරිදි ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක නොවන අතර කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් ලංකා බැංකුව සමඟ විශේෂ ණය යෝනා ක්‍රමයක් දැනටමත් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ අක්කරයක භූමි ප්‍රමාණයක් සඳහා රුපියල් 500,000ක (ලක්ෂ පහක) උපරිමයකට යටත්ව තේ නව හා නැවත වගාවට සහ තේ පැළ තවාන් පිහිටුවීමටද, රුපියල් 300,000ක (ලක්ෂ තුනක) උපරිමයකට යටත්ව ආදායම් උත්පාදන කටයුතු සඳහාද ණය ලබා දීම සිදු කරනු ලබයි.

(ඇ) අදාළ නොවේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මාතර දිස්ත්‍රික්කයේ පමණක් තේ කර්මාන්තශාලා 16ක් වසා දමා ඇති බව ඔබතුමා පිළිගන්නවාද?

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් වසන්ත පෙරේරා)
(The Hon. Lakshman Wasantha Perera)

ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දිනක මාතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පැවැත්වූවා. ඒ අවස්ථාවේදී මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් පැන නැඟුණේ නැහැ. දිස්ත්‍රික් ලේකම්තුමිය ඒ සම්බන්ධයෙන් කිසිම වාර්තාවක් අපට ඉදිරිපත් කර නැහැ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)

අපේ ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා දන්නවා, දැනට තේ කර්මාන්තශාලා කොපමණ ප්‍රමාණයක් වැහිලා තිබෙනවාද කියලා. මා තමුන්නාන්සේගෙන් අහන්නේ ඒ ප්‍රශ්නයයි. තමුන්නාන්සේ ඒ ප්‍රදේශය ගැන දන්නේත් නැහැ, තමුන්නාන්සේ වගාව ගැන දන්නේත් නැහැ.

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් වසන්ත පෙරේරා)
(The Hon. Lakshman Wasantha Perera)

අප සතුව තිබෙන වාර්තා මතයි අපට පිළිතුරු දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් අපට වාර්තා වෙලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

හොඳයි. පිළිතුර පැහැදිලියි. දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ආණ්ඩුව බලයට එන කොට තේ කිලෝග්‍රෑම් එකකට රුපියල් 90කුත්, රබර් කිලෝග්‍රෑම් එකකට රුපියල් 350කුත් දෙන්න පොරොන්දු වුණු බව ඔබතුමා පිළිගන්නවාද?

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් වසන්ත පෙරේරා)
(The Hon. Lakshman Wasantha Perera)

දේශපාලනමය වශයෙන් එහෙම පොරොන්දුවක් දෙන්න ඇති. නමුත්, ඒ සම්බන්ධයෙන් ගෙවීමක් කරනවා කියන එක ගරු මන්ත්‍රීතුමනි, ලොකු ගැටලුවක්. අද ඇත්තටම ලංකාවේ තේවලින් පාරිභෝගික නිෂ්පාදන 70ක් කරන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, ලංකාවේ කරන්නේ නිෂ්පාදනය 30ක් පමණයි.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒක අය වැයෙන් දුන් පොරොන්දුවක්.

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් වසන්ත පෙරේරා)
(The Hon. Lakshman Wasantha Perera)

ඒ අවස්ථාවේ අය වැය පොරොන්දුවක් වශයෙන් එය කියන්න ඇති. 2015දී ගෙවා තිබෙනවා. ඊට පසුව ගෙවා නැහැ කියා පිළිගන්නවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ අය වැය පොරොන්දුව ඉෂ්ට කරන්න තමුන්නාන්සේලා කවදාවත් සැලසුමක් හදන්නේ නැද්ද?

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් වසන්ත පෙරේරා)
(The Hon. Lakshman Wasantha Perera)

ගරු මන්ත්‍රීතුමනි, දැනට කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන වැඩ පිළිවෙළ - IFAD යෝජනා ක්‍රමය - යටතේ මිලියන 25ක් අපට ලැබී තිබෙනවා. මිලියන 64.67ක් දැනට,-

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)

ඒ යෝජනා ක්‍රමය පසු ගිය අවුරුදු දහය තුළම ක්‍රියාත්මක වුණු එකක්.

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් වසන්ත පෙරේරා)
(The Hon. Lakshman Wasantha Perera)

ඒක තමයි. ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ අනුමැතිය ලැබිලා, ගිවිසුම් අත්සන් කර තිබෙනවා. කුඩා තේ හා රබර් වතු හිමියන් සඳහා අප එය ක්‍රියාත්මක කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 8-560/'16-(1), ගරු එස්. ශ්‍රීතරන් මහතා.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
Hon. Deputy Speaker, I ask Question No. 8.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

"මවුලානා ටෙක්ස්ටයිල්ස්" කල්පිටිය : වන්දි

"மௌலானா ரெக்ஸ்ரைல்ஸ்" கற்பிட்டி: நட்டஈடு
"MAULANA TEXTILES" KALPITIYA: COMPENSATION
576/'16

9. ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුත්තලම, කල්පිටිය, සින්නකුඩියිරුප්පුව, ආනවාසර් පාර ලිපිනයේ පදිංචි එම්.එච්.එම්. සාලි මහතාට අයත් කල්පිටිය, බසාර් වීදියේ පිහිටි, "මවුලානා ටෙක්ස්ටයිල්ස්" වෙළඳ ආයතනය 2002.02.21 දින දාමරිකයින් පිරිසක් විසින් ගිනිතබා විනාශයට පත් කරන ලද බවත්;

(ii) ව්‍යාපාරය අහිමි වී අසරණභාවයට පත්ව සිටින සාලි මහතා විසින් තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුරුත්ථාපනය කිරීමේ අධිකාරිය වෙත වන්දි අපේක්ෂාවෙන් අංක REP/PV/APP/2002 යටතේ අයදුම්පත්‍රයක් යොමු කරනු ලැබුවද ඔහුට මේ දක්වාත් වන්දි ප්‍රදානය කිරීමක් සිදුවී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වසර ගණනාවක කාලය තුළ නොයෙකුත් හේතු කාරණා ඉදිරිපත් කරමින්, එම අයදුම්පත් සම්බන්ධයෙන් කල්මැරීමේ ප්‍රවණතාවක් තිබෙන හෙයින්, මේ සම්බන්ධයෙන් සොයා බලා සාලි මහතාට හිමි වන්දි මුදල නොපමාව ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்து சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம், கற்பிட்டி, சின்னக்குடியிருப்பு, ஆனவாசர் வீதி எனும் முகவரியில் வசிக்கின்ற திரு. எம்.எச்.எம். சாலிக்கு உரித்தான கற்பிட்டி, பஸார் வீதியில் அமைந்துள்ள, "மௌலானா ரெக்ஸ்ரைல்ஸ்" வியாபார நிறுவனம் 2002.02.21 ஆம் திகதி குண்டர்களினால் தீயிட்டுக் கொழுத்தி அழிக்கப்பட்டது என்பதையும்;

(ii) வியாபாரத்தை இழந்து அநாதரவான நிலைக்கு ஆளாகியுள்ள திரு. சாலியினால் ஆட்கள், ஆதனங்கள் மற்றும் கைத்தொழில்களை புனரமைக்கும் அதிகாரசபைக்கு, நட்டஈட்டை எதிர்பார்த்து REP/PV/APP/2002ஆம் இலக்கத்தின் கீழ் விண்ணப்பப்படிவமொன்று சமர்ப்பிக்கப்பட்ட போதிலும், இவருக்கு இதுவரை நட்டஈடு வழங்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(அ) பல வருட காலமாக பல்வேறு காரணங்களைச் சமர்ப்பித்து, மேற்படி விண்ணப்பம் தொடர்பாக காலத்தைக் கடத்தும் போக்கு காணப்படுவதன் காரணமாக, இது தொடர்பாக ஆராய்ந்து திரு. சாலிக்கு உரித்தான நட்டஈட்டுத் தொகையை தாமதிக்காது பெற்றுக் கொடுக்க அவர் நடவடிக்கை மேற் கொள்வாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Prisons Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs:

(a) Is he aware -

(i) that the commercial establishment "Maulana Textiles" located in Bazaar Street, Kalpitiya, owned by M.H.M. Sali of Anawasar Street, Sinnakudiyiruppu, Kalpitiya, Puttlam was destroyed on 21.02.2002 by a mob of thugs by setting fire; and

(ii) that even though an application, bearing No. REP/PV/App/2002 was forwarded by Mr. Sali who has been rendered helpless having lost the business, to the Rehabilitation of Persons, Property and Industries Authority, expecting compensation, no compensation has been granted to him until now?

(b) Will he inform this House whether measures will be taken to provide his compensation without delay looking into this matter, since there is a tendency to pass time on aforesaid application for years, giving various excuses?

(c) If not, why?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)
(The Hon. D.M. Swaminathan - Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs)
Hon. Deputy Speaker, I answer Question No. 9.

(a) (i) I am aware.

[ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා]

(ii) Concerned to compensation on political violence, Cabinet approval has been granted only to compensate election violence occurred at the elections held from year 1977 to 2001.

Therefore, no authority has been entrusted to compensate for election violence occurred at the elections held after year 2001.

(b) The above answer for a (ii) is applicable. Further, due to special reasons, a President Committee was appointed through President's Office in order to investigate incidents occurred during the time period of General Election 2001, 2004 and Presidential Election 2005. Accordingly, Mr. M.H.M. Sali was informed about and communicated to forward his compensation request of his destroyed property to the President's Office.

(c) Does not arise.

ඌව පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ විදේශ සංචාර : රජයේ වියදම්

ஊவா மாகாண சபை உறுப்பினர்களின் வெளிநாட்டுச் சுற்றுலா :அரச செலவு

FOREIGN TOURS OF MEMBERS OF UVA PROVINCIAL COUNCIL: PUBLIC EXPENDITURE

580/'16

10. ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 වසරේ ඌව පළාත් සභාවේ මන්ත්‍රීවරු රජයේ වියදමින් විදේශ සංචාරයක් සඳහා සහභාගි වී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ජනාධිපතිවරයා අනුමතිය ලබාදී තිබේද;

(iii) ඒ සඳහා වැයකර ඇති මුළු මුදල කොපමණද;

(iv) මෙම චාරිකාවේ අරමුණ කවරේද;

(v) පළාත් සභා මන්ත්‍රීවරුන්ට අමතරව, වෙනත් පුද්ගලයින් පළාත් සභාවේ වියදමින් මෙම විදේශ සංචාරය සඳහා සහභාගි වී තිබේද;

(vi) එසේ නම්, එම පුද්ගලයින්ගේ නම් හා තනතුරු කවරේද;

(vii) පවතින නීති රීති අනුව රජයේ වියදමින් එම පුද්ගලයින්ට සහභාගි විය හැකිද;

(viii) රජයේ සේවයෙන් නිවාඩු ලබාගෙන සම්බන්ධීකරණ ලේකම් ලෙස කටයුතු කරන පුද්ගලයෙකුට රජයේ වියදමින් විදේශ ගමන් සඳහා සහභාගි විය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மாகாணசபைகள், உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016ஆம் ஆண்டில் ஊவா மாகாண சபை உறுப்பினர்கள் அரச செலவில் வெளிநாட்டுச் சுற்றுலாவொன்றில் பங்கு கொண்டார்களா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கு சனாதிபதி அங்கீகாரம் வழங்கியிருந்தாரா என்பதையும்;

(iii) அதற்கென செலவிடப்பட்ட மொத்த பணத் தொகை எவ்வளவென்பதையும்;

(iv) மேற்படி சுற்றுலாவின் நோக்கம் யாதென் பதையும்;

(v) மாகாண சபை உறுப்பினர்களுக்கு மேலதிகமாக, வேறு ஆட்கள் மாகாண சபையின் செலவில் மேற்படி சுற்றுலாவில் பங்கு கொண்டார்களா என்பதையும்;

(vi) ஆமெனில், மேற்படி ஆட்களின் பெயர்கள் மற்றும் பதவிகள் யாவை என்பதையும்;

(vii) காணப்படுகின்ற சட்ட திட்டங்களுக்கமைய அரச செலவில் மேற்படி ஆட்களுக்கு பங்குபற்ற முடியுமா என்பதையும்;

(viii) அரச சேவையிலிருந்து லீவு பெற்றுக்கொண்டு இணைப்புச் செயலாளராக பணியாற்றும் ஆளொருவருக்கு அரச செலவில் வெளிநாட்டு பயணங்களில் பங்குபெற முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether Members of the Uva Provincial Council took part in a foreign tour in the year 2016 using public funds;

(ii) if so, whether the approval of the President has been granted for the aforesaid tour;

(iii) the total amount of money that was spent on that tour;

(iv) the objective of that tour;

(v) whether any person other than the Members of the Provincial Council took part in that tour spending the funds of the Provincial Council;

(vi) if so, of the names and designations of such persons;

(vii) whether such persons are permitted to take part in a foreign tour using public funds in terms of the laws and rules currently in effect; and

(viii) whether a public servant who has obtained leave from public service and is acting as a Coordinating Secretary is permitted to take part in a foreign tour spending public funds?

(b) If not, why?

ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

2016 වර්ෂයේ උෂව පළාත් සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා කණ්ඩායමක් තායිලන්තයේ හා ඉන්දුනීසියාවේ විදේශ සංචාරයක් සඳහා සහභාගි වී ඇත. 2015 වර්ෂයේදී පැවැත්වීමට නියමිතව තිබූ මෙම විදේශ අධ්‍යයන වැඩසටහන සඳහා අවශ්‍ය පාඨමාලා ගාස්තු එම වැඩසටහන සංවිධානය කරන ලද තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයට ගෙවා ඇත්තේ 2014 වර්ෂයේදී වන අතර, 2015 වර්ෂයේ දී මෙම විදේශ පුහුණු වැඩසටහන පැවැත්වීමට නොහැකිව ඇත්තේ ජනාධිපති ලේකම් විසින් පළාත් සභා ගරු මන්ත්‍රීවරුන්ගේ විදේශ සංචාර අත්හිටවූ බැවිනි. එහෙත් මෙම විදේශ අධ්‍යයන වැඩසටහන සඳහා ඒ වන විටත් පාඨමාලා ගාස්තු ගෙවා තිබූ බැවින් ජනාධිපති ලේකම් වෙත ඒ පිළිබඳ කරුණු දක්වන ලදුව අදාළ විදේශ අධ්‍යයන චාරිකාව ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී ඇත.

එකී අනුමැතිය ප්‍රකාරව මෙම විදේශ අධ්‍යයන චාරිකාව අදියර දෙකකින් ක්‍රියාත්මක කරන ලද අතර, එහි පළමු කණ්ඩායම 2015 වර්ෂයේදීත් දෙවන කණ්ඩායම 2016 ජනවාරි මාසයේදීත් විදේශගත වී ඇත.

(ii) ඔව්.

ඉහත සංචාරය සඳහා ජනාධිපති ලේකම්ගේ අංක සීඑස්ඒ/1/8/1/1 හා 2015.12.14 දිනැති ලිපියෙන් අනුමැතිය ලබාදී ඇත. ඇමුණුම 01 - **සභාගත*** කරමි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, එම ලිපියේ දිනය කවදාද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු මන්ත්‍රීතුමනි, මම එම ලිපිය සභාගත කළා. එහි දිනය 2015.12.14.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පිළිතුරු දීලා අවසන් වුණාට පසුව එතුමාට පුළුවන් අතුරු ප්‍රශ්න අහන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, ගරු නියෝජ්‍ය කථානායකතුමා ඉක්මන් කළ නිසා මම මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය දැන් අහන්නම්.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්න. මම පිළිතුරේ ඉතිරි කොටස සභාගත කරන්නම්. ඔබතුමා මහ ඇමතිතුමාට විශාල ආදරයක් තිබෙනවා නේ. හැම දාම උෂව මහ ඇමතිතුමා ගැන නේ ප්‍රශ්න අහන්නේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඒක නේ, වෙනසක් වුණේ.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිළිතුරේ ඉතිරි කොටස මා **සභාගත**** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුරෙහි ඉතිරි කොටස:
சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி:
***Rest of the Answer tabled:**

(iii) මේ සඳහා පාඨමාලා ගාස්තු ලෙස එක් අයෙකුට ඇමෙරිකන් ඩොලර් 1,828ක් වැය වී ඇත. ඒ අනුව 2016 වර්ෂයේ විදේශගත වූ 21දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම සඳහා පාඨමාලා ගාස්තු ලෙස ඇමෙරිකන් ඩොලර් 38,388ක් වැය කර ඇත. අනිකුත් සියලු වියදම් සඳහා රුපියල් 13,346,724.42ක මුදලක් වැය කොට ඇත.

(iv) රාජ්‍ය අංශයේ යහ පාලනය හා නායකත්වය උදෙසා ධාරිතා සංවර්ධනය කිරීම.

(v) ඔව්.

(vi) ඉහත (i)හි සඳහන් කර ඇති පරිදි 2015 වර්ෂයේ විදේශ අධ්‍යයන වැඩසටහන් අනුව විදේශගත වීමට නියමිතව සිටි දෙවන කණ්ඩායම 2016 වර්ෂයේදී විදේශගතව ඇති අතර ඒ අතුරින් පළාත් සභා මන්ත්‍රීවරුන්ට අමතරව සභාගී වූ පළාත් සභාවේ නිලධාරීන් පහත පරිදි වේ.

- ඩබ්ලිව්.එම්.එම්.ජී. අබේසිංහ බණ්ඩා මහතා එවකට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
- එස්.ඩබ්ලිව්. ලයරත්න මහතා - සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), පළාත් මාර්ග අමාත්‍යාංශය
- වසන්ත රංජිත් බණ්ඩාර මහතාm - සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
- අජිත් දිසානායක මහතා - පළාත් කර්මාන්ත අධ්‍යක්ෂ
- ඩී.එම්. සමරසේකර මහතා - සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), පළාත් මාර්ග අමාත්‍යාංශය
- ජී.ඒ. ආනන්දසිරි මහතා - නිසි බලධාරී, මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය
- ජී.වයි.ආර්. පුෂ්පකුමාර මහතා - කළමනාකරු, උෂව ප්‍රජා ගුවන් විදුලිය

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ෆයිසර් මුස්තාපා මහතා]

- සුමතිපාල ලියනාරච්චි මහතා - ඌව පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ ලේකම්
- අජිත් උපුල් රණවීර මහතා - ඌව පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ උපදේශක

(vii) මෙම විදේශ සංචාරය සඳහා ඌව පළාත් ප්‍රධාන ලේකම් ඇමතූ ජනාධිපති ලේකම්ගේ අංක සීඑස්ඒ/1/8/1/1 හා 2015.12.14 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලැබී ඇති අතර ජනාධිපති ලේකම්ගේ අංක සීඑස්/1/1/16 හා 2012.06.11 දිනැති ලිපියෙන්ද ඊට අදාළ උපදෙස් නිකුත් කර ඇත. ඇමුණුම 02* බලන්න.

(viii) රජයේ සේවයෙන් නිවාඩු ලබාගෙන සම්බන්ධීකරණ ලේකම් ලෙස කටයුතු කරන පුද්ගලයෙකු මෙම විදේශ සංචාර සඳහා සහභාගි වී නොමැත.

(ආ) අදාළ නොවේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපති කාර්යාලයෙන් 2015 දෙසැම්බර් මාසයේ 14වැනි දින නිකුත් කළ මේ විදේශ සංචාරය සඳහා අවසර දී තිබෙන ලිපිය තිබෙනවාය කියන කාරණය මෙතුමා කිව්වා.

ඒ වාරිකාව සම්බන්ධව ජනාධිපති ලේකම් කාර්යාලය 2015 දෙසැම්බර් මස 22වන දින නිකුත් කරපු ලිපිය මා සතුව තිබෙනවා. මේ ගරු සභාවේ දැනගැනීම පිණිස එය කියවීමට මම ඔබතුමාගේ අවසර ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
ලියුම කියවන්න අවශ්‍ය නැහැ. ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
මෙම ලිපියේ සඳහන් කරන්නේ, ඒ විදේශ සංචාරය සඳහා කිසිසේත් අවසර නැහැ කියන කාරණයයි. යන්න අවසරයක් දීලා නැහැ. ජනාධිපතිතුමා විසින් ඒ විදේශ ගමන අත් හිටුවන ලද - යන්න එපා කියා සඳහන්- ලිපිය මම **සභාගත*** කරනවා.

එසේ අත් හිටුවා තිබියදීත් එතුමාගේ නියෝගය නොතකා රුපියල් මිලියන 220ක් වෙන් කරලා-

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(*மாண்புமிகு பைசர் முஸ்தபா*)
(The Hon. Faiszer Musthapha)
මම එය ප්‍රතික්ෂේප කරනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ඊට අදාළ කරුණු අප පසුව සඳහන් කරන්නම්.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(*மாண்புமிகு பைசர் முஸ்தபா*)
(The Hon. Faiszer Musthapha)
අවශ්‍ය සියලු අනුමැතීන් ලබා තමයි ගිහින් තිබෙන්නේ. රුපියල් මිලියන 200න් රුපියල් මිලියන 13ක් තමයි ඊට අදාළ වියදම වන්නේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඔය ලේඛනය සභාගත කරන්න**.** ඒ අනුව මම ඊළඟ ප්‍රශ්නය අහන්නම් ඊළඟ දවසේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ සංචාර සඳහා සභා අරමුදලින් වියදම් කරලා සභාවේ මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් කැටුව යෑමේ හැකියාව තිබෙනවා. නමුත්, මා මේ නම් සඳහන් කරන තුන්දෙනා රාජ්‍ය නිලධාරීන් නොවෙයි. ජී.එම්. ආනන්දසිරි මැතිතුමා, විශ්‍රාමික නිලධාරියෙක්. උපුල් රණවීර මහ ඇමතිවරයාගේ උපදේශකයකු ලෙස පත් කර තිබෙනවා. ඔහු උපදේශකවරයෙක් නොවෙයි. ඔහු, මහ ඇමතිවරයා කොළඹ ප්‍රදේශයට ආවාම, එතුමාගේ සුඛ විහරණය සඳහා ඔහුගේ නිවස ලබා දෙන පුද්ගලයායි.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(*மாண்புமிகு பைசர் முஸ்தபா*)
(The Hon. Faiszer Musthapha)
ඒ ඔබතුමාගේ මතය.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ජී.වයි.ඒ. පුෂ්පකුමාර මැතිතුමා කියන්නේ, පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයෙක්. මගේ ප්‍රශ්නය මේකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
Order, please! ඔබතුමා පොඩ්ඩක් ඇහුම් කන් දෙන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
නිලධාරීන් හැටියට පත් කර යවා තිබෙන මේ කියපු තුන්දෙනා රාජ්‍ය නිලධාරීන් නොවෙයි.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(*மாண்புமிகு பைசர் முஸ்தபா*)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමා, දේශන පවත්වන්න එපා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පොඩ්ඩක් ඉන්න, ගරු ඇමතිතුමා. ප්‍රශ්නයට එන්න ඕනෑ. දැන් ගරු මන්ත්‍රීවරු ඇහුවා,-

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ඔබතුමා මහ ඇමතිතුමාට පුදුම ආදරයක් තමයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට අසාධාරණයක් කරන්න එපා. නවක මන්ත්‍රීවරුන් හැටියට අපි දැක්කා,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු මන්ත්‍රීවරයකු අසන ප්‍රශ්නයකට ගරු ඇමතිතුමා පිළිතුරු දුන්නාම ඒ පිළිතුර ප්‍රකාරව එතුමාට ප්‍රශ්නයක් අසන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. එතැනින් එහාට ගිහින් ප්‍රශ්න ව්‍යාප්ත කරන්න ගියොත් මේ ප්‍රශ්න අසා අවසන් කරන්න දවසක් යාවි. ඔබතුමාගේ ප්‍රශ්නය පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමා. දැන් තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මා ප්‍රශ්නය අසා අවසන් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා දේශනයක් කරනවා නේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මා දේශනයක් නොවෙයි කරන්නේ. මම කෙටියෙන් අවසන් කරනවා.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ඔබතුමා ප්‍රශ්නයක් අහනවා නොවෙයි, දේශනයක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය පැහැදිලියි. ඇමතිතුමනි, ඒකට උත්තරයක් දෙන්න.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඌව පළාතේ මහ ඇමතිතුමා ගැන ලොකු ආදරයක් තිබෙනවා වාගෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමනි, දෙවන අතුරු ප්‍රශ්නයට පිළිතුර දෙන්න.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
අදාළ සියලු අනුමැතීන් ලබා තමයි ගොස් තිබෙන්නේ. කිසිදු නීත්‍යානුකූල නොවන ආකාරයකට කටයුතු කර නැහැ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමා නඟන point of Order එක? [බාධා කිරීම්]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු චමින්ද මන්ත්‍රීතුමා පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීවරයකුට අයිතියක් තිබෙනවා ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න. ඇමතිතුමා ඒ ප්‍රශ්නයට පිළිතුර දෙන්න පෙරාතුව තමන්ගේ පෞද්ගලික මති මතාන්තර මේ ගරු සභාවට ගෙනැල්ලා ඇමතිවරයාත්, මේ ගරු සභාවත් හැල්ලුවට ලක් කරමින් අපේ කාලය කා දමන්න මේ ගරු මන්ත්‍රීතුමාට ඉඩ දෙන්න එපා කියා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තමුන්නාන්සේගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු මන්ත්‍රීතුමා, මෙය වැදගත් ප්‍රශ්නයක්. ඔබතුමන්ලා ඌවට එන්නේ ඇයි? ඔබතුමන්ලා ඊයේ-පෙරේදා ඌවට ආවේ ඇයි? ඒ මහ ඇමති නිසා තමයි ඔබතුමන්ලා ඌවෙන් පටන්ගන්න හදන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එතුමාගේ ප්‍රශ්නයටත් උත්තරයක් දෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමාගෙන් අහන මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු අමාත්‍යතුමනි. ඒ මහ ඇමතිවරයා ඒ කියපු සියලු දේවල් කරලා තිබෙනවා, තවත් මහා මගෝඩි වැඩ කරලා තිබෙනවා. අපි ඔබතුමාගේ අමාත්‍යාංශයට මේ ප්‍රශ්න ලිඛිතව යවලා ඉල්ලා සිටියා, මේවා විසඳා දෙන්න කියා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියලු, හොරකම්, මැරකම් එතුමා වසාගත්තේ කොහොමද? ඒ, සීනිගම දේවාලයට ගිහින් මිරිස් අඹරලායි. එහෙම ගිහින් පොල් ගහන්න අපට බැහැ. එහෙම ගිහින් මිරිස් අඹරන්න අපට බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය පැහැදිලියි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, ඒ නිසා අප ඔබතුමාගෙන් අහන්නේ, ඒ සියලු වංචා දූෂණ ආදිය සියල්ල අප සොයා දුන්නාම ඔබතුමා ඒවා සම්බන්ධයෙන් කොහොමද කටයුතු කරන්නේ කියලායි.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Hon. Deputy Speaker, he cannot use this opportunity to slander the Chief Minister on irregularities which is not part of the Question. He has to withdraw that. He is asking a Supplementary Question and making a slanderous statement against the Chief Minister. So, Hon. Deputy Speaker, I respectfully request you to expunge that. The Hon. Member does not have the Privilege to slander a Chief Minister by asking Supplementary Questions, because the Chief Minister does not have the right to reply. I answered all the Questions that has asked and he cannot say that the Chief Minister is involved in corruption.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කාරණය පැහැදිලියි. ඔබතුමාගේ ප්‍රශ්නයත් පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමා. අපි ඊළඟ ප්‍රශ්නයට යමු.

ප්‍රශ්න අංක 11-594/'16-(1), ගරු ලකී ජයවර්ධන මහතා.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 12-606/'16 - (1), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 14-617/'16 - (1), ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Hon.Deputy Speaker, I ask that Question.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Hon. Deputy Speaker, I ask for four weeks' time to answer the Question, so that I can give him a comprehensive Answer.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවන වටය.

නිවාස ණය වැඩසටහන: විස්තර
வீடமைப்புக் கடன் நிகழ்ச்சித்திட்டம் : விபரம்
HOUSING LOAN SCHEME : DETAILS

441/'16

3. ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් රුපියල් 50,000/= සහ රු. 100,000/= බැගින් වන නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) 2015 වර්ෂය සඳහා එම නිවාස ණය ලබාදුන් ණයලාභීන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අදාළ ණයලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ණය ලබාදීමේදී සලකා බලනු ලබන නිර්ණායක කවරේද;

(v) ණය ලබාදීම සඳහා දේශපාලන පක්ෂ ශාඛා සමිතියක නිර්දේශය ඉල්ලා සිටින බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையின் மூலம் ரூபாய் 50,000/- மற்றும் ரூபாய் 100,000/- வீதம் வழங்கும் வீடமைப்புக் கடன் நிகழ்ச்சித்திட்டம் ஒன்று நடைமுறைப்படுத்தப்படுகின்றதா என்பதையும்;

(ii) 2015ஆம் ஆண்டுக்காக மேற்படி வீடமைப்புக் கடன் வழங்கப்பட்ட கடன் பெறுனர்களின் எண்ணிக்கை, ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவு மட்டத்தில் தனித்தனியாக யாதென்பதையும்;

(iii) சம்பந்தப்பட்ட கடன் பெறுனர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவையென்பதையும்;

(iv) கடன் வழங்கப்படும்போது பரிசீலனைக்குட் படுத்தப்படும் அளவுகோல்கள் யாவை யென்பதையும்;

(v) கடன் வழங்குவதற்காக அரசியல் கட்சிக் கிளைச் சங்கத்தின் சிபாரிசு வேண்டப்படுகின்ற தென்பதை அறிவாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing and Construction:

(a) Will he inform this House-

(i) whether a Housing Loan Scheme of Rs. 50,000 and Rs. 100,000 is implemented by the National Housing Development Authority;

(ii) the number of recipients in each Divisional Secretary's Division who have received that housing loan in 2015;

(iii) the names and addresses of those recipients;

(iv) the criteria considered in the disbursement of the loan; and

(v) whether he is aware of the fact that recommendation of a branch union of a political party is required to consider the loan?

(b) If not, why?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Housing and Construction)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. නිවාස අලුත්වැඩියා කර ගැනීම සඳහා රුපියල් 50,000 සිට රුපියල් 75,000 දක්වා වන ණය මුදලක් ද නව නිවසක් ඉදිකර ගැනීම සඳහා රුපියල් 100,000 ණය මුදලක්ද සියයට 3.732ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ ලබාදී ඇත.

(ii) ඇමුණුමෙහි ඇත. එම ඇමුණුම* ඉදිරිපත් කරනවා.

(iii) දිවයින පුරා 2015 වර්ෂය සඳහා ණය ලබාදී ඇති නාම ලේඛනය මේ සමඟ අමුණා ඇත.

(iv) 2015 ණය වැඩසටහනේ අත්වැල* මේ සමඟ අමුණා ඇති අතර අදාළ නිර්ණායක එහි අන්තර්ගත වේ.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගලේවෙල - තෝනිගල මාර්ගය : ප්‍රතිසංස්කරණය කිරීම

கலேவெல - தோணிகல வீதி: மறுசீரமைத்தல்

GALEWELA-THONIGALA ROAD: RECONSTRUCTION

614/'16

13.ගරු ලකී ජයවර්ධන මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)

(மாண்புமிகு லக்கி ஜயவர்தன - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)

(The Hon. Lucky Jayawardana on behalf of the Hon. Ishak Rahuman)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ - අනුරාධපුර ප්‍රධාන මාර්ගයේ, ගලේවෙල නගරයෙන් වමට හැරී, කලාවැව වැව් බැම්ම හරහා, ඉහළගම හන්දිය පසුකර, තෝනිගල හන්දියෙන් A-9 ප්‍රධාන පාරට සම්බන්ධ වන මාර්ගය අවුරුදු 50කින් ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්;

(ii) මෙම මාර්ගය ඔස්සේ, ගලේවෙල සිට A-9 මාර්ගයට සම්බන්ධ වීමෙන් යාපනය සහ වවුනියාව යන නගරවලට පහසුවෙන් ළඟා විය හැකි බවත්,

(iii) එමඟින් ආර්ථික වාසි මෙන්ම, ප්‍රධාන මාර්ගයේ වාහන තදබදයද අවම වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මහවැලි ප්‍රදේශයේ ජනතාවට පහසුකම් සැලසෙන කි.මී. 46ක් වන මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතුව කවරේද;

(ii) එම මාර්ගය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසු ගිය රජයෙන් ප්‍රතිසංස්කරණය ආරම්භ කර මේ වනවිට වැඩ නවතා ඇති කැකිරාව නගරයේ සිට ගනේවල්පොල දක්වා වූ කි.මී. 07ක මාර්ගයෙහි වැඩ කටයුතු නැවත ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு - அனுராதபுரம் பிரதான வீதியில், கலேவெல நகரத்திலிருந்து இடதுபுறம் திரும்பி, கலாவெவ குளக்கட்டினூடாக, இஹலகம சந்தியைத் தாண்டி, தோணிகல சந்தியில் A-9 பிரதான வீதியுடன் தொடர்புபடும் வீதி, 50 வருடங்களாக மறுசீரமைக்கப்படவில்லை என்பதையும்;

(ii) இவ்வீதியினூடாக, கலேவெலயிலிருந்து A-9 வீதியினூடாக யாழ்ப்பாணம், வவுனியா ஆகிய நகரங்களை எளிதாகச் சென்றடையலாம் என்பதையும்;

(iii) இதன்மூலம் பொருளாதார நன்மைகள் கிடைப்பதுடன், பிரதான வீதியில் வாகன நெருக்கடியும் குறைவடையுமென்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) மகாவலி பிரதேச மக்களுக்கு வசதி ஏற்படுத்தும் 46 கி.மீ. கொண்ட இவ்வீதி புனரமைக்கப் படாமைக்கான காரணம் யாது;

(ii) இவ்வீதியை துரிதமாக புனரமைக்க நடவடிக்கை மேற்கொள்வாரா;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) கடந்த அரசாங்கத்தினால் புனரமைப்புப் பணிகள் ஆரம்பிக்கப்பட்டு தற்போது வேலைகள் நிறுத்தப்பட்டுள்ள கெக்கிராவ நகரத்திலிருந்து கனேவல்பொல வரையான 07 கி.மீ. வீதியின் பணிகளை மீண்டும் ஆரம்பிப்பாரா;

(ii) ஆமெனில் அத்திகதி யாது;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he admit that-

(i) the Galewela-Thonigala Road, which turns left from the Colombo-Anuradhapura main road at Galewela, runs via the embankment of the Kalaweva Tank, passes the Ihalagama Junction and links with the A-9 Road at Thonigala Junction, has not been reconstructed for fifty years;

(ii) it is possible to reach cities of Jaffna and Vavuniya easily by travelling from Galewela through this road and entering A-9 Road; and

(iii) this will bring economic benefits while minimizing vehicular traffic congestion on the main route?

(b) Will he inform this House -

(i) the reasons for not reconstructing this 46-km road, which facilitates people of Mahaweli area; and

(ii) whether steps will be taken to reconstruct that road expeditiously?

(c) Will he also inform this House-

(i) whether reconstruction work pertaining to the 7-km stretch of road from the Kekirawa town to Ganewalpola, which was commenced by the previous regime and has been stopped now, will be resumed; and

(ii) if so, on which date?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I **table*** the Answer.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මෙම මාර්ගයේ කිලෝමීටර 13 සිට කිලෝමීටර 33 දක්වා වූ කොටස 2005 වර්ෂයේදී ගල් අතුරා තාර දමා ප්‍රතිසංස්කරණය කර ඇති අතර, දැනට මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් මෙම මාර්ගයේ නඩත්තු කටයුතු සිදු කරමින් පවතී.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) (i) ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරනු ඇත.

(ii) ඔව්. 2017 සිට ඉදිරි වර්ෂවලදී දේශීය අරමුදල් මඟින් -GOSL- මාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ -Widening and Improvement- වැඩසටහන් යටතේ අදියර වශයෙන් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු යොදා ඇත.

(ඇ) (i) ඔව්. දේශීය අරමුදල් මඟින් -GOSL- මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ 2017 වසර තුළදී ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු යොදා ඇත.

(ii) දැනට දිනයක් ප්‍රකාශ කළ නොහැකිය.

(ඈ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE
I

වතු කම්කරුවන් මුහුණ දෙන ප්‍රශ්න
தோட்டத்தொழிலாளர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்
PROBLEMS FACED BY PLANTATION WORKERS

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් මා මේ ප්‍රශ්නය අහනවා.

ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තයේ සේවය කරන කම්කරු ජනතාව ලක්ෂ දෙකහමාරක් පමණ වේ. ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන තේ, පොල් හා රබර් කර්මාන්තයේ මෙම සේවකයන් ඉටු කරන දායකත්වය අති වැදගත් වේ. ඒ වාගේම මෙම සේවකයන්ගේ ශ්‍රමය, ශක්තිය හා දායකත්වයට ලබාදෙන වැටුප් ආදායම සාධාරණ නොවන බව පිළිගත යුතුව ඇත. එහෙයින් වැටුප් වැඩි කිරීමට හා ආදායම් වැඩිකොට හොඳ ජීවන තත්ත්වයක් ලබා දීමට එම ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති හා වැඩ කරන ජනතාවගේ ඉල්ලීම් ලබා දීමට රජය බැඳී සිටී. මෙම වැවිලි ක්ෂේත්‍රයේ පෞද්ගලික සමාගම්, රජයට අයත් වතු පාලනය භාර දී ඇති සමාගම්, ජනවසම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම ආදිය හා රාජ්‍ය ආයතන ද වේ.

01. ගරු ඇමතිතුමනි, ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ඇමතිතුමා විසින් පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්නා ලද -අනුමැතිය ලබා ගත්- රුපියල් 2,500ක අවම වැටුප් වැඩිවීම මෙම සේවක මහතුන්ට ලැබී නොමැති හෙයින් එය ලබා දෙන්නේ කවදාද?

02. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයද පිළිගන්නා වතු සමාගම් සේවක වෘත්තීය සමිති හා වැටුප් වැඩි කිරීමට සාමූහික ගිවිසුම් මඟින් කරන ලද සාකච්ඡා - විශේෂයෙන් 2015 අප්‍රේල් මාසයෙන් පස්සේ අවුරුදු එකහමාරක් ගත වෙලා, the Collective Agreements have come to an end. -සාර්ථකව නිම කර, සේවක වැටුප් වැඩි කිරීමට ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ඇමතිතුමා හා අමාත්‍යාංශය කටයුතු කිරීමට වහා පියවර ගන්නවාද?

03. එම ක්ෂේත්‍රයේ සාමාන්‍ය කම්කරුවන්ගේ වැටුප මෙන් සිය ගුණයක් වැඩියෙන් සුමාගම්වල නිලධාරීන් වැටුප් ලබද්දී වතු කම්කරුවන් ඉල්ලන සාධාරණ වැටුප් වැඩි කිරීම ලබා නොදෙන්නේ මන්ද?

04. කම්කරු නීතිය යටතේ ප්‍රකාශිත අයිතිවාසිකම්වලට අනුකූලව සේවයේ යෙදෙන කාන්තා සේවිකාවන්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම ක්‍රියාත්මක නොකෙරෙන ආයතන ඇති හෙයින් ඒ සම්බන්ධව ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ඇමතිතුමා මැදිහත් වී කටයුතු කිරීමට පියවර ගන්නවාද?

05. මෙම ක්ෂේත්‍රය හා අනෙකුත් ක්ෂේත්‍රයට ද බලපාන කම්කරු විනිශ්චය සභාවන්හි විභාග වන නඩු සඳහා 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 46වන වගන්තිය සලසා ඇති ප්‍රතිපාදනයන්ට අනුව, පාර්ශ්වකරුවන්ගේ බලය පැවරීමේ ලිපි මත පෙනී සිටින නියෝජිතයන් හට එසේ පෙනී සිටීමට කම්කරු විනිශ්චය සභාවන්හි ගරු සභාපති අතිරේක මහෙස්ත්‍රාත්තුමන්ලා/ තුමියන්ලා විසින් අවසර නොදීමේ අර්බුදකාරී තත්ත්වයක් මතුවී ඇති බව එතුමා පිළිගන්නේ ද?

එය ප්‍රකාරව විසඳීමට වහා පියවර ගන්නේ ද?

ඒ ප්‍රධාන කාරණා මම ඉදිරිපත් කරන්නේ, මිලියනයක් පමණ වන වතු කම්කරු සේවකයන් හා ඔවුන්ගේ පවුල් ජීවත් වෙන්නේ මේ වැටුපෙන් නිසා. මේ සම්බන්ධව එක උදාහරණයයි මම ගරු ඇමතිතුමාට දුන්නේ. සාමාන්‍ය වතු කම්කරුවෙක් ලබා ගන්නා වැටුප මෙන් සිය ගුණයක්, මේ කොම්පැනිවල ලොකු මහත්වරු වැටුප් වශයෙන් ලබනවා. ඉතින්, සල්ලි නැහැ කියන්නේ කොහොමද? එක පැත්තකින් සාමූහික ගිවිසුමක් තිබෙනවා. අනෙක් පැත්තෙන්, ගරු ඇමතිතුමා පාර්ලිමේන්තුවේ නීතියක් සම්මත කර පොරොන්දු වුණු රුපියල් 2,500 දීමනාව. ඒ නිසා, මෙම ප්‍රශ්නවලට ගරු ඇමතිතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Labour and Trade Unions Relations)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 23(2) යටතේ ඇසූ ප්‍රශ්නයෙන් කරුණු තුනක් පැන නැඟුණා. ඒ කරුණු තුනටම වෙන වෙනම පිළිතුරු ලබා දෙන්නට මම බලාපොරොත්තු වෙනවා.

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

2016 අංක 4 දරන අය වැය සහන දීමනා පනත යටතේ මාසිකව දිය යුතු රුපියල් 2,500 වැටුප් වැඩි වීම වැවිලි ක්ෂේත්‍රයේ පෞද්ගලික සමාගම් සමහරක් තවමත් ලබා දී නැති බව කම්කරු ඇමතිවරයා වශයෙන් මා වෙතද වාර්තා වී ඇත.

මේ සම්බන්ධව ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ආර්ථික කටයුතු කළමනාකරණ කමිටුව මඟින්ද සාකච්ඡා කළ අතර, ප්‍රාදේශීය වැවිලි සමාගම් අතර ද කිහිපවිටක් සාකච්ඡා කරන ලදී. ඒ අනුව වතු ක්ෂේත්‍රයට තම නිෂ්පාදනයන් සඳහා ලැබෙන මිල පහළ යෑම නිසා මුහුණ දීමට ඇති දුෂ්කරතාවන් පිළිගෙන, බැංකුව හරහා ණයක් වශයෙන් මූල්‍ය පහසුකම් සලසා, පළමු මාස දෙකෙහි ලැබිය යුතු රුපියල් 2,500 බැගින් වූ පඩි වැඩිවීම් ප්‍රමාණය වහාම ලබා දීමට පියවර ගෙන ඇත. ඉන්පසු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේද සහභාගිත්වය ඇතිව, දෙපාර්ශ්වය අතර සාමූහික ගිවිසුමක් අත්සන් කිරීමට කඩිනමින් පියවර ගැනීමට බලාපොරොත්තු වේ.

වතු සමාගම් හා සේවක වෘත්තීය සමිති අතර සාකච්ඡා සාර්ථකව නිම කර එකඟතාවකට පැමිණීමෙන් පසුව, සාමූහික ගිවිසුමක් අත්සන් කිරීම සිදු කළ යුතුව ඇත. මේ සඳහා කම්කරු අමාත්‍යාංශය හැකි සෑම අයුරකින්ම දිරිගැන්වීමෙන් කටයුතු කරන බව කිව යුතුව ඇත.

කාන්තා සේවිකාවන්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් විමසිලිමත්ව සිටින අතර, වැඩබිමක් හෝ කර්මාන්තශාලාවක් පරීක්ෂා කරන සෑම අවස්ථාවකදීම මේ අංශ සම්බන්ධයෙන් වැඩි අවධානයක් දැක්වීම ප්‍රතිපත්තියක් කර ගන්නා ලෙසට අප නිලධාරීන්ට නිරන්තරයෙන් උපදෙස් දෙනු ලැබේ. මේ පිළිබඳව යම් පැමිණිල්ලක් තිබේ නම්, වහාම කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අවධානයට ලක් කරන්නේ නම් අගය කරමි.

කම්කරු විනිශ්චය සභාවල පාර්ශ්වකරුවන්ට තම නියෝජිතයෙකු මඟින් කරුණු ඉදිරිපත් කිරීමට නොහැකිවීම ගැන කථා කරන විට, කම්කරු විනිශ්චය සභා ගරු සභාපතිවරු, නැතහොත් අතිරේක මහෙස්ත්‍රාත්වරු විසින් පාර්ශ්වකරුවන්ගේ බලය පැවරීමේ ලිපි මත, එම නියෝජිතයන් හට එසේ පෙනී සිටීමට කම්කරු විනිශ්චය සභාවන්හි සමහර ගරු සභාපතිවරු, නැතහොත් අතිරේක මහෙස්ත්‍රාත්වරු විසින් අවසර නොදීමේ අර්බුදකාරී තත්ත්වයක් මතුවී ඇති බව, කම්කරු ඇමතිවරයා වශයෙන් මටද වාර්තා වී ඇත. පාර්ශ්වකරුවන්ගේ බලය පැවරීමේ ලිපි මත නියෝජිතයින් හට පෙනී සිටීමට මෑතක් වන තෙක් ප්‍රශ්නයක් පැන නැඟී නොතිබුණි. [බාධා කිරීමක්] Only for the last two years.

කෙසේ නමුත්, ඉතාම මෑතක සිට සමහර විනිශ්චය සභා සභාපතිවරු, නැතහොත් අතිරේක මහෙස්ත්‍රාත්වරු ඒ සඳහා ඉඩ කඩ නොදුන් අවස්ථා පිළිබඳව වාර්තා වෙමින් පවතී. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතට සංශෝධනයක් වශයෙන් 1957 අංක 62 යටතේ කම්කරු විනිශ්චය සභා පිහිටුවන ලදී. මෙම අදාළ ප්‍රශ්නයට සම්බන්ධිත විධිවිධානය වන්නේ, කම්කරු ආරවුල් පනතේ 46 (1)වන උප වගන්තියයි. එකී උප වගන්තියට අනුව, "යම් බලයලත් නිලධාරියෙකු හෝ බෙරුම්කරුවෙකු හෝ කාර්මික අධිකරණයක් හෝ කම්කරු විනිශ්චය අධිකාරියක් හෝ කම්කරු කොමසාරිස් ඉදිරියේ මේ පනත යටතේ පැවැත්වෙන නීති කෘත්‍යයක පාර්ශවයන් විසින් තමාගේ නියෝජනයන් මඟින් ක්‍රියා කළ හැක. තවද, නියෝජිතයින් මඟින් ක්‍රියා කරන ලෙස එකී නිලධාරියා හෝ බෙරුම්කරු හෝ අධිකරණය හෝ විනිශ්චය අධිකරණය හෝ කොමසාරිස්වරයා හෝ විසින් නියම කරනු ලැබුවහොත්, ඒ පාර්ශවය විසින් එසේ කළ යුතුය."

මෙම විධිවිධාන යටතේ මෑතක් වන තෙක් යම් කිසි පාර්ශවයක් වෙනුවෙන්, එකී පාර්ශ්වකරුවන්ගේ බලය පැවරූ ලිපියක් මත වෘත්තීය සමිති නියෝජිතයෙකු හෝ එම විෂය පිළිබඳ දැනුමක් ඇති වෙනත් කෙනකු හෝ නීතිඥවරයකුට පෙනී සිටීමට පුළුවන් විය. කම්කරු විනිශ්චය සභාවල සභාපතිවරුන්ද, අදාළ අනෙක් නිලධාරීන්ද එම නිවැරැදි තත්ත්වය පිළිගෙන කටයුතු කර ගෙන යන ලදී.

එහෙත්, බලය පැවරූ තම නියෝජිතයෙකු මඟින් පෙත්සම්කරුවන්ට හෝ පැමිණිලිකරුවන්ට පෙනී සිටීමට මෑතක සිට සමහර කම්කරු විනිශ්චය සභා සභාපතිවරු, නැතහොත් අතිරේක මහෙස්ත්‍රාත්වරු අවසර නොදෙන බවට මා වෙතද කරුණු ඉදිරිපත් වෙමින් පවතී.

1957දී කම්කරු විනිශ්චය සභා සංස්ථාපනය කිරීමේදී අදහස් කරන ලද්දේ මෙම කම්කරු විනිශ්චය සභා විශේෂයෙන් සේවයෙන් පහ කිරීමට ලක් වූ අසරණ කම්කරුවන්ට සහන ලබා දීමේ සාමාන්‍ය මිනිසාගේ විනිශ්චය සභාවක්, නැත්නම් "common man's tribunal" ලෙසයි. එනම් සරල නීති කෘත්‍ය මණ්ඩලයක් ලෙසයි. එහෙත් මෙම විනිශ්චය සභා පද්ධතිය විරාගත ක්‍රමයට සංකීර්ණ අධිකරණයක් බවට පත් වේ නම් එය සාමාන්‍ය මිනිසාට සේවයක් සිදු නොවන ආයතනයක් බව මගේ හැඟීමයි. රැකියාව අහිමි වූ සේවකයාට වෙනත් ආදායම් මාර්ගයක් ඇත්තේ නැත. එසේ අසරණ තත්ත්වයට පත් වූ සේවකයාට යම් කම්කරු විනිශ්චය සභාවක් විසින් නීතිඥයකු මාර්ගයෙන් පමණක් ඉදිරිපත් වැන්නැයි කිවහොත් එවිට එම අයට දැරීමට සිදුවන අධික වියදම් දරාගත හැක්කේ කෙසේද? මෙය විශේෂයෙන් අඩු චේතනයක් ලැබූ රැකියාව අහිමි වූ සේවකයන්ට දරා ගත නොහැකි දුෂ්කරතාවකි. මෙම කම්කරු උසාවි ඇති කිරීමේ ප්‍රධාන පරමාර්ථය වනුයේ සාමාන්‍ය සාම්ප්‍රදායික අධිකරණ ක්‍රමයෙන් ඇත්ව රැකියාව අහිමි වී දුක්ඛිත තත්ත්වයට පත් වී තම දරු පවුල් නඩත්තු කිරීමට හෝ ගෙවල් කුලී ගෙවීමට අපහසු වී, දරුවන් පාසල් යැවීමට පවා නොහැකි වන ලෙසින් අපහසුතාවට පත් වී සිටින, සේවයෙන් පහ කළ කම්කරුවන්ට සරල ලෙසින්, ඉතාම අවම වියදමකින් තම දුක්ගැනවිල්ලට සහනයක් ලබා ගැනීම සඳහා බව අවධාරණය කළ යුතුව ඇත.

පාර්ශ්වකරුවන්ගේ බලය පැවරූ ලිපිය මත නියෝජිතයන් පෙනීසිටීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව දැනට පවත්නා ප්‍රශ්නය පිළිබඳව මම අධිකරණ සේවා කොමිෂන් සභාව මෙන්ම අධිකරණ විෂය භාර ගරු ඇමතිතුමා සමඟ ද සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමි. අවශ්‍ය වුවහොත් පර්ශ්වකරුවන්ගේ බලය පැවරූ ලිපියක් මත නියෝජිතයන් මඟින් පාර්ශ්වකරුවන්ට පෙනී සිටීමට හැකිවන අයුරින් ඍජු විධිවිධානයක් කාර්මික ආරවුල් පනතට සංශෝධනයක් ලෙස හඳුන්වා දීමට අපේක්ෂා කරන බව ද ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

වැදගත් ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමා දීර්ඝ පිළිතුරක් දුන්නා. අපට පුළුවන් මේ කාරණය, ආංශික අධීක්ෂණ කාරක සභාවකට යොමු කරලා, මේ සම්බන්ධයෙන් අලුත් නීතියක් ගෙන ඒමට කටයුතු කිරීම වැනි දෙයක් කරන්න.1950 වර්ෂයේ පමණ නීතියක් එක්ක නේද, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි අපි මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ? [බාධා කිරීමක්] ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා කියන පරිදි අපට මේ සම්බන්ධයෙන් ආංශික අධීක්ෂණ කොමිටියට යා හැකියි. ගරු ඇමතිතුමා පැහැදිලි ස්ථාවරයක් දරනවා, මේ අයිතිය දිය යුතුය කියා. උදාහරණයක් හැටියට දෙමළ කථා කරන සාමාන්‍ය වතු කම්කරුවෙක් ගිහින් කොහොමද, සහනයක් ගන්නේ, තමන් වෙනුවෙන් නියෝජිතයෙක් ගිහින් දෙමළ බසින් කථා කර ගන්නට බැරි නම්? මේ වාගේ ප්‍රධාන දේවල් තිබෙනවා.

ඇමතිවරුන් තුන් දෙනෙක් ඉන්නවා, ගරු දිගම්බරම් අමාත්‍යතුමා, ගරු මනෝ ගනේෂන් ඇමතිතුමා සහ ගරු රාධාකෘෂ්ණන් රාජ්‍ය ඇමතිතුමා. මේ රුපියල් 2,500 කම්කරුවන්ට දෙන්නේ නැහැ කියා ඒ ගොල්ලෝ මහ පාරේ උපවාස කරනවාය කියනවා. තවම කිසි තැනක මේ රුපියල් 2,500 දීලා නැහැ, ගරු ඇමතිතුමා. දෙන්න නිර්දේශ කළා කියා ඔබතුමා කිව්වාට, කිසි තැනක රුපියල් 2,500 තවම දීලා නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමා, -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Give me one moment.

ඔබතුමා වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා නොවෙයි. කරුණාකර පොඩ්ඩක් ඉන්න. මහ ජනතාව බොහොම අමාරුවෙන් ජීවත් වෙන්නේ. පිටි මිල කීයද දැන්? සීනි මිල කීයද? මේ වතු කම්කරුවෝත් කාලා බීලා ඉන්න ඕනෑ ජනතාවක් නේ.

අනෙක් කරුණ, Collective Agreement එකේ රුපියල් 1,000ත් ඉල්ලනවා. ඔබතුමා පිළිගන්නවා, මේ ප්‍රශ්නය විසඳිය යුතුයි කියලා. විසඳීම සඳහා ඔබතුමා මැදිහත් වෙලා තිබෙනවා. නමුත් විසඳෙන්නේ නැහැ, for over one-and-a-half years. මම යළිත් අහන්නේ කවදාද, ආණ්ඩුව මේ මුදල - රුපියල් 2,500 සහ Collective Agreement එකේ මුදල- ගෙවන්නේ කියලායි. ගෙවා ඉවර කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, ඔබතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න ගරු ඇමතිතුමාගේ එකඟතාව තිබෙනවා. මේක ස්ථාවර නියෝග 23(2) යටතේ එන ප්‍රශ්නයකට උත්තරයක්.

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්තුතියි. අය වැය සහන දීමනා කටයුතු වෙනුවෙන් අපි පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් සම්මත කළා. ඒ පනතට අනුව ඇමතිතුමාට බලය තිබෙනවා, ඒ සහන නොදෙන අයට විරුද්ධව නඩු දාන්න; ඒ අය හිරේ යවන්න. ඇයි, ඔබතුමා නඩු දැමීමේ කටයුත්ත ක්‍රියාත්මක නොකරන්නේ? ඔබතුමා ඒ උදව්යට ඉඩ දීලා තිබෙනවා, ඒ දේ කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජෝන් සෙනෙවිරත්න අමාත්‍යතුමා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මෙය පනතක් මඟින් ක්‍රියාත්මක වන නීතියක්. ඒ පනතේ යම් යම් විධිවිධාන තිබෙනවා, ඒ පනතේ විධිවිධාන උල්ලංඝනය කරන අයට විරුද්ධව පියවර ගන්න. නමුත් මම පැහැදිලිව කියනවා, යම් යම් කරුණු අපි සැලකිල්ලට ගත යුතුව තිබෙනවා කියන එක. දැනට මේ මුදල වහාම ගෙවීමට අවශ්‍ය පියවර රජය මඟින් ගනිමින් තිබෙනවා.

මම හිතන විධියට අද හෙටම එය ගෙවන්න පුළුවන් තත්ත්වයක් ඇති කර තිබෙනවා. පළමුවෙනි මාස දෙක සඳහා රජය මඟින් ණයක් වශයෙන් මේ අයට මුදලක් දෙනවා. ඒ වාගේම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දායකත්වය ඇතිව සාමූහික ගිවිසුමක් අත්සන් කිරීමටත් අපි සාකච්ඡා ආරම්භ කරනවා. මොකද, දෙපාර්ශ්වයේ එකඟතාව ඇතිව සාමූහික ගිවිසුමක් අත්සන් කළාම ඉදිරියේදී මේ ගෙවීම කර ගෙන යන්න පුළුවන් කියා මම හිතනවා. මුල් මාස දෙකේ ගෙවීම සඳහා අවශ්‍ය මූල්‍ය සහනය ණයක් වශයෙන් ඒ අයට දෙන්න තීන්දු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පැහැදිලි කිරීමක් කරන්නේ. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, කුරුණෑගල වතු සමාගම සහ හලාවත වතු සමාගම මේ දීමනාව ගෙවා තිබෙනවා; they have paid. The Kurunegala Plantations Limited and the Chilaw Plantations Limited, owned by the State, have paid the Rs. 2,500.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමා.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

නුවරඑළියේ වතු කම්කරුවන්ට එහෙම දීමනාවක් ගෙවීම තවම පේන මානයකවත් නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කොහේද?

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

නුවරඑළිය සහ බදුල්ල ප්‍රදේශවල අයට. ඒ නිසා මේ කාරණයට මැදිහත් වෙන්න කියන එකයි කියන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම කිව්වේ, the Kurunegala Plantations Limited and the Chilaw Plantations Limited have paid.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
කුඩා වතු ටිකක් තිබෙන්නේ.[බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා නඩු දමන්නේ නැත්තේ ඇයි? ඔබතුමා, නීතිය කඩන අයට නඩු දමන්නේ නැත්තේ ඇයි?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Douglas Devananda.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වතු දුන්නේ මේ ගොල්ලෝ. [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කවුරු දුන්නත්,-[බාධා කිරීම්] තමුන්නාන්සේලානේ ඒ කාලයේ -[බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! Hon. Douglas Devananda, you may speak now.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඇයි නඩු දාන්නේ නැත්තේ? [බාධා කිරීම්]

II

ඔඩ්ඩුසුඩාන් සඳහා වෙනම ප්‍රාදේශීය සභාවක් පිහිටුවීම

ஒட்டுசுட்டானுக்கென தனியான பிரதேச சபையை நிறுவுதல்

ESTABLISHMENT OF A SEPARATE PRADESHIYA SABHA FOR ODDUCHUDAN

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 23/2 இன் கீழ் மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் கௌரவ பைசர் முஸ்தபா அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி தெரிவிக்கின்றேன்.

முல்லைத்தீவு மாவட்டத்தின் ஒட்டுசுட்டான் பிரதேச செயலாளர் பிரிவில் மூவின மக்களுமாக 19,096 பேர் வாழ்ந்து வருகின்றனர். இங்கு 1990ஆம் ஆண்டு ஜனவரி மாதம் 14ஆம் திகதி பிரதேச செயலாளர் அலுவலகமொன்று திறந்து வைக்கப்பட்டது.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Mr. Deputy Speaker -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! Yes, Hon. Faiszer Musthapha?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Sir, I want one week's time to answer the Question.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
First, he has to pose the Question. Then, you can answer it later; you do not have to reply today.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
உதவி அரச அதிபர் அலுவலகம் என்ற பெயரில் ஆரம்பிக்கப்பட்ட இந்த அலுவலகம் ஒட்டுசுட்டான், மேல்பற்று வடக்கு கிராம சபைக் கட்டிடத்தில் இயங்கிவந்தது. 1998ஆம் ஆண்டு இடம்பெற்ற இடப்பெயர்வின்போது முத்தையன்கட்டு, இடதுகரைப் பிரதேசத்திற்கு அது மாற்றப்பட்டு பின்னர் புதுக்குடியிருப்புக்கு இடம்மாறியது. அதன் பின்னர் 2000ஆம் ஆண்டு ஏப்பிரல் மாதம் கற்சிலைமடுவில் தனியார் வீடொன்றில் இயங்கிய நிலையில் பின்னர் மீண்டும் ஒட்டுசுட்டானில் தனியார் வீடொன்றில் இயங்கி, 2006ஆம் ஆண்டு பெப்ரவரி மாதம் 02ஆம் திகதி முதல் ஒட்டுசுட்டானில் புதிதாக அமைக்கப்பட்ட நிரந்தரக் கட்டிடத்தில் இயங்க ஆரம்பித்தது. ஒட்டுசுட்டான் பிரதேச செயலாளர் அலுவலகமானது இன்றுவரை புதுக்குடியிருப்பு பிரதேச சபையுடன் இணைந்து இயங்கி வருவதனால், ஒட்டுசுட்டான் பகுதிவாழ் மக்கள் தங்களது பிரதேச சபை தொடர்பான தேவைகளைப் பூர்த்திசெய்து கொள்வதற்காக புதுக்குடியிருப்பு செல்லவேண்டிய நிலை ஏற்பட்டுள்ளது. அந்த வகையில், திருமுறிகண்டி, கூழாமுறிப்பு, ஒதியமலை, பெரியகுளம், தண்டுவான், பழம்பாசி, எபரிய, இத்திமடு போன்ற பகுதிகளில் வாழ்ந்துவரும் மக்கள் பல்வேறு சிரமங்களுக்கு முகங்கொடுத்த நிலையில் தங்களது பிரதேச சபை தொடர்பான தேவைகளைப் பூர்த்திசெய்து கொள்வதற்கு புதுக்குடியிருப்பு நோக்கிச் செல்லவேண்டிய நிலைமையில் இருக்கின்றனர். இந்த நிலையில் ஒட்டுசுட்டானுக்கென தனியான பிரதேச சபை ஒன்றினை அமைத்துக்கொள்வதற்காக இப்பகுதி மக்கள் பல ஆண்டு காலமாக முயற்சித்து வருகின்றபோதிலும், அவர்களது முயற்சிகள் ஈடேறாத நிலையிலேயே உள்ளன.

ஒட்டுசுட்டானுக்கென தனியானதொரு பிரதேச சபையை அமைப்பதில் தடைகள் ஏதும் உள்ளனவா? தடைகள் ஏதும் இருப்பின், அவற்றை நிவர்த்திசெய்து உரிய பிரதேச சபையை அமைக்க நடவடிக்கை எடுப்பதற்கான சாத்தியப்பாடுகள் குறித்து விளக்க முடியுமா? அவ்வாறான தடைகள் ஏதும் இல்லாதவிடத்து, இப்பிரதேச சபையை எவ்வகையில், எப்போது அமைக்க முடியுமென தெளிவுபடுத்த முடியுமா?

அதேநேரம், வெலிஓயா பிரதேச செயலாளர் பிரிவானது முல்லைத்தீவு மாவட்ட நிருவாகத்தின்கீழ் வரும் நிலையில், இங்குள்ள 9 கிராம சேவையாளர் பிரிவுகளில் 4 கிராம சேவையாளர் பிரிவுகளின் பிரதேச சபை தொடர்பான பணிகள், வவுனியா மாவட்டத்தின் வவுனியா வடக்கு பிரதேச சபையின்கீழ் கொண்டுவரப்பட்டுள்ளன. ஏனைய 5 கிராம சேவையாளர் பிரிவுகளின் பிரதேச சபை தொடர்பான பணிகள், முல்லைத்தீவு மாவட்டத்தின் கரைதுறைப்பற்று பிரதேச சபையின்கீழ் செயற்படுத்தப்பட்டு வருகின்றன. இதனால், நிருவாக ரீதியில் பல்வேறு சிக்கல்களைச் சந்திக்க வேண்டிய நிலை ஏற்பட்டுள்ளது.

முல்லைத்தீவு மாவட்டத்தின்கீழ் செயற்பட்டு வரும் வெலிஓயா பிரதேச செயலாளர் பிரிவின் கீழுள்ள அனைத்து கிராம சேவையாளர் பிரிவுகளினதும் பிரதேச சபை தொடர்பான பணிகளை முல்லைத்தீவு மாவட்டத்திலுள்ள கரைதுறைப்பற்று பிரதேச சபையின்கீழ் கொண்டுவர நடவடிக்கை எடுக்க முடியுமா? அல்லது, மேற்படி நிருவாக ரீதியிலான சிக்கல்களைத் தீர்க்கக்கூடிய வகையில் மேற்கொள்ளப்படக்கூடிய நடவடிக்கை என்ன என்பது பற்றி தெளிவுபடுத்த முடியுமா?

எனது மேற்படி கேள்விகளுக்கான பதில்களையும் எடுக்கப்படக்கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் கௌரவ அமைச்சர் பைசர் முஸ்தபா அவர்கள் வழங்குவாரென எதிர்பார்க்கிறேன். அத்தோடு, இந்தக் கேள்விகளுக்கான பதில்களை நீங்கள் விரும்பிய மொழியில் கொடுத்தாலும் அதனோடு சேர்த்து தமிழ் மொழிபெயர்ப்பையும் தருமாறு தயவுடன் கேட்டுக்கொள்கின்றேன்.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Sir, I seek a week's time to answer the Question.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You can answer it in the next Sitting week.

කොළඹ සහ මහ කොළඹ ප්‍රදේශවල ජල සැපයුම හදිසියේ බිඳ වැටීම : නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

கொழும்பு மற்றும் பாரிய கொழும்புப் பிரதேசங்களில் திடீர் நீர் விநியோகத் தடை : நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சரின் கூற்று

SUDDEN INTERRUPTION OF WATER SUPPLY IN COLOMBO AND GREATER COLOMBO AREAS: STATEMENT BY MINISTER OF CITY PLANNING AND WATER SUPPLY

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

Hon. Deputy Speaker, it is my unenviable but obligatory duty to provide this House with an adequate and accurate explanation regarding the sudden interruption of water supply to many densely populated parts of Colombo and Greater Colombo. It affected and inconvenienced residents of Wellawatte, Ratmalana, Mount Lavinia, Dehiwala, Bambalapitiya, some parts of Kollupitiya, Kohilawatta, Ambatale, Mulleriyawa, Jayanthipura, Pelawatta, Pamankada, Thimbirigasyaya, Havelock Town and such areas on Monday the 05th and Tuesday the 06th of July.

The immediate cause of it was a severe rupture of the main arterial pipeline that carries water from the purification plant at Ambatale to the distribution centre at Dehiwala. The rupture of the pipeline, which affected nearly 10 feet of the supply line, occurred at the Thalangama Depot near the Hyundai service station. This massive pipeline is about 60 years old and conveys 5.4 million litres of water per day. The imperativeness of attending to the necessary repairs was obvious in the light of the threat of flooding a huge residential area in the immediate environs of the pipe burst. Hence, urgent repair work was undertaken immediately.

Attending to repairs of the subterranean pipeline naturally involved complex excavation work. The affected portion of the pipe had to be replaced. The work had to be carried out after reinforcing the walls on either side of the site to prevent a collapse, which would have been an added impediment. The replaced pipe weighed about three tonnes and 36 slangue joints had to be replaced in the operation.

The National Water Supply and Drainage Board and my Ministry deployed all required resources, which included more than 50 workmen and varied heavy equipment. The replacement of the part of the pipe and the attendant adjustments were executed in the minimum time, given its complexity. The pumping of water at Ambatale recommenced at 5.30 in the evening yesterday.

A similar breakdown had occurred about 40 years earlier in 1982 at Battaramulla and the restoration work took four days. We managed to attend to the most recent episode in less than 24 hours and that is an achievement that testifies to the progress we have made in the provision of the vital utility and the technical prowess we have since acquired.

Parallel to the repair work, we used 25 army bowsers to carry 8,000 litres of water every five minutes continuously to Dehiwala, Bambalapitiya and Kollupitiya areas. Water was supplied to Ratmalana from Moratuwa while Kollupitiya and Bambalapitiya areas were provided with water from Fort and other areas.

The Chairman and the Vice Chairman of the National Water Supply and Drainage Board were physically on location at the repair site throughout the day. The Resident Engineer, the General Manager, three Deputy General Managers and an Additional General Manager together with a crew of about 50 workmen offered their tireless support during the operation despite an

[ගරු රවුෆ් හකීම් මහතා]

intervening holiday. I would be seriously remiss if I do not take this opportunity to express my deepest appreciation and gratitude to each one of them.

I offer my humblest apology to the general public inconvenienced by an accidental occurrence that was totally beyond the control of those responsible for the supply of water to the premier metropolis.

It occurred on a day that the Muslims were celebrating Eid was an added unhappy coincidence.

I deeply regret the insinuations made in statements attributed to by some politicians who rushed to condemn me for my supposedly scant knowledge of the subject. Those malicious utterances were intended to fish in troubled waters. The pun is intended. No doubt, the people would have treated the utterances of bankrupt politicians with the contempt they deserve.

Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, are you suggesting a solution as well?

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
No, no. It was repaired immediately. But, in the future-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
But, you may need new pipelines so that we will have a long-term solution.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Mr. Deputy Speaker, the fact is that when such an accident occurs, the difficulty is that we have only two-and-a-half hours of supply in stock. Therefore, we have to take some immediate steps to at least carry 12 hours of supply in stock. For that, we have to create sumps and new towers. That is something that we have to concentrate on. I will soon be taking action towards that.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Eventhough it is not your personal matter, taking the responsibility is a great thing. People will respect you for that.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Thank you.

වරප්‍රසාද: 2016 ජූනි 24වන දින "දිවයින", "රිවිර" සහ "මව්බිම" වාර්තා

சிறப்புரிமை : 2016 யூன் 24ஆம் திகதிய 'திவயின', 'ரிவிர' மற்றும் 'மவ்பிம' அறிக்கைகள்

PRIVILEGE : "DIVAINA", "RIVIRA" AND "MAWBIMA" REPORTS OF 24TH JUNE 2016

ගරු සාගල රත්නායක මහතා (නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சாகல ரத்நாயக்க - சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sagala Ratnayaka - Minister of Law and Order and Southern Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 23 (2) යටතේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා විසින් 2016 ජූනි මස 23වන දින පොලිසිය සම්බන්ධයෙන් අසන ලද ප්‍රශ්නයකට මා විසින් පිළිතුරු ලබා දුන් අතර, ඒ පිළිබඳව 2016 ජූනි මස 24වන දින "දිවයින" පුවත් පතේ 7වන පිටුවේ "පොලිස් නිලධාරියා රජයේ නිලධාරියකු නොවෙයි" යන ශීර්ෂය යටතේ අජිත් අලහකෝන් හා කුෂාන් සුබසිංහ විසින් පළ කරන ලද ලිපියක්ද, "රිවිර" පුවත් පතේ 3වන පිටුවේ "පොලිස් නිලධාරීන් රජයේ නිලධාරීන් නොවන නිසා වෙනම වැටුප් ව්‍යුහයක් සකස් කරනවා" යන ශීර්ෂය යටතේ රුවිර ඩිලාන් මධුෂංක හා සුරේකා නිල්මිණි විසින් පළ කරන ලද ලිපියක්ද, "මව්බිම" පුවත් පතේ 7වන පිටුවේ පාර්ලිමේන්තු වාර්තාකරුවන් වන දයා පෙරේරා හා ජේ.ටී. ද සිල්වා විසින් පළ කරන ලද ලිපියක්ද මඟින් මවිසින් පාර්ලිමේන්තුවේදී ලබා දුන් පිළිතුර මුළුමනින්ම සාවද්‍ය ලෙස අර්ථ කථනය කරමින් වැරදි සහගත ලෙස ප්‍රකාශයට පත් කොට තිබිණි.

මා විසින් කළ කථාව 2016 ජූනි මස 23වන දින හැන්සාඩ් වාර්තාවේ 244 වෙළුමේ 1391 තීරුවේ සිට වාර්තා කොට ඇත.

මේ අනුව අදාළ පුවත් පත් වැරදි පුවත් පළ කිරීම තුළින් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ "අ" කොටසේ 5වන ඡේදය උල්ලංඝනය වන අයුරින් කටුයුතු කර ඇති අතර, එය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන මාගේ වරප්‍රසාද කඩ කිරීමකි. ඒ නිසා මාගේ හා පාර්ලිමේන්තුවේ හිමිකම් හා වරප්‍රසාද ආරක්ෂා කිරීම සඳහා මේ පිළිබඳව සුදුසු ක්‍රියා මාර්ග ගන්නා ලෙස ගරු නියෝජ්‍ය කථානායකතුමා වන ඔබතුමාගෙන් ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විශේෂයෙන්ම ඉල්ලා සිටින්නේ මෙම පුවත් නිවැරදි කරමින් පුවත් ප්‍රකාශ කරන ලෙසත්, සාවද්‍ය පුවතට ලබා දුන් ප්‍රමුඛත්වයම ඒවාටත් ලබා දෙන ලෙසයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
"දිවයින", "රිවිර" සහ "මව්බිම" කියන පුවත් පත්වලින් ඔබතුමාගේ ඉල්ලීම ඉටු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඔබතුමාගේ වරප්‍රසාද කඩවීම පිළිබඳ කාරණය ගරු කථානායකතුමාට යොමු කරනවා. ඒ වාගේම එම පුවත් පත් ඒ වරද නිවැරදි කර පළ කළාද කියා සොයා බලනවා.

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත
இலங்கை தேசிய ஆராய்ச்சி பேரவைச் சட்டமூலம்
NATIONAL RESEARCH COUNCIL OF SRI LANKA BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 1.01]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Science, Technology and Research)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතුයි" මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකාව තුළ විද්‍යා සහ තාක්ෂණ පර්යේෂණ සංස්කෘතියක් සහ ප්‍රජාවක් අභිවර්ධනය කිරීමේ සහ තහවුරු කිරීමේ කාර්යය සඳහා සහ ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයට දායක වන පර්යේෂණ වැඩසටහන් සඳහා පහසුකම් සැලැස්වීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභ සඳහන් කරනු ලබන සභාවක් පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතක් හැටියටයි මගේ අමාත්‍යාංශයෙන් "ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව" යනුවෙන් අද දින න්‍යාය පත්‍රයේ සඳහන් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

මෙහි ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය මේ පනත් කෙටුම්පතේ සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම වගන්ති 29කින් යුතුව අද දින මා විසින් මේ පනත් කෙටුම්පත මේ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට පවතින ජාතික පර්යේෂණ සභාව ආරම්භ කළේ 1999දී ජනාධිපති ලේකම් කාර්යාලයෙන්. 2007දී එය විශේෂ නියෝජිත ආයතනයක් ලෙස එහෙම නැත්නම් ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා නම් "agency" එකක් ලෙස ස්ථාපනය කරනු ලැබුවා. පර්යේෂණ සහ සංවර්ධනය සඳහා අරමුදල් හා පහසුකම් සපයන නියෝජිත ආයතනයක් ලෙස තමයි මේ ආයතනය හඳුනාගෙන තිබුණේ.

මේ ආයතනය පිහිටුවනු ලැබුවේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය තුළ පහසුකම් සැලසීමට සහ සම්බන්ධීකරණය කිරීම සඳහායි. මෙහි අරමුදල් සෘජුවම පර්යේෂණ කරන විද්‍යාඥයන්ට සැපයීම කරනු ලබනවා. අරමුදල් සැපයීමේදී ජාතික ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීම මෙහි සුවිශේෂී වූ අංගයක්. රාජ්‍ය විශ්වවිද්‍යාල පර්යේෂණ හා සංවර්ධන කටයුතු කරනු ලබන්නා වූ සංවිධාන සහ ඕනෑම රාජ්‍ය ආයතනයකට මෙයින් අරමුදල් සැපයීම සිදු කරනු ලැබුවා. පාරදෘශ්‍යභාවය සඳහා මණ්ඩල සාමාජිකයින් මෙයින් අරමුදල් ඉල්ලීමෙන් වැළකී සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ සැලසුම්වලට සහය වීම, පර්යේෂණ සහ සංවර්ධන - research and development - ඒ වාගේම විද්‍යා හා තාක්ෂණයට අදාළ වන්නා වූ පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණයද මේ ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වනවා. රටේ පර්යේෂණ සම්බන්ධීකරණ සංස්කෘතියක් බිහි කිරීම මෙහි මූලික අංගයක් වනවා. අද වන කොට පසු ගිය දශකය තුළදී දියුණුවට පත් වූ ආසියානුකරයේ බොහෝ රටවල් - දකුණු කොරියාව, චීනය වැනි රටවල්- මේ පර්යේෂණ සහ සංවර්ධන සඳහා ඒ අයගේ GDP එකෙන් විශාල ප්‍රතිශතයක් වෙන් කරනු ලබනවා. සංසන්දනාත්මකව බැලුවොත්, සෙසු රටවලට වඩා වෙන් කරනු ලබනවා. එම රටවල් පසු ගිය දශකයක පමණ කාලයක් තුළදී ඉතාම ශීඝ්‍ර ලෙස විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය තුළ පර්යේෂණ වාණිජකරණය දක්වා ගෙන ගොස් තිබීම නිසා තමයි අද ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කර ගෙන තිබෙන්නේ. ඒ නිසා අපේ රටේ සම්ප්‍රදායික අපනයන සහ විදේශගතව රැකියා කරන අපේ ශ්‍රමිකයන් විසින් මේ රටට ප්‍රේෂණය කරනු ලබන්නා වූ විදේශ විනිමය මත යැපීම කොයි තරම් දුරට සාධාරණීකරණය වනවා ද කියන ප්‍රශ්නය මේ දිනවල පැන නඟිනවා.

විශේෂයෙන්ම මැද පෙරදිග රටවල ඇති වී තිබෙන තත්ත්වය වාගේම ලෝකයේ 2007- 2008 ඇති වූ ආර්ථික අවපාතය සහ ඒ හා සමාන තත්ත්වයක් ගොඩ නැහෙමින් පැවතීම කියන කරුණු ගත්තොත්, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය තුළ පර්යේෂණ සංස්කෘතියක් බිහි කරලා ඒ පර්යේෂණ තුළින් ලබා ගන්නා වූ ප්‍රතිඵල වාණිජකරණයට ලක් වීම තුළින් අප රටේ විදේශ විනිමය උපයා ගැනීමේ නව මංපෙත් විවර වනවායි කියන එක මෙහිදී සඳහන් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම global competitiveness, එහෙම නැත්නම් ලෝකයේ තරගකාරීත්වය පිළිබඳ දර්ශකයෙහි දොළොස් වන සාධකය හැටියට හඳුන්වනු ලබනවා නව නිපැයුම් - innovation-. රජයේ මෙවර අය වැය ලේඛනයෙන් නව නිපැයුම් ආර්ථිකයක් ඇති කිරීම සඳහාත්, පර්යේෂණ සංස්කෘතියක් බිහි කිරීම සඳහාත් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒවා මේ වන විට මේ ආයතන තුළින් ඒ අදාළ ක්ෂේත්‍රවලට, පර්යේෂකයින්ට නිකුත් කරමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මෙහි බලපාන සාධක හැටියට, පර්යේෂණ සහ සංවර්ධන - research and development - සඳහා patent බලපත්‍ර ලබා ගැනීම්, ඒවායේ වියදම්, තත්ත්ව පාලනය මේ සියලු කරුණු අඩංගු වනවා. ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා. ඉලක්ක පදනම් කරගත් ව්‍යාපෘති, පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ විවිධ විෂයන්, ක්ෂේත්‍රයන් සඳහා කරනු ලබන ව්‍යාපෘති, පර්යේෂණ සහ ඒ සඳහා වන්නා වූ ප්‍රදාන, විද්‍යාත්මක ග්‍රන්ථ සඳහා ජනාධිපති සම්මාන ලබා දීම වාගේම ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් මේ තුළ අඩංගු වනවා. තවත් කරුණු රාශියක් මේ තුළ අඩංගු වනවා.

විශේෂයෙන්ම පර්යේෂණ සංස්කෘතියක් බිහි කිරීම මේ තුළ සිදු වෙමින් පවතිනවා. මේ වන විට ඩෙංගු අවදානම දුරු කරලීම පිළිබඳව පර්යේෂණ පැවැත්වෙනවා. ඒ වාගේම උතුරුමැද පළාතේ පැතිරී ගොස් තිබෙන CKD - Chronic Kidney Disease සඳහා හේතු පාදක වූ කරුණු මොනවාද, ඒවා වළක්වා ගන්නේ කොහොමද කියන එක පිළිබඳව ජාතික විද්‍යාත්මක පදනම - NSF - National Science Foundation - මඟින් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය තුළ සිටින දේශීය විද්වතුන් 400කට වැඩි ප්‍රමාණයක් සහභාගි කරවාගෙන අද සහ හෙට වැඩ මුළුවක් පැවැත්වෙනවා.

[ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා]

මේ වන විටත් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ කමිටු කාමරවල එම වැඩ මුළු පැවැත්වෙමින් තිබෙනවා. එය හෙට තමයි අවසන් වන්නේ. එහිදී වැදගත් කරුණු රාශියකට අවධානය යොමු කර තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තොත් CKD පිළිබඳව, බෝ නොවන රෝග හැටියට සැලකෙන පිළිකා, diabetes කියලා ඉංග්‍රීසියෙන් හඳුන්වනු ලබන රුධිරයේ අධික සීනි පැවතීම කියන මේ රෝග සම්බන්ධ ක්ෂේත්‍රයන්වල පර්යේෂණ කටයුතු සඳහා දැනටමත් මුදල් වෙන් කිරීම් සිදු කරනු ලබනවා.

මේ පනත් කෙටුම්පත ගෙන ඒම තුළින් බලාපොරොත්තු වන කරුණු කිහිපයක් තිබෙනවා. මෙතෙක් සභාවක් හැටියට, එහෙම නැත්නම් නියෝජිත ආයතනයක් හැටියට ජනාධිපති ලේකම් කාර්යාලයේ පවත්වා ගෙන ගිය මෙම ආයතනය 2007 සිට තවත් පියවරක් ඉදිරියට ගිහිල්ලා තිබෙනවා. ඒක එතැනින් තවත් ඉදිරියට ගෙනැල්ලා මෙම NRC - National Research Council කියන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බවට පත් කිරීම සඳහා තමයි මේ පනත් කෙටුම්පත අද මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ. මෙහි ආරම්භයක් හැටියට 2014 මැයි 23වැනිදා එවකට තිබුණු තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍ය කාර්යාලය මඟින් ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ජාතික පර්යේෂණ සභාව ස්ථාපනය කිරීම සඳහා වන්නා වූ අමාත්‍ය මණ්ඩල සන්දේශය ගරු පාඨලී චම්පික රණවක එවකට හිටපු අමාත්‍යවරයා විසින් ඇමුණුම් සහිතව ඉදිරිපත් කර තිබුණා. ඉන් පසුව අමාත්‍ය මණ්ඩලය මඟින් එය අනුමත කිරීම කරනු ලැබුවා. ඉන් පසුව නැවත මා විසින් 2015 ඔක්තෝබර් මස 15වැනි දින ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ජාතික පර්යේෂණ සභාව ස්ථාපනය කිරීම සඳහා වන්නා වූ අමාත්‍ය මණ්ඩල නිර්දේශය අපේක්ෂාවෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සන්දේශයට අනුමැතිය ලැබුණා. ඒ අනුව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කරලා කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීම 2016 මාර්තු මාසයේ සිදු කරනු ලැබුවා. එම කෙටුම්පත තමයි අනුමත කරවා ගැනීම සඳහා අද මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ.

මේ පිළිබඳව තවදුරටත් කරුණු ඉදිරිපත් කරනවා නම්, 2014 ඉඳලා ඉලක්ක පදනම් කර ගත් බහු විධ ක්ෂේත්‍ර පර්යේෂණ වැඩසටහන් මේ සභාව මඟින් සිදු කරනු ලැබූ බව විශේෂයෙන් සඳහන් කළ යුතුව තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය, පෞද්ගලික සහයෝගිතා වැඩ සටහන 2012 සිට ක්‍රියාත්මක කළා. මේ ක්ෂේත්‍රය තුළ එම වැඩ සටහන යටතේ ව්‍යාපෘති පහක් ක්‍රියාත්මක වුණා. එනම් වල්ලාපට්ටා රෙසීනය නිෂ්පාදනය කිරීම, ස්වසන ආරක්ෂණ භාණ්ඩ නිෂ්පාදනය, පලතුරු මැස්සා විකර්ශන කාරක සංවර්ධනය, රබර් හා පොලිඑතිලීන් මඟින් වහළ සෙවිලි තහඩු නිපදවීම මේ ව්‍යාපෘතීන් අතර සිදු වෙනවා. මෙවැනි ව්‍යාපෘතීන් 12ක් මේ වන විට ඇගයීමට ලක් වෙලා තිබෙනවා.

ඊළඟට, පරීක්ෂක ඉල්ලීම මත පර්යේෂණ ප්‍රතිපාදන වැඩසටහන් 1999 සිට ක්‍රියාත්මක කරනු ලැබුවා. මේ තුළින් පර්යේෂණ රාශියක් සිදු කර තිබෙනවා. විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ලබා දීම 2001 වර්ෂයේ සිටම සිදු කරනු ලැබුවා. විශේෂයෙන්ම මෙහිදී සඳහන් කරන්න ඕනෑ, මේ පර්යේෂණවලින් ඉතා විශාල ප්‍රමාණයක් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණ ග්‍රන්ථ සඳහා, එහෙම නැත්නම් ඒ සම්බන්ධ පත්‍රිකා සඳහා ඉදිරිපත් කර තිබෙන බව. ඒ වාගේම වෙනත් වැඩ සටහන් රාශියක් මෙහිදී ක්‍රියාත්මක කරනු ලැබුවා. ඒ සියල්ලම ගත්තාම පර්යේෂණ ව්‍යාපෘති 402කට අරමුදල් සැපයීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් රුපියල් බිලියන 1.5කට වැඩි මුදලක් මේ කාලසීමාව තුළ මුදා හැර තිබෙනවා. වර්තමානයේ රුපියල් මිලියන 730කට වැඩි වටිනාකමින් යුක්තව ව්‍යාපෘති 137ක් සිදු කෙරෙමින් පවතිනවා. සමස්ත ව්‍යාපෘතිවලින් සියයට 83ක් සතුටුදායක ලෙස අවසන් කර තිබෙනවා. 2015 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් වෙන් කළ ප්‍රාග්ධන අරමුදල රුපියල් මිලියන 277ක් වන අතර, එයින් සියයට 95.4ක් පසු ගිය වර්ෂයේදී මුදා හැර තිබෙනවා. එයින් ඉතා විශාල ප්‍රතිශතයක් පෙන්නුම් කරනු ලබනවා.

ජාතික පර්යේෂණ සභාවේ මුදල් ආධාර සහ පහසුකම් සැපයීමේ ප්‍රතිඵල ලෙස බොහෝ ප්‍රතිලාභ අත්වෙලා තිබෙනවා. ඒ අතර, සඟරා හා ප්‍රකාශන 361ක්, පේටන්ට් බලපත්‍ර සඳහා ඉල්ලීම් 20ක්, පේටන්ට් බලපත්‍ර 2ක් සඳහා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ආදී තොරතුරු ප්‍රචාරණ අවස්ථා 111ක්, පශ්චාත් උපාධි සම්පූර්ණ කළ පර්යේෂකයින් 49දෙනෙකු සඳහා අරමුදල් සැපයීම, ඒ වාගේම ප්‍රතිපත්ති වෙනස් කිරීම් අවස්ථා 5ක්, සම්පූර්ණ කරන ලද පර්යේෂණයන් හේතුවෙන් සිදු කරන ලද මැදිහත්වීම් අවස්ථා 32ක් සහ අවසන් නිෂ්පාදන 3ක් වශයෙන් මේ වන විට වාර්තා වෙලා තිබෙනවා.

මේ ආකාරයෙන් ගත්තාම ඉතාම අඩු සේවක සංඛ්‍යාවක් පවත්වාගෙන යමින් මේ වන විට විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය තුළ ජාතික පර්යේෂණ සභාව - National Research Council, NRC - හැටියට විශාල වැඩ කොටසක් ඉටු කරනු ලැබ තිබෙනවා. ඒ නිසා අද ඉදිරිපත් කර තිබෙන මෙම පනත් කෙටුම්පත මඟින් මගේ මේ සම්පිණ්ඩනය තුළ මම සාධාරණීකරණය කරන්න බලාපොරොත්තු වුණේ මෙය ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බවට පත් කිරීමට තිබෙන්නා වූ පදනම සහ එහි අවශ්‍යතාව සම්බන්ධවයි.

විශේෂයෙන්ම මේ වන විට විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාංශය මඟින් පාසල් තුළ විද්‍යා විෂය ප්‍රවලිත කිරීම සඳහා, ඒ වාගේම විශ්වවිද්‍යාල පද්ධතිය තුළ එම දැනුම යාවත්කාලීන කිරීම සඳහා, ඒ වාගේම පර්යේෂණයන් සඳහා දිරිගැන්වීමට වැඩසටහන් රාශියක් ආරම්භ කර තිබුණා. ඒ වාගේම මම මුලින් සඳහන් කළා වගේ දේශීය විද්‍යාඥයින් 400ක් පමණ සහභාගි වන දින දෙකක වැඩමුළුව අදත්, හෙටත් පැවැත්වෙනවා විතරක් නොවෙයි, තාක්ෂණ වශයෙන් තිබෙන සැසිවාර - technical sessions - 4ක් ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් 4ක් ඔස්සේ ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම අද කොළඹ දිස්ත්‍රික්කය ඇතුළුව බස්නාහිර පළාතේ ප්‍රධාන නගරවල පවතින්නා වූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම පිළිබඳවත් මේ සැසිවාර තුළ සාකච්ඡා වෙනවා.

බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳව කථා කළොත්, පසු ගිය වර්ෂයේ අවසානයේ අපේ අතිගරු ජනාධිපතිතුමන් වෙනත් රාජ්‍ය නායකයින් සමඟ එකඟතාව පළ කරපු දේශගුණික විපර්යාස පිළිබඳ ඓතිහාසික ගිවිසුම වන පැරිස් සම්මුතියට - the Paris Agreement එකට - පසු ගිය අප්‍රේල් මාසයේ 22වැනිදා ඇමෙරිකාවේ නිව්යෝක්වල එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සභා ගර්භය තුළදී සාමාජික රටවල් 193කින් රටවල් 171ක් සමඟ අතිගරු ජනාධිපතිතුමා සහ රජය නියෝජනය කරමින් අත්සන් කරන්න මට අවස්ථාව ලැබුණා. ඒ නිසා අපි ඒ සඳහා බැඳී සිටිනවා. ඒ වාගේම මේ ගරු සභාවට ඉදිරිපත් කරලා ඉදිරියේදී තව කටයුතු කිහිපයක් කරන්න තිබෙනවා. එහි ratification එකට, එහෙම නැත්නම් ස්ථිර කරනු ලැබීමට යටත්ව දැනට ඒ කටයුතු සිදුවෙලා තිබෙනවා.

විශේෂයෙන්ම පසු ගිය දශක දෙකක පමණ කාලය තුළදී ගෝලීය උෂ්ණත්වය සාමාන්‍ය ගෝලීය උෂ්ණත්වයට වඩා සෙල්සියස් අංශක 2කින් ඉහළ ගොස් අවසානයි. පසු ගිය වසර 20ක පමණ කාලය තුළදී උෂ්ණත්වය වැඩි වීම පාලනය කිරීම

සඳහා විවිධ ක්‍රමෝපායයන් යෝජනා කළත්, සාමාන්‍යයෙන් ඕනෑම රටක දේශපාලන නායකත්වයකින් තොරව මේ කටයුතු ක්‍රියාත්මක වීම පහසු වන්නේ නැහැ. සමහර බලවත් රටවල් අන්තර්ජාතික Kyoto Protocol වැනි ගිවිසුම් සඳහා මෙතෙක් අත්සන් තබා නැහැ. නමුත් මම ඉතා සතුටින් කියන්න ඕනෑ, the Paris Agreement එකට ඇමෙරිකා එක්සත් ජනපදය, රුසියාව, මහා බ්‍රිතාන්‍ය ඇතුළු යුරෝපීය රටවල්, ඒ වාගේම චීනය, ඉන්දියාව වැනි රටවල් පවා මේ වන විට අත්සන් කරලා අවසානයි. ඒකට හේතුව තමයි, මීළඟ වසර 30 තුළදී, බොහෝ විට 2050 වර්ෂය වන විට අද පවතින ගෝලීය උෂ්ණත්වය තවත් සෙල්සියස් අංශක 2කින් වැඩි වුණොත්, විශේෂයෙන්ම දුපත් රාජ්‍යයන් හැටියට හැඳින්වෙන රාජ්‍යයන්වල වෙරළ ආශ්‍රිත ප්‍රදේශ මීටර් භාගයකට වැඩි ප්‍රමාණයක් මුහුදු ජලයෙන් යටවීමේ අවදානමකට ලක්වන බවට පුරෝකථනයක් කර තිබීම.

උත්තර ධ්‍රැවයේ සහ දක්ෂිණ ධ්‍රැවයේ තිබෙන්නාවූ ග්ලැසියර දියවීමට පටන් ගෙන තිබෙනවා. එයට හේතුව ගෝලීය උෂ්ණත්වය වැඩි වීම. එයට හේතුව ස්වාභාවික හේතූන් නොවෙයි; මිනිස් ක්‍රියාකාරකම්. විශේෂයෙන් greenhouse gas වර්ගයක් වන මීතේන් වායුව ප්‍රධාන වශයෙන් තිබෙන, නිෂ්පාදනය වෙන අවස්ථාවලදී ඒවා වායු ගෝලයට මුදා හැරීම තුළින් මේ ගෝලීය උෂ්ණත්වය වැඩි වීම ප්‍රධාන හේතුවක් හැටියට සලකා තිබෙනවා. මේ වනවිට තාක්ෂණික වශයෙන් විවිධ ක්‍රියා මාර්ග ගෙන තිබෙනවා. නමුත් ඒවා පමණක් ප්‍රමාණවත් වන්නේ නැති නිසා එක්සත් ජාතීන්ගේ සංවිධානය 2015 වසරේ සිට 2030 දක්වා ක්‍රියාත්මක වෙන Sustainable Development Goals - SDGs - තිරසාර සංවර්ධනයක් සඳහා ඉලක්කයන් 17ක් ඇති කර තිබෙනවා. මේ ඉලක්ක දහහතේ ඉතාමත් වැදගත් කරුණු දහහතක් සඳහන් වෙනවා. එය තව අනු ක්ෂේත්‍ර 162 ක් සඳහා වෙන් වී යනවා. මේ තුළ බලාපොරොත්තු වෙන කාරණයක් වන්නේ, මේ ඉලක්කයන් සපුරා ගන්නා විට විශේෂයෙන් පරිසරය සුරක්ෂිත කරමින් මේ ඉලක්කයන් සපුරා ගැනීම ප්‍රධාන ලක්ෂණයක් බවට පත් වෙලා තිබීමයි. එම නිසා අපේ රටත් ශ්‍රී ලංකාව හැටියට ප්‍රථම වතාවට තිරසාර සංවර්ධනය සහ වනජීවී යනුවෙන් අමාත්‍යාංශයක් නිර්මාණය කර තිබෙනවා. එයින් පෙන්නුම් කරනු ලබනවා, ශ්‍රී ලංකාව හැටියට රාජ්‍ය පාලනයේදී කොයිතරම් වැදගත් ස්ථානයක් තිරසාර සංවර්ධනය සඳහා ලබා දී තිබෙනවා ද කියන එක. ඒ වාගේම මේ ඉලක්කයන් දහහතෙන් ඉලක්ක හතක් සෘජුවම විද්‍යා හා තාක්ෂණ විෂය හා බද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම නවෝත්පාදන මෙහි ප්‍රධාන අංගයක් බවට පත් වෙලා තිබෙනවා.

දැනට අවුරුදු හතරකට පමණ පෙර විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය එවකට මෙහෙයවූ අමාත්‍යවරුන් විසින් COSTI ආයතනය පිහිටුවා තිබෙනවා. එය ලේකම් කාර්යාලයක්. එය දැනට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙනවා. එම ආයතනය මඟින් කරන්නේ පර්යේෂකයින් විසින් පර්යේෂණ සිදු කර, ගවේෂණය කර සොයා ගන්නා වූ කරුණු වාණිජ තත්ත්වයට පත් කිරීම සඳහා මැදිහත් කරුවකු ලෙස කටයුතු කිරීමයි. එයත් මේ තිරසාර සංවර්ධනයේ ඉලක්කයන් ළඟා කර ගැනීම සඳහා මුළු ලෝකයම ගෙන යන වැඩ පිළිවෙළේ දී ලංකාව තවත් පියවර ගණනාවක් ඉදිරියට තැබීමක් හැටියට අප සලකනවා. නමුත් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ ඒක නොවෙයි. පර්යේෂණය සහ සංවර්ධනය සඳහා 2013 වර්ෂයේ අපේ රටේ GDP එකෙන් වෙන් වෙලා තිබෙන්නේ සියයට 0.11ක මුදලක්. එයින් රාජ්‍ය අංශය සියයට 0.06ක් හා පෞද්ගලික අංශය 0.05ක් වෙන් කර තිබෙනවා. ඒ ආකාරයටයි අපේ රටේ GDP එකෙන් 0.11ක ප්‍රතිශතයක් වෙන් කරන්න කටයුතු කර තිබෙන්නේ. එය කිසිසේත්ම ප්‍රමාණවත් වන්නේ නැහැ. දකුණු කොරියාව වැනි රටවල්, ආසියානුකරයේ රටවල් අද පියවර ගණනාවක් ඉදිරියට තබා තිබෙන්නේ විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ තුළිනුයි.

Samsung නිෂ්පාදන ගැන බලන්න. Samsung රූපවාහිනිය අපි කවුරුත් දන්නවා. ඒ වාගේම ඒ ආශ්‍රිත වන්නාවූ ඉලෙක්ට්‍රොනික උපකරණ, මේ සියල්ල පර්යේෂණය කර සොයා ගත් දේවල්. අද පෙරදිග, අපරදිග භේදයකින් තොරව ඒ නිෂ්පාදන දකින්නට තිබෙනවා. බටහිර ලෝකයේ රටකට ගියත් Samsung නිෂ්පාදන තිබෙනවා. අනෙක් පැත්තෙන් පෙරදිගට ගියත්, මැද පෙරදිගට ගියත් අපට දකින්නට ලැබෙනවා. බලන්න, විද්‍යා හා තාක්ෂණවලට කොයිතරම් මුදල් වෙන් කර, එයින් සොයා ගත් කරුණු මත ඒ රටවල විදේශ විනිමය උත්පාදනය කර ගෙන ඒ රටේ ජනතාවගේ සුබසිද්ධිය සඳහා කටයුතු කරන්නට පුළුවන්කම ලැබී තිබෙනවාද කියන එක.

මේ පර්යේෂණවලින් දවසෙන් දෙකෙන්, අවුරුද්දෙන් දෙකෙන් බොහෝ වෙලාවට ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. විද්‍යාත්මක පර්යේෂණයක් සඳහා අවුරුදු දෙකක් ගත වෙන්නටත් පුළුවන්, අවුරුදු පහක් ගත වෙන්නටත් පුළුවන්, අවුරුදු දහයක් ගත වෙන්නටත් පුළුවන්. මේ පර්යේෂණ කොටස් තුනකට බෙදෙනවා. මූලධර්ම පිළිබඳ පර්යේෂණ සිදු වෙනවා. ඊළඟට යම් කිසි රෝගයක් හෝ යම්කිසි කාරණයක් පිළිබඳව වෙනම පර්යේෂණයක් කෙරෙන්නට පුළුවන්. එම නිසා වාණිජකරණය සඳහා පර්යේෂණයන් කරන්න පුළුවන්. මේ ක්ෂේත්‍ර තුන තුළම පර්යේෂණ සඳහා මුදල් වෙන් කිරීම සිදු කරනු ලබනවා. එම නිසා අද ලෝකයේ දේශගුණික විපර්යාසවලට විසඳුම් සඳහා ද අවශ්‍ය පර්යේෂණ සිදු කරමින් පවතිනවා. අද ජෛව තාක්ෂණය - biotechnology - මඟින් කෙරෙන කටයුතු ගැනත් කිව යුතු වෙනවා.

දැනට විදේශ රටවල කටයුතු කරන අපේ රටේ විද්‍යාඥයකුගේ දේශනයක් අද උදේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ආරම්භ වුණා. කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ, සත්ව නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ, ජෛව තාක්ෂණය යොදා ගෙන කරන පර්යේෂණවල ප්‍රගතිය කෙසේද කියන එක පිළිබඳව එතුමා ඉතා පැහැදිලි ලෙස සඳහන් කළා. 2050 වසර වන විට ලෝකයේ ජනගහනය අද වාගේ දෙගුණයක් -බිලියන 12ක්- වනවා. එහෙමනම්, බිලියන 12ක අවශ්‍යතා සපුරා ගන්න කටයුතු කරන්නේ කොහොමද? වගා කරන ඉඩම් ප්‍රමාණය වැඩි කරන්න පුළුවන්ද? බැහැ. එහෙම වුණොත් පරිසරයට හානි වනවා. එහෙම නම් තිබෙන්නා වූ සම්පත්වලින් නවෝත්පාදන ඇති කිරීම සහ විද්‍යා හා තාක්ෂණ විෂය තුළ පර්යේෂණයන් සිදු කිරීම තුළින් ඒ කර්තව්‍ය කරන්න පුළුවන්.

ජපන් විද්‍යාඥයෙක් ලංකාවට ඇවිල්ලා ඉන්නවා. මට එතුමාව පෙරේදා හමු වුණා. මේ වන විට ජපානයේ වාහන දුවන තෙල් සියයට 50යි, ජලය සියයට 50යි -මේ ද්‍රව්‍ය දෙක හරි හරියට භාගය බැගින්- මිශ්‍ර කරලා වාහන ධාවනය කිරීමේ තාක්ෂණය සොයා ගෙන තිබෙනවා. මේ වන විට ඒ සඳහා යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය කරලා තිබෙනවා. ඒවා ඒ රටේ ක්‍රියාත්මක වනවා. ඒවා වෙනත් රටවලත් ප්‍රචලිත වෙලා තිබෙනවා. ඒක එකක්. ඒ වාගේම මම මේ ළඟදි ජිනීවා ගියාම CERN පර්යේෂණ විද්‍යාගාරයට යන්න පුළුවන්කම ලැබුණා. පොළොවේ ඉඳලා අඩි 100ක් පහළින් තමයි ඒ විද්‍යාත්මක උපකරණ සකස් කරලා තිබෙන්නේ. අපේ රටේ තරුණ විද්‍යාඥයන් දෙදෙනෙකුට එහි යන්න අවස්ථාව ලැබිලාත් මුදල් නැතිකම නිසා යන්න බැරි වුණා. මම CERNවල ඉඳගෙන මෙහාට කථා කළා. රුපියල් ලක්ෂ 12යි ඔවුන් පුහුණු කිරීම වෙනුවෙන් වැය වන්නේ. අපේ තරුණ විද්‍යාඥයන් පුහුණු කරන්න අපට රුපියල් ලක්ෂ 12ක මුදල සපයා ගන්න බැරිද? රුහුණු විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා අංශයේ උපාධිධාරියෙක් සහ කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙක් ඊළඟ semester එක සඳහා එහි යැවීමට සියලු අරමුදල් සපයලා තිබෙනවා. ඒවා මේ තුළින් තමයි කරන්න පුළුවන් වුණේ. එතැනදී මොකක්ද කෙරෙන්නේ?

[ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා]

විද්‍යාගාරයක් තුළ particles නිෂ්පාදනය කරලා තිබෙනවා. අපේ බිමල් රත්නායක මැතිතුමා protons හොඳින් දන්නවා. Protons නිෂ්පාදනය කරලා තිබෙනවා. ඒක මූලික වශයෙන් කළේ ලෝකයේ උපත පිළිබඳ පර්යේෂණ කිරීම සඳහායි. මහා පිපුරුම -Big Bang - කියන එක පර්යේෂණාගාරයක කරනු ලබනවා. එම පර්යේෂණාගාරයේ හොයා ගත්ත particlesවලින් දැන් කරලා තිබෙන්නේ මොකක්ද? මේ වන විට මොළයේ පිළිකා සෛල විනාශ කිරීම සඳහා වඩාත් සාර්ථක වැඩ පිළිවෙළක් proton particles මඟින් සිදු කරලා තිබෙනවා. මේ වන විට යුරෝපය පුරාම එය ක්‍රියාත්මක වනවා. ඒ නිසා මිනිසාගේ පැවැත්ම සඳහාත්, ලෙඩ රෝගවලට ප්‍රතිකර්ම සඳහාත් මේ පර්යේෂණ ඉදිරියට ගෙන ගිහින් තිබෙනවා.

බලශක්ති නිෂ්පාදනයේදී අපි තවදුරටත් ගල් අඟුරු යොදා ගන්නවාද නැද්ද කියන එක සම්බන්ධයෙන් දැන් අපි එක් යුගයකට ඇවිල්ලා තිබෙනවා. ඒ වෙනුවට විකල්ප බලශක්ති නිෂ්පාදනය සඳහා අපි නැඹුරු වෙන්න ඕනෑ. අපට න්‍යෂ්ටික බලශක්තිය සපයන්න පුළුවන්කමක් නැහැ. මොකද, එහි අපද්‍රව්‍ය ගෙන යන්න තැනක් නැහැ. අපේ රට කුඩායි. අපේ රටට අවශ්‍ය විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා ගල් අඟුරු සහ ඉන්ධනවලින් තොරව වෙනත් විකල්ප ක්‍රියාමාර්ග සඳහා යන්න පුළුවන්කම තිබෙනවා. නිරක්ෂය ආසන්න රටවල් හැටියට රටවල් 41ක් මේ වන විට සංවිධානගත වෙලා තිබෙනවා. ඉන්දියාව සහ ප්‍රංශයේ නායකත්වය ඇතිව සූර්ය තාපය මඟින් විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. ජලාශවල එහෙම නැත්නම් මුහුදේ wind towers ඇනි කරලා එමඟින් විදුලිය ජනනය කරන්න. මේ ආදී වශයෙන් තාක්ෂණයේ දියුණුව සිදු වී ගෙන යනවා.

අපි බලාපොරොත්තු වනවා, අපේ රටේ ඉපදිලා විද්‍යාඥයන් බවට පත් වෙලා වෙනත් රටවලට ගිහිල්ලා දැනට සේවය කරන පර්යේෂකයන්ව, විද්‍යාඥයන්ව අපේ රටට ගෙන්වලා සැප්තැම්බර් මාසයේ 07, 10 කාල සීමාව තුළදී සාකච්ඡා කරන්න. නාලන්දා විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙක් වූ ආචාර්ය සරත් ගුණපාල මැතිතුමා මීට මාසයකට කලින් ලංකාවේ දේශනයක් කරන්න පැමිණි අවස්ථාවක මට හමු වුණා. එතුමා නාසා ආයතනයේ ඉතාම ඉහළ මහාචාර්යවරයෙක් හැටියට කටයුතු කරනවා. තවත් 25කට වැඩි පිරිසක් නාසා ආයතනයේ කටයුතු කරනවා. ඒ වාගේම නියුස්ටන් ප්‍රදේශයේ නවෝත්පාදන 13ක් සොයා ගත්ත ආචාර්ය බන්දුල විජය කියන පුද්ගලයා තව සති දෙක, තුනක මගේ පෞද්ගලික සංචාරයකදී මුණ ගැසීමට බලාපොරොත්තු වනවා. මම රජයේ මුදල් වියදම් කරලා නොවෙයි යන්නේ. එයින් බලාපොරොත්තු වන්නේ මොකක්ද? එතුමාගේ ආයතනයේ නිෂ්පාදනය කරලා තිබෙනවා හදවත්වලට stents දමන්න. නැත්නම්, හදවත් රෝගීන්ගේ bypass surgery වෙනුවට stent එක දමන්න, ඒකේ balloon එක දමන්න. මේවා නිෂ්පාදනය කරන තැනට ඒ අය ගිහින් තිබෙනවා.

ඉලිනෝයි විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ශිවනාදන් මහතා පේරාදෙනිය විශ්වවිද්‍යාලයෙන් මූලික උපාධිය ලබා ගත්තා. එතුමා අද මහාචාර්යවරයෙක්. එතුමාගේ සොයා ගැනීම සඳහා ජනාධිපති ඔබාමා විසින් පසු ගිය වර්ෂයේ විදේශ රටවලින් ඒ රටට පැමිණි විද්‍යාඥයන්ට ලබා දෙන ඉහළම සම්මානය ලබා දී තිබෙනවා. එතුමා අපේ රටේ විශ්වවිද්‍යාල හතරක් එක්ක සම්බන්ධ වෙලා මේ වන විට භෞතික විද්‍යා අංශයේ පර්යේෂණාගාර දියුණු කිරීම සඳහා කටයුතු කරනවා. සූර්යාලෝකයෙන් ලබා ගන්නා තාපය මඟින් සිලිකාවලින් නිෂ්පාදනය කරන විදුරුවලට, විදුරු ඒ සඳහා panel හැටියට භාවිත කර බලශක්තිය නිෂ්පාදනය කිරීම සඳහා පුරෝගාමියෙකු හැටියට අද එතුමා කටයුතු කරනවා. මම මේ උදාහරණ දෙකක් තමයි කිව්වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බවට පත් කිරීම තුළින් වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා ක්‍රියාත්මක වන එහි අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා ගැනීම, සභාපතිවරයා තෝරා ගැනීම, අරමුදල් සැපයීම, පාරදෘශ්‍යභාවය කියන රජය අනුගමනය කරන මේ සියල්ලම අමාත්‍යාංශය යටතේ තිබෙන ව්‍යවස්ථාපිත මණ්ඩලයක ආකාරයෙන්ම සිදු කිරීම සඳහායි. ඕනෑම සංශෝධනයක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. අපි ඒවා කාරක සභා අවස්ථාවේදී සලකා බලන්න සූදානම්. මේ පනත් කෙටුම්පත සඳහා ඔබ සියලුදෙනාගේ සහයෝගය අපේක්ෂා කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is, the Hon. I. Charles Nirmalanathan. Before that, will an Hon. Member propose the Hon. Bimal Rathnayake to the Chair?

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

[ப.ப. 1.29]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இலங்கை தேசிய ஆராய்ச்சிப் பேரவை சட்டமூலமானது விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சரினால் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. தற்பொழுது, இங்கு கௌரவ அமைச்சர் அவர்கள் குறிப்பிட்ட விடயங்கள் தொடர்பில் நான் ஒருசில கருத்துக்களைச் சொல்ல விரும்புகின்றேன். இலங்கை தேசிய ஆராய்ச்சிப் பேரவை யானது, உண்மையிலே இந்த நாட்டு மக்களுக்கு மிகவும் தேவையானதாகும். எங்களுடைய சுகாதாரத்துக்காகவும் எமது நாடு பொருளாதாரத்தில் பின்தங்கியிருக்கின்ற நிலைமைக் காகவும் நாட்டில் ஆராய்ச்சிப் பேரவை அமைக்கப்பட வேண்டும். அதன்மூலம் மக்களுக்குத் தேவையான விடயங் களை விஞ்ஞானிகள் மட்டும் தெரிந்துகொள்ளாமல் பாமர மக்களும் தெரிந்துகொள்வதற்கு பாடசாலைக் கல்வியிலிருந்து அது ஆரம்பிக்கப்பட வேண்டும் என்பது எனது கருத்தாக இருக்கின்றது.

அதேநேரத்தில், இந்த ஆராய்ச்சிப் பேரவை ஆரம்பிக்கப்படும் காலத்தில் பௌதிக வளங்களைக் கொண்டும் விஞ்ஞானம், கணிதம், விவசாயம் ஆகிய பாடங்களில் மிகவும் தேர்ச்சிபெற்ற ஆசிரியர்களைக் கொண்டும் மாணவர்கள் மத்தியில் ஆராய்ச்சி சம்பந்தமான அறிவை வழங்கலாம். அவர்கள் பல்கலைக்கழகம் செல்கின்றபோது, ஆராய்ச்சி தொடர்பில் முழுமை பெற்றிருப்பார்கள். முழுமைபெற்றிருப்பது என்றால், அவர்கள் பல்கலைக்கழகம் செல்கின்றபோது, ஆராய்ச்சி தொடர்பான அறிவில் உச்சநிலையை அடைந்திருப் பார்கள். இது அவர்கள் நமது நாட்டில் இல்லாத, கண்டுபிடிக்கப்படாத புதிய முயற்சிகளில் ஈடுபடுவதற்கு இலகுவாக அமையும். அந்த அடிப்படையில், பாடசாலைகளில் இருக்கின்ற தொழில்நுட்ப, விஞ்ஞான ஆய்வுகூடங்கள் ஆராய்ச்சியை நோக்கியதாக அமைந்தால், மிகவும் வரவேற்கத்தக்கதாக இருக்கும்.

அதேநேரத்தில், இலங்கை தேசிய ஆராய்ச்சி பேரவை சட்டமூலம் நிறைவேற்றப்பட்டு, அது அமைக்கப்படும்போது, வடக்கின் மத்திய பகுதியான மாங்குளத்திலும் அதன் ஒரு கிளை - ஓர் ஆராய்ச்சி நிலையம் - அமைக்கப்பட வேண்டும் என்பது கௌரவ அமைச்சர் அவர்களுக்கு நான் வழங்கும் ஆலோசனையாகும். இதற்கு கௌரவ அமைச்சர் அவர்கள் இன்றே பதில் அளித்தால் நன்றாக இருக்கும் என்று நான் நினைக்கின்றேன்.

இன்று நாங்கள் வடக்கிலுள்ள வைத்தியசாலைகளில் kidney - சிறுநீரகப் பாதிப்புக்குள்ளான நோயாளிகளை அதிகமாகக் காண்கின்றோம். ஏன், இந்த சிறுநீரகப் பிரச்சினையானது, வடக்கில் வாழுகின்ற மக்களுக்கு அதிகமாக ஏற்படுகின்றது என்பதை ஆராய்ச்சிமூலம் கண்டறிந்து அதனைத் தடுக்கவேண்டும். அங்கு யுத்தம் நடந்த காரணத்தினால்தான் எங்களுடைய மக்களுக்கு சிறுநீரகப் பிரச்சினை அதிகமாக ஏற்படுகின்றதா? அல்லது, அங்கு தற்போது இருக்கின்ற வாழ்க்கை முறையினால்தான் சிறுநீரகப் பிரச்சினை அதிகமாக ஏற்படுகின்றதா? என்பதை உண்மையில் ஓர் ஆராய்ச்சிமூலம்தான் கண்டறிய முடியும். ஆராய்ச்சிமூலம் காரணம் கண்டறியப்பட்டு, அவற்றைத் தடுப்பதற்கு உரிய முயற்சிகள் எடுக்கப்பட வேண்டும். வெறுமனே சட்டங்களை இயற்றி, கொழும்பில் காரியாலயங் களைத் திறந்து, இங்கு மட்டும் அது தொடர்பான நடவடிக்கைகளை அவதானித்துக்கொண்டிருந்தால், அது நாட்டிலுள்ள மக்கள் அனைவருக்கும் ஏற்புடையதாக அமையாது.

நாடளாவிய ரீதியில் மலையகம், வடக்கு, கிழக்கு, காலி, மாத்தறை என்று எல்லாப் பிரதேசங்களிலும் சுகாதாரம் சம்பந்தப்பட்ட நோய்கள் குறிப்பாக சிறுநீரக நோய், நீரிழிவு, டெங்கு போன்றவை என்ன காரணத்தால் உருவாகின்றன? அவற்றை எப்படித் தடுக்கலாம்? என்பவற்றைப் பற்றி இந்த ஆராய்ச்சியின்மூலம் கண்டறிந்து அந்தக் கிராமங்களிலுள்ள சகல பாமர மக்களுக்கும் அது சம்பந்தமான ஒரு விழிப்புணர்வுத் திட்டத்தை ஏற்படுத்தி இனிவரும் காலங்களில் இப்படியான நோய்கள் ஏற்படுவதைத் தடுக்க வேண்டும். அதாவது, டெங்கு நோய் என்ன காரணத்தால் ஏற்படுகின்றது, எப்படி அந்த நோய் ஏற்படாது தடுக்க முடியும், சீறுநீரக நோய் ஏன் வடக்கில் அதிகமாகக் காணப்படுகின்றது, இன்ன காரணத்தால்தான் இந்த நோய் உண்டாகின்றது போன்ற விபரங்கள் குடிமகனுக்குத் தெரியப்படுத்தப்பட வேண்டும். அந்த வகையில் இந்த நோய்கள் உண்டாவதற்குரிய காரணிகளைத் தடுக்கும் வழிவகைகளை அரசாங்கம் மேற்கொள்ள வேண்டும். அப்போதுதான் இந்தச் சட்டமூலத்தின் பயன்பாடு மக்களைச் சென்றடையும் என்பது எனது கருத்தாக இருக்கின்றது.

அதேநேரத்தில் இந்தச் சட்டமூலத்தை நிறைவேற்றுவதன் மூலம் இலங்கையின் தொழில்நுட்பமும் வளரும். 2050ஆம் ஆண்டு புவி வெப்பமடைதல் இரண்டு 'செல்சியஸ்' அதிகரித்தால், இலங்கையிலும் வெப்பம் அதிகரிக்கும் என்று அமைச்சர் அவர்கள் குறிப்பிட்டிருந்தார். அந்த அதிகரிப்பை எப்படி நாங்கள் கட்டுப்படுத்துவது என்று ஆராய வேண்டும். அந்த ஆராய்ச்சியின்மூலம் அதனைக் கட்டுப்படுத்தலாம். இந்த வெப்ப அதிகரிப்பினால் குறிப்பாக சிறிய, சிறிய தீவுகள் அழிந்துவிடும் என்று கூறப்படுகின்றது. இலங்கை ஒரு தீவாகும். அதிலுள்ள மன்னாரும் ஒரு தீவாக இருக்கின்றது. ஆகவே ஆராய்ச்சியின்மூலம் இந்த வெப்ப அதிகரிப்பைக் கட்டுப்படுத்துவதற்கு முயற்சி செய்தல் வேண்டும். எங்களுடைய பிரதேசங்கள் கடல் ஆக்கிரமிப்பால் அழிவடை வதைத் தடுப்பதற்கும் மிக முக்கியமாக ஆராய்ச்சிகள் மேற்கொள்ளப்படல் வேண்டும். ஏனென்றால் அது முற்றுமுழுதாகக் கடலால் சூழப்பட்டிருக்கின்றது. ஆகவே, அந்த ஆராய்ச்சிக்கும் மிக முக்கியத்துவம் கொடுத்துச் செயற்பட வேண்டும். அதாவது, எங்களுடைய நிலங்களையும் மக்களையும் கடல் அனர்த்தத்திலிருந்து பாதுகாப்பதற்கான முயற்சிகளை மேற்கொள்ள வேண்டும். இந்த ஆராய்ச்சியின் மூலம் குறித்த விடயங்களைக் கண்டுபிடிப்பது மட்டுமல்லாமல், நாட்டின் வைத்தியத் துறையும் தொழில்நுட்பத் துறையும் தொடர்ந்து முன்னேறுவதற்கும் வழிவகுக்க வேண்டும்.

இந்தப் பேரவைக்கான உறுப்பினர்களை எல்லாப் பிரதேசங்களிலிருந்தும் உள்வாங்குவதுடன், உண்மையில் தகுதியானவர்களை, அதாவது நிபுணத்துவம் பெற்றவர்களை இன, மத, மொழி பேதம் பார்க்காமல் உள்வாங்கி குறித்த ஆராய்ச்சிகளை நடத்தினால்தான் அது எங்களுடைய நாட்டுக்கும் எங்களுடைய மக்களுக்கும் மிகவும் பயனுள்ளதாக அமையும். அதைவிடுத்து அரசியல் ரீதியான நியமனங்கள் மூலம் இந்த ஆராய்ச்சிகளைச் செய்ய முற்பட்டால் உண்மையில் அது ஒரு காரியாலயம் மட்டுமாக இயங்குமே தவிர, இதனால் ஏற்படக்கூடிய உரிய முன்னேற்றத்தை நாடு அனுபவிக்காது. எனவே, இந்த ஆராய்ச்சி நிலையம் அமைக்கப்படுகின்றபோது வட மாகாணத்தின் மத்திய பகுதியான மாங்குளத்திலும் ஓர் ஆராய்ச்சி நிலையத்தை அமைத்து வட மாகாண மக்கள் பயன்பெறுவதற்கு வழிவகுக்க வேண்டும் என்று கௌரவ அமைச்சர் அவர்களிடம் மீண்டும் விநயமாகக் கேட்டுக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.39]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපිත කිරීමේ පනත් කෙටුම්පතට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න තමයි අද විවාදයෙන් විනාඩි කිහිපයක් මම ඉල්ලා සිටියේ.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

පර්යේෂණ සම්බන්ධයෙන් තිබෙන්නේ මේ ආයතනය පමණක්ම නොවෙයි. මේ සම්බන්ධයෙන් රජයේ ආයතන කිහිපයක්ම තිබෙනවා. National Science Foundation එක තිබෙනවා, COSTI ආයතනය තිබෙනවා. අපි අද කථා කරන්නේ National Research Council එක ගැනයි. අපේ රටේ පර්යේෂණ කිරීම සඳහා සහ ඒවා සම්බන්ධීකරණය කිරීම සඳහා රජයට අනුබද්ධ හා රජයට අනුබද්ධ නොවන මෙවැනි ආයතන බොහොමයක් තිබෙනවා. ජාතික පර්යේෂණ සභාව මේ පර්යේෂණ කරමින්, පර්යේෂකයන්ට මුදල් ලබා දෙමින්, ඒ පර්යේෂණවලින් ලැබෙන ප්‍රතිඵල ජාතික සංවර්ධන වැඩපිළිවෙළට දායක කර ගනිමින් කාලයක් තිස්සේ බොහෝ වැඩ කටයුතු කර ගෙන ගිහිල්ලා තිබෙනවා.

මේ සම්බන්ධයෙන් මම පොඩ්ඩක් හොයා බැලුවා. ලංකාවේ "Sri Lanka Science & Technology Statistical Handbook" කියලා එකක් 2013දී තමයි අවසාන වතාවට National Science Foundation එකෙන් publish කරලා තිබුණේ. ඒක ඉංග්‍රීසි භාෂාවෙන් තිබෙන්නේ. මම ඒකේ copy එකක් ගත්තා. මෙහි තිබෙනවා, ලංකාව 2013 වර්ෂයේ රුපියල් මිලියන 9,670ක් research and developmentවලට වියදම් කරලා තිබෙනවාය කියලා. ඒ කියන්නේ දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව 0.1ක ප්‍රමාණයක්. ඔවුන් කියනවා, 2010දී 0.16ට තිබුණු ප්‍රමාණයට වඩා 2013 වනකොට සෑහෙන දුරකට මේ ප්‍රමාණය අඩු වෙලාය කියලා. 2015 වර්ෂය වනකොට මෙය කොයි ආකාරයෙන් ක්‍රියාත්මක වුණාද කියලා කියන්න මම දන්නේ නැහැ. නමුත්, ඉතාමත්ම සුළු ප්‍රමාණයක් තමයි අපි පර්යේෂණ හා සංවර්ධනය -research and development- වෙනුවෙන් වෙන් කරන්නේ කියන එක නම් කියන්න අපට හැකියාවක් තිබෙනවා. මේකෙන් ආණ්ඩුව -රජය- විසින් වියදම් කර තිබෙනවා, සියයට 54ක්. Business enterprise sector කියන එක, එහෙම නැත්නම් වාණිජ අංශය විසින් සියයට 41ක් වියදම් කර තිබෙන බව තමයි වාර්තා වෙන්නේ. එතකොට අපි හොයා බලන්න ඕනෑ, මොනවාටද මේ research and development expenditure වැඩිපුරම තිබෙන්නේ කියලා.

මම දැන් අහගෙනයි ඇමතිතුමා කියනවා, National Research Council එක හරහා වල්ලාපටිට සම්බන්ධයෙන් research එකක් කරනවාය, පලතුරු මැස්සා සම්බන්ධයෙන් research එකක් කරනවාය, ඩෙංගු සම්බන්ධයෙන් research එකක් කරනවාය, වකුගඩු රෝගය සම්බන්ධයෙන් research එකක් කරනවාය කියලා. රුපියල් මිලියන 50 ගණනේ වැය කර පර්යේෂණ පහක්ද කොහෙදෝ කරනවා කියලා එතුමා සඳහන් කළා. නමුත්, ලංකාවේ මොන ක්ෂේත්‍රවලද වැඩියෙන්ම මේ research and development කෙරෙන්නේ කියලා අපි සමස්තයක් හැටියට අරගෙන බැලුවොත් පෙනෙනවා, 2013 වර්ෂයේ මේ පර්යේෂණවලින් සියයට 33ක් කරලා තිබුණේ engineering sciences and technologies සම්බන්ධයෙන් බවත්, සියයට 28ක් කෘෂි කර්මාන්තය සම්බන්ධයෙනුත් බව. ඊළඟට වෛද්‍ය පර්යේෂණ -medical sciences- හැටියට සියයට 10කට ආසන්න ප්‍රමාණයක් සහ සමාජ විද්‍යා පර්යේෂණ සියයට 5කට ආසන්න ප්‍රමාණයක් තමයි මේ පර්යේෂණවලින් ලංකාවේ කරලා තිබෙන්නේ.

ඊළඟට, science and technology ක්ෂේත්‍රයේ රැකියාවල ලංකාවේ කොපමණ ප්‍රමාණයක් නියැලිලා ඉන්නවාද කියලා බැලුවොත් - ඇත්ත වශයෙන්ම මට පොඩ්ඩක් පුදුම හිතුණා - science and technology related activitiesවලට 113,447දෙනෙක් සම්බන්ධ වෙලා ඉන්නවා. නමුත්, මේ ප්‍රමාණයෙන් සියයට 11ක් පමණයි විද්‍යාඥයන්, ඉංජිනේරුවරුන් සහ වෘත්තීයවේදීන් -scientists, engineers and professionals - හැටියට ඉන්නේ. සියයට 14ක් ඉන්නේ techniciansලා හැටියටයි. සියයට 75ක් support staff හැටියට තමයි ඉන්නේ. Science and technology ක්ෂේත්‍රයේ රැකියාවල 113,447ක් හිටියට සියයට 75ක් ඉන්නේ support staff. Sri Lanka Science & Technology Statistical Handbook එකේ තිබෙන්නේ, "ඉන්න මුළු scientistsලා ප්‍රමාණය 5,705ක්" කියලායි. එතකොට ලංකාවේ මිලියන 20ක් වූ ජනගහනයෙන් scientistsලා ඉන්නවා කියා හඳුනාගෙන තිබෙන්නේ 5,705යි; techniciansලා 3,200යි. ඉතාමත්ම සුළු ප්‍රමාණයක් තමයි මේ කාර්ය භාරයේ නියැළිලා ඉන්නේ. ඒකෙනුත් සියයට 50කට කිට්ටු - සියයට 47ක් - ප්‍රමාණයක් විශ්වවිද්‍යාලවලත්, සියයට 32ක් රජයේ අනෙකුත් ආයතනවලත් සේවය කරනවා. වාණිජ්‍ය ආයතනවල - business enterprisesවල - scientistsලා ඉන්නේ 5,705න් සියයට 21ක් පමණයි. එතකොට මේ කරන පර්යේෂණ, රටේ පුද්ගලික අංශය සමඟ දායක වෙලා කරන ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට එකතු වෙන්නේ කොයි ආකාරයටද කියන එක පිළිබඳව ගැටලු රාශියක් මේ දත්තවලින්ම පිළිබිඹු වනවා.

මම හොයලා බැලුවා මේ ක්ෂේත්‍රයේ ඉන්න ගැහැනු, පිරිමි අනුපාතය කොයි වාගේද කියලා. Research and Development Scientistsලා හැටියට සියයට 40ක් වැඩ කරන්නේ කාන්තාවන් කියලා මේ වාර්තාවේ තිබෙනවා. 2003දී කොපමණ විද්වත් ලිපි - research articles published by Sri Lankan scientists in science journals - පළ කරලා තිබෙනවාද කියලා බලමු.

ඒවා සියයට 77ක් foreign co-authorsලා එක්ක තමයි කරලා තිබෙන්නේ. ඔක්කෝම ලිපි 391ක් තමයි පළවෙලා තිබෙනවා කියලා වාර්තාගත වෙන්නේ. අවසාන වශයෙන් එක්ලක්ෂ දහතුන්දහසක් වැඩ කරන මේ science, technology and research community එකෙන් අලුත් සොයා ගැනීම් - new products - හැටියට 2013දී register කරලා තිබෙන්නේ 28යි. They have developed 28 new products, transferred six of their technologies and commercialized five items. එතකොට commercialize කරලා තිබෙන්නේ, එහෙම නැත්නම් වාණිජමය වශයෙන් පාවිච්චි කරන්න හැකි වෙලා තිබෙන්නේ අයිතම 05යි. අපි මෙච්චර වියදම් කරලා, එක් ලක්ෂ දහතුන්දහසක් වැඩ කරලා, රුපියල් මිලියන යම් ප්‍රමාණයක් වියදම් කරලා ඒ අවුරුද්දේ new products 05ක් commercialize කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. මම හිතන විධියට මේක මදියි. මදියි කියන්නේ හොඳටෝම මදියි. ඊළඟට මම ලංකාවේ දත්ත අරගෙන සංසන්දනය කළා, ලෝකයේ research and technology ක්ෂේත්‍රයට කොච්චර වියදම් කරනවාද; ලෝකයේ rankings අරගෙන බැලුවාම ලංකාව කොයි වාගේ තැනකද ඉන්නේ කියලා.

Sir, I have with me a document titled "The Global Innovation Index 2015, Effective Innovation Policies for Development", which I would like to **table***.

මේ වාර්තාව ඉදිරිපත් කරන්නේ Cornell University එකේ INSEAD ආයතනය සහ World Intellectual Property Organization - WIPO - කියන ආයතන එකතු වෙලායි. මෙතැනදී මම ඉස්සෙල්ලාම බැලුවේ ලංකාව නවෝත්පාදන ශ්‍රේණිගත කිරීමේ - Global Innovation Index එකේ - කොතැනද ඉන්නේ කියලායි. අපි දැක්කා, ලංකාව කොයි වාගේ වියදමක් ද කරන්නේ; කොයි වාගේ පර්යේෂණවලද නියැලිලා ඉන්නේ; කොපමණ ප්‍රමාණයක් මේ නවෝත්පාදන කිරීම සඳහා මහන්සි

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

වෙනවාද කියලා. 2013දී අයිතම 05ක් තමයි අලුතෙන් හඳුන්වා දී තිබුණේ. මේ ශ්‍රේණිගත කිරීමේ රටවල් 141ක් තිබෙනවා. මේක තමයි 2015ට කරපු අලුත්ම ශ්‍රේණිගත කිරීම. මේ රටවල් 141න් ලංකාව ඉන්නේ 85වැනි ස්ථානයේයි. බිංදුවේ ඉඳලා සියය වෙනකම් ලකුණු දීලා තිබෙනවා. වැඩිපුරම ලකුණු අරගෙන - ලකුණු 68ක් අරගෙන- මුල් ස්ථානයේ ඉන්නේ ස්විට්සර්ලන්තයයි.

ඊළඟට, ලකුණු 62ක් අරගෙන මහා බ්‍රිතාන්‍ය දෙවැනි ස්ථානයේ ඉන්නවා. ස්වීඩනය ලකුණු 62ක් අරගෙන තුන්වැනි ස්ථානයේ ඉන්නවා. නෙදර්ලන්තය ලකුණු 62ක් අරගෙන හතරවැනි ස්ථානයේ ඉන්නවා. ඇමෙරිකාව ලකුණු 60ක් අරගෙන පස්වැනි ස්ථානයේ ඉන්නවා. පින්ලන්තය ලකුණු 60ක් අරගෙන හයවැනි ස්ථානයේ ඉන්නවා. සිංගප්පූරුව ලකුණු 59ක් අරගෙන හත්වැනි ස්ථානයේ ඉන්නවා. අයිස්ලන්තය ලකුණු 59ක් අරගෙන අටවැනි ස්ථානයේ ඉන්නවා. ලක්සම්බර්ග් ලකුණු 59ක් අරගෙන නමවැනි ස්ථානයේ ඉන්නවා. ඩෙන්මාර්කය ලකුණු 57ක් අරගෙන දහවැනි ස්ථානයේ ඉන්නවා. මේ ශ්‍රේණිගත කිරීමේදී ලංකාවට ලැබිලා තිබෙන්නේ 85වැනි ස්ථානයයි. එය ඉතාමත්ම පහළ තත්ත්වයක්. මම ඊට පස්සේ හොයලා බැලුවා, ලංකාව ලකුණු කීයක් ලබාගෙන තිබෙනවාද කියලා. ඇත්ත වශයෙන්ම ලංකාව ලබාගෙන තිබෙන්නේ ලකුණු 30.8යි. අපි කොයි වෙලාවේත් ආසියානු රටක් හැටියට කථා කරන, මේ නවෝත්පාදන ශ්‍රේණිගත කිරීමේ ඉහළම තිබෙන ආසියාතික රට වන සිංගප්පූරුව සමඟ යම්කිසි විධියකට අපේ රට සංසන්දනයක් කරන්න පුළුවන් ද කියලා බලන්න මම උත්සාහ කළා.

එහෙම සංසන්දනය කරන කොට ඉතාම වැදගත් කරුණු රාශියක් බැලූ බැල්මට අපට පෙනෙනවා. ඔවුන් ශ්‍රේණිගත කිරීමේ පළමුවන ස්ථානයේ ඉන්න අයිතම කිහිපයක්ම මෙහි සඳහන් වෙනවා. නමුත් ඔවුන් පළමුවන ස්ථානයට එන විට අපි සියවන ස්ථානය පසු කර යන අවස්ථාව තමයි මෙයින් පිළිබිඹු වෙන්නේ. උදාහරණයක් හැටියට "Knowledge & technology outputs" කියන එක යටතේ Domestic resident patent app./bn PPP$ GDP වාගේ indicator එකක් අර ගෙන බැලුවොත්, ලංකාව ඉන්නේ පනස්වන ස්ථානයේ විතර. නමුත් සිංගප්පූරුව විසිවන ස්ථානයේ විතර රැඳිලා ඉන්නවා.

ඊළඟට, High-tech exports වාගේ එකක් ගත්තොත්, ප්‍රතිශතයක් හැටියට මුළු අපනයනවලින් කොච්චර High-tech exports තිබෙනවාද කියලා මෙහි තිබෙනවා. මෙය ඉතාම හොඳින් හිතට ගත යුතු කාරණයක්. මොකද, සිංගප්පූරුව තමයි අංක එකට ඉන්නේ. If you take high-tech exports less re-exports as a percentage of total trade, the the percentage of rank No. 1 is 26.8 per cent. High-tech exports less re-exports as a percentage of total trade යටතේ ශ්‍රේණිගත කිරීම අනුව ලංකාව ඉන්නේ අසූඑක්වන ස්ථානයේයි. ප්‍රතිශතයක් හැටියට ගත්තොත් 0.4යි. මෙන්න මේ වාගේ දේවල් පිළිබඳව තමයි අපේ රජයේ අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, අපි අපේ රට දියුණු කරන්න බලාපොරොත්තු වෙන්නේ ඉහළ තරගකාරී රටක් බවට පරිවර්තනය කරලායි. අපේ දැනුම මත කේන්ද්‍රගත වුණු ඉහළ තරගකාරී රටක් නිර්මාණය කරන්න නම්, නවෝත්පාදන සහ research and development කියන ක්ෂේත්‍රය දැන් තිබෙන තත්ත්වයට වඩා ඉතාම ශීඝ්‍රයෙන් මීට වඩා ඉහළ තැනකට අර ගෙන එන්න අපට මීට වඩා වෙහෙසෙන්න වෙනවා; උත්සාහ කරන්න වෙනවා. එහෙම කරන්න බැරි නම්, ලෝකයේ ඉහළ තරගකාරිත්වයක් තිබෙන රටවල් සමඟ අපි තරග කරන්නේ කොහොමද? අපි ලෝකයට අපනයනය කරන්න බලාපොරොත්තු වෙන්නේ මොනවාද? රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ කාලයේදී පටන් ගත් ඇඟලුම් කර්මාන්තය නිසා තමයි තවමත් අපි මේ තත්ත්වයට හරි ලෝකයත් එක්ක අපනයන ගනුදෙනුව කර ගෙන යන්නේ. ඇත්ත වශයෙන්ම අද වන විට අපි ඇඟලුම් කර්මාන්තයෙන් ලබා ගන්නා ඩොලර් බිලියන හතරහමාරක්-පහක් වාගේ ප්‍රමාණයට සාපේක්ෂව අපේ කාන්තාවන් ප්‍රධාන වශයෙන්ම මැද පෙරදිග ඉඳලා උපයන මුදල් ප්‍රමාණය දෙගුණයක් පමණ වෙනවා. ඩොලර් බිලියන අටහමාරක් විතර ඔවුන් උපයලා මේ රටට එවනවා. එතකොට අපට අවශ්‍ය කරන දිශාවට නොවෙයි මේ රට කාලයක් තිස්සේ ගමන් කරලා තිබෙන්නේ. ලෝකයත් එක්ක තරග කරන්න පුළුවන් ආකාරයේ අපනයන මේ රටේ නිෂ්පාදනය කරන්න බැරි වෙලා තිබෙනවා. ප්‍රතිශතයක් හැටියට ඉහළ තාක්ෂණයෙන් යුත් අපනයන ශ්‍රේණිගත කිරීම අනුව සිංගප්පූරුව පළමුවන ස්ථානයේ සිටීමත්, ලංකාව අසූඑක්වන ස්ථානයේ සිටීමත් සම්බන්ධයෙන් අපි ඉතාම ගැඹුරෙන් හිතන්න ඕනෑ. අපි කොහොමද අවශ්‍ය තැනට මේ රට ගෙන යන්නේ කියලා අපි හිතන්න ඕනෑ.

සිංගප්පූරුව පළමුවැනි ස්ථානයේ සිටින විට අපේ රට ඉන්නේ පස්වැනි හෝ විසිපස්වැනි ස්ථානයේ නම් අපට යම් කිසි විධියකට හිතන්න පුළුවන්, මේ තත්ත්වය fine-tune කරන්න පුළුවන් වෙයි කියලා. Fine-tune කරලා තව වැඩිපුර මුදල් ටිකක් එහාට මෙහාට කරලා මේ තිබෙන තත්ත්වයෙන් ගොඩ එන්න පුළුවන් වෙයි කියලා අපට හිතන්න පුළුවන්. නමුත් සිංගප්පූරුව පළමුවැනි ස්ථානයේ ඉන්නකොට අපි ඉන්නේ අසූඑක්වැනි ස්ථානයේ නම්, එතැන විශාල වෙනසක් තිබෙනවා. ඒ වෙනස අඩු කිරීම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව පක්ෂ - විපක්ෂ භේදයකින් තොරව මීට වඩා අපේ අවධානය යොමු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම උදාහරණ කිහිපයක් පෙන්වා දෙමින් මේ ගැන පැහැදිලි කර දෙන්නයි උත්සාහ කළේ. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් අපි යම් කිසි ප්‍රමාණයකට වැඩ කටයුතු කරලා තිබෙනවා. සම්පූර්ණයෙන්ම අගාධයේ නොවෙයි අපි ඉන්නේ. අපේ රටේ සිදු කර තිබෙන පර්යේෂණ පිළිබඳව අපේ ඉතිහාසය අරගෙන බැලුවොත්, අපේ පැරණි වාරි ඉංජිනේරු තාක්ෂණය හොඳම උදාහරණයක්. ඒ කාලයේ අපේ රට ලෝකයේ සිටි දියුණුම ඉංජිනේරුවන් හිටපු රටක් හැටියට සලකන්න පුළුවන්. ඒ කාලයේ කෘෂිකර්මයට ජලය ලබා ගැනීම සඳහා ඇළ මාර්ග ආදිය සංවර්ධනය කර තිබුණු ආකාරය පිළිබඳව කථා කිරීමේදී අපට ඒ ගැන දැන ගන්න පුළුවන්. නමුත් අපි හැම දාම ඉතිහාසයේ අපි ලබා ගත් දැවැන්ත ජයග්‍රහණ ගැන කථා කරලා වැඩක් නැහැ. වර්තමානයේ ගෙන යන මේ වැඩ පිළිවෙළ වෙනස් කර ගෙන, ඒ අවශ්‍ය මූල්‍ය සහ ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කර ගෙන, අපි මේ යන දිසාව වෙනස් කර ගත්තේ නැත්නම් අපේ ඉලක්කයට ගමන් කරන්න බැරි වෙනවා.

මම නැවතත් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ ආයතනය ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපනය කරන්න පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම පිළිබඳව. නමුත්, එවැනි නීතිමය වෙනස් කිරීම්වලින් පමණක් යා යුතු ඉලක්කයට යන්න අපට පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ සභාපති මහාචාර්ය ජනක ද සිල්වා මැතිතුමා අපේ පාසලේ අපට වඩා ඉහළ පන්තියක සිටි ජ්‍යෝෂ්ඨ පුද්ගලයෙක්. කවුරුත් දන්නවා, එතුමා මහාචාර්යවරයකු හැටියට ඉතාම හොඳින් මේ කටයුත්ත කර ගෙන යන බව. එතුමාටත් එතුමාගේ කාර්ය මණ්ඩලයටත් මේ කටයුතු කරගෙන

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

යෑම සඳහා අවශ්‍ය ඒ ශක්තිය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම අවම වශයෙන් තව අවුරුදු දහයකින් අපේ රට දැනට සිටින අසූඑක්වැනි ස්ථානයේ සිට පනස්වැනි ස්ථානයට ගෙනෙනවා කියලා ඉලක්කයක් හදා ගන්න ඔවුන්ට පුළුවන් නම්, එය තමයි අවශ්‍ය වෙන්නේ. මොකද, කරන්නන්වාලේ පර්යේෂණ කිරීමෙන් ඇති ප්‍රයෝජනයක් නැහැ. පර්යේෂණ කළ යුත්තේ රටේ සංවර්ධන වැඩ පිළිවෙළ සඳහා අවශ්‍ය ආකාරයටයි. ඒ නිසා ඒ අවශ්‍ය පර්යේෂණ කිරීම පිළිබඳවත්, ඒවා වාණිජමය ආකාරයෙන් රටේ සංවර්ධනය සඳහා යොදා ගන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අවධානය යොමු කරන්නය කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Lakshman Senewiratne. You have 13 minutes.

[අ.භා. 2.00]

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன) - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - State Minister of Science, Technology and Research)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බවට පත් කිරීම ඉතාම කාලෝචිතව සිදු වෙන දෙයක් බව ප්‍රකාශ කරන්න ඕනෑ. මගේ මිත්‍ර, අපේ නියෝජ්‍ය අමාත්‍ය ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාගේ කථාවෙන් පසුවයි මම කථා කරන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගේ කථාවට ඇහුම් කන් දුන්නා. ඔබතුමා කියපු බොහෝ කරුණු නිවැරදියි. අපි පසු ගිය මාස දෙක තුළදී ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා සමඟත් මේ සම්බන්ධව සාකච්ඡා කළා. මේ රටේ ඉතිහාසයේ හුඟක් අවස්ථාවල පර්යේෂණවලට, විද්‍යාව හා තාක්ෂණයට -Research and Development -R&D සඳහා-, මුල් තැනක් ලබා දුන්නේ නැහැ.

අපි බලාගෙන ගියොත් පෙනෙනවා, අද අපට වඩා ඉදිරියෙන් සිටින රටවල්, අවුරුදු ගණනාවකට කලින් අපට පසු පසින් සිටි රටවල් බව. ඒ රටවල සිද්ධ වුණේ මොකක්ද? ඒ රටවල සෑම ක්‍රියාවලියක්ම සිද්ධ වුණේ විද්‍යාව සහ තාක්ෂණය පදනම් කර ගෙනයි. ඒකයි සිද්ධ වුණේ. කොරියාව, ජපානය වාගේ රටවල් අද බොහොම ඉදිරියෙන් ඉන්නවා. ඔබතුමා කිව්වා වාගේ අපේ අල්ලපු වැටේ ඉන්න සිංගප්පූරුව, ඉන්දියාව වැනි සියලුම රටවල් අද ප්‍රමුඛතාව දීලා තිබෙන්නේ මොනවාටද? විද්‍යාව හා තාක්ෂණයටයි. පසු ගිය වකවානුව - අවුරුදු 40, 50 කාලය- ගත්තොත්, සංඛ්‍යා ලේඛන, දත්ත අනුව බැලුවත් අපි ඒ අතින් බොහොම පසුපසින් ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විද්‍යාව හා තාක්ෂණය බහුල වශයෙන් යොදා ගැනීම ඉදිරියේදී සිද්ධ වනවාය කියන විශ්වාසය අපට තියන්න පුළුවන් ප්‍රධාන හේතුව තමයි, වර්තමාන ජනාධිපතිතුමාත්, අග්‍රාමාත්‍යවරයාත් මේ පිළිබඳව තීන්දුවක් අරගෙන තිබෙන එක. ඔවුන් තීන්දුවක් අරගෙන තිබෙනවා මේ රට ඉස්සරහට යන්න නම් අපි විද්‍යාව හා තාක්ෂණයට මුල් තැනක් දෙන්න ඕනෑ කියලා. ඒ ගැන අපි බොහොම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපේ කාර්මික කටයුතුවලට, කෘෂිකාර්මික කටයුතුවලට, සිවර කටයුතුවලට තාක්ෂණය යොදා ගත්තත්, තාක්ෂණය අතින් අපි මොන තරම් පසුපසින් ඉන්නවාද කියන එක සොයා බැලුවොත් අපට දැනගන්න පුළුවන්. උදාහරණයක් හැටියට අපේ ගම්වල කුඹුරු ඉඩම් අක්කරයකින් නිෂ්පාදනය කරන වී ප්‍රමාණය කොපමණද කියලා බලන්න. ඒ හා සාපේක්ෂව අනෙක් රටවල් අරගෙන බැලුවොත් ඔවුන් මොන තරම් ඉදිරියෙන් සිටිනවාද?

මගේ මිත්‍ර හර්ෂ ද සිල්වා මැතිතුමා කියපු විධියට අපේ පර්යේෂණ ගත්තොත්, අපේ ඒ බොහෝ පර්යේෂණ රටට ගැළපෙන දේවල් නොවෙයි. ඒවා වාණිජමය වශයෙන් අපට ගැළපෙන දේවලුත් නොවෙයි. වාණිජමය වශයෙන් අපි පර්යේෂණ කරලාත් නැහැ. මේ ආයතනයෙන් සිද්ධ වන ප්‍රධානම දේවල් ගැන ගරු අමාත්‍යතුමා හොඳ පැහැදිලි කිරීමක් කළා. අද අපි තමුන්නාන්සේලා සියලු දෙනාම ඒකරාශීවෙලා අනුමත කරන මේ ව්‍යවස්ථාපිත මණ්ඩලයට අපි මූල්‍ය බලයක් ලබා දෙනවා. වෙනත් ආයතනවලින් ප්‍රදාන සහ ණය ලබා ගැනීමේ බලය ලබා දෙනවා. අවශ්‍ය කටයුතු සඳහා රජයේ ක්‍රමවේදය අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ බලය ලබා දෙනවා. අදාළ කාර්යයන් කරගෙන යෑම සඳහා පෞද්ගලික ආයතන සමඟ ගනුදෙනු කිරීමේ බලය ලබා දෙනවා. පර්යේෂණ සඳහා සුදුසු පුද්ගලයන් වෙත ප්‍රතිපාදන ලබා දීමේ බලය ලබා දෙනවා. සුදුසු පුද්ගලයන් වෙත වැඩිදුර අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබා දීමේ බලය ලබා දෙනවා. ප්‍රදාන අනුව කෙරෙන පර්යේෂණ කටයුතුවල ප්‍රගතිය පරීක්ෂා කිරීමේ බලය ලබා දෙනවා.

අනවශ්‍ය කටයුතු වෙනුවෙන් පර්යේෂණ පැවැත්වීම සඳහා රජයේ මුදල් වැය වීම, එකම පර්යේෂණ කටයුතු සඳහා ආයතන දෙකක් මඟින් කටයුතු කිරීම නිසා රජයේ මුදල් නාස්ති වීම, අරමුදල් ලබා දීමෙන් පසු ප්‍රගතියක් නොපෙන්වීම, අනවශ්‍ය පර්යේෂණ වෙනුවෙන් කටයුතු නොකිරීම, නිසි ප්‍රමිතියකින් තොරව පර්යේෂණ කටයුතු සිදු කිරීම කියන ඒවා තමයි මෙච්චර කාලයක් අපේ රටේ තිබුණු දුර්වලතා. ලංකාවේ අපි බොහොම දක්ෂයි duplicate වැඩවලට. එකම දේ සම්බන්ධයෙන් ආයතන ගණනාවක් පර්යේෂණ කරනවා. මම මුලදී කිව්වා වාගේ සමහර පර්යේෂණ රටට කිසිසේත්ම ගැළපෙන්නේ නැති පර්යේෂණ. අනෙක් පැත්තෙන් ඒවායින් වාණිජමය වාසියක්වත් රටට ලැබෙන්නේ නැති තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. එම නිසා අද තමුන්නාන්සේලා -අපි සියලුම දෙනා ඒක රාශී වෙලා තමුන්නාන්සේලාගේ උදව්වෙන්- පත් කරන මේ ව්‍යවස්ථාපිත මණ්ඩලයෙන් අපේ රට යම් තැනකට අරගෙන යන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒකට අවුරුදු කිහිපයක් යයි.

Why is R&D important to Sri Lanka? Twelfth pillar of the global competitive index is very important. If, as a country, we do not perceive research and development in science and research and innovation, the country would stagnate at this level of development.

අද මේ ඉන්න තත්ත්වයේ ඉඳලා ඊළඟ පියවරට යන්න නම්, රජයක් හැටියට, රටක් හැටියට අපි අත දීලා, සියලුම අමාත්‍යාංශත් ඒකාබද්ධ කර ගෙන, අනිවර්යයෙන්ම විද්‍යාව හා තාක්ෂණය තුළින් ඉදිරියට යෑම ඉතාමත් වැදගත් වනවාය කියන එක ප්‍රකාශ කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරේ අපේ ගරු මන්ත්‍රීවරයකු කථා කරනවා මා අහගෙන සිටියා. එතුමා ප්‍රශ්න කිහිපයක් මතු කළා. එතුමා උතුරේ වකුගඩු රෝගය ගැන ප්‍රකාශ කරන ගමන්, සමහර විට උතුරේ වකුගඩු රෝගය ඇති වුණේ යුද්ධය නිසාද කියන ප්‍රශ්නය මතු කළා. යුද්ධය නිසා වකුගඩු රෝගය ඇති වුණේ නැහැ. අද වන කොට මහියංගනය, ගිරාඳුරුකෝට්ටේ, පොලොන්නරුව වැනි ප්‍රදේශවල වකුගඩු රෝගීන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. යුද්ධය නිසා වකුගඩු රෝගය ඇති වන්නේ නැහැයි කියලා ඕනෑ කෙනෙක් දන්නවා. අද අපේ

ජනාධිපතිතුමාත්, සියලුම රාජ්‍ය නායකයනුත් ඒක රාශි වෙලා මේ වකුගඩු රෝගයට මූලික හේතුව කුමක්ද කියලා සොයා ගැනීමට කටයුතු කරමින් සිටිනවා. ඒ වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරගෙන යනවා. ඇත්තම කියනවා නම්, වකුගඩු රෝගයට මූලික හේතුව කුමක්ද කියලා තවමත් සොයා ගන්නට බැරි වෙලා තිබෙනවා. ලෝකයේ සිටින විශේෂඥයන් ඇවිල්ලා ඒ පිළිබඳව මෙහි පර්යේෂණ කරලා තිබෙනවා; ඉදිරියටත් කරනවා. වැඩි කල් යන්නට පෙර මේ ප්‍රශ්නයට පිළිතුරක් ලැබෙයි කියලා මා විශ්වාස කරනවා.

එතුමා ඩෙංගු රෝගය පිළිබඳව කථා කළා. ඇත්තටම ලංකාවේ ඩෙංගු රෝගය තිබුණාට, රටේ ජනතාවගේ දැනුවත් වීම තුළින් අද ඩෙංගු රෝගය බොහෝ දුරට මැඩ පවත්වාගෙන තිබෙනවා. රටේ ජනතාව ඉදිරිපත් වෙලා තමන්ගේ ගම් ප්‍රදේශ පිරිසිදුව තබා ගැනීමේ හේතුව මත අද ගම්වල ඩෙංගු රෝගය බොහෝ දුරට තුරන් වෙලා තිබෙනවා. ඩෙංගු රෝගය වැඩි වශයෙන් තිබෙන්නේ කොළඹ නගරය තුළ සහ ගම්පහ නගරය තුළයි. අපේ ප්‍රදේශවල ඩෙංගු රෝගීන් ඉන්නවා නම් ඉන්නේ 1/1000ක් පමණ ඉතා සුළු ප්‍රමාණයකුයි. ඒ දැනුවත් කිරීම තුළින් අද ඩෙංගු රෝගය මර්දනය කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම එතුමා ඉල්ලීමක් කළා, මේ සොයාගත් ප්‍රතිඵල පිළිබඳව මහ ජනතාව දැනුවත් කළ යුතුයි කියලා. අපේ විද්‍යාඥයින් සොයා ගන්නා ප්‍රතිඵල මොනවාද කියා රටේ ජනතාව දැන ගන්න ඕනෑ.

අද අපේ පාසල්වල ශිෂ්‍යයන්ට විද්‍යා දැනුම, තාක්ෂණය පිළිබඳව ලොකු පිපාසයක් තිබෙනවා. ඒ පිළිබඳව ඔවුන්ට ලොකු ඕනෑකමක්, උනන්දුවක් තිබෙනවා. අද මේ පාසල්වල තිබෙන බරපතළම ප්‍රශ්නය තමයි සාමාන්‍ය විද්‍යාව උගන්වන්නවත් ගුරුවරුන් නැතිකම. එතකොට මේ දරුවන්ගේ දැනුම පිළිබඳ පිපාසය නැති කරන්න අපි ක්‍රමවේදයක් හදා ගන්න ඕනෑ. පාසල්වල දරුවන් විශාල ඕනෑකමකින් science societies හදාගෙන තිබෙනවා. නමුත් අපි ඉන්නේ ඊට සෑහෙන පිටුපසින්. සංඛ්‍යා ලේඛන අනුව ගත්තත්, අපි ඉන්නේ සෑහෙන පසු පසින්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කළ මේ පටන් ගැන්ම ඉතාමත් වැදගත් වනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය තුළින් මේ රටේ විශාල ආයතන ගණනාවක් සම්බන්ධීකරණය කරන්න අපට පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. විශාල ආයතන ගණනාවක් සම්බන්ධීකරණය කරන එක තමයි අත්‍යවශ්‍යම දේ. ඒ සම්බන්ධීකරණය තුළින් අපි පසු බා තිබෙන තත්ත්වය යම් තාක් දුරකට මහ හරවා ගෙන අපේ ඉලක්කවලට යන්නට අපේ අමාත්‍යාංශයේ සියලුම නිලධාරි මහත්වරුන්ට හැකි වේවා!යි කියා ප්‍රාර්ථනා කරමින්, සියලු දෙනාගේම සහයෝගය බලාපොරොත්තු වෙමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික තලමෙහෙයුම්කරු සභාපති අසුන හාරගනියි)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. S. Shritharan. You have 20 minutes.

[பி.ப. 2.11]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை தேசிய ஆராய்ச்சிப் பேரவைச் சட்டமூலம் சம்பந்தமான விவாதத்திலே கலந்துகொள்வதில் மகிழ்ச்சியடைகிறேன். இந்த நாட்டிலே இருக்கின்ற இளைய விஞ்ஞானிகளையும் ஆராய்ச்சியாளர்களையும் ஊக்குவிக்கும் வகையில் இந்த இலங்கை தேசிய ஆராய்ச்சிப் பேரவை ஒரு முக்கியமான பங்கை வகிக்கவேண்டுமென்பது எல்லோருடையதும் விருப்பமாகும். குறிப்பாக, இன்று உலக நாடுகள் பல்வேறுபட்ட விஞ்ஞான ரீதியான வளர்ச்சிகளைக் கண்டிருக்கின்றன; பல முன்னேற்றங்களைக் கண்டிருக்கின்றன. 1948ஆம் ஆண்டு இலங்கை சுதந்திரம் பெற்றபொழுது ஜப்பான் நாட்டின் தனிநபர் தலா வருமானமும் இலங்கை நாட்டின் தனிநபர் தலா வருமானமும் சமமாகவே காணப்பட்டது. ஆனால், இன்று ஜப்பான் நாட்டின் தலா வருமானம் எத்தனையோ ஆயிரம் அமெரிக்க டொலர்களைத் தாண்டி முன்னேற்றம் கண்டிருக்கின்றது. இலங்கையிலே இன்று தனிநபருடைய தலா வருமானம் 240 அமெரிக்க டொலரைத் தாண்ட முடியாமல் தவிப்பதை நாங்கள் அவதானிக்கின்றோம். ஆகவே, ஒரு காலகட்டத்தில் இருந்த விஞ்ஞான முன்னேற்றம் ஜப்பானை உலகத்திலேயே ஒரு முன்னேற்றகரமான நாடாகக் காண்பித்திருக்கின்றது. நாங்கள் இன்று இந்தப் பாராளுமன்ற வளாகத்தில் நின்று பேசுகிறோம் என்றால், இந்தப் பாராளுமன்றக் கட்டிடமும்கூட ஜப்பான் நாடு தந்த ஓர் அன்பளிப்புத்தான். 1948களில் எமது நாட்டோடு சமமான தலா வருமானத்தைப் பெற்றிருந்த ஜப்பான் நாடு எமது நாட்டுக்கு ஒரு பாராளுமன்றத்தைக் கட்டித் தந்திருக்கிறது என்றால், அந்த அளவுக்கு அது முன்னேற்றமடைந்திருக்கின்றது.

இங்கு பலரும் குறிப்பிட்டதுபோல கொரியா, சிங்கப்பூர் போன்ற நாடுகள்கூட விஞ்ஞான ரீதியாகப் பல முன்னேற்றங்களையும் வளர்ச்சிகளையும் கண்டிருக்கின்றன. ஆனால், எமது நாட்டிலே அவ்வாறான முன்னேற்றங்கள் எதுவும் இல்லை. இளைய கண்டுபிடிப்பாளர்களுக்கு அல்லது இளமைக் காலத்திலே பாடசாலையில் கற்கின்ற மாணவர்களுக்கு அவர்களுடைய கண்டுபிடிப்புகளை வெளிக் கொண்டு வருவதற்கான முயற்சிகள், ஊக்குவிப்புகள் வழங்கப் படவில்லை. அவ்வாறு முயற்சி செய்பவர்களுடைய முன்னேற்றங்கள்கூட தடுக்கப்பட்ட வரலாறுகள்தான் அதிகமானவை. அண்மையில் வவுனியாவில் ஜக்ஷன் என்ற மாணவன் தன்னுடைய கண்டுபிடிப்புகளை 200 கோடி ரூபாய்க்கு தனி நிறுவனங்களுக்கு விற்பனை செய்ததாக ஒரு செவ்வியிலே தெரிவித்திருந்தார். அத்துடன், "நான் ஒரு தனி மாணவனாக எவ்வளவோ கடினமாக முயற்சி செய்திருந்தேன்; பலரிடமும் பல நிறுவனங்களிடமும் சென்று உதவி செய்யுமாறு கேட்டபொழுதும் எனக்கு எந்த உதவிகளும் கிடைக்கவில்லை; என்னை யாரும் கவனிக்கவில்லை" என்றும் அவர் குறிப்பிட்டிருந்ததாகப் பத்திரிகைகள் பிரசுரித்திருந்தன. அந்த மாணவனுக்கு இந்த உயர்ந்த சபையினூடாக நான் என்னுடைய பாராட்டுக்களைத் தெரிவித்துக்கொள்கிறேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු එඩිවඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩිවඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩිවඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. BIMAL RATHNAYAKE *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

எமது நாட்டிலே பல மாணவர்கள் இவ்வாறு முயற்சிகளை மேற்கொள்கிறார்கள். தென்பகுதியில்கூட பல மாணவர்கள் தங்களுடைய முயற்சியினூடாக கண்டுபிடிப்புகளைச் செய்திருக்கிறார்கள். அதுபற்றிய செய்திகளை நாங்கள் பத்திரிகைகளில் வாசித்திருக்கிறோம். இவற்றை ஊக்குவிக்கக் கூடிய வகையிலே இந்த இலங்கை தேசிய ஆராய்ச்சிப் பேரவை பல்வேறுபட்ட விஞ்ஞானக் கண்டுபிடிப்புகளையும் பல்துறை சார்ந்த கணித ரீதியான science and technology துறைகளிலே அவர்களுடைய முயற்சிகளை மேற்கொள்வதற்கான ஒத்துழைப்பையும் வழங்க வேண்டும். குறிப்பாக, இன்று அமெரிக்கா தனது software companies ஐ இந்தியாவில் பல இடங்களில் நிறுவியிருக்கின்றது. அங்கிருக்கின்றவர்களின் தொழில்நுட்பத் திறன்களைப் பெற்றுக்கொள்வதற்காக இவ்வாறு மேற்கொண்டிருக்கிறது. இலங்கையில் தென் பகுதியிலோ அல்லது வடபகுதியிலோ இருக்கின்ற ஊழிய வளங்களைப் பயன்படுத்தக்கூடிய வகையில் software companies ஆரம்பிக்கப்படவில்லை. இந்த நாட்டிலே சரியான முறையில் இந்த science and technology கொண்டுவரப் படவில்லை என்ற குறைபாடு பரவலாகக் காணப்படுகின்றது.

அண்மைக் காலங்களில் மிகமுக்கியமான சில செய்திகளை நாங்கள் படித்திருக்கின்றோம். அதாவது, புனர்வாழ்வு பெற்று வந்த 104க்கு மேற்பட்ட பெண் போராளிகளும் ஆண் போராளிகளும் cancer நோயினால் இறந்திருக்கிறார்கள். அண்மையிலே சாலாவ இராணுவ முகாமிலுள்ள ஆயுதக் களஞ்சிய வெடிப்பின் காரணமாக மக்களுக்கு சுவாச நோய்கள், cancer போன்ற நோய்கள் ஏற்படுமென பாராளுமன்றத்தில் கௌரவ உறுப்பினர்கள் பலரால் எடுத்துரைக்கப்பட்டது. அப்படியாயின், 30 ஆண்டுகள் இந்தக் கந்தகக் காற்றைச் சுவாசித்திருந்த எமது மக்களுடைய நிலைமை என்ன? புனர்வாழ்வு பெற்று அவர்கள் மீண்டு வந்தபின்னர் 104க்கு மேற்பட்ட போராளிகள், குறிப்பாக பெண் போராளிகள் புற்றுநோயினால் இறந்திருக்கிறார்கள். இவ்வாறான இறப்பு களுக்கான காரணங்களைக் கண்டறிவதற்கு உண்மையிலே ஒரு நம்பகத்தன்மையின் அடிப்படையில் ஆய்வு செய்யப்பட வேண்டும். இந்த ஆய்வுகளை இந்த நாட்டிலே மேற்கொள்வதற்கு சுதந்திரமான, வெளிப்படையான ஆய்வு நிறுவனங்கள் இருக்க வேண்டும்.

இந்தத் தேசிய ஆராய்ச்சிப் பேரவை வெறுமனே பெயரளவில் ஒரு காரியாலயமாக இருக்கக்கூடாது; எழுத்தினாலான ஒரு சட்டமூலமாக இருக்கக்கூடாது. யுத்தத்தின்போது சரணடைந்த போராளிகள் புனர்வாழ்வு பெற்று வந்ததன் பிற்பாடுதான் இந்த cancer நோயினால் சாகடிக்கப் பட்டிருக்கிறார்கள் என்றால், அதற்குரிய காரணங்கள் அறியப் படவேண்டும். யாழ்ப்பாண மாவட்டத்திலும் வன்னியில் குறிப்பாக முல்லைத்தீவு, கிளிநொச்சி, மன்னார் ஆகிய மாவட்டங்களிலும் இருக்கின்ற மக்களில் பெரும்பாலானவர்கள் காச நோய், இதயநோய் போன்றவற்றால் பாதிக்கப் பட்டிருக்கின்றார்கள் என்றும் அதற்குக் காரணம் அவர்கள் வெடி மருந்துப் புகையினை சுவாசித்தமைதான் என்றும் 4 ஆண்டுகளுக்கு முன்பு டாக்டர் தர்மேந்திரா அவர்கள் யாழ்ப்பாணத்திலே கூறியிருந்தார். அத்துடன் இந்த வெடி மருந்துப் புகையினைச் சுவாசித்தமை இதயநோய்க்கு மிக முக்கியமான காரணமாக இருக்கின்றது என்றும் அவர் குறிப்பிட்டிருந்தார். இவற்றையெல்லாம் ஓர் ஆய்வுக்கு உட்படுத்தக்கூடிய சுதந்திரமான நிறுவனங்கள் இந்த நாட்டிலே காணப்படவில்லை. இவை சரியான மனித நேயத்தோடும் மனித விழுமியங்களோடும் ஆராய்ச்சி செய்யப்படவில்லை. எனவே, இந்த ஆய்வுகள் மேற்கொள்ளப்பட வேண்டும்.

இவற்றைவிட, இராணுவத்தடை முகாம்களிலிருந்து அவர்களுக்குரிய புனர்வாழ்வு பெற்று அல்லது விசாரணை களுக்குட்படுத்தப்பட்டு வந்த பல போராளிகள் இடுப்பிற்குக் கீழே இயங்க முடியாதவாறு வெளியிலே வந்திருக்கின்றார்கள். அவர்களுக்கு ஏதோ ஒருவித மருந்து இடுப்பிலே ஏற்றப்பட்டதாக அவர்கள் என்னிடம் தெரிவித்தார்கள். அவர்களுடைய உயிருக்கு உத்தரவாதமில்லாததனால் அவர்கள் இதனை வெளிப்படையாகச் சொல்ல முடியாதிருக்கின்றார்கள். தென்பகுதியிலே இருக்கின்ற சில வைத்தியசாலைகளில் சில சகோதர வைத்தியர்கள் அவர்களில் சிலருக்கு வைத்தியம் செய்து குணப்படுத்தியும் இருக்கின் றார்கள். தங்களுடைய பெயர்களைச் சொல்லவேண்டாமென்று கூறி அவர்கள் குணப்படுத்தப்பட்டிருக்கின்றார்கள். இவ்வாறானவர்களின் இந்த நிலைமைக்குக் காரணம் என்ன? அவர்களுக்கு என்ன நடந்தது? போன்ற கேள்விகளுக்கான விடைகளைப் பெறுவதற்கு, அந்த உண்மை நிலைமையை வெளியிலே கொண்டுவருவதற்கு இவர்கள்மீதான ஆய்வுகள் செய்யப்படவேண்டும். இந்த ஆய்வுகள் செய்யப்படுகின்ற போதுதான் உண்மை நிலைமை கண்டறியப்படும்.

அதேபோல் வடக்கு, கிழக்கிலே இருக்கின்ற கிளிநொச்சி, முல்லைத்தீவு, மட்டக்களப்பு, அம்பாறை மாவட்டங்களில் 'பொஸ்பரஸ்' குண்டுகளால் பாதிக்கப்பட்ட பல பெண்களையும் ஆண்களையும் நான் சந்தித்துக் கதைத்திருக்கின்றேன். அவர்கள் எங்களிடம் நேரடியாக வந்து வாக்குமூலம் தந்திருக்கின்றார்கள். அவர்களுடைய முகங்களிலும் கை கால்களிலும் மற்றும் உடலின் ஏனைய பாகங்களிலும் இன்றும் அந்த எரிகாயங்கள் காணப்படுகின்றன. இவற்றுக்கான நிவாரணம் என்ன? இவர்கள் ஏன் அவ்வாறு பாதிக்கப்பட்டார்கள்? இந்த நாட்டில் நடந்த யுத்தத்திலே அவர்கள் எவ்வாறு பாதிக்கப்பட்டார்கள்? என்பன தொடர்பான ஆய்வுகள் மேற்கொள்ளப்பட வேண்டும். இவையெல்லாம் 2009ஆம் ஆண்டு நடந்த யுத்தத்தின்போது ஏற்பட்ட பாதிப்புக்களாகும்.

அண்மையில் காணாமல்போனோர் தொடர்பான ஜனாதிபதி ஆணைக்குழுவின் தலைவராக இருக்கின்ற மக்ஸ்வெல் பரணகம அவர்கள் இந்த நாட்டிலே யுத்தத்தின் போது கொத்தணிக் குண்டுகளைப் பாவித்திருந்தாலும் அது பிழையில்லை என்று குறிப்பிட்டிருக்கின்றார். ஆனால், பிரித்தானியாவிலிருந்து வெளிவருகின்ற 'கார்டியன்' பத்திரிகை இங்கே யுத்தத்தின்போது கொத்தணிக் குண்டுகள் பாவிக்கப்பட்டதை உறுதிப்படுத்தி ஆதாரங்களோடு செய்தி வெளியிட்டிருக்கின்றது. அதுமட்டுமல்லாமல் இந்தியா விலிருந்து நேற்றையதினம் வெளிவந்த 'இந்து' பத்திரிகையிலும் நிர்மானியன் பாலசுந்தரம் அவர்கள் எழுதிய ஒரு கட்டுரை, இலங்கையில் கொத்தணிக் குண்டுகள் பாவிக்கப் பட்டதை வெளிக்கொண்டுவந்திருக்கிறது. கொத்தணிக் குண்டு என்பது மனித உயிர்கள்மீது பாவிக்கப்பட முடியாத ஒரு குண்டு. ஆனால், யுத்தத்தில் இந்த நாட்டின் குடிமக்கள்மீது இந்த நாட்டின் படைகள் அந்தக் குண்டுகளைப் பாவித்திருக்கின்றபோது, "அவ்வாறு பாவித்திருந்தாலும் பிழையில்லை" என்று சொல்கின்ற ஜனாதிபதி ஆணைக்குழு வின் தலைவர் மக்ஸ்வெல் பரணகம என்பவர், எவ்வாறு ஒரு நீதியான விசாரணையை மேற்கொள்வார்? என்கின்ற கேள்வி இன்று பரவலாக எல்லோரது மனதிலும் இருக்கின்றது. குறிப்பாகத் தமிழர்கள் அவர் தலைமையிலான அந்த ஆணைக்குழுவின் அறிக்கையை நம்புவதற்குத் தயாராக இல்லை. உலகம் இதனை எவ்வாறு ஏற்றுக்கொள்ளப்

போகின்றது? இதற்கு ஒரு வெளிப்படையான விசாரணை தேவை; ஆராய்ச்சி தேவை.

இந்த ஆராய்ச்சிக்கு இந்தப் பேரவைகள் ஒரு நல்ல வழியை வகுக்குமா? என்பதை நாங்கள் இந்த இடத்திலே ஆராயவேண்டும். ஏனென்றால், பாதிக்கப்பட்டவர்கள் தமிழர்கள்; உடற்பாதிப்புக்குள்ளானவர்களும் தமிழர்கள். இப்போது யார் அவர்கள் மீது பாதிப்பை ஏற்படுத்தினார்களோ, அவர்களே விசாரணைகளை நடத்திக்கொண்டிருக்கின்றார்கள். அது நல்லிணக்க ஆணைக்குழுவின் விசாரணையாக இருக்கலாம் அல்லது ஜனாதிபதி ஆணைக்குழுவின் விசாரணையாக இருக்கலாம். எந்த விசாரணைகளாக இருந்தாலும் யார் தமிழர்கள்மீது குண்டுகளை வீசினார்களோ, யார் தமிழர்களை அழித்தார்களோ, யார் தமிழர்களை இன அழிப்புச் செய்தார்களோ அவர்களேதான் இந்த விசாரணைகளை மேற்கொள்கின்றார்கள். ஆகவே, அடித்தவனே விசாரணை செய்வதானால் அது நீதியான விசாரணையாக இருக்குமா? இதற்காகத்தான் ஒரு சர்வதேச ரீதியான நீதித்தன்மை கிடைக்கக்கூடிய வகையில் வெளிப்படையான விசாரணையாக இது இருக்கவேண்டும் என்பதைத் தமிழர்கள் விரும்புகின்றார்கள். சர்வதேசமும் இதனை ஏற்றுக்கொண்டதன் அடிப்படையில்தான் கடந்த ஆண்டு கொண்டுவரப்பட்ட ஜெனீவா தீர்மானத்தில், இந்த விசாரணைகளில் சர்வதேச நீதிபதிகள், சர்வதேச சட்டவாளர்கள் போன்றோரின் பங்களிப்பு இருக்கவேண்டும் என்று தெரிவித்திருந்தது. அதனை அரசாங்கமும் ஏற்றிருந்தது. ஆனால், இவ்வருடம் நாட்டின் தலைவர்களிடமிருந்து அதற்கு மாறாகப் பல கருத்துக்கள் வருவதை நாங்கள் அவதானிக்கின்றோம். இது மிகமிக ஆபத்தானது. இது இந்த நாட்டிலே ஒரு நியாயமான, ஜனநாயகமான கருத்துக்களுக்கு வழி கொடுக்கிறதா? என்ற கேள்வியை எழுப்புகின்றது. கௌரவ உறுப்பினர் சார்ள்ஸ் நிர்மலநாதன் அவர்கள் சொன்னதுபோல் வடக்கு, கிழக்கை மையப்படுத்தி மாங்குளத்திலே இந்த இலங்கைத் தேசிய ஆராய்ச்சிப் பேரவையின் காரியாலயம் ஒன்று அமைக்கப்படவேண்டும்.

அங்கே நடந்த யுத்தத்தின்பொழுது கொல்லப்பட்டவர்களும் யுத்தத்தால் தங்களுடைய அவயவங்களை இழந்தவர்களும் ஒவ்வொரு உடலிருந்தும் வடிந்துகொண்டிருக்கின்ற ஊனங்களும் யுத்தத்தின் வடுக்களைச் சொல்வதற்கான ஆதாரங்களாக இருக்கின்றன. இவை ஆய்வுக்கு உட்படுத்தப்படவேண்டும். இதற்கு இந்தப் பேரவையின் ஒரு கிளை மிகக் காத்திரமான முறையில், நேர்மையான முறையில் அங்கு அமைக்கப்படவேண்டும்.

2009ஆம் ஆண்டு பங்குனி மாதம் 03ஆம் திகதிக்கும் 09ஆம் திகதிக்குமிடையில் வன்னிப் பகுதியில் குறிப்பாக, முல்லைத்தீவு மாவட்டத்தில் சுதந்திரபுரம், உடையார்கட்டு, ஆனந்தபுரம், முள்ளிவாய்க்கால் பகுதிகளிலே கொத்தணிக் குண்டுகள் வீசப்பட்டதற்கான ஆதாரங்களை மக்களும் தெரிவிக்கிறார்கள்; பத்திரிகைகளும் தெரிவிக்கின்றன. இவை 2009ஆம் ஆண்டு காலப்பகுதியில் ஏற்படுத்தப்பட்ட யுத்தத்தின் வலிகள். அந்த வடுக்கள் இன்றும் அந்த மக்களை நாளாந்தம் கொன்றுகொண்டே இருக்கின்றன; அவர்கள் செத்துக் கொண்டே இருக்கிறார்கள். சிறுநீரகம் - kidney - சம்பந்தமான நோய்கள் யுத்தத்தால் வருவதில்லை என்று அமைச்சர் அவர்கள் பேசும்பொழுது சொன்னார். சரி, சிறுநீரகப் பாதிப்பானது குடிநீரினால் கூடுதலாக ஏற்பட்டாலும், இன்று மன்னார், வவுனியா, கிளிநொச்சி, யாழ்ப்பாணத்தின் வடமராட்சி மற்றும் கிழக்குப் பகுதிகளில் வாழ்ந்த மக்கள் ஒட்டுமொத்தமாக முல்லைத்தீவில் குடியேறினார்கள். அவர்கள் கொண்டுசென்ற இலத்திரனியல் பொருட்கள், அவர்களுடைய கையில் இருந்த பல்வேறு வகையான இரும்புப் பொருட்கள், அவர்களிடமிருந்த சூழலைப் பாதிக்கக்கூடிய பல்வேறு வகையான பொருட்கள் முல்லைத்தீவு மண்ணிலே புதைக்கப்பட்டன, அல்லது அங்கு விட்டுவிட்டு வரப்பட்டன. இவ்வாறான பொருட்கள் இப்பொழுது அந்த மண்ணோடு கலப்பதனால் - அந்த மண்ணுக்குள்ளே புதையுண்டு இருப்பதனால், "கட்மியம்" போன்ற நச்சுப் பொருட்களின் அளவு அதிகரித்துள்ளது. இதனால் இலங்கையிலே கூடுதலான சிறுநீரகப் பாதிப்புக்கு முல்லைத்தீவு மாவட்டம் உட்படப்போகின்றது என்ற எச்சரிக்கையை இன்று பல ஆராய்ச்சியாளர்கள், scientist - விஞ்ஞானிகள் - குறிப்பிட்டிருக்கின்றார்கள். ஆகவே, இவையெல்லாம் மிக முக்கியமானவை; ஆய்வுக்கு உட்படுத்தப்பட வேண்டியவை.

யுத்தம் நடந்த பிரதேசங்களில் இருக்கின்ற மக்களுடைய சுகாதாரம், அவர்களுடைய எதிர்காலம், அவர்கள் எந்த அடிப்படையில் பாதிக்கப்பட்டிருக்கின்றார்கள் என்பது தொடர்பில் ஆராய்ச்சிப் பேரவையானது சுதந்திரமான முறையில் ஆராய்ச்சிகளை மேற்கொள்ளவேண்டும். இந்த சுதந்திரத்தன்மை இந்த நாட்டில் கிடைக்குமா? சுதந்திரமான, பக்கச்சார்பற்ற, நீதியான விசாரணைக்கு இது நல்லதொரு வழியை வகுக்குமா? என்பதை நாங்கள் இந்தச் சபையிலே கேள்வியாக முன்வைக்க விரும்புகின்றோம்.

நான் முன்னர் குறிப்பிட்டதுபோன்று, மிக முக்கியமாக, 104க்கும் மேற்பட்ட போராளிகள் cancer நோயினால் கொல்லப்பட்டிருக்கிறார்கள். இன்றும் பல போராளிகள் இடுப்புக்குக் கீழே இயங்க முடியாதவர்களாக இருக்கின்றார்கள். அவ்வாறு இயங்க முடியாமல் இருந்த சிலருக்கு தென்னிலங்கையில் இருக்கின்ற சகோதர சிங்கள வைத்தியர்கள் சிகிச்சை செய்திருக்கின்றார்கள். ஆகவே, இந்த அடிப்படையில் இவை சிந்திக்கப்படவேண்டும். இந்தப் பேரவையானது, இளைய விஞ்ஞானிகளை, இளைய தலைமுறைகளை ஊக்குவிக்கின்ற அதேநேரம், பாதிக்கப்பட்ட, அழிக்கப்பட்ட தமிழர்களுக்கு நீதி கிடைக்கக்கூடிய வகையில் ஆய்வுகளை மேற்கொள்ளவேண்டும். இதனை நான் இந்தச் சபையினூடாக சர்வதேச நாடுகளுக்கு ஒரு கோரிக்கையாக முன்வைக்க விரும்புகின்றேன். அமெரிக்கா, பிரித்தானியா, யப்பான் போன்ற வளர்ந்த நாடுகளும் இந்தியா போன்ற நாடுகளும் வடக்கு, கிழக்கில் வாழுகின்ற, யுத்தத்தால் பாதிக்கப்பட்டு இன்றும் யுத்தத்தின் வடுக்களையும் வலிகளையும் சுமக்கின்ற மக்களிடம் ஒரு வெளிப்படையான ஆய்வு நடத்த வேண்டும். யுத்தத்தின் சாயல்கள், கந்தகக் காற்றின் வலிகள் இன்றும் அந்த மக்களைத் தாக்கிக்கொண்டே இருக்கின்றன. அங்கே மூளை வளர்ச்சி குன்றிய, உடல் ரீதியாகப் பாதிக்கப்பட்ட குழந்தைகள் பிறப்பதற்கான சந்தர்ப்பங்கள் அதிகமாக இருக்கின்றன. இவற்றுக்கான தீர்வுகள் குறித்து விரைவாக ஓர் ஆய்வு மேற்கொள்ளப்பட வேண்டும் என்று கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

[අ.භා. 2.24]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පතට අදාළව කරුණු කීපයක් ගෙන හැර දක්වන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[ගරු බිමල් රත්නායක මහතා]

මෙම පනත සම්බන්ධව අපේ විශේෂ විවේචනයක් නොමැති බව පළමුවෙන්ම මා සඳහන් කරන්න ඕනෑ. නමුත්, අපට තිබෙන ගැටලුව තමයි මේ පනතින් බලාපොරොත්තු වන අරමුණු ඉටු වනවාද කියන කාරණය. "ජාතික පර්යේෂණ සභාවක්" කිව්වාම, එහි නම ඉතා පුළුල්. නමුත්, රටේ තිබෙන අනිකුත් ජාතික පර්යේෂණ ආයතන සහසම්බන්ධ කර ගන්න සත්‍ය වශයෙන්ම එයට පුළුවන්කමක් තිබෙනවාද? උදාහරණයක් හැටියට ගත්තොත් ලංකාවේ ඉතා ප්‍රසිද්ධ පර්යේෂණ ආයතන වන්නේ බතලෙගොඩ වී පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය වාගේම පේරාදෙනියේ තිබෙන පශු සම්පත් ආශ්‍රිත පර්යේෂණ ආයතනය. මා නොදන්නා තවත් මෙවැනි ආයතන ගණනාවක් තිබෙනවා. ඒ නිසා මේක විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට පමණක් වග කියන ආයතනයක් බවට පත් වන බව තමයි මෙම පනතින් පෙනෙන්නේ. එම නිසා ඒ කාරණය අමාත්‍යවරයාගේ අවධානයට යොමු විය යුතුයි කියා මා හිතනවා. මම උදාහරණයක් කියන්නම්. අපේ රටේ මධ්‍යම සංස්කෘතික අරමුදල පිහිටුවා තිබෙනවා. එය සංස්කෘතික අමාත්‍යාංශයේ විෂයක් වුණාට, මගේ දැනීමේ හැටියට එහි සභාපතිවරයා වන්නේ නිල බලයෙන් අගමැතිවරයායි. අගමැතිවරයා මෙම සභාවට පත් කරන්න කියන එක නොවෙයි මා කියන්නේ. නමුත්, මෙම ආයතනය "ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව" කියා හැඳින්වුවත්, සැබෑ ලෙස අනිකුත් පර්යේෂණ ආයතන සම්බන්ධීකරණය කරන්න පුළුවන් ක්‍රමවේදයක් මේ පනත තුළ අපට පෙනෙන්නේ නැහැ. සාමාන්‍ය මට්ටමේ වගන්ති පමණයි මෙම පනත් කෙටුම්පතේ තිබෙන්නේ. එම කාරණය කෙරෙහි මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. එහෙම නැත්නම් වෙලා තිබෙන්නේ මෙන්න මේ වාගේ දෙයක්.

අපි පිහිටුවන්නේ National Research Council එක නේ. මෙහි "National" කියන එකයි, "Research" කියන එකයි දෙකම පොඩි වෙලා, "Council" කියන එක විතරක් ලොකු වෙනවා. අපේ රටේ එහෙම ආයතන ගොඩක් තිබෙනවා. National Livestock Development Board එක අරගෙන බලන්න. එහි "Livestock Development" කියන කෑල්ලේ "L" එකයි, -ඔබතුමා ඒ board එකත් බලන්න.- "N" එකයි ලොකුයි. "B" එකත් ලොකුයි. "Livestock Development" කියන එක පොඩියි. ඒ නිසා මේකේ "N"එකයි, "R" එකයි තව පොඩි වෙලා, "C" එක ලොකු කරගන්නේ නැතිව, "National Research" කියන එක ලොකු කර ගන්න පුළුවන් විධියට ආයතනය සකස් කරගන්න හැකි වෙන්න කියා අප ප්‍රාර්ථනා කරනවා. නැත්නම් නිකම් රටේ මුදල් නාස්ති කිරීමක් පමණක් වෙයි කියන අදහස තමයි මට තිබෙන්නේ. මේක විරෝධයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සෘජුව දන්නවා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට සමාජ විද්‍යාවන් අදාළ වන්නේ නැති බව. ඒ නිසා මේ පර්යේෂණ ආයතනයට සමාජ විද්‍යාවන් අඩංගුද කියන කාරණයත් මා දැන ගන්න කැමැතියි. මොකද, උදේට බොරු සාස්තර කියන්න එන ඔක්කොම අය දැන් laptop අරගෙන නේ එන්නේ. ඒ අය mechanical හෝ electronic හෝ වෙන කුමන හෝ ආකාරයකින් විද්‍යාව සහ තාක්ෂණය පාවිච්චි කරලා සමාජ විද්‍යාත්මක බොරු කියනවා. ඒ නිසා ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී හෝ මේ ගැනත් විශේෂයෙන්ම දැනගන්න මා කැමැතියි. නැත්නම් මා යෝජනා කරනවා සමාජ විද්‍යාත්මක, humanities පැත්ත ගැනත් මේ ආයතනයට යම්කිසි ඉඩක් හදාගන්න කියා. එහෙම තිබෙනවා නම් හොඳයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා දැන් තමයි සභා ගර්භයට ආවේ. ඔබතුමා නැවත ඒ කාරණය එතුමාට කියන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට COPE එකට සහභාගි වෙන්න යන්නත් තිබෙනවා. නමුත්, මම ඒ කාරණය නැවත කියන්නම්. ගරු ඇමතිතුමනි, මම ඇහුවේ ඔබතුමා මේ හදන ආයතනයට සමාජ විද්‍යා පැත්තත් අදාළද කියායි.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මෙම ආයතනය දැනට තිබෙන්නේ විද්‍යාත්මක සහ තාක්ෂණික පර්යේෂණ සඳහා පමණයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Pure science විතරයි නේ.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
එය විතරයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ජාතික පර්යේෂණ සභාව කිව්වාම සමාජ විද්‍යා පැත්තත් අදාළ විය යුතුයි කියා මා හිතනවා.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මෙතෙක් එම අංශය ඇතුළත් වී තිබුණේ නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
දැන් එය ඇතුළත් වෙනවාද, ගරු ඇමතිතුමනි?

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඔව්, එය ඇතුළත් කරන්න පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
තාක්ෂණය, විද්‍යා, pure science පැත්තට ප්‍රමුඛතාව දුන්නාට කමක් නැහැ. නමුත්, සමාජ විද්‍යා පැත්තත් තිබිය යුතුයි. නැත්නම් තේරුමක් නැහැ. මොකද, සමාජයට වැඩිපුර බලපාන්නේ සමාජ විද්‍යාත්මක පැත්ත නේ.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ඇත්තටම විශ්වවිද්‍යාලවල කලා පීඨ සහ කළමනාකරණ පීඨවල විශාල වශයෙන් පරීක්ෂණ කෙරෙන්නේ ඔබතුමා කියන ඔය විෂයට අදාළවයි. නමුත්, මෙතැනදීත් විද්‍යාත්මක සහ තාක්ෂණ පර්යේෂණ කළා වුණත්, අප ඊට වඩා කාර්ය භාරයක් මෙතැන සපයනවා. ඒ නිසා ඔබතුමා කියන කාරණයත් හරි. අපි සමාජ විද්‍යාවත් මේකට ඇතුළත් කරන්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ විද්‍යාඥයන් දිගුකාලීනව කරන ඉල්ලීමක් තමයි, මේ සඳහා කෙරෙන පර්යේෂණවලට මුදල් වෙන් කරන්න කියන එක. ඒක රජයක් වශයෙන් අය වැයකදි කළ යුතු දෙයක්. නමුත් ඊළඟට තිබෙන ප්‍රශ්නය, අපි කරන පර්යේෂණ පැහැදිලිවම කුමක් ඉලක්ක කර ගෙනද කරන්නේ කියන එක. ශුද්ධ පර්යේෂණ - pure research - අපි ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ඒක රටකට අත්‍යවශ්‍යයි. නමුත් අපට පෙනෙනවා, විශේෂයෙන්ම රජයට සම්බන්ධ දෙපාර්තමේන්තු යටතේ පවතින පර්යේෂණ ආයතන ගොඩක් MSc target කර ගත් පර්යේෂණ සිද්ධ කරන බව.

මම උදාහරණයක් කියන්නම්. අනුර දිසානායක සහෝදරයාත්, මමත් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාර්මාර්ග ඇමති සහ නියෝජ්‍ය ඇමති වශයෙන් හිටපු කාලයේ අපි හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු, පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ගෙන්නුවා. ඒ ආයතනය ඉතා වැදගත් ආයතනයක්. නමුත් අපි එහි අවුරුදු දෙකක සියලුම පර්යේෂණ පත්‍රිකා ගෙනැල්ලා සාකච්ඡා කළා. එහි අදාළත්වය ගත්තොත් එය කරන පුද්ගලයාට පමණයි එය අදාළ වෙන්නේ. 1956 පිහිටුවන ලද ගමක වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් පර්යේෂණ පත්‍රිකාවක් තිබුණා. මම කියන්නේ නැහැ, කිසිම පර්යේෂණයක් නොවැදගත් කියලා. නමුත් අපට අදාළ, අත්‍යවශ්‍ය පර්යේෂණ තිබෙන්න ඕනෑ. මේ විද්‍යාත්මක ආයතනවල තිබෙන ප්‍රශ්නයක් තමයි, ඒවායේ පර්යේෂණ ඉලක්ක ශුද්ධ පර්යේෂණ වුණත්, ව්‍යවහාරික - applied - පැත්තට යොමු වන ප්‍රමාණය හරිම අඩුයි. පර්යේෂකයන් පිළිබඳව අපට ගරුත්වයක් තිබුණාට, ඒ පර්යේෂකයන් විසින් රටට ගෙනැත් දුන්නු ආර්ථික සහ සමාජයීය ජයග්‍රහණ මොනවාද කියලා බැලුවොත් මා හිතන්නේ රටේ ජනතාව තුළ ඔවුන් පිළිබඳව එච්චර ලොකු ඇගැයීමක් නැහැ. අවංකව ගත්තොත් පෞද්ගලිකව අපට නම් මතක් වෙන්නේ නැහැ, අපේ රටේ විද්‍යාඥයෙකු විසින් හඳුන්වා දුන්නු මෙන්න මේ පර්යේෂණ හරහා අපට හොඳ ප්‍රතිලාභයක් ලැබිලා තිබෙනවාය කියලා. ඒක ඒ ගොල්ලන්ට චිතරක් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. ලොකුම ප්‍රශ්නය හැටියට තිබෙන්නේ ඔවුන් ඉදිරිපත් කරන්නා වූ සොයා ගැනීම්, යෝජනාවන් ක්‍රියාත්මක කරන්න රාජ්‍යමය වශයෙන් සහ වාණිජමය වශයෙන් කවුරුවත් ඉදිරිපත් වෙන්නේ නැති එකයි. හොඳ දෙයක් පොතක ලිව්වාට වැඩක් නැහැ, laboratory එකක හැදුවාට වැඩක් නැහැ, ඒක වාණිජ වශයෙන් විකුණන්න බැරි නම් වාගේම ඒක අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හරහා ප්‍රායෝගිකව ක්‍රියාවට නැහෙන්නේ නැත්නම්. පර්යේෂණ ඉලක්ක ගත්තාමත් අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා, පෞද්ගලික අධ්‍යාපනික අරමුණුවලට එහා ගිය සමාජයීය වශයෙන්, ක්ෂේත්‍රයීය වශයෙන් යොමු වීම අඩුයි කියලා. මේ පර්යේෂණය කරන්න කියලා විද්‍යාඥයින්ට නියෝග කරන්න අපට බැහැ. නමුත් එවැනි සංස්කෘතියක් විද්‍යාත්මක ප්‍රජාව ඇතුළේ ගොඩ නැඟිය යුතුයි කියලා මා හිතනවා.

ඊළඟට ගරු ඇමතිතුමනි, විශේෂම කාරණය හැටියට මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමතියි. විද්‍යා පර්යේෂණ ආයතනයක් හදන වෙලාවේ අපි ඉතා පැහැදිලිවම කියන්න ඕනෑ, අපේ රට දැනුවත්ව මිථ්‍යාවට ගෙනි යමින් ඉන්න බව. මම නැවත නැවතත් කියන දෙයක් තමයි, කිසිම රූපවාහිනී නාලිකාවක විද්‍යාව උගන්වන්න විනාඩි තිහක් වෙන් වන්නේ නැති බව. විද්‍යාව උගන්වනවාය කියන්නේ බුධ ශ්‍රාවකයාගේ කක්ෂය වෙනස්වෙලා තිබෙන්නේ කොහොමද කියන එක නොවෙයි. සාමාන්‍ය මිනිසුන්ට විද්‍යාව උගන්වන්න කිසිම රූපවාහිනී නාලිකාවක විනාඩි තිහක් වෙන් කරන්නේ නැහැ. හැබැයි, හැම මාධ්‍ය නාලිකාවකම -channel එකකම- සාස්තරකාරයෝ ඇවිල්ලා laptop තියාගෙන උදේට පැය ගණන් අමු බොරු කියනවා. මේවා අපි අහගෙන ඉන්නවා. කුමන නාමයකින්ද මේවා කෙරෙන්නේ? මොවුන් බරපතළ ගණයේ වංචනිකයෝ. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාව මේ රටේ සාස්තරකාරයෝ අනාථ කරලා තිබෙනවා. දැන් ඔප්පුවෙලා තිබෙනවා නේ, මේ රටේ සාස්තරකාරයෝ බොරු කිව්වේ කියලා. එහෙම තත්ත්වයක් තිබියදී මම හිතනවා, ආණ්ඩුවක් වශයෙනුත්, පර්යේෂකයන් වශයෙනුත් වාගේම ජනමාධ්‍යවලටත් මේ සම්බන්ධයෙන් වගකීමක් තිබෙනවාය කියලා. හැම දාම උදේ 8.00 ඉඳලා 9.00 වන තුරු මිනිසුන්ගේ ඔළු කුණු කරනවා. මේ කරන කටයුත්ත වැරැදියි.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඔබතුමා කියන කාරණයට මම සියයට සියයක් එකඟයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

එකඟවෙලා චිතරක් මදි, ගරු ඇමතිතුමා. ඔබතුමාට ඒ සඳහා බලය තිබෙනවා. මේ කටයුත්ත කරන්න කියලා මම යෝජනා කරනවා. මම කියන්නේ මේකයි. මිනිස්සු කැමැති නම් ඔවුන් සාස්තර ඇහුවාට අපට ප්‍රශ්නයක් නැහැ. අපට ඒක නතර කරන්න බැහැ නේ. නමුත් ජනමාධ්‍යය කියන්නේ මහ ජනතාවට තිබෙන දේපළක්. ඒ, frequency පාවිච්චි කරලා ඕනෑ කුණුහරුපයක්, ඕනෑ කුණු ගොඩක් පෙන්නුවාට වැඩක් නැහැ. මම නම් කියන්නේ ඔය පැය තුළ blue film එකක් පෙන්නුවත් ඔච්චර නාස්තියක් වෙන්නේ නැහැ කියලායි. උදේ 8.00 ඉඳලා 9.00 වනතුරු ඔළු කුණු කරන සාස්තරවලට වඩා කුණුහරුප පෙන්නුවොත් අඩු හානියක් තමයි වෙන්නේ. මිනිස්සු කැමැති නම් ගිහිල්ලා සාස්තර බලා ගත්තාවේ. හැබැයි, මේවා ඉතාම වැරැදි මත. ඊයේ උදේ පත්තර විස්තරවලින් පස්සේ විකාශනය වූ වැඩසටහනක් මම බැලුවා. එක අම්මා කෙනෙක් සාස්තරකාරයෙකුට call කළා. ඒ, අම්මා දරුවාගේ උපන් වෙලාව කිව්වා.

"ලැප් ටොප්" එකට ඒ තොරතුරු ඇතුළත් කරලා, "ආ, දරුවා ශිෂ්‍යත්වයට ලියනවාද?" කියලා අහලා, මිනිහා කේන්දරය බලලා කියනවා, "කිසි ප්‍රශ්නයක් නැහැ, ෂුවර් ඇන්ඩ් ෂොට්, දරුවා ශිෂ්‍යත්වයෙන් පාස් වෙනවා" කියලා. මට මේක බලාගෙන ඉන්න බැරි නිසා මම එදා රූපවාහිනිය off කළා. සමහරවිට ඔහු කියන්න ඇති, ළමයාට ලැබෙන ඉස්කෝලයේ නමත්. ඒ ළමයා මේ ලකුණු ගණන අරගෙන යන ඉස්කෝලෙත් කියාවි. මම මෙය නැවත, නැවත කියන්න අවශ්‍ය නැහැ. රජයක් වශයෙන් ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා. එම නිසා මේ පර්යේෂණ ආයතනයේ ඔබතුමා විශේෂ ඒකකයක් පිහිටුවන්න, මෙවැනි දේ සම්බන්ධයෙන් කටයුතු කරන්න. මේ දේවල් තහනම් කරන්න

[ගරු බිමල් රත්නායක මහතා]

බැරි නම්, මේ මිථ්‍යා මත සම්බන්ධයෙන් රජයේ පර්යේෂණායතනය සහ National Science Foundation එක counter කරන්න ඕනෑ. National Science Foundation එක කියන්න ඕනෑ, මේවා බොරුය කියා. එතකොට වාදයක් නේ. අද ඒක වෙන්නේ පෞද්ගලික මට්ටමෙන්. රටේ භෞතිකවාදී සංගමයෙන්, නැත්නම් සමහර විද්‍යාඥයන්, ඒ වාගේම සමහර දොස්තර මහත්වරුන් තනි තනිවම ඒක කරනවා. ඒ අය තනි තනිවම කරන දේවල් තමයි තියෙන්නේ. එහෙම නොවෙයි, කළ යුත්තේ. මේවායින් කී දෙනෙක් මැරිලා තියෙනවාද කියන එක ඔබතුමා දන්නවා. දූ වරුන් දෙන්නෙක් මැරුණා. මොකක්ද විශේෂ බලයක් තිබෙනවාය කියා දරුවෝ දෙන්නාට තැඹිලි ගෙඩියක් බොන්නට දීලා. ඒ සිද්ධිය වෙලා දැනට මාස ගණනක් වෙනවා. මේ අය පල් බොරු කරන්නේ.

රත්රන් පොරවා ගත් එක් ශාස්ත්‍රකාරයෙක් ඉන්නවා. එයාගේ රත්රන් හොරකමක් සිදු වුණාය කියා පැමිණිලි කරන්නේ තලාතුඔය පොලීසියට. තමන්ගේ නැති වෙච්ච රත්රන් හොයා ගන්න බැරි වෙච්ච මිනිහා කොහොමද, අපේ ප්‍රශ්න විසඳා දෙන්නේ?

සමහරු දේවාල ගානේ යනවා. දැන් මාස ගණනක් තිස්සේ, පැලවත්තේ තිබෙන, ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ මූලස්ථානයට අනුර දිසානායක මන්ත්‍රීතුමා හමු වෙන්න රටේ තිබෙන ප්‍රධානම දේවාල දෙකේ කපුවෝ දෙන්නා එනවා, ඒ ගොල්ලන්ගේ කපුකම බේරාගන්න. අපි කපුවා හරහා නේ දෙවියන්ට අපේ විභාග ප්‍රශ්න, මානසික ප්‍රශ්න ඔක්කොම දෙන්නේ. කපුවා කපුවාගේ ප්‍රශ්න විසඳා ගන්න එනවා, ජේවීපී මූලස්ථානයට. කපුවාට පුළුවන් නේ, දෙවියොත් එක්ක direct කථා කරලා ඒක බේරා ගන්න. මම ආගම සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි මේ කියන්නේ. මේ, ආගම සම්බන්ධයෙන් කටයුතු කරනවාය කියා මිනිසුන්ගේ තියෙන දෙයත් ගසා කෑමක් කරන්නේ.

අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවෙන් මේ මිථ්‍යාව සම්බන්ධයෙන් අධ්‍යයනය කර, සමාජයීය වශයෙන් ඒ ඒ මොහොතේ පවතින, ජනතාව මං මුළා කරන, ජනතාව නාස්ති වෙන මේ තත්ත්වය නැති කරන්නට කටයුතු කරන්නටය කියා.

අපි ඔබතුමාට වගකීමකින් මේ කාරණයත් කියනවා. කොළඹ අග නගරයට ආසන්න පැලවත්ත ප්‍රදේශයේ දරුවෙකු නැති වුණා, ලිව්කේමියා රෝගයෙන්. රුපියල් ලක්ෂ 130ක් දරුවා වෙනුවෙන් දෙමව්පියෝ වියදම් කර තිබුණා. ඒ ලක්ෂ 130න් ලක්ෂ සියයක් විතර වියදම් කර තිබෙන්නේ, වෛද්‍ය පරීක්ෂණවලට අමතරව, විවිධ කපුවන්ට සහ එවැනි විවිධ පුද්ගලයන්ට. එම නිසා, ඔබතුමා මෙම පර්යේෂණායතනයේම මෙවැනි දේ සම්බන්ධයෙන් පර්යේෂණ කරන්නට වෙනම ඒකකයක් පිහිටුවන්න. මාස්පතා press conference එකක් තියලා කියන්න, මේ මේ පත්තරවල, මේ මේ රූපවාහිනී නාලිකාවල මේවා මේ ලෙස වාර්තා කර තිබෙනවා, නමුත් මේ සම්බන්ධ විද්‍යාත්මක මතය මේකයි කියා. තහනම් කරනවා නොවෙයි නේ. විද්‍යාත්මක මතය මේකයි කියා කියන්න.

දැන් සමහර පුවත් පත්වල යම්කිසි ප්‍රවර්ධනීය තත්ත්වයක් තිබෙනවා. ඒක හොඳ දෙයක්. අවතාර, හොල්මන්, බොරු දේවල් ගැන විස්තරයක් පිටුවක් පුරා දමන ගමන් ඒ ගැන වෛද්‍ය මතය පළකරන්න, සෙන්ටිමීටර් 10ක විතර column එකක් වෙන් කරනවා. ඒක හොඳයි නේ. ඉස්සර ඒවායේ සම්පූර්ණයෙන්ම පළ වුණේ බොරු මතය විතරයි. දැන් වෛද්‍ය මතයටත් කොලමක් තියෙනවා. මේ කාරණය නැවත නැවත කියන්න අවශ්‍ය නැහැ.

ලෝකයේ රටවල ජාතික පර්යේෂණ ආයතනවලින් මේ කටයුත්ත කරනවා. ඕනෑම මිනිහෙකු තමන්ට හාස්කමක් තිබෙනවාය කියා කියනවා නම්, ඉස්සෙල්ලා ජාතික පර්යේෂණ සභාවට ගිහින් ඒ හාස්කම ඔප්පු කරන්නය කියා ඔබතුමා රෙගුලාසියක් පනවන්න. ආගම ප්‍රචාරය කරනවා නොවෙයි නේ. ඕනෑම ආගමක් ප්‍රචාරය කරන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි තමන්ට විශේෂ හාස්කමක් තිබෙනවා කියලා කෙනෙක් කියනවා නම්, තමන්ට කෙනෙකුගේ විභාග අංකය දුන්නාම results කියන්න පුළුවන් කියනවා නම්, තමන්ට කෙනෙකුගේ මුහුණ බලා අනාගතයේ අවුරුදු 25කින් ඔහු ඉංජිනේරුවරයකු හෝ දොස්තරවරයකු හෝ වෙනවාය කියා කියන්න පුළුවන් නම්, නැත්නම් තරඟ වෙච්ච අය යහළු කරන්න පුළුවන් නම්, තරඟ වෙච්ච අය ගෙන්වලා දෙන්න පුළුවන් නම් එවැනි විශේෂ හාස්කමක් තිබෙන අය ඉස්සෙල්ලා ජාතික පර්යේෂණ සභාවේ, එය ඔප්පු කරලා පෙන්වන්න කියන්න. ඔප්පු වුණොත් කිසි ප්‍රශ්නයක් නැහැ නේ. එයාවත් ඔබතුමාට Council Member කෙනෙක් කරන්න පුළුවන්. එහෙම කරන්නේ නැතිව මිනිසුන් ගසා කන්න දෙන්න එපා. VAT එකෙන් කනවාට වඩා මේකෙන් කනවා. එම නිසා මම ඉතාමත් ඕනෑකමින් කියන්නේ. මෙවැනි පනත් කෙටුම්පත් කලාතුරකින් නේ පාර්ලිමේන්තුවට එන්නේ. එම නිසායි මම මේ කරුණ ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

ගරු ඇමතිතුමනි, අපේ රටේ Historical Science ගැන මම ඔබතුමාට කියන්න කැමතියි. අපි කොහේවත්, බටහිර, නැහෙනහිර කියා විද්‍යාවට සීමා පනවා ගන්නේ නැහැ. නමුත් අපි දන්නවා, ලෝකයේ හැම රටකම එම රට ඇතුළේ නිර්මාණය වෙච්ච විද්‍යාවන් තිබෙන බව. උදාහරණයක් වශයෙන් ආචාර්ය හර්ෂ ද සිල්වා ඇමතිතුමා කිව්වා වාගේ අපේ රට වාරි ශිෂ්ටාචාරය අතින්, වාරි විද්‍යාව සම්බන්ධයෙන් උපරිම තැනක ඉන්න රටක්. මගේ දැනීමේ හැටියට දැනට 10 වසර හෝ, 11 වසර පෙළ පොත්වලට අපේ රටේ Historical Science සම්බන්ධව එක පරිච්ඡේදයක් එකතු කර තිබෙනවා.

අපේ ජාතික අධ්‍යාපන ආයතනයට මේ ව්‍යුහයන් ගැන අවබෝධයක් තිබෙනවා. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි, ඔබතුමා හිටපු අධ්‍යාපන ඇමතිතුමකු නිසා මේ ව්‍යුහයන් ගැන ඔබතුමාට අවබෝධයක් තිබෙනවා. වර්තමානයේ පාසල්වල 1 වසරේ සිට විද්‍යාව උගන්වන්නේ නැහැ. නමුත්, පාසල්වල විද්‍යාව උගන්වන සෑම වසරක සිටම historical science පිළිබඳව යම් ආකාරයක පරිච්ඡේද කිහිපයක්, පාඩම් කිහිපයක් දරුවන්ගේ අධ්‍යාපනයට එකතු කරන්නය කියා ජාතික අධ්‍යාපන ආයතනයට මේ පර්යේෂණ සභාව හරහා යෝජනා කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. එතකොට ඒ ගොල්ලන් දන්නවා, ඒ ගොල්ලන්ගේ රට දැන් සවුත්තු වෙලා තිබුණාට එක කාලයක අපේ රටේ විද්‍යාව හා තාක්ෂණය උපරිම මට්ටමට ගිහින් තිබුණාය කියලා. ඒ නිසා මේ අවස්ථාවේදී මම ඔබතුමාගෙන් ඒ කාරණයත් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, අපේ රටේ පර්යේෂකයන් බෙහෙවින් අධෛර්යයට පත්වෙලා නේ ඉන්නේ. ඒ ගොල්ලන් කරන පර්යේෂණ නිෂ්පාදනයකට ගෙනෙන්න පුළුවන් කර්මාන්තකරුවන් මේ රටේ නැහැ. ප්‍රශ්නය ඒකයි. අපේ ආර්ථිකය පොඩියි; දුර්වලයි. ඒ නිසා අපි කරන පර්යේෂණ වාණිජ මට්ටමින් නිෂ්පාදනයට එන්නේ නැහැ. ඒක එකක්. දෙවෙනි කාරණය තමයි වාණිජ නොවන මට්ටමේ සොයාගැනීම්, සමාජ විද්‍යාත්මක මහ පෙන්වීම්. ඒවාට අදාළ වෙන නිසියාකාර පිළිගැනීම, නිසියාකාර රාජ්‍ය අවධානය පරිපාලනමය වශයෙන්

එන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ රටේ විද්‍යා හා පර්යේෂණ ක්ෂේත්‍රය සම්බන්ධව අලුත් සංස්කෘතියක් ඇති කරන්න කියලා. රටේ ජනාධිපතිවරයා මේ පාර්ලිමේන්තුවට සහභාගි වන දිනවලින් අවුරුද්දකට එක දිනයකදී අපේ රටේ තෝරාගත් විෂය ක්ෂේත්‍ර 10ක ප්‍රවීණතම විද්‍යාඥයන් දස දෙනෙකුට පාර්ලිමේන්තුවට කැඳවා ඔවුන්ගේ පර්යේෂණ පත්‍රිකා හෝ ඒ සම්බන්ධව ඔවුන්ගේ අදහස මේ මහජන නියෝජිතයන් 225 දෙනාට ඉදිරිපත් කිරීමට අවස්ථාවක් හදන්න ඕනෑ. දැන් මේ ගරු සභාව අමතන්නේ දේශපාලන නායකයන් විතරයි නේ. නමුත් මේ සභාවේ එක විද්‍යාඥයෙක් ඇමතුවොත් ඒක අපට අවුලක් වෙයිද? එහෙම වෙන්නේ නැහැ. මම කියන්නේ නැහැ, එය නිතර නිතර කරන්න කියලා. අවුරුද්දකට සැරයක් හෝ රටේ ඉන්නා වැදගත් පර්යේෂකයන් දස දෙනෙකුට, රටේ ජනාධිපතිවරයා සහභාගි වන රැස්වීමකදී ඒ කාරණා කියන්න අවස්ථාව සලසා දෙන්න. එතකොට අපටත් අදහස් ඇති වනවා.

ගරු ඇමතිතුමනි, අනිත් කාරණය ඔබතුමාගේ පනත් කෙටුම්පතේ තිබෙන ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවට, රටේ ප්‍රධාන පෙළේ පර්යේෂණ ආයතනවල සිටින ප්‍රධානීන්ට නිල බලයෙන් පත්වෙන්න පුළුවන් වන විධියේ සංශෝධනයකුත් වෙනවා නම් හොඳයි කියන අදහස මම දරනවා. මොකද, නැත්නම් මේ ආයතනය ජාතික පර්යේෂණ සභාවක් බවට පත් වෙන්නේ නැහැ. පනත් කෙටුම්පතට අදාළව ගත්තොත් ඒ කරුණු ප්‍රමාණය තමයි මට කියන්න තිබෙන්නේ.

මේ අවස්ථාවේදී ඔබතුමාට සෘජුව සම්බන්ධ නැති වුණත්, රටේ අවධානයට, විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ අවධානයට යොමු විය කළ යුතු එක කාරණයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මෙය පනත් කෙටුම්පතට අදාළ කාරණයක් නොවෙයි. විද්‍යාපීඨවලට ඇතුළත්වීමේදී ඇතිවන ගැටලුවක් ගැන මේ අවස්ථාවේදී කියන්න ඕනෑ කියා මම හිතුවා. මොකද, ඒ සඳහා වෙන අවස්ථාවක් නොලැබෙන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ශිෂ්‍යයකුගෙන් ලිපියක් ලැබී තිබෙනවා. ඔහු කලවාන ප්‍රදේශයේ නිපුන් චාතුර්ය අමරතුංගයි. ඔහු ක්‍රීඩා විෂයයෙන් විද්‍යාපීඨයට ඇතුළත්වීමට කල්පනා කරන දරුවෙක්. ඔහු වාගේම තවත් විශාල පිරිසක් සිටිනවා කියන එක තමයි ඔහුගේ අදහස. නමුත් විද්‍යාපීඨවලට ඇතුළත්වීම සඳහා 2014 වර්ෂයේ උසස් පෙළ කරපු ළමයින්ට අදාළ ගැසට් පත්‍රය තවම පළ කරලා නැහැ. ඒ නිසා අවුරුදු 25 පහුවුණාම මේ ළමයින්ට ක්‍රීඩා සම්බන්ධයෙන් විද්‍යාපීඨයට ඇතුළත්වීමට තිබෙන අවස්ථාව නැති වෙනවා. මේ ශිෂ්‍යා ගත්තොත්, ඔහු සමස්ත ලංකා වූෂු විනිසුරු පාඨමාලාව හදාරා තිබෙනවා; සමස්ත ලංකා මලල ක්‍රීඩා හා තාක්ෂණ පාඨමාලාව හදාරා තිබෙනවා; සමස්ත ලංකා 60 බර කාණ්ඩයේ තරගයකින් රන් පදක්කම ලබා ගෙන තිබෙනවා. ඔහු ඒ වාගේ සුදුසුකම් ගොඩක් තිබෙන දරුවෙක්. ඔහුගේ අරමුණම තිබෙන්නේ ක්‍රීඩා ගුරුවරයෙකු වෙන්නයි. ඉතින් ඒ නිසා මේ කාරණය අසා ගෙන සිටින ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු ඉන්නවා නම්, මම විශේෂ ඉල්ලීමක් කරනවා. මේ ගැසට් පත්‍රය පළ කරද්දී, 2014 වර්ෂයේ පළමු වතාවට නොවෙයි, තුන්වන වතාවට උසස් පෙළ කරපු දරුවන්ගේ වයස අවුරුදු 25 සමාප්ත වෙනවා. ඒ නිසා මේ ගැසට් පත්‍රය පළ කිරීමේදී, 2014 වර්ෂයේ තුන්වන වතාවට උසස් පෙළ කරපු ළමයින්ටත් ඉඩක් ලැබෙන විධියට ගැසට් පත්‍රය පළ කරන්න කියන ඒ ඉල්ලීම කරනවා. ඒ සමඟම එම ශිෂ්‍යයාගේ ලිපිය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින් මම එය **සභාගත*** කරනවා. එම කාරණයත් සමඟින් මාගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා.

[අ.භා. 2.43]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි විවාදයට ගන්නේ ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්. විශේෂයෙන්ම ජාතික පර්යේෂණ සභාව ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් කිරීම සඳහා වන පනත් කෙටුම්පත ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා. මේ පනත් කෙටුම්පතට අදාළ විවාදයේදී වැදගත් කරුණු රාශියක් මෙතෙක් කථා කළ සෑම ගරු මන්ත්‍රීවරයෙක්ගෙන්ම අපට අසන්නට ලැබුණා. මම හිතනවා, මේ ආයතනය මීට හුඟක් කළකට පෙරම ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත්විය යුතුව තිබුණ ආයතනයක්ය කියලා.

ගරු ඇමතිතුමාගේ කථාවේදී සඳහන් වුණා වාගේ, අපට තවදුරටත් කෘෂි කාර්මික අපනයන මත පවතින්න පුළුවන්ද, එහෙම නැත්නම් මැද පෙරදිග රටවල ගෘහ සේවයේ යෙදෙන කාන්තාවන්ගෙන් ලැබෙන ආදායමෙන්, ඔවුන් උපයන මුදලින් රටක් හැටියට අපට යැපෙන්න පුළුවන්ද කියලා කල්පනා කළ යුතුව තිබෙනවා.

මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන්, මෙම ආයතනය ව්‍යවස්ථාපිත සභාවක් බවට පත් කිරීමේදී ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන පරමාර්ථ ගණනාවක් තිබෙනවා. එයින් එක් පරමාර්ථයක් තමයි පර්යේෂණ සංස්කෘතියක් බිහි කිරීම තුළින් වාණිජකරණයට ලක් කිරීම. ගරු ඇමතිතුමනි, ඒක වැදගත් කාරණයක්. විශේෂයෙන්ම අපේ කෘෂිකර්ම අපනයන මේ වන විට සම්ප්‍රදායික අපනයන බවට පත් වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත් තේ කර්මාන්තය පිළිබඳව මේ දිනවල ලොකු කථිකාවක් පවතිනවා, අපේ තේ මිල පහත වැටිලා කියලා. තේ පර්යේෂණ ආයතනයක් වෙනම තිබෙන්නට පුළුවන්. නමුත් තේ කර්මාන්තයට මේ වාගේ ඉරණමක් අත්වෙලා තිබීමට හේතුව කුමක්ද කියන එක ගැන කල්පනා කරලා බැලුවාම මට හිතෙනවා අපි ලෝකයට ගැළපෙන, ලෝකයේ වැඩිම ඉල්ලුමක් තිබෙන නිෂ්පාදනවලට ගිහින් නැහැ කියලා. තේ තුළින් අපට මොනවාද අලුතෙන් ඇති කරන්න පුළුවන් නිෂ්පාදන, කුමන ඉසව්වලටද අපට යන්න පුළුවන් කියා අප බලන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විවිධ ඖෂධ වර්ග නිෂ්පාදනය කරන්න පුළුවන් අපනයන අපේ රටේ තිබෙනවා. හොඳම උදාහරණය කුරුඳු. ලෝකයේ තිබෙන හොඳම කුරුඳු ලංකාව නිෂ්පාදනය කරනවා. මම නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේ ඉතාම හොඳ කුරුඳු තිබෙනවා. නමුත් අපි මේ තුළින් යම් පර්යේෂණයකට ගිහින් තිබෙනවාද? අද ලෝකය කුරුඳු භාවිත කරමින් නිෂ්පාදනය කරන විවිධ ඖෂධ වර්ග සහ වෙනත් විවිධ නිෂ්පාදන සිදු කිරීම සඳහා අපි කිසියම් හෝ පර්යේෂණයක් සිදු කර තිබෙනවාද, ඒ සඳහා යම් කිසි උත්සාහයක්වත් ගෙන තිබෙනවාද කියන එක මට නම් ප්‍රශ්නයක්. මෙම ශ්‍රී ලංකා ජාතික

---

* *ප්‍රශ්නකාලයේ නබා ඇත.*
* *நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

පර්යේෂණ සභාව එවැනි ඉසව්වලටත් අවධානය යොමු කර ඉදිරියට ගියොත් හුඟක් ලොකු සේවයක් රටට කරන්නට පුළුවන් කියලා මේ කාරණා දිහා බැලුවාම, පනත් කෙටුම්පත කියවලා බැලුවාම අපට පැහැදිලිව පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද ලෝකයේ පවතින තරඟකාරිත්වය සඳහා ගරු අගමැතිතුමාගේ දර්ශනයත් සමඟ අපේ රජය ඉදිරිපත් කළේ, නව නිපැයුම් ආර්ථිකයක් බිහි කිරීමයි. මේ සඳහා යන ගමනේදී ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවට ඉතාම වැදගත් වැඩ කොටසක් ඉටු කිරීමට හැකි බව අපට පෙනෙන්න තිබෙනවා. අපි ලෝකයත් සමඟ ඉස්සරහට යනවා නම්, ලෝකයත් සමඟ තරඟ කරන තැනකට අපේ නිෂ්පාදන යොමු කරනවා නම් අපිට මෙවැනි ආයතනයක වැදගත්කම, වටිනාකම සුවිශාලයි.

ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ ඉන්න සේවක සංඛ්‍යාව ගැන මම බැලුවා. මට පෙනෙන විධියට 15ක් වාගේ සංඛ්‍යාවක් තමයි සඳහන් වෙන්නේ. එම සංඛ්‍යාව ප්‍රමාණවත්ද කියන එක ගැටලුවක්. ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව රටට ගැළපෙන පර්යේෂණ සිදු කරන ආයතනයක් බවට පත් කරනවා නම්, ඇමතිතුමාගේ කථාවේදී සඳහන් කළා වාගේ චීනය වැනි දියුණු වුණු රටක්, නව නිෂ්පාදන සොයාගෙන ගිය රටක් ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කළ විධිය දිහා බැලුවාම, මෙවැනි පර්යේෂණ ආයතනවලින් ගත් ප්‍රයෝජනය දිහා බැලුවාම අපි මේ සඳහා යම් කිසි වැය බරක් දැරීම පාඩුවක් හැටියට මම සලකන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ රටට සුවිශේෂ යම් යම් කාරණා තිබෙනවා. විශේෂයෙන්ම අපේ දේශීය වෛද්‍ය ක්‍රමය දිහා බලමු. උදාහරණයක් ලෙස, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ගෙන බලමු. ලෝකයේ හුඟක් රටවල ජනතාවට අද මහත් ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන, ඖෂධ වර්ගවලට විශාල මුදලක් වියදම් කිරීමට සිදු වන බෝ නොවන රෝග සඳහා අපේ දේශීය වෛද්‍ය ක්‍රම මඟින් -විශේෂයෙන් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මඟින්- ප්‍රතිකාර කළ හැකියි කියන එක පිළිබඳ කරුණු එම ක්ෂේත්‍රයේ වෛද්‍යවරුන්, විශේෂඥයන් විවිධ අවස්ථාවලදී ඒ අයගේ දක්ෂතා පෙන්වමින් අපට ඉදිරිපත් කර තිබෙනවා. මේ පර්යේෂණ සභාව එවැනි ඉසව්වලටත් යොමු වුණොත්, එවැනි පැතිකඩ දිහාත් බැලුවොත් වඩාත්ම සාර්ථකයි කියා මා විශ්වාස කරනවා. මොකද, ලෝකය ඉස්සරහා අපට අළෙවි කරන්න පුළුවන් ඉතාම වැදගත් දෙයක් තමයි අපේ රටේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය. ඒ වාගේම, ඇතැම් බෝ නොවන රෝග නිවීටාවට සුව කරන්න පුළුවන් කියා සොයා ගැනීම් කර තිබෙන ක්‍රමයක් තමයි අපේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය. එවැනි දේ පිළිබඳ පර්යේෂණ කරන්න අද ඒ ක්ෂේත්‍රයේ අයට අවකාශ නැහැ කියා මම හිතනවා. ඔවුන්ට ඒ සඳහා පහසුකම් නැහැ. ඒ සඳහා වැඩි ඉඩ කඩක් නැහැ. මෙවැනි ආයතන පිහිටුවීමෙන් ඒ සඳහාත් යම්කිසි ඉඩ කඩක් සකස් කරන්න පුළුවන් කියන එක මගේ විශ්වාසයයි.

විශේෂයෙන් ඩෙංගු අවදානම දුරු කිරීම සඳහා මෙම ආයතනය මේ වන විට පර්යේෂණ පවත්වමින් සිටිනවා කියා අපට දැනගන්න ලැබුණා. අපේ ප්‍රදේශවල -ග්‍රාමීය ප්‍රදේශවල- ඩෙංගු රෝගය සඳහා ජනතාව බිලි වීමේ අවදානම දවසින් දවස වැඩි වෙමින් යනවා. මෙය දරුණු තත්ත්වයක් බවට පත් වෙමින් තිබෙනවා. ඒවාට පිළියම් සොයා ගැනීම සඳහා පර්යේෂණ සිදු කරන්න මේ ආයතනය කටයුතු කිරීම අපේ ප්‍රශංසාවට ලක් වන අතර, එය විධිමත් කිරීම සඳහා, ඒවා ශක්තිමත් කිරීම සඳහා දිය හැකි තවත් සහයෝගයන් ලබා දීමට කටයුතු කරන හැටියටත් අපි ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විෂය භාර අමාත්‍යතුමා පිළිබඳව අපගේ යම් පැහැදීමක් තිබෙනවා. එතුමා, මෙතෙක් දරපු අමාත්‍යාංශවල යම්කිසි වැඩ කොටසක් කරපු කෙනෙක්. එම නිසා මේ ආයතනය ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් කිරීමෙන් රට යම්කිසි තැනකට ගෙන යන්න අපට පුළුවන්කම ලැබේවි කියන එකයි මගේ විශ්වාසය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සමඟම අවධානය යොමු කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. විවිධ දක්ෂකම් පෙන්වන, නිර්මාණ හැකියා පෙන්වන තරුණ කොටස් අපේ රටේ ඉන්නවා. ඒ අයට බොහෝ වෙලාවට එතැනින් එහාට යන්න ඉඩ කඩක් ලැබෙන්නේ නැහැ. සමහර වෙලාවට අලුත් දෙයක් සොයා ගත්තාම, අලුත් නිපැයුමක් කළාම එය නවත්වන්න තිබෙන නීතිමය සාධක සොයනවා විනා එතැනින් එහාට ඔහුට අත දෙන ක්‍රමයක් සොයන තත්ත්වයක් අපේ රටේ නැහැ. යම්කිසි කාර්මික නිෂ්පාදනයක් කරන කෙනෙකු වෙන්න පුළුවන්, විවිධ හැකියා තිබෙන අය වෙන්න පුළුවන්, බොහෝ වෙලාවට එවැනි දක්ෂයන් තමන්ගේ හැකියාවන් පෙන්වන්න ගිහින් අපහසුතාවට පත් වෙලා තිබෙනවා. විවිධ යන්ත්‍රෝපකරණ සකස් කරපු තරුණයන් පසු ගිය කාල පරිච්ඡේදයේදී අපේ ගම්වල සිටි බව අපි දැක්කා. යම් තරුණ මහත්මයකු එවැනි කිසියම් උපකරණයක් හැදුවාම, එවැනි දෙයක් නිෂ්පාදනය කිරීම අපේ රටේ නීතිය අනුව වරදක් නම් නීතිය ඉදිරියට ගෙන ගිහිල්ලා, ප්‍රශ්න කරලා ඔහුට එරෙහිව නීතිමය පියවර ගන්නවා හැරෙන්න, ඔහුගේ දක්ෂකම්වත් එතැනින් එහාට යන්න, ඔහුගේ මොළය පාවිච්චි කරලා ඔහු දකින දේ අනුව ඉස්සරහට යන්න අත දෙන ක්‍රමයක් නැහැ. අපේ පාසල්වල පවත්වන විවිධ ප්‍රදර්ශන බලන්න ගියාම පාසල් ශිෂ්‍යයන් විවිධ නිර්මාණ ඉදිරිපත් කරපු අවස්ථා අපට දකින්න තිබෙනවා. පුංචි ත්‍යාගයක් දීලා, සහතිකයක් දීලා, සම්මානයක් දීලා එය අගය කරනවා හැර එතැනින් එහාට ඔහු අරගෙන ගිහින්, ඉස්සරහට යන්න පුළුවන් මාර්ගයක් ඔහුට හදා තිබෙනවාද කියන එක ප්‍රශ්නයක්. ඒ නිසා එවැනි විවිධ දක්ෂතාවන් තිබෙන, හැකියාවන් තිබෙන තරුණ කොටස්වලට, නව නිපැයුම් කරන්න පුළුවන් හැකියාව තිබෙන තරුණ කොටස්වලට මේ පර්යේෂණ සභාව හරහා අවස්ථාවක් දිය යුතුය, ඔවුන් දිරිමත් කළ යුතුය කියා මම යෝජනා කරනවා. ඔවුන්ට වැඩිදුර පුහුණුවක් අවශ්‍ය නම් ඒ පුහුණුව ලබා දෙන්න, ඒ පුහුණුව ලබා දීලා අපේ රටේ අලුත් විද්‍යාඥයන් පිරිසක් ගොඩ නඟන්න, ඔවුන් දක්ෂයන් බවට පත් කරලා ඔවුන්ගේ නිර්මාණවලට අවස්ථාවක් ලබා දෙන්න ක්‍රියා කරන්න කියලාත් මම මේ වෙලාවේ ඉල්ලා සිටිනවා.

මම මීට වඩා දිගට කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ගොඩ නඟන්න ක්‍රියා කිරීම පිළිබඳව අපේ සතුට ප්‍රකාශ කරන අතර, මෙය ශක්තිමත් ආයතනයක් බවට පත් කරලා රටට සේවයක් කරන්න ඇමතිතුමාට ශක්තිය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.55]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට ඉතාම වැදගත් අවශ්‍යතාවක් වෙනුවෙන් අපේ ගරු ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. මේ පනත් කෙටුම්පත ගෙනෙන්න අවශ්‍ය කටයුතු ආරම්භ වුණේ දැනට අවුරුදු තුනහමාරකට, හතරකට විතර කලින් අපේ රජය පැවති කාලයේ. අපි මේ ගැන මූලික සාකච්ඡා පැවැත්වුවා. පර්යේෂණ අංශ සම්බන්ධ සියලුම අමාත්‍යාංශවල උදවිය එකතු වෙලා තමයි මේ අදහස අපි රජයට එදා ඉදිරිපත් කළේ. ඒක මහා

භාණ්ඩාගාරය පිළිගත්තා. පිළිගෙන මේ වැඩසටහනට අවශ්‍ය කරන මුදල් ඒ වෙලාවේ අපට වෙන් කරලා දුන්නා. අද තමයි ඊට අදාළ පනත් කෙටුම්පත ගරු ඇමතිතුමා ඉදිරිපත් කරන්නේ. අපි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන ඉතාම සතුටු වෙනවා. නමුත් මෙතැනදී මට එතුමාට මතක් කරන්න කාරණා කිහිපයක් තිබෙනවා. මේ පනත් කෙටුම්පතේ පරමාර්ථ හැටියට -අරමුණු හැටියට- එතුමා ඉදිරිපත් කරලා තිබෙන්නේ කාරණා තුනයි. ඒවා නම්,

"(අ) රට තුළ උද්දීපිත විද්‍යා සහ තාක්ෂණික ප්‍රජාවක් ගොඩනැඟීම සඳහා විද්‍යාවට සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ පහසු කිරීම සඳහා ආණ්ඩුවට සහාය වීම;

(ආ) ජාතික අවශ්‍යතාවලට දායක වන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීමට හැකිවන පරිදි උසස් අධ්‍යාපන ආයතනවල, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනවල සහ වෙනත් රාජ්‍ය ආයතනවල විද්‍යාව සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඊට පහසුකම් සැලසීම;

සහ

(ඇ) විද්‍යාව සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ වැඩි දියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝග ඉල්ලා සිටීම."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙනෙන හැටියට මේ පරමාර්ථ පුළුල් මදි. මීට වඩා ගැඹුරු පරමාර්ථ තමයි අපි එදා යෝජනා කළේ. මොකද, ඒ වාගේ ප්‍රශ්න අපේ රටේ තිබෙනවා. පර්යේෂණයක් කරනවාය කියන්නේ ලෙහෙසි පහසු කටයුත්තක් නොවෙයි. ඒක දැවැන්ත කැපවීමක්. ඒක දැවැන්ත මහන්සියක්. ඒ වාගේම විශාල වගකීමක්. මේක තමයි ඔබතුමා කියන විධියට apex body කියලා කියන්නේ, ගරු ඇමතිතුමනි. මේ විධියේ ආයතනයක ඒ පරමාර්ථ සීමාසහිත වෙලා තිබෙනවා. මේ ආයතනයට කරන්න පුළුවන් මොනවාද? දැන් බැලුවාම, මේ ආයතනයට කරන්න පුළුවන් දෙයක් නැහැ. ආණ්ඩුවෙන් සල්ලි ලැබුණොත් බෙදලා දෙන්න පුළුවන්. එහෙම නැත්නම් කාටහරි මේ ආයතනයෙන් ඉල්ලීමක් කරන්න පුළුවන්. එහෙම නැත්නම් පර්යේෂණ සඳහා ආණ්ඩුවට සහාය වීම කරන්න පුළුවන්. ආණ්ඩුව මොනවා කරන්නද? ආණ්ඩුවට සහාය වෙන්නේ මොකටද? මේ ගැන මීට වඩා ගැඹුරින් කල්පනා කළා නම් හොඳයි කියලායි මම හිතන්නේ. මේ මූලික සාකච්ඡාවලදී මේ ගැන අපි ගැඹුරින් සාකච්ඡා කළා. ඒ කරුණු අද මේ පනත් කෙටුම්පතට ඇතුළු වෙලා නැහැ. මේක බරපතළ අඩුපාඩුවක් හැටියටයි ගරු ඇමතිතුමනි, මා දකින්නේ. මේ වැඩ පිළිවෙළ කරන්න ගියොත් කවදා හරි ඔබතුමාට මේ කරුණු සංශෝධනය කරන්න වෙනවා. මොකද, මේ පරමාර්ථ ගැඹුරු මදි.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු දේවල් මම සටහන් කර ගත්තා. මම බලාපොරොත්තු වෙනවා, (3) වැනි වගන්තියේ අරමුණු හැටියට (ඇ) කියන වගන්තියක් ඇතුළත් කරලා මේ පරාසය පුළුල් කරන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු ඇමතිතුමනි, ඒ පරාසය පුළුල් කිරීම විතරක් නොවෙයි, direct supervision කියන තැනට යන්න පුළුවන් වෙන්න ඕනෑ.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

එතැනට ඒ ටික අඩංගු කරන්නම්.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

බොහොම ස්තුතියි. ගරු ඇමතිතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පර්යේෂණ කරන ආයතන රාශියක් අපේ රටේ තිබෙනවා. විශ්වවිද්‍යාලවල තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ තිබෙනවා. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබෙනවා. සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව යටතේ තිබෙනවා. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ තිබෙනවා. මේ විධියේ පර්යේෂණ ආයතන රාශියක් අපේ රටේ තිබෙනවා. නමුත් මේ පර්යේෂණවලින් අපට ලැබුණු වඩා හොඳ ප්‍රතිඵල මොනවාද? ලැබිච්ච තැන් තිබෙනවා. ඒ පර්යේෂණ කරලා හොඳ ප්‍රතිඵල ලැබිච්ච තැන් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, උදාහරණයක් හැටියට මම මේ කාරණය කියන්නම්. පසු ගිය වසර ගණනාවක් තිස්සේ බතලගොඩ වී පර්යේෂණ ආයතනය පර්යේෂණ කළා. ඒ හරහා විවිධ වී වර්ග අපි සොයා ගත්තා. ඉතා සාර්ථක ලෙස අද ඒවා ක්‍රියාත්මක වෙනවා. හැබැයි, මේවා ක්‍රියාත්මක කරන පදනම වුණේ රසායනික පොහොර භාවිතය මත. තේ පර්යේෂණ ආයතනය පර්යේෂණ කරලා රිකිලි තේ සොයා ගත්තා. මේ රිකිලි තේවල නිෂ්පාදනය සම්පූර්ණයෙන් රඳා පවතින්නේ පොහොර භාවිතය මත.නමුත් අපි අද ප්‍රතිපත්තියක් හැටියට පිළිගන්නවා, රසායනික පොහොර භාවිත කරන්නේ නැහැ කියලා. රසායනික පොහොර භාවිත කරන්නේ නැහැ කියලා අපි ප්‍රතිපත්තියක් ගෙනෙනවා. එතකොට, අවුරුදු ගණනාවක් තිස්සේ මෙතරම් මහන්සි වෙලා කරපු පර්යේෂණ එහෙම පිටින්ම ඇද වැටෙනවා; ඒවායින් වැඩක් නැති වෙනවා. අපි වැඩිදුර කල්පනා කරන්නේ නැතිව කරන වැඩ තමයි මේ.

ලෝකයේ හැම රටකම අද කෘෂි ක්ෂේත්‍රය දියුණු වෙලා තිබෙන්නේ රසායනික පොහොර භාවිතයෙන්. ඒ ගැන කිසිම වග-විභාගයක් නැහැ. සෑම රටකම ඒවා භාවිත කරනවා. නමුත් අපි තමයි ආපස්සට යන්න කල්පනා කරන්නේ. ඒ අය ඒවා භාවිත කරන්නේ පිළිවෙළකට. අවශ්‍ය ප්‍රමාණයට ඒවා භාවිත කරන හැටි අපි කියලා දෙන්න ඕනෑ. වුවමනාවට වැඩියෙන් පාවිච්චි කරන්නේ නැතිව, වුවමනා ප්‍රමාණයට, වුවමනා විධියට පාවිච්චි කරන විධිය ගැන අපේ ජනතාව දැනුවත් කිරීමයි කරන්න ඕනෑ. ඒකත් එක පර්යේෂණයක් කියලායි මම කියන්නේ.

ඊළඟට ගරු ඇමතිතුමනි, මේ පර්යේෂණවලට දෙන මුදල් ගැන කියන්න ඕනෑ. පර්යේෂණවලට දෙන මුදල් පිළිබඳව අපි සම්පූර්ණ පසු ඇගැයීමක් කරන්නට ඕනෑ. මම එහෙම කියන්නේ යම් හේතුවක් නිසායි. අපි එක්තරා විශ්වවිද්‍යාලයකට, එක්තරා පර්යේෂණයක් කරන්න කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් රුපියල් කෝටියක් -මිලියන දහයක්- දුන්නා. ඒ පර්යේෂණය කරන්න අපි මහා භාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලා සිටියාම මුදල් ලැබුණා. ඒ ලැබුණු මුදල් අපි ඒ ආයතනයට දුන්නා. ඒ මුදල් ඒ ආයතනයට දීලා අවුරුදු තුනක් ගත වුණා. නමුත්, ඒ ගැන කිසිම සඳහනක් නැහැ; ප්‍රතිඵලයක් නැහැ. ඒ ගැන දැනගන්න ලියුමක් ඇරියාට උත්තරයක් එවන්නේත් නැහැ. මහා භාණ්ඩාගාරයෙන් අහනවා,"ඔය ගොල්ලන්ට අපි සල්ලි දුන්නා. ඒ සල්ලිවලට මොකද කළේ " කියලා. අපට වාර්තාව දෙන්න කියනවා. බේරෙන්න බැරි තැන, මේ මුදල් ටිකට මොකද කරලා තිබෙන්නේ, මේ සම්බන්ධ පසු වාර්තා එවා තිබෙනවාද කියා දැනගෙන එන්න කියලා මම අපේ නිලධාරියෙක් ඒ ආයතනයට යැවුවා. කියන්න කනගාටුයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාර්තාව ආවාම අපට පෙනී ගියා, ඒ මුදලින් සියයට හැටක් වියදම් කර අවසන් බව. ඒ සියයට හැටෙන් සියයට අසූවක් වියදම් වෙලා

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

තිබෙන්නේ, ගමන් වියදම් සඳහා. මහාචාර්යවරුන්ගේ ගමන් වියදම් සහ ඒ ගොල්ලන්ගේ අනෙකුත් වියදම් සඳහා. පර්යේෂණයට වියදම් වෙලා තිබෙන්නේ බොහොම සුළු ප්‍රමාණයක්. ඒ නිසා මුදල් පරිපාලනය ගැන මේ පිහිටුවන ආයතනයට කිසියම් වගකීමක් තිබෙන්න ඕනෑ. මම ඒකයි කිව්වේ, මේ ආයතනය පිහිටුවීමේ අරමුණු පළල් වෙන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, ඒ ආධාර කිසි දෙයක් නැතිව පර්යේෂණ කරන උදවියත් මේ රටේ ඉන්නවා. ඒකට උදාහරණයක් මම ගරු ඇමතිතුමාට කියන්නම්. ඩෙංගු රෝගය සඳහා පැපොල් යුෂ භාවිත කිරීම අපේ වෛද්‍ය සහත් හෙට්ටිගේ මැතිතුමා පර්යේෂණ කරලා හොයා ගත්තා. ඒකේ සාර්ථක ප්‍රතිඵල තිබෙනවා. ඒක අපි අත්හදා බලා තිබෙනවා; මම අත්හදා බලා තිබෙනවා. ඒක හරි ගියා. ඒ වාගේම, එතුමා පැපොල් යුෂ අරගෙන විවිධ කුඩා නිෂ්පාදන කරලා තිබෙනවා. පෙති වශයෙන් හදා තිබෙනවා; කරල් වශයෙන් හදා තිබෙනවා; විවිධ ඒවා හදා තිබෙනවා. නමුත් එතුමාට රජයෙන් හෝ කිසිම පර්යේෂණ ආයතනයකින් කිසිදු සහයෝගයක් ලැබුණේ නැහැ. එතුමාගේ වියදමෙන්, එතුමාගේ ශක්තියෙන්, එතුමාගේ කැපවීමෙන්, එතුමාගේ අධිෂ්ඨානයෙන් තමයි එතැනට ආවේ. නමුත්, ඒවා භාවිත කරන්න රජයේ නියමිත, නීත්‍යානුකූල අවසරය තවමත් ලබා දීලා නැහැ. හැබැයි, පසු ගිය දවසක ජනාධිපතිතුමා එතුමා කැඳවලා සම්මානයක් පුද කළ බව මම රූපවාහිනියෙන් දැක්කා. ඒක හොඳ වැඩක්. නමුත්, ඒක කෙරෙන්න ඕනෑ කාලය පහු වෙලා. ඒක කෙරෙන්න තිබුණේ මේ වාගේ විද්‍යාත්මක සභාවකදී ඇගැයීමකට ලක් කරලායි. ඒ හැකියාව මේ හඳන apex body එකක තිබෙන්නට ඕනෑ. පර්යේෂකයන් යොමු කිරීමේ හැකියාව, පර්යේෂණයකට යොමු කිරීමේ අවශ්‍යතාව මෙවැනි ආයතනයකට තිබෙන්න ඕනෑ.

වර්තමානයේ සෑම තැනම නොයෙක් පර්යේෂණ කරනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ, කෘෂිකර්ම ජාතික ප්‍රතිපත්ති සභාවෙනුත් පර්යේෂණ කරනවා. ඒ වාගේම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බතලගොඩ වී පර්යේෂණ ආයතනයත් පර්යේෂණ කරනවා. ගන්නොරුවේ තිබෙන කෘෂි පර්යේෂණ ආයතනයෙනුත් පර්යේෂණ කරනවා. මේ සෑම තැනම පර්යේෂණ කරගෙන යනවා. නමුත්, මේ පර්යේෂණවලින් ලැබෙන ප්‍රතිඵල මොනවාද කියලා ජනතාවටවත්, අපටවත් සමහර වේලාවට දැනගන්න ලැබෙන්නේ නැහැ. මෙන්න මේ කරුණු monitor කරන්න, මේ ගැන හොඳට හොයා බලන්න පුළුවන් වග කිව යුතු ආයතනයක අවශ්‍යතාව තමයි එදා අපි යෝජනා කළේ. ඒක තමයි අද මේ සභාවට පනත් කෙටුම්පතක් හැටියට ඉදිරිපත් වෙලා තිබෙන්නේ. නමුත් ඒ අරමුණු සීමා සහිත වුණාම, අපි බලාපොරොත්තු වන අරමුණු ඉෂ්ට කර ගන්න අමාරුයි කියන එකයි මට ගරු ඇමතිතුමාට මතක් කරන්න තිබෙන්නේ.

වෙනත් රටවල කරන පර්යේෂණවල තොරතුරුත් මේ රටට එනවා. අපට ඒ විස්තර කියනවා. ඒවා පුවත් පත්වල දැන්වීම්වලින් ඕනෑ තරම් පෙන්වනවා. යම් යම් දේවල් මේ රටට ගෙනැල්ලා ඒවායේ තිබෙන වටිනාකම, ඒවායේ තිබෙන හොඳ දේ විවිධ ආකාරයෙන් අපට කියා දෙනවා.

එහෙම කියා දීලා ඒ ගොල්ලන් මේ රටේ ඒවා විකුණන්න උත්සාහ කරනවා. එතකොට මේවා ගැනත් යම් කිසි හැදෑරීමක්, අධ්‍යයනයක් අපේ රටේ තියෙන්නට ඕනෑ. ඒකට වග කියන්න පුළුවන් යම් කිසි ආයතනයක් අපේ රටේ තිබෙන්නට ඕනෑ. වග කියනවා විතරක් නොවෙයි, ඒ ගැන විශ්වාසය තියන්න පුළුවන් ආයතනයක් තියෙන්නත් ඕනෑ. ඒකට තමයි මේ ආයතනය අපි එදා යෝජනා කළේ. ඉතින් මේ සීමාසහිත අරමුණු තුළ අද අපට මේ අරමුණ ඉෂ්ට කර ගන්න පුළුවන්ද කියන එක ගැන සැකයක් ඇති වී තිබෙනවාය කියලා මා කිව්වේ ඒ නිසයි.

සමහර වෙලාවට මේ ආයතනයත් තවත් NGO එකක තත්ත්වයට පත් වෙන්න පුළුවන්. මොකද, අපේ රටේ හැම දේටම NGOs තිබෙනවා. ඒ ගොල්ලන් තමයි මේවා කරවන්නේ. දැන් මේ ආයතනයත් NGO එකක තත්ත්වයට වැටෙන්න දෙන්න එපාය කියලයි මා ගරු ඇමතිතුමාට කියන්නේ. NGOsවලින් මොකද කරන්නේ? කොහෙන් හෝ මුදල් ගෙනැල්ලා කාට හෝ දීලා, කවුරු හෝ මොනවා හරි කරනවා. ඒවායේ ගනු දෙනු ගැන, ඒවායින් සේවයක් වනවාද, නැද්ද කියන එක ගැන අපේ රටේ තවමත් නියමාකාරයෙන් සොයා බැලීමක් සිද්ධ වෙන්නේ නැහැ. ඒ තුළින් මුදල් කාබාසිනියා කිරීමකුයි සිද්ධ වෙන්නේ. අපේ රටට ලැබෙන ආධාර මුදල් ඇතුළු යම් යම් දේවල් විවිධාකාරයෙන් නොමහට ගමන් කර තිබෙනවා මේ NGOs හරහා. ඒක වෙනම කථා කරන්න තිබෙන මාතෘකාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, NGOs කියන්නේ අපේ රටේ ක්‍රියාත්මක වන දැවැන්ත සංවිධාන. මේවා ඉතා දරුණු විධියට අපේ රටේ ජන ජීවිතයට බලපෑම් කරන අවස්ථාවකයි අපි මේ ඉන්නේ. ඒ නිසා ඒක ගැන වෙනම කථා කරන්න ඕනෑ. නමුත්, මේ ආයතනය පිහිටුවා තිබෙන්නේ අපේ රටේ, අපේ රජයේ සල්ලිවලින්. අපේ රජයේ අරමුණු ඉෂ්ට කර ගන්න, ඒවා අනාගතයට ගෙන යන්න, මේ රටේ ඉදිරි අනාගතය සකස් කරන්න තමයි අපි මේ ආයතනය පිහිටුවන්නේ. මේකේ අරමුණු මීට වඩා පුළුල් වෙන්න ඕනෑයි කියලා මා කියන්නේ ඒකයි.

අපේ ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ, හොඳ පර්යේෂකයන් වන පාඨල් දරුවන් ඉන්නවා. ඒ ගොල්ලන්ට හොඳ නව නිපැයුම් කරන්න හැකියාව තිබෙනවා. මේ අයගේ ඉදිරි ගමනට මොකද වෙන්නේ? ඒ ගැනත් මා හොඳ උදාහරණයක් කියන්නම්. අපේ රටේ මාතර දිස්ත්‍රික්කයේ තරුණයෙක් හැදුවා, දුම්රිය සංඥා ක්‍රමය. කොහෙන්වත් ගෙනෙන්න ඕනෑ නැහැ ඒක. බෝපේ රේල් ගේට්ටුව ළඟ ඒ දුම්රිය සංඥා ක්‍රමය විවෘත කළේ මගේ අතින්මයි. අද වන තුරු කිසි ප්‍රශ්නයක් නැතිව එය හොඳින් ක්‍රියාත්මක වනවා. දැනට අවුරුදු 5ක් හෝ 6ක් ගත වෙලා තිබෙනවා. අද වන තුරු එය හොඳින් ක්‍රියාත්මක වනවා. නමුත් දුම්රිය දෙපාර්තමේන්තුවට මේක හඳුන්වා දෙන්න ගියාම; ඉදිරිපත් කරන්න ගියාම ඒ උදවිය ඒක පිළිගත්තේ නැහැ. එය පිළි නොගන්නට ඒ ගොල්ලන් හොඳ තර්කයක් ගෙනාවා. මේකේ පොඩි වැරැදීමක් හෝ වුණොත් දුම්රිය අනතුරක් වෙන්න පුළුවන් කිව්වා. ඒක කොහෙත් වෙන්න පුළුවන්.

පොඩි හෝ වැරදීමක් වුණොත් අනතුරක් වෙනවා. එහෙම කියලා, පිට රටින් ගෙනැල්ලා සංඥා ක්‍රමයක් සවි කරන්න ඒ ගොල්ලන් කැමැති වුණා. ඒ සඳහා දැවැන්ත මුදලකුත් වියදම් කළා. නමුත්, ඒ මුදලට වඩා සියයෙන් පංගුවටත් අඩුයි අපේ රටේ දරුවකු යෝජනා කරපු ක්‍රමය. අදටත් කිසිම ප්‍රශ්නයක් නැතිව බෝපේ රේල් ගේට්ටුව ළඟ ඒ දුම්රිය සංඥා ක්‍රමය ක්‍රියාත්මක වනවා. දැන් අවුරුදු ගණනාවක් තිස්සේ එය ක්‍රියාත්මක වනවා. නමුත්, ඒ ගැන කිසිම සැලකිල්ලක් නැහැ.දුම්රිය දෙපාර්තමේන්තුව ඒක සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළා. හැබැයි, පෞද්ගලික සමාගමක් ඇවිල්ලා මේ තාක්ෂණය ඒ ළමයාගෙන් ඉල්ලුවා. ඒ සඳහා විශාල මුදලක් දෙන්න සූදානම් වෙලා ඒ ගොල්ලන් මේ තාක්ෂණය ඉල්ලුවා. අන්න ඒ වාගේ තැනකදී තමයි මේ වාගේ ආයතනයක් අවශ්‍ය වන්නේ, ගරු ඇමතිතුමනි. මේ ආයතනයේ අරමුණු පුළුල් වෙන්න ඕනෑයි කියන්නේ මෙතැනදීයි. අපේ රටේ හැකියාවන් තිබෙන දරුවන් යම් යම්

නිෂ්පාදන කළාම ඒවා රැක ගන්නත්, ඒවා ගැන සොයා බලන්නත්, ඒවාට මැදිහත් වෙන්නත්, ඒ අයගේ ඉදිරි ගමන ගැන සහතික වෙන්නත් පුළුවන් ආයතනයක් වෙන්නට ඕනෑ, මේ ආයතනය. මේකේ අරමුණ වෙන්න ඕනෑ, ඒකයි. ඉතින් ඒ හැකියාව ඔබතුමා සහතික කරන්න. මේක ඉතාම වටිනා වැඩක්. මේක කෙරෙන්න ඕනෑ. ඒ වාගේම මේ සියලුම පර්යේෂණ ආයතන -

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු ඒ.ටී. සුසිල් පිරේමජූයන්ත)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ යෝජනාව draft කරන්න මම Legal Draftsmanට දුන්නා. Committee Stage එකේදී 3.(ඇ) amendment එක හැටියට ගෙනෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අබේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)

බොහොම ස්තුතියි. මේ අරමුණ ගැන අපි එදා මහා භාණ්ඩාගාරයේදී කථා කරලා තමයි මෙය ඉදිරිපත් කළේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා එදා හිටියේ නැහැ. මේවා ආරක්ෂා කරන්න ඕනෑ. සමහර දේවල් පර්යේෂණ කරලා හොයා ගත්තා නොවෙයි, අහම්බෙන් ලැබුණු දේවල්. මේ හැම දේකටම මැදිහත් වෙන්න පුළුවන් වන විධියට මෙහි අරමුණු වෙනස් කරන්න ඕනෑ. ඒ වාගේම ඒකට සුදුසු යන්ත්‍රණය සකස් වෙන්න ඕනෑ. දැන් ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා කිව්වා 15දෙනකු විතර තමයි මේකේ ඉන්නේ කියලා. මේ ප්‍රමාණය මදි ගරු ඇමතිතුමනි. මේ වැඩේට එහෙම පිරිසක් ප්‍රමාණවත් නැහැ. රට ගැන හැඟීමක් තිබෙන, මේ වෙනුවෙන් කැප වෙන්න පුළුවන් විශේෂඥයන්, විද්‍යාඥයන් රාශියක් මේකට ඇතුළත් කර ගන්න ඕනෑ.

ඒ ගොල්ලන් එක එක අංශවලට යවන්න වෙනවා. නැනෝ තාක්ෂණය ගැන බැලුවොත්, අපේ රටේ නැනෝ තාක්ෂණය තවමත් ළදරු වියේ තිබෙන්නේ. මට මතකයි අපි ගිහිල්ලා ආයතනයක් විවෘත කළා. නමුත් අපි බලාපොරොත්තු වුණු වේගයෙන් ඒ ආයතනය ඉදිරියට ගියේ නැහැ.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු ඒ.ටී. සුසිල් පිරේමජූයන්ත)
(The Hon. A.D. Susil Premajayantha)
පිටිපන.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)

ඔව්. හෝමාගම, පිටිපන. අපි ගිහිල්ලා ඒක විවෘත කරලා බොහොම ආශාවෙන් ඒ කටයුතු කළා. නමුත් තව වෙනකල් බලාපොරොත්තු වුණු වේගයෙන් ඒක ඉදිරියට ගියේ නැහැ. යමක් කෙරීගෙන යනවා. නමුත්, අපි බලාපොරොත්තු වුණු වේගය තවම ලැබුණේ නැහැ. ඒ වගේ වෙලාවක තමයි මේ මැදිහත්වීම කළ යුතු වන්නේ. අන්න එතැනදී තමයි මේ ආයතනය වැදගත් වෙන්නේ. මේක ජාතික ආයතනයක්. මේ ආයතනයට සම්පූර්ණයෙන්ම නිදහස තිබෙන්නට ඕනෑ. මේ ආයතනයට කටයුතු කරන්න පුළුවන් සම්පූර්ණ නිදහස තිබෙන්නට ඕනෑ. ඒ වාගේම මෙම ආයතනයේ කටයුතු කරගෙන යද්දී, එය ක්‍රියාත්මක කරන්න ඉදිරිපත් වන සියලු දෙනාටම මොකක්ද මේ කරන්නේ කියන එක ගැන හොඳ වැටහීමක් තිබෙන්නට ඕනෑ.

අපේ රටේ ඉදිරි අනාගතය සම්පූර්ණයෙන් රැඳෙන්නේ මේ වගේ ආයතන මතයි. කෘෂිකාර්මික අංශය විතරක් නොවෙයි, කර්මාන්ත අංශය විතරක් නොවෙයි, මෙම ආයතනය අපේ රටේ තිබෙන සියලුම පර්යේෂණායතන සම්බන්ධීකරණය කරන්න පුළුවන් ආයතනයක් වෙන්න ඕනෑ. අනෙකුත් පර්යේෂණායතන සියල්ලක්ම මේ ආයතනයත් සමඟ අනිවාර්ය සම්බන්ධතාවක් තබාගන්නට ඕනෑ. සමහර වෙලාවට සමහර ආයතන පෞද්ගලිකව කටයුතු කරනවා. සමහර උගත් උදවිය පිට රටවලට ගිහිල්ලා කථා කරලා ඒ ගොල්ලන්ගෙන් විශාල මුදලක් මෙහාට අරගෙන එනවා. හැබැයි කවුරුවත් දන්නේ නැහැ. කෘෂිකර්ම අමාත්‍යාංශය භාරව ඉන්න කොට මට ඒ විධියේ ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ ආයතනය අපේ අමාත්‍යාංශය හරහා සල්ලි එවලා. ඊට පස්සේ ඒ මුදල්වලට වෙච්ච දෙයක් නැහැ. ඒ මුදල් වෙන කොහේද ගිණුමකට ගිහිල්ලා. ඒ ගොල්ලෝ මෙහාට වාහනත් එවලා තිබුණා. ඒ වාහන clear කරලා තිබුණේත් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන්. අන්තිමට වාහනත් නැහැ. පර්යේෂණ ක්ෂේත්‍රය තුළ එහෙම දේවලුත් සිද්ධ වෙනවා. අපට ඒ විධියේ ගැටලු තිබෙනවා. මේක ජාතික ආයතනයක් නම් සියලුම පර්යේෂණ සඳහා අපේ රටට එන සියලුම මුදල්, සියලුම දැනුම මේ හරහායි එන්න ඕනෑ. ඒවා අදාළ ආයතනවලට එන්න ඕනෑ මේ හරහායි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ ආයතනයේ අරමුණු මීට වඩා පුළුල් කරලා, මේ සම්බන්ධව තවත් අධ්‍යයනයක් කරලා සංශෝධන සහිතව හෝ මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා මේ මහින් වඩා ඵලදායී, වඩාත් සාර්ථක ගමනක් යන්න පුළුවන් වන විධියට මේ කටයුත්ත අවසන් කරන්න ඔබතුමාට හැකි වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

[අ.භා. 3.12]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයට ගැනෙන මේ පනත් කෙටුම්පත පිළිබඳව මටත් අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. එදා කුමාරතුංග මුනිදාසයන් කියූ කාව්‍යයක් මට මේ අවස්ථාවේ සිහිපත් වෙනවා. ඒ තමයි, "අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනඟී, සිහාකෑම බැරි වූ කල ලගී ගයා මර ගී." අලුත් අලුත් දේ කරන්නට සහාය ලබා දෙන්නට තමයි එදා, 1999 ජූලි මාසයේ ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ආරම්භ කළේ. ඊට අවුරුදු 16කට පසුව තමයි මේ අලුත් වෙනස්වීම් කරන්න උත්සාහ කරන්නේ. අවුරුදු 16කට පෙර තමයි මේ පනත සම්මත කරලා තිබෙන්නේ.

එදා ජනාධිපති බලතල මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33වන ව්‍යවස්ථාව ප්‍රකාරවයි මේ සභාව ආරම්භ කළේ. නමුත් ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ආරම්භ කළේ නැහැ. ඊට අවුරුදු 16කට පස්සේ විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කර ගනිමින් සිදුකරනු ලබන පර්යේෂණයන් මහින් රට විශාල වෙනසකට භාජනය කිරීමට ඇති හැකියාව තේරුම් අරගෙන, එහි

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ඇති වැදගත්කම තේරුම් අරගෙන අද එය කෙටුම්පතක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගෙන වඩාත් ශක්තිමත් පර්යේෂණ සභාවක් පිහිටුවීමට කටයුතු කිරීම ගැන අපි සතුටු වෙනවා. මොකද, අවුරුදු 16ක් තිස්සේ කථා කරමින් සිටියා මිසක්, මේ ආයතනය ශක්තිමත් කරන්න අවස්ථාව එළැඹිලා තිබුණේ නැහැ; හැකියාව තිබුණේ නැහැ. ඒ නිසා මේ ආයතනය ශක්තිමත් වුණේ නැහැ. අපේ අනන්‍යතාව අනුව, අපේ තාක්ෂණය මඟින්, අපටම අනන්‍ය වූ ඉදිරි දැක්මක් ඇතිව රට ගොඩනැඟීමේ කාර්ය භාරයට අපේ උගතුන්ගේ, බුද්ධිමතුන්ගේ දායකත්වය අරගෙන කටයුතු කිරීමට නව රජය උත්සාහ කිරීම, ඒ පිළිබඳව විශ්වාසය තබාගෙන කටයුතු කිරීම මෙම ආයතනය ශක්තිමත් කිරීමක් විධියට, එහෙම නැත්නම් මෙම පනත ශක්තිමත් කිරීමක් විධියට හඳුන්වන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා දාගැබ, වැව්, අමුණු හැදුවේ අපි. වාරි කර්මාන්තය ගොඩනැඟුවේ අපි. අපට ඒ තාක්ෂණ දැනුම තිබුණා. විවිධ කැනීම්වලින් අපට විවිධ මැටි භාණ්ඩ හමුවුණා. ඒ කියන්නේ මේ රට යටත්විජිතයක් වන්නට ඉස්සරවෙලා අපි පිහන් මැටි ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වයට පත්වෙලා සිටියා. නමුත් අද වෙනකොට පිහන් මැටි කර්මාන්තයත් අපෙන් ගිලිහිලා තිබෙනවා. පිහන් මැටි කර්මාන්තය දෙස බැලුවොත් පසු ගිය දවස්වල එම කර්මාන්තය සඳහා පාවිච්චි කළේ එංගලන්තයේ මැටි මිශ්‍රණයක්. සුද්දෝ ලංකාවට ඇවිල්ලා මීගමුවේ කර්මාන්තශාලාවක් හදලා; පිළියන්දල කර්මාන්තශාලාවක් හදලා පිහන් හදන්න පටන් ගත්තා නම්, ඒ මැටි මිශ්‍රණය තමයි පසු ගිය කාලය වෙනකල්ම පාවිච්චි කළේ.

එහෙම නැත්නම් දංකොටුවේ තිබෙන්නේ ජපන් මැටි මිශ්‍රණය. අපේ රටේ මැටි මිශ්‍රණයක් තවමත් අපට යොදා ගන්න බැරි නිසා, අපේ පිහන් නිෂ්පාදන ක්ෂේත්‍රය අපෙන් ගිලිහී ගිහිල්ලා විදේශිකයන් අතට පත් වෙලා තිබෙනවා. එපමණක් නොවෙයි, විදේශිකයන්ට ආක්‍රමණය වෙච්ච වෙළෙඳ පොළක් බවට අපේ වෙළෙඳ පොළ පත් වෙලා තිබෙනවා.

අපි ගොඩනැඟිලි ද්‍රව්‍ය ආනයනය කරන්න රුපියල් කෝටි විසිදාහක් වසරකට වියදම් කරනවා. ඒ කියන්නේ, දවසකට රුපියල් ලක්ෂ පන්දහස් හාරසීයක් වියදම් කරනවා. මේ ක්ෂේත්‍රයට සම්බන්ධ අපේ හිටපු ප්‍රවීණයෝ අපට නැති වෙලා ගිහිල්ලා තිබෙනවා. සීගිරිය බලකොටුව හැදුවේ අපි. සීගිරිය නිර්මාණ දිහා බැලුවොත්, චිත්‍ර ශිල්පය දිහා බැලුවොත් ඒවායේ වර්ණ ගැන්වීම සහ එහි කලාත්මකභාවය එදා මෙන් අදත් තිබෙනවා. මුළු ලෝකයම අගය කරන විස්මිත නිර්මාණයක් වන රුවන්වැලි මහා සෑය හැදුවේ අපි. ලෝවාමහාපාය හැදුවේ අපි. කලා වැව හැදුවේ අපි. අද තිබෙන විදේශ ආක්‍රමණයන් එක්ක අපේ තාක්ෂණයන් සියල්ලම යට කරගෙන විදේශ තාක්ෂණය ඉදිරියට පැමිණිලා තිබෙනවා. දැන් අපේ ගොඩනැඟිල්ලක් හදන්නත්, අපේ වැවක් හදන්නත්, අපේ ඉදි කිරීමක් කරන්නත් විදේශ තාක්ෂණයේ සහාය අරගෙන විදේශිකයන් ඇවිල්ලා කරන කාලයක් තමයි දැන් උදා වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොසොන් උත්සවය ගැන කථා කරන කොට මහින්දාගමනය ගැන සිහිපත් වෙනවා. අනුරාධපුරයේ කොච්චර අඹ ගස් තිබුණාද? අඹ ඵලදාව තිබුණා. ඒ කථාව කිය වෙන කොට ඒ ගැන අපට මතක් වෙනවා. නමුත්, වර්තමානය වන විට විෂ කවපු ඇපල් ගෙඩිය ඇමෙරිකාවෙන්, චීනයෙන් ලංකාවට ගෙන්වනවා. අපේ රටේ අඹ ගෙඩියට වඩා මිල අඩුයි. ඇමෙරිකාවෙන් ගෙන්වනවාට transportවලටම කොච්චර යනවා ඇතිද? නමුත්, අපේ රටේ හැදෙන, අපේ පොළොවේ හැදෙන, අපේ ගෙදර හැදෙන අඹ ගෙඩිය ඊට වඩා මිලයි.

අපි මේ ඇපල් ගෙඩි ආනයනය කරන්න වසරකට රුපියල් කෝටි 290ක මුදලක් වැය කරනවා. ඒ කියන්නේ අපි දවසකට රුපියල් ලක්ෂ 80ක ඇපල් ආනයනය කරනවා. දොඩම් වගාව ගැන කියනවා නම්, අපේ දොඩම් හැදෙන්නේ කාලයකටයි. නමුත්, විදේශ රටවලින් හැමදාම හැදෙන දොඩම් අපි ආනයනය කරනවා. සාමාන්‍යයෙන් අපේ දොඩම් ගෙඩිවලට වැඩිය ඒ දොඩම් ලස්සනයි, ප්‍රසන්නයි, පැණි රසයි. මේ ඔක්කෝම තිබෙන දොඩම් ගෙඩිය දැන් අපි ආනයනය කරනවා. අපේ දොඩම් ගෙඩිය දැන් පුරා වස්තුවක් වේ ගෙන එනවා. අපි වසරකට රුපියල් කෝටි 71ක මුදලකට දොඩම් ආනයනය කරනවා. ඒ කියන්නේ දවසකට රුපියල් ලක්ෂ 20ක පමණ මුදලකට දොඩම් ආනයනය කිරීම සඳහා අපි විදේශ විනිමය වියදම් කරනවා.

මිදි වගාව ගැන කියනවා නම්, ඒත් ඒ ටිකම තමයි. උතුරු නැඟෙනහිර යුද්ධය අවසන් වෙලා දැන් අවුරුදු 6ක් වනවා. මිදි වගාව ගැන අපේ කාලයට ගැළපෙන උන්නතියක් ආවාද? යුද්ධය අවසන් වෙලා අවුරුදු 6ක් ගියත් මිදි වගාවට සැලකිය යුතු වර්ධනයක් තිබුණාද? නමුත්, අපි අවුරුද්දකට රුපියල් කෝටි 180ක මිදි ආනයනය කරනවා. ඒ කියන්නේ දවසකට රුපියල් ලක්ෂ 50ක මිදි අපි ආනයනය කරනවා. මිදි, ඇපල්, දොඩම් කියන පලතුරු තුන විතරක් ගත්තොත්, අවුරුද්දකට රුපියල් කෝටි 540ක මුදලකට අපි ඒවා වෙනත් රටවලින් ආනයනය කරනවා. ඒ කියන්නේ මේ පලතුරු තුන සඳහා පමණක් දවසකට ලක්ෂ 150ක මුදලක් අපි විදේශ රටවලට පූජා කරනවා. තේ, පොල්, රබර් ගත්තත් ඒ වාගේම තමයි. එදා තේ, පොල්, රබර් කිව්වාම අපේ විදේශ ධන උල්පත් ලෙස සැලකුවා. අද අපි දන්නවා තේ වෙළෙඳ පොළට මොකද වෙලා තිබෙන්නේ කියලා. වටිනාකම එකතු කරන ලද තේ හදා ගන්න අපට හැකියාව ලැබිලා නැහැ. Value added teaවලට අපි ගියේ නැහැ. තිබෙන තේ කොළයම අපි විකුණා විකුණා හිටියා. පර්යේෂණ කරලා අලුත් තැනකට ආවේ නැහැ. ඒ නිසා අපේ තේ වෙළෙඳ පොළ ලෝකයෙන් ප්‍රතික්ෂේප වුණා. නමුත්, එදා ලෝකයටම තේ සපයන තේ වත්ත වුණේ ශ්‍රී ලංකාවයි. එහෙම තිබුණු අපට මොකද වුණේ? ලංකාවේ පොල් වගාව ගත්තත් එහෙමයි. එදා පොල් තෙල් මෝල් තිබුණා. Desiccated coconut අපනයනය කළා. අපට ඒවා විශාල ධන උල්පත් වෙලා තිබුණා. නමුත්, තවමත් ඒ තෙල් මෝල ඒකම තමයි. ඒවා වැහිලා ගියා. Desiccated coconut රට යවන එක නැති වෙලා ගියා. තවමත් පොල් ගහේ ඵලදාව ඒකමයි. එදා තිබුණු පොල්ගහම තමයි අදත් තිබෙන්නේ. එහි ඵලදාව වැඩි කර ගැනීම සඳහා අලුත් ක්‍රමවේද සොයා ගෙන නැහැ. ඒ නිසා අපි වසරකට- [බාධා කිරීමක්]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමන්ලා value-added teaවලට-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
අලුතින් tax හඳුන්වා දී තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අපි ඒක ඉදිරියේදී ගේන්න යනවා. අපි tax හඳුන්වා දීලා, ඒකට උදව් කරලා, ඒකට ශක්තියත් දීලා, ඒ ඔක්කෝම අපි

කරනවා. මෙතෙක් කල් මේවා ගැන කථා කළේ නැහැ නේ. දැන් කථා කරනවා. මේකයි වෙනස. අපි පොල් තෙල් සහ palm oil ආනයනය කරන්න වසරකට රුපියල් කෝටි 1,678ක් වියදම් කරනවා. ඒ කියන්නේ, දවසකට අපි රුපියල් ලක්ෂ 460ක් වියදම් කරනවා. මේ පොල් පිට රට යවපු රට.

කුළු බඩු ගනිමු. ඒ කාලයේ අපි යටත් විජිතයක් ලෙස ඉන්න කොට කුළු බඩු අපනයනය කළා. නමුත්, අද කුළු බඩු ආනයනය කරන්න වසරකට රුපියල් කෝටි 1,600ක් වියදම් කරනවා. ඒ කියන්නේ, දිනකට රුපියල් ලක්ෂ 455ක කුළු බඩු අපි ආනයනය කරනවා. අපේ මිරිස් වගාව දිහා බැලුවත් හොඳයි. අපේ දේශගුණයට, අපේ පොළවට ගැළපෙන වගාවක් මිරිස්. නමුත්, අද මිරිස් ආනයනය කරනවා. ලූනු ගෙඩිය දිහා බැලුවත් එහෙමයි. අපි මිරිස්, ලූනු ආනයනය කිරීම සඳහා වසරකට රුපියල් කෝටි 2,375ක් විදේශ රටවලට සල්ලි යවනවා. පරිප්පු ගත්තත්, සීනි ගත්තත්, කිරි පිටි ගත්තත් එහෙමයි. අපේ දවසකට රුපියල් කෝටි 10ක් වියදම් කරනවා කිරි පිටි ආනයනය කරන්න. මේ උක් හැදෙන රටේ සීනි ගෙන්වන්න දවසකට රුපියල් කෝටි 10ක් වියදම් කරනවා.

ඉතිහාසයේදී සහල්වලින් ස්වයංපෝෂිත වුණු රටක් මේක. නමුත්, පසු ගිය ආණ්ඩුව කාලයේ -2014දී- මේ රටට විශාලතම සහල් තොගය ආනයනය කළා. ඒ නිසා 2015 වන කොට මේ රටේ නිෂ්පාදනය කළ සහල්වලට කර ගන්න දෙයක් නැතිව වී ගොවියා අමාරුවේ වැටුණා. අපි දන්නවා අස්වැන්න තැන්පත් කරන්න අපට තැනක් නැහැ. ගබඩා පහසුකම් නැහැ. අන්තිමට මත්තල ගුවන් තොටුපොළේ වී ගබඩා කරන්න සිද්ධ වුණා. අපට පරිභෝජනය කරලා ඉවර කරන්න බැරි තරම් වී ඵලදාවක් තිබුණා. එවන් අවස්ථාවක තමයි මෙට්‍රික්ටොන් ලක්ෂ 600ක්ද කොහෙද වී ගෙන්නුවේ. නමුත්, අන්තිමට ඒ වී ටිකට මොකක්ද කළේ? රජය විශාල මුදලකට වී මිලදී අරගෙන සත්ව ආහාරවලට කුණුකොල්ලෙට දීලා දානවා. එහෙම නැත්නම් බියර් හදන්න හෝ කුණුකොල්ලෙට විකුණනවා. නමුත්, පිටි සෑදීමට අවශ්‍ය කරන ඉරිඟු සහ තිරිඟු ආනයනය කරන්න වසරකට රුපියල් කෝටි 5,212ක් අපි වියදම් කරනවා. ඒ කියන්නේ, ඉරිඟු සහ තිරිඟු ආනයනය කරන්න අපි දවසකට රුපියල් කෝටි 14ක් වියදම් කරනවා. නමුත්, පර්යේෂණ තුළින් ඉරිඟු පිටිවලට සමාන පිටි වර්ගයක් සහල් පිටිවලින් අපට නිර්මාණය කර ගන්න බැරිද? ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය අපට නැද්ද? තිරිඟු පිටිවලින් එන powder එක, නැත්නම් පාන් පිටිවලට සමාන පිටි වර්ගයක් ලැබෙන වී වර්ගයක් පර්යේෂණ කරලා අපට හඳුන්වා දෙන්න බැරිද? මේ වාගේ ප්‍රශ්න අපට තිබෙනවා. මට හිතෙනවා තාක්ෂණය අතින් අපි පසු බෑමට ලක්වී සිටින බව. වෙනත් රටවල් තමුන්ගේ දේ රැක ගන්න, තමුන්ගේ දේ දියුණු කර ගන්න තාක්ෂණය අතින් වේගයෙන් ඉහළට ගිහින් තිබෙනවා. නමුත්, අපි තාක්ෂණය පැත්තෙන් ඉහළට ගියේ නැහැ. ඒ නිසා අපි පහළට වැටුණා කියලා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දිනක ගරු අග්‍රාමාත්‍යතුමා මේ ගරු සභාවේදී රට ගැන සඳහන් ගීතයක කොටසක් සඳහන් කළා. දීපිකා ප්‍රියදර්ශනී මහත්මිය සහ ආනන්ද වීරසිරි මහතා ගායනා කළ "ආජු තපර ලාභිලා - පීජු තපර ලාභිලා" ගීතය මතක් කර දුන්නා. මමත් ඒක කියනවා:

"විදු නැණයෙන් අභිසෙස් ලබමින්නේ
සඳ මතුපිට පියවර එසවෙන්නේ
අප පමණද එක තැන කැරකෙන්නේ
අප තනිකර ලෝකය දිව යන්නේ"

ඊළඟ පද මෙසේයි:

"අපේ හදට සතුටක් මුසු වේ නම්
අපේ දුකට සුසුමක් මතු වේ නම්
අපේ හිතට දිරියක් ලැබ දේ නම්
එදා අපට පෙරමඟ සූදානම්"

ඒ කියන්නේ, අපි බලාපොරොත්තු වනවා ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ශක්තිමත් කරලා, පර්යේෂණ තුළින් රට වෙනස් කරන්න. එය කළ හැකියි කියන විශ්වාසය අප තුළ තිබෙනවා. රටේ ජනතාවට පෙරමඟ සූදානම් කරන්න මේ පර්යේෂණ ආයතනය ඉවහල් කර ගන්න පුළුවන් ලෙස ශක්තිමත් ආයතනයක් කරන්න තමයි ගරු අමාත්‍යතුමා උත්සාහ අරගෙන අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

අපේ රටේ කරන පර්යේෂණ තුළින් දළ දේශීය නිෂ්පාදනය ඉහළ නංවන්නට පුළුවන්ය කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම මේ පර්යේෂණ තුළින් රට වැසියාගේ ආර්ථික ශක්තිය ඉහළ නංවන්නත් අපට පුළුවන් වෙයි කියලා අපි දැඩි ලෙස විශ්වාස කරනවා. ඒ එක්කම නව රජයේ බලාපොරොත්තුව තුළින් මේ පර්යේෂණ ආයතනය ශක්තිමත් කර විවිධ පර්යේෂණ සඳහා රට තුළ ඉඩ ප්‍රස්ථා ඇති කෙරුවාම මේ රට උගතුන්ගේ පාරාදීසයක් කරන්නට අපට පුළුවන්ය කියලා අපි විශ්වාස කරනවා. ඒ මඟින් රට හැර ගිය උගතුන් නැවතත් මේ රටට ගෙන්වා ගැනීමට හැකිවනු ඇතැයි අපි විශ්වාස කරනවා.

රැකියා දශ ලක්ෂයක් බිහි කිරීමේ වැඩසටහනටත් මේ ආයතනයට අත්වැලක් වෙලා උගතුන් රටට ආවාම ඒ ආශ්‍රිතව රැකියා නිර්මාණය වන අවකාශයක් බිහි වෙයි කියලා අපි දැඩි ලෙස විශ්වාස කරනවා. රට තුළ මහා පෙරළියක් ඇති කළ හැකි ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ශක්තිමත් කිරීමට, අර්ථවත් කිරීමට පියවර ගැනීම ගැන විශේෂයෙන්ම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, ඒ වාගේම අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, අපේ අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාටත්, රාජ්‍ය අමාත්‍ය ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමාටත් මේ අවස්ථාවේ මගේ විශේෂ ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ශක්තිමත් කළ පමණින්ම අපේ අරමුණ ඉටු වීමක් නම් සිදු වන්නේ නැහැ. අපට කරන්න ගොඩක් වැඩ තිබෙනවා. වර්තමානයේ විද්‍යාඥයින් පර්යේෂණ කරන්නේ මේ රටේ ප්‍රශ්න ගැන නොව ජාත්‍යන්තර ප්‍රශ්න ගැන කියලා අපි දන්නවා. බරපතළ ජාත්‍යන්තර ප්‍රශ්න ගැන තමයි ඔවුන් කටයුතු කරන්නේ. ඒවා කරන්න අපේ රටට වඩා වෙනත් රටවල හොඳ පහසුකම් සහිත විද්‍යාගාර, පහසුකම් සහිත ස්ථාන තිබෙනවා. ඒවා ඒ ගොල්ලන් කරයි. අන්තිමට බැලුවාම වෙලා තිබෙන්නේ අපි ඒවාට එකතු වන එකයි. නමුත්, අපි අපේ රටට වාසියක් වන විධියට, රටේ දළ දේශීය නිෂ්පාදනය වැඩි කරන්න පුළුවන් වන විධියට, රටෙන් විදේශ විනිමය ගලා යෑම නවත්වන්න පුළුවන් වන විධියට පර්යේෂණ කරන්න පුළුවන් නම්, ඒ සඳහා විශේෂ උනන්දුවක් යොමු කරන්න පුළුවන් නම්, ඉතාමත් වැඩදායී වනවා කියලායි මම හිතන්නේ.

මේ මහා පර්යේෂණ කරපු උදවිය ලංකාවේ ඉන්නේත් නැහැ. ඒ පර්යේෂකයින්, ඒ විද්‍යාඥයන් සමහර විට පවුල් පිටින්ම රට හැර දාලා වෙන රටකට ගිහිල්ලා ටික කාලයකින් ඒ රටේ පුරවැසිභාවයත් ගන්නවා. අන්තිමට බැලුවාම ඒ අය රටත් දාලා ගිහිල්ලා. නමුත්, මේ පර්යේෂණවලට වියදම් කරන්නේ මේ රටේ අහිංසක දුප්පත් මිනිසුන්ගේ සල්ලි. වර්තමානය බැලුවාම මේ රටේ ආදායමෙන් සියයට 80ක් සඳහා අහිංසක දුප්පත් මිනිස්සු තමයි බදු වශයෙන් තමුන්ගේ කොටස ගෙවන්නේ. මුදල් තිබෙන අය එහෙම නැත්නම් රාජ්‍ය ආදායම මේකට එකතු වෙලා තිබෙන්නේ සියයට 20යි.

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ඒ කාලයේ රුපියල් කෝටි අටක ඇට බෙදුවා. එකක්වත් පැළ වුණේ නැහැ. අන්න ඒ වාගේ මේ රටේ සල්ලි නාස්ති වන්න දෙන්නේ නැතිව හැම ශතයක්ම ප්‍රයෝජනයට ගත හැකි ආකාරයෙන් රටේ සංවර්ධනයක් ඇතිවන ආකාරයෙන් කටයුතු කරන්න පුළුවන් නම් හොඳයි කියලා මම විශ්වාස කරනවා. මොකද, ලෝකයේ සංවර්ධනය පිළිබඳව කථා කරන්න ඉස්සෙල්ලා අපේ රට ශක්තිමත් කිරීමට අපි පියවර ගත යුතු වනවා. ඒ නිසා අපේ දළ දේශීය නිෂ්පාදනය ඉහළ දැමීමටත්, රටේ ජීවන තත්ත්වය උසස් කර ගැනීමටත් මේ පර්යේෂණයන් සෘජුව දායක වන්නේ නම් වඩා වැදගත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ උගතුන් ආචාර්ය උපාධිය ගන්නකොට නැත්නම් මහාචාර්ය උපාධිය ගන්නකොට විවිධ පර්යේෂණ කරනවා. මේ පර්යේෂණ හුඟක් වටිනවා කියලා අපි දන්නවා. සමහර විට මේවාට රජයේ මුදල් වියදම් කරලා තිබෙන්නත් පුළුවන්, රජයේ මුදල් වියදම් නොවී තිබෙන්නත් පුළුවන්. කෙසේ වෙතත් මේ පර්යේෂණවලට රටේ මුදල් වියදම් කරලා තිබෙනවා. නමුත්, ඒවා ගොඩක් වෙලාවට තිබෙන්නේ ඒ ආයතනවල කබඩ් ඇතුළේ වසා දමායි. ඒවා එළියට එන්නේ නැහැ. ඒ උපාධිය ගත්තත් එක්කම ඒ උපාධි සහතිකය කබඩ් එකට දමා lock කරනවා. ඒවා එළියට එන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන්න ඕනෑ. ඒ නිසා මම විශේෂයෙන් කියනවා, ඒවා ක්‍රියාත්මක වීමේදී ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා යාන්ත්‍රණයක් ඇති කිරීමේ වැඩ පිළිවෙළක් හැදෙන්න ඕනෑය කියලා. ඒක අපට ඇති විශාල අඩුවක්. අපට ප්‍රශ්න තිබෙනවා. ජනතාව ප්‍රශ්නවලින් පෙළෙනවා. රටේ ආර්ථිකය ප්‍රශ්නවලින් පෙළෙනවා. රටේ විදේශ විනිමය ප්‍රශ්නයක් තිබෙනවා. පර්යේෂකයෝ ඒ සඳහා හොඳ පර්යේෂණ කරලා ප්‍රතිඵල ගන්නවා. නමුත්, ප්‍රතිඵලය එක පැත්තක, ප්‍රශ්නය තව පැත්තක. ඔය දෙක අතර විශාල පරතරයක් තිබෙන නිසා මේ ප්‍රතිඵලවලින් රටට වැඩදායී දේ සිද්ධ වනවා අඩුයි කියන එක විශේෂයෙන්ම අපි දකින දෙයක්.

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පර්යේෂණවලටම සීමා වන්නේ නැතිව එම පර්යේෂණවල ප්‍රතිඵල රටේ ජනතාවට ගලා යෑමේ වැඩ පිළිවෙළක් නිර්මාණය කළ යුතු වනවා. ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට කිසියම් ක්‍රමවේදයක් නිර්මාණය කළ යුතු වනවා. නැත්නම් පර්යේෂණය කබඩ් එක ඇතුළේම තියේවි. ඒවා ගැන ජනතාව දන්නේත් නැහැ. එහෙම අත් දැකීම් අපිට ඕනෑ තරම් තිබෙනවා. ඒ ක්‍රමවේදය අපි නිර්මාණය කරන්න වෙනවා. සරලව කියනවා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවියාගේ ප්‍රශ්නය ගොවි බිමේ සිට පර්යේෂකයා තුළට යන ක්‍රමයකුත්, පර්යේෂකයා කරන පර්යේෂණයේ ප්‍රතිඵලය, පර්යේෂකයාගේ සිට ගොවි බිමට එන විධියකුත් නිර්මාණය කළ යුතු වෙනවා. නිෂ්පාදකයාගේ ප්‍රශ්නය වැඩ බිමේ සිට පර්යේෂකයාට ගලා යන ක්‍රමවේදයකුත්, පර්යේෂණයේ ප්‍රතිඵලය නැවතත් වැඩ බිමට ගලා එන ක්‍රමයකුත් අපි නිර්මාණය කළ යුතු වෙනවා. වෛද්‍යවරයාගේ ගැටලුවත් එසේමයි. වෛද්‍යවරයාගේ ගැටලුව පර්යේෂකයා තුළට යනවා වාගේම පර්යේෂකයා කරපු සොයා ගැනීම රෝගියා දක්වා ගලා ඒමේ ක්‍රමවේදයක් අපි නිර්මාණය කළ යුතු වෙනවා. ඒ නිසා මම විශේෂයෙන් කියනවා, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පර්යේෂණයට ලබා දෙන තැන වාගේම වැදගත් තැනක් එහි ප්‍රතිඵල අදාළ පුද්ගලයන්ට සහ රටේ ජනතාවට ගලා එන ක්‍රමවේදයක් නිර්මාණය කිරීමත් විශේෂයෙන්ම වැදගත් වෙනවා කියලා. ඒ සඳහා පිළිවෙළක් සකස් කළ යුතු වෙනවා.

මෙවැනි ක්‍රමවේදයක් නොමැති වීම නිසා අද මේ රටේ වටිනා පර්යේෂණ ජනතාවට දැනෙන්නේ නැති, ප්‍රතිඵල ලැබෙන්නේ නැති අවස්ථා බොහොමයක් තිබෙනවා. එම නිසාම බොහෝ පර්යේෂණවල ප්‍රතිඵල උපන් තැනම මිය යන බව අපි දැකලා තිබෙනවා. මම විශේෂයෙන්ම කිව යුතු දෙයක් තිබෙනවා. ඒ තමයි බොහෝ දියුණු වූණු රටවලට ගිහින් බැලුවාම ඒ රටවල එම පර්යේෂණය කරන්නේ -විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයා වෙන්න පුළුවන්; ආචාර්ය උපාධිය ගන්න පුද්ගලයා වෙන්න පුළුවන්; විද්‍යාඥයා වෙන්න පුළුවන් බොහෝ විට ඒ පර්යේෂණ කරන්නේ.- අදාළ පෞද්ගලික සමාගම් හා ඒකාබද්ධ වෙලායි. ඒ ගොල්ලන්ට තිබෙන ප්‍රශ්නය, ඒ ගොල්ලන්ගේ ව්‍යාපාරික ප්‍රශ්නය, ඒ ගොල්ලන්ගේ නිෂ්පාදන ප්‍රශ්නය සඳහා තමයි පර්යේෂණ වෙන්නේ. බොහෝ විට පර්යේෂකයාට මුදල් ගෙවන්නේත් ඒ වෙළඳ ආයතනයෙන් වෙන්න පුළුවන්. නැත්නම් නිෂ්පාදකයා වෙන්න පුළුවන්. අන්න මේ වාගේ වැඩ පිළිවෙළක් අපි විශ්වවිද්‍යාල තුළ හදන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අවසාන වශයෙන් කියනවා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ ආයුර්වේද විශ්වවිද්‍යාලය තිබෙනවා. අපේ රටේ රියදුරන් රාත්‍රියේදී වාහන පදවන විට නින්ද යනවාට බුලත් විටක් සපමින් වාහන පදවන්න පුරුදු වෙලා සිටින බව අපි දන්නවා. රාත්‍රියේදී රියදුරාට නිදිමත එනකොට එයා ළඟ තියෙන කඩේකින් බුලත් විටක් අරගෙන එය කටේ දමාගෙන සපමින් තමයි වාහනය පදවන්නේ. මොකද, බුලත් විට කටේ තිබෙද්දී රියදුරාට නින්ද යන්නේ නැහැ. අපට මේ බුලත් විටවල තිබෙන සාරය එකතු කරලා chewing gum එකක් හදන්න බැරි ඇයි? නමුත් අපි තවමත් එතැනට ඇවිල්ලා නැහැ. ඒ වාගේ තැනකට අපි ආවොත් මොකක්ද වෙන්නේ? එතකොට අපේ බුලත් වගාව දියුණු වෙයි. පුවක් වගාව දියුණු වෙයි. විවිධ රැකියා හම්බ වෙයි. ඇයි අපට ඒ තැනට යන්න බැරි? මේක වටිනා දෙයක් නේ. මම හිතන විධියට අපි මේ වාගේ පර්යේෂණවල මහා ඉහළට යන්න ඕනෑ නැහැ. අපේ රටට, අපේ පොළොවට ගැළපෙන විධියට, අපේ රටේ ආර්ථිකය වෙනස් කරන්න පුළුවන් විධියට, අපේ රටේ ජන ජීවිතය වෙනස් කරන්න පුළුවන් විධියට, අපේ රටේ විදේශ විනිමය අපේ රට තුළ රඳවා ගන්න පුළුවන් විධියට, පර්යේෂණවලට වැඩි තැනක් ලබා දෙන්නේ නම් අද අපි සම්මත කරන මේ පනත් කෙටුම්පත රටට වඩාත් අර්ථවත් වෙනවා කියලා මා විශ්වාස කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ඕළඟට, ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා කථා කරන්න.

ඊට පෙර, මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු පී. හැරිසන් මහතා (ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ஹரிசன் - கிராமியப் பொருளாதார அலுவல்கள் பற்றிய அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Rural Economic Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලකී ජයවර්ධන මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

[අ.භා. 3.33]

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Disaster Management)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ලෝකයේ තිබෙන කුඩා දූපතක ඉන්න මිනිස්සු. අද අපේ රටේ මිනිසුන්ගේ හිතේ දූපත් මානසිකත්වයක් තිබෙනවාද කියලා මට වෙලාවකට සැකයකුත් ඇති වෙනවා. මම එහෙම කියන්නේ, අද ලෝකයේ අනෙකුත් රටවල් කරලා තිබෙන විවිධ නිර්මාණ නැත්නම්, පර්යේෂණ එක්ක ගැළපීම සඳහාවත් අපි ක්‍රියා කරන්නේ නැහැ. අපි තවමත් ඉන්න කැමති අපේ සීමාවල් වහගෙනයි. ඒ සීමාවල් ඇතුළත අපේ දැනුම ලෝකයේ තිබෙන ඉහළම දැනුම කියලා හිතාගෙන ඒ වෙනුවෙන් ඉදිරියට යන්න, කිසි දෙයක් ගැන කල්පනා නොකර ඉන්න පරිසරයක් අපට විවෘත වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම ශ්‍රී ලංකාව හැම අංශයකින්ම කුඩායි. ඉඩම් අංශයෙන් කුඩායි. ස්වභාවික සම්පත් අතින් කුඩායි. සමහර විට දැනුම අතින් කුඩායි. අත් දැකීම් අතින් කුඩායි. ඒ වාගේම අපි මොනවා කළත්, කොච්චර කථා කෙරුවත්, ලෝකයේ ඉදිරිපෙළේ රටවල් එක්ක නොවෙයි, අඩු ගණනේ ආසියාවේ සමහර රටවල් එක්කවත් අපි ඉදිරියට ගමන් කිරීමක් මට නම් පෙනෙන්නේ නැහැ. ඒ වාගේම අද අපි එක්තරා විධියක මධ්‍ය ආදායම් හිරවීමක රැඳිලා ඉන්නවා. අපි මධ්‍ය ආදායම් මට්ටමට ගියා වුණත්, මධ්‍ය ආදායම් මට්ටමක අපි හිරවෙලා ඉන්නවා කියලා මට හිතෙනවා.

එහෙම නම් අපි කොහොමද, මධ්‍ය ආදායම් තලයෙන් ඉහළට ගිහිල්ලා ලෝකයේ දියුණු රටක් බවට පරිවර්තනය වෙන්නේ; අඩු වශයෙන් ඉහළ ආදායම් සහිත රටක් බවට පත් වෙන්නේ? මේ කියන තර්කය සම්පූර්ණයෙන්ම අදාළ වන්නේ අද මේ ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පතත් එක්කයි. ලෝකයේ කිසිම රටක් දියුණු වෙලා නැහැ, පර්යේෂණ සහ නවෝත්පාදන සිදු කරන්නේ නැතුව. සමහර රටවල් විශාල කාර්මික නිෂ්පාදන සිදු කරනවා. එක පැත්තකින් ඒ රටවල් ධනවත්, ඒ වාගේම කාර්මික නිෂ්පාදන සඳහා, නව නිෂ්පාදන සඳහා ඔවුන් විශාල වශයෙන් වියදම් කරනවා. අඩු ගණනේ අපේ රටේ කෘෂි කර්මාන්තයවත් කාර්මීකරණය කිරීම සඳහා අපි පියවරක් අරගෙන තිබෙනවාද කියලා මට වෙලාවකට හිතෙනවා. එහෙම වෙන්නේ මොකද, සාම්ප්‍රදායික තලයෙන් ඉහළට යන්න අපේ තිබෙන නොකැමැත්ත නිසාද, එහෙම නැත්නම් අපි පර්යේෂණ සඳහා වියදම් නොකරන නිසාද, එහෙම නැත්නම් ඒ පිළිබඳ ක්‍රමවේද අප සතුව නැති නිසාද කියලා අද අපි කවුරුත් කථා කරනවා.

අද අපි කොයි පැත්තේ සිටියත් මේ රට මේ තිබෙන තත්ත්වයට වඩා ඉහළට ගෙන යන්න ඕනෑ නම්, අපට ආදායම් අවශ්‍ය වෙනවා. ආදායම් අවශ්‍ය නම් අපි අපනයනය සඳහා ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. එහෙම නැතුව වෙන කිසිම ලෙසකින් අපට මේ කටයුත්ත කරන්න බැහැ. අපි අපනයනය සඳහා ක්‍රියා මාර්ග නොගන්නා තාක්කල් අපට කවදාවත් මේ මට්ටමෙන් ඉහළට යන්න බැහැ. මට පෙනෙන හැටියට අපි තවමත් ඉන්නේ ප්‍රාථමික අපනයනය සිදු කරන රටක් හැටියටයි. තේ අපනයනය කළත්, පොල් අපනයනය කළත්, ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කළත්, රබර් අපනයනය කළත් ප්‍රාථමික නිෂ්පාදන හැටියට තමයි යන්නේ. පසු ගිය දශක පහ, හය තුළ ඊට එහා ඒ දේවල් දියුණු කරන්න අපට පුළුවන්කමක් ලැබුණා කියලා මම විශ්වාස කරන්නේ නැහැ. ඒකට ප්‍රධන හේතු තමයි අපේ පර්යේෂණ හිහකම, නවෝත්පාදන සඳහා ක්‍රියා මාර්ග නොගැනීම සහ ඒවා ප්‍රායෝගික වශයෙන් යොදා ගැනීමට අපේ තිබෙන අසමත්කම.

පසු ගිය කාලයේ අපි යම් යම් අංශවලින් ප්‍රගතියක් ලැබුවා. විශේෂයෙන්ම කුඹුරු ගොවිතැනේ යෙදෙන අය අද වෙනදාට වඩා යන්ත්‍ර පාවිච්චි කරනවා. නමුත් අපි ඊට එහාට යන්න ඕනෑ. අක්කරයක දෙකක, නැත්නම් වී ලාස් 20ක, 30ක කුඹුරු කැබැල්ලක් හැරුණු විට ඊට වඩා ලොකු කුඹුරු තිබෙන පිරිස් ඉතා අඩුයි. යායක් ගත්තොත් ඒ යායේ කුඹුරු හිමියන් පනහක්, සියයක් නැත්නම් දෙසියයක්, තුන්සියයක් ඉන්නවා. ඒ වාගේම අපි තාක්ෂණය පාවිච්චි කරන්නේ නැති නිසා අනිවාර්යයෙන්ම අපේ අස්වැන්න අඩුයි. ඉන්දියාවේ අස්වැන්න සහ ලංකාවේ අස්වැන්න අතර පරතරය බැලුවාම අපට පෙනෙනවා, අපේ නිෂ්පාදන වියදම ඉතා වැඩියි කියන එක. අපි වැව්වත්, මිරිස් පැළයක් වැව්වත්, වී වගා කළත්, මොනවා කළත් අපේ නිෂ්පාදන වියදම් ඉතාම අධිකයි. අපට කොහොමවත් පිට රටත් එක්ක තරග කරන්න බැහැ. පිට රටත් එක්ක තරග කරන්න බැරි නම්, අපි ඒක නිර්මාණය කරන්නේ කොහොමද?

මට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ සියලු පර්යේෂණ ආයතන එකට එකතු කරන තැනක් තිබෙන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත හරහා අපි කළ යුතු වන්නේ ඒකයි. ඒවා දැන් අමාත්‍යාංශ ගණනාවකට බෙදිලායි තිබෙන්නේ. මම හිතන විධියට අමාත්‍යාංශ දහයකට, පහළොවකට බෙදිලා තිබෙනවා. ඒ නිසා අපි කොච්චර කථා කළත් ඒවා තවම එතැනමයි තිබෙන්නේ. ඒ නිසා අද මොකක් හරි දෙයක් සොයා ගත්තත්, යම් කිසි නිර්මාණයක් කළත්, ඒක පිට රටට විකුණන තැනට තමයි අපි ඇවිල්ලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒවා දේශීය වශයෙන් යොදා ගන්නා තැනකට අපි ඇවිල්ලා නැහැ.

දෙවන කාරණය වන්නේ අපි රටක් හැටියට මේ පර්යේෂණ සඳහා කොපමණ වියදම් කරනවාද කියන එකයි. මම හිතන විධියට ජාතික ආදායමෙන් සියයට 0.1කට වඩා අඩුවෙන් තමයි ඒ සඳහා අපි වියදම් කරන්නේ. අපි කෙසේ හෝ මේ නවෝත්පාදන සහ පර්යේෂණ, Research and Development - R&D, කියන ප්‍රධාන කාරණාව වෙනුවෙන් අපේ ජාතික ආදායමෙන් සියයට 1.5කට හෝ සියයට 1කටවත් ආසන්න ප්‍රමාණයක් වෙන් කිරීම ආරම්භ කරන්න ඕනෑ. එහෙම නැතුව පනතක් සම්මත කර ගත්තා කියලා ඒකෙන් කවදාවත් අපට සහනයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ.

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

අනෙක් පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධ වීමේ ජාලයක් නිර්මාණය කරන්නේ නැතුව විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට වැඩ කරන්නත් බැහැ. මොකද, ඒ අය බොහෝ වෙලාවට කියන දේ අහන්නේ නැහැ. ඒ නිසා එවැනි ක්‍රමයක් ඇති කිරීමේ ක්‍රමවේදයක් පිළිබඳව අපි කල්පනා කරන්න ඕනෑ. ඒ සඳහා අපි විශාල මහන්සියක් ගත යුතුයි කියලා මම විශ්වාස කරනවා.

යම් කිසි භාණ්ඩයක් ගැන අපේ තිබෙන "Research and Development" කියන කොටස හරි අඩුයි. අපි ඒක කරන්නේ නැහැ. බොහෝ වෙලාවට මේක සිද්ධ වෙන්නේ, ඇඟලුම් කර්මාන්තයේ පමණයි. ඇඟලුම් කර්මාන්තයේ සෑහෙන දුරට ඒක කෙරෙනවා. නමුත් අනෙක් කිසිම තැනක ඒක සිදු වෙන්නේ නැහැ. ඒ කියන්නේ, සාමාන්‍යයෙන් අපට ආසන්නතම රටවල් සමඟ බැලුවත් අප තවම ඉන්නේ අවුරුදු දහයක් නැත්නම් පහළොවක් පිටුපසින්. ඒ නිසා මේක කරන්න පුළුවන්කමක් තිබෙනවාද කියා මට හිතෙනවා. අපි මධ්‍ය ආදායම් රටකින් ඉහළට යන්න නම් සම්පූර්ණයෙන්ම පුළුල් වෙනසකට අප පාත්‍ර විය යුතුයි. පුළුල් වෙනසකට පාත්‍ර කරන්නේ නැතුව අපිට මේ කටයුත්ත කරන්න බැහැ.

අපේ රටේ පවතින තාක්ෂණය ඉතාම අඩුයි. ඉතා කුඩා තාක්ෂණ ප්‍රවේශයක අපි ඉන්නේ. ඒ තාක්ෂණ ප්‍රවේශයෙන් ඔබ්බට යන්නේ නැතුව අපට කවදාවත් රටේ වෙනස්කමක් කරන්න පුළුවන් වෙයි කියා මම නම් විශ්වාස කරන්නේ නැහැ. ඒ වාගේම අපි වෙනත් රටවල් අරගෙන බලමු. සිංගප්පූරුව එහෙම නැත්නම් දකුණු කොරියාව වාගේ රටවල් ගත්තොත්, ඒ ගොල්ලන්ට ලොකු පර්යේෂණ කණ්ඩායම් ඉන්නවා. විශාල පර්යේෂණ කණ්ඩායම් ඉන්නවා. ඒ පර්යේෂණ කණ්ඩායම් මගින් පුළුවන් තරම් දුරට නව නිෂ්පාදන, නිර්මාණ ඇති කරන්න ඔවුන්ට පුළුවන් වෙලා තිබෙනවා.

ඊළඟට, ඒ නිර්මාණ රටේ පාවිච්චි කරන කණ්ඩායමකුත් ඉන්නවා. අපි හැම වේලාවේම කථා කරන ධනපති පන්තියේ රටවල් ක්‍රියා කරන්නේ, ඒ පර්යේෂණ පාවිච්චි කරලා ඒවායෙන් නිෂ්පාදන සකස් කරලා පිට රටට ගෙන යන්නයි. අපේ රටේ කරන්නේ අපි යම් කිසි දෙයක් සොයා ගත්තොත්, ඒක, ඒ කියන්නේ සොයා ගත්ත දෙය, පිට රටට විකුණන එකයි. නමුත් ඒ රටවල් එහෙම නොවෙයි. ඒ රටවල ධනපති පන්තිය එහෙම නැත්නම් නිෂ්පාදන පන්තිය සූදානම් වෙලා ඉන්නවා, ඒවා අරගෙන ලෝකයේ වෙළෙඳ පොළ තරණය කරන්න.

"සැම්සුන්" වාගේ ආයතන ලෝකයේ තිබෙන දියුණුම තාක්ෂණය සහිත ආයතන බවට පත් වෙන්නේ, සිංගප්පූරුව සහ දකුණු කොරියාව වාගේ රාජ්‍යවල ආයෝජනය කරන නිසායි. ඒ නිසා රාජ්‍ය ආයෝජනය කරන්නේ නැතුව කවදාවත් මේ "Research and Development" කියන section එක හදන්න බැහැ. ආණ්ඩුව ඒ සඳහා ආයෝජනය කළ යුතුයි.

අපි මන්ත්‍රීවරුන් විධියට දිගටම අය වැය ගණනාවකට සහභාගි වෙලා තිබෙනවා. ඒ කිසිම අය වැයකදී මේ කාර්යය වෙනුවෙන් නිශ්චිත මුදලක් වෙන් කරන වකවානුවක් මා දැකලා නැහැ. ඒ නිසා ඒ තත්ත්වය වෙනස් කිරීම සඳහා අද අපි ක්‍රියා කරන්න ඕනෑ. සාමාන්‍යයෙන් ඒ රටවල මේ වෙනුවෙන් තමන්ගේ දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 2ක් -විශාල ප්‍රමාණයක්- වියදම් කරනවා. ඒ සියයට 2 වියදම් කරන නිසා තමයි, ඒ රටවල් දියුණු තත්ත්වයට ඇවිල්ලා තිබෙන්නේ. සිංගප්පූරුවට සහ දකුණු කොරියාවට තිබෙන්නේ අවුරුදු විස්සක නැත්නම් විසිපහක ඉතිහාසයක්. ඒ කාලය තුළ ඔවුන්ට පුළුවන් වෙලා තිබෙනවා, ලෝකයේ දියුණුම රටවල් බවට පත් වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණය මෙයයි. අපි එහෙම අපනයනය කරන්නේ නැත්නම් මේ ලබා දී තිබෙන දැවැන්ත යටිතල පහසුකම් පවත්වා ගෙන යෑමේ අසීරුවටත් ඊළඟ වසර දහයේදී අප මුහුණ දෙනවා. ඊළඟ වසර දහයේදී අපි අනිවාර්යයෙන්ම එයට මුහුණ දෙනවා. මොකද, අපි සෑහෙන පමණ යටිතල පහසුකම් ලබා දී තිබෙනවා. ණය වෙලා හෝ ණය නොවී හෝ ඒවා කර තිබෙනවා. ඒවා පවත්වා ගෙන යෑමටත් අපිට ආදායම් අවශ්‍යයි. ඒ ආදායම් සාමාන්‍ය ජනයාට බෙදී යා යුතුව තිබෙනවා. ඒ දෙය නොකර ඉන්නකොටත් වෙන්නේ, ඒ යටිතල පහසුකම් පවත්වා ගෙන යාමේ අසීරුවට අපි ඊළඟ වසර දහය තුළ මුහුණ දෙන එකයි. ඒ බව අප තමුන්නාන්සේලා සියලු දෙනා මතක තබා ගන්න ඕනෑ. ඒ නිසා මේ කාරණා සියල්ලම එකතු කරන වැඩ පිළිවෙළක් වෙනුවෙන් අපේ ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා දැවැන්ත වැඩ පිළිවෙළක් සිදු කර ගෙන යනවා.

අපි බ්‍රිතාන්‍යය ගනිමු. බ්‍රිතාන්‍යය වානේ කර්මාන්තයෙන්, එහෙම නැත්නම් steel manufacturing process එකෙන් ලෝකයේ ඉහළම තාක්ෂණය අත්කර ගෙන ඉන්නවා. ඒ ගොල්ලන් ඒක කළේ කොහොමද? ඒ ගොල්ලන් එය වානේ කර්මාන්තය යනුවෙන් හඳුන්වන්නේ නැහැ. ඒ ගොල්ලන් වානේවලට "Sheffield" කියායි කියන්නේ. Sheffield advanced manufacturing facility එකක්, University of Sheffield එකේ තිබෙනවා. ඒ නිසා බොහෝ පර්යේෂණ එකතු කර ගෙන ඒ industry එකට ඕනෑ කරන නිර්මාණ ගණනාවක් කරලා, ඒක ලෝකයේ තිබෙන ඉහළ පෙළේ භාණ්ඩයක් බවට ඔවුන් පත් කරලා තිබෙනවා.

මේ වෙනස්කම පිළිබඳව තේරුම් කරනවා නම් මට තව බොහෝ දේ ගැන කථා කරන්න තිබෙනවා. නමුත් කාලය අවසන් නිසා මගේ කථාව මා අවසන් කරනවා.

අවසාන වශයෙන් අපි රජයෙන් ඉල්ලා සිටිනවා, අපි රජයට බලපෑම් කරනවා, විශේෂයෙන්ම ඊළඟ අය වැයෙන් හෝ මේ R&D වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සලසන්න විශාල මුදලක් වෙන් කරන්න කියලා. බොහොම ස්තුතියි.

[ප.ව. 3.45]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இப்பாராளுமன்றத்தில் இலங்கை தேசிய ஆராய்ச்சிப் பேரவை பற்றி முற்போக்கான சிந்தனையோடு, மூளை வேலைசெய்யக்கூடிய விதத்தில் ஒரு சட்டமூலத்தைச் சமர்ப்பித்த கௌரவ அமைச்சர் சுசில் பிரேமஜயந்த அவர்களுக்கும் அவருடைய பிரதி அமைச்சர் அவர்களுக்கும் முதலில் நன்றியைக் கூறிக்கொண்டு, இவ்விடயம் பற்றி எனது கருத்துக்களை முன்வைக்கலாம் என்று நினைக்கின்றேன். இன்று அபிவிருத்தியடைந்த நாடுகளைப் பார்க்கின்றபோது, அந்த நாடுகள் அறிவியலை தங்களுடைய கைகளில் எடுத்துக்கொண்டிருப்பதைக் காணலாம். அத்துடன், அவை தொழில்நுட்பத்தையும் கைகளில் எடுத்துக்கொண்டு அபிவிருத்தியடைந்திருக்கின்றன. இரண்டாம் உலக மகா யுத்தத்தின்போது அணுக்குண்டுகள் வீசப்பட்டு நிர்மூலமாக்கப்பட்ட யப்பான் தேசம், இன்று மேற்குலகோடு போட்டிபோடக்கூடிய விதத்தில் எழுந்து ஆசியாவிலே தலைநிமிர்ந்து நிற்கின்றது என்றால், அது அறிவியல் மூலமாகவும் தொழில்நுட்பம் மூலமாகவும் ஏற்படுத்தப்பட்ட சாதனை என்பதை எவரும் மறுக்கவோ, மறைக்கவோ

முடியாது. அந்த வகையில், அறிவியலையும் தொழில்நுட்பத்தையும் அரவணைத்துக்கொண்டவர்கள் உலகத்தில் பொருளாதாரத்திலும் மனிதவள அபிவிருத்தியிலும் உயர்ந்து நிற்கின்றார்கள்; மற்றைய நாடுகளுக்கு எடுத்துக்காட்டாக இருக்கின்றார்கள். இன்று மேற்குலக நாடுகள் அறிவியலையும் தொழில்நுட்பத்தையும் பயன்படுத்தி அபிவிருத்தியடைந்த நாடுகளாக இருந்துகொண்டு, மற்றைய நாடுகளுக்கு வழிகாட்டக்கூடியதாகவும் அவற்றைத் தம்பக்கம் ஈர்க்கக்கூடியதாகவும் மாறியிருக்கின்றன. ஆனால், கீழைத்தேய நாடுகள் அறிவியல், தொழில்நுட்பம் என்பவற்றைக் கைகளுக்குள் எடுப்பதற்குப் பதிலாக, மதத்தைக் கையில் எடுத்துக்கொண்டிருக்கின்றன. மதத்தின்மீது அபரிமிதமான அக்கறையைச் செலுத்தியிருக்கின்றன. மதம் எங்களுக்குத் தேவைதான்; அது எமது கலாசாரத்துக்கு வேண்டும்; எங்களது ஒழுக்க விழுமியங்களை வெளிப்படுத்துவதற்கு வேண்டும். ஆனால், எதனையும் அளவுக்கு அதிகமாகப் பயன்படுத்துகின்றபோது, அது அழிவைத் தந்துவிடும். இன்று உலகத்தை எடுத்துப் பாருங்கள்! மதத்தின்மீது அளவுக்கு அதிகமான பற்றுதலைக் கொண்ட பல நாடுகளில் அழிவுகள் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. "Too much of anything is good for nothing" என்று கூறுவார்கள். அளவுக்கு மிச்சமாக -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair and THE* HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

நாங்கள் அளவுக்கு மீதமாக எதையும் கைகளிலே எடுத்துக்கொள்ளும்போது அது ஆக்கத்தைத் தருவதைவிட அழிவைத்தான் தந்திருக்கின்றது என்பதற்குப் பல நாடுகள் உதாரணங்களாக இருக்கின்றன. இன்று மத்திய கிழக்கு நாடுகளில் மதத்தின்மீது அளவுக்கு அதிகமாகக் கொண்டிருந்த ஈடுபாடு, அறிவியலினதும் தொழில்நுட்பத்தினதும் தன்மையைக் குறைத்துவிட்டுள்ளது. மதத்தின் மீதுள்ள அபரிமிதமான பற்றுதல் அங்கே அழிவுகளை ஏற்படுத்திக் கொண்டிருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. எமது நாட்டிலும் கடந்த காலத்தில் மதம் பயன்படுத்தப்பட்டிருக்கின்றது. மதம் என்பது அரசியலுக்கு அப்பால் இருக்க வேண்டும்; அதாவது அரசியலை வழிப்படுத்துவதாக இருக்க வேண்டும்; அரசியலுக்கு ஒரு நல்ல பாதையை வழிவகுத்துக் கொடுப்பதாக இருக்க வேண்டும். மதமானது அரசியலுக்குள் வந்தால், அது அந்த நாட்டின் அபிவிருத்திக்குத் தடைபோட்டு, இனங்களுக்கிடையிலே போட்டிகள், பூசல்கள், முரண்பாடுகள் என்பவற்றை உருவாக்கிவிடும்.

இன்றைய நிலையில் எங்களுடைய கௌரவ அமைச்சர் சுசில் பிரேமஜயந்த அவர்கள் அறிவியல்பூர்வமாகச் சிந்தித்து மூளைக்கு வேலை கொடுக்கக்கூடிய வகையில் ஒரு நல்ல சட்டமூலத்தை இந்தச் சபையில் கொண்டு வந்திருக்கின்றார் என்றால் அதனை எம்மால் பாராட்டாமல் இருக்க முடியாது. மெட்டீக்கலின் என்பவர் 14 வகையான இயல்பூக்கங்கள் மாணாக்கர்களில் - பிள்ளைகளில் இருக்கின்றன என்று சொல்கிறார். அந்த இயல்பூக்கங்களில் இரண்டைக் குறிப்பிட விரும்புகின்றேன். ஒன்று ஆக்க ஊக்கல். அடுத்தது ஆராய்வு ஊக்கல். இவை குழந்தைப் பருவத்திலே பிள்ளைகளிடம் இருக்கின்றன. இந்த ஆக்க ஊக்கலையும் ஆராய்வு ஊக்கலையும் பாடசாலை மட்டங்களில் சரியாகப் பேணி வளர்த்தெடுக்கின்றபோதுதான் நாங்கள் விஞ்ஞானிகளைப் பெற்றுக்கொள்ளக்கூடிய வாய்ப்பு ஏற்படுகின்றது. ஆனால், எங்களுடைய பாடசாலைகள் எந்தளவுக்கு ஆக்க ஊக்கலையும் ஆராய்வு ஊக்கலையும் ஏற்படுத்தக்கூடிய விதத்தில் ஆய்வுக் களங்களாக அமைந்திருக்கின்றன என்பதை நாங்கள் சிந்திக்க வேண்டியவர்களாக இருக்கின்றோம். பாடசாலைகளில்தான் குழந்தைப் பராயம் ஆரம்பிக்கின்றது; பிள்ளைப் பராயம் ஆரம்பிக்கின்றது; கட்டிளமைப் பராயம் ஆரம்பிக்கின்றது. அந்த இடங்களில் ஆராய்வு ஊக்கலை ஏற்படுத்தக்கூடிய விதத்தில் பிள்ளைகளை வளர்த்துக்கொண்ட நாடுகள்தான் இன்று நாங்கள் ஆச்சரியப்படக்கூடிய விதத்தில் உயர்ந்து வளர்ந்து எமக்கு ஒரு முன்னுதாரணமாக இருந்துகொண்டிருக்கின்றன. எனவேதான் நாங்கள் பாடசாலை மட்டத்தில் மாணவர்களது ஆக்கத்தை, அவர்களுடைய ஆராய்வை ஏற்படுத்தக்கூடிய விதத்தில் வசதிவாய்ப்புக்களைச் செய்துகொடுக்க வேண்டும். அதாவது, பாடசாலைகளில் விஞ்ஞான மன்றங்கள் வலுவாக ஆக்கப்பட வேண்டும். விஞ்ஞானத்தை ஆராய்வு ரீதியாகக் கற்கக்கூடிய விதத்தில் விஞ்ஞான ஆய்வுகூடங்கள் மற்றும் தொழில்நுட்ப ஆய்வுகூடங்கள் வலுவாகக் கட்டியெழுப்பப்பட வேண்டும். இன்று எங்களுடைய மாணவர்கள் மத்தியில் ஆக்க ஊக்கம் இல்லாதவர்கள் இல்லை, ஆராய்வு ஊக்கம் இல்லாதவர்கள் இல்லை. நிறையப் பேர் இருக்கின்றார்கள். ஆனால், அவர்களுக்குரிய வசதிகள் பாடசாலைகளில் செய்து கொடுக்கப்பட்டிருக்கின்றனவா என்பதைப் பற்றி நாங்கள் சிந்திக்க வேண்டியிருக்கின்றது.

இந்தச் சட்டமூலம் நிறைவேற்றப்பட்டு இலங்கைத் தேசிய ஆராய்ச்சிச் சபை நிறுவப்படுகின்ற அடுத்த கணமே பாடசாலைகளில் இந்த ஆய்வுக் களங்கள், ஆராய்ச்சிச் சபைகள், ஆராய்கின்ற மன்றங்கள் உருவாக்கப்பட வேண்டும். அதாவது, இளம் பருவத்திலேயே மாணவ விஞ்ஞானிகளை நாங்கள் உருவாக்கி எடுக்கவேண்டும். "இளமையிற் கல்வி சிலையில் எழுத்து" என்று சொல்வார்கள். ஆகவே இளமைப் பருவத்தில்தான் இந்த மாணவர்களை ஆக்கவாளர்களாக, ஆராய்ச்சியாளர்களாக மாற்ற வேண்டிய தேவை இருக்கின்றது. அதற்குப் பின்னர் பல்கலைக்கழகத்துக்குச் செல்லும்போது அவர்களுடைய அடுத்த பரிணாம வளர்ச்சி ஏற்படுகின்றது. அந்த வகையில், பாடசாலைகளில் இருந்தே தொழில்நுட்ப ரீதியாகவும் மற்றும் விஞ்ஞானபூர்வமாகவும்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

ஆராய்ச்சித் தன்மையை ஏற்படுத்தக்கூடிய வசதிவாய்ப்புகளை நாங்கள் அந்த மாணவர்களுக்கு ஏற்படுத்திக் கொடுக்கவேண்டியிருக்கின்றது.

இரண்டு வகையான மனித சிந்தனைகள் இருக்கின்றன. ஒன்று முற்போக்கான சிந்தனை. அடுத்தது பிற்போக்கான சிந்தனை. இந்த முற்போக்கான சிந்தனையில் ஒன்றுதான் அறிவியல்பூர்வமாக ஒரு விடயத்தைப் பற்றி ஆராய்ந்து கொள்வது. இனம், மதம், மொழி, ஜாதி, பிரதேசம் என்றெல்லாம் எமது மக்கள் மத்தியில் பிளவுகளை ஏற்படுத்திக்கொண்டு, அந்தப் பிளவின்மூலமாக அரசியல் நடத்துகின்ற ஒரு பாங்குதான் பிற்போக்கான சிந்தனை என்று கூறுவார்கள். இலங்கை சுதந்திரம் அடைந்ததன் பின்னர் எமது அரசியல்வாதிகள் துரதிஷ்டவசமாக இனம், மதம், மொழி என்பவற்றைத் தங்களுடைய அரசியலுக்காகப் பயன்படுத்திக் கொண்டதால்தான் எமது நாடு எதையும் ஈட்டிக்கொள்ளவில்லை. அதாவது, எமது நாட்டை அபிவிருத்தி செய்யவில்லை. மாறாக, இன முறுகல்களையும் இன முரண்பாடுகளையும் இனப் போர்களையும்தான் அவர்கள் கட்டியெழுப்பியிருக்கின்றார்கள். எனவே, கடந்த காலத்தில் தவறான பாதையில் பயணித்தபடியால் அல்லது மதத்தை, மொழியை அரசியலுக்குப் பயன்படுத்தியதன் காரணமாக நாங்கள் பெறுமதிமிக்க மனித வளங்களை இழந்திருக்கின்றோம்; பௌதீக வளங்களை இழந்திருக்கின்றோம். எமது நாடு உச்ச மட்டத்தில் பௌதீக வளங்களைப் பயன்படுத்தவில்லை; மனித வளங்களைப் பயன்படுத்தவில்லை; ஆற்றலுள்ள பல புத்திசாலிகள் எம்மத்தியிலிருந்து அழிக்கப்பட்டிருக்கின்றார்கள்; பலர் அகற்றப்பட்டிருக்கின்றார்கள். இங்கு அழிக்கப் பட்டிருக்கின்றார்கள் என்பது அவர்கள் மரணிக்கப் பட்டிருக்கின்றார்கள் என்பதையும் அகற்றப்பட்டிருக் கின்றார்கள் என்பது அவர்கள் இந்த நாட்டை விட்டு வெளிநாடுகளுக்குச் சென்றிருக்கின்றார்கள் என்பதையும் குறிக்கும்.

ஆகவே, கடந்த காலத்தில் ஆக்கப்பாதையில் செல்ல வேண்டிய எமது நாடு, அறிவியல்பூர்வமாகவும் ஆராய்ச்சிபூர்வமாகவும் சிந்திக்காமல் மத ரீதியாகச் சிந்தித்ததன் பேறாக அழிவுப் பாதைக்குள் சென்றிருக்கின்றது என்பதை இன்று நாங்கள் அறிகின்றோம். இந்த நிலையில் இனிமேலாவது எமது நாட்டை ஓர் ஆக்கபூர்வமான பாதையில், ஓர் அறிவியல் பாதையில் கொண்டுசெல்ல வேண்டும் என்ற அடிப்படையில் இந்தத் தேசிய ஆராய்ச்சிப் பேரவையினை ஏற்படுத்திக்கொள்வதற்கு கௌரவ அமைச்சர் அவர்கள் எடுத்த முயற்சியினை இந்த இடத்தில் மீண்டும் நான் பாராட்டுகின்றேன்.

அணுவைப் பிளந்துவிட்டான் மனிதன்!
அண்டத்தை அளந்துவிட்டான் மனிதன்!
விண்ணுக்குள் புகுந்துவிட்டான் மனிதன்!
விந்தைகள் படைத்துவிட்டான் மனிதன்.

என்று மனிதனுடைய சாதனைகளையும் சாகசங்களையும் நாங்கள் அடுக்கிக்கொண்டே செல்லலாம். இவ்வாறு சாகசம் படைப்பதற்கும் சாதனை படைப்பதற்கும் அவன் அறிவியல் ரீதியாகவும் தொழில்நுட்ப ரீதியாகவும் பயணித்தமைதான் காரணமாக அமைந்திருக்கின்றது. மதரீதியாகச் செயற்பட்டு மத வெறியை ஏற்படுத்தி மதரீதியான வெறுப்புணர்வினால் நாட்டு மக்கள் மத்தியில் பிளவுகளையும் பிரிவினைகளையும் உருவாக்கிய எந்தவொரு நாடும் உயர்ந்த நிலைக்குச் செல்லவில்லை என்பதை நாங்கள் கண்கூடாகப் பார்க்கின்றோம். எனவே, இங்கு கொண்டுவரப்பட்டிருக்கின்ற இலங்கை தேசிய ஆராய்ச்சிப் பேரவை என்ற விடயம் வெறுமனே கோட்பாடாகவோ, சபையாகவோ அமைந்துவிடக்கூடாது. இதனைச் செயற்பாடாக மாற்றி எமது தேசத்தையும் மக்களையும் வளப்படுத்த வேண்டும். மனித வளங்களை உச்சமாகப் பயன்படுத்தி அதன்மூலமாக எமது நாட்டை ஓர் அபிவிருத்தியடைந்த நாடாகக் கட்டியெழுப்புவதற்கு இந்தப் பேரவை எமக்கு வழிகோல வேண்டும். கௌரவ அமைச்சர் அவர்களைப் பொறுத்தமட்டில், அவர் கொடுக்கின்ற அமைச்சைத் திறம்பட நடத்திக் காட்டவேண்டும் என்ற அடிப்படையில் செயற்படுகின்ற ஒருவர் என்பது எமக்கு நன்றாகத் தெரியும். அந்தவகையில், இந்த ஆராய்ச்சிப் பேரவையினையும் சிறப்பான முறையில் செயற்படுத்த வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

இந்த ஆராய்ச்சிப் பேரவையானது தேசிய மட்டத்தில் மட்டும் இருந்தால் போதாது. இது மாகாண மட்டங்களுக்கும் பரவலாக்கப்பட வேண்டும். ஒவ்வொரு மாகாணத்திலும் இருக்கின்ற அறிவியல் சிந்தனையாளர்கள், விஞ்ஞானிகள் மற்றும் தொழில்நுட்பவியாளர்கள் ஒன்றாகக்கூடி மனிதகுல விருத்திக்கும் நாட்டின் அபிவிருத்திக்கும் பயன்படுத்தக்கூடிய விதத்தில் தங்களுடைய ஆக்க சிந்தனைகள், ஆராய்ச்சிகள் என்பவற்றை வெளிக்கொணர்வதற்குத் தகுந்த வாய்ப்பினை ஏற்படுத்திக்கொள்ள வேண்டும். மாகாண மட்டங்களில் மட்டுமல்ல, மாவட்ட மட்டங்களிலும் இந்தப் பேரவையை உருவாக்கினால் அங்கிருக்கின்ற விஞ்ஞானிகளின் அறிவாற்றலையும் நாங்கள் பெற்றுக்கொள்ள முடியும்.

விஞ்ஞானத்தை இயற்கை விஞ்ஞானம், சமூக விஞ்ஞானம் என இரண்டு வகையாகப் பிரிக்கலாம். இயற்கை விஞ்ஞானமானது பௌதிக வளங்களோடு சம்பந்தப்பட்டதாக இருக்கின்றது. சமூக விஞ்ஞானம் என்பது மனிதனோடு சம்பந்தப்பட்டதாக இருக்கின்றது. எங்களைப் பொறுத்தமட்டில் மனித வளத்தை உச்சமாக அபிவிருத்தி செய்துகொள்வதற்கு நிச்சயமாக அதனைப் பயன்படுத்தக்கூடிய விதத்தில் நாங்கள் அதற்கான வழிமுறைகளையும் நெறிமுறைகளையும் வகுத்துக்கொள்ள வேண்டும். எமது நாட்டில் பிறந்து இலவசக் கல்வியைக் கற்றுக்கொண்டவர்கள், இலவசமாக பல தேவைகளை நிறைவேற்றிக்கொண்டவர்கள் இந்த நாட்டில் காணப்பட்ட வன்முறைக் கலாசாரம் காரணமாக, தொடர்ந்தும் நிலைத்திருக்கின்ற இனப்பிரச்சினையைத் தீர்க்காததன் காரணமாக இங்கிருந்து வெளியேறி அந்நிய நாடுகளுக்குச் சேவகம் செய்யவேண்டிய ஒரு நிர்ப்பந்த நிலை ஏற்பட்டிருக்கின்றது. எனவே, புலம்பெயர்ந்து சென்ற எமது புத்திஜீவிகளையும் விஞ்ஞானிகளையும் அறிவியலாளர்களையும் தொழில்நுட்பவியலாளர்களையும் இந்த நாட்டுக்குள் கொண்டுவந்து நாட்டைக் கட்டியெழுப்புவதற்குரிய சரியான ஒரு மார்க்கத்தை - வழிமுறையை உருவாக்கி, மிகவும் வினைத்திறனுடனும் விளைதிறனுடனும் இலங்கை தேசிய ஆராய்ச்சிப் பேரவையைச் செயற்படுத்துவதற்கு நீங்கள் ஆவன செய்வீர்கள் என்று நாங்கள் நம்புகின்றோம்.

இலங்கை தேசிய ஆராய்ச்சிப் பேரவையானது உண்மையில் மிகவும் வினைத்திறனாகச் செயற்பட்டு எம்மத்தியில் காணப்படுகின்ற இனவாதம், மதவாதம், மொழிவாதம், பிரதேசவாதம், குலவாதம் என்கின்ற இந்தக் குறுகிய சிந்தனைகளை நீக்கி, நடுநிலையான சிந்தனையோடும் அறிவு ரீதியான பார்வையோடும் எமது

நாட்டினையும் மக்களையும் முற்போக்கான பாதையில் கொண்டுசெல்வதற்கு வழிகோல வேண்டும்.

குறிப்பாக, இயற்கை விஞ்ஞானத்தோடு மட்டும் இந்த ஆராய்ச்சிகளை நிறுத்திவிடாமல், சமூக விஞ்ஞானத்தோடும் தொடர்புபடுத்தி இதனைக் கொண்டுசெல்ல வேண்டிய தேவையிருக்கின்றது. ஏனென்றால், எமது சமூகங்கள் பிளவடைந்து - பிரிவடைந்து காணப்படுகின்றன. இப்படிப்பட்ட சமூகங்களை ஒன்றாக இணைத்து இந்த நாட்டையும் மக்களையும் அபிவிருத்தி செய்ய வேண்டுமாக இருந்தால், நிச்சயமாக சமூக விஞ்ஞானத்தை ஆய்வுப்பொருளாகக் கொண்டு இங்கு சமூக ரீதியாகக் காணப்படுகின்ற பிரச்சினைகள் என்னவென்பதை நாங்கள் அடையாளம் காணவேண்டும். எமது நாட்டில் சமூக ரீதியான, சுகாதார ரீதியான, விவசாய ரீதியான, சூழல் ரீதியான பல பிரச்சினைகள் இருக்கின்றன. அதேபோன்று, மதரீதியான பிரச்சினைகள் இருக்கின்றன. இவ்வாறு பல்வேறுபட்ட பிரச்சினைகளையும் அடையாளம் கண்டு, பகுப்பாய்வு செய்து அவற்றைத் தீர்க்கக்கூடிய விதத்தில் நல்ல முன்மொழிவுகளையும் நல்ல ஆராய்ச்சி முடிவுகளையும் நாங்கள் கண்டுகொள்ள வேண்டும்.

ஏனோதானோவென்று எடுத்தஎடுப்பிலே மேற்கொள்கின்ற தீர்மானங்களால் - முடிவுகளால் எங்களால் எதனையும் சாதித்துவிட முடியாது. உண்மையில் நாங்கள் சிந்தித்துப் பார்க்க வேண்டும். அந்நியரின் ஆட்சியிலிருந்து நாங்கள் விடுதலை பெற்றிருக்கின்றோம். இந்த விடுதலையைப் பற்றி இந்திய கவிஞர் ஒருவர் அழகாகக் குறிப்பிட்டிருக்கிறார். "வெள்ளை இருட்டினை வெளியேற்றிவிட்டு கறுப்பு இருட்டினைக் கட்டியணைத்த நாள்தான் சுதந்திர நாள்" என்று அவர் கூறியிருக்கிறார். இதேபோன்று, "அர்த்த ராத்திரியில் பெற்றோம்; இன்னும் விடியவில்லை" என்று இந்தியாவின் சுதந்திரத்தைப் பற்றி மேலும் அழகாகச் சொல்லியிருக்கிறார். இன்னொரு விதமாக, "அந்நியன் செய்த விலங்குகளைக் கழற்றிவிட்டு சொந்த நாட்டவன் செய்த விலங்குகளைப் பூட்டிக்கொண்ட நாள்தான் சுதந்திர நாள்" என்று கூறியிருக்கிறார். இந்தக் கருத்துக்களெல்லாம் எங்களுக்கு எவற்றை எடுத்துக்கூறுகின்றன என்பதை யோசித்துப் பாருங்கள்! அதாவது ஒருகாலத்தில் அமெரிக்கக் குண்டுகளால் தகர்க்கப்பட்ட ஜப்பான், இன்று எல்லா நாடுகளுக்கும் ஒரு முன்னுதாரணமாக விளங்குவதுபோன்று எமது நாட்டையும் முன்னுதாரணமுள்ள ஒரு நாடாக அபிவிருத்தி செய்யவேண்டும். அவ்வாறு செய்வதானால், இந்த நாட்டில் புரையோடிப்போயிருக்கின்ற, சமூகங்களுக்கிடையில் பிளவுகளை ஏற்படுத்திக்கொண்டிருக்கின்ற இனப்பிரச்சினையானது அறிவியல்பூர்வமாக - விஞ்ஞானபூர்வமாகத் தீர்த்துவைக்கப்பட வேண்டும்.

கடந்த காலத்தில் மத ரீதியான மேம்பாடுகள், இன ரீதியான மேம்பாடுகளென்று பெரும்பான்மை இனத்தவர்கள் சிறுபான்மை இனத்தவர்களை ஏதோ ஒரு விதத்தில் அடக்கியாள வேண்டுமென நினைத்த அந்தப் பாரபட்சமான, பிற்போக்குவாதச் சிந்தனைதான் எமது நாட்டில் பிரச்சினைகளை உருவாக்கியிருந்தது. எல்லோருக்கும் சமத்துவம், சம வாய்ப்பு என்ற வழிகளை நீங்கள் திறந்துவிட்டு அவர்களுக்குச் சரியான வழிப்படுத்தல்களையும் செய்திருந்தால் புலம்பெயர்ந்து சென்றிருக்கின்ற எமது சமூகத்தவர்கள் இந்த நாட்டைக் கட்டியெழுப்புகின்ற சிற்பிகளாக இருந்திருப்பார்கள். இந்த நாட்டை ஓர் உச்சமான நிலைக்குக் கொண்டுசெல்லக்கூடிய விதத்தில் அவர்களுடைய மூளைகளைப் பயன்படுத்தியிருப்பார்கள். எனவே, கடந்த காலங்களைப் பற்றி விமர்சன ரீதியில் சிந்தித்துக் கொண்டிருக்காமல் நிகழ்காலத்தையும் எதிர்காலத்தையும் பற்றி நாங்கள் சிந்திக்க வேண்டியவர்களாக இருக்கின்றோம். கடந்த காலத்தில் பல தவறுகள் விடப்பட்டிருக்கின்றன; தப்புகள் விடப்பட்டிருக்கின்றன. இவை யாவற்றையும் சமூக விஞ்ஞான ரீதியாக நோக்க வேண்டும். அதாவது, கடந்த காலத்தில் விடப்பட்ட சமூக ரீதியிலான தவறுகள், தப்புகள் எவை? அந்த தவறுகள், தப்புகளால் இந்த நாடு எவ்வாறு சின்னாபின்னமாக்கப்பட்டது? இந்த நாட்டின் அபிவிருத்திக்காக, ஆக்கத்திற்காக பயன்படவேண்டிய இளைஞர்கள் எவ்வாறு அழிவுப்பாதையை நோக்கிச் சென்றார்கள்? என்பன பற்றியெல்லாம் நாங்கள் நடுநிலையாக, விஞ்ஞானபூர்வமாகச் சிந்திக்க வேண்டியவர்களாக இருக்கின்றோம். மாறாக இன ரீதியாக, மத ரீதியாக, குல ரீதியாகச் சிந்தித்து ஓரினத்தை இன்னோர் இனம் அடக்கவேண்டுமென்ற பிற்போக்குவாத - பழைமைவாத சிந்தனையில் செயற்படுவோமாக இருந்தால் இலங்கை தேசிய ஆராய்ச்சி பேரவை என்ற இந்த அறிவியல் மன்றம் - ஆராய்ச்சி மன்றம் அர்த்தமற்றதாக மாறிவிடும்.

கௌரவ அமைச்சர் அவர்களால் ஆரம்பிக்கப்படவிருக்கின்ற இலங்கை தேசிய ஆராய்ச்சிப் பேரவை வெறுமனே இயற்கை விஞ்ஞானத்தினை மட்டும் ஆராய்ச்சி செய்து அந்தப் பிரச்சினைகளைத் தீர்க்கின்ற மன்றமாக அல்லாமல், சமூக விஞ்ஞான மன்றமாகவும் செயற்பட வேண்டும். சமூகத்தில் காணப்படும் பல்வேறுபட்ட பிரச்சினைகளையும் ஆராய்ச்சி மூலமாகக் கண்டறிய வேண்டும். அதாவது, பிரச்சினைகளை அவதானித்து, தரவுகளைத் திரட்டி, அந்தத் தரவுகளைப் பகுப்பாய்வு செய்து, பகுப்பாய்வு செய்த தகவல்களிலிருந்து சரியான கருதுகோள்களை உருவாக்கி, அந்த கருதுகோள்களிலிருந்து நல்ல முடிவுகளை - தீர்மானங்களை எடுப்பதன் மூலமாக இந்த நாட்டையும் மக்களையும் செழிப்படையச் செய்யமுடியும். இன ரீதியான, மத ரீதியான வேறுபாடுகள் இல்லாமல் ஜப்பான், சுவிற்சர்லாந்து, கனடா போன்ற நாடுகளில் வாழும் மக்கள் தங்கள் நாட்டை நேசித்து, அபிவிருத்தி செய்வதைப் போன்று எமது நாட்டிலுள்ள மக்களும் செயற்படக்கூடிய விதத்தில் தேவையான அடித்தளத்தினை இந்த இலங்கை தேசிய ஆராய்ச்சிப் பேரவை ஏற்படுத்திக் கொடுக்க வேண்டும். மாறாக, கோட்பாட்டு ரீதியாக இன்னுமின்னும் மன்றங்களை உருவாக்கி, செயற்பாடற்ற விதத்தில் அவற்றின் உன்னதமான குறிக்கோள்களை நிறைவேற்ற முடியாத அளவுக்கு நாங்கள் முடக்கி வைத்திருக்கக்கூடாது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one more minute.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

ஆகவே, விஞ்ஞான பூர்வமாக, விஞ்ஞான மனப்பாங்கோடு, விஞ்ஞானத் திறனோடு, விஞ்ஞான செயற்பாட்டோடு செயற்படக்கூடிய மன்றங்கள் இந்த நாட்டில் உருவாக்கப்படுகின்ற வரலாறு என்பது முற்போக்கான சிந்தனையின் வெளிப்பாடாக இருக்க வேண்டும். இந்த முற்போக்கான சிந்தனை பாடசாலை மட்டத்தில் மாணவர்கள் மனதில் விதைக்கப்பட வேண்டும். எமது நாடு இவ்வளவு தூரம் பின்தள்ளப்பட்டதற்கு காரணம் மதரீதியான அடிப்படைவாத சிந்தனைகளாகும். ஜப்பானிலும் மக்கள் மதத்தைப் பின்பற்றுகிறார்கள். அவர்கள் மதத்தை அளவோடு வைத்துக்கொண்டு விஞ்ஞானத்தை அதற்கு மேல்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

තූක්කියෙදුත්තිරුක්කිරාර්කළ්. වාළ්ක්කෙයිල් ඔළුක්කනෙරිෙයෛප් පින්පර්රුවතර්කු මතඞ්කළ් වළිකාට්ට වේණ්ටුමේයොළිය, ඒනෙය ඉනඞ්කළ් මීතු කුරෝතඞ්කළෙ ඒර්පටුත්තක්කූටිය විතත්තිල් අවෛ වළිකාට්ටක් කූටාතු. විඥ්ඤානපූර්වමාක එමතු නාටු සෙළිප්පතර්කුම් මක්කළ් ඔන්රිණෛවතර්කුම් ඉනප් පිරච්සිනෛක්කාන තීර්වු කිටෛප්පතර්කුම් ඉලඞ්කෛ තේසිය ආරාය්ච්සිප් පේරවෛ වළිකාට්ටුවතර්කු උයිර්ත්තුඩිප්පුටන් අතනෛ වළිනටත්ත වේණ්ටුමෙන්රු කූරි, අමර්කින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා.

[අ.භා. 4.04]

ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත පිළිබඳව අද දින පැවැත්වෙන විවාදයට සහභාගී වීමට ලැබීම ගැන මා පළමුවෙන්ම සතුට පළ කර සිටිනවා. මා තාක්ෂණ හා පර්යේෂණ ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේ තමයි මේ වැදගත් ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනතකින් සංස්ථාපිත කරන්න ඕනෑය කියලා තීරණය කළේ. ජාතික පර්යේෂණ ආයතනයේ සභාපති (මහාචාර්ය) ජානක ද සිල්වා මැතිතුමාගේ මූලිකත්වයෙන්, එවකට අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය වුණු ධාරා විජේතිලක මැතිනියගේ සහභාගීත්වයෙන් හා කැපවීමෙන් තමයි මේ පනත් කෙටුම්පත ගෙනාවේ. අපේ අමාත්‍ය ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාටත්, ඒ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයටත් මම ස්තුතිවන්ත වනවා, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරගෙන ඉදිරි කාලයේදී කටයුතු කර ගන්න මෙය ශක්තිමත්ව යොදා ගැනීම පිළිබඳව. අද තාක්ෂණ ලෝකයේ ඇති වෙලා තිබෙන නව ප්‍රවණතාවන් කීපයක් පිළිබඳව මගේ කථාව ආරම්භයේදීම මම සඳහන් කරන්න කැමැතියි. ගෝලීය ප්‍රවණතාවන් ගැන කථා කරනකොට ඉන් පළමුවැනි ප්‍රවණතාව තමයි, අද ඇති වෙලා තිබෙන නව කාර්මික විප්ලවය නමින් අපි හඳුනා ගන්නා ක්‍රියාවලිය. 1760 වැනි වසරක කාර්මික විප්ලවය නමින් වූ ක්‍රියාවලියක් එංගලන්තයේ ආරම්භ වුණා. ඒක යුග තුනක් හරහා ගමන් කළා. ඒ යුග තුන අවසන්වෙලා, 2010 ඉඳලා නව කාර්මික විප්ලවය නමින් වූ නව යුගයකට අපි පිවිසිලා තිබෙනවා. ඒ අනුව අලුත් තාක්ෂණයන් ගණනාවක් අපට දැන් දැක ගන්න පුළුවන්.

ඉන් පළමුවැන්න තමයි, මේ තොරතුරු තාක්ෂණය. අපි කවුරුත් දන්නවා, කිලෝබයිට්වලින්, මෙගාබයිට්වලින්, ගිගාබයිට්වලින් කටයුතු කරන යුගයක් තමයි දැන් තොරතුරු තාක්ෂණයේ ඇවිල්ලා තිබෙන්නේ කියලා. ඒ වාගේම ඉතාම වැදගත් තාක්ෂණ ස්වරූපයක් තමයි, අද මතුවෙලා තිබෙන නැනෝ තාක්ෂණය - නිණිති තාක්ෂණය -. එමඟින් ද්‍රව්‍යයන්ගේ යම් යම් ගුණාංගයන් වෙනස් කර ගැනීමට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ පිළිබඳව පර්යේෂණ ආයතනයක් සහ වැඩ පිළිවෙළක් අපේ රටෙත් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ වාගේම කොන්ටම් තාක්ෂණය මඟින් අද විද්‍යාත්මක ක්ෂේත්‍රය අලුත් ආරම්භයක් ඇති කර ගෙන තිබෙනවා. එමඟින් පරමාණු අණු ආදියත් සමඟ නව ශක්ති ප්‍රභේදයන්, නව අංශු ප්‍රභේදයන්, නව තරංග ප්‍රභේදයන් පිළිබඳව විශාල අවකාශයක් අද අපට විවෘත කර තිබෙනවා. ඒ වාගේම තමයි ජීව තාක්ෂණය. ඉපෙව විවිධත්වයෙන් අනූන රටක් හැටියට ජීව තාක්ෂණයත් අපට ඉතාම වැදගත්. ආහාර විවිධත්වයෙන් අනූන රටක් හැටියට, අනාගත අපනයනයේ ප්‍රධාන ක්‍රියාවලියක් හැටියට ජීව තාක්ෂණය යොදා ගැනීම මඟින් විවිධ ජීවීන්ගේ, ශාකවල ගුණාංග වෙනස් කර ගැනීමට අපට හැකියාව ලැබෙනවා.

ඊළඟ එක තමයි, ජාන තාක්ෂණය. ඒක ඊට වඩා සියුම් තාක්ෂණයක්. එමඟින් නව ජීව විශේෂ, නව සත්ව විශේෂ, නව ශාක විශේෂ ඇති කර ගන්නට වාගේම ඇතැම් ලෙඩ රෝගවලට විසඳුම් සොයා ගැනීමට හැකියාව ලැබෙනවා. ඒ වාගේම ස්නායු තන්ත්‍ර විද්‍යාව ඉතාමත්ම ප්‍රබල විධියට දැන් ක්‍රියාත්මක වෙනවා. මිනිස් මොළය පිළිබඳව, අපේ ස්නායු පද්ධතිය පිළිබඳව ඇති කර ගෙන තිබෙන එම පර්යේෂණ සහ තාක්ෂණය මඟින් විශාල විප්ලවකාරී වෙනසක් ඉදිරි කාලයේදී ඇති වෙන්නට නියමිතයි. මේ ක්‍රියාකාරකම් සියල්ලටම අපි ඉංග්‍රීසි භාෂාවෙන් කියන්නේ "BANG - Bits Atoms Neurons and Genes" කියලායි. මේ "BANG" කියන සංකල්පය තුළින් නව තාක්ෂණයන් සියල්ලම ඇති වෙලා තිබෙනවා. නව තාක්ෂණයන් ඇති වනවා වාගේම අද තිබෙන ලෝක ප්‍රවණතාව තමයි, නව කාර්මික විප්ලවය ඇතුළේ තාක්ෂණයන් අතර ඇති වන මුසු වීම. එහෙම නැත්නම් සංසර්ගය. මේ මඟින් අලුත් තත්ත්වයන් මතු වෙමින් තිබෙනවා. අපට උදාහරණයක් හැටියට ගන්න පුළුවන්, අපේ තොරතුරු තාක්ෂණයට, එහෙම නැත්නම් අපේ ඉලෙක්ට්‍රොනික තාක්ෂණයට ජාන තාක්ෂණයෙන් ලැබෙන ප්‍රයෝජනය. ඉදිරි කාලයේදී දන්ත ගබඩා කිරීම සඳහා සිලිකන් වෙනුවට ජීවමය ජාන භාවිත කිරීම් පිළිබඳව දැන් අවධානය යොමු වෙලා තිබෙනවා. මෙන්න මේ ආකාරයට අනාගතයේදී තාක්ෂණයන් එකිනෙක හා බලගතු විධියට මුසු වෙන්න, එකිනෙක සමඟ සංසර්ගයක් ඇති කර ගන්න පුළුවන් විධියේ ක්‍රියා මාර්ගයක් අද ඇති වෙලා තිබෙනවා.

ඒක තමයි ලෝකයේ ඇති වී තිබෙන බලගතුම වෙනස. එහිත් තිබෙන විශේෂිතම, බලගතුම කාර්ය තමයි මෙතෙක් කාලයක් අන්තර් ජාලය හරහා ගොඩනැඟුණු ඒ "පාර යථාර්ථය" එහෙම නත්නම් "සයිබර් අවකාශය" නමින් අපි හඳුනා ගන්න දේත්, එදිනෙදා අපේ යථාර්ථයත් අතර ඇති වී තිබෙන මුසුවීම, එහෙම නැත්නම් සංසර්ගය. ඒකට තමයි අපි "සුහුරු ලෝකය" එහෙම නැත්නම් "smart world", "smart planet" කියලා කියන්නේ. එමඟින් අපගේ නිෂ්පාදනය, පරිභෝජනය, අපගේ එදිනෙදා දෛනික කටයුතු සියල්ලම අන්තර් ජාලය මඟින් පාලනය වන්න නියමිතයි. අපගේ වර්තමාන මහා නගර සංකල්පයේ එක ප්‍රධාන සංකල්පයක් තමයි නගර, සුහුරු නගර බවට පත් කිරීම; පුද්ගලයන් සුහුරු පුද්ගලයන් බවට පත් කිරීම. එමඟින් මේ රට තුළ සුහුරු රටක් ගොඩනැඟීම. ඉතින් අපට ඉතා පැහැදිලිව පෙනී යනවා, තාක්ෂණයේ ඒ ක්‍රියාවලිය අද ලෝක ක්‍රියාවලියක් බවට පත් වෙලා තිබෙන බව.

දෙවනුව, ගෝලීය ආර්ථික ප්‍රවණතාව ගත් කල, අද ගෝලීය ආර්ථික ප්‍රවණතාවේ නව උපාය මාර්ගය හැටියට හඳුනා ගෙන තිබෙන්නේ නවෝත්පාදනයයි. මීට කලින් උපාය මාර්ගය හැටියට හඳුනා ගත්තේ ලාභ ශ්‍රමය, ලාභ බලශක්තිය, ඒ වාගේම ලාභ පරිසර සාධක පෙන්වලා ආයෝජකයින් ඇද ගැනීම සහ නිෂ්පාදන සාධක ලාභ කිරීමයි. දෙවනුව නිෂ්පාදන සාධක සහ ඊට දායක වන ක්‍රියාවලින්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මඟින් ආර්ථිකය වර්ධනය කර ගන්න පුළුවන්; දියුණු කර ගන්න පුළුවන් කියලා

උපාය මාර්ගයක් ආවා. අද ලෝකය පුරාම නවතම උපාය මාර්ගය වෙලා තිබෙන්නේ නවෝත්පාදනයයි. ඒ සඳහා පර්යේෂණ අත්‍යවශ්‍යයි. ඒ පිළිබඳව වෙච්ච නිවැරදි ක්‍රියා මාර්ගයක් අපට අත්‍යවශ්‍යයි. ඒ වාගේම අද ලෝකයේ ඇති වෙලා තිබෙන ගෝලීය ආර්ථික ප්‍රවණතාවේ ඉතාම වැදගත් ගුණාංගය තමයි මෙතෙක් කාලයක් බටහිර ලෝකයට සීමා වෙලා තිබුණු තාක්ෂණය, නවෝත්පාදනය, ආර්ථික නිෂ්පාදනය ක්‍රමයෙන් ලෝකයේ අනෙක් රටවලට, විශේෂයෙන්ම ආසියාවට ගමන් කරමින් තිබීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1970 දී ලෝකයේ දළ ජාතික නිෂ්පාදනය; විශේෂයෙන්ම කාර්මික නිෂ්පාදනය සියයට 80ක් තිබුණේ යුරෝපයේ සහ උතුරු ඇමෙරිකාවේයි.

අද ඒ ප්‍රතිශතය අඩු වෙලා තිබෙනවා. 2013 වන විට තිබුණේ සියයට 55යි. අද වන විට සියයට 50ට අඩු වෙලා තිබෙනවා. ඒ කාලය ඇතුළත සියයට 23ක අඩුවීමක් අපට පෙනෙන්නට තිබෙනවා. ඒ වාගේම වැඩෙන ආර්ථිකයන්; එහෙම නැත්නම් "emerging economies" කියලා අපි හඳුනා ගන්නා ඒවායේ 1970 තිබුණේ සියයට 17යි. 2013දී ඒක සියයට 40ට වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ අතැනින් අඩු වන ප්‍රමාණය මේ වැඩෙන ආර්ථිකයන්වලට ගමන් කර තිබෙනවා. ඒ වැඩෙන ආර්ථිකයන් අතරේ ඉන්න රටක් හැටියට මේ ක්‍රියා දාමයට එකතු වන්න දැන් අපටත් අවස්ථාවක් ඇති වෙලා තිබෙනවා. දැන් දැනුම නිෂ්පාදනය වන්නේ, දැනුම බෙදා හරින්නේ, දැනුම මඟින් ආර්ථිකයන් ක්‍රියාත්මක වන්නේ බටහිර රටවල නොවෙයි, ආසියානු රටවලය කියන එක අපි පළමුව අවබෝධ කර ගත යුතු වනවා. මෙවරවත්, අපට මේ බස් එකත් miss වෙන්න කලින් අපි මේ ක්‍රියා දාමයට එකතු විය යුතුයි.

ඊළඟට, අද තිබෙන්නේ ගෝලීය පාරිසරික ප්‍රවණතාවක්. අද අපට පැරණි ක්‍රමයට හිතන්න බැහැ; පැරණි ක්‍රමයට බලශක්ති නිපදවන්න බැහැ; පැරණි ක්‍රමයට ජීවත් වන්න බැහැ. මනුෂ්‍ය වර්ගයාගේ පැවැත්මම අභියෝගයට ලක් වන ගෝලීය උණුසුම නැමති ගැටලුව පැන නැඟිලා තිබෙනවා. ඒ මඟින් ඉදිරි දශක ගණනාව තුළ මනුෂ්‍යයා තියුණු අභියෝගයකට මුහුණ දෙනවා විතරක් නොවෙයි, ඇතැම් විට අපි මේක පාලනය නොකළහොත් ඉදිරි සියවස් දෙක ඇතුළත මනුෂ්‍ය වර්ගයා වඳ වී යා හැකියි. ඒ නිසා සම්පත් හිඟය, පරිසර දූෂණය හා විශේෂයෙන්ම ගෝලීය උණුසුම මඟින් ඇති වෙලා තිබෙන මේ බලපෑම ඉදිරියේ අනිවාර්යයෙන්ම හරිත තාක්ෂණයට සහ හරිත ආර්ථිකයක් සොයා ගෙන යාමට තාක්ෂණ ක්ෂේත්‍රය අපට බල කර තිබෙනවා. ඒ වාගේම ගෝලීය සමාජ ප්‍රවණතාවන් ගත්තාම, අද ලෝක ජනගහනය බිලියන 7කට කිට්ටු වෙලා තිබෙන බව අපට පෙනෙනවා. හැම රටකම වාගේ ඇතැම් දුරකට ජනගහනය පාලනය වෙලා තිබෙනවා. සමහර රටවල ජනගහනය අඩු වෙමින් පවතිනවා. වියපත් ජනගහනයේ වර්ධනයක් අපට දැක ගන්න පුළුවන්. ඒ වාගේම මේ තාක්ෂණ විපල්ව්‍යත් එක්ක දුගීකම සැලකිය යුතු මට්ටමකින් පාලනය කරන්න ලෝකය හැකියාව ලබා ගෙන තිබෙනවා.

1990 දී ලෝකයේ නිරපේක්ෂ දුගීකමේ පහළ හිටපු ප්‍රතිශතය සියයට 43යි. ඒ අවස්ථාවේ ලංකාවේ සියයට 28යි. 2013දී ලෝකයේ දුගීකම සියයට 21 දක්වා අඩු වෙලා තිබෙනවා. ලංකාවේ සියයට 6 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම ජීවන තත්ත්වය ඉහළ යාම නිසා විශාල මධ්‍යම පන්තියක්; ගෝලීය මධ්‍යම පන්තියක් මුළු ලෝකය පුරාම බිහි වෙලා තිබෙනවා. ඒ එක්කම ගෝලීය සංස්කෘතියක් බිහි වෙලා තිබෙනවා. ඒකට එරෙහිව විවිධ සංස්කෘතීන්වලින් අභියෝග එල්ල වෙලා තිබෙනවා. අද ඒවා යුද ගැටුම් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මේ සංස්කෘතීන්ගේ ගෝලීය ප්‍රවණතාවන් හැටියට මේවා තමයි අපට දැක ගන්න ලැබෙන්නේ. ඒ සංස්කෘතීන්ගේ වෙනස අනුව අපට අලුත් තර්කයක් මතු වෙලා තිබෙනවා. එක තාක්ෂණයක් නොවෙයි, ඒ ඒ සංස්කෘතීන්ට අනුකූල වූ, ඒ ඒ සංස්කෘතීන්ට ආවේනික වූ තාක්ෂණයන් පැවතිය හැකියි. ඒ තාක්ෂණයන්වලින් දැන් තිබෙන තාක්ෂණයන්ට නැති විසඳුම් ලැබෙනවාය කියන විශ්වාසය ඇති වෙලා තිබෙනවා.

උදාහරණයක් හැටියට, ඇලපති වෛද්‍ය ක්‍රමයට විසඳන්න බැරි වෛරස් රෝග ඇතැම් විට ආයුර්වේදයට, සිංහල වෙදකමට, යුනානි වෙදකමට, හෝමියෝපති ක්‍රමයට, චීන කටු චිකිත්සාවට විසඳන්න පුළුවන්. ඒවා එකක්වත් අවිද්‍යාත්මක නැහැ. ඒවා ඔක්කොම විද්‍යාත්මකයි කියා පිළිගන්නා තැනට අද ලෝකය ඇවිල්ලා තිබෙනවා. එය තාක්ෂණ ක්ෂේත්‍රයේ අලුත් ප්‍රවණතාවක්.

මෙහිදී ලාංකීය ප්‍රවණතාව ගැන කියන්න මා කැමැතියි. අද අපට රාජ්‍ය විශ්වවිද්‍යාල 17ක් තිබෙනවා; විද්‍යාව හා සම්බන්ධ වුණු පීඨයන් 25ක් පමණ තිබෙනවා. විශ්වවිද්‍යාලවල විද්‍යා ආචාර්යවරු 1,000ක් පමණ සේවය කරනවා. ලංකාවේ 5,000ක පමණ විද්‍යාත්මක ප්‍රජාවක් ඉන්නවා. ඒ වාගේම රාජ්‍ය අංශයට සම්බන්ධ විවිධ පර්යේෂණ ආයතන 30කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. මේ ආයතනවලින් අපේ දළ ජාතික නිෂ්පාදනයට, අපේ සමාජයේ ඉදිරි ගමනට දායකත්වයක් සිදු වෙලා නැත්තේ ඇයි කියන කාරණය අපි සලකා බැලිය යුතු වනවා. එහිදී සලකා බැලිය යුතු ප්‍රධාන හේතු දෙකක් තිබෙනවා.

එකක් තමයි, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට කරන ආයෝජනයේ තිබෙන සීමාකාරිභාවය. අපේ දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට දශම 2කටත් අඩු ප්‍රමාණයක් තමයි අපේ විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ ක්ෂේත්‍රවලට වැය කරන්නේ. ඒකෙන් සියයට 55ක් පමණ රජය දරනවා; සියයට 45ක් පමණ පෞද්ගලික අංශය දරනවා. වෙනත් රටවල පර්යේෂණ ක්ෂේත්‍රයට විශාල දායකත්වයක් රජයත්, ඊටත් වඩා විශාල දායකත්වයක් පෞද්ගලික අංශයත් දරනවා. නමුත් ඒ පිළිබඳව ලංකාවේ තිබෙන්නේ ඉතාම මන්දෝත්සාහී ආකල්පයක්.

දෙවන බරපතළ හේතුව තමයි, අපේ විද්‍යා තාක්ෂණ ක්ෂේත්‍රය හුදු සෛද්ධාන්තික විද්‍යාවන්ට සීමා වීම සහ ප්‍රායෝගික කලාපවලට ගමන් නොකිරීමයි. මේ තත්ත්වය දැකලා ඇමතිවරයා වශයෙන් සිටි අවස්ථාවේදී මා තීරණය කළා, ප්‍රායෝගික විද්‍යා පර්යේෂණවලට සියයට 70කුත්, සෛද්ධාන්තික විද්‍යා පර්යේෂණවලට සියයට 30කුත් වශයෙන් වියදම් ලබා දිය යුතුයි කියලා. ඒ වාගේම ප්‍රධාන මට්ටමේ, ඉහළ මට්ටමේ, ඉහළ ගණයේ පර්යේෂණ සඳහා, ඒ කියන්නේ රුපියල් මිලියන 50කට ඔබ්බෙන් තිබෙන විද්‍යා තාක්ෂණ පර්යේෂණවලට ජාතික පර්යේෂණ සභාව හරහා ආයෝජන ලබා දිය යුතුයි කියන යෝජනාව ඉදිරිපත් කළා.

අපි ඇත්තටම ලජ්ජා විය යුතුයි. නවෝත්පාදන සංගුණකයේ රටවල් 143ක් අතරින් අපේ රට ඉන්නේ 105වන තැනයි; හොංකොං රට 10වන තැන ඉන්නවා; දකුණු කොරියාව 16වන තැන ඉන්නවා; මැලේසියාව 33වන තැන ඉන්නවා; තායිලන්තය 48වන තැන ඉන්නවා; අපි ඉන්නේ 105වන තැනයි. රටවල් 143ක් අතරින් අපි නවෝත්පාදන සංගුණකයේ මෙපමණ පස්සට වැටිලා තිබීම ගැන අපි ලජ්ජා විය යුතුයි. මෙය වෙනස් කරන්න පුළුවන් එකම මඟ, තාක්ෂණ විද්‍යා ක්ෂේත්‍රයට කරන විධිමත් ආයෝජනයක් හා විධිමත් ක්‍රියා මාර්ගයක් මඟින් ඒක ජාතික ආර්ථිකයට සම කරගැනීම පමණයි.

ඒ විතරක් නොවෙයි. අද අපේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්න තිබෙන ප්‍රධාන බාධාව හැටියට අපි දකින්නේ, මැදි ආදායම් උගුලයි. අපි අද මැදි ආදායම් රටක්; දුප්පත් රටක් නොවෙයි. අපේ ඒක පුද්ගල ආදායම ආසන්න වශයෙන් ඩොලර් 4,000ක් පමණ

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

වනවා. අපි දියුණු රටක් කරා යන්න නම් ඒක පුද්ගල ආදායම ඩොලර් 12,000 සීමාවට යන්න ඕනෑ. දැන් මේ පවතින ආර්ථික වර්ධන වේගයෙන් ඒ ගමන ගියොත් 2045 දී ලංකාව එතැනට ළඟා වෙයි. 2013 දී ආසියානු සංවර්ධන බැංකුව ලංකාවේ නිෂ්පාදන ශ්‍රිතය අරගෙන ඒ පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණයක් කරලා පෙන්වුවා, මොන සංඛ්‍යා ලේඛන පෙන්වුවත් ලංකාවට ළඟා කරගන්න පුළුවන් ආර්ථික වර්ධන වේගය උපරිම වශයෙන් සියයට 6.7යි කියලා. උපරිමයෙන් ළඟා කරගත හැකි ආර්ථික වර්ධන වේගය සියයට 6.7 නම්, අපි සියයට 7ක, සියයට 8ක ආර්ථික වර්ධනයක් ළඟා කර ගත්තාය කිව්වා නම් ඒවා ඉලක්කම් සෙල්ලම් විතරයි. නිශ්චිතව සියයට 6.7ක ආර්ථික වර්ධන වේගයකින් ගියොත් 2045 දී තමයි අපට ඉහළ ආදායම් ලබන රටක් බවට පත් වන්න පුළුවන් වන්නේ. 2030 දී ඉහළ ආදායම් ලබන රටක් බවට පත් වන්න අපට තිබෙන එකම යතුර තමයි, පර්යේෂණ ක්ෂේත්‍රයට මේ ආකාරයේ විධිමත් මැදිහත් වීමක් කිරීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විධිමත් ආර්ථික විද්‍යාඥයකු වන සිරිමෙවන් කොළඹගේ මැතිතුමා ඒ වකවානුවේදී සොයා ගැනීමක් කළා. අපි කවුරුත් දන්නවා, අද අපේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 5ක්, සියයට 6ක් ලබාගන්න අපි දළ ජාතික ආදායමෙන් සියයට 35ක් පමණ ආයෝජනය කරන්න ඕනෑය කියලා. ඒ කියන්නේ අපි සියයට 4ක් පමණ ආයෝජනය කළොත් තමයි, අපට සියයට 1ක පමණ වර්ධනයක් ළඟා කරගන්න පුළුවන් වන්නේ. හැබැයි දළ ජාතික ආදායමෙන් සියයට 1ක් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට යොදා ගත්තොත්, අනිවාර්යයෙන්ම අපට සියයට 2ක්, සියයට 3ක් දක්වා දළ දේශීය නිෂ්පාදනය වැඩි කරගන්න පුළුවන්. මා අවධාරණය කරලා කියන්න ඕනෑ, වෙනත් ක්ෂේත්‍රවලට වාගේ නොවෙයි, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණවලට දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1ක් වැය කළොත්, දළ ජාතික ආදායම සියයට 3කින් වර්ධනය කරගන්න පුළුවන්ය කියලා. එහෙම නම් ඉතාම පහසුවෙන් අපට හැකියාව ලැබෙනවා, සියයට 5ක, සියයට 6ක තිබෙන අපේ ආර්ථික වර්ධන වේගය සියයට 8ක, සියයට 9ක ස්ථාවර වර්ධන වේගයක් බවට පත් කරගන්න. ඒ වර්ධන වේගය අඛණ්ඩව රැගෙන ගියොත් අපට පුළුවන්කම ලැබෙනවා, අනිවාර්යයෙන්ම 2030 දී ලංකාව ආර්ථිකමය වශයෙන් ශක්තිමත් රටක් බවට, ලෝකය ඉදිරියේ කෙළින් හිටගන්න පුළුවන් රටක් බවට පරිවර්තනය කරන්න.

මා විශේෂයෙන්ම කියන්න ඕනෑ, අද අපේ සෑම ක්ෂේත්‍රයක්ම එක තැන පල්වන තත්ත්වයට පත් වෙලා තිබෙනවාය කියලා. උදාහරණයක් හැටියට අපේ අපනයන ගත්තොත් 1977 ලිබරල් ආර්ථිකය හඳුන්වා දෙන්නට ප්‍රථම අපේ අපනයන සැදුම්ලා තිබුණේ තේ, පොල් හා රබර්වලින්. ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති මත අපනයන අභිමුඛ උපාය මාර්ගයක් අනුගමනය කළාම අපේ ඇඟලුම් ක්ෂේත්‍රය එතැනට ආවා. අද ඇඟලුම් තිබෙනවා. නමුත් මේ පසු ගිය අවුරුදු 30ක, අවුරුදු 35ක කාලය ඇතුළත ඒ ඇඟලුම් හැරෙන්න වෙන කිසිම ආකාරයක ශක්තිමත් තාක්ෂණික මැදිහත් වීමක් සහිත අපනයන භාණ්ඩයක් අපි අපනයනය කරලා නැහැ.

ඒ ගැන අප ලජ්ජාවට පත්වන්නට ඕනෑ. අපත් එක්ක මේ තරගයට ගිය බංග්ලාදේශය 1980 සිට මේ කාලය ඇතුළත තමන්ගේ අපනයනය දහ ගුණයකට වැඩි ප්‍රමාණයකින් වැඩි කර ගෙන තිබෙනවා. ඒ වාගේම වියට්නාමය ඒ කාලය තුළ තමන්ගේ අපනයනය 70 ගුණයකින් වැඩි කර ගෙන තිබෙනවා. නමුත් ලංකාව තවමත් එය දෙගුණයකින්වත් වැඩි කර ගන්නට බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

අපට යතුර තිබෙනවා. යතුර තමයි තාක්ෂණය. එමගින් අපේ ඛනිජ ක්ෂේත්‍රයට අලුත් අගයක් ලබා දෙන්න, නව පර්යේෂණ කරන්න කටයුතු කරන්න පුළුවන්. නැනෝ තාක්ෂණයෙන් අපට විශාල ඉදිරි පිම්මක් ලබා ගන්න පුළුවන්. මොකද, ඉදිරි කාලයේදී ලෝකයේ ප්‍රවණතාවය වෙන්නේ විදුලි වාහන. විදුලි වාහනවලට වුවමනා කරන්නේ විදුලි බැටරි. විදුලි බැටරිවල ප්‍රධානම මූලධර්මයක් තමයි අපේ රටේ තිබෙන මිනිරන්. මොකද, මේ ලෝකයේ තිබෙන පිරිසිදුම, වැදගත්ම මිනිරන් සංචිතය තිබෙන්නේ අපටයි. ඒ නිසා අපි ඒකට නිසි ආකාරයට වටිනාකමක් එකතු කර ගත්තා නම් විදුලි වාහන ලෝකයේ ප්‍රමඛයා බවට පත් වෙන්නට මේ රටට වැදගත් විභවයක් තිබෙන බව අමතක කළ යුතු නැහැ. ඒ වාගේම අපේ "ක්වාට්ස්" සම්පත, අපේ "ටයිටේනියම්" සම්පත යන මේ එකකින්වත් අප විධිමත් ප්‍රයෝජනයක් ළඟා කර ගෙන නැති බව බොහොම කනගාටුවෙන් වුවත් ප්‍රකාශ කරන්නට ඕනෑ. අපේ විද්‍යාව හා තාක්ෂණය යොමු විය යුත්තේ, ඒ ඛනිජයන් ශක්තිමත්ව අපට ඉදිරි කාලයේදී යොදා ගැනීම සඳහායි. ඒ වාගේම අපේ රට ජීව විවිධත්වයෙන් අනූන රටක්. ලෝක වෙළෙඳ පොළ තුළ ජීව විවිධත්වය අද වාණිජ භාණ්ඩයක් බවට පත් කර ගන්නට බොහොම පැහැදිලිව පුළුවන්. අප දන්නවා. තායිලන්තය ඉතාම බරපතළ විධියට ඒ ගොල්ලන්ගේ සංකල්පය අනුව ගෝලීය කුස්සිය - Global Kitchen එක - බවට තමන්ගේ රට පත් කරනවාය කියන හැඟීමෙන් ඒ දෙසටම ආයෝජන කර අද ආහාර ලෝකයේ විශාල විප්ලවයක් තායිලන්තය විසින් ඇති කර තිබෙනවා. මේක අපටත් කරන්නට පුළුවන් දෙයක්.

අපේ ජීව තාක්ෂණය , ජාන තාක්ෂණය දෙසට අප විධිමත් අවධානය යොමු කර, ආහාර විද්‍යාව විධිමත් විධියට කර ගත්තා නම්, අපට මේ ලෝකයේ විශාල අභියෝග ජය ගන්නට පුළුවන් වෙනවා. උදාහරණයක් හැටියට, පොල් වතුර ගැන කියන්න පුළුවන්. මීට දශකයකට පමණ ආසන්න කාලයේ සිට අපේ ව්‍යාපාරිකයන් කිහිප දෙනෙක් මේ ක්ෂේත්‍රයට පිවිසුණා. අද ඒක පෙප්සිකෝලා, කොකාකෝලා සමාගම වැනි බහුජාතික සමාගම්වල බලගතු ව්‍යාපෘතියක් බවට පත් වෙලා තිබෙනවා. අපේ මේ විශාල ජීව විවිධත්වය රටේ ආර්ථිකයට ගන්න නම්, ඒ පර්යේෂණ ක්ෂේත්‍රවලින් ආහාර විද්‍යාව ශක්තිමත්ව ඉදිරියට ගතයුතු වෙනවා. ඒ වාගේම අපේ විශාලම සම්පත අපේ මානව සම්පත; දැනුම් සම්පත. දැනුම පදනම් කර ගත් ඉහළ ගණයේ සේවාවන් ලෝකයට සැපයීමට පුළුවන්. අපට පුංචි බලාපොරොත්තුවක් හෝ තිබෙන්නේ, අපේ අපනයන ක්ෂේත්‍රයේ තොරතුරු තාක්ෂණ ප්‍රමාණය අද ඩොලර් මිලියන 750 සීමාවට ඇවිත් තිබීමයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මේක ඩොලර් බිලියන පහක්, හයක්, දහයක් බවට පරිවර්තනය කර ගැනීමේ විභවය මේ රටේ උගත් පිරිසට තිබෙනවා. ඒකට අපි විධිමත් ආකාරයට පර්යේෂණ ක්ෂේත්‍රයට මැදිහත්වීමක් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ගැන කියන්නට ඕනෑ. අද අපේ ආනයන බිලෙන් විශාල ප්‍රමාණයක්- සියයට 20කට, 25කට ආසන්න ප්‍රමාණයක් පිට රටින් ගෙනෙන ආහාරවලට, පිට රටින් ගෙනෙන

භාණ්ඩවලට යොමු වෙලා තිබෙනවා. මේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවා ශක්තිමත් කරන්න, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවාට දිරි දෙන්න, ඔහුට අවශ්‍ය කරන පර්යේෂණ කටයුත්ත කරන්න ආයතනයක් අවශ්‍ය වෙලා තිබෙනවා. අපේ තාක්ෂණ නගරය යටතේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයෙන් ඉදිරියේදී එවැනි තාක්ෂණ ප්‍රවේශයන් සහිත පර්යේෂණාගාරයක්, එවැනි ආකාරයට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට දිරි දෙන ස්ථානයක් හෝමාගම ඉදි කරන බව අපි බොහොම සතුටින් ප්‍රකාශ කරන්නට කැමැතියි. එම නිසා, ශ්‍රී ලංකාව මේ සම්බන්ධයෙන් විධිමත් වැඩ කොටසක් කළ යුතුයි.

2013 -2014 කාලයේදී, NASTEC ආයතනයේ මහාචාර්ය ධම්මික තන්තිරිගොඩගේ මූලිකත්වයෙන් මේ පිළිබඳව 2015 සිට 2020ට ක්‍රියාත්මක කරන්න විධිමත් සැලැස්මක් හැදුවා. එය ජාතික පර්යේෂණ සඳහා වෙච්ච සුවිශේෂී ආයෝජන සැලැස්මක්.

ක්ෂේත්‍ර දහයක් හඳුනා ගත්තා. ජලය, ආහාර සහ කෘෂිකර්මය, සෞඛ්‍යය, නිවාස හා නාගරීකරණය, පරිසරය, බලශක්තිය, ඇඟලුම්, ඛනිජ ද්‍රව්‍ය, මෘදුකාංග සහ දැනුම් පද්ධති පදනම් කරගත් සේවා, පොදුමය වශයෙන් මූලික විද්‍යාවන්, ඒ වාගේම නැගී එන තාක්ෂණයන් සහ සාම්ප්‍රදායික දැනුම ආකාරයට වුණු මූලික ක්ෂේත්‍ර දහයක් ඔස්සේ ආයෝජනය කළ යුත්තේ කෙසේද කියන එකත්, මේ සඳහා වුණු මූලික මැදිහත්වීම් දහයකුත් හඳුනා ගත්තා. මූලික මැදිහත්වීම් දහයත් එක්ක මේ අනික් දහය එකතු කළාම අවස්ථා සියයක් එනවා. ඒ අවස්ථා සියයට රජය විධිමත් ලෙස ආයෝජනය කළොත්, මේ රට මහා ආර්ථික ඉදිරි පිම්මකට ගෙන යන්න පුළුවන් බව පෙන්වා දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේදී එම අවස්ථා දැක්වෙන ලේඛනය මා **සභාගත*** කරනවා.

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවත්, සෙසු සියලු පර්යේෂණ ආයතනත් එකට එකතු වෙලා හදාගත් මේ ජාතික සැලැස්මට අනුව රජය හා පෞද්ගලික අංශය විධිමත්ව ආයෝජනය කළහොත්, අපට අනිවාර්යයෙන්ම මැදි ආදායම් උගුල පන්නලා ඉදිරියට යන්න පුළුවන්. මැදි ආදායම් උගුල පන්නලා ඉදිරියට යන්නත්, රට අද පෙළෙන මූල්‍ය අර්බුදයෙන් ගැළවෙන්නත්, ඒ වාගේම අනාගතයේදී රටේ ඇති වන පාරිසරික, සමාජ ගැටලු ජය ගන්නත් තිබෙන ප්‍රධානම යතුර පර්යේෂණ හා ඒ හරහා කෙරෙන නව නිර්මාණ බවත් අවධාරණය කරමින්, නවෝත්පාදනය තමන්ගේ ආර්ථික ප්‍රතිපත්ති හා ආර්ථික උපාය මාර්ගය කර ගත් ආණ්ඩුවක් හැටියට ඒ ඉදිරි පිම්ම ජය ගැනීමට සියලුදෙනාම ජාතික පර්යේෂණ සභාව වැනි ආයතන තවදුරටත් ශක්තිමත් කරන්න ඉදිරිපත් විය යුතු බවත් අවධාරණය කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 4.26]

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of City Planning and Water Supply)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය මූලාසනයේ සිටියදී කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සන්තෝෂ වෙනවා.

අද ඉතාම වැදගත් ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත තමයි දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර තිබෙන්නේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව තුළ පර්යේෂණ සංස්කෘතිය ශක්තිමත් කරන්න, රටේ සංවර්ධනය ඉලක්ක කර ගනිමින්, රටේ සංවර්ධනයට දායක කර ගනිමින් අලුත් නිපැයුම් ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ව්‍යවස්ථාපිත සභාවක් බවට පත් කරන නීති තමයි අද ඉදිරිපත් වන්නේ. ජාතික පර්යේෂණ සභාව ආරම්භ කර තිබෙන්නේ 1999දීයි. 2007දී එය විධිමත් විධියට ස්ථාපිත කළත්, එය ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හැටියට පත් කිරීම සඳහා වන නීත්‍යානුකූල බලය අද ලබා දෙනවා.

විශේෂයෙන්ම ලංකාව තුළ විද්‍යා සහ තාක්ෂණ පර්යේෂණ සංස්කෘතියක් ගොඩනඟන්න, ඒ වාගේම අපේ සංවර්ධනයට අදාළ පර්යේෂණ වැඩසටහන් සඳහා පහසුකම් සැලැස්වීමට අදාළ කාර්යයන් තමයි මේ පර්යේෂණ සභාවෙන් කෙරෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එදා ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් දුරකථනය සොයා ගත් නිසා සන්නිවේදන පහසුකම රටවල් අතර කොයි තරම් ව්‍යාප්ත වුණාද කියා අප දැක්කා. එයින් ආර්ථිකයට විශාල බලපෑමක් ආවා. එදා සොයා ගත් දුරකථනය අද smart phones දක්වා දියුණු වෙලා තිබෙනවා. එය මේ ලෝකය ලබාගත් ජයග්‍රහණයක්. මේ smart phone එක හරහා අද ගෙදර ඉඳගෙන තමන්ගේ ආර්ථික කටයුතු කරගන්න, ව්‍යාපාර කටයුතු කර ගන්න, වෛද්‍යවරු channel කරන්න, බිල් ගෙවන්න වාගේ විශාල සේවා රාශියක් කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. මේ පර්යේෂණවල ප්‍රතිඵල අද ජනතාව භුක්ති විඳිනවා. ඒ වාගේම තමයි, 1887දී කාල් බෙන්ස් මහත්මයා හයිඩ්‍රජන්වලින් ධාවනය වන කාර් එක හඳුන්වා දුන්නා. අද වන විට විදුලියෙන් දුවන මෝටර් රථ ලෝකයට හඳුන්වා දී තිබෙනවා. ඒ නිසා මෙය නාක්ෂණය, අලුත් සොයා ගැනීම්, පර්යේෂණ එක්ක ආපු ඉදිරි ගමනක්. අද ලෝකයේ රටවල් දියුණු වෙලා තිබෙන්නේ, ආර්ථිකය දියුණු වෙලා තිබෙන්නේ මේ පර්යේෂණවල ප්‍රතිඵලයක් හැටියටයි. නමුත්, අද ශ්‍රී ලංකාව දිහා බලනකොට අප බොහොම පසුගාමී තත්ත්වයක ඉන්න බව තමයි පෙනෙන්න තිබෙන්නේ. ඒ නිසා පර්යේෂණ සංස්කෘතිය, අලුත් නිපැයුම් සොයා ගැනීම් ඒ වාගේම ඒ අලුත් නිපැයුම් රටේ ආර්ථිකයට සම්බන්ධ කරලා ඒ තුළින් අපනයන ආර්ථිකයක් හදා ගැනීම ඉතාම වැදගත් බව මා මේ අවස්ථාවේ මතක් කරනවා.

අපි දැන් ශ්‍රී ලංකාවේ සොයාගැනීම්, පර්යේෂණ ගැන කථා කරමු. අප ලීවරය සහ රෝදය කියන යාන්ත්‍රික සංකල්ප එකට එකතු කරලා දැනට සියවස් 20කට කලින් විල්බැරැක්කය නිපදවුවා. අපේ රේ විජේවර්ධන මැතිතුමාට තමයි අත් ට්‍රැක්ටරයේ පේටන්ට් බලපත්‍රය අයිති. ඒ වාගේම අපේ ආසනයේ ආචාර්ය කුලසිංහ මැතිතුමා දේශීය විද්‍යාඥයෙක් හැටියට පෙරසව් කොන්ක්‍රීට් යොදාගෙන අඩු වියදමින් ඉතා කෙටි කාලයක් තුළ නිවාස හදා දීමේ ව්‍යාපෘති හඳුන්වා දී තිබෙනවා. අලුත් සොයා ගැනීම් රාශියක් හඳුන්වා දී තිබෙනවා.

හැබැයි අපේ දියුණු වීමේ වේගයත්, රටේ ආර්ථිකයත් එක්ක සම්බන්ධ වූ පර්යේෂණ ඉතාම අඩු බව අප මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවුරුද්දක් පාසා බොහෝ නව නිපැයුම් සංකල්ප වෙනුවෙන් බුද්ධිමය දේපළ අයිතිය - පේටන්ට් බලපත්‍ර- සඳහා ඉල්ලුම් කරනවා; එකී බලපත්‍ර ලබා ගන්නවා. නමුත් අද මෙය ප්‍රායෝගික තත්ත්වයට, ජනතාවගේ එදිනෙදා ජීවිතයට එකතු කරගන්නා තත්ත්වයට පත් වෙලා නැහැ කියන එකත් අපි කියන්න ඕනෑ. අපේ රටේ බහුතරයක් කාන්තාවෝ තවමත් ලිප් ගල් තුනක් තියලා, දර පාවිච්චි කරලා උයනවා. දර අඩුවෙන් පාවිච්චි කරන, අඩු දුම් සහිත, අඩු වියදම් සහිත ශ්‍රී ලාංකීය නව නිපැයුමක් ලෙස ලිපක් හඳුන්වා දුන්නා මට

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

මතකයි. හැබැයි, ජනතාව එදිනෙදා ජීවිතයේදී එය පාවිච්චි කරන්නේ නැහැ. අලුත් නිපැයුම් තිබුණත් ඒවා භාවිතයට ගන්නේ නැහැ. එම අලුත් නිපැයුම් එදිනෙදා ප්‍රායෝගික ජීවිතයේදී භාවිත කරන තත්ත්වයට ජනතාවගේ ආකල්ප, දැනුවත්භාවය වැඩි කිරීම ඉතාම වැදගත් වන බව මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රම බලකායේ බොහොම අඩුවක් තිබෙන බව අද අපි දකිනවා. නමුත් අද තවමත් ගොවිතැන කරන්නේ ශ්‍රම බලකාය මඟිනුයි. අලුත් උපකරණ තිබුණත් ඒවා පාවිච්චි කරන්නේ නැහැ. විශේෂයෙන් කෘෂි කර්මාන්තයත් අලුත් තාක්ෂණය උපයෝගි කරගෙන කරනවා නම් අපගේ කාලය, ශ්‍රමය අඩු වෙනවා වාගේම එයින් ලැබෙන ප්‍රතිඵලද හුඟක් වැඩි වෙනවා. ඒ වාගේම, ආර්ථිකමය වශයෙනුත් එහි ප්‍රතිලාභ ජනතාවට ලැබෙන බව අපි මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන් අප කියන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ ප්‍රධාන කාර්යය වෙලා තිබෙනවා**.** ශ්‍රී ලාංකීය විද්‍යාඥයන් ඒ වාගේම ශ්‍රී ලාංකික ආයතන සමඟ සම්බන්ධ කරලා විශේෂයෙන් රටේ සංවර්ධනයට අදාළ වන ව්‍යාපෘති, සංවර්ධනය ඉලක්ක කරගත් ව්‍යාපෘති සඳහා ඉල්ලුම් පත් කැඳවීම, ඒ ව්‍යාපෘති ඇගයීමට ලක් කිරීම, මුදල් ලබා දීම, ව්‍යාපෘති නියාමනය කිරීම ආදිය තමයි ඔවුන්ගේ ප්‍රධාන වගකීම වන්නේ. විශේෂයෙන් ජාතික පර්යේෂණ සභාව 2014 සිට ඉලක්ක පදනම් කරගත් ක්ෂේත්‍ර 10කට අදාළව මේ වනකොට විශාල ව්‍යාපෘති 5ක් ක්‍රියාත්මක කරන බව අපට දැනගන්න ලැබී තිබෙනවා. එයින් එකක් තමයි රට කිරිවලින් ස්වයං පෝෂිත කිරීම සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවලිත කිරීමේ ව්‍යාපෘතිය. මම හිතනවා එය ඉතාම හොඳයි කියා. ඒ මඟින් පිට රටට ඇදී යන රටේ විදේශ විනිමය අඩු කරගන්න පුළුවන්. අපි විශේෂයෙන් කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන බොහොමයක් ගෙන්වන්නේ පිට රටවලින්. එබැවින්, අපේ විදේශ විනිමය පිට රටවලට ඇදී යනවා. රට කිරිවලින් ස්වයංපෝෂිත කරලා කිරි නිෂ්පාදන වෙළෙඳ පොළට හඳුන්වා දීම තුළින් අපේ විදේශ විනිමය ඉතිරි කරගන්න පුළුවන්කම ලැබෙනවා. වෙළඳ පොළට ගියත් අපි දකිනවා, දේශීය කර්මාන්තකරුවන් කිරි ආශ්‍රිත නිෂ්පාදන පෙරට වඩා වැඩි වශයෙන් අද හඳුන්වා දෙන බවක්. නමුත් මෙය වේගවත්ව කළ යුතුයි. කාලයත් එක්ක කළමනාකරණය කරලා අවුරුදු දෙක තුනක කාලයක් අතරතුර කළ යුත්තක් ලෙසට මේ වැඩසටහන් වේගවත් කරනවා නම් ඉතාම හොඳයි කියන එක අප මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා විශේෂ කාරණයක් කියන්න ඕනෑ. රටට, සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඉතාම වැදගත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා. එමඟින් කරන්නේ, සර්ප දෂ්ටනයන් සඳහා ප්‍රතිවිෂකාරක සංවර්ධනය කිරීමයි. මොකද, අපේ රට අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් මිලියනයක් වියදම් කරනවා, ප්‍රතිවිෂකාරක -antivenom- ආනයනය කරන්න. ඉන්දියාවේ සිටින විෂ සර්පයන්ට අදාළ antivenom ඉන්දියාවෙන් ආනයනය කරනවා. ඒවායේ ගුණාත්මකභාවයේ ගැටලු තිබෙනවා. ඒවා ලංකාවේ රෝගීන් භාවිත කරන්න ගියාම බොහෝ විට ආඝාත්මිකතාවන් ඇති වෙනවා. බහුතරයක් රෝගීන්ට අඝාත්මිකතාවන් ඇති වීම නිසා මිය යන රෝගීන්ද බොහෝ ඉන්නවා. මේ නිසා, මහාචාර්ය ඉන්දික ගවරම්මාන මැතිතුමා අවුරුදු තුනකින් නිම කිරීම සඳහා ප්‍රතිවිෂ නිර්මාණය කිරීමේ පර්යේෂණයක් ආරම්භ කර තිබෙනවා. නමුත් මේ වන විට අවුරුදු හතක් ගත වෙලා. එය දැන් අවසන් අදියරේයි තිබෙන්නේ. කොස්ටරිකා විශ්වවිද්‍යාලයත් එක්ක අනුබද්ධිතවයි එය කරන්නේ.

මා හිතන විධියට, එය ඉතාම හොඳ නිපැයුමක්. එතුමා ඇතුළු පර්යේෂකයන්ට අපි උදව් කරන්න ඕනෑ. ඒ පර්යේෂකයන් අනුමැතිය ලබා ගන්න ආයතනවලට ගියාම විශාල ගැටලුවකට මුහුණ දෙන්න සිදු වන බව අපට දැන ගන්න තිබෙනවා. එතුමා එතුමාගේ නිපැයුම හඳුන්වා දුන්නාට පසුව රජයට වගකීමක් තිබෙනවා. Antivenom ආනයනය සඳහා විශේෂයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් මිලියනයක් වෙන් කරනවා. ඒ antivenom රටේ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කරන යටිතල පහසුකම් ලබා දීලා, ඒවා නිෂ්පාදනය කරලා, රටේ ජනතාවට පාවිච්චි කරන්න අවස්ථාව, ඉඩ කඩ ලබා දෙන්න ඕනෑ. එහෙම නැති වුණොත් -මෙය පර්යේෂණයකට විතරක් සීමා වුණොත්- ඉතාම ලොකු අපරාධයක් වෙනවා.

ප්‍රතිවිෂ නිර්මාණය කිරීමේ කර්මාන්තශාලාවක් ඉදි කරන්න අවශ්‍ය වෙන්නේ ඇමෙරිකන් ඩොලර් මිලියන හතක්, අටක් කියලා අපට දැන ගන්න ලැබිලා තිබෙනවා. අපි රජයක් හැටියට ඒ සඳහා මැදිහත් වෙන්න ඕනෑ. මේ සඳහා අවශ්‍ය තල්ලුව ජාතික පර්යේෂණ සභාවට ලබා දෙන්න පුළුවන් නම් ඒක රටට කරන විශාල සෙතක් හැටියට මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ආහාර සුරක්ෂිතතාව ගැනත් අපි කථා කිරීමේදී අපට පෙනෙනවා, අඩු වියදමකින් වැඩි අස්වැන්නක් ලබා ගන්න පුළුවන්, ලෙඩ රෝගවලට ඔරොත්තු දෙන කෘෂිකර්ම භෝග හඳුන්වලා දීම ඉතාමත්ම වැදගත් වන බව. අපනයනය කරන්න පුළුවන් සහල් වර්ග හඳුන්වලා දීම වැදගත් වෙනවා. එතකොට තමයි අපට විදේශ විනිමය ලබා ගන්න පුළුවන් වන්නේ. ඒ වාගේම තමයි පසු අස්වනු තාක්ෂණය ගැන අපි සැලකිලිමත් වෙන්න ඕනෑ. ඒ අතින් අපි හුඟක් පසුගාමී තත්ත්වයකයි ඉන්නේ.

බංග්ලාදේශය වාගේ රටක කෘෂි කර්මාන්තය හුඟක් දියුණුයි. ඒ රටවල පසු අස්වනු තාක්ෂණය ඉතාමත්ම ඉහළ මට්ටමකයි තිබෙන්නේ. අස්වැන්න තිබෙන කාලයට දෙහි, දොඩම්, තක්කාලි වාගේ දේවල් ඉතාමත් අඩු මිලකට විකුණනවා. ගොවි මහත්වරුන්ට වියදම් කරපු මුදලවත් ලබා ගන්න බැරි වෙනවා. පසු අස්වනු තාක්ෂණය අපේ රටේ දියුණු කළ යුතු වෙනවා. එවිට අපට මීල අධික කාලයට අපට මේ පසු අස්වනු තාක්ෂණය පාවිච්චි කරන්න පුළුවන් බව මතක් කරන්න ඕනෑ.

පර්යේෂණ සංස්කෘතියක් බිහි කරන්න නම් පාසල් යන දරුවන්ට, අධ්‍යාපන ක්‍රමයෙන් මේ පර්යේෂණ හරහා නව නිපැයුම් සඳහා අත් දැකීම් ලබා ගැනීමට තිබෙන ඉඩකඩ අපි වැඩි කරන්න ඕනෑ. ඉස්සර අධ්‍යාපන ක්‍රමය තුළ තිබුණා, වඩු වැඩ කර්මාන්තය, යාන්ත්‍රික වැඩ කර්මාන්තය. දරුවන්ට යන්ත්‍රසූත්‍ර එක්ක ගැටිලා අත් දැකීම් ලබා ගෙන අලුත් නිපැයුම් හොයා ගන්න පුළුවන් අවස්ථාව අද ලැබිලා නැහැ. ඒ නිසා මේවා අධ්‍යාපන ක්‍රමය තුළිනුත් හඳුන්වලා දෙන්න ඕනෑ බව මතක් කරන්න ඕනෑ.

මට කලින් කථා කරපු මන්ත්‍රීතුමන්ලාත් කිව්වා, "කරපු පර්යේෂණ ගොඩක් තිබෙනවා, ඒවායේ ප්‍රතිඵල පාවිච්චි නොකරන" කියලා. ඒ නිසා මේ සියලුම පර්යේෂණ එකට සම්බන්ධීකරණය කරලා, ඒවායේ ප්‍රතිඵල රටට බෙදා හැරීමේ ජාලයක් හදන එකත් ඉතාමත්ම වැදගත් බව මතක් කරමින් මට කාලය වෙන් කිරීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 4.35]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපනය කිරීමේ පනත් කෙටුම්පත වෙනුවෙන් කථා කිරීමට ලැබීම ඇත්තටම දේශපාලනඥයකු වශයෙනුත්, පර්යේෂකයකු වශයෙනුත් මම

ඉතාමත් සතුටට පත් වෙනවා. ලංකාවේ අනාගත තාක්ෂණ දියුණුවට ඉතාමත් උපකාරී වන වැදගත් පනත් කෙටුම්පතක් තමයි, පර්යේෂණ සභාව ව්‍යවස්ථාපිත කිරීමේ මේ පනත් කෙටුම්පත.

මේ පනත් කෙටුම්පත ගැන කථා කරන කොට මම කැමැතියි, මුලින්ම පනත් කෙටුම්පතේ තිබෙන වගන්ති කිහිපයක් ගැන කථා කරන්න. ඇත්තටම අපි මේ ගැන ආංශික අධීක්ෂණ කමිටුවේදීත් කථා කළා. මේ පනත් කෙටුම්පතේ 2වැනි පිටුවේ 3වන වගන්තිය යටතේ මෙසේ සඳහන්ව තිබෙනවා:

" (ඇ) විද්‍යාව සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ වැඩි දියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝග ඉල්ලා සිටීම."

ඇත්තටම මේ වගන්තිය ගැන අපි කථා කළා; අපි සාකච්ඡා කළා. ගරු ඇමතිතුමා මේ අවස්ථාවේදී සභාවේ හිටියා නම් හොඳයි කියලා හිතනවා. මම හිතනවා, ලෝකය ඉස්සරහට යනකොට මේ වගන්තිය බොහොම සරල වැඩියි කියලා. හේතුව, අපි මෙතැනින් කියන අංශයේ සහයෝගය ඉල්ලා සිටීම නිසා.

අද ලෝකයේ තාක්ෂණයත් එක්ක ඉදිරියෙන් යන කොට public-private partnership එහෙම නැත්නම් පෞද්ගලික අංශයත් එක්ක එකට එකතු වෙලා යන පර්යේෂණ තමයි ලෝකයේ ඉදිරියටම යන්නේ. මේකට උදාහරණ රාශියක් තිබෙනවා. උදාහරණයක් හැටියට ජපානය ගනිමු. මමත් පර්යේෂකයෙක් හැටියට අවුරුදු 17ක් විතර ජපානයේ සේවය කළා. එහේ සියලුම පර්යේෂණ -සියයට 100ක්ම පර්යේෂණ- රාජ්‍ය පර්යේෂණ නොවෙයි. පෞද්ගලික අංශයත් නැත්නම් ව්‍යාපාරික අංශයත්, ඒ ඒ ප්‍රදේශවල ඉන්න ප්‍රාථමික මට්ටමේ ව්‍යාපාරිකයනුත් මේ සියලු දෙනා සම්බන්ධ කරගෙන යන පර්යේෂණයි තිබෙන්නේ. ඒ නිසා අපි මේ රටේ අලුත් පර්යේෂණ සංස්කෘතියකට යනවා නම්, පෞද්ගලික අංශයත් එක්ක ඒ දේවල් කරන්න ඕනෑ. මට කලින් කථා කරපු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය කිව්වා වාගේ අපි පර්යේෂණ කරනවා. ඒ පර්යේෂණ කරපු ප්‍රතිඵල පාවිච්චි කරන්නේ නැහැ.

මේකට ප්‍රධානම හේතුව, අපි සමාජයත් එක්ක බද්ධ වෙන්නේ නැහැ; ආයතනත් එක්ක බද්ධ වෙන්නේ නැහැ. අපි isolated, ඒ කියන්නේ ස්වාධීනව, තමන්ගේ පාඩුවේ පර්යේෂණයක් කරනවා. අන්තර්ජාතික publication එකක් හැටියට ඒ සම්බන්ධයෙන් ප්‍රකාශනයක් ඉදිරිපත් කරනවා. ඒක එතැනින් ඉවරයි. එතැනින් එහාට ගිය පර්යේෂණ සංස්කෘතියක් -research culture එකක්- මේ රටට අවශ්‍යයි. ඒ සඳහා මේ පනත් කෙටුම්පත විශේෂ හේතුවක් වනවා කියලා මම හිතනවා. නමුත් මෙහි සමහර වගන්ති අපට වෙනස් කළ යුතු වෙනවා. ඒ සඳහා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළොත් හොඳයි කියා මම යෝජනා කරනවා. මීට වඩා එහාට ගිහින්, මීට වඩා ගැඹුරින් සලකා බලා, පෞද්ගලික ආයතනත්, පෞද්ගලික ක්ෂේත්‍රයත්, ව්‍යාපාරික ක්ෂේත්‍රයත් එක්ක බද්ධ වෙන්නේ කොහොමද කියන කාරණය බැලිය යුතු වෙනවා.

මේ ගැන කථා කරන විට, පර්යේෂණ සඳහා ලෝකයේ වැඩියෙන්ම මුදල් ආයෝජනය කරලා තිබෙන සහ ආයතන - the ten biggest R and D spenders worldwide- ගැනත් මම බැලුවා. මුලින්ම අපට දකින්න ලැබෙන්නේ Volkswagen ආයතනය. Volkswagen වාහන නිපදවන සමාගම ඔබ කවුරුත් දන්නවා. මේ Volkswagen සමාගමේ කර්මාන්තශාලාවක් අපේ ආණ්ඩුවෙන් ලංකාවේ ඇති කරනවා කිව්වාම, "ඒක කවදාවත් වෙන්නේ නැහැ" කියලා පසු ගිය කාලයේ ඒ කථාව ආන්දෝලනයට ලක් වුණා. ලෝකයේ වැඩියෙන්ම පර්යේෂණ සඳහා වියදම් කරන්නේ Volkswagen සමාගම බවට එක හොඳ උදාහරණයක් තමයි, එම සමාගම 2013 වර්ෂයේදී US Dollars 13.5 billion වියදම් කර තිබීම. ඒ අයගේ සම්පූර්ණ වියදම්වලින් සියයට 5.2ක්ම වියදම් කර තිබෙන්නේ පර්යේෂණ සඳහායි.

පර්යේෂණ සඳහා ලෝකයේ දෙවැනියට වියදම් කර තිබෙන්නේ Samsung ආයතනය. Samsung ආයතනය US Dollars 13 billion වියදම් කර තිබෙනවා. ඒ අයගේ percentage එකක් හැටියට ගත්තොත් 6.4 වශයෙන් සඳහන් කරන්නට පුළුවන්. තුන්වැනියට වියදම් කර තිබෙන්නේ Intel ආයතනය. හතරවැනියට වියදම් කර තිබෙන්නේ Microsoft ආයතනය. මේ ආදී වශයෙන් හත්වැනියට වියදම් කර තිබෙන්නේ Toyota ආයතනය, අටවැනියට වියදම් කර තිබෙන්නේ Johnson & Johnson ආයතනය, නවවැනියට වියදම් කර තිබෙන්නේ Google සමාගම. මේ ආදී සමාගම් තමයි ලෝකයේ වැඩියෙන්ම පර්යේෂණ සඳහා වියදම් කළ ආයතන හැටියට සැලකෙන්නේ.

මේ සියලුම ආයතන තමන්ගේ පර්යේෂණ තනිවම නොවෙයි කරන්නේ. ඒ ආයතනත් එක්ක බද්ධ වුණු විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන මේ සියලුම දේවලුත් එක්කයි සිදු කරන්නේ. ලෝකයේ විද්‍යාව, තාක්ෂණය සහ පර්යේෂණ වෙනුවෙන් ඉදිරියෙන්ම පෙනී සිටින ආයතන ගැන සොයා බැලුවොත්, Top 25 List එකක් අපට තිබෙනවා. එහි ranking එකේ මුලින්ම ඉන්නේ Franceවල, Alternative Energies and Atomic Energy Commission එක. දෙවැනියට ඉන්නේ Fraunhofer Society, Germany. තුන්වැනියට ඉන්නේ Japan Science and Technology Agency - JST, Japan-. හතරවැනියට ඉන්නේ US Department of Health and Human Services. පස්වැනියට ඉන්නේ National Centre for Scientific Research, France. හයවැනියට ඉන්නේ Korea Institute of Science and Technology. හත්වැනියට ඉන්නේ National Institute of Advanced Industrial Science and Technology.

මේ පළමුවැනි ආයතන හත ඇතුළේ ආසියාවේ ආයතන තුනක් මුලින්ම අපට දකින්නට ලැබෙනවා. විශේෂයෙන්ම Japan Science and Technology Agency - JST, Japan- යටතේ පර්යේෂකයෙක් හැටියට මටත් පර්යේෂණ කරන්න හැකියාව ලැබුණා. ඒ නිසා මෙවැනි ආයතන ගැන මම සන්තෝෂ වෙනවා. මෙවැනි ආයතනත් එක්ක සම්බන්ධ වුණාම, බද්ධ වුණාම ඉදිරියට යන්න අපට තිබෙන අවස්ථා අනන්තයි; අප්‍රමාණයි. ඒ නිසා එවැනි ආයතනත් එක්ක අපේ මේ ජාතික පර්යේෂණ සභාව interconnected network එකක් හැදෙන්න ඕනෑ. එහෙම නැති වුණොත් වෙන්නේ, අපි අර කලින් කිව්වා වාගේ, අපි isolated වෙනවා. අපි විතරක් research එකක් කරලා, suitcase එකේ දමා ගෙන ඉන්න පර්යේෂණයක් වෙනවා, ඒක. ඒක එහෙම නොවිය යුතුයි කියලා මම යෝජනා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

පර්යේෂණ ගැන කථා කරන විට, පර්යේෂණත් එක්කම "විශ්වවිද්‍යාල" බද්ධ වෙනවා. ලෝකයේ විශ්වවිද්‍යාල ගැන බලනකොට, ඒවා ඉදිරියෙන්ම තිබෙන්නේ එම විශ්වවිද්‍යාලයේ කරන පර්යේෂණත් එක්කයි. Research culture එකක්, research society එකක් හැදිලා, ඒත් එක්ක තමයි බද්ධ වෙන්නේ. ඒ පර්යේෂණත් එක්ක විශ්වවිද්‍යාලය වටා ව්‍යාපාරික ආයතන, ලෝකයේ ප්‍රධාන පෙළේ ආයතන, ඒ රටේ තිබෙන ප්‍රධාන පෙළේ ආයතන, පෞද්ගලික ආයතන මේ ආදී සියලු දේවල් බද්ධ වෙනවා.

උදාහරණයක් හැටියට, කටුබැද්ද -දැන් මොරටුව- විශ්වවිද්‍යාලය හෝ, කොළඹ විශ්වවිද්‍යාලය හෝ, පේරාදෙණිය විශ්වවිද්‍යාලය ගත්තොත් ඒවායේ අත් දැකීම් අපට තිබෙනවා. මේ විශ්වවිද්‍යාලවල අවසාන වසරේ ශිෂ්‍යයන්ට කුඩා පර්යේෂණත් එක්ක සම්බන්ධ වෙන්න වෙනවා. එහෙම නැත්නම් තමන්ගේ research එකේ, නැත්නම් පර්යේෂණ නිබන්ධනයේ අදාළ පර්යේෂණත් එක්ක සම්බන්ධ වෙනවා.

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

ලෝකයේ තාක්ෂණයත් එක්ක දියුණු වුණු රටවල් දිහා බැලුවොත් අපට පෙනෙනවා, science and technology researchවලට තමයි ලෝකයේ වැඩියෙන්ම වියදම් කරන්නේ කියලා. උදාහරණයකට මේ වියදම් දෙස අපි බැලුවොත්, එක්සත් ජනපදය expenditure on research and development ලෙස US Dollars 473.4 billion, GDP එකෙන් සියයට 2.74ක් වියදම් කරනවා. චීනය GDP එකෙන් සියයට 2.1ක් වියදම් කරනවා. European Union එක සියයට 2කට ආසන්නව සියයට 1.94ක් වියදම් කරනවා. මේ ක්ෂේත්‍රය සඳහා වැඩියෙන්ම වියදම් කරන රටවල් දෙකක් වන්නේ ජපානය සහ කොරියාවයි. ලෝකයේ රටවල් අතරින් ජපානය සියයට 3.58ක්, කොරියාව සියයට 4.2ක් සහ ඉන්දියාව 0.88ක් ආදී වශයෙන් පර්යේෂණ සහ විශේෂයෙන් research and development සඳහා භාවිත කරනවා. ලෝකයේ දියුණු වුණු රටවල් සහ දියුණු වෙමින් පවතින රටවල් දන්නවා, පර්යේෂණ සඳහා වැඩිපුර ආයෝජනය කළොත් විතරයි, ඒ රටට නවෝත්පාදන සමඟ ඉදිරියට යන්න පුළුවන් වෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ විශ්වවිද්‍යාල ටික මේ කටයුත්තට සම්බන්ධ කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය තමයි අපට තිබෙන්නේ. ඇත්තටම අපේ විශ්වවිද්‍යාල, පර්යේෂණ විශ්වවිද්‍යාල නොවෙයි. අපේ research culture එකක් නැහැ. ඒක මම නොබියව කියනවා. මොකද, මම දැකලා තිබෙනවා, පර්යේෂණ කරන්නේ කොහොමද කියලා; researchවල යෙදෙන්නේ කොහොමද කියලා. ඇත්තටම, අවුරුදු 4 පාඨමාලා තිබෙන විශ්වවිද්‍යාල තමයි අපට තිබෙන්නේ. මේ අවුරුදු 4 පාඨමාලා තිබෙන විශ්වවිද්‍යාල තුළින් අපි එළියට දමන ශිෂ්‍යයන් ගත්තොත්, අතීතයේ එළියට දැමූ ශිෂ්‍යයන් ගැන කථා කළොත්, සමහර ශිෂ්‍යයන් බොහොම ආඩම්බරයෙන් කියනවා, "මම රැකියා විරහිත උපාධිධාරියෙක්" කියලා. මට නම් හරිම ලජ්ජාවක් හිතෙනවා, "මම රැකියා විරහිත උපාධිධාරියෙක්" කියලා කියන්න. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට විතරක් මෙහි වැරැද්ද කියන්න බැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේක ශිෂ්‍යයාගේත් යුතුකමක්; ශිෂ්‍යයාගේ අයිතිවාසිකමක්. නිදහස් අධ්‍යාපනය තුළින් ඉගෙන ගන්නවා නම්, තමන්ට ස්වෝත්සාහයෙන් පර්යේෂණ කරලා ඉදිරියට එන්න පුළුවන් අවස්ථාව මේ රටේ තිබෙනවා. නමුත් අප ඒ culture එක උගන්වන්නේ නැහැ.

ශිෂ්‍යයා සහ විශ්වවිද්‍යාල ආචාර්යවරයා අතර තිබෙන මේ බැඳීම හරියාකාරව අපි නිර්මාණය කළේ නැත්නම් අනාගතයේ පර්යේෂණත් එක්ක බද්ධ වුණු සිසු දරුවන් හදන්න අපට බැරි වෙනවා. ඒ නිසා අපි විශ්වවිද්‍යාල ඇතුළේ research culture එකක් හදන්න ඕනෑ. ඒ research culture එක හරහා විශේෂයෙන් full-time researchersලා හදන්න ඕනෑ. ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ස්ථාපිත කළාට පසුව individual researchersලාට මේකෙන් මුදල් ලබා දෙන්න අපට පුළුවන්. එසේ මුදල් ලබා දීම තුළ විශ්වවිද්‍යාල ඇතුළේ full-time research unit එකක් - full-time researchersලා සමූහයක්- අපට හදන්න පුළුවන්. ඒ හරහා ලෝකයේ තිබෙන පර්යේෂණ ආයතන එනම් JST, Korea Institute of Science and Technology - KIST - National Institute of Advanced Industrial Science and Technology, Japan වාගේ අපේ රට වටේ සිටින ආසියාවේ ප්‍රමුඛ පෙළේ පර්යේෂණ ආයතනත් එක්ක බද්ධ වුණු පර්යේෂණ වැඩ පිළිවෙළක් අපට අවශ්‍යයි. එහෙම වුණොත් විතරයි ලෝකයත් එක්ක අපේ පර්යේෂණ යන්නේ. නැත්නම් මීට කලින් ඇමතිවරයෙක් කිව්වා වාගේ දුපත් මානසිකත්වයෙන් නැත්නම් ළිඳේ ඉන්නා මැඩියන් වාගේ අපි දකින්නේ මේ ටික විතරයි. මේ ටික ඇතුළේ විතරක් පර්යේෂණයක් කරනවා, නමුත් ඒ පර්යේෂණය ලෝකයත් එක්ක යන්නේ නැහැ. නවෝත්පාදන වුණු ගමන්ම අවශ්‍ය වෙන්නේ ලෝකයේ තාක්ෂණයත් සමඟ ඉදිරියට යන ගමන්ම පෞද්ගලික අංශයත් සමඟ නැත්නම් ව්‍යාපාරික කෂේත්‍රයත් සමඟ ඉදිරියට යෑමයි. ඒ නිසා එකට අත් වැල් බැඳගත් පර්යේෂණ බවට එය පත්විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කාරණා ගැන අපේ වැඩි අවධානය යොමු විය යුතුයි. මම මේ ගැන සොයා බලද්දී, ලෝකය වෙනස් කළ හැකි ප්‍රධාන පෙළේ නවෝත්පාදන 10ක් - 10 New Innovations That Could Change the World - පිළිබඳ කරුණු මට ලැබුණා. එකක් තමයි agricultural drones. මේ දවස්වල අපි දැකලා තිබෙනවා, ලොකු පෙළපාලිවල දිග ප්‍රමාණ පින්තූර ගන්න ඒ drones පාවිච්චි කරනවා. විශේෂයෙන් කෘෂිකාර්මික රටක් හැටියට මීට එහා ගිය කටයුත්තකට agricultural drones අපට පාවිච්චි කරන්න පුළුවන්. අපි දැක්කා, පසු ගිය කාලයේ එක පර්යේෂණයක්; තායිලන්තයේ drone එකක් පාවිච්චි කරලා, වගා කටයුතු සිද්ධ කරනවා. තව පර්යේෂණයක් තමයි brain mapping. Neuroscientistsලා එහෙම නැත්නම් වෛද්‍ය විද්‍යාව හා මනෝ විද්‍යාව සම්බන්ධ කරගෙන brain mapping කරන්න පුළුවන්. ඊළඟට Neuromorphic Chips. අපේ ස්නායු සම්බන්ධ chips පාවිච්චි කරලා, කොහොමද අපි ඉස්සරහට යන්නේ කියන තාක්ෂණය ලෝකයේ දියුණු වෙමින් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම ඔබ දන්නවා, 3-D Printing ගැන. 3-D printer එකක් තිබෙනකොට දැන් ඉස්සර වාගේ නොවෙයි, අපි භාණ්ඩයක් නිෂ්පාදනය කරනවා නම්, අපිට ඒ භාණ්ඩයේ ආකෘතිය ගෙදරදීම හදලා print කරලා බලන්න පුළුවන්. ඒ අනුව තාක්ෂණය භාවිත කරලා, නිෂ්පාදනය කරලා කොහොමද ඒක සමාජයට දාන්නේ කියලා බලා ගන්න පුළුවන්. ඒ වාගේම robotic තාක්ෂණය ගොඩක් විශේෂයි. robotic තාක්ෂණය ලෝකයේ ඉදිරියටම ගිහින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම Smart Wind and Solar Power තාක්ෂණය ඉදිරියට ගිහින් තිබෙනවා. මේ Smart Wind and Solar Power අද ලෝකයේම ඉදිරියට යනකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කනගාටුයි! අපේ විදුලි බල මණ්ඩලය පස්සට යනවා. අපේ විදුලි බල මණ්ඩලය Wind and Solar Power ගැන කථා කරනකොට "නැහැ, නැහැ හරි යන්නේ නැහැ. ඩීසල් බලාගාර තමයි අපට ඕනෑ, ගල් අඟුරු බලාගාර තමයි අපට ඕනෑ" කියන කථාව තමයි අදටත් කියන්නේ. ඒ ගොල්ලෝ අලුත් පර්යේෂණ කරන්න කැමැති නැහැ. ඉංජිනේරු මහත්වරු හැටියට ඇහුවොත්, අපි ඉගෙන ගත් ඉංජිනේරු තාක්ෂණයේ කිසි තැනක කියන්නේ නැහැ "මට බැහැ, මට මේක කරන්න බැහැ" කියන එක. නමුත් ලංකාවේ විදුලි බල මණ්ඩලයේ ඉංජිනේරු මහත්වරු කියන්නේ "නැහැ, ඒක අපට කරන්න බැහැ. ඒ නිසා අපට තවමත් ඕනෑ ඩීසල් බලාගාරවලට යන්න; ගල් අඟුරු බලාගාරවලට යන්න" කියන එකයි. නැහැ. මේ තාක්ෂණය වෙනස් විය යුතුයි. ඉංජිනේරුවෙකුට කියන්න බැහැ, "මට බැහැ" කියලා. ඉංජිනේරුවෙක් ක්‍රමවේදය සොයාගන්න ඕනෑ. ඒක තමයි ඉංජිනේරුවෙකුගේ කාර්යභාරය. ඔවුන්ගේ ඇස් පෑදේවා! කියලා මම ප්‍රාර්ථනා කරනවා. අපට ඉන්නේ දක්ෂතම ඉංජිනේරු මහත්වරුයි. ඒ මහත්වරු වටකරගෙන සිටින මාෆියා එකේ කඩතුරාවෙන් එළියට ඇවිල්ලා, ඒ ඉංජිනේරු මහත්වරුන්ගේ දැනුමත් එක්ක ගත්තාම තාක්ෂණයත් එක්ක දියුණු වුණු ලෝකයත් එක්ක ඉදිරියට යන්න අවස්ථාව ලැබෙයි කියන විශ්වාසය අපට තිබෙනවා.

මම මේ දැනුම ගැන කියන්නේ මට තිබෙන අත් දැකීමක් අනුවයි. මම ජපානයේ විශ්වවිද්‍යාලයේ උගන්වන විට, මගේ විශ්වවිද්‍යාලයට එන ලංකාවේ අපේ සිසු දරුවන් තමයි පළමුවෙනියෝ වෙන්නේ. එහෙම නම් අපේ අයට දැනුම

තිබෙනවා; හැකියාව තිබෙනවා. ඒ හැකියාවට අවස්ථාව නැතිකම විතරයි තිබෙන්නේ. ඒ අයට පර්යේෂණ කරන්නට අවස්ථාව ලැබිය යුතුයි. අද අපේ දරුවන්, තාක්ෂණය ඉගෙන ගත් අපේ ශිල්පීන්, අපේ ආචාර්යවරුන්, මහාචාර්යවරුන් අද ලෝකයේ විශ්වවිද්‍යාලවල, ලෝකයේ ආයතනවල ප්‍රමුඛ පෙළේ තැන්වල ඉන්නවා. මම නම් වශයෙන් කියන්නේ නැහැ, එක් කෙනෙකුගේ හෝ නමක් කියන්නට බැරි වුණොත් හොඳ නැති නිසා. ඒ නිසා පර්යේෂණ සම්බන්ධයෙනුත් යම් කාර්ය භාරයක් අපි රජයක් හැටියට කළ යුතුයි.

ඉන්දියාවේ විදේශගත ඉන්දියානුවන් සඳහා වූ වෙනම Ministry එකක් තිබෙනවා - Ministry of Overseas Indian Affairs . ඉන්දියාව ලොකු රටක්. මේ ලොකු රටේ කළ ලොකු වැඩේ පුංචි රටක් හැටියට අපට ලොකු වැඩක් විධියට ගන්නට පුළුවන්. මේ Ministry එක යටතේ ඉන්දියාව, විදේශගත වෙලා ඉන්න ඉන්දියානුවන් හරහා ඒ රටේ තිබෙන පර්යේෂණ ආයතන සමඟ බද්ධ කරලා, ඉන්දියාවට අවශ්‍ය පර්යේෂණ කරලා ඉන්දියාවට අරගෙන එනවා. මෙන්න මේක තමයි ඉන්දියාව කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම අපටත් පුළුවන් ලංකාවේ පර්යේෂකයන්, ලංකාවේ විදේශගත වෙලා ඉන්න ආචාර්ය, මහාචාර්යවරුන් සියලු දෙනාම සම්බන්ධ කර ගෙන, - මේ පර්යේෂණ සභාවත් සමඟ- network එකක් හදා ගෙන කටයුතු කරන්න. "අපේ රටට අවශ්‍ය පර්යේෂණ ඔබලා පිට රට ඉඳගෙන කරන්න. ඔබලා තමන් ඉන්න රටේ ඉඳලා base camp එකක් හදා ගන්න. එහෙම හදාගෙන අපේ ලංකාවට පර්යේෂණ ගේන්න" කියා ඔවුන්ට කියන්න පුළුවන්. මේ දැක්මත් පෙරදැරි කර ගෙන, විශේෂයෙන්ම මම යෝජනා කරනවා, විදේශගත ශ්‍රී ලාංකිකයන් ලංකාවට ගෙනැල්ලා ඒගොල්ලන්ව රතු පලස දාලා පිළිගන්නා ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව මඟින් වාර්ෂිකව සැලසුම් කළ යුතුයි කියලා. අපේ විදේශගත ශ්‍රී ලාංකිකයන් රාශියක් ඉන්නවා. මේ වගකීම දුන්නොත් භාර ගන්න ඒ විදේශගත ශ්‍රී ලාංකිකයන් සැදී පැහැදී ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන් අපි අවධානයට ලක් කළ යුතු දෙයක් තමයි අපේ පර්යේෂණ සඳහා පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම. මේ පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම ගැන කථා කරන විට මට මතක් වෙනවා, අපේ සමහර දේශීය ඖෂධවලට, ආයුර්වේද ඖෂධවලට පේටන්ට් බලපත්‍ර අද ලෝකයේ අනෙක් රටවල් ලබාගෙන තිබෙන බව. උදාහරණයක් ලෙස ජපානය කොතලහිඹුටුවලට පේටන්ට් බලපත්‍රය ලබා ගත්තා. ඇමෙරිකාව 2013වන විට මස්බැද්ද කියන ශාකයට පේටන්ට් බලපත්‍ර සියල්ල ලබා ගත්තා. අද මස්බැද්ද tea එකක්, මස්බැද්ද ශාකයෙන් නිෂ්පාදනය වන කිසිම නිෂ්පාදනයක් අපේ රටෙන් ඇමෙරිකාවට යවන්නට බැහැ. ඇයි? ඒගොල්ලන් අපේ ශාකයක් වන මස්බැද්ද ශාකයට පර්යේෂණ කරලා පේටන්ට් බලපත්‍රය ලබා ගත්තා. එම නිසා අපේ රටේ තිබෙන සම්පත් සහ දැනුම සඳහා පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා යම් ක්‍රමවේදයක් ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව හරහා සකසා ගත හැකි යැයි අපි සිතනවා.

මම කලින් කිව්වා වාගේ අත් දැකීම් ගැන කථා කරනවා නම්, ලෝකයේ පොළොවටම සමතලා වුණු ජාතියක් හැටියට තමයි ජපන් ජාතිය ඉදිරියට ආවේ. මමත් ඒ රටේ ජීවත් වුණු කෙනෙක් හැටියට දැක්කා, ජපන් ජාතිකයන් නැවත නැගිට්ටේ කොහොමද කියලා. ඒ, පර්යේෂණ කරලා, තාක්ෂණ දැනුම ගැන තමන්ගේ තිබෙන උත්සාහය ඉදිරියටම ගෙනිහිල්ලා. උදාහරණයකට ජපානයේ විශ්වවිද්‍යාල ගැන කථා කළොත් දම්වැලක පුරුක් වාගේයි. මහාචාර්යවරයා ඉන්නවා, සහාය මහාචාර්යවරයා ඉන්නවා, ආචාර්ය උපාධිය හදාරන ශිෂ්‍යයා ඉන්නවා, Master's Degree එක හදාරන ශිෂ්‍යයා ඉන්නවා, undergraduatesලා ඉන්නවා. මහාචාර්යවරයා නැතිව ගියොත් ඒ ඒ තලවල අය පහළ අයට උගන්වනවා. ඒ අය දම්වැලක පුරුක් වාගේ තමයි තමන්ගේ දැනුම බෙදාගන්නේ, පර්යේෂණ සඳහා තමන්ගේ දැනුම බෙදා ගන්නේ. මේ පර්යේෂණ සඳහා එක team එකක් හැටියට - collective responsibility එක ඇතිව- පර්යේෂණ කරන සමාජයක් තමයි මේ විශ්වවිද්‍යාලවල තිබෙන්නේ. නමුත් අපේ විශ්වවිද්‍යාලවල ඒක නැහැ.

විශ්වවිද්‍යාල භාර අපේ අමාත්‍යතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා මට වඩා හොඳට මේ ගැන දන්නවා. අපේ විශ්වවිද්‍යාලවල ඒ විධියට පර්යේෂණ කරන්නෙත් නැහැ. කවුරුන් හෝ පර්යේෂණයක් කරනවා නම් ඒකට කොක්ක ගහලා ඒක අයින් කරලා දාන්නයි අපේ රටේ උත්සාහ කරන්නේ. එහෙම නොවෙයි, අපි මේ තත්ත්වය හැදිය යුතුයි. ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව වාගේම විශ්වවිද්‍යාල තුළත් පර්යේෂණ සභාවක් හැදිය යුතුයි. එහෙම නැති වුණොත් තමන්ගේ පර්යේෂණයේ ප්‍රතිඵල අන්‍යෝන්‍ය අවබෝධයෙන් අනෙක් විශ්වවිද්‍යාලවල ආචාර්යවරයෙක්, මහාචාර්යවරයෙක් පාවිච්චි කරන්නේ කොහොමද, හුවමාරු කර ගන්නේ කොහොමද? පර්යේෂණ හුවමාරු කර ගැනීමේ ප්‍රතිපත්තිය අපේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කළ යුතුයි. එහෙම නැති වුණොත් පර්යේෂණ පැත්තෙන් අපේ විශ්වවිද්‍යාල එන්න එන්නම පහළට යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශ්වවිද්‍යාල ගැන කථා කරන විට ලෝකයේ විශ්වවිද්‍යාලවල ranking system එකක් තිබෙනවා; ranking හදන system එකක් තිබෙනවා. ලෝකයේ විශ්වවිද්‍යාල ranking හදන්නේ පර්යේෂණ පත්‍රිකා සහ කරපු ප්‍රතිඵල මතයි. මේ ප්‍රතිඵල දිහා බැලුවාම මේ වර්ගීකරණයේ පළමුවෙනි 2,000 අතරේවත් ලංකාවේ එකම විශ්වවිද්‍යාලයක්වත් නැහැ. ඒ නිසා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ජාතික පර්යේෂණ සභාවත් එක්ක විශ්වවිද්‍යාල අනුගත කරලා, ඒවා ලෝකයේ ප්‍රධාන පෙළේ පර්යේෂණ කරන විශ්වවිද්‍යාල බවට පත් කිරීමේ වගකීම අපට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝකයේ ප්‍රධාන පෙළේ විශ්වවිද්‍යාල ගැන කථා කරන කොට research ranking එකෙන් පළමුවැනි තැන ඉන්නේ Chinese Academy of Sciences. දෙවැනි තැන ඉන්නේ හාවර්ඩ් විශ්වවිද්‍යාලය. තුන්වැනි තැන ඉන්නේ French National Centre for Scientific Research. හතරවැනි තැන ඉන්නේ ජර්මනියේ Max Planck Society එක. මේ ආදී ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන එක්ක අනුගත වෙලා, බද්ධ වෙලා කොහොමද පර්යේෂණ කරන්නේ කියන සංකල්පය අපි ලංකාවට ලබා ගත යුතුයි.

මා හිතනවා, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව හරහා අපට ඒ සියලු දේවල් ලබා ගත හැකියි කියලා. ඒ හැකියාව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉතා කාලෝචිත, වටිනා, වැදගත් පනත් කෙටුම්පතක් ගැන සාකච්ඡා කරන මේ වෙලාවේ ඒ සඳහා මගේත් සහයෝගය ලබා දෙමින් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.56]

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම පිළිබඳව.

අප කාගේත් ගෞරවයට ලක් වුණු ගරු සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමා ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පිහිටුවීම

[ගරු සිසිර ජයකොඩි මහතා]

සම්බන්ධයෙන් ප්‍රකාශ කළා, මේ අරමුණු තව දුරටත් පුළුල් කරලා, ව්‍යාප්ත මට්ටමෙන් අර්ථ නිරූපණය කරන්න මේ පනත් කෙටුම්පත තුළින් අවස්ථාව සැලසෙනවා කියලා. එය ඉතා සතුටු විය හැකි කාරණයක්.

අපේ රටේ විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රය පිළිබඳව ඉතාම අඩු උනන්දුවක් තමයි දක්වන්නේ. ඒ ගැන ඉතාම පසුගාමී ආකල්පයක් තමයි දක්වන්නේ. ඒ සඳහා යොදවන ප්‍රතිපාදන ප්‍රමාණය දවසින් දවස අවම වෙලායි තිබෙන්නේ. ඒ නිසා මේ ක්ෂේත්‍රයේ-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු ශ්‍රීයානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා නව විද්‍යා තාක්ෂණ පර්යේෂණ පිළිබඳව අපේ රට වැඩි උනන්දුවක් දැක්විය යුතු යුගය දැන් එළැඹ තිබෙනවා.

විශේෂයෙන්ම අපේ රටේ දැනුම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ඥානය, ශාස්ත්‍රීය ඥානය මතයි පදනම් වෙන්නේ. ශුද්ධ විද්‍යාත්මක කරුණු තමයි අපේ දරුවන් අධ්‍යයනය කරන්නේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙන්න පුළුවන්, අනෙකුත් ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබන සියලුදෙනා වෙන්න පුළුවන්, ඒ අය ශාස්ත්‍රීය කරුණුවලට කොටු වෙලා තිබෙනවා. ඊට වඩා වෙනස් විධියට, ව්‍යවහාර විද්‍යාත්මක ප්‍රායෝගික උපයෝගිතාවක්, භාවිතයක් සහිත ඥානයේ සංකලනයක් ලෝකය අපේක්ෂා කරනවා.

1642දී යුරෝපයේ මධ්‍යතන යුගයත් එක්කයි ශාස්ත්‍රීය සහ ශිල්පීය සම්ප්‍රදායයන් ඵලදායී ලෙස සංකලනය කිරීමේ වැඩ පිළිවෙළ ආරම්භ වෙන්නේ. නමුත්, අපි එක පැත්තකින් පසුගාමී වෙනවා. එසේ පසුගාමී වෙන්නේ ඇයි? බටහිර තාක්ෂණය පිළිබඳවම අපේ පර්යේෂණ සීමා කරනවාද කියන කාරණය තමයි පසුගාමී වීමට හේතුව. ඒ කාරණයයි අපි විවාදයට ලක් කළ යුත්තේ. හුදෙක්, බටහිර තාක්ෂණික ඥානයට, දැනුමට පමණක් අපේ පර්යේෂණ සීමා කළ යුතුද? බටහිර, ඒ තාක්ෂණයේ උපරිමයකට යම් පමණකින් ළඟා වෙලා තිබෙනවා. නමුත් අපි දන්නවා, අවුරුදු 500ක, 600ක බටහිර තාක්ෂණික ඉතිහාසයට එහා ගිය තාක්ෂණික ඉතිහාසයක් අපට තිබෙන බව. අපට ආවේණික සංස්කෘතියක් තිබෙනවා. අපට ආවේණික උරුමයක් තිබෙනවා. ඒ නිසා, අලුතින් ගොඩ නැඟෙන මේ ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ අරමුණ ව්‍යාප්ත විය යුත්තේ අපේ උරුමයන් බද්ධ කරගෙනයි කියන එක තමයි අපේ අදහස.

ඊළඟට, තවත් කාරණයක් කියන්න තිබෙනවා. දැනටත් මේ අදහස ඉදිරිපත් වෙලා තිබෙනවා. දේශීය ආයුර්වේද ක්‍රමය, අපේ සාම්ප්‍රදායික වෙදකම පිළිබඳව අපේ උනන්දුව නැවත වතාවක් යොමු කළ යුතු කාල වකවානුව ඇවිල්ලා තිබෙනවා. පර්යේෂණ වැඩ සටහන් හරහා ලෝකයට දායාද කරන්න පුළුවන් උරුමයක් තමයි මේ දේශීය ආයුර්වේද ක්‍රමයේ තිබෙන්නේ. ඒ වුණත් ඒ ගැන මේ වෙලාවේ මා වැඩිදුර මතක් කරන්නේ නැහැ.

ඒ වාගේම අපේ රටට ආවේණික ශාක 910කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ගහ කොළ, සතා සීපාවා ඇතුළුව මේ රටේ උරුමයත් එක්ක බැඳුණු ස්වාභාවික සම්පත් අතිවිශාල ප්‍රමාණයක් අපට තිබෙනවා. නමුත්, මේවා අද අභාවයට යමින් තිබෙනවා. අද මේවා අපේ රටින් ක්‍රම ක්‍රමයෙන් ඉවත් වීගෙන යනවා. ඒ නිසා මේවා රැක ගැනීම පිළිබඳව අලුත් මැදිහත්වීමක් රටක් වශයෙන් අප සිදු කළ යුතු වනවා. ඒ වාගේම මේවායේ ඇති ඖෂධීය ගුණය, ගුණාත්මක බව පිළිබඳව මේ රටට සහ ජාත්‍යන්තරයට කරුණු ඉදිරිපත් කිරීමේ මධ්‍යස්ථානයක් බවට මේ රට පරිවර්තනය කිරීම අද අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අපේ වාරි තාක්ෂණය ගැන කථා කළොත් අපි දන්නවා, අවුරුදු දහසකට වැඩි ඉතිහාසයකින් යුතු වාරි තාක්ෂණයක් අපට තිබුණු බව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තිසා වැවට ජලය ගෙනයන යෝධ ඇළ සැතපුම් හතරක් ගලන්නේ අහලක බැවුමකින්. ඒ වාගේ විශ්මිත නිර්මාණ කරපු ජාතියක් අපි. ඒ නිසා බටහිර තාක්ෂණික පර්යේෂණවලට සීමා නොවී අපේ ඒ වාරි තාක්ෂණයේ අනුභව රටක් වශයෙන් ලබා ගත යුතු කාල පරිච්ඡේදයක් උදාවෙලා තිබෙනවා. රුවන්මැලිසෑය, ජේතවනාරාමය අපේ රටේ ජාතික උරුමයන්. ඒවා එක ආගමකට, එක ජාතියකට අයිති, සීමාවුණු දේවල් නොවෙයි. ඒවා මේ රටේ ජාතික වස්තු. අවුකන මහා පිළිමවහන්සේ හදන්න අවුරුදු 30ක කාල පරිච්ඡේදයක් ගත කළා. ගල් වඩුවෙක් තමන්ගේ ජීවිත කාලය තුළ පුදුමාකාර කැපවීමකින් යුතුව ඒ නිර්මාණය කළා. එහිදී ඔහු සතුව තිබූ සංයමය, ඔහු සතුව තිබූ මානසික ඒකාග්‍රතාව මෙන්ම අතීතයේ අපේ ඒ ශිල්පීන් සතුව තිබුණු ඉවසීම සහ නිර්මාණ ශක්තිය පර්යේෂණාත්මකව අලුත් පරපුරට ලබාදීමේ වැඩ කටයුත්තක නියැලීමේ අවශ්‍යතාව අද තිබෙනවා.

විශේෂයෙන්ම කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා ජාන ඉංජිනේරු තාක්ෂණය අද ලෝකය තුළ දවසින් දවස ඉදිරියට යනවා. ඒවායේ අනිටු විපාක තිබෙනවා වාගේම, හොඳ විපාකත් තිබෙනවා. වැඩි අස්වැන්නක් ලැබීම, රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව, ස්වාභාවික උවදුරුවලින් හානි නොවී පැවතීමේ හැකියාව පවතිනවා. අපේ කෘෂි කාර්මික ක්ෂේත්‍රය තුළ තව දුරටත් නව පර්යේෂණාත්මක මට්ටම වර්ධනය කිරීමෙන් අපේ කෘෂි කාර්මික ක්ෂේත්‍රය අපනයන ප්‍රමුඛ ක්ෂේත්‍රයක් බවට පත් කරගෙන, අපේ රට සංවර්ධන මාවතකට යොමු කරගන්න පුළුවන්කම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපේ රටේ ශ්‍රේෂ්ඨ විද්වතුන් සිටියා. ආචාර්ය කුලසිංහ මැතිතුමා තමයි මේ රටේ කොන්ක්‍රීට් විද්‍යාඥයා. අපි දන්නවා, ඔහු කොන්ක්‍රීට් බෝට්ටු හැදුවා. නමුත් අපේ රටේ ඒවා දියුණු කිරීම පිළිබඳවත්, එතුමාගේ ඒ කටයුතු පිළිබඳවත් අවධානය යොමු කළේ නැහැ. හැබැයි, මැලේසියාවට ඒ තාක්ෂණය වික්කා; මැලේසියාව ඒ තාක්ෂණය උපයෝගි කර ගත්තා. ඒ වාගේම කුබෝටා අත්ට්‍රැක්ටරය රේ විජේවර්ධන මහතා දැක්ක හීනයක්. ඔහු ඒක නිර්මාණය කළා. අද රේ විජේවර්ධන මහතාගේ තාක්ෂණයේ අයිතිය යුරෝපය සතු වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි මහාචාර්ය සේනක බිබිලේ මහතාගේ ඖෂධ ප්‍රතිපත්තියත්. මේ රටේ දේශීය ඖෂධ නිෂ්පාදනය පිළිබඳ මහ වියත් දැක්මකින් යුතුව එතුමා කටයුතු

කළා. ඒ පර්යේෂණ පිළිබඳව අද වෙන් වෙන්ව හුදෙකලා ක්‍රියාමාර්ග ගන්නවා මිසක්, ඒවා එක්කාසු කරගත් වැඩ පිළිවෙළක් නැහැ. ඒ නිසා ඒ සියලු දේ එකතු කර ගන්නා ආයතනයක් බවට මේ ජාතික පර්යේෂණ සභාව පත්විය යුතුයි කියා මා හිතනවා.

ගරු ආශු මාරසිංහ මැතිතුමා කිව්වා වාගේ අපේ රටේ සුවිශේෂ බුද්ධිමතුන් ඉන්නවා. ජාත්‍යන්තර වශයෙන් කීර්තියට පත් විශේෂඥවරු ඉන්නවා. ලෝකයට අලුත් දේ නිපදවපු, දායාද කරපු අය ඉන්නවා. මහාචාර්ය සරත් ගුණපාල වැනි උදවිය ජාත්‍යන්තර වශයෙන් පිළිගත් අය. අපේ රටට ගෞරවය ලබාදුන් ඒ විද්‍යාඥයන්ගේ සේවය වෙනුවෙන් ඔවුන්ට නිසි ඇගයීමක් ලබාදීම සඳහා මේ සභාව පෙරමුණ ගත යුතුයි කියන ඉල්ලීම ඉතා ඕනෑකමින් කරනවා.

ලෝකය ශීඝ්‍රයෙන් දියුණු වන බව අපි දන්නවා. ඉදිරි සියවස නැනෝ තාක්ෂණය මත ගමන් කරන සියවසක්. පසු ගිය කාල පරිච්ඡේදයේ හෝමාගම, පිටිපන අක්කර 58ක භූමි භාගයක නැනෝ තාක්ෂණාගාරයක් ඉදිකළා. තිස්ස විතාරණ මැතිතුමා පුළුල් සටනක් කරලා තමයි එම පර්යේෂණායතනය ආරම්භ කළේ. නමුත් අද හෝමාගම, පිටිපන තාක්ෂණ විද්‍යායතනය අභාවයට යමින් පවතිනවා. ඒ නිසා නිසි ක්‍රමවේදයකින් ඒවා නැවත නඟා සිටුවීමේ අවශ්‍යතාවක් දැන් පවතිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විවිධ ස්වාභාවික උවදුරුවලට අපේ රට දිනෙන් දින ගොදුරු වන බව අපි දන්නවා. ඒවා පිළිබඳව නිවැරදි විද්‍යාත්මක හා තාක්ෂණ පර්යේෂණ වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවාද කියන අභියෝගයට අපි රටක් වශයෙන් අද ලක්වෙලා තිබෙනවා. මීට සති කිහිපයකට කලින් සාලාව කඳවුරේ සිදු වුණු මහා විනාශය ගැන අපි දන්නවා. ඒ සිදුවීම නිසා ඇති වුණු ආර්ථික - මූල්‍යමය - හා ජීවිත අලාභ අපි ගණනය කරනවා. හැබැයි, එහිදී රසායනික වශයෙන් අපේ රටේ පරිසරයට ඇතිවෙලා තිබෙන විපත පිළිබඳව නිශ්චිත ඇගැයීමක් අද වන තෙක් සිද්ධ වෙන්නේ නැහැ. මේ වෙඩි බෙහෙත්, උණ්ඩ, රසායනික ද්‍රව්‍ය මේ මහ පොළොවටයි එකතු වෙන්නේ. ඒවායින් ඇති වන හානිය කවරක්ද? ඒ පිළිබඳ ඇගැයීමක් සිදු කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපේ රටේ රණවිරුවන් ගැනත් කියන්න ඕනෑ. පසු ගිය කාලයේ පැවැති යුද්ධය කුරිරුයි; අමිහිරියි; කටුකයි. අපි යුද්ධය ප්‍රතික්ෂේප කරනවා.

හැබැයි, ක්‍රියාන්විත ක්‍රියාවලිය ගැන අපි දන්නවා. ඒ ක්‍රියාවලිය ලෝකයේ සන්නද්ධ ගරිල්ලා හමුදාවකට මුහුණදීම සඳහා අවම ජීවිත හානි යටතේ සිදු කළ සුවිශේෂී ගවේෂණයක්. ඒක අපේ රටේ සුවිශේෂී ව්‍යාපෘතියක්. මේ දැනුම ලෝකයට බෙදා දීම අවශ්‍ය වනවා. මේ පිළිබඳව පර්යේෂණයක් සිදු කරනවාද කියන කාරණය ගැන මම දන්නේ නැහැ. හැබැයි, අපි දන්නවා, ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර යුරෝපය විසින් සිදු කරන ආක්‍රමණ නිසා ඉරාකයේ මේ වන විටත් ලක්ෂ 15ක් පමණ අහිංසක ජනතාව මිය ගොස් සිටින බව. දරුවෝ ඉගෙන ගන්නා පාසල් 58ක් ඇමෙරිකානු බෝම්බ ප්‍රහාරවලින් සුන්නද්දුලි වනවා. නමුත් අපි අවම හානියක් යටතේ මේ ක්‍රියාන්විත කාර්ය සිදු කරලා තිබෙනවා. මේ පිළිබඳව කවදාකවත් පර්යේෂණයක් සිදු වෙනවාද? මේවා අපට ආවේණික ජයග්‍රහණ. මේ ජයග්‍රහණ පමණක් නොවෙයි, අපට විනාශයන් ඇති වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය කාලයේ ගංවතුර උවදුරු ඇති වුණා. මේ පිළිබඳව ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් වෙන්න පුළුවන්; වෙනත් ආයතනයකින් වෙන්න පුළුවන්, ස්වාධීන පරීක්ෂණ සිදු කෙරෙන්න පුළුවන්. අනෙක් පැත්තෙන් අපට නිරන්තරයෙන්ම නාය යෑම් විපත්ති පිළිබඳව කනට ඇහෙනවා. විපතට පත් වූ අයට සහන සැපයීමේ ක්‍රියාවලියන් සිදු කිරීම පමණක් නොවෙයි, විකල්පයක් වශයෙන් වෙනත් ස්ථානයක පදිංචි කිරීම වෙනුවට මේ උවදුරු වළක්වා ගැනීම සඳහා; මේවා අවම කරලීම සඳහා වූ විකල්ප ක්‍රියා මාර්ගයකට රටක් වශයෙන් ගමන් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ සඳහා අපි එකට එක්ව කටයුතු කරමුයි කියන ආයාචනය කරමින්, ගරු ඇමතිතුමාට මේ කටයුත්ත ඉතා ඕනෑ කමින් සිදු කරන්න අවශ්‍ය ශක්තිය ලැබෙවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.07]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නව සංශෝධනයක් යටතේ ඉදිරිපත් කර තිබෙන ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳවයි අද දින විවාද කෙරෙන්නේ. විද්‍යා, තාක්ෂණ, හා පර්යේෂණ අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා දෙවන වර කියැවීම සඳහා මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කරමින් ඒ පිළිබඳව ගරු සභාවේ විවාදයට බඳුන් කර තිබෙනවා. මෙම පනත් කෙටුම්පත හරහා අනාගතයේ මේ රට තුළ විද්‍යා හා තාක්ෂණික සමාජයක් නිර්මාණය කිරීම සඳහා එතුමා ක්‍රියා කර තිබෙනවා. ඒ පිළිබඳව එතුමාට අපේ ගෞරවය පුද කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා අපි පාසලේ විවාද කණ්ඩායම් නියෝජනය කරද්දී "මේ රට කෘෂිකාර්මික ආර්ථිකයෙන් දියුණු කළ හැකිද" කියන මාතෘකාව යටතේ කථා කළා මට මතකයි. එක කණ්ඩායමක් එකක් කියනකොට අනෙක් කණ්ඩායම කියනවා,"නැහැ, විද්‍යාත්මක සංකල්පයක් මත මේ රට ගොඩනැඟිය හැකි ආර්ථිකයක් හදන්න පුළුවන් කියලා. ඒ 1970 දශකයේ වාගේ කාලයේයි. අද දශක හතරහමාරක පමණ කාලයක් -අවුරුදු පනහකට පමණ ආසන්න කාලයක්- ගතවෙලත් විද්‍යා හා තාක්ෂණික දියුණුව තුළින්, පර්යේෂණ තුළින්, නව සංකල්ප තුළින් මේ රටේ ආර්ථිකය ගොඩනඟන්නට තවමත් අපට බැරි වෙලා තිබෙනවා. කෘෂිකාර්මික ආර්ථිකයක් පිළිබඳව අපි මොන විධියේ කතාන්දර කිව්වත්, විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කය ගැන මම කථා කරනවා නම්, හොඳින් වර්ෂාව ලැබෙන, හොඳට හිරු එළිය තිබෙන, හොඳ පසක් තිබෙන ප්‍රදේශයක්. අපේ පරිභෝජන රටාව ගත්තාම එහි වී ගොවිතැන සඳහා සියයට 36ක දායකත්වයක් පමණයි ලබා දෙන්නේ. සියයට 64ක්ම ලබා ගන්නේ අනුරාධපුරයෙන්, එහෙම නැත්නම් පොළොන්නරුවෙන්, එහෙමත් නැත්නම් විදේශ රටවලින්. අද අපට මේ පිළිබඳව ලොකු කතිකාවතකට යන්න, මේ පිළිබඳව ලොකු පර්යේෂණයකට යන්න සිදු වෙලා තිබෙනවා. බොහෝ දෙනෙක් කියනවා අපේ ශ්‍රී ලංකාව සම්පත්වලින් ඉතාමත් අඩුයි, අපි දුර්වලයි කියලා.

මේ රටේ ලෝක පූජිත වුණු විද්‍යාඥයන් ගැන කථා කරනවා නම්, විදේශයක ජන්ම ලාභය ලැබුවත් මේ රටේ ඉතිහාසය වාගේම අනාගතය පිළිබඳව යම් දෙයක් කියන්නට පුළුවන්, විශේෂයෙන්ම තාරකා ශාස්ත්‍රය පිළිබඳව අවබෝධයක් තිබුණු ආතර් සී ක්ලාක් වැනි හොඳ විද්වතුන් මේ රටේ ජීවත් වුණා. එදා ආතර් සී. ක්ලාක් මැතිතුමා කියපු බොහෝ දේවල් අද සක්සුදක් සේ ඉතා පැහැදිලි වෙලා තිබෙනවා, මේ රටේ ආර්ථිකය ගොඩ නඟන්නට ඔවුන් පියවරක් ගත්තාද නැද්ද කියන එක පිළිබඳව. ගාල්ලේ ශාන්ත ඇලෝසියස් විද්‍යාලයේ ඉගෙන ගත් මහාචාර්ය සිරිල් පොන්නම්පෙරුම මැතිතුමා එදා ඇමෙරිකාවට ගිහිල්ලා ගුවන තරණය කරලා හදේ තිබුණු පස් පරීක්ෂා කළා. එවැනි ඉතාමත් දක්ෂ නිර්මාණයන් කළ හැකි විද්‍යාඥයන් අපේ ලංකාවේ ජන්ම ලාභය ලබා තිබෙනවා.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ඒ විතරක් නොවෙයි, විදුලිය නිෂ්පාදනය පිළිබඳ හොඳ අවබෝධයක් තිබුණු විමලසුරේන්ද්‍ර වාගේ අය මේ රටේ හිටියා. ඒ වාගේ දක්ෂතා තිබුණු බොහෝ දෙනෙක් සිටියා. ඒ අය මේ රට ගොඩ නඟන්න තිබුණු සම්පත්. නමුත්, ඒ සම්පත්වලින් අපි කීයක් ප්‍රයෝජනයට ගත්තාද කියන එක පිළිබඳව අපි සැලකිලිමත් වන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපේ රටේ මොන අමාත්‍යාංශවල පර්යේෂණ තත්ත්වයන් ක්‍රියාත්මක වනවාද කියලා මම දන්නේ නැහැ. අපි නොයෙක් දේවල් කියනවා, යම් යම් නිර්මාණයන් කරනවා, අලුත් සම්ප්‍රදායන් ඇති කරනවා, අලුත් අලුත් දේවල් කරන්න ඕනෑ කියලා කථා කරනවා, ඒවා පොත් පත්වල ලියනවා, අන්තිමට ඒවා එතැනටම සීමා වනවා විතරයි. මේ රටේ කිසිම අමාත්‍යාංශයක් ඒ පර්යේෂණ සඳහා එක රුපියලක මුදලක් වැය කරන්නේ නැහැ. ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු අමාත්‍යතුමනි, මේ රටේ විශ්වවිද්‍යාලවල ඉතාමත් දක්ෂ දරුවන් අධ්‍යාපනය ලබනවා. ඉතාම හොඳ හැකියාවන් තිබෙන, අනාගතයේ ඉදිරියට යන්න පුළුවන් ශක්තියක් තිබෙන, ජාත්‍යන්තරයේ ලංකාව රජ කරවන්න පුළුවන් අය විශ්වවිද්‍යාලවල ඉන්නවා. නමුත්, ඒ දරුවන් වෙනුවෙන් අපේ මොන අමාත්‍යාංශයේද අඩු තරමින් ඒ පර්යේෂණවත් කෙරෙන්නේ? අද අපේ රට ඉංජිනේරු විද්‍යාව, වෛද්‍ය විද්‍යාව ආදින් හොඳ දැනුමක් ලෝකයටම දෙන්න පුළුවන් ඉතාම හොඳ සම්පත් තිබෙන රටක්. නමුත්, අපි මේවායින් ප්‍රයෝජන ගන්නවාද?

බලන්න, අපේ කෘෂි ආර්ථිකය. මට පෙර කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, මේ රට වසර 2500ක බෞද්ධ ශිෂ්ටාචාරයක් එක්ක හොඳ ආර්ථිකයක් තිබුණු රටක් බව. එදා ඌව පළාතේ වෙල් ලක්ෂයක් නිර්මාණය කරලා ඒ තුළින් වැවිලි ආර්ථිකයට, කෘෂි ආර්ථිකයට ශක්තිය දුන් බව අපි දන්නවා. ඒ විතරක් නොවෙයි, අනුරාධපුරයේ තිබුණු වාරි මාර්ග ක්‍රමවේද බලන්න. පරාක්‍රම සමුද්‍රය වාගේම අනුරාධපුර, පොළොන්නරුවේ අනෙකුත් වැව් අමුණු බලන්න. එදා කාශ්‍යප රජතුමා මේ රටේ කළ සීගිරිය වැනි නිර්මාණ ගැන අපි දන්නවා.

මහසෙන් රජතුමා ජල කළමනාකරණය කළේ කොයි ආකාරයටද කියලා බලන්න. නමුත්, අද ඉතාමත් කනගාටුයි. අද තරම් පර්යේෂණ කරන්න පුළුවන් දේවල් එදා තිබුණේ නැහැ. නමුත්, අපේ ආදි සිංහලයන් එදා විද්වතුන්, බුද්ධිමතුන් හැටියට විශාල වෙනසක් ඇති කළා. එදා අහස උසට දිව යන රුවන්වැලි මහා සෑය වාගේ දාගැබ් නිර්මාණය කළා. අභ්‍යන්තර මුහුදු වැනි පරාක්‍රම සමුද්‍රය වාගේ නිර්මාණයන් කළා.

ඒ විතරක් නොවෙයි, කලාත්මක අංශයෙන් බැලුවත් සීගිරිය වාගේ නිර්මාණ, නිශ්ශංක ලතා මණ්ඩපය වාගේ නිර්මාණවල ඉතාම ඉහළ කැටයම් කලාවක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අවුකන බුදු පිළිමය වාගේ ඉතාමත් හොඳ නිර්මාණ කර තිබෙනවා. නමුත්, අපි වර්තමානයේ එවැනි හැකියාවන්ගෙන් ප්‍රයෝජනයට ගෙන තිබෙන්නේ කීයෙන් කීයක්ද කියන එක පිළිබඳ අපි නැවත සිතා බලන්නට ඕනෑ. වැඩිය ඕනෑ නැහැ, අද පාසල් දරුවන්ගේ අධ්‍යාපන ප්‍රදර්ශනයක් බලන්න ගියාම, සමහර වෙලාවට අපට හිතා ගන්නවත් බැරි විධියේ නිර්මාණ කර තිබෙනවා දකින්නට ලැබෙනවා. පුවත් පත්වලින් අපි දැක්කා, ජලයෙන් දුවන මෝටර් සයිකලයක් පවා නිෂ්පාදනය කරලා තිබුණා. දරුවෝ රූපවාහිනිය බලලා; internet එක බලලා, ලෝකය දැකලා, එයින් යම් අධ්‍යාපනයක් ලබා ගෙන යම් යම් නිර්මාණ කරනවා. අපි කී දෙනෙක් ඒ නිර්මාණ අගය කරලා, ඒ සඳහා උදව් කරනවාද? රජයට බැරි නම් ඒ සඳහා පෞද්ගලික අංශයේ හෝ උදව් උපකාර ලබා ගෙන ඒ දරුවන්ගේ දක්ෂතා ඉස්සරහට ගෙන යන්න කටයුතු කරනවාද? ඒ නිසා ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව නමට පමණක් තිබෙන, බෝඩ් ලැල්ලට පමණක් සීමා වී තිබෙන ආයතනයක් නොවිය යුතුයි කියලා මම කියනවා.

ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය අද ස්ථාපිත කර තිබෙනවා. අවදානමක්, ආපදාවක් ඇති වුණු අවස්ථාවකදි එවැනි ආයතන වඩාත් වැදගත් වනවා. සුනාමිය සිදු වූ වෙලාවේදී, ගංවතුර ආපදා, නාය යාම් සිදු වුණු වෙලාවන්වලදි එවැනි ආයතන අවශ්‍යයි. අද ගාල්ල දිස්ත්‍රික්කයේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ කාර්යාලයක් තිබෙනවා. අඩු ගණනේ ඒ කාර්යාලයට වාහනයක්වත් නැහැ. ඉන්නේ නිලධාරි එක්කෙනයි දෙදෙනයි. සිය ගණන් ගෙවල් දොරවල් බලන්න ගම්දනව්වලට යන්න ඒ අයට අවශ්‍ය පහසුකම් නැහැ. ඒ වාගේ ආයතන අපට වැඩක් නැහැ. ඒ නිසා අපි පැහැදිලිව කියන්නට ඕනෑ, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ස්ථාපිත කරනවා නම් ඒකට අවශ්‍ය බලය, ශක්තිය, ප්‍රතිපාදන හා කාර්ය මණ්ඩල අවශ්‍යයි. ඒකට අවශ්‍ය වෙනත් ආධාර උපකාර විදේශ රටවල්වලින් හෝ දේශීය වශයෙන් නොයෙක් පෞද්ගලික ආයතනවලින් ලබා ගන්නා ක්‍රමවේද අවශ්‍යයි. එහෙම නැතිව මේ ආයතන පිහිටුවුවාට වැඩක් නැහැ. අද පළාත් සභාව 'සුදු අලියෙක්' කියලා සමහර තැන්වලදී ප්‍රකාශ කරන්නේ ඇයි? මොකද, සභාපතිවරයායි, අධ්‍යක්ෂ ජනරාල්වරයායි, ලිපිකරුවායි පමණක් සිටින සමහර ආයතන තිබෙනවා. ඒ ආයතනවලට වාහන සහ අවශ්‍ය අනෙකුත් පහසුකම් දීලා තිබෙනවා.

දැන් පළාත් සභාවල තිබෙනවා, "කෘෂි කාර්මික සංවර්ධන අධිකාරිය" කියලා ආයතනයක්. මේ ආයතනයෙන් කෙරෙන්නේ මොකක්ද? කෙරෙන පර්යේෂණය මොකක්ද? මේ ආයතනයට තිබෙන සම්පත් මොනවාද? මේ ආයතනයට ජාත්‍යන්තර වශයෙන් ලැබෙන වෙනත් ආධාර මොනවාද?

සමහර තැන්වල තිබෙනවා, "කාර්මික සංවර්ධන අධිකාරිය" කියලා ආයතනයක්. ඒ ආයතනයේ ඉන්නේ සභාපතිතුමායි, තවත් නිලධාරියෙකුයි පමණයි. ඔවුන් වැටුප ගන්නවා; නිකම් ඉන්නවා. කිසිම පර්යේෂණයකවත්, ආර්ථිකයට වැදගත් වන කිසිම කාර්මික සංවර්ධන කටයුත්තකවත් ඔවුන් යෙදෙන්නේ නැහැ. මේ ආයතන පිහිටුවනවා වාගේම, මේ ආයතනය ඉස්සරහට ඇදගෙන යන්න, ඒවා ඉස්සරහට ක්‍රියාත්මක කර ගෙන යන්න පුළුවන් යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ වගකීම රජයක් හැටියට අපි භාර ගන්න ඕනෑ. මේ ආයතනය හිටපු ජනාධිපතිතුමා 2007 වර්ෂයේ ආරම්භ කළේ. එතුමා කිව්වේ 2017 වර්ෂය වනකොට මේ ආයතනය මුළු රටම වෙළා ගත් මහා ජාලයකින් සමන්විත වූ ආයතනයක් බවට පත් කරනවා කියලායි. නමුත්, අද වනකොට - අවුරුදු 10ක් තුළ- මේ ආයතනයේ මොනවාද තිබෙන්නේ? පසු ගිය කාලයේ අපි මේ ආයතනයේ නමක්වත් දැනගෙන හිටියේ නැහැ. එහෙම ආයතනයක් තිබුණාද කියලාවත් අපි දන්නේ නැහැ. පනත ගෙනැල්ලා සම්මත කරලා තිබෙනවා. කොහේද ඒ ආයතනය ක්‍රියාත්මක කළේ? මොනවාද ඒ ආයතනයෙන් කළේ? පර්යේෂණ කටයුතුවලදී ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පිළිබඳව කවදාවත් අපි දන්නේ නැහැ. සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා නව රජය යටතේ ඉතාමත් වැදගත් අවස්ථාවකයි මේ කටයුත්තට අත තියලා තිබෙන්නේ. ඒ නිසා මේ සභාව ක්‍රියාත්මක කර කඩිනමින් පිවිසෙන්න පුළුවන් හොඳ සම්පත් තිබෙන ආයතනයක් බවට මෙය පත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාසලේ අධ්‍යාපන ප්‍රදර්ශනයකදී දක්ෂතා පෙන්වන දරුවාට අත දෙන්න වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. ඒකට හොඳම ආයතනය තමයි, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව. අද හැම research එකකටම ගන්නේ විශ්වවිද්‍යාල දරුවෝ කියලා අපි දන්නවා. රජය යම් යම්

කටයුතු කරන කොට නොයෙක් සමීක්ෂණ කරනවා. ඒ සමීක්ෂණ කරන කොට ඒ අදාළ දත්ත ගන්නත් මේ දරුවෝ උපයෝගී කර ගන්නවා. අඩු ගණනේ මේ අයට මුදලක් දෙන්න අද කෙනෙක් නැහැ. නමුත්, අලුත් නිර්මාණ කරන; අලුත් නිෂ්පාදන කරන දරුවන් පිළිබඳව ඉතාමත්ම හොඳ වැඩපිළිවෙළක් යොදන්න අපට පුළුවන්කමක් තිබෙන්න ඕනෑ. අඩු ගණනේ ඒ සඳහා රජයෙන් ප්‍රතිපාදනයක් දෙන්න ඕනෑ. මෙන්න මේ research එක කරන්න; මේ ව්‍යාපාරය පිළිබඳව අධ්‍යයනයක් කරන්න; මේකේ අලුත් වෙනස්කම් ඇති කරන්න කියලා රජයෙන් ප්‍රතිපාදන ලබා දෙන්න ඕනෑ. යම් දෙයක් ක්‍රියාත්මක වනවා නම්, ඒකේ අඩු පාඩුකම් හඳුන්න මොකක්ද කරන්න ඕනෑ කියන එක අප දන්නවා.

මේ සඳහා හොඳම උදාහරණය තමයි ආසනික් ප්‍රශ්නය. පිට රටින් ගෙන්වූ පොහොරවල ආසනික් තිබුණා කියලා අද කවුරුත් කථා කරනවා. මේ පොහොරවල ආසනික් තිබෙනවාය කියලා දැනගන්නේ ඊයේ-පෙරේදා. අද වනකොට වකුගඩු අමාරු හැදිලා දහස් ගණන් මිනිස්සු මැරෙනවා. වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර කරන්න අද රුපියල් කෝටි ගණන් මේ රටේ ජාතික ආදායමෙන් වෙන් කරනවා. අද කියනවා, ආසනික් නිසා මේ රටට වුණු බෙදවාචකය බලන්න කියලා. ඇයි, පර්යේෂකයෝ හිටියේ නැද්ද? මේවා මේ රටට ගේන්න කලින් නොයෙක් තත්ත්ව පරීක්ෂණ කරලා; පර්යේෂණ කරලා අවසන් වෙලායි මෙහාට එවන්නේ. එහෙම නම්, අපේ පර්යේෂණ සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් තිබෙනවා. පසු ගිය කාලය තුළ මේ රට වෙළා ගත් දැවැන්ත ප්‍රශ්නයක් තිබෙනවා.

වැඩිය ඕනෑ නැහැ. අලුත් නිෂ්පාදන සම්බන්ධයෙන් නොවෙයි. මිනිසෙකුගේ ආයු කාලය වැඩි කරගන්න, මිනිසෙකු කන බොන දේ ගැනවත් අඩු ගණනේ පර්යේෂණ සිද්ධ වෙලා තිබෙනවාද? අද මිනිස්සු මැරෙන තරමක් මැරෙන්නේ කොහොමද? විශේෂයෙන්ම පිළිකා රෝගයෙන් මිනිස්සු මැරෙනවා කියලා අපි දන්නවා. බොහෝ දෙනෙක් කියනවා, අද හෘදය රෝගවලින් මිනිස්සු මැරෙනවා කියලා. එහෙම නම්, මේ රටේ නියම පර්යේෂණ වැඩසටහනක් ක්‍රියාත්මක වුණා නම්, මේ පිළිබඳව යම් කිසි විමර්ශනයන් කළා නම්, ඇත්ත වශයෙන්ම මේ තරම් අහිංසක මිනිස්සු අකාලයේ මියැදෙන්නේ නැහැ. අඩු තරමින් අපේ ජීවිතවලටවත් රැකවරණයක් ගන්න ආණ්ඩුව හැටියට අපි කටයුතු කරලා නැහැ. ඒ නිසා කී දෙනෙක් අකාලයේ මැරුණාද? දොස්තර ජයලත් ජයවර්ධන මැතිතුමා වාගේ වෛද්‍ය වෘත්තියේ යෙදුණු කෙනෙක් හදවත් රෝගයකින් මිය යයි කියලා අපි කවුරුවත් හිතුවාද? එවැනි මේ රටේ සිටි විද්වතුන් කී දෙනෙකු අකාලයේ මිය ගියාද? ඒ නිසා පහු වෙලා හරි අලුත් රජය යටතේ මේ සම්බන්ධයෙන් අලුත් වැඩ පිළිවෙළකට යන්න අපට සිද්ධ වනවා. ඒක ඉතාමත් හොඳ ප්‍රවේශයක්. මේ සඳහා අපි වැඩි වැඩියෙන් උනන්දු වන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අද නොයෙක් දේවල් සම්බන්ධයෙන් පර්යේෂණ කරනවා කියලා අපි දන්නවා. පසු ගිය දවස්වල පොල් සංවර්ධන මණ්ඩලයෙන් එක්තරා demonstration එකක් කළා, පොල් නිෂ්පාදනයන් සාදා ගන්නා ආකාරය සම්බන්ධයෙන්. අපි දැන් සාමාන්‍යයෙන් ගෙදරදි පරිප්පු හොද්දක් හදන්න විශාල පොල් ප්‍රමාණයක් ගානවා. එහිදී අපතේ යන ප්‍රමාණය කොපමණද කියලා මම බැලුවා. සාමාන්‍යයෙන් පොල් ගෙඩියකින් දහදෙනෙකුට හදන කෑම විසිදෙනෙකුට පාවිච්චි කරන්න පුළුවන් විධියේ පර්යේෂණ අද පොල් සංවර්ධන මණ්ඩලය මඟින් සිදු කරලා තිබෙනවා.

මේ අවබෝධය ගෘහිණියන්ට ලබා දෙන්නේ කවුද? ගෘහිණියන්ට මේ අවබෝධය දෙනවාද කියලා මම දන්නේ නැහැ. ඉතාමත් හොඳ රසවත් විධියට, සමහර වෙලාවට අපි වැඩියෙන් පොල් දාලා කන පරිප්පු හොද්දට වඩා හොඳ පරිප්පු හොද්දක් හදන්න අවශ්‍ය පර්යේෂණයන් අද කරලා තිබෙනවා. රස කැවිලි බලන්න. නොයෙක් දේවල් අඩු මුදලකින් ලබා ගන්න පුළුවන්. සමහර වෙලාවට ගෙදරක උදේට තේ බොනකොට, හවසට තේ බොනකොට ගෘහිණියට තමන්ගේ දරුවාට අඩු ගාණේ කිරි ටොපි කෑල්ලක් හරි වෙනත් දෙයක් හදලා දෙන්න පුළුවන් පසුබිමක් සකස් කර තිබෙනවා. කීයෙන් කී දෙනෙක් මේවා ප්‍රයෝජනයට ගන්නවාද කියන එක පිළිබඳව අද අපට ප්‍රශ්නයක් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, අපේ මේ පනත් කෙටුම්පතේ මේ පිළිබඳ ප්‍රවේශයක් නැහැ. අපි දන්නා ගෘහිණියන් ඉන්නවා, සමහර වෙලාවට ඔවුන් කෑම එක ගන්නේ වයිනිස් හෝටලයෙන්. මොකද, තමන්ගේ නිවසේ යම් යම් දේවල් කරන්න ඔවුන් කම්මැලියි. එහෙම නැත්නම් ඔවුන්ට නිසි දැනුවත්කමක් නැහැ. ඒ වාගේ බොහෝ කාරණා තිබෙනවා. ඒ නිසා ජාතික පර්යේෂණ සභාවක් හැටියට ඉදිරියේදී මේක හරියට ක්‍රියාත්මක කළොත්, මේ රටේ තිබෙන නිවාසවල මුළුතැන්ගෙයි ඉදලා, මේ රටේ තිබෙන නිවාසවල ආලින්දයේ ඉදලා බොහෝ දේවල්වලට ප්‍රවේශ වෙන්නට අවස්ථාවන් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මේ රටේ නිෂ්පාදනය වෙච්ච දේවල් පිළිබඳව අපි දන්නවා. මට මතකයි, 60 දශකයේ සහ 70 දශකය අවසානයේ මේ රටේ "Elite" කියලා ගුවන් විදුලියක් තිබුණු බව. එදා උපාලි විජේවර්ධන මැතිතුමා හැදුවා "Unic" කියලා රේඩියෝ එකක්. ඊට පස්සේ "Upali Fiat" මෝටර් රථයක් තිබුණා. මම අහනවා, අවුරුදු 40ක්, 50ක් ගිහිල්ලාත් මේ රටේ නිෂ්පාදනය කරපු ගුවන් විදුලිය මොකක්ද කියලා. මේ රටේ නිෂ්පාදනය කරන මෝටර් රථය මොකක්ද? අද අපේ ගරු අග්‍රාමාත්‍යතුමා වාසනාවකට මේ රටේ මෝටර්,- [බාධා කිරීමක්] මයික්‍රෝ එක ඊයේ-පෙරේදා ඇවිල්ලා තිබෙන්නේ. නමුත් ඒක එක company එකක් විතරයි. ඒක හදන හැටිත් අපි දන්නවා. ඒකේ share එක තිබුණේ කොහොමද කියලාත් අපි දන්නවා. ඒවායින් ලාභ ලබන්න බැහැ නේ. අද මයික්‍රෝ වාහනයක් ගන්නවාට වඩා අඩුවට පිට රටින් ගෙනෙන වාහනයක් ගන්න පුළුවන්. ඒකට ඉතින් ජාත්‍යන්තර- [බාධා කිරීමක්] Share එක කියන්න බැහැ. දැන් මෙතැන කවුරුවත් නැහැ, ඒකට උත්තර දෙන්න. ඒකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද කවුරු හරි කෙනෙක් ගුවන් විදුලි යන්ත්‍රයක් ගත්තොත් ගන්නේ "සැන්යෝ" වර්ගයේ එකක්. එහෙම නැත්නම් "ටොෂිබා" වර්ගයේ එකක්. එදා තිබුණු Unic ගුවන් විදුලි යන්ත්‍රය වගේම "Elite" කියන ගුවන් විදුලි යන්ත්‍රය දෙහිවල ප්‍රදේශයේ හදනකොට අපි ගිහිල්ලා බැලුවා. හැම ගෙදරකම තිබුණේ Elite රේඩියෝ එක, Unic රේඩියෝ එක. අද ඒ ගුවන් විදුලි යන්ත්‍ර නැහැ. අපිට ඒක අහිමි වෙලා තිබෙනවා. අද අවුරුදු 50 ක් ගිහිල්ලාත්, - [බාධා කිරීමක්] ප්‍රශ්නය ඒක නොවෙයි. අපේ ගම්බද අහිංසක ගැමියාගේ පැල්පතේ තිබුණේ, මැස්ස උඩ තිබුණේ ඒ රේඩියෝ එක. අද ඒක අපට අහිමි වෙලා තිබෙනවා. Upali Fiat මෝටර් රථයේ යන කොට අපට මිනිස්සු හිනා වුණා. ඒ කාලේ Upali Fiat එකේ යනකොට මිනිස්සු හිනාවෙලා මොකක්ද කිව්වේ? බෙලෙක් පතුරුයි කිව්වා. එහෙම බෙලෙක් පතුරුවලින් හදපු එකක්වත් නිර්මාණය කරන්න මේ කාලය තුළ අපි අසමත් වෙලා තිබෙනවා. ඒකට අපි ලජ්ජා වෙන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපිට තණකොළ කපන මැෂිමක් නිෂ්පාදනය කරගන්න පුළුවන් කමක් නැහැ. ඉදිරියේදී විදේශ ආයෝජකයන් මගේ ප්‍රදේශයට එන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ අයගේ නිෂ්පාදනය තමයි තණකොළ කපන මැෂින් හදන්න එක. ඒකත් මේ රටේ මිනිසුන්ගේ අවශ්‍යතාවක්. තණකොළ කපන මැෂින් එක අද සෑම ගෙදරකම තියෙන්න ඕනෑ උපකරණයක් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා අපේ අවශ්‍යතාව අපි හරියට හඳුනා ගෙන

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

නැහැ. රටේ අවශ්‍යතාව මොකක්ද? ගෙදරට අද ඕනෑ කරන දේවල් මොනවාද? ඒ සියල්ල පිළිබඳ නොසලකා හැරලා, හැම දෙයක්ම ඉබාගාතේ යන තත්ත්වයකට අපි මේ රට නිර්මාණය කරලා තිබෙනවා. අවශ්‍ය දේත් ගෙන්වනවා; අනවශ්‍ය දේත් අපි ගෙන්වනවා. අද අපේ රටේ නිෂ්පාදනය කරපු ඉදිකටිටක් ගන්න තිබෙනවාද? මේ රටේ තිබුණු ලෝහ සංස්ථාව මේ රටේ යකඩ ටික නිෂ්පාදනය කරපු කාලයක් තිබුණා. අද යකඩ ටික අඩු ගාණේ උණු කරලා නිෂ්පාදනය කරන්න ආයතනවත් අපට නැහැ. ඒ නිසා අපේ ආණ්ඩු මොන විධියට මුදල් වෙන් කළත්, අලුත් තාක්ෂණය තුළ අපිට නිර්මාණය කළ හැකි නොයෙක් දේවල් තිබෙනවා. පාරක් හදන කොට අපි ලජ්ජා නැතිව පිට රටවලට ගිහිල්ලා කාපට් ගේනවා. අද අපට මේ කාපට් නිෂ්පාදනය කරන්න අවශ්‍ය බොහෝ දේවල් තිබෙනවා.

ඒ යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය කරන්න පුළුවන්කම තිබෙනවා. ඒවාට අවශ්‍ය හොඳ තාක්ෂණික දැනුම් තිබෙන ඉංජිනේරුවන් ලංකාවේ ඉන්නවා. නමුත් අපි ඒ අයගෙන් ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. අපි තවමත් මෙහේ ඉන්න මිනිස්සු පිට රට යවලා, රටින් භාණ්ඩ ආනයනය කරනවා. ඒ රටේ ඉතාමත්ම විද්වතුන්ය කියන අය ගෙන්වලා අපි නිෂ්පාදන කරනවා. ඒ නිසා අපේ ජාතියට, දේශයට අත් වන ආදායම සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. මේ රටේ අලුත් දෙයක් නිෂ්පාදනය වෙලා නැහැ. හොඳම උදාහරණයක් තමයි පසු ගිය ආණ්ඩුව තාක්ෂණික විද්‍යාගාර හැදුවා. ඒක බොහෝම හොඳ සංකල්පයක්. මොන දේශපාලන මතිමතාන්තර තිබුණත්, මමත් ඇත්ත වශයෙන්ම ඒක අගය කරනවා. නමුත් අවසානයේදී මොකක්ද වුණේ?

අද මේ විෂය උගන්වන්න ගුරුවරු නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒවාට අවශ්‍ය පහසුකම් ටික අද අපි දීලා නැහැ. මගේ ආසනයේ තිබෙන ආචාර්ය රිවඩ් පතිරණ විද්‍යාලය තමයි මේ සැරේ මුළු ගාලු දිස්ත්‍රික්කයේම වැඩිම ප්‍රතිඵලය තිබුණේ. හැබැයි මේ විද්‍යාලයට මේ සැරේ ළමයි ටික එනකොට ඒ ළමයින්ට ඉන්න තැනක් නැහැ. ගොඩනැඟිලි නැහැ; අවශ්‍ය ගුරුවරු නැහැ; ඒවාට අපි ලැහැස්ති වෙන්නේ නැහැ. අනාගතය වෙනුවෙන් අපේ වැඩ පිළිවෙළ මේකද? අපි ඒවා නිර්මාණය කරනකොට, අපි ඒ දේවල් මේ රටේ ස්ථාපිත කරනකොට අනාගතය වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ කියන එක මම විශේෂයෙන්ම සිහිපත් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට ඒ සඳහා අවශ්‍ය වන බොහෝ දේවල් තිබෙනවා. අපේ ආර්ථිකය තුළ අපට අවශ්‍ය වන දේවල් තිබෙනවා. අද කෘෂිකර්මාන්තයට විතරක්, වැවිලි ආර්ථිකයට විතරක් අපි ඒකේ සරණං ගච්ඡාමි වෙලා ඉඳලා හරි යන්නේ නැහැ. අපි මේ රටේ නිෂ්පාදනයක් ඇති කරන්න ඕනෑ. ඒ සඳහා අපි සූදානම් වෙන්න ඕනෑ. ඒ සඳහා ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ඉතාම ලොකු සම්පතක්. මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව අවුරුදු දහයක්, පහළොවක් ගිහිල්ලා මෙහෙම පනතක් තිබුණා, මෙහෙම ආයතනයක් තිබුණා කියලා කනගාටු වෙන්න, එහෙම නැත්නම් වේදනාවට පත් වෙන්න අවශ්‍ය නැහැ. මෙය හෙට ඉඳලා ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතට කථානායකතුමාගේ අත්සන තැබුවාට පසුව ඉදිරි කාලය තුළ ඉතාම ඉක්මනින් මෙය ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත් ඇතුළු මේ රජයට ඒ සඳහා සියලු ශක්තිය ලැබෙන්න ඕනෑ. විශේෂයෙන්ම විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා මේ සඳහා අත තැබුවා වාගේම, ප්‍රවේශයක් ගත්තා වාගේම මේ තුළින් අනාගත වැඩ පිළිවෙළ ඉතාමත් පැහැදිලිව කර ගෙන යන්න ශක්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මාගේ කථාව අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විවාදයේදී අදහස් දක්වන්න ඉඩ ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තූතියි.

[5.26p.m.]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Eran Wickramaratne - Deputy Minister of Public Enterprise Development)

Mr. Deputy Chairman of Committees, I am glad to participate in this Debate in which we are incorporating the National Research Council of Sri Lanka which was founded in 1999 and formally established in 2007.

I want to congratulate the Minister, Hon. A. D. Susil Premajayantha, for actually presenting this Bill in Parliament which should have been presented a long time ago.

We know that it is very difficult to draw public attention to this subject and also to get resources. I remember the Hon. (Prof.) Tissa Vitharana, in the last Parliament tried many times to get resources from the Ministry of Finance and Planning for science and technology and for research and development and those efforts often failed. Though we were in the Opposition, we were very supportive of his ideas in trying to attract investment into science and technology and research and development. So, I want to congratulate the present Minister, Hon. A. D. Susil Premajayantha, for being able to actually bring this Bill before Parliament.

As we all know, the objective of this Bill is, I quote:

"(a) "to assist the Government to facilitate research relating to science and technology in order to build a vibrant scientific and technological community in the country;"

I think this is a very laudable objective. It is not talking about building an institution but it is talking about the institution being an instrument to build a scientific and technological community.

Just last week, I had the privilege of going to Orion City IT Park. When we think about Orion City, we remember one of the most celebrated industrialists in our country, Mr. A.Y.S. Gnanam, who started his career by collecting scrap iron material. Then, he graduated into light industrial production and if you want you can call it "hardware". When you think about the Orion City which is now the brainchild of the grandson of Mr. A.Y.S. Gnanam, they are now into software. Last week, I had the privilege of opening basically just a space where software engineers, technicians coupled with the British Council bringing in literature and also inviting "Coffee Bean"- just a restaurant- together for creating an environment. What was it about? It was about creating an environment so that people could gather, share their ideas and thoughts and basically come up with some innovations.

Often we hear, in this Assembly, that Sri Lanka has to create a knowledge economy. A knowledge economy

cannot be created unless we actually invest in knowledge, particularly in science and technology. It is actually appalling to see the facts relating to research and development. In 1996, Sri Lanka invested only 0.18 per cent of its GDP and in 2010, it went down to 0.16 per cent and I think, even the latest figures will not be very different. Singapore, in 1996, invested 1.32 per cent of its GDP and it went up to more than 2 per cent in 2010, 14 years later. Malaysia was 0.22 per cent in 1996 when Sri Lanka was 0.18 per cent and we remained at 0.16 per cent going down slightly while Malaysia increased it by nearly five-fold to over 1 per cent of its GDP.

Today, South Korea is 3.47 per cent ; Japan is 3.25 per cent and even India is 0.8 per cent, which is merely six times more than Sri Lanka. So, we have really underinvested in science and technology. If we look at research and development and investments that are made by global companies, we see that among the first 12 companies globally, there are two Asian companies and virtually all the other companies are US companies. One of the two Asian companies is Samsung, which in 2015 invested US Dollars 14.1 billion in research and development and the other is Toyota, the automaker, which invested US Dollars 9.2 billion. All the other companies are well-known companies like Apple, Google Amazon, 3MG, Microsoft and IBM, which are US companies. So, we have over a long period of time underinvested in science and technology and in research.

Time has come. What this National Research Council of Sri Lanka Bill doing is, it is giving a clear signal that science and technology is important. We know the world over that it is now talked about Science, Technology, Education and Management as the areas to invest in or the STEM subjects. In Sri Lanka, our universities receive very little in terms of investment. Therefore, when those few rupees are given, it is distributed on an equity basis so that every university has something and then it could probably get the basic equipment required for research and development. The National Research Council of Sri Lanka is different. It works on a different basis. It works on a basis of not institution-building, but it works on a basis of actually building a science and technology community working through present institutions.

Another objective of the Bill is that it is not confined to the State sector. The Bill provides for encouraging research and development in science and technology basically through encouraging the private sector too. It is encouraging high calibre research. Some of its research is multi-disciplinary and some of it is targeted to national needs. For example, presently, we see that there is research going on in improving the dairy industry to achieve self-sufficiency; there is some research going on in developing polyvalent anti-venom for snake-bite; there is also another research project to integrate vector management for control of Dengue, which has become a national problem; then, there is also an integrated study for kidney disease because of the uncertainty of how actually this happens and what should the response be and then, there is a very interesting research going on into climate resistant agriculture. As you know, Sri Lanka often faces lots of natural disasters and therefore, we need resilient crops as food security is an important part of our Government's policy.

These projects that I identified are already ongoing, funded by the national Budget and those are our development priorities. Presently, as I speak, there are more than 50 applications that are being evaluated to select projects for funding under this programme.

Another important feature of the National Research Council is that it encourages public-private partnerships in science and technology and research and development. Therefore, the Government, through the NRC, is committed to match-funding those private sector companies which come up with potential projects for research and development. There are many, but in the interest of saving time, I would not mention some of the projects that are already ongoing. But, this is a very important step forward because we are interested in having higher-income jobs, which will only come through higher use of technology and science, and that is where the country should migrate to in terms of creating value-added jobs.

The National Research Council also looks at investor-driven research programmes. This is not necessarily what the Government thinks is a priority. But, it is where anyone who can identify a priority could actually put a project forward. So, there are two ways of looking at this. One is, you identify a problem and you put forward a research proposal as I said - a target-oriented, multi-disciplinary programme. The other is to create a need in society, where you take up science and research and you commercialize it for the benefit of the national economy. That does not originate with the Government; that originates with the people who have ideas and the Government is the catalyst in helping those people.

I must also mention that the National Research Council, even though it has not yet been incorporated through Parliament, it has already, to its credit, encouraged many scientists to publish their findings. Therefore, there has been recognition of scientific merit based on their publication in reputed index journals. In recent years, from 1999, we found that the number of publications globally by Sri Lankan scientists has increased by manyfold.

In addition to that, we also see a direction in which new ideas are being patented. I must say a word here about patenting. When a scientist is involved in research and finds something new, an idea, that idea belongs to the scientist. So, the patent will often recognize, not only the institution, but also the scientist, so that the benefits could

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

accrue to those who are working in these particular fields. We are really working for a better Sri Lanka. We want a better environment for our scientists and our technologists; a better future for our children.

If I were to close on a personal note, I also speak as a parent of two children, one of whom is a daughter who has a scientific background and who, until yesterday, worked at the SLINTEC and now, somewhat reluctantly, is moving away for other opportunities. I speak on behalf of the next generation, because Sri Lanka's economic future is dependent on how much we invest in science and technology as that is where value-addition will come in, where new incomes and new jobs will come up.

I would also like to make an invitation, as we vote today on the National Research Council of Sri Lanka Bill, to the Sri Lankan scientists across the world: "You are indeed important. You have a contribution to make and even through this small step we are taking, you will see an opportunity to contribute to your motherland".

Thank you, very much.

[අ.භා. 5.40]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යතුමා ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ ඒ පිළිබඳව වචන කිහිපයක් කථා කරන්න මා කැමැතියි. රටක ඵලදායිත්වය දියුණු කරන්න, ජාත්‍යන්තර වශයෙන් රටක් ඉස්සරහට යන්න එක ක්ෂේත්‍රයක විතරක් නොවෙයි, සියලු ක්ෂේත්‍රවල පර්යේෂණාත්මක අධ්‍යයනයන් තිබෙන්න ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, මේ කටයුතු ඉස්සරහට ගෙන යන්න එතුමාට ශක්තිය තිබෙන බව.

පසු ගිය රජයේ හිටපු තිස්ස විතාරණ ඇමතිතුමා මේ පිළිබඳව ලොකු උනන්දුවක් දැක්වුවා. තිස්ස විතාරණ හිටපු ඇමතිතුමා නිතර මේ නැනෝ තාක්ෂණය ගැන කථා කළා.

මුල් කාලයේ එතුමා නැනෝ තාක්ෂණය ගැන කථා කරන කොට කවුරුවත් ඒ ගැන සැලකිල්ලක් දැක්වුවේ නැහැ. එතුමා අපේ රටේ පර්යේෂණාත්මක පැත්ත දියුණු කරන්න, මගේ මතකයේ හැටියට හෝමාගම ප්‍රදේශයේ අක්කර 58ක පමණ ඉඩමක් පවරා ගෙන විද්‍යා හා නැනෝ තාක්ෂණ උද්‍යානයක් සැලසුම් කළා. අපේ ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත් දන්නවා, ඒ තුළින් ජාතික පරිමාණයෙන් පර්යේෂණාත්මකව රටේ ආර්ථික ඵලදායිත්වය දියුණු කරන්න එතුමා ලොකු උත්සාහයක් ගත් බව. එහිදී මහා පරිමාණ වශයෙන් නොවුණත්, විද්‍යාගාර මධ්‍යස්ථාන ගමට ගෙන යමින් ග්‍රාමීය ජනතාව අතර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ හැඟීම් ඇති කරලා, ගමේ තිබෙන සම්පත් ප්‍රයෝජනයට ගන්න අවශ්‍ය වූ පරිසරය හැදුවා. මම එතුමාත් එක්ක හුඟාක් ළඟින් වැඩ කළා. ඇත්ත වශයෙන්ම එහි ලොකු ඵලදායිත්වයක් තිබුණා.

අපි දන්නවා, අපේ රටේ සමහර නිෂ්පාදනයන් තිබෙනවා කියලා, ඒවායේ අතිරික්තයක් තිබෙන කාලවල ඒ නිෂ්පාදනයන්ට කිසිදු වටිනාකමක් ලැබෙන්නේ නැති. රට ඇතුළේ තිබෙන ඒ සම්පත්වලට යම් වටිනාකමක් එකතු කරන්න අවශ්‍ය විද්‍යා හා තාක්ෂණ දැනීම ගමට ගෙන යන්න, පාසල්වලට ගෙන යන්න ගත් උත්සහයක ප්‍රතිඵලයක් හැටියට ගම ඇතුළේ තිබෙන සමහර සම්පත් කළමනාකරණය වුණා.

මම මතක් කරන්න ඕනෑ, ගරු බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමාත් පාසල් විෂයධාරා පද්ධතියට මේ තාක්ෂණ විෂය ඇතුළත් කළ බව. ඒක අපට අමතක කරන්න බැහැ. මම හිතන විධියට මෙවර විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයට තාක්ෂණ විෂයධාරාව හදාරපු ශිෂ්‍යයෝ 2,000ක් විතර වාඩි වෙනවා. මේ පදනම ගැන හැම රජයක්ම කල්පනා කළා වාගේ, ලෝක පරිමාණව අලුත් තත්ත්වයන්ට මුහුණ දෙන්න පුළුවන් විධියට තාක්ෂණය දියුණු කරන්න ඕනෑ. ඒ පදනම මත තමයි ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත අපේ ඇමතිතුමා ගෙනැල්ලා ඒ සඳහා යම් උපදේශන ලබා ගන්න, ඒක වඩා පුළුල් කරන්න අවශ්‍ය පදනම මේ පනතින් හදා ගෙන තිබෙන්නේ.

ඇත්ත වශයෙන්ම මේකට අවශ්‍ය විද්වත් දැනුම ලබා ගැනීම ගැන අපි බලද්දී අපට පෙනෙනවා, අපේ රටේ උගතුන් හුඟ දෙනෙක් වෙනත් රටවල සේවය කරන බව. මොකද, මේ නිදහස් අධ්‍යාපනය තුළින් ඉගෙන ගන්නා, දක්ෂ දරුවෝ විශ්වවිද්‍යාලවලින් පිට වන කොටම බටහිර රටවල් ශිෂ්‍යත්ව දීලා ඒ රටවලට ගන්නවා. ඔවුන් ඒ රටවල පර්යේෂණායතනවල වැඩ කරනවා. මෙලෙස බුද්ධිගලනයට ඉඩ නොදී, ඉදිරි කාලයේ පර්යේෂණ සඳහා අපේ දැනුම අපේ රටේ ප්‍රයෝජනයට යොදා ගන්න ඕනෑ. ඒ සඳහා අපේ ආරම්භයක් නැහැ. ආරම්භයක් ඇති කරන්න ඕනෑ. මම දන්නවා, චීනය වාගේ රටවල් සහ සමහර ආසියානු රටවල් මේ දැනුම ලබා දෙන්න ඒ රටවලට අවස්ථාව ලබා දීලා -රජය විසින් ශිෂ්‍යත්ව ලබා දීලා- ඒ ළමයින් බටහිර රටවලට යොමු කරනවා. එසේ යොමු කරලා දැනුම ලබා ගත්තාට පස්සේ තමන්ගේ රටට නැවත ගෙන්වා ගන්නවා. මොකද, ඒ රටවල පර්යේෂණ පැත්ත පිළිබඳව තිබෙන උනන්දුව නිසා.

මේ තරගකාරී සමාජය ඇතුළේ අපි පර්යේෂණවලට අවස්ථා ලබා දීලා, ඒ පර්යේෂණාත්මක ගවේෂණයන් හරි හැටි කරලා ඉස්සරහට ගියේ නැත්නම් අපේ රට පසුගාමී රටක් බවට පත් වනවා. අපි මේවා ගැන මොන තරම් කථා කළත්, බලාපොරොත්තු වන ඉලක්කයට අපේ රටට යන්න බැහැ. මොකද, විද්‍යාව හා තාක්ෂණය අද ලෝකයේ පුළුල්වෙලා තිබෙනවා. ඒ පරිමාණයෙන්ම අපේ රටෙත් විද්‍යාව හා තාක්ෂණය දියුණු කළ යුතුයි. ග්‍රාමීය වශයෙන් තිබෙන විවිධ පැතිකඩ හරියට හඳුනා ගන්න ඕනෑ. උදාහරණයක් වශයෙන් ආයුර්වේද ක්ෂේත්‍රය ගනිමු.

අපේ ආයුර්වේදය -හෙළ වෙදකම- ඇත්ත වශයෙන්ම විදේශ විනිමය හොයන මාර්ගයක් බවට පත් කරන්න පුළුවන්. ථේරවාදී බුදු දහම සහ ආයුර්වේදය දැන් ලෝකයේ ජනප්‍රිය වෙලා තිබෙනවා. නමුත් මේවායේ තිබෙන පර්යේෂණාත්මක ඇගැයීම, පර්යේෂණාත්මක තත්ත්වයන් දියුණු නැති නිසා අපි බලාපොරොත්තු වන විධියට ඒ ආදායම් ලබා ගන්න අපට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒවායින් වෙනත් අය ප්‍රයෝජන ලබා ගන්නවා. මේ වාගේ කාලයක ආයුර්වේද ක්‍රමය දියුණු කරලා, ආයුර්වේදය මඟින් නිරෝගී මිනිසකු සමාජයට ලබා දෙන්න ක්‍රියා කළ යුතුයි. ඉන්දියාව වාගේ රටවල් විශාල බලපෑමක් ඇති කරලා, ජාතික ආර්ථික සම්පත් විධියට ආයුර්වේදය තුළින් ප්‍රයෝජන ලබා ගන්නවා. මේ අවස්ථාව, ඒ සම්බන්ධයෙන් හුඟක් දේවල් කියන්න වෙලාවක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපේ සාගරය පිළිබඳ පර්යේෂණාත්මක පැත්ත ගැන බැලිය යුතුයි. සාගරයේ තිබෙන දේවල් සම්පත් විධියට අපි පර්වර්තනය කර ගන්නේ කොහොමද? අපේ රටේ පැත්තකට දමන්න කියලා කිසිම දෙයක් නැහැ. ඇපේ රටේ විසි කළ හැකි කිසිම දෙයක් නැහැ. හැම පැළෑටියක්ම ඖෂධයක්. අද කුණු ගොඩක් කියලා පැත්තකට දමන්න දෙයක් නැහැ. ඒවා ඔක්කොම අපි හරි පර්යේෂණාත්මක පැත්තට යොමු කළොත් මේ රටට කොහෙන්වත් සල්ලි අවශ්‍ය වෙන්නේ නැහැ. අපිට කාගෙන්වත් යැපෙන්න ඕනෑ නැහැ. අපේ පුංචි රටේ තිබෙන සම්පත් තුළින් අපේ ආර්ථික ශක්තිය දියුණු කර ගන්නත්, අපේ ඵලදායීත්වය දියුණු කර ගන්නත් අපට පුළුවන්කම ලැබෙනවා. ඒ සඳහා මේ වාගේ මහ පෙන්වීමක් අවශ්‍යයි.

පර්යේෂණ කිව්වාම පුංචි විෂයයක් නොවෙයි. දැවැන්ත පරිමාණයේ ක්ෂේත්‍රවලටත් මේ පර්යේෂණ විහිදී යනවා. හැබැයි, මේ පනත් කෙටුම්පතේ හැටියට කවුරුන්, කොතැන පර්යේෂණ කළත් ඒ පර්යේෂණ එක තැනකට යොමු වීමක් තිබෙන්න ඕනෑ. මෙතැන තව කෙනෙකු පර්යේෂණ කරනවා, ඒ අය ආයෝජනය කරන්නේ කාටද වශයෙන් ඒ පර්යේෂණයන් කරන අය හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම පර්යේෂණවලට යොමු කිරීමේ ක්‍රමවේදයකුත් තිබෙන්න ඕනෑ. මේවා ඔක්කොටම එක පර්යේෂණයක් කරලා වැඩක් නැහැ. රටට අවශ්‍ය පුමුඛතා අපි හඳුනා ගන්න ඕනෑ. ක්ෂේත්‍ර බෙදා වෙන් කර ගන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත යටතේ ඒ පර්යේෂණයන් කරන පුද්ගලයින් පිළිබඳව හඳුනා ගැනීමේ විධි ක්‍රමයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම පසු විපරම්කරණයක් කළ යුතුයි. සිංගප්පූරුව වැනි රටවල්වල අධ්‍යාපනය හදාරන දරුවන් විශ්වවිද්‍යාලවලින් පිට වුණාම, රජය විසින් ඔවුන් පර්යේෂණවලට යොමු කරලා, ඒ පර්යේෂණ තත්ත්වය දියුණු කරන්න ඔවුන්ට මුදල් ලබා දෙනවා. නමුත් අපේ රටේ එහෙම තත්ත්වයක් පෙනෙන්න නැහැ.

අපේ රටේ ගම්බදව ඉතාම දක්ෂ නව නිර්මාණ ශිල්පීන් ඉන්නවා. සමහර විට ලෝකයේ වෙනත් රටවල්වල ඉන්න නව නිර්මාණ ශිල්පීන් එක්ක සංසන්දනය කළාම අපේ රටේ නව නිර්මාණ ශිල්පීන් ඉතාම දියුණු මට්ටමක ඉන්නවා. ඔවුන්ට සහජ අත් දැකීම් තුළින් ලබා ගන්නා දැනුම තිබෙනවා. ඒ අය පර්යේෂණාත්මකව අපි ඉස්සරහට ගෙනියන්නේ කොහොමද, ඔවුන්ගෙන් අපි ප්‍රයෝජනයක් ලබා ගන්නේ කොහොමද, විශේෂ රැකියා අවස්ථා නිර්මාණය කරන්න අපි ඔවුන් පාවිච්චි කරන්නේ කොහොමද කියන ක්‍රමවේදයක් ඇත්ත වශයෙන්ම රටකට අවශ්‍ය නිසා මෙවැනි සභාවක් අවශ්‍ය වෙනවා. අඩු පාඩු තිබෙනවා නම් අඩු පාඩු සකස් කරගෙන මේ සභාව ඇතුළේ අපි නිවැරැදි ක්‍රමවේදයකට ගමන් කළ යුතුයි. ඒ වාගේම එය තවත් පුළුල් විය යුතුයි කියලා මම හිතනවා. පසු විපරම්කරණයක් තිබෙන්න ඕනෑ. පර්යේෂණය කරන අය ලේඛනගත කිරීම කළ යුතුයි. මේ පනත් කෙටුම්පතේ නම් එහෙම කොටසක් ඇතුළත්වෙලා නැහැ. එවැනි ක්‍රමවේදයක් තුළ මේ ජාතික පර්යේෂණ සභාව වඩා පුළුල් කළ යුතුයි. අපේ රටේ දියුණු කළ හැකි සම්පත් වාගේම දියුණු කළ යුතු සම්පත් තිබෙනවා.

ඒවායේ පුම්බතා තෝරා ගෙන ඒ සඳහා අවශ්‍ය විශේෂඥ ඥානය සම්බන්ධ කර ගන්නේ කොහොමද, සමහර විට අපේ රටේ අධ්‍යාපනය ලබා විදේශ රටවල සිටින දරුවන් මෙයට සම්බන්ධ කර ගන්නේ කොහොමද යන්න පිළිබඳවත්, පෞද්ගලික අංශයත් සම්බන්ධ කර ගෙන ඔවුන්ට පහසුකම් ලබා දීමේ ක්‍රමවේදයක් පිළිබඳවත් රජයට ලොකු වග කීමක් තිබෙනවා. මේ පනත් කෙටුම්පතට කිසි ලෙසකින් විරුද්ධ වන්න අපට අවශ්‍ය වන්නේ නැහැ. ඇමතිතුමා ඉදිරි කාලයේදී මෙය වඩාත් පුළුල් කරලා කටයුතු කරයි කියා බලාපොරොත්තු වෙමින්, මට ලැබුණු සීමිත කාල සීමාව අවසන් නිසා මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.50]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාදයට එක්වීමට ලැබීම සතුටක්. ශ්‍රී ලංකාව තුළ මුහුණ පෑමට සිදුවන පුළුල් ගැටලුවලට අදාළ විසඳුම් විද්‍යාව හා තාක්ෂණය සංවර්ධනය කිරීම තුළින් ලබා ගැනීමත්, ඒ මඟින් ආර්ථික වර්ධනය මෙහෙයුමත්, සෞඛ්‍ය ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම තුළින් ජීවිතයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමත්, ඒ වාගේම කෘෂිකර්ම ඵලදායීතාව වර්ධනය කිරීමත් වැනි ජාතික කර්තව්‍යයන් සිදු කරගැනීම මේ පනත් කෙටුම්පතේ මූලික අභිප්‍රායන් වශයෙන් මට සඳහන් කරන්න පුළුවන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33වන ව්‍යවස්ථාවේ ජනාධිපතිතුමාට අයත් බලතල යටතේ 1999දී පිහිටු වූ ජාතික පර්යේෂණ සභාව 2007දී විධිමත්ව ස්ථාපනය කර විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ඇමතිතුමාගේ අණ පරිදි, නියමය පරිදි 2016 අප්‍රේල් මස 04වන දින ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් ලෙස තමයි ඉදිරිපත් වුණේ. මෙහි මූලික අරමුණ වන්නේ, විද්‍යා හා තාක්ෂණ ප්‍රජාවක් ගොඩනැඟීම සඳහා විද්‍යාවට සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ පහසු කිරීම සඳහා ආණ්ඩුවට සහාය වීමත්, ජාතික අවශ්‍යතාවලට දායක වන පර්යේෂණ පදනමක් සංවර්ධනය කළ හැකි පරිදි උසස් අධ්‍යාපන ආයතනවල, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනවල, සහ වෙනත් රාජ්‍ය ආයතනවල විද්‍යාව සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීමත් සහ විද්‍යාව සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගය ඉල්ලා සිටීමත්ය.

විශේෂයෙන්ම අද ලෝකයේ සීමිත සම්පත්වලින් අසීමිත අවශ්‍යතා සපුරා ගැනීමේ න්‍යාය තුළ, සීමිත සම්පත් සහ අසීමිත අවශ්‍යතා යන හේතු සාධක දෙක එකිනෙකට සම්බන්ධීකරණය කරන පාලම වශයෙන් විද්‍යාව හා තාක්ෂණය හඳුන්වන්න පුළුවන්. විද්‍යාව හා තාක්ෂණය දියුණු කිරීම මඟින් අනාගතයේ සීමිත සම්පත් මඟින් අසීමිත අවශ්‍යතා සපුරා ගත හැකි බව මගේ විශ්වාසයයි.

මූලිකවම මා බලශක්තිය ගැන සඳහන් කරන්න කැමැතියි. අද ලෝකයේ වෙනත් රටවල මෙන්ම සර්ම කලාපීය රටක් විධියට, හිරු එළිය ලැබෙන රටක් විධියට අපේ රටෙත් විශාලතම අර්බුදයක් බවට පත්වෙලා තිබෙන බලශක්තිය ගැන කථා කිරීමේදී, විශේෂයෙන්ම සූර්ය බලශක්තිය ගැන සඳහන් කරද්දී, ලෝකයේ පිළිගත් බලශක්ති ප්‍රභවයක් විධියට සූර්ය බලශක්තිය සැලකුවත්, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ ලංකා විදුලිබල මණ්ඩලය මේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට මැළි වෙනවා. අපි 2020වන විට මේ ආයතන දෙකේ ඉලක්කය මෙගාවොට් 200යි. අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවේ යෝජනාව වෙලා තිබෙන්නේ මෙගාවොට් 1,000ක් නිෂ්පාදනය කරන්නයි. නිලධාරීන්, ඒ වාගේම බලධාරීන් මේ සඳහා විවිධ හේතු සාධක ඉදිරිපත් කරනවා. සූර්ය බලය, හිරු එළිය අඩුවන අවස්ථාවලදී මේ වෝල්ටීයතාව පවත්වාගෙන යෑමට නොහැකියාවක් ඇති බව තමයි ඔවුන්ගේ මතය. හැබැයි මා විශේෂයෙන්ම කියන්න ඕනෑ, අද මේ රටේ ලංකා විදුලිබල මණ්ඩලයේ සියලුම බලාගාරවලින් දළ වශයෙන් දවසකට මෙගාවොට් 3,800ක් පමණ නිෂ්පාදනය වනවාය කියලා.

2020 වර්ෂය වන විට මෙගාවොට් 7,700ක පමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්න බලාපොරොත්තු වෙනවා. හැබැයි, අපේ

[ගරු චන්දිම ගමගේ මහතා]

අසල්වැසි රට වන ඉන්දියාව මේ වන විට මෙගාවොට් 20,000ක නිෂ්පාදන ධාරිතාවක් පවත්වා ගෙන යනවා. ඒ මෙගාවොට් 20,000ට සූර්ය බලශක්තියෙන් කරන නිෂ්පාදනයත් ඇතුළත්. එතකොට ගැටලුවක් මතු වෙනවා, ඉන්දියාව මේ තුළනය සිදු කරන්නේ කොහොමද කියලා. මේ තත්ත්වය මා දකින්නේ -

ගරු අජිත් පී. පෙරේරා මහතා
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණයක් පිළිබඳව මම පැහැදිලි කරන්න කැමැතියි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගෙනහැර දැක්වූ සංඛ්‍යා ලේඛනවල යම් දෝෂයක් තිබෙනවා. මේ රටේ විදුලිය උත්පාදනය කිරීම සඳහා සූර්ය බලශක්තිය යොදා ගැනීම සම්බන්ධව ලංකා විදුලිබල මණ්ඩලය සහ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය බොහොම පැහැදිලි වැඩපිළිවෙළක් ඉදිරිපත් කරනවා. ඊයේ කෙරුණු සාකච්ඡාව ගැන මට දැන ගන්න ලැබුණා. ඒක බොහොම හොඳයි. ඒකට අපට ආරාධනා කරනවා නම් අපි කැමැතියි. මොකද, නියෝජ්‍ය ඇමතිවරයා සහ ඇමතිවරයා වශයෙන් ඒකට සහභාගි වෙන්න අපට බලයක් නැති නිසා.

ඔබතුමාගේ සතුටට හේතු වන කාරණයක් මම කියන්න ඕනෑ. දැනට තිබෙන net metering ක්‍රමවේදය අපි දියුණු කරනවා. ලබන සතිය වන විට මේ රටේ සෑම පුරවැසියෙකුගේම නිවසේ වහල මත, සෑම කර්මාන්තකරුවෙකුගේම ආයතනයේ වහල මත සූර්ය කෝෂ සවි කරලා, එයින් නිපදවන විදුලිබලය ජාතික විදුලිබල පද්ධතියට ලබා දෙන්න පුළුවන්. ඒ අතිරික්තය සඳහා මුදල් ගෙවනවා. මීට කලින් අතිරික්තයට මුදල් ගෙවිවේ නැහැ; credit එකට මුදල් ගෙවිවේ නැහැ. ඒ අතිරික්තය සඳහා සැලකිය යුතු මුදලක් ගෙවන ක්‍රමවේදයක් අපි සතියක් ඇතුළත හඳුන්වා දෙනවා. ඒ අනුව මේ රටේ සෑම පුරවැසියෙකුටම කුඩා පරිමාණ සූර්ය බල විදුලිබල උත්පාදකයකු ලෙස දායක වෙන්න හැකියාව ලැබෙනවා. "Roof Top Model" කියලා අපි ඒ ක්‍රමය හඳුන්වනවා.

ඊට අමතරව Solar Park කියන concept එක අනුව, තාක්ෂණික අභියෝග ජය ගන්න පුළුවන් ආකාරයට මෙගාවොට් 300ක Solar Park තුනක් අපි සැලසුම් කරගෙන යනවා. ඔබතුමන්ලා සඳහන් කරලා තිබෙන්නේ යෝජිත සැලැස්මක් ගැන පමණයි. ඒ සැලැස්ම තවම ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරලාත් නැහැ; විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය අනුමත කරලාත් නැහැ; ඒ වාගේම PUCSL එක මඟින් අනුමත කරලාත් නැහැ. කෙසේ වෙතත්, අපි ඔබතුමන්ලාගේ අදහස් සලකා බලනවා. අනිවාර්යයෙන්ම මේ රටේ පුනර්ජනනීය බලශක්තිය වැඩි දියුණු කිරීමට, රටේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි ප්‍රමාණවත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිත කිරීමට අපි පොරොන්දු වෙනවා. ඒ සඳහා අපි ඔබතුමන්ලාගේ සහයෝගය පතනවා.

ගරු චන්දිම ගමගේ මහතා
(*மாண்புமிகு சந்திம கமகே*)
(The Hon. Chandima Gamage)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. අපි මේ සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කරද්දී බලධාරීන් අප දැනුවත් කළේ, 2020 වර්ෂය වන විටත් මෙගාවොට් 200ක් පමණ තමයි නිෂ්පාදනය කරන්නය හැකියාව තිබෙන්නේ කියලා. අපි යෝජනා කළා, මෙගාවොට් 1,000ක් පමණ නිෂ්පාදනය කරන්න බලන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපි යෝජනා කළා, storage facility එකත් එක්ක මේ කටයුත්ත කරන්න කියලා. එතැනදී අපට ආපු ගැටලුව තමයි storage facility එක high cost facility එකක් වීම. ඒ නිසා තමයි අපි වෙනත් පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනවලට යොමු වන්න තීරණය කළේ. ඒ වාගේම මේ සම්බන්ධයෙන් විවිධ ක්ෂේත්‍රවල බලධාරීන්ගේ මත තිබෙනවා. මේ විවිධ මත ආර්ථික නොවන ආර්ථික සාධකයක් යැයි මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකයේ පුනර්ජනනීය බලශක්ති වශයෙන් සත අපද්‍රව්‍ය නොවන කසළවලින් බලශක්ති උත්පාදනය කරනවා. ඒවා විකිණීමත් සිදු වෙනවා. මෙහිදී තාක්ෂණය වශයෙන් යොදා ගන්නේ සෙන්ටිග්‍රේඩ් අංශක 4000 සිට අංශක 6000ක උෂ්ණත්වයෙන් යුතු burners සහ boilers මඟින් සත අපද්‍රව්‍ය නොවන කසළවලින් ඒ අවස්ථාවේදීම ඉන්ධන නිපදවීමයි. නමුත් අපි තවම මේවා පුනර්ජනනීය බලශක්ති ප්‍රභව විධියට යොදා ගන්නේ නැහැ. පසු ගිය දශකය තුළ කොළඹ නගර මධ්‍යයේ අපි කුණු කඳු ගොඩ ගසා ගෙන තිබෙනවා. මේ කසළවලින් ඉන්ධන උත්පාදන ක්‍රමය ක්‍රියාත්මක වුණා නම්, අපට කසළ කළමනාකරණය කිරීමේ ලොකු පහසුවකුත් ඇති වෙයි. කසළ පරිහරණයෙන් අපට විශාල විදුලිය උත්පාදනයක් කරගත හැකි වෙයි කියලා මා විශ්වාස කරනවා.

මා කැමැතියි කෘෂිකර්මාන්තය සම්බන්ධයෙනුත් වචන කිහිපයක් කථා කරන්න. අද වෙනත් රටවල ගොවීන් සියලුම භෝග සඳහා hybrid තාක්ෂණයෙන් නිෂ්පාදනය කළ බීජ පාවිච්චියට හුරුවෙලා තිබෙනවා. නමුත් අද වෙනතුරු අපේ රටේ දේශීය බීජ මඟින් hybrid බීජ නිෂ්පාදනයට යොමුවන්න හැකියාව ලැබිලා නැහැ. මේ පිහිටුවන ජාතික පර්යේෂණ සභාව මඟින් සිදු කරන පර්යේෂණ හරහා දේශීය බීජ අනුසාරයෙන් hybrid බීජ නිෂ්පාදනයට යොමුවන්න හැකියාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම සත්ව පාලන අංශය ගැනත් කියන්න ඕනෑ. ලෝකයේ බොහෝ රටවල් ET තාක්ෂණය උපයෝගි කරගෙන සත්ව විශේෂ බිහි කරනවා. නමුත් අද අපේ රටේ තිබෙන තත්ත්වය අනුව, ET තාක්ෂණය කෙසේ වෙතත්, AI තාක්ෂණයවත් හරිහැටි ක්‍රියාත්මක කරගන්න හැකියාව නැහැ. එයට එක හේතුවක් වන්නේ අපට ප්‍රමාණවත් තාක්ෂණික නිලධාරීන් නොමැති වීමයි. ඒ වාගේම සිටින සමහර නිලධාරීන්ගේ හැකියාවේ යම් යම් ගැටලු තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී සත්ව පාලනය සඳහා AI තාක්ෂණය හෝ ET තාක්ෂණය උපයෝගි කරගෙන කටයුතු කළ යුතුයි. බීජ නිෂ්පාදනයත් ඒ තාක්ෂණය මත සිදු කළ යුතු යැයි මා විශ්වාස කරනවා.

අද තිබෙන බරපතළම ප්‍රශ්නයක් විධියට වකුගඩු රෝගය හඳුන්වන්න පුළුවන්. ඒ නිසා අද සියලුම ප්‍රජාවේ අවධානය කාබනික පොහොර වෙත යොමු වෙලා තිබෙනවා. යහපාලන ආණ්ඩුවෙන් පොහොර වෙනුවට මුදල් ලබා දෙනවා. ගොවියා

කැමති නම් ඒ මුදලින් රසායනික පොහොර යොදා ගැනීම කරන්න පුළුවන්. එහෙම නැත්නම් කාබනික පොහොර නිෂ්පාදනය කරගන්න පුළුවන්. හැබැයි, තාක්ෂණික ක්‍රමවේද හරහා විද්‍යාත්මක පදනමක් මත කාබනික පොහොර නිෂ්පාදනය සිදු විය යුතු යැයි මා විශ්වාස කරනවා. එහෙම වුණොත් තමයි කාබනික පොහොර මගින් අපට ඉහළ අස්වැන්නක් ලබා ගන්න හැකියාව ලැබෙන්නේ. ඒ නිසා මේ පොහොර සම්බන්ධ ගැටලුව දෙස මීට වඩා අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. දැනට මේ කටයුත්ත සිදු වන්නේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හරහා පමණයි. ඉදිරියේදී වෙනම අංශයක් හරහා ගුණාත්මකභාවයෙන් යුතු කාබනික පොහොර නිෂ්පාදන ක්‍රමවේදය ක්‍රියාත්මක වෙයි කියලා මා විශ්වාස කරනවා.

මා නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කයේ එප්පාවල තමයි ලෝකයේ හොඳම පොස්පේට් නිධිය තිබෙන්නේ. ප්‍රතිශතයක් වශයෙන් එහි පොස්පේට් සියයට 70ක පමණ ප්‍රමාණයක් තිබෙන බවයි සැල වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්ඩලික කටයුතු අමාත්‍ය ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now. ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු චන්දිම ගමගේ මහතා
(මාණ්ඩලික සන්නිවේදන අමාත්‍ය ගරු සන්දිම කමගේ මහතා)
(The Hon. Chandima Gamage)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපට තවම Triple Superphosphate නිෂ්පාදනය කරන්න හැකියාව ලැබිලා නැහැ. මේ ෆොස්ෆේට් නිධිය මංකොල්ල කන්න, එය අයිති කරගන්න විවිධ පාර්ශව පසු ගිය කාලය පුරාම උත්සාහ කළා. නමුත්, ඒ එකක්වත් සාර්ථක වුණේ නැහැ. හැබැයි, මේ Triple Superphosphate නිෂ්පාදනය කරන්න හැකියාවක් නැත්නම්, බටහිර ක්‍රමයට හෝ කියුබානු ක්‍රමයට Double Superphosphate වත් නිෂ්පාදනය කිරීමේ හැකියාව ඉදිරියේදී අප ලබා ගත යුතුයි කියා මා හිතනවා.

අද මේ විවාදයේදී යෝධ ඇළ ගැන කථා වුණා; ඒ ගැන අදහස් පළ වුණා. යෝධ ඇළ කියන්නේ බැස්මක් තිබෙන ඇළක් නොවෙයි. කලා ඔයේ සිට නුවර වැවට යෝධ වැවේ තිබෙන්නේ බැස්මක් නොවෙයි, නැඟීමක්. ඒක නිසා තමයි යෝධ ඇළේ සොරොව්ව එක පාරක් ඇරලා වැහුවාම සම්පූර්ණයෙන්ම ජල පෝෂක මිටියාවතක් විධියට එය ක්‍රියාත්මක වුණේ. ඒ නිසා මේ තාක්ෂණය විශ්මිත තාක්ෂණයක් බව අදටත් අපට කියන්න පුළුවන්.

ඊළඟට, අපි සීගිරිය ගැන කථා කළොත්, සීගිරි පර්වතය මුදුනට ජලය ගෙන යාමේ ක්‍රමවේදය ගැන ගැටලු තිබෙනවා. අද තවමත් මෙය හොයා ගන්න බැරි මට්ටමක තමයි තිබෙන්නේ. හැබැයි, සීගිරි වැවෙන් සොරොව්ව හරහා ඒ ජල පීඩනය යොදාගෙන පර්වතය මුදුනට ජලය ගෙන ගියා කියා තමයි ජන ප්‍රවාදවල තිබෙන්නේ. ඒ නිසා මේ තාක්ෂණික කරුණු ගැන සලකා බලා ඉදිරියේදී අප මීට වඩා සංවාදාත්මකව මේ මාතෘකාවට යොමු විය යුතුය කියා ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
විනා විවාදයෙන් තොරව, ඒකමතිකව පිළිගනු ලැබිණි.
අතන්බලා, සභාව මූලික අයිතිවාසිකම් කාරක සභාවට යොමු කරන ලදී.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය."[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]
තීරණය කරන ලදී.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த]
Resolved:
That the Bill be referred to a Committee of the whole Parliament."- [The Hon. A.D. Susil Premajayantha.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]
කුලුගැන්වීම් කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்]
Considered in Committee.
[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES in the Chair.]

1 සිට 13 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ආම් වාහකත්තිලිරුන්තු 13ආම් වාහකම් වරై සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.
Clauses 1 to 13 ordered to stand part of the Bill.

14 වන වගන්තිය.- (සභාවේ කර්තව්‍ය.)
வாசகம் 14.- (பேரவையின் பணிகள்.)
CLAUSE 14. - *(The functions of the Council.)*

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්ඩලික සන්නිවේදන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"7වන පිටුවේ, 1 සිට 5 දක්වා වන පේළිවල ඇති සියලුම වචන (එකී පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කොට පහත සඳහන් දේ ඇතුළත් කරන්න:-

'පර්යේෂණ සඳහා රජයේ ආයෝජන කාර්යක්ෂම ලෙස උපයෝගී කිරීම සහතික කිරීම පිණිස උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතන සහ වෙනත් රජයේ ආයතනවලට සපයනු ලබන ප්‍රදාන සම්බන්ධයෙන් විද්‍යාව හා තාක්ෂණයට අදාළ පර්යේෂණවලට පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ නියාමනය කිරීම;' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

14 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
14ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 14, as amended, ordered to stand part of the Bill.

15 සිට 29 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
15ஆம் வாசகத்திலிருந்து 29ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 15 to 29, ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Adjournment Motion is to be moved by the Hon. Bandula Gunawardane.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ගිවිසුම් කොන්දේසි
சர்வதேச நாணய நிதியக் கடன் உடன்படிக்கையில் நிபந்தனைகள்
CONDITIONS OF IMF LOAN AGREEMENT

[අ.භා. 6.10]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේ විවාදය සඳහා පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"රට මුහුණ පා සිටින දැවැන්ත ගෙවුම් ශේෂ අර්බුදයට මුහුණ දීම අරඹයා, ශ්‍රී ලංකා ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලබාගත් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක ණය ගිවිසුම හා ඊට අදාළ කොන්දේසි මේ ගරු සභාවට සවිස්තරාත්මකව ඉදිරිපත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කර සිටී."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටේ ඉතා වැදගත් රාජ්‍ය මූල්‍ය හා සම්බන්ධ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ගිවිසුම පිළිබඳව මෙම යෝජනාව ඉදිරිපත් කරමින් කරුණු දක්වන්නට ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් අද දින මට ඉඩ දීම ගැන මම ප්‍රථමයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකයකු බව. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලෝකයේ බරපතළ ලෙස ගෙවුම් ශේෂ අර්බුදයක් ඇති වෙච්ච අවස්ථාවකදී ඒ ගෙවුම් ශේෂ අර්බුදයට මුහුණ දීම සඳහා ද්‍රවශීලතා වත්කම් සපයලා, ණය සපයලා ඒ රටවලට යම් යම් නියමයන් ඉදිරිපත් කරනවා. පසු ගිය දා අපේ රටේ ඇති වුණ දැවැන්ත ගෙවුම් ශේෂ අර්බුදය හා විදේශ විනිමය අර්බුදය කරුණු කොට ගෙන රජය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා වට රාශියක් පවත්වා, ඒ අනුව අවුරුදු තුනක ඉදිරි කාලපරිච්ඡේදයට වාරික හයකින් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක ණය මුදලක් ලබා ගැනීම පිළිබඳව ගිවිසුමකට එළඹුණා. එසේ ගිවිසුමකට එළඹුණා පමණක් නොවෙයි, ඒ ගිවිසුම් ප්‍රකාරව අපේ රටට ඇමෙරිකානු ඩොලර් මිලියන 168ක් පළමු වාරිකය ලෙස ලැබුණා.

දැන් මේ ගරු සභාවට අයිතිය තිබෙනවා, ඒ ගිවිසුම අත්සන් කිරීමේදී මුදල් අමාත්‍යාංශය විසින් -රජය විසින්- රටේ ආර්ථික කළමනාකරණය සම්බන්ධයෙන්, මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන්, ගෙවුම් ශේෂ කළමනාකරණය සම්බන්ධයෙන්, ආර්ථිකයේ ස්ථායිකරණය ඇති කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරපු කොන්දේසි මොනවාද කියලා දැන ගන්න. මේ වන විට "International Monetary Fund - IMF Country Report No. 16/150 - Staff Report for the 2016 Article IV consultation and request for a three-year extended arrangement under the extended fund facility" යනුවෙන් පිටු එකසිය ගණනක වාර්තාවක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ website එකේ තිබෙනවා. ඒ නිසා දැනට ඉදිරිපත් වෙලා තිබෙන වාර්තාව ප්‍රසිද්ධ කරවීම සඳහාත්, මහජනතාවට අවබෝධයක් ලබා දීම සඳහාත් ඔබතුමාගේ කාරුණික අනුග්‍රහය යටතේ එය හැන්සාඩ් වාර්තාවට ඇතුළු කරන්න බැරි නම් පුස්තකාලයේ තැබීම සඳහා මා **සභාගත*** කරනවා.

ඒ වාර්තාව සභවන්නට බැහැ. මොකද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ website එකට ගියාම වාර්තාව තිබෙනවා. ඒ නිසා ඒක අපේ රටේ සිංහලෙන් ප්‍රසිද්ධ කර ගැනීම සඳහා මම මෙය සභාගත කළා. මේ අර්බුදය අපි මේ ගරු සභාවේදී හංගන්නේ නැතුව සාකච්ඡා කළ යුතු වෙනවා. "මේ ඔක්කෝම කළේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව, මහින්ද රාජපක්ෂ, මහින්ද රාජපක්ෂ" කියමින් හිටියොත් රටේ මූලික ප්‍රශ්නයට විසඳුම් ලැබෙන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව නිම වෙන විට මේ රටේ ගෙවුම් ශේෂය අතිරික්තයක් තිබුණා. 2014 වර්ෂයේ ගෙවුම් ශේෂ ගිණුමේ අතිරික්තය මිලියන 1,369යි. 2015 වර්ෂය වන කොට -එක වර්ෂයක් යන කොට- මිලියන 1,487ක ගෙවුම් ශේෂයේ හිඟයක් ඇති වුණා. එතකොට තිබුණු අතිරික්තය බිලියන 1.3 සම්පූර්ණයෙන් නැති වෙලා ගිහිල්ලා බිලියන 1.4ක හිඟයක් ඇති වුණා.

එසේ වුණේ ඇයි? රජය බලයට පැමිණ දින සියයේ වැඩ පිළිවෙළ යටතේ, විශේෂයෙන් ඉන්දියාවට වාසි සැලසීම සඳහා මෝටර් වාහන ආනයනය කරන්නට ඉඩ දුන්නා. එන්ජින් ධාරිතාව 1,000ට අඩු මරුටි මෝටර් රථ ඉන්දියාවේ ඉඳලා තොග වශයෙන්, "වක්කඩ කැඩුවා වාගේ" ලංකාව ඇතුළට එන්න පටන් ගත්තා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2015 වර්ෂයේදී පමණක් ඉන්දියාවෙන් මෝටර් වාහන ආනයනය සියයට 637කින් වැඩි වෙලා තිබෙනවා. අනෙක් අතට, රට ඇතුළේ අය වැය යෝජනා මඟින් වැටුප් වර්ධකයන් ලබා දීම, සමෘද්ධි දීමනා ඉහළ නැංවීම යනාදිය තුළ රටේ සමස්ත ඉල්ලුම - aggregate demand

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

එක - වැඩි වුණා. සමස්ත ඉල්ලුම වැඩි වුණත් ඒ හා සාපේක්ෂව දේශීය නිෂ්පාදනය, සැපයුම නැති වුණාම ඒ භාණ්ඩ ආනයනය කරනවා. ඒ අනුව ආනයනය වැඩි වුණා. ආනයනය වැඩි වෙන කොට, ආනයන වැඩිවීමේ වේගයට සාපේක්ෂව අපනයනය අඩු වුණා. තේ අපනයනය අඩු වුණා; රබර් අපනයනය අඩු වුණා; මැණික් අපනයනය අඩු වුණා. ඒ වාගේම, විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් ලංකාවට එවන ආමුඛ ප්‍රේෂණ පහත වැටුණා; පිට රට රැකියා කරන අය මෙහාට එවන මුදල් ප්‍රමාණය අඩු වුණා. Colombo Port City ව්‍යාපෘතිය නතර කරලා, නෙළුම් කුළුණ සෑදීම නතර කරලා චීනය සම්බන්ධයෙන් දේශපාලන වෛර චේතනාවෙන් කටයුතු කිරීම කරණ කොට ගෙන, ණයත් සමඟ සෘජු විදේශ ආයෝජන 2014 වර්ෂයේ රුපියල් මිලියන 1,635යි. එය 2015දී රුපියල් මිලියන 1,161දක්වා 474කින් අඩු වුණා. ආණ්ඩුව බලයට ආවාට පසුව, පෙබරවාරි මාසයේ 27වැනිදා මහ දවල්, මහ බැංකුවේ, මහා මුදල් මං කොල්ලය සිද්ධවීම තුළින් සමස්ත - [බාධා කිරීමක්] ඔව්. ඔක්කෝම "මහා." මහ දවල්, මහ බැංකුවේ, මහා මුදල් මං කොල්ලය තුළ දැනට මතුපිටට පෙනෙන අලාභය නොවෙයි ඇත්ත අලාභය වෙන්නේ. අවුරුදු තිහක කාල පරිච්ඡේදයකටයි මේක නිකුත් කළේ. ඊට පස්සේ මාර්තු 29වැනිදා අවුරුදු 14යි මාස එකකට සියයට 14.23ක පොලියට සිදු කළ අසාමාන්‍ය බැඳුම්කර නිකුතුව තුළින් හා ප්‍රථම බැඳුම්කර නිකුතුව තුළින් දැනට සිද්ධ වෙලා තිබෙන පාඩුව ඝණක විශේෂඥයන්, මූල්‍ය විශේෂඥයන් ගණන් බලා තිබෙන ආකාරයට රුපියල් කෝටි 15,000ක්. මේ නිසා ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්වසනීයභාවය කඩා වැටුණා. මේ කඩා වැටීමේ ප්‍රතිඵලය වුණේ, අපේ රජයේ සුරැකුම්පත්වල, භාණ්ඩාගාර බිල්පත්වල, බැඳුම්කරවල විදේශිකයන් ආයෝජනය කර තිබෙන මුදල් ආපසු එම රටවලට යන්න පටන් ගැනීමයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

විදේශිකයන් බැඳුම්කර හා බිල්පත්වල රුපියල් බිලියන 456ක් දමා තිබුණා. එය 2015 වන විට රුපියල් බිලියන 303 දක්වා අඩු වුණා. රුපියල් බිලියන 153ක් ආපහු අරගෙන ගියා. මේ සඳහන් කරන්නේ 2015 වර්ෂයේදී පමණක් සිදුවූ පාඩුවයි. මේ විධියට අරගෙන ගිය ප්‍රමාණය මේ වන විට කොපමණද, ඒ ප්‍රමාණය තව ඊට වඩා වැඩි වෙලා තිබෙනවා.

මේ තත්ත්වයත් එක්ක දිගින් දිගට රුපියල කඩා වැටෙන්න පටන් ගත්තා. 2012දී අපි ඩොලරයකට ගෙව්වේ රුපියල් 127යි. 2013දී ගෙව්වේ රුපියල් 129යි. 2014දී ගෙව්වේ රුපියල් 131යි. දැන් ඩොලරයකට රුපියල් 149ක් ගෙවනවා. සියයට 13කින් රුපියල මස්තබාල්දු වෙලා අවප්‍රමාණය වුණා. මෙහෙම අවප්‍රමාණයවීමත් එක්ක රටේ, ජාතියේ ණයබර, අපට නොපියවා තිබෙන ණය ප්‍රමාණය රුපියල් බිලියන 285කින් වැඩි වුණා. රුපියල devalue වීමත් එක්ක රටේ ණයබර තව රුපියල් බිලියන 285කින් වැඩි වුණා. ඒක මේ කථා කරන සංස්ථා පාඩුව, එයාර් ලංකා පාඩුව වාගේ නොවෙයි. රුපියල් බිලියන 285කින් ඒ ණය ප්‍රමාණය වැඩි වුණා.

ඊට පස්සේ ණය ගැනීම වර්ධනය වෙලා තිබෙන ප්‍රමාණය ගැන කිව්වොත්, තමුන්නාන්සේලා පුදුම වෙයි. 2014 විදේශ ව්‍යවහාර මුදල්වලින් ලංකාව ලබා ගත්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 20.4යි. 2015 වර්ෂයේදී විදේශ ව්‍යවහාර මුදලින් ලබා ගත්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 222.4යි. සියයට 1,010කින් විදේශ ව්‍යවහාර මුදලින් ලබා ගත්ත ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ලංකා ඉතිහාසයේ එහෙම වෙලා තිබෙන එකම අවුරුද්ද 2015 බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මොකද, 2014 වර්ෂයේදී විදේශ ව්‍යවහාර මුදලින් ගත්ත ණය රුපියල් බිලියන 20.4යි තිබුණේ. 2015දී රුපියල් බිලියන 222.4ක් ගත්තාම, එතැන සියයට 1,010කින් විදේශ ව්‍යවහාර මුදලින් ගත්ත ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා.

රුපියල පවත්වාගෙන යාම සඳහා මහ බැංකුවේ විශේෂඥ නිලධාරීන්ගේ උපදෙස් නොතකා මහ බැංකු අධිපතිගේ බලකිරීම මත දිනපතාම වෙළඳ පොළේ ඩොලර් විකිණීමෙන් සතියක් ඇතුළතදී ඩොලරය රුපියල් 130ට ගෙනෙනවා කියලා මුදල් අමාත්‍යාවරයා රටට කිව්වා. මේ ඩොලරය එහෙම අතින් හදන්න පුළුවන් එකක් නොවෙයි. මහින්ද රාජපක්ෂ යුගයේ අතින් හදලා ඩොලරය තියා ගන්න බැරි වුණා. මොකද, ඩොලරය තියා ගන්න සල්ලි දැම්මොත් සංචිතය කඩාගෙන වැටෙනවා. අර එදා 127, 129, 141 කියලා අවුරුදු තුනක් තියා ගත්තේ කෘත්‍රිම විධියට නොවෙයි. පොඩි ගණනක් හැම අවුරුද්දේම දාලා තිබෙනවා. නමුත් මෙහෙම නාය යන විධියට රුපියලේ අගය රකින්න මැදිහත් වුණේ නැහැ.

මම තමුන්නාන්සේලාට කියන්න සතුටුයි, 2015දී විතරක් රුපියල ආරක්ෂා කරන්න රුපියල් මිලියන 3,249.53ක් දාලා තිබෙන බව. 2016දී රුපියල් මිලියන 1,240.04ක් දාලා තිබෙනවා. මේ වනකොට රුපියල ආරක්ෂා කරන්න රුපියල් මිලියන 4,480ක් දාලා තිබෙනවා. රුපියල රකින්න කරපු intervention එක මේ තරම් විශාල ප්‍රමාණයක් වෙච්ච දවසක් ලංකා ඉතිහාසයේ කවදාවත් නැහැ. ඉතින් එතකොට විදේශ සංචිතය මොකද, වුණේ? 8.2ට තිබුණ ජාත්‍යන්තර සංචිතය මේ වනකොට 4.4 දක්වා පල්ලෙහාට වැටිලා තිබෙනවා. මේක බරපතළ මූල්‍ය අවධානම් තත්ත්වයක්. ලෝකයේ ඕනෑම රටක් ගත්තොත් මේ කාරණය මීට වඩා බරපතළ ලෙස සාකච්ඡා කළ යුතු තත්ත්වයක් වනවා. ඒ සමඟම මෙලෙසින් අධික ලෙස ණය ගැනීම කරණකොට ප්‍රතිඵල දෙකක් ඇති වුණා. පොලී අනුපාතය දැවැන්ත ලෙස ඉහළ ගියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාර්තු මාසයේ 29 වෙනිදා භාණ්ඩාගාර බැඳුම්කරයන් නිකුත් කළා, අවුරුදු 14යි මාස 1කට. ආණ්ඩුව ඒ ණය ගත් පොලී අනුපාතය සියයට 14.23යි. ඒ අනුව දීර්ඝ කාලයක් single-digit ලෙස තිබුණු පොලී අනුපාතය double-digit වෙලා සියයට 14.23ක් වුණා. එතකොට මුළු රටේම ණය ගන්න, ගන්න පොලිය දැන් අසාමාන්‍ය ලෙස ඉහළ යනවා. ඒ පොලිය ගෙවීම වර්ෂයෙන් වර්ෂයට අවුරුදු තිහ හතළිහ කරන්න වෙනවා. මේ ප්‍රමාණය රටට දැරිය නොහැකි ප්‍රශ්නයක් බවට පත් වුණා. විදේශ වත්කම්වලට විදේශ විනිමය ගලා ඒම් හා ගලා යාම් කොච්චරද කියලා මම කියන්න කැමැතියි. 2015දී විනිමය ගලා ආපු ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 12,642.06යි. ඊට පසුව 2015දී විනිමය ගලා යාම් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 13,347යි. එතකොට විනිමය ගලා ඒම් හා විනිමය ගලා යාම් ප්‍රමාණය අතර වෙනස ඇමෙරිකානු ඩොලර් මිලියන 705යි. 2014 මැයි මාසය වෙනකොට සංචිතයට විදේශ විනිමය ගලා ඒම් ඩොලර් මිලියන 5,147යි. විනිමය ගලා යාම් ප්‍රමාණය ඩොලර් මිලියන 6,697.6යි. එතකොට රටින් ගලා ගිය ප්‍රමාණය ඩොලර් මිලියන 1550.6ක් වැඩියි. අවුරුදු දෙක තුළ රටින් විදේශ විනිමය ගලා ගිය ප්‍රමාණය ඩොලර් මිලියන 2,258කින් වැඩි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙලෙසින් නරක විදේශ විනිමය තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ ලංකාවේ කිසිදු ආණ්ඩුවකට නොවුණ වාසියක් සිදු වෙලා තිබෙද්දියි. ලෝක වෙළඳ පොළේ තෙල් මිල අඩුවීම නිසා රටින් පිටට ගලා යාමට තිබූ විදේශ විනිමය ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5ක් මේ රටේ ඉතුරු වුණා. දැන් මේ අවුරුදු 3කට දහසකුත් එකක් කොන්දේසියටතේ IMF එකෙන් ණය ගන්නවා ඩොලර් බිලියන 1.5ක්. තෙල් මිල අඩුවීම නිසා ඩොලර් බිලියන 2.5ක් අපේ රට තුළ ඉතුරු වුණා. මම කියන්න කැමැතියි, 2014 අපේ ආණ්ඩුව කාලයේ ලංකාවට තෙල් ආනයනය කරන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 4,597ක් වියදම් වුණා. එය ආයාත වියදමෙන්

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

සියයට 24ක්. 2015 වර්ෂයේදී මේ සඳහා ගියේ ඇමෙරිකානු ඩොලර් මිලියන 2,700යි. ආනයන වියදමෙන් තෙල් ගෙන්වන්න දැන් යන්නේ සියයට 14යි. 2015 වර්ෂයේදී විතරක් ඩොලර් මිලියන 1,897ක් ඉතුරු වුණා. මේ වර්ෂයේ මැයි වෙනකම් ඉතුරු වෙච්ච ප්‍රමාණය ගත්තාම, ඛනිජ තෙල් රටින් ගෙන ඒම සඳහා ලංකාවේ හැම ආණ්ඩුවකින්ම එළියට ගිය ප්‍රමාණයට සාපේක්ෂව රට ඇතුළේ ඩොලර් බිලියන 2.5ක් ඉතුරු වුණා. ඒක වාෂ්ප වුණේ කොහොමද? මෙච්චර ණය ගත්තේ ඇයි? මෙච්චර ගිනි පොලියට ගත්තේ ඇයි? මේ නිසා රටේ සම්පූර්ණ මූල්‍ය කළමනාකරණය කඩා වැටිලා අද IMF එක ජුනි මාසයේ 8 වෙනිදා වාරිකය ඩොලර් මිලියන 169ක් දෙනවා. ජුනි 8වෙනිදා 169ක් දුන්නාම, 8 වෙනිදාම වෙළඳ පොළට දානවා ඩොලර් මිලියන 126ක්. ඊට පස්සේ ජුනි 10 වෙනිදා ඉන්දියාවෙන් අරගෙන තිබුණා ඩොලර් මිලියන 1.5ක්. ඒකෙන් ඩොලර් මිලියන 400**ක්** ගෙවලා තිබුණා. එතකොට ඉතිරිය ඩොලර් මිලියන 1.1යි. එයිනුත් ඩොලර් මිලියන 700ක් ජුනි මාසයේ 10 වෙනිදා ඉන්දියාවට ගියා. ඊට පසුව ජුනි 30 වෙනිදා මහ බැංකු අධිපති ඉවත් වෙන දවසේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට රටින් පිට රටට මිලියන 631.81ක් ගියා. ඉතින් මේ තත්ත්වය තුළ අද මේ රටේ මූල්‍ය අර්බුදය, විදේශ විනිමය අර්බුදය තිබෙන්නේ ගිනි කන්දක් වාගේ උඩට රත්වෙලායි.

පමණට වඩා වැඩියෙන් රත් වුණු -overheated- තත්ත්වයක් තුළ තමයි විදේශ විනිමය තිබෙන්නේ. එම නිසා මම මුදල් අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැති කාරණයක් තිබෙනවා. මම බොහොම අවංකව මේ සංඛ්‍යා දත්ත ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා ගත්තේ. අලුතෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නියෝගයක් නිකුත් කරලා තිබෙනවා විනිවිද පෙනෙන ආකාරයට මේ තොරතුරු මහජනයාට ඉදිරිපත් කිරීම සඳහා "Weekly Economic Indicators" හැම දාම ශ්‍රී ලංකා මහ බැංකුවේ website එකේ පළ කරවන්න කියලා. නමුත් ගරු මුදල් ඇමතිතුමනි, මාස දෙකක් විතර පමා වුණු ඉලක්කම් තමයි ඒකේ තිබෙන්නේ.

අපට විතරක් නොවෙයි, මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි, ලෝකයේ, රටේ ඉන්න ඕනෑම කෙනෙකුට මේ රටේ මූල්‍ය තත්ත්වය, විදේශ සංචිත තත්ත්වය, විනිමය අනුපාතයේ තත්ත්වය, දාපු ඩොලර්වල තත්ත්වය, මිල මට්ටම් යනාදිය පිළිබඳ මූලික ආර්ථික දර්ශක -"Weekly Economic Indicators"- සතියෙන් සතියට website එකේ දැමීම සඳහා අවශ්‍ය උපදෙස් නව මහ බැංකු අධිපතිවරයා යටතේවත් සිද්ධ වෙයි කියලා අපි විශ්වාස කරනවා. අපිට දැන ගන්නට තිබෙන ආකාරය අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කර ගත්ත ගිවිසුමේ ප්‍රධාන කොන්දේසි බවට පත් වෙන්නේ මේවායි. පළමුවෙනි එක, රජයේ ආදායම් වැඩි කරන්න ඕනෑ. රජයේ ආදායම් වැඩි කරන්නට ක්‍රම දෙකයි තිබෙන්නේ. බදු ආදායම සහ බදු නොවන ආදායම. බදු ආදායම් වැඩි කිරීමේ කවර එකඟතාවකට ඔබතුමන්ලා පැමිණිලා තිබෙනවාද කියලා මේ සභාවට, අපට සාකච්ඡා කරන්නට කියන්නට ඕනෑ. දෙවෙනි එක, වියදම් අඩු කිරීම. වියදම් අඩු කරන විට පුනරාවර්තන වියදම් හෝ ප්‍රාග්ධන වියදම් - recurrent expenditure හෝ capital expenditure - කපන්න වෙනවා. ඒවා කපන්නේ කොහොමද? කොහෙන්ද කපන්නේ? කොපමණද කපන්නේ?

ඊළඟට, අය වැය පරතරය -budget deficit එක- 2020 වන විට සියයට 3 දක්වා අඩු කරන්නට ඕනෑ. අය වැය පරතරය අඩු කර ගන්නේ කෙසේද? ඊළඟට, intervention. රුපියලේ අගය කොපමණ දුරට නිදහසේ තීරණය වෙන්න ඉඩ හරිනවාද, නැද්ද? ඊළඟට, පහළට වැටිලා තිබෙන විදේශ සංචිත නැවත තිබුණු තත්ත්වයට ඉහළ නැංවීම සඳහා තිබෙන කොන්දේසි මොනවාද? මේ සඳහා යෝජනා කරන ආර්ථික ප්‍රතිසංස්කරණ මොනවාද? ප්‍රතිසංස්කරණ පිළිබඳව තමුන්නාන්සේලා එකඟවෙලා තිබෙන්නේ මොනවාද කියන එක මේ පාර්ලිමේන්තුව රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රබුද්ධ පාර්ලිමේන්තුවක් ලෙස ඒ පිළිබඳ සාකච්ඡාවක් කරන්න, -මඩින් නොවෙයි ගොඩින් ඇවිල්ලා මේක කරගෙන යන්න- අදාළ වන ආකාරයට ප්‍රබුද්ධ සංවාද මණ්ඩපයක් බවට පත් කරන්නට ඔබතුමා IMF එකත් සමඟ ඇති කර ගත්ත ගිවිසුමේ කරුණු ටික වඩාත්ම විස්තරාත්මකව රටේ ජනතාවට පැහැදිලි කරන්නට කාරුණික වෙන ලෙස ඉල්ලා සිටිමින්, මුදල් අමාත්‍යතුමාට ජය පතමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 6.28]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(*மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன*)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු බන්දුල ගණවර්ධන මැතිතුමා විසින් ගෙන එන ලද සභාව කල් තැබීමේ යෝජනාව ස්ථිර කිරීමට ලැබීම ගැන මම ඉතාමත්ම සතුටු වෙනවා. මොකද, අද ඉතාමත්ම බරපතළ නොසන්සුන්කාරී තත්ත්වයකට අපේ රට පත් කරලා තිබෙනවා. අද අපේ ජනතාවට උහුලා ගන්නට බැරි තරම් බදු බර, ජනතාවට තේරුම් ගන්නට බැරි තරම් කරදර රාශියක් මේ වන විට සමාජයේ ඇති වෙලා තිබෙනවා. අද හැම අංශයකින්ම ජනතාව පීඩාවට පත් කිරීමේ වැඩ පිළිවෙළක් තමයි ක්‍රියාත්මක වෙන්නේ. ජනතාවගෙන් සල්ලි උදුරා ගන්න පුළුවන් හැම තැනකින්ම උදුරා ගන්න තමයි කල්පනා කරන්නේ. ඒ එක්කම ජනතාවගේ ආදායම අඩු වෙලා තිබෙනවා. තේ, රබර් වගාව සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටිලා තිබෙනවා. ඒ නිසා අපනයන ආදායම අඩු වුණා. අපනයන ආදායම අඩු නිසා රජයේ ආදායම අඩු වුණා. රජයේ ආදායම් අඩු වුණු නිසා රජයේ වියදම් පියවා ගන්න බැරි වෙනවා. වියදම් පියවා ගන්න බැරි වන විට වෙනත් මාර්ග සොයන්නට වෙනවා. එක්කෝ රටකින් ණය ගන්න වෙනවා. එහෙමත් නැත්නම් ජනතාවට බදු බර පටවන්නට වෙනවා.

අද අපි මේ විධියේ විෂම චක්‍රයක කර කැවෙනවා. විෂම චක්‍රය කර කැවීම කොතැනින් හෝ අපි නතර කර ගන්නට ඕනෑ. ඒක තමයි අපේ ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා යෝජනා කරන්නේ. මේකට පක්ෂ භේදයක් නැහැ. මේකට විරුද්ධ පක්ෂයද, ආණ්ඩු පක්ෂයද කියලා භේදයක් නැහැ. අපි කවුරුත් එක්ක එකතු වෙලා මේ කටයුතු කරන්නට කල්පනා කරන්න ඕනෑ. මොකද, මේක අපේ රට. තව තවත් විනාශ වෙන්න ගියොත්, තව තවත් නැති වෙන්නට ගියොත් අපට අපේ රට නැති වෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. හෙට අනිද්දා වන විට අපේ රටේ මහ දැවැන්ත කලකෝලාහල ඇති වෙන්නට පුළුවන්. මොකද, මිනිස්සු ඒ තරම් කැකෑරිලා, කලකිරිලායි ඉන්නේ. කොහේදී හෝ මේ ප්‍රශ්නය පුපුරන්නට ගත්තොත් කිසි කෙනෙකුට නවත්වන්නට බැරි තැනක දැන් තිබෙන්නේ. ජනතාව තුළ ඒ තරම් මේ කැකෑරීම තිබෙනවා. එම නිසා මේ පාර්ලිමේන්තුවේ ඉන්න අපි සියලු දෙනාගේම වගකීමක් තිබෙනවා ජනතාවට මේ තත්ත්වය වසන් කරන්නේ නැතිව පැහැදිලි කරන්නට.

ලෝක බැංකුවත් එක්ක ඇති කර ගත්ත ගිවිසුමක් තිබෙනවා නම් ඒ ගිවිසුම පිළිබඳව හෙළි කරන්න. මේ VAT එක දමන්නේ ඇයි? එය හැර ආණ්ඩුවට වෙන ගමනක් නැහැ. මේ බදු එකක්වත් අඩු කරන්න පුළුවන්කමක් නැහැ. ජනාධිපතිතුමා තුන් හතර වතාවක් පොරොන්දු වුණා, මේ VAT එක සංශෝධනය කරනවායි කියලා. විවිධ අවස්ථාවල පොරොන්දු වුණා. නමුත්, අද වන තුරු ඒක කරන්න බැරි වුණා. ඇයි ඒ? ඒක නැතිව ආණ්ඩුව ගෙන යන්න බැහැ. ඉතින්, මේ විධියට ඉදිරියේදී තව තවත් බදු

බර දැම්මොත් මොකද වෙන්නේ? අද ඖෂධවල මිල අහස උසට ඉහළ ගිහිල්ලා. දියවැඩියා රෝගියෙකුට මාසයකට දෙන බෙහෙත්වලට රුපියල් 6,400ක් වැඩිපුර ගෙවන්න වෙලා, VAT එක දැම්මාට පස්සේ. ඉතින්, මේ හැම අංශයෙන්ම ජනතාවට පීඩා විඳින්න වෙනවා නම් මේක කොතැනදී හෝ පුපුරනවා. ඊට කලින් මේකට මොනවා හෝ කරන්නය කියන එකයි අපි මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ.

ඔබතුමන්ලා අවංක වෙන්න. අපි සියලු දෙනාටම මේ ප්‍රශ්නය තේරුම් ගන්න පුළුවන්. එහෙම කරන්න බැරිකමක් නැහැ. මෙතැන තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මොකක්ද? මේ රජයට තිබුණේ පසු ගිය රජය පරාජය කිරීමේ වගකීම විතරයි. ඒ වුවමනාව විතරයි තිබුණේ. එතැනින් එහාට මේ රට ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියන එක ගැන කිසිම හැඟීමක්, අවබෝධයක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි ආර්ථික කළමනාකරණය බිඳ වැටී තිබෙන්නේ. ඒ නිසා තමයි අද අපේ රටේ පාලනයක් නැති වෙලා තිබෙන්නේ. ගරු මුදල් ඇමතිතුමනි, මේ වෙලාවේ මා තමුන්නාන්සේට කියන්නේ කොහොම හරි මේ රට බේරා ගන්න, මේ රටේ ජනතාවට සත්‍ය ප්‍රකාශ කරලා රට ආරක්ෂා කර ගන්න, ජනතාවගේ බදු බර තවත් වැඩි කරන්නේ නැතිව කටයුතු කරගෙන යන්නය කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා -ගරු මුදල් ඇමතිතුමා- මේ සභාවේදී පොරොන්දු වුණා, තවත් බදු ගහන්නේ නැහැ කියලා. එහෙම කියලා ගිහිල්ලා ඊළඟ දවසේ තවත් බද්දක් ගහනවා. එහෙම කරන්නේ නැතිව මේ රටේ ජනතාවගේ අවශ්‍යතා සම්පූර්ණ කරන්න. ඔබතුමා ඒ වගකීම ඉෂ්ට කරන්නය කියා ඉල්ලන අතරේ, මේ ඇති කරගෙන තිබෙන ගිවිසුම සභාගත කරලා ජනතාවට කරුණු වටහා දෙන්නය කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 6.31]

ගරු රවී කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල්තබන අවස්ථාවේදී ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාවට පිළිතුරු දීම මගේ වගකීමක් ලෙස මා සලකනවා.

නමුත්, පෙර තිබුණු සැබෑ තත්ත්වය විකෘති කරලා, ඉතිහාසය අමතක කරලා, දැන් රටේ ආර්ථිකය ගිනි කන්දක් ලෙසට එතුමා පෙන්වා දුන්නා. මා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අහන්න කැමැතියි, ඔබතුමන්ලා අපට භාර දුන්නේ, සිසිල් දිය දහරක් ද කියලා. නැහැ. ඔබතුමන්ලා ලජ්ජා නැතිව මේක ගැන defend කරන එක තමයි අපට තිබෙන ප්‍රශ්නය වන්නේ.

අපට භාර දුන්නේ දණ ගස්සපු ආර්ථිකය, අපට දුන්නේ ප්‍රාග්ධන වියදම් සහ ණය පොලී ප්‍රමාණය ගෙවන්න ආදායම මදි ආර්ථිකයක්. ඔබතුමන්ලාට දවස් සියයෙන් අපි පෙන්නුවා මොනවාද කරන්න පුළුවන් කියලා. අද අපි කරන වැඩ කටයුතු විවෘතව සිදු කරනවා. හංගන්න දෙයක් නැහැ. ඔබතුමන්ලා අපෙන් ප්‍රශ්න කරනවා, මොකක්ද මේ ගහලා තිබෙන හොර ගිවිසුම කියලා. නැහැ, අපට කිසිම ගිවිසුමක් නැහැ. අපට තිබෙන එකම ගිවිසුම තමයි ලංකාවේ ආර්ථිකය සංවර්ධනය කරන්න පුළුවන් මාර්ගය ඇති කිරීම. ආයෝජකයෝ ඇවිල්ලා අපට යෝජනා ඉදිරිපත් කළා. අපි ප්‍රතික්ෂේප කළා. ණය ගන්නවා නම්, අපට අවශ්‍ය වන්නේ අපේ කොන්දේසි මත ණය ගන්න මිසක්, ඒ ගොල්ලන්ගේ කොන්දේසි මත ණය ගැනීමක් නොවෙයි, කියන එක මා වගකීමකින් මතක් කරන්න කැමැතියි. ඒ සම්බන්ධයෙන්-

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මේ ණය මුදල ලබා ගැනීමේදී ඔබතුමා හෝ අමාත්‍යාංශයේ බලයලත් නිලධාරියකු IMF එකත් එක්ක ගිවිසුමක් අත්සන් කරලා නැද්ද?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා මෙවැනි සරල දෙයක් දන්නේ නැත්නම් ආර්ථිකය ගැන කථා කරන්නේ කොහොමද? අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක සාකච්ඡා කරනකොට ඒ කාර්යය කළා. 2009 මැයි මාසයේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ අජිත් නිවාඩ් කබ්රාල් අත්සන් කළා වාගේ මේකටත් මහ බැංකු අධිපති සහ මම අත්සන් කරලා, ප්‍රසිද්ධ කරලා website එකට දාලා තිබෙනවා. ඉතින්, මේක ගැන අහන්න දෙයක් නැහැ. මාසයක්ම ගත වුණා. ඔබතුමන්ලා මේවා ගැන නින්දෙන් නැඟිටලා කතා කරන එක තමයි තිබෙන ප්‍රශ්නය වන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

අත්සන් කරපු එක-

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අපි හොර ගිවිසුමක් ගහලා තිබෙනවාද? ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා අපට භාර දුන්නු වැටුණු, දණ ගස්සවපු ආර්ථිකය අද මෙවැනි තත්ත්වයක් තුළින් ගමන් කරන එක අද ඔබතුමන්ලාට පුදුමයක් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි හරි පාරේ යන්නේ නැතිව හරස් පාරවල්වල යනවා කියලා හිතාගෙන එහෙන් මෙහෙන් ප්‍රශ්න අහන්නේ. අද මේ රටේ ආර්ථිකය දෝලනය වනවා ජාත්‍යන්තර මට්ටමේ ඉතාමත් දරුණු තත්ත්වයක් තුළින්. චීන යුවාන් එක සියයට 33කින් අවප්‍රමාණය වනකොට, ඉන්දියානු රුපියල සියයට 28කින් අවප්‍රමාණය වනකොට අපේ රුපියල සියයට 8.4කිනුයි අවප්‍රමාණය වුණේ. ඒත් මේක අපට අමාරු තත්ත්වයක්. එහි අපට හංගන්න දෙයක් නැහැ. නමුත්, ලැබුණු දායාදය තමයි අපට ඉදිරියට ගෙන යන්න තිබෙන්නේ.

දැන්, ඔබතුමා අහනවා, කොන්දේසි මොනවාද කියලා. කොන්දේසි නැත. නමුත්, යම් පුද්ගලයකුගේ උස අඩි 6ක් නම්, බර කිලෝ 500ක් නම් දොස්තර කෙනෙක් ගිහිල්ලා අහන්න ඕනෑද, ශරීරයේ බර අඩු කරන්න ඕනෑද කියලා? අනිවාර්යයෙන්ම අඩු කර ගත යුතුයි. අන්න එවැනි දෙයක් තමයි අපේ ආදායම සම්බන්ධව අපි කළේ. දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව බැලුවාම සියයට 18.4කට තිබුණු අපේ ජාතික ආදායම මහින්ද රාජපක්ෂ කාලයේ සියයට 10.4ට අඩු වුණා. ඉතින්, රටේ ආර්ථිකයක් ගෙන යන්නේ කොහොමද? මෙන්න මේ තත්ත්වය තමයි අපි වැඩි කරන්නේ. ආදායම වැඩි කරන්න අපි යෙදුව කොන්දේසි මොනවාද? අපි කිව්වා, අපේ ආදායම වැඩි කරනවා කියලා. කොහෙන්ද වැඩි කරන්නේ? සුරාබදුවලින් මාසෙකට

[ගරු රවි කරුණානායක මහතා]

රුපියල් මිලියන 2,000ක ආදායමක් රජයට තිබුණා. අපි දැන් ඒක රුපියල් මිලියන11,800කට -සියයට 600 ගුණයකින්- වැඩි කරලා තිබෙනවා. කොහොමද? පිරිසිදු පාලනයක් තුළින්. අපි එහි බදු වැඩි කළේ නැහැ, ගෙනියන ආකාරය වෙනස් කිරීමක් තමයි කළේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ගැන බලමු. ගිය අවුරුද්දට වැඩිය සියයට 23ක ආදායමක් ඒ තුළින් අපි ලබා තිබෙනවා. ඒ ප්‍රමාණයත් සියයට 35කින් වැඩි කරන්නයි අපි මේ අවුරුද්දේ ඇස්තමේන්තු කරලා තිබෙන්නේ. අපි මේවා කරන්නේ කොහොමද? අලුත් විධි ක්‍රම මඟිනුයි. නැතුව අපි බදු වැඩි කරලා නැහැ, අඩු කරලායි තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් වඩා හොඳ කළමනාකරණයක් එකතු කිරීමක් තමයි අපි කරලා තිබෙන්නේ.

රේගුව ගැන බලමු. ගිය වර රේගුවේ ආදායම අපි ඇස්තමේන්තු කරලා තිබුණේ, රුපියල් බිලියන 420කට. නමුත්, ආදායම රුපියල් බිලියන 520ක් ලැබුණා. ඒ වාගේම ඒ රුපියල් බිලියන 520ක මෙවර අපි රුපියල් බිලියන 800කට තල්ලු කර තිබෙනවා. ඇයි, එහෙම කරන්නේ? තිබුණු වංචාව, යම් කිසි ආකාරයකට ජනාධිපති කාර්යාලයෙන් කියන "මේ container එක release කරන්න" වැනි දේවල් දැන් කෙරෙන්නේ නැහැ.

අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගෙනුත්, ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගෙනුත්, මගෙනුත් ඒ වාගේම ඕනෑම කෙනෙකුගෙනුත් අහන්න පුළුවන්, අපි ඒ කාරණය සම්බන්ධයෙන් විවෘතව සාකච්ඡා කරනවා. මොකද, අපි නොදැනුවත්වම යම් ප්‍රශ්නයක් ඇති වනවා නම්, කරුණාකරලා ඔබතුමන්ලා අපව දැනුවත් කරන්න. නමුත්, අපි විවෘතව කියා සිටින්නේ, අපි මේක පිරිසිදුව, විනිවිදභාවයෙන් යුතුවයි ඇති කර තිබෙන්නේ කියලායි. මේක දරා ගන්න බැරි රේගුවේ සියයට දෙතුන් දෙනෙක් - ඕනෑම පවුලක කළු බැටළුවෝ දෙන්නෙක්, තුන්දෙනෙක් ඉන්නවා නේ. - ගිහිල්ලා කියනවා, රේගුවේ නවීකරණයන් ඇති කරන්න අපි නව පනත් කෙටුම්පතක් ගෙනෙන්න හදනවා කියලා.

1864 තිබුණු පනත අද වන විට අවලංගු වෙලා තිබෙන නිසා එය වලංගු කරන්න කියලා අපි White Paper එකක් දාලා විවෘත කළාම මෙහි තිබෙන ප්‍රශ්නය මොකක්ද? ඔබ සියලුදෙනාටම විවෘතයි, ඕනෑ ආකාරයකට ඒ ප්‍රශ්නය සාකච්ඡා කරන්න. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කිව්වා,"ඔබතුමන්ලා ණය දෙනවා නම් අපි මේවා කරනවා" කියලා. දුන්නත් නැතත් අපි මේවා කරනවා. ඒ ගොල්ලන් ඒ යෝජනාවේ හොඳ ගුණාංග දැකලා අපට කිව්වා,"ආදායම් වැඩි කරන මාර්ග හොඳයි. අපිත් ඒවාට කැමැතියි. ඒ අනුව කටයුතු කරන්න" කියලා.

VAT එක සම්බන්ධයෙන් වැඩි කිරීමක් නොවෙයි තිබුණේ. අපි NBT එක සියයට 2ක් වැඩි කළා; VAT එක අඩු කළා. ඔබතුමන්ලා කරපු සද්දය මොකක්ද? මේ ගරු සභාවේදී අය වැය අවස්ථාවේදී ලොකු සද්දයක් කළා. මේ රට ඉදිරියට ගෙන යන්න නම් VAT එක ඕනෑ වනවා. VAT එක නැත්නම් NBT එක ඕනෑ වනවා. ඒ කියන්නේ වක්‍රාකාර බද්දක් හෝ non-regressive බද්දක් වන VAT එක හෝ යොදලා රට ඉදිරියට ගෙනියන්න ඕනෑ වනවා. ඔය දෙකෙන් එකක් කළ යුතු වනවා. නමුත්, එතැන යම් විධියකට සංශෝධනයකට ලක් වුණා. ඒ ගොල්ලන් හිතුවා, "ලෝකයේ රටවල් 196ක් තිබෙනවා. එයින් රටවල් 123ක් VAT එක පාවිච්චි කරනවා. VAT එක ක්‍රියාත්මක කරන මේ ක්‍රමය අපි ලංකාවට ගෙනියමු" කියලා. මේ බදු ක්‍රම දෙක අතර වෙනසක් තිබුණා. සියයට 12ට තිබුණ VAT එක අපි සියයට 15ක් කළා. අපි එය සියයට 11කට අඩු කළේ අය වැය තුළිනුයි. නමුත් ඒක නීත්‍යානුකූලව අඩු වුණේ නැහැ. VAT එක තිබුණේ සියයට 12කටයි. සියයට 12කට තිබුණු VAT එක සියයට 15කට වැඩි කළ එක පමණයි කළේ. අපි එහෙම කළේ ඇයි? අපට අඩු වෙන ආදායම වැඩි කරගන්න අවශ්‍ය නිසායි.

අප රටේ ඉදිරි සංවර්ධන වැඩ කටයුතු කරන්න ඕනෑ තරම් සල්ලි තිබෙනවා. මම නැවතත් එය වගකීමකින් යුතුවයි කියන්නේ. අපි හිතපු නැති විධියට ජපානයෙන් යුඑස් ඩොලර් මිලියන 4,500ක ණයක් දුන්නා. ඒ වාගේම අපි ගිය සුමානයේ ගියාම monorail ඇති කරන්න කියලා මුදල් ලබා දුන්නා. ඒ වාගේම චීනයෙන්, ඉන්දියාවෙන්, කොරියාවෙන් අපට මුදල් ලබා දුන්නා. ඉතින්, අපට ඉදිරි සංවර්ධන කටයුතු කරන්න ඕනෑ තරම් මුදල් තිබෙනවා. නමුත්, පසු ගිය රජයෙන් ලබා ගත් ණය මුදල් ගෙවන්න අපට ලැබුණු මේ ණය මුදල පාවිච්චි කරන්න බැහැ. ඒකයි අපට තිබුණු ප්‍රශ්නය. ඒ ණය ගෙවන්න ආදායම වැඩි කරගන්න අවශ්‍යයි. ඒ අනුව ආදායම වැඩි කිරීම තමයි අපි කළේ. ඒ වැඩි කරන්නේ "රාජපක්ෂගේ සියයට 7ක බද්දක්" ලෙසයි. එසේයි, මම එය නම් කරන්නේ.

දැන් මේ කරන දෙය වැරැදියි. ඔබතුමන්ලා ගිහිල්ලා කඩ වහන්න හදනවා; ඔවුන්ව අනාථ කරනවා. ඒ සිල්ලර වෙළෙන්දෝ අපි ළඟට එනවා. තමුන්නාන්සේලාගේ ඒ බංකොලොත්භාවය සුමාන දෙකකින් අපි පෙන්වන්නම්. කොහේට හරි තැනින් තැනට කිහිප දෙනෙක් ගෙනිහිල්ලා වීඩියෝ කරනවා. ඒ හොරු ටිකම තමයි තැනින් තැනට ගෙන යන්නේ. මේ විධියට ප්‍රශ්න ඇති කරන්නේ බදු ගෙවන්නේ නැතිව වංචා සහගතව ඉන්න අයයි. ඒ අහිංසක සිල්ලර වෙළෙන්දෝ ඇවිල්ලා අපට කිව්වා, "මේ ප්‍රශ්න හරහා නොදැනුවත්වම එක් එක් අයගේ දේශපාලන අරමුණු අනුව ඉෂ්ට වෙලා තිබෙනවා. අපි ඒකට එන්නේ නැහැ. නමුත්, අපේ ප්‍රශ්න තිබෙනවා. කරුණාකර ඒ ප්‍රශ්න විසඳන්න" කියලා. අපි input VAT එක ඔවුන්ට ලබලා දීලා තිබෙනවා. හිතපු නැති දෙයක් අපි කළා. ඒ වාගේම තොග ප්‍රශ්නය අපි විසඳලා දුන්නා. බදු ගෙවන්න තිබුණේ සුමාන දෙකයි, ඒකට අපි කල් දුන්නා. අපට අවශ්‍ය වුණ එකම දෙය තමයි, "කරුණාකරලා හැම ව්‍යාපාරිකයාම අපේ රටට බදු මුදල් ටිකක් ගෙවන්න" කියලා කියන එක.

අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා කොම්පැනි ලක්ෂ 20ක් තිබෙනවා. අපට VAT files තිබෙන්නේ 15,000යි; NBT files 21,000ක් තිබෙනවා; පෞද්ගලිකව ලබන ආදායම් අනුව බදු ගෙවන්නන්ගේ files 1,28,000ක් තිබෙනවා; කොම්පැනි වශයෙන් බදු files -Corporate files- 43,000ක් තිබෙනවා. මෙන්න අපේ රටේ බදු ප්‍රතිපත්තිය! ව්‍යාපාර හා කොම්පැනි ලක්ෂ 20ක් තියෙද්දී ලක්ෂ දෙකක්වත් බදු ගෙවන්නේ නැති තත්ත්වයක් තිබෙන්නේ. ඒ කියන්නේ, බදු ගෙවන්නේ මේ අයගෙන් සියයට 10යි කියන එකයි. ඉතිරි අයට VAT පනවා තිබුණත් ගෙවන්නේ නැහැ. මෙයට හොඳම උදාහරණය-

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු ඇමතිතුමනි, එතැන තිබෙන ප්‍රශ්නය මේකයි. ඔබතුමාගේ අය වැය ඉදිරිපත් කරමින් මෙම ගරු සභාවට කිව්වේ, සිල්ලර සහ තොග වෙළඳාම බද්දෙන් නිදහස් කරනවා කියායි. ඔබතුමා එහෙම තමයි මේ ගරු සභාවට කිව්වේ. ඊට පස්සේ එය 100ට අඩු කළා. ඒ අඩු කිරීම කළේත් ඔබතුමාමයි, එය නැති කරනවා කිව්වෙත් ඔබතුමාමයි. මැයි මාසයේ දෙවන දා VAT එක සියයට 15 වන කොට දවසකට රුපියල් 33,334ක ආදායමක් ලබන කෙනාත්, එනම් රුපියල් 200 ගණනේ බත් පැකට් 200ක් විකුණන කෙනාත් මේ බද්දට යටත් වෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඔන්න ඕක තමයි කියන්නේ. ඔබතුමා අභිංසක දරුවන්ට අධ්‍යාපනය දුන්නා නේ. බත් පැකට් විකුණන අයට බදු පනවා නැහැ කියා ඔබතුමන්ලා දන්නවා නේ. බදු පනවා ඇති භාණ්ඩ ලැයිස්තුවේ බත් පැකට් නැහැ කියන එක ඔබතුමන්ලා දන්නවා නේ. ඒ කියන්නේ, පලතුරු, එළවලු ආදියට -කෑමවලට- කිසිම බද්දක්- [බාධා කිරීමක්] ඔය වාගේ සිල්ලර තර්කයක් ඉදිරිපත් කරන්න එපා. ඕක වැරැදි තර්කයක්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
එහෙම නම්, රෙදි ගන්න.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
රෙදි ප්‍රශ්නය විසඳා ඉවරයි නේ. රෙදි ප්‍රශ්නය විසඳීම තමයි- [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
විසඳුවේ කොහේද? පමුණුවට ගිහිල්ලා බලන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජ්‍යතාස රාජූපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
පමුණුවේ උදේසෝෂණය කරන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඔව්, මෙතුමාගේ ආසනයේ, පමුණුවේ සිටින අයට කිසි ප්‍රශ්නයක් වන්නේ නැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ප්‍රශ්නයක් වන්නේ නැත්නම් කමක් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඕක තමයි කියන්නේ. අපි input VAT එක ලබා දුන්නා. සිතුවේ නැති විධියට ආණ්ඩුව ඉදිරිපත් වෙලා ඒ බර රජයක් වශයෙන් භාර ගත්තා. එවැනි ප්‍රශ්නයක් දැන් නැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ඔබතුමා සෞඛ්‍ය ක්ෂේත්‍රය අරගෙන බලන්න.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
සෞඛ්‍ය ක්ෂේත්‍රයේ- [බාධා කිරීමක්] ඉතින් හරි නේ- [බාධා කිරීමක්] අපි ඒ බද්ද දාලා- [බාධා කිරීමක්] එතුමා ඔය දේවල් නිකම් නැඟිටලා කියනවා. එතුමාගේ කාලයේ ආනයනය කිරීම් නැතිව කෘෂිකර්මය පවත්වාගෙන ගියා කිව්වාට වැඩිම ප්‍රමාණය ආනයනය කරපු කාලය තමයි එතුමන්ලාගේ කාලය. නමුත් ඔය විධියට නිකම් තර්ක විතර්ක නඟනවා. [බාධා කිරීමක්] ඔබතුමාට මතකද, මහින්ද රාජපක්ෂ VAT එක සියයට 22ක් දැම්මා කියලා?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ඒ වුණාට, සියලුදේට දැම්මේ නැහැ නේ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
සියලුදේට දැම්මේ නැති නිසා තමයි මෙතරම් ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. අපි සඳහන් කරන්නේ මොකක්ද? අපි VAT පනවා තිබෙන්නේ පෞද්ගලික අංශයේ සල්ලි තිබෙන අයටයි. නිදහස් අධ්‍යාපන ක්‍රමයට රුපියල් බිලියන 100ක් වැඩි කළේ මොකටද? ඔබතුමාට නිදහස් අධ්‍යාපනයත් ඕනෑ. අප මේ රට සිංගප්පූරුවත් සමඟ සංසන්දනය කළොත්, අපේ දළ දේශීය නිෂ්පාදනය සිංගප්පූරුවට සාපේක්ෂව සියයට 10යි. ඒ කියන්නේ, සිංගප්පූරුවේ එම අගය 100ක් නම් අපේ රටේ 10යි කියන එකයි. නමුත් අපේ රටේ දෙන්න තිබෙන හැම දේම නිකම් දෙනවා. ඒ රටේ ජනතාව අධ්‍යාපනය සඳහා ගෙවනවා, මේ රටේ අය ගෙවන්නේ නැහැ. සෞඛ්‍යය සඳහා ඒ රටේ ගෙවනවා; මේ රටේ ගෙවන්නේ නැහැ. විශ්වවිද්‍යාලවලට යන අය ඒ රටේ ගෙවනවා; මේ රටේ ගෙවන්නේ නැහැ. ඒ රටේ පොහොර ගැන කථා කරන්නේවත් නැහැ, අපේ රටේ පොහොර වර්ග දෙනවා; ගැබිනි මව්වරුන්ට පෝෂණ මල්ල ලබා දෙනවා. සිංගප්පූරුව ආදි සංවර්ධනය වූ රටවල දෙන්නේ නැති සහන අපේ රටේ දෙනවා. එහෙම සහන දෙන අපේ රට ලෝකයේ සංවර්ධිත රටක් එක්ක සංසන්දනය කරන්න හදනවා. මොකක්ද මේ විහිළුව? මේ සම්බන්ධයෙන් තමයි අපගෙන් ඇහුවේ. අපි ආදායම් වැඩි කරන මාර්ග පෙන්නුවා.

අපි වියදම අඩු කරන මාර්ග පෙන්වා තිබෙනවා. ඒ ගැන කියද්දී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ආයතනය, මිහින් ලංකා ආයතනය ගැන කියන්න ඕනෑ. අද උදේ ගරු අග්‍රාමාත්‍යතුමා පෙන්වා දුන්නා, නැව් දෙකක් සම්බන්ධයෙන්. එය හොර ආනයනය කිරීමක්. එදා ඒ සම්බන්ධයෙන් හිටපු අමාත්‍යවරයා කවුද? හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂයි. දැන් එතුමා පන්සල් ගණනේ යනවා, "මම ඩොලර් එකක් හෝ හොරකම් කරලා තිබෙනවා කියා ඔප්පු කරනවා නම් මම මගේ බෙල්ල කපා ගන්නවා." කියලා කියමින්. එතුමා ඩොලර්වලින් ගහන්නේ නැතිව රුපියල්වලින් ගහලා තිබුණා නම් මොකක්ද කියන්නේ?

අග්‍රමාත්‍යතුමා අද උදේ මේ සම්බන්ධයෙන් කරුණු පෙන්වා දුන්නා. එදා US Dollars මිලියන 40ක වටිනාකමක් තිබෙනවාය කියා සඳහන් කළ නැවෙහි අද වටිනාකම US Dollars මිලියන 15යි. එහෙම නම්, US Dollars මිලියන 25 කා අතටද ගිහින් තිබෙන්නේ; කොහේටද ගිහින් තිබෙන්නේ? මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන වාර්තාව- [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
Treasury Bonds සිද්ධියේ කෝටි 15,000 වංචාව ගැන-

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් ඔබතුමන්ලා දැන් COPE එකේ ඉන්නවා නේ. ඒ ගැන සොයන්න. අපි කිසිවක් හංගන්නේ නැහැ. ඔබතුමන්ලා හිතුවා, මහ බැංකු අධිපතිතුමා නැවත පත් කරනවා කියා. නමුත් නැවත පත් කළාද? නැහැ නේ. ඔබතුමන්ලා වාගේ අපි විළිලජ්ජාවක් නැතිව කටයුතු කරන්නේ නැහැ. යම් කාරණයක් තිබෙනවා නම් අපි සාකච්ඡාව මඟින් සම්මුතියට ඇවිල්ලා කටයුතු කරනවා. මා කලින් කී කාරණයට ආයෙත් එන්නම්. මහින්ද රාජපක්ෂ පන්සලෙන් පන්සලට යනවා. මේ දවස්වල වැඩක් නැහැ නේ. ඉතින් පන්සලෙන් පන්සලට ගිහිල්ලා-

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඇයි, එතුමාට පන්සලට යන්න එපා කියන්නේ?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පන්සල් යන එකේ ප්‍රශ්නයක් නැහැ. පන්සලට ගිහිල්ලා දේශපාලනය කරන එක තමයි එපා කියන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔබතුමා කොහොමද කියන්නේ, දේශපාලනය කරනවා කියා?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආගමත් විකුණන්න හදනවා. ආගමට කරපු කෙහෙල්මලක් නැහැ, ඒ කාලයේ. නමුත් සියලු පන්සල්වලට ගිහින් දේශපාලනය කරන එක තමයි කරන්නේ. අප කියන්නේ හිටපු මුදල් ඇමති වශයෙන් අඩු ගණනේ මේ ගරු සභාවට ඇවිල්ලා අපත් එක්ක විවාද කරන්න කියායි. අපි සූදානම් ඕනෑම තැනකදී විවාද කරන්න. මම එතුමා ළඟට යන්නම්. එතුමා ජ්‍යෙෂ්ඨයෙක්. මම එතුමා ළඟට ගිහිල්ලා සාකච්ඡා කරන්නම්; විවාද කරන්නම්. අපට කියන්න, මේ ප්‍රශ්නය ගැන. කොහේද මේ ප්‍රශ්නය තිබෙන්නේ?

අපට මූලිකවම තිබුණු ප්‍රශ්නය තමයි, පසු ගිය රජය ගත්ත US Dollars බිලියන 1,100ක ණය ප්‍රමාණයක් වාර්තා නොකර තිබීම. අපට ඒ ගිනි කන්ද භාර දුන්නා. බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, එදා pin එක ගලවලා දුන්න පුපුරන්න හදන grenade එක තමයි අපි අද නිෂ්ක්‍රිය කරලා මේ තරමින් ගෙනගිහින් තිබෙන්නේ. ඒකයි ඔබතුමන්ලා හොල්මන් වෙලා තිබෙන්නේ.

පී.බී. ජයසුන්දර ලජ්ජා නැතුව පසු ගිය ජනවාරි මාසයේ කිව්වා, මාස තුනකින් මේ රටේ ආර්ථිකය වට්ටනවා කියලා. අජිත් නිවාඩ් කබ්‍රාල් බලු පැටියෙක් වාගේ නිශ්ශබ්දව සිටිනවා. එදා කිව්වා, "ආර්ථික ඝාතකයෝ දෙදෙනා දෙපැත්තේ තියා ගෙන මේ රට පාලනය කරනවා" කියලා. ඒ සද්ද කරන විමල් වීරවංශ අද කෝ? අද ඒ වාගේ කථා තිබෙනවාද? කෝ මහින්ද රාජපක්ෂ? රටේ ආර්ථිකය ගැන සාකච්ඡා කරනවාද? මේ ගිනි කන්ද භාර දුන්නාම ලෝක ආර්ථිකයෙත් පෙරළියක් ඇති වුණා. නැහැ නොවෙයි. ඒ නිසා අපි හිතුවා නිකරුණේ ගිහින් ණය ගන්නවාට වැඩිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක සාකච්ඡා කරලා, සම්මුතියකට ඇවිල්ලා ලෝකයට පෙන්වන්න, අපි විනයක් ඇතිව කටයුතු කරනවා කියලා. විනය අනුව කටයුතු කිරීමක් තමයි අපි කළේ. ඒ අනුව ආදායම් වැඩි කරන මාර්ග, වියදම අඩු කරන මාර්ග අපි පෙන්නුවා. පම්පෝරි ගහමින් කරපු වියදම අපි සම්පූර්ණයෙන් අඩු කළා. එදා හම්බන්තොටට ගිහින් රාජපක්ෂ විදුහලයි, රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළයි, රාජපක්ෂ වරායයි, රාජපක්ෂ වැසිකිළියයි හැදුවා. ඒ කරපු බොරුව අපි නැවැත්තුවා.

අපි අද වග කීමකින් කියනවා, අපි රජය භාර ගත්තාට පස්සේ වියදම් අඩු කර තිබෙනවා කියා. අපේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත් අධිවේගී මාර්ගයේ එක කිලෝමීටරයක් හදන්න යන වියදම සියයට 21කට වඩා අඩු කර තිබෙනවා. මේකට කොහොමද උත්තර දෙන්නේ? එදා සිට ගත්තාම අද -අවුරුදු දෙකහමාරකින් පස්සේ- පටන් ගන්න ව්‍යාපෘතිවල වියදම එදාට වඩා සියයට 21කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේ වියදම් තමයි අපි අඩු කර තිබෙන්නේ. මේක තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කිව්වේ. අපි මීටත් වඩා අඩු කරන්න සූදානම්. නමුත්, වෙලා තිබෙන්නේ අපට දක්ෂ රජයේ නිලධාරීන්ගේ අඩුවක් තිබෙනවා. ඇතැම් නිලධාරීන් වැඩ කරන්නේ නැහැ. මේවා තමයි අපි විවෘත කරගෙන යන්නේ.

ඊළඟට, අපේ ආර්ථික වර්ධන වේගය ගැන බලමු. එය සියයට 5.7 මට්ටමට ගේන්න බැහැ මේ රටේ සල්ලි සංසරණය වෙන්නේ නැත්නම්. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා රටේ ආර්ථිකය කඩා වැටිලා කියලා. කොහේද කඩා වැටිලා තිබෙන්නේ? ආර්ථික වර්ධන වේගය සියයට 5.4 rebase එකේ තිබෙනවා. ඒ වාගේ වෙන්න සල්ලි පුළුවන් තරම් ඇවිල්ලා තිබෙනවා. පසු ගිය අවුරුද්දේ රජයේ සේවකයෙකුට රුපියල් 10,000 බැගින් ලක්ෂ 13කට දුන්නාම රුපියල් බිලියන 166ක් ආර්ථිකයට එනවා. මේ සල්ලි කොහේද යන්නේ? ඒක රාජපක්ෂගේ pocket එකට යනවාද? ඒ Pocket එකට ගිය සල්ලි තමයි අද රජයේ සේවකයන්ට දුන්නේ. ඒ වැඩි කළ ප්‍රමාණයටවත් වැඩ කරනවා නම් අපේ දළ දේශීය නිෂ්පාදනය තව සියයට 2ක, 3කින් වැඩි වන්න ඉඩ තිබෙනවා. මට දුක එසේ නොවන එක ගැනයි. ඒක තමයි අපි ඉල්ලන්නේ. පළපුරුද්දක් තිබෙන නායකත්වයක් ඇති නිසා අපි ඒකත් ඉගෙන ගෙන මේ රටේ ආර්ථිකය නිසි පරිදි කළමනාකරණය කිරීම තමයි කරගෙන යන්නේ. ඒක කිරීම ලෙහෙසි කාර්ය භාරයක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා කිව්වා වාගේ, මේක ජාතික ආර්ථිකයක්. නමුත්, අපට දුන්නේ විනාශ කරපු ආර්ථිකයක්. අපට දුන්නු ඒ විනාශ කරපු ආර්ථිකය ජාතික ආර්ථිකයක් ලෙස බොහොම ආදරයෙන් කථා කරනවා. ඔව්, අපි වැඩ කරනවා. භය වෙන්න එපා. ඔබතුමන්ලා මේ දුන්න ගිනි කන්ද අපි සිසිල් දිය දහරාවක් බවට පරිවර්තනය කරනවා. ඒක අපේ වග කීමක්.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එදා පාර්ලිමේන්තුවේදී ඇහුවා, බදු වැඩි කරනවාද කියලා. මම කිව්වා, නැහැ කියලා. ඔබතුමා කිව්වා, වැඩි කළා කියලා. කවදාද වැඩි කළේ? බදු වැඩි වුණේ ඊට පෙර මිස පසුව නොවෙයි. අපි එන අවුරුද්දේ VAT එක අඩු කරනවා. අපට අවශ්‍ය අපේ ආදායම පෙන්වලා, ඔබතුමන්ලා අනිසි ලෙස ලබා ගත් ණය ටික ගෙවන්න පටන් ගත්තායින් පස්සේ ජනතාවගේ බදු බර අඩු කිරීමයි. ඒ නිසා තමයි අපි රේගුවට කියන්නේ, අපි අලුත් විධියට කටයුතු කරන්න ඕනෑ කියලා. අපි සුරාබදු සම්බන්ධයෙන් අලුතින් සංශෝධන ගෙනාවේ ඒකයි. අපි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අගය කරනවා. එම දෙපාර්තමේන්තුව ගැන අපට ආඩම්බරයි. ඒගොල්ලෝ අපිත් එක්ක සාකච්ඡා කරලා අද අලුත් මාර්ගයක යනවා. මේවාට තමයි අපි නායකත්වය දෙන්නේ. නමුත්, ශත පහක දූෂණයක් වනවා කියලා එක තැනක් කියනවා නම්, අපි එකතු වෙලා ඒ දූෂණය නැති කරනවා කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

අපි කිව්වා, ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය අපිට කිසිසේත්ම දිගටම ඇද ගෙන යන්න බැහැ කියලා. 2009 මාර්තු මාසයේ මහින්ද රාජපක්ෂ එංගලන්තයේ ඉඳලා ලංකාවට එන

කොට business class seats 10ක් ගන්න බැරි වුණා කියලා අත්තනෝමතිකව Emirates Airline එකත් සමඟ තිබුණු ගිවිසුම අහෝසි කරලා, ඒ ආයතනය රජයට භාර ගත්තා. ඒ වාගේ නායකයන් තමයි අපට හිටියේ. දැන් බලන්න අපේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා. එතුමා යන්නේ normal aircraft එකකින්. එහෙම ගිහින් සමහර වෙලාවට පැය දෙක තුනක් Dubai International Airport එකේ ඉන්නවා අනෙක් ගුවන් යානය එනතෙක්. නමුත්, මහින්ද රාජපක්ෂ මොනවාද කළේ? මෙතැන ඉඳන් කෙළින්ම ඇමෙරිකාවට යන්න හදනවා නවත්වන්නේ නැතුව. මේ වාගේ නාස්තිකාර වියදම් නැති කරන්න කියලා තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කිව්වේ. අපි කිව්වේ, ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනයේ පරිපාලනය අපි විධිමත් කරනවා කියලා. ඒක කරන්නේ කොහොමද? අපි වාණිජ්‍යකරණය කරනවා. අපට national carrier එකක් අවශ්‍යයි. අපි ඒක ආරක්ෂා කරනවා. නමුත්, ආරක්ෂා කරන්නේ ජනතාවගේ -බදු ගෙවන්නාගේ- සල්ලි මේකට එවන එක නොවෙයි. ජපානයේ කෙනෙක් එංගලන්තයට යන්න ඕනෑ නම්, අපේ බදු ගෙවන්නෝ ඒකට සහනාධාරයක් දෙන්නේ ඇයි?

ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය 2009 මාර්තු මාසයේදී රජයට ගන්නකොට රුපියල් මිලියන 9,800ක සංචිතයක් තිබුණා. නමුත්, 2015 අපට භාර දෙනකොට මේ ආයතනයේ රුපියල් බිලියන 164ක -රුපියල් කෝටි 16,400ක- අලාභයක් තිබුණා. ණයබරතාව තව රුපියල් බිලියන 28,800ක් තිබෙනවා. මෙන්න මේ වාගේ ඒවා සම්බන්ධයෙන් තමයි අපි නිතක් තබනවා කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කිව්වේ. අපට මේවා අවශ්‍ය නැහැ. airbus ගන්නේ නැතිව අශෝක් ලේලන්ඩ් බස් ටික ගන්න අපට අවශ්‍යයි. අපි ඒවාට මුදල් වෙන් කරලා තිබෙනවා. මෙවර අය වැයෙන් අපි අධ්‍යාපනයට හිතපු නැති තරම් මුදල් ප්‍රමාණයක් වෙන් කළා. එනම්, රුපියල් බිලියන 154ක් වෙන් කරලා තිබෙනවා. සෞඛ්‍යයට ඒ ආකාරයෙන් රුපියල් බිලියන 80ක් වෙන් කළා. අපි මෙන්න මේවා ඔක්කෝම කරලා තිබෙන්නේ නාස්තිකාර වියදම් නැති කරලායි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යම් කොන්දේසි දෙකක් දැම්මාට අපි primary deficit එක ප්‍රතික්ෂේප කළා. මේක පුළුවන් තරම් අඩු කරන්න ඕනෑ. එලෙස අඩු කරන්නේ මොකද? අපි යම් විධියකින් නිල අගයක් එකතු කරන්න ඕනෑය කියන පදනමින්. ඒකට අපි යම් විධියකින් නම්‍යශීලීව හිතුවේ, "ඔව්, export diversification එකක් තුළින් නිල අගයක් එකතු කරන්න පුළුවන් නම්, මේ ආර්ථිකයට හොඳයි" කියලායි. ඒවා අපි නිල නොවන මට්ටමට කථා කරලායි මේ ආර්ථිකය හැඩගස්වා තිබෙන්නේ. නමුත්, අවුරුදු දෙකකට මේ ආර්ථිකය ක්‍රියාත්මක වනවා මිසක්, මේක අවුරුදු ගණනාවකට හිර කරලා තිබෙන ආර්ථිකයක් නොවෙයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙනුත් ජූලි මාසයේ අග වනකොට අපේ රටේ තිබෙන තත්ත්වය බලන්න එනවා. ඒ ගොල්ලන් ජුනි 30වෙනි දා තිබෙන තත්ත්වය බලා තිබෙනවා. අපට භාර දුන් ආර්ථිකයත්, දැන් ආර්ථිකයත් බලා ඒ ගොල්ලන් පුදුම වෙලා තිබෙනවා. ඒ ගොල්ලන්ටත් වාර්තා කරලා නැති US Dollars බිලියන 1,300ක් අද අපි වාර්තා කරලා තිබෙනවා. අපි මෙවැනි විනිවිදභාවයකින් මේ අමාරු ආර්ථිකය කළමනාකරණය කරලා තිබෙනවාය කියලා ඒ ගොල්ලන් පිළිගත්තා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ යෝජනාව ඉදිරිපත් කිරීම මම අගය කරනවා. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය එකක්. මිහින් ලංකා ආයතනය කියන්නේ තව අනවශ්‍ය වියදමක් දැරීමක්. ඔය වාගේ ඒවා තමයි අපි කිව්වේ. මේ ආයතන අපි ඒකාබද්ධ කරනවා. ඕනෑ නැති ඒවා අපි වහලා දමනවා. CPC එක කවදාවත් අපි පෞද්ගලීකරණය කරන්නේ නැහැ. අපි ඒකට ආයෝජනය කරනවා. Lanka IOC එකට සිය දෙනෙකුගෙන් රුපියල් මිලියන 3,000ක් වාගේ හොයාගන්න පුළුවන් නම්, අතැන 10,000ක් තියාගෙන ඇයි මෙපමණ අලාභයක් වන්න අවශ්‍ය? අපි ඒක ලාභයක් බවට පරිවර්තනය කරනවා. ඒකට අවශ්‍ය සියලු කටයුතු අපි කර ගෙන යනවා. ඒ ආකාරයෙන්ම විදුලිබල මණ්ඩලය ඉතාමත් ක්‍රියාශීලී ආයතනයක් බවට පරිවර්තනය කරනවා. නමුත්, යම් ප්‍රමාණයකට වැඩිය කරන්න ගිහිල්ලා තිබෙන තත්ත්වයත් නැති කරන එක තමයි දැන් වෙලා තිබෙන්නේ. දැන් මාස තුන, හතරකට පෙර එක පාර හැම තැනම ලයිට් යන්න පටන් ගත්තා. මේවා කුමන්ත්‍රණකාරී ස්වරූපයේ වැඩ. ඔය රාජපක්ෂ කෑල්ලක්, දෙකක් එහේ මෙහේ ඉන්න නිසා ඔය ප්‍රශ්න ඇති කරනවා. අපි මේ හැම දේම රාජපක්ෂලාට දමන්නේ නැහැ. නමුත්, අපි දැම්මොත් පෙන්වනවා, මෙන්න මෙහෙම තමයි කළේ කියලා. මෙන්න මේක තමයි වන්නේ කියන එක තමයි අපි පෙන්වා දීලා තිබෙන්නේ. ඒක විධිමත් කිරීම අපේ කටයුත්තක්. State-owned enterprises මීට වැඩිය වාණිජකරණයක් සමඟ කටයුතු කිරීම අවශ්‍යයි කියලා අපි පිළිඅරගෙන තිබෙනවා. ඒකට අලාභයක් ඇති කරන්න අවශ්‍ය වන්නේ ඇයි?

නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා මම අගය කරනවා. මහින්ද රාජපක්ෂ කාලාන්තරයේ ලංගම ඔහේ වහගෙන යන තත්ත්වයකට කුමාර වෙල්ගම ඇමතිතුමා තුළින් ක්‍රියාත්මක වුණාට, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා බොහොම ඕනෑකමින් මේ ආයතනය පණ අරගෙන ඉතාමත් ක්‍රියාශීලී ආයතනයක් බවට පරිවර්තනය කරගෙන කටයුතු කර ගෙන යනවා. අපි කොහේවත් සඳහන් කර නැහැ, මෙන්න මේ මිනිස් ප්‍රමාණය අඩු කරනවා කියලා. අපි රාජ්‍ය සේවයේ රක්ෂා ඇති කරනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. 2020 වර්ෂය වනකොට -මේ අවුරුදු පහ තුළ- අපි රක්ෂා ලක්ෂ 10ක් ඇති කරනවා කියන එක ඒ ආකාරයෙන්ම අපි ක්‍රියාත්මක කරනවා. මේ සුමාන දෙක, තුන තුළ අපේ ප්‍රතිපත්ති අපි ඉදිරිපත් කරනවා. අපේ අගමැතිතුමා ඒක හෙළිදරවු කරාවි. ඊට පස්සේ මේ මාස දෙක, තුන තුළ ව්‍යාපෘති 85ක් එනකොට තමයි ඔබතුමන්ලාට පෙනෙන්නේ "ඔව්, මේ අය අවුරුද්දක් නිකරුණේ නොවෙයි හිටියේ. මහන්සියෙන් වැඩ කරලා, පනත් කෙටුම්පත් නීතිගත කරලා ඒවා ජනතාවට, ලෝකයට පෙන්වා දීම තමයි එකම අභිලාෂය වුණේ" කියන එක. මේ රටේ මුදල් හරියාකාරව සංසරණය නොවුණා නම්, නැවත සියයට 5.7ක ආර්ථික වර්ධන වේගයක් පසු ගිය පළමුවෙනි කාර්තුව තුළ ලබා ගන්න බැහැ. දැන් එවැනි ආර්ථික වර්ධනයක් තිබෙනවා. හැබැයි, අපට තිබෙන capacity එක අනුව අමාත්‍යාංශවල feasibility report එකක් ඉදිරිපත් කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මෙන්න මේක තමයි වෙලා තිබෙන්නේ. මේවා සම්බන්ධයෙන් දූෂිතයෝ කොපමණ ඉන්නවාද? මේවා සම්බන්ධයෙන් තවම හොයා ගෙන නැති ප්‍රශ්නය තමයි ජනතාවට තිබෙන්නේ. අපි ඒවාට ඇහුම් කන් දීලා කටයුතු කරනවා. නමුත්, බල්ලාගේ වැඩය බූරුවා කරන්නේ නැහැ. පොලීසියේ වැඩය පොලීසියට දෙනවා. උසාවියේ වැඩය උසාවියට දෙනවා. දේශපාලනඥයා දේශපාලනය කරනවා. අපි ශීලාචාරව යහ පාලනය තුළින් ගමන් කරනවා.

සමහර විට යහ පාලනයේ තිබෙන එකම වැරැද්ද තමයි ඉබි ගමනේ යන එක. ඒ ගමන කොහොමද මීට වැඩිය ඉක්මන් කරන්නේ කියන එක තමයි අපි දැන් කථා කරගෙන යන්නේ. නමුත් බය වෙන්න එපා. ඔබතුමන්ලා වට්ටලා දුන්න මේ රටේ ආර්ථිකය හරිගස්සලා, කෙළින් කරලා නිවැරදි මාර්ගයට ගන්න තමයි තිබෙන්නේ.

අද වන විට රටේ විදේශ සංචිතය බිලියන 6යි. මීට ඉස්සර තිබුණේ බිලියන 5.12ට. ඒක වර්ධනය කරගෙන ඉදිරියට ගෙනියන එක තමයි මේ අවස්ථාවේදී අපි කරන්නේ. ඒ නිසා කරුණාකර ඔබතුමන්ලා නිකරුණේ ශබ්ද කරන්නේ නැතිව ඉන්න. ඔබතුමන්ලා හතර පස්දෙනෙක් විළිලජ්ජා නැතිව හැම

[ගරු රවි කරුණානායක මහතා]

දවසකම රූපවාහිනිය ඉදිරියේ ඉන්නවා. තුණ්ඩු බෙදලා මේ රටේ ආර්ථිකය වහන්න හදන ඒ ගමන දැන් අවසන්. අපි මේ රටේ ආර්ථිකය සවි ශක්තිමත් ආර්ථිකයක් බවට පරිවර්තනය කරලා මේ,-

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒක අපට කියලා වැඩක් නැහැ, යාළුවන්ට කියන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, යාළුවන් අද සැබෑ තත්ත්වයට පරිවර්තනය වෙලා ඉවරයි. ඔබතුමන්ලා තමයි ගල් යුගයට ගෙනියන්න හදන්නේ. මහින්ද රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ, නාමල් රාජපක්ෂ ඇතුළු රාජපක්ෂ කල්ලිය සල්ලි ගිහින් දාපු තැන් අපි ඉදිරියේදී හෙළිදරවු කරන්නම්. මේ ව්‍යාපාරවලට මෙන්න මෙහෙම ගෙව්වා කියලා ඉදිරියේදී කියන්නම්. කොහෙන්ද මේ සල්ලි එන්නේ? උදයංගලා තායිලන්තයෙන් ගෙනාපු සල්ලිවලට මොනවාද කරන්නේ කියලා අපි වැඩි කල් යන්න ඉස්සෙල්ලා හෙළිදරවු කරනවා. ව්‍යාපාරිකයන් කී දෙනෙක් බදු ගෙවලා නැද්ද? අපි ඒවා එකින් එක කියන්නම්.

මහරගම වෙන්න පුළුවන්, කැස්බෑවේ වෙන්න පුළුවන්, මාතර වෙන්න පුළුවන් අද විරෝධතා තියනවා. අද රත්නපුරේත් පවත්වන්න හැදුවා. ඒත් පැවැත්වුණේ නැහැ. ජනතාව එකතුවෙලා කිව්වා මේ වාගේ දේවල් කරන්න එපා, හරි නම් මේ විරෝධතා පවත්වන්න ඕනෑ වෙළෙන්දන් නොවෙයි, අපියි කියලා. අපියි බදු ගෙවන්නේ කියලා ජනතාව කිව්වා. පාරිභෝගිකයා තමයි මේ සියලුම බදු ගෙවන්නේ. ඒ නිසා මේ අසාධාරණය, බොරුව ලෝකයට පෙන්වන්නේ නැතිව, අපි එකතු වෙලා මේ රටේ ජාතික ආර්ථිකය හදමු කියලා මතක් කරනවා.

ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මේ කල් තැබීමේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමන්ලා සියලු දෙනාම අපිත් එක්ක අලුත් ආර්ථිකයක්, අලුත් ශ්‍රී ලංකාවක් හදන්න එකතු වෙන්න. මේ අවුරුද්ද අග වන විට රටේ ආර්ථිකය අපි සාමාන්‍ය මට්ටමට ගෙනෙනවා. එන අවුරුද්දේ full turbocharge එකේ තමයි රට ඉදිරිය ගෙනියන්නේ කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.55 ට, 2016 මාර්තු 08 දින සභා සම්මතිය අනුව, 2016 ජූලි මස 08 වන සිකුරාදා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 6.55 மணிக்கு பாராளுமன்றம், அதனது 2016 மார்ச் 08ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க 2016 யூலை 08, வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament Adjourned accordingly at 6.55 p.m. until 10.30 a.m. on Friday, 08th July,2016 pursuant to the Resolution of Parliament of 08th March, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

245 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 245 - இல. 3
Volume 245 - No. 3

2016 ජූලි 08 වන සිකුරාදා
2016 யூலை 08, வெள்ளிக்கிழமை
Friday, 08th July, 2016

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

කථානායකතුමාගේ සහතිකය

බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයෙකු ආදේශ කිරීම

නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව : සාමාජිකයෙකු ආදේශ කිරීම

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව: සාමාජිකයෙකු ආදේශ කිරීම

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිත පිහිටා ඇති තෙල් ටැංකි සම්බන්ධයෙන් මතුව ඇති ගැටලුකාරී තත්ත්වය

ශ්‍රී ලාංකික මුස්ලිම් ජනතාවට ත්‍යාග කරන ලද රටඉඳි සඳහා ආනයන බදු

අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල පාලනය:

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත:

පළමුවන වර කියවන ලදී

සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත:

නියමය

අධිකරණ සංවිධාන පනත:

නියෝග

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

சபாநாயகரது சான்றுரை

வலு சக்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு : உறுப்பினர் பதிலீடு

உற்பத்திகளும் சேவைகளும் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு : உறுப்பினர் பதிலீடு

அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழு : உறுப்பினர் பதிலீடு

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

திருகோணமலைத் துறைமுக எண்ணெய்த் தாங்கி தொடர்பில் எழுந்துள்ள பிரச்சினை

இலங்கை முஸ்லிம்களுக்கு இலவசமாகக் கிடைக்கும் பேரீச்சம்பழத்துக்கு இறக்குமதி வரி

அத்தியாவசிய உணவுப் பண்டங்களுக்கு விலைக் கட்டுப்பாடு:

கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரினது கூற்று

சேர் பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம் :

முதன்முறை மதிப்பிடப்பட்டது

குற்றவியல் விடயங்களின் பரஸ்பர உதவியளித்தல் சட்டம் :

ஒழுங்குவிதி

நீதித் துறைச் சட்டம் :

ஒழுங்குவிதிகள்

மத்தியஸ்த சபை (திருத்தம்) சட்டமூலம் :

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Certificate

Sectoral Oversight Committee on Energy: Substitution of a Member

Sectoral Oversight Committee on Manufacturing and Services: Substitution of a Member

Committee on Public Enterprises: Substitution of a Member

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Problematic Situation with regard to Oil Tank Farm close to Trincomalee Harbour

Import Tax on Dates Gifted to Sri Lankan Muslims

CONTROL OF PRICES OF ESSENTIAL FOOD ITEMS:

Statement by Minister of Industries and Commerce

VALUE ADDED TAX:

Read the First time

MUTUAL ASSISTANCE IN CRIMINAL MATTERS ACT:

Order

JUDICATURE ACT:

Regulations

MEDIATION BOARD (AMENDMENT) BILL:

Read a Second and the Third time, and passed.

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 ජූලි 08 වන සිකුරාදා
2016 யூலை 08, வெள்ளிக்கிழமை
Friday, 08th July, 2016

පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, 2016 ජූලි මස 07 වැනි දින මට්සින් පහත සඳහන් පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

II

බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයෙකු ආදේශ කිරීම
வலு சக்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் பதிலீடு
SECTORAL OVERSIGHT COMMITTEE ON ENERGY: SUBSTITUTION OF A MEMBER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2015 දෙසැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි 8 (ඇ) සහ (ඉ) ඡේද ප්‍රකාරව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙහි සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සිරිනාල් ද මෙල් මහතා ඉවත් කොට, තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා එකී කාරක සභාවේ සේවය පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

III

නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව : සාමාජිකයෙකු ආදේශ කිරීම
உற்பத்திகளும் சேவைகளும் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் பதிலீடு
SECTORAL OVERSIGHT COMMITTEE ON MANUFACTURING AND SERVICES: SUBSTITUTION OF A MEMBER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2015 දෙසැම්බර් මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි 8 (ඇ) සහ (ඉ) ඡේද ප්‍රකාරව නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙහි සාමාජිකත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා ඉවත් කොට, තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සිරිනාල් ද මෙල් මහතා එම කාරක සභාවේ සේවය පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

IV

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව : සාමාජිකයෙකු ආදේශ කිරීම
அரசாங்கப் பொறுப்புமுயற்சிகள் பற்றிய குழு: உறுப்பினர் பதிலீடு
COMMITTEE ON PUBLIC ENTERPRISES: SUBSTITUTION OF A MEMBER

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වේලු කුමාර් මහතා වෙනුවට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 129 (ඇ) ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුජීව සේනසිංහ මහතා එම කාරක සභාවේ සේවය පිණිස පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013/2014 වර්ෂය සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ව්‍යාපාර සහ වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழுக்களின் அறிக்கைகள்
REPORTS OF SECTORAL OVERSIGHT COMMITTEES

ගරු රංජිත් අලුවිහාරේ මහතා
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)

ගරු කථානායකතුමනි, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද සබරගමුව පළාත් සංචාරක අධිකාරියේ ප්‍රඥප්ති කෙටුම්පත සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "ජනමත විචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාල සීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/මෙහෙයුම් ප්‍රතිපත්ති", "අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග" සහ "සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත යටතේ නියමය" යනාදී කාරණා සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Public Administration and Management)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් අට පිළිගන්වමි.

(1) රාගම, වැලිසර, වෙලින්ටන් පාර්ක්, නො: 90/16 දරන ස්ථානයෙහි පදිංචි ඩෙන්සිල් ලලික් අබේසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) රත්නපුර, මුවගම, බෙමානන්ද මාවත, අංක: 28/9 දරන ස්ථානයෙහි පදිංචි එන්.එල්. චන්ද්‍රසේකර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) තඹලගමුව, කෝවිල්අඩි යන ලිපිනයෙහි පදිංචි පද්මනාදන් ජෙයමාලිනි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(4) රාජගිරිය, රාජගිරිය උද්‍යානය, නො: 615/26 දරන ස්ථානයෙහි පදිංචි රොහාන් පොන්නයියා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) පදවි ශ්‍රී පුර, 1721/බී දරන ස්ථානයෙහි පදිංචි එස්.එම්.සී. දිල්රුක්ෂි සෝමපාල මෙනවියගෙන් ලැබුණු පෙත්සම;

(6) කන්තලේ, වෙන්ද්‍රාසන්පුර, ආර් - 96, යුනිට්- 16 දරන ස්ථානයෙහි පදිංචි එස්.එම්. හීන්බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) නුගේගොඩ, ගංගොඩවිල, පැපිලියාන පාර, නො: 43 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ.ඩී. සිරිවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(8) හරන්කහව, හුරිහෙළපතන, හුරිහෙළපතන ප්‍රයිවට් ලිමිටඩ් යන ආයතනයෙහි සේවය කරන වාසුදේවන් රාසයියා මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හය පිළිගන්වමි.

(1) ගාල්ල, කලේගාන, ගම්සභා පාර, 2/18 දරන ස්ථානයෙහි පදිංචි අමරබන්ද ගුණසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) තංගල්ල, සිටිනමළුව යන ලිපිනයෙහි පදිංචි බර්ටි කුමාරප්පෙරුම මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මහරගම, පන්සල පාර, පළමු පටුමග, 31/22 දරන ස්ථානයෙහි පදිංචි ජේ.එම්.ඩී. විජේවීර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) බත්තරමුල්ල, ලේක් පාර, 160/47 දරන ස්ථානයෙහි පදිංචි කේ. දිසානායක මෙනවියගෙන් ලැබුණු ලැබුණු පෙත්සම;

(5) අම්බලන්තොට, මානජ්ජාව, හයිඩ්‍රාමනි නිවස, නොැ:23 දරන ස්ථානයෙහි පදිංචි රංජිත් සමරවික්‍රම මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(6) නාකුළුගමුව, කුඩාවැල්ල උතුර, "ආනන්ද" යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ජී.එම්.එම්.එන්. ලක්ෂිත මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) වැලිගම, මහවීදිය (පරණ කඩේ), නොැ. 267/2 දරන ස්ථානයෙහි පදිංචි එම්.එච්. ඉජ්හාම් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) නුගේගොඩ, පාගොඩ, 1 වන හරස් වීදිය, නොැ. 52/2 දරන ස්ථානයෙහි පදිංචි ජේ.සී.එල්. බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) පානදුර, වැකඩ, හොරණ පාර, නොැ. 297 දරන ස්ථානයෙහි පදිංචි කේ.යූ.ආර්. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) මාතර, නාදුගල, නාදුගල හන්දිය, "කාන්ති" යන ලිපිනයෙහි පදිංචි කාන්ති සමරසිංහ ගුණසේකර මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) කෝට්ටගොඩ, ලුණුකලපුව පාර යන ලිපිනයෙහි පදිංචි එල්.එච්. සිරිසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(මාණ්පුමිකු அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පොලොන්නරුව, තඹාල, අල්හිලාල්පුර, අංක 106/01 දරන ස්ථානයෙහි පදිංචි එම්.එච්. මොහොමඩ් අලී මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මැදිරිගිරිය, නවනගරය, යාය 06, අංක 18/2 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.පී.බී. වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් අට පිළිගන්වමි.

(1) කඹුරුපිටිය, කරපුටුගල, දිග්ගහ කොරටුව යන ලිපිනයෙහි පදිංචි ඩී. වික්ටර් රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කිරින්ද, පුහුල්වැල්ල, පහළ අරඹ යන ලිපිනයෙහි පදිංචි එච්.එච්. ස්වර්ණා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) මිරිස්ස, උඩුපිල, කස්තුරිගෙවත්ත යන ලිපිනයෙහි පදිංචි කේ.කේ. පියවතී මෙනවියගෙන් ලැබුණු පෙත්සම;

(4) පොල්ගස්ඕවිට, වැතර, ඉසුරු උයන, අංක 55/ඒ/14 දරන ස්ථානයෙහි පදිංචි ලක්මාලි ලියනගේ මෙනවියගෙන් ලැබුණු පෙත්සම;

(5) අකුරැස්ස, මාරඔ, ගංහල පාර, "රණසිරි" යන ලිපිනයෙහි පදිංචි පාලිත රණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) මාතර, ගොම්බද්දල, ගොඩැල්ලවත්ත, "නිලංකා" යන ලිපිනයෙහි පදිංචි නිලකා රණවීර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(7) අකුරැස්ස, මලිදුව, වැලිකැටිය යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එච්. මර්සියන් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(8) මාතර, වල්ගම, ප්‍රගති මාවත, අංක 40 ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.කේ. විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1-158/'15-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

Question ordered to stand down.

රාජ්‍ය විශ්වවිද්‍යාල පාඨමාලා: ශිෂ්‍යයන් බඳවා ගැනීම
அரச பல்கலைக்கழகங்களின் பாடநெறிகள்: மாணவர் அனுமதி
COURSES OF STUDY AT STATE UNIVERSITIES: ADMISSION OF STUDENTS

451/'16

2. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා නිකුත් කර ඇති අත් පොතේ සඳහන් ආකාරයට 2006 - 2009 දක්වා වසර 04 තුළදී රාජ්‍ය විශ්වවිද්‍යාලවල එක් එක් පාඨමාලා සඳහා බඳවා ගැනීමට නියමිත වූ ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ii) එම එක් එක් පාඨමාලාව සඳහා 2006 - 2009 දක්වා වසර 04 තුළ සත්‍ය වශයෙන්ම බඳවා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு வினால் பல்கலைக்கழக அனுமதி தொடர்பாக வெளியிடப்படும் கைந்நூலில் குறிப்பிடப் பட்டுள்ளவாறு 2006 -2009 வரையிலான நான்கு வருடங்களினுள் அரச பல்கலைக்கழகங்களின் ஒவ்வொரு பாடநெறிக்கும் உள்வாங்குவதற்குரிய மாணவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(ii) ஒவ்வொரு பாடநெறிக்கும் 2006 - 2009 வரையிலான 04 வருடங்களினுள் உண்மை யாகவே உள்வாங்கப்பட்ட மாணவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House-

(i) separately, the number of students that was to be admitted to each course of study of State Universities during the 04 years from 2006-2009 as indicated in the University Entrance Handbook issued by the University Grants Commission; and

(ii) separately, the actual number of students admitted to each such course of study during the 04 years from 2006-2009?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඇමුණුමෙහි තීරු අංක 03, 05, 07 හා 09 යටතේ දක්වා ඇත.

(ii) ඇමුණුමෙහි තීරු අංක 04, 06, 08 හා 10 යටතේ දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**

சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :

Annex tabled:

ඇමුණුම

විශ්වවිද්‍යාල ප්‍රවේශ

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල වල එක් එක් පාඨමාලාව සඳහා බඳවාගැනීමට නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව සහ ලියාපදිංචි වන ලද ශිෂ්‍ය සංඛ්‍යාව අ.පො.ස. (උ/පෙළ) වර්ෂය අනුව

තීරු අංක 01	තීරු අංක 02	තීරු අංක 03	තීරු අංක 04	තීරු අංක 05	තීරු අංක 06	තීරු අංක 07	තීරු අංක 08	තීරු අංක 09	තීරු අංක 10
		2006		2007		2008		2009	
අනු අංකය	අධ්‍යන පාඨමාලාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව
01	වෛද්‍ය විද්‍යාව	1155	1152	1155	1154	1165	1166	1165	1165
02	දන්ත ශල්‍ය විද්‍යාව	77	46	80	75	80	81	80	80
03	පශු වෛද්‍ය විද්‍යාව	75	62	100	68	100	75	100	72
04	කෘෂිකර්මය	595	464	645	491	645	564	660	474
05	ආහාර විද්‍යාව හා පෝෂණය	80	64	100	56	100	46	100	60
06	ජෛවිය විද්‍යාව	925	655	995	682	1045	858	1045	870
07	ව්‍යවහාරික විද්‍යාව(ජෛවිය විද්‍යාව)	145	83	165	99	170	166	170	113
08	ඉංජිනේරු විද්‍යාව	1110	1114	1180	1176	1210	1204	1240	1231
09	ඉංජිනේරු විද්‍යාව - (EM)	50	50	50	45	50	51	50	49
10	ඉංජිනේරු විද්‍යාව - (TM)	50	53	50	45	50	47	50	40
11	ප්‍රමාණ සමීක්ෂණය	50	53	100	91	100	92	100	92
12	පරිගණක විද්‍යාව	190	157	215	168	215	152	265	224
13	භෞතික විද්‍යාව	1590	1205	1620	1170	1620	1369	1620	1420
14	මැනුම් විද්‍යාව	58	48	60	55	60	60	60	60
15	ව්‍යවහාරික විද්‍යාව (භෞතික විද්‍යාව)	245	207	290	253	305	270	305	231
16	කළමනාකරණය	2670	2468	2935	2907	3155	3093	3285	3289
17	දේපල කළමනාකරණය හා තක්සේරුකරණය	50	49	60	55	60	62	60	61
18	වාණිජ්‍යය	590	345	590	517	440	484	470	450
19	කලා	4725	4939	4650	4941	4750	4876	4750	4735
20	කලා (SP)- ජනමාධ්‍ය	50	59	50	50	75	76	75	74
21	කලා (SAB)	0	0	175	216	175	174	200	204
22	කළමනාකරණ අධ්‍යයන - (TV)	150	78	150	127	150	143	150	148
23	වාස්තු විද්‍යාව	55	56	55	56	55	57	55	60
24	නිර්මාණවේදය	40	40	50	50	50	50	50	48
25	නීතිය	250	212	250	249	325	325	350	349

ශීර්ෂ අංක 01	ශීර්ෂ අංක 02	ශීර්ෂ අංක 03	ශීර්ෂ අංක 04	ශීර්ෂ අංක 05	ශීර්ෂ අංක 06	ශීර්ෂ අංක 07	ශීර්ෂ අංක 08	ශීර්ෂ අංක 09	ශීර්ෂ අංක 10
		2006		2007		2008		2009	
අනු අංකය	අධ්‍යයන පාඨමාලාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව
26	නොරතුරු තාක්ෂණය	100	99	100	97	100	101	100	101
27	කළමනාකරණය හා නොරතුරු තාක්ෂණය	50	47	50	52	50	44	50	47
28	රාජ්‍ය කළමනාකරණය (විශේෂ)	50	53	75	80	75	79	75	75
29	සන්නිවේදන අධ්‍යයනය	50	56	50	43	50	58	50	50
30	නගර හා ග්‍රාම නිර්මාණය	50	49	50	43	50	46	50	45
31	ඝාමය හා ගැටුම් නිරාකරණය	35	36	35	35	35	32	35	35
32	ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	200	146	230	161	230	212	270	210
33	යුනානි වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය	35	26	50	22	50	37	50	26
34	විලාසිතා නිර්මාණය හා නිපැයුම් ප්‍රවර්ධනය	40	39	40	33	40	42	40	41
35	ආහාර විද්‍යාව හා තාක්ෂණය	85	50	85	62	85	78	85	80
36	සිද්ධ වෛද්‍ය විද්‍යාව	50	23	70	70	70	78	70	69
37	ශබ්ද	105	76	185	129	185	120	205	154
38	නොරුතුරු සහ සන්නිවේදන තාක්ෂණය	205	138	230	219	230	197	230	203
39	කෘෂිකර්ම තාක්ෂණය සහ කළමනාකරණය	200	178	200	192	200	150	200	165
40	කලා (SP) - ප්‍රසංග කලා	50	53	50	45	75	76	75	76
41	සෞඛ්‍ය ප්‍රවර්ධන	35	27	50	40	50	29	50	50
42	ඖෂධ විද්‍යාව	75	35	75	44	75	43	105	88
43	වෛද්‍ය රසායනාගාර විද්‍යාව	60	53	85	67	85	59	100	89
44	චිකිත්‍රණ ශිල්පය	35	27	35	26	35	22	35	21
45	භෞතෙ චිකිත්ස	60	50	60	62	60	65	60	50
46	පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය	50	50	50	54	50	51	50	41
47	පහසුකම් කළමනාකරණය	50	54	50	54	50	46	50	44
48	ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය	50	54	50	48	50	50	50	50
49	අණුක ජීව විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව	60	57	60	51	60	46	60	43
50	කර්මාන්ත සංඛ්‍යානය සහ ගණිතමය ශිල්ප	60	56	60	59	60	64	60	54
51	සංඛ්‍යානය සහ සංකාර්යය පර්යේෂණ	50	41	50	45	50	35	50	32
52	පරිගණනය හා කළමනාකරණය	50	47	50	49	50	54	50	47
53	ධීවර සහ සාගර විද්‍යාව	60	33	60	34	60	32	60	59
54	ඉස්ලාම් අධ්‍යයන	75	82	75	64	75	75	100	91
55	විද්‍යාව සහ තාක්ෂණය	45	53	50	48	50	43	50	56
56	පරිගණක විද්‍යාව සහ තාක්ෂණය	45	44	50	46	50	41	50	42
57	ව්‍යවසායකත්වය හා කළමනාකරණය	45	47	60	51	60	57	50	47
58	සත්ත්ව පාලන විද්‍යාව	45	42	50	43	50	39	50	38
59	සංගීතය	130	106	150	100	290	250	315	309
60	නැටුම්	100	90	100	79	270	250	290	289
61	චිත්‍ර සහ නිර්මාණ	25	34	25	23	25	25	30	29
62	නාට්‍ය හා රංග කලා	50	49	50	53	70	69	70	62
63	දෘශ්‍ය සහ තාක්ෂණික කලා	50	8	50	46	50	49	50	50
64	අපනයන කෘෂිකර්මය	45	41	50	42	50	47	50	44
65	තේ තාක්ෂණය සහ අගය වැඩිකිරීම	-	-	50	48	50	45	50	34
66	කාර්මික නොරතුරු තාක්ෂණය	-	-	50	51	50	50	50	48
67	බනිජ සම්පත් සහ තාක්ෂණය	-	-	50	48	50	43	50	48
68	ව්‍යාපාර නොරතුරු පද්ධති (විශේෂ)	-	-	50	52	50	54	50	53
69	මෙහෙයුම් සහ තාක්ෂණික කළමනාකරණ (විශේෂ)	-	-	50	51	-	-	-	-
70	කළමනාකරණය හා නොරුතුරු තාක්ෂණය (SEUSL)	-	-	60	58	60	57	80	81
71	ආගනණය සහ නොරතුරු පද්ධති	-	-	80	50	80	70	80	
72	ශාරීරික අධ්‍යාපනය	-	-	35	33	35	31	35	37
73	ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය			35	37	35	35	35	33
74	කථන හා ශ්‍රවන විද්‍යාව			35	38	50	45	50	51
75	අරාබි භාෂාව			50	46	50	45	75	72
76	දෘශ්‍ය කලා					60	59	60	61
77	සත්ත්ව පාලන සහ මත්ස්‍ය විද්‍යාව					50	39	50	52
78	ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය					50	33	60	39
79	ජලජ සම්පත් තාක්ෂණය					50	51	50	40
80	තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය වැඩි කිරීම					50	42	50	45
81	ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිලිබඳ කළමනාකරණය					50	49	50	48
82	නොරතුරු තාක්ෂණය හා කළමනාකරණය							35	33
	එකතුව	17630	15908	19260	17819	20270	19180	20835	19476

**** මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***

[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]

[This annex is also placed in the Library.]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ මේ අතුරු ප්‍රශ්නය ඔය සංඛ්‍යා ලේඛනය පදනම් කරගෙනම නොවෙයි අසන්නේ.

2010 සිට 2015 දක්වා කාලයට අදාළව ඔය ප්‍රශ්නයම මම ඊයේ ඔබතුමාගෙන් ඇසුවා, ගරු ඇමතිතුමනි. ඔබතුමා ඉතාම කරුණු සහිත පිළිතුරක් සභාගත කළා. ඒ පිළිතුර අනුව විශේෂයෙන් අපේ රටේ 2014 අවුරුද්ද දක්වා ජීව විද්‍යාව විෂය ධාරාව හදාරා විශ්වවිද්‍යාලවලට ඇතුළු වන්න සුදුසුවන් පාඨමාලා 26ක් තිබෙනවා. සම්පූර්ණ පාඨමාලා 85න් 26කට ඇතුළත් වන්න සුදුසුවන් වන්නේ ජීව විද්‍යාව විෂය ධාරාව හදාරපු අයට පමණයි. ඒ අවුරුදු පහේදී සිසුන් 21,265 දෙනෙකුට අවස්ථාව හිමි වී තිබෙනවා, විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන්න. හැබැයි විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම සඳහා ලියා පදිංචි වෙලා තිබෙන්නේ සිසුන් 17,140යි. ඒ කියන්නේ, ජීව විද්‍යාව හදාරපු සිසුන්ගෙනුත් විශ්වවිද්‍යාලවලට ඇතුළු වෙලා තිබෙන්නේ සියයට 80ක් පමණයි කියන එකයි. දළ වශයෙන් කිව්වොත්, අවුරුද්දකට අවස්ථාව හිමි සිසුන් 825ක් විශ්වවිද්‍යාලයට ඇතුළත් වන්නේ නැහැ. මේක බරපතළ තත්ත්වයක්. මොකද, අපේ දරුවන් ඉගෙනගන්නා පාසල්වල විද්‍යා ගුරුවරු නැහැ; ගණිත ගුරුවරු නැහැ. අපේ පර්යේෂණ අංශයට ගිහින් බැලුවොත් පෙනෙනවා, පර්යේෂණ නිලධාරීන් නැහැ කියා. නමුත් රජය විශ්වවිද්‍යාලවල සම්පත් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා; ගුරුවරුන් සඳහා සම්පත් වෙන් කර තිබෙනවා. හැබැයි ජීව විද්‍යාව විෂය ධාරාව හදාරපු දරුවන්ගෙන් සියයට 80ක් තමයි විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන්නේ. එහෙම නම් මෙහි මොකක් හෝ ගැටලුවක් තිබෙනවා. ඒ ගැටලුව තිබෙන්නේ, UGC එකේද, ඉල්ලුම් කිරීමේද කියන කාරණය ගැන බරපතළ විධියට සාකච්ඡා කරන්න ඕනෑ කියලායි මා හිතන්නේ.

අප විද්‍යා අධ්‍යාපනයෙන් ඉදිරියට යනවා නම් මේ ගැටලුව සිසුන් මත නොපටවා අප හැම දෙනා එකතු වෙලා මෙයට ස්ථිරසාර විසඳුමක් සොයාගන්න ඕනෑ. වැඩිම තරඟකාරිත්වය තිබෙන ජීව විද්‍යාව විෂය ධාරාව හදාරා අපොස (උසස් පෙළ) විභාගයෙන් සමත් වන අයගෙනුත් සියයට 20කට ඒ අවස්ථාව අහිමි වී තිබෙනවා. ඒ සියයට 20 සුදුසුපාඩු විධියට පවතිනවා. ගරු ඇමතිතුමනි, අතුරු ප්‍රශ්නයක් අහනවාට වඩා මා ඔබතුමාගේ අවධානය ඒ කෙරේ යොමු කරවන්න කැමැතියි. අපි හැම දෙනාම මේ පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරලා, සාකච්ඡා කරලා ස්ථිරසාර විසඳුමක් සොයා ගනිමු කියා මම කියනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමාගේ තර්කය මම පිළිගන්නවා.

දුම්රිය හරස් මාර්ග ගේට්ටු අනියම් ක්‍රියාකරුවන්: දීමනා

புகையிரதக் கடவை அமய இயக்குனர்கள் : கொடுப்பனவுகள்

CASUAL OPERATORS OF RAILWAY CROSSING GATES : ALLOWANCES

597/'16

6. ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සේවයේ යොදවා සිටින දුම්රිය හරස් මාර්ග ගේට්ටු අනියම් ක්‍රියාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන මාසික දීමනාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දුම්රිය හරස් මාර්ග ගේට්ටු ක්‍රියාකරුවන් සමාජයට විශාල සේවාවක් ඉටුකරන පිරිසක් බවත්;

(ii) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව මඟින් ඔවුන්ට ලබා දෙන මාසික දීමනාව ප්‍රමාණවත් නොවන බවත්;

(iii) එම නිසා ඔවුන්ට ප්‍රමාණවත් මාසික දීමනාවක් ගෙවිය යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) දුම්රිය හරස් මාර්ග ගේට්ටු ක්‍රියාකරුවන්ගේ රැකියාවේ සුරක්ෂිතභාවය සඳහා සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර ප්‍රමාණවත් දීමනාවක් ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද; යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

சட்டமும், ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையினுள் சேவையில் ஈடுபடுத்தப் பட்டுள்ள புகையிரதக் கடவை அமய இயக்குனர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) இவர்களுக்கு இலங்கை பொலிஸ் திணைக் களத்தினால் வழங்கப்படுகின்ற மாதாந்தக் கொடுப்பனவு எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) புகையிரதக் கடவை இயக்குனர்கள் சமூகத்திற்கு பெரும் சேவை ஆற்றுகின்றவர்கள் என்பதையும்;

(ii) இலங்கை பொலிஸ் திணைக்களத்தினால் இவர்களுக்கு வழங்கப்படுகின்ற மாதாந்தக் கொடுப்பனவு போதுமானதல்ல என்பதையும்;

(iii) இதன் காரணமாக இவர்களுக்கு போதியளவு மாதாந்த கொடுப்பனவொன்று செலுத்தப்பட வேண்டும் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) புகையிரதக் கடவை இயக்குனர்களின் தொழில் பாதுகாப்புக்கான பொருத்தமான வேலைத்திட்ட மொன்றை அமுல்படுத்தி போதியளவு கொடுப் பனவைச் செலுத்த நடவடிக்கை மேற் கொள்வாரா என்பதையும்;

(ii) ஆமெனில், அத்திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Law and Order and Southern Development:

(a) Will he inform this House-

(i) the number of casual operators of Railway Crossing Gates in Sri Lanka; and

(ii) the monthly allowance given to them by Sri Lanka Police Department?

(b) Will he accept that-

(i) the operators of Railway Crossing Gates are a group of people who provides a great service to the society;

(ii) the monthly allowance provided to them by Sri Lanka Police Department is insufficient; and

(iii) so, they should be paid a sufficient monthly allowance?

(c) Will he also inform this House-

(i) whether appropriate measures will be taken for their job security and whether they are paid a sufficient allowance; and

(ii) if so, the aforesaid date?

(d) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 261කි.

(ii) දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් වෙන් කරන ලද වාර්ෂික මුදල් ප්‍රතිපාදන මත පොලිස් දෙපාර්තමේන්තුව විසින් මාසිකව එක් පුද්ගලයෙකුට රුපියල් 7,500ක ගෙවීමක් සිදු කරයි.

ඔව්.

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ඇ) (i) ඔව්. දුම්රිය හරස් මාර්ග ගේට්ටු ක්‍රියාකරුවන් අයීක්ෂණය කිරීමේ වගකීම දුම්රිය දෙපාර්තමේන්තුව වෙත හෝ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත පැවරීමෙන් මෙම සේවකයන්ගේ මතුවන ගැටලුකාරී අවස්ථාවන්ට පහසුවෙන් විසඳුම් ලබා දිය හැකි බව නිරීක්ෂණය කළ බැවින් ඒ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර, ඔවුන් වෙත ගෙවනු ලබන මාසික දීමනාව රුපියල් 12,000 දක්වා වැඩි කිරීම සුදුසු බවට දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යෝජනා කර ඇත.

(ii) අදාළ එකඟතා ලද වහාම.

(ඈ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 11 - 651/'16 (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මෙම ප්‍රශ්නය මම අද නොඅසන බව දැන්වීමට කැමැතියි, ගරු කථානායකතුමනි. මෙම ප්‍රශ්නයේ පරිවර්තනය මගේ නොවෙයි. සාමාන්‍ය ජනයාට තේරුම් ගත හැකි අන්දමට මීට වඩා අර්ථවත් වන ආකාරයට ඒ පරිවර්තනය සිදු කරවා, මෙම ප්‍රශ්නය නැවත ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, අපි එහෙම කරමු නේ.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 - 383/'15 (1), ගරු බුද්ධික පතිරණ මැතිතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Faizal Cassim - Deputy Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13 - 459/'16 (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

පින්නවල එළිමහන් සත්ව උද්‍යානය: ඉපයූ ආදායම

பின்னவல திறந்தவெளி மிருகக் காட்சிச்சாலை :பெற்ற வருமானம்

PINNAWALA OUTDOOR ZOO: INCOME EARNED

481/'16

3. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු කනක හේරත් මහතා වෙනුවට)

(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு கனக ஹேரத் சார்பாக)

(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Kanaka Herath)

තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) පින්නවල එළිමහන් සත්ව උද්‍යානයේ දැනට සිටින සතුන් වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) උද්‍යානය විවෘත කළ දිනයේ සිට මේ දක්වා ලැබී ඇති ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙහි ප්‍රමාණවත් තරම් සතුන් නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් සතුන් නැරඹීමට එන ජනතාව සෑහීමකට පත් නොවන බවත්; එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නරඹන්නන්හට තෘප්තිමත් විනෝදයක් ලබාදීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ගයන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச் சரைக் கேட்ட வினா:

(அ) (i) பின்னவல திறந்தவெளி மிருகக்காட்சிச் சாலையில் தற்போதுள்ள விலங்கின வகைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) மிருகக் காட்சிச்சாலை ஆரம்பிக்கப்பட்ட திகதி தொடக்கம் இதுவரை கிடைத்துள்ள வருமானம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) இங்கு போதியளவு மிருகங்கள் இல்லை என்பதையும்;

(ii) இதனால் மிருகங்களைப் பார்வையிட வரும் மக்கள் திருப்தியடைவதில்லை என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) பார்வையாளர்களுக்குத் திருப்திகரமான பொழுது போக்கை வழங்கும்பொருட்டு பின்பற்றப்படும் வழிமுறை யாது என்பதையும் அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Sustainable Development and Wildlife:

(a) Will he inform this House-

(i) the number of types of animals housed in the Pinnawala Outdoor Zoo at present; and

(ii) the income earned since the date the zoo was opened?

(b) Will he admit that-

(i) there are no sufficient number of animals in this zoo; and

(ii) that results in the visitors to the zoo becoming dissatisfied?

(c) Will he also inform this House the steps to be taken to make the visitors to the zoo entertaining and satisfying?

(d) If not, why?

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය)

(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் பிரதி அமைச்சர்)

(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Deputy Minister of Sustainable Development and Wildlife)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

* සභාමේසය මත තබන ලද පිළිතුර:

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) සත්ව විශේෂ 29කි.

(ii) 2015.05.01 දින සිට 2016.05.31 දිනට ආදායම රුපියල් 34,522,160.00

(ආ) (i) පිළිගත නොහැක.

(ii) පිළිගත නොහැක.

(ඇ) 1. සත්ත්ව භාරකරුවන් විසින් සතුන් පිළිබඳ විස්තර කිරීම - සත්ව විද්‍යාත්මක තොරතුරු ඇතුළත් සත්ත්ව භාරකරුවන්ගේ කථාවන් ඒ ඒ දවසේ විවිධ වෙලාවන්වල පැවැත්වීමට කටයුතු සම්පාදනය කරමින් පවතී.

2. ඉතා ඉක්මනින් ඉතිරි සත්ව අරණවල් ඉදිකිරීම් අවසන් කිරීම.

3. ඉදිකර ඇති සත්ව අරණවල් පිළිබඳ අධ්‍යාපනික තොරතුරු නවීන ක්‍රම මඟින් නරඹන්නන් හට ඉදිරිපත් කිරීම.

(ඈ) අදාළ නැත.

ජනාධිපති ආරක්ෂක අංශය සතු වාහන: හදිසි අනතුරු

ஜனாதிபதி பாதுகாப்புப் பிரிவுக்குரிய வாகனங்கள் : விபத்துக்கள்

VEHICLES OF PRESIDENTIAL SECURITY DIVISION: ACCIDENTS

501/'16

4. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවට)

(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில சார்பாக)

(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Udaya Prabhath Gammanpila)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015.01.09 දින සිට 2016.03.31 දක්වා කාලය තුළදී ජනාධිපති ආරක්ෂක අංශය සතු වාහන හදිසි අනතුරුවලට ලක්වූ වාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම අනතුරුවලින් මියගිය සහ තුවාල ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ ආකාරයෙන් හදිසි අනතුරු ඉහළයෑමට හේතු කවරේද;

(iv) හදිසි අනතුරු අවම කර ගැනීමට ජනාධිපති ආරක්ෂක අංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2015.01.09ஆம் திகதி முதல் 2016.03.31ஆம் திகதி வரையான காலப்பகுதிக்குள் ஜனாதிபதி பாது காப்புப் பிரிவுக்கு உரித்தான வாகனங்கள் திடீர் விபத்துக்குள்ளான தடவைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி விபத்துக்களில் உயிரிழந்த மற்றும் காயமடைந்த ஆட்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) இவ்வாறு திடீர் விபத்துக்கள் அதிகரித்துள்ள மைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) திடீர் விபத்துக்களை குறைத்துக்கொள்வதற்காக ஜனாதிபதி பாதுகாப்புப் பிரிவு மேற் கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) the number of times that the vehicles of the Presidential Security Division, met with accidents during the period from 09.01.2015 to 31.03.2016;

(ii) the number of persons died and got injured as a result of the aforesaid accidents;

(iii) the reasons led for the increase of accidents, in this manner; and

(iv) the measures that have been taken by the Presidential Security Division to minimize accidents?

(b) If not, why?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 10කි.

(ii) මියගිය සංඛ්‍යාව - 06කි.
තුවාල ලැබූ සංඛ්‍යාව - 11කි.

(iii) හදිසි අනතුරු ඉහළ යාමක් දක්නට නැත.

(iv) ඔව්.

මේ සඳහා ඵලදායී ක්‍රියා මාර්ග අනුගමනය කරමින් පවතී.

(ආ) පැන නොනඟී.

එම්. ජේ. එම්. අක්බර් මහතාට අයත් ව්‍යාපාරික ස්ථානය: වන්දි

திரு. எம்.ஜே.எம். அக்பருக்குரிய வியாபார நிலையம் : நட்டஈடு

BUSINESS ESTABLISHMENT OWNED BY MR. M. J. M AKBAR: COMPENSATION

577/'16

5. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Seyed Ali Zahir Moulana)

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගම්පොළ, ජයමාලපුර, නාවලපිටිය පාර, අංක 288 දරන ස්ථානයේ පදිංචි, එම්.ජේ.එම්. අක්බර් මහතාට අයත් නුවරඑළිය, ලෝසන් වීදිය, වරිපනම් අංක 58 දරන ස්ථානයේ පිහිටි අක්බර් ට්‍රේඩර්ස් නම් වූ ව්‍යාපාරික ස්ථානය, 1983 වර්ෂයේ ඇතිවූ ජූලි කලබල අවස්ථාවේ දාමරිකයින් පිරිසක් විසින් ගිනිතබා විනාශ කරන ලද බවත්;

(ii) එම ව්‍යාපාරික ස්ථානයට සිදුවූ අලාභය වෙනුවෙන් වන්දි ඉල්ලා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් හරහා අදාළ අංශය වෙත ඉල්ලීමක් (ලිපිගොනු අංක නුඑ/4/3/52 හා 2005.08.17) යොමු කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අංක ඒ/ඒ/2342 යටතේ වෙළඳ සමාගමක් ලෙස ලියාපදිංචිකර තිබෙන එම ව්‍යාපාරික ස්ථානයට සිදුවූ විනාශය හේතුවෙන් ව්‍යාපාරික කටයුතු සහමුලින්ම අහිමිවී අසරණභාවයට පත්වී සිටින අක්බාර් මහතාට මෙතෙක් වන්දි මුදල් ලබා දීම ප්‍රමාද කිරීමට බලපෑ හේතු කවරේද;

(ii) වන්දි මුදල් නොපමාව ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்ற மற்றும் இந்து சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கம்பளை, ஜயமாலபுர, நாவலப்பிட்டி வீதி, இலக்கம் 288 எனும் இடத்தில் வசிக்கின்ற திரு. எம்.ஜே.எம். அக்பருக்கு உரித்தான நுவரெலியா,

[ගරු බුද්ධික පතිරණ මහතා]

லோசன் வீதி, வரிப்பண இலக்கம் 58 எனும் இடத்தில் அமைந்துள்ள அக்பர் டிரேடர்ஸ் எனும் வியாபார நிலையம், 1983 இல் இடம்பெற்ற யூலைக் கலவரத்தின்போது குண்டர்களினால் தீயிட்டுக் கொளுத்தி அழிக்கப்பட்டது என்பதையும்;

(ii) மேற்படி வியாபார நிலையத்திற்கு ஏற்பட்ட நட்டத்திற்கு நட்டஈடு கோரி நுவரெலியா பிரதேச செயலாளர் ஊடாக உரிய பிரிவுக்கு கோரிக்கை (கோப்பு இலக்கம் நுஎ/4/3/52 மற்றும் 2005/08/17) சமர்ப்பிக்கப்பட்டது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) ஏ/ஏ/2342 ஆம் இலக்கத்தின் கீழ் வர்த்தக கம்பனியாகப் பதிவு செய்யப்பட்டுள்ள மேற்படி வியாபார நிலையத்திற்கு ஏற்பட்டுள்ள சேதம் காரணமாக வியாபார நடவடிக்கைகளை முற்றாக இழந்து அநாதரவான நிலைக்கு ஆளாகியுள்ள திரு. அக்பருக்கு இதுவரை நட்டஈடு வழங்குதல் தாமதமடைவதற்கு ஏதுவான காரணங்கள் யாவை என்பதையும்;

(ii) நட்டஈட்டைத் தாமதிக்காது வழங்க நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Prisons Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs:

(a) Is he aware that-

(i) the business establishment, 'Akbar Traders', located at Assessment No.58, Losan Street, Nuwara Eliya, owned by Mr. M.J.M. Akbar of No.288, Nawalapitiya Road, Jayamalapura, Gampola was set on fire by a mob of thugs in the time of Black July in 1983; and

(ii) a request (File No. நுஎ/4/3/52 and 17/08/2005) was made to the authorities concerned, through Nuwara-Eliya Divisional Secretary asking for compensation for the loss caused on aforesaid business establishment?

(b) Will he inform this House-

(i) the reasons led for the delay of paying compensation to Mr. Akbar who has been rendered helpless, having lost his entire business which has been registered as a commercial company under No. ஏ/ஏ/2342 due to the destruction caused; and

(ii) whether measures will be taken to pay compensation without delay?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සහ (ii) මෙම ලිපිගොනුව වසර 10කට වඩා පැරණි අතර, මේ සම්බන්ධව කිසිදු වාර්තාවක් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ නොමැති බව නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කර ඇත. එමෙන්ම මේ පිළිබඳව තවදුරටත් ක්ෂේත්‍රයේ කරුණු අධ්‍යයනය කර කඩිනමින් වාර්තාවක් ලබා දෙන බවට ප්‍රාදේශීය ලේකම් දැනුම් දී ඇත.

(ආ) (i) සහ (ii) අක්බාර් මහතා විසින් පුනරුත්ථාපන අධිකාරිය වෙත මෙවැනි ලිපිගොනුවක් ඉදිරිපත් කර නොතිබීම නිසා ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් ගෙන නොමැත.

අදාළ සිද්ධිය සම්බන්ධ අයදුම්පත්‍රයක් ප්‍රාදේශීය ලේකම් මඟින් සහතික කළ ලිපි ලේඛන සහිතව යොමු කිරීමෙන් ඒ සම්බන්ධයෙන් රජය මඟින් නිර්දේශ කර ඇති නිර්නායක මත වන්දි ගෙවීම සිදු කළ හැකිය.

කෙසේ වෙතත්, තුස්තවාදී ප්‍රවණ්ඩ ක්‍රියා හේතුවෙන් හානි සිදුවූ අයට වන්දි ගෙවීමේ චක්‍රලේඛය (MRR/COM/GEN/83-95/01හා 1996.02.16 අනුව ජේ.එම්. අක්බාර් මහතාට බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත පුනරුත්ථාපන අධිකාරියට වන්දි අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් වන්දි ලබා ගත හැකිය. උක්ත චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව වන්දි ගෙවීමට හැක්කේ සිදුවූ මුළු හානියෙන් සියයට 20ක වන්දියක් උපරිම මුදල් රුපියල්100,000ක් දක්වා වූ වන්දි මුදලක් බව දන්වමි.

(ඇ) අදාළ නොවේ.

යෝධ ඇළ බැම්ම: ප්‍රතිසංස්කරණය
யோத எல கால்வாய் அணை : புனரமைப்பு
YODHA-ELA BUND: RECONSTRUCTION

615/'16

7. ගරු බුද්ධික පතිරණ මහතා(ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ishak Rahuman)

වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කලාවැවේ ජලය නිකුත් කරන පැරණි යෝධ ඇළෙහි, බටුවත්ත හන්දියේ සිට තිසා වැවට ජලය නිකුත් කරන ඇළ බැම්ම 1977 වර්ෂයේ සිට ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්;

(ii) කි. මී. 12.5 ක් පමණ දිග මෙම ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය නොකිරීමෙන් මෙම මාර්ගය භාවිතා කරන ගොවීන් විශාල පිරිසකට තම අස්වැන්න හා කෘෂි උපකරණ රැගෙන යාමට හා ඒමට අසීරු වී ඇති බවත්; එතුමා දන්නෙහිද?

(ආ) මෙම ඇළ බැම්ම ප්‍රතිසංස්කරණය නොකරන්නේ මන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன மற்றும் நீரகவளமூலங்கள் முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கலாவெவயின் நீரை விநியோகிக்கின்ற பழைய யோத எலவில், பட்டுவத்த சந்தியிலிருந்து திசா வெவவுக்கு நீர் வழங்கும் கால்வாய் அணைக்கட்டு 1977ஆம் ஆண்டு தொடக்கம் புனரமைக்கப்படவில்லை என்பதையும்;

(ii) 12.5 கி.மீ. நீளமான இக்கால்வாய் புனரமைக்கப் படாததால் அவ்வீதியைப் பயன்படுத்தும் பெருந் தொகையான விவசாயிகளுக்கு தமது அறுவடை களையும் விவசாய உபகரணங்களையும் கொண்டுசெல்வதற்குச் சிரமமாயுள்ளதென் பதையும்;

அவர் அறிவாரா?

(ஆ) இந்த கால்வாய் அணைக்கட்டை புனரமைக் காதிருப்பது ஏனென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

aske the Minister of Irrigation and Water Resources Management:

(a) Is he aware that-

(i) the dam of ancient Yodha-Ela of Kala Wewa, that brings water to Tissa Wewa from Batuwatta junction has not been reconstructed since 1977; and

(ii) since no action has been taken to reconstruct this canal which is about 12.5 km in length, a large number of farmers who use this road have found it difficult to carry their yield and farming equipment?

(b) Will he inform this house the reason for not taking action to reconstruct the dam?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කලා වැව දකුණු ඉවුර නව ජය ගමේ සිට තිසා වැවට ජලය සපයනු ලබන බටුවත්ත හැරවුම් නිර්මිතයේ සිට දිවුල් වැව දක්වා ජලය රැගෙන යන පැරණි යෝධ ඇළ 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ජපන් සහයෝගිතා අරමුදලෙහි ණය ආධාර මත ක්‍රියාත්මක වූ වාරි පුබුදුව ව්‍යාපෘතිය මඟින් නවීකරණය කිරීමට කටයුතු කර ඇත.

ඒ යටතේ සම්පූර්ණ ඇළ මාර්ගය 2006 සිට 2012 දක්වා කාලය තුළ අදියරයෙන් අදියර සේවා මාර්ගය ද ඇතුළුව ප්‍රතිසංස්කරණය කර ඇති අතර,

1. රෙගියුලේටර් සහිත දිය බස්නා නිර්මිත - 10
2. ඇළ මාර්ග හරහා පාලම් - 06
3. නාන තොටුපළවල් - 15
4. ජල මිනුම් නිර්මිත - 02
5. ජල අවශ්‍යතා නිර්මිත - 04
6. ජල අවහැරවුම් නිර්මිත - 02

වශයෙන් විශාල නිර්මිත 39ක් ඇතුළුව ඉහත කී නිර්මිත 76ක් ද ඉදිකර ඇත. මේ සඳහා එම ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 83ක් වැය කර ඇත.

මෙම පුනරුත්ථාපනයෙන් පසු දිවුල්වැව සිට බටුවත්ත දක්වා ඇළ මාර්ගය දෙපස ගොවීන් විශාල පිරිසකට ගමනාගමන කටයුතු සඳහා පාලම් නොමැතිවීම හා සේවා මාර්ගය වල්බිහිවී තිබීම නිසා ඇතිව තිබූ ගැටලු සියයට 100ක් ම නිරාකරණය කර දී තිබුණි.

(ii) සේවා මාර්ගයේ නඩත්තු කටයුතු සහ ඇළ මාර්ගයේ නඩත්තු කටයුතු සඳහා වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදනය රුපියල් 132,000කි. ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසුව වරාගොඩ, ඉහුරු වැව, කුඩා තිරප්පනේ, මහ තිරප්පනේ යන පෝෂිත ඇළ මාර්ගවලින් ජලය ලබා ගන්නා වැව් යටතේ ඇති සුළු වාරිමාර්ග ගොවි සංවිධාන මඟින් රජයේ ද සහාය ලබා ගෙන සේවා මාර්ගය නඩත්තු කර ගැනීමේ අවශ්‍යතාව අවබෝධ කර දී ඇති අතර, වසර කිහිපයක් (2010, 2011, 2012) එම ගොවි සංවිධාන විසින් ව්‍යාපෘතිය භාරව සිටි නිලධාරීන්ගේ ද සහයෝගය මත ගොවීන් විසින් ඉටු කර ඇත.

එහෙත්, පසු ගිය වර්ෂ 2ක පමණ කාලයක සිට මෙම කටයුත්ත සඳහා ගොවි සංවිධානවල දායකත්වය නොලැබී ඇති අතර, 2012 - 2015 කාලය තුළ ඇති වූ මහ වැසි හා ගංවතුර සහිත කාලගුණ තත්ත්වය නිසා බොරළු දැමූ මාර්ගයේ සේදී යෑම් හා වලගොඩැලි ඇතිවීම් සිදුව ඇත.

(ආ) 2016 වර්ෂයේ දී මාර්ගයේ කිලෝමීටර 2ක දුර ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් ලක්ෂ 8ක ප්‍රතිපාදනයක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇති අතර, ප්‍රතිසංස්කරණ කටයුතු ඉටු කෙරෙමින් පවතී.

මෙම ඇළ මාර්ගය දෙපස පිහිටා ඇති ජනපද සඳහා වන ප්‍රවේශ මාර්ගය වන්නේ ද යෝධ ඇළෙහි සේවා මාර්ගය වන බැවින්, එය වාර්ෂිකව නඩත්තු කිරීම ප්‍රජා දායකත්වය ද ලැබිය යුතු අතර පස් හා බොරළු ලබා ගැනීමට ඇති බාධාවන් ද මාර්ගය නඩත්තු කිරීමට ඇති ගැටලු ලෙස හඳුනාගෙන ඇත.

දැනට මාර්ගයේ කිලෝමීටර 10.6න් කිලෝ මීටර් 7ක ප්‍රමාණයක් වාහන ධාවනය කළ හැකි තත්ත්වයක පවතින බවත්, කිලෝමීටර 3.6ක ප්‍රමාණයක් වලගොඩැලි සහිතව පවතින අතර, ලැබෙන ප්‍රතිපාදන මත ඉදිරි කාලයේදී එම කොටසද නඩත්තු කිරීම සඳහා කටයුතු යොදනු ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 - 618/'16 - (1), ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මැතිතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ හා බුද්ධශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Buddhasasana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

උතුරු ජල සම්පාදන ව්‍යාපෘතිය: ප්‍රතිලාභී පවුල්

வடக்கு நீர் வழங்கல் கருத்திட்டம் : நலன்பெறும் குடும்பங்கள்

NORTHERN WATER SUPPLY PROJECT: BENEFICIARY FAMILIES

638/'16

9. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු ශෙහාන් සේමසිංහ මහතා වෙනුවට)

(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு செஹான் சேமசிங்க சார்பாக)

(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Shehan Semasinghe)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) අනුරාධපුරය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කළ උතුරු ජල සම්පාදන ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ නම්,

(i) එහි ප්‍රතිලාභ අපේක්ෂිත කාලසීමාව තුළ ජනතාවට ලබා දෙන්නේද;

(ii) එයින් ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එකී ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

(v) එහි වැඩ කටයුතු කඩිනම් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) அநுராதபுரம் மாவட்டத்தில் நடைமுறைப்படுத்தப்பட்ட வடக்கு நீர் வழங்கல் கருத்திட்டம் தற்போது தொழிற் பட்டு வருகின்றதா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

ஆ) அக்கருத்திட்டம் தொழிற்பட்டு வருமாயின்,

(i) அதன் அனுகூலங்கள் எதிர்பார்க்கப்பட்ட காலப் பகுதியில் மக்களுக்குப் பெற்றுக்கொடுக்கப் படுமா என்பதையும்;

(ii) அதன்மூலம் உள்ளவாங்கப்படுகின்ற பிரதேச செயலாளர் பிரிவுகள் தனித்தனியாக யாவை யென்பதையும்;

(iii) அப்பிரதேச செயலாளர் பிரிவுகளுக்குரிய கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை தனித்தனி யாக யாதென்பதையும்;

(iv) குறித்த நலன்பெறும் குடும்பங்கள் எத்தனை என்பதையும்;

(v) அதன் பணிகளைத் துரிதப்படுத்துவற்கு நடவடிக் கைகள் எடுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply :

(a) Will he state whether the Northern Water Supply Project that was implemented in Anuradhapura District is operative, now?

(b) Will he inform this House, if the project is operative-

(i) whether benefits of the Project will be given to the public within an anticipated time period;

(ii) separately, the Divisional Secretary's Divisions covered by the Project;

(iii) separately, the number of Grama Niladhari Divisions, coming under aforesaid Divisional Secretary's Divisions;

(iv) the number of beneficiary families; and

(v) whether measures have been taken to expedite the Project?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) මූලික සැලසුමට අනුව ව්‍යාපෘතිය අවසන්වීමට නියමිතව තිබුණේ 2018 වර්ෂයේ පෙබරවාරි මාසයේ ය. නමුත් සංශෝධිත සැලැස්මට අනුව ව්‍යාපෘතිය අවසන් වන්නට නියමිතව තිබෙන්නේ 2018 වර්ෂයේ නොවැම්බර් මාසයේ ය.

(ii) මැදවච්චිය - සම්පූර්ණයෙන්ම
රඹෑව - සම්පූර්ණයෙන්ම
මිහින්තලය - ග්‍රාම නිලධාරී වසම් 02ක්

(iii) මැදවච්චිය - ග්‍රාම නිලධාරී වසම් 37
රඹෑව - ග්‍රාම නිලධාරී වසම් 38
මිහින්තලය - ග්‍රාම නිලධාරී වසම් 0

(iv) මැදවච්චිය - 14,600 (ප්‍රතිලාභීන් ගණන 65,687)
රඹෑව - 10,714 (ප්‍රතිලාභීන් ගණන 48,213)
මිහින්තලය - 386 (ප්‍රතිලාභීන් ගණන 1,737)

(v) ඔව්.

(ඇ) අදාළ නොවේ.

රුහුණුපුර ජල යෝජනා ක්‍රමය: ඇස්තමේන්තු කළ මුදල

ருகுணுபுர நீர் வழங்கல் திட்டம் : மதிப்பீட்டுச் செலவு

RUHUNUPURA WATER SUPPLY PROJECT: ESTIMATED COST

649/'16

10. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු නාමල් රාජපක්ෂ මහතා වෙනුවට)

(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு நாமல் ராஜபக்ஷ சார்பாக)

(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Namal Rajapaksa)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හම්බන්තොට ඉදිකිරීමට සැලසුම් කරන ලද රුහුණුපුර ජල යෝජනා ක්‍රමයේ II අදියර ආරම්භ කර තිබේද;

(ii) ඒ සඳහා වැය කිරීමට ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) II වන අදියර යටතේ ආවරණය වන ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට නළ ජල සම්බන්ධතාව ලබාදී ඇති ග්‍රාම නිලධාරී වසම් කවරේද;

(iii) නළ ජල සම්බන්ධතාව ලබා දී නොමැති ග්‍රාම නිලධාරී වසම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට නළ ජල සම්බන්ධතාව ලබාදී නොමැති ග්‍රාම නිලධාරී වසම් සඳහා නළ ජල සම්බන්ධතාව ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டையில் நிர்மாணிப்பதற்கு திட்டமிடப்பட்ட ருகுணுபுர நீர் வழங்கல் திட்டத்தின் II வது கட்டம் ஆரம்பிக்கப்பட்டுள்ளதா;

(ii) இதற்காகச் செலவிட மதிப்பீடு செய்யப்பட்ட பணத்தொகை எவ்வளவு;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) II வது கட்டத்தின்கீழ் உள்வாங்கப்படுகின்ற கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை யாது;

(ii) தற்போது குழாய் நீர் இணைப்புகள் வழங்கப் பட்டுள்ள கிராம அலுவலர் பிரிவுகள் யாவை;

(iii) குழாய் நீர் இணைப்புகள் வழங்கப்படாதுள்ள கிராம அலுவலர் பிரிவுகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) தற்போது குழாய் நீர் இணைப்புகள் வழங்கப் படாதுள்ள கிராம அலுவலர் பிரிவுகளுக்கு குழாய் நீர் இணைப்புகளை வழங்குவதற்கு நடவடிக்கை எடுப்பாரா;

(ii) இதற்கு எவ்வளவு காலம் எடுக்கும்;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply :

(a) Will he state -

(i) whether the second phase of the Ruhunupura Water Supply Project that had been planned to be implemented in Hambanthota has been commenced; and

(ii) the amount that has been estimated to be spent for it?

(b) Will he inform this House-

(i) the number of Grama Niladhari Divisions that are covered under the second phase;

(ii) the Grama Niladhari Divisions to which pipe-borne water connections have been given by now; and

(iii) the Grama Niladhari Divisions to which pipe-borne water connections have not been given?

(c) Will he also inform this House-

(i) whether action will be taken to provide pipe-borne water connections to the Grama Niladhari Divisions to which pipe-borne water connections are not provided at present; and

(ii) the period of time that will be taken for it?

(d) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) නැත.

(ii) රුපියල් මිලියන 5200.00

(ආ) (i) වසම් 24කි.

(ii) <u>සූරිය වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය</u>

මීගහජදුර, වැලිවැව, සමාජසේවා පුර, සුරවිරුගම, විජයගම, නමඩගස්වැව, මහවැලි කඩාර අන්දරවැව, සූරියවැව, බැද්දේවැව, විහාරගල.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සෙවණගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (මොණරාගල දිස්ත්‍රික්කය)

නුගේගලයාය

හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

එලල්ල, බැල්ලගස්වැව, කැලියපුර, සාමෝදාගම, සිරිබෝපුර

(iii) ඔව්.

සූරිය වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

රන්මුදු වැව, වැදි වැව, හබරන්නාවල, මහ පැලැස්ස

ලුතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

පහළ මත්තල

සෙවණගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (මොණරාගල දිස්ත්‍රික්කය)

හබරුගල, මහවැව

(ඇ) (i) ඔව්.

(ii) දැනට මෙම ව්‍යාපෘතිය පළමු අදියර යටතේ වූ බෙදාහැරීම් ජල නළ එළීමේ වැඩ කටයුතු 2016.08.13 දිනෙන් අවසන්වීමට නියමිතව ඇත. ඉන් පසුව ඉහත සඳහන් ග්‍රාම නිලධාරී වසම් සඳහා ජලය ලබා දීමට කටයුතු කරනු ඇත.

දැනට ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘති මඟින් ආවරණය වන එහෙත් ගුණාත්මකභාවය හා ප්‍රමාණාත්මකභාවයේ ඌනතාවයක් ඇති ග්‍රාමීය ව්‍යාපෘති සඳහා තොග ජල සැපයුම් පමණක් ලබා දෙනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

එළවලු සහ පලතුරු වගාව: රසායනික ද්‍රව්‍ය යෙදීම
மரக்கறிகள் மற்றும் பழச்செய்கை :இரசாயனப் பொருட்கள் பயன்பாடு
CULTIVATION OF FRUITS AND VEGETABLES: USE OF CHEMICALS

482/'16

14. ගරු බන්දුල ගුණවර්ධන මහතා(ගරු කනක හේරත් මහතා වෙනුවට)

(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு கனக ஹேரத் சார்பாக)

(The Hon. Bandula Gunawardane on bahlf of the Hon. Kanaka Herath)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ශ්‍රී ලංකාවේ එළවලු සහ පලතුරු වගා කිරීම හා ඉදවීම සඳහා රසායනික ද්‍රව්‍ය යොදන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රසායනික ද්‍රව්‍යය යෙදූ එළවලු සහ පලතුරු පරිභෝජනය කරන ජනතාවගේ ශරීර සෞඛ්‍යය පිරිහීමට ලක්වන බවත්;

(ii) එම රසායනික ද්‍රව්‍යය ශරීරගතවීම හේතුවෙන් අධික ලෙස කොලෙස්ටරෝල් තැන්පත් වීම, පිළිකා වැනි අවදානම් රෝග වැළඳිය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) රසායනික ද්‍රව්‍යය භාවිතය අවම කිරීම සඳහා රජය ගන්නා පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதார, போசனை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) இலங்கையில் மரக்கறிகள் மற்றும் பழ வகைகளின் பயிர்ச்செய்கைக்கும் அவற்றைப் பழுக்க வைப் பதற்கும் இரசாயனப் பொருட்கள் பயன்படுத்தப் படுகின்றன என்பதை அவர் அறிவாரா;

(ஆ) (i) இரசாயனப் பொருட்கள் பயன்படுத்தப்பட்ட மரக்கறிகள் மற்றும் பழ வகைகளை நுகர்வு செய்கின்ற மக்களின் தேகாரோக்கியம் வீழ்ச்சியடைகின்றது என்பதையும்;

(ii) மேற்படி இரசாயனப் பொருட்கள் உடலில் சேர்வதனால் அதிக அளவில் கொலஸ்டரோல் பதிதல், புற்று நோய் போன்ற பாரதூரமான நோய்கள் ஏற்படலாம் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) இரசாயனப்பொருள் பயன்பாட்டைக் குறைப்பதற்கு அரசாங்கம் மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine :

(a) Is he aware that chemicals are used in cultivating and ripening fruits and vegetables in Sri Lanka?

(b) Will he accept that-

(i) the health condition of the people gets deteriorated due to consumption of vegetables and fruits for which chemicals have been used;

(ii) people are subjected to hazardous diseases like cancers and excessive deposit of cholesterol due to the exposure to the aforesaid chemicals?

(c) Will he inform this House the measures taken by the Government to minimize the use of chemicals?

(d) If not, why?

ගරු ෆයිසාල් කාසිම් මහතා

(மாண்புமிகு பைஸால் காசிம்)

(The Hon. Faizal Cassim)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) මනා කෘෂිකාර්මික පිළිවෙත් (GAP) මඟින් නිපදවන එළවලු හා පලතුරු පරිභෝජනය මඟින් ජනතාවගේ සෞඛ්‍ය පිරිහීමක් සිදු නොවේ.

(ii) විද්‍යාත්මකව තහවුරු කර නැත.

(ඇ) . රසායනික ද්‍රව්‍ය අවහාවිතය සීමා කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පලිබෝධ නාශක රෙජිස්ට්‍රාර් හා ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව යන ආයතන මඟින් කටයුතු කරයි.

අවදානමකට තුඩුදිය හැකි විෂ සහිත රසායනික ද්‍රව්‍ය ආනයනය කිරීම තහනම් කර ඇත.

. යම් රසායනික ද්‍රව්‍යයක් මානව සත්ව සෞඛ්‍යයට හෝ පරිසරයට අගතිදායක බව විද්‍යාත්මකව අනාවරණය වුවහොත් අවදානම් කළමනාකරණය කිරීමේ ක්‍රියා මාර්ග ගැනීමට රජය කටයුතු කරනු ලැබේ.

. කිසිදු රසායනික ද්‍රව්‍යයක් භාවිත නොකර කාබනික ගොවිතැන ප්‍රවර්ධනය කිරීම සඳහා රජය කටයුතු කරමින් පවතී.

(ඈ) පැන නොනඟී.

නීතිපතිවරයා ලෙස කණිෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම: හේතු

சட்ட மாஅதிபராக கனிஷ்ட அலுவலர் நியமனம் :காரணங்கள்

APPOINTIMENT OF A JUNIOR OFFICER AS ATTORNEY-GENERAL: REASONS

502/'16

15. ගරු බන්දුල ගුණවර්ධන මහතා (උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවට)

(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில சார்பாக)

(The Hon. Bandula Gunawardane on behalf of the Hon. Udaya Prabhath Gammanpila)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නීතිපතිවරයා පත් කිරීමේදී දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වූ සුහද ගම්ලත් මහතා පත් නොකිරීමට හේතු කවරේද;

(ii) ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වෙනුවට දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ නිලධාරියෙකු නීතිපති තනතුරට පත් කිරීම පිළිබඳව මෑත කාලීන පූර්වාදර්ශ තිබේද;

(iii) එවැනි පූර්වාදර්ශ සිදුවූ වසර, පත්වීම ලද කණිෂ්ඨ නිලධාරියාගේ නම, අගතියට පත් ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ නම සහ එවකට සිටි රාජ්‍ය ප්‍රධානියාගේ නම කවරේද;

(iv) ජනාධිපතිවරයා විසින් මෙසේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා පත් නොකිරීමට හේතු නොදක්වමින්, කණිෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ස්වාධීන රාජ්‍ය සේවයක් පිළිබඳව ජනතාවට ඇති කළ බලාපොරොත්තු කඩ කිරීමක් බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) சட்ட மாஅதிபர் நியமிக்கப்பட்டபோது திணைக் களத்தில் சேவை மூப்புடைய அலுவலரான திரு. சுஹத கம்லத் நியமிக்கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) சேவை மூப்புடைய அலுவலருக்குப் பதிலாக திணைக்களத்தின் கனிஷ்ட அலுவலர் ஒருவர் சட்ட மாஅதிபர் பதவிக்கு நியமிக்கப்பட்டமை தொடர்பாக அண்மைக்காலத்தில் முன்னுதா ரணங்கள் உள்ளதா என்பதையும்;

(iii) அவ்வாறான முன்னுதாரணங்கள் இடம் பெற் றுள்ள வருடங்கள், நியமனம் பெற்ற கனிஷ்ட அலுவலரின் பெயர், அதனால் பாதிக்கப்பட்ட சேவை மூப்புடைய அலுவலரின் பெயர் மற்றும் அப்போதைய நாட்டுத் தலைவரின் பெயர் யாவை என்பதையும்;

(iv) சனாதிபதியினால் இவ்வாறு சேவை மூப்புடைய அலுவலர் நியமிக்கப்படாமைக்கான கார ணங்கள் அறிவிக்கப்படாது, கனிஷ்ட அலுவலர் ஒருவர் நியமிக்கப்பட்டுள்ளமையானது 19 ஆவது அரசியலமைப்புத் திருத்தத்தின் ஊடாக சுயாதீன அரச சேவையொன்று தொடர்பாக மக்கள் மத்தியில் ஏற்படுத்தப்பட்டுள்ள எதிர்பார்ப்புக்களை மீறுவதாகும் என்பதை அவர் ஏற்றுக் கொள்வாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the reasons for not appointing Mr. Suhada Gamlath, who was the most senior officer of the Department, to the post of Attorney General;

(ii) whether there are recent precedents of appointing a junior officer to the post of Attorney General instead of the most senior officer;

(iii) the year in which such precedents were set, the name of the junior officer who received the appointment, the name of the senior officer who was aggrieved and the name of the Head of State at that time; and

(iv) whether he admits the fact that the appointment of a junior officer by the President in this manner without giving reasons for not appointing the most senior officer has disappointed the people who were assured of an independent public service through the 19th Amendment to the Constitution?

(b) If not , why ?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඉ.((1)(ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව නීතිපතිවරයා පත් කර ඇත.

(ii) ඔව්.

(iii) මොහාන් පීරිස් මහතා නීතිපති තනතුරට පත් කරනු ලැබුවේ 2008 වසරේ වන අතර, ඒ වන විට වැඩ බලන නීතිපතිවරයා වශයෙන් කටයුතු කළේ ඔහුට වඩා ජ්‍යෙෂ්ඨ ප්‍රියසාද් ඩෙප් මහතා ය. එසේම, ඒ වන විට ඔහුට වඩා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වන ඊවා වනසුන්දර, පාලිත ප්‍රනාන්දු හා යුවන්ජන් විජයතිලක යන නිලධාරීන් නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටින ලදී. 2008 වසරේදී රාජ්‍ය නායකයා ලෙස කටයුතු කළේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ය. ඉන් පසුව, 2012 වසරේදී නීතිපති වශයෙන් කටයුතු කළ ඊවා වනසුන්දර මහත්මියව පෙර පැවති සම්ප්‍රදාය කඩ කරමින් අගවිනිසුරු ලෙස පත් නොකර ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරියක ලෙස පත් කිරීමට කටයුතු කරන ලද්දේ ද මහින්ද රාජපක්ෂ මැතිතුමා විසිනි.

(iv) පිළිනොගනී. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව 61ඉ(1)(ආ)හි සඳහන් තනතුරු සඳහා ජනාධිපතිවරයා විසින් පත් කිරීම් කළ යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඇ) ව්‍යවස්ථාව පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පූර්ණ අනුමැතිය සහිතව නීතිපති පත්කිරීම සිදුකර ඇත. ඒ අනුව ස්වාධීන රාජ්‍ය සේවය පිළිබඳ ජනතාවට ඇති අපේක්ෂාව බිඳවැටීමක් සිදුවී නැත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය. ගරු ඩග්ලස් දේවානන්දා මහතා.- [පැමිණ නැත.]

ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය. ගරු අනුර කුමාර දිසානායක මහතා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දෙන ඇමතිතුමා කවුරුද යන්න දැන ගන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා නේද පිළිතුර ලබා දෙන්නේ?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, ඔබතුමා ළඟ පිළිතුර තිබෙනවාද? මම මේ ප්‍රශ්නය බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් තමයි ඇහුවේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු වන්දිම වීරක්කොඩි මැතිතුමාගේ පිළිතුර නේද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, ඔව්. මම හිතන විධියට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා ළඟ උත්තරය නැහැ, ප්‍රශ්නය පමණයි තිබෙන්නේ. මා ළඟ තිබෙන ලේඛනයමයි එතුමා ළඟ තිබෙන්නේත්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඕනෑ නම් මට කියවන්නට පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, මම ප්‍රශ්නය කියවන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
උත්තරය එවලා නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අඩුම තරමින් අදාළ ඇමතිතුමා ගරු සභාවේ ඉන්න ඕනෑ. එහෙම නැත්නම් නියෝජ්‍ය ඇමතිතුමිය ඉන්න ඕනෑ. උත්තරය ගන්න බැරි නම් බැහැ කියලා කියන්න ඕනෑ. නියෝජ්‍ය ඇමතිතුමියත් අද නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මෙවර ස්ථාවර නියෝග සංශෝධනය වුණාම ඔය තත්ත්වය වෙනස් වෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අදාළ ඇමතිවරයා නැත්නම්, නියෝජ්‍ය ඇමතිවරිය නැත්නම් ඒ ප්‍රශ්නය අහලා වැඩක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන කථා කර තිබෙනවා. ඉදිරියේදී ස්ථාවර නියෝග වෙනස් වෙනවා. එතකොට ඒ අයගේ පැමිණීමත් සඳහන් වෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Shadow Ministersලාත් නැද්ද දන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ සම්බන්ධයෙන් මොකක් හෝ පියවරක් ගන්නට වෙයි ගරු කථානායකතුමනි. නැත්නම් පාර්ලිමේන්තුවේ වටිනාකමක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අග්‍රාමාත්‍යතුමාත් මේ ගැන සඳහන් කළා.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Shadow Ministersලාත් නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අඩුම තරමින් Shadow Ministerවත් සභාවේ නැහැ. ඡායා ඇමතිවත් හිටියා නම් උත්තර දෙන්න තිබුණා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු සභාවේ එක්කෝ ඇමතිතුමා ඉන්නට ඕනෑ; එහෙම නැත්නම් රාජ්‍ය ඇමතිතුමා ඉන්නට ඕනෑ; එක්කෝ සෙවණැලි ඇමතිතුමා ඉන්නට ඕනෑ. දැන් සෙවණැලි ඇමතිතුමාත් නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඡායා ඇමතිවත් සිටියා නම් උත්තර දෙන්න තිබුණා. [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒගොල්ලො එන්න තව අවුරුදු 15ක් විතර ඉන්න වෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මොනවා හෝ කරන්න ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. මොකක්ද කරන්නේ?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් ස්ථාවර නියෝග වෙනස් කර තිබෙනවා. මම එය ලබන සතියේ පක්ෂ නායකයන්ට ඉදිරිපත් කරනවා. ගරු අග්‍රාමාත්‍යතුමාත්, අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු කණ්ඩායමත් බැලුවාට පසුව අගෝස්තුවල සිට ඒ ස්ථාවර නියෝග ඉදිරිපත් කරන්නට පුළුවන්. ඒ අනුව ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නට අදාළ ගරු අමාත්‍යතුමා අනිවාර්යයෙන්ම සභාවේ සිටිය යුතුයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේක, ප්‍රශ්නය අහන මන්ත්‍රීතුමාටත් නිගාවක්, පාර්ලිමේන්තුවටත් නිගාවක්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවට හොඳ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මේවා රටේ ජනතාව අහගෙන ඉන්නවා. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා එනවා නම් පත් කරන්නම්. ඔබතුමාට ඇමතිකමක් දෙන්න ඕනෑ වෙලාවක අපි සූදානම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, මාසයකින් මේ තත්ත්වය වෙනස් වෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නය අහන්නද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අහන්න. ඊළඟ දිනයේදී එතුමා reply කරයි.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිත පිහිටා ඇති තෙල් ටැංකි සම්බන්ධයෙන් මතුව ඇති ගැටලුකාරී තත්ත්වය
திருகோணமலைத் துறைமுக எண்ணெய்த் தாங்கி தொடர்பில் எழுந்துள்ள பிரச்சினை
PROBLEMATIC SITUATION WITH REGARD TO OIL TANK FARM CLOSE TO TRINCOMALEE HARBOUR

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23.(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිත පිහිටා ඇති තෙල් ටැංකි තවත් ප්‍රමාණයක් ඉන්දියානු තෙල් සමාගමට පැවරීමට යන බවට වන පුවත් සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

ලෝකයේ දෙවැනි ගැඹුරුතම ස්වාභාවික වරාය වන්නේ ත්‍රිකුණාමලය වරායයි. එහි සුවිශේෂී පිහිටීම හේතුවෙන් ඉතිහාසය පුරා එය විවිධ රටවල අවධානයට පාත්‍ර වුණා. ත්‍රිකුණාමලය වරායේ වැදගත්කම තවත් ඉහළ නංවන්නේ දෙවැනි ලෝක යුද සමයේ චීන වරාය ආශ්‍රිතව ඉදි කරන ලද තෙල් ටැංකි සංකීර්ණයයි. මෙහි ඝන මීටර් 12,500ක ධාරිතාවයෙන් යුතු ටැංකි 102ක් පිහිටා තිබෙනවා. දැනට ටැංකි 100ක් පාවිච්චියට ගත හැකි

[ගරු අනුර දිසානායක මහතා]

තත්ත්වයේ පවතින අතර, ටැංකි 17ක් පහළ සංකීර්ණය ලෙස හා 83ක් ඉහළ සංකීර්ණය ලෙස කොටස් දෙකකින් යුක්තයි. ඉහළ සංකීර්ණය තුළ දුම්රිය තෙල් ටැංකි සඳහා තෙල් පිරවීමේ පහසුකම් ද තිබෙනවා.

මෙම පහළ සංකීර්ණයේ ටැංකි යම් ප්‍රමාණයක් ලංකා බනිජ තෙල් සංස්ථාව විසින් භාවිත කරන ලද අතර ඒවා 2003 වසරේදී ඉන්දියානු තෙල් සමාගමට කුලියට දීමට එවකට ආණ්ඩුව කටයුතු කළා. ඒ බනිජ තෙල් සංස්ථාව සහ ඉන්දියානු තෙල් සමාගම සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමක් මඟිනුයි. එහෙත් බනිජ තෙල් සංස්ථාවට ටැංකි පිහිටා ඇති භූමියේ අයිතියක් නොතිබූ බැවින්, එය නීත්‍යානුකූල පැවරීමක් නොවෙයි.

මීට පෙර මා පාර්ලිමේන්තුවේදී මේ ප්‍රශ්නය අසන ලද අවස්ථාවේදී බනිජ තෙල් කර්මාන්ත අමාත්‍යවරයා හැටියට ගරු සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යවරයා මේ පිළිබඳවම පාර්ලිමේන්තුවේදී පැහැදිලි කළා.

අත්සන් තබන ලද ගිවිසුමේ මාස 06ක් ඇතුළත නීතිමය ලියවිලි සකස් කරන බව සඳහන් වුවත් මේ දක්වා එවැන්නක් සකස් වී නොමැති බැවින් නීත්‍යානුකූලව සියලුම සම්පත් රජය සතුව පවතිනවා. ඒ අනුව, දැන් මේ තෙල් ටැංකි රජයට අයිතියි.

ඉන්දියානු තෙල් සමාගම විසින් පරිහරණය කරනු ලබන්නේ පහළ සංකීර්ණයේ ටැංකි 17න් යම් ප්‍රමාණයක් පමණයි. රටේ තෙල් ඉල්ලුම ඉහළ යාම සැලකිල්ලට ගත් විට දුම්රිය මඟින් බෙදා හැරීමේ පහසුකම් ද සහිත මෙම ප්‍රයෝජනවත් ගබඩා සංකීර්ණය මෙතෙක් පාවිච්චියට නොගැනීම බලවත් අපරාධයක්. අලුතින් තෙල් ගබඩා ඉදි කිරීම විශාල වියදම් දැරිය යුතු කටයුත්තක් බැවින් ලංකා බනිජ තෙල් සංස්ථාවට විශාල අමතර වැය බරකින් තොරව මෙම ටැංකි සංකීර්ණය පාවිච්චියට ගත හැකිව තිබෙනවා. එසේම ගබඩා සංකීර්ණයේ විශාලත්වය හේතුවෙන් රට තුළ සැපයුමට පමණක් නොව ජාත්‍යන්තර තෙල් වෙළෙඳ පොළට ප්‍රවේශ වීමට ද බනිජ තෙල් සංස්ථාවට මෙමඟින් ඉඩ කඩ පාදා ගත හැකියි.

විශේෂයෙන්ම බනිජ තෙල් සංස්ථාව පාර්ලිමේන්තුවේ කෝප් එක හමුවට කැඳවන ලද අවස්ථාවක මෙම තෙල් ටැංකි පාවිච්චි කිරීමේ හැකියාව සොයා බලන ලෙසට නිර්දේශයක්ද කරනු ලැබ තිබුණා. සංස්ථාවේ වෘත්තීය සමිති විසින් ද මෙම ගබඩා සංකීර්ණය පාවිච්චියට ගැනීමේ අවශ්‍යතාව බලධාරීන්ට පෙන්වා දී තිබුණා. ඒ අනුව සංස්ථාවේ නිලධාරීන් විසින් ටැංකි 17ක් පරීක්ෂා කොට බලා ලබා දුන් තාක්ෂණික වාර්තාවේ ඒවා එම තත්ත්වයෙන්ම පාවිච්චි කළ හැකි බවත්, විනාශ කරනු ලැබ ඇති නළ පද්ධතිය පමණක් අලුතින් ඉදි කළ යුතුව ඇති බවත් පෙන්වා දී තිබුණා. ඒ සඳහා වන වියදම සංස්ථාවට දැරිය හැකි මට්ටමේ වන බවද එහි සඳහන්ව තිබුණා.

දැන ගන්නට ඇති අන්දමට ටැංකි සංකීර්ණය නවීකරණය කොට සංස්ථාවේ පාවිච්චියට ගැනීම වෙනුවෙන් අමාත්‍යවරයා විසින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර එයට අනුමැතිය ද පළ වී තිබෙනවා.

මා ළඟ එම කැබිනට් පත්‍රිකාව තිබෙනවා.

කෙසේ වුවද, ඒ අනුව සංස්ථාව විසින් නවීකරණ කටයුතු ඇරඹීමට කටයුතු සුදානම් වෙමින් සිටියදී කිසියම් අදිසි හස්තයක් විසින් එම කටයුතු නතර කර ඇති බව වාර්තා වෙනවා.

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයක් වී තිබෙන්නේ මේකයි. තෙල් සංස්ථාව සැලැස්මක් හැදුවා, මෙම තෙල් ටැංකි සංකීර්ණය තෙල් සංස්ථාව උපයෝගි කර ගන්න. ඒ සඳහා අවශ්‍ය වන කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කොට අනුමැතියක් ලබා ගෙනත් තිබුණා. එසේ අනුමැතියක් ලබා ගෙන තිබියදී හදිසියේ මෙම තත්ත්වයන් නතර කර තිබෙනවා.

ඒ අනුව මෙම ටැංකි සංකීර්ණයේ ඉතිරි ටැංකි ප්‍රමාණය ද ඉන්දියානු තෙල් සමාගමට ලබා දීමට ආණ්ඩුව සූදානම් වන බවට බනිජ තෙල් සංස්ථා සේවකයින් අතර ද මේ මහා ජාතික සම්පත පිළිබඳ උනන්දුවන ජනතාව අතරද මහත් නොසන්සුන්තාවක් වර්ධනය වෙමින් තිබෙනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

01. බනිජතෙල් සංස්ථාවේ ඉංජිනේරුවන් විසින් චීන වරායේ ටැංකි 17ක් පරීක්ෂා කොට තාක්ෂණික වාර්තාවක් ලබා දී ඇත්ද?

02. එම වාර්තාවෙන් නිර්දේශ කර ඇත්තේ කුමක්ද? එම වාර්තාව මෙම සභාවට ඉදිරිපත් කරනු ලබන්නේද?

03. ටැංකි සංකීර්ණය නවීකරණය කොට සංස්ථාවේ පාවිච්චියට ගැනීම වෙනුවෙන් වූ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද්දේද?

04. අදාළ කැබිනට් පත්‍රිකාව සඳහා අනුමැතිය පළවී ඇත්ද? ඒ කවර දිනයේද?

05. බනිජ තෙල් සංස්ථාව මඟින් ටැංකි පද්ධතියේ නවීකරණ කටයුතු සිදු කිරීමේ ව්‍යාපෘතියක් අත්හිටුවීමට කටයුතු කර තිබේද?

06. එම ටැංකි සංකීර්ණයේ ඉතිරි ටැංකි පද්ධතියද ඉන්දියානු තෙල් සමාගමට පැවරීමට රජය තීරණයක් ගෙන තිබේද? එසේ නම් ඒ කවර හේතු මතද?

යනුවෙන් ඇති ප්‍රශ්නවලට ගරු ඇමතිතුමා විසින් මෙම ගරු සභාව දැනුවත් කරනු ඇතැයි මා බලාපොරොත්තු වනවා. බොහොම ස්තුතියි ,ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ පාර්ලිමේන්තු දිනයේදී මේ සඳහා වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ඉදිරි දිනයේදී මේ සම්බන්ධව පිළිතුරු ලබා දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන පළමුවෙනි දිනයේදී මේ සඳහා පිළිතුරු ලබා දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම ගරු මන්ත්‍රීතුමාගෙන් අහන්න කැමැතියි, මේ තෙල් ටැංකි ඉන්දියාවට ලබා දෙනවාට ඔබතුමන්ලා විරුද්ධයිද කියලා. ඔබතුමන්ලාගේ මතය කරුණාකර කියන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, මගේ මතය කියන්නම්. මම ප්‍රශ්න ඇහුවාම දැන් මගෙන් ප්‍රශ්න අහනවා. ඒක බොහොම හොඳයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කියන්නේ, ජනතාව නොසන්සුන් වෙලා කියලායි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කියන්නේ, 2003 වසරේදී-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම අහන්නේ,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කියන්නේ සිද්ධියත් එක්කයි.

2003 වසරේදී ඉන්දියානු සමාගමට තෙල් ටැංකි ටික දුන්නා. නමුත්, ඉඩම තෙල් සංස්ථාවට අයිති නැහැ. ඒක වරායට අයිති භූමියක්. මාස හයක් ඇතුළත පැවරීම සිදු නොවීම හේතුකොටගෙන ඒ තෙල් ටැංකි සංකීර්ණය නැවත රජයට පැවරී තිබෙනවා.

දැන් අපේ යෝජනාව මම කියන්නම්. ගරු ඇමතිතුමනි, අපට කොළොන්නාවේ ගබඩා සංකීර්ණය තිබෙනවා. කොළොන්නාව ගබඩා සංකීර්ණය අද විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. නළ පද්ධතිය පැල්පත්වාසී නිවාස ආශ්‍රයෙන් එන නිසා විශාල ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා. ඒ වාගේම කොළඹ වරායේ හිර වීමක් තිබෙනවා. අපට ගැඹුරුතම මුහුදක් තිබෙනවා ත්‍රිකුණාමලයේ. එතැන අපට තෙල් ටැංකි සංකීර්ණයක් තිබෙනවා. ඒ වාගේම දුම්රියට තෙල් පැටවීම සඳහා අවශ්‍ය වන ගබඩා 17ක් රේල් පාර ආසන්නයේ තිබෙනවා. එතකොට අපිට දුම්රියෙන් තෙල් ප්‍රවාහනය කරන්නත් පුළුවන්. ඒ නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තමන්ගේ අලාභය අඩු කරගෙන ජනතාවට කාර්යක්ෂම සේවයක් සපයන්න නම්, රටටත් පාඩුවක් නොවෙන්න නම්, මේ තෙල් සංකීර්ණය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් මෙහෙය විය යුතුයි කියන එක තමයි අපේ අදහස.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

මීළඟට ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා.

Order, please! Before he starts, the Hon. Deputy Speaker will take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු සපානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, පිරතිච් සපානායකර් අවර්කළ් [மாண்புமிகு திலங்க சுமதிபால] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Douglas Devananda, please.

II

ශ්‍රී ලාංකික මුස්ලිම් ජනතාවට ත්‍යාග කරන ලද රට ඉදි සඳහා ආනයන බදු

இலங்கை முஸ்லிம்களுக்கு இலவசமாகக் கிடைக்கும் பேரீச்சம்பழத்துக்கு இறக்குமதி வரி

IMPORT TAX ON DATES GIFTED TO SRI LANKAN MUSLIMS

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
කෞරව ප්‍රතිචි සපානායකර් අවර්කළේ, නිලෛයියර් කට්ටළෛ 23/2ඉන් කීළ් කෞරව නිතියමෛච්චර් රවි කරුණානායක්ක අවර්කළිටම් කේල්වි කේට්ක අනුමතිත්තතර්කු නන්රි.

புனித ரமழான் மாதத்தில் இலங்கைவாழ் எமது சகோதர முஸ்லிம் மக்களின் பயன்பாட்டுக்காக உலக இஸ்லாமிய நாடுகளால் வருடந்தோறும் பேரீச்சம்பழங்கள் இலவசமாக வழங்கப்படுகின்றன. இதன் பிரகாரம் டுபாய், ஈரான் உட்பட்ட நாடுகள் வருடந்தோறும் தொடர்ச்சியாகப் பேரீச்சம்பழங்களை வழங்காதவிடத்தும், வழங்கும் சந்தர்ப்பங்களில் அதற்கான இறக்குமதி வரியை அந்தந்த நாடுகளே ஏற்றுக்கொள்வதாகத் தெரியவருகின்றது. இந்த நிலையில் வருடந்தோறும் தொடர்ச்சியாக எமது நாட்டுக்குச் சுமார் 200 மெற்றிக் தொன் பேரீச்சம்பழங்களைச் சவூதி அரேபியா வழங்கிவருகிறது. இதற்கான இறக்குமதி வரியை இலங்கை முஸ்லிம் கலாசார அலுவல்கள் திணைக்களமே செலுத்திவருவதாக அறியமுடிகிறது. அந்த வகையில், இந்த வருடம் இறக்குமதி செய்யப்பட்ட 200 மெற்றிக் தொன் பேரீச்சம்பழங்களுக்கென மேற்படி திணைக்களம் சுமார் 16 மில்லியன் ரூபாயைச் செலவிட்டிருப்பதாகத் தெரியவருகிறது. இலவசமாகக் கிடைக்கின்ற பேரீச்சம்பழங்களுக்கு வருடந்தோறும் மேற்படி திணைக்களம் இவ்வாறானதொரு தொகையைச் செலவிடு வதைத் தவிர்த்தால், முஸ்லிம் மக்கள் நலன் சார்ந்த வேறு பணிகளுக்கு அந்த நிதியைப் பயன்படுத்த முடியும்.

சவூதி அரேபியாவின் மூலம் எமது நாட்டுக்குப் புனித ரமழான் மாதத்தினை முன்னிட்டு இலவசமாக வழங்கப்படுகின்ற பேரீச்சம்பழங்களுக்கு அறவிடப்படுகின்ற வரியை முற்றாக அகற்ற நடவடிக்கை எடுக்க முடியுமா?

அல்லது சவூதி அரேபியா தவிர்ந்த ஏனைய நாடுகள் இறக்குமதிக்கான வரியைத் தாமே ஏற்றுக்கொள்வது போன்ற ஒரு நடைமுறையைச் சவூதி அரேபியா தொடர்பிலும் ஏற்படுத்திக்கொள்வதற்கு ஏதேனும் சாத்தியப்பாடுகள் உள்ளனவா?

மேற்படி எனது கேள்விகளுக்கான பதில்களையும், எடுக்கப்படக்கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் கௌரவ நிதியமைச்சர் ரவி கருணாநாயக்க அவர்கள் வழங்குவாரென எதிர்பார்க்கின்றேன்.

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තරය මෙසේය.

ආනයනය කරනු ලබන රට ඉදි සඳහා අදාළ වනුයේ 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ පනත යටතේ පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බදු වේ. ඒ අනුව, රට ඉදි කිලෝග්‍රෑම් එකක් සඳහා දැනට අය කරනු ලබන බද්ද රුපියල් 60කි.

මෙම වසරේ ශුද්ධ වූ රාමසාන් කාලය තුළදී මෙරට වෙසෙන මුස්ලිම් ජනතාවට, මුස්ලිම් රාජ්‍යයන් විසින් පරිත්‍යාග ලෙස ලබා දී ඇති රට ඉදි තොගයන් රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා අදාළ බදු මුදල රජය විසින් ගෙවීමට කටයුතු කර ඇත. ඒ අනුව, පරිත්‍යාග ලෙස ලැබූ රට ඉදි මෙට්‍රික්ටොන් 268ක් රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා රුපියල් මිලියන 22.82ක මුදලක් තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයට සහ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇත.

Hon. Member, this has been traditionally done before, but, for the first time, we have formalized it with due respect to all the religions. There was a request by the Ministry of Muslim Affairs, and on that, there were five consignments which were personally approved by the President, the Prime Minister and myself. We did not want to give anybody carte blanche to import these consignments on duty-free basis. So, we imposed the duty on to the Ministry of Muslim Affairs, which is transparent, knowing that this would be the case. Any other area which is of similar significance for any religion will certainly be looked at. All we want to say is, it is for the religious harmony that we did it, not with any other intention at all. Any imports coming in now will not be tolerated; it has to be during Ramazan Season, not now.

Thank you for raising this matter.

අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල පාලනය : කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

அத்தியாவசிய உணவுப் பண்டங்களின் விலைக் கட்டுப்பாடு : கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரினது கூற்று

CONTROL OF PRICES OF ESSENTIAL FOOD ITEMS: STATEMENT BY MINISTER OF INDUSTRY AND COMMERCE

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

Hon. Deputy Speaker, an issue has been raised recently with regard to the prices of consumer goods as the prices of essential commodities differ significantly from one district to another. This happens due to transport cost incurred and the number of middlemen involved in the supply chain. However, now, the consumers are of the view that this happens due to increase in Value Added Tax -VAT. Therefore, these concerns should be addressed positively in order to maintain the cost of living in the country while ensuring delivery of quality goods at the lowest price to the end consumer. I must highlight the fact that the VAT component is applied only to certain commodities. It is not applied to essential food items such as white rice, sugar, dhal, onion, potatoes, red onion, milk powder, wheat flour, dried chillies, green gram, chickpeas, canned fish, sprats, chicken and pharmaceutical items. Specially, in Sathosa outlets, we are selling the abovementioned VAT-free essential food items. There is no VAT imposed even on vegetables and dried fish. It must be noted that the items on which VAT is not levied, the prices should be less. When the price of Thai sprats, which are identified as a good quality food item, are sold at Rs. 530.00 per kilo in Sathosa outlets all over the country, I saw it is sold in the range of Rs. 700 - 850 in the outside market. When it comes to remote areas, the price goes up to Rs. 900 due to intervention of middlemen. But, I must emphasize the fact that no VAT is imposed on essential food items. Therefore, the pricing formula which is implemented now by the Consumer Affairs Authority must be re-published and proper monitoring mechanism should be introduced district-wise. My Ministry will take immediate action to re-gazette the essential food items with the maximum price later in consultation with the Hon. Malik Samarawickrama, Chairman of the Subcommittee on Cost of Living and the Hon. Ravi Karunanayake, Minister of Finance.

We will also strengthen the market-driven mechanism. Hereafter, action will also be taken to announce the maximum price of essential food items frequently through print and electronic media also. If these goods are sold above the maximum retail price, the consumer can lodge a complaint at the district offices of the Consumer Affairs Authority which we have established in each and every district. The Consumer Affairs Authority has now introduced a new facility where the consumers can lodge their complaints through the hotline 1977 throughout the day.

As announced in the course of the Budget Speech by the Hon. Minister of Finance and decided by the Cabinet this week, as well as the Special Cost of Living Committee chaired by the Hon. Prime Minister last week, the Government has decided to subsidize essential food items such as sugar, dhal, big onion, sprats, dried chillies, potatoes, canned fish, milk powder, fresh milk, gas, rice and some other food items which will be announced within the next two days.

This week we discussed strengthening the capacity of the Consumer Affairs Authority by employing additional

200 graduates. In addition to that the price control mechanism will be supervised at the district level. The District Secretaries will be in charge of it and our senior Ministers who are in charge of the District Development Committees are to chair the meetings every month at district level.

The other measure that we have taken to ensure controlled prices is by increasing the number of Sathosa outlets in the country. Currently, 319 Sathosa outlets are operating all over the country providing a significant support to the consumers. Also there are 2000 Co-operative outlets. The Hon. Bandula Gunawardane who is present here, supported to establish Co-op shops when he was the Minister of Co-operatives and Consumer Services. The Hon. Prime Minister instructed me to take necessary steps to make available all food items that we are going to Gazette as essential food items at all Sathosa outlets. We are going to sell all these food items at the same price in all 2000 Co-operative outlets and 319 Sathosa outlets. I think within one week or two weeks' time we can start that mechanism. We will ensure the supply chain of essential food commodities to each and every corner of the country. Also, the Hon. Prime Minister, has advised to convene the Cabinet Subcommittee which is Chaired by the Hon. Malik Samarawickrama, on very Tuesday and submit a weekly report on the cost of living along with its recommendations. Therefore, I firmly believe that this proposed mechanism will ensure the control of prices of the essential food items and accessibility of food items at affordable prices.

Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

It is a good sign to see that you are going to make those essential food items available at Sathosa.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

There are 319 Sathosa outlets all over the country plus 2000 Co-op shops. Through the Commissioner of Co-operative Development and Registrar of Co-operative Societies, we are going to supply those food items.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු ඇමතිතුමනි, මිල පාලනය කිරීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමෙන් නිලධාරීන් පත් කරනවා කියලා ඔබතුමා සඳහන් කළා. මේ "මිල පාලනය" කියන වචනය සම්බන්ධයෙන් අපට නීතිමය ප්‍රශ්නයක් ඇති වෙනවා. මොකද, price එක control කරන්න අපට බැරි නිසා. මිල පාලන පනත අහෝසි කරලා, මිල පාලන දෙපාර්තමේන්තුව අහෝසි කරලා තමයි සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත ගෙනාවේ. එතකොට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත යටතේ උපරිම මිලක් නියම කරන්න පුළුවන්. එතකොට controlled price එකක් කියන්න බැහැ. Maximum Retail Price -

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

Yes, MRP.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඔව්. "විකිණිය හැකි උපරිම මිල" කියන්න ඕනෑ. ඒකට "මිල පාලනය" කියන වචනය පාවිච්චි කරන්න එපා. එහෙම වුණොත් එතැනදී නීතිමය ගැටලුවක් ඇති වෙනවා. මිල පාලන පනත අහෝසි කරලා තමයි සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත ගෙනාවේ. ඊට පසුව තමයි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත ගෙනාවේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත අනුව පුළුවන් වෙන්නේ උපරිම මිලක් නියම කිරීමටයි. උපරිම මිල ඉක්මවා ගියාම දඩුවම් කරන්නත් පුළුවන්.

අනෙක් එක, ඔබතුමා බඳවා ගන්නා නිලධාරීන් වෙනත් ආයතනයකට බඳවා ගන්න බැහැ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට තමයි බඳවා ගන්න පුළුවන් වෙන්නේ. ඒ නීතිය යටතේ තමයි ඔවුන්ට ඒකේ implementationsවලට යන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ නීතිය කඩ කළොත් නඩු පවරන්න වෙනවා. නඩු පවරන්න වුණොත් අධිකරණයේදී මේ ප්‍රශ්නය මතු වෙන නිසා ඔබතුමා බඳවා ගන්නා නිලධාරීන් Consumer Affairs Authority එකට බඳවා ගන්න.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් අදාළ ඇමතිවරයා විධියට සිටි නිසා දන්නවා ඇති, පාරිභෝගික සේවා අධිකාරියට -Consumer Affairs Authority එකට- තමයි මේ වාගේ වැඩ කරන්න authority එක තිබෙන්නේ කියලා. [බාධා කිරීමක්] උපරිම මිල - MRP, Maximum Retail Price. We have been discussing this Maximum Retail Price. Before making this statement, I met the Hon. Malik Samarawickrama and the Hon. Ravi Karunanayake and we discussed this. We are going to meet again on coming Tuesday after the Cabinet meeting and then we will finalize the Maximum Retail Price. That is what you are talking about.

ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, අපි අලුතෙන් කට්ටිය බඳවා ගන්නේ නැහැ. දැනට අපේ Investigation Officersලා දෙසියයයි ඉන්නේ. But they come under the Consumer Affairs Authority. අපට නිලධාරීන් මදි. ඒ නිසා ගරු අග්‍රාමාත්‍යතුමා අපට කිව්වා, දැන් හැම කාර්යාලයකම වැඩ අඩු graduatesලා ඉන්නවා, ඒ graduatesලාගෙන් කැමති දෙසියයක් on secondment විධියට අර ගන්න කියලා. දිසාපති කාර්යාලය හරහා ඒ අය පුහුණු කරලා, ඒ අයගෙන් වැඩ ගන්නයි අපි බලන්නේ. බොහොම ස්තුතියි.

ගරු ඒ. ඒ. විජේතුංග මහතා
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)

මේ වන විට සමහර පිට පළාත්වල සීනි මිල වැඩියි. සතොසේ සීනි මිල ගොඩක් අඩු වුණාට, රුපියල් 500ක බඩු මිලදී ගත්තොත් තමයි සීනි කිලෝවක් දෙන්නේ.

මා ඉල්ලීමක් කරනවා, ඒ සීමාව වැඩි කරලා -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඇමතිතුමාට ඒ සම්බන්ධයෙන් උත්තර දෙන්න පුළුවන්.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ඒ ගැන මා උත්තරයක් දෙන්නම්. ඇත්තටම එහෙම නොකර සාමාන්‍ය පරිදි සීනි විකුණන්න කිව්වා නම්, සතොස managersලා කරන්නේ ඔක්කොම සීනි ටික එක වරම පිට කඩවලට විකුණා දමන එකයි. එතකොට සාමාන්‍ය මිනිසුන්ට ගන්න සීනි නැහැ. ඒකයි රුපියල් 500ක හෝ බඩු ගන්න එන මනුෂ්‍යයාට ඒ සහනය දෙන්නේ. සීනි විතරක් ගන්න සතොසට එන්නේ නැහැ නේ.

ගරු තාරානාත් බස්නායක මහතා (විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க - தொலைத்தொடர்புகள் மற்றும் டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Tharanath Basnayaka - Deputy Minister of Telecommunication and Digital Infrastructure)
ගරු ඇමතිතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා කියන කථාවේ සත්‍යතාවක් තිබෙනවා. ඔබතුමා කියන දේ හැම පළාතකටම ගැළපෙන්නේ නැහැ. දුෂ්කර පළාත්වල සතොසෙන් රුපියල් 500ක බඩු ගත්තාම සීනි කිලෝවක් දෙන කොට, අපේ ගම්වල රුපියල් 500ක බඩු මිලදී ගත නොහැකි දුප්පත් අය ඉන්නවා. එවැනි ගැටලුවක් තිබෙනවා. ඒ ක්‍රමවේදය සාර්ථක කර ගන්න නම් විශේෂයෙන්ම පළාත් අනුවත් බලන්නය කියා මා ඉල්ලීමක් කරනවා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
නාගරික ප්‍රදේශවල රුපියල් 500ක බඩු මිලදී ගත්තාම සීනි කිලෝවක් ලබාගත හැකි ආකාරයට, අපි ග්‍රාමීය පළාත්වල රුපියල් 250ක් දක්වා සතොසෙන් බඩු මිලදී ගන්නා අයට සීනි කිලෝවක් ගන්න අවස්ථාව ලබා දෙමු. එහෙම නැත්නම් ඒක අසාධාරණ වැඩක් වෙනවා. [බාධා කිරීමක්] ඒ සම්බන්ධයෙන් අපි Cabinet Subcommittee on Cost of Living එකේ discuss කරලා අභහරුවාදා තීරණයක් දෙන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම, ගරු මුදල් ඇමතිතුමා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත
சேர் பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்
VALUE ADDED TAX (AMENDMENT) BILL

"2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මහතා විසිනි.

2016 ජූලි 20 වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යයි ද නියෝග කරන ලදී.

නිති අමෙච්චර් මාණ්පුමිකු රවි කරුණානායක්ක අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.
2016 යූලෙ 20, පුදන්කිළමෙ ඉරණ්ටාම් මුරෙ මදිප්පිඩප්පඩ වේණ්ඩුමෙනවුම් අච්චිඩප්පඩ වේණ්ඩුමෙනවුම් උරිය තුරෙසාර් මේර්පාර්වෛක් කුළුවුක්කු ආර්රුප්පඩුත්තප්පඩ වේණ්ඩුමෙනවුම් කට්ටළෛයිඩප්පට්ටදු.

Presented by the Hon.Ravi Karunanayake; to be read a Second time upon Wednesday, 20th July, 2016 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That the Government business do have precedence this day."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising of this day do adjourn until 1.00 p.m. on Wednesday, 20th July, 2016."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාද කිරීමට ලබා දෙන දවස කවදාද කියලා දැන ගන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, අපි ලබන 20 වැනි දින ඒ පිළිබඳව විවාද කිරීම සඳහා දැනට යොදා ගෙන තිබෙනවා. මෙම පනත් කෙටුම්පත පිළිබඳව උසාවියට කරුණු ඉදිරිපත් කරන බව මේ

වනකොට අපට දැනුම් දීලා තිබෙනවා. එම නිසා ඒ අතරතුර පක්ෂ නායක රැස්වීමක් කැඳවා අවසාන නිගමනයකට එනවා කියන එක තමයි අපගේ තීන්දුව වන්නේ. දැනට තිබෙන තත්ත්වය අනුව එම පනත් කෙටුම්පත පිළිබඳව ලබන 20 වැනි දා විවාදයට ගැනීමට දින තීරණය කර තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, එය අනුමත කරන්න පුළුවන් නම් මා එය අගය කරනවා. මොකද, මෙය උසාවිය ඉදිරියට යාමට තිබෙන දෙයක්. සමහර අය නිකරුණේ මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කරනවා. මෙතෙක් කාලයක් සම්ප්‍රදාය අනුව කරපු කටයුත්තක් -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට මෙම පනත් කෙටුම්පත 20 වැනි දා විවාදයට ගැනීමට නියම කර තිබෙනවා. The date has been fixed as 20th of this month. නමුත් ඊට කලින් කවුරු හරි අධිකරණයට ගියොත්, අපට මෙය විවාදයට ගැනීම කල් දමන්නට සිදු වෙනවා. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි. මුදල් ඇමතිතුමාගේ අදහස වන්නේ, මෙම පනත් කෙටුම්පත හැකි ඉක්මනින් විවාදයට ගන්න කියන එකයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අපි 20 වැනි දා මෙම පනත් කෙටුම්පත විවාදයට ගැනීමට දින නියම කර තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මෙතැනදී යම් කුට ක්‍රියා ඇති කරන්න හදනවා, මෙය විවාද නොකර ඇදගෙන යෑම සඳහා. අපි ඒ වාගේ අය ගැන හෙළිදරවු කරනවා. ඒ නිසා තමයි මෙතැන නොයෙක් ප්‍රශ්න ඇති කරන්නේ. මම පාර්ලිමේන්තුවෙන් මේ ප්‍රශ්නය අහන්නේ, ඒ සම්බන්ධවයි. නැත්නම් උසාවි ගිහිල්ලා නොයෙක් අර්ථ කථන දෙන්නට පුළුවන්, වෙනත් වෙනත් දේවල් සම්බන්ධයෙන්. ඒ වාගේම දේශපාලන වාසි ගන්න හදනවා. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ පැවැති පක්ෂ නායක රැස්වීමේදී මෙම පනත් කෙටුම්පත 20 වැනි දා විවාදයට ගැනීම සම්බන්ධයෙන් තීරණයක් ගත්තා. අපි දැනට එම ස්ථාවරයේ සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මුදල් ඇමතිතුමනි, මෙම පනත් කෙටුම්පත 20 වැනිදා විවාදයට ගැනීමට තීරණය කර තිබෙනවා.

මීළඟට, යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 150, සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ කරන නියමය, අංක 151, අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග සහ සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීම. ගරු අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා.

සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත : නියමය

குற்றவியல் விடயங்களின் பரஸ்பர உதவியளித்தல் சட்டம் : ஒழுங்குவிதி

MUTUAL ASSISTANCE IN CRIMINAL MATTERS ACT: ORDER

[11.15 a.m.]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ හා බුද්ධශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Buddhasasana)

Sir, I move,

"That the Order made by the Minister of Justice under subsection (3) of Section 2 of the Mutual Assistance in Criminal Matters Act, No. 25 of 2002 and published in the Gazette Extraordinary No.1926/46 of 6th August 2015, which was presented on 21.11.2015, be approved."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ඉදිරිපත් කරනු ලබන මෙම නියෝග දෙක සහ සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව මා ගෞරවයෙන් කරුණු දක්වනවා. 2002 අංක 25 දරන සාපරාධී කරුණුවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ දෙවැනි වගන්තිය යටතේ 2015 ජූලි මස 30වැනි දින පළ කරන්නට යෙදුණ නිවේදනය, 2015 මැයි 28වැනි දින රුසියානු සමූහාණ්ඩුව සමඟ අත්සන් කරන්නට යෙදුණ ගිවිසුම ප්‍රකාරව පළ කරන ලද නිවේදනයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත 2002 අංක 25 වශයෙන් සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීම පිණිස මෙම පාර්ලිමේන්තුවෙන් අනුමත කරනු ලැබුවා. ඒ අනුව මේ වන විට අපි රටවල් රාශියක් සමඟ මෙවැනි සම්මුතීන්වලට එළඹිලා මේ පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන තිබෙනවා. චීන හොංකොං රජය, United Arab Emirates, ඉන්දියාව, තායිලන්තය, බෙලරුස් යන රාජ්‍යයන් සමඟත්, ඊට අමතරව තවත් රාජ්‍යයන් කිහිපයක් සමඟ මෙවැනි ආකාරයේ ගිවිසුම්වලට එළඹීමටත් මේ වන විට අපි කටයුතු කරමින් පවතිනවා. ඒ රාජ්‍යයන් අතර යුක්රේනය, කුවේට්, පාකිස්ථානය, ඕස්ට්‍රේලියාව, කියුබාව, කැනඩාව, කොරියාව, ජර්මනිය, ඇමරිකා එක්සත් ජනපදය, දකුණු අප්‍රිකාව යන රටවල් ද ඇතුළත් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, ලෝකය තාක්ෂණික වශයෙන් දියුණු වුණා වාගේම ලෝකයේ අපරාධ සිදු කරනු ලබන ආකාරයේත් විශාල වර්ධනයක් ඇතිවෙලා තිබෙන බව. ඒ ඒ රටවල දේශසීමාවන් බිඳගෙන ජාත්‍යන්තර මට්ටමේ නොයෙකුත් රාජ්‍යවල වාසය කරන සමහර අපරාධකරුවන් සාමූහිකව සහ තනි තනිව කරනු ලබන අපරාධවලදී අධිකරණ බලය වෙන වෙනම පවත්නාවූ ස්වෛරී අධිකරණ බලය තිබෙන රාජ්‍ය එකක සිට නොවෙයි, රාජ්‍ය ගණනාවක් ආවරණය වන විධියට මේ අපරාධ වර්තමානයේදී ඉතා

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

වේගයෙන් වර්ධනය වෙලා තිබෙනවා. එම නිසා විශේෂයෙන්ම ජාත්‍යන්තර නීතියත් එක්ක සාකච්ඡා වෙච්ච මෙම කාරණය පිළිබඳව ලෝකයේ බොහෝ රාජ්‍යයන්වල අවධානය යොමු වෙලා තිබෙන යුගයක අපි මීට අවුරුදු 14කට කලින් තමයි මේ නීතිය ව්‍යවස්ථාදායක සභාවේ සම්මත කර ගනු ලැබුවේ.

මේ ගිවිසුම අත්සන් කර ගැනීම මඟින් බලාපොරොත්තු වෙන්නේ, යම් රාජ්‍යයක් තුළ සිදු වන අපරාධයක් සම්බන්ධයෙන් වෙනත් රාජ්‍යයක සිට ඊට යම් අනුබල දීමක් හෝ ඊට සහාය ලබා දීමක්, ඊට සම්බන්ධතාවක් දක්වන පුද්ගලයන් සම්බන්ධව නීතිය, යුක්තිය සාධාරණ ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පිටස්තර අධිකරණ බලය ඇති රාජ්‍යයන්වල සහයෝගය ලබා ගැනීමයි. මෙය අපි අන්‍යෝන්‍ය වශයෙන් සිදු කරන දෙයක්. මෙරටදී අපිට නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වන අවස්ථාවකදී එම රාජ්‍යයන් අපිට සහයෝගය ලබා දෙනවා වාගේම, මෙරට පුද්ගලයෙකු මේ ගිවිසුමට ඇතුළත් වනු ලබන විදේශීය රටක අධිකරණයේ යම්කිසි නීති කෘත්‍යයක් - නඩු කටයුත්තක් - සිදු කරන අවස්ථාවක එම සහයෝගය ඒ ආකාරයටම ශ්‍රී ලංකා රජයත් ඔවුන්ට ලබා දීමට බැඳී සිටිනවා. ඒ අතර විශේෂයෙන්ම පරීක්ෂණ කටයුතුවලට අන්‍යෝන්‍යව, නෛතිකව සහයෝගය ලබා දීම මෙහි මුඛ්‍ය පරමාර්ථය වෙනවා. මේ ලබා දෙන සහයෝගයන් අතරට යම් පුද්ගලයන්ගේ සාක්ෂි හෝ ප්‍රකාශ ලබා ගැනීම, ලියවිලි, වාර්තා, අයිතම සහ තොරතුරු ලබා දීම, යම් අපරාධ පරීක්ෂණයක් සම්බන්ධයෙන් සැක කටයුතු හෝ සාක්ෂි හෝ සහයෝගය ලබා ගැනීමේ හැකියාව ඇති පුද්ගලයන් අනාවරණය කර ගැනීම සහ හඳුනා ගැනීම, යම් අපරාධ පරීක්ෂණයක් සහ කරුණක් සම්බන්ධයෙන් අයිතමයක් අනාවරණය කර ගැනීම සහ නීතිමය ලියවිලි බාර දීම, සාක්ෂිකරුවන්ගේ පෙනී සිටීම සඳහා පහසුකම් සැපයීම, තාවකාලික හිර භාරයේ පසු වන පුද්ගලයන් සාක්ෂි සඳහා යැවීම සහ ගෙන්වා ගැනීම, සෝදිසි කිරීම සහ තහනම් කිරීම සඳහා වූ ඉල්ලීම් ක්‍රියාවේ යෙදවීම, අපරාධ සම්බන්ධ මුදල් සහ උපකරණ රාජ සන්තක කිරීම, ඉල්ලීම ලද පාර්ශ්ව**ය** දේශීය නීති රීතිවලට අනුකූල නොවන තාක් දුරට මෙකී ගිවිසුමේ විෂය පථය යටතේ වූ වෙනත් ආකාරයක සහයෝගය ලබා දීම මූලික වශයෙන් බලාපොරොත්තු වනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු අමාත්‍යතුමනි, ඒ කියන්නේ, අධිකරණයක විභාගයට ලක් වෙමින් තිබෙන කරුණකදී අන්‍යෝන්‍ය වශයෙන් හුවමාරු කර ගැනීමයි. අධිකරණ ක්‍රියාවලියට ගිහිල්ලා නැතිව, පරීක්ෂණ ක්‍රියාවලියේ තිබෙනවාය කියලා අපි හිතමු. ඒක අධිකරණ ක්‍රියාවලියට ගිහිල්ලා නැහැ. එහේ පරීක්ෂණයක් තිබෙනවා. මෙහේ පුද්ගලයෙකු අවශ්‍ය වී තිබෙනවා. පරීක්ෂණ වාගේ ක්‍රියාවලියකදී කොහොමද, ඒ මැදිහත් වීම තිබෙන්නේ?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

පරීක්ෂණ සම්බන්ධවත් මේ නීතියට අනුව අන්‍යෝන්‍ය සහයෝගය ලබා දීමේ හැකියාව තිබෙනවා. සමහර වෙලාවට පරීක්ෂණ දෙයාකාරයකට සිද්ධ වෙන්න පුළුවන්. එකක් තමයි අධිකරණයට වාර්තා කිරීමට පෙර සිදු වන පරීක්ෂණ. අනෙක, අධිකරණයට වාර්තා කිරීමෙන් පසු. අපේ රටේ චූදිතයෙක් අත් අඩංගුවට ගත්තොත් පැය 24ක් ඇතුළත අධිකරණයට ඉදිරිපත් කරන්න ඕනෑ. ඊට පසුවත් පරීක්ෂණ සිද්ධ වෙනවා. මේ දෙයාකාරයෙන්ම පරීක්ෂණ සම්බන්ධයෙන් සහයෝගය ලබා දීමේ හැකියාව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා විසින් 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත යටතේ 2016 පෙබරවාරි 12වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ නිවේදනය නිකුත් කරනු ලැබුවා. ඒ අනුව "අධිකරණ සංවිධාන පනතේ 45වැනි වගන්තිය සමඟ කියවිය යුතු 61වැනි වගන්තිය යටතේ අධිකරණ ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ස්ථිර සේවයේ යෙදී සිටින සෑම ග්‍රාම නිලධාරියකුම ඔහුගේ ග්‍රාම නිලධාරි වසම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා නිල බලයෙන් පත් වන සමාදාන විනිශ්චයකාරවරයෙක් වන්නේ ය" යනුවෙන් එහි දැක්වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාදාන විනිශ්චයකාරවරුන් රට පුරා ව්‍යාප්තව සිටින බව අපි දන්නවා. එහෙත් බොහෝ අවස්ථාවලදී ඒ උදව්ය මුණගැසීම, ඒ උදව්යගෙන් යම් කිසි සහායක් ලබා ගැනීම වැනි දේවල් දුෂ්කර තත්ත්වයක් බවට පත් වෙනවා. නිල වශයෙන් ග්‍රාම නිලධාරියකු සමාදාන විනිශ්චයකාරවරයකු වීම තුළ ගමේ සිටින, ඒ ප්‍රදේශයේ ජීවත් වන සියලු දෙනාම දන්නවා, ග්‍රාම නිලධාරින් නිල වශයෙන් සමාදාන විනිශ්චයකාරවරයෙක් වශයෙනුත් කටයුතු කරන නිසා ඔහු ළඟට ගියොත් තමන්ගේ ඒ අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට පුළුවන්ය කියන කාරණය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවනුව අපි බලනවා, ග්‍රාම නිලධාරිවරයෙක් ප්‍රාදේශීය මට්ටමින් රජයේ විශාල වගකීමක් දරන නිලධාරියෙක් නිසා ඔහු කරන කාර්යය පිළිබඳව යම් කිසි නීතිමය අවබෝධයක්, වගකීම පිළිබඳව දැනීමක් ඇතිව ද ඒ දේවල් සිද්ධ කරන්නේ කියා. ඒ නිසා සමාදාන විනිශ්චයකාරවරුන් විසින් කරනු ලබන සේවය වගකීමකින් යුතුව ඉටු කරනු ලබනවාය කියා අපි බලාපොරොත්තු වෙනවා. ඒ එක්කම ග්‍රාම නිලධාරිවරු ගම් මට්ටමින් විශාල සේවාවක් සිද්ධ කරනවා. ඒ නිසා ඔවුන්ගේ සේවා ඇගැයීමකුත් අපි බලාපොරොත්තු වෙනවා. මොකද, මේක ගෞරවනීය තනතුරක් විධියට පිළිගන්නා නිසා. ඒ එක්කම ග්‍රාම නිලධාරිවරයකුට මෙම තනතුර ලැබීම තුළ වඩාත් වගකීමෙන් කටයුතු කිරීමක් පැවරෙනවා. හේතුව, සමහර වෙලාවට තම තනතුරේ කටයුතු කරන අතරතුර ග්‍රාම නිලධාරිවරයෙක් සමාදාන විනිශ්චයකාර තනතුරෙහි කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේදී යම් කිසි වරදක් සිද්ධ කළොත් සමහර වෙලාවට ඒක තමන්ගේ රාජකාරී සේවයට බලපාන්න පුළුවන්. ඒ නිසා ග්‍රාම නිලධාරිවරුන් විසින් සමාදාන විනිශ්චයකාර තනතුරේ බලතල ක්‍රියාත්මක කිරීමේ නිර්ණායකයක් ලබා දෙන්න අපි කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදාහරණයක් විධියට ගත්තොත් තමන් විසින්ම නිකුත් කළ නිල මට්ටමේ සහතිකයක් පිළිබඳව දිවුරුම් ප්‍රකාශයක් මඟින් යම් කිසි කහවුරු කිරීම්, සහතික කිරීම් සිදු වුණහොත් සමහර වෙලාවට ප්‍රතිවිරුද්ධ අයිතිවාසිකම් පිළිබඳ ගැටලු - conflict of interest - මතු වෙන්න පුළුවන්. ඒ නිසා එවැනි ගැටලු මතු නොවන ආකාරයට තමන්ගේ වගකීම ඉටු කිරීම සඳහා අවශ්‍ය නිර්ණායක ඉදිරියේදී අපි ග්‍රාම නිලධාරිවරුන්ට ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වෙනුව මම සමඵ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරනු ලැබුවා; 1988 අංක 72 දරන සමඵ මණ්ඩල පනතට සංශෝධනයක් ඉදිරිපත් කළා. ඒ පනතේ 7වැනි වගන්තිය යටතේ සමඵ මණ්ඩලයක් වෙත යොමු කළ හැකි ආරවුලක මූල්‍යමය වටිනාකම රුපියල් 2,50,000ක් වශයෙන් තමයි දැනට පවතින්නේ. 1950 දශකයේ දී අපේ රටේ සමඵ මණ්ඩල ක්‍රමය ක්‍රියාත්මක වුණා. නමුත් 1972න් පස්සේ අපේ රටේ ඒ ක්‍රමය අහෝසි වෙලා තිබෙනවා.

අපේ රටේ නඩු ඇසීමේ තිබෙන ප්‍රමාදය, නඩු ගොඩ ගැසීම වැනි දේවල් පිළිබඳව වාද විවාද කරන කාලය තුළ මේ

පාර්ලිමේන්තුව නැවතත් තීරණය කළා, අධිකරණ ක්‍රියාවලියේ තිබෙන දීර්ඝභාවය, කාලය ගතවීම, වියදම යනාදිය සලකා බලා, ජනතාවට තමන්ගේ ගැටලු පහසුවෙන් නිරාකරණය කර ගැනීම පිණිස සමථ මණ්ඩල තමන්ගේ ගම් මට්ටමින් ක්‍රියාත්මක කරන්න ඕනෑය කියලා. 1988දී සමථ මණ්ඩල පනත ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදී ආරාවුලක මූල්‍යමය වටිනාකම රුපියල් 25,000කට අඩු නම් පමණක් සමථ මණ්ඩලයට ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබුණා. පසු කාලයේදී එම මුදල රුපියල් 2,50,000 දක්වා වැඩි කරනු ලැබුවා. අපි මේ අවස්ථාවේදී මේ සංශෝධනය මඟින් යෝජනා කරන්නේ, එය රුපියල් ලක්ෂ පහ දක්වා වැඩි කරන්න කියලායි.

එසේ සංශෝධනය කිරීම සඳහා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවශ්‍ය පදනම විධියට අපට පෙන්වන්න පුළුවන් වන්නේ, මෙම ක්‍රමය හා සමාන ක්‍රම ක්‍රියාත්මක වන ලෝකයේ අනිකුත් රටවල් එක්ක බැලුවාම අපේ රටේ මේ ක්‍රමය සාර්ථකභාවයක් ලබා තිබීමයි. උදාහරණයක් විධියට 2015 වසරේදී අපේ රටේ සමථ මණ්ඩලවලට ලැබුණු නඩු ප්‍රමාණය සහ විසඳපු නඩු ප්‍රමාණය පිළිබඳව අවධානය යොමු කළොත් එය අවබෝධ කරගන්න පුළුවන්. අපේ රටේ දැනට සමථ මණ්ඩල 329ක් තිබෙනවා. ඒ සමථ මණ්ඩලවල සේවය කරන සමථකරුවන් 8,425ක් ඉන්නවා. 2015 වසර තුළ සමථ මණ්ඩලවලට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 1,93,201යි. ඒ අතරින් සමථ මණ්ඩල විසින් පැමිණිලි 92,134ක් සමථයට පත්කරලා තිබෙනවා. ඒ කියන්නේ ප්‍රතිශතයක් විධියට ගත්තොත් සියයට 47.7ක්. ඒක බොහොම ඉහළ ප්‍රතිශතයක් විධියට සලකන්නට පුළුවන්. සමථයට පත්කර ගන්න බැරි වුණු පැමිණිලි සංඛ්‍යාව 84,945යි. එය ප්‍රතිශතයක් විධියට ගත්තාම සියයට 43.9යි. මේ දෙකටම අයත් නැති, ඒ කියන්නේ අවසන් කරගන්න බැරිව pending disputes විධියට පැමිණිලි 16,122ක් තිබී තිබෙනවා. එහි ප්‍රතිශතය සියයට 8.3යි.

මෙම සමථ මණ්ඩලවලට පැමිණිලි ලැබීම කිහිප ආකාරයකටම සිද්ධ වනවා. 2005 වසරේ සංඛ්‍යා ලේඛන ගත්තොත්, අධිකරණවලින් යොමු කරන ලද ආරාවුල් ප්‍රමාණය සියයට 7.6යි.

පොලීසි විසින් යොමු කරන ලද ආරාවුල් ප්‍රමාණය සියයට 26.7යි. බැංකු සහ මූල්‍ය ආයතනවලින් යොමු කරන ලද ආරාවුල් ප්‍රමාණය සියයට 52.1යි. ඒ තමයි වැඩිම ප්‍රතිශතය වන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පැමිණිලිවලින් අති බහුතරයක් බොහෝවිට සාමාන්‍ය ව්‍යාපාර කටයුතු යනාදිය සිදු කරන අය බැංකු, මූල්‍ය ආයතනවලින් ණය අරගෙන ඒ මුදල් ගෙවා ගන්න බැරි වුණාට පස්සේ ඒ ආයතන විසින් යොමු කළ බව බොහොම පැහැදිලිව පෙනෙනවා. එහෙම නැතිවුණා නම්, මේ සම්බන්ධයෙන් වන මුදල කුඩා වුණත් අධිකරණයට ගියොත් ඒ පාර්ශ්වයන්ට විශාල වියදමක් දරන්නට සිදු වෙනවා. සමහරවිට තමන් ගත් ණය මුදලට වැඩි වියදමක් දරන්නට සිද්ධ වෙනවා. ඒ වාගේම දීර්ඝ කාලයක් ගත කරන්නත් සිද්ධ වෙනවා.

ඍජු ලෙස පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි ප්‍රමාණය සියයට 1.8යි. ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ඒවා උල්ලංඝනය කිරීම් සම්බන්ධව අදාළ පාර්ශ්ව විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි ප්‍රමාණය සියයට 11. 6ක් වශයෙන් වාර්තා වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ අද ඊයේ සිට පමණක් නොවෙයි, දැනට දශක ගණනාවක් තිස්සේ ලොකු ගැටලු දෙකක් තිබුණාය කියන එක අපි දන්නවා. එකක් තමයි, අධිකරණයේ ස්වාධීනතාවය පිළිබඳ ප්‍රශ්නය. මූලික වශයෙන් මේ රටේ විශාල දේශපාලන වෙනස්කම් කිරීමට පවා තුඩු දුන් කාරණය තමයි අධිකරණයේ ස්වාධීනත්වය. විශේෂයෙන් දේශපාලනඥයන් විසින් මෙවා ඉවත් කර තැබීම, අධිකරණයට කරපු බලපෑම් යනාදිය. අපි දැන් නව රජය විධියට අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කරන්නට ගතහැකි බොහෝ පියවර ගෙන තිබෙනවා. අද කාලයේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව ප්‍රශ්න කරන අවස්ථා දකින්නට ලැබෙන්නේ ඉතාමත්ම කලාතුරකින්.

දෙවන කාරණය, අධිකරණ ක්‍රියාවලියේ තිබෙන ප්‍රමාදය; නඩු කටයුතුවල තිබෙන ප්‍රමාදය. මෙය බරපතළ කාරණයක්. අද ඊයේ ඇති වුණ ප්‍රශ්නයක් නොවෙයි. 2016 වසරේ ජාතික නීති සම්මේලනය පැවැත්වුවා. ඒ සම්මේලනයේ මාතෘකාව තමයි "Laws Delays"; යුක්තියේ ප්‍රමාද වීම. මීට අවුරුදු හැටකට කලිනුත් එක්දහස් නවසිය පණස් ගණන්වල හැට ගණන්වල කියපු සම්මේලන ගැන සොයා බැලුවාම ඒ සමහර සම්මන්ත්‍රණවල මාතෘකාව වෙලා තිබෙන්නේ "Laws Delays" කියන කාරණයයි. යුක්තියේ ප්‍රමාදවීම ඒ කාලයේත් තිබිලා තියෙනවා. නීති කටයුතු ප්‍රමාදවීම අපට සාධාරණීකරණය කරන්නට බැහැ. හැබැයි, එයට බලපෑ නොයෙකුත් කාරණා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් අපි දන්නවා, අපේ රටේ සිවිල් නඩු විධිවිධාන සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය කියන මේ දෙක අවුරුදු සිය ගණනකට වඩා පැරණියි. මේ නීති හදුන්වා දෙන කාලයේ අධිකරණ ඉතා සුළු ප්‍රමාණයක් තමයි තිබුණේ. කොළඹ දිසා අධිකරණය ගත්තොත් දවසකට නඩු විභාග එකක් නැත්නම් දෙකක් වාගේ තිබෙන කාලයකයි මේ නීති පද්ධති අපේ රටට හඳුන්වා දී තිබෙන්නේ.

මේ ක්‍රමය වෙනස් කරන්නට තමයි, 1972දී පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පස්සේ Administration of Justice Law, No. 44 of 1973 ඉදිරිපත් කර තිබෙන්නේ. සිවිල් නඩු විධාන සංග්‍රහයත්, අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයත් ඉවත් කර අලුත් ක්‍රමවේදයක් හඳුන්වා දුන්නා. එය ක්‍රියාත්මක වෙමින් පවතිද්දී ඒ පිළිබඳවත් නොයෙකුත් අඩුපාඩුකම් වාද විවාද ඇති වුණා. එම නිසා නැවතත් 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත වුණාට පස්සේ මේ ක්‍රියාපටිපාටීන් පිළිබඳව පැරණි සිවිල් නඩු විධාන සංග්‍රහයත්, අපරාධ නඩු විධාන සංග්‍රහයත් සංශෝධනයන් සහිතව මේ පාර්ලිමේන්තුව විසින් නැවත වතාවක් ආදේශ කරන්නට පටන් ගත්තා. මේවායේ තිබෙන හුඟක් අඩුපාඩුකම් අප හඳුනාගෙන තිබෙනවා. සිවිල් නඩුවල ප්‍රමාදය වැළැක්වීම පිණිස සෑම සිවිල් නඩුවකම විභාගය ආරම්භ කිරීමට ප්‍රථම අනිවාර්ය ලෙස සමථකරණ ක්‍රියාදාමයක් සඳහා උත්සාහයක් කිරීම මේ වන විටත් කෙටුම්පත් කර හමාරයි.

අපි දන්නවා, සාමාන්‍ය සාම්ප්‍රදායික ක්‍රමයට අපේ රටේ තිබෙන අධිකරණ ක්‍රමය, ප්‍රතිවිරුද්ධ අදහස් මත හැපෙන ක්‍රමය, තුළ නඩු විභාග පටන් ගත්ත ගමන්ම යන්නේ බොහොම අරගළකාරී තත්ත්වයකට බව. Aggressive ක්‍රමයකට තමයි අපේ රටේ නඩු විභාග වන්නේ. නමුත්, අද ලෝකයේ දියුණු රටවල් බොහොමයක් නඩු විසඳීමේ විකල්ප මාර්ගවලට යොමු වී තිබෙනවා. එක ක්‍රමයක් තමයි, මේ බේරුම්කරණය -arbitration- කියන එක. අපේ රටේ arbitration කියන ක්‍රමයත් ක්‍රියාත්මක වෙනවා. නමුත්, එය සාමාන්‍ය ජනතාවට එතරම් ප්‍රයෝජනවත් දෙයක් නොවෙයි. සාමාන්‍යයෙන් ලොකු ව්‍යාපාරිකයන් වැනි අයට තමයි මේ බේරුම්කරණ -arbitration- ක්‍රියාවලියෙන් යම්කිසි සහනයක් ලබාගන්න පුළුවන් වන්නේ. හැබැයි, ඒ ක්‍රමය පිළිබඳවත් දැඩි විවේචන තිබෙනවා. අද සමහර වෙලාවට අධිකරණයෙන් අවුරුදු දෙකකින්, තුනකින් විසඳිය හැකි ප්‍රශ්නයක් බේරුම්කරණයට ගියාම සමහර විට අවුරුදු හතක්, අටක් ගත වෙනවා. ඒ නිසා මේ බේරුම්කරණ ක්‍රමයත්, මේ නීතියත් වර්තමානයට ගැළපෙන පරිදි නවීකරණය කරන්න වෙනවා. අපි,

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂමහතා]

මේ පාර්ලිමේන්තුව, ව්‍යවස්ථාදායකය, බලාපොරොත්තු වුණු ප්‍රතිඵලය බෙරුම්කරණය තුළ සිද්ධ වෙලා නැහැ. සමහර වෙලාවට අධිකරණ ක්‍රියාදාමයේ සිදුවන ක්‍රියාදාමයට යන කාලයටත් වඩා දීර්ඝ කාලයක් ගත වෙමින් පවතින බෙරුම්කරණ ක්‍රමයක් තමයි අද මේ රටේ ක්‍රියාත්මක වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ අමාත්‍යාංශය වශයෙන් අපි ජාත්‍යන්තර බෙරුම්කරණ මධ්‍යස්ථානයක් ආරම්භ කළා. එහි කටයුතු දැන් ක්‍රියාත්මක වෙනවා. එය මීට වඩා ඉහළ තත්ත්වයකට ගෙන ගිහින්, ජාත්‍යන්තර මට්ටමේ බෙරුම්කරණ සඳහා පහසුකම් ලබාදීමේ ආයතනයක් විධියටත්, අපේ රටට විශාල ආදායමක් ලබාගැනීමේ ක්‍රමවේදයක් විධියටත් අපි එය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා.

අපේ රටේ අධිකරණයේ තිබුණු විශාල ගැටලුවක් තමයි, අධිකරණයට ඉදිරිපත් වන නඩුවල වැරදිකාරයෝ බවට අධිකරණ තීරණ මඟින් ලැබෙන ප්‍රතිශතය ඉතා පහළ අගයක් ගැනීම. ඒකට මූලික හේතුවක් තිබුණා. ඒක තමයි යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ -විශේෂයෙන්ම අපරාධ නඩුවලදී- ඒ සිද්ධිය පිළිබඳව සත්‍ය සොයා ගැනීමේ තිබෙන ගැටලුව. මේ සත්‍ය සොයා ගැනීම අධිකරණයට තනියෙන් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මේ ක්‍රියාදාමයට සහභාගි වන නීතිඥවරුන්, ඒ වාගේම නඩු මෙහෙය වන නීතිපති දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව මීට දායක වන රස පරීක්ෂක දෙපාර්තමේන්තුව යන හැම එකකම සහයෝගය ඇතිව තමයි චූදිතයා චෝදනා ලබපු වරදට වරදකරුවකු විය යුතුද, නැද්ද කියා අවසානයේදී විනිශ්චයකාරවරයකුට තීරණයක් දෙන්න පුළුවන් වන්නේ. මීට තිබුණු මහත් බාධකය තමයි සාක්ෂි ඉදිරිපත් නොවීම. ඒකට හේතුව තමයි අපේ රටේ සාක්ෂිකරුවන්ට තිබුණු බලපෑම. සමහර වෙලාවට ඔවුන්ට තර්ජන එන්න පුළුවන්; මරණීය තර්ජන එන්න පුළුවන්. සමහර වෙලාවට මේ රටේ සාක්ෂිකරුවෝ මරලා තිබෙනවා, ඒ සාක්ෂිය ඉදිරියට ඒම වළක්වන්නට. සමහර වෙලාවට සාක්ෂිකාරයෝ මිලදී ගන්නවා. මෙවැනි නොයෙකුත් හේතු නිසා සාක්ෂිකරුවන් තම ඇසින් දැකපු දේ, දන්න දේ කියන්න අධිකරණවලට ඉදිරිපත් වෙන්න බියක් තිබුණා; බාධාවක් තිබුණා. ඒ දුෂ්කරතා ඉවත් කරන්න ඕනෑ නිසා වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කර ගැනීමේ පනත ගිය වසරේදී අපි සම්මත කළා. මේ වන විට වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය ක්‍රියාත්මක වෙනවා. අපි දන්නවා, රටේ ජනතාවට තවම මේ පිළිබඳව ලොකු අවබෝධයක් නැති බව. ඉදිරියේදී ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළකටත් යන්න අප කටයුතු කරමින් සිටිනවා. මෙය සාර්ථකව ක්‍රියාත්මක වුණොත් අපි බලාපොරොත්තු වනවා, අපරාධ නඩුවල සත්‍ය සොයාගැනීමේ ප්‍රතිශතය වැඩි වෙලා චූදිතයන් වැඩි ප්‍රමාණයකට දඬුවම් ලැබීමේ ක්‍රමවේදයට ඒවි කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලයේ අපේ රටේ තිබුණු කලබලකාරී තත්ත්වය -විශේෂයෙන් යුද්ධය පැවැති කාලයේ තිබුණු තත්ත්වය- හේතුකොටගෙන නොයෙකුත් ගැටලු මතු වුණා. ඒ නිසා අපි මීට සති කීපයකට කලින් මේ පාර්ලිමේන්තුවේ තවත් පනත් කෙටුම්පතක් සම්මත කර ගත්තා. ඒ තමයි, කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත. ඒ පනත ගැන අපි පැහැදිලි කළා. නමුත් ජනතාවට ඒ පිළිබඳ හරි අවබෝධයක් තවමත් නැහැ කියා අපිත් පිළිගන්නවා. ඒ පිළිබඳවත් විශාල ප්‍රචාරක යන්ත්‍රණයක් දියත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපේ රටේ දේපොළ නීතිය සම්බන්ධව තවමත් පවතින්නේ රෝම ලන්දේසි නීතියයි. රෝම ලන්දේසි නීතිය පදනම් කරගෙන මීට අවුරුදු 120කට විතර කලින් සම්මත කරපු කාලාවරෝධ ආඥා පනත තමයි දැනට ක්‍රියාත්මක වන්නේ. කාලාවරෝධ පනතේ ක්‍රියා දාමය ක්‍රියාත්මක වීම තුළ යම්කිසි පුද්ගලයකු තමන්ට හිමි නැති දේපළක් වුණත් බලහත්කාරයෙන් අවුරුදු 10කට වඩා වැඩි කාලයක් නියම හිමිකරුගේ හිමිකම පිළිනොගෙන අඛණ්ඩව දීර්ඝ ලෙස භුක්ති විඳ්දොත්, ඒ පුද්ගලයාට ඒ හිමිකම ලැබෙනවා. පසු ගිය කාලයේ විශේෂයෙන් උතුර නැඟෙනහිර ප්‍රදේශයේ පැවැති කලබලකාරී තත්ත්වය නිසා ජනතාවගේ පාලනයකින් තොරව තමන්ගේ ඉඩ කඩම් වෙනත් උදවිය බලහත්කාරයෙන් අල්ලාගැනීම නිසා ඒ ජනතාවට නඩු මහට බහින්න සමහර විට අවස්ථාව ලැබුණේ නැහැ. සමහර ප්‍රදේශවල අධිකරණ ක්‍රමය ක්‍රියාත්මක වුණේ නැහැ. නමුත් දැන් අපි අවස්ථාව දී තිබෙනවා, අවුරුදු දෙකක් ඇතුළත එවැනි නඩුවක් ඉදිරිපත් කළොත්, අවුරුදු 10ට වඩා දීර්ඝ කාලයක් වුණත් ඒ අහිමි වීම සිද්ධ වුණේ 1983 මැයි මාසයේ පළමුවැනි දිනෙන් පසුව නම්, සාමාන්‍ය කාලාවරෝධ නීතිය ඉවත් වෙලා කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත යටතේ, ඒ උදවියට තමන්ගේ අයිතිය තහවුරු කරගැනීමේ ක්‍රමවේදයට පිවිසෙන්නට.

පසු ගිය දිනවල අප විසින් උතුර පළාතේ පිහිටුවනු ලැබුවා, විශේෂ සමථකරණ මණ්ඩල. ඉදිරි සති දෙක ඇතුළත අපි නැඟෙනහිර ප්‍රදේශයේත් එවැනි මණ්ඩල -මේ සමථකරණය තුළම විශේෂ සමථ මණ්ඩල- පිහිටුවන්න කටයුතු කරනවා. "වටිනාකම රුපියල් ලක්ෂ පහ" කියන සංශෝධනය තමයි අද අප සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් ඉදිරිපත් කරන්නේ. නමුත් ඒ ප්‍රදේශවල ඉඩම්වල හඹයට ලක්වූ දේපළේ මූල්‍යය වටිනාකම රුපියල් ලක්ෂ 20ට අඩු නම් ඒවා පිළිබඳ ගැටලු ඒ විශේෂ සමථ මණ්ඩලවලට ඉදිරිපත් කරලා සම්මත කරගන්න පුළුවන්. අපි මේ මාසය තුළ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් එවැනි මණ්ඩල පිහිටුවන්න කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට අමතරව, අධිකරණවල ගොඩ ගැසී තිබෙන නඩු විශාල සංඛ්‍යාවෙන් අවම වශයෙන් 50,000කට වැඩි ප්‍රමාණයක් සමථ මණ්ඩල පනත ක්‍රියාත්මක වීම තුළ ලබන වසරේදී අඩු කරගන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෝටර් වාහන පනත - Motor Traffic Act එක- යටතේ පවරන නඩු සඳහා වසරකට දළ වශයෙන් ලක්ෂ දෙකක පමණ පිරිසක් අධිකරණවලට එනවා. මේවාට සම්බන්ධ වන පාර්ශ්වයන්ටත් විශාල දුෂ්කරතාවන්ට මුහුණ දෙන්නට සිද්ධ වෙනවා. සමහර වේලාවට අවස්ථා ගණනක් අධිකරණයට ගිහිල්ලා තමන්ගේ කාලය නාස්ති කරන්න, මුදල් නාස්ති කරන්න සිද්ධ වෙනවා. එම නිසා අපි හඳුනා ගෙන තිබෙනවා, සමහර වැරදි සම්බන්ධයෙන් දඩ මුදල් spot fine ක්‍රමයට පොලීසියට, නැත්නම් තැපැල් කාර්යාලයට ගෙවලා එතැනින් නඩු කටයුතු හමාර කිරීමේ ක්‍රමයක් ඇති කළ හැකි බව. ඒ අනුව, අධිකරණය තුළ කාලය නාස්ති කිරීමට අනවශ්‍ය ආකාරයේ නඩු විශාල සංඛ්‍යාවක් -අවම වශයෙන් ලක්ෂයකට වැඩි සංඛ්‍යාවක්- මේ සංශෝධනත් එක්ක ලබන වසරේ අඩු කර ගැනීමේ හැකියාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, කාක්ෂණය උපයෝගි කර ගෙන-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එය සඳහන් කිරීම ගැන ඔබතුමාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ කාරණයට තමයි මම ඊළඟට ප්‍රවේශ වෙන්න බලාපොරොත්තු වුණේ.

අපි නියාමන ව්‍යාපෘතියක් -pilot project එකක්- විධියට එය ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වෙනවා. විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයක් එක්ක ගිවිසුමකටත් අප අත්සන් කරලායි තිබෙන්නේ. ඒ අනුව කොළඹ ඇතුළු අධිකරණ තිහක් තෝරා ගෙන, අධි තාක්ෂණ ක්‍රමය යටතේ, e-mail ක්‍රමය මඟින් නඩු පැවරීම, case management වැනි කටයුතු තාක්ෂණයෙන් පරිගණකගත කිරීම තුළ සිදු කරන්නට බලාපොරොත්තු වෙනවා.

මීට පෙර මූලික අයිතිවාසිකම් සම්බන්ධව මෙවැනි ක්‍රමයක්, කෙටි කාලයක් ශ්‍රේෂ්ඨාධිකරණයේ හඳුන්වා දුන්නා. ඒක හරියට පාලනය වුණේ නැති නිසා ඒ ව්‍යාපෘතිය අසාර්ථක වුණා. නමුත් අපි බලාපොරොත්තු වෙනවා, මේ ක්‍රමය තුළ ඒ කටයුත්ත කරන්නට. අප කලින් සඳහන් කළ ආකාරයට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ නියම කරන දඩ මුදල් ගෙවීමට තැපැල් කන්තෝරුවලට ගිහිල්ලා කාලය නාස්ති කිරීම වැනි දේවලින් වැළකී ඒ කටයුතු කළ හැකියි. එහෙම නැත්නම් mobile phone ක්‍රමය යටතේ -ජංගම දුරකථන මාර්ගයෙන්- ගෙවීම් කළ හැකියි. ලෝකයේ සමහර දියුණු රටවල් ඒ ක්‍රම පිළිගෙන ක්‍රියාත්මක කරනවා. එවැනි ක්‍රමවේද අපි අත් හදා බලනවා. ඉදිරි කාලය තුළ ඒ කටයුතු සිද්ධ කරන්න පුළුවන් කියා අප විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සමහර රටවල බොහෝ තැන්වල video footages වැනි දේත් පාවිච්චි කරනවා නේද, ගරු ඇමතිතුමනි. ඒ තාක්ෂණයත් පාවිච්චි කරන්න පුළුවන්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඔව්. ඇත්තටම ඒ වාගේ ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. අපි විශේෂයෙන්ම පොලිස් දෙපාර්තමේන්තුවත් සමඟ ඒකාබද්ධව තමයි ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වෙන්නේ.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)
(The Hon. D.M. Swaminathan - Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඩී.එම්. ස්වාමිනාදන් ඇමතිතුමාට ප්‍රශ්නයක් තිබෙනවාද?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Hon. Minister, now you are bringing it up to Rs. 500,000. Why do you not bring it up to Rs. 1 million because then, you can reduce a lot of litigation? It is a very good suggestion, but Rs. 500,000, Sir, in today's context, with legal costs and all that, is nothing. So, if they can consider raising it to about Rs. 1 million, it will be of great value.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

I appreciate the view of the Hon. Minister. I also think that it is a reasonable suggestion, but what we thought was, if we increase that from Rs. 250,000 to Rs. 1 million straightaway, there may be some other repercussions. So, without making any confrontation, we thought of adopting this peaceful way of settling the issue. As the Hon. Minister said, certainly by looking at the progress of this Amendment, maybe within one year or in a very short time span, we may be able to consider your suggestion very seriously.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණවලට පහසුකම් - infrastructure facilities - ලබා දීම පිළිබඳව මේ වන විට විශාල ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. මම සඳහන් කරන්නට සතුටුයි, උතුරු පළාතේ සහ නැඟෙනහිර පළාතේ සියලුම අධිකරණ නවීකරණය කරලා දැන් කිසිම අඩු පාඩුවක් නැතිව අංග සම්පූර්ණව ක්‍රියාත්මක වෙන බව. ඊට අමතරව අපි තවත් පැරණි අධිකරණයක් වන මාතර අධිකරණය මාතර කොටුවෙන් ඉවත් කරලා කොටවිලට ගෙන යන්නට දැන් ඉදි කිරීම් කරමින් පවතිනවා. ගාල්ල අධිකරණයත් කොටුවෙන් ඉවත් කරලා වඩා පහසුකම් තිබෙන බූස්ස ප්‍රදේශයට ගෙන යන්නට අපි බලාපොරොත්තු වෙනවා. දැනට තිබෙන බන්ධනාගාරය, ඉඩම් කන්තෝරුව වාගේ ආයතන සියල්ලම එක ස්ථානයකට ගෙනිහින්, ඒ පහසුකම් ලබා දීම තුළින් යුක්තිය ඉටු කිරීම වඩාත් වේගවත් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

අපට තිබෙන විශාලම ගැටලුවක් තමයි-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කථාව අවසන් කිරීමට සූදානම් වන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව විනාඩි තුන හතරකින් මම කථාව අවසන් කරන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා හොඳට දන්නවා, අලුත්කඩේ තිබෙන අධිකරණ සංකීර්ණය අපට තිබෙන බරපතළම ගැටලුවක් කියලා. උපරිමාධිකරණ සංකීර්ණය නොවෙයි. උපරිමාධිකරණ සංකීර්ණය සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. අපි චීන රජයත් සමඟ ගිවිසුමක් අත්සන් කරලා තිබෙනවා, උපරිමාධිකරණ සංකීර්ණය සහ අපගේ අධිකරණ අමාත්‍යාංශ ගොඩනැඟිල්ල චීන රජයේ සම්පූර්ණ වියදමින් නවීකරණය කරන්න.

මා හිතන විධියට ඒක විශාල මුදලක් වියදම් වන කාරණයක්. අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි දැනට තාවකාලිකව ඒ අධිකරණය ගෙන යන්න තැනක් නැතිකම. අනෙක මහාධිකරණ, දිසා අධිකරණ තිබෙන ගොඩනැඟිලි ඉතා අබලන් තත්ත්වයේයි තිබෙන්නේ. මීට අවුරුදු කිහිපයකට කලින් වැස්සක් වෙලාවක

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

මහාධිකරණයේ ගොඩනැඟිල්ලක් කඩා වැටුණා. වාසනාවට ඒක සිද්ධ වුණේ රාත්‍රී කාලයේයි. දවාලක සිද්ධ වුණා නම් ඉතාමත් බේදජනක තත්ත්වයක් බවට එය පත් වෙන්න ඉඩ තිබුණා.

දැනටත් දිසා අධිකරණය පිහිටි ගොඩනැඟිල්ලේ සමහර ස්ථාන පිපිරිලා තිබෙනවා, කඩා වැටුණු තැන් තිබෙනවා. ඒ නිසා අලුත්කඩෙට අලුත් අධිකරණ සංකීර්ණයක් ඉක්මනින් ලබා ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ අනුව, මා අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් කරුණු ඉදිරිපත් කිරීම තුළ, කැබිනට් මණ්ඩලයෙන් මේ වන කොට අනුමැතිය ලබා දීලා තිබෙනවා, බීසීසී සමාගම පැවතුණු අලුත්කඩේ භූමියෙන් අක්කර 06ක් අධිකරණයට ලබා දෙන්න. ඒ අනුව, අධිකරණ අමාත්‍යාංශයට දැන් අක්කර 06ක් ලැබිලා තිබෙනවා. ඒ අක්කර 06 තුළ ඉතා ඉක්මනට උසාවි 40කින් සමන්විත අධිකරණ සංකීර්ණයක් ඉදි කරන්න අපි බලාපොරොත්තු වනවා. එහෙම වුණොත් අපට ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය තාවකාලිකව එම ගොඩනැඟිල්ලට ගෙන ගිහිල්ලා, එහි අලුත්වැඩියා කටයුතු අවසාන කළාට පස්සේ නැවතත් ඒ ස්ථානයට ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය ගෙනෙන්න පුළුවන්. අනතුරුව දිසා අධිකරණය සහ මහාධිකරණ පද්ධතියේ සියල්ලම බීසීසී සමාගමේ ඉඩමේ අලුතින් ඉදි කරනු ලබන ඒ අලුත් ගොඩනැඟිලිවලට ගෙන යන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, රිමාන්ඩ් බන්ධනාගාරයත් ගෙන යන්න පුළුවන්කමක් තිබෙනවාද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ යෝජනාව නම් බොහොම ගැළපෙන යෝජනාවක්. මම බොහොම අමාරුවෙනුයි බීසීසී සමාගමට අයත් ඉඩමෙන් අක්කර 06ක් ලබා ගත්තේ. ඒ අක්කර 06ත් අක්කර දෙක බැගින් සිල්ලර ක්‍රමයටයි ලබා ගත්තේ. තවත් අක්කර 06ක් ඉතිරි වෙලා තිබෙනවා.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
Hon. Deputy Speaker -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා, මේක වැදගත් කාරණයක් නිසා ගරු ස්වාමිනාදන් අමාත්‍යතුමාටත් අවස්ථාවක් ලබා දෙන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
හොඳයි.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
Sir, the Remand Prison will be taken to Hulftsdorp.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Everyday, they have to shuttle up and down more than 6,000 remand prisoners from Welikada.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
That is correct. Under the new relocation scheme, the Remand Prison will be situated at Hulftsdorp.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is good.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Hon. Deputy Speaker, I fully agree that there is no reason why we should have a prison in the heart of the Colombo City for convicted prisoners. It is such a valuable land of about 65 acres. I do not know whether I am correct, but I think it is roughly about 65 acres.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
The extent of that land is 38 acres.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Okay. Thirty eight acres have been wasted on nothing for decades. In fact, I suggested to the Hon. Prime Minister also - when we take over six acres from the BCC land, there is a balance of six acres - to have a remand prison on the same land. Then, there is no question of transporting the prisoners from here to there, there would also not be any shootings in between and we can avoid so many conflicts.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වඩාත්ම පහසු ක්‍රමයට අධිකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමා දරපු අදහස බොහොම වැදගත්. ඒ විධියට කරන්න අපි උත්සාහ කරනවා. ගරු ස්වාමිනාදන් ඇමතිතුමා කියපු විධියට දැනටමත් එවැනි තීරණයක් තිබෙනවා නම් ඒක ඉතාම වැදගත්, හොඳ තීරණයක්. අපි අධිකරණ පද්ධතිය ඉදිකරනවාත් සමඟම රිමාන්ඩ් භාරයේ සිටින සැකකරුවන් - remand prisoners - පහසු ක්‍රමයකට අපරාධ අධිකරණ පද්ධතිය තුළට ගෙන ඒමේ ක්‍රියාදාමයක් එහි ගොඩනැඟිලි ඉදිකිරීමේ ක්‍රමවේදය තුළදීම අපට සකස් කරගන්නට පුළුවන්. Convicted prisoners එතැනට ගෙනයන්න කිසි වුවමනාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ආරම්භයේදී වැලිකඩ ඉඩ පහසුකම් තිබුණේ සිරකරුවන් 1,700දෙනෙකුට පමණයි. දැන් 13,000ක් ඉන්නවා.

එයින් 7,000කට වැඩි පිරිසක් අවවු කරපු අය නොවෙයි, රිමාන්ඩ්ගත වුණු අය. ඒ සඳහා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා,-[බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු අධිකරණ ඇමතිතුමනි, ඒ සඳහා වන විකල්ප ඉඩම කොහේද කියන ප්‍රශ්නය තමයි හැමදාම මතු වුණේ. ඒ සඳහා හොරණ ප්‍රදේශයෙන් විකල්ප ඉඩමක් මුල් අවස්ථාවේදී යෝජනා වෙලා තිබුණා. නමුත් හොරණ ප්‍රදේශයේ යම් ගැටලුවක් තිබෙනවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා අධිවේගී මාර්ගයේ ගැලනිගම හා දොඩංගොඩ අතර අලුතින් highway entrance එකක් ඉදි කරනවා. ඒ highway entrance එකට ඉතාම කිට්ටුවෙන් මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ නිව් වැටල් වතුයායේ පුනරුත්ථාපන කටයුතු සඳහා ප්‍රමාණවත් තරම් ගැළපෙන හොඳ සුව පහසු ඉඩම් තිබෙනවා. අපි එහි කර්මාන්ත ජනපදයකුත් ඉදිකරනවා. එම කර්මාන්ත ජනපදයට යාබදව අපට බන්ධනාගාරය ඉදි කරන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය වන අක්කර 38 හෝ 40 අපට ලබා දෙන්න පුළුවන් අධිකරණ ඇමතිතුමනි. මම බොහොම සතුටින් එය භාර ගන්නවා. මොකද, මේ රටේ පුරවැසියන් වන ඔවුන් පුනරුත්ථාපනය කිරීම අපේ වග කීමක්. හුහක් ඇනට අරගෙන යන්නේ නැතිව සුව පහසු, ඒ වාගේම ගමන් බිමන් පහසු වන ප්‍රදේශයක ඉදි කරනවා නම් අපි ඒක භාර ගන්න කැමැතියි. ඒ පිළිබඳව තිබෙන කම්ටුවකටත් මාව පත් කර තිබෙනවා. මම සූදානම් ඒ සහාය දක්වන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

මේ වන විට ලංකාවේ සියලු වර්ගවල රැඳවියන් 17,000ක් පමණ සිටිනවා. එතැනින් 6,000ක් වාගේ පිරිසක් තමයි වැලිකඩ ඉන්නේ. මේ වන විටත් අහුණුකොලපැලැස්සේ විශාල බන්ධනාගාරයක් ඉදි කරගෙන යනවා. එය සම්පූර්ණ වුණාට පස්සේ 1,500කට වැඩි රැඳවියන් පිරිසක් එතැනට යවන්න පුළුවන් කියා මා විශ්වාස කරනවා. ඒ එක්කම බූස්ස බන්ධනාගාරය අපි නැවත බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දූ ආගමික කටයුතු ඇමතිතුමාට භාරදුන්නා. බූස්ස බන්ධනාගාරයටත් 1,000ක්, 2,000ක් වාගේ විශාල රැඳවියන් පිරිසක් ගෙනයන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

There were lands in Panadura and Pannala. - [*Interruption.*]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

In Horana.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

When I was the Minister, we were trying to take it to a land in Padukka. But, I think there was a difficulty in obtaining that land. As a result, they have sought some alternatives. What the Hon. Ajith P. Perera, Deputy Minister of Power and Renewable Energy, suggested, I think, would be a very good option so that we will be able not only to avoid the congestion in the prison, but also to do the justice to the prisoners by doing that.

Sir, with that, I conclude my speech. Thank you very much.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා.

[ප.භා. 11.55]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කිරීමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිය පුද කරනවා.

පසු ගිය කාලය තුළ නව රජය අධිකරණයේ ස්වාධීනත්වය සඳහා විශේෂයෙන් කැප වුණා. අපි දින 100 ආණ්ඩුව යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් ගෙනැල්ලා, ස්වාධීන කොමිෂන් සභා ඇති කරලා මේ රටේ අධිකරණය ඇතුළු ආයතන ගණනාවක ස්වාධීනත්වය තහවුරු කළා. සියලු දෙනාටම මතක ඇති, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අධිකරණයට ඉදිරිපත් කරපු වෙලාවේ එහි තිබුණු කරුණු ගණනාවක් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉවත් කළ බව. ඊට කලින් එවැනි තත්ත්වයක් තිබුණේ නැහැ. නමුත්, නව රජය ඇති කරලා තිබෙන ස්වාධීන නිදහස් වාතාවරණය තුළ, ශ්‍රේෂ්ඨාධිකරණයට ශක්තිය ලැබුණා, පාර්ලිමේන්තුවෙන් ඉදිරිපත් කරපු කරුණු කිහිපයක් ඉවත් කරන්න. ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වා, මේ විධියට බලතල අයින් කරන්න යනවා නම් ජනමත විචාරණයකට යන්න ඕනෑ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණයේ ස්වාධීනත්වය අපි කවුරුත් අගය කරනවා. අද අධිකරණයේ ස්වාධීනත්වයට තර්ජන එල්ල වෙලා තිබෙන්නේ පාලකයන්ගෙන් නොවෙයි, උගත් බුද්ධිමත් ජනතාවගෙන්. ඔබතුමාත් ඒක පුවත් පත්වලින් දකින්න ඇති.

පසු ගිය දවස්වල වෛද්‍යවරු අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණයට ගිහිල්ලා විරෝධතා ව්‍යාපාරයක් පැවැත්වූවා. මොකක්ද ඒ ගොල්ලන් කියන්නේ? ඒ ගොල්ලන් කියනවා,"SAITM ආයතනයේ උපාධිලාභීන් ලියාපදිංචි කළොත්

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ලමහතා]

අපි වැඩ වර්ජනයක් කරනවා" කියලා. They say, "If the SAITM students are recognized and registered, we will launch an island-wide strike." මෙය පැහැදිලිවම අධිකරණයට අපහාස කිරීමක්. සාධාරණ පුරවැසියකු හැටියට මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. ඒ ක්‍රියාව හරිද? SAITM ආයතනය පටන් ගත්තේ අපි නොවෙයි. ගිය ආණ්ඩුවෙන් තමයි ඒක පටන් ගත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඒ උපාධිය පිළිගෙන ඉවරයි. දැන් SAITM වෛද්‍ය උපාධිය පිළිගෙනයි තිබෙන්නේ. පුවත් පත්වල කියලා තිබෙනවා මම දැක්කා,"අධ්‍යාපන අමාත්‍යාංශය ඒකට කුමන්ත්‍රණය කරනවා" කියලා. දැන් කුමන්ත්‍රණය කරන්න දෙයක් නැහැ. මොකද, ගිය ආණ්ඩුවෙන් ඒක පිළිගෙනයි තිබුණේ. ඒ උපාධිය ගත්ත ඒ ශිෂ්‍යයන් ලියාපදිංචි කරන්න පුළුවන්ද බැරිද කියන ප්‍රශ්නය තමයි දැන් තිබෙන්නේ. ඒ ශිෂ්‍යයන් ලියාපදිංචි වෙන්න අවසර ඉල්ලුවා.

වෛද්‍ය සභාව කිව්වා, ලියා පදිංචි කරන්න බැහැ කියලා. ලියා පදිංචි කරන්න බැහැ කිව්වාම ශිෂ්‍යයෝ උසාවි ගියා. ඒක වරදක්ද? උසාවි යන එක වරදක්ද? ශිෂ්‍යයෝ උසාවි ගිහිල්ලා තියෙද්දී වෛද්‍ය සභාවයි, රජයේ වෛද්‍ය නිලධාරි සංගමයයි අධිකරණය ඉදිරියට ගිහිල්ලා, "ලියා පදිංචිය දුන්නොත් අපි දීප ව්‍යාප්ත වැඩ වර්ජනයක් කරනවා" කියලා කියන එක හරිද? ඒක පැහැදිලිව අධිකරණයට අපහාස කිරීමක්. මම ගරු අධිකරණ ඇමතිතුමාගෙන් වාගේම අධිකරණයෙන් ඉල්ලීමක් කරනවා, මේ සම්බන්ධයෙන් පියවර ගන්න කියලා. SAITM ආයතනය උපාධිය ආරම්භ කරපු කාලයේ කවුරුවත් විරුද්ධ වුණේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණ නම් පාර්ලිමේන්තුවේදී විරුද්ධ වුණා, මට හොඳට මතකයි. නමුත් ඊට විරුද්ධව මොනයම් හෝ විරෝධතා ව්‍යාපාරයක් එදා තිබුණේ නැහැ.

එස්.බී. දිසානායක ඇමතිතුමා පාර්ලිමේන්තුවට ඒ පනත් කෙටුම්පත ගෙනාවා. ඒක පාර්ලිමේන්තුවේදී සම්මත වුණා. එක්සත් ජාතික පක්ෂයත් එහි අඩු පාඩුකම් පෙන්වලා දුන්නා. නමුත් අපි ඒකට විරුද්ධ වුණේ නැහැ. පෞද්ගලික අධ්‍යාපනය අද රටට අවශ්‍යයි. මොකද ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාලවලට සමත් වෙන හැම කෙනෙකුටම විශ්වවිද්‍යාලයට යන්න අවස්ථාව ලබා දෙන්න ආණ්ඩුවට බැහැ; ආණ්ඩුවට වත්කම් නැහැ. එංගලන්තය ගත්තොත්, උසස් පෙළ විෂයන් තුනක් සමත් වෙන හැම ශිෂ්‍යයෙකුට මොන මට්ටමේ හරි විශ්වවිද්‍යාලයක් ඒ රටේ තිබෙනවා. "ඒ" තුනක් ගන්න අයට යන්න හොඳම විශ්වවිද්‍යාල තිබෙනවා. Ordinary Passes තුනක් තිබෙන අයට යන්න සාමාන්‍ය මට්ටමේ විශ්වවිද්‍යාල තිබෙනවා. නමුත් අපේ රටේ උසස් පෙළ සමත්වන සියයට 80කට විශ්වවිද්‍යාලයකට යන්න බැහැ.

කොළඹ, මහනුවර සහ ගාල්ල වැනි ප්‍රදේශවල ඉතා හොඳ උසස් පෙළ ප්‍රතිඵල තිබෙන අයටත්,"ඒ" දෙකයි, "බී" එකයි තිබෙන අයටත් විශ්වවිද්‍යාලයට යන්න බැහැ. මේ අය කියනවා, Ordinary Passes තුනක් ගත්ත අයත් SAITM එකට ගිහින් තිබෙනවා කියලා. Ordinary Passes තුනක් අරගෙන රජයේ විශ්වවිද්‍යාලවලටත් ගිහිල්ලා තිබෙනවා, වැල්ලවාය ප්‍රදේශයෙන්. වැල්ලවාය ප්‍රදේශයේ Ordinary Passes තුනක් ගත්ත අය විශ්වවිද්‍යාලයට ගිහිල්ලා තිබෙනවා. කොළඹ, මහනුවර, ගාල්ල වැනි ප්‍රධාන දිස්ත්‍රික්කවලින් "ඒ" දෙකයි, "බී" එකයි ගත්තත් විශ්වවිද්‍යාලයකට යන්න බැහැ, Z-Score එක අනුව. යාපනය දිස්ත්‍රික්කයෙනුත් "ඒ" දෙකයි, "බී" එකයි ගත්තත් යන්න බැහැ.

ගිය ආණ්ඩුව කාලයේ තමයි මේ SAITM ආයතනය ඇති කළේ. අපි නොවෙයි. අපට දැන් කියන්නේ මේ ළමයින් අතරමං කරන්න කියලාද? අපට කියන්නේ මේ ආයතනය වහලා දාන්න කියලාද? ආණ්ඩුවට තීරණයක් ගන්න බැරි නිසා දැන් ඒ අය අධිකරණයට ගියා. අධිකරණයට ගියාම, වෛද්‍යවරු විරෝධතා ව්‍යාපාර පවත්වලා කියනවා, "මේක පිළිගත්තොත් දීප ව්‍යාප්ත වැඩ වර්ජනයක් කරනවා" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක අපට පිළිගන්න බැහැ. අධිකරණයට ඒ විධියට තර්ජනය කිරීම මම හිතන හැටියට නව ආණ්ඩුවේ ප්‍රතිපත්තියට පටහැනිව ක්‍රියා කිරීමක්. ඒ කාරණය පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කර වන්නයි මා කථා කළේ. ඔබතුමාට ස්තුතියි.

[අ.භා. 12.01]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණයට සම්බන්ධ පනත් කීපයකට අදාළව සාකච්ඡා කරන මේ අවස්ථාවේ ඊට සම්බන්ධ කරුණු කීපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

ඊට කලින් කියන්න ඕනෑ, මට කලින් කථා කළ අපේ සහානායකතුමා එතුමාට තිබෙන වෙන ප්‍රශ්නයක් මතු කරන්න ඒ කාලය උපයෝගි කර ගත්තා කියලා. එහෙම තමයි මට හිතෙන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

කාලීන වැදගත් ප්‍රශ්නයක්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

කාලීන වැදගත් ප්‍රශ්නයක්. ඒ නිසා ඒ ගැනත් යමක් කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක් එක් ආයතනවලට තිබෙන ගෞරවය සහ එක් එක් ආයතනවලට තිබෙන බලතල පිළිබඳව අපට අදහස් තිබෙනවා. ඒ වාගේම අපි ඕනෑ තරම් දැක තිබෙනවා, ඒ හැම ආයතනයක් පිළිබඳවම මහජනයා යම් අදහසක් ඉදිරිපත් කරන ස්වභාවයක්. මේ පාර්ලිමේන්තුවේ සමහර පනත් කෙටුම්පත් සම්මත කර ගන්න අවස්ථාවලදී ජනතාව පාර්ලිමේන්තුව ළඟට ඇවිල්ලා, "මේ පනත් කෙටුම්පත සම්මත කරන්න එපා" කියලා උද්ඝෝෂණ කරන හැටි අපි දැක්කා. ඒක ජනතාවගේ අදහස් ඉදිරිපත් කිරීමේ එක් ක්‍රමවේදයක්. සමාජයේ විශාල ආන්දෝලනයකට තුඩු දී තිබෙන ගැටලුවක් පිළිබඳව අධිකරණයේ නඩුවක් විභාග වන කොට -හැම නඩුවක්ම නොවෙයි- යම් යම් පාර්ශ්ව අධිකරණය ඉදිරිපිටට ගිහින් ඒ පිළිබඳ යම් ක්‍රියා මාර්ග අනුගමනය කරලා තිබෙනවා. මේ ඒ වාගේ පළමුවැනි අවස්ථාව නොවෙයි. ඔබතුමා-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

සාමකාමී විරෝධතා ව්‍යාපාරයක් තිබුණා නම් කමක් නැහැ. ඒගොල්ලෝ කිව්වේ, "අධිකරණය ඒ ශිෂ්‍යයන් ලියා පදිංචි කිරීමට තීරණය කළොත්, දීප ව්‍යාප්ත වැඩ වර්ජනයක් කරනවා" කියලා. ඔවුන් හදන්නේ, අධිකරණයේ තීන්දුවට බලපෑමක් කරන්න නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතැන කිසිසේත්ම එවැන්නක් නැහැ. මම දැක්කා. ඡායාරූප සහ-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම කියලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතැන තිබුණේ ඉතාම නිහඬ හා සාමකාමී උද්ඝෝෂණයක්. ගරු සභානායකතුමනි, අඩුම තරමින් ඔවුන්ගේ මුඛයවත් පෙනෙන්න තිබුණේ නැහැ. මුඛයත් වහගෙනයි හිටියේ. ඒක තමයි ඇත්ත. ඒ බෝඩ් අල්ලාගෙන මුඛය වහගෙනයි හිටියේ. මා හිතන හැටියට අධිකරණයත් සමාජ මතය ගැන සැලකිල්ලක් කරන්න ඕනෑ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මුඛය වසාගෙන කීප දෙනෙකු හිටියා. හැබැයි, රූපවාහිනියට කථා කළා. කථා කරලා කිව්වා, "ඒ ශිෂ්‍යයන් ලියා පදිංචි කළොත් අපි වැඩ වර්ජනයක් කරනවා" කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
වෘත්තීය සමිති ව්‍යාපාරයක් තමන්ගේ සටනක් ජයග්‍රහණය කිරීම සඳහා කරන බලපෑමක් තිබෙනවා. ඒක තමයි වෘත්තීය සමිති ව්‍යාපාරයේ ස්වභාවය. ඔවුන් යම් දෙයක් වෙනුවෙන් සාකච්ඡා තබනවා; ලිඛිතව දැනුම් දීම් කරනවා; විවිධ උද්ඝෝෂණ ව්‍යාපාර තියනවා. අවසානයේදී ඔවුන් කියනවා, "අපි හිතන ආකාරයෙන් මේ සටන ජයග්‍රහණය කරන්නේ නැත්නම් වැඩ වර්ජනයකට යනවා" කියලා.

යහ පාලනය ගොඩනැඟීමේ දී ඒ අයිතියත් පිළිගන්න ඕනෑ කියලායි මම හිතන්නේ. ඒ අයිතිය පසෙකලා, "මෙය අධිකරණයට කරන ලද අපහාසයක්, ඔවුන් අධිකරණය හමුවට ගෙන යා යුතුයි" කියලා මෙතැනට ඇවිල්ලා තමන්ගේ මුග්ධ, තක්කඩි වුවමනාව ඉටු කර ගැනීම වෙනුවෙන් අධිකරණය උපයෝගී කර ගන්නවා. අපි ඒ වුවමනාව ඉටු කර ගන්න අධිකරණය උපයෝගී කර ගන්න ඕනෑ නැහැ. කිරිඇල්ල ඇමතිතුමනි, එම පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ ඉතිහාසය, එහි ආරම්භය දෙස බැලුවොත් ඒ ශිෂ්‍යයන්ට, ඒ වෛද්‍යවරුන්ට -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම පටන් ගත්තේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්. ඔබතුමා පටන් ගත්තේ නැති එක ඇත්ත. හැබැයි, දැන් ඔබතුමා ආණ්ඩුවේ; ඔබතුමා දැන් අමාත්‍යවරයා; එහි වගකිව යුත්තා ඔබතුමා; ඒ නිසා ඔබතුමාට දැන් මේ ප්‍රශ්නයෙන් ගැලවෙන්න බැහැ. "මම පටන් ගත්තේ නැහැ, ඒ කාලයේ පටන් ගත් අය ඒක බලා ගන්න ඕනෑ, මට දැන් බැහැ" කියලා ඔබතුමාට කියන්න බැහැ. ඔබතුමාගේ කර මත තමයි මේ උර වක්‍ර මාලය වැටිලා තිබෙන්නේ. ඒක මම දන්නවා. මේ කටු ඔටුන්න වැටිලා තිබෙන්නේ ඔබතුමාගේ හිස මත. ඒ නිසා එය සාධාරණ ලෙස විසඳීම සඳහා මැදිහත් වන්න ඔබතුමාට වග කීමක් තිබෙනවා. ඒක ඔබතුමාගේ කාර්ය භාරය. ඒක ඔබතුමාට අත්හරින්න බැහැ. මේ ආයතනය අතිශය වංචනික, තක්කඩි ආයතනයක්. මේ ආයතනය ආරම්භයේ සිටම කළේ බොරුවක්. මේ SAITM ආයතනය කිව්වේ, රුසියානු උපාධියක් දෙනවාය කියලායි. මේ ආයතනයෙන් රුසියානු උපාධියක් දෙනවාද? නැහැ, ඒක බොරුවක්. මේ ආයතනයෙන් කිව්වේ අවුරුදු කීපයක් මෙහි උගන්වා ඉතිරි අවුරුදු කීපය සඳහා රුසියාවට යවනවා කියලායි. එහෙම කළාද? මේක බොරුවක්. මේ ආයතනයෙන් ඉස්සෙල්ලාම කිව්වේ වෛද්‍ය උපාධිය ලබා ගැනීම සඳහා වෛද්‍ය සභාවේ අනුමැතිය තිබෙනවා කියලායි. ඒක බොරුවක්. ඒ නිසා මේක උපතේ සිටම-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අධිකරණයට තීන්දුව දෙන්න ඉඩ හරින්න. අධිකරණය ඉදිරියට ගිහිල්ලා විරෝධතා ව්‍යාපාර කරන්නේ ඇයි?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කියන්නම්. මේ ආයතනය උපතේ සිටම ගෙන ගිය වංචනික, තක්කඩි ක්‍රියාදාමයට එරෙහිව මේ රටේ වෛද්‍ය ශිෂ්‍යයන් වාගේම මේ රටේ නිදහස් අධ්‍යාපනය පිළිබඳව සැලකිල්ලක් දක්වන, වෛද්‍ය වෘත්තියේ යම් ප්‍රමිතියක් අපේක්ෂා කරන සියලු දෙනාගේම විරෝධයක් තිබෙනවා. අධිකරණ ඉදිරිපිට සිදු වූ කලහකාරී තත්ත්වයන් අපි දැකලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, පසු ගිය කාලයේ අධිකරණ ඉදිරිපිට සිදු වූ යම් යම් කලහකාරී තත්ත්වයන් පිළිබඳව ඔබතුමාත් දන්නවා. එහෙම කලහකාරී තත්ත්වයක් එදා සිදු වුණේ නැහැ. ඒ නිසා එතැන කිසිසේත්ම අධිකරණයට අපහාස කිරීමක් හෝ අධිකරණයේ ස්වාධීන තීන්දුවක් ගැනීම සඳහා කරන අනියම් බලපෑමක් තිබුණාය කියනවා නම්, ඒක මුළුමනින්ම වැරදියි. ඒ අදහසට අපි විරුද්ධයි. හැබැයි, අධිකරණයේ තිබුණු ස්වාධීනත්වයත්, ඒකට තිබෙන උත්තරීතරභාවයත් උපයෝගී කර ගෙන ඒ සටන් ව්‍යාපාරයේ යෙදුණු වෛද්‍යවරුන්ගේ හා ශිෂ්‍යයින්ගේ නැඟී සිටීම මර්දනය කිරීමේ ආයතනයක් හැටියට අධිකරණය උපයෝගී කර ගන්න ඔබතුමා උත්සාහ කරනවා නම්, එය කිසිසේත්ම පිළිගතයුතු නැහැ කියන එක තමයි අපගේ අදහස, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම ඊළඟට ගරු අධිකරණ හා බුද්ධ ශාසන ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන යෝජනා පිළිබඳව සාකච්ඡාවට බඳුන් කරන්න කැමැතියි. ලෝකය වෙළෙඳ පොළෙන් එකතු වෙලා තිබෙනවා නම්, ලෝකය සන්නිවේදනයෙන් එකතු වෙලා තිබෙනවා නම්, ලෝකය ගමනාගමනයෙන් එකතු වෙලා තිබෙනවා නම්, ලෝකය තාක්ෂණයෙන් කිට්ටු වෙමින් තිබෙනවා නම්, ඒ ලෝකයත් එක්ක අධිකරණ පද්ධතිය ගැට ගැසීම වැරදි නැහැයි කියලා අපි පිළිගන්නවා. ඒ නිසා ලෝකය කුඩා වන්න, කුඩා වන්න, රාජ්‍යයන් විවිධාකාරයෙන් සමීප වන්න, සමීප වන්න අධිකරණ ක්‍රියාවලිය තුළත් ඔවුන්ගේ සහයෝගිතාවන් වර්ධනය කර ගැනීම අතිශය වැදගත් කියලා මා හිතනවා. ඒ සඳහා දරන මේ ප්‍රයත්නයට අපේ සහාය ලබා දෙන අතර, ඒක ඉතා වැදගත් ප්‍රයත්නයක් ලෙසත් අපි සලකනවා. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, හැබැයි ඔබතුමා රාජ්‍යයන් ගණනාවක් කිව්වා. එක්සත් අරාබි එමීර් රාජ්‍යයත් - UAE - මේකට ඇතුළත් වෙලා තිබුණා නම් හොඳයි කියලා මම කල්පනා කරනවා. මම දැකපු විධියට මේ ලැයිස්තුවේ UAE තිබුණේ නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, United Arab Emirates මේ ලැයිස්තුවට ඇතුළත් කිරීම සඳහා ඇත්තටම මීට ගොඩක් කාලයකට පෙර එනම්, 2012 පෙබරවාරි දෙවෙනිදා තමයි අමාත්‍ය මණ්ඩලය අනුමත කරලා තිබෙන්නේ. ගිවිසුම අත්සන් කරලා තිබෙනවා, 2014 ජනවාරි 27 වැනිදා. ගැසට් පත්‍රයේ පළ වෙලා තිබෙන්නේ, 2014 අගෝස්තු 29 වැනිදා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කළ අවස්ථාවේදී මම ඇහුවා, මෙම අන්‍යෝන්‍ය බැඳීම් තිබෙන්නේ අධිකරණයේ විභාග වන කරුණක් සම්බන්ධව පමණද, පරීක්ෂණත් මේකට ඇතුළත්ද කියලා. එතකොට ඔබතුමා පෙන්වා දුන්නා, දෙකම මේකට ඇතුළත් බව. දැන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ යම් පරීක්ෂණයක් සිදු වෙමින් තිබෙනවා, පසු ගිය කාලයේ විදෙස් බැංකුවල මුදල් තැන්පත් කිරීම පිළිබඳව.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා අහපු කාරණය සම්බන්ධව 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ, "පනතේ අරමුණ" යටතේ තුන්වන වගන්තියේ මෙසේ සඳහන් වී තිබෙනවා:

> "මේ පනතේ අරමුණ වනුයේ පහත සඳහන් කරුණු ද ඇතුළුව, සාපරාධී කාරණාවල දී ශ්‍රී ලංකාව විසින් සහයෝගීතාව දැක්වීම හා ලබාගැනීම පිළිබඳ විධිවිධානය පහසුකරලීම ය."

සාපරාධී කාරණාවලදී, ඒ කියන්නේ යම් කාරණයක් අපරාධයක් ලෙස සැලකිය හැකි තත්ත්වයට පත් වේ නම්, ඒ කාරණා සියල්ල මේකට ඇතුළත් වෙනවා. ඒ නිසා ඒ සම්බන්ධව අන්‍යෝන්‍ය සහයෝගය ලබා ගැනීමට හැකියාව ලැබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔව්. දැන් ලබා ගත යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලයේදී ප්‍රශ්නයක් පැන නැඟුණා. කැබිනට් ප්‍රකාශකවරයා කියන එක නේ ආණ්ඩුවේ ප්‍රකාශය හැටියට දකින්න තිබෙන්නේ. ඔහු ඉතා පැහැදිලිව කිව්වා, ඩුබායි රටේ ඩොලර් බිලියන 1.3ක මුදලක් තැන්පත් කොට තිබෙන බවත්, ඔහු ඒ ගිණුම් අංක සහ මුදල් ප්‍රමාණය දන්නා බවත්. එතකොට ප්‍රශ්නය වෙලා තිබුණේ, ඒක වෙනම රාජ්‍යයක් නිසා අපේ පරීක්ෂණ කටයුතු සඳහා දායකත්වය ලබා ගැනීම සඳහා තිබෙන දුෂ්කරතාව හේතු කොට ගෙන ඒ පරීක්ෂණ කටයුතු අඩපණ වෙලා තිබෙනවා කියන එකයි. මේ ගිවිසුම අත්සන් කළේ 2014 වසරේ නම්, එහෙම නම් දැන් මේ බැඳීම් එක්ක ඒ සඳහා අපට ඉඩකඩ ලැබෙනවාද කියන කාරණය මම ගරු අධිකරණ ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

දෙවන කරුණ මේකයි. මේ හා සමාන ලෙසම යුක්‍රේන රාජ්‍යයත් එක්ක ඇති වුණු ගැටලුවක් තිබෙනවා. මීග් ප්‍රහාරක යානා මිලදී ගැනීමේදී ශ්‍රී ලංකා රජය සහ යුක්‍රේන රජය අතර - රාජ්‍යයන් දෙකක් අතර- ද්විපාර්ශ්වික ගනුදෙනුවක් හැටියට එය සිදු වුණා කියලා තමයි අර්ථ කථනය කරලා තිබුණේ. හැබැයි මුදල් ගිහිල්ලා තිබුණේ යුක්‍රේනයට නොවෙයි. වෙනත් සමාගමක් හරහා තමයි මුදල් ගිහිල්ලා තිබෙන්නේ. ඒ පිළිබඳව පරීක්ෂණයක් දැන් පැවැත්වෙනවා. විදේශ කටයුතු අමාත්‍යාතුමා ගිහිල්ලා යම් ගිවිසුමක් අත්සන් කරලා තිබුණා. කෙසේ වුවත් මේ නීතිය අනුව අපට දැන් පුළුවන්කම ලැබෙන්න ඕනෑ, යුක්‍රේන රජය ඒකට ඇතුළත් වෙනවා නම් ඒ රාජ්‍යයන්ගෙන් අවශ්‍ය වන තොරතුරු ලබා ගැනීමට. මා පෙනී සිටියේ අන් කවරක් සඳහාවත් නොවෙයි. අපේ රටේ සිදු වී තිබෙන බරපතළ මූල්‍ය අපරාධවලට රට තුළ පමණක් නොවෙයි, රටෙන් බාහිර රාජ්‍යයන්, බැංකු සහ වෙනත් නීතිමය ආයතන සම්බන්ධ වී තිබෙන නිසා පරීක්ෂණ කටයුතු සඳහා ඒ රාජ්‍යයන්ගේ අන්‍යෝන්‍ය දායකත්වය ලබා ගැනීමට මේ නියමය හරහා අපට පුළුවන්කම ලැබෙනවා නම්, ඒක ඉතාම හිතකර තත්ත්වයක් කියා මා කල්පනා කරනවා. මෙය සම්මත කිරීමකින් පසුව ඒ සඳහාත් ඉදිරි ක්‍රියාමාර්ග ගනීවි කියලා මා බලාපොරොත්තු වෙනවා.

ඊළඟ කාරණය හැටියට මා ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, ඔබතුමන්ලා ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් වුණු කාරණයක් පිළිබඳව. එහි ඉතා පැහැදිලිව සඳහන් කර තිබුණා, වංචා හා දූෂණ පිළිබඳ විශේෂ අධිකරණයක් පිහිටුවන බව. වංචා දූෂණ පිළිබඳ පරීක්ෂණ සහ නඩු ක්‍රියාවලිය දියත් වෙමින් තිබෙන්නේ කොහොමද කියලා දැන් අපි දන්නවා. දැන් ඒවා යම් ප්‍රමාණයකට දිනපතා විකාශය වන ටෙලි නාට්‍යයක් වාගේයි. මෙගා නාට්‍යයක් වාගේයි. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. චූදිතයා එනවා; කැමරා ටික අමුණා ගෙන ඉන්නවා; චූදිතයා ඇතුළට යනවා; ආපසු එළියට එනවා. ඊට පසුව "action" කියනවා; "action" කියන කොටම ප්‍රකාශයක් කරනවා; ආයෙත් එළියට එනවා; වාහනයට නඟිනවා; නඟින වාහනයත් පෙන්වනවා. මේ නාටකය තමයි දියත් වෙමින් තිබෙන්නේ. ඊට පසුව තව නඩු දිනයක් දමනවා, මාස තුනකට පසුව. ඊට පසුව තව නඩු දිනයක් දමනවා, මාස හතරකට පසුව. සහතික වශයෙන්ම තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබෙන තෙක් ඒ නඩුවල තීරණයක් ලැබෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත කථාව. ඒක දැන් ඒ ගොල්ලොත් දන්නවා.

මේ අධිකරණ ක්‍රියාවලියේ තිබෙන දුබලතාව නිසා - ඒක ඔබතුමාගේ වැරැද්දක්වත්, අධිකරණ පද්ධතියේ වැරැද්දක්වත් නොවෙයි. කළමනාකරණ පද්ධතියේ ඇති වී තිබෙන ගැටලු ගණනාවක් තමයි ඒකට හේතුව වන්නේ. - නඩු විභාග වීම පමා වීමට හේතු වී තිබෙන ගැටලුව හේතු කොට ගෙන තමයි වංචා හා දූෂණ පිළිබඳව විශේෂ අධිකරණ පද්ධතියක් පිහිටුවනවාය කියන යෝජනාව තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනයට ඇතුළත් කළේ. හැබැයි දැන් අවුරුදු එකහමාරකට ආසන්න කාලයක් ගත වෙමින් තිබෙනවා. එවැනි අධිකරණයක් පිහිටු වීම පිළිබඳව තවමත් කිසිදු තීන්දු තීරණයක් ගත් බවක් පෙන්නුම් කරන්නේ නැහැ. මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, දැනට අමාත්‍යාංශය ඇතුළේ එවැනි සාකච්ඡාවක් සිදු වී තිබෙනවාද, යම් කැබිනට් පත්‍රිකාවක් සකස් කොට තිබෙනවාද, ඒ සඳහා නීතියක් සකස් කොට තිබෙනවාද කියලා. මේ විශේෂ අධිකරණ පද්ධතියක් පිහිටුවීම කෙරෙහි ඔබතුමා අනුගමනය කර තිබෙන්නේ කවරාකාර ක්‍රියා මාර්ගයක්ද කියලා දැන ගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා දන්නා විධියට ඒ පිළිබඳව මූලික වශයෙන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් දැනට ක්‍රියාත්මක වෙනවා. ඊට අමතරව අලුත් අධිකරණ පද්ධතිය පත් කිරීම සම්බන්ධව වෙනම නීතියක් ගෙන එනවාට වඩා මේ වනවිට අලුත්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කරමින් පවතින නිසා අලුත් අධිකරණ ක්‍රම ඇතුළත්

අලුත් අධිකරණ පද්ධතියක් සම්බන්ධව මේ වේලාවේ අපට යෝජනා ඉදිරිපත් වෙමින් පවතිනවා. ඒ වාගේම ඒවා සාකච්ඡා වෙමින් පවතිනවා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා අපේ මෙහෙයුම් කමිටුවේ - Steering Committee එකේ- ඉන්නා නිසා ඒ ගැන දන්නවා. දැන් ඒ පිළිබඳව වෙනම අනු කමිටුවකුත් පත් කරලා තිබෙනවා, ගරු රවූෆ් හකීම් ඇමතිතුමාගේ සභාපතිත්වයෙන්. ඒ තුළින් අපි එය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ පිළිතුර වුණේ, මූලික වශයෙන් ඒ පිළිබඳව ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් ක්‍රියාත්මක වෙන බවයි. ඒ කියන්නේ එක නාටකයක පසුතලය මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය නම් ඊළඟ නාටකයේ පසුතලය තමයි, බරපතළ මූල්‍ය වංචා විමර්ශන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව. ඒක අරකටත් වඩා නාටකයක්. මොකද, මම මේ පාර්ලිමේන්තුවේදී අගමැතිතුමාගෙන් ඇසුවා, ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් මේ වනවිට අවසන් කොට තිබෙන පරීක්ෂණ ගණන කොපමණද කියා. එතුමා කිව්වා, "එකක්වත් අවසන් කොට නැහැ. කිසිදු වාර්තාවක් තවම ඉදිරිපත් කොට නැහැ" කියා. මම දන්නවා, වාර්තා දෙකක් ඉදිරිපත් කළා කියා. අගමැතිතුමා කිව්වේ, වාර්තා එකක්වත් ඉදිරිපත් කළේ නැහැ කියා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් එතුමාට කිව්ව බවයි. මම දන්නවා, දෙකක් ඉදිරිපත් කළ බව. එයින් එකක් තමයි, අයිටීඑන් නාළිකාවේ මූල්‍ය අපරාධය පිළිබඳව ඉදිරිපත් කර තිබෙන පරීක්ෂණ වාර්තාව. අනෙක් එක, මීගමුව පළාතේ සිදු වුණු පාරිසරික හානියක් පිළිබඳව ඉදිරිපත් කර තිබෙන පරීක්ෂණ වාර්තාව. හැබැයි, අග්‍රාමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට කිව්වේ එකක්වත් ඉදිරිපත් කරලා නැහැ කියායි. නමුත් ඉදිරිපත් කළා.

කොමිෂන් සභා ඕනෑ තරම් මේ රටේ ගොඩනැඟී තිබෙනවා. මට මතකයි, 1994 වර්ෂයේදී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය අතුරුදහන්වූවන් පිළිබඳ කොමිෂන් සභාවක් පිහිටෙව්වා. ඒ වාර්තා දෙකම මා සතුව තිබෙනවා. හැබැයි, මොකක්ද සිද්ධ වෙන්නේ?

2015 ජනවාරි මාසයේ 08 වැනි දා ජනවරම තිබුණේ එතැන නොවෙයි. ජනවාරි මාසයේ 08 වැනි දා ලැබුණු ජනවරමේ එවකට පැවති ආණ්ඩුව බිඳ වැටිටවීම සඳහා වංචා, දූෂණ හා නාස්තියට එරෙහිව ප්‍රබල හඬක් තිබුණා. ඒ හඬ කිසි සේත්ම බොරුවක් නොවෙයි; ප්‍රලාපයක් නොවෙයි. එදා, ජනවාරි මාසයේ 08 වැනි දාට පෙර කිව්වාටත් වඩා වැඩියි, ජනවාරි මාසයේ 08 වැනි දායින් පසුව හෙළිදරව් වුණු කරුණු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනවාරි මාසයේ 08 වැනි දාට පෙර අපි වේදිකාවේ යම් කරුණක් ගැන කිව්වා නම් ඊට වඩා බරපතළයි, ඇත්ත තත්ත්වය. හැබැයි, ඒ නිසා තමයි ඒ සඳහාම වූ විශේෂ අධිකරණ පද්ධතියක් පිහිටුවනවා කිව්වේ. දැන් ඒක අලුත් ව්‍යවස්ථාවට මුවා වෙන්න හෝ - ගරු මනෝ ගනේසන් ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. මම හිතන්නේ අලුත් ව්‍යවස්ථාවට මොකක්ද වෙන්නේ කියාත්, එහි කෙළවර කොහොම වෙයිද කියාත් අපි කාටත් යම් සංකල්පයක් තිබෙනවා. ඒ නිසා අලුත් ව්‍යවස්ථාවට මුවා වීම හෝ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට මුවා වීම හෝ නොවෙයි කළ යුත්තේ. මේ වංචා, දූෂණ පිළිබඳව විශේෂ අධිකරණ පද්ධතියක් පිහිටුවා මේ හමාර කොට තිබෙන පරීක්ෂණ වේගවත්ව අධිකරණයට ඉදිරිපත් කොට දඬුවම් ලබා දිය යුතුයි. එසේ කෙළවර කරන්නේ නැතුව මේවා නිකම් නාටකයන් බවට පත්වීමෙන් කෙළවර වීමේ තත්ත්වයක් තමයි, දැන් මතු වෙලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, ඒ නිසා දෙවැනි කරුණ හැටියට මම ඒ කරුණ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරනවා. තමුන්නාන්සේලා මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් කරන ලද පරිදි වංචා සිදු කරන ලද දූෂිතයන්ට දඬුවම් ලබා දීම සඳහා විශේෂ අධිකරණ පද්ධතියක් පිහිටු විය යුතුයි. මට හිතෙන විධියට වර්තමානයේ සිටින සමහර අමාත්‍යවරුන්ගේ ක්‍රියා කලාපයනුත් ඒක හකුළන්න හේතු සාධක වෙනවාද දන්නේ නැහැ. "මේ අධිකරණ පද්ධතියට ගියොත් මාර වැඩක් වෙන්නේ කියා" සැලකිල්ලක් කරනවාද දන්නේත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ හැරුණු කොට මේ වංචා, දූෂණ පිළිබඳව විශේෂ අධිකරණ පද්ධතියක් පිහිටුවීම අත් හැරීමට කිසිදු හේතුවක් නැහැ. ඒ නිසා එය කළ යුතුයි කියන එක තමයි, දෙවැනි යෝජනාව වන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වැනි යෝජනාව තමයි, -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අධිකරණ පද්ධතිය පිහිටුවීමේදී - දැන් පවතින ඒවා හෝ අනාගතයේ පිහිටුවන ඒවා- 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාමුවට පිටින් කටයුතු කරන්න බැහැ. අපේ රටේ අධිකරණ පද්ධතිය ඇති කිරීමේ ක්‍රමවේදය පිළිබඳව ජනතාවගේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය තුළ සඳහන් කර තිබෙනවා. පසු ගිය රජය පැවති කාලයේ සිදු වුණු අපරාධ කියා -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, අපි දහවල් 12.30ට දිවා ආහාරය සඳහා සභාවේ කටයුතු නතර කරන්න තිබෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

හොඳයි. සමාවෙන්න. මම කෙටියෙන් සඳහන් කරන්නම්. පසු ගිය රජය කාලයේ සිදු වුණු අපරාධවලින් තෝරා ගත් ප්‍රමාණයක් වෙනත් අධිකරණයක අහන්න ඕනෑය, අනෙක් නඩු තවත් අධිකරණයක අහන්න ඕනෑය කියා විෂම අධිකරණ ක්‍රමයක් හැදීමේ ක්‍රමවේදයක් සඳහා අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට ඉඩ දීලා නැහැ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

තිබෙන එකේම කරන්න ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

තිබෙන එකේම වෙන් කරලා කරන්න පුළුවන්. විශේෂ අධිකරණ දෙක, තුනක් නම් කරලා ඒ නඩු සඳහාම යන්න පුළුවන්. ඒ එකක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන කිව්වේ මම නොවෙයි. මෙතුමන්ලාම තමයි, මේ ගැන මැතිවරණ ප්‍රකාශයට ලිව්වේ. මම දන්නේ නැහැ, මැතිවරණ ප්‍රකාශනයේ අධිකරණයට අයත් කොටස ලියන්න ඔබතුමා දායක වුණාද, නැද්ද කියලා. ඔබතුමාම ලියපු එක තමයි මම මේ කියන්නේ. ඔබතුමා ඒක ලියනකොටත් 1977 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තමයි තිබුණේ. මොකද, ගිය අවුරුද්දේ ජනවාරි 8වැනිදා කියන්නේ 1977ට කලින් දවසක් නොවෙයි නේ. 2015 ජනවාරි මාසේ 8වැනිදා නේ මේක ලිව්වේ. එහෙනම් 1977ට පස්සේ තමයි මේක ලියලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් මේක ලියන කොටම මුළාවක්, බොරුවක් බව දැනගෙන තමයි ලියන්න ඕනෑකම තිබෙන්නේ.

[ගරු අනුර දිසානායක මහතා]

ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමනි, ඊළඟ ඔබතුමා කිව්ව එක. විශේෂ ලෙස වෙන් කරන ලද අධිකරණ කිහිපයක් මේ වෙනුවෙන් නම් කරන්න පුළුවන්. අපි යාපනයේ විද්‍යා දැරියගේ ඝාතනය පිළිබඳව ප්‍රශ්න කළාට පස්සේ මට මතකයි, මේ පාර්ලිමේන්තුවේදීම ඔබතුමා ප්‍රකාශ කළා, විද්‍යා දැරියගේ ඝාතනය පිළිබඳව විශේෂ අධිකරණයක් හරහා මේ ප්‍රශ්නය විභාගයට ලක් කරනවා කියලා. ඒක විශේෂ කටයුත්තක් ලෙස සලකා එයට මැදිහත් වෙනවාය කියන ප්‍රකාශය ඔබතුමා මේ පාර්ලිමේන්තුවේදී කළා. [බාධා කිරීමක්] හරි, විශේෂ අධිකරණයක් ඇති කරනවා කියලා කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි කරුණට ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. අපේ අධිකරණ පද්ධතිය දේශපාලනයට මැදිහත් වෙලා නැහැ කියලා කිව්වාට අපි කවුරුත් දන්නවා, පසු ගිය දෝෂාභියෝගය වෙලාවේදී අපේ රටේ අධිකරණ පද්ධතියේ විශාල බෙදීමක් ඇති වුණු බව. මීට පෙර ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ ප්‍රශ්න පිළිබඳව පාර්ලිමේන්තුවේ බෙදීම් ඇතිවෙලා තිබෙනවා. ජනතාව අතර විවිධ මත ඇති වෙලා තිබෙනවා. නීතිඥ සංගම් අතර විවිධ මත ඇති වෙලා තිබෙනවා. හැබැයි, ලංකාවේ පළමුවැනි වතාවට අධිකරණ විනිසුරුවන් අතර බෙදීමක් ඇති වුණා, ශිරානි බණ්ඩාරනායක හිටපු අග්‍රවිනිශ්චයකාරතුමියට එරෙහිව දෝෂාභියෝගයක් ගෙනාපු වේලාවේදී. ඒ දෝෂාභියෝගය අවස්ථාවේදී පැහැදිලි බෙදීමක් අපේ අධිකරණ විනිසුරුතුමන්ලා අතර ඇති වුණා. හැබැයි, මොකක්ද වුණේ? ආණ්ඩුව දෝෂාභියෝගය ජයග්‍රහණය කළාට පස්සේ ශිරානි බණ්ඩාරනායක මැතිනිය අග්‍රවිනිශ්චයකාර තනතුරින් නෙරපා හැරලා, එම පුටුවේ මොහාන් පීරිස් මහත්මයා අග්‍රවිනිශ්චයකාරවරයා ලෙස වාඩි වුණාට පසුව අන්න අර බෙදීම තීරණය කරලා විනිසුරුවරුන් මාරු කරන්න පටන් ගත්තා. ඒ නිසා ලංකාවේ මෑත කාලයේ පළමුවැනි වතාවට අධිකරණ පද්ධතිය දේශපාලනයට ලක් කරලා, දේශපාලන වුවමනාවන් මත අධිකරණ විනිසුරුවරුන්ගේ බෙදීමක් ඇති කරලා, විනිසුරුවරුන් තැන තැන මාරු කරන්න පටන් ගත්තා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට උදාහරණයක් කියන්නම්. කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් වශයෙන් කටයුතු කළ රෂ්මී සිංගප්පුලි මහතා ඉවත් කරලා, වෙනත් විනිසුරුවරයෙක් එතැනට පත් කළා. ඒ විතරක් නොවෙයි, කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ එවකට සිටි ටී. රණසිංහ විනිසුරුතුමා හා නිශාන්ත පීරිස් විනිසුරුතුමා හැර සියලුම අතිරේක මහෙස්ත්‍රාත්වරු ඈත ප්‍රදේශවලට ස්ථාන මාරු කළා. ඒ වාගේම දෝෂාභියෝගයේදී පක්ෂපාතීව කටයුතු කරපු විනිසුරුවරුන් කොළඹ අවට අධිකරණ පද්ධතිවලට ගෙනාවා. පසු ගිය කාලයේ එහෙම තමයි කටයුතු කළේ. ඒ නිසා අදත් එදා අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් පෙනී සිටි විනිසුරුවන් ගණනාවක් දුර ඈත පළාත්වල නඩු නැති අධිකරණවලට මාරු කරලා, වැඩ නැති අධිකරණවලට මාරු කරලා, දුෂ්කර පළාත්වලට මාරු කරලා දඩයමේ යෙදෙමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ දඩයම සඳහා උපයෝගී කර ගන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට අධිකරණ සේවා කොමිෂන් සභාවට මැදිහත්වීමට බලයක් නැතත්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ක්‍රියා කලාපය පිළිබඳව අපි මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්න ඕනෑකම තිබෙනවා. මෙම ස්ථාන මාරුවීම් සිදු කිරීම මඟින් ආන්දෝලනාත්මක දෝෂාභියෝග ක්‍රියාවලියේ එවකට පැවති රජයට පක්ෂව ක්‍රියා කළ විනිසුරුවරුන්ට වැදගත් ස්ථාන ලබාදීමටත්, අනෙක් විනිසුරුවරුන්ට වෙනස් කොට සැලකීමටත්, කළුතර හා මාළිගාකන්ද අධිකරණවලදී අල්ලස් ලබා ගත් බවට චෝදනා ලබන අය කොළඹ දිසා අධිකරණයේ ඉතා වැදගත් අධිකරණය වන ආදායම් බදු විභාග කරන අධිකරණයට පත් කළා. අධිකරණ සේවා කොමිෂන් සභාව අධිකරණ නිලධාරීන්ගේ සංගමය හා ක්‍රියාත්මක කිරීමට එකඟ වූ අධිකරණ නිලධාරීන්ගේ ස්ථාන මාරු කිරීමේ ප්‍රතිපත්තිය අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝජ්‍ය ලේකම්ගේ මැදිහත්වීම මත දැන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. විනිසුරුවරුන් එක්ක එකතු වෙලා අපි ප්‍රතිපත්තියක් හැදුවා.

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, එතුමන්ලා වෙනුවෙන් මා එහි පිටපතක් ඔබතුමාටත් බාර දුන්නා; අගමැතිතුමාටත් බාර දුන්නා. නමුත් තවමත් ඒ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැහෙන්නේ නැහැ. අත්තනෝමතිකව හා ඔහුගේ කැමැත්ත හා ප්‍රසාදය පරිදි විනිසුරුවරුන් ස්ථානගත කිරීම සඳහා ක්‍රියාත්මක නොකිරීමෙන් ජ්‍යෙෂ්ඨ සහ ස්වාධීන විනිසුරුවරුන් කලකිරීමෙන් අතෘප්තියට හා අසහනයට පත්ව තිබෙනවා. අධිකරණ සේවය හා වෙනත් දේශපාලන සබඳතා ඇති විනිසුරුවරුන්ට සහ සබඳතා නොමැති විනිසුරුවරුන්ට වෙනස් කොට සැලකීමේ උදාහරණ ඕනෑ තරම් තිබෙනවා. සුප්‍රසිද්ධ අලි මං කොල්ලයේදී දේශපාලන හිතවත්කම් හා වෙනත් සබඳතා තිබෙන අයට අධිකරණ සේවා කොමිෂන් සභාව සලකන විධිය අපි දන්නවා. එම සිද්ධිය ඉතා බරපතළ වරදක්ව තිබියදී ඔහු සම්බන්ධයෙන් දැඩි ආන්දෝලනාත්මක හා දැඩි විරෝධයක් තිබියදී පවා අධිකරණ සේවා කොමිෂන් සභාව නිහඬව සිටියා.

මේ රටේ මතයක් ගොඩනැඟිලා තිබෙනවා, විනිසුරුවරයෙක් අලියෙක් සොරකම් කරලා, ඔහු අධිකරණයට පැමිණීම මහහරිනවා, අධිකරණයෙන් පැනලා යනවා, අධිකරණයට මුහුණ දෙන්නේ නැතිව හැංගිලා ඉන්නවා කියලා. මේ විනිසුරුවරයා පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාව ගත්ත ක්‍රියා මාර්ගය මොකක්ද? සැලකිය යුතු කාලයක් ගත්තා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පිළිබඳව තීරණයක් ගන්න. හැබැයි, අධිකරණ සේවා කොමිෂන් සභාව ඊට හාත්පසින්ම වෙනත් සිද්ධියකදී ඉතා කඩිමුඩියේ වහා ක්‍රියාත්මක වී විනිසුරුවරුන් මාරු කළා. එවැනි සිදුවීම් මා දන්නවා. වෙනත් සිද්ධිවලදී නීතිය ක්‍රියාත්මක කිරීම වේගවත් වෙනවා. අනෙක් සිද්ධිවලදී ඔවුන්ගේ නීතිය ක්‍රියාත්මක වීමේ වේගය අඩාළ වෙනවා. ඇයි ඒ? තමන්ගේ හිතවත්කම් මත, තමන්ගේ වුවමනාකම් මත තමයි මේ දඬුවම් දීමේ සහ මාරු කිරීමේ ක්‍රියාවලියට අවතීර්ණ වෙලා තිබෙන්නේ. අධිකරණ නිලධාරීන් අධිකරණ සේවයට නොගැළපෙන ආකාරයෙන් හැසිරීම හා තම වෘත්තියට නොගැළපෙන ආකාරයෙන් සම්බන්ධතා පවත්වා ගෙන යන අවස්ථාවලදී කිසිදු පියවරක් ගත්තේ නැහැ.

තවද, වෙනත් රටවල සේවය සඳහා විදේශ නිවාඩු ලබා ගැනීමේදී විවිධ ආකාරයෙන් සලකනවා. සමහර අය අධිකරණයේ පත් වීම ගත් විගසම ඒ ගොල්ලන් විදෙස් රටවලට යවලා තිබෙනවා. සමහර අය විදෙස් කාර්යයක් වෙනුවෙන් කියලා කොච්චර කාලයක් ඉල්ලුවත් ඔවුන්ට නිවාඩු ලබා දෙන්නේ නැහැ. ඒ නිසා අධිකරණ සේවා කොමිෂන් සභාව, අද අපේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ ස්වාධීනත්වයට බාධා කරනම ආයතනය බවට පත් වී තිබෙනවා.

අධිකරණ සේවා කොමිෂන් සභාවට මාරු කිරීම්, උසස් කිරීම්, නිවාඩු, විනයානුකූල ක්‍රියා මාර්ග පැවරුවේ මොකක් නිසාද? ඒ, ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙනුයි. හැබැයි, ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් ගොඩ නඟන ලද ආයතන විසින්ම තමයි එහි ස්වාධීනත්වය විනාශ කරලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය මේ කාරණය කෙරෙහි යොමු

කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව ඔබතුමා මීට වඩා වැඩි මැදිහත් වීමක් කරන්න ඕනෑ. හැබැයි, ඔබතුමාට ඒ සඳහා බලය නැති බවත් මම දන්නවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඒ ඉල්ලීම කරපු කාරණය සම්බන්ධයෙන් මට කටයුතු කරන්න බලයක් තිබෙනවා නම් මම හුඟක් කැමැත්තෙන්ම ඒ කටයුත්ත කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

ඒක හරි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

නමුත් එය ස්වාධීන ආයතනයක් නිසා දේශපාලනඥයින් විධියට, ඇමතිවරු විධියට අපට ඒ පිළිබඳව මැදිහත් වීමක් කරන්න කිසිම අයිතියක් හෝ හැකියාවක් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

ඒ නිසාම තමයි මම මේ කථාව මෙතැන කරන්නේ. ඒ මොකද දන්නවාද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මේ පාර්ලිමේන්තුවේදී අපි ස්වාධීනත්වයන් පිළිබඳව කථා කරනවා. මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය, වැදගත්ම ස්වාධීනත්වයක් ලෙස අපි සලකනවා. ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් තමයි ස්වාධීන අධිකරණ සේවා කොමිෂන් සභාව ගොඩ නැඟුවේ. ඒ, ඇමතිවරයාට බලය නොදී, පාර්ලිමේන්තුවට බලය නොදී, ජනාධිපතිවරයාට, කැබිනට් මණ්ඩලයට බලය නොදී. අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරමාර්ථයම තමයි, අධිකරණ සේවාව ස්වාධීනව පවත්වාගෙන යෑම. හැබැයි, අද මොකක්ද සිදුවෙලා තිබෙන්නේ? ඒ අරමුණ වෙනුවෙන් ගොඩ නහන ලද අධිකරණ සේවා කොමිෂන් සභාවම තමයි අද අධිකරණයේ ස්වාධීනත්වයට බරපතළ හානිකර තත්ත්වයක් ඇති කරලා තිබෙන්නේ. ඒ නිසා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ක්‍රියා කලාපයට එරෙහිව මේ පාර්ලිමේන්තුව ප්‍රබල හඬක් නැඟිය යුතුව තිබෙනවා. [බාධා කිරීමක්] මා මට ලැබී ඇති වෙලාව බලමින් තමයි කථා කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟට මා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි, විශේෂයෙන්ම එල්ටීටීඊ රැඳවියන් පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන්. තවමත් එල්ටීටීඊ රැඳවියන් 150කට ආසන්න පිරිසක් බන්ධනාගාරවල ඉන්නවා. ඉන් සමහර අය අනුරාධපුර බන්ධනාගාරයේ ඉන්නවා. අනික් අය, -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

101ක්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

101කට ආසන්න පිරිසක් බන්ධනාගාරවල ඉන්නවා. "කදිර්ගාමර්" ඝාතනය වැනි ලොකු නඩු තමයි ඒ ගොල්ලන්ට පෙන්වන්නේ. එක් කෙනෙක් "කදිර්ගාමර්" ඝාතනයේ වග උත්තරකරු හැටියට ඉන්නවා මම දැක්කා. හැබැයි, සිදුවෙලා තිබෙන්නේ මොකක්ද? ඔහු සාමාන්‍ය දෙමළ පුද්ගලයෙක්. ඔහු ඒ පළාතේ ගස්වල අතු සුද්ද කරනවා. ලක්ෂ්මන් කදිර්ගාමර් ඇමතිතුමා ඝාතනය කරපු දවසේ එතුමාගේ bathroom එක අසල ගහක අත්තක් කැපුවාය කියලා ඔහු අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඔහු අත්ත කපන්නේ ඒකට නොවෙයි. හැබැයි, ඔහු තවම අත් අඩංගුවේ. දැන් අවුරුදු 14කට ආසන්න කාලයක් ගත වෙමින් තිබෙනවා. හැබැයි, නඩුව ගත්තොත් කදිර්ගාමර් ඝාතනය. නමුත් සිදුවෙලා තිබෙන්නේ මොකක්ද? ගස්වල අතු සුද්ද කරන කෙනා එතැන තිබුණු ගහක අත්ත කපපු එකයි සිදු වෙලා තිබෙන්නේ. මොහු අත් අඩංගුවට ගත්තේ කදිර්ගාමර් ඝාතනයේ සැකකරුවා හැටියටයි. හැබැයි, ඔහුට "සැකකරුවා" කියලා කියන්නේ තුවක්කු අරගෙන ඇවිල්ලා වෙඩි තියලා හෝ ඔත්තු බලලා හෝ නොවෙයි. ගෙදර අවට තිබෙන වත්ත සුද්ද කරන කොට ඔහු ඒ ගහේ අත්ත කපපු නිසයි ඔහුට "සැකකරුවා" කියලා කියන්නේ. හැබැයි, ඒ ගොල්ලන්ට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ ගොල්ලන් තවම බන්ධනාගාර ඇතුළේ ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනකොට අවුරුදු 15ක්, 16ක් ගතවෙලා තිබෙනවා. ඒ ගොල්ලන් කොහෙන් හෝ දුරකථනයක් හොයාගෙන බන්ධනාගාරයේ ඉඳගෙන අපට නිතරම කථා කරනවා. ඒ ගොල්ලන් එක දුක්ගැනවිල්ලයි කියන්නේ. ඒ, ඒ ගොල්ලන්ගේ පවුල් විනාශයට පත්වෙලා, දරුවන් විනාශයට පත්වෙලා සිටිනවාය කියලායි. විශේෂයෙන්ම යාපනයේ සැලකිය යුතු ප්‍රමාණයකින් අපරාධ ක්‍රම වර්ධනය වෙමින් පවතින තත්ත්වයක් තිබෙනවා. බිරිඳ අනාරක්ෂිතයි; දරුවන් අනාරක්ෂිතයි; ආදායම් මාර්ගයක් නැහැ. ඒ නිසා විශාල දුක්ගැනවිල්ලක් තිබෙනවා. ඒ නිසා ඔබතුමා මේ පිළිබඳව තවත් වැඩි සැලකිල්ලක් දක්වලා, ඒ පිළිබඳව ක්‍රියාමාර්ගයක් ගනීවි කියලා මා විශ්වාස කරනවා. විශේෂයෙන්ම මේ අය remand බාරයේ ඉන්න අය. ඒ ගොල්ලන්ට අඩුවු කරනවා නම් අඩුවු කරන්න; ඔවුන්ගේ නඩු අවසන් කරනවා නම් ඒ නඩු අවසන් කරන්න. ඔබතුමා ඒ කෙරෙහි දක්වන සැලකිල්ල හොඳයි. ඔබතුමා වෙනම අධිකරණයක් පිහිටුවලා ඒ සඳහා මැදිහත් වීමට දායකත්වය සපයලා තිබෙනවා. හැබැයි, දැන් සිදු වෙලා තිබෙන දේ මේකයි. කලින් ඒ ගොල්ලන්ට නඩු ආවේ මාස දෙකකට විතර සැරයක්. දැන් මාසයකට දෙපාරක් විතර නඩු එනවා. දැන් නීතිඥයන්ට දෙපාරක් සල්ලි දෙන්න ඕනෑ. දැන් ඒ ගොල්ලන් ඉන්නේ බන්ධනාගාර ඇතුළේ. හැබැයි, සති දෙකකට සල්ලි හොයා ගන්න ඕනෑ. මොකද, ඔබතුමා ඒ සඳහාම වූ අධිකරණයක් පිහිටුවලා තිබෙන නිසා ඒ අධිකරණයේ වේගයෙන් නඩු අහනවා. ඒක හොඳයි. හැබැයි, දැන් අර පුද්ගලයාට මොකද වෙලා තිබෙන්නේ? මාසයට දෙපාරක් විතර අධිකරණයට යන්න ඕනෑ; දෙපාරක් නීතිඥ ගාස්තු හොයා ගන්න ඕනෑ. නීතිඥ ගාස්තු හොයා ගන්න නැති නිසා අද ඒ ගොල්ලන්ට සමහර නඩුවලට මුහුණ දෙන්න බැරිවෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය මා යොමු කරනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා සඳහන් කළානේ ත්‍රස්තවාදී කටයුතු පිළිබඳව වෙනම මහාධිකරණයක් ඇති කරන්න ඕනෑය කියලා. එහෙනම් ඒ තර්කයම මේකට ගන්න පුළුවන්නේ. දූෂණය ගැනත් හොයන්න වෙනම මහාධිකරණයක් පිහිටුවන්න. මහාධිකරණ එකක්, දෙකක්, තුනක්. මේ රටේ මිනිස්සු අධිකරණය ගැන ප්‍රශ්න කරන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

අනිවාර්යයෙන්ම. එතකොට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට බාධා වෙන්නේත් නැහැ.

[ගරු අනුර දිසානායක මහතා]

ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා මෙවර මානව හිමිකම් කවුන්සිලය හමුවේදී hybrid අධිකරණය පිළිබඳව එකඟතාවකට ආවාද, දැන් අපට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව එවැනි අධිකරණයක් පිහිටුවීමට හැකියාවක් තිබෙනවාද, විදෙස් රටවල විනිසුරුවන් පත්කොට අපේ රටේ නඩු විභාගයට ලක් කරන්න පුළුවන්ද කියන හතරවැනි කාරණය පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කර වන්න කැමැතියි. මොකද, ඒ එවැනි එකඟතාවක් තිබෙන නිසයි; එවැනි යෝජනාවක් තිබෙන නිසයි. ඒ යෝජනා කරන අයට අපි කියන්න ඕනෑ, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මේක කරන්න බැහැයි කියලා. එක්කෝ ඒක අවසන් කරන්න ඕනෑ. එහෙම නැතිව අපි "හා" කියනවා, ආපසු "බැහැ" කියනවා, ආපසු පුළුවන්ද කියලා බලනවා. එහෙම කරන්නේ නැතිව මේක කරන්න පුළුවන්ද, බැරිද කියලා ශ්‍රී ලංකා ආණ්ඩුව හැටියට ඒ අදාළ ආයතනවලින් අහන්න ඕනෑ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව එවැනි වෙනත් රටවල විනිසුරුවන් සහිතව නඩු අහන්න පුළුවන්ද, බැරිද කියන එක ගැන ආණ්ඩුවක් හැටියට නිශ්චිත පිළිතුරක් ලබා දිය යුතුය කියන කාරණය යෝජනා කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ අවස්ථාවේ දිවා ආහාරය සඳහා අ.භා. 1.30 දක්වා සභාවේ කටයුතු අත්හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා (ගරු ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා)ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] *தலைமை வகித்தார்கள்.*

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *in the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Ajith P. Perera.

[අ.භා. 1.30]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විවාදයේ, මෙම අවස්ථාවේ කථා කරන්නට ලැබීම මට ලැබුණු වටිනා අවස්ථාවක් වශයෙන් මා සලකනවා.

දූෂණ හා සම්බන්ධ නඩු කටයුතු ඉක්මනින් අවසන් කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව ගරු අධිකරණ අමාත්‍යතුමාත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාත් අතර පුළුල් සාකච්ඡාවක් ඇති වුණා. මොකද, දූෂණ චෝදනාවලට ලක් වී ඇති තැනැත්තන්ට ඇති එකම අරමුණ තමයි, තමන්ට එරෙහිව තිබෙන නඩු කටයුතු හැකි තරම් ප්‍රමාද කර ගන්න එක. සාමාන්‍යයෙන් හැම අපරාධකාරයාම හිතන්නේ එහෙමයි. නීතිඥවරුන් වශයෙන් පෙනී සිටීම නිසා ඒ ගැන අපට පළපුරුද්ද තිබෙනවා. එවැනි කාරණාවලදී ඉතාම කලාතුරකින් අවස්ථාවක් හැරෙන්න සාමාන්‍යයෙන් නඩුව කල් ඇද ගන්න තමයි අපරාධකරුවෝ කල්පනා කරන්නේ. එවැනි වෙලාවක පුරවැසියන් විධියට, පුරවැසියන්ගේ නියෝජිතයන් විධියට, ආණ්ඩුව විධියට අපට තිබෙන වගකීම තමයි, අපට ලැබුණු ජනවරමත් සමඟ කල්පනා කරලා, සීමා සහිත කාලයකදී කොහොමද මේ නඩු කටයුතු කාර්යක්ෂමව, සාධාරණ විභාගයකට ලක් කරන්නේ කියන එක සොයා බලා, ඒ සඳහා අවස්ථාව සලසන එක. අනවශ්‍ය ලෙස ඉක්මන් වුණු, යුක්තියට පටහැනි වූ ක්‍රියා දාමයන් සිදු කළ යුතු නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගරු සභාවේ මතු වුණු අදහස තමයි දූෂණ විරෝධී - anti-corruption - ක්‍රියා දාමයක් වෙනුවෙන් වූ අපේ ආණ්ඩුවේ කැපවීම පෙන්නුම් කිරීම උදෙසා රජය හැටියට යම් ක්‍රියා දාමයක් යෝජනා කරන්න අපට හැකි වන්නට ඕනෑය කියන එක. දූෂණ හා සම්බන්ධව ඇති අධි චෝදනා විභාග කිරීම උදෙසා දැනට තිබෙන මහාධිකරණ - ඒ කියන්නේ අලුතින් අධිකරණ පද්ධතියක් ගොඩනැඟීම නොවෙයි.- අතරින් කිහිපයක් වෙන් කරලා, ඒ එක් එක් අධිකරණයට trial-at-bar ක්‍රමයට, මහාධිකරණ විනිශ්චයකාරවරු තිදෙනෙකුගෙන් යුතු වූ විනිශ්චයකාර මණ්ඩලයක් මඟින් නඩු විභාග කිරීම සඳහා වූ, අපි දැනටමත් අත් දැක තිබෙන කාර්යක්ෂම ක්‍රියාදාමය භාවිත කරන්න පුළුවන්. ඒ වාගේම ඒ එක් එක් නඩුව තෝරා ගැනීම වෙනුවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් චෝදනා ගොනු කළ, ඒ වාගේම මූල්‍ය අපරාධ ඒකකයෙන් චෝදනා ගොනු කළ නඩු පිළිබඳව -එවැනි අධි චෝදනා 10ක් පමණ දැනටමත් තිබෙනවා.- ඒ අධි චෝදනා මේ අධිකරණවල විභාග කරන්න පටන් ගන්න පුළුවන්. ඒ අතර තුර දැනට තිබෙන පරීක්ෂණ අවසන් වෙලා අධි චෝදනා ගොනු වෙයි. ඒ වාගේම දැනට නීතිපති ළඟ තිබෙන අධි චෝදනා ගොනු කිරීමට හැකි නඩුවලට අදාළව අධි චෝදනා ඉදිරියට එයි.

ගරු අධිකරණ ඇමතිතුමා මේ ක්ෂේත්‍රයේ බොහොම පළපුරුදු කීර්තිමත් ජනාධිපති නීතිඥවරයෙක් හැටියට සිවිල් සහ අපරාධ කියන දෙවර්ගයේම නඩුවලට පෙනී සිටි, බොහොම ප්‍රායෝගික පළපුරුද්දක් තිබෙන දේශපාලන නායකයකු වශයෙන්, ඒ වාගේම යහපාලන ක්‍රියා දාමය තුළ පුරෝගාමීව කටයුතු කළ නායකයකු වශයෙන් මේ දූෂණ නඩු ඉක්මනින් විභාග කොට අවසන් කරන්නේ කොහොමද කියන එක කාරුණිකව සලකා බලන්නය කියන එකයි, මගේ යෝජනාව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ අනෙක් යෝජනාව මහාධිකරණ පද්ධතියේ අධිකරණ තුනක් හෝ හතරක් මහාධිකරණ විනිශ්චයකාරවරු තුන්දෙනකුගෙන් යුක්තව, trial-at -bar ආකාරයට, මෙම නඩු සඳහාම වෙන් කරන්නය කියන එකයි. ත්‍රස්තවාදී වැරදි විභාග කිරීමට වෙනම High Court එකක් හැදුවා නම්, 'ළමා අපචාර', 'tax නඩු' විභාග කරන්න අපි වෙනමම උසාවි වෙන් කර තිබෙනවා නම්, ඒ මූලධර්මයම අල්ලස හා දූෂණයට අදාළව භාවිත කිරීමට කිසිම බාධාවක් නැහැ. එම ක්‍රියා දාමය සඳහා මේ රටේ කිසිම පුරවැසියෙක් විරුද්ධ වෙයි කියලා මම හිතන්නේ නැහැ. හැබැයි, මම නැවත කියනවා, සාධාරණ නඩු විභාගයක් සඳහා වූ ක්‍රියා දාමය සනාථ කරන්න අවශ්‍යයි; ඒ, කැලේ නීතිය ක්‍රියාත්මක කරන්න නොවෙයි කියන කාරණය. ඒ නිසා ඒ වැදගත් අදහස් සනාථ කිරීමට මම කැමැතියි.

දෙවන කාරණය තමයි, සමථ මණ්ඩල පනතට කෙරුණු සංශෝධන. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉදිරිපත් කරන සංශෝධනය ඉතාමත් ප්‍රායෝගික, මේ කාලයට ගැළපෙන

සංශෝධනයක් කියලා මා දකිනවා. ආරාවුලක මූල්‍ය වටිනාකම රුපියල් 25,000 සිට රුපියල් 2,50,000 දක්වා වැඩි කිරීම සඳහා මීට කලින් ඉදිරිපත් කළ සංශෝධනය පිළිබඳව සාකච්ඡා වූ උපදේශක කාරක සභාවට මමත් සම්බන්ධ වුණා; දායක වුණා. මේ සීමාව කාලයට ගැළපෙන පරිදි රුපියල් 2,50,000 සිට රුපියල් 5,00,000 දක්වා වැඩි කිරීම සඳහා ඉදිරිපත් කරන මේ සංශෝධනද මා නැවත අනුමත කරනවා.

මේ රටේ සමථ මණ්ඩල ක්‍රියාදාමය සිවිල් සහ අපරාධ ක්ෂේත්‍ර දෙකටම අදාළව ඉතාම සාර්ථකව ක්‍රියාත්මක වනවා. සංඛ්‍යා ලේඛන අනුව පෙනෙනවා, සමථ මණ්ඩලයට ඉදිරිපත් වන ආරාවුල්වලින් සියයට 60කට වැඩි ප්‍රමාණයක් සමථ මණ්ඩලය තුළ නිරවුල්ව නිරාකරණය වෙලා අවසන් වනවාය කියලා. එහි ප්‍රතිඵලය පුරවැසියාට ලැබෙනවා. මොකද, සමථය -සමාදානය- තමයි ආරාවුලක් විසඳා ගැනීම සඳහා තිබෙන හොඳම ක්‍රමවේදය. නඩු තීන්දුවක් ලබා ගැනීම කියන්නේ අවසානයටම යා යුතු පියවරයි.

විශේෂයෙන්ම සුළු අපරාධ සහ සිවිල් කාරණා පිළිබඳව මේ ක්‍රියාවලිය සාර්ථකයි. මේ ක්‍රියාවලිය දීර්ඝ කාලයක් තිස්සේ ලංකාවේ ක්‍රියාත්මක වනවා. අධිකරණයන්හි නඩු කටයුතුවල ප්‍රමාදය වැළැක්වීමට මේ හරහා විශාල සහායක් ලැබී තිබෙනවා. නඩු කටයුතුවලට අදාළව රජය දරන වියදම අඩු වෙලා තිබෙනවා. ඒ නිසා සමථ මණ්ඩල තවත් ශක්තිමත් කළ යුතුයි. සමථ මණ්ඩල ශක්තිමත් කිරීම සඳහා ගත යුතු ප්‍රායෝගික ක්‍රියා මාර්ගයක් තිබෙනවා.

අපේ ඩිලාන් පෙරේරා අමාත්‍යතුමා විෂය භාර අමාත්‍යවරයා වශයෙන් කාලයක් කටයුතු කළා. ගරු ඇමතිතුමනි, අද අපේ ගම්වල සමථ මණ්ඩලය සම්පූර්ණයෙන්ම -සියයට 100ක්ම- ක්‍රියාත්මක වන්නේ ස්වේච්ඡා පදනමකිනුයි. සමථ මණ්ඩලය පත්කිරීම රජයෙන් සිදු කළාට ඒ මුළු ක්‍රියාදාමයම ස්වේච්ඡාමය ස්වභාවයක් දරනවා. අපේ යෝජනාව තමයි, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම, සෑම සමථ මූල මණ්ඩලයටම රජය විසින් පවත්වාගෙන යන සමථ මණ්ඩල කාර්යාලයක් අවශ්‍යයි කියන එක. ඒ සඳහා වෙන් වූ ලිපිකරුවකු හෝ ලිපිකරුවන් දෙදෙනකු සහ ලේකම්වරයකු ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව සිටිය යුතුයි. සමථ මණ්ඩලයට අදාළව පැමිණිල්ලක් භාර දෙන්න අවශ්‍ය වුණාම අද තිබෙන ලොකුම ගැටලුව තමයි, සමථ මණ්ඩලයේ සභාපති ධුරය දරන මහත්මයා හෝ ස්වාමීන් වහන්සේ හෝ පියතුමා හෝ කවුරු හෝ ඒ ප්‍රභූවරයාව සොයා ගැනීම. ගෙදරට ගිහින් තමයි පැමිණිල්ල භාර දෙන්න ඕනෑ. ඒක සුදුසු දෙයක් නොවෙයි. මිනිසුන් බැරිමරගාතේ කෙසේ හෝ ඒක කරනවා. පොලීසිය විසින් ඒ ආරාවුල යොමු කරන කොට පොලීසියෙන් එහෙම කරනවා. නමුත් විශේෂයෙන්ම පෞද්ගලිකව සමථ මණ්ඩලයට පැමිණිල්ලක් ඉදිරිපත් කරන විට ඒ පැමිණිල්ල භාර දිය යුතු තැන දන්නේත් නැහැ; භාර ගන්න කෙනකුත් නැහැ. ඒ සම්බන්ධයෙන් නිසි ලෙස පවත්වාගෙන යන කාර්යාල ක්‍රියාවලියක් ඇත්තේත් නැහැ. සමහර අවස්ථාවලදී විශේෂයෙන්ම සිවිල් නඩු කටයුතුවලදී, මේ ප්‍රශ්නය සමථ මණ්ඩලයට ඉදිරිපත් වුණාද, විමසුවාද කියන ප්‍රශ්නය මතු වනවා. එවැනි අවස්ථාවකදී, ඒ සාකච්ඡාව ගැන සහතිකයක් දීමට නොව, එම පැමිණිල්ල සමථ මණ්ඩලයට යොමු වුණාද, නැද්ද කියන ප්‍රශ්නය විමසීමට කලාතුරකින් සාක්ෂිකරුවකු වශයෙන් කැඳවීමත් අවශ්‍ය වනවා. එවැනි අවස්ථාවලදී ඒ පැරණි ලේඛන ක්‍රමවත්ව පවත්වාගෙන ගොස් නොතිබීම ගැටලුවක් වනවා.

ඒ විතරක් නොවෙයි. සමථය වූ විට ඒ සමථ කොන්දේසි වාර්තා කිරීමත් ඉතාමත් අවිධිමත් ලෙසයි සිද්ධ වන්නේ. ඒ සඳහා ආකෘති පත්‍රයක් තිබෙනවා. සම්ප්‍රදානානුකූලව ඒ ආකෘති පත්‍රයේ තිබෙන්නේ ඉතාම සීමිත ඉඩකඩක්. පුළුල් සමථයක් වුණු අවස්ථාවලදී පේළි අතර, එක උඩ එක ලියන්න සිද්ධ වනවා. අතින් ලියපු දේවල් තමයි තිබෙන්නේ. සමථ මණ්ඩලවල යතුරු ලියනයක්, පරිගණකයක් භාවිත වන්නේ නැහැ. ඒ කටයුතු කරන්න පුළුවන් නිසි කාර්යාලයක් තිබෙනවාද? පිටපත් පවත්වාගෙන යෑමක් තිබෙනවාද? සාපේක්ෂව බැලුවොත්, මේ රටේ රාජ්‍ය සේවයේ නිලධාරීන් ඕනෑවටත් වැඩි ප්‍රමාණයක් ග්‍රාමීය මට්ටමේ ඉන්නවා. හැම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකටම අවම වශයෙන් නිලධාරීන් හතරදෙනෙක් ඉන්නවා. උපාධිධාරියකුත් ඒ හැම ගමකම ඉන්නවා. එවැනි තත්ත්වයක් තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වෙනම කාර්යාලයක් පවත්වාගෙන යෑම අත්‍යවශ්‍යයි. මේ කාරණය මීට කලින් යෝජනා වෙලා තිබෙනවා. ප්‍රතිපත්තියක් වශයෙන් අධිකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදී ඒ යෝජනාව සම්මත වෙලා තිබෙනවා. මේ සඳහා අවශ්‍ය වන්නේ පරිගණකයක්, කබඩ් එකක්, නිලධාරීන් දෙදෙනකු හෝ තුන්දෙනකු පමණයි.

එහෙම කළොත් මේ සමථ මණ්ඩලවල සමථකරුවන් විසින් ස්වේච්ඡාවෙන් කරන මේ වැඩ පිළිවෙළ වඩා ව්‍යක්තියමය ලෙස සහ පහසුවෙන් කර ගැනීමට අවස්ථාවක් ලැබෙනවා. මෙය ඉතාම වැදගත් වෙනවා. මේ සමථ මණ්ඩල නිසා මේ රටට, මේ රටේ අධිකරණ පද්ධතියට කෝටි ප්‍රකෝටි ගණනක් මුදල් ඉතිරි වෙලා තිබෙනවා. මිනිසුන් අතර ඇති වෙලා තිබෙන ඒ ප්‍රශ්න විසඳා ගැනීම උදෙසා, ඔවුන් අතර සමථය ඇති කිරීම උදෙසා පෞද්ගලිකව විශාල වශයෙන් කාලය කැප කරන ඒ සමථකරුවන්ට මගේ ප්‍රණාමය මේ අවස්ථාවේ පුද කරන්නට කැමතියි. හැබැයි, ඒ සමථකරුවන්ගේ ජීවිතය පහසු කරන්න, ඔවුන්ගේ රාජකාරිය, වග කීම, යුතුකම, සේවය පහසු කරන්න රජය මීට වඩා ආයෝජනය කළ යුතුයි. මෙතැන ගැටලුවක් තිබෙනවා. සමථ මණ්ඩල විෂයය අධිකරණ අමාත්‍යාංශයට අයිතියි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල අයිති වන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයටයි. ඔය දෙක අතර සටනකුත් තිබෙනවා. මීට කලින් ඔය ප්‍රශ්නය මතු වුණාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ අධිකරණ අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ වන සමථ මණ්ඩලයට අදාළ කාර්යාලයක් දෙන්නට පුළුවන්ද ආදී වශයෙන් අතිශය ප්‍රාථමික ප්‍රශ්න ඇහුවා. වෙනත් අමාත්‍යාංශවල කාර්යාල අනන්තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ කටයුතු කරනවා. සමථ මණ්ඩලයට කාර්යාලයක් සඳහා කාමරයක් දෙන්න බැහැයි කියනවා නම්, ඒක පසුගාමී අදහසක්.

සමථ මණ්ඩලවලින් වන කාර්යය අපි මතු පිටින් අගය කළාට ප්‍රමාණවත් නැහැ. සමථ මණ්ඩල ක්‍රියාදාමයට අවශ්‍ය කරන ආයෝජනය කරන්න ඕනෑ. ඒ වාගේම සමථකරුවෝ අද තමන්ගේ දැනුවත්කම, උගත්කම, කැප වීම, මනුෂ්‍යත්වය අනුව මේ ප්‍රශ්න විසඳුවාට ඔවුන්ට ලැබෙන පුහුණුව ඉතාම අවමයි. ඔවුන්ට ඒ පත්වීම් ලැබෙන විටත්, ඒ වාගේම ඔවුන්ගේ රාජකාරි කරගෙන යන අවස්ථාවේදීත් අඛණ්ඩ පුහුණුවීමකුත් ලබා දෙන්නට අවශ්‍යයි. මොකද, සමථකරණය කියන්නේ විද්‍යාත්මක විෂයයක්. සමථකරණය කියන්නේ ප්‍රායෝගික විෂයයක්. සමථකරණයට අදාළ තාක්ෂණික ක්‍රියාදාමයන් ලෝකයේ දියුණුවෙමින් තිබෙනවා. එම නිසා සමථකරණය මේ රටේ ආරවුල් විසඳීම පිළිබඳ ප්‍රධාන උපාය මාර්ගයක් වශයෙන් අප හඳුනා ගත යුතුයි. ඒ සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් කළ යුතුයි. ඒ සඳහා වූ අවම මූලික පියවරක් විධියට සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම සමථ මූල මණ්ඩලයේ ලේකම් කාර්යාලයක් පිහිටුවීමට පියවර ගත යුතුය කියා මම විශ්වාස කරනවා. ඒ සඳහා ඉදිරි අය වැයේදී මුදල් වෙන් කර ගෙන, ලබන වසරේදීවත් ඒ පිළිබඳව කටයුතු ක්‍රියාත්මක කරන්නය කියා මා යෝජනා කරනවා. මේක මගේ පමණක් හුදු අදහසක් නොවෙයි. මීට වසර දෙකකට හෝ තුනකට කලින් අධිකරණ උපදේශක කාරක සභාවේදී අනුමත වුණු අදහසක්. [බාධා කිරීමක්]

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව එක අදහසක් විතරක් කියන්නට තිබෙනවා. ඊයේ අපට ඉතා සතුටුදායක ආරංචියක් ආවා. ඒ තමයි ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඉතා ඉහළ ප්‍රමිතීන් සහිත රාජ්‍යයන්වල භාවිත කරන ඡායා කැබිනට්ටුව - Shadow Cabinet එක- පිළිබඳ තොරතුරක් අපට ලැබුණා. අපට ඉතාමත් සතුටුයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒකාබද්ධ විපක්ෂයේ නාමයෙන් දේශපාලනය කරන කණ්ඩායම ඊළඟ ආණ්ඩුවක් පිහිටුවීමේ බලාපොරොත්තුව ඇතිව කැබිනට් අමාත්‍ය ධුර පණස් දෙකකින් යුක්ත ඡායා කැබිනට්ටුවක් ප්‍රකාශයට පත් කර තිබෙනවා. හැබැයි පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. අපේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඊළඟ මැතිවරණයෙන් පස්සේ පත්වෙන ආණ්ඩුවේ ඉන්න පුළුවන් උපරිම කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව තිහයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ අය ඒකවත් දන්නේ නැති එකයි ප්‍රශ්නය. [බාධා කිරීමක්] ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා මේ කාරණය හොඳටම දන්නවා. එතුමා මේ ක්‍රියාවලියට හුහක් සම්බන්ධ වුණා. [බාධා කිරීමක්] ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඊළඟ මැතිවරණයෙන් පස්සේ මේ පාර්ලිමේන්තුවෙන් පත් වන්නා වූ මන්ත්‍රීවරුන් අතරින් තෝරා ගන්නා වූ කැබිනට්ටුවේ ඉන්න පුළුවන් උපරිම ඇමතිවරුන් සංඛ්‍යාව තිහයි. ඔබතුමාත් ඒ ගැන "ඔව්" කිව්වා නේ; " හා" කිව්වා නේ; එකඟ වුණා නේ. එතකොට ඡායා කැබිනට්ටුවේ ඇමතිවරුන් 52ක් වුණේ කොහොමද? ඒ කියන්නේ, අපි අවසන් කරපු දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණු, අසීමිත කැබිනට් මණ්ඩලයක් පත් කරන ඒ පරණ ක්‍රියාදාමයට ආපසු යනවාද? [බාධා කිරීමක්] ඔබතුමාගෙන් ඒ ගැන ඇහුවා නම් අනිවාර්යයෙන්ම ඔබතුමා කියනවා. ඔබතුමා දන්නවා නේ ඒ කාරණය. [බාධා කිරීමක්] ඔබතුමාට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා විද්වත්, නැණවත් ප්‍රායෝගික භාවිතය පිළිබඳව දන්නා කෙනෙක්. ඔබතුමා දන්නා විෂයයක් ඔබතුමාට ලැබිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ දවස්වල බදු එහෙම පොඩ්ඩක් වැඩි වෙලා, ප්‍රශ්න ඇති වෙලා, ජනතාව පොඩ්ඩක් අසතුටෙන් ඉන්න වෙලාවේ, අපිට, ජනතාවට හොඳට හිනා වෙන්න, රස කරන්න, තලු මරන්න, ඒ වාගේම ඒ එක් එක් තනතුරට පත් කර තිබෙන කට්ටියගේ ඉතිහාසය, වර්තමානය, අනාගතය පිළිබඳව සාකච්ඡා කරන්න අපට අවස්ථාවක් ලබාදී තිබෙනවා. ඒ සමහර තනතුරුවලට පත් කරපු පුද්ගලයන් ගැන අපට කියන්න කථා, අප දන්නා කථා ගොඩක් තිබෙනවා. ඒ නිසා ඒ අවස්ථාව ලබාදීම ගැන අපේ ස්තුතිය පළ කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. බොහොම ස්තුතියි.

[පි.ප. 1.45]

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, குற்றவியல் விடயங்களில் பரஸ்பர உதவியளித்தல் சட்டத்தின் கீழ் ஒழுங்குவிதி, நீதித்துறை சட்டத்தின் கீழ் ஒழுங்குவிதிகள் என்பன தொடர்பான விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் தந்த உங்களுக்கு நன்றியைத் தெரிவித்து, எனது உரையை ஆரம்பிக்கின்றேன். சட்டம் என்பது ஒரு மனிதனுக்கு அல்லது அந்த நாட்டின் பிரஜைக்கு நீதி தவறாத ஒரு நிலையை வழங்கக்கூடிய ஓர் அளவுகோல் எனலாம். நீதித்துறை, சட்டத்துறை ஆகிய இரண்டும் ஒவ்வொரு பிரஜையும் மனக்கிலேசமின்றி, பயமின்றி நாட்டில் வாழக்கூடிய சூழலை ஏற்படுத்திக் கொடுக்கவேண்டும். அப்போதுதான் அந்தப் பிரஜை அந்த நாட்டை நம்புவான்; தனது தாயாக நேசிப்பான். தனது வாழ்வுரிமை உறுதிப்படுத்தப்பட்டுள்ளது என விசுவாசிப்பான்; சட்டத்துறையை நம்பி பரிகாரம் காண நாடுவான்; நீதித்துறையின் தீர்ப்புக்களை விமர்சிக்காமல் ஏற்றுக்கொள்வான்; குற்றம் செய்பவன்கூட குற்றம் செய்வதிலிருந்து விலகி நிற்பான். ஆனால், எமது நாட்டில் சட்டத்துறை, நீதித்துறை என்பன அரசியல்வாதிகளாலும் தனிமனிதர்களாலும் பொறுப்புள்ள அரச இயந்திரங்களாலும் ஆக்கிரமிக்கப்பட்டுள்ளன என்பதுதான் உண்மை. இன்று சட்டத்துறை, நீதித்துறை என்பன ஒவ்வோர் அதிகாரிகளும் தமது தேவைகளுக்கு ஏற்ப வளைக்கக்கூடிய இறப்பர் கம்பங்களாகவே காட்சி தருகின்றன. தேசியக் கொடியை ஏந்திய கம்பங்களாக நிமிர்ந்து நிற்கவேண்டிய எமது காவல் துறையும் நீதித்துறையும் வளைந்து, நெளிந்து செயற்படு கின்றன. அதுவே எமது நாட்டை அதலபாதாளத்துக்குள் தள்ளிக்கொண்டிருக்கின்றது. உலக அரங்கில் தோல்விகண்ட நாடாக நாம் எம்மை அறியாமலேயே நகர்ந்து கொண்டிருக்கின்றோம்.

கடந்த காலங்களில் நடத்தப்பட்ட ஊடகவியலாளர்கள் மீதான அநீதிக்கு நீதி வழங்காமை ஒரு குற்றச்சாட்டாகத் தொடர்கிறது.

கடந்தகால அரசாட்சியில் 32 ஊடகவியலாளர்கள் கொல்லப்பட்டும் காணாமல் செய்யப்பட்டுமுள்ளனர். புலனாய்வாளர்களின் செயற்பாடு ஊடக அடக்குமுறை வரை விரிவடைந்தது எனலாம். சிவராம் தொடக்கம் லசந்த விக்கிரம துங்க வரை படுகொலை அடக்குமுறை தொடர்ந்தது. லசந்த விக்கிரமதுங்கவைப் படுகொலை செய்த கொலையாளி தொடர்பில் இன்றுவரை நீதி நிலைநிறுத்தப்படாத நிலை காணப்படுகின்றது. காவற்றுறையினரதும் நீதித்துறை யினரதும் இந்தச் செயலற்ற தன்மையை ஊடக அமைப் புக்களும் மனித உரிமை அமைப்புக்களும் வெளிப்படுத்தி வருகின்றன. ஓர் அரசியல்வாதி லசந்த விக்கிரமதுங்கவின் கொலையைப்பற்றிப் பகிரங்கக் கூட்டத்தில் கூறியிருந்தார். அவர் அதைப்பற்றி விபரமாக வெளிப்படுத்தினார். அதுமட்டு மல்ல, ஓர் அமைச்சர் தனது செய்தியை வெளிப்படுத்த மறுத்த அரச தொலைக்காட்சி நிறுவனமான ரூபாவாஹினிக் கூட்டுத்தாபனத்தினுள்ளே அவரது அடியாட்களுடன் சென்று அட்டகாசம் செய்கின்றார். நீதி அங்கு வென்றதா? தொடர்ந்தும் ஊழியர்கள் பலர் அசௌகரியத்திற்கு உட்படுத்தப்பட்டனர் என்பதுதான் பழைய வரலாறு. தமிழர் தரப்பு நியாயங்களுக்காகக் குரல் கொடுத்த சிங்கள ஊடகவியலாளர்கள்கூட கொல்லப்பட்டனர். அதுமட்டுமல்ல, தொடர்ந்தும் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர் ஜோசப் பராராஜசிங்கம், யாழ். மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் நடராஜா ரவிராஜ், ஐக்கிய தேசியக் கட்சிப் பாராளுமன்ற உறுப்பினர் தியாகராஜா மகேஸ்வரன், குமார் பொன்னம்பலம் என அநியாயக் கொலைகளின் பட்டியல்கள் தொடர்ந்தன.

யாழ்ப்பாணத்திலுள்ள உதயன் பணிமனையும் அதன் ஊடகவியலாளர்களும் பலமுறை தாக்குதலுக்குள்ளானார்கள். 'உதயன்', 'தினக்குரல்', 'வலம்புரி' ஆகிய பத்திரிகைகள் வீதியில் வைத்துக் கொளுத்தப்பட்டன. அது மட்டுமல்ல, மஹிந்த ராஜபக்ஷவின் ஆட்சிக்காலத்தில் 2004ஆம் ஆண்டு ஏப்பிரல் மாதத்திலிருந்து 2009 பெப்ரவரி மாதம் வரை 33 ஊடகப் பணியாளர்கள் படுகொலை செய்யப்பட்டும் காணாமல் போயுமுள்ளனர். அதில் சிங்கள ஊடகவிய லாளர்கள் 3 பேரையும் முஸ்லிம் ஊடகவியலாளர் ஒருவரையும் தவிர, 29 தமிழ் ஊடகப் பணியாளர்கள் கொல்லப்பட்டும் காணாமல்போயும் உள்ளனர்.

சிறைச்சாலைகளிலுள்ள தமிழ் அரசியல் கைதிகளை எடுத்துப் பாருங்கள்! அவர்களுக்குப் புனர்வாழ்வு கொடுப் பதற்கு இந்த அரசு இணங்கியிருந்தது. அதன்படி அவர்களில் 90 பேர் புனர்வாழ்வு பெற விரும்புவதாக ஒப்பமிட்டு ஒப்புதல் வழங்கியிருந்தனர். இன்றுவரை அவர்களுக்கான எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை; பிணையிலும் அவர்கள் விடுவிக்கப்படவில்லை. இது கவலைக்குரியதாகும். வற்புறுத்தலின் பேரிலும் சித்திரவதை செய்தும் அதிகமான வர்களின் வாக்குமூலம் பெறப்பட்டிருந்தது என்பதுதான் உண்மையாகும். விசாரணை செய்யப்படாது பலர் பல வருடங் களாக - 10 வருடங்கள் வரை - தொடர்ச்சியாக விசாரணைக் கைதிகளாக அடைத்து வைக்கப்பட்டிருக்கிறார்கள். எனவே, நீதி அமைச்சு அதற்கான சரியான, நியாயபூர்வமான தீர்வை வழங்க முன்வரவேண்டும் என்பதுதான் என்னுடைய வேண்டுகோளாகும்.

கடந்தகால வெள்ளைவான் கடத்தல்காரர்களையும் கொலைகாரர்களையும் சட்டத்தின் முன் நிறுத்தாமை இன்றைய நல்லாட்சி அரசின் இயலாமை என்று சொல்லலாம். கடந்த காலத்தில் வெள்ளைவான் கடத்தல்காரர்கள் மாபியா கும்பல்களாகச் செயற்பட்டார்கள். பாதாள உலகக் கோஷ்டியினராகச் செயற்பட்டார்கள். நாட்டு மக்களைப் பாதுகாக்கவேண்டியது, அவர்களின் வாழ்வுரிமையை உறுதிப்படுத்தவேண்டியது இலங்கை அரசின் கடமையாகும். ஆனால், அரசின் ஆசீர்வாதத்துடன் அந்தக் குழுக்கள் செயற்பட்டன என்பதுதான் உண்மை. எங்கே இலங்கை நாட்டின் அரசியல் உரிமை? பேச்சுக்கு ஓர் அரசியல் சாசனம்; செயற்பாட்டுக்கு ஓர் இரகசிய சாசனம்! இதுதான் இங்கு நடக்கின்றது. இதுதானா உங்கள் நீதி! இதுதானா உங்களது அரசாட்சி! நாட்டு மக்களைக் காணாமற்போகச் செய்தவர்கள், நாட்டு மக்களைக் கொலை செய்தவர்கள், மக்களைச் சூறையாடியவர்கள் எல்லோரும் சுதந்திரமாக கூட்டங் கூட்டமாக வலம் வந்துகொண்டிருகின்றார்கள்.

புத்த துறவி என்பவர் அன்புக்குரித்தானவர்; கௌரவத் துக்கு உரித்தானவர்; மனித நேயத்துக்கு உதாரணமானவர்; இன நல்லிணக்கத்தைக் காக்கவேண்டியவர்; மத ஒற்றுமையை வளர்க்க வேண்டியவர்; ஒட்டுமொத்தத்தில் பஞ்சசீலக் கொள்கையை ஏற்றுக்கொண்டவர். ஆனால் ஞானசார தேரர் என்ற பெயரில் ஒரு துறவி தேள் போன்று கொட்டுகிறார். திரும்பிப் பார்க்கும் பக்கமெல்லாம் முஸ்லிம் மக்களை நோக்கிக் கொட்டுகிறார். தர்ஹா நகரிலே முஸ்லிம் மக்கள்மீது தர்பார் நடத்தியவர்! பகிரங்க கொலைகளுக்கு காரணமானவர் சுதந்திரமாகச் சுற்றுகிறார். மீண்டும் தர்ஹா நகரை ஞாபகப் படுத்துகிறார். முஸ்லிம் மக்கள்மீது போர் நடத்துவாராம் என்று எக்காளம் இடுகிறார். ஞானசார தேரர் உண்மையில் ஒரு புத்த துறவிதானா என்பது எனக்குச் சந்தேகமாக உள்ளது. ஒரு துறவி இப்படியான வசனங்களைப் பாவிக்க முடியுமா? எனக் கேட்கின்றேன். ஒரு துறவி ஒரு சமுதாயத்தின்மீது கொலை மிரட்டல் விடுக்கிறார். அரசாட்சி செய்பவர்களாகிய நீங்கள் அதைப் பார்த்துக்கொண்டிருக்கிறீர்கள்! பயந்துகொண்டிருக் கிறீர்கள்! எனவே பயங்கரவாதத் தடைச் சட்டம் தனியாக தமிழர்களுக்கு மட்டுந்தானா? எனக் கேட்க விரும்புகிறேன். ஒரு தமிழன் இப்படிப் பேசியிருந்தால் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைது செய்திருப்பீர்கள்! விடுதலைப் புலிகளின் சாயலில் தொப்பியைப் போட்டதற்கே கைது செய்தவர்கள் தானே நீங்கள்! ஆனால், ஞானசார தேரரின் கொலை மிரட்டல்களையும் ஆயுத மோதல் எதிர்வு கூறல்களையும் இரசிக்கிறீர்கள்! நடவடிக்கை எடுப்பதாக பொய் வாக்குறுதிகளைக் கூறுகிறீர்கள்!

முஸ்லிம் தலைவர்கள் தங்களின் பதவிகளைத் தக்கவைத்துக்கொள்வதற்காக முஸ்லிம் மக்களின் வாழ்வுரி மையை அடகு வைக்கிறார்கள். முஸ்லிம் தலைவர்களே! பதவிகளை உதறித்தள்ளுங்கள்! ஞானசார தேரரை ஆயுட்காலச் சிறைக்குத் தள்ளுவதற்குப் போராட முன்வாருங்கள்! அதற்கு நானும் உங்களுடன் பங்காளியாக வருகிறேன்.

வன்னியில் புனர்வாழ்வு பெற்ற விடுதலைப் போராளிகள் மீதான அடக்கு முறைகள் இன்னமும் தொடர்ந்து கொண்டிருக்கின்றன. புலனாய்வாளர்கள் என்ற போர்வையில் கொடுக்கப்படும் அழுத்தம் அவர்களை மன உளைச்சலில் தள்ளியுள்ளது. அவர்கள் ஆயுதத்தைப் போட்டுவிட்டு மீண்டும் அமைதி வாழ்வை நோக்கி வந்தவர்கள்; அவர்களை நிம்மதியாக வாழவிடுங்கள்! புனர்வாழ்வு பெற்ற ஒவ்வொரு போராளிக்கும் வீடு வழங்குவதற்கு புனர்வாழ்வு அமைச்சு நடவடிக்கை எடுக்கவேண்டும்; அவர்களுக்கான வாழ் வாதாரங்கள் வழங்கப்பட வேண்டும். நிவாரண உதவிகள் வழங்கப்படும் படிவங்களில்கூட அவர்களுக்கு எதுவும் வழங்க முடியாதவகையில் அப்படிவங்கள் தயார் செய்யப்பட்டுள்ளன. அப்படிவத்தில் ஓர் இடத்தில், "இவர் முன்னர் அரசுக்கு எதிராகப் போராடவில்லையென கிராமசேவையாளர் உத்தரவாதமளிக்க வேண்டும்" என்று கேட்கப்பட்டிருக்கின்றது. இதனால் அவர்களுக்கான அந்த நிவாரண உதவிகளை கிராமசேவையாளர்கள் மறுக்கிறார்கள். அரசியல் சட்டத்தில் ஒன்று சொல்லப்படுகிறது; ஆனால், அங்கு வழங்கப்படுகின்ற படிவங்களில் வேறொன்று இடப்பட்டிருக்கின்றது.

நான் கேட்கின்றேன், தமிழர்களைப் போராடத் தூண்டிய வர்கள் யார்? நீங்கள்தானே அடக்குமுறையைத் தொடங்கி னீர்கள்! தனிச் சிங்களச் சட்டத்தைக் கொண்டுவந்தீர்கள்; இன நல்லிணக்கத்தைக் குலைத்தீர்கள்; தந்தை செல்வாவும் ஆதரவாளர்களும் செய்த அஹிம்சைப் போராட்டத்தைக் காடையர்கள் கூட்டத்தைக்கொண்டு அடக்கினீர்கள். 1974ஆம் ஆண்டு யாழ்ப்பாணத்தில் நடந்த தமிழாராய்ச்சி மாநாட்டில் அரச படையினர் காட்டுத்தர்பார் நடத்தி தமிழர்களை உருக்குலைக்க முயன்றனர். நாடு சுதந்திரம் பெற்ற பின் 242 தடவைகள் தமிழர்கள் கூட்டம் கூட்டமாக சிங்களக் காடையர்களாலும் சிங்களப் படையினராலும் இனப் படுகொலை செய்யப்பட்டனர் என்பதுதான் வரலாறு. எனவே, இன நல்லிணக்கம் பற்றிப் பேசும் அரசு, நீதியை நிலைநிறுத்தி மக்களைச் சுமுகமாக வாழ வழியேற்படுத்திக் கொடுக்க வேண்டும். புனர்வாழ்வு பெற்ற போராளிகளுக்குத் தொடர் ந்தும் இடர்களை ஏற்படுத்தாது அவர்களை நிம்மதியாக வாழவிட வேண்டும்.

மேலும், சட்டமென்று ஒன்றிருக்கும்போது வன்னிப் பிரதேசத்திலுள்ள காணிகளைப் படையினர் அபகரித்து தொடர்ச்சியாக அவர்களின் கட்டுப்பாட்டில் வைத்துக் கொண்டிருக்கிறார்கள். புதுக்குடியிருப்பு நகரின் மத்தியில் பிரதேச செயலகத்திற்கு எதிரிலுள்ள மக்களின் உறுதிக் காணிகள்கூட - Deed lands படையினரால் அபகரிக்கப் பட்டுள்ளது. பொது அமைப்புகளுக்குரிய, பிரதேச சபைகளுக் குரிய காணிகளும் படையினரால் அபகரிக்கப்பட்டுள்ளன. கேப்பாப்பிலவு என்ற கிராமம் ஒட்டுமொத்தமாக படையி னரால் அபகரிக்கப்பட்டுள்ளது. இவை எந்தச் சட்டத்தின்கீழ் வருகின்றதோ நானறியேன்! ஆனால், அங்கு அவர்களது ஆக்கிரமிப்புகள் மிக அதிகமாக இருக்கின்றன. வட்டுவாகலில் பொதுமக்களின் காணிகளை அபகரித்தது போதாதென்று தற்பொழுது பாரிய கம்பங்களை நட்டு மறித்து அடைத்து, bund களை போடுகின்ற நடவடிக்கைகளில் ஈடுபட்டுக் கொண்டிருக்கிறார்கள். அரச படைகள் முகாமிட்டிருப்பதற்கு அரச காணிகள் பல உண்டு. பொதுமக்களின் தனிப்பட்ட

[ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා]

காணிகளை அதற்காக எடுப்பதால் அந்த மக்களுக்குப் பல பிரச்சினைகளும் பலத்த சந்தேகங்களும் எழுகின்றன. இவ்வாறான நிலைமையில் உங்களால் இன நல்லிணக்கம் என்பதைக் கொண்டுவர முடியுமா? என்பதுதான் என்னுடைய கேள்வி.

அதுமட்டுமல்ல, நாயாறு கிராமத்தில் இராணுவத்தினர் இருந்துகொண்டு அங்குள்ள மக்களின் சுமுக வாழ்வைக் குலைக்கின்றார்கள். தமிழர்களைச் சுமுகமாக மீன்பிடித் தொழிலுக்குப் போகவிடாமல் சிங்கள மீனவர்களுக்குக் காவலாக இருந்து சட்டவிரோதமான மீன்பிடித் தொழிலைச் செய்வதற்கு அவர்களுக்கு வழிவகுத்துக் கொடுக்கிறார்கள். தடைசெய்யப்பட்ட-சட்டவிரோத மீன்பிடி முறைகளைப் படையினரின் பாதுகாப்புடனேயே அவர்கள் செய்கிறார்கள். இவை அரசுக்குச் சுட்டிக்காட்டப்பட்டும் இதுவரை நடவடிக்கை எடுக்கப்படவில்லை. எனவே, நீதித்துறையும் சட்டத்துறையும் எந்தவித வேறுபாடுகளுமின்றி சீராக இயங்குமாக இருந்தால், நாடு தானாகவே முன்னேற்ற மடையும். எனவே, அதற்கு வழிவிடவேண்டுமென்று கேட்டுக்கொண்டு என்னுடைய உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி. வணக்கம்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Dilan Perera. You have 12 minutes.

[අ.භා. 1.59]

ගරු ඩිලාන් පෙරේරා මහතා (මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு டிலான் பெரேரா - நெடுஞ்சாலைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilan Perera - State Minister of Highways)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉතාම වැදගත්, කාලීන සංශෝධන කීපයක් සහ යෝජනා කීපයක් ගරු අධිකරණ ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා. සමථ මණ්ඩල පනතට මේ වැදගත්, ඉතාම ප්‍රායෝගික සංශෝධනය ගෙන ඒම සම්බන්ධව මා මුලින්ම ගරු අධිකරණ අමාත්‍යතුමාටත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටත් ස්තුතිවන්ත වන්නට ඕනෑ. අපි අද උදේ සිටම නඩු ප්‍රමාද වන එක ගැන, වංචා දූෂණ නඩු අහන්නේ නැති එක ගැන, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ස්වාධීනභාවය පිළිබඳව මේ පාර්ලිමේන්තු සභා ගර්භයේ ඉඳගෙන විවිධාකාරයේ තර්ක ගොඩ නැඟුවා. අපට එහෙම තර්ක කරන්න පුළුවන්. හැබැයි නඩු ප්‍රමාදය ගැන සොයා බලා ඊට ප්‍රායෝගික විසඳුමක් දෙන එක තමයි අප කළ යුතු වන්නේ.

අද දින සමථ මණ්ඩල පනතේ 7 වන වගන්තියට ගෙන එන සංශෝධනය මඟින්, ආරවුලක මූල්‍ය වටිනාකම රුපියල් දෙලක්ෂ පනස් දහසේ සීමාව කියන එක රුපියල් ලක්ෂ පහ දක්වා ඉහළට ගෙන ඒමක් සිදු වෙනවා. එම සංශෝධනය හරහා නඩු ප්‍රමාදය යම් ප්‍රමාණයකින් වැළැක්වීම සඳහා පියවර ගැනෙනවා. හැබැයි මෙම සංශෝධනය ගෙන ආ පමණින් ඒ පියවර සාර්ථක වන්නේ නැහැ. ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා කියපු විධියට, සමථ මූල මණ්ඩලවලට යම් ආකාරයේ කාර්යාල පහසුකම් ටිකකුත් ලබා දීලා, උසාවියට නොගොස් සමථකරණය හරහා නඩු බේරා ගැනීමේ තත්ත්වයට ගෙන එන්න පුළුවන් නම් විතරයි, සමථ මණ්ඩල පනතට ගෙන එන මේ සංශෝධනය බලාපොරොත්තු වන ඉලක්කය කරා ප්‍රායෝගිකව රැගෙන යන්න අපට පුළුවන් වන්නේ.

සමථකරණය පිළිබඳ අධිකරණ අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ ගැන කථා කරන කොට අපට කමලනී ද සිල්වා හිටපු අතිරේක ලේකම්තුමිය අමතක කරන්න බැහැ. මම ඒ දවස්වල එතුමිය හැඳින්වූයේ "ලංකාවේ සමථකරණයේ මව" හැටියටයි. මොකද, සමථකරණ ක්‍රියාවලිය පිළිබඳව ඉතාම උනන්දුවෙන් එතුමිය ඒ අමාත්‍යාංශය තුළ කටයුතු කළා. සමථකරණ ක්‍රියාවලිය මේ රටට අවශ්‍යම එකක්. ඒ, නඩු ප්‍රමාදය වැළැක්වීම සඳහා පමණක් නොවෙයි. සමථකරණය පිළිබඳව මේ රටේ පුරවැසියන් නිසි ආකාරව දැනුවත්ව සිටියා නම් ජාතිය, කුලය, ආගම පදනම් කරගෙන, කථා කරන භාෂාව පදනම් කරගෙන යුද්ධයක් ඇති වන එක වළක්වන්නත් තිබුණා.

පසු ගිය මාස කීපය තුළ පාර්ලිමේන්තුවේ සිදු වූ සමහර දේවල් දිහා බැලුවාම, අද අපේ පාර්ලිමේන්තුවේ සමහර මන්ත්‍රීවරුන්ටත් සමථකරණය ඉතා වැදගත්ය කියලා සිතෙනවා. සමථකරණය පාසල්වල සමහර දරුවන්ට උගන්වන්න පටන්ගත්තා. ඒකටත් අධිකරණ අමාත්‍යාංශය ඒ කාලයේ මැදිහත් වුණා. සමහර පාසල්වල සමථකරණ සභා හැදුවා. ප්‍රශ්නයක් ආවාම, ඒ ප්‍රශ්නය එක් පැත්තකින්, දෙපැත්තකින් නොව තුන් පැත්තකින් බලා සමථයට පත් කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව දරුවන් දැනුවත් කිරීමත් පාසල්වලින් ආරම්භ වුණා.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සඳහා ගෙනැවිත් විවාද කරන මේ වෙලාවේ මම අධිකරණ අමාත්‍යතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. ගරු අමාත්‍යතුමනි, අද ඔබතුමන්ලා තවත් යෝජනාවක් ගෙනෙනවා, ග්‍රාම නිලධාරි මහත්වරුන්ට සමාදාන විනිශ්චයකාර පදවි ලබා දෙන්න. සමථ මූල මණ්ඩල සාමාජිකයන්ටත් සමාදාන විනිශ්චයකාර පදවි ලබා දෙන්න හැකියාව තිබෙනවා නම් හොඳයි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
බොහෝ අයට -ජ්‍යෙෂ්ඨ අයට- දුන්නා.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

සියලු දෙනාටම දුන්නොත්, ඒක ඒ අයට යම් ආකාරයේ ශක්තියක්, ධෛර්යයක් වේවි කියලා මා හිතනවා, ඇමතිතුමනි. මොකද, ඒ අය ස්වේච්ඡාවෙන්ම වැඩ කරන පිරිසක් නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ විවාදය අතරතුරම කථා වුණු තවත් කාරණයක් තමයි, විදේශීය විනිශ්චයකාරවරුන් සම්බන්ධ ප්‍රශ්නය. නීතිඥ මහත්වරු කීපදෙනෙක් මේ ගරු සභාවේ සිටිනවා. ඒ අයත් එක්ක සංසන්දනය කරන කොට මා ඉතාම කනිෂ්ඨයි. නමුත් මගේ සීමිත දැනුමේ හැටියට, විදේශීය විනිශ්චයකාරවරුන්ට මේ රටේ නඩු අහන්න බැහැ. විවිධ කොමිෂන් සභාවලට උදවු උපකාර කරන්න, වෙනත් තාක්ෂණ විෂයයන් සම්බන්ධයෙන් උදවු උපකාර කරන්න ඒ අයට පුළුවන්. හැබැයි මා දන්නා විධියට, විදේශීය විනිශ්චයකාරවරුන්ට ඇවිත් මෙහේ නඩු අහන්න හැකියාවක් නැහැ. ඒ නිසා හයිබ්‍රිඩ් අධිකරණ කියන කතන්දරය ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කරන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ. මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා කියන කාරණා ඔක්කෝටම මම එකඟ වන්නේ නැහැ.

හැබැයි, එතුමාගේ පොත් පාඩම් කරලා තමයි අපි නීති විද්‍යාල විභාගය පාස් වුණේ. හැබැයි එතුමාට උසාවියේ practise කරන්න බැහැ. ඒ නිසා එතුමාට උසාවියක නඩුකාරයෙක් වෙන්න බැහැ.

මොකද එතුමා නීති විද්‍යාලයේ අවසාන විභාගය පාස් වුණේ නැති හින්දා. ඒ නිසා මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමාට අපේ රටේ නඩු අහන්න බැරි නම්, එහෙම නම් විදේශ විනිශ්චයකාරවරුන් අපේ රටේ නඩු අහන්නේ කොහොමද කියන ප්‍රශ්නය මට මතු වෙනවා. ව්‍යවස්ථානුකූලව නම් එහෙම සිදු වන්න විධියක් නැහැ. හැබැයි මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ, බණ්ඩාරනායක ඝාතනය වෙලාවේ විදේශ විනිශ්චයකාරවරු සහ නීතිය පිළිබඳ විදේශ විශාරදයන් විවිධ ක්ෂේත්‍රවලදී අපට උදවු කළ අවස්ථා තිබෙනවා. ඒ නිසා hybrid අධිකරණය පිළිබඳව කවුරු, කෙලෙස, කොයි ආකාරයට කිව්වත් මේ රටේදී හෝ පිටතදී මම හිතන්නේ නැහැ ඒක ව්‍යවස්ථානුකූලව කළ හැකි දෙයක් කියලා.

ඊළඟට, බන්ධනාගාර ගැන කථා වුණා. එතැනදී, "කොළඹට කිරි, අපට කැකිරි" කියලා මට හිතුණා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යාන්ත්‍රණය පිළිබඳව මා මිත්‍ර ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා කථා කළා. මේ යාන්ත්‍රණය සම්බන්ධව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට මුලින්ම යෝජනාවක් ඉදිරිපත් කරන අවස්ථාවේ "විදේශීය විනිශ්චයකාරවරුන් සහිතව" කියන කාරණයත් එක්කයි ඔය "hybrid" කියන වචනය ඉදිරිපත් කර තිබුණේ. නමුත් අපි ඒ උදවියට පැහැදිලි කරලා දුන්නා, ලංකාවේ තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මේ රටේ පුරවැසියකු නොවෙන කෙනෙකු අධිකරණයක විනිශ්චයකාරවරයෙක් වශයෙන් පත් කිරීමට තිබෙන නොහැකියාව සහ ටෝ දේශීය ජනතාවගේ ස්වාධිපත්‍ය අයිතිය පිළිබඳව ජනතාව දරන මතය. ඒක නිසා ඔවුන් එතැනදී නම්‍යශීලිබවක් දක්වලා තමයි එම වචනය ඉවත් කරලා යාන්ත්‍රණය කියන එකට "Mechanism with the participation of foreign experts." කියලා ඉදිරිපත් කළේ. ඒ හැරෙන්නට ඉන් ඔබ්බට දෙයක් ගැන අපට බලකිරීමක් කරලා නැහැ. නමුත් නොයෙකුත් විදේශීය සංවිධාන සහ රටවල් තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේදී ඔවුන්ගේ අදහසක් විධියට තමයි ජාත්‍යන්තර විනිශ්චයකාරවරුන් හිටියොත් හොඳයි කියලා ප්‍රකාශ කරලා තිබෙන්නේ. ඒක තමයි යථා තත්ත්වය.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

බොහොම ස්තුතියි. ඒ පැහැදිලි කිරීම වැදගත්. මොකද, වෙනත් දේශපාලන ව්‍යාපාර, විශේෂයෙන්ම ජාතික, ආගම වාගේ දේවල් අවුස්සා ගනිමින් ජනතාවට විෂ කවන දේශපාලන ව්‍යාපාර මෙය ප්‍රයෝජනයට ගන්නවා මා දැක තිබෙනවා.

ඊළඟට, බන්ධනාගාර සම්බන්ධයෙනුත් අද උදේ කථා වුණා. ඒ අවස්ථාවේ "කොළඹට කිරි, අපට කැකිරි" කියලා මට හිතුණා. මොකද නියෝජ්‍ය කථානායකතුමා, අජිත් පී පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා, යන ඒ සියලු දෙනාම සාකච්ඡා කළේ කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ තිබෙන තදබදය ගැනයි. හැබැයි මේ තත්ත්වය කොළඹට පමණක් විශේෂිත වූ දෙයක් නොවෙයි. ලංකාවේ හැම තැනකම රිමාන්ඩ් බන්ධනාගාරවල විශාල තදබදයක් තිබෙනවා. කොළඹ විතරක් නොවෙයි, ලංකාවේ සෑම ප්‍රදේශයකම වාගේ බන්ධනාගාර පිහිටලා තිබෙන්නේ නගරය මැද්දේයි. නගර මැද්දේ බන්ධනාගාර හදලා මිනිස්සු නීතියට බය කළාම මිනිස්සු වැරදි කරන එක නවත්වයි කියන එක තමයි ඒ යුගයේ බන්ධනාගාර හදද්දී අපේ රට පාලනය කරපු පිට රට පාලකයන් කල්පනා කළේ. ඒ නිසාම ලංකාවේ බොහෝ තැන්වල බන්ධනාගාර පිහිටා තිබෙන්නේ ඉතාම වටිනා කියන වාණිජ ඉඩම්වලයි. කොළඹත් එහෙමයි; බදුල්ලෙත් එහෙමයි; මාතරත් එහෙමයි; ගාල්ලෙත් එහෙමයි; නුවරත් එහෙමයි. අපි අධිකරණ අමාත්‍යාංශයේ කටයුතු කළ කාලයේ ඉතාම දැඩි පරිශ්‍රමයකින් නුවර බන්ධනාගාරය පල්ලෙකැලේට අරගෙන යෑමේ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න අපට හැකියාව ලැබුණා. දැන් ඒක ඉතාම හොඳින් ක්‍රියාත්මක වෙනවා.

ගරු ඇමතිතුමනි, කොළඹ වාගේම ලංකාවේ හැම තැනකම මේ බන්ධනාගාර පිහිටලා තිබෙන්නේ නගරය මැද්දේ ඉතාම වටිනා කියන වාණිජ ඉඩම්වලයි. ඒ නිසා එම බන්ධනාගාර වෙනත් තැන්වලට ගෙන යන්න පුළුවන් නම් හොඳයි. මේ පිළිබඳව බන්ධනාගාර නිලධාරීන් එක්කත් යම් ආකාරයක සාකච්ඡාවක් කළ යුතුයි. මොකද ඒ අයත් පුරුදු පුහුණු වෙලා තිබෙන්නේ නගර ආසන්නයේ පදිංචිව සිටිමින් එදිනෙදා තම කටයුතු කර ගැනීමටයි. ඒ අයගේ නිල නිවාස සංකීර්ණ බොහෝ විට පිහිටලා තිබෙන්නේ බන්ධනාගාරය ආසන්නයේමයි. ඒ, වටිනා කියන භූමිය වෙනත් වැඩකට පාවිච්චි කරන ගමන්ම, බන්ධනාගාරවල තිබෙන්න ඕනෑ පහසුකම් සහිතව -කුරුවිට බන්ධනාගාරයේ කළා වාගේ- එම බන්ධනාගාර පද්ධති වෙනත් ප්‍රදේශවල විතැන් කරන්න පුළුවන් නම් වඩාත් වැදගත් වෙනවා. මේවා ඉතා වාණිජ වටිනාකමක් තිබෙන ඉඩම් නිසා ඒ ඉඩම්වල යම් ව්‍යාපාරයක් වැනි දෙයක් කරන්න පෞද්ගලික අංශය සම්බන්ධ කර ගන්නවා නම්, එම ආයෝජකයන්ගෙන් ලැබෙන මුදල් පාවිච්චි කර state-of-the-art prison එකක් හැදීමේ කර්තව්‍යය කිරීමේ හැකියාවත් තිබෙනවා.

ඊළඟට, උදේ මතු වුණ තව කාරණයක් තමයි, SAITM ආයතනයේ ප්‍රශ්නය. මගේ කැබිනට් ඇමතිතුමා තමයි ඒක මතු කළේ. ඒ සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නේ මෙපමණයි. දෝෂාභියෝගය ගෙනාපු වෙලාවේත් නීතිඥයෝ නොවන - උසාවියට සම්බන්ධ නොවන- උදවිය ගිහින් පක්ෂව සහ විපක්ෂව - දෙපැත්තටම- අධිකරණ භූමිය ඇතුළේ යම් යම් උද්ඝෝෂණ යනාදිය කරනවා අප දැක්කා. "ඒ සියලු දෙනාම අධිකරණයට අපහාස කළා, අධිකරණයේ තීන්දුවලට බලපෑමක් කළා" කියා ඒ වෙලාවේත් එහෙම නම් කෙනෙකුට ප්‍රශ්න කරන්න තිබුණා. ඒ නිසා SAITM එකේ මේ ප්‍රශ්නයේදී දොස්තර මහත්වරු මෙවර කරපු වැඩේ ලංකාවේ පළමුවෙනි වතාවට කළාය කියා මා හිතන්නේ නැහැ. මීට පෙරත් අධිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ නැති විවිධ උදවිය මේ විධියට කර තිබෙනවා. එය අධිකරණයේ ගන්නා වූ තීන්දුවට බලපෑමක් කළාද කියන කාරණයයි අධිකරණය සොයා බලන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, SAITM එක ගැන කථා කරන කොට එය පිහිටු වූ උදවිය කළ වරදට මේ ශිෂ්‍යයන් වග කියන්න ඕනෑද කියායි මා අහන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, you have one more minute.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

මම කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

SAITM එක පිහිටු වූ අය බොරු කර තිබෙනවා; බොරු පොරොන්දු දී තිබෙනවා; ළමයින් සහ දෙමව්පියන් රවටලා තිබෙනවා. හැබැයි, දැන් ඒ ළමයි කාලයක් SAITM එකේ ඉගෙන ගෙන තිබෙනවා. ඒ නිසා SAITM එක පිහිටුවීමේ අයිතිකාරයෝ කරපු වරදට ඒ ළමයින්ට වග කියන්න බැහැ. මමත් ගිය ආණ්ඩුවේ

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

කොටස්කාරයෙක්. අප ඒ ආණ්ඩුව කාලයේත් මේ ආයතනය පිහිටුවන්න උදවු උපකාර කළා. ඒ නිසා මේ ආයතනයේ ඉගෙන ගත්ත ඒ ළමයින්ට අසාධාරණයක් නොවෙන්න, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගන්නා වූ ඒ නිර්ණායක, නියාමනවලට අනුකූල වන විධියේ ක්‍රමවේදයකටයි අප යා යුතු වන්නේ. එහෙම නැතිව, මේ ප්‍රශ්නයට වෛද්‍ය සංගමය පටලවාගෙන මේක වෛද්‍ය සංගමයත්, ආණ්ඩුවත් අතර යුද්ධයක් බවට පරිවර්තනය කිරීම ආණ්ඩුවට හොඳත් නැහැ, වෛද්‍යවරුන්ට හොඳත් නැහැ කියන කාරණයයි මට කියන්න තිබෙන්නේ.

අද අප වාද විවාද කරන්නේ අධිකරණ අමාත්‍යාංශයට අයත් නියෝග, නියමයක් සහ පනත් කෙටුම්පතක් ගැනයි. අධිකරණ අමාත්‍යාංශයට සම්බන්ධ නීතිඥ මහත්වරු සහ දොස්තරවරු අතර තිබෙන්නේ බොහොම ළඟ මිත්‍රත්වයක්. නීති ශිෂ්‍යයෝ කාලයේත් අප හැම අවුරුද්දේම Law-Medical Cricket Match එක ගහලා අප අවසානයේදී සමු ගන්නෙත් නීති-වෛද්‍ය සාදයකින්. අපේ ගම්වල තිබෙන නීතිඥ සංගම්වලත් Law-Medical Cricket Match එක ගහලා සමුගන්නේ නීති-වෛද්‍ය සාදයකින්. නීතිඥවරුයි, වෛද්‍යවරුයි මේ රටේ ඉතාම හොඳ මිත්‍රයෝ. ඒ නිසා අප මේක වෛද්‍ය සංගමය සහ ආණ්ඩුව අතර ප්‍රශ්නයක් බවට පරිවර්තනය නොකළ යුතුයි. ඒ ළමයි රවටලා තිබෙන්නේ SAITM එක පිහිටු වූ අයිතිකාරයෝ නම්, ඒ අයිතිකාරයන් සම්බන්ධයෙන් කටයුතු කරන එක විනා මේ ළමයින්ට දඩුවම් දිය යුතු නැහැ.

අනෙක් කාරණය, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගත් නිර්ණායකයන්ට යටත් වන විධියට ඒ අයටත් මේ රටේ වෛද්‍ය වෘත්තියට ඇතුළු වීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, please wind up.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
I am winding up.

එහෙම නැතිව අප මේ ප්‍රශ්නයත් දේශපාලනීකරණය කරන්න ගියොත්, ඒ දරුවන් තමයි අසාධාරණයට ලක් වන්නේ. අද ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධන ප්‍රායෝගිකව, යථාවත්ව සාර්ථක කර ගන්න නම් අපට අධිකරණයේ ඉන්න විනිශ්චයකාරවරු සහ නීතිඥවරුන්ගේ සහායක් ඕනෑ.

අප දන්නවා සමහර අධිකරණ විනිශ්චයකාරවරු සමහර වෙලාවට උදේ 11.00ට court එක adjourn කරලා නඩු කල් දමලා යන බව.

සමහර නීතිඥ මහත්වරු නඩුව ටිකක් අමාරු නම්, ගන්නේ දවසේ ගාස්තු නම් විවිධ හේතු මත නඩුවට දින ඉල්ලනවා. මොකද, දවසේ ගාස්තුව ගන්න පුළුවන් නිසා. ඒ නිසා මේ නඩු ප්‍රමාදය වැළැක්වීම සඳහා වන කාරණයේදී අධිකරණ අමාත්‍යාංශය වාගේම අධිකරණ ක්ෂේත්‍රයේ සිටින විනිශ්චයකාරවරුන්ගේ සහ නීතිඥවරුන්ගේ සහායත් අත්‍යවශ්‍යයි කියන කාරණය මතක් කරනවා. ඒ වාගේම ඔබතුමා මට වැඩිපුර විනාඩියක් ලබා දීම සම්බන්ධවත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මේ අවස්ථාවේදී පොඩි කාලයක් ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා මතු කරන ලද කාරණය ගත්තොත්, මේ රටේ නගරාසන්නව ඉතා වටිනා තැන්වල බන්ධනාගාර පිහිටා තිබෙන්නේ. ගාල්ල, මාතර, මීගමුව, ත්‍රිකුණාමලය සහ තවත් නගරයක ඉතාමත් වටිනා තැන්වල - විශේෂයෙන් ගාල්ල සහ මාතර නගරවල කොටුව ප්‍රදේශයේ- බන්ධනාගාර පිහිටා තිබෙන්නේ. ඒවා වටිනා ඉඩම්. ඒ ස්ථාන 5ක් වෙනුවෙන් ගම්බද ප්‍රදේශවල බන්ධනාගාර 5ක් ඉදි කරලා, ඒ ඉදිකිරීම් වෙනුවෙන් මේ ඉඩම්වල පූර්ණ සන්තකයේ හිමිකම චීන සමාගමකට ලබා දීමට පසු ගිය ආණ්ඩු සමයේ ගිවිසුමක් අත්සන් කරලා තිබුණා. අපි එය අධ්‍යයනය කරලා, මේ ආණ්ඩුව ආවාට පසුව ඒක අවලංගු කළා කියන කාරණයත් ජනතාවගේ දැන ගැනීම සඳහා මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, Hon. Bandula Lal Bandarigoda.

[අ.භා. 2.13]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අධිකරණ අමාත්‍යාංශය යටතේ ඉතා වැදගත් නියමයක්, නියෝගයක් සහ සංශෝධන පනත් කෙටුම්පතක් පිළිබඳ විවාදය පවත්වන වෙලාවේ කරුණු කිහිපයක් මේ විවාදයට එකතු කරන්න ලැබීම පිළිබඳව මම අතිශය සතුටට පත් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම වත්මන් රජය බලයට පත්වීමේදී විශේෂයෙන්ම වර්තමාන ජනාධිපතිවරයා ජනාධිපති ධුරයට පත් වෙද්දී, මේ රටේ මහජනතාව බලාපොරොත්තු වෙච්ච සුවිශේෂ වෙනස්කම්වලින් ඉතාම වැදගත් කාරණයක් බවට පත් වුණේ මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය, ඒ වාගේම නීතිය, යුක්තිය පසිඳලීමේ ආයතනවල ස්වාධීනත්වයයි. අද බොහෝ දෙනෙකුට එය අමතක වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ රජය ගැන කෙරෙන යම් යම් විවේචන, පහරදීම් උද්ඝෝෂණ වැනි කාරණාවලදී සමහර අය ඉස්සරහට අරගෙන එන මතවාදයක් තමයි මේ ආණ්ඩුව බලයට පත් වුණේ හුදෙක් ග්‍රාම්‍ය ඉල්ලීම්, එහෙම නැත්නම් බඩ ගැන හිතපු ඒවා, එහෙම නැත්නම් සහනාධාර, බඩු මිල අඩු කරන ඒවා වාගේ පුංචි පුංචි ඉල්ලීම්වලටය කියලා. නමුත් දැවැන්ත වෙනස්කම් දැකීමටයි ජනතාව බලාපොරොත්තු වුණේ.

ඇත්ත වශයෙන්ම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනවාරි 8 වෙනිදා ලබා ගත් ජයග්‍රහණය දෙස මේ රටේ ජනතාව ආපසු හැරී බැලුවොත් පෙනෙනවා, එය එක්තරා විස්මය ජනක දෙයක් බව. මොකද, එදා තිබුණ දැවැන්ත ප්‍රචාරණ යාන්ත්‍රණයකට මුහුණ දීලා තමයි ඒ ජයග්‍රහණය ලබා ගත්තේ. රජයේ සම්පත් සියල්ල ඉතාමත්ම අයුතු ලෙස පාවිච්චි කරද්දී, රාජ්‍ය යාන්ත්‍රණය මැතිවරණ ව්‍යාපාරයට තමන් සතු කරගෙන පාවිච්චි කරද්දී,

බොහොම සරල, බොහොම සියුම් මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයක් තුළින් බොහොම සුළු වියදමක් කරලා ජනාධිපතිවරණයක් ජයග්‍රහණය කරන්න පුළුවන් වුණේ මේ රටේ ජනතාව ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලූ නිසා සහ ඒ වෙනුවෙන් කැප වූ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඉස්සරහට ගෙන ආපු නිසයි. දැන් දේශප්‍රේමයේ වෙවර්ණ සළුපිළිවලින් සැරසුණු සමහර උදවිය; අර ඡායා කැබිනට් එකක් කියලා මොකක්ද එකක් පත් කරලා, 50කගේ විතර ලැයිස්තුවක් පත්තරවල දාලා තිබෙනවා මම දැක්කා; මාධ්‍යවල දාලා තිබෙනවා මම දැක්කා; මේ ලැයිස්තුවේ සිටින සමහර උදවිය අර පරණ ඇමතිකම් දරපු උදවියයි. මේ රටේ කරපු දේවල් ඒ උදවියට අමතක වුණාට මේ රටේ ජනතාවට අමතක නැහැ. ඒ නිසා මේ අය කරපු දේවල් විශේෂයෙන්ම අධිකරණයට අත තියපු විධිය ජනතාවට මතකයි. සමහර අය පාර්ලිමේන්තු සභා ගර්භයේ මේ රටේ අග්‍රවිනිශ්චයකාරවරියට එරෙහිව නඩු ඇහුවා. අඩුම තරමින් ගමේ සමථ මණ්ඩලයක තිබෙන ස්වාධීනත්වය, එනම් විත්තියට මුහුණ දෙන පුද්ගලයාට තමන්ගේ අයිතිවාසිකම වෙනුවෙන් ඉදිරිපත් වෙලා තමන්ගේ පැත්තෙන් කරුණු කියන්න තිබෙන අවස්ථාව පවා නැති කරලා, මේ රටේ අග්‍රවිනිශ්චයකාරවරිය එළියට දමපු විධිය අමතක කරපු ඒ කට්ටිය තමයි අද ඡායා කැබිනට්ටුවක් හදලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් වර්තමාන අධිකරණ ඇමතිවරයා අද දින සංශෝධන රාශියක් කරන්නට සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය, අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග සහ සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන ඒමෙන් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්නට කටයුතු කරලා තිබෙනවා. මම සතුටු වෙනවා ගමේ ජනතාවට වැදගත් සමථකරණය පිළිබඳව තිබෙන ආයතනයක් ශක්තිමත් කිරීම සඳහා, සමථ මණ්ඩලයක් වෙත යොමු කළ හැකි ආරවුලක මූල්‍යමය වටිනාකම් සීමාව රුපියල් 500,000 දක්වා වැඩි කරන්නට, පුළුල් කරන්නට සංශෝධනය ගෙන ඒම පිළිබඳව.

ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ කාරණා වාගේම එතුමා ඉදිරිපත් කළ යෝජනාවලට මමත් එකඟ වෙන ගමන් කියන්නට කැමැති කාරණාවක් තිබෙනවා. ගමේ සමථ මණ්ඩලය, ජනතාවට පහසුවෙන් යන්නට පුළුවන් කුඩාම තැන ශක්තිමත් කරන්නට මීට වඩා පුළුල් අවධානයක් යොමු කරන්නට අධිකරණ අමාත්‍යාංශය කටයුතු කළ යුතුයි කියන අදහස මම ඉදිරිපත් කරන්නට කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා කිව්වා වාගේ ඇතැම් සමථ මණ්ඩල කෙරෙහි ජනතාවගේ විශ්වාසය තව තවත් තහවුරු කරන්නට අපි කටයුතු කළ යුතුයි කියන කාරණයට විශේෂයෙන්ම අධිකරණ අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්නට කියලා මම ඉල්ලා සිටිනවා. සමහර වෙලාවට යම් යම් අය සමථ මණ්ඩලය දිහා අඩු තක්සේරුවකින් බලන්නට පුළුවන්. ඒ නිසා සමථ මණ්ඩලය කෙරෙහි තිබෙන ඒ විශ්වාසය වැඩි කිරීමට, සමථකාරවරුන්ට තිබෙන පිළිගැනීම වැඩි කිරීමට, සමාජයේ ඒ අය කෙරෙහි තිබෙන පිළිගැනීම වැඩි කිරීමට, එම තනතුර ගෞරවනීය තනතුරක් බවට පත් කරන්නට ඒ වාගේම ඒ අයට තමන්ගේ සේවය පවත්වාගෙන යන්නට වැඩි පහසුකම් ලබා දෙන්නට කටයුතු කිරීම අත්‍යවශ්‍යයි.

මින් පෙර කථාවලදී සඳහන් වුණා වාගේ අද විවිධ තනතුරු, විවිධ වගකීම් දරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අසීමිත රජයේ නිලධාරීන් පිරිසක් ඉන්නවා. ලේකම් කාර්යාලයක් පිහිටුවලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් නිලධාරියෙක් දෙදෙනෙක් සමථ මණ්ඩලයකට අනුයුක්ත කරලා, ඒ අයට යම්කිසි වගකීමක් භාර දීමේ කිසිම වරදක් මම දකින්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ දිස්ත්‍රික්කයට අදාළ නිසා මම ගරු අධිකරණ අමාත්‍යතුමාගේ අවධානය ගාල්ල බන්ධනාගාරය කෙරෙහි යොමු කරවනවා. මීන් පෙර සඳහන් වුණා වාගේ ඉතාම වටිනා, නගරයේ වෙනත් වාණිජ කටයුත්තකට යොදාගත හැකි වැදගත්ම ස්ථානයකයි ගාල්ල බන්ධනාගාරය තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම ඒ බන්ධනාගාරයේ රැඳැවියන්ට ඉන්න ඉඩ පහසුකම් නැහැ. බන්ධනාගාරයට ගිහින් බැලුවොත් පෙනෙනවා ඉතාමත්ම අඩු පහසුකම් මැද විශාල පිරිසක් රඳවා තිබෙන බව. පුංචි වරදකට හසු වූ තරුණයෙක් නොයැවිය යුතු තැනක් හැටියට තමයි ගාල්ල බන්ධනාගාරය බොහෝ දෙනෙක් සලකන්නේ. මොකද, එතැනට ගියාම වෙනත් බරපතළ වැරදිවලට රඳවා තිබෙන රැඳැවියන් සමඟ එක ස්ථානයක රඳවා තිබීම හේතුවෙන් ඒ අය බන්ධනාගාරයෙන් පිට වෙන්නේ බරපතළ වැරදි කරන්නට හැකි පුද්ගලයෝ බවට පත් වෙලායි. එහෙම නැත්නම් භයෙන්, සැකයෙන් ඇතුළට යන තරුණයෙක් වැරදි කරන්නට භය නැති, වැරදි කරන්නට ලජ්ජාවක් නැති කෙනෙකු බවට පත් වෙලා තමයි එළියට එන්නේ. ඒකට හේතුව, බරපතළ වැරදි කළ අය, රිමාන්ඩ් බන්ධනාගාරයේ තැබිය යුතු අය, සැක පිට අත් අඩංගුවට ගත් අය එක තැනක, එකට රඳවා තැබීමෙන් ඇති වුණු සමාජ ප්‍රශ්නයයි. එම නිසා මම ඉල්ලා සිටිනවා ඉතා ඉක්මනින්ම ගාල්ල බන්ධනාගාරය බූස්ස වැනි ප්‍රදේශයක ස්ථාපිත කරලා දෙන්න කියලා. මම ගරු අධිකරණ අමාත්‍යතුමාගෙන් මේ අවස්ථාවේදීම එම ඉල්ලීම කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගරු සභාවේ මීට පෙර සඳහන් වුණා දකුණේ ඇතැම් සිංහල අන්තවාදීන් ඇතැම් ආගම්වලට විරුද්ධව, ජාතීන්ට විරුද්ධව කරන එක් එක් කඩාකප්පල්කාරී ක්‍රියාවන් පිළිබඳව. අපි දකිනවා මෙවැනි කොටස් උතුරේත්, දකුණේත් සිටින බව.

මේක සාමාන්‍ය දෙයක්. [බාධා කිරීමක්] බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ජාතීන් අතර ගැටුමකට හෝ මීන් පෙර ඇති වුණු අවාසනාවන්ත සිදුවීම් වැනි සිදුවීම්වලට, මෙවැනි සුළු සිදුවීම්වලින් පාර කැපීමක් සිදු විය යුතුයි කියා මා විශ්වාස කරන්නේ නැහැ.

මම අදහන මගේ ආගම වන බුදු දහමේ, කිසිම ජාතියකට වෛර කරන්න කිසි විටෙක සඳහන් වෙන්නේ නැහැ. කිසිම ජාතියක අයෙකුගෙන් පළිගන්න, කිසිම ජාතියකට එරෙහිව අවි ආයුධ ඔසවන්න කියා සඳහන් වෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේගේ ධර්මය අවිහිංසාවාදය, මෛත්‍රිය, කරුණාව පදනම් කර ගත් ධර්මයක්. ඒ නිසා බුදු දහමේ කොකැනකවත් එහෙම සඳහන් වෙන්නේ නැහැ.

හැබැයි, බුදු දහම තමන්ගේ බඩ ගෝස්තරය බවට පත් කර ගත් ඇතැම් ජාතිවාදීන්, ඇතැම් ආගම්වාදීන් අන්තවාදීන් ඉන්න පුළුවන්. වැරදි විධියට හැසිරෙමින් බුදු දහමටත්, තමන්ගේ ජාතියටත්, රටටත් අවමන් කරන පිරිසක් ඉන්න පුළුවන්. එහෙම සුළුතර එක්කෙනෙක්, දෙදෙනෙක් නිසා මුළු මහත් ආගමකටවත්, ජාතියකටවත්, රටටවත් වෛර කළ යුතු තැනට පත් විය යුතු නැහැ කියා මම විශ්වාස කරනවා. මගේ කථාව අවසන් කරන්න කියා ඔබතුමා කිහිපවරක් ඉඟි කළා. ඒ නිසා මා කියන්නේ, මෙවැනි කොටස් සෑම ආගමකම, සෑම ජාතියකම, සෑම ජන කණ්ඩායමකම ජීවත් වෙන්න පුළුවන්. එවැනි පිරිස් රටක ඉදිරි ගමනට, රටක අනාගතයට බාධාවක් කර ගත යුතු නැහැ. අපි සෑම කෙනෙක්ම ඊට වඩා බුද්ධිමත් සංවාදයක නිරත වෙලා, රටක් හැටියට ඉදිරියට යන ගමනට ශක්තිය දිය යුතුයි කියා ප්‍රකාශ කරමින්, මට ලබා දුන් අවස්ථාව ගැන ස්තුති වන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 2.24]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාවට අවශ්‍ය නිසා, මම පළමුවෙන් අධිකරණ ඇමතිතුමාගෙන් යමක් විමසා දැන ගන්නයි උත්සාහ කරන්නේ. ඒ ගැන මම එතුමාට පොඩි සටහනක් යැවුවා.

ජිනීවා යෝජනාවල ලංකාවේ විදේශ කටයුතු ඇමතිතුමාත්, ඇමෙරිකන් රාජ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජිතයාත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සිටින එක්සත් ජනපදයේ නියෝජිතයාත් අත්සන් කළ යෝජනාවල, "විදේශ විනිශ්චයකාරවරුන්, විදේශීය අධිවෝදනාකරුවන් -prosecutors- විදේශීය පරීක්ෂකවරුන් සහිත වූ යාන්ත්‍රණයක්" කියලායි තිබෙන්නේ. ඔබතුමා කිව්වා ඒ යෝජනාව, "විදේශීය දැනුම ඇති විශේෂඥයින් සහිත යාන්ත්‍රණයක්" යනුවෙන් වෙනස්වී තිබෙනවාය කියා. ඒ යෝජනාව දැන් සංශෝධනය කරලා ද තිබෙන්නේ කියලායි මා අහන්නේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ යෝජනාවේ තිබුණු වචන මට මේ අවස්ථාවේ ඒ ආකාරයෙන්ම මතක නැහැ. නමුත්, මා එහි පිටපතක් ලබා දෙන්න කටයුතු කරන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

එහි තිබෙන්නේ "prosecutors, investigators and judges". කියලායි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

That is, "with the participation of experts including prosecutors and judges" කියලායි තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒක තමයි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

"Participation" කියලා කිව්වාම ඒක අර්ථ නිරූපණය කිරීමේදී ඔවුන් විනිශ්චයකාරවරුන් කිරීමේ-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

That is all I wanted to know. අර්ථ නිරූපණයක් හැටියට ගත්තාම මේක අධිකරණයක් නොවෙයි, යාන්ත්‍රණයක් කියලා අපට තේරුම් ගත හැකියි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඒ එක්කම ජාත්‍යන්තරය තුළ අපේ ස්ථාවරය වුණේ කුමන යාන්ත්‍රණයක් වුණත් අවසානයේ ඒ යාන්ත්‍රණය නිර්මාණය කරන්නේ මේ පාර්ලිමේන්තුව නිසා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ අදහස් අනුව තමයි ඒක කෙරෙන්නේ කියන එකයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මා ඔය කියන ඔක්කෝම පිළිගන්නවා. ඔබතුමාට මතක නැති වුණාට ඒ යෝජනාවේ තිබුණු විධිය මට මතකයි. "International judges, prosecutors and investigators" කියලායි තිබුණේ. නමුත්, ඒක දැන් අර්ථ කථනය වෙලා judges, prosecutors, investigators නොවෙයි, "mechanism with international experts" කියලා කියනවා. දැන් ඒ විධියේ අර්ථ කථනයක් ඔබතුමා ඇති කර ගෙන තිබෙන එක ගැන අපි සතුටුයි. ඒ වාගේම අපේ ජනාධිපතිතුමාත් එවැනි ස්ථාවරයක් උඩ ඉඳගෙන දිගටම ප්‍රකාශයන් කර තිබෙනවා. ඒ යෝජනාවේ තිබුණු වචනවල අර්ථය ඒ විධියටම අපට ගන්න බැහැ කියන එක තමයි කිව්වේ. මේ විධියට අර්ථ කථනයක් එනවා නම් භාර ගන්න පුළුවන් කියන එකයි කියා තිබුණේ. ඒ ගැන අපි සතුටින් හිටියා. නමුත්, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ විදේශ කටයුතු ඇමතිතුමා පෙරේදා කර තිබුණු ප්‍රකාශයෙන් ආපසු මේ ඔක්කෝම මහා පටලැවිල්ලකට ගියා. එතුමා කියා තිබුණා, "ජනාධිපතිතුමාගේ ප්‍රකාශය මේ ප්‍රජාතන්ත්‍රවාදී රටේ තවත් මතයක් පමණයි" කියලා. එතැනදී අපට ප්‍රශ්නයක් මතු වෙනවා. අපි කවුරුත් හිත හදාගෙන හිටියා මේ යෝජනාවේ මොනවා තිබුණත් ඔබතුමා කියන අර්ථ කථනය තමයි අපි මේකට දෙන්නේ කියලා.

ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා කිව්වා වාගේ අපේ ව්‍යවස්ථාව තුළ වෙන දෙයක් කරන්න බැහැ. දැන් එහෙම හිත හදා ගෙන ඉන්නකොට විදේශ කටයුතු ඇමතිතුමා ගිහිල්ලා කියා තිබෙන කථාව බරපතළව අපට දැනෙනවා. අපි හිතාගෙන හිටපු, ඔබතුමා දැන් කියාපු දේ නොවෙයි, එතුමාගේ ප්‍රකාශය අනුව එතුමා හිතේ තියාගෙන ඉන්නේ. ඒකයි මට තිබෙන ප්‍රශ්නය. නැත්නම් එතුමාට කියන්න තිබුණා, "ඔව්, ජනාධිපතිතුමා කිව්ව දේ, නැත්නම් අගමැතිතුමා කිව්ව දේ අනුව තමයි අපි මේ ගැන කටයුතු කරන්නේ" කියලා. ඒ කිව්ව වචනය කටින් ලිස්සලා ගිය වචනයක් කියලා කිව්වොත් ඒ කථාව එතැනින් ඉවර කරන්න පුළුවන්. "That was only a slip of the tongue" කිව්වොත් එතැනින් කථාව ඉවර වෙනවා. එහෙම නැත්නම් ඒක බරපතළ කාරණයක්. ඔබතුමා වුණත් පිළිගනීවි. "ජනාධිපතිතුමා කිව්ව වචනය, ප්‍රකාශය, එතුමාගේ ස්ථාවරය මේ ප්‍රජාතන්ත්‍රවාදී රටේ තවත් මතයක් විතරයි. මේ කිව්ව කථාවත් නොවෙන, අර කථාවත් නොවෙන විසඳුමක් මම දෙනවා." කියලා එතුමා කියනකොට ඒක ගැන බරපතළ ප්‍රශ්නයක් මතු වනවා.

කෙසේ නමුත්, මෙය තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලය කථා කර ගත යුතු තීරණයක්. ඒ ගැන අපට කියන්න තිබෙන්නේ, අපි ජනාධිපතිතුමාගේ ප්‍රකාශය මතත් ඔබතුමා දැන් දුන්නු ඒ අර්ථ කථනය මතත් ඉඳගෙන මේ ගැන තියා ගත්තු විශ්වාසයට බරපතළ විධියට අභියෝගයක් ඇවිත් තිබෙනවා කියන එකයි. ජනාධිපතිතුමාගේ ප්‍රකාශයටත් අභියෝගයක් ඇවිල්ලා තිබෙනවා. මේකට යම් විසඳුමක් අවශ්‍යයි. මට තේරෙනවා මේ තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා අර්ථ කථනය වශයෙන් ඔතැන ඉඳන් ඔහොම කිව්වාට එතුමා තමයි ඒ දුෂ්කර තත්ත්වයට මුහුණ දෙන්නේ. He is the one who has to face the music. අර යෝජනාවට අත්සන් කරපු කෙනෙකු හැටියට ජිනීවා ගියාම

එතුමාට සිද්ධ වෙලා තිබෙනවා, ඒ යෝජනාවේ පාර්ශ්වකරුවන්ගේ interrogationවලට උත්තර දෙන්න. ඉතින්, ඒ අමාරුකමට එතුමා පත් වෙලා තිබෙනවා.

මොකද, ජනාධිපතිතුමා ගත් ස්ථාවරය ඊට වඩා වෙනස්. එතුමා එතැනට ගියාම කියනවා, වචනවල තිබෙන අර්ථයෙන්ම, ඒ වචනවල තිබෙන ජීවයෙන්ම එය ක්‍රියාත්මක විය යුතුයි කියලා. ඒක ටී.එන්.ඒ. පක්ෂයත් කියනවා. මේක තමයි එතුමා අහුවෙලා තිබෙන උගුල. මේ වගේ උගුලකට අහුවුණාම,-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි, ඔබතුමා මට වඩා ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙක් විධියට දන්නවා, කවුරු හෝ කෙනෙක් මේ රටේ විනිශ්චයකාරවරයකු විධියට පත් වුණොත් ජනරජයට පක්ෂපාති වන බවට සහ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරනු ලබන බවට දිවුරුමක් දෙන්න ඕනෑ බව.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මම සම්පූර්ණයෙන් පිළිගන්නවා ඔබතුමා කියන දේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එතකොට විදේශීය රටක පුද්ගලයෙක් අපේ රටට,-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මම පිළිගන්නවා. ඔබතුමා කියන දේ තමයි නිවැරදි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මොකද, මම ජිනීවා සාකච්ඡාවටත් ගියා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
නමුත් මම කියන්නේ ඒකේ තිබෙන්නා වූ වගන්ති, වචන, වාක්‍ය, ඒවායේ තිබෙන්නා වූ dictionary meaning එක අරගත්තාම එන්නා වූ ගැටලුවක් තිබෙනවා. නමුත් ඔබතුමා කියන හැටියට "ඒවා මොනවා වුණත්, අපේ අර්ථකථනයක් තුළයි මේක කෙරෙන්නේ" කියන එක මගේ හිතට සැනසීමක්. නමුත් එතුමා අහුවෙලා ඉන්නේ එක්තරා අමාරු තැනකට. ඒකෙන් ගැලවෙන්නේ කොහොමද කියලා එතුමාම හිතාගන්න ඕනෑ.

මම දැන් අනෙකුත් කාරණාවලට එන්න ඕනෑ. කම්කරු උසාවිය ගැන කථා කළොත්, සමථ මණ්ඩලයයි, කම්කරු උසාවියයි කියන දෙක ඇත්තටම ටිකක් එක හා සමාන අර්ථයකින් ක්‍රියාත්මක වුණු ආයතන දෙකක්. ඒක නොවිධිමත් ආකාරයෙන් තිබෙන්නේ. කම්කරු උසාවිය හැකි තරම් දුරට අධිකරණමය නොවන ස්වභාවයක,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have only one more minute.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
I beg of you to give me more than one minute, I do not want to say how many. Please give me more than just one minute because I have to complete my speech.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නීතිඥ නොවන අයට කම්කරු උසාවියේ පෙනී සිටින්න තිබෙන අයිතිය පිළිබඳව වගන්තියකින්ම කියලා තිබෙනවා. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා ඊයේ කරපු ප්‍රකාශය ඔබතුමා මේ වෙනකොට ලබාගෙන ඇතැයි කියා මා සිතනවා. ඔබතුමා මැදිහත් වෙලා අධිකරණ සේවා කොමිසමට- ඔබතුමාට බලයක් නැහැ, ඒක ස්වාධීන තැනක්. - අපේ පාර්ලිමේන්තුවේ පණිවුඩකරුවා වෙන්න. මුළු පාර්ලිමේන්තුවම එක හඬින් කියා සිටිනවා, "ඔක නම් කරන්න යන්න එපා" කියලා. එහි තිබෙන අධිකරණමය නොවන සමථයකට ගෙන ඒමට හැකිතාක් දුරට බලන්න, බැරිනම් නඩු විභාගයක් කර තීන්දුවක් දෙන ක්‍රියාවලිය හැකි තරම් දුරට ඒ මට්ටමේ සිටින ඉල්ලුම්කරුවන් වූ නියෝජිතයන් ඇතුළත් කර ගෙනයන්න පුළුවන් වැඩ පිළිවෙළක් හැටියට තියන්න. සමථ මණ්ඩලය වාගේම දීර්ඝ කාලයක් තිස්සේ මේ කම්කරු විනිශ්චය සහාත් සාර්ථක වෙලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමා එය කරනවා ඇතැයි කියා මා විශ්වාස කරනවා. සමථ මණ්ඩලය නම් වෙනස් කරන්න යන්න එපා. එය විධිමත් ආකාරයට හදන්න යන්න නම් එපා. එතකොට ඒකත් නැති වෙයි.

අපි ඉන්දියාවේ පංචායත් සභා ගැන කථා කරනවා. අපි පංචායත් සභා ගැන හුඟක් ඉහළින් කථා කරලා ඒවා අධ්‍යයනය කරන්නත් යනවා. මොන එහෙකටද? අපි සමථ මණ්ඩලය හරහා මෙහේ පංචායත් සභා ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ සමථ මණ්ඩලයේ තිබෙන්නා වූ මූලික ගුණය තමයි එහි තිබෙන නොවිධිමත්භාවය. දැන් ඒක විධිමත්භාවයකට පෙරළන්න එපා. හැබැයි, අවශ්‍ය කරන පුටු, මේස ටික සපයන්න. අවශ්‍ය කරන පුටු, මේස ටික සපයලා ලියාගන්න දෙයක් ලියාගන්න පුළුවන් වෙන්න ලිපිකරුවෙක් සපයන්න. එච්චරම පමණයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, I can give you a few minutes. You can continue your speech.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
Thank you very much, Sir. I have a lot to say. I thank you again.

දැන් මම මේක දිගින් දිගට කියන්න අවශ්‍ය නැහැ. මොකද, ගරු ඇමතිතුමායි, මමයි ඒ ගැන එකම අදහසක් දරන බව මට දැන් තේරෙනවා. කාර්යාල වෙනම දාලා, වෙනම විධියක විධිමත් ක්‍රමවේදයන් හැදුවත්, ආරවුලට පැටලී සිටින දෙපාර්ශ්වය ගෙන්වලා, ගමේ ඉන්න ප්‍රභූවරුන් එකතු වෙලා, මේකේ හොඳ නරක කථා කරලා, පුළුවන් නම් දෙපාර්ශ්වය සමාදාන කරන එක කරන්න හොඳම තැන තමයි පන්සල, එහෙම නැත්නම් දේවස්ථානය, එහෙමත් නැත්නම් පල්ලිය. ආගමික සංවේදීතාවන් සහිත අය සිටින නිසා මුස්ලිම්වරුත් සිටින, දෙමළ උදවියත් සිටින තැනක ගන්නත් පුළුවන්. පන්සලම විය යුතුයි කියලා අපි කියනවා නොවෙයි. හැකිතාක් දුරට ඒ ඒ ගම්වල සිටින ජනයාගේ තිබෙන්නා වූ ජන ජීවිතයත් එක්ක එකට බැඳුණු ආකාරයට තමයි මේ සමථ මණ්ඩල ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේකේ මූලික සංකල්පය එකයි.

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

අපි පංචායත් සභා ගැන අගය කරන්නෙත් ඒ නිසායි. මම ඔබතුමාට කියා සිටින්නේ, මේවාට අවශ්‍ය කරන පුටු, මේස සහ ලිපිකරුවෙක් ලබා දෙන්න. නමුත්, මේවායේ තිබෙන මූලික ස්වරූපය නම් වෙනස් කරන්න හදන්න එපා කියලායි. එහෙම වුණොත් අපි සම්පූර්ණයෙන්ම කරන්න යන්නේ ලොකු අපරාධයක්. මේ රටේ දීර්ඝ කාලයක් ඉතාමත්ම හොඳ ජන සම්ප්‍රදායක් ගොඩ නැඟුණා, සමථ මණ්ඩලයත් එක්ක. ඒ ජන සම්ප්‍රදාය අපි රැක ගන්න ඕනෑ.

ඊයේ ගරු අගමැතිතුමා කරපු ප්‍රකාශය ගැන මම භීතියට පත් වෙලා හිටියේ. මම දන්නේ නැහැ, ඇමතිතුමාට කොහොම හිතුණාද කියලා. අපි එකඟ නොවන බොහෝ නඩු තීන්දු තිබෙනවා. ඒ, සමහර විට අපි පෙනී සිටියේ ඒ පැත්තට නිසා නොවෙයි. අපි පෙනී සිටිය පැත්ත හැමදාම දිනන්න ඕනෑ කියලා අපි අදහස් කරලා නැහැ. සමහර විට අපිට විරුද්ධව හොඳ නඩු තීන්දුවක් දෙන කොට අපි ඒක අගය කරලා තිබෙනවා. මොකද, අපි දන්නවා, ඒ නඩු තීන්දුවේ දක්වන කරුණු දැක්වීම හරිම වටිනවා කියලා. සිංහරාසා නඩු තීන්දුව අනුව පහළට ගලා ගිය නඩු තීන්දු රාශියක් අපේ රටේ තිබෙනවා. ඔය නඩු තීන්දු ඔක්කෝම ආපසු හරවලා විනිශ්චයකාරවරුන්ගේ තීරණය පාර්ලිමේන්තුව මඟින් නිෂ්ප්‍රභ කරවන්නට හදනවා නම්, එය එක්තරා විධියක අරාජිකත්වයක් ඇති කිරීමේ හේතුවක් වෙයි කියලායි මම කියන්නේ. අවුරුදු ගණනාවක් තිස්සේ දීපු නඩු තීන්දු ගණනාවකම තීන්දු වැරැදි තීන්දු වෙන්නත් පුළුවන්. ජාත්‍යන්තරයෙත් එහෙමයි. වැරැදි නඩු තීන්දු දීලා තිබෙනවා. නමුත්, අපට ඒ නඩු තීන්දු reverse කරන්න බැහැ. ඒ නඩු තීන්දු තිබෙනවා. පාර්ලිමේන්තුවට තිබෙන්නේ, මේ නඩු තීන්දුත් සැලකිල්ලට අරගෙන අපේ ව්‍යවස්ථා සම්පාදන කාර්යය ඉෂ්ට කරන්නයි. ඒකයි අපි කළ යුත්තේ. පාර්ලිමේන්තුව කළ යුතු කාර්යභාරය ව්‍යවස්ථා සම්පාදනයයි; නැත්නම් නීති සම්පාදනයයි. එහිදී අපි අධිකරණයෙන් දෙන ලද වැරැදි නඩු තීන්දුත් සැලකිල්ලට ගත යුතුයි.

සරත් එන්. සිල්වා මැතිතුමා සිංහරාසා නඩුවේ දුන්නු තීන්දුව වැරැදියි කියලා මම මොහොතකටවත් පිළිගන්නවා නොවෙයි. ICCPR එක ගැන දීපු නඩු තීන්දු වැරැදියි කියලා මම පිළිගන්නේ නැහැ. මම හිතන්නේ අපේ රටේ ස්වෛරී බලය අපි රැක ගන්න ඕනෑ, ඇමෙරිකාවේ Helms-Burton නීතිය වාගේ. ඔබතුමා දන්නවා, ඇමෙරිකාවේ Helms-Burton කියලා නීතියක් තිබෙනවා කියලා. එම නීතිය අනුව ඇමෙරිකාවේ නීතියකට පටහැනිවන කුමන වූ ජාත්‍යන්තර නීතියක්වත් පිළිගන්නේ නැහැ. ඒක තමයි ඇමෙරිකාවේ අධිකරණ විද්‍යාව. එම අධිකරණ විද්‍යාව අනුව ලෝකයේ කුමන නීතියක් කොහේ තිබුණත්, -ජාත්‍යන්තරව වුණත් - එය ඇමෙරිකාවේ නීතියට පටහැනි නම් ඒ නීතිය ඇමෙරිකාවේ අධිකරණය පිළිගන්නේ නැහැ. ඒක තමයි එහි තිබෙන්නා වූ සිද්ධාන්තය. මම කියන්නේ අපටත් ඒ වාගේ ස්වෛරී බලයක් තිබෙනවා කියලායි. අපේ රටේ ස්වෛරීභාවය ගැන ඔබතුමා දැන් මොහොතකට කලින් කිව්වා. ඒ ස්වෛරීභාවය අනුව අපට අපේ රටේ තීන්දු තීරණ ඉක්මවා, අපේ රටේ දැනට තිබෙන්නා වූ, අපගේ නීති රාමුව අභිභවා එන්නා වූ යම් ජාත්‍යන්තර ප්‍රඥප්තියකට අපි අත්සන් කරන නිසා, ඒ ප්‍රඥප්තියට අපේ රටේ නීතිය යටත් කියන මතයට විරුද්ධවයි ඒ නඩු තීන්දු දීලා තිබෙන්නේ. ප්‍රඥප්තියකට අත්සන් කළ පළියටම ඒ ප්‍රඥප්තියට අපේ රටේ නීතිය යටත් විය යුතුයි කියන අදහස ප්‍රතික්ෂේප කරමින් තමයි ඒ නඩු තීන්දු දිගටම ඇවිත් තිබෙන්නේ. ඒ නිසා ඒ නඩු තීන්දු නිෂ්ප්‍රභ කරන්නට මේ පාර්ලිමේන්තුවේ යෝජනා ගෙන එන්නට හෝ සාකච්ඡා ආරම්භ කරන්නට ලැහැස්ති වුණොත් මේ රට එක්තරා විධියක පිස්සු මඩුවක් වෙයි. ඒ වෙනුවට කරන්න තිබෙන්නේ, සියලුම දේවල් සැලකිල්ලට අරගෙන -හරි වේවා, වැරැදි වේවා- නව නීති සම්පාදනය කිරීමයි. නමුත්, යම් කිසි නඩු තීන්දුවක් වැරැදියි කියලා අපට නීතියක් සම්පාදනය කරන්න බැහැ. ඒක අපේ රටේ ව්‍යවස්ථාව අනුවම කරන්න බැරි දෙයක්. පුද්ගලයෙක් මුල් කර ගෙන නීතියක් හදන්න බැහැ වාගේම, යම් කිසි නඩු තීන්දුවක් වැරැදියි කියලා මේ ගරු සභාවේ දී අපට නීතියක් හදන්න පුළුවන්ද? බැහැ.

මම ඉස්සෙල්ලා කිව්වා වාගේ අපට කරන්න තිබෙන්නේ, සියලුම දේ සැලකිල්ලට අරගෙන නව නීති සම්පාදනය කිරීමේ බලය දීමයි. එහෙම නම් බල විභේදනයට - separation of powers - මොකද වෙන්නේ? එහෙම නම් බල විභේදනයක් නැහැ. හැබැයි, මේකේ ඔබතුමන්ලාට පොඩි practice එකක් තිබෙනවා. ඒ තමයි, අග්‍ර විනිශ්චයකාර මොහාන් පීරිස් මහතා ඉවත් කිරීමට ගත්තා වූ ක්‍රියා මාර්ගය. ඔහු අස් කළ යුතු පුද්ගලයෙක්. මම සම්පූර්ණයෙන් එකඟයි. නමුත්, අස් කිරීමට ගත් ක්‍රියා මාර්ගය අරාජික ක්‍රියා මාර්ගයක්. ඒ ක්‍රියා මාර්ගයම ඊළඟට ගත්තොත් ඊළඟට එන ආණ්ඩුව එතැනින් ඇවිළිලා යන්නේ අරාජික ක්‍රියාදාමයකට. ඒ නිසා මම කියන්නේ, ඒ කරපු වැඩේ ගැන කල්පනා කරලා එවැනි වූ මාවතකට නොවැටී යන ගමනක් වෙත ආණ්ඩුව යොමු වෙන්න කියලායි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ මේ විවිධ යෝජනා හා රෙගුලාසිවල ලොකු වටිනාකමක් තිබෙනවා. ග්‍රාම නිලධාරිවරයා ඒ කොට්ඨාසයට පමණක් සමාදාන විනිශ්චයකාර නොකර දිස්ත්‍රික්කයටම සමාදාන විනිශ්චයකාර කිරීම හොඳයි කියා මා හිතනවා. මොකද, ග්‍රාම නිලධාරී- [බාධා කිරීමක්] ග්‍රාම නිලධාරි ඉන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නේ. දිස්ත්‍රික්කයේම මිනිස්සු එහාට මෙහාට යනවා. ඒ නිසා ග්‍රාම නිලධාරිවරුන්ට සමහර විට තමන්ගේ ප්‍රදේශයේ ඉඳලා දිස්ත්‍රික්කයේ වෙනත් තැනකට ගිය කෙනෙකු වෙනුවෙනුත් අත්සන් කරන්න වනවා. ඒ නිසා මම කියන්නේ, මුළු දිස්ත්‍රික්කයටම සමාදාන විනිශ්චයකාර වශයෙන් ග්‍රාම නිලධාරි පත් කරන්න කියලායි. අනෙක් එක, අපේ ජනාධිපතිතුමාත් ඒ කාලයේ ග්‍රාම නිලධාරි කෙනෙක් නේ. ඒකටත් සැලකීමක් කරන්න ඕනෑ. ග්‍රාම නිලධාරි කෙනෙකුට ජනාධිපති කෙනෙක් වෙන්න පුළුවන් බව අපි දන්නවා. අපි ඒක අගය කරනවා. ඒ නිසා ඔබතුමා ගෙනා මේ යෝජනා මඟින් සමථ මණ්ඩලය රැක ගෙන, සමථ මණ්ඩලයේ බල පරිමාණය පුළුල් කරගෙන ඉදිරියට යෑමෙන් ලොකු මෙහෙවරක් කරන්න පුළුවන් වෙයි කියලා මා හිතනවා. ඔබතුමාට ස්තුතියි.

[අ.භා. 2.42]

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අධිකරණ ඇමතිතුමා විසින් දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කරන ලද සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වවන ස්වල්පයක් කථා කරන්න මා බලාපොරොත්තු වනවා.

ග්‍රාමීය මට්ටමේ තිබෙන නඩු සමථයකට පත් කිරීම සම්බන්ධව පසු ගිය කාල පරිච්ඡේදය තුළ සමථ මණ්ඩලවලින් විශාල මෙහෙවරක් වුණා. නමුත්, සමථ මණ්ඩලවලට පවා ඉදිරිපත් වුණු නඩු ඇසීම පක්ෂග්‍රාහීව, වාසි අවාසි අන්දමට, එක එක අරමුණු ඔස්සේ සිද්ධ වුණා. දේශපාලන වශයෙනුත් ඒ කටයුතු සිද්ධ වුණා කියන එක මා මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. ඒ වාගේ බලපෑම් සමහර පළාත්වල ඇති වුණා. නුවරඑළිය දිස්ත්‍රික්කයේත් ඒ වාගේ දේවල් සිද්ධ වුණ බව මා විශේෂයෙන්ම කියන්න ඕනෑ.

අද යහ පාලන රජය යටතේ අධිකරණ පද්ධතිය සම්පූර්ණයෙන්ම යහ පාලන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. නිදහස් අධිකරණයක් මේ රටේ ඇති වෙලා තිබෙනවා. රටේ

ජනතාවට නිදහසේ තමන්ගේ කටයුතු කිරීමට අවස්ථාව සැලසිලා තිබෙනවා. එවැනි අවස්ථාවක මෙවැනි පනත් කෙටුම්පතක් තුළින් බලාපොරොත්තු වන්නේ, තිබෙන්නා වූ අඩු පාඩු සම්පූර්ණ කරලා, සමඵ මණ්ඩලවලින් ලැබෙන්නා වූ සේවාව වැඩිදියුණු කරලා එය ඉදිරියට ගෙන යාමයි. මෙහි තිබෙන අඩු පාඩු ගැන මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමන්ලාත් පෙන්වා දුන්නා.

ඇත්ත වශයෙන්ම සමඵ මණ්ඩලයට ඉදිරිපත් වන නියෝජිත මහත්වරු ගෙවීමක් ලැබීමකින් තොරව සද්භාවයෙන් ඉදිරිපත් වෙලා ගරු සේවයක් කරන අයයි. ඒ මහත්වරුන්ගේ කාල සීමාව තුළ කරන සේවයට යම්කිසි ඇඟයීමක් කරන්න ඕනෑ. ඒ වාගේම එයට තෝරා පත් කර ගන්නා නියෝජිතයන් යම්කිසි ක්‍රමවේදයක් තුළින් තෝරා පත් කර ගන්න ඕනෑ. එක එක අයට හිතුණු හිතුණු විධියට සමඵ මණ්ඩල නියෝජිතයන් පත් කිරීම තුළින් තමයි පසු ගිය කාලය තුළ විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වුණේ. නමුත්, අද එවැනි ක්‍රමයකට තෝරා පත් කර ගන්නේ නැතිව ගරු අධිකරණ ඇමතිතුමා විසින් හොඳ ක්‍රමවේදයක් ඇති කරලා, මෙය ඉදිරියට ගෙන යයි කියන විශ්වාසය අපේ තිබෙනවා.

පසු ගිය කාලය තුළ විශේෂයෙන්ම අධිකරණයේදී වුණු අකටයුතුකම් නිසා සමහර අභිංසක, ඒ වාගේම දුප්පත් අයට අධිකරණයට ගිහිල්ලා යුක්තිය, සාධාරණය ඉෂ්ට කර ගන්න බැරි තත්ත්වයක් තිබුණා. නමුත්, අද එහෙම නොවෙයි. අද යුක්තිය, සාධාරණය ඉෂ්ට කරගන්න පුළුවන් තත්ත්වයකට රට පත් වෙලා තිබෙනවා. ඕනෑම කෙනෙකුට අධිකරණයකට ගිහිල්ලා ඕනෑම ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා තමන්ට යුක්තිය, සාධාරණය ඉෂ්ට කරගන්න පුළුවන් තත්ත්වයකට අද රට පත් වෙලා තිබෙනවා.

අද මේ ඉදිරිපත් කරලා තිබෙන සංශෝධනය ඉතා හොඳයි. ඒ ගැන මම මීට වඩා කථා කරන්නේ නැහැ. විශාල වශයෙන් ගොඩ ගැසී තිබුණු නඩු මේ තුළින් නිරාකරණය කර ගන්න පුළුවන්. මේ වනකොට විශාල සංඛ්‍යාවක්ව තිබුණු ඉඩම් ආරාවුල් ගොඩක් නිරාකරණය කරලා තිබෙනවා. ඒ වාගේම පවුල් ආරාවුල් වාගේ දේවල්, මීල මුදල් සම්බන්ධව තිබෙන්නා වූ ප්‍රශ්න ගොඩක් පොලීසියට, අධිකරණයට යන්නේ නැතිව සමඵ මණ්ඩලය තුළින් නිරාකරණය කරන්න පුළුවන් තත්ත්වයට අද රට පත් වෙලා තිබෙනවා. මා ඒ ගැන විශේෂයෙන් සන්තෝෂ වනවා.

සමඵ මණ්ඩල වැනි අංශ තවත් වැඩිදියුණු කරන්න ඕනෑ. ඒ අයට තිබෙන අඩු පාඩුකම් සපුරන්න ඕනෑ. ඒ අයට කාර්යාලයක් තිබෙන එකත් හොඳයි. කාර්යාලයක් දුන්නාම සේවකයනුත් ඉල්ලයි. සේවකයන් දුන්නාම තවත් අඩු පාඩු ඉල්ලයි. ඒ වාගේ සියලු දේවල් සම්පූර්ණ කළාම සමඵ මණ්ඩලය ගමේ අධිකරණයක් බවට පත් වනවා. ඒ නිසා අධිකරණය හා සමාන තත්ත්වයකට සමඵ මණ්ඩලයත් ගත්තොත් හොඳයි කියන එක විශේෂයෙන් මම මතක් කරනවා. එතකොට අධිකරණයට තිබෙන විශාල බර අඩු වනවා. ඒ අනුව නඩු ක්ෂණිකව විසඳන තත්ත්වයක් ඇති වනවාය කියන එක මම විශ්වාස කරනවා.

ඊළඟට, මම කථා කරන්න යන්නේ සාම විනිසුරු පදවි ගැනයි. සාම විනිසුරු පත්වීම් දීම පසු ගිය කාලය තුළ ඉවක් බවක් නැතිව කළා. සාම විනිසුරු නිලධාරි මහත්ම, මහත්මීන් මේ රටේ කොපමණ ඉන්නවාද කියාවත් අපි දන්නේ නැහැ. උගත්කමක් තිබෙන, මේ පදවිය දිය යුතු පුද්ගලයන්ට දෙන්න ඕනෑය කියන තීරණය අනුව වර්තමානයේ අපේ අධිකරණ ඇමතිතුමා විසින් මේ සඳහා හොඳ ක්‍රමවේදයක් ඇති කර ඒ තුළින් දැන් ඒ පත්වීම් ලබා දීමේ වැඩ පිළිවෙළක් ඇති කරලා තිබෙනවා.

විශේෂයෙන්ම ග්‍රාම නිලධාරි මහත්වරුන්ට මේ පත්වීම් අදාළ බල ප්‍රදේශයට දෙන එක හොඳයි. අපේ ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා යෝජනා කළා වාගේ වසමට වඩා දිස්ත්‍රික්කයටම අදාළ වන පරිදි මේ පදවිය ලබා දෙන එක තවත් හොඳයි. මොකද, දිස්ත්‍රික්කය තුළ මිනිස්සු එහාට මෙහාට යනවා නේ.

යහ පාලන රජය යටතේ සාම විනිසුරු පත්වීම් ලබා දෙන්නේ යම් කිසි අධ්‍යාපන ක්‍රමවේදයකට අනුවයි. සාම විනිසුරු පත්වීම් ලබාදීම ශිෂ්‍යයෙන් වර්ධනය වෙලා වර්තමානය වනකොට මේ පත්වීම් ලබා දීම සම්බන්ධයෙන් යම් පාලනයක් ඇති කර තිබෙනවා. සාම විනිසුරුවන් ගත් කළ කොපමණ ප්‍රමාණයක් ඉන්නවාද කියලාවත් අපි දන්නේ නැහැ. සමහර සාම විනිසුරු නිලධාරීන් තමන්ගෙන් විය යුතු සේවාව මොකක්ද කියන එකවත් දන්නේ නැහැ. තමන්ගෙන් ඒ සේවාව ලබා ගන්න කවුරුන් හෝ ආවාම සමහරු මීල මුදල්, තෑගි බෝග වාගේ දේවල් බලාපොරොත්තු වනවා. ඒ වාගේ දේවල් බලාපොරොත්තුවෙන් තමයි පසු ගිය කාලයේ සාම විනිසුරුවන් කටයුතු කළේ. ඒ ගැන දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළකුත් ඇති වන්න ඕනෑ. පසු ගිය කාලයේ ගණන්කාරයින්ට, එහෙම නැත්නම් චණ්ඩින්ට, හොරුන්ට, තක්කඩින්ට මේ පදවිය ලබා දීලා තිබුණා. එම නිසා ඒ පදවියේ වටිනාකම ගොඩක් අඩුවන තත්ත්වයක් තිබුණා. මීට ප්‍රථම ගම්මුලාදෑනි මහත්මයාට මේ පදවිය දීලා තිබුණා. ඊට පසුව විදුහල්පතිවරුන්ට, ප්‍රදේශයේ පිළිගත් වෛද්‍යවරයෙකුට වැනි අයට තමයි මේ පදවිය ලබා දුන්නේ. ඊට පසුව තමයි හොරුන්, තක්කඩින්, මිනීමරුවන් වැනි අයට මේ පදවිය ලබා දුන්නේ. දැන් එහෙම වන්නේ නැහැ. දැන් මේ පදවිය දෙන පුද්ගලයාගේ සියලුම තොරතුරු, දත්ත ලබා ගෙන, ඇඟිලි සලකුණු ලබා ගෙන තමයි මේ පදවිය ලබා දෙන්නේ. ඒ ගැන ගරු ඇමතිතුමාට විශේෂයෙන්ම මගේ ස්තුතිය පුද කරනවා.

ඊළඟට, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් සාම විනිසුරු පත්වීම් කොපමණ සංඛ්‍යාවක් දීලා තිබෙනවාද කියලා බලන්න ඕනෑ. දිස්ත්‍රික්ක ක්‍රමයට දීලා තිබෙනවාද, දිවයින පුරා දීලා තිබෙනවාද කියලා බලාගන්න සංඛ්‍යා ලේඛන, දත්ත එකතු කර ගත්තොත් ඉදිරියට වටිනවා කියන එක මම විශේෂයෙන් මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මම විශේෂයෙන් වතුකරය ගැනත් කියන්න ඕනෑ.

நாங்க தமிழிலேயும் கொஞ்சம் பேசோணும். இல்லாட்டி, அந்தத் தோட்டப் பக்கம் போகேலாமப் போகும். தலைவர்மார் இருக்காங்க; தோட்ட துரைமார் இருக்காங்க. அங்க தோட்டத்தில வேலை செய்ற ஆக்கள் இந்த certificate எடுக்கிறதுக்கு மிச்சம் கஷ்டப்படணும். Identity card எடுக்கிறதோ இல்லாட்டி birth certificate எடுக்கிறதோ மிச்சம் கஷ்டம். தேடிப் போகணும் town இக்கு. இல்லாட்டி, பெரிய முதலாளிகிட்ட போகணும்! அப்பிடி போயிட்டுத்தான் இந்த certificate வாங்கோணும். இது பெரிய கரச்சல். அதனால தோட்டத்தில இருக்கிற estate managerமார், பெரிய தலைவர்மார் எல்லாருக்கும் இதை கொடுக்கச் சொல்லோணும். ஒவ்வொரு கட்சிட தலைவர்மார் இருக்காங்க. அந்த கட்சி மூலமா பாத்துக் கொடுக்கேலும். அந்த தோட்டத்தில - ஒரு division இலே ஓர் ஆளுக்கு, இரண்டு ஆளுக்கு அப்பிடிக் கொடுத்தா நல்லம். அப்பிடிக் கொடுத்தா அந்த மலைநாட்டில இருக்கிற பிரச்சின முடியும். இல்லாட்டி காப்போத்தல் சாராயம் கொடுக்கோணும்; இல்லாட்டி 100 ரூபாய் - 500 ரூபாய் கொடுக்கோணும்; இல்லாட்டி ஒரு பந்தங்காரனுக்கு - வேலக்காரனுக்கு என்னசரி கொடுக்கணும். அப்பிடிக் கொடுத்தாத்தான் certify பண்ணி அந்த certificate ஐக் கொடுப்பாங்க. அதனால நம்மட Minister கிட்ட சொல்லி இந்த நிலமய உடன மாத்தோணும். அங்கயெல்லாம் 200 union இருக்கு. அப்பிடி இருந்தாலும் union ஆக்கள் தங்கட வேல மட்டுந்தான் பாப்பாங்க. ஆக்களின்ட பிரச்சினைய பாக்க

[ගරු කේ.කේ. පියදාස මහතා]

மாட்டாங்க. அதனால மலையகத்தில இருக்கிற தமிழ் சகோதரமாருக்கு, estate துரைமாருக்கு கட்டாயம் இந்த சாமிவினிசுரு பதவி கொடுக்கோணும் எண்டு நான் சொல்றன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
உங்களுக்கு ஒரு நிமிடம் இருக்கிறது.

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
Thank you.

විශේෂයෙන්ම වතු අධිකාරි මහත්වරුන්ටත්, තලෙයිවර් මහත්වරුන්ටත්, වතුකරයේ ඉන්න කනකපුල්ලේ වාගේ අයටත් සාමිවිනිසුරු පදවි ලබා දෙන්න ඕනෑ. එහෙම දුන්නොත් වතුකරයේ තිබෙන ප්‍රශ්න අඩු වෙනවා. විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කය ගත්තාම සියයට 72ක් පමණ ඉන්නේ වතුකරයේ ද්‍රවිඩ ජනතාව. මම කියපු ආකාරයට සාමිවිනිසුරු පදවි ලබා දුන්නොත් වතුකරයේ ජනතාවට විශාල පහසුවක් වෙන බව මේ අවස්ථාවේදී මතක් කරනවා.

මේ ක්‍රමවේදය තුළින් හැම ප්‍රදේශයකම සාමදාන විනිශ්චයකාරවරුන්ගේ ප්‍රශ්නය නිරාකරණය කර දෙන්න පුළුවන් කියන එක මම විශ්වාස කරනවා. කලින් දුන්නා වාගේ දිගට හරහට, එහෙන් මෙහෙන් තෝරා ගන්නා අයට දෙන්නේ නැතුව, උගත්කම හා සුදුසුකම් පරීක්ෂා කරලා ඒ අනුව ඉතාම සීමිත ප්‍රමාණයකට -දිය යුතු පුද්ගලයන්ට- ඒ තනතුරු ලබා දෙන වැඩ පිළිවෙළක් තමයි දැන් ක්‍රියාත්මක කරන්නේ. ඒක ඉතාම හොඳ වැඩ පිළිවෙළක්. හැම දිස්ත්‍රික්කයකින්ම දිය යුතු පුද්ගලයන් තෝරා ගෙන, හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා මම විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ යෝජනාව අනුව එතුමාගේ වැඩ පිළිවෙළ ඉතාම සාර්ථකව ඉදිරියට ගෙන යන්න ලැබෙවායි කියලා සුබ ප්‍රාර්ථනා කරමින්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාටත් මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමින්, නිහඬ වෙනවා.

[අ.භා. 2.53]

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ සභාවේ සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවත් විවාද වෙනවා. සමථ මණ්ඩල පනත ඉදිරිපත් කළාට පසුව, සමථ මණ්ඩල ක්‍රියාත්මක වුණාට පසුව, මේ රටේ සාමාන්‍ය පුරවැසියන් මුහුණ දුන් අපහසුතා අවම වුණු බව අපි දන්නවා. යම් කෙනෙක් පොලීසියට ගිහිල්ලා යම් පැමිණිල්ලක් ඉදිරිපත් කරලා, එම පැමිණිල්ල උසාවියට ඉදිරිපත් කළාට පස්සේ සමහර අවස්ථාවලදී නැවතත් ඒ පැමිණිල්ල සමථ මණ්ඩලයටම යොමු කරනවා. ඒ පැමිණිලි පොලීසියෙන්ම බේරුම් කරන අවස්ථාත් තිබෙනවා. හුහක් අය උසාවියට යන්නේ ලොකු භීතියකින්. හුහක් වෙලාවට උසාවියකින් තීන්දුවක් දීලා නඩුව අවසන් වන විට පැමිණිලි පාර්ශ්වය සහ විත්ති පාර්ශ්වය නයි පොළොංගු වාගේ වෛරක්කාරයෝ වෙලා තමයි ගමට එන්නේ. නමුත් සමථ මණ්ඩල ක්‍රමය ඇති වුණාට පසුව, හුහක් අය නයි පොළොංගු වාගේ වෛරක්කාරයෝ වෙන්නේ නැතුව ගමට ඇවිල්ලා බොහොම සුහදත්වයෙන් ජීවත්වන තත්ත්වයක් ඇති වුණා. සමථකරණයේ තිබෙන වටිනාකම ඒකයි. ගරු ඇමතිතුමා අද ඒ පනතට සංශෝධනයක් එකතු කරලා තිබෙනවා. පසු ගිය කාලයේදී අපි දැක්කා, සමථ මණ්ඩලයට නියෝජිතයන් පත් කිරීමේදී දේශපාලන ස්වභාවයක් තිබුණු බව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please!

මේ අවස්ථාවේදී මූලාසනය සඳහා ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු පලනි දිගම්බරම් මහතා (කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பழனி திகாம்பரம் - மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சர்)
(The Hon. PalanyThigambaram - Minister of Hill Country New Villages, Infrastructure and Community Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "මේ අවස්ථාවේදී ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ මේ රටේ නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ; මේ රටේ සාධාරණත්වය ක්‍රියාත්මක වුණේ නැහැ. සමථ මණ්ඩලයට නියෝජිතයන් පත් කරද්දීත් හුහක් වෙලාවට දේශපාලන වශයෙන් යම් යම් පක්ෂවලට ගැති වෙලා හිටපු අය පත් වුණු බව අපි දැක්කා. දැනටත් අපේ ප්‍රදේශයේ දේශපාලන වශයෙන් යම් යම් පක්ෂවල ක්‍රියාකාරීව හිටපු අය තමයි සමථ මණ්ඩලවල ඉන්නේ. යම් යම් සිදුවීම් සම්බන්ධයෙන් අද මේ රටේ ජනතාව කුලප්පු කරලා පාරට ඇද දමන්න යම් යම් බලවේග විසින් කටයුතු කරනවා. හැබැයි, 2015 ජනවාරි 08 වැනි දාට පසුව මේ රටේ වෙනසක් සිදු වුණා. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා. ඒ වෙනස නිසා තමයි මේ සියල්ල සිද්ධ වෙන්නේ.

අපේ ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා මගේ කථාව කරන මේ අවස්ථාවේ මේ ගරු සභාවේ සිටියා නම් හොඳයි. මොකද, එතුමා කියනවා, "හිටපු අග්‍රාණ්ඩුකාරතුමිය අයින් කරපු එකට මම සන්තෝෂ වෙනවා, නමුත් ක්‍රමය වැරදියි" කියලා. හැබැයි එතුමා දැන් මෙතැනදී එහෙම කිව්වාට, එදා එහෙම කිව්වේ නැහැ. මම හිතන විධියට එදා ඒ වාගේ කියපු අය ජීවත්වෙලා හිටියේත් නැහැ. එදා මේ රටේ තිබුණු නීතිය වල් වැදිලා තිබුණා; නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. හැබැයි, ජනවාරි මාසයේ 08 වැනි දාට පසුව අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් ඇතුළු අප සියලුදෙනා උත්සාහ කරන්නේ ක්‍රමක්‍රමයෙන් මේ රටේ නීතිය ස්ථාපනය කරන්නයි.

අපි අහලා තිබෙනවා, "සුපිරි ප්‍රජාතන්ත්‍රවාදය" තිබෙනවා යැයි කියා ගන්නා ජර්මනිය වාගේ රටවල පවා පසු ගිය කාලයේ - හිට්ලර්ගේ යුගයේ- නීතිය ක්‍රියාත්මක වුණේ නැති බව. හැබැයි, දැන් ඒ රටවල්වල නීතිය ක්‍රියාත්මක වෙනවා; සුපිරි ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවා. අපිත් එතැනටයි එන්නේ. අපි එතැනට එන පසුබිමක් තමයි හදන්නේ.

අපි දැක්කා, පසු ගිය කාලයේ නීතිය ක්‍රියාත්මක වුණු හැටි. පසු ගිය දවස්වල අපි දැක්කා, පසු ගිය පාලන කාලයේ අපරාධ කළ අය, හොරකම් කළ අය FCID එකට අරගෙන ගිය හැටි. හැබැයි, FCID එකට අරගෙන ගිහින්, එතැනින් උසාවියට ගිහින් එළියට බැහැලා ඔවුන් කිව්වේ, "අපට උසාවියෙන් සාධාරණය ඉෂ්ට වුණා" කියන එකයි. එසේ උසාවියෙන් සාධාරණය ඉෂ්ට වෙන තත්ත්වය හැදුවේ අපි. ජනවාරි මාසයේ 08 වැනි දායින් පසුව ඇති වුණු වෙනස තුළින් තමයි, උසාවියෙන් සාධාරණය ඉෂ්ට වෙන තත්ත්වය හැදුණේ. අපි පැහැදිලිවම ඒ වෙනස සිදු කළා. ඒ වෙනස ගැන අද FCID ගිය හුහක් අය කියනවා. නීතියෙන් සාධාරණය ඉෂ්ට වුණා කියලා ඔවුන් කියනවා.

එදා පොලීසියෙන් සාධාරණය ඉෂ්ට වුණේත් නැහැ; නීතියෙන් සාධාරණය ඉෂ්ට වුණේත් නැහැ. මහ රජ වාසලේ ඉන්නා රජතුමාට පක්ෂපාතී අයට විතරයි, සාධාරණය ඉෂ්ට වුණේ. රජ ගෙදරට පක්ෂපාතීව හිටපු අය ඕනෑ තරම් සිටියා. රජ ගෙදරට පක්ෂපාතීව සිටිමින් අපරාධ කළ අය ඕනෑ තරම් එළියේ සිටියා. මේ රටේ ජනතාවගෙන් හුහක් අයට ඒක තේරෙන්නේ නැහැ. අපි හිතනවා, ක්‍රමානුකූලව ජනතාවට ඒක අවබෝධ වෙයි කියලා.

අද මේ රටේ නීතිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් අප සතුටු වෙන්න ඕනෑ. අද රට තුළ නීතිය ක්‍රියාත්මක වෙමින් පවතිනවා. පසු ගිය කාලයේ ගෙනා දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මේ රටේ තිබුණු නීතිය, ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන් විනාශ කළා. නමුත් අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් යහ පාලන රජය යටතේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා නැවත මේ රටේ නීතිය ක්‍රියාත්මක වන තත්ත්වය ඇති කරලා තිබෙනවා; කාටත් සාධාරණය ඇති කර තිබෙනවා. අද ඕනෑ කෙනෙකුට සමානව නීතිය ක්‍රියාත්මක වෙනවා. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා.

ගරු ඇමතිතුමනි, සමථකරණයේ යෙදී සිටින අය ගරු සේවයක් කරන්නේ. ඒ නිසා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා සමථකරණ කටයුතු කරන ඒ අයට ගරුත්වයක් ලබා දෙන්න කියලා. මුදලකට සීමා කරන්නේ නැතුව ඒ අයට යම් වටිනාකමක් ලබා දෙන වෙන විධියේ ක්‍රමයක් හදන්න කියලා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සමථ මණ්ඩල ක්‍රියාත්මක කරන සමථ මූල මණ්ඩලවල සිටින සභාපතිවරුන් වාගේම සමහර තැන්වල සිටින නියෝජිතයන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධවත් සොයා බලන්නය කියලා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ ගොල්ලන්ගේ දේශපාලන වටපිටාව ගැන සොයා බලන්න අවශ්‍යතාවක් නැහැ. හැබැයි, ඒ ගොල්ලන් දේශපාලනය කරනවාද, නැද්ද කියලා සොයා බලා ක්‍රියාත්මක වෙනවා නම් එයත් බොහොම වටිනා දෙයක් හැටියට මම දකිනවා.

අද දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පතට සියලු දෙනාගේම සහයෝගය ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.01]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී මේ රටේ නීතිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබාදීම පිළිබඳව මම මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පසු ගිය කාල පරිච්ඡේදය පුරා මේ රටේ බලයේ හිටපු නොයෙකුත් ආණ්ඩු නීතිය ක්‍රියාත්මක කරපු ආකාරය පිළිබඳව අපිට සතුටු වෙන්න පුළුවන් කාරණා වාගේම කනගාටු විය යුතු කාරණාත් අපේ ඇස්වලින්ම දැක තිබෙනවා. සමථ මණ්ඩල පනතට සංශෝධනයක් ගෙනැවිත් තිබෙන මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සමථ මණ්ඩලය ක්‍රියාත්මක වෙන ආකාරය පිළිබඳව මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන් නොයෙකුත් අදහස් දැක්වූවා.

මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කළ යුතු දෙයක් තිබෙනවා. මේ සමථ මණ්ඩලවල සාමාජික මහත්වරුන් ඉතා අපහසුවෙන් තමයි එම සමථ මණ්ඩලවල කටයුතු කරන්නේ. අඩුම ගණනේ කාර්යාලයක් කරගෙන යාමටවත්, ලිපි ලේඛන සකස් කර ගැනීම සඳහාවත් අවශ්‍ය පහසුකම් ඔවුන්ට සපයා නැහැ. ඒ වාගේම අතින් ලියන ලිපි ලේඛන තමයි සියලු පාර්ශ්වකරුවන් සඳහා ලබා දෙන්නේ. ඒ නිසා මේ සමථ මණ්ඩල පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබා දීමේ යම් ආකාරයක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා නම් හොඳයි. ඒ වාගේම මේ සමථ මණ්ඩල පැවැත්වීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කළොත්, සමථ මණ්ඩලයේ තිබෙන ගෞරවය නැති වෙන්න පුළුවන් කියලා මම හිතනවා. ඒ නිසා දැනට තිබෙන ආකාරයට පන්සල, පාසල, පල්ලිය සහ කෝවිල ආදී සිද්ධස්ථාන තුළ සමථ මණ්ඩල ක්‍රියාත්මකවීම බොහොම හොඳයි. එහි යන කෙනාටත් ගෞරවයක් ඇති වෙනවා. ඒ නිසා සමථ මණ්ඩල සඳහා එම පසු බිම ඉතාම හොඳයි. ප්‍රජා සංවිධාන සඳහා අපේ විමධ්‍යගත මුදල්වලින් ආර්ථික වශයෙන් උදවු කරන්න අවස්ථාවක් අපට තිබෙනවා. හැබැයි, සමථ මණ්ඩල සඳහා අපිට මුදල් නිදහස් කිරීමේ අවසරය නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා සමථ මණ්ඩල සඳහා යම්කිසි මුදලක් ලබාදීමට අපට අවකාශ ලැබෙනවා නම් හොඳයි කියලා මේ ගරු සභාවේදී මා යෝජනා කරනවා.

පසු ගිය කාලයේ වූ සිදුවීමක් ගැන මම විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. මේ සිදුවීම ආන්දෝලනයට ලක් වුණු කාරණයක් වුණා. සමහර මාධ්‍යවල විකෘති ස්වභාවයෙන් මේ කාරණය පිළිබඳව සාකච්ඡා කළා. සමහර මාධ්‍ය ජනතාව නොමඟ හරින ආකාරයට කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දිනවල මාදිවෙල පාර්ලිමේන්තු මන්ත්‍රී නිල නිවාසයක තිබුණු ඩිෆෙන්ඩර් රථයක් පිළිබඳව මේ රටේ මහා ආන්දෝලනයකට ලක් වුණා. ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමාත්, මමත් මේ කාරණය ඉස්මතු කළේ මේ රටේ වුණු අයහපත් දේවල් නැවත නොවෙන්නයි. මම හිතන විධියට මේ වෙනකම් ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රථය ගැන මම හොඳින් දන්නවා. මේ ඩිෆෙන්ඩර් රථය තවමත් මාදිවෙල පාර්ලිමේන්තු මන්ත්‍රී නිල නිවාසයක තිබෙනවා. මේ දැන් මා අතේ තිබෙන ඡායාරූපයේ තිබෙන්නේ ඒ මෝටර් රථයයි. මේ ඡායාරූපයේ තිබෙන විධියට මෙම රථය කහ ඉරේ නතර කරලායි තිබෙන්නේ. පොලිස් නිලධාරීන් දෙදෙනෙක් දෙපැත්තේ ඉන්නවා. මේ රථයේ දොර ඇරගෙන කහ ඉරෙන් බැහැලා පුද්ගලයෙක් යනවා. නාවලපිටිය පොලීසිය ඉදිරිපිට තමයි මේ වාහනය නතර කර

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේක ඇස් දෙකෙන් දැකලා, ඉතා වටිනා සාක්ෂි ඇතිව වගකීමෙන් යුතුවයි මේ කාරණය පිළිබඳව ගරු සභාවේ කියන්නේ.

2013 අවුරුද්දේ පැවැත්වූ පළාත් සභා මැතිවරණයේදී වීරසිංහ අලුත්ගමගේ කියන අපේක්ෂකයාගේ ස්ටිකර් ගහගෙන, පෝස්ටර් ගහගෙන තමයි මේ වාහනය ගමන් කළේ. පසු ගිය ආණ්ඩුවේ හිටපු ක්‍රීඩා ඇමතිතුමා මේ ගරු සභාවේදී සහ මාධ්‍යවලට ගිහිල්ලා කිව්වා, "මේ වාහනය පිළිබඳව මම දන්නේ නැහැ"යි කියලා. "ලංකාදීප" පුවත් පතට කියලා තිබෙනවා, මේ වාහනය පිළිබඳව එතුමා කිසිවක් දන්නේ නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් තැනක කියලා තිබෙනවා, එතුමාගේ ලේකම්වරයෙක් මේ වාහනය පාවිච්චි කළා කියලා. තවත් තැනක එතුමා කියලා තිබෙනවා, "මගේ ලේකම්වරු තුන්දෙනෙක් මේ වාහනය පාවිච්චි කළා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සොරකමක්, බොරුවක් කළාම, එය වහගන්න තවත් බොරු දහසක් කියන්න වෙනවා. මාධ්‍යය ඉදිරියට ගිහිල්ලා තමන්ගේ මඩ සෝදාගන්න, තමන් කරපු ජරා වැඩ වහගන්න උත්සාහ කරනවා. මාධ්‍ය උපයෝගී කර ගනිමින් තවමත් ඒ සෙල්ලම කර ගෙන යනවා. යහ පාලන ආණ්ඩුව තුළ මේ රටේ නීතිය ක්‍රියාත්මක වෙන ආකාරය පිළිබඳවත් රටේ ජනතාවට යම් සැකයක් ඇති වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා එක වතාවක් කියනවා, මේ වාහනය ජනාධිපති කාර්යාලයට අයිති එකක් කියලා. තව වතාවක කියා තිබෙනවා, එය ක්‍රීඩා අමාත්‍යාංශයට අයිති, නියෝජ්‍ය ඇමතිතුමා පාවිච්චි කරන වාහනය කියලා. හැබැයි, මේ වාහනයම තමයි එදා - 2013 - වීරසිංහ අලුත්ගමගේ පළාත් සභා මන්ත්‍රීවරයා දිනවන්න එතුමාගේ ස්ටිකර් ගහගෙන මැතිවරණ කටයුතුවල යෙදෙව්වේ. මේ සිද්ධිය වහන්න මාධ්‍යය තුළින් නොයෙකුත් අසත්‍ය දේවල් කියනවා. මේ වාහනය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න කියලා ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමාගෙන් මේ අවස්ථාවේදී මා බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නාවලපිටිය ආසනයේ අවුරුදු 20ක විතර කාල පරිච්ඡේදයක් පුරා දේශපාලන කටයුතුවල නියැලෙමින් සිටිනවා. එම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියටත්, පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියටත් කටයුතු කර, මේ වනකොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කරමින් සිටිනවා.

පසු ගිය කාලයේ මගේ පෞද්ගලික ඉඩමක කොස් ගසක් කැපීම සම්බන්ධයෙන් මා කුරුඳුවත්ත පොලිසියට ගිහිල්ලා පැමිණිල්ලක් ඉදිරිපත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේ ඉඩමේ තිබෙන කොස් ගහක් තමන් කැපුවොත් උසාවියට දාලා දඩ ගහනවා. ඒක තමයි නීතිය. මම මේ කියන්න යන්නේ නාවලපිටිය පොලීසිය ක්‍රියාත්මක වුණු ආකාරය පිළිබඳවයි. මගේ ඉඩමේ අනවසරයෙන් - හොරෙන් - කොස් ගහක් කපලා ක්‍රේන් එකකින් අරගෙන ගිහිල්ලා, ලී මේල්ලක ඉරලා තිබෙනවා. මේ සියලු කටයුතු කරපු මිනිස්සු සිටියදීත් ඔවුන්ට විරුද්ධව පොලීසිය කිසිම ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ. මම සංවර්ධන කමිටුවේ සභාපතිවරයා හැටියට පත් වුණාට පස්සේ ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් මේ පිළිබඳව විමසීමක් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ග්‍රාම නිලධාරි වාර්තාවකුත් සමඟ ප්‍රාදේශීය ලේකම්තුමාගේ අත්සන සහිත වාර්තාවක් එතුමා මට ලබා දුන්නා, "කොස් ගහක් කපලා තිබෙනවා; පොලිස් නිලධාරීන් ගිහිල්ලා තිබෙනවා; පරීක්ෂණ කටයුතු කරලා තිබෙනවා; ඉතුරු කටයුතු වෙනුවෙන් රාජකාරි කිරීමට පොලීසියට බාර දීලා තිබෙනවා"යි කියලා. මම පොලීසියට මේ සම්බන්ධයෙන් වෙනම පැමිණිල්ලක් කළා; ප්‍රාදේශීය ලේකම්තුමාට වෙනම පැමිණිල්ලක් කළා. මේ වන තුරු කොස් ගහ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මකවෙලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට එහෙම කළා නම් මහනුවර දිස්ත්‍රික්කයේ, නාවලපිටිය ආසනයේ අහිංසක කෙනෙකුට නීතිය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන එක බොහොම පැහැදිලියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසු ගිය කාල පරිච්ඡේදය පුරාම නාවලපිටිය ආසනයේ සිටින සාධාරණ කෙනෙකුට පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් කරන්න ලැබුණේ නැති බව මම දන්නවා. මට මෙහෙම නම් සාමාන්‍ය කෙනෙකුට නීතිය ක්‍රියාත්මක කරලා තිබෙන්නේ කොහොමද කියලා හිතා ගන්න පුළුවන්. එදා පොලීසියට ගිහිල්ලා යම් කෙනෙක් පැමිණිල්ලක් කරනකොට, හිටපු ඇමතිවරයාගේ නම හෝ ඔහුගේ කාර්යාලයේ සේවය කළ කෙනෙකුගේ නමක් තිබෙනවා නම් එම පැමිණිල්ල ලියන්න තහනම්. ඔහු ගෙදර ගිහිල්ලා නිදා ගන්න ඕනෑ. මොන ප්‍රශ්නය ආවාත් එදා නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. නමුත් මේ යහ පාලන ආණ්ඩුව බිහි වීම තුළින් අද මේ රටේ සියලු දෙනාටම නිදහසේ ජීවත් වන්න පුළුවන් අවස්ථාව ලැබිලා තිබෙනවා. විශේෂයෙන්ම පසු ගිය කාලය පුරාවටම මුස්ලිම් ජනතාවට තමන්ගේ පල්ලියට ගිහිල්ලා වඳින්න අවස්ථාවක් ලැබුණේ නැහැ. අද සිංහල, දෙමළ සහ මුස්ලිම් සියලු දෙනාටම නිදහසේ ජීවත් වෙන්න අවස්ථාව ලැබිලා තිබෙනවා.

මම හිතන විධියට බඩු මිල අඩු කරපු ආණ්ඩුවක් කොහේවත් නැහැ. හැම ආණ්ඩුවම බඩු මිල වැඩි කරලා තමයි කටයුතු කර තිබෙන්නේ. හැම දාම බදු මුදල් වැඩිවෙන එක තමයි සිදු වෙලා තිබෙන්නේ. අධ්‍යාපන, සෞඛ්‍ය පහසුකම් ලබා දෙන්න අනිවාර්යයෙන්ම බදු එකතු කළ යුතුව තිබෙනවා.

අපේ අධිකරණ අමාත්‍යතුමා අද ඉතා වැදගත් යෝජනාවක් මේ ගරු සභාවට ගෙනැල්ලා සාකච්ඡා කරන මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම නැවතත් ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்தகமகே)
(The Hon. Ananda Aluthgamage)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන ඒම තුළින් අධිකරණයට තිබෙන විශාල බරක් අඩු වෙනවාය කියලා මා හිතනවා. මේ සමථ මණ්ඩලවල සේවය කරන අය නඩුවල පාර්ශ්වකරුවන් සමාදාන කිරීම සඳහා විශාල පරිශ්‍රමයක් දරන බව මම දන්නවා. සමථ මණ්ඩලය සඳහා ඉදිරිපත් කළ යුතු නඩු කටයුත්තක මූල්‍ය වටිනාකම රුපියල් ලක්ෂ දෙකහමාරක් විය යුතු බවට තිබුණු සීමාව ලක්ෂ පහ දක්වා ඉහළ නැංවීම හොඳ යෝජනාවක් හැටියට අපි දකිනවා. මීට වඩා යහපත් ආකාරයෙන්, ජනතාවගේ හිත සුව පිණිස සමථ මණ්ඩලය ක්‍රියාත්මක කිරීම සඳහා අධිකරණ අමාත්‍යතුමා මේ ගන්නා වූ උත්සාහයට අපි සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන බවට එකඟ වෙමින්, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් නැවතත් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[අ.භා. 3.11]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අමාත්‍යතුමා දෙවන වර කියැවීම සඳහා සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පතත්, ඒ වාගේම තවත් නියෝග කිහිපයකුත් මේ ගරු සභාව ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් වචන කිහිපයක් කථා කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව අපට විවාදයක් නැහැ. මොකද, සමථ මණ්ඩල ආරම්භ කළාට පස්සේ අධිකරණ පද්ධතියට යම් වාසියක් ලැබුණා. මොකද, අධිකරණයට එන්න තිබෙන නඩු සමථ මණ්ඩලයට යොමු කරලා තීරණ ගන්න පුළුවන් නිසා. සමථ තීරණ අර ගෙන, සමථයක් නැත්නම් අධිකරණයට එන්නත් පුළුවන්. නඩු කාර්ය පටිපාටිය අනුව සමථ මණ්ඩලයට යාමට අවස්ථාව ලැබෙන නිසා අධිකරණවල නඩු ගොනු වීම වළක්වන්නත් එයින් පදනමක් ලැබුණා. පසු ගිය කාලයේ අපි දැක්කා, බොහෝ විට රුපියල් 2,50,000 නොඉක්මවූ වටිනාකමක් තිබෙන නඩු තමයි සමථ මණ්ඩලයට යොමු වුණේ කියන එක. ඒ තිබුණු තත්ත්වය වෙනස් කරලා ගරු අමාත්‍යතුමා මෙම සංශෝධනයෙන් "වටිනාකම රුපියල් ලක්ෂ පහ" යන වචනය ආදේශ කර තිබෙනවා. එයින් අවස්ථාව සලසා දී තිබෙනවා, තමන්ගේ නීතිමය ගැටලුව සමථයක් තුළින් විසඳා ගන්න.

ඇත්ත වශයෙන්ම එක පැත්තකින් මේක මහජනතාවට ලොකු සහනයක්. මොන තත්ත්වයක් යටතේ වුණත් සමහරු සමථ මණ්ඩලයට ගිහිල්ලා සමථයකට එන්නේ නැහැ. ඒ අය බලාපොරොත්තු වන්නේ අධිකරණයෙන්ම තීරණ ලබා ගන්නයි. සමථයට පොළඹවා ගන්න බොහොම අමාරුයි. ඒ නිසා සමථ මූල මණ්ඩලය; සමථ මණ්ඩලය දක්ෂ වෙන්න ඕනෑ, අධිකරණ පද්ධතිය තුළට ගියාම ඔවුන්ට මුහුණ දෙන්න සිදු වන ප්‍රශ්න ගැන ඒ අයට කරුණු පැහැදිලි කර දීලා, තේරුම් කර දීලා සමථය හරියට ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසුබිම හදන්න. බොහෝ අය සමථ මණ්ඩලයේදීම මෙවැනි ආරවුල් සම්බන්ධයෙන් එකඟත්වයට ආවත්, බොහෝ වෙලාවට සමථ තීන්දු ලඝු කොට සලකා එය නොපිළිගන්නා තත්ත්වයකුත් තිබෙනවා. ඒ නිසා ඒ සමථයට යම් කිසි ගෞරවයක් ඇති වන විධියේ ස්වරූපයක්, ඒ දෙන තීන්දු පිළිගන්නා ස්වරූපයක් හදන්න ඕනෑ.

කෙනෙකු වරදකට ලක් වෙලා එල්ලුම් ගහට යන කොට වුණත් මට දීපු තීන්දුව සාධාරණයි කියා ඔහුට හිතෙනවා නම් ඒ තීරණය පිළිගන්න ඕනෑ. ඒ නිසා දැන් අපි කවුරුත් කථා කළා වාගේ සමථ මණ්ඩලය කොහේ හරි අගු පිලක රැස් වෙන කොට ඒකට තිබෙන වටිනාකමත් අඩු වෙනවා. අපේ මානසිකත්වය හැදිලා තිබෙන්නේ ඒ විධියටයි. මැති ඇමතිවරු වුණත් වාහන තුන හතරකින් ගිහිල්ලා බැස්සාම ඔහු තමයි ලොකු ඇමති කියලා, බල පුළුවන්කාර කෙනෙක් කියලා තමයි කල්පනා කරන්නේ. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සරල ස්වභාවයේ හැසිරීමට එච්චර ගරුත්වයක් නැහැ. මම මේ කියන්නේ මිනිස්සුන්ගේ මානසික විඤ්ඤාණය හැදිලා තිබෙන හැටි. ඡන්ද කාලයට අපි මේ තත්ත්වය දකිනවා නේ. ඩිෆෙන්ඩර්ස් කීපයකින් ගිහිල්ලා ඒ එකකින් බැස්සාම ඔහු ටිකක් ප්‍රබලයෙක් කියලා ඔහු වටේ තමයි යන්නේ. ඒ නිසා මම කියන්නේ මේ සමාජ රටාව විසින් මෙවැනි මානසික තත්ත්වයක් ඇති කර තිබෙන බවයි. ඒකෙන් මම කියන්නේ නැහැ, සමථ මූල මණ්ඩලයට; සමථ මණ්ඩලයට ලොකු සම්පත් දෙන්න කියලා. නමුත් අපි කවුරුත් කථා කළා වාගේ සුදුසු පරිසරයක් තුළ රැස් වී ඒ කටයුතු විධිමත්ව කර ගැනීමේ අවස්ථාව ලබා දිය යුතුව තිබෙනවා. මම හිතනවා ගරු ඇමතිතුමා ඒ සඳහා පදනම දමා-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(*මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ*)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, දෙපැත්තෙන්ම ඔය පිළිබඳව අදහස් ගණනාවක් ආවා. විශේෂයෙන්ම ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා දැඩි ලෙස ඉල්ලීමක් කළා, "මේ තිබෙන ආකෘතිය වෙනස් කරන්න යන්න එපා, මෙහි ජීව ගුණය තිබෙන්නේ මෙතැන"යි කියලා.

ගමේ පන්සලට, ගමේ ප්‍රජා ශාලාවට, ගමේ පල්ලියට, ගමේ ආගමික සිද්ධස්ථානයට තමන්ගේ උදව්ය, ගමේ උදව්ය එකතුවෙලා මේ කටයුතු කරන කොට, එහි තිබෙන ජීව ගුණය නිසා තමයි සමථ මණ්ඩල ක්‍රමය සාර්ථක වෙලා තිබෙන්නේ. මීට කලින් කථා කළ ගරු කේ.කේ. පියදාස මන්ත්‍රීතුමාගෙන් පවා කියවුණේ ඒකයි. නීති ක්ෂේත්‍රය නියෝජනය කරන අපේ ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළේ ඔබතුමා කියන කරුණටම සමාන කරුණක්. මගේ පෞද්ගලික මතය වන්නේ, අපි අවශ්‍ය පහසුකම් සියල්ල දෙන්න ඕනෑය කියන එකයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
ඒකයි මා කියන්නේ. ස්ථානය පිළිබඳ ප්‍රශ්නයක් නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(*මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ*)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
නමුත් සමථ මණ්ඩල රැස්වෙන්න සාමාන්‍යයෙන් අධිකරණ ශාලා වාගේ ගොඩනැඟිලි හදන්න ගියොත් ඒකත් තව අධිකරණ පද්ධතියක් වෙන්න ඉඩ තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
නැහැ, එහෙම අවශ්‍ය නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(*මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ*)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ නිසා ගමේ පන්සලට, දේවස්ථානයට සමථ මණ්ඩලය රැස්වෙලා ඒ කටයුතු කරන ක්‍රමය වඩාත් සුදුසුයි කියන එක තමයි මගේ පෞද්ගලික මතය.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*මාණ්පුමිකු සන්ද්‍රිරසිරි කජදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
මා එයට විරුද්ධ නැහැ. ස්ථානය පිළිබඳව නොවෙයි මට ප්‍රශ්නය තිබෙන්නේ. ස්ථානය කොතැනක වුණත්, ඒ කටයුත්ත විධිමත්ව ඉදිරියට ගෙන යනවාය කියන විශ්වාසය ඇති වන්න අවශ්‍ය වූ පරිසරය එතැන හැදෙන්න ඕනෑ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(*මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ*)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ලෝකයේ අනිකුත් රටවල් එක්ක ගත්තාම අපි සාර්ථකයි. ලැබෙන පැමිණිලි සංඛ්‍යාවෙන් දළ වශයෙන් සියයට 50ක ප්‍රතිශතයක් සමථයට පත් වනවා. මා හිතන හැටියට එහි සාර්ථකත්වය මනින්න එය හොඳ මිම්මක්. අධිකරණයකට යන පාර්ශ්ව දෙකම තරහින්, වෛරයෙන් තමයි ආපසු ගෙදර එන්නේ. නඩුව දිනලා ගෙදර එන මනුෂ්‍යයාත්, තරහින්, වෛරයෙන් තමයි ගෙදර එන්නේ. නඩුව පරාජයට පත්වෙලා ගෙදර එන මනුෂ්‍යයාත් තරහින්, වෛරයෙන් තමයි ගෙදර එන්නේ. සමථයට පත්වීම තුළ

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

තිබෙන වාසිය තමයි, නැවතත් ඥාතීන් විධියට, මිත්‍රයන් විධියට හිනාවෙලා ආපසු ගෙදර එන එක. ඒ ප්‍රතිඵලය අධිකරණ ක්‍රමයට වඩා හාත්පසින්ම වෙනස් ආකාරයට ලබන ජයග්‍රහණයක් විධියට අපි සලකන්න ඕනෑ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ඒ ගැන මගේ තර්කයක් නැහැ. ඇත්ත වශයෙන්ම සමහරු සමථයට යන්නේම, මොන විධියකටවත් සමථයකට එකඟ වන්නේ නැහැ කියලායි. අපි උසාවි පද්ධතියේ සිටින නිසා අපි දන්නවා නේ. "සමථයට කැඳවලා තිබෙනවා. මගේ නම් කිසිම සමථයක් නැහැ"යි කියලා සමහර අය කියනවා. මොකද, සමථයක් බලාපොරොත්තු වන්නේ උසාවියකින්; උසාවිය දෙන නියෝගයකින්. මේ සම්බන්ධයෙන් අපි පටලවා ගන්න අවශ්‍ය වන්නේ නැහැ.

මා අහගෙන සිටියා, සමථ මණ්ඩල සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිශ්චිත තැනක් දෙන්න ඕනෑය කියනවා. එවැනි විවිධ කාරණා තිබුණා. රැස්වන තැන කොතැන වුණත් ඒ තුළින් කරන්නේ යම්කිසි විනිශ්චයක් නේ. ඒ විනිශ්චයේ ගෞරවය ඇතිවන පරිසරයක් එතැන තිබෙන්න ඕනෑය කියන එකයි මා කිව්වේ. ස්ථානය පිළිබඳ ප්‍රශ්නයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මගේ අවධානය යොමු කරන්න කැමැතියි, සිරකරුවන් හුවමාරු කිරීම පිළිබඳව. ඔබතුමා අද මේ කාරණය පාර්ලිමේන්තුවේදී මතු කළා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

අද ඉදිරිපත් කළේ සිරකරුවන් ගැන නොවෙයි. 2002 සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ රුසියානු සමූහාණ්ඩුවත්, ශ්‍රී ලංකාවත් අතර අත්සන් කරපු ගිවිසුමට සම්බන්ධ ගැසට් නිවේදනය තමයි අනුමැතිය සඳහා අද ඉදිරිපත් කළේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

මීට කලින් අපි චීනය එක්කත් ගිවිසුමකට එළඹුණා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

රටවල් ගණනාවක් එක්ක ගිවිසුම් අත්සන් කර තිබෙනවා. මා ඒ ලැයිස්තුව ඉදිරිපත් කළා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ඒ කියන්නේ ඇත්ත වශයෙන්ම රටවල් තුළ අන්‍යෝන්‍ය අවබෝධය ඇතිව, එකඟතාවකින් ඉටු විය යුතු කරුණුයි. මොකද, අපට කොපමණ ද්විපාර්ශ්වික ගිවිසුම් ආවත්, ඒකපාර්ශ්විකව එන්න බැහැ. ඒ තුළින් ඒ රටවල් තුළ තිබෙන මිත්‍ර ස්වභාවය වර්ධනය වීමත්, අපේ අපරාධ මර්දනය කිරීමේ කාර්ය පටිපාටිය විධිමත් වීමත් සිද්ධ වනවා. එවැනි සුහදතාවක් නැතුව, විමසීම් කරලා, පර්යේෂණ කරලා, සොයා බැලීම් කරලා අවශ්‍ය නිගමනවලට එන්න බැහැ. ඒ නිසා එය යහපත් පැත්තක්. මොකද, මීට කලින් මෙවැනි අන්‍යෝන්‍ය අවබෝධතා ගිවිසුම් ගණනාවක් තිබුණා. ඔබතුමා රුසියාව සමඟ අලුතින් අවබෝධතා ගිවිසුමකට පැමිණ තිබෙනවා. අද ලෝකය පුරාම ත්‍රස්තවාදයේ අලුත් ස්වභාවයක් මතුවෙමින් තිබෙනවා. එය බරපතළ විධියට මතුවෙමින් තිබෙන දෙයක්.

පසු ගිය කාලයේ මූල්‍ය අපරාධ සම්බන්ධයෙන්, විවිධ වංචාවන් සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුව තුළත්, රටවල් තුළත් කළා කළා. අපි ප්‍රමුඛ ඉලක්ක හදා ගෙන, එවැනි සම්බන්ධතා තිබෙන රටවල් එක්ක එකඟතාවට ඒම සහ ඒ රටවල් සමඟ තිබෙන මිත්‍ර ස්වභාවය වර්ධනය කිරීම අපරාධ මර්දනය කිරීමට පිටිවහලක් වනවා. ඒ ගැන අපේ කිසිම තර්කයක් නැහැ. අපේ විරුද්ධත්වයක් නැහැ. අපේ සුහදතාව ජාත්‍යන්තර වශයෙන් ලබා දෙනවා. අප ගෝලීය සමාජයක් තුළ ඉන්නේ. එක තැනක කැරකැවිලා මේ ලෝකයේ ඇති වන අපරාධ සම්බන්ධයෙන් සහ තාක්ෂණික ක්‍රියාදාමය තුළින් ඇත්ත වශයෙන්ම පටු වෙන්න අපට පුළුවන්කමක් නැහැ. එම නිසා ඒ පුළුල් ස්වභාවය ඇති කර ගැනීම පිළිබඳව අපේ විරුද්ධත්වයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැන් නිශ්චිත කාරණාවකට එන්නටයි හදන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කාලයක් බන්ධනාගාරයත් භාරව සිටියා. බන්ධනාගාරය ඇතුළේ තවමත් මරණීය දණ්ඩනයට ලක් වෙච්ච සිරකරුවන් රාශියක් ඉන්නවා. ඒ වාගේම ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලබන අය ඉන්නවා. ඒ වාගේම විසි අවුරුදු දීර්ඝකාලීන සිර දඬුවම් ලබන අය ඉන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

විනාඩි දෙකට තව එකක් එකතු කර දෙනවා නම් හොඳයි, අපේ පැත්තේ මන්ත්‍රීවරු කවුරුවත් නැති නිසා. [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීතුමන්ලා අඩු නිසා එතුමාට අවශ්‍ය කාලය ලබා දෙන ලෙස යෝජනා කරනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

පසු ගිය කාල පරිච්ඡේදය තුළ අපි පුනරුත්ථාපනයට ප්‍රමුඛත්වය දුන්නා. බන්ධනාගාරය හා පුනරුත්ථාපනය කියන එක තමයි අප ප්‍රමුඛ කර ගත්තේ. ඒ පුනරුත්ථාපන ක්‍රියාවලියේදී නිසි පුනරුත්ථාපනයට යොමු වන, ඒ ක්‍රියා මාර්ග අනුගමනය කරන සිරකරුවන්ට යම් සහන ලබා දිය යුතුය කියන ප්‍රතිපත්තියක සිටිමින් කටයුතු කළා. ඔබතුමා දන්නවා ඔබතුමායි, මායි අපි දෙදෙනාම එකතු වෙලා මරණීය දණ්ඩනයට නියම වූ සිරකරුවන්ට සහන ලබා දීමේ, දඬුවම් අඩු කිරීමේ වාර්තාවක් අධිකරණ අමාත්‍යාංශයට එව්ව බව. ඒ අනුව, 182කට විතර ඔබතුමා දඬුවම් ලිහිල් කර තිබෙනවාය කියා මට දැන ගන්නට ලැබී තිබෙනවා. තවත් ඉන්නවා.

ගරු ඇමතිතුමනි, බන්ධනාගාරය තුළ නොයෙක් විධියේ විරෝධතා මතු වුණා. සමහරු කිව්වා, " එක්කෝ එල්ලා මරාපන්,

නැත්නම් අපට සහන දීපන්" කියා. මොකද, මරණීය දණ්ඩනයට නියම වී ඉන්නවා, මරන්නේ නැහැ. ඒක තව දඬුවමක්. මරණීය දණ්ඩනයට නියම වෙලා තිබෙනවා. මරන්නේ කවදාදැයි දිනයකුත් නැහැ. නමුත්, මේ නිසා බරපතළ විධියේ මානසික වේදනාවකට පත් වෙලා තිබෙනවා. එම නිසා සිරකරුවන් අතර මතයක් හැටියට ආවා, -මේ දඬුවම් ලිහිල් කර ගැනීමේ පදනම තමයි හිතේ තීබුණේ. - එක්කෝ මරාපන්; එක්කෝ නිදහස් කරපන් කියන එක. එතැනදී සෝචනීය සිදුවීම් ද සිදු වුණා. ඒක ඔබතුමා දන්නවා. ඇත්ත වශයෙන් ඒක පමණක් නොවෙයි. මරණීය දණ්ඩනයට නියම වූ සමහර තැනැත්තන්ට අධිකරණ ක්‍රියා මාර්ගවලදී සමහර කරුණු ඔප්පු කර ගැනීමට බැරි නිසා හෝ විවිධ හේතු නිසා මේ අයට සහන දිය යුතුය කියන එක බන්ධනාගාර ඇතුළේ කරපු නිගමන මත පිහිටා තමයි ඒ වාර්තා එව්වේ. නමුත් තවත් අය ඉන්නවා. මේ කාරණය අංග සම්පූර්ණව අධ්‍යයනය කළාද කියා මා දන්නේ නැහැ. ඒ වාගේම මරණීය දණ්ඩනයට නියම වූ සිරකරුවන්ට යම් සහනයක් ලබා දුන්නා වාගේම ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලබන අය පිළිබඳවත් සැලකිල්ල දක්වා, - ඒ ප්‍රමාණයටවත් -යම් සහන සලසා දීමේ ක්‍රියාවලිය බන්ධනාගාර අමාත්‍යතුමාත් එක්ක එකතුවෙලා ඉටු කරන එක හොඳයි. මා දන්නා තරමින් බන්ධනාගාරය ඔබතුමාගෙන් ඇත් වුණාට පස්සේ ටිකක් හුදෙකලා භාවයක තිබෙනවාය කියන එක තමයි මම දන්නේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) ඛිජූයතාස රාජූපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු ගජදීර මන්ත්‍රීතුමා මතු කළ කාරණය සම්බන්ධයෙන් කියන්නට ඕනෑ. අප එකසිය අසූ දෙදෙනෙකු නිර්දේශ කර, ගරු ජනාධිපතිතුමාගේ අනුමතිය දීලා තිබෙනවා. එල්ලුම් ගහට නියම වෙච්ච වැරදි කරුවෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවමට පරිවර්තනය කළා. ඒ අර කොමිටියෙන්. ඔබතුමා දන්නවා; ඔබතුමා ඉන්න කාලයේත් ඒ කමිටුව තිබුණා. අපි ඊට පසුවත් කමිටුවේ නිර්දේශ මත තවත් හැට දෙදෙනෙකුට ඒ වාගේ නිර්දේශ යවා තිබෙනවා, ජනාධිපතිතුමාගේ අනුමතිය ලබා ගන්න. ඉදිරියේදී අපි බලාපොරොත්තු වෙනවා, ඒ ඉන්න සියලු දෙනා සම්බන්ධවම ඒ කමිටුව විමර්ශන කටයුතු කර දෙන්න පුළුවන් උපරිම සහන ලබා දෙන්න.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්ද්‍රිරසිරි කජූදීර*)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු ඇමතිතුමනි, ඒ වාගේම පසු ගිය කාලයේ ත්‍රස්තවාදී ක්‍රියාවලට සම්බන්ධ වුණු අය තවමත් බන්ධනාගාරගතව සිටිනවා. අපරාධ කරලා දඬුවම් ලබපු අය ගැන නොවෙයි මා මේ කියන්නේ. සැක කටයුතුව සහ අධිකරණයේ නඩු ප්‍රමාද වීම, අභියාචනා ප්‍රමාදවීම වැනි හේතු උඩ තමයි මේ අය බන්ධනාගාරගතව ඉන්නේ. මම දන්නවා මරණීය දණ්ඩනයට නියම වූ අයගෙන් අභියාචනා 400ක් පමණ තිබෙන බව. නඩු ප්‍රමාදයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ත්‍රස්තවාදයට සම්බන්ධ ද්‍රවිඩ සිරකරුවන්ගෙන් ඒ ප්‍රශ්නය තිබෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) ඛිජූයතාස රාජූපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රස්තවාදී රැඳවියන් පිළිබඳ ගැටලුව ජාත්‍යන්තර ප්‍රශ්නයක් බවට පත් වෙලා දිගට ඇදුණු දෙයක්. ඔබතුමාත් දන්නවා, ඔබතුමා මේ විෂය සම්බන්ධ ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේත් මේ ප්‍රශ්නය මීට වඩා බරපතළ විධියට තිබුණ බව. මීට අවුරුදු එකහමාරකට විතර කලින් තුන්සියයකට අධික සංඛ්‍යාවක් මේ යටතේ සැකකරුවන් විධියට රඳවාගෙන හිටියා. දැනට එක අධිකරණයක් - මහාධිකරණයක්- තුළින් මේ නඩු ඉක්මනට විසඳීමේ ක්‍රමවේදය බොහෝදුරට සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. මේ වන විට රැඳවියන් විධියට 101යි ඉන්නේ. අප නීතිපති දෙපාර්තමේන්තුවත් සමඟ එකතු වෙලා මේ ගැන බැලුවාම පෙනී ගියා, ඉකාම බරපතළ ගණයේ චෝදනා තිබෙන උදවිය තමයි ඉන්නේ කියා. නඩු විභාගය ඉවර වෙන්න කලින් ඒ උදවිය ඇපදීමකින් විතරයි නේ, එළියට දමන්න පුළුවන් වන්නේ. ඒ අනුව පුළුවන් උදවියට ඒ වරදේ ස්වභාවය අනුව උපරිම මට්ටමට ඇප දීලා, ඇප දෙන්න එකඟතාව පළ කරලා, ඒ අය ඇප පිට මුදා හැර තිබෙනවා. අප විශ්වාස කරනවා තව 15ක්, 20ක් වැනි ප්‍රමාණයකටත් ඇපදීම සඳහා විරෝධතා ඉදිරිපත් නොකර ඉන්න පුළුවන් වෙයි කියා. ඒ අනුව තීන්දුව කුමක් වෙතත්, -මොන පැත්තට ගියත්- අවසානයේ යුක්තිය ඉටු කරන්නේ මහාධිකරණය තුළිනුයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්ද්‍රිරසිරි කජූදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ අයගේ නඩු කඩිනම් කරන්න ඕනෑ, ගරු ඇමතිතුමනි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) ඛිජූයතාස රාජූපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

නඩු ටික ඉක්මනින්ම ඉවර කරන්න ඕනෑ. ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, පුනරුත්ථාපනය සම්බන්ධව ඔබතුමාගේ ඒ අදහසට අප ගරු කරනවා.

එල්ටීටීඊ සංවිධානයේ දේශපාලන අංශයේ හිටපු කාන්තා නායිකාව වන මිය ගිය තමිළිනී මහත්මිය විසින් ලියා තිබුණු පොත ඔබතුමා කියවන්න ඇති නේද?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්ද්‍රිරසිරි කජූදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
මට තවම හරියටම එය කියවන්න ලැබුණේ නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) ඛිජූයතාස රාජූපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

"තියුණු අසිපතක සෙවණ යට" කියායි ඒ පොතට නම දමලා තිබෙන්නේ. ඒකේ තමිළිනී ඔබතුමා ගැන බොහොම අගය කරලා සඳහන් කර තිබෙනවා. පුනරුත්ථාපනය කරන සමයේ ඔබතුමා අවස්ථා දෙකකදී -මාතරදී සහ වවුනියාවේදී- ඇයව මුණ ගැහිලා තිබෙනවා. ඒ අවස්ථා දෙකේදීම ඔබතුමා දේශපාලනයටත් එන්න කියා ඒ මහත්මියට ආරාධනා කළා. පුනරුත්ථාපනය කළ ඒ කාල සීමාව තුළ පුනරුත්ථාපන නිලධාරීන්, හමුදාවේ නිලධාරීන් ඇයට සලකපු ආකාරය පිළිබඳව ඒ පොතේ සඳහන් කරලා ඇය ඔවුන්ට විශේෂ ගෞරවයක් පුද කර තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්ද්‍රිරසිරි කජූදීර*)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු ඇමතිතුමනි, ඒ ඔක්කොටම වඩා ඒ පොතේ සඳහන් වන වැදගත් දෙය මෙකයි. ඒ පොතේ ඇය සිරකරුවන් පිළිබඳ ඇගැයීමක් කර තිබෙනවා, "මම හැබෑ මිනිස්සු හඳුනා ගත්තේ බන්ධනාගාරය තුළදීය" කියා. සිංහල මිනිසුන් තුළ තිබෙන මානව ගතිය ගැන ඇය පැහැදීමට පත් වෙලා තිබෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) ඛිජූයතාස රාජූපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එම කාරණයත් එතුමිය ලියා තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ඒක තමයි, ගරු ඇමතිතුමනි. ඒකෙන් පෙනෙනවා මේ සිරකරුවෝ කොයි තරම් මානුෂිකද කියා. විවිධ අපරාධ කරලා බන්ධනාගාරගතව ඉන්න අය සහ සැක කටයුතු අය කොයි තරම් මානුෂික විධියට ඒ ප්‍රශ්නය දිහා බැලුවාද කියා එයින් පෙනෙනවා. මම මේ කියන්නේ, ඒ දක්වපු සැලකිල්ල ඇයගේම විග්‍රහයෙන්. "මම මිනිසුන්ගේ නියම දයාව දැක්කේ, හඳුනාගත්තේ බන්ධනාගාරය තුළදීය" කියා ඇය කියා තිබෙනවා. මම ඒ උදාහරණයෙන් පෙන්වන්න ගියේ මෙන්න මේ කාරණයයි. පොඩි පොඩි වැරැදිවලට සම්බන්ධ වෙලා බන්ධනාගාර ඇතුළේ ඉන්න එල්ටීටීඊ සිරකරුවන් 12,000ක් පුනරුත්ථාපනය කරලා එළියට දමන්න අපට පුළුවන්කම තිබුණා නම්, පොඩි පොඩි වැරැදිවලට සම්බන්ධ වෙලා දැනට බන්ධනාගාරගතව ඉන්න අය සහ ඊට වඩා විශාල අපරාධකරුවන් - ඔවුන් අවස්ථානුකූලව විවිධ අපරාධවලට පෙළඹුණත්- සම්බන්ධවත් පුනරුත්ථාපන ක්‍රියාවලිය නිසි ලෙස මෙහෙය වූවොත්, ඔවුනුත් නිසි මහට යොමු කරන්න අපට පුළුවන් වෙයි. ගරු ඇමතිතුමනි, මා හිතන විධියට දැන් ඔබතුමාට "පුනරුත්ථාපනය" කියන විෂය අයත් වන්නේ නැහැ. නමුත්, පුනරුත්ථාපනය කියන විෂයය නැති වුණත් ඔබතුමාට අධිකරණ ක්ෂේත්‍රයේ ලොකු වගකීමක් තිබෙනවා. "බන්ධනාගාර" කියන විෂය ඔබතුමාට අයිති නැති වුණත් මේ ක්ෂේත්‍ර දෙක වෙන් කරන්න බැහැ. ඒ නිසා ඒ සඳහා අවශ්‍ය පදනම දමලා ශක්තිමත් කරන එක හොඳයි.

මේ අවස්ථාවේ තවත් කාරණයක් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්න මා කැමැතියි. මෙය බන්ධනාගාර විෂය භාර ඇමතිතුමාටත් යොමු කළ යුතු කරුණක්.

ගරු අමාත්‍යතුමනි, බන්ධනාගාර තුළ අපරාධකරුවෝයි ඉන්නේ. ඒ අපරාධකරුවන් නිසාම තමයි බන්ධනාගාර නිලධාරීන් ඉන්නේ. අපරාධ අවම කිරීමට අප එක් පැත්තකින් පුනරුත්ථාපනය යොදාගන්නවා වාගේම එයට අවශ්‍ය වූ ආකල්ප නිලධාරීන් අතර ගොඩ නහන එක සමාජමය වගකීමක්.

ගරු අමාත්‍යතුමනි, දැනට බන්ධනාගාර තුළ සේවය කරන නිලධාරීන් 5,000ක් විතර ඉන්නවා. නමුත් ඔවුන්ට පුහුණු වීමේ මධ්‍යස්ථානයකුත් නැහැ. ඔවුන්ට පුහුණු වීමට නිශ්චිත තැනක් නැහැ. බන්ධනාගාර සේවය කියන එක පොලීසියේ සේවය වාගේම විශේෂඥ වැඩක්; විශේෂ වැඩක්. එය හැම කෙනෙකුටම කරන්න බැහැ. සිරකරුවන් පාලනය කිරීම, සිරකරුවන්ගේ ආකල්ප වෙනස් කිරීම, ඔවුන්ට රැකවරණය දීම ආදිය හැම කෙනෙකුටම කරන්න බැහැ. නමුත් අපි උත්සාහයක් කළා; මුදල් වෙන් කළා, බන්ධනාගාර නිලධාරීන්ගේ පුහුණු මධ්‍යස්ථානය හදන්න. අපි එය මාතර හදන්න මුල්ගල තබා වැඩ කටයුතු ආරම්භ කළා. මාතර දිස්ත්‍රික්කයේ කොටවිල ප්‍රදේශයේ හදන්න කටයුතු කර තිබෙන අධිකරණය ඉස්සරහාම තමයි ඒ පුහුණු මධ්‍යස්ථානය හදන්න මුල්ගල තැබුවේ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා.

මේ වැඩ කටයුතු කඩිනම් කරලා ඒ නිලධාරීන්ටත් තමන්ගේ පෞරුෂය ගොඩනඟා ගන්න, ආකල්ප සකස් කර ගන්න අවශ්‍ය පරිසරය අපි හදන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, මෙවර ජාතික තරඟාවලියේදී අයෝමය පුරුෂයා තේරීමේ තරඟයේ 1 සහ 2 යන ස්ථාන දෙකම දිනා ගත්තේ බන්ධනාගාරයේ දෙදෙනෙක්. ඒ, බන්ධනාගාරයේ සිරකරුවන් නොවෙයි; බන්ධනාගාර නිලධාරීන් දෙදෙනෙක්. සිරකරුවන් අතරත් ඉන්නවා, අයෝමය පුරුෂයෝ. බන්ධනාගාර නිලධාරීන්ට තිබෙන දක්ෂතා මත තමයි සිරකරුවන්ගේ තත්ත්වය වෙනස් වන්නේ. ඒ කියන්නේ මොකක්ද? සිරකරුවන්ගේ ක්‍රීඩා කුසලතා දියුණු කරන්න, ආකල්ප වෙනස් කරන්න යන්ත්‍රණය ඒකයි. ගරු අමාත්‍යතුමනි, ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

බන්ධනාගාරවල තිබෙන තදබදය අවසන් කරන්නට, බන්ධනාගාර ආඥාපනතට අමතරව, ප්‍රජා පාදක විශෝධන ආඥාපනත යටතේත් දඬුවම් කරන ක්‍රමවේදය භාවිත කළ හැකියි. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා. අපි හුභක් උත්සාහ කළා, අධිකරණ තුළින් ප්‍රජා විශෝධනයට යන සංඛ්‍යාව වැඩි කරන්න. සමහර අධිකරණවල ප්‍රජා විශෝධන ආඥා දෙන්නේම නැහැ. ප්‍රජා විශෝධන ආඥා දුන්නාම, ගෙදර ඉඳගෙන දඬුවම විඳිනවා; සමාජයත් එක්ක ජීවත් වෙනවා. එමඟින් නැවත නැවත අධිකරණයට ඒමේ ක්‍රියාවලිය එක පැත්තකින් ක්‍රමානුකූලව අවම වෙනවා. නමුත් එය වඩාත් පුළුල් කිරීමේ අදහස ඇතිව බන්ධනාගාර ආඥාපනත සංශෝධනය කරලා අපි උත්සාහයක් ගත්තා.

මම හිතන්නේ සමථ මණ්ඩල පනත සංශෝධනය කරනවා වාගේම බන්ධනාගාර තද බදය අවම කිරීම සඳහා සහ පුනරුත්ථාපන ක්‍රියාවලිය ශක්තිමත් කරන්න ප්‍රජා විශෝධන වැඩ පිළිවෙළ වේගවත් කරන එක හොඳයි කියායි. ඒක තමයි දැන් ලෝකයේ අලුත් ප්‍රවණතාව. ඒ නිසා ඔබතුමා ඒ ගැනත් අවධානය යොමු කරන්න, ගරු අමාත්‍යතුමනි. බන්ධනාගාර ආඥාපනතට අවශ්‍ය සංශෝධන පිළිබඳව මූලික වශයෙන් කරපු සාකච්ඡාවලදී එකී සංශෝධන ගැන ඔබතුමාගේ අවධානය යොමු වෙලා තිබෙනවා කියා මම හිතනවා. ඒ සංශෝධනයන් කිරීම් කඩිනම් කරලා අවශ්‍ය කටයුතු කරන්න කියා මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිය හා සාමය නැති තැනක සමාජ ස්ථාවරභාවයක් ඇති වන්නේ නැහැ.යහපත් සමාජ පැවැත්මකට බලපාන ප්‍රධාන දෙයක් තමයි, නීතියේ ස්වාධීනත්වය. නොයෙක් නොයෙක් විවේචන ඇහුණා. පසු පෙළ මන්ත්‍රීතුමකු කළ කථාවකදීත් විවේචනයක් ඇහුණා, සමහර අය මෙහෙම ක්‍රියා කළා, වාහන අයථා විධියට පාවිච්චි කළා, අපට බලපෑම් කළා, නමුත් ඒවා සම්බන්ධයෙන් නිසි ක්‍රියාවලියක් නැහැ කියා. නමුත්, එහිදී නීතියට ඉඩ තබන්න ඕනෑ. ඒවා විමර්ශනය කරන වගකිව යුතු ආයතනවලට ඒ වගකීම තිබෙන්න ඕනෑ. ගරු අමාත්‍යතුමනි, මේවා ගැන මෙතැනදී කථා කළත් ඔබතුමා මේවා කරට ගන්න ඕනෑ නැහැ කියා මම හිතනවා. ඔබතුමාට තිබෙනවා, ඊට වඩා පුළුල් කාර්ය භාරයක්. රටේ තිබෙන නීතිය හා සාමය ස්ථාවර කර ගැනීම සහ ශක්තිමත් කරගැනීම, නීතිය කාටත් සමානයි කියන තැනට රට ගෙන ඒම සඳහා අපි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ ගැන ඔබතුමා අවධානය යොමු කරමින් සිටිනවා. එය ශක්තිමත් කරන්න ක්‍රියා කරන්න කියා ඉල්ලා සිටිනවා. මට ලැබුණු කාලය අවසානයි. කථා කරන්න මට වැඩි කාලයක් ලබා දෙන්න ඔබතුමාගේ අනුමැතිය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා.

[අ.භා. 3.36]

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මම හුඟක් සතුටු වෙනවා; ඒ වාගේම ආඩම්බර වෙනවා, අපේ අධිකරණ අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මහතා ගෙනා සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව වතුකරයේ ජනතාව නියෝජනය කරමින් මටත් වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලැබීම සම්බන්ධයෙන්. කාලයේ අවශ්‍යතාවට අනුව මේ පනතට සංශෝධන ගෙනෙන්න අවශ්‍ය වෙලා තිබෙනවා.

இன்றைய தினம் இந்தப் பாராளுமன்றத்திலே மத்தியஸ்த சபை (திருத்தம்) சட்டமூலம் மற்றும் நீதித்துறைச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகளில் சில திருத்தங்களை மேற்கொள்வது சம்பந்தமாக விவாதிக்கப்படுகின்றது. நீதி அமைச்சர் கௌரவ விஜயதாச ராஜபக்ஷ அவர்கள் இவற்றை இங்கே சமர்ப்பித்திருப்பதையிட்டு மலையக மக்கள் சார்பாக நான் அவரைப் பாராட்டுகிறேன். இன்று இந்த நவீன யுகத்திற்கு ஏற்ற வகையிலே நாட்டின் நீதித்துறையில் பல மாற்றங்களை ஏற்படுத்த வேண்டிய கட்டாயச் சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது. அந்த அடிப்படையிலே சிரேஷ்ட - மூத்த ஜனாதிபதி சட்டத்தரணி கௌரவ விஜயதாச ராஜபக்ஷ அவர்கள் நீதித்துறை அமைச்சராக இருப்பது இந்த நாட்டு மக்களுக்கு ஒரு பெரிய கௌரவம் என நான் நினைக்கின்றேன்.

இன்று இந்த நாட்டிலே தேங்கிக்கிடக்கின்ற வழக்குகள் தீர்க்கப்பட வேண்டும்; மத்தியஸ்த சபைக்கு வழங்கப்படுகின்ற அதிகாரங்கள் அதிகரிக்கப்பட வேண்டும். இன்று இந்த வழக்குகள் தீர்வின்றித் தேங்கிக் கிடப்பதால் மக்கள் கஷ்டப்படுகின்றார்கள். விசேடமாகத் தோட்டத் தொழிலாளர் களுக்கு அதனால் அநீதிகள் ஏற்படுகின்றன. இவ்வாறான சூழ்நிலையில் சட்டத் துறையிலே மாற்றங்களை ஏற்படுத்தி அந்த வழக்குகளைத் துரிதப்படுத்தி இந்த நாட்டு மக்களுக்குச் சேவை செய்ய எத்தனித்திருப்பதையிட்டு நான் இந்த அமைச்சின் அதிகாரிகளுக்கு மீண்டும் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று விசேடமாக மலையகத்திலே தமிழ்மொழி அமுலாக்கம் இல்லை. மலையகத்திலுள்ள பெருந்தோட்டங் களை மையமாகக்கொண்ட நீதிமன்றங்களிலே வழக்குகள் தேங்கிக்கிடப்பதற்கு முக்கிய காரணம், அங்கு தமிழ் மொழி அமுலாக்கம் இல்லாமையாகும். அதாவது, அங்கு தமிழ் மொழியில் சேவையாற்ற அதிகாரிகள் இல்லாத காரணத்தினால் அந்த வழக்குகள் தேங்கிக்கிடக்கின்றன. இதனால் மலையகத்திலுள்ள தோட்டத் தொழிலாளர்கள் சிறுசிறு குற்றங்களுக்காகப் பல வருடங்கள் சிறைவாசம் அனுபவிக்க வேண்டிய ஓர் இக்கட்டான சூழ்நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றார்கள். ஆகவே, அவர்களுடைய வாழ்விலே விமோசனம் ஏற்பட வேண்டுமானால், நீதித்துறையிலே இவ்வாறான மாற்றங்களைக் கொண்டு வருவது காலத்தின் கட்டாயமாக இருக்கின்றது.

මම ගරු අධිකරණ ඇමතිතුමාගෙන් මේ කාරණය ගැන අහන්න කැමතියි. අපේ ලංකාවේ නඩුවක් අහන්න ගියොත්, කිලෝ ගණනක පොත් උස්සා ගෙන යනවා. සමහර විට කිලෝ පහක්, කිලෝ දහයක්, කිලෝ විස්සක් විතර බර පොත් උස්සාගෙන යනවා.

මේ ක්ෂේත්‍රයේ විශිෂ්ට පළපුරුද්දක් තිබෙන ජනාධිපති නීතිඥයෙක් වන ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා අධිකරණ ඇමතිතුමා වශයෙන් පත් වීම අපේ රටේ ජනතාව ලද වාසනාවක්. මේ නඩු අවුරුදු ගණනාවක් තිස්සේ කථා කරනවා. Some people are already dead and gone. For years and years, generations තුනක් විතර යන කල් නඩු කථා කරනවා. පොඩි නඩුවකට තීන්දුවක් ගන්න නඩු කථා කරගෙන, කථා කර ගෙන, කථා කරගෙන යනවා. අවුරුදු 20, 30, 35, 40 කථා කරගෙන යන නඩු තිබෙනවා. ඒ නිසා යහපාලන ආණ්ඩුවේ අධිකරණ ඇමතිතුමාගෙන් මම අහන්න කැමැතියි, මේ නඩු අහන්න යන කාලය අඩු කරන්න ක්‍රමයක් නැද්ද කියලා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමනි, මම යම් කිසි පැහැදිලි කිරීමක් කළා. කාල වේලාව අනුව ප්‍රමාණවත් නොවෙන්නට පුළුවන්. අපේ රටේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ සහ සිවිල් නඩු විධාන සංග්‍රහයේ තමයි අධිකරණ පද්ධතියේ නඩු විමසීමේදී අනුගමනය කරන ක්‍රියාදාමය මුළුමනින්ම ඇතුළත් වෙලා තිබෙන්නේ. මේවා සම්මත කරලා තිබෙන්නේ මීට අවුරුදු 110කට, 120කට කලින් බ්‍රිතාන්‍ය පාලන සමයේයි. ඒ වකවානුව වන විට අපේ රටේ අධිකරණයක දවසකට නඩුවක්, දෙකක් විතරයි අහන්න තිබුණේ. නමුත් මේ වන විට දවසකට නඩු 100, 200 අහන්න තිබෙනවා. සමහර අධිකරණවල නඩු 400, 500 තිබෙනවා. ඒක නිසා අපි මේ වන විටත් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරතුමන් දෙපළකගේ සභාපතිත්වයෙන් යුතුව අපරාධ නඩු විධාන සංග්‍රහයයි, සිවිල් නඩු විධාන සංග්‍රහයයි දෙකම සංශෝධනය කරලා යෝජනා ඉදිරිපත් කරන්න කමිටුවක් පත් කරලා තිබෙනවා. දැන් ඒ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා.

ඉදිරි සති කිහිපය ඇතුළත අපි සිවිල් නඩු විධාන සංග්‍රහයට සංශෝධනයක් ඉදිරිපත් කරනවා, සෑම නඩුවකම විභාගයකට කලින් සමථකරණයක් සඳහා උත්සාහ කිරීම පිණිස. සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත වී ක්‍රියාත්මක වෙන කොට අපට විශ්වාසයක් තිබෙනවා, අවුරුද්දකට අධිකරණයට එන නඩු ප්‍රමාණය 50,000ක් 60,000ක් විතර අඩු කරන්න පුළුවන් වෙයි කියලා.

ඒ එක්කම මෝටර් රථ ප්‍රවාහන පනතට අපි ඉදිරිපත් කරන්න බලාපොරොත්තුවන සංශෝධන සම්මත කර ගත්තොත් තවත් අධිකරණයට එන නඩු වාර්ෂිකව ලක්ෂයක ප්‍රමාණයක් විතර අපට අඩු කර ගැනීමේ හැකියාව තිබෙනවා. මොකද ඇත්තටම ඒවා අධිකරණවල කාලය නාස්ති කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු නොවෙයි. ඒක නිසා අධිකරණය විසින් තීරණය කළ යුතු බරපතළ කාරණා සම්බන්ධව අධිකරණයට කටයුතු කරන්න ඉඩ හැරීම තුළින් මේ වාගේ සාමාන්‍ය -සුළු- විසඳා ගන්න පුළුවන් නඩු එතැනින් ඉවත් කරගෙන මෙය කාර්යක්ෂම කරන්න පුළුවන්.

අපේ ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය ඇත්ත. යම් කිසි ඉඩමක් සම්බන්ධව බෙදුම් නඩුවක් වාගේ එකක් ඉදිරිපත් වුණාම එය අපට ක්ෂණිකව විසඳා ගන්න බැරි වෙනවා. සමහර වෙලාවට පාර්ශ්වකාරයෙක් මැරෙනවා. ඊට පස්සේ ආදේශ කරන්න ඕනෑ. සමහර වෙලාවට ආදේශ කළ යුතු තැනැත්තන් ලංකාවේ ජීවත් වෙන තැන් හොයා ගන්න නැහැ. සමහර වෙලාවට ඒ අය විදේශ ගත වෙලා. ඒ අයගේ ලිපින හොයා ගන්න බැහැ. මේ වාගේ ප්‍රායෝගික ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ සම්බන්ධවත් අපි දැනට කෙටුම්පත් කරලා තිබෙන සිවිල් නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තිබෙනවා.

අපි සමහර වෙලාවට කියනවා, අපේ රටේ තමයි යුක්තිය ඉටු කිරීම ප්‍රමාද වෙන්නේ කියලා. මේක ඇත්තටම පොදුවේ තිබෙන කාරණයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට එංගලන්තයේ

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

නඩු තීන්දුවක් හම්බ වුණා. එංගලන්තය කියන්නේ අපේ අධිකරණ ක්‍රමයේ උල්පත. අපට මේ අධිකරණ ක්‍රමය දායාද කරපු රට. බොහොම ස්ථාවර හොඳ අධිකරණ පද්ධතියක් තිබෙන රටක්.

එංගලන්තයේ 1614 වර්ෂයේ ඉදිරිපත් කළ නඩුවකට "ක්‍රවුන් එදිරිව ලන්ඩන් නගර සභාව" නම් නඩු තීන්දුව ලබා දී තිබෙන්නේ 1992 මැයි මාසයේයි. එක නඩුවක් විමර්ශනය කරන්න එංගලන්තයේ අධිකරණයටත් අවුරුදු 368ක් ගතවෙලා තිබෙනවා. ඉඳලා-හිටලා එන එවැනි සුවිශේෂ වූ නඩු තිබෙනවා. නමුත් අපි සමස්තයක් විධියට ගත්තාම, ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන නීති ප්‍රතිසංස්කරණ හරහා අතිබහුතරයක් නඩු ප්‍රමාණය වඩාත් ශක්තිමත් කිරීම සඳහා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, අපේ අධිකරණ පද්ධතියේ, අධිකරණ රාමුවේ වෙනසක් කරන්නට යෝජනා කරමින් සිටිනවා. මොකද, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරන කොට තිබුණු ක්‍රමවේදයට වඩා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණාට පස්සේ බලය විමධ්‍යගත කිරීම හරහා, පළාත්බද අධිකරණ ඇති කිරීම හරහා ව්‍යාකූල තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ කරුණුත් නීතියේ, යුක්තියේ ප්‍රමාදයට එක්තරා මට්ටමකට දායක වුණු නිසා ඒවා වළක්වා ගනිමින්, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා ඉතාම කාර්යක්ෂම අධිකරණ පද්ධතියක් නිර්මාණය කරන්නට අප බලාපොරොත්තු වෙනවා.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(මාණ්පුමිකු වඩිවේල් සුරේෂ්)
(The Hon. Vadivel Suresh)
Thank you.

අපට ජාතික ආණ්ඩුවේ විශේෂයක් දකින්න තිබෙනවා. අපේ ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ නායකත්වයෙන් බලය බෙදා හැරීම ගැන ගරු අගමැතිතුමාටත්, ජාතික ආණ්ඩුවටත් මම ස්තුති වන්ත වෙන්නට ඕනෑ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් බලයට ආවාම සුළු ජාතීන්ට ලොකු සන්තෝෂයක් ඇති වෙනවා. ඒ සන්තෝෂය ඇති වෙන්නේ සංවර්ධනය සම්බන්ධයෙන් නොවෙයි; jobs හම්බ වෙනවා කියලා නොවෙයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් බලයට ආවාම අපට freedom එකක් හම්බ වෙනවා; අපට නිදහස ලැබෙනවා; අපට භය නැතිව කථා කරන්න පුළුවන් ශක්තියක්, බලයක් ලැබෙනවා.

අප පසු ගිය දේශපාලන ඉතිහාසය දෙස බැලුවාම, උතුර, නැඟෙනහිර, කන්ද උඩරට සෑම ප්‍රදේශයකම සුළු ජාතීන්ගේ ආශීර්වාදය ගරු රනිල් වික්‍රමසිංහ අපේ අගමැතිතුමාට ලැබුණා. ඒ වාගේම ජනතාවගේ වරම එක්සත් ජාතික පක්ෂයට ලබා දෙන්නේ ගරු රනිල් වික්‍රමසිංහ නායකතුමා සම්බන්ධයෙන් තිබෙන විශ්වාසයටයි. මෙවැනි සංශෝධන ඉදිරිපත් කළ යුතුයි. ඒ සංශෝධන මම කියවා බැලුවා. මෙවැනි අලුත් සංශෝධන ගෙන ඒමෙන් වතුකරයේ ජනතාවගේ පොඩි පොඩි ප්‍රශ්න සමථ මණ්ඩලයට ඉදිරිපත් කර විසඳා ගන්න හැකි ලෙහෙසි වෙනවා.

ඉව්වාරාන නඩවඩික්කෙකළ් ඉඩම්පෙරුම්පෝදු පෙරුන්තෝට්ට මක්කළුඩෙය සම්පල උයර්වෛප් පට්රි නාන් පේසාමල් ඉරුක්ක මුඩියාදු. පිරදම අමෛච්සර් මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ අවර්කළ් තෝට්ටත් තොළිලාළර් කළුඩෙය සම්පල උයර්වු සම්පන්දමාක නිදියමෛච්සරෝදු කලන්දුරෛයාඩියිරුක්කිරාර්. අදන්පින්නර්, අවර්කළුක්කුක් කොදුක්කප්පඩ වේන්ඩිය කුරිත්ත සම්පල උයර්වුක්කුත් තේවෛයාන නිදියෛ අරසාංකම් අන්දන්දක් කම්පනිකළුක්කු වළංකියිරුප්පදාකත් තෙරියවරුකින්රදු. ආකවේ, තෝට්ට මුදලාළිමාර් සම්මේලනම් අදිකරික්කප්පට්ට 2,500 රූපායෛ මේලුම් කාලම් තාළ්ත්තාදු අවර්කළුක්කු උඩනඩියාක වළංක වේන්ඩුම්. අදේවේළෛ තෝට්ටත් තොළිලාළර්කළුක්කු වළමෛයාක වළංකප්පට්ට නාට්සම්පළමාන 100 රූපායෛ අදිකරිප්පදර්කාන සෙයර්පාට්ටෛ උඩනඩියාක - මණිත්තියාලංකළුක්කුළ් කම්පනිකළ් නඩෙමුරෛප්පඩුත්ත වේන්ඩුම්. අවර්කළුඩෙය අදිකරික්කප්පට්ට සම්පළත්තෛ අව්වාරු වළංකාවිට්ටාල් කම්පනිච් සොන්දක්කාරර්කළ් අරසාංකත්තුක්කු සවාල් විඩුක්කින්රාර්කළා? එන්ර ඔරු කේල්වියෛ නාන් කේට්කවේන්ඩියිරුක්කුම්. ඒනෙනිල්, තෝට්ටත් තොළිලාළර්කළුඩෙය සම්පල උයර්වු පට්රි ඔරු වරුඩ කාලමාකත් තොඩර්න්දු පේසප්පට්ටු වරුකින්රදු. අදු සම්පන්දමාක නාංකළ් පලමුරෛකළ් පාරාළුමන්රත්තිලේ කුරල් එළුප්පියිරුක්කින්රෝම්.

තෝට්ටත් තොළිලාළර්කළුඩෙය සම්පල උයර්වු මර්රුම් මලෛයක මක්කළුඩෙය උරිමෛකළ් සම්පන්දමාකච් චට්ටත්තිලේ සිල වාසකංකළිල් මාර්රංකළෛක් කොන්ඩුවන්දු අන්ද මක්කළුඩෙය වාළ්විලේ සුපිට්සත්තෛ ඒර්පඩුත්තුවදර්කු නඩවඩික්කෛ එඩුක්ක වේන්ඩුම් එන්රු කෙළරව නීදියමෛච්සර් අවර්කළිඩම් කේට්ටුක් කොළ්කින්රේන්. තෝට්ටත් තොළිලාළර්කළ් තොඩර්පිල් ඉලකුවාන මුරෛයිලේ චට්ටංකළෛක් කෛයාළුවදර්කුරිය ඒර්පාඩුකළෛ අරසාංකම් මේර්කොළ්ළ වේන්ඩුම්. අවර්කළුඩෙය සම්පල උයර්වු සම්පන්දමාක නාන් එන්නුඩෙය උයිරෛයුම් තුච්සමාක මදිත්ත ඉන්දච් සපෛයිලේ තොඩර්න්දු පල වේන්ඩුකෝළ්කළෛ විඩුත්තුවන්දිරුක්කින්රේන්. මෙන්මේලුම් වාර්ත්තෛකළිනාල් සොල්ලි ඉදනෛ මුදිත්තුක්කොඩුක්ක මුඩියාදු. නඩෙමුරෛයිල් චාත්තියප්පඩක්කූඩිය වකෛයිලේ සෙයර්පඩ වේන්ඩුම්. ආකවේ, උඩනඩියාක අමුලුක්කු වරුම් වකෛයිල් ඉලංකෛ අරසින් තොළිල් චට්ටත්තින්පඩි තෝට්ටත් තොළිලාළර්කළුඩෙය සම්පළත්තෛ අදිකරික්ක වේන්ඩුම්. අදාවදු, අරසාංකම් තනියාර් තුරෛක්කු අදිකරිත්ත 2,500 රූපාය් සම්පළත්තෛ තෝට්ටත් තොළිලාළර්කළුක්කුම් උඩනඩියාක වළංකුවදර්කු ඒර්පාඩුකළ් සෙය්යප්පඩ වේන්ඩුම්

ඉන්රු උඩුවරෛ තෝට්ටම් පෝන්රු ඒනෛය තෝට්ටංකළිලේ මූඩප්පට්ටිරුක්කින්ර තේයිලෛත් තොළිර් සාලෛකළෛ උඩනඩියාකත් තිරප්පදර්කුරිය නඩවඩික්කෛකළෛ අරසාංකමුම් පොරුප්පාන අමෛච්සර් අවර්කළුම් මේර්කොළ්ළ වේන්ඩුමෙන්රු නාන් ඉන්දච් සපෛයිලේ කේට්ටුක්කොළ්කින්රේන්. හාලිඑල පකුදියිලේ උඩුවරෛයිල් ඔරු තොළිර්සාලෛ මූඩප්පට්ටදනාල් 450 පේරුක්කු මේල් තොළිලෛ ඉළක්කින්ර ඔරු සූල්නිලෛ ඒර්පට්ටිරුක්කින්රදු. ඉව්වාරාන සූල්නිලෛයෛක් කවනත්තිර්කොණ්ඩු මූඩප්පට්ටිරුක්කින්ර තොළිර්සාලෛකළෛත් තිරප්පදර්කාන මුයර්සිකළෛ නාම් එඩුත්තුක්කොණ්ඩිරුක්කින්ර වේළෛයිල්, සෙව්වනේ ඉයංකික්කොණ්ඩිරුක්කින්ර තොළිර්සාලෛකළෛ මූඩුවදර්කු අංකීකාරම් වළංක මුඩියාදු.

මේලුම්, මලෛයකත්තෛච් චාර්න්ද අරසියල් කෛදිකළ් පට්රිය විඩයම් සම්පන්දමාකවුම් කූරවේන්ඩුම්. කඩන්ද කාලංකළිලේ මලෛයකත්තෛච් චාර්න්ද පල ඉළෛඤර්, යුවදිකළ් කෛදු සෙය්යප්පට්ටු අරසියල් කෛදිකළාක ඉන්රුම් සිරෛකළිලේ වාඩික්කොණ්ඩිරුක්කින්රාර්කළ්. ආකවේ, අවර්කළුඩෙය විඩුදලෛ සම්පන්දමාකවුම් කෙළරව අමෛච්සර් අවර්කළ් නඩවඩික්කෛ එඩුක්ක වේන්ඩුම්. කුට්රමිළෛත්තවර්කළ් නිච්සයමාකත් තණ්ඩනෛක්කුළ්ළාක්කප්පඩ වේන්ඩුම් එන්පදිලේ නාම් තෙළිවාක ඉරුක්කින්රෝම්. ආනාල්, කුට්රමේ ඉළෛක්කාදවර්කළ් තණ්ඩික්කප්පඩක්කූඩාදු එන්පදිලුම් නාම් අවදානමාක ඉරුක්කින්රෝම්. ආකවේ, කෙළරව අමෛච්සර් අවර්කළ් විසේඩමාක මලෛයකප් පිරදේසත්තිර්කු විජයම් සෙය්ය වේන්ඩුම්. මලෛයක

மக்களுடைய நீதி சம்பந்தமான நடவடிக்கைகளை மேற்கொள்வதுடன், அவர்களுக்கு மத்தியில் விழிப்புணர்வுக் கூட்டங்களையும் நடத்த வேண்டும். இன்று மலையகச் சிறார்களுடைய விடயங்களில் அத்துமீறிய சில சம்பவங்கள் அரங்கேறிக்கொண்டிருக்கின்றன. அவற்றுக்கு முற்றுப்புள்ளி வைக்க வேண்டும்.

மலையகத்திலே பிறந்து வளர்ந்த இளைஞர், யுவதிகள் தலைநகர் கொழும்பிலும் மற்றும் பிறநகரங்களிலும் தொழில்புரிகின்றனர். அவர்களுடைய உரிமைகள் சட்டங்கள் மூலம் பாதுகாக்கப்பட வேண்டும் என்று நான் இந்தத் தருணத்திலே கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

අපේ ගරු අධිකරණ ඇමතිතුමා මේ පනත් ගෙනාවත් වතුකරයේ ජනතාවට නීති ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඒ නිසා මීටත් වඩා වෙනස්කම් කරන්න ඕනෑ නම්, පනත් සංශෝධනය කරන්න ඕනෑ නම්, වතුකරයේ ජනතාවගේ නියෝජිතයන් හැටියට ඒකට අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා. ඒ කටයුතු කරන්නට ඔබතුමාට බලය, ශක්තිය සහ ආශීර්වාදය ලැබෙන්න ඕනෑ කියලා වතුකරයේ ජනතාව වෙනුවෙන් කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.50]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතාම වැදගත් කාරණා කීපයක් අද දිනය තුළ සාකච්ඡාවට ලක් කරනවා. විශේෂයෙන් අපේ යහපාලන රජය බලයට පත් වුණාට පස්සේ බොහෝ දුරට ස්වාධීන තීන්දු-තීරණ ගත හැකි, ස්වාධීන පටිපාටියකට ගමන් කරන ආයතනයක් බවට අධිකරණයත් පත් වුණා. අධිකරණය, බන්ධනාගාර, සමථ මණ්ඩල පිළිබඳව සිද්ධ වෙන මේ කතිකාව තුළදී මටත් වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව සතුටු වනවා.

අද මුළු ලෝකයම ගැටුම්කාරී ස්වභාවයකට ඇවිල්ලා තිබෙන තත්ත්වයක් තුළ, ජන ජීවිතයේ තිබෙන අර්බුදකාරී තත්ත්ව තුළ "සමථකරණය" කියන එක අපට ඉතාම වැදගත් මාතෘකාවක්. අපේ අත්තලාගේ, කිරි අම්මලාගේ කාලයේ මිනිසුන්ට යම් කිසි කාරණයකට විසඳුමක් අවශ්‍ය වුණාම, හුළු අතු බැඳ ගෙන, පන්දම් අරගෙන, හැතැප්ම 10, 15, 20, 25 දුර ගෙවා ගෙන උසාවිවලට ගිහිල්ලා තමයි අවශ්‍ය නීතිය, යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට කර ගත්තේ. එහෙත් අද කාලය ඊට වඩා වෙනස්. අද අධිකරණ කටයුතු බොහොම පහසුවෙන් කරගන්න පුළුවන්. හැබැයි, අපේ ගරු ඇමතිතුමා කිව්වා වාගේ, අධිකරණ ක්‍රියාවලිය තුළ බොහොම ප්‍රමාද වෙලා තමයි ඒ අවශ්‍ය විසඳුම් ලැබෙන්නේ. ඉඩම් ආරවුලක් සම්බන්ධ නඩුවක් නම්, ඒ දේපල සම්බන්ධයෙන් විසඳුම එන කොට ඒ ඉඩම, ඒ දේපොළ වෙනුවෙන් ලැබෙන වත්කමෙහි වටිනාකමක් නැහැ. සමහර වෙලාවට ඒ නඩුව පැවරූ අයත් මිය ගිහිල්ලා. මිනීමැරුම් නඩුවක වුණත් එහෙමයි, වෙනත් නඩුවක වුණත් එහෙමයි. යුක්තිය අවශ්‍ය වන කාල පරාසය තුළ යුක්තිය ඉෂ්ට වෙන්නේ නැහැ. ඒක අපේ අධිකරණය තුළ තිබෙන විශාල ප්‍රශ්නයක්. මේ ප්‍රමාදය වළක්වා ගන්නට යොදන සැලසුමක් හැටියට සමථ මණ්ඩල ක්‍රමය බල ගන්වන එක, සමථ මණ්ඩලවලට යම් යම් පහසුකම් ලබා දෙන එක ඉතාම වැදගත් කාරණයක්.

ඒ කාලයේ අපේ ජන ජීවිතය තුළ අපි දැක්කා, ගමේ පන්සලේ හාමුදුරුවෝ, වෙද මහත්තයා සහ කවුරුත් ගරු කරන වැඩිහිටියන්ගෙන් සමන්විත කණ්ඩායමක් තුළින් ගමේ ඇති වූ යම් යම් ගැටලුවලදී තීන්දු තීරණ ගත් බව. ඒ ක්‍රමයේම වැඩිදියුණු වුණ අවස්ථාවක් තමයි මේ සමථ මණ්ඩල ක්‍රමය කියන්නේ. ප්‍රදේශයේ ඉන්න විශ්‍රාමිකයන්, අධ්‍යාපන ක්ෂේත්‍රය ඇතුළු විවිධ ක්ෂේත්‍රවල තනතුරු දරපු නිලධාරින් සමථ මණ්ඩලයේ ඉන්නවා. ජීවිතයේ වැඩි කාලයක් රාජකාරි කරලා, සමාජ ජීවිතය සහ ගැටුම් පිළිබඳ විවිධ අත්දැකීම් ලබාගත්ත, සමථකරණයක් සඳහා යම්කිසි උපදේශයක් ලබා දිය හැකි වියත් කණ්ඩායමක් විසින් ජනතාවගේ ගැටලු සඳහා උපදෙස් සහ සමථකරණයක් ලබා දීම ඉතාම වැදගත්.

උසාවි ක්‍රමය තුළ නිරන්තරයෙන්ම එක් කෙනෙක් දිනනවා; තව කෙනෙක් පරදිනවා. නමුත් දෙපාර්ශ්වයේම නීතිඥ මහත්වරු දිනනවා. පරදින පාර්ශ්වයෙන් ලැබෙන ගාස්තුවලිනුත් නීතිඥ මහත්වරු දිනනවා; දිනන පාර්ශ්වයෙන් ලැබෙන ගාස්තුවලිනුත් නීතිඥ මහත්වරු දිනනවා. හැබැයි, නඩු කියන දෙපාර්ශ්වයෙන් එක පිරිසක් පරදිනවා; තව පිරිසක් දිනනවා. නමුත් සමථ මණ්ඩල ක්‍රමය තුළ ක්‍රියාත්මක වන්නේ win-win position එක. දෙපාර්ශ්වයම දිනනවා. දෙපාර්ශ්වයම තෘප්තියට පත් වෙනවා. ඒ බව දැන් මෙතැනදී කියැවුණා. මෙතැනදී දෙපාර්ශ්වයටම අවශ්‍ය කරන සාමය, සහනය ලැබෙනවා. ඒ ආකාරයේ ගුණාත්මක විසඳුමක් තමයි මේ සමථ මණ්ඩල ක්‍රමය තුළින් ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය වසරේ පැමිණිලි 191,000ක් පමණ සමථ මණ්ඩල කරා යොමු වෙලා තිබෙනවා. මට ලැබුණු තොරතුරු අනුව ඉන් පැමිණිලි 100,000කට පමණ අවශ්‍ය සාර්ථක විසඳුම් ලැබී තිබෙනවා. අපේ අධිකරණ ඇමතිතුමා කිව්වා වාගේ, අනවශ්‍ය කාරණා නිසා උසාවිවල ගොඩ ගැසෙන නඩු, සමථ මණ්ඩල බලාත්මක කිරීම තුළින් ඒවාට යොමු කරන්න පුළුවන්. ඒ තුළින් අපට කාලය ඉතුරු කරගන්න පුළුවන්.

මේ වනකොට ලංකාවේ සමථකරුවන් 9,200ක පමණ කණ්ඩායමක් ඉන්නවා. සමථ මණ්ඩල 336ක් පමණ ස්ථාපිත වෙලා තිබෙනවා. ඒ එක්කම සමථ පුහුණුකරුවන් සම්බන්ධ කාරණයත් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ. සමථ පුහුණුකරුවන් ලංකාවටම ඉන්නේ 12 දෙනයි. අලුතෙන් කණ්ඩායමක් අරගෙන තිබුණත් තවම ඔවුන් සේවයට යොදවා නැහැ. අපි ඒ අයගේ පහසුකම් ගැනත් කථා කරන්න ඕනෑ.

මම හිතන විධියට ඒ ගැනත් අද කථා වුණා. පන්සල්වල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ විවිධ ස්ථානවල මේ මණ්ඩල රැස්වෙනවා. යුක්තිය පසිඳලීමේ මේ සමථ මණ්ඩල ගැන එක් එක් මත තිබෙනවා. අජිත් පී. පෙරේරා මැතිතුමාගේ මතයට මාත් එකඟ වෙනවා. ඇමතිතුමාත් ඒ කාරණය කිව්වා. මේ සමථ මණ්ඩල සඳහා පහසුකම් දෙන්න ඕනෑ. මේ රැස්වීම් සඳහා මේ අයට ස්ථිර තැනක් අපි දෙන්න ඕනෑ. ඒ වාගේම සමථ නිලධාරින් සඳහා ගෙවන්නේ රුපියල් 500ක වාගේ දීමනාවක්. ප්‍රශ්න විසඳන්න සිටින අයගේ ප්‍රශ්න නොවිසඳා, ඒ අය තෘප්තිමත් නොකර මිනිසුන්ගේ ප්‍රශ්න විසඳන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා, සමථ මණ්ඩල නිලධාරින්ට ගෙවන රුපියල් 500ක දීමනාව ප්‍රමාණවත් නැහැ කියන කාරණය ගරු ඇමතිතුමාගේ අවධානයට මා යොමු කරවනවා. සමථ මණ්ඩල නිලධාරින් අඩුම තරමින් වාහනයකින්වත් ඒ ස්ථානයට එනවා නම්, ඒ අයගේ තනතුරේ තිබෙන ගරුත්වය රැකෙනවා. ඒ සඳහා ගමන් වියදම් දෙනවා නම් හොඳයි. විශේෂයෙන් සමථ මණ්ඩලවල සිටින සාමාජිකයන් වැදගත් තනතුරුවල, වැදගත් අත් දැකීම් ලබපු ගෞරවනීය පුද්ගලයන්. ඒ නිසා ඒ ගෞරවය ඔවුන්ට ලබාදීම අවශ්‍ය කාරණයක්.

මම විමසනකොට සමථ පුහුණුකරුවන්ගෙන් කිව්වේ, සමහර වෙලාවට ඔවුන්ට දිස්ත්‍රික්ක දෙකක තුනක කටයුතු ආවරණය කරන්න සිද්ධ වෙන බවයි. මේ අයට අවශ්‍යවන ගමන් වියදම් සඳහා සාමාන්‍ය දීමනාවක් තමයි දෙන්නේ. ඒකත් රුපියල් 500ක වාගේ දීමානාවක්. එසේ යනවිට ඒ අයට නවාතැන් ගන්නත් සිද්ධ වෙනවා. නමුත් නවාතැන් දීමනාවක් නැහැ. එම නිසා අපට සිටින

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

සමඨ පුහුණුකරුවන් දොළොස් දෙනාගේ ප්‍රමාණය මීට වඩා පුළුල් කරලා, ඒ අයගේ වැඩ කටයුතු පහසු කරලා, අවම කරලා ඒ අයට අවශ්‍ය වන සම්පත් ටික ලබා දෙනවා නම් මම ඉතාමත්ම අගය කරනවා.

බන්ධනාගාරගත කිරීම ගැනත් මම කෙටියෙන් සඳහන් කරන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් බන්ධනාගාරගත වෙලා සිටි එක් අවස්ථාවක මම දැකපු දෙයක් කියන්නම්. ඒ අවස්ථාවේ කුඩා දරුවෙක් බන්ධනාගාරගත කරලා තිබුණා, බයිසිකලයක් හොරකම් කිරීමේ වරදට. මම ඒ දරුවාගෙන් ඇහුවා, "පුතේ, මොකක්ද වුණේ?" කියලා. ඒ දරුවා කිව්වා, " මම දන්නේ නැහැ, අපේ lane එකේ තිබෙන ගෙදරක් අයිනේ ලස්සන බයිසිකලයක් හේත්තු කරලා තිබුණා. මම ඒ බයිසිකලය පැද්දා. කවුරුවත් එපා කිව්වෙත් නැහැ, වැළැක්වූවෙත් නැහැ. බයිසිකලය පැදලා මම සවස ඒ බයිසිකලය අරගෙන ගෙදර ගියා. හෙටත් පදින්න මම ඒ බයිසිකලය තියා ගත්තා" කියලා. Lane එකේ සල්ලි තිබෙන ගෙදරක අයිනක නවත්වලා තිබුණු බයිසිකලයක් ඒ දරුවා පැද්දා. එම දරුවාගේ නොදන්නාකම මත ඒ බයිසිකලය ගෙදර ගෙන ගියා. ඒ දරුවා බන්ධනාගාරගත කරන්නට තරම් වැරැද්දක්, අපචාරයක්, දුසිරිතක් කළ දරුවෙක්ද? මම හිතන්නේ මෙය හරිම සානුකම්පික කාරණාවක් කියලායි. ඉස්කෝලේ කටයුත්තකට සල්ලි ගෙවන්න ඕනෑ නිසා පොල් ගෙඩි කිහිපයක් කඩා ගත් දැරිවියක් බන්ධනාගාරගත කළ අවස්ථාවක් පසු ගිය දවසක ජන මාධ්‍යවලින් අපි දැක්කා. මෙවැනි කාරණා සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේදී අපේ විනිශ්චයකාරවරුන්ගේ ඉඳලා, පොලීසිවල ඉඳලා ඒ අභිමතයන් වෙනස් වන්නට ඕනෑ කියලා මම හිතනවා. නීතිය තිබුණාට, නීතියේ අවකාශයන් තිබුණාට මේවා පිළිබඳව අපේ නිලධාරීන්ගේ දෘෂ්ටි කෝණයන් වැඩි වැඩියෙන් පුළුල් වෙන්නට ඕනෑ, සාධාරණ වෙන්නට ඕනෑ, නම්‍යශීලී වෙන්නට ඕනෑ.

බන්ධනාගාරවල තිබෙන තදබදය ගැනත් අපි කවුරුත් දන්නවා. බන්ධනාගාරවල අපේ මිත්‍රයින් ඉන්නවා, අපි ඒ අය බලන්න යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බන්ධනාගාර රැඳවියන්ට නිදා ගන්නවත් ඉඩක් නැහැ. ඒ අය නිදා ගන්නා විධියට කියන්නේ "සැමන් ගහනවා" කියලා. මිනිහෙකුගේ මූලික අවශ්‍යතාවක් නින්ද. උඩුබැලි අතට නිදා ගැනීම සඳහා ඔහුගේ ශරීරයේ ඉඩ ඔහුට අහිමියි. බන්ධනාගාරය භාරව හිටපු ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්නවා; දැන් බන්ධනාගාරය භාරව සිටින ඇමතිතුමාත් ඉන්නවා. මම එතුමන්ලාගේ අවධානයට මේ කාරණය යොමු කරවනවා. මනුෂ්‍යයකුට නින්ද මූලික අවශ්‍යතාවක්. මේ රැඳවියන්ට උඩුබැලි අතට හෝ මුණින් අතට වැතිර නිදා ගැනීමට අවශ්‍ය ඉඩ අද බන්ධනාගාරවල නැහැ. ඒක පැත්තට හරවලා, පැත්තට, පැත්තට, පැත්තට දාලා නිදා ගන්නේ. බන්ධනාගාර භාෂාවෙන් ඒකට කියන්නේ "සැමන් ගහනවා" කියලා. සැමන් ගහන බන්ධනාගාර තමයි අපට තිබෙන්නේ. ඒ නිසා මේ බන්ධනාගාරවල පහසුකම් පුළුල් කරන්නට ඕනෑ. මේ වාගේ අපහසුකම් රාශියක් තිබෙනවා. එම අපහසුකම් මහ හරවා ගැනීම සඳහා අවශ්‍ය සම්පත් ලබාදීම විශේෂයෙන්ම අපේ යුතුකමක් ලෙස මා සලකනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න.

මම කියන්නට ඕනෑ තවත් කාරණාක් තිබෙනවා. අපිත් එක්ක පාර්ලිමේන්තුවට ආපු අලුත් මන්ත්‍රීවරුන් පිරිසක්, ඒකාබද්ධ විපක්ෂය යැයි කියා ගන්නා කණ්ඩායමක් සිටිනවා. මම අද උදේත් දැක්කා, ඒ අය අඩිය තියන්නේ බොහොම බරට. බොහොම සාරගර්භව තමයි මේ දවස්වල ඒගොල්ල ඇවිදින්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක මම දැක්කේ අද උදේ. මම ඇහුවා, "මොකද මචං?" කියලා. " නැහැ මචං, නිකම්" කිව්වා. පත්තරේ බලන කොට තමයි මම දැක්කේ මේ අය ඡායා කැබිනට්ටුවේ ඇමතිවරුන් හැටියට නම් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඡායා කැබිනට්ටුවේ ඇමතිවරු. ඇමතිවරුන් ඇවිදින හැටියට තමයි මේ මන්ත්‍රීවරුන් අද උදේ ඉඳලා ඇවිදින්නේ. හරි බරයි, ඒක ඇහට අරගෙන තමයි ඇවිදින්නේ.

අපේ ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමාවත් ඇමතිවරයෙක් වශයෙන් නම් කරලා තිබෙනවා, මම දැක්කා. එතුමාට බන්ධනාගාරය භාර කරලා තිබුණා. මේ සිටින කණ්ඩායමේ විශාල පිරිසක් තව මාස කිහිපයකින් නීතිය හා අවශ්‍ය ක්‍රියාවලිය සිද්ධ වුණාට පසුව බන්ධනාගාර තුළට යයි කියලා මට හිතෙනවා. ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, ඔබතුමාව තමයි බන්ධනාගාර ඇමතිවරයා හැටියට නම් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා විමල් වීරවංශ මන්ත්‍රීතුමා තමන් යටතේ අමාත්‍යාංශය තිබියදී තමන්ගේ ඥාතීන්ට, ප්‍රේමවන්තයන්ට, හිතවතුන්ට ගෙවල් හදලා දුන්නා අපි දැක්කා. ඉඩම් නැති, නිවාස නැති මිනිසුන්ට එක ගෙයක්වත් හදලා නොදුන්න විමල් වීරවංශ මන්ත්‍රීතුමාට ආයෙත් ඡායා කැබිනට්ටුවේ නිවාස හා ඉදිකිරීම් කියන අමාත්‍යාංශය භාර දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා පැවැති "ගම්උදාව" සංකල්පය පණ නංවා අද වන විට එය හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ආපසු ක්‍රියාත්මක වෙමින් තිබෙනකොට, නිවාස අමාත්‍යාංශය කියන්නේ මොකක්ද කියලාවත් ජනතාව නොදැන සිටි කාලයක නිවාස ඇමතිකම කරපු විමල් වීරවංශ මහත්මයාට ඒකාබද්ධ විපක්ෂයේ ඡායා කැබිනට්ටුවෙනුත් නිවාස හා ඉදි කිරීම් අමාත්‍යාංශය භාර දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපේ උදය ගම්මන්පිල මහත්මයාට නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය භාර දීලා තිබෙනවා මා දැක්කා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මා අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කූට ලේඛන පිළියෙළ කරපු; නීතිය උල්ලංඝනය කරපු; මේ රටේ බරපතළ දූෂණ, වංචාවලට සම්බන්ධ වුණු පුද්ගලයකුට නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය භාර දීලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මෙයට අදාළත් නැහැ නේ. දැන් අවසන් කරන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි ඡායා කැබිනට්ටුවක් පත් කිරීම ගැනත්, ඒ තුළ තිබෙන විහිළු තත්ත්වය පිළිබඳවත්

ඔබතුමාගේ අවධානයට යොමු කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

ඊට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துமை பண்டார - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. EDWARD GUNASEKARA left the Chair and THE HON. LUCKY JAYAWARDANA took the Chair.

[අ.භා. 4.03]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා විසින් අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග මඟින් අධිකරණ පද්ධතිය ගැන ඉදිරිපත් කර තිබෙන යෝජනා ගැනත්, දෙවන වර කියැවීම සඳහා අද දින ඉදිරිපත් කර තිබෙන සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවත් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම අපේ ජයග්‍රහණයත් එක්ක මේ රටේ නීතියේ ආධිපත්‍ය නැවත ස්ථාපිත වුණාය කියන එක අපි සියලු දෙනාම පිළිගන්නා කාරණයක්. ඒ වාගේම මේ රජය යටතේ දේශපාලනඥයන්ගේ ඇඟිලි ගැසීම්වලින් තොරව, රටේ නීතිය හා අධිකරණයේ ස්වාධීනත්වය ක්‍රියාත්මක කරන්නට හැකි වීම ගැන අපි සියලු දෙනාම සන්තෝෂ වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමථ මණ්ඩලය කියන්නේ අධිකරණ ක්ෂේත්‍රය තුළ තිබෙන ඉතාම වැදගත් ආයතනයක්ය කියන එකත් අපි සියලු දෙනාම අවිවාදයෙන් යුතුව පිළිගන්නා කාරණයක්. ජනතාව අතර ඇති වන්නා වූ නොයෙකුත් ආකාරයේ ඝට්ටන සම්බන්ධයෙන් වන සුළු සුළු පැමිණිලි යොමු කරන්නේ මේ සමථ මණ්ඩලයටයි. එම සුළු සුළු ආරවුල් යම් කිසි ආකාරයකින් සමථයකට පත් කිරීම තුළින් සමථ මණ්ඩලය මේ රටේ නීතිය වෙනුවෙන්, සමාජයේ පැවැත්ම වෙනුවෙන්, ජනතාවගේ අන්‍යෝන්‍ය අවබෝධය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කරන ආයතනයක් ලෙස හඳුන්වන්න පුළුවන්.

නමුත්, ඒ සමථ මණ්ඩලය පවත්වා ගෙන යාමේදී ඔවුන්ට ලැබෙන දායකත්වයේ විශාල අඩුවක් තිබෙන බව අපට පෙනෙනවා. ඒවා ගැන අපි අද මෙතැන කථා කරලා, ඒ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට ඕනෑයි කියලා මා හිතනවා. විශේෂයෙන්ම සමථ මණ්ඩලයකට තිබෙන බලය පිළිබඳව නීතිමය ගැටලු තිබෙනවා. නඩුවකට අදාළව යම් පාර්ශ්වකරුවකු කැඳවූ අවස්ථාවේ දී එම අදාළ පාර්ශ්වය පැමිණියේ නැත්නම්, සමථ මණ්ඩලයට ඉන් එහාට ක්‍රියාත්මක වීමේ බලයක් නැති වීමේ යම් අඩුවක් තිබෙනවා. මෙහිදී තිබෙන එක චෝදනාවක් තමයි, පොලීසිය විසින් යම් කිසි ආරවුලක් සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වකරුවන් සමථ මණ්ඩලයට යොමු කර, සමහර වෙලාවට පොලීසිය විසින්ම ඒ අදාළ පාර්ශ්වවලට කියනවා, "සමථ මණ්ඩලයට යන්න අවශ්‍යතාවක් නැහැ, ඕකට ගියේ නැහැයි කියලා මොනවත් වෙන්නේ නැහැ" කියලා. එවැනි තත්ත්වයක් මේ සමාජය තුළ ඇති වුණු අවස්ථා තිබෙනවා. ඒ වාගේම අදාළ පාර්ශ්ව කැඳවීමේදී එයට පාර්ශ්වකරුවන්ගෙන් නිසි ප්‍රතිචාර ලැබුණේ නැත්නම් සමථ මණ්ඩලයට ඉන් එහාට යන්නට තරම් බලයක් නැති වීමේ අඩු පාඩුවක් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, සමථ මණ්ඩලයේ ඉන්න අයට ඊළඟට තිබෙන ගැටලුව තමයි ඔවුන්ට ලැබෙන දීමනාව ප්‍රමාණවත් නොවීම. මා හිතන විධියට සමථ මණ්ඩල සාමාජික සාමාජිකාවන්ට ලැබෙන්නේ, සතියකට රුපියල් 500ක් වාගේ ඉතාම අඩු දීමනාවක්. කාලයකින් ඒ දීමනාව වැඩි කර නැහැ. ඊළඟට, සමථ මණ්ඩලයේ එදිනෙදා කටයුතු කරගෙන යන්න අවශ්‍ය ලිපිගොනු පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ලැබෙන්නේ අවුරුද්දකට රුපියල් 3,000ක් වාගේ ඉතාම අඩු මුදලක්. ඒ අතින් බලන කොට මේ සමථ මණ්ඩල පවත්වාගෙන යාමේදී ඔවුන් අසීරුතාවකට පත් වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම තවත් කාරණයක් තමයි සමහර සමථ මණ්ඩල තිබෙනවා, පොලිස් ස්ථාන 15ක් විතර ඔවුන්ට අයත් වන. විශේෂයෙන්ම කොළඹ ක්‍රියාත්මක වන සමථ මණ්ඩලය අපි අරගෙන බැලුවාම, කොළඹ නගරයේ මැද කොළඹ ආසනය තුළ ක්‍රියාත්මක වන සමථ මණ්ඩලයට අවුරුදු 3කට 23,000ක නඩු ප්‍රමාණයක් ඔවුන්ට යොමු වෙලා තිබෙන බව මම දන්නවා. පොලීසි 15කට වඩා වැඩි ප්‍රමාණයක නඩු එම සමථ මණ්ඩලය සඳහා යොමු කරනවා. නමුත් ඔවුන්ට ඒවා පවත්වාගෙන යන්න අවශ්‍ය පහසුකම් නැති වුණාම, එම සමථ මණ්ඩල ඉතාම අසීරු තත්ත්වයකට පත් වෙනවා.

තවත් වැදගත් දෙයක් තමයි, සමථ මණ්ඩල සඳහා ඔවුන් පාවිච්චි කරන ආයතන. අපි දන්න විධියට සමහර වෙලාවට ගම්වල නම් පන්සල් පාවිච්චි කරනවා, ඒ වාගේම පල්ලි පාවිච්චි කරනවා. නමුත් ඔවුන් බොහෝ දුරට නගරය තුළදී පාවිච්චි කරන්නේ පාසල්. පාසල් පාවිච්චි කරන කොට එදා දිනයට ඔවුන් පාවිච්චි කරන ජලය, විදුලිය වෙනුවෙන් අමාත්‍යාංශය කිසිදු ගෙවීමක් කරන්නේ නැහැ. ඒ නිසා සමහර සමථ මණ්ඩලවල සිටින සාමාජික සාමාජිකාවන් එකතු වෙලා, ඔවුන්ගේ අතින් මුදල් එකතු කරලා කාර්යාලය පවත්වාගෙන යන පාසලට මාසයකට රුපියල් 2,000ක් වගේ මුදලක් ගෙවනු ලබනවා. සමථ මණ්ඩලය පවත්වන දිනට පාසලට පැමිණෙන විශාල පිරිසක් ඒ පාසලේ වැසිකිළි පාවිච්චි කරනවා, ජලය පාවිච්චි කරනවා, ඒ වාගේම පාසල තුළ දුම්බොනවා, තේ පැන් සංග්‍රහ පවත්වනවා. ඒ වගේ දේවල් කළාම පාසල අපවිත්‍ර වෙනවා. නමුත් පාසල සුද්ද කරන්න කම්කරුවන්ට ගෙවන්නේ මාසයකට රුපියල් 500යි. මෙන්න මේ වගේ එදිනෙදා කටයුතුවලදී සමථ මණ්ඩලවල සේවය කරන සාමාජික සාමාජිකාවන් මුහුණ දෙන ගැටලු අප්‍රමාණයි. මේක ඉතාම සාර්ථකව යන ක්‍රමයක් නිසා ඒ ගැන අපට වාද විවාද නැහැ.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

නමුත්, සමඨ මණ්ඩලයේ සිටින නිලධාරී මහත්තුරුන්ට අවශ්‍ය කරන පහසුකම් අපි දැනට වඩා ලබාදිය යුතුයි කියන එක තමයි මගේ හැඟීම.

ගරු ඇමතිතුමනි, අද සමඨ මණ්ඩලවලින් ජනතාවට වඩා විශාල වශයෙන් ප්‍රතිලාභ ලබන්නේ මූල්‍ය ආයතන හා බැංකු කියන එක මම කියන්න ඕනෑ. මොකද, අද ඒ මූල්‍ය ආයතන හා බැංකු උසාවිවලට ගිහිල්ලා නඩු කිව්වාම, තමන්ට අයවිය යුතු මුදල ලබා ගන්න ඊට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් වියදම් කරන්න ඕනෑ. ඒ නිසා අද මූල්‍ය ආයතන, බැංකු රුපියල් 10ක මුද්දර ගාස්තුවක් ගෙවලා ලක්ෂ ගණනක හිඟ මුදල් ලබාගන්න ඔවුන් අද සමඨ මණ්ඩල පාවිච්චි කරනවා. නමුත්, ඔවුන්ගෙන් රජයට ලැබෙන්නේ රුපියල් 10ක මුද්දර ගාස්තුවක් පමණයි. ඊට වඩා දායකත්වයක් ඔවුන්ගෙන් ලබාගත යුතුයි. සමඨ මණ්ඩල අද ජනතාවගේ ප්‍රශ්න විසඳනවාට වැඩිය මූල්‍ය ආයතනවල ප්‍රශ්න විසඳීම තුළින් එම මූල්‍ය ආයතන සමඨ මණ්ඩලවලින් ප්‍රතිලාභ ලබන තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා, මූල්‍ය ආයතනවලට කඩාපැනලා ඒ මූල්‍ය ආයතනවලට සමඨ මණ්ඩල ටික hijack කරන්න ඉඩ දෙන්න එපා කියලා. මේ ආයතනය ජනතාවගේ සේවය වෙනුවෙන්, ජනතාවගේ එදිනෙදා ප්‍රශ්න හා ගැටලු නිරාකරණය කිරීම වෙනුවෙන් හදාගත් ආයතන. අපි ඒ ආයතන ආරක්ෂා කරගන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් ගෙනෙන සංශෝධනය තුළින් මූල්‍යමය වටිනාකම වැඩි කිරීම තුළිනුත් මූල්‍ය ආයතනවලට ලොකු හයියක් ලැබෙනවා. ඔවුන් තව දුරටත් සමඨ මණ්ඩල කරා එක්රැස් වෙනවා. එතකොට ඔවුන් උසාවි යන්නේ නැතුව, උසාවිවල නඩු කියන්නේ නැතුව, නීතිඥ ගාස්තු ගෙවන්නේ නැතුව අවම මුදලකින් - රුපියල් 10ක මුද්දර ගාස්තුවකින් - සමඨ මණ්ඩල හරහා ඔවුන්ට අයවිය යුතු මුදල් ලබාගන්න මූල්‍ය ආයතනවලට පුළුවන් වෙනවා.

අනිවාර්යයෙන්ම අපි මෙම ආයතන වාණිජකරණය නොකළ යුතුයි; මෙය වාණිජ අධිකරණයක් නොකළ යුතුයි කියලා අපි හිතනවා. මේ තුළ තිබෙන ජනතාවගේ එදිනෙදා ගැටලු හා ජනතාව මුහුණ දෙන ප්‍රශ්න නිරාකරණය කර දෙන ආයතනයක් කියන හැඟීමට, ඒ පදනමට මෙම ක්‍රියාමාර්ගය තුළින් හානියක් නොවිය යුතුයි කියන එක තමයි මගේ අදහස.

ඒ විතරක් නොවෙයි, මම ගරු ඇමතිතුමාගේ අවධානය ඒ පිළිබඳව යොමු කරවන්න කැමැතියි. මොකද, දැනට තිබෙන මුදල වැඩි කිරීම තුළින් සමඨ මණ්ඩල ආක්‍රමණය කරන්න මූල්‍ය ආයතනවලට නැවත ලොකු හයියක් ලැබෙනවා. ඒ තුළින් මේවාට වාණිජමය වටිනාකමක් ලැබෙනවා. ඒ නිසා අපි දාපු පදනමට, අපි හිතන දේට, අපි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන දේට ඉදිරියේදී යම් හානියක් වෙන්නත් පුළුවන්. ඒ නිසා එය ආරක්ෂා කරගන්නත් ඔබතුමා යම් වැඩ පිළිවෙළක් ඉදිරිපත් හොඳයි කියන එකයි මගේ අදහස.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම අපි ඔබතුමාගෙන් තව දෙයක් ඉල්ලන්න කැමැතියි. අපි පසු ගිය කාලයේ මේ රටේ ආණ්ඩු හදන කොට, විශේෂයෙන්ම එදා මේ රට තුළ ජාතිවාදී ආකල්ප වැඩිවෙලා තිබුණු ප්‍රවණතාවක් අපි දැක්කා. මේ රටේ ජාතීන් අතර ගැටුම් ඇති කරන ප්‍රවණතාවක් තිබුණා. ජනවාරි 8වැනිදා කලින් මේ රටේ දෙමළ, මුස්ලිම්, සිංහල ජනතාව අතර භේද ඇති කරමින් මේ රට නැවත සිම්බාබ්වේ වගේ රාජ්‍යයක තත්ත්වයට ගෙනයන, එහෙම නැත්නම් මේ රට තුළ ජාතීන් ඇණකොටා ගන්නා තත්ත්වයකට ගෙනයන යුගයකයි අපි ජීවත් වෙලා සිටියේ. නමුත් අපේ වාසනාවකට ජනවාරි 8වැනිදා අපි ඒ බලවේග පරාජය කරලා, මේ රටේ සියලු ජන කොටස් එකට එකතු කරමින් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් අද ගොඩනඟලා තිබෙනවා.

අපි පරාද කරපු ඒ බලවේග -ඒ පැරදිච්ච බලවේග- පරිසරය විනාශ කරන්න නැවත ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අද ඔවුන් ආගමික කොටස් අතර ද්වේශ සහගත වෛරය නැවත ඇති කරන්න කටයුතු කරනවා. මම ඔබතුමාට කියන්න කැමැතියි, පසු ගිය ආණ්ඩුව කාලයේ -මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ - හිටපු අශෝක සේරසිංහ කියන නීතිඥතුමා පසු ගිය සුමානයේ දෙහිවල ප්‍රසිද්ධ ස්ථානයකදී ඉතාම බරපතළ විධියට මුස්ලිම් ජනතාව කෙරෙහි ද්වේශ සහගත ලෙස ප්‍රසිද්ධ ජන මාධ්‍යයකින් චෝදනා එල්ල කළා. ඔහුට විරුද්ධව මම කොහුවල පොලීසියේ පැමිණිල්ලකුත් කරලා තිබෙනවා වහාම ඒ පරීක්ෂණ කරන්න කියලා. මොකද, ඔහු මේ රටේ සිංහල ජනතාව මුස්ලිම් ජනතාවට විරුද්ධව අවුස්සමින් ද්වේශ සහගත විධියට බරපතල චෝදනාවන් කළා. එදා එතුමා මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුව කාලයේදී ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපතිවරයා හැටියට ක්‍රියා කළා. අපට එතකොට පේනවා මේකේ පිටුපස ඉන්නේ කවුද කියලා. අපි මැතිවරණ වේදිකාවලදී කිව්වා- බෙරිහන් දුන්නා-, වෛරය ඇති කරන එකට විරුද්ධව අපි "වෛරී ප්‍රකාශන පනත" - Hate Speech Bill - ගේනවා කියලා.

අපි කියන්නේ ඒ වෛරී ප්‍රකාශන පනත වහාම මේ ගරු සභාවට ගෙන එන්න ඕනෑ කියලායි. එමඟින්, අපි මේ රටේ නැවත ජාති වාදය, ආගමික ගැටුම්, ආගමික නායකයන්ට ගරහන, අපහාස කරන ප්‍රකාශ නවත්වන්න අවශ්‍ය නීති රෙගුලාසි හදන්න ඕනෑ. මොකද, අපි යහ පාලන රජය යටතේ මෙම ආණ්ඩුව පත් කර ගත්තේ නැවත මේ රටේ ජාති වාදී ගිනි දැල්, ආගම්වාදී ගිනි දැල් ඇති නොවෙන්නයි.

මේ රටේ, මේ ලෝකයේ ඉන්න ආගමික නායකයන්ට අපහාස කරන ජාතීන් අතර ඇන කොටා ගන්නා විධියේ ප්‍රකාශයන් අපේ පාලනය යටතේ අපි නවත්වනවා. ඒකට විරුද්ධව අණ පනත් අපි ගෙන එනවා. වෛරී ප්‍රකාශන පනත- Hate Speech Bill - අපි පාර්ලිමේන්තුවට ගෙන එනවා. ඒක අපේ මැතිවරණ ප්‍රකාශවල තිබුණු දෙයක්. ඒ නිසා ගරු අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලායි. ඒ වාගේම, අපි ලබා ගත්ත ජයග්‍රහණ ආපසු හරවන්න දෙන්න එපා. අපි මේ ගොඩනඟා ගත්ත ජාතික සමගිය කඩා බිඳ දමන්න දෙන්න එපා. ඒ ජාතික සමගිය බිඳ දමන්න, කඩන්න නොයෙකුත් කුමන්ත්‍රණ මේ රට තුළ නැවත ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ සඳහා ඔබතුමාගේ අවධානය හා අවශ්‍යකරණ ක්‍රියාමාර්ග ගන්න කියලා කියමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ප.ව. 4.14]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இச்சபையிலே கொண்டுவரப்பட்டிருக்கின்ற 1988ஆம் ஆண்டின் 72ஆம் இலக்க மத்தியஸ்த சபைச் சட்டத் திருத்தம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்ள கடமைப்பட்டிருக்கின்றேன். இந்த மத்தியஸ்த சபைகள் சமாதான சபைகளாக பல்வேறுபட்ட கோணங்களில் செயல்பட்டாலும், இந்த நாட்டில் நீதித்துறையில் தீர்ப்புக்களை வழங்குவதில் ஏற்பட்டுள்ள காலதாமதம் இச்சபைகளின் அவசியத்தை வலியுறுத்தியது. இன்று இச்சபை ஆக்கபூர்வமான நடவடிக்கைகளில் ஈடுபட்டாலும், மற்றவர்களுடைய கேலிக்கு உள்ளாகும் நிலையையும் நாங்கள் அவதானித்துக்கொண்டிருக்கின்றோம்.

இச்சபை யாரால் மதிக்கப்படவேண்டுமோ, அவர்களே இச்சபைக்குப் போகவேண்டாம் என்று கூறுகின்ற நிலைமையை நாங்கள் இன்று காண்கின்றோம். இரு பக்க பிணக்காளர்களிடமிருந்து பெறுகின்ற பணத்துக்காக பிரச்சினைகளை விரிவுபடுத்தி, அவற்றைத் தீர்க்க முடியாத சூழலை உருவாக்குகின்றவர்கள் மற்றும் இச்சபைகளின்மீது அதிகாரமுடையவர்கள்தான் இதனை மலினப்படுத்துகின்றார்கள்.

இன்று வீதிப் போக்குவரத்து தொடர்பான பிரச்சினைகள், கொடுப்பனவு தொடர்பான பிரச்சினைகள், காணி தொடர்பான பிரச்சினைகள் உட்பட பல்வேறுபட்ட பிரச்சினைகளைத் தீர்த்துவைப்பதிலே இந்த மத்தியஸ்த சபை பாரிய பங்களிப்பைச் செய்து வருகின்றது. கௌரவ உறுப்பினர் முஜிபுர் ரஹுமான் அவர்கள் கூறியதுபோன்று, இச்சபைகளுக்கென ஒரு நிரந்தரக் கட்டிடமோ அல்லது நிரந்தர வசதிகளோ ஏற்படுத்திக் கொடுக்காததனால் இவை பாடசாலைகள் அல்லது மதஸ்தாபனங்களில் இயங்கி வருகின்றன. இதனால் வழக்குகளை அல்லது அவர்களுடைய முன்னெடுப்புகளைச் சிறந்த முறையில் கொண்டுசெல்வதற்கு முடியாமல் இருக்கின்றது.

எங்களுடைய நாட்டிலே ஏற்பட்ட ஆட்சி மாற்றத்துக்கு மலையக மக்கள் உள்ளிட்ட தமிழ்பேசும் சிறுபான்மைச் சமூகங்களே காரணமாக இருந்தன. இவற்றுக்கும் பெரும்பான்மைச் சமூகத்துக்கும் இடையில் பிரச்சினைகளை உருவாக்கியதில் பல இயக்கங்கள் சம்பந்தப்பட்டிருக்கின்றன என்பதனை பத்திரிகைகளின் மூலம் அறியக்கூடியதாக இருந்தது.

அதில் பிரதானமாகப் பொதுபலசேனா என்ற இயக்கத்தின் செயற்பாடுகள் இங்கு மீண்டும் தலைதூக்க ஆரம்பித்திருக் கின்றன. இன்றைய பத்திரிகைகளுடைய தலைப்புச் செய்திகளைப் பாருங்கள்! முஸ்லிம் சமூகத்தினர் தங்களின் மதக்கோட்பாடுகளை குர்ஆனின் அடிப்படையிலே எடுத்துச் செல்கின்றபோது, குர்ஆனுக்கெதிராக வழக்குத் தாக்கல் செய்வதற்கான நடவடிக்கையை எடுக்கப்போவதாகக் கூறி எமது மதம் கொச்சைப்படுத்தப்படுகின்றது. மீண்டும் இப்படிப்பட்ட தீய சக்திகள் மேலோங்குவதற்கு எமது நாட்டின் எந்தச் சட்டமும் இடங்கொடுக்கக்கூடாது. கௌரவ நீதியமைச்சர் அவர்கள் இதற்கு உறுதுணையாக இருக்க வேண்டும். முன்னைய அரசாங்கம் தூங்கியது போன்று எமது அரசாங்கம் தூங்க முடியாது. ஏனென்றால், சிறுபான்மைச் சமூகத்தினரின் ஒரே தீர்மானத்தினால்தான் 2015ஆம் ஆண்டு ஜனவரி மாதம் 8ஆம் திகதி இந்த நாட்டிலே இந்த ஆட்சி மாற்றம் எற்பட்டது. பொதுபலசேனா போன்ற அமைப்புக்களுக்கு முன்னைய ஜனாதிபதி முட்டுக்கொடுத்ததும் அவரின் சகோதரர்கள் எடுத்த முனைப்புகளும்தான் இந்த நாட்டிலே ஆட்சிமாற்றம் ஏற்படக் காரணமாயின. இன்று அப்படிப்பட்ட கொடுமைவாதிகள் தங்களுடைய கொள்கைகளை மீண்டும் இந்த நாட்டிலே பெரும்பான்மை பௌத்த மக்களுக்கிடையிலே திணிக்க முயற்சிக்கின்றனர். ஆனாலும், கடந்த பொதுத்தேர்தலில் அந்த நாசகாரிகளை மிகவும் கீழ்த்தரமான முறையிலே மக்கள் தோற்கடித்திருக் கின்றார்கள். அவ்வாறானவர்கள் மீண்டும் தலையெடுக்க இந்த நீதித்துறை இடமளிக்கக்கூடாது என்பதனைக் கௌரவ நீதியமைச்சர் அவர்களுக்கும் மேதகு ஜனாதிபதி அவர்களுக்கும் மாண்புமிகு பிரதம மந்திரி அவர்களுக்கும் நாங்கள் எடுத்துச் சொல்லக் கடமைப்பட்டுள்ளோம்.

அதுமட்டுமல்ல, இன்று குற்றச் செயல்கள் தொடர்பில் எங்களுடைய மாணவர்கள் மத்தியில் ஏற்பட்டிருக்கின்ற நிலைமையையும் கௌரவ நீதியமைச்சர் அவர்களுக்கு எடுத்துச்சொல்ல நான் கடமைப்பட்டிருக்கின்றேன். அதாவது, ஒரு மாணவன் நீதிமன்றத்திற்கு அல்லது பொலிஸ் நிலையத்திற்குக் கொண்டுசெல்லப்படுகின்றபோது அவனது மாணவ அந்தஸ்து குறைவடைவதனால் அந்த மாணவனின் மனோநிலை பாதிக்கப்படுகின்றது. குருநாகலிலே 5 வயதுச் சிறுமியின் கற்பழிப்புச் சம்பவத்திலே ஒரு மாணவன் தவறுதலாகக் கைது செய்யப்பட்டு நீதிமன்றத்திற்குக் கொண்டுசெல்லப்பட்டதால், இன்று அவன் படிப்பையே கைவிட்டுவிட்டான் என்பது உங்கள் அனைவருக்கும் தெரியும். அவனுடைய இந்த மோசமான நிலைமைக்குக் காரணமென்ன? எனவே, நீதிமன்றத்திற்கு மாணவர்கள் கொண்டுசெல்லப்படக்கூடாது. ஆகையால், இந்த மத்தியஸ்த சபைகளுக்கூடாக மாணவர்களுடைய ஒழுக்கச் சீர்கேடுகளைச் சீர்படுத்த முடியுமா? என்பது பற்றி நாம் சிந்திக்கவேண்டும்.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මන්ත්‍රීතුමා මතු කරපු කාරණය වැදගත්. මම ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්නට ඕනෑ. මා හිතන විධියට එතුමා සඳහන් කරන්නට යෙදුණේ කොටදෙනියාව ප්‍රදේශයේ දැරියක් දූෂණය කර මරා දැමීමේ සිද්ධිය සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත් පාසල් ශිෂ්‍යයා පිළිබඳවයි. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා සඳහන් කළේ ඒ කාරණය නේද?

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
ඔව්.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ ගැන මා යමක් කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකේ වගකීම මූලික වශයෙන් භාර ගන්න ඕනෑ අපේ රටේ ජනමාධ්‍ය. අපේ රටේ පොලීසියට නිදහසේ තමන්ගේ රාජකාරිය කරන්නට සමහර වෙලාවට ජනමාධ්‍යකරුවෝ බාධාවක්. ජනමාධ්‍යකරුවෝ සමහර වෙලාවට බලාපොරොත්තු වනවා, යම්කිසි අපරාධයක් කරපු අපරාධකාරයා පැය දෙකෙන්, තුනෙන් හෝ හතරෙන් හඳුනා ගෙන, කුදලා ගෙන ගෙනැල්ලා, අධිකරණයට ඉදිරිපත් කරලා, දඬුවම් දීලා ඔක්කෝම ඉවර කරන්න. ඒක නිසා අපි දැක්කා ඒ වෙලාවේ පොලීසියට දැඩි පීඩනයක් තිබුණ බව. ජනමාධ්‍ය තුළින් විශාල වශයෙන් පොලීසියට ප්‍රහාරාත්මකව විවේචන එල්ල කළා. නමුත්, ඒක ඉතාමත් සැලසුම් සහගතව හෝ නැතත් ටිකක් පරීක්ෂණ කරලා ඉතා අපහසුවෙන් තමයි පොලිස් නිලධාරීන් සොයා ගත්තේ. පොලිස් නිලධාරීන්ට නිදහසේ තමන්ගේ රාජකාරිය ඒ ගොල්ලෝ අනුගමනය කරන ක්‍රමවේදය තුළ කර ගන්නට ඉඩ නොදීමේ ප්‍රතිඵලයක් විධියට හා ජනමාධ්‍ය විසින් එය විශාල විධියට අවුස්සා පොලීසියට මාධ්‍ය හරහා බලපෑම් වන ආකාරයේ විවේචන එල්ල කරමින් සිදු කරපු කාර්ය තුළ පොලීසියටත් සිද්ධ වුණා ක්ෂණිකව අපරාධකාරයෝ හොයන්න. ඒකේ ප්‍රතිඵලය වුණේ මොකක්ද? අවසානයේදී නියම අපරාධකාරයා නොවෙයි අහිංසක මිනිසුන් අපරාධකාරයා විධියට පැටළුණා; සැකකාරයෝ වුණා. අපි ඒ ගැන එම අවස්ථාවේත් සඳහන් කළා. ඒ ගැන අපිත් කනගාටු වනවා. ඒක සිදු වුණේ අපේ රටේ අධිකරණ පද්ධතියේ තිබෙන දුර්වලතාවක් නිසා නොවෙයි. මම විශ්වාස කරන්නේ නැහැ ඒක පොලීසියේ දුර්වලතාවක් කියලා. මොකද, සමහර වෙලාවට කාලයක් ගත වුණත් අපේ රටේ පොලීසිය ඉතා දක්ෂ විධියට

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

නියම අපරාධකාරයෝ හොයා ගන්න කටයුතු කරනවා. ඒ වාගේ අවස්ථාවකදී ජනමාධ්‍යයේ ඒ හැසිරීම නිසා තමයි මේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීමේ අවහාවිතයක් දක්වා තල්ලු වුණේ කියන කාරණය මා මතක් කරන්න ඕනෑ. ස්තුතියි.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(මාණ්පුමිකු අප්දුල්ලා මහ්රූප්)
(The Hon. Abdullah Mahrooff)
கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றி.

ஊடகங்களால் பின்பற்றப்படவேண்டிய ஒழுக்க நெறிகள் சம்பந்தமாக அண்மையிலே இங்கு ஒரு பிரேரணை கொண்டு வரப்பட்டது. அதிலே ஊடகத்துறையின் கடமைப்பாடு, அச்சு-இலத்திரனியல் ஊடகங்களின் கடமை, ஊடகவியலாளர் களுக்கு சமூகத்தை வழிநடத்துகின்ற பொறுப்பு என்பன பற்றியெல்லாம் விரிவாகப் பேசப்பட்டதை நான் இங்கு ஞாபகமூட்ட விரும்புகின்றேன். உண்மையிலே இது நீதித்துறையிலுள்ள குறைபாடு அல்ல என்றும் இதற்கு ஊடகத்துறை பொலிஸாரின் மீது செலுத்திய அழுத்தமே காரணம் என்றும் கௌரவ அமைச்சர் அவர்கள் கூறினார். அதற்காக நான் அவருக்கு நன்றி கூறக் கடமைப் பட்டிருக்கின்றேன்.

நீதிமன்றத்தின் முன்னால் நிறுத்தப்படுகின்ற மாணவர்கள் செய்த குற்றங்களுக்குக் காரணம், இந்த நாட்டிலே பெண்கள் - தாய்மார் வெளிநாடுகளுக்குச் செல்வதுதான் என்பதை நான் இங்கு சொல்ல விரும்புகிறேன். உண்மையிலே ஒரு தாயினது அரவணைப்பின்கீழ் இல்லாததன் காரணமாக, தகப்பன் இல்லாததன் காரணமாக, தாயும் தகப்பனும் வெளிநாடு செல்வதன் காரணமாக, இப்படிப் பல்வேறுபட்ட பிரச்சினைகள் காரணமாக வசதியிலே உச்ச நிலையில் இருக்கின்ற பிள்ளைகள் தாங்கள் எதுவும் செய்யலாம் என்ற எண்ணத்தில் பல்வேறு குற்றச்செயல்களில் ஈடுபடுகின்றார்கள். அவர்கள் குடிகாரர்களாக, புகைபிடிப்பவர்களாக, போதைப் பொருட்களைப் பாவிப்பவர்களாக மாறியிருக்கின்றார்கள். இவர்களை நீதிமன்றத்துக்குக் கொண்டுசெல்லாமல், பொலிஸ் நிலையங்களுக்குக் கொண்டுசெல்லாமல், இம்மத்தியஸ்த சபைகளினூடாக ஒரு நல்ல அறிவூட்டலை வழங்கி, அவர்களது நடத்தையில் மாற்றத்தைக் கொண்டுவரவேண்டும். இன்று குறிப்பிட்ட அந்த மாணவன் பாடசாலைக்குச் செல்வதில்லை. இப்படிப்பட்ட ஒரு நிலைமையை உருவாக்காமல், இந்த மத்தியஸ்த சபையை மாணவர் சமூகத்தை வழிநடத்துகின்ற சபையாக மாற்றுவதற்குச் சிந்திக்க முடியுமா? என்று நான் கௌரவ நீதி அமைச்சர் அவர்களைக் கேட்க விரும்புகின்றேன்.

இன்று இந்த மத்தியஸ்த சபையின் நோக்கம் வரையறுக்கப்பட்டிருக்கின்றது. அவர்களுக்கு கட்டளையிடுகின்ற சபையாக, தீர்ப்பு வழங்குகின்ற சபையாக மட்டுமல்லாமல், நம்பிக்கை, ஐக்கியம், பொறுமை, தியாகம் போன்ற அனைத்து விடயங்களையும் போதித்து, நல்லறிவூட்டலுடன் புரிந்துணர்வு, விட்டுக்கொடுப்பு போன்றவற்றையும் ஏற்படுத்திக் கொடுக்க வேண்டும். அவற்றின்மூலம் அவர்கள் தங்களுக்கு ஏற்பட்டிருக்கின்ற பிணக்குகளிலிருந்து விடுபடுவதற்கும் கொடுக்கல் வாங்கல்களைச் சீர்செய்துகொள்வதற்கும் பயிற்றப்படும் நிலைமையானது இந்த நாட்டிலே நல்ல பெறுபேறுகளை உருவாக்கும். இதன் அடிப்படையில் நாங்கள் சிந்திக்க முடியுமா?

மாணவர்களை நீதிமன்றத்துக்கு அல்லது பொலிசுக்கு அனுப்பாமல் இருக்கத்தக்கவாறு இந்த மத்தியஸ்த சபைகளை வலுவூட்ட வேண்டும். எதிர்காலத்திலே மாணவர்களுக்கு நற்போதனைகளைச் செய்வதன் மூலமும் நல்ல பயிற்சிகளை அளிப்பதன்மூலமும் இந்த மாணவச் சமூகத்தைக் கட்டியெழுப்ப முடியுமா? என்பதைப்பற்றிச் சிந்திக்குமாறு கேட்டுகொள்கின்றேன்.

இன்று பணத்தின் பெறுமதி குறைந்துள்ள காரணத்தினால், இந்த மத்தியஸ்த சபைகளுக்கூடாக 2,50,000 ரூபாய்க்குட்பட்ட கொடுக்கல்வாங்கல்களை விசாரிக்கமுடியும் என்றுள்ளதை 5,000,00 ரூபாய்க்குட்பட்ட கொடுக்கல் வாங்கல்களை விசாரிக்கமுடியுமென்று மாற்றி அதன் அதிகாரத்தைக் கூட்டுவதற்கு இந்தச் சபையில் ஒரு திருத்தம் முன்வைக்கப்பட்டுள்ளது. இது ஒரு நல்ல விடயம்.

மேலும், இந்த நாட்டிலே 30 வருட கால யுத்தத்தின் காரணமாக இன்று பல தமிழ் இளைஞர்கள் சிறைகளிலே அடைக்கப்பட்டுள்ளார்கள். இது தொடர்பில் நாங்கள் உங்களைச் சிந்திக்கச் சொல்கின்றோம்! கிழக்கு மாகாணத்தில் பல்வேறுபட்ட யுத்த நடவடிக்கைகளுக்குத் தலைமைதாங்கி நடத்தி முடித்தவர்தான் கருணா அம்மான் என்று அழைக்கப்படும் விநாயகமூர்த்தி முரளிதரன். அவர் இன்று சுதந்திரமாக நடமாடுகின்றார். அண்மையிலே ஜோர்ஜ் மாஸ்டர் அவர்களுக்கு நீதிமன்றம் விடுதலையளித்திருக் கின்றது. தமிழினி போன்ற முன்னாள் பெண் விடுதலைப் போராளிகளுக்கும் நீதிமன்றமே விடுதலையளித்திருக்கின்றது. ஆனால், இன்று சிறைகளிலே வாடும் தமிழ்க் கைதிகள் ஒவ்வொருவரும் பல்வேறுபட்ட வழக்குகளில் உட்படுத்தப் பட்டிருக்கின்ற காரணத்தினால், ஒன்றில் விடுபட்டாலும் மற்றொன்றில் விடுபட முடியாது காணப்படுகின்றார்கள். தமிழ்க் கைதிகளுடைய இந்த விடயத்தில் கருணைகூர்ந்து, அவர்களுக்குப் பிணையாவது வழங்கி அவர்களுடைய தாய் தந்தையரினதும் அவர்களுடைய குடும்பத்தாரினதும் துன்பமான மனநிலையை நீங்கள் தேற்றவேண்டும்.

அண்மையிலே இந்த நாட்டின் முன்னாள் ஜனாதிபதி அவர்களுடைய மகனார் சிறையிலே அடைக்கப்பட்டபோது அவர் பட்ட வேதனையை அல்லது அந்தக் குடும்பம் பட்ட வேதனையை நாங்கள் அவதானித்தோம். அதைப்பற்றிச் சிந்திப்பவர்களுக்கு தமிழ் மக்களும் இதே வேதனையோடுதான் இருக்கின்றார்கள் என்பது புரியும். அவர்களுடைய தாய், தந்தையர் இன்று உழைப்பில்லாமல் இருக்கின்றார்கள். 20 வருடங்களுக்கு மேலாகவும் சிலர் சிறையில் இருக்கின்றார்கள். சிறையில் இருப்பவர்களில் பெண் பிள்ளைகளும் அடங்குவர். அவர்களை விடுதலை செய்வதன் மூலம் தங்களுடைய தாய், தந்தையரைக் கவனிப்பதற்கான வாய்ப்பை அவர்கள் பெறுவார்கள்.

சட்டமூலங்களை நாங்களே உருவாக்குகிறோம். அந்த வகையில், 1972, 1978ஆம் ஆண்டின் அரசியலமைப்புச் சட்டங்கள் அரசியலுக்காகக் கொண்டுவரப்பட்டவையாக இருந்தாலும் 1978ஆம் ஆண்டின் அரசியலமைப்பு இன்று 19 ஆவது திருத்தத்துக்கு உட்படுத்தப்பட்டிருக்கின்றது. அதுவும் நமது நல்லிணக்க ஆட்சியிலே கொண்டுவரப்பட்ட 19ஆவது திருத்தச் சட்டத்தை சர்வதேசமும் ஏற்றுக்கொள்கின்றது. அந்த வகையில், ஆக்கப்பட்ட அந்தத் திருத்தத்தினூடாக இன்று இந்தச் சபைக்கு ஒரு கௌரவம் ஏற்பட்டிருக்கின்றது. பத்தொன்பதாவது திருத்தச் சட்டம் இந்த உயர்ந்த சபையை அரசியலமைப்புச் சபையாக மாற்றியிருக்கின்றது. இந்த அரசியலமைப்புச் சபையினூடாகவாவது சகலருக்கும்

විදුතලෙ කිටෙක්කක්කූටිය, කෙෞරවම් කිටෙක්කක්කූටිය ඉරු නීති මුරෙමෙයෙ උරුවාක්ක වේණ්ටුමෙන්රු කේට්ටු, විටෙපෙරුකින්රේන්. නන්රි.

[අ.භා. 4.28]

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

අද දිනයේ කථා බහට ලක්වන, සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත යටතේ ඉදිරිපත් කරන නියමයත්, ඒ වාගේම අධිකරණ සංවිධාන පනත යටතේ නියෝගත්, විශේෂයෙන්ම සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවත් මේ මොහොතේ වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටට, රටේ පැවැත්මට, රටේ අනාගතයට ගැළපෙන විධියට නීති හදලා ඒ නීති ක්‍රියාත්මක කිරීම සඳහා අපි අධිකරණයට බලය ලබා දෙනවා. විශේෂයෙන්ම අද දිනයට, එනම් එක් පාර්ලිමේන්තු දිනයකට, රුපියල් ලක්ෂ 43ක මුදලක් අපි වියදම් කරනවා. ඒ ජනතාවගේ මුදල්. අද පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් විමසා ඉදිරිපත් කරන්නා වූ මේ නියමවල, නියෝගවල, පනත් කෙටුම්පත්වල තිබෙන අඩු ලුහුඬුකම් පිළිබඳව කථා කරලා මම කලින් සඳහන් කළ විධියට රටේ පැවැත්මට අපි මේ දේවල් ක්‍රියාත්මක කරන්න අවස්ථාව ලබා දෙනවා.

මේ නීතිය ක්‍රියාත්මක කිරීමේදී, එහෙම නැත්නම් වරදකරුවන් සඳහා දඬුවම් ලබා දීමේදී අපි මේ ගත කරන කාලයේ වටිනාකම සලකා බැලෙනවාදැයි කියන ප්‍රශ්නය මා සතුව තිබෙනවා. මේ අවස්ථාවේ මා ඉතා වේදනාත්මකවයි කථා කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යහ පාලන ආණ්ඩුව නිර්මාණය කරන්නට ඌවේ ජනතාව හා දේශපාලන නායකයන් විශාල වශයෙන් කැප වුණු බව ඔබතුමාත් දන්නවා. ඒ නිසා තමයි පසු ගිය කාලයේ ඒකාබද්ධ විපක්ෂයේ බොහෝ දෙනා යළිත් ඔවුන්ගේ සටන ඌවෙන් පටන් ගන්න කටයුතු කරලා ඌව පළාතේ ජන හමු පවත්වන්න කටයුතු කරලා තිබෙන්නේ. සමහර වෙලාවට මටත් හිතෙනවා, මෙවැනි දෙයක් සිද්ධ වෙන්නේ අපේම වැරදි නිසාය කියලා. අපි නීති හදනවා. නමුත්, ඒ නීති කඩන සමහර දේශපාලන නායකයන් ආරක්ෂා කරන්නට කටයුතු කරන නිසාදෝ මේ දේවල් සිදුවන්නේ කියන කාරණය මටත් හිතෙනවා. ඒ නිසා ඔවුන්ගේ සටන ක්‍රියාත්මක කරන්න ඔවුන් තෝ තැන්නක් හැටියට නැවතත් ඌව පළාත තෝරා ගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පුංචි අවස්ථාවක් දෙන්න. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක රටේ සංවර්ධනය ග්‍රාමීය ජනතාව අතරට යෑමේ අවස්ථාවක් හැටියට පළාත් සභා නිර්මාණය වුණු බව අපි දන්නවා. හැබැයි, රටේ පවතින නීතියට අනුකූලව ඒ ආයතන කටයුතු කළ යුතුයි කියන කාරණය ඔබත්, මමත්, මේ සභාවත් දන්නා කාරණයක්. එය එසේ නොවෙමින් මේ රටේ අහිංසක ජනතාවගේ මුදල්වලින් තමන්ගේ සුඛ විහරණය සහ තමන්ගේ දේශපාලන හෙංචයියන්ට අවශ්‍ය කටයුතු කරන අවස්ථාවක් අද පළාත් සභාවල ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන් ඌව පළාතේ. මා මේ කරුණු සියල්ල ප්‍රකාශ කරමින් ඒ පිළිබඳව වග කිව යුතු අදාළ බලධාරීන් දැනුවත් කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. නමුත්, එයින් ඵලක් සිදු වන්නේ නැහැ. විශේෂයෙන්ම අද අධිකරණ අමාත්‍යාංශය යටතේ ඉදිරිපත් වන මේ කාරණා තුළදී අපි කොතෙක් නීති හදා ඒවා ක්‍රියාත්මක කරන්න අවස්ථාව සලසා දුන්නත්, ඒවා ක්‍රියාත්මක නොවෙනවා කියන කාරණය මතු කරන්නයි මා මේ දේවල් ප්‍රකාශ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අතිගරු ජනාධිපතිතුමා පත් වුණාට පස්සේ ඇමතිවරුන්ට ඔවුන්ගේ ලේකම්වරු හැටියට පත් කර ගන්න පුළුවන් වන්නේ කොපමණ සංඛ්‍යාවක්ද කියන කාරණය සඳහන් කරමින් ගැසට් පත්‍රයක් පළ කරලා තිබෙන බව අපි දන්නවා. නමුත්, මට ප්‍රශ්නයක් තිබෙනවා. ඌව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාට මේ වනකොට උපදේශකවරු හැටියට ලේකම්වරු අට දෙනෙකු පත් කරලා තිබෙනවා. මේ අට දෙනාට පළාත් සභා අරමුදලෙන් සීසල් දීමනාව හැටියට රුපියල් 1,15,000ක් ගෙවනවා. තවත් දීමනාවක් හැටියට රුපියල් 20,000කුත් ගෙවනවා. මේ සියලු දේවල් නීත්‍යානුකූල නොවනවා කියන කාරණාව අපි සඳහන් කළාට පස්සේත් අදටත් මේ මුදල් ඒ අදාළ නිලධාරි වෙත ගෙවනවා. ඒ අනුව වැටුප් දෙකක් ගන්නා සමහර නිලධාරි අදටත් ඉන්නවා.

එක පැත්තකින්, සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති හැටියට පත් වෙලා ඉන්නවා. එතුමා උපදේශකයෙක් හැටියට තවත් වැටුපක් ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එකම ආයතනයෙන් වැටුප් දෙකක් ලබා ගැනීමේ හැකියාව එතුමාට තිබෙනවා. අපට දැන් මේවා නොකියා බැහැ. මේ රටේ යහ පාලන ප්‍රතිපත්ති බලාපොරොත්තු වුණ ජනතාව සහ පළාතේ ඡන්ද දායකයන් අපෙන් අහනවා, ඔබතුමන්ලා මෙවැනි දේවල් දැක දැක පාර්ලිමේන්තුව තුළ ඉඳගෙන මොනවාද කරන්නේ කියලා. එපමණක් නොවෙයි, එතුමාගේ සුඛ විහරණය පිණිස සංග්‍රහ වියදම් හැටියට රුපියල් 85,000ක මුදලක් වෙන් කර ගෙන තිබෙනවා. මම හිතන්නේ, අතිගරු ජනාධිපතිතුමාවත් එපමණ මුදලක් ලබා ගන්නේ නැතිව ඇති කියලායි.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
What is your point of Order?

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, today, we are discussing laws coming under the Ministry of Justice. If the Hon. Member wants to sling mud or do something else, he can choose another forum or another way, but he is making use of his time and talking something completely irrelevant to the subject. Then, what is the purpose of having Standing Orders in this House?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පොඩ්ඩක් ඉන්න ගරු ඇමතිතුමනි, මම ඒ කාරණාවට එනවා. මොකද රීතිය ක්‍රියාත්මක නොවීමේ ප්‍රතිඵලයක් හැටියටයි මම මේ කියන්නේ. ඔබතුමාත් ඒ පළාතේ ඇමතිවරයෙක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා යෝජනාවට අනුකූලව කථා කරන්න.

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, I rise to a point of Order. මම රීති ප්‍රශ්නයක් මතු කරනවා. ගරු මන්ත්‍රීවරුන් යම් විවාදයකට අදාළව මෙම ගරු සභාවේදී කථා කිරීමේදී යම් ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ නිසා තමයි Standing Orders තිබෙන්නේ. ඒ Standing Ordersවල තිබෙනවා,"සභාවේ මාතෘකාවට භාජනය වන කාරණය සම්බන්ධයෙන් කථා කළ යුතුයි" කියලා. මම කියන්නේ, මේ කාරණය කියනවා නම් කියන්න තව ඕනෑ තරම් අවස්ථාව තිබෙනවා. මම මේ මතු කරන රීති ප්‍රශ්නය වන්නේ, මේ මන්ත්‍රීතුමා මේ කථා කරන දෙය අද සභාවේ විවාද වන කාරණයෙන් පිට කාරණයක්. එම නිසා මෙය සම්පූර්ණයෙන්ම ස්ථාවර නියෝගවලට අනුව පටහැනියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, යෝජනාවට අනුකූලව කථා කරන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම යෝජනානුකූලව කටයුතු කරන්න, අපි කොච්චර නීති හැදුවත් මෙම නීති සියල්ල ක්‍රියාත්මක කිරීමේදී ඵලදායීව ක්‍රියාත්මක නොවනවාය කියන කාරණය වටහා දෙන්න තමයි මේ උත්සාහ කරන්නේ. මොකද, පළාතේ වග කිවයුතු ඇමතිවරයෙක් හැටියට, විශේෂයෙන්ම ඔබතුමා විසින්ම නිර්මාණය කරපු මහ ඇමතිවරයා හැටියට-

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය සම්බන්ධයෙන් මට කියන්න පුළුවන්, ඔබතුමාගේ නිර්ණායකය වන්නේ රජයේ ස්ථාවරය. මම රජයේ කෙනෙක්. මම කියන්නේ, අපි එකිනෙකාට මඩ ගහ ගහන්න තැනක් බවට මේ ගරු සභාව පත් කර ගන්නවා නම්, එහෙම නම් ඊළඟ සුමානේ ඉඳලා අපිත් එහෙම කර ගෙන යමු. හැබැයි, එහෙම කරන්නේ නැතුව මේ ගරු සභාවේ Standing Orders අනුව සහ යම්කිසි ආකාරයක සම්මුතියක් අනුව වැඩ කටයුතු කර ගෙන යනවා නම්, එහෙම කර ගෙන යමු.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමා මඩ ගහන්නේම නැහැ නේද, ගරු ඇමතිතුමනි?

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
නැහැ. මම කියන්න හදන්නේ, මේ ගරු සභාවේ කටයුතු කිරීමේදී.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එළියේදී මඩ ගහනවා?

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඒවා කියන තැන් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභාවේ කථා කරන කොට- [බාධා කිරීම්]

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඒවා කියන්න තැන් තිබෙනවා. තමන්ගේ පක්ෂයේ- [බාධා කිරීමක්]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ කාරණාත් එක්ක-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, යෝජනාවට අදාළව කථා කරන්න. ඒ කාරණය වෙනත් අවස්ථාවක මතු කරමු.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු අධිකරණ ඇමතිතුමනි, මෙම කාරණය ඔබතුමාගෙන් අහන්නට මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඌව පළාත් සභාව තුළ විශාල මූල්‍ය වංචා තිබෙනවා. මා සඳහන් කරන්න යන මේ කරුණු පිළිබඳව පළාතේ ජනතාව විෂය භාර ඇමතිවරයාට ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. මේ කියන වංචා පිළිබඳව මා කටයුතු කළා. ඒ වාගේම ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාට මේ පිළිබඳව ලියා දන්වා යවා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. 2016.02.18 දින විගණකාධිපතිවරයාට දන්වා යවා තිබෙනවා, මේ සම්බන්ධව කටයුතු කරන්න කියලා. ඒ විතරක් නොවෙයි. දුලාජ් කියන බණ්ඩාරවෙල පුරවැසියෙක් මටද පිටපත් සහිතව මූල්‍ය අපරාධ කොට්ඨාසයට මේ සම්බන්ධව දන්වා යවා තිබෙනවා. රටේ නීතියක් තිබෙනවා. මේ පැමිණිලි සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරන්න අවශ්‍යයි. නමුත්, අද වන තුරු ඒවා සිද්ධ වෙලා නැහැ. 2016.03.17 දින මේ සියලු වංචාවලට අදාළ අමාත්‍යාංශවල නීති කටයුතු කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, අපි ඉල්ලා සිටින්නේ, වංචා සිදුවූවා යැයි මේ ඉදිරිපත් කර තිබෙන ආයතන සම්බන්ධව ඔබතුමා සොයා බලා කටයුතු කරන්න කියලායි.

ගරු අමාත්‍යතුමනි, පසු ගිය කාල වකවානුව තුළ මටත්, මගේ පියාටත්, මගේ සහෝදරයාටත් සමථ මණ්ඩලයට යන්නට සිද්ධ වුණා. පසු ගිය ජනාධිපතිවරණ සමයේදී අපි යම් ගැටුම්කාරී තත්ත්වයක් ඇති කළාය කියලා අපට විරුද්ධව පැමිණිලි කරලා තිබුණා. ඒ නිසා අපට අවසාන මොහොතේ සමථ මණ්ඩලයට යන්න සිද්ධ වුණා. එහිදී අපි දැකපු දුර්වලතා, අඩු පාඩු පිළිබඳව මම මේ සභාවේදී කියන්න ඕනෑ. සමථ මණ්ඩලයට නිලධාරීන් පත් කරද්දී, සාමදාන විනිශ්චයකාරවරුන් පත් කරද්දී අනිවාර්යයෙන්ම උසස් අධ්‍යාපනයක් ලැබූ පුද්ගලයන් පත් කරන්න ඕනෑ. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

විශේෂයෙන්ම සමථ මණ්ඩලයට පත් කරන්නා වූ නිලධාරීන් ගමේ ස්වේච්ඡා සේවකයන් වෙන්න ඕනෑ. ඒ වාගේම ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම ගැනත් බලන්න ඕනෑ. පක්ෂග්‍රාහී නොවී තමන්ගේ රාජකාරී නිසියාකාරව කරන්න පුළුවන් පිරිසක් ඒ සඳහා යොදවන්න ඕනෑ. මොකද, අපට යම් යම් අසාධාරණ සිදු වුණු

අවස්ථා තිබුණා. අපි ඒවා අත් දුටුවා. අපි ඒවා දැක්කා. ඒ නිසා උගත්, බුද්ධිමත් ඇමතිවරයෙක් හැටියට ඔබතුමා මේ පිළිබඳව සොයා බලා ඒ තනතුරු සඳහා සුදුසු පුද්ගලයන් පත් කරයි කියලා මම විශ්වාස කරනවා.

අතිගරු ජනාධිපතිතුමාගේ මේ වැඩ පිළිවෙළත් සමඟ ගරු ඇමතිතුමා හොඳ තීන්දුවක් අර ගෙන තිබෙනවා. ග්‍රාම නිලධාරිවරුන්ගේ සේවය, ඔවුන්ගේ කැප වීම, ඒ වාගේම ඔවුන්ගේ වටිනාකම පිළිබඳව සලකා බලා අනිවාර්යයෙන්ම ඔවුන්ට සාමදාන විනිශ්චයකාර පදවිය ලබා දීම සඳහා ඔබතුමා කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මම ඔබතුමාට තවත් යෝජනාවක් කරනවා. විශ්‍රාම ගිය ග්‍රාම නිලධාරීන් ඉන්නවා. පුළුවන් නම් ඔවුන්ටත් මේ අවස්ථාව ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. "අපටත් මේ අවස්ථාව ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. ඔබතුමා පාර්ලිමේන්තුවේදී ඒ යෝජනාව ඉදිරිපත් කරන්න" කියලා ඔවුන් මගෙන් ඉල්ලීමක් කළා. පසු ගිය කාලය තුළ ඔවුනුත් මේ රටට විශාල කාර්ය භාරයක් ඉටු කළා. ඔවුන් හරහා ඒ කාර්යය ඵලදායීව, කාර්යක්ෂමව ඉෂ්ට සිද්ධ කර ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

අපි යම් කාරණාවක් ගැන කියන කොට බොහෝ දෙනා ඇවිල්ලා ඒවාට විරුද්ධව කථා කරලා, අදාළ නැති කාරණා කියලා ඒවා යට ගහන්න හදනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මහා විශාල කැප කිරීමක් කළා. අපි විශාල කැප කිරීමක් කර මේ වෙනසට මුල පුරන්න කටයුතු කළා. ඒ වෙනසට පණ දෙන්න මටත් හැකියාවක් ලැබුණා. අපට බැහැ, අපේ පළාතේ ජනතාව විඳින දුක් ගැහැට දිහා බලා ගෙන ඉන්න. ඒ නිසා තමයි මේ නීති ක්‍රියාත්මක කරන්නය කියලා අපි කියන්නේ. ඒ නීති ක්‍රියාත්මක කරන ආයතන අද උඩ බලා ගෙන ඉන්නවා. ඒ ආයතනවලින් සිදු විය යුතු කාර්යය ඉෂ්ට සිද්ධ වෙන්නේ නැති වුණාම මේ රටේ ජනතාවට අපි දෙන උත්තර මොනවාද? වැරදි කරපු නායකයන් මොනවාද, කළේ? සීනිගම දේවාලයට ගිහිල්ලා මිරිස් ඇඹරුවා, මිරිස් ඇඹරුවාට පස්සේ සියලු දේවල් යට යනවා කියලා. එහෙම නම් අපි නීති හදන්නේ නැතුව හැමෝටම කියමු, "සීනිගම දේවාලයට ගිහිල්ලා මිරිස් අඹරන්න, තමුන්නාන්සේලා කරපු වැරදි නිවැරදි වෙයි, තමුන්නාන්සේලා කරපු වැරදි යටපත් වෙයි, තමුන්නාන්සේලා සාධාරණයි කියලා ඔප්පු කරන්න පුළුවන් වෙයි" කියලා. අපට එහෙම කියන්න බැහැ. එහෙම කියලා පොල් ගෙඩියක්වත් ගහන්න අපට බැහැ. ඒවා පෙරළා අපිට වදිනවා. මොකද, අපි මේ ආණ්ඩුව ගොඩ නඟපු නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සඳහන් කරන්න ගිය කරුණු පිළිබඳව ඩිලාන් පෙරේරා ඇමතිතුමා අතරමහදී මැදිහත් වෙලා පැහැදිලි කළා. සැබෑ තත්ත්වය පිළිබඳව සමාජය දැනගත යුතුයි. අපේ පළාතේ ඉන්න දේශපාලන නායකයෙක් හැටියට එතුමාටත් ඒ දේශපාලන තීන්දු ඒ ඒ වකවානුවේදී ලැබෙයි. අධිකරණ පද්ධතියේ ශක්තිමත්භාවය, ස්වාධීනභාවය කියන්නේ ඉතාම වැදගත් දෙයක්. අපේ ගෙදර තුළත් පුංචි අධිකරණයක් තිබෙනවා. ඒ නිසා තමයි අපි අපේ ආචාර ධර්ම ආරක්ෂා කර ගනිමින්, නීතිගරුක වෙමින් සමාජගත වෙන්නේ. අපේ අනාගතයට අවශ්‍ය කරන නීති පද්ධතිය ශක්තිමත්ව, අපට ගැළපෙන විධියට, යහපාලන ප්‍රතිපත්තියට ගැළපෙන විධියට යොමු කිරීමට අවශ්‍ය හැකියාව, ශක්තිය ඔබතුමාට තිබෙනවා, ගරු අමාත්‍යතුමනි. ඒ වාගේම මේ රටේ තිබුණු අවනීතිය තවදුරටත් ක්‍රියාත්මක නොවන විධියට ඔබතුමා කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර දේශපාලනඥයන් නිසා, තමන් වැරැද්දක් කළාය කියලා තමන් විසින් තමන්ම ගස් බැඳ ගත්ත අවස්ථා තිබුණා. අද එවන් යුගයක් මේ රට තුළ නැහැ. බොහෝ දෙනාට අද ඒවා සියල්ල අමතක වෙලා තිබෙනවා. සමහර වෙලාවට අපි ඒ එකක් දෙකක් ගැන කථා කරන කොට තමන් කරපු දේවල් පිළිබඳව කථා නොකර අපි කරන දේවල් ගැන කථා කරන, නින්දෙන් අවදි වුණු, හීනෙන් අවදි වුණු දේශපාලන නායකයන් මේ සමාජය තුළ ඉන්නවා. නමුත් අපි අද සැමට හරියාකාරව ඉෂ්ට සිද්ධ වෙන නීති පද්ධතියක් හදන්න කටයුතු කරනවා. ගරු අධිකරණ අමාත්‍යතුමනි, මහජනතාවගේ මුදල්වලින් පෝෂණය වෙමින්, මෙවැනි වැරදි කරලා සැහවී ඉන්න, සියලු දෙනා නීතියේ රැහැනට හසු කර ගන්න ඔබතුමන්ගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් මට මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා.

[අ.භා. 4.42]

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

කාලානුරූපීව වෙනස් විය යුතු ඉතාමත් වැදගත් පනත් කෙටුම්පතක් වන සමථ මණ්ඩල සංශෝධන පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සඳහා අපේ ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා අද මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මම දැක්කා, අද උදැසන ඉඳන් එතුමා ළඟින්ම ඉඳගෙන වඩාත් හරි දේ ඉදිරිපත් කරන්න අපේ අධිකරණ නියෝජ්‍ය ඇමතිතුමා එතුමාට සහයෝගය දුන් ආකාරය. ඒ වාගේම අපිට අහන්නට ලැබුණා, අපි බලාපොරොත්තු වන ඇමතිතුමන්ලාත් මෙයට සම්බන්ධ වෙලා මේ පනත් කෙටුම්පත ශක්තිමත් කරන්න කටයුතු කළා කියලා. මේ අවස්ථාවේදී මේ සම්බන්ධයෙන් මටත් වචන කිහිපයක් එකතු කරන්නට අවස්ථාව ලබාදීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ගමක, ප්‍රදේශයක, පළාතක සුළු අඩ දබර ඇති වෙනවා. ඒ වාගේම ගෙවල්වල පවුල් ආරාවුල් ඇති වෙනවා. ඒ වාගේම විවිධ ගම් මට්ටමින්, ආගමික ස්ථාන මට්ටමින්, විවිධ කුල මට්ටමින්, ගෝත්‍ර මට්ටමින් ප්‍රශ්න ඇති වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලන නායකයන් විධියට ඔබතුමාත් දන්නවා, ගරු ඇමතිතුමාත් දන්නවා, මේ සියල්ල විසඳෙන්න කාලයේ ඇවෑම ඉතාමත්ම වැදගත් වෙන බව.

මම විශ්වාස කරනවා, මේ සමථ මණ්ඩලය තුළ සිදු වෙන්නෙත් මේ කාලයේ ඇවෑම තුළින් ශක්තිමත් විසඳුමක්, කාලෝචිත විසඳුමක්, වැදගත් විසඳුමක් නිර්මාණය වීමයි කියලා. එතැන ඉන්න බුද්ධිමත්, උගත්, ඒ වාගේම සමාජයේ විවිධ අත්දැකීම්වලින් පරිපූර්ණ වෙච්ච, තලත්තැනි වෙච්ච වැදගත් පිරිසකගේ වටිනා උපදේශ සහ අතීතයේ ඔවුන්ට ලැබිලා තිබෙන අත් දැකීම් එක්ක සමාජයේ ප්‍රශ්න විසඳන්න තමයි සමථ මණ්ඩලය ස්ථාපිත වෙලා තිබෙන්නේ. මේ සමථ මණ්ඩලය

[ගරු අශෝක ප්‍රියන්ත මහතා]

ස්ථාපිත කරලා වසර ගණනාවක් ගෙවිලා තිබෙනවා. එදා කාලයේ වාගේ නොවෙයි, අද ප්‍රශ්න ගොඩාක් සංකීර්ණයි. ඒ ප්‍රශ්න විසඳන්න මේවා කාලානුරූපීව වෙනස් විය යුතුයි. ඒ නිසා අපේ ගරු ඇමතිතුමා ඒ පිළිබඳව බුද්ධිමත්ව හිතලා, දුරදක්නා නුවණින් කල්පනා කරලා මේ පනත සංශෝධනය කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා වෙන්න ඇති, මේ උත්තරීතර සභාව ඉතාමත් දීර්ඝ විවාදයකට පෙළඹුණේ නැත්තේ; තර්ක විතර්ක ගොඩනැඟුණු, වැඩි පරස්පර විරෝධී මත නිර්මාණය වුණු කථිකාවක් නිර්මාණය වුණේ නැත්තේ. එම නිසා මම විශ්වාස කරනවා, මේ පනත් කෙටුම්පතට හැමෝම එකඟයි කියලා. මේක විය යුතු කාරණාවක් කියන එක සියලු දෙනාගේම අදහස් දැක්වීම්වලින්, සියලු දෙනාගෙන්ම මේ සඳහා එකතු වුණු මතවාදවලින් අපට පිළිගත හැකි වෙනවා. රට කරවන තැන, එහෙම නැත්නම් රටේ නීති හදන තැන, රටේ උත්තරීතර ආයතනය වන පාර්ලිමේන්තුවේ ඉන්න මහජන නියෝජිතයන් විධියට අපි මේ කරුණ අවබෝධ කරගත යුතුයි. එය අවබෝධ කරගෙන, අද ගරු ඇමතිතුමා ගෙනෙන කාරණාව අත් දෙකම ඔසවලා අනුමත කරමින් මේ පනත සංශෝධනය කළ යුතුයි. ඒ සඳහා මා වඩාත්ම කැමැති බව ප්‍රකාශ කරන අතර, එයට අපගේ සහයෝගය ලබා දෙන බව මේ මොහොතේ ප්‍රකාශ කරන්නට ඕනෑ. ගරු ඇමතිතුමා සහ ගරු නියෝජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. ඔවුන්ට වැඩි කාලයක් ඉතිරි-

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development)
ඡායා ඇමතිතුමාත් ඉන්නවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
සායා ඇමතිතුමා නේද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නැහැ, "ඡායා".

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha
ඡායා. අනේ! මට සමාවෙන්න ඕනෑ. මොකද, නවක, තරුණ මන්ත්‍රීවරයෙක් විධියට මට ඒ පිළිබඳව අත් දැකීමක් නැහැ. කෙසේ වුණත්, ඡායා කැබිනට් ඇමතිතුමාත් ඉන්නවා. මේ තුන්ගොල්ලන්ම එකතුව මෙය පෝෂණය කරලා, රටේ උන්නතිය වෙනුවෙන් මේ වැඩ කටයුත්ත සාර්ථක කිරීම ඉතාමත් වැදගත් කාරණයක් විධියට මම දකිනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට කාලය ඉතිරි කිරීම සඳහා ඉතාමත් කෙටියෙන් කරුණු කියලා මගේ කථාව අවසන් කරනවා. අධිකරණ පද්ධතිය පිළිබඳව අද මේ සභාවේ කථා කළා. පොඩි වැරදිවලට සම්බන්ධ සැකකරුවෙක් රුපියල් දහසක, දෙදහසක ඇපයක් තබා ගන්න බැරිව එළියට ගන්න බැරි වුණු අවස්ථා තිබෙනවා. ඒ වාගේම සමාජයේ සමහර තලයන්හි ජීවත් වන, අඩු පාඩුවලින් පිරුණු මිනිසුන්ගේ වැරදි වහගන්න බැරිව විශාල පිරිසක් බන්ධනාගාර ගත වෙලා ඉන්නවා. දීර්ඝ කාලීනව, එහෙම නැත්නම් ජීවිතාන්තය දක්වා සිරදඬුවම් විඳින පිරිසට යම් සමාවක්, යම් ක්‍රමවේදයක් නිර්මාණය කළ යුතු වෙනවා.

පසු ගිය දවසක මම මීගමුව බන්ධනාගාරයට ගියා. සිටිය යුතු ප්‍රමාණයට වඩා දෙගුණයක් සිරකරුවන් වර්තමානයේ මීගමුව බන්ධනාගාරයේ සිටිනවා.

බන්ධනාගාර නිලධාරීන්ට ඔවුන් පාලනය කර ගැනීම ඉතාම අසීරුයි. ඒ නිසා ඒ බන්ධනාගාර නිලධාරීන් බුද්ධිමත්ව කල්පනා කරලා ඒ රැඳවුම්කරුවන් අතරින්ම නායකයන් නිර්මාණය කරලා තිබෙනවා. ඒ අනුව එක කණ්ඩායමකට එක රැඳවුම්කරුවෙක් නායකත්වය දීලා, එවැනි නායකයන් කිහිප දෙනෙක් තවත් රැඳවුම්කරුවෙකුට භාර දීලා පාලනය කර ගැනීමේ ක්‍රමවේදයක් සාර්ථකව නිර්මාණය කර තිබෙනවා. මම එහි කොමසාරිස්තුමාත් එක්ක කථා කළ වේලාවේ එතුමා කිව්වේ, එක නිලධාරියෙකුට T-56 දෙකක් දුන්නත්, ඒ සිරකරුවන් යම් වේලාවක නැඟී සිටියොත් පාලනය කරන්න බැහැ කියන කාරණයයි. ඒ සිරකරුවෝ දන්නේ නැද්ද දන්නේ නැහැ, ඔවුන් ඉන්නේ මෙවැනි අඩු ආරක්ෂාවක් තිබෙන, තමන්ට පාලනය කර ගත හැකි පිරිසක් එක්ක කියන කාරණය. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

සමථ මණ්ඩලවල තීන්දු, ලඝු තීන්දු විධියට සලකනවාය කියලා ඡායා කැබිනට් ඇමති ධුරයක් දරන අපේ මන්ත්‍රීතුමෙක් කිව්වා. පසු ගිය කාලය තුළ අපට ගැටලුව වුණේ, මේ තීන්දු දෙන ස්ථානය කුමක්ද කියන එක නොවෙයි. මේ තීන්දු දෙන ස්ථානය පන්සලද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයද, පාසලද, එහෙමත් නැත්නම් පොදු ස්ථානයක්ද කියන එක නොවෙයි, ගැටලුව වුණේ. ඒ කවර ස්ථානයකදී දුන්නත් නීතියේ තීන්දුව පිළිගත යුතුයි. නීතියේ තීන්දුවට අවනත විය යුතුයි. ගරු ඇමතිතුමනි අපි කළ යුතු එකම දෙය තමයි, නීතියේ තීන්දුව පිළිගන්නා සමාජයක් නිර්මාණය කිරීම. අපි එය කළ යුතුයි. නීතියේ තීන්දුව පිළිගන්නා සමාජයක් නිර්මාණය කළොත් මේ ගැටලු විසඳෙනවා. සමථ මණ්ඩලයේ තීන්දු පිළිගන්නේ නැති, එහෙම නැත්නම් එම තීන්දු ලඝු තීන්දු විධියට සලකන පිරිසක් නිර්මාණය වුණේ ඇයි? පසු ගිය කාල පරිච්ඡේදය තුළ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන් තීන්දුත් පිළිගත්තේ නැහැ.

ගරු සභානායකතුමනි, ඔබතුමාත් මේ කාරණයට එකඟ වෙයි. මම ඒකට උදාහරණයක් පෙන්වා දෙන්නම්. පෙට්‍රල් මිල අඩු කරන්න කියලා අධිකරණය තීන්දුවක් දුන් අවස්ථාවේ රටේ නායකයෝ ඒක පිළිගත්තේ නැහැ. අධිකරණ තීන්දු පිළිගන්නේ නැතුව ඉන්න රටේ නායකයන්ට පුළුවන් නම්, රටේ මිනිස්සුත් ඒක පූර්වාදර්ශයක් විධියට ගන්නවා. අපි මේ පසු ගිය කාලය ගැන කථා කරනවා හෝ විවේචනය කරනවා නොවෙයි. අපි රටක් හදමු නීතියේ තීන්දුව, නීතියේ ක්‍රමවේදය පිළිගන්නා මිනිසුන් පිරිසක් ඉන්න. ඒක තමයි, අපි එදා ඉල්ලුවේ.

2015 වසරේ ජනවාරි අට වැනි දා මිනිස්සු ඉල්ලුවේ නැහැ, මහ පාරවල් හදන්න කියලා; විශාල කර්මාන්තශාලා නිර්මාණය කරන්න කියලා; අපේ සාක්කු සල්ලිවලින් පුරවන්න කියලා; අපට සුඛෝපභෝගී ජීවිත ගත කරන්න ඕනෑ කියලා. ගරු අධිකරණ ඇමතිතුමනි, රටේ මිනිස්සු ජනවාරි අට වැනි දා ඉල්ලුවේ, සියලු දෙනාටම ජීවත් වෙන්න පුළුවන් නීතිගරුක රටක්. ඒ වාගේම සියලු දෙනාටම ජීවත් වෙන්න පුළුවන් නීතියේ ස්වාධිපත්‍ය තිබෙන රටක්; තමන්ට ගරුත්වය ලැබෙන රටක්. ඒ රට නිර්මාණය කරන්න තමයි, මිනිස්සු ඒ යුගයේ තිබුණු සියලු බැම්ම බිඳ ගෙන, ඒකාධිපති පාලන ව්‍යරුවට එරෙහිව බය නැතුව එළියට

බැහැලා ඒ පාලන ක්‍රමය වෙනස් කළේ. ඒ පාලන ක්‍රමය වෙනස් කරලා අපට රට භාර දීලා අවුරුද්දක් වාගේ ගත වුණු කාලය තුළ මේ යහ පාලන සම්මුතිවාදී ආණ්ඩුවට පුළුවන්කම ලැබී තිබෙනවා, නීතියේ ස්වාධිපත්‍ය මේ පාර්ලිමේන්තුව හරහා ස්ථාපිත කරන්න. අද දවසේත් එය සිදු වෙනවා. ඒ ගරුත්වය ලැබෙන්න ඕනෑ අධිකරණ ඇමතිතුමා ප්‍රමුඛ මේ රජයටයි. ඒ ගරුත්වය ලැබෙන්න ඕනෑ මේ රට අලුතින් නිර්මාණය කරන්න එක්සත් වුණු සියලු ජනතාවටයි. ඒ නිසා අධිකරණ ඇමතිතුමනි, යහ පාලන රජය ඒ මිනිසුන්ගේ බලාපොරොත්තු ඉෂ්ට කරන දවසක් විධියට මම අද දවස දකිනවා. ඒ බලාපොරොත්තු ඉෂ්ට කරන අද දවසේ ගන්නා තීන්දු-තීරණ හා මෙම පනත් කෙටුම්පතට ගෙන එන සංශෝධන, අපේ ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කිව්වා වාගේ එක කොටසකට පමණක් සීමා කරන්න එපා. සියලුදෙනාට සමානව නීතිය ක්‍රියාත්මක වන රටක් හදන්න.

බලය, ධනය එහෙම නැත්නම් තානාන්තර තිබෙන තැනට නීතිය ක්‍රියාත්මක නොවී, සාමාන්‍ය පොඩි මිනිසාට නීතිය ක්‍රියාත්මක වෙනවා නම්, හිතවත්කම, ඥාතිකම, යහළුකම මත හෝ සහෝදරකම මත නීතිය ක්‍රියාත්මක නොවෙනවා නම් අපි මොන පනත් හැදුවත් වැඩක් නැහැ. ඒ නිසා සමථ මණ්ඩල (සංශෝධන) පනත තුළින් සියලු දෙනාටම එක සමාන ලෙස නීතිය ක්‍රියාත්මක කරන රටක් නිර්මාණය කරන්න අපේ අධිකරණයට ශක්තියත්, ධෛර්යයත් ලැබේවා!යි කියා ප්‍රාර්ථනා කරමින්, මේ වටිනා අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 4.52]

ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා (අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා හා බුද්ධ ශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(මාණ්පුමිකු එච්.ආර්. සාරතී දුෂ්මන්ත - නීති පිරති අමෛච්චරුම් පුත්තසාසන පිරති අමෛච්චරුම්)

(The Hon. H.R. Sarathie Dushmantha - Deputy Minister of Justice and Deputy Minister of Buddha Sasana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදෑසන සිට අපි මේ ගරු සභාවේ කළ කථා බහට සවන් දී ගෙන සිටියා. විශේෂයෙන්ම මම මේ වේලාවේ මුලින්ම මතක් කරන්නට ඕනෑ, අධිකරණ අමාත්‍යාංශයේ වගකීම කුමක්ද කියන කාරණාව.

විශේෂයෙන්ම යුක්තිය පසිඳලීමේ කටයුතු කාර්යක්ෂම කිරීමත්,ගෝලීය වෙනස්කම්වලට අනුරූපව නීතිය ප්‍රතිසංස්කරණය කිරීමත් කියන කාරණා තමයි මූලික වශයෙන්ම අධිකරණ අමාත්‍යාංශයෙන් ඉෂ්ට සිද්ධ වෙන්නේ. වසරක් ගත වන්නටත් කලින් අපි අත්කර ගත්තා වූ ප්‍රගතිය සම්බන්ධයෙන් වාගේම, ඉදිරි වැඩ කටයුතු සම්බන්ධයෙන්ද අමාත්‍යාංශයක් හැටියට අධිකරණ අමාත්‍යාංශය ගත්තා වූ තීන්දු තීරණ පිළිබඳව අපි සතුටු වනවා.

අද දිනයේ සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තමයි බොහෝ මන්ත්‍රීවරුන් කථා බහ කළේ. ඒ ගැන අදහස් රාශියක් මතු වුණා. සමථ මණ්ඩල ඇති වෙන්නට බලපෑ මූලික හේතුව පිළිබඳව අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. සුළු ආරාවුලකදී වුණත් උසාවි ගියාම ඒ නඩු තීන්දුව එන්න වසර ගණනාවක් ගත වෙනවා. නමුත් ජනතාව අපේක්ෂා කරන දේ අධිකරණයෙන් ඉෂ්ට සිද්ධ වුණාද කියන කාරණය ගත්තොත්, ජනතාව අධිකරණයෙන් එළියට බහින්නේ තෘප්තිමත්ව නොවෙයි. ඒ නිසා තමයි විශේෂයෙන්ම 1988 වර්ෂයේදී සමථ මණ්ඩල ඇති කරන්නට කටයුතු කළේ. සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ඒ ප්‍රදේශය තුළ පැන නඟින යම් ආරාවුලක් හෝ ප්‍රදේශය තුළ කරන වරදක් හෝ සම්බන්ධයෙන් වන නඩු කටයුත්තක මූල්‍ය වටිනාකම රුපියල් ලක්ෂ දෙක හමාරක් විය යුතු බවට තිබුණු සීමාව මෙම පනත් කෙටුම්පතින් රුපියල් ලක්ෂ පහ දක්වා වැඩි කිරීමේ නව සංශෝධනයත් එක්කම අපි විශ්වාස කරනවා, උසාවියට යෑමට තිබුණු නඩු කටයුතු සමථ මණ්ඩල කරා යොමු වීමට ඇති ඉඩ ප්‍රස්ථාව වැඩි වුණාය කියලා. මේ මුදල් ප්‍රමාණය වැඩි කළාට පස්සේ, නඩු කටයුතු 50,000ක් විතර අධිකරණ දක්වා යෑමේ අවශ්‍යතාව නැතිව යනවා. ඒ තුළින් වැය වන කාලය, ශ්‍රමය, ධනය -මේ සියල්ල - නතර කර ගැනීමේ හැකියාව ලැබෙනවා.

දෙපාර්ශ්වයක් නඩු කටයුත්තකට ගියාට පස්සේ එයින් එක් පාර්ශ්වයක් ජයග්‍රාහකයන් වෙනවා; අනික් පාර්ශ්වය පරාජිතයෝ වෙනවා. හැබැයි, ඒ නඩු තීන්දුව අරගෙන අධිකරණයෙන් එළියට බැස්සාට පස්සේ එක්කෝ නැවත මරා ගැනීමක් වෙනවා; එහෙම නැත්නම් ගහ බැණ ගැනීම් වෙනවා. බොහෝ වෙලාවට ඒ ඒ පාර්ශ්ව අධිකරණය ගැන තෘප්තිමත් වෙන්නේ නැහැ. සමාජය තුළ තෘප්තිමත් පාර්ශ්ව සිටීම සමාජයේ ඉදිරි ප්‍රගමනය සඳහා වැදගත් වෙනවා. ඒ නිසා දෙපාර්ශ්වයම ජයග්‍රාහකයන් කිරීම මූලික කරගෙන තමයි සමථ මණ්ඩලය පිහිටුවන්නට කටයුතු කළේ.

සමථ මණ්ඩලවලට වෙනම ගොඩනැගිලි, නිලධාරීන් ලබා දිය යුතුයි කියලා සමහර මන්ත්‍රීවරුන්ගෙන් අදහස් ප්‍රකාශ වුණා. ඇත්තටම මගේ මතය මේකයි. දැන් බොහෝ වෙලාවට සමථ මණ්ඩල විහාරස්ථානයක්, දේවස්ථානයක් ආශ්‍රිතව තමයි පවත්වන්න කටයුතු කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගමේ පන්සලේ හාමුදුරුවන්ගේ, දේවස්ථානයේ පූජකතුමාගේ බලපෑම ජන සමාජයකට වැඩිපුර තිබෙනවා. මොකද, අපි ඒ සිද්ධස්ථානවලට ගරු කරන ස්වභාවය වැඩි නිසා. ඒ නිසා තවත් අධිකරණමය තත්ත්වයට සමථ මණ්ඩල ගෙනාවොත්, මේ ක්‍රමය විධිමත් ක්‍රමයකට පාලනය කරන්න උත්සාහයක් දැරුවොත්, දැනට සමථ මණ්ඩලවලට යොමු වන සියයට 40ක්, සියයට 50ක් පමණ වූ ආරාවුල් ප්‍රමාණය, ඉදිරි කාලය තුළදී මීට වඩා අඩු වීමේ ප්‍රවණතාවක් තිබෙනවා. අපේ සංස්කෘතිය, සමාජ මට්ටම් ඒක රාශී කරගෙන, භෞතිකමය වශයෙන් ලබා ගන්න බැරි දෙයක් ඒ ඒ පාර්ශ්වයන්ට ලබා දීමේ අරමුණින් තමයි, අපි මූලිකවම 1988දී සමථ මණ්ඩල නිර්මාණය කරන්නට අදාළ පනත ගෙනාවේ.

සමථ මණ්ඩලවලට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය, ඩෙස්, පුටු සම්බන්ධයෙන් ගැටලුවක් නැහැයි කියලා අපි විශ්වාස කරනවා. අපි දැනටමත් අමාත්‍යාංශය මඟින් ඒ අවශ්‍ය දේ සැපයීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ වාගේම දැනටමත් සමථකරණය සඳහා පුහුණු නිලධාරීන් ඉන්නවා. පුහුණු නිලධාරීන් වශයෙන් අලුතින් 17 දෙනෙකු බඳවා ගන්නත් කටයුතු කළා. ඒ වාගේම උතුරු පළාතේ විශේෂ සමථ මණ්ඩලයක් අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ පත් කරන්නටත් කටයුතු කළා.

ඒ තුළින් අධිකරණයට යන්නේ නැතිව විසඳා ගන්න පුළුවන් ගැටලු ප්‍රමාණය අති මහත්. ද්‍රවිඩ භාෂාවෙනුත් මේ කටයුතු කරන්න පුළුවන් පිරිසක් බඳවා ගැනීමට අපි දැන් කටයුතු කර ගෙන යනවා. විදේශ පුහුණුව සඳහා අවස්ථාව දීලා තිබෙනවා. ඒ නිසා අමාත්‍යාංශය පැත්තෙන් කෙරෙන්නට ඕනෑ වැඩ කටයුතු සියල්ල මේ වන විට අපි කර ගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගය දැක්වීමේ පනත" යටතේ අද ඉදිරිපත් කර තිබෙන ඒ නියමයන්ටත් අපි අනුමැතිය ලබා ගත යුතුයි. මීට පෙර අපි චීනය සමඟත් මෙවැනිම ගිවිසුමකට එළඹුණා. අද රුසියානු රජය සමඟ ඇති කර ගන්නා වූ මේ ගිවිසුම්වල ප්‍රතිඵලය මේකයි. විශේෂයෙන්ම නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත වූ රටක් අපේක්ෂා කරන අප සියලු දෙනාටම වර්තමාන සමාජය තුළ ප්‍රවාහන

[ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා]

කටයුතුවලදී වේවා, අන්තර් ජාලයෙන් වේවා රට රටවල් අතර ඇති වන බැඳීම් වෙනදාට වඩා ප්‍රබල ලෙස තිබෙනවා. ඒ තුළ විවිධාකාර වූ අපරාධ හෝ ඒ සම්බන්ධ කටයුතු කාරණාවලදී ඊට වඩා වැඩි ප්‍රවණතාවක් ඉෂ්ට සිද්ධ කරන්නට තිබෙනවා. ඒ ඒ රටවල් එක්ක සහසම්බන්ධවෙලා, අපේ රටේ නීතියේ ආධිපත්‍යයට තර්ජනයක් වන යම් කිසි කටයුත්තක් සිදු වෙනවා නම් ඒ පිළිබඳව තොරතුරු ලබා ගැනීමේ හැකියාව මේ තුළින් ලැබෙනවා. මම සවිස්තරාත්මකව ඒ සම්බන්ධයෙන් කථා කරන්නේ නැහැ. ගරු අමාත්‍යතුමාත් ඒ පනතේ තිබෙන සියලු දේවල් පිළිබඳව සභාව දැනුවත් කළා. ඒ නිසා අපේ නීතියේ ආධිපත්‍යය රට තුළ සුරක්ෂිත කිරීමේ වැඩ කටයුත්ත තවත් පුළුල් කිරීම තමයි අපි මේ නියෝග අනුමත කිරීම තුළින් බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සෑම ග්‍රාම නිලධාරි මහත්මයෙකුටම තමන්ගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට බල පැවැත්වෙන පරිදි සාමදාන විනිශ්චයකාර පත්වීම් ලබා දෙන්න කටයුතු කරනවා. මම හිතන විධියට ඒක ඒ අයට යම් වැදගත්කමක් ලබා දෙන තනතුරක්. නිරන්තරයෙන්ම ජනතාව එක්ක ගැටෙන නිලධාරියා තමයි ග්‍රාම නිලධාරිවරයා. ඒ නිසා නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දීමේදී ග්‍රාම නිලධාරින්ට වෙනදා ඇති වුණු අපහසුතාවන් නැති වුණාය කියන හැඟීම මේ සාමදාන විනිශ්චයකාර තනතුර ලැබීමත් සමඟම අංග සම්පූර්ණ වෙනවාය කියලා මම හිතනවා. තවත් යෝජනා රාශියක් ඉදිරිපත් වුණා. ඉදිරි කාලය තුළ අමාත්‍යාංශය පැත්තෙන් තවත් සාධනීය තීන්දු තීරණ රැගෙන එන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නඩු හබවල ප්‍රමාදය ගැන තමයි අද බොහෝ දෙනෙක් කථා කළේ. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සෑදීමේ කටයුතු දැන් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ගරු රවුල් හකීම් ඇමතිතුමාගේ සභාපතිත්වයෙන් යුතුව පාර්ලිමේන්තුවේ subcommittee එකක් තිබෙනවා, court structure එක වෙනස් කිරීම සඳහා. ප්‍රශ්නය තිබෙන්නේ කොතැනද, වැඩිපුර නඩු හිර වෙලා තිබෙන්නේ කොතැනද, ඒවාට ගත යුතු විසඳුම් මොනවාද කියන කාරණා පිළිබඳව සියලු පක්ෂ නායකයන්ට, ඒ ඒ පක්ෂවල නියෝජිතයන්ට ඒ කමිටුවට ගිහිල්ලා අදහස් දක්වලා, ඒ සඳහා යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්. ඒක තමයි හොඳම ක්‍රියා දාමය. එහෙම නැතිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පරිබාහිරව අලුතින් අධිකරණ පිහිටුවන්නට අපට හැකියාවක් නැහැ. ඒ නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව; පවතින නීතිය අනුව අපි ඒ කටයුතු ඉෂ්ට සිද්ධ කර ගත යුතුයි. ඉදිරියේදී මෝටර් රථ ප්‍රවාහන පනතට ගෙන එන සංශෝධන, වෙනස්කම් තුළින් වසරකට නඩු ලක්ෂයක් විතර ප්‍රමාණයක් අධිකරණවලට යන්නේ නැතිව බේරා ගන්න පුළුවන්කම ලැබේවි කියා අපි විශ්වාස කරනවා. එවැනි සමාජ තත්ත්වයන්ට ගැළපෙන අන්දමට; උචිත අන්දමට අපේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු මෙහෙයවා ගෙන යනවා.

මේ වන විට අපරාධ නඩු විධාන සංග්‍රහයට සංශෝධන ඉදිරිපත් කරන්න අවශ්‍ය කමිටුවක් අපි පත් කර තිබෙන බවත් අපි මතක් කරන්නට ඕනෑ. සිවිල් නඩු විධාන සංග්‍රහයට අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරන්නත් කමිටුවක් මේ වන විට හදලා තිබෙනවා. මේ සියල්ලම ඉදිරි කාලය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය ශක්තිමත් කරන කරුණු කාරණා. මේ සියල්ල ශක්තිමත් කිරීම තුළ පමණයි අපි අපේක්ෂා කරන රටක් අපට නිර්මාණය වන්නේ. ඒ නිසා අධිකරණයේ ස්වාධීනත්වය වැදගත් වාගේම, නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කිරීමත් වැදගත්. අන් කවරදාකටවත් වඩා මේ ආණ්ඩුවෙන් අපි ඒ කටයුතුවලට ප්‍රමුඛත්වය ලබා දීලා කටයුතු කරනවාය කියන එකත් මේ අවස්ථාවේ දී මතක් කරන්නට ඕනෑ.

මම දීර්ඝ වශයෙන් අදහස් දක්වන්නේ නැහැ. මම හිතන විධියට හොඳ අදහස් රාශියක් ඉදිරිපත් වුණා. අපි ඒවාට සවන් දීලා ඉදිරි කාලය තුළ මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු බෙහොම සාර්ථකව කර ගෙන යන්නට තමුන්නාන්සේලා සියලු දෙනාගේම සහයෝගය අපේක්ෂා කරනවාය කියන කාරණාවත් මතක් කරමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා.

[අ.භා. 5.02]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ හා බුද්ධශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Buddhasasana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ කාරණා තුනක් පිළිබඳව පැවැති දීර්ඝ විවාදය දැන් අවසන් වෙමින් පවතිනවා.

පළමුවන කාරණය, සාපරාධී කරුණුවලදී අන්‍යෝන්‍ය සහයෝගය ලබා දීම සම්බන්ධව අපේ ආණ්ඩුව රුසියානු සමූහාණ්ඩුවත් එක්ක අත්සන් කරන ලද ගිවිසුමට අනුකූලව නිකුත් කරන ලද නියමයයි. සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ මේ වන විට අපි රාජ්‍යයන් 7ක් සමඟ ගිවිසුම්වලට එළඹිලා තිබෙනවා. රුසියානු සමූහාණ්ඩුව, චීන හොංකොං රාජ්‍යය, එක්සත් අරාබි එමිරේට්ස් රාජ්‍යය, ඉන්දියාව, තායිලන්තය, බෙලාරස් සහ යුක්රේන් රාජ්‍යය සමඟ මෙවැනි ගිවිසුමකට ඇතුළත් වන්න අපි පසු ගිය දිනයේදී කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගත්තා.

විශේෂයෙන්ම රුසියානු සමූහාණ්ඩුව කියන්නේ, අද ඊයේ නොවෙයි, අපිත් සමඟ දිගින් දිගටම හැම දාම හිටපු ඉතාම මිත්‍ර රාජ්‍යයක්; ජාත්‍යන්තර වශයෙන් සෑම අවස්ථාවකදීම ශ්‍රී ලංකාවට සහයෝගය ලබා දීපු මිතුරු රාජ්‍යයක් බව සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා රුසියාව වැනි රාජ්‍යයක් එක්ක මෙවැනි ගිවිසුමකට ඇතුළත් වීම රටක් විධියට ශ්‍රී ලංකාවට ඉතාමත් වැදගත් වනවා.

දෙවන කාරණය, අධිකරණ සංවිධාන පනත යටතේ නිකුත් කරන ලද නියෝගයයි. ඒ නියෝගය අනුව ග්‍රාම නිලධාරින්, තමන් රාජකාරි කරන බල ප්‍රදේශය පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා නිල බලයෙන් සාමදාන විනිශ්චයකාරවරුන් බවට පත්කිරීම විශේෂයෙන්ම ඔවුන්ගේ රාජකාරියට දෙන ගෞරවනීය තත්ත්වයක් විධියටත් සලකනවා. ඒ වාගේම ඔවුන්ට යම්කිසි වග කීමකුත් ඒ තුළින් පැවරෙනවා. ඊටත් වඩා එහි ගුණාත්මකභාවය අපි අගය කරන්නේ, ග්‍රාම නිලධාරිවරයා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් කටයුතු කිරීම නිසා ඒ ප්‍රදේශවාසි ජනතාවට තම තමන්ගේ කටයුතු කර ගැනීමේදී දැඩි පහසුවක් ඇතිවීම නිසායි. ඒ සම්බන්ධව විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාට අපේ කෘතඥතාව පළ කරනවා. ග්‍රාම නිලධාරින්ට මෙවැනි පිළිගැනීමක් ලබා දිය යුතුයි කියලා එතුමා ඉදිරිපත් කළ මතය අනුව අපි ඒ අදාළ නියෝගය ඉදිරිපත් කරමින් මෙම තත්ත්වය ඇති කරලා තිබෙනවා.

තුන්වන කාරණය වුණේ, සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීමයි. ඒ පිළිබඳව මේ ගරු සභාවේ පක්ෂ, විපක්ෂ ගරු

අමාත්‍යවරු මෙන්ම ගරු මන්ත්‍රීවරු දීර්ඝ වශයෙන් අදහස් දක්වන්නට යෙදුණා. සමහර ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහසක් වුණා, සමථ මණ්ඩලයත් නිශ්චිත පහසුකම් සහිත කාර්යාල ගොඩනැඟිලි පහසුකම් ඇතිව, අධිකරණ පවත්වාගෙන යන ආකාරයටම පවත්වාගෙන යන්නට ඕනෑය කියලා. එය මේ පනතේ අරමුණක් විධියට මා විශ්වාස කරන්නේ නැහැ. මේ පනතේ අරමුණ වුණේ අධිකරණ ක්‍රමයෙන් බැහැරව මිත්‍රශීලිව ප්‍රශ්න විසඳන ක්‍රමයක් සොයා ගැනීමයි.

අධිකරණය තුළ ක්‍රියාත්මක වන්නේ නීතියේ ආධිපත්‍යය කියලා අපි දකිනවා, අපි පිළිගන්නවා. සමථ මණ්ඩල තුළින් නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කිරීමක් නොවෙයි, අපි බලාපොරොත්තු වන්නේ. සමථ මණ්ඩලය තුළ තිබෙන්න ඕනෑ, මනුෂ්‍යත්වයේ ආධිපත්‍යයයි. එතැනදී ප්‍රශ්න විසඳන්නට ඕනෑ නීතිය ගැන තර්ක කරලා නොවෙයි, මනුස්සකම ගැන කල්පනා කරලායි. ඒ ගැටුම්වලට භාජන වුණු, එහෙම නැත්නම් සම්බන්ධ වුණු පාර්ශ්වයන්, ඒ ගැටුම්වලට සම්බන්ධ වීම නිසාම වෛරක්කාරයන් විධියට, විරුද්ධකාරයන් විධියට සමථ මණ්ඩලයට එන පාර්ශ්වයන්, ඥාතීන් විධියට, මිත්‍රයන් විධියට ආපසු ගෙදර යැවීම තමයි මේ තුළින් බලාපොරොත්තු වන්නේ. අධිකරණය තුළ ඒක කරන්න අපහසුයි. අධිකරණය තුළ තිබෙන adversarial system එක යටතේ ප්‍රතිවිරුද්ධ ආකල්ප තුළමයි අධිකරණය ක්‍රියාත්මක වන්නේ. අපට කරන්න දෙයක් නැහැ. වෙනත් විකල්පයක් නැති නිසා ඒක ක්‍රියාත්මක වනවා. නමුත් බොහෝ කටයුතු සම්බන්ධව අපි දීර්ඝ කාලයක් තිස්සේ අධ්‍යයනය කරලා තිබෙනවා. විශේෂයෙන්ම මේ පනත 1988 ඉඳලා ක්‍රියාත්මක වනවා. ඊට පෙර, එක්දහස් නවසිය පනස් ගණන්වලත් මෙවැනි පනතක් ක්‍රියාත්මක වුණා.

මේ තුළ සාර්ථකත්වය අපට මනින්න තිබෙන හොඳම මිම්ම තමයි , සමථ මණ්ඩලවලට ඉදිරිපත් වන ගැටුම්වලින් කොපමණ ප්‍රමාණයක් සමථය වෙනවාද කියා සලකා බැලීම. 2015 අවුරුද්දේ සියයට 47.7ක් සමථයකට පත් වෙලා තිබෙන බව අපි පෙන්නුවා. ඒ කියන්නේ, විශාල ප්‍රතිශතයක්. නඩු පණස්දාහකට වැඩි ප්‍රමාණයක සංඛ්‍යාලේඛන අපි ඉදිරිපත් කළා. පසු ගිය අවුරුදු පහේ සමස්තය විධියට අරගෙන බැලුවාම සියයට පණහකට වැඩි ආරවුල් ප්‍රමාණයක් සමථ මණ්ඩලවලින් විසඳා තිබෙනවා. ඒක ඉතාමත්ම ඉහළ ප්‍රතිශතයක්. ගුණාත්මකභාවය ඒ තුළ තිබෙනවා. මේ සමථවලට එළඹෙන පාර්ශ්වකරුවන්ට වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව වාගේ දේවල් වර්ධනය කර ගන්නේ නැතිව, නැවතත් තමන්ගේකම, ගමේකම රැක ගනිමින් බිම් අහලකට මිනී මරාගන්නේ නැතිව, සුහදශීලිව ඒ ගොල්ලන්ට ප්‍රශ්න විසඳාගෙන ජීවත්වීමේ පරිසරයක් හදන එක අපට හුහක් වැදගත් වෙනවා. අධිකරණයක් තුළින් ලබන විසඳුමකට වඩා මේ සමථ මණ්ඩලය තුළින් ලබන විසඳුමක සිය දහස් ගුණයක වටිනාකමක් තිබෙනවා. ඒ සඳහා නීතිමය බලයක් දීම තමයි මෙමගින් සිද්ධ කරන්නේ. මීට සහස්‍ර දෙකකට කලින් ජීවත්වෙච්ච ඇරිස්ටෝටල් කියන දාර්ශනිකයා කියා තිබෙන්නේ, "At his best, man is the noblest of all animals; separated from law and justice he is the worst" කියලා. "ලෝකයේ ඉන්න සත්වයන්ගෙන් උත්තරීතරම, උතුම්ම සත්වයා තමයි මනුෂ්‍යයා. හැබැයි ඔහු නීතියෙන් ඉවත් වුණොත් ලෝකයේ ඉන්න නරකම සතා "කියන එකයි. එම නිසා තමයි අද ප්‍රජාතන්ත්‍රවාදී ලෝකයේ හැම රටක්ම හඬගා ඉල්ලන්නේ, "අපට ඕනෑ වෙන මොකුත් නොවෙයි, අපට ඕනෑ, නීතියේ ආධිපත්‍යයයි" කියා.

මීට කලින් ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ 2015 ජනවාරි 8 වනදා අපි ජනාධිපතිවරණයට යනකොට අපෙන් කවුරුවත් ඔය කියන එකක්වත් ඉල්ලුවේ නැහැ. බඩු මිල අඩු කරන්න ඉල්ලුවේත් නැහැ. කන්න ඉල්ලුවේත් නැහැ. ගෙවල් දොරවල් ඉල්ලුවේත් නැහැ. "අපට නීතියේ ආධිපත්‍යය තිබෙන රටක් දෙන්න" කියා විතරයි ඉල්ලුවේ. සමානාත්මතාවය තිබෙන රටක් දෙන්න " කියා විතරයි ඉල්ලුවේ. සෑම ජාතිකයෙකුටම, සෑම ආගමිකයෙකුටම, සෑම භාෂාවක් කථා කරන කෙනෙකුටම සමානව අයිතියක් ඇති බව පිළිගන්න, නීතියේ ආධිපත්‍යය තිබෙන රටක් දෙන්නය කියා තමයි ඉල්ලුවේ. ඒ ඓතිහාසික වෙනස ගැන මම නිරන්තරයෙන් කියනවා, ප්‍රජාතන්ත්‍රවාදයේ සංවර්ධන ඉතිහාසය ලියන දවසක එය ලියැවේවි.

1215 පෙබරවාරි මාසයේ අත්සන් කළ Magna Carta Agreement එකෙන් පස්සේ ප්‍රජාතන්ත්‍රවාදී ඉතිහාසයේ වැදගත්ම සන්ධි ස්ථානය සනිටුහන් වෙන්නේ ශ්‍රී ලංකාව කියන පුංචි දූපතේ ජනවාරි 8 වනදා විප්ලවයයි. ඒ තමයි 2015 ජනවාරි මාසයේ 8 වනදා පැවැත්වූ මැතිවරණය. ඒක දැනටම ඉතිහාස පොතට එකතු වෙලා තිබෙනවා. ඒ තුළ ආණ්ඩුවක් විධියට අප තුළ තිබෙන යුතුකම හා වග කීම තමයි නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කර ගන්න එක. නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම තුළ අප මනුස්සකම කියන එක අමතක කර මේ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කළොත් ඇති වැඩක් නැහැ. මානුෂිකත්වය, දයාව, අනුකම්පාව, කරුණාව හදවත්වල පිරිච්ච මිනිස්සු ජීවත්වෙන සමාජයක් අපිට ඕනෑ. නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරන ගමන්ම ආගම දහමින්, වර්යා ධර්මයෙන් සපිරුණු මිනිස්සු කෝට්ඨාසයක් - සහෝදරත්වයෙන් එකට ජීවත් වෙන්න පුළුවන් මිනිස්සු කොට්ඨාසයක් නිර්මාණය කිරීම සඳහා මූලික පියවර ගැනීම ආණ්ඩුවේ යුතුකමක්, වග කීමක්. ඒ වාගේම ඊට සහයෝගය දැක්වීම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ඕනෑම මහජන නියෝජිතයෙකුගේ යුතුකමක් ද, වග කීමක් ද වී තිබෙනවා.

එවැනි උත්තරීතර ඉලක්කයක් කරා අප මේ යන ගමනේදී පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අද අදහස් ප්‍රකාශ කළ සියලුම මැති ඇමතිවරු මෙය අගය කර, වටිනාකම පිළි අරගෙන අද අදහස් ප්‍රකාශ කිරීම මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායට එකතු කළ ඉතාමත්ම වටිනා ගුණාංගයක් විධියට අපි සලකන්නට ඕනෑ. මේ පාර්ලිමේන්තු ගර්භයේ තිබෙන ගෞරවය ආරක්ෂා කළ, පාලනයක් විධියට පාර්ලිමේන්තුවේ තිබෙන ප්‍රතිතිය ආරක්ෂා කළ අවස්ථාවක් විධියට මෙය සනිටුහන් කරන්නට ඕනෑ. ඒ එක්කම අද දිනයේ දිගින් දිගටම කථා කරන අතරතුරේ බන්ධනාගාර පිළිබඳව, බන්ධනාගාර රැදවියන් පිළිබඳව තිබෙන ප්‍රශ්න රාශියක් කථා කළා.

ඒ අදහසුත් ඉතාම වටිනවා. අපත් දන්නවා, මේ බන්ධනාගාර ඉදි කර තිබෙන්නේ රටේ විශාල ජන කොටසක් මේවා ඇතුළේ ගාල්කර නියන්න නොවන බව. නමුත්, අවාසනාවකට මේ රටේ බන්ධනාගාර ඉදි කළ උදවියගේ ඒ ඉලක්ක ඉක්මවා ගිහින්, කුමන හේතුවක් නිසා හෝ වැරැදිවලට පැටලිලා, අපරාධවලට සැකකරුවන් බවට පත් වෙලා, සමහරු වරදකරුවන් බවට පත් වෙලා අද බන්ධනාගාර පිරිලා තිබෙනවා. 17,000කට වැඩි ප්‍රමාණයකින් අද බන්ධනාගාර පිරී ගිහින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි අවාසනාවන්ත කාරණය, මේ සභාවේත්, මුළුමහත් රටේම ජනතාවගේත් අවධානය යොමු වන්න ඕනෑ කාරණය මේකයි. අද බන්ධනාගාරගත වෙලා ඉන්න පිරිසගෙන් සියයට 45කට වැඩි ප්‍රමාණයක් බන්ධනාගාරගත වෙලා තිබෙන්නේ මත් ද්‍රව්‍ය වැරැදි සම්බන්ධයි. සමහර උදවිය මත් ද්‍රව්‍ය වැරැදි සම්බන්ධව නොවුණත්, ඒ බන්ධනාගාරගත වෙලා තිබෙන වැරැදි දිහා බැලුවාම, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබීමේ හේතුව මත සොරකම් කිරීම යනාදී වෙනත් අපරාධ සිදු කරන්න ගිහින් තමයි එහෙම බන්ධනාගාරගත වෙලා තිබෙන්නේ කියා බොහොම පැහැදිලියි. ඒ අනුව නිශ්චිතවම කිව නොහැකි වුණත්, දළ

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

වශයෙන් ගත්තොත් අද බන්ධනාගාරවල සිටින රැඳවියන්ගෙන් සියයට 55 සිට සියයට 60 දක්වා ප්‍රමාණයක්වත් මේ මත් කුඩු සහ මත් ද්‍රව්‍ය භාවිතය සහ ඒවාට ඇබ්බැහිවීම හේතුවෙන් තමයි බන්ධනාගාරගත වෙලා තිබෙන්නේ. මේක ඩෙංගු ව්‍යසනයට වඩා ඉතාම බරපතළ ව්‍යසනයක්. මුළුමහත් ජාතියක් විනාශ වීමේ තර්ජනයක්, අවදානමක් තිබෙන කාරණයක් විධියට මේ පිළිබඳවත් අපි අලුතින් යමක් හිතලා යම් යම් පියවර ගත යුතු කාලය එළඹිලා තිබෙනවාය කියන කාරණය මා මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට එල්ලුම් ගහට නියම වුණු සිරකරුවෝ දළ වශයෙන් ගත්තොත් 1,100ක් පමණ ඉන්නවා. මෙයින් භාගයක් පමණ උදව්ය වැරදිකාරයෝ වුණාට ඒ තීන්දු, තීරණ අවසානාත්මක නැහැ. හේතුව, ඒ තීන්දුවලට එරෙහිව ඔවුන් අභියාචනා ඉදිරිපත් කර තිබීමයි. අභියාචනා යනාදිය සියල්ල අවසන් වුණු, නඩු කටයුතු නොමැති, එහෙත් එල්ලුම් ගහට නියම වුණු ඒ රැඳවියන් සම්බන්ධව සොයා බලන්න මම මෙම අමාත්‍යාංශය භාර ගැනීමට පෙර පටන්ම විශ්‍රාම ලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමන්ලාගෙන් සමන්විත කමිටුවක් පත් කර තිබුණා. ඒ මඟින් අප ඒ පිළිබඳව සියලු කරුණු අධ්‍යයනය කරලා, පුද්ගලයන් එක එක්කෙනා පිළිබඳව වෙන වෙනම තොරතුරු අරගෙන, මේ වෙන කොට 182කගේ එල්ලුම් ගහේ දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවම වශයෙන් පරිවර්තනය කර තිබෙනවා. ඒ අතිගරු ජනාධිපතිතුමා යටතේ තිබෙන බලය යටතේයි. අපේ නිර්දේශයට එතුමා එකඟතාව පළ කිරීම තුළ ඒ දේ සිද්ධ කළා. තවත් හැටදෙදෙනෙක් පිළිබඳව අප අතිගරු ජනාධිපතිතුමාට නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවා. ඒ එක්කම එල්ලුම් ගහට නියම වුණු ඉතිරි රැඳවියන් සම්බන්ධවත් මේ ක්‍රමය එකින් එක අනුගමනය කරමින්, අප ඔවුන්ටත් දෙන්න පුළුවන් සහනය ලබා දෙනවා.

මෙම කාලය මේ එල්ලා මැරීම කියන දඬුවම දැඩි විවාදයට ලක් කර ගත්ත කාල සීමාවක් බවට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අද මරණ දඬුවම නීති පොතේ තිබෙන රටවල් හරි අඩුයි. රටවල් 40ක් වාගේ අඩු ප්‍රමාණයක තමයි මේ දඬුවම දෙන්නේ. විශේෂයෙන්ම මේ අතර බහුතර රටවල් ප්‍රමාණය තිබෙන්නේ ආසියාවේයි. European Union එකේ රටවල මෙම දඬුවම සම්පූර්ණයෙන් ඉවත් කර තිබෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත කීපයක විතරක් මරණ දඬුවම ක්‍රියාත්මක වෙනවා. අපේ රටේ 1976දී ප්‍රායෝගික අත්හිටුවීමක් -practical moratorium එකක්- යටතේ මරණීය දණ්ඩනය සිද්ධ කර තිබෙනවා. එය කරලා දැනට අවුරුදු 40ක් ගත වෙලා තිබෙනවා. 1976දී අවසාන වශයෙන් එල්ලා මරා තිබෙන්නේ "හොඳ පපුවා" - "the good heart" - නමැති හිරකරුවායි. ඒ නිසාදෝ -මා දන්නේ නැහැ.- එවක් පටන් මරණීය දණ්ඩනය සඳහා ජනාධිපතිවරුන් අත්සන් නොකිරීමේ හේතුව මත එම දණ්ඩනය ක්‍රියාත්මක වුණේ නැහැ. මේ වන විට අප ඉන් ඔබ්බට ගිහින් තිබෙනවා.

2008දී පමණ එක්සත් ජාතීන්ගේ සංවිධානය ද්විවාර්ෂිකව යෝජනාවක් ඉදිරිපත් කළා. මරණ දඬුවම නීති පොතේ තිබෙන රටක වුණත් ප්‍රායෝගිකව එය ක්‍රියාත්මක නොකර තබාගැනීමේ එකඟතාවක්, moratorium එකක් ඉදිරිපත් කළා. අප වසර ගණනාවක් එයට පක්ෂව ඡන්දය දීලා තිබෙනවා. නමුත් පසු ගිය අවුරුදු දෙකතුනක කාලය තුළ යම්කිසි හේතුවක් නිසා අපි එයට පක්ෂව ඡන්දය පාවිච්චි කරලා නැහැ. එහෙත් මේ වසරේ නැවත එම යෝජනාව ඉදිරිපත් කරනකොට ශ්‍රී ලංකාව රාජ්‍යයක් විධියට එයට පක්ෂව ඡන්දය දෙන්න කටයුතු කර තිබෙනවා. අද ශ්‍රී ලංකාවේ මරණීය දණ්ඩනය ක්‍රියාත්මක නොවුණත් එය යම්කිසි මට්ටමකට ප්‍රශ්නසහගත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන් GSP සහන අපට ලබා ගැනීමේදී, යුරෝපාකරයට අපේ මත්ස්‍ය වෙළඳාම සම්බන්ධයෙන් කළ තහනම ඉවත් කරගැනීමේ කටයුතුවලදී අපේ රටේ තිබෙන සමහර නීති පිළිබඳව, ජාත්‍යන්තර ප්‍රමිතියට වඩා පහළින් තිබෙන නීති ක්‍රමවේද පිළිබඳව දිගින් දිගට සාකච්ඡා වෙලා තිබෙනවා. මරණීය දණ්ඩනයත් එක කාරණයක්. එය සම්බන්ධයෙන් ඉදිරියේදී කුමක් කළ යුතුද කියන කාරණය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීතුමන්ලා තීරණයක් ගත යුතුව තිබෙනවා. මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීතුමන්ලා විසින් නිශ්චිත වශයෙන්ම ගනු ලබන තීන්දුව කුමක්ද කියා දැන ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ ඉදිරිපත් වූ අදහස් - ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය නියෝජනය කරමින් කථා කළ සෑමදෙනාගේ අදහස්- බොහොම වැදගත්. විශේෂයෙන්ම අද දින සම්මත කරන පනත් කෙටුම්පත, නියමය සහ නියෝග ගැන පමණක් නොව, අනාගතයේ අපේ රට නීති ක්ෂේත්‍රය කුමන දිශාවකට ගමන් කළ යුතුද, අනාගතයේ අපේ නීති ප්‍රතිපත්ති කෙසේ සකස් විය යුතුද කියන කාරණා සම්බන්ධවත් ඉතාම වැදගත් අදහස් අද ප්‍රකාශ කෙරුණා. ඒ නිසා ඒ අදහස් ප්‍රකාශ කරපු සියලු මැති ඇමතිවරුන්ට ආණ්ඩුව විධියටත්, අධිකරණ අමාත්‍යාවරයා විධියටත් මගේ ගෞරවය, ප්‍රශංසාව මේ අවස්ථාවේදී පළ කර සිටිනවා. අද මේ විවාදයට සවන් දෙමින්, මෙම පාර්ලිමේන්තුවේ රැඳී සිටිමින් මීට සහය දැක්වූ සියලු මැති ඇමතිවරුන්ටත්, මගේ ගෞරවනීය ස්තුතිය පළ කරනවා. මෙම කටයුතු සාර්ථක කරගැනීම සඳහා මගේ නියෝජ්‍ය ඇමතිතුමා, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරිනුත් මට ලබා දුන් සහයෝගය වෙනුවෙන් එතුමන්ලාට මගේ ස්තුතිය පළ කරමින් මගේ අදහස් දැක්වීම මින් අවසාන කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අධිකරණ සංවිධාන පනත: නියෝග
நீதித்துறைச் சட்டம்: ஒழுங்குவிதிகள்
JUDICATURE ACT: REGULATIONS

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වැනි වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යාවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 18 දිනැති අංක 1954/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත
மத்தியஸ்த சபை (திருத்தம்) சட்டமூலம்
MEDIATION BOARD (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය."- [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]
தீர்மானிக்கப்பட்டது.

"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" – [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. PRESIDING MEMBER in the Chair.]

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 to 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendments.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I move,

"That Parliament do now adjourn".

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා.5.25ට, අද දින සභා සම්මතිය අනුව, 2016 ජූලි මස 20 වන බදාදා අ.භා. 1.00 වන තෙක් කල් තියේය.
அதன்படி பி.ப. 5.25 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2016 யூலை 20, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.
Adjourned accordingly at 5.25 p.m. until 1.00 p.m. on Wednesday, 20th, July, 2016, pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

245 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 245 - இல. 4
Volume 245 - No. 4

2016 ජූලි 20 වන බදාදා
2016 யூலை 20, புதன்கிழமை
Wednesday, 20th July, 2016

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
පුනරින් ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය

නොරොච්චෝලේ බලාගාරය සඳහා ගල් අඟුරු මිලදී ගැනීම:
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ක්‍රීඩා පනත:
නියෝග

කල් තැබීමේ යෝජනාව:
බස්නාහිර පළාතේ උපාධිධාරී ගුරු පත්වීම්

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
பூநகரி மக்களின் குடிநீர்ப் பிரச்சினை

நுரைச்சோலை அனல் மின் நிலையத்துக்கான நிலக்கரி கொள்வனவு:
மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரினது கூற்று

விளையாட்டுச் சட்டம் :
ஒழுங்குவிதிகள்

ஒத்திவைப்புப் பிரேரணை:
மேல் மாகாணத்தில் பட்டதாரி ஆசிரியர்கள் நியமனம்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS :
Value Added Tax (Amendment) Bill: Petitions to the Supreme Court

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Drinking Water Problem of Pooneryn Residents

PURCHASE OF COAL FOR NORACHCHOLAI POWER PLANT:
Statement by Minister of Power and Renewable Energy

SPORTS LAW:
Regulations

ADJOURNMENT MOTION:
Graduate Teacher Appointments in Western Province

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 ජූලි 20 වන බදාදා
2016 யூலை 20, புதன்கிழமை
Wednesday, 20th July, 2016

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,
MR. DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් සේර්පෙරුමතී වරි (திருத்தம்) சட்டமூலம் : உயர்நீதிமன்றுக்கு மனுக்கள்
VALUE ADDED TAX (AMENDMENT) BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව "එකතු කළ අගය මත බදු (සංශෝධන)" පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් තුනක පිටපත් ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්;

(ii) 2013 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(iii) 2013 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් වාර්තාව;

(iv) 2013 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(v) 2013 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2012 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 10වැනි වගන්තිය යටතේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2016 ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමේ දී ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ විපක්ෂයට විවාදයක් ලබා දීම මීට පෙර මුදල් අමාත්‍යාංශයෙන් දිගටම කර ගෙන ගියා. අපේ රජය කාලයේ අපි තමුන්නාන්සේලාට එහෙම විවාදයක් ලබා දුන්නා. ඒ නිසා රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව සම්බන්ධයෙන් විවාදයක් ලබා දීමට කාරුණික වන ලෙස මම ගරු සභානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී කරන්නේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට එය යොමු කිරීමයි. ඊට පසුව අපි විවාදයක් ලබා දෙන්නම්. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් නොකර විවාදයක් දුන්නොත් ඔබතුමන්ලා කියයි, "මේක රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කර නැහැ"යි කියලා. [බාධා කිරීමක්] ඔබතුමන්ලා එහෙම කියනවා. විවාදයක් ලබා දීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැහැ. මේ පිළිබඳව අපි පසුව විවාදයක් ලබා දෙන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු අධිකරණ හා බුද්ධ ශාසන අමාත්‍යතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ හා බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

2015 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව. - [පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද ක්‍රීඩා පනත යටතේ නියෝග සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු දුමින්ද දිසානායක මහතා - පැමිණ නැත.

ගරු දයාසිරි ජයසේකර මහතා - පැමිණ නැත.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) හෝමාගම, වැකන්ද පාර, නො. 60/9 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.කේ. ගුණසෝම මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අංගොඩ, හිඹුටාන, පොල්වත්ත, ගුණසේකර මාවත, අංක 241/1 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. උපුල් රෝහිත මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මාකොළ, මාකොළ දකුණ, නො. 170/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩී.එල්. හෙට්ටිහේවා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) යාපනය, පන්සල පාර, 158/4 දරන ස්ථානයෙහි පදිංචි රමීලා මර්වින් ක්ලැරන්ස් මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

1. ගනේමුල්ල, නැදුන, 432/12 දරන ස්ථානයෙහි පදිංචි ඩී. රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සම;
2. රාගම, බටුවත්ත, ගාමිණී මාවත, 199/A දරන ස්ථානයෙහි පදිංචි කේ.එල්. නිලූෂි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;
3. නුවරඑළිය, ගැමුණු මාවත, නො. 18 දරන ස්ථානයෙහි පදිංචි කේ.පී. යෝගරත්නම් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ
4. කොටදෙනියාව, හල්ඔලුව, හීන්පන්දෙණියවත්ත, අංක 86/16 දරන ස්ථානයෙහි පදිංචි මේරි එදිරිසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව : අධ්‍යක්ෂ ජනරාල් තනතුර
கரையோரப் பாதுகாப்புத் திணைக்களம் : பணிப்பாளர் நாயகம் பதவி
DEPARTMENT OF COAST CONSERVATION: POST OF DIRECTOR-GENE

117/'15

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2014.05.01 දින පුරප්පාඩු වූ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නිලධාරියෙකු පත්කළ ක්‍රමවේදය කවරේද;

(ii) උක්ත තනතුර දැරීමට සම්පූර්ණ කළ යුතු, අධ්‍යාපන හා රාජ්‍ය සේවයේ නියමිත මූලික සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2014.06.02 දින ඉහත තනතුරට තාවකාලික පදනමින් අනුයුක්ත කළ ඉන්ද්‍රාණි මංගලිකා වික්‍රමනායක යන නිලධාරිනියගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඇය 2003.03.03 දින සිට 2013.02.11 දින දක්වා නිත්‍ය රාජ්‍ය සේවයේ කෙතරම් කාලයක් සේවය කර තිබේද;

(v) වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීම සඳහා නිලධාරියකු පත් කළ යුත්තේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම නිලධාරිනියට එරෙහිව මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මඟින් පරීක්ෂණයක් සිදු කරන බව දන්නේද;

(ii) එසේ නම්, එවැනි නිලධාරිනියකට අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් ලබාදීමේ නීත්‍යානුකූල පදනම කවරේද;

(iii) අදාළ පත්වීම බල රහිත කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2014.05.01ஆம் திகதியன்று வெற்றிடமாகிய கரையோரப் பாதுகாப்புத் திணைக்களத்தின் பணிப்பாளர் நாயகம் பதவிக்கு உத்தியோகத்த ரொருவரை நியமித்த முறைமை யாதென் பதையும்;

(ii) மேற்படி பதவியை வகிப்பதற்காகப் பூர்த்தி செய்ய வேண்டிய கல்விசார் மற்றும் அரசாங்க சேவையிலான உரிய அடிப்படைத் தகை மைகள் தனித்தனியாக யாவை யென்பதையும்;

(iii) 2014.06.02ஆம் திகதியன்று மேற்படி பதவிக்குத் தற்காலிக அடிப்படையில் இணைக்கப்பட்ட இந்திராணி மங்கலிகா விக்கிரமநாயக்க எனும் உத்தியோகத்தரின் கல்வி மற்றும் ஏனைய தகைமைகள் தனித்தனியாக யாவையென் பதையும்;

(iv) இவர் 2003.03.03ஆம் திகதி முதல் 2013.02.11 ஆம் திகதி வரை நிரந்தர அரச சேவையில் எவ்வளவு காலம் கடமையாற்றியுள்ளார் என்ப தையும்;

(v) கரையோரப் பாதுகாப்புப் பணிப்பாளர் நாயகம் பதவியில் பதில் கடமையாற்று வதற்காக உத்தியோகத்தரொருவரை நியமிக்க வேண்டியவர் யாரென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி உத்தியோகத்தருக்கு எதிராக நிதி மோசடி சம்பந்தமாக இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவினால் விசா ரணையொன்று மேற்கொள்ளப்படுகின்ற தென்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அத்தகைய உத்தியோகத்தரொரு வருக்குப் பணிப்பாளர் நாயகம் பதவியை வழங்குவதற்கான சட்டரீதியான அடிப்படை யாதென்பதையும்;

(iii) மேற்படி பதவியை வலுவற்றதாக்குவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) ஆமெனில், அது எப்போதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the methodology applied in appointing an officer to the post of Director-General in the Department of Coast Conservation, which fell vacant on 01.05.2014;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) the basic educational qualifications and the stipulated basic qualifications in Public Service to be fulfilled to hold the aforesaid post, separately;

(iii) the educational qualifications and other qualifications, separately of the officer named Indrani MangalikaWickremanayaka, who was attached to the aforesaid post on a temporary basis on 02.06.2014;

(iv) the period of time for which she has been in Public Service on a permanent basis from 03.03.2003 up to 11.02.2013; and

(v) the person who is authorized to appoint an officer to act on the post of Director-General of Coast Conservation?

(b) Will he also inform this House-

(i) whether he is aware that an inquiry is being conducted against this officer before the Commission to Investigate Allegations of Bribery or Corruption in regard to financial irregularities;

(ii) if so, the legal basis of giving a post of Director-General to such an officer;

(iii) whether steps will be taken to cancel the relevant appointment; and

(iv) if so, the date on which it will be done?

(c) If not, why?

ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne- Deputy Minister of Mahaweli Development and Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MOD/ ADM/2/113/03 හා 2014.05.26 දිනැති ලිපිය මඟින් 2014.06.02 දින සිට අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩ බැලීම සඳහා එම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු අයි.එම්. වික්‍රමනායක මහත්මිය පත් කර ඇත.

(ii) මෙම තනතුර දෙපාර්තමේන්තු ප්‍රධානී තනතුරක් වන අතර, රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 06/2006 අනුව SL 3-2006 වැටුප් ඛණ්ඩයට අයත් විශේෂ ශ්‍රේණියේ සුදුසුකම් සපුරා ඇති නිලධාරියෙකු විය යුතුය.

(iii) ඉංජිනේරු විද්‍යා උපාධිය
ජල ඉංජිනේරු විද්‍යාපති උපාධිය
ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය
ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණිය (අධි සේවක) නිලධාරිනියකි

(iv) ඇය 2003.03.03 වැනි දින සිට 2013.02.11 වැනි දින දක්වා නිත්‍ය රාජ්‍ය සේවයේ යෙදී ඇති කාලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

* 2003.03.03 සිට 2007.05.06 දක්වා වැටුප් රහිත නිවාඩු මත ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පැවති වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ සේවයේ ද,

* 2007.05.07 සිට 2007.05.08 දක්වා දින 02ක් දෙපාර්තමේන්තු සේවයේද,

* 2007.05.09 සිට 2008.04.30 දක්වා ද්විතියික පදනම මත ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පැවති වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ සේවයේ ද,

* 2010.01.08 සිට 2010.01.17 දක්වා දින 08ක් දෙපාර්තමේන්තු සේවයේ ද යෙදී ඇත.

(v) දෙපාර්තමේන්තු ප්‍රධානී තනතුරක් බැවින් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ යුතුය.

(ආ) (i) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අංක BC/949/09/B32 දරන 2013.08.08 සහ 2015.12.31 දිනැති ලිපි මඟින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ සිදු කරනු ලබන පරීක්ෂණයක් සඳහා මෙම නිලධාරිනිය සම්බන්ධයෙන් තොරතුරු වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.

(ii) මෙම නිලධාරිනියගේ වැඩ බැලීමේ පත්වීම අවසන් කර ඇත.

(iii) අමාත්‍ය මණ්ඩලය විසින් නව වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කිරීම හේතුවෙන් මේ වන විට මෙම පත් කිරීම බල රහිත වී තිබේ.

(iv) 2015.04.20 දින සිට.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙම පත් කිරීම කළ යුතුව තිබෙන්නේ අමාත්‍ය මණ්ඩල නිර්දේශයකිනුයි. නමුත්, මීට කලින් මේ කියන නිලධාරිනිය පත් කර තිබෙන්නේ, අමාත්‍ය මණ්ඩල නිර්දේශයකින් හෝ අනුමැතියකින් තොරව නේද?

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2013 පත්වීම කරපු අවස්ථාවේදී ගැටලුවක් පැන නැඟී තිබුණා. හැබැයි, මේ වන කොට ඒක නිවැරදි වෙලා තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ගැටලු සහගත පත් කිරීමක් කළ නිසා ශ්‍රී ලංකා ජන රජයටත් ඒ වාගේම වෙරළ සංරක්ෂණ

දෙපාර්තමේන්තුවටත් මූල්‍යමය වශයෙන්, කීර්තිනාමය පැත්තෙන් හා වෙනත් ආකාරයකින් පාඩු වෙලා තිබෙනවායි කියලා අමාත්‍යාංශයට හැඟෙනවා ද?

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

පත් වීම සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වාගෙන යනවා. ඒ පිළිබඳව වන පරීක්ෂණය අවසන් වූ වහාම අපට තොරතුරු ඉදිරිපත් කරන්න පුළුවන්කම තිබෙනවා. හැබැයි, ඒ පරීක්ෂණය අවසන් වන තෙක් එයින් සිදු වුණු හානිය මොකක්ද කියන කාරණය පිළිබඳව ප්‍රකාශයක් කරන්න බැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නයෙන් මම මෙන්න මේ කාරණය ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වපසරිය තුළ වෙරළට අයත් ප්‍රදේශ තුළ අනවසරයෙන් විවිධාකාර අකටයුතුකම් සිද්ධ වෙනවා. විශේෂයෙන්ම අවසරයකින් තොර වෙළෙඳාම සිද්ධ වෙනවා. ඒ වාගේම වෙරළ ආශ්‍රිත ශාක සහ විශේෂයෙන්ම ජීවීන් ඉවත් කිරීමත්, වැලි ඉවත් කිරීමත් සිද්ධ වෙනවා. එය පසු ගිය රජය සමයේ සිදු වුණාට වඩා යම් ප්‍රමාණයකින් අඩු වෙලා තිබුණා වුණත්, තවමත් ඒ අකටයුතුකම් සිද්ධ වෙනවා. මේ අකටයුතුකම් මීටත් වඩා අවම කරන්න වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ අමාත්‍යාංශයට තිබෙන දැක්ම සහ වැඩ පිළිවෙළ මොකක්ද?

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ මෙම ප්‍රශ්නය මුල් ප්‍රශ්නයට අදාළ නොවුණත් මම පිළිතුරක් දෙන්නම්. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරයකින් තොරව මොනම හේතුවක් මතවත් ඊට අයත් ප්‍රදේශය තුළ ඉදිකිරීමක් හෝ ඒ ආදී යම් කටයුත්තක් කරන්න කිසිම විධියකින් අවසර ලබා දී නැහැ. පසු ගිය කාලවල විවිධ ඉදිකිරීම් සහ වෙරළ හානි වන ආකාරයට විවිධ සිදුවීම් හා ක්‍රියාකාරකම් රාශියක් සිද්ධ වුණා අපි දැක්කා. හැබැයි, ඒ සියලු දේවල් මේ වන විට අධිකරණය ඉදිරියට පමුණුවා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ඒ සඳහා අවසර දුන් පුද්ගලයන් පවා යම් යම් විමර්ශනවලට භාජනය කර තිබෙනවා. අපි විශ්වාස කරන හැටියට මේ වන විට ඒ ආකාරයේ කිසිම කටයුත්තක් සිදුවෙන්නේ නැහැ. හැබැයි යම් හෝ කටයුත්තක් වෙනවා කියා ගරු මන්ත්‍රීතුමා කරුණු ඉදිරිපත් කළොත් අපට ඒ පිළිබඳව විශේෂයෙන් සලකා බලන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 3 -490/'16- (1), ගරු කනක හේරත් මහතා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ උපදේශකවරුන් : විස්තර
தெற்கு போக்குவரத்து அபிவிருத்திக் கருத்திட்ட ஆலோசகர்கள் : விபரம்
CONSULTANTS OF SOUTHERN TRANSPORT DEVELOPMENT PROJECT: DETAILS

496/'16

4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියේ, දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ උපදේශකවරුන්ගේ නම්, ලිපින, පත්වීම් දිනයන් හා අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් උපදේශකවරයෙකු සඳහා ගෙවනු ලබන දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාර්ග සංවර්ධන අධිකාරියේ, මහජන සම්බන්ධතා නිලධාරින්ගේ නම්, ලිපින, පත්වීම් දිනයන් හා අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් මහජන සම්බන්ධතා නිලධාරින් සඳහා ගෙවනු ලබන දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අ(i) සහ ආ(i)හි සඳහන් තනතුරු ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබා ගෙන තිබේ ද;

(ii) එසේ නම්, අනුමතිය ලබා ගත් දින කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வீதி அபிவிருத்தி அதிகாரசபையின் தெற்கு போக்குவரத்து அபிவிருத்திக் கருத்திட்டத்தின் ஆலோசகர்களின் பெயர்கள், முகவரிகள், நியமனத் திகதிகள் மற்றும் கல்வித் தகைமைகள் வெவ்வேறாக யாவையென்பதையும்;

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ii) ඔව්වෝර් ආලෝසකරුක්කුම් සෙලුත්තප්පටුම් කොටුප්පනවුකළ් වෙව්වේරාක යාතෙන් පතෙයුම්;

අවර් ඉච්සපෙක්කු අරිවිප්පාරා?

(ආ) (i) වීති අපිවිරුත්ති අතිකාරසපෙයින් මක්කළ් තොටර්පු උත්තියෝකත්තර්කළින් පෙයර්කළ්, මුකවරිකළ්, නියමනත් තිකතිකළ් මට්රුම් කල්විත් තකෙමෙකළ් වෙව්වේරාක යාවෙයෙන් පතෙයුම්;

(ii) ඔව්වොරු මක්කළ් තොටර්පු උත්තියෝකත් තරුක්කුම් සෙලුත්තප්පටුම් කොටුප්පනවුකළ් වෙව්වේරාක යාවෙයෙන්පතෙයුම්;

අවර් ඉච්සපෙක්කු අරිවිප්පාරා?

(ඉ) (i) මේලේ අ(i) මට්රුම් ආ(i)ඉල් කුරිප්පිටප් පට්ටුළ්ළ පතවිකළෙ උරුවාක්කුවතර්කු මුකාමෙත්තුව සේවෙකළ් තිණෙක්කළත්තින් අංකීකාරම් පෙරප්පට්ටුළ්ළතා එන්පතෙයුම්;

(ii) ආමෙනිල්, අංකීකාරම් පෙරප්පට්ට තිකති යාතෙන්පතෙයුම්;

අවර් කුරිප්පිටුවාරා?

(ඊ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House -

(i) separately, the names, addresses, dates of appointment and educational qualifications of the consultants of Southern Transport Development Project of the Road Development Authority; and

(ii) separately, the allowances paid for each consultant?

(b) Will he also inform this House-

(i) separately, the names, addresses, dates of appointment and educational qualifications of the Public Relations Officers of the Road Development Authority; and

(ii) separately, the allowances paid for each Public Relations Officer?

(c) Will he state -

(i) whether the approval of the Management Services Department has been obtained to create the posts mentioned in (a) (i) and (b) (i); and

(ii) if so, the date on which the approval was obtained?

(d) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නම - ආර්.එම්.ඩී.පී.ඩබ්ලිව්.එස්. සුභාෂ් බණ්ඩාර යටවර මයා.

ලිපිනය- නො. 383/ඒ, තලවතුගොඩ පාර, අම්පිටිය.

පත්වීමේ දිනය - 2015.12.01

අධ්‍යාපන සුදුසුකම් - අපොස (සාපෙ)

(ii) රුපියල් 25,000.00ක මාසික දීමනාවක් සහ ප්‍රවාහන පහසුකම් සඳහා මසකට රුපියල් 40,000.00ක දීමනාවක් පිරිනමයි.

(ආ) (i) ඇමුණුම් 01හි දක්වා ඇත.

(ii) මසකට රුපියල් 25,000.00ක දීමනාවක්.

(ඇ) (i) උපදේශක සේවා සහ සම්බන්ධීකරණ සේවා ලබා ගැනීම සඳහා එවැනි සේවා සපයන්නන් සමඟ වසරක් වැනි කෙටි කාලයක් සඳහා පමණක් එකී සේවාවන් ප්‍රසම්පාදනය කර ගන්නා බැවින්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඈ) මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය සාධනය සාර්ථක කර ගැනීමට අවශ්‍ය සේවා සම්පාදනය කර ගැනීම පිණිස පත් කරන ලද කමිටු වාර්තාව අනුව සිදු කර ඇත. එම සේවා අවශ්‍යතාව සිදු කර ඇත්තේ අවුරුද්දක කාලයක් සඳහා පමණි.

කමිටු වාර්තාව ඇමුණුම 02හි දක්වා ඇත.

(ඇමුණුම් **සභාගත*** කරමි)

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් අහන්න යන්නේ අතුරු ප්‍රශ්නයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පළමුවෙනි අතුරු ප්‍රශ්නයද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

නැහැ. ඇමුණුමේ කොපමණ ඉන්නවාද? නම් නොකිව්වත් කමක් නැහැ. ගණන කියන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

සම්පූර්ණ ගණනද? මම කියන්නම්. 45 දෙනෙක් ඉන්නවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි.

මහාමාර්ග අමාත්‍යාංශය යටතේ තිබෙන මාර්ග සංවර්ධන අධිකාරියේ උපදේශක තනතුරු සඳහා රුපියල් 25,000ක මාසික දීමනාවකුයි, රුපියල් 40,000ක ප්‍රවාහන පහසුකම් ලබා දීම මතයි බඳවා ගෙන තිබෙන්නේ. එතකොට ඔක්කෝම එකතුව රුපියල් 65,000යි. මා ළඟ ලේඛනය තිබෙනවා. ඒ ලේඛනය අනුව 56දෙනෙක් ඉන්නවා.

බුදු දහමේ නම් අපි අහලා තිබෙනවා, "සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරිහත්" කියලා මාර්ග ඵල ගැන කියනවා. චතුරාර්ය සත්‍යයෙත් තිබෙනවා නේ දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග කියලා. හැබැයි, මහාමාර්ග කියලා නැහැ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි ගම්පොළ, නුවර පාර, හාලිඇල පුරාණ විහාරයේ වට්ටප්පල සීවලී හිමි නව කැලණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ උපදේශක පිළිබඳව.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම නමක්-

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
කොයි මාර්ග ඵලයේ-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ ගැන ඔබතුමාගේ ප්‍රශ්නයෙන් අහලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සුභාෂ් ගැන නේ. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා අහලා තිබෙන්නේ, සුභාෂ් බණ්ඩාර යටවර ගැන විතරයි. ඒකට මම උත්තර දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා අහපු ප්‍රශ්නයට ගරු ඇමතිතුමා උත්තර දුන්නා. පළමුවැනි අතුරු ප්‍රශ්නය අවසන්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හාමුදුරු නමකටත් උපදේශක තනතුරක් දීලා තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා අහලා තිබෙන්නේ සුභාෂ් බණ්ඩාර යටවර ගැන විතරයි. මම උත්තර දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මම අහන්නේ, මාර්ග සංවර්ධන අධිකාරියේ උපදේශක තනතුරට හාමුදුරු නමක් පත් කරලා තිබෙනවා. හරි නේද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ඒකට උත්තරයක් ඉදිරි දිනක දෙන්නම්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක ප්‍රශ්නයට අදාළයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා අද අහලා තිබෙන්නේ, සුභාෂ් බණ්ඩාර යටවර ගැන විතරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා කිව්වා, ලැයිස්තුවේ 45දෙනෙකු ඉන්නවා කියලා. ඒ 45දෙනාගෙන් එක්කෙනෙකු ගැන නේද අහන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී මම දීර්ඝ උත්තරයක් දෙන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඒ 45 දෙනා අතරේ හාමුදුරුවොත් ඉන්නවා නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙය දැනගන්න ඕනෑ. අපි ජනාධිපතිවරණයේදී මහනුවර දිස්ත්‍රික්කය වැඩි ඡන්ද 81,000කින් ජයග්‍රහණය කළා. පාර්ලිමේන්තු මැතිවරණය වැඩි ඡන්ද 131,000කින් ජයග්‍රහණය කළා. ඒ නිසා අපට වග කීමක් තිබෙනවා, ඒ අයට අවස්ථාවක් ලබා දෙන්න. [බාධා කිරීමක්] ඔක වැරදියි. මම ඔක බලන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මේ හාමුදුරුවන්ට මාර්ගඵල අවබෝධ කර ගැනීමක් නොවෙයි නේ. මේ මහාමාර්ග අමාත්‍යාංශයේ උපදේශක තනතුරක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක වැරදියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු ඇමතිතුමනි, උපදේශක තනතුරු ලබා දීමේදී ඔබතුමාට ඒ අයගේ CV එවා තිබෙනවා. ඉන් එකක් මා ළඟ තිබෙනවා. එහි සඳහන් වනවා, "ඒ. නිමල් චන්ද්‍රසිරි, සාමාන්‍ය පෙළ සමත්" කියලා. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරියේ උපදේශක තනතුර ලබා දීලා තිබෙන්නේ සාමාන්‍ය පෙළ සමත් කෙනෙකුට.

ඒ වාගේම තව එකක් මා ළඟ තිබෙනවා. ඔබතුමා සුභාෂ් බණ්ඩාර යටවර කියලා පිළිතුරේදී සඳහන් කරපු කෙනාගේ වෘත්තීය සුදුසුකම් විධියට දක්වා තිබෙන්නේ ගඟවට කෝරළයේ ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක. මෙහෙම තමයි මේ තනතුර දීලා තිබෙන්නේ. විපක්ෂ නායක, හිටපු සභාපති, උපදේශක යන තනතුරු දීලා තිබෙන්නේ මෙහෙම නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ අය පත් කර තිබෙන්නේ ව්‍යාපෘති සඳහා. පොඩ්ඩක් ඉන්න. මේ අය සම්මුඛ පරීක්ෂණයට කැඳවා තමයි පත් කර තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ප්‍රශ්නය අහන තෙක් ඉන්න. ප්‍රශ්නය අහලා අවසන් වන්නේ නැතිව උත්තර දෙන කෙනාගේ microphone එක on වෙන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නය අහන කෙනාගේ microphone එක off වෙලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක මම බලාගන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මම ප්‍රශ්නය අහනකොට microphone එක on වෙලා තිබුණේත් නැහැ නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා දැන් අතුරු ප්‍රශ්න තුනක් ඇසුවා නේ?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා බලා ගන්නවා නම් කියන්න ඕනෑ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉඳගන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම ඉඳගන්න නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා ඉඳගන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පොඩ්ඩක් ඉන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අහන විධිය ගැන ඔබතුමා මට කියා දෙන්න එපා. ඔබතුමා කරුණාකර ඉඳ ගන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා කොහොමද එහෙම කියන්නේ? ප්‍රශ්නය අහනකල් ඉඳලා තමයි උත්තර දීම සඳහා ඇමතිතුමාගේ microphone එක on වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
දෙවන අතුරු ප්‍රශ්නය තවම අහලා ඉවර වුණේ නැහැ. Microphone එක දුන්නේ නැහැ නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Microphone එක තවමත් ඔබතුමාට දීලා තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මේ දැන් නේ දුන්නේ. උපදේශක තනතුරක් සඳහා වට්ටප්පල සීවලී හාමුදුරුවෝ පත් කරලා තිබෙනවා. ඒක හරිද කියලායි මම ඇහුවේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක වැරදියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහලා ඉවර වුණාට පසුව ඔබතුමා උත්තර දුන්නා නම් හරි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් දෙවන අතුරු ප්‍රශ්නය අහලා අවසන්ද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
නැහැ. දෙවන අතුරු ප්‍රශ්නය අහලා අවසන් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හාමුදුරුවන්ගේ ප්‍රශ්නය ඔබතුමා ඉස්සර වෙලා ඉදිරිපත් කළා නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හාමුදුරුවන්ගේ ප්‍රශ්නය ඉවරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමා තවත් කාරණාවක් ගැන කිව්වා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. ඒ ගොල්ලන්ගේ ජීව දත්ත වාර්තාවල වෘත්තීය සුදුසුකම් විධියට තිබෙන්නේ විපක්ෂ නායකකම්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීකම් වාගේ ඒවා. ඒ වාගේ කට්ටියට තමයි උපදේශකකම් දීලා තිබෙන්නේ, රුපියල් හැටපන්දහසක් දීලා. මම අහන්නේ ඒ පදනම මොකක්ද කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හරි, ප්‍රශ්නය පැහැදිලියි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, ඒ දෙවන අතුරු ප්‍රශ්නයට උත්තරයක් දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒවා අතිරේක සුදුසුකම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඒවා professional qualifications.

තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි. මේකේ සඳහන් වෙලා තිබෙනවා, නුවර, අරුප්පලවත්ත, අංක 106 ලිපිනයේ පදිංචි සවින්ද සමරසූරිය කියලා කෙනෙක් ගැන. ඒ එක උපදේශකයෙක්. ඒ වාගේම ඒ ලැයිස්තුවේම සඳහන් වෙලා තිබෙනවා, සිරිල් සමරසූරිය, නොම්මර 106, අරුප්පලවත්ත, නුවර යනුවෙන්. මේ, එකම පවුලේ උපදේශකයෝ.

එකම පවුලේ උපදේශකයෝ. එකම ලිපිනයේ, එකම ගෙදර ඉන්නා අය. මේ පවුල් සැලසුම් උපදේශකකම් නොවෙයි නේ. මහාමාර්ග අමාත්‍යාංශයේ උපදේශකකම් නේ මේ දීලා තිබෙන්නේ. [ඝෝෂා කිරීම්] ඡන්දෙට වැඩ කරපු අයට මේ විධියට උපදේශකකම් දෙන්න නම්, රුපියල් 65,000 ගණනේ ආණ්ඩුවේ මුදල් දෙන්න නම්, යහ පාලන ආණ්ඩුවක් පත් කර ගත්තේ මොකටද? මේ ගොල්ලන්- [ඝෝෂා කිරීම්] ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමනි, ඔය ප්‍රතිපත්ති අගමැතිතුමාත් පිළිගන්නවාද කියා ඔබතුමා එතුමාගෙන් අසන්න. [ඝෝෂා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හරි. දැන් ප්‍රශ්නය පැහැදිලියි නේ. දැන් ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා පැහැදිලි උත්තරයක් ලබා දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා කියන විධියට එකම පවුලේ අයට දීලා තිබෙනවා නම් මම ඒ ගැන බලන්නම්. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාට උත්තර ලබා දීමට අවස්ථාව ලබා දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට කිව්ව විධියට මහනුවර දිස්ත්‍රික්කය ජනාධිපතිවරණයේදී ඡන්ද 81,000කින් දිනුවා; පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්ද 1,31,000කින් දිනුවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා අවුරුදු දහයක් ජනාධිපති වශයෙන් කටයුතු කළ කාලයේ මහාමාර්ග ඇමති මේ වාගේ පත්වීම් 250ක් දීලා තිබෙනවා. [බාධා කිරීම්] 250ක්! [බාධා කිරීම්] මේ අය ඒවා ගැන පරීක්ෂණ කරන්නේ නැහැ. [බාධා කිරීම්] 250ක්! 250ක්!! මොනවාද මේ කථා කරන්නේ? [බාධා කිරීම්] 250ක් දීලා තිබෙනවා. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ record එක කඩන්න යන්නේ.

ජාතික සංහිඳියාව සඳහා වූ කාර්ය සාධක බලකාය: විස්තර
தேசிய நல்லிணக்கத்துக்கான செயலாற்றுப் படையணி : விபரம்
TASK FORCE FOR NATIONAL RECONCILIATION: DETAILS

548/'16

5. ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

[ගරු විමල් වීරවංශ මහතා]

(අ) (i) ජාතික සංහිඳියාව සඳහා වූ කාර්ය සාධක බලකාය නම් වූ ආයතනයක් පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එය පිහිටුවා ඇත්තේ අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය යටතේද;

(iii) එය පිහිටුවනු ලැබුවේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේදී රජය විසින් පිළිගනු ලැබූ යෝජනාවලිය අනුවද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කාර්ය සාධක බලකාය පිහිටුවීමේ අරමුණු සහ එයට පවරා ඇති කාර්ය භාරය කවරේදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත කාර්ය සාධක බලකායේ සභාපති හා අනෙකුත් සාමාජිකයින් කවුරුන්ද;

(ii) ඔවුන්ගේ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම කාර්ය සාධක බලකායේ කටයුතු වෙනුවෙන් එහි සභාපති සහ අනෙකුත් සාමාජිකයන් 10දෙනාට ගෙවනු ලබන දීමනා හා අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

පිරතම අමෙච්චරුම් දේසිය කොල්කෙකළ් මර්රුම් පොරුළාදාර අළුවල්කළ් අමෙච්චරුමානවරෙක් කේට්ට විනා:

(අ) (i) දේසිය නල්ලිණක්කත්තුක්කාන සෙයලාර්රුප් පටෙයණි එන්ර නිරුවනමොන්රු නිරුවప్ පට්ටුళ්ළදා එන්පදෙයුම්;

(ii) ආමෙනිල්, අදු අමෙච්චරවෙයින් අංගීකාරත්තින් කීළ් නිරුවప్පට්ටදා එන්පදෙයුම්;

(iii) ඉක්කිය නාටුකළ් සපෙයින් මනිත උරිමෙකළ් ආණෙක්කුළුවිල් අරසිනාල් ඒර්රුක් කොళ්ළప్පට්ට මුන්මොළිවුක්කමෙය අදු නිරුවప్පට්ටදා එන්පදෙයුම්;

අවර් ඉච්සපෙයිල් අර්රිවිప్පාරා?

(ආ) මේර්කුරිත්ත සෙයලාර්රුප් පටෙයණි නිරුවప్ පට්ටදන් නෝක්කම් මර්රුම් අදර්කු ඔప్පටෙක්කప్පට්ට කටමෙප් පොරුప్පුකළ් යාවෙ එන්පදෙ අවර් කුරිප්පිටුවාරා?

(ඉ) (i) මේර්කුරිත්ත සෙයලාර්රුප් පටෙයින් තලෙවර් මර්රුම් අදන් උරුప්පිනර්කළ් යාවර් එන්පදෙයුම්;

(ii) ඉවර්කළදු තකෙමෙකළ් වෙව්වේරාක යාවෙ එන්පදෙයුම්;

(iii) මේර්පඩි සෙයලාර්රුප් පටෙයණියින් පණි කළුක්කාක අදන් තලෙවර් මර්රුම් ඒනෙය උරුප්පිනර්කළ් 10 පේරුක්කුච් සෙලුත්තప්පටුම් කොටුప්පනවුකළ් මර්රුම් සලුකෙකළ් යාවෙ එන්පදෙයුම්;

අවර් ඉච්සපෙයිල් අර්රිවිප්පාරා?

(ඊ) ඉන්රෙල්, ඒන්?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) whether an institution has been established by the name of the Task Force for National Reconciliation;

(ii) if so, whether the aforesaid institution has been established with the approval of the Cabinet of Ministers; and

(iii) whether the aforesaid institution was established in accordance with the package of proposals accepted by the Government at the United Nations Human Rights Commission?

(b) Will he state the objective of establishing the aforesaid task force along with the functions assigned to it?

(c) Will he also inform this House-

(i) the Chairman and the other members of the aforesaid task force;

(ii) their qualifications, separately; and

(iii) the allowances and the other privileges provided to the chairman and the other 10 members of it for the activities carried out by them through this task force?

(d) If not, why?

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

(ඇ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඈ) පැන නොනඟී.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ජාතික සංහිඳියාව සඳහා වූ කාර්ය සාධක බලකාය" නැමති ආයතනයක් පිහිටුවා තිබෙන බවට මාධ්‍ය මඟින් වාර්තා කර තිබුණා. ඒ වාගේම හිටපු ජනාධිපතිනිය වන චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය එහි ප්‍රධාන භූමිකාව ඉටු කරන

බවටත්, එතුමිය ඒ කාර්යයෙහිලා සමහර කටයුතුවල නියැලෙන බවත් ප්‍රවෘත්ති පවා පසු ගිය කාලයේ ජනමාධ්‍ය ඔස්සේ වාර්තා වුණා. නමුත්, ඔබතුමා මේ ප්‍රශ්නයේ (අ) (i)ට කියන්නේ "නැත" කියන පිළිතුරයි. ඒ අනුව මේ පිළිතුර නිවැරදිද කියලා නැවතත් විමසන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නවලට ගරු රාජ්‍ය ඇමතිතුමා පිළිතුරු දීලා තිබෙනවා. ප්‍රශ්නයක් අහන්න ඕනෑ නම් වෙනම ප්‍රශ්නයක් හැටියට මතු කරන්න.

මම එකක් කියන්න කැමැතියි. හිටපු ජනාධිපතිනිය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිනිය එවැනි කාර්ය සාධක බලකායක භූමිකාවක් ඉටු කරන බව මම නම් දන්නේ නැහැ. ඕනෑ නම් මම එතුමියගෙන් අහලා ඔබතුමාට කියන්නම්. ඔබතුමන්ලා පරණ යහළුවෝ නේ. එක කාලයක් එතුමියත් එක්ක ආණ්ඩුවක් හැදුවා නේ. එතුමියගෙන් call එකක් දීලා අහන්නකෝ. නැත්නම් මම එතුමියගෙන් අහන්නම්. ඒක ප්‍රශ්නයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම විහිළු රසාංගයක් පටන් ගන්න අදහස් කළේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ රටේ පොදු ජනතාව දැනගත යුතුව තිබෙන ප්‍රශ්නයක් මම ඉතා වගකීමෙන් අගමැතිතුමාගෙන් විමසන්නේ. හිටපු ජනාධිපතිනිය අපේ පරණ යහළුවන් වුණාට, එතුමියගේ අලුත් යහළුවන් දැන් ඔබතුමන්ලා නේ. අපේ යාළුකම පරණයි නේ. එතුමිය සමඟ අලුත් යාළුකම් තිබෙන්නේ ඔබතුමන්ලාටයි. එතකොට මට දැනගන්න අවශ්‍යයි, ඒ පිළිබඳව පළ වෙච්ච ජනමාධ්‍ය වාර්තා බොරුද කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒක මම දන්නේ නැහැ. මම නම් ජනමාධ්‍යයෙන් එහෙම දෙයක් දැක්කේ නැහැ. ඔබතුමා දන්නේ නැති වුණාට මම පොඩි කාලයේ ඉඳන් එතුමියව දන්නවා. අපි එකටයි නැටුම් ඉගෙන ගත්තේ. අපි දේශපාලනය කළත් ඒක තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අහන්නේ ගරු මන්ත්‍රීතුමා සංහිඳියාවට හා සමඟියට විරුද්ධ ද කියලායි. විරුද්ධ නැත්නම්, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය නොවෙයි, මහින්ද රාජපක්ෂ කළත්, කවුරු කළත් කමක් නැහැ නේ.

ඒගොල්ලන් තමන්ගේ සාකච්ඡා පැවැත්වූවාට අපි කවුරුවත් විරුද්ධ නැහැ. ඔබතුමා එක් කාලයක -2009 මැයි මාසයේදී- එක්සත් ජාතීන්ගේ මහ ලේකම්තුමා ආවාම සහයෝගය ලබා දුන්නා, "අපේ හමුදාවේ අය යුද අධිකරණයට එවනවා" කියලා. ඊට පස්සේ දරුස්මාන් කොමිටියට ගිහිල්ලා කිව්වා, "ඒ අයට විරුද්ධව නඩු දානවා" කියලා. ඒවා නැතිව දැන් වෙන විකල්පයක් කවුරු හෝ හොයලා දෙනවා නම් ඇයි, අපි ඒවාට විරුද්ධ වෙන්නේ? ඔබතුමන්ලා යුද අධිකරණයට යන්න කැමැති වුණා, දැන් "නැහැ" කියලා කිව්වාට. ඔබතුමා කැමැති වුණා, දරුස්මාන් එක්ක ගිහිල්ලා, -[බාධා කිරීම්] ඔය එකක්වත් අයින් වුණේ නැහැනේ. අන්තිමට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අයින්වෙලා ආව නිසා යුද අධිකරණය වැනි ඔක්කොමගෙන් දැන් අපි බේරිලා ඉන්නවා. දැන් ඉන්නේ Truth and Reconciliation Commission එකේ. ඔබතුමා සංහිඳියාවට පක්ෂද නැද්ද කියලා මට කියන්න; සංහිඳියාවට පක්ෂද නැද්ද කියලා මට කියන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
දෙවැනි අතුරු ප්‍රශ්නය ඇහුවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නවම අගමැතිතුමා කථා කරනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
දැන් අහන්නේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සංහිඳියාවට පක්ෂද නැද්ද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අගමැතිතුමාට අමතරව කථා කරන තව කවුරු හෝ ඉන්නවාද? [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාට අතුරු ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්න ඇසීමේ වාරය තිබෙන්නේ අපටයි. ඇමතිවරු ඉන්නේ උත්තර දෙන්නයි.

[ගරු විමල් වීරවංශ මහතා]

අගමැතිතුමා දැන් මගෙන් ප්‍රශ්න අහනවා. මේ රටේ සංහිඳියාව හැදුවේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව. යුද්ධය අවසන් කරලාත් මේ රට ඒකීය රටක් බවට පත් කළේ ඒ ආණ්ඩුවයි. ඒ ආණ්ඩුව සංහිඳියාවක් නැති කරන වැඩ පිළිවෙළක් කළේ නැහැ. ඔබතුමා කරුණාකරලා කොළේ වහලා ගහන්න එපා. යුද අපරාධ අධිකරණ හදන්න අපේ ආණ්ඩුව අත උස්සලා නැහැ. අද තමුන්නාන්සේලා තිබෙන සංහිඳියාව නැති කරනවා. යාපනය විශ්වවිද්‍යාලයේ මීට කලින් ශිෂ්‍යයන් සිංහල දෙමළ හැටියට මරා ගත්තේ නැහැ. අද තමුන්නාන්සේලාගේ ඊනියා සංහිඳියාව යටතේ යාපනය විශ්වවිද්‍යාලයේ සිංහල ශිෂ්‍යයින්ට ගහනවා. ඒකද සංහිඳියාව? [බාධා කිරීම්] සංහිඳියාව රටකට ඕනෑ. ඒ ගැන විවාදයක් නැහැ. තමුන්නාන්සේලාගෙන් වැදගත් විධියට ප්‍රශ්නයක් ඇහුවාම ඒකට සාධාරණව උත්තර දෙන්න. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
හොඳයි. ගරු අගමැතිතුමා. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කිව්වේ, එහෙම එකක් නැහැ කියලායි. මාධ්‍ය වාර්තා මා දැකලා නැහැ. ඒත් ගරු මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වනවා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා සංහිඳියාව හැදුවේ යුද්ධාධිකරණවලට හමුදාවේ අය යවනවායි කියලා එතුමා පිළිගත්ත එකට. [බාධා කිරීම්] තමන් අහුවෙයි කියා දැන ගත්තාම තමයි විරුද්ධ වුණේ. එච්චරයි වුණේ. ඒක ඇත්ත නේ. 2009දී අත්සන් කළා. දරුස්මාන් කමිටුවට ගිහින් නැවත අත්සන් කළා. ඇයි ගිහින් අත්සන් කළේ? අපි කවුරුත් කිව්වේ නැහැ, යුද්ධාධිකරණයට යවන්නය කියලා. සංහිඳියාව ඇති කරන්න ඕනෑ. දෙපැත්තේම මිනිසුන් මැරුණා. ත්‍රස්තවාදය තිබුණා. ගරු මන්ත්‍රීතුමනි, යුද්ධාධිකරණයක් නැතිව සංහිඳියාව ඇති කරන්න ඔබතුමා කැමැති නම්, චන්ද්‍රිකා කුමාරණතුංග හෝ ඕනෑ කෙනකුට කථා කරලා අදහස් දෙන්න කියන්න. ඔබතුමාගේ අදහසුත් දෙන්න. කිසිම ප්‍රශ්නයක් නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
අතුරු ප්‍රශ්න තුනම ඇහුවා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අවසාන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
බොහොම ස්තුතියි, ඔබතුමාට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුධ අපරාධ අධිකරණ පිහිටුවීමට මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ රජය කිසිම ආකාරයකින් එකඟ වෙලා නැහැ; අපි කවුරුවත් එකඟ වෙලා නැහැ. ඒ නිසා කරුණාකර මේ ගරු සභාව නොමඟ යවන්න එපාය කියලා ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඉල්ලනවා. මෙහෙම අගමැතිතුමෙකු ලොවෙත් නැහැ, ලොව් ගහෙත් නැහැ, ලොව් ගහ මුලත් නැහැ, දෙල්කඳ පොළෙත් නැහැ. ඒ නිසා මට තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න තිබුණත්, මා තුන්වන අතුරු ප්‍රශ්නය අහන්නේ නැහැ; අහලා වැඩක් නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2009දී බැන් කී මූන් එක්ක අත්සන් කළ ඒ යෝජනාව දිහා බලන්න. එතකොට නම් යුද අධිකරණයට යවන්න එකඟ වුණා. දරුස්මාන් ළඟට ගිහින් එදා මොහාන් පීරිස් හිටපු නීතිපතිතුමා මොකක්ද කිව්වේ කියා ඇහුවොත්, ඒවාත් කියන්න පුළුවන්. ඕනෑ වෙලාවට අගමැති. අනික් වෙලාවට නැහැ. ඒකට මට කමක් නැහැ. මම කියන්නේ ඇත්තයි. කලින් යුද අධිකරණයට එකඟ වෙලා, පස්සේ තමන් යුද අධිකරණයට ගෙන යයි කියලා හිතුවාම විතරයි ඒකට විරුද්ධ වුණේ. නැත්නම් කවුද ගිහින් -[බාධා කිරීමක්] ඔව්, ඕනෑ වෙලාවට අගමැති. එච්චරයි මට කියන්න තිබෙන්නේ.

රාජ්‍ය සේවය තුළ පවතින පුරප්පාඩු : විස්තර
அரச சேவையிலுள்ள வெற்றிடங்கள் : விபரம்
VACANCIES IN THE PUBLIC SERVICE: DETAILS

556/'16

7. ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දැනට රාජ්‍ය සේවය තුළ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු පවතින ක්ෂේත්‍ර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පුරප්පාඩු සඳහා රැකියා විරහිත උපාධිධාරීන් බඳවා ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ක්ෂේත්‍ර සඳහාද;

(v) පුරප්පාඩු සඳහා බඳවාගත හැකි උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(vi) පුරප්පාඩු සඳහා රැකියා විරහිත උපාධිධාරීන් බඳවාගනු ලබන කාලවකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் அரசாங்க சேவையில் காணப்படு கின்ற வெற்றிடங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி வெற்றிடங்கள் காணப்படுகின்ற துறைகள் தனித்தனியாக யாவை என்பதையும்;

(iii) மேற்படி வெற்றிடங்களுக்கு தொழிலற்ற பட்ட தாரிகள் ஆட்சேர்ப்புச் செய்யப்படுவார்களா என்பதையும்;

(iv) ஆமெனின், அது எந்தெந்தத் துறைகளுக்கு என்பதையும்;

(v) வெற்றிடங்களுக்கு ஆட்சேர்ப்புச் செய்யக்கூடிய பட்டதாரிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(vi) வெற்றிடங்களுக்கு தொழிலற்ற பட்டதாரிகள் எக்காலப்பகுதியில் ஆட்சேர்ப்புச் செய்யப்படு வார்கள் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Management:

(a) Will he inform this House-

(i) the number of vacancies available in the Public Service at present;

(ii) separately, the sectors in which the aforesaid vacancies exist;

(iii) whether the unemployed graduates will be recruited for the aforesaid vacancies;

(iv) if so, the sectors for which recruitments will be made;

(v) the number of graduates that can be recruited for the vacancies; and

(vi) the period in which unemployed graduates will be recruited for the vacancies?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දීප ව්‍යාප්ත සේවාවන් හා ඒකාබද්ධ සේවාවන්හි මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව 8,388කි.

(ii) මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දීප ව්‍යාප්ත සේවාවන් හා ඒකාබද්ධ සේවාවන්හි මේ වන විට පවතින පුරප්පාඩු පහත පරිදි වේ.

1.	ශ්‍රී ලංකා පරිපාලන සේවය	-	207
2.	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	-	178
3.	ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය	-	18
4.	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	-	147
5.	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	-	184
6.	ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය	-	137
7.	රජයේ භාෂා පරිවර්තක සේවය	-	199
8.	රජයේ පුස්තකාලයාධිපති සේවය	-	394
9.	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	-	2340
10.	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවය	-	1071
11.	සංවර්ධන නිලධාරී සේවය	-	3270
12.	කාර්යාල සේවක සේවය	-	55
13.	රියදුරු සේවය	-	188

(iii) ඔව්.

(iv) ඉහත අංක (ii)හි 1 සිට 6 දක්වා දීප ව්‍යාප්ත සේවාවලට හා අංක 7 සිට 10 දක්වා වූ ඒකාබද්ධ සේවාවලට අදාළ ව්‍යවස්ථාවල සුදුසුකම් සපුරාලන උපාධිධාරීන්ට ඒ සඳහා පැවැත්වෙන බඳවා ගැනීමේ විභාගවලට පෙනී සිටීමේ හැකියාව ඇත.

ඊට අමතරව සංවර්ධන නිලධාරී සේවය සඳහා රැකියා විරහිත උපාධිධාරීන් බඳවා ගැනීමේදී උපාධිධාරී අභ්‍යාසලාභී යෝජනා ක්‍රමය යන මැයෙන් වූ අංක අමප/16/0252/719/017 හා 2016.03.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය සේවයේ දැනට සේවය කරනු ලබන උපාධිධාරී සේවක සංඛ්‍යාව සමාලෝචනය කොට එහි ප්‍රතිඵල මත ඔවුන් ඵලදායී ලෙස නැවත ස්ථානගත කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමටත්, එතෙක් සංවර්ධන නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම කල් තැබීමටත් තීරණය කර ඇත. ඒ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කිරීමට යෝජිතව ඇත.

(v) ඉහත අංක (ii)හි 1 සිට 10 දක්වා සේවාවලට අදාළව පැවැත්වෙන බඳවා ගැනීමේ විභාගවල ප්‍රතිඵල මත පවතින පුරප්පාඩු සඳහා අදාළ බඳවා ගැනීම් සිදු කෙරේ. තවද සංවර්ධන නිලධාරී සේවය සඳහා ඉහත අංක (iv)හි සඳහන් කමිටු නිර්දේශය මත බඳවා ගැනීම් සිදු කළ හැකිය.

(vi) කාල වකවානු නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක. එක් එක් සේවාවලට අදාළව මේ වන විට බඳවා ගැනීම් සිදු කිරීමට ගෙන ඇති පියවර පසුබිම් වාර්තාවෙහි දක්වා ඇත.

(ආ) පැන නොනඟී.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2016 අප්‍රේල් වෙනකොට රැකියා විරහිතව උපාධිධාරීන් 30,000ක් විතර ඉන්නවා. මේ දවස්වල උපාධි ප්‍රදානෝත්සව තිබෙන නිසා තව උපාධිධාරීන් 20,000ක් විතර මේ අවුරුද්ද තුළ එකතු වේවි. 2013 වර්ෂයේ උපාධිධාරීන් 16,517ක් විශ්වවිද්‍යාලවලින් පිටවෙලා තිබෙනවා. 2014 වර්ෂයේදී උපාධිධාරීන් 19,051ක් විශ්වවිද්‍යාලවලින් පිටවෙලා තිබෙනවා. එතකොට, දළ වශයෙන් රැකියා විරහිත උපාධිධාරීන් 50,000ක පිරිසක් මේ අවුරුද්ද අන්තිම වන විට එකතු වෙනවා. නමුත් ඔබතුමාගේ පිළිතුරෙන් කිව්වේ අටදහස් ගණනක පුරප්පාඩු තමයි තිබෙන්නේ කියලා.

ඔබතුමාගෙන් මම අහන්නේ මේකයි. ඔබතුමා කියපු විධියට උපාධිධාරීන් මේ තනතුරුවලට පත් වෙනවා නම්, නැවත තරග විභාගයකට ලියලාද පත් වෙන්න ඕනෑ?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඔබතුමාගේ ප්‍රශ්නයට අනුව, දැනට තිබෙන පුරප්පාඩු සංඛ්‍යාව තමයි පිළිතුරේ සඳහන් කරලා තිබෙන්නේ. බඳවා ගන්නා ක්‍රමය පිළිබඳව තවදුරටත් අදාළ අමාත්‍යතුමාගෙන්ම දැන ගෙන කියන්නම්.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ඇමතිතුමා නැති නිසා මට හරියට ප්‍රශ්නය අහන්න විධියක් නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒ ගැන අහලා, ඔබතුමාට කියන්නම්.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

රැකියා විරහිත උපාධිධාරීන් එක්ක සාකච්ඡා කරලා, ඒ ගැන සොයා බලන්න අග්‍රාමාත්‍යතුමා කමිටුවක් පත් කළා. අපේ ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමාගේ නායකත්වයෙන් තමයි ඒ කමිටුව පත් කළේ.

ඒ කමිටුවෙන් සොයා ගත්ත vacancies ගණනයි, මේ ගණනයි හරිද? Vacancies 17,000ද, 8,000ද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අමාත්‍යාංශ මට්ටමින් යම් කිසි පුරප්පාඩු ප්‍රමාණයක් සොයා ගත්ත. නමුත් මුළු පුරප්පාඩු සංඛ්‍යාව තමයි මන්ත්‍රීතුමා අහලා තිබුණේ. ගරු ඇමතිතුමාත් එක්ක කථා කරලා තමයි ඔබතුමාට ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න පුළුවන් වෙන්නේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ආර්ථික සංවර්ධන නිලධාරීන් විශාල පිරිසක් පත් කළා. මේ යහපාලන ආණ්ඩුවේ ප්‍රතිපත්ති කඩාකප්පල් කරන, දියාරු කරන, ඒවාට කුමන්ත්‍රණ කරන නිලධාරීන් විශාල පිරිසක් අද වන විට ඒ තුළ ඉන්නවා. ඒ නිසා දැනට තිබෙන පුරප්පාඩු ටිකට අලුත් පිරිසක් ඉක්මනින් පත් කරලා අපේ රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න පුළුවන්ද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනිවාර්යයෙන්ම එහෙම කරන්න තමයි රජය අදහස් කරන්නේ.

සිරාජ් කාදර් මහතාට අයත් ඉඩම අත්පත් කර ගැනීමේ නිවේදනය: අවලංගු කිරීම
திரு. சிராஜ் காதரின் காணி சுவீகரிப்பு அறிவித்தல் : இரத்துச்செய்தல்
NOTIFICATION OF ACQUISITION OF LAND BELONGING TO MR. SIRAJ CADER: CANCELLATION

566/'16

8. ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1):

(අ) (i) මාතර දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2014 සහ 2015 වර්ෂවලදී විජයග්‍රහණ සැමරුම් උත්සවය සඳහා මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි, කොටුවේගොඩ ග්‍රාම නිලධාරී වසමේ, මාතර, වෙරළ පාර, අංක 47 දරන ඉඩම, බත්තරමුල්ල, පැලවත්ත, සපුමල් පෙදෙසේ, අංක 793හි පදිංචි සිරාජ් කාදර් මහතාගෙන් තාවකාලිකව ලබා ගෙන ආපසු භාර දී ඇති බවත්;

(ii) 2014 පැවැති සැමරුම් උත්සවයෙන් පසුව කාදර් මහතා වෙත ආපසු භාරදුන් එම ඉඩම, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ අත්පත්කර ගැනීම සඳහා 2014.12.04 දින මාතර ප්‍රාදේශීය ලේකම් විසින් නිවේදනයක් නිකුත් කර ඇති බවත්;

(iii) ඉහත අ(i)හි සඳහන් ඉඩම අත්පත්කර ගැනීමේ නිවේදනය අවලංගු කරන මෙන් කාදර් මහතා විසින් 2014.12.19 දිනැති ලිපිය මඟින් ඉල්ලීමක් කර ඇති බවත්;

(iv) මේ දක්වා අදාළ නිවේදනය අවලංගු නොකිරීම හේතුවෙන් එම ඉඩම ඵලදායී ආකාරයට සංවර්ධනය කිරීමට හැකියාවක් හිමිකරුට ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ඉඩම අත්පත්කර ගැනීමේ නිවේදනය අවලංගු කිරීම සඳහා කඩිනම් පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

කාණි අමෙච්චරෙක් කේට්ට වීනා:

(අ) (i) මාත්තරෙ මාවට්ටච් චෙයලාළරිනාල් 2014 මර්රුම් 2015ආම් ආණ්ඩුකළිල් වෙර්රි විළා කොණ්ඩාට්ටත්තුක්කු මාත්තරෙ පිරදේච චෙයලාළර් පිරිවිල් අමෙච්චුළ්ළ කොට්ටුවේ කොට කිරාම උත්තියෝකත්තර් පිරිවින්, මාත්තරෙ, කඩර්කරෙ වීදි, 47ආම් ඉලක්ක කාණි, පත්තරමුල්ල, පෙලවත්ත, සප්පුමල් පිළේස්, 793ආම් ඉලක්ක විලාසත්තිල් වසික්කුම් තිරු. සිරාජ් කාදරිඩමිරුන්දු තර්කාලිකමාක පෙර්රුක් කොළ්ළප්පට්ටු මීළක්කෙයළික්කප්පට්ටුළ්ළ තෙන්පතෙයුම්;

(ii) 2014ආම් ආණ්ඩු නඩෙපෙර්ර නිනෙවුකූරුම් කොණ්ඩාට්ටත්තෙත් තොඩර්න්දු තිරු. කාතරුක්කු මීළක්කෙයළික්කප්පට්ට මේර්පඩි කාණියෙ, කාණි කොළ්ළල් චට්ටත්තින් 2ආවතු පිරිවින් කීළ් සුවීකරිප්පතර්කු 2014.12.04ආම් තිකතියන්රු මාත්තරෙ පිරදේච චෙයලාළරිනාල් අර්විත්ත ලොන්රු වෙළියිඩප්පට්ටුළ්ළතෙන්පතෙයුම්;

(iii) மேற்படி அ(i)இல் குறிப்பிடப்பட்டுள்ள காணி சுவீகரிப்பு அறிவித்தலை இரத்துச் செய்யுமாறு திரு. காதர் 2014.12.19ஆம் திகதிய கடிதம் மூலம் வேண்டுகோள் விடுத்துள்ளார் என்பதையும்;

(iv) இதுவரை குறித்த அறிவித்தல் இரத்துச் செய்யப் படாததன் காரணத்தினால் மேற்படி காணியை பயன்மிக்கதாக அபிவிருத்தி செய்வதற்கு உரிமையாளருக்கு வாய்ப்புக் கிடைக்கவில்லை என்பதையும்; அவர் அறிவாரா?

(ஆ) மேற்குறிப்பிட்ட காணியைச் சுவீகரிப்பதற்கான அறிவித்தலை இரத்துச்செய்வதற்கு துரிதமாக நடவடிக்கை மேற்கொள்வாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked Minister of Lands:

(a) Is he aware that -

(i) the land located at No.47, Beach Road, Matara in the Kotuwegoda Grama Niladhari Division of the Matara Divisional Secretary's Division which belongs to Mr. Siraj Cader of No. 793, Sapumal Place, Pelawatta, Battaramulla, was taken over from him temporarily and returned by the District Secretary of Matara in order to hold the Victory Celebrations in years 2014 and 2015;

(ii) a notification had been issued by the Divisional Secretary of Matara on 04.12.2014 under Section 2 of the Land Aquisition Act in order to aquire the said land which was returned to Mr. Cader after the celebration in 2014;

(iii) Mr. Cader has made a request through the letter dated 19.12.2014 to the effect that the land aquisition order mentioned in a(i) above be cancelled; and

(iv) the aforementioned owner is unable to develop the said land in a productive manner since the said notification has not been cancelled up to now?

(b) Will he inform this House whether action will be taken immediately to cancel the aforementioned land acquisition notification?

(c) If not, why?

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரும் காணி அமைச்சரும்)

(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs and Minister of Lands)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නොදනිමි.

(ii) නිවේදනය නිකුත් කර ඇති බව දනිමි.

(iii) දනිමි.

(iv) දනිමි.

(ආ) නිවේදනය අවලංගු කිරීම සඳහා ගරු මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගේ නිර්දේශය කැඳවා ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු විදුර වික්‍රමනායක මහතා

(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)

(The Hon. Vidura Wickramanayaka)

ස්තුතියි.

GPS තාක්ෂණ ව්‍යාපෘතිය: විස්තර

GPS தொழில்நுட்பக் கருத்திட்டம் : விபரம்

GPS TECHNOLOGY PROJECT: DETAILS

568/'16

9. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)

(The Hon. Sunil Handunnetti)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික ප්‍රවාහන කොමිසම මඟින් ආරම්භ කරන ලද GPS තාක්ෂණය යෙදවීමේ ව්‍යාපෘතියෙහි අරමුණු කවරේද;

(ii) එමඟින් බස් මගීන්ට ලබා දීමට අපේක්ෂා කළ අමතර සේවා කවරේද;

(iii) සවිකරන ලද GPS යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) GPS යන්ත්‍ර සවිකිරීම සඳහා යෙදවූ මහජන මුදල් ප්‍රමාණය කොපමණද;

(v) ඒ සඳහා බස් හිමියන්ගෙන් මුදලක් අයකර ගත්තේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2014 වර්ෂය ආරම්භයේ සිට මෙම යන්ත්‍ර නඩත්තුව සඳහා මුදල් ගෙවීම නතර කර තිබේද;

(ii) එසේ නම්, ඒ නඩත්තු සේවා ගිවිසුමේ කවර පරිච්ඡේදයකට අනුවද;

(iii) සේවා ගාස්තු ගෙවීම නතර කිරීම සඳහා බස් හිමියන්ගේ එකඟතාව ලැබුණේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සවි කරන ලද GPS යන්ත්‍ර ක්‍රියාත්මකව පැවතියේද;

(ii) 2014 වර්ෂයේ අග භාගයේ සිට සියලුම GPS යන්ත්‍ර අක්‍රියව තිබේද;

(iii) ඒ හේතුවෙන් බස් හිමියන්ට තමන්ගේ බස් රථ ධාවනය සම්බන්ධයෙන් GPS යන්ත්‍ර හරහා නිරීක්ෂණය කිරීමට නොහැකිව තිබේද;

(iv) ඉහත අ(i) හි අරමුණු සාක්ෂාත් කරගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய போக்குவரத்து ஆணைக்குழுவினால் ஆரம்பிக்கப்பட்ட GPS தொழில்நுட்பத்தைப் பயன்படுத்தும் கருத்திட்டத்தின் நோக்கம் யாது;

(ii) இதன்மூலம் பேருந்துப் பயணிகளுக்கு வழங்குவதற்கு எதிர்பார்க்கப்பட்ட சேவை மேம்பாடுகள் யாவை;

(iii) பொருத்தப்பட்ட GPS சாதனங்களின் எண்ணிக்கை யாது;

(iv) GPS சாதனங்களைப் பொருத்துவதற்காக ஈடுபடுத்தப்பட்ட பொதுமக்களின் பணத்தொகை யாது;

(v) இதற்காகப் பேருந்து உரிமையாளர்களிடம் பணம் அறவிடப்பட்டதெனில், அப்பணத் தொகை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2014ஆம் ஆண்டின் ஆரம்பம் முதல் மேற்படி சாதனங்களின் பராமரிப்புக்கான பணக் கொடுப்பனவு நிறுத்தப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், அது பராமரிப்புச் சேவை உடன்படிக்கையின் எந்த அத்தியாயத்தின்படி;

(iii) சேவைக் கட்டணக் கொடுப்பனவை நிறுத்துவது தொடர்பில் பேருந்து உரிமையாளர்களது இணக்கப்பாடு பெறப்பட்டதா;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) (i) பொருத்தப்பட்ட GPS சாதனங்கள் இயங்கிக்கொண்டிருந்தனவா;

(ii) 2014ஆம் ஆண்டின் இறுதிப் பகுதியிலிருந்து அனைத்து GPS சாதனங்களும் செயலிழந்துள்ளனவா;

(iii) இதன் காரணமாக பேருந்து உரிமையாளர்களுக்கு தமது பேருந்து பயணிப்பதை GPS சாதனங்கள் மூலம் அவதானிக்க முடியாத நிலை ஏற்பட்டுள்ளதா;

(iv) மேலே அ(i) இன் நோக்கங்கள் அடையப்பட்டுள்ளனவா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House -

(i) the objectives of the GPS Technology Project launched by the National Transport Commission;

(ii) the added services which are expected to be provided to passengers through this service;

(iii) the number of GPS machines installed;

(iv) the amount of public funds utilized for the installation of GPS machines; and

(v) if money was charged for this purpose from the bus owners, the amount of money that was charged?

(b) Will he state -

(i) whether payment of money to maintain these machines has been stopped from the beginning of year 2014;

(ii) if so, the paragraph of the maintenance agreement which is the basis for stopping payment; and

(iii) whether consent of the bus owners was given to stop the service charge?

(c) Will he also state -

(i) whether GPS machines which were installed were functioning;

(ii) whether all GPS machines have not been functioning since the latter part of 2014;

(iii) whether bus owners were unable to track their buses using GPS machines as a result of this situation; and

(iv) whether objectives mentioned in a(i) above have been fulfilled?

(d) If not, why?

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)

(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව වර්ධනය කිරීම උදෙසා ආරක්ෂිත හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සැපයීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ඒ හා බැඳුණු සෙසු අරමුණු පහත පරිදි වේ.

- අදාළ බස් රථ පවතින නිවැරදි ස්ථානය අක්ෂාංශ හා දේශාංශවලට අනුකූලව නිරීක්ෂණය කළ හැකිවීම මඟින්,

  නියමිත නොවන බස් නැවතුම්පලවල නතර කරන්නේද, නියමිත බස් නැවතුම්පලවල නතර කරන්නේද, බස් නැවතුම්වල බොහෝ වේලාවක් රැඳී සිටින්නේද යන්න නිරීක්ෂණය කළ හැකිවීම සහ එලෙස සිදුවන අවස්ථාවලදී අවවාද කිරීම මෙන්ම අවශ්‍ය පියවර ගැනීම.

  අනුමත මාර්ගයේ ධාවනය කරන්නේදැයි විමර්ශනය කිරීම. (Monitoring Route Violation)

- අනාරක්ෂිතව ධාවනය වන බස් රථ නිරීක්ෂණය කිරීම හා අදාළ ඉදිරි පියවර ගැනීම.

- මෙමඟින් අපේක්ෂා කරන්නේ ගමනාන්තය තෙක් මගී ජනතාවට ආරක්ෂාව සැලසීමයි.

- මහජන පැමිණිලි ඒකකයට ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම හා ක්ෂණිකව විසඳීම.
  - ජී.පී.එස්. උපකරණය සමඟ සවි කර ඇති ද්විත්ව සන්නිවේදන පද්ධතිය (Dual Communication System) මඟින් අදාළ බස් රථයට ක්ෂණිකව කථා කොට අදාළ වරදේ ස්වභාවය අනුව වරද නිවැරැදි කර ගැනීමත්, මගීන්ට ක්ෂණිකව විසඳුම් ලබා දීමත් සිදු කරනු ලැබේ.

- ධාවන වාර්තා නිරීක්ෂණය කිරීම මඟින් එක් එක් මාර්ග අනුකූලව බස් රථ ධාවනය විමර්ශනය කළ හැකි බැවින් ධාවන මාර්ග කළමනාකරණය කිරීමට හැකි වීම (එමඟින් නිවැරැදි කාල සටහන් ක්‍රමයක් කාර්යක්ෂම, ඵලදායී ලෙස සකස් කිරීමට පිටිවහලක් වේ.)

- මගීන්ට තොරතුරු සැපයීමට අදාළව දායක වීම (Passenger information desk)
  - දැනට තමාට අවශ්‍ය බස් රථය පිළිබඳ තොරතුරු 1955 අමතා ලබා ගත හැකි අතර, ඉදිරියේදී කෙටි පණිවුඩ සේවාව (SMS) මඟින් සහ ස්මාර්ට් ජංගම දුරකථනයකින් ඇන්ඩ්‍රොයිඩ් මෘදුකාංගයක් (Android App) හරහා අවශ්‍ය තොරතුරු ක්ෂණිකව මඟින් වෙත ලබා දීමට කටයුතු සිදු කරමින් පවතී.

- බස් රථ සම්බන්ධව ධාවන ගැටලු නිරාකරණය සඳහා අතීත දත්ත ඇතුළත් වාර්තා (past reports) උපයෝගී කර ගැනීම.

- සමාජ අවශ්‍යතාවන් මත පදනම් වූ "සිසු සැරිය" පාසල් බස් සේවාව සහ "ගැමි සැරිය" ග්‍රාමීය බස් සේවාව නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න නිරීක්ෂණය කිරීම සහ ඊට අනුකූලව මූල්‍යාධාර ගෙවීම් සිදු කිරීම.

(ii) මෙම ව්‍යාපෘතිය මගින් මගී ජනතාවට සහ බස් හිමිකරුවන්ට ලබා ගත හැකි ප්‍රතිලාභ පහත පරිදි සැකෙවින් දැක්විය හැකිය.

<u>මගී ජනතාව වෙත</u>

මගීන්ට තමන්ට යෑමට අවශ්‍ය බස් රථය කුමන බස් නැවතුමේ තිබෙන්නේද, කොපමණ වේලාවකින් තමා සිටින ස්ථානයට ළඟා වන්නේ ද යන්න ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පාලන මැදිරියේ ස්ථාපිත 1955 ක්ෂණික දුරකථන මාර්ගය ඔස්සේ අමතා දැන ගැනීමේ පහසුකම් පවතින අතර,

ඉදිරියේදී මගී ජනතාවට කෙටි පණිවිඩ සේවාව (SMS) මඟින් සහ ඇන්ඩ්‍රොයිඩ් ඇප් (Android App) පහසුකම් මඟින් තමාට අවශ්‍ය බස් රථය පිළිබඳ විස්තර ක්ෂණිකව ලබා ගත හැකි වනු ඇත. එමඟින්,

- මඟීන්ට තමාගේ කාලය කළමනාකරණය කරගත හැකි වීම.
- මඟීන්ගේ ආරක්ෂාව තහවුරු වීම (ගමනාන්තය තෙක් සුරක්ෂිත බව)
- මඟීන්ට ඉතා හොඳ කාර්යක්ෂම ඵලදායී සේවාවක් ලැබීම සහ සේවාව පිළිබඳව විශ්වසනීයත්වයක් ගොඩ නැඟීම.

<u>බස් හිමිකරු වෙත</u>

- බස් රථය තිබෙන ස්ථානය, ගමන් කරන මාර්ගය, ගමන් කරන වේගය, දිශාව ආදි තොරතුරු ලබා ගත හැකි වීම. (අන්තර්ජාල පහසුකම් සහිත පරිගණකයක් මාර්ගයෙන් හෝ ස්මාර්ට් ජංගම දුරකථනයක් මාර්ගයෙන් මෙම තොරතුරු ලබා ගත හැකිය.) එමඟින්, බස් හිමිකරු වෙත තම බස් රථය නිසි පරිදි අධීක්ෂණය කිරීම පහසු වන අතර, තම සේවක කණ්ඩායම් මනා ලෙස කළමනාකරණය කිරීමට පිටිවහලක් වේ.
- මඟීන් සහ බස් රථ ධාවකයන් බස් රථයට විරුද්ධව අසත්‍ය පැමිණිලි සිදු කර ඇතොත් ඒවා නිරාකරණය කරගත හැකි වීම (අතීත ධාවන වාර්තා උපයෝගී කර ගෙන)
- අනතුරු පාලනය කරගැනීමෙන් බස් රථය ආරක්ෂා කරගත හැකි වීම.
- බස් රථය අධික වේගයෙන් ධාවනය කරන විට නාද වන අනතුරු හැඟවීමේ සංඥා මඟින් බස් රථය වේගය පාලනයකට හුරු වන අතර එමඟින් අනතුරු අවම කර ගත හැකිය. එබැවින් රක්ෂණ ආයතන මඟින් අමතර වාසි ලබාගත හැකි වීම.
- මගී ප්‍රසාදයට ලක් වීම.

(iii) අන්තර් පළාත් පුද්ගලික බස් රථ 2,085ක ප්‍රමාණයක.

(iv) ජාතික ගමනාගමන කොමිෂන් සභාව ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද පිරිවැය මිලියන 61කි.

(v) ඔව්, බස් හිමියන්ගෙන් එම උපකරණ සවි කිරීමට අදාළව අය කරගත් මුදල මිලියන 23කි.

වාර්ෂිකව උපකරණයේ ඇති සිමිපත් නඩත්තුව සඳහා අය කරගත් මුදල මිලියන 3කි.

(ආ) (i) ඔව්.

(ii) නියමාකාරව නඩත්තු සහ සේවා කටයුතු සිදු කිරීම මග හැරීම අදාළ ගිවිසුමේ 12.1.1 යන වගන්තිය ප්‍රකාරව.

(iii) නැත.

අදාළ සේවා ගිවිසුම ජාතික ගමනාගමන කොමිෂන් සභාව හා අදාළ ආයතනය අතර පැවතුණු ගිවිසුමක් හෙයින් බස් හිමිකරුවන්ගේ මැදිහත්වීමක් ඒ සඳහා බලනොපායි.

(ඇ) (i) ඔව්.

(ii) නැත.

2014 වර්ෂයේ මුල් භාගයේදී 600ක පමණ ප්‍රමාණයක් අක්‍රීය පැවතුණු අතර, මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින්නේ 800ක් පමණ

[ගරු අශෝක් අබේසිංහ මහතා]

ප්‍රමාණයකි. සෙසු බස් රථ විවිධ හේතූන් මත උපකරණය අක්‍රිය කරගෙන පවතී. එම අක්‍රිය වූ බස් රථ නැවත යථා තත්ත්වයට ගැනීම සඳහා සුදුසු සේවා සපයන ආයතනයක් තෝරා ගැනීමට පියවර ගෙන ඇත.

(iii) මෙමඟින් ලබාගත හැකි සේවාව පිළිබඳ සියලුම බස් හිමියන් කිහිප විටක් දැනුවත් කළ ද ඉන් ඒ සඳහා යොමු වී දැනට සේවා පහසුකම් ලබා ගෙන ඇත්තේ සීමිත පිරිසකි. එම පිරිස අතරින් තමාගේ බස් රථයේ සවිකර ඇති ජී.පී.එස් උපකරණය අක්‍රිය තත්ත්වයේ පවතී නම් ඊට අදාළ තොරතුරු ඔහුට ලබා ගත නොහැකි ය.

(iv) තරමක් දුරට අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගෙන ඇත.

(ඈ) පැන නොනඟී.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් එතුමාම සඳහන් කරපු ආකාරයට රුපියල් මිලියන 61ක් වියදම් කරලා, බස් හිමියන්ගෙනුත් රුපියල් මිලියන 23ක් එකතු කරගෙන, රුපියල් මිලියන 84ක් යොදවා මේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙනවා. ඒ අනුව බස් 2,085ක පාවිච්චිය සඳහා මේ උපකරණ යොදවා තිබෙනවා. නමුත් එතුමා කියන විධියට එයින් දැනට පාවිච්චි කෙරෙන්නේ 800ක් පමණ ප්‍රමාණයක්. ඒ වාගේම එතුමා කියනවා, සමහර බස් රථවල මෙම උපකරණය බස් හිමියන් විසින්ම අක්‍රිය කරගෙන තිබෙන බව. මේ උපකරණය යොදවා තිබෙන්නේ බස් රථය තිබෙන්නේ කොහේද කියලා සොයා ගන්නයි. එතකොට මෙම උපකරණය අක්‍රිය කරපු බස් රථ හිමියන් සම්බන්ධයෙන් ගත් ක්‍රියා මාර්ගය මොකක්ද? මේ GPS උපකරණය යෙදුවේ බස් රථය තිබෙන තැන සොයාගන්න නම්, එය අක්‍රිය කර තිබෙන බස් රථ තිබෙනවා නම් ඒවාත් හඳුනාගන්න පුළුවන් නේද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(මාණ්පුමිකු අසෝක් අපේසිංහ)
(The Hon. Ashok Abeysinghe)

2011 වර්ෂයේ තමයි මේ ව්‍යාපෘතිය ආරම්භ කරලා තිබෙන්නේ. එය ආරම්භ කරද්දීම එහි යම් යම් දෝෂ තිබෙන බව සොයා ගෙන තිබෙනවා. එම දෝෂ නිවැරැදි කිරීම සඳහා අපි විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. ඒ සඳහා විශේෂ පාලන මැදිරියකුත් දැන් සකස් කරලා තිබෙනවා. මොකද, ඒ වෙලාවේ මේ උපකරණය හඳුන්වා දුන්නාට, එය නැවත අලුත්වැඩියා කිරීමක් ගැන ගිවිසුමේ අන්තර්ගත වෙලා නැහැ. ඒ නිසා මෙය විශාල ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. අපි දැන් ඒ පිළිබඳව අලුතෙන්ම වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා. දැනට බස් රථ 3,222ක් තිබෙනවා. ඒ සඳහා නැවත ටෙන්ඩර් කැඳවා ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කරලා, එම වැඩ සටහන නැවත ආරම්භ කිරීමට බලාපොරොත්තු වනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ සඳහා රජය විසින් දරන ලද රුපියල් මිලියන 61ට අමතරව බස් රථ හිමියන්ගෙන් අය කර ගත් රුපියල් මිලියන 23ක මුදලක් තිබෙනවා. නමුත් ඒවායින් බස් හිමියන්ට ප්‍රතිලාභයක් ලැබිලාත් නැහැ. ඔබතුමා මුලින් දීර්ඝ ලෙස පැහැදිලි කරන ලද බස් මඟින්ට ලැබිය යුතු ප්‍රතිලාභ ලැබිලාත් නැහැ. අඩු තරමේ බස් හිමියන්ගෙන් අයකර ගත් මුදල් නැවත එම බස් හිමියන්ට ගෙවනවාද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(මාණ්පුමිකු අසෝක් අපේසිංහ)
(The Hon. Ashok Abeysinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ව්‍යාපෘතියේ යම් කිසි අඩු පාඩු තිබෙන බව මා මීට පෙර සඳහන් කළා. රජය මේ සඳහා රුපියල් මිලියන 61ක් වියදම් කර තිබුණා. සාමාන්‍යයෙන් එක GPS උපකරණයකට රුපියල් 35,000ක් පමණ මුදලක් වැය වෙනවා. නමුත් බස් හිමියන්ගෙන් අය කරලා තිබෙන්නේ රුපියල් 10,000ක වාගේ මුදලක්. ඒක ඔවුන්ගෙන් සපයාගෙන තිබෙනවා.

බස් හිමියන්ගෙන් සපයාගත් මුදල් වෙනම තිබෙනවා. ඒ මුදල තමයි රුපියල් මිලියන 23ක් ලැබිලා තිබෙන්නේ. කෙසේ වෙතත් මම මුලින් කිව්වා වාගේ මේකේ අඩු පාඩු තිබෙනවා. ඒ, අඩු පාඩු නැවත සකස් කරන්නට ඕනෑ. සමහර ගිවිසුම් සම්පූර්ණයෙන්ම වැරදියි. මොකද, අවශ්‍ය විධියට ඒවා ගිවිසුම්ගත වෙලා නැහැ. එම නිසා අපි නැවත අලුතෙන්ම ක්‍රමවේදයක් හදලා, ඒක ක්‍රියාත්මක කරන්නට පාලක මැදිරියකුත් සකස් කරගෙන යනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ව්‍යාපෘතිය නැවත අලුතෙන් ආරම්භ කරන්නට බලාපොරොත්තු වෙනවා කියන අදහස තමයි ඔබතුමාගේ උත්තරයේ තිබෙන්නේ. ඒක කරන්න බලාපොරොත්තු වෙන්නේ කවදාද, ඒ සඳහා තිබෙන සැලැස්ම මොකක්ද? අඩු තරමින් මේ ක්‍රියාවලිය නැවත ආරම්භ කරනවා නම් ඒ ආරම්භ කිරීමට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(මාණ්පුමිකු අසෝක් අපේසිංහ)
(The Hon. Ashok Abeysinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මුලින්ම කිව්වා වාගේ දැනටමත් අපි අලුතෙන් පාලක මැදිරිය හදලා තිබෙනවා. ඒ වාගේම දැනට බස් රථ 3,222ක් තිබෙනවා. නමුත් දැනට ධාවනය වෙන්නේ 800ක් පමණයි. එම නිසා නියම විධියට ටෙන්ඩර් පටිපාටියක් කැඳවීමට බලාපොරොත්තු වෙනවා. මුලින්ම නියමු ව්‍යාපෘතියක් විධියට මේකට ආයතන හතක් ආවා. ඒ ආයතන හතෙන් ආයතන තුනකින් තමයි අරගෙන තිබෙන්නේ. ඉන් පසුව මේවා අලුත් වැඩියා කරන්නට කථා කළාම ඒ අය රුපියල් මිලියන 8ක් ඉල්ලුවා. අපි ඒකට කැමති වුණේ නැහැ. එම නිසා විශාල වැඩ කොටසක් කරන්නට තිබෙනවා. මේ වසර තුළ නැවත ඒ සියලුම බස් රථවල අවශ්‍යතා සපුරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 11-608/'16 - (1), ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පැරණි දේශීය වී වගාව: විස්තර
உள்நாட்டுப் பண்டைய நெல்லினச் செய்கை : விபரம்
INDIGENOUS VARIETIES OF PADDY CULTIVATION: DETAILS

128/'15

12. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) අතීතයේ සිට පැවත එන දේශීය වී වර්ග වගා කිරීම සඳහා කෘෂි රසායන ද්‍රව්‍ය අවශ්‍ය නොවන බවත්;

(ii) දේශීය පැරණි වී ප්‍රභේද වගා කිරීමේදී අවම ජල ප්‍රමාණයක් අවශ්‍ය වන අතර පාරම්පරික ක්‍රම භාවිතයෙන් පරිසරයට හා මිනිසාට සිදුවන හානිය අවම බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට හඳුනාගෙන ඇති, ශ්‍රී ලංකාවේ භාවිතා කළ පැරණි වී වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම වී වර්ගයන්ගේ නම් කවරේද;

(iii) දැනට වගා කරන පැරණි වී වර්ග කවරේද;

(iv) අනෙකුත් පැරණි වී වර්ග වගා නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2014 වනවිට දේශීය පැරණි වී වර්ග, බීජ වී ලෙස යොදා ගෙන වගා කරනු ලබන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාව පුරා එම බීජ වී ව්‍යාප්ත කිරීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

කමත්තොழில් அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தொன்றுதொட்டு இருந்துவருகின்ற உள்நாட்டு நெல்லினங்களைப் பயிரிடுவதற்காக விவசாய இரசாயனப் பொருட்கள் அவசியமாகாது என்பதையும்;

(ii) உள்நாட்டுப் பண்டைய நெல்லினங்களைப் பயிரிடுகையில் ஆகக்குறைந்தளவு நீர் அவசியமாவதோடு பாரம்பரிய வழிமுறைகளைக் கையாள்வதால் சுற்றாடலுக்கும் மனிதனுக்கும் ஏற்படுகின்ற சேதம் குறைவானதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இன்றளவில் இனங்காணப்பட்டுள்ள இலங்கையில் பயன்படுத்தப்பட்ட பண்டைய நெல்லினங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி நெல்லினங்களின் பெயர்கள் யாவை;

(iii) தற்போது பயிரிடப்படுகின்ற பண்டைய நெல்லினங்கள் யாவை;

(iv) ஏனைய பண்டைய நெல்லினங்கள் பயிரிடப் படாமைக்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) 2014ஆம் ஆண்டளவில் உள்நாட்டுப் பண்டைய நெல்லினங்களை விதை நெல்லாகப் பயன்படுத்திப் பயிரிடப்படுகின்ற வயல்களின் ஏக்கரளவு யாது;

(ii) இலங்கை பூராவும் அத்தகைய விதைநெல்லைப் பரவச் செய்வதற்கு நடவடிக்கை மேற்கொள்ளப் பட்டுள்ளதா;

(iii) ஆமெனில் அந்நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Is he aware that-

(i) agro-chemicals are not needed for cultivating indigenous varieties of paddy that have been in existence since ancient times; and

(ii) cultivating such old indigenous varieties of paddy needs a minimal amount of water and the use of conventional methods cause minimum damage to man and nature?

(b) Will he inform this House -

(i) the number of old varieties of paddy identified to have been used in Sri Lanka by now;

(ii) the names of such varieties of paddy;

(iii) the names of old varieties of paddy cultivated at present; and

(iv) the reasons for not cultivating the other old varieties of paddy?

(c) Will he also inform this House-

(i) the acres of paddy lands that are cultivated with old indigenous varieties of paddy as seed paddy by 2014;

(ii) whether steps have been taken to promote these varieties as seed paddy throughout Sri Lanka; and

(iii) if so, what those steps are?

(d) If not why?

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture) **

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) සහ (ii) ඔව්.

(ආ) (i) 603 පමණ.

(ii) ඇමුණුමෙහි සඳහන්ව ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) දැනට වගා කරන පැරණි වී වර්ග 27කි. (සාමාන්‍ය අස්වැන්න අක්කර බුසල් 50-60කි.) ඒවා නම්,

කළු හීනටි, සුදු හීනටි, මඩතවාලු, පච්චපෙරුමාල්, සුවඳැල්, පොක්කාලි, කුරුලුතුඩ, සූදුරු සම්බා, සුවඳ සම්බා, රත් සුවඳැල්, බටපොල ඇල්, රතු හීනටි, ගොඩ හීනටි, බෙහෙත් හීනටි, දහනල, දේවැද්දිරි, දික්වී, ගෝනබරු, හේරත් බණ්ඩා, හොඬරවාල, කහටවී, කලු බාල වී, කට්ටකුමන්ජල්, මසුරන්, රත්තැල්, සුලායි, වන්නි දහනල.

(iv) ඔව්.

* අස්වැන්න අඩුබව (අක්කර බුසල් 30-40 ක් පමණ)
* ශාකය ඇද වැටීමට පාත්‍රවීම
* අස්වනු ලැබීමට වැඩි කාලයක් ගතවීම (මාස 5, 1/2 පමණ)
* පාරිභෝගික රුචිය අඩුවීම (ඇලෙන සුළුභාවය හා නිවුඩු සහිත වීම)
* රෝග හා පළිබෝධවලට පාත්‍රවීම.

(ඇ) (i) හෙක්ටෙයාර් 6862ක් පමණ වගා කර ඇත.

(ii) ඔව්.

(iii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් තත්ත්වයෙන් උසස් බීජ නිෂ්පාදනය කරන අතර බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයෙන් එම බීජ ගුණනය කර ගොවීන්ට ලබා දීම.

දැනට සකස් කරමින් යන ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියේ පවා බීජ නිෂ්පාදනය සඳහා වැඩි අවධානයක් යොමු කර තිබීම.

(ඈ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළා, දැනට ලංකාවේ පැරණි වී වර්ග 27ක් හෙක්ටෙයාර් හයදහසකට වැඩි ප්‍රදේශයක වගා කරනවායි කියලා. ඇතැම් පැරණි සම්ප්‍රදායික වී වර්ග වගා නොකිරීමට හේතු වශයෙන් කෘමීන් ප්‍රශ්නය සහ ගස් ඇද වැටීම ඇතුළු හේතු ගණනාවක් සඳහන් කළා. එතකොට පැරණි සම්ප්‍රදායික වී වර්ගවලින් එක කොටසක් වගා නොකරන්නේ ඒ ගැටලු නිසයි. අනෙක් කොටස වගා කරන්නේ ඒ ගැටලු නැති නිසයි. එතකොට ඒ ගැටලු නැති වී වර්ගවල ඒ ජානමය උසස් භාවය අනෙකුත් වී වර්ගවලට මුහුන් කර එහි වටිනාකම, වාසිය ශ්‍රී ලංකාවේ ගොවීන්ට ලබා දෙන්න අමාත්‍යාංශයට දිගුකාලීන දැක්මක් සහ වැඩ පිළිවෙළක් තිබෙනවා ද?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට අපි ඒ සම්බන්ධව ලේකම්තුමා සමඟත් සාකච්ඡා කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් ඉදිරි කාලය තුළදී ක්‍රියාත්මක කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමා සඳහන් කරපු වී ප්‍රභේද අතර කියැවුණේ නැහැ, කෘත යුගයේ ලොව තිබී ඉන් පස්සේ නැති වෙලා ගිහිල්ලා, වර්තමානය වන විට නැවත වතාවක් කථා බහට ලක් වෙලා තිබෙන ස්වයංජාත ඇල් කියන සහල් වර්ගය පිළිබඳව.

"ස්වයංජාත ඇල්" පිළිබඳව වර්තමානයේ විශාල කථිකාවක් ඇති වෙලා තිබෙනවා. ස්වයංජාත ඇල් ගොඩ වී වර්ගයක් ලෙස වගා කරන්න පුළුවන් ප්‍රවණතාවක් ඇති වෙලා තිබෙනවා. මෙම ස්වයංජාත ඇල් වී වර්ගය, වී පඳුරු කපන්න කපන්න එම වී පඳුරෙන් ආපහු සැරයක් පඳුරු දාලා වැවෙනවා. කෘමි හානි අඩුයි. ලංකාවේ ඕනෑම දේශගුණික තත්ත්වයකට ඔරොත්තු දෙනවා. ස්වයංජාත ඇල් වී වර්ගය පිළිබඳව අමාත්‍යාංශය අවධානය යොමු කරන්නේ නැත්තේ ඇයි? වහරක අභයරත්නාලංකාර ස්වාමීන්වහන්සේ පවා "හෙළ බොදු පියුම" සඟරාව හරහාත් මේ පිළිබඳව විශාල වශයෙන් කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. මෙම වී වර්ගය ප්‍රචලිත කරන්න අමාත්‍යාංශය අවධානය යොමු කරන්නේ නැත්තේ ඇයි?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලැබී තිබෙන පිළිතුර අනුව එම වී වර්ගය පිළිබඳව විස්තරාත්මක පිළිතුරක් මට මේ අවස්ථාවේ ලබා දෙන්න බැහැ. නමුත්, පසුව ඒ පිළිබඳව ගරු මන්ත්‍රීතුමා දැනුවත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ නව වී ප්‍රභේද හඳුන්වා දීමේදී බොහෝ විට එක් වී ප්‍රභේදයක්, නැත්නම් ප්‍රභේද දෙකක් තමයි බොහෝ කාලයකට පසුව එන්නේ. අපි දන්නවා, හම්බන්තොට වී පර්යේෂණායතනයක් තිබෙනවා, බතලගොඩ වී පර්යේෂණායතනයක් තිබෙනවා. ඒ වාගේම මහඉලුක්පල්ලම වී පර්යේෂණායතනයක් තිබෙනවා. බතලගොඩත්, මහඉලුක්පල්ලමත්, හම්බන්තොටත් හැරුණු කොට වී සම්බන්ධයෙන් පර්යේෂණ කරන තවත් ආයතන ගණනාවක් තිබෙනවා. හැබැයි, පර්යේෂණ ක්ෂේත්‍රයට මන්දගාමී

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ස්වභාවයක් ඇති වෙලා තිබෙන්නේ ඇයි? පර්යේෂණ ක්ෂේත්‍රයට වැඩි බරක් තැබිය යුතු අවස්ථාවක, නව සොයාගැනීම් සහ පර්යේෂණ වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කළ යුතු අවස්ථාවක එය කුණු මුල්ලේ තියලා තිබෙන්නේ ඇයි?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹாரை)
(The Hon. Wasantha Aluvihare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා කියන විධියට එවැනි ගැටලු අමාත්‍යාංශය තුළ පැවතුණා. නමුත් අපි දැන් ඒ සම්බන්ධයෙන් වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබෙනවා. විශේෂයෙන් බතලගොඩ වී පර්යේෂණ මධ්‍යස්ථානය තුළ අලුත් වී ප්‍රභේද සම්බන්ධව පසු ගිය කාලය තුළදී ක්‍රියාත්මක කළ වැඩසටහන් සම්බන්ධ සම්පූර්ණ වාර්තාවක් අපි ඉල්ලා තිබෙනවා. ඊට පස්සේ තමයි ඔබතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 13 -465/'16- ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
மாண்புமிகு நிரோஷன் பெரேரா
The Hon. Niroshan Perera

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 14 -491/'16- (1), ගරු කනක හේරත් මහතා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

අරුණ දේශප්‍රිය මහගමගේ මහතා පොලිසියට කළ පැමිණිල්ල : විභාගය
திரு. அருண தேசப்பிரிய மஹகமகே பொலிஸில் செய்த முறைப்பாடு : விசாரணை
COMPLAINT LODGED BY MR. ARUNA DESHAPRIYA MAHAGAMAGE: INVESTIGATION

578/'16

15.ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015.03.03 දින වැලිගම, උඩුපිල පදිංචි අරුණ දේශප්‍රිය මහගමගේ මහතා විසින් අංක CIB/2-138/37 යටතේ වැලිගම පොලිසියේ පැමිණිල්ලක් කර තිබේද;

(ii) එම පැමිණිල්ල විභාග කර තිබේද;

(iii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016.01.29 දින උක්ත පැමිණිල්ලට අදාළව, එම්. ඒ. දේශප්‍රිය මහතා විසින් අංක IGP/PAC/O/53/16 යටතේ පොලිස් මූලස්ථානයේ පැමිණිල්ලක්, කර තිබේද;

(ii) එසේ නම්, පොලිස් මූලස්ථානය විසින් එම පැමිණිල්ලට අදාළව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එය විසඳා ඇති ආකාරය කවරේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015.03.03ஆம் திகதியன்று வெலிகம, உடுபில வில் வசிக்கும் திரு. அருண தேசப்பிரிய மஹகமகே CIB/2-138/37ஆம் இலக்கத்தின் கீழ் வெலிகம பொலிஸ் நிலையத்தில் முறைப்பாடு செய்துள்ளாரா என்பதையும்;

(ii) மேற்படி முறைப்பாடு விசாரணை செய்யப் பட்டுள்ளதா என்பதையும்;

(iii) இன்றேல், ஏனென்பதையும்; அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ)(i) 2016.01.29ஆம் திகதியன்று மேற்படி முறைப் பாடு தொடர்பாக, திரு. எம்.ஏ. தேசப்பிரிய இல. IGP/PAC/O/53/16 இன் கீழ் பொலிஸ் தலைமை யகத்தில் முறைப்பாடு செய்துள்ளாரா என்ப தையும்;

(ii) ஆமெனில், பொலிஸ் தலைமையகம் மேற்படி முறைப்பாடு தொடர்பாக விசாரணை மேற் கொண்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அது எவ்வாறு தீர்த்து வைக்கப் பட்டது என்பதையும்;

(iv) இன்றேல், ஏனென்பதையும்; அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

asked the Minister of Law and Order and Southern Development:

(a) Will he inform this House -

(i) whether a complaint has been lodged with Weligama Police under CIB/2 - 138/37 by Mr. Aruna Deshapriya Mahagamage residing at Udupila, Weligama on 03.03.2015;

(ii) whether this complaint has been investigated into; and

(iii) if it has not been, the reason?

(b) Will he also inform this House -

(i) whether Mr. M. A. Deshapriya has lodged a complaint with the Police Headquarters under IGP/PAC/O/53/16 on 29.01.2016 in respect of the above complaint;

(ii) if so, whether the Police Headquarters has conducted an investigation regarding that complaint;

(iii) if so, as to how it was resolved; and

(iv) If not , why?

(c) If not, why?

ගරු සාගල රත්නායක මහතා (නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சாகல ரத்நாயக்க - சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sagala Ratnayaka - Minister of Law and Order and Southern Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) පැන නොනඟී.

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) දෙපාර්ශ්වය සමඨ මණ්ඩලයේදී ද සමඨ නොවීම හේතු කොටගෙන 2016.04.29 දින මාතර මහෙස්ත්‍රාත් උසාවි නඩු අංක 52357/16 යටතේ නඩු පවරා ඇත.

(iv) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න අහනවාද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට අතුරු ප්‍රශ්න නැහැ. මෙහි ගැටලුව බලලා ගරු ඇමතිතුමාත් සමඟ සාකච්ඡා කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 2-464/'16-(1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්තිත හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ඒ.එච්.එම්. හනීෆා මහතාට සහ යූ.එම්.ඒ.එල්. සලාහුදීන් මහතාට අයත් ඉඩම් : වන්දි
திரு. ஏ.எச்.எம். ஹனிபா மற்றும் திரு. யூ.எம்.ஏ.எல். சலாஹுதீனின் காணி :இழப்பீடு
LANDS BELONGING TO MR. A.H.M. HANEEFA AND MR. U.M.A.L. SALAHUDEEN: COMPENSATION

555/'16

6. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Seyed Ali Zahir Moulana)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල, මහ වීදිය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ගල්හින්න, නුවර පාර, අංක 262/2 දරන ස්ථානයේ පදිංචි ඒ. එච්. එම්. හනීෆා සහ යූ. එම්. ඒ. එල්. සලාහුදීන් යන මහත්වරුන්ට අයත්, මු.පි.ක. 2285 හි කැබලි අංක 101 දරන පෞද්ගලික ඉඩම, අංක 1306/37 හා 2003.09.19 දිනැති රජයේ ගැසට් නිවේදනය මඟින් අත්පත් කර ගන්නා ලද බවත්;

(ii) වසර 10කට පෙර පවරාගනු ලැබූ එම ඉඩම සහ කඩා ඉවත්කරන ලද ව්‍යාපාරික ගොඩනැගිල්ල වෙනුවෙන් වන්දි මුදල් මේ දක්වා ප්‍රදානය කර නොමැති බවත්; එතුමා දන්නෙහිද?

(ආ) එම ඉඩම සහ කඩා ඉවත් කරන ලද ව්‍යාපාරික ගොඩනැඟිල්ල වෙනුවෙන් අදාළ වන්දි මුදල නොපමාව ලබා දීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

උයර්කල්වි මත්‍රුම් නෙදුංසාලෙකළ් අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) කුරුනාගල් ප්‍රධාන වීදිය විස්තරික්කුම් කරුත්තිට්ටම් නටෙමුරෙප්පටුත්තප්පට්ටපෝදු කල්හින්න, කණ්ඩි වීදි ඉල.262/2ඉල් වසික්කුම් ඒ.එච්.එම්. හනීපා මත්‍රුම් යූ.එම්.ඒ.එල්. සලාහූදීන් ආකියෝරුක්කුච් සොන්තමාන මු.පී.ක. 2285 ඉල් 101ආම් ඉලක්කත් තුණ්ඩුත් තනියාර්ක් කාණි 1306/37ආම් ඉලක්ක 2003.09.19ආම් තිකතිය අරසාංක වර්ත්තමානප් පත්තිරිකෙ අරිවිත්තලින්මූලම් සුවීකරික්කප් පට්ටුළ්ළතු එන්පතෙයුම්;

(ii) 10 වරුටංකළුක්කු මුන්නර් සුවීකරික්කප්පට්ට මේර්පටි කාණික්කුම් උටෙත්තු අකර්රප්පට්ට වියාපාරක් කට්ටිටත්තිර්කුමාන ඉළුප්පීට්ටුත් තොකෙ ඉතුවරෙ සෙලුත්තප්පටවිල්ලෙ එන්පතෙයුම්;

අවර් අරිවාරා?

(ආ) මේර්පටි කාණි මත්‍රුම් උටෙත්තු අකර්රප්පට්ට කට්ටිටත්තිර්කුරිය ඉළුප්පීට්ටුත් තොකෙයෙ උටනටියාක වළුංක නටවටික්කෙ එටුප්පාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Higher Education and Highways:

(a) Is he aware that -

(i) the private land bearing plot No. 101 of මූ.පි.ක. 2285 belonging to Mr. A.H.M.Haneefa and Mr. U.M.A.L. Salahudeen residing at No. 262/2, Kandy Road, Galhinna was acquired through the Gazette Notification No. 1306/37 dated 19.09.2003 with the implementation of the project to expand the main street of Kurunegala; and

(ii) compensation has not hitherto been paid on behalf of the aforesaid land transferred 10 years ago and the aforesaid business building which was demolished and removed?

(b) Will action be taken to provide compensation without any delay for the aforesaid land and the building which was demolished and removed?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල
The Hon. Lakshman Kiriella

Sir, I **table*** the Answer to that Question.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) This land has been acquired.

(ii) Even though the notice under Section 38(A) had been issued to acquire the land in year 2003 and year 2009, payment of compensation has been delayed due to various reasons.

However, the owner of the land was informed on 01.06.2016 that the estimated value entitled to him (Rs. 3,580,500.00) and the owner of the land has appended to the Compensation Review Board saying that amount is not sufficient.

(b) The RDA will take further actions to pay the relevant compensation when the decision of the Compensation Review Board is received.

(c) Not relevant.

අනුරාධපුර මහ නගර සභාවේ සතිපොළ භූමිය : නවීකරණ ව්‍යාපෘතිය

அநுராதபுரம் மாநகர சபையின் வாராந்த சந்தைப் பிரதேசம் :நவீனமயப்படுத்தும் கருத்திட்டம்

WEEKLY FAIR PREMISES OF ANURADHAPURA MUNICIPAL COUNCIL: MODERNIZATION PROJECT

570/'16

10. ගරු එස්. සී. මුතුකුමාරණ මහතා (ගරු ශෙහාන් සේමසිංහ මහතා වෙනුවට)
(මාණ්පුමිකු එස්.සී. මුත්තුකුමාරණ - මාණ්පුමිකු செஹான் சேமசிங்க சார்பாக)
(The Hon. S.C. Mutukumarana on behalf of the Hon. Shehan Semasinghe)

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) පළමු අදියර සඳහා රුපියල් මිලියන 15ක් අනුමත වී ඇති අනුරාධපුර මහ නගර සභාවේ, මාළු වෙළඳසැල පෙදෙස ඇතුළුව සතිපොළ භූමිය නව ඉදිකිරීම් සහිතව නවීකරණය කිරීමේ හා අපිරිසිදු ජලය ඉවත් කිරීමේ ව්‍යාපෘතියෙහි;

(i) පළමු අදියර අවසන් කර, සැලසුම් කළ පරිදි දෙසැම්බර් 31ට පෙර ජනතා අයිතියට පත් කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) දෙවන අදියර සඳහා මුදල් වෙන්කර තිබේද;

(iv) එසේ නම්, එම අදියර ආරම්භ කරන දිනය කවරේද;

(v) දෙවන අදියර අවසන්කර ජනතා අයිතියට පත්කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

මාකාණ සපෙකළ් මත්‍රුම් උළ්ළූරාට්සි අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) මුතර් කට්ටත්තුක්කාක රූපා 15 මිල්ලියන් අංගීකරික්කප්පට්ටුළ්ළ අනුරාතපුරම් මානකර සපෙයින්, මීන් සන්තෙප් පිරතේසම් උළ්ළිට්ට වාරාන්ත සන්තෙප් පිරතේසත්තෙප් පුතිය කට්ටුමානංකළුටන් කූටියතාක නවීනමයප්පටුත්තුම් මර්රුම් කළිවු නීරෙ අකර්රුම් කරුත්තිට්ටත්තින්,

[ගරු එස්. බී. මුතුකුමාරණ මහතා]

(i) முதற் கட்டத்தை பூர்த்தி செய்து, திட்டமிடப் பட்டுள்ளதன் பிரகாரம் டிசம்பர் 31ஆந் திகதிக்கு முன்னர் மக்களுக்குக் கையளிப்பாரா;

(ii) ஆமெனில், அத்திகதி யாது;

(iii) இரண்டாவது கட்டத்துக்காக நிதி ஒதுக்கப்பட்டுள்ளதா;

(iv) ஆமெனில், குறித்த கட்டம் ஆரம்பிக்கப்படும் திகதி யாது;

(v) இரண்டாவது கட்டத்தைப் பூர்த்தி செய்து, மக்களுக்குக் கையளிப்பதற்குத் திட்டமிடப் பட்டுள்ள திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils and Local Government:

(a) Will he inform this House in relation to the project that has been proposed for modernizing Anurdhapura weekly fair including the fish market area of the Anuradhapura Municipal Council and for removing the contaminated water in those areas for which a provision of Rs.15 million has been approved for implementing Phase I -

(i) whether Phase I will be completed and be commissioned before 31st December as planned;

(ii) if so, the date on which it will be commissioned;

(iii) whether funds have been allocated for Phase II of this project;

(iv) if so, of the date on which activities of Phase II will be commenced; and

(v) the date on which Phase II has been planned to be commissioned after completion of that phase?

(b) If not, why?

ගරු පියංකර ජයරත්න මහතා (පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - State Minister of Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පළමු අදියරට අදාළව කඩ කාමර 16ක් ඇස්තමේන්තු ගත කර ඇත. එයින් කඩ කාමර 08ක වැඩ කොටස් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් අවසන් කර අනුරාධපුර මහ නගර සභාව වෙත 2015.12.31 දින භාර දී ඇති අතර, එම කඩ කාමර මාළු වෙළෙඳ සැල් ලෙස සකස් කර නොමැති නිසාත් 32නෙක් වූ වෙළෙඳ සැල් හිමියන් අතර කඩ කාමර 8 බෙදා දීමේදී ඇති වන ගැටලු හේතුවෙනුත් දැනට කිසිවෙකුට ඒවා බෙදා නොදී වසා දමා ඇත.

(ii) කිව නොහැක.

(iii) ii අදියර සඳහා මුදල් වෙන් කර නොමැත.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ස්ථාවර නියෝග 23(2) යටතේ ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

පුනරින් ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය
பூநகரி மக்களின் குடிநீர்ப் பிரச்சினை
DRINKING WATER PROBLEM OF POONERYN RESIDENTS

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சர் கௌரவ றவுப் ஹக்கீம் அவர்களிடம் இந்த வினாவைக் கேட்க அனுமதித்ததற்கு நன்றி!

கிளிநொச்சி மாவட்டத்தின் பூநகரிப் பிரதேசமானது 448.75 சதுரக் கிலோமீற்றர் பரப்பளவைக் கொண்டதாகும். இங்குள்ள 19 கிராம சேவையாளர் பிரிவுகளில் மொத்தம் 7,310 குடும்பங்களைச் சேர்ந்த 25,742 பேர் வாழ்ந்து வருகின்றனர். இவர்களின் பிரதான தொழில்களாக கடற்றொழிலும் விவசாயமும் கால்நடை வளர்ப்பும் காணப்படுகின்றன. கடந்த காலங்களில் ஏற்பட்ட அசாதாரண சூழ்நிலை காரணமாக இடம்பெயர்ந்து நிர்க்கதியாகிய இம்மக்கள் யாவரும் மீள்குடியமர்ந்துள்ளபோதிலும் பல அத்தியாவசியத் தேவைகள் போதியளவு பூர்த்தி செய்யப்படாத நிலையில் வசித்து வருகின்றார்கள். இம்மக்களின் அத்தியாவசியத் தேவைகளில் ஒன்று குடிநீர்ப் பிரச்சினையாகும். இப்பிரதேசத்துக்குள் முற்றுமுழுவதுமாக நீர்விநியோகம் செய்யக்கூடிய நீர்நிலைகள் காணப்படாமை, தற்போதிருக்கும் கிணறுகளிலும் குளங்களிலும் கோடை காலங்களில் நீர் எடுக்க முடியாத நிலைமை, தொடர்ந்தும் நீர் எடுப்பதால் நீரின் தன்மை மாறுபடல் போன்ற காரணங்களால் இக்குடிநீர்ப் பிரச்சினையைப் போதியளவு தீர்க்க முடியாதுள்ளது.

இங்குள்ள 19 கிராம சேவையாளர் பிரிவுகளில் 9 கிராம சேவையாளர் பிரிவுகளுக்கு மாத்திரமே பூநரிப் பிரதேச சபையினால் நீர் விநியோகம் நடைபெற்று வருவதாகத் தெரிய வருகின்றது. இந்த நீர் விநியோகமானது பூநகரிப் பிரதேச சபைக்குரிய 4 'டிராக்டர் பவுசர்'களுடன் குறைந்தளவு ஆளணியைக் கொண்டே மேற்கொள்ளப்பட்டு வருவதாகவும் அதனால் அங்கு வசிக்கும் மக்களின் குடிநீர்த் தேவையைப் போதியளவு பூர்த்தி செய்ய முடியாமலிருப்பதாகவும் கூறப்படுகிறது. அதேவேளை, ஏனைய 10 கிராம சேவையாளர் பிரிவுகளில் வசிக்கும் மக்களுக்குத் தேவைப்படும் குடிநீர் அங்கு

போதியளவு இல்லை எனவும் அறிய வருகின்றது. நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையினால் இப்பிரதேச சபைக்குத் தற்காலிகமாக வழங்கப்பட்டிருந்த 6,000 லீற்றர் கொள்ளளவு டைய 'பவுசர்' தற்போது பழுதடைந்த நிலையில் காணப்படு வதாகக் கூறப்படுகின்றது. மேற்படி 9 கிராம சேவையாளர் பிரிவுகளுக்குத் தற்போது வழங்கப்பட்டு வரும் நீர் தொடர்பான விபரப் பட்டியல் என்னிடம் உள்ளது.

தற்போது நீர் வழங்கப்படும் 09 கிராம சேவையாளர் பிரிவுகள் விபரம்

கி.சே.பிரிவு	இடம்	1000 L கொள்ளளவு
KN/61	கொல்லன்குறிச்சி	02 தாங்கிகள்
KN/62	செட்டியாகுறிச்சி கறுக்காய்த்தீவு	04 தாங்கிகள் 07 தாங்கிகள்
KN/63	ஞானிமடம்	05 தாங்கிகள்
KN/65	பள்ளிக்குடா	01 தாங்கி
KN/66	மட்டுவில்நாடு மேடு	03 தாங்கிகள்
KN/67	பரமன்கிராய்	02 தாங்கிகள்
KN/74	நாச்சிக்குடா ஜெயபுரம் ஜெயபுரம் சந்தை 19 ஆம் கட்டை	03 தாங்கிகள் 03 தாங்கிகள் 03 தாங்கிகள் 02 தாங்கிகள்
KN/76	பொன்னாவெளி பாலாவி	18 தாங்கிகள் 01 தாங்கி
KN/72	பல்லவராஜன்கட்டு ஜெயபுரம் கிழக்கு	01 தாங்கி 02 தாங்கிகள்

இந்நிலையில் பூநகரிப் பகுதிக்கு நிரந்தரமாக நீர் வழங்கக் கூடியதான இரு திட்டங்கள் இனங்காணப்பட்டுள்ளன. முதலாவது, பூநகரிக்குள அபிவிருத்தித் திட்டத்தின் மூலமாக நீரைப் பெற்றுக்கொள்வது. இதனூடாக நிலத்தடி நீரை நன்னீராக மாற்றுவதன் மூலம் குடிநீரையும் கால்நடை அபிவிருத்தி மற்றும் விவசாயம் செய்வதற்கான நீரையும் வழங்கக்கூடியதாக இருக்கும். இது நீண்ட காலத்திட்டமாகும். இரண்டாவது, இரணைமடு - யாழ்ப்பாண குடிநீர் மற்றும் சுகாதாரத் திட்டத்தின் அடிப்படையில் குழாய்நீர் மூலம் இப்பகுதி மக்களின் குடிநீர்ப் பிரச்சினைக்கு ஓரளவு தீர்வு காண முடியும். இது இடைக்காலத் திட்டமாகும். எனவே, இப்பகுதி மக்களின் கோரிக்கைகளுக்கு அமைவாக நான் இவ்விரு திட்டங்களையும் வலியுறுத்தி வருகின்றேன். இத்திட்டங்கள் செயற்படுத்தப்படும்வரை இப்பகுதி மக்களின் குடிநீர்த் தேவையை முன்னிறுத்தித் தற்காலிக, உடனடி ஏற்பாடுகள் அவசியமாகின்றன.

மேற்படி கிராமங்களுக்குப் போதியளவு குடிநீரை வழங்க 12,500 லீற்றர் கொள்ளளவுடைய 'லொறி பவுசர்'கள் இரண்டையும் 3,500 லீற்றர் கொள்ளளவு கொண்ட 'டிராக்டர் பவுசர்'கள் இரண்டையும் பூநகரிப் பிரதேச சபைக்கு வழங்க நடவடிக்கை எடுக்க முடியுமா? மேலும் 1,000 லீற்றர் கொள்ளளவு கொண்ட 10 தண்ணீர் தாங்கிகள் வழங்குவதற்கு நடவடிக்கை எடுக்க முடியுமா?

கடந்த 6 மாதங்களில் நீர் விநியோகத்துக்கான எரிபொருள் செலவினமாக மாத்திரம் ஏறக்குறைய 4 இலட்சம் ரூபாய் பூநகரிப் பிரதேச சபையால் செலவு செய்யப்பட்டுள்ளதாகத் தெரிய வருகின்றது. இப்பகுதியானது நீண்ட கால யுத்தம் காரணமாகப் பாதிக்கப்பட்டு மக்கள் இடம்பெயர்ந்து முற்றுமுழுதாக மீள்குடியேற்றம் செய்யப்பட்ட பகுதி என்பதால் மேற்படி பிரதேச சபைக்கான வருமானங்கள் போதியளவில் இல்லாத நிலைமை காணப்படுகின்றது.

பூநகரிப் பிரதேச சபையினால் செலவிடப்பட்டுள்ள மேற்படி எரிபொருள் செலவுகளைப் பிரதேச சபைக்கு மீள்செலுத் துவதற்கான சாத்தியங்கள் ஏதும் உள்ளனவா? எதிர்வரும் காலங்களில் தற்காலிக ஏற்பாடாகத் தொடர்ந்தும் தடையின்றி இதற்கு ஏதும் நிதியுதவிகள் மேற்கொள்ள நடவடிக்கைகள் எடுக்க முடியுமா?

அத்துடன் முழங்காவில், நாச்சிக்குடா, கரியாலை, நாகபடுவான் ஆகிய கிராம மக்களுக்குக் குடிநீர் வழங்கும் நோக்கத்தில் முழங்காவில் நிலத்தடி நீர்த் திட்டமும் ஜெயபுரம் மற்றும் வலைப்பாடு ஆகிய கிராம மக்களுக்கு குடிநீர் வழங்கும் நோக்கில் கிராமிய நீர் வழங்கல் மற்றும் சுகாதாரத் திட்டமும் கடந்த காலத்தில் திட்டமிடப்பட்டு முன்னெடுக்கப்பட்டிருந்தன என்பதைத் தாங்கள் அறிவீர்கள்.

முழங்காவில் நிலத்தடிநீர்த் திட்டம் எப்போது நிறை வடையும் என்பதைக் கூறமுடியுமா?

ஜெயபுரம், வலைப்பாடு கிராமிய நீர்வழங்கல் மற்றும் சுகாதாரத் திட்டம் எப்போது ஆரம்பிக்கப்படும் என்பது பற்றியும் கூறமுடியுமா?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள் சமுகமளித்திருப்பதாகத் தெரியவில்லை. எனவே, இந்தக் கேள்விகளுக்குப் பதிலளிப்பது யார் ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Are you going to reply to this now?

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்து புள்ளே - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of City Planning and Water Supply)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිළිතුර ලබා දීම සඳහා වෙනත් දිනයක් ලබා දෙන ලෙස ගරු අමාත්‍යතුමා වෙනුවෙන් මා ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
On behalf of the Minister, the Hon. State Minister is asking for another date to reply.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Okay. Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අමාත්‍යාංශ නිවේදන. ගරු රංජිත් සියඹලාපිටිය අමාත්‍යතුමා.

නොරොච්චෝලේ බලාගාරය සඳහා ගල් අඟුරු මිලදී ගැනීම : විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය

நுரைச்சோலை அனல் மின் நிலையத்துக்கான நிலக்கரி கொள்வனவு: மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரினது கூற்று

PURCHASE OF COAL FOR NORACHCHOLAI POWER PLANT: STATEMENT BY MINISTER OF POWER AND RENEWABLE ENERGY

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා)

(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர்)

(The Hon. Ranjith Siyambalapitiya - Minister of Power and Renewable Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නොරොච්චෝලේ -ලක්විජය- ගල් අඟුරු බලාගාරය සඳහා ගල් අඟුරු මිල දී ගැනීම පිළිබඳව මේ දිනවල මාධ්‍ය මඟින් විවිධ අදහස් පළ වන බැවින් ගරු සභාව දැනුවත් කිරීම වැදගත් යැයි මම සිතුවෙමි.

මෙම බලාගාරයේ මෙගාවොට් 900ක ධාරිතාව මුළුමනින්ම ක්‍රියාත්මක කිරීමට වසරකට ගල් අඟුරු මෙට්‍රික් ටොන් ලක්ෂ 22ක් පමණ අවශ්‍ය වේ. මෙම තොගය ප්‍රවාහනය කළ හැක්කේ මුහුදු රළු නොවන වසරේ සැප්තැම්බර් මස සිට අප්‍රේල් දක්වා මාස හය, හතක කාල සීමාවක් තුළ පමණි. මෙම විශාල අභියෝගය ජයගත යුතුව ඇත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගල් අඟුරු ආනයනය ආරම්භ වූ 2009 සිට 2015 දක්වා කාලය සහ 2015 සිට අද දක්වා කාලය යන කාල තුළදී ගල් අඟුරු මිලදී ගැනීම් පිළිබඳව වෙන් වෙන් වශයෙන් කරුණු පැහැදිලි කිරීම පහසු යැයි මම සිතමි. 2009 ප්‍රථම ටෙන්ඩරය සඳහා එක් ටෙන්ඩර් කරුවෙකු පමණක් ලංසු ඉදිරිපත් කිරීම සහ ඉතා ඉහළ මිලක් ඉදිරිපත් කර තිබූ නිසා ටෙන්ඩරය අවලංගු කිරීමට සිදු විය.

ඉන් පසු 2015 දක්වා ටෙන්ඩර් 5ක් ක්‍රියාත්මක වූ අතර, ඒ සෑම වතාවකම අවසන් වශයෙන් ගල් අඟුරු සැපයුම හිමි වූයේ නොබෙල් රිසෝසස් නම් සමාගමටයි. එම සමාගම කිසිම ටෙන්ඩරයකදී ටෙන්ඩර් මණ්ඩලයේ තීරණයක් අනුව සෘජුව නොතේරුණත් අභියාචනා මණ්ඩලයේ තීරණ මත හෝ අමාත්‍ය මණ්ඩලයේ තීරණ මත හෝ අවසානයේ දිගින් දිගටම බලාගාරයට ගල් අඟුරු සපයන එකම ගල් අඟුරු සැපයුම්කරු බවට පත්වීම විශේෂත්වයකි. මේ සෑම අවස්ථාවකදීම ටෙන්ඩරය අවලංගු කොට නැවත ටෙන්ඩර් කැඳවීමට තීරණය වී ඇත. මේ කාලයේදී ඊළඟ ටෙන්ඩරය පිරිනැමීමට ආසන්න වන විට සැපයුම්කරු එකඟ වූ සැපයුම් ප්‍රමාණය ලබා නොදීම මඟින් ගල් අඟුරු හිඟයක් ඇති කිරීම සාමාන්‍ය කරුණක් වී ඇත. මෙම තත්ත්වය ලංකා විදුලිබල මණ්ඩලය, අමාත්‍යාංශය හා අමාත්‍ය මණ්ඩලයට ගල් අඟුරු හිඟයක් ඇති වීම වළක්වා ගැනීම සඳහා නොබෙල් සමාගමට නැවත ටෙන්ඩරය ලබා දීමට පෙලඹූ වූ ප්‍රධාන සාධකයක් බවට පත් වී තිබූ බව පෙනී යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම කාල සීමාව තුළ ගල් අඟුරු සැපයුමේ තිබූ ප්‍රශ්නගත තත්ත්වයක් නිසා ලංකා විදුලිබල මණ්ඩලයට මහා පරිමාණ අලාභයක් විඳීමට සිදු විය.

01. නොබෙල් සමාගම 2011දී ඇමෙරිකානු ඩොලර් 68.50/ 73.40 මිල දර්ශකය මත පදනම් වූ මිලකට ගල් අඟුරු සැපයීමට එකඟව ගිවිසුම් ගතව තිබියදී එක්වරම ඇමෙරිකානු ඩොලර් 74.42 ස්ථාවර මිලකට ගල් අඟුරු මෙට්‍රික් ටොන් දෙලක්ෂ විසි දෙදහස් හත්සිය තිස් නවයක් සැපයීමට අවස්ථාව ලබාගෙන ඇත.

02. 2011දී මුහුදු රළු අවස්ථාවක ගෙන ආ ගල් අඟුරු නැව් 2ක් ගොඩ බෑමට නොහැකි වීම නිසා නොබෙල් රිසෝසස් සමාගමෙන් ආපසු එම නැව් 2 ගෙන යාමට කළ ඉල්ලීම ප්‍රතික්ෂේප වීමෙන් ටෝරියන් අයත් සහ ස්ටීල් සමාගමට මෙම ගල් අඟුරු තොගය පසුව ගැනීමේ පදනම යටතේ ලබා දීමෙන් අදටත් විසඳාගත නොහැකිව තිබෙන අර්බුදය නිසා ලංකා විදුලිබල මණ්ඩලයට සිදුව ඇති පාඩුව රුපියල් මිලියන 400කට ආසන්නය.

03. නියමිත පරිදි නොබෙල් සමාගමෙන් ගල් අඟුරු සැපයුම නොකිරීමෙන් 2011 සැප්තැම්බර් 28 සිට ඔක්තෝබර් 23 දක්වා බලාගාරය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති අතර, එම නිසා ලංවිමට සිදු වූ පාඩු වූ දළ වශයෙන් රුපියල් මිලියන 3,500ක් බව කියවේ.

04. 2014/2015 ගිවිසුම අනුව සැපයීමට එකඟ වූ ගල් අඟුරු ප්‍රමාණයෙන් මෙට්‍රික්ටොන් ලක්ෂ 3ක ප්‍රමාණයක් ලබා නොදීම නිසා සිදුවූ පාඩුව රුපියල් මිලියන 12,500ක් බව පැවසේ.

05. ගිවිසුම්ගත පරිදි නොබෙල් සමාගමෙන් ගල් අඟුරු තොග නොලැබීම නිසා 2011දී මෙට්‍රික් ටොන් 81,688ක් ද, 2012දී මෙට්‍රික් ටොන් 59,358ක් ද, 2013දී වරින්වර මෙට්‍රික් ටොන් 55,984ක් ද, නැවත මෙට්‍රික්ටොන් 32,828ක් ද, නැවත මෙට්‍රික් ටොන් 55,111ක් ද නිසි ටෙන්ඩර් පටිපාටියකින් හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව හදිසි අවශ්‍යතාව මත තෝරියම් සමාගමෙන් ඉහළ මිල ගණන්වලට මිලදී ගැනීමට සිදුවී ඇත.

2015 වසරේ සැපයුම සඳහා වූ ටෙන්ඩරය:

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සඳහා 2014 නොවැම්බර් මස ටෙන්ඩර් කැඳවූ අතර, සමාගම් 8ක් විසින් ටෙන්ඩර් ඉදිරිපත්කොට ඇත. එයට පැරණි සැපයුම්කරු වූ නොබෙල් සමාගම මෙන්ම වර්තමාන දිගු කාලීන සැපයුම්කරු වන ස්විස් සිංගප්පූර් සමාගම ද ඇතුළත් විය. මෙහිදී නොබෙල් සමාගමේ ලංසුව 1987 පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියා පදිංචි වී නොතිබූ නිසා ප්‍රතික්ෂේප වී ඇති අතර, තරගය වැඩි කර ගැනීමේ අරමුණ ඇතිව නීතිපති උපදෙස් ලබා ගැනීමෙන් පසු නොබෙල් සමාගමද තරගය සඳහා ඇතුළත් කර ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කර ඇත.

ඊට අමතරව පළමු ලංසු ඇගැයීම් වටයේදී වාණිජ හේතූන් මත තවත් සමාගම් හතරක් ප්‍රතික්ෂේප වී ඇත. මෙය ජාතික වටිනාකමකින් යුත් ටෙන්ඩරයක් බැවින් ටෙන්ඩර් ප්‍රදානයේදී ජාතික යහපත සාක්ෂාත් කර ගැනීම උදෙසා වූ අංක අමප/08/0072/301/004 සහ 2008.02.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව යමින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියද ලබා ගෙන තරගකාරිත්වය වැඩි කිරීම සඳහා එම සමාගම් 4ද නැවත ටෙන්ඩර් ඇගැයීමට ඇතුළත් කර ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය කටයුතු කර ඇත. ඔබතුමාගේ අවසරය පරිදි එම අමාත්‍ය මණ්ඩල තීරණයේ පිටපත **සභාගත*** කරමි. (ඇමුණුම 01)

මෙම තරගයේදී අඩුම මිල වාර්තා වී ඇත්තේ ස්විස් සිංගප්පූර් සමාගමේ ගල් අඟුරු මෙට්‍රික් ටොන් 1කට ඇමෙරිකානු ඩොලර් 82.47ක් හා ඊ ළඟට නොබෙල් සමාගම ඉදිරිපත් කළ ඇමෙරිකානු ඩොලර් 83.09 ලෙසය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙත් ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රමිතීන් 5ක් ඇතුළත් කළ විට මෙම මිල ගණන් ස්විස් සිංගප්පූර් සමාගම ඩොලර් 101.71 හා නොබෙල් සමාගම 89.96 ක් ලෙස විය. එහිදී එම මිල වෙනස්වීමට ප්‍රධානවම බලපා තිබුණේ ගල් අඟුරු කැටවල ප්‍රමාණය - size - සම්බන්ධ වූ පරාමිතියයි.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ටෙන්ඩර් ලේඛනවල අනිකුත් සියලුම නිර්ණායක මනින සහ වාර්තා කරන ක්‍රමවේදය නොහොත් "ASTM" ප්‍රමිතිය සඳහන් කර ඇති නමුත් ගල් අඟුරු කැටවල ප්‍රමාණය මනින ක්‍රමවේදය සඳහන් කොට නැත. ටෙන්ඩර් ලේඛනයේ සඳහන් කොට ඇත්තේ ගල් අඟුරු කැටවල ප්‍රමාණය මනින ක්‍රමවේදය පසුව දැනුම් දෙනු ලබන බවයි. "To be notified" යනුවෙන් එහි සඳහන් කර ඇත. ටෙන්ඩර් ලේඛනයට අදාළ පිටු ඇමුණුම 02 වශයෙන් **සභාගත*** කරමි.

මේ නිසා කැටවල ප්‍රමාණය යන නිර්ණායකය ටෙන්ඩර් ලේඛනය අනුව ලංසු ඇගයීම සඳහා යොදා ගැනීමට නොහැකි බවට ටෙන්ඩර් මණ්ඩලයේ අදහස වී ඇත.

ප්‍රමාණය පිළිබඳ ඇති ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ සොයා බැලීමේදී ටෙන්ඩර් මණ්ඩලයට නිරීක්ෂණය වී ඇත්තේ විවිධ රටවල ගල් අඟුරු සැපයීමේ ගිවිසුම් 42කින් කිසිම රටක කැටවල ප්‍රමාණය අනුව ගල් අඟුරුවල මිල අඩු වැඩි නොකරන බවයි.

එමෙන්ම, ටෙන්ඩර් ලේඛනවල ගල් අඟුරුවල ප්‍රමාණය යන නිර්ණායකයට අදාළ සමීකරණයද වැරදි ලෙස වාර්තා කර ඇත. සමීකරණයේ ගල් අඟුරුවල බර -weight of coal- යන වචනය වෙනුවට සඳහන් කොට ඇත්තේ ගල් අඟුරුවල නියම ප්‍රමාණය - actual size of coal- යනුවෙනි. ටෙන්ඩර් ලේඛනයට අදාළ පිටු ඇමුණුම 03 වශයෙන් **සභාගත*** කරමි.

නමුත්, ටෙන්ඩර් ඇගයීමට ලක් කරන අවස්ථාවේ මෙම වරද නිවැරදි කළ නොහැක. කිසිදු ලංසුකරුවකු ගල් අඟුරු කැටවල ප්‍රමාණය වැඩි වන ප්‍රතිශතය වාර්තා කර නොතිබූ අතර, වාර්තා කර තිබුණේ ඒ ඒ ප්‍රමාණයේ ගල් අඟුරුවල බර ප්‍රමාණයයි.

එමෙන්ම පසු ගිය වසර පහ තුළ ලංකා විදුලිබල මණ්ඩලය මිලදී ගෙන තිබුණු ගල් අඟුරු නැව් තොග 78න් නැව් තොග දෙකක පමණක් ගල් අඟුරු කැටවල ප්‍රමාණය අනුව මිල වෙනස් කර ඇත. මෙයින්ද පෙනී යන්නේ කැටවල ප්‍රමාණය මිල කෙරෙහි බල නොපාන බවයි.

එමෙන්ම ශ්‍රී ලංකාවට ගල් අඟුරු ගොඩබාන අවස්ථාවේදී පසු ගිය ගල් අඟුරු නැව් තොග 78න් එකදු නැව් තොගයකවත් ගල් අඟුරු කැටවල ප්‍රමාණය ශ්‍රී ලංකාවේදී මැන බලා ගල් අඟුරු පටවන වරායේදී ලබා දුන් වාර්තාව ගොඩබාන අවස්ථාවේදී තහවුරු කර ගෙන නොමැත. අදටත් ගල් අඟුරු ගොඩබාන අවස්ථාවේදී කැටවල ප්‍රමාණය යන නිර්ණායකය මැන බැලීමට ශ්‍රී ලංකාවේ අවශ්‍ය පහසුකම් නැති බවද ටෙන්ඩර් මණ්ඩලය නිරීක්ෂණය කොට ඇත.

එමෙන්ම තාක්ෂණික ඇගයීම් කමිටුව ලංසුකරුවන්ගේ ණය පොලිය ගණන් බැලීමේදී මාස තුනක පොලිය වෙනුවට මාස දොළහක පොලිය ගණන් බලා තිබුණි. මෙයද නිවැරදි කර ගල් අඟුරු කැටවල ප්‍රමාණය යන නිර්ණායකයට අදාළ නිවැරදි කිරීම් ද සිදු කිරීමෙන් පසු අවසන් තාක්ෂණික ඇගයීම් වාර්තාව ඉදිරිපත් කර ඇත. එම වාර්තාවට අනුව ස්විස් සිංගප්පූර් ආයතනය ඇමෙරිකානු ඩොලර් 82.87ක අවම ඇගයීම කළ ලංසුව ඉදිරිපත් කළ ආයතනය වූ අතර, නොබෙල් සමාගම ඇමෙරිකානු ඩොලර් 83.25ක දෙවැනි අවම ඇගයීම කළ ලංසුව ඉදිරිපත් කර තිබුණි. මේ අනුව ප්‍රසම්පාදන මණ්ඩලය ස්විස් සිංගප්පූර් ආයතනයට ටෙන්ඩරය ලබා දීමට නිර්දේශ කර ඇත.

ප්‍රසම්පාදන මාර්ග උපදේශ වගන්ති 2.5 අනුව ප්‍රසම්පාදන මණ්ඩලයට තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා පිළිබඳ නිර්දේශ කිරීමට, ප්‍රතික්ෂේප කිරීමට, සංශෝධන ඉදිරිපත් කිරීමට හෝ මහ පෙන්වීමට බලය ඇත. අදාළ වගන්ති ඇතුළත් ඇමුණුම 04 හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්පසු අමාත්‍ය මණ්ඩලය මෙම තත්ත්වය පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කොට ඇත. ගල් අඟුරුවල අවශ්‍යතාව සලකා බලා වසර 03කට ගල් අඟුරු මෙට්‍රික් ටොන් ලක්ෂ 65ක් මිලදී ගැනීමට කැඳවා තිබූ ටෙන්ඩරය අනුව වාර්ෂික අවශ්‍යතාව වන ලක්ෂ 22ක ප්‍රමාණය වසර 2ක් තුළ බෙදී යන ආකාරයට ලබා දීමටත්, මෙම වසර දෙකෙහි ඉතිරි සියයට 50 අවශ්‍යතාව ක්ෂණික මිලදී ගැනීම් මත ලබා දීමටත් තීරණය කළේය. එහි අදහස වූයේ ගල් අඟුරු සැපයීමේ ඒකාධිකාරය බිඳ දැමීමටත්, ඒ වන විට ලෝකයේ ගල් අඟුරු වෙළෙඳ පොළේ මිල අඩුවීමේ වාසිය සලකා සැපයුම් පිළිබඳ අවදානමකින් තොරව ගල් අඟුරු මිලදී ගැනීමටත්ය. එතැනින් නොනැවතී අතිගරු ජනාධිපතිතුමාගේ නියමයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ගල් අඟුරු මිලදී ගැනීමේ ඉතිහාසය සහ එහි වර්තමාන තත්ත්වය පිළිබඳව සොයා බලා අවශ්‍ය නිර්දේශ ලබා දීමට පහත සඳහන් ත්‍රිපුද්ගල කමිටුවද පත් කරනු ලැබීය.

ලලිත් ආර්. ද සිල්වා මහතා - සභාපති
(හිටපු අමාත්‍යාංශ ලේකම් හා හිටපු නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්)

ඒ.එම්.ඩී. නයනකාන්ත මහතා - සාමාජික
(අතිරේක විගණකාධිපති)

පී.බී.එස්.සී. නෝනිස් මහතා - සාමාජික
(අධ්‍යක්ෂ - රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව)

එම කමිටුව විසින් 2015 දෙසැම්බර් 21 දාතමින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ පිටපතක් වන ඇමුණුම 05 හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම **සභාගත*** කරමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවද මා විසින් සඳහන් කළ යුතු එක් කාරණයක් වන්නේ, ප්‍රශ්නගත ගල් අඟුරු ටෙන්ඩරය ආරම්භ කරන ලද්දේ 2014 වර්ෂයේ අග භාගයේදී බවයි. තාක්ෂණික ඇගයීම් කමිටුව හා ස්ථාවර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව පත් කරනු ලැබුවේ, එම වකවානුව තුළදීය. ගල් අඟුරු මෙට්‍රික් ටොන් ලක්ෂ 22න් සියයට 50ක් දිගු කාලීන ස්ථාවර සැපයුම්කරුගෙන් සහ සියයට 50ක් ක්ෂණික මිලදී ගැනීම්වලින් සපයා ගැනීමට වැය වූ මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 114ක් පමණ වේ. මෙම ප්‍රමාණය පැරණි ක්‍රමයට නොබෙල් රිසෝසස් සමාගමෙන් මිලදී ගත්තේ නම් ඇමෙරිකානු ඩොලර් මිලියන 121.5ක් ගෙවීමට සිදු වේ. ඒ අනුව ඇමෙරිකානු ඩොලර් මිලියන 7.5ක නැත්නම් රුපියල් මිලියන 1,100කට ආසන්න මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වී ඇත.

බලාගාරය පටන් ගත්තායින් පසුව ප්‍රථම වතාවට මුළු ධාරිතාවම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන ගල් අඟුරු මෙට්‍රික් ටොන් ලක්ෂ 22ම මාස හතක් තුළ සම්පූර්ණයෙන් සපයා ගැනීමටද මේ මහින් අවස්ථාව සැලසුණි. මෙම බලාගාරයේ යන්ත්‍ර තුනම එක් දිනකදී නතර කිරීමට සිදු වුවහොත්, ලංකා විදුලිබල මණ්ඩලයට සිදු වන අලාභය රුපියල් දසලක්ෂ තුන්සියයක් පමණ වන බව මෙහිදී කල්පනා කිරීම වැදගත්ය. ඒ, එක් දිනක ප්‍රමාණයයි. තවද, එක් අයෙකුට සීමා වී තිබුණු ගල් අඟුරු සැපයුමේ ඒකාධිකාරය තරගකරුවන් දහයකට වැඩි පිරිසක් තරග වදින විනිවිදභාවයෙන් යුත් සරල මිලදී ගැනීමේ ක්‍රමයක් බවට පත් කර ගැනීමට අපට හැකි විය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාධ්‍ය වාර්තා කර තිබුණේ ප්‍රශ්නගත දිගු කාලීන ටෙන්ඩරය ටොන් එකක් සඳහා ඇමෙරිකානු ඩොලර් 58ක් ලබා දී ඇති අතර, ක්ෂණික ටෙන්ඩරය, ටොන්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

එකක් සඳහා ඇමෙරිකානු ඩොලර් 51.25කට ලබා දී ඇති බවයි. මේ අනුව ඔවුන් සඳහන් කරන්නේ ඇමෙරිකානු ඩොලර් 58න් ඇමෙරිකානු ඩොලර් 51.25ක් අඩු කිරීමෙන් ටොන් එකක් සඳහා ලැබෙන ඇමෙරිකානු ඩොලර් 6.75ක මිල වෙනස නිසා රජයට ආසන්න වශයෙන් රුපියල් මිලියන 1,803ක අලාභයක් සිදුවී ඇති බවයි.

ටෙන්ඩර් දෙකක් සඳහා අවස්ථා දෙකකදී කැඳවන විට මිල ගණන් දෙකක් ඉදිරිපත් වීම පුදුම විය යුතු කරුණක් නොවේ. එම නිසා දෙවතාවකදී කැඳවන ලද ටෙන්ඩර් දෙකකට ලැබුණු මිල ගණන්වල වෙනස පාදක කර ගනිමින් එය රජයට සිදු වූ අලාභයක් හෝ අලාභයක් ලෙස ගණනය කර වාර්තා කිරීම නිවැරදි නොවෙයි.

දිගු කාලීන ටෙන්ඩරයට ලබා දී ඇති ඇමෙරිකානු ඩොලර් 58ද නියම මිලක් නොවන අතර, නියම මිල ගණනය වන්නේ පහත සඳහන් ආකාරයට සූත්‍රයකට ආදේශ කිරීමෙනි.

ඇමෙරිකානු ඩොලර් 58 (පදනම් මිල) X මිලදී ගන්නා මාසයේ දර්ශක මිල
ටෙන්ඩරය පිරිනැමූ මාසයේ ගල් අඟුරු මිල දර්ශක මිල

ඒ අනුව මිල අඩු වූ අවස්ථාවලදී අනිවාර්යයෙන් ගෙවීමට සිදු වන්නේ ඇමෙරිකානු ඩොලර් 58 හෝ ඊට අඩු මුදලකි.

ක්ෂණික මිල තීරණය වන්නේ ඒ ඒ මාසයේ ගල් අඟුරුවල පවතින මිල අනුවයි. සමහරු අලාභයක් ලෙස සඳහන් කර ඇත්තේ, ක්ෂණික එක් ටෙන්ඩරයකට ලැබුණු මිලක් අහඹු ලෙස ගෙන එම මිල දිගු කාලීන සැපයුම්කරුගේ පදනම් මිල වන ඇමෙරිකානු ඩොලර් 58න් අඩු කර එම වෙනස මෙම ටෙන්ඩරයේදී මිලට ගත් ගල් අඟුරු තොගයෙන් වැඩි කිරීමෙනි.

එය කෙතරම් නොමඟ යවනසුලු පෙන්වීමක් දැයි පැහැදිලි කර ගැනීම අපහසු නැත. යම් හෙයකින් ලොව ගල් අඟුරු මිල වැඩි වී එක් මසක ක්ෂණික මිල දී ගැනීමක් ඇමෙරිකානු ඩොලර් 70ක් වූයේ නම්, ස්ථාවර දිගුකාලීන මිල හා එහි වෙනස පමණක් ගෙන ස්ථාවර මිලදී ගැනීම නිසා මෙතරම් ලාභයක් ලැබුණා යැයි කීමටද කෙනෙකුට පුළුවන. අද ජාත්‍යන්තර ගල් අඟුරු මිල පුරෝකථන අනුව ඉදිරි අගෝස්තු, සැප්තැම්බර් මාසවල AP14 දර්ශක මිල ඇමෙරිකානු ඩොලර් 64ක්, 65ක් දක්වා වැඩි විය හැක. එවිට මෙම ගණන් බැලීම් මුළුමනින්ම වෙනස් විය හැක.

විගණන විමසුම් සඳහා පිළිතුරු යැවීම :

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විගණන විමසුමේ කරුණු ගෙන එය විමසුමක් නොව විගණන වාර්තාවක් සේ සලකා විශාල මතයක් ගොඩ නඟා ඇති බව පෙනේ. විගණන විමසුමක තොරතුරු මත අදාළ අයගෙන් විමසීම අවසාන තීරණය නොවන බව අප හොඳින් කල්පනා කළ යුතුය. 2016.01.19 වන දින විගණන විමසුම යවා ඇත්තේ ලංවිම සභාපතිවරයා වෙත වන අතර, එහෙත් එය අදාළ වන්නේ ලංකා ගල් අඟුරු සමාගමේ සභාපතිවරයාටයි. ලංවිම සභාපතිවරයා ඒ බවට සටහනක්ද සහිතව ආපසු විගණන අධිකාරිවරයා වෙත යවා ඇත. ඊට අමතරව විගණන අධිකාරිගේ POE/C/CEB/COAL-SPOT/2016/2 සහ 2016.03.02 දිනැති විගණන විමසුමටද ලංකා ගල් අඟුරු සමාගමේ සභාපති විසින් 2016.04.01 දාතමින් පිළිතුරු යවා ඇති බව සඳහන් කළ යුතුය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම පිළිතුරෙහි පිටපතක් ඇමුණුම් අංක 06 ලෙස මම **සභාගත*** කරමි.

තවද, 2016.04.08 වන දින අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති විගණන කළමනාකරණ කමිටුවේදී ද විගණන විමසුම්වලට නොපමාව පිළිතුරු යවන ලෙස ගල් අඟුරු සමාගමේ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. කෙසේ වුවද, 2016.01.19 දිනැති ලිපියට පිළිතුරු ගල් අඟුරු සමාගම විසින් යවා නොමැති බව දැන ගැනීමෙන් පසු අමාත්‍යාංශය වෙත ඇති තොරතුරු අනුව සකස් කරන ලද පිළිතුරු 02ක් අමාත්‍යාංශ ලේකම් විසින් විගණකාධිපති වෙත යොමු කර ඇත. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම පිළිතුරු දෙකෙහි පිටපත් දෙකක් ඇමුණුම් අංක 07 සහ 08 වශයෙන් මම **සභාගත*** කරමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින් සඳහන් කළ නොබෙල් රිසෝසස් සමාගම තමන්ට අසාධාරණයක් වූ බවට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය නිෂ්ප්‍රභ කරන ලද බව කවුරුත් දන්නා කාරණයකි. එහෙත් ගරු අධිකරණය ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක වූ ආකාරය ගැන දැඩි අවධානය යොමු කොට වැදගත් නිර්දේශ කිහිපයක් ලබා දී ඇත. එම නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ අමාත්‍යාංශය විසින් නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා සිටි අතර, ඊට පිළිතුරු වශයෙන් ඔහුගේ උපදෙස වූයේ,

ස්විස් සිංගප්පූර් සමාගම සමඟ සාකච්ඡා කොට ඔවුන්ගේ එකඟත්වය මත මූල්‍ය බැඳීම් හෝ ලංවිමට පාඩුවක් සිදු නොවන ආකාරයට ගිවිසුම අවලංගු කිරීම හෝ;

එවැනි එකඟතාවකට ඒමට නොහැකි නම්, 2017.04.30 වන දින එළඹ ඇති ගිවිසුමේ කාලය අවසන් වූ පසු ගිවිසුම අවසන් කිරීම සහ; මේ පිළිබඳ සුදුසු පරිදි අමාත්‍ය මණ්ඩලය දැනුවත් කොට අවශ්‍ය ඉදිරි පියවර ගැනීම.

ඉහත සඳහන් පරිදි ක්‍රියා කරමින් රටට වඩාත් වාසිදායක තීරණය නොබියව ගැනීමට අප ක්‍රියා කරන බවද දන්වා සිටීමට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අධිකරණය මෙම ටෙන්ඩර් පරිපාටිය ගැන පෙන්වා දී ඇති කරුණු ලලිත් ආර්. ද සිල්වා කමිටුවේද විශේෂ අවධානයට යොමු වී ඇති අතර, මෙම ටෙන්ඩරය ගැන පමණක් නොව, සමස්ත ටෙන්ඩර් පරිපාටිය සඳහා ද විහිදී ගිය හුදු කරුණු ලෙස සඳහන් කර ඇත. මෙම කාරණය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ලලිත් ආර්. ද සිල්වා කමිටුව මඟින් ඉදිරිපත් කරන ලද 2015.12.21 දිනැති වාර්තාවේ 15වන පිටුවේ පළමු ඡේදයේ සඳහන් නිර්දේශයක්ද මම මේ අවස්ථාවේදී උපුටා දක්වමි. එහි මෙසේ සඳහන් වෙනවා:

"රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සහ ප්‍රසම්පාදන අත්පොතෙහි දැක්වෙන කරුණුවල අවිනිශ්චිතතාවයන් නිවීමද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ලැයිස්තුගත කර ඇති ප්‍රධාන වෙනස්කම් (Major Deviations) මෙම ටෙන්ඩර් ලේඛනවල පැහැදිලිව සඳහන් කර නොතිබීමද, එසේම අතීත පළපුරුද්ද, ද්‍රවශීල වක්කම් සපයාගෙන තිබීම වැනි ඇතැම් ටෙන්ඩර් කොන්දේසි සමබන්ධ නිර්ණායකයන් ටෙන්ඩර් ලියකියවිලිවල ඇතුළත් කර නොතිබීමද මෙම ටෙන්ඩරය ආශ්‍රිතව ඇති වී ඇති අර්බුදයට හේතු වී ඇති බව මෙම කමිටුවේ අවධානයට යොමු විය.

එබැවින් මෙම කමිටුව, ප්‍රසම්පාදන අභියාචනා කමිටු වාර්තාවේ හෝ වෙනත් වාර්තාවල නම් සඳහන් නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ නොකරයි."

ඉදිරියේදී මෙම අමාත්‍යාංශයේ ටෙන්ඩර් කැඳවීම් ක්‍රියාවලියේදී ඉහත වාර්තාවල සඳහන් අඩු පාඩු සම්පූර්ණ කර නිවැරදි ක්‍රමවේදයන් අනුගමනය කිරීමට අප අමාත්‍යාංශය කටයුතු කරන බව සඳහන් කරමි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් ගැඹුරින් සොයා බැලීමට කමිටුවක් පත් කිරීම සම්බන්ධයෙනුත් මා කියන්න කැමතියි. මෙම ටෙන්ඩර් ක්‍රියාවලිය තුළින් තවදුරටත් රටට අලාභයක් සිදු වී ඇත්දැයි සොයා බැලීමට මවිසින් පහත සඳහන් ත්‍රිපුද්ගල කමිටුව පත් කිරීමට යෙදුණි :

මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්ලිව්. පෙරේරා මහතා - සභාපති

මහාචාර්ය ලක්ෂ්මන් ආර්. වටවල මහතා - සාමාජික

මහාචාර්ය ජනක බී. ඒකනායක මහතා - සාමාජික

එම කමිටුව විසින් මෙම කාරණයට අදාළ සියලුම තොරතුරු සලකා බලනු ඇත. කමිටුවේ වාර්තාව මෙම ජූලි මස 29වන දිනට පෙර මා වෙත ලබා ගැනීමට අපේක්ෂා කරමි. එම කමිටුවේ වාර්තාව ලද පසුව අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට බලාපොරොත්තු වන අතර, අවසන් තීරණ ගැනීම සඳහා කෙටි සාධාරණ කාලයක් අවශ්‍ය වන්නේ විශේෂයෙන්ම මෙම ටෙන්ඩර් ක්‍රියාවලිය තුළ කිසිවකු වරදක් කර ඇත්නම් ඊට නිසි පියවර ගැනීම මෙන්ම යම් කිසිවකු සාධාරණ අරමුණු පෙරදැරිව සද්භාවයෙන් ක්‍රියා කර ඇත්නම් ඒ පිළිබඳව ගැඹුරින් සොයා බලා කටයුතු කිරීම එක සේ වැදගත් වන නිසාය. එවැනි ප්‍රවේශයක් දේශපාලනඥයින්ට, රාජ්‍ය නිලධාරීන්ට මෙන්ම සමස්ත ප්‍රජාවටම හිමි විය යුතු පොදු අයිතිවාසිකමක් ලෙස මම සලකන්නෙමි. එසේ නැතහොත් අප වැනි රටක ජාතියේ ඉදිරි ගමනට අවශ්‍ය වන තීන්දු තීරණ ගන්නා මිනිසුන් සොයා ගැනීම දුෂ්කර වනු ඇත.

මෙම ප්‍රකාශය සකස් කිරීමේදී අමාත්‍යාංශයේ අනිකුත් කටයුතුවලදී මෙන්ම මමත්, මාගේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය නීතිඥ අජිත් පී. පෙරේරා මැතිතුමාත් දීර්ඝ වශයෙන් සාකච්ඡා කොට අවශ්‍ය කරුණු සොයා බැලූ බවද සඳහන් කිරීම වැදගත් යැයි මම සිතමි. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම කාරණය වැදගත් නිසා ඒ සම්බන්ධයෙන් දීර්ඝ පිළිතුරක් ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමා කිව්ව පරිදිම 2015ට පෙර අවුරුදු පහක් එක දිගටම නොබෙල් සමාගමට මෙම ටෙන්ඩරය ලබා දීමත්, ඒ සමාගමේ අයිතිකරුවන් කවුද කියන එකත් රහසක් නොවෙයි. ඒ ඒ ක්‍රියාවලීන් සිද්ධ වුණේ කොහොමද කියා හිටපු ඇමතිතුමාත් දන්නවා. මොකද, ඒ සමාගම කාගේද, ඒ සමාගමේ අයිතිකරුවන් කවුද, ඒක මෙහෙයවූයේ කවුද, ඒ සමාගමේ මෙහේ නියෝජිතයා කවුද, ඒ නියෝජිතයාගේ සබඳකම් මොනවාද කියන එක පිළිබඳව එතුමාටත් අවබෝධයක් තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා ටෙන්ඩර් පටිපාටියක් ක්‍රියාත්මක කිරීම සඳහා දරපු උත්සාහයේ වැරැද්දක් නැහැ. ඒක හොඳයි. හැබැයි, සිදු වී තිබෙන දේ මේකයි. වෙනදා එක දිගටම තෝරා ගන්නා ලද සමාගම වෙනුවට ටෙන්ඩර් පටිපාටියක් හරහා මෙම Swiss Singapore Overseas Enterprises (Pvt.) Limited එක තෝරා පත් කර ගැනීමේදීත් අර ගනු දෙනුවම සිදු වී තිබෙනවා, ගරු ඇමතිතුමනි.

විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමාගේ නියෝගයක් ප්‍රකාරව ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ තීන්දුව ලබා දී ඇති අතර, එහි පැහැදිලිව දක්වා ඇත්තේ Swiss Singapore Overseas Enterprises (Pvt.) Limited වෙත ටෙන්ඩරය ප්‍රදානය කළ ආකාරය වැරදි සහගත බවයි. ඒක වැරදියි කියලා ජනාධිපතිතුමා විසින් පත් කරන ලද අභියාචනා මණ්ඩලය ප්‍රකාශ කළා. එසේ ඒ ප්‍රකාශය කර තිබියදී තමයි අර නියෝගය නොසලකා හැර ලේකම්තුමා විසින් කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාව යවන්නේ. ප්‍රසම්පාදන මණ්ඩලය විසින් ලබා දෙන ලද තීරණය අනුව තමයි -[බාධා කිරීමක්]

මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ප්‍රසම්පාදන මණ්ඩලය විසින් තෝරා ගන්නා ලද ටෙන්ඩර් පටිපාටියට අනුව තමයි කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාව යන්නේ. හැබැයි, අභියාචනා මණ්ඩලය විසින් ලබා දෙන ලද තීරණය පිළිබඳව කිසිදු සැලකිල්ලකට ලක් කර නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න සිද්ධ වන්නේ. තාක්ෂණික හේතු මත ශ්‍රේෂ්ඨාධිකරණය නඩුව පැත්තකින් තියනවා. හැබැයි, ඒ නඩුව පැත්තක තබා තිබියදී වුවත් මෙම ටෙන්ඩරය පිළිබඳව ඒ විනිසුරුවන් විසින් දක්වා තිබෙන අවධානය, ඒ විනිසුරුවන්ගේ ප්‍රකාශනවලින් පවා ඔබතුමා දකින්න ඇති. "මෙවැනි දේ සිදු නොවිය යුතුයි" යන ආකාරයේ ප්‍රකාශයන් පවා සිදු කොට තිබෙනවා. "හෘදය සාක්ෂිය කම්පනයට පත් වෙනවා" කියා තමයි ඒ විනිසුරුවන් ප්‍රකාශ කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ පිළිබඳව ප්‍රකාශයකින් ඔබ්බට යන යම් විවාදයක් මේ පාර්ලිමේන්තුව තුළ පැවැත්විය යුතුව තිබෙනවා. මොකද, විශේෂයෙන්ම පැවැති ආණ්ඩුව බිඳ වැටීමේදී වංචා, දූෂණ ප්‍රධාන සාධකයක් බවට පත් වුණා. ඒ නිසා තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙනුත් විශේෂයෙන්ම ගල් අහුරු ගනු දෙනු පිළිබඳව මතු වී තිබෙන මේ ආන්දෝලනාත්මක තත්ත්වය පිළිබඳව මීටත් වඩා වැඩි සවිස්තරාත්මක සාකච්ඡාවක් පාර්ලිමේන්තුව තුළ සිදු විය යුතුය කියන එක තමයි අපේ යෝජනාව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමාගේ ප්‍රකාශයෙන් පසුව ඒ පිළිබඳව විවාදයකට යන්න බැහැ. ඔබතුමාගේ ඉල්ලීම පැහැදිලියි. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව අදහසක් ඉදිරිපත් කරන්න අවශ්‍යද?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ඔව්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කෙටියෙන් ඉදිරිපත් කරන්නම්. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා සොයා බැලීමේ කමිටුව පත් කළේ ටෙන්ඩරය අනුමත කළ කැබිනට් රැස්වීමේදීයි. ඊට පසුව තමයි ඔවුන්ගේ වාර්තාව ආවේ. ඒක එක කාරණාවක්. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඔවුන්ගේ වාර්තාව දුන්නේ ඊට මාස කිහිපයකට පස්සේයි. ඒකයි ප්‍රධාන කාරණාව.

දෙවනුව, දැනට අපේ තවත් කමිටුවක් ක්‍රියාත්මක වෙනවා. මේ මාසයේ 29වැනි දා එහි වාර්තාව ලැබෙනවා. ඒ වාගේම ඔබතුමා කිව්ව පරිදි මේ පිළිබඳව යම් කිසි විවාදයක් අවශ්‍ය නම් වැඩිදුරටත් මේ ගරු සභාවේ සාකච්ඡා කරන්න අපි ඉතාම කැමැත්තෙන්, සූදානමින් ඉන්නවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1- ගරු ක්‍රීඩා ඇමතිතුමා.

ක්‍රීඩා පනත : නියෝග
விளையாட்டுச் சட்டம் : ஒழுங்குவிதிகள்
SPORTS LAW: REGULATIONS

[අ.භා. 2.20]

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල ඇතුළත් 13 සහ 17 වැනි වගන්ති සංශෝධනය කරමින් 2015 නොවැම්බර් 9 දිනැති අංක 1940/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.26 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනා අංක 1 යටතේ විවාදය ආරම්භ කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විවාදය අවසානයේ මම උත්තර දෙන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

[අ.භා. 2.21]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ ජාතික ක්‍රීඩා සංගම්වල හෝ සම්මේලනයන්හි සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති, සහකාර ලේකම්, සහකාර භාණ්ඩාගාරික යන නිල තලවලට පත්වීම් පිළිබඳව නීති සංශෝධනය කරන විවාදයට එක් වීමට අවස්ථාව ලබා දීම ගැන විශේෂයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ චේතනයක් - පඩියක්- ලබන්නේ නැතිව ස්වේච්ඡාවෙන් කටයුතු කළ යුතු නිල තල ලබා ගැනීම සඳහා බොහෝ අය රුපියල් කෝටි ගණන් වියදම් කරමින්, මිනී මරා ගනිමින් කටයුතු කරන ආකාරය අප දකිනවා. නමුත් මේ අවස්ථාවේදී ක්‍රීඩාව දියුණු කරන්නටය කියා ක්‍රීඩා සංගම්වල නිල තල ගන්නට යන අවස්ථා විතරක් නොවෙයි, ගමේ තිබෙන සමුපකාරයේත් නිල තල ගන්න ගියාම මේ වාගේ ප්‍රශ්න ඇති වන බව අපි දකිනවා. මෙවැනි අවස්ථා දිහා බැලුවාම මේ රටේ මිනිසුන් මේ තරම් ස්වේච්ඡාවෙන් අන් අය වෙනුවෙන් උදවු කරන්න, අන් අය වෙනුවෙන් කැප වෙන්න කොපමණ දහලනවාද කියා අපට හිතාගන්න පුළුවන්. එහෙම ප්‍රශ්න ඇති කරගෙන, රුපියල් කෝටි ගණන් වියදම් කරගෙන, මේ නිල තල අරගෙන කරන්න යන්නේ, ඒ සංගමයේ හෝ, ඒ සංවිධානයේ හෝ මුඛ්‍ය පරමාර්ථය ඉෂ්ට කරන්න නොවෙයි. තමන්ගේ සුඛ විහරණයට යන අවස්ථා තමයි අපි දකින්නේ.

මා හිතන හැටියට ඒ නිසා තමයි මේ ක්‍රීඩා අමාත්‍යාංශය තුළින් ක්‍රීඩාව පිළිබඳව නීති - රීති සකස් කරනවාට වඩා මේ සංගමයට පත්වන නිලධාරීන් වෙනුවෙන් කිහිප විටක්ම නීති - රීති සකස් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ගමේ සමුපකාරයේ ඡන්දය බැලුවත්, නිල්, කොළ, රතු දේශපාලන පක්ෂ අතර තිබෙන භේදයක් හැටියට තමයි අන්තිමට ඒක අවසන් වන්නේ. සමුපකාරයේ නිල තල ගන්න දහලන අය සමුපකාරයේ දියුණුවට වැඩ කරනවාද? අන්තිමට එය දේශපාලන ජයග්‍රහණයක් මිසක් සමුපකාරිකයන්ගේ ජයග්‍රහණයක් බවට පත්වන්නේ නැහැ.

ක්‍රීඩා සම්මේලනය දිහා බැලුවත්, ක්‍රීඩා සංගම්වලට නිලධාරීන් පත් කිරීම දිහා බැලුවත් ඒකත් නිල්, රතු, කොළ දේශපාලන සටනක් විතරක් නොවෙයි, එකම දේශපාලන පක්ෂයේ බල අරගලයක් විධියට තමයි බොහෝ විට දකින්න ලැබෙන්නේ. පසු ගිය කාලයේ එවැනි අවස්ථා තමයි අපි දැක්කේ. මෙවැනි දැහලිල්ලක් තුළ, මෙවැනි මුදල් වියදම් කිරීමක් තුළ, මෙවැනි ප්‍රශ්න ඇති කරගෙන පත්වන නිලධාරීන් කීයෙන් කීදෙනාද දක්ෂ ක්‍රීඩකයන්ට නිසි තැන ලබා දීම උදෙසා ඒ ශක්තිය යොමු කරන්නේ; ක්‍රීඩාව නංවාලීමේ කටයුතු සඳහා ඒ ශක්තිය යොමු කරන්නේ; දක්ෂ ක්‍රීඩකයා නංවාලීමට අවශ්‍ය පහසුකම් ලබාදීම සඳහා ඒ ශක්තිය යොමු කරන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? එම නිසාම තමයි අතිගරු ජනාධිපතිතුමා, ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමා සර්ව පාක්ෂික කැබිනට් මණ්ඩලයක් හදලා, මේ සියලු දෙනාම එකතු වෙලා වැඩ කරන සමාජයක් නිර්මාණය කරන්න උත්සාහ කළේ; ඒ වාගේම මුළු පාර්ලිමේන්තුවම එකම රජයක් බවට පත් කරලා, භේද භින්න වන්නේ නැතුව, බෙදිලා වෙන් වන්නේ නැතුව සියලු දෙනාම එකතු වෙලා සියලු ක්ෂේත්‍රයන් දියුණු කරන්න අවශ්‍ය සංකල්ප ඉදිරිපත් කරලා, සියලු දේශපාලන පක්ෂ එකතු කරගෙන ඉතිහාසයේ පළමුවන වතාවට මේ රටේ යහ පාලනය ක්‍රියාත්මක කරන්නට කටයුතු කළේ. කොහොම වුණත් මෙතෙක් කල් මේ රටේ තිබුණු අඳුරු ඉතිහාසය නිමා කරන්න තමයි එසේ වෙහෙස වුණේ.

මෙවැනි බල අරගළ නිසා විනාශ වෙන්නේ අපේ රටේ ජාතික ධනය. විනාශ වෙන්නේ ජනතාවගේ සල්ලි. ඒ විතරක් නොවෙයි, ඒ අදාළ තනතුරුවලින් අවශ්‍ය කාර්යක්ෂමතාව ඉෂ්ට වෙනවාද? මේ අය මේ තනතුරු ලබා ගන්න යන්නේ ක්‍රීඩාව දියුණු කිරීමටද? එහෙම නැත්නම් තමන්ගේ බලය හෝ පටු දේශපාලන අරමුණක් සඳහාද කියන එක අපි සොයා බැලිය යුතු වෙනවා. එවැනි අරමුණුවලට තිත තියන්න ඕනෑ කාලය අද එළැඹ තිබෙනවා.

මේ ප්‍රශ්න පාලනය කරන්න ඕනෑ නිසා තමයි ක්‍රීඩා ඇමතිතුමා ඉතාම යහපත් සිතකින් ක්‍රීඩා පනත යටතේ මේ නියෝග ගෙනැල්ලා, මේ නිලධාරීන් පත් කිරීමේදී යම් මට්ටමක හෝ පාලනයක් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිද්ධ කරන්නේ. මේ රටේ වර්තමාන ජනාධිපතිවරයා පත් වෙනකොට ඒ පිළිබඳව

මානව හිමිකම් ප්‍රශ්න ඇති වුණේ නැහැ. ඒ සඳහා නඩු නැහැ. ඒ වාගේම, මේ උත්තරීතර පාර්ලිමේන්තුවට මහජන මන්ත්‍රීවරු 225දෙනෙක් පත්වෙනකොට මානව හිමිකම් පිළිබඳ නඩු ගොඩ ගැසී තිබුණේ නැති තරම්. එසේ තිබුණා නම් ඒ බොහොම අල්පයක්. නමුත් ක්‍රීඩා සංගම්වල ස්වේච්ඡා සේවයට නිලධාරීන් පත්වෙනකොට මානව හිමිකම් පිළිබඳ නඩු ගොඩ ගැහිලා තිබෙනවා. ඒ පත්වීම් වැරදියි. ඒ පත්වීම් පනත අනුව නොවෙයි සිද්ධ වුණේ කියන ප්‍රශ්න-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

කරුණාකර ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා මූලාසනය ගතයුතු යැයි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් දහලනවාට වඩා, ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරනවාට වඩා, ක්‍රීඩා සංගම්වලට නිලධාරීන් පත් කිරීමේ කටයුතු පාලනය කිරීම සඳහා, ඒවා ක්‍රමවත් කිරීම සඳහා, ඒවා සාධාරණව කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවට විවිධ අණපනත් ගෙන එන්න අද සිද්ධ වෙලා තිබෙනවා.

එදා ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාත් ක්‍රීඩා සංගම්වලට නිලධාරීන් පත් කිරීම පිළිබඳව හා පාලනය කිරීම සඳහා මේ වාගේ අණපනත් මේ පාර්ලිමේන්තුවට ගෙනාවා. ඊට පස්සේ අපේ ගරු නවීන් දිසානායක ඇමතිතුමා ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න ගිහින් විවිධ ප්‍රශ්නවලට මුහුණ දුන්නා. එතුමාට විවිධ අභියෝගවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ වාගේම වර්තමාන ක්‍රීඩා අමාත්‍ය, ගරු දයාසිරි ජයසේකර මැතිතුමාත් ක්‍රීඩා පනත යටතේ මේ නියෝග ගෙනැවිත් මේ නිලධාරීන් පත් කිරීම යම් ප්‍රතිපත්තියකට අනුව, යම් නීති මාලාවකට අනුව කටයුතු කරන්න උත්සාහ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා අමාත්‍යාංශයේ වගකීම මොකක්ද? ගමේ වෙල් ඉපනැල්ලෙන් බිහිවන ක්‍රීඩකයා ඔහුගේ දෙමව්පියන්ගේ ආර්ථික ශක්තියට බාධාවක් නොවී ඔලිම්පික් තරගාවලිය දක්වා ගෙන යෑමේ ක්‍රමවේදයක් සෑදිය යුතු වෙනවා. අපි ඒ සඳහා සහාය දියයුතු වෙනවා. ඒ චිතරක් නොවෙයි. ක්‍රීඩාව තුළින් නීරෝගිමත් ජාතියක් බිහි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු වෙනවා. ජාත්‍යන්තර ක්‍රීඩා තරගවලදී අපේ රටට ජයග්‍රහණ අත්පත් කර දීමෙන් ලොව තුළ අභිමානවත් ශ්‍රී ලාංකික ජාතියක් ගොඩ නැංවීමේ අවශ්‍යතාව සඳහා කටයුතු කළ යුතු වෙනවා.

ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා දක්ෂ ක්‍රීඩකයෙක්. ඒ වාගේම දක්ෂ නීතිඥයෙක්. ඒ නිසා දැන්වත් මේ අභියෝග ජය ගන්න පුළුවන්වනු ඇතැයි මා විශේෂයෙන් විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ හොඳ අධ්‍යාපනයක් තිබෙනවා. මේ රටේ හොඳ උගතුන් ඉන්නවා. අධ්‍යාපනය ලබා දිය හැකි ගුරුවරු ඉන්නවා. ඒ වාගේම හොඳ විශ්වවිද්‍යාල තිබෙනවා. නමුත් මේ රටේ පුහුණුව ලබා දිය හැකිව තිබියදී, තොග පිටින් කණ්ඩායම් පුහුණුව සඳහා නවසීලන්තය වැනි රටවලට යවන්න කටයුතු කළ හැටි අපි පසු ගිය කාලයේ දැක්කා. ඒක මේ රටේ ලබා දෙන්න පුළුවන් පුහුණුවක්. මේ රටේ ලබා දෙන්න බැරි පුහුණුවක් නොවෙයි. ඒ වාගේම ක්‍රීඩා තරගවලට විදේශගත වෙනකොට ඒ ක්‍රීඩකයන්ට වඩා නිලධාරීන් පිරිසක් යන හැටි අපි දැක තිබෙනවා. ඒ විධියට මුදල් අවභාවිතය සිද්ධ වුණත්, ගමේ පාසලින් විදේශ තරගයකට ඉදිරිපත් වන ක්‍රීඩකයාට සල්ලි දෙන්න, අවශ්‍ය පහසුකම් දෙන්න අවස්ථාව සැලසී තිබුණේ නැහැ. සමහර වෙලාවට දෙමව්පියෝ ඒ සඳහා අප ළඟට පවා එනවා. ඒ වාගේම මෙතැන සිටින සියලුම මන්ත්‍රීවරුන් ළඟටත් එනවා. ඇවිදින් කියනවා, "මගේ දරුවා අහවල් ක්‍රීඩාව සඳහා විදේශ රටක තරගයකට යන්න තේරිලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය ආධාර ලබා දෙන්න" කියලා. අපි මේ ඉල්ලීම් ක්‍රීඩා අමාත්‍යාංශයට යොමු කළාම, ඒ ගොල්ලෝ දෙන උත්තරය තමයි, "මේක පාසල හරහා යන එකක් නොවෙයි. මේක පිළිගත් එකක් නොවෙයි. ඒ නිසා මේ දරුවාට පිට රටකට යන්න උදව් කරන්න බැහැ" කියන එක. ඒ වාගේ තහංචි දමන එක තමයි අපට හුහක් වෙලාවට දකින්න ලැබෙන්නේ.

අපි දන්නවා, දෙමව්පියන් සියලු දේ කරන්නේ තම දරුවන් වෙනුවෙන් බව. මේ දරුවන්ගේ අවශ්‍යතාව ඉෂ්ට කිරීම සඳහා දෙමව්පියන් එක එක ව්‍යාපාරිකයන් ළඟට ගිහින් හිඟා කන අවස්ථා අපි දැක තිබෙනවා. ඔවුන් ණය වෙලා හෝ ගෙදර තිබෙන බඩු මුට්ටු ටික උගස් තියලා හෝ තමන්ගේ දරුවා විදේශ රටක පැවැත්වෙන ඒ තරගාවලියට සහභාගි කරවන්න යවනවා. ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමනි, මම විශේෂයෙන්ම මෙතැනදී අවධාරණය කරනවා අපි මේ අඳුරු ඉතිහාසය වෙනස් කරන්න ඕනෑ කියලා. ක්‍රීඩා අමාත්‍යාංශයට ලැබෙන රජයේ සල්ලි, නැත්නම් විදේශ රටකින් ලැබෙන සල්ලි මෙතෙක් කල් බොහෝ විට නිලධාරීන් සඳහා, නැත්නම් ක්‍රීඩාංගණ ඉදි කිරීමේදී අකටයුතු දේවල්වලට වැය වුණා. ඒ මුදල් අවභාවිත වුණා; වංචා, දූෂණ සිද්ධ වුණා. දෙමව්පියන් බොහොම අමාරුවෙන් පාසලට ඇතුළු කරන දරුවා පාසල තුළදී යම් ක්‍රීඩා දක්ෂතාවක් පෙන්නුම් කරනවා නම්, කුමන ක්‍රමයකින් හෝ වේවා ඔහුට විදේශ රටකට ගිහින් ඒ ක්‍රීඩා තරගවලට සහභාගි වීමේ අවස්ථාව සලසනවා නම් එය ඉතා වටිනවා. ඒ දෙමව්පියන් අසරණ වෙන්න නොදී අපි ඒ සඳහා අවශ්‍ය මූල්‍යාධාර සැපයිය යුතු වෙනවා. ඒ ගැන අපේ අවධානය යොමු කරන්න වෙනවා, ගරු ඇමතිතුමනි. මම එහෙම කියන්නේ, බොහෝ දූෂණ, වංචා මේ ක්‍රීඩාව තුළ සිදු වෙන නිසායි. මේ දූෂණ, වංචා නවත්වලා, මෙවැනි හොඳ දේවල්වලට ක්‍රීඩා අමාත්‍යාංශයේ මුදල් වියදම් කිරීමට හැකියාව, ශක්තිය දෙන්න ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමාට පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. හැකියාව, දක්ෂතාව තිබෙන ඇමතිවරයෙකු වශයෙන් ඔබතුමාගේ අවධානය විශේෂයෙන්ම මේ කෙරෙහි යොමු කළොත්, අපට මේ අඳුරු ඉතිහාසය වෙනස් කරන්න පුළුවන් වෙයි කියා මා හිතනවා.

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජාතික ක්‍රීඩා සංගම්වල මුල් පුටු සඳහා කුළල් කා ගන්නා අවස්ථා අපි මාධ්‍ය හරහා අනන්ත අප්‍රමාණව දැක තිබෙනවා. අද ක්‍රීඩාවට වඩා තරගයක් තිබෙනවා ක්‍රීඩා සංගම්වල නිලතල ගන්න. ක්‍රීඩාවලට වඩා මේ ක්‍රීඩා සංගම්වල නිලතල ගැනීම සඳහා පෞද්ගලික සල්ලි වියදම් කරන හැටි අපි දකිනවා.

යටත් විජිත සමයේත් මේ ක්‍රීඩා සංගම් තිබුණා; ක්‍රීඩා සම්මේලන ක්‍රියාත්මක වුණා. නමුත්, ඒ කාලයේ මෙහෙම ප්‍රශ්න තිබුණේ නැහැ. ක්‍රීඩාවට ආදරය කළ ප්‍රභූවරු බල තණ්හාවකින් තොරව තම ධනය වියදම් කරමින්, මේ රටේ ක්‍රීඩා සංගම් මෙහෙයවපු යුගයක් තිබුණා. ඒ අයගේ යටි අරමුණු තිබුණේ නැහැ. ඒ අයට දේශපාලන අරමුණු තිබුණේ නැහැ. ක්‍රීඩාව නංවාලීම සඳහා වූ කැමැත්ත තුළ ඉඳගෙන තමයි ඔවුන් ඒ කටයුතු කළේ. එදා රජයේ සම්බන්ධයක් නැතිව, මේ ක්‍රීඩා සංගම් හරහා ඔලිම්පික් තරගවලට පවා අපේ ක්‍රීඩකයෝ යොමු වුණු හැටි අපි දැක්කා; ඒ ගැන අපි අහලා තිබෙනවා. 1937 වන විට මේ රටේ ජාතික ඔලිම්පික් කමිටුව රජයේ අනුග්‍රහය ඇතිව සංවිධානයක් ලෙස ඉදිරියට ආවා. ඒ වාගේම එය පරිවාර කර ගත් ක්‍රීඩා සංගම් බිහි වෙලා තිබුණා.

විශේෂයෙන්ම එදා සුදු අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ, රාජ්‍ය සේවා ක්‍රීඩා සමාජ ලෙස දිවයිනේ හැම දිසාපතිවරයෙක් හරහාම ක්‍රීඩා සංගම් ක්‍රියාත්මක වුණා. අද වුණත් කොළඹ නගරය දිහා බැලුවොත්, නුවරඑළිය නගරය දිහා බැලුවොත් එම රාජ්‍ය සේවා ක්‍රීඩා සමාජ එහෙම නැත්නම් Government Service Sports Clubs කියන ඒවා තිබෙනවා. අදත් ඒවා සමහර නගරවල නෂ්ටාවශේෂ වශයෙන් තිබෙනවා. සමහර දිස්ත්‍රික්කවල මේවා ඉතිරි වෙලා තිබෙනවා.

ඩන්කන් වයිට් වාගේ සුපිරි ගණයේ අපේ රටට අභිමානයක් ගෙන එන්නට පුළුවන් ක්‍රීඩකයන් බිහි වුණේ මෙවැනි ක්‍රීඩා සංගම් හරහා මිසක් අද වාගේ මේ බලු පොරවලින් පත් වෙන නිලධාරින් සිටින ක්‍රීඩා සංගම් හරහා නොවෙයි. විශේෂයෙන්ම අපි අවධානය යොමු කළ යුතු කාරණයක් තිබෙනවා. විවිධ ක්‍රීඩා සමාජ හරහා ඔලිම්පික් තරගාවලියට ස්වාධීන ක්‍රීඩකයන් ඉදිරිපත් වුණත්, පසු කාලයක ජාත්‍යන්තර ඔලිම්පික් තරගාවලියට ක්‍රීඩකයන් යැවීම ජාතික ඔලිම්පික් කමිටුව හරහා සිදු වුණා. ජාත්‍යන්තර ඔලිම්පික් ක්‍රීඩා තරගවලට ක්‍රීඩකයන් යැවිවේ, ජාතික ඔලිම්පික් කමිටුව හරහායි.

1966 කාලයේ ඔලිම්පික් කමිටුවේ සාමාජිකයකු වූ හිටපු සුගතදාස ඇමතිතුමා ජනසතු සේවා අමාත්‍යාවරයා වශයෙන් කටයුතු කරද්දී එතුමා තුළ ක්‍රීඩාවට තිබෙන පෞද්ගලික උනන්දුව නිසා ජනසතු සේවා අමාත්‍යාංශය යටතේ පාසල්වල සිටින ශාරීරික අභ්‍යාස ගුරුවරු -PT ගුරුවරු- අරගෙන වෙනම අංශයක් පිහිටුවාගෙන රාජ්‍ය අනුග්‍රහය ක්‍රීඩාවට ලබා දීම ප්‍රථමවරට ඇරඹුවා. ඊට පසුව ආචාර්ය එච්.ආර්.එස්. ගුණවර්ධන මැතිතුමා ප්‍රථම ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් - ක්‍රීඩා සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා වශයෙන් - 1970දී පාර්ලිමේන්තුවේ කටයුතු කළා.

ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් පත් වුණු ආචාර්ය එච්.ආර්.එස්. ගුණවර්ධන අමාත්‍යවරයාට නිල වශයෙන් මේ ක්‍රීඩාවේ තිබෙන දූෂණ, වංචා පිළිබඳ කරුණු ඉදිරිපත් වෙන්න පටන් ගත්තා. ඊට පසුව එතුමා මේවා ගැන සොයා බැලීමක් කළාම දැන ගන්නට ලැබුණා, රට තුළ තිබෙන බහු ජාතික ව්‍යාපාර ක්‍රීඩාව සඳහා මුදල් යොමු කරන ආකාරය. ඒ වාගේම ජාත්‍යන්තර ව්‍යාපාරවලින් එක් එක් ක්‍රීඩා සංගම් සඳහා මුදල් ලබා දීම, ජාත්‍යන්තර සංගම්වලින් ක්‍රීඩා සඳහා මුදල් ලබා දීම, ජාත්‍යන්තර වශයෙන් විවිධ ආයතනවලින් ක්‍රීඩා අමාත්‍යාංශයට නැත්නම් ක්‍රීඩා සංවිධාන වෙත මුදල් ලබා දීම සිදු වුණා. මේවා නියාමනය කිරීම අවශ්‍ය වන බව එතුමාට වැටහුණා. ඒ වාගේම මේ ආධාර වැඩියෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා රජයේ මැදිහත් වීම අවශ්‍යයි කියන එක එතුමාට වැටහුණා.

එක පුද්ගලයකු අවුරුදු ගණනාවක් ඒ ක්‍රීඩා සංගම්වල අරක් ගෙන, එහි නිල තලවල යෙදෙමින් ක්‍රීඩාව ඒකාධිපති ස්වරූපයට පත් කරගෙන තමන්ට වුවමනා විධියට ක්‍රීඩාව හසුරුවන්න පටන් ගෙන තිබුණා. මේ තුළ මාෆියාවක් ගොඩනැඟුණා. එම ඉහත සඳහන් කාරණා හේතු කොට ගෙන තමයි 1973 අංක 25 දරන ක්‍රීඩා පනත මේ රටට බිහි වුණේ. අද දින ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා ක්‍රීඩා පනත යටතේ නියෝග ඉදිරිපත් කරමින් විශේෂයෙන්ම මේ පනතට තවත් සංශෝධන ගෙන ඒම තමයි මේ කර තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. ජාතික ඔලිම්පික් කමිටුව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය, ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය, දූෂණයෙන් නම් දරපු ආයතන විධියට තමයි අපි මාධ්‍ය ඔස්සේ අහලා තිබෙන්නේ. ඒ වාගේම පසු ගිය රජය කාලයේ පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ගෙන ඒමට රාජ්‍ය මුදල් රුපියල් කෝටි 50කට වැඩිය වැය කළා. ඒ මුදල් වියදම් කරලා ලබා ගත්තු දෙයක් නැහැ. එය අපට යන්න බැරි ඉලක්කයක්. රටේ මෙච්චර වැඩ කරන්න තිබෙද්දී, රටේ මෙච්චර ප්‍රශ්න තිබෙද්දී හම්බන්තොටට පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙල අරගෙන යන්න ගිහිල්ලා අපේ රටේ මුදල් කෝටි ගණන් වියදම් කරපු යුගය අපි දැක්කා.

ඒ විතරක් නොවෙයි. කෝටි ගණන් මුදල් වියදම් කරලා සූරියවැව ක්‍රීඩාංගණය හැදුවා. ක්‍රීඩා අංශය හරහා මේ රටේ මහජන මුදල් නාස්ති කළා. දඹුල්ල ක්‍රීඩාංගණය හදන්න ගිහිල්ලා අපේ සල්ලි නාස්ති කළා. පල්ලේකැලේ ක්‍රීඩාංගණය හදන්න ගිහිල්ලා ජනතා මුදල් අයුතු ලෙස පරිහරණය කළා. ඒ විතරක් නොවෙයි, කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේ නවීකරණ කටයුතු ටෙන්ඩර් කැඳවීම්වලින් තොරව කරන්න ගිහිල්ලා මේ රටේ අහිංසක දුප්පත් ජනතාවගේ සල්ලි ක්‍රීඩාව මුවාවෙන් නාස්ති කරපු ආකාරය අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසාන වශයෙන් මේ කාරණය කෙරෙහි ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමාගේ අවධානය යොමු කර වනවා. මේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් ක්‍රීඩාවට නොගිය අපේ අහිංසක මිනිස්සුන්ගේ පවා මුදල් නාස්ති කරලා ඒ අය ලෝකයට ණයකාරයන් කරපු යුගයක් තිබුණා. එම යුගය අවසන් කරන්නට අපි පෙරමුණ ගත යුතුයි කියමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

The next speaker is, the Hon. Charles Nirmalanathan.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජූයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සාකච්ඡාවට අදාළව නොවෙයි, පසු ගිය අප්‍රේල් මස 06 වැනිදා සභාව කල් තැබීමේ විවාදය අවස්ථාවේදී -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා පනත යටතේ නියෝග සම්බන්ධයෙනුයි මේ අවස්ථාවේ විවාද කරන්නේ.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජූයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැන්සාඩ් වාර්තාවේ නිවැරදි කිරීමක් සිදු කිරීම සම්බන්ධයෙනුයි අවසර ඉල්ලා සිටින්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මේ ඒ සඳහා වෙලාව නොවෙයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උරුප්පිනර් ඔරුවර්)
(An Hon. Member)
ස්ථාවර නියෝග යටතේ එතුමාට ඒ සඳහා අයිතිය තිබෙනවා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මට නියමිත වේලාව. මගේ වෙලාව ගත වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මගේ time එක.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජූයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ක්‍රියාපිළිවෙත සම්බන්ධයෙන් 2016 අප්‍රේල් 06වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් විවාදයට මා සහභාගී වුණා. එදින මගේ කථාවේදී, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය නිවසක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවට ඉදිරිපත් කිරීම සඳහා මා විසින් සභාගත කරනු ලැබුවා. නමුත්, කුමක් හෝ හේතුවකින් එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙලා නැහැ. එදින මා විසින් සභාගත කරන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ඩිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මැතිනිය ඉදිරිපත් කර තිබෙන දිවුරුම් ප්‍රකාශය හැන්සාඩ්* ගත කරන ලෙස ඉල්ලා සිටිමින් මා නැවත වතාවක් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරන්නම්.

Hon. Charles Nirmalanathan, please.

[பி.ப. 2.39]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி. மට විනාඩි දහයක් ලබා දී තිබුණත්, වේලාව අඩු කර තිබෙනවා. இன்று விளையாட்டுச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் பற்றிய விவாதத்தில் என்னைப் பேச அனுமதித்தமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். எங்களுடைய பிரதேசங்களில் கடந்த 30 வருடங்களுக்கு மேலாக யுத்தம் நடைபெற்றதன் காரணமாக விளையாட்டுத்துறையில் எங்களுடைய இளைஞர் யுவதிகள் மற்றும் மாணவர்களுக்கு ஆர்வம் இருந்தாலும் அவர்களுக்குத் தேவையான விளையாட்டு உபகரணங்கள், விளையாட்டு மைதானம் போன்ற வற்றில் குறைபாடுகள் தொடர்ந்தவண்ணமே இருந்தன. அந்த நிலையில் யுத்தம் முடிவடைந்ததன் பின்னர் எங்களுடைய பிரதேசங்களில் விளையாட்டு மைதானம் அமைப்பது பற்றிப் பல தடவைகள் வாக்குறுதிகள் வழங்கப்பட்டும் அதற்கான முயற்சிகள் இன்னமும் மேற்கொள்ளப்படவில்லை என்பதை நான் இந்த நேரத்தில் விளையாட்டுத்துறை அமைச்சர் அவர்களிடம் தெரிவிக்க விரும்புகின்றேன். உதாரணமாக 2011ஆம் ஆண்டு மன்னார் மாவட்டத்திற்குரிய விளையாட்டு மைதானத்தை மன்னார் நகரப்பகுதியிலுள்ள எமில்நகர் என்ற கிராமத்தில் அமைப்பதாக அப்போதைய அரசாங்க அதிபர் வேதநாயகம் அவர்கள் திட்டமிட்டிருந்தார். அதற்குரிய ஆவணங்களும் இருந்தன. அதன் பின்பு தற்போது ஐந்து ஆண்டுகள் கடந்த நிலையில் அந்த இடம் விளையாட்டு மைதானம் அமைப்பதற்கு ஏற்றதல்ல என்று கூறி, தற்போது நானாட்டான் பிரதேச செயலகப்பிரிவிலுள்ள நறுவிலிக்குளம் என்ற இடத்தில் அதனை அமைக்க இருப்பதாக நாங்கள் அறிந்தோம். ஆனால், 2011ஆம் ஆண்டு திட்டமிடப்பட்டபடி அந்த விளையாட்டு மைதானத்தை அமைப்பதற்கான கட்டிட வேலைகளோ அல்லது அதற்குரிய ஆயத்த வேலைகளோ இன்றுவரை எடுக்கப்படவில்லை என்பதையும் நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

வன்னித் தேர்தல் மாவட்டங்களான மன்னாரில் மட்டுமல்ல, முல்லைத்தீவிலும் மாவட்ட விளையாட்டு மைதானத்திற்குரிய வேலைகள் இன்றுவரை ஆரம்பிக்கப்படவில்லை. ஆனால், வவுனியாவில் ஆரம்பிக்கப்பட்டிருக்கின்றது. எனவே, அதற்குரிய வேலைகளைத் துரித கதியில் ஆரம்பிக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். அது எப்பொழுது ஆரம்பிக்கப்படும் என்ற உத்தரவாதத்தை, கௌரவ அமைச்சர் அவர்கள் இன்று பதிலளிக்கும்போது குறிப்பிட வேண்டுமென்றும் கேட்டுக்கொள்கின்றேன்.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

2011ආම් ආණ්ඩු මන්නාර් එමිල්නගර් පිරතේසත්තිල් අමෛප්පතර්කුත් තිට්ටමිට්ටිරුන්ත විළෙයාට්ටු මෛතානත් තිර්කු 59 මිල්ලියන් රූපාය් වළංකුවතාකක් කෙළරව අමෛච්චර් අවර්කළ් කුරිප්පිට්ටිරුන්තාර්. අතුතොටර්පාක කිට්ටත්තට්ට නාන්කු මාතංකළුක්කු මුන්පු විළෙයාට්ටු අමෛච්චිලිරුන්තු මන්නාර් අරස අතිපරුක්කුක් කටිතමොන්රු වන්තු. අක්කටිතත්තිල් ඒර්මානික්කප්පට්ට ඉටත්තිල් විළෙයාට්ටු මෛතානම් අමෛප්පතර්කුරිය වේලෛකළෛත් තිට්ටමිටුම්පටියුම් අතර්කු 59 මිල්ලියන් රූපාය් වළංකු වතාකවුම් කුරිප්පිටප්පට්ටිරුන්තු. ඉන්රු නාන් තොලෛපේසි මූලම් අරසාංක අතිපරුටන් තොටර්පුකොණ්ටු, "අන්ත 59 මිල්ලියන් රූපාය්ක්කාන වේලෛත්තිට්ටත්තෛ ආරම්පිප්පතර්කු ඒතාවතු මුයර්සිකළ් එටුක්කප්පට්ටතා?" එන්රු කේට්ටපෝතු, "අන්තක් කටිතම් මට්ටුම්තාන් වන්තු; අතන්පින්පු අන්ත නටවටික්කෛකළ් සම්පන්තමාක එන්තවිත අරිවිත්තලුමිල්ලෛ" එන්රු අවර් සොන්නාර්. අතු නටෛපෙරුවතු සාත්තියප්පටුමා එන්ර සන්තේකත්තිල්තාන් අවර් පතිලළිත්තාර්. අන්ත මෛතානත්තෛ මිකවිරෛවිල් උතෛපන්තාට්ට මෛතානමාක ආක්කුවතර්කු අන්ත 59 මිල්ලියන් රූපායෛ වළංකුවතාක කෙළරව අමෛච්චර් අවර්කළුම් එන්නිටම් තනිප්පට්ට මුරෛයිල් නේරටියාකත් තෙරිවිත්තිරුන්තාර්. ආනාල්, ඉන්රුවරෛ අතුතොටර්පාන මුයර්සිකළ් එටුක්කවිල්ලෛ. එනවේ, අන්තප් පණත්තෛ මික විරෛවිල් වළංක වේණ්ටුමෙන්රු ඉච්චන්තර්ප්පත්තිල් කේට්ටුක්කොළ්කින්රේන්. ඒනෙන්රාල්, මන්නාර් මාවට්ටම් උතෛපන්තාට්ටත්තිල් මිකවුම් තේර්ච්චිපෙර්ර වීරර්කළෛක් කොණ්ටුළ්ළතු. ඉලංකෛත් තේසිය අණියිල් මන්නාර් මාවට්ටත්තෛච් චේර්න්ත ඉරණ්ටු වීරර්කළ් උළ්ළනර් එන්පතෛයුම් ඉන්ත නේරත්තිල් නාන් පෙරුමෛයුටන් සොල්ලික්කොළ්ළ විරුම්පුකින්රේන්.

අත්තුටන්, එංකළුටෛය පිරතේසංකළිල් යුත්තම් නටෛ පෙර්රතන් කාරණමාක ඉව්වළවු කාලමුම් Cricket Associations පතිවු සෙය්යප්පටවිල්ලෛ. යුත්තම් මුටිවටෛන්ත පින්පුම් කුරිප්පාක මන්නාර්, කිළිනොච්චි, මුල්ලෛත්තීවු ආකිය මූන්රු මාවට්ටංකළිලුම් ඉරුක්කින්ර Cricket Associations ඈප් පතිවු සෙය්වතිල් මත්තිය අමෛච්චර් අවර්කළුම් 'කිරික්කට්' සපෛයින් තලෛවර් - පාරාළුමන්රප් පිරතිච් චපානායකර් අවර්කළුම් අසමන්තප්පෝක්කෛක් කාට්ටිවරුකිරාර්කළ්.

මන්නාර්, මුල්ලෛත්තීවු, කිළිනොච්චි ආකිය මාවට්ටංකළිලුළ්ළ Cricket Associations තොටර්න්තුම් පතියප්පටාමල් ඉරුප්පතර්කාන තකුන්ත කාරණංකළෛක් කූර වේණ්ටුම්. අවර්රෛප් පතිවතර්කු අවර්කළ් කේට්ට විපරංකළ් මර්රුම් උරිය ආවණංකළෙල්ලාම් කිරික්කට් චපෛයින් තලෛවරාන එංකළුටෛය පිරතිච් චපානායකර් අවර්කළිටම් ඔප්පටෛක් කප්පට්ටු විට්ටන. මන්නාර් මාවට්ටත්තිර්කුරිය ආවණංකළෛ නාන් නේරටියාක අවරිටම් ඔප්පටෛත්තේන්. ආනාල්, ඇන්රුවරෛ අන්ත Cricket Associations ඇනෛප් පතිවතර්කුරිය මුයර්සිකළ් එටුක්කප්පටවිල්ලෛ. ඉතර්කුරිය කාරණම් එන්නවෙන්රු එංකළුක්කුත් තෙරියවිල්ලෛ. එංකළුටෛය පකුතියිල් ඉරුක්කින්ර විළෙයාට්ටු වීරර්කළුක්කුත් තේසිය රීතියිල් විළෙයාටත් තකුතියිරුන්තුම් කළකංකළ් පතිවු සෙය්යප්පටාතතන් කාරණමාක නේරටියාක අවර්කළාල් තේසිය අණික්කුච් චෙල්ල මුටියාමල් ඉරුක්කින්රතු. මුක්කියමාක අන්ත මූන්රු මාවට්ටංකළිනෙතුම් Cricket Associations ඇනෛ නීංකළ් එන්න කාරණත්තිර්කාක ඉව්වළවු කාලමුම් පතියාමල් තාමතිත්තුක් කොණ්ටිරුක්කින්රීර්කළ්? ඒන්, ඉන්ත අසමන්තප් පෝක්කු? එංකළුටෛය වීරර්කළුටෛය කොටුප්පනවුකළුම් පතිවින්මෛ කාරණමාක කිටෛක්කප් පෙරුවතිල්ලෛ; ඉන්ත Cricket Associations පතියප්පටාමල් ඉරුප්පතන් කාරණමාක වරුටාවරුටම් කිරික්කට් චපෛයාල් ඔතුක්කප්පටුකින්ර නිතියෝ අල්ලතු විළෙයාට්ටු උපකරණංකළෝ අවර් රුක්කුක් කිටෛප්පතිල්ලෛ. ආකවේ, ඉන්ත මූන්රු මාවට්ටංකළුක්කුම් උරිය Cricket Associations ඉන් පතිවුකළෛ තංකළුටෛය මේලාන කවනත්තිර්කොණ්ටු මික විරෛවිල් මේර්කොළ්ළුම්පටි තාழ්මෛයාකක් කේට්ටුක්කොළ්කින්රේන්. ඉප්පෝතු අමෛච්චර් අවර්කළුම් චපෛක්කුළ් වරුකින්රාර්. නල්ල චන්තර්ප්පම්!

මේලුම්, මුල්ලෛත්තීවු මාවට්ටත්තින් මුළ්ළිවාය්ක්කාල් පකුතියිල් 15 ඒක්කර් නිලම් චර්වතේස කිරික්කට් විළෙයාට්ටු මෛතානම් අමෛප්පතර්කෙන්රු ඔතුක්කප්පට්ටිරුක්කින්රතු. අතු පර්රියුම් නාන් අමෛච්චර් අවර්කළින් කවනත්තිර්කුක් කොණ්ටුවරුකින්රේන්. ඉංකු නාන් කුරිප්පිට්ට විටයංකළෛ මික විරෛවිල් නිරෛවේර්රිත් තරුවතෝටු, එංකළුටෛය පකුති විළෙයාට්ටු වීරර්කළුම් තේසිය අණික්කුච් චෙන්රු එමතු මාවට්ටංකළින් පෙරුමෛයෛ නිලෛනාට්ටක්කූටිය වකෛයිල් අන්ත විළෙයාට්ටු මෛතානංකළෛ අමෛත්තුත් තරුමාරුම් කෙළරව අමෛච්චර් අවර්කළෛත් තාழ්මෛයුටන් කේට්ටුක් කොළ්කින්රේන්.

කෙළරව අමෛච්චර් අවර්කළ් චපෛයිල් ඉරුප්පතාල්, නාන් එමිල්නගර් විළෙයාට්ටු මෛතානම් චම්පන්තමාක අවරිටම් කූරලාමෙන නිනෛක්කින්රේන්

ගරු ඇමතිතුමනි, ඔබතුමා අපට පොරොන්දු වුණා මන්නාරම town එක ළඟ තිබෙන ground එකට Rs. 59 million දෙනවා කියලා. ඒ ලිපි පමණයි ඇවිල්ලා තිබෙන්නේ. අපට ඒ සම්බන්ධයෙන් උත්තර ලැබිලා නැහැ. මම GA ට කථා කළා. GA මට කිව්වා, ඒ ගැන එපමණ බලයක් දීලා නැහැ කියලා. ඒ ගැන ඔබතුමා පිළිතුරක් ලබා දුන්නොත් හොඳයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමාට කියන්න කැමැතියි, CECB එකෙන් දැන් ඒ ඇස්තමේන්තු හදාගෙන යනවා. සල්ලි ඇවිල්ලායි තිබෙන්නේ. සල්ලි තිබෙනවා, ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. CECB එකෙන් ඇස්තමේන්තු සකස් කර ගෙන යනවා. ඇස්තමේන්තු ටික ලැබුණු ගමන් එය හදන්න පටන් ගන්නවා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

ගරු ඇමතිතුමනි, මම district complex එක ගැන නොවෙයි කියන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැහැ. නැහැ. මම දන්නවා. පුරවලා හදන්න තිබෙන එක නේ.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

ඔව්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

Rs. 59 million දුන්න එක. ඒක හරි. දැන් CECB එකෙන් ඇස්තමේන්තු සකස් කර ගෙන යනවා. ඇස්තමේන්තු ලැබුණු ගමන් සල්ලි යොදවා හදන්න පුළුවන්. එහි කිසි ගැටලුවක් නැහැ.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Thank you.

ගරු ඇමතිතුමනි, අනික් කාරණය මුලතිව්, මන්නාරම හා කිලිනොච්චි නගර Cricket Association එකේ register කිරීම සඳහා අපට සෑහෙන කාලයක් යනවා. ඒ දිස්ත්‍රික්ක තුනට අදාළව documents ඔක්කෝම දීලා ඉවරයි. අපේ Deputy Speaker තමයි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ President. මෙපමණ කාලයක් ගිහිල්ලාත් register කර නැහැ කියලා අපේ associationsවල කට්ටියට දැන් එපා වෙලා තියෙන්නේ. ඒ සම්බන්ධයෙනුත් ඇමතිතුමාගේ අවධානය යොමු කර වනවා. ගරු ඇමතිතුමා මම කලින් සඳහන් කළ දිස්ත්‍රික් තුන සම්බන්ධයෙන් ඒ ලියා පදිංචි කිරීම ඉක්මනින් කරලා දෙන්න. Thank you.

[பி.ப. 2.51]

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - புனர்வாழ்வளிப்பு மற்றும் மீள்குடியேற்ற இராஜாங்க அமைச்சர்)
(The Hon. M.L.A.M. Hizbullah - State Minister of Rehabilitation and Resettlement)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விளையாட்டுத்துறை அமைச்சு சம்பந்தமான இந்த விவாதத்திலே கலந்துகொள்வதில் நான் மிகவும் மகிழ்ச்சியடைகின்றேன். விளையாட்டுத் துறையை முன்னேற்றி அதனூடாக இனங்களுக்கிடையிலே குறிப்பாக இளைஞர்களிடையே புரிந்துணர்வை ஏற்படுத்தி ஒற்றுமையை வளர்த்தெடுப்பதிலே மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களுடைய தலைமையில் கௌரவ அமைச்சர் தயாசிறி ஜயசேகர அவர்கள் எடுத்துவருகின்ற முயற்சிகளை நான் பாராட்டுகின்றேன். விளையாட்டுத்துறை என்பது வெறுமனே விளையாட்டோடு மாத்திரம் மட்டுப்படுத்தப்படவில்லை. அது இளைஞர்களுக்கு மத்தியிலே ஒற்றுமையை ஏற்படுத்துகின்ற ஒரு துறையாகும். குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களிலே தமிழ், முஸ்லிம், சிங்கள இளைஞர் - யுவதிகள் மத்தியிலே ஒற்றுமையை ஏற்படுத்துவதில் முக்கிய அம்சமாக இந்த விளையாட்டுத்துறை திகழ்கின்றது. அந்த வகையில், விளையாட்டுத்துறையை முன்னேற்றுவதில் கௌரவ அமைச்சர் அவர்கள் அதிக அக்கறை செலுத்த வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்திலே நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

பல்வேறுபட்ட விளையாட்டுக் கழகங்களுக்கு விளையாட்டு உபகரணங்கள் இல்லை. அதனால் சிறப்பான முறையிலே விளையாட முடியாமல் அவர்கள் இருக்கின்றார்கள். குறிப்பாக யுத்தம் காரணமாகப் பாதிக்கப்பட்ட இளைஞர்கள் அவர்களுடைய பிரதேசங்களிலே விளையாடுவதற்கு மைதானம் இல்லாமை பாரிய பிரச்சினையாக இருக்கின்றது. வடக்கு, கிழக்கு முழுவதிலுமே விளையாட்டு மைதானப் பற்றாக்குறை இருந்து வருகின்றது. ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவிலும் ஆகக் குறைந்தது ஒரு விளையாட்டு மைதானத்தையாவது அபிவிருத்தி செய்வதற்கு முயற்சிகளை எடுத்தபோதும் அது கைகூடவில்லை.

ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே, குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களிலே ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவிலும் ஆகக்குறைந்தது ஒரு விளையாட்டு மைதானத்தையாவது உருவாக்கவேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்திலே நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அண்மையிலே அபிவிருத்தி செய்யப்பட்ட மட்டக்களப்பு விளையாட்டு மைதானத்தைக் கௌரவ அமைச்சர் அவர்களின் ஒத்துழைப்போடு மேதகு ஜனாதிபதி அவர்கள் திறந்து வைத்தார். அதேபோன்று காத்தான்குடி ஹிஸ்புல்லா விளையாட்டு மைதானம் ஏற்கெனவே உங்களுடைய அமைச்சினால் அபிவிருத்தி செய்யப்பட்டு இன்று இடைநடுவிலே நிற்கின்றது. கௌரவ அமைச்சர் அவர்களும் கௌரவ பிரதி அமைச்சரும் நண்பருமான ஹரிஸ் அவர்களும் இங்கிருக்கின்றார்கள். அதிகளவான நிதி செலவு செய்யப்பட்ட நிலையிலும் அந்த மைதானத்தின் வேலைகள் முடிவுறாது இடைநடுவிலே நிறுத்தப்பட்டிருக்கின்றன. கௌரவ பிரதி அமைச்சர் அவர்களும் கிழக்குப் பகுதியைச் சேர்ந்த ஒருவர் என்பதால், இந்த மைதானத்தை முழுமையாகப் பூரணப்படுத்துவதற்குரிய நடவடிக்கைகளை எடுக்கவேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்திலே நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் ஸ்ரீநேசன் அவர்களும் இங்கிருக்கின்றார்; வவுணதீவுப் பிரதேச செயலகத்தில் நடத்திய கூட்டமொன்றில் நாங்கள் கலந்துகொண்டபோது அந்தப் பிரதேச செயலகப் பிரிவில் நீண்டகாலமாக ஒரு விளையாட்டு மைதானம் இல்லாத குறைபாடு தெரியப்படுத்தப்பட்டது. அந்தப் பிரதேசம் யுத்தத்தினால் மிகவும் மோசமாகப் பாதிக்கப்பட்டதாகும். ஆகவே, கௌரவ அமைச்சர் அவர்களும் கௌரவ பிரதி அமைச்சர் அவர்களும் வவுணதீவுப் பிரதேச செயலகப் பிரிவில் சகல வசதிகளையும் கொண்ட ஒரு விளையாட்டு மைதானத்தை அமைத்துத் தரவேண்டும். அதற்குத் தேவையான இடத்தைப் பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்கள் பெற்றுத்தருவதற்கு ஆயத்தமாக இருக்கின்றோம். அதற்கான ஏற்பாடுகள் அங்கு நடைபெற்றுக் கொண்டிருக்கின்றன.

எனவே, அதனை நீங்கள் நிறைவேற்றித் தரவேண்டுமென்று இச்சந்தர்ப்பத்திலே நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, குறிப்பாக விளையாட்டுத்துறை ஒற்றுமையை ஏற்படுத்துகின்ற ஓர் அம்சமாக இன்று மாறியிருக்கின்றது. சில சமூகவிரோத சக்திகள் இனரீதியாகவும் மதரீதியாகவும் முறுகல் நிலையை ஏற்படுத்தி, சமூகங்களுக்கு மத்தியில் பிளவுகளை ஏற்படுத்துவதற்குத் திட்டமிட்டுச் செயற்படுகின்றன. அவை இனங்களைப் பிரித்து தங்கள் சொந்த அரசியல் இலாபங்களை அடைவதற்காக முனைகின்ற இந்தச் சூழ்நிலையிலே குறிப்பாக, இளைஞர்களுக்கு மத்தியில் ஒற்றுமையையும் புரிந்துணர்வையும் ஏற்படுத்துவதற்கு மிகமுக்கியமான ஒரு சக்தியாக இருப்பது விளையாட்டுத்துறையாகும். இதன்மூலம் அவர்கள் ஒற்றுமையோடு ஒன்றுபட்டுச் செயற்படுவார்கள். ஆகவே, அந்த ஒற்றுமையையும் இன நல்லுறவையும் வளர்ப்பதற்கு இந்த விளையாட்டுத்துறையை முன்னேற்ற வேண்டும். இதற்கு விளையாட்டு மைதானங்களை அபிவிருத்தி செய்வது மாத்திரமல்ல, விளையாடுவதற்கான சூழ்நிலைகளையும் உருவாக்க வேண்டும். அதாவது, பிரதேச ரீதியாக, மாவட்ட ரீதியாக சிங்கள, முஸ்லிம், தமிழ் இளைஞர்கள் ஒன்றுசேர்ந்து விளையாடுவதற்கான ஏற்பாடுகளை விளையாட்டு அமைச்சு செய்ய வேண்டும். குறிப்பாகச் சிங்கள, முஸ்லிம், தமிழ் பிரதேசங்களைச் சேர்ந்த இளைஞர்களை ஒன்றுதிரட்டி 'கிரிக்கெட்', football போன்ற விளையாட்டுக்களை விளையாடுகின்றபோது அவர்கள் மத்தியில் புரிந்துணர்வு, ஒற்றுமை என்பன ஏற்படும். இன்று எமது நாட்டுக்குத் தேவையான முக்கியமான அம்சம் இந்தப் புரிந்துணர்வும் ஒற்றுமையும்தான். இவற்றை நாங்கள் வளர்க்காமல் இந்த நாட்டைக் கட்டியெழுப்ப முடியாது.

[ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා]

இதனை இழந்ததன் காரணமாகத்தான் இந்த நாடு பல்வேறு பட்ட சோதனைகளைச் சந்தித்தது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் இளைஞர்கள் மத்தியில் புரிந்துணர்வையும் ஒற்றுமையையும் ஏற்படுத்துவதற்கு அதிகளவான முயற்சிகளை எடுக்க வேண்டுமென்று இச்சந்தர்ப்பத்தில் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 2.58]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා පනත යටතේ නියෝග ගෙන එමින් සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරන අවස්ථාවේ පොදුවේ ක්‍රීඩා අමාත්‍යාංශයත්, ක්‍රීඩා සම්මේලන පිළිබඳවත් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වෙනවා. ඒ යටතේ මම මුලින්ම ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද සමහර සංශෝධනවල, -මෙහි තිබෙන මූලික කරුණු අනුව- පදනම මොකක්ද කියලා දැන ගන්නට කැමැතියි. මේ සංශෝධන අනුව ඔබතුමා "රහස්‍ය ඡන්දය මඟින්" කියන එක "අත් එසවීම් මඟින්" කියලා වෙනස් කරනවා. රහස්‍ය ඡන්දය සහ අත් එසවීම කියන්නේ විවාද කරන්නට තරම් දෙයක් නොවෙයි. නමුත් ඔබතුමා දන්නවා මේ දෙකම රුපියල් ලක්ෂ කෝටි ගණන්වලින් ගනු-දෙනු වෙන වැඩක් බව. එක්තරා විධියකට ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදීම ඡන්ද ක්‍රමය කියලා පිළිගන්නේ රහස්‍ය ඡන්දයයි. පසු ගිය කාලයේ සම්මේලන, නිලවරණවල සිදු වුණු මහ විශාල මුදල් ගනුදෙනු දිහා බැලුවාම, රහස්‍ය ඡන්දය නැතිව අත් එසවීම කියන තැනට ගියාම දැනටත් ආයතනගත වෙලා තිබෙන වංචනික ස්වභාවය වැඩි වෙන්නට පුළුවන් නේද කියන ප්‍රශ්නය අපට පැන නඟිනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

එම ප්‍රශ්නය නැඟීම සම්බන්ධව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ සංශෝධනය අදාළ වෙන්නේ වෙන හේතුවක් නිසා නොවෙයි. ක්‍රිකට් ආයතන නිලවරණයේදී අපට විශාල ප්‍රශ්නයක් ආවා. මම හිතනවා ඔබතුමා ඉතිහාසය ටිකක් දන්නා කෙනෙක් කියලා. සාමාන්‍යයෙන් දිස්ත්‍රික් සංගම්වල කැමැත්ත අරගෙන තමයි ජාතික සංගමයේ ඡන්දය දෙන්න එන්නේ. නමුත් දිස්ත්‍රික් සංගමයේදී එකඟ වෙලා ඇවිල්ලා රහස් ඡන්දය දෙන විට මුදල් ගනුදෙනු මත වෙනත් පුද්ගලයින්ට ඡන්දය ලබාදෙන වැඩ පිළිවෙළක් දිගටම ක්‍රියාත්මක වුණා. එය වැළැක්විය හැකි වන්නේ මේ අත් එසවීමේ ඡන්ද ක්‍රමය මඟිනුයි. අපි හිතමු කුරුණෑගල දිස්ත්‍රික් සංගමය තීරණයක් ගන්නවා "x" කියන පුද්ගලයාට ඡන්දය දෙන්න. ඒ අනුව ජාතික සංගමයට ඇවිල්ලාත් "x" කියන පුද්ගලයාට අත ඔසවන්නට පුළුවන්. මොකද, ඔහු දිස්ත්‍රික් සංගමයේ mandate එක තමයි ජාතික සංගමයේදී ඡන්දය දෙන්න අරගෙන එන්නේ. නමුත් ඉස්සර කළේ එහෙම නොවෙයි. දිස්ත්‍රික් සංගමයෙන් තීන්දුවක් ගන්නවා "x" කියන කෙනාට ඡන්දය දෙන්න. නමුත් ඇවිල්ලා රහස් ඡන්දයේදී "y"ට ඡන්දය දෙනවා. නමුත් ඒක දිස්ත්‍රික් සංගමයේ නියම mandate එක නොවෙයි. එතැනදී තමයි මේ හොරය සිදු වුණේ. නමුත් මෙවර ඒ සිද්ධිය සම්පූර්ණයෙන්ම නැවතුණා. කාටවත් සල්ලි දෙන්න වුවමනා නැහැ. දිස්ත්‍රික් සංගමයට ගිහින් කථා කරන්නට අපේක්ෂකයෝ දෙදෙනාටම අයිතිවාසිකම තිබුණා. කථා කළාම ඒ අය තීන්දුවක් ගෙන ජාතික සංගමයේදී ඡන්දය දුන්නා. අනෙක් වතාවලට වඩා වෙනස් තත්ත්වයක් මෙවර ඇති වුණේ ඒ කාරණය නිසා කියලා තමයි මට කියන්නට තිබෙන්නේ. මේ ක්‍රමය බොහොම සාධාරණයි කියලා මම විශ්වාස කරනවා.

මොකද, පෙර තිබුණු ක්‍රමයේදී මෙන්න මෙහෙම සිද්ධියක් වුණා. ඒ ක්‍රමයට අපි කියන්නේ "නෙල්සන්" කියලා. එක ක්‍රීඩා සමාජයක නෙල්සන් කියන පුද්ගලයා බොහොම පැහැදිලිව මම පෙර සඳහන් කළ ක්‍රියාව කළා. ක්‍රීඩා සංගමයට ප්‍රශ්න කරන්නට විධියක් නැහැ. මොකද, එහි නියෝජිතයා විධියට තමයි ඔහු ගියේ. නමුත් ඔහු ඡන්දය දුන්නේ වෙනත් පුද්ගලයකුට. අන්න ඒ ක්‍රියාදාමය තුළයි අත යට ගනු-දෙනු සිද්ධ වෙන්නේ. ඒකයි මම විශ්වාස කරන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, ඇත්තටම ඒකෙන් වෙන්නේ සංගමයේ කැමැත්ත අදාළ ඡන්ද විමසීමේදී ක්‍රියාත්මක නොවීම පමණයි. නමුත් එහිදී මුදල් කථාව නතර වෙන්නේ නැහැ. එතකොට වැඩිපුර මුදල් තිබෙන අයට දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ක්‍රීඩා සංගමයක් ගන්න පුළුවන්නේ. දැන් ගොඩක් සිදු වෙලා තිබෙන්නේත් ඒක නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම ඔබතුමාට තවත් කරුණක් කියන්නම්, ගරු මන්ත්‍රීතුමනි. මොකද, සමහර දිස්ත්‍රික් සංගම්වලට පසු ගිය කාලයේ ඡන්ද බලාගෙනම සල්ලි දුන්නා. ඒ කියන්නේ ඡන්දයට පෙරාතුවත් තමන්ට ඡන්ද ටික ගන්න පුළුවන් ඒවාට සල්ලි දුන්නා. මේ සංශෝධනය ආවාම ඒක කරන්නට බැහැ. මෙහිදී කලින් ඡන්දය දෙන්න බැහැ. නමුත් ජාතික සංගමයේ අපේක්ෂකයෝ ගිහිල්ලා ඒ ගොල්ලන්ගේ Development Plan එක මොකක්ද කියලා දිස්ත්‍රික් සංගම් සමඟ සාකච්ඡා කරනවා.

ඒ සාකච්ඡාවේදී යම් කිසි විධියකින් ඒ ගොල්ලන්ගේ තීන්දු තීරණ ටිකට එකඟ වුණා නම් ඒ ක්‍රිකට් සමාජයට පුළුවන් තීන්දුවක් ගන්න. ඒ ගොල්ලන්ගේ Ex-Co එකත්, මුළු සංගමයත් එකතු වෙලා "මේ පුද්ගලයා අපට මේ අවස්ථාවේදී උදව් කරනවා කියලා ඇවිල්ලා තිබෙනවා." කියලා ඡන්දයක් තියලා ඒ ගොල්ලන් ගන්නවා. අර පුද්ගලයා එන්නේ අරගොල්ලන්ගේ කැමැත්ත අරගෙන ඒ කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහායි. හැබැයි, ඇවිල්ලා කරන්නේ වෙනත් දෙයක් නම් එතැනදී ප්‍රශ්නයක් එනවා. අන්න ඒකයි තිබෙන ප්‍රශ්නය වන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, ඒ ප්‍රාදේශීය සංගමයේ කමිටු රැස්වීමේදී තීන්දුවක් ගන්නවා නේ. එතකොට ඒක ලිඛිතව ගත්තොත් ගැටලුවක් ඇති වනවාද? උදාහරණයක් විධියට කුරුණෑගල සංගමය කියනවා, ඔවුන් කැමැති "x" කියන පුද්ගලයාටයි කියලා. ඒක නිශ්චිත ආකාරයට ලිඛිතව ගන්න බැරිද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

සාමාන්‍යයෙන් Ex-Co එකට එන්නේ අර නියෝජිතයන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

එහෙම ආ යුතුයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

උදාහරණයක් විධියට නීතිඥ සංගමයක් කියලා හිතමු කෝ. කුලියාපිටිය නීතිඥ සංගමයේ සභාපති, ලේකම් දෙදෙනා ජාතික නීති සංගමයට සභභාගි වනවා. එතකොට ඔවුන් තීන්දුවක් ගන්නවා, ඔවුන් සභයෝගය දෙන්නේ කාටද කියලා. හැබැයි, මේකේ තිබෙන වෙනස තමයි ඒ යන අතරතුරේ දැන ගන්න පුළුවන්, කාටද යම් කිසි විධියකින් බහුතර ඡන්ද ප්‍රමාණයක් තිබෙන්නේ කියලා. ඒකත් එක්තරා විධියකින් සාකච්ඡා වෙලා තීන්දු වන කාරණයක් බවට පත් වෙනවා. ඔබතුමා කියන විධියට මේ කටයුත්ත හංගාගෙනම ඉඳලා කරන්න ඕනෑ තැනුත් තිබෙනවා. මා ඒක පිළි ගන්නවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, ක්‍රිකට් සම්බන්ධව අපට යම් පැහැදිලි අදහසක් තිබෙනවා. නමුත්, අනෙකුත් ආයතන තිබෙනවා. ඒවායේදී මා පිළි ගන්නවා ප්‍රාදේශීය සංගමය ගන්න මතය තමයි අදාළ පුද්ගලයා නිලවරණයේදී ප්‍රකාශ කළ යුත්තේ කියලා. ඒ ගැන කිසිම විවාදයක් නැහැ. නමුත්, මේකෙන් සුවිශාල බලපෑමක් ඒ ප්‍රාදේශීය සංගම්වලට සිද්ධ වනවා. බොහෝ ප්‍රාදේශීය සංගම් තුළ ඇත්තටම ප්‍රායෝගිකව ක්‍රියාකාරී කණ්ඩායමක් නැහැ. ඉන්නේ දෙතුන් දෙනායි. අපි දන්නවා, තරගවලට ඉදිරිපත් වන්නේ වැඩි බලයක් සහිත පුද්ගලයින් බව. සමහර වෙලාවට හමුදාවේ අය ඉදිරිපත් වෙනවා. සමහර වෙලාවට පොලීසියේ අය ඉදිරිපත් වනවා. සමහර වෙලාවට ව්‍යාපාරිකයෝ ඉදිරිපත් වනවා. සමහර වෙලාවට රූපවාහිනී නාළිකාවල අය ඉදිරිපත් වනවා. එතකොට වෙන්නේ මොකක්ද? ඡන්දයට කලින් තරගයේ ප්‍රතිඵලය ඇවිල්ලා ඉවරයි.

දැන් මේක ගැසට් එකට දමා තිබෙන නිසා මා දන්නේ නැහැ ඊළඟට මොනවාද කරන්න තිබෙන්නේ කියලා. පැහැදිලිවම මේකෙන් වෙන්න පුළුවන් සාධාරණව, අවංකව, ක්‍රීඩාවට යම් කිසි උදව්වක් කරන්න එන පරිපාලකයෙකුට ඒ අවස්ථාව නැති වීම. ක්‍රිකට්වලට කවුරුත් අවංකව උදවු කරන්න එන්නේ නැහැ නේ. මා විශ්වාස කරන විධියට ඔක්කෝම එන්නේ හොරකම් කරන්න. නමුත්, ඔය පොඩි පොඩි ක්‍රීඩා තිබෙනවානේ. ඒවාට යම් කිසි සේවයක් කරන්න එන්න කෙනෙකුට බැරි වෙනවා මේක නිසා. මොකද, ඔබතුමා දන්නවා දේවාලවල බස්නායක නිලමේවරු පත් කරන තරග ගැන. ඉහළම රාජ්‍ය නිලධාරීන්ගේ ඡන්ද භාවිත කරන ඒවායේදී පවා අතිවිශාල ලෙස මා කලින් කියාපු තත්ත්වය දකින්න තිබෙනවා. ඒ නිසා මේ ගැන ඔබතුමා නැවත හිතා බලන්නය කියන ඉල්ලීම මා කරනවා.

"යම් ක්‍රීඩාවක් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර ඇති, එම ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීමෙහිලා කාර්යයක් ඉටු කර ඇති පුද්ගලයන් යම් ජාත්‍යන්තර සංගමයක් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට පත් කරනු ලැබිය හැකිය" කියලා මෙහි සඳහන් කර තිබෙනවා. ඒක හරි නේ. ඊළඟට කියා තිබෙනවා, "එහෙත් ඉහත කී නිර්ණායක කිසිවක් නොමැති වුවද, එකී සංගමයේ පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්දක් සහිත යම් තැනැත්තෙකු ජාතික සංගමයේ නිර්දේශය සහිතව ඇමතිවරයා විසින් වසර දෙකකට වැඩි කාලයක් සඳහා පත් කරනු ලැබිය හැකිය" කියලා. මා දන්නේ නැහැ, ඒකේ තේරුම මොකක්ද කියලා. "...වසර දෙකකට වැඩි කාලයක් සඳහා පත් කළ හැකිය." කියලා සඳහන් කර තිබෙනවා. ඒක අඩු කාලයක්ද, වැඩි කාලයක්ද?

අනික ගරු ඇමතිතුමනි, මේක ක්‍රියාත්මක කරද්දී ක්‍රීඩා පනත අනුව යම් නිර්ණායකයක් තිබෙනවානේ. "ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීමෙහිලා කාර්ය භාරයක් ඉටු කර ඇති පුද්ගලයන් යම් ජාත්‍යන්තර සංගමයක් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට පත් කරනු ලැබිය හැකිය." කියලා කියන කොට ලංකාව නියෝජනය කර තිබෙන්න ඕනෑය කියන එක නේ කියන්නේ. එතකොට ලංකාව නියෝජනය කරපු කෙනෙකු නැති නම් පමණක් මේ නිර්ණායකය දමන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒකට හේතුවක් තිබෙනවා.

උදාහරණයක් විධියට අපි හිතමු හොකීවලට ලංකාව නියෝජනය කරමින් කවුරුවත් ඉදිරිපත් වෙලා නැහැ කියලා. එවැනි අවස්ථාවකදී පමණක් මේ බලය ජාතික සංගමය හරහා ඔබතුමාට ගන්න කියන එකයි කියන්නේ. ඔබතුමා දන්නවා මේවායේ තිබෙන කැපිලි, කෙටිලි විවිධ ප්‍රශ්න නිසා සුදුසුකම් තිබෙන පුද්ගලයකු සිටියදී පවා මේ නිර්ණායකය ක්‍රියාත්මක වෙන්න පුළුවන් බව. එතකොට තමයි කැරම්වත් ගහපු නැති මිනිස්සු වොලි බෝල්, football clubs වලට පත් වෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ නියෝග නිකුත් කරලා තිබුණේ 2015.11.09 දින. ඒ කියන්නේ මා වැඩ බාර ගන්න කලිනුයි.

කෙසේ වෙතත් අපේ සමස්ත නියෝග ප්‍රමාණයම සංශෝධනය වන වැඩ පිළිවෙළක් ළඟදි සකස් කරලා තිබෙනවා. දැන් ඒක නීතිපතිවරයා ළඟ තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අර 56 කියන වගන්තියද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. මුළු සමස්ත ක්‍රීඩා නීතියම,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
පනත?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

පනත නොවෙයි. 'නියෝග' ලෙස ගෙනත් සංශෝධනය කරන්න අපේ බලාපොරොත්තුවක් තිබෙනවා. මොකද, විශේෂයෙන්ම දේශපාලන වශයෙන් ඇඟිලි ගැසීම් සහ පරිපාලනමය වශයෙන් ඇඟිලි ගැසීම් කරන්න එපාය කියලා 2009 ඉඳලා අන්තර්ජාතික ඔලිම්පික් කමිටුවෙන් ගෙනා යෝජනාවලියක් තිබෙනවා. ඒ නිසා අපි යම් යම් කාරණාවලට යටත්ව සමස්ත වැඩ පිළිවෙළ අවසන් කර තිබෙනවා. ඒ සංශෝධන නීතිපතිතුමා ළඟ තිබෙනවා. ඔබතුමාගේ මෙම කාරණාව පිළිබඳව මම වෙනම සාකච්ඡාවක් කරලා,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මේක වැඩක් නැහැ, ඇමතිතුමා. අවුරුදු දෙකකට වඩා වැඩි කාලයක් සඳහා පත් කරනවා කියන එක නම් මෙහි තිබෙන්නේ

[ගරු බිමල් රත්නායක මහතා]

ඒක ගැටලුවක් බවට පත් වෙනවා. මමත් මේ පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක් කරලා නොවෙයි කථා කරන්නේ. නමුත් මට ලැබී තිබෙන සටහන් සහ මම අධ්‍යයනය කරපු ප්‍රමාණය අනුවයි මම මේ කියන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ගැන අපි එතැනදී සාකච්ඡා කරමු.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ඊළඟ කාරණය තමයි දේශපාලනඥයන් ක්‍රීඩා සංගම්වල සභාපති තනතුරුවලට පත්වෙන එක. ඔබතුමාගේ නියෝගවලට මේ කාරණය සෘජුව සම්බන්ධ නැහැ. නමුත් ඔබතුමා දැන් "ජාතික සංගමයට හෝ අනුබද්ධිත ක්‍රීඩා සමාජයක ධුරයක් දැරීම සඳහා පහත සඳහන් අය නුසුදුසුය" කියලා සඳහන් කරලා තිබෙනවා. එහි යම් කරුණු ප්‍රමාණයක් තිබෙනවා. වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ වැරදි කරපු අය ගැන. නමුත් ඒ අතර මේ වගේ දේවලුත් තිබෙනවා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, "යම් මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයක ජනමාධ්‍යවේදියෙක් හෝ එවැනි ජාලයක අයිතිකරුවෙක්", ඒ වාගේම, "නිශ්චිත ජාතික සංචිතයක හෝ ජාතික කණ්ඩායමේ තරගකරුවකුගේ දෙමව්පියෙකු හෝ සහෝදර සහෝදරියක්" ඒ වෙලාවේ තනතුරක් දරමින් ඉන්නවා නම් හොඳ නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
එහි ඔව්වර ප්‍රමාණයක් සඳහන් වෙලා නැහැ. කොහෙන්ද ඔය ලියව්ල්ල ගත්තේ?

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා කියන්නේ "නියෝග" පිළිබඳව නේ. මම "නියෝග" සම්බන්ධව නෙවෙයි මේ කථා කරන්නේ. මේ කාරණය ඒ සම්බන්ධයෙන් නොවෙයි. ඔබතුමන්ලාගේ ක්‍රීඩා පනතට අනුව ගත්තොත් "ජාතික සංගමයක හෝ අනුබද්ධිත ක්‍රීඩා සමාජයක ධුරයක් දැරීම" සම්බන්ධව මේ වගේ කරුණු ප්‍රමාණයක් තිබෙනවා. නමුත් දේශපාලනඥයන් සම්බන්ධව ඒ තත්ත්වය නැහැ. මම දන්නවා, පසු ගිය රාජපක්ෂ පාලන කාලයේ මේ තත්ත්වය වසංගතයක් වශයෙන් තිබුණා. ඔවුන්ට හැම තනතුරකටම එන්න ඕනෑකම තිබුණා. දේවාලවලට, ක්‍රීඩා සංගම්වලට, කාන්තා සමිති වාගේ හැම දේකටම. දැන් ඒ රෝගය තිබෙන්නේ එක්කෙනාටයි, දෙන්නාටයි. ඒ රෝගය වෙනුවෙන් අපි ක්‍රීඩාවන් බිලි දිය යුතු නැහැ කියලා මම හිතනවා.

දැන් මා සතුව පුවත් පත් වාර්තා කිහිපයක් තිබෙනවා. ක්‍රීඩා ජනමාධ්‍යවේදීන් කරන දේවල් පිළිබඳව වැඩි වශයෙන් සාකච්ඡා නොවන නිසා හොකී සම්මේලනය පිළිබඳව එක් පුවත් පතක තිබෙන වාර්තාවක් උපුටා දක්වන්න මම හිතුවා. 2016 මාර්තු 20වැනි දින පළ වූ පුවත් පත් වාර්තාවක් මම **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මේ තත්ත්වය ඊයේ-පෙරේදා වෙනස් වුණාද කියලා මම දන්නේ නැහැ. මම නිශ්චිතව කියනවා, හොකී සම්මේලනයේ සභාපතිවරයා වශයෙන් අවුරුදු 10ක්ම කටයුතු කරන්නේ එකම කෙනා. ඒ වාගේම අධිකරණ නියෝගයක් තිබිදීත් ඊට අදාළ කරන ඡන්ද පවත්වන්නේ නැතුව කටයුතු කරනවා කියන එක තමයි කියලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, 2015 දී ඔබතුමා ක්‍රීඩා ඇමති වශයෙන් පත් වෙන්න කලින් නිකුත් කළ ගැසට් එකක් අනුව නේ අපි දැන් කටයුතු කරන්නේ. ඔබතුමාට අලුත් ගැසට් නිවේදනයක් නිකුත් කරන්න පුළුවන්. පනත සම්පූර්ණයෙන් සංශෝධනය කරන්නත් පුළුවන්. ජනාධිපති ධුරය සඳහා ඉල්ලන එක අවස්ථා දෙකකට සීමා කර තිබෙනවා නම්, අඩුම ගණනේ ක්‍රීඩා සංගම්වල ප්‍රධාන තනතුරු සඳහා ඉල්ලුම් කරන එකත් අපට සීමා කරන්න බැරි ඇයි? මොකද, අපි ඉතා පැහැදිලිව දන්න දෙයක් තමයි, ඕනෑම ආයතනයක එකම අය වැඩි කාලයක් තනතුරු දැරුවොත් එම ආයතනය දූෂණය වෙනවා කියන එක. හොඳම උදාහරණය තමයි හොකී සම්මේලනය සම්බන්ධයෙන් තිබෙන මා ඉහතින් සභාගත කළ පුවත් පත් වාර්තාව. එහි මෙහෙම සඳහන්ව තිබෙනවා:

> "හොකී සම්මේලනයේ සභාපතිවරයාව සිටි වර්තමාන නියෝජ්‍ය පොලිස්පති...

මම නම කියන්න යන්නේ නැහැ.

> "... වසර 10ක සිටම හොකී සම්මේලනයේ සභාපති ලෙස කටයුතු කරන අතර, මේ වන විට සමුළුව පත් කිරීම පවා අත්හිටුවන අධිකරණ නියෝගයක්ද තිබියදී තවමත් සභාපති ධුරයේ රැඳී සිටීමයි."

මා සතුව තිබෙන පුවත් පත් වාර්තා අනුව ක්‍රීඩා සංගම් 13ක පමණ - ඔබතුමාගේ අවබෝධය අනුව ඊටත් වැඩිද කියලා මම දන්නේ නැහැ - මෙවැනි ගැටලු පැන නැඟලා තිබෙනවා. මේ කොටස ක්‍රීඩාව සම්බන්ධ පොදු ප්‍රශ්නයක්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු මන්ත්‍රීතුමා, මට පොඩි වෙලාවක් දෙනවාද?

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
හොඳයි, කියන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
මම විනාඩියක කාලයක් අරගෙන පැහැදිලි කරන්නම්. අපි අලුතින් ගෙනැල්ලා තිබෙන නියෝග තුළත් මේ ක්‍රියාදාමය තිබෙනවා. "දෙවතාවකට වැඩිය" ඒ කියන්නේ සම්පූර්ණ සේවා කාලය අවුරුදු 4ක් නොඉක්මවිය යුතුයි. ඒ ප්‍රතිපත්තිය තමයි අපි මේ නියෝගවලට ඇතුළත් කරලා තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ඒක තමයි මටත් පැහැදිලි නැති කාරණය. මමත් ඒක mark කරගෙන හිටියේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
"Two terms" කියන එක. ඒ කියන්නේ දෙවතාවයි ඉදිරිපත් වෙන්න පුළුවන්. අපි මෙහෙම හිතමු. යම් පුද්ගලයකු සභාපති

තනතුරේ සිටියොත්, ඔහුට දෙපාරක් පමණයි ඒ තනතුරට එන්න පුළුවන් වන්නේ, "අවුරුදු 4ක් නො ඉක්මවිය යුතුයි" කියන කාල සීමාව තුළ. එවිට ඔහුට ආයෙත් ඒ තනතුරට එන්න බැහැ. නමුත් ඔහුට ආපසු පහළ තනතුරකට යන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණයම තමයි දැන් තිබෙන ප්‍රශ්නය. ඒ තනතුරට පත් වූ කෙනා දිගින් දිගටම -අවුරුදු දෙක, තුන, හතර, පහ- ඉන්නවා. ඒ නිසා අපි සඳහන් කර තිබෙනවා, සභාපති කෙනෙකුට ඉන්න පුළුවන්, two terms පමණයි කියා. ඒ කියන්නේ, පත් වන්න පුළුවන් දෙපාරක් පමණයි කියන එකයි. හැබැයි එහෙම පත් වෙලා ගිය කෙනාට ආපසු තවත් සෑහෙන කාලයක් යන කල් ඒ තනතුරට එන්න හම්බ වන්නේ නැහැ. අන්න ඒක තමයි දැනට ඇති කර තිබෙන තත්ත්වය. ඕනෑ නම් ඔහුට ඒ තනතුරට පහළ තනතුරකට ඉල්ලන්න පුළුවන්. සමහර වෙලාවට ඔහු පහළ තනතුරකට ඉල්ලන්නේ නැහැ නේ. ඒක තමයි දැන් එතැනින්-

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
සමහරු නම් එනවා. දැන් සමහරු අගමැති විධියට එන්න හිතාගෙන ඉන්නවා. පුටින් ගත්තොත්-

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
කොහෙන් ආවත්-

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
පහළ තනතුරකට එන්න පුළුවන් නේද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
පහළ තනතුරකට එන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන කාරණා දෙකක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, යම් යම් පුද්ගලයන් පත් වෙලා ඇවිල්ලා දිගින් දිගටම එම තනතුරුවල ඉන්න එක තුළ විශාල ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ඒ තමයි, පහළ සිටින කෙනෙකුට ඉහළට එන්න බැරි වීම. සභාපති තනතුරෙහි සිටින කෙනාම තවත් team එකක් හදාගෙන ඇවිල්ලා සභාපති විධියට දිගින් දිගටම රැඳෙනවා. නමුත් මේ අනුව ඔහුට එන්න පුළුවන් two terms විතරයි. එවිට, එම තනතුරේ කාලය අවුරුදු හතරක් ඉක්මවන්න බැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
කොහොම නමුත්, ඔබතුමා කියන්නේ, එක තනතුරක ඉන්න පුළුවන් අවුරුදු 4ක්ය කියන එක නේද, ගරු ඇමතිතුමා?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, four years.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
අතුරු කමිටු කියන ඒවාට පත් කරන අයගේ කාලයත් එයට ඇතුළත්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ඒ කිසිම එකකට ඔහුට යන්න බැහැ. පහළ තනතුරක තමයි ඔහුට ඉන්න වෙන්නේ. සෑම තනතුරකටම අදාළව ඔය විධියට කළොත් වෙන්නේ, පරිණත පුද්ගලයන් කාටවත් පහළ ඉඳලා ඉහළට එන්න බැරිව යන තත්ත්වයක් ඇති වන එකයි. ඒ නිසා අපි කිව්වේ, සභාපති කියන තනතුර පමණක් වෙනස් කරමු කියලායි. අනෙක් තනතුරුවල අයට ඉන්න පුළුවන්. ලේකම්ට ඉන්න පුළුවන්, උපසභාපතිට ඉන්න පුළුවන්. ඒ අයට ඉහළට යන්න පුළුවන්. නමුත් සභාපති වූ කෙනාට අවස්ථා දෙකකින් පසුව එම තනතුරෙහි ඉන්න බැහැ. සෑහෙන කාලයක් ඉඳලා තමයි ඔහුට ආපසු එන්න පුළුවන් වන්නේ. එතැනින් පසුව ආ හැකි කාල සීමාවත් තීරණය කරන්න අපි දැන් බලාපොරොත්තු වෙනවා. එවිට ඔය ප්‍රශ්නය අවසාන වනවා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ඒ කියන්නේ, ආයෙත් පත් වන්නම බැහැ කියන එක නොවෙයි නේද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
පත් වන්නම බැහැ කියන එක නොවෙයි. Two termsවලින් පසුව ඉල්ලන්න බැහැ කියන එක දැනට සඳහන් කර තිබෙනවා. නැවත ආපසු ඔහුට එන්න පුළුවන් වන කාල සීමාව මොකක්ද කියන එක ගැන තවම තීරණයක් ගෙන නැහැ. ඒකයි මා ඔබතුමාට කලිනුත් කිව්වේ. අප ඊළඟට ගෙනෙන නියෝග මත තීන්දු කරන්න පුළුවන්, එය කොපමණ කාලයක්ද කියලා. ඔබතුමන්ලාගේ අර කමිටුවට ඉදිරිපත් කරලා, එතැනින් පසුව ඒ තුළ ඒ ගැන සාකච්ඡා කරගන්න පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාව සම්බන්ධව අපට මේ ගරු සභාවේ සාකච්ඡා කරන්න වැඩි අවස්ථාවක් නොලැබෙන නිසා ක්‍රීඩාව සම්බන්ධ තවත් ප්‍රශ්න දෙකතුනක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. පාර්ලිමේන්තුවේදී ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නයක් තිබෙනවා, විශේෂයෙන් පසු ගිය කාලයේ ක්‍රිකට් පාලක මණ්ඩලයේ සිදු වූ වංචා, දූෂණ විමර්ශන පිළිබඳව. ඒ සම්බන්ධයෙන් නීතිඥවරුන් තුන්දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද කමිටු වාර්තාවක් පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී විවාද කළා. ඒවාට ඔබතුමා යම් පිළිතුරු ප්‍රමාණයකුත් ලබා දුන්නා. ඒ කමිටු වාර්තාවේ යම් යම් අඩු පාඩුකම්, සීමාවන් ගැන ඒ නීතිඥ මණ්ඩලයම සඳහන් කර තිබුණා වුණත්, ඉතා පැහැදිලිවම එහි සඳහන් කර තිබුණා, විවිධාකාර දූෂණ සහ අක්‍රමිකතා රාශියක් පිළිබඳව.

උදාහරණයක් විධියට ගත්තොත්, 2012 වසරේ ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ සිදු කරන ලද අලුත්වැඩියාව සම්බන්ධයෙන් කිසිදු ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය නොකර රුපියල් තිස්පන්ලක්ෂයකට අදාළ කොන්ත්‍රාත් එකක් යම්කිසි සමාගමකට ලබා දීම. ඒ වාගේම තමයි ක්‍රිකට් විකාශනය සම්බන්ධව කුඩා දැන්වීමක් පළ කර CSN නාළිකාවට රුපියල් මිලියන 125කට විකාශන අයිතිය ලබා දීම. ඊට පස්සේ ක්‍රිකට් ජාතික පුහුණුකරු ජෙෆ් මාෂ් පිළිබඳ ප්‍රශ්නය. ඔහුට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මඟින් නීතිමය ක්‍රියා මාර්ග නොගෙන ඉන්න

[ගරු බිමල් රත්නායක මහතා]

ඇමෙරිකන් ඩොලර් ලක්ෂයක් -රුපියල් ලක්ෂ 140ක් වාගේ ප්‍රමාණයක්- ගෙවලාත් තිබෙනවා. ඒ කාරණයෙන් වුණු පාඩුව රුපියල් ලක්ෂ 134යි. ඊට පස්සේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අනුබද්ධ ක්‍රිකට් සමාජවලට මුදල් ලබා දීමේදී විනිවිදභාවයකින් තොරව කටයුතු කිරීම. ගණන රුපියල් මිලියන 265යි. මේ ආකාරයට ගත්තාම ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ floodlights ඉවත් කිරීම ඇතුළු සුවිශාල වෝදනා ප්‍රමාණයක් ඉදිරිපත් වුණා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් මේ කාරණය දැනගන්න කැමැතියි. සමහර විට ඔබතුමා අද පිළිතුරු කථාවේදී කියන්න සූදානම් නැති වෙන්න පුළුවන්. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අමාත්‍යාංශ නිවේදනයක් ලෙස හෝ ඒ වංචා හා දූෂණ පිළිබඳ වර්තමාන තත්ත්වය රටට පැහැදිලි කරන්න කියලා. මොකද, ඒවා අතිවිශාල දූෂණ. හැම කෙනාම කියනවා, ඒවා FCID එකට යොමු කර තිබෙනවා; COPE එකට යොමු කර තිබෙනවා; අරකට, මේකට යොමු කර තිබෙනවා කියලා. නමුත්, අදාළ අමාත්‍යාංශයට පැහැදිලි වග කීමක් තිබෙනවා ඒ වංචා හා දූෂණ පිළිබඳව ගත් පියවර මොකක්ද කියා සොයලා බලන්න.

ගරු ඇමතිතුමනි, මා ඊළඟට මේ කාරණය දැන ගන්න කැමැතියි. ක්‍රීඩා අමාත්‍යාංශයේ travel agency එකක් සම්බන්ධව 2016.06.19 දින "රාවය" පුවත් පතේ පළ වූ වාර්තාවක් මා ළඟ තිබෙනවා. ඔබතුමා අනිවාර්යයෙන්ම මේ වාර්තාව බලන්න ඇති. නවසීලන්තයේ පැවැති නායකත්ව පුහුණු වැඩසටහනකට නිලධාරීන් යැවීම සම්බන්ධව ඒ වාර්තාවේ පැහැදිලි කර තිබෙනවා. ඒකට අනුව ක්‍රීඩා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරිය -වෝදනාවක් ඔප්පු වෙලා නැති නිසා මා එතුමියගේ නම කියන්න යන්නේ නැහැ- ලංකාවේ ඉන්නවාට වඩා වැඩිපුර පිට රට ඉන්නවා කියා තමයි මේ පත්තරේ තිබෙන්නේ. උදාහරණයකට ගත්තොත් එතුමිය විවිධාකාර සංචාර රාශියකට එක ළඟ දිනවල සහභාගි වෙලා තිබෙනවා. 2015 වසරේ රග්බි සංගමයෙන් ජපානයේ සංචාරයකට ගිහින් තිබෙනවා. මම දන්නේ නැහැ රගර් සම්බන්ධයෙන් එතුමියට තිබෙන අත් දැකීම මොකක්ද කියලා. මොකද, ලංකාවේ women's rugby පටන් ගත්තෙ ළඟදි. එතුමිය ඒ කාලේ පාසලේ රගර් ක්‍රීඩා කරපු කෙනෙක් කියලා මම හිතන්නේ නැහැ. ඊට පස්සේ 2016 අප්‍රේල් මස ජූඩෝ සංගමය එක්ක උස්බෙකිස්තානයටත් ගිහින් තිබෙනවා. ළඟදි නවසීලන්ත සංචාරයකටත් යනවා කියා තමයි මේ පුවත් පතේ තිබෙන්නේ. ඒ නිසා මා දැනගන්න කැමැතියි, මේ travel agency එකක්ද, මොකක්ද මේ තත්ත්වය කියලා. ඔබතුමන්ලාගේ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් අපට කාලයක් තිස්සේ මෙවැනි ගැටලු ගැන අහන්න ලැබෙනවා.

ගරු ඇමතිතුමනි, මා ඊළඟට ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය සහ ක්‍රිකට් සම්බන්ධවත් දැනගන්න කැමැතියි. ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය ඔබතුමා යටතේ තිබෙන ආයතනයක්. ක්‍රිකට් පාලක මණ්ඩලය පිළිබඳව එක් විශේෂ කාරණයක් අපි ළඟදියි දැන ගත්තේ. ක්‍රිකට් පාලක මණ්ඩලයේ Cricket Aid Fund කියලා අලුතින් සමාගමක් පත් කරලා තිබෙනවාද? ඒක ඔබතුමාගේ අවසරය, අනුමැතිය මතද හදලා තිබෙන්නේ? ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය තිබියදී ක්‍රිකට්වලට උදවු කරන්න තවත් වෙනම කොම්පැනි එකක් අවශ්‍ය වෙන්නේ ඇයි? ඒ කොම්පැනි එක ක්‍රිකට් පාලක මණ්ඩලයට තිබෙන සම්බන්ධය මොකක්ද? ඒ කොම්පැනි එකේ අධ්‍යක්ෂවරු කවුද? Cricket Aid Fund එකේ සභාපති වෙන්නේ නිල බලයෙන් ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපතිවරයාද, එහෙම නැත්නම් වෙනත් පුද්ගලයකුද? මම අහන්නේ, තනතුර. Cricket Aid Fund එකේ සභාපති වෙන්නේ ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපතිවරයාද, නැත්නම් යම් පුද්ගල කණ්ඩායමක්ද? දැන් ක්‍රිකට් පාලක මණ්ඩලය කියන්නේ, මට දැනෙන විධියට ලංකා විදුලිබල මණ්ඩලය වාගෙයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් COPE එක නියෝජනය කරන කෙනෙක් නිසා මේ සම්බන්ධයෙන් හොඳට දන්නවා. ඒක යන්න, යන්න ගුහාවක් වාගේයි. අවසානයක් නොවන ගුහාවක් වාගේයි. අර කමිටු, තේරීම් කමිටු, එක එක කමිටු කියා එක එක නම් දමා එකම වැඩෙට රුපියල් ලක්ෂ ගණන් පඩි ගෙවා සල්ලි කන ආයතනයක් බවට ක්‍රිකට් පාලක මණ්ඩලය පත් වෙලා තිබෙනවා. කොයි සභාපති යටතේත් එහෙමයි. අපට ඒ සම්බන්ධයෙන් කිසිම විවාදයක් නැහැ. ඒ ආයතනය අතිවිශාල මුදල් නාස්තියක් කරන බව පැහැදිලියි. දැන් ක්‍රිකට් පාලක මණ්ඩලයේ මූලික අරමුණ මොකක්ද? ක්‍රිකට් පාලක මණ්ඩලයට තිබෙන ප්‍රධාන වගකීම තමයි, ලංකාවේ ක්‍රිකට් දියුණු කරන එක. ලංකාවේ ක්‍රිකට් දියුණු කරන එකට; ක්‍රිකට්වලට ආධාර කරන එකට වෙනම ආයතනයක් අවශ්‍ය නැහැ. ක්‍රිකට් පාලක මණ්ඩලය තිබෙන්නේම ආධාර කරන්නයි. ගරු ඇමතිතුමනි, දැන් මේ තර්කය අරගෙන බැලුවොත්, අනික් හැම සංගමයටමත් ඕනෑ වෙනවා නේ, aid fund එකක්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම මේකට සවිස්තරාත්මක පිළිතුරක් දෙන්නම්. Cricket Aid Fund එක හැදෙන්නේ 2004 වර්ෂයේ සුනාමි වැඩ පිළිවෙළත් එක්කයි. ඒකේ මුදල් ඒ කාලයේ වියදම් කරලා තිබෙනවා. ඊට පස්සේ ඒක නතර වුණා. ඒක ඇත්තටම පටන් ගත්තේ නිලංග සුමතිපාල මහත්මයා 2004 වර්ෂයේ සභාපතිවරයා විධියට සිටියදීයි. ඒක ඇති කළේ සුනාමියෙන් විපතට පත් වූ ප්‍රදේශවලට උදවු කරන්නයි. කාලයක් යන තෙක් ඒ අරමුදල ඒ විධියටම තිබුණා. හැබැයි, දැන් නැවත ඒ අරමුදල පණගන්වා තිබෙනවාය කියන එක තමයි මට ඔබතුමාට කියන්න වෙන්නේ. වෙනම කොම්පැනියක් විධියට නොවෙයි. ඒ කාරණය පිළිබඳව තව ටිකකින් මම ඔබතුමාට පැහැදිලිව කියන්නම්. මොකද, මේ වෙලාවේදී ඒ හා සම්බන්ධ නිලධාරීන් ඉන්නේ COPE එකේ. එතැනින් අවසර අරගෙන මේවාට උත්තර දෙන්න එක් නිලධාරියෙකුට එන්න කියලා මම දැන් කිව්වා. ඊට පස්සේ මම ඒකට අවශ්‍ය කරන කාරණා ටික කියන්නම්.

දැනට මට ඔබතුමාට කියන්න තිබෙන්නේ මේ කාරණය පමණයි. 2004 වර්ෂයේ සිට තිබුණු, ක්‍රිකට් ආයතනය හා අනුබද්ධ වුණු පොඩි අරමුදලක් විධියට ක්‍රියාත්මක වුණු ස්ථානයක් තමයි එතැන තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඒ නිලධාරි මහතා දැන් COPE එකේ උත්තර දෙනවා නම් ඒක වෙනම කථාවක්. එතුමා මෙතැනදී උත්තර දෙයි කියලා මම හිතන්නේ නැහැ. අපි මේ දේවල් අහන්නේ ක්‍රීඩා ඇමතිවරයාගෙන්. ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න ඔබතුමා දැන් ලැහැස්ති නැත්නම් පසුව හරි උත්තර දෙන්න. ගැසට් එක වෙන එකක් නිසායි මම හැම වෙලාවේම මේක කියන්නේ. නමුත්, ඔබතුමා කරුණාකරලා මේවාට උත්තර දෙන්න. මොකද, මෙතැන හරි පැහැදිලි කාරණයක් තිබෙනවා. කොහොමත් සුනාමිය නිසා එක එක් කෙනා එක එක funds හදා ගත්තා නේ. "Helping Hambantota" එක් කෙනෙක් හැදුවා. ඒ විධියට සුනාමිය විවිධ දූෂණවලට උදව් වෙලා තිබෙනවා. මේ

දේවල් සුනාමියට හැදුවා වුණත්, දැන් මේවායේ අවශ්‍යතාවක් නැහැයි කියලා මම හිතනවා. විශේෂම කාරණයක් විධියට මේ කරුණ මම ඔබතුමාගේ අවධානයට ලක් කරනවා. අපට ලැබී තිබෙන තොරතුරු අනුව මේ අරමුදල වෙනම සමාගමක් විධියට ලියා පදිංචි කරලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් වෙනම බැංකු ගිණුමකුත් ආරම්භ කර තිබෙනවා. අපව සම්පූර්ණයෙන් whitewash වුණු, අපව සම්පූර්ණයෙන් පරාද වුණු England Tour එකේදි ඒකට ආධාර පිණිස යම් කටයුත්තක් කළාය කියලා අපට ආරංචි ලැබී තිබෙනවා. ඒ මුදල් ලංකාවට ලැබිලාද, ක්‍රිකට් පාලක මණ්ඩලයට ලැබිලාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා කරුණාකරලා මේ පිළිබඳවත් ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

2004 වර්ෂයේ -ඔය Aid Fund එක හදපු කාලයේම- ඒ අරමුදලේ යම් කිසි වග කීමක් තිබිලා තිබෙනවා, හිටපු ක්‍රිකට් ක්‍රීඩකයෙකු වුණු, අපි ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධ කටයුතුවලදී ආදරය කරන හෂාන් තිලකරත්න මහත්මයාට. ක්‍රිකට් ගහද්දි අපට දේශපාලනයක් නැහැ. සනත් ජයසූරියට වාගේම, හෂාන් තිලකරත්නටත් අපි කැමැතියි. එතුමාට සුනාමි කළමනාකරණය සම්බන්ධවත් ඒ වෙලාවේ යම් විවේචන තිබුණා. නමුත්, අර ලොකු ගැහිලි අස්සේ ඒවා එච්චර සාකච්ඡා වුණේ නැහැ. අද හෂාන් තිලකරත්න මහත්මයා කියන්නේ දේශපාලනඥයෙක්. එතුමාට සහ එතුමාගේ බිරිඳට මේ ආයතනවල විවිධ තනතුරු ලබා දෙනවාද කියන එක අපට ප්‍රශ්නයක්. මොකද, යම් ආකාරයක චෝදනාවකට ලක් වූ පුද්ගලයන් නැවත නැවත එම තනතුරුවලට පත් කිරීම මේ රටත්, මේ රටේ ජනතාවත් මුළාවේ දැමීමක් කියලා අපි විශ්වාස කරනවා. පසු ගිය පාලනය පෙරළෙන්න බලපෑ එක කරුණක් තමයි, ක්‍රීඩාවට අනවශ්‍ය විධියට දේශපාලන ඇඟිලි ගැසීම් කිරීමත්, ක්‍රීඩාව ඉස්සරහට දමා ගෙන සුවිශාල වශයෙන් මුදල් නාස්ති කිරීමත්. ඒක ඔබතුමාත් දන්නවා. මිනිස්සු වැරදි කරලා ඒවා හදා ගන්නවා නම්, අපට ප්‍රශ්නයක් නැහැ.

හෂාන් තිලකරත්න මහතා පමණක් නොවෙයි, එතුමාගේ බිරිඳට පවා ක්‍රිකට් ආයතනයේ තනතුරක් දෙන්න යනවා කියලා 2016.06.19 දින පත්තරයක වාර්තා කර තිබෙනවා. මේ පත්තරය ඔබතුමාත් බලන්න ඇති. මේ රටේ ඉහළ තනතුරුවල සිටින පුද්ගලයන්ට තිබෙන මොළයේ අමාරුව මොකක්ද කියලා අපි දැනගන්න කැමැතියි. ඒ පුද්ගලයන් තමන්ගේ නෝනාත් කොහේ හරි තනතුරකට දමනවා.

සමහර ඇමතිවරු ඉන්නවා, සමහර රාජ්‍ය නායකයන් ඉන්නවා, සමහර ඉහළ නිලධාරීන් ඉන්නවා, ඒ අය තමන්ගේ නෝනට මොකක් හරි තනතුරක් දෙනවා. ඒ ගැන ලජ්ජා වෙන්න ඕනෑ. එයා නෝනා මිසක් වෙන කවුරුවත් නොවෙයි නේ. Competitive විධියට ඒ තනතුරකට එනවා නම් ප්‍රශ්නයක් නැහැ. එහෙම නැතුව, ඇයි මේ නෝනලා බෑනලා ඔක්කෝම මේ තනතුරුවලට උස්සා ගෙන එන්නේ? ගරු ඇමතිතුමනි, කෙළින් කථා කරන ඇමතිවරයෙකු විධියට ඔබතුමා මේ සම්බන්ධවත් කෙළින් වැඩ කරනවා නම් හොඳයි.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ජාත්‍යන්තර ක්‍රීඩා තරග සඳහා දරුවන් යවනවා. මේවා පාසල් මට්ටමින් සංවිධාන කරන තරග නොවෙයි. ඔබතුමා දන්නවා, දෙමව්පියන් මැදිහත් වෙලා ඉන්දියාව, මැලේසියාව වැනි රටවල් සමඟ කථා කර ගෙන තරග සංචාර කරන බව. ඒවා සම්බන්ධයෙන් යම් ප්‍රතිපත්තියක් ඇති කරනවා නම් හොඳයි කියලා මම හිතනවා. මොකද, ඒවා තුළ රැවටීම් සහ මහා විශාල මගඩි සිදු වන නිසා. ඒ නිසා ඒ තරග සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් ඇති කරන්න ඕනෑ. අපේ ළඟටත් ඒ දරුවන්, දෙමව්පියන් එනවා, සල්ලි හොයලා දෙන්න ආදී වශයෙන් විවිධාකාර දේවල් කියාගෙන. දඹදිව වන්දනාවේ එක්ක යනවා වාගේ දැන් ඒවාත් වෙනම බිස්නස් එකක් වෙලා. දරුවන් හිතන්නේ ඒ ගොල්ලන් ජාත්‍යන්තර තරගයකට යනවා කියලා නේ. නමුත් ගියාට පසුව තමයි ඒ ගොල්ලන් දැන ගන්නේ, ඒවායේ කිසිම ප්‍රතිපත්තියක් නැහැ කියලා. ඒ අය එහෙම යන එක නතර කරන්න කියන එක නොවෙයි මම මේ කියන්නේ. අන්දමන් දූපත්වලට ගිහිල්ලා හරි කමක් නැහැ, ඒ දරුවන් experience එකක් ලබා ගන්න එක හොඳයි. මම ඒක ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. නමුත් එසේ යන්න කලින් ක්‍රීඩා අමාත්‍යාංශය හරහා අදාළ රටේ ඊට සම්බන්ධ ආයතනය මොකක්ද, ඒ පිළිබඳ යම් කිසි පිළිගැනීමක් - accreditation - තිබෙනවාද කියලා සොයා බලනවා නම් හොඳයි. අඩු ගණනේ ඒ ආයතනය ඒ රටේ ක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධද, හොකී ක්‍රීඩාවට සම්බන්ධද, වෙස් ක්‍රීඩාවට සම්බන්ධද, athleticsවලට සම්බන්ධද කියලාවත් සොයා බලලා, යම් කිසි නිර්දේශයක් සහිතව කටයුතු කරනවා නම් හොඳයි, විශේෂයෙන්ම මේ අය පාසල් දරුවන් නිසා. විවෘත තරග සම්බන්ධයෙන් නම් ප්‍රශ්නයක් නැහැ. පාසල් දරුවන් පිට රට යෑමේදී කොහොමත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විශේෂ අවසරයක් ලබා ගත යුතුයි. ඒක ක්‍රීඩා කටයුත්තක් නම් ඒ සඳහා ඔබතුමාගෙනුත් අවසර ගන්න ඕනෑ වන විධියට යම් ක්‍රමයක් හදන්න කියන ඉල්ලීම මම කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි.

ගරු ඇමතිතුමනි, ඉතාම බෙදහීය කාරණය මේකයි. 2016 වසරේ කනිෂ්ඨ නෙට්බෝල් තරගාවලියේ දක්ෂතම මැද පෙළ ක්‍රීඩිකාව ලෙස සම්මානයට පාත්‍ර වූ ගාල්ල දිස්ත්‍රික් කණ්ඩායම නියෝජනය කළ කේ.බී. අචිනි මදුෂිකා පිළිබඳව මා යමක් සඳහන් කරන්න කැමැතියි. ඇය කියනවා, වයස අවුරුදු 19න් පහළ ශ්‍රී ලංකා කනිෂ්ඨ නෙට්බෝල් කණ්ඩායම නියෝජනය කරමින් විදේශ තරග සංචාරවලට යද්දී ගුවන් ටිකට්පතේ සිටම ඔවුන්ටමයි වියදම් කරන්න සිද්ධ වුණේ කියලා. ඒ වාගේම පසු ගිය දා පැවැති තරගාවලියකදී ඉතාම දුෂ්කර පසුබිමකින් ආපු දඹුල්ලේ ක්‍රීඩිකාවක් රන් පදක්කමක් දිනා ගත්තා. අන්තිමට ඇය දඹුල්ලට ගියේ බස් එකේ නැගලා. ඇය පිළිගන්න Airport එකට කවුරුවත් ගිහිල්ලා තිබුණේ නැහැ. සමහර විට නිලධාරියෙක් දෙන්නෙක් ගියාද කියන්න මම දන්නේ නැහැ. නමුත් ඒ ළමයා දඹුල්ලට ගියේ බස් එකේ. ඒක ඉතාම බෙදහීයයි. ඇත්තටම මේ රටේ මෙහෙම දේවල් වෙනවාද කියලාත් හිතෙනවා. ඒ ළමයි නිසා තමයි අපේ රට බැබළෙන්නේ. [බාධා කිරීමක්] නැහැ, නැහැ. මම මේ කාරණා දෙකක් ගැන කියන්නේ. ඇමතිතුමනි, මම මුලින් කිව්වේ, අවුරුදු 19න් පහළ ශ්‍රී ලංකා කනිෂ්ඨ නෙට්බෝල් කණ්ඩායම නියෝජනය කළ ක්‍රීඩිකාවක් ගැන. ඒ ක්‍රීඩිකාව එක්තරා පුවත් පතකට කියා තිබෙන කථාව මම කියවන්නම් :

> "...ඊට පසුව වයස අවුරුදු 19න් පහළ ශ්‍රී ලංකා කනිෂ්ඨ නෙට්බෝල් කණ්ඩායමේ සාමාජිකාවක් ලෙස මැලේසියානු සහ ඉන්දියානු සංචාර සඳහා එක් වුණා. ඒ තරග සංචාර දෙකේදී අපි විශාල ලෙස අත්දැකීම් ලබා ගත්තා. ඒ නිසා අපට විශාල වෙහෙසක් වාගේම අමතර වැයක් දරන්නත් සිදු වුණා. තාත්තාගේ සුළු රැකියාවෙන් මේ සියල්ල කොහොම ප්ලැන් කරනවාද කියලා දන්නේ අම්මා තමයි. ඒ ගැන දන්නා නිසා තමයි මේ ක්‍රීඩාව නතර කරලා දමමු කියලා අම්මා කිව්වේ. අම්මා ඒක කිව්වේ හිතකින් නොවෙයි කියලා මම දන්නවා.

[ගරු බිමල් රත්නායක මහතා]

අන්තිමට මාගේ කැමැත්තට එයාලා ඉඩ දුන්නා. මේ අතර ඉහත කී විදෙස් සංචාර දෙකට යන්න වුණාම තවත් වියදම් වැඩි වුණා. ඒ වෙනුවෙන් ගුවන් ටිකට්පතේ සිටම වියදම් කළේ අපි. අනුග්‍රාහකයන් සොයන්න අපි පුහුණුවීම් කරනවාට වඩා වෙහෙසක් දැරුවා. ඇතැම් රජයේ ආයතනවලදී පුදුම කලකිරීමක් ඇති වුණා..."

ඒ එක ළමයෙකුට මතු වුණ ප්‍රශ්න.

ඊළඟට, මම කිව්වේ ළඟදී රන් පදක්කමක් දිනා ගත් දඹුල්ලේ ක්‍රීඩිකාවක් ගැන. ඇය ජාත්‍යන්තර සම්මානයක් දිනා ගෙන ලංකාවට එන කොට අවම වශයෙන් ඇය පිළිගෙන ගෙදරට ගෙනිහින් දමන්නවත් ක්‍රීඩා අමාත්‍යාංශයෙන්, අදාළ දෙපාර්තමේන්තුවෙන් හෝ සංගම්වලින් කිසිම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබුණේ නැහැ. [බාධා කිරීමක්] කනිෂ්ඨ වුණත් රට නියෝජනය කිරීමක් නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු දයාසිරි ජූයසේකර*)
(The Hon. Dayasiri Jayasekara)

ගරු මන්ත්‍රීතුමනි, ඒ කරුණ නිවැරදි කරන්න ඕනෑ. සාමාන්‍යයෙන් පාසල් මට්ටමින් පැවැත්වෙන තරග සඳහා දරුවන් යවන්නේත්, ඒ සඳහා අනුමැතිය ලබා දෙන්නේත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. ඒ කිසිම අවස්ථාවක අපේ සම්බන්ධයක් ඇත්තේම නැහැ. ඒ වාගේ තරගවලට පිට රට යන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ගුවන් ටිකට් පත් ටිකක් අරගෙන දෙන්නවත් අපට මුදලක් - vote - වෙන් වෙන්නේ නැහැ. මේ අවුරුද්දේ දකුණු ආසියානු මලල ක්‍රීඩා තරගාවලියට ගිය වියදම් ටිකවත් අපට පියවා ගන්න ලැබුණේ නැහැ. අපි රවි කරුණානායක ඇමතිතුමාට කථා කර වෙනත් විධියකට ලැබුණු මුදලකින් තමයි ඒ ටික පියවා ගත්තේ. සාමාන්‍යයෙන් ඒ විධියේ ක්‍රියාදාමයක් ඉතිහාසයේත් තිබිලා නැහැ. ඒ සඳහා vote එකක් වෙන් වුණේ නැහැ. හැබැයි, අපි මේ අවුරුද්දේ හැම සංගමයකටම කියලා තිබෙනවා, 2017 වසරේදී ඔබට තිබෙන ජාත්‍යන්තරව පිළිගත් ක්‍රීඩා තරග ටික කරුණාකර අපට දන්වන්න කියලා. එතකොට Budget එකට දාලා මුදලක් වෙන් කර ගැනීමට ඉල්ලීමක් කරන්න අපට පුළුවන්. එහෙම ඉල්ලීමක් කරන්නේ නැතිව මුදල් දෙන්න විධියක් නැහැ. කනිෂ්ඨ අංශයේ තරගවලට ඒ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ ඒකයි. ඒ කටයුතු කරන්නේ පාසල් ක්‍රීඩා සංගමයෙන්.

ඒ දරුවන්ට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සල්ලි දෙන්න විධියක් නැති නිසා, ඒ දරුවන් කරන්නේ වෙනත් අයගෙන් ආධාර ඉල්ලන එකයි. නමුත් මම පැහැදිලිවම කියන්න කැමැතියි, පසු ගිය කාලයේ පිට රට තිබුණු හැම තරගයකටම වාගේ ඒ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ගුවන් ටිකට්වලට ක්‍රීඩා අමාත්‍යාංශයෙන් මුදල් ලබා දුන් බව, අනෙක් වියදම් සඳහා මුදල් දෙන්න පුළුවන් තත්ත්වයක් තිබුණේ නැති නිසා. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ සිද්ධි දෙකම වෙලා තිබෙන්නේ කනිෂ්ඨ අංශයේ තරගවලට සහභාගි වූ ක්‍රීඩකයන්ටයි. ඒ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ගිය කණ්ඩායම් මිසක් අපේ අමාත්‍යාංශයට අදාළ කණ්ඩායම් නොවෙයි. හැබැයි, ඒක එහෙමයි කියලා මම කර අරින්න සූදානම් නැහැ. ජාත්‍යන්තර තරගවලදී තිබෙන එවැනි තත්ත්ව පිළිබඳව ඒ ක්‍රීඩා සංගම් මේ වන තුරුත් අමාත්‍යාංශය දැනුවත් කර නැහැ. ඒ නිසා අවුරුද්දක, දෙකක කාලය තුළ පැවැත්වීමට නියමිත තරගවල විස්තර කරුණාකර අපට දෙන්න කියලා මම දැන් කියලා තිබෙනවා, ඒවාට යන වියදම් සඳහා budget කරන්න ඕනෑ නිසා. ඒ විස්තර තිබුණොත් බයක් නැතිව අපට මුදලක් වෙන් කර ගැනීමට ඉල්ලීමක් කරන්න පුළුවන්. මම කනගාටු වනවා, මේ වාගේ තත්ත්වයක් ඇති වීම සම්බන්ධව. ඇත්තටම එය මගේ කාර්යභාරයෙන් පිට තිබෙන එකක්. නමුත්, ක්‍රීඩා ඇමතිවරයා විධියට එහි වගකීමෙන් කොටසක් මටත් භාර වෙනවාය කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

ගරු බිමල් රත්නායක මහතා
(*මාණ්පුමිකු පිමල් රත්නායක්ක*)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉදිරිපත් කරන අවසාන කරුණ මෙයයි. අපේ පාර්ලිමේන්තුවේත් දක්ෂ කැරම් ක්‍රීඩකයෝ ඉන්නවා. ඔවුන් අපට ඉදිරිපත් කරපු කරුණක් තමයි, කැරම් ක්‍රීඩාව සඳහා වන ජාතික සම්මේලනයට තැනක් නැහැ කියන එක. රුපියල් ලක්ෂ 213ක් දීලා කෘෂිකර්ම අමාත්‍යාංශයට ගොඩනැඟිල්ලක් කුලියට ගන්නා රටේ, රුපියල් ලක්ෂ 110ක් දීලා කිසිම වැඩක් කරන්නේ නැති සරත් ෆොන්සේකා මහත්තයාගේ අමාත්‍යාංශයට ගොඩනැඟිල්ලක් කුලියට ගන්නා රටේ, ජාතික ක්‍රීඩා සම්මේලනයට තැනක් දෙන්න ගරු අමාත්‍යතුමා බැහැයි කියන එක ඇත්තටම ලජ්ජයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු දයාසිරි ජූයසේකර*)
(The Hon. Dayasiri Jayasekara)

නැහැ. නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එය ප්‍රතික්ෂේප කරනවා. දැනට ඉන්න තැනත් -

ගරු බිමල් රත්නායක මහතා
(*මාණ්පුමිකු පිමල් රත්නායක්ක*)
(The Hon. Bimal Rathnayake)

කොහුවල. මම හොඳට දන්නවා, එතැන ඉන්න බැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු දයාසිරි ජූයසේකර*)
(The Hon. Dayasiri Jayasekara)

ඒ ඉන්න තැනට සල්ලි දෙන්නේ අපි. ක්‍රීඩා අමාත්‍යාංශයෙන් සල්ලි දෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(*මාණ්පුමිකු පිමල් රත්නායක්ක*)
(The Hon. Bimal Rathnayake)

නැහැ. නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු දයාසිරි ජූයසේකර*)
(The Hon. Dayasiri Jayasekara)

ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. ඔය විධියට චෝදනා කරන එක ගැන අපි බලන්න ඕනෑ නේ. ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට ක්‍රීඩා සංගම් 60ක් තිබෙනවා. ඒ ක්‍රීඩා සංගම් 60 සඳහාම office එකක් ඉල්ලනවා. අපි කල්පනා කරන්න ඕනෑ, කොහොමද ඒවා දෙන්නේ කියලා. අපට එහෙම ඉඩකඩක් දෙන්න විධියක් නැහැ. සමහර ක්‍රීඩා සංගම්වල නිලධාරීන් 10ක් 15ක් එක තැනක ඉන්නවා. ඒ නිසා මම කැරම් සංගමයට කිව්වා, ඔබතුමන්ලා මේ ස්ථානය කුලියට ගන්න, මම අවුරුදු එකහමාරක පමණ කාලයකට සල්ලි දෙන්නම් කියලා. ක්‍රීඩා අමාත්‍යාංශය ඇතුළේ අපි දැන් building එකක් හදා ගෙන යනවා. අපි බලාපොරොත්තු වනවා, මේ ක්‍රීඩා සංගම් හැම එකකටම එතැනින් කුඩා ඉඩකඩක් ලබා දෙන්න. ඒක අපි කළ යුතුව තිබෙනවා. නමුත්, ක්‍රීඩා සංගම් 60කට office දෙන එක අමාරු වැඩක්. මේවායේ සමහර ඒවා නිකම් බෝඩ් ලෑලිවලට පමණක් තිබෙන ක්‍රීඩා සංගම්. වැඩ කරන ඒවාත් තිබෙනවා. ඒ නිසා මම මෙතැනදී ගරු මන්ත්‍රීතුමා කියන කාරණය ප්‍රතික්ෂේප කරනවා. ඔබතුමා ගිහිල්ලා කැරම් සංගමයෙන් අහන්න, මම ගිහිල්ලා තමයි ඒක විවෘත කළේ.

අවුරුදු එකහමාරකට ඒ ස්ථානයට සල්ලි දුන්නේත් ක්‍රීඩා අමාත්‍යාංශයෙන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඒක හොඳ දෙයක් වෙන්න පුළුවන්. නමුත් මම ඒ තැන දකින නිසායි එහෙම කිව්වේ. එම ස්ථානය ජාතික ක්‍රීඩා සම්මේලනයකට තියා, වෙනත් කටයුත්තක් කරන්නවත් පුළුවන් තැනක් නොවෙයි. සමහර විට ඒ ප්‍රධානීන්ට නතර වෙලා ඉන්න එතැන හොඳ ඇති. නමුත් ක්‍රීඩාව කරන්න එතැන ප්‍රමාණවත් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා.

[பி.ப. 3.35]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று விளையாட்டுச் சட்டத்தின்கீழ் ஒழுங்குவிதிகள் சம்பந்தமான விவாதத்தில் கலந்துகொண்டு எமது கிழக்கு மண்ணிலே விளையாட்டுத்துறையிலுள்ள பிரச்சினைகளைப் பற்றி அமைச்சர் அவர்களிடம் எடுத்துச்சொல்வதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு நன்றி தெரிவித்துக்கொள்கின்றேன். பொதுத் தேர்தலில் குருநாகல் மாவட்டத்திலே முன்னாள் ஜனாதிபதி அவர்கள் பெற்ற வாக்குகளை விட, வட மேல் மாகாண சபைத் தேர்தலில் அமைச்சர் தயாசிறி ஜயசேகர அவர்கள் இலட்சக் கணக்கான மக்களுடைய - இளைஞர் களுடைய அதிகூடிய வாக்குகளைப் பெற்றவர். அத்தகைய ஓர் இளம் அமைச்சரிடமே என்னுடைய இந்தக் கோரிக்கைகளை நான் முன்வைக்க விரும்புகின்றேன்.

விளையாட்டுத் துறையில் இந்த நாட்டைச் சர்வதேசமும் திரும்பிப் பார்க்க வைத்தது, நகரப்புறப் பாடசாலைகளில் கல்வி கற்றவர்களினாலோ அல்லது நகரத்தை மேம்படுத் தியதனாலோ அல்ல. இலங்கையில் ஆங்கிலேயர் காலத்தி லிருந்து கிரிக்கெட் விளையாட்டு இடம்பெற்று வந்தது. கிரிக்கெட் விளையாட்டு என்பது நாலந்தா, றோயல், ஆனந்தா, டீ.எஸ். போன்ற colleges களிலே பிரபல்யமடைந் திருந்தபோதிலும் கிராமியப் பாடசாலைகளிலே கற்று வந்த அர்ஜுன ரணதுங்க போன்றவர்கள்தான் விளையாட்டுத் துறையில் சர்வதேசத்தை இலங்கையின் பக்கம் திரும்பிப் பார்க்க வைத்தவர்கள். அதேபோன்று கிராமத்திலே மலர்ந்த சுசந்திக்கா ஜயசிங்க போன்றவர்கள்தான் இந்த நாட்டுக்குத் தங்கப் பதக்கத்தைப் பெற்றுக்கொடுத்தவர்கள். இப்படிப் பலர் இருக்கின்றார்கள். ஆனால், இன்று இந்த நாடு விளையாட்டுத் துறையில் சாதனை புரிந்த வடக்கு, கிழக்கு மண்ணைச் சேர்ந்தவர்களைத் திரும்பிப் பார்க்காமல் சென்றுகொண் டிருக்கின்றது.

ஒரு விடயத்தை நான் கூற ஆசைப்படுகின்றேன். அதாவது, கிண்ணியா மண்ணிலே பிறந்த ஜெபறுல்லா என்பவர் 1972ஆம் ஆண்டு யாழ். இந்துக்கல்லூரி மாணவனாக இருந்தபோது கொழும்பிலுள்ள விளையாட்டு மைதானத்திலே நடந்த ஒரு போட்டியில் தேசிய மட்டத்திலே மூன்று சாதனைகளைப் புரிந்தார். ஆசிரியரான அவர் இன்று மிகவும் கஷ்டமான நிலையில் இருக்கின்றார். அவருடைய இரண்டு kidneyகளும் பாதிக்கப்பட்டு வேறு kidney பொருத்தப் பட்டுள்ளது. அவருக்கு ஜனாதிபதி நிதிகூடக் கிடைக்கவில்லை. மருத்துவமனையிலிருந்து மீண்டிருந்தாலும் இன்று அவர் ஒரு சுகதேகியாக இல்லை. ஆனால், அவருடைய விளையாட்டுச் சாதனைகள் பல! அதாவது நீளம் பாய்தல், உயரம் பாய்தல்,100 மீற்றர் ஓடுதல் போன்ற விளையாட்டுக்களிலே அவர் சாதனை படைத்தார். 22 வருடங்களுக்குப் பிறகுதான் அவருடைய high jump சாதனை முறியடிக்கப்பட்டது. 32 வருடங்களுக்குப் பிறகுதான் அவருடைய 100-metre ஓட்டச் சாதனை முறியடிக்கப்பட்டது. அதேநேரம் அவருடைய long jump சாதனை இதுவரையும் சுமார் 43 வருட காலமாக முறியடிக்கப்படாத நிலையில் இருக்கின்றது. அப்படிப்பட்ட ஒரு சாதனை வீரனே இன்று தனது இரண்டு kidney களும் பழுதடைந்த நிலையில் பொருளாதார ரீதியாகக் கஷ்டப்படு கின்றான். இப்படிப்பட்ட சாதனையாளர்கள் பலர் இருக்கின்றார்கள். அந்த வகையில் என்னோடு கல்வி கற்ற பனாகொட மகேஸ்வரன் அவர்களுடைய சகோதரர் ரவீந்திரன் என்பவர் தேசிய மட்டத்திலே high jump, triple jump இலே சாதனை புரிந்தவர். ஆனால், அவர் துரதிஷ்டவசமாகப் படுகொலை செய்யப்பட்டார். இன்று நாங்கள் அப்படிப்பட்டவர்களை எல்லாம் நினைவுகூரவேண்டிய ஒரு காலகட்டத்தில் இருக்கின்றோம்.

இன்று வடக்கு, கிழக்கு மாகாணத்திலே இருக்கின்ற விளையாட்டு வீரர்கள் அங்கு எந்தவொரு சிறந்த விளையாட்டு மைதானமும் இல்லாமலேயே தேசிய மட்டத்தில் சாதனை புரிகின்றார்கள். உலகளாவிய ரீதியாக விளையாட்டுத்துறை முன்னேற்றமடைந்தாலும்கூட தென்கிழக்காசிய விளையாட் டுக்களிலே இன்று வடக்கு, கிழக்கு மாணவர்களும் சாதனை களைப் புரிந்துகொண்டிருக்கின்றார்கள். ஆகவே, விளையாட் டுத்துறை அபிவிருத்தியிலே எங்களுடைய வடக்கு, கிழக்கும் திரும்பிப் பார்க்கப்பட வேண்டிய பகுதிகளாகும். எப்படியோ நீங்கள் நகரப்புறப் பாடசாலைகளையும் நகரப்புற மைதானங் களையும் அபிவிருத்தி செய்துகொண்டிருக்கின்றீர்கள். ஆகவே, இப்பொழுது நீங்கள் கிராமப்புறங்களைத் திரும்பிப் பார்க்க வேண்டும்.

ஏன், நான் இதை உங்களுக்குக் கூறுகிறேன் என்றால், சாதனை என்பது வசதிகளைப் பெற்றுக்கொடுத்த பிறகுதான் ஏற்படுத்தப்படுவதல்ல என்பதைக் காட்டுவதற்குத்தான். கால்நடைகளுக்குப் பின்னால் ஓடித் திரிந்தவர்களும் விளையாட்டு மைதானம் இல்லாத வர்களும் உபகரணங்கள் எதுவும் கிடைக்காதவர்களும்தான் சாதனை படைத்திருக்கிறார்கள். சுசந்திகா ஜெயசிங்க என்ற ஒரு பெண்மணி இந்த நாட்டுக்குத் தங்கப் பதக்கத்தைப் பெற்றுக்கொடுத்தார். ஆனந்த, நாலந்த, றோயல் போன்ற கல்லூரிகளில் திறமையாகக் 'கிரிக்கெட்' விளையாடியவர்கள் எல்லோரும் சர்வதேசத்தில் சாதனை புரியவில்லை. அர்ஜுன ரணதுங்க, சனத் ஜயசூரிய, களுவிதாரண, மஹாநாம போன்றவர்கள் கிராமியத்தைத் திரும்பிப்பார்க்க வைத்தவர்கள்.

முன்னாள் விளையாட்டுத்துறை அமைச்சர் கௌரவ காமினி லொக்குகே அவர்கள் இங்கே இருக்கிறார். திருகோணமலை மாவட்டத்திலுள்ள கிண்ணியா என்ற கிராமம் அகில இலங்கை ரீதியாகப் பல சாதனைகளைப் புரிந்திருக்கிறது. ஆனால், இன்று விளையாட்டுத் துறையிலே அக்கிராமம் பூஜ்ய நிலையை அடைந்திருக்கின்றது. நான் முன்னாள் அமைச்சர் அவர்களிடம், "இங்கு ஒரு வசதியான விளையாட்டு மைதானமொன்றை அமைத்துத் தாருங்கள்" என்று கேட்டபோது, அவர் அதற்காக 55 மில்லியன் ரூபாயை

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

ஒதுக்கித் தருவதாக அப்போது எனக்கு ஓர் உறுதிமொழியைத் தந்தார். ஆனால், அவருடைய அமைச்சு மாற்றப்பட்டது. அதற்குப் பிறகு விளையாட்டுத்துறை அமைச்சராக நியமிக்கப் பட்ட நாவலப்பிட்டியைச் சேர்ந்த மஹிந்தானந்த அலுத்கமகே அவர்கள் எனக்கு உத்தரவாதம் தந்தார்; அதையும் சாதிக்கமுடியாமல் போனது. தற்போது இளைஞர்களுடைய நன்மதிப்பைப் பெற்ற ஓர் இளைஞரான எனது மிகவும் விருப்பத்திற்குரிய நண்பர் தயாசிறி ஜயசேகர அவர்கள் அமைச்சராக இருக்கிறார். குருநாகல் மாவட்டத்தில் இந்த நாட்டின் முன்னாள் ஜனாதிபதி அவர்கள் பெற்ற வாக்குகளுக்கு அதிகமாக அவர் வட மேல் மாகாண சபைத் தேர்தலில் 4 1/2 இலட்சம் இளைஞர்களின் வாக்குகளைப் பெற்றவர்.

இளைஞர்களுடைய விளையாட்டுத்துறையை முன்னேற்று வதற்கு ஒவ்வொரு DS Division மட்டத்திலும் தொகுதி மட்டத்திலும் சர்வதேச மட்டத்திலே மிளிரக்கூடிய வகையில் அதன் தரத்திற்கேற்ப ஒவ்வொரு விளையாட்டு மைதானத்தை 25 மாவட்டங்களிலும் அமைத்துக்கொடுக்க வேண்டும். நான் அதற்காக 3 வருடங்களாக எனது நிதியொதுக்கீட்டைச் செய்து கிண்ணியாவிலே ஓர் இடத்தை இனங்கண்டேன். சாதனை படைத்த அந்தப் பிரதேசத்தில் 400 மீற்றர் ஓடக்கூடிய ஒரு ground இல்லை. எங்களுடைய முன்னாள் அமைச்சர் காமினி லொக்குகே அவர்கள், அங்கு ஒரு நீர்த்தடாகம், indoor stadium, 400 மீற்றர் ground, 'கிரிக்கெட்' மைதானம் போன்ற முழு வசதிகளுடன்கூடிய உள்ளக அரங்கைக் கொண்ட நவீன மைதானத்தை தருகிறேன் என்று கூறியிருந்தார். துரதிருஷ்ட வசமாக அவர் வேறோர் அமைச்சுக்கு மாற்றப்பட்டார். இப்பொழுது எங்களுடைய அமைச்சர் அவர்கள் பலமுறை எனக்கு வாக்குறுதி தந்திருக்கிறார். அவரிடம் எங்களுடைய மாவட்டத்திலுள்ள 20க்கு மேற்பட்ட விளையாட்டு மைதானங்களைப் புனரமைத்துத்தருமாறு கேட்டிருக்கிறேன். எனது நீண்டகால நண்பரான பிரதியமைச்சர் ஹரீஸ் அவர்களுடன் 2000 - 2001 காலப்பகுதியிலும் 2004 இலும் நான் பாராளுமன்றத்தில் இருந்திருக்கிறேன். இப்பொழுதும் அவருடன் சேர்ந்திருக்கும் சந்தர்ப்பம் எனக்குக் கிடைத்திருக்கிறது. எனவே, அமைச்சர் அவர்களும் பிரதியமைச்சர் அவர்களும் திருகோணமலை மாவட்டத்திலே 1940 - 1994ஆம் ஆண்டு வரையும் சாதனை புரிந்த கிண்ணியா மண்ணுக்குச் சர்வதேச விளையாட்டு மைதானம் ஒன்று கிடைப்பதற்கு வழியமைக்க வேண்டும். இந்த நேரத்திலே நான் இதனை ஏன், உங்களுக்குக் கூறுகிறேன் என்றால், எமது மாவட்டத்தில் மீண்டும் இந்த மண்ணைத் திரும்பிப் பார்க்க வைக்கக்கூடிய தகுதிவாய்ந்த விளையாட்டு வீரர்கள் இருக்கிறார்கள் என்பதனால்தான். என்னைப் பொறுத்தவரையிலே, அன்று நான் கல்வியில் கணிதத்திலும் விஞ்ஞானத்திலும் சிறந்த சித்திகளை பெற்றிருந்தாலும் கிண்ணியா மண்ணிலிருந்து தேசிய மட்டத்திலே 100மீற்றர், 200மீற்றர், discus போன்ற விளையாட்டுகளில் நான் முதன்மை மாணவனாகத் தெரிவாகியிருந்தமையால்தான் எனக்கு யாழ். இந்துக் கல்லூரியில் அனுமதி கிடைத்தது.

கௌரவ அமைச்சர் அவர்களே, விளையாட்டுத் துறையில் சாதனை புரிந்தவர்களுக்கு வீட்டுத் திட்டத்தைக் கொண்டு வாருங்கள்! உதவித் திட்டத்தைக் கொண்டுவாருங்கள்! அப்படிப்பட்டவர்களுக்கு இருதய சிகிச்சை அல்லது kidney மாற்றுச் சிகிச்சை நடைபெறுகின்றபோது விளையாட்டுத்துறை அமைச்சின் மூலம் நிதியை ஒதுக்கிக் கொடுங்கள்! இது அவர்களைக் கௌரவிக்கின்ற ஒரு நிகழ்வாகும். நீங்கள் இந்த நாட்டிலே தேசிய மட்டத்திலே சிந்திக்கின்ற ஓர் இளம் தலைவன். எதிர்காலத்திலே உங்களுடைய செயற்றிட்டங்கள் அனைவருக்கும் நம்பிக்கையூட்டக்கூடியதாகவும் விளையாட் டுத்துறை இளைஞர்களைக் கவரக்கூடியதாகவும் இருக்க வேண்டும். எனவே, எமது மண்ணுக்கு மட்டுமல்ல, ஒவ்வொரு தொகுதியிலும் ஒவ்வொரு மாவட்ட மட்டத்திலும் ஒவ்வொரு DS Division இலும் பூரணத்துவம்மிக்க ஒரு விளையாட்டு மைதானத்தை அமைத்துக்கொடுக்க வேண்டுமென்று கேட்டு, எனக்குக் கிடைத்த சந்தர்ப்பத்திற்கு நன்றி கூறி விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you.

මීළඟට, ගරු ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා කථා කරන්න.

ඊට පෙර මූලාසනය සඳහා ගරු කනක හේරත් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු කනක හේරත් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කනක හේරත් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கனக ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair and* THE HON. KANAKA HERATH *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථා කරන්න ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 3.45]

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා අමාත්‍යාංශය මේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ක්‍රීඩා සංගම් සම්බන්ධව ගන්නා තීන්දුව ඉතා හොඳ කටයුත්තක් වාගේම මේක මීට වඩා පළල් වෙන්න ඕනෑ කියලායි මම හිතන්නේ. අද ක්‍රීඩා සංගමයක සාමාජිකයන් දිහාත් මීට වඩා හොඳින් බලන්න ඕනෑ. සෑම ක්‍රීඩා සංගමයක්ම රැඳිලා තිබෙන්නේ රට පුරා තිබෙන ක්‍රීඩා සංගම්වලින්.

අපි දන්න විධියට සියයට 90ක් සාමාජික සංගම් අක්‍රියයි. ඒවායේ පැවැත්ම පිළිබඳව, ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව නිසි ඇගයීමක් වෙන්නේ නැහැ. ඒ නිසා කණ්ඩායමක් සංගම් කිහිපයක් තියාගෙන හැමදාමත් ක්‍රීඩා සංගමයේ බලය අල්ලාගෙන ක්‍රියා කරනවා. ඒකෙන් සමස්ත ක්‍රීඩාවටම ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. ක්‍රීඩා සංගම්වල නිල තල ගන්න කැමැති කණ්ඩායමක්

ප්‍රාදේශීය ක්‍රීඩා සංගම් කිහිපයක් තියාගෙන වාර්ෂික නිලවරණයේදී බලය ගන්නවා. ඒ කණ්ඩායම් අමනාප වුණාම උසාවි ගිහිල්ලා තහනම් නියෝග ගන්නවා.

ගරු ක්‍රීඩා ඇමතිතුමනි, එම නිසා මම හිතනවා, ක්‍රීඩාව දියුණු කරන්න ඕනෑ නම්, ඉස්සරවෙලාම මේ ක්‍රීඩා සංගම්වල සංයුතිය හරියාකාරව ක්‍රියාකාරීන්ගෙන් සම්බන්ධ වෙන්න ඕනෑ කියලා. මොකද, සමහර ක්‍රීඩා සංගම් ගත්තාම සාමාජික සංගම් 5ක් වත් නැහැ. පස්දෙනෙක් එකතු වෙලා ක්‍රීඩා සංගමයක් පිහිටුවා ගෙන සමස්ත ක්‍රීඩාවම පාලනය කරන්න උත්සාහ කරනවා. අඩු ගණනේ ඒකට ප්‍රමිතියක් තිබෙන්න ඕනෑ. ක්‍රීඩා සම්මේලනයක් පිහිටුවනවා නම්, අඩු ගණනේ සාමාජික ක්‍රීඩා සංගම් 25ක් වත් තිබෙන්න ඕනෑ. ඊළඟට, සාමාජික ක්‍රීඩා සංගම් වාර්ෂිකව ක්‍රීඩා කටයුතු කරලා හරියාකාරව ක්‍රීඩාවත් එක්ක සම්බන්ධ වෙච්ච සමිති වෙන්න ඕනෑ. ගරු ක්‍රීඩා ඇමතිතුමනි, මේ පිළිබඳව පරීක්ෂා කරලා බැලුවොත් තමුන්නාන්සේට හොඳට පැහැදිලිව පෙනේවි. එහෙම නැත්නම්, හැමදාම ක්‍රීඩා සංගම් එක්ක නිල තල ලබා ගෙන තමන්ට ඕනෑ විධියට හසුරුවන ක්‍රීඩා සංගම් කිහිපයක් තිබෙනවා. සමහර සම්මේලන මම දැකලා තිබෙනවා, ක්‍රීඩා සංගම් 5ක් වත් නැහැ. හැබැයි, ජාතික ක්‍රීඩා සම්මේලනය හැටියට තමයි ක්‍රියාත්මක වෙන්නේ. රට වෙනුවෙන්, ඒ ක්‍රීඩාව වෙනුවෙන් ඒ ගොල්ලන් තමයි කථා කරන්නේ. ජාත්‍යන්තරයට යන්නේ ඒ ගොල්ලන් තමයි. ඒ ගොල්ලන්ට ඕනෑ කරන කිහිප දෙනා තමයි ඒකට යන්නේ. නියම දක්ෂ ක්‍රීඩකයාට තැනක් හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා ක්‍රීඩාව දියුණු වෙනවා නම්, පාසලත් එක්ක මේ ක්‍රීඩාව සම්බන්ධ වෙන්න ඕනෑ.

ක්‍රීඩා අමාත්‍යාංශයත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් එකට එකතු වෙලා රට පුරා සිටින දක්ෂ ක්‍රීඩකයන් තෝරන වැඩ පිළිවෙළක් ඇති වෙන්න ඕනෑ. එහෙම දක්ෂයන් තෝරන වැඩ පිළිවෙළක් ඇති වුණොත් දක්ෂ ක්‍රීඩකයන් මතු වෙයි. ඒ ක්‍රීඩකයන් ජාත්‍යන්තරයට යයි. ජාත්‍යන්තර වශයෙනුත් අපේ ක්‍රීඩකයන් ශක්තිමත් වෙයි. ඒ තුළින් අපේ රටට ජයග්‍රහණ ලබා ගන්න පුළුවන් වෙනවා. ඒ නිසා තමයි පාසල්වල ක්‍රීඩාව දියුණු කරන්න ඕනෑ. ක්‍රීඩාව වැඩිදියුණු කරන්න පාසල්වලට පහසුකම් දෙන්න ඕනෑ. ඒක අධ්‍යාපන අමාත්‍යාංශයට තනිවම කරන්න බැහැ. ක්‍රීඩා අමාත්‍යාංශයත් ඒකට මැදිහත් වෙන්න ඕනෑ. අධ්‍යාපන අමාත්‍යාංශයේ තිබෙන බරත් එක්ක ක්‍රීඩා අංශය ශක්තිමත් කරන්න නම්, ක්‍රීඩා අමාත්‍යාංශය ශක්තිමත් වෙන්න ඕනෑ. අපි ඒ කාලයේ කල්පනා කළා, රටේ එක දිස්ත්‍රික්කයකට එක ක්‍රීඩා පාසලක්වත් ඇතිවෙන්න ඕනෑ කියලා. ඒ අනුව පාසල් කීපයක් අපි ආරම්භ කළා. මේ ක්‍රීඩා පාසල්වලින් හැමදාම ක්‍රීඩකයන් බිහිවුණා. සේනානායක මහා විද්‍යාලය; විජිතවෙල මහා විද්‍යාලය අපි ආරම්භ කළා. වලව මහා විද්‍යාලය අපි ආරම්භ කළා. නමුත්, තවම ඒක ක්‍රියාත්මක වුණේ නැහැ.

ඒවා හැම දාම දක්ෂ ක්‍රීඩකයෝ බිහි වුණු ක්‍රීඩා පාසල්. ඒවා වැඩිදියුණු කළාම දිස්ත්‍රික්ක මට්ටමින්, පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් ක්‍රීඩකයෝ මතු වෙනවා. එතකොට ක්‍රීඩා අමාත්‍යාංශයට පුළුවන්, ඒ මතු වෙන ක්‍රීඩකයෝ ඉදිරියට ගෙන ගොස් ජාත්‍යන්තර මට්ටමට ගෙන එන්න. එහෙම තමයි, මේ රටේ ක්‍රීඩාව දියුණු කරන්න පුළුවන් වෙන්නේ. දැන් වෙන්නේ කොහේ හරි දක්ෂ ක්‍රීඩකයෙක් දැක්කාම, කොළඹ ඉන්නා පුහුණුකරුවෙකු එම ක්‍රීඩකයාව අර ගන්නා එකයි. ඒකෙන් සමහර වේලාවට ක්‍රීඩකයා දියුණු වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ක්‍රීඩකයා නාස්ති වෙන්න පුළුවන්. ගමේ පුහුණුකරුට කිසිම තැනක් ලැබෙන්නේ නැහැ. මෙතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලා ඒ ගැන සොයා බලා එය විසඳිය හැකි වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න ඕනෑ. අද විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් රටේ අධ්‍යාපනය ලබනවා. ඒ අය අතරේ දක්ෂයෝ ඕනෑ තරම් ඉන්නවා. ඒ දක්ෂයෝ තෝරා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති වෙන්න ඕනෑ. දැන් අපි කරන්නේ කොහෙන් හරි දක්ෂයෙක් මතු වුණාම, ඒ දක්ෂයාව අරගෙන යන එකයි. එහෙම නැතුව දක්ෂයෝ තෝරා ගන්නා වැඩ පිළිවෙළක් අපි ඇති කරලා නැහැ. ඒ එක්කම ක්‍රීඩා සංගම් කරන්නේ දක්ෂයෙක් ආවාම, තමන්ගේ සංගමයට බඳවා ගෙන ඒ සංගමය ගෙන යන එකයි.

ක්‍රීඩා සංගම්වල තිබෙන ඔය ප්‍රශ්නය නිසා තමයි, හැම දාම කණ්ඩායමක් පත් වෙන්නේ. තමුන්නාන්සේ ඒකටත් මෙතැනදී ප්‍රතිකර්මයක් යොදා තිබෙනවා, අවුරුදු දෙකකට වඩා ඉන්න බැහැ කියා. වාර දෙකකට වඩා ඉන්න බැහැ කියා. ඒකේ හොඳ පැතිත් තිබෙනවා. ඒ වාගේම ඒකේ නරක පැතිත් තිබෙනවා. ජාත්‍යන්තර ක්‍රීඩා කරනකොට සභාපතිවරයෙක් දිගටම හිටියොත්, ඔහුට ජාත්‍යන්තර සම්බන්ධතා දිගටම පවත්වා ගෙන යන්න පුළුවන්. නමුත් ඒකෙන් අනිටු ඵල විපාකත් ඇති වෙනවා. මේකේ අසාධාරණයක් නැහැ. නමුත් ක්‍රීඩා සංගමයක සභාපතිවරයෙක් පත් වෙනකොට, ඒ ක්‍රීඩා සංගම්වලට අනුබද්ධ සාමාජික ක්‍රීඩා සමිතිත් හරියාකාරව පිහිටුවෙන්න ඕනෑ. ඒ ක්‍රීඩා සමිති හරියාකාරව පිහිටුවෙන්නේ නැත්නම් බලාපොරොත්තු වුණු දෙය නොවෙයි, එම නිලවරණයෙන් ඇති වෙන්නේ. හැම දාම කණ්ඩායම් දෙකක්, තුනක් හැදෙනවා. තමන්ට ඕනෑ සාමාජික සමිති ටිකක් හදා ගන්නවා. ඒවාට ඡන්දයෙන් පත් වෙනවා මිසක්, ඒ සාමාජික සංගම්වලින් - මම කියන්නේ නැහැ ඔක්කෝම කියා.- සියයට 70ක් පමණ ක්‍රීඩා කරන සමිතිත් නොවෙයි. ඒවා නිලවරණයෙන් ඡන්දය ගැනීමට හදා ගන්නා සමිති පමණයි. ගරු ඇමතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්‍රීඩා නිලධාරීන් ඉන්නවා. තමුන්නාන්සේලාට පුළුවන්, එම නිලධාරීන් හරහා මේ ක්‍රීඩා සංගම් ක්‍රියාත්මක ක්‍රීඩා සංගම්ද කියා වාර්තාවක් ලබා ගන්න. එම වාර්තාව සම්පූර්ණ වෙන්නේ නැත්නම් ඒ ගොල්ලන්ගේ සාමාජිකත්වයත්, ඒ ඡන්ද බලයත් අහිමි කරන්න පුළුවන්. ක්‍රීඩාව දියුණු කරන්න නම් එහෙම වැඩ පිළිවෙළක් ඇති වෙන්න ඕනෑ.

අද ක්‍රීඩාව ව්‍යාපාරයක් බවට පත් වෙලා තිබෙනවා. හූහාක් අය විදේශ ගමන් යෑමට මෙය යොදා ගෙන තිබෙනවා. ක්‍රීඩා තරගයකට ක්‍රීඩකයෝ යවනකොට, ඒ ක්‍රීඩා තරගය සඳහා එක එක නිල හදා ගෙන යෑමට කී දෙනෙකු ඉදිරිපත් වෙනවාද කියා තමුන්නාන්සේටත් පෙනෙනවා ඇති. ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා අරමුදල තිබෙන්නේ මෙන්න මේවාට තමයි. මේ අරමුදලින් තමයි, ඒවා ක්‍රියාත්මක වෙන්නේ. තමුන්නාන්සේලා ක්‍රීඩා සංගම්වලට මුදල් දෙන්නේ, ක්‍රීඩකයින්ට පිටරට යන්න මුදල් දෙන්නේ, ක්‍රීඩකයන්ට පුහුණු වෙන්න මුදල් දෙන්නේ මේ අරමුදල පාවිච්චි කරලායි. එදා මේ අරමුදල ආරම්භ කළ අය, බොහොම දුර කල්පනා කරලා ආරම්භ කරපු අරමුදලක් මෙය. ඒ තුළ ක්‍රීඩාව දියුණු කිරීමේ වැඩ පිළිවෙළ තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා තමුන්නාන්සේ දක්ෂ ඇමතිවරයෙකු හැටියට මේ ගැන තව ටිකක් ගැඹුරට කල්පනා කළොත්, මේ කළා වාගේම මේ කටයුත්ත සාර්ථකව ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා.

ක්‍රීඩාව දේශපාලනයේ තිබෙන කටයුත්තක් නොවෙයි. ක්‍රීඩාව ක්‍රීඩකයන්ට අයිති කටයුත්තක්. ක්‍රීඩාව දියුණු විය යුත්තේ ක්‍රීඩාවට කැමැත්තක් තිබෙන, ඒකට හයියක් තිබෙන උදව්විය හරහායි. ඒ අය ක්‍රීඩාව පිළිබඳව ඇප කැප වෙලා ක්‍රියා කරනවා. සමහරු තනතුර ගන්නවා පමණයි. ඔවුන්ට ක්‍රීඩාව ගැන කල්පනාවක් නැහැ. තමන්ගේ මිත්‍රයන්ට, හිතවතුන්ට තැන දෙන්න තමයි, ඒ අය ක්‍රියා කරන්නේ. පසු ගිය වකවානුවේම අපි ඒක දැක්කා. ඒ නිසා ක්‍රීඩාව දියුණු කරනවා නම් දක්ෂ ක්‍රීඩකයන්ගේ, විශ්‍රාම ගිය ක්‍රීඩකයන්ගේ, ඒ පිළිබඳව හැඟීමක්, වුවමනාවක් තිබෙන

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

උදව්යගේ මැදිහත්වීම සිදු වෙන්න ඕනෑ. ඒ වාගේම මේ ක්‍රීඩා සංගම් ක්‍රමයේ බරපතළ දුර්වලකම් කිහිපයක් තිබෙනවා. ඒ බරපතළ දුර්වලකම් නිවැරදි වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඒ නිසා තමුන්නාන්සේ මේ පිළිබඳව මැදිහත් වෙලා ක්‍රියා කරන්න කියා ඉල්ලමින්, ක්‍රීඩා පනත යටතේ නියෝග තුළින් ගෙන ආ මේ සංශෝධනය පිළිබඳව අපේ ස්තුතියත් පුද කරමින්, මෙය තවත් පුළුල් කර නිරවුල්ව ක්‍රීඩාවේ යෙදෙන, ක්‍රීඩාවත් එක්ක ක්‍රියා කරන උදව්යගේ ආයතනයක් බවට පරිවර්තනය කරන්න කියාත් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට, ගරු අර්ජුන රණතුංග අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි පහළොවක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.54]

ගරු අර්ජුන රණතුංග මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Ports and Shipping)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම ක්‍රීඩා පනත සංශෝධනය කරන්න හිටපු ක්‍රීඩා ඇමති මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා 2013 ජනවාරි 15 වැනිදා ක්‍රියා කළා. මම පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලා හැම දාම කියනවා, ක්‍රීඩාව සම්බන්ධයෙන් මේ රටේ පනත් තිබුණත්, ඒ පනත් ක්‍රියාත්මක වනවාද කියන එක අපි හොයා බලන්න ඕනෑ කියා. ඒ වාගේම අපේ රටේ කිසිම ආයතනයකට ජාතික ප්‍රතිපත්තියක් නැහැ.

අපි පසු ගිය කාලයේ බලාපොරොත්තු වුණා ක්‍රීඩාව සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති හදලා, පනත් සංශෝධනය කරලා, ක්‍රීඩාව ආරක්ෂා කරන වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනයන්න. විශේෂයෙන්ම මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ක්‍රීඩා ඇමතිතුමා මේ සඳහා ආරම්භයක් ලබා දීලා, සංශෝධන ඉදිරිපත් කළා. ඒ වාගේම මමත් සංශෝධන විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කළා. ඒ සංශෝධන තවම ක්‍රීඩා පනතට ඇතුළත් කර නැහැ. ඒ සංශෝධනත් මම අද ඉදිරිපත් කරනවා. ඒ සංශෝධන පිළිබඳවත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර වනවා. විශේෂයෙන්ම මේ රට ජාත්‍යන්තරයට ගියේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ලෝකයේ පළමුවැනි කාන්තා අගමැතිනිය හැටියට පත් වුණාට පසුවයි. ඊට පස්සේ අපේ රටේ දේශපාලන නායකයින් හිටියා. ක්‍රීඩකයන් හිටියා. ක්‍රීඩාව හරහා මේ රට ලෝකයේ ජනප්‍රිය වෙන්න පටන් ගත්තා. ක්‍රිකට් ක්‍රීඩාව කරපු කෙනෙකු හැටියට මටත් අවස්ථාවක් ලැබුණා, 1996 ක්‍රිකට් ලෝක කුසලානය ජයග්‍රහණය කරන්න. 1973 අංක 25 දරන ක්‍රීඩා පනත -දැනට අවුරුදු 40කට ඉස්සෙල්ලා- මේ රටට ඉදිරිපත් කරපු ඇමතිවරු මේ ගැන හොඳ දැනුමක් ඇතිව එය ඉදිරිපත් කර ඇති බව අපි කියන්න ඕනෑ.

ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමනි, පනත් තිබුණාට පනත් ක්‍රියාත්මක කරන්න ක්‍රීඩා අමාත්‍යාංශයට හෝ එහි නිලධාරීන්ට පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. සමහර වෙලාවට මේ පනත කියවා ගන්න පුළුවන්ද කියන කාරණය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. නීති තිබෙන බව අපි දකිනවා. නීතිය තමන්ට ඕනෑ විධියට තමන්ගේ වාසියට හරවා ගන්නත්, ඕනෑ නම් තමන්ගේ හිතවතාගේ වාසියට හරවා ගන්නත් කටයුතු කළ කාලයක් තිබුණා. මම හිතන හැටියට අදත් ඒ තත්ත්වයේ නම් එතරම් වෙනසක් ඇතිවෙලා නැහැ.

ක්‍රීඩා පනතේ 41 වැනි වගන්තිය යටතේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන නියෝගයන් හැකි විගස පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගන්න එක ඉතාමත් වැදගත් දෙයක් වනවා. මොකද, පසු ගිය කාලයේ ක්‍රීඩාව හරහා අතිවිශාල අනවශ්‍ය දේවල් සිදු වුණු බව අපි දැක්කා. ක්‍රීඩාව රටේ තැනකට ගෙන යනවා නම්, එහෙම ගෙන යන්නේ දරුවෙක්ව ක්‍රීඩාවට සම්බන්ධ කිරීමටද කියන කාරණයයි අපි බලන්න ඕනෑ. ඒ කටයුත්ත කරන්නේ පාසලෙන්. ඕනෑම ක්‍රීඩකයෙකුට මූලික අත්තිවාරම දමන්නේ පාසලෙන්. අද වනකොට මුළු පාසල් ක්‍රීඩා පද්ධතියම හුඟක් දුරට ආපස්සට ගිහිල්ලා තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩාව වෙන්න පුළුවන්; මළල ක්‍රීඩාව වෙන්න පුළුවන්; අනිකුත් ක්‍රීඩාවන් වෙන්න පුළුවන්. අද ලෝකයේ ක්‍රීඩාව සම්බන්ධයෙන් පවතින මූල්‍යමය පැත්ත දිහා බලනකොට කියනවා, ක්‍රීඩාව professionalවෙලාය කියලා. ඒ හරහා තිබෙන අපේකම්, ක්‍රීඩාවේ තිබෙන යහ ගුණය හුඟක් දුරට අඩු වෙලා, මුදල් පසු පසම හඹා යන තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. මේ හරහා ක්‍රීඩාව ඉදිරියට ගියා කියලා හිතනවා නම් මම හිතන්නේ ඒක වැරැදියි. ක්‍රීඩකයන්ට මුදල් ලැබෙන්න ඕනෑ. ආයතනවලට මුදල් ලැබෙන්න ඕනෑ. නමුත් මුදල් හම්බ කිරීමේ පරමාර්ථයෙන්ම ක්‍රීඩාව කරනවා නම් ක්‍රීඩා කරන එකේ ඵලක් නැහැ. අපි ක්‍රීඩා කරන කාලයේ හිටපු පුහුණුකරුවන් දිහා බැලුවොත්, ඒ කාලයේ මුදලට වැඩ කරපු පුහුණුකරුවන් හිටියේ බොහොම අඩුවෙන්. ඒ වාගේ පුහුණුකරුවන් යටතේ පුහුණුව ලබන්න අපිට වාසනාව තිබුණා. ක්‍රීඩකයනුත් එහෙමයි. හැම වෙලාවේම රට වෙනුවෙන් ක්‍රීඩා කරනවාය කියන එක තමයි අපට තිබුණු ලොකුම අවශ්‍යතාව, ලොකුම ආඩම්බරය වුණේ. නමුත් අද වනකොට ඒ තත්ත්වය හුඟක් දුරට වෙනස් වෙලා තිබෙනවා.

මම ඒ සම්බන්ධව ක්‍රීඩකයන්ට දොස් කියන්නේ නැහැ. මම දොස් කියන්නේ පරිපාලනයටයි. පරිපාලනය කරනකොට ක්‍රීඩකයන් හදා ගන්න අපි දැන ගන්න ඕනෑ. ක්‍රීඩකයන් එක්ක ජනප්‍රිය වෙන්න, ක්‍රීඩකයන්ට අවශ්‍යම දේ කරන්න ගිහිල්ලා පසු ගිය අවුරුදු තුන හතරේ ක්‍රිකට් ක්‍රීඩාව අන්ත විනාශයකට පත් වුණ බව අපි දැක්කා. ඒකට මූලිකම හේතුව වුණේ දේශපාලන බලපෑම්. හිටපු ක්‍රීඩා අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා හොඳට කථා කළා. මට කියන්න කනගාටුයි, එතුමා ඇමති හැටියට ඒ පුටුවේ ඉන්නකොට අද එතුමා කිව්ව දේවල් ක්‍රියාත්මක වුණා නම්, දයාසිරි ජයසේකර ඇමතිතුමාට කරන්න එතරම් වැඩක් ඉතිරි වන්නේ නැහැ. එතුමා ඒ පුටුවේ ඉන්නකොට කළේ තනිකරම අනෙක් පැත්තේ දේවල්. අන්න එතැන තමයි අපට වැදගත්කම තිබෙන්නේ. ගාමිණී ලොකුගේ හිටපු ඇමතිතුමාට මේවා දැන්වත් තේරිලා අපව දැනුවත් කිරීම ගැන මම සන්තෝෂ වෙනවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට චෝදනාවක් කරනවා නොවෙයි. 2015 අපේ විස්සයි-විස්ස ක්‍රිකට් ලෝක කුසලාන තරගය තිබුණා. ඒ තරගයට යන්න ඉස්සරවෙලා අපේ ක්‍රීඩකයන් කිහිප දෙනෙක් FCID එකට කැඳෙව්වා. තරග පාවා දීම ගැන -[බාධා කිරීමක්] ඉතාමත් වැදගත් ආයතනයක්. ඒ නිසා පොඩ්ඩක් ඉන්න කෝ. තරග පාවාදීම්වලට සම්බන්ධයි කියලා තමයි ඒ ක්‍රීඩකයන් එතැනට යොමු කළේ. ඕනෑම ක්‍රීඩකයෙකුට තරග පාවා දීමේ චෝදනා තිබුණා නම් අනිවාර්යෙන්ම දඬුවම් දිය යුතුය කියලා ඉස්සරවෙලාම කථා කරන කෙනෙක් මම. නමුත් තරගාවලියකට ඉස්සරවෙලා එවැනි දේ ක්‍රියාත්මක වෙනකොට - විශේෂයෙන්ම අපේ කණ්ඩායමේ නායකයා, ප්‍රධාන ක්‍රීඩකයෙක්

සහ තවත් තරුණ ක්‍රීඩකයෙක් - මේ ක්‍රීඩකයන් තුන් දෙනාම දවස් කිහිපයකට ඉස්සරවෙලා FCID එකට අර ගෙන ගිහිල්ලා කළ ඒ ක්‍රියා දාමය අපට අනුමත කරන්න බැහැ. ඒ තරගාවලිය ඉවර වුණාට පස්සේ ඒ ක්‍රීඩකයන්ව ගෙනැල්ලා පරීක්ෂණවලට ලක් කරලා අවශ්‍ය දේ කරන්න තිබුණා. අපි දැක්කා, මාධ්‍ය හරහා විශේෂයෙන්ම අපේ ක්‍රිකට් කණ්ඩායමේ නායකයා විශාල අපකීර්තියකට පත් වුණු බව. එහෙම මනසක් ඇතිව ගිහිල්ලා ක්‍රීඩා කරන්න බැහැ. අපි බලාපොරොත්තු වෙනවා, ක්‍රිකට් පාලක මණ්ඩලයෙන් එළියට යන කොට; තරගාවලියට යන කොට තරගාවලිය ජයග්‍රහණය කර ගෙන එන්න ඕනෑ කියලා. ඒ නිසා ඉදිරියට මේ වාගේ දේවල් සිදු නොවෙන්න අනිවාර්යයෙන්ම ඔබතුමා වග බලා ගත යුතුය කියන එක මම ඉතාමත් ඕනෑකමින් දන්වා සිටිනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මම ඔබතුමාගෙන් තවත් දෙයක් ඉල්ලනවා. විශේෂයෙන්ම අපේ වේග පන්දු යවන පුහුණුකරුවකුගේ ප්‍රශ්නයක් මම මාධ්‍ය හරහා දැක්කා. ඒ අනුෂ සමරනායක කියන පුහුණුකරුවා තරග පාවා දීමේ චෝදනා යටතේ ක්‍රිකට් පාලක මණ්ඩලයෙන් ඉවත් කර තිබෙනවා. ඔබතුමා පුළුවන් නම් ඒ පිළිබඳව වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ලබා දෙන්න. ලෝක ක්‍රිකට් කවුන්සිලයේ තරග පාවා දීම පිළිබඳව විශේෂ කමිටුවක් තිබෙනවා. එයින් ඔහු නිදහස් කරලා ලියුමක් එවලා කියලා අපට දැන ගන්න ලැබී තිබෙනවා. ඒක කොතරම් දුරට ඇත්තද නැද්ද මම දන්නේ නැහැ. එහෙම ලියුමක් ඇවිල්ලා තිබෙනවා නම් ඔබතුමා මැදිහත් වෙලා අනුෂ සමරනායක කියන පුහුණුකරුවා හරිද වැරදිද කියලා මේ රට දැනුවත් කරන්න. එහෙම වරදක් කර තිබෙනවා නම් ඒ ගැන පරීක්ෂණයක් පවත්වන්න. ඒ පුද්ගලයා; ඒ පුහුණුකරුවා වරදක් කරලා නැත්නම් ඒ ක්‍රියා දාමය කරන්න ඉදිරිපත් වුණු පුද්ගලයන් සහ මෙවැනි දඬුවමක් දෙන්න හදපු පුද්ගලයන් ගැන ඔබතුමා විශේෂ අවධානය යොමු කරලා තීරණයක් ගත යුතුයි.

ක්‍රීඩා සංගම්වලට ඒ කාර්යාල පවත්වන්න අවශ්‍ය පහසුකම් නැහැයි කියලා ගාමිණී ලොකුගේ හිටපු ඇමතිතුමා කිව්වා. මට මතකයි, පසු ගිය කාලයේ ජාතික ඔලිම්පික් කමිටුවේ ගොඩනැඟිල්ල හදනකොට එහි එක් අවශ්‍යතාවක් තමයි ක්‍රීඩා සංගම්වලට අවශ්‍ය කාර්යාලය ලබා දීම. හැබැයි, අවසානවකට පසු ගිය කාලය තිස්සේම ඒක චීන හෝටලයකට බදු දීලා තිබුණා. අපි හැමදාම මේ ගැන පාර්ලිමේන්තුවේ කථා කළා. ඒ ගැන දැනුවත් කළා. ක්‍රීඩා සංගම්වලට කාර්යාල ලබා දෙනවාට වඩා චීන හෝටල්වලට -චීන ආපන ශාලාවකට- දීලා මුදල් ලබා ගැනීම පසු ගිය කාලයේ ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේ විධියට ක්‍රීඩා ආයතනවලට අවශ්‍ය පහසුකම් නොදී මෙවැනි දේවල් කිරීම ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පසු ගිය කාලයේ ලබා දී තිබෙන ක්‍රීඩා සංගම් නියෝගවලට අදාළව වෙනස් කළ යුතු නියෝග කිහිපයක් ඇතුළත් ලේඛනය **සභාගත*** කරනවා.

ඒ සඳහා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න. මොකද, මා මේවා ඉදිරිපත් කර තිබෙන්නේ වෙන දෙයක් නිසා නොවෙයි, මේ ක්‍රීඩාව ආරක්ෂා කරන්න අවශ්‍ය නිසායි. ක්‍රීඩාව ආරක්ෂා කරන්න ඕනෑ නම්, තිබෙන නීති ක්‍රියාත්මක වෙන්නත් ඕනෑ. එක පුද්ගලයකුට එක විධියකටත්, තවත් පුද්ගලයකුට තවත් විධියකටත් නීතිය ක්‍රියාත්මක නොකර නිවැරැදි විධියට නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන් මේ කාරණයත් මා ඔබතුමාට කියන්න ඕනෑ. හිටපු ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා ගැනත් ප්‍රශ්න රාශියක් තිබුණා. මට මතකයි, පසු ගිය කාලයේ වොලිබෝල් නිල වරණයේදී මානව හිමිකම් උල්ලංඝනය වූ බවට තීන්දුවක් ගෙන තිබුණු බව. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තිබුණු නිල වරණය ගැනත් මා complaint එකක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ ගැන අපට පසුව කථා කරගන්න පුළුවන්. නමුත් එහිදී යම් වරදක් වෙලා තිබෙනවා නම් ඒ වරද නිවැරැදි කරන්න. සමහර විට ක්‍රීඩා ඇමතිවරයකුට බැණුම් අහන්නත් සිද්ධ වනවා, නිලධාරීන්ගෙන්. අපි වුණත් අමාත්‍යාංශයක ඉන්න කොට අපේ නිලධාරීන් දෙන උපදෙස් අනුව තමයි බොහෝ විට ක්‍රියාත්මක වන්නේ. ඒ නිසා මෙවැනි නිලධාරීන් ගැන ලොකු වුවමනාවකින් සොයන්න ඕනෑ කාලයක් උදාවෙලා තිබෙනවා. අමාත්‍යවරුන් හැටියට අපට කොපමණ වැඩ තිබුණත්, කාර්ය බහුල වුණත්, නිලධාරීන් දෙන දෙයම ක්‍රියාත්මක කරන්නේ නැතුව අපට අවශ්‍ය, රටට අවශ්‍ය වැඩ පිළිවෙළක් ඉදිරියට ගෙන යෑම අපේ රාජකාරියයි.

මා වැඩිපුර කාලය ගන්නේ නැහැ. විශේෂයෙන්ම ගරු ක්‍රීඩා ඇමතිතුමාට මා ස්තුතිවන්ත වනවා, ක්‍රීඩා පනත යටතේ නියෝග ඉදිරිපත් කරලා ක්‍රීඩාවේ යහපත සඳහා නැවත වරක් සංශෝධන ඉදිරිපත් කිරීම ගැන. ඒ වාගේම මා දුන් නියෝග ඇතුළත් කළේ නැති වුණත්, මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ඇමතිතුමාටත් මා ස්තුතිවන්ත වනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඇතුළත් කළා.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ඔබතුමා එකක්වත් ඇතුළත් කරලා නැහැ. [බාධා කිරීමක්] එහෙම කරන්න. මා ඒ නියෝග ඔබතුමාට ඉදිරිපත් කළත් මා ක්‍රීඩා කරන්න යන්නේත් නැහැ. ඔබතුමා ගත් මූලික ක්‍රියාදාමය ගැන මා ඉතාමත් ස්තුතිවන්ත වනවා. 2001 මා මේ පාර්ලිමේන්තුවට පත්වුණු දවසේ සිට හැම දවසකම වාගේ මා මේ ගැන සාකච්ඡා කරනවා. ක්‍රීඩාවට අවශ්‍ය ඕනෑම අවස්ථාවක අපි ඒ වෙනුවෙන් ඉදිරිපත් වන බව කියමින්, ක්‍රීඩාව සම්බන්ධයෙන් මේ රටට අවශ්‍ය ජාතික ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ රටේ ක්‍රීඩාවේ ප්‍රවීණයන් ඉන්නවා. ක්‍රීඩාවේ ප්‍රවීණයන් සහභාගි කරවාගෙන ජාතික ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරන්න. තේරීම් කමිටුවලට, එහෙම නැත්නම් පරිපාලනයට අවශ්‍ය සියලුම දේ සකස් කරමින්, ඉදිරියේදී ක්‍රීඩාව නිවැරැදි මාර්ගයේ ගෙන යන්න අපට පුළුවන් වෙයි. මට මේ අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ඇමතිතුමා.

The next speaker is the Hon. Gnanamuthu Srineshan. You have 10 minutes.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[பி.ப. 4.07]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விளையாட்டுச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான இன்றைய விவாதத்தில் கலந்துகொள்வதில் நான் சந்தோசமடைகின்றேன். எங்களுடைய விளையாட்டுத்துறை அமைச்சரைப் பொறுத்தமட்டில் அவர் மீது எங்களுக்கு நேர்கணியமான பார்வை இருக்கின்றது. அவருடைய நேர்கணியமான அணுகுமுறையினை எங்களால் அவதானிக் கக்கூடியதாக இருக்கின்றது. அண்மையில் அவர் மட்டக்களப்புக்கு விஜயம் செய்து அங்குள்ள பிரபல்யம் வாய்ந்த 'வெபர்' மைதானத்தினைத் திறந்து வைத்தார். நாட்டின் எல்லாப் பிரதேசங்களுக்கும் சென்று விளையாட்டுத்துறையினை விஸ்தரிக்க வேண்டுமென்ற செய்தியினை அதன் மூலமாக எங்களுக்குத் தந்திருந்தார். அந்த வகையில் அவருடைய நேர்கணியமான அணுகுமுறை, நேர்கணியமான சிந்தனையை நாங்கள் வரவேற்கின்றோம். நானும் அவரை அணுகி விளையாட்டு மைதான அபிவிருத்தி தொடர்பான ஒரு வேண்டுகோளினை விடுத்தேன். உடனடியாக அவர் தன்னுடைய பொறியியலாளரை அழைத்து அந்த மைதானங்களுக்கு நேரடியாகச் சென்று பார்வை யிடுமாறு பணிப்புரை விடுத்தார். அதன்பேரில் மறுநாளே அப்பொறியியலாளர் அந்த இடங்களுக்குச் சென்று குறிப்பிட்ட மூன்று மைதானங்களை அபிவிருத்தி செய்வது தொடர்பான ஆலோசனைகளையும் அடுத்தடுத்துச் செய்யவேண்டிய நடவடிக்கைகளையும் அமைச்சரின் சார்பாகத் தெரிவித் திருந்தமை குறிப்பிடத்தக்கதாகும்.

விளையாட்டுத்துறையை வெறுமனே விளையாட்டாக மட்டும் கருதிவிட முடியாது. அது முக்கியமான ஒரு விடயமாகும். மெக்டூகல் என்ற ஆய்வாளரின் கருத்துப்படி 14 வகையான ஊக்கல்கள் இருப்பதாக அவர் குறிப்பிட் டிருக்கிறார். அந்த வகையில், 'போரூக்கல்' என்று ஒருவகை யான ஊக்கல் இருக்கின்றது; 'குழுவூக்கல்' என்று இன்னொரு வகையான ஊக்கல் இருக்கின்றது. 'போரூக்கல்' மற்றும் 'குழுவூக்கல்' ஆகிய இந்த இரண்டு வகையான ஊக்கல் களையும் சரியான முறையில் நெறிப்படுத்தவேண்டுமாக இருந்தால் பிள்ளைகளை ஆரம்பத்திலிருந்தே விளையாட்டில் ஈடுபாடு கொண்டவர்களாக வழிகாட்ட வேண்டும். எனவே பாடசாலை மட்டத்தில் மட்டுமல்ல, கிராம, பிரதேச செயலக, மாவட்ட, மாகாண, தேசிய மற்றும் சர்வதேச மட்டங்களில் விளையாட்டுத்துறையினை அபிவிருத்தி செய்யக்கூடிய விதத்தில் எமது அமைச்சர் தனது செயற்பாடுகளை முன்னெடுத்துச் செல்வார் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது.

குறிப்பாக, 70 சதவீதமான மக்கள் வாழ்கின்ற பிரதேசமாக கிராமங்கள் காணப்படுகின்றன; 30 சதவீதமான மக்கள் வாழ்கின்ற பிரதேசமாக நகரங்கள் காணப்படுகின்றன. அந்த வகையில், கூடுதலான விளையாட்டு வீரர்கள் விளையும் மண்ணாகக் கிராமிய மண் காணப்படுகின்றது. கிராமிய மட்டத்திலிருந்து விளையாட்டுத்துறையினை வளர்ப்பதன் மூலமாக அதிதிறமை வாய்ந்த விளையாட்டு வீர, வீராங் கனைகளை இந்த நாட்டுக்குப் பெற்றுக்கொடுக்கக்கூடிய வாய்ப்பு இருக்கின்றதென்பதை நான் சொல்லித்தான் நீங்கள் அறியவேண்டிய அவசியமில்லை. ஏனென்றால் எமது நாட்டுக்கு கீர்த்தியைப் பெற்றுத்தந்த விளையாட்டு வீர, வீராங்கனைகள் அநேகமாகக் கிராமப் புறங்களிலிருந்துதான் விளைந்திருக்கிறார்கள் என்பதை நீங்கள் அறிவீர்கள். அந்த வகையில் 30 வருட கால யுத்தம் முடிந்ததன் பின்னர் இளைஞர், யுவதிகள் தங்களிடையே காணப்படுகின்ற சக்தியினை - மெக்டூகலின் கருத்தின்படி கூறுவதாக இருந்தால் 'போரூக்கல்', 'குழுவூக்கல்' போன்ற சக்தியினை - சரியான முறையில் பயன்படுத்திக்கொள்வதற்கு இந்த விளையாட்டுச் செயற்பாடுகளைக் கிராமங்கள்தோறும் விஸ்தரிக்கவேண்டு மென்ற கோரிக்கையினை - வேண்டுகோளினை - உங்கள் கவனத்திற்குத் தருகின்றேன். குறிப்பாக, ஒரு மாவட்டத்துக்கு ஒரு மைதானம் என்ற வகையில் சர்வதேச மட்டத்துக்கமைய மைதானங்களை விஸ்தரிக்கவேண்டிய தேவை இருக்கின்றது. கிழக்கு மாகாணத்தைப் பொறுத்த மட்டில் அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை போன்ற மாவட்டங்கள் கடந்த காலத்தில் யுத்தம் நடைபெற்ற இடங்களாகும். என்றாலும், அபிவிருத்தி என்ற விடயத் துக்கான நிகழ்ச்சி நிரலில் அம்மாவட்டங்களுக்கு முன்னுரிமை கொடுக்கப்படவில்லை.

ஆனால், இன்று யுத்தம் மௌனிக்கப்பட்டதன் பின்னரும் நாங்கள் அந்த இடங்களில் விளையாட்டுத்துறையினை அபிவிருத்தி செய்யாமல் இருப்பது எமது இளைஞர் யுவதி களுக்கு வேதனையைத் தருவதாக அமையும். விளையாட்டுத்துறை அமைச்சரைப் பொறுத்தமட்டில் நாங்கள் அவர் மீது நம்பிக்கை வைத்திருக்கின்றோம். கௌரவ அமைச்சர் அவர்களே, இந்த ஐந்தாண்டு காலப்பகுதியில் கிழக்கு மாகாணத்தில் காணப்படுகின்ற அம்பாறை, திருகோணமலை, மட்டக்களப்பு போன்ற மாவட்டங்களிலும் அதேபோன்று வடமாகாணத்தில் காணப்படுகின்ற யாழ்ப்பாணம், கிளிநொச்சி, முல்லைத்தீவு, வவுனியா, மன்னார் போன்ற மாவட்டங்களிலும் இந்த விளையாட்டுத்துறையை அபிவிருத்தி செய்யக்கூடிய விதத்தில் உங்களுடைய செயற் பாடுகள் அமையவேண்டுமெனவும் அவை மற்றையவர்களுக்கு ஒரு முன்னுதாரணமாக, ஓர் எடுத்துக்காட்டாக விளங்க வேண்டுமெனவும் இந்த இடத்தில் நான் கேட்டுக் கொள்கின்றேன். இளைஞர் யுவதிகள் அவர்களது உள்ளத் தைப் பதப்படுத்திக்கொள்வதற்கு -பண்படுத்திக்கொள்வதற்கு, தலைமைத்துவத்தினை வளர்த்துக்கொள்வதற்கு, விட்டுக் கொடுப்பினையும் சகிப்புத் தன்மையினையும் வளர்த்துக் கொள்வதற்கு விளையாட்டு ஓர் உத்தியாக - உபாயமாக அமைகின்றது என்பதனை நீங்கள் அறிவீர்கள். எனவே, பாடசாலை மட்டத்திலிருந்து நாங்கள் விளையாட்டுக்களைக் கட்டியெழுப்பவேண்டிய தேவையிருக்கின்றது.

உண்மையிலேயே தமது திறமையைக் காட்டி நாட்டிற்குத் தங்கப்பதக்கம் பெற்றுத் தருகின்ற சில வீர, வீராங்கனைகள் கௌரவிக்கப்படுவதில்லை என்று ஏற்கெனவே உரையாற்றிய JVP உறுப்பினர் பிமல் ரத்நாயக்க அவர்கள் குறிப் பிட்டிருந்தார். அவர்கள் சாதாரணமாகப் பேருந்து வண்டியில் சென்று மிகவும் அவஸ்தைப்பட்டு, பிற நாடுகளில் கௌரவிப்புகளைப் பெற்றுக்கொள்வதற்கும் பங்குபற்றல் களைச் செய்வதற்கும் உரிய ஏற்பாடுகளை மேற்கொள்கின்ற நிலைமை காணப்படுகின்றதென்று குறிப்பிட்டிருந்தார். அண்மையில் கிழக்கு மாகாணத்திலிருந்து சென்று, தெற்காசிய விளையாட்டு நிகழ்வில் கபடிப் போட்டியில் கலந்துகொண்டு பதக்கங்களைப் பெற்று நாட்டுக்குக் கௌரவம் சேர்த்த வீரர்கள்கூட கிழக்கு மாகாணத்திலிருந்து புறப்படுகின்றபோது பல்வேறுபட்ட அவஸ்தைகளைச் சந்தித்தார்கள். அவர்களுக்குக் கொடுக்கவேண்டிய நிதியைக்கூட சரியான நேரத்தில் வழங்கவில்லை. அதை உங்களது பிழையாக நான் கருதவில்லை. அங்கிருக்கின்ற சில அதிகாரிகள் விட்ட தவறுகள் காரணமாக அவர்களுக்குரிய காசோலை உரிய நேரத்தில் கிடைக்காத நிலைமையில் அவர்கள் அவஸ்தைப்

පට්ටුක් කඩෙසි නෙරත්තිල් එන්නිඩම් වන්තු තංකළතු පයණම් තාමතික්කක්කූඩිය නිලෙයිරුක්කින්රතු අල්ලතු තංකළුක්කු ඉන්තච් චන්තර්ප්පම් කිටෙක්කාමල් පෝකක්කූඩිය ඔරු නිලෙයිරුක්කින්රතු එන්රු කූරි 1,20,000 රූපායෛත් තමක්කුත් තරුම්පටි කේට්ටුක්කොණ්ටාර්කළ්. අන්ත විළෙයාට්ටු වීරර්කළතු පංකුපට්රල් ඉන්තියාවිල් ඉටම්පෙරුවතාල් නාන් අන්තප් පණත්තෛක් කොටුත්තු අවර්කළෛ අනුප්පියිරුන්තේන්. අතර්කුප් පින්නර් අවර්කළ් අන්තප් පණත්තෛත් තිරුප්පිත් තරුවතර්කුරිය නටවටික්කෛයෛයුම් සෙය්තිරුන්තාර්කළ් එන්පතෛයුම් ඉංකු කුරිප්පිට විරුම්පුකින්රේන්.

එනවේ, විළෙයාට්ටුත්තුරෛයිල් තේසිය මට්ටත්තිලුම් සර්වතේස මට්ටත්තිලුම් එමතු නාට්ටුක්කුක් කීර්ත්තියිනෛයුම් - පුකළෛයුම් සේර්ක්කින්ර විළෙයාට්ටු වීර, වීරාංකනෛකළ් කෙළරවික්කප්පට වේණ්ටුම්; අවර්කළ් වෙළිනාටුකළිල් නටෙපෙරුම් විළෙයාට්ටුක්කළිල් කලන්තුකොළ්වතර්කුම් අවර්රිල් පංකුතාරිකළාක ඉරුප්පතර්කුමුරිය වාය්ප්පුකළ් ඉලකුපටුත්තප්පට වේණ්ටුම් එන්පතෛයේ නාන් ඉන්ත ඉටත්තිල් කූරික්කොළ්ළ විරුම්පුකිරේන්. අතුමට්టුමල්ලාමල් තේසිය මට්ටත්තිල් සර්වතේස මට්ටත්තිල් අවර්කළ් කාට්ටුකින්ර-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, you have two more minutes.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(මාණ්පුමිකු ඥානමුත්තු ශ්‍රීනේසන්)
(The Hon. Gnanamuthu Srineshan)

-අන්තත් තිරමෛකළුක්කුප් පරිසාක අවර්කළුක්කු විළෙයාට්ටුත්තුරෛ සාර්න්ත පතවිකළෛප් පෙට්රුක් කොළ්වතර්කුම් - උත්තියෝකංකළෛප් පෙට්රුක්කොළ්වතර්කුම් උරිය අනුමති වළංකප්පට වේණ්ටුම්. ආනාල්, ඉන්රු වටක්කු, කිළක්කු මාකාණංකළිල් සර්වතේස විළෙයාට්ටුප් පෝට්ටිකළිල් කලන්තුකොණ්ටවර්කළ් ඔරු කූලියාළ් වේලෛයෛක්කූටප් පෙට්රුක්කොළ්වතර්කු අතාවතු ඔරු labour ආක කූටච් චේර්න්තුකොළ්වතර්කු මුන්ටියටික්කින්ර නිලෛමෛයිනෛප් පාර්ක්කක්කූඩියතාක ඉරුක්කින්රතු. එනවේ, නාට්ටුක්කුප් පුකළ් චේර්ක්කින්ර ඉන්ත වීර, වීරාංකනෛකළ් තමතු තිරමෛකළෛ වෙළිප්පටුත්තක්කූඩිය ඉන්ත විළෙයාට්ටුත් තුරෛ සාර්න්ත උත්තියෝකංකළිල් චේර්න්තු නාට්ටුක්කු මේලුම් විළෙයාට්ටු වීරර්කළෛප් පයිරුවිත්තුත් තරුවතර්කුරිය මාර්ක්කංකළෛප් පෙට්රුත්තරවේණ්ටුම්. කුරිප්පාකච් චිල විළෙයාට්ටු වීරර්කළ් එන්නිඩම් වන්තු තාංකළ් සර්වතේස මට්ටත්තිල් චෙන්රු චාන්රිතළ්කළෛප් පෙට්රිරුප්පතාකවුම් ආනාල්, තංකළුක්කුරිය තොළිල් වාය්ප්පුක්කළ් චරියාන මුරෛයිල් වළංකප්පටවිල්ලෛයෙන්රුම් කූරි ආතංකප් පට්ටුක්කොණ්ටාර්කළ්.

නාන් කෙළරව අමෛච්චර් අවර්කළෛ නම්පුකින්රේන්. ඉප්පටිත් තේසිය මට්ටත්තිලුම් සර්වතේස මට්ටත්තිලුම් නාට්ටුක් කුප් පුකළෛච් චේර්ත්තුත් තන්ත අන්ත වීර, වීරාංකනෛකළුක්කු උරිය පතවිකළෛ - උත්තියෝකංකළෛ වළංකුවතන් මූලමාක අවර්කළ් කෙළරවික්කප්පට්ටු මේලුම් තංකළෛප් පෝන්ර විළෙයාට්ටු වීරර්කළෛ ඉන්ත මණ්ණුක්කුප් පෙට්රුත් තරුවතර්කු වළිවකෛ සෙය්යවේණ්ටුමෙන්රු කේට්ටුක් කොළ්කින්රේන්. අත්තෝටු පුලම් පෙයර්න්තු චෙන්ර එමතු උරවුකළ් වෙළිනාටුකළිලිරුන්තු චිරන්ත විළෙයාට්ටු මෛතානංකළෛ අමෛත්තුක් කොළ්වතර්කාක එන්නිඩම් චිල proposalකළෛ අතාවතු පිරේරණෛකළෛත් තන්තිරුක්කිරාර්කළ්. අන්තප් පිරේරණෛකළෛ නීංකළ් අනුමතික්කින්ර පට්චත්තිල්, අවර්කළ් වෙළිනාටුකළිලිරුන්තු නිතියිනෛත් තිරට්ටි මට්ටක්කළප්පිල් චිරන්ත මෛතානංකළෛ අමෛප්පතර්කු මුන්වරුවාර්කළ්. ඉතු චම්පන්තමාක උංකළිටම් කලන්තුරෛයාට ඉරුක්කින්රේන් එන්පතනෛක් කූරි, එනතු උරෛයිනෛ මුටික්කින්රේන්. නන්රි.

[අ.භා. 4.17]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා පනතේ වගන්ති සංශෝධනය කරමින් නියෝග ඉදිරිපත් කර ඇති මේ අවස්ථාවේ ඒ පිළිබඳව අදහස් කීපයක් පළ කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මෙම පනතට සංශෝධන දෙකක් ඉදිරිපත් කරමින් ගැසට් පත්‍රයක් මඟින් පළ කරන ලද නියෝග අනුමතිය සඳහා අද මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ක්‍රීඩා පනත මුලින්ම සකස් කළේ 1973 වර්ෂයේදී එවකට ක්‍රීඩා අමාත්‍යව සිටි කේ.බී. රත්නායක මැතිතුමා විසිනුයි. ක්‍රීඩා රෙගුලාසි හැදුවේ 1974 වර්ෂයේදීයි. එතුමා හදපු ක්‍රීඩා පනත, ක්‍රීඩා රෙගුලාසි තමයි අප මේ විටින් විට සංශෝධනය කරමින් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් තීන්දු තීරණ ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1973, 1974 වර්ෂවල මේ ක්‍රීඩා පනත සහ රෙගුලාසි සකස් කළත් ඊට පසු අවස්ථා කිහිපයකදීම මේ ක්‍රීඩා පනතේ සහ රෙගුලාසිවල සංශෝධන විටින් විට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ ඉදිරිපත් කළ යම් යම් සුළු සුළු සංශෝධන හැරෙන්නට, මේ ක්‍රීඩා පනත හා රෙගුලාසි පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් කර රටට කාලෝචිත විධියට, ක්‍රීඩාවට උචිත විධියට පසු ගිය කාලයේ සංශෝධන කර තිබුණේ නැහැ. මම 2011 ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට පත් වුණාට පස්සේ, මේ ක්‍රීඩා පනත සහ ක්‍රීඩා රෙගුලාසි සංශෝධනය විය යුතුය කියා ක්‍රීඩා සංගම්වල ලොකු ඉල්ලීමක් තිබුණු බව ඔබතුමා දන්නවා. ඊට හේතුව තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1973 වකවානුවේ රටේ තිබුණු තත්ත්වයත් මේ වන විට ක්‍රීඩා සංගම්වල තත්ත්වයත් අතර තිබෙන වෙනස. එදා ක්‍රීඩා පනත, ක්‍රීඩා රෙගුලාසි භාවිතා කරමින් ක්‍රීඩාවට කර තිබෙන විනාශය පිළිබඳ මේ ක්‍රීඩා සංගම් විසින් විටින් විට අපට කිව්වා. ඒ අනුව මේ ක්‍රීඩා පනත, ක්‍රීඩා රෙගුලාසි පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් කර මේ පිළිබඳ අපට අදහස් ඉදිරිපත් කරන්නය කියා, මා වෛද්‍ය මයියා ගුණසේකර මැතිතුමා, නීතිඥ පණ්ඩුක කීර්තිනන්ද මැතිතුමා, ඔලිම්පික් කමිටුවේ සභාපතිතුමා, අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමා යන අයගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව අප ඔලිම්පික් සංගමයත් එක්ක මේ කටයුත්ත ආරම්භ කළා. එතැන සිට ලංකාවේ සියලු සංගම් කැඳවා, ක්‍රීඩා පනත සහ ක්‍රීඩා රෙගුලාසි සංශෝධනය කරන්න අවශ්‍ය වටපිටාව සකස් කරන්න අවුරුදු එකහමාරක කාලයක් ගියා. ඒ අනුව, 1973න් පස්සේ පළමුවන වතාවට ක්‍රීඩා පනත හා රෙගුලාසි පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් කර පනත සංශෝධනය කර, රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒවා සම්මත වුණා. ඒවායින් රෙගුලාසි දෙකක් තමයි ගරු ඇමතිතුමා නැවතත් සංශෝධනය කරනු ලැබූ නියෝග හැටියට ඉදිරිපත් කර තිබෙන්නේ. එක සංශෝධනයකින් ඔබතුමා

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

කියනවා, එදා රහස් ඡන්දය ප්‍රකාශ කරන්න තිබුණු අයිතිය වෙනුවට අත උස්සලා ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න කියා. දෙවැනි සංශෝධනය තමයි වසර හතරකට වෙන් කර තිබූ කාලසීමාව සංශෝධනය කිරීම. ගරු අමාත්‍යතුමනි ඔබතුමා දන්නවා, ක්‍රීඩා සංගමයකට කාලය තිබුණේ අවුරුදු දෙකයි කියන එක. අවුරුදු දෙකෙන් දෙකට නිලවරණයකට යන්න ඕනෑ. මේක අපි අවුරුදු හතර දක්වා දීර්ඝ කළා. ඔබතුමා මේ ගැසට් නිවේදනය මඟින් ඒ තිබුණු ප්‍රායෝගික ගැටලුවක් නිවැරදි කර තිබෙනවා. ඒක හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ කාරණය කෙරෙහිත් ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. මා දැකපු දෙයක් තමයි, විටින් විට විවිධ ඇමතිවරු පත් වී එනකොට විවිධ ක්‍රීඩා සංගම්වල නිලධාරීන් ඇවිත් තමන්ගේ පැවැත්ම වෙනුවෙන්, තමන්ගේ වාසිය වෙනුවෙන් මේ ක්‍රීඩා පනතේ රෙගුලාසි වෙනස් කරන්නටය කියා යෝජනා කරන එක. ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා එතැනට වැටෙයි කියා මා විශ්වාස කරන්නේ නැහැ. තමන්ට පෞද්ගලික වාසි වන පරිදි ක්‍රීඩා පනතට අත ගහන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම මම ගරු ඇමතිතුමාට කරන්නට කැමතියි. ඔබතුමා අද වෙන තුරු එහෙම කරලා නැහැ. ඉදිරියේදී ඔබතුමාට එවැනි යෝජනාවක් ආවොත්, මේ පනතට හා රෙගුලාසිවලට අත ගහනකොට ඉතාම කල්පනාකාරී වෙන්න කියා මා කියා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ක්‍රීඩා පනත හා රෙගුලාසි වෙනස් කරන්න අපට මුල් වුණු කාරණා කිහිපයක් තිබුණා. ක්‍රීඩාවට බොහොම ආදරය කරන මන්ත්‍රීවරයෙක් වන ගරු කනක හේරත් මන්ත්‍රීතුමා මුලසුනේ ඉන්න අවස්ථාවක මට කථා කරන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා. අපේ හිතවත් ගරු කනක හේරත් මන්ත්‍රීතුමා ක්‍රීඩා සංගමයක සභාපති කෙනෙකු හැටියටත් කටයුතු කළා.

පසු ගිය කාලයේ ක්‍රීඩා සංගමයකට වසර දෙකක කාලයක් තමයි තිබුණේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිගන්නවා ඇති, අවුරුදු දෙකකින් කිසිම කෙනෙකුට වැටුණු ක්‍රීඩාවක් හදන්න බැරි බව. ජාතික ප්‍රතිපත්තියක් හදලා කටයුතු කරන්න අඩු ගණනේ අවුරුදු හතරක්වත් යනවා. ඒ නිසා තමයි අප මේ කාල සීමාව අවුරුදු හතරක් කළේ. හැබැයි ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙතැන පොඩි වරදක් කර තිබෙනවා. අප මේ කාලය අවුරුදු හතරක් දක්වා දික් කළේ පොඩි condition එකක් දමලායි. අපි අවුරුදු හතරක් ඉන්න දෙනවා. හැබැයි, මේ සංගමයේ නිලධාරීන් මේ අවුරුදු දෙක තුළ කටයුතු කළ ආකාරය පිළිබඳව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව සෑහීමකට පත් වෙනවාද කියා අප බලනවා. ඒ ගැන සොයා බලන්න අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය දීලා තිබුණා. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව එසේ සෑහීමකට පත් වෙනවා නම් පමණයි නිලවරණයකට යන්නේ නැතිව අවුරුදු හතරක් දක්වා දීර්ඝ කරන්න අවසර දෙන්නේ. හැබැයි, දැන් මේ නියෝගවලින් ඔබතුමා අවුරුදු හතරම එකදිගට යන්න දෙනවා. මේකෙන් මතු වන ප්‍රශ්නය මෙයයි. මේ ක්‍රීඩාව විනාශ කරන කෙනෙක් ආවොත්, අවුරුදු හතරක් යන කොට ආයේ ක්‍රීඩාවේ ගන්න දෙයක් නැතිව යනවා. ඒ නිසා ඒ කාරණයට ඔබතුමාට පොඩි සංශෝධනයක් ගේන්න පුළුවන් නම් හොඳයි. අවුරුදු හතර දෙන කොට අවුරුදු දෙකකින් ඔහුගේ ක්‍රීඩාවේ ව්‍යාජතිය පිළිබඳව යම් යම් කාරණා සොයා බලන්න. අප ඒ නීතිය හැදුවා. ඔබතුමා එය ගෙනැත් බලන්න, අප ඒකේ යම් කොන්දේසි ටිකක් දමලා තිබෙනවා. ඒ කොන්දේසි ටික සපුරනවා නම් තමයි ඔහුට අවුරුදු හතරක කාලයක් ඉන්න පුළුවන් වන්නේ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මෙහෙම කියන්නේ ඇයි කියා දන්නවාද? මම පාපන්දු ක්‍රීඩාවෙන් ලත් අත් දැකීම නිසායි මෙහෙම කියන්නේ. පාපන්දු කියන්නේ අපේ රටේ බොහොම ඉහළින්ම තිබුණු ක්‍රීඩාවක්. මේ පාර්ලිමේන්තුවේදී මම ඒ නැනැත්තාගේ නම කියන්න කැමැති නැහැ. මේ පාපන්දුවේ උරුමක්කාරයෙක් හිටියා. අවුරුදු දෙකක් පාපන්දුව පරිපාලනය කළේ ඒ පුද්ගලයායි. ඔහු FIFA එකේ සල්ලි බිලියන ගණනක් හොරකම් කළා. කිසි කෙනෙකුට එතැනින් ඔහුව ඉවත් කරන්න බැරි වුණා. ඇයි ඒ? මේ පනතේ තිබුණු අඩු පාඩුකම් නිසායි. අප මේ පනතට සංශෝධනයක් ගෙනාවා, "කෙනෙකුට ඉන්න පුළුවන් වසර හතරයි. හැබැයි, ඔහුට විරුද්ධව චෝදනා තිබෙනවා නම්, ඔහු මේ ක්‍රීඩාව වෙනුවෙන් යම් යම් අකටයුතුකම් කර තිබෙනවා නම් ඔහුට එම තනතුරේ ඉන්න බැහැ" කියා. ගරු ඇමතිතුමනි, අප මේ අකටයුතුකම්වලට වැට බැන්දා.

ඊළඟට, අපි මලල ක්‍රීඩාව අරගෙන බලමු. ඔබතුමාට මතක ඇති, පසු ගිය කාලයේ මලල ක්‍රීඩා සංගමයේ සභාපති ධුරය එක දිගටම -අවුරුදු අටක් තිස්සේ- දැරුවේ එක පුද්ගලයෙක් විසිනුයි. එතුමා ඒ අවුරුදු අටට මලල ක්‍රීඩාව වෙනුවෙන් කොයි තරම් දෙයක් කළාද කිව්වොත්, අවසාන සාර්ක් ක්‍රීඩා තරගාවලියේදී එක පදක්කමක්වත් නැතිවයි ලංකාව ආවේ. එයා මලල ක්‍රීඩාව බොරැල්ලේ කනත්තට ගෙන ගිහින් තමයි නැවැත්තුවේ. පනතට අප මේ කොන්දේසි දැම්මේ නැත්නම් ඔහු ආපහු එම තනතුර ඉල්ලන්න තීරණය කර තිබුණා. හැබැයි, අප ඒකට ඉඩ දුන්නේ නැහැ, ක්‍රීඩා පනතට රෙගුලාසි ගෙනාවා. ගරු ඇමතිතුමනි, ඇමතිවරයාට ඒ බලය තිබෙනවාය කියා මෙහි සඳහන් කර තිබෙනවා. සමහර දේවල් දෙන්න බැහැ. හැබැයි, ඇමතිවරයාට බලය තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට කොයි තරම් බලය තිබුණත්, කොන්දේසිය දමන්න බැහැ. ඔබතුමාට ඉහළින් කොහෙවත් නියෝගයක් එනවා ඕක දෙන්න කියා. මතක නේ, පසු ගිය කාලයේ ඔබතුමා ක්‍රිකට් පාලක මණ්ඩලයේ ඡන්දය නියන්න යන කොට ඉහළින් නියෝගයක් ආවා නේ, අතුරු කමිටුවක් පත් කරන්න කියා. හැබැයි, ඔබතුමා වීරයා වාගේ තීන්දුවක් ගත්තා. ඔබතුමාට ඉහළින් ඇවිත් ඔය වෙනුවෙන් interim committee එකක් පත් කරන්න ගියා. මම බොහොම ගෞරවයෙන් ඔබතුමාට කියන්න ඕනෑ, එතැනදී ඔබතුමා කෙළින් හිටියා. එය කරන්න දුන්නේ නැහැ. ඒක තමයි වෙන්න ඕනෑ.

ක්‍රීඩා පනත යටතේ රෙගුලාසි ගෙනැත්, පනතින් ඇමතිවරයාට තිබුණු බලය එළියට දමපු, විමධ්‍යගත කරපු එකම ඇමතිවරයා මමයි. මම ඒ බලය ගත්තේ නැහැ. ඒ බලය ගත්තාම අපට ඉහළින් නියෝග එන බව මා දන්නවා. ඊට වඩා හොඳයි, නීතියට ඇතුළත් කළාම ආයේ අපට කවුරුවත් කියන්න එන්නේ නැහැ. මොනම හේතුවකටවත් ඒ විධියට කාගෙන්වත් එවැනි නියෝග එන්න බැහැ, හොඳ දේ කරන්න කියා අප ක්‍රීඩා පනතට නීති රීති ගෙනාවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ එහෙම කටයුතු කරන්න කියායි. උදාහරණයක් වශයෙන් මම ඔබතුමාට පාපන්දු ක්‍රීඩාව ගැන කියන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මට තිබෙන කාලය හෝ අරගෙන මම ඔබතුමාට මේ කාරණය කිව්වොත් හොඳයි. මොකද, ඔබතුමාගේ කාරණා එකක්වත් මම වෙනස් කර නැහැ. මේ ගැසට් පත්‍රයේ ඒ කාරණා එහෙමම තිබෙනවා. හැබැයි, ඔබතුමා ක්‍රීඩා ඇමති වශයෙන් කටයුතු කළ කාලයේ නිකුත් කළ ගැසට් පත්‍රයේ වසර හතරක සමස්ත සේවා කාල එකතුව ගණනය කළ යුතු කාල වකවානුව පිළිබඳව සඳහන් කර තිබුණේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඒක හරි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
අන්න ඒකට තමයි මේ නියෝග ගෙනාවේ. අනික් ඒවා වෙනස් වෙලා නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, මම දැන් අහලා බලන කොට දැන ගත්තේ වෙන දෙයක්. එහෙම නම් මම ඒ කියපු දෙය ඉල්ලා අස් කර ගන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාගේ කාලයේ කරපු කිසිම දෙයක් වෙනස් වෙලා නැහැ. ඉල්ලන්න ආවාම ඒ අය ඇහුවා, මේ අවුරුදු හතර එන්නේ කොහෙන්ද කියලා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, මේ නීතිය අනුව පත් වන කෙනෙකුට අවුරුදු හතරක් එක දිගටම ඒ තනතුරේ ඉන්න පුළුවන්ද? [බාධා කිරීමක්] නැහැ. නිලවරණයෙන් මේ අවුරුද්දේ පත් වුණාම අවුරුදු හතරක් එක දිගට එයාට ඉන්න පුළුවන් නේද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, two terms විධියටයි යන්නේ. ඒ කියන්නේ, ඉන්න පුළුවන් උපරිම කාලය අවුරුදු හතරයි. හැබැයි, දෙපාරක් - two terms - යන්න පුළුවන්. අපි අවුරුදු දෙකයි කියා හිතමු. අවුරුදු දෙක, දෙක අවුරුදු හතරක් ඉන්න පුළුවන්. අවුරුදු හතරට වඩා ඉන්න බැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
අවුරුදු හතරට වඩා ඉන්න බැරි නම්, නිලවරණය එන්නේ අවුරුදු දෙකකින්ද, හතරකින්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
සමහර ඒවායේ නිලවරණය අවුරුද්දකින් එනවා. සමහර ඒවායේ අවුරුදු දෙකකින් එනවා. එහෙම නේ එන්නේ. හැම එකේම අවුරුදු හතර වන්නේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, ගරු ඇමතිතුමනි. අප සකස් කරපු විධියට නම් තිබුණේ අවුරුදු දෙකකින් නිලවරණය පවත්වනවා කියායි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු මන්ත්‍රීතුමනි, ඒක තීරණය වන්නේ මෙහෙමයි. ඔලිම්පික් කමිටුව ජාතික සංගම්වලට කියා තිබෙනවා, ඒ අයගේ ජාත්‍යන්තර සංගම්වල තිබෙන කාල වකවානුව තමයි මේ නිලවරණවලට අදාළ විය යුත්තේ කියා. උදාහරණයක් විධියට අපි table tennis ක්‍රීඩාව ගනිමු.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, මගේ වෙලාව නොවෙයි ඔබතුමාගේ වෙලාවයි මේ ගන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු තයාසිරි ජූයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
කමක් නැහැ.

Table tennis ක්‍රීඩාවේ නිලවරණය පැවැත්විය යුතු කාල සීමාව අපි මෙ හේ අවුරුද්දක් කියා දමලා තිබුණාට, එය අවුරුදු දෙකින් දෙකටයි තිබෙන්නේ කියා International Table Tennis Federation එකෙන් කියා තිබෙනවා නම්, අන්න එය ජාතික සංගමයට අදාළ වනවා කියා තමයි ඔවුන් අපට කියා තිබෙන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමා, ඔලිම්පික් කමිටුව ගෙනෙන සියලු දේ විශ්වාස කරන්න එපා කියන ඉල්ලීම මා ඔබතුමාගෙන් බොහොම ගෞරවයෙන් කරනවා. යම් ක්‍රීඩාවක් වැටිලාය කියලා අපි හිතමු. කෙනෙකුට ඇවිල්ලා අවුරුදු දෙකකින් ඒ ක්‍රීඩාව දියුණු කරන්න පුළුවන් කියනවා නම්, ඒ අසත්‍යයක්. කෙනෙක් අලුතින් ඇවිල්ලා පරණ අයගේ වැරදි සොයලා අනම්මනම් කරන කොටම මාස හයක් විතර යනවා. ඊට පස්සේ, කාමර හදලා අනම්මනම් කරන්න තවත් මාස හයක් විතර යනවා. ඊළඟ ඡන්දය දිනන්න තවත් මාස හයක් යනවා. එතකොට මාස හයයි වැඩ කරන්න තිබෙන්නේ. ඉතින්, ඕනෑම ක්‍රීඩාවක් සම්බන්ධ ප්‍රතිපත්තියක් - policy - හදලා එය ක්‍රියාත්මක කරන්න අවම වශයෙන් අවුරුදු හතරක්වත් යනවා, ගරු ඇමතිතුමා. ඒ නිසා අපි ඒ නිල කාලය අවුරුදු හතරකට දීර්ඝ කළා. අවුරුදු හතරකට දීර්ඝ කරලා, අවුරුදු දෙකකදී ඒ පිළිබඳව අධ්‍යයනයක් කර බැලුවා, අවුරුදු හතරම වැඩ කරන්න දෙනවා ද කියලා. ඔබතුමා කියන විධියට එහෙම ප්‍රශ්නයක් නැත්නම් ගැටලුවක් නැහැ. එහෙම නැත්නම්, ඒ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්න, ගරු අමාත්‍යතුමනි. මොකද, ක්‍රීඩාවේ උරුමක්කාරයන්ම තමයි ක්‍රීඩාවේ කරුමක්කාරයන් වන්නේත්. ඒක මගේ අද්දැකීම.

ගරු ඇමතිතුමා, ඔබතුමා දන්නවා ඒ කාලයේ basketball ක්‍රීඩාවේ තනතුරුවල සිටි අය ගැන. සමහරු එක දිගට අවුරුදු නවයක් ඒ තනතුරුවල සිටියා. Badminton ක්‍රීඩාවේ තනතුරුවල සමහරු අවුරුදු හයක් සිටියා. පිහිනුම් ක්‍රීඩාවේ තනතුරුවල සමහරු අවුරුදු 9ක් සිටියා. මේ ඒකාධිකාරිය කැඩුවේ නැත්නම්, ක්‍රීඩාව ඉදිරියට ගෙන යන්න අපට බැහැ, ගරු ඇමතිතුමා. ඒ අය එන්නේ ක්‍රීඩාව දියුණු කරනවා කියලායි. හැබැයි, ඒ අය ක්‍රීඩාව තමන්ගේ ජීවනෝපාය කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාවට ආදරය කරන විශාල පිරිසක් මේ රටේ ඉන්නවා. අද ඒ අය මේ ක්‍රීඩා සංගම්වල තනතුරුවලට එන්නේ නැහැ. මේ ක්‍රීඩා මාෆියාවට එකතු වෙන්න

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ඒ අය එන්නේ නැහැ. ඒ අයට එන්න, ගෞරවනීය පිරිසක් ක්‍රීඩා සංගම්වලට ගෙන එන්න අවශ්‍ය පසු බිම තමයි අපි හැදුවේ, ක්‍රීඩා පනත හදලා, රෙගුලාසි හදලා. ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාගෙන් නැවතත් ඉල්ලා සිටින්නේ, කවුරු මොනවා කිව්වත් ක්‍රීඩා පනත සහ රෙගුලාසි පිළිබඳව ඔබතුමා පූර්ණ අධ්‍යයනයක් කරන්න කියලායි. ඔබතුමා නීතිඥයෙක්. ඔබතුමාට මේ පිළිබඳව හොඳ දැනුමක් තිබෙනවා. ඒ නිසා කවුරු මොනවා කිව්වත් මේ පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් කරන්නේ නැතිව, මේ පිළිබඳව පෞද්ගලිකව සොයා බලන්නේ නැතිව පනතට සහ රෙගුලාසිවලට අත ගහන්න එපා කියන ඉල්ලීම මා කරනවා.

ගරු ඇමතිතුමනි, අද ඔබතුමා සංශෝධනයක් ගෙනැවිත් තිබෙනවා, "අත ඔසවා ඡන්දය ප්‍රකාශ කළ යුතුය" කියලා. නමුත් මේ අතරේ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ලියැවිල්ලක් යවනවා, ඡන්ද ක්‍රම දෙකක් ඇතුළත් කරලා. අද පාර්ලිමේන්තුවට සංශෝධනයක් ගෙනෙනවා, රහස් ඡන්ද එපා, අත ඔසවා ඡන්දය ප්‍රකාශ කරන්න ඕනෑ කියා. අද පාර්ලිමේන්තුවේ මෙය සම්මත වන විට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට තව ලියැවිල්ලක් යවනවා -එය ඔබතුමන්ලාම යවපු එකක්- මේ ඡන්ද ක්‍රම දෙකම ගැන කියලා. ඉතින් අපට තේරෙන්නේ නැහැ, මොකක්ද කරන්නේ කියලා. එක්කෝ රහස් ඡන්දයක් කියන එක තියන්න. එහෙම නැත්නම්, අත ඔසවා ඡන්දය ප්‍රකාශ කිරීම කියන එක තියන්න. මේ දෙකම ගෙනෙන්න එපා ගරු ඇමතිතුමනි. මේ ක්‍රම දෙකම ගෙන ආ ගමන් ආපසු මාෆියා එක එනවා. මා නම් දන්නා තරමට හොඳම දේ, අත ඔසවා ඡන්දය ප්‍රකාශ කිරීම කියන එකයි. මොකද, මම හොඳටම දන්නවා එතැන සිදු වන දේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට එය කියන්නම්. නිලවරණයට කලින් හැමෝම සල්ලි බෙදනවා. අන්තිමේදී සංගම්වලින් එන නියෝජිතයා නොවෙයි රහස් ඡන්දය දෙන්නේ. ඒ නිසා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවා තිබෙන ලියැවිල්ල ආපසු ගෙන්වා ගන්න, ගරු ඇමතිතුමනි. ඔබතුමා මේ නියෝග ගෙනෙන එක හොඳයි. ඔබතුමා මේ තීරණයේ ඉන්න. නමුත් අර කලින් කී නියෝගය ක්‍රියාත්මක කරන්න එපා. එය ක්‍රියාත්මක කිරීම සඳහා කවුරුන් හෝ ගැටයක් ගහලා තිබෙනවා. ඒ ගැටය ගහලා තිබෙන්නේ, පරණ මාෆියාකාරයෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා පනත සහ රෙගුලාසි පිළිබඳව මා මීන් එහාට කථා කරන්නේ නැහැ. මා ඔබතුමාගෙන් නැවතත් ඉල්ලා සිටින්නේ, මේ පනත සහ රෙගුලාසි පිළිබඳව යම් තීන්දුවක් ගන්නවා නම්, ඔබතුමා ඒ ගැන පෞද්ගලිකව සොයා බලන්න කියන එකයි, ගරු ඇමතිතුමනි. මොකද, මේ අලුත් ගැසට් එක එන විටම මට තේරුණා, ඔබතුමාත් කඩේ යන්න පටන්ගෙන කියලා. කෙසේ වෙතත්, මම ස්තුතිවන්ත වෙනවා ඔබතුමා මේ තීන්දුවත් එක්ක සිටීම පිළිබඳව.

ගරු අමාත්‍යතුමනි, ක්‍රීඩාව සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරවිය යුතු කාරණා කීපයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි අපි ඉදි කරපු පළාත් ක්‍රීඩා සංකීර්ණ, දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ගැනත් කියන්න ඕනෑ. මේ විෂයය භාරගන්නා විට මා දැකපු දෙයක් තිබුණා. ක්‍රීඩාවට අදාළව ලංකාවේ සියලු යටිතල පහසුකම් ටික තිබුණේ කොළඹ. පිහිනුම් තටාක, ගෘහස්ථ ක්‍රීඩාංගණ, synthetic tracks ආදි සියල්ල තිබුණේ කොළඹ. හැබැයි ක්‍රීඩාවේ දක්ෂයන් සිටියේ ගමේ. නමුත් ගමට යටිතල පහසුකම් තිබුණේ නැහැ. ඒ නිසා අපි ජාතික ප්‍රතිපත්තියක් හදලා එවකට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඒ ගැන කිව්වාම, ඒ සඳහා රුපියල් බිලියන හතර හමාරක් -රුපියල් මිලියන 4,500ක්- අපට දුන්නා. ඒ අනුව අපේ කාලයේ අපි කිලිනොච්චිය ක්‍රීඩාංගණය හැදුවා. කිලිනොච්චියේ අපේ ගරු මන්ත්‍රීතුමනි, நான் உங்களுக்குச் சொன்ன, அத பேச சொன்ன. பேச மாட்டாங்க அவரு. අපි කිලිනොච්චිය පිට්ටනිය හැදුවා. උතුරේ දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ විශාල පිරිසක් ඉන්නවා. SD & CC එක බොරු කිය කියා තවම අමාත්‍යාංශය නොමඟ යවනවා. ඒක සම්පූර්ණයෙන් වැරැදියි.

ගරු ඇමතිතුමනි, ගන්න වේවැල අතට. ඒ අයට දී තිබෙන කාලය දැන් ඉවරයි. ඒ අයට දඩ ගහන්න. ඒ අය terminate කරන්න. උතුරේ ඉන්නවා උතුරෙන් බිහි වූ, දක්ෂ ක්‍රීඩකයන් විශාල පිරිසක්. අපි ගිහින් කිලිනොච්චියේ ක්‍රීඩා උත්සව පැවැත්වුවා. අපේ ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා, ඒ කාලයේ නම් අපත් එක්ක කථා කළේ නැහැ. නමුත් දැන් කථා කරනවා. උතුරේ දක්ෂ ක්‍රීඩකයෝ ඉන්නවා. එතුමාත් දැන් මට කිව්වා, අපේ ground එක හදලා දෙන්න කියලා. ඒ වාගේමයි මඩකළපුව තිබෙන ක්‍රීඩාංගණය. ගරු ඇමතුමනි, ඔබතුමා පසු ගිය දාක ගිහිල්ලා එය විවෘත කළා. අපි ඒ ගැන බෙහෙවින් සන්තෝෂ වෙනවා. හොරණ ක්‍රීඩාංගණය හදලා දැන් එය බෙදාගන්න බැරිව ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා අපි එය හැදුවේ කුමන ක්‍රීඩාවලටද කියලා.

අජිත් **පී.** පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා දැන් කියනවා ලු, එහි ක්‍රිකට් ගහන්න ඕනෑ කියලා. දැන් අන්න ආයෙත් වෙනස් කරන්න හදනවා ලු. එක එක ඇමතිතුමන්ලාට ඕනෑ විධියට පිට්ටනි හැදුවොත් මේ වැඩේ කරන්න බැහැ. ඒ නියෝජ්‍ය අමාත්‍යතුමා ක්‍රිකට් ගහන්න කැමැතියි කිව්වත්, හොරණ දිස්ත්‍රික් ක්‍රීඩාංගණය ක්‍රිකට් ගහන්න හදලා නැහැ. ඒක හදලා තිබෙන්නේ යම් වැඩ පිළිවෙළක් තුළයි. ඒ පිට්ටනිය තිබෙන්නේ පාපන්දු, රගර්, මලල ක්‍රීඩා සඳහා. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ක්‍රීඩාංගණය විවෘත කරන්න. ඔබතුමා පසු ගිය දා මාතර එකක් විවෘත කරලා තිබුණා. ඒ වාගේම හොරණ ක්‍රීඩාංගණයත් විවෘත කරන්න කටයුතු කරන්න. ගරු ඇමතිතුමනි, මහනුවර, දිගන ක්‍රීඩාංගණය අපි හදලා සියලු වැඩ ඉවර කරලා තිබුණා. ඒකට පළාත් සභාවෙන් ප්‍රශ්නයක් මතුවෙලා ඔබතුමා ඒ ප්‍රශ්නය විසඳලා තිබුණා. ඒ නිසා පල්ලේකැලේ ක්‍රීඩාංගණයත් කඩිනමින් විවෘත කරන්න කටයුතු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම අපි ඔබතුමාට කරනවා.

ත්‍රිකුණාමලයේ පළාත් ක්‍රීඩා සංකීර්ණය ගැනත් කියන්න ඕනෑ. අපේ මුස්ලිම් මන්ත්‍රීතුමෙකුත් ඒ ගැන කිව්වා. ඒ ප්‍රදේශය විශාල ක්‍රීඩකයෝ පිරිසක් බිහි වෙච්ච ප්‍රදේශයක්. හැබැයි, පසු ගිය අවුරුදු එකහමාරේ කාලය තුළ සම්පූර්ණයෙන්ම ඒ පිට්ටනිය හැදීමේ කටයුතු නැවතිලා. ඔබතුමන්ලාගේ යහපාලන ආණ්ඩුව කාලයේ ඒ පිට්ටනි හැදීමේ කටයුතු නැවතිලා. [බාධා කිරීමක්] ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔතැන ඉඳගෙන කෑ ගහනවාට වඩා, පොඩ්ඩක් ඒ ගැන හොයලා බලන්න.

ගරු ඇමතිතුමනි, ගම්වලින් ඉතා දක්ෂ ක්‍රීඩකයෝ බිහි වෙලා එනවා. නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි දැන් ක්‍රීඩා ඇමතිතුමා බිංගිරියේ පළාත් ක්‍රීඩා සංකීර්ණයක් හදනවා. බලන්න මොන තරම් දක්ෂ ඇමතිවරුද කියලා. බිංගිරියට පළාත් ක්‍රීඩා සංකීර්ණයක් එනවා. බිංගිරිය ආසනයේ පිහිනුම් තටාක හැදෙනවා. ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒකට ගිහිල්ලා නාන්න. පොඩ්ඩක් නාන්න. නාලා පුරුදු නැහැ නේ. මේ ඇමතිතුමා හදන ක්‍රීඩා තටාකයේ නාන්න. ඇමතිතුමා ඒක හදලා තිබෙන්නේත් ඔබතුමාට නාන්නම තමයි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔබතුමන්ලා ජරාව-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ජරාව? මම නොවෙයි ඒක හැදුවේ. ඔබතුමා ක්‍රීඩා ඇමතිතුමාටද ඒක කියන්නේ? මම නොවෙයි හැදුවේ. හදපු කෙනාට ඒක කියන්න. [බාධා කිරීමක්] එතුමා එහෙම කෙනෙක් නොවෙයි. එතුමා එහෙම කරලා නැහැ. [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඉක්මනින් කථාව ඉවර කරනවා. [බාධා කිරීමක්] හරි, හරි. නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට විහිළුවටයි කිව්වේ. මම කිව්වේ, ඔබතුමාට ආඩම්බර වෙන්න ඕනෑ කාරණයක්. ඔබතුමාගේ ආසනයේ ඔබතුමාට හදන්න බැරි වුණ දෙයක් දයාසිරි ජයසේකර ඇමතිතුමා හදනවා. ඔබතුමා ඒ ගැන ආඩම්බර වෙන්න ඕනෑ. ඔබතුමා ඒ ගැන සතුටු වෙන්න. ඔබතුමා ඒකට සුබ පතන්න. අද දක්ෂ ඇමතිවරයෙක් බිංගිරියට ඇවිල්ලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, පළාත් ක්‍රීඩා සංකීර්ණ ටික හැදීම කඩිනමින් ආරම්භ කරන්න. ගරු ඇමතිතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. ඔබතුමාට මතක ඇති, පාසලට ක්‍රීඩාව අනිවාර්ය කිරීමේ වැඩ පිළිවෙළක් අපි ආරම්භ කරපු බව. ගරු ඇමතිතුමනි, ඒ වැඩ පිළිවෙළ දැන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඔබතුමාට මේ හැම එකක්ම බලන්න බැහැ. ඒ කාලයේ නිලධාරීන් හිටියා. ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉන්නවා. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉන්නවා. මේ ගොල්ලන්ට ඒවා බලන්න කියන්න. ඒ දවස්වල අපි ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ගෙන්වලා, පාසලට ක්‍රීඩාව අනිවාර්යය කරලා, ක්‍රීඩාව විෂයයක් කරලා මේ ක්ෂේත්‍රය හැදුවා. හැබැයි ගරු ඇමතිතුමනි, දැන් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අධ්‍යාපන ඇමතිතුමා -අකිල විරාජ් ඇමතිතුමා- දැන් මේක follow-up කරනවාද කියලා මා දන්නේ නැහැ. ක්‍රීඩා අධ්‍යාපන අංශයෙන් කියනවා, ඒ වැඩ පිළිවෙළ වැටිලා; නැවතිලා කියලා.

ගරු ඇමතිතුමනි, ඉස්සර අපි ක්‍රීඩාව විෂයයක් හැටියට පාසලට ගෙනෙන්න ගියා. ඔබතුමා දන්නවා, මේ රටේ ප්‍රාථමික අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ගෙන් ක්‍රීඩා කරන්නේ සියයට පහයි කියලා. සාමාන්‍ය පෙළ දක්වා යනකොට ඒක සියයට 2.5ට බහිනවා. උසස් පෙළ දක්වා යනකොට ඒක දශම පහට බහිනවා. එහෙම වුණොත් තව ටික කාලයක් යන කොට ක්‍රීඩාව මේ රටෙන් නැති වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ දරුවෝ ලෙඩ්ඩු වෙනවා. ඔබතුමා දන්නවාද, මේ රටේ මොන තරම් ලෙඩ්ඩු ප්‍රමාණයක්ද ඉන්නේ කියලා. ඒ සංඛ්‍යා ලේඛන කියන්න මට වෙලාවක් නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමනි, පාසලට ක්‍රීඩාව ගෙනෙන කටයුත්ත ඔබතුමාගේ අතට ගන්න. මට තේරෙනවා, ඒක ඔබතුමා අතට ගන්න අකිල විරාජ් ඇමතිතුමාත් එක්ක පොඩ්ඩක් අමාරුයි කියලා. නමුත් මේ කටයුත්ත ඔබතුමාගේ අතට ගන්න. ඔබතුමාගේ අතට අරගෙන ඔබතුමා මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න. මේක ජාතික ප්‍රශ්නයක්, ගරු ඇමතිතුමනි. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ නැත්නම් ක්‍රීඩාව දියුණු කිරීමේ කටයුතු අපට කරගෙන යන්න බැහැ.

ගරු ඇමතිතුමනි, මේ ජාතික වැඩසටහන් ටික -අපි පසු ගිය කාලයේ ආරම්භ කරපු ක්‍රීඩා ජාතික යටිතල පහසුකම් වැඩසටහන, පාසලට ක්‍රීඩාව ගෙන එන ජාතික වැඩසටහන- ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, අපේ කාලයේ ආරම්භ කරපු කෞතුකාගාරයේ වැඩ කටයුතු ඔබතුමා කරගෙන යන එක ගැන. ඒක බොහොම හොඳයි. අපි ඒ පිළිබඳව සුබ පතනවා. මේ ජාතික වැඩසටහන් ටික ඔබතුමාගේ අතට අරගෙන ක්‍රියාත්මක කරන්න ඔබතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා. නැවතත් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ ක්‍රීඩා පනත යටතේ පනවන නියෝග ඔබතුමාගේ පූර්ණ අධීක්ෂණය යටතේ, ඔබතුමාගේ පූර්ණ අවධානය යටතේ ක්‍රියාත්මක කරන්න කියලායි. ඒ ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

ඊට ප්‍රථම මූලාසනය සඳහා ගරු එඩිවඩ් ගුණසේකර මහතාගේ නම යෝජනා කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩිවඩ් ගුණසේකර මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කනක හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩිවඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு மாண்புமிகு கனக ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. KANAKA HERATH *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

[අ.භා. 4.36]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් අවස්ථාවකයි මට කථා කරන්න අවස්ථාව ලැබුණේ. ඒ වාගේම ඉතාම වැදගත් පිරිසක් මේ ගරු සභාවේ ඉන්නවා. හිටපු ක්‍රීඩා ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. වර්තමාන ක්‍රීඩා ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. අපේ සී.බී. රත්නායක මැතිතුමාත් හිටපු ක්‍රීඩා ඇමතිතුමෙක්. එතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. ඒ වාගේම ඉන්නවා, "ඡායා මායා" කැබිනට් එකේ ක්‍රීඩා ඇමතිතුමාත්. ඒ නිසා මේක ඉතාම වැදගත් අවස්ථාවක්. එවැනි අවස්ථාවක කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම වර්තමාන ක්‍රීඩා ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා, ක්‍රීඩා පනත යටතේ මේ නියෝග ගෙන ඒම පිළිබඳව.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

විශේෂයෙන් අපට මතකයි, පසු ගිය කාලයේ ක්‍රීඩාවට අත් වෙලා තිබුණු ඉරණම. හිටපු ක්‍රීඩා ඇමතිතුමාත් ඉන්න වෙලාවේ ඒ ගැන කරුණු කිහිපයක් මතක් කරන්නම්. "මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය" කියලා එකකට රුපියල් කෝටි හයහමාරක මුදල් යොදවලා තිබුණා.

හැබැයි, මේ ක්‍රීඩාංගණයට අයිතිකරුවෙක් නැහැ. මේක ක්‍රීඩා අමාත්‍යාංශයට අයිතිත් නැහැ. "මහින්ද රාජපක්ෂ පදනමට" අයිති නම්, ඒත් කමක් නැහැ. නමුත් ඒකට අයිතිත් නැහැ. ඇඩ්‍රස් නැති ආයතනයකට තමයි මේ විධියට රුපියල් කෝටි හයහමාරක් වියදම් කරලා තිබෙන්නේ. හිටපු ක්‍රීඩා ඇමතිතුමා දැන් බොහොම වැදගත් විධියට කථා කළාට, එතුමා තමයි ඒ දවස්වල ඒ ආකාරයට කටයුතු කළේ. ඒ වාගේම- [බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
"හිටපු ක්‍රීඩා ඇමතිතුමා" කිව්වේ මටද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔව්, ඔබතුමාට. ඊට පස්සේ-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, what is your point of Order?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයට අයිතිකරුවෙක් ඉන්නවාද, නැතිද කියන එකට වඩා, එයින් සිදු වෙන සේවාව බලන්න. දෙවැනි කාරණය, ක්‍රීඩා අමාත්‍යාංශයට ඒ මුදල් ප්‍රතිපාදන ලබා දුන්නේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා ඒ යෝජනාව අනුවද, නැතිනම් පෞද්ගලිකවද කියන කාරණයත් ඔබතුමා සොයා බලා කියන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊයේ-පෙරේදා සූරියවැව පැත්තේ යන ගමන් මෙතුමා හැදුවාය කියන ටෙනිස් ක්‍රීඩාංගණයක් බලන්න ගියා. මට බොහොම ආසා හිතුණා ඒක බලන්න. රුපියල් මිලියන 40ක් වියදම් කරලා තමයි මේ ටෙනිස් ක්‍රීඩා පිටිය හදලා තිබුණේ. හැබැයි එතැනට ගියාට පස්සේ මට හිතුණා, මේක වෙඩ් පිටියක්ද, එහෙම නැත්නම් car races තියන්න හදපු, පස් පුරවපු ground එකක්ද කියලා. මේවා තමයි රාජපක්ෂ යුගයේ හිටපු, ඔය මහ ලොකු පම්පෝරි ගහන අය කරපු වැඩ. රුපියල් මිලියන 40ක් වියදම් කළත් කරපු දෙයක් නැහැ. හිස් පිටියක් විතරයි තිබෙන්නේ. මේ සල්ලි කොහේටද ගියේ කියන එක තමයි ප්‍රශ්නය. මේ සල්ලි කොහේටද ගියේ කියන එක අපට දැනගන්න පසු ගිය කාලයේ සිදු වුණු ඕනෑ තරම් දේවල්- [බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, what is your point of Order?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා හම්බන්තොට ටෙනිස් පිටියක් පිළිබඳව කිව්වා. අපි Commonwealth Games ලංකාවට ගෙනෙන්න bid කරලා-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා. ඔබතුමා මට ඒ ගැන කියන්න ඉඩ දෙන්න. එතුමා මගේ නම කියලා, මට චෝදනා කළා. [බාධා කිරීම්] මට ඒ ගැන කියන්න දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ පැත්තේ ඉන්න එපා. ඔබතුමා මධ්‍යස්ථව ඉන්න. [බාධා කිරීම්]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
හොරකම් කරපු ඒවා කියන කොට අහගෙන ඉන්න බැහැ. ඒකයි වෙලා තිබෙන්නේ. හොරකම් කරපු ඒවා ගැන කිව්වාම, කම්බා හොරුන්ට අහගෙන ඉන්න බැහැ. ඒ නිසා කරුණාකර මට කථා කරන්න මගේ කාලය දෙන්න.

රුපියල් මිලියන 40කට සිද්ධ වුණු දෙයක් නැහැ. නිකම් පස් ගොඩවල් ටිකක් එහාට මෙහාට කරලා තිබෙනවා විතරයි. එතැන ක්‍රීඩා පිටියක් නැහැ. මට එය දැක්කාම හිතුණා, දෙයියනේ! මේකේ ටෙනිස් ගහන්න තියා, football ගහන්න තියා, අඩුම ගණනේ එල්ලේ ගහන්නවත් බැහැ නේ කියලා. ඔන්න! හදපු ක්‍රීඩා පිටි. ඒ වුණත්, මහා ලොකුවට, මහා වැඩකාරයෝ වාගේ කථා කරනවා.

ඔන්න! අපේ වර්තමාන ක්‍රීඩා ඇමතිතුමා, දැන් අපූරුවට වැඩ පටන් ගෙන තිබෙනවා. බිංගිරියේ වාගේම ලංකාව පුරාම ක්‍රීඩා පිටි හදනවා. මගේ ආසනය වන බිංගිරිය ආසනයේ එතුමායි මමයි එකතු වෙලා කුඩා ක්‍රීඩාංගණ 40ක් හැදුවා. අපි එහෙමයි, මේ යහ පාලන ආණ්ඩුවේ සමගියෙන් වැඩ කරන්නේ. හැබැයි, පසු ගිය

රජයේ අය කරපු දේවල් ගැන කථා කරද්දී ඒ අයට පුටුවේ ඉන්න බැහැ, ආසනය උණු වෙනවා; ආසනය රත් වෙනවා. මොකද, හොරකම් කරපු ඒවා ගැන කථා කරද්දී කම්බා හොරුන්ට ඉන්න බැහැ. ඒ අයව FCID එකට ගෙන යන කොට සමහරු කියනවා, බොරුවට ගෙන යනවා කියලා. මේ විධියට රුපියල් මිලියන 40ක් වියදම් කරලා පස් කණ්ඩි පුරවලා බොරු වැඩ කරපු අයව ගෙන යන්න ඕනෑ FCID එකට නොවෙයි. ඊටත් එහා ගෙන ගිහින්, පුළුවන් නම් එල්ලුම්ගහටම ගෙන යන්න ඕනෑ. එහෙම අයට මේවා ගැන කියද්දී ඉන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

රුපියල් මිලියන ගණනක් වියදම් කරලා සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ ධාවන මංතීරු හදනවාය කියලා මොකක්ද කළේ? ඒක හදලා අවුරුද්දක් තිබුණාද? අද මේවාට මොනවාද වෙලා තිබෙන්නේ? මේ ගැන සොයා බලා ඒවාට විරුද්ධව කටයුතු කරන්න කියලා මම ගරු ක්‍රීඩා ඇමතිතුමාට කියනවා. ඒ අපරාධ කරපු අයට, ඒ ආයතනවලට, ඒ වේලාවේ හිටිය ඇමතිවරුන්ට, හොරකම් කරපු අයට විරුද්ධව කටයුතු කරන්නය කියලා වර්තමාන ක්‍රීඩා ඇමතිතුමාට මේ අවස්ථාවේදී කියනවා. මෙවැනි වැඩ කළ අය තමයි අද මේ යහ පාලන ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන්නේ. හැබැයි, තමන් එක ඇඟිල්ලක් දිගු කරන කොට, ඇඟිලි හතරක් තමන්ගේ පැත්තට දිගු වෙලා තිබෙනවාය කියන එක ඒ අයට මතක නැහැ. ක්‍රීඩාව දියුණු කරනවා වෙනුවට, ක්‍රීඩාව වවා ගෙන කාපු අය තමයි අද මේ විධියට කථා කරන්නේ. ජනතාව දන්නවා ඇත්ත; ජනතාව දන්නවා සත්‍යය. අද අපි දන්නවා - [බාධා කිරීමක්] ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා යන්න එපා, අහගෙන ඉන්න. හොඳ හරිය කියනකල් පොඩ්ඩක් ඉන්න. ඒ විධියට වැඩ කරපු අය තමයි අද මහා ලොකුවට, මහා වීරයන් බවට පත් වෙලා ඉන්නේ. වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ගරු අගමැතිතුමාත් එක්ක මේ යහ පාලන ආණ්ඩුව ඉතාම සාර්ථකව ඉදිරියට ගෙන යනවා.

පසු ගිය කාලයේ අපට ලොකු චෝදනාවක් තිබුණා, වැරැදිකරුවන්ට දඬුවම් දෙන්නේ නැහැයි කියලා. හැබැයි, අද වැරැදිකරුවන්ට දඬුවම් දෙද්දී, වැරැදිකරුවන් අධිකරණයට ගෙන යද්දී අපට කියනවා, "දේශපාලන පළි ගැනීම් කරනවා"යි කියලා. එහෙම කියලා, බොහොම අපූරුවට නිරෝගී පුද්ගලයන් විධියට උසාවියට යන පුද්ගලයන්, බන්ධනාගාර ගත කළාට පසුව ඒ අය ලෙඩුන් බවට පත් වෙනවා. සමහරු ඒවාටත් ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරනවා. පසු ගිය කාලයේ තිබුණු මාෆියාව මේ සෑම තැනම ක්‍රියාත්මක වෙනවා. රජයේ වෛද්‍ය නිලධාරි සංගමයට පසු ගිය කාලයේ අපත් එක්ක ගැටලු තිබුණා. මේ වෛද්‍යවරු වැරැදි වාර්තා ඉදිරිපත් කරලා ද දන්නේ නැහැ. බොහොම හොඳින් හිටිය, පාද යාත්‍රා යන්න හිටිය සමහර අය බන්ධනාගාර ගත වුණාට පස්සේ රෝහල් ගත වෙන්නේ කොහොමද? මේවා ගැනත් සොයා බලන්න වෙනවා. ඒ නිසා මහා ලොකු වීරයෝ වාගේ කථා කළාට, ඒ අයගේ ඇත්ත ජනතාව ඉදිරියේ එළියට එන කොට, බොරු සිංහයන්ගේ ඇත්ත තත්ත්වය දැන ගන්න පුළුවන් වෙනවා.

ඒකාබද්ධ කල්ලියේ අයට මේ අවස්ථාවේ අපි කියන්න කැමැතියි, මේ ආණ්ඩුව පෙරළන්න කරන කුමන්ත්‍රණ කිසිවක් සාර්ථක වන්නේ නැහැ කියලා. [බාධා කිරීම්] ඉදිරි අවුරුදු හතරහමාරට මෙහා නම්, ඔබතුමන්ලා සිහින මවන ආණ්ඩුව ඔබතුමන්ලාට දකින්න හම්බ වෙන්නේ නැහැ. අඩුම ගණනේ, ඉදිරි අවුරුදු හතරහමාරෙන් පසුවවත් ඔබතුමන්ලා සිහින මවන ආණ්ඩුව ඔබතුමන්ලාට දකින්න පුළුවන් වුණොත් ඒක පුදුමයක් කියලයි මම හිතන්නේ. මොකද, මාස හැටෙන් අලුත් රටක් හදන වැඩ පිළිවෙළ මේ ආණ්ඩුව ක්‍රියාත්මක කළාට පස්සේ, අනිවාර්යයෙන්ම ඊළඟ වතාවේත් ජනතාව මේ ආණ්ඩුව බලයට පත් කරනවාය කියන එක අපට ස්ථිරයි. අපේ වර්තමාන ක්‍රීඩා අමාත්‍යතුමා ඉතාම හොඳින් මේ අමාත්‍යාංශය කරගෙන යනවා. ඒක අපට පැහැදිලිවම කියන්න පුළුවන්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තව වැඩිම වුණොත් දෙකයි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා එතුමාට අවශ්‍ය ශක්තිය ලබා දෙනවා. ඒ ශක්තිය අරගෙන ක්‍රීඩාවේ තිබෙන අඩු පාඩු, විශේෂයෙන්ම ක්‍රීඩා නිලධාරීන්ගේ තිබෙන ගැටලු, ක්‍රීඩකයන්ට තිබෙන අපහසුතා නැති කිරීම සඳහා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම පාසල්වල ක්‍රීඩාව සම්බන්ධයෙන් විශාල ප්‍රශ්න තිබෙන බව අපි දන්නවා. පාසල්වල සිටින ක්‍රීඩකයන්ට, ගම්වල සිටින ක්‍රීඩකයන්ට අතහිත දෙන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලනවා. ඒ වාගේම අවධානය යොමුකළ යුතු තවත් කාරණයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඔබතුමා අද ගෙනැල්ලා තිබෙන ක්‍රීඩා පනත යටතේ නියෝගවල, 17 වන වගන්තියේ "රහස්‍ය ඡන්දය මඟින්" කියන වචන වෙනුවට "අත් එසවීම මඟින්" යන වචන ආදේශ කිරීමට යෝජනා කර තිබෙනවා. මෙහි පැති දෙකක් තිබෙනවා. අපි දන්නවා, ක්‍රීඩාවේ මාෆියාවක් තිබෙන බව. ඒ වාගේම රහස්‍ය ඡන්දයක් වෙනුවට අත් එසවීම මඟින් ඡන්දය ප්‍රකාශ කිරීම කියන කාරණය තුළින් ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ දී යම් කිසි ගැටලු සහගත තත්ත්වයක් මතු වෙයිද කියලා පොඩි සැකයක් ඇති වෙනවා. ඒ නිසා එම කාරණය ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි.

තවත් කාරණයක් තමයි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ වන කොට කිසියම් ගැටලුකාරී තත්ත්වයකට මුහුණ පා තිබෙනවා කියන එක. පසු ගිය කාලය තුළ නිලධාරීන් වෙනස් කිරීම, පුහුණුකරුවන් වෙනස් කිරීම හරහා මේ කණ්ඩායම දිගින් දිගටම දුර්වල වුණා. ඒ නිසා ඒ සම්බන්ධවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මේ අවස්ථාවේ දී මතක් කරනවා.

කුරුණෑගල දිස්ත්‍රික්කය ගැන කථා කරනවා නම්, කුරුණෑගල දිස්ත්‍රික්කයට හරිහමන් ක්‍රීඩාංගණයක් නැහැ. ඒ සම්බන්ධයෙන් දැනටමත් ඔබතුමාගේ අවධානය යොමු වෙලා තිබෙනවා කියලා මා හිතනවා. විශේෂයෙන්ම හොඳ ක්‍රිකට් ක්‍රීඩාංගණයක අවශ්‍යතාව අපට තිබෙනවා. වෙලගෙදර ක්‍රීඩාංගණය, ජාත්‍යන්තර ක්‍රිකට් තරග සඳහා ක්‍රීඩා කරන්නට පුළුවන් තත්ත්වයක නැහැ. ඒ වාගේම මලල ක්‍රීඩා සහ අනෙකුත් ක්‍රීඩා තරග සඳහා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක් නැති ප්‍රශ්නය තිබෙනවා. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. යහ පාලන ආණ්ඩුව යටතේ ක්‍රීඩාව නහා සිටුවන්නට, ක්‍රීඩාව ඔසවා තබන්නට ගරු දයාසිරි ජයසේකර ක්‍රීඩා ඇමතිතුමාට ශක්තිය ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් මම නවතිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි.

[பி.ப. 4.45]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் விளையாட்டுச் சட்டத்தின் கீழான ஒழுங்கு விதிகள் தொடர்பான விவாதத்தில் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் கொடுத்தமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இந்த இடத்திலே மிக முக்கியமாக, நான் வாழ்கின்ற கிளிநொச்சி மாவட்டத்திலே அமைக்கப்பட்டுக் கொண்டிருக் கின்ற ஒரு சர்வதேச விளையாட்டு மைதானம் தொடர்பில் கௌரவ விளையாட்டுத்துறை அமைச்சர் தயாசிறி ஜயசேகர அவர்களின் கவனத்தை ஈர்க்க விரும்புகின்றேன். 2009ஆம் ஆண்டுக்குப் பிற்பாடு கிளிநொச்சி மாவட்டத்திலே சர்வதேச தரத்திலான ஒரு விளையாட்டரங்கு அமைப்பதற்கான வேலைகள் ஆரம்பிக்கப்பட்டன. அவ்வாறு அமைக்கப்படத் தொடங்கிய அந்த விளையாட்டரங்கு இன்றுவரையும் அமைக்கப்பட்டுக்கொண்டே இருக்கின்றது. விளையாட்டு என்பது விளையாடிக் கொண்டே இருப்பதுபோல் ஒரு விளையாட்டு மைதானமும் தொடர்ந்து அமைக்கப்பட்டுக் கொண்டே இருக்கின்ற ஒரு நிலைமையைத்தான் அங்கு பார்க்கக் கூடியதாக இருக்கின்றது. இவ்வளவு காலமாகியும் அதற்குரிய வேலைத்திட்டங்கள் சரியானமுறையில் முடிவுறுத்தப்படவில்லை என்ற விடயம் மிகவும் கவலைக்குரியதாகும். அண்மையில் நான் இது தொடர்பான கேள்வியை இந்த உயர்ந்த சபையினூடாக முன்வைத்திருந்தேன். அவ்வாறு முன்வைக்கப்பட்டபொழுது அதற்குரிய பணமூலங்கள் எங்கேயிருந்து பெறப்பட்டன? சரியான முறையில் கூறுவிலைகள் கோரப்பட்டுத்தான் அந்த வேலைத்திட்டங்கள் ஆரம்பிக்கப்பட்டதா? நடைமுறைப் படுத்தப்படுகிறதா? அங்கேயிருக்கின்ற ஒவ்வொரு செயற்பாடு களும் அந்த மாவட்டத்தின் சரியான வழிமுறைகளுக்கமைய முகாமைத்துவக்குழுக்களின் திட்டமிடலுக்கமைய மேற்கொள் ளப்பட்டதா? என்ற கேள்விகளையும் நான் கேட்டிருந்தேன். ஆனால், அவற்றுக்குச் சரியான விடைகள் கௌரவ அமைச்சர் அவர்களிடமிருந்து இன்னமும் கிடைக்கப்பெறவில்லை என்பது மிகவும் கவலைக்குரிய விடயமாகும். மிக முக்கியமாக இது நீண்ட காலமாக எடுத்துச்செல்கின்ற ஒரு விடயமாக இருக்கின்றது.

பல்வேறுபட்ட விளையாட்டு வீரர்களை உள்ளடக்கிய அந்த மாவட்டத்தில் யுத்தத்திற்குப் பின்னர் சர்வதேச தரத்திலான ஒரு விளையாட்டு மைதானத்திலே தங்களுடைய பயிற்சிகளை மேற்கொள்வதற்கும் தங்களுடைய பயிற்சி களுக்கான நடவடிக்கைகளை மேற்கொள்வதற்கும் இதுவரை அவர்களுக்குச் சந்தர்ப்பங்கள் வழங்கப்படவில்லை. அதேநேரம் கிளிநொச்சி, முல்லைத்தீவு, வவுனியா, மன்னார் ஆகிய மாவட்டங்களுக்கு விளையாட்டுத்துறைக்காக ஒதுக்கப் படுகின்ற நிதியின் அளவுகூட மிகமிகக் குறைந்தளவிலேயே காணப்படுகின்றது. அதனால் அந்த மாவட்டங்களிலே இருக்கின்ற மாணவர்கள், பயிற்சியாளர்கள், இளைஞர்கள் போன்றோர் விளையாட்டுத்துறையில் மிகக் கூடியளவில் தங்களை ஈடுபடுத்திக்கொள்வதற்கும் அதற்குரிய முன்னேற்ற கரமான நடவடிக்கைகளை மேற்கொள்வதற்கும் தயங்குகின்றார்கள். குறிப்பாக, கிளிநொச்சி மாவட்டத்திலே வேலையற்ற இளைஞர் யுவதிகளாக ஏறக்குறைய 20,500 பேர் இதுவரை பதிவு செய்யப்பட்டிருக்கின்றார்கள்.

இதிலே விளையாட்டுத்துறை சார்ந்த பலபேருடைய வெற்றிடங்களை நிரப்புவதற்குக்கூட சரியான நடவடிக்கைகள் மேற்கொள்ளப்படவில்லை என்பது இங்கு மிகமுக்கியமாக கவனத்திற்கொள்ளப்பட வேண்டிய விடயமாகும். இதனை விட, மாவட்டங்களில் இருக்கின்ற பல கழகங் களுக்குச் சொந்தமான பல்வேறுபட்ட மைதானங்கள் –

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු මන්ත්‍රීතුමා, මම කිලිනොච්චිය ක්‍රීඩාංගණය ගැන විනාඩියකින් කියන්නද?

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கிளிநொச்சியின் நகரப்பகுதியிலே அமைக்கப்பட்டுக் கொண்டிருக்கின்ற சர்வதேச விளையாட்டு மைதானம் தொடர்பாக நான் ஏற்கெனவே உங்களுக்குத் தெரிவித் துள்ளேன்

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම ඔබතුමාට කිලිනොච්චිය ගැන පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්. ඔබතුමා ඒ ගැන ගොඩාක් උනන්දු වෙන නිසායි මම මේ කථා කරන්නේ. අපේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාත් ඒ ගැන මතක් කළා. මොකද, හේතුව? රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව බංකොලොත්. දහසකට විතර පඩි ගෙවන්නට මුදල් නැතිව රුපියල් මිලියන 750ක බැංකු loan එකක් අනුමත කරන්නට කියලා අද කැබිනට් එකෙන් ඉල්ලා තිබුණා. මේක තමයි රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අද තිබෙන තත්ත්වය. අපි දන්නු මුදල් වාගේම පසු ගිය ආණ්ඩුව දන්නු මුදලුත් කිලිනොච්චි ක්‍රීඩාංගණය හදන්නට පාවිච්චි කරන්නේ නැතිව, ඒ මුදල් සම්පූර්ණයෙන්ම පාවිච්චි කළේ සේවකයන්ගේ පඩි ගෙවන්නට. දහසක් සේවකයෝ වැඩක් නැතිව ඉන්නවා. මේක තමයි රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ තත්ත්වය. දැන් ඔවුන්ට බලපෑම් කරලා වැඩක් නැහැ. මොකද, කලින් සිදු වුණු ඒවායේ ප්‍රශ්න මේ තිබෙන්නේ. අපි දැන් කථා කරලා වැඩ පිළිවෙළක් සකස් කළා. ජූලි අග වන විට පිහිනුම් තටාකයත්, ගෘහස්ත ක්‍රීඩාංගණයත් ආරම්භ කරනවා. ඒක අපි ජූලි අග වන විට විවෘත කරනවා, ඔවුන් අපට එය භාර දීමට සූදානම්. සැප්තැම්බර් මාසයේ තිබෙන ජාතික මහා ක්‍රීඩා උළෙලට ගෘහස්ත ක්‍රීඩාංගණයත්, පිහිනුම් තටාකයත් පාවිච්චි කරලා ඒ ක්‍රීඩා තරග සියල්ල එතැන පවත්වනවා. ඒ වාගේම දුරෙයිඅප්පා ක්‍රීඩාංගණයත් තිබෙනවා. නමුත් ක්‍රීඩා පිටිය හදන එකේ පොඩි ප්‍රමාදයක් තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා ඔක්තෝබර් අග පමණ වන විට ක්‍රීඩා පිටියත් හදලා සම්පූර්ණම වැඩ කටයුතු ටික අවසන් කරන්නට. ඇත්ත වශයෙන්ම ඒ ප්‍රමාදය ඇති වුණේ රාජ්‍ය ආයතනවල තිබෙන ප්‍රශ්නත් සමහයි. බොහොම ස්තුතියි.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ அமைச்சர் அவர்களுடைய கருத்துக்களை நான் செவிமடுத்துக்கொண்டேன். நீங்கள் சொல்லுகின்ற அந்த உள்ளக விளையாட்டரங்கின் வேலைத்திட்டங்களை அண்மை யிலே நான் அரசாங்க அதிபரோடும் பிரதேச செயலாளரோடும் சென்று நேரடியாகப் பார்த்தேன். நீங்கள் சொல்வதுபோல இந்த யூலை மாதத்திற்குள் அந்த வேலைத்திட்டங்கள்

முடிவுற்றால் செப்ரெம்பர் மாதம் அங்கு உள்ளக விளையாட்டுக்களை நடத்தக்கூடிய வாய்ப்புகள் இருக் கின்றன. அத்துடன், நீச்சல் தடாகம் அமைக்கப்பட்டிருக்கிறது. அதன் இறுதி வேலைகளும் நடைபெற்றுக் கொண்டிருக் கின்றன. ஆனால், கிளிநொச்சி மாவட்டத்தில் கூடுதலான இளைஞர்கள் விளையாடுவது உதைபந்தாட்டம் - காற்பந்தாட்டம் ஆகும். ஆனால் இப்பொழுது cricket விளை யாட்டிலும் கூடுதலான அக்கறையைச் செலுத்துகிறார்கள். அதற்குப் பொருத்தமான மைதானங்கள் இந்த மாவட்டத்தில் இல்லை. இப்பொழுது அமைக்கப்படுகின்ற நீச்சல் தடாகம், உள்ளக விளையாட்டு மைதானம் என்பவற்றுக்குக் கிழக்குப் பக்கமாக இருக்கின்ற ஒரு பெரிய நிலப்பரப்பு ஏற்கெனவே கிளிநொச்சி மகாவித்தியாலயத்திற்கென்று ஒதுக்கப்பட்ட ஒரு மைதானமாக இருந்தது. ஆனால், இப்பொழுது அந்த மைதானம் cricket விளையாட்டரங்குக்காக ஒதுக்கப்பட்டிருப் பதாகக் குறிப்பிடுகிறார்கள். அந்த இடத்தையாவது தற்காலிக ஒரு cricket மைதானமாக, அதில் cricketஐ - மென்பந்து, கடின பந்துகளை விளையாடக்கூடிய வகையில் ஒழுங்கமைப் பதற்குத் தேவையான நிதியை நீங்கள் வழங்கலாமென்று நான் கருதுகின்றேன்.

மிகமுக்கியமாக, அந்த மைதானத்துடன் இணைந்த காணிப்பரப்புக்களான கிளிநொச்சி மாவட்டத்தின் கலை இலக்கிய மன்றம் - கவின்கலைக் கல்லூரி இருந்த வளாகம், நீர்ப்பாசனத் திணைக்களத்திற்குச் சொந்தமான காணி, கிளிநொச்சி மகாவித்தியாலயத்தின் primary - ஆரம்பப்பிரிவு அமைந்திருந்த பாடசாலைக் காணி போன்ற இடங்கள் முழுவதும் இப்பொழுது இராணுவ மயமாக்கப்பட்டிருக்கின்றது. அங்கு இராணுவமுகாம் இருக்கிறது. ஆனால், இராணுவத் தினர் அங்கு பெரியளவிலே இல்லை. இருந்தாலும், அவர்களுடைய service station, quarters என்பனதான் அங்கு அமைக்கப்பட்டிருக்கின்றன.

அந்த இராணுவ முகாம் அந்த இடத்திலிருந்து அகற்றப்படுகின்றபொழுதுதான் அங்கு மேற்கொள்ளப்படு கின்ற ஏனைய வேலைத்திட்டங்கள் சரியான முறையிலே அமையும். ஆகவே, கிளிநொச்சியின் இதயப் பகுதியிலே இருக்கின்ற விளையாட்டுத்துறையோடு சம்பந்தப்பட்ட அந்த மிகப் பிரதானமான இடத்தை நீங்கள் தயவு செய்து கவனத்தில் எடுத்துச் செயற்பட வேண்டும். அது கிளிநொச்சி மாவட்டத்தின் மிக முக்கியமான ஒரு பிரதேசமாகும். இதனை விடுவிப்பதற்கு நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டும் என்பதையும் நான் உங்களிடம் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்னுமொரு விடயத்தையும் நான் கௌரவ அமைச்சருடைய கவனத்திற்குக் கொண்டுவருகின்றேன். அதாவது, இந்த நாட்டிலே இருக்கின்ற உதைபந்தாட்டச் சங்கங்கள் உங்களுடைய அமைச்சின்கீழ் இருக்கின்றனவா? அல்லது தனித்துவமான ஓர் அமைப்பின்கீழ் இயங்குகின் றனவா? என்பதையும் நீங்கள் கவனத்திற்கொள்ள வேண்டும். ஏனென்றால், உதைபந்தாட்டச் சங்கங்கள் சம்பந்தமாகப் பல்வேறுபட்ட கருத்து வேறுபாடுகள் காணப்படுகின்றன அல்லது அவற்றின் நடவடிக்கைகள் சம்பந்தமாகப் பல கேள்விகள் எழுப்பப்படுகின்றன.

அதேநேரம் மன்னார், முல்லைத்தீவு, கிளிநொச்சி ஆகிய மாவட்டங்களின் மாவட்ட கிரிக்கெட் சபைகள் இலங்கையின் cricket association உடன் இன்னமும் இணைக்கப்படவில்லை. அதற்காக விண்ணப்பித்தும்கூட அந்த விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படாமல் இருக்கின்றன. விளையாட்டுத்துறை அமைச்சுக்கு அதற்கான காரணங்கள் இன்னமும் சரியாகத் தெரியாத ஒரு நிலை காணப்படுகின்றது. அதாவது மன்னார், முல்லைத்தீவு, கிளிநொச்சி மாவட்டங்களைச் சேர்ந்த ஒவ்வொரு மாவட்ட கிரிக்கட் சபையும் தங்களை இலங்கை கிரிக்கட் சபையோடு இணைக்குமாறு விண்ணப்பங்கள் அனுப்பியும்கூட ஏன், இன்னமும் அவை இணைக்கப்படாமல் இருக்கின்றன? தங்களுடைய அங்கத்துவம் சம்பந்தமாக அவர்கள் சம்பந்தப்பட்டவர்களுக்கு அறிவித்தபொழுதும் அது சம்பந்தமாக எந்த நடவடிக்கையும் மேற்கொள்ளாமல், அங்கிருந்து அவர்களுக்குச் சில அறிவுறுத்தல்கள் வழங்கப் படுகின்றன. அதாவது, "நீங்கள் வடக்கு மாகாணத்தோடு சேர்ந்து செயற்படுங்கள்! அந்த மாகாணத்தில் இருக்கின்ற வர்களோடு இணைந்து செயற்பட்டால் என்ன? ஏன், நீங்கள் மாவட்டம் என்று தனியே இயங்க வேண்டும்?" என்றெல்லாம் கேள்விகளும் கேட்கப்படுகின்றன. ஆனால், இலங்கை யிலுள்ள பல்வேறுபட்ட கழகங்களுக்கு இந்த cricket association இல் அங்கத்துவம் வகிப்பதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட்டிருக்கின்றன அல்லது சந்தர்ப்பங்கள் வழங்கப் பட்டிருக்கின்றன. ஒரு மாவட்டத்தினது கிரிக்கட் சபைக்கு அவ்வாறு அங்கத்துவம் வழங்காமல், கழகங்களுக்கு மட்டும் அங்கத்துவம் வழங்குவது ஏன்? என்பது ஒரு கேள்விக்குரிய விடயமாகும். ஆகவே, இந்த விடயங்களைக் கவனத்தில் எடுத்தால்தான் விளையாட்டுத்துறையில் அபிவிருத்தியைக் கொண்டுவர முடியும்.

உள்ளக விளையாட்டுக்கள் மற்றும் நீச்சல் தடாகங்கள் ஒருபுறமிருக்க, மாவட்டத்திலே மிகப் பிரதானமாக இருக்கின்ற காற்பந்தாட்டம், கிரிக்கெட்-கடினப் பந்து, மென்பந்து - போன்ற துறைகளிலே மாணவர்கள் - இளைஞர்கள் வளர்ச்சியடைந்து வருகின்ற சூழலில் அங்கு அதற்குரிய மைதானங்கள் சரியாக உருவாக்கப்படவில்லை. இந்த நேரத்தில், வடக்கு மாகாணத்தில் அல்லது கிழக்கு மாகாணத்தில் ஒரு சர்வதேச கிரிக்கெட் மைதானம் இன்னமும் உருவாக்கப்படவில்லை என்ற அந்தக் கவலையையும் நான் இந்தச் சபையிலே தெரிவிக்க விரும்புகின்றேன். வடக்கு மாகாணத்தில் எத்தனையோ இளைஞர்கள் கிரிக்கெட் விளையாட்டில் பங்குபற்றுகின்றனர். ஏன், அவர்களுக்காக சர்வதேசத் தரத்திலான, சரியான ஒரு மைதானத்தை இதுவரை உருவாக்க முடியவில்லை? அங்கு உதைபந்தாட்டத்துக்குக்கூட ஒரு மைதானம் உருவாக்கப்படுவதற்கான வாய்ப்புக்கள் இதுவரை கிடைக்கவில்லை. இன்று cricket association, football league - இவற்றினுடைய செயற்பாடுகள்கூட ஒவ்வொரு மாவட்டத்திலும் அரசியல் சார்ந்த அல்லது தனிநபர்களுடைய ஆதிக்கம் சார்ந்த விடயங்களாக மாறிக்கொண்டிருக்கின்றன. இப்படிப் பல விடயங்களை விளையாட்டுத்துறை சம்பந்தமான விவாதம் நடைபெறுகின்ற இன்றைய நாளில் இந்த அமைச்சின் கவனத்துக்குக் கொண்டுவந்திருக்கிறேன். எனவே, விளையாட்டுத்துறை அமைச்சு மிக முக்கியமாக இந்த விடயங்களைக் கவனத்திற்கொண்டு செயற்பட வேண்டும் என்று கூறி, என்னுடைய உரையை நிறைவு செய்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔහොම ස්තුතියි.

මීළඟට ගරු හේෂානී විතානගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 4.55]

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතා වැදගත් කාරණයක් පිළිබඳව කෙරෙන විවාදයේදී අදහස් දක්වන්න අවස්ථාවක් ලබා දීම ගැන පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා.

අද මේ විවාදයේදී කරුණු දැක්වූ හිටපු ගරු අමාත්‍යවරු වාගේම ජ්‍යෙෂ්ඨ ගරු මන්ත්‍රීවරු කිහිප දෙනකුගේම අදහස්වලින් කියැවුණේ එක් එක් කාල සීමාවන් තුළදී ක්‍රීඩාවට වුණු සේවාවන් සහ හානිදායක තත්ත්වයන් පිළිබඳවයි. කෙසේ හෝ මේ රටේ ක්‍රීඩාව දියුණු කිරීමට, මේ රටේ ක්‍රීඩාව නිසි මහකට යොමු කිරීමට, මේ රටේ ක්‍රීඩාව තුළින් ජයග්‍රහණ අත්පත් කර ගැනීමට නම් මේ විවාදවලදී එක් එක් පාර්ශ්ව පිළිතුරු දෙනවා වාගේම අප සියලු දෙනා එකතු වෙලා කටයුතු කරන්න ඕනෑයි කියලා මා විශ්වාස කරනවා. විශේෂයෙන් හිටපු ගරු අමාත්‍යවරු තමන්ගේ කාලසීමාවන් තුළදී තමන්ට හැකි උපරිම ආකාරයෙන් කටයුතු කරපු අවස්ථා තිබෙනවා; නැති අවස්ථා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ළඟදී SAG තරගාවලිය තිබුණා. අපි දැක්කා, ඒ තරගාවලියේ ජයග්‍රහණ වැඩි ප්‍රමාණයක් අත්පත් කර ගන්න තරගාවලියට පෙර මේ රටේ ඒ අදාළ බලධාරීන්ගේ පුදුමාකාර උනන්දුවක් තිබුණ බව. ඒ වෙනුවෙන් ගරු අමාත්‍යතුමා විශාල මුදල් ප්‍රමාණයක් අදාළ ක්‍රීඩා සංගම්වලට ලබා දුන්නා. මා ඒ ගැන මතක් කරන්නම්. වොලිබෝල් සංගමයට රුපියල් ලක්ෂ 100ක්, පාපැදි සංගමයට රුපියල් ලක්ෂ 84ක්, වුෂූ සංගමයට රුපියල් ලක්ෂ 76ක්, මල්ලවපොර ක්‍රීඩා සංගමයට රුපියල් ලක්ෂ 74ක්, ස්කොව් ක්‍රීඩා සංගමයට රුපියල් ලක්ෂ 64ක්, බැඩ්මින්ටන් සංගමයට රුපියල් ලක්ෂ 61ක්, මේස පන්දු සංගමයට රුපියල් ලක්ෂ 58ක් වශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් ඒ ක්‍රීඩා සංගම්වලට වෙන් කරලා බලාපොරොත්තු වුණේ, ඉදිරි SAG තරගාවලියේදී මේ රටට ජයග්‍රහණ රැසක් ගෙන එන්නට පුළුවන් ආකාරයට තමන්ගේ ක්‍රීඩකයන්ට අවශ්‍ය පුහුණුව ලබා දීලා ඒ අවශ්‍ය සූදානම ඇති කරන්නයි. අන්තිමේදී මොකද වුණේ? තරගාවලිය ඉවර වුණා. අර උනන්දුවෙන් හිටපු බලධාරීන්, උනන්දුවෙන් හිටපු සංගම්වල නිලධාරීන් ඒ තරගාවලියේ ප්‍රතිඵලයත් එක්ක එතැනින් එහාට කථා කරන්නේ නැහැ. අර මුලින් තිබුණු උනන්දුව නැති වෙලා ගියා. අන්තිමේදී අපි බලාපොරොත්තු වුණු ප්‍රතිඵල ලැබුණේ නැහැ. මේ රටේ අපි දකින වෙනසත් මේකයි. මොන තරම් මුදල්වලින් සහයෝගය දුන්නත්, දේශපාලන අධිකාරියේ සහයෝගය දුන්නත් ඒ අදාළ තරගාවලියෙන් පස්සේ පසු විපරම් කිරීමක් කවදාවත් වෙලා නැහැ. මා ගරු ඇමතිතුමාගේ අවධානයට මෙය යොමු කරනවා. ඒ පසුවිපරම නොවීම තුළින් මේ රටේ මහජනතාවගේ මුදල් විශාල වශයෙන් විනාශ වනවා වාගේම මේ රටෙන් බිහි වෙන්න ඕනෑ ක්‍රීඩකයින් විශාල ප්‍රමාණයක් මේ රටට අහිමි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි කියනවා, SAG තරගාවලියෙන් හොඳ ආදර්ශයක් අරගෙන මේ ලැබුණු ප්‍රතිඵල පිළිබඳ විශ්ලේෂණයක් කරන්න කියලා. දැන් බලන්න, පිහිනුම් තරගවලදී පදක්කම් දිනා ගන්නා අය සම්බන්ධයෙන් බැලුවොත්, ලංකාවේ ස්ථීර පදිංචිය තිබෙන එක ක්‍රීඩකයකුවත් පිහිනුම් ක්‍රීඩාවෙන් පදක්කම් ගෙනාවාද? ඒ ඔක්කෝම පිට රටවල ඉන්න අය. විශාල වශයෙන් ධනය තිබෙන, මුදල් වියදම් කරන්න පුළුවන් අය පිට රටවල ගිහිල්ලා අධ්‍යාපනය ලබන අතරතුර, විදේශික තරගකරුවන් එක්ක විනෝදයට පිහිනලා ලංකාවේ තරගවලට මුහුණ දුන්න ගමන් පළමුවැනි තැන දිනා ගන්නවා. ලංකාවේ පිහිනුම් ක්‍රීඩාව කොතැනද තිබෙන්නේ කියලා එයින් අපට හිතා ගන්න පුළුවන්. ඔවුන් තමයි ඇවිල්ලා මේ තරග නියෝජනය කරන්නේ. SAG පදක්කම්ලාභී සියලු දෙනා පදක්කම් ටික අරගෙන, ඒ ලැබුණු මුදල් කන්දරාවත් අරගෙන ඔවුන් දැනට ජීවත් වෙන රටවලට ගියා. හැබැයි, මේ රටේ පිහිනුම් ක්‍රීඩාවට මොකද වෙලා තිබෙන්නේ? හරි විධියට කියනවා නම්, අපේ රටේ මොනරාගල, ඇඹිලිපිටිය වාගේ ප්‍රදේශවල අතිංසක දරුවෙකු කොළඹ ජාත්‍යන්තර පාසලක දරුවෙකු එක්ක ඉංග්‍රීසි භාෂාවෙන් විවාදයකට එනවා වාගේ වැඩක් තමයි වෙන්නේ. මොනම වෙලාවකවත් ඒ සඳහා කලින් සූදානම් කිරීමක් කරන්නේ නැහැ. නමුත්, අපි පුදුමාකාර සතුටක් ලබනවා මේ අසවල් පුද්ගලයා පිහිනුම් ක්‍රීඩාවෙන් ජාතික ශූරතාවය දිනුවා, මේ පුද්ගලයා දැන් SAGවලට සූදානම් වෙනවායි කියලා. මෙතැනට නම් මේ රටේ ක්‍රීඩාව යන්නේ, ගරු අමාත්‍යතුමා මොන තරම් මහන්සි වුණත් වැඩක් නැහැ; මේ වෙනුවෙන් සංගම්වලට මොන තරම් වියදම් කළත් වැඩක් නැහැ. ක්‍රීඩාව නිසි ප්‍රමිතියකට, නිසි track එකකට දමන්න අවශ්‍ය වෙනවා.

අපේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ හිටපු අමාත්‍යතුමා තමන්ගේ කාල සීමාව තුළ ක්‍රීඩාව වෙනුවෙන් කළේ මොනවාද කියලා කිව්වා. එතුමාගේ කථාවට පස්සේ අපේ ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා, හිටපු අමාත්‍යතුමාගේ කාලයේ වුණ සිද්ධි ටික මේ පාර්ලිමේන්තුවට මතක් කරලා දුන්නා. මම මේ වෙලාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට, ක්‍රීඩාව වෙනුවෙන් අපේ ගම්වලට මොන තරම් ශක්තියක් දීලා තිබෙනවාද කියන කාරණය ගැන කථා කළොත්, ඔය කථා කරපු ඇමතිතුමන්ලාට සතුටු වෙන්නට හැකි උත්තරයක් දෙන්න බැහැ. මොකද, ඒක එක එක ආකාරයට තමන්ට අවශ්‍ය විධියටයි ක්‍රියාත්මක වුණේ.

ඔබතුමා දන්නවා, මීට අවුරුදු ගණනාවකට ඉස්සර වෙලා රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ යුගයේ ඇඹිලිපිටිය ප්‍රදේශයේ ක්‍රීඩාව දියුණු කරන්න අවශ්‍ය පරිසරය ඉතා විශාල වශයෙන් හැදූ බව. මහවැලි ක්‍රීඩාංගණය හදලා, ඒ ප්‍රදේශයේ ජනතාවට, ඒ ප්‍රදේශයේ දරුවන්ට අවශ්‍ය ශක්තිය ලබලා දුන්නා. අද ඒක වල්බිහිවෙලා තිබෙනවා. ඒ ක්‍රීඩාංගණය පළාත් සභාවට බාර දීලා තිබුණත් පසු ගිය අවුරුදු ගණනාව තුළම ඒ ගැන මැදිහත්වීමක් වුණේ නැහැ. හැබැයි, විශාල ධනස්කන්ධයක් වියදම් කරලා ඊට එහායින් සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හැදුවා. කෝටි ගණනක් වියදම් කරලා හදපු මේ සූරිය වැව ක්‍රිකට් ක්‍රීඩාංගණයට පසු ගිය අවුරුදු 5 තුළ වෙලා තිබෙන්නේ මොකක්ද? 2011දී මේ ක්‍රීඩාංගණය වෙනුවෙන් දැරූ වියදම රුපියල් මිලියන 20.96යි; ආදායම රුපියල් මිලියන 2යි. 2012දී දැරූ වියදම රුපියල් මිලියන 19යි; ආදායම රුපියල් මිලියන 6යි. 2013දී වියදම රුපියල් මිලියන 20යි; ආදායම රුපියල් මිලියන 2යි. 2014දී වියදම රුපියල් මිලියන 18යි; ආදායම මිලියන 2යි. 2015දී වියදම රුපියල් මිලියන 12යි; ආදායම මිලියන 3යි. මෙන්න මේ ව්‍යාපෘති තුළින් ක්‍රීඩාව නංවන්න පුළුවන් කියලා කල්පනා කරලා, ජනප්‍රිය ක්‍රීඩාව විධියට සලකන ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් පසු ගිය රජය තුළ යම්කිසි ශක්තියක් එතුමන්ලා ලබලා දුන්නා. ඒ හේතු නිසාම මේ වෙනකොට රුපියල් බිලියන 2.4ක මූල්‍ය වගකීමක් තිබෙන ආයතනයක් බවට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පත්වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ සා විශාල මූල්‍ය අර්බුදයකට පත්වෙන්න හේතුවෙලා තිබෙන්නේ මොකක්ද? ක්‍රිකට් ආයතනය නොදැන, කැබිනට් මණ්ඩලයට නිතිව්ච විධියට තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් මේ වාගේ තීන්දු තීරණ අරගෙන මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නිසා තමයි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ තරම් මූල්‍ය අර්බුදයකට පත් වුණේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද එතැනින් නැඟිටින්න ඕනෑ කියා අපි විශ්වාස කරනවා. මේ සඳහා දේශපාලනයක් අවශ්‍ය වෙන්නේ නැහැ.

අපි විශ්වාස කරනවා, මේ වෙනුවෙන් නායකත්වය දෙන ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිතුමා අවශ්‍ය ශක්තිය දෙන බව. ඒ කටයුත්තට හයියක් වෙන්න සියලු දෙනාට යුතුකමක් තිබෙනවා. ඒ නිසා අපි කියනවා, පසු ගිය කාල සීමාවල වෙච්ච අසාධාරණ දේශපාලන වුවමනා නිසා මේ රටේ ක්‍රීඩාව තිබෙන්න ඕනෑ තැනින් අවුරුදු ගණනකින් පහළට ගිය බව. ඒ නිසා ක්‍රීඩා සංගම් මුවාවෙන් කරන මංකොල්ලය නතර කරන්න දැන් අවශ්‍යයි. ක්‍රීඩා සංගම්වල අවුරුදු ගණනාවක් පරණ බලධාරින් ඉන්නවා. සුසන්තිකා ක්‍රීඩා කරන කාලයේ හිටපු නිලධාරින් සුසන්තිකාගේ දරුවන් ක්‍රීඩා කරන තුරු මේ සංගම්වල නිලධාරින් - බලධාරින් -බවට පත්වෙලා ඉන්නවා. යල් පැන ගිය පරණ බලධාරින් මේක මිරිකාගෙන, හිරකරගෙන තමන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සිටීම තුළින් මේ රටේ ක්‍රීඩාව දියුණු වෙන්නේ නැහැ. මේ රටේ ක්‍රීඩාව දියුණු වෙන්න නම් පවුල් බලය දේශපාලන බලයෙන් අයින් කරලා, ක්‍රීඩාව ස්වාධීන ජාතික ප්‍රතිපත්තියක් අනුව ඉදිරියට ගෙන යන වටපිටාවක් නිර්මාණය වෙන්න ඕනෑ.

අපි දැක්කා, පසු ගිය කාලයේ රගර් ක්‍රීඩාව තිබුණේ කොතැනද කියා. රගර් ක්‍රීඩාව තුළින් දක්ෂ ක්‍රීඩකයන්ට එළියට එන්න හැකියාවක් තිබුණේ නැහැ. ඔවුන් හිරකරලායි තිබුණේ. උදාහරණයක් විධියට ෆසිල් මරීජා වාගේ දක්ෂ රගර් ක්‍රීඩකයන්ට එතැනම තමන්ගේ ක්‍රීඩා ජීවිතය අවසන් කරන්න වුණා. ඒ කාලයේ හොයා ගත්ත යම් යම් ක්‍රීඩකයන් තමන්ට ඕනෑ ආකාරයට යොදවලා ක්‍රීඩාවේ ජයග්‍රහණය ගෙනෙන්න කියා තමන්ගේ හයිය ශක්තිය පාවිච්චි කළා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් කියනවා මේ රටේ ක්‍රීඩාව දියුණු කරන්න නම්, ක්‍රිකට් ක්‍රීඩාව විතරක් නොවෙයි, මලල ක්‍රීඩාව විතරක් නොවෙයි, හැම ක්‍රීඩාවක් සම්බන්ධයෙන්ම ගමේ තිබෙන සම්පත් ටික කොළඹට අරගෙන එන්න කටයුතු කරන්න ඕනෑ. නැත්නම් ජාත්‍යන්තර පුහුණුකරුවන් ගෙනැල්ලා, මේ රටේ අභිංසක දුවා දරුවන්ගේ ශක්තිය ජාත්‍යන්තරයට අරගෙන යන්න පුළුවන් වටපිටාවක් නිර්මාණය කරන්න ඕනෑ. එහෙම නැතුව තමන්ගේ දේශපාලන ඕනෑකමක් වෙනුවෙන් ක්‍රීඩාව පාවිච්චි කරනවා නම්, දිස්ත්‍රික් සංගමයේ සභාපතිකම ගන්නවා නම්, දිස්ත්‍රික් සංගමයේ බලය තමන්ගේ අතට අරගෙන තමන්ගේ දේශපාලන ඕනෑකම ක්‍රියාත්මක කරනවා නම්, අනාගතයේදීත් අපට මේ වාගේ ප්‍රතිඵල එයි. SAG තරගාවලිය කියන්නේ හොඳ තරගාවලියක්. ඒ සඳහා දක්ෂ ක්‍රීඩකයන් ටිකක් අරගෙන යන්න පුළුවන් ගමනකට සූදානම් වෙන්න ඕනෑ. ඒ කටයුතුවලට නායකත්වය දෙන්න දේශපාලන අධිකාරිය හරි ක්‍රමවේදය අනුගමනය කරන්න ඕනෑ. බලධාරින්ට තමන්ගේ ඕනෑ එපාකම් ඉටු කර ගැනීමට අවස්ථාව නොදිය යුතුයි කියන එක මතක් කරනවා. මේ රටේ ක්‍රීඩාව යහපාලන ආණ්ඩුවත් එක්ක බද්ධ කරගෙන ගරු දයාසිරි ජයසේකර මැතිතුමා අනාගතයේ දරුවන්ට ක්‍රීඩාවෙන් මේ රටට ජයග්‍රහණ අත්කරලා දෙන්න පුළුවන් වන විධියට ඒ කටයුතු කරයි කියා විශ්වාස කරනවා. අඩුම තරමින් මෙවර බැරි වුණත් ලබන ඔලිම්පික් තරගාවලිය වෙනකොට හරි දක්ෂ ක්‍රීඩකයන් බිහි කරන්න පුළුවන් වටපිටාවක් නිර්මාණය කරයි කියන ඒ බලාපොරොත්තුව තබාගෙන මගේ කෙටි වචන කිහිපය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.05]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා විසින් ක්‍රීඩා පනත යටතේ නියෝග මඟින් ගෙන එන ලද සංශෝධන පිළිබඳව කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ආරම්භ කිරීමට පෙර කිව යුතු කාරණයක් තිබෙනවා. ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී ගරු සභා ගැබේ නැහැ. ඒ මන්ත්‍රීතුමා කථා කරන විටම අපට වැටහුණා, එතුමා පොඩ්ඩක් කනගාටුවෙන් ඉන්නේ කියලා. අඩුම තරමින් නියෝජ්‍ය ඇමතිකමක්, අධීක්ෂණ මන්ත්‍රීකමක්වත් එක්සත් ජාතික පක්ෂ රජය තුළින් එතුමාට ලැබුණේ නැති නිසා කනගාටුවෙන් ඉන්නවා කියන කාරණය එතුමාගේ කථාවෙන් පැහැදිලි වුණා. විශේෂයෙන්ම එතුමා චෝදනාවට ලක් කළා, අපේ හිටපු ක්‍රීඩා අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාවත්, මහින්ද රාජපක්ෂ රජයත්. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ රජය විසින් පසු ගිය කාලයේ කළ ක්‍රීඩා ව්‍යාපෘතිවලදී සිදු වූ අක්‍රමිකතා ලැයිස්තුවක් එතුමා කියවාගෙන ගියා.

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිව එතුමාට කියන්නට ඕනෑ, ඒ කියවාගෙන ගිය ලැයිස්තුවේ යම් කිසි චෝදනාවක් ඔප්පු කරන්නට පුළුවන්කමක් තිබෙනවා නම්, පැමිණිල්ලක් කරන්න පුළුවන්කමක් තිබෙනවා නම්, නිසි ක්‍රමවේදය පාවිච්චි කරලා ඕනෑම ආයතනයකට ගිහින් තමන්ට තිබෙන තොරතුරු ලබාදීලා ඒ පැමිණිල්ල කරනවාට ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අපට කිසි ගැටලුවක් නැති බව. නමුත් යම්කිසි ලේඛනයක් කියවලා එක්තරා පුද්ගලයකුට හෝ පසු ගිය ආණ්ඩුවට මඩ ගහන්නට මේ ගරු සභාව භාවිත කරනවා නම් අපි ඒක අනුමත කරන්නේ නැහැයි කියන කාරණයත් මේ වෙලාවේ මතක් කර සිටින්නට ඕනෑ.

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා පනත යටතේ ගෙන එන ලද නියෝග පිළිබඳව කථා කරන විට මට සිහි වෙන කාරණයක් තිබෙනවා. අපි ලංකාවේ ක්‍රීඩාව ගැන ඉතාමත්ම ආඩම්බරයෙන් කථා කළ කාල වකවානුවක් තිබුණා. පසු ගිය කාලයේ අපි එක පැත්තකින් රටේ පැවති යුද්ධයෙන් පීඩාවට පත් වන විට මානසිකව යම් සහනයක් ලබා ගන්නට තිබුණු එකම අවස්ථාව තමයි ලංකාව ඉදිරිපත් වන ක්‍රීඩා තරගයක් දිහා බැලීම. ඒ ක්‍රීඩා තරගයෙන් ජයග්‍රහණය ලබන විට අපි ඒ යුද මානසිකත්වයෙන් ටිකක් ඈත් වුණා.

ක්‍රිකට් ක්‍රීඩාව වෙන්න පුළුවන්, නෙට්බෝල් ක්‍රීඩාව වෙන්න පුළුවන්, පාපන්දු ක්‍රීඩාව වෙන්න පුළුවන්, මලල ක්‍රීඩා වෙන්න පුළුවන්, ඒ හැම ක්‍රීඩාවකින්ම යම් කිසි දක්ෂතා පෙන්නපු කණ්ඩායම් අපේ රටේ සිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස වන විට යුද්ධයක් නොතිබුණත්, බදු බරින් පෙළෙන වෙලාවේ අපේ මානසිකත්වය හදාගන්නවත් බලන්න ක්‍රීඩා තරගයක්වත් නැහැ. ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. කිසිම ක්‍රීඩාවකින් අපට සෑහීමකට පත්වෙන්න පුළුවන් ජයග්‍රහණයක් කරා යනවා බලා ගන්න පුළුවන්කමක් නැහැ. පසු ගිය කාලයේ සෑම ජාත්‍යන්තර ක්‍රිකට් තරගාවලියකදීම අපේ කණ්ඩායම quarter-final, semi-final, final ආපු අවස්ථා ගණනාවක් තිබුණා. T-20 World Cup එකේදී, පන්දු ඕවර් 50 World Cup එකේදී, Asian Gamesවලදී, Champion Trophy එකේදී -ඒ හැම තරගාවලියකදීම- අපේ කණ්ඩායම අවසන් තරගය සඳහා සුදුසුකම් ලැබූ අවස්ථා ගණනාවක් තිබුණා. අපට මතකයි, ඒ කාලයේ විපක්ෂයේ සිටි මන්ත්‍රීවරු චෝදනා කළා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මැච් බලන්න ගිහිල්ලා එම තරග පරද්දනවා කියලා. අපේ ක්‍රිකට් කණ්ඩායමේ අද තිබෙන තත්ත්වය දිහා බැලුවාම semi-final නොවෙයි, quarter-final නොවෙයි, දෙවැනි කඩ ඉමෙන් එහාට යන්න; කණ්ඩායමක් විධියට ඉදිරියට යන්න පුළුවන්කමක් නැහැ. අපි දැක්කා, පසු ගිය දවස්වල පැවැති එංගලන්ත සංචාරය. අපි දැක්කා, එහිදී ක්‍රීඩකයන් සොයා ගන්න තිබුණු අමාරුව.

[ගරු කංචන විජේසේකර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රේණිගත කිරීම්වලට අනුව ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩා කරන කණ්ඩායම් 9 අතරින් අපේ ටෙස්ට් ක්‍රිකට් කණ්ඩායම 7වැනි තැනට පත්වෙලා තිබෙනවා. එක්දින ක්‍රිකට් කණ්ඩායම් අතරින් අද ශ්‍රී ලංකා කණ්ඩායම 6වැනි තැනට පත්වෙලා තිබෙනවා. පසු ගිය ලෝක කුසලානය ජයග්‍රහණය කරපු ශ්‍රී ලංකා T-20 ක්‍රිකට් කණ්ඩායම අද T-20 කණ්ඩායම් අතරින් 8වැනි තැනට පත්වෙලා තිබෙනවා. මේ ක්‍රිකට් ක්‍රීඩාව පමණයි.

නෙට්බෝල් ක්‍රීඩාව ගැන කථා කළොත්, පසු ගිය කාලයේ අපේ නෙට්බෝල් කණ්ඩායම දකුණු ආසියානු ශූරතාව දක්වා ගියා; දකුණු ආසියා ශූරතාව දිනුවා. සාක් තරගාවලිවලදී විශේෂ ශූරතා ලබා ගන්නවා අපි දැක්කා; තරග ජයග්‍රහණය කරනවා අපි දැක්කා. පාපන්දු ක්‍රීඩකයන් සාක් පාපන්දු කුසලානය ජයග්‍රහණය කරන අවස්ථා අපි දැක්කා. නමුත් අපි අද කනගාටු වෙනවා, ඒ හැම ක්ෂේත්‍රයකම දැන් කඩා වැටීමක් තිබීම සම්බන්ධයෙන්.

අපට මතකයි, පසු ගිය කාලයේ නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා වැනි විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරු මෙතැනට ඇවිල්ලා චෝදනා කළා, ඇයි මෙච්චර පහසුකම් ලබා දෙන්නේ, ඇයි මෙච්චර ගොඩනැඟිලි හදන්නේ, ඇයි මෙච්චර ක්‍රීඩා පිටි හදන්නේ, ඇයි ඒවා සඳහා මෙච්චර මුදලක් වෙන් කරන්නේ කියලා. නමුත් අපි තේරුම් ගත යුතු කරුණක් තිබෙනවා. එදා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාල වකවානුවේදී ගමට ක්‍රීඩාව ගෙනගිය නිසා තමයි ගමේ සිටින ක්‍රීඩකයන්ට තමන්ගේ දක්ෂතා පෙන්නුම් කරලා ජාත්‍යන්තරය ජයග්‍රහණය කරන්න පුළුවන් වටපිටාව හැදුණේ. ඒ ක්‍රීඩා පිටි වෙනුවෙන් තවත් මුදලක් වෙන්කර තිබෙනවා. ඒ පිළිබඳව ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කිව්වා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවෙන් රුපියල් බිලියන 4.5ක මුදලක් මේ වෙනුවෙන් වෙන්කරලා වැඩ කටයුතු ආරම්භ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පෞද්ගලිකව දන්නවා, මාතර දිස්ත්‍රික්කයේ, කොටවිල ක්‍රීඩාංගණයේ වැඩ අවසන් කරන්න තිබුණේ 2015 අවුරුද්දේ පෙබරවාරි මාසයේදීයි. නමුත් පසු ගිය මාසයේ තමයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් ගිහිල්ලා ඒ ක්‍රීඩාංගණය විවෘත කළේ. ක්‍රීඩාංගණය විවෘත කිරීම අවුරුදු එකහමාරක් කල් දැම්මා. අවුරුදු එකහමාරක් කල් දාලා ඒ විවෘත කිරීම කළේත් අඩු පාඩුත් එක්කයි. ඒ වාගේම එතුමන්ලා දැනුවත් වෙලා හිටියාද කියලා මම දන්නේ නැහැ, ඒ විවෘත කිරීම වන අවස්ථාව වන විට ක්‍රීඩාංගණයේ සියලු කටයුතු සිදු කරලායි තිබුණේ. එහි සමරු ඵලකය විතරයි නව ආණ්ඩුවෙන් හදපු දේකට තිබුණේ. මෙවැනි ක්‍රීඩාංගණ ගණනාවක් තිබෙනවා. හොරණ ක්‍රීඩාංගණය, කිළිනොච්චිය ක්‍රීඩාංගණය, මහනුවර ක්‍රීඩාංගණය, පළාත් ක්‍රීඩාංගණ 9ක් තිබෙනවා. ඒ වාගේම පළාත් ක්‍රීඩාංගණ ඉදිවන තැන් හැරෙන්න අනෙකුත් දිස්ත්‍රික්ක 16 තුළ ක්‍රීඩාංගණ 16ක් ඉදිකිරීම පසු ගිය කාලය තුළ සිද්ධ වුණා. ඒ නිසා ගමේ ඉන්න ක්‍රීඩකයන්ට ඔවුන්ගේ දක්ෂතා පෙන්වන්න කොළඹට එන්න ඕනෑ වුණේ නැහැ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ සංකල්පය වුණේ හැමදාම කොළඹට සීමා වෙලා තිබුණු ජාතික ක්‍රීඩා උළෙල ගමට ගෙනයෑමයි. ජාතික ක්‍රීඩා උළෙල ගමට ගෙන යමින් වට පිටාවේ තිබෙන ක්‍රීඩා පාසල් ටික හදන්න, ක්‍රීඩාංගණ ටික හදන්න, ඒ සඳහා අවශ්‍ය පහසුකම් ටික හදන්න ඒ අවස්ථාවේ ශක්තිය ලබා දුන්නා.

හම්බන්තොට ටෙනිස් ක්‍රීඩාංගණයක් ගැන කිව්වා, හම්බන්තොට Volleyball ක්‍රීඩාංගණයක් ගැන කිව්වා, හම්බන්තොට සූරියවැව ක්‍රීඩාංගණය ගැන කිව්වා. කල්පනා කරලා බලන්න, ලැබෙන තරග ඒ ක්‍රීඩාංගණවලට දෙන්නේ නැත්නම් ආදායම් ලබන්නේ කොහොමද කියලා. ඒ ක්‍රීඩාංගණවලට තරග නොදී එම ක්‍රීඩාංගණවලින් ක්‍රිකට් ආයතනයට ආදායමක් ලැබෙන්නේ කොහොමද? අද සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය තිබෙනවා. නමුත්, එළැඹෙන ඕස්ට්‍රේලියා කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරයේදී එකම එක තරගයක්වත් සූරියවැව ජාත්‍යන්තර ක්‍රීඩාංගණයට ලබා දීලා නැහැ. සියලු තරග ලබා දී තිබෙන්නේ කොහාටද? පල්ලෙකැලේ ක්‍රීඩාංගණයට සහ කොළඹ තිබෙන ක්‍රීඩාංගණවලට තමයි ඒ තරග ලබාදී තිබෙන්නේ. ක්‍රීඩා තරග පවත්වන්නේ නැත්නම් ආදායමක් ලැබෙන්නේ කොහොමද?

ඔබතුමා කියනවා, සූරියවැව ජාත්‍යන්තර ක්‍රීඩාංගණයෙන් ආදායම් ලබන්නේ නැහැ කියලා. ඒ කාලයේ ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රීඩාංගණයට ක්‍රීඩා තරග දුන්නේ නැත්නම් එම ක්‍රීඩාංගණය නඩත්තු කර ගෙන යන්න ආදායම් ලැබෙනවාද? සුගතදාස ක්‍රීඩාංගණය හදලා තිබෙනවා. නමුත්, සුගතදාස ක්‍රීඩාංගණයට ක්‍රීඩා තරග ලැබෙන්නේ නැත්නම් එය නඩත්තු කර ගෙන යන්න ආදායම ලැබෙනවාද? ඒ නිසා මේ දෙස පටු අරමුණු තුළින් බලන්න එපාය කියන ඉල්ලීම අප කරනවා. ක්‍රීඩාව දියුණු වෙන්න නම් ඒ පහසුකම් හැම ගමකටම, හැම නගරයකටම යන්න ඕනෑ. ඒ වාගේම පාසල් තුළටත් ඒ පහසුකම් යන්න ඕනෑ. පසු ගිය කාලයේ පාසල් තුළටත් ඒ පහසුකම් ගෙන ගියා. පළමුවෙනි වතාවට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව තුළින් පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් කරන කටයුතුවලදී කොළඹින් පිට පාසල් තුළ ක්‍රීඩාංගණ, පිහිනුම් තටාක ඉදි කරන්න පටන් ගත්තා. මම පෞද්ගලිකව දන්නවා, මම නියෝජනය කරන දෙවිනුවර ආසනයේ විජිත මධ්‍ය මහා විද්‍යාලයේ පිහිනුම් තටාකය, වොලිබෝල් ක්‍රීඩාංගණය, මලල ක්‍රීඩා ක්‍රීඩාංගණය යනාදී සියලුම දේවල් වෙනුවෙන් පසු ගිය කාලයේ මුදල් වෙන් වෙලා ගමේ ක්‍රීඩකයන්ට තමන්ගේ දක්ෂතාවන් පෙන්නුම් කරන්න විශාල ශක්තියක් ලැබුණාය කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ නිලවරණ තියලා නිලතලවලට අලුතින් පුද්ගලයන් පත් වුණා. ඒ පත් වෙන හැම අවස්ථාවකම ආණ්ඩුව කිව්වේ,"දූෂණය, වංචාව අඩු කරන්න අලුතෙන් නිලවරණ තියලා කණ්ඩායම් පත් වෙනවා" කියලායි. ක්‍රිකට් ආයතනය ගැන පසු ගිය දවස්වල පත්තරවල තිබුණා මම දැක්කා. ක්‍රිකට් ආයතනයට මුදල් හොයාගන්න, නැත්නම් Cricket Aid එකට මුදල් හොයා ගන්න, ආධාර ලබා ගන්න එංගලන්ත සංචාරය අතරතුරේ මුදල් එක රාශි කිරීමේ ව්‍යාපෘතියක් ලෝඩ්ස් පිටියේදී තිබුණා කියා ඒවායේ සඳහන් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පත්තරවල තිබෙන විධියට දැක්කේ, ලෝඩ්ස් ක්‍රීඩාංගණයේ මේ කටයුත්ත කිරීම තුළින් රුපියල් ලක්ෂ 95ක මුදලක් ඉපැයුවා කියලායි. ඒ වාගේම ඒ වෙනුවෙන් වියදම් වෙච්ච මුදලත් සඳහන් කර තිබුණා. ඒ පින්තූරවල ලංකාවෙන් සහභාගී වුණු කණ්ඩායම් ඉන්නවා අපි දැක්කා. පැරණි ක්‍රිකට් ක්‍රීඩකයන්, පැරණි ක්‍රිකට් නායකයන් වාගේම ක්‍රිකට් ආයතනය නියෝජනය කරන සමස්ත නිලධාරීන් කණ්ඩායමම ඒ එංගලන්ත සංචාරයේ හිටියා. ඔවුන් වෙනුවෙන් වියදම් කරපු මුදලයි, ලැබුණු මුදලයි දිහා බැලුවාම අපි කල්පනා කර බලන්න ඕනෑ, ලෝඩ්ස් පිටියට ගිහිල්ලා එවැනි උත්සවයක් තියන්න ඒ දරපු වියදමත් එක්ක ලැබුණු ආදායම ප්‍රමාණවත් වෙනවාද කියලා. ලංකාවේ ක්‍රිකට්වලට ආදරය කරන පිරිස ඉන්නේ ලංකාව තුළයි. එංගලන්තයේ ඉන්නේ එංගලන්තයේ ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරන පිරිස. එම නිසා මගේ පෞද්ගලික විශ්වාසය වන්නේ, එවැනි යම් කිසි දෙයක් කළ යුතු නම් ලංකාවේ ඒ කටයුත්ත කිරීම සුදුසුයි කියලායි.

අද දවසේ ක්‍රිකට් ක්‍රීඩාව ගැන විතරක් නොවෙයි, මලල ක්‍රීඩාව ගැනත් කථා කළ යුතුයි. පසු ගිය කාලයේ පැවැති සාර්ක් ක්‍රීඩාවලදී සුගත් තිලකරත්නලා, සුසන්තිකා ජයසිංහලා මීටර් 200, මීටර් 400 ධාවන තරග අවුරුදු ගණනාවක් දිගින් දිගටම ජයග්‍රහණය කරලා

ආසියානු තරග මට්ටමට පැමිණියා. නමුත්, මෑත කාලයේ පැවැති සාර්ක් ක්‍රීඩා උළෙලේදී අපට දිනා ගන්න පුළුවන්කම තිබූ පදක්කම් ගිලිහී යනවා අපි දැක්කා.

ගරු ක්‍රීඩා ඇමතිතුමා කිව්වා,"තරගවලට ඉදිරිපත් වෙන තරගකරුවන්ට මුදල් ලබා දෙන ක්‍රමවේදයක් නැහැ" කියලා. නමුත්, අය වැය ලේඛනය ඉදිරිපත් කරන වෙලාවේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ මුදල් ඇමතිවරයා කරපු ප්‍රකාශය කෙරෙහි මම ගරු ක්‍රීඩා ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. අය වැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේදී එතුමා කියපු දේ තමයි,"ක්‍රීඩා තරගවලට උනන්දුවක් දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තරගවලට සහභාගිවීමේදී ඔවුන් සඳහා දරන සම්පූර්ණ වියදම රජය විසින් දැරීමට මා යෝජනා කරනවා" කියලා. ඊට පහළ පේළියේ තිබෙනවා,"ඉහත කරුණු ඉටු කරලීම සඳහා රුපියල් මිලියන 1,000ක මුදලක් ක්‍රීඩා අමාත්‍යාංශය වෙත වෙන් කරනවා" කියලා. මුදල් ඇමතිතුමා මෙවැනි ප්‍රකාශයක් කර තිබියදී ගරු ක්‍රීඩා ඇමතිතුමා කියා සිටියා,"ජාත්‍යන්තරයේ තරගවලට ඉදිරිපත්වීමට යන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ලබා දෙන්න අපට මුදල් නැහැ" කියලා. මේ සඳහා රුපියල් මිලියන 1,000ක මුදලක් රටේ ජාතික අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. දැන් අපි අගෝස්තු මාසය දක්වා ඇවිල්ලා තිබෙනවා. තව මාස දෙකකින් අලුත් අය වැය ලේඛනයක් ඉදිරිපත් වෙනවා. පසු ගිය වසරේ අය වැයෙන් වෙන් කරපු රුපියල් මිලියන 1,000ට මොකක්ද වුණේ කියන ප්‍රශ්නය අපට මතු වෙනවා. ඒ පිළිබඳවත් අප ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න බලාපොරොත්තු වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විනාඩියකින් මගේ කථාව අවසන් කරනවා. විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරන්න කැමැතියි. පසු ගිය දා කොටවිල ක්‍රීඩාංගණය විවෘත කළා වාගේම රට පුරාම ආරම්භ කරපු ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා.

ඒ සියලු ව්‍යාපෘති ඉතා කඩිනමින් අවසන් කරලා, විවෘත කරන්න. ක්‍රීඩාංගණ හදලා සමහර වෙලාවට විවෘත කරන්න බලාගෙන ඉන්නවා ඇමතිවරයාගේ දිනය ලැබෙන තෙක්; ජනාධිපතිවරයාගේ දිනය ලැබෙන තෙක්; නැත්නම් ප්‍රදේශයේ ඉන්න දේශපාලන නායකයාගේ දිනය ලැබෙන තෙක්. කොටවිල ක්‍රීඩාංගණය විවෘත කරන්න අවුරුදු එකහමාරක් එහෙම බලාගෙන හිටියා. ඒ නිසා දේශපාලන නායකත්වයේ කාලය මේ කාර්යය සඳහා ඉතා ඉක්මනින් යොදවලා ඒ ක්‍රීඩාංගණ විවෘත කරන්න කියන ඉල්ලීම මා මේ අවස්ථාවේදී කරනවා.

ගරු ඇමතිතුමනි, අද ඔබතුමා පාර්ලිමේන්තුවට සංශෝධනයක් ගෙනෙනවා, රහස් ඡන්ද එපා, අත් ඔසවා ඡන්දය ප්‍රකාශ කරන්න ඕනෑ කියා. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් මේ සංශෝධනය ගැන මතක් කළා. විශේෂයෙන්ම ඔබතුමා රහස් ඡන්දය තුළින් බලාපොරොත්තු වෙන්නේ අක්‍රමිකතා හා දූෂණ වළක්වා ගන්න නම්, මම හිතනවා ඔබතුමා ඒ නිවැරදි මාර්ගයේ යයි කියලා. අපි දැක්කා 2015 අවුරුද්දේ යහ පාලන රජයෙන් ආප්පවලට පාලන මිලක් දැම්මා. ආප්පවලට පාලන මිලක් දාලා කිව්වා, "හැම කඩයකම ආප්පයක් රුපියල් 10ට විකුණනවා" කියලා. ඒ නිසා මේ ගෙනෙන සංශෝධනත් ආප්පවලට ලැබුණු පාලන මිල සේ කර ගන්න එපා කියන ඉල්ලීම කරමින්, ගරු ඇමතිතුමාට ක්‍රීඩාව දියුණු කිරීමට අවශ්‍ය ශක්තිය අමාත්‍යාංශය හරහා ලැබෙවා කියන ප්‍රාර්ථනයත් කරමින් මම නිහඬ වනවා.

[අ.භා. 5.19]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩා පනතට අදාළ ඉතා වටිනා සංශෝධන කීපයක් ගෙන එන වෙලාවේ එම වටිනා විවාදයට කරුණු කීපයක් එකතු කරන්න ලැබීම ගැන මම අතිශය සතුටට පත් වනවා. පසු ගිය දවස්වල ඡායා කැබිනට් මණ්ඩලයක් පත් කර තිබෙනවා මම දැක්කා. ඒ ඡායා කැබිනට් මණ්ඩලයේ අපේ දකුණෙන් බිහි වුණු ඡායා ක්‍රීඩා ඇමතිවරයා මායාවක් නොවේවා කියලා මා ප්‍රාර්ථනා කරනවා. එතුමා කථා කළාට පස්සේ මේ කථාව කරන්න ලැබීම ගැන මම සතුටට පත් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදය පුරාවට ගරු මන්ත්‍රීවරු කළ කථා අපි ඇහුවා. විවිධ අදහස් මේ ගරු සභාවේ ඉදිරිපත් වුණා. හිටපු ක්‍රීඩා ඇමතිවරුත් කථා කළා. ඒ වාගේම ක්‍රීඩා ඇමතිවරයා වරින් වර යම් යම් පැහැදිලි කිරීම් කළා. මේ ගරු සභාවට ගමකින් ආපු මන්ත්‍රීවරයෙක් හැටියට මට එක දෙයක් කියන්න තිබෙනවා. ඒ තමයි, තවමත් අපේ ජාතික ක්‍රීඩාවලට, විශේෂයෙන්ම ජාත්‍යන්තරයට යා හැකි ක්‍රීඩාවලට ගම්වල දරුවන්ට ඉඩකඩක් සැබෑවටම විවෘත වෙලා තිබෙනවාද කියන එක පිළිබඳ අප ප්‍රශ්න කළ යුතුව තිබෙනවා. අපි ඒ ගැන සොයා බැලිය යුතු වනවා. ගම්වල ජාත්‍යන්තර ක්‍රීඩාංගණ හදලා, පළාතකට එක ක්‍රීඩාංගණයක් හදලා, එහෙම නැත්නම් දිස්ත්‍රික්කයකට එක ක්‍රීඩාංගණයක් හදලා කවුරු හෝ කියනවා නම්, "ගම්වල දරුවන්ට ජාත්‍යන්තර තලයට යන්න, ජාතික ක්‍රීඩාවලින් ඉස්සරහට යන්න අවස්ථාව දුන්නා" කියලා ඒක ඒ තරම්ම නිවැරදි අර්ථ දැක්වීමක් හැටියට මා පිළිගන්නේ නැහැ. මගේ මතය තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාසල් දරුවා ක්‍රීඩාවට යොමු කිරීම ආරම්භ විය යුත්තේ පෙර පාසලෙන් කියන එක. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉඳලා තමයි දරුවා ක්‍රීඩාවට යොමු කළ යුත්තේ කියලා මා විශ්වාස කරනවා. ඒ වාගේම පාසලේ පහළ ශ්‍රේණියේ ඉඳලා දරුවාගේ හැකියාව, දක්ෂතාව මැන බලා එම දරුවා ක්‍රීඩාවට යොමු කළ හැකි කෙනෙක්ද කියන එක පිළිබඳ කිසියම් අධ්‍යයනයකින් තොරතුරු එක්රැස් කරලා, පාසල තුළින් ඒ දරුවාට අවස්ථාවක් දෙන්න ඕනෑ දරුවාගේ දක්ෂතාව, හැකියාව අනුව ඉස්සරහාට යන්න. ඊට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රීඩා පිටි ඉදි විය යුතුයි. දරුවන්ට ඒ සඳහා අවස්ථාව ලබා දිය යුතුයි කියලා අප විශ්වාස කරනවා.

අද ගම්වල ඇතැම් පාසල්වල දරුවන් නගරයේ පාසල්වලට ඇතුළු කර ගන්න දෙමවුපියන් දරන උත්සාහයට එක හේතුවක් වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්බද පාසල්වල දරුවන්ට ක්‍රීඩා පහසුකම් නොමැතිකම; ක්‍රීඩාවෙන් ඉස්සරහාට යන්න ඉඩකඩ නොමැතිකම. ඒක බරපතළ හේතුවක් බවට පත් වෙලා තිබෙනවා. "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතියේ තිබෙනවා මම දැක්කා, ක්‍රීඩා සඳහා වැඩි අවධානයක් ලබා දීලා, ගම්බද පාසල්වල දරුවන්ට පුහුණුව ලබා දෙන්න පුළුවන් හොඳ ක්‍රීඩාංගණ සහ ක්‍රීඩාගාර පාසල්වල ඇති කරන යෝජනාවක්. ඒක ඉතා හොඳ අදහසක් හැටියට මම දකිනවා. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමත් ඉතාම

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

අවශ්‍ය කාරණයක් හැටියට මම දකිනවා. අපි කොයි තරම් පුරාජේරු කථා කළත්, විවිධ දේ කිව්වත්, හුඟක් ගම්බද පාසල්වල ඉන්න දක්ෂතාව තිබෙන දරුවන්ට ජාතික තලයට එන්න තිබෙන ඉඩකඩ තවම ඒ තරම් ප්‍රමාණවත් මට්ටමක නැහැ, කොහෙත්ම ප්‍රමාණවත් නැහැ කියන එකයි මාගේ විශ්වාසය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මලල ක්‍රීඩාවට අවශ්‍ය මීටර 400 ධාවන පථයක් තිබෙන එකම ක්‍රීඩා පිටියක්වත් ගාලු දිස්ත්‍රික්කයේ නැහැ. මේ රටේ ජාතික මට්ටමේ ක්‍රීඩකයන් රාශියක් නිර්මාණය වුණු, දක්ෂයන් විශාල ප්‍රමාණයක් බිහි වුණු ගාලු දිස්ත්‍රික්කයේ, ගාල්ල නගරයේ තිබුණු ක්‍රීඩා පිටිය ක්‍රිකට් ක්‍රීඩාංගණයක් බවට පත් වුණාට පස්සේ මලල ක්‍රීඩාවට සුදුසු ක්‍රීඩා පිටියක් මේ දක්වා සකස් කරලා නැහැ. හුඟක් ස්ථානවල ක්‍රීඩා පිටි ඉදි කිරීම සඳහා අවධානය යොමු කළත්, ඒ සඳහා මූලික පියවර ගත්තත්, මලල ක්‍රීඩාවට අවශ්‍ය ක්‍රීඩා පිටියක් ගාලු දිස්ත්‍රික්කයේ ඉදි කරන්න මේ වන තෙක් හැකියාවක් ලැබුණේ නැහැ. විශාල මුදලක් වියදම් කරලා බද්දේගම නගරයේ ඉදි කිරීමට යෝජිත වුණු, නමුත් තවමත් ක්‍රියාවට නොනැගුණු මලල ක්‍රීඩා පිටිය ඉදි කිරීම සඳහා අවධානය යොමු කරලා එහි වැඩ කටයුතු අවසන් කරලා දෙන්න කියලා ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට ක්‍රීඩා ඇමතිවරයාගෙන් ඉල්ලීමක් කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අඩුම තරමින් එක ක්‍රීඩා පිටියක්වත් දියුණු කරන්න ඕනෑ. ඒ හරහා පාසල්වල ඉන්න දක්ෂ දරුවන්ට, තරුණයන්ට ක්‍රීඩාවට යොමු වීමට අවස්ථාව උදා කර දීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා මම මේ වෙලාවේදී ක්‍රීඩා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මීට ටිකකට කලින් මේ සභාවේ කියැවුණා, අද මේ රටේ ක්‍රීඩාවේ යහ ගුණය පසෙකලා මුදල් මත ක්‍රීඩාවට යොමු වන අවස්ථා දක්නට තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාව තිබෙන්නේ මොකටද කියලා කුඩා දරුවෙක් එක අවස්ථාවක මගෙන් ඇහුවා. මම ඒ දරුවාට විස්තර කරලා දුන්නා, ක්‍රීඩාව කියන්නේ පුද්ගලයෙකුගේ ශරීර සෞඛ්‍යය, ඉවසීම, දරා ගැනීමේ ශක්තිය ආදී හැම එකක්ම ප්‍රගුණ කරලා හොඳ නිරෝගී පුද්ගලයෙක් නිර්මාණය කරන්න පුළුවන් දෙයක් කියලා. ඒ දරුවා අනෙක් පැත්තට මගෙන් ඇහුවා, එහෙම නම් ක්‍රීඩා සංගම්වල විවිධ තනතුරු ගන්න මේ තරම් ගහ ගන්නේ ඇයි, මේ තරම් ඇන කොටා ගන්නේ ඇයි, මේ තරම් රණ්ඩු වෙන්නේ ඇයි කියලා. අද අපට පෙනෙන්න තිබෙනවා, ක්‍රීඩාවේ යහ ගුණය පසෙකලා ක්‍රීඩා සංගම්වල තනතුරුවලට යන අයගේ බලකාමිත්වය සඳහා වන සටන. ඒක ක්‍රීඩාවේ පරමාර්ථවලටත් අනුකූල නොවන එකක්. ක්‍රීඩාවේ පරමාර්ථය පැත්තක තියලා තමයි මේ ක්‍රීඩා සංගම්වල තනතුරුවලට යන අය අද සටන් කරන්නේ. ඒ අය එහෙම සටන් කරන්නේ කුමක් අරබයාද කියන එක අපට ප්‍රශ්නයක්. කුමක් සඳහාද, ඒ අය මහා ලොකු සටනක නිරත වෙලා ඉන්නේ? සමහර වෙලාවට එකම තරාතිරමේ අය ගහ ගන්නවා, පාර්ලිමේන්තුවේ එකට ඉන්න අය ගහ ගන්නවා, එක පක්ෂයේ ඉන්න අය රණ්ඩු වෙනවා, එක පවුලේ අය රණ්ඩු වෙනවා. ඒ වාගේ එකට ඉන්න අය පවා මේ ක්‍රීඩා සංගම්වල තනතුරු වෙනුවෙන් මහා ලොකු සටනක් කරනවා. ඒ අය ඒ තනතුරු වෙනුවෙන් එහෙම සටන් කරලා ඒ තනතුරු දරන්නේ ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් නම්, ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. අපට ඒ ගැන සතුටු වෙන්න පුළුවන්. හැබැයි එහෙම රණ්ඩු වෙලා, සටන් කරලා තනතුරු අරගෙන ක්‍රීඩාව වෙනුවෙන් යමක් නොකර ඒ තනතුරු සහ ක්‍රීඩාව වෙනුවෙන් දෙන මුදල් භාවිත කරන්නේ වෙනත් අරමුණු වෙනුවෙන් නම්, ඒක මේ රටටත් ප්‍රශ්නයක්; රටේ අනාගතයටත් ප්‍රශ්නයක්; අපි සියලු දෙනාටත් ප්‍රශ්නයක්.

ක්‍රීඩා ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා, හුදෙක් බලකාමිත්වය සහ වෙනත් අරමුණු ඉලක්ක කර ගෙන එම තනතුරුවලට යන්න තිබෙන ඉඩකඩ, ඒ සඳහා සටන් කිරීමට තිබෙන ඉඩකඩ අහුරන විධියේ යම් යම් නියෝග ක්‍රීඩා පනතට එකතු කරලා තිබෙන බව අපට පෙනෙනවා. අපි ඒක අගය කරනවා. ඒ වාගේම වත්මන් රජයේ දැක්මත් සමඟ අපේ රටේ ක්‍රීඩාව වෙනුවෙන්, අපේ රටේ බාල පරපුර වෙනුවෙන්, අපේ රටේ අනාගතය වෙනුවෙන් යමක් කරන්න අලුත් ක්‍රීඩා ඇමතිවරයාට හැකියාව ලැබේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා. ලෝකය ඉදිරියේ අපේ රට ප්‍රචලිත කරන්න ක්‍රීඩාව මේ තාක් දුරට යම් කිසි සේවාවක් කළාද, මේ රටේ ක්‍රීඩකයන් යම් කිසි සේවාවක් කළාද, ඊට නොදෙවෙනි ගමනක් ඉදිරියට ගිහිල්ලා, මේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය දෙතුන් ගුණයකින් ඉහළ නංවලා, ක්‍රීඩාවෙන් සිදු වන මෙහෙය පුළුල් කරන්න අවකාශ ලැබේවා කියාත් මම මේ වෙලාවේ ප්‍රාර්ථනා කරනවා.

ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා කථා කළ වේලාවේ, එතුමා විවිධ කාරණා සඳහන් කළා. ඒ අතරේ අපේ එතුමා ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා ගැනත් සඳහන් කළා. එතුමා කිව්වා, නියෝජ්‍ය ඇමතිකම්, අධීක්ෂණ මන්ත්‍රීකම් නැතිකමේ දුකින් ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා පෙළෙනවා කියලා. මට හිතෙන හැටියට නම් ඒක එතුමාටම කියා ගත්තොත් හොඳයි. මොකද, පසු ගිය දවස්වල අපට පෙනුණා, නියෝජ්‍ය ඇමතිකම්, ඇමතිකම්, තනතුරු නැති දුකින් පෙළෙන්නේ කවුද කියලා. ඒක මුළු රටම දැක්කා. අද රටේ තිබෙන ප්‍රශ්නය අපි කාට හෝ තනතුරු ගන්න එකවත්, මේ ඇමති මුහුණ වෙනුවට වෙන මුහුණක් ගෙනෙන එකවත් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කවුරු හරි කෙනෙකුට තනතුරක් දීලා, යාන-වාහන දීලා ඔහු සන්තෝෂ කරලා ඉස්සරහට යන එක නොවෙයි, අද රටේ ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. අපි කවුරුත් එකතු වෙලා රට වෙනුවෙන් යමක් කරලා, ජාතික ප්‍රතිපත්ති ටික හදාගෙන අපේ රට ඉස්සරහට ගෙන යන්න කැප වෙන එක තමයි අද රටේ අවශ්‍යතාව වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්] ඒ නිසා ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාටවත්, ආණ්ඩු පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙකුටවත් කිසිම දුකක් නැහැ කියලා මා කියන්න කැමැතියි. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට දුකක් නොවෙයි පොඩි හිරිකිතයක් නම් තිබෙනවා, සමහර උදව්ය රටේ අනාගතය පැත්තක තියලා, රටේ අනාගත ගමන ගැන හිතන එක පැත්තක තියලා තනතුරු පසුපස දුවන එක ගැන. ඒ ගැන නම් අපට පොඩි හිරිකිතයක් තිබෙනවා කියන එක මේ වේලාවේ කියන්න කැමැතියි. [බාධා කිරීම්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට වඩා දිගට කථා කරන්න මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය කියන මේ සියල්ල ඒකාබද්ධ කරගෙන

කිසියම් විධිමත් වැඩ පිළිවෙළක් ඉස්සරහට ගෙන යමින් සැලසුම් සහගතව ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් කටයුතු කරන්න අපේ ක්‍රීඩා ඇමතිවරයාට ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 5.30]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු ක්‍රීඩා අමාත්‍ය, මා මිත්‍ර ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා මේ ගරු සභාවේ සිටින වේලාවේ, එතුමා කියපු කාරණයකින්ම මගේ කථාව පටන් ගන්න කැමැතියි. අද ක්‍රීඩා පනත යටතේ ගෙනෙන නියෝග ගැන කථා කරද්දී, දෙපාර්ශ්වයෙන්ම -ආණ්ඩුවෙන් මෙන්ම විපක්ෂයෙන්- කළ පොදු කථා අනුව, අද රටේ ක්‍රීඩාව අරාජික වෙලා තිබෙනවා කියලා සඳහන් වුණා. එසේ අරාජික වුණු ක්‍රීඩාවකට සම්බන්ධ කිසිම සංගමයක සභාපතිවරයෙකුට තමන්ගේ දැක්ම අනුව අවුරුදු දෙකක කාලයක් ඇතුළත නැවත ඒ ක්‍රීඩාව නංවන්න බැහැ කියලා එතුමා කියපු එක ගැන මම එතුමාට ස්තූතිවන්ත වෙනවා. මොකද, ඊටත් වඩා ජරාජීර්ණ වුණු රටක් අපට අවුරුද්දකින් හදන්න බැහැ කියන එකත් එතුමන්ලා තේරුම් ගෙන තිබෙනවාය කියන එක අපට ඒකෙන් පෙනෙනවා. එතුමාම ඒක පිළිගන්නවා. ඒ නිසා අපි එතුමාගෙන් ඉල්ලා සිටිනවා, අපට නියමිත අවුරුදු පහ අපට දෙන්න කියලා. අවුරුදු හතරහමාරක් යන තෙක්, 2020 පෙබරවාරි 28 වැනි දා වෙන තෙක් ඡන්දයක් නොපැවැත්වෙන නිසා.

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා පාද යාත්‍රා ගිහිල්ලා, එක එක ඒවා කරලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලය අල්ලන්න හදන එක ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. [බාධා කිරීම්] ඒ එක්කම ඒකාබද්ධ කණ්ඩායම විසින් පත් කර ගෙන ඉන්නා ඡායා කැබිනෙට්ටුවේ ක්‍රීඩා අමාත්‍ය, මා මිත්‍ර ගරු කංචන විජේසේකර මැතිතුමා කිව්වා, පසු ගිය කාලයේ ගමේ ක්‍රීඩාව දියුණු කරන්න ක්‍රීඩාංගණ හැදුවා, එසේ හදා ඉවර කරන්න බැරි වුණු ක්‍රීඩාංගණවල ඵලක විතරක් වෙනස් කරලා අද විවෘත කරනවා කියා. ඉතින් මොකෝ? මේවා කාගේවත් පෞද්ගලික බූදල්වලින් හදපු ඒවා නොවෙයි. මේවා රටේ මිනිසුන්ගේ බදු මුදල්වලින් හදපු ඒවා. එහෙම නැත්නම් රටේ මිනිසුන් ගෙවන්න එකඟ කර ගත් ණයවලින් ගත් සල්ලිවලින් තමයි මේ ක්‍රීඩාංගණ හදා තිබෙන්නේ. ඒ ක්‍රීඩාංගණ කාගේවත් පෞද්ගලික බූදලයකින් හදපු ඒවා නොවන නිසා ඒවා විවෘත කරන්න රජයකට අයිතිය තිබෙනවා. ඒ නිසා අපි ඒ අයිතිය නිසියාකාරයෙන් පාවිච්චි කරලා ඒ කටයුතු ටික හරියට කරනවාය කියන එක කියන්න ඕනෑ. මම ඊට වඩා ඒ කරුණු දෙක ගැන කථා කරන්න යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කාරණා තුනක් ගැන මගේ කථාවෙන් අවධානය යොමු කරන්න කැමැතියි. අපේ රටේ ක්‍රීඩාව දියුණු කරන්න අපි අනිවාර්යයෙන්ම කටයුතු කරන්න ඕනෑ. ක්‍රීඩාව තුළින් අපේ ඉලක්කගත ජයග්‍රහණ කරා ළඟා වන්න බැරි වෙලා තිබෙනවාය කියන කාරණය අපට තේරෙනවා. අපි හැමෝම එය පිළිගන්නවා. ඒ නිසා අපට මේ සඳහා ජාතික වැඩ පිළිවෙළක් අවශ්‍යයි. කොළඹ නගරයේ තිබෙන ජනප්‍රිය පාසල්වලට යන, සල්ලි තිබෙන දෙමවුපියන්ගේ දරුවන්ට පමණක් ක්‍රීඩාවේ තැන ලැබෙනවා වෙනුවට, ඈත ගම්දනව්වල ඉන්නා දක්ෂතාව තිබෙන, හැකියාව තිබෙන එහෙත් අවස්ථාව නොමැති තරුණ-තරුණියන්ටත් ඒ අවස්ථාව ලබා දීම සඳහා කටයුතු කළ යුතුයි. ඒක මලල ක්‍රීඩාව වෙන්න පුළුවන්, ක්‍රිකට් ක්‍රීඩාව වෙන්න පුළුවන්, බාස්කට් බෝල් වෙන්න පුළුවන්, බැඩ්මින්ටන් වෙන්න පුළුවන්. එම ක්‍රීඩා සඳහා ජාතික වැඩ පිළිවෙළක් හදලා දක්ෂයන් සොයා යන talent search එකක අවශ්‍යතාව මේ මොහොතේ අපේ රට හමුවේ තදබල ලෙස තිබෙනවා කියලා මා හිතනවා. මට මතකයි, එදා රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා සාෆ් ක්‍රීඩා උළෙල ඉලක්ක කරගෙන රටේ ක්‍රීඩාව දියුණු කරන්න දැක්මක්, දර්ශනයක් ඇතුව ක්‍රියා කළ ආකාරය. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වීම හරහා නොයෙක් දක්ෂයන් දුෂ්කර පළාත්වලින් ඇවිල්ලා සාෆ් රන් පදක්කම් දිනා ගන්නා තත්ත්වයකට ආවා. එතුමාගේ අභාවයෙන් පසුව එස්.බී. දිසානායක හිටපු ක්‍රීඩා ඇමතිතුමා මේ පිළිබඳව යම් උත්සාහයක් ගත්තා කියලා මම හිතනවා. නමුත් පසු කාලීනව අපේ රටේ ක්‍රීඩාව දේශපාලනීකරණය වීම නිසා ජයග්‍රහණ ලබා ගන්න බැරි ජරා ජීර්ණ වෙච්ච තැනකට පත්වෙලා තිබෙනවා. මෙය ව්‍යාපාරික මාෆියාවට යටත් වෙලා තිබෙනවා. ප්‍රධාන ක්‍රීඩා සංගම්වල මුල් පුටු ඩැහැගැනීම නිසා මේ ක්‍රීඩාව පරිහානියට ළඟා වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම දේශපාලන පක්ෂ නියෝජනය කරන මහජන නියෝජිතයන්ට ක්‍රීඩා පාලක සංගම්වල ප්‍රධාන තනතුරුවලට පත් වන්නට බැරිවෙන ආකාරයේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් මේ වන විටත් මා ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. මොකද හේතුව, ක්‍රීඩා ඇමතිවරයා සිටිනකොට තවත් ඇමතිවරයකු හෝ මන්ත්‍රීවරයකු ක්‍රීඩා ඇමතිවරයා යටතේ තිබෙන ක්‍රීඩා පාලක මණ්ඩලයක මුල් පුටුවකට ආවාම, ක්‍රීඩා ඇමතිවරයාට පාලනයක් නැති වෙනවා. අතීතයේදී ටිරෝන් ප්‍රනාන්දු, ගාමිණී දිසානායක වැනි රටට ආදරය කරපු දක්ෂ දේශපාලනඥයන් රටේ ක්‍රීඩාව දියුණු කිරීමේ අභිලාෂයෙන් එම තනතුරුවලට ඇවිල්ලා ඒ ක්‍රීඩාව දියුණු කරපු ආකාරය අපි දැක තිබෙනවා. අද අපට ජාත්‍යන්තර ගෞරවයක් ලබා දී තිබෙන අපේ ක්‍රිකට් ක්‍රීඩාව මේ තත්ත්වයට පත් කර ගැනීමේ ගෞරවය හිමිවිය යුත්තේ දිවංගත ගාමිණී දිසානායක මැතිතුමාටයි. නමුත්, අවාසනාවකට ඊට පසු කාලයක දේශපාලනඥයන්ගේ ක්‍රියා කලාපය නිසා, දේශපාලනඥයන්ගේ වුවමනාව පිළිබඳව තිබුණු ගැටලුවක් නිසා අද අපේ රටේ ක්‍රීඩාව පරිහානියට ලක්වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම අපි ක්‍රීඩා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ව්‍යාපාරික මාෆියාවටවත්, දේශපාලන මාෆියාවටවත් යට වෙන්නේ නැතිව අපේ රටේ ක්‍රීඩාව දියුණු කරන්න කියලා. අපේ රටට ජයග්‍රහණ ගෙන එන්න ඕනෑ නම්, ගමේ ක්‍රීඩාව දියුණු කරලා; රටේ ක්‍රීඩාව දියුණු කරලා, මේ මාෆියාවට යට වෙන්නේ නැතිව තීන්දු ගන්න.

අවුරුදු හතරක කාලයකට පස්සේ නැවත තරග කරන්න බැහැ කියලා තාවකාලික පැලැස්තර විසඳුමක් ගෙනැල්ලා වැඩක් නැහැ කියන එකයි මගේ අදහස. ඒ නිසා අවුරුදු හතරක කාලයක් - terms දෙකක් - දෙනවා නම්, එතැනින් ඉවර කරලා දමන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විධායක ජනාධිපතිවරයෙක් දෙවතාවක් පත් වුණාට පස්සේ එක term එකක් අගමැති වෙලා, එහෙම නැත්නම් මහින්ද රාජපක්ෂ මහත්මයා වාගේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආයෙත් විධායක ජනාධිපති වෙන්න බැහැ. ඒ නිසා ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපති ධුරයේ දෙවතාවක් හිටියා නම්, නැත්නම් වොලිබෝල් සංගමයේ, මලල ක්‍රීඩා සංගමයේ සභාපති ධුරයේ දෙවතාවක් හිටියා නම්, ඊට පස්සේ ආයෙත් ලේකම් තනතුරකට හරි, විධායක සභාවට හරි ගිහිල්ලා ආයෙත් සභාපති වෙන්න ඉඩ දෙන්න එපා කියලා අපි ගරු ක්‍රීඩා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද හේතුව, සභාපති ධුරයේ දෙවතාවක් ඉඳලා විධායක සභාවට ගියත්, ඒ ව්‍යාපාරික මාෆියාව මඟින් සභාපතිකමේ හොල්මන් කරනවා. ඊට පස්සේ ආයෙත් ඊළඟ පාර සභාපති ධුරයට එනවා. ඒ නිසා මේ ක්‍රමය නවත්වන්න ඕනෑ කියන එකයි අපේ අදහස.

ක්‍රිකට් ක්‍රීඩාව, වොලිබෝල් ක්‍රීඩාව, මලල ක්‍රීඩාව වාගේම අපට මේ සියලු ක්‍රීඩාවලට දැක්මක් සහිතව talent search එකක ජාතික ප්‍රතිපත්තියක් හදලා, ව්‍යාපාරික මාෆියාව විසින් පාලනය කරනු ලබන ක්‍රීඩාවක් වෙනුවට සැබෑ දක්ෂයන්ට නිසි තැන

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ලැබෙන ක්‍රීඩාවක් ගෙන එන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ක්‍රීඩා අමාත්‍යාංශයට සහ ක්‍රීඩා ඇමතිතුමාට ඒකේ මූලික පියවර ගන්න පුළුවන් කියලා මම හිතනවා. මොකද, ලබන අවුරුද්දේ ප්‍රාදේශීය ක්‍රීඩා උළෙලවල් පැවැත්වෙනවා. අපි දන්නවා, සාමාන්‍යයෙන් මේ ප්‍රාදේශීය ක්‍රීඩා උළෙලකට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළින් 150ක්, 200ක් වත් එන්නේ නැහැ කියලා. එහෙම උත්තේජනයක් තිබෙනවා නම්, එහෙම පිබිදීමක් තිබෙනවා නම්, කෝටි ප්‍රකෝටි ගණනින් මුදල් වියදම් කරලා ක්‍රීඩාංගණ හදපු පමණින් ඒ උත්තේජනය එනවා නම්, ප්‍රාදේශීය ක්‍රීඩා උළෙල මීට වඩා සාර්ථක වෙන්න ඕනෑ. ඒ නිසා අපි ගරු ක්‍රීඩා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ලියා පදිංචි ක්‍රීඩා සංගම් ගණන වැඩි කරන්න; රාජ්‍ය ආයතනවල ක්‍රීඩා සංගම් ඇති කරන්න; පෞද්ගලික ආයතනවල ක්‍රීඩා සංගම් ඇති කරන්න; ගම ඇතුළේ ක්‍රීඩාවට ප්‍රබෝධයක් ඇති කරන්න කියලා. දක්ෂයාට නිසි තැන ලැබෙනවා කියන විශ්වාසය ඇති කරලා, ලබන අවුරුද්දේ මාර්තු මාසයේදී පමණ පැවැත්වීමට නියමිතව තිබෙන ප්‍රාදේශීය ක්‍රීඩා උළෙල හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඉතා සාර්ථක ක්‍රීඩා උළෙලක් බවට පත් කරගෙන, එය -talent search එකක්- දක්ෂයන් සොයා යන ඉසව්වක් බවට පත් කරලා ඒ විශ්වාසය තහවුරු කළොත්, ගම ඇතුළෙන් ක්‍රීඩාව පිළිබඳව පිබිදීමක් ඇති කරන්න පුළුවන්. ඒ පිබිදීමට සමගාමීව තමයි මේ ක්‍රීඩාංගණ හදන්නත්, ඒවාට අවශ්‍ය පහසුකම් ලබාදීමත් වෙන්න ඕනෑ. මෙන්න මේ දෙක එකට සමගාමීව ගියොත් තමයි අපට රටේ ක්‍රීඩාව දියුණු කරලා ජාත්‍යන්තර ජයග්‍රහණ අත්කර ගැනීමේ වැඩ පිළිවෙළකට යන්න පුළුවන් වෙන්නේ. අන්න ඒ නිසා අපි ක්‍රීඩා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ක්‍රීඩාවට අලුත් පිබිදීමක් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න කියලා.

අපේ ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා ඇහුවා, ක්‍රීඩාවට රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා, මොකක්ද කරලා තිබෙන්නේ කියලා. අපි දන්නවා, අපේ වර්තමාන ක්‍රීඩා ඇමති ගරු දයාසිරි ජයසේකර මැතිතුමා හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම ක්‍රීඩාංගණයක් ලබාදෙන වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙන බව. ඒක මම පෞද්ගලිකව දන්නවා. මොකද හේතුව, මා නියෝජනය කරන කොලොන්නාව ආසනයට අවුරුදු 10ක්, 15ක් තිස්සේ ක්‍රීඩාංගණයක් නැහැ. ක්‍රීඩාවට එක රුපියලක්වත් වෙන් කරලා නැහැ. ගරු නවීන් දිසානායක ඇමතිතුමා ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් කටයුතු කරපු කාලයේ - පසු ගිය අවුරුද්දේ - ක්‍රීඩා සමිතිවලට ලබාදීම සඳහා මට ක්‍රීඩා භාණ්ඩ ප්‍රමාණයක් ලබා දුන්නා. එච්චරමයි හම්බවෙලා තිබෙන්නේ. නමුත් මේ අවුරුද්දේ රුපියල් මිලියන 4.2ක් වර්තමාන ක්‍රීඩා ඇමතිතුමා අපට ලබා දීලා තිබෙනවා. ලබන අවුරුද්දේ ඉතිරි මුදල් ලබාදෙනවා කියලා අපිට කියලා තිබෙනවා. - [බාධා කිරීමක්]- විශේෂයෙන්ම මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කෑ ගහන නිසා මම එතුමාගේ දැනගැනීම සඳහා මේ කාරණය කියන්නම්. මොකද, කොලොන්නාවෙන් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයෙක් බිහි කරන්න අපට වුවමනාවක් තිබෙනවා. ඒ සඳහා අපේ ක්‍රීඩා ඇමතිතුමාගෙන් අපට සහයෝගය ලැබෙනවා. ක්‍රීඩාංගණයත් හැදෙනවා; talent search එකත් කරනවා. ප්‍රාදේශීය ක්‍රීඩා උළෙලත් ඉතා හොඳ ආකාරයෙන් පවත්වලා, මේ වැඩ පිළිවෙළ තව අවුරුදු තුනක් ඇතුළත ප්‍රතිඵල ලැබෙන වැඩ පිළිවෙළක් බවට පත් කරන්න අවශ්‍ය සහයෝගය අපි ලබා දෙනවාය කියලා මා පැහැදිලිවම කියන්න කැමැතියි. ක්‍රීඩා පාලක සංගම්වල මුල් පුටුවල මොන ව්‍යාපාරික මාෆියාව හිටියත්, මොන දේශපාලනඥයා හිටියත්, ක්‍රීඩාව දියුණු කිරීමේ වගකීම හැම ප්‍රාදේශීය දේශපාලනඥයාටම පැවරී තිබෙනවා. ඒ, ප්‍රාදේශීය දේශපාලනඥයාගේ වගකීම විය යුත්තේ රටේ පාලක මණ්ඩලය එක්ක පමණක් නොවෙයි, රටේ ක්‍රීඩා ඇමතිතුමා එක්කත් එකතුවෙලා තමන්ගේ ප්‍රදේශයෙන් දක්ෂ ක්‍රීඩකයන් බිහි කිරීමයි. තමන්ගේ ප්‍රදේශයට පාරවල් හදන්න තිබෙන වුවමනාව වාගේම, රස්සාවල් අරගෙන දෙන්න තිබෙන වුවමනාව වාගේම, ගෙවල් හදා දෙන්න තිබෙන වුවමනාව වාගේම, සමෘද්ධිය ලබා දෙන්න තිබෙන වුවමනාව වාගේම, තමන්ගේ ප්‍රදේශයෙන් දක්ෂ ක්‍රීඩකයන් බිහි කරන්නත් ප්‍රාදේශීය දේශපාලනඥයන්ට වුවමනාවක් හා කැක්කුමක් තිබිය යුතුයි. ඒ සඳහා වැඩ පිළිවෙළක් හදා ගත්තොත්අපට මේ රටේ ක්‍රීඩාව දියුණු කරන එක මහා විශාල වැඩක් නොවෙයි කියලා මම හිතනවා. ඉදිරි අවුරුදු තුනක කාලය තුළදී ක්‍රීඩා ඇමතිතුමා එක්ක එකතුවෙලා අපි ඒ ආදර්ශය ලබා දෙනවා. ක්‍රීඩා ඇමතිතුමා ඒ සඳහා අපට සහයෝගය ලබා දෙනවාය කියන එක ගැන අපට විශ්වාසයක් තිබෙනවා. ඒ වාගේම ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයන් බිහි කරන්න අපිට පුළුවන් වෙයි කියන විශ්වාසයත් අප තුළ තිබෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණය ගැනත් කියන්න කැමැතියි. මම මීට පෙර පෞද්ගලික මාධ්‍ය ආයතනයක වැඩ කරද්දි සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියක් සංවිධානය කරලා, talent search කරලා, ජාතික මට්ටමේ ක්‍රිකට් ක්‍රීඩකයකු ගෙනාවා වාගේම අනාගතයේදී අපේ වර්තමාන ක්‍රීඩා ඇමතිතුමාගේ සහයෝගයෙන් සහ එතුමාගේ උදව් උපකාර ඇතිව කොළොන්නාවෙනුත් ජාත්‍යන්තර මට්ටමේ හා ජාතික මට්ටමේ ක්‍රීඩකයින් බිහි කරන්න අනිවාර්යයෙන්ම වැඩ කටයුතු කරනවාය කියලා ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 5.40]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ සාදන ලද නියෝගවල ඇතුළත් වගන්ති සම්බන්ධයෙන් ගරු ක්‍රීඩා අමාත්‍යතුමා ගෙන එන ලද මේ සංශෝධන පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී මටත් කෙටියෙන් හෝ මේ ගරු සභාව ඇමතීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ප්‍රථමයෙන්ම මා ස්තුතිවන්ත වනවා. මේ රටේ ක්‍රීඩාව පිළිබඳව කථා කරනකොට මම කියන්න ඕනෑ, ඉතා හොඳින් ක්‍රීඩාවට අවතීර්ණ වුණු යම් කාල පරිච්ඡේදයක් අපේ රටේ තිබුණු බව. ඒ වාගේම ක්‍රීඩාව ඉතා පහත් මට්ටමට කඩා වැටුණු අවස්ථාවනුත් මේ රටේ ඇතිවී තිබෙනවා. ගරු දයාසිරි ජයසේකර අමාත්‍යතුමා මේ වැටුණු ක්‍රීඩාව ඉහළට ඔසවා තැබීම සඳහා ඉතා විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරීමට මේ ගන්නා වූ උත්සාහය පිළිබඳව අපි ඉතා සතුටට පත් වනවා. එතුමාට ඒ සඳහා සහයෝගය ලබා දෙන බවට අපි එකඟ වනවා.

ඇත්තෙන්ම අද මේ ගරු සභාවේදී හිටපු ක්‍රීඩා ඇමතිවරුන්, ඒ වාගේම මන්ත්‍රීවරුන් කීප දෙනෙකු කථා කළා. එතුමන්ලා නොයෙකුත් අදහස් මේ ගරු සභාවේදී එළි දැක්වුවා. නමුත් සමහර වගකිව යුත්තන් මේ ගරු සභාව අමතපු ආකාරය දිහා බැලුවාම මටම ලජ්ජා හිතෙනවා. අපි ඇස් දෙකෙන් දැක තිබෙන දේවල් ගැන එතුමන්ලා මෙතැනට ඇවිල්ලා මහා මවා පෑමක් කරලා පෙන්නුවා. එතුමන්ලා පට්ටපල් බොරු, බේගල් මෙතැනට ඇවිල්ලා ඇද බෑවා. මේ කාරණා නිසායි ක්‍රීඩාව මේ තැනට පත් වෙලා තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ නැහැ. නාවලපිටිය ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මම ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, නාවලපිටිය ආසනයට ක්‍රීඩා පිට්ටනියක් ලබා දෙන්න කියලා. නාවලපිටිය ආසනයේ දරුවන්ට සෙල්ලම් කරන්න අද ක්‍රීඩා පිට්ටනියක් නැහැ. ක්‍රීඩා පිට්ටනියේ ගෙවල් ගහලා තිබෙනවා. මධ්‍ය මහා විද්‍යාලයේ පිට්ටනිය ලොකු වැඩියි කියලා පර්චස් 40කට හේත්තු කරලා, මීටර් 300ක ගහපු ක්‍රීඩාංගණයත් අද වනකොට නැති කර දමා තිබෙනවා. පසු ගිය කාලයේ හිටපු ක්‍රීඩා ඇමතිවරයා මෙතැනට ඇවිල්ලා පම්පෝරි දොඩවනවා; මහ ලොකුවට විනිවිදභාවය ගැන කථා කරනවා.

මෙන්න තිබෙනවා, විනිවිදභාවය. වීරසිංහ අලුත්ගමගේ පාවිච්චි කරන GE - 2034 වාහනය කාගේද? මේ වාහනය මොන අමාත්‍යාංශය යටතේ තිබුණත්, 2013 පළාත් සභා මැතිවරණය අවස්ථාවේදී මේ වාහනය ධාවනය කළේ වීරසිංහ අලුත්ගමගේගේ බෝඩ් එක ගහලායි. විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරපු හිටපු ක්‍රීඩා ඇමතිතුමාගේ වැඩද මේවා? මේ කියන ඒවා අසත්‍යයද? මේවා කියනකොට අමාරුද? මේකට උත්තරයක් දෙන්න.

මේ කියන්නේ අසත්‍යයද? රෙදි ඇඳ ගෙන, ටයි කෝට් දමා ගෙන සුදනා වෙන්න මෙතැන කථා කරනවා. වීරසිංහ අලුත්ගමගේ කියන්නේ හිටපු ක්‍රීඩා ඇමතිවරයාගේ එක කුසේ උපන් අක්කාගේ මහත්තයා. දෙදෙනාම අලුත්ගමගේ වෙන්නේ කොහොමද? මම තාත්තට අම්මට හොඳට ජාතක වෙච්ච අලුත්ගමගේ කෙනෙක්. කොහොමද, නෝනයි මහත්තයයි දෙන්නම අලුත්ගමගේ වෙන්නේ? ඒකේ සාධාරණය තිබෙන්නේ කොහේද? නිවරදිභාවය ගැන කථා කරන්නේ කවුද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඩිෆෙන්ඩරය නතර කරලා තිබුණේ කහ ඉර උඩ. නාවලපිටිය පොලීසිය ඉස්සරහ. පොලීසියේ දෙන්නෙක් ඉන්නවා. ඩිෆෙන්ඩරය දොරවල් ඇර ගෙන නවත්වලා තිබෙනවා. මෙන්න ක්‍රීඩා අමාත්‍යවරු මේ රටේ නීතිය ක්‍රියාත්මක කළ හැටි. ප්‍රාදේශීය සභාවේ වාහන පස්සෙන් යනවා. පෙළපාළි යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම වාහනය නවතා තිබූ ආකාරය පිළිබඳ ඡායාරූපය ඇතුළත් ලේඛනයක් මම **සභාගත*** කරනවා.

මම මේ පිළිබඳව වෙනම පරීක්ෂණයක් ඉල්ලා සිටිනවා. මේ රට කාපු, ක්‍රිඩාව විනාශ කරපු, මධ්‍ය මහා විද්‍යාලවල ළමයින්ට සෙල්ලම් කරන්න තිබුණු පිට්ටනිවල ගුරු ගම්මාන ගහපු ක්‍රීඩා ඇමතිවරු තමයි මේ රටේ විනිවිදභාවය ගැන කථා කරන්නේ, දැන් ඉන්න ක්‍රීඩා ඇමතිවරයා නිවැරදි කරන්න කථා කරන්නේ. මෙතැන රෙදි ඇඳ ගෙන ද මේවා කථා කරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අක්කර 11ක් තිබුණු නාවලපිටිය මධ්‍ය මහා විද්‍යාලය අද අක්කර 3/4ට බැහැලා. ළමයින්ට සෙල්ලම් කරන්න පර්චස් 40ක් ඉතිරි කරලා. "ළඟම පාසල - හොඳම පාසල" හැටියට නම් කළත්, අද විද්‍යාලයට විද්‍යාගාරයක් හදන්න තැනක් නැහැ; තට්ටු දෙකේ ගොඩනැගිල්ලක් හදන්න තැනක් නැහැ. එතැන ගුරු ගම්මානයක් හදලා. ගුරු ගම්මානයේ තිබෙන පළමුවැනි ගේ අයිති දැන් ගම්පොළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාටයි. එයාගේ නෝනාට ලක්ෂ 17ට විකුණලා තිබෙනවා. ඉඩමක් නැතිව ගුරු ගම්මානයේ ඉඩමක් දුන්නාමයි කියමු කෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අධ්‍යක්ෂතුමා රුපියල් ලක්ෂ 17කට විකුණලා එතුමාගේ තිබුණු ගේ ළඟ ගෙයක් හදා ගත්තා. මේ පිළිබඳව සම්පූර්ණ පරීක්ෂණයක් කරන්න කියලා ඒ සම්පූර්ණ ලිපිගොනු ටික මම අගමැතිතුමාට දුන්නා. අධ්‍යාපන කාර්යාලයේ එක ලිපිගොනුවක්වත් නැහැ. මොකද, අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට ඉඩම හම්බ වෙන කොට ලිපිගොනු තියේවිද? එල්ආර්සී එකේ එකම ලිපිගොනුවක්වත් නැහැ. මම ඒවා ගිහිල්ලා දුන්නා අගමැතිතුමාට. පරීක්ෂණයක් කරන්න කියලා අගමැතිතුමා නියෝග කළා. පරීක්ෂණය කරන්න ගියාම "හොරාගේ අම්මගෙන් ජේන අහනවා වගේ" අර අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් තමයි විස්තර අහන්නේ. එතුමා කියනවා, මේ ඉඩම විද්‍යාලයට අවශ්‍ය නැහැයි කියලා. ඒ විද්‍යාලයේ ළමයි 1,200ක් හිටියා. අද ළමයි 550ට බැහැලා. මේ ඉස්කෝලේ වහලා. ඒ ඉඩම පර්චස් එකක් රුපියල් ලක්ෂ 3ක් වටිනවා. ගරු රවුෆ් හකීම් මැතිතුමා බලා ගෙන ඉන්නවා. ඔබතුමා මේ ගැන හොඳින් දන්නවා. මේවා ගැන කථා කරන කොට ඔබතුමා හිනා වෙනවා. ඔබතුමා මේ ගැන හොඳටම දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පර්චස් එකක් රුපියල් ලක්ෂ 3ක් වටිනවා. නගරය මැද තිබෙන මධ්‍ය මහා විද්‍යාලය වහලා. තමන්ගේ දේශපාලන හෙන්චයියලාට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තිය සමිතියට, ගුරු ගම්මාන හදන්න නාවලපිටියේ ඕනෑ තරම් ඉඩම් තිබෙනවා. මේ ඉඩමට අල්ලපු ඉඩම අක්කර 100ක් තිබෙනවා.

එදා 2002 ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා පවරා ගත් ඉඩමක් තිබෙනවා. ඒකත් කට්ටි කරලා තමන්ගේ හිතවතුන්ට බෙදලා තිබෙනවා. මමත් දේශපාලනය කළ පවුලක කෙනෙක්. අපේ තාත්තාගේ තාත්තා තමයි පළමුවරට අලියා ලකුණින් නාවලපිටිය ආසනයට තරග කර තිබෙන්නේ. මටත් දේශපාලනය කිරීමට පරම්පරාවෙන් අයිතියක් තිබෙනවා. ඒ බුදලයේ අයිතියක් මට තිබෙනවා. හොරකම් කරලා මෙතැන පම්පෝරි ගහනවා. හැමදාම FCID අර CID මේ CID. මේවා ඕනෑ නැහැ. ක්‍රීඩා අමාත්‍යාංශයට අයිති වාහනය අර ගෙන ගිහිල්ලා කර තිබෙන අවභාවිතය ගැන බලන්න. මේකටද ක්‍රීඩා අමාත්‍යවරු පත් කර තිබෙන්නේ? රාජපක්ෂ ආණ්ඩුව යටතේ සිදු වුණු මේ දේවල් එපා වෙලා තමයි අපි ඒ පක්ෂය අතහැරලා මේ පැත්තට ආවේ.

ගරු අර්ජුන රණතුංග ඇමතිතුමනි, මම තමුන්නාන්සේගේ කථාව හොඳින් අහගෙන හිටියා. තමුන්නාන්සේ බොහොම වේදනාවෙන් කථා කළේ. තමුන්නාන්සේට අද ඇමති තනතුරක් ලැබී තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. තමුන්නාන්සේ ක්‍රීඩාව තුළින් මේ රටට ජාත්‍යන්තර කීර්තියක් ගෙනාපු කෙනෙක්. දේශපාලනය කෙසේ වෙතත් තමුන්නාන්සේ ක්‍රීඩාව තුළින් රටට ලබා දුන් ඒ ගෞරවය සම්බන්ධයෙන් අපි හිස නමා ආචාර කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරු ඇවිල්ලා පාළු අම්බලමේ වළං බින්දා. කරලා තිබෙන සට කපට වැඩ, කරලා තිබෙන හොරකම් ඔක්කොම අපි දන්නවා. මාව FCID එකට අර ගෙන ගියොත් මම සාක්ෂි දෙනවා. නාවලපිටියේ ඉඩම් නැහැ. රේල්වේ ඉඩම් බලෙන් අල්ලා ගෙන තමන්ගේ පෞද්ගලික බුදලය වාගේ තිබෙන්නේ. කොහෙද අවසර තිබෙන්නේ?

අනුන්ට ඇඟිල්ල දික් කරනවා. කොහේද අවසර තිබෙන්නේ? අපේ පවුලේ මිනිස්සු දේශපාලනය කරලා තිබෙනවා. නමුත් මේ වාගේ දහ ජරා දේශපාලනයක් කරලා නැහැ. මා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයකු වශයෙන් සිටියා; පළාත් සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් දීර්ඝ කාලයක් සිටියා; දැන් පාර්ලිමේන්තුවට තේරී පත්වෙලා ඇවිල්ලා ඉන්නවා. මා රහසින් හෝ වැරැද්දක් කළොත් FCID එකෙන් ගෙන යන කල් ඉන්නේ නැහැ. මා ගෙදර ගිහින් තමයි ඒවාට මුහුණ දෙන්නේ. මොකද, අපේ මිනිසුන්ගේ ගෞරවය අපි රකින්න ඕනෑ. අපේ ඥාතීන්ගේ ගෞරවය අපි රකින්න ඕනෑ. වග කීමක් ඇතිව, ගෞරවයක් ඇතිව දේශපාලනය

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

කරලා මිය ගිය ඒ මිනිසුන්ගේ ගෞරවය රකින්න අපි බැඳිලා ඉන්නවා. එතුමා මෙතැනට ඇවිල්ලා අසත්‍ය ප්‍රකාශ කරනවා. මා කවදාවත් ඒවාට ඔට්ටු වෙන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. මොකද, කියන්න කාරණා ඕනෑ තරම් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජූඩෝ ක්‍රීඩාව මධ්‍යම පළාතේ ප්‍රචලිත ක්‍රීඩාවක්. ක්‍රීඩා ඇමතිවරයෙක් මධ්‍යම පළාතෙන් බිහි වුණා. නමුත් එතුමා ජූඩෝ ක්‍රීඩාව පිළිබඳව ඇහැ ඇරලා බැලුවේ නැහැ. ජූඩෝ ක්‍රීඩාව කරන්න තැනක් නැහැ. අපේ ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් කිව්වා වාගේ සල්ලි ගසා කන්න කැලෑවල පිට්ටනි හදලා තිබෙනවා. නාවලපිටියේ ක්‍රීඩාංගණයෙන් කොපමණ ගසා කෑවාද කියලා මා දන්නවා. වවපු තණකොළ කෝ? ක්‍රීඩා ඇමතිවරයා හැටියට නාවලපිටියෙන් පත්වෙලා ආපු කෙනා කරපු විනාශය තමයි ඒ. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙන්කර තිබෙන කාලය අවසන් බව තමුන්නාන්සේ ප්‍රකාශ කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, දැන් අවසන් කරන්න.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොල්මන් ඇමති මණ්ඩලයක් පත් කරගෙන තිබෙනවා. මේ ගොල්ලන්ට බලයක් නැතුව ඉන්න බැහැ. කරලා තිබෙන හොරකම් ගැන අහන කොට, අන්න FCID එකෙන් අරගෙන ගියා, අරකෙන් අරගෙන ගියා, මේකෙන් අරගෙන ගියා කියලා කියනවා. අරගෙන නොගිහින් ඉන්න පුළුවන්ද? මේ කරන හොරකම්වලට අරගෙන නොගිහින් ඉන්න පුළුවන්ද?

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, point of Order එකක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මන්ත්‍රීතුමාගේ කථාව පැහැදිලි නැහැ. ඔබතුමා පොඩ්ඩක් පරීක්ෂා කර බලන්න. මද්‍යසාර පාවිච්චි කර තිබෙන අය ඇතුළට ගන්න කොටත්, කථාව දෙන්න ඉස්සෙල්ලාත් පරීක්ෂා කර බලන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එය point of Order එකක් නොවෙයි. ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මද්‍යසාර පාවිච්චි කරනවා. ඕනෑ තැනකට මාව ගිහින් දමන්න. ඒ කාපු බීපු අය තමයි මේ කථා කරන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
කටේ කබර දමා තිබෙන්නේ මා ගිහින් දීපු ඒවා කාලා තමයි. මහින්දානන්දගේ කටේ කබර තිබෙන්නේ මා ගිහින් දීපු ඒවා කාලා තමයි. අපි කවදාවත් ජරාව කාලා නැහැ. ජරාව කාපු නිසා පිටිපස්සේත් කබර ඇවිල්ලා ඇති.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහා පැත්තට ඇවිල්ලා කියලා දෙනවා. මිනිහෙකුට කියා දෙන්න තරම් තමන් හැදිලා ඉන්න ඕනෑ. ලෝකයේ තිබෙන ලොකුම හොරකම් ටික කරලා මෙතැන සුදන වෙන්න අනික් මිනිසුන්ටත් කියා දෙනවා. අනික් අයට කියලා දෙන්න තමන් හැදිලා ඉන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට මා ස්තුතිවන්ත වනවා, මේ දහඅරා වැඩ කරපු මිනිසුන් ඉදිරියේ මේවා දිග හරින්න අවස්ථාව ලබා දීම ගැන. ඒ වාගේම මාව පාර්ලිමේන්තුවට එවපු මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවටත් මා ස්තුතිවන්ත වනවා. අපි බොහොම ගෞරවයක් ඇතුව දේශපාලනය කරපු පවුලක්. එතුමා දෙකේ පන්තියට ඉගෙන ගත්තේ නැහැ. මා දන්නවා, එතුමා ගිය ඉස්කෝලේ මොකක්ද කියලා. රෝයල් එකේ 9 වසරේ ඉඳලා 10 වසරට ගිහිල්ලා විභාගේ ෆේල් වෙලා ගෙදර සිටියා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකයි ඇත්ත කථාව. මා නිවැරැදි කරන කොට මගේ කාලය අවසන් වෙලා තිබෙනවා. මම ඒවාට භය නැහැ. මා භය නම් සොහොනේ ගෙවල් හදන්නේත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම පිළිබඳව තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලකී ජයවර්ධන මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

[අ.භා. 5.52]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉතාමත් සතුටු වනවා, ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට අපේ ගරු දයාසිරි ජයසේකර මැතිතුමා වර්තමාන රජය යටතේ ක්‍රීඩාව සංවර්ධනය කිරීම සඳහා මේ අවස්ථාවේදී ක්‍රීඩා පනතට නියෝග ඉදිරිපත් කර තිබීම ගැන. මෙය, මේ රටේ ක්‍රීඩා සමාජ, ඒ වාගේම ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳව ඉතාමත් දැඩි ලෙස අවධාරණය කරන අවස්ථාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මා සතුටු වනවා, හිටපු ක්‍රීඩා අමාත්‍යවරුන් දෙපොළක් -රත්නායක මැතිතුමාත්, මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාත්- මේ ගරු සභාවේ සිටීම ගැන. විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩාව තුළින් ලංකාව පිළිබඳව අපට අභිමානයෙන් කථා කරන්න පුළුවන් ඉතාමත් වැදගත් අවස්ථාවකට අවතීර්ණ කළ අපේ ලෝක ක්‍රිකට් ශූරතාව ලංකාවට ගෙනාපු අර්ජුන රණතුංග මැතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. ඒ නිසා මේ අවස්ථාව, ඉතාමත් වැදගත් සංවාදයකට යන්න ඕනෑ අවස්ථාවක්. දයාසිරි ජයසේකර ඇමතිතුමා මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ නැති වුණත් මා එතුමාට කියනවා, එදා කේ.බී. රත්නායක මැතිතුමා, ගාමිණී දිසානායක මැතිතුමා වැනි ඉතාමත් ශ්‍රේෂ්ඨ ක්‍රීඩා අමාත්‍යවරුන් මේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය නඟා සිටුවන්න ගත්ත උත්සාහයන් ඉදිරියට ගෙන යමින්, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේත්, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේත් සුසංයෝගය තුළින් බිහි වුණු ආණ්ඩුවක් තුළ දයාසිරි ජයසේකර මැතිතුමා යටතේ ඉතා වැදගත් කාර්ය භාරයක් අපට ඉෂ්ට කරන්නට වෙනවාය කියලා. ක්‍රීඩා පනත යටතේ මේ නියෝග තුළින් අපි බලාපොරොත්තු වන්නේ, මේ රටේ ඉතිහාසයත්, වර්තමානයත්, අනාගතයත් පිළිබඳව -තුන් කල් බලා- කටයුතු කරන්න ඕනෑය කියලායි.

එදා මේ රටට ක්‍රීඩා ජයග්‍රහණ ගෙනා අර්ජුන රණතුංග මැතිතුමා වැනි කෙනෙක් කැබිනට් ඇමතිවරයෙක් වශයෙන් ඉන්න වෙලාවක, එතුමා ක්‍රීඩා ඇමතිව නොසිටියත් මේ අවස්ථාව ක්‍රිකට් ක්‍රීඩාවේ හිණි පෙත්තට යන්න ඕනෑ අවස්ථාවක්ය කියා මම හිතනවා. එහෙම වැඩ පිළිවෙළක් අපට සකස් කරන්නට පුළුවන්. ගම් මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින්, පළාත් මට්ටමින් ජාතික මට්ටම දක්වා යන ගමන් මඟ කොයි ආකාරයට සැකසිලා තිබෙනවාද කියා අප බලන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්නට කනගාටුයි. මාත් වසර ගණනාවක් දේශපාලන කටයුතු කළා. මහජන නියෝජිතයකු හැටියට, ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට ඉඳලා තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට ආවේ. මේ හැම කාලයකදීම අපි ගම් මට්ටමේ තිබෙන ග්‍රාමීය ක්‍රීඩා තරගවලට යනවා; තෑගි බෙදා දෙන්නට යනවා. ඒ වාගේම අපේ ප්‍රතිපාදන ලබා දෙනවා. නමුත් අද අපේ ගම් මට්ටමේ ක්‍රීඩා සමාජවල තත්ත්වය ඉතාමත්ම කනගාටුදායකයි. මොකද, ක්‍රීඩා සමාජ අද නමට විතරයි. අද ක්‍රීඩා සමාජ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක, ග්‍රාම නිලධාරී කොට්ඨාසයක ක්‍රීඩා සමාජයක් හදන්නට ඕනෑය කියා කිව්වාට, ප්‍රාදේශීය තරගවලට එන්නේ ක්‍රීඩා සමිති දහයයි නැත්නම් එකොළහයි කියන එක අපි දන්නවා. සමහර තැන්වල මා අලුත් දෙයක් දැක තිබෙනවා. ක්‍රීඩා සමාජ දෙක තුනක් එකතුවෙලා එක ක්‍රීඩා සමාජයක නමින් පවත්වාගෙන යනවා. එය මේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ඉතාමත්ම නරක තත්ත්වයක්.

අපට ක්‍රීඩා නිලධාරීන් ඉන්නවා. ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ඊට ඉහළ නිලධාරීන් ඉන්නවා. ගමට ගිහින් අභිංසක දරුවන්ගේ දක්ෂතාවන් එළි දක්වන්නට අප මුලින්ම කටයුතු සකස් කරන්නට ඕනෑ. එම නිසා, සෑම ක්‍රීඩා සමාජයක්ම අඩු ගණනේ ක්‍රීඩකයන් විසිපහක් සම්බන්ධ කර, එහි ක්‍රීඩා පුහුණුවීම් කටයුතු අප ඉෂ්ට කළ යුතු වෙනවා. ක්‍රීඩා සමාජ මට්ටමින් එනකොට එම කොට්ඨාසයේ තිබෙන සියලුම ක්‍රීඩා සමාජ ඒක රාශි කරන්නට ඕනෑ. ක්‍රීඩා තරගයක් අවසානයේ ජය සංකේතයක් පිරිනමන්නට යනකොට අනේ! ක්‍රීඩා සමාජ දෙක තුනක් විතරයි තිබෙන්නේ. මේ බෙදාවාචකයෙන් ක්‍රීඩාව මුදවා ගන්නට ඕනෑ. එතැනින් එහාට, දිස්ත්‍රික් මට්ටමට යනකොට ක්‍රීඩාවේ යෙදෙන තරුණ තරුණියන්ට තිබෙන පහසුකම් මොනවාද කියා අප දන්නවා. අපි පළාත් සභා මන්ත්‍රීවරු හැටියට කාලයක් ඉන්නකොට ඒ අය තමන්ට අවශ්‍ය පාවහන් කට්ටලය ගන්නට අපි ළඟට එනවා. එසේ නැත්නම් බෝලය ගන්නට මේ ඉන්න පළාත් සභා මන්ත්‍රීවරු, විශේෂයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැම කෙනෙක්ම තමන්ගේ විමධ්‍යගත මුදල්වලින් විශාල මුදලක් සපයා දෙනවා. සාමාන්‍ය මන්ත්‍රීවරයෙක් අඩු තරමින් අවුරුද්දකට රුපියල් ලක්ෂ දෙකක් වැය කරනවා. මා අවුරුදු දහසයක් පළාත් සභාව නියෝජනය කළා. මන්ත්‍රී කණ්ඩායමක් එකට එකතු වී

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

විශාල මුදලක් වියදම් කරන බව පෙනුණා. නමුත් මෙයින් ලැබෙන ප්‍රතිඵලය මොකක්ද? සමහර ගම්වල අතීතයේ තිබිච්ච ක්‍රීඩාපිටි අද කැලෑ බවට පත් වී තිබෙනවා. අද සමහර තැන්වල "වොලිබෝල් කෝට්" එකක් නැහැ. අඩු තරමින් ක්‍රීඩා කරන්නට තැනක් නැති තත්ත්වයට පත් වී තිබෙනවා.

ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය හදනකොට ගාල්ලේ තිබිච්ච පාපන්දු ක්‍රීඩාව නැති වුණා. ගාල්ලේ වෙනත් මලල ක්‍රීඩාවක් කරන්නට බැහැ. අද ගාල්ල සවුත්ලන්ඩ් විද්‍යාලය, ඇලෝසියස් විද්‍යාලය, රිපන් බාලිකා විද්‍යාලය, All Saints විද්‍යාලය වාගේ ඉතාමත් හොඳ විද්‍යාලවලට අද ක්‍රීඩාපිටි නැහැ. ඒ සඳහා තිබිච්ච එකම තැන ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය. අවුරුදු ගණනක් ගැන කථා කරන අපේ ගරු කංචන විජේසේකර මැතිතුමන්ලා, මා ළඟ ඉන්න ගරු අලුත්ගමගේ මැතිතුමන්ලා අද මහ ලොකුවට විස්තර කරනවා, පසු ගිය කාල පරිච්ඡේදය තුළ ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කරපු ආකාරය ගැන. තමුන්නාන්සේලා අවුරුදු විස්සක් මේ රට පාලනය කළා. අඩු ගණනේ ගාල්ලට ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් හරියට හදා ගන්නට බැරි වුණා. මේක ගිහිල්ලා හැදුවා, සූරිය වැව.

සූරිය වැව මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය ගැන ඔබතුමන්ලා කියනවා. ගාල්ලේ තිබිච්ච ජාත්‍යන්තර ක්‍රීඩාංගණයේත් අවුරුද්දකට ක්‍රීඩා දෙක තුනක් හැර ක්‍රීඩා පැවැත්වෙන්නේ නැහැ. එහෙම නම් රුපියල් කෝටි ප්‍රකෝටි ගණන් මුදල් වැය කර, ඒ තුළින් මුදල් කාබාසිනියා කළා. අද රටේ ජනතාව වැටි එක ගෙවන තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ මොකද්? මෙන්න මේ වාගේ කාලකණ්ණි ආස්වාදයක් ලැබූ නිසායි. මෙතුමන්ලා කියනවා, "අද ක්‍රීඩාංගණ විවෘත කරන්නට යනවාලු. ඒවා විවෘත කරන්නට තමන් බලාගෙන ඉන්නවාලු" කියා. මේ රටේ මහින්ද රාජපක්ෂ නමින් වැසිකිළියයි, ආදාහනාගාරය විතරයි නම් කළේ නැත්තේ. හැම තැනම "මහින්ද රාජපක්ෂ" කියා නම් කළා. ඒ වාගේ මේනියා එකක් අපට නැහැ. මා නියෝජනය කරන ආසනය තුළ රුපියල් ලක්ෂ දෙදාහකට වැඩි මුදලකින් ලක්ෂ දහයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙනවා. අපි කොහේවත් බෝඩ් ගහලා නැහැ. රුපියල් ලක්ෂ හය දාහක් වැය කර කරාපිටියේ මාර්ග සංවර්ධනය කර තිබෙනවා. අපි කොහේවත් බෝඩ් එකක් ගහගෙන නැහැ. අද මාර්ග සංවර්ධනය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප මෙවැනි තත්ත්වයකට පත් වෙන්න ඕනෑ නැහැ. අප මෙතැන වාද විවාද කරනවා. අලුත්ගමගේ දෙබෑයන් අද මෙතැන ලොකු "ඝටනක්" කළා. ඒ ගැන මම කනගාටු වෙනවා. අපට ඕනෑ වාද විවාද නොවෙයි. මේ රටේ සිටින අහිංසක මිනිසුන් වෙනුවෙන් පාර්ලිමේන්තුව -ව්‍යවස්ථාදායකය- හැටියට අපට ගෙනෙන්න පුළුවන් හැම අණපනතක්ම ඉතාම සාධාරණ සහ යුක්තිසහගත ලෙස ගෙනැත්, මේ රටේ ක්‍රීඩා මාෆියාව නැති කරලා, ඒ තුළින් ජාත්‍යන්තරය ජයග්‍රහණය කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමයි අප කළ යුත්තේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු ලක්ෂ්මන් ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ වීය.

අතන්පිරකු, මාණ්පුමිකු ලක්කි ජූයවර්තන අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ වැඩ කටයුතු බොහොමයක් කළ කෙනෙක්; නොයෙක් විවේචන තිබුණත් ක්‍රීඩාව වෙනුවෙන් මහන්සි වුණු කෙනෙක්. ඒ නිසා ඔබතුමා මූලාසනයේ ඉන්න අවස්ථාවේ කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

අපේ කංචන විජේසේකර මන්ත්‍රීතුමා තමයි ඡායා කැබිනෙට්ටුවේ ක්‍රීඩා ඇමතිවරයා. මම ඒ ගැන සතුටු වෙනවා. එතුමා අපේ සහෝදර මන්ත්‍රීවරයෙක්. එතුමා කථා කරන්නේ හරියට එතුමන්ලා හැම දෙයක්ම කළා වාගේයි. ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා අවුරුදු ගණනාවක් පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට හිටියා. පොඩි එකා වාගේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පස්සෙන් ගියා. මා අහනවා ක්‍රීඩා ක්ෂේත්‍රයට නොවෙයි, වෙනත් ක්ෂේත්‍රවලටවත් ඔබතුමන්ලා මොනවාද කළේ කියා. ඒ කාලයේ එතුමන්ලාට කථා කරන්න බැරි වුණා. අද මෙතුමන්ලා වැඳ පුදාගෙන පස්සෙන් යනවා. හැබැයි, එදා මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාත් එහෙම තමයි. එතුමාට ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කරන්න අවශ්‍ය දේවල් දුන්නේ නැහැ. අධිකරණයේ නඩුවක් තිබෙන නිසා මම මේ කාරණය ගැන කථා කරන්නේ නැහැ. රගර් ක්‍රීඩාවට වෙන් කළ මුදල් ගැනයි මම කියන්න හැදුවේ. මොන කෙහෙල් මලකින් මුදලක් ආවත් මන්ත්‍රීවරුන්ට වියදම් කරන්න දෙන රට මොකක්ද? ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒවා දුන්නෙත් නැහැ. රගර් ක්‍රීඩාවට වියදම් කරන සල්ලි ගත්තේ කවුද? නාමල් රාජපක්ෂ මැතිතුමායි. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා තමයි ඒ කාලයේ ක්‍රීඩා ඇමතිවරයා. ඔබතුමා ඒක පිළිගන්න ඕනෑ. එතුමන්ලා CSN නාළිකාව යොදාගෙන වැඩ කටයුතු කළ ආකාරය පිළිබඳව අප කල්පනා කරන්න ඕනෑ. මම වැඩි චෝදනා කරන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පැහැදිලිව ඕනෑම උත්තරයක් දෙන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරමින් කිව්වා, රගර් ක්‍රීඩාව සම්බන්ධයෙන් ආ මුදල් ඔක්කොම ක්‍රීඩා අමාත්‍යවරයාගෙන් නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ගත්තාය කියා. ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේදී ඔබතුමා වග කීමකින් කථා කරන්න. තොරතුරු නැතිව, කොළයක් නැතිව ඔහොම කථා කරන්න එපා. විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමනි, අප ඔබතුමාට බොහොම ගරු කරනවා. ඔබතුමා තොරතුරු නැතිව කථා කරන්න එපා. මමයි ඒ කාලයේ සිටි ක්‍රීඩා ඇමතිවරයා. මුදල් වෙන් කළ ආකාරය අප දන්නවා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාව මේවාට සම්බන්ධ කර ගන්න එපා. ඒවා වෙන ප්‍රශ්න. ක්‍රීඩා අමාත්‍යාංශයේ මුදල් තමයි අප වෙන් කළේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුப්பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමාට වැරදුණා නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
නැහැ. මට වැරදුණේ නැහැ. මම හොඳට දැනගෙනයි කථා කළේ.

මම දන්නවා එතැනට මුදල් ආපු හැටි. ඒ මුදල් කොහෙන්ද ආවේ කියා මා දන්නවා. ඒ අමාත්‍යාංශයේ මුදල් නොවෙයි. අධිකරණයේ නඩුවක් තිබෙන නිසා මම ඒ ගැන කථා කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
අධිකරණයට අපහාස කරන්න මම ලැහැස්ති නැහැ. ඔබතුමන්ලා නම් කියාවි. නමුත්, අපි හදවතට එකඟව ඇත්ත කථා කරන්න ඕනෑ. අප ඔය ඉඩම් ගැන, අක්කර එකොළහ නිවාසවලට බෙදා දීපු ඒවා ගැන නොවෙයි කථා කරන්නේ. අප ක්‍රීඩාව ගැනයි කථා කරන්නේ. අන්න ඒක මතක තියාගන්න.

ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. ඉදිරියේදී මේ වැඩ පිළිවෙළ තුළින් අවශ්‍ය වන්නේ ග්‍රාමීය මට්ටමින් ක්‍රීඩාව නහා සිටුවීමයි. අදට, හෙටට, අනිද්දාට අපට ජාත්‍යන්තරය දිනාගන්න බැහැ. ඒ පහසුකම් ටික තියෙන්න ඕනෑ. වොලිබෝල් ක්‍රීඩාව කරන්න ගමේ පහසුකම් නැත්නම්, පාපන්දු ක්‍රීඩාව කරන්න ගමේ පහසුකම් නැත්නම්, ක්‍රිකට් ක්‍රීඩාව කරන්න ගමේ පහසුකම් නැත්නම් ඒවා දියුණු කරන්න ටික කලක් යනවා. අවුරුදු එකහමාරකින් ඒ සියල්ල කරන්න බැහැ. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා අවුරුදු පහක් තිස්සේ මොනවාද කළේ? ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියනි, ඔබතුමිය අම්පාර ප්‍රදේශයට හොඳ ක්‍රීඩාංගණයක් ගත්තේ නැහැ. [බාධා කිරීමක්] කොහේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
කොහේද ඒ ක්‍රීඩාංගනය තිබෙන්නේ? මට කියන්න. අපේ ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය දැන් නිකම් කෑ ගහනවා. මහා ලොකුවට මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පස්සෙන් යනවා. නිකම් අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. අපි මේ රටේ ඇට බෝලත් ගහපු උදවිය. ඒකත් අපට හොඳට කරන්න පුළුවන්, මතක තියාගන්න. ඒ නිසා බොරුවට කථා කරන්න ඕනෑ නැහැ. ඔබතුමන්ලා ගාමිණී දිසානායක, කේ.බී. රත්නායක, ඩී.ඒ. සුගතදාස වාගේ මේ රටේ සිටි කෘතහස්ත ක්‍රීඩා ඇමතිවරු අනුගමනය කරන්න. ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියනි, කොහේද ඒ ක්‍රීඩාංගණය හදා තිබෙන්නේ? මට පෙන්වන්න.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
අම්පාරේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
මොනවාද ඒකේ තිබෙන්නේ? කියන්න බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
ඒ ක්‍රීඩාංගණය තිබෙන්නේ කොතැනද කියා මට කියන්න. ඒ ක්‍රීඩා පිටියේ හරකුන් ඇති කරන්න පුළුවන්. හරකුන්ට තණ කොළ වවන්න පුළුවන්. ක්‍රීඩා පිටියක් කියන්නේ ඔහොම එකක් නොවෙයි. අන්න, සුගතදාස ක්‍රීඩාංගණය දිහා බලන්න. ඒ වාගේ නාන තටාක එක්ක, මීටර් 400 දුවන්න පුළුවන් විධියේ ක්‍රීඩා පිටි තමයි හදන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට එච්.එම්.එම්. හරිස් මහතා.

[ප.ව. 06.03]

ගරු එච්. එම්. එම්. හරීස් මහතා (ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු எச்.எம்.எம். ஹரீஸ் - விளையாட்டுத்துறை பிரதி அமைச்சர்)
(The Hon. H.M.M. Harees - Deputy Minister of Sports)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, விளையாட்டுச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமான இந்த விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். விளையாட்டுத்துறை அமைச்சின் கீழ் வருகின்ற சங்கங்களின் கட்டுக்கோப்பை மேலும் ஒழுங்கமைப்பதற்காக இந்த ஒழுங்குவிதிகள் கொண்டுவரப்பட்டிருக்கின்றன. குறிப்பாக, இரகசிய வாக்கெடுப்பைத் தவிர்த்து, கையுயர்த்தி வாக்கெடுப்பதன்மூலம், சங்கத் தெரிவுமுறைகளில் இடம்பெறுகின்ற ஒழுங்கீனங்களைத் தவிர்ப்பதற்கு எமது அமைச்சு நடவடிக்கை எடுத்துள்ளது. இந்த நாட்டில் மாவட்டந்தோறும் உள்ள விளையாட்டுச் சங்கங்களின் பிரதிநிதிகளை ஊழல் மற்றும் சர்வாதிகாரப் போக்கிலன்றி ஜனநாயக முறைப்படி தெரிவுசெய்கின்ற ஒரு கட்டமைப்பு இதனூடாக சீரான முறையில் உருவாக்கப்படும் என்பது சட்டத்தரணி என்ற அடிப்படையில் எனது நம்பிக்கையாகும். மேலும், கௌரவ அமைச்சர் தயாசிறி ஜயசேகர அவர்கள் இந்த அமைச்சைப் பொறுப்பெடுத்ததன் பின்பு தனது பணிகளைக் கட்சி, இன பேதங்களுக்கு அப்பால் திறம்படச் செய்து வருகின்றார், எதிர்காலத்திலும் அப்படிச் செய்வாரென்ற நம்பிக்கை இந்த நாட்டின் பிரஜைகள் மத்தியில் குறிப்பாக விளையாட்டை நேசிக்கின்ற மக்கள் மத்தியில் உருவாகி இருக்கிறது. அதற்கேற்றாற்போல் விளையாட்டுத்துறை

[ගරු එච්. එම්. එම්. හරීස් මහතා]

அமைச்சர் மற்றும் அமைச்சின் அதிகாரிகளின் பல்வேறுவிதமான நடவடிக்கைகள் மிக விரைவானதும் துரிதமானவையுமாக இருக்கின்றன. அண்மையில் இந்தியாவில் நடைபெற்ற 'SAG' - தெற்காசிய விளையாட்டுப் போட்டிகளின்பொழுது எங்களுடைய நாடு இரண்டாவது நிலைக்கு வந்ததும் அதிகபட்ச பதக்கங்களைப் பெற்றதும் அதற்குச் சான்றாகும். அதனையிட்டு இந்த அமைச்சின் பிரதி அமைச்சர் என்ற ரீதியில் சந்தோசப் படுகின்றேன்.

வடக்கு, கிழக்குப் பிரதேசங்கள் 30 வருட காலமாக யுத்தம் நடைபெற்ற பகுதிகளாகும். அதேநேரம் அவை சுனாமியாலும் அதிகம் பாதிக்கப்பட்டிருக்கின்றன. கடந்த அரசாங்க காலத்தில் அப்பிரதேசத்தைச் சேர்ந்த அமைச்சர்கள் பலர் இருந்தும் அதன் வளர்ச்சிக்கெனப் போதிய நடவடிக்கைகளை எடுக்காதிருந் தார்கள். ஆனால், இன்று கௌரவ அமைச்சர் அவர்கள் என்னுடைய வேண்டுகோளின் பேரில் வடக்கு, கிழக்குப் பிரதேசத்தின் விளையாட்டுத்துறையை ஊக்குவிப்பதற்காகப் பல்வேறு விதமான நடவடிக்கைகளை எடுத்துவருகின்றார். குறிப்பாக, எப்போதும் இல்லாத வகையில் வடக்கு, கிழக்கின் சகல மாவட்டங்களிலும் மைதான அபிவிருத்தி, பாடசாலை மைதான அபிவிருத்தி போன்ற விடயங்களுக்காக 2016ஆம் ஆண்டுக்கெனக் கோடிக்கணக்கான ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. அவற்றின் வேலைகளும் ஆரம்பிக்கப்பட்டுள்ளன. வட மாகாணத்தைச் சேர்ந்த கௌரவ உறுப்பினர்கள் இந்தச் சபையில் பல்வேறு விதமான பிரச்சினைகளை எடுத்துக்கூறினார்கள். குறிப்பாக, கிளிநொச்சி மைதான அபிவிருத்தி தாமதமடைவது சம்பந்தமாகக் கூறப்பட்டது. அந்த மைதான அபிவிருத்திக்கென அமைச்சு தேவையான நிதியினை ஒதுக்கீடு செய்திருக்கிறது. அப்படியிருந்தும், அதன் கொந்தராத்து உரிமை பெற்ற இலங்கை பொறியியல் கூட்டுத்தாபனம், அதன் உள்ளகப் பிரச்சினை காரணமாக அங்குள்ள வேலைகளைத் தாமதித்திருக்கின்றது.

இருந்தும், அண்மையில் யாழ்ப்பாணத்தில் இடம்பெற்ற எமது அமைச்சின் உயர்மட்டக் கூட்டத்தில் அமைச்சர் அவர்கள் கலந்துகொண்டு எடுத்த தீர்மானத்தின்படி, அந்த மைதானத் தின் பெரும் பகுதி வேலைகளை வருகின்ற ஆகஸ்ட் மாதத்துக்கு முதல் முடிவுறுத்துவதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட்டிருக்கின்றன.

கிரிக்கெட் கட்டுப்பாட்டுச் சபையின் தலைவரான பிரதிச் சபாநாயகர் அவர்கள் இச்சபைக்குத் தலைமைதாங்கிக் கொண்டிருக்கின்ற இவ்வேளையில் நான் ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, யாழ். மாவட்ட உறுப்பினர் கௌரவ சிறீதரன் அவர்கள் பேசியபொழுது கிளிநொச்சி, முல்லைத்தீவு, மன்னார் போன்ற மாவட்டங்களின் கிரிக்கெட் சபைகள் தேசிய கிரிக்கெட் சபையில் அங்கத்துவம் பெறுவதற்குச் சந்தர்ப்பம் வழங்கப்படுவதில்லை என்று கூறியிருந்தார். அது சம்பந்தமாகக் கிரிக்கெட் கட்டுப்பாட்டுச் சபைத் தலைவரும் பிரதிச் சபாநாயகருமான கௌரவ திலங்க சுமதிபால அவர்களுடன் பேசி, ஆவன செய்வோம் என்பதையும் நான் இங்கு தெரிவித்துக்கொள்கின்றேன்.

இன்று விளையாட்டுத்துறையின் வளர்ச்சியினை மேம் படுத்துகின்ற வகையில் தேசிய ரீதியிலான வேலைத்திட்டம் அமைச்சினால் வரையப்பட்டுள்ளது. இது சம்பந்தமாக ஜனாதிபதி அவர்களும் பிரதம அமைச்சர் அவர்களும் பூரணமான ஆலோசனைகளை வழங்கிக்கொண்டிருக்கின் றார்கள். அந்த அடிப்படையில் எங்களுடைய அமைச்சர் அவர்களுடைய தலைமையில் எதிர்காலத்தில் எமது நாடு விளையாட்டுத்துறையில் ஓர் உன்னதமான நிலையை அடையும் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது.

அதுமட்டுமல்லாமல், அந்த நிலைக்குக் கொண்டுவருவதற் காக இன்று மாவட்டந்தோறும் விளையாட்டு மைதானத் தொகுதிகளும் அதேபோன்று மாகாண விளையாட்டுத் தொகுதிகளும் அமைக்கப்பட்டு வருகின்றன. ஏற்கெனவே சில விளையாட்டு மைதானத் தொகுதிகள் அமைக்கப்பட்டுத் திறக்கப்பட்டிருக்கின்றன. அதேபோன்று சில விளையாட்டு மைதானத் தொகுதிகள் அமைக்கப்பட்டும் வருகின்றன.

இங்கு பேசிய கௌரவ உறுப்பினர்கள் பலர் கிராமிய ரீதியாக விளையாட்டுத்துறையை ஊக்குவிப்பதற்கு வசதிகள் ஏற்படுத்தப்படவேண்டுமென்று கோரிக்கை விடுத்திருக்கின் றார்கள். எனவே, அடுத்தகட்டமாக இந்தக் கிராமிய வீரர்களுக்குச் சந்தர்ப்பமளிக்குமுகமாகப் பிரதேச செயலகப் பிரிவுகள்தோறும் விளையாட்டுத் தொகுதிகளை அமைக்கின்ற திட்டத்தினை அமைச்சு ஆரம்பிக்க இருக்கின்றது. அவ்வாறு பிரிவுகள்தோறும் விளையாட்டுத் தொகுதிகள் பூரண வசதி களுடன் அமைக்கப்படுமானால், பாடசாலை மாணவர்கள் உட்பட கிராமப்புறங்களிலுள்ள வீரர்கள் சிறந்தமுறையில் விளையாட்டுப் பயிற்சிகளைப் பெறுவார்கள். அதன்மூலம் தேசிய ரீதியாக மட்டுமல்லாமல் சர்வதேச ரீதியாகவும் இந்த நாட்டுக்குப் பதக்கங்களையும் புகழையும் ஈட்டித்தருவார்கள் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றதென்று கூறி, இந்த விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பமளித்தமைக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன்.

[අ.භා. 6.13]

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ක්‍රීඩා නීතියේ රෙගුලාසි කීපයක් අපි වෙනස් කර තිබෙනවා. ඒ සම්බන්ධව මම බෙහෙවින්ම සන්තෝෂ වෙනවා. ඒ සම්බන්ධව තමයි අපේ සාකච්ඡාව දිගටම සිද්ධ වුණේ. මා කියන්න කැමැතියි, මෙය වරදවා-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමාගේ කතාවට අවස්ථාව දුන්නේ නැහැ නේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

එතුමාගේ නම අපට ඉදිරිපත් කර නැහැ කියායි නියෝජ්‍ය මහ ලේකම්තුමා කියන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඉදිරිපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, ගරු අමාත්‍යතුමාගේ පිළිතුරු කථාව අතරතුර අවසරයක් අරගෙන අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
කමක් නැහැ ගරු අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අමාත්‍යතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගෙන් පටන් ගෙන මේ සම්බන්ධව අදහස් දැක්වූ කථිකයන් සියලු දෙනාට මම ස්තූතිවන්ත වෙනවා. එම කථාවලින් මතු වූ කාරණා කීපයක් පිළිබඳව ඔබතුමන්ලා දැක්වූ අදහස්වලට අවධානය යොමු කරන්න මා කැමැතියි. විශේෂයෙන් මේ වෙනස්කම කළ හේතුව මා කියන්නම්. මා කලින් කිව්වා වාගේම ගරු මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ඇමතිතුමාට මම ස්තූතිවන්ත වෙනවා. එතුමා 2009 ඉඳලා ක්‍රීඩා පනත වෙනස් කිරීම සඳහා, රෙගුලාසි වෙනස් කිරීම සඳහා අවශ්‍ය කරන මූලික කටයුතු ටික කර තිබුණා.

අපේ ක්‍රීඩා ඡායා ඇමතිතුමාත් මේ වෙලාවේ නොයා ගරු සභාවේ රැඳී සිටියා නම් හොඳයි. මොකද, එතුමා චෝදනා කීපයක් කර තිබුණා. ඒවාට උත්තර දෙන්නත් ඕනෑ. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා, ඉඳගෙන පොඩ්ඩක් අහගන්න. [බාධා කිරීම්] ඡායා ඇමතිතුමා, පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉඳලා මේ කාරණා අහගන්න එපා යැ. එහෙම නේද හොඳ?

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඔය තනතුරට පත් කළේ ගරු සභාවේ ඉන්න ඕනෑ නිසා තමයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ඇමතිතුමා කාලයක් සංශෝධන සම්බන්ධයෙන් මහන්සි වුණා. නමුත් එය ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා. අප ක්‍රීඩා පනතට ගෙන ආ රෙගුලාසි මේ වන කොට තිබෙන්නේ නීතිපතිතුමා ළඟයි. අපි බලාපොරොත්තු වෙනවා, එය ඉතාම ඉක්මනින් සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය කරන කටයුතු ටික කරන්න. මොකද, ඒකට හේතු කාරණා සපයන සිද්ධි ගණනාවක් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් මා කියන්න ඕනෑ, ප්‍රශ්නය තිබෙන්නේ ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුව ගැන නොවන බව. පසු ගිය කාල වකවානුවේදී විවිධ ක්‍රීඩාවලට දිගින් දිගටම ඇති වූ දේශපාලන බලපෑම් නිසා ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව ප්‍රශ්න කිරීම් කළා. ඒ විතරක් නොවෙයි. ඔවුන් දිගින් දිගටම ඒ බලපෑම් වෙනස් කරන තැනකට ආවා. ඒවා වෙනස් කළේ නැත්නම් ලංකාවේ ඔලිම්පික් කමිටුව මේ ක්‍රීඩා තහනම් කරන තැනකට එන්න, ජාත්‍යන්තර ඔලිම්පික් තරගවලට ඒ ක්‍රීඩාවන් වෙනුවෙන් යන්න බැරි වන තත්ත්වයකට පත් කරන්න තමයි ඔවුන් උත්සාහ කළේ. මා අමාත්‍ය ධුරයට පත් වුණාට පසුව ගිහිල්ලා ඔවුන් එක්ක පෞද්ගලිකව සාකච්ඡා කරලා ඒ නීති කෙටුම්පත් ටික දැන් වන විට සකස් කර තිබෙනවා. ඒකට අදාළව නොවෙයි මේ වෙනස්කම් ටික කරන්නේ. මා එය බොහොම පැහැදිලිව කියන්න කැමැතියි. මම මේ සම්බන්ධව පැහැදිලි කිරීමකුත් කළා, අපේ ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාටත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් නිල වරණ කීපයක් හදිසියේ පවත්වන්න අපට සිද්ධ වුණා. හේතුව, ඒවායේ කාල වකවානු අවසන් වීමයි. විශේෂයෙන් ක්‍රිකට් නිල වරණය පැවැත්වුණා. ඒ වාගේම, රගර් නිල වරණයත් පැවැත්වුණා, පසු ගිය කාල වකවානුව තුළ. ඊට අමතරව, තවත් නිල වරණ ගණනාවක් පවත්වන්න අපට හැකියාව ලැබුණා. ඒ ක්‍රියා දාමය තුළ ගැනීමට තිබූ ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් තමයි අපි මේ යෝජනාව ගෙනැවිත් තිබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා නවසීලන්ත නායකත්ව පුහුණුව ගැන කථා කළා. මා ඒ ගැනත් කියන්න කැමැතියි. "රාවය" කියන්නේ, මම බෙහෙවින්ම ගරු කරන පුවත් පතක්. "රාවය" පුවත් පතේ පළවන අනෙක් කාරණා පිළිබඳව මා එකඟතාව පළ කළාට "රාවය" පුවත් පතේ ක්‍රීඩා පිටුව ලියන්නේ කිසිම දෙයක් ගැන දැනුවත්කමක් නැතිවයි කියන එක කියන්න ඕනෑ. ඒ නිසා මම විටින් විට ඔවුන්ට කථා කරනවා. කථා කරලා ඔවුන් නිවැරැදි කරන්න උත්සාහ කරනවා. හැබැයි ඔවුන් දිගින් දිගටම කියන්න බලාපොරොත්තු වන්නේ නොදන්නා දේවල්ම තමයි. ඒ නිසා මා ඒ ගැන ඊට වඩා කථාබහ කරන්නේ නැහැ. නමුත් "රාවය" පුවත් පතේ අනෙක් කොටස් ගැන මගේ ලොකු පැහැදීමක් තිබෙනවා. හැබැයි ක්‍රීඩා පිටුව ගැන මගේ විශාල චෝදනාවකුත් තිබෙනවා. මොකද, ඔවුන් නිවැරැදි ලෙස කාරණා පිළිබඳව නොදැනුවත්ව, කාගෙන් හෝ අසාගත් කාරණා කීපයක් තමයි දිගින් දිගට ලියන්නේ. හිටපු අධ්‍යක්ෂතුමෙක් ඉන්නවා. එතුමා වටේ හැම තැනම ගිහිල්ලා කියන කාරණා ටික එකතු කරගෙන, අරහෙන් මෙහෙන් සොයාගත් කෑලි ටික තමයි ලියන්නේ. මොනවා හරි තිබෙනවා නම් මට එය කෙළින්ම කිව්වාට කමක් නැහැ.

මම ඒකට උත්තර දෙන්න සූදානම්. ඒ නිසා ඒක ගැන ලොකුවට හිතන්න ඕනෑ නැහැය කියලායි මම කියන්නේ. නවසීලන්ත නායකත්ව පුහුණු වැඩ මුළුවෙන් අපි අදහස් කළේ මොකක්ද කියන එක ගැන මම යමක් කියන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම අපේ ජාතික ක්‍රීඩා සංගම්වල තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි මෙවැනි වැඩ මුළුවලට ව්‍යාපෘති නිලධාරීන් පමණක් සහභාගී වීම. අපේ රටේ ක්‍රීඩාවන් 60ක් විතර තිබෙනවා. ව්‍යාපෘති නිලධාරීන් ඉන්නේ 10දෙනායි. මේ ව්‍යාපෘති නිලධාරීන් තමයි ඒ ක්‍රීඩා සංගම් වෙනුවෙන් හැම එකකටම යන්න වැඩ පිළිවෙළ සකස් කරගෙන තිබුණේ.

ඉතිහාසයේ මේක තමයි තිබුණු තත්ත්වය. නිරීක්ෂකයන් විධියට කිසිම ව්‍යාපෘති නිලධාරියෙක් අරගෙන යන්න එපා කියන යෝජනාව අපි කරලා තිබෙනවා. මෙතැනින් පස්සේ ඒ දේ නතර වෙනවා. හැබැයි, මතක තබා ගත යුතු කාරණයක් තිබෙනවා. SLIDA එකත් එක්ක සාකච්ඡා කරලා අපේ අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරීන් පිරිසක් නවසීලන්තයේ පැවැති මේ වැඩ මුළුව සඳහා සහභාගී වුණා. ඔවුන් අවුරුදු හතරකට, පහකට සැරයක්වත් මේ වාගේ වැඩ මුළුවකට ගිහිල්ලා තිබුණේ නැහැ. ගිය අය ඒ තනතුරුවල ඉන්නා නිසා ඒ වැඩ මුළුවට සම්බන්ධ වුණා මිසක වෙන කාරණයක් නිසා ඔවුන් ඒ වැඩ මුළුවට ගියා නොවෙයි.

මම දන්නවා, මේ අය පසු ගිය කාල වකවානුව තුළ දිගින් දිගටම හැම සංගමයක් එක්කම සම්බන්ධතාවක් තිබුණු බව. මොකද එක පුද්ගලයෙකු සංගම් හතරක්, පහක් ආවරණය කරනවා. අපට මේ වැඩේ කරන්න 10දෙනායි ඉන්නේ. ඒ නිසා මේ ගොල්ලන් හැම සංගමයකම toursවලට එක්ක ගෙන යනවා. මේ ගොල්ලන් tours යන එක තමයි අවසාන වශයෙන් සිද්ධ වුණේ. දැන් මම ඒක නතර කරලා තිබෙනවා. දැන් නිරීක්ෂකයන්

[ගරු දයාසිරි ජයසේකර මහතා]

විධියට කවුරුවත් එක්ක ගෙන යන්න දෙන්නේ නැහැ. මේ වැඩ මුළුවලට දිස්ත්‍රික්කවල ඉන්න පුහුණුකරුවන්, ජාත්‍යන්තර තරගවලට ශක්තිය දෙන පුහුණුකරුවන්, පාසල්වල ඉන්න දක්ෂ පුහුණුකරුවන් යවන වැඩ පිළිවෙළක් සකස් කරන්න අප බලාපොරොත්තු වෙනවා.

ඊට අමතරව Cricket Aid එක ගැන කථා කළා. මෙය ලියා පදිංචි කිරීම සම්බන්ධව යම් තාක්ෂණික දෝෂයක් තිබෙනවා. අපේ සභාපතිතුමාට මම උපදෙස් දුන්නා, මේ සම්බන්ධව වහාම ක්‍රියාත්මක වෙන්න කියලා. මම මේ ගැන හොයලා බැලුවාම මට දැනගන්න ලැබුණේ, මේක හදිසියි කියලා ඒ ක්‍රියාදාමයට පෙර ලියා පදිංචි කරලා තිබෙනවා කියලායි. මේ සම්බන්ධයෙන් පත්තරවල විවිධ කාරණා පළ වුණා. මම ඒවාට එක පාරටම උත්තර දෙන්න ගියේ නැහැ. රුපියල් ලක්ෂ 55ක ආදායමක් ලැබිලා තිබෙනවා. ඒක ශුද්ධ ආදායමක් විධියට කියන්න බැහැ. මොකද තවමත් ඒක ස්වේච්ඡා සංවිධානයක් නිසා. ඒ ගිය වියදමෙන් රුපියල් ලක්ෂ 55ක් ලැබිලා තිබෙනවා. ඒක Cricket Aid එකේ ගිණුමේ නොවෙයි තිබෙන්නේ. තවමත් Sri Lanka Cricket එකේ ගිණුමේයි තිබෙන්නේ. අර ක්‍රියාදාමය හරියට ක්‍රියාත්මක වුණාට පස්සේ, එන සභාපතිවරයා කවුරු හෝ Cricket Aid එකේ සභාපතිවරයා වෙනවා මිසක, ඒකෙන් එළියට ගියත් ස්ථිරවම සභාපති වෙන විධියේ නීතියක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියන එක මම විශේෂයෙන් කියන්න කැමැතියි. ගරු කංචන විජේසේකර මැතිතුමාත් මේ කාරණය මතු කළා. Cricket Aid එකෙන් සල්ලි හම්බ වුණේ නැහැ කියලා එතුමා කිව්වා. එතුමාට දැනගන්න මම කියන්න කැමැතියි, ඒ කාරණය මම කලින් කියපු විධියට සිද්ධ වෙලා තිබෙනවාය කියලා.

ඊට අමතරව අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, හෂාන් තිලකරත්න මහත්මයා සහ එතුමාගේ නෝනා මහත්මිය ගැන කථා කරලා තිබුණු එක ගැන. විශේෂයෙන්ම අප පුද්ගලයන් විධියට හිතලා කල්පනා කරන්නේ නැහැ. ක්‍රිකට් ක්‍රීඩාවේ හිටපු නායකයන් විධියට අනෙක් අය සියලු දෙනාම ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුවට සම්බන්ධ කරගෙන තිබුණා. හෂාන් තිලකරත්න මහත්මයා ඇවිල්ලා මාත් එක්ක කථා කළා. "දේශපාලනය කරපු හින්දාද මාව සම්බන්ධ කර ගත්තේ නැත්තේ" කියලා ඇහුවා. මම එතුමා එක්කත් සාකච්ඡා කළේ යම් ක්‍රියාදාමයකදී යම් විධියකට ඔවුන්ගෙන් ප්‍රයෝජනයක් ගැනීම සම්බන්ධවයි. නමුත් ඒක දේශපාලනීකරණය කරන්න ඉඩ නියන එක-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, මගේ කථාවේදී මා මේ කාරණය මතු කළා. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදීත් මා මේ කාරණය ගැන කිව්වා. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයන් නැතුව කරන්න බැහැ කියන එක අප පිළිගන්නවා. නමුත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ වැඩිහිටි නිවාසයක් බවට පත් වෙලායි තිබෙන්නේ. එහෙම වෙන්න දෙන්න එපා. ඒක අනාථ මඩමක් වෙන්න දෙන්න එපා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක හරි. නමුත් අපි හැම කෙනාගේම දක්ෂතාවෙන් ප්‍රයෝජනයක් ගන්න ඕනෑ නිසා යම් විධියකට ගන්නවා මිසක අර විධියේ තත්ත්වයකට-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

දක්ෂතාවට ගන්න. නෝනා මහත්මිය කරන්නේ මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක හරි. ඒ නෝනා මහත්මිය කරන එක ගැන අපි වෙනම හොයලා බලන්න වෙයි. මට ආරංචි විධියට එතුමිය පඩි රහිත උපදේශිකාවක් විධියටයි අරගෙන තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම මෙහෙම කාරණයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. අපි පිරිමි ක්‍රිකට් කණ්ඩායම් ටික ශක්තිමත් කළාට කාන්තා ක්‍රිකට් කණ්ඩායම් ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් ඇත්ත වශයෙන්ම ක්‍රිකට් ආයතනයට තිබුණේ නැහැ. ඒ නිසාම කාන්තා ක්‍රිකට් කණ්ඩායම් ටික ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළකට කවුරු හරි කාන්තාවක් යොදා ගැනීම ප්‍රශ්නයක් නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමා නීතිඥයෙක් නිසා දන්නවා ඇති, ක්ලින්ටන් මහත්මයා, මොනිකා ලෙවෙන්ස්කි case එකේ සාක්ෂි දෙද්දී ඇල්ලුවේ මුහුණේ හිනාවෙන්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අසත්‍ය කියනවා කියලා? මට ඒ වාගේ ලෙවෙන්ස්කිලා සම්බන්ධ කර ගන්න ඕනෑ නැහැ. ඊට වඩා වැඩ පිළිවෙළක් අපට තිබෙනවා. ඒ කාරණය ගැන අපි සාකච්ඡා කරලා බලමු.

ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා ක්‍රීඩා සංගම්වල ක්‍රියාකාරිත්වය පිළිබඳව ප්‍රකාශ කළා. ගරු බිමල් රත්නායක මැතිතුමනි, මම දැන් වැඩ පිළිවෙළක් විධියට දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් හමුවෙමින් දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට යන්න පටන් ගත්තා. සමහර තැන්වල දිස්ත්‍රික් ක්‍රීඩා සංගමයේ තුන්දොයි ඉන්නේ. මම ඔවුන්ට කිව්වා, ක්‍රීඩා ව්‍යාප්තිය ගැන ලබන අවුරුද්ද සඳහා budget එකක් කරුණාකරලා මේ අවුරුද්දේ අපට දෙන්න කියලා. විවිධ ක්‍රීඩාවන් බැලුවාම, අපි හිතමු football කියලා. අපි දන්නේ නැහැ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මොනවාද කරන්නේ කියලා. මාතර දිස්ත්‍රික්කයේ මොනවාද කරන්නේ කියලා අපි දන්නේ නැහැ. නමුත් සෑම ක්‍රීඩා සංගමයක්ම එකතු කර ගෙන, දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට ගිහිල්ලා, ඒ දිස්ත්‍රික්කයේ අයත් එක්ක සාකච්ඡා කර, විශේෂයෙන් ඒ පළාතේ අධ්‍යාපන ඇමතිවරුන් එකතු කර ගෙන, ඒ අයත් එක්ක සාකච්ඡා කරලා, පාසල් මට්ටම සහ එතැනින් ඉහළට එන ළමයි ටික කොහොමද බලා ගන්නේ කියන කාරණය සම්බන්ධව අපි වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. ඒ ලබා දෙන වැඩ පිළිවෙළ තමයි 2017 වර්ෂයේ අපේ අය වැයට ඉදිරිපත් කරන්නේ. ඒ අනුව තමයි දිස්ත්‍රික් සංචිත විධියට වැඩ කරන්න ඔවුන්ට අවශ්‍ය කරන කටයුතු ටික සකස් කරන්නේ.

මීට අමතරව මම අමාත්‍යවරයා ලෙස පත්වූ හැටියේ මම වැඩ පිළිවෙළක් පටන් ගත්තා, Talent Identification Programme කියලා. ඒ කියන්නේ, අපේ දරුවන් තුන්ලක්ෂ හැත්තෑපන්දහසක් පරීක්ෂණයකට - test එකකට - භාජනය කර, ඒ පරීක්ෂණයෙන් විවිධ ක්‍රීඩාවලට පනස්දහසක් තෝරා ගන්නවා. සාමාන්‍යයෙන් අපි කරන්නේ මොකක් හෝ meet එකකට ගිහිල්ලා, ඒ meet එකේ හොඳටම දුවන ළමයින් තුන් හතර දෙනා අරගෙන train කරලා, ඒ ළමයි ටික විතරක් අරගෙන යාමයි. නමුත් දැන් අනෙක් ක්‍රීඩාවලට

ළමයින් නැහැ. ඒ නිසා අපි වැඩ පිළිවෙළක් සකස් කළා. දැන් ලෝකයේ සෑම රටකම කරන විද්‍යාත්මක පරීක්ෂණයක් තිබෙනවා. යම් කෙනෙක් දක්ෂ ක්‍රිකට් ක්‍රීඩාවටද; footballවලටද; volleyballවලටද, දුවන්නද කියලා ඒ පරීක්ෂණයෙන් හොයා ගන්න පුළුවන්. දුවනවා නම්, ජවන හා පිටිය ක්‍රීඩාවලටද දක්ෂ යනාදී දේවල් හොයා ගන්න පුළුවන්.

මුළු ලංකාවේම මේ තුන්ලක්ෂ හැත්තෑපන්දහස දැනට දවස් දෙකක් ඇතුළත trainersලා මඟින් train කරලා ඉවරයි. දවස් දෙකක කාල වකවානුවක් ඇතුළත සම්පූර්ණයෙන් මුළු ලංකාවේම ඒ කටයුත්ත අවසන් කරලා, එයින් පනස්දහසක් විවිධ ක්‍රීඩාවලට තෝරා ගන්න බලාපොරොත්තු වෙනවා. ඒ අයව කලාපීය මට්ටමෙන් - zonal මට්ටමෙන්- සංචිතගත කරලා, අපේ "ක්‍රීඩා ශක්ති" වැඩසටහන යටතේ 2024 වසර දක්වා ඔලිම්පික් තරගාවලියට යන තුරු මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න අප බලාපොරොත්තු වෙනවා. එවිට අඛණ්ඩ වැඩ පිළිවෙළක් අපට තිබෙනවා.

අවුරුදු 13න් පහළ දරුවන් තමයි මේ විධියට තෝරා ගැනීම කරන්නේ. මේ අයව දිගින් දිගටම ශක්තිමත්ව ගොඩනැඟුවොත් 2024 වසර වන විට ඔලිම්පික් තරගාවලිය සඳහා යන කණ්ඩායම දැන් සිටම ශක්තිමත්ව ගොඩනඟන වැඩ පිළිවෙළකට අපට යන්න පුළුවන්. මෙහෙම අඩිතාලමක් නොදැමීම තුළ තමයි අහම්බෙන් ආ සුසන්තිකාලා අපට හමු වුණේ. එතැනින් පස්සේ එවැනි අය කවුරුවත් හමු වුණේ නැහැ. නමුත්, අපට දැන් ශක්තිමත් විධියට මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න පුළුවන්.

අර්ජුන රණතුංග මැතිතුමා අද කථා කළා. ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියත් එක්ක තිබෙන වැඩ පිළිවෙළට, ක්‍රීඩා නියෝග මාලාවට -regulations- එතුමාගේත් අදහස් කිහිපයක් ලබා දී තිබුණා. ඒ ගැනත් සාකච්ඡා කරන්න මම බලාපොරොත්තු වෙනවා. තරග පාවාදීම්වලට අදාළව ක්‍රීඩකයන් FCID එකට ගෙන යාම ගැන එතුමා කථා කළා. අනුෂ සමරනායක මහත්මයා ගැනත් එතුමා කථා කළා. කුසල් ජනිත් පෙරේරා ක්‍රීඩකයාගේ ක්‍රීඩා තහනමත් එක්ක, net practicesවලට යන අය අතර, මේ ක්‍රීඩකයන්ට විවිධ බලපෑම් කරන අය ඉන්නවාය කියා අපට ලොකු චෝදනාවක් ආවා. ගයාන් කියා පුද්ගලයෙක් හිටියා. සාමාන්‍යයෙන් ඔහු ඉහළ මට්ටමින් ක්‍රිකට් ක්‍රීඩා කරලා තිබුණු කෙනෙක් නොවෙයි. අඩුම තරමින් ඔහු සාමාන්‍ය තරගවලට ක්‍රීඩා කළ කෙනෙකුත් නොවෙයි. ලංකාවේ teamsවල ක්‍රිකට් ක්‍රීඩා කළ කෙනෙකුත් නොවෙයි. හැබැයි, උදේට ගිහිල්ලා ඔහු bowl කරනවා. අනුෂ සමරනායක මහත්මයා දැනගන්න ඕනෑ, මෙවැනි පුද්ගලයෙක් fast bowler කෙනෙක් විධියට තෝරා ගත්තේ කොහොමද කියලා. ඒ සම්බන්ධව අපට ප්‍රශ්නයක් තිබෙනවා. රංගන හේරත් ක්‍රීඩකයාත්, කුසල් ජනිත් පෙරේරාත් බොහොම පැහැදිලිව කිව්වා, තරග පාවා දීම පිළිබඳව මේ දෙදෙනාටම ගයාන් කියන පුද්ගලයා මුදල් දෙන්න කථා කළාය කියා. ඒ අවස්ථාවේ අපට කරන්න වෙන දෙයක් තිබුණේ නැහැ. මොකද, එක පැත්තකින් කුසල් ජනිත් පෙරේරාට තරග තහනම් කරලා තිබුණා. ඔහුට තරග පාවාදීමේ චෝදනාවකුත් එල්ල වුණා. ඒ අතරේ ඔහුට විරුද්ධව විවිධ දේවල් ගත්තාය කියන චෝදනාවකුත් එල්ල වුණා. මෙය නිරාකරණය කර ගන්න අපට තිබුණු එකම ක්‍රමය මොකක්ද? ඒ නිසා තමයි මේ ගැන අපි FCID එකට පැමිණිලි කළේ. ඒ අනුව තමයි රංගන හේරත්, කුසල් ජනිත් පෙරේරා, මැතිව්ස් යන මේ තුන්දෙනාම ගිහිල්ලා කට උත්තර දුන්නේ. තරග පාවා දීම්වලට ඔවුන් සම්බන්ධයි කියා චෝදනාවක් නොවෙයි තිබෙන්නේ. මේ චෝදනා සම්බන්ධව ඔවුන්ට කියන්න තිබෙන්නේ මොකක්ද කියන එක ගැන ඔවුන් කට උත්තර දුන්නා. එහෙම නැතිව, ඔවුන් තරග පාවාදීම්වලට සම්බන්ධ කරලා වැඩ කටයුතු කළේ නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් අර්ජුන රණතුංග මැතිතුමාට මම කියන්න කැමැතියි, කරුණාකර මේක වැරදියට තේරුම් ගන්න එපා කියා.

එහෙම කළාම අපටත් හොඳ නැහැ. මොකද, මේ තුන් දෙනාම එතැනට ගියේ ඒ කාරණය පිළිබඳව කට උත්තරයක් දෙන්න මිසක් තරග පාවා දීම් සම්බන්ධව චෝදනා එල්ල වූ නිසා නොවෙයි. ඔවුන් තරග පාවා දීම්වලට සම්බන්ධ වෙලා නැහැ. හැබැයි, අනුෂ සමරනායක මහත්මයා ගයාන් කියන පුද්ගලයා ගෙනැල්ලා, පන්දු යැවීම සඳහා භාවිත කළා. ඔහු ඒ ක්‍රීඩකයන්ට තරග පාවා දෙන්න කියා බලපෑම් කළා. ඒ සම්බන්ධයෙන් කට උත්තරයක් ගන්න තමයි ඔවුන් ගෙන්වන්න අපට සිද්ධ වුණේ. වෙන හේතුවක් නිසා නොවෙයි. ඒ නිසා මෙය වැරදියට තේරුම් ගැනීම ගැන මම කනගාටු වෙනවා. අපි මේ කරුණු කෙසේ හෝ හොයා ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලබාදුන් කාලය අවසානයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් තව විනාඩියක කාලයක් ඉල්ලා සිටිනවා.

දැන් ICC එක අනුෂ සමරනායක මහතාට තිබුණ චෝදනාවලින් නිදහස් කරලා තිබෙනවා. නමුත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ඔහුට විරුද්ධව වෙනම පරීක්ෂණයක් කරනවා. ඒ කටයුතු අවසන් වුණාට පසුව තමයි ඉදිරි කටයුතු තීරණය කරන්න තිබෙන්නේ.

කංවන විජේසේකර මන්ත්‍රීතුමා කියලා තිබුණා රුපියල් මිලියන 1,000ක මුදල තවම පාවිච්චි කර ගන්න බැරි වුණා කියලා. එතුමා හරියට කරුණු නොදැනයි කථා කරන්නේ. එතුමා "ඡායා - මායා" වුණාම ඊට වඩා දැනුවත්කමක් තිබෙන්න ඕනෑ. රුපියල් මිලියන 500කට අදාළ වැඩ කටයුතු අපි මේ වනවිට කරලා තිබෙනවා. Zero-based budgeting system එකටයි අපි කටයුතු කරන්නේ. ඒ රුපියල් මිලියන 500 ඉවර වුණ ගමන්ම අපේ අනෙක් වැඩ කටයුතුවලට අවශ්‍ය ඉතුරු රුපියල් මිලියන 500 දෙන්න ගරු රවි කරුණානායක මුදල් ඇමතිතුමා සම්පූර්ණ එකඟතාව පළ කරලා තිබෙනවා. ඒ නිසා මේ අවුරුද්ද ඉවරවෙනකොට රුපියල් මිලියන 1,000ම වියදම් කරලා, හැම ප්‍රදේශයකම කරන්න තිබෙන වැඩ කටයුතු සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සකස් කරනවා. මතක තියා ගන්න ඕනෑ කාරණය තමයි, ක්‍රීඩා ඇමතිවරයා නියෝජනය කරන පළාතට පමණක් සේවය කරපු වැඩ පිළිවෙළ දැන් ලංකාව පුරාම අපි ක්‍රියාත්මක කරලා තිබෙන බව. ඒ කාරණයත් මම බොහොම පැහැදිලිව කියන්න කැමැතියි. ඒ වාගේම එතුමා කියා තිබුණා, හදපු ක්‍රීඩාංගණ ටික විවෘත කළේ නැහැ කියලා. බාගෙට හදපු ඒවා මම විවෘත කරන්නේ නැහැ. ඒවා හදලා ඉවර වුණාම තමයි මම විවෘත කරන්නේ. නුවර, දිගන ක්‍රීඩාංගණය බාගෙට හදලා නතර කර තිබුණා. මෙවර තමයි අපි ඒ ක්‍රීඩාංගණය වෙනුවෙන් රුපියල් මිලියන 98ක මුදලක් යෙදෙව්වේ. නුවර දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු ක්‍රීඩා ඇමතිවරයා අවුරුදු පහක් හිටියා. නමුත් දිගන ක්‍රීඩාංගණය හදාගන්න එතුමාට බැරි වුණා. මම එතුමාට චෝදනා කරනවා නොවෙයි. නමුත්, මේවා එක එක්කෙනා ලවා කියවන එක නොවෙයි කරන්න තිබෙන්නේ. එහෙම බාගෙට හදපු ඒවා අපට විවෘත කරන්න බැහැ. මඩකළපුව ක්‍රීඩාංගණයත් බාගෙට තමයි හදලා තිබුණේ. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒ සියල්ලේ

[ගරු දයාසිරි ජයසේකර මහතා]

කටයුතු අපි නිම කරනවා. මේ රටේ ක්‍රීඩාව අලුත් තෝතැන්නකට ගෙන යන්න අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, අපේ කැබිනට් මණ්ඩලයත්, අපේ සියලු මන්ත්‍රීවරුත් මට දෙන සහයෝගය අගය කරනවා. අපේ නියෝජ්‍ය ඇමතිතුමා, අපේ ලේකම්තුමා, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජනරාල්තුමා ඇතුළු ක්‍රීඩා සංගම්වලින් මට ලබා දෙන සහයෝගය නැවතත් ආදරයෙන් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

බස්නාහිර පළාතේ උපාධිධාරි ගුරු පත්වීම්
மேல் மாகாணத்தில் பட்டதாரி ஆசிரியர்கள் நியமனம்
GRADUATE TEACHER APPOINTMENTS IN WESTERN PROVINCE

[අ.භා. 6.30]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මා ඉදිරිපත් කරනවා.

"රටේ වැඩිම ජනගහනයක් හා වැඩිම පාසල් ප්‍රමාණයක් සහිත බස්නාහිර පළාත් පාසල්වලද දැඩි ලෙස ගුරු හිඟයක් පවතී. විශේෂයෙන් උසස්පෙළ විද්‍යා/ගණිත විෂය ධාරාව සඳහා පවතින ගුරු හිඟයෙන් සිසු දරුවන් පීඩාවට පත්ව සිටී. බස්නාහිර පළාත් සභාව මඟින් පවත්වන ලද ගුරු විභාගයෙන් උපාධිධාරීන් 4,000ක් පමණ සමත්ව ඇතත් ඔවුනට මෙතෙක් ගුරු පත්වීම් ලබා දීමට පියවර ගෙන නොමැත.

එබැවින් මෙම උපාධිධාරීන්ට අදාළ ගුරු පත්වීම් ලබා දීමට කටයුතු කරන ලෙස රජයට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

කරුණාකර මූලාසනය සඳහා ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, " ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන හැටියට අපේ පළාත් පාලන ඇමති ෆයිසර් මුස්තාපා මැතිතුමා මේකට සතුටුදායක පිළිතුරක් අරගෙන ඇවිල්ලා ඇති. එතුමා මේ දවස්වල ටිකක් වැඩියෙන් වැඩ තිබෙන ඇමතිවරයෙක්. මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමට එතුමා මහන්සි වෙනවා.

1987 ඉන්දු ලංකා ගිවිසුම හරහා අපේ රටේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරන්නට කලින් ජාතික පාසල්, පළාත් සභා පාසල් කියලා බෙදීමක් තිබුණේ නැහැ. එදා රටේ තිබුණ සියලු පාසල්වලට ගුරුවරුන් පත් කිරීමේ බලය තිබුණේ අධ්‍යාපන අමාත්‍යාංශයට. ගුරු විද්‍යාල හරහා පාසල්වලට ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් තිබුණා. නමුත් මේ වන විට අපේ රටේ ජාතික පාසල් 352ක් මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පාලනය වෙනවා. ඒ වාගේම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ නවය යටතේ පළාත් පාසල් 9,769ක් පාලනය වෙනවා. ඒ අනුව සමස්ත පාසල් 10,121 අධ්‍යාපන අමාත්‍යාංශ 10ක් යටතේ තමයි පාලනය වෙන්නේ. පරිපාලනය විමධ්‍යගත කිරීම සඳහා මෙවැනි ආකාරයේ බෙදීමක් තිබුණාට, පාසලට ඇතුළත් වන දරුවා ඉහළට ඉගෙන ගන්නා විට ඔහුට ඒ බෙදීම අදාළ වෙන්නේ නැහැ. ඒ නිසා ජාතික පාසල්ද, පළාත් පාසල්ද කියලා බෙදීමක් නැතිව ඒවාට අවශ්‍ය කරන සම්පත් -භෞතික හා මානව සම්පත්- සියල්ල ලබා දීම තමයි රජයේ වගකීම. අපි එක පැත්තකින් හිතනවා අධ්‍යාපන ඇමතිවරුන් 13කට ආසන්න ප්‍රමාණයක් සිටින විට අවශ්‍ය නම් මේ ක්‍රියාවලිය වෙනදාට වඩා සාර්ථකව කර ගන්නට පුළුවන් කියලා. නමුත් මේ වන විටත් රටේ පාසල් වැඩි ප්‍රමාණයක් පවතින, රටේ ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් ජීවත් වන බස්නාහිර පළාතේ තිබෙන 1,359ක් වන පාසල් ප්‍රමාණයටවත් අවශ්‍ය කරන ගුරුවරු ප්‍රමාණය බඳවා ගැනීමට අප අසමත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට බස්නාහිර පළාතට අනුමත ගුරුවරුන් සංඛ්‍යාව 44,867ක් වන අතර, ගුරුවරුන් සිටින්නේ 42,359ක් පමණයි. ඒ අනුව, කොළඹ දිස්ත්‍රික්කයේ ගුරු හිඟය 402යි, ගම්පහ දිස්ත්‍රික්කයේ ගුරු හිඟය 1,122යි, කළුතර දිස්ත්‍රික්කයේ ගුරු හිඟය 984යි. ඒ අනුව බස්නාහිර පළාතේ 2,508ක ගුරු හිඟයක් පවතිනවා.

මම මේ ඉදිරිපත් කරන්නේ 2016 පෙබරවාරි 11වෙනි දින අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන ලද ගුරු අවශ්‍යතාව පිළිබඳ තොරතුරු

වාර්තාවේ විස්තර. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුරුවරුන් 2,508ක හිඟය නිසා මේ පළාතේ ජීවත් වන සිසු දරුවන් මුහුණ දෙන පීඩාව ඔබතුමාට අමුතුවෙන් මතක් කළ යුතු නැහැ. මොකද, ඔබතුමාත් දන්නවා ගම්පහ දිස්ත්‍රික්කයේත් කොතරම් ගුරු හිඟයක් පවතිනවාද කියලා. මේ පවතින ගුරු හිඟය සංඛ්‍යාත්මකව 2,508 වුණාට, ඒ ඒ විෂයයන්ට තිබෙන අඩු පාඩුකම් ඊට වඩා වැඩියි. මොකද, දැනට සිටින ගුරුවරු අතර ගුරු උපදේශක සේවාවේ නිරත වෙන අයත් ඉන්නවා. ඔවුන්ද මේ cadre එකට ඇතුළත්ව තමයි සමස්ත ගුරුවරු ප්‍රමාණය ගණනය කරලා තිබෙන්නේ.

දැනට ගුරුවරුන් බඳවා ගැනීමේ නිශ්චිත ක්‍රමවේද දෙකයි අපට තිබෙන්නේ. එකක් තමයි, උපාධිධාරින් බඳවා ගැනීම. අනෙක් එක තමයි, විද්‍යාපීඨ හරහා ගුරුවරුන් පුහුණු කරලා ගුරු සේවයට යොමු කිරීම. දැන් විවිධ පළාත් සභා උපාධිධාරින් තෝරාගෙන, විභාගයක් පවත්වලා ගුරු පත්වීම් දීමේ ක්‍රමවේදයක් තිබුණා. ඒ අනුව පසු ගිය කාලයේ බස්නාහිර පළාතේත් ඒ විධියට ගුරුවරුන් බඳවා ගැනීම සිදු කළා. 2014 දෙසැම්බර් 27වෙනි දා බස්නාහිර පළාත් සභාව මඟින් පවත්වන ලද ගුරු විභාගයට 14,295 දෙනෙකු මුහුණ දීලා තිබෙනවා. එහිදී ලකුණු 80ට වැඩියෙන් අරගෙන සමත් වුණු උපාධිධාරින් 4,046 දෙනෙක් ඉන්නවා. වාර තුනකදී, ඒ කියන්නේ 2015.12.01වෙනි දින 118 දෙනෙකු, 2016.03.23වෙනි දින 170 දෙනෙකු සහ 2016.07.18වෙනි දින 152 දෙනෙකු විධියට ඔවුන්ගෙන් 440 දෙනෙක් බඳවාගෙන තිබෙනවා. ගුරු විභාගයෙන් 4,046 දෙනෙක් සමත් වුණාට බඳවාගෙන තිබෙන්නේ 440යි.

බස්නාහිර පළාතේ අධ්‍යාපන ඇමතිවරයා සහ ප්‍රධාන ඇමතිවරයා විටින් විට මාධ්‍යවලට ප්‍රකාශ කරලා තිබෙනවා බස්නාහිර පළාතේ තිබෙන ගුරු හිඟය පිළිබඳව. එක් අවස්ථාවකදී බස්නාහිර පළාතේ ගුරු පුරප්පාඩු 2,565ක් පවතිනවා කියලා, "අද" පුවත් පතට පළාත් අධ්‍යාපන ඇමති රංජිත් සෝමවංශ මැතිතුමා ප්‍රකාශ කරලා තිබුණා. ඒ වාගේම, 2014දී පවත්වන ලද ගුරු විභාගයෙන් සමත් වූ උපාධිධාරින් අදියර දෙකකින් මාර්තු මාසයේ මුලදී, -මේ ගතවුණු මාර්තු මාසයේ - බඳවා ගන්නා බවට එතුමා නැවත ප්‍රකාශ කරලා තිබුණා. 2016 ජූනි මාසයේ 02වෙනි දා ගම්පහ ප්‍රදේශයේ පාසලක උත්සවයකට සහභාගි වුණු ජනාධිපතිතුමා බස්නාහිර පළාතේ පවතින ගුරු පුරප්පාඩු සඳහා මේ උපාධිධාරින් බඳවා ගන්න කියලා ප්‍රසිද්ධ වේදිකාවේදී බස්නාහිර පළාත් අධ්‍යාපන ඇමති රංජිත් සෝමවංශ මහතාට නියෝග කළා කියලා පුවත් පත් වාර්තා කරලා තිබුණා. ඒ වාගේම, 2015.09.21වෙනි දා බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මහතා පොරොන්දු වෙලා තිබෙනවා, ගුරුවරුන් 2,000ක් බඳවා ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ඉල්ලා තිබෙනවා, අනුමැතිය ලැබුණු පසු සති දෙකක් තුළ බඳවා ගන්නවා කියලා.

මේ ආකාරයට ගුරුවරුන් බඳවා ගන්න කියලා ජනාධිපතිතුමා නියෝග කරලා තිබෙනවා; ප්‍රධාන ඇමතිවරයා පොරොන්දු වෙලා තිබෙනවා. ඔහු ගිය අවුරුද්දේ කියා තිබුණා, සති දෙකක් ඇතුළත බඳවා ගන්නවා කියලා. අධ්‍යාපන ඇමතිවරයා විටින් විට ප්‍රකාශ කර තිබෙනවා, බඳවා ගැනීම් කරනවා කියලා. නමුත්, මේ උපාධිධාරින් තවමත් ගෙදර. මේක ජාතික අපරාධයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ශිෂ්‍යයන් වසර 13ක් තිස්සේ පාසල් අධ්‍යාපනය ලබලා, තවත් වසර 3ක් හෝ 4ක කාලයක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබලා, සාමාන්‍ය හෝ විශේෂවේදී උපාධියක් ලබා ගත් අය. තමන්ගේ ශ්‍රමය අධ්‍යාපනය වෙනුවෙන් වැය කරපු අය. ඒ වාගේම ඒ අයට උගන්වන්න මේ රටේ ජනතාවගේ බදු මුදල් සෑහෙන ප්‍රමාණයක් වියදම් කර තිබෙනවා. දැන් ඔවුන් පාරට බැහැලා දිගින් දිගටම උද්ඝෝෂණය කරමින් ඉල්ලන්නේ තමන්ට රක්ෂාවක් දෙන්න කියලයි. තමන්ට වියදම් කරන ලද බදු මුදල්වලින් මේ රටේ ජනතාවට පෙරළා ප්‍රයෝජනයක් ගන්නය කියලා තමයි ඔවුන් ඉල්ලන්නේ.

පසු ගිය කාලය පුරාම බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය තිබෙන බත්තරමුල්ල රන්මඟ පායට හැම බදාදාවකම ගිහිල්ලා ඒ ශිෂ්‍යයෝ ඇමතිවරයාව හමු වුණා. එක් වරකදී මටත් අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළේදී ගුරුපත්වීම් ඉල්ලා සිටින එම උපාධිධාරින් රාශියක් මුණ ගැහුණා. අධ්‍යාපන ඇමතිවරයා පොරොන්දු වෙනවා. නමුත්, මේ ගුරු පත්වීම් දෙන්න කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා බස්නාහිර පළාතේ පවතින ගුරු හිඟය ගැන විශේෂයෙන් සලකා බලා මේ අවස්ථාවේදී කටයුතු කරන්නය කියලා මා යෝජනා කරනවා.

පාසල්වල මෙවර අපොස උසස් පෙළ විභාගයට පෙනී සිටින ශිෂ්‍යයින්ට -විශේෂයෙන් ජීව විද්‍යා, ගණිත අංශවලින් පෙනී සිටින ශිෂ්‍යයන්ට- ගුරු හිඟය නිසා බලවත් අසාධාරණයකට, අකටයුත්තකට මුහුණ දෙන්නට සිදු වෙලා තිබෙනවා. මධ්‍යම ආණ්ඩුවේ බලය තිබෙනවා; පළාත් සභාවේ බලය තිබෙනවා. ඒ නිසා ගැටුමක් ඇති වෙන්න විධියකුත් නැහැ. මොකද, පළාත් සභාවේ බලය තිබෙන්නේත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට. අපේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය, ගරු ෆයිසර් මුස්තාපා මැතිතුමාත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. එතුමාගේ රාජ්‍ය ඇමතිතුමාත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙක්. ඒ නිසා වෙන පළාත් සභාවල වාගේ ගැටුමක් වෙන්න විධියක් නැහැ. රංජිත් සෝමවංශ මැතිතුමාට, ඉසුර දේවප්‍රිය මැතිතුමාට නියෝග කරන්න ඔබතුමන්ලාට පුළුවන්.

ඇත්තටම මේක ලජ්ජාවට කාරණයක්. බස්නාහිර පළාතේ, රටේ වැඩිම ආදායම් උපදවන පළාතේ, රටේ දළ ජාතික නිෂ්පාදිතයට වැඩිම දායකත්වයක් දෙන පළාතේ දෙදහස් පන්සිය ගණනක ගුරු හිඟයක් පවතිද්දී, ගුරු විභාගය සමතුන් 4,000ක් මහ පාරට බැහැලා උද්ඝෝෂණය කරද්දී, මේ ගුරු හිඟයට පිළියමක් විධියට උපාධිධාරින් බඳවා ගන්න බැරි නම් මොකක්ද මේ වැඩේ තේරුම? මෙච්චර ලොකු ඇමති මණ්ඩලයක් සිටියදී - ඇමතිවරු සංඛ්‍යාව 70යි කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබුණාට, ඇමතිවරු සංඛ්‍යාව 92කටත් වඩා සිටියදී - මේ දේ කර ගන්න බැරි නම්, රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් වෙනත් දේවල් කරන එක ගැන කවර කථාද?

මා යෝජනා කරන්නේ ගුරු විභාගය සමත් වෙලා සිටින උපාධිධාරින් බඳවා ගැනීම සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් දියත් කරන්න කියලායි. බොරු පොරොන්දු දෙන්නේ නැතිව, ඒ අය ඉගෙන ගත්ත දේ පෙරළා මේ රටේ දරුවන්ට උගන්වන්න, රටට සේවයක් කරන්න වහාම ඒ අයට අවස්ථාව ලබා දෙන්න කියන යෝජනාව කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා.

[பி.ப. 6.40]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மேல் மாகாணப் பாடசாலைகளின் வெற்றிடங்களை நிரப்புவதற்கு மேல் மாகாணசபையினால் நடத்தப்பட்ட பட்டதாரி ஆசிரியர்களை நியமிப்பதற்கான பரீட்சையில் 4,000 பட்டதாரிகள் சித்தியடைந்துள்ளபோதும் அதிகமானோருக்கு நியமனங்கள் வழங்கப்படவில்லை. எனவே, கணித,

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

විஞ்ஞான பிரிவுகளுக்கு ஆசிரியர் பற்றாக்குறை நிலவுவதால் மேற்படி பட்டதாரிகளுக்கு ஏற்புடைய நியமனங்களை வழங்கக்கோரி மக்கள் விடுதலை முன்னணி உறுப்பினர் கௌரவ வைத்திய கலாநிதி நளிந்த ஜயதிஸ்ஸ அவர்கள் முன்வைத்திருக்கும் இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையை நான் ஆமோதிக்கின்றேன். மேல் மாகாணத்தை முன்னிறுத்தி இந்தப் பிரேரணையை முன்வைத்திருக்கின்ற போதும் சிறப்பான ஒரு காலகட்டத்தில் இது முன்வைக்கப் பட்டிருக்கின்றது என்ற வகையிலே இதற்குப் பலம் சேர்க்கும் வகையில் சில முக்கியமான கருத்துக்களை இந்தச் சபையில் பகிர்ந்துகொள்ளலாமென்று நினைக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தற்காலத்தில் நாங்கள் அரசியலமைப்பு மாற்றம் குறித்த கலந்துரையாடல்களை அரசியலமைப்புச் சபையினூடாக இந்தப் பாராளுமன்றத்திலே செய்துவருகின்றோம். அந்த வகையில் இந்த அரசியலமைப்புச் சபையின் சார்பாக, அதனுடன் தொடர்புடையதாகப் பல்வேறு உப குழுக்கள் இந்தப் பாராளுமன்றத்திலே நியமிக்கப்பட்டிருக்கின்றன. அந்தச் சபையின் உப குழுக்களில் Subcommittee on Centre-Periphery Relations எனப்படுகின்ற மத்திய மற்றும் மாகாண அரசாங்கங்களுக்கிடையிலே அதிகாரங்களைப் பகிர்ந்து கொள்வது சம்பந்தமான உப குழுவில் நானும் ஓர் உறுப்பின ராக இருக்கின்றேன். அந்த உப குழுவில் மத்திய அரசாங்கத்துக்கும் மாகாண அரசாங்கங்களுக்குமிடையே அதிகாரங்களைப் பகிர்ந்துகொள்வது சம்பந்தமாக உரையாடல்கள் இடம்பெறுகின்றபோது அடிக்கடி பேசப்படு கின்ற ஒரு விடயம், கல்வி சார்ந்த விடயங்களையும் சுகாதாரம் சார்ந்த விடயங்களையும் எவ்வாறு மத்திய, மாகாண அரசாங்கங்களுக்கிடையே பகிர்ந்துகொள்வது? என்பதாகும்.

குறிப்பாக, இந்தப் பாடசாலைகள் விடயத்தில் மத்தியிலே ஒரு கல்வியமைச்சு இருக்கின்றது; அது நாடு முழுவதுமாகத் தேசிய பாடசாலைகளைக் கொண்டதாகப் பல்வேறு அதிகாரங் களைக்கொண்டு தனது நிர்வாகத்தை நடத்திவருகின்றது. அதேபோல் மாகாணங்களிலும் கல்வியமைச்சு இருக்கின்றது; அந்த மாகாணக் கல்வியமைச்சின் கீழேயும் பல்வேறு பாடசாலைகள் இருக்கின்றன. அந்த அடிப்படையில்தான் கௌரவ உறுப்பினர் வைத்திய கலாநிதி நளிந்த ஜயதிஸ்ஸ அவர்கள் இந்தப் பிரேரணையைச் சமர்ப்பித்திருக்கிறார். சனத் தொகை அதிகமாகக் காணப்படுகின்ற மேல் மாகாணத்தில் இந்தப் பட்டதாரி ஆசிரியர் நியமனங்கள் குறைந்திருப்பது எவ்வாறு? குறிப்பாக கணித, விஞ்ஞான பாடங்களுக்கு ஆசிரியர் பற்றாக்குறை நிலவுவதால் அவற்றுக்கான நியமனங்களை வழங்க வேண்டும் எனக் கோரியிருக் கின்றார். இந்தத் தருணத்தில் இவை கல்வியமைச்சு சார்ந்த நியமனங்களாக இருந்தபோதும் மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் கௌரவ பைசர் முஸ்தபா அவர்கள் இன்று பதிலளிக்கின்றார் என்பது மிகவும் சிறப்பான ஒரு விடயம்.

அவர் முதன்முதல் பாராளுமன்ற உறுப்பினராக அரசியலில் பிரவேசித்தபோது பெருந்தோட்ட ஆசிரிய நியமனங்கள் இடம்பெற்றன; அது தொடர்பாக ஏற்பட்ட பிரச்சினைகளை அவர் நன்கு அறிவார். அந்த வகையில் மத்திய, ஊவா, சப்பிரகமுவ போன்ற மாகாணங்களில் பெருந்தோட்டப் பகுதி ஆசிரியர்களை நியமிக்கும்போதும் இதே மாகாண, மத்திய அரசாங்க நியமனங்கள் அடிப்படையில் வருகின்ற பிரச் சினைகள் அங்கும் பல்வேறு விதங்களில் வருகின்றன.

இச்சந்தர்ப்பத்தில் ஓர் உதாரணத்தைச் சொல்ல விரும்பு கின்றேன். அண்மையில் 3,000 பெருந்தோட்ட ஆசிரிய உதவியாளர் நியமனங்கள் வழங்கப்பட்டன. அவை பகுதிபகுதியாக வழங்கப்பட்டன. அதில் ஒரு பகுதி மத்திய அரசாங்கத்தின் கீழுள்ள பாடசாலைகளுக்கும் வழங்கப்பட்டன. நுவரெலியா விண்ணப்பதாரிகளுக்குக் கிடைத்த நியமனக் கடிதங்களின்படி அவர்களுக்கு ஊவா மாகாணத்தின்கீழ் வருகின்ற பாடசாலைகள் வழங்கப்பட்டிருக்கிறது. அவர்கள் நியமனக் கடிதங்களைப் பெற்றபோதும் ஊவா மாகாண சபையினால் அவர்களுக்கான பாடசாலைகள் இன்னமும் வழங்கப்படவில்லை. அவர்கள் நியமனக் கடிதங்களைக் கைகளில் பெற்றுக்கொண்டு ஒரு மாதத்திற்கும் மேலாக மாகாணப் பாடசாலைகளில் நியமிக்கப்படாமல் வேலையற்ற நிலையில் இருக்கின்றார்கள். இத்தனைக்கும் அவர்களுக்கு வழங்கப்படுகின்ற மாதாந்தச் சம்பளம் 6,000 ரூபாய். இதற்கு ஊவா மாகாண சபையினரால் சொல்லப்படும் காரணம், "6,000 ரூபாய் சம்பளத்தைக் கொடுத்து அந்த 200 ஆசிரிய உதவியாளர்களையும் பாடசாலைகளில் நியமிப்பதற்குப் போதுமான நிதியில்லை" என்பதாகும். மத்திய அரசாங்கம் ஆசிரிய உதவியாளர் நியமனங்களைப் பெற்றுக்கொடுத்தும் கூட மாகாண அரசாங்கத்தின் கீழ் நியமிக்கப்பட்டவர்களுக் கான சம்பளத்தை வழங்குவதற்குப் போதிய நிதியில்லை என்ற காரணத்தினால் அவர்கள் பாடசாலைகளுக்கு நியமிக்கப் படாமல் இருக்கின்ற ஒரு துர்ப்பாக்கிய நிலைமை காணப்படுகின்றது.

எனவே, நான் இங்கு பிரதானமாகக் கூறுகின்ற விடயம், கல்வி அமைச்சுடன் தொடர்பான இந்த நியமனங்கள் சார்பாக மத்திய, மாகாண அரசாங்கங்களுக்கிடையே ஒரு புரிந் துணர்வும் அந்நியோன்னியமான செயற்பாடும் அவசியமாகக் காணப்பட வேண்டும். குறிப்பாக மலையகப் பகுதிகளிலே தமிழ் மொழிமூல கணித, விஞ்ஞான ஆசிரியர்களின் பற்றாக்குறை பெருமளவில் காணப்படுகின்றது. இதனால் கணித, விஞ்ஞானத் துறைகளில் உயர்தரம் கற்கும் மாணவர்கள் பெரும் சிரமத்திற்குள்ளாகியிருக்கிறார்கள். இதற்கு முன்னதாகப் பல்வேறு சந்தர்ப்பங்களிலே இந்த விடயம் பிரஸ்தாபிக்கப்பட்டது. வடக்கு, கிழக்கில் இருக்கின்ற தமிழ் மொழியைக் கற்ற, உயர்தரத்தில் கணிதம், விஞ்ஞானம் கற்ற அல்லது கணித, விஞ்ஞானப் பட்டதாரிகளை மலையகப் பகுதிகளிலுள்ள தமிழ்மொழிமூலப் பாடசாலைகளுக்கு நியமிப் பதாக உத்தரவாதம் அளிக்கப்பட்டாலும் அது நடைமுறைப் படுத்தப்படாமையால் ஆசிரியப் பற்றாக்குறையும் தொடர்ந்து கொண்டிருக்கின்றது.

அண்மைக்காலமாக ஊவா மாகாணத்திலே இத்தகைய குறைபாடுகள் அதிகமாகக் காணப்படுகிறது. அதேவேளை, மத்திய மாகாணத்தில் கணித, விஞ்ஞான பாடங்களில் ஓரளவு சித்தி பெறுகின்ற நிலைமை காணப்படுவதால் பதுளை மாவட்டத்திலிருந்து பெரும்பாலான தமிழ்மொழி மூல மாணவர்கள் நுவரெலியா மாவட்டத்தை நோக்கி உயர் தர வகுப்புகளில் கற்பதற்காக வருகிறார்கள். இதனால் இங்கு இரண்டு பிரச்சினைகள் எழுகின்றன. ஒன்று, ஆசிரிய நியமனங்கள் உரிய மாகாணங்களுக்கு உரிய வகையில் இடம்பெறுவதில்லை. அடுத்தது, இந்த ஆசிரிய நியமனங்கள் உரியமுறையில் இடம்பெறாததன் காரணமாக ஒரு மாவட்டத்திலிருந்து இன்னுமொரு மாவட்டத்திற்கு உயர்தரக் கல்விக்காக மாணவர்கள் வந்துசேர்கின்றனர். அதனால் வேறு மாகாணத்திலுள்ள பாடசாலையின் வளங்கள் போதாமையின் காரணமாக அந்தக் குறிப்பிட்ட மாவட்டத்திலுள்ள பாடசாலையில் அதிகளவான மாணவர்களை உள்வாங்க வேண்டிய நிலைமை ஏற்படுகின்றது. இதனால் இங்கே பாடசாலை அனுமதி தொடர்பான சிக்கல்களும் நிலவுகின்றன.

எனவே, கல்வி அமைச்சினால் வழங்கப்படுகின்ற இந்த நியமனங்கள், மத்திய அரசாங்கத்தின் தீர்மானங்கள் என்பன மாகாண அதிகாரங்களைக் கொண்ட கல்வியமைச்சுடன் எவ்வாறு பொருந்தும் என்பது பற்றி இந்த இரண்டு அமைச்சு களும் ஒன்றுசேர்ந்து ஒரு தீர்க்கமான முடிவுக்கு வரவேண்டும். அப்போதுதான் குறிப்பிட்ட இந்தப் பிரச்சினைக்குத் தீர்வு காணக்கூடியதாக இருக்கும். கௌரவ உறுப்பினர் அவர்கள் குறிப்பிட்டதுபோல பட்டதாரிகளாக இருந்தும் வேலையற்று அவர்கள் போராட்டம் நடத்திக்கொண்டிருக்கின்ற சூழ்நிலை காணப்படுகிறது. இவ்வாறான குறைபாடுகள் பல்வேறு அமைச்சு மட்டங்களிலும் இருப்பதனால் மத்திய, மாகாண அரசுகளைச் சமரசம் செய்யும் வகையில் ஒரு முறையான திட்டமிடலின்கீழ் இந்த வேலைத்திட்டத்தை முன்னெடுக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා.

[අ.භා. 6.47]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව ඉතාමත්ම කාලීන හා වැදගත් යෝජනාවක් කියා මා විශ්වාස කරනවා. එතුමා කිව්ව විධියටම, දකුණු පළාතේ තිබෙන මාතර, ගාල්ල, හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුනේත් මීට සමානම මහා දැවැන්ත අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. අද මේ ජාතියේ වාසනාවට බිහි වුණු දරුවන් වෙනුවෙන් පළාත් සභා ඇමතිවරු විසින් සහ වර්තමාන යහ පාලන ආණ්ඩුව විසින් ඉතාමත් යහපත් ප්‍රතිචාරයක් දක්වා තිබෙනවාය කියන එක විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. 2014 වසරේදී ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක සහිත දකුණු පළාතට අදාළව උපාධිධාරින් බඳවා ගැනීම සිදු කළා. දළ වශයෙන් උපාධිධාරින් 8,500ක් පමණ. වයස අවුරුදු 35ට අඩු උපාධිධාරින්ට ඉල්ලුම්පත් යොමු කරන ලෙසයි එහි සඳහන් කරලා තිබුණේ. පසුව අපි ඒ සඳහා දැඩි අරගළයක් කළා. මොකද, ඒ වෙන කොට බස්නාහිර පළාත් සභාවේ උපාධිධාරින් බඳවා ගැනීමේ වයස අවුරුදු 45ක් ලෙසයි සඳහන් කරලා තිබුණේ. මම චන්දිම රාසපුත්‍ර අමාත්‍යවරයාගෙන් ඇහුවා, "ඇයි, තමුන්නාන්සේ දකුණු පළාතේ උපාධිධාරින්ගේ මානව හිමිකම් උල්ලංඝනය කරන්නේ" කියලා. ඊට පස්සේ වයස් සීමාව 45 දක්වා වැඩි කරලා ඉල්ලුම් පත්‍ර දාන්න දවස් 10ක් කල් දුන්නා. ඒ දරුවෝ 8,500ක් අයදුම්පත් ඉදිරිපත් කිරීම නිසා පළාත් සභාව රුපියල් 350 ගණනේ දළ වශයෙන් රුපියල් ලක්ෂ 27ක් පමණ සොයා ගත්තා. ගරු ඇමතිතුමනි, අවුරුදු එකහමාරකට විතර පස්සේ තමයි මේකට අදාළ විභාගය පැවැත්වූවේ. බරපතළ ප්‍රශ්නයක් මතු වුණු නිසා තමයි ඒ විභාගය පැවැත්වූවේ. මොකද, ඒ අයගේ ප්‍රයත්නය අනුව පළමුවැනි වතාවට මූලික පියවර වුණේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් උපාධිධාරින් තෝරාගෙන එහි තිබුණු පුරප්පාඩු පුරවලා ඉතිරි පුරප්පාඩු අල්ලපු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පුරවන්නයි. ඒ සඳහා පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මුළුමනින්ම විරුද්ධ වුණා. මොකද, ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සිටින ආසන්න ලකුණු ලබාගත් උපාධිධාරින්ට අසාධාරණයක් වෙනවා කියලා. ඒ නිසා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බඳවාගත් අය හැරුණු කොට ඉතුරු අය බඳවා ගැනීම සඳහා ඒ 8,500දෙනා සඳහාම විභාගයක් පැවැත්වූවා. ඒ විභාගයෙන් ඔවුන් සමත් වුණා. ලකුණු තේරුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විශ්වාස කරන්න, ලකුණු අනුව මුළු පළාතෙන්ම තෝරාගත්තේ 850දෙනයි. අද මේ මොහොත වන විටත් ඒ දරුවෝ දකුණු පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය ළඟ විරෝධය පාලා අරගළ කරනවා. විභාගය සමත් වෙලා, ලකුණුත් අරගෙන, උපාධිය සාපයක් බවට පත්වෙලා තිබෙන දරුවන්ට අද රැකියා අවස්ථා ලබාදෙන්නේ නැහැ. දකුණු පළාත් සභාවේ පාසල්වල ඕනෑ තරම් පුරප්පාඩු තිබෙනවා. නමුත් අද ඒ දරුවන්ට බරපතළ ගැටලුවක් ඇතිවෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උපාධිධාරින් තෝරා ගැනීමේදී උපාධිධාරින් 5දෙනෙක් හිටියා. ඒ 5දෙනා සඳහා primary අංශයේ, ඒ කියන්නේ ප්‍රාථමික අංශයේ පුරප්පාඩු තුනයි තිබුණේ. එම ප්‍රාථමික අංශයේ පුරප්පාඩුවලින් පළමුවැනි දෙදෙනාට පුරප්පාඩු දෙකක් ලබා දුන්නා. ඊළඟට එක පුරප්පාඩුවක් ඉතුරු වුණා. ඒ පුරප්පාඩුව සඳහා ලකුණු 116 සම මට්ටම ලබාගත් තුන්දෙනෙක් සිටියා.

ඊළඟට ප්‍රශ්නයක් මතු වුණා, ඒ එක පුරප්පාඩුව පුරවන්නේ කොහොමද කියලා. ඒ වාගේ අවස්ථාවල කාසි උඩ දාලා chance එකක් දෙන්න බැහැ නේ. ඒ නිසා දකුණු පළාත් සභාවේ අමාත්‍යවරයාම කියලා තිබුණා, එම උපාධිධාරින් තුන්දෙනාගෙන් වැඩිම සුදුසුකම් තිබෙන කෙනාට පත්වීම දෙනවා කියලා. ඒ අයගෙන් දෙදෙනෙක් බාහිර උපාධිධාරින්. එක් අයෙක් අභ්‍යන්තර උපාධිධාරියෙක්. ඔහුට දෙවැනි පන්තියේ සාමර්ථයක් තිබෙනවා.

මා ප්‍රශ්න කළායින් පස්සේ කිව්වා, "අනිවාර්යයෙන්ම ඒ දෙවැනි පන්තියේ සාමාර්ථය තිබෙන අභ්‍යන්තර උපාධිධාරියාට තමයි මේ පත්වීම දෙන්නේ" කියලා. නමුත් ගරු ඇමතිතුමනි, අදත් ඒ පුරප්පාඩුව එසේම තිබෙනවා. අමාත්‍යවරයා හෝ නිලධාරින් මේ පුරප්පාඩුව පිරෙව්වේ නැහැ. එහෙම තිබියදී, 2016ට නැවත වතාවක් පසු ගිය දවස්වල applications කැඳෙව්වා, ගුරු ව්‍යවස්ථාව අනුව වයස 35ට සීමා වන පරිදි. දැන් දහස් ගණනක් මේ වතාවේත් රුපියල් 350, 400 වියදම් කරලා ඒ පුරප්පාඩුවලට ඉල්ලුම් කරලා තිබෙනවා. නමුත්, දැනටත් විභාගය පාස් වෙලා, ලකුණු අරගෙන ඉන්න අය ඉන්නවා. පුරප්පාඩු තිබෙනවා; දෙන්නේ නැහැ. අධ්‍යාපන බලධාරින්ට, අමාත්‍යවරයාට මේ සම්බන්ධයෙන් කිසිදු ආකාරයක වැඩ පිළිවෙළක්, ප්‍රතිපත්තියක්, ක්‍රියා මාර්ගයක් නැහැ. ඔහේ නිකරුණේ බලාගෙන ඉන්නවා.

අද විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා ගන්නවා කියලා කියන්නේ කණ කැස්බෑවෙක් විය සිදුරෙන් එළිය බලනවාට වඩා අමාරු දෙයක්. බාහිර උපාධියක් ලබා ගන්නවා කියලා කියන්නේ ඊටත් වඩා අමාරු දෙයක්. අපි විශ්වවිද්‍යාලයට ගිය කාලයේ බාහිර උපාධිධාරින්ට උපාධියක් ලබා ගන්න ඒ තරම් මුදලක් වැය වුණේ නැහැ. නමුත්, බාහිර උපාධියක් ලබා ගන්න අද දහස් ගණනක් වැය කරන්න සිදු වෙලා තිබෙනවා. මහා දැවැන්ත syllabus එකක් පාඩම් කරලා තමයි එය ලබා ගන්න ඕනෑ. එහෙම ලබා ගත්තත් අද මේ උපාධිය ඒ අයට ශාපයක් බවට පත් වෙලා තිබෙනවා. අපි අමාත්‍යවරුන්ගෙනුත් බලධාරින්ගෙනුත් අහන්නේ, ජාතියේ දරුවන්ගේ අවශ්‍යතා තේරුම් ගන්න බැරි ඇයි කියලායි. ඒ අයටත් පවුල් තිබෙනවා. ඒ අයටත් අම්මලා, තාත්තලා ඉන්නවා. සහෝදර, සහෝදරියෝ ඉන්නවා. අසල්වැසියෝ ඉන්නවා. ඔවුන්ටත් අවශ්‍යතාවන් තිබෙනවා. ඒ අයත් හරි ලස්සනට ජීවත් වෙන්න කැමැතියි. ඒ මිනිසුන්ගේ කුරුලු කූඩු මේ විධියට විනාශ

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

කරන්න මේ පුද්ගලයෝ උත්සාහ ගන්නේ ඇයි කියලායි අපි ප්‍රශ්න කරන්නේ. ඒ නිසා නිශ්චිත වැඩ පිළිවෙළක්, ප්‍රතිපත්තියක් සකස් කරලා කරුණාකර උපාධිධාරීන්ගේ ප්‍රශ්නය විසඳන්න කියන ඉල්ලීම අපි අපේ පැත්තෙන් කරමින් මා නිහඬ වනවා.

[අ.භා. 6.54]

ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කල් තැබීමේ යෝජනාව ඉතා කාලීනයි, උචිතයි. මම හිතන්නේ ශ්‍රී ලංකාවේ-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, මෙම යෝජනාව සම්බන්ධව කථා කරන අවස්ථාවේදී මම මූලාසනයේ හිටියේ නැතිනම් මමත් ඔය කාරණය සම්බන්ධව කථා කරනවා. නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා කිව්වා වාගේ බස්නාහිර පළාතේ මෙම ප්‍රශ්නය තිබෙනවා. විභාගයට පෙනී හිටපු බොහෝ ළමයි බලාගෙන ඉන්නවා.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

මම හිතන්නේ මේක ජාතික ප්‍රශ්නයක් කියලායි. දේශපාලන භේදයකින් තොරව අපි සියලු දෙනාම එකතු වෙලා අනිවාර්යයෙන්ම මේ ප්‍රශ්නයට විසඳුමක් සෙවිය යුතුයි. අපි සියලු දෙනාම නිදහස් අධ්‍යාපනයෙන් බිහි වුණු අය.

බස්නාහිර පළාත ගැන කථා කරනකොට, අනුමත ගුරු සංඛ්‍යාව 34,374යි. දැනට සේවය කරන සංඛ්‍යාව 34,642යි. ඒ අනුව දැනට 260ක ගුරු අතිරික්තයක් තිබෙනවා. නමුත්, 2016/1 දරන චක්‍රලේඛය අනුව school-based circular එකක් ගෙනාවා. පාසලට පදනම් වූ ගුරු පත්වීම් දෙන යහ පාලන ආණ්ඩුවේ මෙම ක්‍රියාදාමය තුළ දුෂ්කර පාසල්වලට පත්වීම් ගන්නවා. මාසයකින්, දෙකකින් වෙනත් පාසල්වලට යනවා. මම හිතන්නේ, මේ ප්‍රශ්නයට ඉතාමත් හොඳ විසඳුමක් හැටියට school-based පත්වීම් ක්‍රමවේදයට අපි සියලු දෙනාම ප්‍රශංසා කළ යුතුයි කියලායි. මේ චක්‍රලේඛයෙන් පසු ගුරු පත්වීම් 37,205ක් තිබෙනවා. ඒ නිසා නව ගුරු පත්වීම් 2,831ක් අපට දිය හැකියි. 2004 විභාගයෙන් සමත් වූ උපාධිධාරීන් 4,097ක් හිටියා. එයින් 574ක් සම්මුඛ පරීක්ෂණයට කැඳෙව්වා. ගුරුවරු 1,067ක් ඒ සම්මුඛ පරීක්ෂණයට පැමිණියේ නැහැ. ඒ අනුව අපට තවදුරටත් ගුරු පත්වීම් 3,523ක් ලබා දෙන්න පුළුවන්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

බස්නාහිර පළාතේද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ඔව්. මම හිතන්නේ, සමස්තයක් විධියට ගත්තාම සෑම පළාත් සභාවකම මේ ප්‍රශ්නය තිබෙනවා. පළාත් සභාවල මහ ඇමතිවරු සහ අධ්‍යාපන ඇමතිවරු කැඳවලා මේ ප්‍රශ්නයට ක්ෂණික විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්නම් කියලා මම මේ අවස්ථාවේදී ඔබතුමන්ලාට දැනුම් දෙනවා. මේ සම්බන්ධව අධ්‍යාපන ඇමතිතුමා එක්කත් සාකච්ඡා කරලා පූර්ණ විසඳුමක් ලබා ගැනීමට අවශ්‍යයි. ඒ නිසා කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් මම කියනවා, ගුරු පත්වීම්වලට ක්ෂණික විසඳුම් ලබා දෙන්න කටයුතු කරන බව.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු ඇමතිතුමනි, අපත් සහභාගි වෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමාට පැහැදිලි කර ගැනීමට අවශ්‍යද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ඇමතිතුමනි, මට යමක් පැහැදිලි කර ගැනීමට අවශ්‍යයි. ඔබතුමා ගුරු අතිරික්තයක් ගැන කිව්වා නේද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ඔව්. ඒ කියන්නේ cadre එක අනුවයි. Cadre එක තිබුණේ 34,374යි. දැනට ගුරුවරු 34,642කට පත්වීම් දීලා තිබෙනවා. Cadre එක අනුව 260කගේ excess එකක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ඔය කියන්නේ පළාත් පාසල්වල පමණක්ද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ඔව්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරන කොට මේකට වඩා වෙනස්

සංඛ්‍යා ලේඛනයක් තමයි ඉදිරිපත් වුණේ. කොහොම වුණත් ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිගන්නේ කී දෙනෙකුට රැකියා දෙන්න පුළුවන් කියලාද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
3,523දෙනෙකුට.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඒ ප්‍රමාණයට දෙන්න පුළුවන්.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ඒ සම්බන්ධයෙන් මම බස්නාහිර පළාත් මහ ඇමතිතුමා එක්ක සහ අධ්‍යාපන ඇමතිතුමා එක්ක කථා කරලා ක්ෂණික විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්නම්. ඔබතුමා ප්‍රශ්නය යොමු කළා. මේ ප්‍රශ්නයට ක්ෂණික විසඳුමක් අනිවාර්යයෙන්ම අවශ්‍යයයි. නැත්නම් අධ්‍යාපන ක්ෂේත්‍රයේ යම් ප්‍රශ්න මතු වනවා කියන එකත් මම මේ අවස්ථාවේදී පිළිගන්නවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඔබතුමා ගරු සභාව හමුවේ තබන මේ වචනය මම විශ්වාස කරනවා සහ එයට ස්තුතිවන්ත වනවා. මේ තරුණ ජීවිත. ඒ අය දවස් ගණන්, අවුරුදු ගණන් බලාගෙන ඉන්නවා. ඔබතුමාට දළ වශයෙන් කාල නිර්ණයක් කරන්න පුළුවන්ද, ගුරු පුරප්පාඩු ප්‍රමාණය අපි මෙපමණ කාලයකින් උපාධිධාරීන්ගෙන් සම්පූර්ණ කරනවා කියලා.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමා, ක්ෂණික විසඳුමක් දෙන්න මම කටයුතු කරන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
හේතුව, පළාත් සභාව වෙනුවෙන් පාර්ලිමේන්තුවට උත්තර දෙන්නේ මම. හැබැයි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව පළාත් සභාවලට ස්වාධීනත්වයක් තිබෙනවා. ඒ නිසා අපි පළාත් සභාත් එක්ක සාකච්ඡා කර මේ ප්‍රශ්නයට විසඳුමක් හොයමු. අපි ඒ සාකච්ඡාවට ඔබතුමන්ලාවත් සම්බන්ධ කර ගන්නම්. අපි සාකච්ඡාවක් කරලා මේකට විසඳුමක් හොයමු.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තුන්දහස් ගණන බඳවා ගන්නේ බස්නාහිර පළාතේ පැවැති ගුරු විභාගය අනුව නේද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
සමත් වුණු සංඛ්‍යාව 4,097යි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සමත් වුණු අයගේ ලැයිස්තුව අනුවද තෝරා ගන්නේ.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ඔව්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.00ට, 2016 මාර්තු 08 දින සභා සම්මතිය අනුව, 2016 ජූලි මස 21වන බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 වන තෙක් කල් තියේය.

அதன்படி பி.ப. 7.00 மணிக்கு பாராளுமன்றம், அதனது 2016 மார்ச் 08ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க 2016 யூலை 21, வியாழக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 7.00 p.m. until 10.30 a.m. on Thursday, 21st July, 2016 pursuant to the Resolution of Parliament of

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

245 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 245 - இல. 5
Volume 245 - No. 5

2016 ජූලි 21 වන බ්‍රහස්පතින්දා
2016 யூலை 21, வியாழக்கிழமை
Thursday, 21st July, 2016

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
- උතුරු සහ නැගෙනහිර පළාත්වල ආබාධිතවූවන් මුහුණ දෙන ගැටලු
- යාපනය විශ්වවිද්‍යාලයේ ඇති වූ නොසන්සුන් තත්ත්වය

අග්‍රාමාත්‍යතුමාගේ සිංගප්පූරු සංචාරය

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත:
- පළමුවන වර කියවන ලදී

සබරගමුව පළාත් සංචාරක කාර්යාංශ ප්‍රඥප්ති කෙටුම්පත

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත:
- රීති

ආනයන හා අපනයන (පාලන) පනත:
- නියෝග

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
- வடக்கு, கிழக்கு மாகாணங்களில் மாற்றுவலுவுள்ளோர் முகங்கொடுக்கும் பிரச்சினைகள்
- யாழ். பல்கலைக்கழகத்தில் ஏற்பட்ட பதற்ற நிலை

பிரதம அமைச்சரின் சிங்கப்பூர் விஜயம்

பல்கலைக்கழகங்கள் (திருத்தம்) சட்டமூலம் :
- முதன்முறை மதிப்பிடப்பட்டது

சபரகமுவ மாகாண சுற்றுலாத்துறைப் பணியக நியதிச்சட்ட வரைவு

இலங்கை அணுசக்தி சட்டம் :
- ஒழுங்குவிதிகள்

ஏற்றுமதி, இறக்குமதிச் (கட்டுப்பாடு) சட்டம் :
- ஒழுங்குவிதிகள்

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE
- Problems Faced by the Disabled in Northern and Eastern Provinces
- Tense Situation in Jaffna University

SINGAPORE TOUR OF PRIME MINISTER

UNIVERSITIES (AMENDMENT) BILL:
- Read the First time

DRAFT STATUTE OF THE SABARAGAMUWA PROVINCIAL TOURIST BUREAU

SRI LANKA ATOMIC ENERGY ACT:
- Rules

IMPORTS AND EXPORTS (CONTROL) ACT:
- Regulations

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 ජූලි 21වන බ්‍රහස්පතින්දා
2016 யூலை 21, வியாழக்கிழமை
Thursday, 21st July, 2016

පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම සහ තේරීම් කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டமும் தெரிவுக்குழுக் கூட்டமும்
MEETINGS OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS AND COMMITTEE OF SELECTION

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

2016 ජූලි මස 21වන බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 1.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් සහ ඉන් අනතුරුව තේරීම් කාරක සභාවේ රැස්වීමක් ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස එකී කාරක සභාවල ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව 2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ IX සහ X වැනි කොටස්, තුන්වැනි කාණ්ඩයේ VI වැනි කොටස සහ පස්වැනි කාණ්ඩයේ VIII සහ IX වැනි කොටස්; සහ 2014 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XI සහ XII වැනි කොටස් සහ පස්වැනි කාණ්ඩයේ IV සහ V වැනි කොටස් මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තාවල එකී කොටස් මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

2016 ජූනි 22 දිනැති අංක 1972/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින්, සිංහල හා දෙමළ භාෂා පිටපත්වල මුද්‍රණ දෝෂ නිවැරදි කරනු ලැබූ, මෝටර් වාහන පනතේ (203 වැනි අධිකාරය වූ) 122 වගන්තිය සහ VII අ කොටස සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද 2015 නොවැම්බර් 02 දිනැති අංක 1939/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.- [ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Deputy Speaker, I present the Annual Report of the Post Graduate Institute of Medicine for the year 2013, and move that this Report be referred to the Sectoral Oversight Committee on Education and Human Resources Development.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீர மைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිපුණතා සංවර්ධන හා ව්‍යාත්තීය පුහුණු අමාත්‍යතුමා වෙනුවෙන් 2013 වර්ෂය සඳහා නිපුණතා සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව සහ 2013 වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තා සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (වූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழுக்களின் அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු රංජිත් අලුවිහාරේ මහතා
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග තුනක් සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ රීති සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තා
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கைகள்
PUBLIC FINANCE COMMITTEE REPORTS

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Deputy Speaker, I present the Report of the Committee on Public Finance on the Bill entitled, "Fiscal Management (Responsibility) (Amendment)" referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - புனர்வாழ்வளிப்பு மற்றும் மீள்குடியேற்ற இராஜாங்க அமைச்சர்)
(The Hon. M.L.A.M. Hizbullah - State Minister of Rehabilitation and Resettlement)

Hon. Deputy Speaker, I present a petition received from Mr. A.R.F. Ariff of No. 181, Sahibu Road, Kalmunai - 06.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - வெளிநாட்ட லுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නුගේගොඩ, මිරිහාන, රූපසිරි මාවත, නො: 50/4 දරන ස්ථානයෙහි පදිංචි ප්‍රේමා ද සිල්වා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මනුෂ නානායක්කාර මහතා - පැමිණ නැත.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුරාධපුර, 3වන පියවර, නො: 2626 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. දයාරත්න අඹෝගම මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, யாழ்ப்பாணம், நல்லூர், பண்டாரக்குளம் லேன், இல. 36 இல் வதியும் திரு. ஏ. இராசையாவிடமிருந்து கிடைக்கப்பெற்ற மனுவையும் யாழ்ப் பாணம், பருத்தித்துறை வீதி, இல. 88/6இல் வதியும் திரு. எஸ்.ஆர் இராசலிங்கத்திடமிருந்து கிடைக்கப்பெற்ற மனுவை யும் சமர்ப்பிக்கின்றேன்.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුස්සැල්ලාව, නව මෙල්ෆෝට් නිවාස යෝජනා ක්‍රමය, නො: 71 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්.කේ.කේ. කරල්ලියද්ද මෙනවියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් හත මම පිළිගන්වමි.

(1) මාඵුවාන - කෙරදේවල, එලිතුඩුව යන ලිපිනයෙහි පදිංචි ඇග්නස් සී.ඩබ්ලිව්. ජයසේකර මෙනවියගෙන් ලැබුණු පෙත්සම;

(2 බද්දේගම, ගනේගම දකුණ, වලව්වත්ත යන ලිපිනයෙහි පදිංචි අජිත් කුමාර ඒකනායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) ගා/නාගොඩ, උඩවැලිවිටිය, නො. 29 දරන ස්ථානයෙහි පදිංචි ඩයනා කාරියවසම් මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම;

(4) කිරම, කරමැටිය, පුවක්ගස්ආර, මහරුප්ප වත්ත යන ලිපිනයෙහි පදිංචි එම්.ජී. ශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) ගාල්ල, නාගොඩ, කැප්පිටියාගොඩ, "රවීන්ද්‍ර" යන ලිපිනයෙහි පදිංචි එන්.කේ.එම්. කීර්තිසාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) අහංගම මහජන පුස්තකාලයේ සේවය කරන දකුණු පළාත් ශ්‍රී ලංකා එක්සත් නිදහස් පුස්තකාල සහාය සංගමයේ ලේකම් එන්.පී.කේ. ඉන්ද්‍රලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(7) කුලීගොඩ, දිඹුල්දූව යන ලිපිනයෙහි පදිංචි පී.එච්. නන්දන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 1-77/'15-(3), ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සකියක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව : ලබා දුන් ණය
லங்காபுத்ர அபிவிருத்தி வங்கி : வழங்கிய கடன்
LANKAPUTHRA DEVELOPMENT BANK: LOANS GRANTED

409/'16

2. ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ සීවර සමිතියක් වෙනුවෙන් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් රුපියල් ලක්ෂ 750ක මුදලක් දේශපාලනඥවරියකට ලබා දී තිබේද;

(ii) ඇයගේ නම කවරේද;

(iii) එසේ නම්, එම ණය මුදල ලබා දීම සඳහා ඇපයට තබාගෙන ඇති දෑ කවරේද;

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

(iv) එම ණය මුදලෙන් මේ වනවිට කොපමණ ආපසු අය කර ගෙන තිබේද;

(v) එසේ නොමැති නම්, දිගින් දිගටම ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(vi) ඒ පිළිබඳව සම්පූර්ණ විස්තරයක් සභාගත කරන්නේද;

(vii) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් ලබා දෙන ණය සඳහා පන්සල්වල ඔප්පු, කල්බදු ක්‍රමයට රජයෙන් ලබාගත් ඉඩම් හෝ තිරුවානා ගල් ඇපයට තබාගත හැකි ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

අරස තොළිල් මුයර්සිකළ් අපිවිරුත්ති අමෛච්සරෛක් කේට්ට විනා:

(අ) (i) තිරුකෝණමලෛ පිරදේසත්තිල් මීනවර් සංක මොන්රින් සාර්පාක ලංකාපුත්‍ර අපිවිරුත්ති වංකියිනාල් පෙණ් අරසියල්වාදි යොරුවරුක්කු රූපාය් 750 ඉලට්සම් වළංගප් පට්ටුල්ලදා එන්පදෛයුම්;

(ii) ඉවරුදෛය පෙයර් යාදෙන්පදෛයුම්;

(iii) ආමෙනිල්, මේර්පඩි කඩන් තොකෛයෛ වළංගු වදර්කු පිණෛයාක වෛක්කප්පට්ටුල්ලවෛ යාවෛ එන්පදෛයුම්;

(iv) මේර්පඩි කඩන් තොකෛයිල් තර්පෝදු මීළ අරවිඩප්පට්ටුල්ල තොකෛ එව්වළවෙන් පදෛයුම්;

(v) ඉන්රෙල්, තොඩර්ච්සියාක කඩන් සෙලුත්තුදල් තවරවිඩප්පට්ටුල්ලමෛ තොඩර්පාක මේර් කොළ්ළප්පට්ට නඩවඩික්කෛකළ් යාවෛ එන්පදෛයුම්;

(vi) අදු තොඩර්පාන මුළුමෛයාන විපරංකළෛ සපෛයිල් සමර්ප්පිප්පාරා එන්පදෛයුම්;

(vii) ලංකාපුත්‍ර අපිවිරුත්ති වංකියිනාල් වළංගප් පඩුම් කඩන්කළුක්කු පන්සාලෛකළින් උරුදිකළ්, කුත්තකෛ මුරෛයිල් අරසාංකත්තිලිරුන්දු පෙරප්පට්ට කාණිකළ් අල්ලදු පඩිකක් කර්කළෛ පිණෛයාක වෛක්ක මුඩියුමා එන්පදෛයුම්;

අවර් ඉච් සපෛක්කු අරිවිප්පාරා?

(ඇ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Public Enterprise Development:

(a) Will he inform this House -

(i) whether Lankaputhra Development Bank has given Rs. 75 million, to a lady politician on behalf of a fishermen's association in Trincomalee District;

(ii) her name;

(iii) the security kept, to obtain aforesaid loan;

(iv) the amount that has been recovered by now;

(v) if not, the measures that have been taken on the frequent defaults;

(vi) whether a detailed report will be tabled, in that regard; and

(vii) whether deeds of temples, the lands which were leased out by the State or quartz can be produced as security in obtaining loans from Lankaputhra Development Bank?

(b) If not, why?

ගරු කබීර් හාෂිම් මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Public Enterprise Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(vii) පන්සල්වල ඔප්පු - නොහැකියි.

කල්බදු ක්‍රමයට රජයෙන් ලබාගත් ඉඩම් - හැකියි.

තිරුවානා ගල් - නොහැකියි.

(ආ) අදාළ නොවේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය තුන්වතාවක් පමණ කල් ගිහින් අද පිළිතුරක් ලබාදීම ගැන සතුටුයි.

අපේ ගරු ඇමතිතුමා දැන් කිව්වා, "එහෙම දීලා නැහැයි" කියලා. නමුත්, ත්‍රිකුණාමල ප්‍රදේශයේ සිවර සමිතියක් පිහිටුවලා 2007 ජූලි 23වැනි දා ශක්‍යතා වාර්තාවක් දීලා ඉල්ලා තිබුණා, බෝට්ටු 25ක් හදන්න රුපියල් ලක්ෂ 50 බැගින් රුපියල් මිලියන 1,250ක්. නමුත්, බැංකුව පසුව බෝට්ටු 15ක් සඳහා රුපියල් ලක්ෂ 750ක් දීලා තිබෙනවා. ඒකට මැදිහත් වෙලා තිබෙන්නේ, නැහෙනහිර පළාත් සභාවේ හිටපු ඇමතිනිය, ඒ වාගේම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ත්‍රිකුණාමල සංවිධායකවරිය වන ආරියවතී ගලප්පත්ති මහත්මිය. එතුමියට එහෙම ණයක් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් දීලා තිබෙනවාද?

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන කාරණයේ ඇත්තක් තිබෙනවා. බැංකුවෙන් තොරතුරු මෙලෙස දී තිබුණත් මෙහි පසු බිම් වාර්තාව දිහා බලන කොට, එක්සත් සිවර උදාන සමුපකාර සමිතිය කියන ආයතනයට තමයි මේ ණය ලබා දීමට ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් තීරණය

කරලා තිබුණේ. එම සමිතියේ නිලධාරින් හැටියට කීප දෙනෙක් හිටියා. සමන්ත, ලාල් නිශාන්ත, ජානක, රත්නවීර, චින්තක, චමින්ද, සෝමදාස කියන අය. නමුත්, එතැන ඇපකරුවෙක් හැටියට අත්සන් කරලා තිබුණේ, පළාත් සභා ඇමතිනි ඩබ්ලිව්.ජී.එම්.එම්. ආරියවතී මහත්මිය. එතුමිය තමයි රුපියල් මිලියන 75ක ණය මුදලේ ඇපකරුවෙක් හැටියට ඒ සමිතිය වෙනුවෙන් අත්සන් කර තිබෙන්නේ.

මුදල් ලබා ගෙන බෝට්ටු ලබා ගන්නවා කියලා ධීවරයන්ට කියලා තිබුණාට කිසිම කෙනෙකුට බෝට්ටු ලබා දීලා තිබුණේ නැහැ. මුදල් අරගෙන වංචාවක් කරලා තිබෙන බව තමයි පෙනී යන්නේ. මේ වෙනකොට බැංකුවෙන් පොලීසියට පැමිණිලි කරලා නඩු පවරලා තිබෙනවා. නඩු පවරලා දැනට එක් එක් අයගෙන් මෙම මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කර තිබෙනවා. සමහර අයට මේ මුදල් මාසික වාරික හැටියට ගෙවීම සඳහා උසාවියෙන් තීන්දු කරලා තිබෙන අතර තවත් සමහර අය මුදල් නොගෙවා වංචා කරන මට්ටමට ඇවිල්ලා තිබෙනවා. දැන් ඒවාට නඩු පවරලා මුදල් ලබා ගැනීමට හැකියාවකුත් නැහැ. ඒ ඇමතිතුමිය තවම හිටියාට, ඒ ඇමතිතුමිය වග කීම ගන්නේත් නැහැ. ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි, මෙක වංචාවක් හැටියට ඉදිරියේදී FCID එකට හෝ පොලීසියට පැමිණිල්ලක් කරන්න බැංකුවට උපදෙස් දෙන්න අමාත්‍යාංශයෙන් තීරණය කරලා තිබෙන බව.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ශක්‍යතා වාර්තාවක් නැතුව තමයි ඒ මුදල් දීලා තිබෙන්නේ. පිටු 4ක වාර්තාවක් තමයි තිබෙන්නේ. ඒකේ තිබෙන්නේ, "හැකියාව ඇති ධීවරයන්ට ධීවර යාත්‍රා නිපදවා ගැනීමට අවස්ථාව උදා කිරීම, ධීවර පවුල්වලට තම ආදායම් මාර්ග සංවර්ධනය කිරීමට අවස්ථාව දීම, වෙළෙඳ පොළට උසස් තත්ත්වයේ මත්ස්‍යයන් ලබා දීම, ලිපිකරු රැකියා අවස්ථාවන් 25ක් ලබා දීම" කියලායි. එතකොට මෙතැන පැන නැඟෙන ගැටලුව මෙයයි. ණය ගත්තු අය ණය ගෙවන්නේ නැති එකට නීතිමය පියවර ගන්න ඕනෑ වාගේම ඇපකරුවන්ට නීතිමය පියවර ගන්න ඕනෑ වාගේම මේක අනුමත කරපු බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයටත් නීතිමය පියවර ගන්නවාද කියලා මම අහන්න කැමැතියි.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලයේ දේශපාලන බලපෑම් මත ගෙවීම් සිදු කරලා තිබෙන බව පැහැදිලිව පෙනෙනවා. ණය දෙනවා කියලා කිසිම පසු බිම් වාර්තාවක් නැතුව, ශක්‍යතා වාර්තාවක් නැතුව ඒ වාගේම නිසි ඇගැයීමක් බැංකුවෙන් නොකර එම අධ්‍යක්ෂ මණ්ඩලය මේ මුදල අනුමත කරලා තිබීම ලොකු වරදක් හැටියටයි අපට පෙනී යන්නේ.

විශේෂයෙන්ම, පසු ගිය කාලයේ පැවති රජයේ ආධාරකරුවෙක් හැටියට පළාත් සභා ඇමතිවරියක් මෙයට සම්බන්ධ නිසා, මෙහි බලපෑම අපට පෙනෙනවා. ඒ අනුව, එම අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ඒ බැංකුවේ ගනු-දෙනු ක්‍රියාත්මක කළ සෑම අයෙකුටම විරුද්ධව පැමිණිලි කිරීමට කටයුතු කරන බව මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථාව නම් තිබෙන්නේ, මෙය මෙතුමිය පක්ෂ මාරු කරන වෙලාවේ ලබා දුන් අල්ලසක් කියලායි. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවට මෙවැනි ආකාරයට පොලු තියපු අය ගොඩක් ඉන්නවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිටපු ඇමති කෙනෙක් ඉන්නවා. ඒ පුද්ගලයාත් හාල් මෝල්ක් දමන්න රුපියල් මිලියන 37ක් අරගෙන ගෙවා නැහැ.

ගරු ඇමතිතුමනි, අදාළ දේශපාලනඥවරියගේ මැදිහත්වීම මතයි මේ ණය මුදල් අරගෙන තිබෙන්නේ. නඩු පැවරීමේ කටයුතුවලදී ණය ගත්ත අයට විරුද්ධව පමණක්ද කටයුතු කරන්නේ, එහෙම නැත්නම්, නීත්‍යානුකූල ඇපකරුවෙක් පමණක් වුණත්, අදාළ දේශපාලනඥවරියගේ මැදිහත්වීම නිසා එම ණය මුදල ලබා දුන් නිසා, ඇයට විරුද්ධවත් කටයුතු කරනවාද කියලා මම අහන්න කැමැතියි.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි ප්‍රධානම ගැටලුව තමයි, පසු ගිය කාලයේ කිසිම විනිවිදභාවයකින් තොරව, ලියකියවිලි නැතිව, අවශ්‍ය තොරතුරු නැතිව සමහර ණය මුදල් විශාල වශයෙන් බැංකුවලින් ලබා දීම. විවිධ ආකාරයෙන්, විවිධ හේතු දක්වලා දේශපාලනඥයන්ටත් ණය මුදල් ලබාදී තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කරනකොට, අධිකරණයට යනකොට ඒ අදාළ තොරතුරු සොයා ගැනීමේ ගැටලුවක් තිබෙනවා. දැනට පළමුවෙනි පියවර හැටියට ඒ කරුණු එකතු කර ගෙන යනවා. වරදක් කර තිබෙනවා නම්, ඒ බැංකුවේ මුදල් වංචා කර තිබෙනවා නම්, කිසිම පාට භේදයකින් පක්ෂ භේදයකින් තොරව අමාත්‍යාංශය සියලුම කටයුතු ක්‍රියාත්මක කරන බව මේ අවස්ථාවේදී ගරු සභාවට කියන්න කැමැතියි.

දෙමටගොඩ, ඥාණසිංහාරාමය විහාරය ඉදිරිපස ඇති පදික මාරුව: විකල්ප ස්ථානයකට ගෙන යාම

தெமட்டகொட, ஞானசிங்ஹாராமய விகாரைக்கு எதிரேயுள்ள பாதசாரிகள் கடவை : வேறிடத்திற்கு மாற்றுதல்

PEDESTRIAN CROSSING IN FRONT OF GNANASINHARAMA TEMPLE, DEMATAGODA: SHIFTING TO ALTERNATE LOCATION

435/'16

3. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 ජනවාරි 16 දින හෝ ඒ ආසන්න දිනයකදී බෙස්ලයින් පාරේ, දෙමටගොඩ, ඥාණසිංහාරාමය විහාරය ඉදිරිපස ඇති පාර මාරුවීමේ කහ ඉරි තීරුව මත මවක් සහ දියණියක් වාහනයක ගැටී මියගිය බවත්;

(ii) එම කහ ඉරි තීරුව මත මීට පෙරද අනතුරු ගණනාවක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කහ ඉරි තීරුව දෙපස මාර්ගය බැවුම් සහිත වීමද මෙසේ අනතුරු බහුලවීමට හේතු වී ඇති බව පිළිගන්නේද;

(ii) මෙතරම් අනතුරු සිදු වී තිබියදී එම කහ ඉරි තීරුව විකල්ප ස්ථානයකට ගෙන යාමට හෝ එම තීරුව දෙපස මාර්ග සංඥා සවිකිරීම සිදු නොකළේ මන්ද;

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

(iii) එම කහ ඉරි තීරුව විකල්ප ස්ථානයකට ගෙන යාම හෝ එම තීරුව දෙපස මාර්ග සංඥා සවි කිරීම සිදු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 சனவரி 16ஆந் திகதி அல்லது அதை அண்மித்த ஒரு தினத்தில் பேஸ்லைன் வீதி, தெமட்டகொட, ஞானசிங்ஹாராமய விகாரைக்கு எதிரேயுள்ள பாதசாரிகள் கடவையின் மஞ்சள் கோட்டில் ஒரு தாயும் மகளும் வாகனமொன்றில் மோதுண்டு உயிரிழந்துள்ளார்கள் என்பதையும்;

(ii) மேற்படி மஞ்சள் கோட்டில் இதற்கு முன்னரும் பல விபத்துக்கள் இடம்பெற்றுள்ளன என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி மஞ்சள் கோட்டின் இருமருங்கிலும் பள்ளமாக காணப்படுவதும், இவ்வாறு விபத்துக்கள் அதிகரிப்பதற்கு ஏதுவாகியுள்ள தென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) இந்தளவு விபத்துக்கள் இடம்பெற்றுள்ள போதிலும் மேற்படி மஞ்சள் கோட்டை மாற்று இடத்திற்கு கொண்டு செல்லாதிருந்தது அல்லது குறித்த கோட்டின் இருமருங்கிலும் வீதிச் சமிக்ஞைகள் பொருத்தாதிருந்தது ஏன் என்பதையும்;

(iii) மேற்படி மஞ்சள் கோட்டை மாற்று இடத்திற்குக் கொண்டு செல்லல் அல்லது கோட்டின் இருமருங்கிலும் போக்குவரத்து சமிக்ஞை பொருத்தப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways :

(a) Is he aware that -

(i) a mother and a daughter were killed after they were hit by a vehicle on the pedestrian crossing in front of the Gnanasinharama Temple, Dematagoda on the Baseline Road on or around 16th January 2016; and

(ii) a number of accidents have occurred on the aforesaid pedestrian crossing even before this?

(b) Will he inform this House -

(i) whether he admits the fact that the road being sloped on both sides of the pedestrian crossing is contributing to frequent occurrence of accidents in the aforesaid manner;

(ii) the reasons for not taking action to move the said pedestrian crossing to an alternate location or to install road signs on both sides of the pedestrian crossing; and

(iii) the date on which the said pedestrian crossing will be moved to an alternate location or road signs will be installed on both sides of the said pedestrian crossing?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2016 ජනවාරි මස 16 වන දින මවුන්ටිමේරි පදික මාරුව මතින් පාර මාරුවීමට ගිය පුද්ගලයන් දෙදෙනෙකු මියයාම සම්බන්ධව 2016.01.18 වන දින දෙමටගොඩ පොලිස් ස්ථානාධිපති විසින් මාර්ග සංචර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු, කොළඹ වෙත දැනුම් දී ඇත.

(ii) අදාළ ස්ථානයේ මීට පෙර රිය අනතුරු සිදුවීමක් සම්බන්ධයෙන් වාර්තා වී නොමැත.

(ආ) (i) නැත.

කහ ඉරි තීරුව දෙපස මාර්ගය බෑවුම් සහිත බවක් නිරීක්ෂණය නොවේ.

(ii) 2014 වර්ෂයේ මෙම ස්ථානයේ පදික මාරුවක් සලකුණු කළ පසු මාර්ග අනතුරක් පිළිබඳව පොලීසියෙන් වාර්තා කරන ලද්දේ පළමු වතාවට ය.

මෙම පදික මාරුව අවසන්වරට 2015 නොවැම්බර් මාසයේ නිසි අයුරින් දිලිසෙන ආකාරයට පින්තාරු කටයුතු සිදු කර ඇත. එපමණක් නොව පදික මාරුව ඇති ස්ථානයේ මෙන්ම එයට මීටර් 50ක් ඉදිරියෙන් අවශ්‍ය මාර්ග සංඥා නිසි අයුරින් 2004 වර්ෂයේ සිටම යොදා තිබුණි.

(iii) මෙම මාර්ග කොටසේ පදික මාරු අවශ්‍යතා සලකා මෙම ස්ථානය තෝරාගෙන ඇත.

තවද මෙම ස්ථානයේ, කඩිනම් ක්‍රියාමාර්ගයක් ලෙස නිවි නිවී දැල්වෙන පහන් පද්ධතියක් (Blinker Light) යොදා අනතුරු අවම කර ගැනීමට කටයුතු දැනටමත් සිදු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමන්ලා දැනටමත් නිවී දැල්වෙන සංඥා පුවරු සවි කරලා මේ අනතුරු අවම කිරීමට කටයුතු කිරීම ගැන අපි ස්තුතිවන්ත වෙනවා. නමුත් මෙම ස්ථානයේ මීට කලින් අනතුරු සිදු වුණේ නැහැයි කියලා කියන්නේ, පොලීසිය එවැනි දෙයක් වාර්තා නොකිරීම මතයි.

මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මෙම ස්ථානයේ නිරන්තරයෙන් අනතුරු සිදු වන බවට ප්‍රදේශ වාසීන් පැමිණිලි කරන හෙයින්, -අපේ ගරු නියෝජ්‍ය කථානායකතුමාත් මෙම ස්ථානය ගැන දන්නවා. එතුමාගේ ආසනයේ තිබෙන්නේ.- මේ පිළිබඳව සමීක්ෂණයක් කර ඉදිරි පියවර ගැනීමට ඔබතුමා කටයුතු කරනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔව්. මම ඔබතුමා ඉදිරිපත් කළ කරුණ ගැන සොයා බලන්නම්. මොකද, සමහර අනතුරු වාර්තා වන්නේත් නැහැ. මම ඒ ගැන සොයා බලන්නම්.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. පාර මාරු වන කහ ඉරි නිසි ස්ථානයේ ස්ථානගත නොකිරීමත්, -විශේෂයෙන්ම පාර දෙපැත්ත බෑවුම් වන තැන් වෙන්න පුළුවන්, වේගයෙන් ගමන් කරන තැන් වෙන්න පුළුවන්.- හදිසි අනතුරු සිදුවීමට හේතුවක් විධියට හදිසි අනතුරු පිළිබඳව පොලීසියේ තිබෙන විශේෂ අංශය හඳුනා ගෙන තිබෙනවා. එම නිසා ජනතාවට පාර මාරු වීමට තිබෙන කහ ඉරි නිසි ස්ථානයන්හි ස්ථානගත කර තිබේදැයි සොයා බැලීමට ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් සමීක්ෂණයක් කරන්නට සූදානම්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අපි සූදානම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු උදය ගම්මන්පිල මහතා පැන නැඟූ ප්‍රශ්නයට අදාළ ස්ථානයේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා රුපියල් මිලියන 9ක් වියදම් කරලා සංඥා පද්ධතියක් හැදුවා. දැන් මාස තුනක් තිස්සේ ඒ සංඥා පද්ධතිය ක්‍රියාත්මක වෙනවා. ඊට යාබදව තවත් සංඥා පද්ධතියක් අවශ්‍ය වෙනවා, වනාතමුල්ල ප්‍රදේශයෙන් දෙමටගොඩ ප්‍රදේශය දෙසට ගමන් කරන වාහන හැසිරවීම සඳහා. ඔබතුමා ඒ ගැනත් සොයලා බලනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම ඒ ගැන සොයා බලන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සංඥා පද්ධතිය සවි කිරීම මත දැන් බොහෝ අනතුරු වැළකිලා තිබෙනවා. ගරු දයා ගමගේ අමාත්‍යතුමාත් ඉදිරිපත් වෙලා ඔබතුමාගෙන් ඒ ඉල්ලීම කළා. ඒ පළාතේ සියලු දෙනාගේ අවශ්‍යතාව එයයි. බොහොම ස්තුතියි.

මහජන බැංකු විශ්‍රාමිකයන්: ජීවන වියදම් දර්ශක දීමනාව

மக்கள் வங்கி ஓய்வூதியர்கள் : வாழ்க்கைச் செலவுக் கொடுப்பனவு

PENSIONERS OF PEOPLE'S BANK: COST OF LIVING ALLOWANCE

461/'16

4. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) මහජන බැංකුවේ විශ්‍රාමිකයන්ට ගෙවිය යුතු වෙනස් වන ජීවන වියදම් දර්ශක දීමනාව, විශ්‍රාම භාර අරමුදලේ මූලික රෙගුලාසිවලට පටහැනිව සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින්, විශ්‍රාමිකයන්ගෙන් එක්තරා පිරිසකට ගෙවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ හේතුවෙන් මහජන බැංකුවේ ඇතැම් විශ්‍රාමිකයන්ට මාසිකව රු.20,000/- පමණ ජීවන වියදම් දීමනාව අහිමි වී තිබෙන බවත්;

(ii) අනෙකුත් සියලු රාජ්‍ය බැංකුවල විශ්‍රාම වැටුප් ගෙවීමේදී අද දක්වා වෙනස් වන ජීවන වියදම් දීමනාව නිසි පරිදි ගෙවනු ලබන අතර, ඉන් බැහැරව එකම තරාතිරමේ සේවක පිරිසකට දෙයාකාරයකින් සලකා කටයුතු කරනු ලබන එකම රාජ්‍ය බැංකුව, මහජන බැංකුව බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) අනෙකුත් රාජ්‍ය බැංකුවල විශ්‍රාමිකයන්ට ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාව පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(ii) මහජන බැංකුව පමණක් විශ්‍රාමිකයන් කාණ්ඩයකට ජීවන වියදම් දීමනා ගෙවීමේදී වෙනස් ආකාරයකට සැලකීම සම්බන්ධයෙන් කඩිනම් විසඳුමක් ලබා දෙන්නේද;

(iii) 1996 වර්ෂයේ සිට වෙනස් වන ජීවන වියදම් දීමනාව කැටි කර ගෙවීම, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් තොරව හිටපු සාමාන්‍යාධිකාරිවරයෙකු විසින් ලාභය වැඩි කර පෙන්වීම සඳහා ගනු ලැබූ හිතුවක්කාර තීන්දුවක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) ஓய்வுபெற்ற மக்கள் வங்கி ஊழியர்களுக்கு செலுத்தப்படவேண்டிய மாற்றமடையும் வாழ்க்கைச் செலவுச் சுட்டெண் கொடுப்பனவானது, ஓய்வூதிய நம்பிக்கை நிதியத்தின் அடிப்படை ஒழுங்கு விதிகளுக்கு முரணான வகையிலும், அடிப்படை உரிமைகளை மீறுகின்ற வகையிலும், ஓய்வு பெற்றவர்களில் ஒரு சிலருக்குச் செலுத்தப்படுகின்றது என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) இதனால், ஓய்வுபெற்ற மக்கள் வங்கி ஊழியர்களில் சிலர் மாதாந்தம் சுமார் ரூபா 20,000/- வாழ்க்கைச் செலவுக் கொடுப்பனவை இழந்துள்ளார்களென்பதையும்;

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

(ii) ஏனைய அனைத்து அரச வங்கிகளிலும் ஓய்வூதியக் கொடுப்பனவின்போது இன்றுவரை, மாற்றமடையும் வாழ்க்கைச்செலவுக் கொடுப்பனவு முறையாக செலுத்தப்படுவதுடன், இதற்கு மாறாக, ஒரே மட்டத்திலான ஊழியர்களுக்கு இரண்டு விதமாகக் கருதி செயற்படும் ஒரே அரச வங்கி, மக்கள் வங்கியாகும் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) ஓய்வுபெற்ற ஏனைய அரச வங்கி ஊழியர்களுக்கு செலுத்தப்படும் மாதாந்த வாழ்க்கைச் செலவுக் கொடுப்பனவு பற்றிய விபரமான அறிக்கையை சமர்ப்பிப்பாரா என்பதையும்;

(ii) மக்கள் வங்கி மாத்திரம் ஓய்வுபெற்ற ஒரு குழுவினருக்கு வாழ்க்கைச் செலவுக் கொடுப்பனவை செலுத்துகின்றபோது வேறு விதமாகக் கருதிச் செயற்படுவது தொடர்பில் துரித தீர்வொன்றை வழங்குவாரா என்பதையும்;

(iii) 1996ஆம் ஆண்டு முதல் மாற்றமடையும் வாழ்க்கைச் செலவுக் கொடுப்பனவை சுருக்கிச் செலுத்துவதானது, பணிப்பாளர் சபையின் தீர்மானமின்றி, முன்னாள் பொதுமுகாமையாளர் ஒருவரினால் இலாபத்தை அதிகமாகக் காட்டும்பொருட்டு மேற்கொள்ளப்பட்ட தான்தோன்றித்தனமான ஒரு தீர்மானமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise Development:

(a) Is he aware that the variable cost of living allowance that should be paid to the pensioners of the People's Bank is paid only to a certain group of pensioners of the People's Bank violating fundamental rights and in contravention of the basic regulations of the Pension Trust Fund?

(b) Will he admit that -

(i) some of the pensioners of the People's Bank have been deprived of the cost of living allowance amounting to about Rs. 20,000 monthly due to the aforesaid situation; and

(ii) when paying the pensions, all other state banks have been duly paying the variable cost of living allowance to date and the People's Bank is the only state bank that acts outside this procedure treating a group of employees of the same level in two different ways?

(c) Will he inform this House -

(i) whether he would present a detailed report on the monthly cost of living allowance that is paid to the pensioners of the other state banks;

(ii) whether a speedy solution would be provided to the issue of treating differently to a group of pensioners only by the People's Bank when paying the cost of living allowance; and

(iii) whether it is an arbitrary decision taken by a former General Manager to make the payment the freezing the variable cost of living allowance since 1996 without a board decision with a view to showing increased profits?

(d) If not, why?

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) නැත.

(ආ) (i) නැත.

විශ්‍රාම භාර අරමුදලේ මූලික රෙගුලාසි අනුව අදාළ මාසයේ විවල්‍ය ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

(ii) නැත.

මහජන බැංකු විශ්‍රාම භාර අරමුදල මඟින් 1996 වර්ෂයට පෙර හා 1996 වර්ෂයට පසු වශයෙන් විශ්‍රාම වැටුප් ගෙවා ඇත.

· 1996.06.07 දිනට පෙර පැවැති විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමවේදය

මාසික විශ්‍රාම වැටුප ගණනය වන ආකාරය

විවල්‍ය ජීවන වියදම් දීමනාව

හැර දළ වැටුප x $\frac{80\% - 85\%}{100}$ - xxxx

එකතු කළා - අදාළ මාසයේ විවල්‍ය ජීවන වියදම් දීමනාව - xxxx

ඒ අනුව මාසික විශ්‍රාම වැටුප - xxxx

පරිවර්තිත විශ්‍රාම වැටුප ගණනය වන ආකාරය

විවල්‍ය ජීවන වියදම් දීමනාව හැර

දළ වැටුප x $\frac{80\% - 24\%}{100}$ - xxxx

· 1996.06.07 දිනෙන් පසු විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමවේදය

මාසික විශ්‍රාම වැටුප ගණනය වන ආකාරය

උදාහරණ - සේවා කාලය අවුරුදු 20 නම් විශ්‍රාම වැටුප, අවසන් වරට ලද

දළ වැටුප x $\frac{80}{100}$ - xxx

පරිවර්තිත විශ්‍රාම වැටුප ගණනය වන ආකාරය

අවසන් වරට ලද

දළ වැටුප x 90 x 24 - xxx

100

(ඇ) (i) ඔව්.

අනෙකුත් රාජ්‍ය බැංකු විශ්‍රාමිකයන්ට ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනා - 2016 වර්ෂය

මාසය	ජාතික ඉතිරිකිරීමේ බැංකුව ගෙවූ දීමනා	ලංකා බැංකුව ගෙවූ දීමනා රුපියල්
ජනවාරි	27,491.15	27,491.21
පෙබරවාරි	27,444.56	27,444.62
මාර්තු	27,273.74	27,273.77
අප්‍රේල්	26,947.58	26,947.62
මැයි	27,320.33	27,320.37
ජූනි	28,003.70	28,003.74

(ii) ඉහත (ආ) (ii) හි තොරතුරු අදාළ වේ.

(iii) නැත.

(ඇ) අදාළ නොවේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියූ ආකාරයටම විශ්‍රාමිකයන්ට වෙනස් වන ජීවන වියදම් දීමනාව ගෙවන ආකාරය සම්බන්ධයෙන් 1996න් පසු වෙනස් තීරණයක් ගත් නිසා තමයි ඇත්තටම ඒ විකෘති තත්ත්වය ඇති වී තිබෙන්නේ. ගරු අමාත්‍යතුමනි, මා ඔබතුමාගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අධ්‍යක්ෂ මණ්ඩලය හෝ මාණ්ඩලික පත්‍රිකාවක් මඟින් හෝ අවසර දී නොමැති තත්ත්වයක් යටතේ, අනෙකුත් සියලු රාජ්‍ය බැංකුවලින් කටයුතු නොවන ආකාරයට, මහජන බැංකුවට විතරක් අදාළ වන ආකාරයට මෙවැනි තීරණයක් ගන්න චක්‍ර ලේඛයක් තිබෙනවාද?

ගරු කබීර් හාෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

1996 එක් වෘත්තීය සංගමයක් විසින් එහි විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් විෂමතාවක් සිදු වන හේතුව පෙන්වා මෙහි සංශෝධනයක් ඇති කරන්න කියලා ඉල්ලීමක් කළාට පසුව, මහජන බැංකුවේ එම අධ්‍යක්ෂ මණ්ඩලය සහ සියලුම කණ්ඩායම් සාකච්ඡාවක් කරලා එවකට තිබුණු රජය යටතේ අලුත් විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රමයක් මහජන බැංකුව විසින් නිර්මාණය කළා. එහි විශ්‍රාම භාර අරමුදල පිහිටුවා ප්‍රධාන විධායක නිලධාරි, සාමාන්‍යාධිකාරී ඇතුළු කළමනාකාරීත්වයේ නිලධාරින් පස් දෙනකු, මහජන බැංකුවේ සේවක ප්‍රජාව නියෝජනය කරනු ලබන සියලුම වෘත්තීය සමිතිවලින් පත් කළ එක් නියෝජිතයකු බැගින් සහ මහජන බැංකුවේ විශ්‍රාමිකයන්ගේ සංගමයේ නියෝජිතයන් දෙදෙනකුගෙන් එකතු කරපු දොළොස් දෙනකුගෙන් යුත් භාරකාර මණ්ඩලයක් පිහිටෙව්වා. ඒ අනුව 1996 මහජන බැංකුවේ ක්‍රමවේදය වෙනස් කළා. ඒ ක්‍රමය අනෙකුත් රාජ්‍ය බැංකුවල තිබෙන විශ්‍රාම ක්‍රමයට වඩා වෙනස්. ඒ ක්‍රමය අනුමත කර තිබෙන්නේ සියලුම වෘත්තීය සංගම්, විශ්‍රාමික සංගම් සහ ඒ කණ්ඩායම්. මේක අනුමත කළේ 1996 දී. එදා සිට අද දක්වා ඒ ක්‍රමය දිගටම පවත්වාගෙන යනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකම තමයි ප්‍රශ්නය. මේක සම්බන්ධයෙන් වෘත්තීය සමිතිත් මැදිහත් වෙලා කටයුතු කළාට පසු, කම්කරු කොමසාරිස්වරයා විසින් බේරුම්කාරවරයකු දෙන තීන්දුව අනුව, මේ ඉල්ලීම සාධාරණ නිසා දෙපාර්ශ්වය එකතු වෙලා සාකච්ඡා කරලා තීරණයක් ගන්න කියලා තීන්දුවක් දුන්නා. ඒ තීන්දුවට විරුද්ධව මහජන බැංකුවම උසාවියට අභියාචනයක් ඉදිරිපත් කළා. ඉතින් මහජන බැංකුව උසාවියට අභියාචනයක් ඉදිරිපත් කරන කොට ඒක බේරුම්කාරවරයාගේ තීරණයට විරුද්ධ බවයි පෙනී යන්නේ. ඒකෙන් කියන්නේ ප්‍රතිපත්තිමය වශයෙන් ගත්තාම, මහජන බැංකුව මේ දීමනාව මේ ආකාරයට දෙන්න එකඟ නැහැයි කියන එකයි. අනික් සියලු බැංකු ඒ දීමනාව දෙනවා.

ගරු ඇමතිතුමනි, 2000 වර්ෂයෙන් පස්සේ අනික් සියලුම රාජ්‍ය බැංකු, ඒ බැංකුවල විශ්‍රාම වැටුප් දීමනාව දෙවතාවක් වැඩි කර තිබෙනවා. නමුත්, මහජන බැංකුවෙන් විශ්‍රාම ගත් නිලධාරින්ට විතරක් එම දීමනාව ලැබෙන්නේ නැහැ. මෙතැන තිබෙන බරපතළ ප්‍රශ්නය තමයි, සමාන ක්ෂේත්‍රයේ බැංකු දෙකකින් එක බැංකුවකින් විශ්‍රාම ගත් නිලධාරින් පිරිසකට අසාධාරණයක් සිදුවීම. අනික් රාජ්‍ය බැංකුවල විශ්‍රාමික නිලධාරින්ට ලැබෙන වරප්‍රසාද මහජන බැංකුවේ විශ්‍රාමික නිලධාරින්ට ලැබෙන්නේ නැහැ. ඒ අසමානතාව ඇති වෙලා තිබෙන්නේ ඔය කියන තීරණය නිසා නම්, එම තීරණය වෙනස් කරන්න මහජන බැංකුවට බැරි ඇයි?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා කියන්නේ ලංකා බැංකුවේ විශ්‍රාමික නිලධාරින්ට ලබා දෙන විශ්‍රාම වැටුප් දීමනා වැඩි වීම මහජන බැංකුවේ විශ්‍රාමික නිලධාරින්ට ලැබෙන්නේ නැහැ කියලා නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අනෙක් සියලුම රාජ්‍ය බැංකු ඒ තීරණය ක්‍රියාත්මක කරනවා. එහෙම තිබියදී මහජන බැංකුවෙන් විශ්‍රාම ගත් අයට විතරක් ලොකු අසාධාරණයක් සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ක්‍රම දෙකක්?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔව්, ක්‍රම දෙකක්. පැහැදිලිවම ක්‍රම දෙකකට ගණනය කිරීම නිසා තමයි ඒ අසාධාරණය සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1996 ඉඳලා තමයි මේ ක්‍රමවේදය ක්‍රියාත්මක වුණේ. දැන් 2016ත් ඇවිල්ලා. අවුරුදු 20ක් එක දිගටම ක්‍රියාත්මක කළ ක්‍රමවේදයක්. ඒ අතර තුර ආණ්ඩු කිහිපයක් තිබුණා. මේ ප්‍රශ්නය විසඳන්න ඒ ආණ්ඩුවලට අවස්ථා කිහිපයක් තිබුණා. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණත් එක කාලයක පරිවාස ආණ්ඩුවකට සම්බන්ධ වෙලා හිටියා. පරිවාස ආණ්ඩුවේ ඉන්න කොට තමන්ගේ බලය පාවිච්චි කරලා මේ ඉල්ලීම් ඉටු කරන්න අවස්ථාව තිබුණා. ඉදිරියේදී විශ්‍රාමිකයන්ගේ සංගමයේ නිලවරණය පැවැත්වෙනවා. දේශපාලන වශයෙන් මේවා ප්‍රශ්න හැටියට ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් ඒක සැලකිල්ලට ගන්නේ නැතුව මම මේ ප්‍රශ්නයට නිවැරදිව උත්තරයක් දෙන්නම්. එකක් තමයි මේ ක්‍රමය නිර්මාණය කරලා, දැනට ක්‍රියාත්මක කරන මහජන බැංකුවේ විශ්‍රාම වැටුප් ක්‍රමයට අනුව හිමිවන වැටුප - තමන් විශ්‍රාම යනකොට තමන්ට හිමිවන වැටුප - ගණනය කරලා ඒකට, තමන් සේවයේ සිටි අවසාන කාලයේ ජීවන වියදම් දීමනාව - COLA - එකතු කිරීම.

එහෙම එකතු කරලා එන මුළු ගණන තමයි තමන්ගේ ජීවිත කාලය තුළ, විශ්‍රාම වැටුප ලැබෙන තෙක් ලැබෙන්නේ. ඊට අමතරව පරිවර්තික විශ්‍රාම වැටුප -commuted pension එක- ලබා දෙනවා. ඒ කියන්නේ, තමන්ගේ වැටුප මාස 24කින් වැඩි කරලා ඒ මුළු ගණනම විශ්‍රාම යන සේවකයාට මහජන බැංකුවෙන් ලබා දෙනවා. ඒ අනුව විශ්‍රාම යනකොට මාස 24ක වැටුපක් ලබා දෙනවා. 1996ට කලින් අවුරුදු 10ක් ගියාට පසුව ඒ මුදල තමන්ගේ විශ්‍රාම වැටුපෙන් ආපහු කපා ගත්තා. දැන් ඒ මුදල කපා ගන්නේ නැහැ. මාස 24ක වැටුප කිසිම කපා හැරීමක් කරන්නේ නැතිව සම්පූර්ණයෙන්ම විශ්‍රාමිකයාට ලබා දෙනවා. අනෙක් බැංකුවලින් ඒක ගෙවන කොට එය කපා හරිනවා. අනෙක් බැංකු විශ්‍රාම වැටුප් ගණනය කරනකොට ජීවන වියදම් අංකය වෙනස් වන ආකාරයට එකතු කර ගෙන යනවා. අනෙක් බැංකුයි, මහජන බැංකුවයි සසඳන කොට පුංචි වෙනසක් ඇති වෙන්න පුළුවන්. ඒ වෙනස අදාළ වෙන්නේ නැහැ. එයට අමතරව මහජන බැංකුවෙන් සෞඛ්‍ය සඳහා රක්ෂණයක්, වෙනත් ගෙවීම්, විශ්‍රාම යන කෙනෙකුට අඩු පොලියකට -විශේෂ පොලියකට - ණය ගැනීමේ අවස්ථාවන් යනාදී වශයෙන් ඒ හැම පහසුකමක්ම ලබා දෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයට මම කියන්න කැමැතියි, එය බැංකුව තුළින් ගත යුතු තීරණයක්, එයට අපේ දේශපාලනයේ කිසි බලපෑමක් නැහැයි කියලා. විශ්‍රාමිකයන්ගේ පහසුව සඳහා තමන්ගේ ක්‍රමවේදය තුළ යම් යම් වෙනස්කම් කරන්න එම සංගමය, එතැන තිබෙන වෘත්තීය සංගම් හා විශ්‍රාමිකයන්ගේ සංගම් සහ අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ නම් ඒකේ කිසිම ගැටලුවක් නැහැ. ඒ සඳහා කටයුතු කිරීමට අපි ඒක සකස් කරලා දෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මෙහි තිබෙන්නේ දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි; මානුෂික ප්‍රශ්නයක්. මෙහි නිල වරණ ප්‍රශ්නයකුත් නැහැ. මා දන්නවා, නිල වරණයකුත් නැහැයි කියලා. අනික් බැංකුත් එක්ක බලන විට වෙනස අවම වශයෙන් රුපියල් 20,000කට වැඩියි, උපරිම වෙනස ගත්තොත් ඊට වඩා වැඩියි. ඒ කියන්නේ, වෙනස පුංචි එකක් නොවෙයි, ගරු ඇමතිතුමනි. මා ඔබතුමාගෙන් ඉල්ලන්නේ මෙන්න මේ ඉල්ලීමයි. කම්කරු කොමසාරිස්ගේ තීන්දුව විභාගයට ලක්වන අතරේ බෙරුම්කරු මරණයට පත් වුණා. එතකොට මහජන බැංකුව නඩුවක් සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කරලා තිබුණා. එම නිසා තවම එහි අවසානය නිගමනයක් නැතිවයි පවතින්නේ. අඩු තරමේ මේ පිළිබඳව නිසි බලධාරියකු පත් කරලා, මේ කාරණාවට අවසාන නිගමනයක් දෙන්න ඕනෑ. මේ විශ්‍රාමිකයන් සදාකාලිකව ජීවත් වන්නේ නැහැ නේ. ඔවුන් මිය යනවා. විශ්‍රාමිකයන් ඒ කාලයේ තමන් සේවය කළ ආයතනයේ තෘප්තියකින් සේවය කළා නම්, විශ්‍රාම ගියාට පසුවත් තෘප්තියකින් ජීවත් වන්න පුළුවන් විධියට ඔවුන්ට සහනයක් දීම සඳහා ඉක්මනින් බෙරුම්කරුවකු නම් කරලා, නිසි බලධාරි නම් කරලා මේ කටයුත්ත අවසන් කරමු. ඇත්තටම මේ කාරණාව සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් සහ විශ්‍රාමික සංගම්වල ඔය කියන නියෝජිතයනුත් එක මේසයකට කැඳවා සාකච්ඡා කරන්න ඔබතුමා එකඟද?

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු මන්ත්‍රීතුමනි, දැනට දළ වශයෙන් 7,153ක පමණ විශ්‍රාමිකයන් පිරිසක් ඉන්නවා. අපි යම් ක්‍රමවේදයක් අලුතින් සංශෝධනය කරලා නැවත සකස් කරනවා නම්, බැංකුවේ මූල්‍ය පද්ධතියට හානියක් නොවෙන්න ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන් ප්‍රායෝගික ක්‍රමවේදයක් විය යුතුයි. මේ ක්‍රමය සකස් වන්නේ, විශේෂයෙන්ම විශ්‍රාම භාර අරමුදලක් පිහිටුවා, ඒ විශ්‍රාම භාර අරමුදලේ සියලුම පාර්ශ්වකරුවන් කොටස්කරුවන් හැටියට සිටින ලෙසයි. එය ඔවුන්ටම අයිති දෙයක් හැටියටයි යන්නේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න මා එකඟයි. ඒ නිසා විශ්‍රාමික සංගමයේ නියෝජිතයන් සහ බැංකුවේ නියෝජිතයන් එක්ක වගකීමක් ඇති කෙනෙකු පත් කරලා, මේ ගැන පරීක්ෂා කර බලා ඔවුන්ට එකඟත්වයකට එන්න පුළුවන්ද කියලා බැලීමට මා එකඟයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, අපිත් මැදිහත්කරුවන් හැටියට එයට සම්බන්ධ වෙමු. දේශපාලන වශයෙන් නොවෙයි. ඔබතුමාත්, මමත් මෙම කාරණාව නිරවුල් කර ගන්න මැදිහත් වෙමු. මා ඔබතුමාගෙන් ඒ ඉල්ලීම කරනවා.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
හොඳයි. හැබැයි, නිලවරණයෙන් පසුව.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන බදු: විස්තර

ஸ்ரீ லங்கா ரெலிகொம் தொலைபேசி வரிகள் : விபரம்
TAXES LEVIED BY SRI LANKA TELECOM: DETAILS

471/'16

5. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට අයත් සියලු දුරකථනවලින් අයකරනු ලබන බදු වර්ග හා බදු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එකී බදු සියල්ල එකතු වූ පසු මුළු අයකිරීමේ ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට කොපමණ අය කිරීමක් කළ හැකිද;

(iii) එම අයකිරීම් කරනු ලබන්නේ කුමන නිශ්චිත වගන්තියක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

தொலைத்தொடர்புகள் மற்றும் டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஸ்ரீ லங்கா ரெலிகொம் நிறுவனத்திற்குச் சொந்தமான அனைத்து தொலைபேசிகளிலிருந்தும் அறவிடப்படுகின்ற வரி வகைகள் மற்றும் வரித் தொகைகள் வெவ்வேறாக யாவை;

(ii) மேற்படி வரிகள் அனைத்தும் சேர்க்கப்பட்ட பின்னர் மொத்த அறவிடல் சதவீதமென்ற வகையில் ஸ்ரீ லங்கா ரெலிகொம் நிறுவனத்தினால் எவ்வளவு அறவீட்டினை மேற்கொள்ள முடியும்:

(iii) மேற்படி அறவீடுகள் எந்த திட்டவட்டமான வாசகத்தின் கீழ் மேற்கொள்ளப்படுகின்றது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Telecommunication and Digital Infrastructure:

(a) Will he inform this House-

(i) the different taxes charged on all types of telephones belong to Sri Lanka Telecom and the rates at which they are charged separately;

(ii) what percentage Sri Lanka Telecom can collect on the total charges for its services when all the taxes referred to above are added up; and

(iii) under which specific clauses of law those charges are levied?

(b) If not, why?

ගරු තාරානාත් බස්නායක මහතා (විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க - தொலைத்தொடர்புகள் மற்றும் டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Tharanath Basnayaka - Deputy Minister of Telecommunication and Digital Infrastructure)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(ආ) (i) අයකරනු ලබන බදු වර්ග හා බදු ප්‍රමාණ

විදුලි සංදේශ සේවා (අන්තර් ජාල සේවා සහ IDD සේවාව හැර)

සෙස් බද්ද (2%)	2.08%
ජාතිය ගොඩනැගීමේ බද්ද (2%)	2.08%
විදුලි සංදේශ බදු (25%)	26.04%
එකතු කළ අගය මත බදු (15%)	19.53%

අන්තර්ජාල සේවා

සෙස් බද්ද (2%)	2.08%
ජාතිය ගොඩනැගීමේ බද්ද (2%)	2.08%
විදුලි සංදේශ බදු (10%)	10.42%
එකතු කළ අගය මත බදු (15%)	17.19%

IDD ආදායම

සෙස් බද්ද (2%)	2.08%
ජාතිය ගොඩනැගීමේ බද්ද (2%)	2.08%

එකතු කළ අගය මත බදු (15%) - IDD ආදායම,

සෙස් හා ජාතිය ගොඩනැගීමේ බද්ද	15.63%
IDD අය කිරීම් මිනිත්තුවකට රුපියල්	3.00
IDD ආදායම මත එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බද්ද	17.35%

(ii) මුළු බදු හා අය කිරීම්

විදුලි සංදේශන සේවා (අන්තර්ජාල සේවා හැර)	49.73%
අන්තර්ජාල සේවා	31.77%

IDD ආදායම

IDD ගාස්තු මත මුළු බදු	19.79%

IDD අය කිරීම්

මිනිත්තුවකට රුපියල්	3.00
IDD අය කිරීම් මත මුළු බදු	17.35%

(iii) **බදු අය කිරීම්වලට අදාළ වගන්ති හා ලේඛන:**

1. **සෙස්** - 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (2010 දෙසැම්බර් 27 දිනැති අංක 1686/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 1 කොටස: 1 වගන්තිය යටතේ)

2. **ජාතිය ගොඩනැඟීමේ බද්ද** - 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නිවේදනය සහ මුදල් අමාත්‍යාංශය විසින් නිවේදනය කරන ලද වෙනස්වීම් මත පදනම්ව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම විසින් නිකුත් කරන ලද ලිපිය)

3. **විදුලි සංදේශ බද්ද** - 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත.

4. **එකතු කළ අගය මත බදු** - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නිවේදනය සහ මුදල් අමාත්‍යාංශය විසින් නිවේදනය කරන ලද වෙනස්වීම් මත

[ගරු කාරානාත් බස්නායක මහතා]

පදනම්ව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම විසින් නිකුත් කරන ලද ලිපිය)

5. **IDD බදු -** 2004 අංක 11 දරන මුදල් පනත (2015 මැයි 18 දිනැති අංක 1915/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 1කොටස: 1 වගන්තිය යටතේ)

(ආ) අදාළ නොවේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ බදු ප්‍රමාණ හා බදු වර්ග සියල්ලම එකතු කළාම, අපේ විදුලි සංදේශ ගාස්තුවට සාපේක්ෂව මේ බදුවල ප්‍රමාණය කොපමණද? විදුලි සංදේශ ගාස්තුවට සාපේක්ෂව මේ බදුවල එකතුවේ ප්‍රමාණය කොපමණද?

ගරු කාරානාත් බස්නායක මහතා
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க)
(The Hon. Tharanath Basnayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මේ දීලා තිබෙන වාර්තා අනුව අපි ඒ ප්‍රමාණ ඉදිරිපත් කළා. ගරු මන්ත්‍රීතුමා මතු කරන ප්‍රශ්නයට මීට වඩා වැඩි විස්තරයක් ලිඛිතව ලබා දෙන්න ඉදිරි දිනයකදී බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා සරල ප්‍රශ්නයක් අහන්නේ. කෝල් එකක ගාස්තුව රුපියල් 20ක් නම්, එහි බද්ද රුපියල් කීයද කියලායි අහන්නේ. දුරකථන ඇමතුම් ගාස්තුව කීයද, එහි බදුවල එකතුව කීයද කියලායි අහන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම අහන්නේ දුරකථන ගාස්තුවේ බදුවල එකතුවේ ප්‍රතිශතය කොපමණද කියලායි. එය සියයට 80ක්ද, නැත්නම් සියයට කීයක්ද කියලායි මම අහන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහන්නේ විදුලි සංදේශ නියාමන අධිකාරි පනතේ වගන්තියක් තිබෙනවා, "අය කරනු ලබන මුළු බදු එකතුවේ ප්‍රමාණය එක්තරා ප්‍රතිශතයකට නොවැඩි විය යුතුයි" කියලා. ඒ වගන්තිය අනුව තමයි මම මේ ප්‍රශ්නය විමසන්න කල්පනා කළේ. මම මේ ප්‍රශ්නය ඇසීමට යොමු වූ මූලික හේතුව එයයි. ඔබතුමා ඒකට දැන් උත්තර දෙන්නේ නැත්නම්, දැනට ලබාදී තිබෙන තොරතුරුවලත් ඒ ප්‍රශ්නයට පිළිතුරක් නැත්නම්, අපට ලිඛිතව පිළිතුර ලබාදීමට ඔබතුමා බාර ගන්නවා නම් හොඳයි. ඒකයි මගේ වුවමනාව.

ගරු කාරානාත් බස්නායක මහතා
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க)
(The Hon. Tharanath Basnayaka)
ලිඛිතව විස්තර ලබා දෙන්න පුළුවන්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දුරකථන ඇමතුම්වලට අපි කොපමණ ගාස්තුවක් - බද්දක් - ගෙවනවාද කියලා මේ ගරු සභාවට හෙළිදරවු කරන්න අවශ්‍යයි.

ගරු කාරානාත් බස්නායක මහතා
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க)
(The Hon. Tharanath Basnayaka)
ගරු මන්ත්‍රීතුමනි, පුළුල් විස්තරයක් එක්ක ඔබතුමාට ලිඛිතව තොරතුරු ලබා දෙන්න පුළුවන්.

ඖෂධවේදීන්ගේ හිඟය: ගනු ලබන පියවර
மருந்தாளர்களின் பற்றாக்குறை: நடவடிக்கை
SHORTAGE OF PHARMACISTS: MEASURES TAKEN

498/'16

7. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියා පදිංචි ඖෂධ වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ සිටින සහතිකලත් ඖෂධවේදීන් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2011 - 2015 දක්වා ඖෂධවේදී බාහිර විභාගය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වර්ෂ 2011 - 2015 දක්වා එම විභාගය සමත් වූ සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) දිවයිනෙහි ඖෂධවේදීන්ගේ හිඟයක් ඇති බව පිළිගන්නේද;

(vi) එසේ නම්, එම හිඟය මහ හැරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

සුකාතාරම්, පෝසණෙ මර්රුම් සුදේස මරුත්තුව අමෛච්සරෛක් කේට්ට විනා:

(அ) (i) இலங்கையில் பதிவுசெய்யப்பட்டுள்ள மருந்தகங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) இலங்கையிலுள்ள சான்றிதழ்பெற்ற மருந்தாளர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iii) 2011 - 2015 வரை மருந்தாளர்களுக்கான வெளிவாரிப் பரீட்சைக்குத் தோற்றிய அபேட்சகர்களின் எண்ணிக்கை, ஆண்டு அடிப்படையில் வெவ்வேறாக யாதென்பதையும்;

(iv) 2011-2015 வரை மேற்படி பரீட்சையில் சித்தியெய்தியவர்களின் எண்ணிக்கை, ஆண்டு அடிப்படையில் வெவ்வேறாக எத்தனையென் பதையும்;

(v) நாட்டில் மருந்தாளர்களின் பற்றாக்குறை நிலவுகின்றதென்பதை ஏற்றுக்கொள்கின்றாரா என்பதையும்;

(vi) ஆமெனில், மேற்படி பற்றாக்குறையைத் தவிர்ப் பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House-

(i) the number of registered pharmacies in Sri Lanka;

(ii) the number of registered pharmacists in Sri Lanka;

(iii) separately, in respect of each year from the year 2011 to 2015, the number of candidates who sat for the pharmacist external examination;

(iv) separately, the number of candidates who passed the said examination from the year 2011 to 2015;

(v) whether he accepts that there is a shortage of pharmacists in the island; and

(vi) if so, the steps to be taken to overcome this shortage?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 3400 (තුන්දහස් හාරසීයකි)

(ii) 8169 (අටදහස් එකසිය හැට නවයක්) පමණ වේ.

(iii) ඖෂධවේදී බාහිර විභාගය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව

වසර	සංඛ්‍යාව
2011	-
2012	880
2013	2393
2014	-
2015	1737

(iv) විභාගය සමත් වූ සංඛ්‍යාව

වසර	සංඛ්‍යාව
2011	-
2012	238
2013	774
2014	-
2015	128

(v) ඔව්.

(vi) 1. ඖෂධවේදී ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම.

2. ඖෂධවේදී උපාධිධාරීන් බඳවා ගැනීම.

(ආ) අදාළ නොවේ.

ගරු ඇමතිතුමා අද දිනයේ පාර්ලිමේන්තු රැස්වීම් කටයුතුවලට සහභාගි වෙන්නේ නැති නිසායි මා පිළිතුර ඉදිරිපත් කළේ. එතුමාගෙන් මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් තොරතුරු දැනගන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් දැන් වැඩ කටයුතු කරගෙන යනවා. මේ කරුණුවලට අමතරව ඔබතුමාට විස්තර දැනගන්න අවශ්‍ය නම් පසුව පුළුල් විග්‍රහයක් කරන්නම් කියා ගරු ඇමතිතුමා කිව්වා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි.

කින්නියා ගම්මානයේ අවතැන් වූ මුස්ලිම් පවුල් : යළි පදිංචි කරවීම

கிண்ணியாவில் இடம்பெயர்ந்த முஸ்லிம் குடும்பங்கள்: மீளக் குடியமர்த்தல்

DISPLACED MUSLIM FAMILIES IN KINNIYA: RESETTLEMENT

500/'16

8. ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඈත අතීතයේ සිට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කින්නියා ගම්මානයේ මුස්ලිම් ජනතාව ජීවත් වූ බවත්;

(ii) එම ප්‍රදේශයේ පැවති ත්‍රස්තවාදී ගැටුම් හේතුවෙන් අවතැන් වූ මුස්ලිම් ජනතාව මෙතෙක් එම ගම්මානයේ නැවත පදිංචි කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ත්‍රස්තවාදී ගැටුම් හේතුවෙන් කින්නියා ගම්මානයේ අවතැන් වූ මුස්ලිම් පවුල් සංඛ්‍යාව සහ එම පවුල්වල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම ජනතාව එහි නැවත පදිංචි කිරීමට හැකි ඉක්මනින් කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்ற மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பண்டைய காலந்தொட்டு திருகோணமலை மாவட்டத்தில் கிண்ணியா கிராமத்தில் முஸ்லிம் மக்கள் வாழ்ந்து வந்துள்ளார்கள் என்பதையும்;

(ii) அந்தப் பிரதேசத்தில் நிலவிய பயங்கரவாத மோதல்கள் காரணமாக இடம்பெயர்ந்த முஸ்லிம் மக்கள் இதுவரை அக்கிராமத்தில் மீள்குடியமர்த் தப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) பயங்கரவாத மோதல்கள் காரணமாக கிண்ணியா கிராமத்திலிருந்து இடம்பெயர்ந்த முஸ்லிம் குடும்பங்களின் எண்ணிக்கை மற்றும் அக்குடும்பங்களின் அங்கத்தவர் எண்ணிக்கை யாதென்பதையும்;

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

(ii) இந்த மக்களை அங்கு மீளக் குடியமர்த்த துரிதமாக நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs:

(a) Is he aware that-

(i) Muslims lived in Kinniya in Trincomalee District since ancient times; and

(ii) the Muslims who were displaced by the terrorist activities in the area have not been resettled in that village so far?

(b) Will he inform this House-

(i) the number of Muslim families in Kinniya that was displaced by terrorist activities and the number of members of those families; and

(ii) whether arrangements will be made to resettle those people in that area as soon as possible?

(c) If not, why?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)

(The Hon. D.M. Swaminathan - Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs)

Sir, the Answer is as follows:

(a) (i) I am aware that the Muslim Community lived in the village of Kinniya in Trincomalee District.

(ii) 5,377 persons of 897 families who were displaced due to conflict environment have already been resettled.

(b) (i) There are 1,137 families and 5,934 persons of the village of Kinniya who were displaced due to conflict environment.

(ii) These communities previously had resided in the lands possessed by the Department of Forest Conservation. Resettlements can be fulfilled once those lands are released from the Forest Department.

Already 58 families were issued deeds on 20.05.2016 and necessary actions are taken to resettle the remaining displaced families by providing lands.

(c) Not applicable.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)

(The Hon. Imran Maharoof)

குறிப்பாக, நான் இன்று கேள்வி எழுப்பியிருப்பது என்னுடைய பிரதேசமான கிண்ணியா பிரதேசத்தைப் பற்றியாகும். அங்கு மீள்குடியேற்றத்திலே பல குறைபாடுகள் இருந்துகொண்டிருக்கின்றன. அவர்களுக்கு இன்னமும் அடிப்படை வசதிகள் - மலசலகூட வசதிகள்கூட - ஏற்படுத்திக் கொடுக்கப்படவில்லை. இதன் காரணமாக அவர்களுடைய நாளாந்தச் செயற்பாடுகளை செய்வதற்கு மிகவும் கஷ்டப்படுகின்றார்கள். அதைவிட, யானைத் தாக்குதல்களினால் உயிர்ச் சேதங்கள் ஏற்படக்கூடிய நிலை அங்கு இருக்கின்றது. உண்மையிலே மூவின மக்களும் வாழ்கின்ற திருகோணமலை மாவட்ட மீள்குடியேற்ற நடவடிக்கைகள் மிகவும் மந்த கதியிலே நடந்து கொண்டிருப்பதாக தகவல்கள் வந்துகொண்டிருக்கின்றன. கௌரவ அமைச்சர் அவர்களே, அதைத் துரிதப்படுத்தும் செயற்பாடுகளை முன்னெடுக்கக்கடிய வாய்ப்புக்கள் இந்த நல்லாட்சி அரசாங்கத்திலே இருக்கின்றனவா என்பதை இந்த இடத்திலே கூற முடியுமா?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා

(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)

(The Hon. D.M. Swaminathan)

மீள்குடியேற்றங்கள் அங்கு நடைபெற்றன. மேலும், பிரச்சினைகள் அங்கிருந்தால் அதுபற்றி நீங்கள் தயவுசெய்து எழுத்துமூலம் எனக்கு அறிவிக்கவும். அதற்கேற்ற நடவடிக்கையை நான் எடுப்பேன் என்பதைக் கூற விரும்புகின்றேன். மலசலகூடங்களையும் நாங்கள் கட்டிக்கொண்டு வருகின்றோம். உங்கள் கிண்ணியா பிரதேசத்துக்கு மேலதிக மலசலகூடங்கள் வேண்டுமென்றால் தயவுசெய்து அந்த விபரங்களை எனக்கு அறிவித்தால் நான் அதற்கேற்ற நடவடிக்கை எடுப்பேன்.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)

(The Hon. Imran Maharoof)

சரி, நான் எழுத்துமூலமாக விபரங்களை வழங்குகின்றேன்.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා

(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)

(The Hon. D.M. Swaminathan)

நன்றி.

"බුලත් කොවුල්" ප්‍රවාහනය : අවසර

வெற்றிலைக் கம்பங்கள் ஏற்றிச்செல்லல் : அனுமதி

TRANSPORT OF SUPPORTING STAKES FOR BETEL: PERMISSION

553/'16

9. ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)

(The Hon. Seyed Ali Zahir Moulana)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කළුදාවල ගම්මානයේ ජීවත්වන පවුල් 1500 කට ආසන්න පිරිසක් ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ලෙස බුලත් වගා කිරීමේ කටයුතුවල නියැලෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) බුලත් වගාව සාර්ථක ලෙස සිදු කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන, "බුලත් කොවුල්" පොතුවිල්, රොට්ටකුලම් ප්‍රදේශයේ සිට කපා ප්‍රවාහනය කිරීමට තහනමක් පනවා තිබේද;

(ii) එසේ නම්, "බුලත් කොවුල් 2011" අංකය දරණ හා 2014.05.13 දිනැති වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය අනුව, ඔවුන්ට ඒ සඳහා අවසර ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) மட்டக்களப்பு மாவட்டத்தில் களுதாவளை கிராமத்தில் வாழும் அண்ணளவாக 1500 குடும்பங்களைச் சேர்ந்தவர்கள் தமது பிரதான வாழ்வாதாரமாக வெற்றிலைச் செய்கையில் ஈடுபட்டுள்ளார்கள் என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) வெற்றிலைச் செய்கையை வெற்றிகரமான முறையில் மேற்கொள்வதற்கு அத்தியாவசிய மான "வெற்றிலைக் கம்பங்கள்" பொத்துவில் ரொட்டக்குளம் பிரதேசத்திலிருந்து வெட்டி ஏற்றிச் செல்லப்படுவதற்கு தடை விதிக்கப் பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின் வன திணைக்களத்தின் வெற்றிலைக் கம்பம் 2011ஆம் இலக்க மற்றும் 2014.05.13ஆம் திகதிய சுற்றறிக்கையின்படி இவர்களுக்கு அதற்கான அனுமதியை வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Is he aware that approximately 1500 families residing in Kaludawala village of Batticaloa District engage in betel cultivation as their main livelihood activity?

(b) Will he inform this House-

(i) whether it has been banned to cut and transport the "supporting stakes for betel" from Rottakulam area of Pothuvil, which are essential for a successful betel cultivation; and

(ii) if so, whether action will be taken to authorize them to do the above as per Circular No: Supporting stakes for betel 2011 and dated 13.05.2014 of the Department of Forest Conservation?

(c) If not, why?

ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)

(The Hon. Anuradha Jayaratne- Deputy Minister of Mahaweli Development and Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) කළුදාවල ග්‍රාමයේ වසන පවුල් 1500ක් පමණ ජීවනෝපාය වශයෙන් රැකියාව ලෙස බුලත් වගා කරන බවට කළුදාවලේ බුලත් සංවර්ධන සංගමය විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත.

(ආ) (i) නැත.

වන ප්‍රතිපත්තියට අනුකූලව වනාන්තර ආශ්‍රිතව ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය නංවාලීම සඳහා වනාන්තරයට හානියක් සිදු නොවන පරිදි එහි හටගන්නා වනජ ද්‍රව්‍ය ලබා දීමේ හැකියාව පවතී. ඒ අනුව අදාළ ප්‍රදේශයේ වනාන්තර තුළ බුලත් කොවුල් තිබේ නම් සහ වනාන්තරයට හානියක් නොවන සේ ඒවා ඉවත් කිරීමේ හැකියාව ඇත්නම් පමණක් බුලත් වගාවන්හි යෙදෙන ගොවීන් සඳහා වන ආඥා පනතේ ප්‍රතිපාදනවලට යටත්ව බුලත් කොවුල් ලබා දීමේ හැකියාව ඇත. රජයේ ඉඩම්වලින් මෙන්ම වෙනත් ඉඩම්වලින්ද ලබා ගන්නා බුලත් කොවුල් ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන බලපත්‍ර ලබා ගත යුතු වේ.

(ii) බුලත් කොවුල් 2011 හා 2014.05.13 යනුවෙන් චක්‍රලේඛයක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර නොමැති බව සඳහන් කරමි.

(ඇ) පැන නොනඟී.

අනුරාධපුර මහ රෝහල: රථගාල ඉදිකිරීම

அநுராதபுரம் பொது வைத்தியசாலை: வாகனத் தரிப்பிட நிர்மாணம்

ANURADHAPURA GENERAL HOSPITAL: CONSTRUCTION OF CAR PARK

569/'16

10. ගරු ශෙහාන් සේමසිංහ මහතා

(மாண்புமிகு செஹான் சேமசிங்க)

(The Hon. Shehan Semasinghe)

ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2014 වර්ෂයේ ආරම්භ කර අතර මඟ නතර කර ඇති අනුරාධපුර මහ රෝහලේ රථ ගාල ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි වැඩ කටයුතු නැවත ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නො එසේ නම්, ඒ සඳහා විකල්ප වැඩ පිළිවෙළක් හෝ ව්‍යාපෘතියක් තිබේද;

(iv) මේ සඳහා වෙන්ව තිබූ රුපියල් මිලියන දෙකක මුදල අවිච්ඡේද වී ඇති නිසා, එම මුදල නැවත ලබා ගැනීමට කටයුතු කර තිබේද;

(v) නො එසේ නම්, ඒ සඳහා විකල්ප වැඩ පිළිවෙළක් හෝ යෝජනාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

උල්නාට්ටලුවල්කළ් අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) 2014ஆம் ஆண்டில் ஆரம்பிக்கப்பட்டு, இடையில் நிறுத்தப்பட்டுள்ள அநுராதபுரம் பொது வைத்தியசாலையின் வாகனத் தரிப்பிடத்தை நிர்மாணிக்கும் கருத்திட்டத்தின் பணிகள் மீண்டும் ஆரம்பிக்கப்படுமா;

(ii) ஆமெனில், அத்திகதி யாது;

(iii) இன்றேல், அதற்கான மாற்று வேலைத்திட்டம் அல்லது கருத்திட்டம் காணப்படுகின்றதா;

(iv) இதற்காக ஒதுக்கப்பட்டிருந்த ரூபா இரண்டு மில்லியன் பணத்தொகை செலவு செய்யப்படாதுள்ளதால் அத்தொகையை மீண்டும் பெற்றுக் கொள்வதற்கு நடவடிக்கை மேற்கொள்ளப் பட்டுள்ளதா;

(v) இன்றேல், இதற்கான மாற்று வேலைத்திட்டம் அல்லது பிரேரணை காணப்படுகின்றதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House -

(i) whether activities of the project to construct a car park for Anuradhapura General Hospital, which were commenced in the year 2014 and stopped halfway, will be recommenced;

(ii) if so, that date;

(iii) if not, whether there is an alternative arrangement or project for that;

(iv) as the provision of two million rupees that had been allocated for this project has been returned, whether action will be taken to obtain that provision again; and

(v) if not, whether there is an alternative arrangement or proposal for that?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) විකල්ප වැඩ පිළිවෙළක් යෝජනා වී ඇත.

(iv) ව්‍යාපෘතිය අවිච්ඡේද වී නොමැත.

(v) ඔව්.

මෙම ඉඩම් කොටස රථ ගාල ඉදි කිරීම සඳහා යෝජනා වුවද, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අනුරාධපුර ශික්ෂණ රෝහලට ප්‍රතිකාර ගැනීම සඳහා පැමිණෙන වකුගඩු රෝගීන්ට නවාතැන් ගැනීමට සුබ සාධක මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාම සඳහා ඉඩම් කොටස උතුරු මැද පළාත් ලේකම් වෙත වෙන් කර දෙන ලෙස කර ඇති ඉල්ලීමට අනුව දැනට ප්‍රධාන ලේකම් වෙත ඉඩම් වෙන් කර දී එහි ඉදිරි කටයුතු ආරම්භ වී ඇති බැවින් ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු අමාත්‍යතුමනි, අතුරු ප්‍රශ්නයක් තිබෙනවා, ඔබතුමාට හැකි නම් පිළිතුරු දෙන්න. වෘත්තීය සමිති සහ වෛද්‍යවරුන්ගේ ඉල්ලීම මත තමයි ඉඩම් කොටසක් වෙන් කළේ. එය ප්‍රතිකාර ගන්නා වකුගඩු රෝගීන්ට නවාතැන් පොළක් හැටියට වැඩිදියුණු කරනවා නම් රථගාල සඳහාත් විකල්ප ක්‍රමවේදයක් සකසා ගැනීම අත්‍යවශ්‍ය කාරණයක්. මොකද, ඒ අවට උසාවිය තිබෙනවා; ප්‍රසිද්ධ පාසල තිබෙනවා; වෙළඳ සංකීර්ණ තිබෙනවා. එහි දැඩි තදබදයක් තිබෙනවා. ඒ හින්දා තමයි වෘත්තීය සමිති සහ වෛද්‍යවරුන් ඉල්ලීමක් කළේ, ඔවුන්ගේ කඩිනම් සේවාව සැපයීම සඳහා මේ තදබදය අවම කරන්න කියලා. ඒකට විකල්ප ඉඩමක් වෙන් කිරීම අත්‍යවශ්‍ය කාරණයක් කියායි මා හිතන්නේ. ඔය වෙන් කරපු ඉඩමට එහා පැත්තෙන් තිබෙනවා තවත් ඉඩම් කොටසක්. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න ගරු අමාත්‍යතුමනි. මොකද, දැඩි වාහන තද බදයක් එතැන තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

දැනට ඒ රථගාල වෙනුවට වකුගඩු රෝගීන් වෙනුවෙන් -වැඩි අවශ්‍යතාව නිසා- ශුභ සාධන මධ්‍යස්ථානයක් හදන්න තීරණය කර තිබෙනවා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ඒක හොඳයි. එහි ගැටලුවක් නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඔබතුමාගේ අදහස මම ගරු ස්වදේශ කටයුතු ඇමතිතුමාට ඉදිරිපත් කරන්නම්. ඔබතුමා කියන්නේ, දෙකම කෙරෙන්න ඕනෑ කියන එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 11-621/'16-(1), ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

යුරෝපා මහාද්වීපයට අයත් රටවලදී මිය ගිය ශ්‍රී ලාංකික පුරවැසියන් :විස්තර

ஐரோப்பியக் கண்ட நாடுகளில் மரணித்த இலங்கைப் பிரசைகள் : விபரம்

DECEASED SRI LANKAN CITIZENS IN COUNTRIES OF EUROPEAN CONTINENT: DETAILS

105/'15

15.ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා වසර පහක කාලය තුළ යුරෝපා මහාද්වීපයට අයත් රටවලදී මිය ගිය ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය හා උක්ත රටවලදී කරන ලද රැකියා කවරේද;

(iii) එම පුද්ගලයන්ගේ මරණවලට ආසන්නතම හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ යුරෝපා මහාද්වීපයට අයත් රටවලදී පූර්ණ සහ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, වයස, ශ්‍රී ලංකාවේ ලිපිනය හා උක්ත රටවල්හි දී කරන ලද රැකියා කවරේද;

(iii) මෙම පුද්ගලයන් ආබාධිත වීමට හේතු කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් රජය ලබා දුන් සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010.01.01ஆம் திகதி தொடக்கம் 2014.12.31ஆம் திகதி வரையிலான ஐந்தாண்டு காலப் பகுதியில் ஐரோப்பியக் கண்டத்திலுள்ள நாடுகளில் மரணித்த இலங்கைப் பிரசைகளின் எண்ணிக்கை ஒவ்வொரு நாட்டின்படி தனித்தனியாக எத்தனையென்பதையும்,

(ii) இவர்களது பெயர், வயது, இலங்கையில் வசித்த முகவரி மற்றும் மேற்படி நாடுகளில் புரிந்த தொழில் யாவையென்பதையும்,

(iii) இந்த ஆட்களின் மரணங்களுக்கான அண்மித்த காரணங்கள் யாவையென்பதையும்,

(iv) இவர்கள் சார்பாக அரசாங்கம் வழங்கியுள்ள நிவாரணங்கள் யாவையென்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2010.01.01 ஆம் திகதி தொடக்கம் 2014.12.31 ஆம் திகதி வரையிலான ஐந்தாண்டு காலப் பகுதியில் ஐரோப்பியக் கண்டத்திலுள்ள நாடுகளில் முழுமையாக அல்லது பகுதியளவில் அங்கவீன நிலைமைக்கு உள்ளாகிய இலங்கைப் பிரசைகளின் எண்ணிக்கை ஒவ்வொரு நாட்டின் பிரகாரம் தனித்தனியாக எத்தனையென் பதையும்,

(ii) இவர்களது பெயர், வயது, இலங்கையில் வசித்த முகவரி மற்றும் மேற்படி நாடுகளில் மேற் கொண்ட தொழில் யாவையென்பதையும்,

(iii) இவர்கள் அங்கவீனமடைந்ததற்கான காரணங் கள் யாவையென்பதையும்,

(iv) இவர்கள் சார்பாக அரசாங்கம் வழங்கியுள்ள நிவாரணங்கள் யாவையென்பதையும்,

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House -

(i) the number of Sri Lankan citizens who died in countries of European Continent during the period of five years from 01.01.2010 to 31.12.2014 in relation to each country, separately;

(ii) their names, age, residential address in Sri Lanka and the jobs done in the above countries;

(iii) the immediate reason for the deaths of those people; and

(iv) the reliefs provided by the Government for them?

(b) Will he also inform this House -

(i) the number of Sri Lankan citizens who became partially and totally disabled in countries of European Continent during the period from 01.01.2010 to 31.12.2014 in relation to each country, separately;

(ii) their names, age, residential address in Sri Lanka and the jobs done in the above countries;

(iii) the reasons for those people to become disabled; and

(iv) the reliefs provided by the Government for them?

(c) If not, why?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2010.01.01 දින සිට 2014.12.31 දින දක්වා කාලය තුළ යුරෝපා මහාද්වීපයට අයත් රටවලදී ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ මරණ 661ක් සිදුවූ බවට වාර්තා වෙලා තිබෙනවා.

(ii) මීට අදාළව දීර්ඝ ලේඛනයක් තිබෙනවා. එය Annex - A ලෙස **සභාගත*** කරනවා.

(iii) Annex - B හි සඳහන් වනවා. Annex - B **සභාගත*** කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා (අ) (iii)ට පිළිතුර වශයෙන් දැන් කිව්වා, පුද්ගලයන්ගේ මරණවලට ආසන්නම හේතු සභාගත කරනවා කියලා. ඒ හයසිය ගණනේම නම් ඉස්සරහින් තිබෙන හේතු නොව, සමස්තයක් විධියට ගත් කල ඒ කුමන හේතූන් නිසාද කියන එක සම්බන්ධයෙන් summary sheet එකක් ඔබතුමාට දී තිබෙනවාද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

බොහෝ අය වයසට ගිහින් තමයි මීය යන්නේ.

(iv) වාර්තා වී නොමැත.

(ආ) (i) යුරෝපා මහද්වීපයට අයත් රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පවතින වාර්තාවලට අනුව 2010.01.01 සිට 2014.12.31 දක්වා කාලයේදී ආංශික වශයෙන් හෝ පූර්ණ වශයෙන් ආබාධිත ශ්‍රී ලාංකිකයන් පිළිබඳ කිසිදු තොරතුරක් නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මාගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මීය ගිය අය 661 දෙනෙක් පිළිබඳව වාර්තා වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඉතාලිය, මහා බ්‍රිතාන්‍යය, යම් ප්‍රමාණයකට ජර්මනිය සහ ප්‍රංශය ඇතුළු යුරෝපා රටවල් කිහිපයක විවිධ වෘත්තීන්හි ශ්‍රී ලාංකිකයන් සේවය කරනවා. ඒ අය ඒ රටවල තිබෙන මහ කොමසාරිස් කාර්යාල, තානාපති කාර්යාල හෝ ඒ හා සමාන ආයතන සමඟ සම්බන්ධ වෙලා තිබෙනවා. එතකොට තමුන්ගේ රට නියෝජනය කරන ජනතාව මීය යාමට අමතරව, ඒ අයට යම් බෙලහීනතාවක් ඇති වුණොත් ඒ පිළිබඳව සොයා බලන ක්‍රමවේදයක් ඒ තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල හෝ ඊට සමාන ආයතනවල තිබෙනවාද, නැද්ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

එහෙම ප්‍රශ්න ඇති වුණාම පෞද්ගලික වශයෙන් ඔවුන් ඇවිල්ලා සාකච්ඡා කළොත් අපි ඒ පිළිබඳව සොයා බලනවා. මේ ළඟදීත් සිංගප්පූරුවේ විශ්වවිද්‍යාලයකට යන ශිෂ්‍යාවෙක් accident වෙලා තිබුණා. එහිදී ඒ තානාපති කාර්යාලයත් සමඟ සම්බන්ධ වෙලා ඒ රක්ෂණ සංස්ථාවෙන් මිලියන ගණනක වන්දියක් ලබා දුන්නා. උදාහරණයක් හැටියට මම ඒ කිව්වේ මේ ළඟදී වුණු සිද්ධියක් ගැනයි. එහෙම වුණාම Consular Affairs Division එක හරහා ඒ සියලු වැඩ කටයුතු සිදු වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් මමත් දන්නා ආකාරයට මීට අවුරුදු දෙකකට පමණ කලින් මෑත අතීතයේදී - ඈත අතීතයේදී නොවෙයි, මෑත අතීතයේදී - පසු ගිය රජය සමයේදී විශේෂයෙන්ම තානාපති කාර්යාලවල, මහ කොමසාරිස් කාර්යාලවල ඇතැම් මහ කොමසාරිස්වරු වේවා, තානාපතිවරු වේවා, ඊට පහළ නිලධාරීන් වේවා - අපි කියමු, ඉතාලිය කියලා. ලාංකිකයන් වැඩියෙන් ඉන්නේ ඉතාලියේ.- එහි සිටින ශ්‍රී ලාංකිකයන්ට යම් ප්‍රශ්නයක් ඇති වුණු ඇතැම් අවස්ථාවලදී තමුන්ගේ තානාපති කාර්යාලයෙන් සතුටුදායක සේවයක්, තෘප්තිමත් සේවයක්, කාර්යක්ෂම සේවයක් ලබා ගැනීමේ දුෂ්කරතා ඇති වෙලා තිබුණා. වර්තමාන රජය යටතේ විදේශ කටයුතු අමාත්‍යාංශය තමුන්ගේ සේවාව ලබා ගන්නා අයට තෘප්තිමත් සේවයක් ලැබෙනවාද කියලා බැලීමට යම් ඇගයීම් ක්‍රමවේදයක් සකස් කරලා තිබෙනවාද? ඒ ගැන හොයන්න තානාපති කාර්යාලයේ පෙට්ටි තැබුවාට කවදාවත් වැඩක් වෙන්නේ නැහැ. ලංකාවේ hotline number එකකට කථා කරන්න, එහෙම නැත්නම් දැනුවත් කරන හෝ ඇගයීමේ ක්‍රමවේදයක් සහ පසුවිපරම් ක්‍රමවේදයක් සකස් කිරීම ගැන අමාත්‍යාංශය අවධානය යොමු කර තිබෙනවාද, නැත්නම් යොමු කරන්න බලාපොරොත්තු වෙනවාද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රථම වතාවට අප එහෙම ඇගයීම් වැඩ පිළිවෙළක් හඳුන්වා දී තිබෙනවා. ඇත්ත වශයෙන්ම අප ඔවුන්ට ඉලක්කත් ලබාදී තිබෙනවා. ඊට පසුව ඒ ඉලක්ක පසු ඇගයීම්වලට ලක්කරන්න අප පළමුවැනි වතාවට දැන් පටන් අරගෙන තිබෙනවා. ඊට අමතරව හිටපු තානාපතිවරු සහ ලේකම්වරු කිහිපදෙනෙකුගෙන් සමන්විත "Inspectors General" කියා කණ්ඩායමක් හදා තිබෙනවා. ඔවුන් නොයෙකුත් තානාපති කාර්යාලවලට යොමු කරලා, ඒ ඇගයීම් කරන්නත් පළමුවැනි වතාවට අප වැඩ පිළිවෙළක් පටන් අරගෙන තිබෙනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, යම්කිසි යුරෝපා රටක අපේ තානාපති කාර්යාලය පිහිටා තිබෙන්නේ ඒ රටේ අගනුවරයි. සමහර විට ඒ තානාපති කාර්යාලයට පැමිණෙන්න ඒ රටේ එහා කෙළවරක සේවය කරන පුද්ගලයෙකුට දුම්රියට, ගුවන් යානයට හෝ වෙනත් මගී ප්‍රවාහන ක්‍රමයකට එක දවසක් කැප කරන්න වෙනවා. ඒ ඇවිත් ඒ කටයුත්ත කරගෙන යන කොට සමහර විට දවසක් හෝ දෙකක් කැප කරන්න වෙනවා. හැබැයි, අප දන්නවා ඒ රටවල සේවය කරන අයට තිබෙන්නේ අවම නිවාඩු ප්‍රමාණයක් සහ ඒ නිවාඩු පිළිබඳවත් තිබෙන බාධා වැඩි බව. ඒ තරම් බාධක මැද්දේ ආවාම තානාපති කාර්යාලයෙන් සමහර වෙලාවට ඒ සේවය ලබා ගන්න බැරි වුණොත්, දවසක් දෙකක් ඉන්න වෙන තත්ත්වයකුත් තිබෙනවා. ඒ නිසා සමහර අය අතරමැදියෝ පාවිච්චි කරනවා. ඒ අතරමැදියෝ විවිධ අක්‍රමිකතා කරනවා හෝ මුදල් ගරාගැනීම් කරනවා. මේ අතරමැදියන් අවම කරන්නත්, දෙවනුව අර දවස් ගණනක් තමන්ට තිබෙන සොච්චම් නිවාඩුව කැප කරගෙන එන අයට අතරමැදියෝ නැතිව ආවාම මුහුණ දෙන්න වන පීඩා නැති කරන්නත් තිබෙන දැක්ම මොකක්ද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ ඉතාම වැදගත් ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය අපෙන් ඇසීම පිළිබඳව එතුමාට අප ස්තුතිවන්ත වෙනවා. අප මාස හයක පමණ කාලයක සිට තොරතුරු තාක්ෂණය පාවිච්චි කරලා අපේ network එක ශක්තිමත් කරන්න ලොකු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. මම ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි, අද උදේ පවා අප අලුත් ක්‍රමවේදය පිළිබඳව ඇගයීමක් කරලා තමයි මෙතැනට ආවේ කියන එක. ඒ අනුව අප Consular Affairs අංශය ශක්තිමත් කරන්න විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. ගරු ඇමතිතුමා ඒ පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා. මම සෘජුවම ඒ සම්බන්ධයෙන් කැප වෙලා වැඩ කරනවා. මේ අවුරුද්දේ අවසානය වන විට ලංකාවේ සියලු තානාපති කාර්යාලවල තිබෙන මේ Consular Affairs අංශය තොරතුරු තාක්ෂණය භාවිත කරලා ශක්තිමත් කරන්න අප බලාපොරොත්තු වෙනවා. එතකොට අතරමැදියන්ගේ අවශ්‍යතාවත් අඩු වනවා. ඔවුන්ට දවස් දෙකේ වැඩේ පැය භාගයෙන් කර ගන්න හැකියාව ලැබෙනවා. ඒ පිළිබඳව අපි අවධානය යොමු කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ අතුරු ප්‍රශ්න 3 ඉවරයි. දෙවන වටය.

ප්‍රශ්න අංක 6 -483/' 16- (1), ගරු කනක හේරත් මන්ත්‍රීතුමා.

ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතු : විස්තර
மக்கள் பெருந்தோட்ட அபிவிருத்திச் சபைக்குரிய தோட்டங்கள்: விபரம்
ESTATES COMING UNDER JANATHA ESTATE DEVELOPMENT BOARD: DETAILS

629/'16

12.ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. Mahindananda Aluthgamage)
රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වර්ෂ 2001 - 2004 කාලය තුළ පැවති එක්සත් ජාතික පක්ෂ රජය විසින් විකිණීමේ හෝ දීර්ඝ කාලීන බදු පදනම මත පෞද්ගලික සමාගම් හෝ පුද්ගලයින් වෙත ලබාදී ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතුවල නම්, ඒවායේ අක්කර ප්‍රමාණය, විකුණූ හෝ බදු දුන් මුදල, විකිණූ හෝ බදු පදනම මත ලබා දුන් සමාගම් හෝ පුද්ගලයින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම වතු ලබාදී ඇත්තේ කැබිනට් අනුමැතිය, විවෘත ටෙන්ඩර් පටිපාටියකට අනුව හෝ රජයේ තක්සේරුවකට යටත්වද;

(iv) එවැනි කොන්දේසි කිසිවක් නොමැතිව මෙම ඉඩම් විකුණා හෝ බදු දී ඇත්නම්, එම ඉඩම් නැවත රජයට පවරා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

අරස තොළිල්මුයට්සිකළ් අපිවිරුත්දි අමෙච්සරෛක් කේට්ට විනා:

(අ) (i) 2001 - 2004ආම් ආණ්ඩු කාලත්තිනුළ් ආට්සියිලිරුන්ත ඉක්කිය තේසියක් කට්සි අරසාංගත්තිනාල් විර්පනෛ අල්ලතු නීණ්ඩකාල කුත්තගෛ අඩිප්පටෛයිල් තනියාර් කම්පනිකළුක්කු අල්ලතු ආට්කළුක්කු වළංගප් පට්ටුළ්ළ මක්කළ් පෙරුන්තෝට්ට අපිවිරුත්දි සපෛක්කුච් සොන්තමාන තෝට්ටංකළින් එණ්ණික්කෛ යාතෙන්පතෛයුම්;

(ii) අත්තෝට්ටංකළින් පෙයර්කළ්, අවර්රින් ඒක්කර් අළවුකළ්, විර්පනෛ සෙය්යප්පට්ට අල්ලතු කුත්තගෛක්කු වළංගප්පට්ට පණත්තොකෛ, විර්පනෛ අල්ලතු කුත්තගෛ අඩිප්පටෛයිල් වළංගප්පට්ටුළ්ළ කම්පනිකළ් අල්ලතු ආට්කළින් පෙයර්කළ් තනිත්තනියාක යාවෛයෙන්පතෛයුම්;

(iii) මේර්පඩි තෝට්ටංකළ් වළංගප්පට්ටිරුප්පතු අමෛච්සරවෛ අංගීකාරම්, තිරන්ත කේව්විප් පත්තිර නටෛමුරෛ අල්ලතු අරසාංගත්තින් විලෛමතිප්පීට්ටු එන්පවර්රුක්කු උට්පට්ට වකෛයිලා එන්පතෛයුම්;

(iv) අත්තකෛය නිපන්තනෛකළ් එතුවුමින්රි මේර්පඩි කාණිකළ් විර්පනෛ සෙය්යප්පට්ටිරුප්පින් අල්ලතු කුත්තගෛක්කු වළංගප්පට්ටිරුප්පින්

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

அக்காணிகள் மீண்டும் அரசாங்கத்திற்குச் சுவீகரித்துக் கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise Development:

(a) Will he inform this House -

(i) the number of estates coming under the purview of Janatha Estates Development Board, which were sold or given on long term lease basis to private companies or persons by the United National Party Government that existed during the period 2001-2004;

(ii) the names of the aforesaid estates, the acreage of the said estates, the amount of money for which the aforesaid estates were sold or given on lease, the names of the companies or persons that bought the aforesaid estates or took them on lease, separately;

(iii) whether the aforesaid estates were handed over having obtained the approval of the Cabinet of Ministers or adopting open tender procedure or under a valuation of the Government; and

(iv) whether the aforesaid lands will be taken over by the Government back if those lands have been sold or given on lease without any such conditions?

(b) If not, why?

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) බදු දී ඇති වතු සංඛ්‍යාව 05

(ii)

	වතුයායේ නම	අක්කර ප්‍රමාණය (හෙක්ටයාර)	බදු දුන් මුදල රු.	බදු දුන් සමාගම හෝ පුද්ගලයාගේ නම
1	කුඩාදොල - කළුතර	39.0762	65,317.00	ඩබ්ලිව්.එම්.එම්. ප්‍රනාන්දු මහතා
2	බෝහිල් - මහනුවර	6.945	200,000.00	සන්ටැක් ෆවර් (පුද්ගලික) සමාගම
3	හන්තාන - මහනුවර	0.408	150,000.00	ශ්‍රී ලංකා තේ මණ්ඩලය
		0.0716	372,000.00	එම්.ටී.වී. චැනල් (පුද්ගලික) සමාගම
		1.6167	3,328.00	හිල්කන්ට්‍රි ෂූටිං ක්ලබ්
4	මොන්ට්ක්‍රින්ටෝ - මහනුවර	364.36	2,000,000.00	සෙන්ට්‍රල්හිල්ස් ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම
5	කුමාරවත්ත - මොනරාගල	1.214	18,000.00	ශ්‍රී ලංකා කජු සංස්ථාව

(iii)

	වතුයායේ නම	බදුකරුවන්	කැබිනට් අනුමැතිය	විවෘත ටෙන්ඩර් පටිපාටිය	තක්සේරු මුදල හා දිනය
1	කුඩාදොල - කළුතර	ඩබ්ලිව්.එම්.එම්. ප්‍රනාන්දු මහතා	නැත	නැත	290,000.00 2013.01.03
2	බෝහිල් - මහනුවර	සන්ටැක් ෆවර් (පුද්ගලික) සමාගම	නැත	නැත	නැත
3	හන්තාන - මහනුවර	ශ්‍රී ලංකා තේ මණ්ඩලය	නැත	නැත	250,000.00 2001.01.18
		එම්.ටී.වී. චැනල් (පුද්ගලික) සමාගම	නැත	නැත	නැත
		හිල්කන්ට්‍රි ෂූටිං ක්ලබ්	නැත	නැත	289,100.00 2003.02.20
4	මොන්ට්ක්‍රින්ටෝ - මහනුවර	සෙන්ට්‍රල්හිල්ස් ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම	නැත	නැත	නැත
5	කුමාරවත්ත - මොනරාගල	ශ්‍රී ලංකා කජු සංස්ථාව	නැත	නැත	නැත

(iv) බදු ගිවිසුම් යටතේ බදු දී ඇති ඉඩම්, ගිවිසුම් කාලය අවසන් වීමෙන් පසු, නැවත රජයට පවරා ගැනේ.

(ආ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 13 - 643/'16 - (1), ගරු එම්.එච්.එම්. සල්මාන් මන්ත්‍රීතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව : ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වූවන්

இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனம்: சுயவிருப்பில் ஓய்வுபெறச் செய்யப்பட்டோர்

CEYLON PETROLEUM CORPORATION: VOLUNTARILY RETIRED EMPLOYEES

662/'16

14.ගරු බුද්ධික පතිරණ මහතා (ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය වෙනුවට)

(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. (Mrs.) Hirunika Premachandra)

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2002 වර්ෂයේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයන් 1,491කට රැකියාව අහිමි වූ බවත්;

(ii) ඔවුන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම එයට හේතු වූ බවත්;

(iii) එම සේවකයින් නැවත රැකියාවේ පිහිටුවන ලෙසට වර්ෂ 2010දී අභියාචනාධිකරණය විසින් ලබා දුන් තීන්දුවට විරෝධය පාමින්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හිටපු සභාපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයෙහි ගොනු කළ නඩුවද විභාග වී අවසන් වුවත්, මෙතෙක් මෙම සේවකයින්ගට කිසිදු සාධාරණත්වයක් ඉටු වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම සේවකයින් සඳහා සාධාරණයක් ඉටු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

පෙට්‍රෝලිය වලංකල් අපිවිරුත්ති අමෛච්චරෛක් කේට්ට වින්නා:

(அ) (i) 2002ஆம் ஆண்டில் இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்தின் 1491 ஊழியர்கள் தொழிலை இழந்தார்கள் என்பதையும்;

(ii) இவர்களை சுயவிருப்பத்தின் பேரில் ஓய்வுபெறச் செய்தமை இதற்கு காரணமாக அமைந்ததென்பதையும்;

(iii) 2010ஆம் ஆண்டில் மேன்முறையீட்டு நீதிமன்றத்தினால் மேற்படி ஊழியர்களை மீண்டும் சேவையில் அமர்த்துமாறு வழங்கப்பட்ட தீர்ப்பினை எதிர்த்து, இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்தின் முன்னாள் தலைவரினால் மேன்முறையீட்டு நீதிமன்றத்தில் தொடுக்கப்பட்ட வழக்கும் முடிவடைந்துள்ள போதிலும், இற்றைவரை இவ்வூழியர்களுக்கு எந்தவித நீதியும் நிறைவேற்றப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மேற்படி ஊழியர்களுக்கு நீதியை நிறைவேற்றுவாரா என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Petroleum Resources Development:

(a) Is he aware that -

(i) 1491 employees of Ceylon Petroleum Corporation lost their jobs in the year 2002;

(ii) those employees lost their jobs due to volunteer retirement; and

(iii) justice has not been served to those employees so far despite that the Supreme Court has finished the hearing of the case filled by the former Chairman of the Ceylon Petroleum Corporation against the ruling given by the Court of Appeal in the year 2010 to the effect that those employees be reinstated?

(b) Will he inform this House whether action will be taken to serve justice to the aforesaid employees?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) 2002 වර්ෂයේ සංස්ථා ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළ යටතේ හඳුන්වා දුන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමය යටතේ 2002.12.31 දිනට සේවකයන් 945ක් සහ 2003.03.31 දිනට සේවකයන් 532ක් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ලබා ඇත.

(ii) ඔව්.

(iii) 2010 වර්ෂයේ අභියාචනාධිකරණය වෙතින් ලද තීන්දුවෙන් මෙම ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගන්වන ලද සේවකයන් නැවත සේවයේ පිහිටුවන නියෝගයක් ලබා දී නොමැති අතර, ඔවුන් විශ්‍රාම ලැබීමට ප්‍රථම සේවය කළ කාලයට අදාළ වැටුප් සංශෝධනයන්හි හිඟ වැටුප් ලබා දීමට නියෝග කර ඇත.

එම තීරණය සම්බන්ධයෙන් සංස්ථාව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඇපැලක් ඉදිරිපත් කර ඇති අතර එම නඩුව මෙතෙක් අවසන් වී නොමැත.

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ අවසන් නියෝග අනුව අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

ගරු නියෝජ්‍ය කථානායකතුමා

(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)

(The Hon. Deputy Speaker)

ප්‍රධාන කටයුතු. ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්න. ගරු ඩග්ලස් දේවානන්ද මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

උතුරු සහ නැගෙනහිර පළාත්වල ආබාධිතවූවන් මුහුණ දෙන ගැටලු
வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் மாற்றுவலுவுள்ளோர் முகங்கொடுக்கும் பிரச்சினைகள்
PROBLEMS FACED BY THE DISABLED IN NORTHERN AND EASTERN PROVINCES

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனது வினாவை விடுக்க அனுமதியளித்தமைக்கு நன்றி.

கடந்தகால யுத்தம் காரணமாக வடக்கு - கிழக்கு மாகாணங்களில் மாற்று வலுவுள்ளவர்களின் எண்ணிக்கை ஏனைய மாவட்டங்களைவிட அதிகரித்துக் காணப்படும் நிலையைத் தாங்களும் அறிந்திருப்பீர்களென எண்ணுகின்றேன். இவர்களில் பலர் எந்தவிதமான உதவிகளும் இன்றிய நிலையில் தங்களது வாழ்வாதாரங்களை ஈட்டிக்கொள்ள இயலாது பெரிதும் பாதிக்கப்பட்டு வருகின்றனர். அந்த வகையில், வடக்கு மாகாணத்தில் மாற்றுவலுவுடையவர்களென 16,213 பேர் அடையாளங் காணப்பட்டுள்ளனர். இவர்களில் 4,003 பேர் மாத்திரமே அரசாங்கத்தால் வழங்கப்படுகின்ற 3,000 ரூபாய் கொடுப்பனவைப் பெறுகின்றனர். வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையில் மாற்றுவலுவுள்ளவர்களில் 12,210 பேருக்கு மேற்படி கொடுப்பனவு கிடைக்காத நிலைமை காணப்படு கின்றது. எனவே, மாற்றுவலுவுடையோர் தொடர்பான பின்வரும் வினாக்களை எழுப்ப விரும்புகின்றேன்:

யுத்தம் காரணமாகப் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்கு மாகாணங்களுக்கென ஒரு விசேட ஏற்பாடாக மேற்படி 3,000 ரூபாய் பெறுகின்ற பயனாளிகளின் எண்ணிக்கையை அதிகரிப் பதற்கு நடவடிக்கை எடுக்க முடியுமா? அல்லது இவர்களுக் கென வேறு விசேட திட்டங்களை ஏற்படுத்தி அதனூடாக உதவக்கூடிய சாத்தியப்பாடுகள் உள்ளனவாவென்பது பற்றி அறியத்தர முடியுமா?

வடக்கு மாகாணத்தில் மாற்றுவலுவுள்ளவர்களுக்கான மலசலகூடங்களை அமைப்பதற்கென அண்மையில் வழங்கப் பட்ட நிதி போதுமானதாக இல்லையென்றும் பலர் அந்த திட்டத்தில் உள்வாங்கப்படவில்லையென்றும் கூறப்படு கின்றது. இவ்வாறு மாற்றுவலுவுள்ளவர்களுக்கு வழங்கப்படும் உதவித் திட்டங்களின்போது, அந்தந்தச் செயற்பாடுகளை மேற்கொள்வதற்கு ஏற்ற வகையிலான நிதி உதவிகளை வழங்குவதற்கும் பலரை அத்திட்டங்களுக்குள் உள்வாங்கக் கூடிய வகையிலும் திட்டங்களை வகுப்பதற்கான சாத்தியப்பாடுகள் தொடர்பில் தெளிவுபடுத்த முடியுமா?

வடக்கில் மாற்றுவலுவுள்ள பல்கலைக்கழக மாணவர்கள் பலர் மடிக்கணினி பெறுவதில் சிரமங்களை எதிர்நோக்கு வதாகக் கூறப்படுகின்றது. குறிப்பாக, பல்லைக்கழகங்களில் தவணை அடிப்படையில் கட்டணம் செலுத்தி மடிக்கணினிகள் பெற்றுக்கொள்வதற்கான ஏற்பாடுகள் இருப்பினும் இந்த தவணைக் கட்டணங்களைக்கூட செலுத்த வசதியில்லாத நிலையில் பலர் காணப்படுகின்றனர். இவ்வாறானவர்கள் மடிக்கணினிகளைப் பெற ஏதாவது மாற்று ஏற்பாடுகள் செய்யக்கூடிய சாத்தியங்கள் உள்ளனவா?

மாற்றுவலுவுள்ள மாணவர்களுக்கு கடந்த 2015ஆம் ஆண்டுவரை போக்குவரத்து மானியமாக 750 ரூபாய் வழங்கப்பட்டதெனவும் தற்போது ஒதுக்கீடு இல்லாத காரணத்தால் அது இடைநிறுத்தப்பட்டுள்ளதாகவும் தெரிய வருகின்றது. இந்த மானியத்தை மீண்டும் வழங்கக்கூடிய சாத்தியம் குறித்துத் தெளிவுபடுத்த முடியுமா?

வடக்கு - கிழக்கு மாகாணங்களில் யுத்தம் காரணமாகப் பாதிக்கப்பட்டுள்ள மாற்றுவலுவுள்ளவர்களுக்கான சமூக வலுவூட்டல் நடவடிக்கைகள், சமூகப் பாதுகாப்பு ஏற்பாடுகள் என்பன போதியளவில் கிடைப்பதில்லையெனக் கூறப்படு கின்றது. இது தொடர்பில் தங்களது அமைச்சு மேற்கொண்டு வருகின்ற நடவடிக்கைகள் தொடர்பில் தெளிவுபடுத்த முடியுமா?

மேலும், யாழ். மாவட்ட முதியோர் பேரவைக் கூட்டத்தை நடத்தக்கூடிய வகையில் கட்டிட வசதிகள் இல்லை என்றும் அதற்கு ஊரெழுவிலுள்ள மனித உரிமைகள் அமைப்பின் கிளை அலுவலக வளாகத்தை அதன் நிறைவேற்று உத்தியோகத்தர் வழங்க முன்வந்தார் என்றும் தெரியவந்தது. அது தொடர்பில் கொழும்பு முதியோர் செயலகத்துக்கு அறிக்கை சமர்ப்பிக்கப்பட்டதென்றும் இதுவரையில் செயலகத்திலிருந்து எவ்விதமான பதிலும் இல்லை எனவும் கூறப்படுகின்றது.

எனவே, இவ்விடயம் தொடர்பில் உடனடி நடவடிக்கை எடுத்து உதவ முடியுமா?

யுத்தம் காரணமாகக் கடந்த காலங்களில் தங்களது சொந்த இருப்பிடங்களைவிட்டு இடம்பெயர்ந்திருந்த மக்கள் தற்போது மீள்குடியேற்றப்பட்டு வருகின்றனர். வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையில் கிளிநொச்சி, முல்லைத்தீவு ஆகிய மாவட்டங்களில் மீள்குடியேற்ற நடவடிக்கைகள் முழுமையாக முற்றுப்பெற்றுள்ளதாகவும் ஏனைய மாவட்டங்களில் மீள்குடி யேற்ற நடவடிக்கைகள் இன்னமும் முழுமை பெறவில்லை என்றும் தெரியவருகின்றது. இவ்வாறு மீள்குடியேற்றப் படுகின்ற மக்களில் பெரும்பாலானவர்கள் நலன்புரி நிலையங்களில் எதுவித வாழ்வாதார வசதிகளுமின்றி வாழ்ந்தவர்களாவர். ஏனையவர்கள் நீண்டகால யுத்தம் காரணமாகப் பெரிதும் நலிவடைந்த மக்களாவர். இவர்களது நலன்கருதி இவர்களுக்கும் சமூர்த்தி நிவாரணம் வழங்கப் படக்கூடிய வகையில் வடக்கு, கிழக்கு மாகாணங்களில் சமூர்த்தி பயனாளிகளின் எண்ணிக்கையை அதிகரிக்குமாறு நாம் கடந்த காலங்களில் கோரிக்கை விடுத்திருந்தபோதிலும், அது போதியளவு சாத்தியமாகாமல் போயிற்று. அந்த வகையில் தற்போது வடக்கில் 96,804 குடும்பங்கள் சமூர்த்தி நிவாரணம் பெற விண்ணப்பித்துள்ளனர் எனத் தெரிய வருகின்றது. அதேநேரம், ஏற்கெனவே சமூர்த்தி பெறுகின்ற குடும்பங்கள் தொடர்பில் மீள்பரிசீலனை செய்ய வேண்டும் என நாம் பலமுறை கோரிக்கை விடுத்திருந்தும் அந்தக் கோரிக்கை போதியளவில் செயற்படுத்தப்படவில்லை. ஆகவே, இது தொடர்பான பின்வரும் வினாக்களை விடுக்க விரும்புகின்றேன்.

சமூர்த்தி நலனுதவிக் கொடுப்பனவு கோரி விண்ணப் பித்தவர்களின் தெரிவினைப் பிரதேச மட்டங்களில் உடன் மேற்கொள்ள நடவடிக்கை எடுக்க முடியுமா?

தற்போது வழங்கப்பட்டுவரும் வாழ்வாதார உதவிகளை அடுத்துவரும் இரண்டு ஆண்டுகளுக்கு வடக்கு மாகாணத்தில் 100 வீத மானிய அடிப்படையில் வழங்க அவதானம் செலுத்த முடியுமா?

சமுர்த்தி, வாழ்வின் எழுச்சிச் சமூகப் பாதுகாப்பு நன்மைகளான திருமணக் கொடுப்பனவு, பிறப்புக் கொடுப்பனவு, நோயாளர் கொடுப்பனவு, இறப்புக் கொடுப்பனவு ஆகியவற்றைச் சமுர்த்தி கொடுப்பனவு கிடைக்காத வறிய மக்களுக்கும் பெற்றுத்தரக்கூடிய சாத்தியங்கள் உண்டா?

வறிய சமுர்த்திப் பயனாளிகளின் உயர்தர வகுப்பில் கல்வி கற்கும் பிள்ளைகளுக்கு 'சிப்தொற' என்ற பெயரில் புலமைப்பரிசில் வழங்கப்படுகின்றது. இதன் தமிழ் விளக்கம் 'கல்விக் கதவு' என்பதாகும். எனவே தமிழ்மொழிமூல மாணவர்களிடையேயும் 'கல்விக் கதவு' அடையாளப் படுத்தப்படுவதற்கு நடவடிக்கை எடுக்கும்படி கேட்டுக்கொள்கிறேன்.

இந்தப் புலமைப்பரிசில்களின் எண்ணிக்கையை அதிகரிக்கக்கூடிய வாய்ப்புக்கள் உள்ளனவா?

சமுர்த்தி, வாழ்வின் எழுச்சி பயனாளிக் குடும்பங்களின் தகுதியான இளைஞர், யுவதிகளுக்குச் சமுர்த்தி உத்தியோகத்தர் நியமனங்களில் முன்னுரிமை வழங்க முடியுமா?

சமுர்த்தி, வாழ்வின் எழுச்சி வங்கிகள் ஊடாக வறிய, நடுத்தரக் குடும்பங்களைச் சார்ந்த தொழில் முயற்சியாளர்கள் இலகு முறையிலும் விரைவாகவும் கடன்களைப் பெறக்கூடிய பொறிமுறை ஒன்றை உருவாக்க முடியுமா?

விடயத்துக்குப் பொறுப்பான கௌரவ அமைச்சர் அவர்கள் இன்று இந்தச் சபையில் இல்லாதபடியால் மேற்படி எனது கேள்விகளுக்கு யார் பதில் தருவார் என்பது பற்றிப் பிரதிச் சபாநாயகர் அவர்கள் கூற வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. S. B. Dissanayake is not here. ඉදිරියේදී පිළිතුරු දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු අනුර දිසානායක මහතා. ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්නය.

II

යාපනය විශ්වවිද්‍යාලයේ ඇති වූ නොසන්සුන් තත්ත්වය

யாழ். பல்கலைக்கழகத்தில் ஏற்பட்ட பதற்ற நிலை
TENSE SITUATION IN JAFFNA UNIVERISTY

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

පසුගිය දා යාපනය විශ්වවිද්‍යාලයේ හට ගත් සිදු වීම විසින් මතු කරන ලද සමාජයීය අවදානම පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි. පසු ගිය 16වැනි දින යාපනය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ නවක සිසුන් පිළිගැනීමේ උත්සවයකදී සිංහල හා දෙමළ සිසුන් අතර ඇති වූ ගැටුම්කාරී තත්ත්වයක් හේතුවෙන් සිසුන් කිහිප දෙනකු තුවාල ලබා රෝහල් ගත කිරීමට සිදු වුණා.

මෙය විශ්වවිද්‍යාලයක සිදු වූ හුදු පහර දීමේ සිදුවීමක් නොවෙයි. විශ්වවිද්‍යාලවල විවිධ ගැටුම් ඇති වන තත්ත්වයන් අපි දැක තිබෙනවා. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 16වැනිදා යාපනය විශ්වවිද්‍යාලයේ සිදු වුණු මෙම සිදු වීම සාමාන්‍යයෙන් ළමුන් අතර ඇති වූ ගැටුමක් ලෙස සලකන්න බැහැ. දේශපාලනික හා සමාජයීය වශයෙන් බරපතළ අවදානමක් මතු කරන, ජන කොට්ඨාසයන් දෙකක් නියෝජනය කරන සිසුන් අතර හට ගත් සිදු වීමක් ලෙස මෙය තේරුම් ගත යුතුව තිබෙනවා. මෙය එම වසරේ දරුවන් අතර ඇති වූ කෝපයක් හෝ, එතැන ඇති වුණු වෙනත් සිදු වීමක් මත පදනම් වුණු දෙයක් නොවෙයි. සමාජයක් ලෙස හෙළා දැකිය යුතු හා පිටුදැකිය යුතු ජාතිවාදයේ විසකුරුභාවය මෙම සිදුවීම පිටුපස දැකිය හැකියි.

විශේෂයෙන් යාපනය විශ්වවිද්‍යාලයේ සිංහල සිසුන් පිරිසක් වෙත දෙමළ සිසුන් පිරිසක් විසින් කරන ලද පහර දීම උතුරේ වර්ධනය වෙමින් ඇති ජාතිවාදී මනෝභාවයේම දිගුවක්. මෙය ඒ මොහොතේ පැන නැඟුණු සිසුන්ගේ කෝපයක් හෝ ඒ මොහොතේ ඇති වුණු ආවේගයක් ලෙස අප සැලකිය යුතු නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රමානුකූලව වර්ධනය වෙමින් තිබෙන ජාතිවාදී මනෝභාවයේ, ජාතිවාදී ප්‍රවණතාවයේ අවස්ථාවක් ලෙස තමයි මෙම සිදු වීම අප තේරුම්ගත යුතු වන්නේ. මෙම තත්ත්වය සියලු වර්ගයේ ජාතිවාදීන්ට උත්තේජනයක් සපයනවා. ඕනෑම ජාතිවාදයක් අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා මත යැපෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ පිරිසක් තමන්ගේ එකම දේශපාලන ව්‍යාපෘතිය බවට පත්කොට ගෙන තිබෙන්නේ ජාතිවාදය බව අප දන්නවා. ඔවුන්ට වංචාව පිළිබඳව හෝ ඔවුන්ට ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව හෝ ඔවුන්ට රටේ යහපාලනය පිළිබඳව හෝ ඔවුන්ට අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව හෝ ආර්ථිකය නහාසිටුවීම පිළිබඳව කථා කරන්නට බැහැ. ඔවුන්ට කථා කළ හැකි එකම දේශපාලන පැවැත්ම බවට පත් වී තිබෙන්නේ ජාතිවාදයයි. ඒක තමයි ඇත්ත. ඒ නිසා එවැනි කණ්ඩායම්වලට මෙවැනි තත්ත්වයක් විශාල උත්තේජනයක් සපයනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උතුරේ බෝම්බයක් පුපුරණ තෙක්; උතුරේ පහර දීමක් සිදු වන තෙක්; උතුරේ යම් සිදු වීමක් සිදු වන තෙක් දිවා රෑ නොබලා බලා ගෙන ඉන්න කණ්ඩායමක් ඉන්නවා. ඔවුන්ගේ එකම දේශපාලන ව්‍යාපෘතිය බවට පත් වී තිබෙන්නේ ජනතාවගේ සමඟිය හෝ ජනතාවගේ ඒකාබද්ධතාව හෝ නොවෙයි. රටත් ජනතාවත් කුමන විපතකට හෝ පත් කොට තමන්ගෙන් ගිලිහී යන බලය අත්පත් කර ගැනීමේ අරමුණින් තමයි; ඒ පිපාසයෙන් තමයි ඔවුන් පෙළෙන්නේ. එවැනි කණ්ඩායම්වලට මෙම තත්ත්වය විශේෂ උත්තේජනයක් සපයනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඕනෑම ජාතිවාදයක් අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා මත යැපෙනවා. එක් ජාතිවාදයක් තව ජාතිවාදයකින් යට කරන්න බැහැ. ජාතිවාදයේ ස්වභාවයම තමයි එක් ජාතිවාදයක් විසින් අනෙක් ජාතිවාදය පෝෂණය කිරීම. ජාතිවාදය පෝෂණය වන තරමට අනෙක් ජාතිවාදීන් පෝෂණය වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතිවාදී ප්‍රපංචය එකිනෙකා මත සේවය කරමින් අන්‍යෝන්‍ය ලෙස වර්ධනය වන ප්‍රපංචයක්. ඒක අපි ඒ විධියට තේරුම් ගත යුතුව තිබෙනවා. එක් ජාතිවාදයක් එහි විරුද්ධවාදී ජාතිවාදයට අනියමින් උදව් කරනවා. එසේම ජාතිවාදය තවත් ජාතිවාදයකින් යටපත් කළ නොහැකි බව අප දන්නවා. සුළු

[ගරු අනුර දිසානායක මහතා]

ලෙස වර්ධනය වූ මෙවැනි සිදුවීම් විසින් විශාල යුද්ධයක් නිර්මාණය කිරීමට ඉවහල් වූ බව මෑත ඉතිහාසයේ සිදුවීම් අපට පෙන්වා දෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම යුද්ධයේදී මිය ගිය ප්‍රමාණය තවමත් අපි රටක් හැටියට දන්නේ නැහැ. අතුරුදහන් වූ ප්‍රමාණය තවමත් අපි රටක් හැටියට දන්නේ නැහැ. මේ මහ පොළොව ලේවලින් තෙත් වෙලා තිබෙනවා; කඳුළුවලින් පෙහිලා තිබෙනවා. දෙමව්පියන්ට දරුවන් අහිමි වෙලා තිබෙනවා, බිරින්දෑවරුන්ට ස්වාමිවරුන් අහිමි වෙලා තිබෙනවා, දරුවන්ට දෙමව්පියන් අහිමි වෙලා තිබෙනවා. කෝටි සංඛ්‍යාත මහා දේපළක් විනාශ වීමෙන් මේ රට යුග ගණනක් ආපස්සට ගෙන යන්න මේ යුද්ධය හේතු සාධක වී තිබෙනවා. එවැනි කුරිරු විනාශයන්ගෙන් අත් දැකීම් ලබා තිබෙන අප, යළි එවැනි තත්ත්වයක් වර්ධනය වීම සඳහා අඩිතාලම තබන, අවස්ථාව හැදෙන හැම මොහොතකම එය පරාජයට පත් කළ යුතුයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එවැනි තත්ත්වයක් යළි අපේ රටේ උතුරේ හෝ දකුණේ ඇති වීම සඳහා කටයුතු කරන්නට හෝ එය වර්ධනය කරන්නට හෝ පෝෂණය කරන්නට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන අපි කිසිවකුට කිසිසේත්ම අයිතියක් නැහැ. එවැනි තත්ත්වයකට පෙට්‍රල් වත් කරන්න හෝ ගිනි තබන්නට අපට අයිතියක් නැහැ. එය විසඳා ගැනීම සඳහා තමයි අපි මැදිහත් විය යුතුව තිබෙන්නේ.

එහෙයින් මෙම සිදු වීම හුදු සිසුන් අතර සිදු වූ ගැටුමක් ලෙස සලකා නීතිය හමුවේ හෝ විනය පරීක්ෂණවලින් හෝ කාලය විසින් හෝ අවසන් වේ යයි සිතිය නොහැකිය. මෙම තත්ත්වය විනය පරීක්ෂණයක් කිරීමෙන් හෝ නීතිය හමුවේ හෝ කාලය විසින් හෝ යටපත් කරන්නට බැහැ. වර්ධනය වෙමින් තිබෙන ජාතිවාදී මනෝභාවයේ ප්‍රවණතාවක් හැටියටයි මෙම තත්ත්වය නිර්මාණය වී තිබෙන්නේ. මෙම තත්ත්වය සමනය කිරීම සඳහා ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලාටත්, දේශපාලන ව්‍යාපාර හැටියට අපටත්, මේ රටේ පොදු ජනතාවටත් ඒ වාගේම මේ රටේ මාධ්‍ය ආයතනවලටත්, මාධ්‍යවේදීන්ටත් සුවිශාල කාර්ය භාරයක් ඉටු කිරීමට තිබෙනවාය කියා මා විශ්වාස කරනවා.

මේ කාරණය ගැන ආණ්ඩුවේ ස්ථාවරය පිළිබඳව යම් අදහසක් මම දැනගන්නට කැමැතියි. මෙම ගැටුම පිළිබඳ පරීක්ෂණයේ ප්‍රගතිය කුමක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉල්ලා සිටින්නේ වරදකරුවන් හඹා ගොස් දඬුවම් දීම ගැන පමණක් නොවෙයි. මා අහන්නේ මෙවැනි ගැටුමක් වර්ධනය වීම සඳහා, ඇති වීම සඳහා හේතු වී තිබෙන දේශපාලන ප්‍රවණතාව ආණ්ඩුව හඳුනාගෙන තිබෙනවාද, ඒ ප්‍රවණතාව හඳුනාගෙන තිබෙනවා නම් එය දියත් වී තිබෙන්නේ කෙසේද, සිදුවීමට අදාළ හේතු හා ප්‍රතිඵල හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ කමිටුවක් පත් කොට තිබේද, තුවාල වුණේ කාටද, කීදෙනෙකුට තුවාල වුණාද, ගැහුවේ මොනවායින්ද කියන සාධක වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි තත්ත්වයක් වර්ධනය වීමට හේතු සාධක වී තිබෙන මනෝභාවයන් සහ පරිසර තත්ත්වයන් පිළිබඳව තමුන්නාන්සේලා පරීක්ෂණයක් කොට තිබේද යන්නත්, එසේ නම්, එම කමිටු නිර්දේශ වාර්තා මෙම සභාවට ඉදිරිපත් කරනවාද, මෙවැනි සිදුවීම් වළක්වා ගැනීම සඳහා ආණ්ඩුව සතුව වැඩ පිළිවෙළක් තිබෙනවාද යන්නයි. මොකද, මෙහි ප්‍රධානතම කාර්ය භාරය පැවරී තිබෙන්නේ ආණ්ඩුවට. මෙවැනි සිදුවීම් උතුරේ වේවා, දකුණේ වේවා කිසිදු තැනක කිසිසේත්ම සිදු නොවිය යුතු පන්නයේ සිදු වීම්. එම නිසා මෙවැනි සිදුවීම් පරාජයට පත් කරන්න, මෙම තත්ත්වයන් වර්ධනය වීම වැළැක්වීම සඳහා ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලා ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද කියා අපි දැනගන්නට කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Rajavarothiam Sampanthan.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

Sir, I would like to say a few words in regard to this matter. This being, Sir, an unfortunate incident, has apparently been caused as a result of some misunderstandings over arrangements pertaining to a welcome event to new students, I think everyone should ensure that such misunderstandings are avoided. Very fortunately, Sir, the situation was brought under control very rapidly with all sections of students and the University authorities fully cooperating to achieve that objective. I do not think we should exacerbate this situation and I think there is a duty cast on all of us to act with restraint.

The University should be opened and should become functional early. I believe, steps have already been taken and some Departments have already started functioning. Let the normal inquiries take their course and let the results be known and the decisions taken, after the inquiries are over. While we all must act with restraint in regard to a matter of this nature, I think it is also obligatory that we must not be oblivious to the fact that incidents have also taken place in other universities also - I do not want to specifically refer to those incidents - but, I think there is a duty on the part of the Government to take connaissance of the fact that such incidents have taken place in other universities also.

Whether there had been some political motivations behind all these incidents is also a matter that the Government should address and take connaissance of. Such political motivations, Sir, could be to deliberately deter the process of reconciliation and such activity, you will agree, could be intended to jeopardize the country's main goal of reconciliation and unity amongst all people. While there is a duty cast on all of us, as senior citizens of this country, to ensure that the situation is not exacerbated, we must nevertheless be conscious of the fact that there are certain elements in this country who are trying to create mischief and that those elements cannot be allowed to have a free run.

Thank you, Sir.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මෙම කාරණය සම්බන්ධයෙන් රජයෙන් ප්‍රකාශයක් ලබා ගැනීමට මේ අවස්ථාවේ මෙය ඉදිරිපත් කිරීම මම අගය කරනවා. පසු ගිය සෙනසුරාදා යාපනයේ විශ්වවිද්‍යාලයේ ඇති වුණු සිද්ධිය සම්බන්ධයෙන් සලකා බලන විට පෙනී යනවා, වර්ෂ ගණනාවක් තිස්සේ මෙවැනි උත්සවයන් කිසිදු ගැටුමකින් හෝ සිද්ධියකින් තොරව පැවැති බව. මෙදිනත් උදේ වරුවේම නවක සිසුන් පිළිගැනීම සඳහා එම සංස්කෘතික උත්සවය පැවැත් වුණා. දවල් ආහාරය ගැනීමේදීත් කිසිදු ගැටලුවක් ඇති වුණේ නැහැ. පස්වරුවේ 2.00ට පමණ තමයි අන්තවාදී සුළු පිරිසක් මෙම විශ්වවිද්‍යාලය තුළ ජාතිවාදී තත්ත්වයක් ඇති කිරීම සඳහා කටයුතු කර තිබෙන්නේ. පොලීසියට එයට මැදිහත් වෙන්නට පුළුවන් වුණේ බොහෝ වේලාවක් ගත වුණාට පසුවයි. ඒ වන තුරු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාවට කිසිවකු එහි සිට නැහැ. ඔවුන්ටම තම ජීවිත ආරක්ෂා කර ගැනීමට සිදු වී තිබෙනවා. විශ්වවිද්‍යාලයේ මාර්ෂල්වරයා පවා එම අවස්ථාවේදී සිටියේ නැහැ. විශ්වවිද්‍යාලයේ සිදු වීම පිළිබඳව විශ්වවිද්‍යාල භාරකාරවරුන් ඇස් ඇර බලා සිටි බවටත් ඉතා පැහැදිලි සාක්ෂි තිබෙනවා. මා මීට වඩා ඒ ගැන කරුණු කියන්නේ නැහැ. මා මේ තත්ත්වය ගැන කිව්වේ එය ඉතා භයානක තත්ත්වයක් නිසායි. අපි යාපනයේ පවත්වා ගෙන යන්නේ විද්‍යාලයක් නොවෙයි; විශ්වවිද්‍යාලයක්. අපේ දරුවන් විශ්ව දැනුම ඇතිව, විනයෙන්-සංවරයෙන් යුතු මනා ගුණාංගවලින් හෙබි දරුවන් හැටියට විශ්වවිද්‍යාල හරහා සමාජයට පැමිණීමයි බලාපොරොත්තු වෙන්නේ.

ඒ නිසා කිසිම සංස්කෘතික හෝ වෙනත් ජනවර්ග සුද්දයකට මුල පුරන්නට මෙවැනි සිදුවීම් ගමන් කරවීම වළක්වා ගැනීම සඳහා රජය වහාම මැදිහත් වී කටයුතු කළ යුතුයි. කුමන නිලධාරියෙක් හෝ මේ කටයුත්තේ තමන්ගේ රාජකාරිය කර නැත්නම් ඒ නිලධාරින් සම්බන්ධව කටයුතු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අවධානය යොමු විය යුතුයි. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ආරක්ෂාව ඇතිව යළිත් විශ්වවිද්‍යාලයට ගොස් අධ්‍යාපන කටයුතු කර ගෙන යෑමටත්, දැනට රෝහල්වල සිටින ශිෂ්‍යයන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කරගෙන ඉක්මන් ප්‍රතිකාර ලබා දී, යළිත් එම ශිෂ්‍යයන්ටද විශ්වවිද්‍යාලය වෙත යෑමට පුළුවන් තත්ත්වයක් ඇති කර දීමටත් අපි කටයුතු කළ යුතුයි. මෙම අශෝභන, අශීලාචාර ක්‍රියාව අපි හෙළා දකින අතර, ඇමතිතුමා පිළිතුරු ලබාදෙන අවස්ථාවේදී මේ කරුණු ගැනත් යමක් සඳහන් කරාවි කියලා මා විශ්වාස කරනවා.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Hon. Deputy Speaker, thank you very much for granting me an opportunity to speak a few words on this issue that was raised by the Hon. Members of the Opposition.

I was directed by His Excellency the President and the Hon. Prime Minister to visit the University of Jaffna along with the Hon. Minister of Disaster Management as well as the Hon. Karunarathna Paranawithana and have a discussion with the authorities regarding the issue. We had a very long discussion with the heads of students, lecturers, the Senate and the Deans of the Faculties. All were together in one common room and they expressed their views very clearly. The Sinhalese and Tamil students of the Jaffna University very clearly said that there is no difference or any animosity towards any community and the Sinhalese are living very closely with the Tamils and the Tamils are living very closely with the Sinhalese, because a majority of the Sinhalese students are staying in Tamil homes. So, there has been no problem whatsoever.

As the Hon. Member who raised this issue said, this was an issue that had been brought up at a ceremony held on Saturday. There was a custom that had been followed earlier by the University. Suddenly, that custom had been deviated from. I do not want to talk much on that because the deviation of the custom had, unfortunately, not been mutually agreed upon. If it had been mutually agreed upon, this incident would not have happened. All these years, such incidents have never happened, as clearly mentioned and there has been no panic whatsoever.

The Vice Chancellor of the University has taken necessary steps to hold an inquiry immediately and the report will be ready, probably, in another ten days' time. Once the report is ready, we will know exactly what the position is and the Senate of the University as well as the UGC will take necessary action to bring the people concerned to books. But, I want to emphasize that there have been some elements behind this whole issue, maybe, to provoke the situation and that is very unfortunate. As far as the ground situation is concerned, the Sinhalese and Tamil students of the Jaffna University are living very amicably with one another.

Thank you.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේය.

01. මෙම ගැටුමට අදාළ පරීක්ෂණ එම ප්‍රදේශය භාර කෝපායි පොලීසිය විසින් ද යාපනය විශ්වවිද්‍යාලයේ බලධාරීන් විසින් ද කරනු ලැබේ. මෙම ගැටුමට සම්බන්ධව ක්‍රියා කළ සිසුන් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ඇති අතර, ඔවුන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට යාපනය විශ්වවිද්‍යාලය විසින් පියවර ගෙන ඇත.

මෙම සිද්ධියට සැක බවට පොලිස් පරීක්ෂණ මඟින් හෙළි වී ඇති තනකේෂ්වරන් සිසිදරන් නමැති සිසුවා කෝපායි පොලීසිය විසින් අත් අඩංගුවට ගැනීමට කටයුතු කරමින් සිටියදී නීතිඥයෙකු මාර්ගයෙන් උසාවියට ඉදිරිපත්ව උසාවිය විසින් ඇප මත මුදා හැර ඇති බව පොලීසිය විසින් මා වෙත වාර්තා කර ඇත.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

02. ඔව්.

ඉහත පරිදි නිරීක්ෂණය කළ කරුණු තවදුරටත් විමර්ශනයකොට එම සිදුවීමට අදාළ හේතු හා ප්‍රතිඵල හඳුනා ගැනීම සඳහා පහත සඳහන් කමිටුව පත් කරන ලදී.

ඩී.කේ.පී.යූ. ගුණතිලක මහතා, යාපනය විශ්වවිද්‍යාල ඉංජිනේරු පීඨ මණ්ඩල සාමාජික/නියෝජ්‍ය අධ්‍යක්ෂ, ලංකා විදුලි බල මණ්ඩලය

වෛද්‍ය කේ. මුහුන්දන් මහතා, අංශාධිපති (නාරි හා ප්‍රසව) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාපනය විශ්වවිද්‍යාලය

වෛද්‍ය පී.එස්. නවරත්න රාජා මිය, අංශාධිපති (ඖෂධ විද්‍යා) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, යාපනය විශ්වවිද්‍යාලය

03. එම කමිටුවට අදාළ කරුණු තවදුරටත් විමර්ශනය කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දිය යුතුව ඇති බැවින් සහ මේ වන විටත් එම කමිටුව විසින් පූර්ණ කාලීනව එම විමර්ශන කටයුතු කරමින් සිටින බැවින් එම විමර්ශනය මඟින් ලබා දෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.

04. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති, උපසභාපති, ලේකම් 2016.07.22 වන දින යාපනය විශ්වවිද්‍යාල පරිශ්‍රයට ගොස් අධ්‍යයන හා අනධ්‍යන කාර්ය මණ්ඩලය මෙන්ම සිසුන් ඇතුළු සියලු ශිෂ්‍ය සංගම් සමඟ සාකච්ඡාකොට වර්තමාන තත්ත්වය මා වෙත වාර්තා කිරීමට උපදෙස් දී ඇත.

එමෙන්ම සිසුන් විසින් සංවිධානය කරනු ලබන සියලු කටයුතු සඳහා විශ්වවිද්‍යාලයේ සියලුම සිසුන් සහ විශ්වවිද්‍යාලයේ පරිපාලනයේ එකඟතාවන් ඇතිව කටයුතු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අවශ්‍ය උපදෙස් දෙනු ලැබ ඇත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව කාරණයක් කියන්න තිබෙනවා. ඒක මේ ප්‍රශ්නයට අදාළ කාරණයක් නොවෙයි. ඊයේ දවසේ ඔබතුමාත් පාර්ලිමේන්තුවේ සිටියදී ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා මගෙන් ප්‍රශ්නයක් ඇහුවා, මා භික්ෂූන් වහන්සේ නමකට පත්වීමක් දීලා තිබෙනවාද කියලා. ඇත්ත වශයෙන්ම මා ඒ වෙලාවේ කිව්වා "නැහැ" කියලා. මා ඊයේ හැන්සාඩ් වාර්තාව ගෙනාවා. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා අහනවා, "මේ හාමුදුරුවන්ට මාර්ගඵල අවබෝධ කර ගැනීමට නොවෙයි නේ. මේ මහාමාර්ග අමාත්‍යාංශයේ උපදේශක තනතුරක්." මා ඒකට උත්තර දීලා තිබෙනවා, "ඒක වැරදියි" කියලා. පැහැදිලිව "ඒක වැරදියි" කියලා කිව්වාට පස්සේ අද පුවත් පත්වල පොල් ගෙඩි අකුරින් දාලා තිබෙනවා, මම ස්වාමීන් වහන්සේනමකට පත්වීමක් දීලා තිබෙනවා කියලා. [බාධා කිරීමක්] නැහැ, කිසිම තනතුරක් දීලා නැහැ. ඇත්ත වශයෙන්ම අපේ ස්වාමීන් වහන්සේලාට පුවත් පත් හරහා මේ විධියට නිග්‍රහ කරනවා නම් ඒක වැරදියි. අපේ රට බෞද්ධ රටක්. අපේ බෞද්ධකම ගැන අපි ආඩම්බර වෙනවා. මේක අමූලික බොරුවක්.

ඒ වාගේම තව කරුණක් කියන්න තිබෙනවා. සමරසූරිය පවුලේ දෙදෙනෙකුට රක්ෂාවල් දීලා තිබෙනවා කියලා සඳහන් කර තිබෙනවා. එහෙම දීලා නැහැ. එක පත්වීමයි දීලා තිබෙන්නේ. එකම පවුලේ දෙදෙනකුට එහෙම පත්වීම් දීලා නැහැ. [බාධා කිරීමක්] නැහැ, එහෙම නැහැ. මා එහෙම කරන්නෙත් නැහැ. එහෙම කරන්න අවශ්‍යතාවකුත් නැහැ. අනික, අපි මේවා අරගෙන නැහැ. අපි මේවා දීලා තිබෙන්නේ වැඩ කරපු අයටයි. මා කලින් කිව්වා වාගේ පසු ගිය ජනාධිපතිවරණයෙන්, පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් ජයග්‍රහණය කළාට පස්සේ අපට විශාල බලපෑමක් තිබෙනවා, ඒ අවශ්‍ය -[බාධා කිරීමක්] ඔව්. ඕනෑ නම් ඔබතුමන්ලාටත් පහක් දෙන්නම්. [බාධා කිරීම්] භික්ෂූන් වහන්සේනමකට පත්වීමක් දීලා නැහැ. ඇත්ත වශයෙන්ම ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ප්‍රශ්නය අහපු එකත් වැරදියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. ගරු සභානායකතුමාගේ පිළිතුර සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශයක් පුවත් පත්වල පළ වෙලා තිබෙනවා නම්, මාධ්‍යවලින් අපි ඉල්ලීමක් කරනවා ඒ විධියට-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මුළු මහනුවරම කැළඹිලා, පොල් ගෙඩි අකුරින් පුවත් පත්වල පළ කර තිබෙන ප්‍රවෘත්තිය දැකලා. මට උදේ ඉඳන් calls එනවා. ඒක නිවැරදි විය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමා කියනවා, පුවත් පත්වල වැරදි ප්‍රකාශයක් පළ වෙලා තිබෙනවා කියලා. හැන්සාඩ් වාර්තාව අනුව ඒක නිවැරදි කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මා පැහැදිලිව කියලා තිබෙනවා "ඒක වැරදියි" කියලා. ඒ කොටස ඒ පුවත්පත් වල දාලා නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, මා ප්‍රශ්නය ඇහුවාම ඔබතුමා කිව්වේ, මාර්ග සංවර්ධන අධිකාරියේ දක්ෂිණ මාර්ග ව්‍යාපෘතියේ ඒ නම නැහැයි කියලායි. ඊට පසුව කිව්වා, පසුව උත්තරයක් දෙන්නම් කියලා. නමුත් ඔබතුමා කියනවා නම්, ලිපිනයන් සහ දුරකථන අංක සහිත ඒ සම්පූර්ණ ලේඛනය, ඒ වාගේම මොන මොන ව්‍යාපෘතිවලටද ඒ අය වෙන් කර තිබෙන්නේ කියන විස්තරත් මට සභාගත කරන්න පුළුවන්. ඒ ලේඛනය අතේ තියාගෙනයි මා කථා කළේ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

දැන් අපි ස්ථාවර 23.(2) යටතේ ඉතා වැදගත්- [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
මට ප්‍රකාශයක් කරන්නත් තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අද පොල්ගෙඩි අකුරින් ලියලා තිබෙනවා, ස්වාමීන්වහන්සේ කෙනෙකුට තනතුරක් දීලා කියලා. නමුත් ස්වාමීන්වහන්සේ කෙනෙකුට තනතුරක් දීලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අගමැතිතුමනි, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 23.(2) යටතේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ඉතා වැදගත් ප්‍රශ්නයකට ගරු ඇමතිතුමා උත්තර ලබා දුන්නා. ඒක යාපනයට පමණක් සීමා වුණු දෙයක් නොවෙයි. ජාතික වැදගත්කමක් ඇති ප්‍රශ්නයක් ගැනයි එතුමා කථා කළේ. ඒ නිසා රජයෙන් ඒ පිළිබඳ සුදුසු වැඩ සටහනක් ක්‍රියාත්මක වෙයි කියා පාර්ලිමේන්තුව අපේක්ෂා කරනවා. එවැනි ඉදිරි වැඩ පිළිවෙළක් ගැන තමයි එතුමා කිව්වේ. ඒ සඳහා අපි සියලු දෙනාගේම අවධානය යොමු කරන්න ඕනෑ. ටීඑන්ඒ පක්ෂයේ නායක සම්පදන් මැතිතුමාත් ඒ සම්බන්ධයෙන් ක්ෂණිකව ප්‍රකාශයක් කරලා තිබුණා. ඒකත් ඉතා වැදගත් වුණා කියාලායි අපි හිතන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පළමුවෙන්ම මේ ප්‍රශ්නය පිළිබඳව කථා කරන්න කැමැතියි. මේ ප්‍රශ්නය හා සම්බන්ධ පරීක්ෂණ වාර්තා සියල්ලම ලැබුණාම අපට ඊළඟ පියවර ගැන කථා කරන්න පුළුවන්. ඇත්ත වශයෙන්ම සෙනසුරාදා මේ සිද්ධිය ඇති වුණු ගමන් අනුර දිසානායක මන්ත්‍රීතුමා මට කථා කළා. ඒ වාගේම මම මාවෙ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමා සමඟත් කථා කළා. උසස් අධ්‍යාපන හා මහාමාර්ග ඇමතිතුමා සමඟත්, ඒ වාගේම නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා සමඟත් කථා කළා. ඒ වාගේම මම ඩී.එම්. ස්වාමිනාදන් ඇමතිතුමා සමඟත් කථා කළා. මම ඒ සියලු දෙනා සමඟ සාකච්ඡා කළා. විශේෂයෙන්ම නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන ඇමතිතුමා මාධ්‍යයටත්, පොලීසියටත් කථා කළා. ඒ නිසා මෙම ප්‍රශ්නය පිළිබඳව යම් කිසි යහපත් තැනකට පැමිණිලා තිබුණා. විශේෂයෙන්ම ඒ තත්ත්වය ඇතිකර ගැනීම සඳහා උත්සාහ කළ සියලු දෙනාටමත්, උනන්දු වුණු සියලු දෙනාටමත් මම ස්තුති කරන්න ඕනෑ.

විශේෂයෙන්ම මේ සභාවේ සිටින බොහෝදෙනෙක් වාගේම බොහෝ කණ්ඩායම් සාමයක් ඇති කරන්න කියලා ඉල්ලීමක් කළා. මේ රටේ කවුරුවත් ඒ වෙලාවේ ජාතිවාදී අදහස් ප්‍රකාශ කළේ නැහැ. මා ඒ සියලුමදෙනාට ස්තුති කරන්න කැමැතියි. නමුත් අවාසනාවකට එක පුද්ගලයෙක් පමණක් "කාබේරියෝ" දාලා කියනවා, "මෙතැනයි මැරුණේ" කියලා. මම දන්නේ නැහැ කොහේද කාබේරියෝ හෙව්වේ කියලා. ඕනෑ නම් උගන්ඩා ගිහිල්ලා හොයාගන්න පුළුවන්. ඒ විධියේ ජාතිවාදී තත්ත්වයක් ඇති කරන්න උත්සාහ කිරීම ගැන පමණයි අපි මේ අවස්ථාවේ කනගාටු වෙන්නේ. ඒ හැර, මේ සභාවේ සිටින සියලුම කණ්ඩායම් ඉතාම වග කීමකින් යුතුව ක්‍රියා කළා කියන එක මම කියන්න කැමැතියි.

මම දැන් නැඟී සිටියේ මගේ සිංගප්පූරු නිල සංචාරය පිළිබඳව විශේෂ ප්‍රකාශයක් කරන්නයි.

අග්‍රාමාත්‍යතුමාගේ සිංගප්පූරු සංචාරය
பிரதம அமைச்சரின் சிங்கப்பூர் விஜயம்
SINGAPORE TOUR OF PRIME MINISTER

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ අවස්ථාවේ නැඟී සිටියේ මේ සතියේ සඳුදා සහ අඟහරුවාදා දින දෙකෙහි, එනම් 17 සහ 18 දින දෙකෙහි මා විසින් සිංගප්පූරු අග්‍රාමාත්‍ය ගරු ලී සියැං ලූං මැතිතුමාගේ ආරාධනයෙන් සිංගප්පූරුවේ යෙදුණු නිල සංචාරය පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කිරීමටයි.

විදේශ කටයුතු අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය මලික් සමරවික්‍රම මැතිතුමා සහ අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා හා බුද්ධ ශාසන නියෝජ්‍ය අමාත්‍ය සාරති දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා මා සමඟ මෙම සංචාරයට එක්වුණා.

මෙම සංචාරයේදී පළමුවෙන්ම මම රෆල්ස් නාගරික සම්මන්ත්‍රණ කේන්ද්‍රයේදී පැවැත්වෙන තුන්වන දකුණු ආසියා ඩයස්පෝරා සමුළුවේ ආරම්භක සැසිවාරයේ ප්‍රධාන දේශනය පවත්වමින් ශ්‍රී ලංකා ආර්ථිකය නැංවීමට නව රජය විසින් ආරම්භ කර ඇති සැලසුම් පිළිබඳ පැහැදිලි කළා. ශ්‍රී ලංකාව කලාපීය භාණ්ඩ හුවමාරු ව්‍යාපාරික මූල්‍ය මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට රජය ආරම්භ කර ඇති වැඩ පිළිවෙළත් මුහුදු, ගුවන්, මහා මාර්ග, බලශක්ති හා සන්නිවේදන ක්ෂේත්‍රයන්හි පහසුකම් වර්ධනය කිරීම සඳහා වන අපගේ භෞතික යටිතල පහසුකම් සංවර්ධන වැඩපිළිවෙළත් මා ඔවුන්ට පැහැදිලි කළා. ඒ වාගේම අප විසින් ආරම්භ කර ඇති නව සංවර්ධන වැඩ පිළිවෙළ මෙන්ම රැකියා දසලක්ෂයේ වැඩ පිළිවෙළ හා ශක්තිමත් මධ්‍යම පන්තියක් බිහි කිරීම සඳහා වන සැලසුම් පිළිබඳවත් මා ඔවුන් දැනුවත් කළා.

තවද, මහනුවර-කොළඹ-හම්බන්තොට ආර්ථික කලාප සංවර්ධන වැඩසටහන -Kandy-Colombo-Hambantota Economic Corridor - පිළිබඳවත් දැනුවත් කළා. මහනුවර නගර සංවර්ධන ව්‍යාපෘතිය, වයඹ කලාපීය කර්මාන්ත හා සංචාරක වැඩ පිළිවෙළ, බස්නාහිර මෙගාපොලිස් වැඩ පිළිවෙළ, ගාල්ල කේන්ද්‍ර කර ගත් දකුණු පළාතේ සංචාරක කලාප ප්‍රවර්ධන වැඩ පිළිවෙළ, හම්බන්තොට නව ආර්ථික කලාප වැඩ පිළිවෙළ යන ව්‍යාපෘති පිළිබඳවත් මා ඔවුන් දැනුවත් කළා. බස්නාහිර මෙගා පොලිස් ව්‍යාපෘතියට පමණක් ඇමෙරිකන් ඩොලර් බිලියන 40ක යටිතල පහසුකම් ආයෝජන අවශ්‍යයි. හම්බන්තොට ආර්ථික කලාපය සඳහා ඩොලර් බිලියන 10ක යටිතල පහසුකම් ආයෝජන අවශ්‍යයි. මේ සඳහා අවශ්‍ය ආයෝජනය පිළිබඳව මා ඔවුන් දැනුවත් කළා. මේ වැඩසටහන් අප කලාපයේ විශාලම ආර්ථික සංවර්ධන වැඩසටහනයි. මෙය මුම්බායි - දිල්ලි ආර්ථික කලාපය හා සමානයි. මෙය ඉන්දියන් සාගරයේ විශාලම කේන්ද්‍රය බවට පත් වී දකුණු ඉන්දියානු ආර්ථිකයට පවා බලපෑම් එල්ල කරනු ලබන බව අපගේ විශ්වාසයයි. මේ corridor එකට නැත්නම් කලාපයට ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් දෙකක් සහ ජාත්‍යන්තර වරාය දෙකකුත් ඇතුළත් වනවා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

අනතුරුව 17 වන දින සිංගප්පූරු ජනාධිපති ආචාර්ය ටෝනි ටෑන් කෙන්ග් යැම් මැතිතුමා සහ අග්‍රාමාත්‍ය ලී ෂියැන් ලූං මැතිතුමන් හමු වුණා. ජනාධිපති සමඟ පැවැති හමුවට සිංගප්පූරු විදේශ අමාත්‍යාංශයේ ගරු විවියන් බාලක්‍රිෂ්ණන් මැතිතුමා සහ වෙළෙඳ, කර්මාන්ත හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු එස්.ඊශ්වරන් මැතිතුමාද එක්වුණා. සිංගප්පූරු අග්‍රාමාත්‍ය ලී ෂියැන් ලූං මැතිතුමා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය පිළිබඳවත් ප්‍රධාන පක්ෂ දෙක එකතුව පිහිටන ලද ජාතික රජය පිළිබඳවත් සිය සතුට හා විශ්වාසය පළ කළා. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් හැකි සෑම උපකාරයක්ම කරන බවට එතුමා පොරොන්දු වුණා.

සිංගප්පූරුව සමඟ අත්සන් කිරීමට නියමිත නිදහස් වෙළෙඳ ගිවිසුම මෙන්ම ඉන්දියාව සහ චීනය සමඟ අත්සන් කිරීමට නියමිත සහයෝගිතා ගිවිසුම පිළිබඳවද අප සාකච්ඡා කළා. වසර 13ක් අනිවාර්යය අධ්‍යාපනය සමඟ වෘත්තීය පුහුණු අවස්ථා සම්බන්ධ කිරීම තුළින් අපේ තරුණ තරුණියන් කාර්මික අංශයේ රැකියාවලට සුදුසුකම් ලබන බව මා පෙන්වා දුන්නා. ඒ සඳහා "SkillsFuture" කියන සිංගප්පූරු වැඩසටහනේ උපදෙස් අපි ඉල්ලා සිටියා.

ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ ගුණාත්මක බව වැඩි කිරීමට ඇති අවශ්‍යතාව මා විසින් පෙන්වා දුන් අතර, ඒ සඳහා සහයෝගය ලබා දීමට ද සිංගප්පූරු අගමැතිතුමා පොරොන්දු වුණා. මේ වසරේ නොවැම්බර් මස ලංකාවේ පැවැත්වීමට නියමිත දකුණු හා අග්නිදිග ආසියා රටවල බහුවිධ සමාජයන්හි ආගම සතු කාර්යභාරය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව පිළිබඳවත් මා විසින් දැනුම් දුන් අතර, ඒ සඳහා සිය සම්පූර්ණ සහයෝගය දැක්වීමට සිංගප්පූරු අගමැතිතුමා එකඟ වුණා. ශ්‍රී ලංකාවේ සංචාරයේ යෙදෙන මෙන් මා විසින් කරන ලද ආරාධනයත් එතුමා සතුටින් පිළිගත්තා.

මේ සංචාරය අතරතුරදී සිංගප්පූරුව හා ශ්‍රී ලංකාව අතර සංස්කෘතික හුවමාරු වැඩසටහන්, මෙගාපොලිස් ව්‍යාපෘතිය, සිංගප්පූරු සිවිල් සේවා විද්‍යාලය සමඟ රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සහ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ අවබෝධතා ගිවිසුම්වලට අත්සන් කරනු ලැබුවා.

අප අත්සන් කරන එක ගිවිසුමක් යටතේ, සුර්බානා ජරොං සමාගම -දැනට මෙගාපොලිසිය යටතේ ත්‍රිකුණාමලයේ සැලසුම් කරන එම සමාගම- අපි එක්ක එකතු වෙනවා, අපේ ඉංජිනේරුවන් හා ගෘහ නිර්මාණශිල්පීන් ගෙනිහිල්ලා අප්‍රිකාවේ නගර ඒ වාගේම නිර්මාණය කරන්න. ඒක අපට තිබෙන විශාල ශක්තියක්. ඒ වාගේම එයින් අපට විශාල පළපුරුද්දක් හා ප්‍රයෝජනයක් ලැබෙනවා.

19වැනි දා අපේ කණ්ඩායම සිංගප්පූරු සිවිල් සේවා විද්‍යාලයේ නිරීක්ෂණ චාරිකාවක නිරත වුණා. අප විසින් අත්සන් කළ අවබෝධතා ගිවිසුමේ පරිදි 35 දෙනෙකුගෙන් සමන්විත වූ රාජ්‍ය නිලධාරීන් කණ්ඩායම් දෙකක් මේ වසර තුළ පුහුණු කිරීමට සිංගප්පූරු සිවිල් සේවා විද්‍යාලය කටයුතු කරනවා. ශ්‍රී ලංකාවේ සංවර්ධන පරිපාලන ආයතන සමඟ දැනටත් පවතින පුහුණු වැඩසටහන් තවදුරටත් පුළුල් කිරීමට ඔවුන් එකඟතාව පළ කළා. අනතුරුව සිංගප්පූරුවේ ජාත්‍යන්තර ව්‍යවසායකත්ව ආයතනය මඟින් සංවිධානය කරන ලද ව්‍යාපාරික හමුවකට අප සහභාගි වුණා. මෙයට සිංගප්පූරු වෙළෙඳ හා කර්මාන්ත අමාත්‍ය ගරු එස්. ඊශ්වරන් මැතිතුමා මෙන්ම සිංගප්පූරුවේ ප්‍රධාන සමාගම් 15ක ප්‍රධානීන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් සහභාගි වුණා. එහිදී ඔවුන් ශ්‍රී ලංකාවේ මහා පරිමාණ ආයෝජන සඳහා සූදානමින් සිටින බව අප වෙත දැනුම් දුන්නා. දැනටමත් සිංගප්පූරු ආයෝජකයින් කිහිප දෙනෙක් මේ රටේ ආයෝජන කටයුතු අරඹා අවසානයි.

එසේම මා එහිදී මේ රටේ පිහිටුවීමට නියමිත සංවර්ධනය සඳහා වූ නියෝජිතායතනයේ, සිංගප්පූරු ආයෝජකයන්ට පහසුකම් සැලසීම සඳහා වෙනම අංශයක් පිහිටුවීමට පොරොන්දු වුණා. මම හිතන විධියට මූලික වශයෙන් සංචාරක කර්මාන්තයටත්, ඒ වාගේම අනෙකුත් අංශවලත් ආයෝජනය කිරීම සඳහා දැනටමත් හත් අට දෙනෙක් ලංකාවට එන්න සූදානම්.

සිංගප්පූරුවේ වරාය අවට ආරම්භ කර ඇති නවතම සංවර්ධන කටයුතු නිරීක්ෂණය කිරීමටත් අපට අවස්ථාව ලැබුණා. ශ්‍රී ලංකාව එවැනි සංවර්ධන කටයුතු සැලසුම් කිරීමට සහයෝගය ලබා දීමටත් එකඟත්වය පළ කළා. ඉදිරි දිනකදී වෙළෙඳ හා ආයෝජන කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීමට චීනය බලා යාමට මා බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ජපානය සමඟ ආර්ථික සහයෝගිතාව හා ආයෝජන ප්‍රවර්ධනය පිළිබඳව තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා මා ජපානයේ සංචාරයක නිරත වීමටද අපේක්ෂා කරනවා. ජනාධිපතිතුමාත්, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය මලික් සමරවික්‍රම මැතිතුමාත් මෑතකදී ඉන්දියාවේ සංචාරයක නිරත වී වෙළෙඳ හා ආර්ථික සහයෝගිතාව පිළිබඳ සාකච්ඡා කළා. ඔක්තෝබර් මස මුලදී නව දිල්ලියේදී පැවැත්වීමට නියමිත ඉන්දීය ලෝක ආර්ථික සමුළුවේදී මම තවදුරටත් ඉන්දීය අගමැතිතුමා සහ අනෙකුත් මැති ඇමතිවරුන් සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙනවා. GSP Plus සහනය ලබා ගැනීමට මේ වන විට අපි යුරෝපා සංගමයට අයදුම්පත් භාර දී තිබෙනවා.

චීනය, සිංගප්පූරුව, ජපානය, යුරෝපා සංගමය සහ ඉන්දියාව සමඟ ආර්ථික හා වෙළෙඳ සහයෝගිතා ගිවිසුම් අත්සන් කරන්නේ රැකියා ජනිත කර වන්නයි. පිට රටවල අයට ලංකාවේ රැකියා දෙන්න නොවෙයි. එක කාලයක බංග්ලාදේශයෙන් එහෙම කටිටිය ආවා, මෙහේ පාරවල් හදන්න. මේ ආණ්ඩුව යටතේ ඒක වෙන්නේ නැහැ කියලා මම විශේෂයෙන්ම කියන්න කැමැතියි. විශේෂයෙන්ම චීන සමාගම් බලන්නේ ලංකාවට ඇවිල්ලා යුරෝපීය වෙළෙඳ පොළටයි ඇතුළු වෙන්නයි. ඉන්දියානු සමාගම් බලනවා, චීන සහ යුරෝපීය වෙළෙඳ පොළවලට ඇතුළු වෙන්න. සමහර යුරෝපීය සමාගම් බලනවා, ඉන්දියාවේ වෙළෙඳ පොළට ඇතුළු වෙන්න. මේ හැම එකේම රැකියා කරන්න ඉන්නේ ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්. ඒ අයට ඕනෑ පුහුණුව ලබා දීමට උදව් කරන්න තමයි මම සිංගප්පූරුවෙන් ඇහුවේ, අනාගත ශිල්ප පුහුණු කිරීමේ -future skills initiatives- වැඩසටහන පිළිබඳව, ඒ අත් දැකීම් පිළිබඳව අපට උපදෙස් දෙන්න පුළුවන්ද කියලා. මේවා ලංකාවේයි අපි කරන්න ඉන්නේ.

මම හිතන විධියට එන සතිය අවසන් වන විට පළමුවන චීන කණ්ඩායම යනවා, හම්බන්තොට ඉඩම් සොයා ගන්න. කර්මාන්ත වෙනුවෙන් ඉඩම් අක්කර 15,000ක් සොයා ගන්න තිබෙනවා. අපේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා ඇමතිතුමා දැනටමත් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සම්බන්ධයෙන් රජය සමඟ හවුල් වන ලෙස සමාගම්වලින් ඉල්ලා තිබෙනවා. අපට පුළුවන් වෙයි එතැනට මඟින් ලක්ෂ 10ක් ගෙනෙන්න. මෙතෙක් කල් හැම දවසකම එක ගුවන් යානයක් තමයි එහි ආවේ. එක දවසක් මම විතරයි ගියේ. මම තනිවම හෙලිකොප්ටරයකින් ගියා. එච්චරයි එදා ගොඩ බාපු අහස් යානයකට තිබුණේ. මේ යටතේ මඟින් ලක්ෂ 10ක්වත් එහි ගෙනාවාම, දකුණේ විතරක් සතියක් ගත කරන්න පුළුවන් විධියට ඒ වැඩසටහන් ක්‍රියාත්මක කරන්නයි අපි බලන්නේ.

අපි දේශපාලන හා වාණිජ අංශ දෙකම සම්බන්ධ කරලා රැකියා වෙළෙඳ පොළ ඇති කරලා, ආයෝජන වැඩි කරන්න කටයුතු කරනවා. චීන ආයෝජකයන් දැනටමත් හම්බන්තොට

ප්‍රදේශයේ ආයෝජන කටයුතු ආරම්භ කොට තිබෙනවා. ලබන අවුරුද්දේ ශ්‍රී ලංකාවට ජපන් ආයෝජකයන් එනවා. ඒ සඳහා දැන් අපි ක්‍රියා කර ගෙන යනවා. ඉන්දියානු ආයෝජකයන් කිහිප දෙනෙක් ලංකාවේ ඉන්දියානු කර්මාන්ත කලාපයක් ආරම්භ කිරීම සඳහා අපෙන් ඉඩම් ඉල්ලා තිබෙනවා. මේ අය එන්නේ ලංකාවේ ජනතාවට රැකියා ලබා දෙන්නයි.

ශ්‍රී ලංකාවේ ජාතික ආණ්ඩුව ලෝකයේ පැසසුමට ලක් වෙලා තිබෙනවා. ජාතික ආණ්ඩු සංකල්පය තුළින් ඉදිරි වසර පහක කාලය තුළ අපගේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා. ඉදිරි කාලය තුළ මෙම ක්‍රමවේදය අපි වඩාත් ශක්තිමත්ව ඉදිරියට ගෙන යනවා. එම කාලය තුළයි මේ ජාතික ආණ්ඩුවයි පවතින්නේ. ඒ ගැන කිසිදු සැකයක් තබා ගන්න එපා. අවුරුදු පහක් මේ ආණ්ඩුව පවතිනවා. සමහරු හිතනවා, ලබන අය වැයෙන් පසුව මේ ආණ්ඩුව වැටෙනවා කියලා. "අය වැය" සම්මත වුණාට පසුව අපේ ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමියටත් මම ආරාධනා කරනවා, "එන්න අපට එකතු වෙන්න" කියලා. ඊළඟ අවුරුදු හතර අපිත් එක්ක එකතු වෙලා වැඩ කරන්න එන්න. තව කිහිප දෙනෙක් එන්න ඉන්නවා. දකුණ දියුණු කරන කොට ඔබතුමිය එතැන ඉන්න ඕනෑ. [බාධා කිරීමක්] ඔව්. එන්න, එන්න, කිසිම බයක් ඇති කර ගන්න එපා.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

ඔබතුමා පරිස්සමෙන් ඉන්න. ඉදිරි අවුරුදු දෙක ඇතුළත මොනවා වෙයිද දන්නේ නැහැ නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අපි ආරක්ෂා කරනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමියනි, දෙල්දූවට සහ අකුරලට තවත් අලුත් සංචාරක කලාප දෙකක් එනවා.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

ඒවා ආවාට පසුව - [බාධා කිරීමක්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඔව්, ඒක තමයි. එන්න, එන්න. ඔබතුමියට තව මොනවාද ඕනෑ? [බාධා කිරීමක්] කළේ නැහැ නේ? ඔබතුමියලාගේ කාලයේ මොනවාද කළේ? ඔබතුමිය එතැන මොනවාද කළේ? දැන් ඒවා කරගෙන යනවා. දැන් බලන්න, ආපසු ගාල්ල වරාය කරන්න ජපන් ආයෝජකයන් එකඟ වෙලා තිබෙනවා. කිසිම බයක් නැහැ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමිය, බය වෙන්න එපා. ඕගොල්ලන් නොකරපු ඒවා අපි කරලා දෙන්නම්. නූතන දුටුගැමුණු රජ්ජුරුවෝ රුහුණෙන් ආවාට, රුහුණට මොනවාද කළේ? අපි පිටින් ඇවිල්ලා කරන්නේ. දුටුගැමුණු රජ්ජුරුවෝ රුහුණේ සිටියා. නූතන දුටුගැමුණු රජ්ජුරුවෝ රුහුණට මොකුත් කළේ නැහැ. දැන් රුහුණේ වැඩ ටික පටන් ගන්නවා. අපි රුහුණේ වැඩ පටන් ගත්තාම ඔබතුමිය ආණ්ඩුවට එනවාද? [බාධා කිරීම්] ඔබතුමිය කිව්වා, අපි වැඩ පටන් ගන්නේ නැහැ කියලා. අපි රුහුණේ වැඩ පටන් ගත්තොත් ඔබතුමිය ආණ්ඩුවට එනවාද? [බාධා කිරීම්] කමක් නැහැ. එන්න, එන්න. අපි කියන්නේ මේකයි. දැන් ඕනෑ තරම් රැකියා ගන්න පුළුවන්; දියුණු වෙන්න පුළුවන්. ඒ ගැන කිසිම සැකයක් නැහැ. මොකද, ඔබතුමිය ළඟ වාඩි වෙලා සිටින අනෙක් අය එන්න කථා කර තිබෙනවා. ඒ ගොල්ලන් එක්ක ඔබතුමියත් එන්න. [බාධා කිරීම්] අවුරුදු පහක් මේ ආණ්ඩුව තිබෙනවා. මේ ආණ්ඩුව නැති වෙන්නේ නැහැ, බය වෙන්න එපා. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, අනෙක් ඇමතිවරුන් සමඟ අපත් එකතු වෙලා ඒ දියුණුව සිදු කරනවා කියා මම විශේෂයෙන් කියන්න කැමැතියි. ඒ ගැන කිසිම සැකයක් තබා ගන්න එපා කියමින් මා නවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය, ගරු ඩී.එම්. ස්වාමිනාදන් මැතිතුමා. Hon. Minister, will you reply to the Hon. Douglas Devananda's Question raised under Standing Order 23/2?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

I will take it up on another day.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම, ගරු සභානායකතුමා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

I

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත
பல்கலைக்கழகங்கள் (திருத்தம்) சட்டமூலம்
UNIVERSITIES (AMENDMENT) BILL

"1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා විසිනි.

2016 අගෝස්තු 09වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சர் மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2016 ஆகஸ்ட் 09, செவ்வாய்க்கிழமை இரண்டாம்முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Lakshman Kiriella, Minister of Higher Education and HIghways; to be read a Second time upon Tuesday, 09th August, 2016 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

සබරගමුව පළාත් සංචාරක කාර්යාංශයේ ප්‍රඥප්ති කෙටුම්පත
சபரகமுவ மாகாண சுற்றுலாத்துறைப் பணியக நியதிச்சட்ட வரைவு
DRAFT STATUTE OF THE SABARAGAMUWA PROVINCIAL TOURIST BUREAU

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the Provisions of the Standing Order No. 46 A (3) (a) and (b) of the Parliament, this Parliament do grant the Sectoral Oversight Committee on International Relations an extension of time till 09th August, 2016 to submit its report to the Parliament on the Draft Statute of the Sabaragamuwa Provincial Tourist Bureau which was referred by Mr. Speaker on 02nd December 2015."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I propose to take only half an hour's time for lunch.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අද දින පස්වරු12.30 සිට 1.30 දක්වා පැයක කාලයක් දිවා ආහාර විවේකය සඳහා වෙන් කර තිබෙනවා. නමුත් එම කාලය පැය භාගයකට අඩු කරන්න කියලාද ඔබතුමා යෝජනා කරන්නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔව්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ගරු රංජිත් සියඹලාපිටිය මහතා.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත : රීති
இலங்கை அணுசக்தி சட்டம்: ஒழுங்குவிதிகள்
SRI LANKA ATOMIC ENERGY ACT: RULES

[අ.භා. 12.12]

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of Power and Renewable Energy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සාදන ලදුව, 2015 ජූලි 21 දිනැති අංක 1924/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.23 දින ඉදිරිපත් කරන ලද 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (බලපත්‍ර) රීති සහ 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමේ අදහස පිළිබඳ දැනුම් දීමේ) රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා නිබේ.)"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව මඟින් ඉදිරිපත් කළ රීති දෙකක් පිළිබඳවයි, අපි අද කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ. මෙම රීති දෙක 2015.07.21 වැනි දින ගැසට් පත්‍රයක් මගින් හඳුන්වා දෙනු ලැබුවා. දැනට ක්‍රියාත්මකයි. අපේ පනත අනුව අපි එය සාධාරණ කාලයක් තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගත යුතුයි. අද සිදු කෙරෙන්නේ එම කටයුත්තයි.

ශ්‍රී ලංකාව 1957 ජාත්‍යන්තර පරමාණු බල ඒජන්සියේ සාමාජිකත්වය ලබා ගැනීමත් සමඟම න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධ කටයුතුවල නිරත විය. මේ සමඟම කොළඹ විශ්වවිද්‍යාලයේ විකිරණශීලී සමස්ථානික ඒකකය 1962දී පිහිටුවනු ලැබීය.

1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරී පනත යටතේ 1969දී පරමාණුක ශක්ති අධිකාරිය පිහිටුවනු ලැබීය. පරමාණුක ශක්ති අධිකාරියට විකිරණ සමඟ වැඩ කරන සේවකයන්, මහ ජනතාව හා පරිසරය ආරක්ෂා කිරීම සඳහා විකිරණ ආරක්ෂාවට සම්බන්ධ නියාමන කටයුතු සිදු කිරීම සහ න්‍යෂ්ටික තාක්ෂණය යොදාගෙන මිනිසාට ප්‍රයෝජනවත් වන සේවා සැපයීම, පර්යේෂණ කිරීම යන කාර්යයන් පවරන ලදී. 2014 වර්ෂය දක්වාම පරමාණුක ශක්ති අධිකාරිය විකිරණ ආරක්ෂාව සම්බන්ධ ජාතික නියාමන අධිකාරිය ලෙස කටයුතු කළ අතර, න්‍යෂ්ටික තාක්ෂණය යොදා ගනිමින් රටේ සංවර්ධන කටයුතු හා සේවා කටයුතු වෛද්‍ය, කාර්මික හා කෘෂිකාර්මික අංශවලට ලබාදීමත්, ජාත්‍යන්තර පරමාණු බල ඒජන්සියේ ශ්‍රී ලංකාවේ නියෝජිතයා ලෙස කටයුතු කිරීමත් කරගෙන ගොස් ඇත. මෙම අධිකාරිය මඟින්ම න්‍යෂ්ටික තාක්ෂණ කටයුතු විශාල ලෙස එහි අලුතෙන් ඉදි කරන ලද පර්යේෂණාගාර ගොඩනැඟිල්ල ඉදි කිරීමෙන් පසු සිදු කිරීම නිසා හා එම අධිකාරිය විසින් විකිරණ ප්‍රභව භාවිත කිරීම නිසා නියාමන කටයුතු එම අධිකාරිය මඟින් කිරීම නුසුදුසු බව ජාත්‍යන්තර සංවිධාන මඟින් පෙන්නුම් කරන ලදී.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එහි ඉතිහාසය ගැනයි මේ කෙටියෙන් කියන්නේ. ඒ අනුව නියාමන කටයුතු සහ සංවර්ධන කටයුතු එකම ආයතනයකින් කිරීම නුසුදුසු බැවින් වෙනම ආයතනයක් නියාමන කටයුතු සිදු කිරීම සඳහා පිහිටු විය යුතු බව තේරුම් ගැනීමෙන් පසු නව පනතක් පිළියෙළ කරන ලදී. ඒ අනුව වර්තමානයේ ක්‍රියාත්මක වන පනත 2014 ඔක්තෝබර් මාසයේදී, 2014 අංක 40 දරන පරමාණුක ශක්ති පනත ලෙස නීතිගත කරන ලදී. මෙම පනත මඟින් නියාමන කටයුතු සහතික කිරීම මඟින් ජනතාවගේ හා පරිසරයේ ආරක්ෂාව, විකිරණ ප්‍රභවල ආරක්ෂාව, ජාත්‍යන්තරව අත්සන් තබා ඇති සම්මුතිවලින් ශ්‍රී ලංකාව විසින් සිදු කළ යුතු කාර්යයන් කිරීම පරමාණුක බලශක්ති නියාමන සභාවට පැවරී ඇති අතර, විකිරණශීලී ද්‍රව්‍ය යොදා ගනිමින් න්‍යෂ්ටික තාක්ෂණය දියුණු කිරීමේ කටයුතු සහ වෙනත් ආයතනවලට විකිරණ තාක්ෂණය හඳුන්වා දීමේ කටයුතු පරමාණුක ශක්ති බල මණ්ඩලයට පවරන ලදී.

මුලින් එක් ආයතනයක් වශයෙන් තිබුණු මෙම වැඩසටහන 2014 ඔක්තෝබර් මාසයේදී 2014 අංක 40 දරන පනතින් පරමාණුක බලශක්ති නියාමන කොමිසම ලෙස සහ පරමාණුක බලශක්ති මණ්ඩලය ලෙස වගකීම් දෙකකට බෙදී ගියා. මෙම ආයතන දෙක පිහිටුවීමත් සමඟ පෙර පැවති පරමාණුක ශක්ති අධිකාරිය අහෝසි විය. පරමාණුක ශක්ති නියාමන සභාවේ රාජකාරි 2015 ජනවාරි 01වෙනි දින පටන් ගන්නා ලදී.

නියාමන අධිකාරියේ වගකීම්

විකිරණ ප්‍රභවවල ආරක්ෂාව සහතික කිරීමත්, අනවශ්‍ය විකිරණ බලපෑම්වලින් මහ ජනතාව හා පරිසරය ආරක්ෂා කිරීමට නියාමන පද්ධතියක් ස්ථාපිත කිරීමත්, එය පවත්වාගෙන යාමේ වගකීමත් පරමාණුක බලශක්ති නියාමන සභාවට ඇත.

2014 අංක 40 දරන පරමාණුක ශක්ති පනත මඟින් ලබා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා රෙගුලාසි, නීති හා රීති පිළියෙල කිරීමත්, ඒවා නීතිගත කිරීමත්, විකිරණශීලී ද්‍රව්‍ය භාවිත කරන්නන් සඳහා බලපත්‍ර හා පරීක්ෂණ පද්ධතියක් පිහිටුවීමත්, විකිරණශීලී ද්‍රව්‍ය ආනයනය හා අපනයන කිරීම, විකිරණ ප්‍රභවල භෞතික ආරක්ෂාව සහතික කිරීමත්, න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි අවශ්‍යතාවන්ට මුහුණදීම සඳහා හැකියාවන් දියුණු කිරීමත්, ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති විකිරණ ආරක්ෂණ සම්මුතියේ නියමයන් ඉටු කිරීමත්, ඉහත කාරණා සඳහා නීතිමය සහ නියාමන පද්ධතියක් පිහිටුවීමත් පරමාණුක බලශක්ති නියාමන සභාවට පැවරී ඇත.

අද මේ සිදු වෙන්නේත් ඒ කාරණාවයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අනුව පරමාණුක ශක්ති භාවිතය විශේෂයෙන්ම වෛද්‍ය විද්‍යාවේ භාවිතයන් සහ කර්මාන්තවල භාවිතයන් ලෙස කොටස් දෙකකට බෙදෙනවා. පරමාණු බලශක්ති නියාමන සභාවේ ක්‍රියාකාරකම් අපට සරලව මේ වේලාවේදී දක්වන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍ය විද්‍යාවේදී, කර්මාන්තවලදී, පර්යේෂණවලදී, පර්යේෂණ හා කෘෂිකර්මාන්තවලදී විකිරණවල යොදා ගැනීම් මඟින් සිදුවිය හැකි අන්තරාවන්ගෙන් මහජනතාවගේ, වැඩ කරන සේවකයන්ගේ, රෝගීන්ගේ හා පරිසරයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විකිරණ භාවිත කරන කාමර නිර්මාණයට උපදෙස් ලබා දීමත්, එම කාමර අනුමත කිරීමත් සිදු කරනු ලබයි.

විකිරණශීලී ප්‍රභව හා විකිරණ භාවිත කරන ස්ථාන පරීක්ෂා කිරීම හා ඒවායේ තත්ත්වය සුදුසු පරිදි දියුණු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී පහත සඳහන් කාර්යයන් ද සිදු කරනු ලබයි:

විකිරණ ස්ථාන සඳහා බලපත්‍ර ලබා දීම;

විකිරණ ආරක්ෂණය සඳහා සේවකයන් පුහුණු කිරීම;

විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා උපදෙස් ලබා දීම;

අනවශ්‍ය විකිරණශීලී ද්‍රව්‍ය රට තුළ ගොඩ ගැසීම වැළැක්වීම සඳහා විකිරණශීලී ද්‍රව්‍ය ආනයනය හා අපනයනය පාලනය කිරීම;

මහජනතාව හා පරිසරය අනවශ්‍ය විකිරණවලින් ආරක්ෂා කිරීමට විකිරණශීලී ද්‍රව්‍ය සුදුසු පරිදි බැහැර කිරීමට උපදෙස් ලබා දීම;

අධිවිකිරණ ප්‍රභව සඳහා භෞතික ආරක්ෂණය සැලසීම;

විකිරණ ආපදාවන් සඳහා පෙර සූදානම හා ප්‍රතිචාර දැක්වීමට කටයුතු කිරීම;

ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය හා වෙනත් ජාත්‍යන්තර ආයතනවල පිළිගත් නිර්ණායක පිළිබිඹු වන ආකාරයට විකිරණ ආරක්ෂාව හා අයනීකරණ විකිරණ යොදා ගැනීම සම්බන්ධව නීති - රීති සම්මතයක් පිළියෙල කර ක්‍රියාවට නැංවීම; සහ

සුරක්ෂිතතාව, ආරක්ෂාව හා ආරක්ෂණය සම්බන්ධව ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති සම්මුති සඳහා ශ්‍රී ලංකාවේ නියෝජිත ආයතන ලෙස ක්‍රියා කිරීම සහ එම සම්මුතිවල එකඟ වූ ක්‍රියාකාරකම් ඉෂ්ට කිරීම.

විශේෂයෙන්ම මෙන්න මේ කාරණා පරමාණුක බලශක්ති නියාමන සභාවේ ක්‍රියාකාරකම් ලෙස පවතිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන්ම පරමාණුක බලශක්ති මණ්ඩලයේ වපසරියට කාරණා කිහිපයක් අයත් වෙනවා. ඒවා පහත දැක්වේ.

රටේ සියලුම සංවර්ධන කටයුතු සඳහා විකිරණ තාක්ෂණය යොදා ගැනීම;

විකිරණ තාක්ෂණය සම්බන්ධ සියලුම පරීක්ෂණ කටයුතු සිදු කිරීම;

න්‍යෂ්ටික තාක්ෂණය හා වෙනත් විකිරණශීලී ද්‍රව්‍ය උපයෝගී කර ගැනීම පිළිබඳ සියලුම තොරතුරු මහජනතාව සහ අදාළ ආයතනවලට ලබා දීම;

රට තුළ න්‍යෂ්ටික තාක්ෂණය පරිසරයට හානියක් නොවන අයුරින් සාමකාමීව සංවර්ධනය සඳහා යොදා ගැනීම;

රට තුළ පැවතිය හැකි විකිරණශීලී බණිජ ද්‍රව්‍ය ගවේෂණය කිරීම; සහ

ජාත්‍යන්තර හා පරමාණුක බලය ඒජන්සිය මඟින් විකිරණ යොදා ගෙන වෛද්‍ය ක්ෂේත්‍රයේදී, කර්මාන්ත ක්ෂේත්‍රයේදී හා කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේදී කරනු ලබන සංවර්ධන හා පර්යේෂණ කටයුතු සඳහා තාක්ෂණික විශේෂඥ දැනුම ලබා දීමට හා ඒවාට අවශ්‍ය උපකරණ සැපයීම.

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

මේ ආයතන දෙකෙහි වගකීම මේ ආකාරයට බෙදී යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මේ පිළිබඳව විස්තර කරන්න ටිකක් වෙලාව ගත්තා. පරමාණු කියලා කියපු ගමන් සමහර වේලාවට ඒ දිහා බොහොම කුතුහලයෙන් බලන තත්ත්වයක් අපි සමහර කාරණාවලදී දකිනවා. ඒ නිසා මේ සභාවටත් ඒ පිළිබඳව විශේෂයෙන්ම පැහැදිලි කළ යුතුයි කියලා මම හිතුවා. අද සිද්ධ වෙන්නේ විශේෂයෙන්ම නීති රීති සකස් කිරීමේ නියාමන කොමිසමේ බලතල අනුව ඔවුන් ඉදිරිපත් කළ රීති දෙකක් මේ සභාවේ අනුමැතියට ලක් කිරීමයි.

එකක් තමයි, පරමාණුක බලශක්ති (බලපත්‍ර) රීති අයනීකාර විකිරණ හා සම්බන්ධ ක්‍රියා පිළිවෙතක් පැවැත්වීම. මෙම රීතිය පනතේ 23(1) (ඇ) සහ පනතේ 30(1) වගන්තිය සමඟ කියවිය යුතු, 87 වගන්තිය යටතේ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සාදා ඇත. මෙමඟින් අයනීකාර විකිරණ පරිහරණයේදී පවතින අවදානම යන කාරණය මත පදනම්ව, එක් එක් බලපත්‍රය වලංගු වන උපරිම කාලසීමාවන් මේ ගැසට් එක මඟින් වර්ගීකරණය කරලා තිබෙනවා. මෙසේ එක් එක් බලපත්‍රය වලංගු වන උපරිම කාලසීමාවන් තීරණය කර ඇත්තේ අයනීකාර විකිරණ පරිහරණය කරනු ලබන ක්‍රියා පිළිවෙත් එනම්, විකිරණ චිකිත්සාව, ජීවානුහරණය, කාර්මික විකිරණ ලේඛය, න්‍යෂ්ටික වෛද්‍ය කර්මය, වෛද්‍ය විකිරණ ලේඛය, විකිරණශීලී ප්‍රභව බැහැර කිරීම සහ විසර්ජනය, විකිරණශීලී ප්‍රභව ප්‍රවාහනය කිරීම, විකිරණශීලී ප්‍රභව ගබඩා කිරීම, විකිරණශීලී ප්‍රභව බැහැර කිරීම සහ විසර්ජනය, විකිරණශීලී ප්‍රභවයන් විකිණීම යනාදිය සලකමින්. තවද, මෙම රීතිය මඟින් බලපත්‍රයක් දරන්නා එම බලපත්‍රය කල් ඉකුත් වන දිනට මාස 3කට පෙර බලපත්‍රය අලුත් කිරීම සඳහා අයදුම් කිරීමට අසමත් වුවහොත්, එක් දිනකට රුපියල් 100ක අධිභාරයක් අයකිරීමේ බලය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව වෙත ලබාදී ඇත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් මේකෙන් අදහස් කරන්නේ ඒ විකිරණශීලී ද්‍රව්‍ය භාවිත කරන ආයතනයේ තිබෙන විශේෂ තත්ත්වයන් මත ලබා දෙන බලපත්‍රය අවදානම අඩු ස්ථානවලට වර්ෂ තුනක් සඳහාත්, නිතර සොයා බලන ස්ථානවලට වර්ෂ දෙකක් හෝ වර්ෂයක් සඳහාත් වශයෙන් කාල පරාසයක් තෝරාගෙන ලබා දීමේ වැඩ පිළිවෙළක් පිළිබඳවයි.

අද දින ඉදිරිපත් කරනු ලබන අනෙක් රීතිය තමයි, 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමේ අදහසක් පිළිබඳ දැනුම් දීමේ) රීති. ඒ අනුව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සාදන ලද මෙම රීතිය, පනතේ 87 වන වගන්තිය හා 20(1) වැනි වගන්තිය සමඟ කියවිය යුතු අතර මෙම රීතිය යටතේ දක්වා ඇති "දැනුම් දීමේ ආකෘතිය" අයනීකාර විකිරණ සම්බන්ධ ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමට අදහස් කරන ඕනෑම පුද්ගලයකු විසින් බාර දිය යුතුය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සඳහා නිශ්චිත පෝරමයක් -ඉල්ලුම් පත්‍රයක්- සකස් කරලා, ඒ ඉල්ලුම් පත්‍රය ලැබුණාට පසුව තමයි මේ සඳහා බලපත්‍රයක් ලබා ගත යුතුද නැද්ද කියලා තීරණය කරන්නේ. ඉතා සරලව කිව්වොත් මේ තුළින් සිදු වන්නේ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන කොමිසම මගින් විකිරණශීලී ද්‍රව්‍ය භාවිත කිරීම පිළිබඳ වඩාත් ක්‍රමානුකූල තත්ත්වයක් මේ රට තුළ ඇති කිරීමයි. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිණා එලුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

[අ.භා. 12.23]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ අනාගතය සම්බන්ධයෙන් ඉතාම වැදගත් අංශයක් පිළිබඳවයි අද අපි සාකච්ඡා කරන්නේ. ගරු රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා සඳහන් කරපු ආකාරයටම ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය, මීට වසර දෙකකට පමණ පෙරාතුව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන කොමිසම සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වශයෙන් අංශ දෙකකට වෙන් වුණා. ඇත්තටම එසේ අංශ දෙකකට වෙන් කිරීමේ පදනම බවට පත් වෙන්නේම ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන කොමිසම මගින් මේ ආයතනයට අදාළ නීති, රෙගුලාසි ක්‍රියාත්මක කිරීමත්, අනික් පැත්තෙන් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට මේ රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා පුළුල් ඉඩකඩක් ලබා දීමටත්ය. ඒ අනුව දැනටමත් මේ මණ්ඩලය සහ නියාමන කොමිසම මගින් අපේ රටේ කෘෂි කාර්මික, කාර්මික, සෞඛ්‍ය, උසස් අධ්‍යාපන සහ ආරක්ෂක කියන ක්ෂේත්‍රවල පර්යේෂණ ගණනාවක් සිදු කරලා තිබෙනවා. ඒ වාගේම අපේ රටට එන ආහාරවල - ටින් මාළු වෙන්න පුළුවන්; කිරි පිටි වෙන්න පුළුවන්; වෙනත් ආහාර ද්‍රව්‍ය වෙන්න පුළුවන්.- විකිරණශීලිතාව පරීක්ෂා කර බලා, රටේ ජනතාවට සෞඛ්‍ය සම්පන්න ආහාර වර්ග ලබා දීමේදීද මේ ආයතනයේ පර්යේෂණ ඉතාම වැදගත් වෙනවා.

දැනටමත් අපේ රටේ රෝහල්වල X-ray යන්ත්‍ර ආශ්‍රිතව වැඩ කරන සෞඛ්‍ය සේවකයන්ට මුහුණ දෙන්නට සිදු වන විකිරණශීලී තත්ත්වය ගැන නිරතුරුවම පරීක්ෂාවෙන් ඉඳලා, ඒ අයගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කරන්නත් මේ අධිකාරිය මැදිහත් වෙනවා. ඒ වාගේම අපේ රට අවට - ආසන්න - රටවල පිහිටලා තිබෙන න්‍යෂ්ටික බලාගාර හරහා අපේ රටට කොපමණ බලපෑමක් එල්ල වෙනවාද කියන කාරණය පිළිබඳව පරීක්ෂා කිරීමේ බලයත්, හැකියාවත් තිබෙන්නේ මේ ආයතනයටයි. ඒ නිසාම න්‍යෂ්ටික ශක්තිය ගැන අවධානය යොමු කරනකොට පෙනෙනවා, මේ ආයතනය අපේ රටේ ඉතාම විශාල වැඩ කොටසක් කළ හැකි ආයතනයක් බව. ලෝකයේම පවතින බලශක්ති අර්බුදය පිළිබඳව සාකච්ඡා කරනකොට ගල් අඟුරු වෙනුවට, ඛනිජ තෙල් දහනය වෙනුවට දැන් පුනර්ජනනීය බලශක්තිය කරා යොමු වෙමින් පවතිනවා.

ලෝකයේ රටවල් අතුරින් අපේ රට සාක්ෂරතාව අතින් කොතරම් ඉහළින් හිටියත්, පරිගණක සාක්ෂරතාව අපේ රටේ ඉහළ මට්ටමක පැවතියත් අපි තවමත් සිටින්නේ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ දැනුම ගම් මට්ටමට ගෙන යාම පිළිබඳ බලවත් අර්බුදයකයි. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, "පරමාණු" කියලා කියපු විගසම ජනතාවගේ මතකයට නැඟෙන්නේ අන් කිසිවක් නොව, න්‍යෂ්ටික බලාගාර, න්‍යෂ්ටික අවි ආයුධ සහ න්‍යෂ්ටික පිපිරුම් පිළිබඳවයි. ඒ නිසාම මේ ආයතනය පිළිබඳවත් ජනතාව තුළ මහා භීතියක් ගොඩනැඟිමේ හැකියාවක්, ඉඩ පහසුවක් කෙනකුට තිබෙනවා. ගරු ඇමතිතුමනි, මෙවැනි සේවයක් කරන ආයතනයක් ගැන අපි කථා කරන කොට මේ ආයතනයේ සේවය කරන අපේ විද්‍යාඥයන්, පර්යේෂණ නිලධාරීන් රැක ගැනීම අපේ ජාතික වගකීමක් වෙනවා. මොකද, විද්‍යාඥයන් විධියට මේ ආයතනයට බඳවා ගන්නේත් අපේ රටේ විශ්වවිද්‍යාලයක එක්කෝ රසායන විද්‍යාව නැත්නම් භෞතික විද්‍යාව පිළිබඳ විශේෂවේදී

උපාධිධාරින්. ඔවුන්ට මේ රට අතහැර ගිහිල්ලා රැකියා කිරීමේ අවස්ථාව තිබෙනවා. ඉතා ඉහළ වැටුප්වලට ඔවුන් බඳවා ගන්න ලෝකයේ ඕනෑම රටක් බලා ගෙන ඉන්නවා. නමුත් මේ අය නිදහස් අධ්‍යාපනයෙන් තමන් ඉගෙන ගත් දෙයින්, තමන්ගේ රටේ ජනතාවට යම් සේවයක් කිරීමේ අරමුණින් රටේ රැඳිලා යම් අවදානමකුත් දරා ගෙන ඔවුන්ගේ සේවය රටට සපයනවා.

මම දන්නා ආකාරයට පරමාණුක බලශක්ති මණ්ඩලය තුළ දැනට එවැනි විද්‍යාඥයන් 40ක් පමණ සේවය කරනවා. නමුත් ඔවුන්ගේ වෘත්තීයමය ගැටලු විසඳන්න පසු ගිය දශකය පුරාම වූ මැදිහත්වීම ප්‍රමාණවත් වන්නේ නැහැ. ඔබතුමා දන්නවා ඇති පරමාණුක බලශක්ති මණ්ඩලය සහ පරමාණුක බලශක්ති නියාමන සභාව වෙන් කිරීමේදී ඔවුන් මුහුණ දුන් බලවත් වූ වැටුප් විෂමතාවක් තිබෙන බව. විශේෂයෙන් 2006 වක්‍රලේඛය අනුව ඔවුන්ට හිමි නියමිත වැටුපවත් ලැබිලා නැහැ.

පසු ගිය අවුරුදු දහය පුරාම ඔවුන් යම් සාකච්ඡා කර තිබෙනවා; ලියුම් ලියලා තිබෙනවා; විටින් විට අදාළ ඇමතිවරු එක්ක, මුදල් අමාත්‍යාංශයත් එක්ක විවිධ සාකච්ඡා කර තිබෙනවා. නමුත් ඒ ගැටලු එහෙමමයි. ඒ නිසාම පසු ගිය දවසක ජනාධිපතිතුමාගේ පෞද්ගලික ලේකම්වරයා මුදල් අමාත්‍යාංශය අමතලා මොවුන්ගේ සාධාරණ ගැටලුවට නිසි විසඳුමක් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කර තිබෙනවා. ඒ ඉල්ලීම මුදල් අමාත්‍යාංශට යොමු කර තිබෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, තවමත් ඒ සඳහා සාධාරණ පිළිතුරක් ලබා දීලා නැහැ. මම කලින් කිව්වා වාගේ අවදානමකුත් දරා ගෙන; ඉතාම අඩු වැටුපක් සහිතව, තමන් එක්ක විශ්වවිද්‍යාලයේ එකට ඉගෙන ගත් අය වෙනත් පෞද්ගලික ආයතනවලට බැඳිලා වැඩි වැටුපක් ලබද්දී ඔවුන් මේ ආයතනයේ සේවය කිරීම ඇත්තටම ගත්තොත් මේ රට, ජාතිය වෙනුවෙන් කරන මහා දැවැන්ත කාර්ය භාරයක්. ඒ නිසා මුදල් අමාත්‍යාංශයේ, කළමනාකරණ සේවා මණ්ඩලයේ පසුබැසීම එහෙම නැත්නම් අකාර්යක්ෂමතා නිසා තමයි මේ ගැටලුවලට මුහුණ දී තිබෙන්නේ. ඒ නිසා අපි මේ රටේ සංවර්ධනයේ වෙනත් මානයන් පිළිබඳව අවධානය යොමු කරනවා නම් ලෝකයේ අලුත් තාක්ෂණය අනුව අපේ කෘෂි කාර්මික ක්ෂේත්‍රය දියුණු කරන්න පරමාණුක බලශක්ති අධිකාරිය යොදා ගන්නවා නම්, අපට මේ අය රැක ගන්න වෙනවා.

මම දන්නා ආකාරයට දැනටමත් ඔවුන් අපේ රටේ කෘෂිකර්ම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඉතා විශිෂ්ට පර්යේෂණයන් කර තිබෙනවා. ඉස්සන්ගේ කකුළුවන්ගේ කටුවලින් කයිටින් කියන රසායනිකය වෙන් කර ගෙන දැනටමත් ඔවුන් ඉතා ප්‍රබල දිලීර නාශකයක් හදලා තිබෙනවා. මේ එක උදාහරණයක් විතරයි. ඒ සඳහා ලෝකයේ සම්මානත් හම්බ වෙලා තිබෙනවා. හැබැයි, අපට තිබෙන කනගාටුව මේ විද්‍යාඥයන්ට රට අතහැර යන්න බල කරනවා මිසක් ඔවුන් රට තුළ තබා ගැනීම සඳහා වුණු මැදිහත්වීමක් නැහැ. ඒ නිසා ඇත්තටම ඔවුන් තැන් තැන්වල; කෘෂිකර්ම අමාත්‍යාංශයේ, කර්මාන්ත අමාත්‍යාංශයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ පර්යේෂණ කරමින් නිකරුණේ තමන්ගේ පර්යේෂණ අපතේ යවා ගන්නවා. ඒ වෙනුවට රටක් හැටියට අපි පර්යේෂණ පිළිබඳව අවධානය යොමු කරනවා නම්, ඇත්තටම මේ සියලු පර්යේෂණ ඒකාබද්ධ කරලා ජනාධිපතිවරයා හෝ අගමැතිවරයා යටතේ පවත්වා ගත යුතු අංශයක් බවට පත් කළ යුතුය කියන යෝජනාව අප ඉදිරිපත් කරනවා. මේ කෙටි කාලය තුළ මා කිව්ව කරුණු ගැන අවධානය යොමු කරන්නය කියා ඉල්ලමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 12.31]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)

(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් මෙවැනි රෙගුලාසි පිළිබඳව විවාදයක් පැවැත් වෙන්නේ නැති වුණත් අද දවසේ ලැබුණු අවස්ථාව විශේෂ වරප්‍රසාදයක් හැටියට අමාත්‍යාංශය සලකනවා. මක් නිසාද, පරමාණුක බලශක්ති බලපත්‍ර රීති හරහා මේ රටේ විකිරණ භාවිතය පිළිබඳව තිබෙන තත්ත්වයන් නියාමනය කරන්නට හැකියාව ලැබෙනවා. ඒ හරහා ඒ අදාළ ක්ෂේත්‍රවල විකිරණ භාවිතය පිළිබඳව තිබෙන ප්‍රමිතින් ස්ථාපනය කිරීමට හැකියාව ලැබෙනවා. ඒ සඳහා අවශ්‍ය වන පරිදි පරමාණුක බලශක්ති නියාමන සභාවත්, පරමාණුක බලශක්ති මණ්ඩලයත් නීතියෙන් සහ භෞතික වශයෙන් එකිනෙකට වෙන් වූ ආයතන විධියට පවත්වාගෙන යනවා. නියාමනය කිරීමේ වගකීම වෙන්වූ ආයතනයකට පවරා ඒ හරහා පරමාණුක බලශක්තිය එහෙම නැත්නම් විකිරණ භාවිතය පිළිබඳ ලෝකය පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතින් සහ ජාත්‍යන්තර කාර්ය පටිපාටි ශ්‍රී ලංකාව තුළ අනුකූල කර ගැනීම පිළිබඳව අපි කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ රටේ මූලික වශයෙන් පරමාණුක බලය භාවිත වන්නේ වෛද්‍ය ක්ෂේත්‍රයේ හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේයි. අපේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි අපේ රටේ පර්යේෂණ පිළිබඳව තිබෙන අවස්ථාවන් ඉතාම අඩුයි. මේ ක්ෂේත්‍රවල පමණක් නොවෙයි, ඇත්ත වශයෙන් අනික් ක්ෂේත්‍රවලත්, විශ්වවිද්‍යාල තුළ පවා පර්යේෂණයන්ට තිබෙන ඉඩකඩත්, ආයෝජනයත්, වුවමනාවත් ඉතාම අවම මට්ටමකයි තිබෙන්නේ. විශේෂයෙන්ම පරමාණුක බලශක්ති පිළිබඳ ක්ෂේත්‍රවල පර්යේෂණය කරන්න තිබෙන ඉඩකඩ ඉතාම සීමිත වෙලා තිබෙනවා. මොකද, කරන ආයෝජනවල අඩුකමත් ඒ වාගේම ඒ ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාලවල සිදු වන සිද්ධාන්ත ඉගැන්වීම මූලිකව සිදුවන නිසායි. ඒත් මා කියන්නට ඕනෑ, පරමාණුක බලශක්ති මණ්ඩලයත්, පරමාණුක බලශක්ති නියාමන සභාවත් කියන ආයතන දෙක ලෝකයේ පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතින්ට සහ කාර්ය පටිපාටියට අනුකූලව තමන්ගේ වගකීම ඉටු කරමින් ඉන්න බව. ඒ නිසා පුරවැසියන්ගේ ආරක්ෂාව සනාථ කරන ගමන්, පරමාණු බලය අපේ රටේ සාමාන්‍ය ජනතාවගේ අවශ්‍යතාවන් උදෙසා භාවිත කිරීමට අවශ්‍ය කරන නීතිමය පරිසරයත්, ප්‍රායෝගික පරිසරයත් ඔවුන් සකස් කිරීමට දිගු කාලයක් තිස්සේ කැපවෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ දිගු කාලීන ජනන සැලැස්ම තුළ විදුලි බලය උත්පාදනය කිරීම සඳහා පරමාණු විදුලි බලාගාරයක අවශ්‍යතාව තෝරාගත හැකි විකල්පයක් - optional- වශයෙන් සඳහනක් තිබෙනවා. අප වැනි පුංචි රටකට එසේ කළ හැකිද, ඒ සඳහා අවශ්‍ය කරන ඉඩකඩම් අපට තිබෙනවාද, අපේ රටේ ආර්ථික ශක්තිය එයට ඉඩ දෙනවාද එහෙම නැත්නම් ඊට වඩා විකල්ප බලශක්ති ප්‍රභේද තිබෙනවාද කියන කාරණය සම්බන්ධයෙන් විශාල වශයෙන් විවාද තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ තර්ක කෙසේ වෙතත්, අපේ රටේ අනාගත බලශක්ති සුරක්ෂිතතාව උදෙසා වැදගත්වන සෑම බලශක්ති ප්‍රභේදයක් පිළිබඳවම අධ්‍යයනය කිරීම වැදගත් වනවා. ඒ නිසා අපේ දිගු කාලීන ජනන සැලැස්ම තුළ තෝරාගත හැකි ජනන ප්‍රභවයක් ලෙස පරමාණු බලශක්ති පිළිබඳ කාරණය තවමත් ඉතිරිව තිබෙනවා. අපි මේ ගැන බලන්නට ඕනෑ. බංගලාදේශය

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

විශාල රටක් නොවෙයි. අධික ජනගහනයක් තිබෙන රටක්. නමුත් ඔවුන් අද පරමාණු විදුලි බලාගාර දෙකක් ඉදි කරමින් තිබෙනවා.

එක්සත් අරාබි එමීර් රාජ්‍යයත් පරමාණු විදුලි බලාගාර දෙකක් ඉදි කරමින් තිබෙනවා. ඉන්දියාව අපේ රටට කිලෝමීටර් 200ක් දුරින් කුන්ඩන්කුලම් පරමාණු විදුලි බලාගාරය ඉදි කළා විතරක් නොවෙයි, එහි දෙවන අදියරත් ආරම්භ කිරීමට දැන් සූදානමින් ඉන්නවා. මේ කුන්ඩන්කුලම් බලාගාරය ඉදි කිරීම හරහා ශ්‍රී ලංකාවට ඇති වන බලපෑම තක්සේරු කර තිබේද, ඒ වාගේම එම බලාගාරය හා සම්බන්ධව ඉන්දියානු රජය සමඟ ශ්‍රී ලංකා රජය පවත්වාගෙන යන සබඳතාව කෙලෙසද කියන කාරණා ගැන මීට වසර 4කට පමණ කලින් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මම එවකට විදුලිබල අමාත්‍ය ධුරය දැරූ පාඨලී චම්පික රණවක අමාත්‍යතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. අපට ඒ ගැන ලොකු තෝරා ගැනීමක් හෝ ලොකු පාලනයක් නොතිබුණු බව කිව යුතුයි. නමුත්, අද වන විට ඉන්දියාවේ කුන්ඩන්කුලම්හි දෙවැනි පරමාණු බලාගාරයත් commission කරන්නට ඔන්න මෙන්න තත්ත්වයකයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක් විධියට අප මෙන්න මේ කාරණය ගැන කල්පනා කරන්න අවශ්‍යයි. පරමාණු බලශක්තිය හා සම්බන්ධව ගත්තොත්, කිලෝමීටර් 200ක් කියන එක එතරම් ලොකු දුරක් වශයෙන් සලකන්න බැහැ. එවැනි තත්ත්වයක් තුළ අප පරමාණු බලයෙන් විදුලිය උත්පාදනය කිරීම පිළිබඳව තිබෙන අවස්ථාව භාවිත කළ යුතුද, නැද්ද කියන කාරණය ගැන දුරදිග හිතලා තීරණ ගත යුතුව තිබෙනවා. එය එකවරම බැහැර කිරීම හෝ එකවරම භාර ගැනීම නොකළ යුතුයි. ඒ පිළිබඳව අධ්‍යයනය කළ යුතුව තිබෙනවා. එසේ අධ්‍යයනය කිරීම සඳහා වැය වන මුදල් ප්‍රමාණය අපට යම් ආකාරයකින් ඒ පිළිබඳව උදව් කරන ආයතන හරහා ලබාගැනීමට හැකියාව තිබෙනවා. ඒ නිසා පරමාණු බලය සෞඛ්‍යය, කෘෂිකර්මය වැනි කෂේත්‍රවල දැනට කරන ඒ අවම භාවිතය වඩා ආරක්ෂිතව කර ගැනීමට අවශ්‍ය වන මෙවැනි රෙගුලාසි සකස් කරන ගමන්ම, විදුලිය උත්පාදනය කිරීම උදෙසාත් පරමාණු බලශක්තිය භාවිත කිරීමේ අවස්ථාව පිළිබඳව අප අධ්‍යයනය කළ යුතුයි. අද හෙට නොවෙයි, තව වසර 15කින්, 20කින්, 30කින්, විශේෂයෙන්ම පොසිල ඉන්ධන භාවිතය නුසුදුසු හෝ කළ නොහැකි යුගයක් උදා වන විට, වඩාත් සාපේක්ෂව ආරක්ෂාකාරීව, වඩාත් සාපේක්ෂව පරිසර හිතකාමීව, වඩාත් සාපේක්ෂව ආර්ථික වශයෙන් දිගුකාලීනව භාවිත කිරීමට හැකියාව තිබෙන විකල්පයක් ලෙස පරමාණු බලශක්තිය භාවිත කරනවාද, නැද්ද කියන කාරණය ගැන ගැඹුරින් අධ්‍යයනය කළ යුතු අවස්ථාවක් දැන් උදා වෙලා තිබෙනවා. ඒ අද ගැන හිතලා නොවෙයි, අනාගතය ගැන හිතලායි. බොහොම ස්තුතියි.

[අ.භා. 12.40]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සාදන ලද රීති ගණනාවක් සම්බන්ධව ගරු ඇමතිතුමා පාර්ලිමේන්තුවේ අනුමැතිය ඉල්ලා තිබෙන මේ මොහොතේ, ඒ ගැන කථා කරන්න මටත් අවස්ථාවක් ලබා දීම ගැන මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මට ඉතාම ටික වේලාවයි තිබෙන්නේ. ඒ නිසා මම කාරණා දෙක තුනක් පමණක් සඳහන් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම දියුණු වන ආර්ථිකයකට, දියුණු වන සමාජයකට අද බලශක්තිය අත්‍යවශ්‍ය බව පිළිගන්නා වූ වැඩසටහනක් අපේ රටට අවශ්‍යයි. එය සකස් කළ හැක්කේ දේශපාලනඥයන්ට නොවෙයි. එය සකස් කළ හැක්කේ විද්‍යාඥයන්ට පමණයි කියන දෙය අප මූලිකව පිළිගන්න ඕනෑ. දේශපාලනඥයන් වන අපට ජන සමාජයට එයින් වන්නා වූ යම්කිසි දීර්ඝ කාලීන හානියක්, පාරිසරික හානියක්, පැවැත්මකට වන හානියක් පිළිබඳ කරුණු සාකච්ඡා කළ හැකියි. ඒ වාගේම එවැනි යහපත් වැඩ පිළිවෙළක දිගු ගමනට මෙම ආයතනයේ විශේෂඥ දැනුමක් ඇති අයට අපට ලබා දිය හැකි සහයෝගය ලබා දෙන්න ඕනෑ.

මා දීර්ඝ කාලයක් තිස්සේ නියෝජනය කරන ප්‍රදේශයට අයත් මහරගම පිහිටි පිළිකා රෝහල පිළිබඳව විශේෂයෙන්ම මේ අවස්ථාවේ ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර වන්න මා කැමැතියි. පිළිකා රෝහලෙන් පිටවන අපද්‍රව්‍ය විකිරණයන්ගෙන් සමන්විත බවත්, එම භූමි ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට එම විකිරණ අනතුර සහිතව ජීවත් වන්නට සිදු වී තිබෙන බවත්, පරමාණු බලශක්ති අධිකාරියට අවස්ථා රාශියකදී දැනුම් දී තිබෙනවා. ඔවුන් විසින් ඒ සඳහා මැදිහත් වී තිබෙනවා. ඔවුන් විසින් යම් යම් විකල්ප ඉදිරිපත් කර තිබෙනවා. නමුත්, තවම ඒ පරිසරය හා ජන සමාජය සම්පූර්ණයෙන් ආරක්ෂා වී නැහැ. ඒ නිසා මා පරමාණු බලශක්ති අධිකාරියෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා, මේ ගැන විශේෂ මැදිහත් වීමක් කරන්න කියලා. අපට විකිරණ - radiation - අවශ්‍යයි; radioactive ද්‍රව්‍ය අවශ්‍යයි; පිළිකා මර්දනයට ඒවා අවශ්‍යයි; සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුව සඳහා අවශ්‍යයි. ඒක තමයි මේ ආයතන ඒවා පාවිච්චි කරන්නේ. ගරු ඇමතිතුමනි, රෝහල ආරම්භ කළ කාලයට වඩා දැන් පිළිකා රෝගීන් විශාල ප්‍රමාණයක් එතැනට පැමිණෙනවා. ඒ වාගේම එහි අනෙක් පැත්ත ගැන අපි දක්වන උනන්දුවත් වැඩියි. මේ කාරණය විශේෂයෙන් අවධානයට යොමු වන කොට එහි බලපෑම එන විවිධ ප්‍රදේශ තිබෙනවා.

ජන ජීවිතය ආරක්ෂා කර ගැනීම සඳහා සුද්ද පවිත්‍ර වායුව පිළිබඳ මෙම අධිකාරියට ඇති බලය වාගේම, ජලයේ පවිත්‍රතාව ආරක්ෂා කර ගැනීම සඳහාත් මෙම අධිකාරියට බලයක් තිබෙනවා. මොකද, ඔබතුමාත් දන්නවා, අද පානීය ජලය ගන්නේ අපේ ප්‍රධාන ගංගාවලින් බව. ගංගාවලට අපවිත්‍ර ද්‍රව්‍ය එකතුවීම වැළැක්වීමට පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා පරමාණු බලශක්ති අධිකාරිය සහ පරමාණු බලශක්ති නියාමන සභාව නිරන්තරයෙන් මැදිහත්වන නව වැඩ පිළිවෙළක් අවශ්‍ය වනවා. ඒ සම්බන්ධව පැමිණිල්ලක් පැමිණෙන තුරු බලා නොසිටිය යුතුයි. අපේ සිරිත තමයි පැමිණිල්ලක් පැමිණෙන තෙක්, "සියල්ල හොඳයි" කියා හිතා ගෙන සිටීම. අද තිබෙන්නේ වෙගයෙන් හානි වන පරිසරයක්. ගරු ඇමතිතුමනි, උදාහරණයක් වශයෙන් ගන්න ඔබතුමා නිතර දෙවේලේ එන, මමත් නිතර දෙවේලේ යන අපේ ගම් පළාතේ, කොස්ගම, සාලාව යුද හමුදා කඳවුර පසු ගිය දා පුපුරා ගියා. අද වන තුරු පරමාණු බලශක්ති අධිකාරිය ඒ අවට තත්ත්වය ගැන සහතිකයක් දෙන්නට ඉදිරිපත් වෙලා නැහැ. ඒ, පැමිණිල්ලක් නැතිකම. පැමිණිල්ලක් කළ යුතුමද? අපට හමුදා කඳවුර ඇතුළට යන්න බැහැ. අපි ගිහියන් හැටියටයි සලකන්නේ! නමුත් මහණ වුණ අයයි හමුදාව ඇතුළේ ඉන්නේ!

පුපුරා ගිය හමුදා කඳවුරෙන් පැතිරී ගිය විකිරණ කොයි තරම් ප්‍රමාණයක් තිබෙනවාද, නැද්ද? එය සීතාවක ප්‍රදේශයේ ජන ජීවිතයට අද අති බරපතළ ප්‍රශ්නයක්. ප්‍රදේශයේ තත්ත්වය බලන්න ගරු අග්‍රාමාත්‍යතුමා ආවා. මම එතුමාට විස්තර කිව්වා. ගරු ජනාධිපතිතුමා රැස්වීමක් කැඳෙව්වා. මම එතැනදීත් ඒ ගැන කිව්වා. අද වන තෙක් හමුදාවට ඒ ප්‍රදේශයේ තත්ත්වය පිළිබඳ සහතිකයක් දෙන්න බැහැ. වැටුණු වැටුණු තැන්වල පුපුරන

ද්‍රව්‍යවලින් තවමත් විකිරණ පැතිර යමින් පවතින බව අද මම පාර්ලිමේන්තුවේදී පැමිණිල්ලක් ලෙස ගරු ඇමතිතුමාටත්, පරමාණු බලශක්ති අධිකාරියටත් කනගාටුවෙන් සඳහන් කරන්න ඕනෑ. මෙවැනි තත්ත්වයක් ඇති වීම එදිනෙදා ජන ජීවිතයට බරපතළ ප්‍රශ්නයක්.

ගරු ඇමතිතුමනි, පාරිසරික හානි ස්වාභාවිකව සිදු වන බව අපි දන්නවා. මනුෂ්‍යයා අකිනුත් පරිසරයට හානි සිදු වනවා. පසු ගිය දා සාලාව හමුදා කඳවුරේ සිදු වුණේ ස්වාභාවික හානියක් නොවෙයි. එවැනි තත්ත්වයකදී පැතිරී යා හැකි විකිරණ ද්‍රව්‍ය පිළිබඳ රට පුරා ප්‍රචාර පවතිනවා. ඒවා මහ මුහුදේ තැන්පත් කළා කියනවා. ඒවා මහ මුහුදේ තැන්පත් කරන්න පරමාණු බලශක්ති නියාමන සභාවේ අවසරය ලබා දුන්නාද? මොකද, ජාත්‍යන්තර නීතිය යටතේ ඒවා මුහුදේ තැන්පත් කිරීමේ අවසරය දීමේ බලය තිබෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නියාමන සභාවට. මම විශේෂයෙන්ම මේ කාරණා අවධානයට ගෙනෙන්නේ, බොහෝ විට මේ සිද්ධීන් යටපත් වුණත් ඒවායේ අහිතකර බලපෑම් පසු කාලීනව ජන ජීවිතයට බලපාන නිසායි. අද ඒ සඳහා මැදිහත් වීමේ වැදගත්කමක් තිබෙනවා. මොකද, බොහොම සරලව කියන්න පුළුවන්, "පුපුරා ගිය කිසිම දෙයක විකිරණ අඩංගු නැහැ" කියලා. නමුත්, අපි දන්නවා පාකිස්තානය වාගේ රටවල මෙලෙස පුපුරා ගිය තැන්වල විකිරණවලින් ඇති වුණු විනාශයන් සොයා ගත්තේ අවුරුදු ගණනාවක් පහු වෙලා බව. අපට වඩා වේගයෙන් විද්‍යාඥයන්ට ඒවා සොයා ගත හැකියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුපුරා ගිය, කොස්ගම හමුදා කඳවුර ඇතුළේ, හමුදා කඳවුරෙන් පිට ඉඩම් කඩම්වල, ගෙවල් දොරවල්වල තැන්පත් වී තිබෙන එවැනි දේ රැගෙන ගොස් රහසේ හෝ අද මහ මුහුදට වීසි කර දමනවා නම් ඒ පිළිබඳව වග කියන්නේ කවුද කියන කාරණාව ගරු ඇමතිතුමාගේ වගකීම ඇතිව කොමිසමට යොමු කරන්න කියා මා මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා. ස්තුතියි.

[අ.භා. 12.47]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1969 අංක 19 දරන පරමාණුක බලශක්ති අධිකාරිය පනත එදා හදලා පරමාණුක බලශක්ති අධිකාරිය පිහිටුවුවා. විශේෂයෙන් අහිතකර විකිරණයන්ගෙන් හා ඒවායෙන් සිදු වන අනතුරුවලින් රටේ මහ ජනතාව හා විකිරණ භාවිත කරන සේවකයන් මෙන්ම පරිසරය ආරක්ෂා කරගැනීමත්, ඒ වාගේම ජාතික, සමාජ, ආර්ථික සංවර්ධන වැඩ කටයුතු සඳහා මේ න්‍යෂ්ටික තාක්ෂණය යොදා ගැනීමත් වෙනුවෙන් තමයි එය පිහිටුවුවේ. නමුත් මේ රට තුළ පරමාණුක බලශක්තිය, නැත්නම් විකිරණ විකාශනය වත්ම මේ සඳහා වෙනම ආයතන දෙකක් අවශ්‍ය වුණා. එහෙම නැතිව, කාර්යයන් දෙකම එකකින් කරන්න ගියාම සිදු වන්නේ, "නඩුත් හාමුදුරුවන්ගේ, බඩුත් හාමුදුරුවන්ගේ" වාගේ වැඩක්. ඒ හින්දා තමයි 2014 අංක 40 දරන පනත මඟින් රට තුළ පරමාණුක බලශක්තිය ප්‍රයෝජනයට ගැනීම පුළුල් කිරීමේ වගකීම භාර ගැනීමට ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයත්, ඒ වාගේම, පරමාණුක බලශක්තිය උපයෝගි කරගෙන වැඩ කටයුතු කිරීමේදී ජනතාවත්, සේවකයනුත්, පරිසරයත් ආරක්ෂා කිරීමේ වගකීම ඇතිව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවත් කියන දෙක ස්ථාපිත වුණේ. අද අපි විශේෂයෙන් මේ ගරු සභාවේ සාකච්ඡාවට බඳුන් කරන්නේ, විවාද කරන්නේ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් රටේ ජනතාවත්, සේවකයනුත්, පරිසරයත් ආරක්ෂා කර ගැනීම සඳහා සාදන ලද රීති පද්ධතියක් ගැනයි. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ ගරු සභාවෙන් නික්ම යන මේ අවස්ථාවේ මා කියනවා, එතුමා මෙහි සුළු මොහොතක් රැඳී සිටියා නම් හොඳයි කියා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාට අවුරුදු 20ක් කර ගන්න බැරි වූ දේවල් මේ ආණ්ඩුව ලවා මේ මාස කීපය තුළ කරවා ගන්න ඔබතුමන්ලා උත්සාහ කරනවා. අවුරුදු 20ක් රට පාලනය කරලා, ඇමතිකම් දරලා අද සාලාවේ පිපිරීම ගැන කථා කරනවා. මීට ඉස්සර පසු ගිය ආණ්ඩුව කාලයේම කොච්චර තැන් -හමුදා කඳවුරු, අවි ගබඩා- පිපිරුණාද? එදා ඒ ගැන කථා කිරීම තබා අඩුම ගණනේ මාධ්‍යවත් හරියට දැනුවත් කළේ නැහැ. අපේ නව රජය ලබා දී තිබෙන මේ මාධ්‍ය නිදහස සහ තොරතුරු දැන ගැනීමේ අයිතීන් නිසා මෙවැනි කාරණා අරගෙන අද කථා කරනවා, කිසිම දෙයක් දන්නේ නැති ආකාරයට. අපි ඒ ගරු මන්ත්‍රීතුමාට කියනවා, ඒ අවුරුදු 20 තුළ කුමන ඇමතිකම් දැරුවත් මහරගම පිළිකා රෝහලෙන් ඉවත් වන විකිරණ ද්‍රව්‍යවලින් හානියක් නොවන පරිදි ආරක්ෂාවක් ලබා දීමට එතුමාට නොහැකි වෙලා තිබෙන බව. නමුත් අපි අද මේ වාගේ රීති සම්මත කරලා උත්සාහ කරන්නේ එවන් ආරක්ෂාවන් ලබා දීමටයි. ඒ වාගේම, එදා මහරගම පිළිකා රෝහලේ රෝගීන්ට ලබා දීමට කටයුතු කර තිබුණේ වටිනාකමින් වැඩි බෙහෙත් සීමාසහිත ප්‍රමාණයක් විතරයි. නමුත් මම ආඩම්බරයෙන් කියනවා, එවැනි කිසිම සීමාවක් නොමැතිව එම රෝගීන්ට අවශ්‍ය බෙහෙත් ටික ලබා දීමට අද කටයුතු කර තිබීම අපේ මේ යහ පාලනය ලබාගත් විශේෂ ජයග්‍රහණයක්ය කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විකිරණ ගැන කථා කරද්දී එය අපට නැතිවම බැරි දෙයක්. ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමාත් අදහස් දැක්වූ පරිදි විකිරණ භාවිතයෙන් විදුලිය නිපදවීම දැන් බොහෝ රටවල සිද්ධ වනවා. ඉන්දියාව, පාකිස්තානය, චීනය ආදි රටවල එසේ සිදු වනවා. නමුත් අප එතැනට යෑම ගැන තවත් හිතන්න වෙලා තිබෙනවා. කොහොම වුණත්, දීර්ඝ කාලීනව විදුලිය නිපදවීමේ අපේ සැලැස්ම තුළ මේවා අඩංගු වෙනවා. විකිරණ ගැන කථා කරද්දී කියන්න ඕනෑ, අපට විකිරණ නැතිව බැරි බව. විකිරණ ඇතිවත් බැහැ; නැතිවත් බැහැ. ඒවා "a good servant but a bad master". විකිරණ ඕනෑ. හැබැයි එය, පරෙස්සමෙන් හැසිරවිය යුතු දෙයක් වනවා. වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණය, නිෂ්පාදන කාර්යයන්, කෘෂිකර්මය ආදි හැම දේකටම විකිරණ ක්‍රියාවලිය අවශ්‍ය වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලබා දී ඇති කාලය අවසන් වෙලායි තිබෙන්නේ. මා විශේෂයෙන් ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ඇමතිතුමා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ කාර්ය මණ්ඩලය ඇතුළු සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා, මේ අවස්ථාවේදී විකිරණ භාවිතය පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම ගැන. ඒ වාගේම ඒවා නියාමනය කිරීමට රටේ වැසියන්, පරිසරය හා ඒ සඳහා කටයුතු කරන නිලධාරීන් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය රීති පද්ධතිය සැකසීමට කටයුතු කිරීම ගැන විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 12.52]

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සාදන ලද පරමාණුක බලශක්ති රීති පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

[ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය]

ගරු අමාත්‍යතුමා කිව්වා වාගේ මෙය කාලීන මාතෘකාවක්. විශේෂයෙන් පරමාණුව හා න්‍යෂ්ටි ගැන කථා කරන විට ඉස්සෙල්ලාම සමාජයේ තිබෙන්නේ ඒ ගැන බියක්. මේ බිය නැති කිරීමට නම් න්‍යෂ්ටික තාක්ෂණය පිළිබඳව තිබෙන අවිද්‍යාව දුරු කරන්නට ඕනෑ. ඒ ගැන නිවැරදි දැක්මක් ජනතාව අතරට දෙන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලැබී තිබෙන කාලය අනුව, විකිරණ ගැන කථා කිරීමේදී වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධව කථා කරන්නට මා බලපොරොත්තු වෙනවා. මේ විකිරණ අපට ඇතිවත් බැරි, නැතිවත් බැරි දෙයක් වාගෙයි අපට දැනෙන්නේ. මේ විකිරණ අපේ ජීවිතවලට හානි ගෙන දෙනවා වාගේම මේ ලෝකය ජය ගන්න තිබෙන අභියෝගවලදී විකිරණවල තිබෙන වැදගත්කමත්, වටිනාකමත් අපි දැනගන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍ය විද්‍යාව, කර්මාන්ත, කෘෂිකර්මය, බලශක්ති හා පර්යේෂණ සඳහා මේ විකිරණ න්‍යෂ්ටික තාක්ෂණය යොදා ගන්නට ලැබී තිබෙන මේ අවස්ථාවේදී විකිරණශීලී ද්‍රව්‍යවලට ප්‍රතිතියට වඩා ගොදුරු වුණාම ශරීරයේ තිබෙන සෛල විනාශ වී DNAවලට හානි පැමිණිලා ඒ සෛල විකෘති වීම තුළින් අසාමාන්‍ය ලෙස සෛල වර්ධනය වෙනවා. මේ නිසා පිළිකා තත්ත්වය යටතේ අද මේ සමාජය බෝ නොවන රෝගවලට ගොදුරුවීම බරපතළ ගැටලුවක් වෙලා තිබෙනවා. විකිරණ ගැන කථා කිරීමේදී විශේෂයෙන් මාරි කියුරි නමැති විද්‍යාඥවරිය අපට අමතක කරන්නට බැහැ. එතුමිය නොබෙල් ත්‍යාගය දිනූ ප්‍රථම කාන්තාව. එතුමිය මේ ලෝකයට එක්ස් කිරණ සොයා ගැනීමේදී විකිරණ තාක්ෂණවේදීන් සමඟ අසාමාන්‍ය ලෙස විකිරණවලට ගොදුරු වීම නිසා ඇයටත් "aplastic anaemia" කියන පිළිකා රෝගයෙන් මිය යන්නට සිද්ධ වුණා. අසාමාන්‍ය ලෙස විකිරණවලට ගොදුරුවීම රෝග තත්ත්වයන්ට බලපානවා වාගේම පිළිකා ප්‍රතිකාර සඳහාත් මේ කිරණ යොදා ගන්නවා. Nuclear medicine ඒ වාගේම radiotherapy ප්‍රතිකාර ක්‍රමයටත් මේ විකිරණ යොදා ගැනීමේ අවස්ථාව ලැබී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ නියාමන සභාවේ මේ ප්‍රමිතිකරණයත් එක්ක නීති රෙගුලාසි තුළින්, මේ හා ආශ්‍රිතව සේවය කරන සේවකයින්ගේ, ඒ වාගේම කාර්ය මණ්ඩලවල ජීවිතවල ආරක්ෂාව සහතික කිරීමේදී ගරු අමාත්‍යතුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයට මේ උත්තරීතර සභාවේ සියලුදෙනාගේම සහයෝගය ලබාදිය යුතුයයි මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා. ස්තුතියි.

[අ.භා. 12.55]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාමත් වැදගත් මාතෘකාවක් සම්බන්ධයෙන් කථා කිරීමට ලැබීම ගැන සතුටු වෙනවා. මේ සම්බන්ධයෙන් වූ විවිධ පර්යේෂණවල ප්‍රතිඵල ගැනත් මා කථා කරන්නට බලාපොරොත්තු වුණා. නමුත් කාලවේලාව නොමැති නිසා ඉතාමත් කෙටියෙන් කාරණා කිහිපයක් ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වෙනවා.

නියෝජ්‍ය අමාත්‍ය, ගරු අජිත් පෙරේරා මැතිතුමා කිව්වා වාගේ විදුලි බලය සඳහා න්‍යෂ්ටික බල ශක්තිය යොදා ගැනීම ගැන සංවාදයක් ඇති වීම පිළිබඳව මා සතුටට පත් වෙනවා. මොකද, අද ලෝකයේ මේ ගැන තිබෙන බියත් එක්ක මේ සම්බන්ධයෙන් වාද විවාද කර හරියට දැනුවත් වෙලා එයට සම්බන්ධ වෙනවා නම් ඉතාමත් හොඳයි. ලෝකයේ තිබෙන ලොකුම nuclear power plant එක තිබෙන්නේ ජපානයේ Niigata ප්‍රදේශයේයි. මම අවුරුදු දහයක් ජීවත් වුණු ජපානයේ මගේ විශ්ව විද්‍යාලයේ සිට කිලෝ මීටර් 10ක් දුරින් මේ බලාගාරය තිබෙන්නේ. මේ බලාගාරයෙන් විදුලිබලය මෙගාවොට් 7965ක් නිෂ්පාදනය වෙනවා. ඒ ප්‍රමාණය, ලංකාවේ විදුලිබල නිෂ්පාදනය වාගේ තුන් ගුණයක්.

මගේ විශ්වවිද්‍යාලයේ තිබුණා, Nuclear Safety Engineering කියා පඨමාලාවක්. ඒ පාඨමාලාවත් එක්ක අපි මෙහි තිබෙන අහිතකර බලපෑම් ගැන අධ්‍යයනය කළා. එම නිසා පර්යේෂකයින් හැටියටත් පරමාණුක බලශක්තිය ගැන රටේ තිබෙන දුර්මතය අප දුරු කළ යුතු වෙනවා.

ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ගොඩනැඟිලි ඉදිකිරීම සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේදීත් මේ ගැන කථා කළා. අලුතින් හැදීමට යෝජිත කැලණි පාලමත් සමඟම ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ගොඩනැඟිල්ලත් හල්බරාව ප්‍රදේශයේ අලුතෙන් හදන්න යෝජනා වෙලා තිබෙනවා. නමුත් සමාජයේ තිබෙන වැරැදි මත නිසා ඒ ඉදිකිරීම් කරන්න දෙන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගැන අපි සමාජය දැනුවත් කළ යුතු වෙනවා. විකිරණ ගැන නැත්නම් න්‍යෂ්ටික පරමාණු ගැන පර්යේෂණ කිරීම කියන එක මහා භයානක දෙයක්වත්, සමාජයට අහිතකර දෙයක්වත් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයෙන් කරන්නේ විකිරණ ආරක්ෂණ පහසුකම් සැපයීම සහ ජාතික, සමාජ, ආර්ථික සංවර්ධනය උදෙසා න්‍යෂ්ටික තාක්ෂණය යෙදවීමයි. ඒ පර්යේෂණ කටයුතු තමයි කරන්නේ. මාලඹේ, හල්බරාව ප්‍රදේශයේ මෙම නව ගොඩනැඟිලි සංකීර්ණය ඉදිකිරීම හා ප්‍රතිෂ්ඨාපන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික අනුමැතිය ලැබී තිබෙනවා. නමුත් අනුමැතිය ලැබී තිබෙන ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් ප්‍රදේශයේ පදනම් විරහිත මහජන විරෝධතා නිසා නවත්වලා තිබෙනවා. ඒ නිසා සංවර්ධන වැඩ කටයුතු කිහිපයක්ම නැවතිලා තිබෙනවා. අලුතෙන් ඉදිකිරීමට බලාපොරොත්තුවන පාලමත්, ඒත් සමඟම, පර්යේෂණ කරන්න තිබෙන පරමාණුක බලශක්ති මණ්ඩලයේ මේ ගොඩනැඟිල්ල ඉදිකිරීමත් නැවතිලා තිබෙනවා.

මේ සම්බන්ධයෙන් ඒ ප්‍රදේශයේ මන්ත්‍රීතුමාගේ -මරික්කාර් මන්ත්‍රීතුමාගේ- අවධානය යොමු කරවන්න මා කැමතියි. එතුමාට පුළුවන්, "සිරස" නාළිකාව උපයෝගි කරගෙන මේ ගම්වාසීන්ගේ සහ මේ ප්‍රදේශයේ තිබෙන දුර්මතය නවත්වලා, රටට වැඩදායී පර්යේෂණ සිදු කරන ස්ථානයක් ඉදි කර ගැනීමට අවශ්‍ය නිවැරැදි මතය ඒ ජනතාවට ලබා දෙන්න. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මේ රටේ අනාගතය ගැන, අලුත් පර්යේෂණ ගැන, බලශක්තිය ගැන කරන මේ කටයුතු සඳහා දේශපාලනඥයන් හැටියට විතරක් නොවෙයි, පර්යේෂකයන් හැටියටත් අපි සියලුදෙනාම සම්පූර්ණය සහයෝගය ලබා දිය යුතුයි කියලා මා ප්‍රකාශ කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

දිවා ආහාරය සඳහා පස් වරු 1.30 දක්වා සභාවේ වැඩ කටයුතු තාවකාලිකව අත් හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා]ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පසු, අමර්වූ ප.ව. 1.30 වන තුරු විවේකයක් ගෙන නැවත රැස්විය. නියෝජ්‍ය කාරක සභාපතිතුමා [මාණ්ඩලික සභාවේ සභාපති ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] in the Chair.

ආනයන හා අපනයන (පාලන) පනත: නියෝග

ஏற்றுமதி, இறக்குமதிச் (கட்டுப்பாடு) சட்டம்: ஒழுங்குவிதிகள்

IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

I

[අ.භා. 1.30]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1985 අංක 48 හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජලය මිනිසාගේ පැවැත්මට අත්‍යවශ්‍ය මූලික සාධකයක්. ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් සියයට 40ක් පමණ සංවිධානිත ජල සැපයුම් බුක්ති විඳින අතර, මුළු ජනගහනයෙන් සියයට 60ක් ළිං, නළ ළිං, ඇළ මාර්ග සහ ගංගා වැනි ජල ප්‍රභව මත යැපෙනවා. මෙයින් සියයට 10ක ප්‍රමාණයක් ආරක්ෂිත ජල ප්‍රභව මත යැපෙනවා. ශ්‍රී ලංකා රජය වර්ෂ 2025දී මුළු රටටම සනීපාරක්ෂිත පානීය ජලය සැපයීමටත්, 2020දී මුළු ජනගහනයෙන් සියයට 60කට නළ ජලය සැපයීමටත් ප්‍රමුඛතාව දී සැලසුම් සකස් කරලා තිබෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ශ්‍රී ලංකාව තුළ පානීය ජලය සැපයීමේ බලධාරියා වන අතර, වර්තමානයේ පවුල් මිලියන 1.5කට පමණ පානීය ජලය සපයනු ලබනවා. වර්ෂ 2020 වන විට මෙම ප්‍රමාණය සියයට 60ක් දක්වා ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දත්තවලට අනුව, ජලය ඝන මීටර් 1ක් නිපදවීම සඳහා රුපියල් 160ක පමණ මුදලක් වැය වුවද, පිරිසිදු කළ ජලය බෙදා හැරීමේදී හා ගෘහස්ථ මට්ටමේ ජලාපවහන පද්ධතිවල කාන්දුවීම හේතුවෙන් විශාල ජල ප්‍රමාණයක් අපතේ යන බව රහසක් නොවෙයි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ, ගුණාත්මකභාවයෙන් අඩු ජල නළ සවිකිරීම්, උපාංග භාවිතය හා ප්‍රමිතියෙන් තොර ජල නළ කාර්මික කටයුතුයි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගණනය කිරීම් අනුව, ජල කාන්දුවීම් නිසා සිදුවන නාස්තිය දිනකට ජලය ඝන මීටර් දෙලක්ෂ පනස්දහසක් පමණ වෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු අනුර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින ඉදිරිපත් වෙලා තිබෙන්නේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග සම්බන්ධයෙන් යෝජනා තුනක්. ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා දැන් ඉදිරිපත් කරමින් තිබෙන්නේ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අදාළ කරුණු කිහිපයක්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මෙයටම අදාළව ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන්නට දුන් කරුණු ටික තමයි ප්‍රකාශයට පත් කළේ. ඉදිරිපත් කළ නියෝග තුන පැහැදිලි කිරීමට තමයි මේ කාරණා ඉදිරිපත් කරන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමාත් පැමිණෙනවා. ගරු ඇමතිතුමනි, මෙහි අරමුණ ටිකක් ඔබතුමා පැහැදිලි කළොත් හොඳයි.

ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් තිබෙන පයිප්පවල quality එක හොඳ නැහැ. ඒ හේතුව නිසා හුඟක් වතුර නාස්ති වෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ආනයන අපනයන (පාලන) පනත යටතේ නියෝග මේකට සම්බන්ධ වෙන්නේ කොහොමද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
එම දෙපාර්තමේන්තුවට තමයි ඒක අයිති වෙන්නේ. Import Export quality standard එක නියමාකාරයෙන් develop කරන්න ඕනෑ. [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක අදාළද කියන එකයි -

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අදාළයි, අදාළයි. අනුර දිසානායක මන්ත්‍රීතුමනි, හරි නේද? දැන් පැහැදිලියි නේ? සාමාන්‍යයෙන් ආණ්ඩුවට වරදින්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ලොකු වැරැදීමක් තිබෙනවා. [බාධා කිරීමක්] වැසිකිළි-කැසිකිළි ගැනත් මෙහි කියැවෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අපි තව පැහැදිලි කිරීමක් කරන්නම්. එතකොට ඔබතුමාට තව ටිකක් පැහැදිලි වෙයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මේ අනුව සැලකීමේදී ජල නාස්තිය අවම කිරීමෙන් ඉතිරි වන විශාල මුදලක් තවදුරටත් නළ ජලය ලබා දීමේ කටයුතු ව්‍යාප්ත කිරීම පිණිස භාවිත කළ හැකියි. එලෙස ජල නාස්තිය අවම කිරීම සඳහා ඉහළ ප්‍රමිතියෙන් යුතු ජල නළ සවි කිරීමේ උපාංග භාවිත කළ යුතු අතර, එය පිරිසිදු කරන ලද ජලය නාස්තිවීම වැළැක්වීමට මහෝපකාරී වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා, තත්ත්වයෙන් උසස් ජල නළ හා උපාංග භාවිත කළ යුතු අතර, ඒ සඳහා දේශීයව හා විදේශීයව නිෂ්පාදනය කරන ජල නළ හා සවි කිරීමේ උපාංග වෙළෙඳ පොළට නිකුත් කිරීමට පෙර ප්‍රමිතිකරණයකට යටත් කිරීම අවශ්‍ය වෙනවා.

ඉහත කරුණු සලකා තෝරාගත් ජල නළ උපාංග කිහිපයක උසස් ප්‍රමිතිය, තත්ත්ව පාලනය සහ පිරිවිතර කිරීම සඳහා 2016.02.11 දිනැතිව අංක 1953/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගවලට පාර්ලිමේන්තුවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

දැන් තේරුණා නේද? [බාධා කිරීමක්] ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා අහනකොට මමත් බැලුවා. මොකද, මේ ආණ්ඩුවට එහෙම වරදින්න විධියක් නැහැ.

රට තුළ අපද්‍රව්‍ය එක්රැස් කිරීම වළක්වනු පිණිස වාණිජමය පදනමින් විශාල වශයෙන් පාවිච්චි කළ වාහන, වාහන කොටස්, පාවිච්චි කළ පරිගණක සහ ගෘහ උපකරණ ආදිය ආනයනය කිරීමට රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව පෙලඹවීමක් නො කෙරේ. එමෙන්ම විවිධ යෝජනා ක්‍රම යටතේ ඒවායේ අරමුණුවලට පටහැනිව යමින් වාණිජමය අරමුණු සඳහා පාවිච්චි කළ වාහන හා වාහන කොටස් ආනයනය කරන අවස්ථා නිරීක්ෂණය වී ඇත. කෙසේ වුවද, එම අයිතම ආනයනය සම්පූර්ණයෙන්ම තහනම් කිරීම මෙම අවස්ථාවේ යෝජනා කළ නොහැකි අතර, විශේෂිත අවස්ථාවලදී එම ආයතනයන් සඳහා සීමිත වශයෙන් ඉඩකඩ ලබා දීමට සිදුවේ. එවැනි ආනයනයන් දැඩි උපමානයන් යටතේ අවස්ථානුකූලව සලකා බැලීම අවශ්‍ය කරුණකි. එබැවින් එවැනි විශේෂිත අයිතම සඳහා පරිපාලනමය වශයෙන් මෙහෙයුම් උපදෙස් මාලාවක් අනුගමනය කරන ලෙස ආනයන හා අපනයන පාලක ජනරාල් වෙත දැනුම්දීමට උපදෙස් දී ඇති අතර, 2016.02.11 දිනැතිව අංක 1953/28 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ආනයන හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු හා අනෙකුත් ගාස්තු නැවත ප්‍රසිද්ධියට පත් කරන ලද රෙගුලාසි සඳහා ද පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

එමෙන්ම 2016 අය වැය යෝජනා අනුව යතුරු පැදි ධාවකයන්ගේ හා ධාවන තරග සඳහා භාවිත කරන මෝටර් වාහනවල ධාවකයන්ගේ ආරක්ෂාව සලකා හිස් ආවරණ ආනයන බලපත්‍ර පාලනයට යටත් කරන ලදී. තවද සංවර්ධන ක්‍රියාවලිය සඳහා පහසුකම් සලසනු වස් විශේෂ කාර්ය වාහන ගණයේ ලා සැලකෙන දොඹකර, ලොරි සහ කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ ලොරි රථවල ආනයනය සඳහා වලංගු වයස් සීමාව වසර 7 සිට 10 දක්වා ඉහළ නංවන ලදී. මෙම තීරණය අනුව හිස් ආවරණ බලපත්‍ර පාලනයට ලක් කළ යුතු වූ අතර, විශේෂ කාර්ය වාහන ආනයනය සම්බන්ධයෙන් පැවැති ආනයන රෙගුලාසි වසර 7 සිට 10 දක්වා සංශෝධනය කළ යුතු විය. ඒ අනුව ඉහත පළමු හා දෙවන ඡේදයේ දක්වන ලද යෝජනා ක්‍රියාත්මක කරමින් 2016.06.07 වන දින අංක 1970/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරන ලද නියෝගවලට පාර්ලිමේන්තුවේ අනුමැතිය ඉල්ලා සිටීමට කැමැතියි. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[අ.භා. 1.39]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම නියෝග යටතේ කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමා මෙහි දෙවන නියෝගය යටතේ ප්‍රකාශ කළා, ලංකාවට වාහන ආනයනය කිරීමේදී යම් සීමාවන් පැනවිය යුතු වුවත් මුළුමනින්ම එම සීමාකිරීම්වලට යන්න මේ අවස්ථාව යෝග්‍ය නොවන බව. දැනට තිබෙන සීමාව තමයි සාමාන්‍ය මෝටර් රථ, එනම් කාර් වෙන්න පුළුවන්; ජීප් වෙන්න පුළුවන්; බස් රථ වෙන්න පුළුවන්. ඒවා අපේ රටට ආනයනය කිරීමේ හැකියාව තිබෙන්නේ වසර දෙකකට අඩුවෙන් පාවිච්චි කරන ලද වාහන නම් පමණයි. වසර දෙකකට වැඩියෙන් පාවිච්චි කරන ලද වාහන අපේ රටට ආනයනය කරන්න බැහැ. නමුත් කෘෂිකාර්මික වාහන, ඒවා බැකෝ යන්ත්‍ර වෙන්න පුළුවන්; අත් ට්‍රැක්ටර් වෙන්න පුළුවන්, එහෙම නැතිනම් ඔබතුමා කියපු විධියට කොන්ක්‍රීට් මිශ්‍ර කරන උපකරණ සහිත වාහන වෙන්න පුළුවන්, ඒවා අපේ රටට ආනයනය කරන්න පුළුවන්. මේක තමයි නීතිය. හැබැයි,

ඔබතුමාගෙන් මම මේ කාරණය ගැනත් දැන ගන්න කැමැතියි. 2015 ජනවාරි මාසයේ සිට මැයි 05 දක්වා විශේෂ බලපත්‍ර 480ක් ලබා දීලා තිබෙනවා. ඒ බලපත්‍ර 480 ලබා දුන්නේ කෘෂිකාර්මික වාහනවලට නොවෙයි. ඒ බලපත්‍ර 480 ලබා දී තිබෙන්නේ වැන් රථ සහ ජීප් රථ ආනයනය කිරීම වෙනුවෙනුයි.

පාර්ලිමේන්තුවේ දැන් මොන ප්‍රමිති හැදුවත්, මොන නීති හැදුවත් වැඩක් නැහැ. මොකද, පසු ගිය ජනවාරි මාසයේ 01වැනිදා සිට මැයි මාසය වෙනකොට අපේ රටට ආනයනය කළ යුතු ප්‍රමිතියට අනුකූල නොවන වාහන බලපත්‍ර 480ක් ලබා දීලා තිබෙනවා. එතකොට ඔබතුමා යටතේ නොවෙයි, මුදල් අමාත්‍යාවරයා යටතේයි මෙම මණ්ඩලය තිබුණේ. මුදල් අමාත්‍යාවරයා විසින් ඒ බලපත්‍ර ලබා දීලා තිබෙනවා. මම ඔබතුමාගෙන් දැන ගන්නට කැමැතියි, එවැනි වාහන බලපත්‍ර ප්‍රමාණයක් නිකුත් කිරීම සම්බන්ධව අමාත්‍යාංශයෙන් යම් පරීක්ෂණයක් කරලා තිබෙනවාද කියලා. මම දන්නවා සමහර වාහන බලපත්‍ර දුන්නේ තමන්ගේ හිතවත් මැතිවරණ ක්‍රියාකාරිකයින්ට බව. ඒ අය ඒක වියදම් කරලා ඡන්ද කළා. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා ඔබතුමාගෙන් දැන ගන්නට කැමැතියි 2015 ජනවාරි මාසයේ 01වෙනි දා සිට මැයි මාසය වන විට වාහන බලපත්‍ර කීයක් තමුන්නාන්සේගේ ආනයන අපනයන පාලක විසින් නිකුත් කරලා තිබෙනවාද කියලා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ප්‍රශ්නය මීට පෙර ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඇහුවා. ඒ සම්බන්ධ විස්තර, කාටද දීලා තිබෙන්නේ කියන සියලු විස්තර අපි සභාගත කළා. මේ අවස්ථාවේ මා ළඟ ඒ තොරතුරු නැහැ. නමුත් ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ වාහන බලපත්‍ර 480ක් පමණ 2015 ජනවාරි සිට මැයි මාසය හෝ සැප්තැම්බර් මාසය දක්වා දීලා තිබුණා. ඉන් පසුව නම් අපි එකක්වත් දීලා නැහැ. ඒ දීපු ඒවා පිළිබඳ විස්තර සියල්ලම අපි දැනටමත් සභාගත කරලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක තමයි ප්‍රශ්නය. මේ බලය අමාත්‍යාවරයා සතුවට ආවාට පසුව අමාත්‍යාවරයා මොකක්ද කරන්නේ? තමන්ගේ හිතවාදී කණ්ඩායම්වලට, - මා දන්නේ නැහැ ඔබතුමා ඒක කරාවිද නැද්ද කියලා. නමුත් අපට තිබෙන අද්දැකීම එයයි.- අමාත්‍යාවරයා විසින් එවැනි බලපත්‍ර ලබා දීලා තිබෙනවා. අපි පාර්ලිමේන්තුවේදී නීති සම්පාදනය කරලා අමාත්‍යාවරයෙක් සතුවට ඒ බලය දෙන්නේ ඒ අමාත්‍යාවරයාගේ ක්‍රියා කලාපය පිළිබඳව විශ්වාසයක් ඇතිව, එතුමා සමාජයේම අවශ්‍යතාව අනුව කටයුතු කරාවි කියන උපකල්පනය මත. නමුත් ඔහු තමන්ට ලැබී තිබෙන බලතල උපයෝගී කරගෙන තිබෙන්නේ තමන්ගේ ජාවාරම්කාර වුවමනාව සඳහා නම් මේ නීති, මේ බලයන් අමාත්‍යාවරයාට පැවරීමේ කිසි තේරුමක් නැහැයි කියන එක තමයි මගේ අදහස ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

එකඟ වෙනවා. ඒ නිසා තමයි අපි දැන් ප්‍රතිපත්ති මාලාවක් සකස් කරලා තිබෙන්නේ. අපට ඒ ප්‍රතිපත්ති මාලාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට පුළුවන්. එයින් පිටස්තරව කාටවත් වැඩ කරන්නට බැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

බොහොම හොඳයි. මගේ දෙවන කරුණ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරනවා ගරු අමාත්‍යතුමනි. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 1) යටතේ ඔබතුමා ප්‍රකාශ කළා, -විශේෂයෙන්ම අපේ ජල සම්පාදන අමාත්‍යතුමාත් සභාවේ ඉන්නවා- ජල සම්පාදන අමාත්‍යාංශයත් මැදිහත් වෙලා එළන ලද සමහර නළ මාර්ගවල අදාළ ප්‍රමිතිය ආරක්ෂා වෙලා නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා සමහර ප්‍රදේශවල රජය විසින් ලබා දෙන ජල ව්‍යාපෘතිවල පවා නියමිත ප්‍රමිතිය නැහැ. ඒවා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මැදිහත් වෙලා නොවෙයි ගොඩ නහලා තිබෙන්නේ. විවිධ කොන්ත්‍රාත්කරුවන්ට ලබා දීලා තිබෙනවා. කොන්ත්‍රාත්කරුවන්ට ලබාදීමේදී එළිය යුතු නළ පද්ධති පිළිබඳව යම් ප්‍රමිතියක් ලබාදීලා තිබෙනවා. නමුත් ඇත්තටම මෙම ප්‍රමිතීන්ට අනුකූලව ඒ නළ පද්ධතිය එළිලා නැහැ. ඒ නිසා තමයි අද වන විටත් සමහර ප්‍රදේශවල ජල සම්පාදන මණ්ඩලය හරහා බෙදා හරින ජලයේ විශාල අපිරිසිදු භාවයක්, මලකඩ වාගේ විවිධ විෂ මිශ්‍ර වුණු තත්ත්වයක් ඇති වී තිබෙන්නේ. එම නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා, මේ නියෝග යටතේ නළ එළීම සඳහා පමණක් නොවෙයි ලංකාවට නළ ආනයනය කිරීම සඳහා අවසර ලබාදීමේදීත් ඒ ප්‍රමිතීන් ඉතා වැදගත් ලෙස ආරක්ෂා කළ යුතුයි කියලා. අපේ රටේ ජනතාව මේ වන විටත් පානය සඳහා ජලය ලබා ගන්නා විශාල නළ පද්ධති රැසක මේ ගැටලුව මතු වෙලා තිබෙනවා. තමුන්නාන්සේ විසින් ඒ පිළිබඳවත් අවධානය යොමු කරාවි කියා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මම ඔබතුමාගේ අවධානය යොමු කරන්නට කැමැති කාරණය මෙයයි. අග්‍රාමාත්‍යතුමා සිංගප්පූරුවට ගිහිල්ලා ප්‍රකාශයක් කරලා තිබුණා, ETCA එක මේ වසර අවසන්වීමට පෙර අත්සන් කරනවා කියලා. මා දන්නා පරිදි ETCA එක සම්බන්ධ සාකච්ඡාවේ ප්‍රධානියෙක් බවට පත් වෙලා සිටි වර්තමාන මහ බැංකු අධිපතිතුමා එම තනතුර ලබා ගැනීමත් සමඟ දැන් එහි සැලකිය යුතු කාර්ය භාරයක් සමන් කැලේගම කියන මහත්මයා විසින් ඉටු කරනවා. සමන් කැලේගම මහත්මයා සමඟ එම වෘත්තීයවේදීන් කරන ලද සාකච්ඡාවකදී දැඩි ලෙස අවධාරණය කරලා තිබෙනවා, මෙම අගෝස්තු මාසය පමණ වන විට මෙම ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කරන බව. මට ඊයේ ඒ වෘත්තීයවේදීන් කණ්ඩායම මුණ ගැහුණා. ඒගොල්ලන් මීට පෙර කළ සාකච්ඡාවේදී එකඟ වෙලා තිබුණේ දෙසැම්බර් මාසය දක්වා යාවි කියලා. නමුත් ඊයේ දවසේ ඇති වුණු සාකච්ඡාවේ ප්‍රතිඵලය තමයි අගෝස්තු මාසය වන විට ETCA එක අත්සන් කිරීමට සූදානම්ව තිබෙන බව. ඒක ඇත්තද කියලා ඔබතුමාගෙන් දැන ගන්නට කැමැතියි ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමනි?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක සම්පූර්ණයෙන් වැරදියි. අගෝස්තු මාසයේ තමයි ඒ සාකච්ඡාව පටන් ගන්නේ. ඉවර වන කොට දෙසැම්බර් මාසය විතර වේවි. අගෝස්තු මාසයේ 9වැනිදා, 10 වැනිදා තමයි ඒක පටන් ගන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

බොහොම ස්තුතියි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඊළඟට, අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා ගැන ඔබතුමා මොනවා හරි කිව්වා ද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ. අර්ජුන මහේන්ද්‍රන් මහත්මයා ගැන නොවෙයි කිව්වේ. වර්තමාන සභාපතිතුමා ගැනයි කිව්වේ. අර්ජුන මහේන්ද්‍රන් මහත්මයා ගැන කථා කරන්නම් ඔබතුමා මතක් කරපු නිසා. මට එතුමා ගැන හුඟාක් කථා කරන්න අවස්ථාව තිබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහ බැංකු අධිපති ධුරය එතුමාට ලබා නොදීම පිළිබඳව ජනාධිපතිවරයා විසින් තීරණය ගනු ලැබුවේ බැඳුම්කර ගනු දෙනුවට එතුමාගේ දායකත්වයක් තිබෙනවා කියන එක මතයි. ඒ සම්බන්ධයෙන් "කෝප්" එක විසින් පරීක්ෂණයක් පවත්වාගෙන යනවා. ඒ පරීක්ෂණ අපි පැත්තකින් තියමුකෝ. හැබැයි, එතුමා නැවත පත් නොකළේ එවැනි ගනු දෙනුවකට සම්බන්ධ වුණා යැයි කියන කරුණ මතයි. එතකොට එවැනි ගනු දෙනුවකට සම්බන්ධ වුණා යැයි කියන කරුණ මත ආණ්ඩුවේ වැදගත් තනතුරක් එතුමාට ලබා නොදුන්නත් - ගරු මලික් සමරවික්‍රම මැතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය තමයි ඒ නිවේදනය නිකුත් කළාය කියා තිබුණේ; නිවැරදි කිරීම හෝ නිවේදනය කර තිබුණේ- රුකියා දසලක්ෂයක් ගොඩ නැඟීම පිළිබඳ ආණ්ඩුවේ ව්‍යාපෘතියක ප්‍රධානියා බවට අර්ජුන මහේන්ද්‍රන් මහත්මයා පත් කරනවා කියලා මාධ්‍ය හරහා වාර්තා කරලා තිබුණා මා දැක්කා.

එතැනදී ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාට ඕනෑ නිලධාරියකු පත් කිරීමේ අයිතිය තිබෙනවා. නමුත්, මා අහන්නේ මෙකයි. අර්ජුන මහේන්ද්‍රන් මහත්මයා පිළිබඳව තමුන්නාන්සේලාගේ මේ තරම් ලෙන්ගතුකමක් සහ බැඳියාවක් තිබෙන්නේ ඇයි කියන කරුණ පිළිබඳව මා ඔබතුමාගෙන් යමක් දැන ගන්න කැමැතියි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
එහෙම කිසිම බැඳීමක් නැහැ. මා එය නිවැරදි කළ බව අද පත්තරේ තිබෙනවා. ඒක සම්පූර්ණ අසත්‍යයක් කියලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කියන්නේ, අර්ජුන මහේන්ද්‍රන් මහත්මයා මහ බැංකුවේ අධිපති ධුරයෙන් ඉවත් වූවාට පසුව රජයේ කිසිදු ව්‍යාපෘතියක ප්‍රධානියකු බවට පත්-

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
වෙළෙඳ ගිවිසුම් ගැන කිසිදු සම්බන්ධයක් නැහැ කියලයි -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැනට ගත්තොත් රුකියා දසලක්ෂයක් ගොඩ නැඟීම පිළිබඳ වැඩ පිළිවෙළේ එතුමා නැති වුණාට වෙනත් ව්‍යාපෘති සඳහා - [බාධා කිරීමක්] මොකද, දැන් මේක වැදගත්. එතුමා මහ බැංකු අධිපති ධුරයට පත් නොකර සිටින්නේ, සැබවින්ම සමාජයෙන් ඇති වූ විවේචනයක් නිසයි. මා කෝප් සභාවේ අවසන් නිර්දේශය දෙන්න සූදානම් නැහැ. නමුත්, මා පෞද්ගලිකව විශ්වාස කරනවා එතුමා මේ බැඳුම්කර ගනු දෙනුවේදී ශ්‍රී ලංකා රාජ්‍යයට විශාල මුදල් ප්‍රමාණයක් අහිමි කිරීම වෙනුවෙන් වගකිව යුත්තෙක් කියලා. විශේෂයෙන් එතුමාගේ ඥාතියකුට අයථා ලෙස මුදල් උපයා ගැනීම සඳහා අවස්ථාවක් ලබා දුන්නු බව මා විශ්වාස කරනවා. එතකොට එවැනි චෝදනාවකට ලක් වූ කෙනකු රජයේ කවර හෝ ක්‍රියාවලියක පංගුකාරයකු, කොටස්කාරයකු බවට පත් කරන්න තමුන්නාන්සේලා සූදානම් ද කියලා මා දැන ගන්න කැමැතියි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මට ඒ ගැන කියන්න බැහැ. මට කියන්න පුළුවන්, මේ වෙළෙඳ ගිවිසුම් ගැන සාකච්ඡාවලට එතුමා කිසි සේත් සම්බන්ධ වෙන්නේ නැහැ කියන එකයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කියන්නේ, ඔබතුමාගේ අමාත්‍යාංශයේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්නේ නැහැ?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නමුත් ආණ්ඩුවක් හැටියට එතුමාගේ දායකත්වයක්-

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මට ඒක ගැන උත්තර දෙන්න බැහැනේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාගේ කොටස ගැන විතරයි ඔබතුමා -

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඔව්. ඒක අදාළත් නැහැමේ වෙලාවේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ. ඔබතුමා අර්ජුන මහේන්ද්‍රන් මහත්මයා ගැන මතු කරපු නිසයි මා මේ කාරණාව ඇහුවේ.

ඊළඟට, ETCA ගිවිසුම පිළිබඳ ප්‍රශ්නය සැලකිය යුතු කාලයක් තිස්සේ මේ සමාජයේ කථා බහට ලක් වෙමින් තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ වෘත්තීයවේදීන් ගණනාවක් මෙම ETCA ගිවිසුමේ තිබෙන ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳව ඉස්මතු කර තිබෙනවා. ඒ ඉස්මතු කිරීම් දේශපාලන ව්‍යාපාරයක් හැටියට පෞද්ගලිකවත් අප පිළිගන්නවා. මෙම ETCA ගිවිසුම

හරහා තමුන්නාන්සේලා අපේක්ෂා කරන රැකියා වෙළෙඳ පොළක් නිර්මාණය වනවා වෙනුවට අපේ රටේ තිබෙන රැකියා වෙළෙඳ පොළට සැලකිය යුතු බාධාවක් ඇති කරන බව අප පිළිගන්නවා. ඒ වාගේම අපි පිළිගන්නවා, අපේ රටේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට - IT - වඩා ඉන්දියාවේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ යම් ඉදිරි ගමනක් තිබෙන බව. හැබැයි, එවැනි විශේෂඥ දැනුමක් සහිත ඉන්දියානුවන් ලංකාවට එන්නේ නැහැ. මොකද, ඕනෑම කෙනෙකු පිට රට රැකියාවක් සොයා ගැනීමේදී රැකියාව පමණක් නොවෙයි අපේක්ෂා කරන්නේ. ඔවුන්ගේ ආරක්ෂාව, සමාජ තත්ත්වය, ජීවන තත්ත්වය, දරුවන්ගේ අධ්‍යාපනය කියන මේ සියල්ල සැලකිල්ලට ලක් කරලා තමයි යම් පුරවැසියකු විදේශ රටක රැකියාවක් හොයා ගන්නේ. එතකොට ඉන්දියාවේ ඉන්නවා නම් තොරතුරු තාක්ෂණය පිළිබඳව - IT - විශේෂඥයකු, ඔහුට කිසිසේත්ම ලංකාව අධ්‍යාපනය පිළිබඳව, සමාජ ජීවිතය පිළිබඳව හෝ ආරක්ෂාව පිළිබඳව තෝතැන්නක් බවට පත් වෙන්නේ නැහැ. ඔහු වෙනත් රාජ්‍යයකට යන්න බලනවා. යුරෝපය, එහෙම නැත්නම් ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය වැනි රාජ්‍යයන් කෙරෙහි තමයි ඔහුගේ වැඩි පෙලැඹීම තිබෙන්නේ. ඒ නිසා මේ ETCA ගිවිසුම හරහා ඉන්දියානු තොරතුරු තාක්ෂණයේ තිබෙන ඉහළ දැනුම ලංකාවට ගෙනෙන්න පුළුවන් කියලා තමුන්නාන්සේලා කල්පනා කරනවා නම් ඒක වෙන්නේ නැහැ. තොරතුරු තාක්ෂණය අතින් ඉහළ දැනුමක් සහිත කණ්ඩායම ලංකාවට එන්නේ නැහැ.

පළමුවැනි එක ඒක. එහෙනම් කවුද එන්නේ? මැද කණ්ඩායමක්. ඉන්දියාවේ ඉන්න තොරතුරු තාක්ෂණ දැනුම පිළිබඳ මැද කණ්ඩායම එහෙම නම් ලංකාවට එන්න ඕනෑ. නමුත්, ඒ මැද කණ්ඩායමට ඉන්දියාවේ jobs තිබෙනවා. ඒ නිසා ඔවුන් ලංකාවට එන්නේ නැහැ. එහෙනම් කවුද එන්නේ? පහළ කණ්ඩායම තමයි එන්නේ. ඒ කියන්නේ, ඉන්දියාවේ තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම තිබෙන පිරිස අපි කොටස් තුනකට බෙදුවොත්, ඉහළම දැනුමක් සහිත කණ්ඩායම ඇදී යනවා යුරෝපය ඇතුළු නවසීලන්තය, ඕස්ට්‍රේලියාව, එංගලන්තය වැනි රාජ්‍යයන්ට. මැද කණ්ඩායමට ඉන්දියාවේ jobs ඇති වෙනවා. එහෙම නම් අපට එන්නේ පහළ කණ්ඩායම.

දැන් තොරතුරු තාක්ෂණයේ නියැලෙන අපේ තරුණයන්ට විශාල bargain power එකක් තිබෙනවා. ඔවුන් company එකකට ගිහිල්ලා,"මෙන්න මගේ package එක" කියලා ඒ package එකට අනුවයි ඉල්ලන්නේ. අපේ කාලයේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන වර්ධනයට අනුව, අපේ තරුණයන්ට ඔවුන්ගේ දැනුම අනුව ඒ පිළිබඳව bargain කිරීමේ හැකියාව සෑම ක්ෂේත්‍රයකටම වඩා තිබෙනවා. ඒ නිසා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධව ලංකාවට එන්න ඉඩ කඩ තිබෙන්නේ ඉන්දියාවේ අඩියේ ඉන්න පිරිස. අඩියේ ඉන්න පිරිස ලංකාවට ආවාට පසුව ඉතාමත් අඩු වැටුපකට ඉන්දියානු කණ්ඩායම් මේකට සම්බන්ධ කර ගන්නවා. ඒකෙන් වෙන්නේ ලංකාවේ තොරතුරු තාක්ෂණය සම්බන්ධව ඉහළ නිපුණතාවක් තිබෙන අය ලංකාව අත්හැරලා යන එක. එමඟින් තොරතුරු තාක්ෂණයේ නව පරිච්ඡේදයක් ඇති වෙනවා වෙනුවට සිදු විය හැකි වන්නේ, තොරතුරු තාක්ෂණයේ දැනුම හා විශේෂඥ ඥානය තිබෙන අය රට අත්හැරලා යන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේකෙන් සිදු විය හැකි ඉතාමත් භයානක ප්‍රතිඵලය වන්නේ ඒකයි. යුරෝපා සංගමයෙන් එංගලන්තය ඉවත් වුණු අවස්ථාවේදී තමුන්නාන්සේලා තර්කය ගෙනාවේ, යුරෝපා සංගමයෙන් එංගලන්තය ඉවත් වුණු නිසා ලංකාවේ ආර්ථිකයේ ඇති වෙන පසුබැම වළක්වා ගැනීම සඳහා මේ ETCA ගිවිසුමට යන්න ඕනෑ කියලා. ඒ නිසා කිසිදු අන්තර් සබඳතාවකින් තොරව නිරන්තරයෙන්ම තමුන්නාන්සේලා හැම තත්ත්වයකදීම මේ ETCA ගිවිසුම හරහා රටේ රැකියා වර්ධනයක්, ආර්ථිකයේ වර්ධනයක් ඇති වෙනවා කියලා අපේක්ෂා කරනවා. හැබැයි මොකක්ද සිදු වන්නේ? දැනට තමුන්නාන්සේලා සාකච්ඡා කරමින් තිබෙන ETCA ගිවිසුම හරහා එවැනි රැකියා වර්ධනයක් හෝ එවැනි ආර්ථිකයේ වර්ධනයක් ඇතිවීමට කිසිදු බලපෑමක් සිදු වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මම කියන්න කැමැතියි ETCA ගිවිසුම අත්සන් කිරීමට සති දෙකකට පෙර මේ පාර්ලිමේන්තුවට දෙන්න එපා; අත්සන් කිරීමට මාසයකට පෙර මේ පාර්ලිමේන්තුවට දෙන්න එපා. හැබැයි, තමුන්නාන්සේලා ගිවිසුම සකස් කරලා අවසන් නම්, අඩුම තරමේ මාස 3කට පෙරවත් ඒ පිළිබඳව වෘත්තීයවේදීන්, මේ රටේ විද්වතුන්, මේ රටේ පොදු ජනයා සමඟ සාකච්ඡාවන් කිරීම සඳහාත් -මේක ඔබතුමාගේ garment factory එකක් පිළිබඳ ගිවිසුමක් නොවෙයි නේ. එහෙම ගිවිසුමක් නොවෙයි. මේ රටේ රැකියා වෙළෙඳ පොළත්, ආර්ථිකය පිළිබඳවත් ගිවිසුමකටයි මේ යන්නේ.- සංවාදයක් කිරීම සඳහාත් ගිවිසුමට පෙර වාගේම ගිවිසුම සකස් කළාට පසුවත් සැලකිය යුතු කාලයක් ලබා දිය යුතුයි. ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමනි, ඔබතුමා ඒ සඳහා සූදානම් ද කියලා දැන ගන්න කැමැතියි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්ව අදහසට මම එකඟ වෙන්නේ නැහැ. අපි මේවා ගැන දැනටමත් IT අංශයේ වැඩ කරන අයගේ Chambersවලදීත් සාකච්ඡා කරලා තිබෙනවා. අපේ IT exports ගණන බැලුවම ඩොලර් මිලියනයක් පමණ තිබෙනවා. ඒ ගොල්ලන්ගේ අදහස වන්නේ, මෙය ඩොලර් මිලියන 5ක් පමණ 2020 වසර අවසන් වන්නට කලින් ගෙන යන්න පුළුවන් කියලායි. ඒවා කරන්න නම් BPO, KPO ඉන්දියාවෙන් මෙහාට ගෙන්වන්න ඕනෑ කියලා ඒ ගොල්ලන් කියනවා. ඒකෙන් කියන්නේ අපේ අයට තව තව රැකී රක්ෂා ලැබෙනවා. එම නිසා මෙතුමාගේ අදහසට මම එකඟ වෙන්නේ නැහැ. අපි හැම තිස්සේම අලුතින් හිතන්න ඕනෑ. හැමදාම ඉන්න තැන අපට ඉන්න බැහැ. අපේ අදහස් හුහාක් වෙනස්. ඒ නිසා තමයි අපි මේ විධියට කටයුතු කරන්නේ. අනෙක් කාරණය නම්-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ඔබතුමාගේ කාලයේදී කියන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

අනෙක් කාරණය නම්, මේ ගිවිසුම ගැන අපි නිතර නිතර සාකච්ඡා කරලා තිබෙනවා. Professionalsලාත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. Trade Chambers එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. ඒ වාගේම අපිත් එක්ක ඇවිල්ලා සාකච්ඡා කරන්න කියලා දේශපාලන පක්ෂවලටත් අපි ආරාධනා කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමන්ලාටත් අපි මෙම ලිපිය ඉදිරිපත් කරලා තිබෙනවා. ජේවීපී එකටත් අපි කියලා තිබෙනවා, අත්සන් කරන්න ඉස්සර වෙලා Working Group එකක් හැටියට වරින්වර අපි මේ ගැන සාකච්ඡා කරලා තීරණ ගනිමු කියලා. තවමත් ඒකට ප්‍රතිචාරයක් ලැබිලා නැහැ. ඔබතුමන්ලාට මේ ගැන එතරම්ම උනන්දුවක් තිබෙනවා නම්, අපිත් එක්ක ඇවිල්ලා වැඩ කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමන්ලාගේ අදහස් වෙනස් බව මම පිළිගන්නවා. වෙනස් නිසාම තමයි 1977දී තමුන්නාන්සේලා ආරම්භ කරපු ආර්ථික ගමන අද මහා ණය කන්දරාවක හිරවුණු, ණය උගුලක හිරවුණු, නිෂ්පාදනය කඩා වැටුණු ප්‍රධාන විදෙස් වෙළෙඳාමේ පංගුව ගෘහ සේවිකාවන් යැවීමේ පංගුවක් බවට පත් කර ගත්තු රාජ්‍යයක් ගොඩ නඟලා තිබෙන්නේ. ඒ අපේ අදහස්වලට වඩා තමුන්නාන්සේලාගේ අදහස් වෙනස් නිසයි. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අදහස්වල වෙනස්කම් තිබෙන්න පුළුවන්. අදහස්වල වටිනාකම් තිබෙන්නේ වෙනස්කම මත නොවෙයි. ඒ අදහස් රටේ ආර්ථිකයටත්, මේ රට ගොඩ නැංවීමටත්, ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමටත් මොන තරම් වැදගත් ද කියන කරුණ මතයි. ඒ කරුණ මත තමයි අදහස්වල නිවැරදිතාව රඳා පවතින්නේ. හැබැයි, තමුන්නාන්සේලා විසින් අනුගමනය කරන ලද අදහස්වලින් සිදු වී තිබෙන දේ තමයි සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය ඉතාම පහත් අඩියකට මේ වන විට ඇද වැටිලා තිබෙනවාය කියන එක. අදහස් වෙනස් වුණාට වැඩක් නැහැ. අදහස් හොඳද නරකද කියලා මනින්න පුළුවන්කම තිබෙන්නේ ඒවා ජන ජීවිතය උසස් කරන්න මොන තරම් දායක වුණාද නැද්ද කියන සාධකය මත. මා නැවතත් ඔබතුමාට කියන්න ඕනෑ ETCA ගිවිසුම පිළිබඳ ප්‍රශ්නය ගැන. තමුන්නාන්සේලා ලියුමක් එවලා තිබුණා. අනෙක් පක්ෂවලටත් ලියුමක් යවලා තිබුණා. තමුන්නාන්සේලා ලියුම යවන්න.

පළමුවන කාරණය මේකයි. තමුන්නාන්සේලා තමයි නිලධාරී කණ්ඩායමක් සමඟ සාකච්ඡා කරන්නේ. සාකච්ඡා කරලා, එකඟතා සහිත ලියවිල්ල ඉස්සර වෙලා අපට දෙන්න. එහෙම නැතුව ඒ සාකච්ඡාවල පාර්ශ්වකරුවන් ලෙස කටයුතු කරන්න අපි සූදානම් නැහැ. සමාජයේ ගොඩ නැඟෙන යම් විවේචනයක් තිබෙනවා නම් ඒ විවේචනය වසා ගැනීම සඳහා අරයත් එක්කත් කථා කරනවා, මෙයත් එක්කත් කථා කරනවා, මෙයත් මුණ ගැහෙන ආකාරයේ උපක්‍රමවලට හසු වෙන්න අපි සූදානම් නැහැ. එවැනි උපක්‍රමයක් තමයි මෙහි අරමුණ වෙලා තිබෙන්නේ. ඒ නිසා ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමනි, අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමන්ලා නිලධාරී කණ්ඩායමත් එක්ක සාකච්ඡා කරලා, ඒ සාකච්ඡාවේ අවසන් ලියවිල්ල අපට ලබා දෙන්න කියලා. ඒ අවසන් ලියවිල්ල පිළිබඳව අපට අපේ අදහස් කියන්න පුළුවන්. ඊට පසුව ඒ අදහස් සැලකිල්ලට ලක්කොට තමුන්නාන්සේලා අවසන් ගිවිසුමක් සකස් කරනවා නම්, අඩුම තරමේ ඒ ගිවිසුම අත්සන් කිරීමට මාස තුනකටවත් පෙර එය අපට ලබා දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මීට පෙර "Thirteen plus"ද, "Thirteen minus"ද කියලා හිටපු ජනාධිපතිතුමාගේ කාලයේදී සංවාදයක් ඇති වුණු වෙලාවේදී මට මතකයි ගරු අග්‍රාමාත්‍යතුමා කිව්වා, "මම නම් ඔය තරම් ඇද ඇද ඉන්නේ නැහැ. පෑන ගත්තා අත්සන් කළා." කියලා. ඔබතුමන්ලාට මතක ඇති. "මම නම් ඔහොම ඇද ඇද ඉන්නේ නැහැ. පෑන ගත්ත ගමන් අත්සන් කළා" කිව්වා. ඒක තමයි ඔබතුමන්ලාගේ ස්ථාවරය. ඒ නිසා බෙල්ල ළඟට ගෙනැල්ලා හිර කරලා, "මෙන්න ගිවිසුම. ලබන සතියේ අපි මේ ගිවිසුම අත්සන් කරනවා" කියලා කියන්න එපා. අවසන් ගිවිසුම සකස් කළාට පසුව මාස තුනක කාලයක්වත් අවශ්‍යයි, ඒ පිළිබඳ සංවාදයක් ඇති කරන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ගිවිසුම සකස් කරලා ලබන සඳුදා අත්සන් කරනවා කියලා කියාවි. එහෙම තමයි කරන්නේ. සමාජ මතයක් ගොඩ නැඟෙන්න දෙන්නේ නැහැ; ඒකේ ඇතුළාන්තය පිළිබඳව සාකච්ඡා කරන්න ඉඩකඩ ලබා දෙන්නේ නැහැ. ඒ හරහා ගිවිසුම සම්මත කර ගැනීම සඳහායි තමුන්නාන්සේලාගේ උපාය මාර්ගය සකස් වෙලා තිබෙන්නේ. ඒ නිසා මම දැන ගන්න කැමැතියි, අවසන් ගිවිසුම සකස් කළාට පසුව ඒ පිළිබඳව සමාජ සංවාදයක් ආරම්භ කරන්න අඩු තරමේ මාස තුනක කාල පරිච්ඡේදයක්වත් ලබා දෙනවාද කියලා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි අපි ආරාධනා කළේ, ඇවිල්ලා අපිත් එක්ක සාකච්ඡා කරන්න කියලා. වැරදි විධියකට යනවා නම්, ඕනෑ වෙලාවක ඉවත් වෙන්න පුළුවන්. එහෙම සාකච්ඡා කරන්නේ නැතුව මේ ගැන විවේචනය කරන එක මම හිතන විධියට සම්පූර්ණයෙන්ම වැරදියි. අපිත් එක්ක සාකච්ඡා කරලා එකඟ වුණා නම්, ඒ අනුව ඉන්දියාව සමඟත්, අනෙක් රටවල් සමඟත් ඒ සාකච්ඡාව දිගටම ගෙන යන්න පුළුවන් වෙනවා. මොනවා හරි දෙයක් වෙන්නේ නැත්නම්, ඒ වෙලාවට ඉවත් වෙන්න පුළුවන්. අනෙක් එක, ඒ ගිවිසුම අත්සන් කරන්න මාසයකට කලින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අපට පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අවසන් ගිවිසුම සකස්කොට අත්සන් කිරීමට මාසයකට පෙර ඔබතුමන්ලා එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඉදිරිපත් කරනවාද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

හැම දෙනාටම මම ආරාධනා කරනවා, ඇවිල්ලා මේ ගැන සාකච්ඡා කරන්න කියලා. විටින් විට සාකච්ඡා කරන්න. හැම stage එකේදීම අපි ඉදිරිපත් කරන්නම්, මොනවාද වෙන්නේ කියලා. අපට මේකේ හංගන්න දෙයක් නැහැ. අපි හැම වෙලාවේම වෘත්තීයවේදීන් -professionalsලා- සමඟත්, Trade Chambers සමඟත් නිතරම කථා කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, ඒ සාකච්ඡාවල ස්වභාවය පිළිබඳව මා දන්නවා. සාකච්ඡාවලට සහභාගි වුණු පිරිස් අපට හමු වෙනවා. එම සාකච්ඡාවලදී සමහර කණ්ඩායම් වෘත්තීයවේදීන්ගේ අදහස්වලට සාවධානව ඇහුම්කන් දෙන්නවත් සූදානම් නොවන ආකාරයට තමයි ප්‍රතිචාර දක්වා තිබෙන්නේ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. ඒක තමයි මම කිව්වේ, "ඔබතුමන්ලාත් කවුරු හරි එවන්න" කියලා. එතකොට දැන

ගන්න පුළුවන් නේ, මොනවාද වෙන්නේ කියලා. එක එක් කෙනා කියන දේවල් අහන්න අවශ්‍ය නැහැ නේ. එතැනට ඇවිල්ලා සාකච්ඡා කළාම ඔක්කෝම දැන ගන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, මේක ඔබතුමන්ලාගේ ආණ්ඩුව. ඔබතුමන්ලා තමයි මේ ආර්ථික ප්‍රතිපත්තිය තීරණය කරලා තිබෙන්නේ, ඉන්දියාවත් සමඟ වෙළෙඳ ගිවිසුමක් අත්සන් කිරීම හරහා තමයි රටේ ආර්ථිකය ගොඩ නඟා ගත හැකි වන්නේ, රැකිරක්ෂා උත්පාදනය කළ හැකි වන්නේ කියලා. අපි මූලික ලෙසම ඒ ප්‍රතිපත්තියත් එක්ක ගැට ගැහෙන්නේ නැහැ. ප්‍රතිපත්ති පරස්පර දේශපාලන ව්‍යාපාර දෙකක ගිවිසුමක අඩු ලුහුඬුකම් ගැන සාකච්ඡා කිරීම, එක් ආර්ථික ප්‍රතිපත්තියක වුවමනාව මත ගොඩ නැඟිලා තිබෙන ගිවිසුමක් පිළිබඳව සාකච්ඡා කිරීම එලක් නැහැ. ආර්ථික ප්‍රතිපත්තිය ලෙස ගත්තොත් එතැන තිබෙන්නේ දේශපාලන ව්‍යාපාර දෙකක්. ඒ නිසා ගිවිසුමේ "අ"යන්න, "ආ"යන්න පිළිබඳව සාකච්ඡා කිරීමෙන් එලක් නැහැ.

ගිවිසුම සකස් කරලා ඔබතුමන්ලා ඉදිරිපත් කරන්න. ගිවිසුමේ හොඳ නරක පිළිබඳව, වෙනස් විය යුතු තැන් පිළිබඳව අපට අපේ අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්. ගිවිසුම එවැනි වෙනස් කිරීමකට භාජන කළ යුතුයි කියන එක තමයි අපගේ ස්ථාවරය වන්නේ. මේ කරුණු සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන ගමන් පිළිතුරු ලබා දීම පිළිබඳව මා එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු අග්‍රාමාත්‍යතුමා අද උදේ මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ යම් පෞද්ගලික සමාගමක් එක්ක ඒකාබද්ධ කොට මෙහෙයවීම සඳහා සැලැස්මක් තිබෙනවා." කියලා. මා දන්නා පරිදි, චීන රජයත් එක්ක කරන ලද සාකච්ඡාවලදී මත්තල ගුවන් තොටු පොළ අවට ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාවක් තමුන්නාන්සේලා ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි, මට තේරෙන්නේ නැත්තේ මත්තල ගුවන් තොටු පොළ රජයේ භාරයේම තබා ගෙන ඒ ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා අනෙක් ආයෝජකයින් කැඳවන්න බැරි ඇයි කියායි. ගරු අගමැතිතුමා පාර්ලිමේන්තුවේදී කියපු දෙය තමයි, මත්තල ගුවන් තොටු පොළ පෞද්ගලික සමාගමක් එක්ක ඒකාබද්ධ කොට එය මෙහෙයවමින් දස ලක්ෂයක් සංචාරකයින් දකුණට ගෙනෙන්න සැලැස්මක් තිබෙනවා කියන එක. මත්තල ගුවන් තොටු පොළ පෞද්ගලීකරණය කිරීමත්, සංචාරකයින් ඒමත් අතර තිබෙන සම්බන්ධය මොකක්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මත්තල ගුවන් තොටු පොළට සංචාරකයින් එන්නේ නැත්තේ එය රජයේ භාරයේ තිබෙනවාය කියන කාරණය මත පදනම්ව නොවෙයි. ඒ නිසා ඒ ගුවන් තොටු පොළ රජයේ භාරයේ තිබෙනවාද, පෞද්ගලික අංශය භාරයේ තිබෙනවාද, එහෙම නැත්නම් ඒ අංශ දෙකම ඒකාබද්ධ වෙලා මෙය මෙහෙයවනවාද කියන සාධකය නොවෙයි, වැදගත් වෙන්නේ. වැදගත්කම තිබෙන්නේ, එම මත්තල ගුවන් තොටු පොළ ආශ්‍රිතව කරනා සැලසුමේයි. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලා යෝජනා කර තිබෙන්නේ, මෙය පෞද්ගලික අංශයත් එක්ක ඒකාබද්ධ කිරීමටයි. එසේ පෞද්ගලික අංශයත් එක්ක ඒකාබද්ධ කිරීමේ අරමුණ මොකක්ද කියා මම දැන ගන්න කැමැතියි. අද තමුන්නාන්සේලා විශාල ණය බරක හිර වෙලා තිබෙනවා. ඒ ණය වාර්ෂිකව පරිපූර්ණ වෙනකොට තමුන්නාන්සේලාට ණය පංගුව ගෙවා ගන්න බැරි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍යයෙන් අපේ ගම්වල ජීවත් වෙන වැසියෙක් ණය වෙලා, ඔහුට ණය ගෙවා ගන්න බැරි වුණාම ඔහු කියනවා, "මගේ පොල් අක්කර කිහිපයක් තිබෙනවා, ඒක ලියා ගන්න" කියා. එහෙම නැත්නම් ඔහු කියනවා, "මගේ වැන් එක තිබෙනවා, ඒක ලියා ගන්න" කියා. ගරු ඇමතිතුමනි, දැන් තමුන්නාන්සේලාත් කරන්නේ මොකක්ද? තමුන්නාන්සේලා විශාල ණය උගුලක හිර වෙලා තිබෙනවා. ණය පංගුව ගෙවා ගන්න බැරි වෙලා තිබෙනවා. මත්තල ගුවන් තොටු පොළ ගොඩ නඟන්න චීනයෙන් ණය අරගෙන තිබෙනවා. හම්බන්තොට වරාය ගොඩ නඟන්න චීනයෙන් ණය අරගෙන තිබෙනවා. නොරොච්චෝලේ බලාගාරය ගොඩ නඟන්න චීනයෙන් ණය අරගෙන තිබෙනවා. දැන් තමුන්නාන්සේලාට ණය ගෙවා ගන්න විධියක් නැහැ. තමුන්නාන්සේලා මොකද කියන්නේ? " ණයට හිලව් වෙන්න මත්තල ගුවන් තොටු පොළ තබා ගන්න, ණයට හිලව් වෙන්න හම්බන්තොට වරාය තබා ගන්න" කියා කියනවා. මේක සාමාන්‍යයෙන් අපේ රටේ දුගීභාවයට පත් වෙලා, අතේ වියදමවත් සොයා ගන්න බැරි, එදිනෙදා ජීවත් වෙන්න බැරි ගම් වැසියෙක් සතු ආර්ථික දැක්මක්. මේක අලුත් දැක්මක් නොවෙයි. ගම්වැසියෙකුට තමන්ගේ ණය ගෙවා ගන්න බැරිව තිබෙනවා නම් ඔහු ණයහිමියාට කියනවා, "මෙන්න මේ දේපළ ගන්න; මේ ඉඩම ලියා ගන්න; මේ බයිසිකලය තබා ගන්න" කියා.

ගරු ඇමතිතුමනි, දැන් තමුන්නාන්සේලාත් මොකද කරන්නේ? චීනයෙන් ගත් ණය වෙනුවෙන් විශාල ණය කන්දක හිර වෙලා තිබෙනවා. ණයෙන් භාගයක් ගෙවීම වෙනුවෙන් මත්තල ගුවන් තොටු පොළ ගන්න කියනවා; හම්බන්තොට වරාය ගන්න කියනවා. [බාධා කිරීමක්] මේ මොකක්ද? මේ නිකම් තමුන්නාන්සේලා උකස් බඩු කඩේකට බඩු ගන්න යනවා වාගේ දෙයක් නේ. ඒ ආර්ථික ප්‍රතිපත්තිය නේ, සකස් කරලා තිබෙන්නේ. හම්බන්තොට වරායේ අයිතිය සම්බන්ධව නොවෙයි, ප්‍රශ්නය තිබෙන්නේ. ඒ වරායේ අයිතිය පිළිබඳව ප්‍රශ්නයක් එතැන පැන නඟින්නේ නැහැ.

මම දැක්කා, අගමැතිතුමා සිංගප්පූරුවට ගිහින් ඇවිල්ලා සිදු කර තිබුණු ප්‍රකාශයක්. එතුමා කියා තිබුණා, හම්බන්තොට වරාය සංවර්ධනය කරන්න සිංගප්පූරු රජයෙන් විශාල දායකත්වයක් සපයනවා කියා. සිංගප්පූරුව තමයි, හැම දාමත් හම්බන්තොට වරාය සංවර්ධනය කිරීම සම්බන්ධව තිබෙන ප්‍රධාන බාධකය. ඒක තමයි, ඇත්ත කථාව. ඒ සඳහා ඉතිහාසයේ ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. සිංගප්පූරුව තමයි, හම්බන්තොට ප්‍රදේශයේ වරායක් දියුණු වීම පිළිබඳව, ලංකාව නාවික කේන්ද්‍රස්ථානයක් වීම පිළිබඳව විශාල කුකුසකින්, සැකයකින් සහ විරෝධයකින් හැම දාමත් කටයුතු කරන්නේ. හැබැයි, අගමැතිතුමා කියනවා, හම්බන්තොට වරාය දියුණු කිරීම සඳහා සිංගප්පූරුව එකඟ වුණාය කියා. බොරු හොඳේ! එය සිංගප්පූරුව විසින් නැවතත් අපේ රටේ හම්බන්තොට වරාය ඔවුන්ගේ වරාය වුවමනාවන් වෙනුවෙන් කඩා වැටීවීමේ සැලැස්මක්. ඒ නිසා මම දැන ගන්න කැමැතියි, තමුන්නාන්සේලා මත්තල ගුවන් තොටු පොළෙන් පංගුවක් චීනයට දීම සඳහා, හම්බන්තොට වරායෙන් පංගුවක් චීනයට දීම සඳහා, නොරොච්චෝලේ බලාගාරයේ පංගුවක් චීනයට දීම සඳහා මේ සකස් කර තිබෙන සැලසුම මොකක්ද කියා.

ගරු මලික් සමරවික්‍රම මැතිතුමනි, තමුන්නාන්සේ අවස්ථා කිහිපයකදී චීන සංචාරයේ යෙදුණා. මම ඒ ගැන දන්නවා. ඒ සංචාරවල අරමුණු බවට පත් වෙලා තිබුණේ, මේ ව්‍යාපෘතීන් ණය වෙනුවෙන් හිලව් කිරීමයි. ඒ සඳහා තමුන්නාන්සේ දැනට අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියා මා දැන ගන්න කැමැතියි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම නම් හිතන්නේ නැහැ, අගමැතිතුමා ඒ විධියේ ප්‍රකාශයක් කර තිබුණාය කියා. නමුත් මම කියන්න කැමැතියි, Hambantota Integrated Development Plan එක ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියා. අපි ළඟදීම ඒ plan එක ඉදිරිපත් කරනවා. තවම සාකච්ඡා කර ගෙන යනවා. තව සුමාන දෙකකින්, තුනකින් මුළු plan එකම අපි ඉදිරිපත් කරනවා. එතකොට දැන ගන්න පුළුවන්, අපි කොහොමද එය සිදු කරන්නේ කියා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අගමැතිතුමා අද උදේ පාර්ලිමේන්තුවේදී කිව්වා -

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
අද උදේ මම ගරු සභාවේ සිටියේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, අගමැතිතුමා අද උදේ පාර්ලිමේන්තුවේදී කිව්වේ, මත්තල ගුවන් තොටුපළ පෞද්ගලික අංශයත් එක්ක ඒකාබද්ධව මෙහෙයවනවා කියායි. මට ලැබී තිබුණු තොරතුරු අනුව දැන ගන්න ලැබුණේ, එය සම්පූර්ණයෙන්ම පෞද්ගලික අංශයට පැවරීමට යන බවයි. නමුත් අගමැතිතුමා කිව්වා, පෞද්ගලික අංශයත් එක්ක ඒකාබද්ධව මත්තල ගුවන් තොටුපොළ දියුණු කරලා සංචාරකයින් දස ලක්ෂයක් ගෙන්වා ගැනීම සඳහා සැලැස්මක් තිබෙනවා කියා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඔව්, public-private partnership එකක් හැටියට.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සංචාරකයින් ඒම හෝ නොඒම රඳා පවතින්නේ, මේ ගුවන් තොටුපොළ කාටද කියන එක මත නොවෙයි කියන එකයි මගේ තර්කය වන්නේ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට දියුණු කරන්න plan එකක් අපට තිබෙනවා. ඒ අනුව කර්මාන්තශාලා සියල්ලම එතැනට ගෙනෙනවා. ඒක කරන්නේ කොහොමද කියා අපි තව සති දෙකක්, තුනක් ඇතුළත ඉදිරිපත් කරන්නම්. ඒ ගැන කලබල වෙන්න අවශ්‍ය නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි. ගරු ඇමතිතුමනි, හම්බන්තොට වරාය පිළිබඳව ඉස්සෙල්ලාම කැබිනට් මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කළේ, හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියයි. ඔබතුමාත් ඒ ගැන දන්නවා. එතුමිය හම්බන්තොට වරායේ පළමු සැලැස්ම බවට පත් කර තිබුණේ, භාණ්ඩ ගොඩ බෑමේ වරායකට වඩා bunkering services කියන එකයි. ඒ කියන්නේ නැව් සඳහා තෙල් ගැසීමේ ප්‍රධාන ව්‍යාපෘතිය තමයි, හම්බන්තොට වරායේ වඩාත් යෝග්‍ය අරමුණ වූයේ. ඒක අපිත් පිළිගන්නවා. හම්බන්තොට සීමාව අයිනෙන් නැව් දෙසීයයකට වඩා ප්‍රමාණයක් යනවාය කියා මතයක් තිබෙනවා. ඒ නිසා ඒ නැව්වලට සැපයුම් ලබාදීම තමයි වඩා යෝග්‍ය කියලා කියනවා. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය කැබිනට් මණ්ඩලයට මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ පළමු කැබිනට් පත්‍රිකාව තමයි හම්බන්තොට වරායේ දෙවැනි පියවර මඟින් හම්බන්තොට වරාය කුඩා මධ්‍යස්ථානයක් බවට පත් කරලා bunkering services සඳහා දියුණු කරන්න ඕනෑ කියන එක. ඒ නිසා හම්බන්තොට වරායෙන් වැඩිම ප්‍රයෝජනයක් ගැනීමට හැකියාව තිබෙන්නේ නැව්වලට තෙල් සැපයීම සඳහා කටයුතු කිරීමෙන් කියා අපි අදත් විශ්වාස කරනවා. මා දන්නා පරිදි මීට පෙර සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගේ කාලයේ නැව්වලට තෙල් සැපයීමේ අයිතිය තෙල් සංස්ථාවට ලබාදෙන්න කියලා තෙල් සංස්ථාව විසින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. මොකද, මා දන්නා පරිදි වරාය මැදිහත්වෙලා ඒ ප්‍රදේශයේ තෙල් ටැංකි 8ක් ගොඩනඟමින් තිබෙනවා. හැබැයි, සිද්ධ වෙමින් තිබෙන්නේ මොකක්ද? Bunkering services. අන්න ඒක තමයි වැඩිම ලාභ ලැබිය හැකි දේ. තෙල් සංස්ථාව තිබෙන කොටත් Lanka Marine Services එකෙන් තමයි තෙල් සංස්ථාව වැඩියෙන්ම ලාභ ලැබුවේ. ඒ ලාභය නිසා තමයි අඩු මිලට තෙල් දුන්නේ. නැව් තෙල් අංශය Lanka Marine Services කියලා කොම්පැනියක් බවට පත් කරලා ඒක ජෝන් කීල්ස් මුදලාලිට විකුණුවා. පසුව නඩුවක් මඟින් පවරාගත්තා. නඩුවෙන් පස්සේ නැවතත් විකුණුවා. ඒකයි සිද්ධ වුණේ. ඒ නිසා හම්බන්තොට වරායේ නැව්වලට තෙල් ගැසීමේ අංශය වැදගත්. මා දැන් තමුන්නාන්සේලාගෙන් දැනගන්න කැමැතියි, නැව්වලට තෙල් සැපයීමේ අවසරය තෙල් සංස්ථාවට ලබා නොදී - ඇමතිතුමා ඒක දන්නවා. - එම අවසරය IOC එකට සහ තවත් පෞද්ගලික සමාගම් වෙත ලබා දෙන්න තීරණය කර තිබෙන්නේ ඇයි කියලා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
එහෙම තීරණයක් කර නැහැ. ඔබතුමා දන්නවා, -

ගරු චන්දිම වීරක්කොඩි මහතා (බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Chandima Weerakkody - Minister of Petroleum Resources Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව - CPC - සහ බනිජ තෙල් තොග ගබඩා පර්යන්තය - CPSTL - යන දෙකටම බලපත්‍ර තිබෙනවා. 2008 වර්ෂයෙන් පස්සේ ප්‍රථම වතාවට අපි ඒ දෙකෙන්ම නැව් තෙල් වෙළෙඳාම ආරම්භ කරන්න දැන් වැඩ කටයුතු කරමින් යනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කොතැනද?

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
අපි කොළඹින් ආරම්භ කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
නැහැ, මම අහන්නේ මේකයි. වරාය මැදිහත් වෙලා හම්බන්තොට ටැංකි 8ක් හදනවා. ඒ ටැංකි අටෙන් එක ටැංකියක් හෝ තමුන්නාන්සේලාට පවරලා තිබෙනවාද?

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සන්දිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody)
නැහැ, පවරලා නැහැ. මේ මොහොතේත් අපි ගෙනාපු තෙල් ඒ ටැංකි කිහිපයක තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
එක කාරණයයි මට දැනගන්න ඕනෑ. දැනට වරාය අධිකාරිය මැදිහත් වී ගොඩනඟා තිබෙන තෙල් ටැංකි යොදාගෙන රජය සතුව නැවි තෙල් අංශයක් පිහිටුවලා - එක්කෝ Ceylon Petroleum Corportion එකට වෙන්න පුළුවන්, පිටින් වෙන්න පුළුවන් - ඒ හරහා නැව්වලට තෙල් සැපයීම කරනවාද? එහෙම නැත්නම් එම තෙල් ටැංකි ප්‍රමාණය පෞද්ගලික අංශයට පවරා දෙන්න තමුන්නාන්සේලා කටයුතු කරනවාද කියලා දැන ගන්න කැමැතියි. එච්චරයි.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සන්දිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody)
අපෙත් යෝජනාවක් තිබෙනවා. ඒ ගැන අපි අධ්‍යයනයක් කරමින් ඉන්නවා. ඉදිරියේදී අපි ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්න අදහස් කරනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
මගේ යෝජනාව මේකයි. නැවි තෙල් අංශය තමයි හම්බන්තොට වරායේ වැඩියෙන්ම ප්‍රයෝජනයට ගත හැකි අංශය. ඒ නිසා තමුන්නාන්සේලා නැවි තෙල් අංශය පෞද්ගලීකරණය කිරීම, එහෙම නැත්නම් විදෙස් නැව්වලට තෙල් සැපයීම සඳහා තිබෙන ඒ ටැංකි කිහිපය පෞද්ගලික අංශයට පැවරීම සඳහා දරන ප්‍රයත්නය නතර කළ යුතුයි කියන එක තමයි මගේ යෝජනාව. එක්කෝ ඒක තෙල් සංස්ථාවට පවරන්න ඕනෑ. එහෙම නැත්නම් නැවි තෙල් සැපයීම සඳහා වෙනම අධිකාරියක් ගොඩනඟලා එය ප්‍රධාන වෙළෙඳ පොළක් බවට පත් කරන්න ඕනෑ. ඒක කරන්න පුළුවන්. ඒ සඳහා මැදිහත් වෙන්න කියා ඉල්ලා සිටිනවා.

තෙල් සංස්ථාවේ භාර අමාත්‍යතුමාත් සිටින නිසා අවසන් වශයෙන් මා මෙන්න මේ කාරණයත් මතු කරන්න කැමැතියි. ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමාට මේක සම්බන්ධයි. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි 103ක් තිබෙනවා.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සන්දිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody)
මම උත්තර දෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
නැහැ, මෙතුමාගෙන් ගිවිසුමත් එක්කම දැන ගන්න ඕනෑ. [බාධා කිරීමක්] නැහැ, නැහැ, ඔබතුමාගේ වෙළෙඳ ගිවිසුමත්,-

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සන්දිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody)
අද සවස 3.00ට අපේ ලිහිසි තෙල් කර්මාන්තායතනයට මුල්ගල තියන්න තිබෙනවා. දැන් වේලාව 2.10යි. මම මුතුරාජවෙලට යන්න ඕනෑ. ඒ හේතුව නිසා මම දැන් යනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
කමක් නැහැ, ඔබතුමා යන්න.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සන්දිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody)
තෙල් සංස්ථාව ගැන කථා කරන කොට මම නැඟිටලා ගියා කියලා කියන්න එපා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ. මම මේ පිළිබඳව ජාත්‍යන්තර වෙළෙඳ ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. 2002-2004 ඔබතුමන්ලාගේ රජය කාලයේ, කරු ජයසූරිය මැතිතුමා බලශක්ති අමාත්‍යවරයා හැටියට කටයුතු කළ කාලයේ එම තෙල් ටැංකි ටික ඉන්දියානු IOC එකට පවරා දුන්නා. ඒ එක ටැංකියක තෙල් මෙට්‍රික් ටොන් 10,000ක ධාරිතාවක් තිබෙනවා. එය දෙවන ලෝක යුද්ධය කාලයේ මේ ප්‍රදේශයේ ගොඩනඟන ලද විශාලම තෙල් ටැංකි සංකීර්ණය වෙනවා. එක ටැංකියක මෙට්‍රික් ටොන් 10,000ක් ගබඩා කරන්න පුළුවන්. ටැංකි 117ක් තිබුණා. දැන් 103ක් ඉතාම හොඳ තත්ත්වයේ තිබෙනවා. එම ටැංකි ජාලයම IOC සමාගමට පවරා දුන්නා. [බාධා කිරීමක්] මා කියන්නම්. IOC සමාගමට පවරා දුන්නාට පස්සේ, ඒ ගිවිසුම අත්සන් කළේ තෙල් සංස්ථාවේ ලේකම්වරයා. නමුත් ඊට අදාළ ඉඩම තිබුණේ වරාය අධිකාරිය සතුවයි. ඒ නිසා IOC සමාගමට මෙහි අධිකාරිත්වය ගියේ නැහැ. ඒ නිසා දැන් මුළු තෙල් ටැංකි ජාලයම විනාශයට ලක් වෙමින් තිබෙනවා.

මා දන්නවා, තෙල් සංස්ථාවේ නිලධාරි කණ්ඩායමක් ගිහිල්ලා සමීක්ෂණයක් කළ බව. ඒ අනුව අදත් ඔවුන් එතැනට ගිහිල්ලා තිබෙනවා. තෙල් පටවන්න පුළුවන් ටැංකි 17ක් තිබෙනවා. එතැන දුම්රිය ප්‍රවාහන පහසුකම් තිබෙන නිසා කොළඹ වරායේ ඇති වෙන තදබදය වාගේ තදබදයක් ඇති වෙන්නේත් නැහැ. අද කොළඹ නගරයේ නළ පද්ධතියේ විශාල ගැටලුවක් ඇතිවෙලා තිබෙනවා. ඒ ගැටලුවටත් අපට මෙයින් විසඳුමක් ලැබෙනවා. ත්‍රිකුණාමලය වරාය කියන්නේ විශාල ගැඹුරක් සහිත වරායක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුழුක්කළින් பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
මම මගේ කථාව අවසන් කරනවා. විශාල නැවි ප්‍රමාණයක් එතැනට ගෙනෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම දුම්රිය රේල් පාර තිබෙනවා. ඒ නිසාම ඉතාම හොඳ ප්‍රවාහන පහසුකම් සකස් කරන්න පුළුවන් මධ්‍යස්ථානයක් වාගේම ඉතා හොඳ ගබඩා සංකීර්ණයක් එහි තිබෙනවා. මෙම ගබඩා සංකීර්ණය යළි IOC සමාගම වෙත ලබා දෙනවාද නැද්ද කියන කරුණ පිළිබඳව මම තමුන්නාන්සේගෙන් දැනගන්න කැමැතියි.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා කිව්ව විධියට 2002 අවුරුද්දේ හෝ 2003 අවුරුද්දේ ඉන්දියාවත් සමඟ MOU එකක් අත්සන් කරලා තිබෙනවා. මට හරියටම මොන අවුරුද්දේද කියලා මතක නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
2003 අවුරුද්දේ.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ඔව්. 2003 අවුරුද්දේ ඉන්දියාවත් සමඟ MOU එකක් අත්සන් කරලා තිබෙනවා, ටැංකි 15ක් IOC එකට දෙන්න. තවත් ටැංකි 90ක්ද, 93ක්ද තිබෙනවා. ඒ සියල්ලම 50:50 ඒගොල්ලන්ගේ subsidy එකත් එක්ක, ලංකාවේ CPC සමාගමයි, IOC එකයි දියුණු කරන්න ඒ කාලයේදීම එකඟ වෙලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තවම මොකුත් වෙලා නැද්ද?

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මම දන්නා විධියට දැන් පටන් ගන්න යනවා, 30:30 ඒවා use කරන්න. එක වරකට 30ක් වාගේ ප්‍රමාණයක්. ඒ ඔක්කොම සුද්ද කරලා -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නමුත් 2003 අවුරුද්දේ තමයි අපි MOU එක අත්සන් කළේ. මේ වනකොට අවුරුදු 13ක් ගතවෙලා තිබෙනවා.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
2004න් පස්සේ අපි නොවෙයි ආණ්ඩුව කළේ. ඔබතුමා ඒ ආණ්ඩුවේ හිටියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

[අ.භා. 2.13]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ අනුර දිසානායක මැතිතුමා කියපු කාරණයක් එක්ක මම මගේ කථාව ආරම්භ කරන්න සූදානම්. මොකද, එතුමා මේ bunkering සම්බන්ධව කථා කළා. අපි දන්නා විධියට සමාගම් 12කට විතර මේ bunkering licences දීලා තිබෙනවා. හැබැයි, වෙරළ ආසන්න - inshore - කොටසේ bunkering සඳහා තමයි මේ අවසරය ලබා දීලා තිබෙන්නේ. ගැඹුරු ජාත්‍යන්තර මුහුදේ - offshore - bunkering සඳහා මේ දක්වා කිසිදු bunkering licence එකක් දීලා නැහැ. මේ සම්බන්ධව අදත් අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කළා. එතැනදී නීති පිළිබඳව වාගේම අලුතින් පනත් ගෙන ඒමේ අවශ්‍යතාව පිළිබඳව කරුණු ඉස්මතු වුණා. ඉදිරියේදී ජාත්‍යන්තර මුහුදේදී bunkering කරන්න පුළුවන් වන ආකාරයට ලංකා නැව් සංස්ථාවට අවශ්‍ය අනුමැතිය දීමට නව රජය කටයුතු කරයි කියලා අප හිතනවා.

හම්බන්තොට වරාය නාවික ක්ෂේත්‍රයට ඉන්ධන සැපයීම - bunkering - ඉලක්ක කර ගත් වරායක් කියලා එතුමා කිව්වා. මම හිතන විධියට ඒකත් එක කොටසක් විතරයි. අපිට bunkering කරලාම හම්බන්තොට වරාය ලාභදායී තත්ත්වයට ගෙනෙන්න බැහැ. තව ගොඩක් ව්‍යාපාර අවශ්‍යයි, හම්බන්තොට වරාය ලාභදායී ව්‍යාපාරයක් බවට පත් කරන්න. විශේෂයෙන්ම නාවික ක්ෂේත්‍රයේ ගොඩක් ව්‍යාපාර තිබෙන බව අපි දන්නවා.

අද අපේ කොළඹ වරාය ඉතාමත්ම කාර්යක්ෂම වරායක් බවට පත් වෙලා තිබෙනවා. ලෝකයේ ප්‍රධාන වරායන් 30ක් තිබෙනවා. එයින් 26වැනි ස්ථානයට 2015 වසරේ කොළඹ වරාය පත්වෙලා තිබුණා. ගිය අවුරුද්දේ කොළඹ වරාය 27වැනි ස්ථානයේ තිබුණේ. හැබැයි, ප්‍රධාන වරායන් 30න් වැඩිම ප්‍රගතියක් වාර්තා කරපු වරාය බවට කොළඹ වරාය පත්වෙලා තිබෙනවා. ඒ තත්ත්වය තුළ තවදුරටත් කොළඹ වරාය නවීකරණය කිරීම, ඉදිරි වසර 10, 15 සඳහා සැලසුම් සකස් කිරීම කළ යුතුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොළඹ වරාය ලබන ආදායමින් තමයි හම්බන්තොට වරායේ ණය සහ පොලී වාරිකය ගෙවන්නේ. හම්බන්තොට වරාය ඉදිරියේදී ලාභ ලබන ආයතනයක් බවට පත් කර ගැනීම සඳහා ගරු අගමැතිතුමා දැඩිව කටයුතු කරගෙන යන බව අපි දන්නවා. නැඟෙනහිර අප්‍රිකානු රටවල වරායන් ගණනාවක් තිබෙනවා. ඒ නිසා නැඟෙනහිර අප්‍රිකානු රටවල් පිළිබඳව දැන් අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. පසු ගිය කාලය තුළ අපේ ලංකාවේ වරාය ක්ෂේත්‍රයට ව්‍යාපාර සැපයුවේ ආසියානු කලාපයේ රටවල වරායන්වල මෙහෙයුම් එක්කයි. හැබැයි, අපි නැඟෙනහිර අප්‍රිකානු රටවල් එක්ක සම්බන්ධතා තර කර ගත්තාට පස්සේ අපේ ගාලු වරාය තවදුරටත් ශක්තිමත් කරන්න පුළුවන් වෙයි කියලා අප විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපි තවත් යෝජනාවක් කරනවා. හම්බන්තොට වරායත් එක්ක විශාල ඉඩම් ප්‍රමාණයක් තිබෙන නිසා ඒ ප්‍රදේශය වාහන සම්බන්ධයෙන් නිදහස් කලාපයක් -duty-free zone එකක්- බවට පත් කරන්න අපට පුළුවන් නම් වැදගත් වනවා. මොකද, ජපානයේ සිට දකුණු අප්‍රිකානු මහාද්වීපයේ තිබෙන රටවලට ගෙනයන වාහන ගොඩක් වෙලාවට ඩුබායි වෙළෙඳ පොළට ගිහිල්ලා එතැනින් තමයි බෙදා හරින්නේ. හම්බන්තොට තිබෙන ඉඩත් එක්ක ඒ ප්‍රදේශය වාහන සම්බන්ධයෙන් නිදහස් කලාපයක් බවට පත් කර ගත්තොත් -

duty-free zone එකක් බවට පත් කර ගත්තොත් - ව්‍යාපාරිකයන්ට, වෙළෙඳුන්ට මෙතැන hub එකක් බවට පත් කර ගෙන එතැනින් අනෙක් රටවලට වාහන බෙදා හැරීමට, වාහන නිකුත් කිරීමට ඉඩ කඩ විවෘත වෙනවා.

සාම්පූර් ගල් අඟුරු බලාගාරය අපට බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. දැන් ඒක ක්‍රියාත්මක නොවන මට්ටමට ඇවිල්ලා තිබෙනවා. මම හිතන විධියට සාම්පූර් ගල් අඟුරු බලාගාරය ක්‍රියාත්මක වන්නේ නැත්නම් ඒ සඳහා වඩාම සුදුසු තැනක් තමයි හම්බන්තොට වරාය ආශ්‍රිත ප්‍රදේශය. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරවනවා. මොකද, නිරිත දිග මෝසම් සුළං සහ ඊසාන දිග මෝසම් සුළං ක්‍රියාත්මක වන රටාව අනුව හම්බන්තොට ප්‍රදේශයේ ගල් අඟුරු බලාගාරයක් පිහිටෙව්වොත් කිසිදු අවස්ථාවක රට අභ්‍යන්තරයට ඒ dust එක හෝ ash එක එන්නේ නැහැ. ඒ නිසා ඒ සඳහාත් අපට හම්බන්තොට වරාය යොදා ගන්න පුළුවන්.

නාවුක ක්ෂේත්‍රයේ තිබෙන තවත් ව්‍යාපාරයක් තමයි කල් ඉකුත් වූ නෞකා යකඩවලට කැපීමේ ව්‍යාපාරය -scrap -. හම්බන්තොට වරායේ ඉඩ කඩ තිබෙන නිසා අපට කල් ඉකුත් වූ නෞකා යකඩවලට කැපීම සඳහා -scrap iron සඳහා- අංගනයක් සකස් කරන්නත් හම්බන්තොට වරාය යොදා ගන්න පුළුවන්. හම්බන්තොට වරායෙන් ලාභ ලබන්න නම් ඒ විධියට අපට තවත් ගොඩාක් ක්ෂේත්‍ර ගැන අවධානය යොමු කරන්න වෙනවා.

ගරු අගමැතිතුමා ඉලක්ක කර ගෙන තිබෙනවා, චීනයත් එක්ක එකතු වෙලා හම්බන්තොට දිස්ත්‍රික්කයත් මොණරාගල දිස්ත්‍රික්කයත් කර්මාන්ත කලාපයක් බවට පත් කර ගෙන දියුණු කරන්න. ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයන් මොනවා කිව්වත් අපට public-private partnershipsවලට යන්නේ නැතිව සමහර අංශ දියුණු කරන්න බැහැ. ඒකට හොඳම උදාහරණය තමයි පසු ගිය කාලයේ නැව් සංස්ථාව මිල දී ගත් "සිලෝන් බ්‍රීස්" සහ "සිලෝන් ප්‍රින්සස්" කියන නෞකා දෙක. පසු ගිය වසර පහ, හය ඇතුළත ලාභ ලැබූ නැව් සංස්ථාව නැවතත් අලාභ ලබන තත්ත්වයට පත් වන්න කටයුතු කරන තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. 2014 තමයි ලෝක වෙළෙඳ පොළේ මේ නැව් ගනු දෙනුව සිද්ධ වන්නේ. මෙට්‍රික් ටොන් 65,000කට ආසන්න ප්‍රමාණයක් පටවන්න පුළුවන් මේ නෞකා දෙක එක නෞකාවක් ඩොලර් මිලියන 35ක් වාගේ වෙන්න ඩොලර් මිලියන 70කට තමයි මිලදී ගෙන තිබෙන්නේ.

අපි මේ ගැන සොයා බැලුවා. අද මේ සම්බන්ධයෙන් ආංශික අධීක්ෂණ කාරක සභාවේදී නැව් සංස්ථාවේ නිලධාරීන්ගෙන් ප්‍රශ්න කළාම ඒ අය කිව්වේ ඒ අවස්ථාවේ ලෝක වෙළෙඳ පොළේ තිබුණු මිලත් එක්ක ඩොලර් මිලියන 26ක විතර මිලකට ඒ එක නැවක් මිල දී ගැනීමේ හැකියාව තිබුණා කියලා. අද ඒගොල්ලෝ උත්සාහ කරනවා මේ නැව් දෙක ලාභ ලබන්න කටයුතු කරන්න. මොකද, ඒගොල්ලන්ට එක දවසකට බැංකු ණය සඳහා පොලිය සහ වාරිකය ඩොලර් 15,616ක් වෙනවා. මේ වන විට ඩොලර් 7,500ක් වාගේ මිලකට නැව කුලියට දීලා තිබෙනවා. ඒ වාගේම මෙහෙයුම් වියදම් විධියට එක නැවකට දවසකට ඩොලර් 4,825ක් යනවා. ඒ අනුව ඩොලර් 21,000ක් විතර නැවක් වෙනුවෙන් එක දවසකට වියදම් කරන්න වෙනවා. නැව් දෙකේ බැංකු ණය සඳහා වාරිකයත්, පොලියත් ගෙවන්න operational cost එක වශයෙන් එපමණ මුදලක් ගෙවන්න වෙනවා. හැබැයි දවසකට ඩොලර් 7,500ට තමයි නැවක් කුලියට දීලා තිබෙන්නේ. එතැනම ඩොලර් 15,000ක් දවසට පාඩු වෙනවා. මේ විධියට බලනකොට වසරකට ඩොලර් මිලියන හතහමාරක් විතර පාඩු වෙනවා මේ නැව් දෙක තබා ගැනීම හරහා. මේකට හේතුව පසු ගිය ආණ්ඩුවේ දූෂිත ගනුදෙනුවක් වෙන්න පුළුවන්. ඩොලර් මිලියන විසිහයක් වටිනා නැවක් ඩොලර් මිලියන 36කට ගත්තාය කියන්නේ එතැන විශාල දූෂණයක් තිබෙනවා කියන එකයි. ඒ දූෂණය තිබුණත් දැන් මේවා ලාබදායි ලෙස පවත්වා ගෙන යන්නේ කොහොමද කියලා අපි කල්පනා කරනවා. මේ සඳහා වූ එක යෝජනාවක් තමයි, මේ නැව් දෙක පෞද්ගලික අංශයත් එක්ක හවුල් ව්‍යාපාරයකට යෙදවීම. එහෙම කරද්දී මොනවාටද මේකට පෞද්ගලික අංශය සම්බන්ධ කර ගන්නේ කියලා ජනතාව කෑ ගහන්න පුළුවන්. නමුත් අපි දන්නවා, පෞද්ගලික අංශයත් එක්ක හවුල් ව්‍යාපාරවලට ගිය ව්‍යාපාර ඉතාම හොඳ තත්ත්වයේ තිබෙන බව.

උදාහරණයක් හැටියට කියන්න පුළුවන්, ලංකා විදුලිබල මණ්ඩලයට අනුබද්ධ ආයතනයක් වන, ලංකා විදුලිබල මණ්ඩලයට කොටස් 63ක් තිබෙන LTL සමාගම. ඒ සමාගම ඉතාම හොඳින් ඒ ව්‍යාපාරය කර ගෙන යනවා. LTL සමාගම ලංකාවේ විතරක් නොවෙයි, බංගලිදේශය වැනි රටවල, ආසියානු රටවල, දකුණු අප්‍රිකානු රටවල, විදුලි බලාගාර ඉදිකිරීම්, ගල් අඟුරු බලාගාර ඉදිකිරීම් වැනි ව්‍යාපාරවලට අත ගසා තිබෙනවා. ලෝකයේ විශාල ලෙස පිළිගන්නා උසස් තත්ත්වයේ ට්‍රාන්ස්ෆෝමර්ස් නිෂ්පාදනය කරන ආයතනයක් බවට ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගම පත්වෙලා තිබෙනවා. අපි මේ වාගේ public-private partnerships වලට යද්දී, හැම දෙයකම අසුබවාදී පැත්ත දකින ජනතා විමුක්ති පෙරමුණ නිතරම දකින යක්ෂයා මේ තුළත් දකින විධියයි අපට පෙනෙන්නේ. අපි රටක් විධියට ඉස්සරහට යද්දී නිතරම පෞද්ගලික අංශයේ ආයෝජනවලට, පෞද්ගලික අංශයත් සමග හවුල් ආයෝජනවලට යන්න වෙනවාය කියන එක මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි භාර ගත්තේ බොහොම සුන්දර රටක් නොවෙයි. අපේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, ලංකාවේ වරායක් දියුණු වෙනවා දකින්න සිංගප්පූරුව කැමැති නැහැ කියලා. හැබැයි, ලංකාවත් සිංගප්පුරුවත් කියන්නේ තැන් දෙකක පිහිටි රටවල් දෙකක්; මට්ටම් දෙකක තිබෙන රටවල් දෙකක්. 1970 දශකයේ සිංගප්පූරුවත් අපේ රටේ මට්ටමේ තිබුණා වෙන්න පුළුවන්. නමුත් අද අපට ගව් ගණනාවක් ඉස්සරහින් සිංගප්පූරුව ඉන්නේ. සිංගප්පූරුව - ලංකාව හරහා තමයි සේද මාවත තිබෙන්නේ. මේ ජාත්‍යන්තර මුහුදු මාවතක් ඔස්සේ පිහිටි රටවල් දෙකක්. ඒ රටවල් දෙක එකතු වෙලා වරාය හරහා ආයෝජන කරන කොට ප්‍රශ්නයක් වෙන එකක් නැහැ. චීනය, සිංගප්පූරුව, ලංකාව හරහා යන නැව් මාර්ගය තුළ තිබෙන වරායන් විධියට යම් කිසි වැඩසටහනක් ක්‍රියාත්මක කරනකොට එහි වාසිය අපේ රටට ගන්න පුළුවන් කියන කාරණය මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

අද අපි රටක් විධියට බොහොම එඩිතර තීන්දු ගණනාවක් ගෙන තිබෙනවා. විශේෂයෙන් ETCA ගිවිසුම සම්බන්ධයෙන් ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමාත්, ගරු අගමැතිතුමාත් බොහොම සාධනීය දේවල් කරගෙන යනවා. පසු ගිය දවස්වල ETCA ගිවිසුම ගැනත් බොරුවට කෑ ගැහුවා. නමුත් මේ ගිවිසුමෙන් අපේ රටට විශාල ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාවක් ලැබෙනවා. පසු ගිය කාලයේ කිව්වා, මේ ගිවිසුම් නිසා ඉන්දියානු ජාතිකයෝ මේ රටට ඇවිත් මේසන් වැඩ කරන්න ගනියි, කම්කරු වැඩ කරන්න ගනියි, බේකරි වැඩ කරන්න ගනියි කියලා. නමුත් එහෙම තත්ත්වයක් උදාවන්නේ නැහැ. පසු ගිය කාලයේ ambulance සේවා සපයන ඉන්දියානු සමාගමක් මේ රටට ආවා. ඒ ambulance එක්ක ඉන්දියාවේ නර්ස්ලා, ඉන්දියාවේ ඩ්‍රයිවර්ස්ලා මේ රටට එනවාය කිව්වා. නමුත් සිද්ධ වුණ දේ ඊට හාත්පසින්ම වෙනස්.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

පසු ගිය දවස්වල Science subjectsවලින් Advanced Level සමත් වුණු ලංකාවේ ළමයි 250ක් ඉන්දියාවේ හයිද්‍රාබාද් විශ්වවිද්‍යාලයට ගිහින් දවස් 52ක් Emergency Medical Technicians ලා හැටියට පුහුණු වුණා. ඒ වාගේම දැන් රියැදුරන් පුහුණු වෙමින් ඉන්නවා. අපේ රටට ලැබුණු රැකියා අවස්ථා තමයි මේවා. හැම දාම විපක්ෂය - ඒකාබද්ධ විපක්ෂය වෙන්න පුළුවන් - මේවා දකින්නේ වැරදි කෝණයෙන්. හැබැයි, පසුව මේවායේ ඇත්ත තත්ත්වය හඳුනා ගන්නවා.

මේ හැම එකක්ම ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා, ජනාධිපතිතුමාත් එක්ක එකතුවෙලා මේ රට ඉස්සරහට ගෙන යන්න ගත්ත බොහොම එඩිතර තීන්දු විධියට අපි දකින්න ඕනෑ. අපි රටක් විධියට ඉස්සරහට යන්න නම් යම් කිසි රැඩිකල් තීන්දුවලට යන්න වෙනවා. සාම්ප්‍රදායික ක්‍රමයම ඉස්සරහට ගෙන යන්න සූදානම් ආණ්ඩුවක් නොවෙයි මේ ආණ්ඩුව.

ගරු අධ්‍යාපන ඇමතිතුමා පාසල් ළමයින්ගේ නිල ඇඳුම පිළිබඳව තීන්දුවක් ගනිද්දී මීන්ස්සු කෑ ගැහුවා. අද සියලු දෙනාම ඒක හොඳයි කියනවා. ඒ වාගේම, අපේ ගොවීන්ට පොහොර සහනාධාරය මුදලින් දෙනකොට විශාල කලබගෑනියක් කළා; ගොවියෝ කොළඹට ගෙනාවා. අපි අද කියනවා පුළුවන් නම් ගොවියෙක් ගෙනැත් ඒකට විරුද්ධව ජන මතයක් තිබෙනවාය කියලා පෙන්වන්න කියලා. නමුත්, අද කවුරුවත් ඒකට නැහැ. අද සියලු ගොවියෝ ඒ ක්‍රමයට කැමැතියි; ඒ ක්‍රමය වැළඳගෙන තිබෙනවා. යම් ක්‍රමයක් අලුතින් අත්හදා බලද්දී එකපාරටම විරුද්ධතා එනවා තමයි. නමුත්, ටික දවසකින් ජනතාව තේරුම් ගන්නවා මේවා බොහොම සාධනීය, රටට හිතකර, ජනතාවට හිතකර දේවල් බව. අන්න ඒ කාරණය මම ඔබතුමන්ලාට මතක් කරනවා.

දැන් මේ පාර්ලිමේන්තුවේ කැබිනට් ඇමතිවරු බහුතරයක් ඉන්නවා. අපි නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විතරයි. දැන් මන්ත්‍රීවරු කීපදෙනායි ඉන්නේ. අනික් පැත්තේ -ඒකාබද්ධ විපක්ෂයේ- "ඡායා මායා" කැබිනට් එකේ කට්ටිය ඉන්නවා. ඡායා මායා කැබිනට් එකේ අය දැන් සැලසුම් කරනවා, නුවර ඉඳන් පෙළපාළියක් ඇවිත් මේ ආණ්ඩුව පෙරළන්න. හැබැයි, හොඳට මතක තියාගන්න, පෙළපාළි ඇවිත් මේ ආණ්ඩුව පෙරළන්න බැරි බව.

ඔබතුමන්ලාට අපි කියන දේ පිළිගන්න බැරි නම්, ගිහිල්ලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගෙන් පාඩමක් ඉගෙන ගන්න කොහොමද ආණ්ඩු පෙරළන්නේ කියලා. මහින්ද රාජපක්ෂ මහත්මයා හිටපු අරලියගහ මන්දිරයේ ඩෙස්ක්, බංකු අස්සේ මැති ඇමතිවරු හැංගිලා ඉඳිද්දී තමයි එතුමා නොබියව එළියට බැහැලා ඒ ආණ්ඩුව පෙරළුවේ. ඒ නිසා මේක පෙළපාළි ගිහින් පෙරළන්න පුළුවන් ආණ්ඩුවක් නොවෙයි. මේක තුනෙන් දෙකකට වඩා බලයක් තිබෙන ශක්තිමත් ආණ්ඩුවක්. ඡායා මායා කැබිනට් එකේ ඇමතිකම් දරන මහත්වරු ඒ කාරණයත් හිතේ ධාරණය කරගෙන ඉන්න.

ඔබතුමන්ලාගේ පක්ෂයේ වර්තමාන නායක ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, ඒ කාලයේ ඔබතුමන්ලාගේ පක්ෂයේ හිටපු නායිකාව වන ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියත් මේ රටට ශක්තියක් දෙමින් අද මේ යහ පාලන ආණ්ඩුවේ ඉන්නවා. මා හිතන විධියට ඒ අය ඔබතුමන්ලා ඔය පාද යාත්‍රා යන තුරු තමයි බලාගෙන ඉන්නේ. ඊයේ පෙරේදා දකුණේ හිටපු, කීකරු නැති ඩී.වී. උපුල් ඇමතිතුමාත් ඉවත් කළා. ඒ නිසා ඔබතුමන්ලාත් පොඩ්ඩක් හිතා බලා කටයුතු කරන්න. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ ආණ්ඩුවට විරුද්ධව අනවශ්‍ය වැඩ කරන්න ගිහින් ඔබතුමන්ලාගේ මන්ත්‍රී ධුරයත් අහෝසි වෙයි. ඒ නිසා ඒ කාරණයත් කල්පනාවේ තබාගෙන සිහි නුවණින් යුතුව කටයුතු කරන්න. ඡායා මායා කැබිනට් එකේ අය අද ඉන්නේ අඩි ගණනක් උඩින්. ඔබතුමන්ලා හෙට ආණ්ඩුව අරගෙන අමාත්‍යාංශයේ වැඩ කටයුතු කරන්න බලාගෙනයි ඉන්නේ. ඡායා මායා කැබිනට් එකේ ඉන්න සමහරුන්ට ඇමතිකම් දුන්නොත් ලංකාවට "අබ සරණයි" කියලා තමයි කියන්න වන්නේ. එහෙම අය විපක්ෂයේ ඉදිරිපස අසුන්වල ඉඳගෙන ඉන්න හැටි මට මේ අවස්ථාවේ පෙනෙනවා. අපූරුයි! කැලණිය දිහාවේ හරක් පට්ටි බලපු අයට කැබිනට් ඇමතිකමක් ඇත්තටම දුන්නොත් අපූරුවට තියෙයි. එහෙම වුණොත් මේ රටට, "අබ සරණයි" කියන්න තමයි වන්නේ.

ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් එක්ව හදපු මේ යහ පාලන ආණ්ඩුව තුළින් මාස 60කින් අලුත් රටක් හදන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණාට පස්සේ, මේ අවුරුදු හතරහමාරෙන් පසුවත් එන්නේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවක්ය කියන කාරණය මම මේ අවස්ථාවේ මතක් කරනවා. ඒ නිසා ඔබතුමන්ලා විපක්ෂය පැත්තට වෙලා ඡායා මායා කැබිනට් එකේ සැතපිලා, සිහින මව මවා ඉන්න. තව අවුරුදු හතරහමාරකින් පසුව ඒ හීනෙන් ඇහැරිලා ආයෙත් විපක්ෂයට වෙලා ඔබතුමන්ලාට ඡායා මායා කැබිනට් හදාගෙන ඉන්න පුළුවන්. ඒ නිසා විහිළු සපයන්න එපා, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුනි. මේ ආණ්ඩුව කරන වැඩවලට උදව් කරන්න; සහයෝගය දෙන්න.

කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමා ඔන්න දැන් අපේ ආංශික අධීක්ෂණ කමිටුවලට එනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. එතුමා ඒ කමිටුවලට ඇවිත් අපිත් එක්ක එකතු වෙලා සහයෝගයෙන් වැඩ කරනවා. ඔබතුමන්ලාත් ඒවාට ඇවිත් වැඩ කරන්න. ඒවා හදලා තිබෙන්නේ ඡායා මායා කැබිනට් හදන්න නොවෙයි. ආංශික අධීක්ෂණ කාරක සභා හදලා තිබෙන්නේ විපක්ෂයේ අයටත් තනතුරු, සභාපතිකම් දෙන්නයි. ඒ නිසා ඒ කාරක සභාවලට හොඳ යෝජනා අරගෙන ඇවිත්, තිබෙන ගැටලු විසඳාගෙන ඉස්සරහට යන එකයි ඔබතුමන්ලාට කරන්න තිබෙන්නේ. ඒ නිසා ඡායා මායා කැබිනට් හදන්න ඕනෑ නැහැ. ආංශික අධීක්ෂණ කමිටු හදලා තිබෙන්නේ විපක්ෂයේ අයටත් ඒ ශක්තිය දෙන්නයි. ඒ නිසා ඡායා මායා කැබිනට් ඕනෑ නැහැ. මේ පාර්ලිමේන්තුව ශක්තිමත් කරන්න ගත්ත තීන්දුත් එක්ක එකතු වෙලා කටයුතු කරන්න කියලා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිමින්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 2.30]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වයඹ පළාත නියෝජනය කරන අපේ නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කළාට පස්සේ මට කථා කරන්න අවස්ථාව ලැබී තිබෙනවා. මේක නිකම් දිට්ඨධම්ම වේදනීය කර්මය වාගෙයි. ඊයේ මම කථා කළාට පසුව එතුමා කථා කළා. ඒ නිසා අද එතුමාගේ කථාවෙන් පසුව අදහස් ප්‍රකාශ කරන්න මට අවස්ථාව ලැබීම ගැන සන්තෝෂ වෙනවා.

නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා ලොකු වේදනාවකින් කථා කළා. මොකද, එතුමා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ලොකු බරක් ඇදපු, මහන්සි වුණු කෙනෙක්. රූපවාහිනී විවාදවලට පවා එතුමා සම්බන්ධ වුණා. අද කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කරන එතුමාට තිබෙන වේදනාව සාධාරණයි කියලා මා පිළිගන්නවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

හිටපු ක්‍රීඩා ඇමතිතුමනි, අපි ආණ්ඩුව හදන්න දායක වුණු අය. අපට තනතුරු ඕනෑ නැහැ. අපි මේ ආණ්ඩුව හදන්න ශක්තිය දීපු අය. ඒක ගැන අපට [බාධා කිරීමක්] ගෞරවයක් තිබෙනවා. ඒ ඇති. වැඩ කරන්න අපට තනතුරු ඕනෑ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

එතුමා කිව්වා, "තනතුරු ඕනෑ නැහැ. ගෞරවය තිබෙනවා" කියලා. හැබැයි, කැන්ටීන් එකේදී නම් කියන්නේ, "තනතුරු බම්බු ගහන්නද? ගෞරවය තියාගෙන මොනවා කරන්නද?" කියලායි. තනතුරු ඕනෑ කියලා අපිත් එක්කයි කියන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඒ ගැන වැඩිය කියන්න යන්නේ නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඊයේ ක්‍රීඩා පනත යටතේ නියෝග සම්බන්ධව වූ විවාදයේදී කථා කරමින් කිව්වා, හම්බන්තොට ටෙනිස් පිටියක් සහ සුගතදාස ක්‍රීඩා පිටිය පිළිබඳව. එම විවාදයේදී අපි කථා කරන කොට ඔබතුමා හිටියේ නැහැ. ඒ නිසා ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මම ඔබතුමාට යෝජනා කරනවා, ක්‍රීඩා අමාත්‍යාංශයේ යම් දූෂණයක් හෝ අක්‍රමිකතාවක් සිදු වෙලා තිබෙනවා නම් ඔබතුමන්ලාගේ සිරිකොත පොලීසියේ තිබෙනවා FCID එකක්. ඔබතුමා ගිහින් ඒකට පැමිණිල්ලක් භාර දෙන්න. පැමිණිල්ල භාර දුන්නාට පසුව ඒ පිළිබඳ විභාග කරන කොට අපිත් එන්නම්. ඔය සියලු චෝදනා පාර්ලිමේන්තුවේ කියන්න එපා. ඔබතුමන්ලා අපව හිරේට දාන්න හදපු තැනක් තිබෙනවා. ඒ තමයි, FCID එක. ඒ නිසා එහි ගිහින් පැමිණිලි කරන්න. පැමිණිලි කරලා ඒ ගැන හොයා බලන්න. පාර්ලිමේන්තුවේදී වීරයෝ වාගේ කථා කරන්න එපා කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා ඉදිරිපත් කර තිබෙන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග සම්බන්ධව කථා කරන මේ අවස්ථාවේදී මමත් අදහස් කීපයක් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වනවා. මේ යහ පාලන ආණ්ඩුවේ ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව මුලින්ම ගැසට් කර තිබුණේ මුදල් අමාත්‍යාංශය යටතේයි. මුදල් ඇමතිතුමා යටතේ තමයි, ආනයන අපනයන පාලකතුමා කටයුතු කළේ. එකපාරම ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව ගැසට් එකක් මඟින් මුදල් ඇමතිවරයාගෙන් අයින් කරලා මලික් සමරවික්‍රම අමාත්‍යතුමා යටතේ තිබෙන සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයට භාර දුන්නා. ආනයන අපනයනයි, විදේශ ප්‍රවර්ධනයි ගැළපෙන දෙකක් නොවෙයි. දැන් මේ මොකක්ද වුණේ? මුදල් ඇමතිතුමාට ඒක මුලින් භාර දුන්නා. දුන්න ගමන් කෙළින්ම permit විශාල ප්‍රමාණයක් මුදලට වික්කා. එක එක්කෙනාට වාහන බලපත්‍ර දුන්නා. ලක්ෂ 5ට, 6ට, 10ට බලපත්‍ර විකුණන්න පටන් ගත්තා. තමුන්නාන්සේලාගේ යහ පාලන ආණ්ඩුව වාහන බලපත්‍ර 600 ගණනක් දීලා තිබෙනවා. අගමැතිතුමාට මේ ගැන දැනුම් දුන්නා; ජනාධිපතිතුමාට මේ ගැන දැනුම් දුන්නා. ජනාධිපතිතුමා වහාම කළේ, මුදල් ඇමතිවරයාගෙන් ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව ගලවලා, ගැසට් එකක් ගහලා සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ ඇමතිතුමාට භාර දුන් එකයි.

ඔබතුමන්ලාගේ වසන්ත අලුවිහාරේ රාජ්‍ය අමාත්‍යතුමා බලන්න. ඔබතුමන්ලා එක්සත් ජාතික පක්ෂයේ හොඳ පතාක අලියෝ. බලන්න, තමුන්නාන්සේලාගේ මේ ආණ්ඩුව කරන වැඩ ගැන කොච්චර දුක හිතෙනවාද? අන්න, එක්සත් ජාතික පක්ෂයේ පිටු පස ආසනවල ඉන්නවා හොඳ බඩු. අපේ කේ.කේ. පියදාස මන්ත්‍රීතුමා, රංජිත් අලුවිහාරේ මන්ත්‍රීතුමා, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මොන තරම් කැප කිරීම් කරපු අයද? අර බලන්න, අද පිටු පස පේළියට දාලා. අද ඉන්නේ පිටු පස පේළියේ. ඒගොල්ලෝ ඉන්න ඕනෑ එකැනද? ඒගොල්ලන්ට හිමි තැන එකැනද? ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ ප්‍රශ්න ටික කථා කරනවාට අඩු ගණනේ අපට ගණනක් දෙන්න. අද මෙතුමන්ලා කථා කරන්නේ නැහැ, කම්මුලේ අත තියාගෙන කනගාටුවෙන් ඉන්නවා. මේ ආණ්ඩුවට ජන්දය දුන්නේ ඒකට නොවෙයි. මේ ආණ්ඩුවට රටේ මිනිස්සු ජන්දය දුන්නේ ඒකට නොවෙයි. අගමැතිතුමා, මුදල් ඇමතිවරයාගෙන් මහ බැංකුව ගන්නවා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට මුදල් ඇමතිවරයාගෙන් මහ බැංකුව අගමැතිතුමා ගන්නවා. ඇයි? අර බලන්න, අපේ මිත්‍ර දයාසිරි ජයසේකර ඇමතිතුමා නැඟිටලා යනවා. එතුමන්ලාටත් තේරෙනවා. ලජ්ජයි.

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)

COPE එකට යන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

COPE එකට ගෙනෙන්න, බලපත්‍රවලින් ගහපු එක ගැනත්. ආණ්ඩුවේ ඇමතිවරු අද නැඟිටලා යනවා. එච්චර කනගාටුයි. මගේ හිතවත් නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, පසු ගිය අවුරුද්දේ ජනවාරි 08වැනි දා මේ රටේ මිනිසුන් වෙනසක් අපේක්ෂාවෙන් ඔබතුමන්ලාට ජන්දය දුන්නා. ඔබතුමන්ලාට ජන්දය දුන්නේ පසු ගිය කාලයේ චෝදනා එල්ල කළාට නොවෙයි. ආනයනය අපනයන පාලකතුමාගේ තනතුර පාවිච්චි කරලා මුදල් අමාත්‍යාංශයේ ලාච්චුවෙන් අරගෙන බලපත්‍ර විකුණන්න නොවෙයි. සල්ලිවලට permit විකුණන්න නොවෙයි. ඒ නිසා අපි ඔබතුමන්ලාට කියනවා, එහෙම කරන්න එපා කියලා.

බලන්න, අද අගමැතිතුමා තමුන්නාන්සේලාගේ මුදල් ඇමතිවරයාව රකිනවා. මට නම් තේරන්නේ නැහැ, මොකක්ද ඒ ගනු-දෙනුව කියලා. අගමැතිතුමා මොනවා කිව්වත් මුදල් ඇමතිතුමාව රකිනවා. මහ බැංකුව මුදල් අමාත්‍යාංශයෙන් ඉස්සෙල්ලාම ගැලෙව්වා, විශ්වාස නැති නිසා. ආනයන අපනයන පාලකතුමාව ගැලෙව්වා. අපි කිව්වා, හිටපු මහ ඇමතිතුමාගේ බෑනා තමයි මුදල් ඇමතිතුමාගේ ගෙදරට කුලිය ගෙවන්නේ කියලා. ඒත් පිළිගන්නේ නැහැ. මට තේරෙනවා, මේවා කියන කොට මරික්කාර් මන්ත්‍රීතුමා හිත යටින් හිනා වෙනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතාව මේ ආණ්ඩුව බලයට ගෙනෙන්න එතුමන්ලාට ජන්දය දුන්නේ මේවාට නොවෙයි. ඒ නිසා අපි යහපාලන ආණ්ඩුවේ ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරවනවා, මේ වාගේ ඇමතිවරු මේ වාගේ කටයුතු කරනවා නම් මේ පිළිබඳ හොයලා බලලා අවශ්‍ය කටයුතු

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

කරන්න කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ මහනුවර දිස්ත්‍රික්කයෙන් ආපු සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ ඇමතිතුමාට තමයි විදේශ ආයෝජන විෂය අයිතිව තිබෙන්නේ. අන්න, ගයන්ත කරුණාතිලක ඇමතිතුමා ආවා. ඔබතුමා වුණත් අවංකව හදවතින් කනගාටු වෙනවා, මේ මුදල් ඇමතිතුමා කරන කටයුතු පිළිබඳව. මම ඒක දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදේශ - [බාධා කිරීමක්] නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා කෑ ගැහුවා කියලා අගමැතිතුමා නියෝජ්‍ය ඇමතිකමක් දෙන්නේ නැහැ. ඔහොම කරලා ඒක ගන්න බැහැ. ඔබතුමා ටයි එකක් දාලා, කෝට් එකක් ඇඳලා ඉස්සෙල්ලාම එක විධියක් වෙන්න කෝ. ඇමතිකමක් ඕනෑ නම් ඉස්සෙල්ලාම එක විධියක් වෙන්න කෝ. ඔහොම ඉඳලා බැහැ. බුලත් විට කාලා බැහැ. බුලත් විට කාලා ඔය ආණ්ඩුවේ ඇමතිකම් හම්බ වෙන්නේ නැහැ. උඩ බොත්තම දාලා, ටයි එකක් දාලා, බෝ එකක් දාන්න කෝ. එතකොට අපි ඒ ගැන හිතන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ආපසු මාතෘකාවට එන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය භාර අමාත්‍යතුමාට -මලික් සමරවික්‍රම ඇමතිතුමාට- තමයි සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය භාරව තිබෙන්නේ. ඔබතුමන්ලා පිළිගන්නවා, අපි වාගේ රටකට විදේශ ආයෝජන නැතිව ඉදිරියට යන්න බැහැ කියලා. අපට foreign investments ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ණය ගන්න එක ලෙහෙසි නැහැ. හොඳම දේ රටකට විදේශ ආයෝජන ගෙන්වා ගන්න එකයි.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේ විදේශ ආයෝජන චිතරක් 2014 වර්ෂයේ ඩොලර් මිලියන 1,610ක් ඇවිල්ලා තිබෙනවා. රටේ මතයක් තිබෙනවා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් බලයට ආවාම මිනිස්සුන්ගේ අතමිට සරු වෙනවාය; රටට සල්ලි එනවාය; ආයෝජන එනවාය කියලා. එහෙම මතයක් තිබෙනවා. හැබැයි ඒ මතය වෙනස් කළා, ඔබතුමන්ලාගේ අගමැතිතුමා. ඔබතුමන්ලාගේ අගමැතිතුමාගේ ආණ්ඩුවේ 2015දී විදේශ ආයෝජන ඇවිල්ලා තිබෙන්නේ ඩොලර් මිලියන 1,030යි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ විදේශ ආයෝජන සියයට 40කින් අඩු වෙලා. මෙහෙම කොහොමද ආණ්ඩුවක් යන්නේ? ඇයි, මේ විදේශ ආයෝජන අඩු වෙන්නේ?

ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමාත් පිළිගන්නවා ඇති විදේශ ආයෝජකයෙක් රටකට එන කොට ඒ රට ගැන සොයා බලන බව. ඔබතුමා වුණත් ගාල්ලේ බුලත් විට කඩයක් දාන්න හරි, බේකරියක් දාන්න හරි, එහෙම නැත්නම් රෙදි කඩයක් දාන්න හරි කලින් ගාල්ල පිළිබඳව හොයා බලනවා. ඔබතුමා බලනවා, ගාල්ලේ,-

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගීතා මන්ත්‍රීතුමියගෙන් ඉස්සෙල්ලා අහනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගීතා මන්ත්‍රීතුමියගෙන් ඉස්සෙල්ලා අහනවා? අපි ඒක දැන ගෙන හිටියේ නැහැ නේ. ඒක හොඳයි.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)
මගෙන් අහලා තමයි එතුමා ඔක්කෝම කරන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බොහොම හොඳයි, ඔහොම යමු. හැබැයි ඔය පැත්තේ ඉන්න අනෙක් අයට ඇහෙන්න ඕක කියන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියාගෙන ආවේ ආණ්ඩුවේ විදේශ ආයෝජන අඩු වන්නට හේතුව මොකක්ද කියලායි. ගරු ඇමතිතුමනි, විදේශ ආයෝජකයෙකුට යම් ආයෝජනයක් කරන්න, පළමුවෙන්ම රටේ දේශපාලන ස්ථාවර භාවයක් තිබෙන්නට ඕනෑ. ඕනෑම විදේශ ආයෝජකයෙක් මේ රටට ආයෝජනයක් ගෙනෙන්න කලින් බලනවා, මේ රට දේශපාලන වශයෙන් ස්ථාවරද කියලා. පළමුවෙන්ම බලපු ගමන් ඔබේ රට දේශපාලන වශයෙන් ස්ථාවර රටක් ලෙස පෙනෙනවාද කියලා කියන්න. මේක එළහරක්, මීහරක් ආණ්ඩුවක් නේ. මේක යූඑන්පී එකයි, ශ්‍රී ලංකා එකයි එකතු වෙලා හදපු ආණ්ඩුවක්. එතකොට මේ ආණ්ඩුව ස්ථාවරද? මේ ආණ්ඩුව දිගයක් හදලා තිබෙනවා, අවුරුදු දෙකකට. අවුරුදු දෙකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් අතර විවාහයකට ඇවිල්ලා තිබෙනවා. දැන් මේ දිගය අනුව තමයි මේ ආණ්ඩුව යන්නේ. එතකොට බිලියන, මිලියන ගණනක ආයෝජකයෙක් එයිද අවුරුදු දෙකකට අටවපු ආණ්ඩුවකට. ඒ නිසා ඔබේ ආණ්ඩුවට - ඔබේ රජයට- විදේශ ආයෝජනයන් නොඑන්න මූලික හේතුව තමයි ඔබේ රට දේශපාලන වශයෙන් ස්ථාවර නැති වීම. මේ ආණ්ඩුව - තමුන්නාසේලාගේ යහපාලන ආණ්ඩුව- දේශපාලන වශයෙන් ස්ථාවර නැහැ. මේක කොයි වෙලාවේ කඩා වැටෙයිද දන්නේ නැහැ.

අපි ලබන 28වැනි දා "පාද යාත්‍රාව" පටන් ගන්නවා. පුදුම බයක් නේ තිබෙන්නේ. පුදුම බය වීමක් නේ බය වෙලා තිබෙන්නේ. ඊයේ දවස තිස්සේම ආණ්ඩු පක්ෂයේ සිටින එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් මේ පාද යාත්‍රාව විවේචනය කරනවා. ඇයි? බයයි. ඇයි? වැටෙයි කියලා. ආණ්ඩුව අස්ථාවරයි. මිනිස්සු පාරට බැහැලා. තමුන්නාන්සේලා බයයි. අපි shadow cabinet එකක් පත් කළා. මේකේ සිංහල තේරුම අධීක්ෂණ මන්ත්‍රී. අපි ඇමතිවරයාගේ පස්සෙන් ඉන්නවා. ඔබතුමා මතක තියා ගන්න, ඔබතුමාගේ පස්සෙන් ඉන්නවා දිලුම් අමුණුගම මන්ත්‍රීතුමා. හෙවණැල්ල වාගේ ඔබතුමාගේ පස්සෙන් ඉඳගෙන බලාගෙන ඉන්නවා. මොනවාද කරන්නේ කියලා ඔක්කෝම බලාගෙන ඉන්නවා. හැබැයි ඔබතුමාට අපි ගරු කරනවා. ඔබතුමා හොඳ ඇමතිවරයෙක්. ඔබතුමාට තවම චෝදනාවක් නැහැ. ඔබතුමා, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ ඉන්න අනෙක් බඩුව වාගේ නොවෙයි. එතුමාට අහු වුණොත් දාම් බෝඩ් එකත් විකුණයි. එතුමා පාර්ලිමේන්තුවත් විකුණයි. ඔබතුමාට අපේ ගෞරවය තවම තිබෙනවා. හැබැයි, හෙට අනිද්දා වෙන කොට කොහොම වෙයිද කියලා දන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, අපේ මේ අධීක්ෂණ මන්ත්‍රී - shadow cabinet - කියන්නේ අමාත්‍යාංශයක විෂය භාර අමාත්‍යවරයාගේ කටයුතු ගැන සොයා බලන්න පත් කරපු යම් මන්ත්‍රීවරයෙක්. මේ අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කරපු ගමන් බය වුණා. අවුරුදු දෙකයි කියලා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඇමතිවරු හිටගෙන හම්බ කරන්න පටන් අරගෙන. දැන් ඒ බව පෙනෙනවා නේ. ගල් අහුරු වංචාවට ඇමති කෙනෙක් සම්බන්ධයි ලු. ඊළඟට, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ රක්ෂණයකට ඇමතිවරියක් සම්බන්ධයි ලු.

ඊට පස්සේ bond issue එකට, අගමැතිතුමාගේ අමාත්‍යාංශයේ ගනු-දෙනුවකට කවුද සම්බන්ධයිලු. ඔබතුමන්ලාට චෝදනා එනවා. අපේ මන්ත්‍රීවරයෙක් අදාළ ඇමතිවරයා අධීක්ෂණය කරලා, ඒ ඇමතිවරයා පිළිබඳව සොයා ගෙන, බලා ගෙන ඉන්න කොට, ඒ පිළිබඳව සියලු දෙනා භය වෙලා ඉන්නවා. අර, මගේ මිත්‍ර මහනුවර අබ්දුල් හලීම් ඇමතිතුමා ඉන්නවා. ඒ.සී.එස්. හමීඩ මහතා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මොන තරම් කැප කිරීම් කරපු මනුස්සයෙක්ද? ඒත් මෙතුමාට මොනවාද හම්බ වෙලා තිබෙන්නේ? "තැපැල් ඇමතිකම." ඔරලෝසු කණුව ඉස්සරහට ගිහින් දිව දාගෙන ඉන්න ඕනෑ මුද්දර අලවන්න. එච්චරයි කරන්න පුළුවන්. ගරු හලීම් ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන්ද රස්සාවක් දෙන්න? ඔබතුමා ඡන්ද එක්ලක්ෂ ගණනක් ගත්තා. ඔබතුමාට මොනවාද පුළුවන්? ඕනෑ නම් කොල්ලෝ ටිකක් දාලා තැපැල් කන්තෝරුව ඉස්සරහ දිව දාගෙන ඉන්න කියන්න පුළුවන්. එච්චරයි. ඒක තමයි දෙන්න පුළුවන් රස්සා, මුද්දර අලවන්න. වෙන දෙයක් කරන්න බැහැ නේ. හැබැයි, ඒ.සී.එස්. හමීඩ් කියන්නේ එක්සත් ජාතික පක්ෂය හදපු පතාක යෝධයෙක්. කෝ, අද ඔබතුමන්ලා නැහැ. ඔබතුමා කම්මුලේ අත තියාගෙන ඉන්න විධියෙන්, ඔබතුමා ඉන්න වේදනාව අපට තේරෙනවා. පියදාස මන්ත්‍රීතුමා, නුවරඑළියේ තනි අලියා. එතුමා ඡන්දයට කියක් වියදම් කළාද? කෝ! අර පොළොන්නරුවේ සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමාත් අපි දන්නවා. එතුමා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් අපිත් එක්ක ගහ මරා ගත්තා. හැබැයි, තවම පසු පෙළ මන්ත්‍රී. අන්න, කණ්ණාඩි දෙක ගලවලා කඳුළුත් පිහදාගත්තා. බලන්න, මොන තරම් වේදනාවක්ද කියලා මන්ත්‍රීවරුන්ගේ හදවතේ තිබෙන්නේ. මේකට නොවෙයි තමුන්නාන්සේලා අවුරුදු ගාණක් දුක් විඳලා ආණ්ඩුව හැදුවේ. එහෙමනම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම නැවත මාතෘකාවට එන්නම්.

ඔබතුමන්ලාගේ ආණ්ඩුවට ඇයි විදේශ ආයෝජන එන්නේ නැත්තේ කියලා මම කියන්නම්. පළමුවැනි එක දේශපාලන අස්ථාවරභාවය, ගරු ගයන්ත ඇමතිතුමනි. දෙවැනි එක, විකෘති පාර්ලිමේන්තුවක් දැන් තිබෙන්නේ. සියයට 4.10ක් ඡන්ද ගත්ත කෙනෙකුට විපක්ෂ නායකකම දෙනවා. මේ පාර්ලිමේන්තුව විකෘති පාර්ලිමේන්තුවක්. මේ වාගේ අස්ථාවර දේශපාලන රටකට විදේශ ආයෝජකයෝ එයි කියලා ඔබතුමන්ලා හිතනවාද? ඊළඟට තමුන්නාන්සේලා බලන්න, දැන් විදේශ ආයෝජකයෝ කොහොමද එන්නේ කියලා? නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, විදේශ ආයෝජකයන් එන්න කලින් රට ගැන විශ්වාසයක් තිබෙන්න ඕනෑ. කොහොමද මේ රට ගැන විශ්වාසයක් තබන්නේ?

පසු ගිය රජය කාලයේදී Port City Project එකට අත්සන් කළා. මේ ආණ්ඩුව ආපු ගමන් ලොකු show දමලා Port City Project එක නැවැත්තුවා. මහා ලොකුවට තමුන්නාන්සේලාගේ නාළිකාවලින් වෙනම දෙයක් කථා කළා. "Port City Project එක දෙන්නේ නැහැ, මේකෙන් මහා මූල්‍ය වංචාවක් වෙනවා. මේකේ අරක නැහැ, මේක නැහැ" කියලා. ඒ දවස්වල අපට රූපවාහිනී විවාදවලට යන්න බැහැ. අන්තිමට චීනයට ගිහිල්ලා, China වලින් කාලා, අගමැතිතුමා Port City Project එක ආපසු දීලා ආවා. නිකම් නොවෙයි, අක්කර 33ක් වැඩියෙනුත් දුන්නා. ඒ වාගේම ඔබතුමන්ලා මතක තියා ගන්න, චීනයේ ජනාධිපතිවරයායි ආවේ Port City Project එකට මුල් ගල් තියන්න. චීනයේ ජනාධිපතිතුමා කියන්නේ මේ ලෝකයේ බලවත් රටවල ඉන්න ප්‍රබල, අංක එකේ නායකයෙක්. ඔබතුමන්ලා දැක්කා, චීනයේ ජනාධිපතිතුමා එංගලන්තයට ගියාම මහරැජිණ එතුමාව පිළිගත්ත හැටි. [බාධා කිරීමක්] චීනයේ ජනාධිපතිතුමා ආවාම එතුමා අත්සන් කළ ගිවිසුම ඉරලා, කැලිවලට දාලා, "මේක දෙන්නේ නැහැයි" කිව්වා. තමුන්නාන්සේලා ඒ සමරු ඵලකය ගලවලා මුහුදට දැම්මා. තමුන්නාන්සේලා ආයෝජන ගෙනෙන්න හදන්නේ මෙහෙමද? තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යන්නේ කොහොමද? තමුන්නාන්සේලා අද හිර වෙලා ඉන්නේ ඇයි? තමුන්නාන්සේලාට විදේශ ආයෝජන එන්නේ නැහැ. එහෙම වෙන්නේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පිළිබඳ විශ්වාසයක් නැති නිසා. අපි දන්නවා නේ, මේ ආණ්ඩුව පිළිබඳව.

දැන් මලික් සමරවික්‍රම ඇමතිතුමා තමයි, විදේශ ආයෝජන ප්‍රවර්ධනය සම්බන්ධව කටයුතු කරන ඇමතිවරයා. ඒ කියන්නේ, විකුණන්න තිබෙන සියලු ආයතන තිබෙන්නේ එතුමා යටතේ. අගමැතිතුමා ගෙනෙනවා, "Regaining Sri Lanka". ඔබතුමන්ලාගේ නායකතුමා -අගමැතිතුමා- කියන්නේ, විකුණන්න තිබුණොත් ඕනෑ එකක් විකුණන කෙනෙක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have only one more minute.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I will take another two minutes from a Friend of mine.

2001- 2004 කාලයේ "Regaining Sri Lanka" කියලා පොතක් මුද්‍රණය කරලා, සුදු මහත්වරු ටිකක් ඇවිල්ලා මේ රටේ සියලු රාජ්‍ය ආයතන විකුණන්න පිඹුරුපත් හැදුවාය කියන එක ඔබතුමන්ලාට මතකයි. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මේ සියල්ල; නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා, අපි ගමන් කළ සාමාන්‍ය බස් රථය, දුක් විඳින සාමාන්‍ය ජනතාව ගමන් කළ කෝච්චිය මේ සියල්ල විකුණන්න පිඹුරුපත් හැදුවා. හොඳම filling stations සියය IOC එකට දුන්නා. තමුන්නාන්සේලා ලංකා විදුලිබල මණ්ඩලය විකුණන්න සියලු පිඹුරුපත් හදලායි හිටියේ. පසුව ඒ සියල්ල නැවතුණා. දැන් ආපහු ඒක කරන්න හදනවා. අගමැතිතුමා හදන්නේ, මේ තිබෙන මොනවා හරි ආයතන ටිකක් විකුණලා මේ සල්ලි ටික හොයන්නයි. ඒකට නොවෙයි, මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට ඡන්දය දුන්නේ. ඔබතුමන්ලා මේ ආයතන විකුණන්න හදනවා. මේ ආයතන විකුණන්න ඔබතුමන්ලාට මොකක්ද තිබෙන අයිතිය? ඒකට මේ රටේ ජනතාව ඔබතුමන්ලාට ජන වරමක් දීලා නැහැ. [බාධා කිරීමක්]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Hon. Deputy Chairman of Committees, you ask him under which Standing Order he is raising his point of Order.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු මන්ත්‍රීතුමනි, එයාර් ලංකා සමාගම රුපියල් කෝටි හතළිස්හයදහස් එකසියයක් පාඩුයි. එතකොට ඒවා සැපද?[බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

That is not a point of Order. Hon. Aluthgamage, you continue with your speech.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

Sir, the point of Order என்று சொல்லேக்க, நீங்க கேளுங்க, "Standing Order என்ன section?" என்று. அப்ப அவரு உக்காருவார். இல்லாட்டி அவரு point of Order என்று பொய் சொல்லுவார். அப்பிடிக் கொடுக்கவேணாம். சரியா? මම කියලා දෙන්නම් ඔබතුමාට.

නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, මට සන්තෝෂයි. ඔබතුමා දැන් සභාවේ කෑ ගහලා, අග්‍රාමාත්‍ය කාර්යාලයට ගිහිල්ලා කියනවා, "සර්, මම අරයාට වැඩිය කෑ ගැහුවා," කියලා. ඒක හොඳයි. එහෙම කරලා වින්දනයක් ලබන්න; සතුටක් ලබන්න. එහෙම කරලා හරි නියෝජ්‍ය ඇමතිකමක් ගන්න. ඒකට කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ කථා කරන්නේ මෙතුමන්ලාගේ ආණ්ඩුව හරි මගට යවන්නයි. ඔබතුමන්ලා හිතනවා, අපි පාද යාත්‍රා ගිහිල්ලා මේ ආණ්ඩුව ගන්න හදනවා කියලා. අනේ අම්මේ! මේ ආණ්ඩුව නම් අපිට එපා. අපි ඉතිරි අවුරුදු හතරත් විපක්ෂයේ ඉන්නම්. අපිට ආණ්ඩුව ගන්න ඕනෑ නැහැ. ඔබතුමන්ලාට නාන්න දීලා අපි බලාගෙන ඉන්නම්. අපි ඔබතුමන්ලාට ෂැම්පු ටිකක් විතරයි ගෙනත් දෙන්නේ. අපි ඔබතුමන්ලාට බොඩි වොෂ් ටිකක්, ෂැම්පු ටිකක් ගෙනත් දෙන්නම් නා ගන්න. ඔබතුමන්ලා හොඳයි. මේ විධියට රටේ දේපළ විකුණන්න. තමුන්නාන්සේලා හම්බන්තොට වරායට බැන්නා. මත්තල ගුවන් තොටුපොළට බැන්නා. චීනයට ගිහිල්ලා කථා කළේ මොනවාද? මත්තල ගුවන් තොටුපොළ ගැනයි. හම්බන්තොට වරාය ගැනයි.

අවසානයේදී තමුන්නාන්සේලා කථා කළේ මහින්ද රාජපක්ෂ මහත්මයා කරපු දේවල් ගැන නොවෙයිද? අද තමුන්නාන්සේලාට පාරක යන්න පුළුවන් වෙලා තිබෙන්නේ කවුරු නිසාද? ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාට අද දකුණට යන්න අධිවේගී මාර්ග හැදුවේ කාගේ පාලන කාලයේදීද? මේ මාස 16ක කාලය තුළ ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ අසාර්ථකභාවය පෙන්වීමට හොඳම පිළිතුර තමයි ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමාගේ අමාත්‍යාංශය. බලන්න, විදේශ ආයෝජන සියයට 40කින් අඩු වෙලා.

අන්න! ගරු ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාත් මේ ගරු සභාවට එනවා. එතුමාත් හොඳ එක්සත් ජාතික පාක්ෂිකයෙක්. ඔන්න, මොනරාගල දිස්ත්‍රික්කයේ අය. බර ඇදලා, ඇදලා අනේ ඉතින් ඔබතුමා ඒ මුල්ලේ. මම මේ මුල්ලේ. ඔබතුමාට මුකුත් ලැබුණේ නැහැ. පසු පෙළ මන්ත්‍රීකම විතරයි. ඒ ගැන අපිට දුකයි. අපි ඔබතුමන්ලාට වෙලාවට කියන්නම්. එතකොට මේ පැත්තට එන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මේ ආණ්ඩුවට කියන්නේ මේ ගමන යන්න බැහැ කියලායි. මේ ආණ්ඩුව මේ යන වැඩ පිළිවෙළ කරන්න එපා. මේ යන විධියට ගියොත් ඔබතුමන්ලා ලොකු අමාරුවක වැටෙනවා. තවත් අවුරුදු හතරකින් අපි ආණ්ඩුව ගත්තොත් අපි මේ පවට කරගහන්න වෙනවා. ඒ නිසා මේ රට හරි වැඩ පිළිවෙළකට ගෙනියන්න.

මහ බැංකු අධිපතිවරයාගේ වැඩ ගැන බලන්න. තමුන්නාන්සේලා අපට හොරු, හොරු කියලා චෝදනා එල්ල කරනවා. දැන් බලන්න, මහ බැංකු අධිපතිවරයා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා පාර්ලිමේන්තුවට වාර්තාවක් ගෙනාවා, රුපියල් බිලියන 1.6ක වංචාවක් වෙලා කියලා. ගරු මහින්ද අමරවීර ඇමතිතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා පැමිණිල්ලක් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, please wind up now.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

I will finish in two seconds.

හැබැයි අද වෙනකම් මහ බැංකු අධිපතිවරයාව ගෙනැල්ලා ප්‍රශ්න කළේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නීතිය කාටත් සාධාරණ වෙන්න ඕනෑ. ඒකාබද්ධ විපක්ෂයට එක නීතියකුත්, ආණ්ඩුවට එක නීතියකුත් තිබෙන්න බැහැ. මේ රටේ අධිකරණ දෙකක් තිබෙන්න බැහැ. මේ රටේ නීති දෙකක් තිබෙන්න බැහැ. මේ රටේ පාර්ලිමේන්තු දෙකක් තිබෙන්න බැහැ. එක පාර්ලිමේන්තුවයි, එක නීතියයි, එක රටයි තිබෙන්න ඕනෑ. නමුත් ඔබතුමන්ලා මේ යන්නේ එකක් විධියට නොවෙයි, දෙකක් විධියටයි. මේක කරන්න එපා. වැරදි කරනවා නම්, කවුරු වුණත් වැරදිකාරයෝ. ඒක ආණ්ඩුවේ ඇමතිවරයාටත් එකයි. විපක්ෂයේ මන්ත්‍රීවරයාටත් එකයි. සාමාන්‍ය පුද්ගලයාටත් එකයි. නීතිය කාටත් සාධාරණ වෙන්න ඕනෑ.

මම හිතනවා, ගරු අගමැතිතුමයි, ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමායි හිටියා නම් ගොඩාක් හොඳයි කියලා. අද මම මෙතැනදී මේ දෙදෙනා ගැන කථා කළාට පස්සේ sure එකටම අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් FCID එකටයි, CID එකටයි call එකක් යනවා, "අරුව තවම අත් අඩංගුවට ගත්තේ නැද්ද, මොකක්ද කරන්නේ, ඉක්මනින්ම ඇතුළට දාන්න" කියලා. මම පාර්ලිමේන්තුවේ කථා කරපු හැම දවසකම CID එකේ නිලධාරීන් කියනවා, "අයියෝ, සර් කථා කරන්න එපා. ඔබතුමා කථා කරපු ගමන් අපිට කියනවා ඔබතුමාව අත් අඩංගුවට ගන්න," කියලා.

මම මීට වඩා කාලය ගන්නේ නැහැ. අවසාන වශයෙන් ආණ්ඩුව ගෙනියන මේ වැඩ පිළිවෙළ වෙනස් කරලා මේ රට හරි මගට ගොනු කරගන්න ආණ්ඩුව කටයුතු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පි.ප. 2.49]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஏற்றுமதி, இறக்குமதிக் கட்டுப்பாட்டுச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பில் ஒருசில வார்த்தைகள் பேச

நினைக்கின்றேன். போர்த்துக்கேயரின் காலந்தொட்டு ஆங்கிலேயரின் காலம் வரைக்கும் இலங்கைத் திருநாடானது ஓர் ஏற்றுமதி நாடாகத்தான் விளங்கியது. இலங்கை நாட்டிலே உற்பத்தி செய்யப்பட்ட தேயிலை, இறப்பர், கோப்பி, கொக்கோ, மற்றும் வாசனைத் திரவியங்கள் என்பனவும் தென்னை உற்பத்திகளும் ஏற்றுமதி செய்யப்பட்டமை நாங்கள் அனைவரும் அறிந்த விடயமாக இருக்கின்றது. அன்று ஆங்கிலேயரும் போர்த்துக்கேயரும் இலங்கை நாட்டைக் கைப்பற்றியதன் நோக்கம் என்னவென்றால், இப்படியான உற்பத்திகளில் ஈடுபட்டு அவற்றை ஏற்றுமதி செய்வதேயாகும். அவ்வுற்பத்திப் பொருட்களை உயர்தரத்தில் பெற்றுக்கொள்ளக் கூடிய வளமிக்க மண்ணுள்ள ஒரு நாடாகவும் அவற்றை உலக நாடுகளுக்கு சந்தைப்படுத்தக் கூடிய ஓர் இடமாகவும் இலங்கை காணப்பட்டது. அதன் விளைவாகத்தான் போர்த்துக்கேயரும் ஆங்கிலேயரும் இங்கு வந்தார்கள்.

1948ஆம் ஆண்டு இலங்கைக்கு சுதந்திரம் கிடைக்கப்பெற்றது. இலங்கை நாட்டிலே போர்த்துக்கேயரும் ஆங்கிலேயரும் எவ்வகையான உற்பத்திப் பொருட்களை அறிமுகப்படுத்தி வைத்தார்களோ, அதே உற்பத்திப் பொருட்களை, அவர்களுக்குப் பின்னர் வந்த ஆட்சியாளர்களும் ஏற்றுமதிப் பொருட்களாகப் பயன்படுத்தித் தொடர்ந்தும் நாட்டுக்குத் தேவையான பொருளாதாரத்தைத் தேடிக்கொண்டார்கள். 1977ஆம் ஆண்டு ஆட்சி செய்த ஜனாதிபதி ஜே.ஆர். ஜயவர்தன அவர்கள் இலங்கைத் திருநாட்டிலே உற்பத்தி செய்யப்படுகின்ற வாசனைத் திரவியங்களுட்பட அனைத்து ஏற்றுமதிப் பொருட்களையும் உலகச் சந்தையிலே விலைமதிப்புள்ள இடத்தில் வைக்க வேண்டுமென்ற நோக்கத்தோடு செயற்பட்டார். அவ்வாறே, இலங்கையில் அதிகளவில் உற்பத்தி செய்யப்படுகின்ற இறப்பர்மூலம் இந்த நாட்டிலே தோல் பொருட்களின் உற்பத்தியை அதிகரிக்கலாம் என்ற எண்ணத்தில் ஒரு பாரிய திட்டத்தை அவர் உருவாக்கினார். ஐக்கிய தேசியக் கட்சியின் ஆட்சிக் காலத்தில் பல்லாயிரக்கணக்கான இளைஞர், யுவதிகளுக்குத் தொழில் வழங்கும் நோக்கத்தோடும் வெளிநாட்டுச் செலாவணியை ஈட்டும் நோக்கத்தோடும் கொக்கல, பியகம போன்ற பகுதிகளில் சுதந்திர வர்த்தக வலயங்கள் போன்ற பாரிய திட்டங்கள் முன்னெடுக்கப் பட்டமை நாங்கள் அனைவரும் அறிந்த விடயமாகும்.

அதனைத் தொடர்ந்து இந்நாட்டின் ஜனாதிபதியாக இருந்த ஆர். பிரேமதாஸ அவர்கள் வெளிநாட்டுச் செலாவணியை ஈட்டிக்கொள்வதற்காக நாடளாவிய ரீதியில் 250க்கும் மேற்பட்ட ஆடைத் தொழிற்சாலைகளை நிறுவினார். அதன்மூலம் அவர் இலங்கையில் வேலைவாய்ப்பற்றிருந்த பல்லாயிரக்கணக்கான இளைஞர், யுவதிகளுக்கு வேலை வாய்ப்புக்களைப் பெற்றுக்கொடுத்தார். அவ்வாறு உற்பத்தி செய்யப்பட்ட ஆடைகளின் ஏற்றுமதியினால் இந்நாட்டுக்கு அதிகளவு அந்நியச் செலாவணி கிடைத்தது. அதன்மூலம் இந்த நாட்டின் பொருளாதாரத்தில் மாபெரும் புரட்சி ஏற்பட்டதுடன் இந்த நாடு சர்வதேச ரீதியில் பேசப்படக்கூடிய அளவுக்கு ஓர் இடத்தைப் பிடித்திருந்தது.

இன்று எங்களுடைய நாட்டை சிங்கப்பூர் போன்று ஆக்கவேண்டுமென்று நாங்கள் அனைவரும் விரும்புகின்றோம். கௌரவ பிரதம அமைச்சர் அவர்கள் இரண்டு - மூன்று நாட்களுக்கு முன்னர் அங்கு சென்றிருந்தார். முன்னாள் ஜனாதிபதி ஜே.ஆர். ஜயவர்தன அவர்களுடைய ஆட்சிக் காலத்திலே, "இலங்கைபோன்று எங்களுடைய திருநாட்டை மாற்றவேண்டும்" என்று சிங்கப்பூர் மக்களும் அந்த நாட்டு அரசியல்வாதிகளும் ஆசையோடும் ஆவலோடும் சொன்னார்கள். ஆனால், இன்று அதற்கு மாற்றமாக நாங்கள் மட்டுமல்ல, முழு உலக நாடுகளும் சிங்கப்பூர் போன்று தங்களுடைய நாட்டை ஆக்கவேண்டுமென்ற உணர்வோடு இருக்கின்றன. எமது நாட்டின் நிலையை எண்ணி நாங்கள் வெட்கப்பட வேண்டியவர்களாக இருக்கின்றோம். எங்களுடைய பிரதமர் அவர்களும் அந்நாட்டுக்குச் சென்று, அங்கு நடைமுறைப்படுத்தப்பட்டுள்ள வேலைத்திட்டங்களைப் பார்த்து, அவற்றை எமது நாட்டிலும் நடைமுறைப் படுத்துவதற்கான ஏற்பாடுகளை மேற்கொண்டு வருகின்றார்.

கடந்த காலத்தில் இருந்த ஆட்சியாளர்கள் வெளிநாட்டுச் செலாவணியை ஈட்டித்தரக்கூடிய ஆடைத் தொழிற் சாலைகளை முற்றுமுழுதாக முடக்கிவிட்டார்கள். இதனால், அதன்மூலமான வெளிநாட்டுச் செலாவணி எங்களுடைய நாட்டுக்குக் கிடைப்பது தடைப்பட்டது. அதன் விளைவாகத்தான் இன்று இந்த நாடு பொருளாதார ரீதியில் பாரிய நெருக்கடிகளுக்கு முகம்கொடுக்க வேண்டியிருக்கின்றது என்பதை அவர்கள் அறியாததுபோல் இன்று கதைத்துக்கொண்டிருக்கின்றார்கள். எங்களுடைய நாட்டுக்கு வெளிநாட்டுச் செலாவணி கிடைக்கவேண்டும் என்றால், ஆளுக்கு ஆள் இனவாதம், மதவாதம், குலபேதம் கதைக்காமல் இருக்கவேண்டும். அன்று சிங்கப்பூர் மக்கள் இனவாதத்தையும் மதவாதத்தையும் குலபேதத்தையும் மறந்ததனால்தான், இன்று உலகிலே பெயரும் புகழும் பெறுகின்ற ஒரு நாடாக அது திகழ்கின்றது என்பதை நாங்கள் அனைவரும் உணரக் கூடியதாக இருக்கின்றது. எங்களுடைய நாட்டுக்கு அண்மையிலுள்ள நாடான பங்களாதேஷ்கூட, இன்று முன்னேறிக்கொண்டு செல்கின்றது. காரணம், அங்கு இனவாதமோ, மதவாதமோ, குலபேதமோ, அணிப் பிரிவுகளோ இல்லை. அதேபோன்று, நாங்கள் வியட்நாமையும் கொரியாவையும் எடுத்துப் பார்க்கலாம்.

இன்று மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களும் மாண்புமிகு பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களும் நாட்டின் அபிவிருத்தியில் ஒரு பாரிய புரட்சியை ஏற்படுத்துவதற்கு முயற்சித்துக்கொண்டிருக்கின்றார்கள். ஆனால், அதனைச் செய்யவிடாமல் எதிரணியினர் தடைகளை ஏற்படுத்திவருவதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. இந்த நாட்டிலே பாரியதொரு பொருளாதாரப் புரட்சியை ஏற்படுத்துவதற்காகப் பாரிய திட்டங்கள் அமுல்படுத்தப் படுகின்றன. 1977ஆம் ஆண்டு கௌரவ ஜே.ஆர். ஜயவர்தன அவர்கள் இந்த நாட்டிலே ஒரு மாபெரும் புரட்சியை ஏற்படுத்தினார். அவர், இந்த நாட்டுக்கு வெளிநாட்டுச் செலாவணியை ஈட்டித்தந்த தலைசிறந்த ஒரு தலைவராக விளங்கினார். இன்றும்கூட அவருடைய பெயரை யாரும் மறக்கமுடியாத அளவுக்கு அவர் சாதனை படைத்தார் என்பதை நாங்கள் அனைவரும் அறிவோம். அதேபோன்றுதான், முன்னாள் ஜனாதிபதி அமரர் ஆர். பிரேமதாஸ அவர்களும் இந்த நாட்டுக்கு வெளிநாட்டுச் செலாவணியைக் கொண்டுவந்தார். ஆனால் இன்று அதற்கு மாறாக இந்த நாட்டிலே உற்பத்தியென்பது இல்லாதொழிக்கப்பட்டு வெளிநாடுகளிலிருந்து பொருட்கள் இறக்குமதி செய்யப்படுகின்றன.

நான் ஒரு விவசாயக் குடும்பத்தில், விவசாய மாவட்டத்தில் பிறந்தவன் என்பதால் எனக்கு விவசாயம் தொடர்பாக நன்றாகத் தெரியும். எங்களுடைய நாட்டிலே ஒரு விவசாயப்

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

பயிராக இருந்த மிளகாயின் உற்பத்தி தன்னிறைவு பெற்றிருந்த நிலையிலே முன்னாள் ஆட்சியாளர்கள் அதை இல்லாமல் செய்தார்கள். இன்று அதனை வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்கின்ற அளவுக்கு இந்த நாடு அந்த உற்பத்தியில் பின்தங்கிவிட்டது. இன்றும் எமது நாட்டை விவசாய நாடென்று பெயரளவில்தான் பேசிக்கொண்டிருக்கின்றோம். ஆனால், வெளிநாடுகளிலிருந்து அந்த உற்பத்திப் பொருட்களை இந்த நாட்டுக்குக் கொண்டுவருவதற்காகப் பலகோடி ரூபாய் வெளிநாட்டுச் செலாவணியை நாங்கள் அந்த நாடுகளுக்குக் கொடுக்கின்றோம். இலங்கை மத்திய வங்கியின் தரவுக்கமைய 2016ஆம் ஆண்டு பெப்ரவரி மாதத்திலே 1,439.3 மில்லியன் US Dollars இறக்குமதிக்காகச் செலவு செய்யப்பட்டதாகப் பதியப்பட்டுள்ளது. அதே ஆண்டு மார்ச் மாதத்திலே இறக்குமதிக்காக 1,560 மில்லியன் US Dollars செலவு செய்யப்பட்டதாகப் பதிவாகியுள்ளது. இது இலங்கைப் பொருளாதாரத்தில் பாரிய பாதிப்பை ஏற்படுத்தும் என்பதில் ஐயமில்லை.

நாங்கள் எங்கள் நாடு ஒரு விவசாய நாடென்று சொல்லிச் சந்தோசப்பட்டுக்கொண்டிருக்கின்றோம். ஆனால், இன்று இந்த நாட்டிலே எவ்வகையான விவசாயப் பொருட்களையும் உற்பத்தி செய்வதற்குரிய ஊக்குவிப்பு இல்லை. அரசியல்வாதிகள் ஆட்சியைப் பிடிக்க வேண்டுமென்றுதான் தடுமாறிக்கொண்டிருக்கின்றார்களே தவிர, இந்த நாட்டிலே விவசாயத்தை முன்னெடுக்க ஊக்கமளிக்கத்தக்கவாறு பொருளாதார நிலைமையை அவர்கள் அமைத்துக் கொடுக்கவில்லை. ஜப்பான் போன்ற முன்னேற்றகரமான நாடுகளைப் பார்த்தால், அங்கே வேறு தொழில் புரிகின்றவர்கள்கூட விவசாயத்திற்கு முக்கியத்துவம் கொடுத்து அதனை முன்னேற்றிவருவதைக் காண்கிறோம். அதன்மூலம் அந்த நாடு மட்டுமல்ல, அவர்களும் பொருளாதாரத்திலே முன்னேற்றம் காண்கின்றார்கள். ஆனால், விவசாய நாடென்று சொல்லிக்கொண்டிருக்கின்ற இந்த நாட்டின் வாலிபர்கள் இன்று விவசாயத்தில் அணுவளவுகூடப் பங்காளிகளாக இல்லை. இதற்குக் காரணம் விவசாயிகளுக்குப் பிரயோசனமளிக்கக்கூடியவாறான எந்த ஒரு சந்தர்ப்பத்தையும் அவர்களுக்கு வழங்காததுதான். அதனால், நாங்கள் வெறுமனே பேசிக்கொண்டிருப்பதனால் இந்த நாட்டை ஒருபோதும் முன்னேற்ற முடியாது.

அண்மையிலே நான் துருக்கி நாட்டுக்குச் சென்றிருந்தேன். அந்த நாட்டிலே ஒரு மாபெரும் புரட்சியை அந்த நாட்டுத் தலைவர் ஏற்படுத்தியுள்ளார். துருக்கி நாட்டிலே முன்பிருந்த ஆட்சியாளர்களினால் பாரிய வீழ்ச்சிகண்ட அதன் பொருளாதாரம், கடந்த 10 வருடங்களுக்குள் உலகத்திலே 16வது இடத்திற்கு முன்னேறிய நிலையில் இருக்கின்றது. நான் அங்கு Hydromet என்ற ஒரு கம்பனிக்குச் சென்றிருந்தேன். அந்தக் கம்பனி இன்று உலகத்திலுள்ள 50 கம்பனிகளிலே 36வது இடத்திலிருக்கின்றது. அந்த நாட்டின் ஆட்சியாளர்களும் மக்களும் அதை முன்னேற்றவேண்டு மென்று விரும்புவதனால் அந்தக் கம்பனிக்குப் பல சலுகைகள் வழங்கப்பட்டுவருவதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. அந்த வகையில் அவர்களுடைய target என்னவென்றால், 2024ஆம் ஆண்டிலே Hydromet என்ற கம்பனியானது உலகத்திலுள்ள 10 மாபெரும் கம்பனிகளில் ஒன்றாக வரவேண்டும் என்பதுதான். அதற்காக அவர்கள் 10 இலட்சம் சதுர அடி பரப்பிலே பாரிய ஒரு factoryஐ அமைப்பதற்கான திட்டங்களைச் செய்துகொண்டிருப்பதை என் கண்ணால் பார்த்து வந்தேன்.

இன்று எங்களுடைய நாட்டின் மேதகு ஜனாதிபதி அவர்களும் மாண்புமிகு பிரதமர் அவர்களும் அவ்வகையான ஊக்குவிப்புக்களை அளிக்கும்போது, இவர்கள் இடத்தை விற்கப்போகின்றார்கள் என்றும் வெளிநாட்டவர்களுக்கு அனைத்து ஏற்பாடுகளையும் செய்துகொடுக்கின்றார்கள் என்றும் எங்கள் மக்களுக்குச் செய்வதில்லையென்றும் எதிரணியினர் சொல்கின்றார்கள். வெளியுலகத்திலுள்ளவர்கள் இங்கு முதலீடுகளைச் செய்ய முன்வருகின்றபோது இந்த நாட்டுக்குப் பொருளாதாரமும் பிரகாசமும் வரும். நாங்கள் சிங்கப்பூரை எடுத்துக்கொண்டால், அந்த நாட்டிலுள்ளவர்கள் மட்டும் அங்கே முதலீடுகளைச் செய்யவில்லை. ஆனால், இந்த நாட்டில் வாழ்கின்றவர்கள் மட்டும்தான் வியாபாரத்தில் ஈடுபடவேண்டும்; இந்த நாட்டிலுள்ளவர்கள் மூலம்தான் இந்த நாட்டின் உற்பத்தியைப் பெருக்கி நாட்டை முன்னோக்கிக் கொண்டுசெல்ல முடியும் என்று எதிரணியினர் கணிப்பிடுகின்றார்கள். அவர்கள் அந்த நிலைப்பாட்டிலிருந்து விலகி உலகமயமாக்கப்பட்ட பொருளாதாரத்தைக் கடைப்பிடிக்கத் தங்களை மாற்றிக்கொள்ள வேண்டும். பாதைகளை அமைப்பதனால் மட்டும் இந்த நாட்டில் அபிவிருத்திகளைச் செய்ய முடியாது. இந்த நாட்டிலே பொருளாதார மறுமலர்ச்சியை ஏற்படுத்த வேண்டும் என்பதற்காகத்தான் இன்று எங்களுடைய நாட்டின் பிரதம அமைச்சர் அவர்கள் பாரிய செயற்றிட்டங்களை மேற்கொண்டு வருகின்றார். இந்த நாட்டின் அபிவிருத்தியில் பாரிய ஒரு புரட்சியை ஏற்படுத்தும் வகையில் இன்று பல திட்டங்களை மேற்கொள்வதற்குத் தன்னைத் தயார்ப்படுத்திக் கொண்டிருக்கின்றார். ஆகவே, இன்னும் ஐந்து வருட காலத்துக்குள் இந்த நாட்டின் அபிவிருத்தியில் பாரிய புரட்சி ஏற்படும் என்பதில் எந்தச் சந்தேகமுமில்லை என்பதை எதிரணியினருக்கு நாங்கள் சொல்லிக்கொள்ள விரும்புகின்றோம்.

இன்று உலகிலே எங்கு சென்றாலும் அங்குள்ள பலர் இந்த 'යහ පාලන' அரசாங்கத்துக்கு உதவி செய்ய முன்வருகின்றார்கள். ஆனால், கடந்த சில வருடங்களுக்கு முன்னர் இங்கு வந்து முதலீடுகளைச் செய்வதற்கு வெளிநாட்டவர்கள் தயங்கினார்கள். இன்று உலகின் மிக முக்கிய நிறுவனமான Ford Companyயும் இந்த நாட்டில் தன்னுடைய உற்பத்திகளை மேற்கொள்ள ஆரம்பித்துள்ளது. இதன்மூலம் இன்று இந்த நாட்டுக்கு வெளிநாட்டுச் செலாவணி அள்ளப்பட்டு வருமென்பதை நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. எமது நாட்டின் துறைமுகங்களை அபிவிருத்தி செய்வதற்காகவும் விமான நிலையங்களை அபிவிருத்தி செய்வதற்காகவும் பல கோடி ரூபாய் இன்று இந்த அரசாங்கத்தினால் ஒதுக்கப்பட்டுள்ளது. மாண்புமிகு பிரதம அமைச்சர் அவர்கள் இன்று காலையில் பேசியபொழுது துறைமுக அபிவிருத்திக்காகவும் விமான நிலைய அபிவிருத்திக்காகவும் ஜப்பான் நிறுவனங்கள் இங்கு வருகை தரவுள்ளமை பற்றிக் குறிப்பிட்டார். முன்னாள் ஜனாதிபதிகளான ஜே.ஆர். ஜயவர்தன, ஆர். பிரேமதாச ஆகியோரின் ஆட்சிக் காலத்தில் இந்த நாட்டிலே எந்த அளவுக்கு வெளிநாட்டுச் செலாவணி இருந்ததோ, அந்தளவுக்கு இந்த 5 வருட காலத்திற்குள்ளே வெளிநாட்டுச் செலாவணி ஈட்டிக்கொள்ளப்படுமென்று நான் நினைக்கிறேன். அதேமாதிரியான உன்னதமான நிலையைத் தற்போதைய இரு தலைவர்களும் உருவாக்குவார்கள் என்பதில் எந்தவித சந்தேகமுமில்லை; பொறுமையாக இருங்கள்! இன்னும் குறுகிய காலத்திற்குள் அதற்குரிய பிரதிபலனை நீங்கள் கண்டுகொள்வீர்கள்! அதனால் யாரும் குழப்பமடைய வேண்டிய தேவையில்லை.

Ford Company மட்டுமல்ல, உலகத்திலுள்ள மாபெரும் கம்பனிகள் இந்த நாட்டுக்கு வந்து முதலீடுகளைச் செய்யவேண்டும். எங்கள் நாட்டின் முன்னேற்றத்தை நாளுக்குநாள் விளங்கிக்கொள்ளக்கூடியதாக இருக்கின்றது. காரணம், புலம்பெயர்ந்து வெளிநாடுகளிலுள்ளவர்கள் இங்கு வந்து அவர்களுடைய தொழிலை ஆரம்பிக்கும் வகையில் அந்தந்த நாட்டின் பிரதமர்களோடும் ஜனாதிபதிகளோடும் பல ஒப்பந்தங்கள் செய்யப்பட்டு வருகின்றன. எங்கள் நாட்டின் பிரதமர் அவர்களும் ஜனாதிபதி அவர்களும் பல உலக நாடுகளுக்கும் வீணே பொழுதுபோக்குக்காகச் செல்லவில்லை. இந்த நாட்டில் அபிவிருத்தியை ஏற்படுத்த வேண்டும்; இங்கு வாழ்கின்ற மக்களுக்கு ஒரு நல்ல வாழ்க்கை நிலையை ஏற்படுத்த வேண்டும்; சமூக பொருளாதார நிலையை உயர்த்த வேண்டுமென்ற நோக்கில்தான் உலக நாடுகளின் தலைவர்களோடு இணக்கப்பாட்டுக்கு வருகிறார்கள். அந்த வகையில்தான் இப்படியான ஒரு மாற்றம் ஏற்படுகின்றது. கூடிய விரைவில் இதற்குரிய பலனை நாங்கள் கண்டுகொள்ளுவோம் என்பதில் எந்தவித சந்தேகமுமில்லை.

இந்த நாட்டிலே இன்று விவசாயத்திற்கு முக்கிய இடம் கொடுக்கப்பட்டிருக்கின்றது. கமத்தொழில் அமைச்சர் கௌரவ துமிந்த திசாநாயக்க அவர்கள் புதுவகையான நெல் இனங்களை எமது நாட்டுக்கு அறிமுகப்படுத்தி வெளிநாட்டுச் செலாவணியை ஊக்குவிக்கக்கூடிய வகையில் பல திட்டங்களைச் செய்துவருகின்றார். மேலும், வெளிநாட்டிலிருந்து உரத்தை இறக்குமதி செய்வதை நிறுத்துவதற்கான ஏற்பாடுகள் மேற்கொள்ளப்படுகின்றன. இதற்குப் பதிலாக எமது நாட்டில் உர உற்பத்தியை அதிகரிப்பதற்கான பாரியதொரு திட்டத்தை நடைமுறைப்படுத்த ஜனாதிபதி அவர்களும் பிரதமர் அவர்களும் கமத்தொழில் அமைச்சர் அவர்களும் திட்டமிட்டுவருவதை நாங்கள் உணரக்கூடியதாக இருக்கின்றது. இவ்வகையான திட்டங்கள் அனைத்தையும் செய்வது இந்த நாட்டின் பொருளாதாரத்தை முன்னேற்ற வேண்டும் என்பதற்காகவேயாகும்.

இன்று harbour மூலமாகவும் எங்களுடைய நாட்டின் வருமானம் அதிகரித்துக்கொண்டிருக்கின்றது. இன்று காலையில் நடைபெற்ற கூட்டத்தில் சமர்ப்பிக்கப்பட்ட அறிக்கையின்படி, வெளிநாட்டு வருவாயானது பல வருடங்களுக்கு முன்னர் இருந்ததைவிட இவ்வருடம் அதிகரித்துக் காணப்படுகின்றது. இந்த நாட்டின் යහ පාලන அரசாங்கத்தின்மீதுள்ள நம்பிக்கை காரணமாக வெளிநாடுகளிலுள்ள நிறுவனங்கள் எங்கள் நாட்டுக்கு வந்து எங்கள் harbourஇல் அவர்களுடைய பொருட்களை இலகுவான முறையில் பெற்றுக்கொள்கின்றன. அதற்கான வசதிவாய்ப்புகளை இந்த அரசாங்கம் செய்துள்ளது. இப்படியான ஓர் ஏற்பாட்டின்மூலம் இந்த நாடு உலகப் பொருளாதார மயமாக்கப்பட்டிருக்கின்றது என்பதையும் தெளிவாகச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

எங்களுடைய நாட்டின் பொருளாதாரம் அன்று எப்படி ஓர் உன்னதமான அளவுக்கு உயர்ந்திருந்ததோ, அதே நிலையை எங்களுடைய ஜனாதிபதி அவர்களும் பிரதமர் அவர்களும் அமைச்சர்களும் மீண்டும் கொண்டுவர முயற்சி செய்வார்கள் என்பதில் யாரும் ஐயம் கொள்ளத் தேவையில்லையென்று கௌரவ உறுப்பினர்களுக்கு மட்டுமல்ல, நாட்டு மக்களுக்கும் கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

[பி.ப. 3.08]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, முதலில் இன்றைய தினம் விவாதிக்கப்படுகின்ற தலைப்புக்கு அப்பால் நான் சில விடயங்களைப் பேச விரும்புகின்றேன். மிக முக்கியமாக சென்றவாரம் யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தில் நடைபெற்ற மாணவர்களுக்கிடையிலான சிறுமோதல் என்பது கவலைக்குரியது; அது துரதிஷ்டவசமானது. இதற்குப் பின்னணியிலே பல காரணங்கள் இருப்பதையும் இதற்குப் பின்னால் இருக்கின்ற வரலாற்று ரீதியான நடவடிக்கைகளையும் நாங்கள் இந்த இடத்திலே கவனத்திற்கொள்ள வேண்டும் என்பதற்காக நான் என்னுடைய கருத்துக்களை இந்த உயர்ந்த சபையினூடாகப் பகிர்ந்துகொள்கின்றேன்.

இலங்கையிலே ஒரு காலத்தில் சேர் பொன். இராமநான் அவர்கள் இந்து - பௌத்த பாடசாலைகளை ஆரம்பிப்பதற்கு முயற்சிகளை மேற்கொண்டிருந்தார். அவ்வாறான முயற்சியினூடாக இனங்களிடையில் ஒற்றுமைத் தன்மையை உருவாக்க முனைந்தவர் சேர் பொன். இராமநாதன் அவர்கள். அதற்காக ஒரு நிதியத்தைக்கூட தன்னுடைய சொந்தப் பணத்திலே ஆரம்பித்தார். சாதாரண குடும்பமொன்று கிட்டத்தட்ட ஒரு வாரம் அரைப் பணத்தில் சீவிக்கக்கூடிய அந்தக் காலத்தில், சேர் பொன். இராமநாதன் அவர்கள் 15,000 ரூபாய் பணத்தை முதலீடு செய்து ஒரு நிதியத்தை உருவாக்கி, அதனூடாகக் கல்வி வளர்ச்சிக்காக தனது முயற்சிகளை மேற்கொண்டார். ஆனால், அவர் அதிலே தோல்விகண்டதன் அடிப்படையில், யாழ்ப்பாணத்திலே பரமேஸ்வராக் கல்லூரியையும் - இன்றைய யாழ்ப்பாணப் பல்கலைக்கழகம் - மற்றும் இராமநாதன் கல்லூரியையும் உருவாக்கவேண்டிய ஒரு நிலைமை ஏற்பட்டது.

நாங்கள் கண்டிய நடனம் தொடர்பாகப் பல்வேறுபட்ட கருத்துக்களைச் சொல்லிக்கொள்கின்றோம். 1970ஆம் ஆண்டுக்கு முன்னர் சுதுமலை அம்மன் கோவில், மற்றும் அளவெட்டியிலுள்ள கோவில் போன்றவற்றில் திருவிழாக்கள் இடம்பெறும்போது தென்னிலங்கையிலிருந்து யானைகள் கொண்டுவரப்பட்டன. அவ்வாறு கொண்டுவரப்பட்ட யானைகளில் சுவாமிகள் ஊர்வலம் வருதல் - அந்த யானைகளுக்கூடாக திருவிழாக்களைக் கொண்டாடுகின்ற சிறப்பு - 1970ஆம் ஆண்டு காலப்பகுதியில் அந்த மக்களிடம் காணப்பட்டது. இவ்வாறு கொண்டுவரப்படுகின்ற யானைகளை யாழ்ப்பாணக் குளங்களில் குளிப்பாட்டும்போது நான்கு வயது முதல் நாற்பது வயது வரையான குழந்தைகளும் இளைஞர்களும் அந்த யானைகளுக்கு கரும்புகளையும் வாழைக்குலைகளையும் கொடுத்து, அவற்றைத் தடவி, அவற்றுடன் நின்று விளையாடிய அந்த நாட்களை இப்பொழுதும் யாழ்ப்பாணத்தில் இருக்கின்ற மக்கள் மிக முக்கியமான விடயங்களாகப் பகிர்ந்துகொள்கின்றார்கள். யானைகள் கொண்டுவரப்பட்ட இந்தக் காலத்தில்தான் கண்டிய நடனமும் இந்து ஆலயங்களின் திருவிழாக்களிலே இடம்பெற்றதை நாங்கள் மறக்கமுடியாது.

ஆனால், 1974இல் தமிழர் கலாசார மரபின்படி நடைபெற்ற தமிழாராய்ச்சி மாநாட்டிலே ஒன்பது பேர் கொல்லப்பட்டதன் பிற்பாடுதான், தென்பகுதி கலை வடிவங்களை அதிகார ஆக்கிரமிப்பின் சின்னங்களாகத் தமிழர்கள் பார்க்கத்

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

தொடங்கினார்கள். தமிழாராய்ச்சி மாநாட்டில் ஏற்பட்ட அசம்பாவிதங்களும் அங்கு ஒன்பது பேர் கொல்லப்பட்டதும் தமிழர்களுடைய மனங்களிலே ஆறா வடுக்களை ஏற்படுத்தியிருந்தன. அதனைத் தொடர்ந்துதான் அங்கு வருகின்ற ஒவ்வொரு கலை வடிவங்களையும் அதனூடாக இடம்பெறுகின்ற விடயங்களையும் தமிழர்கள் - தமிழ் இளைஞர்கள் - வித்தியாசமான சிந்தனையிலே பார்க்கவேண்டிய தேவை ஏற்பட்டது.

நாங்கள் யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தை ஒரு தனியான பிரதேசம் சார்ந்த பல்கலைக்கழகமாகப் பார்க்கவில்லை. இலங்கையிலே இருக்கின்ற பிரதான பல்கலைக்கழகங்களில் முதன்முதல் ஆரம்பிக்கப்பட்ட பேராதனைப் பல்கலைக்கழகம், அதனோடு அடுத்தடுத்ததாக ஆரம்பிக்கப்பட்ட யாழ்ப்பாணப் பல்கலைக்கழகம் என்பன இன்று உலகத்திலே அங்கீகரிக்கப்பட்ட பிரபல்யமான பல்கலைக்கழகங்கள். இதனை யாழ்ப்பாணம் என்ற ஒரு வரையறைக்குள் தமிழர்கள் பார்க்கவில்லை. ஆனால், ஒரு பல்கலைக்கழகம் அமைந்திருக்கும் இடம், அது உருவாக்கப்பட்ட வரலாறு, ஒரு பிரதேசத்தின் இன, கலாசார, விழுமிய அடையாளங்களைப் பிரதிபலிப்பதாக அமைந்திருக்கும். இதனை நாங்கள் யாரும் நிராகரிக்க முடியாது. பரமேஸ்வரா கல்லூரியே யாழ்ப்பாணப் பல்கலைக்கழகமாக மாற்றப்பட்டது என்பதை நாங்கள் இந்த இடத்திலே நிராகரிக்க முடியாது. ஆகவே, ஒரு பல்கலைக்கழகம் என்பது அதனுடைய பிராந்தியம் சார்ந்த, பிரதேசம் சார்ந்த அங்குள்ள மக்களின் எண்ணங்களையும் கலை வடிவங்களையும் கலாசார விழுமியங்களையும் வெளிப்படுத்துகின்ற ஓர் இடமாக அமைந்திருக்கின்றது.

1905ஆம் ஆண்டில் முதன்முதல் நீராவியின்மூலம் இயங்குகின்ற புகையிரதம் யாழ்ப்பாணத்துக்குக்கும் கொழும்புக்கும் இடையில் சேவையில் ஈடுபடுத்தப்பட்ட பொழுதுதான் யாழ்ப்பாண உணவுப் பழக்கவழக்கத்துக்கு சிங்கள மக்களை உள்வாங்கிய வரலாறு இடம்பெற்றது. இங்கே நாங்கள் ஏற்றுமதி, இறக்குமதி பற்றிப் பேசுகின்றோம். அக்காலத்தில் புறக்கோட்டையில் நடைபெற்ற புதன், வெள்ளிச் சந்தைகளில் இந்த நீராவி இயந்திரப் புகையிரதத்தின்மூலம் யாழ்ப்பாணத்திலிருந்து மிளகாயைக் கொண்டுவந்து தமிழர்கள் விற்பனை செய்தார்கள். அன்று மிளகை மட்டுமே உணவுக்குப் பயன்படுத்தப் பழகிக்கொண்டிருந்த சிங்கள மக்கள், மிளகாயைப் பயன்படுத்தவும் பழகிக்கொண்டார்கள். இது காலத்தின் மிக முக்கியமான ஒரு மாற்றம். இங்கு தேயிலை, தென்னை, இறப்பர் போன்ற உற்பத்திகள் இருக்கின்ற பொழுது, யாழ்ப்பாணத்திலே உற்பத்தி செய்யப்பட்ட பொருட்கள் - கமத்தொழில் உற்பத்திகள் நீராவிப் புகையிரதம்மூலம் இந்த மண்ணுக்குக் கொண்டுவரப்பட்டன. இதன்மூலம் மக்கள் சந்தைப் பழக்க வழக்கத்துக்குக் கொண்டுவரப்பட்டார்கள். இவ்வாறெல்லாம் நடைபெற்ற இந்த மண்ணில்தான் இன்று இந்தக் கசப்பான விடயங்கள் அரங்கேறுகின்றன. இதனை மிக முக்கியமாக நாங்கள் கவனத்தில் எடுக்க வேண்டும்.

கண்டிய நடனத்தில் பெரும்பாலும் தமிழர்களுடைய கலாசாரத்தின் பங்களிப்பு இருக்கின்றது. அதில் இடம்பெறுகின்ற 'பறை' என்பது தமிழர்களுடைய அடிப்படைக் கலாசார மரபிலிருந்து வந்த ஒரு தாள வாத்தியமாகும். அது தமிழர்களுக்கு உரித்தானது. "எப்பொழுதும் சிங்கள கலை, இலக்கிய வளர்ச்சிக்கு தமிழர்களின் பங்களிப்பு மிகப் பெரிதாக இருந்துள்ளது" என்று இன்று சிங்கள மக்கள் மத்தியில் மிகப் பிரபல்யம்வாய்ந்த பேராசிரியர் சரத் சந்திர அவர்கள் கூறியிருக்கிறார். இதனை இந்தச் சபையிலுள்ள யாரும் மறுக்கமாட்டார்கள் என்று நான் நினைக்கின்றேன். ஏனென்றால் இந்தக் கலையை வளர்ப்பதிலும் 'மௌனம்' என்கின்ற மொழியின் ஊடாக இந்த நாட்டிலே ஒரு மாற்றத்தைக் கொண்டுவருவதிலும் பேராசிரியர் சரத் சந்திர அவர்கள் மிக முக்கியமானவராக இருந்துள்ளார். அதேபோலத்தான் கலாஜோதி ஆனந்தகுமாரசுவாமி அவர்களும் செயற்பட்டிருக்கின்றார். அதாவது, ஒரு தமிழரான கலாஜோதி ஆனந்தகுமாரசுவாமி அவர்கள் சிங்களக் கலை வடிவங்களை வளர்ப்பதிலும் சிங்களக் கலை வடிவங்களுக்கு ஓர் அத்திவாரத்தைக் கொடுப்பதிலும் மிக முக்கியமான பங்களிப்பைச் செய்திருக்கின்றார். ஆகவே, மிக முக்கியமாக கலைகள் ஊடாகவும் இன, மொழி அடிப்படையிலும் ஒற்றுமையை வளர்ப்பதிலே தமிழர்களும் மிகக் கூடியளவு பங்களிப்பைச் செய்திருக்கின்றார்கள்.

ஊவா - வெல்லஸ்ஸ, சப்ரகமுவ மற்றும் கிழக்குப் பல்கலைக்கழகங்களிலும் இவ்வாறான பல சம்பவங்கள் இடம்பெற்றிருக்கின்றன. ஆனால், அவை கருத்திலே எடுக்கப்படவில்லை. யாழ்ப்பாணத்தில் நடந்த சம்பவத்தின் பொழுது அங்கு ஆளுநர் நேரடியாகச் சென்று நிலைமைகளைப் பார்வையிட்டிருக்கின்றார். ஆனால் அவருடைய கருத்துக்கள் தமிழ் மாணவர்களைச் சாடுவதுபோல் அமைந்திருப்பதுதான் வேதனைக்குரியது. அவர் தமிழ்மொழி தெரிந்த ஓர் ஆளுநர்; ஒற்றுமைக்காகப் பேச வேண்டிய ஒருவர். அவர் ஆளுநராக வந்தபொழுது அவர் தமிழ் பேசுவார் என்று சொன்னார்கள். ஆனால், அவரே இவ்வாறு பேசியிருப்பது தமிழ் மக்களின் மனங்களிலே ஏமாற்றங்களைக் கொண்டுவருகின்ற விடயமாக இருக்கின்றது. ஆகவே, நாங்கள் இதனை மிக முக்கியமாகக் கருத்தில் எடுக்க வேண்டும்.

கொழும்பில் தமிழ்ச் சங்கம் அமைந்திருக்கின்ற வீதியை "தமிழ்ச் சங்க வீதி" என்று பெயரிடுவதற்குச் சம்பந்தப் பட்டவர்கள் மறுப்புத் தெரிவித்துவிட்டார்கள். அந்தப் பெயரிடலுக்கு எதிராக சம்பந்தப்பட்டவர்கள் கடுமையாகப் போராடினார்கள். ஆனால், இப்பொழுதும் அது 'சங்க வீதி' என்றுதான் பெயரிடப்பட்டிருக்கின்றது. அதைவிட நீங்கள் கிளிநொச்சியில் ஒன்றைப் பார்க்கலாம். அதாவது, அங்கே ஓர் இராணுவச் சின்னம் - monument இருக்கின்றது. அதேபோன்ற இராணுவச் சின்னங்கள் ஆனையிறவிலும் முள்ளிவாய்க்காலிலும் இருக்கின்றன. இவை எல்லாம் அங்கிருக்கின்ற இளைஞர், யுவதிகள், குழந்தைகள், பாடசாலைப் பிள்ளைகளின் மனங்களில் எப்பொழுதும் உணர்வு மாற்றங்களைக் கொடுத்தவண்ணம் இருக்கின்றன; எதிர் மனப்பாங்குகளை உருவாக்கிக்கொண்டிருக்கின்றன. இவற்றை எல்லாம் அங்கிருக்கின்ற தமிழ் சிறுவர்கள், இளைஞர்கள் மற்றும் குழந்தைகள் ஓர் ஆக்கிரமிப்பின் அடையாளங்களாகப் பார்க்கின்றார்கள்.

நேற்றைய தினம் யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் மாணவர் ஒன்றியத் தலைவர் சசிதரன் பொலிஸாரால் விசாரணைக்கு உட்படுத்தப்பட்ட பின்னர் நீதிமன்றத்தினால் விடுதலை செய்யப்பட்டிருக்கின்றார். ஆனால் ஒரு பல்கலைக்கழகத்தினுடைய அனைத்துப் பீடங்களின் மாணவர் ஒன்றியத்தின் தலைவராக இருப்பவர் ஒருகாலமும் இவ்வாறான தாக்குதல் நடவடிக்கைகளில் ஈடுபடமாட்டார்.

அவர் சமாதானம் பேசுவதிலும் பிரச்சினைகளைச் சமாளிப்பதிலுமே கூடிய பங்கை வகிப்பார். இது யதார்த்தமானது. அப்படியிருக்க, அவர்மீது ஒரு குற்றம் சுமத்தப்பட்டிருப்பதும் தமிழ் மாணவர்கள் கைது செய்யப்பட வேண்டும் என்று வித்தியாசமாக, வேகமாகச் சொல்ல நினைப்பதும் நல்லிணக்கத்தை ஏற்படுத்தாது. நல்லிணக்கம் யாருக்குத் தேவை? இந்த நாட்டில் யார் நல்லிணக்கத்தை விரும்புகின்றார்கள்? இந்த மண்ணில் யார் பாதிக்கப் பட்டார்களோ, யார் அநியாயங்களைக் கூடுதலாகச் சந்தித்தார்களோ, சூழலிலே யார் தாக்கப்பட்டிருக் கின்றார்களோ அவர்களுக்கே நல்லிணக்கத்தைக் காட்ட வேண்டும். அந்தப் பாதிப்பைக் கொடுத்தவர்களே அவர்களுக்கு நல்லிணக்கத்தைக் காட்ட வேண்டியவர்களாவர். ஆனால், இன்று நல்லிணக்கம்கூட கேள்விக்கு உட்படுத்தப் பட்டிருக்கின்றது. இந்த விடயங்களையே நான் இந்தச் சபையினூடாக முன்கொண்டுவர விரும்புகின்றேன்.

ஆகவே, இந்தப் பல்கலைக்கழகத்தின் விடயங்களை நாங்கள் கருத்திலே எடுத்துக்கொள்ள வேண்டும். ஏனென்றால், இது சாதாரண விடயமல்ல. ஆனால், இப்படியான சம்பவங்கள் தொடர்ந்தும் அந்த மண்ணிலே நடந்துவிடக்கூடாது. அதிலும் யாழ்ப்பாண மண்ணிலே நடந்தது துரதிஷ்டவசமானது. ஆனால், தமிழ் இளைஞர்களோ சிங்கள மாணவர்களோ தமிழ் மாணவர்களோ இதனை ஒரு பெரிய விடயமாக எடுத்துக் கொள்ளவில்லை. அவர்களுக்குள்ளே புரிதலில் ஏற்பட்ட ஓர் இடைவெளியாகவே இதனைக் கருதுகின்றார்கள். அதேநேரத்தில் ஒருவர்மீது வலுக் கட்டாயமாகக் கலை வடிவங்கள் திணிப்பது என்பது நிறுத்தப்பட வேண்டும். அங்கு மிக முக்கியமாக இராணுவப் புலனாய்வாளர்கள், பொலிஸார் மற்றும் சம்பந்தப்பட்ட பலர் சிவில் உடையிலே பிரசன்னமாக இருந்தமையைப் பற்றி மாணவர்களும் மற்றும் பொதுமக்களும் தெரிவிக்கின்றார்கள். எனவே இந்த விடயங்களையும் கருத்திற்கொள்ள வேண்டும். மிக முக்கியமாக இந்த விடயங்களுக்குப் பின்னணியில் பல்வேறுபட்ட நோக்கங்கள் இருந்திருக்கும் என்பதையும் நாங்கள் கவனத்திற்கொள்ள வேண்டும் என்று கூறி, என்னுடைய உரையை நிறைவுசெய்கின்றேன். மிக்க நன்றி.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඊළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 3.38]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ අද දින ඉදිරිපත් කර තිබෙන නියෝග සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ලැබුණු මේ අවස්ථාව මා ඉතා සතුටින් භාර ගන්නවා. 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග සම්බන්ධයෙන් 2016.02.11වන දිනැති අංක 1953/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර තිබෙනවා, ජල නල සම්බන්ධ උපකරණ පිළිබඳව. 1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර තිබෙනවා, රට තුළට අපද්‍රව්‍ය එක්රැස්වීම වළක්වා ගැනීම සඳහා, පාවිච්චි කරපු වාහන, වාහන අමතර කොටස්, පාවිච්චි කරපු පරිගණක, ගෘහ උපකරණ ආදිය ආනයනය කිරීම පාලනය කිරීම -සීමා කිරීම- පිළිබඳව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. J.M. Ananda Kumarasiri to the Chair?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Sir, I propose that the Hon. J.M. Ananda Kumarasiri do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
1970/9 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 8702 වර්ගීකරණ සංකේතාංකය යටතේ කුඩා බස් රථ, කුඩා වෑන් රථ ආනයන කාල පරිච්ඡේදය පළමු ලියා පදිංචි කිරීමේ දිනයේ සිට වසර පහේ සිට වසර දහය දක්වාත්, සංකේත අංක 8703 යටතේ කාර් සහ කුඩා වාහන ආනයන කාල පරිච්ඡේදය ලියා පදිංචි දිනයේ සිට වසර දෙකේ සිට වසර තුන දක්වාත්, ඒ වාගේම විශේෂ කාර්යය සඳහා වන වාහන -ලොරි, දොඹකර, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ ලොරි- ආනයන කාල පරිච්ඡේදය වසර හතේ සිට වසර දහය දක්වාත් දීර්ඝ කිරීමේ සහ යතුරු පැදි හා තරගකරුවන්ගේ ආරක්ෂාව පිණිස හිස් ආවරණ ආනයන බලපත්‍ර පාලනයට යටත් කිරීමේ නියෝග තුනක් ක්‍රියාත්මක වීමට නියමිතයි.

පසු ගිය කාලයේ ලාභ ඉපයීමේ අරමුණින් විශේෂ වූ පුද්ගලයන් සඳහා ඕනෑම දෙයක් රට තුළට ආනයනය කිරීමේ අවස්ථාව ලබා දුන්නා. ඒ තුළින් විශේෂයෙන්ම මේ ආනයන භාණ්ඩවලට අමතරව මත් කුඩු සහ එතනෝල් ආනයනය කිරීම සිද්ධ වුණා. පාවිච්චි කළ වාහනවල වාගේම ගෘහ උපකරණ කාල සීමාවකින් තොරව ආනයනය කිරීම රටේ විවිධ අංශවල නිෂ්පාදනවලට තදින්ම බලපෑවා. විශේෂයෙන්ම වඩු කාර්මිකයා, යකඩ කාර්මිකයා, වාහන අමතර කොටස් නිෂ්පාදකයා නිෂ්පාදනය කරන සියලුම දේවල්වලට මේ නියෝගය බලපෑවා. ඇත්ත වශයෙන්ම තාවකාලික ලාභය මත සහ ආර්ථික හේතු මත ජනතාව මේ වාගේ බාල උපකරණ මිලදී ගැනීමට පුරුදු වුණා.

විශේෂයෙන්ම වොට් 110 විදුලි උපකරණ විදේශ රටවලින් ලංකාවට ගෙන්වා, ඒවා වොට් 220 දක්වා ප්‍රතිනිර්මාණය කරලා

[ගරු වන්දිම ගමගේ මහතා]

විකිණීම සිද්ධ වුණා. එවැනි භාණ්ඩ ටික කාලයකින් පාවිච්චි කළ නොහැකි තත්ත්වයට පත් වුණාට පස්සේ ජනතාව ඒ භාණ්ඩ මිලදී ගැනීම අත්හැර දැමීමට පුරුදු වුණා. ඒ වාගේම ඒ භාණ්ඩවල මිල අඩුවීම නිසා දේශීය වශයෙන් නිෂ්පාදනය කරන හොඳ භාණ්ඩවලට වෙළෙඳ පොළේ තරගකාරිත්වයට මුහුණ දෙන්න හැකියාවක් ලැබුණේ නැහැ. එම නිසා විශේෂයෙන්ම විදුලි භාණ්ඩ, ගෘහ උපකරණ, දේශීය වාහනවල අමතර කොටස් නිෂ්පාදනය සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුණා. ඒ වාගේම වාහනවල අමතර කොටස් ගෙන්වීමේ මුවාවෙන් තීරු බදු වංචා කරලා, වාහනවල කොටස් ගෙන්වා වාහන එකලස් කිරීමේ ව්‍යාපාරයක් ක්‍රියාත්මක වන්නත් පටන් ගත්තා. එවැනි කූට ව්‍යාපාර හරහා එකලස් කරන වාහන ලියා පදිංචි කිරීමේ ක්‍රමවේදයකුත් පටන්ගත්තා. ඒවාට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ යම් යම් පුද්ගලයන්ගේ හවුල් වීමක් සිද්ධ වුණා. ඒ නිසා කල් බදු සමාගම්වලටත් දැඩි අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. අවසානයේදී සොයා බලද්දී කල් බදු පහසුකම් ලබා දුන් සමහර වාහන මේ වාගේ කූට ව්‍යාපාරිකයන් විසින් එකලස් කරන ලද වාහන බවට හෙළි වුණා. ඒ තත්ත්වයත් එක්ක මේ රටේ ජනතාව වාහන මිලදී ගැනීමට බිය වුණා. ඒ එක්කම මූල්‍ය ආයතනවලින් වාහනවලට ලීසිං පහසුකම් ලබා දීමේදී විවිධ කොන්දේසි දැමීම නිසා ජනතාව දිගින් දිගටම අසහනකාරී තත්ත්වයකට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊළඟට අදහස් දක්වන්න බලාපොරොත්තු වෙනවා, 1970/9 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිබඳව. එහි සඳහන්, වසර පහකට වඩා නොපැරණි කුඩා වෑන් රථ හා කුඩා බස් රථ සම්බන්ධව මෙහිදී විශේෂයෙන් කියන්න ඕනෑ. නවීන වාහන මේ රටට ගෙන්වන එක හොඳයි. ඉතා ඉහළ තාක්ෂණ ක්‍රමවේද හරහා තමයි නවීන වාහන නඩත්තු කළ යුතු වන්නේ. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවලට ගියාම මේ සම්බන්ධයෙන් බරපතළ ගැටලු තිබෙන බව පෙනෙනවා. මේ රටේ නවීන වාහනවල නඩත්තු කටයුතු සඳහා කාර්මිකයන්ගේ ලොකු හිඟයක් තිබෙනවා. කාර්මිකයන් සිටියත් ඒ කටයුත්ත සඳහා අවශ්‍ය වන ආම්පන්නවලට ඉතා අධික මිලක් ගෙවන්න සිද්ධ වෙනවා. ඒ නිසා, ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රවාහන කටයුතුවලට, පාසල් සේවය වාගේ සේවාවලට මේ වාගේ කුඩා ප්‍රමාණයේ බස් රථ හෝ වෑන් රථ තමයි යොදා ගන්නේ. ඒවායේ නඩත්තුවලට සහ අලුත්වැඩියාවලට ගත වන කාලය සහ මුදලේ ගැටලුවත් එක්ක එකී වාහන හිමියන්ට නඩත්තු කටයුතු දරාගැනීමේ නොහැකියාවක් තිබුණා. දීර්ඝ කාලීනව තිබුණු නීති-රීතිත් එක්ක එවැනි අඩු තාක්ෂණයෙන් යුතු වාහන මේ රටට ගෙන්වීම නැවැත්වීම තුළ ගැටලුකාරී තත්ත්වයක් ඇති වුණත්, තමන්ට හැකි පමණින් ඒ වාගේ වාහන නඩත්තු කරලා පාවිච්චි කිරීමට ඒ වාහන හිමියෝ උත්සාහයක් ගත්තා. ඒ තුළ විවිධ දුෂ්කරතාවලට ඔවුන්ට මුහුණ දෙන්න සිද්ධ වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ කාර්යය සඳහා වන වාහන ගැනත් කියන්න ඕනෑ. විශේෂයෙන් දොඹකර, කොන්ක්‍රීට් මිශ්‍රණ, ලොරි රථ ආදිය අනිවාර්යයෙන් යොදාගන්නේ ඉදි කිරීම් ක්ෂේත්‍රයේ කටයුතුවලට වාගේම ප්‍රවාහන කටයුතුවලට. මෙහිදී අප විශේෂයෙන් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඉදි කිරීම් ක්ෂේත්‍රයේ වාහන ගත්තාම, අද වන විට ඒවා ICTAD C1 - C6 කාණ්ඩ ලෙස වර්ගීකරණය -ප්‍රමිති වර්ගීකරණය- කර තිබෙනවා. ඒ ඒ කාණ්ඩවලට අනුව ඉහළ වර්ගීකරණයට යොමු වන විට මේ වාගේ වාහන තමා සතුව තබාගන්න සිද්ධ වෙනවා. එහෙම නැත්නම් කාර්යක්ෂමතාව පිළිබඳ ගැටලුවලට මුහුණ දෙන්න සිද්ධ වනවා. ඒ නිසා විශේෂයෙන් ඉදි කිරීම් ක්ෂේත්‍රයේ සමාගම් හිමියන් විවිධ ක්‍රමවේද හරහා ඒ වාහන ගන්න පුරුදු වෙලා සිටියා. ඒවාට ඉතා ඉහළ මිලක් ගෙවන්න සිද්ධ වෙනවා. ඒ ඉහළ මිල ගෙවීමේදී විවිධ මූල්‍ය ආයතනවලට ණය තුරුස් වන්නත් සිද්ධ වුණා. ඒ තත්ත්වය මේ අලුත් නියෝගය හරහා යම්කිසි මට්ටමකට පහ වෙවි කියා අපි විශ්වාස කරනවා. ඉදි කිරීම් ක්ෂේත්‍රයේ පසු ගිය කාලයේ තිබුණු යම් යම් පසුබට වීම් ඒ තත්ත්වයත් එක්ක ඉදිරියේදී නිවැරැදි වේවි කියාත් බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තිබෙන තාක්ෂණයත් එක්ක යන්තු නැතිව කිසි දෙයක් කරන්න බැහැ. මහා පරිමාණයේ ගොඩනැඟිල්ලක් හදන්න පටන් ගත් දවසේ ඉඳලා එය අවසන්වන කල්ම දොඹකරය ඒ ස්ථානයේ සවි කර තබන්න සිද්ධ වනවා. ඒක තමයි ක්‍රමවේදය. ඒ නිසා මේ රටේ ඉදි කිරීම් ක්ෂේත්‍රයට බලපාන වාහන සඳහා පනවා තිබූ කොන්දේසිවල යම්කිසි ලිහිල්භාවයක් ඇති කිරීම ඇගයිය යුතුයි කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මා කියන්න කැමැතියි කුඩා කාර් ගැන. පසු ගිය කාලයේ විශාල ගැටලුවක් ඇති වුණා, කුඩා වාහනයක් හිමි කර ගැනීමේ රජයේ සේවකයන්ගේ සිහිනය බොඳ වෙලා ගියා කියලා. ඒ ගැන ලොකු චෝදනාවක් රජයට එල්ල වුණා. දැන් අපි අවස්ථාව දීලා තිබෙනවා කුඩා වාහන ඉතා අඩු මිලකට ගෙන්වාගන්න. ඕනෑම කෙනෙකුට තමන්ගේ budget එකට, එහෙම නැත්නම් තමන්ගේ මූල්‍ය හැකියාවට ගැළපෙන වාහනයක් ලබා ගැනීමේ හැකියාව ඉදිරියේදී මේ හරහා ලැබේවි කියලා අපි විශ්වාස කරනවා.

ඊළඟට, 1953/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයෙන් කියැවෙන්නේ ජල නළ සම්බන්ධයයි. අපි දන්නවා, මේ රටේ ජල පහසුකම් ගැන කථා කළොත්, සියයට 40ක් තමයි නළ ජලය මඟින් තමන්ගේ ජල අවශ්‍යතා සපුරා ගන්නේ. මීට ඉහත දී මේ තත්ත්වය ප්‍රබල ගැටලුවක් බවට පත්වෙලා තිබුණා. අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මම කියන්න කැමැතියි, අද ඒ ප්‍රදේශවල ළිංවල ජලය සහ නළ ළිං වල ජලය බොන්න බැරි තත්ත්වයක් තිබෙන බව. අද භූගත ජලය දූෂිත වෙලා තිබෙනවා. වකුගඩු රෝගයට අදාළ රෝග කාරකය එම භූගත ජලයේ තිබෙනවා කියන විශ්වාසයක් ජනතාව තුළ තිබෙනවා. වකුගඩු රෝගය පවතින අනුරාධපුරය වාගේ ප්‍රදේශවල පාවිච්චි කරන්නේ වාරි ජලය ආශ්‍රිතව ලබා ගන්නා ජලයයි. දවසකට ඝන මීටර් 250,000ක ජල විනාශයක්, එහෙමත් නැත්නම් නාස්ති වීමක් සිද්ධ වෙනවා නම් එය සහගහන අපරාධයක්. ඒ තත්ත්වය නිවැරදි කර ගන්න දේශීය සහ විදේශවලින් ආනයනය කරන ජල නළවල ප්‍රමිතියක් තිබිය යුතුයි. ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයෙන් මේ කටයුතු සිදු කළත්, රටේ ඕනෑම තැනක ගිහිල්ලා බැලුවොත් ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයේ ජල පද්ධතිවල කාන්දුවීමක් අපට බලා ගන්න පුළුවන්. ඒ නිසා ප්‍රමිතියෙන් යුතු ජල නළ මේ රටට ගෙන්වීම සහ නිෂ්පාදනය කිරීම සිදුවිය යුතුයි.

අපි දන්නවා, පසු ගිය කාලයේ අනවශ්‍ය විධියට පොහොර යෙදීම සහ ලබා දීපු පොහොරවල ප්‍රමිතියේ හිඟකම නිසාත් රෝගී සහගත තත්ත්වයක් මේ රටේ ඇති වුණු බව. ඒ තත්ත්වය පහ කරන්න අද වෙනකොට වර්තමාන යහ පාලන ආණ්ඩුවෙන් කාබනික පොහොර ලබා දීමේ සහ කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියට ගොවි ජනතාව යොමු කරලා තිබෙනවා. මොන හොඳ දේ කරන්න හැදුවත් ඒකේ හැමදාම ඇදයක් නැත්නම් කොස්සක් දකින පිරිසක් ඉන්නවා. ඒ පිරිස

හිතනවා, මේ හරහා ජනතාව උසි ගන්වා පාරට බස්සවා විරෝධතා කරලා ආණ්ඩු පෙරළන්න පුළුවන් කියලා. එහෙම කාලයක් තිබුණා. ඒ කාලය දැන් අවසන් වෙලා තිබෙනවා. ජනතාව දැන් යථාර්ථය තේරුම් අරගෙන තිබෙනවා. ජනතාව දිනෙන් දින, ටිකෙන් ටික යථාර්ථය තේරුම් ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පවතින පානීය ජල හිඟය මැඩ පැවැත්වීමට, ඒ තත්ත්වය පාලනය කිරීමට කටයුතු කළ යුතුයි. අද ප්‍රජා ජල මූල්‍ය සංවිධානවල තිබෙන තත්ත්වය බොහොම දුර්වලයි. තමන්ගේ ප්‍රජා ජල මධ්‍යස්ථානයෙන් පොම්ප කරලා, ටැංකියට පුරවා ගන්න වතුර ටික සාර්ථකව බෙදා හැරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර ගැනීමේ නොහැකියාවක් අද ඒ පුද්ගලයන්ට තිබෙනවා. ඉදිරියේදී ප්‍රමිතියෙන් යුතු ජල නළ සහ ප්‍රමිතියෙන් යුතු උපාංග ලබා දීම තුළ ඒ තත්ත්වය නිවැරදි වෙයි කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින කථිකයන්ගේ අදහස් දැක්වීම්වලදී විදේශීය ණය ගැන කථා කළා. ඒ වාගේම විදේශීය ආයෝජකයන් මේ රටට එන්නේ නැහැ කියලාත් කියැවුණා. අපි දන්නවා, පසු ගිය කාලයේ විදේශීය ආයෝජකයන්ගේ මුදල් හොරකම් කළ බව. හොර ඇටර්නි බලපත්‍ර හදලා, හොර ඇටර්නි බලපත්‍ර හරහා අදාළ විදේශිකයාගේ සමාගමේ කොටස් විකුණා තිබුණා. ඒ හේතුවෙන් අවුරුදු 19කට පස්සේ හිරේ යන්න සිද්ධ වෙච්ච කථාවකුත් අපි දන්නවා. [බාධා කිරීමක්] මම නම ගම කියන්නේ නැහැ. ඒ නිසා කවුරුවත් කලබල වෙන්න අවශ්‍ය නැහැ. රිදෙනවා නම් ඒකට මට කරන්න දෙයකුත් නැහැ. නඩුව යට ගසා තිබුණාට, අවුරුදු 19කට පස්සේ හරි හිරේ යාමට සිදුවීම තුළ දැන් මේ රටේ ජනතාව තේරුම් අරගෙන තිබෙනවා මේ ආණ්ඩුවෙන් වැරදිකරුවන්ට දඬුවම් කරනවා කියලා. ඒ වාගේ ස්ථාවර මට්ටමක් ඇති කරලා තිබෙනවා.

මේ තත්ත්වයත් එක්ක තමයි විදේශීය ආයෝජකයන් මේ රටට එන්නේ. ඒක තේරුම් ගන්න බැරිව බොරුවට කෑ ගහනවා. ඒ වාගේ තත්ත්වයන් තුළ විදේශීය ආයෝජකයන් මේ රටට එන්නේ නැහැ. අපි දන්නවා, පසු ගිය කාලයේ GSP සහනය නැති වුණාම "GSP සහනය මොකටද? අපට කරන්න පුළුවන්" කියලා කෑ ගැහුවා. අන්තිමට මොකද වුණේ? කර්මාන්ත 700කට වැඩි ප්‍රමාණයක් වැහිලා ගියා. ජනතාවගේ රැකියා නැති වෙනකොට ඒගොල්ලන්ට දෙන්න විසඳුමක් නැති වුණා. ඒක නිසා තමයි බලය අහිමි වුණේ. අද විපක්ෂයේ ඉඳගෙන පාලක පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ තනතුරු සහ ඇමතිකම් ගැන කථා කරනවා. එහෙම නම් තමන්ට බලය තිබෙන කාලයේ ඒවා කරන්න තිබුණා. ඒවා සිදු කළේ නැතිව දැන් විකල්ප සොයනවා, ආණ්ඩු බලය ගන්නට. ඔහොම දඟලුවාට ආණ්ඩු බලය ගන්න ලැබෙන්නේ නැහැ.

මම කියන්නට ඕනෑ, මේ වාගේ පිරිසක් සමඟ පාර්ලිමේන්තුවේ ඉන්න ලැබීම සම්බන්ධයෙනුත් මගේ යම්කිසි කලකිරීමක් තිබෙන බව. මොකද, මොනවා කළත් මේගොල්ලන් "එපා" කියන එකයි කියන්නේ. මේගොල්ලන්ට අවශ්‍ය වෙලා තිබෙන්නේ හැමදාම කෑ ගහන්න විතරයි. අද අපේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කථා කරන විට කියනවා, "අපට ආණ්ඩුව ගන්න ඕනේ නැහැ, අපට ආණ්ඩුව එපා. තව අවුරුදු 4ක් අපි විපක්ෂයේ ඉන්නම්" කියලා. නමුත් එහෙම කියන ගමන් බොරු "ෂෝ" එකක් ගහලා පෙන්වනවා, "අපිට යළි බලය ගන්න පුළුවන්" කියලා. බලය එපා නම්, ඔබතුමන්ලා තව අවුරුදු 4ක් විපක්ෂයේ ඉන්නවා නම්, මොකටද ඔව්වර දඟලන්නේ? පාඩුවේ අවුරුදු 4ක් ඉඳලා බලන්න, මොනවාද වෙන්නේ කියලා. යහ පාලන ආණ්ඩුවේ ක්‍රමවේදය සහ යහ පාලන ආණ්ඩුවේ ක්‍රියාකාරකම්වලට බොරුවට බාධා කරන්න එපා. එහෙම බාධා කළා කියලා ඔබතුමන්ලාට බලය ගන්නත් බැහැ, බාධා කළා කියලා යහ පාලන ආණ්ඩුවේ ගමන නවත්වන්නත් බැහැ. බලය එපා නම්, බලය එපා කියලා ඒ විධියට ඉන්න. බොරුවට කෑ ගහලා අනවශ්‍ය ගැටුම් ඇති කර ගන්නට උත්සාහ කරන්න එපා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සිසිර ජයකොඩි මහතා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.35]

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් සුවිශේෂී වැදගත්කමක් තිබෙන කරුණු සම්බන්ධ විවාදයක් පැවැත්වෙන මේ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේ හැම ආසනයක්ම හිස් වෙලා තිබෙනවා. අපේ රටේ ආර්ථිකය විනාශ කරලා, හිස් කරලා, අපේ රටේ අපනයන ආදායම දිගින් දිගටම අඩු වෙමින් යන කාලයක්. අපේ ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා නම් සභාවේ ඉන්නවා. ගරු සභානායකතුමා දැන් සභාවට එමින් සිටිනවා. මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවේ හිස් අවකාශයක් තමයි අපට අමතන්නට සිදු වෙලා තිබෙන්නේ. මේ රටම ආර්ථික වශයෙන් හිස් කරපු රජයකට විපක්ෂයේ කරුණු ඉදිරිපත් කිරීම් අහගෙන ඉන්න හෘදය සාක්ෂියට එකඟව බැරි බව තමයි අපට පෙනී යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉකුත් වර්ෂයේ -2015 සහ 2016 වර්ෂවලට සාපේක්ෂව- ආනයන සහ අපනයන අතර වෙළෙඳ හිඟය සියයට 20.2කින් ඉහළ ගිහින් තිබෙන බව අපි දන්නවා. 2015 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 516ක් වුණු මුළු වෙනස අද ඇමෙරිකානු ඩොලර් මිලියන 620ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා ආනයන අපනයන අතර විශාල පරතරයක් රට තුළ ඇති වෙලා තිබෙනවා. 2015 ජනවාරි 08වෙනි දායින් පසුව අපේ රටේ සමස්ත අපනයන ආදායම දවසෙන් දවස කඩා වැටෙමින් තිබෙනවා; අඩුවෙමින් තිබෙනවා. ඔබතුමන්ලාගේ වාර්තාවලින් කියන අන්දමටම පසුගිය මාර්තු මාසය වන විට - පළමු කාර්තුව- අපේ අපනයන ආදායම සියයට 11.2කින් අඩු වෙලා තිබෙනවා. අපේ රටේ අපනයන ආදායම නැති කළ වර්තමාන රජය, ලංකාවේ ආර්ථික වැඩ පිළිවෙළක් නැතිම රජය බවට ඉතිහාසගත වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේවලට දෙන සහනාධාරය කපා හරින විට, රබර්වලට දෙන සහනාධාරය කපා හරින විට, පොහොර සහනාධාරය නැති කරන විට අපනයන වර්ධනය වෙන්නේ කොහොමද? එහෙම අපනයන වර්ධනයක් බලාපොරොත්තු වෙන්නට බැහැ. ඒ නිසා මේ රජය ගෙන යන වැරැදි ආර්ථික ප්‍රතිපත්තියේ පාපයට තමයි අද රටට මුහුණ දෙන්නට සිදු වෙලා තිබෙන්නේ.

අපි දන්නවා, ආනයන වියදම දවසින් දවස වැඩි වෙන බව. පසු ගිය මැයි මාසය වන විට සියයට 22කින් ආනයන වියදම වැඩි වුණා. ආනයන වියදම වැඩි වෙන්නට හේතුව මොකක්ද?

[ගරු සිසිර ජයකොඩි මහතා]

ඩොලරයේ අගය දවසින් දවස ඉහළ යාම. මේ ආණ්ඩුවේ කළමනාකරණයක් නැති, අදූරදර්ශී ආර්ථික ප්‍රතිපත්තිය නිසා අද ඇමෙරිකන් ඩොලරයේ විකුණුම් මිල රුපියල් 148 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා අපේ රට කාපු, අපේ රටේ අනාගතය විනාශ කරපු පාලනයක් තමයි අද මේ විදේශ ආයෝජන කියලා කථා කරන ආර්ථික සංවර්ධන මූලෝපායන් සියල්ලම තුළින් සිදුව ඇත්තේ. මේ වර්තමාන පාලනය විසින් මේ රටට ඇති කරපු මේ පාපකාරී ක්‍රියාදාම සියල්ලම අපේ රටේ ඉදිරි අනාගතයට ශාපයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ වාර්තා අනුව උද්ධමනය සියයට 4.3කින් ඉහළ යාමක් පෙන්නුම් කරනවා. මේක නොවෙයි සත්‍ය. දවසින් දවස හැම භාණ්ඩයකම මිල වැඩි වෙනවා.

කොටස් වෙළෙඳ පොළ කඩා වැටෙනවා. ආයෝජකයෝ ලංකාවට එන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා කිව්වේ, එතුමා බලයට පැමිණියාම ආයෝජකයෝ නැව් පිටින් එනවා කියලා. අද කොටස් වෙළෙඳ පොළට වෙලා තිබෙන්නේ මොකක්ද? දවසින් දවස කඩා වැටෙනවා. ඒක තමුන්නාන්සේලාගේ වාර්තා අනුව පේනවා. එහෙමනම්, රට ආර්ථික වශයෙන් බංකොලොත් වුණු තත්ත්වයකට තමයි පත් වෙලා තිබෙන්නේ.

අපි දන්නවා, අද අපේ අගමැතිතුමා "සිංගප්පූරුව සරණං ගච්ඡාමි" වෙලා තිබෙනවා. සිංගප්පූරුව තමයි එතුමාගේ පරමාදර්ශය. සිංගප්පූරුව ආර්ථික මූලෝපායන් වශයෙන් කටයුතු කරන්නේ අපට සතුටු පිලේද නැතිනම් අපට සතුරු පිලේද කියලා තෝරා ගන්න ඕනෑ කාල පරිච්ඡේදයකයි අප ඉන්නේ. දැනට අවුරුදු 30කට ඉස්සෙල්ලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හම්බන්තොට වරායක් ඉදි කිරීමේ වැදගත්කම ගැන කිව්වා. වරායක වැදගත්කම කිව්වා. ඊට පස්සේ පැවැති හැම රජයක්ම -අපේ රජයක් වෙන්න පුළුවන්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව වෙන්න පුළුවන්- ද්විතීයික වරායක් හදා ගන්න බැරි ප්‍රශ්නයට මුහුණ දුන්නා. අගමැතිතුමා කියන සිංගප්පූරුවේ සමස්ත ආර්ථිකයම දුවන්නේ වෙළෙඳාම මතයි. ඒ වෙළෙඳාම පදනම් වෙන්නේ වරාය මතයි. එසේ නම්, සිංගප්පූරුවේ වරායක් සමඟ තරගකාරීව කටයුතු කළ හැකි තවත් වරායක් ආසියාවේ ප්‍රවර්ධනය වෙනවාට සිංගප්පූරුව කැමැතිද? නැහැ. කැමැති නැහැ. ඉතින්, අගමැතිතුමා ජෝඩු දාගෙන සිංගප්පූරුවට යන්නේ මේ රටේ ජාතික ආදායමේ සුවිශාල ප්‍රමාණයක්, ලංකා ඉතිහාසයේ මහා දැවැන්තම හොරකම කරපු හිටපු මහ බැංකු අධිපති එක්කයි. මොන ජෝඩුව දානවාද කියලා අපි දන්නේ නැහැ. හැබැයි, සිංගප්පූරුවට යන්නේ අර්ජුන මහේන්ද්‍රන් එක්ක. මේ රටේ ආර්ථිකය කාපු, විනාශ කරපු ඉදිරි අවුරුදු 30කටම බලපාන විධියට රුපියල් කෝටි පහළොස්දාහක මේ රටේ ආර්ථිකයේ බරපතළම හානිය කරපු අර්ජුන් මහේන්ද්‍රන් එක්කයි සිංගප්පූරුවට යන්නේ. සිංගප්පූරුවෙන් අපට ආර්ථික මූලෝපායන් උගන්වන්න යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංගප්පූරුව අපට ආර්ථික වශයෙන් උදව් කරන්නේ නැහැ. ඒක අපි තෝරා ගන්න ඕනෑ. උපාය ශීලීත්වය පැත්තෙන් එහෙම වෙන්න විධියක් නැහැ. සිංගප්පූරුව වාගේ රටවල් වරායක් අපේ රටේ ඉදි වෙනවා නම් ඩොලර් මිලියන ගණනක් වැය කරලා හරි ඒ පවතින ඕනෑම රජයක් පෙරළන්න ඒ රටවල් සූදානම්. මොකද, ඔවුන්ගේ ආර්ථික සක්‍රීයභාවය කේන්ද්‍ර වෙලා තිබෙන්නේ වෙනත් රටක වරායක් ඉදි නොවීම මතයි. ඉතින්, සිංගප්පූරුවත් එක්ක කථා කරනවා. එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයින්ට මෙවා මැජික්. සිංගප්පූරු ගිහිල්ලා රැකියා දසලක්ෂයක් ලැබෙනවා කියලා ඔවුන්ට මැජික්.

මොකක්ද, මේ විහිළුව? ඒ නිසා ආර්ථිකයේ "අ" යන්න දන්නා මනුස්සයෙක් සිංගප්පූරුවත් එක්ක ගිවිසුම් ගහනවාද? ඒ නිසා මේ වැරැදි ප්‍රතිපත්තියක රට ගෙන යනවා. දැවැන්තව ගොඩනැඟෙන වරාය පුළුල් කිරීමේ වැඩසටහනට චීනය අපට උදව් කළා. පසු ගිය ජනවාරි 8 වෙනිදා පත් වෙච්ච පාලනය තුළින් එය සුනු විසුනු කරලා දැම්මා. දැන් යථාර්ථය තේරුම් ගෙන තිබෙනවා. වරාය, ආනයන අපනයන කර්මාන්තය රඳා පවතින කේන්ද්‍රීය ස්ථානය. එක් අපරාධයක් කළා.

අපි දන්නවා, මත්තල ගුවන් තොටුපොළට කරපු දේවල් ගැන. රටකට දෙවැනි ගුවන් තොටුපොළක් ඕනෑ. දැන් කටුනායක ගුවන් තොටුපොළ මාස තුනකට වසා දමන්න හදනවා. එතකොට ආනයන, අපනයන සිදු කෙරෙන්නේ කොහොමද? විදේශ සංචාරකයන් එන්නේ කොහොමද? අද කටුනායක ගුවන් තොටුපොළ රාත්‍රියට පැය කිහිපයක් පමණයි විවෘත කරලා තබන්න යෝජනා වෙලා තිබෙන්නේ. එතකොට සංචාරක ව්‍යාපාරය තිබෙයිද? ගුවන් මඟින් සිදු කරන අපනයනවලින් ලැබෙන ආදායම රඳා පවත්වා ගන්න පුළුවන්ද? එහෙම නම් විකල්ප ගුවන් තොටුපොළක් ඕනෑ. මත්තල ගුවන් තොටුපොළ පාඩු ලබනවා නම් -පාඩු ලබන බව අපි දන්නවා- එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තුළ අඩු ගණනේ ඒ සඳහා යම් ආයෝජනයක් සිදු කරයි කියලා මිනිස්සු හිතුවා; අපි හිතුවා. ඒ ප්‍රදේශයේ සංවර්ධන වටපිටාවක් හදයි කියලා අපි හිතුවා. නමුත් ඒක වී ගබඩාවක් බවට පත් කළා. සමහරුන්ගේ එක එක මානසික රෝගවලට රටේ ආර්ථිකයේ කේන්ද්‍රීය ස්ථානවලින් පළි ගන්න යනවා නම්, එය රටට කරන බරපතළ හානියක්. එතකොට වගකීමක් නැති ඇමතිවරුන්ගේ, වගකීමක් නැති අගමැතිවරයෙකුගේ පාලනයක් බවට මේ රටේ පාලනය පරිවර්තනය වෙනවා. මත්තල ගුවන් තොටුපොළේ වී ගබඩා කරන්න යෝජනා කරන්නේ මොළේ නැති මිනිහෙක් වෙන්න ඕනෑ. මේ වාගේ අපරාධ සිදු කරන්නේ මොකද, කාගේ උපදෙස් මත මොන විධියට මේ රට ගෙන යනවාද, අපේ රට යන්නේ කොතැනටද කියන ප්‍රශ්න අපට මතු වෙනවා.

අද මුදල් ඇමතිතුමා නීතියක් රීතියක් නැතුව, පාර්ලිමේන්තුව බුල්ඩෝසර් කරමින් අණ පනත් ගෙනෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දන්වා තිබෙන ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වැනි ව්‍යවස්ථාවේ සඳහන් වන පාර්ලිමේන්තුව සතු මූල්‍ය බලය අබමල් රේණුවක තරමටවත් සැලකිල්ලට ගන්නේ නැතුව තමයි මේ මුදල් ඇමතිවරයා එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන්නේ. එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනාවේ අපි නඩුවක් දැම්මාට පස්සේයි; උසාවියට කරුණු ඉදිරිපත් කිරීමට. නැත්නම් ඒ පනත් කෙටුම්පත ගෙනෙන්නේත් නැහැ. සියයට 15ක බද්දක් පනවන්න ගැසට් නිවේදනයක් පළ කළා, තොග සහ සිල්ලර වෙළෙඳාමට හා අනෙකුත් සේවා අංශවලට. කොහොමද, රටක එහෙම වෙන්නේ? පාර්ලිමේන්තුව සතු බලය අතික්‍රමණය කරමින් තමයි ඒ කටයුත්ත කළේ. ශ්‍රේෂ්ඨාධිකරණය ඒක නැවැත්වුවා. අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සමක් ගොනු කළා. මේ වන විට එය විභාග වෙනවා. ඒ ගෙනාපු පනත් කෙටුම්පතත් වැරදියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටට බලපාන යම් පනත් කෙටුම්පතක් ගෙනෙනවා නම්, එය කැබිනට් මණ්ඩලයේ අනුමැතිය යටතේයි ගෙනෙන්න ඕනෑ. පෙත්සම්කරුවන් වන අප වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතීඥ මනෝහර ද සිල්වා

මැතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ප්‍රකාශ කර සිටියේ, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන තිබෙනවා නම් ඒ බව පෙන්වන ලෙසයි. මුදල් ඇමතිතුමා කැබිනට් මණ්ඩලයේ අනුමැතියකින් තොරව භිතුවක්කාර විධියට බද්දක් පනවන්න හදනවා, රටේ සමස්ත රට වැසියාට බලපාන විධියට. ඒක තමයි අපේ ප්‍රධාන විවාදිත කාරණය වුණේ. අපේ විවාදිත කාරණය වුණේ ඒකයි. නීති විරෝධී ක්‍රියාදාමයක් මතයි "වැට්" එක අය කරලා තිබෙන්නේ. ඒක නීති විරෝධී ක්‍රියාදාමයක්.

අතීතයට බලපාන ලෙස නීති පැනවීමට පනත් සම්මත කර ගන්න බැහැ. නීති විරෝධී ක්‍රියාදාමයක් අතීතයට බලපාන ලෙස නීත්‍යානුකූල කිරීමට පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත් ගෙනෙන්න බැහැ. ඒ නිසා තමයි අපි දෙවැනි කරුණ විධියට ශ්‍රේෂ්ඨාධිකරණයට කිව්වේ, මේ පනත් කෙටුම්පත නීති විරෝධියි, ඒ නිසා සාකච්ඡාවට ලක් කළ යුතු නැහැ කියලා. නීති විරෝධී, සදාචාර විරෝධී, ආර්ථිකයට බරපතළ ලෙස හානිකර, වැරදි අඩි පාරක මේ රට ගමන් කරනවා. ඒ නිසා මේ රට යන්නේ කොතැනටද, නවතින්නේ කොතැනින්ද කියන ප්‍රශ්නය අද ඇති වෙලා තිබෙනවා. ඒ ගැන අපට බය හිතෙනවා.

අවසාන වශයෙන්, මම අනාවැකියක් කියනවා. නොසන්සුන්තාව ඇති කිරීම, රට අරාජිකභාවයට පත් කිරීම, ඒ ආරාජිකභාවය තුළ පැවැත්ම ස්ථාවර කිරීම ආදිය එක්සත් ජාතික පක්ෂයට හරි හුරු පුරුදු දේවල්. ඒ අරාජිකභාවය තමයි මේ නිර්මාණය කරන්න උත්සාහ දරන්නේ කියන කාරණය මේ වෙලාවේ අපට තේරෙනවා.

ඇමතිකම් අරගෙන ඉන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැති ඇමතිවරුන්ට අපි කියනවා මේ විධියට මේ රට ගෙනයන්න දෙන්න එපා, මේ රටට මේ අපරාධය වෙන්න ඉඩ දෙන්න එපා, රටේ ආනයන හා අපනයන ආදායම අතර බරපතළ වෙනසක් තිබෙනවා නම්; අපනයන දවසින් දවස කඩාගෙන වැටෙනවා නම්; ආනයන වියදම සියයට 22කින් වැඩි වෙනවා නම්; උද්ධමනය වැඩි වෙනවා නම්; ඇමෙරිකානු ඩොලරය රුපියල් 150ට වැඩි වෙනවා නම්. රට තුළ ඩොලරයේ අගය වැඩිවීම නිසාම විදේශ ණය ප්‍රමාණය වැඩිවෙලායි තිබෙන්නේ. ලජ්ජා නැතුව කියනවා, "මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ ණය ගත්තා" කියා. 2015 වර්ෂයේ තමයි ණය අරගෙන තිබෙන්නේ. 2015දී දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 76ක් ණය වශයෙන් අරගෙන තිබෙනවා. 2014 වර්ෂයේ ඒ ප්‍රමාණය සියයට 70යි. [බාධා කිරීමක්] ඩොලරයේ අගය වැඩිවීම නිසා අපේ රටට දරන්න බැරි ප්‍රමාණයකින් ණය බර වැඩිවෙලා තිබෙනවා. ණය වැඩිවෙන්න හේතුව ඩොලරයේ අගය වැඩිවීම, සාපේක්ෂව රුපියලේ අගය පහළට බැසීමයි. ඒ නිසා මූලික කාරණය, මූලික සිද්ධාන්තය තෝරාගන්නේ නැතුව අනුන්ට දොස් පවරන එක වෛරය මූලික කරගත් දේශපාලනයක ස්වභාවයයි. එවැනි මහක තමයි මේ රට යන්නේ. වෛරය, පළි ගැනීම පමණයි මේ රටේ එකම පැවැත්ම ලෙස ඔවුන් සලකන්නේ. අවසානයේ මර්දනය. එය තමයි මොවුන්ගේ පැවැත්ම වන්නේ. ඒ හැර මේ රට ආර්ථික වශයෙන් බරපතළ ලෙස විනාශ කරලා තිබෙන බව අවසාන වශයෙන් කියමින්, එය නිවැරදි කරගන්න පෙළගැසෙන්න කියන ආයාචනය කරමින්, ඔබතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.50]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද දිනයේ රැස්වීම් ආරම්භ කළ වෙලාවේ කථා කරන්න බලාපොරොත්තු වුවත්, වැට් එක සම්බන්ධ නඩුවට සහභාගි වෙන්නට ගිය නිසා ප්‍රමාදයක් වුණා.

විශේෂයෙන්ම නීති විරෝධී ආකාරයෙන් මේ රටේ වැට් එකක් පනවලා අධිකරණය විසින් එය නීති විරෝධී බව තීරණය කළාට පස්සේ දැන් මේ ආණ්ඩුව නීති විරෝධී පනතක් ගෙනැල්ලා තිබෙනවා. මේ ආණ්ඩුව රටේ පවතින නීතිය පිළිපදින තත්ත්වයට ගෙන ඒම සිහිනයක් විධියටයි අපි දකින්නේ. එදා යහ පාලන ආණ්ඩුව පත් වුණු දවසේ සිට, මේ රටේ අගමැතිවරයෙක් ඉන්න කොට තව අගමැතිවරයෙක් පත් කළා. අග්‍රවිනිශ්චයකාරවරයෙක් සිටියදී තවත් අග්‍රවිනිශ්චයකාරවරයෙක් පත් කළා. එතැන සිට පටන් ගත් නීත්‍යානුකූල නොවන ක්‍රියාදාමයන් යහපාලන බෝඩ් එක ගහගෙන අද මේ ආණ්ඩුව දිගටම ගෙනයනවා. මොළය තිබෙන මිනිස්සු ටිකට නම් අද මේක පැහැදිලි වෙලා තිබෙනවා.

අපි 2020 වෙනකල් ඉන්නවා. 2020 වෙනකල් ඡන්දයක් නොතියා ඉන්න පුළුවන් කියලා තමයි මේ ආණ්ඩුව කියන්නේ. එහෙම ඉන්න තමයි ඔවුන් බලාගෙන ඉන්නේ. මම මේ ආණ්ඩුවට අභියෝග කරනවා, පුළුවන් නම් ඡන්දයක් කියන්න. මේ ආණ්ඩුව පෙරළන හැටි, රනිල් වික්‍රමසිංහ මහත්මයා ගෙදර යවන හැටි එතකොට බලාගන්න පුළුවන් කියා.

භාණ්ඩ කිහිපයක් ප්‍රමිතිකරණයට ලක් කරන්නට පනතක් ගෙනැල්ලා තිබෙනවා. මට මතකයි එදා යහපාලනය ගැන කථා කරද්දී, ඡන්ද පොරොන්දු ලබා දෙද්දි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රට කරද්දී රුපියල් 350 ගණනේ ලබා දුන් පොහොර ටිකේ ප්‍රමිතිය ගැන බොහොම පුරාජේරු දෙඩුවා. හැබැයි, අද රුපියල් 2,500 ගණනේ යහ පාලනයෙනුත් ඒ පොහොරම තමයි දෙන්නේ. ප්‍රමිතිය වෙනස් වෙලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ග්‍රාමීය ආර්ථිකයට සම්බන්ධ කෘෂි කර්මාන්තය කරන පළාතක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට අපි මේ කවුරුත් ලබන අත් දැකීම ලබනවා. ඒ නිසා මේ ආණ්ඩුව ගෙනෙන ප්‍රමිතිය ගැන නම් අපට විශ්වාසයක් නැහැ.

මේක කාට හෝ ගහන්න, කොහේ හෝ රටකට ගහන්න ගෙනා එකක් වෙන්න ඇති. මට මේකේ ඉතිහාසය ගැන ගොඩාක් සොයන්න ලැබුණේ නැහැ. මේ ගොල්ලන්ගේ යහ පාලනය හදා ගැනීමට වාසියට උදව් කරපු රටවල් ඉන්නවා නේ. අන්න ඒ රටකට උදව්වට ගෙනා නීතියක් කියා මම විශ්වාස කරනවා. ඒ නිසා මේවා ගැන අපිට ලොකු විශ්වාසයක් නැහැ. 2015 ජනවාරි 08 වැනි දා මේ රටේ මිනිසුන් යම් කිසි විශ්වාසයකින් තමුන්නාන්සේලාට ඡන්දය දෙන්න ඇති. හැබැයි, ඒ ඡන්දය දුන් අයගෙන් සියයට 75ක් මේ වෙනකොට වෙනස් වෙලා ඉන්නේ. ඒක අපි සඳහන් කරන්න ඕනෑ. මේ රටේ ජනතාව ඡන්දයක් එනකම් බලා ගෙන ඉන්නවා, යහ පාලනයට පාඩමක් ඉගැන්වීම සඳහා.

[ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය]

විශේෂයෙන්ම අපි කියන්නට ඕනෑ, අද නිශ්චිතවම ආනයන වැඩි වෙලා අපනයන ආදායම අඩු වෙලා තිබෙන බව. 2014 වර්ෂයේදී මේ රටේ පැවැති අපනයන ආදායම 2015 වර්ෂයේදී කෝටි 1,200කින් අඩු කර ගන්නට මේ ආණ්ඩුව සමත් වෙලා තිබෙනවා. මේක අපි කියන එකක් නොවෙයි. නැත්නම් තමුන්නාන්සේලා කියාවි, ඒකාබද්ධ විපක්ෂය අසත්‍ය කියනවා කියා. එහෙම නැත්නම් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කියනවාය, එහෙමත් නැත්නම් හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ කබ්‌රාල් මහතා කියනවාය කියා තමුන්නාන්සේලා කියාවි. නමුත් ඒ කවුරුවත් නොවෙයි, එහෙම කියන්නේ. තමුන්නාන්සේලා පත් කරපු අර්ජුන මහේන්ද්‍රන් මහත්මයා තමයි මේ අඩු වුණු කථාව මහ බැංකු වාර්තාවේ කියා තිබෙන්නේ. ඒ නිසා මේ ආර්ථිකය ගෙන යන්නේ කොහේටද, මේ රටට අනාගතයේ ඇති වෙන තත්ත්වය මොකක්ද කියන එක ගැන ලොකු කැක්කුමක්, වේදනාවක් අපිට තිබෙනවා. මේ රට බොහොම අමාරුවෙන් එල්ටීටීඊ ත්‍රස්තවාදයෙන් නිදහස් කර ගෙන යම් කිසි මට්ටමකට ගෙන ආවා. කෘෂි කාර්මික පරිසරයක් රට තුළම තිබෙන මේ රටේ ගොවි ජනතාවත් එක්ක රාජ්‍ය සේවය වැඩි කරලා මේ රට යම් කිසි ස්ථාවර මට්ටමකට ගෙනෙන්න මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කටයුතු කළා. නමුත් අද වනවිට ඒ ඇති කර තිබුණු තත්ත්වය අඩු කර ගෙන, අඩු කර ගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද එක ගමක් ගත්තොත්, ඒ ගමේ ගොවියෝ කී දෙනෙකු කුඹුරු කරන්නේ නැද්ද කියා හිතන්න. හැම ගමකම අක්කර පහහකට එහා කුඹුරු වල් වැදිලා. මිනිසුන් මේ වතාවේ කුඹුරු කළේ නැහැ. මොකද, වී විකුණා ගන්න බැහැ. පොහොරවලට දෙන ඒ සහනාධාරයවත් දුන්නේ නැහැ. ඒවාත් එක්ක අද මේ රටේ ආර්ථිකය ගම් මට්ටමින් කඩා වැටිලා. ඒ වාගේම අපේ රටේ විදේශීය සංචිත ප්‍රමාණය අඩු වෙලා. ඒ අනුව මේ රටට ලොකු ප්‍රශ්නයක් ඇති කරන්න මේ ආණ්ඩුව කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම අද ගෘහණියන්ගේ කුස්සියටත් මේ ප්‍රශ්නය බලපා තිබෙනවා. අද "වැට්" කියා බද්දක් ගහලා තිබෙනවා. මම මේ පාර්ලිමේන්තුවේදී යෝජනාවක් කරනවා, නීත්‍යානුකූල නොවන ආකාරයෙන් අය කර ගත් ඒ වැට් එක මේ රටේ අහිංසක මිනිසුන්ට නැවත ගෙවන්නය කියා. එසේ අය කිරීම වැරදියි. නීතියෙන් පිට කටයුතු කරන්න රජයකට අයිතියක් නැහැ. තමුන්නාන්සේලා හිටපු ආණ්ඩුවට වඩා හොඳ වෙයි කියා නේ, මේ රටේ මිනිසුන් ඡන්දයක් දුන්නේ. ඒ නිසා ජනතාවට ශාපයක් නොවී මේ රට ඉදිරියට ගෙන යන්නය කියා මම කියනවා.

අද වෙනකොට මේ රටේ නිවාසවල කුස්සියට මේ වියදම දැනෙන ආකාරය ගැන මම පොඩ්ඩක් කථා කරන්න ඕනෑ. මමත් ගෘහණියක්. දරුවෝ ඉන්නා අම්මා කෙනෙක්. 2014 වර්ෂයේදී රතු හාල් කිලෝවක මිල රුපියල් 68යි. 2015 වර්ෂයේදී එහි මිල රුපියල් 74ට වැඩි වෙලා තිබෙනවා. හැබැයි, අද -2016 වර්ෂයේදී- තමුන්නාන්සේලා රුපියල් 65ට දෙනවා. මම මේ තොරතුරු ලබා ගත්තේ පාර්ලිමේන්තුවේ Research Unit එකෙන්. හැබැයි, අද වෙනකොට අම්පාරේ රතු හාල් නිෂ්පාදනය කරපු අයට ඒවා විකුණා ගන්න බැරුව, රතු වී ටික විකුණා ගන්න බැරුව ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මොකද, වී කිරන්නේ නැහැ. රතු නම් ගන්නේ නැහැ. රතු වී විකිණීම සම්බන්ධයෙන් මේ වන කොට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. රතු සහල්වල පෝෂණය වැඩියි, ලෙඩ රෝගවලට හොඳයි කියලා විද්‍යාත්මකව පිළිගෙන තිබෙනවා. ඒ නිසා මේ වී නිෂ්පාදනය විකුණා ගන්න බැහැ, ඒවා රතු වී නොවුණු නිසා. ඒ වාගේ ගැටලු තිබෙනවා.

ඊළඟට, සුදු හාල් ගනිමු. 2014 අවුරුද්දේ සුදු හාල් කිලෝවක් රුපියල් 68යි; දැන් රුපියල් 70යි. 2014 අවුරුද්දේ නාඩු හාල් කිලෝවක් රුපියල් 78යි; දැනුත් රුපියල් 78යි. 2014 අවුරුද්දේ සම්බා හාල් කිලෝවක් රුපියල් 81යි; දැන් රුපියල් 92යි.

2015 අය වැය ඉදිරිපත් කරනකොට කිව්වා, "පාන් පිටිවලට ලොකු සහනයක් ලබා දෙනවා"ය කියලා. දැන් ඒ සහනය ආපසු අය කරගෙන අවසානයි. පරිජ්ජු ටික, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, දැන් ඔබතුමියගේ කථාව අවසන් කරන්න.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මම මගේ කථාව ඉක්මනින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එදා අපේ ආණ්ඩුව තිබියදී කන්න පරිජ්ජු නැහැ වාගේ තමයි කෑ ගැහුවේ. හාල්මැස්සෝ, පරිජ්ජුවල මිල තවත් අඩු කරන්න කියලා අපිත් එදා හිටපු ජනාධිපතිතුමාට කරදර කළා. එදා පරිජ්ජු කිලෝ එකක මිල රුපියල් 158යි; අද රුපියල් 200යි. ගෘහිණියන්ට අද තමන්ගේ දරුවන්ට හාල්මැස්සෝ ටිකක් කන්න දෙන්න බැහැ. මොකද, කන්න පුළුවන් හාල්මැස්සෝ කිලෝවක් අද රුපියල් 700ක් වෙනවා. මේ වාගේ තත්ත්වයක් තමයි අද රටේ ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා කරුණාකරලා කළමනාකරණයක් කරන්න. මේ ආණ්ඩුව ප්‍රමිතිය ගැන කථා කිව්වාට, ආණ්ඩුවටත් ප්‍රමිතියක් නැහැ. මේ ආණ්ඩුවට, මොන ප්‍රමිතියක්ද?

ආණ්ඩුව බලයට පත් වුණු වෙලාවේ ඉඳලා නීති විරෝධීව කටයුතු කරන්න පටන් ගත්තා. දැන් නීතියක් ක්‍රියාත්මක කරන්න සදාචාරයක් ඇති වෙලාත් නැහැ; ඒ සදාචාරයම නැති වෙලා. ඒ නිසා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගෙන් පළි ගන්න හිතලා මේ රට විනාශ කරන්න එපා. මේ ආණ්ඩුව මේ රටේ ජනතාවට වග කියන්න ඕනෑ. මේ රටේ ජනතාව වෙනුවෙන් රටට යහපතක් කරන්න ETCA වාගේ ගිවිසුම් ගෙනැල්ලා, මේ රටේ ආර්ථිකය තවත් කඩා වටින්න සූදානම් වෙන්න එපා. ඔබතුමන්ලාට ඡන්දයට ලබා දුන්නු සහයෝගයට තමුන්නාන්සේලා දේශපාලන සහයෝගය ලබා දෙන්න රටේ ආර්ථිකය පාවා දෙන්න එපා කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ගරු විජයපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා - නැත; ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමා - නැත; ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ල ඇමතිතුමා - නැත; ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා - නැත.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Development Strategies and International Trade, I move,

"That the Regulations made by the Minister of Development Strategies and International Trade under Section 20 read with sub-section (3) of Section 4 and Section 14 of the Imports and Exports (Control) Act, No.1 of 1969 as amended by the Act, No.48 of 1985 and No. 28 of 1987 and published in the Gazette Extraordinary No. 1953/28 of 11th February 2016, which were presented on 10.03.2016, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Development Strategies and International Trade, I move,

"That the Regulations made by the Minister of Development Strategies and International Trade under Section 20 read with Subsection (3) of Section 4 and Section 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 as amended by Act, No. 48 of 1985 and No. 28 of 1987, published in the Gazette Extraordinary No. 1970/9 of 07th June 2016, which were presented on 07.07.2016, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා. එතුමා මේ අවස්ථාවේදී සභාවේ නැති බවයි පෙනෙන්නේ.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.00ට, 2016 මාර්තු 08 දින සභා සම්මතිය අනුව, 2016 ජූලි 22වන සිකුරාදා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 4.00 மணிக்கு பாராளுமன்றம், அதனது 2016 மார்ச் 08ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க 2016 யூலை 22, வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 4.00 p.m. until 10.30 a.m. on Friday, 22nd July, 2016, pursuant to the Resolution of Parliament of 08th March, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

245 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 245 - இல. 6
Volume 245 - No. 6

2016 ජූලි 22වන සිකුරාදා
2016 யூலை 22, வெள்ளிக்கிழமை
Friday, 22nd July, 2016

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

කථානායකතුමාගේ සහතිකය

උසස් නිලතල පිළිබඳ කාරක සභාව: අතිරේක සාමාජිකයකු පත් කිරීම

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව: අතිරේක සාමාජිකයකු පත් කිරීම

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

එළාර රජුගේ සොහොන ප්‍රතිසංස්කරණය කිරීම

පුනරින් ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය:

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

කල් තැබීමේ යෝජනාව:

රටේ ආර්ථික සහ සමාජ මට්ටම පිරිහීම

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

சபாநாயகரது சான்றுரை

உயர் பதவிகள் பற்றிய குழு : மேலதிக உறுப்பினர் நியமனம்

பொது மனுக் குழு : மேலதிக உறுப்பினர் நியமனம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

எல்லாள மன்னனின் சமாதியைப் புனரமைத்தல்

பூநகரி மக்களின் குடிநீர்ப் பிரச்சினை :

நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சரின் கூற்று

ஒத்திவைப்புப் பிரேரணை:

பொருளாதார மற்றும் சமூக நிலையில் வீழ்ச்சி

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Certificate

Committee on High Posts: Additional Member

Committee on Public Petitions: Additional Member

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Restoration of Tomb of King Elara

DRINKING WATER PROBLEM OF POONERYN RESIDENTS:

Statement by Minister of City Planning and Water Supply

ADJOURNMENT MOTION:

Deterioration of Economic and Social Standards of the Country

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 ජූලි 22වන සිකුරාදා
2016 யூலை 22, வெள்ளிக்கிழமை
Friday, 22nd July, 2016

ප. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2016 ජූලි මස 21 වැනි දින ගරු කථානායකතුමා විසින් පහත සඳහන් පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

සමථ මණ්ඩල (සංශෝධන)

II

උසස් නිලතල පිළිබඳ කාරක සභාව: අතිරේක සාමාජිකයකු පත් කිරීම
உயர் பதவிகள் பற்றிய குழு: மேலதிக உறுப்பினர் நியமனம்
COMMITTEE ON HIGH POSTS: ADDITIONAL MEMBER

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තුවේ අංක 128අ ස්ථාවර නියෝගය සහ 2015 ඔක්තෝබර් මස 08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව සහ 2015 ඔක්තෝබර් මස 09 වැනි දින ගරු කථානායකතුමන් විසින් කරන ලද නිවේදනයට අමතරව තේරීම් කාරක සභාව විසින් ගරු ඉරාන් වික්‍රමරත්න මහතා උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ සේවය සඳහා නම් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

III

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව: අතිරේක සාමාජිකයකු පත් කිරීම
பொது மனுக் குழு: மேலதிக உறுப்பினர் நியமனம்
COMMITTEE ON PUBLIC PETITIONS: ADDITIONAL MEMBER

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තුවේ අංක 128 ස්ථාවර නියෝගය අනුව සහ 2015 නොවැම්බර් මස 04 වැනි දින සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව සහ 2015 නොවැම්බර් මස 21 වැනි දින ගරු කථානායකතුමන් විසින් කරන ලද නිවේදනයට අමතරව තේරීම් කාරක සභාව විසින් ගරු වජිර අබේවර්ධන මහතා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ සේවය සඳහා නම් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

Hon. Deputy Speaker, on behalf of the Prime Minister and Minister of National Policies and Economic Affairs, I present the Annual Report of the *Ranaviru Seva* Authority for the year 2012. I move that the said Report be referred to the Sectoral Oversight Committee on National Security.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரும் காணி அமைச்சரும்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs and Minister of Lands)

Sir, I present the Annual Performance Report of the Land Commissioner General's Department for the year

[ගරු ජෝන් අමරතුංග මහතා]

2015. I move that the said Report be referred to the Sectoral Oversight Committee on Agriculture and Lands.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Development Strategies and International Trade, I present the Annual Performance Report of the Ministry of Development Strategies and International Trade for the year 2015. I move that the said Report be referred to the Sectoral Oversight Committee on Economic Development.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු පාඨලී චම්පික රණවක මහතා - පැමිණ නැත.

ගරු චන්දිම වීරක්කොඩි මහතා - පැමිණ නැත.

ගරු සාගල රත්නායක මහතා (නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சாகல ரத்நாயக்க - சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sagala Ratnayaka - Minister of Law and Order and Southern Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පිටබැද්දර, බුළුවන, "සමර නිවස" යන ලිපිනයෙහි පදිංචි එම්.ජී. ආරියවංශ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) සූරියවැව, මහගල්වැව, අංක 15 දරන ස්ථානයෙහි පදිංචි ජේ.පී. සුමතිපාල මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) තංගල්ල, උණාකුරුව, කපුහේන යන ලිපිනයෙහි පදිංචි මොරටු හේවාගේ ඩොනල්සිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු මනුෂ නානායක්කාර මහතා (විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - வெளிநாட்டுத் தொழில்வாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara - Deputy Minister of Foreign Employment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගාල්ල, රිච්මන්ඩ් කන්ද පාර, 226/10 ඒ දරන ස්ථානයෙහි පදිංචි කේ.ඩබ්ලිව්. දේවිකා ප්‍රියදර්ශනී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක්; සහ

(2) ගිංතොට, කුරුඳුවත්ත, අබ්දුල් අසීස් මාවත, නො.117/1 දරන ස්ථානයෙහි පදිංචි පී.එම්. ෆවුසියා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மன்னார், சிலாவத்துறை, அரிப்பு எனும் விலாசத்தில் வசிக்கும் திரு. அந்தோனி குரூஸ் மேரியன் குரூஸ் என்பவரிடமிருந்து பெற்ற மனுவைச் சமர்ப்பிக்கின்றேன்.

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சம்மாந்துறை நீதிமன்ற வீதியைச் சேர்ந்த திரு. M.Z. முனாஸ் காரியப்பர் என்பவரிடமிருந்து பெற்ற மனுவைச் சமர்ப்பிக்கின்றேன்.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 2 - 384/' 15-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Deputy Speaker, on behalf of the Minister of Power and Renewable Energy, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීමේ අවම ලකුණු : නීර්ණය කිරීමේ ක්‍රමවේදය

பல்கலைக்கழக அனுமதிக்கான குறைந்தபட்ச புள்ளிகள்: தீர்மானிக்கும் முறைமை

CUT-OFF MARKS FOR UNIVERSITY ADMISSIONS: METHODOLOGY ADOPTED

434/'16

3. **ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල සඳහා සිසුන් බඳවා ගැනීමේදී එක් එක් දිස්ත්‍රික්කය අනුව අවම ලකුණු නිර්ණය කිරීමට යොදා ගන්නා ක්‍රමවේදය කවරේද;

(ii) එම ක්‍රමවේදය භාවිතා කිරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(iii) එම ක්‍රමවේදය වර්තමානයට කෙතරම් දුරට ගැළපේද යන්න අධ්‍යයනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) க.பொ.த. (உயர்தர) பரீட்சைப் பெறுபேறுகளின் அடிப்படையில் பல்கலைக்கழகங்களுக்கு மாணவர்களை அனுமதிக்கும்போது ஒவ்வொரு மாவட்டத்தின்படி குறைந்தபட்ச புள்ளிகளை தீர்மானிப்பதற்குப் பயன்படுத்தும் முறைமை யாது என்பதையும்;

(ii) அந்த முறைமை பயன்படுத்துவதை ஆரம்பித்த வருடம் யாதென்பதையும்;

(iii) அந்த முறைமை நிகழ்காலத்துக்கு எவ்வளவு தூரம் பொருந்தும் என்பது பற்றி ஆராயப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House -

(i) the methodology adopted in deciding the cut-off marks as per each district with pertinence to admitting students to universities based on the results of the G.C.E (Advanced Level) Examination;

(ii) the year in which the aforesaid methodology was first adopted;

(iii) whether it has been studied as to which extent the aforesaid methodology is suitable to be adopted at present?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) එක් එක් පාඨමාලා සඳහා අදාළ වර්ෂයේදී ඉල්ලුම් කරනු ලබන සිසුන්ගේ Z ලකුණු පදනම් කොටගෙන දීපව්‍යාප්ත කුසලතාව මත හා දිස්ත්‍රික් කුසලතාව මත දිස්ත්‍රික්කයකින් බඳවා ගනු ලබන සිසුන්ගේ අවම ලකුණු තීරණය කරනු ලැබේ. මෙහිදී කලා අධ්‍යයන පාඨමාලා සඳහා දීප ව්‍යාප්ත කුසලතා පදනම මත පමණක්ද, අනෙකුත් විෂය ධාරාවන් සඳහා දීපව්‍යාප්ත සහ දිස්ත්‍රික් කුසලතා යන පදනම් දෙකම මත ද සිසුන් තෝරා ගැනීම සිදු කෙරේ.

(ii) 1994 වර්ෂයේදී එය ආරම්භ කර ඇත.

(iii) මෙය අධ්‍යයනය කොට වාර්තා කිරීම පිණිස 8 දෙනෙකුගෙන් යුත් විද්වත් කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටුව විසින් දැනට පවතින විශ්වවිද්‍යාල ප්‍රවේශ නිර්ණායකවල වෙනසක් නොකළ යුතු බවට නිර්දේශ කර ඇත. එය සැලකිල්ලට ගත් 2013.06.20 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් පවතින නිර්ණායක එලෙසින්ම පවත්වා ගත යුතු යැයි තීරණය කර තිබේ.

(ආ) පැන නොනඟී.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, මේ කමිටුව එම තීන්දුවට පැමිණීමේදී මහජන අදහස් විමසීමක් කරලා තිබෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පසු ගිය ආණ්ඩුව කාලයේ තමයි මේ කමිටුව පත් කළේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් අහගෙන ඉන්න. පසු ගිය රජය කාලයේ මේ ක්‍රමය වෙනස් කරන්න කියලා යෝජනාවක් තිබුණා. නමුත් මෙය තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පත් කළා. ඒ කමිටුව නිර්දේශ කළේ මේ පවතින ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යන්න කියලායි. මා අහන්න කැමැතියි, මේ ක්‍රමය වෙනස් කරනවාට ඔබතුමා කැමැතිද කියලා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මා ඉන්නේ මේ ක්‍රමය වෙනස් කළ යුතුයි කියන මතයේයි. ගරු අමාත්‍යතුමනි, මගේ -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

බොහොම හොඳයි. ඔබතුමා ඒ මතයේ ඉන්නවා නම් අපි දෙගොල්ලන්ම එකතු වෙලා මේ ක්‍රමය වෙනස් කරමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, මෙම ක්‍රමය වෙනස් නොකළ යුතු යයි නිර්දේශ කරමින් 8දෙනාගෙන් යුත් කමිටුව විසින් අමාත්‍යවරයාට භාර දෙන ලද වාර්තාවේ පිටපතක් සභාගත කරන්න පුළුවන්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පසු ගිය රජය කාලයේ තමයි ඒ කමිටුවේ වාර්තාව ඉදිරිපත් කළේ. මා ඔබතුමාට පිටපතක් දෙන්නම්. නමුත් දැන් පසු ගිය ඒවා කථා කරලා වැඩක් නැහැ. විශ්වවිද්‍යාලවලට ඇතුළු වීමේ ක්‍රමය වෙනස් කරන්න ඔබතුමන්ලා කැමැති නම් අපි දෙගොල්ලන් එකතු වෙලා සාකච්ඡා කරලා මේ ක්‍රමය වෙනස් කරමු.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු අමාත්‍යතුමනි, වෙනස් කළ යුතුද, නැද්ද කියන එක තීරණය වන්නේ කමිටුවේ නිර්දේශ දිහා බැලුවාට පසුවයි. මොකද, අපි නොදන්නා දෙයක් අධ්‍යයනය කරපු කමිටුවක් තමයි ඒ නිර්දේශ ඉදිරිපත් කර තිබෙන්නේ. මගේ පෞද්ගලික මතය එයයි. ඒකයි මා මේ ප්‍රශ්නය ඇහුවේ. දැනට තිබෙන ක්‍රමය පවත්වා ගත යුතුයි කියා කමිටුව තීරණය කර තිබෙනවා නම්, එසේ තීරණය කරන්න ඔවුන්ට සාධනීය හේතු ඇති. ඒ නිසා කමිටුවේ වාර්තාව අධ්‍යයනය කරලා, මගේ මතය වැරැදියි කියා ජේනවා නම් මාව වෙනස් කරගන්න මම කැමැතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

කමිටුවේ මතය ගැන මේ වෙලාවේ අපේ අවධානය යොමු කරන්න අවශ්‍යතාවක් නැහැ. මොකද, විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීමේ ක්‍රමය වෙනස් කරන්න ඕනෑය කියා පසු ගිය රජය 2013දී යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. පොඩ්ඩක් මම කියන දෙය අහගන්න, ගරු මන්ත්‍රීතුමනි. මේ ගැන තවදුරටත් අධ්‍යයනය කරන්න එම රජය කමිටුවක් පත් කළා. "ඒක වෙනස් කරන්න එපා, පවතින ක්‍රමය හොඳයි" කියා ඒ කමිටුවම තමයි කිව්වේ. මේ ක්‍රමය වෙනස් කරන්න ඕනෑය කියා මමත් විශ්වාස කරනවා. මේ ක්‍රමය වෙනස් කරන්න ඕනෑය කියා ඔබතුමාත් හිතනවා නම් අපි දෙගොල්ලන් එකතු වෙලා ඒ කාර්යය පාර්ලිමේන්තුව තුළ කරමු. කමිටු වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න මම ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාට භාර දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවසරයක් තිබෙනවා. ඒ එකඟතාව බොහොම හොඳයි.

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායමයි, ආණ්ඩුවයි එකතු වෙලා මේ ක්‍රමය වෙනස් කරමු.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

මේ පාලනය හොඳයි. ඒක නේ, දැන් දෙගොල්ලන්ම එකතු වෙලා ඉන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අපි ඒ ක්‍රමය වෙනස් කරමු. අපට ඔය කමිටු වාර්තා වැඩක් නැහැ, නේද ගරු මන්ත්‍රීතුමනි?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට අදාළව අහන තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, 2015 උසස් පෙළ විභාග ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල සඳහා සිසුන් බඳවා ගන්නා අවම "Z" ලකුණ මෙම වසරේ උසස් පෙළ විභාගය පැවැත්වීමට පෙර ලබා දීමට කටයුතු කරන්නේද කියන ප්‍රශ්නයයි මා ඔබතුමාගෙන් අහන්නේ. මොකද, එසේ නිකුත් කිරීමෙන් දෙවන සහ තෙවන වතාවට උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන්ට තමන් විභාගයට පෙනී සිටිනවාද, නැද්ද යන්න ගැන තීරණය කරන්න පුළුවන්. ඒ වාගේම පීඨවල ලියා පදිංචි වීම හෝ නොවීම කරන්න පුළුවන්. එම නිසා 2015 වර්ෂයේ එම ප්‍රතිඵල මත අවම "Z" ලකුණ අගෝස්තු මාසයේ A/L පටන් ගන්න කලින් නිකුත් කරනවාද කියා මා දැනගන්න කැමැතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අප උත්සාහ කරනවා එම ප්‍රතිඵල නිකුත් කරන්න. ඔබතුමාත් ඒ කණ්ඩායම එක්ක සාකච්ඡා කීපයක් පැවැත්වුවා නේ. අගෝස්තු මාසයට කලින් එම ලකුණු මට්ටම නිකුත් කරන්න අප උත්සාහ කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා පසු ගිය වතාවේ පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරපු තර්කය ගැන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අයත් සමඟ මම සාකච්ඡා කළා. ඒ අය කියන්නේ, ශිෂ්‍යයකු ලියා පදිංචි වුණාට පසුව; වෛද්‍ය පීඨයට ඇතුළු වෙන්න බලාපොරොත්තු වෙලා ඔහු BSc degree එකට ලියා පදිංචි වුණොත්, දෙවන වර අපොස (උසස් පෙළ) විභාගයට ඉදිරිපත් වුණාට පසුව ඔහු එය වෙනස් කරනවා නම් ඊට කලින් අවුරුද්දේ එක් කෙනෙකුට Science Faculty එකට යෑමේ අවස්ථාව අහිමි වනවා කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා, අද දවසේ අහපු ප්‍රශ්නයට-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි මේ ගැන සංවාදයක් පැවැත්වුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමා ඇහුවේ Z - Score එක ගැන ප්‍රශ්නයක්. ඔබතුමා වෙනත් එකකට උත්තර දුන්නා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
වෙනත් එකකට නොවෙයි. මේ කණ්ඩායමත් එක්ක අපි සති ගණනක් සාකච්ඡා කළා. වෙනත් එකක් වෙන්නේ කොහොමද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේම ළමයින්ට වාගේම නාලන්ද විද්‍යාලයේ බොහෝ ළමයින්ටත් මේ ප්‍රශ්නය බලපානවා. මා අහපු අතුරු ප්‍රශ්නය මේකයි ගරු අමාත්‍යතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම උත්සාහ ගන්නවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපොස (උසස් පෙළ) විභාගයට තවත් සතියයි තිබෙන්නේ. ඔබතුමා මේ සතිය ඇතුළත "Z" ලකුණු දෙන්න බලාපොරොත්තු වෙනවා කියලාද කියන්නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
උත්සාහ කරනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමා, ඉහත කී කාරණය කරුණක් වශයෙන් නිවැරදි වෙන්න ඕනෑ මෙසේයි. අපි නැවත නැවත කියන්නේ, පළමු වතාවට ලියා පදිංචි වූ ශිෂ්‍යයකුට, ලියා පදිංචි වූ පාඨමාලාව තමාගේ දෙවන වර විභාගයේ ප්‍රතිඵල එන කල් පටන් ගෙන නැති නම් පමණක් ලියා පදිංචිය අවලංගු කරන්න ඉඩ දෙන්න කියලායි. ඒ මඟින් කිසිම ළමයකුට අවස්ථාව නැති වන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ශිෂ්‍යයකු පළමුවැනි අවස්ථාවේ BSc degree එක තෝරා ගත්තා කියා අපි හිතමු. ඔහු දෙවන අවුරුද්දේ medicine තෝරා ගන්නවා කියලාත් සිතමු. එතකොට පළමුවැනි අවුරුද්දේ ශිෂ්‍යයා ඇතුළු කරන්නේ කොහොමද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ශිෂ්‍යයන් ඇතුළු කරලා නැහැ. First attempt එකේ පාඨමාලා පටන් ගෙන නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, Z-score එකෙන් පස්සේ පාඨමාලා තෝරා ගැනීමට එම ශිෂ්‍යයන්ට අයිතිය තිබෙනවා. ඒ අයිතිය නැති කරන්න එපා කියලායි ගරු මන්ත්‍රීතුමා කියන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ඒ කාරණය ගැන වෙනම සාකච්ඡා කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර අවස්ථාවල දෙවන වතාවේ විභාග ප්‍රතිඵල එනතෙක් පළමුවැනි වතාවේ විභාගයට ලියපු ළමයි විශ්වවිද්‍යාලවලට බඳවා ගෙන නැහැ. ඒ කියන්නේ, පෙර අවුරුද්දේ විභාගයට ලියපු ළමයින් මේ අවුරුද්දේ විභාග ප්‍රතිඵල එනතෙක් බඳවා ගෙන නැහැ. එතකොට එක් ළමයෙකුගේ අතේ, පසු ගිය අවුරුද්දේ ප්‍රතිඵලත් තිබෙනවා; මේ අවුරුද්දේ ප්‍රතිඵලත් තිබෙනවා. පසු ගිය අවුරුද්දේ විභාගය ලියපු ළමයෙක් BSc සඳහා තේරිලා නම් මේ අවුරුද්දේ ඔහුට Medical Faculty එකට යන්න පුළුවන් නම් මේ අවුරුද්දේ ගියා කියලා බාධාවක් වෙන්නේ නැහැ. මොකද, පසු ගිය අවුරුද්දේ ළමයිනුත් තවම ඇතුළු කරගෙන නැති නිසා. එතකොට දෙවැනි වතාවේ විභාගයට ලියපු ළමයා Medical Faculty එකට යනකොට BSc සඳහා පුරප්පාඩුවක් ඇති වනවා නම් අර පළමුවැනි වතාවේ විභාගයට ලියපු ළමයෙකු එයට ඇතුළු කර ගන්නට පුළුවන්. එවැනි අවස්ථාවක ඉඩ තමයි සකස් කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමන්ලාගේ මතයේ තමයි මමත් ඉන්නේ. නමුත්, මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් අතර ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒ ගැන සාකච්ඡා කරමු; We will discuss it.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 4, 487/'16 - (1), ගරු කනක හේරත් මහතා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

වෛද්‍ය නිලංග සමරසිංහ මහතාට එල්ලව ඇති ජීවිත තර්ජන: විමර්ශනය

டாக்டர் திரு. நிலங்க சமரசிங்க மீதான கொலை அச்சுறுத்தல்: விசாரணை

DEATH THREATS TO DR. NILANGA SAMARASINGHE: INVESTIGATION

497/'16

5. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වෛද්‍ය නිලංග සමරසිංහ මහතා ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ සභාපති ලෙස පත් වූ දිනය කවරේද;

(ii) ඔහු එම ධුරයේ සේවය කරන ලද කාලය කොපමණද;

(iii) ඔහු එම ධුරයෙන් ඉවත් කරනු ලැබුවේද; නැතහොත්, කැමැත්තෙන් ඉල්ලා අස්වූයේද;

(iv) ඔහුට ඇති ජීවිත තර්ජන හේතුවෙන් ඔහු විදේශගත වී ඇති බව දන්නේද;

(v) එම ජීවිත තර්ජන සම්බන්ධයෙන් රජය මඟින් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(vi) එසේ නම්, එහි ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சட்டமும் ஒழுங்கும் மற்றும் தென் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) டாக்டர் திரு. நிலங்க சமரசிங்க தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டுச் சபையின் தலைவராக நியமிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) இவர் அந்தப் பதவியில் எவ்வளவு காலம் பணியாற்றினார் என்பதையும்;

(iii) இவர் அந்தப் பதவியிலிருந்து நீக்கப்பட்டாரா அல்லது விருப்பத்துடன் விலகினாரா என்பதையும்;

(iv) இவர் மீதான கொலை அச்சுறுத்தல் காரணமாக இவர் வெளிநாடு சென்றுள்ளார் என்பதை அவர் அறிவாரா என்பதையும்;

(v) மேற்படி உயிர் அச்சுறுத்தல் தொடர்பாக அரசு விசாரணை நடத்தியுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், அதன் முன்னேற்றம் யாதென் பதையும்:

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Law and Order and Southern Development:

(1) Will he inform this House-

(i) the date on which Dr. Nilanga Samarasinghe was appointed as the Chairman of the National Dangerous Drugs Control Board;

(ii) the period of time for which he served in the said office;

(iii) whether he was removed from the said office; or if not, whether he resigned of his own accord;

(iv) whether he is aware that this person has migrated to a foreign country since he was threatened with death;

(v) whether any investigation was carried out by the government in relation to the aforesaid threats to life; and

(vi) if so, of its progress?

(b) If not, why?

ගරු සාගල රත්නායක මහතා
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2015 පෙබරවාරි මස 02 දින.

(ii) මාස 9යි.

(iii) 1984 අංක 11 දරන ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත ප්‍රකාරව සභාපතිවරයා පත් කිරීමට අමාත්‍යවරයා වෙත ඇති බලතල අනුව 2015 අගෝස්තු මස නව රජය පත්වීමෙන් පසු නව සභාපතිවරයෙකු පත් කිරීමත් සමඟ වෛද්‍ය නිලංග සමරසිංහ මහතාගේ නිල කාලය නීත්‍යානුකූලව අවසන් විය.

(iv) ඔහු විදේශගත වී ඇති බව අනාවරණය වී තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් ඔහුට ඇති ජීවිත තර්ජන හේතුවෙන් විදේශගත වූ බවට කරුණු අනාවරණය වී නොමැත.

(v) ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන කාල සීමාවේදී ඔහුට පැවති ජීවිත තර්ජන පිළිබඳව කරන ලද පරීක්ෂණවලට අනුව ඔහු වෙත තර්ජනයක් පවතින බවට නිශ්චිත තොරතුරු වාර්තා වී නොමැති නමුත් වෛද්‍ය නිලංග සමරසිංහ මහතා විසින් රාජකාරියේ ස්වභාවය අනුව සිය ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලු ඇති විය හැකි බව දක්වමින් කර ඇති ඉල්ලීමක් අනුව පොලිස් විශේෂ කාර්ය බලකායෙන් හා ඇමති ආරක්ෂක අංශයෙන් ඒ මහතා නිලය දැරූ කාල සීමාවෙහි ආරක්ෂාව ලබා දීමට කටයුතු කර ඇත.

(vi) ඒ කාල සීමාවෙහි ඒක ලබා දුන්නා. නමුත් ඊට පස්සේ -එතුමා ඒ ධුරයෙන් ඉල්ලා අස් වුණාට පස්සේ- 2016.04.12 දින වෛද්‍ය නිලංග සමරසිංහ මහතාගේ සොයුරිය විසින් කරන ලද පැමිණිල්ලකට අදාළව විමර්ශන කටයුතු පවත්වා ගෙන යමින් සිටියා. 2016.04.24 වෙනි දින පැමිණිලිකාරිය විසින්, පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන අවශ්‍ය නොවන බවට දන්වා, අවශ්‍ය වුවහොත් පැමිණිල්ලක් කරන බවට වැඩිදුර ප්‍රකාශයක් ලබා දී ඇත.

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, (අ) (i) අනුව, ඔහු පත් වූ දිනය ලෙස කිව්වේ කවදාද ?

ගරු සාගල රත්නායක මහතා
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)

ඔහු පත් වූ දිනය ලෙස කිව්වේ, 2015 පෙබරවාරි මස 02 වෙනි දින.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස නිලංග සමරසිංහ මහතා පත් වූ කාලයේ, -විශේෂයෙන් දින සියයේ කාලය තුළ- රටේ යහ පාලනය පිළිබඳව විශාල සංවාදයක් තිබුණු බව ගරු ඇමතිතුමාට මතක ඇති. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හා දේශපාලනයට සම්බන්ධ අය කුඩු, එතනෝල් ජාවාරමට සම්බන්ධයි කියන එක ගැන ලොකු ආන්දෝලනයක් තිබුණා. ඒ නිසාම එක්වරෙක මාධ්‍යවල වාර්තා වුණා, චෝදනා ලැබූ අයගේ නාම ලේඛනයක් ඔහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත්, එක්සත් ජාතික පක්ෂයටත් ඉදිරිපත් කළා කියා. එතැනින් පස්සේ තමයි, -ක්‍රමානුකූල පෙළ ගැසීමකින් නොවෙයි.- ඔහු හදිසියේම ඉවත් වෙන්නේ. ගරු ඇමතිතුමාට මතක ඇති, ඒ ඉවත් වෙන්නට ඔහු කාර්යාලයට යන විට ඔහුගේ පුටුවේ වෙනත් සභාපතිවරයෙක් වාඩි වෙලා සිටිය බව. ඒ නිසා ඔහුම තමයි කියා තිබුණේ, ඔහුට ජීවිත තර්ජන තිබුණාය කියා.

යම් පුද්ගලයෙක් ජාතික අන්තරායකර පාලක ජාතික මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කරමින්, අපේ රටේ කුඩු, එතනෝල් ජාවාරමට සම්බන්ධ දේශපාලනඥයන් ගැන හෙළිදරවු කර තියෙද්දී, කිසිදු පැහැදිලි සාධාරණ හේතුවකින් තොරව ඔහුගේ නිල කාලයත්, නිල ධුරයත් අවසන් වෙලා ඔහුට විදේශ ගත වෙන්න සිදු වෙලා තිබෙනවා නම්, මෙහි පැහැදිලිවම යම් සැකයක් තිබෙනවා.

අනෙක් කාරණය, ඔහු සහ ඔහුගේ සොහොයුරිය මාධ්‍යවලට ප්‍රකාශ කරලා තිබුණා, එහෙම ජීවිත තර්ජනයක් තිබුණ නිසා තමයි ගියේ කියලා.

ගරු සාගල රත්නායක මහතා
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණා පිළිබඳව මට සොයා බලන්න පුළුවන්. මම ඇත්තටම ඔය කියන ලේඛනයක් ගැන දන්නේ නැහැ. නමුත් එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ ගැන පැමිණිලි කරන්න පුළුවන්. එතකොට අනිවාර්යයෙන්ම ඒ පිළිබඳව විමර්ශන කරනවා.

එතුමා ධුරය දැරූ කාලයේ ඒ ධුරයත් එක්ක එන්න පුළුවන් ගැටලු ගැන එතුමා කරන ලද ඉල්ලීම නිසා ධුරය දැරූ කාලයට ආරක්ෂාව සපයා තිබෙනවා. නමුත් ඉන් පස්සේ එතුමාට තර්ජනයක් තිබෙන බව අපි දැනගෙන තිබෙන්නේ එතුමාගේ සොහොයුරිය අප්‍රේල් මාසයේ 12 වෙනිදා කරන ලද පැමිණිල්ලත් සමඟයි. ඒ පැමිණිල්ල තවදුරටත් විමර්ශනය කරන්න අවශ්‍ය නැහැ කියලා, ඒ මාසයේම 24 වෙනිදා එතුමියම ප්‍රකාශයක් දීලා තිබෙනවා. තවදුරටත් විමර්ශනය ගෙනියන්න ඕනෑ නම් අපට ඒ බව දන්වනවා කියලා එතුමිය ප්‍රකාශ කරලා තිබෙනවා. නමුත් මෙහෙම ලේඛනයක් තිබෙනවා නම් කොයි අවස්ථාවක හෝ ඒ ගැන පැමිණිලි කරන්න පුළුවන්. එතකොට ඒ ගැන විමර්ශනය කරනවා.

මත් ද්‍රව්‍ය පිළිබඳ රජය විශේෂ අවධානයක් යොමු කරනවා. ඊයේත් කොකේන් කිලෝ විශාල ප්‍රමාණයක්, වෙළෙඳ පොළේ රුපියල් කෝටි 400ක වටිනාකම තිබෙන කොකේන් කිලෝග්‍රෑම් 200 ගණනක් අල්ලා ගත්තා. පසු ගිය මාස කිහිපය තුළ, ඒ වාගේ මත් ද්‍රව්‍ය ජාවාරමේ යෙදෙන අය ගැන අපි කටයුතු කරලා තිබෙනවා. අපි ජාත්‍යන්තරය එක්ක එකතුවෙලා කටයුතු කරලා, අපේ මුහුදු සීමාව තුළට එන නෞකාවක් තුළත් මත් ද්‍රව්‍ය තිබී අල්ලා ගෙන තිබෙනවා. ඒ වාගේ කටයුතු රාශියක් කර තිබෙනවා. ඒ පිළිබඳව ප්‍රගතියක් තිබිලා තිබෙනවා. මට කියන්න පුළුවන්, අපි විශේෂයෙන් මේ මත් ද්‍රව්‍ය පිළිබඳව ලොකු වැඩ පිළිවෙළක් කර ගෙන යන බව. ඔබතුමා කියන ඒ ලේඛනය තිබෙනවා නම්, එහෙම දෙයක් තිබෙනවා නම් ඒ පිළිබඳව අපට දැනුම් දුන්නොත්, හරියාකාර පැමිණිල්ලක් ආවොත් අනිවාර්යයෙන්ම ඒ ගැන කටයුතු කරන්නට අපට පුළුවන්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

අපට නොවෙයි ඉදිරිපත් කර තිබෙන්නේ, ඔය පක්ෂ දෙකට කියලා කියන්නේ.

කෙසේ නමුත් මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි ගරු ඇමතිතුමනි. ඔබතුමා යටතේ පවතින පොලිස් දෙපාර්තමේන්තුව යටතේ තමයි FCID එක තිබෙන්නේ. පසු ගිය කාලයේ සිදු කරන ලද බරපතළ මූල්‍ය අපරාධ පිළිබඳව FCID එකෙන් පරීක්ෂණ කරලා යම් යම් පුද්ගලයන්ව අධිකරණයට ඉදිරිපත් කළාට පසුව ඔවුන් හිටි ගමන් රෝහල්ගත වෙනවා. මහනුවර ඉඳන් කොළඹට පයින් එන්න ලැහැස්ති වෙලා සිටි අයත් ජාතික රෝහලට ඇතුළත් වෙනවා, මහා බරපතළ අසනීප කියලා. ඇත්තටම පොලිස් දෙපාර්තමේන්තුව යටතේ තිබෙන FCID එකෙන් මේ අයව උසාවියට ඉදිරිපත් කළේ නැත්නම්, මහනුවර ඉඳන් ගැටඹේ දිහාට එන විට පාද යාත්‍රා නොවෙයි කාලක්‍රියා කරන්නත් ඉඩ කඩ තිබුණා. මම අහන්නේ මෙයයි. දේශපාලනඥයෙක්, ප්‍රභූවරයෙක් යම්කිසි අපරාධයකට, මුදල් වංචාවකට, රජයේ මුදල් අවභාවිතයකට අත් අඩංගුවට අරගෙන රිමාන්ඩ් බණ්ඩනාගාරගත කළාට පසුව ඊළඟ දවසේ ඔහු බන්ධනාගාර රෝහලට හෝ ජාතික රෝහලට යනවා කියන එක දැන් සුලබ සිදුවීමක් වෙලා. මේකෙන් අධිකරණය, ඒ නිර්දේශ ලබා දෙන වෛද්‍යවරුන් සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව තිබෙන විශ්වාසයත් බිඳ වැටෙනවා.

එම නිසා මම අහන්නට කැමැතියි FCID එකෙන් අත් අඩංගුවට ගන්නේම බරපතළ අසනීප තිබෙන අය විතරද කියලා. එහෙම නැත්නම් මේ අවස්ථාව බන්ධනාගාරයේ සිටින හැම දෙනාටම දෙනවා නම් බොහෝ අය රෝහල්ගත වෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අපිට වෙනම රෝහලක් අරින්න වෙයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

වෙනම රෝහලක් හෝ ජාතික රෝහලේ FCID වාට්ටුවක් අරින්නට වෙනවා.

ගරු සාගල රත්නායක මහතා
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න මම කැමැති වුණත්, මගේ විෂය පථයට අදාළ නැති නිසා මම මේ අවස්ථාවේ පිළිතුරු දෙන්නේ නැහැ. නමුත් හදිසියේවත් ඇප ලැබුණොත් පා ගමන යන්න නම් සතීප තත්ත්වයක් තියේවි.

උතුරු පළාතේ හඳුනාගත් ඉඩම් ගැටලු : විසඳුම්
வட மாகாணத்தில் இனங்காணப்பட்ட காணிப் பிரச்சினைகள் : தீர்வுகள்
LAND ISSUES IDENTIFIED IN THE NORTHERN PROVINCE: SOLUTIONS

605/'16

8. ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ සහ 2011.05.04 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමක් වශයෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ ඉඩම්වලට අදාළ ගැටලු කඩිනමින් විසඳීම සඳහා ඉඩම් කොමසාරිස් විසින් නිකුත් කරන ලද අංක 2013/01 හා 2013.01.03 දිනැති චක්‍රලේඛය අනුව, 2013 සහ 2014 වර්ෂ තුළ උතුරු පළාතේ යාපනය, මුලතිව්, කිලිනොච්චිය, වවුනියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල හඳුනාගත් ඉඩම් ගැටලු ප්‍රමාණය, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම චක්‍රලේඛයේ අංක 2.2, 2.2.1, 2.2.1:1, 2.2.1:2, 2.2.2, 2.2.2.1, 2.2.2.2, 2.2.2.3, 2.2.3.4 හා 2.2.3.5 දරන වගන්තිවල සඳහන් උපදෙස් ක්‍රියාත්මක කරනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මේ වනවිටත් හඳුනා නොගත් එවැනි ගැටලු සහ විසඳුම් නොලැබූ පුද්ගලයන්ගෙන් බහුතර පිරිසකගේ ප්‍රශ්න මහඟරී ඇති බැවින්, මෙතෙක් විසඳුම් නොලැබූ පුද්ගලයන්ට ද ඒ සඳහා විසඳුම් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

காணி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கற்றுக்கொண்ட பாடங்கள் மற்றும் நல்லிணக்க ஆணைக்குழுவின் சிபாரிசுகள் மற்றும் 2011.05.04 ஆம் திகதி அமைச்சரவையினால் மேற்கொள்ளப்பட்ட கொள்கைசார் தீர்மானங் களை அமுல்படுத்தும் வகையில் வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் யுத்தத்தின் பின்னரான காலப்பகுதியில் காணிகள் தொடர்பான பிரச் சினைகளைத் துரிதமாகத் தீர்த்து வைப்பதற்காக காணிகள் ஆணையாளரினால் வெளியிடப்பட்ட 2013/01ஆம் இலக்க 2013.01.03ஆம் திகதிய சுற்றறிக்கைக்கு அமைய 2013 மற்றும் 2014ஆம் ஆண்டுகளில் வட மாகாணத்தின் யாழ்ப்பாணம், முல்லைத்தீவு, கிளிநொச்சி, வவுனியா மற்றும் மன்னார் ஆகிய மாவட்டங்களில் இனங் காணப்பட்டுள்ள காணிப் பிரச்சினைகளின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்ட அடிப் படையில் தனித்தனியே யாது என்பதையும்;

(ii) மேற்படி சுற்றறிக்கையின் 2.2, 2.2.1, 2.2.1.1, 2.2.1.2, 2.2.2, 2.2.2.1, 2.2.2.2, 2.2.2.3, 2.2.3.4 மற்றும் 2.2.3.5ஆம் இலக்க பிரிவுகளில் குறிப்பிடப்பட்டுள்ள அறிவுரைகள் அமுல்படுத்தப்பட்டதா என்பதையும்;

(iii) ஆமெனில் அது பற்றிய விபரங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இதுவரை இனங்காணப்படாதுள்ள அவ்வாறான பிரச்சினைகள் மற்றும் தீர்வுகள் வழங்கப்படாதுள்ள ஆட்களில் பெரும்பாலானோரின் பிரச்சினைகள் விடுபட்டுள்ளதன் காரணமாக, இதுவரை தீர்வுகள் கிடைக்காதுள்ள ஆட்களுக்கும் அதற்கான தீர்வு களைப் பெற்றுக்கொடுக்கத் தேவையான நடவடிக் கைகளை மேற்கொள்வாரா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Lands:

(a) Will he state -

(i) separately as per each district, the number of land issues identified in the districts of Jaffna, Mullaitivu, Kilinochchi, Vavuniya and Mannar in the Northern Province in 2013 and 2014 as per the Circular bearing No: 2013/01 dated 03.01.2013 issued by the Commissioner of Lands to address speedily the issues related to lands in the post war phase in the Northern and Eastern Provinces, as an implementation of the recommendations of the Lessons Learnt and Reconciliation Commission and the policy decisions taken by the Cabinet of Ministers on 04.05.2011;

(ii) whether the instructions given in Sections No.2.2, 2.2.1., 2.2.1.1., 2.2.1.2., 2.2.2., 2.2.2.1., 2.2.2.2., 2.2.2.3., 2.2.3.4., and 2.2.3.5. in that Circular were implemented; and

(iii) if so, the details in that regard?

(b) Will he also state whether the necessary steps will be taken to provide solutions also to the individuals whose issues have not been resolved, as such issues that have not been identified up to now and issues of the majority of people who were not provided solutions have been overlooked?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම යටතේ 2013/01 චක්‍රලේඛයට අනුව උතුරු පළාතේ දිස්ත්‍රික්කවල 2013, 2014 යන වර්ෂවල ඉදිරිපත් වූ ගැටලු ප්‍රමාණය පහත පරිදි වේ.

දිස්ත්‍රික්කය	ඉදිරිපත් වූ ගැටලු	
	2013	**2014**
යාපනය	7556	923
කිලිනොච්චිය	34896	11322
මුලතිව්	38033	25429
මන්නාරම	21437	5342
වව්නියාව	41959	90315
එකතුව	**143881**	**133331**

(ii) ඔව්.

It is a long answer. Shall I table it? Then, you can collect it. It is a six-page answer.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)
Okay, you can table it.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I **table*** the rest of the Answer.

සභාමේසය මත තබන ලද පිළිතුරෙහි ඉතිරි කොටස:
சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி::
Rest of the Answer tabled:

(iii) ඒ අනුව එයට අදාළ විස්තර පහත පරිදි වේ.

2.2.1. ඉඩම් නොමැති හෝ ඉඩම් අයිති පුද්ගලයින් වෙත ඉඩම් බෙදාදීම.

ඉඩම් නොමැති හෝ ඉඩම් අහිමි වූ පුද්ගලයින් වෙත ඉඩම් බෙදාදීම ඉඩම් කච්චේරි පැවැත්වීම මඟින් සිදුකර ඇත.

දිස්ත්‍රික්කය	බෙදා දී ඇති ඉඩම්	
	2013	2014
යාපනය	254	1140
කිලිනොච්චිය	2057	6257
මුලතිව්	316	11287
මන්නාරම	5220	10508
වව්නියාව	1022	12503
එකතුව	8869	41695

2.2.1.1. ඉඩම් නොමැති පුද්ගලයින්ට ඉඩම් බෙදා දීම.

ඒ අනුව ඉඩම් නොමැති පුද්ගලයින්ට ඉඩම් බෙදා දීම යටතේ යුද ගැටුම් පැවති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පීඩාවට පත් පුද්ගලයින්ගේ තොරතුරු ලබාගෙන එම පුද්ගලයින්ටද ඉඩම් බෙදාදීම සිදු වුණි. එමෙන්ම රජය අනුමත කළ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීමට කටයුතු කර ඇත.

2.2.1.2. ඉඩම් අහිමි වූ පුද්ගලයින් වෙත ඉඩම් බෙදාදීම.

ඉඩම් අහිමි වූ පුද්ගලයින් වෙත ඉඩම් බෙදාදීම යටතේ 2013/01 හා 2008/04 චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව ඉඩම් කච්චේරි මඟින් පමණක් ඉඩම් බෙදාදීම සිදු වූ අතර, ඒ අනුව සංඛ්‍යාත්මකව උතුරු පළාත තුළ 2013 වර්ෂයේදී ඉඩම් කච්චේරි 86ක් හා 2014 වර්ෂයේදී ඉඩම් කච්චේරි 761ක් පවත්වා ඉඩම් බෙදාදීම සිදුකර ඇත.

2.2.2. පුද්ගලයින් මුහුණ දී ඇති රජයේ ඉඩම්වලට අදාළ විවිධ ගැටලු විසඳීම

2.2.2.1.ට අදාළව පුද්ගලයින් මුහුණ දී ඇති රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීම සඳහා ගැටලු හඳුනා ගැනීමේ ආකෘතියට අනුව තොරතුරු ග්‍රාම නිලධාරී මට්ටමෙන් හඳුනාගෙන ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සම්බන්ධ වී විසඳීමට කටයුතු කර ඇත. මෙලෙස ඉදිරිපත් වූ ගැටලු සඳහා 2013 වර්ෂයේ සිට 2014 වර්ෂය වන විට ලබා දී ඇති විසඳුම් ප්‍රමාණයන් පහත පරිදි වේ.

දිස්ත්‍රික්කය	විසඳා ඇති ගැටලු	
	2013	2014
යාපනය	105	870
කිලිනොච්චිය	1484	2274
මුලතිව්	2054	4436
මන්නාරම	302	1018
වව්නියාව	116	204
එකතුව	4061	8802

2.2.2.1. හා 2.2.2.2. කොට්ඨාස දින පැවැත්ම වීම

ඒ අනුව කොට්ඨාස දින පැවැත්වීම යටතේ වර්ගීකරණය කරගත් ගැටලු විසඳීම සඳහා ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් හෝ කොට්ඨාස කිහිපයකට එකක් බැගින් කොට්ඨාස දින පැවැත්වණි. කොට්ඨාස දිනවලට කලින් හඳුනාගත් ගැටලුවලට අදාළව අවශ්‍ය කාර්යාලයීය තොරතුරු අදාළ පාර්ශ්වකරුවන් කැඳවාගෙන ගැටලු විසඳීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව පහත පරිදි කොට්ඨාස දින පවත්වා ඇත.

දිස්ත්‍රික්කය	පවත්වා ඇති කොට්ඨාස දින	
	2013	2014
යාපනය	56	-
කිලිනොච්චිය	72	32
මුලතිව්	92	46
මන්නාරම	51	35
වව්නියාව	89	25
එකතුව	360	138

2.2.2.3. ජංගම සේවා පැවැත්වීම

කොට්ඨාස දින වැඩසටහන් මඟින් විසඳීමට නොහැකි වූ සංකීර්ණ ගැටලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ජංගම සේවා සඳහා යොමුකර විසඳීමට කටයුතු කර ඇත. ඒ අනුව උතුරු පළාතේ 2013 හා 2014 වර්ෂයන්හි ජංගම සේවා 04ක් පවත්වා ඇති අතර, ඒ අනුව ඉදිරිපත් වූ ගැටලු සඳහා විසඳුම් ලබා දී ඇත.

2.2.3.4. අවසර පත්‍ර විනාශ වූ හෝ අස්ථානගත වූ ඉඩම්

අවසර පත්‍ර විනාශ වූ හෝ අස්ථානගත වූ අවස්ථාවල එවැනි ගැටලු විසඳීම සඳහා ඉඩම් කොමසාරිස්තුමාගේ හා පළාත් ඉඩම් කොමසාරිස්වරුන් වෙත ඉදිරිපත් කර උපදෙස් ලබාගෙන එවැනි ලියවිලි යාවත්කාලීන කිරීම සඳහා ඉඩම් කච්චේරි ක්‍රමවේදය මඟින් නැවත තෝරාගෙන බලපත්‍ර නිකුත් කිරීමට හා අස්ථානගත වූ බලපත්‍ර සඳහා සහතික

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

නිකුත් කරන ලද පිටපතක් නිකුත් කිරීමට පියවර ගෙන ඇත.

දිස්ත්‍රික්කය	ඉඩම් ලේඛන යාවත්කාලීන කිරීම	
	2013	2014
යාපනය	199	132
කිලිනොච්චිය	1185	1961
මුලතිව්	166	5296
මන්නාරම	91	326
වවුනියාව	305	245
එකතුව	1946	7960

2.2.3.5. වාර්ෂික අවසරපත්‍ර නිකුත් කරනු ලබන ඉඩම්

වාර්ෂික අවසරපත්‍ර සහිත ඉඩම්වල මුල් අවසරපත්‍රකරුවන් අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමෙන් පසුව හා නිරවුල්ව භුක්තිවිඳි ඇති පුද්ගලයින් ඉඩම් කච්චේරි සඳහා යොමුකර අදාළ පරිදි ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අවසරපත්‍ර හා රජයේ ඉඩම් ආඥාපනත යටතේ දීර්ඝ කාලීන බදුකර නිකුත් කිරීමට පියවර ගෙන ඇත.

(ආ) තව දුරටත් ඉදිරිපත් වන ගැටලු විසඳීම සඳහා 2015 වර්ෂයේ මෙන්ම 2016 වර්ෂය සඳහාද භාණ්ඩාගාරයෙන් ලබාදෙන මුදල් ප්‍රතිපාදන මඟින් ඉතිරි ගැටලු විසඳීමට එම ක්‍රමවේදයම් ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් දී ක්‍රියාත්මක කිරීම මේ වන විට ආරම්භ කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. M.H.M. Salman, you can go ahead with Supplementary Question No.1.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඉඩම් අමාත්‍යතුමා මේ අවස්ථාවේදී ගරු සභා ගැබේ නැති වුණත් මට එක අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මගේ ප්‍රශ්නය මේකයි. මෑතකදී කාලාවරෝධී (විශේෂ) විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී සම්මත කළා.

එම පනතේ පස්වන වගන්තියේ තිබෙනවා, කාලාවරෝධ පනත යටතේ දෙන සහනය රජයේ ඉඩම් ප්‍රදාන, ඉඩම් ආඥාපනත යටතේ ප්‍රදානය කරන ලද ඉඩම් සම්බන්ධයෙන් බලපාන්නේ නැහැ කියලා. මේ ප්‍රශ්නයට පාදක වෙලා තිබෙන්නේ රජයේ ඉඩම් සම්බන්ධ ගැටලුවක්. උතුරු ප්‍රදේශයේ අවුරුදු 30ක් පැවැති යුද්ධය හේතුවෙන් රජයේ ඉඩම් ප්‍රදාන ලැබූ හිමිකරුවන්ට කාලාවරෝධ පනත යටතේ ඒ සහනය ලැබෙන්නේ නැහැ. ඒක බරපතළ ප්‍රශ්නයක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

සංශෝධනයක් ගෙනැල්ලා ඒක නිවැරදි කරන්න.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් යම් පියවරක් ගන්නවා නම් හොඳයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා මතක් කරන්න. අපි සංශෝධනයක් ගෙනැල්ලා එය නිවැරදි කරන්නම්.

පෞද්ගලික අංශයේ සේවකයන් : වැඩි වූ වැටුප් නොගෙවීම
தனியார் துறை ஊழியர்கள்: சம்பள அதிகரிப்பை வழங்காமை
PRIVATE-SECTOR EMPLOYEES: NON-PAYMENT OF SALARY INCREASE

619/'16

9. **ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) පෞද්ගලික අංශයේ සේවකයින්ට ලබා දෙන බවට පොරොන්දු වූ රුපියල් 2,500/- ක මාසික වැටුප් වැඩි වීම නොගෙවන හාම්පුතුන්ට එරෙහිව කම්කරු කාර්යාලවලට පැමිණිලි ඉදිරිපත් කළ හැක්කේ කවර දිනයක සිටද;

(ii) පඩිපාලක සභා පනත අනුව හවුල් සේවා යෝජක පදනම මත මෑන් පවර් සේවකයන්ට ද එම මුදල් ගෙවීමට නියම වන්නේද;

(iii) පඩිපාලක සභා මඟින් නියම කරන හෝ කර ඇති රුපියල් 10,000/- සීමාවට රුපියල් 2,500/- ඇතුළත් කරන්නේද; නැතහොත්, අවම වැටුප රුපියල් 12,500/- කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தனியார் துறை ஊழியர்களுக்குப் பெற்றுக் கொடுப்பதாக வாக்குறுதியளிக்கப்பட்ட 2,500/- ரூபாய் மாதாந்தச் சம்பள உயர்வைச் செலுத்தாத தொழிலதிபர்களுக்கு எதிராக தொழில் அலுவல கங்களில் எத்திகதி தொடக்கம் முறைப்பாடு களைச் சமர்ப்பிக்கலாம் என்பதையும்;

(ii) சம்பள நிர்ணய சபைச் சட்டத்தின் பிரகாரம் கூட்டுச்சேவை வழங்குனர் அடிப்படையிலான மேன்பவர் ஊழியர்களுக்கும் மேற்படி தொகை யைச் செலுத்தவேண்டி நிர்ணயிக்கப்படுமா என்பதையும்;

(iii) சம்பள நிர்ணயச் சபை ஊடாக நிர்ணயிக்கப்படும் அல்லது நிர்ணயிக்கப்பட்டுள்ள 10,000/- ரூபாய் வரையறைக்குள் 2,500/- ரூபாய் உள்ளடக்கப் படுமா; இன்றேல் ஆகக்குறைந்த சம்பளம் 12,500/- ரூபாயாக ஆக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Trade Unions Relations:

(a) Will he inform this House-

(i) the date from which complaints can be lodged at the labour offices against the employers who do not pay the Rs. 2,500 monthly salary increase which was promised for private-sector employees;

(ii) whether aforesaid payment should also be made to the manpower employees, according to the Wages Board Ordinance on the basis of "Co-Employer"; and

(iii) whether the Rs. 2,500 will be added to the Rs. 10,000 limit that has been stipulated or which will be stipulated by the Wages Boards or whether the minimum wage will be increased up to Rs. 12,500?

(b) If not, why?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Labour and Trade Unions Relations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පනත බලාත්මක වන 2016.03.23වන දින සිට.

(ii) මෑන් පවර් සේවකයින්ද ඒ සඳහා හිමිකම් ලබයි.

(iii) 2016 අංක 03 දරන සේවකයින්ගේ ජාතික අවම වේතන පනත අනුව 2016 ජනවාරි 01 දින සිට අවම වේතනය රුපියල් 10,000/-කි. ඊට අමතරව 2016 අංක 04 දරන සේවකයින්ගේ අය වැය සහන දීමනා පනත අනුව රුපියල් 2,500/-ක දීමනාව ගෙවිය යුතු වේ.

(ආ) පැන නොනඟී.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

දැනට මේ වැටුප් වැඩි වීමේ සහන දීමනාව වන රුපියල් 2,500 නොගෙවා ඇති වතු සමාගම්වලට විරුද්ධව නඩු පැවැරීමට ඔබතුමා කටයුතු කරන්නේද? නොකරන්නේ නම් ඒ කුමක් නිසාද?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය ගැන මම පැහැදිලි කරන්නට ඕනෑ. මේ කාරණයේදී වතු සමාගම් විසින් ඒ ගොල්ලන්ට ආර්ථික වශයෙන් තිබෙන අපහසුකම් ඉදිරිපත් කළා. දිගින් දිගටම මේ කරුණු ඉදිරිපත් කළාම රජය මහින් මේ අයට යම් කිසි සහනයක් ලබා දෙන්න ඕනෑය කියන තීන්දුව අරගෙන ඒ අයට ලංකා බැංකුවත්, මහජන බැංකුවත් හරහා රුපියල් බිලියනයක් -මිලියන 1000ක්- ණයක් වශයෙන් දෙන්න තීන්දු කළා. දැනට ඒ මුදල ගෙවීමට පියවර අරගෙන මේ වන විට වතු සමාගම් තමුන්ට අවශ්‍ය කරන මුදල් ඒ ඒ බැංකුවලින් ගන්නට දැන් කටයුතු කරගෙන යනවා. ඒ මුදල් ලබා ගෙන ඒ ගොල්ලන් පළමුවෙනි මාස දෙකේ මුදල් ගෙවන්නටත් කටයුතු කර තිබෙනවා. සාමූහික ගිවිසුමක් අත්සන් කිරීම සඳහා අදාළ පාර්ශ්වයන් කැඳවලා සාකච්ඡා ආරම්භ කරන්නත් අපි කටයුතු යොදා තිබෙනවා. ඒ සාකච්ඡා ආරම්භ කරලා සාමූහික ගිවිසුමක් සඳහා එකඟතාවකට එන්න පුළුවන් වෙයි කියන විශ්වාසය අපට තිබෙනවා. එහෙම සාමූහික ගිවිසුමක් අත්සන් කළාට පස්සේ ඒ අනුව වේතන ගෙවන්නත් එකඟ වෙලා තිබෙනවා. ඒක වතු ක්ෂේත්‍රයේ වෘත්තිය සමිති සියල්ලම පිළිගෙන තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ පාර්ලිමේන්තුවට කෙටුම්පතක් ඉදිරිපත් කරලා එය පනතක් හැටියට, නීතියක් හැටියට අප සම්මත කළාට පස්සේ එය ක්‍රියාත්මක කරන්න අපහසුයි කියා පුද්ගලයන්ට හේතු දැක්වීම් කරලා, ඒ නීතිය ඔවුන්ට ක්‍රියාත්මක නොවෙන ආකාරයට කල් ගන්නට හා කටයුතු කරන්නට ඉඩ දෙනවා වාගේ කම්කරු ක්ෂේත්‍රයේ අනෙකුත් නීති සම්බන්ධයෙනුත් ඔබතුමා ඒ වාගේම ඉඩ දෙනවාද?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මීට අදාළ ක්ෂේත්‍රය ගැනත්, වටපිටාව ගැනත් කල්පනා කරලා තීන්දු ගනියි කියා මා හිතනවා. මම එහෙම කියන්නේ, යම් යම් ක්ෂේත්‍රවල යම් යම් කඩා වැටීම් තිබෙන බව අප දන්නවා. අද තේ ක්ෂේත්‍රයේ විශාල වශයෙන් කඩා වැටීමක් තිබෙනවා. අද තේ වතු හිමියන්ට, කුඩා තේ වතු හිමියන්ට තමන්ගේ වතු පවත්වා ගෙන යන්න බැරි තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ඒ වාගේම ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත් දන්නා ආකාරයට ඔබතුමාගේ ප්‍රදේශයේ -ඇහැළියගොඩ ප්‍රදේශයේ- අද සමහර රබර් වතුවල කිරි කපන්නේ නැහැ. මොකද, රබර් කිරි මිල අනුව ඒ වතුවල රබර් කිරි කපා සේවකයන්ට පඩි ගෙවා ගන්න බැහැ. එවැනි තත්ත්වයන් තිබෙනවා. අපි මේවා ටිකක් සැලකිල්ලට භාජන කරන්න ඕනෑ. ඒ අයට රුපියල් 2,500 වැටුප් වැඩිවීම ගෙවීමෙන් ඈත් වෙන්නට බැහැ. ඒක ඒ අය නීත්‍යානුකූලව කළ යුතුව තිබෙනවා. නමුත් ඒ අය ඉදිරිපත් කරන මේ අමාරුකම් ගැනත් අපි සලකා බලා ඒ අයට යම් කිසි සහනයක් දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒකෙන් අදහස් කරන්නේ නැහැ, අපි නීතිය අක්‍රීය කරනවාය කියා. නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැ කියන එක ඒකෙන් අදහස් කරන්නේ නැහැ. නමුත් ඒ අයගේ අමාරුකම්වලට ඇහුම් කන් දීලා, ඒ අමාරුකම්වලින් ගොඩ ඒම සඳහා යම් යම් ප්‍රතිපාදන කම්කරු දෙපාර්තමේන්තුවෙන් නොවෙයි, රජය විසින් වෙනත් අංශයන් හරහා ලබා දීමට කටයුතු කර ගෙන යනවා. එසේ කිරීමෙන් එම කම්කරුවන්ට ඒ මුදල් ලබා ගැනීමට පහසුවක් සැලසීමයි රජය කරන්නේ කියා මා හිතනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දැනට පෞද්ගලික තේ වතු හිමියන් මේ වැඩි කරපු රුපියල් 2,500 ඒ සේවකයන්ගේ වැටුප්වලට එකතු කරලා තිබෙනවා. ඒ වාගේම දැන් තේ මිලේ යම් වැඩිවීමකුත් තිබෙනවා. ඒ නීතිය සම්මත කරනකොට, ඒ නීතිය ඇතුළේ එවැනි ව්‍යතිරේකයක් ඇතුළත් නොකිරීම නිසා මේ පාර්ලිමේන්තුවේ සම්මත කරන නීති විහිළුවක් බවට පත් වන බව ඔබතුමාට තේරුම් යන්නේ නැද්ද?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ඩි.ජේ. සෙනෙවිරත්න)
(The Hon. W.D.J. Senewiratne)
ඒ සම්බන්ධයෙන් මම ඔබතුමාට පැහැදිලි කරන්නට ඕනෑ. ඒ පනතේ විධිවිධානයක් තිබෙනවා, පසු ගිය වේතන ගෙවීමේ යම්කිසි අපහසුවක් තිබෙනවා නම්, 2016 මාර්තු 23වැනි දා සිට 2017 මාර්තු 23වැනි දා දක්වා අවුරුද්දක කාලයක් ඒ හිඟ පඩි ගෙවීම පිළිබඳව සලකා බලන්න. මේ පනතින් අවුරුද්දක කාලයක් දීලා තිබෙනවා, හිඟ පඩි ගෙවීම පිළිබඳව සලකා බලන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
හිඟ පඩි ගෙවීම සම්බන්ධයෙන් නොවෙයි, වර්තමාන පඩි ගෙවීම සම්බන්ධයෙන් මම අහන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
අතුරු ප්‍රශ්න තුන අහලා අවසානයි.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ඩි.ජේ. සෙනෙවිරත්න)
(The Hon. W.D.J. Senewiratne)
මම කියන්නේ පසු ගිය - ගෙවී ගිය - කාලය සම්බන්ධයෙන්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
වර්තමානයේ පඩි ගෙවීම?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ඩි.ජේ. සෙනෙවිරත්න)
(The Hon. W.D.J. Senewiratne)
වර්තමානයේ පඩි ගෙවන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමා, වර්තමානයේ පඩි ගෙවීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති වෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා, ඔබතුමා මොකක්ද තුන්වැනි අතුරු ප්‍රශ්නයට එකතු කරන්න යන්නේ?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
වර්තමාන පඩි ගෙවීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැත්තේ මොකද?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ඩි.ජේ. සෙනෙවිරත්න)
(The Hon. W.D.J. Senewiratne)
වර්තමානයේ පඩි ගෙවිවේ නැත්නම් ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
වර්තමානයේ සමාගම් ඒ වැඩ් කරපු රුපියල් 2,500 ගෙවන්නේ නැහැ. මේ වනකොට ඒ සම්බන්ධයෙන් කොච්චර නඩු දාලා තිබෙනවාද?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ඩි.ජේ. සෙනෙවිරත්න)
(The Hon. W.D.J. Senewiratne)
සමහර ආයතන කම්කරු සමිති සමඟ සාකච්ඡා කරලා යම් යම් විධිවිධාන ගන්නවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මා විසින්ම පැමිණිලි දෙකක් දමා තිබෙනවා. තමුන්නාන්සේට කොපමණ පැමිණිලි සංඛ්‍යාවක් යොමු කරලා තිබෙනවාද? කී දෙනෙකුට නඩු දමා තිබෙනවාද?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ඩි.ජේ. සෙනෙවිරත්න)
(The Hon. W.D.J. Senewiratne)
තමුන්නාන්සේ පැමිණිලි දමා තිබෙනවා නම්, ඒ පිළිබඳව මම බලන්නම්. ඇමතිවරයෙකු වශයෙන් මට නොවෙයි නේ පැමිණිලි ලැබී තිබෙන්නේ. පැමිණිලි ලැබී තිබෙන්නේ මගේ දෙපාර්තමේන්තුවට නේ. ඔබතුමා පැමිණිල්ලක් දමා තිබෙනවා නම්, ඒ පිළිබඳව මම බලන්නම්. ඒ පැමිණිල්ල දැමීමේ කවද්ද, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කරලා තිබෙනවාද, පරීක්ෂණ කිරීමෙන් පසුව නීතිමය ක්‍රියාමාර්ගවලට ඇවිල්ලා තිබෙනවාද කියන එක මම සොයා බලා උත්තරයක් දෙන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ලැබී තිබෙන පැමිණිලි ඔක්කෝම බලලා, ඒවා සම්බන්ධයෙන් නඩු පැවරීමේ කටයුතු ඔබතුමා ආරම්භ කරන්න.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ඩි.ජේ. සෙනෙවිරත්න)
(The Hon. W.D.J. Senewiratne)
නඩු දැමීමේ විධිවිධාන පනතේ තිබෙනවා. ඒ විධිවිධාන අනුව අපි කටයුතු කරනවා. මේ දීමනාව ගෙවීම නීතිගත වුණේ මාර්තු මාසයේ 23 වෙනි දා. මේ ජූලි මාසය. එපමණ ඉක්මනට නඩු දමන්න බැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමන්ලා හාම්පුතුන්ගේ බලපෑම්වලට යට වෙලා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(මාණ්පුමිකු ඩබිල්යු.ඩි.ජේ. සෙනෙවිරත්න)
(The Hon. W.D.J. Senewiratne)
නැහැ, නැහැ. අපි හාම්පුතුන්ගේ බලපෑමට යට වෙන්නේ නැහැ. මේ නීතිය හදන කොට හාම්පුතුන්ගේ බලපෑම්වලට අපි යට වුණේ නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
වැඩි කිරීම් ලැබෙන්නේ නැත්නම් මොකක්ද කරන්නේ?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ඒ වැඩි කරපු එක ගෙවන්න ඕනෑ. ගෙව්වේ නැත්නම් නීතිය ක්‍රියාත්මක වනවා. පසු ගිය මාසයේ පඩි ගෙව්වේ නැහැ කියලා මේ මාසයේ නඩු දමන සිරිතක් කම්කරු දෙපාර්තමේන්තුවේ නැහැනේ. ඒ පිළිබඳව සාකච්ඡා කරලා ගෙවන්න බැරි වුණු මුදල් කොටස් වශයෙන් හරි ගෙවන්න සලකා බලන්න අපි කටයුතු කරනවා. නඩු දැමීමේ ක්‍රමවේදයක් තිබෙනවා. අපි ඒ ක්‍රමවේදය අනුගමනය කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඔබතුමා මතු කරන කාරණය මොකක්ද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමනි, වැදගත් කාරණාවක් නිසායි මම මේ ප්‍රශ්නය අහන්නේ. සමුපකාර සමිතිවල වැඩ කරන සේවකයන්ටත් මේ රුපියල් 2,500 දීමනාව අදාළද, නැද්ද කියන එක පිළිබඳව බරපතළ විවාදයක් තිබෙනවා. සමුපකාර සමිතිවලින් කොමසාරිස්තුමාට යොමු කරලා තිබෙනවා, සමුපකාරවලට මේ දීමනාව අදාළ කර ගන්නේ කොහොමද කියලා පැහැදිලි කිරීමක් කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ රුපියල් 2,500?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔව්, රුපියල් 2,500 දීමනාව.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ප්‍රශ්නය පැහැදිලියි. ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්න.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
සමුපකාර සේවකයන්ට පඩි ලැබෙන්නේ වෙනත් පදනමක් උඩ. ඇත්ත වශයෙන්ම අපි දන්වා තිබෙනවා, ඒ රුපියල් 2,500ත් ඒ ගොල්ලන්ගේ වේතනයට එකතු කරන්න කියලා. එය නීතියෙන් ආවරණය වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 10 - 622/'16-(1), ගරු චමින්ද විජේසිරි මහතා

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

විශ්වවිද්‍යාල විද්‍යායතන: විස්තර
பல்கலைக்கழகக் கல்வி நிறுவனங்கள் : விபரம்
UNIVERSITY COLLEGES : DETAILS

644/'16

11 ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) දැනට ශ්‍රී ලංකාවේ පිහිටා ඇති විශ්වවිද්‍යාල විද්‍යායතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සේවය කරන ආචාර්ය මණ්ඩලය සහ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ආයතන සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ආයතන කවරේද;

(iv) සිසුන්ගෙන් මුදල් අය කිරීමක් සිදු කරන්නේ නම්, ඒ කවර පදනමක් යටතේද;

(v) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උප කුලපති හා විශ්වවිද්‍යාල විද්‍යායතන ප්‍රධානී සහ ප්‍රධාන විධායක නිලධාරී අතර ඇති සම්බන්ධය හෝ බැඳීම කවරාකාරද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රධාන විධායක නිලධාරියාගේ 2016.02.23 දිනැති "පත්වීම් ලිපි නැවත නිකුත් කිරීම" නමැති අභ්‍යන්තර සංදේශය මඟින් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයීය උපකුලපති විසින් නිකුත් කළ සියලු පත්වීම් 2016.02.15 දින සිට අවලංගු කර ඇති බව දන්නේද;

(ii) පත්වීම් අවලංගු කිරීමේ සහ යළි පත්වීම් ලබා දීමේ බලයක් ප්‍රධාන විධායක නිලධාරියාට පවරා තිබේද;

(iii) එසේ නම්, ඒ කෙසේද;

(iv) පත්වීම් අවලංගු කිරීම සඳහා අමාත්‍යාංශයේ අනුමනියක් ලබාගත යුතු නොවන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

திறன் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது இலங்கையில் தாபிக்கப்பட்டுள்ள பல்கலைக்கழகக் கல்வி நிறுவனங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) அவற்றில் பணியாற்றுகின்ற விரிவுரையாளர் களினதும் மாணவர்களினதும் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(iii) மேற்படி நிறுவனங்களுக்கு நிதி ஏற்பாடுகளை வழங்கும் நிறுவனங்கள் யாவை என்பதையும்;

(iv) மாணவர்களிடமிருந்து பணம் அறவிடப்படு மாயின், அது என்ன அடிப்படையில் என்பதையும்;

(v) தொழில்சார் தொழில்நுட்பவியல் பல்கலைக் கழகத்தின் துணைவேந்தருக்கும் பல்கலைக் கழகக் கல்வி நிறுவன தலைமை அதிகாரிக்கும் பிரதம நிறைவேற்று உத்தியோகத்தருக்குமிடை யிலான தொடர்பு அல்லது உறவு எத்தகையது என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பிரதம நிறைவேற்று உத்தியோகத்தரின் 2016.02.23ஆம் திகதிய "நியமனக் கடிதங்களை மீள வழங்குதல்" எனப்படும் உள்ளகப் பத்திரத் தின் மூலம் தொழில்சார் தொழில்நுட்பவியல் பல்கலைக்கழகத்தின் துணைவேந்தரினால் வழங் கப்பட்ட சகல நியமனங்களும் 2016.02.15ஆம் திகதியிலிருந்து இரத்துச் செய்யப்பட்டுள்ள தென்பதை அறிவாரா?

(ii) நியமனங்களை இரத்துச் செய்வதற்கும் மீள நியமனங்களை வழங்குவதற்குமான அதிகாரம் பிரதம நிறைவேற்று உத்தியோகத்தருக்கு அளிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அது எவ்வாறென்பதையும்;

(iv) நியமனங்களை இரத்துச் செய்வதற்கு அமைச் சின் அங்கீகாரத்தைப் பெறவேண்டிய தில்லையா என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Skills Development and Vocational Training:

(a) Will he inform this House-

(i) the number of University Colleges in Sri Lanka at present;

(ii) the number of teachers and students in those University Colleges, separately;

(iii) the institutions that make financial allocations to those institutions;

(iv) the basis on which fees is charged from students, if any; and

(v) the nature of the relationship or bond between the Vice Chancellor of the University of Vocational Technology, the Chief of the University College and the Chief Executive Officer?

(b) Will he also inform this House-

(i) whether he is aware that the Internal Memorandum of the Chief Executive Officer with the title "Re-issuing the Letters of Appointment" dated 23.02.2016 has cancelled all appointments made by the Vice Chancellor of the University of Vocational Technology from 15.02.2016;

(ii) whether the Chief Executive Officer has been empowered to cancel appointments and making appointments afresh;

(iii) if so, in what way; and

(iv) whether it is not required to obtain the approval of the Ministry to cancel appointments?

(c) If not, why?

ගරු මහින්ද සමරසිංහ මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා)

(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி அமைச்சர்)

(The Hon. Mahinda Samarasinghe - Minister of Skills Development and Vocational Training)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) විශ්වවිද්‍යාල විද්‍යායතන සංඛ්‍යාව 06 කි.

අංක 1882/51 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලිය අනුව විශ්වවිද්‍යාල විද්‍යායතන 05 (පහක්) 2014 ඔක්තෝබර් මස පළමු දින ආරම්භ කරන ලදී.

බටන්ගල විශ්වවිද්‍යාල විද්‍යායතනය 2016.06.01 දින ආරම්භ කර ඇති අතර එහි පාඨමාලා මෙම වසරෙහි සැප්තැම්බර් මස ආරම්භ කිරීමට අපේක්ෂිතය.

(ii) පාඨමාලා නොමිලයේ පවත්වන්න අපි තීරණය කළායින් පස්සේ ශිෂ්‍ය සංඛ්‍යාව තුන් ගුණයකින් විතර වැඩි වෙලා තිබෙනවා.

(iii) මහා භාණ්ඩාගාරය

(iv) 2016 අප්‍රේල් මස සිට සියලුම පාඨමාලා නොමිලයේ පැවැත්වීමට ගත් තීරණයට අනුව මීට ප්‍රථම මුදල් අය කර පැවැත් වූ පාඨමාලාවන්ද ඇතුළුව සියලුම පාඨමාලාවන් නොමිලයේ පැවැත්වීමට කටයුතු කර ඇත.

(v) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උපකුලපති 2008 අංක 31 දරන විශ්වවිද්‍යාල පනතේ 11 (7) වගන්තිය යටතේ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා, ගණන් දීමේ නිලධාරියා සහ විනය පවත්වාගෙන යාමේ වගකීම ද පැවරෙන නිලධාරියා වේ.

විශ්වවිද්‍යාල විද්‍යායතන යනු වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියට අනුව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධ

ආයතන වන අතර, විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 6(1) වගන්තිය අනුව එහි අධ්‍යක්ෂ, එම විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිලධාරියා මෙන්ම එම නියමාවලියේ 16 (1) වගන්තිය අනුව ගණුන් දීමේ නිලධාරියාද වේ. එසේම විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 6(6) වගන්තිය අනුව විද්‍යායතනය තුළ චිනය පවත්වා ගැනීමේ වගකීමද පැවරී ඇත්තේ විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා වෙතය. විශ්වවිද්‍යාල විද්‍යායතනවල ප්‍රතිපත්තිමය කරුණු සඳහා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ එකඟත්වය ලබා ගැනීම හැර එදිනෙදා පරිපාලන කටයුතු සඳහා උපකුලපතිගේ අනුමැතියක් ලබා ගැනීම අවශ්‍ය නොවේ.

(ආ) (i) පත්වීම් අවලංගු කිරීමක් සිදු කර නැත.

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 12(2) (අ) අනුව විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව විද්‍යායතනයේ ආචාර්යවරුන් සහ වෙනත් පරිපාලන නිලධාරීන් හා සේවකයන් පත් කිරීම එම ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ කාර්යයක් වන බැවින්, ඒ අනුව ක්‍රියා කිරීමට හැකි වන පරිදි වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මඟින් විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 18(1) යටතේ නිකුත් කර අති පත්වීම් ලිපි වෙනුවට විද්‍යායතනයේ අධ්‍යක්ෂකගේ අත්සනින් නව ලිපි මුල් පත්වීම් දින සිට වලංගු වන පරිදි නිකුත් කර ඇත.

මෙතැන සිදු වුණේ, Ordinance එකේ තිබුණු transitional provision එකක් අනුව තමයි විශ්වවිද්‍යාලයෙන් මුලින්ම පත්වීම් ලිපි දුන්නේ. හැබැයි, ඊට පස්සේ නීත්‍යානුකූලව Ordinance එක පදනම් කරගෙන තමයි එම ලිපි වෙනුවට විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ අත්සනින් පාලක මණ්ඩලයේ අනුමැතිය ඇතිව ඒ පත්වීම් ලිපි ලබා දීලා තිබෙන්නේ.

(ii) නැත.

පත්වීම් දීමේ සහ අවලංගු කිරීමේ බලය වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අනුමැතියට යටත්ව විශ්වවිද්‍යාල විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලය සතු වේ.

ප්‍රධාන විධායක නිලධාරිවරයා නොවෙයි, මණ්ඩලයේ තීරණයක් අරගෙන university එකට අනුමැතිය සඳහා එවන්න ඕනෑ.

කළමනාකරණ මණ්ඩල තීරණය ක්‍රියාත්මක කරනු ලබන්නේ විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වේ.

(iii) අදාළ නොවේ.

(iv) නැත.

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත සහ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලිය අනුව අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නැත. අමාත්‍යාංශ ලේකම් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ නිල බලයෙන් පත් වන සාමාජිකයෙකි.

එතකොට ඒ ගන්න තීරණවලටත් එතුමා සහභාගි වෙනවා.

(ඇ) අදාළ නොවේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීම පිළිබඳව ඉතාම ස්තුතිවන්ත වෙනවා. මොකද, ඒ පැහැදිලි කිරීම හරහා තිබුණු ගොඩාක් ගැටලු නිරාකරණය වෙනවා. මෙහිදී "පත්වීම් ලිපි නැවත නිකුත් කිරීම" කියන ශීර්ෂ පාඨය ආවාම තමයි මේ ප්‍රශ්නය පැන නඟින්නේ.

ඔබතුමා කියන ආකාරයට නැවත පත්වීම් ලිපි නිකුත් කිරීමක්වත්, අදාළ ප්‍රධාන විධායක නිලධාරියාගේ බලය යටතේ අලුත් පත්වීමක් හැටියට එය අර්ථ කථනය වන්නේත් නැත්නම්, ඒ කියන්නේ කලින් ලබා දුන් පත්වීම් ලිපි අවලංගු කිරීමක් සිද්ධ නොවී අඛණ්ඩතාව දිගටම රැඳිලා තිබෙන ආකාරයෙන් ඒ පත්වීම ලැබී තිබෙනවා නම් ගැටලුවක් නැහැ. මා හිතන විධියට ඔබතුමාගේ සම්පූර්ණ පැහැදිලි කිරීමේ තිබුණේ, මේකෙන් අලුත් පත්වීම් දීමක් සිද්ධ වන්නේ නැහැ; තිබෙන ඒවා අවලංගු වීමක් වන්නේත් නැහැ, අර අඛණ්ඩතාව දිගටම තිබෙන පරිදි පත්වීම තහවුරුවෙලා තිබෙනවාය කියන එකයි. ඒ කාරණාවත් එක්ක මට අතුරු ප්‍රශ්න පැන නඟින්නේ නැහැ. හැබැයි මේ ප්‍රශ්නය මතු කළ පාර්ශ්වයන් එක්ක සාකච්ඡා කරලා, ඔබතුමාගේ මේ පිළිතුර පිළිබඳව නැවත දැනුවත් වීමට මා අවස්ථාවක් ලබා ගන්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න දෙකක් තිබෙනවා. එයින් පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. විශ්වවිද්‍යාල පනත පාර්ලිමේන්තුවේ සම්මත කරන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් කෙරුණු උපදේශක කාරක සභා විවාදයේදීත්, අවසාන උපදේශක කාරක සභාව තුළදීත් නිගමනයට ආවේ, මෙය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුව ආරම්භ කරන ලද බවයි. නමුත් ඔබතුමා දන්නවා, එය එලෙස නොවෙයි පිහිටුවා තිබෙන්නේ කියලා. මා අහන්නේ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිළිබඳවයි. මේ ආයතනය ලෝකයේ තිබෙන අනෙකුත් ආයතන සමඟ පිළිගැනීමේදී, සැබෑ ලෙසම විශ්වවිද්‍යාලයක් ලෙස මෙයට ඇති වී තිබෙන බාධාව වෙනස් කරන්න ඇමතිතුමාගේ පැත්තෙන් කරන්නේ මොනවාද කියලා මා දැනගන්න කැමැතියි.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

ඇත්ත වශයෙන්ම මා දැනටමත් ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබෙනවා, රත්මලානේ තාක්ෂණ විශ්වවිද්‍යාලය UGC එකේ අධීක්ෂණයට යටත් වන්න ඕනෑය කියලා. ඇත්ත වශයෙන්ම අපට ඕනෑ, ප්‍රමිතිය වැඩිදියුණු කරන්නයි. ඒ සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබුණා. ඒ පිළිබඳව අපේ අදහස් ඉල්ලා තිබුණා. මෙය අලුත් විශ්වවිද්‍යාලයක් නේ. අපට කාලයක් යනවා, නමක් හදාගන්න. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පැත්තෙන් බලා මා හිතුවා, පිළිගැනීමක් තිබෙන ආයතනයක් හැටියට UGC එකේ අධීක්ෂණය යටතේ අපට මෙය පවත්වාගෙන යන්න පුළුවන් නම් ඒ ප්‍රමිතිය වැඩිදියුණු කරන්න පුළුවන් කියලා. එතකොට UGC එකෙන් මෙම තාක්ෂණ විශ්වවිද්‍යාලය අධීක්ෂණය කරනවා නම්, විශ්වවිද්‍යාල යටතේ පවත්වාගෙන යන විද්‍යායතනවලටත් ඒක සම්බන්ධ කරන්නේ කොහොමද කියා මා බලනවා. අපට එය තවදුරටත් අධ්‍යයනය කරන්න සිද්ධ වනවා. තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අධීක්ෂණ කටයුතු කරන්න UGC එකට ඉඩ දෙන්න මා කැමැතියි. හැබැයි පාර්ලිමේන්තු පනතක් යටතේ ස්ථාපිත කර තිබෙන විශ්වවිද්‍යාලයක් නිසා, යම් වෙනසක්

[ගරු මහින්ද සමරසිංහ මහතා]

කරනවා නම් අපට පාර්ලිමේන්තුවට එන්න වෙනවා. නමුත් දැන් තිබෙන තත්ත්වයත් එක්ක කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව එහි අධීක්ෂණ කටයුතු කරන්න ඉඩකඩ සලසා දෙන්න අපට පුළුවන්, .

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

දෙවැනි කාරණය මේකයි, ගරු ඇමතිතුමනි. මම අතුරු ප්‍රශ්න දෙකම එකට අහන්නම්. මා හිතන විධියට රත්මලානට ඒ ප්‍රශ්නය බරපතළ ලෙස නැහැ. නමුත්, කොළඹ පිහිටි නිසා පොදුවේ මේ වෘත්තීය පුහුණු ආයතන සියල්ලටම තිබෙන ප්‍රශ්නයක් තමයි සුදුසු ආචාර්යවරුන් බඳවා ගැනීමේදී තිබෙන ගැටලුව. මොකද, එහිදී විශ්වවිද්‍යාල මට්ටමට සමාන සුදුසුකම් ඉල්ලනවා. නමුත්, වැටුප් තල අඩුයි; වැටුප් මට්ටම් අඩුයි. පිළිගැනීමත් අඩුයි. ඒ නිසා එය වෙනස් කරන්න ඔබතුමා කරන්නේ කුමක්ද කියන එකයි මා පළමුවෙන්ම අහන්නේ.

ඊළඟ කාරණය මේකයි. ශිෂ්‍යයන් එවපු ඉල්ලීමක් මම ඔබතුමාගේ අමාත්‍යාංශයේ අධීක්ෂණ කාරක සභාවට යොමු කර තිබෙනවා. එම ඉල්ලීම මෙයයි. ඔබතුමාගේ ආයතනවල Screen Printing පාඨමාලාව පවත්වාගෙන ගිහින් තිබෙනවා. ඒ සම්බන්ධව ඉතා දක්ෂ ගුරුවරු සහ පුහුණුකරුවන් ඉන්න බව තමයි ශිෂ්‍යයන් සඳහන් කර තිබෙන්නේ. නමුත්, දැන් එම පාඨමාලාව නතර කර තිබෙනවා කියන එකයි ඔවුන් දැනුම් දී තිබෙන්නේ. ඒ නිසා ඒ ගැන සොයා බලා එම පාඨමාලාව ආරම්භ කරන්න කියාත් ඉල්ලා සිටිනවා.

ගරු මහින්ද සමරසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද සමරසිංහ)
(The Hon. Mahinda Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට සියයට හතළිහේ දීමනාව නොලැබිලා තිබුණේ. ඒ වාගේම විශ්වවිද්‍යාලවලට දුන්න ඒ සහනත් අපේ තාක්ෂණ විශ්වවිද්‍යාලයට ලැබී තිබුණේ නැහැ. මම දැනට සති දෙකකට පෙර මේ පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. දැන් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබෙනවා, අද මේ මොහොතේ පමණක් නොවෙයි, ඉදිරියටත් විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන්ට, කාර්ය මණ්ඩලයට, සේවකයන්ට පවා දෙන හැම දීමනාවක්ම තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සියලුම අයටත් ලබා දෙන්න. එතකොට ආපසු අපට මේක වෙනස් කරන්න ඕනෑ නැහැ. ඒක automatically සිද්ධ වෙනවා. ඇත්ත වශයෙන්ම අප ලොකු ජයග්‍රහණයක් ඒ ලබා ගත්තේ. සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල වාගේම මේ තාක්ෂණ විශ්වවිද්‍යාලයත් වැඩිදියුණු කරලා, ඒ ආචාර්යවරු එතැනම රඳවාගෙන, මම කලින් කිව්වා වාගේ UGC එකත් සම්බන්ධ කරගෙන, හොඳ වැඩ පිළිවෙළකට යන්න තමයි දැන් මම කටයුතු කරගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 14-665/'16-(1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
දෙවන වටය.

කොටස් වෙළඳ පොළ තුළ සිදු වූ වංචා හා දූෂණ : පරීක්ෂණවල ප්‍රගතිය

பங்குச் சந்தை ஊழல், மோசடிகள்: விசாரணைகளின் முன்னேற்றம்

FRAUD AND CORRUPTION IN SHARE MARKET: PROGRESS OF INVESTIGATIONS

348/'15

1. ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) පසු ගිය සමයේ කොටස් වෙළඳ පොළ තුළ සිදු වූ වංචා හා දූෂණ මේ වන විටත් සිදුවන්නේද;

(ii) එසේ නොවේ නම්, ඒ හරහා ලබාගත් ප්‍රගතිය කවරේද;

(iii) සිදුකර ඇති වංචා හා දූෂණ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන්නේද;

(iv) එසේ නම්, එම පරීක්ෂණවල වර්තමාන තත්ත්වය කවරේද;

(v) පරීක්ෂණවලින් වැරදිකරුවන් වන පුද්ගලයින්ට එරෙහිව නීතිමය පියවර ගැනීමේ වගකීම භාර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த காலத்தில் பங்குச் சந்தையில் நடைபெற்ற ஊழல் மற்றும் மோசடிகள் தற்போதும் நடைபெறுகின்றதா;

(ii) இன்றேல், இதனூடாகப் பெற்றுக் கொண்ட முன்னேற்றம் யாது;

(iii) நடைபெற்றுள்ள ஊழல் மற்றும் மோசடிகள் தொடர்பில் விசாரணைகள் நடத்தப்படுகின்றதா;

(iv) ஆமெனில், இவ் விசாரணைகளின் தற்போதைய நிலைமை யாது;

(v) விசாரணைகளில் குற்றவாளியாகும் நபர்களுக்கு எதிராக சட்ட நடவடிக்கை மேற்கொள்வதற்கான பொறுப்பை ஏற்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) whether the acts of fraud and corruption which had been occurring at the share market in the past era are continuing;

(ii) if not, what progress has been achieved through absence of frauds and corruptions;

(iii) whether investigations are being conducted into such acts of fraud and corruption that have been committed;

(iv) if so, what the present status of the investigations is; and

(v) whether he will undertake the responsibility to take legal action against the persons who are found guilty at the investigations?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නැත.

(ii) ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොටස් වෙළෙඳ පොළ පිළිබඳ ආවේක්ෂණ කටයුතු ගනුදෙනු වෙලාව තුළ සජීවීව මෙන්ම ඉන් පසුවද සිදු කරනු ලබන අතර, වර්තමානයේදී යම් අක්‍රමිකතාවක් සිදුවිය හැකි බවට නිරීක්ෂණය වූ විගස අදාළ පාර්ශ්වයන් අමතා ඒ පිළිබඳව ඔවුන්ගෙන් කරුණු විමසා අවශ්‍ය තීරණ ගනු ලබයි. එමඟින් අක්‍රමිකතාවක් සිදුවීම මුලිනුපුටා දැමීමක් බලාපොරොත්තු වේ. අක්‍රමිකතාවක් සිදුවූ පසු ඒ පිළිබඳව කටයුතු කරනු වෙනුවට අක්‍රමිකතාවක් සිදු නොවී නිවීමට වග බලා ගැනීම තුළින් ආයෝජකයන්ගේ අයිතීන් ආරක්ෂා කරදීමට අවස්ථාව උදා වේ. අක්‍රමිකතාවක් යම් අයුරකින් සිදුවූවහොත් විධිමත් පරීක්ෂණයකින් පසුව ඔවුනට විරුද්ධව කඩිනමින් නීතිය ක්‍රියාත්මක කිරීමට යාන්ත්‍රණයක්ද වර්තමානයේ ක්‍රියාත්මක කර ඇත.

ලොව ඕනෑම කොටස් වෙළෙඳ පොළක ආයෝජකයන් හෝ වෙනත් පාර්ශ්වයක් අක්‍රමිකතා සිදු කිරීමට උත්සාහ කිරීම නොවැළැක්විය හැකි අතර, නියාමකයාගේ සහ කොටස් වෙළෙඳ පොළේ කාර්ය භාරය වන්නේ එම අක්‍රමිකතා සිදු කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා ඇහිරීමයි. එමෙන්ම ක්‍රමවත්ව නියාමනය කිරීමයි. වර්තමානයේ කොටස් වෙළෙඳ පොළේ එම ක්‍රමවත් නියාමනය සිදු වෙමින් පවතී.

(iii) සිදුවෙමින් පවතී.

(iv) පසු ගිය කාල වකවානුවේදී සිදු කරනු ලැබූ විමර්ශන පිළිබඳව සෑහීමකට පත් විය නොහැකි හෙයින් වර්තමාන ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිසම විසින් නව කණ්ඩායමක් යටතේ සමහරක් විමර්ශන නැවත ආරම්භ කර ඇත.

මේ වන විට විමර්ශන 11ක් නැවත ආරම්භ කර ඇති අතර, එම විමර්ශන එකොළහම පසු ගිය කාල වකවානුවේදී විමර්ශනය කර අවසන් කළ ඒවා වේ. නව විමර්ශන කණ්ඩායම යටතේ මෙම නැවත ආරම්භ කළ විමර්ශන පිළිබඳ පරීක්ෂණ පැවැත්වෙන අතර එයට අමතරව නව විමර්ශන 4ක කටයුතුද කෙරෙමින් පවතී.

එම විමර්ශන නිශ්චිත කාල පරාසයක් තුළ කඩිනමින් අවසන් කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.

(v) භාරගනු ලැබේ.

(ආ) පැන නොනඟී.

එම්.එස්. නූරුල් නිලායා මහත්මියගේ නිවස : ප්‍රතිසංස්කරණය

திருமதி எம்.எஸ். நூருல் நிலாயாவின் வீடு :

மறுசீரமைப்பு

HOUSE OF MRS. M.S. NURUL NILAYA: RECONSTRUCTION

552/'16

6. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Seyed Ali Zahir Moulana)

ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පොල්ගොල්ල, වත්තේගෙදර, අංක 50/බී2, දරන ස්ථානයේ පදිංචි, එම්.එස්. නූරුල් නිලායා මහත්මිය සහ ඇයගේ පවුලේ සාමාජිකයන් පදිංචි වී සිටින නිවස කඳු මුදුනක පිහිටා ඇති බවත්;

(ii) පසු ගිය දා අධික වර්ෂාවක් සමඟ ඇති වූ නාය යෑමෙන්, එම නිවස කඩා වැටීමේ අවදානම් තත්ත්වයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, අවදානම් තත්ත්වයට පත් වී තිබෙන නිවස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එම කඳු තවදුරටත් නාය යෑමෙන් අවට නිවෙස්වලටද සිදු විය හැකි හානි අවම කිරීම සඳහා සුදුසු පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தில், பொல்கொல்ல, வத்தேகெதர, 50/பீ2ஆம் இலக்கத்தில் வசிக்கும் திருமதி எம்.எஸ். நூருல் நிலாயா மற்றும் இவரின் குடும்பத்தினர் குடியிருக்கும் வீடு மலை உச்சியில் அமைந்துள்ளதென்பதையும்;

(ii) கடந்த நாட்களில் அதிக மழையுடன் ஏற்பட்ட மண்சரிவினால், இவ்வீடு உடைந்து விழும் இடர்காண் நிலையிலுள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) ஆமெனில், இடர்காண் நிலைக்கு உள்ளாகியுள்ள வீட்டை மறுசீரமைப்பதற்குத் தேவையான நடவடிக்கைகளை மேற்கொள்வாரா;

(ii) மேற்படி மலைகள் மேலும் மண்சரிவுக்குள்ளாவதன் மூலம் பக்கத்திலுள்ள வீடுகளுக்கு ஏற்படக்கூடிய சேதத்தைக் குறைப்பதற்குத் தகுந்த நடவடிக்கைகளை மேற்கொள்வாரா;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු බුද්ධික පතිරණ මහතා]

asked the Minister of Disaster Management:

(a) Is he aware that -

(i) the house of Mrs. M.S. Nurul Nilaya and members of her family at No. 50/B2, Wattegedara, Polgolla in Kandy District is located on top of a hill; and

(ii) due to the landslide which followed the recent torrential rains, this house is on the verge of collapse?

(b) Will he state whether -

(i) steps will be taken to renovate that house which is highly vulnerable to disaster; and

(ii) appropriate steps will be taken to minimize the damages being caused to other houses in the vicinity, with further landslides occurring in those mountains?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Disaster Management, I **table*** the Answer for Question No. 06.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) Situated on a mountain slope (20^0 - 30^0.)

(ii) There has been no landslide consequent to the recent heavy rains. The layer of filled soil in front of this house has been washed away by the rain water and has subsided and no damage has been caused to this house so far. If no remedy is taken to prevent the filled soil from being washed away, the house will face the risk of being damaged.

(b) (i) There is no need for repairing the house. However, if the fill slope continues to be washed away, the house will possibly be damaged and therefore, some remedy has to be taken to prevent it. There is no possibility of allocating provisions from public funds to construct retention walls in order to protect houses from damages that could be caused by such improper human activities. Action can only be taken to raise awareness.

(ii) A comprehensive geological examination was carried out at this site by the National Building Research Organization and according to the findings of that examination, it was observed that the instability has been caused by human activities (improper constructions, very high vertical cut slopes, and improper rainwater management) and remedies such as introducing retention methods for cut slopes and constructing a surface drainage system to facilitate rainwater flow should be taken and in future, plans should be developed in such a way that they are appropriate for the geographical position. This recommendation of the National Building Research Organization should be taken into consideration.

(c) Not relevant.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 7-598/'16-(1), ගරු ලකී ජයවර්ධන මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ලකී ජයවර්ධන මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

රුහුණුපුර ජල ව්‍යාපෘතිය : විස්තර
ருஹுணுபுர நீர் விநியோக கருத்திட்டம் : விபரம்
RUHUNUPURA WATER PROJECT: DETAILS

648/'16

12. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු නාමල් රාජපක්ෂ මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு நாமல் ராஜபக்ஷ சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Namal Rajapaksa)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හම්බන්තොට සංවර්ධන කලාපය ආවරණය වන පරිදි ඉදි කිරීමට සැලසුම් කරන ලද රුහුණුපුර ජල ව්‍යාපෘතියේ I වන අදියරේ ඉදි කිරීම් නිම කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ව්‍යාපෘතිය මඟින් ආවරණය කිරීමට නියමිත ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද; එම වසම් කවරේද;

(ii) ජල ව්‍යාපෘතිය මඟින් ජල සම්පාදනය ලබා දී ඇති ආයතන හා ග්‍රාම නිලධාරී වසම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ජල සම්බන්ධතා ලබා දී නොමැති ග්‍රාම නිලධාරී වසම් කවරේද;

(iv) එම ග්‍රාම නිලධාරී වසම්වලට ජලය ලබා දීමට කටයුතු කරන්නේද;

(v) ඒ සඳහා ගත විය හැකි කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல், நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டை அபிவிருத்தி வலயத்தை உள்ளடக்கும் வகையில் நிர்மாணிப்பதற்கு திட்டமிடப்பட்ட ருஹுணுபுர நீர் விநியோக கருத்திட்டத்தின் 1வது கட்டத்தின் நிர்மாணப் பணிகள் நிறைவு செய்யப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனின், இதற்கென செலவிடப்பட்டுள்ள மொத்த பணத்தொகை எவ்வளவென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) கருத்திட்டத்தின் மூலம் உள்வாங்கப்படுவதற்கு உத்தேசமாயுள்ள கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்; அப்பிரிவுகள் யாவை என்பதையும்;

(ii) நீர் விநியோகக் கருத்திட்டத்தினூடாக நீர் வழங்கல் பெற்றுக்கொடுக்கப்பட்டுள்ள நிறுவனங்கள் மற்றும் கிராம அலுவலர் பிரிவுகள் தனித்தனியே யாவை என்பதையும்;

(iii) நீர் இணைப்புக்கள் வழங்கப்படாத கிராம அலுவலர் பிரிவுகள் யாவை என்பதையும்;

(iv) மேற்படி கிராம அலுவலர் பிரிவுகளுக்கு நீரைப் பெற்றுக்கொடுக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(v) இதற்கென எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply:

(a) Will he inform this House -

(i) whether construction work of Phase 1 of the Ruhunupura Water Project planned to be constructed to cover the Hambantota Development Zone, has been completed; and

(ii) if so, of the total amount of money spent on that?

(b) Will he also inform this House -

(i) the number of Grama Niladhari Divisions to be covered by that project and the names of those Divisions;

(ii) the institutions and the Grama Niladhari Divisions provided with water supply through that water project, separately;

(iii) the Grama Niladhari Divisions that have not been provided water supply connections;

(iv) whether action will be taken to provide water to those Grama Niladhari Divisions; and

(v) the possible time frame required for that?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of City Planning and Water Supply, I **table*** the Answer for Question No. 12.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) Stage 1 of the Ruhunupura Project is implemented under 02 contracts.

* First contract was completed on 09.11.2014 and it was funded by foreign aid.

* Second contract was laying of pipes for a length of 270 kilometres of the PVC distribution system. It was funded by local funds and the project was commenced on 20.11.2014 and planned to be completed by 13.08.2016.

(ii) Expenditure of money for the contract 01 - Rs. 13,131.32 million.

Expenditure of money for the contract 02 - Rs. 1,929.6 million

(b) (i) 24 Divisions

Sooriyawewa Divisional Secretariat

Meegahajadura, Weliwewa, Samajaseva Pura, Suravirugama, Weeriyagama, Namadagaswewa, Mahaweli Kadara, Andarawewa, Sooriyawewa, Ranmuduwewa, Beddewewa, Wedhiwewa, Habaraththawala, Viharagala, Mahapelessa.

Sevanagala Divisional Secretariat (Monaragala District)

Nugegalayaya, Habarugala, Mahagama.

Hambantota Divisional Secretariat

Elalla, Bellagaswewa, Kaaliyapura, Samodagama, Siribopura.

Lunugamvehera Divisional Secretariat

Pahala Mattala.

(ii) Institutions that the connections of water supply have given

- Kothalawala Defence Academy - Sooriyawewa
- China Harbour Institute (Contractor of Southern Highway)
- Madunagala Monastery (Aranya Senasanaya) and Karandulena Aranya Senasanaya
- Mahamevuna Monastery.

Grama Niladhari Divisions

- Sooriyawewa Divisional Secretariat Meegahajadura, Weliwewa, Samajaseva Pura, Suravirugama, Weeriyagama, Namadagaswewa, Mahaweli Kadara Andarawewa, Sooriyawewa, Beddewewa, Viharagala.
- Sevanagala Divisional Secretariat (Monaragala District)

  Nugegalayaya.
- Hambantota Divisional Secretariat

  Elalla, Bellagaswewa, Keliyapura, Samodagama, Siribopura.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

(iii) Sooriyawewa Divisional Secretariat

Ranmuduwewa, Wediwewa, Habaraththawala, Mahapelessa.

Lunugamvehera Divisional Secretariat

Pahala Mattala.

Sevanagala Divisional Secretriat (Monaragala District)

Habarugala, Mahawewa.

(iv) Yes.

(v) Currently, laying out of distribution pipe lines under Stage I of this project is scheduled to be completed by 13.08.2016. Then, the water supply connections for the above-mentioned GN Divisions could be given.

Currently, for rural projects which are covered by some rural water supply projects but have less good quality and quantity has planned to give a bulk water supply.

(c) Not relevant.

කාන්තාවන්ට සමානාත්මකව සැලකීම: පියවර
பெண்களின் சமத்துவம் பேணல்: நடவடிக்கை
EQUAL TREATMENT TO WOMEN: ACTION TAKEN

661/'16

13. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය වෙනුවට)

(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. (Mrs.) Hirunika Premachandra)

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ හුදෙක් කාන්තාවක වීම පමණක් හේතුකොටගෙන සමාජයේ සෑම අවස්ථාවකදීම කිසියම් වෙනස් ආකාරයේ සැලකිලිවලට ලක් වූ සහ ලක් වන කාන්තාවන්ට සාධාරණයක් ඉටු කිරීම සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් මේ වන විට කිසියම් පියවරක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආගම් හා ජාතීන් අනුව කාන්තා අයිතිවාසිකම් වෙනස් වීම් මඟින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීතියට යම්කිසි බලපෑමක් සිදු වන්නේද;

(ii) එසේ නම්, එම බලපෑම කවරේද;

(iii) එම බලපෑම මඟින් විවිධ ජාතීන් හා ආගම් නියෝජනය කරන කාන්තාවන් කිසියම් වෙනස්කමකට භාජනය වන්නේද;

(iv) එසේ නම්, ලංකාවේ වෙසෙන සියලුම කාන්තාවන් එකම නීතියකට යටත් කිරීම සඳහා නීති සම්පාදනය කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா: (1)

(அ) (i) இலங்கையில் பெண் என்ற ஒரே காரணத்தினால் சமூகத்தில் எல்லாச் சந்தர்ப்பங்களிலும் ஏதேனும் ஒரு வகையில் பாரபட்சம் காட்டப்பட்ட பெண்களுக்கு நீதியை நிறைவேற்றுவதற்கு மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு இன்றளவில் ஏதேனும் நடவடிக்கை மேற்கொண்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மதம் மற்றும் இனங்களுக்கமைய பெண்கள் உரிமைகள் மாறுபட்டிருப்பதன் மூலம் இலங்கையின் பிரதான சட்டத்துக்கு ஏதேனும் தாக்கம் ஏற்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அத் தாக்கம் யாதென்பதையும்;

(iii) மேற்படி தாக்கத்தினால் பல்வேறு இனங்கள் மற்றும் மதங்களை பிரதிநிதித்துவப்படுத்துகின்ற பெண்கள் ஏதேனும் பாரபட்சத்துக்கு உள்ளாக்கப்படுகின்றார்களா என்பதையும்;

(iv) ஆமெனில், இலங்கையில் வசிக்கின்ற சகல பெண்களையும் ஒரே சட்டத்துக்கு உட்படுத்துவதற்கான சட்டம் இயற்றுவதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Women and Child Affairs:

(a) Will she inform this House -

(i) whether any step has been taken by the Ministry of Women and Child Affairs by now to ensure justice to women who have been and continue to be discriminated at all spheres of society in Sri Lanka simply because she is a woman; and

(ii) if so, of the steps that have been taken?

(b) Will she also inform this House -

(i) whether differentiating between the rights of women according to different religions and races will have some impact on the common law of the country;

(ii) if so, of the impact it will have?

(iii) whether such an impact will cause discrimination towards women representing different races and religions; and

(iv) if so, whether steps will be taken to formulate laws to subject all women living in Sri Lanka to a single body of laws?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Women and Child Affairs, I **table*** the Answer for Question No. 13.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) Yes.

(ii) Our Ministry has taken action in various fields to eradicate discrimination that women face due to being women.

1. Introduction of new legal provisions

Eg: To eradicate discrimination against women that occurred in obtaining land ownership for women under the Land Development Ordinance, taking action in collaboration with the Ministry of Land Reforms to introduce amendments to the said law.

Taking measures to get a Bill passed for the appointment of a National Women's Commission empowered with the authority and capacity to provide services for women actively and more effectively to ensure the rights of women who are subjected to discrimination.

Prevention of Domestic Violence Act enforced in 2005 is being amended at present.

2. Taking new policy measures

A National Policy on Widows that emphasizes fair treatment for the widows in this country is being drafted.

Advocating the adoption of a gender perspective in formulating every policy of the Government.

Informing the line Ministries, Provincial Councils and Districts to allocate 25 per cent out of government funds allocated for rural development affairs for projects to empower women as per the Cabinet Decision in that regard and assisting the implementation of the same.

3 Taking measures to eradicate violence against women

One main consequence of discrimination against women is women becoming victims of violence. A dominant task of our Ministry is the implementation of rural and national level policy, programmes and measures to eradicate that. Introduction of new laws and regulations for that purpose as well as initiating the introduction of amendments to laws.

(Eg: Amendment of law related to abortion/ assisting the preparation of the background required to recognize marital rape as an offence.)

At the same time, Cabinet approval has already been obtained to formulate and implement a National Action Plan to eradicate violence against women in collaboration with United Nations Development Programme.

Further, a Women Help hotline (1938) and a complaint centre to refer problems of women victims of various types of discrimination and violence is already in operation attached to the National Women's Committee of our Ministry. Provision of legal and counselling services to the victim is done through that.

Several islandwide awareness and empowerment programmes on various topics are also implemented.

In addition to that, implementation of gender sensitization programmes for law enforcement institutions (Eg. The Judiciary, the Police) and officers at decision-making level of this country.

(b) (i) There is no impact on the primary law. The Constitution is the primary law of this country. As per Article 12(2) of the Constitution, no citizen shall be discriminated against on the grounds of race, religion, language, caste, sex, political opinion, place of birth or any one of such grounds. But Article 12(4) allows making special provision by law or subordinate legislation for the advancement of women and children. Even though there is the possibility of enforcing laws specifically for different communities according to their religions and opinions there are instances when personal laws are in conflict with the common law of this country.

(ii) As a result of the inclusion of contradicting provisions in the common law and the personal laws of this country (Muslim Law and Thesawalamai Law) there are instances when certain injustices are done to women within the family and the society.

Eg. Property ownership and division, marriage and divorce.

(iii) There are instances when certain conflicting laws, in particular in the Muslim Law, Thesawalamai Law, Kandyan Law and the common law in this country affect specially women.

Accordingly, discrimination against women who are subjected to the said laws may be witnessed. As one obvious example, anyone could argue that women who come under the Muslim law are subjected to injustice as Muslim law allows marriage for a girl of even 12 years of age though the marriageable age under the common law is 18 years. It should be stated that this situation is a controversial one.

(iv) Yes.

(c) Converting various systems of law that had prevailed in this country for a long time into a single system of law could cause a huge upheaval. As we are bound by the Constitution itself to ensure equality while strongly rejecting racism and religious fanaticism in this country where people of different ethnic groups live, it is better to bring all citizens under a common law without causing problems. Anyway, my Ministry which represents women is laying the ground work at present to build up a dialogue with all relevant parties to amend laws that discriminate against women and provide equal protection of law for all women.

රක්වාන - මාදම්පේ මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය : වන්දි මුදල්

ரக்வான - மாதம்பே வீதி அபிவிருத்திக் கருத்திட்டம் : இழப்பீடு

RAKWANA-MADAMPE ROAD DEVELOPMENT PROJECT: COMPENSATION

679/'16

15. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ටී. රංජිත් ද සොයිසා මහතා වෙනුවට)

(මාණ්පුමිකු පුත්තික පතිරණ - மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. T. Ranjith De Zoysa)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, රක්වාන - මාදම්පේ මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ වැඩ මේ වන විට අවසන් කර තිබේද;

(ii) එසේ නොමැති නම්, වැඩ ආරම්භ කර මේ වන විට ගත වී ඇති කාලය කොපමණද;

(iii) එහිදී ඉඩම් පමණක් අහිමි සහ නිවාස අහිමි පුද්ගලයන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනයේදී ඉඩම් හා නිවාස අහිමි වූවන් වෙනුවෙන් වන්දි ලබා දීමට වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) ඔවුන් වෙනුවෙන් ලබා දීමට නියමිත වන්දි මුදල් මේ වන විටත් ලබාදී නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, එම වන්දි මුදල් කඩිනමින් ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொடகவெல பிரதேச செயலாளர் பிரிவுக்குரிய ரக்வான - மாதம்பே வீதியை விஸ்தரித்து அபிவிருத்தி செய்கின்ற கருத்திட்டத்தின் வேலைகள் தற்போது நிறைவடைந்துள்ளதா என்பதையும்;

(ii) இன்றேல், வேலைகள் ஆரம்பிக்கப்பட்டு இன்றளவில் கடந்துள்ள காலம் எவ்வளவென்பதையும்;

(iii) இதன்போது காணிகளை மாத்திரம் இழந்துள்ள மற்றும் வீடுகளை இழந்துள்ள ஆட்களின் எண்ணிக்கை தனித்தனியாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வீதி அபிவிருத்தியின்போது காணிகள் மற்றும் வீடுகளை இழந்தவர்களுக்கு இழப்பீடு வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள நிதித் தொகை எவ்வளவென்பதையும்;

(ii) இவர்களுக்கு வழங்கப்பட வேண்டியுள்ள இழப்பீட்டுத் தொகை இதுவரை வழங்கப்படவில்லை என்பதை அவர் அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி இழப்பீட்டுத் தொகையைத் துரிதமாகப் பெற்றுக்கொடுக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) அதற்காக எடுக்கும் காலம் எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House -

(i) whether the work of the Project for the expansion and development of Rakwana-Madampe Road belonging to the Godakawela Divisional Secretary's Division has been completed;

(ii) if not, the period of time that has lapsed since the commencement of the project work; and

(iii) the number of persons who only lost their lands and who lost their houses separately?

(b) Will he also inform this House -

(i) the amount of money allocated for compensating those who lost their lands and houses owing to the development of the aforesaid road;

(ii) whether he is aware that the compensation to be provided for them has not hitherto been provided;

(iii) if so, whether action will be taken to compensate them expeditiously; and

(iv) the period of time that will be taken for that purpose?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්.

2013 වර්ෂයේ ආරම්භ කර 2015 වර්ෂයේදී අවසන් කර ඇත.

(ii) අදාළ නොවේ.

(iii) අහිමි වූ ඉඩම් කැබලි ගණන - 1,155

නිවාස අහිමි පුද්ගලයන්ගේ සංඛ්‍යාව 50ක් පමණ වේ.

(ආ) (i) රුපියල් මිලියන 348යි.

(ii) ඔව්.

2013 හා 2015 කාලයේදී වන්දි ගෙවිය යුතුව තිබුණද අදාළ වන්දි මුදල් ගෙවීමට ක්‍රියා කර නැත.

එසේ වුවද වර්තමානයේදී සියලු වන්දි මුදල් ගෙවීමට කඩිනමින් ක්‍රියා කරනු ලැබේ.

(iii) ඔව්.

එසේ ක්‍රියා කර ගෙන යනු ලැබේ.

(iv) ඉදිරි මාස 06ක කාලය තුළ අවසන් කිරීමට සැලසුම් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ සුසංයෝගය හොඳයි.

මීළඟට, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය, ගරු ඩග්ලස් දේවානන්ද මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

එළාර රජුගේ සොහොන ප්‍රතිසංස්කරණය කිරීම
எல்லாள மன்னனின் சமாதியைப் புனரமைத்தல்
RESTORATION OF TOMB OF KING ELARA

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 23(2)இன்கீழ், உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர் மாண்புமிகு எஸ்.பி. நாவின்ன அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்தற்கு நன்றி.

இலங்கையிலே அநுராதபுரத்தில் 44 ஆண்டுகள் நீதி தவறாது ஆட்சி செய்த தமிழ் அரசனான எல்லாளன் பற்றி மகாவம்சம் கூறுகின்றது. எல்லாள மன்னன் நீதி, நேர்மை தவறாது நல்லாட்சி நடத்தியதாகவும் எல்லாளன் - துட்டகைமுனு ஆகிய அரசர்களுக்கிடையேயான யுத்தத்தின்போது துட்டகைமுனு மன்னன் வெற்றிபெற்றபோதிலும், அவர் எல்லாள மன்னனை ஒரு விரோதியாகக் கருதாமல் மேன்மையானவராகக் கருதி, அவருக்குக் கௌரவம் செலுத்தியதாகவும் வரலாறு கூறுகின்றது. எல்லாளனை வெற்றிகொண்டமை பற்றி இறுமாப்புடன் சிந்திக்காத துட்டகைமுனு மன்னன், அவருக்கு அநுராதபுரத்திலே எருக்கலன்காடு என்னுமிடத்தில் மாபெரும் சமாதியை அமைத்து, அதனை ஓர் புனித இடமாக அறிவித்து, அம்மன்னனுக்குக் கௌரவம் கொடுத்தார் எனவும் கூறப்பட்டுள்ளது. அதுமட்டுமன்றி, மேற்படி சமாதியைக் கடந்து செல்வோர் வாகனங்களில் செல்லாது நடந்து செல்ல வேண்டும், தொப்பி, தலைப்பாகை போன்றவற்றை கழற்றி மரியாதை செலுத்த வேண்டும் என்றெல்லாம் துட்டகைமுனு மன்னன் கட்டளையிட்டிருந்ததாகவும் அறிகின்றோம். இக்கௌரவத்தைச் சிங்கள மக்களும் ஏனைய மக்களும் கடந்த 2000 ஆண்டுகளாக வழங்கி வந்துள்ளனர்.

சிங்கள வரலாற்று ஆசிரியர்களால் மேற்கொள்ளப்பட்டுள்ள எல்லாளன், துட்டகைமுனு ஆகிய மன்னர்களுக்கிடையிலான யுத்தம் பற்றிய அண்மைக்கால ஆய்வுகளுக்கமைய, அது ஓர் இன அடிப்படையிலான யுத்தமல்ல என்றும் அநுராதபுர அரசைக் கைப்பற்றுவதற்கான யுத்தமென்றும் இதற்கு உதாரணமாக இரு மன்னர்களது படைகளிலும் சிங்கள, தமிழ் படைவீரர்கள் மற்றும் படைத் தளபதிகள் இருந்துள்ளமையும் எடுத்துக்காட்டப்பட்டுள்ளதாக அறியமுடிகிறது.

இந்நிலையில், சிங்கள, தமிழ் மக்களிடையே இனவாதக் கருத்துக்களைப் பேசுகின்றவர்களும் சிங்கள மக்களிடையே இனவாதக் கருத்துக்களை விதைத்து வருவோரும் உண்மையான வரலாற்று நிகழ்வை மறைத்து அல்லது திரிபுபடுத்தி எல்லாளன் - துட்டகைமுனு யுத்தத்தையே அவர்களது இனவாதச் செயற்பாடுகளுக்கு அடிப்படையாகக் கொள்கின்றனர். எமது நாட்டில் இனங்களுக்கிடையில் தேசிய நல்லிணக்கத்தைக் கட்டியெழுப்பும் நோக்குடன் நாம் செயற்பட்டு வருகின்ற நிலையில், துட்டகைமுனு மன்னனின் ஆணைப்படி எல்லாள மன்னனின் சமாதிக்கு உரிய கௌரவத்தை மக்கள் வழங்கக்கூடிய வகையில் அதனைத் திருத்தி அமைப்பது அவசியமாகும். வரலாற்றுச் சின்னம் என்ற வகையிலும் இது முக்கியத்துவம் வாய்ந்த விடயமென நான் எண்ணுகிறேன். இல்லையேல், துட்டகைமுனு மன்னனின் ஆணையை நாம் உதாசீனம் செய்த நிலைக்குத் தள்ளப்படுவதுடன், அவரின் உயர்ந்த பண்புகளைச் சிதைப்பதாகவும் அமையும். எனவே, எனது கேள்வி:

தற்போது எல்லாளன் சமாதி எனக் கூறப்படும் சமாதி உண்மையானது அல்ல என்றும் தகணதூபி என்ற பௌத்த தாதுகோபுர அமைவிடமே அந்தச் சமாதி என்றும் கூறப்படுகின்ற நிலையில், எல்லாள மன்னனின் உண்மையான சமாதியை இனங்கண்டு, அதனை மீளப் புனரமைப்புச் செய்து மக்களின் கௌரவத்துக்குரிய தளமாக மாற்றியமைக்க முடியுமா?

எனது இக்கேள்விக்கான பதிலை கௌரவ அமைச்சர் எஸ்.பி. நாவின்ன அவர்கள் தரவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். நன்றி.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Deputy Speaker, I will be replying to his Question during the next Sitting week.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පසු ගිය පාර්ලිමේන්තු රැස්වීම් වාරයේදී ස්ථාවර නියෝග 23(2) යටතේ මේ ගරු සභාවේදී බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයාගෙන් ප්‍රශ්නයක් ඇහුවා, ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම

[ගරු අනුර දිසානායක මහතා]

සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් සකස් කර තිබෙන වැඩ පිළිවෙළ පසෙකලා ඉන්දියානු සමාගමත් එක්ක වෙනස් ව්‍යාපෘතියකට යන්න සූදානමක් තිබෙනවාද, එහෙම සූදානමක් තිබෙනවා නම් එහි තත්ත්වය කවරේද කියලා. ගරු සභානායකතුමනි, ඔබතුමාටත් එය මතක ඇති. ගරු සභානායකතුමනි, මම හිතන හැටියට ඔබතුමා කාරණය අහගෙනයි ඉන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔව්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාට මතක ඇති. ඔබතුමා මේ ගරු සභාවේදීම කිව්වා, "මෙවැනි ප්‍රශ්න අහපුවාම පිළිතුරු දෙන්න ගරු ඇමතිවරු සභාවේ ඉන්න ඕනෑ. ඇමතිවරු නොපැමිණීම පිළිබඳවත් සැලකිල්ලක් කරනවා" කියලා. ගරු කථානායකතුමා මුලසුනේ සිට කිව්වා, ඒ සම්බන්ධ ස්ථාවර නියෝග පිළිබඳව සාකච්ඡාවක් තිබෙනවා කියලා. ඒක තමයි එදා සිද්ධ වුණේ. නමුත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තු සතියේම මම බලාගෙන හිටියා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයා ගරු සභාවට ඇවිල්ලා වග කීමෙන් යුතුව මේ සම්බන්ධව ප්‍රකාශයක් කරයිද කියලා. ඊයේ එතුමා ගරු සභාවේ හිටියා. එතුමා සභා ගර්භයට එන්නේ පරක්කු වෙලායි. උදේ ඇවිල්ලා ඒ ප්‍රකාශය කළේ නැහැ. ඊයේ වෙනත් විවාදයකදි මම මේ ගැන අහන කොට කොට එතුමා කිව්වා, අද ඒ පිළිතුර ලබා දෙනවා කියලා. අපි අද ආවා ඒ පිළිතුර ලබා ගන්න.

අමාත්‍යවරු වෙත යොමු කරන ප්‍රශ්න පිළිබඳව කිසිදු සැලකිල්ලක් සහ වග කීමකින් යුතුව පිළිතුරු ලබා නොදෙන තත්ත්වයක් උදා වී තිබෙනවා. ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම අවස්ථාව ලැබිලා තිබෙන්නේ, ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්නයක් විමසන්න. මොකද ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තෙල් ටැංකි සංකීර්ණය ලබා දුන්නාට පස්සේ ඇමතිතුමා ඇවිල්ලා මෙතැන කථා කරලා වැඩක් නැහැ. එතුමා ඒක මතකයෙන් කියන්න ඕනෑ ඇමතිවරයෙක් නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මට මතකයි ඔබතුමා ඊයේත් හම්බන්නොට වරායේ තෙල් ටැංකි 08 ගැන කථා කළා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක එතුමාට මතක තිබෙන්න ඕනෑ. එතුමා මෙතැන ඇවිල්ලා පිළිතුරු දෙන්න ඕනෑ. මොකද, අමාත්‍යවරයා කියන්නේ,- මම දැක්කා එතුමා කියලා තිබෙනවා, "අංශ භාගේ හැදෙනවා ලොකු වාහන ඕනෑ" කියලා. අංශ භාගේ හැදෙනවා නම් ලොකු වාහන ගන්න ඇමතිවරු ඒ වැඩත් කරන්න ඕනෑකම තිබෙනවා. වාහන ඉල්ලන කොට අංශ භාගේ හැදෙනවා කියලා ලොකු වාහන ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය පැහැදිලියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හැබැයි, ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙන්න පාර්ලිමේන්තුවට එන්නේනැහැ. මේ සතියෙත් බලාගෙන හිටියා ඇවිල්ලා උත්තරය ලබා දෙයි කියලා. පාර්ලිමේන්තුවට එනවා 12ට විතර. ඇවිල්ලා යනවා යන්න. එවැනි තත්ත්වයක් තිබෙන්නේ. ඔබතුමා සභානායකවරයා හැටියට උත්සාහ කරන්න, මේ ගරු සභාවේ මන්ත්‍රීවරයෙකු විසින් ස්ථාවර නියෝග 23(2) යටතේ මතු කරන ප්‍රශ්නයකට උපරිම ලෙස එදාම පිළිතුරු ලබා දෙන්න කටයුතු කරන්න. එසේ පිළිතුරු ලබා දෙන්නේ නැත්නම්, අඩුම තරමේ පසු දිනවත් පිළිතුරු ලබා දිය යුතුව තිබෙනවා. දැන් පිළිතුරක් ලබා දෙනවාද? නැහැ. දෙන්නේ කවදාද කියලා දන්නේ නැහැ. ඇමතිවරු එයිද දන්නේ නැහැ. මෙවැනි තත්ත්වයකුයි ඇති වෙලා තිබෙන්නේ. සභානායකවරයා හැටියට ඔබතුමාගේ ස්ථාවරය මොකක්ද කියලා මා දැන ගන්න කැමැතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය කනගාටුදායක තත්ත්වයක්. අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් හැම කණ්ඩායම් රැස්වීමකදීම නිරන්තරයෙන් පවසා තිබෙනවා, ගරු අමාත්‍යවරුන්ට පාර්ලිමේන්තුවට ඇවිල්ලා අවශ්‍ය උත්තර ලබා දෙන්න කියලා. ඇත්ත වශයෙන්ම මේක පාර්ලිමේන්තුවට කරන නිග්‍රහයක්. විපක්ෂයේ මන්ත්‍රීවරු උදේට ඇවිල්ලා ප්‍රශ්න අහනවා. පාර්ලිමේන්තුවට ගරු කිරීමක් වශයෙන් මෙතැනට ඇවිල්ලා උත්තර දෙන්න ඕනෑ. මම අනුර දිසානායක මන්ත්‍රීතුමා කියන කාරණය පිළිගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නයක් අහනවා කියන්නේ මන්ත්‍රීවරයෙකුට නොව පක්ෂ නායකයෙකුට තිබෙන වරප්‍රසාදයක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I agree. They should come here and answer the Questions out of respect to Parliament. පාර්ලිමේන්තුවට ගරු කිරීමක් වශයෙන් උත්තර දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න කියලා අපි සභානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් පුන පුනා කියලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ මේ වන විට ඉදිරිපත් කරපු ප්‍රශ්න සහ ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්න ගත්තු කාලය පිළිබඳව වාර්තාවක් ලබාගෙන පක්ෂ නායක රැස්වීමේදී අපි ඒ ගැන පක්ෂ නායකයන්ව දැනුවත් කරන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, මම පෞද්ගලිකව කථා කරලා අගෝස්තු 9වැනි දාට උත්තරයක් ලබා දෙන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ සභා වාරයේදී එයට පිළිතුරක් ලබා දෙන්න සභානායකතුමා එකඟ වීම හොඳයි. හැබැයි, දැන් මෙතැන ඇති වී තිබෙන තත්ත්වය මෙයයි. ප්‍රශ්නය අහන මන්ත්‍රීවරයා වශයෙන් මමත් ඒ වාගේම ආණ්ඩු පක්ෂය වෙනුවෙන් සභාවේ ප්‍රධාන කටයුතු භාරව සිටින සභානායකතුමාටත් එකම දේ කියන්න සිදු වෙලා තිබෙනවා. මම කියන එකම තමයි එතුමාටත් දැන් කියන්න සිදු වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලාගේ පාර්ශ්වයට අමාත්‍යවරු කැඳවා ගැනීමට වගකීමක් තිබෙනවා. ඒක මගේ වගකීමක් නොවෙයි. මම ප්‍රශ්න කරන්නේ ඔබතුමාගෙන්. ඔබතුමා තමයි එයට පිළිතුරු ලබා දිය යුතු වන්නේ. නිශ්චිත වශයෙන් ප්‍රශ්නයක් ඇහුවාට පසුව අමාත්‍යවරු මේ සභාවට ඇවිල්ලා පිළිතුරක් ලබා දිය යුතුව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක හෑල්ලුවට ලක් කරනවා කියලා මම කියන්නේ මේ කාරණය නිසායි. ඊයේ කියනවා, අද දෙනවා කියලා. අද දකින්නවත් නැහැ. ඊයේ එන්නේ දවල් වෙලා. උදේ 10.30ට ඇවිල්ලා පිළිතුරු ලබා දෙන්න පුළුවන්. ඒකෙන් පෙන්නුම් කරන්නේ කිසිදු වගකීමකින් යුතුව මේ පාර්ලිමේන්තුවේ වැඩ කටයුතුවලට එම අමාත්‍යවරයා සහභාගී නොවන බවයි. එම නිසා එම අමාත්‍යවරයාගේ හැසිරීම පිළිබඳව සභානායකතුමා හැටියට මීට වඩා අවධානය යොමු කරන්න ඕනෑය කියලා කියන එක තමයි මගේ අදහස වන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මූලික වගකීම තිබෙන්නේ පාර්ලිමේන්තුවට.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නවලට උත්තර ලබා ගැනීමට පාර්ලිමේන්තුවට අයිතිවාසිකමක් තිබෙනවා. ඒක මන්ත්‍රීවරයෙකුගේ අයිතිවාසිකමක් නොවෙයි. මෙතැන අපේ සභානායකතුමා තමන්ගේම අමාත්‍ය මණ්ඩලයේ තවත් ඇමතිවරයෙකුට දෝෂාරෝපණය කිරීමෙන් මේ ප්‍රශ්නය කෙළවර කරන්න බැහැ. කෝ, ඒ ගොල්ලන්ගේ තිබෙන සාමූහික වගකීම?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ අහපු ප්‍රශ්නයකට ගරු රවුෆ් හකීම් මැතිතුමා පිළිතුරු දෙන්නයි හදන්නේ. හොඳ ඇමතිවරයෙක්.

පුනරින් ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය: නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

பூநகரி மக்களின் குடிநீர்ப் பிரச்சினை: நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சரின் கூற்று

DRINKING WATER PROBLEM OF POONERYN RESIDENTS: STATEMENT BY MINISTER OF CITY PLANNING AND WATER SUPPLY

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා පැන නඟපු ප්‍රශ්නයක් මේක.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் முன்கூட்டியே அறிவித்திருந்தால் நான் தயாராக வந்திருப்பேன்.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
இது நீங்கள் கேட்ட கேள்விதானே?

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நான் கேட்ட கேள்விதான். ஆனாலும் நான் உரிய ஆவணங்களுடன் தயாராக வந்திருக்கலாம் என்பதற்காகத்தான் கூறுகிறேன். சரி, நீங்கள் சொல்லுங்கள்!

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
அப்படியென்றால் இன்னுமொரு நாளைக்கு இதனை எடுக்கலாம்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rauff Hakeem, you may reply.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
சரி. கௌரவ டக்ளஸ் தேவானந்தா அவர்கள் கேட்ட கேள்விக்கான பதிலை நீர் வழங்கல் வடிகாலமைப்புச் சபையினர் சிங்களத்தில் அனுப்பி வைத்திருக்கிறார்கள். நான் அதனைத் தமிழில் மொழிபெயர்த்து வாசிக்கிறேன்.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
எனக்கு தமிழ் மொழிபெயர்ப்பைத் தாருங்கள்! நான் கேட்டபோது சபாநாயகர் அவர்கள் அதனை ஏற்றுக்கொண்டிருக்கிறார்.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
இதனை உரைபெயர்ப்பாளர்கள் தமிழில் மொழிபெயர்ப்பார்கள்.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
அவர்கள் மொழிபெயர்ப்பதை என்னால் கேட்க முடியும். ஆனால், எழுத்திலும் தரச்சொல்லி நான் கேட்டிருக்கிறேன். சபை முதல்வர் அவர்களும் இங்கே இருக்கிறார். தயவுசெய்து அமைச்சர்கள் இதனைக் கருத்தில் எடுத்துக்கொள்ள வேண்டும்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, he is asking for it in writing or -

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
I can translate it myself.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
நான் அதனைத் தமிழிலேயே சொல்கிறேன்.

12,500 லீற்றர் கொள்ளளவுள்ள இரண்டு 'லொறி பவுசர்"கள் இல்லாவிட்டாலும் 8,000 லீற்றர் கொள்ளவுள்ள இரண்டு 'லொறி பவுசர்'களை நீர் வழங்கல் வடிகாலமைப்பு சபையினால் வட பிரதேசத்திற்கென ஒதுக்க முடியும். இதற்காக ஒவ்வொரு மாதமும் நீர் வழங்கல் வடிகாலமைப்பு சபை 6 இலட்சம் ரூபாயை அரசாங்க நிதியிலிருந்து பெறவேண்டிய அவசியம் ஏற்படுகிறது.

வட பிரதேசத்திற்கு வழங்குவதற்கு 3,500 லீற்றர் கொள்ளளவுள்ள 'டிரக்டர் பவுசர்'கள் தற்போது நீர் வழங்கல் வடிகாலமைப்புச் சபையிடம் இல்லை. 1000 லீற்றர் கொள்ளளவுள்ள 10 நீர்த்தாங்கிகளை உலக வங்கியின் கடனுதவியோடு கிளிநொச்சி மாவட்டத்தில் நடைமுறைப்படுத்தப்படும் செயற்றிட்டத்தினூடாக உள்நாட்டு நிதியொதுக்கீட்டின்மூலம் பெற்றுத்தருவதற்கான முயற்சிகள் செய்யப்படும்.

பூநகரி பிரதேச சபை செலவிட்டுள்ள 4 இலட்சம் ரூபாயைக் குறைநிரப்புச் செய்வதற்கு நீர் வழங்கல் வடிகாலமைப்பு சபைக்கு அங்கீகாரம் எதுவும் இல்லை. பிரதேச சபைகள் செலவிட்ட பணத்தை நாங்கள் எவ்வாறு கொடுப்பது? இது சம்பந்தமாக முயற்சி செய்து பார்க்கலாம்.

மேலும் 'பவுசர்' வழங்குவது சம்பந்தமாக நீர் வழங்கல், வடிகாலமைப்புச் சபைக்கு 6 இலட்சம் ரூபாய் ஒதுக்கீடு தேவையென்று மதிப்பிடப்பட்டிருக்கின்றது. இந்த ஒதுக்கீட்டைப் பெற்றுக்கொள்வதற்காகவும் முயற்சிகள் செய்யவேண்டிய அவசியமிருக்கின்றது.

உலக வங்கிச் செயற்றிட்டத்தின்மூலம் கிளிநொச்சிப் பிரதேசத்தில் நடைமுறைப்படுத்தவுள்ள செயற்றிட்டத்தின்கீழ் நீர் வழங்கப்படும் பிரதேசங்களாக முழங்காவில், நாச்சிக்குடா, கரியாலை, நாகப்படுவான் ஆகியவை உள்ளடக்கப்பட்டிருக்கின்றன. இந்த நீர் வழங்கல் திட்டத்தை 2018ஆம் ஆண்டளவில் முடிவுறுத்துவதற்கு ஏற்பாடுகள் செய்யப்பட்டுள்ளன.

ஜெயபுரம், வலைப்பாடு கிராமிய நீர் வழங்கல் திட்டங்கள் இந்தச் செயற்றிட்டத்தின்கீழ் 3வது கட்டமாக நிறைவேற்றப்படுவதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டுள்ளன. அந்தவகையில் 2017ஆம் ஆண்டு நடுப்பகுதியளவில் அதற்கான வேலைத்திட்டங்கள் ஆரம்பிக்கப்படவுள்ளன.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Minister, why is it that the Kilinochchi Water Supply and Sanitation Project getting delayed without any reason? I am not talking about the main line to Jaffna which was a planned project that was approved, but about the Kilinochchi Water Supply and Sanitation Project. It was almost 80 per cent through. For the last 18 months, you have not been able to do it. Why is that?

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
There is a problem. -[*Interruption.*] Definitely, I do agree. In this regard, I have made several statements in the House. Questions have been posed to me by the Hon. Members. I went to the Kilinochchi District Secretariat and held a meeting with all the Northern Province political representatives. The issues are well known to all the political representatives in the House. Almost all the elected political representatives both in Parliament and Provincial Councils are opposing the Iranamadu tank water to be used for the Jaffna Peninsula.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
That is a separate issue. I am talking about the Kilinochchi Water Supply and Sanitation Project.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

Ah, you are talking about the Kilinochchi Project. That is being done. The Kilinochchi Water Supply and Sanitation Project is on. By 2018, it is to be completed.- [*Interruption*.] It is correct. I have replied here. That Project is now on and will be completed by 2018. Hon. Devananda asked about the Pooneryn area.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, please reply without making it a debate.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

I have answered.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay. Thank you.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

මේලුම් කොල්ලංකුරිච්චියිල් 2 තාංකිකළ්, චෙට්ටියාකුරිච්චියිල් 4 තාංකිකළ්, කරුක්කාය්ත්තීවිල් 7 තාංකිකළ්, ඥානිමඩත්තිල් 5 තාංකිකළ්, පල්ලික්කුඩාවිල් 1 තාංකි, මට්ටුවිල්නාදු මේට්ටිල් 3 තාංකිකළ්, පරමන්කිරායිල් 2 තාංකිකළ්, නාච්චික්කුඩාවිල් 3 තාංකිකළ්, ජෙයපුරත්තිල් 3 තාංකිකළ්, ජෙයපුරම් සන්තෙයිල් 3 තාංකිකළ්, 19ආම් කට්ටෙයිල් 2 තාංකිකළ්, පොන්නාවෙළියිල් 18 තාංකිකළ්, පාලාවියිල් 1 තාංකි, පල්ලවරාජන්කට්ටිල් 1 තාංකි, ජෙයපුරම් කිළක්කිල් 2 තාංකිකළ් එන්ර එණ්ණික්කෙයිල් තාංකිකළ් වළංගප්පට්ටුල්ළන. ඉතිල් පාලාවික්කු මාත්තිරම් 4000 ලීට්ටර් කොල්ළවුල්ළ තණ්ණීර් තාංකි වළංගප්පට්ටුල්ළතු. ඒනෙයවෙ 1000 ලීට්ටර් කොල්ළවු කොණ්ටවෙයාකුම්. ඉවර්‍රෙයෙල්ලාම් වඩිකාලමෙප්පුච් සපෙ කොටුත්තතනාල්තාන් අංකු නීර් විනියෝකික්කප්පට්ටු වරුකිරතු.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

අවෙ පෝතාතෙන්රුතාන් කේට්කින්රෝම්.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

ඉව්වළවුතූරම් නාංකළ් සෙය්තිරුක්කින්රෝම්. ඉතර්කාන මේලතිකමාන සෙලවිනංකළෙ නාංකළ් අමෙච්චරවෙප් පත්තිරම්මූලම් පෙර්රු, නීංකළ් සොල්ලියිරුක්කින්ර විටයංකළුක්කාන මුයර්චිකළෙච් සෙය්වෝම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා, ගරු සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I move,

"That notwithstanding the provisions of the motion agreed to by Parliament on 08.03.2016, the hours of Sitting this day shall be 10.30 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 6.30 p.m.. At 11.30 a.m. Standing Order No. 7 (5) of the Parliament shall operate. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තැබීමේ යෝජනාව, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මුලසුන ගත්නවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

රටේ ආර්ථික සහ සමාජ මට්ටම පිරිහීම
நாட்டின் பொருளாதார மற்றும் சமூக நிலையில் வீழ்ச்சி
DETERIORATION OF ECONOMIC AND SOCIAL STANDARDS OF THE COUNTRY

[පූ.භා. 11.37]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජනතාවගේ ජන ජීවිතය පිරිහීමෙන් ආරක්ෂා කිරීමට ජාතික ආර්ථිකය ස්ථාවර මට්ටමකින් පවත්වාගෙන යෑම වෙනුවෙන් වූ ක්‍රියා මාර්ග සම්පූර්ණයෙන්ම අසාර්ථකව ආර්ථික අවුලකට අද අප රට පැමිණ තිබේ. රට දිනපතා ණය බරින් වැඩි වීම (දේශීය හා විදේශීය) රූපියලෙහි වටිනාකම පිරිහීම, ජීවන වියදම වේගයෙන් වැඩිවීම, හිතුවක්කාර ලෙස VAT හා බදු ක්‍රම ජනතා කර පිට පැටවීමේ බදු පැනවීමද, ආර්ථික පීඩනය හා එයින් සහනයන් ඉල්ලන ජනතාව මර්දනය ද, වැඩ කරන ජනතාව, ශිෂ්‍ය හා විශ්වවිද්‍යාලවලට, රජය සේවකයාට ද, වෛද්‍යවරු හා වෘත්තිකයන්ටද, දේශපාලන විරුද්ධවාදීන්ට ද, රණවිරුවන්ටද එම මර්දනය හා දඩයම දියත් කිරීම, ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා මාර්ග වහා නවතන ලෙස මෙම පාර්ලිමේන්තුවට යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් අප මෙම යෝජනාව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් හැටියට සාකච්ඡාවට ගැනීමට තීරණය කළේ, රටේ උද්ගත වී තිබෙන ආර්ථික අහේනියත්, සමාජ ජන ජීවිතයේ පරිහානියත් ඒ වාගේම දිනපතා වැඩි වන මර්දනය හා පරිපාලන කඩා වැටීමත් නිසායි.

දේශීය වශයෙන් රජය විවිධ ආයතනවලින් ණය ගැනීම හා විදේශීය ආයතනවලින් ණය ගැනීම නිසා දිනපතා ණය බර වැඩි වී තිබෙන අර්බුදය විසඳා ගැනීමට නොහැකිව, රට තවත් අර්බුදයකට ගමන් කරන බව පැහැදිලියි.

මහින්ද රාජපක්ෂ රජය පාලන බලය භාර දෙන අවස්ථාවේදී රුපියල් 131ට තිබුණු ඇමෙරිකානු ඩොලරයේ වටිනාකම අද රුපියල් 148 දක්වා බාල්දු වී තිබෙනවා. රුපියලේ වටිනාකම පිරිහී තිබෙනවා. පිරිහෙන ආර්ථික අහේනියේ බර රටේ ජනතාව මත පැටවී තිබෙනවා. රුපියල බේරා ගැනීම සඳහා ස්ථාවරව තිබුණු විදේශ සංචිතය විශාල වශයෙන් වියදම් කරනු ලැබුව ද රුපියල බේරා ගැනීමට බැරි වුණු බවත් අපි ඉතා පැහැදිලිව දන්නවා. ජීවන වියදම වේගයෙන් වැඩි වෙමින් පවතිනවා. රජය කුමක් කිව්වත් අද ජනතාවට ජීවත් වන්න බැරි තත්ත්වයට පත් වී තිබෙනවා. ජීවන වියදමේ ප්‍රශ්නයට අද හැම ගෙයක් දොරක්ම, ජන ජීවිතයක්ම මුහුණ දී සිටිනවා. ඒ හේතුවෙන් ජනතාව බරපතළ අර්බුදයකට වැටී තිබෙනවා.

ඊයේ දිනයේදී අපේ ගරු මන්ත්‍රීතුමන්ලා භාණ්ඩ හා සේවාවල වැඩි වීම පිළිබඳව ඉතා පැහැදිලිව එකින් එක කරුණු ඉදිරිපත් කළා. මේ ප්‍රශ්නයට අතිරේකව පසු ගිය අය වැය ලේඛනයෙන් අනුමත කර ගත් වැට බදු ප්‍රමාණය හිතුවක්කාර ලෙස වෙනස් කර තිබෙනවා. අය වැය ලේඛනයෙන් පිට පැනලා සම්පූර්ණයෙන්ම හිතුවක්කාරී බදු ක්‍රමයක් මඟින් බදු පැනවීමෙන් අද ජනතාවගේ කරපිට බදු බර පැටවීම සිදු කර තිබෙනවා. මේ වන විටත් එය පාර්ලිමේන්තුවෙන් නීත්‍යානුකූලව අනුමත කර ගෙන නැහැ. ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට යාම නිසා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වැට් එක අත්හිටුවනු ලැබුවා. වැට් එක ගෙවපු අයගේ ඒ මුදල්වලට සිදු වන්නේ කුමක්ද? මෙලෙස ඉතාම හිතුවක්කාරී ලෙස පනවන ලද වැට් එක තවමත් නීත්‍යානුකූල හා ව්‍යවස්ථාමය අර්බුදයකට පත් වී තිබෙන අතර, එය ජන ජීවිතයට විශාල ලෙස බලපා තිබෙනවා. මේ ආර්ථික පීඩනය නිසා විවිධ ජනතා කොටස් සහන ඉල්ලා ඉදිරිපත් වෙනවා. ඒ අයට අද ආණ්ඩුව එල්ල කරන්නේ මර්දනයයි. වැඩ කරන ජනතාවගේ පැත්තෙන් බැලුවත් විවිධ ස්ථානවල වැඩ කරන ජනතාවගේ ඉල්ලීම් බලහත්කාරයෙන් යටපත් කිරීමට රජය උත්සාහ දරන බව පෙනෙනවා.

විශ්වවිද්‍යාල ප්‍රශ්න විසඳා ගැනීම සඳහා ශිෂ්‍යයන් හා විශ්වවිද්‍යාල එකින් එක ඉදිරිපත් වනවිට ඒ විශ්වවිද්‍යාල වසා දැමීම, ශිෂ්‍යයන් අත් අඩංගුවට ගැනීම, ඒ අයට එරෙහි මර්දනකාරී ක්‍රියාමාර්ග දියත් කිරීම රජයේ එකම විසඳුම බවට පත් වෙලා තිබෙනවා.

යාපනය විශ්වවිද්‍යාලයේ අර්බුදය අපි දන්නවා. යාපනය විශ්වවිද්‍යාලයේ ඇති වුණු අර්බුදය සම්බන්ධයෙන් කියනවා නම්, දවල් 12.00 වන තුරු මේ උත්සවය කිසිදු ගැටලුවක් නැතිව සිදු වුණා. දහවල් ආහාර වේලාවෙන් පසු මේ ශිෂ්‍යයන් ඉදිරිපත් කළ සංස්කෘතික අංගයට ඉතා සුළු අන්තවාදීන් කොටසක් පහර දීම නිසා ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන් කිසිදු ආරක්ෂාවක් නැති තත්ත්වයකට පත් වුණා. මාර්ෂල්වරයා එදා දවසේ විශ්වවිද්‍යාලයේ සිටියේ නැහැ. යාපනයේ විශ්වවිද්‍යාලයේ බලධාරීන් මේ සිද්ධිය සිදු වෙනවා බලාගෙන සිටියා; කිසිදු පියවරක් ගත්තේ නැහැ. පසුව ශිෂ්‍යාවන්ට ගල් ගසා පහර දෙනවිට ඒ ශිෂ්‍යාවන් ආරක්ෂා කර ගැනීමට හිටපු ශිෂ්‍යයන් ගත් පියවර නොවන්නට මීට වඩා භානිකර තත්ත්වයක් ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිදු වන්නට ඉඩ තිබුණු බව කනගාටුවෙන් සඳහන් කරන්නට ඕනෑ. පසුව පොලීසිය මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් බස් මගින් නගරයේ ආරක්ෂක ස්ථාන කරාත්, කිලිනොච්චි-වවුනියා හරහා කොළඹටත් එවන්නට කටයුතු කළා. යාපනය විශ්වවිද්‍යාලය අද තාවකාලිකව වසා දමා තිබෙනවා. සුළු අන්තවාදී පිරිසකට යාපනය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය කඩා කප්පල් කිරීමට ඉඩ නොදී කටයුතු කරන ලෙස අප රජයට කියා සිටිනවා. හැම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම ආරක්ෂාව ඇති කොට යළිත් යාපනය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම සඳහා අවස්ථාව සලසා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වාගේම වසා දමා ඇති අනෙකුත් විශ්වවිද්‍යාලවල දියත් කර ඇති මර්දනයන් ඉවත් කරන ලෙස ද අපි මේ අවස්ථාවේදී ඉල්ලීමක් කර සිටින්නට කැමැතියි.

රජයේ සේවකයන් මෙන්ම, විශේෂයෙන් වෛද්‍යවරුන් ද අපේ රටේ සෞඛ්‍ය වෛද්‍ය සේවාවද ප්‍රශ්න රාශියක් පාලනයට ඉදිරිපත් කළ ද, පාලනය අනුගමනය කරන හිතුවක්කාර ක්‍රියා මාර්ගය නිසා වෛද්‍යවරු විටින්විට දිනක, අඩ දිනක වර්ජනකාරී තත්ත්වයකට පරිවර්තනය වීමෙන් අපේ රටේ ඇති කර ගෙන යන මේ මර්දනයේ තවත් ස්වභාවයක් රජය පෙන්නුම් කර තිබෙනවා.

රජයේ සේවකයන් වෙනුවෙන් සත්‍ය ප්‍රකාශ කරන්නට ඉදිරිපත් වුණු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් දඩල්ලගේ මහතා සත්‍ය කීවාය කියා ඔහුගේ තනතුරින් මාරු කර යවා තිබෙනවා. තමන්ගේ සේවාව තවදුරටත් කර ගෙන යන්නට බැරි සගයන් දහස් ගණනක් වෙනුවෙන් රාජ්‍ය සේවයෙන් ඉවත් වී රාජ්‍ය සේවයට 'ආයුබෝවන්' කියන තත්ත්වයකට පරිවර්තනය වීමට එතුමාට සිදු වුණා. රජයේ සේවකයන්ට අද එවැනි ආකාරයේ මර්දනයක් දියත් වී තිබෙනවා.

දේශපාලන විරුද්ධවාදීන්ට, රණ විරුවන්ට ඒ මර්දනය ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වනවා. නීති විරෝධීව පිහිටුවා තිබෙන ආයතන ගැන අපි පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කර තිබෙනවා. FCID එකේ නීති විරෝධීභාවය ගැන අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් තිබෙනවා; අභියාචනාධිකරණයට ගිහින් තිබෙනවා. අද වන තුරු නඩු තීන්දුවක් නොදී, මේ ආයතනය නීති විරෝධීව පවත්වා ගෙන යාමේ කනගාටුදායක තත්ත්වයට පත් වීමෙන්, මේ මර්දනකාරී හස්තය අපේ රටේ සෑම ක්ෂේත්‍රයකම සිටින තමන්ගේ ප්‍රතිවිරුද්ධවාදීන්ට එල්ල කරමින් සිටිනවා. ඒ නිසා එම මර්දනය හා දඩයම දියත් කිරීම, ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා මාර්ග වහා නවතන ලෙස මේ පාර්ලිමේන්තුව යෝජනා කරයි කියන සභාව කල් තැබීමේ යෝජනාව මා ඉදිරිපත් කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම තව එක කාරණයක් කියන්න කැමැතියි. ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව ප්‍රකාශයක් කළා, ජීනීවා යෝජනා අනුව, විදේශීය විනිශ්චයකරුවන් කිසි

ලෙසකින් ලංකාවේ අධිකරණවලට හෝ අධිකරණ කටයුතු කිරීමට පත් කරන්නේ නැහැයි කියා. දැන් බලන්න. ජනාධිපතිතුමා එහෙම කිව්වත්, විදේශ කටයුතු ඇමතිතුමා එයට ප්‍රතිවිරුද්ධ ප්‍රකාශයක් කළා. එයයි අද තත්ත්වය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වොෂිංටන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් නිවේදනයක් නිකුත් කර තිබෙනවා. The Embassy of Sri Lanka at 3025, Whitehaven Street Northwest, Washington, District of Columbia 20008, United States මේ ආකාරයේ නිවේදනයක් නිකුත් කර තිබෙනවා. It states, I quote:

> "The Consultation Task Force on Reconciliation Mechanisms is calling for submissions from diaspora organisations on the design of structures, processes and measures for truth, accountability, reparations and non-recurrence, i.e. an Office on Missing Persons, an Office on Reparations; a Judicial Mechanism with a Special Counsel; a Truth, Justice, Reconciliation and Non-Recurrence Commission; and any other mechanisms, processes or measures for advancing reconciliation in Sri Lanka.
>
> Submissions can be made to the Task Force by diaspora organisations/ individuals **until July 28, 2016.**"

This has been issued on the 20th of July, 2016 by the Embassy of Sri Lanka in Washington to the international community. But, the Parliament of Sri Lanka is unaware of this. I do not know whether the President is aware of what the Ministry of Foreign Affairs is doing. These actions have to be accountable.

මෙහි ඉතා පැහැදිලිව සඳහන් වනවා, "judicial mechanism" කියා. ජනාධිපතිතුමා විදේශ නියෝජිතයන්ගේ සහභාගිත්වය ප්‍රතික්ෂේප කළා. එසේ නම් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙනම අමාත්‍යාංශයක්ද? It also states "with a Special Counsel". විදේශ නියෝජිතයන් ප්‍රතික්ෂේප කළා. එසේ නම්, අද වෙනම කටයුත්තක් කරන්නට අපේ තානාපති කාර්යාලයට බලයක් තිබෙනවාද? මේ පිළිබඳව රජය අනුගමනය කරන්නට බලාපොරොත්තු වන මර්දනය, ප්‍රජාතන්ත්‍ර විරෝධීභාවය පාර්ලිමේන්තුව අබිබවා කටයුතු කිරීමේ ක්‍රියා මාර්ගය ඉතා පැහැදිලිව භයානක ක්ෂේත්‍රයකට පරිවර්තනය වෙමින් තිබෙනවා. පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථා සම්පාදන කම්ටුව අලුත් ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම ගැන සාකච්ඡා කරමින් සිටිනවා. පාර්ලිමේන්තුව කෙරෙහි විශ්වාසයක් මේ ආණ්ඩුවට නැද්ද? පාර්ලිමේන්තුවටත්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ටත්, ඒ වාගේම අපේ ව්‍යවස්ථා සම්පාදනය සඳහා පත් කර තිබෙන අනු කම්ටු සියල්ලටත් හොරෙන් -Constitutional Assembly එක නොමඟ යවන- ජාත්‍යන්තරව මෙවැනි ආකාරයේ රහසිගත කටයුත්තක නිරත වී තිබෙන්නේ ඇයි? ඒ සම්බන්ධයෙන් මේ අවස්ථාවේ අපි රජය කෙරෙහි අප්‍රසාදය පළ කරනවා.

මෙය මර්දනයේ හස්තයක්. මේ රටේ රණ විරුවන් මර්දනය කරන්න, මේ රටේ ත්‍රස්තවාදය පරාජය කළ අය මර්දනය කරන්න, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට බාහිරව, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන අධිකරණයට බාහිරව ඇති කරන්න යන මේ ක්‍රියාවලිය මර්දනය හා ප්‍රජාතන්ත්‍ර විරෝධීභාවය බව කනගාටුවෙන් මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. රජයේ වග කිව යුත්තන් මේ සම්බන්ධයෙන් අද දිනයේදී වගකීමෙන් ප්‍රකාශයක් කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා. මේ ලියවිල්ල සමඟරවිට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුවත් දැකලා නැතුව ඇති; සමඟර විට අපේ රාජ්‍ය සේවාවේ ඉහළ අංශ කිසිවක් දැකලා නැතුව ඇති. මෙවැනි භීතුවක්කාර ක්‍රියාමාර්ග අරගෙන අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අභියෝගයක් එල්ල කරමින් කටයුතු කරන්න විදේශ අමාත්‍යාංශයට පුළුවන් ද කියන ප්‍රශ්නය අපි අහනවා.

අපි මේ අවස්ථාවේදී ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා මාර්ගවලට අවතීර්ණ නොවී, මර්දනකාරී ක්‍රියා මාර්ගවලට අවතීර්ණ නොවී, මේ සම්බන්ධනේ අපේ අප්‍රසාදය පළ කරනවා. අපේ රට ආර්ථික අවුලකට පත්වී තිබෙන බව සැබෑයි. ඒ ආර්ථික අවුලෙන් ගොඩ එන්නට ගන්නා විසඳුමක් නැති ක්‍රියාමාර්ගවල එක හස්තයක් තමයි, මර්දනය දියත් කිරීම. මේ මර්දනය විවිධ විවිධ අංශ කරා දියත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අපේ අප්‍රසාදය පළ කරමින් මේ ක්‍රියාමාර්ග වහා ඉවත් කිරීමට අද මේ යෝජනාව ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Then, the Hon. Bandula Gunawardane to second the Adjournment Motion.

[පූ.භා. 11.52]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් එහි නායක සහ මහජන එක්සත් පෙරමුණේ නායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව ස්ථිර කරමින් මේ ගරු සභාවට කරුණු කිහිපයක් සඳහන් කරන්න මා කැමැති වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාව අනුව රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පූර්ණ බලය හිමි වෙන්නේ පාර්ලිමේන්තුවටයි. පාර්ලිමේන්තුවට කියන්නේ කැබිනට් ඇමතිවරුන්ට නොවෙයි; අදාළ විෂයභාර ඇමතිවරයාට නොවෙයි. ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් අපි සියලු දෙනාගෙන් සමන්විත වන පාර්ලිමේන්තුවට තමයි රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ බලය තිබෙන්නේ. ඒ අනුව බදු පැනවීම, බදු සංශෝධනය කිරීම, ආදායම් රැස් කිරීම, වියදම් කිරීම, අය වැය පරතරය, පරතරය පියවීම, ණය ගැනීම යනාදිය පිළිබඳ සම්පූර්ණ බලය මේ ගරු සභාවටයි තිබෙන්නේ. ඒ නිසා තමයි පාර්ලිමේන්තුව උත්තරීතර වෙන්නේ, පාර්ලිමේන්තුව මහ ජනයාගේ ඡන්දයෙන් පත් වුණු නියෝජිතයන්ට පවරන්නේ, කුමන අපහාස උපහාස බාධක ආවත් තමන්ගේ නිල රාජකාරිය ලෙස පැවතෙන රාජ්‍ය මූල්‍ය කටයුතු කරයි කියලා. ඒ අනුව රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් වැඩි ඉඩ කඩක් විපක්ෂයට ලබා දෙනවා. වර්ෂයකට වරක් ඉදිරිපත් කරන අය වැය ලේඛනය මේ රටේ ව්‍යාපාරික ක්ෂේත්‍රය, පාරිභෝගික ක්ෂේත්‍රය ඇතුළු අනෙකුත් සියලුම ක්ෂේත්‍රවලට නීතියක් ලෙස පිළිගැනීමක් ඇති වෙනවා. 2016 අය වැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේදී මේ ගරු සභාවේදී ඒ අය වැය ලේඛනය තුනෙන් දෙකක ඡන්දයකින් සම්මත වුණා. ඒ සම්මත වන අවස්ථාවේදී අද විශාලම අවුල ඇතිවෙලා තිබෙන VAT සම්බන්ධයෙන් මොකක්ද ඉදිරිපත් කළ යෝජනාව?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ යෝජනාව තමයි පසුගිය රජය විසින් VAT අය කිරීමේදී විකෘතිතාවක් ඇති වෙලා තිබෙනවා. ඒ විකෘති තත්ත්වය නිවැරදි කිරීම සඳහා තනි VAT අනුපාතයක් එනවා සියයට 11යි කියලා. සිල්ලර හා තොග වෙළෙඳාම සම්පූර්ණයෙන් බද්දෙන් නිදහස් කරනවා. ඒක තමයි මේ ගරු සභාව සම්මත කළ යෝජනාව. තමුන්නාන්සේලා සම්මත කළේ තුනෙන් දෙකක ඡන්දයකින්. අපි විරුද්ධ වුණා. එදා සම්මත වුණු යෝජනාවේ සිල්ලරට හා තොග වෙළෙඳාමේ VAT තිබුණේ කෙසේද?

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

බදු නැතිව ලංකාවේ ආණ්ඩුවක් දුවන්නට බැහැ. බදු ආදායම වැඩි කර ගන්නට ඕනෑ. ඒක ඇත්ත. ආණ්ඩුවේ වියදම වැඩි වෙනවා නම් ඒ වියදම් පියවා ගැනීම සඳහා ආදායම් ලබා ගන්නට ඕනෑ. "දියව්, දියව්" කියන්නට ලෙහෙසියි. ඒ "දියව්" කියන අයට "හිටපියව්" කියලා ආපහු හැරිලා දෙන්න නම් මහ ජනතාවගෙන් මේ ටික ගන්නට ඕනෑ. ඒක තමයි ලෝකයේ තිබෙන පරම සත්‍යය. එහෙම නැත්නම් ඕනෑම කෙනෙකුට කියන්නට පුළුවන්, "අපි ආපුවාම රුපියල් 20,000කින් පඩි වැඩි කරනවා, සමෘද්ධි දීමනාව රුපියල් 65,000කින් වැඩි කරනවා, හැම පදුරකටම පොහොර දාන්න පොහොර සහනාධාරය දෙනවා" කියලා. ඒ කියන එකට අහුවෙන අයත් ඉන්නවා. ඒක කියලා සටන් කරන අයත් ඉන්නවා. මේ රටේ නිරායුධ, අවිංහිසක ලක්ෂ ගණන් බදු ගෙවන මිනිසුන් තමයි ඒ සියලු වියදම් දරන්න අවශ්‍ය මුදල් ප්‍රමාණය භාණ්ඩාගාරයට ලබා දෙන්නේ. කවුරු මුදල් ඇමති වුණත් එහෙමයි.

චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මුදල් ඇමති වෙලා ඉන්න කාලයේ අත්තනගල්ලෙන් ගෙනැල්ලා භාණ්ඩාගාරයට සල්ලි දුන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ මුදල් ඇමතිතුමා කාලයේ මැදමුලනෙන් ගෙනැල්ලා සල්ලි දුන්නෙත් නැහැ. මේ මුදල් ඇමති කොහොමත් තිබෙන එකක් ගන්නවා මිසක් කවදාවත් දෙන්නේ නැහැ. මේ කවුරුවත් දෙන්නේ නැහැ, මේ රටේ මිනිස්සු තමයි සියලුම වියදම් ටික දරන්නේ. රජයේ සේවකයන්ට වැටුප් ගෙවන්නේ, විශ්‍රාම වැටුප් ගෙවන්නේ, සමෘද්ධි සහනාධාර ගෙවන්නේ, මංමාවත්, විදුලිය, ජලාපවාහන ක්‍රම හදන්නේ, ණය ගෙවන්නේ, ණය පොලිය ගෙවන්නේ මේ රටේ මිනිස්සු. මහ ජනයාගේ ඒ මුදල් හැසිරවීමේ බලය තමයි අපි මේ පාර්ලිමේන්තුවට දීලා තිබෙන්නේ.

මේ රජය මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරලා VAT අය කරන්න පටන් ගත්තා. ඒ අය වැයෙන් පස්සේ ජනවාරි මාසයේ, පෙබරවාරි මාසයේ, මාර්තු මාසයේ, අප්‍රේල් මාසයේ කඩ වැහුවාද? මිනිස්සු පාරට බැහැලා ටයර් පිච්චුවාද? "VAT අවුල" කියලා කොහේ හෝ කඩයක banners දාලා තිබුණාද? නැහැ. ඒ අය නිරුපද්‍රිතව VAT ගෙවාගෙන ගියා. අය වැයේදී යෝජනා කරලා අච්චු ගහලා තිබෙනවා, VAT අනුපාතය අඩු කරලා වෙනස් කිරීම කරන කොටගෙන, 2014ට වඩා 2015දී VATවලින් ලැබෙන ආදායම රුපියල් මිලියන 25,000කින් අඩුවන බව. VAT සංශෝධනය කිරීම නිසා, VATවලින් ලැබෙන ආදායම 2014ට වඩා 2015දී රුපියල් මිලියන 25,000කින් අඩුවන බව මෙම ගරු සභාවට කියනවා. මුදල් අමාත්‍යවරයා වශයෙන් VAT පැනවීමේදී - බදු අයකිරීමේදී - අනුගමනය කළ යුතු මූලධර්ම තිබෙනවා. සාධාරණ බවේ මූලධර්මය, සරල බවේ මූලධර්මය, නිශ්චිත බවේ මූලධර්මය, සානුබල මූලධර්මය වාගේ මූලධර්ම තිබෙනවා. මගේ උගත් මිත්‍ර ගරු කබීර් හාෂිම් අමාත්‍යතුමා ඒ ගැන දන්නවා. බදු අය කරන්න ඕනෑ මෙම මූලධර්මවලට අනුවයි කියලා එතුමා දේශන පවත්වලා තිබෙනවා. අපේ කාලයේ - මහින්ද රාජපක්ෂ යුගයේ - පරමාර්ථය විධියට තිබුණේ ඒ අනුව කටයුතු කිරීමයි.

සුළු පරිමාණ වෙළෙන්දන් ආක්‍රමණය කරමින් මහා පරිමාණික සමාගම්, සුපිරි වෙළෙඳසල් ජාලා රට පුරා ව්‍යාප්ත වෙන්න පටන් ගත්තා. පුංචි පුංචි වෙළෙඳාම් කරගෙන ජීවිතය ගෙනයන අසරණ සුළු පරිමාණ වෙළෙන්දෝ ලක්ෂ සංඛ්‍යාත පිරිසක් ඉන්නවා. ඒ අය ජීවනෝපාය සලසා ගන්නේ පොළෙන් පොළට ගිහිල්ලා වෙළෙඳාම් කරලා, තැනින් තැන ගිහිල්ලා වෙළෙඳාම් කරලා, pavement එකේ වෙළෙඳාම් කරලා, ගෙයින් ගෙට ගිහිල්ලා වෙළෙඳාම් කරලා. ආණ්ඩුවට බරක් වෙන්නේ නැතුව ඒ විධියට ලක්ෂ සංඛ්‍යාත පිරිසක් තමන්ගේ ජීවනෝපාය සලසාගන්නවා. මහන්සි වෙලා, දුක් විඳලා, අවදානම් දරලා තමයි ඒ අය මුදල් උපයාගන්නේ. ඒ අය සම්පූර්ණයෙන් බද්දෙන් නිදහස් කරන්න මහින්ද රාජපක්ෂ යුගයේ කළේ, වර්ෂයක ආදායම රුපියල් මිලියන 250ට වැඩි නම් පමණක් සිල්ලර - තොග වෙළෙඳාමෙන් බදු අය කිරීමයි. ආදායම රුපියල් දසලක්ෂ 250ට වැඩි වුණාම සුපිරි වෙළෙඳසැල් තමයි මේ බද්ද ගෙව්වේ. එතකොට රුපියල් බිලියන 9ක විතර බදු ආදායමක් ලැබුණා. වර්තමාන මුදල් ඇමතිවරයා ආපු ගමන් කළේ, තමන්ට ඡන්දයේදී උදව් කරපු අය සන්තෝෂ කරන්න කියලා ඒ සීමාව රුපියල් මිලියන 250 ඉඳලා රුපියල් මිලියන 100ට අඩු කළ එකයි.

පසු ගිය අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට කිව්වා, ඒක බිංදුවයි කිව්වා. මහින්ද රාජපක්ෂ යුගයේ සිල්ලර තොග වෙළෙඳාමට පැවැති පිරිවැටුම මිලියන 250, මිලියන 100 කළේත් රවී කරුණානායක මැතිතුමා. මිලියන 100, බිංදුව කළේත් එතුමා. ඊට පස්සේ දේශීය ආදායම් කොමසාරිස්ට කියනවා,"වහාම VAT සංශෝධනය කරන්න" කියලා. ඊට පස්සේ සියයට 11ට තිබුණු අනුපාතය සියයට 15ට වැඩි වෙනවා. මෙච්චර කල් බද්දක් අය කරපු නැති පෞද්ගලික සෞඛ්‍ය සේවාවට සියයට 15ක් බදු ගෙවන්න කියනවා. විදුලි සංදේශ ක්ෂේත්‍රයටත් ඒක ගෙවන්න කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි රෝහලකට ගියොත්, නිදහස් සෞඛ්‍ය සේවය යටතේ ඒ වියදම දරන්නේ රජය. දැන් බොහෝ දෙනෙක් රජයේ රෝහලට යන්නේ නැතිව, රජයට බරක් දෙන්නේ නැතිව, රුධිර සාම්පලයක් පරීක්ෂා කර ගන්න, මූත්‍ර පරීක්ෂා කර ගන්න, X-ray එකක් ගන්න පුද්ගලික ස්ථානවලට යනවා. එතකොට සියයට 15ක් බදු ගෙවන්න වෙනවා.

ගරු කබීර් හාෂිම් මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Public Enterprise Development)

Sir, can I raise a point of Order? The Hon. Member is misleading the House. We have asked to withdraw the VAT on all healthcare services. So, it will be withdrawn; there will be no VAT applicable.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හරි. හරි.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා තව එකක් කිව්වා. මෙම පිරිවැටුම මිලියන 100 ඉඳලා බිංදුවට ගෙනාවේ නැහැ. මිලියන 3 දක්වා තමයි පිරිවැටුම අඩු කරලා තිබෙන්නේ. ඒ නිසා පොළට යන පුංචි වෙළෙන්දන් ඒකට ඇතුළත් වෙන්නේ නැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
හොඳයි. ඔබතුමාගේ කථාවේදී පිළිතුරු දෙන්න.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
VAT අදාළ භාණ්ඩවල පිරිවැටුම දවසකට රුපියල් 33,000ක් ගණනේ මාසයකට ලක්ෂ 30ක් විය යුතුයි. ඒ නිසා පුංචි වෙළෙන්දා මේ බද්දට ඇතුළත් වෙන්නේ නැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු ඇමතිතුමනි, පිරිවැටුම - turnover - තිස්තුන්දහස් ගණනට බදු ගෙවන්න වෙන්නේ නැහැ. ඒකෙන් එකතු කළ අගයට පමණයි ගෙවන්න වෙන්නේ. ඒක මම දන්නවා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී පිළිතුරු දෙන්න කෝ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have one more minute.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

Sir, දැන් පෞද්ගලික සෞඛ්‍ය සේවයට බදු අය කරන්නේ නැහැ කියලා මෙතුමා කිව්වාට, ඒ රෝහල්වලින් සැත්කම් කරපු අයගේ receipts ගෙනැල්ලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ සඳහා 35,000යි, 50,000යි 100,000යි ආදි වශයෙන් බිල් ගෙවා තිබෙනවා. දැන් ඒ අයගෙන් ඒ බද්ද අය කරලා ඉවරයි. ඒකයි අපි කියන්නේ, ඒක අසාධාරණයි කියලා. අපේ මුත්‍ර, අපි සල්ලි ගෙවලා පරීක්ෂා කර ගත්තාම ඇයි ආණ්ඩුවට සියයට 15ක් දෙන්නේ? ඒකට අගයක් එකතු වෙනවාද? තිබෙන අගය අඩුවෙලා -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒකාබද්ධ විපක්ෂයේ වෙලාවෙන් තව විනාඩි 10ක් මම ගන්නවා.

මෙම බදු අය කිරීම සම්බන්ධව අපි අධිකරණයට ගියා. අධිකරණයට ගියාට පස්සේ අධිකරණයෙන් ඒක නතර කළා. ඊට පස්සේ තමුන්නාන්සේලා ඉදිරිපත් කළා, එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත. ඒකේ සෞඛ්‍ය සේවය සම්බන්ධව සඳහන්ව තිබෙනවා. මතක තියාගන්න, ඒ පනත් කෙටුම්පතේ සෞඛ්‍ය සේවය සම්බන්ධව කියලා තිබෙනවා. ඒ වාගේම සිල්ලර හා තොග වෙළෙඳාම සම්බන්ධව තිබෙනවා; විදුලි සංදේශ සේවා සම්බන්ධව තිබෙනවා; පනත් කෙටුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදී මම නැගිටලා මුදල් ඇමතිවරයාට කිව්වා, දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමායි මමයි මේකට විරුද්ධව අධිකරණයට යනවා කියලා. අපි අධිකරණයට ගියා. ඊයේ ශ්‍රේෂ්ඨාධිකරණය මේ පිළිබඳව අපේ උගත් නීතිඥවරු ඉදිරිපත් කළ කරුණු විමසුවා. එතකොට හෙළිදරව් වුණා, පළමුවන වතාවට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය නැතුව පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට පිළිගන්වලා තිබෙන බව. ඒ වෙලාවේ මම Supreme Court එකේ හිටියා. ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියත් හිටියා. නීතිපති දෙපාර්තමේන්තුවෙනුත් ඇවිල්ලා හිටියා. සංශෝධන පනත් කෙටුම්පතක් වුණත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පෙර ඒ ගැන කැබිනට් මණ්ඩලයේදී සාකච්ඡා කරන්න ඕනෑ. කබීර් හාෂිම් ඇමතිතුමාත් එතුමාගේ අදහස කියන්න ඕනෑ. තමන්ගේ අදහස කියන්න එතුමාටත් අයිතියක් තිබෙනවා. එහෙම නැතිව පනත කෙටුම්පත් කරලා හොර පාරෙන් පාර්ලිමේන්තුවට එවලා සම්මත කරන්න බැහැ. ඒ නිසා අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරතුමා ඇතුළු උගත් විනිශ්චය මණ්ඩලය මේ පිළිබඳ තීන්දුව දෙයි. ඒ තීන්දුව දුන්නාට පස්සේ අපි විශ්වාස කරනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුව -පාර්ලිමේන්තුව හා ප්‍රජාතන්ත්‍රවාදය බුල්ඩෝස්කරණය නොකර- පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතු නියමිත ආකාරයට පනත් කෙටුම්පත් ඉදිරිපත් කරයි කියලා. ඒ වාගේම අවුලක් ඇති කළා, මිල පාලනය කරලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මිල පාලනයක් කරන්න බැහැ. මොකද, මිල පාලන පනත අහෝසි කළේ 1977දී විවෘත ආර්ථිකය එනකොට. ඒ අනුව මිල පාලන දෙපාර්තමේන්තුව අහෝසි කළා. ඊට පස්සේ සාධාරණ වෙළෙඳ කොමිෂන් සභා පනත ගෙනාවා; පාරිභෝගික ආරක්ෂණ පනත ගෙනාවා.

මහින්ද රාජපක්ෂ රජයේ වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා ඇමතිවරයා ලෙස මම දීර්ඝ කාලයක් වැඩ කරලා තිබෙනවා. ඒ කාලයේ දැවැන්ත අර්බුදයක් තිබුණා. අද වාගේ බොර තෙල් බැරල් එකක් ඇමෙරිකානු ඩොලර් 40ට තිබුණේ නැහැ. එතකොට බොර තෙල් බැරල් එකක් ඇමෙරිකානු ඩොලර් 127යි. එදා ලෝක ආහාර අර්බුදයක් තිබුණා. අවුරුදු 40කට පස්සේ ලෝකවාසීන්ට කන්න නැති වුණා. ඒ වාගේම ලෝක මූල්‍ය අර්බුදයක් තිබුණා; ලෝකයේ මුදල් ක්‍රම කඩා ගෙන වැටුණා. අපේ රටේ යුද්ධය තිබුණා.

ඒ කාලයේ රොකට් වේගයෙන් භාණ්ඩ මිල වැඩි වෙනකොට අපි මේ පාරිභෝගික ආරක්ෂණ පනත පාවිච්චි කළා. ඒ වෙනකොට සතොස සම්පූර්ණයෙන් විනාශ කරලා තිබුණේ. මම වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශය භාර ගන්න කොට සතොස වෙළෙඳ සැල් විස්සයි තිබුණේ. මම "ලක් සතොස" කියා සතොස වෙළෙඳ සැල් 200ක් හැදුවා. සමුපකාරවල ණය සම්පූර්ණයෙන් කපා හැරලා, දහස් ගණනක් co-op city විවෘත කළා. Mini co-op city විවෘත කළා. වේයන්ගොඩ, නුවර එළිය, තඹුත්තේගම, වැලිසර, මීගොඩ, රත්මලාන හා පිළියන්දල ආදී ප්‍රදේශවල ආර්ථික මධ්‍යස්ථාන 13ක් විවෘත කළා. එදායින් පසුව තව වෙනකම් එකම ආර්ථික මධ්‍යස්ථානයක්වත් විවෘත කරලා නැහැ. ඒ කාලයේ එහෙම අමාරුවෙන් මහන්සි වෙලා ඒවා කළේ, පාරිභෝගික ආරක්ෂණ පනතේ 14 වන වගන්තියට අනුවයි. මම අද ඉතා පැහැදිලිව කියනවා, මේ 14 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කර තිබෙනවාය කියලා. අපි ඒ සම්බන්ධයෙන් අධිකරණයට යනවා. අපි අධිකරණයට යන්නේ - [බාධා කිරීමක්] ගරු කබීර් හාෂිම් ඇමතිතුමනි, තමුන්නාන්සේ තමුන්නාන්සේගේ වැඩක් බලා ගෙන අහගෙන ඉන්න. [බාධා කිරීම්] ඔබතුමා වැදගත් විධියට අහ ගෙන ඉන්න කෝ, නිකම් කුඛුකාරයෙක් වාගේ කෑ ගහන්නේ නැතිව.

අද රුපියල් 95ට සීනි මිල නියම කරලා තිබෙනවා. [බාධා කිරීම්] සීනිවලට රුපියල් 30ක් වශයෙන් තිබුණු බද්ද ශත 25ට අඩු කරලා තිබෙනවා. එහෙම කරන්නේ මොකටද? සීනිවලට රුපියල් 30ක බද්දක් ගෙවා ගෙන්වන කොට, රජයේ ආදායමට අවුරුද්දකට සීනිවලින් බිලියන 19.6ක් එකතු වෙනවා. සීනි මෙට්‍රික් ටොන් 50,000-55,000ක් පමණ ප්‍රමාණයක් ගෙන්වනවා. රුපියල් 30ට තිබෙන බද්ද ශත 25ට අඩු කළාම මෙපමණ කාලයක් සීනි ගෙන්වූ ව්‍යාපාරිකයන්ට තමන් ගෙන්වපු සීනිවලින් ප්‍රකෝටි ගණනක් පාඩු වෙනවා. ඒ අය වෙළෙඳ පොළෙන් යනවා. ශත 25ක බද්දට ගෙනෙන ටික stock කරනවා. තව ටික දවසකින් ආපසු එය වැඩි කළාම - [බාධා කිරීම්] දේශීය සීනි නිෂ්පාදකයන් ඔක්කෝම ටික ඉවරයි. ලංකාවේ ඇත පළාත්වල - [බාධා කිරීම්]

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

නීතියට අනුව කරන්න ඕනෑ. නීති විරෝධී ලෙස කරන්න එපා. [බාධා කිරීම්] නීතිය කඩන්න එපා. ඒකාධිපතියෝ ලෙස හැසිරෙන්න එපා. ෆැසිස්ට් විධියට වැඩ කරන්න එපා. [බාධා කිරීම්] පනතක් සම්මත කරලා තිබෙනවා නම් පනතට අනුව කටයුතු කරන්න. පනතට අනුව කටයුතු කරලා නැහැ. උපරිම මිල පිළිබඳව වෙළෙඳ සංගම් එක්ක ගිවිසුමක් අත්සන් කරන්න ඕනෑ. කළ යුත්තේ එයයි. පාරිභෝගික ආරක්ෂණ පනතේ 14 වන වගන්තිය බලන්න. [බාධා කිරීමක්] Lawmakersලා කියන්නේ. මේක පාර්ලිමේන්තුව. නීතියට අනුව වැඩ කරන්න ඕනෑ. නීතියට අනුව වැඩ කරන්නේ නැතුව වළං කඩේට පැනපු ගොනෙකු වාගේ ඔක්කෝටම ඇන ගෙන, ඇන ගෙන ගියාම මේ රටේ නීතිය කඩා ගෙන වැටෙනවා. ඒකයි අපි තමුන්නාන්සේලාට කියන්නේ. ලංකා ඉතිහාසයේ කවදාවත් නැති ආකාරයේ ණයක් අරගෙන - [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2013 නොවැම්බර් 22 වැනි දින ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් පාර්ලිමේන්තුවේදී සිදු කළ කථාවක කොටසක් අවසාන වශයෙන් මා සඳහන් කරන්නට කැමැතියි. එදින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 277 යටතේ මෙසේ සඳහන් වෙනවා:

"එහෙත් අද තත්ත්වය කුමක්ද? මහ බැංකු වාර්තාවට අනුව රුපියල් බිලියන 80ක භාණ්ඩාගාර බිල්පත් සහ රුපියල් බිලියන 317ක භාණ්ඩාගාර බැඳුම්කරත් විදේශීය පෞද්ගලික ආයෝජකයින් අයිති කරගෙන තිබෙනවා. ණයවලින් සියයට 12ක් මේ විදේශීය පෞද්ගලික ආයෝජකයින් පාලනය කරනවා. මෙය එක් අතකින් විදේශීය ෂයිලොක්ලාට රට උකස් කිරීමක්. අනෙක් අතින් අපේ රටේ ස්වෛරී භාවය විදේශීය ෂයිලොක්ලාට පාවා දීමක්. අන්න ඒකයි මම කියන්නේ. මෙය සිදු කරන්නේ රටේ පරමාධිපත්‍ය ගැන පම්පෝරි ගහන උදවියමයි. මේකද ඔබේ ජාතිකත්වය, දේශානුරාගය? ඇයි අපි විදේශීය පෞද්ගලික ආයෝජකයන්ට අපේ ජාතික ණයෙන් කොටසක් දෙන්නේ?

රට පාවා දී තිබෙන්නේ කවුද කියා මෙයින් පැහැදිලියි. එදා දොන් ජුවන් ධර්මපාල රජු රටේ කොටසින් කොටස පෘතුගාලයට පාවා දුන්නා වාගේ අපේ ජාතික ණයෙන් කොටසින් කොටස විදේශීය පෞද්ගලික ආයෝජකයින්ට පාවා දී තිබෙනවා."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
2013 නොවැම්බර් 22 වැනි දින හැන්සාඩ් වාර්තාව, රනිල් වික්‍රමසිංහ මහතා තමයි මෙහෙම කියලා තිබෙන්නේ. විදේශයකින් ණය ගන්න ප්‍රමාණය අද සියයට 1,010කින් වැඩි කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
රට විනාශ කරලා, අපේ රට පාවා දීලා තිබෙන්නේ කවුද කියන කාරණය දැන් මොනවාට පැහැදිලි වනවාය කියන කාරණයත් සඳහන් කරමින් මගේ වචන කීපය මම අවසන් කරනවා.

[අ.භා. 12.10]

ගරු කබීර් හාෂිම් මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Public Enterprise Development)
කාලයකට පසුව මගේ මිත්‍ර බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව කථා කරන්නට ලැබීම ගැන මම සතුටු වනවා. එතුමා මම ආදරය කරන, ගරු කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වාගේම හිටපු ඇමතිවරයෙක්.

දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අද කථා කරන කොට හොඳ, වැදගත් දෙයක් කිව්වා. "සෑම ගෙදරක්ම බරපතළ අර්බුදයකට හිර වී සිටී" කියලා එතුමා කිව්වා. වසර 10ක් ආණ්ඩු පක්ෂයේ ඇමතිකම් කරපු; ඒ ආණ්ඩුවේ ඇමතිවරයෙක් හැටියට හිටපු කාලය එතුමාට මතක ඇති. එතුමාගේ ආණ්ඩුව කළමනාකරණය කරපු, මහින්ද රාජපක්ෂ මුදල් ඇමතිතුමාගේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් පී.බී. ජයසුන්දර මහතා, 2014 අප්‍රේල් මාසයේ 23වැනිදා - වැඩි ඇතක නොවෙයි, අපි ආණ්ඩුව පෙරළන්නට මාස ගණනකට කලින් - පුවත් පතකට කියලා තිබුණා. "අප රටේ ආර්ථිකය ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය කරන විට පෙනෙන්නේ නාගරික ආර්ථිකය credit card මත පදනම් වෙද්දි ග්‍රාමීය ආර්ථිකය උගස් ණය ක්‍රම මත පදනම් වන බවය" කියලා. තවත් ගොඩක් දේවල් එතුමා කියලා තිබෙනවා. නමුත් ඒවා ඔක්කොම කියන්න වෙලාවක් නැහැ. එතුමා තවදුරටත් කියලා තිබෙනවා, "මේ ආකාරයට ගම්බද ජනතාව සිය රත්තරන් භාණ්ඩ උගස් කර ලබා ගන්නා ණය මුදල් රෝල් කර තමන්ගේ වියදම් පියවා ගනිති. ගමේ ආර්ථිකයට වැඩිපුර මුදල් සැපයෙන්නේ උගස් ණය ආශ්‍රයෙන් මැවෙන මුදලිනි. මෙය පිළිගත යුතු සත්‍යයකි" කියලා.

එතුමා එහෙම කිව්වේ, 2014 අවුරුද්දේදී. දැන් අපි ඉන්නේ 2016 වර්ෂයේ. මේ ආණ්ඩුව පිහිටුවා මේ වනකොට ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ මාස 10යි. මහින්ද රාජපක්ෂ මහතා වසර 10ක් ආණ්ඩු කළා. 2014 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම් කියා තිබෙනවා, "ගමේ හැම මිනිහෙක්ම ණයයි. ගමම නඩත්තු වෙන්නේ ණය මුදල්වලින්, උගස් ණයවලින්. ඒ වාගේම නගරබද නඩත්තු වෙන්නේ credit cardsවලින්" කියලා. තමුන්නාන්සේලා අවුරුදු 10ක් මොකක්ද කළේ? අවුරුදු 10ක ප්‍රතිඵලය මේකයි. අවුරුදු 10ක් තිස්සේ මිනිස්සු ගැන කථා කරන්න බැරි වුණු; මිනිසුන් නියෝජනය කරන්න බැරි වුණු; මිනිස්සුන්ගේ දුක තේරුණේ නැති මිනිස්සු අපි බලයට පත් වෙලා අවුරුද්දක්වත් යන්න ඉස්සර -මාස 10කට පස්සේ- දැන් ඇවිල්ලා අහනවා, මේවා වෙනස් කළේ නැත්තේ ඇයි කියලා. ඒ පිළිබඳව මට පුදුමයි.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
අපි කියන්නේ නැහැ. ඔබතුමාම කියන්න.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මම කියන්නම්, ඒ මොකද කියලා.

ඊළඟට, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කළා, FCID එක ගැන. එතුමා අහනවා, දේශපාලන පළිගැනීම් කරන්නද FCID තිබෙන්නේ කියලා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාව අසාධාරණ විධියට; වැරදි විධියට ඇතුළට ගත්තා කියලා එතුමා කියනවා. මේ රටේ නීතියක් තිබුණේ නැත්නම්, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට එළියට එන්න බැහැ. ඔබතුමන්ලාට VAT එකට විරුද්ධව අද

අධිකරණයට යන්නත් බැහැ. අපි ඒ ක්‍රමය වෙනස් කළා. අපි අද ඔබතුමන්ලාට නීතිය, ස්වාධීනත්වය ඇති කර දීලා තිබෙනවා. මේ විපක්ෂ මන්ත්‍රීවරුන්ට මෙතැන කථා කරන්න ඒකම ප්‍රමාණවත්. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඇතුළට ගියා, ඒ වරදක් කළ නිසා. නීතියෙන් එතුමාට ඇප දුන්නා. ඇප දුන්නා කියලා එතුමා චෝදනාවෙන් නිදහස් නැහැ. නමුත්, නීතිය ක්‍රියාත්මක කරනවා. ඒක තමයි වෙනස. අපි ඒකට මැදිහත් වුණේ නැහැ. ඔබතුමන්ලා ඒක අගය කළ යුතුයි. ඒ වාගේම ජිනීවා යෝජනා අනුව නිරීක්ෂකයන් වශයෙන් විදේශ රටවලින් නඩුකාරතුමන්ලා පත් කිරීම සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාංශයෙන් කරපු ප්‍රකාශයක් දිනේෂ් ගුණවර්ධන මහතා මෙතැන ඉදිරිපත් කළා. මම එතුමාට කියනවා, ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිවරයා එතුමාගේ අවස්ථාවේදී ඒකට උත්තර දෙයි කියලා.

පසු ගිය මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ සිංහලෙන් මෙහේ එක ප්‍රකාශයක් කරලා, ඇමෙරිකාවට ගිහිල්ලා ඉංග්‍රීසියෙන් තවත් විධියක ප්‍රකාශයක් කරනවා අපි දැක්කා. අපි එහෙම කරන්නේ නැහැ. අපි සිංහලෙන් කරන ප්‍රකාශයම තමයි ඉංග්‍රීසියෙනුත් කරන්නේ. අපි දෙවිධියකට වැඩ කරන්නේ නැහැ. මේ ආණ්ඩුව එනකොට මහින්ද රාජපක්ෂ මහත්මයා වෙච්ල වෙච්ලා සිටියේ. හැම දාම එතුමා කිව්වේ, "මට විදුලි පුටුවට යන්න සිද්ධ වෙයි" කියලායි. "අනේ භයයි, මාව විදුලි පුටුවට ගෙන යයි. මෙන්න මාව ගෙනයන්න හදනවා"යි කියලා තමයි එතුමා හැමදාම කිව්වේ. නමුත් එතුමාගේ ආණ්ඩුව පෙරළුණු දවසේ සිට අද දක්වා එක දවසක්වත් විදුලි පුටුව ගැන කථා කරලා නැහැ. ඒ ඇයි? එතුමා අද සුරක්ෂිතයි. අද අපි ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ දණ ගහන්නට යන්නේ නැහැ. අපේ රටේ අභ්‍යන්තර ක්‍රමවේදයක් හදලා තමයි අපේ ප්‍රශ්න විසඳන්න අපි තීරණය කරලා තිබෙන්නේ. එදා "අපේ ලොක්කා විදුලි පුටුවට යයි" කියලා මැතිවරණ රැස්වීම්වල හැම වේදිකාවක් ගණනේම කථා කරපු අයට අද ඒ දේවල් ගැන කථා කරන්න ඕනෑ නැහැ නේ. අද ඒ ප්‍රශ්නය විසඳිලා නැද්ද? ඒ අපි කෙළින් හිටගෙන කටයුතු කරපු නිසායි. ඔබතුමන්ලාගේ නායකයාත් බෙරාගෙන අපි ඒ කටයුතු කරලා තිබෙනවාය කියන එකත් මතක තියා ගන්න.

මම ආර්ථිකය ගැනත් කථා කරන්න කැමැතියි. 1994 වර්ෂයේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව බලයට ආවා. අවුරුදු විස්සක් බලයේ හිටියා. 2005 වර්ෂයේ සිට මහින්ද රාජපක්ෂ මහතා මේ රටේ ජනාධිපති වුණා. මහින්ද රාජපක්ෂ මහත්තයා හිටපු නැති තනතුරක් නැහැ. එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, විපක්ෂ නායකවරයෙක්, ඇමතිවරයෙක්, අගමැතිවරයෙක්, ජනාධිපතිවරයෙක්. එතුමාට මේ රට වෙනස් කරන්න හැම අවස්ථාවක්ම තිබුණා. එතුමාට මේ රටේ දුප්පත්කම නැති කරන්න උපරිම අවස්ථා තිබුණා. එතුමා සෑම තනතුරකම සිටියා. එතුමා fail. මේ රටේ පොදු ජනයාගේ ප්‍රශ්න විසඳන්න, දුප්පත්කම නැති කරන්න, සාධාරණ සමාජයක් ඇති කරන්න එතුමාට ඕනෑ තරම් අවස්ථා තිබුණා. 2005 සිට 2015 දක්වා වසර 10ක කාලය තුළ එතුමා කරපු විපර්යාසය මොකක්ද කියලා මම අහන්න කැමැතියි. 2005 සිට 2015 දක්වා කාලය තුළ -බන්දුල ගුණවර්ධන මැතිතුමා මේ පැත්තේ වාඩි වනකොට- බන්දුල ගුණවර්ධන මැතිතුමාත් ඇතුළත්ව ඇඟිල්ල දිගු කරලා චෝදනා කළේ මොනවාටද? 2005 වර්ෂයේ බලය ගත් දා සිට එතුමන්ලා කිව්වේ, "අපට මේ රටේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ ජේ.ආර්. ගේ විවෘත ආර්ථිකය නිසා" කියලායි.

1977 වර්ෂයේ ආරම්භ කරපු විවෘත ආර්ථිකය නිසා තමයි තවමත් මේ සමාජයේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ කියලා කිව්වා. ඔය හැම ප්‍රශ්නයක්ම අපි හදපු ප්‍රශ්න කියලා කිව්වා. මහ පාරේ කණුවක ඇති විදුලි බල්බ් එක දැල්වෙන්නේ නැත්නම්, පාරේ වළක් තිබෙනවා නම්, ගැහැනු ළමයෙක් කොටට රෙද්දක් ඇදගෙන ගියා නම්, මේ 1977 වර්ෂයේ ජේ.ආර්. ජයවර්ධන ගෙනාපු විවෘත ආර්ථික ක්‍රමය නිසා ඇති වුණු දේවල් කියලා කිව්වා. 1994 සිට දිගටම අවුරුදු 25ක්, 30ක් තිස්සේ මේක තමයි මහ ජනතාවට පෙන්නුවේ. ආණ්ඩුවට මිනිස්සුන්ගේ ප්‍රශ්න විසඳන්න බැරි වුණේ ඒ නිසාය කියලා කිව්වා. 2014 වන තෙක් ඒක කියාගෙන ආවා. විවාදයකට නාලිකාවකට ගියාමත් ඔය දේමයි කිව්වේ. "ජේ.ආර්.ගේ පව තමයි තවම තිබෙන්නේ" කියලා 2015 වන තෙක් කියා ගත්ත මිනිස්සු, තමන්ට වසර 10කින් වෙනසක් ඇති කරන්න බැරි වුණේ, ජේ.ආර්. 1977 ආරම්භ කරපු ප්‍රතිපත්ති නිසායි කිව්ව අය, දැන් අපි බලයට ඇවිල්ලා මාස 10කින් අහනවා, "ඇයි, මේ ප්‍රශ්නය වෙනස් කරන්නේ නැත්තේ" කියලා. අවුරුදු 20ම තමන්ට ඒ ප්‍රශ්න විසඳන්න බැරි වුණු අය, ඒකත් 1977 ගොනුවට දමා බෙරුණු අය මේ මාස 10ක් ගිය තැනදී අපෙන් අහනවා, "තමුන්නාන්සේලා මේක වෙනස් කරන්නේ නැත්තේ ඇයි" කියලා. මාස 10කින් රටක් වෙනස් කරන්න බැහැ, ආර්ථිකයක් වෙනස් කරන්න බැහැ. ඒක කරන්න අමාරුයි. නමුත්, අපි ඒ ගමන ආරම්භ කරලා තිබෙනවා. අපි මේ ආණ්ඩුව භාර ගන්න කොට මේ රටේ මිනිස්සු අපෙන් ඉර, හඳ, තාරකා ඉල්ලුවේ නැහැ. මේ රටේ මිනිස්සු ඉල්ලුවේ ප්‍රජාතන්ත්‍රවාදය; මේ රටේ මිනිස්සු ඉල්ලුවේ නීතියේ ආධිපත්‍යය; මේ රටේ මිනිස්සු ඉල්ලුවේ සාධාරණ සමාජයක්. එක පන්තියකට විතරක් සියලුම ආදායම් හිමි වන එක නතර කරන්න මේ රටේ ආදායම් බෙදී යාමේ වැඩ පිළිවෙළක් සකස් කරලා දෙන්න කියලා තමයි මිනිස්සු ඉල්ලුවේ. අද අපි ඒක ආරම්භ කර තිබෙනවා.

ප්‍රථමයෙන්ම අපි මේ රටට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ඉදිරිපත් කළා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත වෙනුවෙන් තමන්ට කට ඇරලා කථා කරන්න බැරි වුණු අවස්ථාවක් තිබුණා. විපක්ෂයත් ඒකට සහයෝගය දුන්නා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්න අපි කටයුතු කළා. අපි ජනාධිපතිවරයාගේ බලය අඩු කරලා පාර්ලිමේන්තු බලය ගැන මෙතුමාම -ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා- දැන් පුන පුනා කථා කළා. ඔබතුමා දන්නවා මහින්ද රාජපක්ෂ මහත්මයා මුදල් ඇමතිවරයා හැටියට ඒ දවස්වල මුදල් පනත් අනුමත කර ගත්තේ කොහොමද කියලා. අද වන කොට පාර්ලිමේන්තුවට නැවත ඒ බලය ලබා දීලා, මුදල් අමාත්‍යාංශයේයි, පාර්ලිමේන්තුවේ බලයයි ස්ථාපිත කර, ජනාධිපතිවරයාගේ බලයත් අඩු කිරීම සඳහා සංශෝධන ඉදිරිපත් කර, එදා අපේ මිනිස්සු ඡන්දය වෙලාවේ ඉල්ලපු දේ, පොදුජන මතය ඉල්ලපු දේ දෙන්න අපි ඉදිරිපත් වෙලා තිබෙනවා.

එපමණක් නොවෙයි. අපි අවශ්‍ය කොමිෂන් සභා ටික පත් කර මහජන සේවය සඳහා ඒ හැම දෙයක්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළා. ඒක අපට පාඩුවක් වෙන්න පුළුවන්. නමුත්, මේ සියලු දෙයක්ම කරන්න කටයුතු කළා. [බාධා කිරීම්]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
පැය 24න් ජනාධිපති- [බාධා කිරීම්] ඒවා මතකවත් නැහැ.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
අපි එහෙම කිව්වේ නැහැ. අපි කිව්වේ පැය 24ක් ඇතුළත අපි සංශෝධන ගේනවා කියලයි. අපි අගමැතිවරයෙක් පත් කළා. ඒ වාගේම මේ තිබෙන අභියෝගත් එක්ක අපි ආර්ථික ප්‍රතිලාභ වෙනස් කරන්න ගියේ නැහැ. ඔබතුමන්ලා දන්නවා, මේ රට ණය වෙලා තිබෙන හැටි. ඒ ප්‍රශ්නත් එක්ක අපි ආර්ථික ප්‍රතිලාභ වෙනස් කරන්න ගියේ නැහැ. අඩු කරන්න ගියේ නැහැ. අපි සමෘද්ධි දීමනාව සියයට දෙසියයකින් වැඩි කළා. රාජ්‍ය

[ගරු කබීර් හාෂිම් මහතා]

සේවකයන්ගේ වැටුප් රුපියල් 10,000කින් වැඩි කළා. කරන්න බැහැයි කියාපු දේවල් අපි කළා. පෞද්ගලික අංශයේ වැටුප් අවම වශයෙන් රුපියල් 2,500කින් වැඩි කිරීමේ පනත සම්මත කරලා ඒක ක්‍රියාත්මක කිරීමේ කටයුත්ත ආරම්භ කළා.

අපි ඩීසල්, පෙට්‍රල් මිල අඩු කළා, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කළා. ඒ වාගේම 2011 උපාධිය ලබා ගත්ත 2,600කට පත්වීම් ලිපි ලබා දීලා රජයේ පුහුණුවට ඇතුළත් කළා. වතු කම්කරුවන් එක්ලක්ෂ හැටදහසකට අඩු වියදම් නිවාස හදන වැඩ පිළිවෙළ ආරම්භ කළා. ඒ වාගේම ඉඩමක් නැති සෑම කෙනකුටම ඉඩම් හිමිකම් ලබා ගැනීම සඳහා ඉඩම් පනතක් ගෙනැල්ලා ලක්ෂ 25ක ජනතාවට ඉඩම් ලබා දීමේ වැඩ පිළිවෙළ අපි ආරම්භ කරනවා. නිවාස නැති අයට නිවාස ලබා දීම සඳහා එක මැතිවරණ කොට්ඨාසයක නිවාස 1,000ක් ඉදි කිරීමේ වැඩ පිළිවෙළ අපි ආරම්භ කරනවා.

නිවාස සෑදීම සඳහා සිමෙන්ති ආධාර ලබා දීම සෑම මැතිවරණ කොට්ඨාසයකම ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම සෑම මැතිවරණ කොට්ඨාසයකටම ග්‍රාමීය පාරවල් සෑදීම සඳහා රුපියල් ලක්ෂ 600ක් වෙන් කරලා ඒ කටයුතු ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ වාගේම සෑම මැතිවරණ කොට්ඨාසයකම වසමකට රුපියල් ලක්ෂ 10ක් ලබා දීම සඳහා අපි කටයුතු කරගෙන යනවා. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීතුමනි, අහ ගන්න. මෙච්චර කාලයක්- [බාධා කිරීම්] අහ ගන්න. මෙච්චර කාලයක් ආපදාවක් වුණාම උපරිම දුන්නේ රුපියල් 10,000යි, 15,000යි. මෙවර ඉඩමක් නැති අයට ඉඩමක් ගන්න රුපියල් ලක්ෂ 4ක මුදලක් දෙන්නත්, නිවසකට ලක්ෂ 12ක් ලබා දීමත් අපි අනුමත කළා. තමන්ගේ ව්‍යාපාරවලට හානියක් වුණා නම් අවමය රුපියල් 25,000 සිට උපරිම රුපියල් ලක්ෂ 25 දක්වා වන්දි දීම අනුමත කර තිබෙනවා. ඔබතුමන්ලා දන්නවාද, ඔබතුමන්ලාගේ කාලයේ සුනාමි ආධාරවලට ආපු සල්ලි නායකයෝ සාක්කුවලට දා ගත්තා, හොරකම් කර ගත්තා, නඩු වෙනස් කර ගත්තා කියලා. තමුන්නාන්සේලාට අද මේවා ගැන රෙදි ඇඳගෙන කථා කරන්න අයිතියක් නැහැ. ඒ මිනිස්සුන්ට ආපු සල්ලි තමුන්නාන්සේලා හොරකම් කළා. ඕක තමයි යථාර්ථය. ඒක තමයි ඇත්ත. ඒ නිසා අපි මේ හැම දෙයක්ම ක්‍රියාත්මක කරන්න අද සූදානම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පසු ගිය කාලයේ පව් කියව කියවාම ඉන්නේ නැහැ. මාස 10කින් අපි මේ වෙනස්කම් දෙන්න ආරම්භ කළා; ප්‍රතිලාභ දෙන්න ආරම්භ කළා. සමහර විට මේක අහගෙන ඉන්න අමාරු ඇති. බලයේ හිටපු අය බලය දාලා යන්න කැමැති නැහැ. බලය මත යැපුණු අයට අද බලය නැතිව ඉන්න බැහැ. එදා පොදු ජනතාවගේ බදු සොරකම් කරලා දූෂණ, වංචා කරපු අයට අද මේවා අහගෙන ඉන්න බැරිව ඇති.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියන්න කැමැතියි, 1994 වර්ෂයේදී එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව බාර දෙනකොට මේ රටේ අපනයනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 30කට වර්ධනය කර තිබුණ බව. එහෙම තමයි එදා අපි රට බාර දුන්නේ. 2014 වන විට මේ රටේ අපනයනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 15 දක්වා අඩු වෙලා තිබෙනවා; සියයට සියයකින් අඩු වෙලා තිබෙනවා. මේ රටේ දේශීය නිෂ්පාදන පද්ධතිය කඩා වැටුණා. ඒ වාගේම value chain එක එහෙම නැත්නම් එකතු කළ වටිනාකම් මත ග්‍රාමීය නිෂ්පාදන අංශය - backward linkage එක - කඩාගෙන වැටුණා. ඒ වාගේම අනෙක් පැත්තෙන් රටට ලැබෙන්න තිබුණු බදු ආදායම නැතිව ගියා. දැන් එක එක දේවල් කථා කරන පසු ගිය ආණ්ඩුවේ හිටපු ඇමතිවරු බදු ගෙවන්නේ නැතිව එතනෝල් මෙට්‍රික් ටොන් දහස් ගණනක් මේ රට ඇතුළට ගෙනාවා.

මේ රටට හිමි වෙන්න තිබුණු බදු, මේ රටේ පොදු ජනයාට වියදම් කරන්න තිබුණු මුදල් අහිමි වුණේ ඔය හොරු ටික නිසායි. 1994දී අපි ලබාගත්ත බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 20යි. 2014දී, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩු කාලයෙන් පස්සේ ඒ බදු ආදායම සියයට 10 දක්වා අඩු වුණා. ඇයි, බදු ආදායම් ලබා ගැනීමේදී සුපිරි වෙළෙන්දන්ට, ජාවාරම්කරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට බදු තියා නීතියක්වත් ක්‍රියාත්මක කළේ නැති නිසා.

එක පන්තියකට විතරක්, තමන් පෝෂණය කරන්න, - [බාධා කිරීමක්] - ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා ටිකක් සද්ද නැතිව ඉන්න. තේරෙන්නේ නැත්නම් පොඩ්ඩක් අහගෙන ඉන්න. ආර්ථික විද්‍යාව දන්නේ නැත්නම් අහගෙන ඉන්න. පොඩ්ඩක් තේරුම් ගන්න. 2010 සිට 2015 දක්වා ආර්ථික වර්ධන වේගය කොහෙන්ද ආවේ? මහ ලොකුවට 2010 සිට 2015 දක්වා ආර්ථික වර්ධන වේගය ගැන කථා කරනවා. සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් තිබුණා. ඒක පුද්ගල ආදායම කොච්චරද කියලා අහන්න. ඒක පුද්ගල ආදායම ඩොලර් 3,800යි; ඒක බොහොම හොඳයි කියලා කියනවා. නමුත් මේ රටේ ජීවත් වෙන අයගෙන් සියයට 42ක් දවසකට ඩොලරයක්වත් උපයන්න හැකියාවක් නැතිව 2014 දක්වා ජීවත් වුණා කියන එක ඔප්පු වෙලා හමාරයි. ඒක පුද්ගල ආදායම ඩොලර් 3,800ක් බව ඇත්ත. ඒ ඩොලර් 3,800 හදන්නේ කොහොමද? මේ රටේ සුපිරි පන්තියේ ජීවත් වෙන කොන්ත්‍රාත්කරුවන්, ජාවාරම්කරුවන් සහ ව්‍යාපාරිකයන් සියයට එකක් විතර මේ රටේ ජීවත් වුණා. ඔවුන් එක පවුලකට, එක පන්තියකට අයිති පිරිසක්. ඒ අය උපයන ආදායමෙන් තමයි මේ රටේ ඒක පුද්ගල ආදායම පදනම් වුණේ. කණගාටුයි කියන්න. සාධාරණ සමාජයක් ඇති කිරීම සඳහා තමයි අපි ඒ වෙනස් කිරීම දැන් කරන්න බලාපොරොත්තු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඔප්පු කරලා පෙන්වන්නම්, ඒ දවස්වල අපේ ආර්ථික වර්ධන වේගයක් තිබුණේ ඉදිකිරීම් ක්ෂේත්‍රයෙන් බව. ඉදිකිරීම් හරහා රාජ්‍ය ආයෝජනයෙන් තමයි රටේ යම්කිසි ආර්ථික වැඩක් සිද්ධ වුණේ. ඒ ආයෝජනය කොහෙන්ද ආවේ? කෝටි ගණනක් ගිනි පොලියට ණය ගත්තා. ඒ ණය අරගෙන ලොකු සුදු අලි ව්‍යාපෘති රට හැමතැනම හැදුවා. මත්තල ගුවන් තොටුපොළ හදන්න ඩොලර් මිලියන 250ක් ගියා. නමුත් එහි මාසයක ආදායම රුපියල් 16,000යි. තව අවුරුදු 200ක් යයි ණය ටික ගෙවන්න. හම්බන්තොට වරාය හදන්න ඇත්තටම යන වියදම ඩොලර් මිලියන 500යි. එතුමන්ලා ණය අරගෙන හම්බන්තොට වරාය හදන්න කොච්චරද මුදලක් ගියාද? ඩොලර් මිලියන 1,200යි. ඒ කියන්නේ ඩොලර් බිලියන 1.2යි. නමුත්, අද වනතුරු ණය ගෙවන්න ආදායමක් නැහැ. ඒක මහා වංචාවක්. නොරොච්චෝලේ විදුලි බලාගාරය හැදුවා. ඩොලර් මිලියන 250කට හදන්න පුළුවන් නොරොච්චෝලේ විදුලි බලාගාරය හදන්න ඩොලර් මිලියන 500ක් ගියා. ඒකේ කොමිස් එක ඩොලර් මිලියන 250යි.

ගුවන් යානා - airbuses - 8ක් order කළා. එක ගුවන් යානාවකින් ගහපු කොමිස් මුදල මම පෙන්වන්නම්. ඩොලර් මිලියන 1.4යි. ඒකේ මුළු පාඩුව රුපියල් කෝටි 3,250යි. මෙන්න මේ වාගේ රටට පාඩු කරපු ඒවාත් ආණ්ඩුවක් ඉතිහාසයේ ලියැවිලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය කාලයේ අපේ දේශීය නිෂ්පාදන අංශය ශක්තිමත් වුණේ නැහැ. ඉදි කිරීම් ක්ෂේත්‍රයෙන් සහ සේවා අංශයෙන් තමයි මේ රට ගෙන ගියේ. මූල්‍ය අංශයේ මූල්‍ය සේවාවන්; ප්‍රවාහන සේවාවන්; ඉඩම් සේවාවන්; වෙළෙඳ සේවාවන් ආදී වශයෙන් සේවා අංශයෙන් තමයි අපේ මුළු ආර්ථික වර්ධනයෙන් සියයට 63ක දායකත්වයක් ලබා ගත්තේ. නිෂ්පාදනය කඩා වැටුණා. අපි සිංගප්පූරුව නොව

අපි ලංකාව. ලංකාව සිංගප්පූරුව වෙන්න ඕනෑ නැහැ. ඒ නිසා අපේ කුඩා සහ මධ්‍යම පරිමාණයේ කර්මාන්ත, අපේ දේශීය කර්මාන්ත ගැන කථා කළ මහින්ද රාජපක්ෂලා, මහ ලොකුවට දේශප්‍රේමය ගැන, මාතෘ භූමිය ගැන කථා කළ අය මේ රටේ කුඩා කර්මාන්තවලට කළේ මොකක්ද? චීනය, ඉන්දියාව කළේ මොකක්ද? අපි එටිකා ගිවිසුම අත්සන් කරනවාලු. අපි මේ වෙළෙඳ ගිවිසුම අත්සන් කරනවා. මේවායින් පාඩුයිලු. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමන්ලා දන්නේ නැහැ, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ - 2014 වෙනකොට- චීන කම්කරුවෝ 8,000ක් මේ රටේ සේවය කරමින් සිටි බව. ඉන්දියාවේ කම්කරුවෝ 7,000ක් ලංකාවේ සේවය කරමින් සිටියා. මොන ගිවිසුමක්ද තිබුණේ? මොන ගිවිසුමක්වත් තිබුණේ නැහැ. ලංකාවේ කම්කරුවන්ට රක්ෂා දෙන්නේ නැතිව, පිටරටින් මිනිස්සු ගෙන්වුවා. ගිවිසුම් නැතිව චීනයෙන් සහ ඉන්දියාවෙන් 15,000කට වැඩි පිරිසක් ඇවිල්ලා මේ රටේ වැඩ කළා. කථා කරන්න ලජ්ජා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය කාලයේ අපේ ලංකාවේ කුඩා කර්මාන්තකරුවන්ට මොකක්ද වුණේ? ගිනිපෙට්ටිය, ඉඳිකට්ට, පොත පත, ගල්ලෑල්ල, වෙසක් කූඩුව හැම දෙයක්ම චීනයෙන් ගෙන්වපු කාලයක් ඔබතුමාට මතක ඇති. එතකොට අපේ නිෂ්පාදනවලට මොකක්ද වුණේ? කොට්ටයට දමන පුළුන් ටික පවා චීනයෙන් ආනයනය කළ මහින්ද රාජපක්ෂ යුගය නැවත මේ රටේ ඇති කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. මේ රටේ දේශීය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අපට මාස දහයකින් විපර්යාසයක් කරන්න බැහැ. මේවාට අඩිතාලම දමා ගන්න අපට පළමුවැනි අවුරුද්ද ඕනෑ. මේ විපර්යාසය කරන්න අපි යම් යම් දේවල් කරන්න ඕනෑ. නමුත් මිනිසුන්ට අවම බලපෑමක් කරලා, අවම බරක් දමලා මේ වෙනස ඇති කිරීම සඳහා අපි වැඩ ආරම්භ කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම විශේෂයෙන්ම කියන්න කැමැතියි කාර්මික නිෂ්පාදන, මූහුදු නිෂ්පාදන, කෘෂි නිෂ්පාදන වැඩි දියුණු කිරීමේ වැඩ පිළිවෙළක් අපි ආරම්භ කරන බව.

මේ පුංචි දූපතේ වටේටම මුහුදු තිබෙනවා. හැබැයි, මහින්ද රාජපක්ෂ මහත්තයා 2014 වන විට මේ රටට මසුන් මෙට්‍රික් ටොන් හැත්තෑඅට දහස් ගණනක් ආනයනය කර තිබෙනවා. ඒක තමයි මේ රටේ මහින්ද රාජපක්ෂ මහත්තයාගේ පාලනය වන්නේ. කියන්න කනගාටුයි. තායිලන්තයට වඩා මේ රට වටේටම මුහුදුකරය තිබෙනවා. නමුත් අපි පිටරටින් මසුන් ආනයනය කරනවා. මේ අය අවුරුදු විස්සක් හිටියා. මහින්ද රාජපක්ෂ මහත්තයා අවුරුදු 10ක් හිටියා. මහින්ද රාජපක්ෂ මහත්තයාට තව අවුරුදු සියයක් දුන්නත් මේ රටේ වෙනසක් ඇති කරන්න එතුමන්ලාට බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්ඩුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! The Sitting is suspended till 1.30 p.m.

රැස්වීම රීට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.

අතන්පඩි, අමර්වු පි.ප. 1.30 මණිවරෙ ඉඩෙනිරුත්තප්පට්ටු මීණ්ටුම් තොඩංගිර්රු.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

[பி.ப. 1.30]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இலங்கையின் இன்றைய பொருளாதாரம் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையின்மீது பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்குத் தங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இச்சந்தர்ப்பத்தில் எங்கள் நாட்டிலிருக்கின்ற சில முக்கிய விடயங்களைப் பற்றிப் பேச எண்ணுகின்றேன்.

இன்று இங்கு பேசிய கௌரவ அமைச்சர் கபீர் ஹாஷிம் அவர்கள் கடந்தகால ஆட்சியில் அரசாங்கத்தின் திட்டமிடல்கள் சம்பந்தமாகவும் அந்த அரசாங்கத்தினால் செய்யமுடியாத விடயங்கள் சம்பந்தமாகவும் குறிப்பிட்டிருந்தார். அரசாங்கங்கள் மாறுகின்றபோது ஓர் அரசாங்கம் இன்னொரு அரசாங்கத்தின் குறைகளைப் பட்டியலிடுவது வழமையான விடயம். அந்த வகையில் அவர் மஹிந்த ராஜபக்ஷவின் அரசு செய்த வேலைகள் தொடர்பாகக் குறிப்பிட்டிருந்தார். நான் அந்த அரசு செய்த விடயங்கள் எல்லாம் நல்லதென்று சொல்லவில்லை. ஆனால், மஹிந்த ராஜபக்ஷ அரசு அந்த விடயங்களைச் செய்தபோது அவருடைய கூட்டணிக்குள் இருந்தவர்கள்தான் இன்று இந்த அரசாங்கத்திலும் இருக்கின்றார்கள் என்பதைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

இலங்கையில், குறிப்பாக அரசாங்கங்கள் மாறுகின்ற போது, ஒவ்வொரு துறைசார் அமைச்சுக்களிடமும் பொருளாதாரத்தை வளர்க்கின்ற திட்டமிடல்களோ, கொள்கைகளோ இருப்பதில்லை. உதாரணமாக, இன்றைய அரசாங்கத்தில் விவசாய அமைச்சர் தனது அமைச்சு தொடர்பான, விவசாயப் பொருளாதாரம் தொடர்பான விடயங்களைத் தான் நினைத்த படி முன்னெடுத்துச் செல்கின்ற நிலையில் இருக்கின்றார்; அவ்வாறுதான் முன்னைய அரசாங்கங்களும் இருந்திருக் கின்றன. ஒரு நாட்டின் பொருளாதாரம் வளரவேண்டுமானால், அந்தந்தத் துறைசார் அமைச்சுக்கள் நன்றாகச் செயற் படவேண்டும். அந்த வகையில் எங்களுடைய நாட்டில் என்னவிதமான வளங்கள் இருக்கின்றன என்பதையறிந்து, அந்த வளங்களின் அடிப்படையில் ஒவ்வொரு துறைசார் நிபுணர்களைக் கொண்ட குழுவின் திட்டமிடலுக்கமைய, அவ்வமைச்சுக்கள் பயணித்தால் மட்டுமே, நமது நாட்டைப் பொருளாதாரத்தில் முன்னேற்ற முடியும். அதைவிடுத்து, அமைச்சர்களினதும் அரசாங்கத்தினதும் தன்னிச்சையான முடிவுகள்மூலம் நாட்டை முன்னேற்ற முடியாதென்பதை நான் இந்த நேரத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

"இன்று FCID சுயாதீனமாகச் செயல்படுகின்றது" என்று கௌரவ அமைச்சர் கபீர் ஹாஷீம் அவர்கள் குறிப்பிட்டார். தற்பொழுதுள்ள அமைச்சர்கள் மீதும் FCIDஇல் முறைப் பாடுகள் செய்யப்பட்டிருக்கின்றன. FCID சுயாதீனமாகச் செயற்படுகின்றது என்றால் ஏன், இந்த அரசாங்கத்தின் அமைச்சர்கள்மீது கொடுக்கப்பட்டுள்ள முறைப்பாடுகள் தொடர்பில் விசாரணைகள் இடம்பெறுவதில்லை? என்ப தையும் நான் அவரிடம் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

ஒரு நாட்டில் இனங்களுக்கிடையில் முறுகல் நிலையும் ஒற்றுமையின்மையும் தொடர்ந்து காணப்பட்டால், அந்த நாடு பொருளாதாரத்தில் எந்த வகையிலும் முன்னேறாது. தீட்டு கின்ற பொருளாதாரத் திட்டமிடல்களும் பயனற்றதாகிவிடும். ஒரு நாட்டில் அனைத்து இனங்களும் சமமாக வாழக்கூடிய வகையில் அதிகாரங்கள் பகிரப்பட்டால் மட்டும்தான், அந்நாடு

[ගරු ඉ. වාල්ස් නිර්මලනාදන් මහතා]

பொருளாதாரத்தில் முன்னேறும். இலங்கையில் அரசியல் யாப்பின்மூலம் இனங்களுக்கிடையிலும் மதங்களுக்கிடையிலும் ஒற்றுமையை ஏற்படுத்தினால் மட்டும்தான் எமது நாடு பொருளாதார ரீதியில் முன்னேறும். அரசியல் யாப்பில் மாற்றம் செய்யப்போவதாக கௌரவ அமைச்சர் குறிப்பிட்டார். அவர் அவ்வாறு செய்வதாக வார்த்தையளவில் குறிப்பிட்டாலும், எங்களுடைய பிரதேசங்களில் நடக்கின்ற விடயங்களைப் பார்த்தால், அதில் எவ்வளவு உண்மைத் தன்மை இருக்கின்றது என்பது தொடர்பில் நாம் சந்தேகிக்க வேண்டியிருக்கின்றது.

உதாரணமாக, யுத்தத்தினால் நொந்துபோன, இழப்புக்களைச் சந்தித்த எங்களுடைய மக்களுக்கு புதிய அரசியல் யாப்பின்மூலம் ஒரு கௌரவமான தீர்வைக் - வாழ்க்கையைக் கொடுப்பதாக தற்பொழுது அரசாங்கம் தெரிவித்துக் கொண்டிருக்கின்றது. அப்படியிருக்கும்போது, இம்மாதம் ஐந்தாம் திகதி வடக்கின் மீள்குடியேற்றம் தொடர்பில் செயலணியொன்று உருவாக்கப்பட்டு அமைச்சரவையின் அங்கீகாரமும் பெறப்பட்டிருக்கின்றது. வடக்குடன் சம்பந்தப்பட்ட இச்செயலணியில் - வடக்கிலிருந்து வெளியேறியவர்களை மீள்குடியேற்றம் செய்யப்படுவதற்கென உருவாக்கப்பட்ட இச்செயலணியில் - வட மாகாண முதலமைச்சர் இல்லை; வடக்கைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற தமிழ் தேசியக் கூட்டமைப்புப் பாராளுமன்ற உறுப்பினர்கள் இல்லை. இப்படி அங்குள்ள மக்கள் பிரதிநிதிகளைப் புறந்தள்ளிவிட்டு, உங்களுடைய அதிகாரத்தில் வடக்குடன் சம்பந்தப்பட்ட ஒரு செயலணியை அமைப்பதானது, இந்த அரசாங்கத்தின் நல்லாட்சியா? அல்லது நல்லிணக்கமா? அல்லது அதை எப்படிச் சொல்வது? நீங்கள் இதற்குரிய பதிலைச் சொல்லவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். நாங்கள் இதனை வன்மையாகக் கண்டிக்கின்றோம்.

நீங்கள் எங்களுடைய மக்களின் பிரதிநிதிகளை, எங்களுடைய மாகாண முதலமைச்சரை இந்த மீள்குடியேற்றச் செயலணியில் உள்வாங்காமல், உங்களுடைய அமைச்சரவையில் அங்கம் வகிக்கின்ற மூன்று அமைச்சர்களை உள்வாங்கியிருக்கின்றீர்கள். அவர்களில் ஒருவர்தான் றிஸாட் பதியுதீன் அவர்கள். அவர், "தற்பொழுது வடக்கின் சார்பாக நான்தான் அமைச்சரவை அந்தஸ்துள்ள அமைச்சராக இருக்கின்றேன்" என்று பல கூட்டங்களில் பேசிவருகிறார். அவர், கடந்தமுறை பொதுத்தேர்தலில் தான் பெற்ற வாக்குகளுக்கும் அண்மையில் நடைபெற்ற பொதுத்தேர்தலில் பெற்ற வாக்குகளுக்கும் இடையிலுள்ள வித்தியாசத்தை முதலில் ஒப்பிட்டுப் பார்க்கவேண்டும். அவரை மக்கள் எவ்வளவுதூரம் நிராகரித்திருக்கிறார்கள் என்பதை அரசாங்கமும் சற்றுக் கவனத்திற்கொள்ள வேண்டும். அதேநேரத்தில் அவருக்கு எதிராகப் பல முறைப்பாடுகள் செய்யப்பட்டிருக்கின்றன. FCID இலும் முறைப்பாடுகள் செய்யப்பட்டிருக்கின்றன. ஆகவே, இப்படியான ஓர் அமைச்சரை வடக்கின் மீள்குடியேற்றத்துக்கான செயலணியில் எப்படி நீங்கள் நியமிப்பது? எங்களுடைய மக்கள் கௌரவமாக வாழக்கூடிய ஒரு தீர்வை இந்த அரசாங்கம் தரும் என்று நாங்கள் என்ன அடிப்படையில் நம்புவது?

இலங்கை பொருளாதாரத்தில் முன்னேற வேண்டுமாக இருந்தால் முதலில் அமைச்சர்கள் தன்னிச்சையாகச் செயற்படுவதை நிறுத்த வேண்டும். உதாரணமாக கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சுக்குக்கீழ் இருக்கின்ற மன்னார் உப்பளம் இலங்கை அரசாங்கத்தின் ஒரு கூட்டுத்தாபனமாகும். ஆனால் அந்த நிறுவனத்தில் வேலை செய்கின்றவர்கள் பெறுகின்ற இலாபங்களை இன்று அமைச்சர் தன்னுடைய சொந்த விருப்புவெறுப்புக்காகப் பயன்படுத்துகின்றார். அந்த உப்பளத்தில் சம்பளம் பெறுகின்ற ஒருவர் அமைச்சருடைய காரியாலயத்தில் வேலை செய்கின்றார். அவர் கிழமையில் ஒரு நாள் அங்கு போய் கையெழுத்து வைத்துவிட்டு வந்தால் அவருக்குச் சம்பளம் கிடைக்கின்றது. இப்படி ஒவ்வோர் அமைச்சின்கீழும் உள்ள நிறுவனங்களும் கூட்டுத்தாபனங்களும் இயங்கி வருகின்றபோது, அந்தந்த அமைச்சர்கள் தத்தமது அரசியல் இலாபத்துக்காக, அதாவது தங்களுடைய கட்சியை வளர்க்கும் நோக்கத்துக்காகவும் தங்களுடைய உறவினர்களை வளர்க்கும் நோக்கத்துக்காகவும் செயற்பட்டால் பொருளாதாரத்தில் இலங்கை எப்படி முன்னேறும்? என்பதை நான் அரசாங்கத்திடமும் அமைச்சர்களிடமும் தயவாகக் கேட்கின்றேன்.

இன்று அமைக்கப்பட்டுள்ள மீள்குடியேற்றச் செயலணியைத் தமிழ்த் தேசியக் கூட்டமைப்பினரும் மற்றும் வடக்கு, கிழக்கில் வாழ்கின்ற தமிழ் மக்கள் அனைவரும் வன்மையாகக் கண்டிக்கின்றார்கள். இதை மேதகு ஜனாதிபதி அவர்களும் மாண்புமிகு பிரதம அமைச்சரும் மற்றும் அமைச்சர்களும் விளங்கிக்கொள்ள வேண்டும் என்று நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்கின்றேன். கௌரவ அமைச்சர் கபீர் காஷிம் அவர்கள் குறிப்பிட்டிருந்தார், "எல்லாருக்கும் சமவாய்ப்பு வழங்கப்படுகின்றது" என்று. அப்படியென்றால் வடக்குக்கான மீள்குடியேற்றச் செயலணியை உருவாக்கும்போது அதில் சம்பந்தப்பட்டவர்கள் அனைவரையும் சேர்த்திருக்க வேண்டும். அப்படியானால் அந்தச் செயலணியில் தமிழ் தேசியக் கூட்டமைப்பு எங்கே? வடக்கு மாகாண சபை உறுப்பினர்கள் எங்கே? சம்பந்தப்பட்ட பாராளுமன்ற உறுப்பினர்கள் எங்கே? ஆகவே, என்ன வகையில் சமவாய்ப்பு வழங்கப்படுகின்றது? நீங்கள் தமிழ் மக்களையும் தமிழ் மக்களுடைய பிரதிநிதிகளையும் புறங்தள்ளிவிட்டு அந்தச் செயலணியை அமைத்திருக்கின்றீர்கள். அதற்கு சமவாய்ப்பு என்று சொல்லி ஒரு பெயரும் கொடுத்திருக்கின்றீர்கள். ஆகையால், நான் இதை வன்மையாகக் கண்டிப்பதோடு, இது தொடர்பான வடக்கு மாகாண சபையின் தீர்மானத்தை ஏற்றுக் கொள்ளும்படியும் கேட்டுக்கொள்கின்றேன்.

எங்களுடைய நாட்டில் பொருளாதாரம் வளர்ச்சியடைய வேண்டுமானால் கிராமப் புறங்களில் விவசாயத்தை ஊக்குவிக்க வேண்டும். அப்போதுதான் நாடு விவசாயத்தில் முன்னேறும். ஆனால் முப்பது - நாற்பது வருடங்களுக்கு முன்னர் கடைப்பிடித்த விவசாய முறைகளைத்தான் எங்களுடைய மக்கள் தற்பொழுதும் பின்பற்றிக் கொண்டிருக்கின்றார்கள். இன்று விவசாயப் பண்ணைகளில் புதுவிதமான கண்டுபிடிப்புக்கள் இடம்பெறுகின்றபோதிலும் அந்தச் செயற்பாடுகள் பண்ணைகளில் மட்டும்தான் இடம்பெறுகின்றன. அதாவது குறித்த பண்ணைகளில் ஒவ்வொரு சிறிய சிறிய தோட்டங்களை அமைத்து அங்குள்ள பயிர்கள்மூலம் இவ்வளவு பலன் கிடைக்கின்றது என்ற வகையில் கண்காட்சி நடைபெற்றுக்கொண்டிருக்கின்றதே ஒழிய, அதுகுறித்து கிராமப்புற விவசாயிகள் மத்தியில் ஊக்குவிப்புக்கள் இல்லை.

அதேபோல் மீன்பிடித் தொழிலாளர்களை மதித்து அவர்களுக்கு என்னென்ன பிரச்சினைகள் இருக்கின்றன என்பது பற்றிக் கேட்டறிந்து, அவை குறித்து ஆராய்ந்து தீர்த்துவைத்தால் மட்டும்தான் நாடு மீன்பிடியில் முன்னேறும். நாட்டில் கிராம மட்டங்களில் பொருளாதாரம் வளர்ச்சியடையாவிட்டால் நாடு தழுவிய ரீதியில் அது வளர்ச்சியடைய

මුදියාතු. නීංකළ් පල විදහංකලිල් වරුමාන වරිකළෛත් තීර්මානික්කලාම්; අරවිටලාම්. ඉන්ත අරසාංකම් තේසිය අරසාංකමාක ඉරුප්පතනාල් අන්තප් පෙරුම්පාන්මෛයෛ වෛත්තුක්කොණ්ටු නීංකළ් එටුක්කින්ර මුටිවුකළ් එල්ලාම් සරි එන්රු නිනෛක්කලාම්. ආනාල් කිරාමප්පුර මක්කළ් මත්තියිල් පොරුළාතාරක් කට්ටමෛප්පෛ වළර්ත්තාල් මට්ටුම්තාන් ඉලංකෛ පොරුළාතාරත්තිල් මුන්නේර මුටියුම්. ඉල්ලා විට්ටාල් කටන්කළුක්කුමේල් කටන්කළාක ඉන්නුම් පල මිල්ලියන් රූපායෛප් පෙරවේණ්ටිය නිලෛමෛතාන් ඒර්පටුම්.

කෞරව අමෛච්චර් කපීර් හාෂිම් අවර්කළ් ඉ.නා. සපෛත් තීර්මානම් තොටර්පාකක් කුරිප්පිට්ටිරුන්තාර්. අතාවතු, මේතකු ජනාතිපති අවර්කළ් අතු තොටර්පාකක් කූරිය "වෙළිනාට්ටු නීතිපතිකළෛ අනුමතික්කමාට්ටෝම්" එන්ර කරුත්තෛයේ අවරුම් කූරියිරුන්තාර්. මේලුම්, "ඉරාණුවත්තෛක් කාට්ටික්කොටුක්ක මාට්ටෝම්" එන්රුම්, "ජනනායක විරෝතච් චෙයලෛච් චෙය්ය මාට්ටෝම්" එන්රුම් අවර් චොල්ලියිරුන්තාර්. ජනනායක විරෝතච් චෙයල් එන්රාල් එන්න? එංකළ් මක්කළෛප් පටෙයිනර් කොටූරමාකක් කොලෛ චෙය්තතු ජනනායක විරෝත චෙයල් ඉල්ලෛයා? අව්වාරු කොලෛ චෙය්තුවිට්ටු නීංකළේ විචාරණෛ චෙය්තු, නීංකළේ තණ්ටනෛ වළංක මුටියුමා? එංකළුටෛය මක්කළුක්කු කෞරවමාන වාළ්ක්කෛයුම් වේණ්ටුම්; අතේනේරත්තිල්, නටන්ත චම්පවත්තින් උණ්මෛ නිලෛයෛක් කණ්ටරියවුම් වේණ්ටුම්. උණ්මෛයෛක් කණ්ටරිය වේණ්ටුමාක ඉරුන්තාල්, චර්වතේච නීතිපතිකළ් ඉංකු වරවේණ්ටුම්. අවර්කළ් වන්තාල් මට්ටුන්තාන් අතු චාත්තියමාක අමෛයුමෙන්රුම් ඉන්ත නේරත්තිල් නාන් චොල්ලික්කොළ්ළ විරුම්පුකින්රේන්.

ඉන්ත අරසාංකත්තින් මාණ්පුමිකු පිරතම මන්තිරි අවර්කළ්, අරසියල් යාප්පිල් මාට්රම් කොණ්ටුවරුම් පිරේරණෛයෛක් කටන්ත ජනවරි මාතම් 09ආම් තිකති පාරාළුමන්රත්තිල් මුන්මොළින්තාර්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිචාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
උංකළුක්කු ඉන්නුම් ඔරු නිමිටන්තාන් ඉරුක්කින්රතු.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු ඉ. චාර්ල්ස් නිර්මලනාතන්)
(The Hon. I. Charles Nirmalanathan)
අතු ඉරණ්ටු මාතම් කළිත්තු නිරෛවේරියතු. අරසියල් යාප්පිල් මාට්රම් චෙය්යප්පෝවතාකච් චොල්ලි උලකත්තිල් ඉරුක්කින්ර එල්ලා නාටුකළුක්කුම් ඉන්ත අරික්කෛයෛ අනුප්පිවිට්ටු, තංකළුටෛය කපට නාටකංකළෛ එංකළු ටෛය පිරතේචංකළිල් තොටර්න්තුම් අරංකේට්රික් කොණ්ටිරුක්කින්රාර්කළ්. මුන්නර් ඉරුන්තතෛවිටවුම් එංකළු ටෛය මක්කළ් මිකවුම් වේතනෛප්පටුකින්ර වකෛයිල් ඉන්ත අරසාංකත්තින් චෙයර්පාටුකළ් ඉටම්පෙර්රු වරුකින්රන. කුරිප්පාක, කටන්ත 3 තිනංකළුක්කු මුන්පු මුල්ලෛත්තීවිලුළ්ළ කොක්කිළාය් එන්ර කිරාමත්තිල් පූර්වීකමාක වාළ්න්තු වරුකින්ර - අංකේයේ පිරන්තු වළර්න්ත - මක්කළුක්කු මීන්පිටිප් පටකුකළෛක් කට්ටුවතර්කෙන 150 මීර්රර් පරප්පුළ්ළ ඉටම් පිරතේච චෙයලාළරාල් වළංකප්පට්ට පෝතුම්, අතු මීන්පිටි අමෛච්චිනාල් තටුක්කප්පට්ටතු. නිලත්තුක්කුම් මීන්පිටි අමෛච්චුක්කුම් එන්න චම්පන්තම් ඉරුක්කින්රතු? චොන්ත නිලත්තිල් වාළ්කින්ර මීනවර්කළුක්කු මීන්පිටිප් පටකුකළෛක් කට්ටමුටියාතු; ආනාල්, තෙන් පකුතියිලිරුන්තු වරුකින්ර මීනවර්කළුක්කු අංකු කරෛවලෛ ඉළුක්ක මුටියුම්! ඉප්පටියාන ඔරු චූළ්නිලෛ එංකළුටෛය මක්කළුක්කු ඉන්ත අරසාංක කාලත්තිල් ඒර්පට්ටිරුක්කින්රතු. අන්ත නිලෛමෛ ඉන්නමුම් තොටර්න්ත වණ්ණමේ ඉරුක්කින්රතු. ඉතනෛයුම් වන්මෛයාකක් කණ්ටිප්පතෝටු, වටක්කු මීළ්කුටියේර්රච් චෙයලණි නියමනත්තුක්කු එනතු එතිර්ප්පෛත් තෙරිවිත්තු, උටනේ අතනෛ නිරුත්ත වේණ්ටුමෙන්රුම් කේට්ටු, විටෛපෙරුකින්රේන්. නන්රි.

[අ.භා. 1.45]

ගරු රවී කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(මාණ්පුමිකු රවි කරුණානායක්ක - නිති අමෛච්චර්)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධ විවාදයට එකතුවීමට ලැබීම ගැන මා සතුටු වෙනවා. මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙන හා ස්ථිර කර තිබෙන මන්ත්‍රීවරුන් දෙපළ අද රටේ තිබෙන තත්ත්වය උග්‍ර ලෙස පෙන්වන්නට හැදුවාට, ආණ්ඩුව වෙනුවෙන් සැබෑ තත්ත්වය පෙන්වා දීම මගේ යුතුකමක්. මීට පෙර කථා කළ මන්ත්‍රීවරුන්ගේ කථා මට මේ ගරු සභාවේ වාඩි වී ඉඳගෙන අසන්නට බැරි වුණාට මගේ කාර්යාලයේ අමුත්තන් හමුවන අවස්ථාවේදී මට අසන්නට ලැබුණා. මීට පෙර කථා කළ මන්ත්‍රීතුමන්ලාගේ අදහස් මම අගය කරනවා. අපට අවශ්‍ය වන්නේ, මේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ කොයි ආකාරයෙන් කටයුතු කළොත් ද කියා සොයා බලා ඒ කටයුත්ත කිරීමටයි.

ඒ මන්ත්‍රීවරුන් පෙන්වා දී තිබෙන පරිදි, මේ රටේ ජීවන වියදම වැඩියිලු; ආර්ථිකය කඩා වැටී තිබෙනවාලු; ජනතාවට ජීවත් වෙන්න අමාරුයිලු. මේ රට නිකම් සුන්දර ලෝකයකින් අප හාර අරගෙන අපායකට ගෙනියන්න හදන ගමනක් වාගෙයි පෙන්වන්නට හදන්නේ. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කෙසේ කීවත්, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා නම් රුපියල් 2500කින් මාසයක් ජනතාවට කවන්න හදලා, මගේ නම සම්බන්ධයෙනුත් මේ ගරු සභාවේ වැරදි දේ නැවත, නැවත ප්‍රකාශ කර තිබෙන කෙනෙක්. එවැනි මන්ත්‍රීවරුන්ගේ කථා වෙනුවෙන් මා වැඩි වෙලාවක් මිඩංගු කරන්න අවශ්‍ය නැහැ. නමුත් මූලික හරය වශයෙන් අද තත්ත්වය පෙන්වා දීම මගේ යුතුකමක්ව තිබෙනවා.

සමස්තයක් වශයෙන් බලන කල ජීවන වියදම අද රට කථා කරන දෙයක් බවට පරිවර්තනය කර තිබෙනවා. නමුත් ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 8වැනි දා ඔබතුමන්ලාගේ ආණ්ඩුව ජනතාව ප්‍රතික්ෂේප කරන අවස්ථාවේදී තිබුණු ජීවන වියදම සමඟ සංසන්දනය කරමින් ඔබතුමන්ලාගෙන් මා අභියෝගකාරීව අහනවා, එදාට වඩා අද ජීවන වියදම අඩු වෙලා නැද්ද කියා. එය විතරයි මට මෙතැනදී අහන්නට තිබෙන ප්‍රශ්නය.[බාධා කිරීමක්] ඔබතුමා හිනා වුණාට කමක් නැහැ. [බාධා කිරීම්] ඔව්. මිනිස්සු හිනා වෙන්නට පුළුවන්. නමුත් ඇත්ත තත්ත්වය ඒකනේ. එදා රුපියල් 160ට තිබුණු පෙට්‍රල් ලීටරයක මිල අද රුපියල් 115 වුණාම ඒක වැඩිද අඩුද කියා මා අහනවා. එදා රුපියල් 110ට තිබුණු භූමිතෙල් ලීටරය අද රුපියල් 55 වුණාම ඒක වැඩිද අඩුද? එදා රුපියල් 450ට තිබුණු කිරිපිටි මිල අද කීයද? දේශීය කිරිපිටි රුපියල් 325යි. ආනයනය කරන ලද කිරිපිටි රුපියල් 380යි. වැඩිද, අඩුද? ඒ වාගේම රුපියල් 2650ට තිබුණු ගෑස් සිලින්ඩර් එක අද රුපියල් 1355කට අඩු වෙලා තිබෙනකොට වැඩිද , අඩුද? ඒ වාගේම තමයි සීනි මිල. අප මේ රටේ පාලනය භාර ගන්නකොට රුපියල් 108ට රුපියල් 110ට තිබුණු සීනි කිලෝ එකේ මිල අද අඩු කර තිබෙනවා. මොන අමාරු තත්ත්වය තිබුණත් රුපියල් කෝටි දෙදාහක් නැතිකර ගෙන, අපේ ආදායම අඩු කර ගෙන, ජීවන වියදම අඩු කරන්නට අප කටයුතු කර තිබෙනවා. ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්

[ගරු රවි කරුණානායක මහතා]

ජීවන වියදම අඩු කරනවාය කියා පොරොන්දු වුණා. අප අද ජීවන වියදම අඩු කර පෙන්වා දී තිබෙනවා.

අපි යමක් කිව්වොත් ඒ ආකාරයෙන් කරන පක්ෂයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි ටින් මාළු සම්බන්ධයෙනුත්. උදාහරණ වශයෙන් පෙන්වා දෙන්න මා ගත්තේ අත්‍යාවශ්‍ය භාණ්ඩයි; හැම බෙකන් ආදිය නොවෙයි. මේවා තමයි එදිනෙදා ජීවත් වෙන්න අවශ්‍ය දේවල් හැටියට අපි පාරට බැහැලා පෙන්නුවේ. රාජපක්ෂගේ හොර වංචාවලට වඩා, අපි ඉදිරියට මහජනතාවට දෙන්න යන්නේ මේවායි කියා තමයි අප පෙන්නුවේ. එදා මාළු ටින් එක රුපියල් 240යි; 250යි. අද දේශීය මාළු ටින් එකක් රුපියල් 125යි. ඒ සම්බන්ධයෙන් දේශීය මාළු නිෂ්පාදනය වැඩි කර තිබෙනවා. ආනයනය කරන ලද මාළු ටින් එකක් රුපියල් 140ට රුපියල් 150ට අඩු කර තිබෙනවා. ඒ විධියට බලන විට මොනවාද මේ සංසන්දනය කරන්න හදන්නේ?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මට ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

රු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඕනෑ එකක් අහන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
උද්ධමනය සියයට 7වෙලා තිබෙන්නේ කොහොමද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අත්‍යාවශ්‍ය භාණ්ඩ ප්‍රමාණයක් පෙන්නුවා. අරක්කු මිල වැඩි කළා නම්, සිගරට් මිල වැඩි කළා නම් ඒවා ඔක්කෝම කොළඹ මිල දර්ශකයට බලපානවා. ඒ තුළින් වැඩි වීමක් තිබෙනවා. මේක එදාට වඩා සුන්දර තත්ත්වයක්ය කියා මම කියන්නේ නැහැ. මම කියන්නේ අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල බැලුවාම එදා අපි රට භාර ගන්නකොට තිබුණාට වඩා අද අඩුයි කියන එකයි. නමුත් යම් යම් දේවල්වල මිල වැඩි වෙලා තිබෙනවා. "නැහැ" නොවෙයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
සමස්තය?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සමස්තයක් වශයෙන් අපට තිබෙන දේ තමයි -[බාධා කිරීමක්] එහෙම ගත්තා නම් 2004 වර්ෂයේ අප රට භාර දෙනකොට තිබුණාට වඩා මහින්ද රාජපක්ෂ අපට රට භාර දෙනකොට වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේ ජීවන වියදම ලෝකයේ වැඩි වේගෙන යනවා මිසක් අඩු වෙන්නේ නැහැ. [බාධා කිරීමක්] හැබැයි, ඒ අතර අපේ රජය විතරයි වියදම වැඩි වෙනකොට එයට සාපේක්ෂව ආදායම වැඩි කර තිබෙන්නේ. මහින්ද රාජපක්ෂ අවුරුදු 11ක් මේ රට පාලනය කළා. මහින්ද රාජපක්ෂ මේ ගැන සිතුවාද? දළදා මාළිගාව ඉස්සරහා ගිහින් වැඳලා පුදලා, රුපියල් 10,000ක් දෙනවාය කිව්වාට, අපේ ආණ්ඩුවයි ඒක දුන්නේ. වෙනස ඒකයි. අපේ ආණ්ඩුව ආදායම සහ වියදම අතර සමබරතාවක් ඇති කර දී තිබෙනවා. [බාධා කිරීමක්] සියලු දෙය ගැනම අපට බැණලා හරියන්නට පුළුවන්. නමුත් ඇත්ත තත්ත්වය මෙයයි. අපට භාර දුන්නේ කඩා වට්ටලා දණ ගස්වන ලද ආර්ථිකයක්. මේක අපි නැවත නැවත කිය කියා ඉන්න අවශ්‍යතාවක් නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ආර්ථික වර්ධන වේගය වැඩි වීම කඩා වැටීමක්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආර්ථික වර්ධන වේගයේ වැඩිවීම අපි කඩා වැටිටුවා නොවෙයි. ඔබතුමන්ලා තමයි කියන්නේ ආර්ථිකයේ කඩා වැටීමක් තිබෙනවාය කියා. [බාධා කිරීමක්] ගරු වාසුදේව මන්ත්‍රීතුමා කියන එකම තමයි මාත් කියන්නේ. මේවා කඩා වැටුණාය කියලා කියා තිබෙන්නේ දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමායි, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමායි; මම නොවෙයි. මා කියන්නේ, එහෙම නොවෙයි කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Bimal Rathnayake to the Chair?

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் பிரதி அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Deputy Minister of Sustainable Development and Wildlife)
"ගරු බිමල් රත්නායක මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඩ විය.

අතන් පිරකු, මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු පිමල් රත්නායක අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair,and THE HON. BIMAL RATHNAYAKE took the Chair.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඩ ගරු මන්ත්‍රීතුමනි, මට අවශ්‍ය වන්නේ මේ අවස්ථාවේදී මේ සභාව දේශපාලන පොර පිටියක් කරන්න නොවෙයි, සැබෑ තත්ත්වය සම්බන්ධයෙන් උත්තර දෙන්නයි. රටේ ආර්ථිකය යම් විධියකින් ඉදිරියට තල්ලු කරගෙන යන බවක් පෙන්නුම් කර තිබෙනවා. එදා අපි මේ පුංචි ලංකාවේ පාලනය භාරගත් අවස්ථාවේදී තිබුණු ආර්ථික තත්ත්වයට වඩා අද මොනවාද වෙලා තිබෙන්නේ? අද සංවර්ධනය ඇත හිටලා තිබෙනවාය කිව්වාට හැම කොනකම යම් දෙයක් පටන්ගෙන තිබෙනවා. හැබැයි ඔබතුමන්ලා වාගේ අපි පම්පෝරි ගහන්නේ

නැහැ. වැසිකිළියක් හැදුවාම එය "රාජපක්ෂ වැසිකිළියක්" කියලා ශබ්ද කරනවා වාගේ අපි "මෛත්‍රීපාල සිරිසේන වැසිකිළියක්" කියලා ශබ්ද කරන්නේ නැහැ. [බාධා කිරීමක්] ඉතින් අහගන්න. ආර්ථිකය කඩා වැටිලා තිබෙන කොට දැන්වත් අහගන්න. හැම වෙලාවේම ශබ්ද කර-කර ඉන්නවා. රාජපක්ෂ කල්ලිය තමයි මේවා කරන්නේ. මේ රට හදන්න අපි භාරගෙන තිබෙනවා. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ යන සියලු ජාතීන්ට එකට ජීවත්වන මාර්ගයක් ඇති කරන්න තමයි අපි කටයුතු කරලා තිබෙන්නේ.

අපට පෙනෙනවා, මේ රජය ගෙනයන එක ලේසි නැහැයි කියලා. යහ පාලනය කිව්වාම, වල් බූරු නිදහසකුත් ඇවිල්ලා තිබෙනවා. ඒ වල් බූරු නිදහස තිබෙන්නේ උසාවියේ වෙන්න පුළුවන්, පොලීසියේ වෙන්න පුළුවන්. නමුත් ඒකත් එක්ක තමයි අපි කරගෙන යන්නේ. අපි බොහොම සතුටින් බදු මීට වඩා අඩු කරන්නම්. නමුත් අඩු කරන්න තිබෙන බාධාව -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා කිව්වා නේ උසාවියේ තිබෙන්නේත් වල් බූරු නිදහස කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකක්ද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා කිව්වා නේ උසාවියේත් තිබෙන්නේ වල් බූරු නිදහස කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඒ විධියට කියනවා නම් එය ඔබතුමාගේ interpretation එක. [බාධා කිරීමක්] නැහැ. ඔබතුමා කියන එක නේ. මා ඒක කිව්වේ නැහැ නේ. [බාධා කිරීමක්] ඔබතුමාගේ ඔය තියුණු තර්කවලට - [බාධා කිරීමක්] 1994 අගෝස්තු මාසයේ මා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඔබතුමා ළඟ ඉඳගත්ත නිසා මට පරිණතභාවයක් ඇති වෙලා තිබෙනවා. ඔබතුමා කියන තර්ක ලේසියෙන් පැත්තකට දමලා උත්තර දෙන එක තමයි වඩා හොඳ. හැබැයි මන්ත්‍රීතුමා, ඔබතුමා සත්‍ය වශයෙන් දන්නවා, අපි මේ භාරගෙන තිබෙන්නේ ඔබතුමන්ලා වටිටලා තිබෙන ආර්ථිකයක් කියලා. එදා ඒ ණය ටික ගෙවන්න අදායම නැති වුණා. ඒක තමයි ඇත්ත තත්ත්වය.

හම්බන්තොට වරාය සම්බන්ධයෙන් බලන්න. හම්බන්තොට වරායට රුපියල් කෝටි 28,200ක් වියදම් කළා. ඒක ප්‍රාග්ධන වියදමක්. ඒ සඳහා සියයට 6ත්, සියයට 6.8ත් අතර පොලියක් ගෙවනවා. නමුත් ශුද්ධ අදායම වශයෙන් ලැබෙන්නේ රුපියල් මිලියන 300යි. මේ රුපියල් මිලියන 300 ඇතිද මේ මුදල ගෙවන්න? අවුරුදු 800ක් ගියත් මදියි, මේ මුදල ගෙවන්න. ඉතින් මේක තමයි අපට වෙලා තිබෙන්නේ. අපට මේ සල්ලි ගෙවන්න වෙන්නේ කොළඹ වරායෙන් එකතු කරන ආදායමෙන්. ඒ මුදලත් මදිවෙලා තිබෙන නිසා තමයි වෙනත් තැන්වලින් අරගෙන ගෙවන්න තිබෙන්නේ. ඒ කිව්වේ, හම්බන්තොට වරාය ගැන.

දැන් බලන්න, සූරියවැව ක්‍රීඩා භූමිය ගැන. මේ ක්‍රීඩාංගණයට රුපියල් මිලියන 4,500ක් වියදම් කරලා තිබෙනවා. මේ රුපියල් මිලියන 4,500 වියදම් කරලා තිබෙන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන්. ශ්‍රී ලංකා වරාය අධිකාරිය මේ ක්ෂේත්‍රයට කිසිසේත්ම අදාළ නැහැ. නමුත් ඒ අවසරය දීලා තිබෙනවා. අවසර දුන්නාට පසු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ක්‍රීඩාංගණය ඉදි කළා. අද ඒ ගොල්ලෝ කියනවා, ඒ මුදල ගෙවන්න කියලා. අපි කියනවා, ගෙවන්නේ නැහැයි කියලා. ඊට පස්සේ ඒ ක්‍රීඩාංගණය ඉදි කරපු චීන කොම්පැනිය අපට කිව්වා, "ඔබතුමන්ලා අතර දේශපාලන ප්‍රශ්න තිබුණාට අපි කරපු දෙයට කරුණාකර අපට මුදල් ගෙවන්න"යි කියලා. අපි කිව්වා, මේකේ වටිනාකම කීයද කියලා කරුණාකරලා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න කියලා. අපට ගිය සුමානේ ඒක ලැබුණා. ඒකට රාජපක්ෂ පාලනය තුළින් රුපියල් මිලියන 4,500ක් වියදම් කළාට, අද ඒකේ සැබෑ ඇස්තමේන්තු වටිනාකම වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, රුපියල් මිලියන 852යි. රුපියල් මිලියන 4,500න්, රුපියල් මිලියන 852ක් අඩු කළාම රුපියල් මිලියන 3,648යි. රුපියල් මිලියන 3,700කට ආසන්න මුදලක් කොහේද ගිහින් තිබෙන්නේ? මේ රුපියල් මිලියන 3,700ක් පමණ මුදල වියදම් කර තිබෙන්නේ කවුද? රාජපක්ෂ පාලනය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ එදා හිටපු සභාපති Dr. Wickrama වියදම් කරලා අද උත්තර දෙන්න බැරි තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. මේවා ගැන ප්‍රශ්න කළාම දේශපාලන හිරිහැර කිරීමක් කියලා කියනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, පොදු වැදගත්කමක් තිබෙන කරුණක් නිසා මූලාසනය වශයෙන් යම් මැදිහත් වීමක් කරන්න මා හිතුවා. ඔබතුමා කියපු කාරණය ඉතා වැදගත් නිසා ඒ රුපියල් මිලියන 852 සඳහා වූ ඇස්තමේන්තුව ඔබතුමන්ලා ලබා ගත් ආකාරය ගැනත් මේ සභාවට හෙළිදරවු කරන්න පුළුවන් නම් එය වටිනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්තුතියි. ඒක ඇස්තමේන්තුවක් නොවෙයි. ඒක තක්සේරුවක්, professional valuation එකක්. ඒ තක්සේරුව තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ ගොල්ලෝ ඒ සඳහා රුපියල් මිලියන 5,500කට ඇස්තමේන්තුවක් සකස් කරලා එවා තිබුණා. නමුත් ඇත්ත වශයෙන් වියදම් කළේ රුපියල් මිලියන 4,500යි. ඒ රුපියල් මිලියන 4,500ක් කියා ඉදිරිපත් කර තිබෙන්නේ අපි අද ගත්ත තක්සේරුව තමයි. ඇත්ත වශයෙන්ම එකකින් මදි නිසා අපි තැන් දෙක තුනකින් තක්සේරුවක් ගත්තා. අනෙක් ඒවායේ ඊටත් වඩා අඩුයි. මේ මිලියන 3,700 කවුද වියදම් කරලා තිබෙන්නේ? මේ වාගේ දේවල් තමයි වෙලා තිබෙන්නේ. මේ එක නිදසුනක් විතරයි මම ඉදිරිපත් කළේ.

දෙවනුව, මට පාරවල් ගැන කියන්න පුළුවන්. අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා තමයි දැන් මහාමාර්ග ඇමතිතුමා වශයෙන් කටයුතු කරන්නේ. මම වගකීමකින් කියනවා, අද අපි මේ වියදම අඩු කරන්න අලුත් ආකාරයකින් කටයුතු කර තිබෙන බව. ගිය සතියේ වැඩ පටන් ගත්ත අධිවේගී මාර්ගවල වියදම කලින් ගිය වියදමට වඩා සියයට 21කින් අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේත්, ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේත් පාලන කාලය තුළ, ඒ වියදම සියයට 21කින් අඩු කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. නමුත්, අපට තවම සතුටු නැහැ. ඇත්ත වශයෙන්ම ඒ වියදම සියයට 35කින් විතර අඩු කරන්න පුළුවන් වෙයි කියලා තමයි අපි විශ්වාස කරන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමන්ලා කොහොමද අඩු කරන්නේ?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කලින් මේ වියදම තක්සේරු කරලා තිබුණේ කොහොමද? කිසිම සම්බන්ධකමක් නැති අය ඇවිත් කියනවා කිලෝමීටරයක් හදන්න යන වියදම මෙන්න මේකයි කියලා. ඒ ගණන තමයි ගන්නේ. ඊට පසුව ඒ අයගේ හිතුමතයට, ටෙන්ඩර් දෙනවා. චීනයට දෙන්න පුළුවන්; ජපානය දෙන්න පුළුවන්. ඒ විධියට දන්නා ඕනෑම කෙනෙකුට ටෙන්ඩර් දෙනවා. ඒ අයගේ සැබෑ වටිනාකම ගත්තාට පස්සේ ඉතිරි ටික තමයි දූෂණය වශයෙන් යන්නේ. මේ කටයුතු අපි භාර ගත්තාට පස්සේ කිව්වා, "මේ තිබෙන Bill of Quantity.." - [බාධා කිරීමක්] ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, මේක නේ කාරණය. ඇස්තමේන්තු කළාට පසුව ඒ අයගේ construction cost එක ඒකයි. Bid කරන්නේ ඒකට. Bid කළාට පස්සේ රාජපක්ෂ පාලනය තුළ දුන්න ගණන සහ ඇත්ත ගණන අතර වෙනස තමයි පගා ලෙස ගණන් ගන්නේ. මොනවාද ආයෙත් හංගන්න තිබෙන්නේ? ඔබතුමා මම කියන දෙය අහගන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කොහොමද ඒක කරන්නේ කියලා කියන්න කෝ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා නොදන්නවාද? සැබෑ ලෙසම වියදම් කරන්නේ මිලියන 10යි නම්, ඒක මිලියන 50යි කියනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
සැබෑ මට්ටම තීන්දු කරන්නේ මෙතුමාද, නැත්නම් ඒ කටයුත්ත, කර්මාන්තය කරන උදවියද?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමනි, එක එක කොම්පැනි තිබෙනවා නේ. චීන කොම්පැනි භාරගන්නවා. ඒ චීන කොම්පැනි මේ කටයුත්ත භාර ගත්තාට පස්සේ, සියයට සියයක් subcontracts කරන්නේ local companiesවලින්. ඒ local companiesවලට භාර දුන්නාට පස්සේ, -

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ගරු රවී කරුණානායක ඇමතිතුමා කිව්වා සූරියවැව ක්‍රීඩාංගණයට මෙච්චර මුදලක් ගිහින් තිබෙනවා කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. ඔබතුමා point of Order එකක් raise කරනවා නම් කරුණාකරලා ස්ථාවර නියෝගයේ අංකය කියලා එය ඉදිරිපත් කරන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා හරියට දැනගෙන point of Order එක ඉදිරිපත් කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා වාඩි වෙන්න. ඒක point of Order එකක් නොවෙයි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මට කියන්න පුළුවන් මෙයයි. පාරක් හදන්න කිලෝමීටරයකට රුපියල් බිලියන 10ක් වැය වෙනවා නම් ඒකට බිලියන 15ක් යනවා කියලා තමයි ගණන දීලා තිබෙන්නේ. ඒක award කරනවා. ඒ රුපියල් බිලියන 15 දුන්නාට පසුව වියදම් කරන්නේ බිලියන 10යි. ලංකාවේ කොම්පැනි තමයි අපට ඇවිත් කිව්වේ, "මෙන්න ඇත්ත වශයෙන්ම ගෙව්ව මුදල, අපි වියදම් කළ ප්‍රමාණය මෙච්චරයි" කියලා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කොහොමද එහෙම ප්‍රකාශයක් දෙන්නේ? මොකක්ද ඒ කොම්පැනිය?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒවා අපි කියන්නම්. විමර්ශන තුළින් අපි සොයාගත්ත දේවල් තමයි මම ඒ කිව්වේ. අපි ඒවා හෙළිදරවු කරන්නම්. ඒ ගැන බය වෙන්න එපා. සූරියවැව ක්‍රීඩාංගණය ගැන වගකීමකින් මම ඒ කාරණය කිව්වේ. ඒ වාගේම තමයි පාරවල් ගැනත් කියන්නේ.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඒ කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, අපි ඉදිරිපත් කරනවා. මේක පාර්ලිමේන්තුව මිසක් නගර සභාවක් නොවෙයි නේ.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු ඇමතිතුමනි, ඔබතුමා අසත්‍ය සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්න එපා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අසත්‍යයක් නොවෙයි මා කියන්නේ. තවත් ඕනෑ නම් කියන්නම්, මහින්ද රාජපක්ෂ කරපු වැඩ ටික. නාමල් රාජපක්ෂ මොනවාද කරලා තිබෙන්නේ? නාමල් රාජපක්ෂගේ සල්ලි කොහේද තිබෙන්නේ? [බාධා කිරීමක්] ක්‍රිෂ් සමාගම ගෙව්වේ අපිටද? නිකම් බොරුවට අවුස්සා ගන්න එපා, ගරු මන්ත්‍රීතුමනි. බැසිල් රාජපක්ෂ මොනවාද කරලා තිබෙන්නේ? "දිවි නැගුමේ" සල්ලි ගන්න කිව්වේ අපිද? මෙන්න මෙවැනි දේවල් නිසා තමයි අද රටේ ආර්ථිකය අමාරු තත්ත්වයකට තල්ලු වෙලා තිබෙන්නේ. සැබෑ වියදමට වඩා පෙන්නුවාම මොකද වන්නේ? රුපියල් දහයේ වැඩේට ලක්ෂ දහයක් කළාම ඇතිවන ප්‍රතිවිපාකය ඔන්න ඕකයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒකාබද්ධ පොඩි කල්ලියේ ඡායා කැබිනට් එකේ ඇමතිවරු දෙස බලන්න. ඒක වැඩ පටන් ගන්නත් කලින් අගමැති කොට උඩ ගිහින්. කෝ, ඡායා කැබිනට් එකේ මුදල් ඇමති? එයාගේ හුළං බැහැලා. මෙවැනි දේවල් ප්‍රකාශ කරලා, "මෙන්න ආර්ථිකය කඩා වැටෙනවා" කියලා අපට ලොකු මිථ්‍යාවක් පෙන්වන්න හදනවා. සැබෑ මට්ටමට වට්ටලා තිබෙන්නේ කවුද කියලා දන්න අපට කියන්න තිබෙන්නේ, අපි ඒවා නිවැරදි කරන්න පටන් අරගෙන තිබෙනවා කියලායි. මේක ලෙහෙසි ගමනක් නොවෙයි. රටක ආර්ථිකය හදන්න අවුරුදු ගණනාවක් යනවා. එය නැති කරන්න අවුරුදු දහයයි ගියේ. අන්න ඒ ආර්ථිකය තමයි අපි නැවත යථා තත්ත්වයට පත් කරන්න හදන්නේ.

අද බස්නාහිර, දකුණේ, උතුරේ, නැඟෙනහිර ආදී හැම කොනකම සංවර්ධනය තිබෙනවා. නමුත් අපි සද්ද කරන්නේ නැතිව ඒ වැඩකටයුතු කරගෙන යනවා. ලබන සඳුදා මොරගහකන්ද ව්‍යාපෘතියේ වැඩ නැවත පටන් ගන්නවා. එය අවුරුදු 10ක් නිස්සේ ඇනහිට තිබූ ව්‍යාපෘතියක්.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු ඇමතිතුමනි, මොරගහකන්ද ව්‍යාපෘතිය පටන් අරගෙන දැන් අවුරුදු පහකටත් වැඩියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමාගේ කථාවට බාධා කරන්න එපා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වාරිමාර්ග අමාත්‍යවරයා වශයෙන් සිටි කාලයේ මෙම ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යන්න නොදී එතුමාට කොතරම් හිරිහැර කළාද? වර්තමාන ආණ්ඩුව බලයට පත් වුණාට පසුව තමයි ඒ සඳහා අවශ්‍ය සල්ලි වෙන් කරලා එම කටයුතු කරගෙන යන්නේ. පසු ගිය ආණ්ඩුව ඒ සඳහා ලබා නොදුන් සල්ලි ප්‍රමාණය තමයි වර්තමාන ආණ්ඩුවෙන් ලබා දීලා තිබෙන්නේ. මේවා නොදන්නා ඊයේ පෙරේදා ආපු මන්ත්‍රීවරු තමයි මේ ශබ්ද කරන්නේ.

අපි ජීවන වියදම අඩු කිරීම මුල් කොට ගෙන භාණ්ඩ 15ක මිල අඩු කළා. අද බලන්න, සීනි මිල. රුපියල් 120ක් වුණු සීනි කිලෝවක මිල අපි රුපියල් 30කින් අඩු කළා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Duty එක වැඩි කළා නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Duty එක අඩු කළාද නැද්ද කියන එක නොවෙයි නේ ප්‍රශ්නය. අපි මිල අඩු කළා. දැන් අහනවා, වෙළෙන්දන් කීදෙනෙක් ඒ අඩු මිලට විකුණුවාද කියලා. අපි සතොස පාවිච්චි කරලා, හිතවත් තොග වෙළෙන්දන් පාවිච්චි කරලා දැන් මෙවැනි මිල තත්ත්වයක් ඇති කරලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කළ යුතුයි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ මට කියන්න පුළුවන්, රටේ ආර්ථිකය කොතරම් ශක්තිමත්ද කියන එක. අපි Treasury Bonds issue කළා. එමඟින් අපි රුපියල් මිලියන 1,000ක් තමයි ඉල්ලුවේ. රුපියල් මිලියන 1,000ක් ඉල්ලුවත් රුපියල් මිලියන 6,900ක් අපට ලැබුණා. පසු ගිය වතාවේ සියයට 6.8ක පොලියකට ගත් අවුරුදු 5 Treasury Bonds මේ වතාවේ සියයට 6.57ක පොලියකට ගන්න අපට පුළුවන් වුණා. මීට පෙර තිබුණේ පොලිය සියයට 7.2යි. මේ වතාවේ සියයට 6.57ක පොලියකට ලබා ගන්න පුළුවන් වුණා. ලංකාවේ විතරක් නොවෙයි, ලෝකයේම ආර්ථිකය කඩා වැටී තිබෙන අවස්ථාවක, ලංකාවේ බැරුරුම් ආර්ථික තත්ත්වයක් තිබෙනවා කියා පෙන්වන්න හැදුවත්, එදාට වඩා අද අඩු පොලියකට ගන්න පුළුවන් නම් එයින් හැඟෙන්නේ යම් විධියක සංවර්ධනයක්, විශ්වාසයක් තිබෙනවා කියන එක නොවේද? අපට අවශ්‍ය වන්නේ එයයි. දේශපාලන පොර පිටියේ ඒ පැත්තේ ඉඳන් කෑ ගහන එක සාමාන්‍ය සම්ප්‍රදායක්. නමුත් අපට කරන්න තිබෙන්නේ සැබෑ තත්ත්වය පෙන්වන එකයි. මේක පාට කරන්න තිබෙන ආර්ථිකයක් නොවෙයි. මේක ජාතික ආර්ථිකයක්. මේ ආර්ථිකය නංවන්න පාර්ලිමේන්තුවේ සියලුදෙනාම එකට එකතු වෙලා වැඩ කරන්න ඕනෑයි කියන එකත් මතක් කරමින්, මෙම විවාදයට සම්බන්ධ වන්නට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මා නවතිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.03]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටි කරුණානායක ඇමතිතුමා ගැලවිජ්ජාවක් මෙතැන පෙන්නුවා. යමක් හදන්න ගිය සත්‍ය වියදම එතුමා තමයි ඉදිරිපත් කරන්නේ. එතුමා කියනවා, "මෙය හදන්න ගියේ මේ ගණනයි" කියලා. නමුත් ඊට වඩා වියදම් කර තිබෙනවා. ඒ නිසා මෙතැන හොරකමක් සිද්ධ වෙලා තිබෙනවා. නමුත් ඔය ගණනට හදන්න පුළුවන් කියා මෙතුමා තක්සේරු කළාට ඒක හදපු මිනිහා එයට යන වියදම තක්සේරු කර තිබෙන්නේ ඊට වඩා වැඩියෙන්. ඒ නිසා මේ වාගේ නිකම් පදනමක් නැති කථාවලින් මේ රටේ සිද්ධීන් පිළිබඳව විග්‍රහයක් කරන්න බැහැ; මුදල් තත්ත්වය ගැන විග්‍රහයක් කරන්න බැහැ. ඒ ගැන මම ඊට වඩා එහාට කියන්න යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සීනිවල මිල පවත්වාගෙන යෑමට ශත 25 දක්වා තීරු බදු අඩු කළා. ශත 25 ගණනේ තීරු බදු ගෙවා සීනි ගෙන්නුවාට පසුව තීරු බදු ගණන වැඩි වෙනවා. මා මේ කියන්නේ අනාගත වාක්‍යයක්. තීරු බදු ගණන වැඩි වුණාට පසුව අර ශත 25 ගණනේ තීරු බදු ගෙවා සීනි ගෙන්වපු මිනිසුන්ට ප්‍රකෝටියක් ලාබ ලැබෙනවා. මෙන්න මේ තුළ තිබෙන රහස මොකක්ද? රේගු බදු අඩු වැඩි වන ආකාරය බලන්න. මීට පෙර වාහන සම්බන්ධයෙන් මේ ගැන ප්‍රශ්න කර තිබුණා. බදු අඩු කරනවා; වැඩි කරනවා. බදු වැඩි කළාට පස්සේ ඒ උදව්ය ඇවිල්ලා පැමිණිලි කරනවා; පැමිණිලි කළාට පස්සේ බදු අඩු කරනවා. එහෙම බදු අඩු කළාට පසුව ඒ දෙක අතර වෙනසේ වටිනාකම කොහේටද යන්නේ? මෙන්න මෙහෙම ප්‍රශ්න අහන්න පුළුවන්. නමුත් ඒ ප්‍රශ්න ඇසීමෙන් අපට කිසි දෙයක් ඔප්පු කරගන්න බැහැ.

ඊළඟට, මා විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණාවට මම එන්නම්. අය වැය හිඟය සියයට 7.4ක් දක්වා ඉහළ යනවා කියා දැනටමත් තක්සේරු කර තිබෙනවා. මේ අය වැය හිඟය සියයට 8ක් දක්වා ඉහළ යා හැකිය කියා විවාරකයෝ අද කියමින් සිටිනවා. මෙහි බරපතළ විපාක තිබෙනවා. අය වැය හිඟය සියයට 5ට ගෙනෙනවා කියලායි කිව්වේ. මේ නිසා උද්ධමනයට ඇති වන බලපෑම, පොලී රේට්ටුවට ඇතිවන බලපෑම නිසා බරපතළ විධියට ආර්ථිකයට රෝගී තත්ත්වයක් ඇති කර දෙනවා. මේ රජය භාර ගත්තු දවසේ ඉඳලා ආර්ථික කළමනාකරණයේ දුර්වලකම ඉතා හොඳින් පෙන්වන හොඳම දර්ශකය තමයි අය වැය හිඟය වැඩි වීම. දැන් ගරු සභාවට පැමිණි අපේ ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය ඇමතිතුමාටත් මේකට දායක වෙලා අපට කියන්න පුළුවන්, අය වැය හිඟය මෙසේ වැඩිවෙමින් තිබෙන්නට හේතු වුණු කරුණු මොනවාද කියලා. හැබැයි මේ ආණ්ඩුව අපට කියන්නේ, අපේ ආණ්ඩුව තිබුණු කාලය තමයි අභාග්‍යමත්ම කාලය කියලායි. මෙන්න, ඒ කියන අභාග්‍යමත් කාලයේ ඉලක්කම් කිපයක් !

2004වන විට වතු කම්කරුවන්ගේ දෛනික වැටුප තිබුණේ රුපියල් 200ට. 2014වන කොට ඒ දෛනික වැටුප රුපියල් 687.50ක් දක්වා වැඩි වුණා. ඒක සියයට 343ක පමණ වැඩි වීමක්. ඒ අභාග්‍යමත් කාලය! ඊළඟට තේවල මිල ගනිමු. 2004 රුපියල් 181යි. 2014වන කොට රුපියල් 462යි. ඒක සියයට 255ක වැඩි වීමක්. ඒ අභාග්‍යවත් කාලය! දැන් තමුන්නාන්සේලාගේ කාලයේ තත්ත්වය මොකක්ද කියලා අපි බලමු. 2014 තේ අපනයන ආදායම ඩොලර් මිලියන 1,627.3යි. 2015 වර්ෂය වන කොට ඒ ගණන වැටිලා තිබෙනවා ඩොලර් මිලියන 1,340.5 දක්වා. ඩොලර් මිලියන 285ක අඩු වීමක්. දැන් තේ ප්‍රචාරක මණ්ඩලය කියලා එකක් තිබෙනවා. ඒකට විශාල මුදලක් වෙන් කර තිබෙනවා. මේ ආණ්ඩුව භාර ගත් දා ඉඳලා ලංකාවේ තේ ප්‍රචාරණය සඳහා තමුන්නාන්සේලා මොනවාද කළේ? ලෝකයේ තේ නිපදවන හැම රටකම තේවලට වෙළෙඳ පොළවල් හොයන්න නිරන්තර තරගයක් තිබෙනවා. අපේ තේවලට වෙළෙඳ පොළ හොයන්නට තමුන්නාන්සේලා තේ ප්‍රචාරණ අරමුදල පාවිච්චි කරලා මේ අවුරුදු එකහමාරේ කරපු කාර්ය භාරය මොකක්ද කියලා අපි දැන ගන්න කැමැතියි.

ඊළඟ කාරණය තමයි, අපේ රජය සතුව තිබුණු වැවිලි සමාගම් යුඑන්පී ආණ්ඩු කාලයේ කොම්පැනිවලට දුන්නා. ඊට පස්සේ චන්ද්‍රිකා මැතිනියගේ කාලයේ එම කාලය තවත් දීර්ඝ කරලා දුන්නා. කොම්පැනිවලට නීතියක් ගෙනාවා, සේවකයන්ගේ මාසික වැටුප රුපියල් 2,500කින් වැඩි කරන්න ඕනෑ කියලා. නමුත්, එයාලා ගෙව්වේ නැහැ. අද උදේ මම ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයකුත් ඇහුවා. ඇයි එයාලාට විරුද්ධව නඩු දාන්නේ නැත්තේ? දැන් ඉතාමත්ම පුදුම වැඩක් කරලා තිබෙනවා. රජය නීතියක් පනවලා තිබෙනවා, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප රුපියල් 2,500කින් වැඩි කරන්න කියලා. කොම්පැනි කියනවා, -මේ ආණ්ඩුවේ ඉඩම් පරිහරණය කරන කොම්පැනි- "අපට ගෙවන්න බැහැ" කියලා. එතකොට ආණ්ඩුව කියනවා, "මෙන්න අපේ රාජ්‍ය බැංකුවලින් ණයක් දෙනවා" කියලා. කීයද? රුපියල් මිලියන 1,000ක්. මේ රජයේ ඉඩම් කළමනාකරණය කරන කොම්පැනිවලට රුපියල් මිලියන 1,000ක ණයක් සහන පොලියට දෙනවා, කම්කරුවන්ගේ වැටුප් ගෙවන්න. මෙවැනි ප්‍රතිපත්තියක් තමයි අද මේ ආණ්ඩුව ගෙනියන්නේ. මම මේ පෙන්වන්න හැදුවේ, කොම්පැනිවලට සහන දීම මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන බවයි.

කොහොමද මේ අය වැය හිඟය ආවේ? තමුන්නාන්සේලා කොම්පැනි බදු අඩු කළා. ඊළඟට ආදායම් බදු අය කරන තලය රුපියල් ලක්ෂ 5 ඉඳලා ලක්ෂ 25ක් දක්වා ඉස්සුවා. ඊළඟට, ආදායම් බදු අඩු කළා සියයට 15කට. මෙහෙම බදු අඩු කළාම ආණ්ඩුවේ ආදායම අඩු වනවා. දැන් ජනතාවගේ බෙල්ල මිරිකන්න හදනවා. සිල්ලර වෙළෙඳාමට, තොග වෙළෙඳාමට වැට් බදු නියම කළේ මොකටද? වැට් බදු නියම කළේ ඉතා කුඩා ව්‍යාපාරිකයන් වැට් බද්දට අල්ලන්නයි. ඉතා කුඩා ව්‍යාපාරිකයන් හා ඔවුන්ගෙන් බඩු මිලදී ගන්න මිනිසුන් වැට් බද්දට යට කරන්න තමුන්නාන්සේලා කොම්පැනිවල බදු අඩු කරනවා; ඉහළ ආදායම් මට්ටම්වල බදු අඩු කරනවා. ඊළඟට වැට් බද්ද ඊටත් වඩා පළල්ව මේ රටේ ජනතාවගෙන් හූරා ගන්නට තමුන්නාන්සේලා නීති ගෙනෙන්න හදනවා. නමුත්, ඒක කරන්න හැදුවෙත් පාර්ලිමේන්තුවට හොරා. උසාවියෙන් කිව්වා, "යහ පාලනය කුමක් වුණත් කරුණාකරලා නීතියේ රාමුව තුළ පාර්ලිමේන්තුව හරහා මේ යෝජනාව ගෙනෙන්න" කියලා. ඒක හරවලා එව්වා. අද ආපහු එය අධිකරණයේ තිබෙනවා. ඒක වෙනම කාරණයක්.

අධිකරණයේ තිබෙන කාරණය ගැන මම කථා කරන්න යන්නේ නැහැ. ඒ නිසා අපට පෙන්වන්න තිබෙන්නේ මොකක්ද? තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ මුදල් ඇමතිතුමා යම් ද්‍රව්‍ය ගණනාවක මිල පෙන්වලා ජීවන වියදම් බර අඩු කළායි කියලා කිව්වා. නමුත් සමස්ත ජීවන වියදම වැඩි වීමේ වේගය කොච්චරද කියන එක අද පත්තරේ තිබුණා. සියයට 7යි, ආහාරවල වියදම වැඩි වීම. මේකත් එක්ක අද සමස්ත ජීවන වියදම -සියලු දේවල්වල වියදම- වේගයෙන් වැඩි වීගෙන යන බවයි ඒ අනුව පෙනෙන්න තිබෙන්නේ. මෙයට එකතු වන්නට ඕනෑ, එදිනෙදා මිනිස්සුන්ගේ අවශ්‍යතාවන් සියල්ලක්ම. බස් ගාස්තුත් වැඩි කළා. මේ ඔක්කෝම එකතු වෙන්නේ මිනිස්සුන්ට. තමුන්නාන්සේලා පෙන්වනවා, රජයේ සේවකයන්ට රුපියල් 10,000 වැඩි කළාය; 2,500 වැඩි කළාය කියලා. නමුත් මේවා වේගයෙන් බාදනය වෙනවා, මේ අය වැය පරතරයත් එක්ක.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳමයි. "චීනයෙන් ණය ගත්තා, චීනයෙන් ණය ගත්තා" කියලා තමුන්නාන්සේලා කෑ ගහනවා. චීනයට තිබෙන ණය, මුළු ණය ප්‍රමාණයෙන් සියයට 23ක් පමණයි. ඒකත් මේ වෙලාවේ අපි වාර්තා කළ යුතුයි. ඊළඟට මේ ආණ්ඩුව රජයේ ආදායම් පිළිබඳ ප්‍රතිපත්තියක් ගැන කිව්වා. ඒක ගෙනෙනවා කිව්වා, වක්‍ර බදුවලින් සියයට 60ක් සහ සෘජු බදුවලින් සියයට 40ක් වන විධියට. වක්‍ර බදුවලින් සියයට 60ක් ගෙනෙනවා කිව්වා; සෘජු බදුවලින් සියයට 40ක් ගෙනෙනවා කිව්වා. අන්තිමට දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? තිබුණේ වක්‍ර බදුවලින් සියයට 80යි, සෘජු බදුවලින් සියයට 20යි. දැන් සියයට 85ක්ම වක්‍ර බදුවලිනුයි ගන්නේ. සියයට 15යි අද සෘජු බදුවලින් ගන්නේ. ඒකෙන් පෙන්නුම් කරන්නේ ඉහළ ආදායම් ලබන අයගෙන් බදු අය කිරීම මේ ආණ්ඩුව අඩු කර තිබෙන බවයි. මේ ආකාරයට මේ ආණ්ඩුව මේ රටේ සහන කප්පාදුවක් කරලා තිබෙනවා. මිනිස්සුන්ගේ ආදායම් ඇහිරීමක් කරලා තිබෙනවා. වියදම් වැඩි කිරීමක් කරලා තිබෙනවා. මිනිස්සුන්ගේ ජීවිත තුන් පැත්තකින් ඇවිළෙනවා.

වැවිලිකරයට පොහොර දෙනවාය කිව්වා. ඒ කියන්නා වූ මිල ගණන්වලට තවම නම් අපට පොහොර ලැබෙන්නේ නැහැ. තවම තේවලට පොහොර නැහැ. රබර්වලට පොහොර නැහැ. කිසිම පොහොරක් ඒ මිල ගණන්වලට ලැබෙන්නේ නැහැ. ඒවා ගැනත් කියලා තිබෙනවා. ඒ අතර තමුන්නාන්සේලා පොහොර සහනාධාරය හැම පැත්තකින්ම අහුරලා තිබෙනවා. පොහොරවල මිල වෙළෙඳ පොළේ වැඩි වෙලා තිබෙනවා. මේවා තමුන්නාන්සේලාට පාලනය කරන්න බැහැ. තමුන්නාන්සේලා ඉන්නේ වෙළෙඳ පොළවාදයේ. තමුන්නාන්සේලා කියන්නේ, "වෙළෙඳ පොළේ මිල උච්චාවචනය එහෙම වෙන්නට ඕනෑ. ඒකට ඔරොත්තු දෙන්න බැරි අය මැරෙන්න ඕනෑ. පුළුවන් අය නැඟිටින්න ඕනෑ." කියලායි. මේකයි තමුන්නාන්සේලාගේ වෙළෙඳ පොළවාදී ප්‍රතිපත්තිය. මේක තමයි අද ආර්ථිකය තුළ තමුන්නාන්සේලා පණ ගන්වා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.15]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ත්‍රී දූෂණයක් කරපු පුද්ගලයෙක් එහි සලකුණ වියකෙන්නටත් කලින් ස්ත්‍රී අයිනිවාසිකම් ගැන කථා කිරීම ලෝක විහිළුවක්. ඒ වාගේම ඉරාකය මතට බෝම්බ වැසි වස්සපු ඇමෙරිකා එක්සත් ජනපද ආණ්ඩුව ඊට පහුවැනිදාම මානව අයිතිවාසිකම් ගැන කථා කරනවා නම් ඒකත් ලෝක විහිළුවක්. ඒ වාගේම, අපේ රටේ ආර්ථිකය මේ තරම් ප්‍රමාණයකට කඩා වැටිටන්න, මේ තරම් ප්‍රමාණයකට බංකොලොත් කරන්න වැඩි දායකත්වයක් දක්වපු රාජපක්ෂ කල්ලියේ අයම රටේ ආර්ථිකය ගැන කථා කරන්න යෝජනා ගෙන ඒමත් ඒ වාගේම විහිළු සහගත තත්ත්වයක්.

ඔය කලින් කථා කරපු සූරියවැව ක්‍රීඩාංගණය ගැන විතරක් මම කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සූරියවැව ක්‍රීඩාංගණය හදන්න රුපියල් මිලියන 4,200ක් වියදම් කරලා තිබෙනවා. රුපියල් කෝටි 420ක්. නමුත් දැන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය කියනවා, "ඒකේ වියදම ඊට වඩා වැඩියි. රුපියල් කෝටි 520ක්වත් මේකට ලැබෙන්න ඕනෑ" කියලා. එතකොට කෝටි 520ක් දීලා සූරියවැව මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය හදලා තිබෙනවා. එහි pavilion එකේ වහලය හදන්න විතරක් රුපියල් කෝටි 60ක් වියදම් කරලා තිබෙනවා. මේ විධියට රටේ ජනතාවගේ මුදල් කාබාසිනියා කරපු අය තමයි ඔය කථා කරන්නේ. නමුත්, මේ ආර්ථික අර්බුදයට ඒ අය විතරක් නොවෙයි, ඊට කලින් හිටපු ආණ්ඩු සියල්ල වග කියන්න ඕනෑ. ඒ නිසා තමයි අපේ රාජ්‍ය ආදායම හිඳිලා තිබෙන්නේ. පසු ගිය අවුරුද්දේ රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,450ක් වෙන කොට, එයින් රුපියල් බිලියන 1,350ක් මේ රටේ ජනතාව මත බදු ගහලා උපයා ගන්න තැනට පත් කර තිබෙන්නේ මේ ආණ්ඩුව විසින්. ඒ වාගේම, මේ වන විට රුපියල් බිලියන 10,500ක ණය කන්දක් අපේ රට මත ගොඩ ගහලා තිබෙන්නේ ඔය ආණ්ඩුවල ක්‍රියාවලිය විසින්. අපේ ආනයනය වියදම ඩොලර් බිලියන 19.5ක් වෙලා, අපනයන ආදායම ඩොලර් බිලියන 11 දක්වා වන විශාල ආනයන අපනයන පරතරයක් රඳවා තිබෙන්නේ ඒ ආණ්ඩුවල ක්‍රියාවලිය විසින්. ඒ බර තමයි ජනතාව මත පැටවී තිබෙන්නේ.

මේ රටේ ජනතාව අවුරුදු පහෙන් පහට භාණ්ඩාගාරයේ භාරකාරත්වය එක් එක් ආණ්ඩුවලට පවරනවා. භාණ්ඩාගාරයට ජනතාව මුදල් එකතු කරලා දෙනවා. ඒ මුදල් ආරක්ෂා කරන්න, ඒ මුදල් පෙරළා ජනතාවගේ ප්‍රතිලාභ වෙනුවෙන් යොදවන්න කියලායි, ජනතාව ඒ වරම ලබා දෙන්නේ. නමුත්, කාලයක් තිස්සේම සිද්ධ වෙන ආකාරයට, ජනතාව විසින් ජනතාවගේ බදුවලින්, ජනතාවගේ දඩවලින්, ලෝකයෙන් ණය අරගෙන පුරවන භාණ්ඩාගාරයේ තිබෙන දේපල, නැතිනම් ජනතාවගේ මුදල් හොරකමට ලක් වෙලා තිබෙන බව අපි සෑම දෙනාම දන්නවා. රජයේ මුදල් දූෂණයට ලක් වෙලා තිබෙනවා; රජයේ මුදල් අවභාවිත වෙලා තිබෙනවා. කලින් එක පක්ෂයක් ආණ්ඩු කළා. අපි ඒ ආණ්ඩුවට චෝදනා කළා. ඊට කලින් තව පක්ෂයක් ආණ්ඩු කළා. ඒ ආණ්ඩුවටත් අපි චෝදනා කළා. දැන් හවුල් ආණ්ඩුවේ දෙගොල්ලන්ම එකතු වෙලා මේ වැඩේ කරනවා.

අගමැතිතුමා පාර්ලිමේන්තුවට කිව්වේ, රටේ ආර්ථික අර්බුදයක් තිබෙනවා කියලායි. ඔව්, ඒක ඇත්ත. වර්තමානයේ රටේ දැවැන්ත ආර්ථික අර්බුදයක් තිබෙනවා. ඒ ආර්ථික අර්බුදය හමුවේ ජනතාවට කිව්වේ, පටි තද කර ගන්න කියලායි. ඒ ආර්ථික අර්බුදය නිසා තිත්ත බෙහෙත් බොන්න කියලායි කිව්වේ. අපි අහන්නේ, ජනතාවට එහෙම කියන අය, ජනතාවට තිත්ත බෙහෙත් පොවන්න උත්සාහ කරන අය, ජනතාවට පටි තද කර ගන්න කියන අය, තමන්ගේ නිස්කාරණ වියදම්වලින් එකක් අඩු කර ගෙන තිබෙනවාද? මෙවැනි ආකාරයට සිදු වන මුදල් නාස්තිය අවම කර ගන්න භාණ්ඩාගාරයෙන් ක්‍රමවේදයන් හදලා තිබෙනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට අපේ අල්ලපු වැටේ තිබෙන කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබා ගත්ත building එක ගැන මම කියන්නම්. පාර්ලිමේන්තුව පහු කර ගෙන රාජගිරිය පැත්තට යන කොට, වම් අත පැත්තේ පාර අයිනේ තිබෙනවා "DPJ Towers" කියලා ගොඩනැඟිල්ලක්. පසු ගිය කාලයේ කෘෂිකර්ම අමාත්‍යාංශය තිබුණේ "ගොවිජන මන්දිරයේ."

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ඔබතුමාත් එක්තරා කාලයක කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යවරයා වෙලා හිටියා. ආංශික අධීක්ෂණ කාරක සභා පවත්වන්න කියලා කෘෂිකර්ම අමාත්‍යාංශයත්, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයත් එතැනින් ඉවත් කළා. අඩුම තරමින්, කෘෂිකර්ම අමාත්‍යාංශය, විකල්පයක් හැටියට තමන්ට යන්න පුළුවන් ලාභදායී ගොඩනැඟිල්ලක් පිළිබඳව සැලකුවේ නැහැ. නමුත් වනජීවී අමාත්‍යාංශය ගියා. මේ අමාත්‍යාංශ සෙත්සිරිපායට අර ගෙන යන්න කියලා යෝජනාවක් තිබුණා. එහෙම කරන්නේ නැතිව, කිසිදු ටෙන්ඩර් කිරීමකින් තොරව කුලී පදනම මත ලබා ගන්න උත්සාහ කළා. "ඩී.පී. ජයසිංහ සමූහ ව්‍යාපාරය" පාර්ලිමේන්තු සංකීර්ණය ආසන්නයේ තිබෙන ඒ ගොඩනැඟිල්ල හැදුවේ වාණිජ වෙළෙඳ සාජ්ජු සංකීර්ණයක් විධියට. ඒ වෙළෙඳ සංකීර්ණය කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව, පසු ගිය අප්‍රේල් මාසයේ 8වැනිදා ගිවිසුමක් අත්සන් කරලා ගත්තා. එහි මාසික කුලිය රුපියල් ලක්ෂ 210යි. අවුරුදු දෙකක -මාස 24ක- අත්තිකාරම රුපියල් ලක්ෂ 5,040යි. VAT එක සහ NBT එක්ක බදු එකතු වුණාම, රුපියල් ලක්ෂ 5,700ක අත්තිකාරමක් ගෙවලා තමයි තකහනියේ; තදියමේ කෘෂිකර්ම අමාත්‍යාංශය මේ ගොඩනැඟිල්ල ගත්තේ. වසර පහකට මේ ගොඩනැඟිල්ලට කුලිය විතරක් රුපියල් ලක්ෂ 13,350ක්, හෙවත් රුපියල් කෝටි 133.5ක්. මම මේ කිව්වේ, වර්ග අඩියකට රුපියල් 60 ගණනේ තිබෙන සේවා ගාස්තුව නැතිවයි. මේ වෙනුවෙන් අවුරුදු පහක් අවසන් වන විට රජයට දරන්න සිදු වන මුළු මුදල රුපියල් කෝටි 185ක්. මම අහන්නේ මොන සාධාරණයක්ද? ජනතාවට පටි තද කර ගන්න කියන කොට, ජනතාවට තිත්ත බෙහෙත් බොන්න කියන කොට, රුපියල් කෝටි 185ක් වියදම් කරලා අමාත්‍යාංශයකට ගොඩනැඟිල්ලක් ගන්න, මේ මොන යහපාලනයක්ද?

විගණකාධිපතිවරයා හෙළිදරවු කරලා තිබෙනවා, මහ බැංකු බැඳුම්කර වංචාව නිසා ආණ්ඩුවට ඒ වෙලාවේ සිදු වෙච්ච පාඩුව - අවුරුදු 30ක පාඩුව නොවෙයි.- රුපියල් කෝටි 167ක් බව. හැබැයි, කෘෂිකර්ම අමාත්‍යාංශයට ගත් මේ ගොඩනැඟිල්ලට විතරක් රුපියල් කෝටි 185ක් වැය කර තිබෙනවා. අඩු තරමේ මේ සඳහා විකල්පයක් සලකා බලන්න කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත් වුණේ නැහැ; ටෙන්ඩර් කරන්න මැදිහත් වුණේ නැහැ. අගමැතිතුමා පාර්ලිමේන්තුවට කිව්වා, "ආංශික අධීක්ෂණ කාරක සභාවලට ඉඩක් ඕනෑ." කියලා. ඉඩක් ඕනෑ කිව්වාට ආංශික කාරක සභා තවම හරියට ක්‍රියාත්මක වෙන්නෙත් නැහැ. ආංශික අධීක්ෂණ කාරක සභා පාර්ලිමේන්තු සංකීර්ණයේ කාරක කාමරවල රැස්වෙනවා. එහෙම රැස් වෙන්න හැකියාව තිබෙද්දී, අප්‍රේල් මාසයේ 8 වෙනිදා තකහනියක් මෙහෙම ගොඩනැඟිල්ලක් ගත්තේ ඇයි? ගොඩනැඟිල්ල ගත්තා විතරක් නොවෙයි, ගොඩනැඟිල්ලට පදිංචියට යන්න විධියක් නැහැ.

දැන් මාස තුනක් ගතවෙලා තිබෙනවා. ඒ මාස තුනට කුලිය විතරක් මාසයකට ලක්ෂ 210 ගණනේ රුපියල් ලක්ෂ 630ක් ගෙවා තිබෙනවා. එයින් එක දශමයක, එක බිම් අහලක ප්‍රයෝජනයක් අපි ගන්නේ නැහැ. ගොඩනැඟිල්ල ගත්තාට වැඩක් නැහැ. දැන් ඒ ගොඩනැඟිල්ලේ අමාත්‍යාංශය පවත්වාගෙන යන්න බැහැ. ඇයි? ඒක සාජ්ජු සංකීර්ණයක් විධියටයි හැදුවේ. අමාත්‍යාංශ ගොඩනැඟිල්ලක් විධියට නොවෙයි. ඒ ගොඩනැඟිල්ල ඒ ප්‍රදේශයේ තිබෙන නවීනතම සුඛෝපභෝගී ගොඩනැඟිල්ලක්. දැන් ප්‍රශ්නයක් තිබෙනවා, මෙය අමාත්‍යාංශයක් බවට පත් කරන්න නම් computers ඕනෑ; photocopying machines ඕනෑ; printers ඕනෑ. නමුත් මේවා භාවිත කරන්න ඒ ගොඩනැඟිල්ලේ තිබෙන විදුලි ධාරිතාව ප්‍රමාණවත් නැහැ. ඒ නිසා විදුලි ධාරිතාව තව ඇම්පියර් 60කින් වැඩි කරන්න ඕනෑ. වැසිකිළි ප්‍රමාණවත් නැහැ. කැළි කසළ බැහැර කරන ක්‍රමවේදයක් නැහැ. Lift එකේ යන්න පුළුවන් හත්දෙනෙකුට විතරයි. රටේම ඉන්න ගොවීන්ගේ ප්‍රශ්න විසඳන්න මැදිහත් වෙන කෘෂිකර්ම අමාත්‍යාංශයට ගොඩනැඟිල්ලක් අරගෙන තිබෙනවා, එහි තිබෙන lift එකේ යන්න පුළුවන් ගණන ප්‍රමාණවත් නැහැ. දැන් මේවා අලුතෙන් හදන්න ඕනෑ. ගිවිසුමේ තිබෙන විධියට ඩී.පී. ජයසිංහ සමාගම අඩු තරමේ එහි inventory එකේ තිබෙන බඩු ටිකවත් හරියට හදලා දීලා නැහැ. රථගාල ප්‍රමාණවත් නැහැ. ඒ නිසා අල්ලපු ඉඩම මාස 6කට කුලියට ගන්න සිද්ධ වෙලා තිබෙනවා.

අමාත්‍යාංශ ගොඩනැඟිල්ලක් හදනකොට ඒක partition කරන්න වෙනම ටෙන්ඩර් කැඳවන්න දැන් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා රුපියල් කෝටි 185 නොව මේ ගොඩනැඟිල්ල වෙනුවෙන් තවත් රුපියල් කෝටි ගණනක් එකතුවෙලා රුපියල් කෝටි 210ක පමණ වියදමක් දරන තැනකට මේ කෘෂිකර්ම අමාත්‍යාංශ ගොඩනැඟිල්ල දැන් සුදු අලියෙක් බවට පත් වෙලා තිබෙනවා. ටෙන්ඩර් කරන්නේ නැතුව ගොඩනැඟිල්ලක් අරගෙන දැන් වසා දමා තිබෙනවා. ගොඩනැඟිල්ල partition කිරීම, රථගාල් ඉදි කිරීම් ඇතුළු තවත් විවිධ අංගෝපාංග ඉදිකිරීම් සඳහා තවත් රුපියල් කෝටි ගණනක් වියදම් කරන්න වෙනවා. අපි අහන්නේ මොකක්ද, මේ යහ පාලනය? කවුද, මේ අමාත්‍යාංශය බාරව ඉන්නේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ කාලයෙන් කොටසක් මම ලබා ගන්නවා.

මේ අමාත්‍යාංශය බාරව ඉන්නේ හවුල් ආණ්ඩුවේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම්වරයායි. මේ එතුමා අමාත්‍ය ධුරය දරන අමාත්‍යාංශය. ඒ අමාත්‍යාංශයට මේ යහ පාලනයේ හැඩරුව පෙන්වන්න බැරි නම් මොකක්ද, මේ රටේ ජනතාවගේ බදු මුදල්වලට සිද්ධ කරන්නේ? මේ එක කාරණයක්. ඒ විතරක් නොවෙයි, හවුල් ආණ්ඩුවේ අනිත් භාගය ගනිමු. අනිත් භාගය තමයි එක්සත් ජාතික පක්ෂය. දැන් දවස් දෙක තුනක ඉඳලා රටේ මාධ්‍යවල ප්‍රධාන ප්‍රවෘත්තියක් බවට පත්වෙලා තිබෙනවා, අපේ සභානායකතුමා අමාත්‍ය ධුරය දරන මහාමාර්ග අමාත්‍යාංශයට උපදේශකවරු සහ මහජන සම්බන්ධතා නිලධාරීන් බඳවා ගැනීම පිළිබඳ කාරණය. මම දැක්කා, අදත් අපේ රටේ ප්‍රවෘත්ති පත්‍රවල ඒ පිළිබඳ කාටුන් හුඟක් පළවෙලා තිබෙන බව. "ඔන්න බබෝ ඇතින්නියා, කිරිඇල්ලේ නිදන්නියා දොයි දොයි දොයි" කියලා කාටුනයක් තිබුණා. මාර්ග සංවර්ධන අධිකාරියේ උපදේශක මණ්ඩලය දමා තිබෙනවා, එක් කෙනෙක් පාර පින්තාරු කරනවා; තව 15ක් 20ක් විතර උපදේශකයන් විධියට බලාගෙන ඉන්නවා. "සර් 45 දෙනෙකුගේ උපදෙස් ගන්නවාද? නැහැ බං පඩි දෙනවා" කියන ආකාරයට විවිධ කාටුන් ශිල්පීන් කාටුන් පළ කරලා තිබෙනවා. මොකක්ද, මේ? ඒ වාගේම මහාමාර්ග අමාත්‍යාංශයට අයත් මාර්ග සංවර්ධන අධිකාරියට මහජන සම්බන්ධතා නිලධාරීන් බඳවා ගත්තා. මම පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් ඇහුවා. ඇමතිතුමා කිව්වා, "නිලධාරීන් 45යි" කියලා. ඇමතිතුමා පාර්ලිමේන්තුවට අසත්‍ය ප්‍රකාශ තමයි කළේ. සභානායකවරයා, මහාමාර්ග ඇමතිවරයා පාර්ලිමේන්තුව නොමඟ යැව්වා. 45 නොවෙයි, මෙහි ඇත්ත ගණන 94යි. සම්පූර්ණ ලැයිස්තුව මා ළඟ තිබෙනවා. ලැයිස්තුවේ 45 දක්වා පමණයි ඇමතිවරයා කිව්වේ. ඉතුරු ටික කිව්වේ නැහැ. මේ 45නුත් එතුමා සඳහන් කරපු

ආකාරයට අපොස සාමාන්‍ය පෙළ දක්වාවත් -සමත් නොවෙයි.- ඉගෙන ගෙන තිබෙන්නේ 36යි. උසස් පෙළ දක්වා ඉගෙන ගෙන තිබෙන්නේ 9යි. මෙන්න තත්ත්වය. මේ කවුද? මේ ඇවිල්ලා කිරිඇල්ල ඇමතිතුමාගේ, මහාමාර්ග අමාත්‍යවරයාගේ මහජන සම්බන්ධතා නිලධාරීන් නොවෙයි. ඒ අයගේ අධ්‍යාපන සුදුසුකම් අපි අහන්නෙත් නැහැ. දෙක පාස් කෙනෙකුගෙන් තමන්ගේ වැඩේ කර ගන්නට ඇමතිට පුළුවන් නම් අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ රටේ මහාමාර්ග අමාත්‍යාංශයේ-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඔය උපුටා දක්වන ලේඛන වගකීමකින්ද ඉදිරිපත් කරන්නේ?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ඔව්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ලේඛන සියල්ල **සභාගත*** කරනවා.

මේ අමාත්‍යවරයාගේ මහජන සම්බන්ධතා නිලධාරීන් නොවෙයි. මේ මහාමාර්ග අමාත්‍යාංශයේ, මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති සඳහා පත් කළ මහජන සම්බන්ධතා නිලධාරීන්. මොවුන්ව තමයි මේ විධියට අරගෙන තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. කාවද මේ පත් කරලා තිබෙන්නේ? ලජ්ජාවේ බැහැ. කාවද මේ මහජන සම්බන්ධතා නිලධාරීන් ලෙස පත් කරලා තිබෙන්නේ. මම නැවත අවධාරණය කරන්නේ, එතුමාගේ PROලා නම් කමක් නැහැ. නමුත් මේ අමාත්‍යාංශයක PROලා. කවුද මේ ඉන්නේ? මේ ලැයිස්තුවේ ඉන්න අය කොණක ඉඳලා මම කියන්නම්. කේ.ඒ.එම්. නිජාම්, නාවලපිටියේ හිටපු නාගරික මන්ත්‍රී. හර්ෂ කුමාර සාසනතිලක, ගහඉහළ හිටපු විපක්ෂ නායක. කීර්ති රත්නායක, උඩපළාතේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. මිහිරාන් වීරරත්න, ගම්පොළ හිටපු නාගරික මන්ත්‍රී. දයා අනුර ශාන්ත, පන්විල හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. අකිල බණ්ඩාර ඒකනායක, පාතදුම්බර හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. හේරත් අඹන්වළ, යටිනුවර හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. සඳරුස් යාපා, යටිනුවර ප්‍රාදේශීය සභා මන්ත්‍රී. චම්පික නිලන්ත, යටිනුවර ප්‍රාදේශීය සභාවේ හිටපු විපක්ෂ නායක. මහමුද් හලීම්, උඩුනුවර හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. දිලියප් ද සිල්වා, උඩුනුවර හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්.පී. උඩයාර්, උඩුනුවර හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. ජී.එස්.එම්. ලියනගේ, හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, උඩුනුවර. පද්මා විජේසිංහ, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රී. මහේෂ් කොතලාවල, බණ්ඩාරගම හිටපු විපක්ෂ නායක. තව නම් තිබෙනවා. කුණ්ඩසාලේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.ඒ. අබේසිංහ. සිඩ්නි රත්නායක, පාතදුම්බර හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. අනුර ශාන්ත විමලසිරි, මහනුවර හිටපු නාගරික මන්ත්‍රී. අනුර අල්විස්, මහනුවර හිටපු නාගරික මන්ත්‍රී. විපුල ජයම්පති, උඩපළාත ප්‍රාදේශීය සභා මන්ත්‍රී. ජයන්ත වන්දලාල් සිල්වා, ගම්පොළ හිටපු නාගරික මන්ත්‍රී. හසිඩ් මොහොමඩ් මින්හාව්, ගම්පොළ හිටපු උප සභාපති. එස්. ක්‍රිෂ්ණපිල්ලේ, ගම්පොළ හිටපු නාගරික මන්ත්‍රී. ඩී.ජී. උපාලි, උඩපළාත හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.

මේ. තමුන්නාන්සේලාගේ පක්ෂයේ ප්‍රාදේශීය සභා, නගර සභා මන්ත්‍රීවරුන්ගෙන් පුරවපු ලැයිස්තුවක්. මේ වාගේ ලැයිස්තුවක මහජන සම්බන්ධතා නිලධාරීන් විධියට දමා රුපියල් 25,000 ගණනේ පඩි ගෙවනවා. ඒ විතරක් නොවෙයි. මහනුවර එක්සත් ජාතික පක්ෂ කාර්යාලයේ මහජන සම්බන්ධතා නිලධාරී විධියට වැඩ කරන සුනිල් ප්‍රනාන්දු නමැත්තාත් මේ ලැයිස්තුවේ ඉන්නවා, පඩි අරගන්නවා. මේකේ හිටියා ලාෆීර් කියලා පළාත් සභා මන්ත්‍රී කෙනෙක්. ඔහුගේ driver මේ ලැයිස්තුවේ ඉන්නවා, ඔහුගේ clerk මේ ලැයිස්තුවේ ඉන්නවා. ඔවුන්ට පඩි දෙනවා. එක්සත් ජාතික පක්ෂ ක්‍රියාකාරිකයන්ට පඩි දෙන තැනක් බවටද මේ අමාත්‍යාංශය පත් කරගෙන තිබෙන්නේ? මහජන සම්බන්ධතා නිලධාරීන් විධියට පත් කරගෙන රුපියල් 25,000ක පඩියක් දෙන මේ 94 දෙනා වැඩ කරන්නේ කොහේද කියලා අපි අහනවා. මේ අය කොහේද වැඩ කරන්නේ? මොකක්ද ඒ ගොල්ලන්ගේ duty එක, මොකක්ද ඒ ගොල්ලන්ගේ වැඩ රාජකාරිය, කවදාද සේවයට වාර්තා කරලා තිබෙන්නේ? කිසිම දෙයක් නැහැ. මේ අය වැඩ කරනවා කිරිඇල්ල ඇමතිතුමාගේ රුපියල් 25,000 පඩියට. මෙන්න ලැයිස්තුව.

ඒ විතරක් නොවෙයි. ඊළඟට උපදේශකයෝ දැම්මා. මහාමාර්ග අමාත්‍යාංශයේ උපදේශකයන් මිස කිරිඇල්ල ඇමතිතුමාගේ උපදේශකයෝ නොවෙයි. මහාමාර්ග අමාත්‍යාංශයේ මාර්ග සංවර්ධන අධිකාරියේ උපදේශකයන් මිසක ඇමතිවරයාගේ උපදේශකයන් නොවෙයි. ඇමතිවරයාගේ උපදේශකයන් ඕනෑ තරම් පත් කර ගත්තාට අපට ප්‍රශ්නයක් නැහැ. මේ, මහාමාර්ග අමාත්‍යාංශයේ මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති සඳහා පත් කළ උපදේශකයන්. මේ උපදේශකයන් කවුද?

මම එදා කිව්වා, "හාමුදුරු නමක් ඉන්නවා." කියලා. ඇත්ත. මේ ලැයිස්තුවේ 10වෙනි තැනට තිබෙන්නේ මම කියපු හලියාල පුරාණ විහාරයේ හාමුදුරුවන් වහන්සේගේ නම. නව කැලණි පාලම ව්‍යාපෘතියේ උපදේශකයෙක් විධියට උන්වහන්සේ පත් කරලා තිබෙනවා. මම එදා කිව්වා, " එකම පවුලේ දෙදෙනෙක් හිටියා" කියලා. නැහැ, ඒක වැරදියි. එකම පවුලේ තුන්දෙනයි. නො. 106, අරුඵපලවත්ත පාර, නුවර. ඔන්න ගෙදර. මරු ගෙදර. එක් කෙනෙක් සිරිල් සමරසූරිය. මෙයා තමයි තාත්තා. ඊළඟට ඉන්නවා සවින්ද සමරසූරිය. ඒ, පුතා. ආත්මා මධුමාධවී පීරිස්. ඒ, පුතාගේ නෝනා. මේ තුන්දෙනාගේම ඥාතියා කිරිඇල්ල ඇමතිතුමාගේ මාධ්‍ය අංශයේ. හරිද? හතරදෙනායි. ඒ තුන්දෙනා කිසි වැඩක් නොකර රුපියල් 65,000 ගණනේ රුපියල් 195,000ක් ගෙවල්වලට යනවා. Media unit එකේ වැඩ කරන කෙනාගේ තාත්තායි, අයියයි, අයියාගේ නෝනයි තුන්දෙනාම උපදේශකයෝ. ඔන්න! මට කියනවා, එක පවුලේ දෙන්නෙක් ඉන්නවා නම් පෙන්වන්න කියලා. මේ අය එකම address එකේ ඉන්න අය. අඩුම ගණනේ address තුනක් නම් ඒත් කමක් නැහැ.

ඊළඟට, පත් කරලා තිබෙන උපදේශකයෝ කවුද? මෙන්න අහගන්න.

- අරුණ අමුණුගම, වත්තේගම ප්‍රාදේශීය සභාවේ හිටපු විපක්ෂ නායක.
- සුමින්ද වික්‍රමසිංහ, මහනුවර නගර සභාවේ හිටපු විපක්ෂ නායක, නියෝජ්‍ය නගරාධිපති.
- විපුල ලාල් රණසිංහ, මහනුවර හිටපු නාගරික මන්ත්‍රී.
- ලලන්ත සංජීව පීරිස්, මහනුවර හිටපු නාගරික මන්ත්‍රී.
- ඉලාන් ආබ්දීන්, මහනුවර හිටපු නාගරික මන්ත්‍රී.
- ඩී.එම්.ටී.බී. දිසානායක, ගඟවට කෝරළයේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.
- අජිත් විජේබණ්ඩා, පන්විල හිටපු විපක්ෂ නායක.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

- හේමසිරි ධර්මරත්න, කුණ්ඩසාලේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.
- තිලක් දර්ශන රණසිංහ, හාරිස්පත්තුවේ හිටපු විපක්ෂ නායක.
- පී.බී. නුගලියද්ද, උඩපළාත හිටපු ප්‍රාදේශීය සභා සභාපති.
- ටිකිරිබණ්ඩා කුලසූරිය, ගලගෙදර හිටපු විපක්ෂ නායක.
- අසේල අමරසේන, උඩපළාත හිටපු විපක්ෂ නායක.
- ලක්මාල් ජයසිංහ, පාතදුම්බර හිටපු විපක්ෂ නායක, ප්‍රාදේශීය සභා මන්ත්‍රී.
- සුභාෂ් බණ්ඩාර යටවල, ගඟවට කෝරළයේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.
- මහින්ද බණ්ඩාර, ගඟවට කෝරළයේ හිටපු සභාපති.

එක්සත් ජාතික පක්ෂයේම අයම චෝදනා කරලා තමයි එතුමාව සභාපතිකමින් ඉවත් කළේ.

- නිමල් චන්ද්‍රසිරි, ගඟවට කෝරළයේ හිටපු විපක්ෂ නායක.

ඔන්න! උපදේශකයෝ ඉන්නේ 54යි. 54දොගෙන් මම කිව්වේ ප්‍රාදේශීය සභාවේ හිටපු අය විතරයි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු, විපක්ෂ නායකවරු. වැටුප් හා දීමනා රුපියල් 65,000යි. ඒ විතරක් නොවෙයි, පළාත් සභා මන්ත්‍රීවරුත් ඉන්නවා.

- චානක අයිලප්පෙරුම, මධ්‍යම පළාත් සභාවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක.

ඔන්න, එක උපදේශකවරයෙක්!

- එච්.එම්. ජයවීර, හිටපු පළාත් සභා මන්ත්‍රී.
- ඩී.ආර්.බී. රත්නායක, හිටපු පළාත් සභා මන්ත්‍රී.
- දිමුතු අබේකෝන්, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී.

නලින් මීගහගෙදර, හිටපු පළාත් සභා මන්ත්‍රී, චිත්‍රා මන්තිලකගේ ලේකම්.

පීටර් ගංගෙදර, මධ්‍යම පළාත් සභාවේ හිටපු සභාපති.

ඔන්න! මේ ටික ඉවර වුණාට පස්සේ උපදේශකකම් ඉවරයි. මේ විධියේ උපදේශක තනතුරුද දීලා තිබෙන්නේ? මහාමාර්ග අමාත්‍යාංශයේ, මාර්ග සංවර්ධන අධිකාරියේ උපදේශක විධියට පත් කරලා රුපියල් 65,000ක් ගෙදරට යවනවා. නමුත් ඒ අය කරන සේවයක් නැහැ. කිසිම සේවයක් කරන්නේ නැහැ. මේ අය මොන උපදේශයද දුන්නේ කියලා, කොහේද වැඩ කරන්නේ කියලා, මොන පැයද වැඩ කළේ කියලා හොයලා බලන්න. මොකුත් නැහැ. ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී පිළිගත්තා වාගේ, ඒක රටම දැන ගත්තා,- ඒ අය සියලු දෙනාම පසු ගිය ජනාධිපතිවරණයේදී තමන්ට වැඩ කරපු එක්සත් ජාතික පක්ෂයේ අය. පසු ගිය මහ මැතිවරණයේදී ඒ අයට දෙන්න කියලා තමයි කිව්වේ. හැබැයි, මතක තියාගන්න. මේ සිද්ධිය හෙළිදරවු වුණාට පස්සේ මහනුවර දිස්ත්‍රික්කයේ බොහෝ එක්සත් ජාතික පාක්ෂිකයින් මට කථා කළා. අපේ පක්ෂයේ අය නොවෙයි, එක්සත් ජාතික පාක්ෂිකයෝ කථා කරලා කිව්වා, "මේක තමයි මන්ත්‍රීතුමා ප්‍රශ්නය. ඇමති පස්සෙන් ගිය අයට විතරයි තනතුරු දීලා තිබෙන්නේ. සැබෑ එක්සත් ජාතික පාක්ෂිකයෝ රස්සා නොවෙයි බලාපොරොත්තු වෙන්නේ" කියලා. ජනාධිපතිවරණයේ දී ඔවුන් ඡන්දය දුන්නේ තමන්ගේ පක්ෂයේ නොවන කෙනෙකුට. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්ට. උත්පත්තියෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙකුට. එහෙම කෙනෙකුට එක්සත් ජාතික පාක්ෂිකයෝ කතිරය ගැහුවේ මොකටද? යහ පාලනය වෙනුවෙන්. ඒ අයගේ බලාපොරොත්තුව යහ පාලනය. මේ මොකද කරලා තිබෙන්නේ? තමන්ගේ කෙනෙකුට රුපියල් 65,000ක් දෙන්න උපදේශකකම්, මහජන සම්බන්ධතා නිලධාරිකම් පාවිච්චි කරලා තිබෙනවා.

අපි අහන්නේ, මේ යහ පාලනයද කියලායි. කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් රුපියල් කෝටි 200ක building එකක් ගන්නවා. ඒ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්. මේ, සභානායකවරයා, එක්සත් ජාතික පක්ෂයේ උප සභාපතිවරයා. ඔහු මේ ආකාරයට උපදේශකයෝ ගන්නවා. මේක මහින්ද චින්තනයෙන් කළා නම් ඒ අයට විවේචනය තිබෙනවා. හැබැයි, ඒ ගොල්ලෝ කරපු වැඩේ කරන්න නොවෙයි තමුන්නාන්සේලා බලයට පත් කළේ. 'මහින්ද චින්තන' කියන්නේ, මහින්ද රාජපක්ෂ මහත්මයා කල්පනා කරන විධිය. එයා කල්පනා කරන විධිය ඕනෑ එකක්. නමුත් මේ යහ පාලනයට ලෝකයේ නිශ්චිත නිර්වචනයක් තිබෙනවා. ජනතාව බලාපොරොත්තු වෙන්නේ ඒක. මෙවැනි ආකාරයට ජනතා මුදල් කොල්ල කෑම නොවෙයි ජනතාව බලාපොරොත්තු වෙන්නේ. තමුන්නාන්සේලාට ඕනෑ නම් තමුන්නාන්සේලාගේ පාක්ෂිකයන්ට මාසිකව කීයක් හරි දෙන්න. ඒවා දෙන්න සිරිකොතේ සල්ලිවලින්. ඒවා දෙන්න දයා ගමගේ මහත්මයාගේ කොන්ත්‍රාත් සමාගමෙන්. ඒවායේ රස්සාවලට දාන්න. එහෙම නැත්නම් මලික් සමරවික්‍රම මහත්මයාගේ garment එකට දාන්න. කටුනායක තිබෙන රවි කරුණානායක මහත්මයාගේ yard එකේ රස්සාවලට දාන්න. මේවා සිරිකොතේ මුදල් නොවෙයි. මේ, මේ රටේ මහා භාණ්ඩාගාරයේ මුදල්, ජනතාවගේ මුදල්. තේ දල්ල කඩලා, ඒකට බදු ගහලා මහා භාණ්ඩාගාරයට එන සල්ලි. කිරි ටික කපලා, ඒ කිරි ටිකට බදු ගහලා මහා භාණ්ඩාගාරයට එන සල්ලි. අපේ මිනිස්සු මුහුදු ගිහිල්ලා ඒකට වැදෙන බද්දෙන් මහා භාණ්ඩාගාරයට එන සල්ලි. ඒ සල්ලි වියදම් කරලා තමන්ගේ පාක්ෂිකයන්ට - එක පවුලකට - මෙච්චර වියදම් කරනවා. මම අහන්නේ, ලජ්ජා නැද්ද? මොකක්ද මේ? එක පවුලක් වෙනුවෙන් පෙනී පෙනී තිබියදී, මේ ආකාරයට කරන මේවා හිහන වැඩ.

මේවාට කියන්න වෙන වචන නැහැ. තමුන්නාන්සේලා මෙහෙම මිනිසුන්ගෙන් කොල්ල කනවා නම්, ජනතාව බලාපොරොත්තු වුණේ මේක නොවෙයි. ඒ නිසා මහින්ද රාජපක්ෂ මහත්තයා අවුරුදු 11ක් ජනාධිපතිකමේ ඉඳලා මහාමාර්ග ඇමතිකම් දරලා දැම්මේ 250යි නම් ඒක සාධාරණයිද? ඒක පෙන්වලා ඇමතිට මෙතරම් ප්‍රමාණයක් මාස 11න් දාන්න බැහැ. කොහොමද, මෙහෙම කරන්නේ? අධ්‍යාපන සුදුසුකමක් නැහැ. පාරවල් හදන B.Sc ඉංජිනේරුවන්ට GCE (O/L) සමත් නැති තමන්ගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීලා උපදේශකයන් විධියට දාලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ලජ්ජා නැතිව තමන්ගේ අධ්‍යාපන සුදුසුකම CV එකේ දාලා එවනවා. මම ළඟ CV එකක් තිබෙනවා. මේ තිබෙන්නේ. එක්කෙනෙක් තමන්ගේ අධ්‍යාපන සුදුසුකම දක්වා තිබෙනවා, "අපොස සාමාන්‍ය පෙළ දක්වා" කියා; වෙනත් සුදුසුකම් යටතේ කියා තිබෙනවා,"හෝටල් ක්ෂේත්‍රයේ කාමර පිරිසිදු කරන්නෙකු වශයෙන් අවුරුදු 8ක පළපුරුද්ද" කියලා. හෝටලයක වැඩ කිරීමේ සුදුසුකම මහා මාර්ග අමාත්‍යාංශයේ උපදේශකවරයෙක් වෙන්න සුදුසුකමක් වෙන්නේ කොහොමද? ලජ්ජා නැතිව තව ලියා එවලාත් තිබෙනවා. ඒවා අමාත්‍යාංශයෙන් අරගෙනත් තිබෙනවා. දැන් ඔවුන්ට පඩිත් දෙනවා. ඔන්න! මෙහෙම නේ හදලා තිබෙන්නේ. මේ ගොල්ලොන්ට ලියුම් ගහලාත් තිබෙනවා. මේ සියලු විස්තර අපි ළඟ තිබෙනවා. ඒ නිසා මේවා ප්‍රතික්ෂේප කරන්න බැහැ. මේවා ඇස් පනා පිට වෙච්ච සත්‍ය.

ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා හිනාවෙවී ඉන්නවා. මම හිතන්නේ, මේවා කාටවත් අනුමත කරන්න බැහැ. දැන් ඒ නිසා-

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩලික (කලානිති) හර්ෂ ද සිල්වා - විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාට තිබෙන්නේ තව විනාඩියක කාලයක් පමණයි කියලා තිබියදීත්, දැන් බොහෝ වෙලාවක් කථා කළා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්ඩලික (වෛද්‍ය කලානිති) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)

නැහැ, නැහැ. මම කාලය ඉල්ලා ගත්තා. කාලයේ ප්‍රශ්නයක් නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම දෙයක් සඳහන් කළ යුතුයි. මොකද, ඔබතුමා කරන බරපතළ චෝදනාවක් වශයෙන් එය එන්නේ. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා අරගෙන තිබෙන්නේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට වෙන් කරලා තිබුණු විනාඩි දහ අට.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්ඩලික (වෛද්‍ය කලානිති) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ කාලයයි ගත්තේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්ඩලික (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ සම්බන්ධයෙන් අපව දැනුවත් කළේ නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්ඩලික (වෛද්‍ය කලානිති) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)

කිව්වා, කිව්වා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ඔබතුමන්ලා දැනුවත් කරන්න ඕනෑ නැහැ, ඔබතුමන්ලා දෙන්නා කථා කරන්නේ නැතිව එතුමා කියන දේ අහගෙන හිටියා නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්ඩලික (වෛද්‍ය කලානිති) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ කාලය කොට කළාට වැඩක් නැහැ. මෙහෙම කළොත් ඔබතුමන්ලාගේ කාලයයි කොට වෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්ඩලික (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

මම ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය ඇමතිතුමාත් එක්ක රජය ගැන වැදගත් සාකච්ඡාවක් කර කර හිටියේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්ඩලික (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

ඒකට ඔව්වර කෑකෝ ගහන්න ඕනෑ නැහැ. ඔබතුමා කිව්වා නේ තව විනාඩියයි තිබෙන්නේ කියලා. අපි බලාගෙන හිටියා, විනාඩිය ඉවර වෙන කල්. අපි කථා කරපු එකට ඔබතුමා කියන්න ඕනෑ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

නැහැ. නැහැ. ඔබතුමා-

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්ඩලික (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

මම ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය අමාත්‍යතුමාත් එක්ක රජයේ වැදගත් කාරණාවක් ගැනයි සාකච්ඡා කරමින් හිටියේ. ඒක ඔබතුමාට අදාළ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ඒක මට අදාළයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්ඩලික (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔබතුමාට අදාළ නැහැ, මම ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය අමාත්‍යතුමාත් එක්ක කථා කර කර හිටියේ මොකක්ද කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ඒක මට අදාළයි. ඒක මට අදාළ වන්නේ ඔබතුමා මූලාසනයට චෝදනාවක් කරනවා, -

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්ඩලික (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔබතුමා අපට කට වහගෙන ඉන්න කියලා-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ඔබතුමා ඉස්සෙල්ලා මට ඇහුම්කන් දෙන්න. ඔබතුමාට ඒක ඇහුනේ නැති වෙන්න හේතුව තමයි, - [බාධා කිරීමක්] ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාගේ කථාවට තිබුණු කාලය විනාඩියකින් අවසන් වෙනවා කියලා මම කලින් කිව්වා. ඊට පසුව එතුමා ප්‍රසිද්ධියේම මේ ගරු සභාවට ඇහෙන්න කිව්වා,"ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ කාලය ලබා ගන්නවා" කියලා. ඒ කාලය තමයි මම ලබා දුන්නේ. ඔබතුමන්ලාගේ කථාව මට බලපාන්නේ මම මූලාසනය දරන නිසා වාගේම, කථාව කරන මන්ත්‍රීතුමා මගේ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නිසායි. ඔබතුමා ඒ අර්ථයෙන් ඉදිරිපත් කළාම එහි අනියම් චෝදනාවක් තිබෙනවා.

[ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා]

ඒක මම පැහැදිලි කළ යුතුයි. ඒක ඔබතුමාට ඇහුණේ නැති හේතුව තමයි මම පැහැදිලි කළේ.

ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කරන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

මේ කාර්යයම මීට කලිනුත් කරලා තිබෙනවා. මහා මාර්ග අමාත්‍යාංශය යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විධියට මෙහෙම බඳවා ගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් 2013 වසරේ කරන ලද විගණකාධිපති වාර්තාවක් තිබෙනවා. ඒ විගණකාධිපති වාර්තාවේ පැහැදිලිව සඳහන් කරනවා,"මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඕනෑ" කියලා. නමුත්, ඇමතිතුමා උත්තර දෙනවා,"මේක කොන්ත්‍රාත් පදනමින් කරලා තිබෙන නිසා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් අදාළ වෙන්නේ නැහැ" කියලා. විගණකාධිපති වාර්තාවෙන් ඒ අනුමැතිය ගිය ආණ්ඩුවෙන් ඉල්ලලා තිබෙනවා. එහෙම තිබියදී තමයි තමුන්නාන්සේලා මෙහෙම කරන්නේ. එම නිසා මම නැවතත් මතක් කරන්නේ, තමුන්නාන්සේලා මේ ආර්ථිකය ගොඩ ගන්නවා නම් පාර මේක නොවන බවයි. මෙහෙම ජනතාවට පටි තද කර ගන්න කියලා, ජනතාවට තිත්ත බෙහෙත් බොන්න කියලා භාණ්ඩාගාරයේ තිබෙන සොච්චමත් තමන්ගේ දේශපාලන හිතවත්කම් මත තමන්ගේ පක්ෂ යන්ත්‍රණය ශක්තිමත් කරන්න මේ විධියට යොදවනවා නම්, එය යහ පාලනය නොවෙයි කියලා අවධාරණය කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා කථා කරන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 13ක කාලයක් වෙන් වී තිබෙනවා.

[අ.භා. 2.39]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Foreign Affairs)

බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන සිදු වුණු දේ ගැන මම දන්නේ නැහැ. ඔබතුමා කල්පනා කරලා බලන්න මෙය සිද්ධ වෙන්නේ කොහොමද කියලා. මොකද, අපි මේ වෙලාවටයි කථා කරන්නේ කියලා අපට කියලා තිබෙනවා. අපි දෙවනුව කථා කරනවා, තුන්වෙනුව කථා කරනවා කියලා යම් කිසි ක්‍රමවේදයක් තිබෙනවා. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කථා කළාට පසුව කථා කරන්න මම සූදානම් වෙලා හිටියා. එතුමාගේ කථාවේ අවසාන විනාඩියක කාලයත් අවසන් වුණාම තවත් මන්ත්‍රීවරයකුගේ සම්පූර්ණ කාලය ඔබතුමා එතුමාට ලබා දුන්නා. ඒක නේ වුණේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම අහන්නේ, ඒකේ සාධාරණය මොකක්ද කියලායි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මම ඔබතුමාට ඒක පැහැදිලි කරන්නම්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඔව්. පැහැදිලි කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මන්ත්‍රීවරු තමන්ගේ පක්ෂයෙන් අවශ්‍ය කාලය වැඩිපුර අරගෙන කථා කිරීමේ සම්ප්‍රදායක් මේ ගරු සභාවේ තිබෙනවා. එයට උදාහරණයක් වශයෙන් මම කාරණයක් කියන්නම්. ආණ්ඩු පක්ෂයේ කථික ලැයිස්තුවේ මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමාගේ නම නැහැ. නමුත්, අද විවාදයේ වැදගත්කම සලකා එතුමාගේ නම මෙම කථික ලැයිස්තුවට අතරමගදී එකතු කරලා තිබෙනවා. ඒ අනුව, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා එතුමාට දෙවැනි කථාව ලබා දෙන්නේ ඔබතුමන්ලා හැමදෙනාගේම කාලය විනාඩි පහ, පහ අඩු කරලා. එතකොටත් ඔය කාරණය සිද්ධ වනවා. පාර්ලිමේන්තුවේ එවැනි සම්ප්‍රදායක් තිබෙනවා. ඒක පළමු කාරණයයි.

දෙවන කාරණය මේකයි. පිළිවෙළ අනුව ගත්තාම ආණ්ඩු පක්ෂයේ කථාවෙන් පසුව දෙවැනි කථාව තිබුණේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාටයි. නමුත් ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා තවත් රැස්වීමකට යන්න අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා තිබුණු නිසා එතුමාටත් අවස්ථාව ලබා දීලා තමයි ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දුන්නේ. පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව මෙතෙක් වැඩ කෙරී ගෙන ගිය විධියට තමයි ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාට අනෙක් මන්ත්‍රීතුමාගේ කාලය ලබා දුන්නේ, එතුමාගේ ඉල්ලීම මත. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් කාලයක් සේවය කරලා තිබෙන නිසා ඔබතුමා දන්නවා ඇති, සාමාන්‍ය වශයෙන් එවැනි දෙයක් සිදු වන බව.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

එහෙම නම් වෙනත් කමිටුවලට සම්බන්ධ වෙන්න අපටත් අවස්ථාව ලබා දෙන්න ඕනෑ. අපට ඒක කර ගන්න බැරි වුණා. ඒ පාඩුව දරා ගන්න අපට සිද්ධ වෙනවා. ඔබතුමාට තීරණ ගන්න පුළුවන්. නමුත් මට තිබෙන ප්‍රශ්නය ඊට වඩා එහා ගිය එකක්. මම ගරු ඇමතිතුමාත් එක්ක යම් කිසි දෙයක් ගැන සාකච්ඡා කළාම, ඒ සම්බන්ධයෙන් මට අණ දෙන්න ඔබතුමාට අවශ්‍යතාවක් නැහැ. ඒ බව කියලා තමයි මම කථාව පටන් ගන්න බලාපොරොත්තු වෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට ඒක ප්‍රකාශ කරන්න අයිතියක් තිබෙනවා. ඒ වාගේම මමත් ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි, ඔබතුමාට මම එවැනි දෙයක් කියන්න පෙලඹුණේ ඔබතුමාගේ ප්‍රකාශයේ තිබුණු ඇඟවුම මූලාසනයටත්, මන්ත්‍රීවරයෙක් වශයෙන් මටත් නුසුදුසු වන නිසා බව. නැත්නම් මම එවැනි ආකාරයේ මැදිහත්වීමක් කරන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා කථාව කරන්න, ඔබතුමාට ලැබිලා තිබෙන වෙලාව අනුව.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් අවුරුදු හයක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මමත් දකිනවා, මේ වැඩ කටයුතු

සිද්ධ වන ක්‍රමවේදය මොකක්ද කියලා. මූලාසනය භාරවන මන්ත්‍රීවරයාට අපි නොයෙකුත් විධියට අපේ අදහස් ඉදිරිපත් කරනවා. නමුත් මේ අවුරුදු හයටම ඔය පුටුවේ හිටපු කිසිම කෙනෙක් ඔය විධියට අපට කථා කරලා නැහැ. ඔබතුමා ඒ විධියට කථා කළේ ඇයි කියන එක පිළිබඳව මට ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් තමයි ඒ අවස්ථාවේදී කථා කරමින් සිටියේ. නමුත් ඔබතුමා අණ කරපු විධියට කිසිම කෙනෙක් අණ කරලා නැහැ, "ඇමතිතුමාට කථා කරන්න එපා, ඔයා මොනවාටද කථා කරන්නේ?" කියලා. අපි දැන් ඒක එතැනින් ඉවර කරමු. අපි වෙන වැඩකට නේ මෙතැනට ආවේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මූලාසනයත් සමඟ වාද කරන නිසායි මම මේ ගැන ඔබතුමාට නැවත වතාවක් පැහැදිලි කරන්නේ. ඔබතුමා විසින් අනියම් ඇඟවීමක් කරපු නිසා තමයි මම ඒ ගැන සැලකිලිමත් වෙලා ඒ ගැන අදහස් දැක්වුවේ. මෙය විවාදයක් වශයෙන් තවදුරටත් ඉදිරියට ගෙන යන්නේ නැතුව ඔබතුමාගේ කථාව කරන්න කියන ඉල්ලීම මා මූලාසනය වශයෙන් කරනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
අනියම් ඇඟවීම් වශයෙන් අපි හැම වෙලාවේම මුලසුනට අපේ අදහස් ඉදිරිපත් කරනවා. ඒ අදහස් ඉදිරිපත් කරන්න අපට ස්වාධීන අයිතියක් තිබෙනවා.

මෙතැන මූලික ප්‍රශ්නය ගැන කථා කරනවා නම්, අපේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා නම් ලැයිස්තුවක් කියා ගෙන ගියා. ඒක එහෙම නොවෙයි කියලා අදාළ ඇමතිවරයා පෙරේදා පාර්ලිමේන්තුවේදී සඳහන් කළා මම අහගෙන හිටියා. ඒකේ හරි වැරැද්ද මොකක්ද කියලා අපි දන්නේ නැහැ. දිගින් දිගටම ඒ චෝදනාව ඉදිරිපත් කළා, නම් කියෙව්වා, එක එක ඒවා කළා. මම හිතන විධියට ඇමතිවරයෙක් හැටියට ඒ ඇමතිතුමා මීට පෙර ඉතාම වගකීමෙන් ප්‍රකාශක් කළා, එහෙම දෙයක් නැහැ කියලා. මම දන්නේ නැහැ, මෙහෙම කරන එක සදාචාරාත්මකව කොච්චර හරිද කියලා. ඇමතිතුමා "නැහැ" කියලා තිබෙද්දීත් එතුමා ඒ විධියට කියා ගෙන ගියා. ඊට වඩා මට ඕවාට කියන්න දෙයක් නැහැ. ඒවා ඉදිරියේදී සාකච්ඡා කරලා විසඳාගන්න බලන්න. [බාධා කිරීමක්] Joke එකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ආර්ථිකයට අද අත් වෙලා තිබෙනවා කියලා මොවුන් කරන චෝදනා පිළිබඳව යම් කිසි විධියක විග්‍රහයක් කරන්නයි මා බලාපොරොත්තු වෙන්නේ. ඒ සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමා කථා කළා; ගරු කබීර් හාෂීම් ඇමතිතුමා කථා කළා. මූලික වශයෙන් අපි තේරුම් ගන්න ඕනෑ, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා මේ රට ගෙන ගිය පාරේ තව දුරටත් අපි මේ රට අර ගෙන ගියා නම් මේ අවස්ථාව වන විට මේ රටට වෙලා තිබෙන්නේ මොකක්ද කියලා. එදා කිව්වේ මොනවාද? විදුලි පුටුව ගැනයි කිව්වේ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති වුණොත් මහින්ද රාජපක්ෂ විදුලි පුටුවට ගෙන යනවා; ජීනීවා මානව හිමිකම් කොමිසමට ගෙන යනවා; හේග් එකට ගෙන යනවා; ජාත්‍යන්තර යුද අධිකරණයක් දමනවා; ඔන්න ඕවා තමයි කිව්වේ. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න. ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලා බාධා නොකර ඉන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
වචන දෙකයි, කිව්වේ. "විදුලි පුටුව" කිව්වා. "ජාත්‍යන්තර යුද අධිකරණය" කිව්වා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති වුණොත්, මහින්ද රාජපක්ෂ ගෙන ගොස් මරා දමාවි කියා කිව්වා. එහෙමයි කිව්වේ. එහෙම කියා තමයි කිව්වේ, "ඒ නිසා ඒ අයට ඡන්දය දෙන්න එපා, මට ඡන්දය දෙන්න. මම මේ ප්‍රශ්නය විසඳා ගන්නම්" කියා. ඒ අවස්ථාව වෙනකොට ලෝකයෙන් ආර්ථික සම්බාධක දමන තත්ත්වයකට තමයි, ලංකාව පත් වෙලා තිබුණේ. ඒ ක්‍රමවේදය ඉස්සරහට ගියා නම් මොකක්ද වෙන්නේ? ඇත්තටම ප්‍රශ්නයක් ඇති වෙනවා. නමුත් අද වෙනකොට ඔය "ජාත්‍යන්තර යුද අධිකරණ" කියන ඒවා සම්පූර්ණයෙන්ම අයින් කරලා. "විදුලි පුටුව" කියන ඒවා සම්පූර්ණයෙන්ම අයින් කරලා.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(මාණ්පුමිකු එස්.සී. මුත්තුකුමාරණ)
(The Hon. S.C. Mutukumarana)
අපිට රටේ ජීවත් වෙන්න බැහැ. බඩු මිල වැඩි වෙන එක ගැන කියන්න.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රමේෂ් පතිරණ)
(The Hon. (Dr.) Ramesh Pathirana)
රබර් මිල කීයද? වී මිල කීයද?

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උරුප්පිනර් ඉරුවර්)
(An Hon. Member)
අහගන්න, අහගන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ආර්ථික සම්බාධක දැම්මා නම් වෙන්නේ මොකක්ද කියා ඔබතුමන්ලාට හිතා ගන්න හරි පුළුවන්ද?

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රමේෂ් පතිරණ)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ඒ, දැම්මා නම් නේ. දැම්මේ නැහැනේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි මේ කියන්නේ. අපි ඒ ප්‍රශ්නයෙන් මේ රට බේරා ගත්තා. ඉස්සෙල්ලාම කල්පනා කරන්න, අද මේ රට ලෝකයත් එක්ක එකට සිටිය හැකි වැදගත් රටක් හැටියට, පිළිගන්නා රටක් හැටියට පත් කළේ කවුද කියා. එසේ පත් කළේ, මේ "මෛත්‍රීපාල සිරිසේන-රනිල් වික්‍රමසිංහ" ආණ්ඩුව කියන එක අමතක කරන්න එපා.

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
ජය වේවා!

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
බොහොම ස්තුතියි.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අතින් මොකක් හරි වැරදීමක් සිදු වුණා නම් සමාවෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ. නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා තමන්ගේ මූලික කථාව කරනවා නම් හොඳයි. මොකද, ඔබතුමාට ලොකු වේලාවකුත් ඉතුරු වෙලා නැහැ. ඉක්මනින්ම කථාවට ප්‍රවේශ වෙන්න. බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒකට කමක් නැහැ. මට ඕනෑ කථාවනේ, මම කරන්නේ. ඔබතුමාට ඕනෑ කථාව නොවෙයි, මම කරන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක හරි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මගේ කථාව සම්බන්ධයෙන් ඔබතුමා මට උපදෙස් දෙන්න ඕනෑ නැහැ.

ඔබතුමන්ලා ඔක්කෝම මුලින්ම දැන ගන්න ඕනෑ, ඒ තිබුණු ප්‍රවණතාව සම්පූර්ණයෙන් වෙනස් කරලා, ඒ ගමන් මාර්ගය වෙනස් කරලා තමයි, අද නැවතත් මේ රටේ මිනිසුන්ට ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කරලා තිබෙන්නේ කියන එක.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. BIMAL RATHNAYAKE left the Chair and THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA took the Chair.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ ආර්ථිකයේ ජයග්‍රහණ අපට අත් පත් කර ගන්න පුළුවන් වෙන්නේ, ජාත්‍යන්තර වශයෙන් අපේ රට ලෝකයත් එක්ක එකතු කළොත් පමණයි කියන එකයි මා කියමින් සිටියේ. ඒ සරල යථාර්ථය පිළිගන්න සූදානම් නැත්නම්, කිසිම විධියකින් මේ රට ආර්ථික වශයෙන් ගොඩනඟන්න හැකියාවක් නැහැ. ඒ නිසා අපි බැලිය යුත්තේ, ලංකාව ජාත්‍යන්තරය සමඟ වෙළෙඳ සම්බන්ධතා ඇති කර ගැනීමට, ඒවා තහවුරු කර ගැනීමට ඉස්සරහට ගෙන යන්නේ කොහොමද කියන එකයි. අපි උත්සාහ කළ යුත්තේ එයටයි. ඒ නිසා තමයි, අපේ රජයේ වැඩ පිළිවෙළ අප ක්‍රියාත්මක කළේ. අපි කොහොමද දේශපාලන වශයෙන් රාජ්‍ය තාන්ත්‍රික ලෙස ලෝකයේ අනෙකුත් රටවල් සමඟ සම්බන්ධතා තර කර ගන්නේ කියා අප කල්පනා කරන්න ඕනෑ. ඒ වාගේම අපි අපේ රට ඒ රාජ්‍ය තාන්ත්‍රික පාලම්වලින් ලෝකයත් එක්ක එකතු කරන්නේ කොහොමද කියා කල්පනා කරන්න ඕනෑ. අපිට වෙලා තිබුණේ මොකක්ද? අපිට යුරෝපයෙන් දීලා තිබුණු තීරුබදු රහිත අපනයන -duty-free access එක- සම්පූර්ණයෙන්ම අයින් කර තිබුණා. අපේ මාළු වෙළෙඳාම සම්පූර්ණයෙන්ම නවත්වා තිබුණා. අපිට ලෝකයත් එක්ක කරන්න තිබුණු වෙළෙඳාම බොහෝ සෙයින් අඩු වෙලා තිබුණා. අපි එක පැත්තකින් යුරෝපයත් සමඟ ඒ පරස්පරය ඇති කර ගත් වේලාවේ, ඉන්දියාව එක්කත් ප්‍රශ්න ඇති කර ගත්තා. චීනය විතරයි අපට හිටියේ යම්කිසි විධියකට හෝ ගනුදෙනුවක් කරන්න. නමුත් චීනයට අපේ අපනයනවලින් සියයට එකක්වත් විකුණා ගන්න හැකියාවක් තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට අවශ්‍යවෙලා තිබුණේ රාජ්‍ය තාන්ත්‍රික පාලම් ටික නැවතත් ශක්තිමත් කර ගන්නයි. ඒ රාජ්‍ය තාන්ත්‍රික පාලම් ශක්තිමත් කිරීම තමයි අපි මූලික වශයෙන් පළමුවැනි අදියර හැටියට ක්‍රියාත්මක කළේ. ඒ හරහා ඉන්දියාව, චීනය, ජපානය, සිංගප්පූරුව, යුරෝපය, ඇමෙරිකාව, අප්‍රිකාව ඇතුළු ලෝකයේ තිබෙන සියලුම රටවල් සමඟ එකතුවෙලා, අපට අවශ්‍ය ඒ රාජ්‍ය තාන්ත්‍රික පාලම් ටික නිර්මාණය කර ගන්න අද වනකොට පුළුවන්වෙලා තිබෙනවා. දෙවැනි අදියර හැටියට දැන් අපට අවශ්‍ය වෙන්නේ මේ නිර්මාණය කරපු රාජ්‍ය තාන්ත්‍රික පාලම් හරහා එක පැත්තකින් අපේ රටට ආයෝජන අරගෙන එන්නත්, අනික් පැත්තෙන් අනික් රටවලට අපනයන කරන්නත්. අන්න ඒක තමයි අපට කරන්න අවශ්‍යවෙලා තිබෙන්නේ. මේ පළමුවැනි සහ දෙවැනි අදියර කියන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න තමයි අපි මේ අවස්ථාවේදී උත්සාහ කරන්නේ.

ඊයේ ගරු අගමැතිතුමා මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කළා ඔබතුමියත් දකින්න ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒ ප්‍රකාශයේදී එතුමා කිව්වා, සිංගප්පූරුවේ ජනාධිපති සහ අගමැති සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුමක් ගැන සාකච්ඡා කළාය

කියලා. ඊයේ අපි ලංකාවේ මෙක්සිකෝ තානාපතිතුමිය පිළිගත්තා. මෙක්සිකෝ රට ලෝකයේ අනික් රටවල් සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුම් 45ක් අත්සන් කරලා තිබෙනවා. ඒ නිදහස් වෙළෙඳ ගිවිසුම් 45 හරහා තමයි ඔවුන් මෙක්සිකෝවේ ආර්ථික ජයග්‍රහණ ලබා ගෙන තිබෙන්නේ. සිංගප්පූරුව වාගේ රටක් ගත්තොත් සිංගප්පූරුව රටවල් 30 ගණනක් සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුම් 20 ගණනක් අත්සන් කරලා තිබෙනවා. කලාපීය සහ ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් හරහා අපේ ලංකාවේ ආර්ථික ශක්තිය ගොඩ නඟන්න අපිත් පුළුවන් තරම් උත්සාහ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා තමයි මම කිව්වේ අපි අදියර දෙකක වැඩ පිළිවෙළක් තමයි මේ ක්‍රියාත්මක කරන්නේ කියලා. පළමුවැනි අදියර හැටියට රාජ්‍ය තාන්ත්‍රික පාලම් අපි නිර්මාණය කළා; ශක්තිමත් කළා. දෙවැනි අදියර හැටියට තමයි ඒ නිර්මාණය කරපු රාජ්‍ය තාන්ත්‍රික පාලම් හරහා එක් පැත්තකින් ආයෝජනය ලංකාවට ලබා ගන්නත්, අනික් පැත්තෙන් ඒ රටවල්වලට අපනයනය කරන්නත් බලාපොරොත්තු වෙන්නේ. බොහොම ස්තුතියි.

[අ.භා. 2.54]

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දවසේ ආර්ථිකය පිළිබඳව කෙරෙන මේ සභාව කල් තබන අවස්ථාවේ විවාදයට මටත් එකතු වන්න ලැබීම ගැන මා විශේෂයෙන්ම සන්තෝෂ වනවා. ලංකාවේ ආර්ථික ක්‍රියාදාමය පිළිබඳව අපි අවුරුදු ගණනාවක් තිස්සේ කථා කළා. රටේ ආදායම වැඩි කර ගන්නේ කොහොමද, වියදම් අඩු කර ගන්නේ කොහොමද, සංවර්ධනයට අවශ්‍ය කරන මූල්‍ය පහසුකම් ටික ලබා ගන්නේ කොහොමද, බඩු මිල අඩු කරන්නේ කොහොමද, මිනිසුන්ට අඩු මිලකට බඩු ගන්න පුළුවන් වාතාවරණයක් සකස් කරන්නේ කොහොමද කියන කරුණු ගැන අපි සාකච්ඡා කළා. කොටින්ම කියතොත් මිනිසුන්ට කරදරයක් නැතිව ජීවත් වෙන්න පුළුවන් සමාජ වාතාවරණයක් හදන්නේ කොහොමද කියලා අපි අවුරුදු ගණනාවක් තිස්සේ කථා කළා. විපක්ෂයේ ඉඳලා අපිට ඕනෑ දෙයක් කියන්න පුළුවන්. හැබැයි, ආණ්ඩුවක් ගත්තාම ඒ දේවල් කරන්න ටිකක් අමාරු බව හැම දෙනාම තේරුම් ගනිමින් ඉන්නවා; හැම දෙනාම එය තේරුම් අරගෙනත් සිටිනවා.

ඇත්තටම අද අපේ රජයේ විය හියදම් පිළිබඳව සාමාන්‍ය මතයකට ආවොත්, 2010 වර්ෂයේ අපේ වර්තන වියදම තිබුණේ බිලියන 779ක්. හැබැයි, මේ වියදම කරන්න අපට බදු ආදායම හැටියට ලැබුණේ බිලියන 724යි. අපට වියදම් කරන්න තිබෙන ප්‍රමාණයට වැඩිය බිලියන 50ක, බිලියන 60ක විතර ප්‍රමාණයක් අඩුවෙන් තමයි අපි ආදායම ලබාගෙන තිබෙන්නේ කියන කාරණය ඒකෙන් බොහොම පැහැදිලියි. ඒ වාගේම 2011 වර්ෂයේ බදු ආදායම බිලියන 845යි. හැබැයි, එදා අපේ වියදම හැටියට තිබුණේ බිලියන 815යි. ඒක අපට පොඩ්ඩක් බේරා ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා.

ඊළඟට, 2012 අවුරුද්දේ අපේ ආදායම බිලියන 908යි. හැබැයි, අපට වියදම් වෙලා තිබෙනවා බිලියන 914ක්. ඊළඟට, 2013දී බිලියන 1005ක් බදු ආදායම වශයෙන් අපට ලැබිලා තිබෙනවා. හැබැයි, අපි වියදම් කරලා තිබෙනවා බිලියන 995ක්. ඒ අවුරුද්දේත් යම් ක්‍රමවේදයක් ඇති වෙලා යංතමින් පරතරය අඩුවෙලා තිබෙනවා. 2014දී අපේ ආදායම බිලියන 1,050යි. හැබැයි, බිලියන 1,051ක් වියදම් කරලා තිබෙනවා. 2015දී බදු ආදායම වශයෙන් අපට ලැබිලා තිබෙනවා බිලියන 1,355ක්. අපි වියදම් කරලා තිබෙනවා, බිලියන 1,335ක්. ආදායමට සාපේක්ෂව බැලුවාම, පළමු වතාවට අපේ වියදම් ප්‍රමාණයේ විශාල ඉතුරුවක් වෙලා තිබෙනවා, 2015 වර්ෂයේ. 2016 වර්ෂයේ ඇස්තමේන්තුව අනුව බිලියන 1,646ක් බදු ආදායමින් එකතු කර ගන්න අපි බලනවා. හැබැයි, අපට මුළු වියදම් හැටියට තිබෙනවා බිලියන 1,413ක්. අපි බලාපොරොත්තු වනවා, පළමුවැනි වතාවට බිලියන 200කට අධික ඉතුරුවක් මේ අවුරුද්ද ඇතුළත කරගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සාමාන්‍යයෙන් පවුලක් ගත්තොත් ඒ තුළ ජීවත් වන පුද්ගලයන්ට පවා ආදායම කොච්චරද, වියදම කොච්චරද කියන එක මතයි ඒ පවුලේ ආර්ථිකය ගැන නැත්නම් ඒ අය එදිනෙදා ජීවත් වෙන විධිය ගැන හිතන්න වෙන්නේ. ඒ විධියේම ක්‍රියාදාමයක් තමයි ආණ්ඩුවකත් ක්‍රියාත්මක වෙන්නේ. කොයි තරම් සහනාධාර ඉල්ලුවත්, කොයි තරම් සහනාධාර දුන්නත්, කොයි තරම් උද්ඝෝෂණ කළත්, ජීවත් වෙන්න බැහැයි කිව්වත්, පුළුවන් කිව්වත් අපට වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ, අපේ ආදායම් මාර්ග වැඩි කරගෙන වියදම් පාලනය කර ගැනීම සඳහා. මේ ක්‍රියාදාමය මත තමයි විවිධ ආකාරයට ආදායම් සොයා ගැනීම සඳහා ආණ්ඩුවක් වැඩ කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මධ්‍යකාලීන වාර්තාවක් විධියට ගෙනැල්ලා තිබෙන "වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2016" කියන මූල්‍ය දත්ත පිළිබඳ වාර්තාවෙන් මා කියන්න කැමැතියි, මේ තිබෙන වැඩ පිළිවෙළවල් රාශියක් ගැන. 2015 වර්ෂයේ පළමු කාර්තුවේ සියයට 4.4ක මූර්ත වර්ධනයක් තිබුණා. අපට 2016 වර්ෂයේ ඒක සියයට 5.5ක මූර්ත වර්ධනයක් කරා ගෙන යන්න හැකියාව ලැබුණා. විශේෂයෙන් මෙම වර්ධනයට මූල්‍ය සේවා, රක්ෂණ, තොග හා සිල්ලර වෙළෙඳාම වාගේම ආහාර හා පාන වර්ග ආදී විශාල ක්ෂේත්‍ර ප්‍රමාණයක් තිබෙනවා. ඒවායේ වර්ධනය මත අපේ මූර්ත වර්ධනය වැඩි වෙලා තිබෙනවා සියයට 4.4 සිට සියයට 5.5 දක්වා. 2015 අවුරුද්දේ අපේ රටේ පළමු කාර්තුවේ කර්මාන්ත අංශයෙන් සියයට 1.4ක වර්ධනයක් ලබා ගෙන තිබෙන අතර, එය 2016 වර්ෂයේ පළමු කාර්තුව වන කොට සියයට 8.3ක් දක්වා විශාල වර්ධනයක් අත්කර ගෙන තිබෙනවා. 2015 වර්ෂයේ පළමු කාර්තුවේ නිෂ්පාදන කටයුතුවල සියයට 5.4ක වර්ධනයක් හිමි කරගෙන තිබෙන අතර, යම් කිසි විධියකින් එය සියයට 5.9ක් දක්වා වැඩි වෙලා තිබෙනවා 2016 වර්ෂයේ. මෙය වාසිදායක තත්ත්වයක් විධියට අපි දකිනවා. කෙසේ වෙතත්, විවිධ අංශවල යම් පසුබෑමක් තිබෙන අවස්ථාත් තිබෙනවා. සමහර වෙලාවට අලුත් වර්ධන ඇති වෙලා තිබෙන තත්ත්වයකුත් තිබෙනවා.

විශේෂයෙන් අපි දන්නවා අපේ තේ නිෂ්පාදනය කිලෝ මිලියන 70 දක්වා පහළ වැටුණු බව. ඒ වාගේම රබර් නිෂ්පාදනය කිලෝ මිලියන 28.2 දක්වා සියයට 2.4කින් පහළ වැටුණා. හැබැයි, අපේ පොල් නිෂ්පාදනය සියයට 6.2කින් වර්ධනය වුණා. ඉදිකිරීම් කර්මාන්තය ගත්තොත් විශාල වර්ධනයක් තිබෙනවා. විශේෂයෙන් සිමෙන්ති සැපයුම සියයට 23.3කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා මේ කර්මාන්ත අංශය සියයට 62ක දායකත්වය දක්වන කොට. රෙදිපිළි හා නිම් ඇඳුම් අපනයනයෙන් සියයට 8.8ක වර්ධනයක් මේ 2016 පළමු කාර්තුවේ අපි ලබා ගෙන තිබෙනවා.

ඇත්තටම අපි මොන කථා කොයි විධියට කිව්වත් මූලික වශයෙන් අපි එක පැත්තකින් ආදායම් සහ වියදම් පාලනය කර ගන්න ඕනෑ. අනෙක් පැත්තෙන් අපේ අපනයන ආදායම වැඩි කරගෙන ආයනය වියදම අඩු කර ගන්න ඕනෑ. මේක කරන්න තමයි ආර්ථික විශේෂඥයෝ, මුදල් ඇමතිවරු එකතු වෙලා කටයුතු කරන්නේ. ආණ්ඩු පෙරළන්න, ආණ්ඩු හදන්න යන මේ සියල්ලටම අපට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ මේ නිසායි. කවුරු ආවත් මේ සමීකරණය එහාට මෙහාට කරනවා

[ගරු දයාසිරි ජයසේකර මහතා]

මිසක මේකේ rocket science එකක් නැහැ. වෙන කරන්න පුළුවන් දෙයක් නැහැ. මේකම තමයි අපි එහාට මෙහාට කරකවන්නේ. ඒ නිසා අපි සියලු දෙනාම මේක අවබෝධ කර ගෙන කථා කළොත් වටිනවාය කියලා මම විශ්වාස කරනවා. මොකද හේතුව, රටක් විධියට අපට විවිධ අර්බුද ප්‍රශ්න ආපු හැම වෙලාවේදීම ඒ සියලු තීරණ ගත්තේ රටේ ආදායම් වියදම් කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක කල්පනා කරලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව පොරොන්දු වුණා - මම නම් ඒක ඒ තරම් පිළිගන්නා කාරණයක් නොවෙයි.- රජයේ සේවකයන්ට රුපියල් 10,000කින් පඩි වැඩි කරනවාය කියලා. රුපියල් 10,000කින් පඩි වැඩි කිරීම කවුරුවත් ඉල්ලපු දෙයක් නොවෙයි. ඉල්ලුවේ රුපියල් 15,000කින් වැඩි කරන්න කියලායි. සාමාන්‍යයෙන් අපි ඉල්ලන කොට විශාල ගණනක් ඉල්ලනවා. හැබැයි, දෙන කොට දැන ගන්න ඕනෑ දෙන ප්‍රමාණය කොච්චරද කියලා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ රුපියල් 2500ක් විතර දීලා ෂේප් **වෙලා** නිකම් හිටියා. හැබැයි, මේ ආණ්ඩුව රුපියල් 10,000කින් පඩි වැඩි කරන්න කටයුතු කළා. කවදාවත් කවුරුවත් එහෙම කළේ නැහැ. ඒ නිසා ඒ ගැනත් ස්තුතිවන්ත වෙන්න ඕනෑ. හැබැයි, මේ රටේ සිටින රාජ්‍ය සේවකයන් ලක්ෂ 14න් ලක්ෂ කීයක් මේකට සන්තෝෂ වෙලා තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි. "රුපියල් 10,000කින් පඩි වැඩි කළා, අනේ පව්, මේ ආණ්ඩුවට බණින්න හොඳ නැහැ, අමාරුවෙන් තමයි ආණ්ඩුව දුවන්නේ" කියලා ආණ්ඩුවට බණින්නේ නැතිව ඉන්නේ කවුද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පඩි වැඩි කිරීම නිසා අපට තිබුණු වියදමට වඩා එක අවුරුද්දකට රුපියල් මිලියන 94,000ක් වියදම් කරනවා. ජනතාව කල්පනා කළා, රුපියල් 10,000ක පඩි වැඩි වීමක් ඕනෑ නම් මේ ආණ්ඩුව පෙරළන්න ඕනෑ කියලා. ඉතින් ආණ්ඩුව පෙරළුවා. දැන් රුපියල් 10,000ක පඩි වැඩිවීමකුත් ලැබෙනවා. රුපියල් 10,000කින් පඩි වැඩි වුණාම ආණ්ඩුවට ස්තුති කරලා අඩුම තරමින් ලිපියක්වත් එව්වේ මොන රාජ්‍ය සේවකයාද කියලා මම අහන්න කැමැතියි. දැන් මොකද කියන්නේ? දැන් කියනවා, රුපියල් 10,000ක් වැඩි වුණත් ජීවත් වෙන්න බැහැයි කියලා.

එක කාලයක රුපියල් 2,500නුත් ජීවත් වෙන්න ගණන් හැදුවා නේ. අපි ඔක්කොම ඒක දැක්කා නේ. රුපියල් 2,500න් ජීවත් වෙන්න බැරි වුණත් ගණන් හදලා පෙන්නුවා. කැත්තිමේ බත් එක කාලා රුපියල් 2,500න් ජීවත් වෙන්නේ කොහොමද කියලා අපේ බන්දුල ගුණවර්ධන ශූරීන් පෙන්නුවා. ඒක කොයි තරම් විහිළුවක්ද කියන එක එතුමාට තේරුණේ නැහැ. නමුත් ඒක විහිළුවක් කියන එක මුළු රටටම තේරුණා. හැබැයි, රුපියල් 2,500කින් මේ වැඩේ කරන්න පුළුවන් කියලා එතුමා කියලා දුන්නා.

දැන් රුපියල් 10,000කින් පඩි වැඩිවෙලාත් ඒක කර ගන්න බැහැ. දැන් මිනිස්සු කියන්නේ මොකක්ද? අපේ වාසුදේව නානායක්කාර මැතිතුමා කියන්නේ මොනවාද? අපේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කියන්නේ මොනවාද? ජීවත් වෙන්න බැහැයි කියනවා. අපිත් දන්නවා, ජීවත් වෙන්න අමාරුයි කියලා. ඒක මේ ආණ්ඩුවද, ගිය ආණ්ඩුවද, එන ආණ්ඩුවද කියලා නැහැ, ඔක්කොම ආණ්ඩුවල තත්ත්වය මේක තමයි. හැබැයි, ඒක තේරුම් ගන්නේ නැතිව සියල්ල මේකෙන් විසඳන්න පුළුවන් කියලා මිනිස්සු කල්පනා කරනවා නම්, වෙන ආදායම් මාර්ග ලබා ගන්නා ක්‍රමයකුත් සොයා ගන්න ඕනෑ.

අනෙක් පැත්තෙන් බැලුවොත්, දැන් වැටි එක වැඩි කර තිබෙනවා. එක වතාවක් වැටි එක සියයට 20 දක්වා වැඩි කර තිබුණා. ඒකට කවුරුවත් කථා කළේ නැහැ; ඒ ගැන කථා කරන්න කවුරුවත් උනන්දු වුණෙත් නැහැ; උද්ඝෝෂණත් නැහැ; මොකුත් නැහැ; සියයට 12ට තිබුණු වැටි එක සියයට 20 දක්වා එක පාරටම වැඩි කළා. එහෙම වැඩි කළේ කවදාද කියලා මම කියලා දෙන්නම්. දිනයවත් මතක තියෙන්න එපායැ. 2002 - 2003 තිබුණේ සියයට 10යි. 2004.12.31 වන විට වැටි එක සියයට 15ක් කළා. ඊට පස්සේ 2005.01.01 සිට 2005.12.31 දක්වා සියයට 10 ඉඳලා සියයට 18, 15 සහ 5 විධියට ගත්තා. ඊළඟට 2006.01.01 ඉඳලා 2006.12.31 දක්වා අවුරුද්දක් වැටි එක සියයට 20 දක්වා අර ගෙන ගියා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண*)
(The Hon. (Dr.) Ramesh Pathirana)
සේවාත් එක්කද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ඔක්කොම ටික. ඔක්කොම ටික එකතු කරලා. මේකේ වෙන කිසිම දෙයක් කරලා නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා කියන්නේ සිල්ලර වෙළෙඳාම ගැන. කලබල කරන්න එපා. ඉන්න, මම කියන්නම්. [බාධා කිරීමක්] ඒ විධියට වැටි එක සියයට 20ට ගෙනාවා. සියයට 20ට ගෙනෙන කොට [බාධා කිරීමක්] කලබල කරන්න එපා, අපේ ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමනි. පොඩ්ඩක් අහගෙන ඉන්න. අපි හැමදාම දන්නවා, අපේ ජයකොඩි මන්ත්‍රීතුමා හරියටම ජනතාවට උගන්වන එක්කෙනා නේ. ඒ නිසා අපි ඒක දන්නවා. ඒ නිසා කරුණාකරලා පොඩ්ඩක් ඉවසා ගෙන ඉන්න. මේ කථාව මම කිව්වේ වෙන කාරණයක් නිසා නොවෙයි. අපිත් මේවා බල බලා, මේවා ගැන කල්පනා කරලා තමයි වැඩ කටයුතුවලට අතගහන්නේ. ඒක මතක තියා ගන්න. මේ වැටි එක වැඩි කරන කොට 2009 නව ලක්ෂ ගණනකට තිබුණු බදු ෆයිල්ස් ගණන, එහෙම නැත්නම් ආදායම් බදු ගෙවන ප්‍රමාණය 2014 වන විට හාරලක්ෂ ගණනකට ආවා. ඇයි, එහෙම වුණේ? කරුණාකරලා ඔය කියන කටින්ම මට ඒකටත් උත්තරයක් දෙන්න කෝ. නව ලක්ෂ ගණනක්ව තිබුණු ආදායම් බදු ෆයිල්ස් ටික ලක්ෂ හතරකට අඩු වෙන කොට ඒකට වගකියන්නේ කවුද? ආදායම් සහ වියදම් අතර පරතරය ගැනයි මම කථා කරමින් සිටියේ. මට ඒකටත් උත්තරයක් කියන්න කෝ. ඒකට මොකුත් කියන්නේත් නැහැ. ඔය සිල්ලරද, සේවාද, භාණ්ඩද, මොනවා මතද බදු ගහන්නේ කියලා කියපු කට්ටිය මේකටත් කථා කරන්න ඕනෑ. නමුත් මේවාට කථා කරන්නේ නැහැ. ඒකයි මම කියන්නේ.

මේ බදු ගෙවන ප්‍රමාණය අඩු වෙන්න, අඩු වෙන්න අපට ලැබෙන බදු ආදායමත් අඩු වෙනවා. මේ වන විට ආදායම් බදු ප්‍රමාණය සියයට 14 සිට සියයට 9 දක්වා අඩුවෙලා තිබෙනවා. ලක්ෂ නවයයි ගණනක බදු ආදායම් ප්‍රමාණයක් තිබුණු බදු ආදායම් ෆයිල්, ලක්ෂ හතර දක්වා අඩු වෙලා තිබෙනවා. දැන් අපි ක්‍රියාත්මක කරන ක්‍රමවේදය මොකක්ද කියලා මට කියන්න. ඔක්කොම එකතු වෙලා සල්ලි ටිකක් ගෙනැල්ලා එක පාරටම මේකට දමනවාද, නැත්නම් මේ විධියට ජනතාවගෙන්ම බදු මුදල් අය කර ගෙන බදු ආදායම් වැඩි කරලා වියදම් සීමා කර ගන්නවාද? මොකක්ද කරන්නේ? එහෙම නැත්නම් අපි ණය ගන්න ඕනෑ. වර්තමානයේ අපේ ආදායම රුපියල් 100ක් වනකොට අපේ වියදම රුපියල් 113යි. අපේ ආදායම රුපියල් 100යි; වියදම රුපියල් 113යි. එතකොට ආර්ථිකයකට ඔරොත්තු දෙන්න පුළුවන්ද? අපි ආර්ථිකයක් හදන්නේ කොහොමද? අපි සහනාධාර දෙන්නේ කොහොමද? මේ සියල්ල කරන්න මේ වැඩ පිළිවෙළ අවශ්‍යයි.

දෙවන කාරණය තමයි, මා කිව්වා වාගේ රුපියල් 100ක් ලැබිලා, රුපියල් 113ක් වියදම් කරනකොට අපට සංවර්ධනය සඳහා යොදන්න තිබෙන මුදල් ටික නැති වන එක. එතකොට අපි විදේශවලින් ණය ගන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයයි තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
බොහොම ස්තුතියි.

රුපියල් 113ක් වියදම් කරන්න, ලැබෙන ආදායම මදි වනකොට අපි මොකද කරන්නේ? ණය ගන්නවා. ගන්න ණයවලින් සියයට 80ක් වියදම් කරනවා, පරණ ණය ටිකයි, වාරික ටිකයි ගෙවන්න. එහෙම තත්ත්වයක් දැන් රටේ තිබෙන්නේ. ඒක ගැන අරයාට ඇහිල්ල දික් කරලා, මෙයාට ඇහිල්ල දික් කරලා හරි යන්නේ නැහැ. අපි ගන්න ණයවලින් සියයට 80ක් ණය වාරිකයයි, පොලියයි ගෙවනකොට, තව ණය ගන්නවා හැර අපට යන්න වෙනත් මාර්ගයක් තිබෙනවාද කියලා කරුණාකරලා මට කියන්න. ඒ නිසා තමයි මේ බදු පැනවීම් සහ අනික් දේවල් කරන්නේ. ඒ කාලයේ සියයට 20 දක්වා බදු පනවන කොටත් මේ කථා කිව්වා. ඒ ගැන මේ පාර්ලිමේන්තුවේදී මා බොහොම පැහැදිලිව ඇති තරම් කථා කරලා තිබෙනවා. අපි කල්පනා කරලායි මේ ගැන කථා කළේ. අදත් අපි ඒ ගැන කල්පනා කරන්නේ ඒ විධියටයි. රටක ආණ්ඩුවක් පවත්වාගෙන යන්න නම් බදු පනවන්නේ නැතිව බැහැ. හැබැයි, මිනිසුන්ගෙන් සාධාරණව බදු අය කරන ක්‍රියාදාමයක් පිළිබඳ වැඩ පිළිවෙළක් අපට තිබෙන්න ඕනෑ. අපි මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේදී දිගින් දිගටම කථා කළා; රවි කරුණානායක ඇමතිතුමා එක්ක සාකච්ඡා කළා; අග්‍රාමාත්‍යතුමා එක්ක සාකච්ඡා කළා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපේත් අදහස්, යෝජනා ගණනාවක් ක්‍රියාත්මක කරනවා. අපි කියන්නේ ඒ කාරණා මත අපි යම් සංශෝධන කිහිපයකට යමු කියලායි. ඒ අනුව එකඟ වෙලා මේ වනකොට භාණ්ඩ 28කට යම් සහනයක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම සිල්ලර වෙළෙඳාම සම්බන්ධවත් සහනයක් ලබා දීලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තව තත්පරයක් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මේ නිදහස ලබා ගන්නවා වාගේම අනෙක් පැත්තෙන් මිනිසුන්ව පෙළන්නේ නැතුව බදු ආදායම වැඩි කරගෙන, ඒ මුදල් රටේ සංවර්ධනයට යොදා ගැනීම ගැනත් අපි කල්පනා කළ යුතුයි කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.
ඊළඟට, ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 3.09]

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් අද දින ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් විවාදයේදී මමත් අදහස් කිහිපයක් එකතු කිරීමට බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම මේ රටේ වර්තමාන ආර්ථික තත්ත්වය සහ අනෙකුත් කාරණා මුල් කරගෙන එතුමා ගෙන එන ලද ඒ යෝජනාව ගැන අප සියලුදෙනාම විශේෂ අවධානයක් යොමු කළ යුතුයි කියා මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. මොකද, අද තිබෙන වර්තමාන තත්ත්වය ගැන ඇත්ත පැහැදිලි කිරීමත්, ඒ වාගේම අනාගතයේදී අපි කොයි මාර්ග ඔස්සේද ගමන් කළ යුත්තේ, මේ රට සංවර්ධනය කරලා ජනතාව අපේක්ෂා කරන ඒ අලුත් රට අපි නිර්මාණය කරන්නේ කොහොමද කියන ඒ භූමිකාව අපි මේ අවස්ථාවේදී සකස් කර ගන්න ඕනෑය කියන මතයේ මා ඉන්නවා.

එතුමන්ලා ප්‍රකාශ කළා, අද වන කොට අපේ ආර්ථිකය කඩාගෙන වැටිලාය, අද ජනතාව කන්න නැතුව ඉන්නවාය, මේ රජය කිසිම වැඩ පිළිවෙළක් නැතිව යම් යම් කටයුතු ක්‍රියාත්මක කරනවාය කියලා. අද අපි සියලු දෙනාගේම මේස උඩ තිබෙනවා, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව. මට ඉහතදී කථා කරපු ගරු දයාසිරි ජයසේකර අමාත්‍යතුමාත් සඳහන් කළ පරිදි එම වාර්තාවට අනුව 2016 වසරේ පළමු කාර්තුවේ අපේ ආර්ථික වර්ධන වේගය සියයට 5.5ක් වෙලා තිබෙනවා. පළමුවන කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සියයට 5.5ක් වශයෙන් තිබියදී, මේ ආර්ථිකය කඩාගෙන වැටෙන්නේ කොහොමද කියන එක පිළිබඳව අප සියලුදෙනාටම ප්‍රහේළිකාවක් වෙනවා. එක්කෝ එය දන්නේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා සහ අපට රුපියල් 2,500න් ජීවත් වෙන්න උගන්වපු ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමන්ලා පමණක්ද, නැත්නම් මේකේ මොනවා හෝ වෙනත් අභිරහසක් තිබෙනවාද කියා ඇත්තටම අප සියලු දෙනාම හොඳට හිතන්න ඕනෑය කියන කාරණය තමයි මම මතක් කරන්නේ. මේ සියයට 5.5ක ආර්ථික වර්ධන වේගය ආවේ කොහොමද කියාත් අපේ ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා විග්‍රහ කළා. විශේෂයෙන්ම අපේ කර්මාන්ත අංශය සියයට 8.3කින් වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම සේවා අංශය සියයට 4.9කින් වර්ධනය වෙලා තිබෙනවා. ඉදිකිරීමේ අංශ, මූල්‍ය සේවා, රක්ෂණ, තොග හා සිල්ලර වෙළෙඳාම ඒ සඳහා විශේෂ දායකත්වයක් දීලා තිබෙනවා.

අපි 2015 වර්ෂය අරගෙන බලමු. එම වසරේ පළමු කාර්තුවේ වර්ධන වේගය සියයට 4.4යි. ගෝලීය ආර්ථික තත්ත්වයේ මෙවැනි ප්‍රශ්නයක් තියෙන කොට, චීනයේ ආර්ථික වර්ධන වේගය අඩු වෙන කොට, ඒ වාගේම දියුණු වන රටවලින් මූල්‍ය නැවතත් ඇමෙරිකාව වැනි රටවලට ගලාගෙන යද්දිත්, අප මේ වාගේ වර්ධන වේගයක් සටහන් කිරීම සුවිශේෂී කාරණයක් බව මම මේ අවස්ථාවේදී පෙන්වා දෙනවා. කවුරු මොනවා කිව්වත්, අප මේ රට භාර ගන්න කොට රට ණය උගුලක පැටලිලායි හිටියේ.

විශේෂයෙන්ම සහනදායී සහ සහනදායී නොවන ණය ගැනීම නිසා ගිය ආණ්ඩුව කාලයේ අපේ රටට විශාල වෙනස්කම් රාශියකට මුහුණ දෙන්න සිද්ධ වුණා. 2000 වර්ෂය ගත්තොත්, සියයට 98.7ක් සහනදායී ණය ලෙසයි ලංකාව අරගෙන තිබුණේ. නමුත්, මේක ක්‍රම ක්‍රමයෙන් වෙනස් වෙලා 2014 වර්ෂය වන විට මේ සහනදායී ණය ප්‍රතිශතය සියයට 47.9කට අඩු කරන්න මහින්ද

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

රාජපක්ෂ මැතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට සමත් වුණා. අපේ සහනදායී නොවන ණය සියයට 52.1ක් හැටියට වැඩි වුණා. මේ ඕනෑම කෙනෙක් දන්නවා සහනදායී නොවන ණය වෙනුවෙන් අපට විශාල මුදලක් ගෙවන්න සිද්ධ වුණු බව. ඒ විධියට ඒ කාලයේ අපේ ණය බර විශාල පරිවර්තනයකට ගිහින් ඒ බර ජනතාව මත පැටෙව්වා. මොකද, මේ ණයවලට ගෙවන්න වන්නේ ජනතාවටයි. කවුරු මොනවා කිව්වත්, කවුරු මොනවා කැරකුවත් ජනතාවගේ බදුවලින් තමයි මේ ණය ගෙවන්නේ. ඒ ණය අරගෙන මොනවාද කළේ කියන එක තව වෙනම කථාවක්.

සූරියවැව ක්‍රීඩාංගණය හැදුවේ කොහොමද කියා අපේ මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමා අද මේ සභාවේදී කියා දුන්නා. එම ක්‍රීඩාංගණයේ තක්සේරු මුදල රුපියල් මිලියන අටසිය ගණනයි කියා එතුමා කිව්වා. නමුත්, රුපියල් මිලියන 4,500ක් වියදම් කර තිබෙනවා. ඒ වාගේම මත්තල ගුවන් තොටුපළ හදන්න ගිහින් මොනවාද කළේ? එහි මාසික ආදායම රුපියල් 16,000යි. මත්තල ගුවන් තොටුපළට වියදම් කළ මුදල කීයද, හම්බන්තොට වරායට නැව් කීයක් ආවාද, වැඩි මුදලක් දමලා මාර්ගවලින් කොයිතරම් මුදලක් ගසා කෑවාද කියා මේ ගරු සභාවේ මීට කලින් කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා පෙන්වා දුන්නා. ඒ වාගේම එතුමන්ලා කිව්වා, අපේ රුපියලේ අගය එන්න එන්නම පහත වැටුණාය කියා. අපේ රුපියලේ අගය පහත වැටිලා ඉදිරියේදී එම අගය තව තවත් පහත වැටිලා ඩොලරය රුපියල් 200ටත් යයි කියා කිව්වා. නමුත්, අපේ රුපියලට වෙලා තිබෙන්නේ මොකක්ද කියා අපි දැන් සොයා බලමු.

අපි පිළිගන්නවා, 2015 වර්ෂයේදී රුපියල සියයට නවයකින් අවප්‍රමාණය වුණාය කියන එක. 2016 වර්ෂයේදී රුපියල සියයට දශම 82කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ජනවාරි මාසයේ තිබුණු ගණනටම වාගේ රුපියලේ අගය තිබෙනවා. නමුත් 2015 වර්ෂයේදී මැලේසියාවේ ව්‍යවහාර මුදල සියයට 19කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඉන්දුනීසියාවේ සියයට 9.1කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. සිංගප්පූරු ඩොලරය සියයට 6.7කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඒ වාගේම ඉන්දියානු රුපියල සියයට 4.6කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතාව හා ඒවායේ තිබුණු ගැටලු නිසා, චීනයේ ආර්ථික වර්ධන වේගය පහළ බැසීම නිසා, ඇමෙරිකාවේ පොලී අනුපාතය ඉහළ දැමීම නිසා සංවර්ධනය වන රටවල මුදල් නැවත ඒ ප්‍රදේශවලට ගලා ගෙන යනවාය කියා කොච්චර කිව්වත්, විපක්ෂයේ සමහර උදවිය ඒක පිළිගත්තේ නැහැ.

බලන්න අද වෙනකොට කියනවා, අපේ ආණ්ඩුව මේ රටේ ජනතාවගේ අමාරුකම් කෙරෙහි කිසිම අවධානයක් යොමු කරන්නේ නැහැ කියා. එහෙම නම් අපට කියන්න සිද්ධ වනවා, එදා මොකක්ද කළේ කියා. එදා ජනතාව තෙල් මිල අඩු කරන්නටය කිව්වාම, ඒ ධීවර ජනතාවට වෙඩි තබා එක් අයෙකු මරා දැම්මා. කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ උද්ඝෝෂණය කරන ජනතාවට වෙඩි තබා එක් අයෙකු මරා දැම්මා. ඒ වාගේම වතුර දෙන්න කියා ඉල්ලූ ජනතාවට වෙඩි තබා ඒ අය මරා දැමූ කට්ටිය අද මෙතැන ඇවිත් ජනතාව ගැන කථා කරන්නට සැරසෙනවා.

අපි රාජ්‍ය සේවකයාට රුපියල් දහ දාහකින් පඩි වැඩි කළාය කියන එක අද ඒ අයට අමතකයි. ජීවන වියදම පහත දාන්නට අප පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්වල මිල අඩු කළාය කියන එක අද ඒ අයට අමතකයි. අප බලයට ඇවිත් සුළු කාලයකින් අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පහළ දමන්නට කටයුතු කළ බව ඒ අයට අමතකයි. ජනතාව ගැන සිතා ආණ්ඩුවක් හැටියට දෙන්නට පුළුවන්තරම් සහන දෙන්නට අපි කටයුතු කර තිබෙනවා.

රාජ්‍ය නිලධාරීන් අවතක්සේරු කර, රාජ්‍ය නිලධාරීන්ට වැඩ කරන්නට බැරි ආකාරයට අප කටයුතු කරනවාය කියා විපක්ෂයෙන් චෝදනා කරනවා. නමුත් අප ඒ අයටම මතක් කර දෙනවා, රාජ්‍ය සේවකයන් ගස් බැන්ද යුගයක් මේ රටේ තිබුණු බව. අගවිනිසුරුතුමියව දවසෙන් දෙකෙන්- [බාධා කිරීමක්]

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)
ඔය පැත්තේ නේ.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ආ කොයි පැත්තේද ඉන්නේ? ඔබතුමිය ඇවිල්ලා පොඩ්ඩක් පෙන්වන්න කෝ.[බාධා කිරීමක්] ඔව්. ගස් වටේ දුවන එකක් නොවෙයි, ගස් බැන්ද එකක් තියෙන්නේ.[බාධා කිරීමක්] ඔබතුමියට පොඩ්ඩක් පැටලිලා ඇති. ගස් වටේ දුවන එකයි, ගස් බඳින් එකයි පොඩ්ඩක් වෙනස්. [බාධා කිරීමක්] අද කියනවා, අපි රණවිරුවන්ට අපහාස කරනවාය කියා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
නමුත් අපි දැක්කා, මේ අය පොන්සේකා මැතිතුමාට කොහොමද සැලකුවේ කියන එක. [බාධා කිරීමක්] අපේ දොස්තර මහත්මයකුත් ඉන්නවා. පොඩ්ඩක් බෙහෙත් ටිකක් අරගෙන එන්න මෙහාට. [බාධා කිරීමක්] කමක් නැහැ. දොස්තර මහත්මයාට බෙහෙත් ටිකක් තමන්ටම දී ගන්නට පුළුවන් නේ. [බාධා කිරීමක්] කමක් නැහැ. එතුමන්ලාටම සිනහ යනවා තමයි මේවා කියනකොට.

අප අද යම් කිසි වැඩ පිළිවෙළකින් රට ඉස්සරහට ගෙනයන්න හදන කොට, විශේෂයෙන්ම ගෝලීය ආර්ථිකයට අපේ රට නැවත බද්ධ කරන අවස්ථාවට පැමිණ තිබෙන කොට, එදා අපි සතුරු කර ගෙන නැතිකර ගත් ජාත්‍යන්තර සබඳතා නැවතත් ඇති කරගෙන, නැවතත් වැදගත් රටක් හැටියට මේ රට ලෝකයේ හොඳ තැනකට ගෙනියන්නට හදනකොට සමහර අයට එයින් අමාරුවක් තිබෙනවාය කියා මම හිතනවා.

විශේෂයෙන් යුරෝපා සංගමයේ මත්ස්‍ය තහනම අද අයින් කර, ඒ තුළින් විශාල විදේශ විනිමයක් මේ රටට ගෙන එන්නට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම තව සුළු කාලයකින් GSP Plus වැනි සුවිශේෂී දේවල් අපේ දේශීය නිෂ්පාදකයාට ශක්තියක් හැටියට පාවිච්චි කර, ඒ තුළින් ගෝලීය ආර්ථිකයේ සම්පත් අපේ රටේ ජනතාවට සාධාරණ ලෙස බෙදී යන ආකාරයට අපි කටයුතු කරන බව මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. ඒ වාගේම තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණු -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නියමිත කාලය අවසානයි, ගරු රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මට තත්පරයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

වෘත්තීය පුහුණුව මඟින්, රැකියා දසලක්ෂයේ වැඩසටහන මඟින් සියලු දෙනා වෙනුවෙන් ශක්තිමත් ආර්ථිකයක් මේ රජය ගොඩ නඟනවා කියමින් මගේ කථාව අවසාන කරනවා. [බාධා කිරීමක්]

[අ.භා. 3.22]

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

මේ වෙලාවේ ගස් ගැන තමයි මෙතුමන්ලා කථා කරන්න කියන්නේ. නමුත් ආර්ථිකය ගැන කථා කරන්න තමයි මම සූදානම් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපනයනය හෝ ආනයනය ගැන කොයි කතා කිව්වත් අවසානයේ මේ රටේ කාන්තාවට, ගෘහිණියට, මවට තමයි වැඩිම බරක් දැනෙන්නේ. තමන්ගේ දරුවන් ගැන, තමන්ගේ ස්වාමියා ගැන, පවුලේ ආර්ථිකය ගැන එහෙම නැත්නම් ගෘහස්ථය ගැන කටයුතු කරන්න සිද්ධ වන්නේ කාන්තාවටයි. කාන්තාව ජීවිතය ගැට ගහගන්නේ කොහොමද කියන ප්‍රශ්නය තුළ මේ තරම් අතර මං වූ යුගයක් ඉතිහාසයේ කවදාවත් තිබුණේ නැහැ. අද මේ හැම කාන්තාවක්ම කල්පනා කරනවා, දරුවන්ට පෝෂ්‍යදායී ආහාර වේලක් දෙන්නේ කොහොමද කියලා. මොකක් හෝ කවා යන්තම් බඩ කට පිරෙව්වාට, දරුවන්ට සම බල ආහාර වේලක් දෙන්න පුළුවන්ද, දරුවකුට මාළු කැල්ලක්, මස් කැල්ලක් දෙන්න පුළුවන්ද අද පවතින මේ මිල ගණන් යටතේ? එළවලුවල මිල ගණන් බලන්න. අමු මිරිස් කිලෝ එකකට රුපියල් 1,000ක් ගෙවන රටක්, මේක. එදා කෙහෙල් මුහයක් වත්තෙන් කඩාගෙන දරුවන්ට කන්න දීපු ගෙදරක ගෘහස්ථ ආර්ථිකය තුළ අද පිරිහීමක් පවතිනවා. [බාධා කිරීම්] අද එහෙම වෙලා තිබෙන්නේ ඇයි? නමුත් එදා එහෙම නොවන්න තමයි, මේ රටේ කාන්තාවට තමන්ගේ ගෘහ ආර්ථිකය නංවා ගන්න තමයි "දිවි නැඟුම" ගෙනාවේ. [බාධා කිරීම්] ඒවා අවඥාවෙන් බැහැර කරමින් කටයුතු කරපු තමුන්නාන්සේලා වාගේ අය නිසා තමයි අද දෙහි ගෙඩියටත් රුපියල් 50ක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්] දෙහි ගෙඩියටත් රුපියල් 50ක් ගෙවන රටක්, මේක. කෙහෙල් මුහයට රුපියල් 60ක් ගෙවන රටක්, මේක. [බාධා කිරීම්] අමු මිරිස් කිලෝවට රුපියල් 1,000ක් ගෙවන රටක්, මේක. සීනි කිලෝව රුපියල් 95ට දෙනවා කියලා මෙතැන කයිවාරු ගහපු ඇත්තන්ගෙන් මා ප්‍රශ්නයක් අහන්න කැමැතියි. සීනි කිලෝව රුපියල් 95ට ගන්න නම් රුපියල් 1,000ක බඩු ගන්න ඕනෑ. රුපියල් 1,000ක බඩු ගත්තොත් විතරයි ඒ ගණනට සීනි කිලෝව දෙන්නේ. එවිට රුපියල් 1,095ක් වෙනවා, සීනි කිලෝ එක. අත්තම දෙකක් වැඩ කරලා අත්තම දෙකක් බඩ ගින්නේ සිටියොත් තමයි මිනිසුන්ට ඒ වාගේ හැකියාවක් ඇති කරගන්න වන්නේ. ටීවීවල ලස්සන දැන්වීම් දමා පෙන්වන රස කෑම දෙන්න බැරිව අද මේ රටේ මව්වරු දහස් ගණනක් දුක් විඳිනවා; හිතේ අමාරුවෙන් ඉන්නවා. රුපියල් 10,000ක් වැඩි කරනවා කියා කිව්වාට මේ රටේ සියලු දෙනාට -සියලු ජනතාවට- එයින් ආර්ථික වශයෙන් ලාභයක් ලැබෙන්නේ නැහැ. තමුන්නාන්සේලා ප්‍රෝඩාවෙන්, බොරුවෙන් කටයුතු කරනවා. බලාගෙන ගියාම අද තේ දල්ලට, රබර්වලට කිසිම තැනක් නැහැ. මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේ සියලු මිනිසුන්ගෙන් භාගයක්ම පාහේ ජීවත් වන්නේ තේ දල්ලෙන්; රබර්වලින්. අද ඒ මිනිසුන්ට යන එන අතක් නැහැ. "වැට්" එක කියලා බැට් එකක් ගෙනැල්ලා ගැහුවේ ගැහැනුන්ටයි. කාන්තාවකට ලෙඩක් හැදිලා අද ඉස්පිරිතාලයකට ගියොත් සියයට කීයක් ගෙවන්න වෙනවාද? ඩෙංගු මදුරුවෙකු හෝ විදලා කාන්තාවකට අඩු ගණනේ උණ ගන්නවා නම් තමුන්නාන්සේලා හරි සතුටෙන් බලාගෙන ඉන්නවා. මොකද, ලේ පරීක්ෂණවලට යන යන අවස්ථාවේ තමුන්නාන්සේලාට සියයට 15ක් ගන්න පුළුවන්.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
VAT එක නතර කරලා ඉවරයි.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

නමුත් එය ආයෙත් ගෙනෙන්න කල්පනාවක් තිබෙනවා කියා අපි දන්නවා. VAT එක නතර කළේ අපියි. ඒ නිසා අපි ආඩම්බර වෙනවා. එය මාර්තු මාසයේ ආපසු ගෙනෙන්න බලාපොරොත්තු වන තමුන්නාන්සේලාට මා කියන්න කැමැතියි, එය ආපසු ගෙනෙන්න වුවමනාවක් නැහැ කියලා. නමුත් ඒ ඇති කරපු අලකළංචිය, ඒ ඇති කරපු පටලැවිල්ල නිසා කුඩා වෙළෙන්දාගේ ඉඳලා මහා පරිමාණ වෙළෙන්දා දක්වා computerize කරගත් සියල්ල වෙනස් කරගන්න තවම බැරි වුණා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
What is the point of Order, Hon. Member?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතුමිය අසත්‍ය කියනවා. දැන් VAT එක අය කරන බඩු-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමිය කථා කරන්න.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දරුවන්ට පාසල් යන්න රෙදි කෑල්ලක් දුන්නා. ඒක එක වාරයකට පමණයි අඳින්න පුළුවන්. අනෙක් වාර දෙක එන කොට මව්පියන් තම දරුවන්ට uniform එකකට රෙදි අරගෙන දෙන්න ඕනෑ, සපත්තු කුට්ටමයි, මේස් කුට්ටමයි -ඒ සියලු දේ- අරන් දෙන්න ඕනෑ. දරුවාගේ uniform එකෙනුත් ගසා කාපු ආණ්ඩුවක්, මේක. තමුන්නාන්සේලාට අවුරුදු 5ක් නොවෙයි, අවුරුදු දෙකෙන් ගෙදර යන්න වනවා. කාන්තාවෝ අහසට අත් දික් කර කියනවා, "හෙණ ගහන්න ඕනෑ" කියා. ඒ නිසා තමුන්නාන්සේලාට මෙහේ ඉන්න බැහැ. තමුන්නාන්සේලා දවසින් දවස වැඩි කරන බඩු මිලට, අනෙකුත් දේවල්වලට විරෝධය පාන්න අපි 28වැනිදාට මේ රටේ සමස්ත කාන්තාවෝ සමඟ පාරට බහිනවා. පාර දිගේ ගිහින් මේ රජයට තදබල ලෙස විරෝධය පානවා කියා අපි තමුන්නාන්සේලාට කියනවා. කාන්තාවෝ පාරට බහිනවා කියන්නේ, තමුන්නාන්සේලාගේ අවසානය ළං වෙලායි කියා මතක තබා ගන්න.

පිට රටින් ගෙන්වලා අපට පෙන්වනවා, ඇපල්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇයි, පැපොල්?

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

පැපොල් තිබෙනවා. පැපොලුත් ඒ වාගෙයි, ඇපලුත් ඒ වාගෙයි. තමුන්නාන්සේලාගේ ගස්වල හැදෙන්නේ පැපොලුත් නොවෙයි, ඇපලුත් නොවෙයි, දෙහිත් නොවෙයි. මතක තබා ගන්න, තමුන්නාන්සේලාට අද අමු මිරිස් කරලක් දෙන්න බැහැ. මේ යූඑන්පී එකේ අයට කියන කථා බිරි අලින්ට වීණා ගායනයක් වෙලා. කියන කිසි දෙයක් තමුන්නාන්සේලා අහන්නේ නැහැ. තමුන්නාන්සේලාට අවශ්‍ය එක දෙයයි. මොන ජාතිය දාලා හෝ මිනිසුන්ව රැවටීම කරනවා.

ඊයේ ගරු අග්‍රාමාත්‍යතුමා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී මට විවෘත ආරාධනාවක් කළා, එතුමා ළඟින් වාඩි වෙන්න කියලා. නම කිව්වේ නැති වුණාට ගාල්ලේ මන්ත්‍රීතුමිය මම. එක දෙයක් නිසා මට සතුටුයි. ආණ්ඩු පක්ෂයේ ඉන්න ඇමතිවරුවත්, මන්ත්‍රීවරුවත්, තරුණ මන්ත්‍රීවරුවත් එතුමාට සතුටු වෙන්න පුළුවන් තරමට වැඩ කරන්නේ නැහැ. එතුමා මට කථා කළා. ස්තුතියි අග්‍රාමාත්‍යතුමනි; කථාවට ස්තුතියි. හැබැයි මෙන්න කිව්වා, මේ ගීතා නම් කවදාවත් ඔහෙට එන්නේ නැහැ. මට කථා කළාට වැඩක් වෙන්නේ නැහැ. මොකද, මම එන්නේ නැහැ.

අද එතුමා පාර්ලිමේන්තුවට එයි කියලා මම ආසාවෙන් ආවා. එතුමාගේ මුහුණ බලන්න මම හරි ආසාවෙන් ආවේ. මේකට පිළිතුරු දෙන්නේ කොහොමද කියලා බලන්න. මොනවා වුණත් ඒ රටේ අග්‍රාමාත්‍යතුමා. එතුමාගේ හිත වෙනස් කරන්න- [බාධා කිරීමක්]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

එතුමාගේ හිත වෙනස් කරන්න පුළුවන් බලයක් මට තිබීම ගැන මා සතුටු වනවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේගේ වෙලාවේදී තමුන්නාන්සේ කථා කරන්න. දැන් වාඩි වෙන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
Madam Presiding Member, I rise to a point of Order.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)
කියන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා ඉල්ලීමක් කරනවා. හැදිව්ව නැති පරිසරයකින් ආවත් මෙතුමියට හැදිව්ව විධියට කථා කරන්න කියන්න. ගැලරියේ පාසල් දරුවෝ ඉන්නවා. අගමැතිතුමා ළඟට එන්න කියලා කථා කළේ නැහැ. ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට ආස නම් ඒවා වෙනම කර ගන්න. [බාධා කිරීම්] ගැලරියේ පාසල් දරුවෝ ඉන්නවා කියන එක මතක තබා ගන්න.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

මට කථා කළා. අග්‍රාමාත්‍යතුමා කථා කරලා කිව්වා, එන්න; මෙහෙට එන්න. ඔයාට ඕනෑ දෙයක් දෙන්නම් කියලාත් කිව්වා. එහෙම කිව්වා. හැන්සාඩ් වාර්තාව බලන්න. මේ කියන්නේ අසත්‍ය කථා හදලා නොවෙයි. ඔයාට අමාරු වුණාට වැඩක් නැහැ. ඔයාට වැඩිය අග්‍රාමාත්‍යතුමා මට කැමැතියි. [බාධා කිරීම්] ඒ වාගේ විවෘතව උත්තරීතර පාර්ලිමේන්තුවේදී අගමැතිතුමෙක් නැඟිටලා ආරාධනා කළාම මට පුළුවන්ද ඒක අහක දාන්න. නමුත්, මම අහක දානවා. මේ වාගේ කිසි කමකට නැති, වැදගත්කමක් නැති, කිසි දෙයක් කරන්නේ නැති, රටේ ජනතාවට හැම දාම කොකා පාන මේ වාගේ ආණ්ඩුවකට එකතු වන්න මගේ කිසිම කැමැත්තක් නැහැ කියලා මම තමුන්නාන්සේලාට අද ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය අමාත්‍යතුමාගේ දුවගේ මංගල්‍ය උත්සවය. මෙතුමියත් ඒ උත්සවයට ගිහින් හිටියා. මම හිතන්නේ එහිදී මොනවා හෝ පානය කරලා වෙන්න ඇති මේ වාගේ විකාර කථා මේ ගරු සභාවේ කියන්නේ. ඒවා මදාසාර බීලා කරන කථා නිසා හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරලා දමන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
That is not a point of Order. ගරු මන්ත්‍රීතුමිය කථා කරන්න.

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)
අද හාල් කිලෝ එකක් ගන්න ගියාම-

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අග්‍රාමාත්‍යතුමාගේ-

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) கீதா சமன்மலீ குமாரசிங்ஹ)
(The Hon. (Mrs) Geetha Samanmalee Kumarasingha)

අග්‍රාමාත්‍යතුමා ගැන ඔබතුමා කථා කරන්න එපා. අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී කියපු ඒ කථාව හැන්සාඩ්ගත වෙලායි තිබෙන්නේ. ඔබතුමාට ඊර්ෂ්‍යාද? ඔබතුමන්ලා ඊර්ෂ්‍යා කරලා වැඩක් නැහැ. එහා පැත්තේ තරුණ මන්ත්‍රීවරු කට්ටියක් මේකට හරියට upset වෙලා. මට කරන්න දෙයක් නැහැ. ඔහොම තමයි. කාලයෙන් කාලයට එක එක්කෙනාගේ නොයෙක් විපරියාස වනවා; කාලයෙන් කාලයට නොයෙක් වෙනස්කම් වනවා. සමහර විට මේක මා වෙනුවෙන් වෙච්ච දෙයක් වෙන්න ඇති. [බාධා කිරීමක්]

එහෙම නම් අවසාන වශයෙන් මේ කාරණය කියනවා. ගරු අග්‍රාමාත්‍යතුමනි, බෙන්තර හැදෙනවාය කියපු දෙද්දුව project එක

ගැන කිය කියා දාහත් අවුරුද්දක් බෙන්තර, ඇල්පිටියේ ගියා. මෙවර වැඩි ඡන්ද 14,000කින් බෙන්තර, ඇල්පිටිය අපි ජයග්‍රහණය කෙරුවේ, ඔය බොරුවලට උත්තර හැටියටයි. ඊළඟට කියන්නේත් දෙද්දුව project එක කරනවා කියලා. පුළුවන් නම් කරලා පෙන්වන්න, අපි සතුටු වෙනවා. අපි එදාට ඔබතුමන්ලා එක්ක කථා කරනවා. නමුත් එතකල් අපි තමුන්නාන්සේලාව විශ්වාස කරන්නේ නැහැ කියන එක මේ සභාවේ කියමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමියනි.

ඊළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 3.33]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Public Enterprise Development)
ස්තුතියි.

අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවෙන් ආර්ථිකය ගැන කථා කරන වෙලාවේදී අපි මතක තබා ගත යුතු වැදගත් කරුණක් තිබෙනවා. 2015 ජනවාරි මාසයේ මේ රටේ ජනතාව මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට විශාල ජනවරමක් ලබා දුන්නා. ඒ ජනවරම වන්නේ එතුමා එක්ක තරග කරපු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂට වැඩිය ලක්ෂ 5කින් එතුමා එදා ජයග්‍රහණය කිරීමයි. එපමණක් නොවෙයි, 2015 අගෝස්තු මාසයේදී මේ රටේ ජනතාව නැවතත් මේ ආණ්ඩුවට විශාල ජනවරමක් ලබා දීලා තිබෙනවා, මේ රජයේ ඉදිරි වැඩ පිළිවෙළ ගෙන යන්නට.

මට ප්‍රථමයෙන් කථා කරපු සමහර මන්ත්‍රීවරු තර්ජනය කරමින් කියා සිටියා, ඒ අය පාරට බැහැලා මේ ආණ්ඩුව පෙරළන්න යනවා කියලා. මම මෙතැන පැහැදිලිව ප්‍රකාශ කරන්නට ඕනෑ, අපේ මෛත්‍රීපාල සිරිසේන-රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව ඒ ඕනෑම අභියෝගයක් පිළි අරගෙන ඒකට මුහුණ දෙන්නට ලැහැස්තියෙන් සිටින බව. අපි මේ ආණ්ඩුව ගෙන යන්නේ මේ රටේ ජනතාවගේ ජනවරම අනුවයි. ඉතින් මම හිතන්නේ නැහැ, කිසිම කෙනෙකුට ඔය විධියේ තර්ජනයක් කරලා මේ ආණ්ඩුව යටපත් කරන්න පුළුවන් කියලා.

මම මෙතැනට කරුණු එකතු කරන්නේ, ආර්ථිකය ගැනයි. විශේෂයෙන්ම කෙටි කාලීන ආර්ථික කරුණු පමණයි අද තිබුණු විවාදයට එකතු වුණේ. මම කැමැතියි, ආර්ථිකය පිළිබඳව දීර්ඝ කාලීන කරුණු කිහිපයක් එකතු කරන්නට. අද අය-වැය පරතරය ගැන කථා කළා; අපනයන-ආනයන පරතරය ගැන කථා කළා; ණය ගැන කථා කළා. රාජ්‍ය ව්‍යවසාය මට සම්බන්ධ විෂයයක් නිසා ඒ පිළිබඳවත් යමක් කෙටියෙන් සඳහන් කරන්නට මම කැමැතියි.

අපි මේ රජය භාර ගන්න කොට මේ රාජ්‍ය ව්‍යවසායවල -රාජ්‍ය ව්‍යාපාරවල- අලාභය 2006 ඉඳලා 2015ට රුපියල් බිලියන 636යි. තව විධියකට කිව්වොත් ඒකේ අලාභය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 20ක් පමණ වුණා. මේ රාජ්‍ය ආයතනවල අලාභය අය වැය පරතරයෙන් සියයට 81ක් විතර වුණා. ඒ කරුණුත් මේ විවාදයට එකතු කරන්න අවශ්‍ය වෙනවා. අපේ රජයට පැවරී තිබෙන කාර්ය භාරය වන්නේ මේ ආර්ථික ප්‍රතිපත්ති අපි සංශෝධනය කරන්නේ කොහොමද කියන එක ගැන සොයා බලන්නයි. අපි ඒ වැයම තුළ තමයි දැන් ගමන් කරන්නේ. මේ රට ගොඩ ගන්න අපි මේ ආර්ථික ප්‍රතිපත්ති සංශෝධනය කළ යුතුයි.

අපි ගොඩනඟන්නේ සමාජ වෙළෙඳ පොළ ආර්ථිකයක්. සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය තුළ ඒකේ දායකත්වය දක්වන්න පුළුවන් වන්නේ රජයට පමණක් නොවෙයි. රාජ්‍ය නොවන ආයතනවලටත් එයට දායකත්වය දක්වන්නට පුළුවන්. අපි දන්නවා, රජයේ ව්‍යවසාය මඟින් විශාල අලාභ සිදු වෙලා තිබෙන බව. අපි ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව ගත්තත්, ලංකා විදුලිබල මණ්ඩලය ගත්තත්, ශ්‍රීලන්කන් ගුවන් සේවය ගත්තත්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ගත්තත් විශාල අලාභ තිබෙනවා. නමුත් රජයට අයිති ලාභ ලබන ආයතනත් තිබෙනවා. ඉන් එකක් තමයි, ශ්‍රී ලංකා වරාය අධිකාරිය. මේ කාල පරාසය -මේ දශකය- තුළ එම ආයතනයෙන් රුපියල් බිලියන 39ක ලාභයක් ලබලා තිබෙනවා. බැංකු ක්ෂේත්‍රය ගත්තොත්, රුපියල් බිලියන 294ක ලාභයක් ලබලා තිබෙනවා. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ගත්තොත්, රුපියල් බිලියන 42ක ලාභයක් ලබලා තිබෙනවා. ඔය ආයතන තුන ගැන මොහොතක් කල්පනා කළොත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ලාභය ලබලා තිබෙන්නේ රජය නිසා පමණක් නොවෙයි. රජයයි, පෞද්ගලික අංශයයි එකතු වෙලා කර ගෙන යන නිසායි ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ එවැනි ලාභයක් දකින්නට තිබෙන්නේ. එයට Public-Private Partnership කියලා ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා. "රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර" නිසා තමයි ඒ ලාභය තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, අපි බැංකු ක්ෂේත්‍රය දිහා බැලුවොත්, අද රාජ්‍ය බැංකු ගැන මම ආඩම්බර වෙනවා. ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව ගැන මම ආඩම්බර වෙනවා. ඒවා ලාභ ලබන්නේත් තරගකාරී ව්‍යුහයක් තුළිනුයි. 1978දී තිබුණේ එක්සත් ජාතික පක්ෂ රජයක්. ඒ කාලයේ සිට නිවැරැදි, පැහැදිලි ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කළ නිසායි, රාජ්‍ය බැංකුත් මේ තත්ත්වයට ගෙනෙන්න අපට පුළුවන් වෙලා තිබෙන්නේ.

අපි ගොඩනඟන්නේ සමාජ වෙළඳ පොළ ආර්ථිකයක්. මේ ව්‍යුහය තුළ තමයි අප ඉදිරියට යන්නේ. අපි කරන කිසිම දෙයක් අපි සඟවා කරන්නේ නැහැ. අපි ඒ දේ කරන්නේ ප්‍රසිද්ධියේ. පසු ගිය රජය හම්බන්තොට වරාය භදන්න ඩොලර් මිලියන 250ක් වියදම් කරලා තිබෙනවා. මේ සභාවේ සිටින මන්ත්‍රී කෙනෙක් මාසයකට ලබන ආදායම හා සමාන මුදලක් පමණයි, මුළු හම්බන්තොට වරායම මාසයකට ලබන්නේ. අපි පුවත් පත්වල දැන්වීම් දමා ප්‍රකාශ කර තිබෙනවා, හම්බන්තොට වරාය මීට වඩා ප්‍රතිලාභ ලබන වරායක් කරන්නේ කොහොමද කියා ඕනෑම කෙනෙකුට යෝජනාවක් ඉදිරිපත් කරන්න පුළුවන් බවට. අපි ශ්‍රී ලංකන් ගුවන් සේවය වෙනුවෙන් ප්‍රසිද්ධ දැන්වීම් දමා තිබෙනවා, ලංකාවේ හෝ ජාත්‍යන්තරව ඕනෑම යෝජනාවක් ගෙනෙන්න කියලා. එම සේවාව කාර්යක්ෂම කරන්න පුළුවන් නම්, අලාභය නැති කරන්න පුළුවන් නම්, එය පෙන්වන්න ඕනෑම කෙනෙකුට යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්. හේතුව, මෙම ආයතන අලාභ ලබන කොට ඒවාට ගෙවන්නේ මේ රටේ පොදු ජනතාවයි. බදුවලට කිසිවෙක් කැමැති නැහැ. නමුත්, අලාභ ලබනවා නම් එයට ගෙවන්න වෙනවා. එසේ ගෙවන්න වෙන්නේ පොදු ජනතාවටයි. ඒ නිසා අපි කරන දේවල් සඟවා කරන රජයක් නොවෙයි. අපි ඒවා ප්‍රසිද්ධියේ කරන්නේ. අප අනුගමනය කරන ප්‍රතිපත්තිය නිවැරැදි ප්‍රතිපත්තියක්ය කියන එක ගැන අපට විශ්වාසයක් තිබෙනවා.

වළක් තිබෙන කොට ඒ වළ තවත් හාරා ගෙන, හාරා ගෙන ගියා කියලා විසඳුමක් ලැබෙන්නේ නැහැ. වළක වැටිලා ඉන්නවා

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

නම් වළෙන් එළියටයි එන්න ඕනෑ. වළෙන් එළියට එන්නේ කොහොමද? ඒ වළෙන් එළියට එන්නට උපායශීලී ක්‍රම, විධි තිබෙන්නට ඕනෑ. අපට එවැනි ආර්ථික සැලැස්මක් තිබෙනවා. අපි සඳහන් කළේ, මේ රාජ්‍ය ව්‍යවසාය ගැනයි. රජයයි, පෞද්ගලික හවුල් ව්‍යාපාරයි හරහා මේ ආයතන ගොඩ ගන්න පුළුවන් කියන විශ්වාසය අපට තිබෙනවා.

එපමණක් නොවෙයි, අපේ ආර්ථික වැඩ පිළිවෙළ එක පවුලක් ගොඩනැඟීමේ ආර්ථික වැඩ පිළිවෙළක් නොවෙයි. මේ රටේ පවුල් ලක්ෂ 50ක් ඉන්නවා. ඒ පවුල් ලක්ෂ 50 ඉලක්ක කරමින් කර ගෙන යන වැඩ පිළිවෙළක් තමයි, අපේ රජයට තිබෙන්නේ. එසේ නොමැතිව, අඩු ආදායම්ලාභීන්ට සමාජ සුබසාධනය බෙදා දීමේ වැඩ පිළිවෙළක් නොවෙයි අපට තිබෙන්නේ. අපේ රජය බලයට පත් වුණාට පස්සේ, එතෙක් ලබා දෙමින් තිබුණු සමෘද්ධි සහනාධාරය දෙගුණයක් කළා කියා මම ආඩම්බරයෙන් කියනවා. නමුත්, අපි මෙය කරන්නේ සමාජ සුබසාධනය හරහා විතරක් නොවෙයි; ආදායම, වියදම හරහා සාකච්ඡාව තුළින් පමණක් නොවෙයි. මේ රටේ මධ්‍යම පන්තිය ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් විතරක් නොවෙයි අපි මේ ක්‍රියාත්මක කරන්නේ. මේ රටේ මධ්‍යම පන්තිය වැඩි කිරීමේ වැඩ පිළිවෙළක් කරන්නේ කොහොමද කියලායි අපි බලන්නේ. ඒ නිසා අපේ වැඩ පිළිවෙළ තුළ, අපි මේ රටේ ජනතාවට අයිතිය දෙන්න ලැහැස්ති වෙලා ඉන්නවා. ඔවුන්ට ඉඩම්වල අයිතියත් ලබා දෙන්න අපි ලැහැස්ති වෙලා ඉන්නවා. මේ රටේ සිටින ජනතාවගෙන් සියයට අසූවකට තවම ඉඩමක අයිතිය නැහැ. අපි දැන් ඒ සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ගෙන යනවා.

රට පුරාම තිබෙන්නේ රජයට අයිති ඉඩම්. නමුත්, මේ ඉඩම් රජයට අයිති වෙලා මදි. මේ ඉඩම් ජනතාවට අයිති වන්න ඕනෑ. මේ ඉඩම්වල අයිතිය ජනතාවට ලබා දීලා අපි මධ්‍යම පන්තියක් මේ රටේ ඇති කරනවා. අපි දැනට තිබෙන මධ්‍යම පන්තිය ආරක්ෂා කරනවා විතරක් නොවෙයි, මේ රටේ මධ්‍යම පන්තියක් අපි ඇති කරනවා. මේක අපේ චින්තනයේ කොටසක් කියලා මා මේ අවස්ථාවේදී කියනවා.

අපේ ඉතිහාසය දිහා බැලුවොත් සමාජවාදී රජයන් තිබුණු බව අපි දන්නවා. සමාජවාදී රජයන් තිබුණත්, ඉඩමක අයිතිය අඩු ආදායම්ලාභියෙකුට, පොඩි මිනිහෙකුට දෙන්න ඒ එක රජයකටවත් බැරි වුණා. නමුත්, මේ අවුරුදු හතර තුළ ඒ දේ අපි වෙනස් කරනවා. අගමැතිතුමා දැනටම සඳහන් කරලා තිබෙනවා, මිලියන තුනකට අපි ඉඩම් අයිතිය ලබා දෙනවා කියලා. ඒ වැඩ පිළිවෙළ තුළ සජිත් ප්‍රේමදාස ඇමතිතුමා දැනටමත් ඉඩම් දහස් ගණනක අයිතිය රට පුරාම ලබා දීලා තිබෙනවා. අපි මුලින්ම කොළඹත්, මොරටුවේත් ඒ ඉඩම් අයිතිය ලබා දීලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ අපි ශීඝ්‍රයෙන් ක්‍රියාත්මක කරනවා.

ඉඩමක අයිතිය ලැබුණාම ආදායම විතරක් නොවෙයි, බැංකුවකට ගිහිල්ලා උගසට තබන්න පුළුවන් වත්කමක් ඒ අයට ලැබෙනවා. ඒ තුළින් යම් වටිනාකමක් ඒ අයට ලැබෙනවා. ඒ තුළින් හැම එක් කෙනාටම යම් හැඟීමක් ඇති වනවා. ඒ විධියට ඉඩම් අයිතිය ලබා දීලා එවැනි ආර්ථික ප්‍රතිසංස්කරණ කරන්න තමයි අපි ලැහැස්ති වෙලා ඉන්නේ. විපක්ෂයේ ඉන්න කවුරු හරි අභියෝගයක් කරනවා නම් ඒ අයගේ පැතිවල ඉඩම් දීලා නැහැයි කියලා, අපට කියන්න. මේ අවුරුදු හතර තුළදී අපි ඒ පැතිවලට ඇවිල්ලා ඉඩම් බෙදනවා. ඊට පස්සේ මහ මැතිවරණය එනකොට මොනවාද වෙන්න යන්නේ කියලා අපට බලාගන්න පුළුවන්. අපට වැඩ පිළිවෙළක් තිබෙනවා. අද අපට වැඩ පිළිවෙළක් නැහැයි කියලා චෝදනා කළා. අපට වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒක වෙළෙඳ පොළ සමාජ ආර්ථිකයක් ගොඩ නඟන වැඩ පිළිවෙළක්. මේ රටේ ජනතාව ඉඩම් අයිතිකරුවන් කරන්නට අපට වැඩ පිළිවෙළක් තිබෙනවා.

අපි ඉඩම දෙනවා විතරක් නොවෙයි. දැනටමත් අපි ගම්බද ප්‍රදේශවල නිවාසත් ගොඩ නඟා ගෙන යනවා. ඒ විතරක් නොවෙයි. මේ රටේ ඕනෑම කෙනෙකුට තමන්ගේ නිවසට විදුලිය ලබා ගන්න බැරි නම්, ඒ ඕනෑම නිවසකට විදුලිය ලබා දෙන්නත් අපි දැනටමත් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තිබෙනවා.

අලුත් නිවාස යෝජනා ක්‍රම ඉදිකරන වැඩ පිළිවෙළ අපි ගිය සතියේ හෝමාගමින් මුල්ගල තබා පටන් ගත්තා. නාගරික ප්‍රදේශවල ජීවත් වනවා නම්, මේ වැඩ පිළිවෙළ යටතේ ඉඩමේ අයිතිය විතරක් නොවෙයි, නිවාසවල අයිතියත් දීර්ඝ කාලීන පදනමකට ලබා දෙන්නට අපි වැඩ පිළිවෙළ දියත් කරලා තිබෙනවා. යම් පුද්ගලයෙකුට නිවසක අයිතිය තිබෙන කොට, ඉඩමක අයිතිය තිබෙන කොට බැංකුවකට ගිහිල්ලා එම දේපළ උගසට තබා ණයක් ලබා ගෙන ව්‍යවසායකයෙකු වීමේ හැකියාව තිබෙනවා. ඕනෑම තරුණ තරුණියකට ඒ අදහස ගෙන යන්න පුළුවන්. ඉස්සර බැංකුවකින් ණය ලබා ගන්න බැරි වුණත්, දැන් ඔවුන්ට බැංකුවකින් ණය ලබා ගන්න පුළුවන්. අපි ඒක අපනයනයට සම්බන්ධ කරනවා. ඒ නිසා තමයි මම මේ දේ සඳහන් කරන්නේ. අපි වැඩ කරන්නේ යම් කිසි පිළිවෙළකට අනුවයි. පසු ගිය අය වැය කථාවේදී මුදල් ඇමතිතුමා අධ්‍යාපනයට වෙන් කරන මුදල් ප්‍රමාණයත් වැඩි කළා. අවුරුදු ගණනාවක් නිස්සේ මේ මුදල කප කපා තිබුණේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ විනාඩි 13ක කාලය අවසන්.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම තව විනාඩි පහක කාලයක් ඉල්ලා ගත්තා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාගේ කාලයෙන්ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
අපේ කථික ලැයිස්තුවේ අවසානයට නම තිබෙන, නොපැමිණි මන්ත්‍රීතුමාගේ වේලාවෙන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේ අවස්ථාවේදී තව කථිකයන් සිටින බව පෙනෙනවා. කාගේ කාලයෙන්ද දෙන්නේ? එහෙම නම්, කථා කරන්න සිටින මන්ත්‍රීවරුන්ගේ කාලය අඩු කරන්නම්. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම පුළුවන් නම්, ඊට පෙර අවසන් කරන්නම්.

මම කියන්න යෙදුණේ මේකයි. අපට වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ තුළින් පවුලට යම් ස්ථාවරභාවයක්

ලැබෙනවා. අපේ වැඩ පිළිවෙළ තිබෙන්නේ යටිතල පහසුකම් ගොඩ නඟන්න නොවෙයි, මානව සම්පත ගොඩ නඟන්නයි. මුදල් ඇමතිතුමා පසු ගිය වසරේදී අධ්‍යාපනයට කරන ආයෝජනය වැඩි කළා. අපි දැන් එන වසරේ අය වැය ගැන සාකච්ඡා කර ගෙන යනවා. ඒකේදී අපි ඊටත් වැඩිය ආයෝජනය කරන්නට යනවා. හැම දරුවාටම උසස් අධ්‍යාපනයක් ලබා දෙන තැනට තමයි අපි ඒ ආයෝජන වැඩි කරගෙන යන්නේ. පාර හැදුවොත් වාහන තිබෙන මිනිහාට තමයි එහි වාසිය තිබෙන්නේ. නමුත් අපේ චින්තනය, පුද්ගලයා ගොඩනැඟුවොත්, පුද්ගලයාට ආදායම් මාර්ගයක් ඇති කර දුන්නොත්, පුද්ගලයාට පුහුණුවක් ලබාදුන්නොත් ඒ පුද්ගලයාම තමන්ගේ පාර කපා ගනීවි කියන එකයි. සුබසාධනය හරහා අපි පුද්ගලයෙකුව රජයකට ණයගැති කරන්නේ නැහැ. හැම පුද්ගලයාටම ගෞරවයක් තිබෙන්නට ඕනෑ. ඒ ගෞරවය එන්නේ ඒ අයට අධ්‍යාපනයක් තිබෙනවා නම්, තරුණ කෙනෙකුට කෙළින් හිටගන්න පුළුවන් නම් පමණයි. දැන් තිබෙන ක්‍රමවේදය වෙනස් කිරීම සඳහා වූ දීර්ඝකාලීන සැලැස්මකයි අපි ඉන්නේ. තරුණ තරුණියන් දේශපාලනඥයන් පිටිපස්සේ රැකියාවල් සොයාගෙන යනවාට අපි කැමැති නැහැ. ඒ වාගේ ආර්ථික ක්‍රමවේදයක් තමයි පසු ගිය දශකය තුළදී හැදුවේ. CV එක අරගෙන, biodata එක අරගෙන දේශපාලනඥයා පිටිපස්සේ රැකියාවක් සොයා එන, දේශපාලනඥයාට ණයගැති ක්‍රමයක් තමයි පසු ගිය රජය විසින් මේ රටේ හැදුවේ. නමුත් මේ ක්‍රමය දිගින් දිගටම කරන්න අපි ලැහැස්ති නැහැ.

සාමාන්‍ය පෙළ කරලා, උසස් පෙළ කරන්න යන හැම තරුණ තරුණියකටම ඉන් එහාට විශ්වවිද්‍යාලය විතරක් නොවෙයි, උසස් අධ්‍යාපනයක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු ගැන අපි සාකච්ඡා කරමින් යනවා. ලෝක බැංකුව එක්ක, ආසියානු සංවර්ධන බැංකුව එක්ක, ජර්මන් ආණ්ඩුව එක්ක ඒ සඳහා ආධාර ලබා ගැනීමට අපි සාකච්ඡා කරගෙන යනවා. එතකොට උසස්පෙළ සමර්ථ වෙන 150,000න් 25,000කට විතරක් නොවෙයි, අනික් 125,000ටත් යම් ක්ෂේත්‍රයක පුහුණුවක් ලබා දීලා ඔවුන් ලෝකයත් එක්ක සම්බන්ධ කරන්න පුළුවන්. එතකොට මේ ආර්ථිකය තුළින් ඒ අයටත් ප්‍රතිලාභයක් ලබා ගන්නට පුළුවන්.

මම කථා කරන්න ප්‍රථමයෙන් ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා කථා කළා. එතුමා කථා කළේ අපේ ආර්ථිකය ජාත්‍යන්තරයට සම්බන්ධ කිරීම පිළිබඳවයි. අපි දන්නවා, දැන් අපි ඒකෙන් පිම්මක් පැනලා තිබෙන බව. පසු ගිය රජය කාලයේ වාගේ නොවෙයි, දැන් අපි ජාත්‍යන්තරයෙන් කොන් වෙලා නැහැ. අපි යන යන තැන ලෝකයේ පිළිගැනීමක් තිබෙනවා. අද ලංකාවට පිළිගැනීමක් තිබෙනවා. ඒ නිසා තමයි අපි වෙළෙඳ ගිවිසුම්වලට යන්නේ. පසු ගිය සතියේ ගරු අගමැතිතුමා සිංගප්පූරුවට ගිහිල්ලා, අලුත් වෙළෙඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා අරඹා තිබෙනවා. මාස ගණනාවකට උඩදී චීනයත් සමඟ අපි ඒ සාකච්ඡා පටන් ගත්තා. මේ එළැඹෙන ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් හරහා තමයි අපි මේ ක්‍රමවේදයට යන්නේ. මේ රට ආර්ථික මධ්‍යස්ථානයක් කිරීමේ අරමුණිනුයි ඒ යන්නේ.

සමහර අය දැන් පාර්ලිමේන්තුව හුහක් වෙලාවට අසත්‍ය ප්‍රචාරය කරන මධ්‍යස්ථානයක් කර ගෙන ඉන්නවා. අද ඒ වාගේ හුහක් මන්ත්‍රීවරු ඉන්නවා. මම මාධ්‍යයට කියනවා, ඒ අය දෙන දේවල් පළ කරන්න ඉස්සරවෙලා ඔය දෙන දත්ත ගැන පොඩ්ඩක් හොයලා බලන්න කියා. මාධ්‍යයෙන් ඒවා පළ කරන්නට ඉස්සර වෙලා facts check කරන්න කියලා මම කියනවා. මොකද, ආණ්ඩුව අස්ථාවර කරන්න කියා හිතාගෙන මෙතැන ඇවිල්ලා එක එක ඒවා කියලා ජනමතයක් හදන්නයි හදන්නේ. ඒකට නම් කවදාවත් ඉඩක් ලැබෙන්නේ නැහැ. පසු ගිය රජයකින් හොඳ දෙයක් කළා නම් අපේ රජය ඒ ආර්ථික ප්‍රතිපත්තිය වෙනස් කරන්න යන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා කාලය අවසානයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩියක් දෙන්න. මම මගේ කථාව අවසාන කරන්නම්.

පසු ගිය රජය කාලයේ පටන්ගත් එක් දෙයක් උදාහරණයකට අරගෙන මම මගේ කථාව අවසන් කරන්නම්. පසු ගිය රජය කාලයේ වෛද්‍ය අධ්‍යාපනය වෙනුවෙන් ආයතන දෙකක් ගොඩ නැඟුවා. එකක් තමයි, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය. ඒක රාජ්‍ය ආයතනයක වෛද්‍ය පීඨයක් වශයෙන් ඇති කළා. අනෙක් එක, පෞද්ගලික වෛද්‍ය පීඨයක් ඇති කරන්න ඉඩ දුන්නා. ඊට පස්සේ UGC එකෙන් ඒවාට පිළිගැනීමක් ඇති කළා. නමුත් දැන් අපට චෝදනා කරනවා, "මේ මොකක්ද, මේ කරන්නේ? පෞද්ගලික ආයතනයකින් වෛද්‍ය උපාධියක් දෙන්න යනවා" කියලා. ඒක පසු ගිය රජය පටන්ගත් දෙයක්. පසු ගිය රජය ඇති කරගත් ප්‍රශ්නයක්. ඒක අපි ඇති කරපු ප්‍රශ්නයක් නොවෙයි. නමුත් අපි කල්පනා කරන්නේ මෙහෙමයි. මේ රටේ තරුණ තරුණියන්ට ඒකෙන් යහපතක් වෙන්න යනවා නම් අපි ඒකට විරුද්ධ නැහැ. අපි අහන්නේ ඇයි ඒකට ඉඩ දෙන්නේ නැත්තේ කියන එකයි. ඒක පසු ගිය රජයේ යෝජනාවක් මිස අපේ යෝජනාවක් නොවෙයි. නමුත් අපි මේ තීරණ ගන්නේ මේ රටේ තරුණ පරපුර දිහා බලලා. ඒවා ඒ අයට සුදුසු, ඒ අයගේ අනාගතය යහපත් කරන්න ගන්න තීරණයි. කවුරු හෝ පටන් ගත්තා, ඒ නිසා අපි ඒක නතර කරන්න, අවසන් කරන්න යනවා කියන ප්‍රතිපත්තියේ අපි නැහැ.

මම නැවතත් කියනවා, අපට සැලැස්මක් තිබෙන බව. ඒක දීර්ඝ කාලීන සැලැස්මක්. අපි දැන් ආර්ථික ප්‍රතිසංස්කරණ කරගෙන යන්න පටන් අරගෙනයි තිබෙන්නේ. තව වසරකින් ඒ ප්‍රතිඵල දකින්නට ලැබෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමියට බොහොම ස්තුතියි.

[අ.භා. 3.53]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජනතාවගේ ජන ජීවිතයේ පිරිහීම ආරක්ෂා කිරීම, ජාතික ආර්ථිකය ස්ථාවර මට්ටමකින් පවත්වාගෙන යෑම වෙනුවෙන් වූ ක්‍රියාමාර්ග සම්පූර්ණයෙන්ම අසාර්ථකව ආර්ථික අවුලකට අද අප රට ඇද වැටෙන බව සහ තවත් දේවල් කියමින් දිනේෂ් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් සභාව කල් තැබීමේ යෝජනාවක් ගෙනැල්ලා දැන් ඒ විවාදය පවත්වාගෙන යනවා. නමුත් කනගාටුවට කරුණ වෙන්නේ දිනේෂ් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමාවත්, එතුමාට සහයෝගය දෙන ඒකාබද්ධ විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක්වත් මේ සභා ගැබේ නොසිටීමයි. ඔබතුමිය නම් මූලාසනයේ ඉන්නවා ගරු මන්ත්‍රීතුමියනි. නමුත් සභාවේ ඒ කිසිම මන්ත්‍රීවරයෙක් නැහැ. මේක ඒ අයට වැදගත් යෝජනාවක් නොවෙයි වෙන්න ඇති. ඒ නිසා නිකම් මාධ්‍ය සන්දර්ශනයට කළ දෙයක් විධියට තමයි මට නම් හිතෙන්නේ. වැදගත් යෝජනාවක් නම් අපි මොනවාද කථා කරන්නේ, මොනවාද අපේ අදහස් කියලා එතුමා බොහොම ඕනෑකමින් අහගෙන ඉන්න ඕනෑ. නමුත්

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

එතුමාවත්, එතුමාගේ කණ්ඩායමේ කවුරුන්වත් මේ සභාවේ නොමැතිවීම විශේෂයෙන්ම කනගාටුවට කරුණක් වෙනවා.

අපේ ගරු ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා, එදා බොහොම හොඳට ජීවත් වෙන්න පුළුවන්කම තිබුණු කාන්තාවට අද එහෙම ජීවත් වෙන්න බැරි වෙලා කියලා. මම එතුමියගෙන් අහනවා, එතුමිය ඊයේ පෙරේදා මැරිලා ආයේ ඉපදුණාද කියලා. මොකද 2014දී කිරි පිටි කිලෝවක මිල කීයද? ආනයනික කිරි පිටි රුපියල් 962යි. දැන් ඒක රුපියල් 810ට බැහැලා. ඔය "වැට් බැට්" මොනවා තිබුණත් කිරි පිටි රුපියල් 810ට බැහැලා. එදා 2014දී දේශීය කිරි පිටි කිලෝවක් තිබුණේ රුපියල් 962ට. අද ඒක රුපියල් 735ට බැහැලා. කිලෝග්‍රෑම් 12.5 ගෑස් කෑන් එකක් කීයටද තිබුණේ? රුපියල් 2,650ට. අද ඒක රුපියල් 1,350ට බැහැලා. පෙට්‍රල් ලීටරයක් එදා කීයටද තිබුණේ? රුපියල් 165යි. අද ඒක රුපියල් 117ට බැහැලා. ඩීසල් ලීටරය එදා කීයටද තිබුණේ? රුපියල් 130ට. අද ඒක රුපියල් 95ට බැහැලා. භූමි තෙල් ලීටරයක් එදා තිබුණේ රුපියල් 95ට. අද ඒක රුපියල් 55ට බැහැලා. පරිප්පු කිලෝ එකක් එදා තිබුණේ රුපියල් 220 - 240ට. අද ඒක රුපියල් 169ට බැහැලා. පාන් දිහා බැලුවත්, පොල් දිහා බැලුවත්, කිරි පිටි දිහා බැලුවත් ඒවායේ මිල අඩු වෙලා. සීනි තිබුණේ කීයටද? රුපියල් 116ට. අද ඒක රුපියල් 95ට බැහැලා. රටේ ජීවත් වන කාන්තාවට, ගෘහණියට අවශ්‍ය අත්‍යවශ්‍ය භාණ්ඩ සිල්ලේම මිල 2014 අවුරුද්දට වඩා -මහින්ද රාජපක්ෂ පාලන කාලයට- අද අඩුයි කියන එක මම විශේෂයෙන්ම සඳහන් කරනවා. එතුමිය කොහේද දන්නේ නැහැ ඒ කාලයේ හිටියේ. කුස්සියේ නොවෙයි වෙන්න ඇති ඉන්න ඇත්තේ; දැන් තමයි කුස්සියට යන්න ඇත්තේ.

අපි ඇයි මේ ආර්ථික අවුලකට වැටුණේ? එහෙම වුණේ එදා ගත් අදූරදර්ශී ක්‍රියා මාර්ග නිසා. 2011දී මේ රටට හාල් ගෙනාවේ ටොන් 28,000යි. 2012දී ටොන් 36,000ක් ගෙනැල්ලා තිබෙනවා. 2013දී මේ රටට හාල් ආනයනය කළේ ටොන් 23,000යි. 2014දී මේ රටේ ඉතිහාසයේ වැඩිම හාල් ප්‍රමාණය වන ටොන් 600,000ක් ආනයනය කරලා මේ රටේ සමස්ත වී ගොවියා නැති කරලා දැම්මා. 2015දී තමයි ඒකට උත්තර ආවේ. එදා හාල් ආනයනය කරන විට ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ටික, එදා කැබිනට් ඇමතිවරුන් කිව්වේ නැද්ද, "එපා සර්, එපා ජනාධිපතිතුමනි, හාල් ආනයනය කරන්න" කියලා. කැබිනට් එකේදී එහෙම ප්‍රකාශ කළේ නැද්ද? එදා ගොවීන් අතර මං කරලා දැන් කිඹුල් කඳුළු හෙළනවා.

එදා හිටපු ජනාධිපතිතුමාගේ ලයිට් බිල කීයද? වතුර බිල කීයද? මාසයකට රුපියල් ලක්ෂ 23යි. එදා කිව්වේ නැද්ද, "අනේ සර්, ඔව්වර ලයිට් පාවිච්චි කරන්න එපා, වතුර පාවිච්චි කරන්න එපා. රට ටිකක් අමාරුවෙන් ඉන්නේ" කියලා. ලක්ෂ 23ක ලයිට් බිලක් ගෙවන්න එපා කියලා කිව්වේ නැද්ද? එදා ඡන්දයට වැඩ කරපු ගුවන් හමුදාවේ හෙලිකොප්ටර්වල බිල කීයද? ජනාධිපතිවරණයේදී රජයේ හෙලිකොප්ටර් සඳහා රුපියල් ලක්ෂ 304ක් වියදම් කළා. එදා මැයි පෙළපාළි සඳහා CTB බස් අරගෙන ගියේ කොහොමද? ශ්‍රී ලංගමය කඩාගෙන වැටිලා, රටේ ආර්ථිකය ණයවලින් හිරවෙලා තිබියදී තමුන්නාන්සේලා කිව්වේ නැද්ද, "අනේ සර්, මැයි පෙළපාළි සඳහා අරගෙන යන බස්වලට කීයක් හරි ගෙවමු, නැත්නම් CTB එකට දුවන්න බැහැ, සේවකයන්ගේ පාරිතෝෂිකය ගෙවන්න බැහැ, සේවකයෝ අසරණ වෙලා, පඩි ගෙවාගන්න බැරිව CTB එක දහලනවා, අපි සල්ලි කීයක් හරි දීලා බස් අරගෙන යමු, නිකම් අරගෙන යන්න එපා" කියලා. තමුන්නාන්සේලා එහෙම කිව්වේ නැද්ද?

එදා ඡන්දය මුල් කරගෙන සමෘද්ධිලාභීන්ගේ සල්ලිවලින් රුපියල් කෝටි දෙකක ලිත් ගැහුවා. එදා හිටපු ඇමතිවරු, දැන් ඉන්න මන්ත්‍රීවරු එදා මේවා ගැන කිව්වේ නැද්ද? "ලිත් ගහන්න එපා, අභිංසක සමෘද්ධිලාභීන්ට ජීවත් වෙන්න විධියක් නැහැ, සමෘද්ධි දීමනාව දෙගුණ කරමු, මේ වාගේ විනාශ කරන්න එපා" කියලා එදා ඇමතිවරු කැබිනට් එකේදී කිව්වේ නැද්ද?එදා මේ රටේ ව්‍යාපෘති - රුපියල් කෝටි 55,500ක ව්‍යාපෘති - ටෙන්ඩර් පටිපාටියක් නැතුව චීන්නුන්ට, වෙනත් විදේශ රටවලට කොන්ත්‍රාත් දුන්නා. "අනේ, ඕවා කරන්න එපා, අපි මේවා නවත්වලා රට හදමු" කියලා තමුන්නාන්සේලා ඒ වෙලාවේ කැබිනට් රැස්වීමේදී කිව්වේ නැද්ද? අද නිකම් කිඹුල් කඳුළු හළනවා.

2014දී SriLankan Airlines එකේ පාඩුව කීයද? රුපියල් කෝටි 3,136යි. ශ්‍රීලන්කන් පාඩු ලබද්දී ජනාධිපති airbus එකක් අරගෙන බොලීවියා ගියා. තමන්ගේ කාර් එක අරගෙන ගිහිල්ලා ගහක් යට නවත්වලා තියනවා වාගේ, බොලීවියා ගිහිල්ලා සමුළුව අවසන් වනතෙක් ගුවන් යානය airport එකේ නවත්වාගෙන හිටියා. ඒවා කරන්න එපා කියලා තමුන්නාන්සේලා කිව්වේ නැද්ද? නමුත් අපි ඒවා කිව්වා. අපි ඒවා ගැන කථා කළා.

අද ජනාධිපතිවරයා ඒ විධියට යන්නේ නැහැ. අද අග්‍රාමාත්‍යවරයා ඒ විධියට වියදම් කරන්නේ නැහැ. රටේ ආර්ථිකය ගැන, රටේ ජනතාව ගැන යම් දැක්මක් ඇතුවයි අපි කටයුතු කරන්නේ. මෙන්න මේ වාගේ වැඩ කරලා මේ රටේ ආර්ථිකය කඩාගෙන වැටුණා. අද අපි ඒක ජනතාවට හෙළි කරනවා. නිත්ත වුණත් අපි ඇත්ත කියනවා. කොච්චර උද්ඝෝෂණ කළත්, විරුද්ධව කොච්චර මත ප්‍රකාශ කළත් අපි රටේ ජනතාවට ඇත්ත කියනවා.

සියලු දේශපාලන පක්ෂ එකතු වෙලා තීන්දු තීරණ අරගෙන, සර්වපාක්ෂික කැබිනට්ටුවක් හදලා, මුළු පාර්ලිමේන්තුවම එකම රජයක් කරලා, මේ රටේ රාජ්‍ය ආයතනවල වංචා දූෂණ තිබෙනවා නම් හොයන්න කියලා ඒ කමිටුවේ සභාපතිකමත් ජනතා විමුක්ති පෙරමුණට හාර දීලා, ද්විඩ පක්ෂවලටත් තැනක් දීලා, ඔවුන්ට විපක්ෂ නායකකමත් දීලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටින මන්ත්‍රීවරුන්ට ඇමතිකම් දීලා, ඒ ඔක්කෝම එකතු කරගෙන රට ගොඩනඟන ක්‍රමවේදය අරගෙන යනවා. අද රට අවුලකට වැටිලා තිබෙනවා. ඒ අවුලට වැටිටෙව්වේ කවුද? ඒ අවුලෙන් රට ගොඩගන්න අපි ඔක්කෝම අත් වැල් බැඳගෙන කටයුතු කරනවා කියලා. ඒ විධියට කටයුතු කරලා මාස 60 අවසාන වන විට අපි මේ රටේ ප්‍රගතිය පෙන්වනවාය කියන එකත් විශේෂයෙන් සඳහන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2005දී මේ රටේ රාජ්‍ය ණය කීයද? 2005දී මේ රටේ රාජ්‍ය ණය රුපියල් කෝටි 222,234යි. 2014දී රාජ්‍ය ණය කීයද? අවුරුදු 10ක් යන්නත් පෙර 2014දී රාජ්‍ය ණය රුපියල් කෝටි 950,000යි. ණය ප්‍රමාණයේ කොපමණ වැඩිවීමක් වෙලා තිබෙනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013දී මේ රටේ සමස්ත ආදායම කීයද? රුපියල් කෝටි 113,700යි. කීයක් ණය ගෙව්වාද? සමස්ත ආදායම විධියට රුපියල් කෝටි 113,700ක් අරගෙන කොපමණ ණය ගෙව්වාද? රුපියල් කෝටි 116,200යි. ණය ගෙවාගන්නවත් රටේ සමස්ත ආදායම මදිවන යුද්ගයක් එදා මේ රටේ තිබුණා. මේ සමස්ත ආදායම සොයාගත්තේ කොහොමද? සියයට 10ක්ව පවතින රාජ්‍ය ආදායම - හරි නම් රාජ්‍ය ආදායම සියයට 20ක්, 30ක්, 40ක් වෙන්නට ඕනෑ - ප්‍රමාණවත් නැති නිසා රාජ්‍ය ආයතන පාඩු පිට පාඩු විඳිනවා. අපි බැලුවොත්, 2014දී ලංකා විදුලිබල මණ්ඩලය පාඩු විඳිනවා රුපියල් කෝටි 1,460ක්. මිහින් ලංකා ආයතනය රුපියල් කෝටි 259ක් පාඩු විඳිනවා. SriLankan Airlines රුපියල් කෝටි 3,136ක් පාඩු විඳිනවා. ශ්‍රී ලංගමය රුපියල් කෝටි 186ක් පාඩු විඳිනවා. ශ්‍රී ලංකා දුම්රිය

දෙපාර්තමේන්තුව රුපියල් කෝටි 1,103ක් පාඩු විඳිනවා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් කෝටි 36,500ක් ණයයි. වරාය අධිකාරිය රුපියල් කෝටි 26,000ක් ණයයි. SriLankan Airlines ණයයි. අපි 2015 වර්ෂයේදී මේ ආණ්ඩුව ගත්ත ගමන් ලංකා විදුලිබල මණ්ඩලයේ ණය සහ පොලිය රුපියල් කෝටි 1,800ක් ගෙව්වා. කොහොම රටක්ද අපි ගත්තේ? කොහොම රටක්ද අපට භදන්න වෙලා තිබෙන්නේ? පාඩු විඳින ආයතන නඩත්තු කරන්නත් මේ රටේ අහිංසක දුප්පත් ජනතාවට සිද්ධ වෙලා තිබෙනවා.

රාජ්‍ය ආදායමේ වටිනාකම සියයට 10යි. මේ සමස්ත ආදායමෙන් සියයට 90ක් බදු මුදල්. බද්දෙන් දුවන රටක්. රාජ්‍ය ආයතන කාබාසිනියා කරලා, රුපියල් කෝටි හතක විතර ඇට බෙදලා, මහජන මුදල් කාලා තිබෙනවා. අවසානයේ බද්දෙන් දුවන රටක් නිර්මාණය වුණා. රාජ්‍ය ආදායම කැළේ ගියා. ඒවා පාඩු බවට පත් වෙලා බද්දෙන් දුවන රටක් නිර්මාණය වුණා. එහෙත් ධනවතුන්ගෙන් බදු ආදායම හැටියට ලැබුණේ සියයට 20යි. මේ රටේ බොහෝ ධනවතුන් හිටියා. ජනාධිපතිවරයා කිව්වා; රජය කිව්වා; මහ බැංකුව කිව්වා, ඒකපුද්ගල ආදායම ඩොලර් 3,125යි කියලා. ඒ කියන්නේ මේ රටේ සාමාන්‍ය පවුලක සමස්ත මාසික ආදායම රුපියල් 1,60,000යි කියලා. නමුත් එහෙම ආදායම් ලබන මිනිස්සු කොහේද හිටියේ? එච්චර ආදායමක් ලැබුණා කියලා ආදායම් බදු ගෙව්වාද? නැහැ. කුඩු ව්‍යාපාරවලින්, කැසිනෝ ව්‍යාපාරවලින්, නීති විරෝධී ව්‍යාපාරවලින් ආදායම් ලබමින් මේ රටේ ධනවතුන් පිරිසක් බිහි වුණා. හැමදාම අහිංසක, දුප්පත් මිනිසුන් පහළට වැටුණා. ඒ අය වෙනුවෙන් කථා කරන්න කවුරුවත් හිටියේ නැහැ. මේ විධියට බදු මුදල් අය කළේ දුප්පත් මිනිසුන්ගෙන් කියලා මම කියනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමීය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)
විනාඩි කීයක්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමීය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
විනාඩි එකයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)
දුප්පත් මිනිසුන්ගේ කර මත තමයි බදු වැටුණේ. බදු මුදල් විධියට ධනවතුන් ගෙව්වේ සියයට 20යි. සියයට 80ක්ම මේ රටේ දුප්පත් මිනිස්සු තමයි බදු ගෙව්වේ. සියයට 80ක් දුප්පත් මිනිස්සුන්ගේ බදු තමයි එක්කාසු වුණේ. ඒ සඳහා ක්‍රමවේදයක් හදන්න තමයි අපි අලුත් VAT system එක හැදුවේ. මහින්ද රාජපක්ෂ මහත්මයා 2013 මේ රටට හඳුන්වා දුන් තොග සහ සිල්ලර වෙළෙඳ බදු ක්‍රමය ක්‍රියාත්මක කරන්නයි අපි උත්සාහ කළේ. මහින්ද රාජපක්ෂ මහත්මයා තොග සහ සිල්ලර වෙළෙඳාමට 2013 වැට බද්ද ගහන කොට, එදා හිටපු මැති ඇමතිවරු - අද ඒකාබද්ධ විපක්ෂයේ ඔය කියන කණ්ඩායම - පුස් පැටව් ටික වාගේ අත එසවූවා, "ගහන්න, ගහන්න, සර්. ප්‍රශ්නයක් නැහැ" කියලා. නමුත් අද අපි එය ක්‍රියාත්මක කරන්න ලැහැස්ති වෙලා කටයුතු කරන කොට,"මේක වැරැදියි" කියලා පෙළපාළි යනවා. මම කියන්නේ ඇත්ත. ඒක තමයි යථාර්ථය. "කන කොට තලගොයි, නොකන කොට කබරගොයි" වැනි සංස්කෘතියකට යන්න එපා. එක්වෙලා රට හදන තැනට කටයුතු කරමු කියලායි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, 2015 ජනවාරි 8වැනිදා මේ රට වෙනස් කරන්න ජනතාව අපට අවස්ථාවක් දුන්නා. ඒ ක්‍රියාදාමයේ දී මොන විරෝධතා ආවත්, ගල් පෙරළුවත් අපි ඒ ගල් පර අස්සෙන් ගිහිල්ලා මේ රට හදනවා. අපි ජනතා බලාපොරොත්තු ඉෂ්ට කරනවා.

2015 වසරේදී අපි අලුත් රජය හදන්න කලින් මේ රටේ බොහෝ නීති - රීති සම්පාදනය කළා. යහ පාලනයක් සඳහා, දූෂණයක් නැති රටක් නිර්මාණය කිරීම සඳහා ස්වාධීන කොමිෂන් සභා මේ රටට හඳුන්වා දීලා, රාජ්‍ය සේවකයාට නිදහසේ වැඩ කරන්න පුළුවන් කාලයක් මේ රටේ අපි ඇති කරලා දුන්නා. අපට එදා තොරතුරු දැන ගැනීමේ අයිතිය තිබුණේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමීය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට ලැබී ඇති කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන අපි මත්තල ගුවන් තොටුපළට ගිහිල්ලා, "මේක පාඩු ලබන්නේ ඇයි? ණය ගත්තේ කොහොමද?" කියලා ඇහුවාම මොකද වුණේ? නගරාධිපතිවරුන්, දේශපාලනඥයන් පිස්තෝල අරගෙන අපි පස්සෙන් පැන්නුවා. නමුත්, මේ රටේ ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්නත්, අපිට වුණු දේ මේ රටේ අහිංසක ජනතාවට නොවෙන්නටත් ඕනෑ නිසා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත අපි මේ රටට හඳුන්වා දුන්නා. දැන් එහෙම වෙන්න බැහැ. හැම කෙනෙකුටම, මේක අපේ සල්ලි රජයේ සල්ලි කිව්වාට රජයට සල්ලි නැහැ. රජයේ සල්ලි කියන්නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සල්ලි නොවෙයි. අග්‍රාමාත්‍යතුමාගේ-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමීය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ වීය.

අතන් පිරකු, මාණ්පුමිකු (තිරුමති) ශ්‍රීයාණි විජේවික්කිරම අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON.(MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මම විශේෂයෙන් කියන්න කැමැතියි, අපේ ආර්ථික දැක්ම, ආර්ථික වැඩ පිළිවෙළ ගැන. දැනුම මත පදනම් වූ තරගකාරී සමාජ වෙළෙඳ පොළ ආර්ථිකයක් නිර්මාණය කරන්න අපි අවශ්‍ය කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි, ආර්ථිකය කඩා ගෙන වැටෙද්දී අපි කොයි තරම් අමාරුවෙන් මේ කටයුතු කළත්, ජනතාවට දෙන්න ඕනෑ සහන අමතක කළේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඒ සහන සියල්ලම ලබා දෙනවා. අපි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල අඩු කළා. ඒ කාලයේ සීනිවලට, කිරි පිටිවලට වැට බද්ද තිබුණා. අපි බදු අඩු කරලා, 2014 වසරේ තිබුණු බඩු මිලට වඩා අඩු බඩු මිලක් නිර්මාණය කර දීලා තිබෙනවා.

මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි, අපි ව්‍යාපාරිකයන්ගේ ණය පොලිය අඩු කර තිබෙන බව. ඒ විතරක් නොවෙයි, 2014 වර්ෂයට වඩා අපි සහන ලබා දීලා තිබෙනවා. අපටත් අඩු පාඩුවක් සිදු වෙලා තිබෙනවා. අපි ජනතාවට සහන දුන්නා, ජනතාවගේ පඩි වැඩි කළා. නමුත් මේවා ප්‍රචාරය කරන්න කෙනෙක් නැහැ. වැරැදි ගැන විතරයි කථා කරන්නේ. 2014 වර්ෂයේදී ගොවියාගේ විශ්‍රාම වැටුප ගෙවීම සඳහා වියදම් කර තිබුණේ, රුපියල් මිලියන 126,136යි. නමුත් අපි රුපියල් මිලියන 155,320ක් 2015 වර්ෂයේදී ගෙවා තිබෙනවා. සමෘද්ධිය සඳහා පසු ගිය රජයෙන් වෙන් කර තිබුණේ, රුපියල් මිලියන 15,042යි. අපි රුපියල් මිලියන 39,954ක් සමෘද්ධි ආධාර වශයෙන් වෙන් කළා. පොහොර සහනාධාරය සඳහා පසු ගිය රජයෙන් වියදම් කළේ, රුපියල් මිලියන 31,802යි. 2015 වර්ෂයේදී අපි ඒ සඳහා රුපියල් මිලියන 49,000ක් වෙන් කළා. ඒ විතරක් නොවෙයි, පසු ගිය රජය කාලයේ අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදනයෙන් වෙන් කර තිබුණේ, සියයට 1.9යි. නමුත් අපි මේ කෙටි කාලය තුළදී සියයට 2.9ක මුදලක් වෙන් කළා. මේවා කරන ගමන් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය තවත් වැඩ පිළිවෙළවල් අප ක්‍රියාත්මක කරනවා.

අපි යුරෝපීය මත්ස්‍ය තහනම ඉවත් කර ගෙන රුපියල් කෝටි 3,000ක විදේශ විනිමය ලැබෙන ක්‍රමවේදයක් ඇති කර ගත්තා. ජාත්‍යන්තරය හා එක්කාසු වෙලා අපේ රට විදේශ විනිමයෙන් ශක්තිමත් කරන්න අවශ්‍ය පියවර ගත්තා. හෙට අනිද්දා වෙනකොට මේ රටට GSP සහනය ලබා දීලා, යුරෝපයත් එක්ක සාකච්ඡා කරලා මේ රටේ කර්මාන්තශාලා නිර්මාණය කරනවා. ඒ විතරක් නොවෙයි, එදා swimming pool එකක් වෙලා තිබුණු නැව් එන්නේ නැති වරාය ලෝකයේ ප්‍රබලම වරායක් බවට පත් කිරීමට ලෝකයේ සියලු රටවල් සමඟත්, දේශීය විද්වතුන් සමඟත් එක්කාසු වෙලා අප සාකච්ඡා කරනවා. ඒ වාගේම මත්තල ගුවන් තොටුපොළ පාවිච්චි කරලා දකුණ විදේශීය සංචාරකයන්ගේ කලාපයක් බවට පත් කර ජනතාවගේ කර මතට එක්කාසු වී තිබුණු ඒ බර අප ඉවත් කරනවා කියන එකත් මේ අවස්ථාවේදී මා සඳහන් කරන්න කැමැතියි. එම නිසා මම කියනවා, අපි තව ටිකක් ඉවසමු. අපි පැමිණි දුරක් තිබෙනවා. අපේ අලුත් ආණ්ඩුව තවම අවුරුද්දක කාලයක්වත් ගත කරලා නැහැ. අලුත් ආණ්ඩුව ඇවිල්ලා මාස දොළහක් ගත වෙලා නැහැ. තව ඉදිරියටත් මාස පනහකට වඩා කාලයක් අපට ගමන් කරන්නට තිබෙනවා. අන්න ඒ ගමන බොහොම ඉවසිල්ලෙන් යමු. භයානක චිත්‍ර පෙන්වූවාට, යකුන් මැව්වාට, භූතයෝ මැව්වාට ඒවාට හසු වෙන්න එපා. වැට බද්දට "වැට රකුසා" කියලා කිව්වා. ඒවාට හසු වෙන්නේ නැතුව ඉතාම ඉවසීමෙන් කටයුතු කරමු කියලා මම මේ රටේ ජනතාවට කියනවා. එදා, ලී ක්වාන් යූ මැතිතුමා සිංගප්පූරුව ගොඩ නැඟුවා වාගේ අද ශ්‍රී ලංකාව ගොඩ නහන්නේ රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ රජය කියන එකත් මේ අවස්ථාවේ දී මා විශේෂයෙන්ම සඳහන් කරනවා. ඒ ගැන විශ්වාසය තබාගෙන ඒ ගමනට එකතු වෙන්නය කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා, බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා.

[අ.භා. 4.10]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අදාළ විවාදයට සහභාගිවීමට ලැබීම ගැන මා සතුටු වෙනවා. නමුත් මෙම යෝජනාව ඉදිරිපත් කළ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාවත්, එතුමාගේ Shadow Cabinet එකේ අයවත් මේ අවස්ථාවේ ගරු සභාවේ නැතිවීම ගැන යම් දුකක් තිබෙනවා. එයින්ම පෙනී යනවා, මේ යෝජනාවේ තිබෙන දුර්වලකම සහ මෙම යෝජනාව ඉදිරිපත් කළේ ඇයි, එය ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ මොනවාද කියන කාරණය. මෙම යෝජනාව පාර්ලිමේන්තුවේ සියලු දෙනා එකතු වෙලා සාකච්ඡා කරන්න නොවෙයි, වෙනත් මොකක් හරි agenda එකකට ඉදිරිපත් කරපු යෝජනාවක්ද කියන ප්‍රශ්නය අපට පැන නඟිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට කඩා වැටුණු ආර්ථිකයක් පැවති රටක්. නමුත් අපි අපේ ආණ්ඩුව ජනතාවට වග කියන ආණ්ඩුවක් බවට පත් කර තිබෙන බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. මේ ආණ්ඩුව බොහොම වගකීමකින් ගමන් කරන මොහොතක තමයි, මෙවැනි යෝජනාවක් ඉදිරිපත් වී තිබෙන්නේ. ඔබ කවුරුත් දන්නවා, යහ පාලන ආණ්ඩුව බලයට පත් වෙනකොට මේ රට තිබුණේ කොහොමද, මේ රට තිබුණේ කොතැනද කියලා. මේ සියලු ප්‍රශ්නවලට විසඳුම් සොයන සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය ජය ගෙන, අවුරුදු 30කින් පස්සට ගිය ලංකාවේ අනාගතය නැවත ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියලා දකින යෝජනාවලියක් තමයි අප සතුව තිබෙන්නේ.

මේ අවස්ථාවේදී ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ගරු සභාවට පැමිණීම ගැන මා සතුටට පත් වෙනවා. අපට මේ ගැන වාද විවාද කරන්න පුළුවන්.

විශේෂයෙන් මේ ආර්ථිකය ගැන කථා කරන කොට පසු ගිය අවුරුදු 20 තුළ එවකට ආණ්ඩුවේ හිටපු ආර්ථික ඔස්තාර්වරු කියපු කථා අපිට මතකයි. අපිට මතකයි, රුපියල් 2,500න් පවුලකට මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියලා කියපු කථාව. රුපියල් 2,500න් පවුලකට මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියලා කිව්වාට, පසු ගිය රජය ආර්ථිකය මෙහෙයවූයේ කොහොමද කියලා අපි දැක්කා. කවුරු කතන්දර කිව්වත්, මේ ආර්ථික ක්‍රියාදාමයන්වලට තීරණ ගත්තේ කොහෙන්ද කියලා අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය කියලා අමාත්‍යාංශයක් තිබුණා. මෙන්න මේ තීරණ ගන්න කොට මේ කියන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය තමයි බූවල්ලා වාගේ සියලුම අමාත්‍යාංශ ටික වහගෙන ඒ අමාත්‍යාංශවල ක්‍රියා පටිපාටියන් ක්‍රියාත්මක කළේ. සමහර වෙලාවට ජලය පිළිබඳව ඇමතිවරයෙක් සිටියත්, ජලය සම්බන්ධ සියලුම projects කළේත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන්. මහා මාර්ග පිළිබඳව ඇමතිවරයෙක් සිටියත්, පාරවල් හදන්න

සියලුම මුදල් වියදම් කළේත් ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන්. ඒ දවස්වල මේ කියන ආර්ථික ඔස්තාර්වරු පැත්තකට වෙලා පූසන්ට භය මීයෝ වාගේ තමයි කටයුතු කළේ. අද අපේ යහ පාලන ආණ්ඩුවේ තිබෙන තිරසාර ආර්ථික වැඩපිළිවෙළට ඔවුන් භය වෙලා. මේ භයවීම කොහොමද කියලා කියනවා නම්, හෙට අනිද්දා ලැහැස්ති වෙනවා, නුවර සිට කොළඹ දක්වා පා ගමනින් පැමිණෙන්න. මම හිතන්නේ, පසු ගිය අවුරුදු 20ක් තිස්සේ වැඩිය ඇවිද්දේ නැති නිසා මේ ආර්ථිකය ගැන කථා කරන්න නුවර ඉඳන් කොළඹට ඇවිදින්නත් ලැහැස්ති වෙනවා කියලායි. අවුරුදු 20ක් තිස්සේ රට කාලා, කාලා මහත් වෙලා, දැන් හිතනවා ඇති exercise එකටත් එක්ක පොඩ්ඩක් ඇවිදින එක හොඳයි කියලා. අපි එහෙමවත් හිතමු. මම හිතන්නේ ඇවිදින එකෙන් සමහර වෙලාවට එක එක ලෙඩ රෝග වැඩිවෙලා,- රට කාපු තරමට ඒ කාලයේ ඇවිදින්නවත් වෙලාවක් තිබෙන්නේ නැතිව ඇති. -[බාධා කිරීමක්]- දැන් සල්ලිත් තිබෙනවා නේ. රට කාපු කෑම දිරවා ගන්න බැරිව මේ සල්ලිත් වියදම් කරලා ඇවිදින්න පටන් අරගෙන කියලායි අපිට නම් හිතෙන්නේ.

මේ ආර්ථික ඔස්තාර්ලා අපේ රට කාපු එක ගැන අපි දිගටම කථා කළා. අපට තිබෙන අභියෝගය තමයි, මේ කාපු කෑම නිසා අවුරුදු 30ක් පස්සට ගිය රට ඉදිරියට ගෙනැල්ලා රටේ සියලු දෙනාටම මුදල් ගලායන ක්‍රමවේදයකට රට සංවර්ධනය කරන්නේ කොහොමද කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා, පසු ගිය අවුරුදු 20ක කාලය තුළම මුදල් ගලා ගියේ එක්තරා පවුලක් වටා භ්‍රමණය වෙච්ච ව්‍යාපාරික පන්තියකට විතරක් බව. මේ සමාජ තලය තුළ ඉන්න පහළ මධ්‍යම පන්තියේ අයට සහ ඉහළ මධ්‍යම පන්තියේ අයටත්, මේ ආදී සියලුම පන්ති තුළටත් ඒ ආදායම ගලායන ක්‍රමවේදයක් නොවෙයි තිබුණේ. තමන් මේ රට විනාශ කරලා, කාබාසිනියා කරලා හම්බ කරගත්ත සල්ලි ටික කොහේද දැම්මේ කියලා හොයන කොට තමයි මේ හිටපු කණ්ඩායම තව තවත් භය වෙලා තිබෙන්නේ. එහෙම නැත්නම්, මේ ගොල්ලන් අයථා ගනු - දෙනුවලින් හම්බ කරගත්ත ආකාරය ගැන හොයන කොට මෙන්න නිදාගෙන හිටිය අය නැගිට්ටා වාගේ කලබල වෙලා ඇවිදින්න පටන් ගන්න හදනවා. ඒක තමයි අපි දකින මේ කාරණයත් එක්ක පිළිබිඹු වෙන්නේ. පැහැදිලිවම මේ ආණ්ඩුව අවුරුදු 5ක් යනතෙක් හොල්ලන්නවත් බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, ගරු ජනාධිපතිතුමායි, ගරු අගමැතිතුමායි රටේ ප්‍රධාන පක්ෂ දෙක එකතු කරලා ප්‍රබල විධියට ආණ්ඩුවක් ගොඩනඟා තිබියදී, බොරුවට කෑ ගැහුවාට, ඇවිද්දට මේ ආණ්ඩුව හොල්ලන්න බැහැ කියලා. නමුත්, මගේ හිතවත් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ යෝජනාව මේ වෙලාවේ ඉදිරිපත් කරපු එක ගැන සන්තෝෂ වෙනවා. මොකද, මේ කාරණා ටිකවත් එතුමාට පැහැදිලි කරලා දෙන්න අවස්ථාවක් ලැබුණ නිසා.

මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමියන්ලා කාන්තාවන් ගැන කථා කළා. කාන්තාවන් සම්බන්ධයෙන් කථා කරන කොට කාන්තා කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමියක් කියපු කථාවක් මට මතක් වෙනවා. ඒක අපි බොහෝ දෙනෙක් දන්නා කථාවක්. මීට අවුරුදු 5කට, 6කට කලින් පසු ගිය රජය කාලයේ කාන්තාවන් ගැන කථා කරන ප්‍රඥප්තියක් ඉදිරිපත් කළාම, ඒ ප්‍රඥප්තිය අරගෙන විසි කරලා තිබෙනවා. විසි කරලා අහලා තිබෙනවා, "කාන්තා ප්‍රඥප්තියක් හැදුවොත් අපි ඊළඟ ඡන්දයට යන්නේ කොහොමද?" කියලා. ඇයි, කාන්තාවන් රවටන්න බැරි වෙනවා නේ. පන්සල්වලට ගිහිල්ලා පපුවට ගහ ගෙන, එහෙමත් නැත්නම් ගමට ගිහිල්ලා, කලින් ලැහැස්ති කරපු පුංචි අත දරුවෙක් වඩා ගෙන කාන්තාව රැවටුවා නේ. නමුත් කාන්තා ප්‍රඥප්තියක් හැදුවා නම් ඒ ගොල්ලන්ට කාන්තාව රවටන එක කරන්න බැරි වෙනවා. කාන්තාව සඳහා කටයුතු කරන එක, කාන්තාව ඉදිරියට එන එක වළක්වා ගන්න බැරි වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් අපේ රජය පැහැදිලිවම කාන්තාව වෙනුවෙන් පෙනී සිටිනවා. ඒ විතරක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂය තමයි කාන්තා නායකත්වය සඳහා සියයට 25ක නියෝජනයක් ලබා දෙනවා කියපු ලංකාවේ ප්‍රථම පක්ෂය. කිසිම පක්ෂයකට අද වෙනකල් ඒක කියා ගන්න බැරි වුණා. අපට තිබෙනවා, එඩිතර නායකත්වයක්. ඒ යටතේ තමයි අපි කාන්තාවට සලකන්නේ.

විදුලිබල ක්ෂේත්‍රය ගැන කථා කරද්දී අද අපට නිතර ඇහෙනවා, නොබෙල් ත්‍යාග ලාභීන් ගැන. අපි අහලා තිබෙන විධියට ලෝකයේ නොබෙල් ත්‍යාග ලාභීන් ඉන්නේ විද්‍යාව, තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රවලයි. නමුත් අපට ඊයේ පෙරේදා තව අලුත් විධියක නොබෙල් ත්‍යාග ලාභීන් ගැන අහන්න ලැබුණා, විදුලිබල ක්ෂේත්‍රයේ; ගල් අඟුරු සැපයීම සම්බන්ධයෙන්. 2010 සිට 2015 වසර දක්වා ගල් අඟුරු සැපයීම සඳහා සියලුම ටෙන්ඩර් ලබා ගෙන තිබුණේ නොබෙල් රිසෝසස් කියන සමාගම. මේ නොබෙල් රිසෝසස් කියන සමාගම කොච්චර බලවත්ද කියනවා නම්, ඒ ගොල්ලන්ට හිතුණාම ගල් අඟුරු ගෙන්වන එක නවත්වනවා, ලංකා ගල් අඟුරු සමාගම, "අනේ, අපට ගල් අඟුරු ගෙනැල්ලා දෙන්න" කිව්වාම ඔන්න ආයෙත් ගෙනැල්ලා දෙන්න පටන් ගන්නවා. මේ ගැන කවුරුවත් කථා කළේ නැහැ. බයයි නේ. පූසට බයේ මීයෝ ටික ඉන්නවා වාගේ බයට හිටියා. දැන් ඒ සම්බන්ධයෙන් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය අලුත් ටෙන්ඩර් පටිපාටියකට යන කොට ඔන්න රත් වෙනවා, නොබෙල් සමාගමෙන් නොබෙල් ත්‍යාග ලබා ගත්ත කණ්ඩායම. මේ නොබෙල් ත්‍යාග ලබා ගත්ත කණ්ඩායමේ ඉන්න අය අතරේ පසු ගිය රජයේ හිටපු රජවරුන්ගේ කුමාරවරුනුත් ඉන්නවාය කියලායි අපට ආරංචි. ඉතින් ඒ කට්ටිය ඔක්කෝම කලබල වෙලා වැරදි විධියට චෝදනා කරනවා, දත්ත හරියට සංසන්දනය නොකර. ඉතින් මේක තමයි ඒ ගොල්ලන්ගේ පරාජිත දේශපාලනයේ මානසිකත්වය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අධ්‍යාපනය පැත්තට හැරුණොත්, අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා වැඩිම මුදලක් වැය කරන ආණ්ඩුවක් බවට අද අපේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. 2020 වර්ෂය වන විට ගුරුවරයෙකුගේ වැටුප කොච්චර ප්‍රමාණයකට ඉහළ නංවනවාද කියනවා නම්, 2020 වර්ෂය වන විට පළමුවන ශ්‍රේණියේ - Grade I - ගුරුවරයෙකුගේ වැටුප රුපියල් 71,000ක් දක්වා වැඩි වෙනවා. ඉතින් මේ කාරණා ක්‍රියාත්මක වෙන කොට ඒ ගොල්ලන් බයයි. ඇයි? රුපියල් 71,000ක් දක්වා ගුරුවරයෙකුගේ වැටුප වැඩි කළ ආණ්ඩුවක් ආපසු කවදාවත් වෙනස් වෙන්නේ නැති නිසා. අපේ මේ යහ පාලන ආණ්ඩුව 2020 වර්ෂය වන විට අපේ සියලුම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළාට පසුව අවුරුදු 20කට 30කටවත් හොල්ලන්න බැරි ආණ්ඩුවක් බවට පත් වෙනවා. ඒකට තමයි මේ බය. ඒ බය නිසා තමයි විවිධ නාඩගම් නටලා, විවිධ රඟපෑම් කරලා කොහොම හරි ජනතාව ගොනාට අන්දවන්න ලැහැස්ති වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ජනතාවට ගොනාට අන්දවන්න බැහැ. ඉස්සර අපි පොඩි කාලයේදී නම් මාධ්‍යවලින් එකක් කියනවා, "අනේ, ඇත්තද?" කියලා අපිත් ඒක අහ ගෙන ඉන්නවා. නමුත් අද මාධ්‍ය වෙනස්. අද සමාජ ජාල වෙබ් අඩවි හරහා තමන්ටත් තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්; සත්‍යය ප්‍රකාශ කරන්න පුළුවන්. අද ඒ හරහා විවෘත මනසකින් යුතුව තීරණ ගන්න පුළුවන් හැකියාව හැමෝටම ලැබී තිබෙනවා. ඒ නිසා ඉස්සර වාගේ මාධ්‍යවලින් ජනතාව රවටන්න බැහැ. තවමත් මේ රටේ රාජපක්ෂ මාධ්‍ය තිබෙද්දී ඒ ගොල්ලන් කරපු වැරදි වහ ගන්න, ඒ ගොල්ලන් කරපු හොරකම් වහ ගන්න බැරි වෙලා තිබෙනවා. මේ සියලු දේවල් කරන්න අද ඉඩකඩ ලැබිලා නැහැ. අදටත් මේ සමාජ ජාල හරහා ඇත්ත

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

තත්ත්වය අපට දැනගන්න පුළුවන්. ඒ නිසා පැහැදිලිවම කිසි කෙනෙකුට සත්‍යය වසන් කරන්න බැරි වෙනවා. ඒක තමයි අද මේ හොර නඩයට තිබෙන ප්‍රධානම අභියෝගය වන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ විවාදය සඳහා ඉදිරිපත් කරපු යෝජනාවේම බොහොම ආකර්ෂණීය වචන කිහිපයක් ඇතුළත් කරලා තිබෙනවා. රුපියලෙහි වටිනාකම පිරිහීම, ජීවන වියදම වේගයෙන් වැඩි වීම, වැට් ප්‍රශ්නය, ශිෂ්‍ය මර්දනය, විශ්වවිද්‍යාල සිසුන් මර්දනය, ලෝක බැංකුවේ plug එක ගැලවීම ආදී කෝකටත් තෙලය කියන වචන ටික තමයි හැම දාම භාවිත කරන්නේ. එහෙම නැතිව මේගොල්ලන්ට ප්‍රතිපත්ති ගැන වාද විවාද කරන්න බැහැ. ප්‍රතිපත්ති ගැන කථා කරන්න මේගොල්ලන්ට මනස පෑදෙන්නේ නැහැ. මේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය වැඩිදියුණු කරන්න වැඩියෙන්ම ආයෝජනය කරන්නේ මේ රජය බව මම පැහැදිලිවම කියනවා. ඒ වාගේම අලුතින් විශ්වවිද්‍යාල බිහි වෙනවා. අලුතින් Public-Private Partnership එකත් එක්ක යන ලෝකයේ පිළිගත් විශ්වවිද්‍යාල අපිට එනවා. ඒ වාගේම ලෝකය පිළිගත් වෙනත් විශ්වවිද්‍යාල හරහා අපේ ලංකාවේ ඒවායේ branches හැදෙනවා. මේ ආදී වශයෙන් විශ්වවිද්‍යාල පද්ධතියයි, අධ්‍යාපන පද්ධතියයි සම්පූර්ණයෙන්ම දියුණු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුද්දකට අපේ ශිෂ්‍යයෝ මිලියන 14,000ක් විතර පිට රට ඉගෙන ගන්න යනවා. අපි මේක නවත්වන්නේ නැද්ද? මේ තත්ත්වය නවත්වන්න අවශ්‍ය ප්‍රතිපාදන සමඟ අවශ්‍ය වැඩසටහන්, අවශ්‍ය projects අපි හදන්නේ නැද්ද? මේවාටයි මේගොල්ලන් විරුද්ධ වෙන්නේ. අපේ රටේ සිටින දුප්පත් මහ ජනතාව -අම්මලා, තාත්තලා- එදිනෙදා හම්බ කර ගත් සල්ලි තමයි මේ පිට රටට ඇදිලා යන්නේ. රුපියල් මිලියන 14,000කට වැඩියෙන් වියදම් වෙන්නේ අපේ සිසු දරු දැරියන් අධ්‍යාපනය සඳහා පිට රටට ගිහිල්ලා ඉගෙන ගැනීම වෙනුවෙනුයි. මේ කාරණා ගැන කල්පනා කරනකොට පැහැදිලිවම පෙනෙනවා, විශ්වවිද්‍යාල පද්ධතිය ගත්තාම රාජ්‍ය විශ්වවිද්‍යාල විතරක් නොවෙයි, රාජ්‍ය හා පෞද්ගලික අංශයත් ඒකාබද්ධ කරගෙන යන විශ්වවිද්‍යාල වාගේම පෞද්ගලික විශ්වවිද්‍යාලත් අපේ රටට අවශ්‍ය වන බව. එහෙම විශ්වවිද්‍යාල අවශ්‍ය වුණොත් විතරයි රටට අවශ්‍ය මානව සම්පත සංවර්ධනය කර ගත හැකි වෙන්නේ. ආසියානු රටවල් ගත්තොත් ඉන්දියාව, පිලිපීනය ආදී රටවල ප්‍රධාන වශයෙන්ම ආර්ථිකය ගෙන යන පිරිස වෙන්නේ මේ මානව සම්පතයි. උදාහරණයක් වශයෙන් පිලිපීනය ගත්තොත්, ඔවුන් වැඩියෙන්ම ආදායම් ලබා ගන්නේ දැනුම හා සම්බන්ධ රැකියාවන්වල නිරත වන ශ්‍රමිකයින් මඟිනුයි. සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය ජය ගන්න අපට අවශ්‍ය දැනුම් සම්භාරය හදා ගන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් අපි වැඩි අවධානයක් යොමු කරලා තිබෙනවා. ජර්මන් තාක්ෂණික පුහුණු ආයතනයක් කිලිනොච්චියේ ආරම්භ වෙනවා අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජර්මන් තාක්ෂණික පුහුණු ආයතනය තමයි ලංකාවේ ඉතාමත් කීර්තිමත්ම තාක්ෂණික ශිල්පීන් බිහි කරන ආයතනය බව ඔබතුමාත් දන්නවා ඇති. ජර්මන් තාක්ෂණික පුහුණු ආයතනයේ පාඨමාලාව හදාරා පාස් වෙච්ච අය සිංහල අවුරුදු උත්සවයක් සංවිධානය කරනවා මම වරක් දුටුවා. ජර්මන් තාක්ෂණික පුහුණු ආයතනයෙන් පාඨමාලා හදාරපු අය ඕස්ට්‍රේලියාවේ 800ක විතර පිරිසක් ඉන්නවා. ඔවුන් ලංකාව ජය අරගෙන විතරක් නොවෙයි, පිට රටවලත් රැකියා කරනවා. මේක තමයි අපිත් බලාපොරොත්තු වන knowledge economy එක. අපේ දැනුම -knowledge එක- අපි market කරන්න ඕනෑ. ඒ සඳහා අවස්ථාව ලබා දීමට අපි කිලිනොච්චියේ ජර්මන් තාක්ෂණික පුහුණු ආයතනය -German Technical Training Institute- ආරම්භ කළා. මේ ආදී වශයෙන් ආර්ථික ක්‍රමවේදය විශාල විප්ලවයකට යන ගමනකයි අපි ඉන්නේ. සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය ජයගෙන, ඒ සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය තුළින් - මම කලින් කිව්වා වාගේ- සෑම දෙනාටම මුදල් ගලා යන ආකාරයේ ක්‍රමවේදයකට මේ ආර්ථිකය හසුරුවන්නේ කොහොමද කියලා අපට පැහැදිලිවම දැක ගත හැකි වෙනවා.

මේ සභාව කල් තබන අවස්ථාවේ විවාදය සම්බන්ධයෙන් මටත් කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සන්තෝෂ වනවා. අපිත් එක්ක එකතු වෙන්න කියලා අපි දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාටත් ආරාධනා කරනවා. අපිත් එක්ක එකතුවෙලා, සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය ජයගෙන, රට ඉදිරියට ගෙන යන වැඩේට ඔබතුමාටත් සම්මාදම් වෙන්න පුළුවන්. අපි දැනටමත් ඒ සඳහා දොර විවෘත කරලා තිබෙනවා. ඒ සඳහා අපිත් එක්ක එකතු වෙන්න කියා ඔබතුමාටත් ආරාධනා කරමින් මම මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.27]

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. අද සභාව කල් තැබීමේ විවාදය මට පෙනෙන විධියට වගඋත්තරකරුවන් විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කළා හා සමානයි. මේ රටේ ආර්ථික ව්‍යසනයට වග කියන පසු ගිය රජයේ මැති ඇමතිවරුන් අද අදහස් දක්වන්නේ හදිස්සියේ නින්දෙන් ඇහැරුණු "රිප් වැන් වින්කල්" වාගෙයි. මේ අය මෙපමණ දවසක් නින්දේ සිටියාද එහෙම නැත්නම් මැරිලා ඉපදුණාද කියන ප්‍රශ්නය අපට මෙතැනදී මතු වනවා. වර්තමාන ආර්ථිකයේ පසු බිම නිර්මාණය වූ ආකාරය ගැන; ඒ අඳුරු ඉතිහාසය ගැන වැඩි යමක් කියන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ පිළිබඳව හොඳම විග්‍රහයක් මෑතකදී අපි දැක්කා. ඒ තමයි, අප සතු සෑම රුපියලකින්ම ශත 96ක්ම වැය වෙන්නේ රටේ ණය සඳහායි. රටේ සංවර්ධනයට සහ අනෙකුත් වැඩවලට ඉතිරි වන්නේ රුපියලකින් ශත 4ක්. එහෙම නම්, තවත් මොනවාටද අපට අටුවා ටිකා, ටිප්පණි කියලා මම අහන්න ඕනෑ. මේවා සිද්ධ වුණේ මේ පසු ගිය මාස 10ද? මේවා සිද්ධ වුණේ කොයි කාලයේද කියන එක තමන්ගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා බලන්න කියලා මම ඒ මැති ඇමතිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ආර්ථික ඔස්තාර්ලා; කෙරුමේ; වැඩකාරයෝ කියලා හිතාගෙන ඉන්න අයගෙන් රටේ ජනතාවට දැන් අහන්න සිද්ධ වෙලා තිබෙන්නේ, "දැන් ඔබට සතුටුයිද?" කියලායි. මොකද, අද ජනතාව මේ තත්ත්වයට වැටුණා නම්, වැටුණේ පසු ගිය මාස 10 සිද්ධ වුණු දේවල්වලින් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාවට අදහස් දක්වන විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා hedging ගිවිසුම අමතක කරලා තිබෙනවා; ග්‍රීක බැදුම්කර අමතක කරලා තිබෙනවා; පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා උළෙලට ලබා ගත් සෙල්ලම් කෝච්චි සන්දර්ශන පැවැත්වූ ආකාරය අමතක කරලා තිබෙනවා; සේවක අර්ථ සාධක අරමුදල මත බදු පැනවූ බව අමතක කරලා තිබෙනවා; සියයට 20ක් වැට් ගැහුවා කියන එක අමතක කරලා තිබෙනවා. මේවා අමතක කරලා නින්දෙන් නැඟිට්ටා වාගේ කථා කිරීම හරිම ශෝචනීයයි. මේ විධියට ජනතාව මුළාවට පත් කිරීම හරිම නින්දිතයි. ඒ නිසා අතීතයේ උරුම කරපු දායාදයන් මත වර්තමානය සකස් කිරීම අද යහ පාලන රජයේ ප්‍රධාන වගකීම වෙලා තිබෙනවා. හරියට ෆීනික්ස් පක්ෂියා අලු මතින් නැඟිට්ටා වාගේ කඩා වැටුණු ආර්ථිකය ගොඩ අරගෙන මේ රජයට ඉදිරියට යන්න සිද්ධ වෙලා තිබෙනවා. අතීතයට බැණ වැදීමෙන් පමණක්

වර්තමානය සකස් කරන්න බැහැයි කියන එක අපි තේරුම් අරගෙන තිබෙනවා. ඒ නිසා දැන් විධිමත් වැඩ පිළිවෙළක අවශ්‍යතාව තිබෙනවා. ඒ සඳහා මේ වනකොට අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත් ඉතාමත් සැලසුම්සහගතව පියවර අරගෙන තිබෙනවා. මේවා දිහා බලන්නේ නැතිව ජනතාව කුලප්පු කර ගෙන, වැරදි මතවාද පෝෂණය කර ගෙන, ශිෂ්‍යයෝ පාරට දමා ගෙන, ජනතාව පාරට බස්සවා ගෙන තමන්ගේ පටු දේශපාලන අභිමථාර්ථයන්, අවශ්‍යතාවන් ඉෂ්ට කර ගන්න කටයුතු කිරීම කනගාටුවට කරුණක් විධියට මම දකිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ජනතාව පසු ගිය මැතිවරණ දෙකේදී ඡන්දය භාවිත කළේ 2015 දක්වා පැවැති අදූරදර්ශී දේශපාලන හා ආර්ථික ප්‍රතිපත්ති අතහැර දමන්න කියලායි. ඒ නිසා ජනතා අපේක්ෂාවලට අනුගත වෙමින් තිරසාර ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව අද තිබෙනවා. ඒ සඳහා යටිතල පහසුකම්, පරිසරය හා ප්‍රතිපත්ති සකස් කරන්න ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමා, මුදල් අමාත්‍යතුමා මේ වනකොට ඒ සඳහා පියවර ගන්නවා. ජනාධිපතිතුමා, අගමැතිතුමා අද ජාත්‍යන්තර සභාය ලබා ගනිමින් රටේ ආර්ථික සංවර්ධනයට අදාළ විවිධ ගිවිසුම්වලට එළඹෙන්නේ ඒ නිසායි. ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අරමුණෙන් අද ඒ කටයුතු සිද්ධ වනවා. ඒ නිසා අද රටම වැළඳගත් ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වනවා.

ගරු අග්‍රාමාත්‍යතුමා සිංගප්පූරු සංචාරයේදී මහනුවර, හම්බන්තොට, කොළඹ ආර්ථික මංපෙත පිළිබඳව ඉතාමත් පැහැදිලි ප්‍රකාශයක් කළා. එතුමා කළ සවිස්තරාත්මක ප්‍රකාශය සංක්ෂිප්තව මේ සභාවේ අවධානයට යොමු කරන්න මම කැමැතියි. මහනුවර මහා සංවර්ධන ව්‍යාපෘතිය, වයඹ කාර්මික හා සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර මහනගර සංවර්ධන ව්‍යාපෘතිය, දකුණු සංචාරක හා කර්මාන්ත ව්‍යාපෘතිය කියන මේ ව්‍යාපෘති තුළින් රටේ ආර්ථිකයේ නව මං විවර වෙනවා, ජනතාව අතට මුදල් එනවා.

ඒ විතරක් නොවෙයි, අපනයන වැඩි කිරීම අත්‍යවශ්‍ය කරුණක් විධියට මේ වන විට හඳුනාගෙන තිබෙනවා. අපි ආනයනය කරන ප්‍රමාණය ඉහළයි. ඒත් එක්ක ගත්තාම අපි අපනයනය කරන ප්‍රමාණය බොහොම සුළු ප්‍රමාණයක්. ඒ නිසා ගුවන් තොටු පොළවල් දෙකක්, වරායන් දෙකක් මේ ආර්ථික මං පෙතේ වැදගත් ස්ථාන ලෙස බිහි වෙමින් තිබෙනවා. සැලසුමක් නැතිව පසු ගිය කාලයේ මහජන මුදල් විනාශ කරමින් හදාපු හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටු පොළ ඵලදායි ලෙස භාවිතයට ගන්න මේ වන කොට උපක්‍රම සකස් කරමින් තිබෙනවා. ජනාධිපතිතුමා, අගමැතිතුමා පසු ගිය කාලයේ සිදු කළ විදෙස් සංචාරවලදී, විශේෂයෙන් ජර්මනිය, ඔස්ට්‍රියාව, ජපානය, චීනය, ඉන්දියාව වාගේ ආර්ථික බලවතුන් සමඟ රටේ ආර්ථික සංවර්ධනයට අදාළ ගිවිසුම් ගණනාවකට එළැඹුණා. මෙන්න මේවායේ ප්‍රතිඵල අනාගතයේ රටට හිමි වන්නේ යහපත් ආර්ථිකයක් මේ රටට උදා කරමිනුයි. ඒ ප්‍රතිලාභ ජනතාවගේ ජීවිත සමෘද්ධිමත් කරන්නට හේතු වන බව සහතිකයි; නොඅනුමානයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපට නිවැරදි දැක්මක් තිබෙනවා. නිවැරදි වැඩ පිළිවෙළක් අද ක්‍රියාත්මකයි. ඒ සඳහා නිවැරදි නායකත්වයක් අද තිබෙනවා. ඒ දැක්ම එක පවුලක් වෙනුවෙන් නොවෙයි, මුළු රටක් වෙනුවෙනුයි. ඒ වැඩ පිළිවෙළ එක පවුලක් වෙනුවෙන් නොවෙයි, මුළු රටක් වෙනුවෙනුයි. ඒ වාගේම එම නායකත්වය එක පවුලක් වෙනුවෙන් නොවෙයි, මුළු රටක් වෙනුවෙනුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පක්ෂයේ කාර්ය භාරය හැම දෙයටම විරුද්ධ වීමයි කියලා හිතනවා නම් ඒක වැරදියි. විරුද්ධ වීමේ අරමුණින් විරුද්ධ වෙමින් කටයුතු නොකර, ඇත්ත ඇති සැටියෙන් දකිමින්, විවේචනාත්මක කරුණු ඉදිරිපත් කරමින් විපක්ෂයක කාර්ය භාරය ඉටු කිරීම විපක්ෂයේ වගකීමයි කියන එක මා මේ වෙලාවේ මතක් කර දෙමින් විපක්ෂයට ඒ සඳහා ආරාධනා කරනවා. අද මේ රට ඉදිරියට යන ගමනකට එළැඹිලා තිබෙනවා. විපක්ෂයේ තමුන්නාන්සේලාත් මේ රටේ ජනතාව වෙනුවෙන් මේ රජය සමඟ එකතු වෙලා, කරන යහපත් දේ යහපත් විධියට දකින්න; වැරැද්දක් සිද්ධ වනවා නම් ඒ විධියට ඒ විවේචන ඉදිරිපත් කරන්න. මේ රටේ ජනතාව පාරට බස්සවමින් ඒ ජනතාවගේ හැඟීම්, ඒ ජනතාවගේ ආවේග දඩමීමා කර ගනිමින් මේ රට ප්‍රපාතයට හෙළන්න එපාය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වනවා. ස්තූතියි.

[අ.භා. 4.34]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වැදගත් විවාදයක් සිදු වන අවස්ථාවේදී මේ උත්තරීතර සභාවේ කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

විශේෂයෙන් ඒකාබද්ධ විපක්ෂයේ නායකතුමන් වාගේම මහජන එක්සත් පෙරමුණේ නායකතුමන් වන ගරු දිනේෂ් ගුණවර්ධන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා අද මේ රටේ පවතින ආර්ථික, දේශපාලන තත්ත්වයන් ගැන ඉතා කාලෝචිත යෝජනාවකුයි ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ.

විශේෂයෙන් ආණ්ඩුවේ පාර්ශ්වයන් විසින් මේක ගණනකට ගන්නේ නැතිව, දිගින් දිගටම මේ කාරණාව සැහැල්ලුවට අරගෙන පහර දෙන ආකාරය අපි දුටුවා. මොකද, අවුරුදු 20ක් තිස්සේ ආණ්ඩු බලයක් නැතිව හිටපු එක්සත් ජාතික පක්ෂය යම් කිසි බලයකට ඇවිල්ලා අද එය දරා ගන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවායි කියන කාරණය තමයි අපට කියන්නට තිබෙන්නේ, ඒ අයගේ හැසිරීම දැක්කාම. ඒ නිසා මේ රටේ ප්‍රශ්න ගැන අපි වෙනුවෙන් නොවෙයි, ඒකාබද්ධ විපක්ෂයේ මේ මන්ත්‍රීවරු නොවෙයි, මේ රට වෙනුවෙන්, ජාතිය වෙනුවෙන් හොඳින් හිතලා බලන්න කියලා මේ රටේ ආණ්ඩු කරවන පක්ෂයෙන් මා පළමුවෙන්ම ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම පසු ගිය දවස්වල අපි දැක්කා, රට පුරාම විශ්වවිද්‍යාලවල දරුවන් මහ පාරට බැස්සාට පස්සේ, ශිෂ්‍ය මර්දනය මහා බලවත් විධියට සිදු කරමින් ශිෂ්‍යයන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන් නොදී මේ ආණ්ඩුව කරගෙන යන ව්‍යාපාරය. ඔවුන් මේ ශිෂ්‍යයන්ගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඇඟිල්ල දිගු කරන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පැවති ආණ්ඩුවටයි. මේ ආණ්ඩුවේ අය මතක තියා ගන්නට ඕනෑ, ආණ්ඩුව බාර අරගෙන මාස 20යි වෙන්නේ කියලා. නීති විරෝධී විධියට පත් කරපු මේ ආණ්ඩුව 2015 ජනවාරි 8වැනි දා ඉඳන් අද වෙන තෙක් මේ රටේ ආණ්ඩුව කරනවා. නීත්‍යානුකූල නොවන විධියකින් උපත ලබපු ආණ්ඩුවකට සදාචාරාත්මක සහ නීති විරෝධී කරුණු කාරණා ගැන වැටහීමක්, පැහැදිලි කිරීමක්, දැනීමක්, හැඟීමක් ඇති වෙයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ කොහොම වුණත්, සිංහල, දෙමළ, මුස්ලිම් සහ මේ රටේ ජීවත් වෙන සියලුම ජනතාව වෙනුවෙන් ඒ දැනීම, හැඟීම ඇති කරවන්නට යුතුකමක්, වගකීමක් අපිට තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි ඒකාබද්ධ විපක්ෂය විධියට අපි මේ රටේ ජනතාව වෙනුවෙන් සටන් කරන්නේ.

[ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය]

උතුරේ විශ්වවිද්‍යාල දරුවන් තුවාල ලබලාත් ඒ දරුවන්ට කියලා තිබුණේ, "පොලීසි යන්න එපා, සමථයට පත් වෙන්න" කියලායි. මම දන්නේ නැහැ, අපරාධයක් සිද්ධ වුණා නම්, පරීක්ෂණයක් කරන්නේ නැත්තේ ඇයි කියලා. විශ්වවිද්‍යාල දරුවන් ගහගත්තත්, රටේ මොන පුරවැසියෙක් ගහගත්තත්, මරා ගත්තත්, ඒක අපරාධයක්. මා දන්නේ නැහැ, අපරාධයකට පරීක්ෂණයක් කරන්න එපා, විශ්වවිද්‍යාල ළමයින්ට පැමිණිලි කරන්න එපා කියලා රජයේ වගකිව යුත්තන් ප්‍රකාශ කරනවා නම්, මේ රට කොතැනටද ගෙනියන්න හදන්නේ කියලා. මේ අසාධාරණයට ලක් වෙච්ච දරුවන්ගෙන් මම අද විවෘතව ඉල්ලීමක් කරනවා, "ඔබට පිහිටට ඇත්තේ රටේ නීතිය පමණයි. තමන්ගේ අයිතිය ආරක්ෂා කර ගැනීමට ඔබ වහාම ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරන්න" කියා.

විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ ගැටලු අද හැම තැනම ගින්නක් සේ ඇවිලිලා. මේ රට ගිනි ජාලාවක් වෙලා. මේ රටේ අනාගතය බාරගන්න ඉන්න ඒ ඉගෙන ගන්න දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරලා, මේ අය රටට අවශ්‍ය කරන උගතුන්, බුද්ධිමතුන් පිරිසක් බවට පත් කරලා මේ රටට ලබාගන්නට ඕනෑ. ඒ වෙනුවෙන් කටයුතු කරන්න කියලා මම විශේෂයෙන්ම ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා.

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් මර්දනය කරනවා. ඒ වාගේම ඒකාබද්ධ විපක්ෂයෙත් මර්දනයක් තිබෙනවා. මම නම් අහලා නැහැ, ආණ්ඩුවේ කවුරුවත් FCID එකට ගෙන්වනවා කියලා. වැරදි කරලා තිබුණත්, නැතත් ආණ්ඩුවේ කෙනෙක් නම්, FCID එකට ගෙන්වන්නේ නැහැ. FCID එකට යන්න තිබෙන සුදුසුකම තමයි ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හෝ ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් වැඩ කරන කෙනෙක් වීම. ඒක තමයි තත්ත්වය. අපි දැක්කා, මුදල් විශුද්ධිකරණ පනත යටතේ වැරැද්දක් කළා කියලා අපේ සහෝදර නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා පසු ගිය දවස්වල රිමාන්ඩ් බන්ධනාගාරගත කළ ආකාරය. ඒ පනතේ 5(1) වගන්තිය යටතේ නඩුවක් පවරන්නට නම් විශේෂයෙන්ම නීත්‍යානුකූල නොවන ආකාරයකින් උපයා ගත්ත මුදලක් සම්බන්ධයෙන් විය යුතුයි. එම මුදල ජාවාරමකින්, කුඩුවලින්, ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලින්, ඒ වාගේ නීති විරෝධී ආකාරයට උපයා ගත් මුදලක් වීමත්, ඒ මුදල් නීත්‍යානුකූල මුදල් බවට ඔප්පු කරන්න බැරි වීමත් යන හේතු මත තමයි ඒ යටතේ නඩු පවරන්න පුළුවන්කම තිබෙන්නේ. හැබැයි, 'ක්‍රිස්' කියන සමාගමෙන් ලැබිච්ච මුදල්වලට තමයි එතුමාව අත් අඩංගුවට ගන්නේ. එහෙම අත් අඩංගුවට අරගෙන එතුමාට විරුද්ධව නඩුවක් ගොනු කරලා, මේ වන විට - නඩුවෙන් නිදහස් වෙලා නොවෙයි- ඇප මත නිදහස් වෙලා තිබෙනවා. මොකද, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාත් එක්ක මේ රටේ ජනතාව වැඩි ප්‍රතිශතයක්, වැඩි සංඛ්‍යාවක් අද මේ ආණ්ඩුවට එරෙහිව ඔළුව උස්සාගෙන, නැඟිටගෙන සටන් කරන අවස්ථාවේදී ඒ ජනතා ශක්තිය, ආණ්ඩුවට එරෙහි බලවේගය මර්දනය කරන්නට මොනවා හරි පටලවලා නඩුවක් දාන්න තමයි කටයුතු කරන්නේ. ඒක තමයි ඒ නඩුවෙන් ඔප්පු වෙලා තිබෙන්නේ.

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට විරුද්ධව පැමිණිල්ලක් නැති නඩුවක් පවරන්න රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා යටතේ පාලනය වන මේ FCID එක කටයුතු කර තිබෙනවා. මහ ලොකුවට යහ පාලනය ගැන පුරාජේරු දොඩවන මේ ආණ්ඩුවේ පොලිස් දෙපාර්තමේන්තුව අග්‍රාමාත්‍යවරයාගේ අතකොළුවක් බවට පත්වෙලා තිබෙනවා. ඇත්තටම පොලිස් දෙපාර්තමේන්තුවට ගිය කල මේකයි. රටේ දේශපාලනඥයන් මර්දනය කරන හැටි දැක්කාම පුදුම කනගාටුවක් තිබෙන්නේ. හැබැයි, අන්තර් ජාතික ප්‍රජාවට, බටහිර ප්‍රජාවට මේවා බොහොම හොඳයි. මොකද, බටහිරට ඉල්ලන දෙයක් දෙන, ඉන්දියාවට ඉල්ලන දෙයක් දෙන ආණ්ඩුවක් අද බිහි වෙලා තිබෙනවා. රට ජාතිය ගැන නොසිතා මේ රටේ ඕනෑම පාවා දීමක් කරලා, බටහිර ගැත්තන් එක්ක එකට එකතු වෙලා හවුලේ මේ රට විනාශ කරන්න මේ ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහ මහත්තයා ඇතුළු කණ්ඩායම කටයුතු කර ගෙන යනවා. අපි කියනවා, මේවා ටික කාලයයි කියලා. එක්සත් ජාතික පක්ෂය රට පාලනය කරන කාලයේ 1988 අවුරුද්දේත් මේ වාගේ භීෂණයක් තිබුණා. හැබැයි, ජනතාව පුපුරා යනවා. අද ඉන්නේ එක්දහස් නවසිය අසූ ගණන්වල, අනූ ගණන්වල ජීවත් වුණු ජනතාව නොවෙයි. ඊළඟ පරම්පරාව. ඒ අය එච්චර ඉවසන්නේ නැහැ. ඒ නිසා පරෙස්සමින් කටයුතු කරන්නය කියන කාරණය ආණ්ඩුවට මම විශේෂයෙන් කියන්න ඕනෑ.

බැසිල් රාජපක්ෂ හිටපු ඇමතිතුමා පසු ගිය දිනවල දේශපාලන කටයුතු සංවිධානය කළා; පා ගමනක් කරන්න කටයුතු සංවිධානය කළා; ඒකාබද්ධ විපක්ෂයත් එක්ක දේශපාලන වැඩවල යෙදුණා. දිවි නැහුම අරමුදලේ මුදල් සම්බන්ධයෙන් චෝදනාවක් එල්ල කරලා, එතුමා අත් අඩංගුවට අර ගෙන පා ගමන ඉවර වෙන දවසට තමයි ඊළඟට උසාවියට කැඳවන්නේ. පොදු දේපොළ ආඥාපනත යටතේ නඩුවක් දැම්මාම ඇප ලබා ගන්න වෙන්නේ සුවිශේෂී කරුණක් ඉදිරිපත් කරලායි. පනතේ නම් තිබෙන්නේ අසමාන කරුණක් කියලා. එවැනි විශේෂිත කරුණු ඉදිරිපත් කරලා තමයි ඇප ලබා ගන්න වෙන්නේ. එහෙම නැතිව එළියට එන්න හම්බ වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට එල්ල වෙලා තිබෙන චෝදනාවේ ආකාරයට දිවි නැහුම අරමුදලේ මුදල් පරිහරණය කිරීමක් ඔහු සිද්ධ කරලා නැහැ. නමුත් ආණ්ඩු බලය පාවිච්චි කරලා දිවි නැහුම අරමුණු ක්‍රියාත්මක කරන්නට මධ්‍යම ආණ්ඩුවෙන් - මහා භාණ්ඩාගාරයෙන්- ලැබුණු මුදල් පරිහරණය කළාය කියන කාරණයට තමයි එතුමා අත් අඩංගුවට අර ගෙන තිබෙන්නේ. මම දන්නේ නැහැ, එහෙම නඩු දමන්න පුළුවන්ද කියලා. එහෙම නම් මේ හැම ඇමති කෙනකුටම විරුද්ධව නඩු දමන්න වෙනවා. ඇමතිවරු තමන්ගේ අමාත්‍යාංශයේ අරමුණු අතර, ඒ අරමුණු රාමුව තුළ තමන්ට මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් වියදම් කරනවා. එහෙම නම් මේ නඩුව දමා තිබෙන විධියට මේ ඔක්කෝම අය FCID එකට ගෙන යන්න වෙනවා. නමුත් ගෙන යන්නේ මම කලින් කිව්ව කණ්ඩායම පමණයි. ඒ අයට පමණක් සීමා වුණු FCID එකක් තමයි දැන් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේ තත්ත්වයක් තමයි දැන් රටේ තිබෙන්නේ. හරි කනගාටුදායකයි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව තිබෙන කාලයේ මෙච්චර බෙදවාචකයක් මේ රට තුළ තිබුණේ නැහැ. අද විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එක මතයක් දරනවා; රනිල් වික්‍රමසිංහ මහත්තයා තව මතයක් දරනවා. ඒ ඔක්කොටම වඩා ඉහළින් මංගල සමරවීර විදේශ කටයුතු අමාත්‍යවරයා වෙනම ගමනක් යනවා.

මම දන්නේ නැහැ, මේ විධියට මේ රට කී පැත්තකට ඇද ගෙන යාවිද කියලා. එක නායකයෙක් යටතේ ආණ්ඩුවක් කරන්න බැරි වුණු නිසා තමයි, මේ ආණ්ඩුව පැත්තෙන් පැත්තට ඇදෙන්නේ. මේ රටේ නායකයා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා නම්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ විදේශ ප්‍රතිපත්තියට එහා යන්නේ ඇයි? [බාධා කිරීමක්] හරි, අපි ඒකට උත්තර දෙන්නම්. ආණ්ඩුවකට ආචාර ධර්මයක්, ශීලාචාරකමක් තිබෙන්න ඕනෑ, නායකයෙක් එක්ක වැඩ කරන්න. ආණ්ඩුව ඉස්සෙල්ලාම ඒක පුරුදු වෙන්න.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ඔබතුමියගේ නායකයා කවුද?

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මගේ නායකයා දිනේෂ් ගුණවර්ධන පක්ෂ නායකතුමා. [බාධා කිරීමක්]

ඊළඟට, වැටි එක ගැන කථා කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ කථාව අවසන් කරන්න.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
තව විනාඩි 2ක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ කාලය වැඩිපුර ඉතිරිව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමිය ලබා ගෙන තිබෙන්නේ මහින්ද සමරසිංහ ඇමතිතුමාට වෙන් කර තිබෙන කාලයයි.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් පොඩි කාලයක් මට දෙන්න. කරුණු කිහිපයක් කියා මගේ කථාව නතර කරනවා.

ඊයෙත් වැටි එක සම්බන්ධයෙන් නඩුව තිබුණා. වැටි එකට විරුද්ධව ඒකාබද්ධ විපක්ෂයේ අපි තීරණයක් ගත්තා, වැටි එක අය කිරීම නීති විරෝධියි කියලා. ඒක තහනම් කරන කොටම වැටි එක සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට නැවතත් පනත් කෙටුම්පතක් ගෙනාවා. ඒ සම්බන්ධයෙනුත් අපි නඩු පවරා ඊයේ ඒ නඩුව කථා කළා. ඒ වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේදී විශේෂයෙන්ම විවාදයට භාජන වුණු ප්‍රධාන ඉසව්ගත කාරණය තමයි, මෙය කැබිනට් මණ්ඩලයේ අනුමැතිය නැතිව ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතක්ය කියන එක. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, ඒ වාගේම අපේ පාර්ලිමේන්තුව පාලනය වන ස්ථාවර නියෝගයන්ට අනුව මෙය කැබිනට් මණ්ඩලයට ගිහින් කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙන් ඉදිරිපත් විය යුතුයි. ඒ අවස්ථාව උල්ලංඝනය කරලා තිබෙනවා.

රවි කරුණානායක මුදල් ඇමතිතුමා අද සම්පූර්ණ මුදල් බලය තමන්ගේ අතට අරගෙන ඒකාධිපතියකු විධියට මේ රටේ ආර්ථිකය හසුරුවන හැටි අපට පෙනෙනවා. දිගටම නඩු පැවරීම අපි නතර කරන්නේ නැහැ. ඒ වෙනුවෙන් සටන් කරනවා. මොන මර්දනය ආවත් අපි ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරනවා. මේ රටේ ඇතිකර තිබෙන මර්දනය ගැන බොහොම කනගාටුදායකයි.

ඒ විතරක් නොවෙයි. අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා බඩු මිල ගැන බොහෝ පුරාජේරු දෙඩුවා. එතුමා කිව්වා, තෙල් මිල අඩු කළා; ගෑස් මිල අඩු කළා; පෙට්‍රල් මිල අඩු කළාය කියලා. හැබැයි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා රට පාලනය කරපු කාලයේ අය කරපු බද්ද අදත් ජනතාවගෙන් අය කර ගන්නවා. එතුමන්ලාට ඒ මිල අඩු කරලා දෙන්නට පුළුවන් වුණේ ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල පහත වැටුණු නිසායි. ඒ කාරණය මේ රටට හඟවන්නේ නැතුව මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා බදු අය කර ගත්තාය කියා හුවා දක්වනවා. අපි ඉල්ලීමක් කරනවා, කන බොන ද්‍රව්‍යවල බදු අඩු කරන්න කියලා. අද හාල්මැස්සන් කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 700 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. අද පරිප්පු කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 250යි, රුපියල් 300යි. වෙළෙන්දෝ කියනවා, කඩල පරිප්පු රුපියල් 300ට අඩුවෙන් දෙන්න බැහැයි කියලා. හැබැයි ආණ්ඩුව සහනික මිලක් නියම කරලා තිබෙනවා. ප්‍රායෝගික වශයෙන් කරන්නට බැරි දේවල් රටට ඉදිරිපත් කරමින් මුළු රටම ව්‍යාකූල තත්ත්වයට පත් කරන්න කටයුතු කරලා තිබෙනවා. මේ තත්ත්වය තමයි මේ රටේ තිබෙන්නේ. අපි මේ ක්‍රියා කලාපයන්ට එරෙහි වන බව ප්‍රකාශ කරමින්, මෙය නිවැරැදි කර ගන්නට මේ ආණ්ඩුවට කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වනවා. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමා.

[අ.භා. 4.50]

ගරු මහින්ද සමරසිංහ මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Skills Development and Vocational Training)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තාවක් හැටියට අපේ ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය වැඩිපුර වෙලාවක් ඉල්ලුවාම බැහැයි කියන්න බැහැ. ඒ නිසා තමයි අමතර විනාඩියක්, විනාඩි දෙකක් මගේ වෙලාවෙන් දුන්නේ.

ආර්ථික ප්‍රශ්න ගැන අද කරන විවාදයේදී නොයෙකුත් අදහස් දෙපාර්ශ්වයෙන්ම ඉදිරිපත් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ ආර්ථික ප්‍රශ්න ගැන විශේෂයෙන්ම විපක්ෂය වෙනුවෙන් අදහස් දැක්වූ ඒ මන්ත්‍රීවරුන්ගේ කථාවලට ඇහුම්කන් දෙනකොට පැහැදිලි වුණු කාරණයක් තමයි, 2015 ජනවාරි 08වන දාට පෙර තිබුණු අවදානම් තත්ත්වය ගැන බොහෝදෙනකුට අමතක වෙලා තිබෙන බව. මා හොඳටම දන්නවා, මහින්ද රාජපක්ෂ අපේ හිටපු ජනාධිපතිතුමා අවුරුදු දෙකකට පෙර මැතිවරණයකට ගියේ ජ්‍යෝතිෂය පැත්ත පමණක් බලා නොවෙයි කියලා. ඇත්ත වශයෙන්ම එතුමා හොඳටම තේරුම් අරගෙනයි තිබුණේ, එතුමා යුද්ධය අවසාන කරන්නට කටයුතු කළා වුණත්, එතුමාටත්, එතුමාගේ රජයටත්, ඒ රජයේ ප්‍රධානීන්ටත් ජාත්‍යන්තරයෙන් එල්ල වෙලා තිබුණු නොයෙකුත් චෝදනා පදනම් කර ගෙන ජිනීවා මානව හිමිකම් කවුන්සිලයට බොහොම භයානක වාර්තාවක් ඉදිරිපත් කරන්න ඒ වෙනකොටත් පිළියෙල කර තිබුණාය කියන එක. ඒ වාර්තාව ඉදිරිපත් කර අනුමත වුණා නම්, රටවල් කිහිපයක් සූදානම් වෙලා සිටියා, අපේ රටට ආර්ථික සම්බාධක පනවන්න. 2015 මාර්තු මාසයේ සැසි වාරයට ඒ වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආර්ථික සම්බාධක පැනෙව්වා නම්, අද පාද යාත්‍රා නොවෙයි කරන්න වෙන්නේ. අද සමහරු සංවිධානය වෙලා පාද යාත්‍රා ක්‍රියාත්මක කරන්න හැදුවත්, එදා එහෙම වුණා නම්, අද ජනතාව පාරට බැහැලා මේ මුහුණ දෙන්න වෙලා තිබෙන ප්‍රශ්නයෙන් අප බේරා ගන්න කියලා බඩගින්නේ කෑ ගහන්න පටන් ගන්නවා.

ඇත්ත වශයෙන්ම එවැනි තත්ත්වයක් තිබුණු අවස්ථාවක ජනවාරි 8 වැනිදා තිබුණු ජනාධිපතිවරණයෙන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජයග්‍රහණය කරලා, මේ රටේ ආර්ථිකය විශාල වශයෙන් බිඳ වැටෙන්න තිබුණු අවස්ථාවෙන් බේරා ගත්තාය කියන එක මා මේ අවස්ථාවේදී කෘතවේදීව සිහිපත් කරන්න කැමැතියි. මොකද, ආර්ථික සම්බාධක පැනෙව්වා නම්

[ගරු මහින්ද සමරසිංහ මහතා]

වැටි බද්ද සියයට 4කින් වැඩි කළා වාගේ නොවෙයි, ජනතාවට මුහුණ දෙන්න තිබෙන ප්‍රශ්න වැඩි වෙන්නේ. ඊට වඩා විශාල වශයෙන් ප්‍රශ්න ඇති වන නිසා තමයි හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අවුරුදු දෙකකට පෙර මැතිවරණයකට ගියේ. නැත්නම් එතුමාට කවුරුත් කිව්වේ නැහැනේ, අවුරුදු දෙකකට පෙර මැතිවරණයට යන්න කියලා. අවුරුදු දෙකක් කියන්නේ සෑහෙන කාලයක්. ඇත්ත වශයෙන්ම ඒ අවුරුදු දෙක තුළදී රට තවත් සංවර්ධනය කරලා, ඒ අවස්ථාවේ තිබුණු තත්ත්වයට වඩා සුබවාදී තත්ත්වයක් ඇති කර ගෙන මැතිවරණයට ගිහින් සමහර විට ජයග්‍රහණය කරන්නත් ඉඩකඩ තිබුණා. හැබැයි එතුමා මැතිවරණයට යන එක හදිසි කර ගත්තේ, ඉක්මන් කර ගත්තේ මා කලින් කියපු කාරණය නිසායි. එතුමාත් හොඳටම දැනගෙන හිටියා, මේ යෝජනාව ගෙනෙනවා, මේ වාර්තාව මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් වෙනවා, ඒක අනිවාර්යයෙන්ම සම්මත වෙනවා කියලා. මොකද, මම 2009 වර්ෂයේ අපේ කණ්ඩායමේ නායකත්වය දරමින් ජිනීවා ගිහින් ඒ පළමුවෙනි යෝජනාවට මුහුණ දෙනකොට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට පක්ෂව තුනෙන් දෙකකට කිට්ටුවෙන්න ඡන්ද ගත්තා. අපට හොඳ අවස්ථාවක් ලැබුණා, ඒ අවශ්‍ය දේවල් කරලා ජාත්‍යන්තරයේ සහයෝගය තවදුරටත් ලබාගන්න. නමුත් අපි ඒක කළේ නැහැ. ඒකයි අපට මුහුණ දෙන්න සිදුවුණු ලොකුම ප්‍රශ්නය.

අපි ඒ කටයුතු හරියට කළේ නැති නිසා, ඊට පස්සේ මානව හිමිකම් කවුන්සිලයේ තිබුණු ඡන්දවලදී ක්‍රමානුකූලව අපේ ඡන්ද ටික අඩුවෙලා, අන්තිම ඡන්දයේදී ඡන්ද 11යි අපට ලබා ගන්නට පුළුවන් වුණේ. මානව හිමිකම් කවුන්සිලයේ සාමාජිකයන් 47දෙනාගෙන් තුනෙන් දෙකකට කිට්ටු වෙන්න ඡන්ද ගත්ත රට, අවසානයේදී ඡන්ද 11ට බැස්සා. මාර්තු මාසයේ 15 වැනි දා ඒ වාර්තාව ඉදිරිපත් වුණා නම් අනිවාර්යයෙන්ම සම්මත වෙන්න තිබුණා. මහින්ද රාජපක්ෂ මැතිතුමා හොඳට දැනගෙන හිටියා ඒක සම්මත වෙනවා කියලා. ආර්ථික සම්බාධක ඇති වෙනවාය කියන එකත් එතුමා දැන ගෙන සිටියා. ඊට වඩා දරුණු තත්ත්වයක් ඇති වෙයි කියන එකත් එතුමාගේ හිතේ තිබුණා. ඒ නිසා තමයි, ඇත්ත වශයෙන්ම අවුරුදු දෙකකට පෙර ජනාධිපතිවරණයකට ගිහින් පැරදුණේ. ජනතාවත් සමහර වෙලාවට තේරුම් අරගෙන ඉන්න ඇති, ජාත්‍යන්තරයෙන් අපට මුහුණ දෙන්න සිදුවන ප්‍රශ්නත් එක්ක, ඒ කොන්වීමත් එක්ක ආර්ථිකය නහා සිටුවන්නත් අමාරු වෙනවා කියලා. ඒ නිසා තමයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට විශාල ඡන්ද සංඛ්‍යාවක් ලබා දීලා එතුමා මේ රටේ ප්‍රධානියා හැටියට පත්කර ගත්තේ. එතුමා මේ රටේ ප්‍රධානියා හැටියට පත් කර ගත්තාට පස්සේ, එතුමා මේ අභියෝගය භාර අරගෙන මාර්තු මාසයේ ඉදිරිපත් කරන්න තිබුණු ඒ වාර්තාව කල් දමා ගන්න සමත් වුණා. එතුමා ඒ වාර්තාව ඉදිරිපත් කිරීම සැප්තැම්බර් මාසය වනතුරු කල් දමාගෙන, මාර්තු මාසයයි, සැප්තැම්බර් මාසයයි අතරේ ගන්න තිබුණු පියවර රාශියක් ගත්තා. එතුමා බොහොම සුබවාදී පණිවුඩ ජාත්‍යන්තරයට යවන්න පටන් ගත්තා. එතුමා සිංහල ජනතාව පාවා දීලා නොවෙයි ඒක කළේ. එතුමා හරි දේ තමයි කළේ. මේ රටේ විවිධ ජන කොටස් ජීවත් වනවාය කියන කාරණයත්, ඒ සියලු දෙනාම මේ රටේ සම පුරවැසියන් හැටියට පිළිගෙන සම අයිතිවාසිකම් ලබාදිය යුතුය කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පිළිගෙන තිබෙන තත්ත්වය මත, එතුමා ඒ නිවැරදි දේ කරලා හොඳ සුබවාදී පණිවුඩයක් ජාත්‍යන්තරයට යැව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි වාගේම, ඔබතුමා මාර්ගයෙන් මේ කාරණය මේ පාර්ලිමේන්තුවට දන්වන්නත් කැමැතියි. මෑත ඉතිහාසයේ ස්වේච්ඡාවෙන් තමන්ගේ බලතල අයින් කරගන්න ඉදිරිපත් වුණු නායකයෙක් මේ ලෝකයේ හිටිය බවක් මා නම් දන්නේ නැහැ. කවුරුවත් එහෙම කරලා නැහැ. නොයෙකුත් අය මැතිවරණයක් එන කොට පොරොන්දු වෙනවා, "මගේ බලතල අඩු කරනවා, තනතුර ඉවත් කරනවා" කියලා. මහින්ද යාපා අබේවර්ධන හිටපු ඇමතිතුමනි, ඔබතුමාත් මේ ගැන හොඳටම දන්නවා නේ. හැබැයි, බලයට ආවාට පස්සේ ඒවා අමතක වෙනවා. නමුත්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඒක අමතක කළේ නැහැ. එතුමාගේ අත්සනින්ම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, එතුමාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් දීලා තිබෙන සුවිශේෂ බලතල ඉවත් කරන්න ඕනෑය කියන පැහැදිලි ස්ථාවරයේ එතුමා හිටියා. ඒ කාරණය ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාට පස්සේ එහිදී තමයි කිව්වේ, "ජනතාවගෙන් පත් වුණු ජනාධිපතිවරයෙක් නිසා ඒ වෙනස්කම් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් ලබාගෙන මදි, ජනමත විචාරණයකටත් යන්න වෙනවා" කියලා. ජනමත විචාරණයකට ගියා නම් මේ රටේ ලොකු බෙදීමක් ඇති වෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තමයි ඒක කරන්න දුන්නේ නැත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රධාන බටහිර රටවල් සහ වෙනත් රටවල් නියෝජනය කරන මේ රටේ ඉන්න තානාපතිවරු ඒ ගොල්ලන්ගේ රටවලට හැම සතියේම මේ රටේ දේශපාලන වාර්තා යවනවා. ඒ දේශපාලන වාර්තා ලියන කොට කියනවා, මේ රටේ ජනාධිපතිවරයා තමන්ගේ බලතල ස්වේච්ඡාවෙන්ම අයින් කරගන්න ඉදිරිපත් වුණු නායකයෙක් කියලා. මේවාට විශාල වශයෙන් ලකුණු ලැබෙනවා. මේවා වෙන රටවල වෙන්නේ නැති නිසා, ඒ රටවල ඉන්න ප්‍රධානීන් තේරුම් ගන්නවා බොහොම හොඳ නායකයෙක් මේ රටට ලැබී තිබෙනවා කියලා. ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන නායකයෙක් මේ රටේ ඉන්නවා කියලා ඔවුන් තේරුම් ගන්නවා. බල ලෝභය, තණ්හාව මුල් කරගෙන මේ රට පාලනය කරන්න ඉදිරිපත් වෙලා ඉන්න නායකයෙක් නොවෙයි කියලා ඒ අය අපේ ජනාධිපතිතුමා හඳුනා ගන්නවා. ඒවාට විශාල වශයෙන් ලකුණු ලැබෙනවා; ලොකු පිළිගැනීමක් ඇති වෙනවා. අනෙක් රටවල් එක්ක සංසන්දනය කරලා බැලුවාම එතුමා කුඩා රටක් නියෝජනය කළත්, කොහේ ගියත් එතුමාට මහත් පිළිගැනීමක් ලැබෙන්නේ ඒ නිසා තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ජර්මනියට ගිය අවස්ථාවේදී මාත් එතුමා සමඟ එහි ගියා. එහිදී පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවේදී ජර්මනියේ ප්‍රධානියා වන චාන්සලර් ඇන්ජලා මර්කල් මහත්මියගෙන් මාධ්‍යවේදීන් ඇහුවා, "ඇයි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ආරාධනා කළේ?" කියලා. එතුමාගේ වැඩ පිළිවෙළ හොඳ නිසාත්, එතුමා අපිත් එක්ක සම්බන්ධ වෙන්න ඉදිරිපත් වුණු නිසාත් එතුමාට ආරාධනා කළාය කියලා එතුමිය ඒ අවස්ථාවේදී කිව්වා. කලින් අපේ තිබුණු විදේශ ප්‍රතිපත්තිය අනුව නම්, අපි තෝරලා බේරලා නේ රටවල් ආශ්‍රය කළේ. අපි බොහොම ප්‍රසිද්ධියේ සමහර රටවලට විශේෂ තැනක් දීලා, අනෙක් රටවල් අඩු සැලකිල්ලකට ලක් කළා.

විශේෂයෙන්ම ඉන්දියාව වැනි රටක් අරගෙන බලන්න. එය අපේ අසල්වැසි රට. දකුණු ආසියාවේ බලවත්ම රට. ඒ වාගේම න්‍යෂ්ටික බලයක් තිබෙන රටක්. ඒ රට දන්නේත් නැතිව, අපේ රටේ ජනතාව දන්නේත් නැතිව, තව රටකින් සබ්මැරීන දෙකක් අපේ ලංකාවට ආවාය කියලා පුවත් පත්වල පළවන කොට අනිවාර්යයෙන්ම ඒ රට කුලප්පු වෙනවා නේ. චීනයෙන් තමයි ඒ සබ්මැරීන ඇවිත් තිබුණේ. එවැනි බොහොම බොළඳ විදේශ ප්‍රතිපත්තියක් තමයි ඒ වෙලාවේ අනුගමනය කළේ. අද අපේ විදේශ ප්‍රතිපත්තිය දිහා බැලුවාම අපට බොහොම පැහැදිලිව පෙනෙනවා, ඇත්ත වශයෙන්ම ප්‍රායෝගික, යථාර්ථවාදී, සියලුම රටවල් සමඟ බොහොම මිත්‍රශීලීව කටයුතු කරන, කිසිම රටකට විශේෂත්වයක් දක්වන්නේ නැති විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන බව.

අපට බොහොම අමාරු වූ කාලයේදී උදවු කරපු චීනය, රුසියාව, කියුබාව ආදි රටවල් කොන් නොකර, ඒ අයටත් අනෙක් රටවලට හා සමානව මිත්‍රශීලිභාවය පෙන්නුම් කරලා, ඒ අය සමඟත් ගනු-දෙනු කරන්න ඉදිරිපත් වන ගමන්, අපට මේ ප්‍රශ්න ඇති කරපු, අපට මේ යෝජනා ඉදිරිපත් කරපු රටවල් සියල්ල සමඟ අපි අද මිත්‍රශීලිත්වයක් ඇති කරගෙන කටයුතු කරන්න පටන් ගෙන තිබෙනවා. එයින් අපට විශාල ප්‍රතිඵල ලැබී තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අපට ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක් දුන්නේ සියලුදෙනාගේ එකඟතාව මතයි. බටහිර රටවල්ද ඒ අරමුදලෙහි විශේෂ තැනක් දරනවා. ඒ අය ඒකට විරුද්ධ වුණේ නැහැ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබුණු ඒ මුදල නිසා වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින්, රටවලින් විශාල අනුග්‍රහයක් අපට දැන් දක්වන්න පටන්ගෙන තිබෙනවා.

ජනාධිපතිතුමා ඔස්ට්‍රියාවට ගිහින් ආවාට පසුව ඔස්ට්‍රියාවෙන් විශාල මුදලක් බොහොම සහන පොලියකට සංවර්ධන කටයුතු සඳහා දැන් අපේ රටට දීලා තිබෙනවා. ජර්මනියේ චාන්සලර්තුමිය වන ඇන්ජෙලා මර්කල් මහත්මිය ඒ සාකච්ඡාවේදී කිව්වා, යුරෝ මිලියන 15ක ප්‍රදානයක් කරනවා කියා. ඒ යුරෝ මිලියන 15 සම්බන්ධයෙන් රවි කරුණානායක අමාත්‍යතුමා ගිය සතියේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, ඒ යුරෝ මිලියන 15න් යුරෝ මිලියන 4ක් අපේ අමාත්‍යාංශයටත් ලබා දුන්නා. ඒවා ණය නොවෙයි. ඒවා ප්‍රදානයි. සියයට සියයක ප්‍රදානයක්. විල්පත්තුව ප්‍රදේශයේ සිටින තරුණ තරුණියන්ට පුහුණු පාඨමාලා ආරම්භ කරලා, ඒ සල්ලි භාවිත කරමින් ඒ ළමයින්ට නිපුණතා සංවර්ධනය ලබා දෙන වැඩ පිළිවෙළකට අපි යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ධීවර තහංචිය පැනෙව්වේ ඇත්ත වශයෙන්ම දේශපාලන න්‍යාය පත්‍රයක් පදනම් කරගෙනයි. වෙනත් නොයෙකුත් හේතු ඉදිරිපත් කළා තමයි. හැබැයි, ඒවා නොවෙයි ප්‍රධානම හේතු. දේශපාලන න්‍යාය පත්‍රයක් පදනම් කරගෙන තමයි ඒ තහංචිය අපට පැනෙව්වේ. දැන් ඒ තහංචිය ඉවත් කර තිබෙනවා, මේ සුහදතාව ගොඩ නඟපු නිසා. මේ අවුරුද්දේ අවසාන වන කොට GSP Plus සහනය අපට ලැබෙන ලකුණු බොහෝ දුරට පහළ වී තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේ විශාල සහයෝගයක් ලැබෙන අවස්ථාවකදී මේ රටේ ආර්ථිකය මීට වඩා හොඳ තත්ත්වයකට ගෙනෙන්න, වැඩි දියුණු කරන්න අපට හැකියාවක් තිබෙනවා; අපේ රජයට හැකියාවක් තිබෙනවා. සමහරු සටන් පාඨයක් නැති වන කොට ඔය පාද යාත්‍රා වාගේ ඒවා සංවිධානය කරලා නැති ප්‍රශ්න ඇති කරනවා.

මේ පාද යාත්‍රාව සංවිධානය කරන්න හේතු කීපයක් ඉදිරිපත් කර තිබුණා, මම දැක්කා. එකක් තමයි, "ව්‍යවස්ථා සංශෝධන මර උගුලෙන් බේරෙන්න පාද යාත්‍රාවට එකතු වන්න" කියන එක. අපි බොහොම සහයෝගයෙන් නේ මේ ව්‍යවස්ථා සංශෝධන වැඩ පිළිවෙළ පටන් ගෙන තිබෙන්නේ. අද අගමැතිතුමාත් එක්ක දිනේෂ් ගුණවර්ධන හිටපු ඇමතිතුමාත් වාඩි වුණා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන සාකච්ඡා කරන්න. බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමාත් ඇවිල්ලා වාඩි වුණා. සියලු දෙනාවම සම්බන්ධ කරගෙනයි අපි මේක කරන්නේ. බන්දුල ගුණවර්ධන අපේ හිටපු ඇමතිතුමා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුවේ මුදල් අනුකමිටුවේ - Subcommittee on Finance - සභාපති. එතුමා දැන් හොඳ වැඩ කොටසක් කරගෙන යනවා. ඇත්ත වශයෙන්ම එතුමාත් සහභාගි වෙලා තමයි මේ රටට ඔබින, අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න දැන් පටන් ගෙන තිබෙන්නේ. මෙයින් අපේ සමඟියත් වැඩිදියුණු වෙනවා; තිරසාර සංවර්ධනයට යන ගමනත් ශක්තිමත් වෙනවා. ඇත්ත වශයෙන්ම පිටතට ගිහින් කියන එක නොවෙයි පාර්ලිමේන්තුව තුළ සිද්ධ වනවා අප දකින්නේ.

මා කියන්නේ මේ වාගේ දේවල් පදනම් කරගෙන ජනතාව පාරට බස්සවා නිකම් අනවශ්‍ය ප්‍රශ්න ඇති කරන්න ඕනෑ නැහැ කියන එකයි. අප මේ ස්ථාවරභාවය ලබාගෙන තිබෙන්නේ දහස් සංඛ්‍යාවක් ජීවිත පරිත්‍යාග කරලායි. අපේ රණ විරුවෝ දහස් සංඛ්‍යාවක් ජීවිත පරිත්‍යාග කළා, අපට මේ නිදහස ලබා දෙන්න. අහිංසක ජනතාව දහස් ගණනක් ඝාතනය වුණා; භික්ෂූන් වහන්සේලා ඝාතනය වුණා. මේ රටේ ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන අවස්ථාවකදී තමයි අපේ රණ විරුවන් ජීවිත පරිත්‍යාග කරලා මේ නිදහස අපට ලබා දුන්නේ. ඒ නිසා අප සියලුදෙනාම අත් වැල් බැඳගෙන නැඟිටලා මේ රට විශාල සංවර්ධනයක් කරා ගෙන යන්න කටයුතු කරමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් තවත් එක කාරණයක් කියා මම කථාව අවසන් කරන්නම්. නම් වශයෙන් මම කියන්න යන්නේ නැහැ. ජාත්‍යන්තරයත් සමඟ අපි කටයුතු කරන කොට එක්සත් ජාතීන්ගේ සංවිධානයත් සමඟ බොහොම සමීපව අපි කටයුතු කරනවා. අපි මානව හිමිකම් කොමිසමත් එක්ක, කොමසාරිස් එක්ක සමීපව සම්බන්ධ වෙලා කටයුතු කරනවා. නමුත්, ඇත්ත වශයෙන්ම එතැන දෙබිඩි පිළිවෙතක් ක්‍රියාත්මක වනවා. ඒක අපි කියන්න ඕනෑ. ඒකට හොඳම උදාහරණය තමයි, ඊයේ පෙරේදා නිකුත් කර තිබුණු විල්කොට වාර්තාව. ඒ වාර්තාව ඉදිරිපත් කරපු අවස්ථාවේ ඉඳලා අද වන තුරු ඒ වාර්තාව පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානය අදහසක් දක්වලා නැහැ නේ. මානව හිමිකම් මහ කොමසාරිස්තුමා ලංකාවේ වන පොඩි දේකටත් කෑ ගහනවා; කථා කරනවා. අද වන තුරු ඒ දරුණු වාර්තාව පිළිබඳ අදහසක් ප්‍රකාශ කරලා නැහැ. රටවල් දෙකකට ගිහින් ඒ රටවල් ආක්‍රමණය කරලා, භයානක අවි ආයුධ ඒ රටවල තිබෙනවා කියලා බොරුවක් ගොතලා, දහස් සංඛ්‍යාවක් මරා දාමලා, අද ඒ රටවල් දෙක අස්ථාවර රටවල් දෙකක් බවට පත් වෙලා තිබෙනවා නේ. එතකොට ඒවාට කවුරු හෝ වග කියන්නත් ඕනෑ. ඒ දෙබිඩි පිළිවෙත් අනුගමනය කරන එකට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි. ඉදිරියේදීවත් ඒ පිළිබඳව ප්‍රකාශයක් කරයි කියලා අපි බලාපොරොත්තු වනවා. එම වාර්තාව ඇත්ත වශයෙන්ම ලොකු වාර්තාවක්. ඒක කියවන්නත් කාලයක් ගත වෙනවා. කොහොම වුණත් ඒකයි යථාර්ථය.

අද ජාත්‍යන්තරයේ පාලන බලය තිබෙන අයත් එක්ක අපි ගිහින් හැප්පෙන්න ඕනෑ නැහැ. අපි කාටවත් යටත් වෙන්න ඕනෑත් නැහැ. අපි කාටවත් යටත් වෙන්නේත් නැතුව, අපේ ස්වාධීනත්වයත් රැකගෙන, ඒ අයත් එක්ක මිත්‍රශීලීව කටයුතු කරලා, මේ රට විශාල සංවර්ධනයකට ගෙන යන්න පියවර ගන්නවාය කියන කාරණයත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 5.09]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන අපේ හිටපු ඇමතිතුමා ඉදිරිපත් කරපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් වචන කීපයක් කථා කරන්නට ලැබීම ගැන මම සතුටු වනවා. ඊටත් වඩා මම සතුටු වනවා, අපේ මහින්ද සමරසිංහ ගරු අමාත්‍යතුමාගේ කථාවෙන් පසුව කථා කරන්නට ලැබීම ගැන. එතුමා කියපු සමහර දේවල් අහගෙන හිටියාම මට පුදුම හිතුණා. මොකද, එතුමා මුලදීම කිව්වා, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ තිබුණු මහා ව්‍යසනයකින් රට බේරා ගත්තා කියලා. සමහර විට ඒක ඇත්ත වෙන්න පුළුවන්. නමුත්, ඒ වෙලාවේ අපේ ගරු ඇමතිතුමා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට නොවෙයි උදවු කළේ, මහින්ද රාජපක්ෂ මැතිතුමාට. මේවා සේරම දැන ගෙන-

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

ගරු මන්ත්‍රීතුමා, ඒක ඇත්ත. ඒ සහයෝගය දුන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති හැටියට එතුමා හිටපු නිසාත්, අපේ ජනාධිපති අපේක්ෂකයා වුණු නිසාත්. දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒ පැහැදිලි කිරීමට, බොහොම ස්තුතියි.

එතුමා රට ගැන බොහොම වේදනාවෙන් කථා කළා. මේ රටේ තිබුණු ප්‍රශ්නය ඒ තරම් බරපතළයි, ඒ තත්ත්වය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ජයග්‍රහණයත් එක්ක මහ හරවා ගත්තා කියලා එතුමා කිව්වා. එතුමා ප්‍රකාශ කළ එම මතයත් එක්ක මමත් එක්තරා ප්‍රමාණයකට ඉන්නවා. නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ එතුමා එදා ඒක අපටත් වඩා හොඳින් දැන ගෙන හිටපු එකයි. මොකද, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ අපේ මහින්ද සමරසිංහ ඇමතිතුමා තමයි විදේශ කටයුතු සම්බන්ධයෙන් හුඟාක් වෙලාවට සහභාගි වුණේ; ඒවා ගැන කථා කරන්න ගියේ. එතුමා ඒ අවදානම ගැන හොඳටම දැන ගෙනත්, ඒ කාලයේ වචනයක්වත් ඒ ගැන කථා කළේ නැහැ. දැන් කියනවා, මෙහෙමයි කියලා. මට පෙනෙන්නේ එතුමා මේ වෙලාවේ පෙරළුණු පිට හොඳයි කියනවා වගෙයි. ඒකට කමක් නැහැ. පෙරළුණු පිට හොඳයි කියන්න. ඒකේ කිසි වරදක් ඇත්තේ නැහැ. [බාධා කිරීමක්] කොහොම හරි එතුමා පෙරළුණු පිට හොඳයි කියනවා නේ. ඒකට අපි සුබ ප්‍රාර්ථනා කරනවා.

ඊට අමතරව එතුමා තවත් කාරණා කිහිපයක් ගැන කිව්වා. එකක් තමයි, මෛත්‍රීපාල සිරිසේන ගරු ජනාධිපතිතුමා විදේශ කටයුතුවලදි කිසියම් ජයග්‍රහණයක් ලබාගෙන තිබෙනවාය කියලා. මම ඒක පිළිගන්නවා. ඒකට අපි ගරු කරනවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එක්ක පැවැති රැස්වීමකදීත් මම ඒක කිව්වා. "ඔබතුමා ජයග්‍රහණය ලබා තිබෙනවා. ඒකට අපි සුබ පතනවා" කියලා මම කිව්වා. ඒක මම අදත් කියනවා. දැන් තිබෙන්නේ, ඊට එහා යන ගමනක්. එතුමා ලබා ගත් ජයග්‍රහණය තවත් ටිකක් සාර්ථක කර ගන්න එකයි දැන් කරන්න අවශ්‍ය වන්නේ.

දැන් විදේශ කටයුතු ඇමතිතුමා රට පුරා කියනවා, "හයිබ්‍රිඩ්" අධිකරණයක් ගෙනෙවා කියලා. පය පොළොවේ ගහලා කියනවා. අපේ ජනාධිපතිතුමාගේ මතය ඒක නොවෙයි. මේ රටේ ජනාධිපතිතුමා ප්‍රකාශ කරන්නේ ඊට වඩා වෙනස් මතයක්. විදේශ කටයුතු ඇමතිතුමා "හයිබ්‍රිඩ්" අධිකරණයක් ගෙනෙවා කියනවා; විදේශ විනිසුරුවරු ගෙනෙවා කියනවා. ඇයි, මේ මත දෙකක්? ඔබතුමන්ලා මැදිහත් වෙලා මේක එක මතයකට ගෙනෙන්න. එක මතයකට ගෙනැල්ලා මේක කරන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
පාර්ශ්ව දෙකක්.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

එහෙම නම් ආණ්ඩුවක් වෙන්න බැහැ නේ. පාර්ශ්ව දෙකක් වුණාට අපේ රට එකයි. ඒක මතක තියා ගන්න. අපි කවුරුත් මුහුණ දෙන්න ඕනෑ, මේ ගැටලුවට. අපි ඒක එතුමාට විතරක් නොවෙයි, මෙතැන ඉඳගෙන මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් කියනවා. අපේ රට එකයි. අපි ඒකට එකමුතුව මුහුණ දෙන්න ඕනෑ. එහෙම මත දෙකක් එක්කෙනෙකු යට කරගෙන තව එක්කෙනෙකුට ක්‍රියාත්මක කරන්න බැහැ.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමාගේ ස්ථාවරය පමණක් නොවෙයි අගමැතිතුමාගේ ස්ථාවරයත් ඒකයි. අපේ මේ පවතින ව්‍යවස්ථාවට අනුව විදේශ විනිසුරුවරු ගෙනෙන්න කොහොමවත්ම ඉඩකඩක් නැහැ. එහෙම එන එකටත් අපි විරුද්ධයි. අපට අත්දැකීම් තිබෙනවා, පිට රටින් ගෙන්වලා අපේ රටේ මොකක්ද කළේ කියන එක ගැන. මෙහේ අවුලක් කළා මිසක් විසඳුමක් දුන්නේ නැහැ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
බොහොම හරි.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

ඒ ගොල්ලන් දේශපාලන න්‍යාය පත්‍රයක් අරගෙනයි එන්නේ. ඒ වාගේම මා මේ කාරණය කියන්න ඕනෑ. මංගල සමරවීර ඇමතිතුමා උත්තර දෙන්න මෙතැන නැහැ. මම නම් කිසිම තැනක දැක්කේ නැහැ, මංගල සමරවීර ඇමතිතුමා ප්‍රකාශයක් කරලා තිබෙනවා විදේශ විනිසුරුවරු ගෙනෙන්න ඕනෑය කියලා. එතුමා කිසිම තැනක ඒක කිව්වේ නැහැ. හැබැයි එතුමා කිව්වත්, කිව්වේ නැති වුණත් ඒක නොවෙයි සිදු වන්නේ. මේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක සමන්විත මේ සම්මුතිවාදී රජයේ ප්‍රධානින් දෙපළ හැටියට මේ රටේ ජනාධිපතිවරයාත්, අගමැතිවරයාත් ඒ ගැන කථා කළාට පස්සේ ඊට එහායින් කාටවත් කථා කරලා වැඩක් නැහැ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

බොහොම හරි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ඒ ප්‍රකාශයත් එක්ක මා එකඟ වෙනවා. මේ යන ගමනේදී අපි රටක් වශයෙන් එකට මුහුණ දෙමු. අපට එන පොදු ප්‍රශ්නවලට අපි එකට මුහුණ දෙමු. අපි ඇතුළේ පිල් බෙදෙමු. අපි රණ්ඩු වෙමු. ඒකේ ඇති ප්‍රශ්නයක් නැහැ. නමුත් පොදු ප්‍රශ්නයක් ආවාම එකට කටයුතු කරමු.

ඔබතුමා දන්නවා, ඊයේ පෙරේදා යාපනය විශ්වවිද්‍යාලයේ ඇති වෙච්ච ප්‍රශ්නය ගැන. මේක එක එක්කෙනා එක එක විධියට විග්‍රහ කරනවා. නමුත් මෙතැන එක සත්‍යයක් තිබෙනවා. ඒ ශිෂ්‍යයන්ට පහර දුන්නා. එළවා එළවා පහර දුන්නා. ඔළු පැළෙන කල් පහර දුන්නා. දුවන කල් පහර දුන්නා. ඒක මුළු ලෝකයම දැක්කා. මොකක්ද වෙච්ච රාජකාරිය? කැලණිය විශ්වවිද්‍යාලයේ ගැහැණු දරුවෝ නවක වදය දුන්නා කියලා -ගවුමක් ඇඳගෙන එන්න කිව්වා කියලා- අත් අඩංගුවට ගත්තා. ඒ ළමයි අට දෙනෙක් දැන් මාස තුනක් තිස්සේ ඇතුළේ. ඊයේත් ඇප ගන්න බැරි වුණා. දැන් ඒක පළමුවැනිදාට කල් දාලා. මොකක්ද මේ double standards? ඇයි, එහෙම double standards තිබෙන්නේ? මේකටයි අපි විරුද්ධ වෙන්නේ. මෙහෙම කරන්න එපා. නීතිය කාටත් එකයි. අපි රටක් වශයෙන් මුහුණ දෙන ප්‍රශ්න සියල්ලම එකයි. මේකේ ඇතුළේ අපි එක එක තර්ක විතර්ක කර ගනිමු. ඒකේ අවුලක් නැහැ.

විල්කොට් වාර්තාව ගැන එතුමා පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරපු එක ගැන බොහොම හොඳයි. මම කල්පනා කළා, මේ වෙන කල් කිසිම ඇමතිවරයෙක් ඒ ගැන ප්‍රකාශ කළේ නැහැ නේ කියලා. අඩු ගණනේ ඒ අදහසවත් ප්‍රකාශ කළේ නැහැ. ඒක ප්‍රකාශ කිරීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේවා අපි කියන්න ඕනෑ. මේවා අපි ලෝකයට කියන්න ඕනෑ, විල්කොට් වාර්තාවේ මෙන්න මේකයි තිබෙන්නේ කියලා. Double standards මෙතැනත් තිබෙනවා. ඇයි, අපට විතරක් වෙන විධියකට කටයුතු කරන්නේ? ඇයි, එංගලන්තයට වෙනම standard එකක් කියලා අහන්න ඕනෑ. එච්චර විතරක් නොවෙයි. ඔය මහ ලොකුවට කථා කරන පුවත් පත් නිදහස, පුවත් පත් නිදහසේ තිබෙන උත්තරීතර භාවය පතුරු ගහලා තිබෙනවා, Chilcot Report එකෙන්. ඔබතුමා සමහර විට ඒක කියවන්න ඇති. ඒකේ තිබෙනවා, පත්තර කොහොමද එදා හිටපු අග්‍රාමාත්‍යවරයාට මේ මහා ලෝක අපරාධය සිදු කරන්න උදව් කළේ කියලා. ලක්ෂ දහයක් මිනිස්සු මැරුවා. කිසිම පදනමක් නැතුව ඒ රටවල් දෙකම සුන් කෙරුවා.

අපි ඇත්ත වශයෙන්ම විල්කොට් මහත්තයාගේ ඒ වාර්තාව එළියට ප්‍රකාශ කරන්න ඕනෑ. මෙහාට බිස්වාල් නෝනා හරි, කවුරු හරි ආවාම අපි ඒ ගැන අහන්න ඕනෑ. ඒක ප්‍රසිද්ධියේ අහන්න ඕනෑ. ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ කරපු ප්‍රකාශය මම අගය කරන්නේ ඒ කාරණය ගැන කියපු නිසායි. මොකද මේ වෙන කල් අගමැතිතුමාවත්, විදේශ කටයුතු ඇමතිතුමාවත් එහෙම නැත්නම් මේ ඉන්න ඇමතිවරු කිසිම කෙනෙක්වත් ඒ සම්බන්ධයෙන් එකම වචනයක්වත් මේ වෙන කල් ප්‍රකාශ කරලා නැහැ. කවුරුත් වලිගයෙන් අමුඩ ගහගෙන ඉන්නවා. එහෙම නොවෙයි ඉන්න ඕනෑ. අපටත් ප්‍රශ්නයක් තිබෙනවා. අපේ රටට මේ ගොල්ලන් සියලු දෙනාම එකතු වෙලා කරන දේ ගැන ඔබතුමා හොඳටම දන්නවා. ඔබතුමා හොඳටම දන්නවා, යුද්ධය පැවති කාලයේ මොන වාගේ බලපෑමක් අපට කෙරුවාද කියලා. ඒක ඔබතුමාට නැහැයි කියන්න බැහැ. ඔබතුමා හොඳාකාරවම ඒ ගැන දන්නවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ප්‍රශ්නවලට මුහුණ දුන්නා. ඔබතුමා ඒ ප්‍රශ්නවලදී මේ රට වෙනුවෙන් යම් ආකාරයක දායකත්වයක් දුන්නා. අපි ඒක නොදන්නවා නොවෙයි. අපි ඒක හොඳටම දන්නවා. ඒ විධියේ තත්ත්වයකදී තමයි, ඒ ප්‍රශ්නයට මහින්ද රාජපක්ෂ මහත්මයා මුහුණ දීලා කොහොම හරි යුද්ධය අවසාන කළේ. ඒකත් අහක දමන්න එපා; ඒකත් හෑල්ලුවට ලක් කරන්න එපා. ඒ බලවේගයට මුහුණ දෙන්න පුළුවන් හයියක් එතුමාට තිබුණා. ඒක මේ රටේ කිසිම නායකයෙකුට තිබුණේ නැහැ. මේ රටේ කිසිම නායකයෙක් ඒකට මුහුණ දුන්නේ නැහැ. එතුමාට පුළුවන්කම තිබුණා, ඒ තර්ජනයට මුහුණ දීලා අපේ රට බේරා ගන්න. අද එතුමාව හිරේ දමන්න, අද එතුමාව නිකම් තුට්ටු දෙකේ පුරවැසියෙක් බවට පරිවර්තනය කරන්න, එතුමා සත පහක වැඩක් නැති පුද්ගලයෙක් බවට පරිවර්තනය කරන්න, අපිත් එක්ක හිටපු උදවියත් මහන්සි වෙන එකයි අපට කනගාටු; මේක දැන ගෙන ඉන්න උදවියත් ඒකට සහභාගි වෙන එකයි කනගාටු. ඒ නිසා සත්‍යය කථා කරන්න. ප්‍රශ්නයට මුහුණ දුන්නු තැන කථා කරන්න. මොකක්ද මෙතැන වුණේ කියන්න. ඒක කියන්න භය වෙන්න එපා.

අද ගරු ඇමතිතුමා කියනවා "අපේ ජනාධිපතිතුමා මේ මේ ජයග්‍රහණ ලැබුවා" කියලා. ඒක හොඳයි. හැබැයි, අර "කපුටා සහ කේඳු කෑල්ල" කථාවේ තත්ත්වයට වැටෙන්න දෙන්න එපා. එතකොට මේ ජනාධිපතිතුමාත් නැති වෙනවා; මේ ජනාධිපතිතුමාත් විනාශ වෙනවා. එතුමාටත් ඇත්ත කියන්න. මේ රටේ යථාර්ථය කියන්න. මේ රටේ මහ පොළොවේ මොකක්ද තිබෙන්නේ කියන්න. ඒකයි මේ රටට විය යුතු යුතුකම. එතුමා මුළා කිරීම නොවෙයි, කපුටා සහ කේඳු කෑල්ලේ කථාව ආපහු ගෙනෙන එක නොවෙයි කළ යුත්තේ. එතුමාට මේ රටේ තිබෙන යථාර්ථය පිළිබඳ ඇත්ත දැනගන්න තිබෙන්නට ඕනෑ. මේ ආර්ථිකයත් අද වැටිලා තිබෙන්නේ එතැනටයි. එතුමාට මේ තොරතුරු යන්නේ නැහැ. ගියාම කියන්නේ වෙන එකක්.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලා පසු ගිය දවස්වල ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී රැස්වීමක් තිබ්බා. එහිදී මොකද වුණේ? බඩු මිල ගැන කථා කළාම මොකද වුණේ? මොනවාද කිව්වේ? [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒක බොරු. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එක්ක තමයි මේ රටේ සියලුම දෙනා ඉන්නේ. ඒ නිසා එහෙම කරන්න එපා. එහෙම නායකයන්ට කිව්වාම ඒ නායකයෝ විනාශ වෙනවා. කවුරුත් එක්ක එකතු වෙලා ඒක තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් කළේ. "ඔබතුමා තරම් මේ රටේ නායකයෙක් තවත් නැහැ" කිව්වා. මම දන්නවා වෙච්ච දේ. [බාධා කිරීමක්]

ගරු මහින්ද සමරසිංහ මහතා
(*மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ*)
(The Hon. Mahinda Samarasinghe)

ගරු මහින්ද යාපා මන්ත්‍රීතුමනි, එහෙම දෙයක් වුණේ නැහැ කියලා මගේ වචනය පිළිගන්න කෝ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(*மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன*)
(The Hon. Mahinda Yapa Abeywardena)

එහෙම වුණේ නැති නම්, එච්චරයි.

ගරු මහින්ද සමරසිංහ මහතා
(*மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ*)
(The Hon. Mahinda Samarasinghe)

ඔබතුමාට වැරැදි තොරතුරක් දීලා තිබෙන්නේ. අපි දෙගොල්ලන් හප්පන්නත් සමහරු බොරු ගොතලා තමුන්නාන්සේලා නොමඟ යවනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(*மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன*)
(The Hon. Mahinda Yapa Abeywardena)

ඔබතුමා එහෙම කියනවා නම් මම පිළිගන්නම්.

නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාටත් කළේ ඔය දේමයි. එතුමාට කිව්වා, "ඔබතුමා පණ තිබෙන තුරු මේ රටේ ජනාධිපති" කියලා. අපි පිටිපස්සෙන් ඉඳගෙන හිනහ වෙනවා. අපට කථා කරන්න ඉඩක් නැහැ. "ඔබතුමා මහ රජා"ය කිව්වා; "මේ රටේ රජ්ජුරුවෝ" කිව්වා. ඔය වටේ හිටිය උදවිය එහෙම කියලා ඒ මනුස්සයා විනාශ කළා. ඒක නේ වුණේ. ඒක නේ ඇත්ත කථාව. දැන් ඒ කට්ටිය අනෙක් පැත්තට ගිහින්. දැන් එතුමා තනි වෙලායි ඉන්නේ. එතුමාට අපි ගෞරව කරන්නේ මේ රට බේරා ගත්ත නායකයා නිසායි. එතුමා මේ රට වෙනුවෙන් දැවැන්ත සේවාවක් කළා. ඉතිහාසයේ අපි දන්නා කාලයක, අපේ වයසේ කාලයක මේ රටට වැඩිම සේවයක් කළ පුද්ගලයා හැටියටයි අපි එතුමාව දකින්නේ.

මේ රටේ මොන තරම් නායකයෝ හිටියාද? ඒ උදවිය වැඩ කරන හැටි අපි දැක්කා. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ නායකත්වය තිබෙන කාලයේ ඉඳලා මම මේ ගරු සභාවේ හිටියා. එදා ඉඳලා මේ ප්‍රශ්නය තිබුණා. මේ ප්‍රශ්නයට ඒ නායකයන් මුහුණ දුන් හැටි අපි දැක්කා. එදා ඉන්දියාවේ බලපෑම් ආ වේලාවේ ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ හැසිරීම මොකක්ද කියන එක අපි දැක්කා. ආණ්ඩු පක්ෂයේ රැස්වීමට ඇවිල්ලා මොනවාද කිව්වේ කියලා මම ඇහුවා. කොයි විධියටද හැසිරුණේ කියන එක අපි දැක්කා. සමහර වේලාවට අපට භය හිතුණා, මේ අපේ රටේ නායකයාද කියලා. අපට ලජ්ජා හිතුණා, මේ අපේ රටේ නායකයාද කියලා. ඒ නිසායි අපට එක්සත් ජාතික පක්ෂයෙන් යන්න වුණේ; ඒ නිසායි එදා අපි විරුද්ධව කථා කළේ.

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පස්සේ ආපු නායකයෝත් අපේ රටේ මේ ප්‍රශ්නවලදී මේ විධියට මුහුණ දුන්නේ නැහැ. මේ විධියට රට ගැන කැක්කුමක් ඇතිව ඒවාට මුහුණ දුන්නේ නැහැ. රටේ ප්‍රශ්න ගැන අවබෝධයක් ඇතිව මුහුණ දුන්නේ නැහැ. මේ සෑම බලවේගයකටම මුහුණ දුන් නායකයෙක් තමයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඒ ගෞරවය අපි එතුමාට දෙන්න සූදානම් නැත්නම්, අපි මේ රටේ පුරවැසියෝ නොවෙයි; අපි මේ රටේ මනුස්සයෝ නොවෙයි. අද එතුමාව තියා ගෙන දෙන්න පුළුවන් දස වධ එතුමාට දෙනවා. ඒකටයි අපි විරුද්ධ. එතුමාගේ අඩු පාඩුකම් ඇති. එතුමා වටේ හිටිය, එතුමා විනාශ කළ මිනිසුන්ගේයි එතුමාට වැඩිය අඩු පාඩුකම් තිබුණේ. ඒ අඩු පාඩුකම්වලට දඬුවම් දෙන්න. නමුත්, මෙවැනි ආකාරයට රටට වැඩක් කළ, ඓතිහාසිගත සේවයක් කළ පුද්ගලයෙකුට මේ විධියට අපහාස කරන්න එපාය කියායි අපි කියන්නේ. අනෙක් ඕනෑම දෙයක් අපට කමක් නැහැ. උසාවි ගෙනිහින් නඩු දමනවා නේ; දමන්න. දමන නඩු මොනවාද? අපි දැක්කා, බට බෙදුවයි කියලා බැසිල් රාජපක්ෂ මහත්තයාට නඩුවක් දැම්ම බව. එතැන කිසිම නඩුවක් නැහැ. ඒ කරුණු සම්බන්ධව ඊට පෙර ඉහළ උසාවියෙන් ඇප දුන්නා. දැන් පහළ උසාවියට ගිහින් දාලා, නැවත එතුමා ඇතුළට දැම්මා. ඇතුළට දාලා මොකක්ද, මේ වෙන්නේ? සතුටු වෙනවා. මහින්ද රාජපක්ෂට ගහන්න; නාමල් රාජපක්ෂ ඇතුළට දැම්මා. අඩු පාඩු නොතිබුණු පුද්ගලයන් නම් නොවෙයි කියන එකත් කියන්න ඕනෑ. අඩු පාඩුකම් තිබුණා. නමුත් මේ නඩු, බොරුවට ගොතාපු නඩු. සාක්ෂි නැතුව ගොතාපු නඩු. අපි උසාවියේ ගිහින් බලාගෙන හිටියා මොකක්ද, මේ නඩුව කියලා. පොලීසියේ මහත්වරු ඇවිල්ලා කියන ඒවාට මුළු උසාවියම හිනා වෙනවා. FCID එකේ මහත්වරු ඇවිල්ලා කියන ඒවාට උසාවියම හිනා වෙනවා, මේවාද මේ නඩු; මේවාද, මේ සාක්ෂි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පොලීසිය ඉතාමත් අසරණ වෙලා ඉන්නේ. ඒ මිනිසුන්ගේ පඩි වැඩි කළේ නැහැ; ඒ මිනිසුන්ට පඩි ලබා දෙන්න. මේ ආර්ථිකය ගැනයි තමුන්නාන්සේලා කථා කරන්නේ. නියමිත වැටුපක් නොලැබෙන නිසා තමයි ඒ මිනිස්සු මේ බලකම්වලට ලැහැස්තිවෙලා ඉන්නේ. Promotion එක දෙනවා නම්, ඕනෑම ජරා වැඩක් කරන්න සූදානම්. සමහර වෙලාවට ඔය වාගේ ලාභ ප්‍රයෝජන දෙනවා කිව්වා නම් ඕනෑම පහත් වැඩක් කරන්න පුළුවන්. එතැනටයි අද පොලීසියට වැටිලා තිබෙන්නේ. ඒ ගැන අපි කනගාටු වෙනවා. ඒ මිනිසුන්ට නියමිත උසස්වීම් ටික දෙන්න; ඒ මිනිසුන්ට නියමිත වැටුප දෙන්න. සියයට 40ක වැටුප් වැඩිවීමක් දෙන්න කථා කරපු ආණ්ඩුවක් තමයි මේ තිබෙන්නේ. එහෙම කියාගෙන තමයි බලයට ආවේ. ඇයි, ඒ වැටුප දෙන්න බැරි? ඒක දෙන්න. ඒක දුන්නොත් මේ රටේ නිදහස් පොලිස් සේවයක් ඇති වෙයි; මේ රටේ ගෞරවනීය පොලිස් සේවයක් ඇති වෙයි. නමුත් මහින්ද රාජපක්ෂ මැතිතුමාට අපහාස කරන්න, මේ රටට සේවයක් කරපු නායකයා නැති කරන්න, මේ නායකයා සම්පූර්ණයෙන් සමූල ඝාතනය කරලා දමන්න ගෙනියන වැඩ පිළිවෙළ ඉතාමත් අශෝභන ඒ වාගේම අසික්කිත වැඩ පිළිවෙළක් හැටියටයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි මම දකින්නේ. බොහොම ස්තුතියි.

[අ.භා. 5.24]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ විවාදය වෙනුවෙන් කථා කරන්න ලැබීම පිළිවෙ මම විශේෂයෙන් සන්තෝෂයට පත් වෙනවා. ඒ එක්කම අපේ ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමාගේ අදහස ගැනත් මුලින්ම ප්‍රකාශ කරන්නම්. යුද්ධයේ ජයග්‍රහණයත් සමඟ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ගෞරවය ලැබිය යුතු පුද්ගලයෙක් හැටියට සැලකීමට නම් හිටපු ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා වාගේ බොහොම ගෞරවාන්විත විධියට තමන්ගේ යුතුකම කරලා නිසි කලට, නිසි අවස්ථාවේ ඉවත් වෙන්න තිබුණා. අපි බෞද්ධයන් හැටියට නිරන්තරයෙන් කථා කරන දෙයක් තමයි අත්හැරීම කියන්නේ. එතුමාත් නෙල්සන් මැන්ඩෙලා වාගේ අදර්ශවත් චරිතයක් වුණා නම්, ඔය ඔබතුමා කියන ගෞරවය සහ ඒ සියල්ල ලැබීමට නියමිතව තිබුණා. හැබැයි, ඕනෑම දෙයක් ඕනෑවට වැඩිය ඕනෑම නැහැ කියන කාරණයත් එක්ක ඒ තිබිච්ච අධික බල තණ්හාව, තෘෂ්ණාව නිසා - [බාධා කිරීමක්] එතුමා සහ එතුමාගේ ගෝලයෝ කණ්ඩායම පිරිහීමකට පත් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද එතුමා කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී. ඒ මට්ටමේම මමත් අද කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී. ඒ වාගේ පහත් තත්ත්වයකට වැටෙන තීන්දු තීරණ ගනිද්දී ඊට වෙනස්ව එතුමාව මෙහෙයවීමට ඔබතුමාලාටත් වගකීමක් තිබුණා. තමන්ගේ නායකයා ඒ වාගේ මට්ටමකට යෑමේ තීන්දු තීරණ ගැනීමේදී ඒවායින් එතුමාව වළක්වා ගන්නට ඔබතුමන්ලාටත් වගකීමක් තිබුණා. ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි, අද තුෂාර ඉඳුනිල්ගේ තත්ත්වයට මහින්ද රාජපක්ෂව වැටීම පිළිබඳව තමුන්නාන්සේත් ඒ වගකීම බාරගන්න ඕනෑ. ඒ කාරණය මම විශේෂයෙන්ම තමුන්නාන්සේට කියනවා. ඒකාබද්ධ විපක්ෂය අද මේ ඉදිරිපත් කරපු යෝජනාව - [බාධා කිරීමක්] ඒක තමයි තිබෙන නරක. කඵු කිරි කොල්ලෝ ගහන සෙල්ලම් වියපත් දේශපාලකයන් ගැහුවාම ඒ තත්ත්වයට පත් වෙනවා. ඒ වාගේම ජනවාරි 8න් පස්සේ මේ රජය ආවාම මේ ඒකාබද්ධ විපක්ෂය යැයි කියා ගන්නා කණ්ඩායම විවිධාකාරයෙන් ගල් ගහන්න පටන් ගත්තා. සතියෙන් දෙකෙන්, සතියෙන් දෙකෙන්, සතියෙන් දෙකෙන් මොනවා හෝ ප්‍රශ්නයක්, මොනවා හෝ මාතෘකාවක් අරගෙන, මොනවා හෝ අවුලක් ඇති කරලා, "මේ පාර්ලිමේන්තුව අස්ථාවරයි. දැන් මේක නූලෙන්, නූල් කෑල්ලෙන් එල්ලෙන්නේ. පාර්ලිමේන්තුව ඇතුළ හරි කවල්" කියලා, මේ වාගේ මතයක් රට පුරා සමාජගත කරන්නට ඒකාබද්ධ විපක්ෂය යැයි කියා ගන්නා කණ්ඩායම උත්සාහ කරනවා. මේක ඒකාබද්ධ විපක්ෂයේ නූල් සූත්තර වැඩක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මෙතැන අමුතුම සිද්ධියක් සිදු වෙන්නේ. අපි රටක් හැටියට, මහජන නියෝජිතයෝ හැටියට මේ හොර නඩය බලයෙන් පහ කරලා දැම්මා. මුළු රටේම සිටි ජනතාව මේ හොර නඩය දිහා බලාගෙන හිටියා. "අන්න හොරු. අන්න හොරු. අන්න හොරු" කියලා මේ හොර නඩය දිහා මුළු රටේම ජනතාව බලාගෙන හිටියා. දැන් මේගොල්ල මනෝ විද්‍යාත්මක වැඩක් කරනවා. සියලුදෙනා තමන් දිහා බලාගෙන ඉන්න විට හොර කණ්ඩායම එකතු වෙලා, "නැහැ, නැහැ. අපි නොවෙයි හොරු. අන්න හොරු." කියලා අලුත් ආණ්ඩු පක්ෂයේ කණ්ඩායමට ඇඟිල්ල දික් කරනවා. මේක බොහොම මනෝ විද්‍යාත්මකයි. තමන් දිහා 24 පැයේම බලා සිටින ජනතාවගේ ඇස් වෙනත් කෝණයකට යොමු කරනවා. ඇයි දෙවියනේ, පැයක් දෙකක් හෝ වෙනත් පැත්තකට යොමු කිරීමෙන් ලබන සැනසිල්ල ලබා ගන්න හොරුන් විසින්ම අලුත් ආණ්ඩුවට ඇඟිල්ල දික් කරනවා. කලින් නම් හොරාගේ ජේන හොරාගේ අම්මාගෙන් ගිහිල්ලා ඇහුවේ. දැන් මේ අහන්නේ හොරුන්ගෙන්මයි. ඒකාබද්ධ විපක්ෂය යැයි කියා ගන්නා හොරු ටික ජනතාවගේ ඇස් වසන් කරන්නට, ජනතාව නොමඟ යවන්නට "අන්න හොරු" කියලා සිදු කරන ක්‍රියාවේ ප්‍රතිඵලයක් තමයි මේ. ඒකාබද්ධ විපක්ෂය හැම තිස්සේම චෝදනා කරන අපේ අලුත් ආණ්ඩුව මොනවාද ලබා නොදුන්න සහන?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ආපු ගමන්ම ලංකාවේ රාජ්‍ය සේවයට වැඩිම පඩි වැඩිවීම කළා. ලක්ෂ 14ක් වන රාජ්‍ය

සේවකයින්ට රුපියල් 10,000 බැගින් ලබා දුන්නා. ඒවායේ ගණන් හදා ගන්න ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමනි. 1,400,000 x රු.10,000. ඒ වාගේම අපි විශ්‍රාමිකයන්ගේ දීමනාව වැඩි කළා. විශේෂයෙන් සමෘද්ධි දීමනාව ගැන චෝදනාවක් තිබෙනවා. තමුන්නාන්සේලාගේ කාලයේ නම් එක්සත් ජාතික පාක්ෂිකයෙක් වූ පමණින් සමෘද්ධි දීමනාව අහලකටවත් යන්නට ලැබුණේ නැහැ. ඒක සියයට 90ක්ම තමුන්නාන්සේලාගේ පක්ෂයේ අය තමයි ගත්තේ. නමුත් අපේ ආණ්ඩුව ඒ විධියට වර්ගීකරණය කළේ නැහැ. යූඑන්පීකාරයින්ට -එක්සත් ජාතික පාක්ෂිකයින්ට- අපි සමෘද්ධිය හදලා දුන්නේ නැහැ. අපි මේ වන විට ප්‍රතිලාභ ලබා ගන්නා සමෘද්ධි ලාභීන්ගේ සමෘද්ධි ප්‍රතිලාභය වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම අපි වැඩිහිටි දීමනාව වැඩි කළා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
උපදේශක තනතුරු දුන්නා කියලා කිව්වා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඒක මම දන්නේ නැහැ. අපි වැඩිහිටි දීමනාව වැඩි කළා. තමුන්නාන්සේලාගේ කාලයේ ඩීසල් ලීටරයක් රුපියල් 123යි. අපි ඒක 95ට බැස්සුවා. තමුන්නාන්සේලාගේ කාලයේ අධිකරණයෙන් නියෝගයක් දීලා තිබුණත්, ඔය කියන විධියට ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අඩු වුණත් තමුන්නාන්සේලා ඒක අඩු කළේ නැහැ. නමුත් අපි දැන් වසරකටත් එහා කාලයක සිට ඒක අඩු කරලා තිබෙනවා. මතක තියා ගන්න. තමුන්නාන්සේලා චෝදනා කළාට අපි තවම එක ශත 50ක් වැඩි කළේ නැහැ. ඒ වාගේම අපි හැම ගමකටම රුපියල් ලක්ෂ 10ක දීමනාවක් ලබා දීමේ වැඩසටහන මේ වන විට එක වටයක් බොහොම සාර්ථකව අවසන් කරලා තිබෙනවා. දැන් එහි දෙවෙනි වටය ක්‍රියාත්මක වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ඡායා කැබිනට්ටුවේ විමල් වීරවංශ මහත්මයාට -ගමකට සිමෙන්ති කොට්ටයක්වත් බෙදපු නැති විමල් වීරවංශ මහත්මයාට- ආපහු අධීක්ෂණය කරන්න කියලා දීලා තිබෙනවා එතුමාගේ හිටපු අමාත්‍යාංශය.

අපි පොඩි තරුණයින් කාලයේ, ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ අපි ඇහුවා "උදාගම්" වැඩසටහන්, නිවාස වැඩසටහන් ගැන. ඉන් පසුව අපේ නව රජය යටතේ නිවාස වැඩසටහනක් ගැන ඇහුවා මිස තමුන්නාන්සේලාගේ රජය කාලයේ ගමට සමාජගත වුණු, ගැමියන්ට, අභිංසකයින්ට, අසරණයින් නිවාස ලැබෙන වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒවා මේ රජය තුළ අපි විශේෂයෙන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අපේ නිලධාරී මහත්මයෙක් කිව්වා, "පසුගිය කාල පරිච්ඡේදය තුළ විවාහ වීම් - කසාද බැඳීම්- අඩු වෙලා තිබෙනවා." කියලා. කසාද බැඳීම් අඩු වෙලා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒ මේ ආණ්ඩුව ආවාට පස්සේ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඒක තමයි. මම තමුන්නාන්සේට කියා දෙන්නම්.

පසු ගිය කාල පරිච්ඡේදයේ කසාද බඳින එක අඩුවෙලා තිබුණා ලු. කොයි කාලයේද කියලා කිව්වොත්, දැනට අවුරුදු 5ක, 6ක ඉඳලා කසාද බඳින එක අඩු වෙලා. ජනගහනය වැඩි වෙනවා. ජනගහනය වැඩි වෙන්න, වැඩි වෙන්න කසාද නොබඳින්නේ ඇයි?

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඒක නිසා දැන් සමලිංගික විවාහ නීතිගත කරන්න යනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු මන්ත්‍රීතුමා, අවශ්‍ය නම් ඒ විධියටත් කසාද බඳියි. ගරු මන්ත්‍රීතුමනි, කසාද බඳින එක අඩු වුණේ ඇයි? තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ රෙජිස්ට්‍රර් ගාස්තුව වශයෙන් කසාද බඳින සෑම යුවලකගෙන්ම රුපියල් 5,000ක් අය කළා. එහෙම තමයි මේ ගොල්ලෝ දාලා තිබුණු බදු. අද අපි ඒ සියල්ල නිදහස් කරලා තිබෙනවා. ඒ විධියට නිදහස් කර තිබියදීත් හොරුන් විසින් නිර්දෝෂී මිනිසුන්ට ගහන ගල් ප්‍රහාරවලින් තවත් එක් ගල් ප්‍රහාරයක් හැටියට තමයි විශේෂයෙන් මම මේක දකින්නේ.

තමුන්නාන්සේලා පසු ගිය කාලයේ පොහොර ප්‍රශ්නය අරගෙන ගල් ගැහුවා; නිල ඇඳුම් ප්‍රශ්නය අරගෙන ගල් ගැහුවා; 'වැට්' ප්‍රශ්නය අරගෙන ගල් ගැහුවා; මහ බැංකු අධිපතිගේ ප්‍රශ්නය අරගෙන ගල් ගැහුවා; වාහන ප්‍රශ්නය අරගෙන ගල් ගැහුවා; ETCA සිද්ධිය අරගෙන ගල් ගැහුවා. එහෙම ගල් ගහන ගමන් තමුන්නාන්සේලා පොල් ගහන්නත් පටන් ගත්තා.

මම පොහොර ප්‍රශ්නය ගැන කියන්නම්. අපේ ගම්වල ජනතාව පොහොර ප්‍රශ්නය අරගෙන අපිවත් කුලප්පු කළා. ගමට යන්න බැහැ. "අයියෝ! රුපියල් 350ට තමයි එදා පොහොර මිටියක් දුන්නේ" කියලා කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි කිහිපයක් මට ලබා දෙන්න.

මම පොහොර ප්‍රශ්නය ගැන කථා කරනවා නම්, විශේෂයෙන්ම පොහොර මිටියක් රුපියල් 350 ගණනේ ලබා දුන්නා. සාමාන්‍යයෙන් අක්කරයක් වගා කරන පුද්ගලයෙකුට පොහොර මිටි දෙකක් ලබා දුන්නා. පොහොර මිටිය රුපියල් 350 ගණනේ දුන්නාට රක්ෂණ ගාස්තු කියලා රුපියල් 150ක්, 200ක් ගන්නවා. ප්‍රවාහන ගාස්තු කියලා රුපියල් 100ක්, 150ක් ගන්නවා. රැඳවුම් ගාස්තු, ගබඩා ගාස්තු කියලා මුදලක් අය කරනවා. සාමාන්‍යයෙන් පොහොර මිටියක් සඳහා අය කරන්නේ රුපියල් 350යි කියලා නාම මාත්‍රිකව පෙන්නුවාට, පොහොර මිටියක් සඳහා රුපියල් 700ක්, 750ක් වැය කරන්න සිදු වුණා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, මමත් ගොවියෙක්. පොහොර මිටියක් සඳහා රුපියල් 700ක්, 750ක් වැය කරන්න සිදුවුණා. පසට දාන්න හොඳ නැති, පසට විෂකාරක වුණු බාල පොහොර තමයි එදා දුන්නේ. මේ

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

වෙන කොට ගොවියෝ කියනවා, "අක්කරයක් සඳහා ලබා දුන් රුපියල් 5,000න් රුපියල් 4,500යි තමන්ට වියදම් වෙන්නේ" කියලා. පොහොර කිලෝ ප්‍රමාණය කොච්චරද කියලා තමුන්නාන්සේලා ගණන් හදලා බලන්න. රුපියල් 4,500යි වියදම් වෙන්නේ. හොඳ ප්‍රමිතියකින් යුක්ත, පසට හිතකර ගුණාත්මක පොහොරක් දැන් පසට යොදනවා. ඒ ලබා දෙන මුදලිනුත් දැන් රුපියල් 500ක් ඉතුරු කර ගන්නවා. කලින් රුපියල් 350ට පොහොර දීමේ ක්‍රියාවලිය තුළ ඔවුන්ගේ අතින් වියදම් වෙච්ච රුපියල් 1,500කුත් ඔවුන් දැන් ඉතුරු කර ගන්නවා. ගුණාත්මක වටිනාකමක් ඇති පොහොර යෙදීම නිසා ඉඩම් අක්කරයක් තිබූ ගොවියාට දැන් රුපියල් 2,000ක් පමණ ඉතුරු වෙනවා.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමා මෙතැනදී කිව්වාට, ගමට ගිහිල්ලා ඕවා කියන්න එපා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු මන්ත්‍රීතුමනි, අපි රට වටේ ගිහිල්ලා දන්නා දේ ගැනයි කියන්නේ.

Hon. Speaker, in deference to the judgment of the Supreme Court, we will re-present this Bill in the House later. But, there are a large number of Bills which have become laws in this Parliament, the last Parliament and the Parliament before, following the procedure in respect of the Value Added Tax (Amendment) Bill. Now, this raises an issue, which I think I should point out to you. While we have got this question out of the way, I think the House will have to give a Ruling on this matter because, නීතිය අනුව ප්‍රකාශ කර තිබෙනවා, පාර්ලිමේන්තුවෙන් නීතියක් සම්මත වුණාට පස්සේ උසාවියේ ප්‍රශ්න කරන්න බැහැ කියලා. නමුත් ඇත්ත වශයෙන් ඒ අයට පුළුවන් උසාවියට ගිහින් මූලික අයිතිවාසිකම් නඩු දාලා මේ පාර්ලිමේන්තුවේ, පසු ගිය පාර්ලිමේන්තුවේ, ඊට ඉස්සර පැවැති පාර්ලිමේන්තුවේ සම්මත වූ පනත් යටතේ බදු, එහෙම නැත්නම් මුදල් නොගෙවීම, එහෙමත් නැත්නම් ඒ මුදල් වියදම් කිරීම ගැන ප්‍රශ්න කිරීමට. ඒ නිසා පක්ෂ නායකයන් එක්ක සාකච්ඡා කරලා මේ ගැන පාර්ලිමේන්තුවේ තීරණයක් ගන්න සිදු වෙයි. මා ගරු කථානායකතුමාගේ අවධානය මේ කෙරේ යොමු කරවන්නේ ඒ නිසායි.

පළමුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152වන ව්‍යවස්ථාවට අනුව, මහජනතාවගේ ආදායමට බලපාන්නා වූ පනත් කෙටුම්පත් අමාත්‍ය මණ්ඩලය විසින් බලය පවරනු ලබන ආකාරයකින් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. දෙවනුව, ස්ථාවර නියෝග 133 අනුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අදාළ අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු වේ.

අධිකරණයේ මතය වනුයේ මෙම විධිවිධාන දෙකම අනිවාර්ය වන අතර, ඒ කිසිවකට අනුගතව කටයුතු කර නොමැති බවයි.

මේ දක්වා අමාත්‍ය මණ්ඩලය විසින් යම් කරුණක් ප්‍රතිපත්තිමය වශයෙන් අනුමත කොට නීති කෙටුම්පත් කිරීම සඳහා බලය පැවරීම හෝ දැනටමත් කෙටුම්පත් කර ඇති පනත් කෙටුම්පත් අනුමත කිරීම වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාව කරා වූ ප්‍රවේශ දෙකක් අනුගමනය කර ඇත.

මේ අමාත්‍ය මණ්ඩලයන්, මීට පෙර පැවැති අමාත්‍ය මණ්ඩලයන් මේ ක්‍රමවේද දෙකම අනුමත කර තිබෙනවා. කෙටුම්පතක් අනුමත කර තිබෙනවා, නැත්නම් මූලධර්ම අනුමත කර ඒ සඳහා ඉඩ දීලා තිබෙනවා. නීතිපතිතුමාගේ අනුමැතිය ලැබුණාම එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාවේ සඳහන් වන ආකාරය දැක්වුවහොත් එය මෙසේය:

> "... අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කොට ඇතොත් මිස හෝ අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලබන යම්කිසි ආකාරයකට අනුමත කොට ඇතොත් මිස, ..."

මේ ක්‍රම දෙකම පිළිගත හැකි ඒවා සේ සලකා ඇති අතර, කිසි විටෙක කිසිදු විරෝධයක් ඉස්මතු කොට නොමැත.

අමාත්‍ය මණ්ඩලය විශේෂයෙන්ම පාර්ලිමේන්තුවටද, පාර්ලිමේන්තුව ජනතාවටද වග කිව යුතු වේ. එබැවින්, පනත් කෙටුම්පත් සභාගත කරනු ලැබ සභාව දැනුවත් කොට ඇති බැවින්, අමාත්‍ය මණ්ඩලය විසින් නිසි කාර්ය පරිපාටිය අනුගමනය කොට ඇත්තේද යන්න තීරණය කිරීම පාර්ලිමේන්තුව විසින් සිදු කළ යුත්තකි. එනම්, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණය මේ කාර්යාවලියේ ආරම්භයයි. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ සහතිකයක් අධිකරණමය කටයුතු සඳහා ප්‍රමාණවත් වේ. වෙනයම් විභාගයක් සිදු කරන්නේ නම්, එය අවශ්‍යයෙන්ම පාර්ලිමේන්තුව විසින් සිදු කළ යුතු වේ.

මේ ආණ්ඩුවත්, පසු ගිය ආණ්ඩුවත් ඒ ක්‍රමවේද දෙකම ක්‍රියාත්මක කරලා තිබෙනවා. 152 ව්‍යවස්ථාවේ සඳහන් එක ක්‍රමවේදයක් පමණක් අනුගමනය කර තිබෙනවා නම්, අනික් ක්‍රමවේදය අනුමත කරලා පාර්ලිමේන්තුවට කෙටුම්පත ඉදිරිපත් කළා නම්, ඒ ගැන තවත් ප්‍රශ්න කරන්න පුළුවන්.

ස්ථාවර නියෝග 133 සම්බන්ධයෙන් කරුණු විමසන කල, පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අමාත්‍යවරයකු විසින් ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බවට ප්‍රකාශ කිරීමේ සම්ප්‍රදායක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම එය ස්ථාවර නියෝගවල තිබුණාට අපි ක්‍රියාත්මක කරලා නැහැ. මා බැලුවා, මේ පාර්ලිමේන්තුවේ වාගේම ගිය පාර්ලිමේන්තුවේත් ඇමතිවරු ඒ විධියට ක්‍රියා කරලා නැහැ.

විශේෂයෙන්ම 1993 සිට ජනාධිපති, මුදල් ඇමතිවරයා වශයෙන් පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනකොට ඒ අනුව ක්‍රියා කරලා නැහැ. අපේ සභාවත් ඒක පිළිගෙන ක්‍රියාත්මක කරලා තිබෙනවා. පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන විට සමහර වෙලාවට අහනවා, ආණ්ඩුවේ අනුමැතිය තිබෙනවා ද කියලා. නැත්නම් ඒවා අනුමත කරලාත් තිබෙනවා.

ස්ථාවර නියෝග අනුගමනය කොට ඇත්තේද නොමැත්තේද යන්න පාර්ලිමේන්තුවේ අභ්‍යන්තර කාර්යක් වන අතර, ඒ සම්බන්ධයෙන් තීරණ ගත හැක්කේ කථානායකවරයාටයි. ඔහුගේ තීරණය අවසාන තීරණය වෙනවා. කථානායකවරයාගේ තීරණය ලබා දීමෙන් ඉක්බිතිව කටයුතු කරන ආකාරය පිළිබඳව පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබනවා.

ස්ථාවර නියෝග 135 මඟින් ස්ථාවර නියෝග අත්හිටුවීමේ බලය පාර්ලිමේන්තුව වෙත ලබා දෙන බැවින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිය තීරණය ලබා දීමේදී පාදක කොට ගත් එක් කාරණයක් වන ස්ථාවර නියෝග 133 අත්හිටුවීමට පාර්ලිමේන්තුවට මනා හැකියාවක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුවේ ඒ ප්‍රශ්නය පැන නැඟුණා නම්, මෙතැනදී හරි අපට තිබුණා ස්ථාවර නියෝග 133 අත්හිටුවන්න. පාර්ලිමේන්තුවේ අයිතිය මේකෙන් නැති වෙලා තිබෙනවා. ඒ ගැන අපි මෙතැන වාද කරන්නේ නැහැ.

එම තීන්දුව ලබා දීම මඟින් ශ්‍රේෂ්ඨාධිකරණය මේ දක්වා අනුගමනය කරන ලද සම්ප්‍රදායෙන් බැහැරව, අනුර බණ්ඩාරනායක හිටපු කථානායකතුමාගේ තීන්දුවටත් විරුද්ධවයි ක්‍රියා කරලා තිබෙන්නේ. මේක ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුවට අයත් වැඩ කටයුත්තක්. ගරු කථානායකතුමනි, අපි දැන් ගත්ත තීරණය ගැන ප්‍රශ්නයක් මතු නොකළාට, අතීතයේ සම්මත වුණු නීති පිළිබඳව ඔබතුමා පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කරලා මේ සභාවට යම් කිසි තීන්දුවක් ප්‍රකාශ කරන්න.

නීති ගණනාවක් තිබෙනවා. පාර්ලිමේන්තු දෙකක් කියන්නේ අවුරුදු දහයක දොළහක කාලයක් පැවැති පාර්ලිමේන්තුවල නීති තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා පක්ෂ නායකයන් සමඟත් කථා කරලා යම්කිසි තීන්දුවක් ප්‍රකාශ කරන්න කියලා මම යෝජනා කරනවා. එතකොට අනාගතයේදීත් පාර්ලිමේන්තුව ඒ අනුවම ක්‍රියා කරයි. ඇත්ත වශයෙන්ම මේ ගැන ප්‍රශ්න කීපයක් තිබුණත්, මෙතැන සටහනයක් ඇති කරන්න අපිට වුවමනාවක් නැහැ. ඒ වාගේම ශ්‍රේෂ්ඨාධිකරණයට අලුත් බලතල දෙන්න වුවමනාවකුත් නැහැ. මූලික අධිකරණ බලය තිබෙන්නේ මේ සභාවටයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු අග්‍රාමාත්‍යතුමා කියපු කරුණු ගැන අපේ අවධානය යොමු කරනවා. ඒ වාගේම මම ඉතා ඉක්මනින් ඒ සම්බන්ධයෙන් පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කරලා තීරණයක් ලබා දෙන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සඳහන් කළ කාරණය ගැන මම යමක් සඳහන් කරන්න කැමැතියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78වැනි ව්‍යවස්ථාව යටතේ ස්ථාවර නියෝග අනුගමනය කරමින් පනත් කෙටුම්පතක් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන අවස්ථාවේ තිබෙන බැඳියාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට තිබෙන බැඳියාවක්. ඒ බැඳියාව උල්ලංඝනය කිරීමෙන් කිසිම ඇමතිවරයෙකුට මේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න බැරි බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා. අපේ ස්ථාවර නියෝග අනුවත් එහෙම තිබෙනවා. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනලද එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්ති ප්‍රකාරව නැති නිසා පාර්ලිමේන්තුව ඉදිරියේ එම පනත් කෙටුම්පත අවලංගුයි කියලා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සඳහන් කරලා තිබෙනවා. දැන් තිබෙන ප්‍රශ්නය තමයි, පාර්ලිමේන්තුව ඉදිරියේ පනත් කෙටුම්පතක් නොමැති බැවින් ආණ්ඩුව යළිත් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනවාද, නැද්ද කියන කාරණය. ඒ පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශයක් කිරීම ආණ්ඩුව වෙනුවෙන් කරන කටයුත්තක්. තව බරපතළ ප්‍රශ්නයක් මතුවෙනවා, ගරු කථානායකතුමනි. මේ අවස්ථාවේදී අපි එය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මොකක්ද? මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු අවස්ථාවේත් බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා නැඟිටලා කිව්වා, මේක අපි අධිකරණයේ විනිශ්චයට භාජන කරනවාය කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78වන ව්‍යවස්ථාවේ (2) අනුව්‍යවස්ථාව අනුව ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා, පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන විට අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ සහතිකය ඉදිරිපත් කළ යුතුයි කියලා. අමාත්‍යවරයා එසේ සහතිකය ඉදිරිපත් නොකර පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනැවිත් තිබෙනවා නම් එය බරපතළ ප්‍රශ්නයක්. මෙහිදී අමාත්‍යවරයා පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනෙන්නේ අදාළ සහතිකය නැතිවයි.

දෙවන කාරණය, එවැනි සහතිකයක් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට ලැබුණේ නැත්නම් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා ඒ සම්බන්ධයෙන් කටයුතු කළේ නැත්තේ ඇයි? මෙය වැදගත් පනත් කෙටුම්පතක්. අපි පනත් කෙටුම්පතට පක්ෂ වුණත්, විපක්ෂ වුණත් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා අදාළ අමාත්‍යතුමාට හෝ අමාත්‍යතුමාගේ ලේකම්වරයාට ඒ සම්බන්ධයෙන් දැනුම් දීමට අනිවාර්යයෙන් බැඳියාවක් තිබෙනවා. එසේ නැතුව ඊළඟ පියවරකට යන්න බැහැ; න්‍යාය පත්‍රයට හෝ ඔබතුමා වෙත හෝ ඉදිරිපත් කරන්න බැහැ. ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා හදිසියෙන්වත් මේ පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් නොකළා නම්, කැබිනට් අනුමැතියේ සහතිකය නොමැතිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව පාර්ලිමේන්තුව මෙය සම්මත කිරීමට ඉඩ තිබුණා.

අගමැතිතුමා සඳහන් කළ කාරණයට අදාළව යම් සිද්ධියක් පිළිබඳව මා කියන්නම්. ගරු අගමැතිතුමනි, මගේ මතකයේ හැටියට ඒ අමාත්‍ය මණ්ඩලයේ ඔබතුමාත් සිටියා. මා නම් සිටියේ නැහැ. අභාවප්‍රාප්ත ඒ.එම්. එස්. අදිකාරි ඇමතිතුමා එදා ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ ඒ පනත් කෙටුම්පත කැබිනට් අනුමැතිය පරිදි නොවෙයි ඉදිරිපත් කළේ. එය හදිසි පනතක් ලෙසයි ඉදිරිපත් කළේ. එදා ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන දවසේ බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාත් පාර්ලිමේන්තුවේ සිටියා. ඒ ඇමතිතුමාව ප්‍රශ්න කරලා, එතුමාගේ අමාත්‍ය ධුරයත් නැති කළා. එතුමා කිව්වා, පාර්ලිමේන්තුවේ අනුගමනය කළ යුතු පිළිවෙත් නිවැරදිව අනුගමනය කරන්න කියා. ඒ නිසා මෙහිදී ගරු අග්‍රාමාත්‍යතුමාට මම විශේෂයෙන්ම මේ කාරණය සඳහන් කරන්න කැමැතියි. පරාජයක් ලැබෙන්න ඇති. පරාජය නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. පාර්ලිමේන්තුව උත්තරීතරයි. පාර්ලිමේන්තුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව ගමන් කරන්න බැහැ. ඒ නිසා මම කියන්න කැමැතියි, මේ පනත දැන් වලංගු නැති බව. වලංගු නැති පනතක් ගැන කථා කර වැඩක් නැහැ. ඇමතිතුමා පාර්ලිමේන්තුව හමුවට ගෙනැත් තිබෙන්නේ වලංගු නැති පනතක්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ශුන්‍යයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

එය ශුන්‍යයි. පාර්ලිමේන්තුවට පනතක් ගේන කොට ඇමතිතුමාත් වගකීමක් දරන්න ඕනෑ. ඇමතිතුමාව ලේකම්වරයා නොමඟ යවා තිබෙනවා නම්, ලේකම්වරයා වග කියන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ ලේකම්වරයා නොමඟ යවා තිබෙනවා නම්, -මුළු පාර්ලිමේන්තුවම- ගරු කථානායකතුමනි, ඒකත් බරපතළ දෙයක්. මේ වාගේ දේවල් කොයි තරම් වෙලා තිබෙනවාද? පාර්ලිමේන්තුව වශයෙන් බලන කොට මේ කාරණය හරිම බරපතළයි.

අනික් කාරණය මේකයි. මේක මුදල් පනතක්, ගරු අගමැතිතුමනි. මුදල් පනතක තිබෙන බරපතළකම අගමැතිතුමා දන්නවා. ඒ නිසා මා ගරු කථානායකතුමාගෙන් ඉතාම ගෞරවයෙන් මේ දෙය ඉල්ලා සිටිනවා. ශ්‍රේෂ්ඨාධිකරණය දීලා තිබෙන තීරණය අප අනුගමනය කරනවා විනා වෙන කිසිම විකල්පයක් පාර්ලිමේන්තුවට නැහැ. වැටි බදු පනත ශුන්‍යයි. එය වලංගු නැති පනතක්. එය මේ පාර්ලිමේන්තුව හමුවේ ගෙනෙන එක තේරුමක් නැහැය කියන කාරණය මම අවසාන වශයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, මම කථා කළේ මේ පනත් කෙටුම්පත ගැන නොවෙයි. මේ ක්‍රමවේදය සුදුසු නැහැ කියා ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා නම්, අප කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කරලා එය ආපසු මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නම් කියා මම කිව්වා. මම කිව්වේ මීට ඉස්සර වෙලා සම්මත කරගත් කාරණා ගැනයි. මොකද, අප සියලු දෙනාම පිළිගන්නවා අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4. (ඇ) අනුව්‍යවස්ථාව අනුව අධිකරණ බලතල තිබෙන්නේ පාර්ලිමේන්තුවේ බව. පාර්ලිමේන්තුව විසින් තමන්ගේ බලතල අනුව ඍජුව ක්‍රියාත්මක කරලා, අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන ඊට යටත්ව ක්‍රියාත්මක කරන්නේ. ස්ථාවර නියෝග 133 යටතේ පාර්ලිමේන්තුවේ වග කීමක් හැටියට මම ප්‍රකාශ කරන්න කැමැතියි මේ කාරණය.

ස්ථාවර නියෝග 133 තිබෙන්නේ, "යෝජනාවකට, පනත් කෙටුම්පතකට හෝ සංශෝධනයට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණා කියලා ඇමතිවරයා පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කරන්න ඕනෑ" කියලා. දැන් මගේ ප්‍රශ්නය වුණේ මේක නොවෙයි. මේ පනත් කෙටුම්පත ගැන අපට ප්‍රශ්නයක් නැහැ. මගේ ප්‍රශ්නය

වුණේ, මීට ඉස්සෙල්ලා ඉදිරිපත් කළ පනත් කෙටුම්පත් ගැනයි. මීට ඉස්සෙල්ලා මගේ මිත්‍ර මන්ත්‍රීතුමාත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක හැටියට සිටියදී සම්මත වුණු පනත් කීයක් තිබෙනවාද? එදා ඇමතිතුමා ප්‍රකාශ කළේ නැහැ, "කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණා" කියලා. හැම පාර්ලිමේන්තුවේම සම්මත වුණු ඒ ලැයිස්තුව මම දැන් හදාගෙනයි යන්නේ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, එදා ඔබතුමාටත් ඒක අමතක වුණා. ඇයි, අමතක වුණේ? ඇත්ත වශයෙන්ම මේක ස්ථාවර නියෝගවලට බලපාන කාරණයක්. එලෙස සම්මත වුණු පනත් ගණනාවක් තිබෙනවා. මම ඒ ප්‍රශ්නය පැන නැඟුවේ, එදා ඔබතුමා හිටියා පාර්ලිමේන්තුවේ. ඔබතුමා දැන ගන්න ඕනෑ ඇමතිවරයාට කියන්න, "නැගිටලා ඒක කියන්න" කියලා. ඇත්ත වශයෙන්ම මේ කාරණයේදී සිදු වෙලා තිබෙන්නේ, මුදල් ඇමතිතුමායි, ජනාධිපතිතුමායි එක ස්ථාවරයක් ගත්තේ. එදා පාර්ලිමේන්තුවේ මුදල් පාලනය නැති වුණා. මේ යහ පාලනය නිසා තමයි ආපහු ඒක වෙන් කරලා, අඩු ගණනේ නඩුවක් කියලා හෝ මේක නවත්වා ගන්න පුළුවන් වුණේ. අනික- [බාධා කිරීම]ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව එක්ක මට ප්‍රශ්නයක් තිබුණාට, මම ගිහින් ශ්‍රේෂ්ඨාධිකරණය එක්ක හැප්පෙන්නේ නැහැ. මම අග්‍රවිනිශ්චයකාරතුමාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙනෙන්නේ නැහැ. ඒවාත් එක්ක මගේ ප්‍රශ්න නැහැ. මම ඒවාට හිස නමලා කටයුතු කරනවා. අතීතයේ, විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ වැරැදි විධියට සම්මත වුණු නීතිවල නීත්‍යානුකූලභාවය ආරක්ෂා කරන්නයි මම ඉන්නේ. [බාධා කිරීම්] වෙන එකක් නොවෙයි. [බාධා කිරීම්] මට සිදු වෙලා තිබෙන්නේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ සම්මත වුණු නීතිවල නීත්‍යානුකූලභාවය ආරක්ෂා කරන්නයි. අපේ වැරැදි තිබෙනවා නම් අපි ඒවා හදා ගන්නම්. අපට ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා දැන් කියන්නේ, ඔබතුමාගේ හිටපු ජනාධිපතිතුමා ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කළා කියලා. එහෙම නම් දැන් හරි එතුමාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙනෙන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වැනි ව්‍යවස්ථාවට අනුව මුදල් පිළිබඳ බලය පැවරිලා තිබෙන්නේ මේ ගරු සභාවටයි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට අවස්ථාව දෙන්න, කරුණු පැහැදිලි කරන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේ පාර්ලිමේන්තුවේදී කථා කරන්න දෙන්නේ නැත්නම්,- [බාධා කිරීම්] ඒ නිසා තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සිදු වෙලා තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න. [බාධා කිරීම්] මුදල් ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේදීම මම නැඟිටලා කිව්වා, "මේ පනත් කෙටුම්පත ගෙනාවොත් අපි උසාවියට යනවා" කියලා. වැටි සංශෝධනය කරන්න ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතේ තමුන්නාන්සේලා "සෞඛ්‍ය අංශයට, රෝගීන්ට බදු පනවන්නේ නැහැ" කියන කාරණය ඇතුළු කරලා නැහැ කියලායි ජනාධිපතිතුමාගේත් විශ්වාසය. [බාධා කිරීම්] අපිත් කිව්වා ඒක ඇතුළු කරලා නැහැ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට අවස්ථාවක් දෙන්න. ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමනි, කථා කිරීමේ අයිතිය තිබෙනවා. එතුමාගේ කථාවෙන් පස්සේ මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නමුත් ඔබතුමන්ලා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ඒ සියලු කොටස් ඇතුළත්ව තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ ගරු සභාව නොමහ යවලා, මේ ගරු සභාවේ අපේ හඬට කන් දෙන්නේ නැතුව පාර්ලිමේන්තුව බුල්ඩෝස්කරණය කරගෙන යෑමට දරන උත්සාහය තුළින් තමයි ශ්‍රේෂ්ඨාධිකරණය මේ -[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මෙහි තිබෙන ගැටලු තත්ත්වය පැහැදිලි කර ගෙන, ඒ සම්බන්ධයෙන් අපි තීරණයක් ගනිමු. මේ ගැන වාද විවාද කරන්න අවශ්‍ය වන්නේ නැහැ. මම මේ ගැන අධ්‍යයනය කරන්න පටන් අර ගෙන තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව ඇතුළේ එහෙම ඉඩ දෙන්නේ නැති නිසා තමයි ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න වන්නේ. ඔබතුමා ගරු කථානායකතුමා ලෙස මුදල් පිළිබඳ ප්‍රශ්නය අපට කථා කළ හැකියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක අධ්‍යයනය කර අපි තීන්දුවක් ගනිමු.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
කථා කරන්න දෙන්නේ නැති වුණාම කොහොමද -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අප අතීතය හාරා අවුස්සන්න අවශ්‍ය නැහැ නේ. [බාධා කිරීම්] හොඳයි. [බාධා කිරීම්]

ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා සඳහන් කළ කාරණය ගැන අප සතුටු වනවා. ශිරාන් බණ්ඩාරනායක මැතිනිය ඉවත් කිරීම අප පිළිගත්තේ නැහැයි කියා ප්‍රකාශ කළ නිසා තමයි, අද මේ අවස්ථාව ලැබිලා තිබෙන්නේ. අද අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ඇඟිලි ගහන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ ගැන සම්පූර්ණ අධ්‍යයනයක් කරලා අපි තීරණයක් ගනිමු. මම පක්ෂ නායකයන්ගේ අදහසුත් විමසනවා.

ඊළඟට, ලිපි ලේඛනාදිය පිළිගැන්වීම.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2013 වර්ෂය සඳහා රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එකී වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එකී වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා වෙනුවෙන් 2012 වර්ෂය සඳහා සාගර විශ්වවිද්‍යාලයේ ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එකී වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)

ගරු කථානායකතුමනි, පහත දැක්වෙන වාර්තා මම ඉදිරිපත් කරමි.

(i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2016 අප්‍රේල් 29 දිනැති අංක 1964/70 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2016 මැයි 2 දිනැති අංක 1965/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2016 මැයි 16 දිනැති අංක 1967/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2016 මැයි 19 දිනැති අංක 1967/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල්අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජනවාරි 20 දිනැති අංක 1950/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(vi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජනවාරි 28 දිනැති අංක 1951/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(vii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 29 දිනැති අංක 1956/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(viii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ

වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 මාර්තු 08 දිනැති අංක 1957/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(ix) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 අප්‍රේල් 01 දිනැති අංක 1960/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(x) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 මැයි 12 දිනැති අංක 1966/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(xi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 මැයි 20 දිනැති අංක 1967/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(xii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 16 දිනැති අංක 1971/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(xiii) (235 වැනි අධිකාරය වන) රේගු ආඥා පනතේ 10 වැනි වගන්තිය යටතේ තීරු ගාස්තු සම්බන්ධයෙන් 2016 ජූනි 16 දිනැති අංක 1971/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවූ යෝජනාව සහ;

(xiv) 2015 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව.

එකී වාර්තා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් 2014/15 වර්ෂය සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துமை பண்டார - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சர்)
(The Hon. R. M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management)

ගරු කථානායකතුමනි, මම 2015 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 අංක 02 දරන පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරමි.

එම ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සහ ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාරක සභා වාර්තා පිළිගැන්වීම.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවන වාර්තාව එම කාරක සභාවේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා විසින් පිළිගැන්වීම.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவின் அறிக்கை
REPORT OF COMMITTEE ON PUBLIC ENTERPRISES

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය සඳහා 2016 ජනවාරි 26 වැනි දින සිට 2016 අප්‍රේල් 08 වැනි දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ගරු කථානායකතුමනි, මෙය විශේෂ අවස්ථාවක් නිසා මම අවධානය යොමු කළ යුතු කාරණා කිහිපයක් තිබෙනවා. කෙටි කාලයක් තුළ අතුරු වාර්තාවක් හැටියට මෙම වාර්තාව ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාටත්, නියෝජ්‍ය කථානායකතුමාටත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලාටත් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මම මුලින්ම ස්තුති කරන්න කැමැතියි. ගරු කථානායකතුමනි, මොකද අපට අත් දැකීම් තිබෙන්නේ, අවුරුද්දක විතර කාලයක් ගත වුණාට පසුව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා විවාද කිරීම ගැනයි. නමුත්, අපේ කාරක සභාවට කැඳවන ආයතනවල කටයුතු වර්තමාන තත්ත්වයට අදාළ කරලා පුළුවන් තරම් යථාරූපී ආකාරයකට පාර්ලිමේන්තුවේ විවාද කරන්න අවස්ථාවක් ලබා දෙන්න අපි උත්සාහ කළා. ඒ නිසා ආයතන මට්ටමෙන් වෙන වෙනම වාර්තා ඉදිරිපත් කරන්න පුළුවන් නම් වඩාත් හොඳයි කියලා අපි බලාපොරොත්තු වුණා. නමුත් ප්‍රායෝගිකව මතු වෙන ගැටලු ගණනාවක් නිසා තමයි මාස තුනක -ජනවාරියේ ඉඳලා අප්‍රේල් දක්වා- කාලයක් තුළ ආයතන 19ක කටයුතු පිළිබඳව සංක්ෂිප්ත අතුරු වාර්තාවක් මේ අයුරින් ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මේ ආයතන වර්තමාන තත්ත්වයට අදාළ කරලා පාර්ලිමේන්තුවේ විවාද කරලා අපි ඉදිරිපත් කරලා තිබෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා යම් බලයක්, යම් ශක්තියක් ලබා දෙන එක සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට අවස්ථාවක් ලැබී තිබෙනවා. එහෙම නැත්නම් අවුරුද්දකට, දෙකකට වාර්තාවක් ඉදිරිපත් කළාම සිදු වන දේ තමයි සමහරවිට ඒ නිලධාරීන් මාරු වෙන එක. එහෙම නැත්නම් ඒ ආයතන සම්බන්ධයෙන් විගණන වාර්තාවලින් ඉදිරිපත් කරන නිර්දේශ යල් පනිනවා. ඒ නිසා ඒ කාරණා පිළිබඳව අවධානය යොමු කරලායි මේ අතුරු වාර්තාව ඒ ආයතන සම්බන්ධයෙන් සංක්ෂිප්ත වාර්තාවක් හැටියට අපි ඉදිරිපත් කරන්නේ. මීට අමතරව අපි තවත් ආයතන 15ක් විතර මේ වන විට කැඳවලා තිබෙනවා. ඒ ආයතන සම්බන්ධවත් කඩිනමින් වාර්තාවක් ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, අපේ කාරක සභාව මුහුණ දෙන පොදු ගැටලු පිළිබඳව අපි මේ වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා. එයින් ප්‍රධාන කාරණාවක් තමයි කාරක සභාවේ කටයුතු විධිමත්ව කර ගෙන යාමට ස්ථාවර නියෝගවලින් තිබෙන බාධා. ඒවා ඉවත් කර ගන්න අපට ඕනෑකම තිබෙනවා. ඒ පිළිබඳව මම ඔබතුමාට පෞද්ගලිකවත්, රජයේ ගිණුම් පිළිබඳ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාර්යාංශයේ ලේකම්තුමිය හරහාත් ලිඛිතව දැනුම් දුන්නා. ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ යෝජනා ගණනාවක්ම තිබෙනවා. ඒ වාගේම අපේ මේ කාරක සභාවට නීතිපතිතුමාගේ නිලධාරියකුගේ සහයෝගයත් අවශ්‍ය වෙලා තිබෙනවා; විශේෂඥ සහයෝගය අවශ්‍ය වෙලා තිබෙනවා, තාක්ෂණික වශයෙන් තිබෙන යම් යම් කාරණා ඉෂ්ට කර ගැනීම සඳහා.

අපේ කාරක සභාවේ විමර්ශන කටයුතු සහ යම් යම් නිර්දේශ පිළිබඳව මීට වඩා මහජනතාව දැනුවත් වෙන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ 'ආ' කොටසේ 9 වන වගන්තියෙහි මෙසේ සඳහන් වී තිබෙනවා:

> "පාර්ලිමේන්තුවේ කාරක සභාවක කටයුතු කිසිවක් පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමට පෙර, ඒවා ප්‍රකාශනය කිරීම."

විශේෂයෙන්ම මූල්‍ය පාලනය පිළිබඳ වගකීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට තිබෙන නිසාම, ස්ථාවර නියෝගවලින් තිබෙන බාධා ඉවත් කරලා, කාරක සභාවේ කටයුතු මහජනතාවට වාර්තා කරන්න පුළුවන් වන විධියේ යම් ක්‍රමවේදයක් කඩිනමින් සකස් කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. කාරක සභාවේ උන්නතිය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වන යෝජනා ගණනාවක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කටයුතු නහා සිටුවීම සඳහා ගත් ක්‍රියා මාර්ග ගණනාවක්ම තිබෙනවා. විශේෂයෙන්ම අපි මේ කාරක සභාවේ වාර්තා අද මේ පාර්ලිමේන්තුවට සංක්ෂිප්ත වාර්තාවක් හැටියට ඉදිරිපත් කළත්, කාරක සභාවට ආයතන කැඳවන අවස්ථාවේම ක්ෂණිකවම අදාළ ආයතන හා අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන් දැනුම්වත් කර තිබෙනවා. අපේ නිර්දේශයන් සම්බන්ධයෙන් අප ඉතා කඩිනමින් දැනුම්වත් කර තිබෙනවා. ඒ වාගේම එක අවස්ථාවකදී අපිට සිද්ධ වුණා, කැබිනට් මණ්ඩලයේ අවධානයට යොමු විය යුතු කාරණා පිළිබඳව කාරක සභාව හැටියට අගමැතිතුමාත් එක්ක සාකච්ඡාවක් පවා කරන්න. ජනාධිපති ලේකම්තුමාටත්, අග්‍රාමාත්‍ය ලේකම්තුමාටත් අප දෙනිකව කාරක සභාවේ කටයුතුවල වාර්තා යොමු කර තිබෙනවා. ඒ නිසා මේ වෙනකොටත් සමහර ආයතනවල මේ සම්බන්ධයෙන් යම් ප්‍රගතියක් ඇති වෙලා තිබෙනවා කියා මම විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, නමුත් තවමත් මේ කාරක සභාවේ අප සඳහන් කර තිබෙන ආයතන 19ට අදාළව බොහෝ නිර්දේශයන් අමාත්‍යාංශ මට්ටමින් ක්‍රියාවට නැඟී නැහැ; කැබිනට් මණ්ඩලය මට්ටමින් ක්‍රියාවට නැඟී නැහැ. ඒ නිසා කාරක සභාව හැටියට අප බලාපොරොත්තු වන ප්‍රගතිය සමහර ආයතනවලින් ළඟා කර ගන්න බැරි වෙලා තිබෙනවා. මෙන්න මේ කාරණා මම මේ ගරු සභාවේ අවධානයට යොමු කරවනවා. ඒ වාගේම මෑත කාලයේ අවධානයට ලක් වුණු ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධයෙන් අපි මේ වාර්තාවේ අඩංගු කර තිබෙන්නේ පොදුවේ මහ බැංකුවේ කටයුතුයි. නමුත් මහ බැංකුවේ බැඳුම්කර ගනු දෙනුව පිළිබඳවත් අපේ කාරක සභාවේ වාර්තාව කාරක සභාවේ සියලුම සහික මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ඇතිව ඉදිරි දෙසතිය ඇතුළතදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න හැකි වෙයි කියා අප විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මේ කාරණා අවධාරණය කරමින් විශේෂයෙන් මම රජයේ ගිණුම් පිළිබඳ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාර්යාංශයේ නිශාන්ති වික්‍රමරත්න ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්, අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා) ජගත් ගජවීර ආරච්චිගේ මහත්මයාටත් මගේ ස්තුතිය පළ කරනවා. මේ වාර්තාව මේ තරම් කඩිනමින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවස්ථාව ලැබුණේ, ඔවුන්ගේ මැදිහත්වීම නිසායි.

පාර්ලිමේන්තු කථා පරිවර්තක අංශය ගැනත් මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. ඉංග්‍රීසි සහ දෙමළ පරිවර්තන කටයුතු අපට ලබා දෙන්න එම නිලධාරීන් විශේෂ උනන්දුවෙන් යුතුව කටයුතු කළා.

ඊට අමතරව අපේ කාරක සභාවටත්, දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තන කටයුතු කර ගන්න යම් කාර්ය මණ්ඩලයක් ලබා ගන්න පුළුවන් නම් මීටත් වඩා ඉක්මනින් අපේ මේ වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කරන්න පුළුවන්කම ලැබෙනවා, ගරු කථානායකතුමනි. මොකද, පාර්ලිමේන්තු කථා පරිවර්තක අංශයේ නිලධාරීන් සාමාන්‍ය කටයුතු කරන අතරතුරදී තමයි මේ වාර්තාවේ කටයුතු සිදු කළේ. ඒ නිසා තමයි අපිට මේ වාර්තාව සභාගත කරන්න මේ තරම් කාලයක් ගත වුණේ. අප්‍රේල් මාසයේ

වාර්තාවක් අගෝස්තු මාසයේ සභාගත කරන්න ලැබීම පිළිබඳව ඇත්තටම එක පැත්තකින් අපි කනගාටු වෙන්න ඕනෑ. නමුත් මීටත් වඩා මේ වාර්තා යාවත් කාලීන කරලා ඉදිරිපත් කරන්න පුළුවන්කම ලැබුණොත්, රාජ්‍ය ව්‍යාපාරවල කටයුතු මීට වඩා විධිමත් කර ගැනීමට අපේ කාරක සභාවට ශක්තියක් ලැබෙවි කියලා මම හිතනවා.

හැන්සාඩ් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයද මෙම කාරක සභාවේ කටයුතු වාර්තා කිරීමෙන් මෙම වාර්තාව ඉදිරිපත් කිරීමට විශාල දායකත්වයක් ලබා දුන් බව සඳහන් කරන්න කැමැතියි.

අවසාන වශයෙන් මම විගණකාධිපතිතුමාටත්, විගණන නිලධාරින්ටත්, විගණන පරීක්ෂකවරුන්ටත් ස්තුතිවන්ත වනවා. මේ කාර්යයට ඔවුන්ගේ මැදිහත් වීම නොවෙන්නට අපේ කාරක සභාවට මේ වාර්තා මෙතරම් පහසු ආකාරයෙන් ඉදිරිපත් කරන්න බැරි වෙනවා. මම මේ කාරණා ටික අවධාරණය කරමින්, අතුරු වාර්තාවක් හැටියට කාරක සභාවේ මාස හතරක වාර්තාව පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කරනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි විපක්ෂයේ ඉන්න කාලයේත් නිතරම කිව්ව දෙයක් තමයි, මාධ්‍යවේදීන්ට වාගේම තෝරා ගත් මහජන නියෝජිතයින්ට කෝප් කමිටුව ඉදිරියට ඇවිල්ලා ඒ රැස්වීම් නරඹන්න අවස්ථාවක් ලබා දෙන්න කියන එක. අපි ඒකට විරුද්ධ නැහැ. මොකද, ලෝකයේ හැම රටකම පාර්ලිමේන්තුවල මේ වාගේ කමිටුවල රැස්වීම් මාධ්‍ය මඟින් ආවරණය කරනවා. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ තිබුණු කමිටු රැස්වීමක් මුළු ලෝකයටම live දුන්නු බව මට මතකයි. අපි විපක්ෂයේ හිටපු කාලයේත් කිව්වා, මාධ්‍යවේදීන්ට මේ කමිටු රැස්වීම් විවෘත කරන්න, මහ ජනතාවට ඒ රැස්වීම්වලට එන්න ඉඩ හරින්න කියලා. අපි ඒ සඳහා ක්‍රමවේදයක් හදමු. අපි ඒකට විරුද්ධ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මම අපේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාට ස්තුතිවන්ත වනවා, වැදගත් කරුණු කීපයක්ම මේ ගරු සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. ස්ථාවර නියෝග සම්බන්ධයෙන් දැන් අපි අධීක්ෂණයක් කරගෙන යනවා. ඉතා ඉක්මනින් අලුත් ස්ථාවර නියෝග ගෙනෙන්න කටයුතු කරන අවස්ථාවේදී ඔබතුමා සහ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කියපු කරුණු සම්බන්ධයෙනුත් අපි අධ්‍යයනයක් කරලා, අවසානයේදී පක්ෂ නායකතුමන්ලාත් සමඟ සාකච්ඡා කරලා, ඉතා ඉක්මනින්ම මේ සම්බන්ධයෙන් තීරණයක් ගන්න බලාපොරොත්තු වනවා. ඒ වාගේම ඔබතුමා සඳහන් කළා, මේ කාරක සභාවට නීතිපතිතුමාගේ පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සහයෝගයත් අවශ්‍යවෙලා තිබෙනවාය කියලා. නීතිපතිතුමා මට කථා කළා. පූර්ණ කාලීන නිලධාරියෙක් එම රැස්වීමට සිටීම යෝග්‍ය නොවේ කියලා එතුමා කිව්වා. නමුත් ඒ වෙනුවෙන් ඔබතුමාට අවශ්‍ය වෙලාවට උපදෙස් දිය හැකි පරිදි නිලධාරියෙකු නම් කරන්න පුළුවන් කියා එතුමා කිව්වා. ඒ නිසා ඒ ගැන ඔබතුමා සාකච්ඡා කරන්න. ඒ වාගේම, මා පිළිගත යුතු තවත් දෙයක් තිබෙනවා. පරිවර්තන කටයුතු සම්බන්ධ නිලධාරින්ගේ විශාල හිඟයක් තිබෙනවා. ඒ අවශ්‍ය නිලධාරින් සපයා ගැනීම සඳහා අපි යම් යම් පියවර ගන්න ඕනෑ.

මා විශේෂයෙන් පක්ෂ නායකයන්ගේ අවධානයට යොමු කරන්න කැමැතියි, පසු ගිය මාස හය තුළ කමිටු රැස්වීම්වලට මන්ත්‍රීවරුන්ගේ සහභාගි වීම් සම්බන්ධයෙන්. බොහෝ මන්ත්‍රීවරු පැමිණ නැහැ. ඉතාම අඩු සංඛ්‍යාවක් තමයි පැමිණ තිබෙන්නේ. ඒ නිසාත් මේ කටයුතුවලට බාධා ඇති වෙනවා. ඒ නිසා විශේෂයෙන් පක්ෂ නායකයන්ගෙන් ඉල්ලා සිටිනවා, ඒ සාමාජිකයන්ට කමිටුවේ පූර්ණ කාලීනව කටයුතු කරන්න බැරි නම් වෙනත් අය නම් කරලා ඒ අයගේ සහභාගිත්වය ලබා දෙන්න කියලා. මා හිතන හැටියට කමිටුවේ සභාපතිතුමා වන ඔබතුමාටත් එය ශක්තියක් වෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Business and Commerce on the matter related to, "Regulations under the Measurement Units, Standards and Services Act" referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු රංජිත් අලුවිහාරේ මහතා
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)
ගරු කථානායකතුමනි, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද සබරගමුව පළාත් සංචාරක කාර්යාංශය ප්‍රඥප්ති කෙටුම්පත සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් සබරගමුව පළාත් සභා සංචාරක කාර්යාංශය ප්‍රඥප්ති කෙටුම්පත් කරන ලද සංශෝධනවලට යටත්ව එකී ප්‍රඥප්ති කෙටුම්පතට එකඟ වූ අතර, එකී සංශෝධන ඇතුළත් වාර්තාව සබරගමුව පළාත් සභාවට යොමු කිරීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය අපේක්ෂා කරන බව මෙම ගරු සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු අබ්දුල් හලීම් මහතා (තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு அப்துல் ஹலீம் - தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Abdul Haleem - Minister of Post, Postal Services and Muslim Affairs)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් තුන මම පිළිගන්වමි.

(1) කටුගස්තොට, සෙනරත්ගම, අංක 716 දරන ස්ථානයෙහි පදිංචි එච්. ගුණසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අකුරණ, කුරුඳුගහ ඇළ, ටෙලිකොම් පාර, අංක 07 දරන ස්ථානයෙහි පදිංචි කේ.ජී.එන්.පී.එච්.එම්.අයි. මොහොමඩ් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) මහනුවර, පූජාපිටිය, දිද්දෙනිය අංක 13/ඒ දරන ස්ථානයෙහි පදිංචි එස්.බී.එම්.එච්.ඩී. සමරකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය (ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன் - சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran - State Minister of Child Affairs)

Hon. Speaker, I present a petition received from Mr. M. Ratnasingam of No. 44C, Hena Road, Mount Lavinia.

ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) අනුරාධපුරය, හරිස්චන්ද්‍ර මාවත, අංක 388/52 දරන ස්ථානයෙහි පදිංචි අශෝක මහදිවුල්වැව මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) සිංහපුර, දකුණු හෝකන්දර, අංක 266 දරන ස්ථානයෙහි පදිංචි ශ්‍රියාණි මුණසීර මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) පේරාදෙනිය, හිඳගල, අංක 148 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ.පී.එම්.එච්. අබේකෝන් මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) උකුවෙල, ගුරුලවෙල - උතුර, අංක 140 දරන ස්ථානයෙහි පදිංචි පී.ජී.එම්. මල්ලිකා වික්‍රමසිංහ මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) වාසලකෝට්ටේ, මැදබැද්ද, බෝමලුව යන ලිපිනයෙහි පදිංචි එස්.ඒ.ආර්. ප්‍රේමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පයාගල, කුඩා පයාගල, ශාන්ත අන්තෝනි මාවත යන ලිපිනයෙහි පදිංචි පී.ඩී. ක්ලේරා මේරියන්ස් මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) හොරණ, දොඹගොඩ, රණවිරුගම යන ලිපිනයෙහි පදිංචි එස්.ඒ. විජේසේකර මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු එම්.එස්. තව්ෆික් මහතා
(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)
(The Hon. M.S. Thowfeek)

Hon. Speaker, I present a petition received from Mr. S. Subramaniyam of No. 748, Potkerny, Thampalagamam.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්: හිඟය
தொழில்நுட்பச் சேவையின் விசேட தர உத்தியோகத்தர்கள்: பற்றாக்குறை
OFFICERS OF SPECIAL GRADE OF SRI LANKA TECHNOLOGICAL SERVICE: SHORTAGE

385/'15

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයට අයත් කාර්මික නිලධාරීන්ට ව්‍යාපෘති ඇස්තමේන්තු අනුමත කිරීමේ උපරිම සීමාව රුපියල් ලක්ෂ දහයක් වන බවත්;

(ii) රුපියල් ලක්ෂ 10ට වඩා වැඩි ඇස්තමේන්තු අනුමත කිරීම ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සිදු කළ යුතු බවත්;

(iii) තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් රාජ්‍ය සේවයේ නොමැති බවත්;

(iv) එහෙයින් ව්‍යාපෘති ඇස්තමේන්තු අනුමත කිරීමේදී ප්‍රමාද සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දකුණු පළාතේ දැනට සේවයේ යෙදී සිටින,

(i) කාර්මික නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කාර්මික නිලධාරීන්ට ව්‍යාපෘති අනුමත කිරීමට හැකි සීමාව ඉහළ දැමීමට කටයුතු කරන්නේද;

(ii) තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් අලුතින් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) ව්‍යාපෘති අනුමතවීම ප්‍රමාදවීම වැළැක්වීමට ගන්නා වෙනත් ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

උල්නාට්ටලුවල්කළ් අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) පොදු නිරුවාග මුකාමෙත්තුව අමෙච්සුක්කුරිය තොළිල්නුට්ප උත්තියෝකත්තර්කළාල් කරුත්තිට්ට මතිප්පීටුකළෙ අංගීකරික්කක්කූටිය උච්ච එල්ලෙ රූපාය් පත්තු ඉලට්චම් ආකුම් එන්පතෙයුම්;

(ii) රූපාය් පත්තු ඉලට්චත්තුක්කු මේර්පට්ට මතිප්පීටුකළෙ අංගීකරිත්තල් ඉලංකෙත් තොළිල් නුට්ප චේවෙයින් විචේට තරත්තින් උත්තියෝකත්තර් ඔරුවරිනාල් මේර්කොළ්ළප්පට වේණ්ටුම් එන්පතෙයුම්;

(iii) තොළිල්නුට්පච් චේවෙයින් විචේට තර උත්තියෝකත්තර්කළ් පෝතියළවිල් අරච චේවෙයිල් ඉල්ලෙ එන්පතෙයුම්;

(iv) ඉතනාල් කරුත්තිට්ට මතිප්පීටුකළෙ අංගීකරිප්පතිල් තාමතංකළ් ඒර්පටුම් එන්පතෙයුම්

අවර් අරිවාරා?

(ආ) තෙන් මාකාණත්තිල් තර්පෝතු කටමෙයිල් ඊටුපට්ටුල්ළ,

(i) තොළිල් නුට්ප උත්තියෝකත්තර්කළින් එණ්ණික්කෙ එව්වළවු එන්පතෙයුම්;

(ii) තොළිල් නුට්ප චේවෙයින් විචේට තර උත්තියෝකත්තර්කළින් එණ්ණික්කෙ එව්වළවු එන්පතෙයුම්

අවර් ඉච්චපෙයිල් අරිවිප්පාරා?

(ඉ) (i) තොළිල් නුට්ප උත්තියෝකත්තර්කළිනාල් කරුත්තිට්ටංකළෙ අංගීකරික්කක් කූටිය එල්ලෙයෙ අතිකරික්ක නටවටික්කෙ එටුප්පාරා එන්පතෙයුම්;

(ii) තොළිල් නුට්ප චේවෙයින් විචේට තර උත්තියෝකත්තර්කළෙ පුතිතාක ආට්චේර්ක්ක නටවටික්කෙ එටුප්පාරා එන්පතෙයුම්;

(iii) කරුත්තිට්ටංකළ් අංගීකරික්කප්පටුවතිල් තාමතම් ඒර්පටුවතෙ තවිර්ප්පතර්කාක එටුක්කප්පටුම් වේරු නටවටික්කෙකළ් යාවෙ එන්පතෙයුම්

අවර් ඉච්චපෙයිල් අරිවිප්පාරා?

(ඊ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Home Affairs:

(a) Is he aware that -

(i) the maximum limit applicable in approving the project estimates by Technical Officers under the Ministry of Public Administration and Management is Rs.10 lakhs;

(ii) approving project estimates exceeding Rs.10 lakhs has to be done by an officer of the Special Grade of the Sri Lanka Technological Service;

(iii) a sufficient number of officers of the Special Grade of the Technological Service is lacking in Public Service; and

(iv) delays occur in approving project estimates as a result ?

(b) Will he inform this House -

(i) the number of Technical Officers; and

(ii) the number of officers of the Special Grade of the Technological Service;

serving in the Southern Province at present?

(c) Will he also inform this House -

(i) whether action will be taken to increase the maximum limit applicable in approving the project estimates by Technical Officers;

(ii) whether action will be taken for fresh recruitment of officers of the Special Grade of the Technological Service; and

(iii) of the other measures that will be taken to avoid the delays in approving projects?

(d) If not, why?

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)

(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) ඔව්.

(iv) අදාළ නොවේ.

(ආ) (i) 45කි.

(ii) ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ කාර්මික නිලධාරීන් නොමැත.

(ඇ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇමතිතුමා සඳහන් කරන්නට යෙදුණා, තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගේ ප්‍රමාණවත් සංඛ්‍යාවක් රාජ්‍ය සේවයේ නැහැ කියලා. ඒ ඌනතාව අවම කර ගන්න රජයට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද?

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයත්, අපේ අමාත්‍යාංශයත් මේ ගැන සාකච්ඡා කරලා දැනට මාස දෙකකට උඩදි තීරණය කීපයක් ගත්තා. එකක්, විශ්‍රාමික නිලධාරීන් මේ සඳහා යොදවා ගැනීම. ඒ වාගේම ත්‍රිවිධ හමුදාවේ සිවිල් ඉංජිනේරු අංශවල සිටින නිලධාරීන් යොදවා ගැනීම. දැනට සේවය සඳහා නියමිත විධියට පාවිච්චි නොවන ස්ථානවල නිලධාරීන්ද මේ කාර්යය සඳහා අනුයුක්ත කරගෙන මේ කටයුතු කරන්න අපි තීරණය කරලා තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

විවිධ ඇස්තමේන්තු අනුමත කිරීම සම්බන්ධයෙන් අහලා තිබෙන ප්‍රශ්නයට පිළිතුර වශයෙන් ඔබතුමා "අදාළ නොවේ" යනුවෙන් සඳහන් කළේ ඇයිද කියන්න මා දන්නේ නැහැ. හැබැයි, රුපියල් ලක්ෂ 10ට වැඩි ඇස්තමේන්තු හදන්න විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වුවමනායි. ඔබතුමා දේශපාලනය කරන ගාල්ල දිස්ත්‍රික්කය ගත්තත්, මාතර දිස්ත්‍රික්කය ගත්තත්, හම්බන්තොට දිස්ත්‍රික්කය ගත්තත් විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ගේ ඌනතාව නිසා ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ගැටලු තිබෙනවා. ඒ වාගේම ඒවා ප්‍රමාද වෙනවා.

විශේෂයෙන්ම ශූන්‍ය අය වැය ක්‍රමය - zero-based budgeting system - යටතේ මේ ව්‍යාපෘතිවලට ගැටලුවක් වෙන්න පුළුවන්. ඒ වාගේම කාලගුණික තත්ත්වය තුළත් සමහර ප්‍රමාදවීම් සිද්ධ වෙන්න පුළුවන්. මේ කාරණා දෙකම නිසා ප්‍රමාදවීම් සිද්ධ වෙන්න පුළුවන්. කෙසේ හෝ මේ ව්‍යාපෘති සඳහා ලැබී තිබෙන මුදල් zero-based budgeting system එක තුළ, දෙසැම්බර් 31 වන විට ආපසු භාණ්ඩාගාරයට යෑමේ අවදානමක් තිබෙනවා. ඒ නිසා මේ සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කරන්න අමාත්‍යාංශයට දෙන්න පුළුවන් සහයෝගය මොකක්ද?

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, මා හිතන හැටියට මේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රශ්නයක් පැන නඟින්නේ නැහැ. උදාහරණයක් හැටියට කිව්වොත්, 2015 වර්ෂයේ අපි ලක්ෂ පහළොස්දහසක මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332 තුළ පාවිච්චි කරලා තිබෙනවා. දැනට තිබෙන නීති - රීති අනුව, කාර්මික නිලධාරීන් විසින් ඇස්තමේන්තු අනුමත කිරීමක් සිදු කරන්නේ නැහැ. ඇස්තමේන්තු සකස් කළාට පස්සේ ප්‍රාදේශීය ලේකම් සහ දිසාපතිතුමා මාර්ගයෙන් තමයි අනුමත කිරීම සිදු කරන්නේ. ඒ අනුව ප්‍රශ්නයක් පැන නඟින්නේ නැහැ. පෞද්ගලික අංශයේ විශාල වශයෙන් පඩි නඩි ගෙවන නිසා සහ රාජ්‍ය අංශයේ ආකර්ෂණීය ස්වභාවයේ තිබෙන අඩු පාඩුකම් නිසා රජයේ කාර්මික නිලධාරීන්ගේ බරපතළ හිඟයක් තිබෙනවා. ඒ පිළිබඳ ගැටලුවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් තමයි මා දීපු පිළිතුර අනුව කටයුතු කරගෙන යන්නේ. කොහොමත් මේ නිලධාරීන්ට අනුමත කිරීමේ බලයක් නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

අනුමත කරන්නත් අදාළ තක්සේරු එහෙම නැත්නම් ඒ ඇස්තමේන්තු හදන්න ඕනෑ. දැන් ඒ නිලධාරීන් තමුන්ගේ වපසරිය තුළ ලක්ෂ 10ට එහා ඇස්තමේන්තු හදන්න බැරි බව කියනවා. ඒ හදන්න බැරිවීම තුළ අනුමත කිරීමත් ප්‍රමාද වෙනවා. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාම පිළිගන්නවා ඒ නිලධාරීන්ගේ බරපතළ හිඟයක් තිබෙන බව. ඒ නිසා මේ සඳහා විකල්ප ක්‍රමවේදයක් හදන්න පුළුවන්ද?

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, දැනට මෙහි තිබෙන නීතිමය ස්වභාවය අනුව, පළමුවන ශ්‍රේණියේ නිලධාරියකුට රුපියල් ලක්ෂ 30 දක්වාත්, දෙවන ශ්‍රේණියේ, තුන්වන ශ්‍රේණියේ නිලධාරීන්ට ලක්ෂ 2 දක්වාත් වටිනාකමක් ඇති කර්මාන්ත ඇස්තමේන්තු සකස් කිරීම, සැලසුම් කිරීම, පිළියෙළ කිරීම කරන්න පුළුවන්. ඒවා අනුමත කිරීම ප්‍රාදේශීය ලේකම් සහ දිසාපතිතුමා විසින් සිදු කරනවා. ඒ වාගේම අධීක්ෂණය සහ අනෙක් කටයුතුත් ඔවුන් විසින් කරගෙන යනවා. ලංකාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332ක සහ දිසාපති කාර්යාල 25ක තිබෙන 2015 වර්ෂයට අදාළ ප්‍රගති වාර්තා අනුව, හැම තැනකම ව්‍යාපෘති සියයට 85කට, 90කට වඩා සාර්ථකව අවසන් කර තිබෙනවා. ඒ ක්‍රමවේදය දිහා බැලුවාම, ප්‍රශ්නයක් තිබුණත්, නැවත භාණ්ඩාගාරයට මුදල් හරවා යැවීමේ තත්ත්වයක් පැන නඟින්නේ නැහැ. මොකද, තිබෙන ප්‍රශ්නවලට අදාළ විසඳුම් දීමට දිසාපති කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රියා කරගෙන යන නිසා.

රජයේ පාසල් : ස්ථිර විදුහල්පතිවරුන්
அரசாங்கப் பாடசாலைகள் : நிரந்தர அதிபர்கள்
GOVERNMENT SCHOOLS: PERMANENT PRINCIPALS

599/'16

3. ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාවෙන්, පළාත් සභා හා මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි පාසල් අතරින් ස්ථිර පත්වීමක් නොමැතිව වැඩ බලන හා තාවකාලික පදනම මත සේවය කරන විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ස්ථිර පත්වීම් නොලැබූ විදුහල්පතිවරුන් සිටින එම පාසල්වල පරිපාලනය නිසි ලෙස සිදු නොවන බව පිළිගන්නේද;

(iii) ස්ථිර විදුහල්පතිවරුන් නොමැති පාසල්වලට ස්ථිර විදුහල්පතිවරු පත්කිරීමට කඩිනම් පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் இயங்கிவருகின்ற அரசாங்க பாடசாலைகளின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி எண்ணிக்கையில், மாகாண சபைகளின் கீழ் இயங்குகின்ற பாடசாலைகளின் மற்றும் மத்திய அரசாங்கத்தின் கீழான பாடசாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேலே அ (i)இல் குறிப்பிடப்பட்ட பாடசாலை களில் நிரந்தர நியமனம் இன்றி, பதில் கடமையாற்றும் அடிப்படையில், தற்காலிக அடிப்படையில் கடமையாற்றும் அதிபர்களைக் கொண்ட பாடசாலைகளின் எண்ணிக்கை யாது;

(ii) நிரந்தர நியமனம் பெறாத அதிபர்களைக் கொண்ட மேற்படி பாடசாலைகளில் நிருவாகம் உரியவாறு இடம்பெறுவதில்லை என்பதை ஏற்றுக்கொள்கிறாரா;

(iii) நிரந்தர அதிபர்கள் இல்லாத பாடசாலைகளுக்கு நிரந்தர அதிபர்களை நியமிப்பதற்கான துரித நடவடிக்கைகளை மேற்கொள்வாரா;

(iv) ஆமெனில், அத் திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of government schools operating in Sri Lanka; and

(ii) separately of the number of schools operating under Provincial Councils and the number of schools operating under the Central Government out of the aforesaid schools?

(b) Will he also inform this House -

(i) out of the schools mentioned in (a)(i) above, the number of schools in which principals are assigned on acting and temporary basis without a permanent appointment;

(ii) whether he admits that administration of these schools which do not have principals with permanent appointments is not carried out properly;

(iii) whether immediate steps will be taken to appoint principals on permanent basis to these schools which do not have principals appointed on permanent basis; and

(iv) if so, of the date on which it will be done?

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)

(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)

(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පාසල් 10,161යි. (දස දහස් එකසිය හැට එකයි.)

(ii) පළාත් සභා යටතේ ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව 9,809යි. (නවදහස් අටසිය නවයකි.)

මධ්‍යම රජයේ පාසල් සංඛ්‍යාව 352යි. (තුන්සිය පනස් දෙකකි.)

(ආ) (i) පාසල් 3,270යි. (තුන්දහස් දෙසීය හැත්තෑවයි.)

(ii) නැත.

ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නයට "නැත" කියන උත්තරය දුන්නාට, එක පාරටම "ඇත" හෝ "නැත" කියලා කියන්න බැහැ. හේතුව තමයි මේකේ දෙපැත්තම තිබෙනවා. ගරු කථානායකතුමනි, වැඩ බලන විදුහල්පතිවරු ඉන්න සමහර පාසල්වල වැඩ කටයුතු හොඳින් කරගෙන යන තැන් තිබෙනවා. ඒ වාගේම පරිපාලනය අඩාල තැනුත් තිබෙනවා. ගරු කථානායකතුමනි, වසර ගණනාවකට පසුව විදුහල්පති විභාගයක් අපි පැවැත්වුවා. ඒ විභාගයට අයදුම් පත්‍ර 21,000ක් ලැබිලා තිබුණා. එයින් 19,000ක් විභාගයට පෙනී සිටියා. එයින් 3,859 දෙනෙක් මේ වන විට බඳවා ගෙන විධිමත් පුහුණුවක් ලබා දීලා තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා, ඒ විදුහල්පතිවරුන් ස්ථානගත කිරීමේ වැඩ පිළිවෙළ මේ දිනවල සකස් කරමින් යනවා. මම හිතන විධියට ඒ වැඩ පිළිවෙළ මේ සතියේදී අවසන් කරන්න පුළුවන්. මොකද, අපේ රටේ තිබෙන රජයේ පාසල් 10,161න්, පාසල් 4,400කට වැඩි ප්‍රමාණයක විදුහල්පතිවරු හිඟයි. එහෙම නැත්නම් ස්ථිර විදුහල්පතිවරු නැහැ. අපි කිසිම දේශපාලන භේදයකින් තොරව විධිමත් ආකාරයෙන් බඳවා ගත් විදුහල්පතිවරුන් 3,859ක් සිටිනවා. එම විදුහල්පතිවරුන් ස්ථානගත කළත්, තවත් යම් ප්‍රමාණයක් වැඩ බලන විදුහල්පතිවරුන් පත් කර ගන්න පුළුවන්කම තිබෙනවා. අපි බලන්නේ, වැඩ බලන විදුහල්පතිවරුන්ගෙන් කාර්ය සාධනය පෙන්වා තිබෙන අයවත් අරගෙන, විධිමත්ව බඳවා ගත් අයත් අරගෙන මේ කටයුත්ත කරන්නයි කියන එක මා කියන්න ඕනෑ.

(iii) පියවර ගනිමින් සිටී.

(iv) ඉතාම කෙටි කාලයක් තුළ -සතියක්, සති 1 1/2ක් ඇතුළත- විධිමත් ක්‍රමවේදය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා.

(ඇ) අදාළ නොවේ.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, යහ පාලන ආණ්ඩුව පත් වුණාට පස්සේ ගරු ඇමතිතුමා මේ පිළිබඳව ක්ෂණිකව පියවර ගැනීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඉතා කඩිනමින් මේ කටයුතු අවසන් කරන්න එතුමාට හැකියාව ලැබෙවායි කියා ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -609/'16- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

අඹතලේ ජල පවිත්‍රාගාරය : විස්තර
அம்பதலே நீர் சுத்திகரிப்பு நிலையம் : விபரம்
AMBATALE WATER TREATMENT PLANT: DETAILS

625/'16

5. ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අඹතලේ ජල පවිත්‍රාගාරය සතු විදුලිජනක යන්ත්‍රයේ ධාරිතාව කවරේද;

(ii) අඹතලේ ජල පවිත්‍රාගාරයෙහි දෛනික ජල විදුලි පරිභෝජනය ඒකක කොපමණද;

(iii) දීර්ඝ කාලයක් සඳහා විදුලිය විසන්ධි කර ඇති අවස්ථාවක අඛණ්ඩ පානීය ජල සැපයුමක් පවත්වා ගැනීම සඳහා මෙම විදුලිජනක යන්ත්‍රය ප්‍රමාණවත්ද;

(iv) එසේ නම්, 2016 මාර්තු 13 වැනි ඉරිදා දින මුළු දිවයිනටම විදුලිය නොමැති වූ විට අඹතලේ ජල පිරිපහදුවේ කටයුතු සිදු කිරීමට නොහැකි වූයේ මන්ද;

(v) එම විදුලිජනක යන්ත්‍රය ප්‍රමාණවත් නොවේ නම්, මේ පිළිබඳව අඹතලේ ජල පවිත්‍රාගාරයේ ප්‍රධානියා අදාළ බලධාරීන්ට දැනුම් දුන්නේද;

(vi) දැනුම් දී තිබුණේ නම්, ඒ සඳහා ගත් පියවර කුමක්ද;

(vii) එසේ දැනුම් දී තිබුණේ නම්, බලධාරීන් විසින් එම දැනුම් දීම පැහැර හැරීම පිළිබඳව ඔබතුමා ගන්නා පියවර කුමක්ද;

(viii) එසේ නොවේ නම්, දැනුම් නොදීම සම්බන්ධව වගකිව යුත්තන්ට එරෙහිව ගන්නා පියවර කුමක්ද;

(ix) අනාගතයේ ජනතාවට අත්‍යවශ්‍ය පානීය ජලය අඛණ්ඩව ලබාදීමට කටයුතු කරන්නේද;

(x) එසේ ලබාදීමට කටයුතු කරන්නේ නම්, ඒ පිළිබඳව විස්තර කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பதலே நீர் சுத்திகரிப்பு நிலையத்திற்குச் சொந்தமான மின் பிறப்பாக்கியின் கொள்திறன் யாதென்பதையும்;

(ii) அம்பதலே நீர் சுத்திகரிப்பு நிலையத்தின் நாளாந்த நீர் மின் பாவனை எத்தனை அலகுகள் என்பதையும்;

(iii) நீண்ட காலம் மின்சாரம் துண்டிக்கப்பட்டுள்ள போது தங்குதடையின்றி குடிநீர் வழங்கலை பேணிவருவதற்கு மேற்படி மின்பிறப்பாக்கி போதுமானதாக உள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், 2016 மார்ச் 13ஆம் திகதி ஞாயிற்றுக்கிழமை முழு நாட்டுக்கும் மின்சாரம் இல்லாமற்போனபோது அம்பதலே நீர் சுத்திகரிப்பு நிலையத்தின் பணிகளை ஏன் மேற்கொள்ள முடியவில்லை என்பதையும்;

(v) மேற்படி மின்பிறப்பாக்கி போதுமானதாக இல்லையெனில், இது சம்பந்தமாக அம்பதலே நீர் சுத்திகரிப்பு நிலையத்தின் பிரதானி தொடர்புடைய அதிகாரிகளுக்கு அறிவித்தாரா என்பதையும்;

(vi) அறிவித்திருப்பின், அதற்காக மேற்கொள்ளப் பட்ட நடவடிக்கை யாதென்பதையும்;

(vii) அவ்வாறு அறிவித்திருப்பின், அதிகாரிகள் மேற்படி அறிவித்தலை புறக்கணித்தமை சம்பந்தமாக அவர் எடுக்கின்ற நடவடிக்கை யாதென்பதையும்;

(viii) அவ்வாறின்றேல், அறிவிக்காமை தொடர்பில் பொறுப்புக்கூற வேண்டியவர்களுக்கு எதிராக மேற்கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதை யும்;

(ix) எதிர்காலத்தில் மக்களுக்குத் தேவையான குடி நீரைத் தங்குதடையின்றிப் பெற்றுக் கொடுப் பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(x) அவ்வாறு பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாராயின், அது சம்பந்தமாக விபரிக்க முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply:

(a) Will he inform this House -

(i) the capacity of the electricity generator of the Ambatale Water Treatment Plant;

(ii) the daily consumption of hydro electricity units in the Ambatale Water Treatment Plant;

(iii) whether this generator is sufficient to maintain an uninterrupted supply of drinking water when there is a long-term power outage;

(iv) if so, the reason for the Ambatale Water Treatment Plant to stop functioning on Sunday the 13th March 2016 due to the island-wide blackout;

(v) if the aforesaid generator is not sufficient whether the chief of the Ambatale Water Treatment Plant informed the relevant authorities;

(vi) if it had been informed, the action that has been taken in this regard;

(vii) if it had been informed the steps that will be taken against the authorities on their negligence;

(viii) if not, the steps that will be taken against the responsible persons on their failure to inform it;

(ix) whether steps will be taken to ensure an uninterrupted supply of drinking water to the people in Sri Lanka in the future; and

(x) if so, can you explain it?

(b) If not, why?

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ප්‍රධාන ජල පවිත්‍රාගාරය - 37 KVA

නව ජල පවිත්‍රාගාරය - 100 KVA

තුළුම්ං පොම්පාගාරය (Intake) - 37 KVA

(ii) 190,000 K Wh/ day

(iii) නැත. මෙම විදුලිජනක යන්ත්‍ර විදුලි ආලෝකය සැපයීමට පමණක් යොදා ගැනේ. පොම්ප ක්‍රියා කිරීමට ඉතා විශාල විදුලි ධාරිතාවකින් යුත් විදුලිජනක යන්ත්‍ර තබා ගැනීම තාක්ෂණික වශයෙන් ප්‍රායෝගික නොවේ.

(iv) ලංකා විදුලිබල මණ්ඩලය මඟින් විදුලිය අඛණ්ඩව ලබා දීමට අඹතලේ ජල පවිත්‍රාගාරය සඳහාම වෙන් වූ පෝෂක දෙකක් ලබා දී ඇතත් දිවයිනටම විදුලිය විසන්ධි වූ විට පමණක් අඹතලේ ජල පිරිපහදුවේ නිෂ්පාදනය නැවැත්වීමට සිදු වේ.

(v) ඔව්. අඹතලේ ජල පවිත්‍රාගාරයට අවශ්‍ය විදුලිජනක යන්ත්‍ර පද්ධතියේ ධාරිතාව 20,000 KVA වේ. එම නිසා අධික විදුලි පරිභෝජනයක් ඇති අඹතලේ ජල පවිත්‍රාගාරය විදුලිජනක යන්ත්‍ර මඟින් මෙහෙයුම් කටයුතු කිරීම සංකීර්ණ ක්‍රියාවලියකි.

(vi) මේ පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත වාර්තා කළ අතර ඔවුන් හා මනා සම්බන්ධීකරණයෙන් හා ඉහළම ප්‍රමුඛත්වයෙන් යුක්තව ක්‍රියා කර විදුලි බලය ලබා ගෙන ජල සැපයුම් යථා තත්ත්වයට පත් කරන ලදී.

(vii) අදාළ නොවේ.

(viii) අදාළ නොවේ.

(ix) ඔව්.

(x) දිවයිනටම විදුලිය බිඳවැටීමක් සිදු වූ විට අඹතලේ ජල පවිත්‍රාගාරය වෙත ඉහළම ප්‍රමුඛත්වය ලබා දී ඉතා කෙටි කාලයකින් විදුලිය ලබාදීමේ ක්‍රමවේදයක් ලංකා විදුලිබල මණ්ඩලය මඟින් අනුගමනය කිරීමට එකඟ වී ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අඹතලේ ජල පවිත්‍රාගාරයෙන් තමයි කොළඹ දිස්ත්‍රික්කයේ සියයට 90ක පමණ -විශේෂයෙන්ම කොළඹ නගර සීමාව, කොළොන්නාව, දෙහිවල, හෝමාගම සහ මහරගම ප්‍රදේශවල- ජල පරිභෝජනය ආවරණය කරන්නේ. මෙවැනි හදිසි විදුලි බිඳවැටීමක් තිබෙන වෙලාවක අඹතලේ ජල පවිත්‍රාගාරය අකර්මණ්‍ය වුණොත්, ළිඳක් හෝ නළ ළිඳක් හෝ හදාගන්න එක කොළඹ ජනතාවට සිහිනයක්. එම නිසා මේ මොහොතේවත් ලංකා විදුලිබල මණ්ඩලය එක්ක එකතු වෙලා ඒ සඳහා වූ විකල්ප වැඩ පිළිවෙළක් හදන්න පුළුවන්කම තිබෙනවාද? මොකද, අප දන්නා තරමට ලංකා විදුලිබල මණ්ඩලයේ ලොකුම පාරිභෝගිකයා තමයි අඹතලේ ජල පවිත්‍රාගාරය. ඔවුන් රුපියල් මිලියන 65ක විදුලි බිලක් ගෙවනවා. එහෙම ප්‍රමුඛතාව ලැබෙන වැඩ පිළිවෙළක් හදන්න පුළුවන්ද, ගරු ඇමතිතුමනි?

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
ගරු මන්ත්‍රීතුමනි, අපේ මේ පවිත්‍රාගාරය තුළ විදුලිබල මණ්ඩලයෙන් ප්‍රාථමික උපපොළක් - sub-grid station එකක්- පවත්වා ගෙන යනවා. ඒ විතරක් නොවෙයි, මෙහි "අවකර පරිණාමක" කියා step-down transformers 20ක් තිබෙනවා. විශේෂයෙන්ම අපේ පවිත්‍රාගාරය තුළ ඇති පොම්ප, අනෙකුත් විදුලි උපකරණ ක්‍රියාත්මක කිරීමට විවිධ ධාරිතාවකින් යුත් මේ යන්ත්‍රණ පාවිච්චි කරන්න සිදු වෙනවා. මේක සංකීර්ණ වැඩ පිළිවෙළක්. මේ කාර්ය generators හරහා කරන්න ගියොත්, ඒකට යන වියදම අනවශ්‍ය එකක් ලෙස අප සලකනවා. ඊට වඩා, එකවර මුළු දිවයිනේම විදුලිය බිඳවැටීම ඉතාම විරල සිදුවීමක්. එබැවින් මේ ක්‍රමවේදය පිළිබඳව අප සෑහීමකට පත් වෙනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සාමාන්‍යයෙන් අඹතලේ ජල පවිත්‍රාගාරයෙන් දවසකට ජලය ඝනමීටර් 530,000ක් නිපදවනවා. මෙවැනි තත්ත්වයක් ආවොත් ඒකට මුහුණ දීම සඳහා අතිරේක ජලය රඳවා ගැනීමේ වැඩ පිළිවෙළකට යොමු වීමේ අදහසක් තිබෙනවාද?

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
එය ඉතා හොඳ යෝජනාවක්. ඒ පිළිබඳව අප සලකා බලනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ඇමතිතුමනි, මගේ මේ ප්‍රශ්නය පාවිච්චි කරලා අවසාන වශයෙන් මා ඉල්ලා සිටිනවා, මෙන්න මේ කාරණය කෙරෙහිත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා. අඹතලේ ජල පවිත්‍රාගාරය හරහා කොළඹ නගරයට වතුර යන නළ මාර්ගය - අඹතලේ ඉඳලා ඔරුගොඩවත්ත දක්වා- තිබෙන්නේ අපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මැදිනුයි. අපේ පාර හදා ගැනීම සම්බන්ධයෙන් දැන් ගැටලුවක් වෙලා තිබෙන්නේ, එම ජල මාර්ගයයි. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරලා, එම ජල මාර්ගයක් ඉක්මනින් සාදා දෙන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
ගරු කථානායකතුමනි, මෙතුමා ඒ පිළිබඳව නිතරම මට මතක් කරනවා. අපි අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් කැබිනට් මණ්ඩල උප කමිටුවට ඒ පිළිබඳව වාර්තා කරලා දැන් ක්‍රමවේදයක් හදාගෙන යනවා. ඒකට අවශ්‍ය ණය පහසුකම් ශීඝ්‍රයෙන් ලබාගෙන, ඒ වැඩ කටයුතු ආරම්භ කරන්න අපි සූදානම් වනවා.

ගුවන් විදුලි සංස්ථා සේවකයන්: මානව හිමිකම් කඩවීම

ஒலிபரப்புக் கூட்டுத்தாபன ஊழியர்கள்: மனித உரிமைகள் மீறப்பட்டமை
EMPLOYEES OF SRI LANKA BROADCASTING CORPORATION:VIOLATION OF HUMAN RIGHTS

636/'16

6. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,- (1)

(අ) (i) 2003 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවකයන් 18දෙනෙක් තමන්ගේ මානව හිමිකම් කඩවී ඇති බවට මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්;

(ii) 2007 වර්ෂයේදී එම සේවකයන්ගේ මානව හිමිකම් කඩවී ඇති බවට එවකට පැවති ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය වෙත දන්වා ඇති බවත්;

(iii) ඒ අනුව, 2014 වර්ෂයේදී එවකට ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා විසින් මානව හිමිකම් කොමිසමේ තීරණය ක්‍රියාත්මක කරන මෙන් සියලු ලේකම්වරුන් වෙත දන්වා යවා තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 17/2005 දරන චක්‍රලේඛය ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිගන්නේද;

(ii) එසේ නම්, ඉහත අ (i) හි සඳහන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවකයින් 18දෙනා සඳහා එම චක්‍රලේඛය අනුව හිමිකම් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2003ஆம் ஆண்டு இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனத்தின் 18 ஊழியர்கள் தமது மனித உரிமைகள் மீறப்பட்டுள்ளதாக மனித உரிமைகள் ஆணைக்குழுவில் முறைப்பாடு செய்துள்ளார்கள் என்பதையும்;

(ii) 2007ஆம் ஆண்டு மேற்படி ஊழியர்களின் மனித உரிமைகள் மீறப்பட்டுள்ளதாக அப்போதைய வெகுசன ஊடக மற்றும் தகவல் அமைச்சுக்கு அறிவிக்கப் பட்டுள்ளது என்பதையும்;

(iii) அதற்கமைய, 2014ஆம் ஆண்டு அப்போதைய சனாதிபதியின் செயலாளராக இருந்த திரு. லலித் வீரதுங்க மனித உரிமைகள் ஆணைக்குழுவின் தீர்மானத்தை அமுல்படுத்துமாறு சகல செயலாளர்களுக்கும் அறிவித்திருந்தார் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அரசாங்க நிருவாக அமைச்சினால் வெளியிடப் பட்டுள்ள 17/2005ஆம் இலக்க சுற்றறிக்கையை வெகுசன ஊடக அமைச்சு ஏற்றுக் கொள்கின்றதா என்பதையும்;

(ii) ஆமெனில், மேலே அ(i) இல் குறிப்பிடப் பட்டுள்ள இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனத்தின் 18 ஊழியர்களுக்கும் மேற்படி சுற்றறிக்கைக்கு அமைய உரிமைகள் பெற்றுக் கொடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Parliamentary Reforms and Mass Media:

(a) Is he aware that -

(i) a complaint has been made at the Human Rights Commission by 18 employees of the Sri Lanka Broadcasting Corporation in the year 2003 to the effect that their Human Rights have been violated;

(ii) in 2007, it has been informed to the then Ministry of Mass Media and Information that human rights of the aforesaid employees were violated; and

(iii) accordingly in 2014, the then Secretary to the President Mr. Lalith Weerathunga notified all Secretaries that the decision of the Human Rights Commission should be implemented?

(b) Will he inform this House -

(i) whether the Ministry of Mass Media recognizes Circular No. 17/2005 issued by the Ministry of Public Administration; and

(ii) if so, whether rights of the 18 employees of the Sri Lanka Broadcasting Corporation mentioned in (a)(i) above will be granted as per the aforementioned circular?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) හැකියාවක් නොමැත.

(ඇ) 1967 ජනවාරි 05 දිනට පෙරාතුව වූ දිනකදී ගුවන් විදුලි දෙපාර්තමේන්තුවෙහි සේවයේ නියුක්තව සිට පසුව 1996 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත මඟින් ස්ථාපිත ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට අනුයුක්ත කරන ලද සේවකයින්ට උක්ත පනත යටතේ විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලැබිය හැකි වේ.

එවකට සිටි සංස්ථා බලධාරීන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා නීතිපති දෙපාර්තමේන්තුවේද උපදෙස් පරිදි 1967.01.05 දිනට පසු දිනකදී සංස්ථා සේවයට බඳවා ගනු ලැබූ සේවකයින් 35දෙනෙකු සඳහා පමණක් එම සේවකයින්ගේ පත්වීම් දිනය පෙරදාතම කිරීමෙන් විශ්‍රාම වැටුප් හිමිකම් ලබා ගැනීමේ අවස්ථාව හිමිකර දීමත් සමඟ මෙම ගැටලුකාරී තත්ත්වය උද්ගත වී ඇත.

ඒ සමඟම ඊට ආසන්න තත්ත්වයන්ගෙන් සිටි සේවකයන්ද විශ්‍රාම වැටුප් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමට යෙදුණු බැවින් මෙම ගැටලුකාරී තත්ත්වය විසඳීම සඳහා 2006.08.07 දින එවකට සිටි අමාත්‍යාංශ ලේකම් විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිද ඇතුළත්ව සිදු කරන ලද සාකච්ඡාවේදී තීරණය වී ඇත්තේ පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට පමණක් විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලබා දිය හැකි බවයි.

* 1967 ජනවාරි 05 දිනට පෙර ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ පත්වීමක් තිබිය යුතුය.
* අදාළ තනතුරෙහි සේවය ස්ථිර කර තිබිය යුතුය.
* වසර 10 අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
* විධිමත් පරිදි සේවය අවසන් කර තිබිය යුතුය.

මේ තීරණයෙන් සෑහීමට පත් නොවූ 10දෙනෙකුගෙන් හා 8දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් දෙකක් විසින් අවස්ථා දෙකකදී තමන්ට විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලබා දෙන ලෙස ඉල්ලා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර තිබුණා. ඊට පස්සේ, මානව හිමිකම් කොමිෂන් සභාව තීරණයක් දීලා තිබෙනවා, "පෙරදාතම කිරීම නිවැරදි, නීත්‍යානුකූල තීරණයක් ලෙස අර්ථ ගැන්වීමට නොහැකි නමුත් එම වරද වගඋත්තරකරුවන් විසින් සිදු කිරීම මතම පැමිණිලිකරුවන් වෙතද එකී වරද මත පදනම් වෙමින් ඔවුන් බලාපොරොත්තුවන සහනය එනම්, විශ්‍රාම වැටුප් හිමි ලෙස සැලකිය හැකිද යන්න ගැටලු සහගත බවයි" කියලා. කොහොම නමුත් ඉදිරිපත් වී ඇති තත්ත්වය අනුව සමානයින් අතර අසමානව සැලකීමක් ඇති වී ඇති බව පැහැදිලි වී ඇති බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12වැනි ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවට තීරණය කරලා එසේ වෙනස්කමකට භාජනය වී ඇති බැවින් මෙම පෙත්සම ඉදිරිපත් කර ඇති 10දෙනාට පමණක් පත්වීම් දිනය පෙරදාතම කර විශ්‍රාම වැටුප් හිමි තත්ත්වයට පත් කරන්න කියලා ඉල්ලීමක් කරලා තිබෙනවා.

දීර්ඝ කාලයක් සංස්ථා සේවයක් කර වයස සම්පූර්ණ වීම නිසා විශ්‍රාම ගොස් සිටින පැමිණිලිකරුවන්ට සහනයක් ලබා දීම සාධාරණ ක්‍රියාවක් වශයෙන් නිගමනය කළ හැකිය කියලාත් තිබෙනවා. එබැවින් අමාත්‍යාංශයේ ලේකම් සහ සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙම කරුණ සම්බන්ධයෙන් සානුකම්පිකව බලලා සහනයක් ලබා දීමට පරිපාලනමය වශයෙන් ප්‍රායෝගික පියවරක් ගැනීම සුදුසුයි කියලා නිර්දේශ හැටියට දීලා තිබෙනවා.

මේ නිර්දේශයන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත දැනුම් දීලා තිබෙනවා. ඒ සඳහා පිළිතුරු වශයෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් 2009.10.12වන දින - ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ- කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලිපියෙන් දැනුම් දී ඇත්තේ, "ඉහත දී ඇති නිර්ණායක මත මිස විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දීමට හැකියාවක් නොමැති බවයි." ඉතින් මීට පෙර බලධාරීන් විසින් 35දෙනෙකුට පමණක් විශ්‍රාම වැටුප් ලබා දීමට ගෙන ඇති වැරදි තීරණය නිසා නැවත නැවතත් විශ්‍රාම වැටුප් සඳහා ඉල්ලීම් ඉදිරිපත් වෙමින් පවතින අතර, ඒ අනුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් මේ වන විට විශ්‍රාම වැටුප් හිමිකම් ඉල්ලුම් කරනු ලබන 63දෙනෙකුගේ නම් ලැයිස්තුවක් අමාත්‍යාංශයට දැන් එවලා තිබෙනවා, මේ ගැන තීරණයක් ගන්න කියලා.

35දෙනෙකුට පෙරදාතම කර, එය ලබා දීලා වැරදි වැඩක් කරලා තිබෙනවා. ඒ මත මේ අයත් දැන් ඉල්ලනවා, සෑහෙන කලක් වැඩ කරපු නිසා අපටත් මේකට සාධාරණයක් කරන්න කියලා. අමාත්‍යාංශයෙන් ඒ 63දෙනා ගැන තීරණයක් ගන්න අවශ්‍ය නිසා ත්‍රිපුද්ගල කමිටුවක් පත් කළා. ඒ ත්‍රිපුද්ගල කමිටුව නැවතත් වැරදි පරිපාලනමය තීරණයක් නොගෙන අසාධාරණයට ලක් වූවන්ට සාධාරණයක් ඉටු කිරීමට වර්තමානයේදී පුළුවන් හැකියාව ගැන සොයා බලමින් පවතිනවා. ඒ කමිටුවේ නිර්දේශය ආවාට පස්සේ තමයි අපට ඒ වැරැද්ද, නිවැරදි කරන්න පුළුවන්ද කියලා බලන්න පුළුවන් වන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඇමතිවරු ගණනාවක් යටතේ මේ ප්‍රශ්නය විසඳිලා තිබුණේ නැහැ. අපිත් බලන්නේ සාධාරණයක් කරන්න පුළුවන් නම් කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙවැනි අවස්ථා රාජ්‍ය පරිපාලනයේ අනන්තවත් මතු වෙලා ඇවිත්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

තිබෙනවා. එක අතකින් අපේ ව්‍යවස්ථාවේ කියනවා, "මෙහෙම අසමාන ලෙස සලකන්න බැහැ" කියා. අපේ මූලික නීතිය ව්‍යවස්ථාව හැටියට ඒක පිළිපදින්න ඕනෑ.

ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, මේ දහඅටදෙනා ගැන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් චක්‍රලේඛයක් නිකුත් කරපු බව. ඒක ඔබතුමා අතේ තිබෙනවාද මා දන්නේ නැහැ. ඒ අතරම, මෙබඳු තත්ත්වයකදී ගත යුතු ක්‍රියා මාර්ග ගැන, සියලුම අමාත්‍යාංශ ලේකම්වරු වෙත එවකට ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා විසිනුත් එබඳුම චක්‍රලේඛයක් නිකුත් කළා. ඒ අනුව දැන් 63දෙනෙක් ඉතිරි වෙලා ඉන්නවා නම්, මේ 63දෙනා පිළිබඳව, ව්‍යවස්ථාවේ මූලික නීතිය අනුව ඔබතුමාට ක්‍රියා කළ හැක්කේ මේ විධියට විතරයි නේද? ඒ වාගේම, මානව හිමිකම් කොමිසමේ නිර්දේශ අනුව මේ අය ගැනත් එසේ ක්‍රියා කිරීමෙන් හැර, ඔබතුමාට මේ වරද නිවැරදි කරන්න බැහැ නේද කියලායි මම අහන්නේ?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, ඔය කියන කාරණා සියල්ලම පසු ගිය කාලයේ -ඔබතුමන්ලාගේ රජය කාලයේ- හිටපු අයත් සැලකිල්ලට ගන්න ඇති. නමුත් ප්‍රශ්නය විසඳිලා නැති නිසා තමයි අපි ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර, මේ කාරණය විසඳන්න පුළුවන් ක්‍රමයකට යන්න හදන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

"විසඳීමේ ක්‍රමයක්" යනුවෙන් ඔබතුමා අදහස් කරන්නේ, මේ අය විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් කර ගන්නවා හෝ විකල්පව යම් ආකාරයක සමස්ත වශයෙන් අවසාන ගෙවීමක් සිදු කිරීම පිළිබඳ අදහසක්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
නැහැ. ඇත්ත වශයෙන්ම, විශ්‍රාම වැටුප දෙන්න පුළුවන්ද කියන කරුණ බැලීමයි අපි ත්‍රිපුද්ගල කමිටුව පත් කිරීමෙන් අදහස් කළේ. ඒ වරද ඒ අය පිට දමන්නේ නැතිව, සානුකම්පිකව බලන්න කියා මානව හිමිකම් කොමිසමේ නිර්දේශයක් තිබෙනවා. එහෙම සලකා බලා තමයි ත්‍රිපුද්ගල කමිටුව පත් කළේ. හැබැයි, අපි කමිටුවේ නිර්දේශය බලලා තමයි තීරණය ගන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මේ ප්‍රශ්නය විසඳීමට වුවමනා ක්‍රියා මාර්ගයකට එතුමන්ලාගේ අදහස් දක්වන්නය කියලා, ඔබතුමා පත් කර තිබෙන ත්‍රිපුද්ගල කමිටුවේ උදවියට, මේ අංශය භාරව ඉන්න ඇමතිවරයා හැටියට ඔබතුමාගෙන් යම් උපදේශයක් අවශ්‍යයි නේද? මක් නිසාද, එහෙම නොවුණොත්,-

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, මෙය විසඳන්න කියා අදාළ උපදෙස් දීලා තමයි ත්‍රිපුද්ගල කමිටුව පත් කළේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ අයට ඇමතිතුමාගේ උපදේශයක් ලැබුණොත් එවැනි විසඳුමකට පැමිණ මෙය අවසන් කරන්න පුළුවන්. එහෙම නැත්නම් මෙවැනි ප්‍රශ්න නිසා ඔබතුමාගේ කාලය නිකම් නාස්ති වෙනවා; පාර්ලිමේන්තුවේ කාලය නාස්ති වෙනවා. ඒ නිසා අපි මෙය අවසන් කරමු.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය අවසන් කරන්නයි අපි උත්සාහ කරන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මත්පැන් බලපත්‍ර : විස්තර

பாராளுமன்ற உறுப்பினர்களுக்கு மதுபான உரிமப்பத்திரம் : விபரம்

LIQUOR LICENCES TO MEMBERS OF PARLIAMENT: DETAILS

640/'16

7. **ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(මාණ්පුමිකු උදය ප්‍රභාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1):

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට මත්පැන් බලපත්‍ර ලබාදීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) එවකට ශ්‍රී ලංකාණ්ඩුවේ ප්‍රධානියා කවුරුන්ද;

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට මත්පැන් බලපත්‍ර අවසන් වරට ලබා දුන් වර්ෂය කවරේද;

(iv) එවකට ශ්‍රී ලංකාණ්ඩුවේ ප්‍රධානියා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අවසන් වරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට මත්පැන් බලපත්‍ර ලබා දුන් අවස්ථාවේදී බලපත්‍ර ලබා නොගත් මන්ත්‍රීවරයන් කවුරුන්ද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

නිති අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) பாராளுமன்ற உறுப்பினர்களுக்கு மதுபான உரிமப் பத்திரங்கள் வழங்குவது ஆரம்பிக்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;

(ii) அப்போது இலங்கை அரசின் தலைவர் யார் என்பதையும்;

(iii) பாராளுமன்ற உறுப்பினர்களுக்கு மதுபான உரிமப் பத்திரங்கள் இறுதியாக வழங்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;

(iv) அப்போது இலங்கை அரசின் தலைவர் யார் என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இறுதியாக பாராளுமன்ற உறுப்பினர்களுக்கு மதுபான உரிமப் பத்திரங்கள் வழங்கப்பட்டபோது உரிமப் பத்திரங்களை பெற்றுக்கொள்ளாத பாராளுமன்ற உறுப்பினர்கள் யார் என்பதையும் அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance :

(a) Will he inform this House -

(i) the year in which the granting of liquor licences to Members of Parliament commenced;

(ii) as to who was the Head of the Government of Sri Lanka at that time;

(iii) the year in which liquor licences were granted to Members of Parliament last; and

(iv) as to who was the Head of the Government of Sri Lanka at that time?

(b) Will he also inform this House of the Members of Parliament who did not obtain liquor licences when they were granted to Members of Parliament last?

(c) If not, why?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේය.

(අ) (i) මන්ත්‍රීවරුන්ට හෝ ඔවුන්ගේ ඥාතීන් හෝ හිතවතුන් නමින් බලපත්‍ර නිකුත් කර ඇති බව පොදුවේ සඳහන් කළද, නම් වශයෙන් සඳහන් කර නොමැති බැවින් ඒ පිළිබඳ තොරතුරු සොයා ගත නොහැක.

(ii) අදාළ නොවේ.

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බලපත්‍ර ලබා දුන් අවසන් වර්ෂය 1995 ලෙස පොදුවේ පිළිගැනුණද ඒ පිළිබඳ තොරතුරු ද සොයා ගැනීමට නොමැති බැවින් සනාථ කළ නොහැක.

(iv) අදාළ නොවේ.

(ආ) මෙම බලපත්‍ර මන්ත්‍රීවරුන්ගේ හෝ ඔවුන්ගේ ඥාතීන්ගේ හෝ හිතවතුන්ගේ හෝ වෙනත් අයගේ නමින් ලබා ගෙන තිබෙන බව අපි සියලු දෙනා දන්නා කාරණයක්. මේ පිළිබඳව සොයා බැලීමට කාලයක් ගතවනු ඇත.

අපි මේ පිළිබඳව සොයන්න පුළුවන්තරම් උත්සාහ කළා. ඇත්ත වශයෙන්ම ඔබතුමා වාගේම මමත් මෙය කාගේ නමින් ද තිබෙන්නේ කියලා සොයනවා. අපි කාටවත් අසාධාරණයක් නොවන ලෙස තොරතුරු සොයා බලා වාර්තා කරන්නම්.

(ඇ) වසර ගණනාවක් ගතවී ඇති බැවින්, අදාළ ලිපිගොනු නොමැති වීමෙන් තොරතුරු සොයා ගැනීම දුෂ්කර වී ඇත. කෙසේ වෙතත් බලපත්‍රධාරීන් තම බලපත්‍ර විකුණා තිබේද යන්නත්, දේශපාලනඥයින් තම ඥාතීන් හෝ හිතවතුන් නමින් බලපත්‍ර ලබා ගෙන තිබේද යන්නත් පිළිබඳව විමර්ශනයක් කළ යුතුය.

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් මට කියන්න අවශ්‍ය වන්නේ නැවත මේ licence ක්‍රමය පිළිබඳ සලකා බලා විනිවිදභාවයක් ඇති වන පරිදි එය ටෙන්ඩර් පරිපාටියක් තුළින් විය යුතුයි කියන එකයි. අපි ඒ විධියට කටයුතු කිරීමට අදහස් කරගෙන සිටිනවා. හැබැයි, ඒ ගැන මට මේ අවස්ථාවේ නිල වශයෙන් කියන්න අපහසුයි.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ඔබතුමා පරණ ලිපිගොනු ඇදලා මේ පිළිබඳ අවධානය යොමු කළාට බොහොම පින්.

ගරු කථානායකතුමනි, මාගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙසේයි.

ගරු මන්ත්‍රීවරුන්ට බලපත්‍රය බැගින් හෝ බලපත්‍ර දෙක බැගින් හෝ ලබා දීමේදී, එවකට සිටි රාජ්‍ය නායකයාගෙන් හෝ මුදල් ඇමතිවරයාගෙන් නම් ලැයිස්තුවක් ලැබීමක් අඩුම ගණනේ සිද්ධ වෙලා නැද්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ.

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය : විවෘත තරග විභාගය

இலங்கை தகவல் மற்றும் தொடர்பாடல் தொழிநுட்ப சேவை: திறந்த போட்டிப் பரீட்சை

SRI LANKA INFORMATION AND COMMUNICATION TECHNOLOGY SERVICE: OPEN COMPETITIVE EXAMINATION

645/'16

8. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අංක 1904 හා 2015.02.27 දිනැති ගැසට් පත්‍රය මඟින් අයදුම්පත් කැඳවා, විභාග දෙපාර්තමේන්තුව මඟින් 2015.06.26 දින පවත්වන ලද "ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ, 2 වැනි පංතියේ, II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015" සඳහා අයදුම් කළ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අනුව රුපියල් 500/- බැගින් විභාග ගාස්තු ලෙස එකතු වූ මුළු මුදල කොපමණද;

(iii) විභාගයට හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට අනුව පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ සංඛ්‍යාව කොපමණද;

(iv) සුදුසුකම් ලැබූවන්ගේ නාම ලේඛනය හා ලකුණු අනුපිළිවෙළ සහාගත කරන්නේද;

(v) සුදුසුකම් සපුරන ලද පිරිස මේ දක්වා බඳවා නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1904ஆம் இலக்க 2015.02.27ஆந் திகதிய, வர்த்தமானப் பத்திரிகையின் மூலம் விண்ணப்பங்கள் கோரப்பட்டு, பரீட்சைத் திணைக்களத்தினால் 2015.06.26ஆந் திகதி நடத்தப்பட்ட "இலங்கை தகவல் மற்றும் தொடர்பாடல் தொழிநுட்ப சேவையின், 2ஆம் வகுப்பின், 11ஆம் தரத்திற்கு ஆட்சேர்ப்பதற்கான திறந்த போட்டிப் பரீட்சை - 2015" இற்கு விண்ணப்பித்தவர்களின் எண்ணிக்கை யாது;

(ii) இதற்கமைய ரூபாய் 500/- வீதம் பரீட்சைக் கட்டணமாக சேர்ந்த மொத்தப் பணத்தொகை எவ்வளவு;

(iii) பரீட்சைக்கு மற்றும் தகைமைகளைப் பரிசோதிக்கும் நேர்முகப்பரீட்சைக்கு அமைய, வெற்றிடங்களை நிரப்புவதற்கான தகைமை களைப் பூர்த்தி செய்தவர்களின் எண்ணிக்கை யாது;

(iv) தகைமை பெற்றவர்களின் பெயர்ப் பட்டியல் மற்றும் புள்ளிகளின் ஒழுங்குவரிசையை சபையில் சமர்ப்பிப்பாரா;

(v) தகைமை பெற்றவர்கள் இதுவரையில் ஆட்சேர்க்கப்படாமைக்கான காரணம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Management :

(a) Will he inform this House -

(i) the number of candidates applied for the “Open Competitive Examination for Appointment to Grade II, Class 2 of Sri Lanka Information and Communication Technology Service - 2015” conducted by the Department of Examinations on 26.06.2015 by calling applications through Gazette Notification No. 1904 dated 27.02.2015;

(ii) with Rs. 500/- per person, the total amount of money collected as examination fees;

(iii) the number who gained qualifications to fill vacancies subsequent to the examination and interviews conducted to examine qualifications;

(iv) whether he will table the list of names of those who gained qualifications and the order of marks; and

(v) the reason for not recruiting those who fulfilled the qualifications yet ?

(b) If not, why?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේ ය.

(අ) (i) 953.

(ii) රුපියල් 476,500.00

(iii) පුරප්පාඩු 145ක් පිරවීමට නියමිතව පැවතුණි. එම සංඛ්‍යාව පිරවීම වට 3කදී පහත පරිදි ක්‍රියාකර ඇත.

	කැඳවූ අයදුම්කරුවන් ගණන	කැඳවූ කඩඉම් ලකුණ	සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ගණන	පත්වීම් දිනය	සේවයට වාර්තා කළ සංඛ්‍යාව	පිරවිය යුතු පුරප්පාඩු ගණන
1වටය	139	162	94	2016.05.02	88	57
2 වටය	10	161	6			
3 වටය	76	150	35	2016.07.11 දින සම්මුඛ පරීක්ෂණ පැවැත්වුණි.		

(iv) ඔව්. ඇමුණුමෙහි සඳහන්ව ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(v) ලිඛිත විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ 100 දෙනෙකු 2016.05.02 දින සිට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට විවෘත පදනමින් පත් කර ඇත. සෑම විෂයකටම ලකුණු සියයට 50කට වැඩියෙන් ලබාගෙන සහ මුළු ලකුණු 150ක් ලබා අවම ලකුණු සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් 76 දෙනෙකු 2016.07.11 දින සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද අතර, ඔවුන් අතරින් අදාළ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් 35 දෙනෙකුට ඉදිරියේදී පත්වීම් ලබාදීමට නියමිතය.

(ආ) පැන නොනඟී.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය යොමු කිරීමට ප්‍රධාන හේතුව මෙයයි. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා තරග විභාගය පැවැත්වුණේ 2015.06.26 වන දිනයි. ඒ සඳහා අයදුම් පත්‍ර කැඳවුවේ 2015.02.27 වන දිනයි. 2015 පෙබරවාරි මාසයේ 27 අයදුම් පත්‍ර කැඳවලා, 2015 හය වන මාසයේ විභාගය පවත්වලා මම මේ ප්‍රශ්නය යොමු කරන අවස්ථාව වන විටත් බඳවා ගැනීම් කරලා තිබුණේ නැහැ ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමනි, ඔබතුමා පළමුවෙනි කණ්ඩායම බඳවාගෙන තිබෙන්නේ 2016.05.02 දිනයි. ඒ අනුව විභාගය පවත්වලා අවුරුද්දකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. ඒ නිසාම තමයි මේ ප්‍රශ්නය යොමු කළේ. ඔබතුමාගේ පැහැදිලි කිරීම අනුව මම විශ්වාස කරනවා පළමුවෙනි කණ්ඩායම 2016 මැයි මාසයේ 02වෙනි දා වන විට බඳවාගෙන තිබෙන බව.

ඒ අනුව, තව පුරප්පාඩු තිබෙනවාද, ඉතිරි ප්‍රමාණයත් බඳවා ගැනීමට පුළුවන්ද කියන කාරණය පමණයි ඔබතුමාගෙන් මට දැන ගන්නට තිබෙන්නේ.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මේ 35 දෙනා බඳවා ගත්තාට පසුව තව පුරප්පාඩු 10ක් පමණ තිබෙනවා. ප්‍රමාදයට හේතුව මෙයයි. විභාග පවත්වලා ප්‍රතිඵල නිකුත්වීමට මාස ගණනාවක් පරක්කු වෙනවා. ඒක අපට විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙන්නේ එම වර්ෂයේ ඇති වන පුරප්පාඩු සංඛ්‍යාව ඒ විභාගයෙන්ම බඳවා ගැනීමේ ක්‍රමයක් හදන්නටයි. රාජ්‍ය සේවයේදී විශාල වශයෙන් විභාග ප්‍රතිඵල ප්‍රමාදවීමේ ප්‍රශ්නයට අපට මුහුණ දෙන්නට සිදු වෙලා තිබෙනවා. ඒක කඩිනම් කරන්න අවශ්‍ය කටයුතු පිළිබඳව මේ වෙන කොට සාකච්ඡා කරමින් පවතිනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම විභාගයක් පවත්වලා අවුරුද්දක් ගතවෙන කොට එම විභාගයෙන් තේරුණු අය වෙනත් තනතුරු සඳහා පත්වීම් ලබා ගෙන රැකියාවලට ගිහින් ඉන්න පුළුවන්. ඒ ගැටලුව තිබෙනවා. මේ ප්‍රමාදය නිසා ඔබතුමන්ලා තෝරා ගත් අය වුණත් නැවත වතාවක් කැඳවන අවස්ථාවේ නොපැමිණෙන්න පුළුවන්. ඔබතුමාගේ පැහැදිලි කිරීම පිළිබඳව මම එකඟයි. විභාග පවත්වලා රාජ්‍ය සේවයට බඳවා ගැනීම කඩිනම් කරනවා නම් මේ ප්‍රශ්නය මතු වෙන්නේ නැහැ. එතකොට අපට මෙවැනි ප්‍රශ්න ඉදිරිපත් කරන්න වෙන්නේත් නැහැ.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ඒක අපේ අමාත්‍යාංශය පැත්තෙන් සිදු වුණු ප්‍රමාදයක් නොවෙයි. විභාග දෙපාර්තමේන්තුව පැත්තෙන් සිදු වුණු ප්‍රමාදයක් නිසා තමයි මේක ඇති වෙලා තිබෙන්නේ. හැම ආයතනයකම මේ ප්‍රශ්නය තිබෙනවා. අපි එම සේවකයන් බඳවා ගැනීම කඩිනම් කිරීමේ වැඩ පිළිවෙළක් දැන් හදාගෙන යනවා. අපි ලබන අවුරුද්ද ඇතුළත වන පුරප්පාඩු සංඛ්‍යාව ගණනය කරලා, ඉදිරියට ඇති වන පුරප්පාඩු සඳහාත් එම විභාගයෙන්ම බඳවාගන්න කටයුතු කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බොහොම ස්තුතියි.

ක්වාසි විනිසුරුවන් යොමු කරන නිවේදන: ප්‍රදර්ශනය

காதி நீதிபதிகளால் ஆற்றுப்படுத்தப்படும் அறிவித்தல்கள்: காட்சிப்படுத்தல்

ANNOUNCEMENTS REFERRED BY QUASI JUDGES: DISPLAY

657/'16

9. ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) අංක 1951/13 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 24වැනි වගන්තිය ක්‍රියාත්මක කිරීමේදී ක්වාසි විනිසුරුවරු විසින් ජුම්ආ පල්ලිවලට අයත් භාරකරුවන්ගේ දායකත්වය සහ ඔවුන්ගේ සහාය ලබාගැනීමේ අවශ්‍යතාව පැන නඟින බව දන්නේද;

(ii) රාජකාරිමය අවශ්‍යතා සඳහා ක්වාසි විනිසුරුවන් විසින් දිවයිනේ ජුම්ආ පල්ලිවල භාරකරුවන්ට යොමු කරන නිවේදන, එම පල්ලිවලට අයත් දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කිරීමේ අවශ්‍යතාව සහ සම්ප්‍රදායානුකූලව පවතින එම වගකීම් දැනුවත් කරමින් අවශ්‍ය උපදෙස් නිකුත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1951/13ஆம் இலக்க முஸ்லிம் திருமண மற்றும் மணநீக்கச் சட்டத்தின் 24வது பிரிவினை அமுலாக்குகையில் காதி நீதிபதிகள் ஜும்மா பள்ளிவாசல்களுக்குரிய நம்பிக்கைப் பொறுப்பாளர்களின் பங்களிப்பையும் அவர்களின் ஒத்துழைப்பையும் பெற்றுக்கொள்ள வேண்டிய தேவைப்பாடு தோன்றுகின்றதென்பதை அறிவாரா;

(ii) கடமைத் தேவைகளுக்காக காதி நீதிபதிகளால் நாட்டிலுள்ள ஜும்மா பள்ளிவாசல்களின் நம்பிக்கைப் பொறுப்பாளர்களுக்கு ஆற்றுப்படுத்தப்படுகின்ற அறிவித்தல்கள், அந்த பள்ளிவாசல்களின் அறிவித்தல் பலகைகளில் காட்சிப்படுத்தப்பட வேண்டியதன் தேவைப்பாடு மற்றும் மரபுரீதியாக நிலவுகின்ற அப்பொறுப்பு பற்றி விழிப்புணர்வூட்டி தேவையான அறிவுறுத்தல்களை வழங்க நடவடிக்கை மேற்கொள்வாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Post, Postal Services and Muslim Religious Affairs:

(a) Will he inform this House-

(i) whether he is aware that the need of obtaining the contribution and assistance of the trustees of the Jumma mosques by the Quasi Judges arises, when enforcing Section 24 of the Muslim Marriages and Divorce Act, No. 1951/13; and

(ii) whether steps will be taken to issue the necessary instructions educating the trustees of the Jumma mosques on the need to display the announcements referred to them by Quasi Judges on official matters on the notice boards of the mosques and on that traditional responsibility?

(b) If not, why?

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න අහන්න තිබෙනවාද?

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)
ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්න හේතු වුණේ එතුමාගේ අමාත්‍යාංශය මේකට සම්බන්ධ නිසයි. ක්වාසි විනිශ්චයකාරවරුන් විසින් නිකුත් කරන notice එක ඒ පුද්ගලයන් ජීවත් වන ප්‍රදේශවල ජුම්ආ දේවස්ථානවල ප්‍රදර්ශනය කළ යුතුයි. එයට කාරණා දෙකක් හේතු වෙනවා. එකක් තමයි යම් පුද්ගලයෙක් තම විවාහය සම්බන්ධයෙන් අනෙක් පාර්ශ්වය දැනුවත් කිරීම. ඊට වඩා වැදගත් කාරණයක් තිබෙනවා. එහෙම දැනුම් දීමක් නොකර විවාහ වෙනවා නම්, එම විවාහය මෙම පනත යටතේ ලියා පදිංචි කිරීමක් සිදු වෙන්නේ නැහැ. මේ පිළිබඳව පියවර ගන්නවා කියලා ගරු අමාත්‍යතුමා ප්‍රකාශ කළා. එම නිසා වක්‍රලේඛයක් මාර්ගයෙන් අමාත්‍යාංශය හරහා මෙම කරුණ පිළිබඳව අදාළ ජුම්ආ දේවස්ථාන දැනුවත් කරන ලෙස මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)
ගරු කථානායකතුමනි, මේ වෙන කොටත් ඒක සිදු වෙනවා. ඒ වාගේම ක්වාසි විනිසුරුවරු සම්බන්ධව කටයුතු කරන්නේ තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය නොවෙයි. ඒ කාර්ය අධිකරණ අමාත්‍යාංශයට තමයි පැවරී තිබෙන්නේ. කෙසේ වෙතත් මේ වෙනකොට අපට ඒ විධියේ දෙයක් පිළිබඳව වාර්තා වෙලා නැහැ. ඒ පිළිබඳව මොනවා හෝ පැමිණිලි තිබෙනවා නම් අපට ඒ ගැන සොයා බලා කටයුතු කරන්න පුළුවන්.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)
බොහොම ස්තුතියි.

ඌන සුදුසුකම් සහිත තැපැල් ස්ථානාධිපතිවරු: විස්තර

குறைந்த தகைமை கொண்ட தபால் அதிபர்கள் : விபரம்

LESS-QUALIFIED POST MASTERS : DETAILS

663/'16

10. ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ඌන සුදුසුකම් සහිත පුද්ගලයන් ලෙස සැලකෙන තැපැල් ස්ථානාධිපතිවරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට විශ්‍රාම වැටුපක් හිමි වන්නේද;

(iii) එසේ නොවේ නම්, ඔවුන් තැපැල් සේවයට සිදු කළ දීර්ඝ කාලීන සේවය සලකා කිසියම් සහනදායී දීමනාවක් හෝ ලබා දීමට හැකියාවක් තිබේද;

(iv) එසේ නොමැති නම්, ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குறைந்த தகைமை பெற்றவர்களாகக் கருதப்படுகின்ற தபால் அதிபர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) இவர்களுக்கு ஓய்வூதிய உரித்துள்ளதா என்பதையும்;

(iii) இன்றேல், இவர்கள் தபால் சேவைக்கு ஆற்றியுள்ள நீண்டகால சேவையைக் கவனத்திற்கொண்டு ஏதேனும் நிவாரணக் கொடுப்பனவைப் பெற்றுக் கொடுக்கும் ஆற்றல் உள்ளதா என்பதையும்;

(iv) இன்றேல், இவர்களின் நலனுக்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Post, Postal Services and Muslim Religious Affairs:

(a) Will he inform this House-

(i) the number of Post Masters, treated as having less qualifications;

(ii) whether they are entitled to a pension;

(iii) if not, is it possible to provide them with a relief allowance, in view of their long term service to the Postal Service; and

(iv) if not, the measures taken for their wellbeing?

(b) If not, why?

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ඌන සුදුසුකම් සහිත තැපැල් ස්ථානාධිපතිවරුන් තැපැල් දෙපාර්තමේන්තුවට බඳවා ගෙන නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
ගරු අමාත්‍යතුමනි, මම මේ කථා කරන්නේ ඔබතුමාගේ අමාත්‍ය ධුරය දරන කාලයේ සිදු වුණ දේවල් ගැන නොවෙයි. මේ වනවිට ඌන සුදුසුකම් සහිතව විශ්‍රාම ගිය තැපැල් ස්ථානාධිපතිවරුන් ලංකාවේ බොහොමයක් ඉන්නවා. ඔවුන් බඳවා ගැනීමේදී අධ්‍යාපන සුදුසුකමක් බලන්නේ නැතිව තමයි බඳවා ගෙන තිබෙන්නේ. මෑත කාලයේ වක්‍රලේඛය වෙනස්වීමත් එක්ක ඔවුන් විශ්‍රාම ගිය පසුව ඔවුන්ට විශ්‍රාම වැටුපක් ලැබෙන්නේ

නැහැ. ඒක තමයි ඔවුන්ට තිබෙන ලොකුම ගැටලුව වන්නේ. ඒක ඉතාම අසාධාරණයි. ගරු ඇමතිතුමනි, ඔවුන් වෙනුවෙන් යම් කිසි සහනයක් ලබා දෙන්න ඔබතුමාට පුළුවන් නම් ඒක ගොඩාක් වටිනවා කියලා මම විශ්වාස කරනවා.

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

මම හිතන්නේ ඔබතුමිය ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයේ තමයි වැරැද්දක් තිබෙන්නේ. ඌන සුදුසුකම් සහිතව සිටින්නේ තැපැල් ස්ථානාධිපතිවරුන් නොවෙයි, උප තැපැල් ස්ථානාධිපතිවරුන්. ඌන සුදුසුකම් සහිත පුද්ගලයන් ලෙස සලකන උප තැපැල් ස්ථානාධිපතිවරුන් කොටස් තුනකට වෙන් කර තිබෙනවා. එක කොටසක් තමයි, 2000.09.21 වන දිනට ස්ථිර පත්වීම් ලබා දී පසුව ඌන සුදුසුකම් සහිත අය සේ සලකා ඇති උප තැපැල් ස්ථානාධිපතිවරුන්. ඔවුන්ගේ සංඛ්‍යාව 240යි.

ඒ වාගේම කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන MN1 හා MN2 ශ්‍රේණිය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අංක 25/2014 අනුව 2014.10.27 වෙනිදාට වයස අවුරුදු 45ක් ඉක්මවීම නිසාම සුදුසුකම් සහිත උප තැපැල් ස්ථානාධිපතිවරුන් 107 දෙනෙක් ඉන්නවා. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 යටතේ සුදුසුකම් සම්පූර්ණ නොකරන ලද ස්ථිර පත්වීම් නොලද වැඩ බලන උප තැපැල් ස්ථානාධිපතිවරුන් 15 දෙනෙක් ඉන්නවා. ඒ අනුව ඌන සුදුසුකම් සහිත උප තැපැල් ස්ථානාධිපතිවරුන් 360 දෙනෙක් ඉන්නවා. ඒ අයට දැනට විශ්‍රාම වැටුප් හිමි වන්නේ නැහැ. ඔවුන් තැපැල් සේවයට සිදු කළ දීර්ඝ කාලීන සේවය සලකා අවුරුදු 60 වන තුරු රාජකාරී කළ හැකි වන අතර මාසිකව වැටුප් ගෙවීම සිදු කරනු ලබනවා. ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසා අර්ථ සාධක අරමුදල් ගෙවනු ලබනවා. මෙම පිරිස පසු ගිය කාලයේ අමාත්‍යාංශයේදී මා හමු වුණා. මේ සම්බන්ධව මා කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. අද උදේ වරුවේ මට දැන ගන්න ලැබුණා, කැබිනට් අනු කාරක සභාව ඒ සම්බන්ධයෙන් නිර්දේශයක් ලබා දීලා තිබෙන බව. ඒ සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගත හැකි වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. මෙය ඔවුන්ට හරි සතුටුදායක කාරණයක් වෙයි. මොකද, ඒ පිරිස මා මුණ ගැහෙන්න ඇවිල්ලා කාලයක් තිස්සේ අහපු ප්‍රශ්නයක් තමයි මම ඔබතුමාට ඉදිරිපත් කළේ.

විශේෂ චීන කර්මාන්ත කලාපය: ගිවිසුම
விசேட சீன கைத்தொழில் வலயம் : உடன்படிக்கை
SPECIAL CHINESE INDUSTRIAL ZONE: AGREEMENT

667/'16

11. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) රජය මඟින් ප්‍රකාශ කර ඇති පරිදි අග්‍රාමාත්‍යවරයාගේ චීන සංචාරයේ දී එකඟ වූ බවට සඳහන් කරන මත්තල ගුවන් තොටුපළ ආශ්‍රිත විශේෂ චීන කර්මාන්ත කලාපය පිළිබඳව චීන රජය සමඟ එළැඹී ඇති ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද;

(ii) එසේ නම්, එම ලියවිල්ල සභාගත කරන්නේද;

(iii) එම විශේෂ චීන කර්මාන්ත කලාපය පිහිටුවීමේ මූලික කොන්දේසි හා කළමනාකරණය සිදු වන ආකාරය පැහැදිලි කරන්නේද;

(iv) එම කර්මාන්ත කලාපය සඳහා හඳුනාගෙන ඇති භූමියේ සිතියමක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்தினால் பிரகடனப்படுத்தப்பட்டுள்ள வாறு பிரதம அமைச்சரின் சீன விஜயத்தின் போது இணக்கம் தெரிவிக்கப்பட்டதாகக் குறிப் பிடப்படுகின்ற மத்தள விமான நிலையத்தை அண்டியதான விசேட சீனக் கைத்தொழில் வலயம் தொடர்பாக சீன அரசாங்கத்துடன் ஏற்படுத்திற்கொள்ளப்பட்டுள்ள ஓர் உடன் படிக்கை அல்லது உடன்பாட்டு ஆவணம் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அந்த ஆவணத்தைச் சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) மேற்படி விசேட சீன கைத்தொழில் வலயத் தினைத் தாபிப்பதற்கான அடிப்படை நிபந் தனைகள் மற்றும் முகாமைத்துவம் நடைபெறும் விதத்தைத் தெளிவுபடுத்துவாரா என்பதையும்;

(iv) மேற்படி கைத்தொழில் வலயத்தின் பொருட்டு இனங்காணப்பட்டுள்ள நிலத்தின் வரைபட மொன்றைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) whether there is an agreement or accord entered into with the Government of China with regard to the Special Chinese Industrial Zone, associated to the Mattala Airport which is said to have been agreed to by the Prime Minister on his visit to China, as stated by the Government;

(ii) if so, whether that document will be tabled;

(iii) whether he will make a clarification of the preliminary conditions of establishing that Special Chinese Industrial Zone and the manner it is managed; and

(iv) whether a map of the land earmarked for that industrial zone will be presented?

(b) If not, why?

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.
අවබෝධතා ගිවිසුමේ පිටපත ඇතුළත් ඇමුණුම **සභාගත*** කරමි.

(iii) ශ්‍රී ලංකාව විසින් හෝ වෙනයම් රටක් විසින් ඉදි කරන ලද කාර්මික උද්‍යානවලට හෝ විශේෂ ආර්ථික කලාප ලෙස සැලකෙන ව්‍යාපෘතිවලට අදාළව පිරිනැමෙන නෛතිකමය අයිතිවාසිකම් හා අනුග්‍රාහාත්මක කොන්දේසි චීන සමාගම් විසින් ශ්‍රී ලංකාවේ ඉදි කරනු ලබන කර්මාන්ත උද්‍යාන සඳහා ද අදාළ නීති රීති යටතේ පිරිනැමීමටත්, ආරක්ෂාව තහවුරු කිරීම් සහ වෙනත් අදාළ අංගයන් ඇතුළත් ප්‍රමාණවත් සම්බන්ධතාවන් එකී කාර්මික උද්‍යාන සඳහා සැපයීම තහවුරු කරමින්, ප්‍රමාණවත් යටිතල පහසුකම් සහතික කෙරෙන අවශ්‍ය සහාය සලසා දීමටත්, ශ්‍රී ලංකා රජය හා චීන රජය ඒකාබද්ධව එම කර්මාන්ත කලාප කළමනාකරණය කිරීමටත් එකඟ වී ඇත.

(iv) නැත.
කාර්මික කලාපය සඳහා වෙන් කෙරෙන ඉඩමේ සැලැස්ම මෙතෙක් නිශ්චය කර නැත.

(ආ) අදාළ නොවේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මේ කර්මාන්ත කලාපයේ අයිතිය ශ්‍රී ලංකා රජය සතුද, චීන රජය හෝ සමාගමක් සතුද, නැත්නම් ඒකාබද්ධද කියලා මාගේ පළමුවන අතුරු ප්‍රශ්නයෙන් මා දැන ගන්න කැමැතියි.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, මම සඳහන් කළ පරිදි ඒක ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතියක් හැටියට තමයි ක්‍රියාත්මක වන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහි ප්‍රතිශතය ඔබතුමාට කියන්න පුළුවන්ද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ප්‍රතිශතය නිශ්චය කර නැහැ, මේක මූලික ගිවිසුමක් නිසා. අපි ඒක ඉදිරියේදී ඔබතුමාට දන්වන්නම්.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය නේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය. මගේ ගණනය අනුව නම් තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි. මම දෙවන අතුරු ප්‍රශ්නයයි, තුන්වන අතුරු ප්‍රශ්නයයි එකතු කරලා අහන්නම්.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ ආරම්භ කරන්න යන කර්මාන්ත මොනවාද කියන එක ගැනත්, ඔබතුමන්ලා මේ කර්මාන්ත කලාපය සිතියමකින් හඳුන්වා දී නැති නිසා එහි කටයුතු ආරම්භ කරන්න කලින් පිළිගත් පරිසර අධ්‍යයන වාර්තාවක් ලබා ගන්නවා කියන එක ගැන එකඟ වෙනවාද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ඔව්. ගරු කථානායකතුමනි, අපි නව රජයක් හැටියට, මේ අසාර්ථක වුණු ව්‍යාපෘති නැවත අපේ ආර්ථිකයට බද්ධ කරලා ඒ තුළින් පසු ගිය රජයෙන් ගත් ණය ගෙවන්න පුළුවන් ආකාරයකට ඵලදායී ලෙස එම කටයුතු ඉදිරියට ගෙන යන්න තමයි සැලසුම් කර තිබෙන්නේ. විශේෂයෙන්ම පරිසරයට හානියක් නොවන අයුරෙනුත්, ඒ වාගේම අපේ රටේ සිටින තරුණ-තරුණියන්ට මේ තුළින් රැකියා උත්පාදනය වන ආකාරයෙනුත් කර්මාන්තශාලා පිහිටුවන්නට අප කටයුතු කර තිබෙනවා. පරිසර අධ්‍යයනයෙන් පසුව එම කලාපයට සුදුසු කර්මාන්තශාලා පිහිටුවීමට ඒ ආයෝජකයන් සමඟ සාකච්ඡා කර, ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවට දැනුම් දීලා ඉස්සරහට යන්න තමයි අප බලාපොරොත්තු වෙන්නේ.

මේජර් ජේ. ආර්. එස්. රූපසිංහ මහතාට එරෙහි පරීක්ෂණය: හේතු

மேஜர் திரு. ஜே.ஆர்.எஸ். ரூபசிங்ஹவுக்கு எதிரான விசாரணை :காரணம்

INVESTIGATION AGAINST MAJOR J.R.S. RUPASINGHE: REASONS

386/'15

12. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1);

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවය කරන මේජර්වරයෙකු වන ජේ. ආර්. එස්. රූපසිංහ මහතාට එරෙහිව මේ වනවිට යම් පරීක්ෂණයක් ක්‍රියාත්මක වෙමින් පවතිද;

(ii) එසේ නම්, එයට හේතුව කවරේද;

(iii) මෙම පරීක්ෂණය මෙහෙයවන නිලධාරීන්ගේ නම් හා තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේජර් ජේ. ආර්. එස්. රූපසිංහ මහතාට සාධාරණයක් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

පිරතම අමෙච්චරුම්, දේසිය කොළ්කෙකළ් මට්රුම් පොරුළාදාර අළුවල්කළ් අමෙච්චරුමානවරෙක් කේට්ට විනා:

(அ) (i) இலங்கை இராணுவத்தில் பணியாற்றும் மேஜர் ஒருவரான திரு. ஜே.ஆர்.எஸ். ரூபசிங்ஹவுக்கு எதிராக இன்றளவில் விசாரணையொன்று நடைபெற்றுக்கொண்டிருக்கிறதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கான காரணம் யாது என்பதையும்;

(iii) இந்த விசாரணையை வழிப்படுத்தும் உத்தியோகத்தர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) மேஜர் திரு. ஜே.ஆர்.எஸ். ரூபசிங்ஹவுக்கு நியாயமொன்றைப் பெற்றுக்கொடுக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அது எவ்விதமாக என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) whether an investigation is being carried out at present against Major J.R.S. Rupasinghe of Sri Lanka Army;

(ii) if so, the reason for it; and

(iii) the names and the positions of the officers who conduct the aforesaid investigation?

(b) Will he also inform this House -

(i) whether steps will be taken to do some justice to Major J.R.S. Rupasinghe; and

(ii) if so, the manner in which it will be done?

(c) If not, why?

ගරු රුවන් විජයවර්ධන මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு ருவன் விஜயவர்தன - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)

(The Hon. Ruwan Wijayawardene - State Minister of Defence)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

(ii) මේජර් ජේ.ආර්.එස්. රූපසිංහ මහතාට එරෙහිව මේ වනවිට කිසිදු පරීක්ෂණයක් ක්‍රියාත්මක නොවන නමුත් ඔහු යුද හමුදා සේවා කාලය තුළ සිදු කරන ලද වැරදි සබැඳිව පරීක්ෂණ සිදු කර යුද හමුදා පනතට අනුව දඬුවම් ලබා දී ඇත.

(iii) අදාළ නොවේ.

(ආ) (i) අදාළ නිලධාරියා විසින් සිදු කරන ලද විනය කඩකිරීම් හේතුවෙන් ඔහුට සාධාරණයක් ඉටු කිරීමට හැකියාවක් නොමැත.

(ii) ඉහත (ආ) (i)පිළිතුරට අනුව පැන නොනඟී.

(ඇ) යුද්ධ හමුදා පනතේ අංක 116(අ), 129(1), 106(අ), 109, 120 දරන වගන්ති ප්‍රකාරව යුද හමුදාව තුළ වැරදි ගණනාවක් සිදු කර තිබීම හේතුවෙන් පරීක්ෂණ සිදු කර යුද්ධ හමුදා පනත අනුව දඬුවම් ලබා දී ඇත.

මේජර් ජේ.ආර්.එස්. රූපසිංහ 1996.12.27 දින ඔහුගේ රාජකාරී කටයුතු සබැඳිව වැරදි දත්තයන් සිය රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වෙත ඉදිරිපත් කරමින් වරදක් සිදු කිරීම සබැඳිව යුද හමුදා නීතිය අනුව ලඝු නඩු විසඳීමක් සිදු කර දඬුවමක් ලෙස තදින් තරවටු කර ඇත.

අදාළ නිලධාරි 1997.08.28 දින සිට 1997.10.06 අතර කාලය තුළ තමන්ගේ පෞද්ගලික නිවස සෑදීම සඳහා යුද හමුදා සෙබළුන් යොදා ගැනීමෙන් සිදු කරන ලද වැරදි සබැඳිව යුද හමුදා නීතිය අනුව ලඝු නඩු විසඳීමක් සිදු කර දඬුවමක් ලෙස තදින් තරවටු කර ඇත.

අදාළ නිලධාරි 2002.03.31 දින නිලධාරි උසස් කිරීමේ පරීක්ෂණ සඳහා පෙනී නොසිටීම සබැඳිව ඔහුට වසර 05ක දේශීය හා විදේශීය පාඨමාලාවන්ට සහභාගි වීම අත්හිටුවා ඇත.

තත් නිලධාරි, නිලධාරි නිවස්න උත්සවයකදී ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු සමග ගැටුමක් ඇති කර ගැනීම හේතුවෙන් 2002.06.03 වන දින යුද හමුදා නීතියට අනුව ලඝු නඩු විසඳීමක් සිදු කර අවවාද කර ඇත.

මෙම නිලධාරි සිය ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුගේ රාජකාරී උපදෙස්වලට පටහැනිව යුද හමුදා සේවයට නිසි අවසරයක් නොගෙන නොපැමිණ සිටීමේ බරපතළ වරදක් සිදු කිරීම හේතුවෙන් ලඝු නඩු විසඳීමක් සිදු කර ඔහුගේ යුද හමුදා ජ්‍යෙෂ්ඨතාව අංක 06කින් පහත දමා ඇත.

කරුණු එසේ හෙයින් මෙම නිලධාරි තෝරා ගැනීමේ මේජර් නිලය (Selected Major List) සඳහා පවත්වන ලද, යුද හමුදා මූලස්ථාන පළවන හා දෙවන මණ්ඩල විසින් නිර්දේශ නොකරන ලදී.

එහෙත් යුද හමුදා වර්යා නියෝග 05/2010 ප්‍රකාරව ඉහත පරිදි සුදුසුකම් නොලබන නිලධාරි සඳහා අවසන් අවස්ථාවක් ලබා දීම සබැඳිව සලකා බැලීම සඳහා 2014.02.26 දින යුද හමුදා මේජර් නිලය සඳහා තෝරා ගැනීමේ මණ්ඩලය වෙත විශේෂ නිර්දේශයක් මත හා තත් නිලධාරිගේ කරුණු දැක්වීම පිළිබඳ සැලකිල්ලට ගෙන අදාළ මණ්ඩලය විසින් තත් නිලධාරි මේජර් නිලය ලබා දීමට සුදුසු නිලධාරියෙකු බවට නම් කරන ලදී.

තත් නිලධාරි 2014.04.04 දින, 33 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව ඒකක අණදෙන නිලධාරි වශයෙන් රාජකාරී කරමින් සිටියදී සිය බලතල හා වරප්‍රසාද අනිසි ලෙස භාවිත

[ගරු රුවන් විජයවර්ධන මහතා]

කරමින් යුද හමුදා සෙසු නිලයන්ගේ පරිභෝජනය සඳහා යුද හමුදාව වෙතින් 33 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව ඒකකය වෙත ලබා දෙන ලද ආහාර ද්‍රව්‍ය තොගයක් සිය නිවස වෙත යුහ 49039 දරන මහේන්ද්‍රන් බොලෙරෝ කැබ් රථයෙන් රැගෙන යමින් සිටියදී ශ්‍රී ලංකා යුද හමුදා පොලිස් භේවා බලකාය වෙතින් අත් අඩංගුවට ගන්නා ලදී.

ඒ අනුව තත් නිලධාරි විසින් සිදු කරන ලද ඉහත ක්‍රියාවට ඔහු වැරදිකරුද, නිවැරදිකරුද යන්න තීරණය කිරීම සඳහා සිදු කරනු ලබන මූලික පරීක්ෂණ උසාවිය අවසන් වනතුරු මෙම නිලධාරි 2015.07.01 සිට 2016.06.30 දින දක්වා වැටුප් රහිතව සක්‍රීය සේවයෙන් මුදවා හැර ඇත. ඒ සඳහා පැවති යුද හමුදා පරීක්ෂණය 2015.08.18 දින අවසන් කරමින් යුද හමුදාධිපති නිගමනය ලබා දී ඇති අතර, එහිදී එම නිලධාරි වරදකරුවීම හේතුවෙන් 2015.10.01 දින නැවත යුද හමුදා සේවයට කැඳවා 2015.10.30 දින යුද හමුදා පිළිවෙතට අනුව දඬුවමක් ලෙස තදින් තරවටු කර ඇත. මේ වන විට 2016.07.01 දින සිට 2016.12.31 දක්වා වැටුප් රහිතව සක්‍රීය සේවයෙන් මුදවා හැර ඇත.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ නිලධාරියා කරපු වැරැදි සම්බන්ධයෙන් නඩුවක තීන්දුවක් එනතුරු ඉන්නවාය කියලා ගරු රාජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරේදී සඳහන් කරන්නට යෙදුණා. ශ්‍රී ලංකා යුද හමුදාවේ සෘජුවම එහෙම වැරැදි කරපු නිලධාරීන් සිටිනවා. ඒ වාගේම පළිගැනීම සඳහා වුවමනා නම් චෝදනා හදලා යම් කෙනෙක්ව සම්පූර්ණයෙන්ම හමුදා ජීවිතයෙන් නෙරපන්නත් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරන්න පුළුවන්. ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මැතිතුමාට සිදු වුණු දේ අපි දන්නවා. අපේ වර්තමාන යහ පාලන ආණ්ඩුව තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ හමුදාව තුළ විනය ඇති කිරීම වාගේම හමුදා නිලධාරීන් තුළ තෘප්තිය ඇති කිරීමයි. සමහර විට නිලධාරීන්ට හිතා මතා චේතනාන්විතව අසාධාරණකම් කිරීමට එරෙහිව ක්‍රියාත්මක වෙන්න අමාත්‍යාංශයට නැවුම් වූ අලුත් දැක්මක් තිබෙනවාද කියලා මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු රුවන් විජයවර්ධන මහතා
(මාණ්පුමිකු රුවන් විජයවර්තන)
(The Hon. Ruwan Wijayawardhana)

ගරු කථානායකතුමනි, එවැනි අවස්ථා තිබෙනවා නම් අනිවාර්යයෙන්ම ඒ ගැන අපිට බලන්න පුළුවන්. එතුමාට අසාධාරණයක් වෙලා තිබෙනවාය කියලා මෙතුමා කියනවා නම්, අපිට ඒ පිළිබඳව ලිඛිතව දැනුම් දෙන්න. හමුදාපතිතුමාත් සමඟ ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා, නැවත පරීක්ෂණයක් පවත්වන්නට මට කටයුතු කරන්න පුළුවන්. නමුත් මම හිතන හැටියට අවුරුදු ගණනාවක් තිස්සේ මෙතුමාට විවිධාකාර චෝදනා පැන නැඟිලා තිබෙනවා. පළිගැනීමක් හැටියට නම් මට මේක පෙනෙන්නේ නැහැ. නමුත් එතුමා කියනවා නම්, එවැනි අසාධාරණයක් වෙලා තිබෙනවා කියා, ආපසු ඒ ගැන පරීක්ෂා කර බලන්න අපට පුළුවන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාත් දන්නවා, මා මේ ගරු සභාවේදී මීට කලින් ත්‍රිවිධ හමුදාවට ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳව කථා කළ බව සහ ඒ පිළිබඳව ඔබතුමාත් දැනුවත් කළ බව. විශේෂයෙන් යුද හමුදාවට ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුවට අදාළව එක්තරා මේජර්වරයකු පිළිබඳ තොරතුරු අප ඉතා පැහැදිලිව සනාථ කළා. හැබැයි, මේ ගරු සභාවේ ඒ ගැන කථා කරලා, තොරතුරු සභාගත කරලා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබියදීත් අද වන කල් ඒ මේජර්වරයා -මේජර් රසික පණ්ඩිතරත්න නිලධාරියා- සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයකට යුද හමුදාව ගිහින් නැහැ. මෙහිදී එක් විධියකටත්, පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීවරයකු ඉදිරිපත් කරපු කරුණු සම්බන්ධයෙන් තවත් විධියකටත් ආදී වශයෙන් දෙයාකාරයකට සලකන්නේ ඇයි? මේ පිළිබඳව ඔබතුමා සොයා බලනවාද, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි?

ගරු රුවන් විජයවර්ධන මහතා
(මාණ්පුමිකු රුවන් විජයවර්තන)
(The Hon. Ruwan Wijayawardhana)

අනිවාර්යයෙන් ඒ ගැන සොයා බලනවා. ඔබතුමා එදා අපට ලබා දුන් ඒ විස්තර ඔක්කෝම අපි හමුදාපතිතුමාට යොමු කළා. හමුදාපතිතුමා සමඟත් අපි එදා ඒ ගැන සාකච්ඡා කළා. මා දන්නා තරමින් යුද හමුදාපතිතුමා ඒ සම්බන්ධවත් පරීක්ෂණයක් පැවැත්වූවා. ඒ ගැනත් විස්තර ටික අරගෙන මා ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙසේයි.

යුදමය වාතාවරණයක් නැති මේ වකවානුවේ ශ්‍රී ලංකා යුද හමුදාවේ නිලධාරීන්ට ක්‍රියාන්විත සේවයක් නැහැ. යුද මානසිකත්වය තුළ සහ හදිසි ආපදාවලදී පමණක් නොව විශේෂයෙන් ජනතාවගේ ප්‍රජා සංවර්ධන ක්‍රියා දාමය තුළත් ඔවුන් සම බරව ක්‍රියාවේ යොදවාගන්න අමාත්‍යාංශයට තිබෙන දැක්ම මොකක්ද?

ගරු රුවන් විජයවර්ධන මහතා
(මාණ්පුමිකු රුවන් විජයවර්තන)
(The Hon. Ruwan Wijayawardhana)

අපි දැනට ඒ වැඩ කටයුතු දිගටම කරගෙන යනවා, ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් ඔබතුමා සඳහන් කළා වාගේම විවිධ ආපදා අවස්ථාවලදී පමණක් නොව, ආණ්ඩුව විධියට ප්‍රජා සත්කාර සඳහාත් එතුමන්ලා යොදවාගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා නම් අපි ඒ කටයුත්ත කරනවා. දැනටමත් එතුමන්ලා එවැනි වැඩ කටයුතු ගොඩක් කරනවා. විශේෂයෙන් ජාතික ආණ්ඩුවක් හැටියට අප සංහිඳියාව ඇති කරන මේ අවස්ථාවේදී අපේ ත්‍රිවිධ හමුදාව උතුර නැඟෙනහිර ජනතාවගේ ජීවිත යථා තත්ත්වයට ගෙන ඒමට ඉතාම විශිෂ්ට මෙහෙවරක් කරනවා. එවැනි ප්‍රජා සත්කාර ගණනාවක් අපේ යුද හමුදාව කරනවා. ඊටත් අමතරව, ලේ බැංකුවට ලේ දන් දීම ආදී විවිධාකාර වැඩසටහන් ත්‍රිවිධ හමුදාව කරගෙන යනවා. අපි ඒ වැඩසටහන් අනිවාර්යයෙන් ඉදිරියට කරගෙන යනවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, බාධා කළාට සමාවන්න. ජූලි මාසයේ පළමුවැනි පාර්ලිමේන්තු සතියේ ඒ පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේදී විමසුමට ගත්තා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ප්‍රශ්නය අහලා ඉවර වුණාට පසුව ඒ කාරණය ගනිමු, ගරු මන්ත්‍රීතුමා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
එසේ ඒ පෙත්සම විමසුමට ගත් වෙලාවේ එම අවස්ථාවට යුද හමුදා නිලධාරීන් ඇවිත් සිටියා; පෙත්සම්කරුත් ඇවිත් සිටියා. එතැනදී ඔහු අහපු එකම ප්‍රශ්නයකට හෝ උත්තර දෙන්න එතුමන්ලා අසමත් වුණා. ඒ නිසා මේ පිළිබඳව ස්වාධීන පරීක්ෂණයක් නැවත පවත්වා ඔහුට සාධාරණයක් ඉෂ්ට කරනවා කියා ඔවුන් එදා පොරොන්දු වෙලා ගියා. මා හිතන හැටියට ඒ සම්බන්ධයෙන් මහජන පෙත්සම් කාරක සභාව මඟින් මේ ගරු සභාව දැනුවත් කෙරිලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන්නේ, පණ්ඩිතරත්න කියන නිලධාරියා සම්බන්ධයෙන්ද?

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මේජර් රූපසිංහ සම්බන්ධයෙන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු රුවන් විජයවර්ධන මහතා
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardhana)
මා ඒ ගැන හමුදාපතිතුමා සමඟ සාකච්ඡා කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14-611/'16-(1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය : බිඳ වැටීම්
நுரைச்சோலை அனல் மின்னுற்பத்தி நிலையம் : செயலிழப்புகள்
NOROCHCHOLAI THERMAL POWER STATION: BREAKDOWNS

627/'16

15.ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසු ගිය වර්ෂය තුළ නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ බිඳ වැටීම් සිදු වූ අවස්ථා සංඛ්‍යාව කොපමණද;
(ii) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ආරම්භයේ සිට මේ දක්වා සිදු වූ බිඳ වැටීම් සංඛ්‍යාව කොපමණද;
(iii) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය රටේ සමස්ත විදුලි අවශ්‍යතාවෙන් කොපමණ ප්‍රතිශතයක් ලබා දෙන්නේද; එම ඒකක සංඛ්‍යාව කොපමණද;
(iv) තාප විදුලි බලාගාරයක් මත රටේ ජාතික විදුලි නිෂ්පාදනයට යැපීමට සිදු වීම අවදානම්සහගත කටයුත්තක් නොවේද;
(v) නො එසේ නම්, එය පැහැදිලි කරන්නේද;
(vi) එම අවදානමෙන් මිදීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

මින්වලු මත්‍රුම් පුදුප්පික්කත්තක්ක සක්ති අමෛච්චරෛක් කේට්ට විනා:

(ஆ) (i) කඩන්ත ආණ්ඩු නුරෛච්චෝලෛ අනල් මින් උර්පත්ති නිලෛයත්තින් නඩවඩික්කෛකළ් තඩෛප් පට්ට චන්තර්ප්පංකළින් එණ්ණික්කෛ එත්තනෛ;
(ii) නුරෛච්චෝලෛ අනල් මින්නුර්පත්ති නිලෛයම් ආරම්භික්කප්පට්ටතු මුතල් ඉතුවරෛ අතන් නඩවඩික්කෛකළිල් ඉඩම්පෙර්රුළ්ළ තඩෛකළින් එණ්ණික්කෛ එත්තනෛ;
(iii) නුරෛච්චෝලෛ අනල් මින්නුර්පත්ති නිලෛයම් නාට්ටින් ඔට්ටුමොත්ත මින්චාරත් තේවෛයිල් එත්තනෛ චතවීතත්තෛප් පෙර්රුක්කොටුක්කින්රතු එන්පතෛයුම්; මර්රුම් මේර්පඩි අලකුකළින් එණ්ණික්කෛ එත්තනෛ;
(iv) අනල් මින්නුර්පත්ති නිලෛයමොන්රිල් නාට්ටින් තේචිය මින්නුර්පත්ති තංකියිරුක්ක වේණ්ඩියේර්පට්ටුළ්ළමෛ අපායකරමාන චෙයල් අල්ලවා;
(v) ඉන්රේල්, අතනෛ තෙළිවුපටුත්තුවාරා;
(vi) ඉන්ත අපායත්තිලිරුන්තු විටුපටුවතර්කු එටුක්කප් පටවුළ්ළ නඩවඩික්කෛකළ් යාවෛ;

එන්පතෛ අවර් ඉච්චපෛක්කු අර්විවිප්පාරා?

(ஆ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House -

(i) how many times breakdowns occurred at the Norochcholai Thermal Power Station during the past year;

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

(ii) how many times breakdowns occurred at the Norochcholai Thermal Power Station from its inauguration up to now;

(iii) what percentage of country's overall power need is met by the Norochcholai Thermal Power Station and how many units it amounts to;

(iv) whether it is not a risky thing for the country to depend on a thermal power station for its national power need;

(v) if it is not, why it is not risky; and

(vi) if it is, what steps will be taken to avoid that risk?

(b) If not, why?

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2015 වර්ෂය තුළදී නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ ක්‍රියාත්මක වූ ජනක යන්ත්‍ර තුන පහත අයුරින් බිඳ වැටී තිබුණි.

ජනක යන්ත්‍ර 1 - බිඳ වැටීම් 1

ජනක යන්ත්‍ර 2 - බිඳ වැටීම් 6

ජනක යන්ත්‍ර 3 - බිඳ වැටීම් 6

(ii) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ ආරම්භයේ සිට මේ දක්වා සිදුවූ බිඳ වැටීම් සංඛ්‍යාව පහතින් දක්වා ඇති පරිදි වේ.

ජනක යන්ත්‍ර 1 - බිඳ වැටීම් 33

ජනක යන්ත්‍ර 2 - බිඳ වැටීම් 17

ජනක යන්ත්‍ර 3 - බිඳ වැටීම් 8

(iii) 2015 වර්ෂයේදී නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය රටේ සමස්ත විදුලි අවශ්‍යතාවෙන් සියයට 34ක් නිෂ්පාදනය කර ඇත. එය 4,457GWhකි.

(iv) ඇත්ත වශයෙන්ම එක් බලාගාරයක් (තාප විදුලි බලාගාර හෝ ජල විදුලි බලාගාර හෝ වෙනත් මොනයම් ආකාරයක විදුලි බලාගාරයකින්) මත ජාතික විදුලි සැපයීම සිදු නොවේ. මුළු අවශ්‍යතාවෙන් වැඩි ප්‍රතිශතයක් දැනට ලක් විජය බලාගාරයෙන් ජාතික පද්ධතියට ලබා දීම සිදු කරන අතර, එම හේතුවෙන් මුළු බලාගාරයම අක්‍රිය වන තත්ත්වයක් යටතේ විදුලි බල සැපයුමට දැනට යම් ආකාරයක අවදානමක් ඇතැයි සැලකිය හැක.

කෙසේ නමුත් විදුලි බල පද්ධතියේ විකාශනය සමඟ ඉල්ලුම සැපයීම සඳහා ජනන ප්‍රභවයන් මිශ්‍රණයක් (තාප/සුළං/හිරු එළිය/පෙව ස්කන්ධ/ද්‍රව ස්වාභාවික ගෑස් - LNG) ස්ථාපනය කිරීමට සැලසුම් කෙරෙන අතර එමඟින් ඉහත දැක්වූ අවදානම අවම කර ගැනීමට අපේක්ෂා කෙරේ.

(v) අදාළ නොවේ.

(vi) අනාගතයේදී ඉදි කිරීමට සැලසුම් කර ඇති ජල විදුලි යෝජනා ක්‍රම වන බ්‍රෝඩ්ලන්ඩ්ස්, උමාඔය, මොරගහකන්ද, මොරගොල්ල, මන්නාරම සුළං බලාගාරය සහ ඉදිරියේදී ඉදි කිරීමට යෝජිත ද්‍රව ස්වාභාවික ගෑස් (LNG), ගල් අඟුරු බලාගාර ආදී ව්‍යාපෘති නිසි කලට ඉදි කර විදුලිය ජනනය කිරීම තුළින් රට පුරා විසිරී පවතින ජනන පද්ධතිය තවදුරටත් පුළුල් කළ හැකි වන අතර, එමඟින් ජනන පද්ධතියේ ජනන හැකියාව එනම්, විවිධ ප්‍රදේශවල සිට පැතිරුණු විදුලි ජනනය තවදුරටත් වර්ධනය වනු ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මෙගාවොට් 1,200ක ධාරිතාවකින් යුක්ත අධි තාක්ෂණික ගල් අඟුරු බලාගාරයක් හඳන්න දීර්ඝ කාලීන අඩු පොලී ණයක් ජපානය යෝජනා කළ බව අපි දන්නවා. ඩොලර් මිලියන 300ට ජපානය යෝජනා කරපු ඒ ව්‍යාපෘතිය එහෙම තියෙද්දි තමයි, පසු ගිය ආණ්ඩුව ඩොලර් මිලියන 450කට චීනයත් එක්ක මේ ගිවිසුම අත්සන් කළේ. මේ බිඳ වැටීම් සංඛ්‍යාව සම්බන්ධයෙන් මගේ ළඟ තිබෙන තොරතුරුවලට වඩා වැඩි ගණනක් තමයි ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වේ. මම දන්නා තරමට විදුලිය බිඳ වැටීමකදී එක ජනන යන්ත්‍රයක් පණ ගන්වන්න රුපියල් මිලියන 26ක් වැය වනවා. නොරොච්චෝලේ බලාගාරය හදපු දවසේ සිට මේ ගෙවුණු අවුරුදු ගණන ඇතුළත මම හිතන විධියට රුපියල් බිලියනයකට වඩා අපට පාඩු වෙලා තිබෙනවා. මේ කාලය තුළ සිදු වූ විදුලිය බිඳ වැටීම්වලදී මේ විදුලි ජනන යන්ත්‍ර නැවත පණ ගන්වන්න වැය වූ මුදල ඔබතුමාට කියන්න පුළුවන්ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

එක් එක් බිඳ වැටීම සහ එක් එක් බිඳ වැටීම නිසා යථා තත්ත්වයට පත් කිරීමට වියදම් වූ මුදල අපි ගණනය කර නැහැ. නමුත්, ඔබතුමා කියන එකේ යම් සත්‍යතාවක් තිබෙනවා. යම් හෙයකින් විදුලි ජනන යන්ත්‍රයක ක්‍රියාකාරිත්වය සම්පූර්ණ වශයෙන් නතර වුණොත්, එය බලගැන්වීම සඳහා විශේෂ ක්‍රියාදාමයක් තිබෙනවා. ඒ ගල් අඟුරු විදුලි බලාගාරවල ස්වභාවය. ඒ වාගේම ඒ සඳහා සැලකිය යුතු කාලයක් ද ගත වනවා. ඒ නිසා අපට ඒ සඳහා සැලකිය යුතු වියදමක් දරන්නත් සිදුවනවා. හැබැයි, ඒ ගල් අඟුරු බලාගාරවලට අනන්‍ය වූ ක්‍රමවේදයක් තිබෙන නිසායි. කොහොම වුණත්, විශේෂයෙන්ම මේ යන්ත්‍ර තුනෙන් පළමුවැනි යන්ත්‍රය විශාල වශයෙන් ගැටලු සහගත බව පිළිගන්නවා. නමුත්, දෙවෙනි සහ තුන්වෙනි යන්ත්‍ර වඩාත් හොඳ මට්ටමකින් ක්‍රියා කරන බවත් කියන්න අවශ්‍යයි.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සාමාන්‍යයෙන් විදුලි බලය බිඳ වැටුණාට පස්සේ මෙගාවොට් 90ක් සහ 110ක් වන තෙක් මේ යන්ත්‍ර පණ ගන්වන්න ඩීසල් වැය වනවා. එතැනදී විශාල පාඩුවක් වෙලා තිබෙනවා. මේ හරහා වන පාඩුව කොපමණද කියලා මේ රටේ ජනතාව දැනගන්න ඕනෑ. මම දන්නා තරමට මේ ගෙවුණු අවුරුදු නවයක කාලය තුළ දින 271ක් මේ බලාගාරය වැඩ කරලා නැහැ. ඒ, විටින් විට වූ බිඳ වැටීම් නිසා. එහිදී ඒ වෙනුවට විකල්ප පාවිච්චි කළා. ඩීසල්වලින් විදුලි බලය නිෂ්පාදනය කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ පිළිබඳව ගණනය කිරීම් කරලා මේ සභාවටත්, මේ රටටත් ඒ තොරතුරු පෙන්වන්න. ඔබතුමා මේ නොරොච්චෝලේ බලාගාරයෙන් වූ වාසිය පෙන්වන අතර, මේ තුළින් වෙලා තිබෙන අවාසියත් පෙන්වන්න කියලා මම

ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද හේතුව, ජපානය වාගේ අධි තාක්ෂණික ගල් අඟුරු බලාගාර තිබෙන රටවලුත් දැන් ගල් අඟුරුවලින් ඈත් වනවා. ඉදිරි කාලයේදී කරන්න යන වැඩසටහන සම්බන්ධව ඔබතුමා ඉදිරිපත් කළ යෝජනාවට මම ස්තුතිවන්ත වනවා. නමුත්, මේ වුණු පාඩුව සහ එතැනින් එහාට ගිහිල්ලා මේකෙන් හොරකම් කරපු ගණනක් කියන්න පුළුවන් නම් හොඳයි. ඒක කියන්න බැරි නම්, වෙලා තිබෙන පාඩුවවත් ඉදිරි කාලයේදී මේ සභාවටත්, රටටත් දැනුම් දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයෙන් එම බලාගාරයට අදාළව නිශ්චිතව ඒ එක් එක් කරුණ ගැන විමසුවා නම්, ඒ හා සම්බන්ධව ගණනය කරන්න පුළුවන්කම තිබුණා. නමුත්, මා ඔබතුමාට කියන්න අවශ්‍යයි ගල් අඟුරු මේ රටේ භාවිත කරනවාද, නැද්ද කියන කාරණය ගැන විශේෂඥ කමිටුවක් විසින් මේ අවස්ථාව වන විට පරීක්ෂණ කරමින් පවතින බව. දැන් අපට නොරොච්චෝලේ බලාගාරය වසා දමන්න පුළුවන්කමක් නැහැ. අපට ඒක උරුම වෙලායි තිබෙන්නේ. ඒ නිසා නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය වඩාත් හොඳට, පරිසරය වඩාත් හොඳින් ආරක්ෂා වන ආකාරයට, වඩාත් ලාභදායී විධියට පවත්වා ගෙන යෑමට අවශ්‍ය කරන සෑම ක්‍රමවේදයක්ම අපි අනුගමනය කරනවා. ඔබතුමා කිව්වා දින දෙසිය හැත්තෑගණනක් වසා දැමීම පිළිබඳ කාරණය. එසේ වුණේ යන්ත්‍රවල දෝෂ නිසා පමණක් නොවෙයි, ගල් අඟුරු සැපයීම අඛණ්ඩව කරන්න බැරි වුණු නිසායි; ගල් අඟුරු සැපයීම භාරව හිටපු නොබෙල් සමාගම ඒ වගකීම ඉෂ්ට නොකරපු නිසායි. ඒ වාගේම ගල් අඟුරු හා සම්බන්ධව මතු වුණු ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රශ්න නිසායි. ඒ නිසාත් රටට විශාල මුදලක් අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගල් අඟුරු පිළිබඳ ප්‍රශ්නය ඉතා සංකීර්ණ එකක්. ඒ වාගේම රටේ අනාගතයේ බලශක්ති උත්පාදන ක්‍රමවේදයක් විධියට ගල් අඟුරු භාවිත කළ යුතු ද, නැද්ද කියන කාරණය පිළිබඳ උපදෙස් ගැනීමට ආර්ථික අනුකාරක සභාව විසින් පත් කර තිබෙනවා විශේෂඥ කමිටුවක්. ඒවා පිළිබඳව තීරණය කිරීමට දේශපාලනඥයන්ට දැනුම නැහැ. ඒ විශේෂඥ කමිටුවේ වාර්තාව ආවාට පස්සේ, ගල් අඟුරු භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ඉදිරියේදී ගන්නවා කියන කාරණය කියන්න ඕනෑ. ඒ තීරණ ගන්නේ ව්‍යක්තිකයන්ගේ තීරණ මත. ඒ වාගේම ඔවුන් විදුලිබල මණ්ඩලය සහ අමාත්‍යාංශයෙන් පරිබාහිර, ගරු අග්‍රාමාත්‍යතුමා විසින් නම් කරපු නියම ව්‍යක්තිකයන්. ඔවුන්ගේ තීරණය අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා, අනාගත ගල් අඟුරු භාවිතය පිළිබඳව.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ඒ නිලධාරීන් නැති එක නම් හොඳයි.

ළමා අපචාර පිළිබඳ පරීක්ෂණ: විස්තර
சிறுவர் துஷ்பிரயோகம் தொடர்பான விசாரணைகள் : விபரம்
INVESTIGATIONS INTO CHILD ABUSE CASES: DETAILS

488/'16

2. ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා (ගරු කනක හේරත් මහතා වෙනුවට)
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட - மாண்புமிகு கனக ஹேரத் சார்பாக)
(The Hon. Bandula Lal Bandarigoda on behalf of the Hon. Kanaka Herath)

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ දිවයිනෙන් වාර්තා වූ ළමා අපචාර සිද්ධි සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිද්ධිවලට සම්බන්ධ සැකකරුවන් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වැරදිකරුවන්ට නීත්‍යානුකූලව දඬුවම් කර තිබේද;

(iii) පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි වූ සිද්ධි ඉතිරිව තිබේද;

(iv) එසේ නම්, එම පරීක්ෂණ කඩිනම් කිරීමට යම් ක්‍රියා මාර්ගයක් ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015 ஆம் ஆண்டில் நாட்டில் அறிக்கையிடப் பட்ட சிறுவர் துஷ்பிரயோக சம்பவங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி சம்பவங்களுடன் தொடர்புடைய சந்தேக நபர்களைப் பற்றிய விசாரணைகள் மேற் கொள்ளப்பட்டு குற்றவாளிகளுக்குச் சட்டரீதி யாக தண்டனை வழங்கப்பட்டுள்ளதா என்ப தையும்;

(iii) விசாரணைகள் மேற்கொள்ளப்பட்டு சட்ட ரீதியாக நடவடிக்கை மேற்கொள்ள இயலாமல் போன சம்பவங்கள் எஞ்சியுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி விசாரணைகளைத் துரிதப் படுத்துவதற்கு ஏதேனும் நடவடிக்கை மேற் கொள்வாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Women and Child Affairs:

(a) Will she inform this House -

(i) the number of child abuse cases reported in the country in year 2015;

(ii) whether investigations have been carried out regarding suspects of the aforesaid cases and offenders have been lawfully punished;

(iii) whether there are incidents regarding which action could not be taken according to the law after conducting investigations; and

(iv) if so, whether some action will be taken to expedite these investigations?

(b) If not, why?

ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය (කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Chandrani Bandara - Minister of Women and Child Affairs)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත වාර්තා වීම් 10732

(ii) නැත.

[ගරු වන්දානි බණ්ඩාර මහත්මිය]

(ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත වාර්තා වූ පැමිණිලිවලින් අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන අංශයට යොමු වී ඇති පැමිණිලි අතුරින් පැමිණිලි 74ක් සඳහා නඩු පවරා ඇති අතර ඊට අදාළව නඩු කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. පැමිණිලි 06ක ගොනු නීතිපති උපදෙස් සඳහා යොමු කර ඇත.)

(iii) ඔව්.

(ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත 1929 ළමා උපකාරක සේවය මඟින් සහ පැමිණිලිකරුවන් විසින් සිදු කරනු ලබන සෘජු පැමිණිලි, ෆැක්ස් සහ ලිපි මඟින් පැමිණිලි යොමු කරනු ලැබේ. මේ අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය වෙත පැමිණිලිකරුවන් විසින් යොමු කරන ලද සෘජු පැමිණිලි ගණන 176ක් වන අතර, එම සියලු පැමිණිලිවලට අදාළ විමර්ශන සිදු කර ඇත. 1929 ළමා උපකාරක සේවය සහ ලිපි මඟින් අධිකාරිය වෙත පැමිණිලි 6889ක් යොමු වී ඇති අතර ඉන් පැමිණිලි 14ක් අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය මඟින් සෘජුව විමර්ශනය කර ඇත. උක්ත පැමිණිලි 6889 අතුරින් පැමිණිලි 6875ක් විමර්ශනය කිරීම සඳහා ප්‍රාදේශීය පොලිස් ස්ථාන වෙත බැහැර කර ඇති අතර ඉන් පැමිණිලි 4875ක් සඳහා විමර්ශන සිදු කර වාර්තා අධිකාරිය වෙත යොමු කර ඇත. ඉන් පැමිණිලි 2000කට අදාළව විමර්ශන වාර්තා අධිකාරිය වෙත යොමු වී නොමැත.)

(iv) පොලිස්පතිවරයා සහ අධ්‍යක්ෂ ළමා හා කාන්තා කාර්යාංශය හරහා අදාළ පොලිස් අධිකාරිවරුන් දැනුවත් කර විමර්ශන කටයුතු කඩිනම් කිරීමට සහ විමර්ශනවාර්තා කඩිනමින් අධිකාරිය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කිරීම.

(ආ) පැන නොනඟී.

දඹදිව වන්දනා චාරිකා සංවිධාන කරන ආයතන: නියාමනය

தம்பதிவ யாத்திரையை ஒழுங்குசெய்யும்

நிறுவனங்கள் : ஒழுங்குமுறைப்படுத்தல்

AGENCIES ORGANIZING DAMBADIVA PILGRIMAGE TOURS: MONITORING

600/'16

13. ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා (ගරු ලකී ජයවර්ධන මහතා වෙනුවට)

(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட - மாண்புமிகு லக்கி ஜயவர்தன சார்பாக)

(The Hon. Bandula Lal Bandarigoda on behalf of the Hon. Lucky Jayawardana)

බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දඹදිව වන්දනා චාරිකා සංවිධානය කරන ආයතන විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බවත්;

(ii) එකී සමහර ආයතන මඟින් විදෙස් ගත වන වන්දනාකරුවන්ගේ සුරක්ෂිතභාවය පිළිබඳව නිසි ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකරන බවත්;

(iii) එම නිසා බැතිමතුන් මහත් අසීරුතාවට පත්වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දඹදිව පූජා භූමි වන්දනා කිරීම සඳහා වසරකට සහභාගි වන වන්දනාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) විදෙස් ගතවන ශ්‍රී ලාංකික වන්දනාකරුවන්ගේ සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා වන්දනා චාරිකා සංවිධානය කරන ආයතන නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකසන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

புத்தசாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தம்பதிவ யாத்திரைகளை ஒழுங்கு செய்யும் ஏராளமான நிறுவனங்கள் இலங்கையினுள் இயங்கி வருகின்றன என்பதையும்;

(ii) மேற்குறிப்பிட்ட சில நிறுவனங்கள் மூலம் வெளிநாடு செல்லும் யாத்திரிகர்களின் பாது காப்பு தொடர்பில் உரிய வழிமுறைகள் பின்பற்றப்படுவதில்லை என்பதையும்;

(iii) இதனால் பக்தர்கள் பெரும் சிரமங்களுக்கு உள்ளாகின்றார்கள் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்கிறாரா?

(ஆ) (i) தம்பதிவ புனித தலங்களை தரிசிப்பதற்காக ஓர் ஆண்டினுள் பங்குபற்றும் யாத்திரிகர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) வெளிநாடு செல்லும் இலங்கை யாத்திரிகர் களின் பாதுகாப்பை உறுதிப்படுத்துவதற்காக, யாத்திரைகளை ஒழுங்கு செய்யும் நிறுவனங் களின் ஒழுங்குமுறைப்படுத்தலுக்கு முறைசார்ந்த செயன்முறையொன்றை தயாரிப்பாரா என்ப தையும்;

(iii) ஆமெனில், அத் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana:

(a) Will he admit that -

(i) a large number of agencies which organize pilgrimage tours to Dambadiva are operating in Sri Lanka;

(ii) some of such agencies do not make appropriate arrangements to ensure the safety of the pilgrims who go on pilgrimages overseas; and

(iii) devotees experience serious difficulties due to this reason?

(b) Will he inform this House-

(i) the number of pilgrims who go on pilgrimages to visit the sacred places in Dambadiva annually;

(ii) whether a proper methodology will be developed to monitor the agencies that organize pilgrimages in order to ensure the safety of the pilgrims who go on pilgrimages overseas; and

(iii) if so, the date on which such methodology will be developed?

(c) If not, why?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Minister of Buddhasasana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) (i) දඹදිව පූජා භූමි වන්දනා කිරීම සඳහා වසරකට සහභාගි වන වන්දනාකරුවන් අවුරුද්දෙන් අවුරුද්ද වෙනස් වේ.

අවුරුද්ද	සහභාගී වූ වන්දනාකරුවන් සංඛ්‍යාව
2015	31075
2014	24684
2013	20178

(ii) ශ්‍රී ලාංකික වන්දනාකරුවන්ගේ සුරක්ෂිතභාවය සහතික කිරීමට දැනටමත් විධිමත් ක්‍රමවේදයක් සකස් කර ඇත. දඹදිව වන්දනා වාරිකා සංවිධානය කරනු ලබන ආයතන ලියාපදිංචි කරගනු ලබන අවස්ථාවේ සම්පූර්ණ කළ යුතු සුදුසුකම් පිළිබඳ උපදෙස් සහිත අයදුම්පත හා දිවුරුම් ප්‍රකාශයේ පිටපතක් අමුණා ඇත. - (ඇමුණුම්* 1 සිට 6 දක්වා)

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I
පරංගි ආරු ජලය පාලි ආරුවට හැරවීම
பறங்கியாற்று நீரைப் பாலியாற்றுக்குத் திருப்புதல்
DIVERSION OF WATER FROM PARANGI ARU TO PALI ARU

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 23 (2)இன் கீழ் நீர்ப்பாசன மற்றும் நீர்வளமூல முகாமைத்துவ அமைச்சர் அவர்களிடம் எனது கேள்வியைக் கேட்க அனுமதித்ததற்கு நன்றி.

வடக்கு மாகாணத்தில் மன்னார் மாவட்டத்தை அண்டியுள்ள பறங்கியாற்றிலிருந்து நீரினை கால்வாயினூடாக பாலியாற்றுடன் இணைப்பதன்மூலம் மாங்குளம், வவுனிக்குளம், கொள்ளாவிலன்குளம், கல்விலன்குளம், மல்லாவிக் குளம் போன்ற பாரிய குளங்கள் பயனடையும். இத்திட்டத்தை நடைமுறைப்படுத்துவதன்மூலம் மாங்குளம், மன்னாரின் ஒரு பகுதி, மற்றும் கிளிநொச்சி மட்டுமன்றி, யாழ்ப்பாணத்தின் ஒரு பகுதி மக்களினதும் குடிநீர்ப் பிரச்சினையானது தீர்க்கப் படுவதுடன் விவசாயம், கால்நடை அபிவிருத்தி மற்றும் அதற்கேற்ற மேய்ச்சல் தரை உருவாக்கம் என்பனவும் ஊக்குவிக்கப்படும். நிலத்தடி நீர் வளம் மேம்படுத்தப்படும். இதனால் மக்களின் வாழ்வாதாரத்தை உயர்த்தக்கூடியதாக இருப்பதுடன், வட மாகாணப் பிரதேசங்கள் பொருளாதார ரீதியில் முக்கிய பங்கினை வகிப்பதற்கும் அதனூடாகத் தேசிய பொருளாதாரத்திற்குப் பங்களிப்பினை வழங்குவதற்கும் வழிவகுக்கும்.

ஆரம்பத்தில் பாலியாற்றுத் திட்டமானது எமது நாட்டின் மகாவலி திட்டத்திற்குள் உள்வாங்கப்பட்டிருந்தது. இத் திட்டத்தினை நடைமுறைப்படுத்தும்போது 30,000 எக்கர ளவில் காடழிப்பு இடம்பெறுவதற்கான சாத்தியப்பாடுகள் காணப்படுகின்றமையினால் அது சுற்றுச்சூழல் தாக்கத்தினை ஏற்படுத்துமென்ற வகையில் இத்திட்டமானது நடைமுறைப் படுத்தப்படவில்லை. ஆனால், இத்திட்டத்திற்கு மாற்றீடாகப் பறங்கியாற்றிலிருந்து கால்வாய் அமைத்துப் பாலியாற்றுக்கு நீரைக் கொண்டுவருவதன்மூலம் வட மாகாணத்தின் ஒரு கணிசமான பகுதி சிறந்த முறையில் அபிவிருத்தியடைய முடியும். குறிப்பாக சுற்றுச்சூழல் தாக்கத்தினைத் தவிர்க்கும் வகையிலேயே இப் பாலியாற்றுத் திட்டத்தினை நான் முன்மொழிகின்றேன்.

கடந்த காலப்பகுதியில் இத்திட்டமானது முன்மொழியப்பட்டிருப்பினும் இதுவரை நடைமுறைப்படுத்தப்படாதது மிகவும் வேதனையளிக்கின்றது. "ஒரு துளி நீரேனும் பயன்படுத்தப்படாமல் கடலைச் சென்றடையக்கூடாது" என்ற பராக்கிரமபாகு மன்னனின் கூற்றுக்கு மாறாக, இங்கு நீர் வளமானது விவசாயத்திற்கேனும் பயன்படாமல் மன்னார்க் கடலுக்குள்ளேயே சென்றுகொண்டிருக்கின்றது. இதனால் பெருமளவு நிலங்கள் இன்றுவரை தரிசு நிலங்களாகவே காணப்படுகின்றன. இத்திட்டம் தொடர்பில் ஏற்கெனவே மேற்கொள்ளப்பட்ட திட்ட மதிப்பீட்டு அறிக்கையை இங்கு தருகின்றேன்.

பாலியாற்றுத் திட்டத்தின் திட்ட மதிப்பீடு

பாலியாற்றுத் திட்டத்தின் புனரமைப்புக்கென முன்மொழியப்பட்ட செலவினங்கள் (ரூபாய்)	
பறங்கியாற்றுக்கு குறுக்காக அணைக்கட்டை அமைத்து பாலமோட்டைக்கு நீரைத் திருப்பி வாய்க்கால்மூலம் கொண்டுசெல்லல்	100 மில்லியன்
வவுனிக்குளத்தைப் புனரமைப்பதுடன் பாரிய கதவுடன்கூடிய கலிங்கு மற்றும் வாய்க்கால்களையும் புனரமைத்தல்	400 மில்லியன்
வவுனிக்குளத்துக்குக் கீழ் பாலியாற் றுக்குக் குறுக்கே அணைக்கட்டைக் கட்டுவதனூடாக நீரைச் சேமித்தல்	100 மில்லியன்
பாலியாற்றின் அனைத்து நடுத்தர மற்றும் சிறிய குளங்களைப் புனரமைத்தல்	98 மில்லியன்
மொத்தம்	**698 மில்லியன்**

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

ආකවේ, -

පාලියාත්‍රුත් තිට්ටත්තෙ මුන්නෙටුක්කක්කූටිය වාය්ප්පුක්කළ් උළ්ළනවා?

ඉල්ලෙයෙනිල්, අතර්කාන කාරණත්තෙයුම්, උණ්ටෙනිල්, ඉත්තිට්ටම් මුන්නෙටුක්කප්පටක්කූටිය කාලකට්ටම් කුරිත්තුම් කූර මුටියුමා?

ඉක්කේල්විකළුක්කාන පතිල්කළෙයුම් එටුක්කප්පටක් කූටිය නටවටික්කෙයිල් තොටර්පාන විළක්කඞ්කළෙයුම් කෙළරව අමෙච්චර් විජිත් විජයමුනි සොය්සා අවර්කළ් වළඞ්ක කුවාරෙන එතිර්පාර්ක්කින්රේන්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පෙර කිව යුතු කරුණක් තිබෙනවා. ගරු සභානායකතුමනි, ඔබතුමාටත් මතක ඇති, මා මේ ගරු සභාවේදී අවස්ථා ගණනාවක් ප්‍රශ්න කළා, මා ඉදිරිපත් කරන ලද ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නයකට ඛනිජ තෙල් අමාත්‍ය වන්දිම වීරක්කොඩි අමාත්‍යාවරයාගෙන් පිළිතුරක් ලබා ගැනීම පිළිබඳව. මම පාර්ලිමේන්තුවට ස්ථාවර නියෝග 23(2) යටතේ ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරලා සති දෙකකට පසුව, - ඊළඟ පාර්ලිමේන්තු සතියේ - නැවත ඒ ගැන විමසුවා. ඒ අවස්ථාවේදීත් පිළිතුරක් ලබා දුන්නේ නැහැ. පසු ගිය පාර්ලිමේන්තු සතියේත් ඒ ගැන විමසුවා; දැන් අදත් විමසනවා. ගරු සභානායකතුමනි, මොකක්ද මේ තත්ත්වය? එක්කෝ එතුමා මේ ගැන සලකන්නේ නැහැ. එහෙම නැත්නම් එතුමා ගැන මොකක් හරි -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා පිළිතුරු දෙනවාද? නැත්නම් ඉදිරියේදී-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)

මට ඒකට උත්තර දෙන්න විධියක් නැහැ. 12වැනි දා උත්තරයක් දෙනවා කියලා එතුමා මට දැනුම් දීලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

පරණ ප්‍රශ්නයට නේද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)

මම මේ තත්ත්වය අනුමත කරන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම මේ උත්තරය ලබා දීම ප්‍රමාදයි.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

දැන් සෑහෙන කාලයක්. ඔබතුමාත් දන්නවා. පාර්ලිමේන්තුවේදී අවස්ථා කිහිපයදී මේ ප්‍රශ්නය ගැන ඇහුවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)

ඔව්, සෑහෙන කාලයක්. මේවා ජාතික වැදගත්කමක් තිබෙන ප්‍රශ්න. මේවාට පිළිතුරු දීම ප්‍රමාද කරන්න බැහැ. ක්ෂණික උත්තරයක් අවශ්‍යයි කියලා මාත් පිළිගන්නවා. හැබැයි, එතුමා මට දන්වා තිබෙනවා, 12වැනි දා උත්තරයක් දෙනවා කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් අපි දැනට ඒක පිළිගනිමු. ඒක සාමාන්‍යයෙන් හරි ක්‍රමය නොවෙයි කියලා මාත් පිළිගන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

ගොඩක් කාලයක් ගත වී තිබෙනවා. මේක සාමාන්‍ය තත්ත්වයක් නොවෙයි. සාමාන්‍යයෙන් අමාත්‍යවරු කල් අරගෙන පිළිතුරු ලබා දුන් අවස්ථා තිබෙනවා. නමුත් මේ ප්‍රශ්නය ගැන පාර්ලිමේන්තුවේදී අවස්ථා ගණනාවක් ප්‍රශ්න කළත්, එතුමා ඇවිල්ලා උත්තරයක් දෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නය මා දැන් ඉදිරිපත් කරනවා.

II

මාර්ග පුළුල් කිරීමේදී වන්දි නොගෙවීම

වීදිකළ් විස්තරිප්පින්පෝතු නෂ්ටඈටු වළඞ්කාමෙ
NON-PAYMENT OF COMPENSATION IN WIDENING OF ROADS

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මාතලේ නගරය ආශ්‍රිත මාර්ග පුළුල් කිරීම යටතේ සිදු කරන ලද ව්‍යාපාරික ස්ථාන හා නිවාස ඉවත් කිරීම සඳහා වන්දි නොගෙවීම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

මහනුවර - යාපනය (A9) මාර්ගයේ, මාතලේ නගරයේ ප්‍රධාන වීදිය - ඒකට අපි කියනවා ත්‍රිකුණාමල වීදිය කියලා- පුළුල් කිරීම යටතේ 2013 වසරේදී මාර්ගය දෙපස භූමිය රජයට අත්පත් කර ගනු ලැබ, එහි ව්‍යාපාරික ස්ථාන හා නිවාස 600කට වැඩි ප්‍රමාණයක ගොඩනැඟිලි කඩා ඉවත් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ පාර පුළුල් කරන්න සමහර නිවෙස්වලින් ඒ මිනිස්සු ඉවත් කළා. සමහර බිල්ඩින් කඩන්න සිද්ධ වුණා. කඩා ඉවත් කර, මේ පාර පුළුල් කරන්න ඒවා පවරා ගත්තා. එම ස්ථාන ඒවායේ හිමිකරුවන් විසින් ඉතා දුක් මහන්සියෙන් උපයා ගන්නා ලද දේපොළයි. එහෙත් ඒ වෙනුවෙන් ඔවුන්ට අදාළ වන්දි මුදල් ගෙවීමට මේ දක්වා පියවර ගෙන නැහැ. මේ සම්බන්ධව ප්‍රදේශවාසීන් විසින් මාතලේ දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කරන ලද ලිපියකට පිළිතුරු වශයෙන් 2013.03.19 දාතමින් මාතලේ ප්‍රාදේශීය ලේකම්වරිය විසින් ඉඩමේ අයිතිය සම්බන්ධව තීරණය කළ පසු ඉඩම් හිමියන්ට වන්දි ප්‍රදානය කළ හැකි බව දන්වා තිබුණා. එහෙත් අදාළ ව්‍යාපෘතිය අවසන් වී වසර දෙකකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද මේ දක්වා එම ඉඩම්වල සිටින්නක්කර හිමිකරුවන්ට හා දේපොළ අහිමිවූවන්ට වන්දි ගෙවලා නැහැ.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නා විධියට පාර හදනකොට ඇත්තටම කරන්න ඕනෑකම තිබෙන්නේ වන්දි දීලා ඒ දේපොළ පවරා ගැනීමයි. හැබැයි මෙතැනදී සිද්ධ වෙලා තිබෙන දේ තමයි ඊට පෙර ඒවා ඔක්කොම කඩලා බිඳලා දැමීම. කෙසේ වෙතත්, දැන් ඒ ජනතාව යම් ප්‍රමාණයකට ඒ ගොඩනැඟිලි හදලා, ප්‍රතිසංස්කරණය කරගෙන තිබෙනවා. තමුන්නාන්සේලා පාරත් හදලා තිබෙනවා. නමුත් තවමත් ඒ ජනතාවට ඒ වන්දි මුදල් ලබා දීලා නැහැ. ගරු කථානායකතුමනි, ඒ දේපොළවල තක්සේරුව කරලා තිබෙන්නේත් බාගෙට. සමහර අයගේ ගොඩනැඟිලි තක්සේරු කරලා තිබෙනවා. සමහර අයගේ දේපොළ තක්සේරු කරලාත් නැහැ. එසේම, මෙම ගොඩනැඟිලි කඩා ඉවත් කිරීමේදී ඒවායේ හිමිකරුවන්ට වාචිකව දෙන ලද උපදෙස් අනුව ඔවුන් විසින් එම ව්‍යාපාර හා නිවාස ගොඩනැඟිලි අදාළ සීමාව තුළ නැවත ඉදි කරනු ලැබුවා.

ගරු කථානායකතුමනි, මෙතැන සිද්ධ වුණේ ගෙයක් මුළුමනින්ම කඩා ඉවත් කිරීමක් නොවෙයි. ඔබතුමාත් දැකලා ඇති, පාර පුළුල් කරන කොට ගෙයින් භාගයක් කැඩෙනවා; ගොඩනැඟිල්ලේ භාගයක් කැඩෙනවා. එතකොට සාමාන්‍යයෙන් කරන දේ තමයි ඒ ගොඩනැඟිල්ල සම්පූර්ණ ගෙඩනැඟිල්ලක් බවට පත් කරන්න ඒ ඒ ව්‍යාපාරිකයන් විසින් විවිධ ප්‍රතිසංස්කරණ වැඩ කරන එක. කඩයක් බාගෙට කැඩුණොත් නැවත ඒ කඩය සම්පූර්ණ කඩයක් බවට පත් කර ගන්න අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු ඒ අය කරනවා.

එහෙත් මේ වන විට ඔවුන් විසින් නැවත ඉදි කරන ලද ගොඩනැඟිලි අනවසර ඉදි කිරීම් බව පවසමින් මාතලේ නගර සභාව විසින් ඔවුන් වෙත අසාධාරණ ලෙස දැඩි දඩ පැනවීමට කටයුතු කරමින් සිටිනවා. ඉවත් කරන ලද ගොඩනැඟිලි වෙනුවෙන් මෙතෙක් වන්දි පවා නොලද ඔවුන්ට මෙබඳු කොන්දේසි පැනවීම කෙතරම් සාධාරණදැයි ගැටලුවක් පැන නඟිනවා.

ඔබතුමාත් දන්නවා ඇති, - [බාධා කිරීමක්] ඔව්. සිද්ධ වෙලා තිබෙන්නේ ඒක. වන්දි ගෙවලාත් නැහැ. ඔවුන්ගේ ගෙවල්වල කැඩුණේ ඉස්සරහ දොර නම්, නැවත පිටිපස්සෙන් දොරක් සවි කර ගන්න ඕනෑ. තට්ටු දෙකේ බිල්ඩින් එකක් කැඩුණා නම්, උඩ තට්ටුව ප්‍රතිසංස්කරණය කර ගන්නට ඕනෑ. ඒවා ප්‍රතිසංස්කරණය කර ගත්තාම දැන් ඇවිත් කියනවා, ඒවා නීති විරෝධී ඉදිකිරීම් කියලා. ඒවාට දැන් නගර සභාවෙන් දඩ ගහන්න යනවා. මේ තත්ත්වය යටතේ පැන නඟින පහත සඳහන් ගැටලුවලට අමාත්‍යතුමා පිළිතුරු ලබා දෙනවා ඇතැයි මා අපේක්ෂා කරනවා.

1. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් (A9) මාර්ගයේ මාතලේ නගර ප්‍රධාන වීදියේ කොපමණ ඉඩම් ප්‍රමාණයක් පවරා ගනු ලැබේවේද?
2. එසේ ඉඩම් පවරා ගැනීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කුමක්ද?
3. එකී ව්‍යාපෘතිය සඳහා සකස් කළ ව්‍යාපෘති වාර්තාව තුළ වන්දි නිර්දේශ කර තිබුණේද?
4. එසේ පවරා ගත් ඉඩම් වෙනුවෙන් මේ දක්වා වන්දි ප්‍රදානය නොකළේ මන්ද?
5. ඉඩම් හා දේපළ අහිමි වූවන්ට අදාළ වන්දි ගෙවීමට කටයුතු කරන්නේද?
6. ඒ කුමන කාල රාමුවක් තුළද?
7. ඔවුන් විසින් නැවත ඉදි කරන ලද ගොඩනැඟිලි වෙත පනවා ඇති අසාධාරණ කොන්දේසි ඉවත් කිරීමට කටයුතු කරන්නේද කියා දැනගන්නට කැමතියි. ගරු කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එම ගැටලුවලට පිළිතුරු මෙසේයි.

1. ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 1.2484 - අක්කර 3 රූඩ් 0 පර්චස් 12යි. ඉඩම් කට්ටි ප්‍රමාණය 719යි.
2. 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ මෙම අත්පත් කර ගැනීම් කටයුතු සිදු කරන ලදි .
3. ව්‍යාපෘතිය කර ගෙනයාමේදී ප්‍රදේශයේ මහජන නියෝජිතයන්ගේ හා මහජනතාව විසින් කරන ලද ඉල්ලීම් සලකා බලා, මෙම නාගරික ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීමට සහ වන්දි ගෙවීමට කටයුතු කරන ලදි
4. මෙම මාර්ග සංවාර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම 2013-2014 වර්ෂවල සිදු වී ඇත. එසේ වුවද, ක්‍රමානුකූල ලෙස එම වකවානුවේදී වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සිදු වී නොමැත. ඒක පිළිගන්නට ඕනෑ.
5. ඔව්. ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ විධි විධාන ප්‍රකාරව ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර, එම පනතේ 17 වන වගන්තිය යටතේ වන්දි ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් විසින් මහාමාර්ග අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කළ වහාම වන්දි ගෙවීමට කටයුතු කරනු ලැබේ.
6. ඉදිරි මාස 6-9 කාල වකවානුව තුළ අවසන් කිරීමට හැකිවෙයයි අපේක්ෂිතය.
7. මේ අත්පත් කර ගැනීම්වලදී කඩා ඉවත් කිරීමට සිදුවූ ගොඩනැගිලි පමණක් නැවත පිළිසකර කර ගැනීම සඳහා අවස්ථාව ලබා දෙන ලදි. එම ගොඩනැඟිලි නැවත පිළිසකර කිරීමේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අසාධාරණ කොන්දේසි කිසිවක් පනවා නොමැත.

ගරු කථානායකතුමනි, මෙතැන සිදු වී තිබෙන්නේ - [බාධා කිරීමක්] පාරක් හදනකොට ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කර ගන්නා ඉඩම්වල අයිතිය තහවුරු කරන්නට ඕනෑ. එතකොට තමයි අපට වන්දි ගෙවන්නට පුළුවන්. මාර්ග සංවර්ධන අධිකාරිය ඕනෑම වෙලාවක වන්දි ගෙවන්න සූදානම්. ප්‍රාදේශීය ලේකම් විසින් තමයි ඒ අයිතිය තහවුරු කරන්නට ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, දැන් මතු වෙලා තිබෙන ප්‍රශ්නය මෙකයි. වන්දි ගෙවන්නට කලින් මේවා තක්සේරු කරන්නට ඕනෑකම තිබෙනවා නේ. ඒ තක්සේරු වාර්තාවක් තමයි ප්‍රාදේශීය ලේකම්තුමා විසින් ඔබතුමාගේ අමාත්‍යාංශයට යොමු කරන්නට ඕනෑකම තිබෙන්නේ. දැන් මතු වෙලා තිබෙන තත්ත්වය තමයි, මේවා තක්සේරු කර ගෙන යන අවස්ථාවේදී ඒ තක්සේරුකරුවන් සියලු දෙනාවම මොරගහකන්ද ජලාශයට යට වෙන තැන් තක්සේරු කිරීම සඳහා ගෙන ගිහින් තිබෙනවා. මොරගහකන්ද ජලාශය ඉදි කිරීම නිසා අවතැන් වන ප්‍රමාණයක් තිබෙනවා නේ. හදිසියේම එම තක්සේරුකරුවන් එතැනට ගෙන ගිහින් තිබෙනවා. ඒ නිසා මේ ඉඩම්, නිවාස, තක්සේරු කිරීමේ කටයුතු දැන් නතර වෙලා තිබෙනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය මේ පිළිබඳවත් මැදිහත් වෙලා කටයුතු කිරීම අවශ්‍ය වෙනවා. මොකද, අවසානයේදී ඔබතුමාගේ අමාත්‍යාංශය නේ මේ කටයුත්ත භාරගෙන තිබෙන්නේ. ප්‍රාදේශීය ලේකම්තුමාට තමයි බලය තිබෙන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇත්ත වශයෙන්ම මේ පාර හදනකොට කඩහිමියන් සහ ගෙවල් හිමියන් සිය කැමැත්තෙන්ම ඉඩම් ටික දුන්නා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කැමැත්තෙන්මද කියන්න මම දන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කාලයේ කැමැත්ත කියන්නේ මොකක්ද කියලා ඔබතුමා දන්නවා නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාත් දන්නවා නේ ඒ කාලයේ ක්‍රමය.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ ක්‍රමයට භයෙන් තමයි ඇත්ත වශයෙන්ම ඉඩම් දුන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
භයට තමයි -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බියට පත් කරලා තමයි ඒ අයගේ ඉඩම් පවරා ගත්තේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තක්සේරු කරලා නැහැ, හරියට පවරා ගැනීමක් කරලා නැහැ. මේක ඇහැලියගොඩත් සිද්ධ වුණා මට මතකයි. කෙසේ වෙතත්, අපි වන්දි ගෙවන්නට සූදානම්. අපිට ගෙවන්න සල්ලි තිබෙනවා. හැබැයි, ඔබතුමා කියපු තක්සේරුකරුවන් සම්බන්ධ කාරණය ගැනත් මම සොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, අමාත්‍යාංශ නිවේදන - ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා.

ගංවතුරෙන් පීඩාවට පත් උතුරු පළාතේ ජනතාවට සහන: ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගේ ප්‍රකාශය

வெள்ளத்தால் பாதிக்கப்பட்ட வட மாகாண மக்களுக்கு நிவாரணம் : அனர்த்த முகாமைத்துவ அமைச்சரினது கூற்று

RELIEF TO PEOPLE DISTRESSED DUE TO FLOODS IN NORTHERN PROVINCE : STATEMENT BY MINISTER OF DISASTER MANAGEMENT

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Disaster Management)

ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්ද මන්ත්‍රීතුමා විසින් 2016 ජූනි 24 වැනි දින 23(2) ස්ථාවර නියෝගය යටතේ අසන ලද ප්‍රශ්නය වෙනුවෙන් මා පිළිතුරු ලබා දෙනවා. එතුමා අපෙන් අහලා තිබෙනවා, උතුරේ විපතට පත් ජනතාවට රුපියල් 10,000ක සහනාධාරයක් ලබා දුන්නේද? නොදුන්නේ නම් ඊට හේතු දක්වන්න කියලා.

උත්තරය, මෙම දිස්ත්‍රික්කවල ගංවතුරෙන් හානි වූ නිවාස සඳහා ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ ජාතික රක්ෂණ භාර අරමුදලින් හානි වූ නිවසකට රුපියල් 10,000 බැගින් අත්තිකාරම් මුදල් ලබාදීමට අදාළ උපදෙස් ආකෘති පත්‍ර හා පශ්චාත් ආපදා නිවාස හානි ප්‍රතිපූර්ණය කිරීමේ අය වැය ඇස්තමේන්තු මාර්ගෝපදේශන හා ආකෘති පත්‍ර මේ වන විටත් උතුරු පළාතේ සෑම දිස්ත්‍රික්කයකටම ලබාදී ඇත. ඒ උපදෙස් අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් නිවාස හානි තක්සේරු සිදු කරමින් පවතී. 2016.06.29 වන දින මුලතිව් නිවාස හානි සඳහා රුපියල් 10,000ක් බැගින් අත්තිකාරම් මුදලක් ලබාදීමට රුපියල් 216,000ක මුදල් ජාතික රක්ෂණ භාර අරමුදලින් ඉල්ලා ඇත. යාපනය දිස්ත්‍රික්කයේ 2016.07.01වන දින නිවාස හානි 192ක් සඳහා රුපියල් 1,920,000ක මුදලක් යවා ඇති අතර, එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් ඉල්ලා ඇත. ලැබුණු වහාම එය අදාළ දිස්ත්‍රික්කයට ලබාදීමට කටයුතු කරනු ඇත.

ඊළඟට එතුමා අහලා තිබෙනවා, උතුරු පළාතේ සම්පූර්ණ වශයෙන් හා අර්ධ වශයෙන් හානියට පත් නිවාස නැවත ඉදිකරදීමට, අලුත් වැඩියා කරදීමට ගන්නා ක්‍රියා මාර්ග පැහැදිලි කළ හැකිද? ඒවා කුමන ආයතන යටතේ ක්‍රියාත්මක කරන්නේද? ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද කියලා.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ජාතික රක්ෂණ භාර අරමුදල සමඟ ස්වාභාවික ආපදා සඳහා රක්ෂණ ක්‍රමයක් ස්ථාපනය කර ඇත. ගරු කථානායකතුමනි, මෙම රක්ෂණ ක්‍රමය ආරම්භ කළේ භාණ්ඩාගාරයයි. අපේ අමාත්‍යාංශය හරහා තමයි මෙය ක්‍රියාත්මක වෙන්නේ. ඒ යටතේ හානියට පත් නිවාස සඳහා උපරිමය රුපියල් මිලියන 2.5ක රක්ෂණාවරණයක් හිමි වේ. ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතින් තක්සේරු වාර්තා ලැබුණු විට හානියට පත් නිවාස සඳහා අරමුදල් වෙන් කළ හැකිය. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ස්වාභාවික ආපදාවලින් හානියට පත්

සියලු නිවාස සඳහා අරමුදල් වෙන් කිරීමේ වගකීම දරයි. ගරු ඩග්ලස් දේවානන්ද මන්ත්‍රීතුමනි, ඒ අනුව එම පළාතේ දිසාපතිවරයා අමතා ඔහුගේ කටයුතු ඉක්මන් කෙරුවොත් අපට මේ මුදල් ඉක්මනින්ම නිදහස් කළ හැකියි.

ඊළඟට, උතුරු පළාත තුළ හානියට පත් කෘෂි කාර්මික වැව්, කෘෂි කාර්මික ඉඩම්, පාලම්, මාර්ග ඇතුළු යටිතල පහසුකම් නැවත ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න කියලා කියනවා. ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් තමයි අරමුදල් ලබාගන්න ඕනෑ.

ඊළඟට එතුමා අහලා තිබෙනවා, ඉහත හානියට පත් උතුරු පළාතේ යල කන්නයේ වගාවන් හා සුළු භෝග වගාවන් සඳහා කුමන ආකාරයට වන්දි ලබා දෙන්නේද කියලා. ඒ සඳහා වන්දි ලබාදීම කරන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශය මඟිනුයි.

හානියට පත් හා විපතට පත් උතුරු පළාත් ධීවර ජනතාවගේ ධීවර ආම්පන්න සඳහා ලබා දීමට බලාපොරොත්තු වන සහන මොනවාද කියලා ඊළඟට අහලා තිබෙනවා. මේ කටයුතු කරන්න ඕනෑ ධීවර අමාත්‍යාංශය මඟිනුයි.

ඊළඟට එතුමා අහලා තිබෙනවා, "මේ ආකාරයට අනාගතයේදී ස්වාභාවික විපත් සිදු වන අවස්ථාවලදී ඉන් ජනතාව මුදවා ගැනීම සඳහාත්, ස්වාභාවික විපත්වලින් සිදු වන හානි අවම කර ගැනීම සඳහාත්, උතුරු පළාත්වල ඔබගේ අමාත්‍යාංශය මඟින් සිදු කරන ක්‍රියාමාර්ග පැහැදිලි කළ හැකිද?" කියලා. ඔව්, උතුරු පළාතේ ආපදා තත්ත්වය සැලකිල්ලට ගෙන සංවර්ධනයක් ඇති කිරීම සඳහා සංකල්පීය පාරිසරික උපාය මාර්ග සැලැස්මක් සකස් කර සියලු පාර්ශ්වකාර ආයතන වෙත ලබාදීමට කටයුතු කර ඇත. උතුරු පළාතේ ඇති වන ආපදා තත්ත්වයන්වලදී ජනතාව මුදවා ගැනීම සඳහා ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සහාය මත යුද හමුදාවේ සෙවීම් හා මුදවා ගැනීමේ කණ්ඩායම් අටක්, නාවික හමුදාවේ 4RS කණ්ඩායම පුනරින්වල ස්ථාපිත කර ඇත. ආපදා අවම කිරීම යටතේ යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම, වව්නියාව යන දිස්ත්‍රික්කවල ගංවතුර හා නියඟයන් වැනි ආපදාවන්ගෙන් සිදු වන හානි අවම කරගැනීම සඳහා ව්‍යුහාත්මක නිර්මාණ ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කොට දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා මෙම ඉදිකිරීම් කරනු ලැබේ. අනෙකුත් පළාත්වල මෙන්ම ආපදා කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත සහකාර අධ්‍යක්ෂ හා කාර්ය මණ්ඩලය සමඟ දිස්ත්‍රික් ආපදාකරණ සම්බන්ධීකරණ ඒකකයන්ද, සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම ආපදා සහන සේවා නිලධාරින්ද අනුයුක්ත කර ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සෑම දිස්ත්‍රික්කයකම වාර්ෂික ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මීට අමතරව වාර්ෂික ආපදා සම්බන්ධයෙන් මෙන්ම එම ආපදා හානි අවම කිරීම සඳහා පූර්ව සූදානම්, පූර්ව අනතුරු ඇඟවීම් සම්බන්ධ ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම, ප්‍රජාව, රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල අනුබද්ධිතව ස්ථාපිත කර ඇති ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක මඟින් කටයුතු කරනු ලැබේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම් දීම, ගරු මුදල් අමාත්‍යතුමා. 2015 අංක 16 දරන විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම කැබිනට් අනුමැතිය සහිතව විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත
ஒதுக்கீடு (திருத்தம்) சட்டமூலம்
APPROPRIATION (AMENDMENT) BILL

"2015 අංක 16 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

පිළිගන්වන ලද්දේ මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මහතා විසිනි.

2016 අගෝස්තු 23 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයි ද, එය මුද්‍රණය කළ යුතුයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයි ද නියෝග කරන ලදී.

நிதி அமைச்சர் மாண்புமிகு ரவி கருணாநாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2016 ஓகஸ்ட் 23, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Ravi Karunanayake, Minister of Finance; to be read a Second time upon Tuesday, 23rd August, 2016 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

නීති කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත
சட்ட ஆணைக்குழு (திருத்தம்) சட்டமூலம்
LAW COMMISSION (AMENDMENT) BILL

"1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අධිකරණ අමාත්‍ය හා බුද්ධශාසන අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2016 අගෝස්තු 23 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයි ද, එය මුද්‍රණය කළ යුතුයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයි ද නියෝග කරන ලදී.

நீதி அமைச்சர் சார்பாக மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2016 ஓகஸ்ட் 23, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Justice and Buddhasasana; to be read a Second time upon Tuesday,23rd August, 2016 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
லசாலியன் சமூக கல்விச் சேவைகள் (கூட்டிணைத்தல்) சட்டமூலம்
LASALLIAN COMMUNITY EDUCATION SERVICES (INCORPORATION) BILL

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය"

ගරු ඒ. ඒ. විජේතුංග මහතා
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)

විසින් ස්ථිර කරන ලදී.

ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5)இன்படி சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Empowerment and Welfare for report.

රාජිත සේනාරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
ராஜித சேனாரத்ன மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
RAJITHA SENARATHNE FOUNDATION (INCORPORATION) BILL

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

" රාජිත සේනාරත්න පදනම සංස්ථාගත කිරීම සඳහ වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

විසින් ස්ථිර කරන ලදී.

ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Empowerment and Welfare for report.

ලක් ජනසෙත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
லக் ஜனசெத்த மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
LAK JANASETHA FOUNDATION (INCORPORATION) BILL

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ලක් ජනසෙත පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

විසින් ස්ථිර කරන ලදී.

ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Empowerment and Welfare for report.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු, න්‍යාය පත්‍රයේ විෂය අංක 1ට යාමට ප්‍රථමයෙන් දැන්වීමක් කළ යුතුයි. අද මේ සභාවේ කටයුතු ආරම්භයේදී අපි තීරණය කළා, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මේ රැස්වීම අවසානයේදී පවත්වන්න කියලා. නමුත් ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වීමට තිබෙන නිසා අපර භාග 4.30ට අපි මේ රැස්වීම පවත්වන්න තීරණය කළා. එයට සියලුම දෙනා පැමිණ සහභාගි වන ලෙස දන්වා සිටිනවා.

මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் *அக்கிராசனத் தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] *தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister of Finance to move Item No. 1

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත
நிதி முகாமைத்துவம் (பொறுப்பு) (திருத்தம்) சட்டமூலம்
FISCAL MANAGEMENT (RESPONSIBILITY) (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[2.58pm]

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)
I move,

"That the Bill be now read a Second time."

Sir, we are debating today the Fiscal Management (Responsibility) (Amendment) Bill. As you know, this was enacted in 2003 and at that time the limit set on GDP was 4.5 per cent. After that, on the 01st of January, 2013, this was increased by the then Government to 7 per cent. Since then, up to 2015, you had certain snowballing payments made. There was Rs. 796 billion paid in the year 2015. Another proposed that this would be going up to Rs. 1,137 billion. So, that is, it would increase by Rs. 341 billion. On the 31st of December, 2015, the total stood at Rs. 603 billion. That is the total commitment given by the Government. The 2016 figure remains to be Rs. 186 billion and this is related to State-owned enterprises.

ජලය, විදුලිය, මහාමාර්ග සහ ගුවන් තොටුපොළවල් ආදී වශයෙන් රජයේ ආයතන සම්බන්ධයෙන් දරන්නට තිබෙන වියදම් වැඩිවෙලා තිබෙනවා. ඒ නිසා 2013 සියයට 4.5 තිබුණු එක සියයට 7 වුණා. අප යෝජනා කරනවා, ඒක සියයට 10 දක්වා වැඩි කරන්න කියලා. අපි කටයුතු කර තිබෙන්නේ කොහොමද කියලා මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ සංශෝධන තුළ අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම ගත් සියලුම ණය පිළිබඳව හැම මාසයකම අපි කැබිනට් එකට වාර්තා කරනවා. මින් පසුව අපි එයටත් අභිබවා යනවා. ඒ ණය ගන්නේ කොච්චර කාලයකටද, පොලී ප්‍රමාණය කොච්චරද, ඊට සාපේක්ෂව ගන්න පුළුවන් ණයත් අපි පෙන්වනවා. සියයට 6ට ගන්න කොට සියයට දශම එකට අර ගෙන තිබෙනවා නම් එසේ වැඩියෙන් ගෙවන්න තිබෙන්නේ ඇයි කියන එක අපි ඉදිරිපත් කරනවා. මම හිතන විධියට නැවත පත් වන මා වැනි මුදල් ඇමතිවරයකුට කවදාවත් මෙවැනි ණය කන්දරාවක් ලැබෙන්නේ නැති විධියට කටයුතු කිරීමට තමයි අප මෙයින් බලාපොරොත්තු වන්නේ. [බාධා කිරීමක්] ඔව්, කැබිනට් එකට සහ පාර්ලිමේන්තුවටඉදිරිපත් කරනවා. මොකද, අපේ ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මැතිතුමා එවකට භාර ගත් යුද්ධය අවසන් කරලා තමයි භාර දෙන්නේ කියලා කිව්වා වාගේ, අපිත් මේ තිබෙන ආර්ථික යුද්ධය ජයග්‍රහණය කරලා ඉදිරියට කටයුතු කර ගෙන යන්න තමයි අදහස් කරන්නේ. ඔබතුමන්ලාත් ඒකට කැමැති වෙයි. මොකද, විපක්ෂයේ ඉන්න කොට අපි විනිවිදභාවය ගැන කථා කළා. ඒ නිසා මම හිතන විධියට ඔබතුමන්ලාටත් අයිතියක් තිබෙනවා, අපි එදා කිව්ව දේ ක්‍රියාත්මක කරන්නේ කොයි ආකාරයෙන්ද කියලා බලන්න.

අපි සියයට 10ක් දක්වා වැඩි කරන්නට යෝජනා කර තිබෙන්නේ මොකද කියන එකට මම උදාහරණයක් කියන්නම්. ඊයේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපති මා හමුවන්න ආවා. ඒ අවස්ථාවේ එවකට පැවැති ආණ්ඩුව නිර්දේශ කර තිබුණා, ජාතික ඉතිරි කිරීමේ බැංකුවට යූඑස් ඩොලර් මිලියන 1000ක් ගන්න කියලා. ඒ මිලියන 1000 ගන්න තිබුණේ, සියයට 8.65ක fixed ණය පොලියකටයි. ඉතින් ජාතික ඉතිරි කිරීමේ බැංකුව triple A rated company එකක් නිසා, එයට සියයට 2.25කට අනුපාතයකට ණය ගන්න පුළුවන්. ඉතින් එවැනි ණයබරක් ගත්තේ නැත්තේ සංචිත වැඩි කරන්න ඕනෑ පදනමින්. නමුත්, අපට තවමත් මේක ඇදගෙන යන්න තිබෙනවා. ආණ්ඩුවක් වශයෙන් අපට කියන්න බැහැ, "එදා කරපු දේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා, ඒ නිසා ගෙවන්න බැහැ" කියලා. ඔබතුමන්ලා දැන් දන්නවා ඇති, අපි මේක වැඩි කරන්න ඉල්ලන්නේ ඇයි කියලා. මා සරල නිදසුනක් ගත්තේ. එවැනි, ණය තුළිනුත් තවම මිලියන 250ක් පාවිච්චි කරලා නැහැ. මොකද, ඒ ණය සියයට 8.65ක පොලියකට අරගෙන පාවිච්චි කළොත් ඔබතුමන්ලාට අයිතියක් තිබෙනවා, අහන්න සියයට 3,4කට ගන්න පුළුවන්කම තිබියදී, සියයට 8.65කට ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ගන්නේ ඇයි කියලා. මේ නිසා තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තුළින් ගත් අපට දැනුවත් නොවූ ණය ප්‍රමාණය කීයද කියලා ඉදිරිපත් කළේ. ඒ වෙලාවේ ඒක හාස්‍යයට ලක් කළාට අද ඒ සියල්ලම ගණනය කර තිබෙනවා. ඒ බිලියන 1300 අපට ගෙවන්න තිබෙන හැකියාව දැන් ඔප්පු වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේදී අපි බලන්න ඕනෑ, මේ තිබෙන ණය බරතාව අඩු කරන්න, ආදායම වැඩි කරන්න කොහොමද කටයුතු කරන්නේ කියන එක. අපි ඇස්තමේන්තු කරලා තිබෙනවා, 2020 වන කොට අපේ අය වැය හිඟය සියයට 3.5යි කියලා. ඒ කියන්නේ fiscal consolidation එක. ඒ fiscal consolidation එක ඇති කරගෙන යන අවස්ථාවේදී - මේක කවුරුත් කිව්වේ නැහැ.- සියයට 6.4 තිබෙන එක 5.4ට අඩු කරගන්න තිබුණා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක තිබුණු සාකච්ඡාවේදී. ඒක හොඳ නිසා අපි එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කළා. ඒකට එන අවුරුද්දේ

[ගරු රවි කරුණානායක මහතා]

සියයට 4.5යි ඒ වාගේ කරගෙන යන කොට අපේ එකම අභිලාෂය වන්නේ ආදායම වැඩි කරන්නයි. ආදායම වැඩි කළාම අපට ව්‍යදම් කරන්න හැකියාව -fiscal space එක- ඇති වනවා. ඒ වාගේම අපි ව්‍යදම අඩු කරගෙන යනවා. ව්‍යදම අඩු කරන්නේ ප්‍රාග්ධන ව්‍යදම්වලින් නොවෙයි. පුළුවන් තරම් පුනරාවර්තන ව්‍යදම්වලින් අඩු කර ගෙන යනවා. පසු ගිය අවුරුද්දේ අපි -ඔබතුමන්ලාත් සමඟ- සම්මත කළා, රජයකට වාහන අවශ්‍ය නම් operating lease එකක් අනුව කරන්න කියලා. Operating lease එක අනුව අපට පුළුවන් වෙලා තිබෙනවා, රුපියල් බිලියන 10ක් -රුපියල් කෝටි 1,000ක්- ඉතිරි කරන්න. දැන් ඒ මුදල සංවර්ධන කටයුතුවලට යොදවා තිබෙනවා. ඒ නිසා තමයි මොන සද්ද කළත් අද හැම කොනකම සංවර්ධනයක් කර තිබෙනවාය කියලා පෙනෙන්නේ. එක පැත්තකින් මොරගහකන්ද ව්‍යාපෘතිය පටන්ගෙන තිබෙනවා. අනික් පැතිවලින් අධිවේගී මාර්ග 3ක්, 4ක් පටන්ගෙන තිබෙනවා.

පොලොන්නරුවේ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා, මහනුවරින් වැඩ පටන්ගෙන තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ හැම කොනකම සංවර්ධනය වෙලා තිබෙනවා. ගෙවල් 65,000ක් ඉදි කිරීමේ වැඩසටහන ආරම්භ කරලා තිබෙනවා. දණ ගැස්වූ ආර්ථිකයක් අපට භාර දුන්නාට, අමාරු කාලයක් තුළින් අපි ඉදිරියට ගිහින් තිබෙනවාය කියන එක ඔබතුමන්ලා සියලුදෙනාම පිළිගන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විනිවිදභාවයකින් කටයුතු කරන අමාත්‍යාංශයක් වශයෙන් අපි ක්‍රියාත්මක කරනවා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත දැන් සම්මත වෙලා තිබෙනවා. ඔබතුමන්ලාට ඕනෑ අවස්ථාවක මුදල් අමාත්‍යාංශයට ඇවිල්ලා විවෘතව තොරතුරු ලබා ගන්න පුළුවන්. මා නිලධාරින්ට කියා තිබෙනවා, දෙන්න පුළුවන් සියලුම තොරතුරු ලබා දෙන්නය කියලා. මොකද, අපට මේවා පතුයෙන් දැනගන්න ඕනෑ නැහැ. අපේ හිතවත් මන්ත්‍රීවරුන්ට වෙන්න පුළුවන්, විපක්ෂ මන්ත්‍රීවරුන්ට වෙන්න පුළුවන් තොරතුරු දැනගැනීම සඳහා අයිතියක් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවේ තිබෙන්නේ රාජ්‍ය මූල්‍යය පිළිබඳ පාලනය පාර්ලිමේන්තුව සතු බවයි. ඒ නිසා අපි මේක විවෘත කළා. හැබැයි, මේක වල්බූරු නිදහසක් වශයෙන් පාවිච්චි කරන්න එපාය කියලා මා කාරුණිකව ඉල්ලනවා.

මා හිතන විධියට නොයෙක්-නොයෙක් වැරැදි ප්‍රකාශ කරලා තිබෙනවා. අපට පුළුවන් වෙලා තිබෙනවා, මේ අවුරුද්දේ ආදායම පසු ගිය අවුරුද්දට වඩා සියයට 34කින් වැඩි කරන්න. ඒක දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ආදායමයි. සුරාබදුවලින් ලැබෙන ආදායම සියයට 6කින් වැඩි වෙලා තිබෙනවා. මොකද, පසු ගිය වතාවේ සියයට 52කින් වැඩිවුණු නිසායි. ඒ ආකාරයෙන්ම ශ්‍රී ලංකා රේගුවේ ආදායම ජූනි මාසය වන කල් සියයට 29කින් වැඩි වෙලා තිබෙනවා. ඒ තුළින් අපට සතුටුදායක තත්ත්වයක් ඇති වුණාට ඒක ප්‍රමාණවත් නැහැ. අපට රුපියල් බිලියන 1,200ක් පමණ ශ්‍රී ලංකා රේගුවෙන් ලබා ගන්න අවශ්‍යයි. නමුත් අපට ලැබෙන්නේ රුපියල් බිලියන 853යි. තවමත් සියයට 35ක, සියයට 40ක gap එකක් තිබෙනවා. ඒ නිසා තමයි අපි පුළුවන් තරම් අලුත් වැඩ පිළිවෙළවල් ඉදිරිපත් කර තිබෙන්නේ.

අපි බොහොම ප්‍රසිද්ධියේ කිව්වා, "scanningවලට ටෙන්ඩරයක් ඉදිරිපත් කරනවා." කියලා. ලෝකයෙන්ම හොඳම company එකක් ඇවිල්ලා තිබෙනවා. පළමුවන වතාවට කිසිම ඇඟිලි ගැසීමක් නැතුව ඒක ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ පිරිසිදු මාර්ගයේ ගියාට පස්සේත්, පැරදුණු එක් කෙනා fundamental right case එකකට උසාවියට ගිහින් තිබෙනවා. හිතුමතයට මේ වාගේ කටයුතු කරගෙන යනකොට අපට ව්‍යදමක් දරන්න තිබෙනවා. පඩි වැඩි කරනකොට අපි කිව්වා, "මේ ආකාරයෙන් තමයි ආදායම සොයන්න තිබෙන්නේ" කියලා. අපි දැනට ව්‍යදමක් දරාගෙන යනවා. නමුත් ආදායම හිර කරලා තිබෙනවා. කොහෙන්ද හිර කරලා තිබෙන්නේ? උසාවියෙන්. 2015 වර්ෂයේ Supreme Court එකට මේ වාගේ fundamental right cases 10ක් ඉදිරිපත් කරලා තිබෙනවා, මේ අවුරුද්දේ 23ක් ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මුදල් අමාත්‍යාංශයට සම්බන්ධවද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්. දැන් අපි excise duty එක වැඩි කරනවා. ඒක වැඩි කරනකොට කවුරු හෝ උසාවි ගිහින් stay order එකක් ගන්නවා. නමුත් අපි කියා තිබෙනවා අපේ ආදායම මෙපමණයි, ඒකෙන් තමයි ව්‍යදම දරන්නේ කියලා. එතකොට මේ පරතරය ගෙවන්නේ කවුද? මෙවැනි විනයක් නැති මූල්‍ය පාලනයකට ගමන් කරන එක අපි නවත්වන්න ඕනෑ. සියලුදෙනාගෙන්ම මා කාරුණිකව ඉල්ලන්නේ උසාවි යන්න, ඒක නවත්වන්න ඕනෑ නැහැ, නමුත් අපට දවස් 2කින් හෝ දවස් 3කින් උත්තර දෙන්න කියලායි. නොවැම්බර් මාසයේ අපි ඉදිරිපත් කරපු අය වැය යෝජනා 18කින් 16ක් උසාවියේ තිබෙනවා. මාස 8කට රුපියල් මිලියන ගණනාවක් නැතිවෙලා තිබෙනවා. නමුත් ඒකේ ව්‍යදම අපි දරලා ඉවරයි. මා මේ පාර්ලිමේන්තුවෙන් කාරුණිකව ඉල්ලනවා, මේ අක්‍රමිකතා සම්බන්ධයෙන් සහ Supreme Court එකේ තිබෙන නඩු සම්බන්ධයෙන් මීට වඩා නම්‍යශීලිව, -නම්‍යශීලි නොවෙයි- ඉක්මනින් අපට සම්පූර්ණ සහයෝගය ලබා දෙන්නය කියලා.

මා මීට වඩා කාලය ගන්නේ නැහැ. රටක් ඉදිරියට යන්න ආදායම අවශ්‍යයි. සීමිත සම්පත්වලින් අසීමිත ඉල්ලීම් ඉටු කරන කොට ප්‍රමුඛත්වය අනුව වෙනස් කරන්න ඕනෑ. මේක කොළඹට විතරක් කරලා හරියන්නේ නැහැ. මේක පොලොන්නරුවට විතරක් කරලා හරියන්නේ නැහැ. රටේ හැම කොනක්ම -කොළඹ සිට මඩකලපුවටත්, යාපනයේ සිට දෙවුන්දර තුඩුවටත්- සමබරතාවෙන් සංවර්ධනය කිරීම තමයි අවශ්‍ය වන්නේ. ඒ සඳහා ඔබ සියලු දෙනාම දක්වන අදහස් අපි අගය කොට සලකනවා. කොතරම් විවේචනයන් ඇති වුණත්; සාධාරණ විවේචනය තුළින් දක්වන අදහස් අපි පිළිගන්නා බව අප මේ අවස්ථාවේදී මතක් කරනවා. මා පසු ගිය සෙනසුරාදා අනුරාධපුරයේ සිටියා. ඒ අවස්ථාවේදී විලච්චියේ ගැමි ප්‍රදේශයකට ගිහින් එනකොට අපි සතුටට පත් වුණා. එහිදී ඉදිරිපත් කළ කාරණා 28කින් කාරණා 26කට අපි මුදල් වෙන් කර තිබුණා. මුදල් වෙන් කර තිබුණත් ඒවා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාදාමයේ ප්‍රශ්නයක් තමයි ඇති වී තිබුණේ. සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර රජයේ නිලධාරීන් තුළින් ගම් ප්‍රදේශවලට ඒ වාසිය ලබා දෙන්න යාමේදී යම් තැනක කඩා වැටීමක් තිබෙන බව අපට පෙනෙනවා. එහෙම නේද ගරු වන්දිම ඇමතිතුමනි? ඔබතුමාත් ඒ අවස්ථාවේ සිටියා. මා මේ කාරණය ආදර්ශයක් වශයෙන් ගත්තේ අපි මුදල් වෙන් කර තිබෙන බව පෙනෙන නිසයි. දැනට අපේ ප්‍රාග්ධනවලින් ව්‍යදම් කර තිබෙන්නේ සියයට 11.8යි. මීට වඩා හුහක් පාවිච්චි කළ යුතුයි. මෙහිදී ශූන්‍ය අය වැය ක්‍රමවේදය උපයෝගී කර ගැනීම නිසා නාස්තිය අවම කර තිබෙනවා. නමුත් ඒ සමඟ තිබෙන අනවශ්‍ය ප්‍රශ්නත් අපි ලිහිල් කරන්න අවශ්‍යයි කියන එක මම පිළිගන්නවා. අපි ඒක කර ගෙන යනවා. පුනරාවර්තන ව්‍යදම ජූනි

මාසයේ 30 වනදා වනතුරු සියයට 46ක් වියදම් කර තිබෙනවා. ඇස්තමේන්තුව අනුව පුනරාවර්තන වියදමෙන් සියයට පහක් පමණ අඩුවෙන් වියදම් කිරීමට කටයුතු කරනවා. ප්‍රාග්ධන වියදම සම්බන්ධයෙන් මීට වඩා ක්ෂණිකව, ඕනෑකමින් ඒ අමාත්‍යාංශ කටයුතු කරන්න ඕනෑය කියන එක අපි කැබිනට් මණ්ඩලයේත් සාකච්ඡා කර තිබෙනවා.

අද මෙවැනි උසාවි තීන්දුවක් තුළින් අපට වෙන එක දෙය මෙයයි. අපි ක්‍රමවේදය උපයෝගී කර නැහැ කියා තිබුණා. 2002 වර්ෂයේ පටන් ගත් වැට එක විසිතුන් වරක් ඒ ඒ මුදල් ඇමතිවරු ඒ ආකාරයෙන් ඉදිරිපත් කර තිබෙනවා. මෙවර විතරක් සුවිශේෂී වෙනසක් ඇති වී තිබෙනවා. එම නිසා අපට කියන්නට පුළුවන් එකම දෙය වන්නේ මෙයයි. පාර්ලිමේන්තුවත් මෙවැනි දෙයක් යම්කිසි විධියකින් නීත්‍යානුකූලව හෝ සම්ප්‍රදායානුකූල නොවන විධියට කටයුතු කිරීමේ - [බාධා කිරීමක්]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්ද්‍රසිරි කජුදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ කාරණය උසාවියට චාර්තා කළේ නැහැ නේ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
චාර්තා කළා. එතැන කියා තිබෙන්නේ, මම මේක වාචිකව පාර්ලිමේන්තුවේ කිව්වේ නැත්තේ ඇයි කියායි. මා හිතන හැටියට Attorney-General's Department එකේ Mrs. Farzana තමයි මේකට ඉදිරිපත් වුණේ. ඒ අවස්ථාවේදී "මෙන්න document එක" කියලා අපි දුන්නා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ මම මේ ප්‍රකාශය නොකිව්ව නිසා, මේක සරල වශයෙන් මේ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. මම හිතන විධියට උසාවි මීට වඩා හුහක් නම්‍යශීලී විය යුතුයි. මේ හැම දෙයක් ගැනම ලිපිකරු level එකෙන් වැඩ කරන්න යනවා නම් රටේ ආදායම ගැන කවුද සලකන්නේ?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්ද්‍රසිරි කජුදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
අපේ වැඩය අපි හරියට කරනවා නම් -

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
හරියට වැඩය කියන්නේ මේක නේ. මේක උසාවියට ඉදිරිපත් කරලා තිබෙන්නේ, මේක කර තිබෙනවාය කියා. පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙනවා. ඊට පස්සේ තව මොනවාද? පාර්ලිමේන්තුවට ගෙනාවාම ඒ ගොල්ලෝ දැන ගන්නට ඕනෑ, මේකට යම් විධියක ක්‍රමවේදයක් පාවිච්චි කර තිබෙනවාය කියා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඔබතුමන්ලා වැට් (සංශෝධන) පනත් කෙටුම්පත සකස් කරලා කැබිනට් මණ්ඩලයට ගොස්, කැබිනට් මණ්ඩලයේ අනුමතිය අරගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාය කියාද ඔබතුමා කියන්නේ?

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඔව්. ඒක කරලා ඒක කියලාත් තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
නමුත් කථානායකතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දැනුම් දෙනකොට- එතුමා සම්පූර්ණ නඩු වාර්තාව කියෙව්වේ නැහැ.- සරල වශයෙන් කියනකොට, අදහස් වුණේ කැබිනට් මණ්ඩලයට නියමිත පරිදි ලබා නොදීම මත තමයි මේක සිද්ධ වුණේ කියා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි සුප්‍රීම් උසාවිය කියන්නේ. සුප්‍රීම් උසාවිය procedure එක කියා කියන්නේ, මම මෙතැන කැබිනට් මණ්ඩලයේ අනුමතිය සහිතව කිව්වේ නැත කියන ප්‍රශ්නය. කැබිනට් එකේ සම්පූර්ණ අනුමතිය තිබෙනවාය කියන එක දැනගන්නට ඕනෑ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්ද්‍රසිරි කජුදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
ඔබතුමා කියන්නේ ඒක අධිකරණයේ වරදක් කියන එකද?

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
නැහැ. උසාවියෙන් වැට් එක නවත්වනකොට බලන්න ඕනෑ ඒකේ ඉදිරි කටයුතු කර ගෙන යන්නේ කොහොමද කියා. "Retroactive" කියන එක පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායක්. මුදල් ඇමතිවරයෙක් ඒක ප්‍රකාශ කළ මොහොතේ සිට ආදායම එකතු කරන්න පුළුවන් මාර්ගය තමයි තිබෙන්නේ. ඒක උසාවියෙන් එකපාරට නැවැත්වූවාම ඊට පස්සේ කියන්න ඕනෑ, මෙන්න මේක මෙදා සිට retroactive විධියට කර ගෙන යන්න පුළුවන්, පාර්ලිමේන්තුවේ මේක සම්මත වුණාට පස්සේ කියන එක.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු *සන්ද්‍රසිරි කජුදීර*)
(The Hon. Chandrasiri Gajadeera)
මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතට අනුව අපි අතින් යම් පැහැර හැරීමක් සිදුවෙලා තිබෙන නිසා නේ අධිකරණය එහෙම කියා තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
නිකම් බොරු දෙයකට එල්ලෙන්න ඕනෑ නැහැ. කැබිනට් එකේ අනුමතිය තිබෙනවා නම්, මම මෙතැනට ඇවිත් ඒක කිව්වේ නැහැ කියන එක නම් ප්‍රශ්නය, මාසයකට රුපියල් මිලියන 6000ක ආදායමක් නැති වී යනවා. කවුද ඒකට වග කියන්නේ? ඒ අයට කාර් ඕනෑ කියනවා, පඩි වැඩි කරන්න කියනවා, මහ පාරේ බෝඩ් ලෑලි අල්ලාගෙන ඉන්නවා, බෝක්කු උඩට නැඟලා ඉන්නවා, ප්‍රශ්න කර කර යනවා. මේකට මට කියන්න පුළුවන් වන්නේ, ඉදිරියට යන කොට කරුණාකර මෙහි තිබෙන ප්‍රශ්න දෙස බලලා ප්‍රායෝගික ලෙස උත්තර දෙන්න කියන එකයි. මම මේ දෝෂාරෝපණයක් කරනවා නොවෙයි. ආදායම සහ වියදම අතර පරතරය අය වැය හිඟය ලෙසයි කියන්නේ. ප්‍රශ්නයක් නිසා ඒක ලබා ගන්න බැරි වුණාම ඒකට වග කියන්නේ කවුද? හැම එකටම කියන්නේ අප ක්‍රියාත්මක කළේ නැහැ කියායි. නමුත්, උසාවියෙන් තමයි නවත්වලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මගේ අතේ තිබෙන්නේ මේ සම්බන්ධයෙන් සුප්‍රීම් උසාවියේ ඇති නඩු පිළිබඳව සඳහන් වන ලේඛනයක්. මට ලැබී තිබෙන වෙලාව සීමිත නිසා

[ගරු රවි කරුණානායක මහතා]

ඔබතුමාගේ අවසරය පරිදි මෙම ලේඛනය හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

2015 සහ 2016 වර්ෂවලට අදාළව මේ නඩු පවරා තිබෙන්නේ කුමන කාරණා සම්බන්ධයෙන්ද කියා මෙම ලේඛනයේ සඳහන් වී තිබෙනවා. එතකොට සියලු දෙනාම දන්නවා, මේ නඩු දමා තිබෙන්නේ මොන පදනම්න්ද කියා. වැඩියෙන්ම නඩු තිබෙන්නේ සුරාබදුවලටයි. නිෂ්පාදනය කරන අය බදු ගෙවන්නේ නැතිව වෙළෙඳාම් කර තිබෙන නිසා අප ඒ ප්‍රමාණය යම් විධියකින් ශීඝ්‍රයෙන් වැඩි කළා. ඉතින් වැඩි වුණාම උසාවියට යනවා. ඒක සාධාරණ නැහැ නේ.

ඔබතුමන්ලා දන්නවා, මන්ත්‍රීවරයෙකුට කවදාවත් ලැබුණේ නැති විධියට අද වර්ෂයකට රුපියල් මිලියන 15ක ප්‍රතිපාදන මුදලක් ලබා ගන්න අවස්ථාව උදා වෙලා තිබෙන බව. ඒ වාගේ දෙන්න පුළුවන් හැම දෙයක්ම ඔබතුමන්ලාට දීලා මන්ත්‍රීවරයෙක් වශයෙන් ගරුත්වයක් තියාගෙන කටයුතු කරන්න පුළුවන් වාතාවරණය අප හදලා තිබෙනවා. ඒ නිසා මෙවැනි ජාතික ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී පක්ෂ භේදයෙන් තොරව එකට එකතු වෙලා වැඩ කරන්න කියා ඔබ සියලුදෙනාගෙන්ම මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

අපේ ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා අදහස් දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. [බාධා කිරීමක්] මම ඒක ප්‍රතික්ෂේප කරනවා. සියයට හතේ තිබෙන එක සියයට අට කළා කියන්නේ ආයෙත් මාසයෙන් මාසයට හෝ අවුරුද්දෙන් අවුරුද්දට එන්න අවශ්‍යයි කියන එකයි. අප භාරගන්න කොටම එය සියයට අට පන්නලා ඉවරයි. අප භාර ගන්න කොට කියලා කියන්න කනගාටුයි. අප ලබා ගත්ත දෙයට ණය ගෙවන්න තිබුණේ 2015, 2016 වර්ෂවලයි. ඒවා ගෙවන කොට ඉබේම සියයට 8.8ත් පන්නලා ඉවරයි. මම සුමන්තිරන් මන්ත්‍රීතුමාට කථා කළ අවස්ථාවේදී එතුමා කිව්වා ඉදිරිපත් කරනවා කියා. මම ඒකට මගේ තර්කය ඉදිරිපත් කළා. එය සියයට 10ක් කරන එක එතුමා අනුමත කරනවා. හැබැයි, සමස්තයක් වශයෙන් ගත්තාම ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් මන්ත්‍රීතුමන්ලා එක හොඳ අදහසක් ඉදිරිපත් කර තිබෙනවා. අප රජයේ ආයතනයකට යම් මූල්‍ය සහයෝගයක් දෙනවා නම්, ඒකේ අඩු ගණනේ සියයට 20ක කොටස් ප්‍රමාණයක් තිබිය යුතුය කියන එකට එතුමා යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එතුමා ඉදිරිපත් කර තිබෙන්නේ "සියයට 50ක්" කියලා. නමුත්, අප එතැනදී එතුමාට පෙන්වා දුන්නා, බැංකුවක වැඩියෙන්ම තියාගන්න පුළුවන් සියයට 20ක් බව. ඒ නිසා සියයට 50ක් කරලා කියන්න බැහැ, එතැනදී යම් විධියෙන් සහයෝගයක් දෙන්න අවශ්‍ය නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, "මූල්‍ය ආයතන හැර" කියා සඳහන් කර තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමනි, "මූල්‍ය ආයතන හැර" කියා තිබුණාට, අප රක්ෂණය අරගෙන බලමු. සමහර වෙලාවට රක්ෂණයේ යම් තැන්වල- [බාධා කිරීමක්] අප මේක සියයට 20ක් කළොත් ඔය ඔක්කොම එකට ගණනය වෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතකොට මතුවන ප්‍රශ්නය මේකයි. අනික් ආයතනවලටත් සියයට 20ක් දෙනවාද? මා දන්නේ නැහැ කොහොමද තිබෙන්නේ කියා. මූල්‍ය ආයතනවල සියයට විස්සේ සීමාව මහ බැංකුව විසින් පනවා තිබෙන නිසා එම ආයතනවලට අප ඒ ණය ලබා දීමේදී මතුවන ගැටලු නිරාකරණය කිරීමට නම් අඩුම තරමේ රාජ්‍ය පංගුව සියයට පණහක්වත් පැවතීම තමයි වඩාත් සාධාරණ වන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සාධාරණ වෙනවා, විනිවිදභාවයක් තිබෙනවා කියන එකත් මම පිළිගන්නවා. නමුත්, හැම තැනම මේ වාගේ දෙයක් වුණොත් මොකද වන්නේ? සියයට 20 වුණත්, අප පාර්ලිමේන්තුවට ගේන්න අවශ්‍ය නැහැ. මොනවාද දුන්නේ කියා මාසයකට සැරයක් අප වාර්තා කරන්න ඕනෑ. එතකොට ඇයි දුන්නේ කියා ඔබතුමාට අහන්න අයිතියක් තිබෙනවා. අපට මේ තිබෙන විවේචනයම තමයි පසුවට එන ආණ්ඩුවලටත් එන්නේ. මීන් පසුව එන ඕනෑම ආණ්ඩුවකට එයට උත්තර දිය හැකි සැලැස්මක් තමයි අප හදුන්වා දෙන්න යන්නේ. මම මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුදෙනාගෙන්ම නැවත ඉල්ලා සිටින්නේ මේකයි. ඒ සියයට 20 කියන ගණන ඔබිනවා. ඒක කරන්න පුළුවන් වුණොත් ඔබතුමන්ලාට පෙනේවි එය හොඳයි කියා.

බලන්න, අද COPE එකේ සභාපතිවරයා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. Public Accounts Committee එකේත් එහෙමයි. ඊළඟට review panels, ඒ කියන්නේ -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, PAC එකේ සභාපතිවරයා ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමායි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි. අපේ සුමන්තිරන් මන්ත්‍රීතුමා Committee on Public Finance එකේ සභාපතිතුමායි. මේ දේවල්වලින් පෙනෙනවා, අපි රජයක් වශයෙන් තනියම මේවා බදාගෙන යන්නේ නැහැ කියලා. අපි මේ කමිටු විනිවිදභාවයෙන් යුතුව පවත්වාගෙන යනවා. එහෙමයි අපි කටයුතු කර තිබෙන්නේ. නමුත්, අසාධාරණ ප්‍රයෝජනයක් ගන්න එය පාවිච්චි කරන්න එපාය කියා මම ඔබතුමන්ලාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

මගේ අදහස් ඉදිරිපත් කරලා අන්තිමට ඔබතුමන්ලාගේ අදහස් දැක්වීම්වලට පිළිතුරු දෙන්න මම බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සියලු කරුණු සම්පිණ්ඩනය කර ඉදිරිපත් කරන්න මට නැවත අවස්ථාවක් ලැබෙනවාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Okay. At the end of the Debate, you can summarize that.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Thank you very much. Then, I will take it up at the end.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is the point of Order?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු ඇමතිතුමනි, ඔබතුමා යන්න පෙර පොඩි කාරණයක් පැහැදිලි කර ගන්න තිබෙනවා. දැන් ඔබතුමා කිව්වා, "විවිධ ක්‍රියා මාර්ග නිසා අපට ලැබිය යුතු බදු ආදායම නිසි ලෙස ගලා ඒමක් සිදු වුණේ නැහැ" කියලා. ඇත්ත වශයෙන්ම මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 12වන වගන්තිය අනුව, අපි සත්‍ය ආදායම හෙළි කරන්න ඕනෑ නේ. ඒ අනුව දැන් ප්‍රශ්නයක් මතු වෙන්නේ නැද්ද? අපි වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරන කොට, සත්‍ය ආදායම ඉදිරිපත් කරන්න ඕනෑ නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 12වන වගන්තිය අනුව සත්‍ය ආදායම ඉදිරිපත් කරන්න ඕනෑ. මම අහන්නේ, ඒ අනුව ප්‍රශ්නයක් වනවා නේද කියලායි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි මම කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Chandrasiri Gajadeera, that is not a point of Order.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ප්‍රශ්නයක් වන කොට අපට කියන්න පුළුවන්ද, සුප්‍රීම් උසාවිය ගත්ත තීන්දුව නිසා, ප්‍රායෝගික නොවන දෙයක් නිසා මෙන්න මේක වුණා කියලා?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Anura Dissanayake.

[අ.භා. 3.19]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ වැදගත්කම තමයි, අප රටේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදී, රජයට වුවත් සැලකිය යුතු සීමා පනවලා නීතියක් සම්පාදනය වෙලා තිබීම. මම ගරු මුදල් අමාත්‍යතුමාගෙන් මීට පෙර මේ පාර්ලිමේන්තුවේදී විමසුවා, මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව ගැන. ගරු මුදල් ඇමතිතුමනි, ඔබතුමා අහගෙන ඇතිය කියා මා හිතනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, ගරු මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම කලින් පෙන්වා දුන්නා, ඔබතුමාගේ වාර්තාව අනුව පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ණය සීමාව ඉක්මවා ණය ප්‍රමාණයක් ලබාගත් බවට විගණකාධිපතිතුමා විසින් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙන බව. ඒ කරුණු ඉදිරිපත් කළාට පසුව, ඒ පිළිබඳව යම් විමර්ශනයක්, සාකච්ඡාවක් සිදු වනවා කියා ඔබතුමා කිව්වාට ඒකට අවසන් වශයෙන් සිදු වූයේ කුමක්ද කියලා මේ පාර්ලිමේන්තුව තවම දැනුවත් කර නැහැ.[බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කථාව අවසානයේ මට ඒ ගැන කියන්න බැහැ. මොකද, මට ජනාධිපති කාර්යාලයට එන්න කියලා තිබෙනවා, හදිසි රැස්වීමකට.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
වැටි එක ගැන කථා කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, වැටි එක ගැන නොවෙයි. ඒක කරන ආකාරය උදේ අනුමත කර තිබෙනවා. විගණකාධිපතිගේ වාර්තාව අනුව ඔබතුමා අපට පෙන්වා දුන් කාරණය ගැන කියනවා නම්, ඒක වැරදිව උපුටා ගන්නේ. 2005 ඉඳන් Auditor-Generalලා පස්දෙනෙක් ඉදිරිපත් කරපු වාර්තා-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කියන්නේ, මීට කලින් විගණකාධිපති දෙපාර්තමේන්තුව අනුගමනය කරලා තිබෙන සම්ප්‍රදාය අනුව ගත්තොත්, ඒක හරි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නමුත් සිද්ධ වෙලා තිබෙන දේ තමයි, මෙතෙක් කල් අනුගමනය කරලා තිබෙන්නේ ඇත්ත එක නොවෙයි. ඒ කියන්නේ, අපි ගත්තු ණය ප්‍රමාණය- [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක මම- [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපි ඒකට වෙනම සංවාදයක් ගනිමු.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අද අපි විගණකාධිපති එක්ක කථා කළෙත් ඒ සම්බන්ධයෙනුයි. අද මගේ ලේකම්තුමා සහ නියෝජ්‍ය ලේකම්වරු දෙදෙනෙක්, Department of National Budget එකේ සියල්ලෝමත් මේ සම්බන්ධයෙන් කථා කළා. මම හිතන්නේ ඒ සම්බන්ධයෙන් යම් එකඟතාවකට- [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමන්ලා සාකච්ඡා කරලා අවසන් පිළිතුරක් අපට ලබා දෙන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි අද Cabinet එකට ඒක ඉදිරිපත් කළා. විගණකාධිපති මෙහෙම කියලා තිබෙනවා. නමුත්, 2005 ඉඳන් අවුරුදු ගණනාවක් කරලා තිබෙන්නේ මෙහෙමයි. අපි දැනුවත් කිරීමක් කළා. ඔබතුමන්ලාට ඒක වාර්තා කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මා අවධානය යොමු කරන්නේ අපේ රටේ ආර්ථිකය දැන් මුහුණ දීලා තිබෙන ප්‍රධාන ප්‍රශ්න අතර තිබෙන ණය බර ගැන. එහිදී මම හිතනවා, මේ නාස්තිය හා හොරකම නිසා ගන්නා ලද ණයවලින් අපට ප්‍රතිලාභයක් අත්පත් වුණාද කියලා. ඒ ප්‍රශ්නය තමයි මෙහි ප්‍රධාන ලෙසම තිබෙන්නේ. ඒ අනුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විගණකාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම සහ එයට තවත් බලතල පැවරීමක් පිළිබඳව අපේ අවධානය යොමු කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව අනුව, "රාජ්‍ය මූල්‍ය පාලනය සම්බන්ධ සම්පූර්ණ, අත්‍යන්ත බලය පාර්ලිමේන්තුව සතු වනවා." වාර්ෂිකව සම්මත කරන විසර්ජන පනතේ දැක්වෙන රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම සම්බන්ධ ගිණුම් පරීක්ෂා කර බලා පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමේ වගකීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව මඟින් විගණකාධිපති වෙත පවරා තිබෙනවා. එතකොට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විගණකාධිපතිවරයා රාජ්‍ය මූල්‍ය පිළිබඳව තම වාර්තා මඟින්, එනම් මූල්‍ය කාර්යක්ෂමතාව සහ ආර්ථික හා ඵලදායිතාව පරීක්ෂා කර පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමේ භාරමය වග කීමක් දරනවා. ඒ ව්‍යවස්ථානුකූල වග කීමක්. ඒ වාගේම විගණකාධිපතිවරයා විගණනය කරනුයේ පාර්ලිමේන්තුව වෙනුවෙන්. එනම්, මහ ජනතාව වෙනුවෙන්. විගණකාධිපතිවරයාට බලය ලබා දීම රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ පාර්ලිමේන්තු පාලනය ශක්තිමත් කිරීමකි. එය විගණකාධිපති තනතුර ශක්තිමත් කිරීමක් නොවන බව වටහා ගත යුතුය.

ඒ නිසා අද මේ විගණන පනත් කෙටුම්පතත් එක්ක ඇති වී තිබෙන ගැටලුව මම කියන්නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. කිසිසේත්ම විගණකාධිපතිවරයාගේ බලය අඩු කරනවාද, වැඩි කරනවාද කියන සාකච්ඡාවක් නොවෙයි මෙතැන තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවට පැවරී තිබෙන මූල්‍ය බලය ශක්තිමත් කරනවාද නැද්ද කියන සාකච්ඡාවක් තමයි මෙතැන තිබෙන්නේ. හැබැයි, මේ විගණන පනත් කෙටුම්පත පිළිබඳව 2003 සිට සාකච්ඡාවක් දියත් වෙමින් තිබෙනවා. 2003 මේ පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නැවත 2003 සිට 2015 දක්වා ගත වුණු අවුරුදු 12ම මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක කරනවා වෙනුවට, මේ පනත් කෙටුම්පත අඩ පණ කරන්න, මෙය සම්මත කිරීම වැළැක්වීම සඳහා තමයි ක්‍රියා මාර්ග ගත්තේ. ඒ නිසාම තමයි 2015 ජනවාරි මාසයේ 8වැනි දා බලයට පැමිණි තමුන්නාන්සේලාගේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කරන ලද දින සියයේ වැඩ පිළිවෙළ තුළ ඇතුළත් කර තිබුණා, දින සියයක් ඇතුළත මේ විගණන පනත් කෙටුම්පත සම්මත කොට ක්‍රියාත්මක කරන්න ඉඩ කඩ ලබා දෙනවාය කියා. හැබැයි, දැන් මොකක්ද සිදු වී තිබෙන්නේ? දැන් මාස 15කට අධික කාලයක් ගතවෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මෙම විගණන පනත් කෙටුම්පත සම්මත කිරීමට තමුන්නාන්සේලා තවමත් කටයුතු කරලා නැහැ. ඒ ඇයි? මම දැන ගන්න කැමැතියි, ඇයි මේක අදින්නේ කියලා. 2003 වසරේ සිට සාකච්ඡාවට බඳුන් වී තිබුණු, 2015 තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනයටත් ඇතුළත් කරන ලද සහ අග්‍රාමාත්‍යවරයා විසින් කැබිනට් මණ්ඩලයටත් ඉදිරිපත් කරන ලද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම සඳහා තමුන්නාන්සේලා මැළිකමක් දක්වන්නේ ඇයි? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ මූල්‍ය විගණනය සම්බන්ධයෙන් විශේෂයෙන්ම මේ ඇති වී තිබෙන විගණන පනත් කෙටුම්පත සම්මත කිරීම වැළැක්වීම සඳහා ආණ්ඩුවේ ඉහළ මට්ටමින්ම බලපෑමක් දියත් වෙමින් තිබෙනවා. මා කියන්නේ, කැබිනට් මණ්ඩලය මොන තරම් සදාචාර විය යුතුද? මොකද, අපේ රටේ මුදල් පාලනයේදී කැබිනට් මණ්ඩලය තමයි ඒ විධායකයේ කාර්ය භාරයේ විශාල පංගුවක් ඉටු කරන්නේ. හැබැයි, ඒ කැබිනට් මණ්ඩලයම මේ පනත් කෙටුම්පත සම්මත කරන්න අද බාධා කරමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය අවුරුදු ගණනාවක පාලනය දෙස බැලුවොත්, ඒ විගණන ක්‍රියාවලියේදී රාජ්‍ය මූල්‍ය අවභාවිතාව පිළිබඳ තොරතුරු එනවා නම්, ඒ තොරතුරු කෙළවරට හොයා ගෙන ගියාම, කැබිනට් මණ්ඩලයේ සාමාජිකයා තමයි අහු වෙන්නේ. ආරම්භයේදීම අහු වෙන්න පුළුවන් අධ්‍යක්ෂවරයා. ඊට පස්සේ අහු වෙන්න පුළුවන් ගණකාධිකාරිවරයා. ඊට පස්සේ අහු වෙන්න පුළුවන් අමාත්‍යාංශ ලේකම්වරයා. හැබැයි, කෙළවරට ගියාම ඉන්නේ අමාත්‍යවරයා. දේශපාලන හස්තයෙන් මිදිලා, ඒ මූල්‍ය අවභාවිතාව සිදු වුණේ

නැහැ. ඒ නිසා අද මොකක්ද සිදු වෙමින් තිබෙන්නේ? විගණන පනත් කෙටුම්පත සම්මත කිරීම මේ කැබිනට් මණ්ඩලය තමයි අද වළක්වා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහි කරුණු ලෙස ගත්තොත් මා ඔබතුමාට මේ ටික කියන්නම්.

2016.03.29වැනි දා, -ඒ කියන්නේ මාර්තු මාසයේ 29වැනි දා- අගමැතිතුමා විසින් විගණන පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළා. සුපුරුදු පරිදි 2016.04.26වැනි දින කැබිනට් අනු කමිටුවකට පනත් කෙටුම්පත ඉදිරිපත් කළා. -ආයෙත් කැබිනට් අනු කමිටුවක් දැම්මා- කවුද, එහි සාමාජිකයන්? සභාපති, සරත් අමුණුගම අමාත්‍යවරයා. රවුල් හකීම්, රවි කරුණානායක, අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා යන සාමාජිකයන්ගෙන් මේ කැබිනට් අනු කමිටුව හැදුවා. කැබිනට් අනු කමිටුව හදලා මේ අමාත්‍යවරු අතර නොවෙයි මේ සාකච්ඡාව සිද්ධ වුණේ. මා ඉතා වගකීමෙන් කියන්නේ. අමාත්‍යාංශ ලේකම්වරු තිදෙනෙකු විසින් 2016 මැයි මාසයේ 02වැනි දා අමාත්‍ය මණ්ඩලය වෙත සංශෝධන ඉදිරිපත් කළ පසු, එය කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. මෙම සංශෝධන අනුව පනත් කෙටුම්පතේ ඇති සමස්ත වගන්ති 57 තුළින් වගන්ති 27ක් සම්බන්ධයෙන්ම සංශෝධන, නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණා. මෙමඟින් පනත් කෙටුම්පතේ ඇති හරයාත්මක අරමුණු සම්පූර්ණයෙන්ම මරා දැම්මා; මේ පනත් කෙටුම්පතේ තිබෙන හරයාත්මක අරමුණු මුළුමනින්ම විනාශ කළා. මෙහි සභාපතිවරයා හැටියට කටයුතු කළේ කවුද? සරත් අමුණුගම අමාත්‍යවරයා. හැබැයි, ඔහු 2013- 2015 කාලය තුළ විගණන පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් වී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සූදානම් වූ අවස්ථා කිහිපයකදීම, එය නැවත කැබිනට් අනු කමිටුවට හෝ වෙනත් කමිටුවල සාකච්ඡා කිරීමට යොමු කිරීම පුරුද්දක් වී තිබුණා. ඊට හේතු වී ඇත්තේ, රාජ්‍ය මූල්‍ය පාලනය ශක්තිමත් කිරීමට අවංක වුවමනාවක් මෙම පාලකයන්ට නොමැතිවීමයි. එදාත් මොකද වුණේ? එදාත් ඒ හදපු සෑම කැබිනට් අනු කමිටුවකම සභාපති ධුරය හෙබවූයේ, සරත් අමුණුගම අමාත්‍යවරයායි. අදත් මෙම කැබිනට් අනු කමිටුවේ සභාපතිවරයා හැටියට සරත් අමුණුගම අමාත්‍යවරයා පත් කළා. ඔවුන් විසින් මොකක්ද කළේ?

2013 සිට විශේෂඥයන් කණ්ඩායමක් එකතු වෙලා, විගණන දෙපාර්තමේන්තුව එකතු වෙලා, නීතිපති දෙපාර්තමේන්තුව දායක කර ගෙන සකස් කරන ලද පනත් කෙටුම්තෙහි, වගන්ති 57න් වගන්ති 27ක්ම නැවත කැබිනට් අනු කමිටුව විසින් එක්කෝ සංශෝධනය කරන්න කියනවා; එක්කෝ වෙනස් කරන්න කියනවා. මොකක්ද මේ කරන්නේ? මේ පනත් කෙටුම්පතේ තිබුණු හරය මුළුමනින්ම මකා දැම්මා. ඒකෙන් කියන්නේ මොකක්ද? මුදල් අමාත්‍යවරයා කථා කරනකොට කියනවා, අපේ රටට මුදල් පිළිබඳ වගකීමක් තිබෙනවා; එය පාලනය කරන්න ඕනෑ; විශාල ණය කන්දක හිරවෙලා තිබෙනවා; කැබිනට් මණ්ඩලයට වාර්තා ඉදිරිපත් කරනවා කියා. ඒ පිළිබඳ වාර්තා පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් කරනවා කියා මුදල් අමාත්‍යවරයා කියනවා. මුදල් අමාත්‍යවරයා එසේ කිව්වත්, මුදල් අමාත්‍යවරයාගේ වැකි වැඩක් නැහැ. ප්‍රධාන වෙන්නේ මොකක්ද? ඒකට අදාළ වෙන පරිදි යන්ත්‍රණය සකස් කරන එකයි. යන්ත්‍රණයේදී ඉතා වැදගත් කාර්යයක් විගණන දෙපාර්තමේන්තුවට පැවරී තිබෙනවා. නමුත් මොකක්ද වෙලා තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව දැන් විගණන සේවා කොමිෂන් සභාවක් පිහිටුවා තිබෙනවා. විගණන සේවා කොමිෂන් සභාව පිහිටුවා දැන් මාස 7ක් ගතවෙලා තිබෙනවා. හැබැයි, කොමිෂන් සභාව පිහිටෙව්වාට ඒ කොමිෂන් සභාව ක්‍රියාත්මකවීමට අදාළ වන පනත හදලා නැහැ. දැන් කොමසාරිස්වරු පත් කරලා තිබෙනවා. ඔවුන්ට දීමනාවත් දෙනවා. මහජන මුදල් යම් ප්‍රමාණයක් ඒ කොමිෂන් සභාව වෙනුවෙන් වැය කරනවා. හැබැයි, කොමිෂන් සභාව ක්‍රියාත්මක වීමට අදාළ වෙන පරිදි විගණන පනත සකස් කර දීලා නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොමිෂන් සභාවක් තිබෙන හැබැයි, කොමිෂන් සභාවට බලය පැවරෙන පනතක් නැති ලෝකයේ එකම රට ලංකාවයි. කොමිෂන් සභාවක් ස්ථාපිත කළා නම්, ඒ කොමිෂන් සභාවට අදාළ වන පරිදි නීති සම්පාදනය කිරීම සඳහා, පාලනය කිරීම සඳහා පනත තිබෙන්න ඕනෑ. දැන් කොමිෂන් සභාව හදලා තිබෙනවා. පනත හදන්නේ නැහැ. ඇයි ඒ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පැවැති හැම පාලකයන්ම රාජ්‍ය මුදල් විගණනයට බයයි. ඒ නිසා තමුන්නාන්සේලා මොකක්ද කරමින් තිබෙන්නේ? ඒ විගණන ක්‍රියාවලිය අඩපණ කිරීම සඳහා මේ පනත් කෙටුම්පත සම්මතවීම අද මුළුමනින්ම වළක්වමින් සිටිනවා. ඊට පස්සේ මොකක්ද වුණේ? ඒ කිසිදු විරෝධයක් නොතකා අමාත්‍ය මණ්ඩලය විසින් එනම් නීතිපතිවරයා හරහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත අදාළ සංශෝධන ඉදිරිපත් කරන ලෙස අග්‍රාමාත්‍ය ලේකම්වරයා උපදෙස් දී තිබුණා. මේ සංශෝධනවලට විගණන ක්ෂේත්‍රයේ සියලුම ව්‍යක්තිය සමිති විරුද්ධ වුණා. හැබැයි, අග්‍රාමාත්‍යවරයා මොකක්ද කළේ? ඒ සංශෝධන යටතේ නැවත කෙටුම්පත හදන්න කියා අග්‍රාමාත්‍ය ලේකම්වරයාට උපදෙස් දුන්නා. අනතුරුව නැවතත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් වී ඇති අතර, එහිදී චරිත රත්වත්තේ මහතා ප්‍රමුඛ කමිටුවකට නැවත නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කළා. මාස දෙකක කාලය තුළ මෙසේ අමාත්‍යවරු සහ වෙනත් පුද්ගල කමිටුවලට පනත් කෙටුම්පත යොමුවීම තුළ රාජ්‍ය මුදල් පාලනය ශක්තිමත් කිරීම සඳහා වන අවංක චේතනාවෙන් කටයුතු කරන බවක් පෙනෙන්න නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා වැකිවලින් රාජ්‍ය මුදල් කළමනාකරණය පිළිබඳව, රාජ්‍ය මුදලේ ආරක්ෂාව පිළිබඳ සාකච්ඡා කළත් තමුන්නාන්සේලා ක්‍රියාකාරිත්වයෙන් පෙන්නුම් කරන්නේ, තමුන්නාන්සේලාගේ ඇත්ත චේතනාව වෙලා තිබෙන්නේ මෙම රාජ්‍ය මුදල් පාලනය ශක්තිමත් කිරීම වෙනුවට එය මුළුමනින්ම තමන්ට අවශ්‍ය වන පරිදි හැසිරවීම සඳහා කටයුතු කිරීමයි. අමාත්‍ය අනුකමිටුව මඟින් මූලිකවම පනත් කෙටුම්පත අධිභාර බලය, විගණන අරමුදල, අභ්‍යන්තර විගණනය, විගණන දෙපාර්තමේන්තුවේ වාර්ෂික ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය සම්බන්ධව නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දන්නවා, ඕනෑම අමාත්‍යාංශයක් ඒ අමාත්‍යාංශයට අවශ්‍ය වෙන මුදල් ලබා ගැනීම වෙනුවෙන් වාර්ෂික ඇස්තමේන්තුව සකස් කරලා භාණ්ඩාගාරයට ගිහිල්ලා, භාණ්ඩාගාරයත් එක්ක සාකච්ඡා කරලා තමයි ඒ මුදල් ලබා ගන්න ඕනෑ. ඒක හරි. කෘෂිකර්ම අමාත්‍යාංශය තමන්ට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන පිළිබඳ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කරලා, මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා ඒ මුදල් ලබා ගන්නවා. හැබැයි, අපි කියනවා කිසිසේත්ම විගණන දෙපාර්තමේන්තුව තවදුරටත් භාණ්ඩාගාරයේ අතකොළුවක් බවට පත්විය යුතු නැහැ කියා. විගණන සේවා කොමිෂන් සභාව හරහා අපි විගණන දෙපාර්තමේන්තුව ස්වාධීන ආයතනයක් බවට පත් කරන්න හදනවා නම්, එහි ප්‍රතිපාදන වෙන් කිරීම භාණ්ඩාගාරය අතේ තබා ගත යුතු නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ Sectoral Oversight Committees ගොඩ නඟා තිබෙනවා. ඒ Sectoral Oversight Committees හරහා මුදල් වෙන් කිරීම කරන්න අපට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා විගණන සේවා කොමිසමටත්, විගණන දෙපාර්තමේන්තුවටත් මුදල් වෙන් කිරීම එම නිලධාරීන්, භාණ්ඩාගාරය එක්ක කරන සාකච්ඡාවකින්

[ගරු අනුර දිසානායක මහතා]

නොවෙයි සිදුවිය යුත්තේ. Sectoral Oversight Committeesවලට, මූල්‍ය බලතල පිළිබඳ දැන් තිබෙන කාරක සභාව මඟින් තමයි විගණන දෙපාර්තමේන්තුවට අවශ්‍ය වන මුදල් ප්‍රතිපාදන වෙන් කර ගන්න ඕනෑ. එතකොට තමයි විගණන දෙපාර්තමේන්තුවෙත්, විගණන සේවා කොමිෂන් සභාවෙත් ස්වාධීන බව ආරක්ෂා වෙන්නේ. එසේ නැතුව භාණ්ඩාගාරයට ගිහින් සල්ලි ඉල්ලනවා නම්, එම ස්වාධීනභාවය විනාශ වෙනවා. මොකද, විගණන දෙපාර්තමේන්තුව තමයි භාණ්ඩාගාරයත් පරීක්ෂාවට භාජනය කරන්නේ. ඒ නිසා ඒ ගොල්ලන් මොකද කරන්නේ? තමන්ට ලබා දෙන මුදල් මත පාලනය කිරීමේ බලයක් එනවා. ඒ නිසා විගණන සේවා කොමිසමටත්, විගණන දෙපාර්තමේන්තුවටත් මුදල් වෙන් කිරීම දැන් ගොඩ නඟා තිබෙන Committee on Public Finance එක හරහා හෝ Budget Committee එක හරහා පාර්ලිමේන්තුව විසින් කරන්න ඕනෑ. එය පනත් කෙටුම්පතට ඇතුළත් කරන ලද වගන්තියක්. කොහොමද එය වැරැදියි කියන්නේ? හැබැයි, දැන් සරත් අමුණුගම අමාත්‍යතුමා ප්‍රධානත්වය දරන කමිටුව ඒ වගන්තිය ඉවත් කරන්න කියා කියනවා. එසේ ඉවත් කරන්න කියන්නේ ඇයි? මුදල් අමාත්‍යාංශයත් විගණනයට භාජනය වන ආයතනයක් නිසා, එම ආයතනයෙන් මුදල් ඉල්ලා ගැනීම වෙනුවට පාර්ලිමේන්තුව විසින් ඔවුන්ට ඒ මුදල් ලබාදීමේ ක්‍රමවේදය සකස් කළ යුතුයි කියා ඒ වගන්තියේ තිබෙනවා. නමුත් දැන් ඒ වගන්තිය වෙනස් කරන්න කියනවා.

ඊළඟට, මේ අධිභාරය පිළිබඳ ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අධිභාරය දඩයක් නොවෙයි. මෙය කිසිසේත්ම උසාවියක් හැටියට කටයුතු කිරීමක් නොවෙයි. යම් අමාත්‍යාංශයක රාජ්‍ය මුදල් අවභාවිත වෙලා තිබෙනවාය කියලා සාක්ෂි තිබෙනවා නම්, තොරතුරු තිබෙනවා නම්, විගණන දෙපාර්තමේන්තුවට බලයක් තිබිය යුතු වෙනවා, එම මුදල් නැවත අය කර ගැනීම සඳහා නියෝගයක් නිකුත් කරන්න. අමාත්‍යාංශ ලේකම්වරයාට ඒ නියෝගය නිකුත් කිරීමේ බලය විගණන දෙපාර්තමේන්තුවට තිබෙන්න ඕනෑ. 1993දී නිකුත් කළ චක්‍රලේඛනයක් තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්. අමාත්‍යාංශයේ ලේකම්වරයා මුළු මූල්‍ය ක්‍රියාවලියටම වග කියනවා නම්, එහිදී අවභාවිතයක් සිදු වෙලා තිබෙනවා නම්, ලේකම්වරයාගෙන් එම මුදල් අය කර ගැනීම සඳහා නියෝගයක් නිකුත් කිරීමේ බලය විගණන දෙපාර්තමේන්තුවට තිබෙන්න ඕනෑ. නමුත් මොකක්ද වෙලා තිබෙන්නේ? 1993දී නිකුත් කළ චක්‍රලේඛනයක් හරහා එම බලය ලබා දීලා තිබෙනවා අමාත්‍යාංශ ලේකම්වරයාට. ඒ නිසා, අමාත්‍යාංශයක යම් මුදල් අවභාවිතයක් සිද්ධ වුණොත් ඒවා නැවත අය කර ගැනීමේ බලය ලබා දෙන්නේ අමාත්‍යාංශ ලේකම්වරයාට, 1993 සිට. එදා සිට දැන් ගතවෙලා තිබෙනවා අවුරුදු 23ක්. මේ අවුරුදු 23ක කාලයටම එක අමාත්‍යාංශ ලේකම්වරයෙක්වත් ඒ බලය පාවිච්චි කරලා මුදලක් අය කරගෙන නැහැ. ඒ කියන්නේ මොකක්ද? ඒ මුදල් අවභාවිතයට මූලික ලෙස වග කිව යුතු වන්නේ අමාත්‍යාංශයේ ලේකම්වරයායි. ඒ නිසා අවභාවිතයේ යොදන මුදල් අය කර ගැනීමේ බලය අමාත්‍යාංශ ලේකම්වරයාට පවරා ගැනීම ස්වාභාවික යුක්තියට පටහැනියි. ඒ නිසා එහෙම නොවෙයි විය යුත්තේ. විගණන දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුව හරහා ක්‍රියාත්මක වන ස්වාධීන ආයතනයක් නම්, එම මුදල් නැවත ලබා ගැනීම සඳහා අධිභාරය පැනවීමේ බලය විගණන දෙපාර්තමේන්තුවට තිබෙන්න ඕනෑ. නමුත් අමාත්‍යාංශ අනු කමිටුව විසින් මොකක්ද කරන්නේ? විගණන දෙපාර්තමේන්තුවට තිබෙන ඒ අධිභාරය පැනවීමේ බලය ඉවත් කරලා තිබෙනවා.

ඊළඟ ප්‍රධාන ප්‍රශ්නය තමයි, විගණන අරමුදලක් ගැන යෝජනා කිරීම. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විගණන අරමුදල ගැන යෝජනා කරන විට සමහර අයට හිතෙනවා, මේ අරමුදල හදන්නේ නිලධාරීන් අතර බෙදා ගන්නයි කියලා. අපි දන්නවා රේගුවේ එවැනි අරමුදලක් හදන විට ඒ නිලධාරීන් අතර බෙදා ගන්න තමයි ඒ අරමුදල හැදුවේ කියලා. නමුත් නිලධාරීන් අතර බෙදා ගැනීමේ කථාවක් නොවෙයි මෙකැන තිබෙන්නේ. විගණන දෙපාර්තමේන්තුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම බලය පවරලා තිබෙනවා, තාක්ෂණික සහාය ලබා ගන්න ඕනෑ නම් විවිධ විශේෂඥයන්ගෙන් දැනුම ලබා ගන්නට පුළුවන් කියලා. අපට මතකයි, පසු ගිය කාලයේ වූ බැඳුම්කර ගනුදෙනුවේදී විගණකාධිපතිතුමා කිව්වා, ඒ ගනුදෙනුවේ සමහර ක්ෂේත්‍ර පිළිබඳව විශේෂඥ සහාය ලබා ගන්න ඕනෑය කියලා. ඒ විශේෂඥ සහාය ලබා ගන්නා විට ඔවුන්ට අතිරේක ගෙවීමක් කරන්න වෙනවා. නමුත් භාණ්ඩාගාරයෙන් ඒ මුදල දෙන්නේ නැත්නම් ඒ විශේෂඥ සහාය ලබා ගන්න බැහැ. ඒ නිසා "විගණන අරමුදල" කියලා ඔවුන් යෝජනා කරන්නේ කිසිසේත්ම එම නිලධාරීන්ට බෙදා ගැනීම සඳහා වන අරමුදලක් නොවෙයි. විගණන කටයුතු සඳහා යම් විශේෂඥ සහායක්, යම් ක්ෂේත්‍රයක ප්‍රවීණත්වයක් තිබෙන කණ්ඩායමකගේ සහායක් ලබා ගන්න ඕනෑ නම්, ඔවුන්ට ගෙවීම වෙනුවෙන් තමයි මේ අරමුදල යෝජනා කරන්නේ. "විගණන අරමුදල" කියන විට සාකච්ඡාවක් ගොඩ නැඟෙනවා, විගණනය කරලා යමක් අහු වුණාට පස්සේ, නිලධාරීන් අතර බෙදා ගන්න තමයි මේ අරමුදල හදන්නේ කියලා. නමුත් එහෙම එකක් නොවෙයි මේ. මේ අරමුදල හැදීමට යෝජනා කරලා තිබෙන්නේ වෙන මොකකටවත් නොවෙයි, විගණනය සඳහා තාක්ෂණික විශේෂඥ සහාය ලබා ගැනීමට අවශ්‍ය නම්, ඒ සහාය ලබා ගැනීම වෙනුවෙන් යම් මුදලක් දරන්නට වෙනවා නම්, අන්න ඒ මුදල සපයා ගැනීමේ අරමුදලක් ගොඩ නැඟීම සඳහායි. අමාත්‍යාංශ අනු කමිටුව ඇයි ඒක ප්‍රතික්ෂේප කරන්නේ? මම කැමැතියි ගරු සරත් අමුණුගම අමාත්‍යවරයා දැන් මේ සභාවේ හිටියා නම්.

ඊළඟට, අපි අභ්‍යන්තර විගණනය ගැන බලමු. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහිදී විශේෂයෙන්ම අභ්‍යන්තර විගණන බලය ශක්තිමත් කරන්න ඕනෑය කියන අතරම, මූල්‍ය විගණනයෙන් ඔබ්බට යන තාක්ෂණික විගණනය පිළිබඳ වැඩි බලයක් විගණන දෙපාර්තමේන්තුවට පවරා ගැනීම තමයි අරමුණ බවට පත් වී තිබෙන්නේ. අද අපි මුදල් පොත අරගෙන සල්ලි කියක් වියදම් වුණාද, වියදම් වුණේ කොහොමද කියන එක සොයා බලනවාට වඩා, එම වියදම් කරන ලද මුදල අදාළ ප්‍රතිලාභ ගෙනැත් දුන්නාද, නැද්ද කියන එක සෙවීම තමයි වැදගත් වෙලා තිබෙන්නේ. ඒ නිසා විගණන දෙපාර්තමේන්තුවට තවදුරටත් මූල්‍ය විගණනයෙන් ඔබ්බට යන තාක්ෂණික විගණනයක් කිරීමේ බලයක් තිබිය යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දී තිබූ කාලය අවසානයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 2003දී සාකච්ඡාවට බඳුන් වුණු මේ විගණන පනත් කෙටුම්පත , දින 100 වැඩසටහන තුළට ඇතුළත් කර තිබුණු යෝජනාව, මාර්තු මාසයේ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණු යෝජනාව, නැවත අනු කමිටුවලට දමන ලද සහ නැවත වරින වර රත්වත්තේ කමිටුවට දමන ලද යෝජනාව හරහා සම්මතවීම වැළැක්වීම සඳහා ආණ්ඩුව කටයුතු කරන්නේ ඇයි කියලා මම තමුන්නාන්සේලාගෙන් දැනගන්න කැමැතියි.

විගණන කොමිසමක් හදලා තිබෙනවා. ඒකොමිසමට මුදල් ප්‍රතිපාදන වෙන් කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව ටික දවසකින් මොකක්ද දන්නවාද වෙන්නේ? මේ විගණන කොමිෂන් සභාවත් විගණනයට ලක් වෙනවා. ඇයි ඒ? විගණන කොමිෂන් සභාවට මුදල් ලබා දීලා තිබෙනවා, නමුත් වැඩක් කෙරිලා නැහැ. ඒ නිසා විගණන කොමිසන් සභාවට එරෙහි audit query එකක් එනවා. ඒක මතක තියා ගන්න. අනිවාර්යයෙන්ම විගණන කොමිෂන් සභාවට එරෙහි විගණන විමසුමක් එනවා. ඇයි ඒ? කොමිෂන් සභාව හදලා තිබෙනවා. නමුත් ඒ කොමිෂන් සභාවට බලය පවරන පනත සම්මත කරලා නැහැ. ඒ නිසා ආණ්ඩුව, ඉක්මනින්ම, විගණන පනත් කෙටුම්පත සම්මතවීම වැළැක්වීම සඳහා දරන කුට ප්‍රයත්නය යටපත් කරලා, රාජ්‍ය මුදල් පිළිබඳ භාරකාරත්වය, මේ පාර්ලිමේන්තුවට තිබෙන භාරකාරත්වය ගැන හිතලා, ස්වාධීනව විගණනය කිරීම සඳහා වන බලය සහිත ඒ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවේදී සම්මත කර ගැනීම සඳහා කටයුතු කළ යුතුයි කියන යෝජනාව කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you very much. The next speaker is the Hon. Bandula Gunawardane. Before he speaks, will an Hon. Member propose the Hon. J.M. Anada Kumarasiri to the Chair?

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

Sir, I propose that the Hon J.M. Anada Kumarasiri do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் *தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

[අ.භා. 3.38]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පතට අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2003 වර්ෂයේදී ඉදිරිපත් කළ මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත මේ රටේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් වූ ඉතාම වැදගත් පනතක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවට අනුව, මුළු පාර්ලිමේන්තුවටම තමයි මූල්‍ය කළමනාකරණය පිළිබඳ වගකීම් පැවැරෙන්නේ. අත්තනෝමතික ලෙසත්, හිතුවක්කාර ලෙසත්, දේශපාලනික ඕනෑ එපාකම් අනුවත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සිද්ධ වුණොත් එහි බර සමස්ත ලාංකීය ජනතාව මත පැටවෙනවා. ඔවුන්ගේ ජීවිතවලට අතිරේක බරක් අපි එකතු කරනවා. ඒ නිසා තමයි රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වඩා කාර්යක්ෂමව ඵලදායී ලෙස කරන්නත්, හිතුවක්කාරී ලෙස රජයට හා දේශපාලනඥයන්ට හැසිරෙන්නට ඉඩ නොදෙන්නටත් අවශ්‍ය විධිවිධාන ඇතුළත් කරලා මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත් කෙටුම්පත මේ ගරු සභාවේ සම්මත කළේ. ඒ පනත් කෙටුම්පත සම්මත කිරීම හා පනත් කෙටුම්පත ගෙන ඒම සඳහා සක්‍රිය ලෙස දායක වූ කෙනෙකු ලෙස තමයි මා මේ කරුණු ඉදිරිපත් කරන්නේ.

රජය යම් යම් ආයතනවලින් ණය ලබා ගැනීමේදී ඇප වෙනවා. රජය ඇප වුණත්, ඒ ආයතනයට ඒ ණය මුදල ගෙවන්න බැරි වුණොත්, ඒ ණය මුදල ගෙවන්න රජයට සිද්ධ වනවා. සාමාන්‍ය ව්‍යවහාරයේදී වුණත් අපි වෙන කෙනෙක් වෙනුවෙන් ඇප වෙන්න බයයි. මොකද, අපි ඇප වෙන පුද්ගලයා ඒ ණය නොගෙවා සිටියොත් අපට ඒ ණය මුදල ගෙවන්න සිද්ධ වන නිසා. මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත අනුව 2016.04.30 වන දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැංකු ඇපකර ලැයිස්තුවක් දක්වා තිබෙනවා. එය මගේ කථාවේ කොටසක් ලෙස පළ කරන්නැයි ඉල්ලා සිටින අතර, එහි සඳහන් ආයතන කිහිපයක් ගැන සඳහන් කරන්න කැමැතියි.

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව ලංකා බැංකුවෙන් රුපියල් මිලියන 132,678.00ක් ලබා ගෙන තිබෙනවා. එයට රජය ඇප වෙලා තිබෙනවා. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ලංකා බැංකුවෙන් රුපියල් මිලියන 16,348.96ක් ලබා ගෙන තිබෙනවා. එයට රජය ඇප වෙලා තිබෙනවා. මාර්ග සංවර්ධන අධිකාරිය ලංකා බැංකුවෙන් ලබාගත් රුපියල් මිලියන 42,356.51ක ණය වෙනුවෙන් රජය ඇප වෙලා තිබෙනවා. මාර්ග සංවර්ධන අධිකාරිය හැටන් නැෂනල් බැංකුවෙන් ලබා ගත් රුපියල් මිලියන 28,262.54ක් සඳහා රජය ඇප වෙලා තිබෙනවා. සීමා සහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගම ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයෙන් - JICA - ලබා ගෙන තිබෙන රුපියල් මිලියන 40,145.24ක් වෙනුවෙන් රජය ඇප වෙලා තිබෙනවා. මේ විධියට දේශීය හා විදේශීය අයට රජය ඇප වෙනවා. ඒ ආකාරයෙන් ඇප වුණු මුදල් පිළිබඳව මුදල් අමාත්‍යාංශය විසින් පළ කරන ලද, "වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව-2016" පොතේ 45, 46 වෙනි පිටුවල ඇතුළත් කරුණු ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවබෝධය සඳහා මගේ කථාවේ කොටසක් ලෙස හැන්සාඩ් වාර්තාවේ පළ කරන ලෙස ඉල්ලා සිටිමින් එය **සභාගත*** කරනවා.

ගරු මුදල් අමාත්‍යවරයා අලුත් යෝජනාවක් ගෙනාවා, රාජ්‍ය හා පෞද්ගලික අංශය විසින් ව්‍යාපාර පටන් ගන්න. ඒ විධියට පටන් ගන්න ව්‍යාපාරවල රජයේ ප්‍රාග්ධනය සියයට 50ට අඩුවෙන් යොදවා තිබෙනවා නම්, ඒක රාජ්‍ය ව්‍යවසායයක් ලෙස සැලකෙන්නේ නැහැ. සියයට 47ක්, සියයට 48ක් යොදලා දේශීය හෝ විදේශීය ආයෝජකයෙක් එක්ක ව්‍යාපාරයක් පටන් ගත්තොත්, ඒක සම්පූර්ණයෙන් රාජ්‍ය ව්‍යවසායයක් වෙන්නේ නැහැ. පෞද්ගලික හා රජයේ හවුල් ව්‍යාපාර ලෙස කරගෙන යන ව්‍යාපාරවලටත් ඇප වෙන්න අවසර ඉල්ලමින් තමයි අද මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ. ඒක අය වැය යෝජනාවක්. රවි කරුණානායක මුදල් අමාත්‍යවරයා අය වැයෙන් මේ ගරු සභාවට එය යෝජනා කළා. එය ඉතා අහිතකර තත්ත්වයක්. මක්නිසාදයත්, සියයට 50ටත් වඩා අඩුවෙන් රජයේ කොටස් තිබෙන පෞද්ගලික අංශයේ සමාගම්වලට රජය ඇප වෙලා, ඒ සමාගම් බංකොලොත් වුණොත්, නැත්නම් ඒ සමාගමේ ව්‍යාපෘතිය අසාර්ථක වුණොත් එහි සම්පූර්ණ බර මේ රටේ ජනතාව මත පැටවෙන නිසා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

මේ පනත් කෙටුම්පත ගෙනෙන අවස්ථාවේදී, දළ දේශීය නිෂ්පාදනයෙන් රජයට ඇප වෙන්න පුළුවන් ප්‍රමාණය සියයට 4.5යි. මහින්ද රාජපක්ෂ රජය විසින් යුද්ධය නිම කිරීමෙන් පස්සේ සියයට 7 දක්වා ඇප වීමේ සීමාව වැඩි කළා. දළ දේශීය නිෂ්පාදනය සියයක් නම් 7 දක්වා ඇප වෙන්න පුළුවන්. මේ සංශෝධන පනත් කෙටුම්පතෙන් ඇමතිතුමා අවසර ඉල්ලා සිටිනවා, සියයට 10 දක්වා ඇපවන සීමාව වැඩි කරන්න කියලා. මේ දෙකම රටේ රාජ්‍ය ණය පිළිබඳ අවදානම වැඩි කරන දේවල්. දළ දේශීය නිෂ්පාදනය සියයක් නම් ආණ්ඩුව බාහිර පාර්ශ්වය වෙනුවෙන් සියයට 10ක් ඇප වෙලා තිබෙනවා.

පෞද්ගලික අංශයත් එක්ක පටන් ගන්න ව්‍යාපෘති අසාර්ථක වුණාම ඒවාට රජයට ගෙවන්න සිදු වෙනවා. ඒ දෙකම රටට, රටේ අනාගතයට අහිතකර වෙන නිසා මේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියට ප්‍රමාණික අවබෝධයකින් යුතුව දායකවන කෙනෙකු ලෙස මම ශ්‍රේෂ්ඨාධිකරණයට මේ පිළිබඳව පෙත්සමක් ඉදිරිපත් කළා. මම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටියා, මේ දෙකම අහිතකර වන නිසා මේ සඳහා මැදිහත් වෙන්න කියලා. ශ්‍රේෂ්ඨාධිකරණයේ උගත් විනිසුරුතුමන්ලා කිව්වා, ඒක පාර්ලිමේන්තුවට ගිහිල්ලා බේරා ගන්න කියලා. පාර්ලිමේන්තුව තුළ ඉන්න ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට මේ කරුණු පැහැදිලි කර දීලා පාර්ලිමේන්තුව විසින් මීසක් එයට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියෝගයක් දෙන්න බැහැ කියලා කිව්වා.

කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් නොකර, ස්ථාවර නියෝගවලට පටහැනිව එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන නිසා එය ශූන්‍ය කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් දුන්නා. මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පතට විරුද්ධව මම පෙත්සම ඉදිරිපත් කළාම එහෙම නියෝගයක් දුන්නේ නැහැ. උසාවිය මීට ඉස්සෙල්ලාත් එහෙම ක්‍රියා කරලා තිබෙනවා. මට මතකයි, රවි කරුණානායක අමාත්‍යතුමා විපක්ෂයේ සිටි කාලයේ කින්නියාවල පාලිත ස්වාමීන් වහන්සේ සමඟ උසාවියෙන් තීන්දුවක් ගත්තා, බඩිජ තෙල් සඳහා අය කරන බදු අඩු කරන්න කියලා රජයට නියම කරන්න කියලා. ඒක ශ්‍රේෂ්ඨාධිකරණයට කියන්න පුළුවන් එකක් නොවෙයි. මක්නිසාදයත්, බදු අඩු කරනවාද, බදු වැඩි කරනවාද, බදු සංශෝධනය කරනවාද, බදු පනවනවාද, බදු පනවන්නේ නැද්ද යන්න තීරණය කිරීම පිළිබඳ පූර්ණ අයිතිය තිබෙන්නේ මේ ගරු සභාවට; පාර්ලිමේන්තුවට.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වැනි ව්‍යවස්ථාවට අනුව මුදල් පිළිබඳව සම්පූර්ණ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. එතකොට මේ විධියට බදු පනවන්නය කියලා මේ ගරු සභාවට විධාන දෙන්න ශ්‍රේෂ්ඨාධිකරණයකට බැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයේ උගත් විනිසුරුතුමන්ට පරීක්ෂා කරන්න පුළුවන් වන්නේ, මේ ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පත් හෝ සංශෝධන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිද, ස්ථාවර නියෝගවලට පටහැනිද කියන එකයි. අත්තනෝමතික ලෙස ඒවා ඉදිරිපත් කරලා තිබෙනවා නම් ඒ අවස්ථාවේදී අධිකරණයට පුළුවන් සාධාරණ හා යුක්ති සහගත තීන්දුවක් ලබා දෙන්න. එම තීන්දුව තමයි එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ලබා දුන්නේ. නමුත් මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පතට විරුද්ධව එසේ ක්‍රියා කරන්න ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් ලබා දුන්නේ නැති බව ගරු කථානායකතුමා පසු ගිය දා මේ ගරු සභාවට දැනුම් දුන්නා.

ඊට පසුව මේ පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කමිටු - Sectoral Oversight Committees - අලුතෙන් ඇති කළා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ලෙස කටයුතු කරන්නේ විපක්ෂයේ -TNA එකේ- අපේ ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා. මේ කමිටුව රැස් වුණා. අග්‍රාමාත්‍යතුමා මේ ආංශික අධීක්ෂණ කාරක සභා පත් කරන අවස්ථාවේ කිව්වා, කලින් පැවතුණු උපදේශක කාරක සභා වෙනුවට ඉතාම ප්‍රබුද්ධ පිරිසකගෙන් සමන්විත, ඇමතිවරයාගේ කටයුතු පාලනය කරන්න පුළුවන්, රටට අහිතකර දේවල්වලට මැදිහත් වෙන්න පුළුවන්, ප්‍රජාතන්ත්‍රවාදී, ලිච්ඡවී ක්‍රමය අනුගමනය කරන Sectoral Oversight Committee තමයි මේ ඇති කරන්නේ කියලා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ මමත් සාමාජිකයෙක්. මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළු කමිටුව රැස් වෙච්ච අවස්ථාවේදී අපි මේ කරුණ සම්බන්ධයෙන් කිව්වාම, ලංකාවේ පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ඒකමතිකව යෝජනා දෙකක් සම්මත කර ගත්තා. ආණ්ඩුවේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරු එහි හිටියා. ඒ යෝජනා දෙක මොකක්ද? එක යෝජනාවක් තමයි පෞද්ගලික අංශයත්, රජයත් හවුල් වෙලා කරන ව්‍යාපෘතිවලට රජය ඇප නොදිය යුතුයි කියන යෝජනාව. රජය ලබා ගන්නා ණයවලට පමණයි ඇප දිය යුත්තේ. රජය ගන්නා ණයවලට හැර - රාජ්‍ය අංශයේ, රජයේ බහුතර අයිතිය යටතේ තිබෙන ආයතන ගන්නා ණයවලට හැර - පෞද්ගලික අංශය සමඟ අඩු අයිතියක් තිබෙන රජයේ ආයතනවලට ඇපවීම සම්පූර්ණයෙන් නොකළ යුතුයි කියලා එදා එම කාරක සභාව විසින් තීන්දුවක් ගත්තා.

දෙවනුව, මෙය සියයට 10 දක්වා වැඩි කිරීම දැඩි ලෙස අවදානම් සහිත නිසා එය සියයට 8ක් විය යුතුය; සියයට 10ට වඩා අඩු විය යුතුය කියන යෝජනාව සම්මත කර ගත්තා. එම යෝජනා දෙකම සංශෝධන ලෙස මේ වන විට මෙම ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. කවුද ඉදිරිපත් කරලා තිබෙන්නේ? රජයේ මුදල් පිළිබඳ කාරක සභාව - Committee on Public Finance - තමයි මේ යෝජනා දෙක ඉදිරිපත් කරලා තිබෙන්නේ. මුදල් අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවලට ගරු කරනවාද, ආංශික අධීක්ෂණ කාරක සභා ගණන් ගන්නවාද, නැත්නම් මේවා විහිළු සපයන ආයතනද කියන ටික අද සවසට මේ සංශෝධන දෙක පිළිගන්නවාද, නැද්ද කියන එක මත තීන්දු වෙනවා. ඒක අද හවස් වෙනකොට බලන්න පුළුවන්. ඒ නිසා අපි ඉතාම කරුණාවෙන් හා ඕනෑකමින් ඉල්ලීමක් කරනවා. මුදල් පිළිබඳ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තුවට පත්වන මන්ත්‍රීවරුන්ගේ වගකීම අනුව පාර්ලිමේන්තුවේ සකස් කර තිබෙන ආංශික අධීක්ෂණ කමිටුව විසින් තීරණයක් අරගෙන, ඒ තීරණය සංශෝධන ලෙස ඉදිරිපත් කළාම එය මුදල් ඇමතිවරයා පිළිගන්න ලැහැස්තිද, නැද්ද? ප්‍රජාතන්ත්‍රවාදී, විනිවිද පෙනෙන, කාර්යක්ෂම මූල්‍ය පාලනයකට වග කියන්න ලැහැස්ති මුදල් අමාත්‍යාංශයක්ද තිබෙන්නේ කියන එක තීරණය වන ඓතිහාසික දවසක් ලෙස අද දවස ඉතිහාසයේ සටහන් වෙයි. ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා, මෙක පාර්ලිමේන්තුවට අරගෙන ගිහිල්ලා විසඳාගන්න කියලා. පාර්ලිමේන්තුවට ඇවිල්ලා, පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාව කියනවා, "ඉදිරිපත් වෙලා තිබෙන සංශෝධනය වෙනස් කරන්න ඕනෑ" කියලා. ඒ සඳහා සංශෝධනයක් දෙනවා. ඒ සංශෝධන දැන් මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. අපි අද සවසට බලමු, මුදල් ඇමතිතුමා මේ සංශෝධන පිළිගන්නවාද, නැද්ද කියලා. පිළිගන්නේ නැත්නම් එතුමා තව දුරටත් සූදානම් වෙන්නේ පාර්ලිමේන්තුව බුල්ඩෝසර්කරණය කරගෙන හිතුවක්කාර ලෙස යන ගමන, අවදානම් සහිත ගමන ඒ ආකාරයෙන්ම ගමන් කරන්නයි. ඒක නිරෝගී ප්‍රජාතන්ත්‍රවාදයට බාධාවක් වන අතර, මේ රජය අගාධයට ඇදගෙන වැටීම සඳහා වන හේතු සාධකවලට අලුත් එකතුවක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1989 ඉඳලා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් ලෙස මම

ඉතාම වග කීමෙන් කියනවා, සාමාන්‍යයෙන් රජය හෝ කැබිනට් අමාත්‍යවරු විසින් කවදාවත් අසත්‍යයක්; බොරුවක්, පාර්ලිමේන්තුව නොමඟ යවන සුළු ප්‍රකාශයක් මේ ගරු සභාවට කරන්නේ නැහැ කියන එක. ඒක තමයි මේ රටේ තිබුණු පාර්ලිමේන්තු සම්ප්‍රදාය. දශමයක්, ඉලක්කමක් වෙනස් වුණොත්, ඒ වෙනස නිවැරදි කරලා කියන එක තමයි මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය. නමුත් ඉතාම අවාසනාවන්ත ලෙස මේ රජය බලයට පත් වූ දවසේ සිට රාජ්‍ය මූල්‍ය හා සම්බන්ධයෙන් කියන ප්‍රධාන තර්ක දෙකක් තිබෙනවා. එකක් තමයි "විනාශ කරලා, ඉවර කරලා, දණ ගස්සපු මේ රටේ ආර්ථිකය ගොඩ ගන්න ඕනෑ" කියන එක. හැබැයි, ඒක පට්ටපල් අසත්‍යයක්. මොකද, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ ඉදිරිපත් කර තිබෙන සියලු සංඛ්‍යා දත්ත සහිත වාර්ෂික වාර්තාව අනුව, රටේ නිමැවුම වැඩි වෙලා, ආදායම වැඩි වෙලා, සේවා නියුක්තිය වැඩි වෙලා, විරැකියාව අඩු වෙලා, පොලී අනුපාතය අඩු වෙලා, ඉතුරුම් වැඩි වෙලා, ආයෝජනය වැඩි වෙලා, ගෙවුම් ශේෂයේ අතිරික්තයක් ඇති වෙලා, මුදල ස්ථාවර වෙලා, ණය බරතාව අඩු වෙලා, ආර්ථිකයේ ස්වර්ණමය යුගය මහින්ද රාජපක්ෂගේ 2014 වර්ෂය කියලා ඔප්පු කරලා තිබෙනවා. 2015 වාර්ෂික වාර්තාව මහින් මුදල් අමාත්‍යවරයා මේ ගරු සභාවට දත්ත, සංඛ්‍යා සහිතව ඒක ඔප්පු කරලා කියලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
එහෙම කියන අතරම, ණය බරතාව පිළිබඳව විශාල අසත්‍යයක් ප්‍රකාශ කර තිබෙනවා. ණය බර පිළිබඳව මම මේ කරුණ විතරක් පැහැදිලි කරන්නම්. 1977 සිට 1994 දක්වා වූ මුළු කාලයටම ණය බර වැඩි වෙලා තිබෙනවා, සියයට 2098කින්. වර්ෂයකට සියයට 116කින් ණය බර වැඩි වෙලා තිබෙනවා. 1995 වසරේ සිට 2014 වසර දක්වා ණයබර වැඩි වෙලා තිබෙන්නේ සියයට 1070කින්. ඒ කියන්නේ වර්ෂයකට සියයට 53.5කින්. 2005-2014 කාලය ගත්තොත් ණයබර වැඩි වෙලා තිබෙන්නේ සියයට 228කින්. එතකොට වාර්ෂික සාමාන්‍යය සියයට 23යි. ණයබර පිළිබඳව සම්පූර්ණ අසත්‍යයක් තමයි මේ පතුරවන්නේ. මක්නිසාද යත්, 2005 වසරේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට භාර ගන්නා විට දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය ප්‍රමාණය 102.3යි. 2014 වසරේදී රට භාර දෙන විට දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය ප්‍රමාණය 70යි; භාර දීලා අවුරුද්දක් තුළදී 76ට වැඩි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, රුපියල අවප්‍රමාණය වීම නිසා පමණක් රටේ ණයබර රුපියල් බිලියන 285කින් වැඩි වෙලා තිබෙනවා.

2014 වසරේදී මහින්ද රාජපක්ෂ ආණ්ඩුව විදේශ ව්‍යාපාර මුදලින් අර ගෙන තිබුණු දේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 20.4යි. 2015 වර්ෂයේදී විතරක් මේ රජය ලබා ගත්තා, රුපියල් බිලියන 222.4ක්. ඉතිහාසය දෙස බලන විට විදේශවලින් ගත්ත ණය ප්‍රමාණය සියයට 1010කින් වැඩි කරපු එකම ආණ්ඩුව තමයි මේ ආණ්ඩුව. එය එසේ නොවෙයි කියලා පුළුවන් නම් කියන්න. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2015 වාර්ෂික වාර්තාවේ 199 වැනි පිටුවේ සඳහන් වන ආකාරයට විදේශ ණය ප්‍රමාණය සියයට 1010කින් වැඩි කර ගෙන තිබෙනවා.

ස්වෛරී බැඳුම්කර නිකුත් කිරීම ගත්තොත්, ස්වෛරී බැඳුම්කර නිකුත් කිරීමෙන් පිට රටවලින් ගිනිපොලියට ණය ගැනීම සම්බන්ධයෙන් වත්මන් අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් කරන ලද කථාවක් 2013 නොවැම්බර් මාසයේ 22වන දා හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 277හි මෙසේ සඳහන් වී තිබෙනවා:

> "එහෙත් අද තත්ත්වය කුමක්ද? මහ බැංකු වාර්තාවට අනුව රුපියල් බිලියන 80ක භාණ්ඩාගාර බිල්පත් සහ රුපියල් බිලියන 317ක භාණ්ඩාගාර බැඳුම්කරත් විදේශීය පෞද්ගලික ආයෝජකයින් අයිති කරගෙන තිබෙනවා. ණයවලින් සියයට 12ක් මේ විදේශීය පෞද්ගලික ආයෝජකයින් පාලනය කරනවා. මෙය එක් අතකින් විදේශීය ෂයිලොක්ලාට රට උකස් කිරීමක්. අනෙක් අතින් අපේ රටේ ස්වෛරී භාවය විදේශීය ෂයිලොක්ලාට පාවා දීමක්. අන්න ඒකයි මම කියන්නේ. මෙය සිදු කරන්නේ රටේ පරමාධිපත්‍ය ගැන පම්පෝරි ගහන උදවියමයි. මෙකද ඔබේ ජාතිකත්වය, දේශානුරාගය? ඇයි අපි විදේශීය පෞද්ගලික ආයෝජකයන්ට අපේ ජාතික ණයෙන් කොටසක් දෙන්නේ?
>
> රට පාවා දී තිබෙන්නේ කවුද කියා මෙයින් පැහැදිලියි. එදා දොන් ජුවන් ධර්මපාල රජු රටේ කොටසින් කොටස පෘතුගාලයට පාවා දුන්නා වාගේ අපේ ජාතික ණයෙන් කොටසින් කොටස විදේශීය පෞද්ගලික ආයෝජකයින්ට පාවා දී තිබෙනවා."

ඒ මහින් සිදු වන්නේ ෂයිලොක්ලා වාගේ පෞද්ගලික ආයෝජකයන්ට අපේ රටේ ස්වෛරී භාවය පාවා දීමක්ය කියලා එදා කියලා, 2015 වසරේදී සියයට 6.12 පොලියට රුපියල් මිලියන 650ක ස්වෛරී බැඳුම්කර නිකුත් කළා. ඊට පස්සේ සියයට 6.85 පොලියට රුපියල් මිලියන 1,500ක බැඳුම්කර නිකුත් කළා. 2016 වසරේදී සියයට 7 පොලියට රුපියල් මිලියන 1,500ක බැඳුම්කර අලුතෙන් නිකුත් කළා. දැනට රුපියල් බිලියන 3.6ක් ස්වෛරී බැඳුම්කරවලින් - sovereign bondsවලින් - විතරක් ණය අර ගෙන තිබෙනවා. මේ ඔක්කෝම අර ගෙන මොනවා කරනවාද කියලා හිතා ගන්න බැරි, පිට රටින් ඛනිජ තෙල් ගෙන්වීමට වැය වන මුදලින් ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5ක් ඉතුරු වෙලා තිබෙන නිසයි. මොන ණයද ගෙවන්න බැරි, ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5ක මුදලක් රට ඇතුළේ ඉතුරු වුණාම? මූල්‍ය කළමනාකරණය සම්පූර්ණයෙන් විනාශ වෙලා තමයි නවතින්නේ. අද VAT එකට විරුද්ධව තීන්දුවක් දීලා තිබෙන්නේත්, අනුගමනය කළ යුතු ක්‍රමවේද අනුගමනය කරන්නේ නැතුව හිතුවක්කාරී ලෙස මේ රටේ පනත්, අණ පනත් සියල්ල උල්ලංඝනය කරමින්, මුදල් ඇමතිවරයා සහ මුදල් අමාත්‍යාංශය අත්තනෝමතික ගමනක් යන්න හදපු නිසයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ලංකා ඉතිහාසයේ හිටපු කිසිම මුදල් ඇමතිවරයෙකුට මේ වාගේ තත්ත්වයක් උදා වුණේ නැහැ. මෙය මුදල් අමාත්‍යතුමා පෞද්ගලිකව විවේචනය කිරීමක් නොවෙයි. එතුමාගේ පෞද්ගලික ව්‍යාපාර ගැන, එතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල ගැන අපි කථා කරන්නේ නැහැ. මම කථා කරන්නේ විෂයානුබද්ධව, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට කරන විනාශය ගැනයි. මේක එතුමාට වඩා හොඳට ළමයෙකුටත් කරන්න පුළුවන්. පාර්ලිමේන්තුව හා පාර්ලිමේන්තුවේ තිබෙන කමිටුවල නියමවලට ගරු කරමින්, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරමින්, අපි අපේ වගකීමට අනුව මූල්‍ය කළමනාකරණය සඳහා සක්‍රිය ලෙස මැදිහත් වෙන්න ඕනෑ. ජනතාවට අහිතකර ලෙස අණපනත් ගෙනෙන්න හදන උත්සාහය පරාජය කරලා, Oversight Committee එකේ සංශෝධන දෙක පිළිගෙන අලුත් ආදර්ශයක් දෙන්න කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිමින්, මාගේ වචන කිහිපය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.58]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට විහිළු සපයන්නේ Oversight Committees නොවෙයි. මමත් Oversight Committee එකක සභාපතිවරයෙක්. එදා හිටපු ඇමතිවරු තමයි මේ රටට විහිළු සැපයුවේ. එදා ආණ්ඩුවේ හිටපු ගරු බන්දුල ගුණවර්ධන වාගේ ඇමතිවරු කියපු කථා අපිට අමතකවෙලා නැහැ. හතර දෙනෙකු ඉන්න පවුලකට රුපියල් 2,500කින් මාසයක් කන්න පුළුවන් කියලා කිව්වා. ඔන්න ඔවා තමයි විහිළු. මේ රටට විහිළු සපයන්නේ Oversight Committees නොවෙයි. ඔබතුමා මුදල් ඇමතිතුමා හැටියට සිටියදී කිව්වා, සක්කරයාගේ පුතා වයිමා ආවාත් ගෑස් සිලින්ඩරයේ මිල අඩු කරන්න බැහැ කියලා. අපි අද සියයට 50කින් ගෑස් සිලින්ඩරයේ මිල අඩු කරලා තිබෙනවා, ඔබතුමා නිතුවාට වඩා. ගරු මන්ත්‍රීතුමා කිව්ව අන්න ඒවා තමයි විහිළු. ඔවා අමතකවෙලා තමයි දැන් කථා කරන්නේ.

ඒ විතරක් නොවෙයි, අද අපි මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරනවා; ණය ගන්නා සීමා ගැන කථා කරනවා; පනත් ගැන වාද විවාද කරනවා. එදා පාර්ලිමේන්තුව තියා මහ බැංකුව දන්නේත් නැහැ, මේ රට ගත්ත ණය ප්‍රමාණය කොච්චරද කියලා. මැරිලා උපන්නා වාගේ අද ඒවාට සීමා දමන හැටි ගැන කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි කථාවක් අහලා තිබෙනවා, "ළිඳේ වැටුණු මිනිහා ළිං කටින්ම ගොඩ එන්න ඕනෑ"ය කියලා. මේ අය මේ රටේ මිනිසුන් ණයකාරයින් බවට පත් කරලා තිබෙනවා. මේ රටේ මිනිසුන් ණයකාරයින් බවට පත් කළත් කමක් නැහැ, එදා ජේ.ආර්. ජයවර්ධන වාගේ ණය අරගෙන, ඒ මුදල් රටේ සංවර්ධනයට යෙදෙව්වා නම්. නැව් එන්නේ නැති වරායවල් හදලා, ගුවන් යානා එන්නේ නැති ගුවන් තොටු පොළවල් හදලා, රටේ මිනිසුන් ණයකාරයින් බවට පත් කරලා, අන්තිමට ණය අරගෙන, ණය අරගෙන බැරිම තැන Colombo Port City වාගේ ව්‍යාපාර කරලා, චීනුන්ට මේ රටේ ඉඩම් පවා සින්නක්කරව දීපු රටක් තමයි අපි නිවැරැදි කරන්න දැන් උත්සාහ කරන්නේ. අපි විශේෂයෙන් කියනවා, -[බාධා කිරීමක්] ඒ වැටුණු වළෙන් දැන් ගොඩ එන්න තමයි උත්සාහ කරන්නේ. ඔබතුමා ඔය කියන ඒවා අපිට පිළිගන්න බැහැනේ, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. හතර දෙනෙකු ඉන්න පවුලකට රුපියල් 2,500කින් මාසයක් කන්න දෙන්න පුළුවන් කියලා කිව්වා. ඔවා තමයි විහිළු; ඔවා තමයි විහිළු. මුදල් ඇමතිවරයා, අග්‍රාමාත්‍යතුමා සහ අතිගරු ජනාධිපතිතුමා එදා දැක්කා, මේ රට හිරකරලා තිබෙන ණය උගුල මොකක්ද කියලා. එදා අය වැය යෝජනා ඉදිරිපත් කරනකොට - අද කියන කථාවක් නොවෙයි - අපි කිව්වා, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 7ක් වූ රජයේ ඇප සීමාව, සියයට 10 දක්වා පුළුල් කළ යුතුයි කියලා. අපි තමයි එදා එහෙම කිව්වේ. අද දවස තමයි, රජයේ ඇප සීමාව සියයට 10 දක්වා පුළුල් කරලා, ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විවාද කරලා, සම්මත කර ගන්න කටයුතු කරන දවස.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ එක් රැස් කරපු මුළු ආදායම් ප්‍රමාණයෙන් රට කරවන්න තියා, ණය ගෙවා ගන්නවත් බැරි කාලයක් තමයි පසු ගිය කාලයේ තිබුණේ. විශේෂයෙන්ම 2011 අවුරුද්ද ගත්තොත් එහෙම, -

ගරු සාලින්ද දිසානායක මහතා
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සාලින්ද දිසානායක මන්ත්‍රීතුමා.

ගරු සාලින්ද දිසානායක මහතා
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)
ඒකේ තිබෙනවා, මහින්ද රාජපක්ෂගේ යුගයේ කියලා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඔක point of Order එකක්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඉදිරිපත් කරපුවා තමයි කියන්නේ. බන්දුල ගුණවර්ධන හිටපු ඇමතිතුමා කරපු විහිළු තමයි ඉස්සෙල්ලා කිව්වේ. දැන් කියන්නේ ඉදිරිපත් කරපු දේවල්.

2011 අවුරුද්දේ මේ රටේ මුළු ආදායම රුපියල් බිලියන 967.8යි. එයින් ණය ගෙව්වා, රුපියල් බිලියන 896ක්. ඒ කියන්නේ, සියයට 92.6ක්ම ණය ගෙවන එක තමයි කළේ. 2012 අවුරුද්ද ගත්තොත් මුළු ආදායම රුපියල් බිලියන 1,052යි. ණය ගෙව්වා, සියයට 96.7ක්. ඒ කියන්නේ, රුපියල් බිලියන 1,017ක් ණය ගෙව්වා. 2013 අවුරුද්දේ මේ රටේ සම්පූර්ණ ආදායම රුපියල් බිලියන 1,137යි. ණය විධියට රුපියල් බිලියන 1,162ක් ගෙව්වා. ණය ගෙවන්නත් මුදල් නැහැ. පඩි ගෙවීම කෙසේ වෙතත් පොහොර සහනාධාරය දෙන්නවත් මුදල් නැති, ණය ගෙවන්නත් ආපසු ණය ගත් රටක් මේක. ඒ රට නිවැරැදි කරන්න තමයි අද අපි ඒකාබද්ධවෙලා - එක්කහුවෙලා - කටයුතු කරන්නේ. 2014 අවුරුද්දේ රටේ මුළු ආදායම රුපියල් බිලියන 1,254යි. ඒකෙන් රුපියල් බිලියන 1,052ක්ම - සියයට 83.8ක්ම- ණය ගෙව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කෙටි වෙලාවේදී මේ කාරණයත් කියනවා. 2016 අවුරුද්දේදී අඩු ගණනේ මුළු ආදායමින් සියයට 60ක්වත් ණය ගෙවලා, ඉතුරු සියයට 40න් රටේ සංවර්ධනයට ණය නොවී කටයුතු කරන්න පුළුවන් රාජ්‍යයක් නිර්මාණය කරන්න අපි උත්සාහ කරනවා. ඒ කාලයේ රුපියල් කෝටි අටක වියදමින් පැළ වෙන්නේ නැති ඇට බෙදුවා. පොහොර සහනාධාරය ලබා දීම, සමෘද්ධි සහනාධාරය ලබා දීම, මැෂින් බෙදා දීම, විශ්‍රාම වැටුප් ගෙවීම, රජයේ සේවකයින්ගේ පඩි

ගෙවීම - මේ ඔක්කොම - කළේ ණය අරගෙනයි. හරියට තමුන්ගේ සාක්කුවෙන් දෙනවා වාගේ තමයි මැෂින් බෙදුවේ. ඇට බෙදුවේ තමන්ගේ සාක්කුවෙන් දෙනවා වාගේයි. මේ ඔක්කොම කළේ ණය අරගෙන. ඒවාට සීමා පනවලා, හැම කෙනාම දැනුවත් කරලා, ප්‍රායෝගිකව මේ කටයුතු කරන්න ඕනෑ නිසයි මේ සංශෝධන අද ඉදිරිපත් කරන්නේ.

එදා ගමේ පාර කාපට කළත්, වරාය හැදුවත්, ගුවන් තොටුපොළ හැදුවත්, නොරොච්චෝලේ විදුලි බලාගාරය හැදුවත්, ඒවා කළේ, ආදායම් නොලබන සංවර්ධන ව්‍යාපෘති රට තුළ කළේ, කොමිස් මුදල් ගැහුවේ -මේ සියලු දේ කළේ- ලෝකයෙන් ණය අරගෙනයි. ඒ ගත් ණයවලින් සමහර විට භාගයක්වත් ලංකාවට ආවේ නැහැ. ඒවා, විදේශ රටවල ගිණුම්වල තමයි තැන්පත් වුණේ. ඒ නිසා විශේෂයෙන් මේ රටේ රාජ්‍ය ආදායම කඩා වැටුණා. එදා මේ රටේ සියලු රාජ්‍ය ආයතන දේශපාලනීකරණය කළා. ආයතන ප්‍රධානීන් හැටියට පත් කළේ තමන්ගේ නෑදෑයෝයි. එදා SriLankan Airlines එකේ සභාපති කළේ කවුද? මස්සිනායි. අන්න එවැනි රටක් තමයි අපට නිවැරැදි කරන්න දුන්නේ. දැන් මහා ලොකුවට කථා කරනවා.

2014 වර්ෂය අරගෙන බලන්න. ගරු මන්ත්‍රීතුමා, ඔය පොත - 2015 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව- අරගෙන බලන්න, 2014 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලයේ පාඩුව කීයද කියා. රුපියල් මිලියන 14,600යි, 2014 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලයේ පාඩුව. රුපියල් මිලියන 214,267ක් ණය අරගෙන තිබුණා. 2015 වර්ෂයේදී ණය පොලිය ලෙස රුපියල් මිලියන 18,000ක් ගෙව්වා. එවැනි රටක් තමයි තිබුණේ. 2014 වර්ෂයේදී ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ පාඩුව කීයද? එක් අවුරුද්දක පාඩුව රුපියල් මිලියන 31,360යි. රුපියල් මිලියන 211,000ක් SriLankan Airlines එක ණයයි. එතරම් ණය වුණත් එක ගුවන් යානාවක් හෝ අපට අයිතිව තිබුණේ නැහැ. විද්‍යුත් මාධ්‍යවල -TV එකේ- advertisements යනවා අපි දැක්කා, "පොළොව අපේ! අහස අපේ! සයුර අපේ!" කියලා. නමුත් ගුවන් යානාව අපේ නොවෙයි. කුලියට ගත් ඒවායි. දවසකට රුපියල් ලක්ෂ 70කට කුලියට ගත් ගුවන් යානා තමයි ලංකාවේ තිබුණේ. අප සතුව ගුවන් යානා එකක්වත් තිබුණේ නැහැ. පොළොවත් අපේ තමයි, මුහුදත් අපේ තමයි, අහසත් අපේ තමයි. නමුත් ගුවන් යානාවල දවසක කුලිය රුපියල් ලක්ෂ 70යි. ගුවන් යානාව අපේ නොවෙයි. අන්න එවැනි රටක් නිවැරැදි කරන්න තමයි අද අප මෙසේ කටයුතු කරන්නේ. එදා එහෙමයි වුණේ. SriLankan Airlines එක අවුරුද්දකට රුපියල් කෝටි 3,136ක් පාඩු විඳිද්දී හිටපු ජනාධිපතිවරයා විදේශ රටවලට ගියේ මුළු ගුවන් යානාවම තම සගයන්ගෙන් පුරවාගෙනයි. ඒ අයට අපේ සල්ලිවලින් හෝටල් කාමර අරගෙන දුන්නා. ඒ විතරක්ද? සමුළුව අවසන් වන කල් ඒ රටේ ගුවන් තොටු පොළේ අපේ ගුවන් යානා නවතා තබාගෙන සිටියා. ගුවන් යානාව නවතා තබනවාටත් රුපියල් ලක්ෂ 70ක් පමණ දවසකට ගෙවන්න සිද්ධ වුණා. අන්න එවැනි රටක් තමයි නිර්මාණය වෙලා තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංගමයේ පාඩුව කීයද? 2015 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව බලන්න ගරු මන්ත්‍රීතුමා. 2014 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පාඩුව රුපියල් මිලියන 1,860යි. හැබැයි, රුපියල් මිලියන 1,860ක් පාඩු විඳිද්දී මැයි දිනයට, ජනාධිපතිවරණයට යොදාගත් බස් වෙනුවෙන් CTB එකට සල්ලි ගෙව්වාද? සල්ලි ගෙවන්නේ නැතිවයි බස් ටික අරගෙන ගියේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හිහන්නෝ ටික.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
එහෙම රටක් නිවැරැදි කරන්න තමයි අද අප කටයුතු කරන්නේ. සේවකයාට පාරිතෝෂිකය වශයෙන් අඩුම ගණනේ රුපියල් මිලියන 4,000ක් ගෙවන්න තිබුණා. ගෙව්වාද ඒ සල්ලි? සේවකයෝ 2,000ක් විතර පාරිතෝෂික මුදලවත් ගන්නේ නැතිව මිය ගියා. සේවකයාගේ පඩියෙන් කපාගත් රුපියල් මිලියන 2,200 ඔවුන්ගේ ගිණුම්වලටවත් බැර කළේ නැහැ. ඒවාත් හොරා කෑවා. අන්න එවැනි රටක් තමයි අපට නිර්මාණය කර දී තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුම්රිය සේවය ගැනත් මා විශේෂයෙන් කියනවා. 2014 වර්ෂයේදී දුම්රිය සේවයේ පාඩුව කීයද? පාඩුව රුපියල් මිලියන 11,034යි. ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාව රුපියල් මිලියන 276,409ක් ණයයි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය රුපියල් මිලියන 225,640ක් ණයයි. මුළු රටම රුපියල් මිලියන 95,00,000ක් ණය කරලා ණය උගුලක පටලවායි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය වීමයි, ණය උගුලයි කියන්නේ දෙකක්. ණය වීම කියන්නේ මොකක්ද? ආදායම් උපයන්න පුළුවන් ව්‍යාපෘතිවලට යොදවා, රටේ ආදායම වැඩි කරන්න, රටේ ජනතාවගේ ආදායම වැඩි කරන්න පාවිච්චි කරන්න ණය ගැනීම තමයි, "ණය වීම" කියන්නේ. ණය උගුල කියන්නේ මොකක්ද? ණය අරගෙන රටේ ජනතාවගේ ආර්ථිකය දියුණු කරන්නේ නැතිව පාඩු ලබන ව්‍යාපාර කරලා ඒවාට යොදවපු මුදල්වලින් භාගයක් සාක්කුවේ දාගෙන මේ රටේ අභිංසක ජනතාව ණය ගොඩට කඩා වටිටපු එක තමයි, "ණය උගුල" කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවට නියමිත කාලය අවසන් වේගෙනද එන්නේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාවට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසන් වශයෙන් කියනවා, "මගේ රට, මගේ මව් බිම කියා පපුවට ගහගන්නේ නැතිව, මේ රටේ ජනතාවට යහපත්ව ඉන්න පුළුවන් සමාජයක් නිර්මාණය කරන්න අපි කටයුතු කරනවා" කියා. අපේ රටේ ආර්ථිකය ගොඩ නැඟීමට, අපේ දරුවා වෙනුවෙන් සදාචාරාත්මක සමාජයක් ගොඩ නැඟීමට අපි මේ සියලු පියවර ගන්නවා; ගත යුතු සියලු පියවර ගන්නවා. ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 1977 වර්ෂයේදී මේ රටේ ආර්ථික විප්ලවය කළා වාගේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාත්, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් එක්කාසු වෙලා ඊළඟ ආර්ථික විප්ලවය මේ රටේ අනිවාර්යයෙන්ම සිදු කරනවා. ආර්ථිකය කඩා වැටුණු මේ රට ගොඩ නඟනවා විතරක් නොව, මේ රටේ යහ පාලනය ස්ථාපිත කරනවා. සාදාචාරය අතින් කඩා වැටුණු මේ රට යහ පාලන රටක් බවට පත් කරන්න අපි කටයුතු කරනවා කියන එක විශේෂයෙන් සඳහන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Sivasakthi Ananthan. You have 12 minutes.

[பி.ப. 4.09]

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நிதி முகாமைத்துவம் (பொறுப்பு) (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்திலே ஒரு சில விடயங்களைக் குறிப்பிட லாமென்று நினைக்கின்றேன். இந்த நாட்டினது வரவுக்கு ஏற்றாற்போல் செலவுகளைக் கட்டுப்படுத்துவதற்கான வழிவகைகள் காணப்படவேண்டும். கடந்த ஆட்சியின்போது பெறப்பட்ட கடன்களைத் திருப்பிச் செலுத்துவதற்கு சர்வதேச நாடுகளிடம் கடன்வாங்கும் நிலையே இன்று ஏற்பட்டுள்ளது. அதேநேரத்திலே நாட்டில் அபிவிருத்தியையும் மேற்கொள்ள வேண்டிய ஒரு நிலைமையுள்ளது. போரினால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்கு மாகாணங்களில் இயல்பு நிலைமை திரும்பு வதற்காக பாரிய அபிவிருத்தித் திட்டங்கள் முன்னெடுக்கப்பட வேண்டியுள்ளது. ஆனால், இந்த அரசாங்கம் கடந்த அரசாங்கத்தைப் போலவே, இந்த இரண்டு மாகாணங்களுக்கும் குறைந்தளவான நிதியையே ஒதுக்கியுள்ளது. ஒதுக்கிய நிதியில் பெரும்பகுதி மீண்டெழும் செலவினங்களைச் சமாளிப்பதற்கே செலவழிக்கப்படுகின்றது. வழமைபோன்று, பாதுகாப்புக்கான நிதி ஒதுக்கீடு வரலாறு காணாத வகையில் அதிகரித்துச் செல்கின்றது. சமர்ப்பிக்கப்படவிருக்கின்ற எதிர்வரும் வரவு செலவுத்திட்டத்தைத் தயாரிக்கும்போதாவது, இந்த நாட்டின் மீது அக்கறையுள்ள உண்மையான தேச பக்தர்களைக் கண்டுபிடித்து, தேச பக்தியுள்ள பொருளாதார வல்லுனர்களை அடையாளம்கண்டு, அவர்களது உதவியுடன் முழு நாட்டுக்கு மான பாரபட்சமற்ற ஒரு வரவு செலவுத் திட்டத்தை இந்த அரசாங்கம் முன்வைக்கவேண்டுமென்று நான் இந்த நேரத்திலே கேட்டுக்கொள்கிறேன்.

மேலும், இந்தச் சந்தர்ப்பத்தில், முன்னாள் போராளிகளுக்கு விஷ ஊசி ஏற்றப்படுவது தொடர்பாகவும் நேற்றைய தினம் தங்களை விடுதலை செய்யக்கோரி சிறைகளில் இருக்கின்ற அரசியல் கைதிகளின் உண்ணாவிரதம் இருப்பது தொடர் பாகவும் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். தற்சமயம் வடக்கிலும் கிழக்கிலுமுள்ள தமிழ் மக்கள் மத்தியிலே இவை சம்பந்தமாக ஒரு பரபரப்பான நிலைமை ஏற்பட்டிருக்கின்றது. நேற்றைய தினம் நான் அநுராதபுரம் சிறைச்சாலைக்குச் சென்று அங்கு உண்ணா விரதம் இருந்த அரசியல் கைதிகளைச் சந்தித்தேன். அங்குள்ள, யாழ்ப்பாணம் வரணியைச் சேர்ந்த 37 வயதுடைய இராசையா ஆனந்தராசா என்பவர் 2006ஆம் ஆண்டு கைதுசெய்யப்பட்டு, 2012ஆம் ஆண்டு விடுதலை செய்யப்பட்டார். மீண்டும் இவர் கைது செய்யப்பட்டிருக்கிறார். இவர் கைதுசெய்யப்பட்டதற்குப் பிற்பாடு, தன்னுடைய விடுதலையை வலியுறுத்தி உண்ணா விரதம் இருந்ததால் அவரது உடல்நிலை மிக மோசமாகப் பாதிக்கப்பட்டது. அப்பொழுது அவருக்கு இரண்டு ஊசிகள் ஏற்றப்பட்டிருக்கின்றன. இந்த ஊசிகள் ஏற்றப்பட்டதற்குப் பிற்பாடு, இவருடைய உடல்நிலை மிகமோசமாகப் பாதிக்கப் பட்டிருக்கின்றது. தற்சமயம் இவர் ஒரு மனநோயாளியாக மாற்றப்பட்டிருக்கின்றார்.

இவரைப் போன்ற 12,000 முன்னாள் போராளிகள் தடுப்பு முகாம்களிலிருந்து விடுதலை செய்யப்பட்டிருக்கின்றார்கள். இந்த 12,000 பேர்களிலே, 107 முன்னாள் இளம் போராளிகள் இறந்திருக்கிறார்கள். இவர்களில் பெரும்பாலானவர்கள் புற்றுநோய் காரணமாகத்தான் இறந்திருக்கிறார்கள். இவர்கள் கைதுசெய்யப்பட்டிருந்த காலகட்டத்தில் இவர்களுக்கும் ஊசி மருந்து ஏற்றப்பட்டிருக்கின்றது. அதற்குப் பிற்பாடுதான் இவர்களுடைய இறப்பு ஏற்பட்டிருக்கின்றது. இந்த முன்னாள் போராளிகளுக்குத் தொற்றாத நோயான புற்றுநோய் ஏற்படுவதற்கு எந்தச் சந்தர்ப்பமும் இல்லை. இவர்கள் போராளிகளாக இருந்த காலத்தில்கூட, புகைபிடிக்கின்ற அல்லது மது அருந்துகின்ற பழக்கங்கள் எதுவும் அற்றவர் களாக இருந்திருக்கிறார்கள். ஆகவே, இவர்களுடைய மரணம் தொடர்பாகவும் தடுப்பிலே இருந்தவர்களுக்கு ஊசி ஏற்றப்பட்டதாகக் கூறப்படுவது தொடர்பாகவும் சர்வதேச நிபுணர்களுடன்கூடிய மருத்துவ நிபுணர் குழு நியமிக்கப்பட்டு உண்மை நிலை கண்டறியப்பட வேண்டும். இதனால் ஏனைய முன்னாள் போராளிகளும் மிகுந்த அச்சத்தோடு இருக்கின்றார்கள்.

சிறைச்சாலைகளிலே இருக்கின்ற இந்தக் கைதிகளுக்கு வைத்தியசாலைகளிலே வழங்கப்பட்ட சிகிச்சைகள் அல்லது ஊசி மருந்துகள் அவர்களை மனநோயாளிகளாக ஆக்கியிருக்கின்றன அல்லது அவர்களுடைய உடல்நிலையை மிகப் பலவீமனமடையச் செய்திருக்கின்றன. இந்த மரணங்கள் மற்றும் இழப்புக்களானவை தமிழ் மக்கள் மத்தியில் மிகுந்த அச்சத்தையும் முன்னாள் போராளிகள் மத்தியில் மிகுந்த பயப்பீதியையும் ஏற்படுத்தியிருக்கின்றது. ஆகவே, இந்த அரசாங்கம் இவற்றுக்கான உண்மைகளைக் கண்டறிவதற் குரிய நடவடிக்கையை அவசரமாக எடுக்க வேண்டும்.

நான் நேற்றைய தினம் சிறைச்சாலைக்குச் சென்றிருந்த நேரம் அந்த அரசியல் கைதிகள் என்னிடம் உருக்கமான கடிதமொன்றைத் தந்திருந்தார்கள். இந்தக் கடிதத்தை இந்த நாட்டிலே இருக்கின்ற பொதுமக்கள், அரசியல் தலைவர்கள் அனைவருக்கும் மற்றும் அனைத்து ஊடகங்களுக்கும் தெரியப் படுத்தும்படி கூறியிருந்தார்கள். இங்கு அந்தக் கடிதத்தை முழுமையாக வாசிப்பதற்கு எனக்குத் தரப்பட்ட நேரம் போதாமல் இருப்பதனால், அதில் இருக்கின்ற சில முக்கியமான பகுதிகளை இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன்:

"எமது வழக்குகளை வகைப்படுத்தி விடுதலையைத் தாமதப் படுத்துவது, விசேட நீதிமன்றம் அமைத்து விசாரணை செய்வது என்பதானது காலத்தை இழுத்தடிப்பதாகவே தென்படுகின்றது. எம்மை விடுதலை செய்வதில் சட்டச்சிக்கல் இருப்பதாக அரசாங்கத் தரப்பும் ஏனையவர்களும் கூறிவருகின்றார்கள். கௌரவ சரத் பொன்சேகா, முன்னாள் பிரதம நீதியரசர் ஷிராணி பண்டாரநாயக்க, ஜெனீபன் போன்றோரின் வழக்குகளும் உயர் நீதிமன்றத்தில் நிலுவை யில் இருந்தன. அரசியல் காரணங்களுக்காகச் சட்ட மாஅதிபர் அவர்களால் அவற்றினை வாபஸ் பெற்று அவர்களை விடுதலை செய்ய முடிந்திருக்கிறது என்றால், எமது வழக்குகளை மாத்திரம் முடிவுக்குக் கொண்டுவந்து எங்களை விடுவிப்பதில் என்ன சட்டச்சிக்கல்?

மேலும், அண்மையில் குமாரபுரம் படுகொலை வழக்கு 21 நாட்களில் முடிவுக்குக் கொண்டுவரப்பட்டது. அத்துடன், அது திருகோணமலை - மூதூர் நீதிமன்ற நியாயாதிக்க எல்லைக்குள் இடம்பெற்ற ஒரு சம்பவம் பற்றிய வழக்காக இருந்தபோதும், அவர்களின் நலன் கருதி அனுராதபுர நீதிமன்றத்திற்கு மாற்றப்பட்டு முடிவுக்குக் கொண்டு வரப்பட்டது. ஆனால், எமது வழக்குகளைத் தமிழ் பிரதேசங்களிலிருந்து சிங்களப் பிரதேசங்களுக்கு மாற்றுதல்,

அவற்றுக்கு நீண்டகாலத் தவணையிடுதல், சட்ட மாஅதிபர் மற்றும் பயங்கரவாத விசாரணைப் பிரிவின் அதிகாரிகள் விசாரணைக்கு ஒத்துழைக்காமை, மொழிரீதியாக ஏற்படும் பாரிய பிரச்சினை என்பவற்றினால் நீதிமன்ற நடவடிக்கை மூலமாக எங்களை விடுதலை செய்வதென்பது சாத்தியமற்றதாகவே காணப்படுகின்றது.

இன நல்லிணக்கம், நல்லாட்சி எனக் கூறுபவர்கள் ஒருசாராரைப் பழிவாங்கும் செயலானது எவ்வாறு நல்லாட்சியாகும்? எனவே, அரசுக்கு அழுத்தத்தைக் கொடுத்து கொள்கை ரீதியான ஒரு முடிவை எடுத்து நிபந்தனையின்றி அனைவரையும் விடுதலை செய்வதே, அரசியல் கைதிகளின் விடுதலை தொடர்பில் உண்மையான கரிசனை உள்ளவர்களின் முன்னுள்ள பாரிய பொறுப்பாகும். மேற்படி விடயம் தொடர்பாக மனித உரிமை அமைப்புக்கள், வெகுஜன அமைப்புக்கள், மதத் தலைவர்கள், பல்கலைக்கழகச் சமூகம், அரசியல் தலைவர்கள் அனைவரும் ஒன்றிணைந்து எம்மனைவரின் விடுதலைக்காகவும் குரல் கொடுக்குமாறு அன்புடன் கேட்டுக்கொள்கின்றோம்."

ஆகவே, இந்த அரசியல் கைதிகள் விடுதலை செய்யப்பட வேண்டும். இலங்கையில் இருக்கின்ற சகல சிறைச்சாலைகளிலும் இடநெருக்கடி! சுகாதாரப் பிரச்சினை! உடல் ரீதியாக, உள ரீதியாக இந்த அரசியல் கைதிகள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். இந்த அரசாங்கம் கொடுத்த வாக்குறுதிகள் பல தடவைகள் மீறப்பட்டிருக்கின்றன.

எங்களைப் பொறுத்தவரை இந்த நல்லாட்சி அரசாங்கத்தை உருவாக்குவதற்காக அரசியல் கைதிகளுடைய குடும்பங்கள், முன்னாள் போராளிகளுடைய குடும்பங்கள், மாவீரர்களின் குடும்பங்கள் உட்பட அனைத்துப் பொதுமக்களும் நாங்களும் ஆதரவு தெரிவித்திருந்தோம். "நல்லாட்சியை உருவாக்குவதற்காக இந்த அரசாங்கத்துக்கு நீங்கள் வாக்களியுங்கள்! உங்களுக்கு விமோசனம் கிடைக்கும்; உங்களுக்கு விடுதலை கிடைக்கும்!" என்று நாங்கள் இவர்களிடம் சென்று கேட்டுக்கொண்டோம். ஆனால், இந்த நல்லாட்சி அரசாங்கம் உருவாக்கப்பட்டு இன்றைக்கு 18-19 மாதங்கள் கடந்தும், இந்தச் சிறைகளிலே இருக்கின்றவர்கள் தொடர்ந்தும் பல்வேறு வகைகளிலே பாதிக்கப்பட்டு வருகின்றார்கள். இவர்களுக்கு விடுதலை இல்லாத காரணத்தினால் இவர்களுடைய குடும்பங்கள் பாதிக்கப்பட்டிருக்கின்றன. இவர்களுடைய பிள்ளைகளின் கல்வி மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றது. ஆகவே, இந்த அரசியல் கைதிகளை விடுதலை செய்வதற்குரிய நடவடிக்கைகளை இந்த அரசாங்கம் விரைவாக எடுக்க வேண்டும்.

அதுபோல், புனர்வாழ்வளிக்கப்பட்ட முன்னாள் போராளிகளுக்கு விஷ ஊசி ஏற்றப்பட்டதால் அவர்களில் 107 பேர் மரணமடைந்திருக்கின்றார்கள். இதுவும் ஒரு பெரிய சர்ச்சைக்குரிய விடயமாக இருக்கின்றது. ஆகவே, அரசாங்கம் இந்த இரண்டு விடயங்களுக்குமான உரிய நடவடிக்கைகளை விரைவாக எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

அடுத்தது, வடக்கிற்கான பொருளாதார மத்திய நிலையம் தொடர்பான சர்ச்சை இன்னமும் நீண்டுகொண்டே செல்கின்றது. இந்த பொருளாதார மத்திய நிலையமானது வவுனியா மாவட்டத்திற்கானதா அல்லது வடக்கு மாகாணத்திற்கானதா என்பது தொடர்பில் அரசாங்கம் கொள்கை ரீதியில் ஒரு முடிவை எடுக்க வேண்டும். ஆரம்பத்திலே அது வவுனியா மாவட்டத்திற்கென்று சொல்லப்பட்டது. 2010ஆம் ஆண்டு மாவட்ட ஒருங்கிணைப்புக் குழுக்கூட்டத்திலே அதற்கான ஒரு தீர்மானமும் எடுக்கப்பட்டு உரிய இடமும் தெரிவு செய்யப்பட்டது. அதற்குப் பிற்பாடு அமைச்சரவைக் கூட்டத்தில் அது வட மாகாணத்திற்கென்று தீர்மானிக்கப் பட்டது. பின்னர் மீண்டும் அது வவுனியா மாவட்டத்திற் கென்று தீர்மானிக்கப்பட்டது. இப்படிக் கொள்கை ரீதியாகச் சரியான முடிவில்லாமல் அரசாங்கம் வட மாகாணத்தின் பொருளாதார மத்திய நிலையம் தொடர்பாக தமிழ் மக்கள் மத்தியிலும் தமிழ்த் தேசியக் கூட்டமைப்புக்கு மத்தியிலும் திட்டமிட்டு குழப்பத்தை ஏற்படுத்திக்கொண்டிருக்கின்றது. ஆகவே, இந்த மத்திய நிலையம் தொடர்பாக விரைவாக முடிவெடுக்க வேண்டும். தாமோதரம்பிள்ளை மகேஸ்வரன் என்ற எழுபத்தைந்து வயது முதியவர் இந்த நிலையம் ஓமந்தையில் அமையவேண்டுமென்று நாளைய தினத்திலிருந்து சாகும்வரை உண்ணாவிரதத்தில் ஈடுபட இருக்கிறார். அவரை அந்த நிலைமைக்குத் தள்ளாமல், பொருளாதார மத்திய நிலையம் ஓமந்தையில் அமைக்கப்பட வேண்டுமென்ற நிபுணர்களுடைய அறிக்கையின்படி ஜனாதிபதி அவர்களும் பிரதமர் அவர்களும் அதனைச் செயற்படுத்த வேண்டுமென்று கூறி, என்னுடைய உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.19]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒரு நாட்டின் பொருளாதாரத்தினை நியம முறையில் அளவிடுவதற்கு GDP பயன்படுத்தப்படுகின்றது. இலங்கையின் GDP 0.13 சதவீதமாக உலகளவில் பங்கு வகிக்கின்றது. ஒரு நாட்டின் GDP ஆனது, உள்நாட்டுப் பொருட்களில் மட்டுமன்றி வெளிநாட்டு இறக்குமதியிலும் பாரிய அளவில் பாதிப்பை ஏற்படுத்துகின்றது.

2015ஆம் ஆண்டின் முதல் நான்கு மாத காலத்தின் அறிக்கையுடன் ஒப்பிடுகையில் 2016ஆம் ஆண்டு காலப் பகுதியில் 4.5 வீதத்தினால் ஏற்றுமதி வருமானம் வீழ்ச்சியடைந்துள்ளது. தேயிலை ஏற்றுமதி வருமானம் 7.1 வீதத்தினாலும் வாசனைத் திரவியங்கள் மற்றும் மரக்கறிகள் உட்பட ஏனைய விவசாய உற்பத்திகளின் ஏற்றுமதி வருமானம் 23.1 வீதத்தினாலும் பெற்றோலிய ஏற்றுமதிப் பொருட்களின் வருமானம் 38.7 வீதத்தினாலும் வீழ்ச்சியடைந்தமையே இந்தப் பின்னடைவுக்குக் காரணமாகும்.

2016ஆம் ஆண்டின் முதல் நான்கு மாதங்களில் புடவைகள், இறப்பர் மற்றும் தெங்குப் பொருட்களின் ஏற்றுமதி வருமானம் அதிகரித்துள்ளது. இது 7.7 வீத அதிகரிப்பாகும். மொத்த இறக்குமதி தொடர்பில் 2015ஆம் ஆண்டின் முதல் நான்கு மாதங்களுடன் 2016ஆம் ஆண்டின் அதே காலப்பகுதியை ஒப்பிடுகையில், அது 3.6 வீத வீழ்ச்சியாகக் காணப்படுகின்றது. இதற்குப் பெற்றோலிய உற்பத்திப்

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

பொருட்களின் இறக்குமதி 25.5 வீதத்தாலும் உணவு மற்றும் குடிபான வகைகளின் இறக்குமதி 15.5 வீதத்தாலும் போக்குவரத்து உபகரணங்களின் இறக்குமதி 47 வீதத்தாலும் வீழ்ச்சியடைந்தமையே காரணமாக அமைந்துள்ளது. எனினும், மீளாய்வுக் காலப்பகுதியில் புடவைகள் மற்றும் ஆடைகள் இறக்குமதிச் செலவு 16.6 வீதம் வரை அதிகரித்துள்ளது.

மேலும், பொருட்களின் VAT அளவினை அதிகரிப்பதன் மூலம் அதனால் கிடைக்கப்பெறும் பணப்பெறுமதியானது ஒரு நாட்டின் GDP பெறுமானத்தில் அதிகரிப்பினை ஏற்படுத்து கின்றது. உற்பத்திப் பொருட்களின் செலவினங்களை நாட்டினுள் பகிர்வதன்மூலம் GDP இல் அதிகரிப்பினை ஏற்படுத்த முடியும். அதற்காக அரசு தற்போது பல முயற்சிகளைச் செய்துள்ளமை வரவேற்கத்தக்கது. எனினும், உள்நாட்டுப் பொருட்களின் உற்பத்திகளை அதிகரிப்பதற்குப் புதிய தொழில்நுட்ப முறைகளைப் பயன்படுத்திப் புதிய உற்பத்திகள்மூலம் சந்தைக்குத் தேவையானவற்றை உற்பத்தி செய்யவேண்டியிருக்கின்றது. அந்த வகையில்தான் எங்களுடைய நாட்டின் மேதகு ஜனாதிபதி அவர்களும் கௌரவ பிரதமர் அவர்களும் எமது நாட்டில் பெரும் தொழிற்சாலை களை உருவாக்கவேண்டுமென்ற அடிப்படையில் பாரிய திட்டங்களைத் தீட்டி, இன்று உலகம் பூராவும் சென்று அதற்குரிய முயற்சிகளை மேற்கொண்டு வருகின்றார்கள்.

காங்கேசன்துறையிலுள்ள சீமெந்துத் தொழிற்சாலை, வாழைச்சேனையிலுள்ள கடதாசித் தொழிற்சாலை, கந்தளாயி லுள்ள சீனித் தொழிற்சாலை போன்றவை பல வருட காலமாக எமது நாட்டின் உற்பத்திக்கு உறுதுணையாக இருந்து இந்த நாட்டிலே பாரியதொரு மாற்றத்தை ஏற்படுத்திய தொழிற் பேட்டைகளாகும். தற்போது யுத்தத்தினால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்கிலுள்ள யுவதிகளும் வாலிபர்களும் வேலையற்ற நிலையிலே தங்களுடைய காலத்தினைக் கழித்துக் கொண்டிருக்கின்ற நிலையில், மீண்டும் இந்தத் தொழிற் சாலைகளைப் புதுப்பித்தும் மேலும் தொழிற் பேட்டைகளை அமைத்தும் உற்பத்தியை அதிகரிப்பதன்மூலம் எமது நாட்டின் GDP இனை அதிகரிக்க முடியும். அத்துடன், இந்த நாட்டி லுள்ள வேலையற்றவர்களுக்கு வேலை வாய்ப்புக் களையும் கொடுக்க முடியும் என்பதனையும் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

"எங்களுடைய நாடு விவசாய நாடு" என்று சொல்கின் றார்கள். ஆனால், எமக்குத் தேவையான அனைத்துப் பொருட்களும் அயல் நாடுகளிலிருந்து இறக்குமதி செய்யப் படுவதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. நான் வாழும் அநுராதபுர மாவட்டம் உட்பட வடக்கு, கிழக்கிலுள்ள அனைத்து மாவட்டங்களும் விவசாய மாவட்டங்களாகக் கணிப்பிடப்படுகின்றன. ஆனால், இன்று பெயரளவில்தான் இவை விவசாய மாவட்டங்களாக இருக்கின்றன. அங்குள்ள விவசாயிகள் தற்போது பாரியதொரு பிரச்சினைக்கு முகங்கொடுக்கின்றவர்களாக இருக்கின்றார்கள். இங்கு தற்போது வெங்காயம், எள்ளு போன்றவை அறுவடை செய்யப்படுகின்றன. எனவே, இவற்றுக்கான இறக்குமதி Tax இனை அதிகரிப்பதன்மூலம் உள்நாட்டு விவசாயிகள் நன்மை களைப் பெற்றுக்கொள்ள முடியும். இதனால் GDP இனையும் அதிகரித்துக்கொள்ள முடியும். ஆனால், அதற்குப் பதிலாக வெங்காயம், எள்ளு போன்றவை அறுவடை செய்யப்படுகின்ற காலத்திலே அவை இறக்குமதி செய்யப்படுகின்றன. இதன் காரணமாக எமது வருமானம் தடைப்படுகின்றது; வெளிநாட்டு வருமானம் இல்லாமல் ஒழிக்கப்படுகின்றது. இந்த GDP இன் அதிகரிப்பும் இல்லாமல்போகின்றது.

அதாவது இந்தியா, பங்களாதேஷ், சீனா, பர்மா, பாகிஸ்தான் போன்ற நாடுகளிலிருந்து இலங்கைக்கு விவ சாயப் பொருட்களை ஏற்றுமதி செய்கிறார்கள். இப்படிச் செய்வதன்மூலம் எப்படி எமது நாட்டின் GDPஐ அதிகரிக்க முடியும்? GDP ஐ அதிகரிக்க வேண்டுமென்றால், எங்கள் நாட்டை விவசாய நாடு என்று சொல்வது மாத்திரமல்லாமல், விவசாய உற்பத்திக்கு முக்கியத்துவம் கொடுக்க வேண்டும்; விவசாய உற்பத்திப் பொருட்களின் இறக்குமதியைத் தடைசெய்ய வேண்டும்; இல்லையேல், வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்கின்ற பொருட்களுக்கு tax ஐ அதிகரிக்க வேண்டும். அவ்வாறு செய்தால்தான் விவசாயிகளுக்கும் நாட்டின் பொருளாதாரத்திற்கும் நன்மை கிடைக்கும் என்று சொல்லிக்கொள்ள விரும்புகின்றேன். மேலும், எமது நாட்டில் இவ்வாறான நிகழ்வுகள் பல வருட காலமாக நடைபெற்றுக் கொண்டிருக்கின்றன. கூட்டு எதிரணியினர் இன்று இவைபற்றிக் கூடிக் கதைத்துக் கொண்டிருக்கிறார்கள். ஆனால், அவர்களுடைய காலத்திலும் விவசாயத்தில் இதே நிலைமைதான் காணப்பட்டது.

தற்பொழுது எங்களுடைய நாட்டின் மேதகு ஜனாதிபதி அவர்களும் மாண்புமிகு பிரதமர் அவர்களும் இந்த நாட்டிலே விவசாயத்தில் பாரியதொரு மாற்றத்தை ஏற்படுத்த வேண்டு மென்ற நோக்கோடு பல செயற்றிட்டங்களை மேற்கொண்டு வருகின்றார்கள். நான் கூட்டு எதிரணியினரிடத்தில் சில கேள்விகளைக் கேட்க விரும்புகிறேன். உங்களுடைய காலத்திலும் வடக்கு, கிழக்கில் குறிப்பாக, காங்கேசன்துறை சீமெந்துத் தொழிற்சாலை, வாழைச்சேனை கடதாசித் தொழிற்சாலை, கந்தளாய் சீனித் தொழிற்சாலை போன்றவை பல வருட காலமாக, 30 - 40 வருடங்களாக மூடப்பட்டிருந்தன. ஏன், அவற்றினை ஆரம்பிக்க வேண்டுமென்று நீங்கள் கனவிலும்கூட நினைக்கவில்லை? யுத்தம் முடிந்த பிறகு எத்தனை வருடங்கள் நீங்கள் ஆட்சி செய்தீர்கள்? ஏன், அவற்றைத் திறப்பதற்கு நீங்கள் எந்த முயற்சியும் எடுக்கவில்லை? ஆனால், எங்களுடைய நாட்டின் மேதகு ஜனாதிபதி அவர்களும் மாண்புமிகு பிரதமர் அவர்களும் தற்பொழுது அவற்றை மீள ஆரம்பிப்பதற்கு பாரிய திட்டங்களை மேற்கொண்டுள்ளார்கள் என்பதை இந்தச் சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

இந்த நாட்டின் பொருளாதாரத்தை அபிவிருத்தி செய்ய வேண்டுமானால், இந்த நாட்டின் உற்பத்தியை அதிகரிக்க வேண்டும். இல்லாவிட்டால் இந்த நாட்டின் GDP ஐ அதிகரிக்க முடியாது. அதற்கு மாறாக எந்தப் பொருளானாலும் அதனை வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்வது இங்கு பழக்கமாகி விட்டது. வேறு நாடுகளிலே GDP ஐ அதிகரிப்பதற்காகத் தமது நாட்டின் உற்பத்திகளை அதிகரிக்கிறார்கள். ஆனால், எங்களுடைய நாட்டில் அதற்கு மாறாக இறக்குமதியை அதிகரித்தார்கள். அதில் மாற்றத்தினைக் கொண்டுவருவதற் காகத்தான் தற்போது மேதகு ஜனாதிபதி அவர்களும் மாண்புமிகு பிரதமர் அவர்களும் பாரிய தொழிற்பேட்டைகளை அமைத்து அதன்மூலமாக இந்த நாட்டின் வெளிநாட்டு வருமானத்தை அதிகரிக்க எண்ணியுள்ளார்கள். அதனூடாக GDPஐ அதிகரிப்பதற்குப் பாரிய செயற்றிட்டத்தை மேற்கொண்டு வருகிறார்கள் என்பதை நாங்கள் அனைவரும் அறியக்கூடியதாக இருக்கின்றது.

இலங்கையில் மட்டுமல்ல, வெளிநாடுகளிலிருந்து வெளிநாட்டு நிறுவனங்களை இந்த நாட்டுக்குக் கொண்டு வந்து தொழிற்பேட்டைகளை அதிகரித்து, அதன்மூலமாக வெளிநாட்டு வருமானத்தை அதிகரிப்பதற்குப் பல முயற்சிகள் தற்பொழுது நடைபெற்றுக்கொண்டிருக்கின்றன. அதற்கு ஓர் உதாரணமாக இலங்கையிலே கார் உற்பத்தியை

மேற்கொள்வதற்காக Ford Motor Company இங்கே வரவழைக்கப்பட்டு தற்போது அவ்வுற்பத்தி அதிகரிக்கப்பட்டு வருவதையும் நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. மேலும், சீனா, சிங்கப்பூர் போன்ற உலகிலுள்ள நாடுகளுடனும் தற்பொழுது பேச்சுவார்த்தைகளில் ஈடுபட்டுக்கொண்டிருக் கின்றார்கள். அன்று எமது நாட்டைப் பார்த்து உற்பத்தியை அதிகரிக்க வேண்டுமென்று சிங்கப்பூர் நாட்டைச் சேர்ந்தவர்கள் கதைத்துக்கொண்டிருந்தார்கள். ஆனால், இன்று எங்களுடைய மக்கள் சிங்கப்பூரின் அபிவிருத்தியைப் பார்த்து வியந்துநிற்கும் அளவுக்கு நிலைமை மாறிவிட்டது. உலக நாடுகள் அனைத்தும் வெளிநாட்டு வருவாயை அதிகரிக்கக்கூடிய வகையில் உலக வியாபார மத்திய நிலையமாக சிங்கப்பூரை அமைத்ததன் காரணமாக அந்த நாடு GDPஐ அதிகரித்து உலகிலேயே பெயரும் புகழுமுடைய ஒரு பொருளாதாரமிக்க நாடாக மாறியுள்ளதென்பதை இச்சந்தர்ப்பத்தில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். ஆனால், எமது நாடு எந்தப் பொருளையும் உற்பத்தி செய்வதற்கு முன்வருவதில்லை; எப்பொருளையும் இறக்குமதி செய்வதிலேயே முனைப்புக் காட்டுவது, நாட்டின் பாரிய வீழ்ச்சிக்குக் காரணம் என்பதை நாங்கள் அறியக் கூடியதாக இருக்கின்றது. எனவே, வெளிநாட்டு இறக்குமதி களை நிறுத்திவிட்டு உள்நாட்டு உற்பத்திகளை அதிகரிக்கின்ற வாய்ப்பினை நாட்டிலுள்ள அனைவருக்கும் வழங்க வேண்டும்.

வடக்கு, கிழக்கிலுள்ள இளைஞர் யுவதிகள் வேலையற்ற வர்களாகவும் யுத்தத்தினால் பாதிக்கப்பட்டவர்களாகவும் இருக்கின்றார்கள். அவர்கள் தற்பொழுது தங்களுடைய கைகளை - கரங்களை இழந்தவர்களாக வாழ்ந்துகொண்டிருக் கின்றார்கள். எனவே, அங்கு நல்ல முறையில் தொழில் பேட்டைகளை அமைத்து அவர்களுக்கு ஏற்ற வகையில் தொழில்களை வழங்குவதன்மூலம் நாட்டிலே உற்பத்தியை அதிகரிக்க முடியும். இன்று அவர்கள் தங்களுடைய வீட்டில் வீணாகக் காலத்தைக் கழித்துக்கொண்டிருக்கின்றார்கள். அவர்களுக்கு நல்ல வழிகாட்டலை வழங்குங்கள்! அவர்கள் இந்த நல்லாட்சிக்கு வாக்களித்ததன் காரணம் என்ன? எங்களுடைய மக்கள் பாதிக்கப்பட்டவர்கள்; ஒரு வருடமல்ல பல வருட காலமாக யுத்தத்தினால் பாதிக்கப்பட்டவர்கள். அவர்கள் தங்களுடைய கைகள் போன்ற உடலுறுப்புகளை - அவயவங்களை இழந்திருக்கின்றார்கள். அவர்கள் தங்களுக்கு நல்லதொரு முடிவு வரும் என்பதன் காரணமாகத்தான் நல்லாட்சி அரசாங்கத்துக்கு வாக்களித்தார்கள்.

எங்களுடைய மக்கள் உங்களை விரும்பி ஆட்சியில் அமர்த்தியதற்கு காரணம் என்னவென்பதை அறிந்து நீங்கள் அவர்களுக்கு வேண்டிய வசதிவாய்ப்புகளைச் செய்துகொடுக்க வேண்டுமென்று மேதகு ஜனாதிபதி அவர்களிடமும் மாண்பு மிகு பிரதம அமைச்சர் அவர்களிடமும் அமைச்சர்களிடமும் நான் கேட்டுக்கொள்கிறேன். இது எங்கள் அனைவரதும் அதாவது ஆட்சியில் இருக்கின்றவர்கள் மற்றும் எதிரணியில் இருக்கின்றவர்கள் அனைவரதும் பொறுப்பாக இருக்கின்றது. இன்று மீண்டும் யுத்த நிலைமை ஏற்படாமல் இருப்பதற்கு எங்களுக்கு நல்லாட்சி கிடைத்திருக்கின்றது. இந்த மக்களுக்கு நல்வழியைக் காட்டுவதன்மூலம்தான் இந்த நாட்டின் பொருளாதாரத்தை அதிகரிக்க முடியும். அதாவது வடக்கு, கிழக்கினூடாக இந்த நாட்டின் GDPஐ அதிகரிக்க முடியும் என்று சொல்லி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Gnanamuthu Srineshan. You have 12 minutes.

[பி.ப. 4.32]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு வணக்கத்தைத் தெரிவித்துக்கொண்டு எனது உரையினை ஆரம்பிக்கின்றேன். அந்த வகையில் நிதி முகாமைத்துவம் (பொறுப்பு) (திருத்தம்) சட்டமூலம் பற்றிய எனது கருத்துக்களை இந்தச் சபையில் முன்வைக்க விரும்புகின்றேன்.

முகாமைத்துவம் என்பது, சிறந்த உபாயங்கள் உத்திகள் மூலமாக இருக்கின்ற வளத்தினை உச்சமாகப் பயன்படுத்தி உயரிய விளைவினைப் பெறக்கூடிய ஒரு முறைமையாகும். அந்த வகையில் இலங்கையிலே குறிப்பாக நிதி முகாமைத் துவமானது இருக்கின்ற வளத்தினை உச்சமாகப் பயன்படுத்து கின்ற தன்மையைக் கொண்டிருக்கின்றதா? அந்த உச்சமாகப் பயன்படுத்துவதன் மூலமாக உயரிய விளைவைப் பெறக்கூடிய விதத்தில் இந்த முகாமைத்துவம் செய்யப்படுகின்றதா? என்ற விடயம் பற்றி நாங்கள் கேள்விகளைக் கேட்க வேண்டிய நிலையில் இருக்கின்றோம்.

குறிப்பாக அண்மையில் பிரதம அமைச்சர் அவர்கள் வெளியிட்ட ஒரு கருத்தில் அரச சேவையின் வினைத்திறன் என்பது 30 வீதமாகக் காணப்படுகின்றது என்பதைக் குறிப் பிட்டதோடு, அந்த வினைத்திறனை 50 வீதமாக அதிகரிக்க வேண்டும் என்ற செய்தியினையும் தெரிவித்திருந்தார். ஆகவே, அரச சேவையின் வினைத்திறன் 30 வீதமாக இருக்குமாக இருந்தால், அது 70 வீதம் செயற்றிறன் அற்றதாக இருக் கின்றது என்கின்ற விடயம் எங்களுக்கு மறைமுகமாகச் சுட்டிக்காட்டப்படுகின்றது. அரச சேவை 30 வீதமான வினைத்திறனில் இருக்கின்றது என்றால் எம்முடைய நிதி முகாமைத்துவத்திலும் குறைபாடுகள் இருக்கின்றன என்பதை நாங்கள் அறிந்துகொள்ளக்கூடியதாக இருக்கின்றது. குறிப்பாக நிதி முகாமைத்துவத்தில் வினைத்திறனை அதிகரிக்க வேண்டும்; விளைதிறனை அதிகரிக்க வேண்டும். அதேவேளை வீண் விரயங்கள் தவிர்க்கப்பட வேண்டும் என்கின்ற உண்மையை நாங்கள் விளங்கிக்கொள்ளக்கூடியவர்களாக இருக்க வேண்டும்.

நிதி மூலங்களைக் கையாளுகின்ற திறைசேரியாக இருக்கட்டும், மத்திய வங்கியாக இருக்கட்டும், அரச சார்பான வங்கியாக இருக்கட்டும், அரச திணைக்களங்கள் மற்றும் அமைச்சுக்களின் நிதிப் பிரிவுகளாக இருக்கட்டும், நிதியினை வீண் விரயம் செய்யாமல், முழுமையாகப் பயன்படுத்தக்கூடிய விதத்தில் மக்களுக்கு முழுமையான சேவையை வழங்கக்கூடிய விதத்தில் அவற்றின் நிதி முகாமைத்துவம் அமைகின்ற போதுதான் எமது நாட்டில் உண்மையான அபிவிருத்தியைக் காணமுடியும்; மக்கள் மத்தியில் முக்கியமான மாற்றங்களைக் காணக்கூடியதாக இருக்கும். அண்மையில் மேதகு ஜனாதிபதி அவர்கள் நிதியமைச்சின் புதிய கட்டிடத்தைத் திறந்துவைத்து உரையாற்றியபோது, "ஜனாதிபதி செயலகத்தின் செலவினை 60 வீதத்தினால் குறைத்திருக்கின்றேன்" என்று கூறிய ஒரு செய்தியைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அதாவது, இதற்கு முன்பாக 100 வீதமாக இருந்த அந்தச் செலவினம் 60 வீதத்தால் குறைக்கப்பட்டிருக்கின்றது. இன்று 40 வீதம்தான் ஜனாதிபதி செயலகத்தின் செலவாக இருக்கின்றது என்ற செய்தியினை அவர் தந்திருக்கின்றார்.

அதுமட்டுமல்லாமல், நிதி முகாமைத்துவம், நிதி ஒழுக்கம் என்பவற்றில் அரசு கூடுதலான கவனம் செலுத்தி வருவதாகக் குறிப்பிட்டிருந்தார். தான் விமானப் பயணங்களை மேற்கொள்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

கின்றபோது, தனிப்பட்ட விமானங்களைக் கொண்டு செல்லாமல், சாதாரண பயணிகள் செல்லுகின்ற விமானத்தில் செல்வதாகவும் அப்பயணத்தில் தன்னுடன் செல்லுகின்ற பிரமுகர்களின் எண்ணிக்கையை மட்டுப்படுத்தியிருப்பதாகவும் அதன்மூலமாக அரச செலவினைக் குறைத்து மக்களுக்குப் பணியாற்றக்கூடிய விதத்தில் செயற்படுவதாகவும் குறிப்பிட்டிருந்தார். கடந்த காலத்தில் ஸ்ரீலங்கன் விமான சேவையானது, பாரிய நட்டத்தினை எதிர்நோக்கவேண்டிய ஒரு நிலைமை ஏற்பட்டது என்பதை நாங்கள் அறிந்திருக்கின்றோம். எனவே, அரசுக்குரிய நிதியினை - மக்களுக்குரிய நிதியினை வீண் விரயம் செய்யாமல், அதனைச் சரியான வழியில் கொண்டுசெல்லும் உத்தியுடன் செயற்பட்டால்தான் எங்களால் எமது நாட்டினை வளர்த்தெடுக்க முடியும்.

நாங்கள் சுதந்திரமடைந்து பல தசாப்தங்களைக் கடந்திருக் கின்றோம். ஆனால், அபிவிருத்தி என்கின்ற விடயத்தில் எமக்குச் சரி நிகராக இருந்த பல நாடுகள், இன்று அபிவிருத்தியில் தலைநிமிர்ந்து நிற்கின்ற ஒரு நிலைமையைக் காண்கின்றோம். அப்படியென்றால், அங்கு நிதி முகாமைத் துவம் என்பது, ஒரு நேர்கணியமான பாதையில் சென்றிருக்கின்றது என்பதை எங்களால் உணர்ந்துகொள்ளக் கூடியதாக இருக்கின்றது. நிதி முகாமைத்துவம் சரியாக இருக்கின்றபோது, முதலீடுகள் அதிகரிக்கின்ற தன்மையும் சேமிப்புகள் அதிகரிக்கின்ற தன்மையும் தலா வருமானம் அதிகரிக்கின்ற தன்மையும் பாதீட்டில் நேர்க்கணியமான விளைவு கிடைக்கக்கூடிய தன்மையும் ஏற்பட்டிருக்கின்றன. ஆனால், எமது நாட்டில் துண்டுவிழும் தொகையானது, ஒவ்வோர் ஆண்டிலும் அதிகரித்துக்கொண்டு செல்கின்றது என்றால், எமது நிதி முகாமைத்துவத்தில் ஏதோ குறைபாடு இருக்கின்றது என்பதை நாங்கள் ஏற்றுக்கொண்டேயாக வேண்டும். அதேவேளை, இந்த நிதி முகாமைத்துவத்தினூடாக நாங்கள் பல்வேறுபட்ட தொழிற்சாலைகளையும் பல்வேறுபட்ட நிறுவனங்களையும் இயக்கிக்கொண்டு வருகின்றோம். இந்தத் தொழிற்சாலைகள் வெற்றிகரமாக இயங்குமாக இருந்தால், அங்கு நிதி முகாமைத்துவமும் சரியான முறையில் அமைந்திருக்கும். ஆனால், நிதி முகாமைத்துவத்தில் ஊழல், மோசடிகள், சுருட்டல்கள் இடம்பெறுமாக இருந்தால், அந்தத் தொழிற்சாலைகள் முடங்கிப்போகக்கூடிய ஒரு நிலைமை அல்லது தோல்வியில் முடிவடையக்கூடிய ஒரு நிலைமை ஏற்படும்.

நான் இந்த இடத்தில் குறிப்பிடவேண்டிய ஒரு விடயம் என்னவென்றால், மட்டக்களப்பு - வாழைச்சேனையில் 1956ஆம் ஆண்டு தேசிய கடதாசித் தொழிற்சாலை உருவாக் கப்பட்டது. 1956ஆம் ஆண்டு காலப்பகுதியில் - ஐக்கிய தேசியக் கட்சியின் ஆட்சிக் காலத்தில் - மட்டக்களப்பில் அபிவிருத்திகளைப் பற்றி அதிகமாகச் சிந்தித்தவரும் அமைச்சராக இருந்தவருமான அமரர் நல்லையா அவர்களது முயற்சியாலும் கைத்தொழில் அமைச்சராக இருந்த ஜீ.ஜீ. பொன்னம்பலம் அவர்களது முயற்சியாலும் அந்தத் தொழிற் சாலை ஆரம்பிக்கப்பட்டது. அந்தத் தொழிற்சாலை மிகவும் வெற்றிகரமான முறையில் செயற்பட்டது மட்டுமல்லாமல், 4,000 - 5,000 தொழிலாளர்களுக்கு தொழில் வாய்ப்புக் களையும் பெற்றுக்கொடுத்தது. அத்துடன், அந்தத் தொழிற்சாலையிலிருந்து கிடைக்கக்கூடிய வருவாயின் மூலமாக சுமார் 12,000 - 15,000 வரையான மக்கள் தமது வாழ்வாதாரத்தைப் பெறக்கூடிய ஒரு நிலைமையும் காணப் பட்டது. யுத்த காலத்திலும், 1996-1997களில் உற்பத்தியின் மூலமாகத் தேசிய விருதினைப் பெற்றுக்கொடுத்த ஒரு தொழிற்சாலையாகவும் இருந்தது. ஆனால், அந்தத் தொழிற் சாலையின் தற்கால நிலைமையைப் பார்க்கின்றபோது மிகவும் வேதனையாக இருக்கின்றது. 4,000 தொழிலாளர் களைக் கொண்டிருந்த இத்தொழிற்சாலை, இன்று 139 தொழிலாளர் களுடன் ஊசலாடிக்கொண்டிருக்கின்றது.

அதேவேளை, இந்தத் தொழிற்சாலையில் பணியாற்று கின்ற ஊழியர்களைக் கட்டாயப்படுத்தி VRS என்கின்ற - Voluntary Retirement Scheme -முறைமையினூடாக அவர்க ளைத் தொழிலிருந்து நிறுத்துகின்ற நிலைமையும் ஏற்பட்டிருக்கின்றது. ஒரு காலத்தில் கொடிகட்டிப் பறந்து கொண்டிருந்த வாழைச்சேனை காகிதத் தொழிற்சாலை, இன்று பூச்சிய இயக்கநிலையில் - மரணப்படுக்கையில் விழக்கூடிய ஒரு சூழ்நிலையில் - காணப்படுகின்றது. இதனால், அந்தத் தொழிற்சாலையிலிருந்து பயன்பெற்ற தொழிலாளர்களும் அதனை நம்பியிருந்த பல குடும்பங்களும் வாடுகின்ற நிலைமை அல்லது தொழிலை இழக்கின்ற நிலைமை காணப்படுகின்றது. கடந்த காலங்களில் இந்தத் தொழிற்சாலை இயங்கியபோது, பல சாதனைகளைப் படைத்திருக்கின்றது. அந்தத் தொழிற்சாலையின் உற்பத்தி மூலமாக இலங்கையின் காகிதத் தேவையின் 25 சதவீதத்தைப் பூர்த்திசெய்யக்கூடிய ஒரு நிலைமையும் இருந்ததோடு, அவ்வுற்பத்திப் பொருளின் தன்மையும் - qualityயும் உயர்வாகத்தான் இருந்தது. அப்படிப் பட்ட அந்தத் தொழிற்சாலை இன்று வினைத்திறனும் விளைதிறனும் குன்றிக் காணப்படுகிறது. அத்துடன், பழைய இயந்திர உதிரிப்பாகங்களைக்கொண்டு இயங்க வைக்கப்படு கிறது. இந்த நிலைமையில் அது முற்றுமுழுதாக மூடப்படக் கூடிய ஒரு சூழ்நிலை காணப்படுகின்றது. அண்மையில் எங்களுடைய கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரின சிரேஷ்ட மேலதிகச் செயலாளர் ஒருவர் அந்த ஊழியர்களை VRS மூலமாக ஓய்வு பெறும்படி குறிப்பிட்டிருக்கிறார். இந்த நல்லாட்சியை ஏற்படுத்துகின்ற விடயத்தில் பல்வேறு அச்சுறுத்தல்களின் மத்தியில் சிறுபான்மை இனத்தவர்கள் - தமிழர்களாக இருந்தாலென்ன, முஸ்லிம்களாக இருந்தாலென்ன, எங்களது மலையகத்து தமிழ் உறவுகளாக இருந்தாலென்ன - மிகவும் பகீரதப் பிரயத்தனத்தோடு முக்கிய பணியினை ஆற்றியிருந்தார்கள். அதுபற்றி எனக்கு முன்னர் பேசிய சகோதர உறுப்பினரும் குறிப்பிட்டிருந்தார். தங்களுடைய வாழ்க்கையில் ஒரு மறுமலர்ச்சி ஏற்பட வேண்டும்; எழுச்சி ஏற்பட வேண்டுமென்ற நோக்கத்தில்தான் அவர்கள் அந்தப் பணியினைச் செய்திருந்தார்கள்.

கௌரவ நிதி அமைச்சர் ரவி கருணாநாயக்க அவர்கள் தன்னுடைய வரவு செலவுத்திட்ட உரையின்போது, அந்த காகிதத் தொழிற்சாலையினை மீண்டும் கட்டியெழுப்பித் தருவ தாகவும் மண்டூரில் காணப்பட்ட ஓட்டுத் தொழிற்சாலையை மீண்டும் புனருத்தாரணம் செய்து தருவதாகவும் உத்தரவாதம் தந்திருந்தார். அவருடைய அந்த வாக்குறுதிகள் எங்கள் காதுகளில் ஒலித்துக்கொண்டிருக்கின்ற அதேவேளை ஹன்சாட்டிலும் பதிவு செய்யப்பட்டிருக்கிறது. இந்த நிலையில் அந்தத் தொழிற்சாலை மூடப்படக்கூடிய ஓர் அபாய நிலைக்குத் தள்ளப்பட்டிருக்கிறது. சுமார் 320 ஏக்கர் பரப்பளவைக் கொண்ட அந்த தொழிற்சாலையானது மட்டக்களப்பு மக்களுக்கோ, கிழக்குப் பிராந்தியத்திலுள்ள மக்களுக்கோ மட்டுமல்லாது இலங்கை முழுவதிலுமுள்ள மக்களுக்கும் தொழில்வாய்ப்பைப் பெற்றுக்கொடுக்கக்கூடிய கேந்திர முக்கியத்துவம் வாய்ந்த ஒரு நிலையமாகக் காணப்பட்டது. சிங்கள மக்களாக இருந்தாலென்ன, தமிழ் மக்களாக இருந்தாலென்ன, முஸ்லிம் மக்களாக இருந்தாலென்ன

අනෙවරුම් ඔන්ටාක ඉණෙන්දු තොෆිල් පුරිකින්ර ඕර් උයර්න්ද තොෆිල්චාලෙයාක අදු ඉරුන්දු වන්තදු. ඉන්රු අන්දත් තොෆිල්චාලෙයිල් ඉරුක්කින්ර තොෆිලාලර්කළ් එංගිප් පරිතවික්කින්රාර්කළ්. අවර්කළුටෙය තොෆිල්කළෙ ඉළුක්කක්කූටිය ඔරු නිලෙමෙ අංකු කාණප්පටුකින්රදු.

කුරිප්පාක, 50 වයතුක්කුට්පට්ට 28 ඌෆියර්කළුම්, 50 - 55 වයතුක්කුට්පට්ට 40 ඌෆියර්කළුම්, 55 වයතුක්කු මේර්පට්ට 61 ඌෆියර්කළුමාක මොත්තම් 129 ඌෆියර්කළ් අංකු පණියාර්රික්කොණ්ටිරුක්කිරාර්කළ්. ඉන්ත නිලෙයිල් තංකළුටෙය තොෆිල්කළෙ ඉළුක්කින්රපොදු ඉන්ත නල්ලාට්චියින්මීදු අවර්කළුක්කු අතිරුප්ති ඒර්පටුම්. අවර්කළ් විරක්තියටෙවාර්කළ්. ඉන්ත නිලෙමෙයිනෙච් චරියාක විළංකික්කොණ්ටු අන්දත් තොෆිල්චාලෙ මූටප්පටාමල් මීණ්ටුම් ඉයංකුවතර්කු ඒර්රවිතත්තිල් නල්ලාට්චි අරචානදු උරිය චෙයර්පාටුකළෙ මුන්නෙටුක්ක වේණ්ටුම්. අව්වාරු අදු මූටප්පටුමාක ඉරුන්තාල්, තේචිය අරචාංකම් එන්රු චොල්ලප්පටුකින්ර ඉන්ත නල්ලාට්චි අරචාංකම් අන්ත මක්කළින් චාපක්කේට්ටුක්කු උළ්ළාකවේණ්ටි වරුමෙන්පතෙ ඉන්ත ඉටත්තිල් චුට්ටික්කාට්ට විරුම්පුකින්රේන්. අත්තෝටු, අංකු පණියාර්රියවර්කළ් විරුම්පි ඕය්වුපෙර්රුච් චෙල්ලුම්පොදු VRS කොටුක්කප්පට්ටාලුම් අන්ත තොෆිල්චාලෙයෙ මීණ්ටුම් කට්ටියෙළුප්ප වේණ්ටුම්. අදු මීණ්ටුම් උයර්නිලෙක්කු වන්තු මක්කළුක්කු තොෆිල්වාය්ප්පුක් කළෙ වළංක වේණ්ටුමෙන්ර නোක්කිල් පල උත්තියෝකත් තර්කළ් උළන්රු චෙයලාර්රික්කොණ්ටිරුක්කින්රාර්කළ්. අවර්කළ් තිණෙක් කළත්තින් තලෙවර්කළාකවුම් අත්තියාවචිය නීර් වළංකල් චේවෙයෙච් චෙය්කින්රවර්කළාකවුම් මින්චාර චේවෙකළෙච් චෙය්කින්රවර්කළාකවුම් කාණප්පටුකින්රාර්කළ්. අප්පටිප්පට්ට වර්කළ් අන්දත් තොෆිල්චාලෙයෙ මරණප්පටුක්කෙයිල් විට්ටුවිට්ටු අල්ලතු අතනෙච් චාකටිත්තුවිට්ටු වෙළියේරු වතර්කු තයාරාක ඉල්ලෙ. එනවේ, අන්ත තොෆිල්චාලෙයෙ මීණ්ටුම් ඉයක්කුවතර්කු ඒර්ර විතත්තිල් කෛත්තොෆිල් මර්රුම් වාණිප අළුවල්කළ් අමෙච්චර් කෙරව රිසාට් පතියුතීන් අවර්කළ් උරිය චෙයර්පාටුකළෙ මුන්නෙටුක්ක වේණ්ටු මෙන්රු ඉන්ත උයරිය චපෙයිල් කේට්ටුක්කොළ්කින්රේන්.

අන්ත වකෙයිල්, අන්දත් තොෆිලාලර්කළතු එතිර්පාර්ප්පු නිරෙවේර්රප්පට වේණ්ටුම්. අව්වාරු නිරෙවේර්රප්පටු කින්රපොදුතාන් උණ්මෙයාකවේ නල්ලාට්චි නිලවුකින්ර තෙන්පතෙ අවර්කළ් විළංකික් කොල්වාර්කළ්. එනවේ, අන්ත තොෆිල්චාලෙකළුක්කු මීණ්ටුම් උයිර් කොටුංකළ්! අන්දත් තොෆිලාලර්කළින් ඒක්කංකළෙ, ආතංකංකළෙ, ආක්රෝෂංකළෙත් තීර්ත්තු වෛයුංකළ්! එන්රු ඉන්ත උයරිය චපෙයිල් කේට්ටුක්කොල්වතෝටු, එනතු උරෙයිල් කුරිප්පිට්ට ඉන්ත විටයංකළෙ හන්චාට්ටිල් උරංක වෛක්කාමල්, අවර්රෛච් චෙයර්පාට්ටිල් කාණ්පික්කවේණ්ටුමෙන්රුම් කූර්, විටෙපෙරු කින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

Thank you.

ඊළඟට ගරු රංජිත් සොයිසා මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 26ක කාලයක් තිබෙනවා.

ඊට පෙර මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු මංගල සමරවීර මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(මාණ්පුමිකු මංකළ චමරවීර - වෙළිනාට්ටලුවල්කළ් අමෙච්චර්)
(The Hon. Mangala Samaraweera - Minister of Foreign Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේදී ගරු ලකී ජයවර්ධන මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
වින්නා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

අනතුරුව ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
අතන් පිර්කු, මාණ්පුමිකු ජේ.එම්. ආනන්ද කුමාරසිරි අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු ලක්කි ජයවර්තන අවර්කළ් තලෛමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. J.M. ANANDA KUMARASIRI *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

[අ.භා. 4.45]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්පුමිකු ෆී. රඥ්ජිත් ත චොය්චා)
(The Hon. T. Ranjith De Zoysa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ඉදිරිපත් කරන්නට යෙදුණු මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන මේ වේලාවේදී මටත් අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වනවා. 2003 අවුරුද්දේ ඉදිරිපත් කර තිබෙන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත මඟින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳව රජයේ වගකීම කොයි ආකාරයෙන් විය යුතුද යන්න පැහැදිලි කර තිබෙනවා. ඒ වාගේම අද මෙම පනතට ඉදිරිපත් කර තිබෙන සංශෝධන සහ ඒ සම්බන්ධයෙන් අදහස් දක්වපු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම දිහා අපේ අවධානය යොමු කරලා බලන කොට මේ පනතේ අරමුණු සහ ඉදිරිපත් කරපු අදහස් සම්බන්ධව බරපතළ නොගැළපීම් කිහිපයක් තිබෙන බව අපට පෙනී යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වර්තමාන රජය බලයට පත්වීමේදී ඉතාම දැඩි ලෙස කියන්නට යෙදුණා, පැවැති ආණ්ඩුව රාජ්‍ය මූල්‍ය අවභාවිත කිරීම සිදු කළ බව සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳව පැවැති රජයට කිසිම වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ කියලා.

පසු ගිය රජයට එවැනි චෝදනාවක් තිබුණා. එය නිවැරදි කිරීම සඳහා විවිධාකාර වූ වැඩ පිළිවෙළවල් දින සියයේ වැඩ පිළිවෙළ තුළත්, ඉන් අනතුරුව මාස 60න් අලුත් රටක් නමැති ඒ විප්ලවීය ප්‍රතිපත්ති ප්‍රකාශන වැඩ පිළිවෙළ තුළිනුත් රටේ ජනතාව ඉදිරියට අරගෙන ආවා. එහෙම අරගෙන ඇවිල්ලා දැඩි ලෙස තිබෙන මූල්‍ය අවභාවිතය වැළැක්වීම සඳහා විවිධාකාර ක්‍රමෝපායන් රට හමුවේ ඉදිරිපත් කළා. විශේෂයෙන්ම යහ පාලනයක් ඇති කිරීම සඳහා විවිධාකාර රාජ්‍ය කොමිෂන් සභා පත් කරලා ඒ හරහා නැතිවී ගිය යහ පාලනය නැවත ඇති කිරීම සඳහා කටයුතු කරනවාය කියන පොරොන්දුව දිගින් දිගටම, දිගින් දිගටම රට හමුවේ තැබුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අද වන විට ඒ දීපු පොරොන්දු පිළිබඳව කුමන ආකාරයෙන් අවරෝහණ පැත්තට රට

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

ගමන් කරමින් තිබෙනවාද කියන එක සක්සුදක් සේ අපට පෙනෙනවා. දින සියයේ වැඩ පිළිවෙළ තුළින් ඉතා පැහැදිලිව කිව්වා, මීට ඉස්සෙල්ලා ප්‍රකාශ වෙච්ච ආකාරයට විගණන කොමිසම පිහිටුවලා, විගණන පනත ඉදිරිපත් කරලා ඒ සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගන්නවා කියලා. දින වකවානුත් දීලා තිබුණා. හැබැයි, දින සියයේ වැඩ පිළිවෙළ තුළ එය ඉෂ්ට කරන්න බැරි වුණා. දින සියයත් පසු වුණා; දෙසීයත් පසු වුණා; තුන්සියයත් පසු වුණා. දැන් දින පන්සියයකටත් කිට්ටු වෙලා තිබෙනවා. මාස 18ක් මේ ආණ්ඩුව පසු කරලා තිබෙනවා. තවම බැරි වුණා ඒ කටයුත්ත හරියාකාරව කරගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තුළින් අපිට පෙනී යන දෙයක් තමයි ඒ කියපු ලස්සන සර්ව පිත්තල වචන, සර්ව පිත්තල ලෝකය අද ඉතාම පැහැදිලිව බිඳ වැටෙමින් පවතින බව. මේ කියපු දේවල් අද ඉෂ්ට කරගන්න බැරිව, රජයේ නායකයින්ගේ සිට පහළ අය දක්වා සියලු දෙනාගේම එකම ප්‍රතිපත්තිය, එකම වැඩ පිළිවෙළ වෙලා තිබෙන්නේ දිගින් දිගට, දිගින් දිගටම පසු ගිය මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පාලනයට අත දිගු කරමින්; ඇඟිල්ල දිගු කරමින් "ඒ කාලයේ එහෙම වෙච්ච හින්දා මේ කාලයේ මෙහෙම වෙනවා" කියන එක ආරෝපණය කිරීමට උත්සාහ කිරීමයි. සුපුරුදු කියමනක් තිබෙනවා නේ, "අච්චරට මෙච්චර නම්, මෙච්චරට කොච්චරද?" කියලා. ඒ වාගේ "එදා එහෙම වුණා, මෙදා මෙහෙම වෙනවා" කියන එක තමයි දැන් මේ කියන්නේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙච්ච යහ පාලනය,

මේ රටේ මිනිස්සු බලාපොරොත්තු වෙච්ච යහ පාලනය, මිනිස්සුන්ට දුන්න පොරොන්දු අද අයිස් කන්දක් වාගේ දියවෙමින් පවතිනවා. අන්න එවැනි තත්ත්වයක් තුළ තමයි මේ මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

අද ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත පිළිබඳව විවාදයේ දී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් දීර්ඝ වේලාවක් තිස්සේ ඒ සම්බන්ධයෙන් කරුණු දැක්වුවා අපි දැක්කා. හැබැයි, මොකක්වත් තේරුණේ නම් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බර, බර ගාන සද්දයක් තමයි මේ පැත්තට නම් ඇහුණේ. මේ කියන කරුණක් පිළිගත හැකි ආකාරයට, වැදගත් ආකාරයට ඉදිරිපත් කරනවා නම්, ඒ සම්බන්ධයෙන් විපක්ෂයේ අපට යම් තරමකටවත් හිතලා බලන්න පුළුවන් කියලායි මම කියන්නේ. නමුත්, ඒ මන්ත්‍රීතුමා දිගින් දිගටම ප්‍රකාශ කළේ පසු ගිය කාල පරිච්ඡේදය තුළ සිදු වෙච්ච ක්‍රියාදාමයන් දිහා බලන කොට පසු ගිය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය තුළින් කිසිම වැඩ කටයුත්තක් සිද්ධ වුණේ නැහැ; රට විනාශයෙන් විනාශයට පත් වුණාය කියන කතාන්දරය විතරයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම මේ ඉදිරිපත් කරන්නේ, මුදල් අමාත්‍යාංශය විසින් 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කළ වාර්ෂික වාර්තාවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතට අනුව තමයි මෙම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර තිබෙන්නේ. මෙම වාර්තාවේ ඉතාම පැහැදිලිව ප්‍රකාශ කර තිබෙන කරුණු පිළිබඳව මම දැන් ඔබතුමාගේ සහ මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා. මේ තිබෙන කරුණු අසත්‍යද කියලා කියන්න. මේ කරුණු අසත්‍යයි කියලා ඔප්පු කරනවා නම්, පසු ගිය දස වසරකට ආසන්න කාලයක් මේ රට පාලනය කළ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව මොනවත්ම කළේ නැහැයි කියන එක අපි පිළිගන්නම්. හැබැයි, මහින්ද රාජපක්ෂ රජය 2014 වර්ෂය වෙනකොට රට තුළ කර තිබුණු වැඩ කටයුතු පිළිබඳව මෙම වාර්ෂික වාර්තාව තුළ පැහැදිලිව සඳහන් කර තිබෙනවා. මෙය ඉදිරිපත් කරන්නේ, මේ රජයේ මුදල් ඇමතිවරයා. මේ රජයේ මුදල් අමාත්‍ය, ගරු රවි කරුණානායක මැතිතුමා, මුදල් රාජ්‍ය අමාත්‍ය, ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා ඇතුළු එම කණ්ඩායම ඉදිරිපත් කළ මෙම වාර්තාව තුළ ඒ සියල්ල අන්තර්ගත වෙලා තිබෙනවා. හැබැයි, ගත් කටටම කියාගෙන-කියාගෙන යනවා, අරක මෙහෙමයි; මේක මෙහෙමයි කියලා.

2014 වර්ෂය තුළ රටේ ආයෝජන සියයට 32ක් වැනි ඉහළ මට්ටමක තිබුණාය කියා මෙම වාර්තාවේ කියා තිබෙනවා. මම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් අහනවා, මේක වැරදිද කියලා. සියයට 32 දක්වා රටේ ආයෝජන මට්ටම ඉහළ ගොස් තිබුණාය කියා මෙම වාර්තාවේ සඳහන් කර තිබෙන එක වැරදිද? ජාතික ඉතිරිකිරීම් ප්‍රතිශතය සියයට 29.5ක් වැනි ඉහළ මට්ටමක පැවතුණාය කියා මෙහි සඳහන් වෙනවා. ඒක වැරදිද? මහින්ද රාජපක්ෂ රජය තුළ 2014 වර්ෂයේ අය වැය හිඟය සියයට 5.7යි කියලා මෙහි සඳහන් වෙනවා. ඒක වැරැදිද? ඊළඟට, 2004 වර්ෂය වනකොට සියයට 103ක් තිබුණු රාජ්‍ය ණය 2014 වර්ෂයේ සියයට 70.7ක් දක්වා අඩු කර තිබෙනවා කියලා මෙම වාර්තාවේ සඳහන් කර තිබෙනවා. ඒක වැරැදිද? රට තුළ ජාත්‍යන්තර සංචිතය ඇමෙරිකානු ඩොලර් මිලියන 8.2ක් තිබුණු බව මෙහි සඳහන් වෙනවා. ඒක වැරදිද? අපි අහනවා, මේ මහා ප්‍රාඥයෝ ටික, මේ ලොකු ඔළු ගෙඩි ටික, මේ මොළ ගෙඩි ටික එකතු වෙලා අද වෙනකොට -2016 පළමුවැනි කාර්තුව අවසාන වෙනකොට- සියයට 8.2ට තිබුණු ජාත්‍යන්තර සංචිතය වැඩි කර තිබෙනවාද, අඩු කර තිබෙනවාද කියා. මම අහන්නේ මේ ලේඛනය බලාගෙනයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 වර්ෂය වනවිට රටේ ජංගම දුරකථන ඝනත්වය පුද්ගලයන් සියයකට 107ක මට්ටමේ තිබුණාය කියා මෙහි සඳහන් කර තිබෙනවා. ඒක වැරැදිද? ස්ථාවර දුරකථන ඝනත්වය පුද්ගලයන් සියයකට 120ක මට්ටමේ තිබුණාය කියා මෙහි සඳහන් කර තිබෙනවා. ඊළඟට, විදුලි බලය සඳහා ප්‍රවේශය ජන ගහනයෙන් සියයට 98 දක්වා වැඩි කර තිබුණාය කියා මෙහි සඳහන් කර තිබෙනවා. ඒකත් වැරැද්දක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2009-2014 කාලයේ දී රටේ ජාතික නිෂ්පාදනයන් අඛණ්ඩව ඉහළ වේගයකින් වර්ධනය වුණු බව මෙම වාර්තාවේ සටහන් කර තිබෙනවා. මේක වැරැදිද? ඒ වාගේම 2014 වර්ෂයේ දී උද්ධමනය සියයට 3.3 දක්වා අඩු වෙලා තිබෙනවා. ජීවන වියදම් අර්බුදය පහළ මට්ටමක තිබුණු බව ප්‍රකාශ කර තිබෙනවා. ඒ වාගේම මෙම වාර්තාවේ පිටු අංක 03හි සඳහන් වෙනවා, විරැකියාව අනුපාතය සියයට 4.3 දක්වා අඩු වෙලා තිබුණු බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවේ මැති ඇමතිවරුන් දිගින් දිගටම, දිගින් දිගටම ණය බරතාව පිළිබඳව, පසු ගිය රජයේ තිබුණු අඩු පාඩුකම් පිළිබඳව ප්‍රකාශ කරද්දී, ගරු මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මෙම වාර්ෂික වාර්තාවේ සඳහන් කරුණු හරිය කියලා කියනවාද, වැරැදියි කියලා කියනවාද කියන එකයි අපි රජයේ පාර්ශ්වයෙන් අහන්නේ. නමුත් එහෙම මොකුත් කියන්න බැහැ. මොකද, මෙම වාර්තාව ඉදිරිපත් කළේ අපි නොවෙයි. තමුන්නාන්සේලාගේම ආණ්ඩුවයි මෙය ඉදිරිපත් කළේ. ඒ නිසා අපි ඉතාම කරුණාවෙන් ආණ්ඩුවේ පාර්ශ්වයෙන් ඉල්ලීමක් කරනවා, තමන්ගේ නොහැකියාව, තමන්ගේ බැරිකම, තමන්ගේ මෝඩකම, මඝරකම, අමනකම වසා ගන්න හැම දෙයක්ම මේ පැත්තට දමලා, රාජපක්ෂ ආණ්ඩුවට, එහෙම නැත්නම් පසු ගිය කාලයේ පැවැති සන්ධාන ආණ්ඩුවට ඇඟිලි දිගු කරනවා වෙනුවට තමන් විසින් රට හමුවේ, ජනතාව හමුවේ තැබූ පොරොන්දු ඉෂ්ට කරන්න කටයුතු කරන්නය කියලා. එහෙම කළොත් යහ පාලනය තව ටික කාලයක් හෝ පවතීවි. ඒ වාගේම අද කියනවා, දැවැන්ත ආකාරයේ සංවර්ධනයක් රට පුරාම සිදු වෙමින් පවතිනවා කියලා.

ගරු මුදල් ඇමතිතුමාත් අද මේ පනතට සංශෝධන ඉදිරිපත් කරමින් කිව්වා, විශාල සංවර්ධනයක් බැලූ බැලූ හැම අතේම තිබෙනවා කියලා. හැබැයි, රූපවාහිනිය දැක්කාම අපටත් හිතෙනවා, සංවර්ධනයක් තිබෙනවා තමයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැති ඇමතිවරුන් -ආණ්ඩුවේ ඉහළම උදවිය- හැම දාම වාගේ ගිහිල්ලා කරන විවෘත කිරීම් රූපවාහිනියේ පෙන්වනවා. ඊයේ හෝ පෙරේදාත් එවැනි දේවල් පෙන්වුවා. අව්වර ගියා, මෙව්වර ගියා කියලා විවෘත කිරීම් පෙන්වනවා. අපි ඒ විවෘත කිරීම් පිළිබඳව හොයා බලන කොට ඒ හැම එකක්ම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේ වැඩ අවසාන කරපු කර්මාන්තයි මේ ආණ්ඩුවේ නායකයෝ ගිහිල්ලා විවෘත කරන්නේ.

දැන් නිවාස සංකල්පය පිළිබඳව මහා ලොකුවට පුරසාරම් දොඩවන නියෝජ්‍ය නායකතුමාත් මාළිගාවත්තේ නිවාස සංකීර්ණයක් විවෘත කළා. ඔය විවිධ චෝදනා, අපහාස, උපහාස එල්ල කරන විමල් වීරවංශ මැතිතුමා නිවාස ඇමතිවරයා හැටියට සිටි කාලයේ මාළිගාවත්තේ හදපු නිවාස සංකීර්ණයක් තමයි එතුමා එසේ ගිහිල්ලා විවෘත කරලා එන්නේ.

ඒ විතරක් නොවෙයි. පිහිනුම් තටාක, පාසල් ගොඩනැගිලි, රෝහල්, පාරවල්, වෙන එකක් තියා මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයත් ආණ්ඩුවේ ඉහළ තැන්වල උදවිය ගිහිල්ලා විවෘත කළා. හැබැයි, මේ ඔක්කෝම පසු ගිය ආණ්ඩුව කාලයේ හැදුව ඒවා.

මේ මාස 18ට ලංකා රාජ්‍යයේ මුදල් වෙන් කරලා, වියදම් කරලා හදපු ව්‍යාපෘතියක්; විවෘත කරපු ස්ථානයක් පිළිබඳව කියන්න. පාලම් දහසේ ව්‍යාපෘතිය ගෙනාවා. පාලම් දහසේ ව්‍යාපෘතිය ගෙනැල්ලා පාලම් ටිකේ වැඩ පටන් ගෙන තිබෙන කොට ආණ්ඩුව පෙරළුණා. හැබැයි, දැන් මේ ආණ්ඩුවේ ලොකු ලොක්කෝ ගිහිල්ලා බෝඩ් ගහගෙන පාරවල් ටික විවෘත කරනවා; පාලම් ටික විවෘත කරනවා. නමුත්, ඒවාට ප්‍රතිපාදන දීලා කටයුතු කෙරුවේ මේ ආණ්ඩුව නොවෙයි. මේ දේවල් කියන්න ලජ්ජයි.

පසු ගිය දවස්වල පත්තරවල තිබෙනවා අපි දැක්කේ පාරවල් හදලා විවෘත කරන ඒවා නොවෙයි. හදපු පාරවල් කඩලා තිබෙන බව පත්තර වල දමා තිබෙනවා අපි දැක්කා. ඒ තොරතුරු අනිකුත් මාධ්‍යවලත් තිබුණා. ඇවිදින මං තිරු කඩලා ගලවපු ඒවා අපි දැක්කා. රාජ්‍ය අරමුදල් අවභාවිත කිරීම පිළිබඳව විවධ හඬ නැහෙන මේ කාල වකවානුව තුළ පසු ගිය රජයේ සිටි අපේ ඇමතිවරයෙක් වුණු බැසිල් රාජපක්ෂ මැතිතුමා මුදල් අවභාවිත කිරීම සම්බන්ධව රිමාන්ඩ් බන්ධනාගාරගත කළා. එතුමා කරපු වැරැද්ද මොකක්ද? ප්‍රාදේශීය සභාවලට, පළාත් පාලන ආයතනවලට යකඩ බට ලබා දීම. හැබැයි, ඒ දීපු බට අදත් පළාත් පාලන ආයතනවල තිබෙන බව අපි දැක්කා. නමුත්, වෙනසක් තිබෙනවා. අද නගර හැම තැනම ඒ දීපු බටවල කොළ පාට කොඩි දමා තිබෙනවා. මෙන්න, මූල්‍ය අවභාවිතය. දීපු බට එහෙමම තිබුණත්, පාරවල් කඩපු අය සම්බන්ධව, මූල්‍ය අවභාවිත කිරීමක් සම්බන්ධව ඔය කියන මූල්‍ය වංචා විමර්ශන කොට්ඨාස, අලුත් පොලිස්පති, කිසි කෙනෙක් පියවරක් ගන්නවා අපි දැකලා නැහැ. ඒ නිසා මේ රටේ ජනතාවට දෙනවා කිව්ව යහ පාලනය මේකද කියලා අපි නැවතත් අහන්න ඕනෑ. උදා කරනවා කිව්ව යහ පාලනය මේකද? ඒ නිසා අපට මේ සම්බන්ධව නැවත නැවත හිතා බලන්න වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එමෙන්ම මෙම මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත තුළ ඉතාම බරපතළ ආකාරයේ දෙයක් ගැබ් වෙලා තිබෙනවා. දැන් රාජ්‍ය අරමුදල් සහ පෞද්ගලික මුදල් එකතු කරලා ආරම්භ කරන ව්‍යාපෘතිවල අවදානම මේ ආණ්ඩුව භාර ගන්න සූදානම් යනුවෙන් කියලා තිබෙන මේ ප්‍රකාශය තුළ -මේ වගන්තිය තුළ- මොන තරම් දුරට රාජ්‍ය අරමුදල් සුරක්ෂිත වනවාද කියන ප්‍රශ්නය තවදුරටත් රටට ප්‍රශ්නයක් නොවෙයිද? රටේ ආර්ථිකයට ප්‍රශ්නයක් නොවෙයිද? මේක ආර්ථිකය කළමනාකරණය කිරීමක්ද? ඉතාම අඩු කොටස් ප්‍රමාණයක් තිබෙන හවුල් සමාගම්වල වගකීම රජය දරනවා යැයි ප්‍රකාශ කිරීම තුළ රාජ්‍ය අරමුදල් නිසි පරිදි කළමනාකරණය වීමක් සිදුවේද යන්න පිළිබඳව මේ සභාවේ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරු නැවත නැවතත් සිතා බැලිය යුතු වනවාය කියන ප්‍රකාශය අපි මේ සභාවේදී කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එමෙන්ම මේ ආකාරයට දිගින් දිගට කටයුතු කිරීමත්, මේ ආකාරයේ ප්‍රකාශ කිරීමත් තුළ, රාජ්‍ය අරමුදල් නිසි පරිදි කළමනාකරණය කිරීම පිළිබඳව සභාවේ කථා කරන මේ වෙලාවේ අපට අහන්න වෙනවා, රජයට ආදායම් එකතු කර ගැනීමේ විශාල බලාපොරොත්තුවක් ඇතිව ඉදිරිපත් කරපු වැට් -බදු- සංශෝධන පනත් කෙටුම්පතට මොකද වුණේ කියන ප්‍රශ්නය. "මේක බොහොම හොඳයි" කියලා, එහෙම නැත්නම් "රාජපක්ෂගේ බදු" කියලා, "රාජපක්ෂ බද්ද" කියලා අලුත් නමකුත් දාලා වෛරී සහගතව ගෙනාපු පනත් කෙටුම්පත අධිකරණයේ ප්‍රතික්ෂේප වීම තුළම රජයේ ගමන් මාර්ගයට කණු කොකා හඬා තිබෙන බව පෙනී යනවා. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කෙරුවේ ලොකු ආදායම් ප්‍රමාණයක් එකතු කර ගන්න බලාගෙනයි. "රාජපක්ෂ බද්ද" කියලායි හැඳින්වූයේ. රාජපක්ෂ ණය ගෙවන්නය කියලා පනත් කෙටුම්පත ඉදිරිපත් කෙරුවා. හැබැයි, මහා විශාල කණ්ඩායමක්, 93දෙනෙකුගෙන් යුත් ඇමති මණ්ඩලයක් ඉන්න මේ ආණ්ඩුවේ කාටවත් පෙන්වා දෙන්න බැරි වුණාද, කැබිනට් මණ්ඩලයේ අනුමැතියකින් තොරව මේ පනත් කෙටුම්පත ගියාම ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි කියන එක. යම් කිසි විධියකින් ඒකාබද්ධ විපක්ෂයේ අපේ මන්ත්‍රීවරුන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට නොයන්න මේ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුව තුළ සම්මත වනවා නේද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? එසේ වූවා නම්, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන මහ ලොකුවට කථා කරන, රාජපක්ෂ ඒකාධිපතිවාදය ගැන නන් දොඩවන මේ උදවිය කරන්න හැදුවේ පාර්ලිමේන්තුව bulldoze කරගෙන යන්නයි. හැබැයි, ඒ තත්ත්වය, ඒ ව්‍යායාමය වළක්වන්න කටයුතු කිරීම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයට, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දීපු තීන්දුවට. අද මේ ආකාරයට කුමන දේවල් ඉදිරිපත් කරමින් කටයුතු කළත්, අපට පෙනී යන්නේ රජයේ ගමන් මාර්ගය ඉතා අපැහැදිලියි, ඉතාම අඩමානයි කියන එකයි. ඔවුන් ආදායම් එකතු කර ගැනීමේ අදහසින්, රාජ්‍ය ආදායම් වැඩි කර ගැනීමේ අදහසින් -මේ කුමන අදහසින්- වැඩ කළත් ඒ හැම දෙයකම අවසානයේ අඩංගු වෙලා තිබෙන්නේ වෛරී ස්වභාවයයි; වෛරයයි. ආණ්ඩුවේ මැතිඇමතිවරු කථා කරන වචනයක් වචනයක් පාසා වෛරය වැක්කෙරෙනවා. ඒ නිසා මෙවැනි නරක අදහසකින්, නරක හිතකින් ඉදිරිපත් කරන වැඩ පිළිවෙළක් කොයි තරම් දුරට සාර්ථක වේවිද කියන එක පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ගැටලු -ප්‍රශ්න- තිබෙනවා.

අපි අවසාන වශයෙන් ප්‍රකාශ කරනවා, "රාජපක්ෂ", "රාජපක්ෂ", "රාජපක්ෂ" යනුවෙන් අත දිගු කර කර, ඇඟිල්ල දිගු කර කර මාස 18ක් තිස්සේ පුනරුච්චාරණය කරපු මෙන්න මේ ක්‍රියා මාර්ගයෙන් බැහැරව රට ඉදිරියට ගෙන යාම සඳහා වැඩ පිළිවෙළක් ආණ්ඩුව විසින් ඉදිරිපත් කළ යුතු බව. එසේ නොකර, සියලු වැරදි ඒකාබද්ධ විපක්ෂය මතත්, මහින්ද රාජපක්ෂ මැතිතුමා මතත් පවරමින් කරගෙන යන මේ වැඩ පිළිවෙළට තව

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

දුරටත් ඉදිරි ගමනක් නැහැයි කියන එක මේ රටේ ඉන්න පුංචි දරුවකුට පවා වැටහෙන දෙයක්, තේරෙන දෙයක්. අද රජය ජප කරන එකම මන්තරය වෙලා තිබෙන්නේ "රාජපක්ෂ" කියන වචනයයි. මෙයින් තොරව වැඩ පිළිවෙළක් මේ ආණ්ඩුවට නැහැ. ඒ නිසා තමයි මේ ඉදිරිපත් කළ බොහෝ අණ පනත් පිළිබඳව ගැටලු සහගත තැන් ඇති වෙලා රට අගාධයට යන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ.

අද කියනවා, උද්ධමනය අඩුයි කියලා. රට සංවර්ධනය වෙලායි කියනවා, යහ පාලනය ඇති වෙලායි කියනවා, සුදු වෑන් නැහැයි කියනවා, අධිකරණය ස්වාධීනයි කියනවා, පොලිස් කොමිසම ස්වාධීනයි කියනවා, රාජ්‍ය සේවය ස්වාධීනයි කියනවා. මේ ඔක්කෝම හුදු වචන මාලාවක් පමණක් වෙලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොන සුරංගනා වචන, කතා කිව්වත් ජනතාවගේ බඩට දැනෙන දෙයක් කරන්නේ නැත්නම් කිසිම ආණ්ඩුවකට පවතින්න බැහැයි කියන එක අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ.

එදා ඇහුවා, පාරවල් කාපට කරලා කන්න ද කියලා. අපි අද අහනවා, මේ රටේ මිනිස්සු බඩ ගින්නේ ඉන්දැද්දී යහ පාලනය කන්න ද කියලා. අද මේ රටේ මිනිස්සු බඩගින්නේ, හාමතේ ඉන්දැද්දී රටේ නායකයෝ, ආණ්ඩුවේ නායකයෝ ගිහිල්ලා යහ පාලනය ගැන පුරසාරම් දොඩනවා. අපි අහනවා යහ පාලනය කන්න ද කියලා. මේ මිනිස්සුන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නය කියලා අපි ආණ්ඩුවට කියනවා. ආණ්ඩුව අද කුමන ආකාරයේ ප්‍රකාශ කෙරුවත් අපි කියන්න ඕනෑ, පසු ගිය දශකයක කාලය තුළ මේ රට යම් කිසි ස්ථාවර තැනකට ගෙන ගිය බව. නමුත්, අද ඒ තත්ත්වය දිනෙන් දින විනාශයෙන් විනාශයට පත් වෙමින් තිබෙන මේ වෙලාවේ මේ මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පතෙහි ඉදිරිපත් කර තිබෙන වගන්ති, වචන ඉතා හොඳ වුණත් මෙහි අඩංගු වෙලා තිබෙන අදහස ඒ තරම් හොඳ දෙයක් වෙන්නේ නැහැ. ඒ නිසා මූල්‍ය කළමනාකරණය කිරීමේ මුවාවෙන් මේ ඉදිරිපත් කර තිබෙන වචන නොවෙයි ක්‍රියාත්මක වන්නේ. මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳව අද මුළු ආණ්ඩුවම නිශ්ශබ්දයි.

ගරු ජනාධිපතිතුමා කියනවා, "මේ සම්බන්ධයෙන් යම්කිසි ගැටලුවක් තිබෙනවා" කියලා. හැබැයි, ඒ සම්බන්ධයෙන් රජයේ ගරු අගමැතිතුමා ක්‍රියා කළ ආකාරය ගැන බරපතළ ගැටලුවක් අපට තිබෙන්නේ. මහ බැංකු අධිපති තනතුරේ හිටපු ඒ පුද්ගලයා ඉවත් කළාට ඔහු හෙවණැල්ල වාගේ තවත් අගමැතිතුමා පිටිපස්සේ වාඩිවෙලා කැරකැවි, කරකැවි ඉහළ තනතුරු තානාන්තර දරමින් දඟලන්නේ ඇයි? මේ රටට - ලංකාවට- වැඩක් කරන්නද? නැහැ. තමන්ගේ සුබ විහරණය සඳහා යම් යම් ක්‍රියා මාර්ග ගන්නවා. ඒ වාගේම මේ රටේ ආර්ථිකයට බරපතළ හානි කරපු මිනිස්සු; එදා ඉඳලා පැනලා ගිය මිනිස්සු අද නැවත වරක් ඇවිල්ලා අගමැතිතුමාත්, ජනාධිපතිතුමාත් වටේ ඉඳගෙන ආර්ථික උපදේශකයෝ වෙලා උපදෙස් දෙන්නේ යටි මඩි ගහ ගෙන, සාක්කු පුරවා ගෙන මේ රටේ ආර්ථිකය බංකොලොත් කරලා ආපසු යාමේ ව්‍යාපාරයට මිසක් වෙනත් දෙයකට නොවෙයි.

මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත තුළින් ප්‍රකාශ කරන දේ, බලාපොරොත්තු වන දේ නොලැබී යනවා වාගේම මේ යහපාලන රජය තුළින් රටේ ආර්ථිකය දිනෙන් දින මරු කටට ගමන් කරමින් තිබෙනවාය කියන එක අවසාන වශයෙන් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.06]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (කිරිසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා)

(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)

(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් ඇමතිතුමාගෙන් පස්සේ කථා කරන්න නිබුණේ මටයි. නමුත් හදිසි ප්‍රශ්න රාශියක් ගැන සාකච්ඡාවකට ගිය නිසා එන්න බැරි වුණා. මේ අවස්ථාවේ කථා කරන්නට ඉඩ ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිය පුද කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එහා පැත්තේ ඉඳගෙන කථා කරන ආර්ථික විශේෂඥයන් දිහා බැලුවාම ඒ ආර්ථික විශේෂඥයන් අතරින් හොඳම කෙනෙක් තමයි මගේ මිත්‍ර බන්දුල ගුණවර්ධන මැතිතුමා. මම මුලින් කථා කරන්නයි හිටියේ. මගේ මිත්‍ර බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රකාශයක් ඇතුළත් පත්තර පිටුවක් මම **සභාගත*** කරනවා.

මෙහි තිබෙන්නේ බන්දුල ගුණවර්ධන මැතිතුමා අධ්‍යාපන ඇමති විධියට එදා කළ ප්‍රකාශයක්. මේ අය තමයි අද මේ වැදි බණ දේශනා කරන්නේ. 2012 අප්‍රේල් මස 9වැනි සඳුදා "ලංකාදීප" පුවත්පතට එතුමා මෙසේ කියා තිබෙනවා:

"හාල්පිටි කිලෝවකින් ඉදිආප්ප 350ක් හදන හැටි මැයි මාසයේදී කියනවා: එවිට උදේ වෙලට යන්නේ රු.10යි.

ඇමති බන්දුල ගුණවර්ධන කියයි."

හාල් පිටි කිලෝවකින් ඉදිආප්ප 350ක් හදන හැටි මම බැලුවා. දවසක් TNL එකේද කොහෙද සංවාදයකදී එතුමාගෙන් මම ඒ ගැන ඇහුවා. එතකොට එතුමා කිව්වා, "මැෂින් එකක් හදලා තිබෙනවා කියලා කෙනෙක් මට කිව්වා" කියලා. මම අද උදේ ඉදිආප්පයක් ගත්තා. සාමාන්‍යයෙන් කිලෝවකින් මේ වාගේ ඉදිආප්ප 80ක් විතර හදන්න පුළුවන්. මේක ඉදිආප්පයකුත් නොවෙයි. කිලෝවකින් 80යි හදන්න පුළුවන්.

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரும் காணி அமைச்சரும்)

(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs and Minister of Lands)

සම්බෝල නැහැ නේ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)

(The Hon. Gamini Jayawickrama Perera)

සම්බෝල කටට දමා ගන්න එක නේ තියෙන්නේ. ඉදිආප්ප 350ක් හදනවා නම් පොඩි පොඩි කෑලි කෑලි 350ක් හදන්න පුළුවන්. ආණ්ඩුවටත් විපක්ෂයටත් උපදෙස් දෙන රාජපක්ෂ පක්ෂයේ ආර්ථික විශේෂඥ බන්දුල ගුණවර්ධන මැතිතුමා තවදුරටත් මෙහෙම කියා තිබෙනවා:

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

"... තරුණ ව්‍යවසායකයෙක් මැයි මාසයේදී හඳුන්වා දෙනවා. එවිට ඉදිආප්ප විස්සකට වැය වන්නේ රුපියල් භයක් පමණයි."

රාජපක්ෂ න්‍යාය අනුව මේ වාගේ පොඩි කැලි විස්සක් තමයි කන්න වෙන්නේ. ඒකයි එහෙම කියන්නේ. එතුමා තවදුරටත් මෙහෙම කියනවා:

"ඉදිආප්ප විස්සක් සම්බල් ටිකක් එක්ක කෑවොත් උදේ ආහාර වේල රුපියල් දහයකින් සකස් කර ගත හැකියැයි"

රුපියල් දහයෙන් ඔක්කොම කරන්න පුළුවන්ලු. තේ එකකුත් බීලා ඔක්කොම කරන්න පුළුවන්ලු. ඒ වාගේම එතුමා කිව්වා, "තිදෙනකුගෙන් යුත් පවුලකට රුපියල් 7,500ක මුදලකින් හොඳට කා බී නොමැරී ජීවත් විය හැකියි" කියලා.

එතුමා 2012.03.27 වැනි දින "ලක්බිම" පුවත්පතට මෙහෙම කියා තිබෙනවා.

"මෙරට එක පුද්ගලයෙකුට රුපියල් 2500කට අඩුවෙන් කාල බීල නොමැරී ඉන්න පුළුවන්"

ඉතින් මේක තමයි න්‍යාය.

රාජපක්ෂ රෙජීමය පාලනය කරන කාලයේ නීතියක් කියලා එකක් තිබුණේ නැහැ.පොන්නි සම්බා සහ රතු කැකුළු හාල් මෙට්‍රික් ටොන් 2,25,000ක් ඉන්දියාවෙන් ගෙන්වන්න භාණ්ඩාගාරයේ හිටපු ලේකම් කැබිනට් මණ්ඩලය අනුමත කළ නියෝගයක් එවා තිබෙනවා. ඒ කාලයේ ලංකාවේ හාල් හිඟයක් තිබුණේ නැහැ. මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් පී.බී. ජයසුන්දර සතොස සභාපතිට ලියුමක් යවනවා, ඒ company එකෙන් හාල් ගන්න කියලා. The Treasury Secretary sent a letter to the CWE Chairman ordering to buy from that company. ටෙන්ඩර් පටිපාටිය යටතේ US Dollars 18 millionවලට ගෙනාවා. මම ආහාර සුරක්ෂිතතාව ඇමති විධියට භිටියා. ඇමති විධියට ඒ වෙලාවේ මම මේවා ඔක්කොම ඉදිරිපත් කළා. දැනටත් ඒ නඩුව යනවා. දැන් ඒ ඔක්කොම එනවා.

නීතියක් නැතිව, සදාචාරයක් නැතිව, භයක් නැතිව මේ අය අද මෙතැන කථා කරනවා. භාණ්ඩාගාරයේ එවැනි දේවල් සිද්ධ වෙලා, මේ රට බංකොලොත් කරලා, කැබිනට් මණ්ඩලයට නොදන්වා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර කටයුතු කරපු සමාජයක අද අපි විවෘතභාවයකින් ආර්ථිකය දියුණු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. එදා මූල්‍ය කළමනාකාරිත්වයක් තිබුණාද කියලා මා අහනවා. එදා කිසිම කළමනාකාරිත්වයක් තිබුණේ නැහැ. එදා කැබිනට් මණ්ඩලයේ මෙතුමා -මංගල සමරවීර ඇමතිතුමා- සිටියා. මෙතුමන්ලා අයින් වුණේ ඇයි? එදා පවුල් 3ක් තමයි මේ රට පාලනය කළේ. ඒ කවුද? ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු අධිපති අජිත් නිවාඩ කබ්‌රාල්, භාණ්ඩාගාරයේ හිටපු ලේකම් පී.බී. ජයසුන්දර සහ රාජපක්ෂ සමාගමයි එදා රට පාලනය කළේ. මේ අය තමයි රට පාලනය කිරීමේ ඔක්කොම තීරණ ගන්නේ. කැබිනට් මණ්ඩලය දන්නේත් නැහැ, එය අනුමත වෙලා සල්ලි, මිනිසුන් අරගෙන ව්‍යාපෘති පටන් ගන්න ගිහිල්ලා. එවැනි තත්ත්වයක තිබුණු රටක් තුළ අද අපි විවෘතභාවයක් ඇති කරලා තිබෙනවා. අපි කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කරලා තීරණය කළා. අගමැතිතුමාගේ ආර්ථික කමිටු සියල්ලේම සාකච්ඡා කරන දේවල් කැබිනට් මණ්ඩලයට එන්න ඕනෑ. කැබිනට් මණ්ඩලයට එන්න ඉස්සෙල්ලා අගමැතිතුමාට සහ ජනාධිපතිතුමාට යවන්න ඕනෑ. ජනාධිපතිතුමාත් කමිටු පත් කරලා, ඒවා විවෘතව සාකච්ඡා කරලා බලලා තමයි, කැබිනට් මණ්ඩලය අනුමත කරන්නේ.

ජපන් ආධාර තුළ අද මුළු කොළඹ නගරයේම monorail system එකක් ඇති කරන්න කටයුතු කරනවා. නමුත් එදා එහෙම නොවෙයි නේ. අහවල් අහවල් රටවල් චීනය එක්ක ගිවිසුමක් ගැහුවාය කියනවා. සියයට 8ක, සියයට 9ක පොලියට ණය ගන්නවා. ඒ ගැන කවුරුවත් දන්නේ නැහැ; කැබිනට් මණ්ඩලයවත් දන්නේ නැහැ. ඒ ගත්ත ණයවලට තමයි අපි පව් ගෙවන්නේ. මෙතුමන්ලාට අද කථා කරන්න අයිතියක් නැහැ. ඒ කරපු වංචාවන් තවම හෙළිවෙනවා. අපි අද විවෘතව කැබිනට් මණ්ඩලය තීරණ ගත්තා. එස්.බී. දිසානායක ඇමතිතුමා වැනි ජ්‍යෙෂ්ඨ ඇමතිතුමන්ලා ඉන්නවා. මේවා සියල්ලම ගැන අපි විවෘතව කථා කරනවා.

මා Minister of Sustainable Development and Wildlife හැටියට එක්සත් ජාතීන්ගේ සමුළුවට ගියා. 12වන දා සිට 22වන දා දක්වා ඒ සමුළුව පැවැත්වුවා. එක්සත් ජාතින්ගේ සමුළුවේදී විදේශ නියෝජිතයෝ මට කිව්වා, "Your President is a marvelous man" කියලා. Then, I asked, "why do you say so?". They said, " See, your President was able to get the support of the most powerful other political party and see how he is working together with the two main political parties, the United National Party and the Sri Lanka Freedom Party." Sir, they also admired his foreign policy of getting the support of all the countries.

ජනාධිපතිතුමා ගිය වෙලාවේ ඒ නායකයෝ ඔක්කොම එකතු වෙලා එතුමාව වට කර ගත්තාය කියලා ඒ තානාපති කාර්යාලයේ අය මට කිව්වා. අන්න ඒ වාගේ තත්ත්වයකට, රටේ ආර්ථිකය දියුණු කරන වැඩ පිළිවෙළකට අපි බැහැලා ඉන්නවා. මගේ අමාත්‍යාංශය ගන්න කෝ. Safari park කියනවා, බිලියන ගණන් ගහන ඒවාට Commissions පත් කරලා ඒවා පරීක්ෂණය කරනවා කියලා. මේ සෑම දෙයක් සම්බන්ධයෙන්ම inquiries කරලා, අද අභිංසක නිලධාරීන් interdict කරන්න වෙලා තිබෙනවා. නීති විරෝධීව අලි අම්මලා මරලා, අලි පැටවු ගෙනාවා. අරලියගහ මැදුරේ තබා ගෙනයි එදා පොත ලිව්වේ. අපි දළ දා මාලිගාවේ පෙරහැරට අලි දුන්නා. මොකද වෙන්නේ? උපවාස කරලා DIGට කියනවා ලු, "මේ අලි ටික අපට දෙනවාය කියා ලියවිල්ලක්, සහතිකයක් දුන්නොත් අපි සත්‍යාග්‍රහය ඉවර කරනවා"යි කියලා. මේ වාගේ හොරකම් කරපු හොරුන්ට රාජපක්ෂ යුගයේ නීතියක් නැති වුණාට මේ යුගයේ නීතියක් තිබෙනවාය කියන්න කියලා මා කිව්වා. ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් ඒකයි කිව්වේ. අපි පෙරහැරට අවශ්‍ය අලි දීලා තිබෙනවා. කඩාකප්පල් කරන්න අපි ලෑස්ති නැහැයි කියලා මා කියන්න කැමැතියි. මෙවැනි තත්ත්වයක් තුළ අපේ පක්ෂ දෙක තීරණය කළා, අවුරුදු 5ක කාලය තුළ මේ රටේ ආර්ථික සංවර්ධනයක් කරනවාය කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඒ සංවර්ධනය තුළින් අපි මේ රට ඉදිරියට ගෙනයනවා. ගරු ජනාධිපතිතුමා මගේ මිත්‍රයා. කෑ ගහන මේ අය කොරියාව, ජපානය වාගේ රටවලට ගිහින් සර්කස් ගැහුවාට, අපි මේ ආණ්ඩුව ඉදිරියට ගෙන ගිහින් මේ රට හදනවාය කියන එක මම කියන්නට කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member))
ඊළඟට, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

[අ.භා. 5.16]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට හැකි වීම ගැන මම විශේෂයෙන් සතුටු වෙනවා.

මේ කාරණය ගැන කථා කරනකොට පසු ගිය කාලයේ මේ රටේ මූල්‍යමය කටයුතු පාලනය වේචව ආකාරය ගැන හොඳම නිදසුන තමයි, මේ රටේ අය වැයෙන් සම්මත වන මුදල්වලින් සියයට 70ක් පාලනය කළේ එක පවුලක් වීම. ඒ කාලයේ මේ රට පාලනය කළ ආකාරය ගැන එතැනින් එහාට විස්තර කරන්නට අවශ්‍යයි කියා මා හිතන්නේ නැහැ. මේ රටේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මහාමාර්ග අමාත්‍යවරයා හැටියටත්, ඒ වාගේම තිබුණු ප්‍රධානතම අමාත්‍යාංශ ගණනාවක් එකතු කර ආර්ථික සංවර්ධන ඇමතිවරයා හැටියට බැසිල් රාජපක්ෂ මැතිතුමාත්, රටේ ආරක්ෂක ලේකම්වරයා හැටියට කටයුතු කළ අයත් ඇතුළු මේ වාගේ හතර පස් දෙනෙක් තුළින් තමයි මේ රටේ අය වැයෙන් සියයට 70ක් පාලනය වුණේ; මුදල් වියදම් කළේ. මට මතකයි, විශේෂයෙන් මැතිවරණ කාලසීමාව තුළදී මේ රටේ මූල්‍ය කළමනාකරණය කළ ආකාරය; වියදම් කළ ආකාරය. කිසිම ක්‍රමවේදයකින් තොරවයි කටයුතු කළේ. ටෙන්ඩර් සම්බන්ධව ක්‍රමවේදයක් කිසිසේත්ම අනුගමනය කළේ නැහැ. තමන්ට හිතවත්, තමන්ට අවශ්‍ය කොන්ත්‍රාත්කරුවාට කොන්ත්‍රාත්තුව ලබා දෙන යුගයකුයි තිබුණේ. විශේෂයෙන්ම ජනාධිපතිවරණයට කලින් දෙසැම්බර් මාසයේ අවස්ථා ගණනාවකදී, ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කළා; මුල් ගල් තැබුවා. නමුත් ජනවාරි 08වන දායින් පස්සේ අපට දකින්නට ලැබුණා, මේ ව්‍යාපෘතිවලට ලබා දුන් එක කොන්ත්‍රාත්තුවක්වත් නිසි ක්‍රමවේදයකට ලබා දුන් ඒවා නොවන බව.

විශේෂයෙන් මහාමාර්ග සම්බන්ධයෙන් විශාල මුදල් ප්‍රමාණයක් අවභාවිතයට ලක් වී තිබෙනවා. දැන් මේ ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු මේ ආණ්ඩුව පෙරළන්න කැමැත්තෙන්, ආශාවෙන් බඩ ගාන්නේ ඒ සොරකම් ටික වසා ගන්නයි. නැතුව වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි. අද නඩු තිබෙන අය, ඇප මත ඉන්න අයට තමයි අවශ්‍යතාව තිබෙන්නේ, කරපු හොරකම් ටිකෙන් බේරෙන්න ආණ්ඩුව පෙරළන්න.

අද අපට නව රජයක් හැටියට පුළුවන් වෙලා තිබෙනවා, මූල්‍ය කළමනාකරණය හරි මහකට ගෙන යන්න. අපි ඒක නිකම් වචනයකට සීමා කර නැහැ. ඒක වචනයකට සීමා නොකර ප්‍රායෝගිකව පෙන්නුම් කර තිබෙනවා. අද සෑම ව්‍යාපෘතියක්ම ටෙන්ඩර් කිරීම අත්‍යවශ්‍යයි. එය අනිවාර්ය කර තිබෙනවා. තිබුණු තත්ත්වය රජයේ ප්‍රතිපත්තියක් හැටියට වෙනස් කර තිබෙනවා. සෑම ව්‍යාපෘතියක්ම ටෙන්ඩර් කිරීම අනිවාර්ය කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, රජයේ ආයතනවල මූල්‍ය කළමනාකරණය පිළිබඳව පසු ගිය කාලයේ 'කෝප්' එකේදී කොච්චර කථාබහ වුණත් ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ. මොකද, එවකට 'කෝප්' එකේ සභාපතිවරයා හැටියට පත් වුණේ, කැබිනට් මණ්ඩලයේම ඇමතිවරයෙක්. කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයෙක් තමයි එවකට 'කෝප්' එකේ සභාපතිවරයා. එහෙම වුණාම අපට නඩුවක් අහලා සාධාරණයක් ඉටු කර ගන්නට පුළුවන් වෙනවාද? නැහැ. අද වර්තමාන ආණ්ඩුවට පුළුවන් වෙලා තිබෙනවා, 'කෝප්' එකේ සභාපතිවරයා හැටියට විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් පත් කර ගන්න. විපක්ෂය නියෝජනය කරන පුද්ගලයෙක් එම කමිටුවේ සභාපතිවරයා හැටියට පත්වීම තුළින් රජයේ ආයතනවල මූල්‍ය කළමනාකරණය පිළිබඳව ප්‍රශ්න කරන්න දැන් අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ ප්‍රශ්න කිරීම් තුළින් ඒ අවශ්‍ය පියවර ස්වායත්තව ගැනීමේ හැකියාව මේ වන විට ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මුළු රටේම මූල්‍ය කළමනාකරණයේ විශාල වෙනසක් ඇති වෙලා තිබෙනවා. මෙහිදී යම් යම් ප්‍රමාදයන් සිදුවෙලා තිබෙනවාය කියා සමහර විට සමහර අය චෝදනා කරන්න පුළුවන්. ඔව්, ඒක ඇත්තයි. යම් යම් ප්‍රමාදයන් සිදු වෙනවා. මගේ ගෙදර අලුත්වැඩියා කරනවා නම්, ඒවා මම උපයා ගත්ත මුදල් නම් මට ඕනෑ විධියට වියදම් කරන්න පුළුවන්. නමුත්, මහ ජනතාවගේ මුදල් වියදම් කරන කොට ඒ හරි ක්‍රමවේදයට අනුව ඒවා වියදම් කරන්න ඕනෑ. තමන්ගේ ගෙදර අලුත්වැඩියා කරන්න මුදල් වියදම් කරන ආකාරයට මහජන මුදල් වියදම් කරන්න බැහැ. යම් යම් ප්‍රමාදයන් සිදු වුවත්, ඒ නිසි ක්‍රමවේදයට මහ ජනතාවගේ මුදල් වියදම් කළ යුතුයි. විනිවිදභාවය අනිවාර්යයෙන්ම තිබිය යුතුයි. ඒ නිසි ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ කටයුත්ත කරන්න පුළුවන් හොඳ නායකයන් තමයි මේ රටට අවශ්‍ය වන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒ සඳහා නිදසුනක් හැටියට අපේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නම් සඳහන් කරන්න පුළුවන්. එතුමන්ලා දැන් මේ රටේ පිරිසිදු පාලනයක් ගෙන යනවා. මේ රට ඉදිරියට ගෙන යන්න, දූෂණයෙන් තොර රටක් බවට පත් කරන්න එතුමන්ලාට තිබෙන වුවමනාව නිසාම ඉදිරියේදී මේ රටම ඒ ආකාරයට ගමන් කරලා, දූෂණයෙන්, වංචාවෙන් තොර, අපේ මහජන මුදල්වලින් ජනතාවට උපරිම ප්‍රයෝජනයක් ලැබෙන පිරිසිදු රටක් ගොඩනඟන්න අපට හැකිවනවා නොඅනුමානයි. බොහොම ස්තුතියි.

[අ.භා. 5.22]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

අද දිනයේ මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව මේ පාර්ලිමේන්තුවේ ඉන්න ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු, මන්ත්‍රීවරු සහ විපක්ෂයේ මන්ත්‍රීවරුත් අදහස් ප්‍රකාශ කළා. මේ විපක්ෂයේ එක්තරා කණ්ඩායමක් ඉන්නවා නේ. මම නම් ඒ අය "මෝඩ කල්ලිය" කියා තමයි හඳුන්වන්නේ. හැබැයි, මෝඩ නැති කීප දෙනෙකුත් ඒ කල්ලියේ ඉන්නවා. ඒ කල්ලියේ අයත් මේ පනත් කෙටුම්පත ගැන අදහස් ප්‍රකාශ කළා. මේ පනත් කෙටුම්පත ගැන අදහස් ප්‍රකාශ කරන්න දැන් මටත් අවස්ථාවක් ලැබී තිබෙනවා.

අතීතයේ මේ රටේ සිටි නායකයන් මේ රටේ සිටින ජනතාව වෙනුවෙන් මුදල් කළමනාකරණය කර තිබෙන ආකාරය දෙස ආපසු හැරී බැලුවොත්, එයින් අපට ඉගෙන ගන්න බොහෝ දේවල් තිබෙනවා. ඒ මුදල් කළමනාකරණය කරද්දි ඒ නායකයෝ යම්කිසි වැඩ පිළිවෙළවල් සැබෑ ලෙසම ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ මුදල් කළමනාකාරිත්වය තුළින් ඔවුන් රටේ සංවර්ධනය ඇති කර තිබෙන ආකාරය බලන්න. ඒක තමයි අප විශේෂයෙන්ම හඳුනාගත යුතු වන්නේ. රටක් ඉස්සරහට ගෙන යන්න නම්, අපේ රටේ අනාගත සැලසුම් සකස් කරන්න අවශ්‍ය කරන කරුණු, කාරණා ඒක රාශි කර ගන්න නම්, වර්තමානයේ අපේ රටේ කරන සංවර්ධන කටයුතු සැලසුම් කරන්න අවශ්‍ය වන කරුණු කාරණා එකතු කර ගන්න නම්, අතීතයේ අපේ රටේ මුදල් කළමනාකරණය කර තිබෙන ආකාරය පමණක් නොවෙයි, රටේ සැලසුම් කළමනාකරණය කළේ කොහොමද කියන එකත් ඉතා හොඳින් විමසා බලා තමයි අප වැඩ කටයුතු කරන්න ඕනෑ.

අපේ අලුත් රජය ආරම්භ කළ දවසේ සිට අප මොකක්ද කළේ? අප කරපු පළමුවැනි දෙය තමයි, මීට පෙර පැවැති රජය කරපු වැරදි ටික හරියට හඳුනාගත්ත එක. ඒ වැරැදි ටික හරියට හඳුනාගත්තාට පසුව, අප මේ රට අලුතින් නිර්මාණය කරන්නේ කොහොමද කියන එක ගැන අපේ නව රජය තීන්දුවක් ගත්තා. එහෙම නම් ඒ රට නිර්මාණය කරන්න අවශ්‍ය කරන ඒ සැලැස්ම තමයි දැන් ක්‍රියාත්මක වන්නේ. හැබැයි ඒ සැලැස්ම ක්‍රියාත්මක වෙද්දි, අවුරුදු 10ක්, 15ක් තිස්සේ දූෂණයට, වංචාවට, හොරකමට ලක් වුණු, සමහර වෙලාවට ජනතාව නොමහ යවපු වැඩසටහන් ක්‍රියාත්මක කරපු තත්ත්වය තුළ අපේ අලුත් සංවර්ධනය ක්‍රියාවලිය, කළමනාකරණය හරියට කරගෙන යාම ඇත්තටම පහසු නැහැ.

එතැනදී අපට යම් ප්‍රශ්න මතු වනවා. ඒ ප්‍රශ්න මතු වන්න හේතුව තමයි, මුදල් කළමනාකරණය කරන්නේ කොහොමද කියලා අපි හඳුනා නොගැනීම. අපි බොහෝ වෙලාවට රටේ සංවර්ධන සැලසුම් සකස් කරද්දි ආදායම් සහ වියදම් කියන මේ දෙක හරියට ගළපා ගන්නේ කොහොමද කියලා හඳුනා ගන්නේ නැහැ. මේ දෙක හරියට ගළපා ගන්නවා හා සමානවම අපි ඊළඟට හඳුනා ගන්න ඕනෑ, විදේශ රටවල් එක්ක සම්බන්ධතා ඇති කර ගෙන, මේ රටට සම්පත් ටික ගෙනැල්ලා, ඒ සම්පත් ටික මේ රටේ කළමනාකරණය කරන්නේ කොහොමද කියලා.

ඒක හඳුනා ගන්න අපට තිබෙන පළමුවැනි රාජකාරිය තමයි, රට තුළ පමණක් නොව, විදේශ රටවලුත් එක්ක අපි වැඩ කටයුතු කරන්නේ කොහොමද කියලා යම්කිසි විධිමත් සැලැස්මක් අපිට මීට පෙර තිබුණාද කියා හඳුනා ගැනීම. ඒ හඳුනා ගැනීමෙන් පස්සේ විදේශ රටවල් එක්ක අපි යම්කිසි සම්බන්ධතාවක් ඇති කර ගන්න ඕනෑ. මොකද, විදේශ රටවල දැනුම සහ විශේෂයෙන්ම සහයෝගය අපට ලබා ගන්න වුවමනා නිසා. කාලයක් තිස්සේ අපට ඒවා ලැබුණේ නැහැ. දැන් අපි ඒවාත් අරගෙන තමයි මේ කළමනාකරණයට ඇවිල්ලා තිබෙන්නේ. හැබැයි, මේ කළමනාකරණයට එන කොට, අර කිව්වා වාගේ එකපාර කරුණු කාරණා ටික වෙනස් කරන කොට, අපි මේ කළමනාකරණය ගමේ පුංචි පැල්පතේ ඉඳලා මහ ආණ්ඩුවේ තිබෙන සියලු ආයතන දක්වා ගලා යන සේ අරගෙන එන්න ඕනෑ. මේ සියල්ල එකට -එක විධිමත් වැඩ පිළිවෙළක්- සකස් කරද්දි අපි දැක්කා අර එහා පැත්තේ උදව්ය කථා කළ හැටි. පරණ පව් ගෙවන්න කකුලේ යටි පතුල් ගෙවෙනකම් පාරේ පයින් බඩ ගෑවා. කරපු වැරදිවලට, ජරා වැඩවලට, මිනී මරපුවාට, හොරකම් කරපුවාට, ඒ සියලු දෙයට වන්දි ගෙවන්න ස්වභාව ධර්මයත් මිනිහෙකුට ජීවත් වෙලා ඉන්න කාලය තුළ අවස්ථාව දෙන බව අපි දන්නවා. ඒ වන්දි ගෙවන්න දීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි මේ අය මේ වන්දිය ගෙවන්නේ. ඒ වන්දි ගෙවන අය අද කථා කරපු හැටි අපි දැක්කා. මේ අය අපේ අලුත් රජයෙන් යෝජනා කරන හැම දෙයක් දිහාම බැලුවේ නරක විධියටයි.

මීට පෙර කථා කළ අපේ රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා විශේෂයෙන්ම කිව්වා, වැටි බදු සම්බන්ධව අධිකරණය ගත්ත තීන්දුව ගැන. මට තේරුණේ නැහැ එතුමා ඒ කියපු කාරණය. ඒ කිව්වේ, මහින්ද රාජපක්ෂගේ ණය ටික ගෙවන්න, එහෙම නැත්නම් මහින්ද රාජපක්ෂගේ බද්ද ගෙවන්න ගහන නිසා අධිකරණයෙන් ඒක නැවැත්තුවා කියලාද? එහෙම කථාවක්ද කිව්වේ කියලා මට හරියට වැටහුණේ නැහැ. එතුමා දැන් ගරු සභාවේ හිටියා නම් හොඳයි. මට ඒක අහගන්න ඕනෑකම තිබුණා. මොකද, ඒ නිසා නැවැත්තුවා කියන හැඟීම තමයි මට තේරුණේ.

අපි විශේෂයෙන්ම බලන්න ඕනෑ, "ඇයි, අපි මේ ආදායම් එකතු කරන්නේ?" කියලා. ආදායම් එකතු කරන්නේ, අපේ පවුල් ටික නඩත්තු කරන්න නොවෙයි. ආදායම් එකතු කරන්නේ, මේ පාර්ලිමේන්තුවේ ඉන්න මැති ඇමතිවරුන්ගේ සුබ විහරණය සඳහා නොවෙයි. සැබෑ ලෙසම අපි ආදායම එකතු කරන්නේ, අපිට රටේ ක්‍රියාත්මක කරන්න දැන් සැලැස්මක් තිබෙන නිසායි. අපි ළඟ කළමනාකරණයක් තිබෙනවා. මුදල් එකතු කරන්න කළමනාකරණයක් තිබෙනවා. මුදල් වියදම් කරන්න කළමනාකරණයක් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ඉදිරියේදී මේ රටේ අනාගත පරපුර මේ රට භාර ගනිද්දි අප විඳපු ප්‍රශ්න ටික ඒ දරුවන්ට විඳින්න නොවන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ අපට සකස් කරන්න තිබෙනවා. අන්න ඒ වැඩ පිළිවෙළ සකස් කරන්න තමයි අපි විශේෂයෙන්ම මේ කළමනාකරණය, මේ සැලැස්ම සකස් කර තිබෙන්නේ.

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරද්දි අපට තාක්ෂණය ගැන කථා කරන්න පුළුවන්. එහෙම නැත්නම් එහි සැලසුම් ගැන කථා කරන්න පුළුවන්. හැබැයි, ඊට වඩා ප්‍රායෝගිකව රටේ සිද්ධ වන දේවල් ගැන අපි විශේෂයෙන් කථා කරන්න ඕනෑ. රටේ එදා වුණු දේ සහ අද වන දේ ගැන අප කථා කරන්න ඕනෑ. ඒ වාගේම අපි දන්නවා එදා-

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා වුණු දේ සහ අද වන දේ ගැන කථා කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. අද මේ විවාදයේදී ලොකු ප්‍රශ්නයක් මතු කළා, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ගැන. ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට ඔබතුමා ඒ ගැනයි සඳහන් කරන්නේ.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඔව්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

දැන් මෙතැන බොහොම පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ දෙයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද රටේ නීතියේ පාලනයක් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ස්ථාවර නියෝග පිළිබඳව නිසි ලෙස සලකා බලනවා. හැබැයි, රජයේ සමහර නිලධාරීන් තමන්ගේ පරණ පුරුද්දට රාජකාරි කරනවා. ඒ පරණ පුරුද්දට කරන කටයුතුවල හරි වැරැද්ද පරීක්ෂා කිරීම ගරු මන්ත්‍රීතුමා, දැන් තමයි සිද්ධ වෙන්නේ. අධිකරණයට නියම බලතල ඇවිල්ලා, අධිකරණයට ශක්තිය ඇවිල්ලා, අධිකරණයේ ස්වාධීනත්වය ඇති වෙලා හරියට පොතේ හැටියටම නීතිය ගැන හොයන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

ඒ නිසා ඔබතුමන්ලා ඒ පිළිබඳව සංසන්දනය කිරීමේදී අද රටේ ඇති වෙලා තිබෙන වෙනස -නීතියේ ආධිපත්‍යයේ වෙනස- තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ඔබතුමන්ලාගේ ඒ සංසන්දනයේදී කරුණාකරලා භාවිත කරන්න. මොකද, ඒ තමයි අද මේ රටේ ඇති වෙලා තිබෙන වෙනස. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ස්ථාවර නියෝග තිතටම, තූලටම පිළිපදින්න ඕනෑය කියලායි ශ්‍රේෂ්ඨාධිකරණය කියන්නේ. ඒ නිසා අපි ඒකට ගරු කරන්න අවශ්‍යයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මොකද හේතුව, මට ඇත්තටම අවශ්‍ය වෙලා තිබුණේ මේ පිළිතුර තමයි. හැබැයි පොදු කියන මෝඩ කණ්ඩායමෙන් තමයි මේ පිළිතුර දෙන්න තිබුණේ. මේ පිළිතුර දෙන්න තිබුණේ අපෙන් නොවෙයි. මම බලාපොරොත්තු වුණේ ඒ පිළිතුර ඒ අය දෙයි කියලායි. අවංක ලෙසම, සැබෑ ලෙසම මේ රටට ආදරය කරනවා නම්, මේ රටේ ජනතාව වෙනුවෙන් ඒ අය වැඩ කටයුතු කරනවා නම්, ජනතාවගේ ඡන්දයෙන් මෙතැනට ආවා නම්, අන්න ඒ කථාව තමයි ඒ අයගෙන් එළියට එන්න ඕනෑ. මම විශේෂයෙන්ම අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද ඒක තමයි අද රටේ තිබෙන වෙනස. අලුත් ආණ්ඩුව අපි ඇති කරලා, මේ රට තුළ අපි නිර්මාණය කළේ ඔය වෙනසයි කියා සැබෑ ලෙසම ජනතාවට කියන්න ඕනෑ. සමහර වෙලාවට ජනතාව නොමහ යවන අවස්ථා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මට පොඩි කාරණයක් කියන්න වෙලාව දෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මගේ කාලය එතුමාට ලබා දෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ වෙලාවත් ඔබතුමාට දෙනවා ලු. එතකොට තව විනාඩි අටක කාලයක් තිබෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මේ ගැන කථා කරද්දී මා මේ කාරණය විශේෂයෙන්ම කියන්න ඕනෑ. මම "කෝප්" එකේ සාමාජිකයෙක්. "කෝප්" එකේ සාමාජිකයෙක් වුණේ මම නවක මන්ත්‍රීවරයෙක් හැටියටයි. හැබැයි, මම නවක මන්ත්‍රීවරයෙක් විධියට එතැන කටයුතු කරද්දී මම ලබා ගත්තු තොරතුරු ටිකක් තිබෙනවා. මම එතැනින් යමක් ඉගෙන ගන්නවා. විශේෂයෙන්ම රටේ කළමනාකරණය සම්බන්ධයෙන් තමයි මම බොහෝ දේවල් ඉගෙන ගන්නේ. පොදු ව්‍යාපාර සම්බන්ධව තිබෙන කළමනාකරණය ගැන මම ඉගෙන ගන්නවා. හැබැයි, එතැනදී මට වැඩියෙන්ම ඉගෙන ගන්න ලැබිලා තිබෙන දේ ගැන මා ඔබතුමාට දැන් ප්‍රකාශ කරන්න ඕනෑ. මට එතැන වැඩියෙන්ම ඉගෙන ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ, අතීතයේ ඒ කම්ටු ක්‍රියාත්මක වුණේ කොහොමද කියන එක ගැනයි. ඒ කළමනාකරණය පිළිබඳව, ඒ ආයතන හැසිරුණු ආකාරය සම්බන්ධව, ඒ ආයතනවල මුදල් පරිහරණය කරපු ආකාරය සම්බන්ධව, ඒ ආයතනවල සිදු වුණු දූෂණ සම්බන්ධව කථා කරන්න ඒ නිලධාරී මහත්වරුන්ට අවස්ථාව ලැබිලා නැහැ. ඒ නිලධාරී මහත්වරු ගෙන්වලා කථා කරන්න උත්සාහ කළාට, ඒ හැම උත්සාහයක්ම එතැනදී කඩාකප්පල් කරලා තිබෙනවා. ඒ කඩාකප්පල් කරලා ආපු ගමන අද අවසන් වෙලා තිබෙන නිසා රාජ්‍ය නිලධාරී මහත්වරු අද ඉතාම නිදහසේ අදහස් විතරක් නොවෙයි, ඒ අයගේ නිර්මාණ පවා අප ඉදිරියට ගෙනෙනවා. ඒ ගොල්ලන් අලුත් යෝජනා ඉස්සරහට ගෙනෙනවා. අද විශේෂයෙන්ම අපි එතැනදී දකිනවා, ඒ කටයුතු එදා කොහොමද සිද්ධ වුණේ, අද කොහොමද සිද්ධ වෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නවක මන්ත්‍රීවරු හැටියට අපට මේ මුදල් කළමනාකරණය, ආර්ථික කළමනාකරණය, විශේෂයෙන්ම රට තුළ සැලසුම් සකස් කරන ආකාරය, රටේ පරිපාලනය සකස් කරන ආකාරය සම්බන්ධව ඉගෙන ගන්නවාට වඩා දේශපාලනඥයන් හැටියට ඉගෙන ගත යුතු ප්‍රධාන දෙයක් තිබෙනවා. අපට ඡන්දය දීලා විශාල බලාපොරොත්තු තියාගෙන අපව මේ පාර්ලිමේන්තුවට එවපු ජනතාව වෙනුවෙන් අපි කළ යුතු පළමුවැනි දේ විධියට අපි හඳුනා ගත යුතු වෙනවා, අපි කොහොමද ජනතාව වෙනුවෙන් වැඩ කරන්න ඕනෑ කියලා; මේ අණපනත් එක්ක අපි කොහොමද වැඩ කටයුතු කරන්න ඕනෑ කියලා.

එදා සමහර අමාත්‍යවරු ක්‍රියා කරපු ආකාරය අපි දැක්කා. එදා කියපු ප්‍රකාශ ගැන හිටපු ඇමතිතුමෙකුත් අපට කිව්වා. ඒ කියද්දී ඒ ප්‍රකාශවල තිබුණු දේවල් සහ අද ප්‍රායෝගිකව අපි අත් දකින දේ අතර ලොකු වෙනසක් තිබෙනවා. අද අපි දන්නවා, අපි අනුගමනය කරන ක්‍රමවේදය මොකක්ද කියලා. අපි ආදායම් උපදවන්න යන ක්‍රමවේද ඉතාමත්ම විනිවිදභාවයෙන් කරනවා. එදා බොහෝ වෙලාවට කැබිනට් මණ්ඩලයටවත් දාන්නේ නැතුව ක්‍රියාත්මක කරපු ඒවා තිබෙනවා. සමහර වෙලාවට කිසිම අමාත්‍යවරයෙකුට,

කිසිම නිලධාරියෙකුට දැනුම් දෙන්නේ නැතුව වෙනස් කරපු තැන් තිබෙනවා. මහ බැංකුවේ බොහෝ දේවල් එදා හිටපු මහ බැංකු අධිපතිවරයා වෙනස් කරලා තිබෙනවා. ඒ වෙනස් කරලා තිබෙන්නේ කාගෙන්වත් අහලා නොවෙයි. හැබැයි ඒ වෙනස් කරපු ආකාරයට වැඩ කරන්නේ නැතුව, අද නියමිත ආකාරයෙන් - කළ යුතු නියම නීතිය අනුව- වැඩ කටයුතු කළොත් සමහර වෙලාවට වැරැදිකාරයෝ හැටියට පත් වෙලා තිබෙනවා.

මහ බැංකුවේ අධිපතිතුමා එතැනින් වෙනස් කරලා අලුත් කෙනෙක් පත් කළාට, කාටද කියන්න පුළුවන් හිටපු අධිපතිතුමා වැරැද්දක් කළා කියලා. තවම කාටවත් වැරැද්දක් කළා කියලා කියන්න බැහැ. හැබැයි ඒ සම්බන්ධයෙන් රටේ ජනතාවගේ යම් කිසි මතයක් ගොඩ නැඟුණා. එවැනි මතයක් ජනතාව අතර ගොඩනැහෙන කොට තිබෙන වැදගත්කම තමයි, ඒ ආයතනයේ ප්‍රධානියා එතැනින් ඉවත්වෙන එක. ඒ වෙලාවේ එතුමාගේ සේවා කාලය අවසන් වෙලා තිබුණා. එතුමාගේ සේවා කාලය අවසාන වුණාට පස්සේ නැවත සේවය දීර්ඝ කිරීමයි නොකර හිටියේ. එහෙම නැතිව, කවුරුවත් එතුමා අයින් කරන්න ගියේ නැහැ. ජනතාව තුළ යම් මතයක් ගොඩනැඟී තිබුණු නිසා, එතුමාගේ සේවා කාලය දීර්ඝ කරන්නේ නැතිව වෙනත් කෙනෙකුට ඒ තනතුර භාර දුන්නා. හැබැයි, ඉදිරියේදී අදාළ පරීක්ෂණවලදී එතුමා නිර්දෝෂ වෙයි. එහෙම නැත්නම් එතුමාගේ වැරැද්දක් තිබෙනවා නම් ඒකත් එළියට එයි. අන්න! මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඉදිරියට ගෙනැල්ලා තිබෙනවා. ඒ කාලයේ යම් කෙනෙක් මේ විධියට කථා කළා නම් කොහොමද?

පසු ගිය දා අතිගරු ජනාධිපතිතුමා අපට කණ්ඩායම් රැස්වීමේදී කිව්වා, හිටපු ජනාධිපතිවරයා හිටපු සමහර ඇමතිවරුන් කාමරය ඇතුළට ගෙනැල්ලා, කන පැලෙන්න දෙකක් ගහලා, "එළියට යද්දී හිනා වෙලා පලයන්" කිව්වාම, අපූරුවට හිනාවෙලා එළියට ආවා කියලා. සමහර වෙලාවට ඒ අය අදත් මේ තැන්වල ඇති; අදත් මහා හයියෙන් කථා කරනවා ඇති; කෑ ගහනවා ඇති; බෙරිහන් දෙනවා ඇති. හැබැයි, එදා කනේ පාර කාගෙන මොකෙක්ද වාගේ එළියට ඇවිල්ලා, ජනතාව ඉදිරියේ මහා හයියෙන් වේදිකාවේ කෑ ගහන්නත් ඇති. නමුත්, අද එහෙම රටක් නොවෙයි තිබෙන්නේ.

අද ජනාධිපතිතුමා ගැන අපට කථා කරන්න පුළුවන්; අගමැතිතුමා ගැන අපට කථා කරන්න පුළුවන්; මෙතැන ඕනෑම ප්‍රශ්නයක් අහන්න පුළුවන්; "කෝප්" එකට ගිහිල්ලා ඕනෑම ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න පුළුවන්. කොන්ද කෙළින් තියාගෙන ඒ නිලධාරියාගේ රාජකාරිය හරියට කරන්න පුළුවන්. ඒ අවස්ථාව ලැබිලා තිබෙන්නේ යහ පාලන ආණ්ඩුවේ ප්‍රතිඵලයක් හැටියටයි. යහ පාලනයේ ප්‍රතිපත්තිත් එක්ක තමයි මූල්‍ය කළමනාකරණය හරියට කරන්න පුළුවන් වෙන්නේ. විශේෂයෙන්ම, දේශපාලඥයන් හැටියට අපට දීලා තිබෙන වගකීම ඒකයි. මේ තමයි, උත්තරිතරම ආයතනය. ඒ ආයතනයේ සාමාජිකයන් තමයි අපි. අපි තමයි මේ රටේ තීන්දු-තීරණ ගන්නා කණ්ඩායම. මෙතැන තීන්දු-තීරණ හරියට ගන්න නම්, අපට ඒ අවස්ථාව තිබෙන්න ඕනෑ. ඒ අවස්ථාව හරියට තිබුණොත් තමයි-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ට ලැබී ඇති කාලය අවසානයි.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
-අපට මූල්‍ය හෝ වෙනත් කළමනාකරණයක් හරියට කරන්න පුළුවන් වෙන්නේ. එවැනි තත්ත්වයක් අපි සෑම කෙනෙකුටම අද මේ රටේ නිර්මාණය කරලා තිබෙනවා. අපට ඡන්දය දුන් රටේ ජනතාවගේ වගකීම භාර අර ගෙන, අපේ සේවය හරියට, සාධාරණව ඉෂ්ට කරන්න අවශ්‍ය කරන යහපාලනය අපට ලැබිලා තිබෙන නිසා, ඒ ප්‍රතිඵලය ජනතාවට ලබා දෙන්නත් පුළුවන් කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අදහස් ඉදිරිපත් කරන්න වැඩියෙනුත් කාලය ලබා දුන්නාට තමුන්නාන්සේට විශේෂයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 5.39]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දහවල් සිට මේ දක්වා පැවැත්වෙන මේ විවාදයේදී අදහස් කිහිපයක් දැක්වීමට කෙටි කාලයක් හෝ ලබා දීම පිළිබඳව ඔබතුමාට මගේ ගෞරවය ප්‍රථමකොට පිරිනමනවා. විශේෂයෙන්ම ඉතා වැදගත් මාතෘකාවක් වන, මේ රටේ මූල්‍ය පාලනය පිළිබඳව මේ දක්වා ගරු අමාත්‍යවරුන්, ගරු මන්ත්‍රීවරුන් දැක්වූ අදහස්වලට අනුව යම් අදහසක් දැක්වීමට මා බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම, වර්තමානයේ පවතින දේශපාලන ක්‍රමය දිහා බැලුවාම, කවදාවත් බලාපොරොත්තු නොවුණු ආකාරයේ දේශපාලන සංස්කෘතියක්, සංයමයක්, හැදියාවක් අද මේ උත්තරිතර සභාව තුළ සහ මේ රටේ ඇති වෙමින් පවතිනවා. මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් පිහිටුවුවොත් එදා ඉඳලා ඔවුන්ට හතුරුකමට හිටියේ, එරෙහිව හිටියේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ විපක්ෂය තමයි. එසේ වුණත්, අද මේ ලෝකයම සතුටු වෙන කාරණයක් මේ රටේ සිද්ධ වෙමින් පවතිනවා. එවැනි ආකාරයට හතුරුකම් කර ගත්ත, ගහ ගත්ත, මරා ගත්ත, මේ රටේ ආණ්ඩු කරපු පක්ෂ දෙක අද එකට එකතුව සිටිනවා. ජනාධිපතිවරයා සහ අගමැතිවරයා බොහොම විනිවිදභාවයෙන් යුක්තව මේ රටේ ජනතාව දිහා බලා ගෙන ඉන්නවා; ජනතාව ආණ්ඩුව දිහා බලා ගෙන ඉන්නවා. තව මාස හයක්, හතක්, අවුරුද්දක්, දෙකක් ඉවසුවොත්, මේ "විපක්ෂය" කියා ගන්නා කණ්ඩායමට නැවත අනාගතයක් නැති වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේකට ප්‍රධාන හේතුව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වැඩි වශයෙන් විමධ්‍යගත අරමුදල් ලැබිලා තිබෙන්නේ අපි පත් වුණු මේ පාර්ලිමේන්තුවෙන් වීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රුපියල් ලක්ෂ 150ක විමධ්‍යගත මුදල් ලැබිලා තිබෙනවා. ඒ වාගේම අද රුපියල් ලක්ෂ 10ක මුදලක් හැම වසමකටම යනවා. අපේ නාවලපිටිය ආසනය ගත්තොත්, එහි විශාල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය සහ ඉඩම් අමාත්‍යතුමා අපට මුදල් ලබා දීලා තිබෙනවා. අපි ඒ කටයුතු ඇස්තමේන්තු කරලා තිබෙනවා. ඒ වාගේම කෘෂිකර්ම ගම්මානයක් හදන්නත් අපට මුදල් ලැබිලා තිබෙනවා. ඒ වාගේම සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නිවාස ව්‍යාපෘතියත් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම උසස් අධ්‍යාපන අමාත්‍යතුමා රුපියල් කෝටි 50ක මුදලක් නාවලපිටිය ආසනයේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා වන පුහුණු වැඩසටහනක් ආරම්භ කිරීම වෙනුවෙන් අපට ලබා දීලා තිබෙනවා. මේ වාගේ මහා දැවැන්ත සංවර්ධන යෝජනා ක්‍රම අද ක්‍රියාත්මක වෙනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්සත් ජාතික පක්ෂයත් නියෝජනය කළ මන්ත්‍රීවරයකු වශයෙන් මම දැකපු කාරණයක් තමයි, පසු ගිය මැතිවරණයේදී රාජපක්ෂ මැතිතුමා මේ විපක්ෂයේ

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

ඉන්න කණ්ඩායමට නායකත්වය දෙනවා තියා, මහනුවර දිස්ත්‍රික්කයේ තමන්ගේ පක්ෂයේ අයටවත් නායකත්වය දුන්නේ නැහැ කියන කාරණය. එතුමා ඔය තැනට තල්ලු වෙලා යන්න හේතුව වුණේ බෙදාගෙන වැඩ කළ නිසායි. එකම පක්ෂයෙන්, බුලත් කොළෙන් ඡන්දය ඉල්ලපු අපේක්ෂකයන්ට එතුමා පහර ගැහුවේ බොහොම ප්‍රසිද්ධියේ. මහනුවර රැස්වීම්වලදී එතුමා තමයි මනාප අංක කිව්වේ.

අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකු වන එස්.බී. දිසානායක මැතිතුමා මේ ඉස්සරහා වාඩිවෙලා ඉන්නවා. එතුමා අපට බොහොම උදවු කරපු කෙනෙක්. ගරු එස්.බී. දිසානායක මැතිතුමනි, ඒ මැතිවරණයේදී තමුන්නාන්සේගේ නම කොහේදීවත් කිව්වේ නැහැ. තමුන්නාන්සේට වේදිකාවක් තිබුණේ නැහැ. තමුන්නාන්සේ පරද්දලා ඉවරවෙලා දැන් කියනවා, පැරදිච්ච මන්ත්‍රීවරයෙක් කියලා. අපි දැක්කා, තමුන්නාන්සේ ගෙදර ගියේ කොහොමද කියලා. රාජපක්ෂ මැතිතුමා තමුන්නාන්සේට ගෞරවයක් ඇතිව දේශපාලනය කරන්න දුන්නේ නැහැ. බුලත් කොළය බෙදන්න එතුමා කටයුතු කළා. ඒ වාගේම කැගල්ල දිස්ත්‍රික්කයේ ලලිත් දිසානායක මැතිතුමා ගැන මම හොඳටම දන්නවා. එතුමා මගේ ඥාතිවරයෙක්. එතුමාටත් දේශපාලනය කරන්න දුන්නේ නැහැ. ඒ නිසා තමයි දිවිය ධම්ම වේදනීය කර්මය පල දීලා නැවත ආණ්ඩුවක් ගන්න රාජපක්ෂ මැතිතුමාට පයින් යන්න, පයින් ගාටන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මගේ සහෝදරයා මහින්දානන්ද අලුත්ගමගේ. එතුමා මේ පාද යාත්‍රා කමිටුවේ සභාපතිවරයා. මේ ආණ්ඩුව පත්වෙලා අවුරුද්දක් ගියේ නැහැ. ඉවසාගෙන ඉන්න බැරිව පාද යාත්‍රාවක් ලැහැස්ති කරගෙන එතුමා කියනවා, "මේවා කරන්නේ ආණ්ඩුව ගන්න නොවෙයිලු! රතු එළියක් පත්තු කරන්න ලු!" එතුමන්ලා කොළඹට පයින් ඇවිල්ලා කොළ පාට එළිය දිගටම පත්තු වෙන්න පාර හදලා තමයි ආපසු ගියේ. රතු පාට එළිය තැන් තැන්වලින් පත්තු වුණා. හැබැයි, ඒ රතු එළිය සම්පූර්ණයෙන් නිවලා දිගටම කොළ එළියක් පත්තු කරලා තමයි එතුමන්ලා ආපසු හැරිලා ගියේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතියේ ආධිපත්‍ය එදා පැතිරුවේ රාජපක්ෂ මැතිතුමායි. නමුත් අද එතුමාට ඒ පක්ෂයේ නායකත්වය නැතිවෙලා තිබෙනවා. විධායක බලතල එතුමාට නැති වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණයට අණ දීමේ වරප්‍රසාදය එතුමාට නැතිවෙලා තිබෙනවා. එතුමා දන්නවා, පාද යාත්‍රාව හෝ මොනවා හරි කරලා තව අවුරුද්දක් යනකොට මේ ආණ්ඩුව පෙරළා ගත්තේ නැත්නම් සදාකාලිකව එතුමාගේ දේශපාලන අනාගතයට ඇණය ගහගෙන හමාරයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය දියත් කළ පාද යාත්‍රාව තුළින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකට තුනට කඩලා දැම්මා. වාමාංශික පක්ෂ තුනට හතරට කඩලා තමයි ඒ පෙළපාළිය ගියේ. එතුමා දන්නවා, නොබෝ දිනකින් පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණයේ, පළාත් සභා මැතිවරණයේ ජයග්‍රහණයක් පෙනෙන තෙක් මානයකවත් එතුමන්ලාට නැති බව. ඒ ගොල්ලන්ට දිනන්න අඩියක් ඉදිරියට යන්න බැහැ. ඒ නිසා තමයි මෙතුමන්ලා මේ වලි කන්නේ කොහොම හරි ආණ්ඩුවක් හදන්න පුළුවන් වෙයිද කියලා. නමුත් මේ පාද යාත්‍රාවේ එහෙම සලකුණක්වත් තිබුණේ නැහැ. එදා කොළඹ ඉඳලා කතරගමට මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ පයින් ගිය කට්ටිය තමයි අපි. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සියලු වාමාංශික පක්ෂ එකට හිටියා. එක්සත් ජාතික පක්ෂයේ කලකිරුණු පිරිසේ රහසිගතව එදා පාද යාත්‍රාවට උදවු කළා. හැබැයි, මේ පාද යාත්‍රාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලු දෙනාවත් එකතු කර ගන්න බැරි වුණා. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යටතේ බුලත් කොළයෙන් ඡන්දය දිනපු ගෞරවනීය මන්ත්‍රීවරු අපේ පැත්තේ වාඩිවෙලා ඉන්නවා.

හොරකම්වලට අහු වුණු, පගා ගහපු, වංචා කළ, දූෂණවලට අහු වුණු මිනිස්සුත් අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අගමැතිතුමා කරන ආණ්ඩුවට එක් වෙන්න දැන් ලැහැස්තියි. අතිගරු ජනාධිපතිතුමා තීන්දු කරලා තිබෙනවා, මේ එක හොරෙක්වත් ගන්නේ නැහැ කියලා. අපි බොහොම ගෞරවනීය දේශපාලනයක් කරන්නේ. ඒගොල්ලන් එකැනම හිටියොත් තමයි අපට මේ ආණ්ඩුව ඉස්සරහට ගෙනයන්න පුළුවන් වන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකයි ඇත්ත කථාව. එම නිසා පෙළපාළි නොවෙයි, පාද යාත්‍රා නොවෙයි, ඔළුවෙන් හිටගෙන ගියත් කිසිම දවසක මේ ආණ්ඩුව පෙරළන්නට හම්බ වෙන්නේ නැහැ. මෙවැනි ආණ්ඩුවක් ඉතිහාසයේ බිහි වෙලාත් නැහැ; අනාගතයේදී බිහි වෙන්නෙත් නැහැ. මේ ආණ්ඩුව පරිස්සම් කර ගත්තොත් මේ රටේ ජනතාවට විශාල සුගතියක්, සුබ සිද්ධියක් ඇති වෙන බව බොහොම පැහැදිලිව මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කර සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම සතුටට පත් වෙනවා මේ යහ පාලන ආණ්ඩුව තුළ මේ සභාව නියෝජනය කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව. විශේෂයෙන්ම අද මේ සභාව දිහා බලපුවාම මට හිතෙනවා කිසිම දවසක මෙවැනි ගෞරවනීය පාර්ලිමේන්තුවක් ක්‍රියාත්මක නොවෙන්නට ඇති කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ කිහිප විටක්ම මහනුවර දිස්ත්‍රික්කයෙන් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් විධියට තමුන්නාන්සේත් එය දන්නවා ඇති.

අද අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් එකම තැනක, එකම වේදිකාවක ඉඳගෙන බොහොම සුහදශීලීව තීන්දු ගන්නවා. එදා ජනාධිපති වෙන පැත්තක, අගමැතිවරයා වෙන පැත්තක, ඇමතිවරු තව පැත්තක හිටියේ. අද එහෙම නොවෙයි. රටේ ජනාධිපතිවරයාත්, අගමැතිවරයාත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් එක තැනකට එකතු වෙලා මේ රටේ ජනතාව වෙනුවෙන් එකම තීන්දුව ගන්නා විට බොහොම සතුටින් එකතු වෙලා ඒකට අත උස්සලා ඡන්දය දෙන්න ලැබීම අපේ භාග්‍යයක් හා වාසනාවක් හැටියට මා දකිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබාදීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. M.A. Sumanthiran. You have eight minutes.

[5.47p.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Mr. Presiding Member, for the opportunity given to participate in the Debate on the Amendment to Fiscal Management (Responsibility) (Amendment) Act. Although the proposed Amendment is a very short one, the only thing that is sought to be done in that, is to change the percentages in the original Act with regard to the extension of government guarantees from seven per cent of GDP to 10 per cent of GDP. Now, if one considers the quantum of GDP, this is a huge sum and this is a matter that was considered by the Committee on Public Finance. There is a Report that was submitted at the last Session where two recommendations have been unanimously made and I would like to state that here in my speech and I am also moving some Committee Stage Amendments in accordance with the recommendations of the Committee on Public Finance. The Committee, unanimously, with Hon. Members from both sides of the House, said that it is not advisable to extend the government guarantees on behalf of the Public-Private Partnership in which the Government holds less than 50 per cent of shares. I am saying this because the proposal to increase it from seven per cent to 10 per cent of the GDP was made in the Budget Speech by the Hon. Minister of Finance when he presented the Budget Proposals on 20th November, 2015. Under paragraph 422 he stated, I quote:

> "Honourable Speaker, I propose to increase the guarantee limit under the Fiscal Management (Responsibility) Act (FMRA) from current 7 percent of GDP to 10 percent of GDP, and to enable the issuance of guarantees to Public Private Partnerships in which the government holding is less than 50 percent, at a fee. Regulations will be issued enabling the issuance of Treasury Guarantees on a fee basis."

So, this is the rationale according to the Hon. Minister of Finance for the increase of the Treasury Guarantee limit from seven per cent of the GDP to 10 per cent of the GDP. There are two aspects to this; one is, perhaps, the limit has been reached and the Government is unable to issue Treasury Guarantees even for State entities because you have already reached the saturation point of seven per cent. But, there is another proposal here - a very curious one - which says to extend this Treasury Guarantees on behalf of the Public-Private Partnership in which the Government holding is less than 50 per cent. It does not give the limit; presently perhaps, the rules under which these guarantees are given, require that the Government has control over these enterprises. So, you have a shareholding of more than 50 per cent. But, the proposal is, by amending and increasing that limit, you propose to give guarantees to even entities and enterprises in which the Government holds less than 50 per cent.

It does not have a lower limit, which means, even in enterprises where the Government holding is .0001 per cent, a Treasury guarantee, a sovereign guarantee is given and even if it is given for a fee that is a very serious issue, because any time there is a default the Government must honour its guarantee. We have had a very good track record as a country in honouring guarantees. Therefore, we propose that that not be done and that you cannot open it up for the Government to give Treasury guarantees in enterprises in which Government holds measly shareholding and therefore appropriately the limit also must be adjusted. You do not need to raise it to 10 per cent. You can perhaps raise it to eight per cent. Therefore, in respect of both these matters I have already tendered a Committee Stage amendment that I will be moving and I want to bring to the notice of the House that these amendments are in line with the unanimous recommendation of the Committee on Public Finance.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 5.55]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2016 මැයි මස 27වැනි දින ගැසට් පත්‍රයේ පළ කරන ලද 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත මඟින් රාජ්‍ය ආයතනවල ඇපකර සීමාව දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 7 සිට සියයට 10 දක්වා ඉහළ නැංවීම සඳහා ගෙන එන ලද යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා.

විශේෂයෙන්ම ලාභදායී නොවන ආයතන සඳහා ණය ලබාදීම වෙනුවෙන් ඇපවීම සිදු කරනු ලබන අතර, පසු ගිය කාලයේ රටේ විවිධ රාජ්‍ය ආයතන බරපතළ ලෙස ණය බරතාවට ලක් වුණා. විශේෂයෙන්ම ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගම, ඒ වාගේම ලංකා විදුලිබල මණ්ඩලය ඇතුළු ආයතන 26ක් පමණ අද මේ තත්ත්වයට මුහුණ දීලා තිබෙනවා. එම ආයතනවල ඇපකර සීමාව සියයට 7ට ආසන්න මට්ටමක තිබුණත්, පසු ගිය කාලයේ තිබුණු තත්ත්වයත් එක්ක අද එය සියයට 7 සීමාව ඉක්මවා ගොස් සියයට 8 සීමාවත් ඉක්මවා තිබෙනවා. ඒ නිසා එම ආයතන පවත්වාගෙන යෑම සඳහා සහ අදාළ ආයතනවල ඉදිරි ආයෝජන කටයුතු වැඩි කිරීම සඳහා තමයි එය සියයට 10 දක්වා ඉහළ නංවන්න බලාපොරොත්තු වෙන්නේ.

2015.12.31 වන විට රජය මඟින් නිකුත් කර ඇති මුළු ඇපවීම් ප්‍රමාණය රුපියල් මිලියන 642,744යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාල වකවානුව තුළ මූල්‍ය පාලනය ක්‍රියාත්මක නොවීම නිසා, මූල්‍ය පාලනය අක්‍රමවත් ලෙස සිදුවීම නිසා තමයි මේ තත්ත්වය ඇති වුණේ. අද මූල්‍ය කළමනාකරණය ආරම්භ කරන්න සිදුවෙලා තිබෙනවා. එය ආරම්භ කරන කොට එදා ගිණුම්ගත නොකළ ණය ප්‍රමාණය රුපියල් බිලියන 1.4ක් දක්වා ඉහළ ගොස් තිබෙන බව අද වාර්තා වෙලා තිබෙනවා. අද ඒ තත්ත්වය වෙනස් කරන්න යහපාලන ආණ්ඩුවෙන් ක්‍රියාමාර්ග

[ගරු වන්දිම ගමගේ මහතා]

අරන් තිබෙනවා. පාර්ලිමේන්තු අය වැය කාර්යාලයක් ස්ථාපිත කිරීමට කටයුතු කර තිබෙනවා. රාජ්‍ය මූල්‍ය කමිටුව ක්‍රියාත්මක වෙමින් පවතිනවා. එදා ණය ගැනීමට ලෝකය වටේ ගියත්, අද ඇමෙරිකානු ඩොලර් මිලියන 6ක් ලබා දෙන්න ආයතන එකහ වෙනකොට, අපේ රජය ලබාගන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1.5ක් පමණයි. එදා එහෙම තත්ත්වයක් තිබුණේ නැහැ. ඒක නිසා අද යහ පාලන ආණ්ඩුව මූල්‍යමය වශයෙන් ස්ථාවර වෙමින් සිටිනවා. මේ තත්ත්වය අද පාඩු ලබන ආයතනවල පාඩුව අවම කිරීමට පිටිවහලක් වෙලා තිබෙනවා. ඒ වාගේම පාඩු ලබන රාජ්‍ය ආයතන, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වශයෙන් ප්‍රතිව්‍යුහගත කිරීමට උත්සාහ කරන අවස්ථාවකදී ඊට විරුද්ධ පිරිස් විවිධ බාධා එල්ල කරමින් පවතිනවා. එවැනි ආයතන සඳහා ඇපකර නිකුත් කරන බවට අද විවිධ පිරිස් චෝදනා කළත්, මම අහනවා එවැනි ආයතනවලට ඇපකර නිකුත් කරන බවට තිබෙන ලිඛිත සාක්ෂිය මොකක්ද කියා. එදා මහ බැංකුව පවා අසත්‍ය තොරතුරු තමයි ඉදිරිපත් කළේ. නිවැරදි මූල්‍ය කළමනාකරණයක් ඇති කරන්න මූලිකවම අවශ්‍ය වන්නේ නිවැරදි දත්තයන්. ඒ තුළින් උද්ධමනය, විරැකියාව, ගෙවුම් ශේෂයේ හිඟය හා ණයබර ස්ථාවරව පවත්වා ගන්නට හැකි වෙනවා. මේ මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත ක්‍රියාත්මක කිරීමෙන් 2020 වන විට බාහිර ණය ඇතුළු ආණ්ඩුවේ මුළු බැරකම් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 80කට වඩා අඩු කරන්නට සහ 2020 ජනවාරි 01වෙනි දින සිට ආරම්භ වන මුදල් වර්ෂය සඳහා බාහිර ණය ඇතුළු රජයේ මුළු බැරකම් ප්‍රමාණය සියයට 60 දක්වා අඩු කරන්නට බලාපොරොත්තු වෙනවා.

රාජ්‍ය විරෝධීන් කොපමණ විවේචනය කළත්, 2016 මුල් කාර්තුව වන විට වෙළෙඳ ශේෂයේ හිඟය අඩු වෙලා තිබෙන බව ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම ආණ්ඩුවේ වියදම් අඩුවෙමින් පවතිනවා. සංචාරකයන්ගේ පැමිණීම සියයට 20කින් ඉහළ ගිහින් තිබෙනවා. රටේ දළ සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 6.2ක් දක්වා සහ සමස්ත සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 8.2 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යහ පාලන ආණ්ඩුව තුළ වෙනත් රටවලින් ණයට ගත්ත විදේශ සංචිත නැති බව විශේෂයෙන් කියන්නට ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

ගරු වන්දිම ගමගේ මහතා
(මාණ්පුමිකු සන්දිම කමකේ)
(The Hon. Chandima Gamage)

රටේ මූල්‍ය පාලනය ඇති කිරීම සඳහා මේ වන විට දූෂණ මර්දන කමිටුව, දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වාගේම අකර්මණ්‍ය වෙලා තිබුණු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්ථාපනය කරලා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පි.ප. 6.00]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(මාණ්පුමිකු මයිල්වාහනම් තිලකරාජා)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டின் நிதி முகாமைத்துவத்தைச் செம்மைப்படுத்தும் விதத்திலே இன்று சபைக்குச் சமர்ப்பிக்கப்பட்டிருக்கும் நிதி முகாமைத்துவம் (பொறுப்பு) (திருத்தம்) சட்டமூலத்திற்கு ஆதரவாக எனது கருத்துக்களையும் பதிவுசெய்வதற்கு வாய்ப் பளித்தமைக்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றேன்.

நிதி அமைச்சர் என்ற வகையில் எதிர்வரும் காலங்களில் இந்த நாட்டின் பொருளாதார வளர்ச்சியை மேல்நோக்கிக் கொண்டுசெல்வதற்கு செய்ய வேண்டிய சட்டத் திருத்தங்களை இந்தச் சபைக்குச் சமர்ப்பித்து முறையான நிதி நிர்வாகத்தை மேற்கொள்வதற்கு கௌரவ ரவி கருணாநாயக்க அவர்கள் முன்னெடுத்திருக்கும் நடவடிக்கையை நாங்கள் பாராட்ட வேண்டும். குறிப்பாக, பாராளுமன்ற உறுப்பினர்களுக்கு வழங்கப்படுகின்ற பன்முகப்படுத்தப்பட்ட வரவு செலவுத்திட்ட நிதியின்மூலம் வழமையாக மரபுரீதியாக பிரதேச செயலகங்களினூடாக முன்னெடுக்கப்பட்டு வந்த அபிவிருத்தி நடவடிக்கைகளைக்கூட கடந்த அரசாங்கக் காலத்தில் பொருளாதார அபிவிருத்திக்குப் பொறுப்பாக இருந்த முன்னாள் அமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களின் அமைச்சின்கீழ் செய்ய வேண்டிய கடப்பாட்டுக்குத் தள்ளப் பட்டிருந்த நிலைமை காணப்பட்டது. அதனை மாற்றியமைத்து, இன்று மக்களுக்கு சேவையாற்றும்வகையில், ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினருக்கும் வழங்கப்படுகின்ற 15 மில்லியன் ரூபாயிலிருந்து மேற்கொள்ளப்படுகின்ற கருத் திட்டங்கள் இரண்டு இலட்சம் ரூபாய்க்கு மேற்பட்ட தொகை யாக அமைகின்ற பட்சத்தில் அவற்றைக் கேள்விப்பத்திர அனுமதி அடிப்படையில் செயற்படுத்த வேண்டுமென ஒரு முறையான நிதி நிர்வாக முறைக்குக்கீழ் இந்த அரசாங்கம் கொண்டுவந்திருக்கின்றது. அந்தளவுக்கு நிதி நிர்வாகத்தை முறையான வகையில் அமைப்பதற்குப் பல்வேறு முயற்சிகள் மேற்கொள்ளப்பட்டிருக்கின்றன.

'வற்' வரி உட்பட பல்வேறு வரி சம்பந்தமான விடயங்களை முன்வைத்து கூட்டு எதிர்க்கட்சியினர் பல்வேறு பிரசாரங்களை முன்னெடுத்து வருகின்ற இச்சந்தர்ப்பத்தில் மக்களுக்குப் பல்வேறு நிவாரணங்கள் வழங்கப்படுகின்றன என்பதையும் நாங்கள் இந்தச் சந்தர்ப்பத்திலே நினைவுபடுத்த வேண்டியுள்ளது. குறிப்பாக, தனியார் துறையினருக்கு வழங்கிய 2,500 ரூபாய் கொடுப்பனவைத் தோட்டத் தொழிலாளர்களுக்கும் பெற்றுக்கொடுக்க வேண்டுமென்ற அடிப்படையில், ஐக்கிய தேசிய முன்னணியின் சார்பில் போட்டியிட்டுத் தெரிவுசெய்யப் பட்டிருக்கின்ற தமிழ் முற்போக்குக் கூட்டணியின் பாராளு மன்ற உறுப்பினர்களான நாங்கள் தொடர்ச்சியாகப் பாராளு மன்றத்தில் முன்வைத்த கோரிக்கைகளை நல்லாட்சிக்கான இந்த அரசாங்கம் ஏற்றுக்கொண்டது. அதன்படி அந்த 2,500 ரூபாயைப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுத்ததனால், இன்று அது தோட்டத் தொழிலாளர்களுக்கும் கிடைத்திருக் கின்றது. அந்த நிவாரணத்தைப் பெற்றுக்கொடுத்தவர் என்ற வகையிலே இங்கு அமர்ந்திருக்கின்ற தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சர் மாண்புமிகு டபிள்யு.டீ.ஜே. செனெவிரத்ன அவர்களுக்கு எமது கூட்டணி சார்பாக முதற்கண் எனது நன்றியைத் தெரிவித்துக்கொள்ளக் கடமைப் பட்டிருக்கின்றேன்.

மேலும், நிதி அமைச்சர் மாண்புமிகு ரவி கருணாநாயக்க அவர்கள் இந்தத் தோட்டக் கம்பனிகளுக்குக் கடன்களைப் பெற்றுக்கொடுத்து அதனைத் தோட்டத் தொழிலாளர்களுக்கு வழங்கக்கூடிய வகையில் எங்களுக்கு ஆதரவை வழங்கி யிருக்கிறார். அவருக்கும் இந்தத் தொகையைப் பெற்றுக் கொடுத்தமைக்காக இந்த நல்லாட்சி அரசாங்கத்துக்கும் நாங்கள் நன்றியைத் தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු ලක්කි ජයවර්තන අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(මාණ්පුමිකු මයිල්වාකනම් තිලකරාජා)
(The Hon. Mylvaganam Thilakarajah)

ආනාල්, ඉන්දත් තොකෙයිනෙ අරසාංකත්තිටම් කටනාකප් පෙට්රුක්කොණ්ට කම්පනිකළ් මුළුමෙයාක අතනෙත් තෝට්ටත් තොළිලාළර්කළුක්කුප් පෙට්රුක් කොටුප් පතිල් පල්වේරු තටෙකළෙ ඒර්පටුත්ති වරුකින්රන. සිලර් ඉන්ත 2,500 රූපාය් කොටුප්පනවෙ තෝට්ටත් තොළිලාළර් කළුක්කුක් කොටුක්කක්කූටාතු එන්ර නිලෙයිලේ කම්පනි කළුටන් ඉණෙන්දු තංකළතු අරසියල් සෙයර්පාටුකළෙ මුන්නෙටුත්තු වරුකින්ර නිලෙමෙයෙ නාංකළ් අවතානිත් තුක්කොණ්ටු වරුකිරෝම්. ඉන්ත නිලෙමෙ මාර්රප්පට වේණ්ටුම්. කූට්ටු ඔප්පන්දත්තින්කීළ් කටන්ත 24 වරුටංකළාකත් තෝට්ටත් තොළිලාළර්කළුක්කුච් චම්පළම් වළංකප්පට්ටු වන්තතු. ඉන්තක් කාලප්පකුතිකළිල් අරසාංකම් තනියාර් තුරෙයිනරුක්කුප් පල්වේරු නිවාරණක් කොටුප්පනවුකළෙ වරවු සෙලවුත් තිට්ට කාලංකළිල් අර්විත්තිරුන්තපෝතුම්, අවෙ පෙට්රුක්කොටුක්කප්පටාත නිලෙයිල්තාන් තර්පොළුතු තමිල් මුර්පෝක්කුක් කූට්ටණි ඉන්දප් පාරාළුමන්රත්තිල් කුරලෙළුප්පි අන්දත් තොකෙයෙත් තෝට්ටත් තොළිලාළර් කළුක්කුප් පෙට්රුක්කොටුත්තිරුක්කින්රතු. අතනෙප් පෙට්රුක් කොටුප්පතර්කු යාරාවතු තටෙයාක ඉරුප්පාර්කළාක ඉරුන්තාල් අතර්කෙතිරාක නාංකළ් පල්වේරු මාර්රු නටවටික් කෙකළෙ එටුප්පතර්කුම් තයාරාක ඉරුක්කින්රෝම් එන්පතෙ ඉන්දච් චපෙයිලේ තෙරිවිත්තුක්කොළ්ළක් කටමෙප් පට්ටිරුක්කින්රෝම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Member, you have only one more minute.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(මාණ්පුමිකු මයිල්වාකනම් තිලකරාජා)
(The Hon. Mylvaganam Thilakarajah)

එනවේ, අන්තවකෙයිල් ඉන්රු අටුත්ත කට්ටමාකක් කූට්ටු ඔප්පන්දම් චෙය්යවේණ්ටිය නිලෙමෙ ඒර්පට්ටිරුක්කින්රතු. අතනෙච් චෙය්වතිලේ ඉලංකෙත් තොළිලාළර් කාංකිරස් එන්ර තොළිර්චංකම් කෛච්චාත්තිටවේණ්ටිය තේවෙයිරුක් කින්රතු. තෝට්ටක් කම්පනිකළ්, "තේයිලෙක්කු විලෙයේර්රම් ඉල්ලෙ; චර්වතේචච් චන්තෙයිලේ තේයිලෙයින් විලෙ වීළ්ච්චියටෙන්දිරුක්කින්රතු" එනක් කාරණම් කූරුවතුපෝල්, තොළිලාළර්කළ් චාර්පාකච් චෙයර්පටවේණ්ටිය ඉන්දත් තොළිර් චංකමුම් අතේ තෝරණෙයිල් තොටර්ච්චියාකච් චෙයර්පට්ටුක්කොණ්ටිරුප්පතෙ නාංකළ් අවතානිත්තුක් කොණ්ටිරුක්කින්රෝම්. ඉන්රු චර්වතේචත්තිල් තේයිලෙයින් විලෙ අතිකරිත්තාලුම්, චර්වතේචච් චන්තෙයිලේ තේයිලෙක්කාන ඒර්රුමති වරුමානම් කිටෙත්තාලුම් අතනෙ මරුතලිත්තුප් පේසුකින්ර නිලෙයෙ ඉන්දත් තොළිර්චංකංකළ් එටුක්කක්කූටාතු. අතර්කුප් පතිලාක ඉන්දත් තොළිලාළර් කළුක්කුරිය චම්පළත්තෙප් පෙට්රුක්කොටුප්පතර්කු නටවටික්කෙ එටුක්කවේණ්ටුමෙනක් කේට්ටුක්කොණ්ටු විටෙපෙරු කින්රේන්. නන්රි. වණක්කම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මීළහට, ගරු විජයපාල හෙට්ටිආරච්චි මහතා.

[අ.භා. 6.05]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු කථානායකතුමනි, ඔබතුමාට නිදුක් නිරෝගි සුවයත්, විර ජීවනයත් ප්‍රාර්ථනා කරනවා. ජාතික රජයට වසරක් ගත වෙන්නට කාලය එළැඹෙනවා. මෙතෙක් කාලයක් -මේ අවුරුද්දක කාලය ඇතුළතදීත් පසු ගිය කාල පරිච්ඡේදයේදීත්- මේ ආණ්ඩුව වටිටවන්නට නොයෙක් විධියේ බහුබූත දේවල් කළා. අඩුම ගණනේ අද මුදල් පනත් කෙටුම්පතක් ගෙනෙන විටවත්, අපි කථා කරන ඒවාට විරුද්ධව එක වචනයක් කථා කරන්න ඒකාබද්ධ විපක්ෂයේ කල්ලියට පුළුවන්කමක් ලැබිලා නැහැ. ගරු කථානායකතුමනි, ඔවුන් කොච්චර පරාජයට පත් වෙලාද කියලා කිව්වොත්, අද මේ එක මන්ත්‍රීවරයෙකුටවත් මෙම ස්ථානයේ අසුන් ගෙන මෙවාට මුහුණ දෙන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ නිසා ගරු කථානායකතුමනි, මේ පාළු අම්බලමේ වළන් බිඳින්න තමයි අද අපට සිදු වෙලා තිබෙන්නේ.

මම කියන්නට ඕනෑ, එදා අපේ මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමා ගෙදර යවන්න නොයෙක් විධියේ කැස කැවිව බව. පාද යාත්‍රා යන්න මුලින්ම ආරම්භ කරන වෙලාවේ රූපවාහිනී මාධ්‍යවලට පෙනෙන්න ඩෙහා නටලා නොයෙක් විධියේ දේවල් කරපු කණ්ඩායම අද පාද යාත්‍රාවත් එක්ක නන්නත්තාර වෙලා පාරට බැහැලා තිබෙනවා. [බාධා කිරීමක්] එන්න, පුළුවන්නම් උත්තර දෙන්න. අනේ, පව්! අද මේ පක්ෂයට ගිහිල්ලා තිබෙන කල. පක්ෂයක් තිබෙනවාද කියලාවත් දන්නේ නැහැ. දැන් මේ ගරු සභාවට ශ්‍රියානි විජේවික්‍රම මැතිනිය එනවා. අනේ! අපි ඔබතුමියව අපහසුතාවට පත් කරන්නේ නැහැ, පසු ගිය දවස්වල පාද යාත්‍රාවේ ගිහිල්ලා හතර හන්දි රිදෙමින් බොහොම අමාරුවෙන් ඉන්න වෙලාවක අපි හිතට සහනයක් දෙනවා.

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා මේ පනත් කෙටුම්පත සංශෝධනය කරන්නට ගෙනාවේ පසු ගිය කාල පරිච්ඡේදය තුළ -අපේ රජය පත් වෙන්නට කලින්.- මේ රටේ මූල්‍ය විනිවිදභාවයක් තිබුණේ නැති නිසා බව අපි දන්නවා. ගරු කථානායකතුමනි, දකුණු පළාත් සභාවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට මම අවුරුදු 5ක් කටයුතු කළා. අවුරුදු 11ක් එම කාරක සභාවේ සාමාජිකයෙක් හැටියට හිටියා. මහ ආණ්ඩුව වාගේ තමයි එතැනත්. මූල්‍ය පරිපාලනය පිළිබඳව, ඒකේ විනිවිදභාවය පිළිබඳව අඹමල් රේණුවක තරම්වත් තකන්නේ නැතිව quotations 3කට රුපියල් කෝටි ගණන් යම් යම් කොන්ත්‍රාත් දීලා මේ සැරේ ටෙන්ඩර් පටිපාටිය උල්ලංඝනය කරලා මේ රට ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයකට පත් කළා.

විශේෂයෙන්ම මේ යහ පාලන ආණ්ඩුව ඉතාමත් වැදගත් කරුණු කාරණාවලට -මූල්‍ය පිළිබඳව- ඉදිරියේදී මුල් තැන දෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. කොටින්ම කියනවා නම්, විශ්වාස භංගයක් ගෙනැල්ලා මුදල් ඇමතිවරයාව ගෙදර

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

යවන්නත්, මුදල් අමාත්‍ය ධුරයෙන් අයින් කරන්නත් බොළඳ තර්ක ඉදිරිපත් කරමින් කටයුතු කළා. ඒ සියල්ල අද යටපත් කරලා තිබෙනවා. අර මඩ ගොහොරුවේ තිබුණු නෙළුම් පොහොට්ටුව වාගේ පිපිලා මේ රටටම ඉතාමත්ම වාසනාවන්ත සෞභාග්‍යවත් යුගයක් ගෙනෙන්නයි අපි සූදානමින් සිටින්නේ. ඒ නිසා විශේෂයෙන්ම මේ කටයුතුවලදී අපි කියන්නට ඕනෑ, මේ රටේ අපට දකින්නට තිබුණු දෙයක් ගැන. පසු ගිය කාලසීමාව තුළ මේ රටේ මුදල් පිළිබඳව කථා කරන විට අපි දැක්කා, අය වැය පරතරය; උද්ධමනය; විරැකියාව; ගෙවුම් ශේෂ හිඟය; ණය බරතාව යනාදිය.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු කථානායකතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

මේ සාර්ව ආර්ථික කළමනාකරණය පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්පූර්ණයෙන්ම විනාශ කර තිබුණා. මේ රටේ අය වැය ලේඛනය හදන්න පටන් ගන්න කොට මේ සියලු දේවල් පිළිබඳව සැලකිලිමත් වෙන්නට ඕනෑ. රටේ අය වැය ලේඛනය හදලා මාස 6ක් ගතවන විටත් එහි ප්‍රගතිය පිළිබඳව අධීක්ෂණය කරන්න වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඉදිරි මාස කිහිපය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත අය වැයෙන් ඉදිරිපත් කළ යම් යම් කාරණා පිළිබඳව කථා කරන්න අවස්ථාවක් තිබුණේ නැහැ.

පසු ගිය රජය අවසාන කාලයේ දී මොකක්ද කළේ කියා අප දන්නවා. රුපියල් කෝටි ගණන් මුදල් තමන්ගේ හිතු මනාපයට යෙදෙව්වා කියලා අපි දන්නවා. අහිංසක මිනිසුන්ට වතුර ටිකවත් හරියට දුන්නේ නැහැ. ගරු රවුෆ් හකීම් ඇමතිතුමනි, වතුර දෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. හැබැයි, බට ටික ගෙනෙන්න මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව, බැසිල් රාජපක්ෂ මහත්තයලාට රුපියල් කෝටි ගණන් මුදල් දුන්නා. පාරවල් හැදුවා කිව්වා. ඒවා කොයි ආකාරයකට කළාද යන්න පිළිබඳව අපට වාර්තා තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපට කාල වේලාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා දැන් කථාව අවසන් කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු කථානායකතුමනි, තව විනාඩියයි මම කථා කරන්නේ.

ඒ සඳහා මුදල් වෙන් කළේ කොහොමද කියලා අපි දන්නවා. මුදල් වෙන් කළා. මුල් ගල තිබ්බා. මූලික දේ කළා. මේ ආණ්ඩුව එනකොට කිසිම විනිවිදභාවයක් තිබුණේ නැහැ. මේවා ගිවිසුම්ගත වෙච්ච නිසා අකමැත්තෙන් වුණත් අපට රුපියල් කෝටි ගණන් මුදල් ගෙවන්නට සිදු වුණා.

අවසාන වශයෙන් මම ඉතාමත්ම පැහැදිලිව කියනවා, "මේ මොන දේවල් කළත් මේ රටේ සාධාරණ යුක්ති සහගත සමාජයක් ඇති කර, විනිවිදභාවයෙන් යුක්ත මූල්‍ය තත්ත්වයක් උරුම කරන්නට මේ රජය ඉදිරියේදී කටයුතු කරනවා" කියලා. ගරු කථානායකතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
The next speaker is the Hon. Velu Kumar. You have five minutes.

[ප.ව. 6.10]

ගරු වේලු කුමාර් මහතා
(මාණ්පුමිකු වේලු කුමාර්)
(The Hon. Velu Kumar)
கௌரவ சபாநாயகர் அவர்களே, நாட்டின் நிதி முகாமை தொடர்பான திருத்தச் சட்டமூலத்திலே எனது கருத்துக்களைப் பதிவு செய்வதற்கான சந்தர்ப்பத்தைத் தந்தமைக்கு நன்றி கூறிக்கொள்கின்றேன். நிதிப் பரிகரணம் தொடர்பாகப் பாரிய விவாதத்திற்குட்பட்ட ஒரு காலகட்டத்தை நாங்கள் கடந்த காலங்களிலே சந்தித்திருந்தோம். அதனைத் தாண்டி இன்று இருக்கின்ற இந்த நல்லாட்சி அரசாங்கத்திலே நாட்டினது நிதியினைச் சீராகப் பயன்படுத்துவது தொடர்பாக முழுக் கவனமும் செலுத்தப்படுகின்றது. அந்த வகையிலே ஏற் கெனவே காணப்பட்ட அத்தகைய குறைபாடுகளை நிவர்த்தி செய்துகொண்டு புதிய அணுகுமுறைகளைக் கையாண்டு எங்களுடைய நாட்டின் நிதிப் பரிகரணத்தைச் சீர்படுத்துவதற் குரிய நடவடிக்கைகள் நிதியமைச்சினால் எடுக்கப்படுகின்றது. அதனுடைய ஒரு படிமுறையாக இந்த நாட்டின் நிதி முகாமை தொடர்பான சீர்திருத்தம் பற்றி இன்று பேசப்பட்டு திருத்தம் செய்யப்படுகின்றது.

இலங்கையின் வரலாற்றிலே அதன் வருமானத்தில் பெருந்தோட்டத்துறை மக்களினது பங்களிப்பு என்பது அளப்பரியது. கடந்த இரண்டு தசாப்தங்களுக்கு முன்னைய காலப்பகுதிகளிலே இலங்கையின் மொத்த வருமானத்திலே பெரும்பகுதியினைக் கொண்டிருந்த ஒரு பிரதான துறையாகப் பெருந்தோட்டத் துறை இருந்திருக்கின்றது. இன்று காணப்படு கின்ற பல்வேறு சூழ்நிலைகளால் அது சற்றுக் குறைவடைந் திருந்தாலும் இன்றும் எங்களுடைய வருமானத்திலே ஒரு பாரிய பங்கைத் தருவதாக இந்தப் பெருந்தோட்டத்துறை காணப்படுகின்றது. அண்மைக்காலமாக பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பளம் சம்பந்தமான பாரிய பிரச்சினை களுக்கு நாங்கள் முகம் கொடுத்துக்கொண்டிருக்கின்றோம்.

1992 වසරේ සිට Collective Agreement එක හරහා වතු කම්කරුවන්ගේ කුලිය තීරණය කළා. 1992 වසරේදී ඒ තීරණය ගන්න කොට වතු ක්ෂේත්‍රය තුළ කම්කරුවන් තුන්ලක්ෂ විසිහත්දහසක් පමණ රැඳී සිටියා. නමුත් ඒ ක්‍රමයේ වැරැද්දක් නිසා අද වන විට වතු කම්කරුවන්ගේ සංඛ්‍යාව එක්ලක්ෂ පනස්හයදහසක් පමණ වෙනකල් අඩු වෙලා තිබෙනවා. හැම අවුරුදු දෙකකට වරක්ම Collective Agreement එක හරහා තීරණය වුණ වතු කම්කරුවන්ගේ කුලිය 2015 මාර්තු 31වැනි දා ඉඳලා අද වෙනකල් අපට තීරණය කර ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Member, you have only two more minutes.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

නමුත් යහ පාලන රජය පෞද්ගලික අංශයේ සේවකයන්ට ලබා දුන් රුපියල් 2,500 දීමනාව කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය හරහා වතු කම්කරුවන්ට ලබා දීමට හැකියාව ලැබී තිබෙනවා. ඒ පිළිබඳව මා මේ රජයට ස්තුතිවන්ත වෙනවා. නමුත් පෞද්ගලික අංශයේ සේවකයන්ට ලබා දුන් රුපියල් 2,500 වැටුප් වැඩි වීම රාජ්‍ය වතු සමාගම්වල කම්කරුවන්ට තව වෙනතුරු ලබා නොදීම පිළිබඳව මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට මම කනගාටු වෙනවා. මේ අවස්ථාවේදී කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා මේ ගරු සභාවේ රැඳී සිටිනවා. JEDB, SPC, Elkaduwa Plantations වැනි රාජ්‍ය වතු සමාගම්වල වතු කම්කරුවන් 10,000ක් පමණ ඉන්නවා. ඒ වතු කම්කරුවන්ට තවම රුපියල් 2,500 දීමනාව ලබා දීමට කටයුතු කරලා නැහැ. ඒක ලබා දීමට කටයුතු කරන්න ඕනෑ. රජයක් හැටියට ඒ වගකීම ඉටු කරන්නැයි ඉල්ලා සිටිමින්, මාගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 7.08]

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)

ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අන්තිම මොහොතේ වචන ස්වල්පයක් එකතු කිරීමට ලැබීම මා බොහොම අගය කොට සලකනවා. ගරු මන්ත්‍රීවරුන් ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කළා. මා ඒවා බොහොම අගය කරනවා. සමහර අය විවේචනාත්මක අදහස් ඉදිරිපත් කළා. ඒවා නම්‍යශීලීව භාර ගන්න අපි සූදානම්. නමුත් මම මූලිකව කියන්න ඕනෑ, මෙවැනි අවස්ථාවක් උද්ගත වූයේ ණයත් සමඟ මේ රටේ ආර්ථිකය භාර ගැනීමට අපට සිදු වූ නිසා බව. ඒ නිසා අපට අවශ්‍ය වුණා, මේ රට භාර ගත් අවස්ථාවේ සිට ශීඝ්‍ර සංවර්ධනයක් කරා ගෙන යන්න. සියයට 6ක ණය අරගෙන සියයට 0.05ක ආදායමක් උපයන ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා. ඊට උදාහරණයක් තමයි හම්බන්තොට වරාය. ඒ සඳහා රුපියල් කෝටි 28,200ක් වියදම් කරලා රුපියල් මිලියන 300ක ආදායමක් ලබා තිබෙනවා. අන්තිමට ඒ ණය ගෙවන්න වෙන්නේ කොළඹ වරායේ ආදායමෙන්. ඒ වාගේම තමයි ජාතික ඉතිරි කිරීමේ බැංකුව. මම මේ ගැන උදෙත් මතක් කළා. US Dollars මිලියන 1,000ක් ගන්නවා. ඒ කියන්නේ රුපියල් බිලියන 145ක්. ඒකෙන් මිලියන 750ක් පාවිච්චි කරනවා, යෝජිත වැඩ පිළිවෙළට අදාළ නොවන කටයුතු සඳහා. අන්තිමට සියයට එන්නේ 8.64යි. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පත්කරුවන් අවදානම් තත්ත්වයෙන් මුදා ගන්න අවශ්‍යයි. මෙවැනි දේවල් එක්ක තමයි අපට මේ රට භාර දුන්නේ. එදා ණය ගත්තේ ඒ අය කියලා. ඒවා කපා හරින්න ප්‍රජාතන්ත්‍රවාදී රටක් ලෙස අපට බැහැ. ඒ නිසා අපි සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, ජාතික ආර්ථිකයක් හදන්න අපිත් එක්ක එකතු වෙන්න කියලා.

ගරු මන්ත්‍රීවරු අදහස් ගණනාවක් ඉදිරිපත් කළා. ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා යෝජනා කරලා තිබෙනවා, 2013 වැඩි වුණු සියයට 7ක සීමාව සියයට අටක් දක්වා වැඩි කරන්න කියලා. ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි ඒ ප්‍රමාණයත් අභිභවායි යන්නේ. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. අපි ඒ වාගේ කළොත් අවුරුද්දෙන් අවුරුද්දට එන්න අවශ්‍යයි. සියයට දහයක් වුණාම මූල්‍ය කළමනාකරණය අවශ්‍යයි. මම කාරුණිකව ඔබතුමා ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා, මේක සියයට දහයක් කරන්න කියලා.

දෙවන යෝජනාව සම්බන්ධයෙන් කියනවා නම්, මම හිතන විධියට ඒක ඉදිරි දැක්මක් සහිතව තිබෙන අදහසක්. නමුත් සියයට පනහක් නොවෙයි, අපි ආණ්ඩුවක් වශයෙන් ඒක සියයට විස්සක් - ඇයි, එහෙම කරන්නේ? සියයට විස්ස තමයි බැංකුවල කොටස් ගන්න පුළුවන් උපරිම මට්ටම වන්නේ.- තිබෙනවා කියන පදනමින් ඉදිරියට ගෙන ගියොත්, මම හිතන විධියට ඔබ අදහස් කරපු යෝජනා - [බාධා කිරීමක්]

I think we will meet the expectations that you wanted. I think that the Hon. Sumanthiran spoke on behalf of the plural Opposition Members of Parliament who are there and we will certainly accept that you have brought that forward in that spirit and I hope that you will reciprocate in the same manner. At the end of the day, we want to bring in financial discipline. The Hon. Prime Minister has mentioned that financial consolidation will take place by the year 2020 which will be 3.5 per cent of the budget deficit. Our journey is increasing fiscal space by increasing revenue, reducing the cost and ensuring that we put that to productive use. Productive use is capital expenditure and that is to what we are basically coming forward. So, I do not want to deliberate this any further. I only want to mention that these were the salient facts that were discussed and we are ready to accommodate that and go forward.

Thank you, Sir.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු රවි කරුණානායක මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு ரவி கருணாநாயக்க]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Ravi Karunanayake]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[THE HON. SPEAKER in the Chair.]

1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 1 ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
2 වන වගන්තිය සංශෝධන ඉදිරිපත් කිරීම, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, in view of the assurance given by the Hon. Minister of Finance, I am not moving that amendment.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Thank you.

2 සහ 3 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
2 ஆம், 3 ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 2 and 3 ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
නව වගන්තිය සංශෝධන ඉදිරිපත් කිරීම, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, with regard to this amendment, just a moment ago the Hon. Minister gave an undertaking that where the Government holding is less than 50 per cent, still it will be over 20 per cent. Now, how will that be incorporated into this? It is an assurance that you have given on the Floor of this House, I am willing to accept it. This is a concern that was raised in the Committee on Public Finance.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
So, if it is legally in order, we can bring that in saying anything that is over 20 per cent only can get a Government guarantee. If that can be incorporated, that is not a problem.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Even if by way of a Regulation if that could be brought about and that guarantee is given by the Minister, I am not moving that amendment.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Thank you, Hon. Member.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendment.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I move,

"That the Bill, be now read the Third Time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறை வேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු බුද්ධික පතිරණ මහතා.

සංවර්ධනය පිළිබඳ ජාතික ඇගයීම් ප්‍රතිපත්තියක් සකස් කිරීම
அபிவிருத்தி பற்றிய தேசிய மதிப்பீட்டுக் கொள்கையைத் தயாரித்தல்
FORMULATION OF NATIONAL EVALUATION POLICY ON DEVELOPMENT

[අ.භා. 6.22]

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකාව තුළ සිදු වූ හා සිදුවන සංවර්ධන වැඩසටහන්හි ඵලදායීතාව කෙසේද යන්න පිළිබඳ සලකා බැලීමට නිසි ඇගයීම් ක්‍රමවේදයක් අවශ්‍ය වී ඇත. මන්ද, එම සංවර්ධන වැඩසටහන් සඳහා වැය කරන පිරිවැයට සාපේක්ෂව එහි අවසන් ප්‍රතිඵලයේ ඵලදායීතාව කෙසේද යන්න පිළිබඳව නිවැරදි නිගමනයන්ට එළඹීමට හා එම වාර්තා හරහා රටේ ඉදිරි සියලුම සංවර්ධන සැලසුම් සකස් කිරීමට හැකි වීම තුළින් ආර්ථික හා සාමාජීය ගලායාමේ යහපත් ප්‍රවණතාවන්ට මහඟු රුකුලක් වනු ඇත. එහෙයින් ජාතික ඇගයීම් ප්‍රතිපත්තියක් සකස් කර සංවර්ධන වැඩසටහන් පියවර වශයෙන් ඇගයීමට හැකි සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු කථානායකතුමනි, යහ පාලන රජයේ ජාතික ප්‍රතිපත්ති පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන බව ඔබතුමාත්, අපත් දන්නවා. ඒ නිසා තමයි, මේ යෝජනාව ඉදිරිපත් කළේ. මේ වේලාවේ ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා මෙම යෝජනාව ස්ථිර කළාට පසුව මම මේ යෝජනාව පිළිබඳව කථා කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මැතිතුමා.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(මාණ්පුමිකු ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
ගරු කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද සභාව කල් තැබීමේ යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, "මේ අවස්ථාවේදී ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் *அக்கிராசனத் தினின்று அகலவே,* மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் *தலைமை வகித்தார்கள்.*
Whereupon MR. SPEAKER *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ඇගයීම් ප්‍රතිපත්තියක් සැකසීම සඳහා හැකියාවක්, සුජාතභාවයක් ඉතිහාසයේ පත් වුණු සෑම රජයකටම වඩා යහ පාලන රජයට තිබෙය කියලා අප විශ්වාස කරනවා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට ප්‍රධාන පක්ෂ දෙක එකතුවෙලා, ජාතික ආණ්ඩුවක් හදලා තිබෙනවා. එසේ ජාතික ආණ්ඩුවක් හදන්න ප්‍රධාන වශයෙන්ම බලපෑ කාරණය තමයි ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ අවශ්‍යතාව. ශ්‍රී ලංකාව තුළ සිදු කරන හා සිදු වූ සංවර්ධන ව්‍යාපෘතීන්හි ඵලදායීතාව විමසීමේ ඇගයීම් ක්‍රමවේදයක් සකස් කිරීමට, වැය කළ මුදලට සාපේක්ෂව අවසන් ප්‍රතිඵලය ඵලදායීද කියලා විමසීමට, මෙය ආර්ථික සහ සමාජයීය වශයෙන් ප්‍රගමනයන්ට හේතු වන කාරණා කියලා අප විශ්වාස කරනවා. ආර්ථික සහ සමාජයීය ප්‍රගමනයට හේතු වන ක්‍රමවේදයක් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හරහා ලබා ගත හැකියි කියලා අප කල්පනා කරනවා. මොකක්ද, මේ ව්‍යාපෘතිය? ඒ තමයි, ජාතික ඇගැයීම් ප්‍රතිපත්තියක් ඇති කිරීම සඳහා වැඩ පිළිවෙළක් පාර්ලිමේන්තුව තුළින් අපි යෝජනා කරලා ඉදිරියට ගෙන යෑම. දකුණු ආසියානු කලාපය තුළ අධ්‍යාපනය, සෞඛ්‍යය වාගේම ආර්ථික, සමාජයීය දර්ශක පිළිබඳව අප කිරලා මැනලා බලනකොට ලංකාව ඉදිරියෙන් ඉන්නවා. හැබැයි, ලෝකයේ දියුණු රටවල් එක්ක බලනකොට අපට සතුටු වෙන්න පුළුවන් තත්ත්වයක් නැහැ. මොකද, අපි ඉන්නේ පසුගාමී තත්ත්වයකයි.

2015දී සහස්‍ර සංවර්ධන ඉලක්කයන් - Millennium Development Goals - පිළිබඳ කතිකාව නිමා කරලා තව අවුරුදු 15කින් - 2030දී - තිරසර සංවර්ධන ඉලක්ක - Sustainable Development Goals - සපුරා ගැනීමේ ගමන් මහටයි මේ රට අද ප්‍රවේශවෙලා ඉන්නේ. අපගේ සංවර්ධන ක්‍රියාදාමය - ඒ ක්‍රියාකාරකම් - අගයන්නට නම් එහි ප්‍රගතිය හීන වීමට හේතු වී ඇති වැඩසටහන් තිබෙනවාද, එසේ ප්‍රගතිය හීන වන්නට බලපෑ හේතු තිබෙනවාද, එසේ වන්නට බලපෑ අඩු පාඩු මොනවාද, එකී අඩු පාඩු සකස් කර ගන්නේ කොහොමද කියන කාරණා පිළිබඳව අප අවධානය යොමු කරන්න ඕනෑ. මේ තුළින් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව රටක සංවර්ධනයේ ප්‍රතිඵල ජනතාවට අත් කර දෙන්න, ජනතාවාදී සංවර්ධනයක් බවට පත් කරන්න පුළුවන් කියන එකයි අපේ විශ්වාසය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ රටවල් ගණනාවක මෙවැනි ක්‍රමවේද ස්ථාපනය කරලා තිබෙනවා. ලෝකයේ රටවල් 20කට වැඩි ප්‍රමාණයක ජාතික ඇගයීමේ ප්‍රතිපත්තියක් - National Evaluation Policy එකක් - ක්‍රියාත්මක වෙනවා -ස්ථාපනය කරලා තිබෙනවා-. දකුණු අප්‍රිකාව ගත්තොත් එහි ජනාධිපතිවරයා යටතේ මෙවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. එය වඩාත් සංවර්ධිත, විධිමත් ආයතන ව්‍යුහයක් විධියට අපිට හඳුනා ගන්න පුළුවන්. සියලුම ජාතික සංවර්ධන වැඩසටහන් ඇගයීමට ලක් කරලා, එහි ප්‍රතිඵල, දුර්වලතා, තවත් කළ හැකි වර්ධනයන් තිබෙනවා නම් ඒ වර්ධනයන් පිළිබඳවත් අමාත්‍ය මණ්ඩලයට යෝජනා කිරීමයි මේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය -National Evaluation Policy එක - තුළින් සිදු කරන්නේ.

දකුණු අප්‍රිකාව සඳහා වූ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය - National Evaluation Policy Framework of South Africa - සඳහා අවශ්‍ය රාමුව සකස් කරලා තිබෙනවා. මැලේසියාව සලකා බැලුවොත් මැලේසියාවේ ක්‍රියාත්මක වෙන්නේ RBM ක්‍රමයක් - Results-based Management System එකක්-. මොකක්ද, මේ කියන්නේ? ප්‍රතිඵල පාදක කළමනාකරණ ක්‍රමය. ඒක වැදගත් ව්‍යුහයක්; වැදගත් ක්‍රමයක්. එරට මුදල් අමාත්‍යාංශය හරහා දියුණු දත්ත හා තොරතුරු ක්‍රමවේදයක් සහිතව ස්ථාපනය කරලා මේ RBM ක්‍රමය ක්‍රියාත්මක කරනවා. ඒ අනුව සියලු අමාත්‍යාංශයන්හි වැඩසටහන්වල ප්‍රතිඵල පාදක කර ගනිමිනුයි මෙය සකස් කළ යුතුව තිබෙන්නේ. වාර්ෂික අය වැය මේ මතයි පදනම් වෙලා සැකසෙන්නේ. වාර්ෂික අය වැයෙන් වෙන් වන මුදල් එම RBM ක්‍රමය අනුව ප්‍රතිඵල ළඟා කර ගැනීමේ නිශ්චිත ඉලක්ක කරා

[ගරු බුද්ධික පතිරණ මහතා]

පැහැදිලිවම ඉලක්කගත කර තිබීම මැලේසියාවේ තිබෙන විශේෂ තත්ත්වයක්. ශ්‍රී ලංකාවේත් බොහෝ රාජ්‍ය නිලධාරීන් ඒ මැලේසියානු ක්‍රමය පිළිබඳව අධ්‍යයනය කර තිබෙනවා. හැබැයි තවම ලංකාව විධියට අපට ඒ ක්‍රම ස්ථාපනය කර ගන්න නොහැකි වීම කනගාටුවට කරුණක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි නේපාලය ගෙන බලමු. රට සංවර්ධනය කිරීමේදී ඇගයීම් ක්‍රමවේදයක් ඇති කළ යුතු යැයි එරට මූලික නීතිය වන නේපාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පිළිගෙන තිබෙනවා විතරක් නොව, නේපාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54වන ව්‍යවස්ථාවේ ඒ කාරණය නිශ්චිතවම ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම, ජාතික ඇගයීමේ ප්‍රතිපත්තිය සකස් කර එය කැබිනට් මණ්ඩලය දක්වා ගෙන යන්න නේපාල රජය සමත් වී තිබීම නිසාම මේ කලාපය තුළ මේ කාරණයේදී -මේ සිද්ධියේදී- නේපාලය ඉන්නේ අපට වඩා ඉදිරියෙන්ය කියන එක අපි කනගාටුවෙන් වුණත් සඳහන් කරන්න ඕනෑ.

නේපාලයේ ජාතික සැලසුම් කොමිසම - National Planning Commission -කියන්නේ, ඇගයීම් පිළිබඳව වගකීම් දරන, රජයට සහාය දෙන, අග්‍රාමාත්‍යවරයා යටතේ ස්ථාපනය වූ ආයතනයක්. මා හිතන්නේ, මෙවැනි ක්‍රමවේදයක් ගැන රටක් විධියට අපත් දැන් සිතිය යුතුව තිබෙනවා කියලායි. නේපාලය ජාත්‍යන්තර ඇගයීමේ වර්ෂය ලෙස 2015 වර්ෂය නම් කරලා ලෝකයේ විවිධ රටවල පාර්ලිමේන්තු නියෝජිතයන්, ඇගයීමේ විශේෂඥයන්, රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ කරගෙන ප්‍රධාන සැමරීමේ උත්සවය පැවැත්වීම, නේපාල පාර්ලිමේන්තුව ලෝක ඉතිහාසයේ සුවිශේෂී හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස ලෝක ඉතිහාසයට එකතු වීමක් හැටියට අපට පෙන්නුම් කරන්න පුළුවන්. ජාතික ඇගයීමේ ක්‍රියාවලියට ජනතා නියෝජිතයන් බද්ධ කරගන්නේ කොහොමද, ඒ සඳහා නිලධාරීන් පුහුණු කරන්නේ සහ නිලධාරීන්ට මහ පෙන්වන්නේ කොහොමද, ජාත්‍යන්තර ආයතනයන්හි සහාය ලබාගන්නේ කොහොමද, සමස්ත රාජ්‍ය යන්ත්‍රණයම එයට සූදානම් කරන්නේ කෙසේද කියන කරුණු අතින් ආදර්ශයක් ගන්න අපට අවශ්‍ය නම්, නේපාලය ඒ සඳහා හොඳ කලාපීය ආදර්ශයක්ය කියන එකයි මගේ අදහස, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම, තිරසර සංවර්ධනයේ ප්‍රධාන සිද්ධාන්තයක් වන්නේ, "no one left behind" කියන එකයි. දරිද්‍රතාවෙන් පෙළෙන සෑම පුරවැසියකුටම මෙන්න මේ ප්‍රධාන සිද්ධාන්තය තුළ සංවර්ධනයේ ප්‍රතිලාභ ගලා යෑම තහවුරු කරන්න පුළුවන්. ලංකාව සලකා බැලුවොත්, සංවර්ධනයේ ප්‍රතිලාභ ලංකාවේ ඇත එපිට හතර දිග් භාගයේම ග්‍රාමීය ජනතාව දක්වා, ජනතාවගේ දෙපතුල දක්වා ගෙන යන්න මේ ක්‍රමවේදය අත්‍යවශ්‍යයි කියන එකයි මා විශ්වාස කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අධ්‍යාපනය, සෞඛ්‍යය ආදිය නැංවීම, දිලිඳු ජනතාවගේ ආර්ථික සමෘද්ධිය සඳහා ඇගයීමේ ක්‍රමවේදය ස්ථාපනය කිරීම ප්‍රයෝජනවත් වෙනවා. දකුණු ආසියානු කලාපය තුළ සලකා බැලුවත් නේපාල උදාහරණයම අපට ඇති, පරමාදර්ශයක් විධියට ගන්න. එපමණක් නොවෙයි. ලෝකයේ තවත් රටවල් ගණනාවක මේ ක්‍රමවේදය ක්‍රියාත්මක වෙනවා. උගන්ඩාව ගත්තත්, කෙන්යාව ගත්තත්, චිලී රාජ්‍යය ගත්තත්, මෙක්සිකෝව ගත්තත්, කොලොම්බියාව ගත්තත් දියුණු ඇගයීමේ ක්‍රමවේද ස්ථාපනය කර තිබෙන රටවල් විධියට ඒවා හඳුන්වා දෙන්න අපට පුළුවන්. අපට ආදර්ශයට ගන්න පුළුවන් තවත් රාජ්‍යය දෙකක් විධියට විශේෂයෙන් මෙක්සිකෝව සහ පිලිපීනය හඳුන්වා දෙන්න මා කැමැතියි. විශේෂයෙන් පිලිපීනය ගැන කියද්දී මේ ඇගයීමේ ක්‍රමවේදය වාගේම එරට ඇති තවත් වැදගත් ක්‍රමයක් ගැන -මේ කාරණයෙන් තරමක් බැහැර වුණත්- මා සඳහන් කරන්න ඕනෑ. ඒ තමයි, පිලිපීනයේ ක්‍රියාත්මක වන පළාත් පාලන ක්‍රමවේදය වන "Barangay System" එක. එය අපේ රටේ පළාත් පාලන ක්ෂේත්‍රයේදී ආදර්ශයට ගත හැකි හොඳ නියාමක ආදර්ශනයක් අපට පෙන්වනවා කියා මා මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආපසු අපේ ප්‍රස්තුත කාරණයට එමු. ශ්‍රී ලංකාවටද එවැනි ජාතික ඇගයීමේ ප්‍රතිපත්තියක් සහ ඇගයීමේ ක්‍රමවේදයක් - National Evaluation Policy and System එකක් - සකස් කර ගැනීමට කාලය ඇවිත් තිබෙනවා. එවැන්නක් අද ශ්‍රී ලංකාවට ඉතාම වැදගත්. එය ශ්‍රී ලංකාවේ ආණ්ඩුකරණයේදී -රාජ්‍ය පාලනයේදී- ප්‍රමුඛතාවෙහි ලා සැලකිය යුතු වැදගත් අංශයක් විධියට සලකායි අපි මේ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ. මේ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙන ඒම මඟින් අප බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක් පැත්තකින්, රටට ජාතික ඇගයීමේ ප්‍රතිපත්තියක් ඕනෑ, ඒ ජාතික ඇගයීමේ ප්‍රතිපත්තිය සකස් වෙන්න ඕනෑ කියා මතවාදමය වශයෙන් රට තුළ සංවාදයක් ඇති කරන්නයි, එවන් වැඩ පිළිවෙළකට මුල පුරන්නයි යහ පාලන ආණ්ඩුවේ අපි වසරක් ගත වන්නට ප්‍රථම මේ ක්‍රමවේදය පිළිබඳ යෝජනාව ගෙන එන්නේ.

දුම් වැටි සඳහා රූපමය අවවාද ඇතුළත් කරලා අපි විප්ලවීය පියවරකට ගියා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හරහා අපි විප්ලවීය පියවරකට ගියා. ජාතික විගණන සේවා කොමිසම ස්ථාපනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරමින් අපි විප්ලවීය පියවරකට ගිහිල්ලා තිබෙනවා. ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් ඇති කිරීම සඳහා අපි විප්ලවීය පියවරකට ගිහිල්ලා තිබෙනවා. ඒ නව්‍ය ක්‍රමවේද ඉදිරියට ක්‍රියාත්මක කරමින් ජාතික ඇගැයීමේ ප්‍රතිපත්තියක් ඇති කිරීමේදීත් අපි ඒ අනුව කටයුතු කළ යුතුයි කියලා මම කියනවා.

සංවර්ධනයේ අරුණලු හෙවත් ප්‍රතිලාභ නොලැබුණු ජනතාවට ඒ ප්‍රතිලාභ ලබා දෙමින්, ශ්‍රී ලාංකීය සමාජය ගෝත්‍රික යුගයෙන් නූතනත්වයට පොලා පනින්නට මේ කාරණය ඉතා වැදගත් කියන එකයි මගේ විශ්වාසය. මේ ගරු සභාවේ අද අපි අරඹන මේ සංවාදය සිවිල් සමාජය සමඟ ඒකාබද්ධ කරලා සමාජය තුළ මහා කතිකාවක් ඉදිරියේදී ඇති කරන්න අවශ්‍යයි. ජාතික ඇගැයීමේ ප්‍රතිපත්තියක් හරහා ඇගැයීමේ ක්‍රමවේදයක් ගෙන ඒම මධ්‍යම පාන්තිකයාට වැදගත් වන්නේ කොහොමද, රටේ ජාතික ප්‍රතිපත්තිවලට වැදගත් වන්නේ කොහොමද, රටේ මහා භාණ්ඩාගාරයට වැදගත් වන්නේ කොහොමද, සාමාන්‍ය මධ්‍යම පන්තියේ පුද්ගලයෙකුට වැදගත් වන්නේ කොහොමද, නිර්ධන පන්තියේ පුද්ගලයෙකුට වැදගත් වන්නේ කොහොමද කියන කාරණය මේ එක සංවාදයකින් එහෙම නැත්නම්, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන කල් තැබීමේ යෝජනාවකින් පමණක් සිද්ධ වන්නේ නැහැයි කියන කාරණය අපි දන්නවා. ඒ නිසා අපට අවශ්‍ය මේ සංවාදය අද මෙතැනින් -රටේ උත්තරීතරම පාර්ලිමේන්තුවෙන්- ආරම්භ කරන්නයි. එසේ ආරම්භ කරලා හෙට දවසේ මෙය සමාජගත කරන්නයි. ඒ වාගේම සමාජයේ නිර්ධන පන්තිය, පහළ පන්තිය, මධ්‍යම පන්තිය, ඉහළ මධ්‍යම පන්තිය, අධ්‍යාපන ආයතනවල, තෘතීයික අධ්‍යාපන ආයතනවල, විද්වත් සංගම්වල මේ ගැන පුළුල් සංවාදයක් ඇති කිරීමයි අපට අවශ්‍ය.

විශේෂයෙන්ම මේ ගැන සිවිල් සමාජය තුළ, තරුණ තරුණියන් තුළ, විශ්වවිද්‍යාල තුළ සංවාදයක් ඇති කරන්න ඕනෑ. ඒ සංවාදය කුමක් සඳහාද? ඒක තමයි මෙහි තිබෙන වැදගත්කම. අපි ඒ සංවාදය ගොඩ නැඟුවාම ඒ සංවාදය තුළින් මේ ගැන පදනම් පත්‍රිකාවක්, ධවල පත්‍රිකාවක් - White Paper- හදා ගන්න අපට පුළුවන් වෙයි. ඒ හදන පත්‍රිකාව තුළින් තවදුරටත් සංවාද කරලා ජාතික ඇගැයීමේ ප්‍රතිපත්තිය සඳහා අවශ්‍ය මූලික රාමුව හදන්න

අපට පුළුවන් වෙයි. ඒ හරහා ජාතික ප්‍රතිපත්තිය සකස් කර ගන්න අපට පුළුවන්. නේපාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළු කළා වාගේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් මෙය ඇතුළු කිරීම අවශ්‍යයි. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන රටේ සංවාදයක් ඇති වෙලා තිබෙන මේ මොහොතේදී, උදාහරණය ගනිමින් මම කලින් කිව්වා වාගේ නේපාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වෙනි ව්‍යවස්ථාවේ තිබෙනවා වාගේ අපේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් හැකි නම් මෙය ඇතුළු කරන්න ඕනෑ. ඒක තමයි අපි කර ගත යුතු ප්‍රධානම කාරණය. එතැනට තමයි අප යා යුතුව තිබෙන්නේ. එය පියවර ගණනාවකින් යා යුතු ක්‍රියාවලියක්. අපට එතැනට යෑමට යම් මට්ටමකින් හැකියාවක් ලැබෙන්නේ නැත්නම්, අඩුම වශයෙන් එහි පළමුවැනි පියවරේදී අපි මේ ජාතික ප්‍රතිපත්තිය හදලා, ඒ ජාතික ප්‍රතිපත්තියට අවශ්‍ය පනත් කෙටුම්පත් නිර්මාණය කර ගෙන, ඒ සඳහා අවශ්‍ය නීති රෙගුලාසි සම්මත කර ගෙන, ගැසට් හරහා යම් යම් නියෝග ඇති කර ගෙන මේ ජාතික ප්‍රතිපත්තිය වඩාත් විධිමත් ආකාරයකට ස්ථාපනය කරන්න කටයුතු කරන්න ඕනෑ. ජාතික ප්‍රතිපත්තිය විතරක් ස්ථාපනය කරලා මදි. මම කලින් සඳහන් කළ විධියට ඊළඟට වැදගත් වන්නේ ආයතනික රාමුවයි. ජාතික ප්‍රතිපත්තිය තිබුණාට මදි. ජාතික ප්‍රතිපත්තිය මත පදනම් වූ ආයතනික රාමුවක් අවශ්‍යයි. ඊ ළඟ පියවර විධියට අපි ආයතනික රාමුව ගොඩ නඟන්න ඕනෑ. ඒ ආයතනික රාමුව මත ආයතන බිහි කරන්න ඕනෑ.

සමහර රටවල ජනාධිපතිවරයාට වග කියන, සමහර රටවල අග්‍රාමාත්‍යවරයාට වග කියන, ඇතැම් රටක මුදල් අමාත්‍යවරයා යටතේ නියාමනය වන ආයතන තිබෙනවා. ඒ ආයතනික රාමුව තුළින් ඒ ආයතන බිහි කර ගන්න වුවමනායි. ඒ ආයතන බිහි කර ගැනීම තුළින් ජාතික ඇගැයීමේ ප්‍රතිපත්තියේ සඳහන් මූලික කාරණා වඩාත් සූක්ෂ්ම හා වඩාත් නිශ්චිත කාරණා බවට පත් කර ගෙන කෙටි කාලීන, මැදි කාලීන, දිගු කාලීන ක්‍රියා මාර්ග හරහා ජනතාව අතරට ගෙන යන්න අපට පුළුවන් වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද මේ යෝජනාව ඉදිරිපත් කිරීම තුළින් බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. මේ රටේ ජනතාව එක්ක, ඒ වාගේම මහ ජන මුදල් තිබුණු භාණ්ඩාගාරයත් එක්ක සෙල්ලම් කරපු අතීතයක්, එහෙම වකවානුවක් අපේ රටේ තිබුණා. ඒ වාගේම ඒ සංවර්ධන ව්‍යාපෘති හුදෙක් ප්‍රචාරාත්මක ව්‍යාපෘති හෝ මුදල් ගිලින මකරුන් යක්ෂයන් විධියට අපි දැකපු යුගයක් තිබුණා. ඒවායේ ප්‍රායෝගික සත්‍යය අපි එදා දැක්කා. ඒ නිසා අද අවශ්‍ය වෙලා තිබෙන්නේ, මේ ජාතික ඇගැයීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම හරහා මේ රටේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන සෑම සංවර්ධන ව්‍යාපෘති පිළිබඳවම, මහජන මුදල් වියදම් කරන සෑම සංවර්ධන ව්‍යාපෘති පිළිබඳවම, විදේශ ණය, ආධාර, ප්‍රදාන ලබා ගන්නා සියලුම ව්‍යාපෘති පිළිබඳවම ආපසු විභාවක් ඇගැයීමක් කර, ඒ ඇගැයීම හරහා ඒ ව්‍යාපෘතිවල අඩු ලුහුඬුකම් තිබෙනවා නම් ඒවා නිවැරදි කර ගැනීමයි. ඒ වාගේම මින් ඉදිරියට ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරද්දී එහෙම අඩුලුහුඬුකම් සිදු නොවන්නට ක්‍රමවේද සකස් කර ගැනීමයි.

එදා 1930දී දිවංගත ඩී.එස්. සේනානායක මැතිතුමා ගල් ඔය සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරද්දී කිව්වේ, "කපුටන්ට වැඩිය ලොකු මදුරුවන්ට අභිංසක ජනතාව ගොදුරු කරලා මැලේරියාව හදන්නයි මේ කැලෑ ජෝන් හදන්නේ" කියලා. එහෙමයි එදා ඩී.එස්. සේනානායක අගමැතිතුමාට අපහාස කළේ. තිස් අවුරුදු මහවැලිය "කඩිනම් මහවැලිය" නමින් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා වෙනස් කරමින්, කඩිනම් මහවැලිය හරහා ආර්ථික සෞභාග්‍යයක්, කෘෂිකාර්මික නවෝදයක්, බලශක්තියේ පරිවර්තනීය පිම්මක් ඇති කරන්න ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, දිවංගත ගාමිණී දිසානායක මැතිතුමාත් එක්ක අත්වැල් බැඳ ගනිද්දී ඒ ගැනත් විවිධ දේවල් සඳහන් කළා. නමුත් අද අපට පෙනෙනවා ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල. හැබැයි, ඒ ප්‍රතිඵල ඇගැයීමේ ක්‍රමවේදයක් තිබුණා නම් එකී ව්‍යාපෘතිවල ඵලදායිතාව තවත් වැඩි කර ගන්න පුළුවන්කම තිබුණා. ඒ නිසා මා අවසාන වශයෙන් සඳහන් කරන්න කැමැතියි, ජනතාව සුවපත් කරන යහ පාලන රජය, ජනතාවගේ අනාගතය ගැන හිතන යහපාලන රජය ජාතික ප්‍රතිපත්ති හඳුන්වා දීමේදී, අත්හල නොහැකි, අනිවාර්යයෙන්ම ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කළ යුතු වැදගත්ම කාරණයක් වන රටේ ජාතික ඇගැයීමේ ප්‍රතිපත්තියක් සඳහා වන සංවාදයක් ඇති කළ යුතු බව. ඒ හරහා එවැනි ප්‍රතිපත්තියක් පිළිබඳ මූලික රාමුව ඇතුළත් ධවල පත්‍රිකාවක් සකස් කර, එය යළි සංවාදකොට අවසානයේදී ජාතික ඇගයීමේ ප්‍රතිපත්තියක් හදා ගෙන, ඒ තුළින් ආයතනික රාමුවක් ගොඩ නඟාගෙන, ඒ හරහා අවශ්‍ය ආයතන ගොඩ නඟාගෙන වඩාත් සංවිධිත හා විධිමත් ආකාරයෙන් මේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බව සඳහන් කරන්න කැමැතියි. ඒ සඳහා මේ සභාවේ අදින් අරඹන සංවාදයත් ඉවහල් වේවි කියලා බලාපොරොත්තු වෙමින් මගේ අදහස් ස්වල්පය සමාප්ත කරනවා. බොහොම ස්තුතියි.

[6.41 p.m.]

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)

Thank you, Hon. Presiding Member, for giving me this opportunity. I think it is a timely Adjournment Motion regarding the problems faced by Sri Lanka in the development projects as one of the smallest Asian countries.

I am really thankful to the Hon. Speaker for giving the Hon. Thilakarajah and myself an opportunity to take part in the Asian Parliamentary Association in Pakistan a few weeks back where 43 countries took part. Hon. Members of Parliament and Senators from all the Asian countries were present there. The same problems that we face here are faced by almost all the other countries. We all stressed the problems faced by the South East Asian countries including Sri Lanka and realized the problems faced by all the countries are almost the same. Sir, I followed the speech made by the Hon. Buddhika Pathiran. The same pattern was followed there. We had long discussions with the Hon. Members of Parliament and the Senators there. Actually, we must thank the Government of Pakistan and also the Chairman of the Senate of Pakistan for organizing this event. We mostly discussed trade and problems faced by all these countries. I would like to table* the speech made there by myself.

Every country represented in that Association is experiencing the same problems we are facing here today. We spoke about trade. In fact, both of us had a discussion with the Chairman of the Senate for 15 minutes where we discussed trade relations between

---

පුස්තකාලයේ තබා ඇත.
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මොහොමඩ් නවවි මහතා]

Pakistan and Sri Lanka. There we stressed that we had a good relationship earlier with the Pakistan Government. We told them that they helped us to win the war. Similarly, we reminded them about the Bangladesh war where our previous Government allowed their planes to be landed here and proceeded to Bangladesh. Actually, they are very keen to improve the industries of our country. Also, we brought to their notice the houses built by the Indian Government and requested that they follow suit. Now time has come for us to get together. We must get the help of the other countries also.

When we take the industries or the mega projects implemented in this country, they have been a real failure. That is why we are facing all these problems today. So, we must think of a future where we can make people happy and peaceful by developing our trade and industries. As you know, certain industries were started by the previous Government taking big loans, but what happened was they have been a failure. For instances, take the Mattala Airport, the Harbour and the Cricket Stadium in the Hambantota District. I do not think they have played at least ten matches a year in the Cricket Stadium in Hambantota. So, this is the situation.

I must also speak about the SriLankan Airlines. I read in the newspapers that there are only 23 flights for SriLankan Airlines whereas there are 300 pilots and 8,000 employees. This is the situation. Every organization in this country is facing this problem. So, to bring in a peaceful existence for our people, we have to concentrate on these things. It is useless speaking of the past because the damage is already done. Actually speaking they have spent billions unnecessarily. Why we are facing this situation is because the expected income from all those mega projects which were done earlier is not coming. That is why the Treasury has to pay. In fact, it must be corrected.

The former Minister of Sports is not here. There are several cricket grounds available in the country. In Colombo, there are three or four stadiums. In Kandy, there is the Asgiriya Stadium. In Dambulla, there is a stadium. But what did they do? They did not improve the Asgiriya Stadium. Without doing that they opened another. Look at the stadium in Hambantota. I think, only elephants are there now. I am a big fan of cricket. I think they did not play even ten matches in Hambantota for the last two to three years. Millions of rupees have been wasted to maintain that stadium. This is the situation our country is in today.

Take for instance the CTB. The CTB is facing the same plight. Although there are 2,000 odd buses there are only 1,600 drivers and 1,400 conductors but there are 8,000 employees doing nothing. All these things will have to be put right.

I know that His Excellency the President and the Hon. Prime Minister together with the Cabinet are trying to bring all these things under control. Of course, it will take some time. It cannot be done overnight. It is only twelve months since our Government came into power. I do not think it is possible to solve all these problems within twelve months. However, gradually we can improve the situation and our industries and agriculture will help us move forward.

Thank you.

[6.49 p.m.]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

Hon. Presiding Member, thank you very much for the opportunity given to me to speak on this important subject, evaluation of development and making policies. I thank Hon. Buddhika Pathirana for moving this timely Adjournment Motion. I also thank the Hon. Speaker for giving me this opportunity to participate in the forum in Pakistan which focused on adopting legislation to support the implementation of Sustainable Development Goals adopted in September last year in New York.

I was able to put forward some suggestions at this Standing Committee of Asian Parliamentary Assembly on Economic and Sustainable Development Affairs. Both as a member country and as a Parliamentarian, we actively participated and we were able to get some experience from the other countries that participated from the Asian Region. Forty-two countries were there. They were discussing the adoption of legislation with regard to Sustainable Development Goals.

I heard the concept of sustainable development during my college days and we were taught that we must reach that in next 10 years - it was in early 1990's. Then I heard the concept of "Millennium Development Goals". It was determined in the year 2000 and it was said that we must reach the 10 goals. It was a global concept. Globally we had to reach the Millennium Development Goals. Then again I heard the same wordings, but with some developments to the Millennium Development Goals. It was called, “Sustainable Development Goals”, which was determined in September last year. Those goals should be reached by 2030. That UN Summit was held in New York. I was able to participate in that Summit as a civil society member. Even though I was a Member of Parliament- I was a new Member in September, 2015 - I was able to sit at that table where it was determined. There I understood that there are 17 goals to be achieved by 2030 to reach sustainable development. The main aspects are environment, poverty alleviation and there are so many other things that I will not describe here. We all know those aspects. But, at this juncture, what are the experiences that we can get from our neighbour countries? There was the Speaker from Bhutan. He was

explaining that they were able to plant 50,000 trees a year to preserve their environment for a better future. There was a Senator from Pakistan. They were introducing a proactive Parliament. They call it, "Green Parliament".

The entire roof of their House of Parliament is covered with solar power panels and they produce electricity for the Upper House and the Lower House. They have taken this step to strengthen their development plan and as an example project on how to achieve Sustainable Development Goals and promote environmental protection.

As a representative of a member country, I was able to put forward some suggestions to the Standing Committee on how to adopt legislations to attain these Sustainable Development Goals. As the Hon. Member who moved the Motion said, we must have a policy and we must have a plan. If we look at the portfolio of His Excellency the President, we can see that there is special emphasis on environmental protection. So, it is related to Sustainable Development Goals. In order to achieve the Sustainable Development Goals we must have concern on our environment when implementing development activities. But we are not bothered about the environment when we implement our development activities and later on we suffer from their consequences such as landslides which is a threat to our environment.

The Hon. Prime Minister has now introduced a Sectoral Oversight Committee system to Parliament. Therefore, as Members of Parliament who represent these Sectoral Oversight Committees, we have an opportunity to discuss matters that come under various ministerial portfolios in Parliament itself and enhance the activities of each and every Ministry.

When you take the 17 goals which were determined by the UN Summit, you can see that these 17 goals come under17 ministerial portfolios of our country. For example, the subject of poverty alleviation goes to one Ministry and subject of environment goes to another Ministry. Likewise, every Ministry should take part in this process of reaping the benefits of Sustainable Development Goals to our country.

Therefore, what I am asking is, why can we not have a Standing Committee or an Oversight Committee or a Task Force especially to achieve these Sustainable Development Goals? Then, such a Committee would have the responsibility to implement what we are suggesting and it could see as to how these goals are going to be achieved by each and every Ministry in the next 15 years. So, we have a responsibility in this regard.

I put forwarded this suggestion to the Asian Parliamentary Assembly. Then we personally met the Chairman of the Senate of Pakistan and we discussed how we can carry this forward. We can introduce this to all the Parliaments who represent the Asian Parliamentary Assembly and then we can take part in this development process as a region and see as to how we can adopt this implementation process in order to achieve these Sustainable Development Goals in every country. That is one of our suggestions. So, it can be worked out in order to uplift and evaluate the implementation process of the Sustainable Development Goals.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 6.56]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජාතික ඇගයීම් ප්‍රතිපත්ති සකස් කිරීම සම්බන්ධයෙන් විවාදයට සම්බන්ධවීමට ලැබීම සතුටට කරුණක් බව මා සඳහන් කරන්න ඕනෑ. අපේ රට 1948 වර්ෂයේදී නිදහස ලැබුවාට පස්සේ මුලින්ම අම්පාර ගල්ඔය ව්‍යාපෘතියයි පටන් ගත්තේ. එදා ලංකා රාජ්‍යයේ මුදලින්ම ක්‍රියාත්මක වෙච්ච මෙම ව්‍යාපෘතිය සාර්ථක ව්‍යාපෘතියක් බවට පත් වුණා. ඊළඟට දේශපාලන පසු බිමත් එක්ක අපි විවිධ ව්‍යාපෘති මේ රටේ ක්‍රියාත්මක කළා. ඒ අතරින් පංච විල් ඇතුළු මහවැලි ව්‍යාපෘතිය විශේෂ ව්‍යාපෘතියක් බවට පත් වුණා. මේ සංවර්ධනය 2005 වර්ෂය දක්වා යම් යම් අඩු පාඩු තිබුණත්, සාර්ථකව සිදු වුණා. නමුත්, 2005 වර්ෂයෙන් පස්සේ සංවර්ධනය වෙනත් පැත්තකට හැරුණා. පසු ගිය කාල වකවානු තුළ කරපු සංවර්ධනය අද වන විට අපේ රටේ පිළිලයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ සංවර්ධන ව්‍යාපෘති සඳහා ගත්ත ණය අද ගෙවා ගන්න බැරි මට්ටමට ඇවිල්ලා තිබෙනවා. එතැනදී අනිවාර්යෙන්ම ජාතික ඇගයීමේ ප්‍රතිපත්තියක අවශ්‍යතාව ඉස්මතු වෙලා තිබෙනවා.

පසු ගිය ආණ්ඩුවලින් සිද්ධ වුණු අඩු පාඩු නිසා අද රට සංවර්ධනය කර ගැනීමේ අපහසුතාවට මුහුණ පා තිබෙනවා. එම නිසා අනිවාර්යයෙන් මේ ජාතික ඇගයීම් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ඊට ආනුෂංගික ආයතන ඇති කරලා, මේකට අවශ්‍ය කරන දේශපාලන නායකත්වය ලබා දීලා, මේ ඇගයීම් බොහොම සාධාරණ මට්ටමින් දේශපාලන භේදයකින් තොරව ඉදිරියට ක්‍රියාත්මක විය යුතු යෝජනාවක් විධියට මම දකිනවා. එහෙම වුණා නම්, අපිට අද මුහුණ පෑමට තිබෙන තත්ත්වය මීට වඩා වෙනස් වෙන්න ඉඩ තිබුණා.

මේ ගරු සභාවේ කථා කළ ගරු මන්ත්‍රීවරුන්ගේ කථාවලදී කියැවුණා, වීරකැටිය ව්‍යාපෘතිය අද නිකම්ම නිකම් පස් ගොඩක් බවට පත් වෙලා තිබෙනවා කියලා. මේ වාගේ අසාර්ථක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට විතරක් නොවෙයි, ඒ තුළින් මුදල් හම්බ කිරීම පවා පසු ගිය කාලයේ සිද්ධ වුණා. ඒ හරහා විවිධ අක්‍රමිකතා සිද්ධ වුණා. මේ අක්‍රමිකතාවලට අවසානයේදී වන්දි ගෙවන්න වුණේ මේ රටේ ජනතාවටයි. එම නිසා ඉදිරියේදී මේ තත්ත්වය ඇති නොවීමටත්, ඒ වාගේම ඉදිරියේදී ඇති වන ව්‍යාපෘති යෝජනා

[ගරු වන්දිම ගමගේ මහතා]

සාර්ථකව ක්‍රියාත්මක කිරීමටත්, ඇගයීම් ප්‍රතිපත්තියක් සකස් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හැටියට මා දකිනවා. ඒ සඳහා ගෞරවනීය පාර්ලිමේන්තුවට අද මේ ඉදිරිපත් වෙච්ච යෝජනාව සම්මත වෙලා, අදාළ ඇමතිතුමාගේ අවධානයත් එක්ක ඉදිරියේදී සාර්ථක ඇගයීම් ප්‍රතිපත්තියක් මේ රට වෙනුවෙන් අපේ කාල වකවානුව තුළ නිර්මාණය කරන්න හැකි වෙයි කියලා මා විශ්වාස කරනවා. ඒ හරහා ඉදිරියේදී මේ රටේ සංවර්ධනයට විශාල පිටිවහලක් අනිවාර්යෙන්ම සිදු වන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

[අ.භා. 6.59]

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ජාතික ඇගයීම් ප්‍රතිපත්ති සකස් කිරීම පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මා එතුමාට ස්තුතිවන්න වෙනවා. විශේෂයෙන්ම ඊට පස්සේ කථා කරපු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා මෙම අවශ්‍යතාව ගැන කථා කරද්දී, විශේෂයෙන්ම පසු ගිය වකවානුවේ මේ රටේ සිද්ධ වුණු සංවර්ධනය තුළින් අපේ රටේ ජනතාවට ප්‍රතිලාභ ලැබුණා ද; ඒ ප්‍රතිලාභ තුළින් අපට ආදායම් උත්පාදනය කරලා රටේ ආර්ථිකයට ඒ සංවර්ධන කටයුතුවලින් මොන වාගේ දායකත්වයක් ලැබුණා ද; ඒ සංවර්ධනය කරන්න ගත්ත ණය අද වන විට ගෙවන්න පුළුවන්ද කියන එක පුළුල් කතිකාව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉදිරිපත් වුණා. විශේෂයෙන්ම අපි දැන් මේ රට සංවර්ධනය කිරීමේ දිශාවට හරවා තිබෙනවා. ගෝලීය ආර්ථිකය සමඟ බද්ධ කරලා ගෝලීය ආර්ථිකයේ ප්‍රතිලාභ මේ රටට ගෙන එන ගමන්ම ඒ සම්පත් සාධාරණ ලෙස අපේ ජනතාවට බෙදී යන ආකාරයේ ආර්ථිකයක් සැදීමට අප සියලු දෙනාම ඇප කැප වෙලා ඉන්නවා.

විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ, මේ රටේ මතු පරම්පරා ගණනාවකට ශ්‍රී ලංකාව මේ ලෝකයේ තිබෙන උතුම්ම රට හැටියට නිර්මාණය කිරීමේදී, විශේෂයෙන්ම මේ අවස්ථාවේ අපි ගන්නා තීන්දු තීරණ, සංවර්ධන ක්‍රියා දාමයන්ගේ ප්‍රතිලාභ ජනතාවට හරිහැටි ලැබෙන පරිදි ඒ වැඩසටහන් ක්‍රියාත්මක වෙනවාද කියන එක ඇගයීම ඉතාමත් වැදගත් වෙනවා. විශේෂයෙන්ම යහ පාලන සංකල්පය යටතේ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා නායකත්වය දෙන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය තුළින් කරුණු රාශියක්; මෙවැනි ප්‍රතිපත්ති රාශියක් ගෙන එන්නට අපට හැකියාව තිබුණා. අපි ඒ හැකියාව ශක්තිමත් කර තිබෙන්නේ අද වන විට මේ රටේ ජාතික ආණ්ඩුවක් ස්ථාපනය කර තිබෙන නිසායි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා වන මේ රටේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, එක්සත් ජාතික පක්ෂයේ නායකයා වන අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් එකට ඉඳ ගෙන එකම ප්‍රතිපත්තියක් ඔස්සේ මේ රටේ යහ පාලනය ස්ථාපිත කරලා, ආර්ථික ප්‍රතිපත්තියක් තුළින් ඉදිරියට යන්න පුළුවන් ශක්තිය ඒ දෙදෙනාට තිබුණු නිසා තමයි අපට මේ අවස්ථාව උදා වෙලා තිබෙන්නේ. ඒ තුළින් මේ අවස්ථාවේ කථා කරන ජාතික ඇගයීමේ ප්‍රතිපත්තිය ඉස්සරහට ගෙන යන්නට අප සියලු දෙනාම මේ උත්තරීතර සභාව තුළින් ඒ කටීකාව පටන් ගැනීම පිළිබඳව සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම පසු ගිය සමය ගත්තොත් හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ, නොරොච්චෝලේ විදුලි බලාගාරය කියන ව්‍යාපෘති තුන ගැන අපි විපක්ෂයේ ඉඳගෙන කිව්වා. මේ ව්‍යාපෘති තුනෙන් තමයි අපේ රටේ සංවර්ධනය කඩා වැටුණේ. මේ ව්‍යාපෘතිවලට විශාල වශයෙන් ගත් ණය තමයි ගෙවා ගන්න බැරිව අපේ මතු පරම්පරා ගණනාවකට ගෙවන්නට සිදු වෙලා තිබෙන්නේ. අද සැලැස්මක් අනුව මේ ආර්ථිකයට ඵලදායී වන ආකාරයට ඒ ව්‍යාපෘති සකස් කරන්නට අපට සිද්ධ වෙලා තිබෙනවා. නමුත් එදා මේ ප්‍රතිපත්තිය තිබුණා නම් ඒ ප්‍රතිපත්තිය උඩ විශේෂයෙන්ම අපි සංවර්ධන ව්‍යාපෘතියක් පටන් ගන්න පෙර, ඒ සංවර්ධන ව්‍යාපෘතිය අපේ ආර්ථිකයට බද්ධ කරන්නේ කොහොමද කියලා ඇගයීම, ඒ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන වෙලාවේදී ඒ ප්‍රතිලාභ අපේ ජනතාවට ආවේ කොහොමද කියන ඇගයීම තිබුණා නම් අපට මේ අඩු පාඩු හුහාක් දුරට මහහරවා ගන්න තිබුණාය කියා මා හිතනවා.

විශේෂයෙන්ම ලෝකයේ විවිධ රටවල් මේ ආකාරයට ප්‍රතිපත්ති සකස් කරලා ඒ තුළින් ඒගොල්ලන්ගේ පාලනය සහ ඒ සම්පත් නිසියාකරව සංවර්ධන ක්‍රියා දාමයට යොදා ගන්නා හැටි අද මේ සභාව කල් තැබීමේ විවාදයේදී අපි සාකච්ඡා කළා. විශේෂයෙන්ම රජයක් හැටියට අපි පිළිගන්නවා, අපේ සංවර්ධන ක්‍රියා දාමය මුළු රටේ සමස්ත සංවර්ධන ක්‍රියා දාමයත් සමඟ සියලුම පළාත්වල ජනතාවට ඒ ආර්ථික ප්‍රතිලාභ ගන්න පුළුවන් ආකාරයට සකස් කළ යුතුයි කියලා. අපට තිබෙන සීමිත සම්පත් ප්‍රමාණයෙන් මේ රටේ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම, සංවර්ධන අවශ්‍යතා විවිධ පළාත්වලට හඳුන්වා දීම, සංවර්ධන අවශ්‍යතා තුළින් අප ගෝලීය ආර්ථිකයට බද්ධ වීම වාගේම රැකියා උත්පාදනය වැනි විශාල කරුණු ප්‍රමාණයක් මේ තුළින් ඇගයීමකට ලක් කරලා ඉස්සරහට යන්නට ඒ යෝජනාවලිය ඉවහල් වනවා.

විශේෂයෙන් මේ අවස්ථාවේදී අප මතක් කරන්න ඕනෑ, රැකියා දස ලක්ෂයේ වැඩසටහන ගැන. අපේ රටේ තරුණ තරුණියන් හට අපි ඒ වැඩසටහන ක්‍රියාත්මක කරනවා. ඒ වැඩසටහන තුළින් වුණත් හරිහැටි ප්‍රතිලාභ අපේ ජනතාවට ගියොත් තමයි අපේ රටේ ඒ වාගේම අපේ රජයේ සාර්ථකභාවය රඳා පවතින්නේ. මේ වෙන කොට විශාල ව්‍යාපෘති ගණනාවක් ලංකාවේ පටන් අරගෙන තිබෙනවා. අධි වේගී මාර්ග ඉදි කිරීම, නිදහස් වෙළඳ කලාප ඇති කිරීම, සංචාරක ව්‍යාපාර දියුණු කිරීම ඇතුළුව දැවැන්ත සංවර්ධනයක් අද අප රටේ සිදු වෙමින් පවතිනවා.

අපි රුපියල් දසලක්ෂයේ වැඩසටහන ග්‍රාමීය ආර්ථිකය ඉලක්ක කරගෙන, සියලුම ගම් ආවරණය වන පරිදි කරගෙන යනවා. ජනතාවගේ අදහස් උදහස් අරගෙන, දේශපාලන නායකත්වයේ අනුග්‍රහය අරගෙන අද ඒ වැඩසටහන ඉස්සරහට ගෙන යන්නට අපේ අමාත්‍යාංශය, අපි වැඩ කරලා තිබෙනවා. විශේෂයෙන් ලෝකයේ සම්මත මෙවැනි සංවර්ධන ප්‍රතිපත්ති තුළින් අපට ඉස්සරහට යන්නට ශක්තිමත් පදනමක් ඇති වෙනවා කියලා අපි රජයක් හැටියට පිළිගන්නවා.

විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාත් ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමාත් ඉදිරියේදී ජාතික ප්‍රතිපත්තියක් තුළින් අපේ රටේ සංවර්ධනය මීටත් වඩා ශක්තිමත් කරලා, මේ රටට ගලා එන සම්පත් හරිහැටි කළමනාකරණය කරලා, වංචාව හා දූෂණය පිටුවහල් කරලා, විනිවිදභාවයකින් යුතුව අපේ රට යහපාලනයෙන් පිරුණු රටක් හැටියට ඉස්සරහට ගෙන යන්නට කටයුතු කරනවා. ඒ නිසා මේ යෝජනාව ගෙනාපු ගරු මන්ත්‍රීතුමාටත් මේ සම්බන්ධව කථා කරපු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 7.08]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Eran Wickramaratne - Deputy Minister of Public Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ප්‍රථමයෙන්, I would like to say something. Some Members spoke about Sustainable Development Goals and how those could be mainstreamed for development. I am not going to comment on that only for the reason that I think we probably need a separate Adjournment Debate on Sustainable Development Goals itself and how to mainstream it.

There was a reference to Sectoral Oversight Committees and I think this is a very big positive departure from the past Parliaments to this Parliament. One of the functions of these Sectoral Oversight Committees is to ensure that policies - not just the policies of the Government but also Legislator views - are carried out because the present Committees, unlike the Committees in the past which were Consultative Committees, are chaired by backbenchers and that also is a big positive departure from the past. So, it has the oversight function but where it will eventually lead - maybe like in other countries' legislatures- that you will probably be able to propose legislation via the Committees to Parliament which is different to the practice that we have up to today where it is largely the Government that proposes legislation. So, I will not comment more on that.

"අද ජාතික ඇගැයීම් ප්‍රතිපත්තියක් රටට අවශ්‍යයි" කියන මේ කල් තැබීමේ යෝජනාව පිළිබඳව අදහස් කිහිපයක් එකතු කරන්නට මා කැමැතියි. මා පළමුවෙන්ම කියන්නට ඕනෑ, මෙය ඉතාම කාලෝචිත යෝජනාවක් කියලා. අපේ යහ පාලන ආණ්ඩුව මෙය යහ පාලන මූල ධර්මයක් හැටියට පිළිගන්නවා. මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ වාගේම රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ යම්කිසි වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවාය කියලාත් මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. මෙතැන ප්‍රධාන කරුණු දෙකක් තිබෙනවා. එකක් ඇගැයීමයි. අනික් එක අධීක්ෂණයයි. මේ කරුණු දෙකම වැදගත් වනවා; කරුණු දෙකම අවශ්‍යයි. මොකද, සමහර මන්ත්‍රීවරු කථා කරනකොට දැනටමත් තිබෙන උදාහරණ ගැන කියලා, ශ්‍රී ලංකා ගුවන් සේවය ගැන කථා කළා; හම්බන්තොට සිදු වුණු ආයෝජන ගැන කථා කළා. ඒවා පිළිබඳව හරියාකාර ඇගැයීමක් සිදු වුණා නම් අද පවතින තත්ත්වය පවතීද, නැද්ද කියන එකත්, ඒකෙන් ඇති වන ප්‍රයෝජනය ගැනත් අපට හිතන්නට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ආයතන ගැන කථා කරන කොට, රාජ්‍ය ආයතන කොටස් දෙකකට බෙදන්න පුළුවන්. පළමුවන එක, රජයෙන් වාණිජ මට්ටමෙන් කරන ආයතනයි. දෙවන එක, වාණිජමය නොවන දේශපාලන හා සමාජයීය අරමුණු තිබෙන ආයතනයි. මේ රාජ්‍ය ආයතන කොටස් දෙකම ඇගැයීමටයි, අධීක්ෂණයටයි ලක් කරන්නට අවශ්‍යයි. වාණිජමය ආයතන ගැන අපි දැනටමත් වැඩ පිළිවෙළක් කර ගෙන යනවා. අපි ඇගැයීමට ලක් කරන්නේ මොකක්ද කියන එක පැහැදිලි වන්න ඕනෑ. වාණිජමය ආයතනයක් නම් අපි අනිවාර්යෙන්ම බලන්නට ඕනෑ, යොදවන ප්‍රාග්ධනයට ප්‍රතිලාභයක් තිබෙනවාද, නැද්ද කියලා. මොකද, මේ ප්‍රාග්ධනය මහ ජනතාවගේ බදුවලින් ලබා ගන්නා මුදල්. ඒකට ප්‍රතිලාභයක් තිබෙනවාද, නැද්ද කියලා බලන්නට ඕනෑ. ඒ වාගේම ROE, ROI ආයෝජනයටත් ප්‍රතිලාභයක් තිබෙනවාද? සේවය කරන පිරිස දිහා බැලුවොත් ඒ සේවය කරන පිරිසට කාර්යක්ෂම ප්‍රතිලාභයක් තිබෙනවාද, නැද්ද කියලාත් දැනගත යුතුයි. ඒ වාගේම ROA එකටත් ප්‍රතිලාභයක් තිබෙනවාද, නැද්ද කියලාත් දැනගත යුතුයි. දැන් මේ වාණිජමය ආයතන හරහා සමාජයීය හා දේශපාලන අරමුණු ඉෂ්ට කරනවා නම්, ඒ සමාජයීය දේශපාලන අරමුණු ඉෂ්ට කරන්න යම්කිසි වියදමක් දරන්න වෙනවා. එතකොට ඒ වියදම දරන්නේ කවුද? උදාහරණයක් හැටියට ලංකා විදුලිබල මණ්ඩලය ගත්තොත්, ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලිය නිෂ්පාදනය කරන්න යම්කිසි මුදලක් වැය වනවා නම්, ඒ මුදලට වඩා අඩුවෙන් වියදම් කරනවා නම් සමාජයේ යම් කොටසකට අලාභයක් වෙනවා. ඒ අලාභය කොහොමද පියවන්නේ? එය ආයතනයෙන් පියවිය යුතුද එහෙම නැත්නම් එය අය වැය හරහා පියවිය යුතුද, නැද්ද කියන ගැටලුව, ප්‍රශ්නය මතු වනවා. සමාජයීය දේශපාලන අරමුණුවලට අය වැයෙන් මුදල් වෙන් කරලා තමයි කරන්න ඕනෑ. ඒ ආයතනයට ඒ අලාභය පටවන්න බැහැ. නමුත් අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි ආයතන ගත්තොත් ඒවා වාණිජමය ආයතන නොවෙයි.

ඒවාත් ඇගයීම්වලටයි, අධීක්ෂණයටයි ලක් කරන්නට අවශ්‍යයි. ඒක වියදම අනුව වෙන්නට පුළුවන්. නැත්නම් වෙන සමාජයීය මිම්මකින් ඒ ගැන බලන්න ඕනෑ. ඇගයීම, අධීක්ෂණය, ක්‍රමවේදය, තාක්ෂණය, පුහුණුව වැනි දේවල් මේ සඳහා අවශ්‍යයි. අවසාන වශයෙන් මන්ත්‍රීතුමන්ලාගේ දැන ගැනීමට මම මේ කාරණය කියන්නට කැමැතියි. මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ යෝජනාවන් තිබෙනවා. එයින් එක් යෝජනාවක් වන ජාතික ඒකාබද්ධ සංවර්ධන තොරතුරු පද්ධතියක් - Integrated National Development Information System එකක් - දැනටමත් ඇති කර තිබෙනවා. ඒ වාගේම ව්‍යාපෘති ඇගයීමේ තොරතුරු පද්ධතියක්- Evaluation Information System එකක්- තිබෙනවාය කියන එක සඳහන් කරන්නට ඕනෑ. මේවායින් අපට සතුටු වෙන්නට පුළුවන්ද? මේවායින් අපට අවශ්‍ය ප්‍රතිඵල ලැබෙනවාද කියන එක ප්‍රශ්නයක්. සඳහන් කර තිබුණාට මම නම් හිතන්නේ එසේ ලැබෙන්නේ නැහැ කියායි. එසේ නම්, මේ කල්තැබීමේ යෝජනාව බොහොම කාලෝචිත යෝජනාවක්. මේවා පද්ධතිවලින්, ආයතනවලින් පමණක් විසඳෙන ප්‍රශ්න නොවෙයි. එම නිසා මේවා ගැන ගැඹුරට හිතන්නට ඕනෑ. ඒ වාගේම ශ්‍රී ලංකා පසු විපරම් සංගමය -Sri Lanka Evaluation Association - කියා සංගමයක් තිබෙනවා. ඒ හරහා ජාතික ප්‍රතිපත්තියක -National Evaluation Policy එකක- පළමුවන කෙටුම්පත -first draft එක- දැනටමත් සාකච්ඡා වෙමින් පවතිනවා. ඒක මහජනතාවටත් ලබා ගන්නට පුළුවන්. හැම කෙනෙක්ම පර්ශ්වකරුවන් වෙන්නට ඕනෑ. ඊට පසුව ඒක පාර්ලිමේන්තුවට ගෙනෙන්න බලාපොරොත්තු වෙනවා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මේ කටයුත්ත ඉස්සරහට ගෙනියන්න ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් ස්ථාපිත කරන්නටය කියා ගරු මුදල් අමාත්‍යතුමා යෝජනා කරනවා. එතුමාගේ දෙවෙනි යෝජනාවේ ඒ අනු කමිටුවට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන නියෝජනය කරමින් නිලධාරී අනු කමිටුවකුත් පත් කරන්නය කියා සඳහන් කර තිබෙනවා. මෙම ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා ලේකම් කාර්යාලයක් ස්ථාපිත කර එම ඇගයීම් කටයුතු - ව්‍යාපෘති කළමනාකරණය, අයිත්ෂණය - දෙපාර්තමේන්තුව වෙත භාර දෙන්නය කියා තිබෙනවා.

මේ කල්තැබීමේ යෝජනාවේ තිබෙන කරුණු රජය පිළිගන්නවා. ලබන වසරේදී එම යෝජනාව ක්‍රියාවට යොදවන්නට රජය බලාපාරොත්තු වෙනවා. ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටது.

Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා.7.17 ට, 2016 අගෝස්තු 10 වන බදාදා අ.භා.1.00 වන තෙක් කල් තියේය.

அதன்படி பி.ப. 7.17 மணிக்கு பாராளுமன்றம், 2016 ஓகஸ்ட் 10, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 7.17 p.m. until 1.00 p.m. on Wednesday,10th August, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

245 වන කාණ්ඩය - 08 වන කලාපය
தொகுதி 245 - இல. 08
Volume 245 - No. 08

2016 අගෝස්තු 10 වන බදාදා
2016 ஓகஸ்ட் 10, புதன்கிழமை
Wednesday, 09th August, 2016

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :

දෙමළ මාධ්‍ය පෙළ පොත්වලට ශ්‍රී ලංකාවේ සත්‍ය ඉතිහාසය ඇතුළත් කිරීම

ගල් අඟුරු මිලදී ගැනීම සම්බන්ධව පත් කරන ලද ත්‍රිපුද්ගල කමිටුවේ වාර්තාව :

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:

වයඹ හෘද රෝග නිවාරණ සංගමය) සංස්ථාගත කිරීමේ) –]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා-[පළමුවන වර කියවන ලදි

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත :

නියෝග

பிரதான உள்ளடக்கம்

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

தமிழ் மொழிமூலப் பாடநூல்களில் இலங்கையின் உண்மை வரலாற்றை உட்புகுத்தல்

நிலக்கரி கொள்வனவு பற்றிய மூவரடங்கிய குழுவின் அறிக்கை:

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரின் கூற்று

தனி உறுப்பினர் சட்டமூலங்கள்:

வடமேல் மாகாண ஹிருதய நோய் நிவாரண சங்கம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு டக்ளஸ் தேவானந்தா] - முதன்முறை மதிப்பிடப்பட்டது

அளவீட்டு அலகுகள் மற்றும் சேவைகள் சட்டம்:

ஒழுங்குவிதிகள்

PRINCIPAL CONTENTS

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

QUESTIONS POSED TO HON. PRIME MINISTER

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Insertion of True History of Sri Lanka in Tamil Medium Text Books

THREE-MEMBER COMMITTEE REPORT ON PURCHASE OF COAL:

Statement by Minister of Power and Renewable Energy

PRIVATE MEMBERS' BILLS:

North Western Association for Restraint of Heart Disease (Incorporation) – [The Hon. Douglas Devananda] – Read the First time

MEASUREMENT UNITS, STANDARDS AND SERVICES ACT:

Regulations

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 අගෝස්තු 10 වන බදාදා
2016 ஓகஸ்ட் 10, புதன்கிழமை
Wednesday, 10th August, 2016

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசனஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(ii) 2013 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව;

(iii) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 සහ 2014 වර්ෂ සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, 2015 වර්ෂය සඳහා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමිය වෙනුවෙන් මම තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "සත්ව ආහාර (සංශෝධන)" යන පනත් කෙටුම්පත සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු තිලක් මාරපන මහතා
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "අතුරුදහන් වූ

[ගරු තිලක් මාරපන මහතා]

තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත්" යන පනත් කෙටුම්පත සම්බන්ධයෙන්, එම කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ටී. බී. ඒකනායක මහතා - පැමිණ නැත.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - திறன் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Skills Development and Vocational Training)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කොබෙයිගනේ, හෙන්ගමුව, හෙන්ගමුව වත්ත යන ලිපිනයෙහි පදිංචි බී.කේ.ඒ.එල්.ආර්. මතුරට මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ඉහිණිමිටිය, පලතුරු ගම්මානය, අංක එච්.01.ඒ දරන ස්ථානයෙහි පදිංචි එල්.පී.ඩී. ලක්ෂානි නිමේෂිකා ජයසූරිය මෙනවියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) තඹබෝව, අනුරාධපුර පාර, 8 කණුව දරන ස්ථානයෙහි පදිංචි ටී.බී. දයාවති මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රුවන් විජයවර්ධන මහතා - පැමිණ නැත.

ගරු සී.බී. රත්නායක මහතා - පැමිණ නැත.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(මාණ්පුමිකු ජේ.එම්. ආනන්ද කුමාරසිරි)
(The Hon. J.M. Ananda Kumarasiri)
ගරු කථානායකතුමනි, බුස්ස, තුරඟ තරග පිටිය පාර, අංක 12 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ඒ.එල්.එස්. මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු රංජිත් අලුවිහාරේ මහතා
(මාණ්පුමිකු රන්ජිත් අලුවිහාරේ)
(The Hon. Ranjith Aluvihare)
ගරු කථානායකතුමනි, ගලේවල, දඹගොල්ල පාර, "වසන්ත" යන ලිපිනයෙහි පදිංචි ජේ. දයානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, තිස්සමහාරාම, වැලිඅරාගොඩ, අංක106 දරන ස්ථානයෙහි පදිංචි බී. මංගලා ජයන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
ගරු කථානායකතුමනි, කොළඹ 04, දුම්රියපොළ පාර, ඕෂන් ටවර්, 1 සී දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඩී. නාගොඩවිතාන මෙනවියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, කැලණිය, පෙතියාගොඩ, බියගම පාර, අංක 383/1 දරන ස්ථානයෙහි පදිංචි එම්.කේ. අයිරාංගනී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
Hon. Speaker, I present a petition received from Mr. B.A.P.D. Guys of Asiri Mawatha, Mudukatuwa, Marawila.

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seenithamby Yoheswaran)
கௌரவ சபாநாயகர் அவர்களே, மட்டக்களப்பு, திமிலதீவு, டேனியல் சதுக்கம், இலக்கம் 19 எனும் முகவரியில் வதியும் திரு. கணபதிப்பிள்ளை தவராசா அவர்களிடமிருந்து கிடைத்த மனுவைச் சமர்ப்பிக்கின்றேன்.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න
மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
QUESTIONS POSED TO HON. PRIME MINISTER

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ பிரதம அமைச்சர் அவர்களே, வடக்கு மாகாண மீள்குடியேற்றச் செயலணிக்கு 05.07.2016 அன்று அமைச் சரவையில் அங்கீகாரம் வழங்கப்பட்டது உண்மையா?

ஆமெனில், கௌரவ அமைச்சர்களான றிஸாட் பதியுதீன், டீ.எம். சுவாமிநாதன், பைசர் முஸ்தபா ஆகியோர் இச்செயல ணியில் உள்ளார்களா?

ஆமெனில், வடக்கு மாகாண சபை முதலமைச்சரையும் வடக்கு மக்களின் ஆதரவினைப் பெரிதும் பெற்ற பாராளுமன்ற உறுப்பினர்களையும் உள்வாங்காததன் நோக்கம் என்ன?

இல்லையெனில், இச்செயலணியின் செயற்பாட்டை உடன டியாக நிறுத்திவைப்பீர்களா? அல்லது வடக்கு மாகாண சபை முதலமைச்சருடன் வடக்கு மாகாணப் பாராளுமன்ற உறுப்பினர்களையும் இணைத்து இச்செயலணியை நியமிக்க நடவடிக்கை எடுப்பீர்களா?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)

(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

Hon. Speaker, the Central Government has defined responsibilities in respect of the resettlement of the unfortunate people in the North. Therefore, the Cabinet wanted three Ministers to go into this issue and to make proposals as to how we can do this work with better coordination within the Government and also to speed up the process, because we felt that better coordination was required in the Government sector. The three Ministers - the Hon. D.M. Swaminathan, the Hon. Risad Badhiutheen and the Hon. Faiszer Musthapha - were to report in that regard. The first is the Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs, the second is the Minister of Industry and Commerce and the third is the Minister of Provincial Councils and Local Government and they are Ministers in the Cabinet who represent these areas.

They decided that there should be a Director-General appointed with the relevant staff and a task force of the three Ministers to ensure proper implementation. They also wanted the Chief Minister of the Northern Provincial Council to ensure that there was coordination with the Northern Provincial Council and there was no misunderstanding.

So, this is done mainly for the Government to implement its work. Similarly, the Northern Provincial Council also has work. We understand that the Chief Minister and the Board of Ministers are also undertaking work within those areas. Since that work has to be done by the Provincial Council, we have not gone to interfere into the work of the Provincial Council. We have left that as it is. We only wanted some coordination and that is why the Chief Secretary has been called in.

Since the Hon. Member has mentioned, "the Members of Parliament of Northern Province," we can ask the task force to talk to the Members of Parliament of the Northern Province, but we have not included anyone outside the Cabinet Ministers to be there. They can always work together with the Chief Minister and whatever committee or task force that the Chief Minister has established for the Northern Province. We did not want the two to clash. That is all. This seems to be the best arrangement possible. If there is an alternate arrangement that the Chief Minister of the Provincial Council is contemplating, we can certainly consider it. But, we went on the basis that we had to perform the functions that came to us in accordance with the Constitution and then there were other functions in regard to resettlement, which has to be done by the Provincial Council, the Chief Minister and the Board of Ministers of the Provincial Council.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

Is that solution acceptable to you, Hon. Member?

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)

(The Hon. I. Charles Nirmalanathan)

மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களே, நீங்கள் குறிப் பிட்டதுபோல் பாராளுமன்ற உறுப்பினர்களை உள்வாங்குவது எங்களது நோக்கமல்ல. வடக்கு மாகாணத்தில் உள்ள தமிழர்கள் வடக்கு மாகாண சபையையும் தமிழ்த் தேசியக் கூட்டமைப்பையும்தான் மிகவும் நம்பியிருக்கின்றார்கள். அப்படியிருக்கையில் வடக்கு மாகாணத்தில் மீள்குடியேற்றம் செய்கின்றபோது வடக்கு மாகாண முதலமைச்சரை உள்வாங் காமல் நீங்கள் மத்திய அமைச்சில் அங்கம் வகிக்கின்ற மூன்று அமைச்சர்களை உள்வாங்கி மீள்குடியேற்றம் செய்ய நினைப்பது, மக்கள் மத்தியில் ஒரு சந்தேகத்தை ஏற்படுத்தி யிருக்கின்றது. அதேநேரம் வடக்கு மாகாண சபையிலும் அதற்கெதிரான தீர்மானம் நிறைவேற்றப்பட்டிருக்கின்றது. இந்தச் செயலணியில் உள்ள அமைச்சர்களுடன் சம அந்தஸ் துள்ள அதிகாரத்தில் கௌரவ முதலமைச்சர் விக்கினேஸ்வரன் அவர்களும் இடம்பெறவேண்டும் என்பதுதான் உறுப்பினர் களாகிய எங்களுடைய விருப்பமாகவும் மக்களுடைய விருப்பமாகவும் உள்ளது. ஏனென்றால், வடக்கு மாகாண முதலமைச்சர் இல்லாத ஒரு மீள்குடியேற்றச் செயலணியில் எவ்வளவு உண்மைத்தன்மை இருக்குமென்று எங்களால் சொல்ல முடியாது.

அதேநேரத்தில் மாண்புமிகு பிரதம அமைச்சர் அவர்கள் ஒன்றை விளங்கிக்கொள்ளவேண்டும். இந்த மீள்குடியேற்றச் செயலணியில் அங்கம் வகிக்கின்ற வடக்கு மாகாணத்தைச் சேர்ந்த

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]

[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]

[Expunged on the order of the Chair.]

அவர்கள் கடந்த காலத்தில் முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷவின் மகனென்று தன்னை அடையாளப்படுத்தியவர். இவர் கடந்த ஆட்சியில் நீதிமன்றத்திற்குக் கற்களால் எறிந்து, நீதிபதியைத் தொலைபேசியில் மிரட்டியவர். இவருக்கெதிராக FCID இல் வழக்குக்கூடத் தொரடப்பட்டிருக்கின்றது. இப்படிப் பட்ட ஓர் அமைச்சரை நீங்கள் இந்த மீள்குடியேற்றச் செயலணியில் நியமித்ததால் இந்தச் செயலணி உண்மைத் தன்மையாக இயங்குமா? என்ற மிகப்பெரியதொரு அச்சம் மக்கள் மத்தியில் ஏற்பட்டிருக்கின்றது. அவருடைய கடந்த காலச் செயற்பாடுகளை நீங்கள் நன்கு அறிவீர்கள். அரசியற் காரணங்களுக்காக நீங்கள் அவரைச் சேர்த்துவைத்திருக் கலாம். ஆனால், அவர் மீள்குடியேற்றச் செயலணியில் இணைத்துக்கொள்ளப்பட்டதால் மக்கள் மிகவும் அச்சமடைந் திருக்கிறார்கள். உண்மையில் நீங்கள் நல்லாட்சி, நல்லிணக்கம் என்ற ரீதியில் தற்போது அரசாங்கத்தை நடத்திக் கொண்டிருக் கிறீர்கள். அப்படியானால், இந்த வடக்கு மாகாண மீள்குடியேற்றச் செயலணியில் முதலமைச்சர் சீ.வி. விக்கினேஸ்வரன் அவர்கள் இடம்பெறவேண்டும் என்பது மக்களுடைய கோரிக்கையாகவும் எங்களுடைய கோரிக்கை யாகவும் இருக்கின்றது. அவ்வாறு முதலமைச்சர் இல்லாத ஒரு செயலணியில் உண்மைத்தன்மை இருக்கும் என்பதை மக்கள் நம்பவில்லை.

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

அதேநேரத்தில், ஆரம்ப காலங்களில், அதாவது யுத்தத்திற்கு முன்பு அங்கு இருந்த சிங்கள மக்களை மீள்குடியேற்றம் செய்வதற்கோ அல்லது யுத்தத்திற்கு முன்பு இருந்த முஸ்லிம் மக்களை மீள்குடியேற்றம் செய்வதற்கோ வடக்கில் உள்ள அரசியல் பிரதிநிதிகளால் எந்தவிதமான எதிர்ப்பும் தெரிவிக்கப் படவில்லை. அப்படியிருக்கின்றபோது மத்திய அரசாங்கத்தில் பல அமைச்சுக்கள் இருக்கின்றபோதும் மீள்குடியேற்றத்திற் கென்று மட்டும் தனியான செயலணி ஏன் உருவாக்கப்பட்டது? அப்படி உருவாக்கப்பட்டதன் நோக்கம் எங்களுக்குச் சந்தேகத்தை உண்டுபண்ணியிருக்கின்றது. வடக்கிலுள்ள தமிழ் மக்களுக்கெதிராக உருவாக்கப்பட்ட செயலணியாகத்தான் நாங்கள் இதனைப் பார்க்கின்றோம். ஆகவே, மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களே, இந்த வடக்கு மாகாண மீள்குடியேற்றச் செயலணியில் வடக்கு மாகாண முதலமைச்சர் அவர்களும் இணைந்து செயற்பட்டால் அதில் நல்லிணக் கத்தைக் காணமுடியும். இப்போது அந்தச் செயலணியில் அவர் இல்லாமலிருப்பதால் அது தொடர்பில் மக்கள் மிகவும் அச்சத்திலிருக்கின்றார்கள். இது மீண்டும் பிரிவினைகளை ஏற்படுத்தக்கூடிய வாய்ப்பைத் தோற்றுவிக்கும். எனவே, மாண்புமிகு பிரதம அமைச்சர் அவர்கள் இதற்குரிய பதிலைத் தற்போது வழங்கினால் நன்றாக இருக்குமெனத் தெரிவித்துக் கொள்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Prime Minister, please.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Hon. Speaker, actually the work is being carried out. There are people who have returned to their places of origin after normalcy has been achieved; there are those who have returned to their places of origin but not living permanently due to lack of housing and other facilities; there are those who have deregistered in the place of displacement willing to return and unable to return and there are those who have integrated with the host family therefore not willing to return.

So, it is a question of the measures that has to be taken. In order to address these issues arising from lack of status, there is a circular issued by the Ministry of Public Administration. Secondly, there is registration of electors under the Elections Act. Thirdly, there were monies that had been voted for the Ministry of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs for resettlement of these people. Finally, determining the number of houses that are required and how we are going to build them - there is already a controversy about the prefabricated system - then, there were monies for the other items that had to be given either to the relevant Central Government Agencies or to the Provincial Council.

Then there is a question of the Muslims who left Jaffna and went to Puttalam. We have to find out who are the ones who want to live in Puttalam and who want to return and what are the problems that will be there. What we have done is, we have appointed a task force which consists of the Secretary to the Ministry of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs, the Secretary to the Ministry of National Policies and Economic Affairs, the Secretary to the Treasury or a representative from the Ministry of Finance, the Secretary to the Ministry of Provincial Councils and Local Government and of course the Secretary to the Ministry of Industry and Commerce. These are the people who will be there in that task force. In addition, we also have the Chief Secretary of the Northern Province.

But certainly I will ask these Ministers to consult the Chief Minister also in matters that concern them. I do not think it is fair to put the Chief Minister among the Secretaries to these Ministries anyway. Three Cabinet Ministers are overlooking the work as Cabinet Ministers. The task force is there to implement and these Secretaries have been named for that.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
இங்கு நியமிக்கப்பட்டுள்ள மூன்று அமைச்சர்களுடன் நான்காவதாக முதலமைச்சர் விக்கினேஸ்வரன் அவர்களைச் சேர்த்துக்கொள்ள முடியுமா? என்பதுதான் எனது கேள்வி. பிரதம செயலாளர் ஓர் அரசாங்க அதிகாரி. அவர் மக்களுக் குரிய நன்மைகளைக் கதைப்பதற்குச் சில தடைகள் அவருக்கு இருக்கக்கூடும். எனவே, இந்தச் செயலணியில் நான்காவதாகக் கௌரவ விக்கினேஸ்வரன் அவர்களை இணைத்துக்கொள்ள முடியுமா என்பதுதான் இங்கு முக்கியமான விடயம்.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
The task force consists of Secretaries. That is why the Chief Secretary is there. The Cabinet Committee consists of these three Ministers. They appointed a task force of these Secretaries.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
The Chief Secretary என்பவர் ஒரு அரசாங்க அதிகாரி. அவர் அமைச்சர்கள் பணிப்பதைத்தான் செய்வார். அவர் மக்களுடைய விடயங்களைக் கதைக்கமாட்டார்.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
The three Ministers are in a Cabinet Subcommittee. The task force has the Chief Secretary of the Northern Province. We will ask the Cabinet Subcommittee to consult the Chief Minister and have discussions with the Chief Minister from time to time. This is to ensure that the Government does its work properly. Hon. D.M. Swaminathan, would you like to explain this?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)
(The Hon. D.M. Swaminathan - Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs)
Yes

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Okay, you can do that.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
Hon. Speaker -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. I. Charles Nirmalanathan has asked three questions and I think the Hon. Prime Minister has given his answer.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
I think, the Hon. Minister can explain it.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Swaminathan.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
Thank you, Hon. Speaker. With the permission of the Hon. Prime Minister, I wish to state that I have discussed this issue with the co-chairs of the subcommittee appointed by the Cabinet and at any stage, we will be inviting the Chief Minister or any representative from the Northern Provincial Council to discuss any issue in regard to resettlement. So, we are not, in any way, trying to jeopardize the Tamils or the community in Jaffna. They will be invited.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ அமைச்சர் அவர்களே, ஆலோசனைக் குழுவில் முதலமைச்சரைச் சேர்க்கும்படி நான் கேட்கவில்லை. முடிவெடுக்கும் அந்த மூன்று பேருடன் நான்காவது நபராக முதலமைச்சரைச் சேர்த்துக்கொள்ளுமாறுதான் கேட்கின்றோம்.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
That is not a decision that I can take. That is a decision to be taken by the Cabinet of Ministers. It is only the Cabinet of Ministers who can be the Members of the subcommittee but we will be inviting the Chief Minister. There is no reservation on that.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ அமைச்சர் அவர்களே, நான் சொல்லும் விடயம் என்னவென்றால், நீங்கள் மத்திய அரசாங்கத்தால் முடிவெடுத்துச் செயற்படுத்தும் எல்லா விடயங்களையும் மாகாணத்திலுள்ள அரசாங்கமும் மாகாணத்திலுள்ள மக்களும் ஏற்றுக் கொள்ளவேண்டும் என்ற ஓர் அதிகாரத்தில்தான் நீங்கள் செயற்படுகின்றீர்கள். மாகாணத்திலுள்ள எங்களது மக்களையும் இணைத்துச் செய்வதாக இருந்தால் முதலமைச்சரைச் சேர்த்துக்கொள்ளுங்கள்! அதற்கு விரும்பாமல், "நாங்களும் மஹிந்த செய்ததைத்தான் செய்வோம்" என்று நீங்கள் சொல்வதாயின் அதேமாதிரிச் செய்யுங்கள்!

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
Hon. Speaker, I think the Hon. Prime Minister replied to that very clearly, because it is the Cabinet of Ministers who have been appointed for the Cabinet subcommittee. I am reiterating that the Hon. Chief Minister or his representative or any Member of the Northern Provincial Council could make representation to this subcommittee and then we will adhere to their request. That is all we can say. Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, Hon. Prime Minister has explained that it is only the Cabinet Ministers who will be in this subcommittee and also he has given the assurance that the Chief Minister will be consulted at all times, if necessary. So, since it is the policy I do not think, we could argue it any further. We will see how it works.

මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමාගේ ප්‍රශ්නය.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, පසු ගිය රජය සමයේ රාජ්‍ය ගිණුම්වලට ඇතුළත් නොකර ලබා ගත් ණය පිළිබඳව පසු ගිය කාලයේ විශාල ආන්දෝලනාත්මක කථා බහක් සමාජය තුළ ඇති විය. එම නිසා පහත ප්‍රශ්න ඔබතුමා වෙත ඉදිරිපත් කරමි.

1. පසු ගිය රජයේ රාජ්‍ය ගිණුම්වලට ඇතුළත් නොවූ හඳුනා නොගත් ණය කොපමණ ප්‍රමාණයක් මේ වනවිට හඳුනාගෙන ඇද්ද?
2. එම ණය ලබාගෙන ඇති රාජ්‍ය ආයතන කවරේද?
3. එම ණය පියවීමට ගන්නා පියවර කවරේද යන්න මෙම ගරු සභාවට දැනුවත් කරන මෙන් ගරු අගමැතිතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, ජනවාරි මාසයේ 08වැනිදා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා බලයට පත් වන අවස්ථාවේ රටේ

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ආර්ථිකය තවදුරටත් ඉදිරියට ගෙනි යන්නට නොහැකි මට්ටමට ඇද වැටී තිබුණා. ණය ගෙවන්න තවත් ණය ගැනීමත්, පොලී ගෙවන්න තවත් ණය ගැනීමත් සිදු කළ විෂම චක්‍රයකුයි ක්‍රියාත්මක වුණේ. ආණ්ඩුව ඉතා බරපතළ විධියට ණය වී තිබුණා. මේ ණය කන්දරාවේ ප්‍රමාණය හොයා ගැනීමත් ඉතා අසීරු කටයුත්තක් වුණා. ඒ තරම්ම අවිධිමත් විධියටයි ණයගෙන තිබුණේ.

2016 වසරේ අය වැය ලේඛනය සකස් කරද්දිත් රටේ ණය පිළිබඳ සම්පූර්ණ තොරතුරු වාර්තා වී තිබුණේ නැහැ. අය වැයෙන් පසුවත් අපිට නොගෙවූ ණය පිළිබඳව තව තොරතුරු වාර්තා වුණා. මෙතැනදී අපිට පෙනී ගිය තව කරුණක් වූයේ ආණ්ඩුව විවිධ ආයතන හරහා ගත් ණය ප්‍රමාණයන් ආණ්ඩුවේ ආදායම් හැටියට දක්වා ඇති බවයි. මේ නිසා අය වැය පරතරය පිළිබඳව හෝ ලබා ගත් ණය පිළිබඳව හෝ සෑම සංඛ්‍යා ලේඛනයක්ම එළිදරවු වී තිබුණේ නැහැ.

අපි පසු ගිය දෙසැම්බර් මාසයේත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව සමඟත් මේ පිළිබඳව -අපේ අදහස්, වැඩසටහන් ගැන- සාකච්ඡා කළා. ආණ්ඩුවේ ණය පිළිබඳව සහතිකයක් අපට සකස් කරගන්න හැකි වුණේ දෙසැම්බර් මාසයේදීයි. අපි තීරණය කළා මේ දේ හෙළි කරන්න; හංගන්නේ නැතිව මේ සියල්ල අපේ ණයට එකතු කරන්න. රාජ්‍ය ණය පිළිබඳ ඉදිරියේදී තවතවත් තොරතුරු හෙළි විය හැකි නිසා දැනට සහතික කර ඇති ණය ප්‍රමාණයද සියයට 10කින් පමණ ඉහළ යා හැකි බවකුත් අපට පෙනුණා. අප කියන සංඛ්‍යාව මෙතැනින් අවසන් වන්නේ නැහැ. තව මොනවාද එළියට එන්නේ කියා අපි දන්නේ නැහැ. රාජ්‍ය ගනු-දෙනු සම්බන්ධයෙන් පූර්ණ විගණනයක් කරන්න අප තීරණය කළේ ඒ හේතුව නිසායි. පසු ගිය අය වැය අවස්ථාවේදී ගෙවීමට ඇති රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් බිලියන 8,475ක් ලෙස නිල වශයෙන් වාර්තා වී තිබුණා. ඒ කියන්නේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 74.9ක්. 2016 වසරේදී ණය සඳහා ආපසු ගෙවීමේ ප්‍රමාණය රුපියල් බිලියන 1,209යි. මේ මුදලින් රුපියල් බිලියන 647ක් ණය ආපසු ගෙවීම්. ණය මත ගෙවන පොලිය රුපියල් බිලියන 562යි. රාජ්‍ය ව්‍යවසායන් විසින් ගෙවීමට ඇති ණය ප්‍රමාණය ජාතික ණය පද්ධතියට ඇතුළත් කර තිබුණේ නැහැ. දැනට ලැබී ඇති තොරතුරු අනුව රාජ්‍ය ගිණුම්වලට ඇතුළත් නොවූ රාජ්‍ය ආයතන හා අර්ධ රාජ්‍ය ආයතන විසින් ගෙවීමට ඇති හිඟ මුදල්වල එකතුව රුපියල් බිලියන 1,358යි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් බිලියන 424ක්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය රුපියල් බිලියන 240ක්, SriLankan Airlines එක රුපියල් බිලියන 308ක්, ලංකා විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 238ක් ආදි වශයෙන් දිගු ලැයිස්තුවක් තිබෙනවා.

පසු ගිය රජය "සංවර්ධනය කළා" යැයි කියමින් කළ කිසිම දෙයකින් ආර්ථිකය ඉහළට ඔසවා තබන්න කිසිම උත්තේජනයක් ලැබුණේ නැහැ. හම්බන්තොට ඊට හොඳම උදාහරණයක්. ගුවන් තොටු පොළක් හැදුවා, ගුවන් යානා නැහැ. වරායක් හැදුවා, නැව් නැහැ. අපි ආපහු චීනය සමඟ ඒ සම්බන්ධව සාකච්ඡා කරමින් සිටිනවා. මේ ගුවන් තොටු පොළෙන් සහ වරායෙන් වැඩක් ගන්න පුළුවන් අන්දමේ සැලැස්මක් ඔවුන්ට තිබුණේ නැහැ. අඩු තරමින් වරාය හා ගුවන් තොටු පොළ ආශ්‍රිතව කර්මාන්ත කලාපයක් ඉදි කරන්න ඉඩම් වෙන් කිරීමක්වත් සිදු කළේ නැහැ.

මම හිතන්නේ එතැන වෙන් කර තිබුණේ උද්‍යානයකටයි; Botanical Garden එකකටයි. අපි තමයි ඒ ප්‍රදේශයට ගිහිල්ලා පළමුවෙනි වතාවට ඉඩම් වෙන් කළේ. ඔවුන් කළේ අපේ රට ණය උගුලකට සිර කිරීම පමණයි. එම හිතුවක්කාරී ක්‍රියා පිළිවෙත නිසා මේ වන විට අපේ රට රුපියල් ට්‍රිලියන 9.5ක ණය උගුලක සිර වෙලා තිබෙනවා. ඒ කියන්නේ රුපියල් බිලියන 9,500ක ණය උගුලක්. සමහර විට අපේ ණය ප්‍රමාණය රුපියල් බිලියන 10,000ක් වන්නත් පුළුවන්.

2016 පෙබරවාරි 10වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් අනුව මේ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා 2016 මාර්තු 01වැනි දින සිට බලපැවැත්වෙන පරිදි හිටපු ලේකම්වරයකුගේ සභාපතිත්වයෙන් යුත් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරලා තිබෙනවා. එම කමිටුව මඟින් දැනටත් මේ පිළිබඳ විමර්ශන සිදු කරමින් පවතිනවා. සම්පූර්ණ ණය ප්‍රමාණය පිළිබඳව විස්තර සඳහන් කළ හැක්කේ එම වාර්තාව ලැබුණායින් පසුවයි. දැන් අප ඉදිරියේ ඇති එක් අභියෝගයක් වන්නේ මේ ණය උගුලෙන් ගැලවීමයි. ඒ අභියෝගය ජය ගැනීමේ පදනම ජාතික ආණ්ඩුව නිසා ඇති වී තිබෙන බව මම මෙහිදී අවධාරණය කරන්න කැමැතියි. සම්මුතිවාදී ජාතික ආණ්ඩුවක් මඟින් මේ අභියෝගය ජය ගත හැකි බව බහුතර මතයයි. ලෝක ප්‍රජාවගේ මතයත් ඒකයි.

අප මුහුණ දෙන අනෙක් අභියෝගය වන්නේ වත්මන් ගෝලීය ආර්ථික අර්බුදයයි. ඒ අපේ දෙවන අභියෝගයයි. ඒ නිසා අප එක් අතකින් ගෝලීය ආර්ථික අර්බුදයෙන් අපේ රටට සිදු වන බලපෑම් අවම කර ගත යුතුයි. අනෙක් අතින් ණය උගුලේ බලපෑමෙන් මිදිය යුතුයි. රාජ්‍ය ණය පද්ධතියෙන් සහවා තිබූ ණය මුදල් රාජ්‍ය ණය පද්ධතියට එකතු වීම නිසා ඇති වුණු අර්බුද ණය ගෙවීමේ ප්‍රතිව්‍යුහගත කිරීම්වලින් හෝ සමනය කර ගැනීමේ අවස්ථාවද ගෝලීය ආර්ථික අවපාතය නිසා අහිමි වී ගොස් තිබෙනවා. මේවා අපේ ආර්ථිකයට එකතු කළාම අපි ගෙවන්න තිබෙන මුදල් ප්‍රමාණය වැඩි වෙනවා.

කලින් ආණ්ඩුව කළා වාගේ තව තව ණය ගැනීමෙන් මේ ප්‍රශ්නය විසඳා ගන්න බැහැ. අපි ඉන්නා මේ අනතුරුදායක තත්ත්වයෙන් ගොඩ එන්න නම් රටේ ආදායම් වැඩි කර ගත යුතුයි. අපි සිදු කරන්නේ එයයි. ඒ සඳහා වැඩි වශයෙන් ආයෝජන මේ රටට ලබා ගත යුතුයි; රැකියා අවස්ථා වැඩි කර ගත යුතුයි; අපේ නිෂ්පාදන සඳහා වඩාත් පුළුල් විදේශීය වෙළෙඳ පොළක් නිර්මාණය කර ගත යුතුයි; බදු ආදායම් විධිමත් කර ගත යුතුයි.

නවීන ලෝකයට ගැළපෙන පරිදි, වර්තමාන අවශ්‍යතාවන්ට සරිලන පරිදි බදු එකතු කිරීමේ නව ක්‍රමවේදයක් සැකසීම ගැනත් අපගේ අවධානය යොමු වී තිබෙනවා. මෙයට සමගාමීව නව බදු ක්‍රමයක් සහ වැඩි දියුණු කළ ආදායම් රැස් කර ගැනීමේ ක්‍රමවේදයක් 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍යයි. මේ ගැන අප දැනටමත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා ආරම්භ කර තිබෙනවා. ඒ නිසා දැන්වත් පටු දේශපාලන කෝණවලින් නොබලා මේ ගමන යන්න එක් වෙමු; පුළුල්ව සිතමු; ආර්ථික අභියෝගය ජය ගන්න එකට එක්වෙමු. අපි එකාවන්ව මේ අභියෝගය ජය ගැනීමට අවංක චේතනාවෙන් එක් වුවහොත් අපේ රට ඉහළටම ඔසවා තබන්නට හැකි වෙනවා.

නිසි ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම තුළින් මෙරට දළ දේශීය නිෂ්පාදනය 2024 වන විට දෙගුණයක් කර ගැනීමටත්, 2035 වසර වන විට ශ්‍රී ලංකාව ඉහළම ආදායම් ලබන රටක් බවට පත් කිරීමටත් අපට අවකාශ සැලසෙනවා. අපේ රට ඉන්දියන් සාගරයේ ආර්ථික හා මෙහෙයුම් මධ්‍යස්ථානය බවට පත් කිරීමට අපට හැකි වෙතැයි මා බලාපොරොත්තු වෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු අගමැතිතුමනි, මෙවැනි පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. කොළේ වහලා, එහෙමත් නැත්නම් රාජ්‍ය ගිණුම්වලට ඇතුළත් නොකර මේ විධියට ණය

ගත්තේ මේ රටේ ජනතාව රවටන්නද, එහෙම නැත්නම් ලෝක බැංකුව රවටන්නද, එහෙම නැත්නම් කුමන ආයතනයක් රවටන්නද? ගරු අගමැතිතුමා හිතන්නේ කුමක් කළා කියලාද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ජනතාව රවටන්න, ලෝක බැංකුව රවටන්න, සාක්කුව පුරවාගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මේ ණය ගන්න කාලයේ මුදල් ඇමතිවරයා විධියට හිටියේ නිටපු ජනාධිපතිවරයායි. මේ ණය ගැනීම් කළේ එතුමාත් දැනුවත් වෙලාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

අපේ පාර්ලිමේන්තුවේ තිබෙනවා, පොදු මූල්‍ය කොමිටියක්. මම හිතන විධියට එය තිබෙන්නේ සුමන්තිරන් මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන්. ඒ කොමිටියට පුළුවන්, පසු ගිය ආණ්ඩුවේ මුදල් ඇමතිවරයා වශයෙන් කටයුතු කරපු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ඒ කොමිටියට කැඳවලා මේ ප්‍රශ්න අහන්න. එහෙම අහලා ඒ වාර්තාව අපිට ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මී ළඟට, ගරු අනුර දිසානායක මහතාගේ ප්‍රශ්නය.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පිළිතුරු අපේක්ෂාවෙන් මා මෙම ප්‍රශ්නය එතුමාට යොමු කරනවා:

01. පෝර්ට් සිටි ව්‍යාපෘතිය අත් හිටුවීමට රජය තීරණය කළේ ඇයි?

02. එම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට අවසර ලබා දීමට හේතු කවරේද?

03. එම අත් හිටුවීමෙන් පසු අදාළ සමාගම වෙත යම් වන්දියක් ගෙවීමට සිදු වී තිබේද? එසේ නම් එය කවරේද?

04. අවසර ලබා දී තිබෙන්නේ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතට අනුව නිවැරදි ක්‍රමවේදයෙන් යුතුව පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට යටත්වද?

05. මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද කළුගල් හා වැලි ප්‍රමාණයන් කොපමණද? ඒවා සපයා ගන්නා ක්‍රමවේදය කුමක්ද? එම සම්පත්වල දළ වෙළෙඳ පොළ වටිනාකම කවරේද?

06. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ශ්‍රී ලංකා රජය හා අදාළ සමාගම සමඟ අත්සන් කොට ඇති ගිවිසුම් කවරේද? එම ගිවිසුම් සභාගත කරන්නේද? එම ගිවිසුම්වල තිබෙන අඩංගුව පිළිබඳව යම් දළ අදහසක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

පසු ගිය රජය සමයේ ආරම්භ කළ කොළඹ වරාය නගරය ව්‍යාපෘතිය -Colombo Port City Project- නවතා දැමීමට හේතු කිහිපයක් පාදක වුණා. එයින් ප්‍රධානම හේතුව වූයේ එම ව්‍යාපෘතිය සම්බන්ධව සම්පූර්ණ පාරිසරික බලපෑම් ඇගැයීමක් සිදුකර සංවර්ධන බලපත්‍රයක් ලබා ගෙන නොතිබීමයි. ඒ වාගේම රජයේ ප්‍රතිපත්තියට විරුද්ධව චීන සමාගම වෙත සින්නක්කර ඉඩම් ලබා දීමට එවකට රජය එකඟ වෙලා තිබුණා. සාමාන්‍යයෙන් අපේ රටේ සින්නක්කර ඔප්පු හැටියට ඉඩම් ලබා දුන්නේ නැහැ. ඕනෑම සමාගමකට ඉඩම් ලබා දුන්නේ වැඩිම වශයෙන් අවුරුදු 99කටයි. ඒ වාගේම එම ව්‍යාපෘතිය සම්බන්ධ ගිවිසුම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කොට තිබුණේත් නැහැ. එදා පොරොන්දු වුණා, එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාය කියලා. නමුත් එසේ ඉදිරිපත් කළේ නැහැ. එවකට සකසා තිබූ ව්‍යාපෘති ගිවිසුම අනුව ව්‍යාපෘතියෙන් වැඩි වාසි චීන සමාගම සතු වුණා. අපි මේ ගැන හොයා බලන්න නිලධාරි කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව 2015 මාර්තු මාසයේ ව්‍යාපෘතිය තාවකාලිකව අත් හිටුවීමට තීරණය කළා.

පසු ගිය අවුරුද්ද තුළ විධිමත් සහ පූර්ණ පාරිසරික ඇගයීමක් සිදු කර අදාළ ආයතනවලින් කොන්දේසිවලට යටත්ව නිසි අනුමැතියක් සහ සංවර්ධන බලපත්‍රය ලබා ගෙන තිබෙනවා. ඒ කොන්දේසිවලට අනුව පරිසර බලපෑම අවම වන ආකාරයට තමයි මේ මුහුදු ගොඩ කිරීම කළ යුත්තේ. ඒ ගත යුතු පියවර සියල්ලම ඒ වාර්තාවට ඇතුළත් වෙලා තිබෙනවා.

රටේ මහා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කිරීමද කළ යුත්තේ ආර්ථිකයට සෘජු ප්‍රතිලාභ ලබා දිය හැකිවන ආර්ථික දැක්මකට අනුවයි. දැක්මක් නැතිව කරන ව්‍යාපෘතිවලින් පරිසරයට වාගේම රටේ ආර්ථික හා සමාජ තත්ත්වයට දිගුකාලීන හානි ඇතිවන්න පුළුවන්. අප මෑතකදී බස්නාහිර "මෙගාපොලිස්" සැලසුම සකස් කළා. එහිදී බස්නාහිර පළාත ආශ්‍රිතව සිදු කළ සංවර්ධනයන් සහ අවශ්‍යතා පිළිබඳ නිසි අධ්‍යයනයක් සිදු කර ඒ අනුව "පෝට් සිටි" ව්‍යාපෘතියට අවශ්‍ය වෙනස්කම් හඳුනා ගත්තා. ඒ අනුව රටේ සංවර්ධනයට අවශ්‍ය විධියට ව්‍යාපෘතිය සිදු කරන්න තමයි අප දැන් අනුමැතිය ලබා දී තිබෙන්නේ. ඒ අනුව අප සාකච්ඡා කරලා මේ ගිවිසුමේ කොන්දේසිත් සංශෝධනය කර තිබෙනවා.

ජනාධිපතිතුමාගේ සහ මාගේ චීන සංචාරවලදී මේ ව්‍යාපෘතිය ගැන චීන රජය සමඟ සාකච්ඡා කළා. එහිදී අප පෙන්වා දුන්නා මෙම ගිවිසුම තනිකරම ඒකපාර්ශ්වික ගිවිසුමක් බව. එහිදී මෙම ගිවිසුම සාධාරණ තත්ත්වයකට ගෙන එන්න අපට එකඟතාවකට එන්න පුළුවන් වුණා. ඒ අනුව අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ කමිටුවක් පත් කරලා නීතිපති උපදෙස් සමඟ ශ්‍රී ලංකාවට හිතකර කොන්දේසි සහිතව මේ වන විට ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් සකස් කරමින් පවතිනවා. එම ගිවිසුම "මෙගාපොලිස්" අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය සහ ව්‍යාපෘති සමාගම අතර අත්සන් තැබීමට නියමිතයි.

යෝජිත නව ගිවිසුමට අනුව අපි ව්‍යාපෘති සමාගමට සින්නක්කර ඉඩම් ලබා දෙන්නේ නැහැ. රජයට ලැබෙන ඉඩම්වලට පනවා තිබූ සීමා ඉවත් කර තිබෙනවා. ඒ වාගේම night racing වෙනුවට ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයක් ඉදි කරන්න එකඟ වෙලා තිබෙනවා. කලින් ගිවිසුමට අනුව ධීවරයන්ට සිදු වන සමාජ ආර්ථික බලපෑම වෙනුවෙන් රජයට තමයි වගකීම තිබුණේ. නමුත් දැන් ඔවුන් එකඟ වෙලා තිබෙනවා, රුපියල් මිලියන 500ක්

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ඒ වෙනුවෙන් යොදවන්න වාගේම අවශ්‍ය වෙනත් සමාජ පිරිවැය දරන්නත්. අප දැන් අනුමැතිය ලබා දී තිබෙන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබාගත හැකිවන ආකාරයට සැලසුම් කරපු, නිසි පාරිසරික අනුමැතියක් ලබාගෙන, අපට හිතකර ආකාරයට සකස් කළ ගිවිසුමක් අත්සන් කරන්නයි.

පසු ගිය රජය ගිවිසුම අත්සන් කර තිබුණු විධියට මෙම ව්‍යාපෘතිය නැවැත්තුවොත් රජයට විශාල වන්දියක් ගෙවන්න වෙනවා. ව්‍යාපෘති සමාගම ඒ වන කොටත් විශාල ආයෝජනයක් කරලා තිබුණා. ඒත් අප චීන රජය සහ ව්‍යාපෘති සමාගම එක්ක කථා කරලා එකඟතාවකට ආවා, වන්දි ඉල්ලීම ඉවත් කර ගන්න. ඒ අනුව සමාගම වෙත කිසිදු වන්දියක් ගෙවන්න අවශ්‍ය නැහැ. ව්‍යාපෘතියට අයත් සියලු අංශ ඇතුළත්වන සේ සිදු කරන ලද අතිරේක පාරිසරික බලපෑම් ඇගැයීම් වාර්තාව, රජයේ ආයතන සහ විශේෂඥයන්ගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් ඇගැයීමට ලක් කර එම වාර්තාව පිළිබඳ මහජන අදහස් ලබා ගැනීමෙන් අනතුරුව, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාවේ නිර්දේශ සහ මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාව ඇතිව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුකූලව තමයි මෙම අවසරය නිකුත් කරලා තිබෙන්නේ.

මෙම ව්‍යාපෘතිය සඳහා කළු ගල් සහ මීටර් මිලියන 3.45කුත්, වැලි සහ මීටර් මිලියන 65කුත් අවශ්‍ය වන බව ගණන් බලා තිබෙනවා. එම කළු ගල් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල බලපත්‍රලාභී අනුමත ගල් කොරි මඟින් සපයා ගන්නත්, මුහුදු වෙරළේ සිට කිලෝ මීටර් 4ක් ඈත මුහුදෙන් පොම්ප කිරීමෙන් වැලි සපයා ගන්නත් සැලසුම් කර තිබෙනවා. කළු ගල් සහ මීටර් මිලියන 3.45 සඳහා රුපියල් බිලියන 1.83කුත්, වැලි සහ මීටර් මිලියන 65 සඳහා රුපියල් බිලියන 117.14කුත් වැය වන බව ගණන් බලා තිබෙනවා.

අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ, අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ කමිටුව නීතිපති උපදෙස් අනුව සකස් කරනු ලබන නව ගිවිසුම ඉදිරියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම පරණ ගිවිසුමත් අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ඒ ගිවිසුම් දෙකම ගරු සභාවට අපි ඉදිරිපත් කරන්නම්. මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින් මේ සම්බන්ධව විශේෂ ප්‍රකාශයක් ද ඉදිරියේදී සිදු කිරීමට නියමිතයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අගමැතිතුමනි, ඔබතුමා විපක්ෂ නායකවරයා විධියට Port City ව්‍යාපෘතිය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ කරුණු ඉදිරිපත් කර කිව්වා, ඔබතුමා බලයට පත් වූ වහාම මේ ව්‍යාපෘතිය නතර කරනවා කියලා. ඒ බව ඔබතුමාට මතක ඇති. ඒ ව්‍යාපෘතිය නතර කරනවා කියන ප්‍රකාශය තමයි ඔබතුමා මේ පාර්ලිමේන්තුවේදී කළේ. තමුන්නාන්සේලා බලයට පත් වුණාට පසුව මේ ව්‍යාපෘතිය නතර කිරීමේ තීරණයක් ගත්තා. කැබිනට් මාධ්‍ය ප්‍රකාශක රාජිත සේනාරත්න අමාත්‍යවරයා ප්‍රකාශ කර තිබුණා, "මෙම ව්‍යාපෘතිය නතර කිරීමට හේතු සාධක වූයේ ඉන්දියානු රජයේ බලපෑම" කියලා. එතුමා මාධ්‍යවලට එලෙස ප්‍රකාශ කර තිබුණා.

ඒ වාගේම ගයන්ත කරුණාතිලක අමාත්‍යවරයා ප්‍රකාශ කරලා තිබුණා, "මූල්‍යමය වන්දි ගෙවීමක් සිදු කරන්නේ නැහැ, ඒ මූල්‍යමය වන්දි ගෙවීම වෙනුවට හෙක්ටෙයාර දෙකක් අමතර වශයෙන් චීන සමාගමට ලබා දෙන්න එකඟතාවක් පළ වුණා" කියලා. ගරු කථානායකතුමනි, මේ ව්‍යාපෘතිය ආරම්භ කළේ කොහොමද කියලා බැලුවොත්, නිසි පරිසර ඇගැයීම් වාර්තාවක් මෙහිදී සකස් කළේ නැහැ. ආරම්භයේදී මේ ව්‍යාපෘතිය හෙක්ටෙයාර 200ක් ලෙස තිබුණා. හෙක්ටෙයාර 200ක් ගොඩ කිරීම පිළිබඳව තමයි පරිසර ඇගැයීම් වාර්තාව සකස් කළේ. නමුත් මේ ව්‍යාපෘතිය හෙක්ටෙයාර 269 දක්වා වැඩි වෙනවා. ඒ ඉඩම් ප්‍රමාණය වැඩි වීම මත අලුත් පරිසර ඇගැයීම් වාර්තාවක් සකස් කළේ නැහැ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත කොන්දේසි 42කින් සමන්විත අනුමැතියක් ලබා දුන්නා, ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය වන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන්. ඔවුන් කොන්දේසි 42කින් සමන්විත අනුමැතියක් ලබා දුන්නා. එම අනුමැතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලැබීමට ප්‍රථම, චීන සන්නිවේදන ඉදිකිරීම් සමාගම මඟින් 2014 සැප්තැම්බර් මාසයේ 16වැනි දින සිට ගොඩකිරීමේ කටයුතු ආරම්භ කළා. එතකොට, මෙම සමාගම නිසි පරිසර ඇගැයීම් වාර්තාවකින් තොරව, ඒ නියමිත කාලවකවානු තුළ අවශ්‍ය වන වාර්තා සකස් කොට නොවෙයි ගරු කථානායකතුමනි, මේ ව්‍යාපෘතිය ආරම්භ කළේ. නියමිත පරිදි අවශ්‍ය කරුණු සම්පූර්ණ නොකර ව්‍යාපෘතිය ආරම්භ කළා නම්, ඒක ඒ සමාගමේ වැරැද්දක්. ඒ සමාගම තමයි ඒ අවශ්‍ය කටයුතු කරන්න පෙර ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර තිබෙන්නේ. හරි නම්, ඒ ආරම්භ කිරීම වෙනුවෙන් ඒ සමාගම තමයි රජයට වන්දි ගෙවන්න ඕනෑ. හැබැයි, දැන් තමුන්නාන්සේලා එකඟතාවට ඇවිල්ලා තිබෙන දේ මොකක්ද? මා දන්නේ නැහැ, මේ ප්‍රමාණ ගණනය කළේ කොහොමද කියලා. චීන සමාගම කියනවා, මේ ව්‍යාපෘතිය නතර කිරීම නිසා ඩොලර් මිලියන 143ක අලාභයක් සිදු වෙලා තිබෙනවා කියලා. ඩොලර් ලක්ෂ 1,430ක්. ඩොලර් මිලියන 143 ගණනය කළේ කොහොමද කියලා අපි දන්නේ නැහැ. තමුන්නාන්සේත්, ජනාධිපතිවරයාත් චීනයට ගිය ගමනේ ලැබුණු ප්‍රතිලාභ මත, හෙක්ටෙයාර දෙකක් ලබා දෙන්න එකඟතාවට ආවා කියලා තමයි ප්‍රකාශ වෙලා තිබෙන්නේ. පාරිසරික ඇගැයීම් වාර්තාව නිසි පරිදි සකස් නොකොට මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම හේතුකොටගෙන, ඇත්තටම එම සමාගමෙන් නේද ශ්‍රී ලංකා රජය වෙත වන්දි ලබාගත යුතු වන්නේ?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු මන්ත්‍රීතුමනි, මේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම ගැන මේ සභාවේ අවධානය යොමු කරලා ඒ ගැන හොයලා බලන්න පුළුවන්, ගිවිසුම් දෙකම මේ සභාවට ඉදිරිපත් කළාට පස්සේ. මේ ව්‍යාපෘතිය ගැන සම්පූර්ණයෙන්ම ක්‍රියා කළේ වරාය අධිකාරියයි. නීතිපති දෙපාර්තමේන්තුව වරාය අධිකාරියට කිව්වා, "පනත යටතේ මේක කරන්න බලයක් නැහැ. එසේ කරනවා නම් පනත සංශෝධනය කරන්න ඕනෑ. ඒ නිසා අමාත්‍යාංශයේ ලේකම්ගේ නමින් මේ ගිවිසුම් අත්සන් කරන්න" කියලා. නීතිපතිතුමා එහෙම කිව්වාට වරාය අධිකාරිය මේ කටයුතු කළා. වරාය අධිකාරිය ව්‍යාපෘතියට අනුමැතිය දුන්නා. අන්තිමට ගිවිසුම අත්සන් කළා. එතැනදී ලංකා ආණ්ඩුවේ නියමිත නිලධාරියාගේ අනුමැතිය නැති වුණාට, මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න කියලා වරාය අධිකාරිය අනුමැතිය දීලා, වරාය අධිකාරිය පළමුවැනි ගිවිසුමත් අත්සන් කළා. ඇයි, එහෙම වුණේ, කොහොමද එහෙම වුණේ කියලා මේ සභාව හොයලා බලන්න ඕනෑ. ඒ ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ඒ අදාළ ලිපි සියල්ලම ලබා දෙන්න පුළුවන්. නීතිපතිතුමා එවපු ලිපි හා අනෙක් සියලුම දේ ලබා දෙන්න පුළුවන්. ඒවා අපි

දැකලා තිබෙනවා. මෙතැනදී වුණේ මේ ව්‍යාපෘතිය හදිසියේ ආරම්භ කිරීමයි. හදිසියේ ආරම්භ කරපු බව ඒ ලිපි ගනුදෙනුවෙන්ම පෙනෙනවා. චීන සමාගමේ ස්ථාවරය වුණේ, "ශ්‍රී ලංකා වරාය අධිකාරිය අපට කිව්වා වැඩ පටන් ගන්න. ඒ නිසා අපි වැඩ පටන් ගත්තා" කියන එක. එතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒක මේ සභාවෙන්ම හොයා බලන්න ඕනෑ කාරණයක්. ඇත්ත වශයෙන්ම අපි එදා කිව්වේ පරිසර වාර්තා නැතිව මොනවත් ඉදිරියට යන්න බැහැ කියලායි. ඒකයි අපි ඒ වැඩ නැවැත්වුවේ. දෙවනුව අපි කිව්වා, මෙතැනට සින්නක්කර ඔප්පු දෙන්න බැහැ කියලා. ඒ කාරණා දෙක උඩ තමයි අපි සාකච්ඡා කළේ.

ජනාධිපතිතුමාත්, මමත් චීනයට ගියාම ඒ අය එකඟ වුණා, සින්නක්කර ඔප්පු දෙන්න වුවමනා නැහැ කියලා. චීනයේ ප්‍රතිපත්තියත් ඒකයි; මේ රටේ ප්‍රතිපත්තියත් ඒකයි. ඒ සමාගමේ අය කිව්වේ, "අපට මෙහෙම පොරොන්දු වුණා, එහෙම නම් ඒ වෙලාවේ බැහැ කියන්න තිබුණා" කියලා. කෙසේ හෝ මේ ආණ්ඩුවේ අපේ ප්‍රතිපත්තිය අපි ඒ අයට පෙන්වුවා. දෙවනුව, අර පරිසර වාර්තාව අපි අලුතින් ලබා ගත්තා. ඒ පරිසර වාර්තාව අනුව ක්‍රියා කරලා තමයි ආපහු වැඩ පටන් ගන්න ඉඩ දෙන්න තීරණය කළේ. මේ ප්‍රශ්න දෙක තමයි අපට තිබුණේ. නමුත් ඒ අවස්ථාවේදී එතැන තිබුණු තවත් අඩු පාඩුකම් ගණනාවක් අපේ කොමිටියේ නිලධාරීන් පෙන්වලා දුන්නා. ඒවා ගැනත් අපි සාකච්ඡා කළා. ඒ තිබුණු සමහර කරුණු සංශෝධනය කරන්න ඒ අය එකඟ වුණා.

ගරු මන්ත්‍රීතුමනි, මේ ව්‍යාපෘතිය අලුතින් සකස් කරන කොට අපි කිව්වා, night racing tracks වුවමනා නැහැ. කැසිනෝ වට රවුමක් වුවමනා නැහැ කිව්වා. ඒවා නතර කරන විට වැඩිපුර ඉඩම් එකතුවෙද්දී, හෙක්ටෙයාර් දෙකක් අපෙන් ඉල්ලා තිබුණා. කැබිනට් මණ්ඩලයත් කිව්වා, "අපට වන්දි ගෙවන්න බැහැ" කියලා. ඊට පස්සේ අපි කරපු සාකච්ඡාවේදී ඒ ගොල්ලන් වැඩිපුර හෙක්ටෙයාර් දෙක ඉල්ලුවේ නැහැ. ඒ විධියට තමයි මේ වැඩ කටයුතු අවසන් කළේ. ඒ ගොල්ලන්ගේ එහෙම ඉල්ලීමක් තිබුණා. ඊටත් ඉස්සරවෙලා මුදල් ඉල්ලුවා. හැම වේලාවේම මොනවා හරි ඉල්ලුවා. ඒත් අන්තිමට ඒ ආකාරයට එකඟ වුණා. මෙතැන මූල්‍ය නගරයක් ආරම්භ කරන කොට වටිනාකම තව වැඩි වෙනවා. හැම කෙනාටම විශාල දියුණුවක් ඇති වෙනවා. ඉස්සෙල්ලාම ඒ ව්‍යාපෘතිය පටන් ගත්තේ තට්ටු නිවාස හදලා විදේශිකයන්ට ඇවිල්ලා මෙහේ ඉන්න ඉඩ දෙන්නයි. ඒ ගොල්ලන් බලාපොරොත්තු වුණේ පැකර්ගේ කැසිනෝ එකට ඒ අය යවන්නයි. එහෙම නැත්නම් අර බෙරේ වැව ළඟ තිබෙන ජෝන් කීල්ස් ආයතනය ළඟ ආරම්භ කරන්න තිබුණු අනෙක් කැසිනෝ දෙකකට ඕනෑ කට්ටිය මෙතැනින් යවන්නයි බලාපොරොත්තු වුණේ. ඔය ඉඩම් ටික හදන කොට යම් කිසි ඉඩමක් ඉතිරි වෙන්න ඕනෑ. නැත්නම් අපට night racing tracks දාන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි ප්‍රශ්නය මෙයයි.

අපේ රටේ ගොඩබිමේ සෑම භූමියක්ම කවර හෝ පළාත් පාලන ආයතනයකට ඇතුළත් වෙනවා. ඒක වනාන්තරයක් වෙන්න පුළුවන්; ජලාශයක් වෙන්න පුළුවන්; විලක් වෙන්න පුළුවන්; ගොඩබිමක් වෙන්න පුළුවන්. අපේ රටේ මුළු භූමියම යම් යම් පළාත් පාලන ආයතනවලට ඇතුළත්ව තමයි වෙන් කරලා තිබෙන්නේ. මෙතැන හෙක්ටෙයාර් 269කින් යුත් අලුත් භූමියක් එනවා. ඒ අලුතින් හැදෙන භූමිය අපේ රටේ කවර පළාත් පාලන ආයතනයකටද ඇතුළත් වන්නේ කියලා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු මන්ත්‍රීතුමනි, එක පළාතකටවත් අයිති නැහැ. එක දිස්ත්‍රික්කයකටවත් අයිති නැහැ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පස්වැනි ව්‍යවස්ථාව යටතේ මේ දිස්ත්‍රික්ක 25ට අයිති ඒක වෙන්න වුවමනායි. නමුත් ඒක ඒ දිස්ත්‍රික්ක 25ට අයිති වෙලා තිබුණේ නැහැ, ඒකෙන් පිට තිබුණේ. ඒකෙන් හෙක්ටෙයාර් 20ක් සින්නක්කර හැටියට දුන්නා නම්, ඒක ඕනෑ කාලයක් තියාගෙන ඉන්න තිබුණා. අපි ගැසට් එකක් මඟින් අලුතෙන් නීතිය සංශෝධනය කරනවා, මේ ප්‍රදේශය කොළඹ දිස්ත්‍රික්කය ඇතුළට, [බාධා කිරීමක්] අපි ඒ කොටස පාලනය කරන්න කොළඹ නගරය එක්ක එකට එකතු වෙලා වෙනම සංස්ථාවක් දානවා. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේක අපේ රටේ භූමියට අලුතින් එකතු වෙන කොටසක්. ඒක මුහුද ගොඩ කිරීම හරහා අලුතින් භූමියට ඇතුළත් වෙලා තිබෙන කොටසක්. ඒ කොටස අපේ රටේ කවර හෝ පළාත් පාලන ආයතනයකට ඇතුළත් විය යුතුව තිබෙනවා. තමුන්නාන්සේලාගේ ගිවිසුමේ තිබෙන යෝජනාව තමයි, ශ්‍රී ලංකා රජයත්, චීන සමාගමත් ඒකාබද්ධ වූ සංස්ථාවක් හරහා මෙම කොටස පාලනය වෙන්නේ කියන එක.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
නැහැ, චීන රජය නැහැ. මෙතැන ආයතන දෙකක් තිබෙනවා. චීන සමාගමයි - [බාධා කිරීමක්] නැහැ, නැහැ. මන්ත්‍රීතුමනි, දෙකක් තිබෙනවා. එකක්, මේ භූමිය භාර ගන්නා management company එක. ඒක සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා ආණ්ඩුව භාර අරගෙන තිබුණේ. නමුත් අපි කිව්වා චීන සමාගමට දෙන්න කියලා. මොකද, පළමුවැනි කාලයේ තිබෙන්නේ ලාභ නොවෙයි, අලාභ. එහෙත් පාර්ලිමේන්තුවෙන් ඇති කරන සංස්ථාවක් මඟින් තමයි මේ භූමිය පාලනය කරන්නේ. ඒ සංස්ථාවේ සාමාජිකයන් පත් කරන්නේ ලංකා ආණ්ඩුවෙන්. කිසිම ප්‍රාදේශීය සභාවකට අයත් නැති යාල වාගේ සමහර ප්‍රදේශ තිබෙනවා. විල්පත්තුව, යාල වාගේ ප්‍රදේශ කිසිම ප්‍රාදේශීය සභාවකට අයත් වන්නේ නැහැ. මේ ඇති කරන සංස්ථාව මහ ආණ්ඩුව යටතේ තිබෙන සංස්ථාවක්. හෙක්ටෙයාර් 260ක් අපි පාලනය කරනවා. අවශ්‍ය සේවා සියල්ලම කොළඹ මහ නගර සභාවෙන් ලබලා දෙනවා. ඉඩමේ අයිතිය තිබෙන්නේ අපට.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් පැහැදිලි කළා නේ. අපි මේ කාරණය අවසාන කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, විල්පත්තුව ගත්තොත් එහි මුවන් සහ හාවන් ඉන්නවා. යාල ගත්තොත්, එහි කිඹුලන් සහ ඉත්තෑවන් ඉන්නවා. ඒවා වෙනම ප්‍රදේශ. ඒවා නගර සභාවලට සහ පළාත් පාලන ආයතනවලට අයත් වන්නේ නැහැ කියන කාරණය පිළිගන්න පුළුවන්. ඒවා අයත් වන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටයි. එහි පාරවල් සකස් කිරීම, සංවර්ධන කටයුතු සිදු කෙරෙන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන්. හැබැයි, දැන් මෙතැන ගොඩනැහෙන්නේ

[ගරු අනුර දිසානායක මහතා]

වනජීවී ස්ථානයක් නොවෙයි. මේ ප්‍රදේශයේ ව්‍යාපාරික ස්ථාන ගොඩ නැගෙනවා; මිනිස් වාසස්ථානයන් ගොඩ නැගෙනවා. ඒ වාගේම වෙනත් සනීපාරක්ෂක කටයුතුවලට අදාළ ගොඩනැඟීම් සිදු වෙනවා. මේ ස්ථානය කොළඹ නගරයෙන් වෙනස් වන්නේ මුහුදු ගොඩ කර හදන කාරණය නිසා පමණයි. එහෙම නැත්නම් අලුතෙන් හදන buildings නිසා පමණක් වෙන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, මෙය කිසිසේත්ම වෙනම සංස්ථාවක් යටතට ඇතුළත් විය යුතු නැහැ. මේ භූමිය එක්කෝ කොළඹ නගර සභාවට අනුබද්ධ කරන්න ඕනෑ. එක්කෝ පළාත් පාලන ආයතනයක් යටතට ඇතුළත් කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, එහෙම නැතිව සංස්ථාවක් විසින් අපේ රටේ භූමියක් පාලනය කිරීමට යන එක කිසිසේත්ම යෝග්‍ය නැහැ. මේ භූමිය කොළඹ දිස්ත්‍රික් පරිපාලන ඒකකයට ඇතුළත් කරලා තිබුණාට තමුන්නාන්සේලා දැනට සකස් කරමින් පවතින යෝජනාවේ තිබෙන්නේ පළාත් පාලන ආයතනයක් වෙනුවට සංස්ථාවක් ස්ථාපිත කිරීමයි. ඒක වැරැදියි, ගරු කථානායකතුමනි. ඒ වාගේම මේ භූමිය මත පදනම් වූ විෂ්කම්භය ගත්තොත් කිලෝ මීටර් 40ක් වනවා. අරය ගත්තොත් එය කිලෝමීටර් 20ක් වනවා. කිලෝමීටර 20ක අරයකින් යුතු භූමි ප්‍රමාණයක කිසිදු ව්‍යාපෘතියක් රජය විසින් හෝ පෞද්ගලික සමාගමක් විසින් හෝ යළි ඇති නොකළ යුතුයි කියන කොන්දේසියක් ගිවිසුමේ ඇතුළත් කරලා තිබෙනවාද කියලාත් මම දැන ගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)

එහෙම එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මෙතැන අදාළ වන්නේ කාල සීමාවයි. මොකද, ඉස්සෙල්ලා විකුණන ඉඩම්වල මිල අඩු වෙනවා. පස්සේ විකුණන ඉඩම්වල මිල වැඩි වෙනවා. ඒ නිසා අපි පළමුව විකිණීම සඳහා ඉඩම් යම් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. අපට පෙනෙන හැටියට අපට වාසි වෙන්නේ අවසානයේ අපි මේ ඉඩම් ටික විකුණනවා නම් තමයි. බියගම, කටුනායක වෙළඳ කලාප සම්පූර්ණයෙන් පාලනය වුණේ මහ කොළඹ ආර්ථික කොමිසමෙන්. දැන් එයට කියන්නේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කියලායි. ඒ වෙළඳ කලාපවල අක්කර 200,300,400 පාලනය කරනවා.

පනාගොඩ යුද හමුදා කඳවුර සම්පූර්ණයෙන්ම පාලනය කරන්නේ යුද හමුදාව. නමුත් පනාගොඩ හමුදා කඳවුර වටේටම ඇති ප්‍රදේශය අයිති වන්නේ හෝමාගම ප්‍රාදේශීය සභාවටයි. ඕනෑ නම් එහි පදිංචි අයට ගිහින් ඡන්දය දෙන්නත් පුළුවන්. එහෙම කිසිම ප්‍රශ්නයක් නැහැ. තමන්ගේ වැඩ කටයුතු නිසා බියගම නිදහස් වෙළඳ කලාපය තුළ ජීවත්වන අය සිටිනවා. ඒ අයට බියගම නැත්නම් තමන් ඉන්න ප්‍රදේශයට ගිහින් ඡන්දය දෙන්න පුළුවන්. මෙතැන තිබෙන්නේ සාමාන්‍ය සේවා සපයන එක මේ සංස්ථාව බාරගෙන, ඒ සඳහා වැඩ කටයුතු කිරීමයි. එසේ නැතිව වෙන මොකක්ද එතැනින් කරන්නේ? නගර සභා ඡන්දයකදී, තමන් කොළඹ පදිංචිව සිටිනවා නම් කොළඹ නගර සභාවට ඡන්දය දෙන්න පුළුවන්. තමන් පිට ප්‍රදේශයක පදිංචිව ඉන්නවා නම් ඒ ප්‍රදේශයට ගිහින් ඡන්දය දෙන්න පුළුවන්කම තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම එහි වෙළඳ කලාපයක වාගේම වැඩ කටයුතු කෙරෙනවා. ඊට වඩා වෙනසක් නැහැ. [බාධා කිරීම්] ආයෝජන මණ්ඩලයෙන් තමයි අද බියගම නිදහස් වෙළඳ කලාපය, කටුනායක නිදහස් වෙළඳ කලාපය සහ සීතාවක වෙළඳ කලාපය පාලනය වෙන්නේ. ඒක ඇතුළේ ඒ වැඩ කටයුතු සියල්ලම කරන්නේ ආයෝජන මණ්ඩලයයි. එහෙම නැතිව අවිස්සාවේල්ල නගර සභාවත්, සීතාවක ප්‍රාදේශීය සභාවත්, බියගම ප්‍රාදේශීය සභාවත්, කටුනායක නගර සභාවත් නොවෙයි. ඒ වාගේම මේ හෙක්ටයාර් 260 ඇතුළේත් වැඩ කටයුතු කරන්නේ මේ ඇති කරන සංස්ථාවෙන්. සේවා ඔක්කෝම සපයා දෙන්නේ මේ සංස්ථාවෙන්. අපි දැන් කරනවා වාගේම ඒ සංස්ථාවටත් ඕනෑ කරන වතුර ප්‍රමාණය කොළඹ නගර සභාවෙන් මිලදී ගන්නවා. කසළ ඉවත් කරන එකත් මේ සංස්ථාවෙන් කරනවා. කසළ ඉවත් කිරීමේ වැඩ කටයුතු සෘජුවම සංස්ථාව කරන්නේ නැතිව වීන සමාගමක් සමඟ එකතු වෙලා ඒ වැඩ කටයුතු කළමනාකරණය කරනවා. අනෙක් කාරණය තමයි, එතැන ව්‍යාපාර සියල්ලම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියා පදිංචි කරනවා. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වාගේම තමයි මෙතැනත් ඇති කරන්නට යන්නේ. වෙනම පාලනයක් කියලා දෙයක් නැහැ. ඒ ප්‍රදේශයේ ජීවත් වන අය ශ්‍රී ලාංකික ඡන්ද දායකයන් නම්, ඒ අයගේ ඡන්දය අයත් වන්නේ කොළඹ නගර සභා ප්‍රදේශයටයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. අද තව බොහෝ වැඩ කටයුතු තිබෙන දවසක් නිසා අපට කාලය සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නට සිදු වෙනවා. ඉදිරියේදීත් මේ ගැන කරුණු පැහැදිලි කර ගන්නට පුළුවන් නේ. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

මීට කලින් මේ ගිවිසුම් මේ පාර්ලිමේන්තුවට ආවේත් නැහැ. තමුන්නාන්සේලා ගිවිසුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ වැඩ පටන් ගත්තාට පසුව. වැඩ පටන් ගත්තාට පසුව මේ පාර්ලිමේන්තුවට ගිවිසුම් ඉදිරිපත් කරලා වැඩකුත් නැහැ, මේ පාර්ලිමේන්තුවේ විවාද කරලා වැඩකුත් නැහැ. විවාද කරන විට තමුන්නාන්සේලා ගිවිසුම රකින්නට ඕනෑ. තමුන්නාන්සේලා ඒ ගිවිසුමට අනිවාර්යයෙන් බැඳෙනවා. ඒ නිසා ඇත්තටම කළ යුතුව තිබෙන්නේ මෙයයි. තමුන්නාන්සේලා එම ව්‍යාපෘතිය තාවකාලිකව නතර කරලා තිබෙනවා නම් නැවත ආරම්භ කළ යුතු වන්නේ මෙම ගිවිසුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුවයි. ගරු අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම පිළිබඳව පුරෝගාමියා වශයෙන් කටයුතු කරමින් සිටින බව නේ පෙන්වන්නේ. එහෙම නම් දැන් අග්‍රාමාත්‍යතුමා කරන්නට තිබෙන හොඳම කටයුත්ත මෙයයි. එම ගිවිසුම් අත්සන් කොට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ගිවිසුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ඒ පිළිබඳව විවාදයක් කරලා, යම් සංශෝධනයක් තිබෙනවා නම් ඒවාත් සැලකිල්ලට ලක්කිරීමයි. ඊට පසුව ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම පිළිබඳව අවධානය යොමු කරන ලෙස තමයි අපි ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)

ගරු මන්ත්‍රීතුමනි, මුදල් පිළිබඳව කිසිම දෙයක් මෙතැනට අදාළ වෙලා නැහැ. ඒ පිළිබඳ යෝජනා සහ අදාළ නීතිය අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නම්. වුවමනා නම් අපට ඒ ගැන සාකච්ඡා කරන්නට පුළුවන්. අපි ඉස්සෙල්ලා අත්සන් කළ ගිවිසුම සංශෝධනය කරලා නැවත අත්සන් කරලා තිබෙනවා. එහි වැඩ කටයුතු ආරම්භ කරන්නට තිබෙන්නේ එම ගිවිසුම පමණයි. එම ගිවිසුමත්, පරණ ගිවිසුමත් අපි දෙන්නම්. ඉන් පසුව එම සංශෝධනවලට හේතු මොනවාද කියලාත්, එය සිදු වුණේ කොහොමද කියලාත් මේ සභාවේදී සොයා බලන්නට පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.
මීළඟට, ගරු ජයන්ත සමරවීර මහතාගේ ප්‍රශ්නය.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, වාචික පිළිතුරු අපේක්ෂාවෙන් මම ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කරන ප්‍රශ්නය මෙයයි:

(අ) (i) ඉන්දියාව සමඟ එටිකා (ETCA) ගිවිසුම අත්සන් කිරීමට බලාපොරොත්තු වන බව ගරු අග්‍රාමාත්‍යතුමා මෙම ගරු සභාවට සඳහන් කරන්නේද?

(ii) ඊට අදාළ කෙටුම්පත මේ වන විට සකස් කර අවසන් කර තිබේද?

(ආ) (i) එසේ අදාළ කෙටුම්පත සකස් කර අවසන් වී නොමැති නම් ශ්‍රී ලංකා රජයේ පාර්ශ්වයෙන් එය සකස් කිරීමේ කාර්ය භාරය භාරව සිටින්නේ කුමන ආයතනයද, කුමන පුද්ගලයන්ද?

(ii) එම කෙටුම්පත සකස් කිරීමට අදාළව මහජන අදහස් ලබා ගත්තේද?

(ඇ) මෙම එටිකා ගිවිසුමට ශ්‍රී ලංකා රජය පාර්ශ්වයෙන් අත්සන් තබන්නේ අග්‍රාමාත්‍යවරයාද, එසේ නැතහොත් ජනාධිපතිවරයාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
2015 සැප්තැම්බර් මාසයේ මා සිදු කළ ඉන්දීය සංචාරයේදී ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා සමඟ දෙරටේ ආර්ථික සම්බන්ධතා ශක්තිමත් කර ගැනීම ගැන සාකච්ඡා කළා. එහිදී, ඉන්දියාව හා ලංකාව අතර ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුමක් අත්සන් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීමටත්, ගිවිසුම කෙටුම්පත් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වීමටත් එකඟතාවකට පැමිණියා. ඊට අදාළ ගිවිසුම කෙටුම්පත් කිරීම සම්බන්ධව මේ වන විට සාකච්ඡා ආරම්භ කර ඇති අතර, එහි වගකීම දරන්නේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයයි. ගරු මලික් සමරවික්‍රම අමාත්‍යතුමා මේ සම්බන්ධව මූලික සාකච්ඡාවන් පවත්වනු ලැබුවා. ආර්ථික කටයුතු පිළිබඳ කැබිනට් කමිටුවේ අනුමැතිය මත සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති කමිටුවක් මඟින් මේ ගිවිසුම සම්බන්ධව ඉන්දීය රජය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබන අතර, එම කටයුතු ආර්ථික කටයුතු පිළිබඳ කැබිනට් කමිටුව මඟින් අධීක්ෂණය කර කැබිනට් මණ්ඩලයට වාර්තා කරනවා. එසේම මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා ඉන්දීය වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා ඉදිරියේදී ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතයි. මෙම ගිවිසුම සම්බන්ධයෙන් අදහස් ලබා ගැනීම සඳහා දැනටමත් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය විසින් වාණිජ මණ්ඩල හා වෘත්තීය වේදීන්ගේ සංවිධාන සමඟ සාකච්ඡා වට ගණනාවක් මෙන්ම මාධ්‍ය හමු කිහිපයක්ද පවත්වා තිබුණා.

එලෙසම ගරු ඇමතිතුමා මෙම සභාවේ දී ප්‍රකාශ කළා, මේ සභාවේ මන්ත්‍රීතුමන්ලා සහ අනෙකුත් පක්ෂ නායකයිනුත් ඒ පිළිබඳව දැනුවත් කරනවා කියලා. ගිවිසුම කෙටුම්පත් කිරීමේ කටයුතු අවසන් වීමෙන් අනතුරුව කැබිනට් අනුමැතිය ලද පසු එම ගිවිසුම සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ ඇමතිතුමා විසින් අත්සන් කරනු ඇත. සාමාන්‍යයෙන් ඇමතිවරු තමයි මේ වාගේ ගිවිසුම් අත්සන් කරන්නේ. ඒ වාගේම ඉදිරියේදී මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව දැනුවත් කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා.

පසු ගිය රජය GSP Plus බදු සහනය නැති කරගත්තා. රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් අහිමි කරගත්තා. අපි දැන් GSP Plus බදු සහනය ආපසු ලබා ගන්න කටයුතු කරමින් සිටිනවා. එසේම අපේ රජය චීනය, සිංගප්පූරුව වැනි මිත්‍ර රටවල් සමඟ වෙළෙඳ සහයෝගිතා ගිවිසුම්වලට ඇතුළු වෙන්න සාකච්ඡා කරගෙන යනවා. අනාගතයේදී ඉන්දුනීසියාව සහ මැලේසියාව සමඟත් අපි එවැනි ගිවිසුම් අත්සන් කරන්න බලාපොරොත්තු වෙනවා. ජපානය සමඟ ආර්ථික සම්බන්ධතා සහ අවබෝධය තවත් දියුණු කරගෙන යනවා. අපේ මහනුවර නගරය තවත් විශාල කරන්නත් ජපන් ආණ්ඩුවෙන් හාර අරගෙන තිබෙනවා. එම ගිවිසුම ඔස්සේ අපි ඒ රටවල වෙළෙඳ පොළ සඳහා අපේ නිෂ්පාදන යොමු කරනවා. අපි අපේ වෙළෙඳ පොළ පුළුල් කරගත යුතුයි. මේ ගිවිසුම ඔස්සේ ඊට ඉඩ කඩ සැලසෙනවා විතරක් නොවෙයි, අපේ රටේ තරුණ තරුණියන් ලක්ෂ ගණනකට අලුතින් රැකියා අවස්ථා සැලසෙනවා. අපි මේ සහයෝගිතා ගිවිසුම අත්සන් කරන්නේ අපේ රටේ අභිංසක තරුණ තරුණියන්ට රැකී රක්ෂා ලබා දෙන්න, ඔවුන්ට ආත්ම ගරුත්වයක් ඇතුව සතුටින් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් ඇති කරන්න. රැකියා දසලක්ෂයක් ලබා දෙන බවට අපි දුන් පොරොන්දුව ඉටු කරන්න තමයි අපි දැන් කටයුතු කරමින් ඉන්නේ. ගිය ආණ්ඩුවට මේක කරන්න බැරි වුණා. ඒ නිසා ඉතා සුළු මුදලකින් ජීවත් වෙන්න කියලා ලක්ෂ ගණන්, දසලක්ෂ ගණන් මැදපෙරදිගට යැව්වා.

අපි මේ සඳහා වෙනම යටිතල පහසුකම් සපයනවා. මහනුවර, කොළඹ, හම්බන්තොට කියලා විශාල තීරුවක් තිබෙනවා, දියුණු කරන්න. අපි මහනුවර නගරය පුළුල් කරලා විශාල නගරයක් ලෙස දියුණු කරනවා. ඒ නගරය සමඟ කර්මාන්ත, සංචාරක ව්‍යාපාර ඇති වෙනවා වාගේම, වයඹ පළාතේ කුරුණෑගල, කුලියාපිටිය, හලාවත, ඒ වාගේම ඉරණවිල විශාල සංචාරක ව්‍යාපාරයක් නැවත ඇති වෙන්න යනවා. ඒ සම්පූර්ණ ප්‍රදේශය තුළම කර්මාන්ත ඇති කරන්නත්, ලක්ෂ 85කට ජීවත් වෙන්න පුළුවන් විධියට බස්නාහිර පළාතේ සම්පූර්ණ Megapolis නගරයක් ඇති කරන්නත් කටයුතු කරනවා. අලුත් වැඩසටහන්, අලුත් විශ්වවිද්‍යාල, අලුත් කර්මාන්තකරණය තුළින් හොරණ ප්‍රදේශයේ අලුතින් කර්මාන්තපුර කිහිපයක් ආරම්භ කරන්න, ඒ වාගේම මීරිගම අලුත් නගරයක් සමඟ කර්මාන්තපුර ආරම්භ කරන්න කටයුතු කරනවා. සිංගප්පූරුවයි, ඩුබායි අතර මුදල් නගරයක් ඇති කිරීමට හිඩැසක් තිබෙනවා. අපි Colombo Port City එක තුළ ඒක ඇති කරන්න කටයුතු කරනවා. ගාල්ල, මාතර නගරවලට විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය හා අනෙකුත් සේවා සඳහා පහසුකම් ලබා දෙන්න කටයුතු කරනවා. හම්බන්තොට තවත් විශාල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කෙරෙනවා. හම්බන්තොට වර්ග කිලෝමීටර් 50ක විතර ප්‍රදේශයක් පුරා කර්මාන්ත ආරම්භ කරන්න කටයුතු කරනවා. මේ සියල්ල වුවමනායි මේ රට දියුණු කරන්න.

ත්‍රිකුණාමලය සංවර්ධන වැඩ කටයුතු පිළිබඳව අපි දැන් සාකච්ඡා කර තිබෙනවා. ජනාධිපතිතුමා පොළොන්නරුවේ වැඩ කටයුතු කර ගෙන යනවා. ඒ සෑම කර්මාන්තයක් තුළම නිෂ්පාදනය කරන භාණ්ඩ සියල්ලම ශ්‍රී ලංකාව තුළ විකුණන්න බැහැ ගරු කථානායකතුමනි. කෝටි 2ක ජනගහනයක් සිටින වෙළෙඳ පොළකට පුළුවන්ද ඒවා අරගන්න? කුඩා ළමයි ඉවත්

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

කළාම මිලියන 15ක විතර ජනතාවක් තමයි මේ රටේ ඉන්නේ. හම්බන්තොට පමණක් වර්ග සැතපුම් 50ක කර්මාන්ත යායක් ඉදි කරලා, හොරණ කර්මාන්ත ඉදි කරලා, වයඹ කර්මාන්ත ඉදි කරලා, මීරිගම කර්මාන්ත ඉදි කරලා, ඒ වාගේම ත්‍රිකුණාමලයේ කර්මාන්ත ඉදි කරලා, ඊට පස්සේ මෙතුමන්ලා කියන විධියට ඒවායේ නිෂ්පාදන සියල්ල දාන්න වෙන්නේ මුහුදට. අපට කියන්න, ඔබතුමන්ලා කියන්නේ ඒවා වෙනත් රටවලට විකුණන්න එපා කියලාද? ඒවා මෙහේ තියාගෙන මොනවා කරන්නද? ජාත්‍යන්තර වෙළෙඳ පොළට ඇතුළු වෙන්න අපට අවස්ථාව ලැබෙන්නේ නැත්නම් අපි වැඩ කටයුතු කරන්නේ කොහොමද?

ගරු කථානායකතුමනි, එහෙම නැත්නම් මමත් කොහේ හෝ වරායක් හදලා, ජනාධිපතිතුමාත් කොහේ හෝ ගුවන් තොටුපළක් හදලා මිනිස්සු උඩ බලාගෙන ඉන්නකල් සල්ලි ටික සාක්කුවේ දමාගෙන ඉන්න පුළුවන්. ඒ වැඩ කටයුත්ත කරන්න අපට වුවමනා නැහැ. තිබෙන ඒවාත් දියුණු කර ගෙන මේ රටේ තරුණ තරුණියන්ට රැකියා ලබා දෙන්නයි අපට වුවමනා කරන්නේ. ඒක කරන ගමන් මම විශේෂයෙන් පොරොන්දු වෙනවා, යාපනය යළි ප්‍රතිසංස්කරණය කරන්නත් පියවර ගන්නවා කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම "එටිකා" ගිවිසුම අත්සන් කිරීම මඟින් ශ්‍රී ලංකා පුරවැසියන්ට හා ආයෝජකයන්ට ඇති අයිතියට සමානම අයිතියක් ශ්‍රී ලංකාවේ සේවා ආර්ථිකය තුළ ආයෝජනය කරන්න ඉන්දියානු ආයෝජකයන්ටත්, ඒ වාගේම ශ්‍රී ලංකාවේ සේවා ආර්ථිකය තුළ රැකියා කරන්න ඉන්දියානු පුරවැසියන්ටත් ලැබෙන බව ඔබතුමා පිළිගන්නවාද? ඒකද ඔබතුමා මේ කියන්නේ?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
නැහැ. පිළිගන්නේ නැහැ. ඕනෑ කෙනෙකුට ඇවිල්ලා ආයෝජනය කරන්න පුළුවන්. අපි නැහැ කියන්නේ නැහැ. කාගේන් සල්ලි ලැබුණත් ලංකාවේ කොල්ලන්ට, කෙල්ලන්ට රැකියා හොයලා දෙනවා නම් ප්‍රශ්නය මොකක්ද? ඉන්දියාවේ අයට ඇවිල්ලා ලංකාවේ වැඩ කරන්න බැහැ. ඉන්දියාවේ අය වැඩ කළේ නැහැ. ගිය ආණ්ඩුව යටතේ බංග්ලාදේශයේ මිනිසුන් ලංකාවට ඇවිල්ලා වැඩ කළා, නේපාලයේ මිනිසුන් ඇවිල්ලා වැඩ කළා, චීනයේ මිනිසුන් ඇවිල්ලා වැඩ කළා. මේ රටේ සේවක පිරිසගේ පඩි වැඩි කරන්න ඒ ගොල්ලන් ලැහැස්ති වුණේ නැහැ. අපි කියන්නේ, පඩි වැඩි කරන්න ඕනෑ. ඩොලර් 300ක් හොයා ගන්න මැද පෙරදිග දුවනවා නම්, ඒ මුදල අපට දෙන්න බැරි ඇයි? සමහරු මෙතැන ලොකුවට කථා කරනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ තරුණ තරුණියන්ට රැකියා ලබා දෙන එකට ඔබතුමා විරුද්ධද? අන්න ඒක මට කියන්න. මන්ත්‍රීතුමනි, ඔබතුමා කැමැතිද විරුද්ධද? [බාධා කිරීම්] ඔබතුමා කැමැතිද විරුද්ධද? [බාධා කිරීම්] ඔබතුමා කැමැතිද විරුද්ධද? ඒ ටික මට කියන්න. [බාධා කිරීම්]

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
ගරු අගමැතිතුමනි,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, මම මතු කරපු ප්‍රශ්නය වුණේ, ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට-

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ඔබතුමා අහපු ප්‍රශ්නයට මම පිළිතුරු දුන්නා. ඔබතුමා මගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
ගරු අග්‍රාමාත්‍යතුමනි, මේ "එටිකා" ගිවිසුම අත්සන් කළාට පසුව ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට වාගේම ඉන්දියානු තරුණ තරුණියන්ටත් ශ්‍රී ලංකාවේ රැකියාවන්වලට ඇතුළත්වීමේ සමාන අයිතිය ලැබෙනවා නේද කියන ප්‍රශ්නයයි මම ඇහුවේ. ඔබතුමා උත්තර ලබා දුන්නේ ඒකට නොවෙයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
නැහැ. නැහැ. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමාට පිළිතුරු ලබා දෙන්න අවස්ථාව ලබා දෙන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
පසු ගිය ආණ්ඩුව - මහින්ද රාජපක්ෂ ආණ්ඩුව - සාකච්ඡා කරපු "සීපා" ගිවිසුම අනුව ඉන්දියාවේ අයට ඇවිල්ලා ලංකාවේ වැඩ කරන්න ඉඩ තිබුණා. අපි ජනාධිපතිවරණයට පෙර කිව්වේ එයට ඉඩ දෙන්නේ නැහැ කියලා. ඒක දැන් වහලා තිබෙන්නේ. බංග්ලාදේශයේ අයට එන්න වැඩක් නැහැ, නේපාලයේ අයට එන්න වැඩක් නැහැ; කාටවත් වැඩක් නැහැ. අපි දෙන්නම්. ඔබතුමා දකුණේ අයට රැකියා දෙන එකට විරුද්ධයි. ඔබතුමා දකුණේ අයට රැකියා දෙන එකට විරුද්ධයි. ඒකනේ, අකමැති වුණේ. ඒ අවස්ථාව ගන්න තිබෙන්නේ ලංකාවේ තරුණ තරුණියන්ට. ඒ අයට රැකියා දෙන්නයි එන්නේ. [බාධා කිරීම්] ලංකාවේ තරුණ තරුණියන් දියුණු වෙනවාට කැමැති නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවසාන අතුරු ප්‍රශ්නය.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජූයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නයක් ඇහුවා. ඔබතුමා අතුරු ප්‍රශ්න දෙසැරයක් ඇහුවා. දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජූයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
ගරු අග්‍රාමාත්‍යතුමනි, මෙම ගිවිසුම අත්සන් කිරීම හරහා අපේ රටේ අනාගතයට වාගේම අපේ රටේ ශිෂ්ටාචාරයටත් ඉතාමත් බරපතළ බලපෑමක් සිදු වෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ශිෂ්ටාචාරයට? ශිෂ්ටාචාරයට ප්‍රශ්නයක් වෙන්නේ කොහොමද?

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජූයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
ඒ නිසා අපි යෝජනා කරනවා මෙම ගිවිසුම අත්සන් කිරීමත් එක්ක - [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ප්‍රශ්නය අහන්න දෙන්නේ නැහැ නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්නය අහන්න අවස්ථාව ලබා දෙන්න, ගරු මන්ත්‍රීතුමන්ලා. [බාධා කිරීම්] Order, please!

ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. ගරු අගමැතිතුමාට පිළිතුරු දෙන්න අවස්ථාව ලබා දෙන්න. Do not disturb.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, බුද්ධ ධර්මය ආවේ ඉන්දියාවෙන්. [බාධා කිරීම්] මෙතුමා කියන්නේ ශිෂ්ටාචාරය එපා කියලා. මිහිඳු මහ රහතන් වහන්සේ වැඩම කළ කාලයේ මේ මන්ත්‍රීතුමන්ලා හිටියා නම්, "මේ ඉන්දියන්කාරයාව පන්නන්න" කියලා මිහිඳු මහ රහතන් වහන්සේව පන්නනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න. ඔබතුමා ප්‍රශ්නය අවසන් කළේ නැහැ. මම එම ප්‍රශ්නය අවසන් කරන්න අවසර දෙනවා.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජූයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
මට ප්‍රශ්නය අහන්න ඉඩ දුන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය වුණේ මෙයයි. ඉකුත් දා පැවැති-[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා එතුමාට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

ගරු චන්දිම ගමගේ මහතා
(මාණ්පුමිකු සන්දිම කමකේ)
(The Hon. Chandima Gamage)
ප්‍රශ්නය අහන්නේ නැද්ද? බොරුවට ප්‍රශ්න අහන්න එපා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Order, please! මේ පාර්ලිමේන්තු රැස්වීමේදී කාටත් ප්‍රශ්න අහන්නත්, උත්තර ලබා දෙන්නත් අවසර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාට ප්‍රශ්නය අහන්න දෙන්න ගරු අගමැතිතුමා පිළිතුරු ලබා දෙන්න. කරුණාකරලා බාධා කරන්න එපා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජූයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
ඉකුත් දා ඉන්දුනීසියාවේ පැවැති ඉස්ලාම් ආර්ථික සමුළුවේදී රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය ගරු කබීර් හාෂීම් මැතිතුමා හනුමන් පාලම පිළිබඳව ප්‍රකාශ කර සිටියා. එම හනුමන් පාලම ඉදි කිරීම පිළිබඳ පැවැත්වූ සාකච්ඡාවන් එකඟතාවකින් අවසන් වෙලා තිබෙන බවත්, ඒ අනුව එම හනුමන් පාලම ඉදි කරන බවත් ප්‍රකාශ කළා. මෙම "එටිකා" ගිවිසුම අත්සන් කරලා හනුමන් පාලමත් ඉදි කළාට පසුව ශ්‍රී ලංකාව දේශපාලන, ආර්ථික, සමාජයීය, සංස්කෘතික වශයෙන් ඉන්දියාවට යටත් වෙනවා. ඉන්දියාවේ ප්‍රාන්තයක් වශයෙන් පත් වෙනවා කියලා ඔබතුමා පිළිගන්නවාද? [බාධා කිරීම්] අහන දේට උත්තර දෙන්නේ නැහැ නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමා පිළිතුරු දෙන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
තමුන්නාන්සේලාට තිබෙන්නේ එක බෙරයනේ. පාලම ගහනවා, ඉන්දියාවට විකුණනවා, චීනයට තිබෙන ගිවිසුම තමයි ඉන්දියාවට දෙන්නේ, ඉන්දියාවට තිබෙන ගිවිසුම තමයි සිංගප්පූරුවට දෙන්නේ කියන බෙරය තමයි තමුන්නාන්සේලා හැමදාම ගහන්නේ. තමුන්නාන්සේලාට වෙන දේශපාලනයක් නැද්ද? [බාධා කිරීම්]

තමුන්නාසේලාට වෙන දේශපාලනයක් නැද්ද? "පාලම ගහනවා, පාලම ගහනවා" කියනවා. ඇත්ත වශයෙන්ම ගරු කථානායකතුමනි, මම මේ පාලම ගැන හිතලා නැහැ. ඒ පාලම ඕනෑ වෙලා තිබෙන්නේ මට නොවෙයි. ඒ පාලම ඕනෑ වෙලා තිබෙන්නේ කොමිස් ගන්නා මිනිසුන්ට. ඒ පාලම හැදුවොත් ගන්න පුළුවන් කොමිස් ටික කොච්චරද කියලා බලන්න කෝ. අපට ඔය පාලම වැඩක් නැහැ. අපට මොකක් හෝ හදන්න ඕනෑ නම්, අපි ප්‍රසිද්ධියේ මේ සභාවට කියලා කරන්නම්. මෙතැන වෙලා තිබෙන්නේ, කථා කරන්න වෙන කාරණයක් නැති වීමයි. පැරදිලා ඉන්නේ; පා ගමන හරි ගිහිල්ලා නැහැ; ඔක්කෝම හිර වෙලායි තිබෙන්නේ. මොනවාද වෙන්නේ කියලා දන්නේ නැහැ. හිටපු ජනාධිපතිතුමා කුරුණෑගල සම්මේලනයට ගිහින් වාඩි වුණොත්, එතැනින් වැඩේ ඉවරයි. ඔබතුමා කොහේද යන්නේ කියලා දන්නේත් නැහැ. දැන් ලොකු හිර වීමකයි ඉන්නේ.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

මෙතැනට ඇවිල්ලා ජාතිවාදය අදින්න එපා. මීට ඉස්සර වෙලා මුස්ලිම් මිනිසුන්ගේ ගෙවල්වලට ගැහුවා. [බාධා කිරීම්] ඊට ඉස්සර වෙලා ගිහින් මල්වතු පාර්ශ්වයේ මහා නායක ස්වාමීන් වහන්සේට තර්ජනය කළා. මල්වතු පාර්ශ්වය කඩලා වෙනත් පාර්ශ්වයක් හදනවා කිව්වා. අපේ සරත් ෆොන්සේකා මැතිතුමා දන්නවා, එතුමා හිරේට දැම්මාට විරුද්ධ වුණා කියලා - [බාධා කිරීම්] ඔබතුමන්ලා ඕවා කියන්න එපා. තව මොනවාද, කියන්නේ? ඔය ගොල්ලන් හිස් නේ. ඔය ගොල්ලන් දන්නේ මොනවාද? [බාධා කිරීම්] හම්බ කරපු එක තමයි මෙතැන කළේ. හම්බ කරන්න පුළුවන් නම් Hanuman Bridge එක හරි තමුන්නාන්සේලා හදයි. සියයට තිහක් කොමිස් හම්බ වෙනවා නම් හනුමන් පාලම නොවෙයි, හනුමන් පාලම් දොළහක් වුණත් හදයි. දැන් හම්බ කරන්න බැහැ නේ. හම්බ කරන්න පුළුවන් නම් ඕනෑ එකක් කරයි. ගරු මන්ත්‍රීතුමනි, දේශපාලනය කරන්න, හොඳට තර්ක කරන්න. දැන් බලන්න. මන්ත්‍රීතුමන්ලා එක එක කාරණා ගැන තර්ක කළා. [බාධා කිරීම්] ඇයි, ඔබතුමා ඉන්දියාවට යන්නේ නැද්ද? අපේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා තිරුපති කෝවිලට ගියා, ගුරුවායුර් කෝවිලට ගියා. කොච්චර හොඳයිද? ඒ සංස්කෘතිය නේ එපා කියන්නේ. ගුරුවායුර් කෝවිලට ගියාම නිකම් නොවෙයි, රත්තරන් දැම්මා. තමන්ගේ බර රත්තරන්වලින් දුන්නා. අපට ඇවිල්ලා කියනවා, "හනුමා" කියලා. එහාට තමයි හනුමා ගියේ. ඔබතුමාට ඕනෑ තව මොනවාද? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා ප්‍රශ්න ඇහුවා. ඔබතුමා ප්‍රශ්න තුනක් අහලා ඉවරයි. ඒවාට පිළිතුරු දුන්නා. [බාධා කිරීම්] ප්‍රශ්න තුනක් ඇහුවා, ගරු මන්ත්‍රීතුමනි. දැන් මෙතැන වාද කරන්න එපා. ප්‍රශ්න තුන හතරකට වඩා ඇහුවා. අද කාලය සම්බන්ධයෙනුත් ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මේ පාර්ලිමේන්තුව කෝලම් මඩුවක් කරන්න එපා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගාල්ල වරාය පොලීසිය මඟින් සොයා ගත් අවි සහ උණ්ඩ: නීත්‍යානුකූල අයිතිය
காலி துறைமுகப் பொலிசாரினால் கண்டுபிடிக்கப்பட்ட ஆயுதங்கள் மற்றும் ரவைகள்: சட்ட ரீதியான உரிமை
WEAPONS AND BULLETS DISCOVERED BY GALLE HARBOUR POLICE: LEGAL OWNERSHIP

9/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (4):

(අ) 2015.08.18 දින ගාල්ල වරාය පොලීසිය කරන ලද පරීක්ෂා කිරීමක දී වරායේ ගාල් කර තිබූ "මහනුවර" නමැති නෞකාව තුළත්, ශ්‍රී ලංකා දක්ෂිණ නෞකා කඳවුරේ සහ එහි සේවා වනිතා ඒකකය සතු ගොඩනැඟිල්ලක අවි සහ උණ්ඩ තිබී හමු වූ බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) පොලීසිය මඟින් අනාවරණය කරගත් අවි සහ උණ්ඩවල නීත්‍යානුකූල අයිතිය කවර පුද්ගලයෙකු හෝ ආයතනයක් සතු වන්නේද;

(ii) එම අවි ආයුධ පුද්ගලයෙකුට හෝ ආයතනයකට කවර පනතක් යටතේ පවරා තිබේද;

(iii) එසේ නම්, ඊට බලය ලබා දුන් බලධරයා කවුරුන්ද;

(iv) එම ආයුධ නිෂ්පාදික රට, වර්ෂය සහ බලපත්‍රය කවරේද;

(v) ආයුධ මිලදී ගත් ක්‍රමය සහ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාවෙන අවි ගබඩාව වරාය පරිශ්‍රයේ පවත්වාගෙන යාමට අවසර තිබේද;

(ii) ඊට අවසර ලබා දී ඇති බලධරයා කවුරුන්ද;

(iii) ඒ වෙනුවෙන් ඇවන්ට් ගාර්ඩ් සමාගම මුදල් ගෙවන්නේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මේ පිළිබඳව නීතිපතිවරයාගේ නිගමනයන් විෂයභාර අමාත්‍යවරයා වශයෙන් පිළිගන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු කමිටුවක් පත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச் சரைக் கேட்ட வினா:

(அ) 2015.08.18ஆம் திகதி காலி துறைமுகப் பொலிசாரி னால் மேற்கொள்ளப்பட்ட புலனாய்வின்போது நிறுத்திவைக்கப்பட்டிருந்த 'மஹநுவர' எனும் கப்பலி னுள்ளும் இலங்கை தென்னக கப்பல் வளாகத் தினுள்ளும் மற்றும் அதன் சேவா வனிதா அலகுக்குச் சொந்தமான கட்டிடத்தினுள்ளும் ஆயுதங்கள் மற்றும் ரவைகள் இருந்து கண்டுபிடிக்கப்பட்டமையினை அவர் அறிவாரா?

(ஆ) (i) பொலிசாரினால் கண்டுபிடிக்கப்பட்ட ஆயு தங்கள் மற்றும் ரவைகளின் சட்டரீதியான உரிமையை எவரேனும் நபர் ஒருவர் அல்லது நிறுவனம் ஒன்று கொண்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி ஆயுதங்கள் எவரேனுமொரு ஆளுக்கு அல்லது ஏதேனுமொரு நிறுவனத்திற்கு எச் சட்டத்தின்கீழ் கையளிக்கப்பட்டிருந்தன என்ப தையும்;

(iii) ஆமெனில், இதற்கு அதிகாரம் வழங்கிய அதிகாரி யார் என்பதையும்;

(iv) மேற்படி ஆயுதங்களை உற்பத்தி செய்த நாடு, ஆண்டு மற்றும் பெற்றுக்கொண்டுள்ள உரிமப் பத்திரம் ஆகியவை யாவை என்பதையும்;

(v) ஆயுதங்கள் எந்த வழிமுறையின்கீழ் கொள்வனவு செய்யப்பட்டுள்ளன என்பதையும் அதற்காகச் செலவிடப்பட்டுள்ள பணத்தொகை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி மிதக்கும் ஆயுதக் களஞ்சியத்தை துறைமுக வளாகத்தில் பேணிச் செல்வதற்கு அனுமதியுள்ளதா;

(ii) இதற்கான அனுமதியை வழங்கியுள்ள அதிகாரி யார்;

(iii) இதன் சார்பில் அவென்கார்ட் நிறுவனம் ஏதேனும் பணத்தொகையைச் செலுத்துகின்றதா;

(iv) ஆமெனில், அப்பணத்தொகை எவ்வளவு;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) (i) மேற்படி சம்பவங்கள் தொடர்பில் சட்ட மாஅதிபர் வழங்கியுள்ள முடிவுகளை விடயத் துக்குப் பொறுப்பான அமைச்சர் என்ற வகையில் நீர் ஏற்றுக்கொள்வீரா;

(ii) இது தொடர்பில் பாராளுமன்றக் குழுவொன்றை நியமிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Law and Order and Southern Development:

(a) Is he aware that weapons and bullets were discoverd in the ship named "Mahanuwara" which was berthed at Galle Harbour and at the Southern Naval Base of Sri Lanka and in a building belongs to its Seva Vanitha Unit at a search carried out by the Galle Harbour Police on 18.08.2015?

(b) Will he inform this House-

(i) the individual or the institution with legal ownership to the weapons and bullets discovered by the Police;

(ii) the Act under which those weapons have been transferred to an individual or an institution;

(iii) if so, the authority who authorized such transfer;

(iv) the country and the year in which those weapons were manufactured and the licence obtained; and

(v) the method adopted in purchasing those weapons and the amount spent for that purpose?

(c) Will he state-

(i) whether permission has been granted for maintaining this floating armoury in harbour premises;

(ii) the authority who granted such permission;

(iii) whether Avant-Garde pays any fee in that respect; and

(iv) if so, the amount paid in that manner?

(d) Will he also inform this House-

(i) whether he, as the Minister in charge of the subject, accepts the conclusions of the Attorney General in this regard; and

(ii) whether a Parliamentary Committee will be appointed in this connection?

(e) If not, why?

ගරු සාගල රත්නායක මහතා (නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு சாகல ரத்நாயக்க - சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Sagala Ratnayaka - Minister of Law and Order and Southern Development)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ප්‍රශ්නයේ සඳහන් සොයා ගැනීම් සිදු වූයේ 2015.08.18 දින නොව 2015.01.18 වන දිනය. ගාල්ල නියෝජ්‍ය පොලිස්පතිතුමා වෙත 2015.01.18 වන දින ලැබී ඇති තොරතුරක් මත ගාල්ල වරාය පොලිස් ස්ථානය මඟින් සිදු කරන ලද පරීක්ෂාවකදී පහත සඳහන් ස්ථානවලින් පහත සඳහන් දෑ සොයා ගන්නා ලදී.

ස්ථාන අංක 01 -

ගාල්ල වරායේ ක්ලෝසන් බර්ග් වරාය ජැටියේ නවතා තිබූ ඇවන්ට්ගාර්ඩ් මෙරිටයිම් සර්විසස් පුද්ගලික සමාගම විසින් ශ්‍රී ලංකා ෂිපින් ලයින් සමාගම වෙතින් බද්දට ගෙන තිබූ එම්.වී. මහනුවර නමැති නෞකාවේ සවිකර තිබූ කන්ටේනර් 20ක් තුළ ගිනි අවි 3005ක් (තුන්දහස් පහක්) සහ එම උණ්ඩ 721,882ක් (හත්ලක්ෂ විසිඑක්දහස් අටසිය අසූදෙකක්) ද,

ස්ථාන අංක 02 -

ගාල්ල දක්ෂිණ ලංකා නාවික කඳවුරේ පිහිටා තිබූ ඇවන්ට්ගාර්ඩ් මෙරිටයිම් සර්විසස් පුද්ගලික සමාගම විසින් ස්ථාපිත කර පවත්වා ගෙන ගිය කන්ටේනර් 3ක් තුළ ගිනි අවි 149ක් (එකසිය හතළිස්නවයක්) සහ උණ්ඩ 25,977 (විසිපන්දහස් නවසිය හැත්තෑහතක්) ද,

ස්ථාන අංක 03 -

ගාල්ල දක්ෂිණ ලංකා නාවික කඳවුරේ සේවා වනිතා ඒකකයේ කාමර 3ක් තුළ රක්නා ආරක්ෂක ලංකා සමාගමෙහි පාලනය යටතේ ගිනි අවි 2,056ක් (දෙදහස් පනස්හයක්) සහ උණ්ඩ 547,367ක් (පන්ලක්ෂ හතළිස්හත්දහස් තුන්සිය හැටහතක්) ද වශයෙන් තිබී හමු වී ඇත.

(ආ) (i) ඉහත සඳහන් ස්ථාන 3හි තිබී හමු වූ ගිනි අවි සහ උණ්ඩවල නීත්‍යානුකූල අයිතිය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණ වූයේ පහත සඳහන් තත්ත්වයන්ය.

ස්ථාන අංක 01 -

ගිනි අවිවල අයිතිය ගිවිසුම් සහගත විදේශීය පෞද්ගලික නාවුක ආරක්ෂක සමාගම් 159ක් (එකසිය පනස්නවයක්) සතු වන බවට ඇවන්ට් ගාර්ඩ් සමාගමෙහි නියෝජිතයන් පවසා ඇත. (මෙම තත්ත්වය සැක කිරීමට හේතු මතු වී

[ගරු සාගල රත්නායක මහතා]

නොමැත.)

උණ්ඩවල අයිතිය ඉහත පරිදිමය.

ස්ථාන අංක 02 -

ගිනි අවිවල අයිතිය ගිවිසුම් සහගත විදේශීය පෞද්ගලික නාවුක ආරක්ෂක සමාගම් 159ක් (එකසිය පනස්නවයක්) සතු වන බවට ඇවන්ට් ගාර්ඩ් සමාගමෙහි නියෝජිතයන් පවසා ඇත. (මෙම තත්ත්වය සැක කිරීමට හේතු මතු වී නොමැත.)

උණ්ඩවල අයිතිය ඉහත පරිදිමය.

ස්ථාන අංක 03 -

ගිනි අවිවල අයිතිය ශ්‍රී ලංකා යුද හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා ශ්‍රී ලංකා පොලීසියට අයත්ය.

උණ්ඩවල අයිතිය ඉහත පරිදිමය.

(ii) ඉහත සඳහන් ස්ථාන තුනෙහි තිබී හමු වූ ගිනි අවි භාර දීම පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද විමර්ශනය තුළින් අනාවරණය වූයේ පහත සඳහන් තත්ත්වයන්ය.

ස්ථාන අංක 01 -

ගිනි අවි - මෙම ගිනි අවි කිසිදු තැනැත්තෙකුට හෝ ආයතනයකට කිසිදු පනතක් (නීතියක්) ප්‍රකාරව භාර දී තිබුණු බවට විමර්ශනයේදී කරුණු අනාවරණය නොවීය. මෙම ගිනි අවි ඉහත පිළිතුරෙහි සඳහන් කර තිබෙන විදේශීය පෞද්ගලික නාවුක ආරක්ෂක සමාගම් විසින් ආරක්ෂාව සඳහා ඇවන්ට් ගාර්ඩ් මෙරිටයිම් සර්විසස් පුද්ගලික සමාගමට භාර දී තිබෙන බවට එම සමාගමේ නිලධාරීන්ගෙන් ලබා ගන්නා ලද ප්‍රකාශ මඟින් සනාථ වේ. මේ පිළිබඳ එම විදේශීය නෞකා සමාගම්වලින් සාක්ෂි ලැබී නැත.

උණ්ඩ - ඉහත පරිදිමය.

ස්ථාන අංක 02 -

ගිනි අවි - මෙම ගිනි අවි කිසිදු තැනැත්තෙකුට හෝ ආයතනයකට කිසිදු පනත් (නීතියක්) ප්‍රකාරව භාරදී තිබුණු බවට විමර්ශනයේදී කරුණු අනාවරණය නොවීය. මෙම ගිනි අවි ඉහත පිළිතුරෙහි සඳහන් කර තිබෙන විදේශීය නෞකා සමාගම් විසින් ආරක්ෂාව සඳහා ඇවන්ට් ගාර්ඩ් මෙරිටයිම් සර්විසස් පුද්ගලික සමාගමේ එම්.වී. මහනුවර නෞකාවේ ගබඩාකොට තැබීමට භාර දුන් බවට එම සමාගමේ නිලධාරීන් විසින් ලබා දී ඇති ප්‍රකාශ මඟින් අනාවරණය වේ. මේ පිළිබඳ එම විදේශීය නෞකා සමාගම්වලින් සාක්ෂි ලැබී නැත.

උණ්ඩ - ඉහත පරිදිමය.

ස්ථාන අංක 03 -

ගිනි අවි - කිසියම් පනතක් (නීතියක්) ප්‍රකාරව මෙම ගිනි අවි 2,056ක් එහි සන්තකය දැරූ රක්නා ආරක්ෂක ලංකා සමාගම වෙතට පවරා තිබුණු බවක් විමර්ශනයේදී අනාවරණය නොවිණි.

නමුත්, ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට හමුදා සම්බන්ධතා නිලධාරියාගේ ලිපි ප්‍රකාරව ආයුධ සහ උණ්ඩ නිකුත් කර ඇත.

උණ්ඩ - ඉහත පරිදිමය.

(iii) ස්ථාන අංක 01 -

ඉහත ආ (ii) ප්‍රශ්නයට දී තිබෙන පිළිතුරට අනුව මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට නොහැකිය. එනමුදු, විමර්ශනයේදී අනාවරණය වී ඇත්තේ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම් ඩී.එම්.එස්.ඩී. ජයරත්න මහත්මිය වෙතට දී තිබෙන අනුමැතිය ප්‍රකාරව එම මහත්මිය විසින් ඒ සඳහා බලය දී තිබෙන බවය. එකී බලය පැවරීම සහ ඒ තුළින් ලැබුණු අවසරය නීත්‍යානුකූලව වලංගු ද යන්න පිළිබඳව ගරු නීතිපතිතුමාගෙන් උපදෙස් අවශ්‍යය.

ස්ථාන අංක 02 -

ඉහත ආ (ii) ප්‍රශ්නයට දී තිබෙන පිළිතුරට අනුව මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමට නොහැකිය. එනමුදු, විමර්ශනයේදී අනාවරණය වී ඇත්තේ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම් ඩී.එම්.එස්.ඩී. ජයරත්න මහත්මිය වෙතට දී තිබෙන අනුමැතිය ප්‍රකාරව එම මහත්මිය විසින් ඒ සඳහා බලය දී තිබෙන බවය. එකී බලය පැවරීම සහ ඒ තුළින් ලැබුණු අවසරය නීත්‍යානුකූලව වලංගු ද යන්න පිළිබඳව ගරු නීතිපතිතුමාගෙන් උපදෙස් අවශ්‍යය.

ස්ථාන අංක 03 -

මෙම ගිනි අවි 2,056 සහ උණ්ඩ 547,367 සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම් ඩී.එම්.එස්.ඩී. ජයරත්න මහත්මිය විසින් ශ්‍රී ලංකා යුද හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා ශ්‍රී ලංකා පොලීසිය වෙත ලිපියක් මඟින් ලබා දෙන ලද අනුමැතියට අනුව මෙම ගිනි අවි රක්නා ආරක්ෂක ලංකා සමාගම භාරයට පත් කර ඇත. එනමුදු එම අවසරය නෛතිකව වලංගු වන්නේ ද යන්න පිළිබඳව ගරු නීතිපතිතුමාගේ උපදෙස් අවශ්‍යය.

(iv) ස්ථාන අංක 01 -

ගිනි අවි - මෙම ආයුධවල නිෂ්පාදිත වර්ෂය සම්බන්ධයෙන් එම ආයුධ පරීක්ෂා කරන ලද ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගේ වාර්තාවේ සඳහන් වේ.

උණ්ඩ - ඉහත පරිදිමය.

ස්ථාන අංක 02 -

ගිනි අවි - මෙම ආයුධවල නිෂ්පාදිත වර්ෂය සම්බන්ධයෙන් එම ආයුධ පරීක්ෂා කරන ලද ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගේ වාර්තාවේ සඳහන් වේ.

උණ්ඩ - ඉහත පරිදිමය.

ස්ථාන අංක 03 -

ගිනි අවි - මෙම අවි චීනයේ නිෂ්පාදිත අවි වන අතර මෙම අවි ත්‍රිවිධ හමුදා සහ පොලීසියට අයත් බව අනාවරණය වේ.

උණ්ඩ - ඉහත පරිදිමය.

(v) ස්ථාන අංක 01 -

ගිනි අවි - ඉහත ආ (ii) ප්‍රශ්නයට දී තිබෙන පිළිතුරට අනුව මෙම ප්‍රශ්නයට ද පිළිතුරු දීමට නොහැකිය. එම ආයුධවල අයිතිය විදේශීය නැව් ආරක්ෂක සමාගම් 159 සතුය.

උණ්ඩ - ඉහත පරිදිමය.

ස්ථාන අංක 02 -

ගිනි අවි - ඉහත ආ (ii) ප්‍රශ්නයට දී තිබෙන පිළිතුරට අනුව මෙම ප්‍රශ්නයට ද පිළිතුරු දීමට නොහැකිය. එම ආයුධවල අයිතිය විදේශීය නැව් ආරක්ෂක සමාගම් 159 සතුය.

උණ්ඩ- ඉහත පරිදිමය.

ස්ථාන අංක 03 -

ගිනි අවි - කිසියම් පනතක් (නීතියක්) ප්‍රකාරව මෙම ගිනි අවි 2,056ක් එහි සන්තකය දැරූ රක්නා ආරක්ෂක ලංකා සමාගම වෙතට පවරා තිබුණු බවක් විමර්ශනයේදී අනාවරණය නොවිණි.

නමුත්, ආරක්ෂක හා නාගරික සංවර්ධන ලේකම් වෙනුවට හමුදා සම්බන්ධතා නිලධාරියාගේ ලිපි ප්‍රකාරව එකී ආයුධ හා උණ්ඩ නිකුත් කර ඇත.

(ඇ) (i) 2012.09.18 දින MODUD/CS/FA/01, MODUD/CS/FA/03 දරන ලිපි මඟින් හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නිර්දේශය මත ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම් ඩී.එම්.එස්.ඩී. ජයරත්න මහත්මිය විසින් ජාත්‍යන්තර මුහුදේ පාවෙන අවි ගබඩාවක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අනුමැතිය ලබා දී ඇත. ඒ සඳහා එම නෞකාවට අවශ්‍ය සේවා කටයුතු සඳහා ගාල්ල වරායට ඇතුළුවීමට අවසර ලබා දී ඇත.

(ii) හිටපු රාජ්‍ය ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නිර්දේශය මත ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම් ඩී.එම්.එස්.ඩී. ජයරත්න මහත්මිය විසින් අනුමැතිය සහිත ලිපියක් ලබා දී ඇත.

(iii) ඒ සඳහා ඇවන්ට් ගාර්ඩ් මෙරිටයිම් සර්විස් පුද්ගලික සමාගම විසින් වරාය අධිකාරිය වෙත අය විය යුතු සියලු මුදල් ගෙවා ඇති බවට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් දන්වා ඇත.

(iv) මෙම ඇවන්ට් ගාර්ඩ් මෙරිටයිම් සර්විස් පුද්ගලික සමාගම මඟින් පවත්වාගෙන යන ලද එම්.වී. මහනුවර නෞකාව වෙනුවෙන් 2012.10.11 දින සිට 2015.11.30 දින දක්වා කාලය තුළ ලබා දෙන ලද සේවා පහසුකම් වෙනුවෙන් රුපියල් 24,029,512.00ක (රුපියල් දෙකෝටි හතලිස්ලක්ෂ විසිනවදහස් පන්සිය දොළහක) මුදලක් ගෙවා ඇති බවටද, හිඟ මුදල් කිසිවක් නොමැති බවටද ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් වාර්තා කර ඇත.

(ඈ) (i) නෛතික කරුණු පිළිබඳ නීතිපතිවරයා ලබා දී ඇති මතය පිළිබඳ අමාත්‍යවරයෙක් වශයෙන් අදහස් දැක්වීම සුදුසු නැතැයි මම මේ ගරු සභාවට දන්වා සිටිමි.

(ii) ඉහත දුන් පිළිතුරු අනුව මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු කමිටුවක අවශ්‍යතාවක් මා දකින්නේ නැහැ.

(ඉ) අදාළ නොවේ.

මේ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු උසාවිය මඟින් තවදුරටත් ඉදිරියට කරමින් යනවා. කරුණු වාර්තා වෙනවා. උසාවියේ මේ නඩුව දැනට විභාග වන නිසා මම ඉදිරිපත් කළ හැකි කරුණු ටික පමණක් ඔබතුමාට ඉදිරිපත් කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සඳහන් කරපු ආකාරයට ජනාධිපතිවරණයෙන් දවස් 10කට පස්සේ ගාල්ල වරාය පරිශ්‍රයේ නතර කර තිබූ මහනුවර නෞකාවේ සහ දක්ෂිණ නාවික කඳවුරේ ගොඩනැඟිලි දෙකක තිබිලා ගිනි අවි 6,000කට ආසන්න ප්‍රමාණයක් හා උණ්ඩ ලක්ෂ 13ක් විතර හොයාගෙන තිබෙනවා. නමුත් ඔබතුමා ලබා දුන් පිළිතුරේ ඒ පිළිබඳව පැහැදිලිව සඳහන් වුණේ නැහැ. හමුදාව සතු සමහර උණ්ඩ, පොලීසිය සතු උණ්ඩ සහ සමහර විදේශීය සමාගම් සතු උණ්ඩ තිබුණාය කියලා කිව්වා. ආරක්ෂක අමාත්‍යාංශයේ නිසි අවසරයකින් තොරව මෙහෙම ගබඩා රට තුළ පවත්වාගෙන යන්න පුළුවන්ද?

ගරු සාගල රත්නායක මහතා
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව අපි නීතිපති උපදෙස් පතලා තිබෙනවා. මේක සංකීර්ණ විමර්ශනයක්. ඒ විමර්ශන කටයුතු කරනවා. නීතිපතිවරයා නැවත අපිට ලබා දෙන උපදෙස් අනුව අවශ්‍ය විමර්ශන කටයුතු කරලා, ඒවාට කරුණු නැවත වාර්තා කරමින් මේ පරීක්ෂණ කටයුතු ඉදිරියට කරගෙන යනවා. ඒ නිසා එම ප්‍රශ්නයට මට තවම පිළිතුරු ලබා දෙන්න අපහසුයි. නමුත් මම නැවත වතාවක්, මේ විමර්ශනය පිළිබඳව වාර්තාවක් පොලිස්පතිවරයාගෙන් කැඳවලා, කරුණු දැනගෙන අපිට ඒ පිළිබඳව කථා කරන්න පුළුවන්. මෙහි පවතින සංකීර්ණභාවය නිසා මේ විමර්ශනය අපි කැමැති වේගයෙන් කරගෙන යන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මම දන්නා ආකාරයට රජයේ රස පරීක්ෂකවරයා මේ සම්බන්ධයෙන් දැනට වාර්තා භයක් ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, මේ කිසිදු විමර්ශනයකට රස පරීක්ෂකවරයා කැඳවලා නැහැ. ඒ වාගේම මේ සමහර අවිවල තිබුණු අංක මකලා තිබෙනවා කියලා ආරංචියක් තිබෙනවා. අවුරුදු එකහමාරක විතර කාලයක් ගතවෙලා තිබෙන පරීක්ෂණයක් නිසායි මම මේ කාරණය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්නේ.

ගරු සාගල රත්නායක මහතා
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
ගරු මන්ත්‍රීතුමනි, සමහර විට මහ මුහුදේදී මේ අවි ටික එකට ගැටිලා අංක මැකිලා ඇති කියලා රස පරීක්ෂකවරයා විසින් අපට දන්වලා තිබෙනවා. ඒ වාගේ පිළිතුරු අපට ලැබී තිබෙනවා. ඒ පරීක්ෂණය තවදුරටත් ඉදිරියට කළාට පසුව මට ඔය ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න පුළුවන් වේවි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සඳහන් කළා, ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම්වරිය වන දමයන්ති

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ජයරත්න මහත්මිය ගැන සහ ආරක්ෂක ලේකම්වරයාව සිටි ගෝඨාභය රාජපක්ෂ මහතා ගැන. ආරක්ෂක අමාත්‍යාංශයේ වැඩ කරමින් සිටි ඒ අතිරේක ලේකම්වරිය එක් වරම ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත කර ගත්තා. ඊට පසුව ඇය ඇමතිවරයාටත් නොකියාම රට ගිහින් තමයි විශ්‍රාම ලියුම එව්වේ. නමුත් අර කියපු සිදුවීමට සම්බන්ධ කිසිම කෙනෙකු -ඒ අනුමැතිය දුන්නාය කියන ආරක්ෂක ලේකම්වරයා හෝ ඒ කාලයේ හිටපු අතිරේක ලේකම්වරිය හෝ එහෙමත් නැත්නම් ඇවන්ට් ගාර්ඩ් අධිපතිවරයා හෝ- හරිහමන් විධියට පරීක්ෂණයට භාජන වෙලා නැහැ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාම දන්නවා, මේ සම්බන්ධ කාරණය නිසා කැබිනට් ඇමතිවරයකුට ඉල්ලා අස් වෙන්නත් සිද්ධ වුණා කියා. කැබිනට් ඇමතිවරුන් අතර ප්‍රශ්න ඇති වුණා. මගේ මේ අවසාන ප්‍රශ්නයෙන් ඇහුවේත්- මීට කලින් නීතිපති දෙපාර්තමේන්තුව සඳහන් කළා, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගිනි අවි ආඥාපනත යටතේ, පුපුරන ද්‍රව්‍ය ආඥාපනත යටතේ සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නඩු පවරන්න පුළුවන් කියා. හැබැයි ඒ වෙලාවේ ආණ්ඩුව පැත්තෙන් කියැවුණා, ඒවා යටතේ නඩු පවරන්න බැහැ, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ තමයි නඩු පවරන්න පුළුවන් කියා. ඒ කෙසේ වෙතත්, මේ පරීක්ෂණ කඩිනමින් සිදු වන බවක් දැන් පෙනෙන්නේ නැහැ. චෝදනා ලබපු අයට කැඳවීම් සිදු වන්නේත් නැති, පරීක්ෂණ සිදු වන්නේත් නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. එම නිසා මා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, මේ ප්‍රමාදය මොකක්ද කියා ගරු ඇමතිතුමනි.

ගරු සාගල රත්නායක මහතා
(මාණ්පුමිකු சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)

මගේ ඇමතිකමත් වෙනස් කරන්න හදනවාද දන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මා අර කලිනුත් කිව්වා වාගේ මා ඔබතුමාට කියන්නේ, මෙය සංකීර්ණ විමර්ශනයක් බවයි. ඒ කටයුතු කරගෙන යනවා. ඔබතුමා කිව්වා වාගේ අපට අවශ්‍ය සියලු පුද්ගලයනුත් අවශ්‍ය විධියට ඒ ප්‍රශ්නකිරීම්වලට භාජන කරන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධවත් අපි ක්‍රියා මාර්ග ගන්න ඕනෑ. ඒ රජය සමහත් කථා කරලා අවසර ගන්න ඕනෑ. ඒ වාගේ කටයුතු කරගෙන යනවා. නමුත් විමර්ශනය පිළිබඳව යම්කිසි ප්‍රමාදයක් තිබෙනවා නම් ඒක වේගවත් කරන්න කටයුතු කරනවා කියා මම මේ ගරු සභාවට දැනුම් දෙනවා.

රණවිරු සේවා අධිකාරියේ කාර්ය මණ්ඩලය: නිල ඇඳුම්
ரணவிரு சேவா அதிகாரசபைப் பணியாட்டொகுதியினர் : சீருடை வழங்கல்
STAFF OF RANAVIRU SEVA AUTHORITY: UNIFORMS

114/'15

2. ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රණවිරු සේවා අධිකාරියේ සේවය කරන ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2013දී හා 2014දී එම අධිකාරියේ ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් සැපයීමට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල ඇඳුම් ලබා දුන් ස්ථිර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය, කාන්තා සහ පිරිමි ලෙස කාණ්ඩගත කළ විට, එක් එක් කාණ්ඩයේ එක් අයෙකු වෙනුවෙන් නිල ඇඳුම් සඳහා දරනු ලැබූ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල ඇඳුම් සඳහා තෝරාගත් රෙදි තත්ත්වයෙන් බාල බවත්;

(ii) එම නිසා නිලධාරීන් එම ඇඳුම් ප්‍රතික්ෂේප කර ඇති බවත්;

(iii) අධිකාරියේ සභාපතිනිය අත්තනෝමතිකව කටයුතු කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) රණවිරු සේවා අධිකාරියේ නිල ඇඳුම් ගැටලුව විසඳීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ரணவிரு சேவா அதிகாரசபையில் பணியாற்றும் நிரந்தர மற்றும் ஒப்பந்த பணியாட்டொகுதியினர் வெவ்வேறாக எவ்வளவு;

(ii) 2013- 2014ஆம் ஆண்டுகளில் இவ்வதிகார சபையின் நிரந்தர மற்றும் ஒப்பந்த பணியாட் டொகுதியினருக்கு சீருடை வழங்குவதற்குச் செலவு செய்யப்பட்ட பணத்தொகை வெவ் வேறாக எவ்வளவு;

(iii) சீருடை வழங்கப்பட்ட நிரந்தர மற்றும் ஒப்பந்த பணியாட்டொகுதியினரை ஆண், பெண் என வகைப்படுத்தினால் ஒவ்வொரு வகையிலுமுள்ள ஒவ்வொருவருக்கும் சீருடைக்காகச் செலவு செய்யப்பட்ட பணத்தொகை வெவ்வேறாக எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சீருடைக்காகத் தெரிவுசெய்யப்பட்ட துணி தரம் குறைந்ததென்பதையும்;

(ii) இதன் காரணமாக உத்தியோகத்தர்கள் இவ் வுடைகளை நிராகரித்துள்ளனர் என்பதையும்;

(iii) அதிகாரசபையின் தலைவி எதேச்சாதிகாரமாகச் செயற்பட்டுள்ளார் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) ரணவிரு சேவா அதிகாரசபையின் சீருடைப் பிரச்சினையைத் தீர்க்க நடவடிக்கை எடுப்பாரா;

(ii) ஆமெனில் அது எவ்வாறு;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House separately -

(i) the permanent and contractual staff attached to the Ranaviru Seva Authority;

(ii) the amount of money spent by the said Authority to provide uniforms to the permanent and contractual staff in 2013 and 2014; and

(iii) the amount of money spent on the uniform of a single person when the permanent and contractual staff are categorized as men and women?

(b) Will he admit the facts that -

(i) the uniform material selected was low in quality;

(ii) the officers have rejected the uniforms because of that reason; and

(iii) the chairperson of the Authority has acted arbitrarily?

(c) Will he state -

(i) whether arrangements will be made to solve the uniform issue of the Ranaviru Seva Authority; and

(ii) if so, how?

(d) If not, why?

ගරු රුවන් විජයවර්ධන මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு ருவன் விஜயவர்தன - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)

(The Hon. Ruwan Wijayawardene - State Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

	2013 වර්ෂය	2014 වර්ෂය
ස්ථිර කාර්ය මණ්ඩලය	29	29
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය	22	24

(ii)

	2013 වර්ෂය		2014 වර්ෂය	
	සංඛ්‍යාව	වැය වූ මුදල	සංඛ්‍යාව	වැය වූ මුදල
ස්ථිර කාර්ය මණ්ඩලය	29	රු. 162,905.00	03	රු. 24,750.00
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය	22	රු. 140,005.00	14	රු. 60,900.00
එකතුව	51	රු. 302,910.00	17	රු. 85,650.00

(iii)

	2013 වර්ෂය		2014 වර්ෂය	
	කාර්ය මණ්ඩල ප්‍රමාණය	එක් අයෙකු සඳහා වැය වූ මුදල	කාර්ය මණ්ඩල ප්‍රමාණය	එක් අයෙකු සඳහා වැය වූ මුදල
කාන්තා				
ස්ථිර කාර්ය මණ්ඩලය	12	රු. 7,250.00	03	රු. 8,250.00
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය	15	රු. 7,250.00	14	රු. 4,350.00
පිරිමි				
ස්ථිර කාර්ය මණ්ඩලය	17	රු. 4,465.00	--	පිරිමි කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් ලබා දී නොමැත.
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය	7	රු. 4,465.00	--	

(ආ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) නැත.

(ඇ) (i) ගැටලුවක් පැන නැඟී නොමැත.

(ii) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මෙය 2013 සහ 2014 වර්ෂවල සිද්ධ වුණු සිද්ධියක්. එවකට රණ විරු සේවා අධිකාරියේ සභාපතිනිය, වත්මන් සභාපතිතුමිය නොවෙයි; පත්මා වැත්තෑව මහත්මියයි. ඒ යුගයේ එක අවස්ථාවක සභාපතිනිය, ස්ථිර කාන්තා නිලධාරින්ට ලබා දුන්නු නිල ඇඳුම්වලට වියදම් කළ මුදලට වඩා, කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා අයට ලබා දුන්නු නිල ඇඳුම්වලට වියදම් කළ මුදල වැඩියි. මෙහි සභාපති ඇතුළු ඉහළ තනතුරුවල වෙනස්කම් වුණාට මේ ප්‍රශ්නවලට පිළිතුරු හදලා දෙන්නේ සහ මේවා ක්‍රියාත්මක වන්නේ තවම පරණ යන්ත්‍රණය තුළමයි. මා ඔබතුමාගෙන් අහනවා, ස්ථිර කාර්ය මණ්ඩලයට වඩා වැඩි පිරිවැයක් දරා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ කාන්තා නිලධාරිනියන්ට නිල ඇඳුම් ලබා දීමේ සිද්ධියක් පිළිබඳව ඔබතුමාට පැමිණිල්ලක් හෝ මේ වාර්තාවලට ලැබිලා නැද්ද කියලා.

ගරු රුවන් විජයවර්ධන මහතා

(மாண்புமிகு ருவன் விஜயவர்தன)

(The Hon. Ruwan Wijayawardhana)

ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව පත් වුණාට පස්සේ ඒ සම්බන්ධයෙන් කිසිම පැමිණිල්ලක් ලැබිලා නැහැ. මම හිතන විධියට ඔබතුමා කියූ පරිදි මේ සිදුවීමත් 2013 සහ 2014 වර්ෂවලදී තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. මේ ආණ්ඩුව යටතේ එවැනි පැමිණිල්ලක් තවමත් මට ලැබිලා නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

මම කලින් ඇහුව අතුරු ප්‍රශ්නයේදී කිව්ව ආකාරයට 2013 අවුරුද්දේ කටයුතු කරන අතරේ 2014 වර්ෂයේදී හිටපු

[ගරු බුද්ධික පතිරණ මහතා]

සභාපතිවරිය යළිත් වරක් නිල ඇඳුම් ලබාදීමේ ගොනුවට සටහනක් තියලා තිබෙනවා. ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරිනියන්ට සහ අනෙක් කාන්තා සේවිකාවන්ටත්, පිරිමි නිලධාරීන්ටත් නිල ඇඳුම් ලබා දීමට අනුමත කිරීමේ සටහනක් තියලා තිබෙනවා. මේ ගැන පරීක්ෂණයක් කළොත් ඔබතුමාට ඒ බව පෙනේවි. ඒ වාගේම ඊට දින කිහිපයකට පස්සේ නැවත වරක් ස්ථිර කාර්ය මණ්ඩලයේ තමුන්ට හිතවත් නිලධාරිනියන් තිදෙනෙකුට නිල ඇඳුම් ලබා දීමේදී වෙනස් ආකාරයකට උපදෙස් හා සටහන් තැබීම කරලා තිබෙනවා. ඒ නිසා මෙතැනට හදලා එවන උත්තරය මොන එක වුණත්, මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න ඔබතුමා බලාපොරොත්තු වෙනවාද? තවම මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබිලා නැහැ කියා ඔබතුමා කිව්වා. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට මම මේ ප්‍රශ්නය මේ ගරු සභාවේදී මතු කරනවා. 2013 හා 2014 කාලයේ රණවිරු සේවා අධිකාරියේ හිටපු සභාපතිනිය කරපු මේ මගඩිය පිළිබඳව අදාළ ලිපි ගොනු ගෙන්වලා, අවශ්‍ය නම් මෙම නිලධාරීන්ගෙන් ඉවත් කරලා, අභ්‍යන්තර විගණන නිලධාරීන් ලවා හෝ පරීක්ෂණයක් කරන්න අමාත්‍යාංශය බලාපොරොත්තු වෙනවාද?

ගරු රුවන් විජයවර්ධන මහතා
(මාණ්පුමිකු රුවන් විජයවර්තන)
(The Hon. Ruwan Wijayawardhana)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අපිට ඉදිරිපත් කරන මේ ප්‍රශ්නවලින් පැන නඟින ගැටලු ගැන ඇත්තටම අපිට අමාත්‍යාංශයෙන් පරීක්ෂණයක් පවත්වන්න පුළුවන්. ඒකට කිසිම බාධාවක් නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මුදලේ ප්‍රමාණය වාගේම මේ ලබා දුන්නු නිල ඇඳුම්වල ප්‍රමිතිය පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. එක පැත්තකින් රණවිරු සේවා අධිකාරියේ එදා ස්ථිර සහ කොන්ත්‍රාත් පදනමින් ගත්ත අයට ලබා දුන්නු නිල ඇඳුම්වලට වැය කරපු මුදලේ ප්‍රශ්නයක් තිබෙනවා. දෙවැනි කාරණය තමයි, ලබා දුන්නු නිල ඇඳුමේ ප්‍රමිතිය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මම තුන්වැනි අතුරු ප්‍රශ්නය වශයෙන් ඔබතුමාගෙන් අහන්නේ, මේ අඩු ප්‍රමිතියෙන් යුක්ත රෙදි මිලදී ගෙන ඒ සඳහා නිල ඇඳුම් සකස් කිරීම පිළිබඳවත් අර හා සමානවම පරීක්ෂණයක් කරන්න අමාත්‍යාංශය බලාපොරොත්තු වෙනවාද කියලායි.

ගරු රුවන් විජයවර්ධන මහතා
(මාණ්පුමිකු රුවන් විජයවර්තන)
(The Hon. Ruwan Wijayawardhana)

අපට අමාත්‍යාංශය හරහා පරීක්ෂණයක් කරන්න පුළුවන්. දැනට නම් අපට ඒ වාගේ පැමිණිල්ලක් ලැබිලා නැහැ. නමුත් ඒ කාරණා ගැනත් අපට පරීක්ෂණයක් පවත්වන්න පුළුවන්.

සමුපකාර ව්‍යාපාරයට ලබා දී තිබූ ණය: කපා හැරීම

கூட்டுறவுத் துறைக்கு வழங்கிய கடன்கள்: பதிவழித்தல்

LOANS GRANTED TO CO-OPERATIVE SOCIETIES: WRITE OFF

445/'16

3. ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2008 වර්ෂයේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා, මුදල් අමාත්‍යවරයා වශයෙන් රාජ්‍ය බැංකුවලින් සමුපකාර ව්‍යාපාරයට ලබා දී තිබූ සියලුම ණය කපා හැරීමට ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවේද;

(ii) ඒ බව සනාථ කරමින් එවකට විෂයභාර අමාත්‍යවරයා වූ පාර්ලිමේන්තු මන්ත්‍රී බන්දුල ගුණවර්ධන මහතා 2015.11.05 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කරනු ලැබුවේද;

(iii) එක් එක් සමුපකාර සමිතිවලින් කපා හරින ලද ණය පිළිබඳ යථා තත්ත්වය අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර දැනුම් දෙන බව කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා 2015.11.05 දින පාර්ලිමේන්තුවට දන්වනු ලැබුවේද;

(iv) මහජන බැංකුව විසින් සමුපකාර සමිතිවලට ලබා දී තිබූ ණය කපා හැරීමට තීරණය කර ඇති නමුත් එම තීරණය මේ දක්වා කිසිදු දිස්ත්‍රික්කයක ක්‍රියාත්මක වී නොමැති බවට රාජ්‍ය අමාත්‍යවරයා 2015.11.05 දින පාර්ලිමේන්තුවේදී දෙන ලද පිළිතුර නිවැරදිද;

(v) ඉහත (iv) හි තීරණය ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ණය කපා හැරීමෙන් සමුපකාර සමිතිවලට යම්කිසි ධෛර්යයක් ලබා දීමට ගත් තීරණය ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව ගන්නා ඉදිරි පියවර සමුපකාර සමිතිවලට දන්වා යවන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2008ஆம் ஆண்டில் முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ, நிதி அமைச்சரென்ற வகையில் அரச வங்கிகளிலிருந்து கூட்டுறவுத் துறைக்கு வழங்கியிருந்த அனைத்துக் கடன்களையும் பதிவழிப்பதற்கு நிதி ஏற்பாடுகளை ஒதுக்கியிருந்தாரா என்பதையும்;

(ii) அதை உறுதிப்படுத்தும்வகையில் அப்போது விடயத்திற்குப் பொறுப்பான அமைச்சராக விருந்த பாராளுமன்ற உறுப்பினர் பந்துல குணவர்தன 2015.11.05ஆம் திகதியன்று பாராளுமன்றத்தில் கூற்றொன்றை விடுத்தாரா என்பதையும்;

(iii) ஒவ்வொரு கூட்டுறவுச் சங்கத்திலிருந்தும் பதிவழிக்கப்பட்ட கடன்களின் உண்மையான நிலைபற்றி அமைச்சருடன் கலந்துரையாடி அறிவிப்பதாக கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர் 2015.11.05ஆம் திகதியன்று பாராளுமன்றத்திற்கு அறிவித்தாரா என்பதையும்;

(iv) மக்கள் வங்கியினால் கூட்டுறவுச் சங்கங்களுக்கு வழங்கப்பட்டுள்ள கடன்களைப் பதிவழிப்பதற்குத் தீர்மானித்திருந்தபோதிலும் அத் தீர்மானம் இதுவரை எந்தவொரு மாவட்டத்திலும் அமுலாக்கப்படவில்லை என

இராஜாங்க அமைச்சர் 2015.11.05ஆம் திகதி யன்று பாராளுமன்றத்தில் வழங்கிய விடை சரியானதா என்பதையும்;

(v) மேற்படி (iv) இல் உள்ள தீர்மானத்தை அமுல் படுத்தாமைக்கான காரணம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி கடன்களைப் பதிவழிப்பதன்மூலம் கூட்டுறவுச் சங்கங்களுக்கு ஒருவிதத்தில் ஊக்க மளிப்பதற்காக மேற்கொள்ளப்பட்ட தீர் மானத்தை நடைமுறைப்படுத்துவாரா என்ப தையும்;

(ii) ஆமெனில், அது சம்பந்தமாக மேற் கொள்ளப்படும் எதிர்கால நடவடிக்கைகளை கூட்டுறவுச் சங்கங்களுக்கு அறிவிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Will he inform this House-

(i) whether allocations were made by the former President Mahinda Rajapaksa as the Minister of Finance in 2008 to write off all loans granted to the Co-operative Movement by the State banks;

(ii) whether the Hon. Bandula Gunawardane, MP, the then Minister in charge of the subject made a statement in Parliament on 05.11.2015 confirming that;

(iii) whether the State Minister of Industry and Commerce informed Parliament on 05.11.2015 that the actual situation in relation to the writing off of loans from each co-operative society would be made known upon discussing the matter with the Minister;

(iv) whether the reply given to Parliament by the State Minister on 05.11.2015 that, although it has been decided to write off the loans granted to co-operative societies by the People's Bank, so far it has not been implemented in any district, is correct; and

(v) the reasons for not implementing the decision of (iv) above?

(b) Will he also inform this House-

(i) whether the decision taken to boost the co-operative societies by writing off the loans will be implemented; and

(ii) if so, whether the co-operative societies would be informed of the future steps to be taken in that regard?

(c) If not, why?

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

Hon. Speaker, the Answer is as follows:

(a) (i) No. Provision had been made to pay only the identified outstanding loans amounting to Rs. 485.80 million granted to the Co-operative Movement by the People's Bank.

(ii) Yes.

(iii) Yes. The Schedule in relation to the write-off of the loans due from co-operative societies as at 30th June, 2008, as per Budget Proposals, is submitted in the Annex. Sir, I **table*** the Annex.

(iv) Yes.

(v) The balance of the identified loans and overdraft, which was granted to co-operative societies and co-operative unions by the People's Bank, as at 31st December, 2009, was Rs. 925,519,448.76. Even though the Cabinet has proposed to grant only a provision of 50 per cent of the total outstanding step-by-step under midterm framework, the said provision has not been granted up to 2015. An allocation of Rs. 100 million has been made by the 2016 Budget Proposals and at present, actions are being taken to write off the loans granted to co-operative societies and co-operative unions.

(b) (i) Yes.

(ii) Yes.

(c) Does not arise.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Hon. Minister, by your long Answer, it is clear that you intend to have all these loans written off and that provisions are being made in order to do so. How much allocation has been made up to now by the Budget in order to write off-

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

Hon. Member, only Rs. 100 million has been allocated from the 2016 Budget. We are now working on settling those before the end of this year. The balance of the approved -

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
How much more is required to settle those?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
We need Rs. 354 million. We have asked the Department of National Budget to allocate it in 2017. If we get that allocation, *Insha Allah*, I think we can complete that next year.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Are you confident that the Hon. Minister of Finance will agree with you in order to allocate such an amount for this purpose?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
He allocated Rs. 100 million by this year's Budget. The balance, we hope he will give us.

ත්‍රිකුණාමලය මුහියිද්දීන් ජුම්ආ පල්ලිය: වකුෆ් දේපළ
திருகோணமலை முஹியித்தீன் ஜும்மா பள்ளிவாசல்: வக்ப் ஆதனங்கள்
MOHIDEEN JUMMA MOSQUE IN TRINCOMALEE: WAKF PROPERTY

508/'16

4. ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ අංක R/0682/T/036 යටතේ ලියා පදිංචි කරන ලද ත්‍රිකුණාමලය, N.C. වීදියේ, අංක 154 දරන ස්ථානයේ පිහිටි මුහියිද්දීන් ජුම්ආ පල්ලියට අයත්, නිශ්චල දේපළ (ඉඩම්, නිවාස හා වෙළඳසැල්) සංඛ්‍යාව කොපමණද;

(ii) එම දේපළ පිහිටා තිබෙන එක් එක් ස්ථානවල ලිපිනය කවරේද;

(iii) එක් එක් දේපළවලින් මාසිකව ලබන ආදායම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වකුෆ් දේපළවලට අයත් ඔප්පුවල සඳහන් නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වකුෆ් දේපළ පරිහරණයේදී දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබා තිබේද;

(ii) එම දේපළ අතරින්, සමහර දේපළ සින්නක්කර ඔප්පු මඟින් කිසියම් පුද්ගලයන්ගේ නමට පවරා තිබේද;

(iii) එසේ නම්, මේ පිළිබඳව ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முஸ்லிம் சமய மற்றும் கலாசார அலுவல்கள் திணைக்களத்தின், இலங்கை வக்ப் சபையில் இலக்கம் R/0682/T/036 இன் கீழ் பதிவு செய்யப்பட்ட திருகோணமலை, N.C. வீதியில், 154 ஆம் இலக்க இடத்தில் அமைந்துள்ள முஹியித்தீன் ஜும்மா பள்ளிவாசலுக்குச் சொந்த மான அசைவற்ற ஆதனங்களின் (காணிகள், வீடுகள் மற்றும் வர்த்தக நிலையங்கள்) எண்ணிக்கை யாது;

(ii) மேற்படி ஆதனங்கள் அமைந்துள்ள ஒவ்வோர் இடத்தினதும் முகவரி யாது;

(iii) ஒவ்வோர் ஆதனத்திலிருந்தும் மாதாந்தம் கிடைக்கின்ற வருமானம் தனித்தனியாக யாது;

(iv) மேற்படி ஒவ்வொரு வக்ப் ஆதனங்களுக்குமுரிய உறுதிகளில் குறிப்பிடப்பட்டுள்ள பெயர்கள் தனித்தனியாக யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வக்ப் ஆதனங்களின் பாவனையின் போது திணைக்களத்தின் அங்கீகாரம் பெறப்பட்டுள்ளதா;

(ii) மேற்படி ஆதனங்களில் ஒருசில ஆதனங்கள் அறுதியுறுதிகள் மூலமாக எவரேனும் ஆட்களின் பெயர்களுக்கு ஒப்படைக்கப்பட்டுள்ளனவா;

(iii) ஆமெனில், இது சம்பந்தமாக இலங்கை வக்ப் சபையினால் மேற்கொள்ளப்படும் நடவடிக் கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Post, Postal Services and Muslim Religious Affairs:

(a) Will he inform this House -

(i) the number of immovable properties (lands, houses and shops) belonging to the Mohideen Jumma Mosque situated at No. 154, N.C. Street, Trincomalee, which has been registered with the Sri Lanka Wakf Board of the Department of Muslim Religious and Cultural Affairs under Registration No. R/0682/T/036;

(ii) the addresses of each of those properties;

(iii) separately the monthly income that is received from each of those properties; and

(iv) separately the names stated in the deeds of each of the aforesaid Wakf properties?

(b) Will he also inform this House -

(i) whether the approval of the Department has been obtained for using the aforesaid Wakf properties;

(ii) whether some of those properties have been transferred to names of certain individuals through freehold deeds; and

(iii) if so, of the nature of action that will be taken in this regard by Sri Lanka Wakf Board;

(c) If not, why?

ගරු අබ්දුල් හලීම් මහතා (තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு அப்துல் ஹலீம் - தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Abdul Haleem - Minister of Post, Postal Services and Muslim Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අක්කරයක ඉඩම තුළ වෙළෙඳසැල් 15ක් ඇත. තවද කින්නියා හි පිහිටි හිස් ඉඩම අක්කර 8කි. මෙම ඉඩම සඳහා ඔප්පුවක් පල්ලි දායක සභාව සතුව ඇත.

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නයේ ඊළඟ කොටස් දෙක සඳහා දීර්ඝ පිළිතුරු තිබෙන්නේ.

Hon. Speaker, since it is a long list, I will **table*** the answers for (a)(ii) and (a)(iii).

(iv) දීර්ඝ කාලයක් මෙම දේපළ මෙම පල්ලිය භාරයේ තිබුණද, වර්තමාන භාරකාර මණ්ඩලයට ඔප්පු සොයා ගැනීමට නොහැකි වී ඇත.

(ආ) (i) නැත.
(ii) නැත.
(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද පිළිතුරේ (අ) (ii) සහ (අ) (iii) කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் (அ) (ii) மற்றும் (அ) (iii) பகுதிகள்:*
** Answer tabled for (a)(ii) and (a)(iii)*

(ii) Addresses are given separately below:

Bare Land - Kanniya, Trincomalee

Shop No. 1 (Fancy shop) - 132, N.C. Road, Trincomalee

Shop No. 2 (Textiles shop) - 136, N.C. Road, Trincomalee

Shop No. 3 (Textiles shop) - 140, N.C. Road, Trincomalee

Shop No. 4 (Shoe palace) - 144, N.C. Road, Trincomalee

Shop No. 5 (Gold House) - 144, N.C. Road, Trincomalee

Shop No. 6 (Closed) - 148, N.C. Road, Trincomalee

Shop No. 7 (Nylon Shop) - 150, N.C. Road, Trincomalee

Shop No. 8 (Store) - 152, N.C. Road, Trincomalee

Shop No. 9 (Warehouse) - 158, N.C. Road, Trincomalee

Shop No. 10 (Gold House) - 162, N.C. Road, Trincomalee

Shop No. 11 (Warehouse) - 166, N.C. Road, Trincomalee

Shop No. 12 (Warehouse) - 166, N.C. Road, Trincomalee

Shop No. 13 (Gold Shop) - 168, N.C. Road, Trincomalee

Shop No. 14 (Grinding mill) - 206, N.C. Road, Trincomalee

Shop No. 15 (Fancy shop) - 208, N.C. Road, Trincomalee

(iii) Monthly income received from each property

Shop No. 1 (Fancy shop) - 132, N.C. Road, Trincomalee - Rs. 8500.00 (Rs. Eight thousand five hundred)

Shop No. 2 (Textiles shop) - 136, N.C. Road, Trincomalee - Rs. 12,500.00 (Rs. Twelve thousand five hundred)

Shop No. 3 (Textiles shop) - 140, N.C. Road, Trincomalee - Rs. 12,500.00 (Rs. Twelve thousand five hundred)

Shop No. 4 (Shoe palace) - 144, N.C. Road, Trincomalee - Rs. 8,500.00 (Rs. Eight thousand five hundred)

Shop No. 5 (Gold House) - 144, N.C. Road, Trincomalee - Rs. 8,500.00 (Rs. Eight thousand five hundred)

Shop No. 6 (Closed) - 148, N.C. Road, Trincomalee - Rs. 10,500.00 (Rs. Ten thousand five hundred)

Shop No. 7 (Nylon shop) - 150, N.C. Road, Trincomalee - Rs. 8500.00 (Rs. Eight thousand five hundred)

Shop No. 8 (Store) - 152, N.C. Road, Trincomalee - Rs. 12,500.00 (Rs. Twelve thousand five hundred)

Shop No. 9 (Warehouse) - 158, N.C. Road, Trincomalee - Rs. 12,500.00 (Rs. Twelve thousand five hundred)

Shop No. 10 (Gold House) - 162, N.C. Road, Trincomalee - Rs. 12,500.00 (Rs. Twelve thousand five hundred)

Shop No. 11 (Warehouse) - 166, N.C. Road, Trincomalee - Rs. 9,500.00 (Rs. Nine thousand five hundred)

Shop No. 12 (Warehouse) - 166, N.C. Road, Trincomalee - Rs. 3,000.00 (Rs. Three thousand)

Shop No. 13 (Gold Shop) - 168, N.C. Road, Trincomalee - Rs. 7,000.00 (Rs. Seven thousand)

Shop No. 14 (Grinding mill) - 206, N.C. Road, Trincomalee - Rs. 7,000.00 (Rs. Seven thousand)

Shop No. 15 (Fancy shop) - 208, N.C. Road, Trincomalee - Rs. 8500.00 (Rs. Eight thousand five hundred)

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(මාණ්පුමිකු එම්.එච්.එම්. සල්මාන්)
(The Hon. M.H.M. Salman)
ගරු කථානායකතුමනි, මට එක අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු ඇමතිතුමනි, දිවයිනේ ඇති මුස්ලිම් දේවස්ථානවලට අයිති නිශ්වල දේපළ හා වත්කම් පිළිබඳව එක් එක් දේවස්ථානවලින් විමසලා මේ වන විට ලියුම් ලැබී තිබෙනවා. එම කාර්යය කිරීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. එම වාර්තාව සකස් කිරීමෙන් අනතුරුව මුස්ලිම් දේවස්ථාන සතු නිශ්වල හා අනිකුත් දේපළ පිළිබඳ ලැයිස්තුවක් මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට ඔබතුමා පියවර ගන්නවාද කියා මම දැන ගන්න කැමැතියි.

ගරු අබ්දුල් හලීම් මහතා
(මාණ්පුමිකු අප්දුල් හලීම්)
(The Hon. Abdul Haleem)
ඔබතුමා අහන්නේ මේ පල්ලිය ගැනද?

ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා
(මාණ්පුමිකු එම්.එච්.එම්. සල්මාන්)
(The Hon. M.H.M. Salman)
සමස්තයක් වශයෙන් මුළු ශ්‍රී ලංකාවේම තිබෙන මුස්ලිම් දේවස්ථානවල නිශ්වල දේපළ පිළිබඳ ලැයිස්තුවක් සකස් කර අවසාන කිරීමෙන් පසුව එය මේ ගරු සභාවට ඉදිරිපත් කරනවාද කියායි මා අහන්නේ, ගරු ඇමතිතුමනි.

ගරු අබ්දුල් හලීම් මහතා
(මාණ්පුමිකු අප්දුල් හලීම්)
(The Hon. Abdul Haleem)
අපි ඒ කාර්යය කරගෙන යනවා. එය අවසන් වූ පසුව දැනුම් දෙන්නම්.

ඒ. එච්. සමුන් මහතා: පාරිතෝෂිකය හා විශ්‍රාම වැටුප
திரு. ஏ.எச். சமூன் : பணிக்கொடை மற்றும் ஓய்வூதியம்
MR. A.H. SAMUN: GRATUITY AND PENSION

574/'16

6. ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(මාණ්පුමිකු செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) කැකිරාව අධ්‍යාපන කලාපයට අයත්, අ/බමුණුගම මුස්ලිම් විදුහලේ විදුහල්පති ධුරය දරමින් සිටි ඒ. එච්. සමුන් මහතා, යම් විනය නියෝගයක් මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:17 වගන්තිය අනුව (යොමු අංක උමැප/අදෙ/07/2/001) විශ්‍රාම ගැන්වීම සඳහා නිර්දේශ කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

(iii) ඒ අනුව, ඔහුගේ විශ්‍රාම පාරිතෝෂික මුදල සහ විශ්‍රාම වැටුප ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி, அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கெக்கிராவ கல்வி வலயத்திற்குட்பட்ட, அ/பமுனுகம முஸ்லிம் வித்தியாலயத்தின் அதிபராக கடமையாற்றிய திரு. ஏ.எச். சமூன் என்பவரை, ஏதேனும் ஒழுக்காற்று கட்டளையின் பேரில் ஓய்வூதிய பிரமாணக் குறிப்பின் 2:17 பிரிவுக்கு அமைவாக (தொடர்பு இலக்கம் வமமா/கதி/ 07/ 02/001) ஓய்வுபெறச்செய்வதற்கு விதந்துரைக்கப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனின், அது எத்திகதியில் இருந்து என்ப தையும்;

(iii) இதற்கு அமைவாக, இவரது ஓய்வூதியப் பணிக் கொடையும் ஓய்வூதியமும் பெற்றுக்கொடுக்கப் படுமா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state-

(i) whether recommendations have been made to send Mr. A.H. Samun who was serving as the Principal of A/Bamunugama Muslim Vidyalaya of Kekirawa Education Zone on retirement, going by a disciplinary order, taken in keeping with the Section 2:17 of Pensions Minutes (Ref. No. උමැප/ අදෙ/07/2/001);

(ii) if so, from which date onwards; and

(iii) accordingly, whether his retirement gratuity and the pension will be paid?

(b) If not, why?

ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) උතුරුමැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිලධාරියා 2:17 වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම අනුමත කර ඇත.

(ii) 2006.12.31 දින සිට.

(iii) මෙතෙක් ලබාදී නැත.

(ආ) නිලධාරියා 2:17 වගන්තිය යටතේ විශ්‍රාම ගන්වා, ආණ්ඩුකාරවරයාගේ නියෝගය අනුව සියයට 20ක දඩ මුදල අයකර විශ්‍රාම වැටුප ගෙවීමේ ඉදිරි කටයුතු සඳහා අදාළ ලිපිලේඛන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යවා ඇත. නමුත්, නිලධාරියා 2:17 වගන්තිය යටතේ විශ්‍රාම ගන්වා ඇති හෙයින් සියයට 20ක දඩ මුදලක් අයකිරීමේ හැකියාවක් නොමැති බව දන්වා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් අදාළ ලිපිගොනු නැවත කැකිරාව කලාප කාර්යාලය වෙත එවා ඇත. එබැවින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් මේ පිළිබඳ උතුරුමැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් උපදෙස් විමසා ඇත.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
will there be a deduction of 20 per cent?

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
Yes. But, it was not agreed.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Okay. Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ඔබතුමාගෙන් තවත් අතුරු ප්‍රශ්නයක් අහන්නයි හදන්නේ. ඔබතුමාට එයට පිළිතුරු දෙන්න පුළුවන්ද?

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ නොවුණත්, උසස් පෙළ විභාගයට අදාළ හදිසි ප්‍රශ්නයක් නිසායි ගරු කථානායකතුමාගේ අවසරය ඇතිව මේ ප්‍රශ්නය ඔබතුමාට යොමු කරන්නේ. ඔබතුමා මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න සූදානමින් නොසිටි නිසා මා මේ අවස්ථාවේදී පිළිතුරක් බලාපොරොත්තු නොවුණත්, මේ ගැන වහාම -අදම- සොයා බලා කටයුතු කරන්නය කියන ඉල්ලීම කරනවා.

ප්‍රශ්නය තමයි, නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් පිටත ළමයින් වංචනික ලෙස 2016 උසස් පෙළ විභාගයට නුවරඑළිය දිස්ත්‍රික්කයේ විවිධ පාසල්වලදී විභාගයට පෙනී සිටීම. දැනට මේ ගැන ශාන්ත සේවියර් විදුහලේ විදුහල්පතිවරයා චෝදනා ලබලා, ඔහු ගැන ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. මේ අතර හැටන් හයිලන්ස් විදුහල, තලවකැලේ දෙමළ විදුහල, හැටන් බොස්කෝ විදුහල යන විදුහල්වල සිසුන්ගේ නාම ලේඛන දෙක බැගින් පවත්වා ගෙන ගිහින්, යාපනය, මඩකළපුව, කොළඹ වාගේ දිස්ත්‍රික්කවලින් ළමයින් ගිහිල්ලා ඒ පාසල්වලදී විභාගය ලියන බවට තොරතුරු තිබෙනවා. ඊට අමතරව හපුගස්තලාව අල්මින්හාජ් විදුහලේත්, පෙන්ටර් අනුස්මරණ විදුහලේත්, ශුද්ධ ත්‍රිත්ව විදුහලේ හා ඩෙල්ටා ගැමුණුපුර මහා විදුහලේත් පිට ප්‍රදේශවල ළමුන් ඇවිල්ලා විභාගය ලියන බවට දැනුවත් කරලා තිබෙනවා, නුවරඑළිය දරුවන්ගේ අධ්‍යාපන අයිතිය සුරැකීමේ සංවිධානය විසින්.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඉන්න ප්‍රධානම රාජ්‍ය නිලධාරියා -මම ඒ නම කියන්නේ නැහැ- ඇයගේ දියණිය විශාකා විද්‍යාලයේ ඉගෙන ගන්න ගමන්, දැන් මේ මොහොතේ නුවරඑළිය ශුද්ධ ත්‍රිත්ව විද්‍යාල විභාග මධ්‍යස්ථානයේ විභාගයට ලියනවා කියලා, නුවරඑළියේ රාජ්‍ය ආයතනයක නිලධාරින් එවපු ලිපියක් මා ළඟ තිබෙනවා. මා මේ ලේඛන සියල්ල ඔබතුමාට ලබා දෙන්නම්.

ඊළඟට, යාපනය සහ නැගෙනහිර විශ්වවිද්‍යාලවල සිසුන් ඇවිල්ලා නුවරඑළිය, හැටන් සහ හපුගස්තලාව ප්‍රදේශවල වෙන අය වෙනුවෙන් භෞතික විද්‍යා ප්‍රශ්න පත්‍රයට, -විශේෂයෙන් දෙමළ මාධ්‍යය- පිළිතුරු ලියනවා කියලා අපට දැනුම් දීලා තිබෙනවා. ඒ සම්බන්ධව දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසර ඇතිව මම මේ ලේඛන සියල්ල හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ගරු ඇමතිතුමනි, මේ තොරතුරු මා ඔබතුමාට එවන්නම්. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගෙන පුළුවන් නම් අදම මේ පිළිබඳව ක්‍රියා මාර්ගයක් ගන්න. මේක බරපතළ අසාධාරණයක්. මේකෙන් නුවරඑළියේ දරුවන්ටත් අසාධාරණයක් වනවා. යාපනයේ දරුවන්ටත් අසාධාරණයක් වනවා. මොකද, යාපනයේ දරුවෙක් 'ඒ' සාමාර්ථ තුනක් ගත්තත් විශ්වවිද්‍යාලයට යන්න බැහැ. නමුත් නුවරඑළියට ඇවිල්ලා විභාගයට ලියලා විශ්වවිද්‍යාලයට යන්න පුළුවන්, 'ඒ' සාමාර්ථ එකකින් හා 'බී' සාමාර්ථ දෙකකින්. ඒකෙන් කොළඹ ළමයින්ටත් අසාධාරණයක් වනවා. නුවරඑළියේ දරුවන්ට සුවිශාල අසාධාරණයක් වනවා. මේ වංචාව පිළිබඳව ඔබතුමා වහාම -අදම- සොයා බලා කටයුතු කරන්නය කියන ඉල්ලීම කරනවා.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
මේ අතුරු ප්‍රශ්නය, ප්‍රශ්නයට අදාළ නැති වුණත් මට උත්තර දෙන්න පුළුවන්.

මේ කාරණය ගැන අපි විශේෂ වැඩ පිළිවෙළක් දැන් ක්‍රියාත්මක කරනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ පාසල් 17ක මෙවැනි සිද්ධි වෙලා තිබෙනවා. ඊට අමතරව පුත්තලම දිස්ත්‍රික්කයේ නාත්තණ්ඩිය පාසලක එවැනි සිද්ධියක් වූ බවට දැන් අපට වාර්තා වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මාර්ගයෙන් දැන් කටයුතු කර ගෙන යනවා. විභාග කොමසාරිස් ජනරාල්තුමාත් මේ ගැන සොයා බලා කටයුතු කරනවා. දැනටම principal කෙනෙක් interdict කර තිබෙනවා. ඒ ළමයි පිට පළාතක ඉඳලා ඇවිත් නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් හෝ වෙනත් දිස්ත්‍රික්කයකින් විභාගයට ලිව්වාට, අපි දැනට තීරණයක් අරගෙන තිබෙනවා, identity card බලලා ඉන්න පළාත අනුව UGC එකට recommend කරන්න. ඒ නිසා දැන් නුවරඑළියේ ළමයින්ට කිසිම බාධාවක් වෙන්නේ නැහැ. ඒ කටයුත්ත අපි කරලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ කරුණු ටිකත් ඔබතුමාගේ අවධානයට යොමු කර ගන්න. ගරු මන්ත්‍රීතුමා ඒ ඉල්ලීම නේ කරන්නේ.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
හොඳයි, අපි ඒ ගැන ඉදිරියේදී සලකා බලන්නම්.

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙතැන සිදු වෙලා තිබෙන ප්‍රධානම දේ තමයි,-

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
මා නියෝජනය කරන්නේත් නුවරඑළිය දිස්ත්‍රික්කය. ඒ නිසා මටත් විශේෂ උනන්දුවක් තිබෙනවා මේ ගැන කථා කරන්න. ඒ නිසා අපි ඒ ගැන ඉදිරියේදී කටයුතු කරනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා මේ පරීක්ෂණය සම්බන්ධයෙන් කිව්වේ, ඒ ප්‍රදේශයේ අදාළ අධ්‍යාපන අධ්‍යක්ෂවරු මාර්ගයෙන් කටයුතු කරනවා කියලා.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු මාර්ගයෙන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
සමහර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුත් රුපියල් ලක්ෂ පහ ගණනේ අරගෙන තමයි මේවා කරලා තිබෙන්නේ කියලා ඒ දෙමව්පියෝ ලියා එවා තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා අධ්‍යාපන අමාත්‍යාංශයේ - Head Office එකේ- වග කිව යුතු ප්‍රධාන නිලධාරියෙක් යවලා මේ ගැන පරීක්ෂණ කරන්න. ඒ අය කෙළින්ම ලියලා තිබෙනවා, රුපියල් ලක්ෂ 5 ගණනේ අරගෙන හොරට ග්‍රාම නිලධාරි සහතික ඔක්කෝම හදලා තමයි මේක කරලා තිබෙන්නේ කියලා. ඔබතුමන්ලා දැනටම මේ ගැන දැනුවත් වීම සම්බන්ධව මා සතුටු වනවා. ඉතා ඉක්මනින් මේ අසාධාරණය නැති කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ සම්බන්ධව අවධානය යොමු කරන්න.

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන අවධානය යොමු කළාට ස්තුතියි.

රක්ෂිත බන්ධනාගාරගත කළ හෝ සිරගතගත කළ භික්ෂූන්වහන්සේලා: විස්තර

විළක්කමරියලිල් අල්ලතු සිරෙක්කෙතිකළාක උළ්ළ පික්කුමාර් : විපරම්

MONKS REMANDED OR IMPRISONED : DETAILS

632/'16

8. ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) වර්ෂ 1948 සිට 2015 ජනවාරි 08 දක්වා කාලය තුළ සැකපිට රක්ෂිත බන්ධනාගාරගත කළ හා චෝදනා ඔප්පු වීමෙන් පසු වැරදිකරුවන් ලෙස සිරගත කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කළ හෝ සිරගත කළ භික්ෂූන්වහන්සේලා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට හෝ සිරගත කිරීමට හේතු වූ චෝදනාව හෝ වරද, එක් එක් භික්ෂූන්වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රක්ෂිත බන්ධනාගාරගත කළ හෝ සිරගත කළ භික්ෂූන්වහන්සේලා රක්ෂිත බන්ධනාගාරගතව හෝ සිරගත කර සිටි කාලය, එක් එක් භික්ෂූන් වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) 2015.01.08 සිට 2016.03.31 දක්වා කාලය තුළ රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන් වහන්සේලාට එල්ල වුණු චෝදනාව, එක් එක් භික්ෂූන් වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම භික්ෂූන් වහන්සේලා රක්ෂිත බන්ධනාගාර ගත කර සිටි කාලය, එක් එක් භික්ෂූන් වහන්සේ අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

නීති අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. Wijayadasa Rajapaksha)
නීති අමාත්‍යාංශයේ ලේකම්තුමා මේ ගැන දන්වා සිටියා, ඒ අනුව මා ඒ ගැන දන්වා සිටිනවා.

නීති අමාත්‍යාංශ ලේකම් මහතා
(சட்ட அமைச்சின் செயலாளர்)
(Secretary, Ministry of Legal Affairs)
නීති අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මහතා වෙනුවෙන් පිළිතුර ඉදිරිපත් කරනවා.

(අ) (i) 1948ආම් ආණ්ඩු මුදල් 2015 සනවරි මාතම් 08ආන් තිකති වරෙයිලාන කාලප්පකුතියිනුළ් සන්තේකත්තින්පේරිල් විළක්කමරියලිල් වෛක්කප්පට්ට මර්රුම් කුර්රච්චාට්ටුක්කළ් නිරූපික්කප්පට්ටතන් පින්නර් කුර්රවාළිකළාකච් චිරෙයිල් අටෛක්කප්පට්ට පෞත්ත පික්කුමාරින් එණ්ණික්කෛ ආණ්ටුවාරියාක වෙව්වේරාක යාතු;

(ii) විළක්කමරියලිල් වෛක්කප්පට්ට අල්ලතු චිරෙයිල් අටෛක්කප්පට්ට පික්කුමාර්, අව්වාරු විළක්ක මරියලිල් වෛක්කප්පටුවතර්කු අල්ලතු චිරෙයිල් අටෛක්කප්පටුවතර්කු කාරණමාන කුර්රච්චාට්ටු අල්ලතු කුර්රම්, ඔව්වොරු පික්කුවුක්කුම් ඒර්ප වෙව්වේරාක යාතු;

(iii)විළක්ක මරියලිල් වෛක්කප්පට්ට අල්ලතු චිරෙයිල් අටෛක්කප්පට්ට පික්කුමාර් විළක්කමරියලිල් වෛක්කප්පට්ටිරුන්ත අල්ලතු චිරෙයිල් අටෛක්කප්පට්ටිරුන්ත කාලප්පකුති ඔව්වොරු පික්කුවුක්කුම් ඒර්ප වෙව්වේරාක යාතු;

එන්පතෛ අවර් සපෛයිල් චමර්ප්පිප්පාරා?

(ආ) (i) 2015.01.08ආන් තිකති මුතල් 2016.03.31ආන් තිකති වරෙයිලාන කාලප්පකුතියිනුළ් විළක්ක මරියලිල් වෛක්කප්පට්ට පික්කුමාරින් එණ්ණික්කෛ යාතු;

(ii) විළක්කමරියලිල් වෛක්කප්පට්ට පික්කුමාරුක්කු එතිරාකච් චාට්ටප්පට්ට කුර්රච්චාට්ටුක්කළ් ඔව් වොරු පික්කුවුක්කුම් ඒර්ප වෙව්වේරාක යාතු;

(iii) மேற்படி பிக்குமார் விளக்கமறியலில் வைக்கப் பட்டிருந்த காலப்பகுதி ஒவ்வொரு பிக்குவுக்கும் ஏற்ப வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice:

(a) Will he table-

(i) the number of Buddhist monks who were remanded on suspicion and who were imprisoned as offenders after having confirmed the allegations levelled against them during the period from the year 1948 to 08th January 2015 separately as per each year;

(ii) separately the allegation or the offence that led to remanding or the imprisonment of each monk who was either remanded or imprisoned; and

(iii) separately the time period during which each remanded or imprisoned monk was either remanded or imprisoned?

(b) Will he inform this House-

(i) the number of Buddhist monks who were remanded during the period from 08.01.2015 to 31.03.2016;

(ii) separately the allegations which were levelled against each monk who was remanded; and

(iii) separately the time period during which each of the aforesaid monks were remanded?

(c) If not, why?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Minister of Buddhasasana)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. වර්ෂ 1948 සිට 2015 ජනවාරි 08 දක්වා සැකපිට රක්ෂිත බන්ධනාගාරගත කළ හා චෝදනා ඔප්පු වීමෙන් පසු වැරදිකරුවන් ලෙස සිරගත කළ බෞද්ධ භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව 172ක් වන අතර වර්ෂ අනුව පහත දැක්වේ.

වර්ෂය	සංඛ්‍යාව
2006ට පෙර	19
2006	12
2007	07
2008	07
2009	15
2010	18
2011	18
2012	14
2013	24
2014 සිට 2015.01.08 දක්වා	38
එකතුව	**172**

ප්‍රභවය - බන්ධනාගාර මූලස්ථානය

ඒ 172න් 153ක්, 2006 සිට 2015 ජනවාරි 08 දක්වා.

(ii) ඔව්. වර්ෂ 1948 සිට 2015 ජනවාරි 08 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන් වහන්සේලා බන්ධනාගාරගත කිරීමට හේතු වූ චෝදනාව ඇමුණුම 01 මඟින් දක්වා ඇති අතර සිරගත කළ භික්ෂූන් වහන්සේලා සිරගත කිරීමට හේතු වූ චෝදනාව ඇමුණුම 01 (අ) මඟින් දක්වා ඇත.

(iii) ඔව්. වර්ෂ 1948 සිට 2015 ජනවාරි 08 දක්වා රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන් වහන්සේලා රක්ෂිත බන්ධනාගාරගත කළ කාලය ඇමුණුම 02 මඟින් දක්වා ඇති අතර වැරදිකරුවන් වූ භික්ෂූන් වහන්සේලා සිරගත කළ කාලය අනුව ඇමුණුම 02 (අ) මඟින් දක්වා ඇත.

(ආ) (i) ඔව්. 2015.01.08 සිට 2016.03.31 දක්වා කාලය තුළ රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව 81කි.

(ii) ඔව්. රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන් වහන්සේලා බන්ධනාගාරගත කිරීමට හේතු වූ චෝදනාව ඇමුණුම 03 මඟින් දක්වා ඇත.

(iii) ඔව්. රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන් වහන්සේලා රක්ෂිත බන්ධනාගාරගත කළ කාලය අනුව ඇමුණුම 03 (අ) මඟින් දක්වා ඇත.

ඇමුණුම් **සභාගත*** කරමි.

(ඇ) පැන නොනඟී.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මේ රටේ සිටින ප්‍රවීණ නීති විශාරදයෙක්. 2015 ජනවාරි 08වන දායින් පසුව රක්ෂිත බන්ධනාගාරගත කළ භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව අසූඑක්නමක් කියලා ඔබතුමා සඳහන් කළා. උන්වහන්සේලා රක්ෂිත බන්ධනාගාරගත කර තිබෙන හේතු ගත්තොත් ඒවා ඉතාම සුළු පැමිණිලියි, එහෙම නැත්නම් සුළු වැරැදියි කියා මා යෝජනා කරනවා. එය එසේ නම් ඔබතුමා එසේය කියා කියන්න. සමහර විට සමථ මණ්ඩලයකට ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් වන වැරැදි මත තමයි උන්වහන්සේලා අසූඑක්නම රක්ෂිත බන්ධනාගාරගත කරලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව ඔබතුමා දරන අදහස කුමක්ද කියා මා දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දරන ඒ අදහස වැරැදියි. පිළිතුරෙන් මා සියල්ල නොකිව්වත්, දළ වශයෙන් ගත්තොත්, ලිංගික අපයෝජන, පුරා වස්තු සොරකම් කිරීම, මුදල් වංචා, දැරියන්ට අතවර කිරීම, හිරිඔතප් බිඳීම, ළමා අපචාර, නිධන් හැරීම, ළමා හිංසනය, ස්ත්‍රී දූෂණය, දේපොළ සොරකම, ආගමන විගමන නීති උල්ලංඝනය කිරීම යන චෝදනා මත තමයි මේ බන්ධනාගාරගත කිරීම් කර තිබෙන්නේ. ළමා අපචාර වැඩි වශයෙන් තිබෙනවා. ඊට අමතරව, භයනමක් හෝ හත්නමක් සම්බන්ධයෙන් තිබෙන

---

* ***ප්‍රශ්නකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

චෝදනාව උසාවි රාජකාරියට බාධා කිරීමයි. මේ සියල්ලම අරගෙන බැලුවාම ඒවා තමයි චෝදනා විධියට තිබෙන්නේ. අලි ප්‍රශ්නය සම්බන්ධ එක නඩුවක් තිබෙනවා.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම ප්‍රශ්නයට කෙළින්ම අදාළ නොවුණත්, එක පැත්තකින් ඔබතුමා බුද්ධශාසන අමාත්‍යවරයා නිසායි මේ ප්‍රශ්නය මතු කරන්නේ. මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව පවතින මුලතිව් සම්බෝධි විහාරය එතැනින් ඉවත් කිරීම සඳහා මේ වෙන කොට දැවැන්ත උත්සාහයක් තිබෙනවා. එක පැත්තකින් තුරෙයි රාසා රවිහරන් නැමැති උතුරු පළාත් සභාවේ TNA මන්ත්‍රීතුමා කිහිප විටක්ම එම පන්සලට ගිහිල්ලා එහි ස්වාමීන් වහන්සේට - තිස්සපුර ගුණරතන ස්වාමීන් වහන්සේට - බලපෑමක් කරලා තිබුණා. අනෙක් පැත්තෙන් දැන් එම පන්සලේ සංවර්ධන කටයුතු කරගෙන යන්න ඉඩ නොදී ඒ කටයුතු අඩාල කර තිබෙනවා. අනෙක් පැත්තෙන් උතුරු පළාත් සභාවේ මහ ඇමතිතුමා -විග්නේෂ්වරන් මැතිතුමා- නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට මෙම පන්සල ඉවත් කිරීම සඳහා පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා. දකුණේ හින්දු කෝවිල් තැනීමේ අවකාශය තිබෙනවා නම්, අනෙක් පළාත්වලටත් ඒ අයිතිය තිබෙන්නට ඕනෑ. ඔවුන්ටත් ඒ අවකාශය තිබෙන්න ඕනෑ. ඒ වාගේම උතුරු පළාතේ බෞද්ධ විහාරස්ථාන පැවතීමේ අයිතියත් තිබෙන්න ඕනෑ. මේ පන්සල් රැක ගැනීම සඳහා එක පැත්තකින් අධිකරණ ඇමතිතුමා හැටියටත්, අනෙක් පැත්තෙන් බුද්ධ ශාසනය භාර ඇමතිතුමා හැටියටත් ගන්නා පියවර මොකක්ද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මෙම ප්‍රශ්නයට අදාළ නොවුණත් මම උත්තරයක් දෙන්නම්. ඒ සම්බන්ධව අපි දැනුවත් වෙලායි තිබෙන්නේ. විශේෂයෙන්ම ආගමික සහජීවනය පවත්වා ගෙන යාම සඳහා අපි විශාල උත්සාහයක් දරනවා. මේ ප්‍රශ්නය සම්බන්ධව සෘජු ලෙසම රජය මැදිහත් වෙලා; පොලීසිය මැදිහත් වෙලා තිබෙනවා. මේ පිළිබඳව දැනටත් අවධානය යොමු කර තිබෙන අතර, යම් මට්ටමින් සාකච්ඡා පවත්වා තිබෙනවා. මෙය සාකච්ඡා මඟින් සාමකාමී තත්ත්වයකට පත් කර ගන්න පුළුවන් වෙයි කියලා අපට විශ්වාසයක් තිබෙනවා.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

1948 කාල වකවානුවේ ඉඳලා ගත්තොත් ඉතිහාසයේ වැඩිම බෞද්ධ භික්ෂූන් වහන්සේලා ප්‍රමාණයක් රක්ෂිත බන්ධනාගාර ගතකොට, එසේ නැත්නම් සිරගතකොට තිබෙන කාලවකවානුව බවට ජනවාරි 8 සිට මේ දක්වා කාල වකවානුව පත් වෙනවා කියලා ඔබතුමා පිළිගන්නවාද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

එහෙම පිළිගන්න බැහැ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ භික්ෂූන් වහන්සේලා 153දෙනෙකු සිරගත වෙලා තිබෙනවා. ඒක ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ප්‍රශ්නයක්වත්, ආණ්ඩුවේ දෝෂයක්වත් නොවෙයි. භික්ෂූන් වහන්සේලා වැරැදි කළොත් -ළමා හා ස්ත්‍රී දූෂණ සිදු කළොත්, නිදන් හැරුවොත්- ඒ ආණ්ඩුව තිබෙන කොටත් අත් අඩංගුවට ගත්තා, මේ ආණ්ඩුව තිබෙන කොටත් අත් අඩංගුවට ගන්නවා. ඒ නිසා ඔබතුමා මේක කාල පරිච්ඡේදයකට අදාළ කර ගන්න යන්න එපා. ඒක වැරැදි පූර්වාදර්ශයක් වෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. අතුරු ප්‍රශ්න තුනම අවසානයි.

සතොස වෙළෙඳ ආයතන : විස්තර
சதொச விற்பனை நிலையங்கள்: விபரம்
CWE OUTLETS: DETAILS

590/'16

7. ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවතින මුළු සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන අතරින් රජයේ ගොඩනැඟිලිවල පවත්වාගෙන යනු ලබන සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව සහ කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන සතොස වෙළඳ ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබාගත් ගොඩනැඟිලි සඳහා කුලී ගෙවීමට සතොස මඟින් වාර්ෂිකව කොපමණ මුදලක් වැය කරන්නේද;

(ii) කුලියට ලබාගත් ගොඩනැඟිලි පිහිටා තිබෙන ස්ථාන කවරේද; එම ස්ථානවල නිමිකරුවන් කවුරුන්ද සහ ඔවුන්ට මාසිකව ගෙවන කුලී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ස්ථානවල දැනට පවත්වාගෙන යන සහ වසා දමා ඇති සතොස ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සතොස වෙළඳ ආයතන පිහිටුවීමට කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையினுள் காணப்படும் சதொச விற்பனை நிலையங்களின் மொத்த எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(ii) மேற்படி நிலையங்களில் அரச கட்டிடங்களில் இயங்கும் சதொச விற்பனை நிலையங்களின் எண்ணிக்கையும் வாடகை அடிப்படையில்

இயங்கிவரும் சதொச விற்பனை நிலையங் களின் எண்ணிக்கையும் வெவ்வேறாக எவ்வள வென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வாடகை அடிப்படையில் பெறப்பட்ட கட்டிடங் களுக்கு வாடகைத் தொகையைச் செலுத்து வதற்கு சதொசவினால் வருடாந்தம் செலவிடப் படும் பணத்தொகை எவ்வளவென்பதையும்;

(ii) வாடகைக்குப் பெறப்பட்ட நிலையங்கள் அமைந்துள்ள இடங்கள் யாவை என்பதையும்; அவற்றின் உரிமையாளர்கள் யாவர் என்ப தையும்; இவர்களுக்கு மாதாந்தம் செலுத்தப்படும் வாடகைத் தொகை வெவ்வேறாக எவ்வள வென்பதையும்;

(iii) மேற்படி இடங்களில் தற்போது இயங்கி வருகின்ற மற்றும் மூடப்பட்டுள்ள சதொச நிலையங்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவென்பதையும்,

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) சதொச விற்பனை நிலையங்களைத் தாபிப் பதற்கு வாடகை அடிப்படையில் கட்டிடங் களைப் பெறுகையில் முறைசார்ந்த செயன்முறை பின்பற்றப்படுகின்றதா என்பதையும்,

(ii) ஆமெனில், அச்செயன்முறை யாதென்பதையும்,

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Will he inform this House-

(i) the total number of CWE outlets in Sri Lanka; and

(ii) of those outlets, the number of outlets which are run in government buildings and the number of outlets which are run in rented buildings?

(b) Will he also inform this House -

(i) the amount of money spent annually by the CWE to pay the rent of rented buildings;

(ii) separately the locations of the rented buildings, their owners and the monthly rent paid to them; and

(iii) separately the number of functioning and closed down CWE outlets at those locations?

(c) Will he state-

(i) whether a formal methodology is followed in obtaining buildings on rent to run CWE outlets; and

(ii) if so, what that methodology is?

(d) If not, why?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

(a) (i) A number of 319 outlets are operating up to date.

(ii) Sathosa outlets in Government Buildings - 69 Nos.

Sathosa outlets in private owners' buildings -250 Nos.

(b) (i) Government building rent value - Rs. 51,666,744.72

Private building rent value - Rs. 242,904,566.76

Total rent value - Rs. 294,571,311.48

(ii) Sathosa outlets in Government buildings- List attached (Annex No. 01 A*)

Sathosa outlets in private owners' buildings -List attached (Annex No. 01 B*)

(iii) List attached (Annex No. 02*)

(c) Yes.

(d) See Annex No. 03*

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, පසු ගිය රජය කාලයේ සතොස ආයතනවල භාණ්ඩ අඩුවෙන් තිබුණත්, මේ කාලය වෙන කොට සතොස ආයතනවල පාරිභෝගික භාණ්ඩ බහුල වශයෙන් තිබෙනවා දකින්නට ලැබෙනවා. ඒ පිළිබඳව ගරු ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. පසු ගිය ආණ්ඩුව කාලයේ කුලී පදනම මත පමණක් පෞද්ගලික ස්ථානවල සතොස ආයතන පවත්වාගෙන ගිය බව අප දන්නවා. ජනතාව වැඩි වශයෙන් පදිංචි ස්ථානවල, ජනතාව ගැවසෙන ස්ථානවල එම සතොස ආයතන පවත්වාගෙන නොගිය නිසා ජනතාවට එයින් වැඩි පහසුවක් ලැබෙන්නේ නැහැ කියා ඔබතුමා දන්නවාද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ඒ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමන්ලාට මම දැනුම් දීමක් කළා. අදාළ තොරතුරු ලබා දෙන්න කියලාත් මම ලිඛිතව ඉල්ලීමක් කළා. විශේෂයෙන්ම අපි වෙනම කමිටුවක් පත් කරලා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබෙනවා. එවැනි ජනතාව නොගැවසෙන ස්ථානවල තිබුණු සතොස ආයතන දෙකක් පමණ ඉවත් කර වෙනත් තැන්වලට ගෙන ගිහින් තිබෙනවා. දිස්ත්‍රික්ක කිහිපයකින් එවැනි ඉල්ලීම් කරලා තිබෙනවා. ඒවා සම්බන්ධයෙනුත් කටයුතු කර ගෙන යනවා.

---

* *ඇමුණුම් පුස්තකාලයේ තබා ඇත.*
* *இணைப்புக்கள் நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளன.*
* *Annexes Placed in the Library.*

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ඒ ගැන ස්තුතිවන්ත වෙනවා, ගරු ඇමතිතුමනි. ඒ වාගේම අපේ පළාත්වල තවත් සතොස වෙළෙඳ ආයතන කිහිපයක් ඇති කිරීම පිණිස ස්ථාන තෝරා ගෙන මේ වනවිට ඔබතුමා වෙත ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා ඔබතුමා ඉක්මනින් පියවර ගෙන, ඒවා විවෘත කිරීමට අවශ්‍ය කටයුතු සලසනවාද කියා දැනගන්නට කැමැතියි.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ගරු මන්ත්‍රීතුමනි, මේ අවුරුද්ද අවසානය වන විට අපි සතොස වෙළෙඳ සැල් 400 දක්වා අලුතෙන් ඇති කරන්න සූදානම් කර තිබෙනවා. දැනටමත් outlets 319ක් තිබෙනවා. මේ අවුරුද්දේ දෙසැම්බර් 31 වන විට සතොස ආයතන 400ක් දක්වා අලුතෙන් ඇති කරන්නට සූදානම් කර තිබෙනවා.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Hon. Speaker, may I ask a Supplementary Question?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
According to the Hon. Minister, there are 319 outlets operating island-wide. When you recruit people for those outlets, is there any formal methodology or criteria that is being followed?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
We advertise for the higher positions like DGM, Operation Managers and Area Managers and get them selected. Applications are called from those who have passed the G.C.E. (O/L) and (A/L) examinations and interviews are held accordingly to select them for the other posts from the respective areas.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Is this applicable to every district?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
Yes.

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Okay, thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

යාපනය කාර්මික විද්‍යාල: මුදල් අක්‍රමිකතාව
யாழ்ப்பாணம் தொழில்நுட்பக் கல்லூரி : நிதி முறைகேடு
JAFFNA TECHNICAL COLLEGE: FINANCIAL IRREGULARITY

562/'16

5. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු එස්. ශ්‍රීතරන් මහතා වෙනුවට)
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு சி. சிறீதரன் சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. S. Shritharan)
නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) යාපනය කාර්මික විද්‍යාලේ සිදු වූ මුදල් අක්‍රමිකතාව පිළිබඳව එතුමා දන්නේද;

(ii) එසේ නම්, මෙතෙක් ඒ සම්බන්ධයෙන් කටයුතු නොකිරීමට හේතු කවරේද;

(iii) එම කාර්මික විද්‍යාලේ අධ්‍යක්ෂවරයා විසින් සිදුකළ මුදල් වංචාව තහවුරු වීමෙන් පසු ඔහුට ස්ථාන මාරුවක් ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම ස්ථාන මාරුව මෙතෙක් ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(v) අදාළ ස්ථාන මාරුව අත්හිටුවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යාපනය කාර්මික විද්‍යාලේ වෙනත් ශාඛා එම දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබේද;

(ii) නොඑසේ නම්, එම දිස්ත්‍රික්කයේ ජීවත්වෙන 650,000 ක ජනතාවට මෙම කාර්මික විද්‍යාල ප්‍රමාණවත්ද;

(iii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி அமைச் சரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாணம் தொழில்நுட்பக் கல்லூரியில் இடம்பெற்றுள்ள நிதி முறைகேடு பற்றி அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், இதுவரை அது தொடர்பாக நடவடிக்கை எடுக்காமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி தொழில்நுட்பக் கல்லூரியின் பணிப் பாளர் புரிந்துள்ள நிதி மோசடி நிரூபிக்கப்பட்ட பின்னர் இவருக்கு இடமாற்றும் வழங்கப் பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், குறித்த இடமாற்றம் இதுவரை நடைமுறைப்படுத்தப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்

(v) மேற்படி இடமாற்றம் இடைநிறுத்தப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) யாழ்ப்பாணம் தொழில்நுட்பக் கல்லூரியின் பிற கிளைகள் அந்த மாவட்டத்தில் அமைந் துள்ளனவா என்பதையும்;

(ii) இன்றேல், அந்த மாவட்டத்தில் வசிக்கும் 650,000 மக்களுக்கு மேற்படி தொழில்நுட்பக் கல்லூரி போதுமானதா என்பதையும்;

(iii) இன்றேல், அது தொடர்பாக எடுக்கவிருக்கும் நடவடிக்கைகள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Skills Development and Vocational Training:

(a) Will he inform this House-

(i) whether he is aware of the financial irregularity that took place in the Technical College of Jaffna;

(ii) if so, the reason for not taking any action in this regard;

(iii) whether a transfer was given to the Director of the Technical College when the financial fraud committed by him was confirmed;

(iv) if so, the reasons for the non-implementation of the transfer; and

(v) whether the said transfer has been suspended?

(b) Will he also inform this House-

(i) whether there are branches of the Jaffna Technical College within the District;

(ii) if not, whether this Technical College is sufficient for 650,000 people living in this district; and

(iii) if not, the steps that will be taken in this regard?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) යාපනය තාක්ෂණික විද්‍යාලයෙහි මුදල් අක්‍රමිකතාවක් පිළිබඳව දැනගැනීමට ලැබී ඇත.

(ii) කටයුතු කර ඇත. යාපනය තාක්ෂණ විද්‍යාලයෙහි සිදුවී ඇතැයි වාර්තා වී ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් කමිටුවක් පත් කර මූලික විමර්ශනයක් සිදුකර, එම මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යාපනය තාක්ෂණික විද්‍යාලයේ අධ්‍යක්ෂ එන්. යෝගරාජා මහතා හට 2016.03.09 දිනැතිව චෝදනා පත්‍රයක් නිකුත් කර, ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

(iii) මූල්‍ය වංචාවක් පිළිබඳව මෙතෙක් තහවුරු වී නැතත්, යාපනය තාක්ෂණ විද්‍යාලේ අධ්‍යක්ෂ එන්. යෝගරාජන් මහතා හට 2016.04.25 දින සිට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුවක් ලබා දී ඇත.

(iv) 2016.04.25 වන දින සිට ස්ථාන මාරුව ක්‍රියාත්මක කර ඇත.

(v) නැත.

(ආ) (i) නැත.

(ii) යාපනය තාක්ෂණ විද්‍යාලයේ සිසුන් 1,600කට ආසන්න ප්‍රමාණයකට අධ්‍යාපනය ලබාදීමේ පහසුකම් ඇති නමුත්, දැනට අධ්‍යාපනය හදාරන්නේ සිසුන් 1,300ක් පමණ වේ. එබැවින් යාපනය තාක්ෂණ විද්‍යාලයට තවදුරටත් සිසුන් බඳවා ගැනීමේ හැකියාව පවතී.

නමුත් අනාගතයේදී කාර්මික අධ්‍යාපනය සඳහා යොමුවිය හැකි සිසුන් පිළිබඳ සලකා බලා, යාපනය දිස්ත්‍රික්කයේ, තෙන්මරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මීසාලෙයි, උතුරු මීසාලෙයි කාර්මික විද්‍යාලයක් ආරම්භ කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලමින් සිටී.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්න.

ඊට ප්‍රථම, කවුරු හෝ මන්ත්‍රීවරයකු ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ දී "ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் *அக்கிராசனத் தினின்று அகலவே,* மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் *தலைமை வகித்தார்கள்.*
Whereupon THE HON. SPEAKER *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

දෙමළ මාධ්‍ය පෙළ පොත්වලට ශ්‍රී ලංකාවේ සත්‍ය ඉතිහාසය ඇතුළත් කිරීම
தமிழ் மொழிமூலப் பாடநூல்களில் இலங்கையின் உண்மை வரலாற்றை உட்புகுத்தல்
INSERTION OF TRUE HISTORY OF SRI LANKA IN TAMIL MEDIUM TEXT BOOKS

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ கல்வி அமைச்சர் அக்கில விராஜ் காரியவசம் அவர்களிடம் இந்த வினாவை கேட்க அனுமதித்ததற்கு நன்றி!

ஒரு நாட்டின் வரலாற்றை ஒவ்வொரு மாணாக்கரும் அவசியம் தெரிந்திருக்க வேண்டியதும் அதில் போதிய அறிவினைக் கொண்டிருக்க வேண்டியதும் முக்கியமானது. அந்த வகையில், எமது மாணவர்களது பாடத்திட்டத்தில் வரலாற்றுப் பாடம் அடங்கியுள்ளதுடன், கல்விப் பொதுத் தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சைக்குரிய பாடங்களிலும் அது இடம்பெற்றுள்ளது. இதே பரீட்சைக்குரிய கட்டாய பாடங்கள் ஆறில் ஒன்றாகவும் இது அமைந்துள்ளது. நிகழ்ந்த நிகழ்வுகளைத் தொகுத்துக் கூறல் வரலாறாகும். அதில் நல்லவை, கெட்டவை, சாதகமானவை, பாதகமானவை என சகலதும் இருக்கலாம். எனினும், பக்கம் சாராது உள்ளதை உள்ளபடி கூறுவது உண்மை வரலாறாகும். அந்த வகையில் எமது நாட்டில் நிகழ்ந்த உண்மை நிகழ்வுகளை இளமை முதல் கற்றுணர்ந்துகொள்வதற்காகவே வரலாறு என்பது பாடசாலை களில் கட்டாய பாடமாக்கப்பட்டுள்ளது.

சிங்கள, தமிழ் மக்களுக்கு நீண்டகால வரலாறு உண்டு. சிங்கள மன்னர்களும் தமிழ் மன்னர்களும் எமது பண்டைய இராசதானிகளை ஆட்சிசெய்துள்ள நிலையில், சிங்கள மன்னர் களது படைகளில் தமிழ் படைவீரர்களும் தமிழ் மன்னர்களின் படைகளில் சிங்களப் படைவீரர்களும் இருந்துள்ளனர். எமது நாட்டைப் பொறுத்தவரையில், வடக்கு எல்லை பருத்தித் துறையாகவும் தெற்கு எல்லை தேவேந்திரமுனையாகவும் உள்ளது. அதேபோல், கிழக்கு எல்லை மட்டக்களப்பாகவும் மேற்கு எல்லை கொழும்பாகவும் உள்ளது. இந்த குறித்த எல்லைக்குள் இடம்பெற்றுள்ள பண்டைய வரலாற்று நிகழ்வுகள் அனைத்துமே இலங்கை வரலாற்றில் உள்ளடக்கப் பட வேண்டியவையாகும். அவை விரிவாகவோ, சுருக்கமாகவோ அமையலாம். எனினும், தமிழர்களின் பண்டைய இருப்பை வெளிப்படுத்தக்கூடிய ஆட்சிகள், மற்றும் ஆட்சியாளர்கள் தொடர்பிலான விடயங்கள் எவையும் பாடசாலை மாணவர்களுக்கான வரலாற்றுப் பாடநூல்களில் தெளிவாக இடம்பெறாமையானது பாரிய குறைபாடாகும். அத்தகைய குறைபாடுகளுடன்கூடிய வரலாறே எமது மாணாக்கருக்குக் கற்பிக்கப்படுகின்றதாக அறியமுடிகின்றது.

அது மட்டுமல்லாது, இனங்களுக்கிடையில் நல்லிணக்கம் வளர்க்கப்பட வேண்டுமென்பதில் அக்கறை காட்டப்படுகின்ற இந்த ஆட்சியில் இந்த வரலாற்றுப் பாடத்திட்டமானது அதற்கு எதிரான விளைவுகளையே கொண்டுவரக்கூடிய வகையில் அமையப் பெற்றிருப்பதையும் காணக்கூடியதாகவுள்ளது. அந்நியர்கள் இந்த நாட்டை ஆக்கிரமித்தபோது சிங்கள மக்களைப் போன்றே தமிழ் மக்களும் அந்நியர்களுக்கெதிரான போராட்டங்களை நடத்தியுள்ளனர். குறிப்பாக, போர்த்துக் கேயரின் ஆட்சி ஏற்படுவதை கோட்டை மன்னன் வித்தியா பண்டாரனும் யாழ்ப்பாண மன்னன் முதலாம் சங்கிலியனும் ஒன்றிணைந்து எதிர்த்துப் போராடினர். அதேபோன்று வன்னிச் சிற்றரசின் இறுதி மன்னன் பண்டாரவன்னியனும் கண்டி மன்னனும் இறுதிவரை ஒன்றிணைந்து ஆங்கிலேய ருக்கு எதிராகப் போராடினர். இறுதியில் 1811இல் பண்டாரவன்னியனை வெற்றி கொண்டதன் பின்னரே 1815இல் ஆங்கிலேயரால் கண்டியை வெற்றிகொள்ள முடிந்தது. இவை பற்றிய போதிய விளக்கங்கள் இன்றியும் உண்மை வரலாறுகள் மறைக்கப்பட்ட நிலையிலுமே எமது மாணாக்கருக்கான வரலாற்றுப் பாடநூல்கள் தயாரிக்கப் பட்டுள்ளதாகத் தெரியவருகிறது.

பொலன்னறுவை அரசு வீழ்ச்சியடைந்ததன் பின்னர், சிங்கள இராசதானி தெற்கு நோக்கி தம்பதெனிய, யாப்பஹுவ, குருநாகல், கம்பளை, கோட்டை என இடம் மாறிய வரலாறு பாடநூல்களில் விரிவாகக் காணப்படுகின்ற நிலையில், அதே காலகட்டத்தில் வட இலங்கையில் கலிங்காமன், சாவகன், வன்னியர், ஆரிய சக்கரவர்த்திகள் போன்றவர்களது இராசதானிகள் தோன்றிய வரலாறுகள் மறைக்கப்பட்டுள்ளன.

சில ஆண்டுகளுக்கு முன்னர் அரசால் வெளியிடப்பட்ட வரலாற்றுப் பாடநூல்களில் தமிழர் மற்றும் தமிழ் மன்னர்களது ஆட்சி பற்றி அரிதாகக் கூறப்பட்டிருந்ததாகவும் அந்த விடயங்களும்கூட அண்மைக்கால வரலாற்றுப் பாடநூல்களி லிருந்து அகற்றப்பட்டுள்ளதாகவும் தெரியவருகிறது. இவ்வாறான மூடிமறைப்புகள், திரிபுபடுத்தல்கள் என்பன பாடசாலைப் பாடங்களினூடாக எமது மாணாக்கருக்குப் புகுத்தப்படுவதால், எமது மாணாக்கர் மற்றும் இளம் சந்ததியினரின் மனதில், தாங்கள் இந்த நாட்டிலிருந்து அந்நியப்பட்டவர்கள் என்ற எண்ணக்கருவே மிக ஆழமாகப் பதிந்துவிடுகின்றது. இவ்வாறான உணர்வுகளுடன் வளரும் எமது இளம் சந்ததியினரிடையே நாட்டுப் பற்றினையும் தேசிய நல்லிணக்க சிந்தனைகளையும் எதிர்பார்ப்பது இயலாத காரியமாகும். "இன்றைய மாணாக்கரே நாளைய எமது நாட்டின் மன்னர்கள்" என்ற நிலையில் வைத்துப் பார்க்கும் போது, இந்த நாட்டு மக்களிடையே மேலும் கசப்புணர்வுகளை வளர்க்குமுகமாகவே இவ்வாறான பாடத்திட்டத் தயாரிப்புகள் காணப்படுவதாகத் தெரியவருகிறது. இது மிகவும் அவதானத்தில் கொள்ளவேண்டிய விடயமாகும். எமது நாட்டில் தேசிய நல்லிணக்கத்தை நாம் பலமிக்கதாகக் கட்டியெழுப்ப வேண்டுமானால் அனைத்துத் தரப்பு மக்களும் அதை உணர்வுபூர்வமாக ஏற்கக்கூடிய சூழல் உருவாக்கப்பட வேண்டியது அவசியமாகும். அதற்கு எமது மாணவர்களைப் பாடசாலை மட்டத்திலிருந்தே தயார்படுத்த வேண்டும்.

அந்தவகையில், சிங்கள மாணவர்கள் இந்நாட்டின் தமிழர் மற்றும் ஏனைய இனத்தவர் பற்றிய வரலாறு, பண்பாடு என்பவற்றையும், தமிழர் மற்றும் ஏனைய இனத்தவர்கள் சிங்கள மக்களின் வரலாறு, பண்பாடு என்பவற்றையும் தெரிந்துகொள்ள வழியேற்படுத்த வேண்டும். அந்த வகையில் -

தமிழ் மொழிமூல வரலாற்றுப் பாடநூல்களில் எமது நாட்டின் உண்மையான வரலாறு பற்றிய விடயங் களை இணைப்பதில் ஏதேனும் தடைகள் உள்ளனவா என்பது பற்றி அறியத்தர முடியுமா?

தடைகள் ஏதும் இல்லையெனில், எமது நாட்டின் உண்மையான வரலாற்றை எமது மாணாக்கரும் அறிந்துகொள்ளும் வகையில் அவற்றைத் தயாரித்து வழங்க முடியுமா?

நாட்டுப் பற்றையும் தேசிய நல்லிணக்கத்தையும் ஏற்படுத்தக்கூடிய வகையில் இவ்வாறு உண்மையான வரலாற்றைத் தயாரித்து அவற்றைத் தமிழ் மொழிமூல வரலாற்றுப் பாடநூல்களில் இடம்பெறச் செய்வ துடன், அதனைத் தொடர்ந்தும் பேணிவருவதற்கான ஏற்பாடுகளை மேற்கொள்ள முடியுமா?

மேலும், இதுவரை காலமும் எமது வரலாற்றுப் பாடநூல்கள் சிங்கள வரலாற்று ஆசிரியர்களால் சிங்கள மொழியில் எழுதப்பட்டவை என்றும் அந்நூல்களே தமிழ் மற்றும் ஆங்கில மொழிகளில் அப்படியே மொழிபெயர்க்கப்பட்டவை என்றும் இதில் தமிழ் வரலாற்று ஆசிரியர்களின் பங்களிப்பு எழுத்துப் பிழைகளைச் சரிபார்ப்பது மட்டுமே என்றும் தெரியவருகிறது.

இந்த நிலையை மாற்றி, தமிழ் வரலாற்றுப் பாடநூல்களைத் தயாரிப்பதற்காகத் தகுதி வாய்ந்த தமிழ் வரலாற்று ஆசிரியர்கள் அடங்கிய குழு வொன்றை அமைத்து அதனை மேற்கொள்ள நடவடிக்கை எடுக்க முடியுமா?

மேற்படி எனது கேள்விகளுக்கு கல்வி அமைச்சர் சார்பாக கல்வி இராஜாங்க அமைச்சர் அவர்கள் பதிலளிப்பார் என நம்புகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුර ලබා දෙනවාද?

ගරු වී.එස්. රාධකිෂ්ණන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ உறுப்பினர் டக்ளஸ் தேவானந்தா அவர்களால் கௌரவ கல்வி அமைச்சரிடம் கேட்கப்பட்ட கேள்விகளுக்கான பதிலை அவர் சார்பாக நான் வழங்குகிறேன்.

தேசிய கல்வி நிறுவகத்தில் தயாரிக்கப்படும் பாடவிதானங் களுக்கு அமைய, பாடசாலைப் பாடப் புத்தகங்களை அச்சிடுவது வழக்கம். அதன்படி, நம் நாட்டில் தேசிய நல்லிணக் கத்தை ஏற்படுத்தக்கூடிய விதத்தில் வரலாற்றுப் புத்தகங்களில் உண்மையான வரலாறுகள் உள்ளடக்கப்பட்டுள்ளன. வரலாற்றுப் புத்தகங்களை எழுதும்போதும் பதிப்புகளை மேற்கொள்ளும்போதும் தமிழ்ப் புத்திஜீவிகளின் உதவியும் பெற்றுக்கொள்ளப்படுகிறது.

6 முதல் 11ஆம் வகுப்பு புத்தகங்களுக்காக தற்போதைய எழுத்தாளர் குழாமில் அங்கம் வகிக்கும் மேரி டொனேட்டா கன்னியாஸ்திரி, யு.எல்.எம். பஸீர், யு.எல். மரிக்கார், எஸ். பாலசுந்தரம், பதிப்பாளர் சபை உறுப்பினர் கலாநிதி அனுஷா சேனாதிராஜா போன்றோர் பாடப் புத்தகக் கமிட்டியில் சிங்கள அங்கத்தவர்களுக்கு மேலதிகமாக அங்கத்துவத்தைப் பெற்றுள்ளார்கள்.

தமிழ் மக்கள் பற்றிய பாரம்பரிய தகவல்கள் தற்போது உபயோகத்திலுள்ள வரலாற்றுப் பாடப் புத்தகங்களில் உள்ளடக்கப்பட்டுள்ளன. 7ஆம் தர வரலாற்றுப் புத்தகத்தின் 60ஆம் பக்கத்தில் யாழ்ப்பாண இராச்சியத்தைப் பற்றிக் குறிப்பிடப்பட்டுள்ளது. அதேபோல் புதிய பாடவிதானங் களுக்கு ஏற்ப தயாரிக்கப்பட்ட 8ஆம் தரப் புத்தகத்தின் 74ஆம் பக்கத்தில் போர்த்துக்கேயருக்கும் யாழ்ப்பாண இராச்சியத் திற்கும் இடையில் இருந்த ஒருமைப்பாடு பற்றி விளக்கப் பட்டுள்ளது. 7ஆம் தர வரலாற்றுப் புத்தகத்தின் 3ஆம் பக்கத்தில் எமது கலாசார உரிமைகள் பற்றிய விபரங்கள் அடங்கியுள்ளன.

விசேடமாக வெளிநாட்டவர்கள் இந்நாட்டை ஆக்கிரமித்த போது இந்நாட்டை மீட்பதற்கு தமிழ், சிங்கள, முஸ்லிம் ஆகிய எல்லா இனத்தவர்களும் ஒன்றுசேர்ந்து அவர்களுக்கு எதிராகப் போராடியுள்ளார்கள். இவ்வரலாறு 11ஆம் தர வரலாற்றுப் புத்தகத்தின் 43ஆம் பக்கத்தில் தொடங்கும் 'இலங்கையில் இன எழுச்சி' என்ற பாடத்தில் தெளிவாக குறிப்பிடப்பட்டுள்ளது. அதில் சிங்கள - பௌத்த, தமிழ் - இந்து மற்றும் முஸ்லிம் தலைவர்கள் சமய எழுச்சியை ஏற்படுத்துவற்கு எத்தகைய நடவடிக்கைளை மேற்கொண்டார்கள் என்று குறிப்பிடப் பட்டுள்ளது.

அத்துடன், போத்துக்கேயர் இந்நாட்டின் யாழ்ப்பாணம், மலையகம், கோட்டே போன்ற இராச்சியங்களுடன் தொடர்பு களை ஏற்படுத்திக்கொண்டபோது அந்தந்த இராச்சியங்களில் இருந்த தமிழ், சிங்கள அரசர்கள் போத்துக்கேயருக்கு எதிராக நடவடிக்கை எடுத்த விதம் பற்றி 8ஆம் தரப் பாடப் புத்தகத்தில் 74ஆம் பக்கத்திலும் 7ஆம் தர பாடப் புத்தகத்தில் 60ஆம் பக்கத்திலும் 10ஆம் தர பாடப் புத்தகத்தில் 102 மற்றும் 103ஆம் பக்கங்களிலும் குறிப்பிடப்பட்டுள்ளது. பொலன்னறுவை அரசாட்சிக்குப் பிறகு சிங்கள இராச்சியம் தென்மேற்கை நோக்கி நகர்ந்ததைப்போல், யாழ்ப்பாண நகரத்தை அடிப்படை யாகக்கொண்டு யாழ்ப்பாண இராச்சியம் உதயமாகிய விதம் மேற்கூறிய புத்தகங்களில் அந்தந்தப் பக்கங்களில் குறிப்பிடப் பட்டுள்ளது.

அதுமட்டுமல்ல, யாழ்ப்பாண இராச்சியத்துடன் தெற்கில் உதயமான சிங்கள அரசுகள் ஏற்படுத்திக்கொண்ட உறவும் அதன் மூலமாகத் தெளிவுபடுத்தப்பட்டுள்ளது. அதன்படி தமிழ் மொழி வரலாற்றுப் பாடப் புத்தகங்களில் எமது நாட்டின் உண்மை வரலாறு பற்றிய விடயங்களைச் சேர்த்துக் கொள்வதற்கு எவ்வித தடையும் ஏற்படாது. இதுபற்றி கௌரவ பாராளுமன்ற உறுப்பினர்களும் தங்களுடைய அபிப்பிராயங் களைத் தெரிவித்துக்கொள்ளலாம். எமது நாட்டின் உண்மை வரலாறு பற்றி எமது நாட்டு மாணவர்கள் தெரிந்து கொள்வதற்காக அப்புத்தகங்கள் தயாரிக்கப்பட்டுள்ளதுடன், அதுகுறித்து எதிர்காலத்திலும் கவனம் செலுத்தப்படும்.

மேலும், நாட்டை ஆதரிக்கக்கூடியதும் ஒருமைப்பாட்டை விரும்புகின்றதுமான ஒரு பரம்பரையை உருவாக்குவதற்கு ஏற்ற விதத்தில் அந்த வரலாறு பற்றிய விபரங்கள் தற்போது தமிழ் மொழிமூல பாடப் புத்தகங்களில் அச்சிடப் பட்டிருப்பதுடன், அவைகளைத் தொடர்ந்து பாதுகாப்பதற்கும் நடவடிக்கை எடுக்கப்படும். இதற்கு மேலாக சேர்க்கப்பட வேண்டிய விடயங்கள் இருந்தால் புத்திஜீவிகளுடைய அனுசரணையுடன் அவை சேர்த்துக்கொள்ளப்படும் என்று இந்த நேரத்திலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

6ஆம் ஆண்டு வரலாற்றுப் புத்தகத்தை எடுத்துப் பார்த்தால், இந்த நாட்டில் சிங்கள மக்களைத் தவிர வேறெந்த மக்களும் இருக்கவில்லையென்ற ஒரு தோற்றப்பாடு காட்டப்பட்டிருப் பதைக் காணலாம். குறிப்பாக நாங்கள் படிக்கின்ற காலத்தில் எல்லாள மன்னனை இலங்கைத் தமிழ் மன்னனாகத்தான் சொல்லப்பட்டது. ஆனால், இம்முறை அவைகளெல்லாம் மறைக்கப்பட்டிருக்கின்றன. நீங்கள் உங்களுடைய பதிலில் பல புத்தகங்களுடைய பக்கங்களைக் குறிப்பிட்டிருந்தீர்கள். அந்த பக்கங்களை நான் திருப்பிப் பார்க்கவேண்டியிருக்கின்றது. நீங்கள் குறிப்பிட்டதுபோல பேராசிரியர்கள் அந்தக் குழுவில் உள்ளடக்கப்பட்டிருந்தாலும் அவர்கள் மொழிபெயர்ப்பை சரி, பிழை பார்ப்பவர்களாக இருக்கின்றார்களேயொழிய, உண்மை யாகவே அவர்கள் தமிழர்களுடைய வரலாற்றைச் சிந்தித்துத் தயாரிக்கக்கூடியவர்களாக இல்லை; அந்த நிலைமையும் அங்கு இல்லை. அதுதான் உண்மையான நிலைப்பாடாக இன்றைக்கு காணப்படுகின்றது. நாங்கள் படித்த காலகட்டங்களில் இருந்த வரலாறு இன்றைக்கு திரிக்கப்பட்டிருக்கின்றது; மறைக்கப் பட்டிருக்கின்றது. அதுதான் உண்மை! ஆகவே, தமிழ் புத்திஜீவிகளோடு அல்லது தமிழ்ப் பேராசிரியர்களோடு நீங்கள் ஒரு சந்திப்பை ஏற்படுத்தித் தருவீர்களாக இருந்தால் இது சம்பந்தமாக நாம் கலந்துரையாடலாம்.

ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

அடுத்த பாராளுமன்ற அமர்வு நாட்களாகிய 23, 24 ஆம் திகதிகளில் -

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

ஆம். இங்கு புத்திஜீவிகளை அழைத்து நாங்கள் கலந்துரை யாடலாம். இதில் எந்தளவுக்கு உண்மைத் தன்மை இருக்கின்ற தென்பதைப் பற்றியும் நாங்கள் ஆராயலாம்.

ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

அடுத்த வாரத்தில் ஒரு திகதியைக் குறிப்பிட்டு அது சம்பந்தமாகக் கலந்துரையாடுவோம். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා මේ කාරණය විවාදයක් බවට පත්කර ගන්න එපා. ගරු ඇමතිතුමා පැහැදිලි කර දුන් කාරණා අනුව ගරු මන්ත්‍රීතුමා එතුමාත් එක්ක සම්බන්ධ වෙලා ඉදිරියට කටයුතු කරන්න. මේ කාරණය විවාදයක් හැටියට යාමට ඉඩ නැහැ. දැනට ගරු ඇමතිතුමා දී තිබෙන කාරණා අනුව එතුමා දිනයක් දෙනවා. ඔබතුමන්ලා සාකච්ඡා කරන්න.

මීළඟට, අමාත්‍යාංශ නිවේදන - විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා.

ගල් අඟුරු මිලදී ගැනීම සම්බන්ධව පත් කරන ලද ත්‍රිපුද්ගල කමිටුවේ වාර්තාව : විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය

நிலக்கரி கொள்வனவு பற்றிய மூவரடங்கிய குழுவின் அறிக்கை: மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரின் கூற்று

THREE-MEMBER COMMITTEE REPORT ON PURCHASE OF COAL: STATEMENT BY MINISTER OF POWER AND RENEWABLE ENERGY

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of Power and Renewable Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගල් අඟුරු මිලදී ගැනීම සම්බන්ධව පත් කරන ලද ත්‍රිපුද්ගල කමිටුවේ වාර්තාව පිළිබඳව කරුනු ලබන විශේෂ ප්‍රකාශය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දිනවල ඇතැම් මාධ්‍ය වාර්තාවල පළ වූ ද, සමාජයේ කථාබහට ලක් වූද, 2015 වර්ෂයේ ගල් අඟුරු ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් මා සහ මගේ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් දීර්ඝ ලෙස කරුණු සොයා බැලීමෙන් පසුව එම කාරණය සම්බන්ධයෙන් මා මේ ගරු සභාවට 2016 ජූලි 20 දින විශේෂ ප්‍රකාශයක් කරන්නට යෙදුණා. එම ප්‍රකාශයෙන් පසුව බොහෝ දුර්මත පහවී ගිය බවක් පෙනෙන්නට තිබෙනවා. මා එම ප්‍රකාශය කරමින් මේ ගරු සභාවට දන්වා සිටියේ ප්‍රශ්නගත කාරණය සම්බන්ධයෙන් මා ඒ වනවිටත් පත් කර තිබූ ස්වායීන විද්වත් කමිටුවේ වාර්තාව 2016 ජූලි මස 29 දින මා වෙත ලැබෙන්නට නියමිත බවත්, එම වාර්තාව ලද පසුව එහි නිරීක්ෂණ අනුව තව දුරටත් අවශ්‍ය කටයුතු කරන බවත් ය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විසින් දැන් වූ පරිදි එම වාර්තාව 2016 අගෝස්තු මස 01 වන දින මා වෙත ලැබුණා. එම කමිටුවේ සංයුතිය වූයේ, මහාචාර්ය විද්‍යාජෝති කේ.කේ.වයි ඩබ්ලිව්. පෙරේරා මහතා - සභාපති; උප කුලපති- මොරටුව විශ්වවිද්‍යාලය, හිටපු සභාපති, ලංකා විදුලිබල මණ්ඩලය, හිටපු ලේකම් විදුලි බල අමාත්‍යාංශය, මහාචාර්ය ලක්ෂ්මන් ආර්. වටවල මහතා - සාමාජික, සභාපති - වරලත් කළමනාකරණ ගණකාධිකාරී සංගමය, හිටපු සභාපති - ආයෝජන මණ්ඩලය සහ මහජන බැංකුව, මහාචාර්ය ජනක ඒකනායක මහතා - සාමාජික, විදුලි ඉංජිනේරු අංශය - පේරාදෙනිය විශ්වවිද්‍යාලය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම විද්වත් කමිටුව ඉතා ගැඹුරින් මෙම කාරණය අධ්‍යයනය කර ඇති බව පෙනෙනවා. බාහිර පාර්ශ්වයන්ගෙන් කරුණු විමසා බලා ඇති අතර, ප්‍රශ්නගත ගල් අඟුරු ටෙන්ඩරයේ පරිපාලනමය පියවරයන්ද පරීක්ෂා කර තිබෙනවා.

පරීක්ෂණ වාර්තාවේ නිගමනයන් වශයෙන් දක්වා ඇති කරුණු මා මේ අවස්ථාවේදී මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට කැමතියි. ඒවා පහත සඳහන් පරිදි වේ.

1. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ගල් අඟුරු මිලදී ගැනීම සඳහා ක්ෂණික මිලදී ගැනීමේ ටෙන්ඩර් ක්‍රමය හඳුන්වා දී ඇත.

   වාර්තාවේ වගු 01න් දී ඇති පරිදි දිර්ඝකාලීන ටෙන්ඩර් ක්‍රමය මඟින් ගල් අඟුරු මිලදී ගැනීම සමඟ සසඳා බලනවිට ක්ෂණික ගල් අඟුරු මිලදී ගැනීමේ ක්‍රමය මඟින් ගල් අඟුරු මිලදී ගැනීමෙන් පසු ගිය වසර තුළදී ඇමෙරිකානු ඩොලර් 7,596,676.03 ක මුදලක් ඉතිරි වී තිබෙනවා.

II. අමාත්‍යාංශය දැනට ගල් අඟුරු මිලදී ගැනීමේදී ක්ෂණික මිලදී ගැනීම් ක්‍රමය මත පමණක් විශ්වාසය නොතබා දිර්ඝ කාලීන ස්ථාවර ටෙන්ඩර් ක්‍රමය හා ක්ෂණික මිලදී ගැනීමේ ක්‍රමය යන ක්‍රම දෙකම යොදා ගනිමින් මිශ්‍ර ප්‍රසම්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක කරයි. මෙම ක්‍රමය තුළින් ගල් අඟුරු සැපයුම් සුරක්ෂිතතාවය ඇති කිරීමට හා සැපයුම් මූලාශ්‍ර ගණන වැඩි කිරීමට හැකි වී ඇත.

III. ලෝක වෙළෙඳපොලෙහි ගල් අඟුරු මිල ගණන් වෙනස් වීම් සැලකිල්ලට ගැනීමේදී ක්ෂණික ටෙන්ඩර් සහ දිගු කාලීන ටෙන්ඩර් ක්‍රමයෙහි තුලනයක් පවත්වා ගැනීම ඉතා වැදගත් වේ.

IV . ගල් අඟුරු කැටවල ප්‍රමාණය මිල තීරණය සඳහා යොදා ගැනීම පිළිබඳ ගැටලුව විසඳීම සඳහා ලොකු කැබලි සහිත ගල් අඟුරු කුඩු කිරීම සඳහා යන වැඩි වියදම ද, එම කාර්යාවලිය තු ළ ඇතිවන පාරිසරික බලපෑම් ද පිළිබඳව ගැඹුරු අධ්‍යයනයකින් පසුව කුඩා කැබලි සහ ලොකු අඟුරු කැබලි පිළිබඳ තාක්ෂණික පිරිවිතර නිර්ණායකයන්ට අදාළ වගන්ති ටෙන්ඩර් ලියකියවිලිවලට හඳුන්වා දිය යුතුය.

V. වාර්තාවේ වගු 3හි පෙන්වා දී ඇති පරිදි ගල් අඟුරු කැටවල ප්‍රමාණය අනුව මිලට අධිභාරයක් පැනවීමෙන් පසුව වුවද, මුල්ම ලංසු මිල හා සසඳා බලන විට සාකච්ඡා කර එළඹෙන ලද මිල අප රටට ඇමෙරිකන් ඩොලර් 2,87,029.73ක ශුද්ධ ඉතිරියක් ඇති කර දීමට හේතු වී ඇත.

VI. ඊට අදාළ විස්තර ප්‍රස්තාර රූපසටහන් 4හි ඇතුළත් වේ. ටෙන්ඩර් ලේඛනවල සඳහන් ගල් අඟුරු කැටවල ප්‍රමාණය නිර්ණායකය සඳහා අධිභාරයක් පනවා දීර්ඝකාලීන ටෙන්ඩරය මඟින් ගල් අඟුරු මිලදී ගත්ත ද මේ දක්වා මිලදී ගෙන ඇති නැව්වලින් විශාල ප්‍රමාණයකින් ශ්‍රී ලංකාවට මූල්‍යමය ලාභයක් ලැබී ඇත.

VII. ගල් අඟුරු සඳහා ගෙවන මිල පදනම් වන්නේ නැව් ගත කරන අවස්ථාවේදී පැවැති දර්ශක මිල මත වුවද, නැව් ගත කොගයන් විවිධ රටවලින් එනම් ඉන්දුනීසියාව, දකුණු අප්‍රිකාව, ඕස්ට්‍රේලියාව, රුසියාව වැනි රටවලින් නැව් ගත කරනු ලබන බැවින් මිල තීරණය කිරීම සඳහා සංයුක්ත දර්ශකයක් භාවිත කිරීම සුදුසු යයි යෝජනා කෙරේ.

VIII. දීර්ඝ කාලීන ස්ථවර ටෙන්ඩර් සහ නිශ්චිත ක්ෂණික මිල දී ගැනීම් සමඟ එකට සලකා බලන විට ගෙවන ලද සම්පූර්ණ මිලෙහි නිශ්චිත වාසියක් ඇති බව සඳහන් කළ හැකිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම නිගමනයන් අනුව පෙනී යන්නේ ද විශාල ආන්දෝලනයක් ඇති කළ මෙම ගල් අඟුරු මිල දී ගැනීම නිසා රටට නැත්නම් ලංකා විදුලිබල මණ්ඩලයට පැහැදිලි ලාභයක් සිදු වී ඇති බවයි.

තවද, අපි දැනට ඉතා දූරදර්ශීව ගෙන ඇති පියවරක් වන නිශ්චිත ක්ෂණික මිල දී ගැනීම සහ ස්ථාවර දීර්ඝකාලීන මිල දී ගැනීම් යන ගල් අඟුරු ප්‍රසම්පාදන මිශ්‍රණය ඉතා විශ්වාසවන්ත එසේම ලාභදායී පියවරක් බව ද පෙන්වා දී තිබෙනවා.

කමිටු වාර්තාව පෙන්වා දී ඇති ආකාරයට ගල් අඟුරුවල "ප්‍රමාණය" සම්බන්ධයෙන් අවශ්‍ය තාක්ෂණික පිරිවිතර නිර්ණායකයන් අදාළ ප්‍රසම්පාදන ලියකියවිලිවලට ඇතුළත් කරමින් මේ සම්බන්ධයෙන් තවදුරටත් විනිවිදභාවය සුරැකෙන ආකාරයට මෙම ජාතික කර්තව්‍යය මතභේදවලට තුඩු නොදෙන පරිදි ඉදිරියේදී ක්‍රියා කරන බවට ද ප්‍රකාශ කරමින් එම සම්පූර්ණ කමිටු වාර්තාව මා මේ අවස්ථාවේදී **සභාගත*** කරමි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු කථානායකතුමාට, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මාගේ ප්‍රකාශය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. මේ කථා බහට ලක් වූ කාරණා පිළිබඳව විවෘත මනසකින් බලන ඕනෑම කෙනෙකුට පැහැදිලි චිත්‍රයක් මවා ගන්න අපි ඉදිරිපත් කළ කරුණු සෑහෙනවා. හැබැයි, ඉන් එහාටත් කෙනෙකුට අවශ්‍ය නම් මේ ගරු සභාව තුළ විවාදයකට වුවත් මමත් මගේ නියෝජ්‍ය අමාත්‍යතුමාත් ඕනෑම වෙලාවක සූදානම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම. ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

වයඹ හෘද රෝග නිවාරණ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
வடமேல் மாகாண ஹிருதய நோய் நிவாரண சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
NORTH WESTERN ASSOCIATION FOR RESTRAINT OF HEART DISEASE (INCORPORATION) BILL

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே,

"வடமேல் மாகாண இருதய நோய் நிவாரண சங்கத்தைக் கூட்டிணைப்பதற்கானதொரு சட்டமூலம் கொண்டுவர அனுமதி வழங்கப்படுமாக."

எனும் பிரேரணையை நான் சமர்ப்பிக்கின்றேன்.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5)இன்படி சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.

Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Health, Nutrition and Indigenous Medicine for report.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.සී. මුතුකුමාරණ මහතා - පැමිණ නැත.
ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා - පැමිණ නැත.

මීළඟට, දිනට නියමිත කටයුතු. ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා.

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත: නියෝග
அளவீட்டு அலகுகள் மற்றும் சேவைகள் சட்டம்: ஒழுங்குவிதிகள்
MEASUREMENT UNITS, STANDARDS AND SERVICES ACT: REGULATIONS

[3.16p.m.]

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
Sir, I move,

"That the Regulations made by the Minister of Food Security under Section 60 of the Measurement Units, Standards and Services Act, No. 35 of 1995 and published in the Gazette Extraordinary No. 1921/54 of 2nd July 2015, which were presented on 05.04.2016, be approved."

Hon. Presiding Member, each country in the world has a special establishment responsible to realize, establish and maintain the national measurement standards. It is generally called, National Measurement Institute (NMI). Measurement Units, Standards and Services Department (MUSSD) under the Ministry of Industry and Commerce is responsible for the NMI in Sri Lanka.

This was established under the Measurement Units, Standards and Services Act, No. 35 of 1995. Establishment, maintenance and dissemination of national measurement standards in Sri Lanka is done by the National Measurement Laboratory (NML) established under the Department. Moreover, various calibrations and verification services for measuring instruments used in fields such as industry, engineering, environment, health protection, road safety are provided by MUSSD.

Measurements Units, Standards and Services Department under my Ministry is the apex institution responsible for providing accurate and reliable measurement procedures and metrology services, safeguarding the interests of the consumer, maintaining and updating the National Measurement Standards in conformity with the international measurement system by implementing the law and regulations of this Act.

To ensure that Sri Lanka's measurements are on par with international standards, MUSSD continues its relations with international metrology organizations such as the International Organization of Legal Metrology (OIML), Asia Pacific Metrology Programme (APMP), International Committee for Weights and Measures (CIPM) and Mutual Recognition Agreement (MRA).

Also MUSSD has participated in international comparison programmes pertaining to various physical quantities. Officials from MUSSD have participated in many foreign training programmes and conferences relating to metrology in 2015 with which I shall deal later in my speech.

Actual Recurrent Expenditure of this Department in 2015 was Rs. 94.9 million. Capital expenditure for the same period was Rs. 220.3 million, and actual expenditure for the same period was Rs. 315.3 million. At a cost of Rs. 15.3 million, the National Measurement Laboratory under this Department procured 25 standard measuring instruments in 2015. The total income stood at Rs. 144.4 million and 97 per cent of this came from stamping charges.

Let me now briefly update the House, on the performance of the Department in 2015.

Pattern approval is a technical assessment, and it is the most important activity of this Department. Pattern approval is a confirmation of any weight, measure or weighing/measuring instrument after a pattern test performed by a recognized laboratory to check whether they are on par with the measurement law in Sri Lanka before they are sent to the market by a producer or before they are imported. The original model of the instrument undergoes a series of tests at the National Measurement Laboratory.

The design and the structure of each of the components of the instruments are checked against the recommendations on type approval defined by the

International Organization of Legal Metrology. Subsequently, based on the evaluation of the test results, a pattern approval is granted by the MUSSD for the intended weights and measuring instruments including vehicle emission testing units and fuel dispensers.

I am pleased to say that 39 pattern approval of weighing and measuring instruments were done with a revenue of Rs. 395,000 for the year 2015. Four approvals of fuel dispensers were granted and 25 weighing machine approvals were also granted.

Then, I am pleased to inform this House that calibrations facilities for pressure gauges, thermometers, weights, scales and length measuring instruments, electrical measuring instruments, moisture meters, laboratory balances used in industry, engineering or any other related field are now available at the MUSSD. Calibration certificates are also issued with such calibrated instruments. Industrial calibration is one of the main services provided by the National Measurement Laboratory. Moreover, verification of vehicle speed detectors and vehicle emission testing instruments has been started. The National Measurement Laboratory of the Department earned Rs. 3.19 million in 2015, by its various calibration services.

Sir, verifications, inspections and raids of weighing and measuring instruments are conducted on district basis. Inspections and raid programmes are implemented by the MUSSD to ensure that the weights, measures, weighing and measuring instruments used in the country are utilized in conformity with the weights and measures laws and regulations of the country. These programmes are very helpful in terms of legal metrology, not only to protect the customer but also to ensure an accurate and reliable measuring practice in the country. Verification of weights, measures and weighing and measuring instruments used in trade is done by Measurement Services and Devices Inspectors at each District Secretariat. Verification centres are held in Pradeshiya Sabhas and any other Government institute of each District under the prior approval of the District Secretariat. Moreover, a mobile verification unit for weighbridges has been commissioned to verify annually all weighbridges placed in every District.

All fuel dispensers mounted at every fuel station in the country are verified once every year. A Fuel Dispensers Verification Unit has been introduced. I am pleased to say that the Department earned Rs. 232 million through its verification services in 2015 by verifying 888,422 units. The Department conducted 15,777 raids and collected Rs. 2.88 million in fines in the year 2015 concluding 1,220 cases. We continued with our annual re-verification of working standards as usual with no special events to mention.

Sir, the commodities that have been packed before selling to the consumers are called pre-packed commodities. Net content mentioned on the pre-packed item is undergone for inspections of verifying whether the right content is available at the display of goods in the market. Inspection of pre-packages is performed according to OIML Regulations. When inspecting pre-packages, samples of a particular item available at the display in the market are arbitrarily selected and subsequently, the net content such as weight, volume and length et cetera of the item is measured.

Three companies that are involved in milk powder and domestic LNG trades have been inspected successfully.

Any organization or individual who is engaged in selling, manufacturing, importing and repairing of weights, measures, weighing and measuring instruments must get registered with the Department as per Section 21 of the Measurement Units, Standards and Services Act. For that, the person must apply via a prescribed application form determined by the Director of Measurement Units, Standards and Services and the corresponding fee must be paid. The certificate issued in such registration will expire on 31st December of the year.

Before starting a business of repairing weights or measuring instruments, the interested person should, first, face a practical test conducted by the MUSSD to prove his competencies and qualifications related to such repairing activities. The examination fee should be paid by the person. After qualifying through the practical test and satisfactory witness of the workshop, a registration certificate is issued to the applicant. This certificate is not transferable. In case of any change of the business ownership, a qualified technician must be appointed to handle the business immediately. We registered 556 private entrepreneurs engaged in commercial activities, controlled over legal metrology in 2015, earning a total registration fee of Rs. 466,650.

The Measurement Units, Standards and Services Department possesses the honour to be the pioneer of generating and broadcasting the Standard Time of Sri Lanka since 2011. The website www.sltime.org was launched in April, 2011 to broadcast the accurate time. People are now able to set their time correctly via the website at any time in the day. Presently, steps are being taken to upgrade this extensively developing service by introducing a Caesium Atomic Clock, which is able to generate the most accurate time in the world.

Sir, as I mentioned earlier, officials from the MUSSD have participated in many foreign training programmes and conferences related to metrology in 2015. The Department sent 22 of its officials to India, Indonesia, Thailand, Korea, Malaysia, the Philippines and China for measurement trainings. They have also been trained at 40 local sessions for a very nominal sum of Rs. 264,000 and six of them received the training free of charge.

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

I am pleased to say that now the Department has the capacity of calibration of measuring instruments in the health sector. We are trying to ensure the accuracy of measuring instruments such as weighing machines, scales, blood pressure meters and thermometers used in the health sector and the calibration of those instruments will , in turn, result in a reliable diagnosis and treatment.

We have already tested ten such meters of importers and of some private hospitals and we are continuing to test more. We have also requested government hospitals to send us the details of their newborn baby weighing scales and blood pressure meters, but so far, we did not receive any details from them, understandably due to their budgetary constraints. The Department strongly recommends the health authorities to assess baby weighing scales and blood pressure meters of all government hospitals, private hospitals and clinics.

Sir, it is important for me to inform this House about the future plans of the Department as well. Today, people have become highly dependent on three-wheelers and taxi services. Often, the passengers are cheated by them and they pay higher than usual rates. Realizing this, I am pleased to inform, the Department is proposing a project to set up a Verification Centre of Taxi Meters in Sri Lanka. This project has been proposed to facilitate people with an accurate and reliable travel fare counting system in taxi meters, of which the accuracy must be verified. We have already started giving pattern approval for manufacturers and importers under the regulations of the OIML, of which this Department is a proud member. Through this process, the metrological parameters related to taxi meters are controlled.

Same as every other measuring instrument used in trade, the legal control of taxi meters will comprise four components: the pattern approval of the meter, initial verification, road test after the installation of the meter and annual verification. It has been planned to appoint a staff consisting of a technical officer and a supporting officer to assume the duties of taxi meter verification and inspection, covering all the districts.

The construction of a Verification Centre of Taxi Meters consisting of all the facilities required to verify and grant approval for the pattern of such meters which are mounted on taxis and the installation of measuring instruments necessary for the centre have to be completed. It is expected to initiate granting pattern approval for taxi meters as a pilot project in 2016. Accordingly, it will be possible to provide necessary facilities by mid-2017 for obtaining pattern approval by the institutions which import and distribute taxi meters.

கடந்த தேர்தல் காலத்திலே இந்த நாட்டின் மாண்புமிகு பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களும் நாட்டின் மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களும் ஒன்றுசேர்ந்து, "எங்களுடைய நாட்டில் வாழ்கின்ற சாதாரண கூலித்தொழில் செய்கின்றவர் தொடக்கம் நடுத்தர வாழ்வு நிலையைக் கொண்டிருக்கின்றவர் வரை அனைத்து மக்களுக்கும் தேவையான அத்தியாவசியமான பொருட்களை அவர்களுடைய பிரதேசங்களில் வழங்குவோம்" என்று கொடுத்த வாக்குறுதியினை நிறைவேற்றுமுகமாக எங்களுடைய கைத்தொழில் வர்த்தக அமைச்சும் இதனோடு சார்ந்ததாக உள்ள பாவனையாளர் அதிகாரசபையும் சேர்ந்து இந்தப் பாரிய பணியைச் செய்துவருகின்றன.

அதேபோல், சதொச - CWE நிறுவனங்களும் மக்களுடைய தேவைகளைக் கருத்திற்கொண்டு நாடு பூராவும் அவற்றின் பணிகளை நேர்மையாகச் செய்துகொண்டிருக்கின்றன. அவ்வாறே, கூட்டுறவுத்துறை அமைச்சும் மாகாணசபை அமைச்சர்களோடு சேர்ந்து இந்த நாட்டிலே கூட்டுறவுத் துறையை மேம்படுத்துவதற்காகப் பாரிய வேலைத் திட்டங்களை முன்னெடுத்து வருகின்றது. அதேபோல், வர்த்தகத் திணைக்களமும் எமது நாட்டின் பொருளாதார மேம்பாட்டுக்காக இந்த நாட்டில் முதலீடுகளைக் கொண்டு வருவதற்கும் சுற்றுலாத்துறையை ஊக்குவிப்பதற்கும் தேயிலை, இறப்பர், apparel போன்றவற்றின் ஏற்றுமதியை அதிகரிப்பதற்குமான வேலைத்திட்டங்களைச் செய்து கொண்டிருக்கின்றது. இவற்றின்மூலம் எங்களுடைய நாட்டுக்கு அந்நியச்செலாவணியைப் பெற்றுக்கொடுக்கின்ற பணியைச் செய்வதோடு, பல வெளிநாடுகளுடனான வியாபார ஏற்பாடுகளை, திட்டமிடல்களை, policy மாற்றங்களைச் செய்கின்ற வேலைத்திட்டங்களையும் வர்த்தகத் திணைக்களம் திடமாகச் செய்துகொண்டிருக்கின்றது.

அதேபோல், இந்த நாட்டின் கைத்தொழில் வளர்ச்சிக்காக IDBயும் எங்களுடைய கைத்தொழில் அமைச்சின் ஒரு பிரிவும் சேர்ந்து வடக்கு, கிழக்கிலே நீண்டகாலமாக இடம்பெற்ற யுத்தத்தினால் பாதிக்கப்பட்ட அனைத்துக் கைத்தொழிற்சாலைகளையும் மீள ஆரம்பிப்பதற்கான ஏற்பாடுகளைச் செய்து வருகின்றன. அதுமாத்திரமல்லாமல், எதிர்காலத்திலே இன்னும் பல புதிய கைத்தொழிற்சாலைகளை அமைப்பதற்கும் திட்டங்களைத் தீட்டியிருக்கின்றது. கௌரவ உறுப்பினர் மன்சூர் அவர்கள் இங்கு இருக்கிறார். அவருடைய சம்மாந்துறைப் பிரதேசத்தில்கூட ஒரு கைத்தொழில் பேட்டையை அமைப்பதற்கு எங்களுடைய அமைச்சு திட்டமிட்டிருக்கின்றது. இதனூடாக அம்பாறை மாவட்டத்திலுள்ள தமிழ் பேசும் மக்களின் தொழில்வாய்ப்புக்களை மேம்படுத்துவதற்கு நாங்கள் எண்ணியிருக்கின்றோம். அதேபோல, பெரும்பான்மை சிங்கள சகோதரர்கள் வாழுகின்ற மஹஓய பிரதேசத்தில் ஒரு கைத்தொழிற்பேட்டையையும் முல்லைத்தீவு, கிளிநொச்சி மாவட்டங்களில் தலா ஒரு கைத்தொழிற்பேட்டையையும் அமைப்பதற்குத் திட்டமிட்டிருக்கின்றோம். ஏற்கெனவே, யாழ். மாவட்டத்தில் அச்சுவேலிப் பிரதேசத்திலே ஒரு கைத்தொழிற்பேட்டை அமைக்கப்பட்டிருக்கின்றது; மன்னாரிலே அமைக்கப்பட்டிருக்கின்றது. வவுனியாவிலே அதற்கெனக் காணிகள் ஒதுக்கப்பட்டிருக்கின்றன.

மூடப்பட்டிருக்கின்ற வாழைச்சேனை காகிதத் தொழிற்சாலையை மீள ஆரம்பித்து அப்பிரதேசத்திலுள்ள மக்களுக்கு வேலைவாய்ப்புக்களை வழங்கக்கூடிய - ஆகக் குறைந்தது 2,000 பேருக்காவது வேலைவாய்ப்பை வழங்கக் கூடிய ஒரு கைத்தொழில் பேட்டையாக அதனை மாற்றுவதற்கும், ஏற்கெனவே இருந்த கைத்தொழிற்சாலையை மீள இயங்க வைப்பதனூடாகப் பல முன்னேற்றங்களை ஏற்படுத்துவதற்கு

மான வேலைத்திட்டங்களை நாங்கள் மட்டக்களப்பு மாவட்டத்திலே முன்னெடுத்து வருகின்றோம். அதுமாத்திரமல்லாமல், எங்களுடைய அமைச்சு மட்டக்களப்பு நகரிலே ஒரு கைத்தொழில் பேட்டையை அமைத்திருக்கின்றது. ஏற்கெனவே, திருகோணமலையிலே கப்பல்துறை என்ற இடத்தில் ஒரு கைத்தொழில் பேட்டையை அமைத்திருக்கின்றோம். அதை இன்னும் விரிவுபடுத்துவதற்குரிய ஏற்பாடுகளை நாங்கள் முன்னெடுத்து வருகின்றோம். எங்களுடைய பிரதி அமைச்சர் அஜித் பீ. பெரேரா அவர்களுடைய வேண்டுகோளின்பேரில் களுத்துறை மாவட்டத்திலே ஒரு பெரிய கைத்தொழில் பேட்டையை அமைப்பதற்கான ஏற்பாடுகள் தற்பொழுது நடந்துகொண்டிருக்கின்றன.

அதேபோல, நாட்டில் கடந்த காலங்களில் அமைக்கப்பட்ட கைத்தொழில் பேட்டைகளில் இருக்கின்ற பிரச்சினைகளை இனங்கண்டு அவற்றைத் தீர்க்கின்ற பணிகளை முன்னெடுத்து வருகின்றோம். நீண்ட காலமாக நட்டத்திலே இயங்கிய பல நிறுவனங்கள் இருக்கின்றன. இன்று அந்த நிறுவனங்களை எல்லாம் இலாபமீட்டக்கூடிய நிறுவனங்களாக மாற்றும் நடவடிக்கைகளை நாங்கள் முன்னெடுத்து வருகின்றோம். அதாவது இந்த அரசு எடுத்திருக்கின்ற நல்ல முன்னேற்ற கரமான நடவடிக்கையாக, ஜனாதிபதி அவர்களினதும் பிரதம அமைச்சர் அவர்களினதும் வேண்டுகோளின்பேரிலே எங்களுடைய அமைச்சுக்குக்கீழே இருக்கின்ற பல நிறுவனங்களை இலாபமீட்டக்கூடிய நிறுவனங்களாக நாங்கள் முன்னெடுத்துச் செல்கின்றோம்.

கௌரவ அமைச்சர் காமினி ஜயவிக்ரம பெரேரா அவர்கள் உணவுப் பாதுகாப்புத்துறைக்கான அமைச்சராக இருந்த பொழுது இந்த ஒழுங்குவிதியை வர்த்தமானப் பத்திரிகையில் பிரசுரித்திருந்தார். எனவே, அவருக்கு என்னுடைய மனமார்ந்த நன்றியைக் கூறிக்கொள்வதோடு, அவர் முன்னெடுத்த அந்தப் பணிகளை எல்லாம் இன்று நாங்கள் தொடர்ந்து முன்னெடுத்துச் செல்கின்றோம் என்பதையும் கூறி, இந்தச் சந்தர்ப்பத்துக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி.

ප්‍රශ්නය සභාගිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජානක වක්කුඹුර මහතා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

මඩකළපුව, ත්‍රිකුණාමලය, කළුතර ආදී වශයෙන් රට පුරාම කර්මාන්ත පුර සකස් කර ගෙන යනවා කියලා දැන් අපේ ඇමතිතුමා පැහැදිලි කළා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
විනාශ වුණු ඒවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඔබතුමා විනාශ වුණු ඒවාත් සඳහන් කළා, අලුත් කලාප ගැනත් සඳහනක් කළා. දැන් මම ඔබතුමාගෙන් මේ කාරණය දැනගන්න කැමැතියි. කිරුම් පඩි, මිනුම් සහ කිරුම් මිනුම් උපකරණ ආනයනය කර විකිණීම සඳහා ලියා පදිංචි කිරීමේ ගාස්තු තමයි මේ ගැසට් නිවේදනයේ සඳහන්ව තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම මේ වාගේ උපකරණත් විදේශවලින් ගෙන්වන්නේ නැතිව මේ රටේ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියක් ඔබතුමාගේ කාලයේදීවත් අපට පටන් ගන්න බැරිද? බලන්න, මේ පොඩි පොඩි දේවල් නේ. තරාදියක් හදා ගන්න, පඩියක් හදා ගන්න, දුනු තරාදියක් හදා ගන්න අපට බැරිද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
දැනටමත් කීපයක් ආරම්භ වෙලා තිබෙනවා. පුළුවන් තරම් ආනයනය අඩු කරවීම සඳහා අපේ අමාත්‍යාංශය විශේෂ වැඩ පිළිවෙළක් යොදවා දැනට සමහර කර්මාන්ත ආරම්භ වෙලා තිබෙන්නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
2015 ජූලි 2 දිනැති අංක 1921/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ මෙසේ සඳහන් වනවා:

"…. අදාළ උපකරණ අලුත්වැඩියා කිරීමට නිපුණතාවය ඇති බවට පිළිගත් පුද්ගලයන් යටත් පිරිසෙයින් එක් අයකුවත් සෑම වැඩ කණ්ඩායමකම සිටිය යුතුය. ….."

ගරු ඇමතිතුමනි, මේ නිපුණතාව තිබෙන අය හඳුනා ගන්නේ කොහොමද කියන එක ගැන ඔබතුමාගේ පළමු කථාවේදී පැහැදිලි කිරීමක් කළා. ඇත්ත වශයෙන්ම කිරුම් මිනුම් සහ ඉලෙක්ට්‍රොනික උපකරණ පිළිබඳව නිපුණතාව තිබෙන අය, ඒ තාක්ෂණික දැනුම තිබෙන අය හඳුනා ගන්න ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ විශේෂ ඒකකයක් තිබෙනවාද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ඉන්න කොට හෝමාගම ඉඩමක් දීලා තිබුණා. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ඉන්න කොට ආරම්භ කළා. අපේ ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමාත් වැඩ කොටසක් කළා. මම ආවාට පස්සේ විවෘත කළා. ගරු මන්ත්‍රීතුමනි, ඒ කටයුත්ත දැනටම ආරම්භ වෙලා තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ පුහුණුවීම් කරනවාද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
පුහුණු කරන එක- [බාධා කිරීමක්] It is a fully equipped centre. ජර්මනියෙන් ආධාරයකුත් දුන්නා. ඒ අනුව අපි වැඩ කටයුතු කර තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ පැහැදිලි කිරීම ප්‍රමාණවත් නේද?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
තව එක කාරණාවක් කියන්න තිබෙනවා. අපට මේ ඇමතිතුමාත් එක්ක ඒක විසඳා ගන්න පුළුවන්. ඒක පොඩි කාරණාවක්. අලුත්වැඩියා සඳහා ලියා පදිංචි ගාස්තු අය කිරීමේදී තනි පුද්ගලයා සහ වැඩ කණ්ඩායමක් කියන එක තිබෙනවා. හැබැයි, පුද්ගලයාටත්, කණ්ඩායමටත් එකම ගාස්තුව අය කරන්නේ. ඒකේ සාධාරණයක් තිබෙනවාද ඇමතිතුමනි. පැහැදිලි කර ගැනීම සඳහා මම අහන්නේ එපමණයි. වෙන මොකක්වත් අහන්නේ නැහැ.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ඒකට ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා answer කළා නම් හොඳයි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, ඒක ඔබතුමාගේ කථාවේදී යෝජනාවක් විධියට හෝ සංශෝධනයක් විධියට ඒක ඉදිරිපත් කරන්න. එතකොට ඒ ගැන නීති අංශය සලකා බලාවි. ඒකට අදාළ ඇමති එතුමායි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා කථා කරන කොට ඒ ගැන කියන්න පුළුවන්. දැන් ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීමක්]

[අ.භා. 3.43]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත යටතේ නියෝග ඉදිරිපත් කළා. 1995න් පසුවයි මෙවැනි සංශෝධනයක් ගෙනාවේ. මේ මිනුම් ඒකක ගෙන්වන අයයි, විකුණන අයයි සියලු දෙනාවම ලියා පදිංචි කරනවා නම් හොඳයි. මොකද, පාරිභෝගිකයන් විසින් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා යම් ප්‍රමිතියක් තිබෙන්නට ඕනෑ. ඒ වාගේම කඩ හිමියකුට වුණත් තමන්ගේ වෙළඳාම් කටයුතු සඳහා අවශ්‍ය වන සියලුම තරාදි ලියා පදිංචි වෙච්ච තැනකින් ගන්න තිබෙනවා නම් හොඳයි. මේ ලියා පදිංචි ගාස්තුව වැඩි කරලා තිබෙනවා. එම වැඩි කිරීම තුළ අවසානයේ ඒකත් අය වන්නේ පාරිභෝගිකයාගෙනුයි. ඒ නිසා පුළුවන් නම් මේ ලියා පදිංචි ගාස්තුව මීට වඩා අඩු කරන්න කටයුතු කරන්න. කෙනෙක් භාණ්ඩයක් මිලදී ගන්න ගියාම, යම් දෙයක් කිරලා ගන්නවා නම් එම තරාදිය හරි ප්‍රමිතියෙන් තිබෙනවාද කියලා බලන්නේ නැහැ. තරාදිය දිහා බලනවා; ඒක electronic තරාදියක්ද, මොකක්ද කියලා බලනවා; එච්චරයි.

අපි දන්නවා, දුනු තරාදි ගැන. වතුකරයේ තේ දළු කිරනවා නම් දුනු තරාදියෙන් තමයි කිරන්නේ. දුනු තරාදිය පොඩ්ඩක් එහා මෙහා වුණොත් සාමාන්‍යයෙන් කිලෝ එකක්, එකහමාරක් පමණ වෙනසක් ඇති වෙනවා. නමුත් තරාදිය හරිද කියලා පාරිභෝගිකයා බලන්නේ නැහැ. පාරිභෝගිකයා කරන වැඩේ තමයි, තේ දලු දෙනවා නම් ලොරියට දෙනවා. ලොරියෙන් කිරන ගණන පොතේ දමනවා. එතකොට එක තරාදියක පොඩි වෙනසක් තිබුණොත්, එක ලොරියකින් අඩුම ගණනේ දලු කිලෝ හාර පන්දහසක් දවසකට එකතු වෙනවා. එතකොට කිලෝ හාර පන්දහසක වෙනසක් ඇති වෙනවා. දුනු තරාදිවල වෙනස එක පාරටම හොයා ගන්න බැහැ. මේවා අවුරුද්දකට පසුව license කරනකොට ඇදෙනවා. ඒ නිසා අමාත්‍යාංශය යටතේ මේ පිළිබඳව ඒකකයක් හදලා වරින් වර මේ මිනුම් ඒකක පරීක්ෂා කරන්න කටයුතු කළොත්, ඒ අය අඩුම ගණනේ තමන්ගේ තරාදිය හරියට තියෙනවාද කියලාවත් බලා ගනියි. තරාදිය වෙනස්වෙලාද කියලා බලන්න අවුරුද්දකට සැරයක් license කරනකම් හිටියොත් දුනු තරාදිය ඇදිලා ඒකෙන් පාරිභෝගිකයාට අවාසියක් වෙන්න පුළුවන්. ඔබතුමන්ලා ඒ ගැන සොයා බලා මේ මිනුම් ඒකක පරීක්ෂා කරන වැඩ පිළිවෙළක් හදන්න කියලා යෝජනා කරනවා. පෙරට වඩා සෑහෙන ගුණයකින් ලියාපදිංචි ගාස්තු හැම එකක්ම වැඩි කරලා තිබෙනවා. අවුරුදු 10කට පසුව කරන නිසාද දන්නේ නැහැ. අපි කියන්නේ ලියාපදිංචිය හොඳයි; මේ ඔක්කෝම හොඳයි.

අපේ චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා වැදගත් කාරණයක් කිව්වා. කිරුම් මිනුම් ඒකක හදන අය ගම්වල ඉස්සර හිටියා. තරාදියක් කැඩුණොත් ඒ අය හදලා දෙනවා. මේ electronic වැඩ කරන පුංචි කාර්මිකයෝ අපේ ගම්වල ඉන්නවා. නමුත් ඒ කාර්මිකයෙක් ලව්වා අපට මේ වැඩේ දැන් කරවා ගන්න පුළුවන්කමක් නැහැ. මොකද, ලියා පදිංචි සහතිකයක් තිබෙන කෙනෙක් මේ වැඩේ කරන්න ඕනෑ කියලා තිබෙනවා. මා දන්නා හැටියට එහෙම ලියා පදිංචි වෙච්ච අය ගම්වල නැහැ. එතකොට තරාදියක් කැඩුණාම එය අරගෙන නගරයේ තරාදි හදන තැනක් හොයාගෙන යන්න ඕනෑ. ඒ නිසා ගම්වල සිටින අයගෙන් ලොකු මුදලක් අය කරන්නේ නැතිව, ඉස්සර කළා වාගේ මේ කිරුම් මිනුම් ඒකක හදන රැකියාව ගමේ අයටත් කරගෙන යාමට ඉඩ සලස්වන්න පුළුවන්කම තිබෙනවා නම් හොඳයි. මොකද, ඒ ගොල්ලන්ට මේ වාගේ repair කටයුතු ගොඩක් එන්නේ නැහැ. ඒ නිසා සහතිකය ගන්න ලොකු ගණනක් දෙන්න වුණොත් ඒ අය ඒ සහතිකය ගන්න කටයුතු කරන එකක් නැහැ. ඒ නිසා ගම්වල ඉන්න අයට යම්කිසි සහන ගාස්තුවකට එම සහතිකය ලබා ගන්න අවස්ථාව දුන්නොත් ඒ අය එය ලබා ගැනීමට කටයුතු කරයි.

අපි දන්නවා, ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීම, mobile phones සෑදීම වාගේ electronic වැඩ කරන තරුණයන් විශාල පිරිසක් ගම්වල සිටින බව. ඒ අය Technical College ගිහිල්ලා ඉගෙන ගෙන අද ඒ කටයුතු කරනවා. ඔවුන් තමන්ගේ ගමේම රැකියාවන් කරනවා. Technical College ගිහින් ඉගෙන ගෙන තිබෙන නිසා ඒ ගොල්ලන්ට ඒ දැනුම හොඳින්ම තිබෙනවා. ඒ නිසා ලොකු මුදලක් අය කරන්නේ නැතිව ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් ඒ අයට සහතිකයක් ලබා දුන්නොත්, ගමේ ඉන්න වෙළෙන්දාටත් පුළුවන් වෙයි ඒ අයගෙන් මේ සේවාව හරියාකාරව ඉෂ්ට සිද්ධ කර ගන්නට.

ලියා පදිංචි ගාස්තු වැඩි කරන්න එපා. ගාස්තු වැඩි වෙන්න, වැඩි වෙන්න ඒ ඔක්කෝම අල්ලන්නේ පාරිභෝගිකයාගෙන්. එම

හේතුව නිසා අද වෙළෙඳ පොළේ සෑම දෙයකම මිල වැඩි වෙලා තිබෙනවා. ඒ සෑම මිල වැඩිවීමක්ම පාරිභෝගිකයාට දරන්නට සිදු වෙලා තිබෙනවා. ලයිෂන් කළත්, ලයිට් බිල ගෙව්වත්, වතුර බිල ගෙව්වත්, මොන දේ ගෙව්වත්, අන්තිමට පාරිභෝගිකයාගෙන් අය කරලා තමයි වෙළෙන්දා ඒ කටයුත්ත කරන්නේ. තරාදිය ලයිෂන් කිරීමට සහ තරාදිය ගන්න යන සියලුම මුදල් අවසානයේදී පාරිභෝගිකයාගෙන් අය කර ගැනීමට වෙළෙන්දාට සිදු වෙනවා. ගරු අමාත්‍යතුමා කිව්වා වාගේ, - [බාධා කිරීමක්] ඔව්. අපි කියන්නේ ලියා පදිංචි ගාස්තුවෙන් අඩක් අය කරගෙන ගම්වල සිටින අයට එම ලියා පදිංචිය ලබා දෙන්න කියලායි.

අපේ රටේ හැම දිස්ත්‍රික්කයකම වාගේ කර්මාන්ත පුර තිබෙනවා. දුනු තරාදියක් කියන්නේ පුංචි දෙයක්. පොඩි ඉලෙක්ට්‍රොනික් තරාදි තිබෙනවා. මේවා පිට රටින් ගෙන්වනවාට වඩා අපේ කර්මාන්ත පුරවල හදලා අඩු මිලකට දෙන්න පුළුවන් නම් හොඳයි. මේක පුංචි දෙයක්. අපට කරන්න බැරිකමක් නැහැ, කරන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය කරන පහසුකම් ලබා දීලා, ඒ අයට පුහුණුවක් ලබා දීලා කටයුතු කළොත් ඒවා අඩු මිලකට ලබා දෙන්නට පුළුවන් වෙයි.

ගොඩක් වෙලාවට තරාදියක් ගෙනැල්ලා එක පාරක් කිරලා, අනෙක් පාර කිරන්න බලන කොට තරාදිය වෙනස් වෙලා. ගෙවල්වලට පොඩි තරාදි ගේනවා. එහෙම වෙලා තිබෙන්නේ ඒක නියම ප්‍රමිතියට නැතිවීමයි. Pavementsවල විකුණනවා, ඒ විකුණන ඒවා අරගෙන එනවා. ඉන් පසුව දවසක් දෙකක් යන විට වෙනස් වෙනවා. එම නිසා ලියා පදිංචි තැනකින්ම ගන්න කියලා කියන එක හොඳයි. එතකොට ඒ පිළිබඳව වගකීමක් තිබෙනවා. අපි ඔබතුමන්ලාට කියන්නේ ලියා පදිංචි ගාස්තු වැඩි කරන්නේ නැතිව පාරිභෝගිකයාට සහනයක් වෙන විධියට මේ කටයුතු කරන්න කියලායි. පාරිභෝගිකයා ආරක්ෂා වෙන විධියට මේ කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමා.

ඊට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එච්චඩ ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

[අ.භා. 3.51]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (කිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් මා දරපු ඇමති ධූරය යටතේ තිබුණු විෂයක් ගැනයි අද මට කථා කරන්නට සිදු වෙලා තිබෙන්නේ. මේ නියෝගයට අදාළ ගැසට් එක ගෙනාවේ මමයි. මම මුලින්ම ඔබතුමන්ලා කියපු කාරණාවලට උත්තර දීලා ඉන්න ඕනෑ. පසු ගිය රජය කාලයේ ජර්මන් රජයේ ආධාර ඇතිව හෝමාගම ජාතික මිනුම් පර්යේෂණාගාරයක් ඇති කළා. ඒක විශාල මධ්‍යස්ථානයක්. මටවත් ඒකට යන්න වෙලාවක් තිබුණේ නැහැ. මොකද, දින 100 වැඩ පිළිවෙළක් එක්ක මගේ අමාත්‍යාංශය වෙනස් වුණු නිසා. මේ ආයතනය ඇති කරලා තිබෙන්නේ ආසියාවේ නවීනතම තාක්ෂණයත් සමඟයි.

ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා කියපු ආකාරයට ගම්වල සිටින කාර්මිකයින් පුහුණු කරලා, ලියා පදිංචි කරලා ඒ අයට මේ උපකරණ නිෂ්පාදනය කිරීමට අවස්ථාව ලබා දීම තුළින් ග්‍රාමීය ස්වයං ව්‍යාපාරිකයන් විධියට ඒ අයව දිරිගැන්වීමක් සිදු කිරීම අපේ ප්‍රතිපත්තිය විය යුතුයි. අමාත්‍යාංශයේ ලේකම් මහත්වරුන් ඇතුළු නිලධාරී මහත්වරුන් මේ අවස්ථාවේ නිලධාරි කුටියේ ඉන්නවා. එම නිලධාරි මහත්වරුන් මේ ගැන අවධානය යොමු කරයි කියලා මම හිතනවා. ගරු අමාත්‍යතුමා සමඟත් මම ඒ ගැන කථා කරන්නම්. එය කළ යුතුයි කියලා මමත් කියනවා.

ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා ලියා පදිංචි ගාස්තු පිළිබඳව ප්‍රශ්නයක් ගැන කථා කළා. මම ආහාර සුරක්ෂිතතාව විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සිටියදී තමයි මේ නියෝගය ගැසට් කිරීම කළේ. මමත් ඒ ගැන කථා කළා. මේක නඩත්තු කිරීම, ව්‍යාප්ත කිරීම කරන්නට ඕනෑ. කොළඹට වෙලා, හෝමාගමට වෙලා සිටීම නොවෙයි අවශ්‍ය වෙන්නේ, ඔවුන්ගේ සේවය ව්‍යාප්ත කිරීමයි. මෙතැනදී ඉතාම වැදගත් වෙන්නේ පාරිභෝගිකයායි; ජනතාවයි. ලෝකයේ බලවත්ම සංවිධාන ලෙස තිබෙන්නේ පාරිභෝගික සංවිධාන. නමුත් ලංකාවේ ඒක ඉතාමත්ම දුර්වලයි. අද පාරිභෝගික නිලධාරීන් සිටින්නේ බොහොම සුළු සංඛ්‍යාවක්. අපි මේ සංඛ්‍යාව වැඩි කළ යුතුයි. කැබිනට් මණ්ඩල රැස්වීමේ දීත් ඒ ගැන කථා කළා. රජයක් මොන තරම් පනත් ගෙනාවාත්, බදු සහන දුන්නත් ව්‍යාපාරිකයා විසින් පාරිභෝගිකයා ගසා කනවා නම්, එයින් රජය බලාපොරොත්තු වෙන අරමුණු ඉෂ්ට වෙන්නේ නැත්නම් රජයට ඒ සඳහා ක්‍රියා මාර්ග ගැනීමට සිදු වෙනවා.

සුදු වැන් සිද්ධි වාගේ දේවල් කරන්න අපි ලැහැස්ති නැහැ. නීත්‍යානුකූල දේවල් කිරීම තමයි අපේ අරමුණ. එකක් තමයි ජනතාවට අවබෝධයක් ලබාදීම. දෙවැනි එක තමයි ජනතාව හවුල් කර ගැනීම. ඒ වාගේම නිලධාරීන් හවුල් කර ගැනීම. මේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී අපට නිලධාරීන් වැඩියෙන් ගන්න වෙනවා. මොකද, ඔවුන් ඒ ගම්වලට යවන්න වෙනවා. කිරුම් මිනුම් උපකරණ සඳහා බලපත්‍ර ගන්න ඕනෑ වර්ෂයකට වරක් පමණයි. මොකද, ඒ සෑම කිරුම් මිනුම් තරාදියක්ම පරීක්ෂා කරන්න ඕනෑ. පොළේ වෙන්න පුළුවන්, pavement එකේ වෙන්න පුළුවන්, කඩයක වෙන්න පුළුවන්, විවිධ භාණ්ඩ මිලදී ගනිද්දී අහිංසක පාරිභෝගිකයාගෙන් ග්‍රෑම් ගණනක් අඩු කරලා කිරුවොත් කොච්චර මුදලක් ගසා කනවාද කියලා බලන්න. ඒ නිසා මේ කටයුතු මීට වඩා ශක්තිමත් කරන්න ඕනෑ. එසේ ශක්තිමත් කිරීම අවශ්‍යයි කියා අපේ කැබිනට් මණ්ඩලය තීරණය කළා. මොකද, මම ඇමතිවරයා වශයෙක් සොයා බැලුවාම දැන ගන්න ලැබුණා,

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිටින නිලධාරීන් 7දෙනෙක් කුරුණෑගල කච්චේරියට වෙලා සිටින බව. ඒ වෙලාවේ කිව්වාට පස්සේ ඒක වෙනස් වුණා. මම කිව්වා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකකට එක් අයෙක් බැගින් ඔවුන්ව පත් කරන්න කියලා. ඔවුන් ඒ තැන්වලට ගිහිල්ලා වැඩ කරන්න ඕනෑ කියලා මම කිව්වා. දැන් සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලකම උපාධිධාරි නිලධාරීන් ඉන්නවා, ඒ වාගේම සෑම ග්‍රාම නිලධාරි වසමකම ඉන්නවා. ඒ වාගේම සංවර්ධන නිලධාරීන් ඉන්නවා, කෘෂි නිලධාරිවරයෙක් ඉන්නවා, සමෘද්ධි නිලධාරියෙක් ඉන්නවා. හැම ග්‍රාම නිලධාරි වසමකම 4දෙනෙක් ඉන්නවා. අපි ඔවුන්ගෙන් වැඩ ගන්නවාද? නැහැ. ඒ නිසා කිරුම් මිනුම් උපකරණ පරීක්ෂා කිරීම සඳහා විතරක් නොවෙයි, මීල පාලන අංශය ඇතුළු ඒ අංශ දෙක සඳහාම සංවර්ධන නිලධාරීන් 100දෙනෙක් කටයුතු කරන්න ඕනෑ. මීල පාලන අංශය එකක්, කිරුම් මිනුම් අංශය තව එකක්. ඒ අංශ දෙකම එකට වැඩ කරන්න ඕනෑ. ඒ දෙකම එකට සමගාමීව කටයුතු කරන්න ඕනෑ.

ඊළඟට, පන්සලේ ඉඳන් නගරය දක්වා ජනතාව දැනුවත් කර පාරිභෝගික කමිටු ඇති කරලා ක්‍රියා කරන වැඩ පිළිවෙළකට යන්න ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම අද ගෙනැවිත් තිබෙන යෝජනාවේ වැදගත්කම නිසා කථිකයෝ ඒ පිළිබඳව කථා කරන බව පෙනෙනවා. තිරසාර බව කියන්නේ මෙන්න මේකයි. අද ලෝකය පිළිගත්, එක්සත් ජාතීන්ගේ සමුළුවට මම සහභාගි වුණා.

ජනාධිපතිතුමා ගිය අවුරුද්දේ පැරිසියට ගිහිල්ලා රටවල් 193ක් සමඟ එම ගිවිසුමට අත්සන් කළා. අපි මේ පාර්ලිමේන්තුව අරගෙන බලමු කෝ. අර්ථවත්, සාරවත් ලෙස අපට පාර්ලිමේන්තුවේ හැසිරෙන්න බැරිනම්, විපක්ෂයේ හෝ ආණ්ඩුවේ හිටියත් අර්ථවත් ලෙස කථා කරන්න බැරි නම් ඒක තිරසරයක් නොවෙයි. මෙන්න මේවා නිසා තමයි අපේ සමාජය නැවතත් පැරණි යුගවලට යන්නේ. එම නිසා එක්සත් ජාතීන්ගේ සමුළුවේදී ක්ෂේත්‍ර 17ක් සඳහා රටවල් 193ක් එම ගිවිසුමට අත්සන් කළා. ගරු අග්‍රාමාත්‍යතුමා එය ඉදිරි සති දෙක තුනේදී ඉදිරිපත් කරයි. හැම අමාත්‍යාංශයක්ම, හැම ආයතනයක්ම, අධ්‍යාපනයේ සෑම දෙයක්ම, එක්සත් ජාතීන් හා බැඳුණු මේ ලෝකයේ සෑම දෙයක්ම එම බැඳීම තුළින් 2017 වසර තුළ අරගෙන යන්න අපි කටයුතු කරනවා. ඒ නිසා මේ කිරුම් මිනුම් කියන එක ඉතාම වැදගත් වෙනවා.

අද මෙතැන the Scout Movement එකේ ළමයි ටික ඉන්නවා. මහාචාර්ය නිමල් ද සිල්වා අද මගේ ප්‍රධාන උපදේශකයෙක් විධියට ඉන්නවා. අපි අධ්‍යාපන ඇමතිතුමා එක්ක කථා කරලා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. මොකද, ගමේ පාසලේ ඉඳලා අනාගතයේදී සමාජයට නායකත්වය දෙන අය අපි හදන්න ඕනෑ. ඒ නිසා මගේ අමාත්‍යාංශයයි, අධ්‍යාපන අමාත්‍යාංශයයි එකතු වෙලා the Scout Movement එක පිළිබඳව Cabinet Paper එකක් ඉදිරිපත් කරලා එය සෑම පාසලකම ආරම්භ කරන විධියට ක්‍රියා කරන්නත් අපි කටයුතු කරනවා.

දැන් වැට බදු පිළිබඳව කථා කෙරෙනවා. භාණ්ඩ133ක් සහ සේවා භාණ්ඩ 21ක් වැට් බද්දෙන් නිදහස් කරන්න කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරලා එය රජය විසින් ප්‍රකාශ කර තිබෙනවා. මේ පුවත් පත්වල තිබෙන්නේ ඒ පිළිබඳවයි. පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය ඇමතිතුමා එය ඉදිරිපත් කළා. නමුත් ඒ ලාභය ඔක්කෝම අද සමහර කඩකාරයෝ ගන්නවා. ජනතාව මේවා දන්නේ නැහැ. ඒ නිසා අපි මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා.

අත්‍යවශ්‍ය භාණ්ඩ 10ක් ඇතුළු භාණ්ඩ හා සේවා 133ක් බදුවලින් නිදහස් කරන්න අපි කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කළා. මේක එක එක්කෙනාට උසි ගන්වන දෙයක් නොවෙයි. අද ජනතාවට වැට් බද්ද බරක් වෙලා තිබෙනවා. අපි නැහැ කියන්නේ නැහැ. ඇයි, පසු ගිය කාලයේ සිදු වූ දේවල් නිසයි ඒ.

පසු ගිය කාලයේ සිදු වූ දේවල් නිසා අපේ අනාගත පරම්පරාවට බිලියන නවයක ණයක් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. මේ තත්ත්වය අද අපට විශාල බරක්. ඒවාත් එක්ක තමයි අද අපට රට සංවර්ධනය කරන්න වෙලා තිබෙන්නේ. ඉදිරියේදී අධිකරණයට ඉදිරිපත් කරන කැරුණු අනුව ඔබට දැන ගන්න හැකිවෙයි. අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා කවදාවත් නොකරපු විධියේ වියදමක් අපි කරනවා. සෞඛ්‍යයට අපි විශාල වියදමක් කරනවා. මොකද, අපි මේ ඔක්කෝම දේවල් කරන්නේ අධ්‍යාපනයේ වෙනසක් කරන්න ඕනෑ නිසායි. මේ සමාජය දියුණු කරන්න නම්, ජාතික පාසල් නමින් කොළඹ තිබෙන ඉස්කෝල අනෙකුත් පළාත්වලටත් ගෙන ගිහින් වෙනසක් කරන්න ඕනෑ.

ගොවියාගේ තැන ඉඳලා බලන්න. තව අවුරුදු 10ක් - 15ක් විතර යද්දී -චකුගඩු රෝගීන් විතරක් නොවෙයි- මේ රටේ සියයට 75ක් පමණ අය රෝගී වෙනවා. ඒ ගැන මම කැබිනට් මණ්ඩලයේ දී ජනාධිපතිතුමාටත් කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතීන්ගේ සමුළුවට මම සහභාගි වුණා. අද බලන්න ගොවියා පොළොවට දාන වස ටික. මඤ්ඤොක්කා ගහේ අල බහින්න පායන කාලයට වස දානවා. එතැන ඉඳලා ගොවියා වතුර ටික වස කරනවා, පොළොව වස කරනවා, පනුවා විනාශ කරනවා. අපේ ස්වභාව ධර්මයේ තිබෙන ඒවා ඔක්කෝම වස කරනවා. තොග වෙළෙන්දා ගොවියාගෙන් එම ආහාර -එළවලු වෙන්න පුළුවන්, පලතුරු වෙන්න පුළුවන්- අරගෙන ගිහිල්ලා විෂ බෙහෙත් ගහනවා. ඊළඟට සිල්ලර වෙළෙන්දා ඒවා අරගෙන ගිහිල්ලා විෂ බෙහෙත් ගහනවා. ඊට පසුව එළවලු විකුණන පොඩි කඩෙත් ඒවාට විෂ බෙහෙත් ගහනවා. අපි ඔක්කෝම කන්නේ වස. මේ සමාජය මෙන්න මේ ක්‍රියාදාමය තුළින් යන්නේ කොහේද? ඒ නිසායි "වස විසෙන් තොර රටක්" යනුවෙන් ජාතික වැඩසටහනක් ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වුණේ. අද අපට එම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට පියවරයන් ගත යුතුව තිබෙනවා. අපි පියවර ගත්තේ නැත්නම්, අනාගතයේ දී මේ රටේ සියයට 75ක් පමණ රෝගී සමාජයක් බිහි වනවා. පාර්ලිමේන්තු පනතින් පසු මගේ අමාත්‍යාංශයත්, හැම රේඛීය අමාත්‍යාංශයක් සමඟත් මම සාකච්ඡා කරනවා. මොකද "තිරසර ජීවිතය" කියලා එයින් රෝගී සමාජයක් බිහි කරනවා නම් එයින් අපට වැඩක් නැහැ. නිදහස් සෞඛ්‍ය කියනවා, නිදහස් අධ්‍යාපනය කියනවා, ඒත් වැඩක් වෙන්නේ නැහැ.

මම මේ අවස්ථාවේ අපේ කෑම කඩවල් ගැන කියන්න කැමැතියි. කෑම කඩවලට ගියාම කන්න හදන්නේ මොනවාද කියලා කඩවල්වල කුස්සියට ගිහිල්ලා බලන්න ඕනෑ. 1977දී මම Parliament එකේ ඉඳලා කෑම පාර්සලයක් ගන්න බම්බලපිටියේ තිබුණු "මැජෙස්ටික්" හෝටලයට ගියා. ඒ අවට වෙන තැනක් නැහැ, ඒක තමයි ලොකුම හෝටලයකට තිබුණේ. ඒ දැන් තිබෙන හෝටලය නොවෙයි. ඒ වෙලාවේ කෑම පරක්කුයි. ඒ නිසා මම කුස්සියේ පිටුපස බලන්න ගියා. කුස්සියේ බිම කෙසෙල් කොළ දාලා. ජරාගොඩේ කෑම දානවා. මම එතැනදිම ගැහුවා. මම පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් කියලා බැලුවෙත් නැහැ. ඊට පසුව කඩේ වැහුණා. තමුන්නාන්සේලා විශ්වාස කරන්න, අදත් මෙවැනි දේවල් සිදු වෙනවා. ඉතින්, මෙවැනි දේවල්ද අපේ සමාජයට කරන්න තිබෙන්නේ. ඒ නිසා නීතිය තිබුණාට විතරක් මදි. අපි ඒ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම කියා සිටින්න කැමැතියි, දේශපාලනඥයන් වුණාම අපි බොහොම

වගකීමක් ඇතිව වැඩ කරන්න ඕනෑ කියලා. ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමනි, ඔබතුමා නම් බොහොම අර්ථවත්ව වගකීමකින් යුතුව වැඩ කරනවා. නමුත්, සමහර දේශපාලනඥයන් බලය ආරක්ෂා කරගන්න ඕනෑය කියලා අනවශ්‍ය විධියේ දේවල් කියලා අනා ගන්නවා. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා මගේ හොඳ මිත්‍රයෙක්. Maternity and Childcare Centre at Mullegama in Homagama විවෘත කිරීමේ උත්සවයේදී එවකට එතුමා අධ්‍යාපන ඇමති විධියට ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශය 2012.03.19 වෙනිදා Daily Mirror පුවත් පතේ සඳහන් වෙනවා. මෙතුමා ජීවන වියදම ගැන කියලා දැන් කෑ ගහනවා. දැන් ජීවන වියදම වැඩියි කියනවා. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා කළ ප්‍රකාශය, Daily Mirror newspaper එකේ කතෘ විසින් සටහන් කරපු මෙම කොටස මම **සභාගත*** කරනවා. එයින් කොටසක් පමණක් දැන් මම කියවන්නම්.

Daily Mirror newspaper of 19.03.2012 states, I quote:

> "The government has been able to contain the increasing cost of living. The prices of goods in 1960s have increased by a large margin by the year 2000, and it will increase further by the year 3000. Then people living in 3000 will say that the prices of goods were much less in the year 2000, just as we talk about the prices of goods in the 1960s."

Muditha Dayanananda has written this article. මේ, අපේ හිටපු අධ්‍යාපන ඇමතිතුමා කියපු එකයි. එතුමාගේ තව ලස්සන කථාවක් තිබුණා. එතුමා කියන්නේ මොකක්ද? මට දෙවැනියා හැටියට කථා කරන්න තිබුණා. අපේ මන්ත්‍රීවරුන් එක්ක වනජීවී අමාත්‍යාංශය ගැන මට රැස්වීමක් තිබුණා. තමන් වගකීමක් ඇතිව වැඩ කරන්න ඕනෑ. මම වුණත් එහෙමයි. මගේ දේශපාලන ජීවිතයට අවුරුදු 40ක් වනවා. ආණ්ඩු පක්ෂයේ ඉන්නවා කියලා විතරක් නොවෙයි අපි කථා කරන එක ගැන වගකීමක් තිබෙන්න ඕනෑ. තමන් විහිළුකාරයෙක් වෙන්න හොඳ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊයේ කියපු කාරණය නැවතත් කියනවා. "රුපියල් 2,500කින් මාසයක් කාලා බීලා ජීවත් වෙන්න පුළුවන්" කියලා කියපු එක්කෙනා නේ මගේ මිත්‍ර ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා. දන්නවා නේද? "තිදෙනෙකුගෙන් යුත් පවුලකට රුපියල් 7,500ක මුදලකින් මාසයක් කාලා බීලා නොමැරී ජීවත් වෙන්න පුළුවන්" කියා එතුමා කිව්වා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු ඇමතිතුමනි, එතුමා ඉන්න වෙලාවක කිව්වා නම් හොඳයි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
එතුමා ඉන්න ඕනෑ නැහැ. ඕනෑ වුණොත් මම ආයෙත් කියන්නම්. එතුමා කියපු අනෙක් කාරණය මොකක්ද? මම එය කියවන්නම්. හරි නම් විපක්ෂයේ කෑ ගහන නායකයෝ මේ ගරු සභාවේ ඉන්න ඕනෑ. කොරියාවේ ගිහිල්ලා ජම්බෝරි දමන එක නොවෙයි කරන්න ඕනෑ. ජපානයේ ගිහිල්ලා, ජාත්‍යන්තර රවුම් ගහලා එන එක නොවෙයි කරන්න ඕනෑ. 2012 අප්‍රේල් මස 9වැනි සඳුදා 'ලංකාදීප' පුවත් පතට බන්දුල ගුණවර්ධන මැතිතුමා මොකක්ද, කියා තිබෙන්නේ? I am repeating it today. "හාල්පිටි කිලෝවකින් ඉදිආප්ප 350ක් හදන හැටි මැයි මාසයේදී කියනවා: එවිට උදේ වේලට යන්නේ රු. 10යි" කියා එතුමා කියා තිබෙනවා. මම මේ ගැන ඊයෙත් කිව්වා. ඒ කියන්නේ ඉදිආප්පයක් රුපියලක විතර ප්‍රමාණය වෙන්න ඕනෑ. එහෙම නැත්නම් 350ක් හදන්න බැහැ. හාල්පිටි කිලෝවකින් හදන්න පුළුවන් වන්නේ ඉදිආප්ප 75යි. ඕනෑ නම් වැඩිම වුණොත් 85ක් හදන්න පුළුවන් වෙයි. එහෙම කියපු කෙනෙක් කොහොමද, අද ජීවන වියදම ගැන කෑ ගහන්නේ? ආර්ථිකය ගැන කථා කරන්නේ කොහොමද? කල්පනා කරලා බලන්න. අවුරුද්දක් තුළදී අපි මේ රටේ ආර්ථිකයේ විශාල වෙනසක් ඇති කරනවා. අපට ජාත්‍යන්තරයෙන් -චීනයෙන්- උදවු ලැබෙනවා. හෙට අනිද්දා අගමැතිතුමා ආයෙත් චීනයට යනවා. චීනය අපත් එක්ක තරහ නැහැ. වැඩි පොලී ඔක්කෝම අඩු කරලා. ආයෝජකයන් ඇවිල්ලා ඒවා ගන්න යනවා.

චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කර දහසක් දියුණු කරනවා. හැබැයි, ඒක මට ප්‍රශ්නයක්. අක්කර දහසක් එහෙන් ගත්තාම අලි ටික ඉන්නේ කොහේද? ඇයි, වැරදි සහගතව ඔබතුමන්ලා airport එක හැදුවා; harbour එක හැදුවා. පරිසරය ගැන, සොබාදහම ගැන හිතුවේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රිස්තු පූර්ව 3වන සියවසේදී මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කරලා මිහින්තලයේදී මොකක්ද කිව්වේ? "මහ රජ, ඔබ මේ භූමියේ අයිතිකරු නොවෙයි, භාරකරු. ඔබට මෙන්ම ගහ කොළ, සතා සිවුපාවාටත් නිදහසේ මේ භූමියේ සැරි සැරීමට අයිතිය තිබෙනවා" කියා කිව්වා. ඒක මම ලෝකයේ හැම තැනකදීම කියනවා. "තිරසර" කියන්නේ ඒකයි.

මම අහන්නේ මේකයි. ඇයි දෙයියනේ, අපේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා සමඟ ඔබතුමන්ලා පයින් යන්නේ? හිටියා නම් අදත් ජනාධිපති නේ. මේ කිසිම බරක් නැහැ නේ. ඔබතුමන්ලා ආණ්ඩු පාර්ශ්වය පැත්තේ නේ. එහෙම නම් අපි ඔය පැත්තේ නේ. ඇයි, හදිස්සි වුණේ? අපේ චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා අදත් ඇමති, එතුමා ජනාධිපති. ඔබතුමන්ලා රජ කරනවා. හැබැයි, රට ඉවරයි. ඇයි, හදිස්සි වුණේ? මම රහස කියන්නම්. මම දැන ගත්ත දෙයක් මේ කියන්නේ. එදා මේ රට ගෙනිව්වේ මහින්ද රාජපක්ෂයි, මහ බැංකුවේ හිටපු අධිපති මගේ මිත්‍ර අජිත් නිවාඩ කබ්‌රාල් මැතිතුමායි, මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් පී.බී. ජයසුන්දරයි. මේ තුන් දෙනා තමයි රට ගෙනිව්වේ. රටේ ආර්ථිකය විනාශ වෙලා, විනාශ වෙලා ලෝකයේ රටවල් ඔක්කෝම ඉරානයට වාගේ අපට තහංචි දමා ගෙන ආවා. අපි කොන් වුණා. එහෙම වුණා නම් මේ වන විට සාගතයෙන් මිනිස්සු මැරිලා. ජන්දයට ගියේ ඒකයි. "සාත්තරකාරයෝ" කියන්නේ බොරු. ඒක එතුමන්ලා තුන්දෙනා විතරයි දැන ගෙන හිටියේ. අන්න ගියා. එහෙම ගිහිල්ලා පැරදිලා තමයි අද කියන්නේ, ආණ්ඩුව දෙන්න කියලා. අද අපි ඒ බර ඔක්කොම කරට අර ගෙන ඒවාත් ගෙවන ගමන් තමයි ජනතාවට සංවර්ධනය උදා කර දෙන්නේ.

සතොස ආයතනයේ සිදු වූ වංචා, ගසාකෑම් සම්බන්ධ files ටික ඔක්කෝම මම ආහාර සුරක්ෂිතතාව ඇමති විධියට හිටපු කාලයේ FCID එකට භාර දීලා තිබෙනවා. චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, පී.බී. ජයසුන්දර සතොස සභාපතිට ලියුමක් යැව්වා. මොකක් සම්බන්ධයෙන් ද? හාල් මෙට්‍රික්ටොන් දෙලක්ෂ විසිපන්දහසක් ගෙන්වන්න ඔබතුමන්ලා අනුමත කළා. ඔබතුමන්ලා ඒ වෙලාවේ හිටියා. ලංකාවේ හාල් තිබුණා. පොන්නි සම්බයි, රතු කැකුළුයි කේරළයෙන් ගෙන්වන්න අනුමත කළා. මෙට්‍රික්ටොන් දෙලක්ෂ විසිපන්දහසක්, කීයටද? ඇමෙරිකානු ඩොලර් මිලියන 80කට. පී.බී. ජයසුන්දර ලියුමක් යැව්වා, ටෙන්ඩර් පටිපාටියෙන් තොරව ඉන්දියාවේ අභවලාට දෙන්න කියලා.

**** ප්‍රස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

මම එදා භාරයක් ඔප්පු කරන්න සෝමාවතී පන්සලට ගිහිල්ලා හිටියා. දෙයියෝ බැලුවා වාගේ, අපේ වර්තමාන ජනාධිපතිතුමාත් ඇවිල්ලා හිටියා. ඒක බෞද්ධයන්ගේ පූජනීය ස්ථානයක්. එතැනට කේරළයෙන් සාමිවරුන් වගයක් ඇවිල්ලා හිටියා. අපේ වර්තමාන ජනාධිපතිතුමාටත් කෑමට ආරාධනා කර තිබුණා. එතුමා කිව්වා, "මට යන්න බැහැ. ජයවික්‍රම යන්න කෝ" කියා.

මම ගිහිල්ලා ඒ කේරළයේ මහත්වරුන් එක්ක කෑම කද්දි මට හඳුන්වා දුන්නා, කොට මහත්මයෙක්ව. "සර්, මෙයා අහවලා" කියා මට හඳුන්වා දුන්නා. ඔබතුමන්ලා දන්නවා ඇති, එම ව්‍යාපාරිකයා ගැන. මම දන්නේත් නැහැ, Gregory's Road එකේ ඔහුගේ office එකක් තිබෙනවාලු. මම ඔහු සමඟ කථා කළාම, "Sir, I have been doing business with the former Sri Lankan Government" කියා කිව්වා. "මොනවාද ගෙනෙන්නේ?" කියා මම ඇසුවා. He said, "I was the one who supplied rice to Sri Lanka". Then, I asked him at what price he supplied *ponni samba.* ඔහු කිව්වා, "I gave it at Rs. 22 and *rathu kekulu* at Rs. 25 or something" කියා. The margin or the CIF value එක මෙහේ සඳහන් කරලා තිබෙන්නේ වරායෙන් ගොඩ බානකොට, 38ට. කිලෝ එකට රුපියල් 14 ගණනේ මෙට්‍රික් ටොන් 225,000ක් සහල් ගෙනාවොත් කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතුවා ඔහුට සිංහල තේරෙන්නේ නැහැ කියා. ඒ නිසා මම මා සමඟ සිටි කෙනෙකුට සිංහලෙන් කිව්වා, "මේක record කරන්න" කියා. මේ මිනිහා පැනලා ගියා. මේ මිනිහා මට නැවත හමු වුණා, කුලියාපිටියට අගමැතිතුමා පැමිණි වේලාවකදී. ඔහු මට මුහුණ දුන්නේ නැහැ. ඔන්න මිනිස්සු. පී.බී. ජයසුන්දරලා ටෙන්ඩර් නැතුව ඇමෙරිකානු ඩොලර් මිලියන 80කට එසේ සහල් ගෙන්වීමට නියෝගයක් දුන්නේ කොහොමද? බයක්, සැකයක්, වකිතයක්, හිරිකිතයක් නැතුව එහෙම වැඩක් කළේ කොහොමද? ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමනි, ඔබතුමා අවංක කෙනෙක්. මම දන්නවා. නමුත් පසු ගිය කාලයේ පැවැති ආණ්ඩුව මේ රට කෑවා. ඒ ඔක්කෝම එළියට එනවා. මේ රටේ නිලධාරීන්ට අපි වැටුප් දෙන්න ඕනෑ. මේ රටේ අධ්‍යාපනය දියුණු කරන්න ඕනෑ. අපි ඒවා කරනවා. අපිට අවුරුද්දක් දෙන්න. මේ රට තුළ සිටිමින් මම මේ කථා කරන්නේ. මම කාටවත් අපහාස කරන්න කැමැති නැහැ.

මම අලි දෙදෙනෙකු ගැන යම් කාරණයක් කථා කරන අවස්ථාවකදී මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් ඇසුවා, "ඇයි, ඔබතුමා කුරුණෑගලින් තරග කෙරුවේ?" කියා. මම එතුමාට කිව්වා, "ඔබතුමාගේ ආත්මය තියා ගන්න" කියා. මොකද, මාත් සමඟ එතුමා නාලන්දේ බෝඩිමේ සිටියා නේ. මම එසේ ඇසුවා. අද ගිහින් උපවාස කරනවා. ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමනි, ඔබතුමාත් වනජීවී ඇමති විධියට කටයුතු කළා. අර හොරු ටිකක් එක්ක ගෙන ගිහිල්ලා අන්න, දළඳා මාළිගාව ළඟ තුන්-හතර දෙනෙකු උපවාස කරනවා. මොකක්ද කොන්දේසිය? මට DIG කියනවා, "නීතිවිරෝධියි කියා අල්ලා ගත් අලි හතළිස් දෙනා දෙනවා නම් අපි නැඟිට යනවා" කියා. මම කිව්වා, "දෙනවා නොවෙයි, අධිකරණයේදී ඔවුන්ට වෙන දෙය බලා ගන්න" කියා. අන්න දැන් කිහිප දෙනෙක් හුළං බැහැලා ඉන්නවා. අලි බාස්ලාට පොවා නටන්න හැදුවා. ඒවාට ඉඩ දෙන්නේ නැහැ. මම කිව්වා, මේ රාජපක්ෂ රජය නොවෙයි; මේ රජය මෛත්‍රී-රනිල් රජය කියා DIGට කියන්න කියා. මෛත්‍රී-රනිල් රජයේ නීතියක් තිබෙනවා. නීතිය කාටත් එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් එකයි; මටත් එකයි. මම වරදක් කළොත් මට ඒකට දඬුවම් දෙන්න ඕනෑ. අපි මහජනතාවගේ සල්ලිවලින් ජීවත් වෙන්නේ. ඒකයි මම මේ ගැන කථා කරන්නේ. ඒ නිසා අපි මේ කටයුතු හරියාකාරව කරන්න ඕනෑ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමනි, ඔබතුමන්ලාගේ ප්‍රධාන පෙළේ අයයි අද අප සමඟ සිටින්නේ. අවුරුදු පහක් තුළ අපි මේ රට හදනවා. නීතියක් ගෙනෙනවා; විනයක් ගෙනෙනවා; රට සංවර්ධනය කරනවා. ආසියාවේ, ලෝකයේ තිබෙන මහා ලස්සන රටක් බවට අප මේ රට පත් කරනවා.

අපි මේ කරන කටයුතු ගැන කථා කරද්දී මම වාගේම ඔබතුමන්ලා කවුරුත් දන්නවා, වැඩි කල් යන්න කලින් ඔය පැත්තෙන් තව කොටසක් මේ පැත්තට එන බව. ගජදීර මැතිතුමනි, බොරුවට තර්ක කර කර ඉන්න එපා. ඔබතුමා හොඳ වාමාංශික නායකයෙක්. ඒ නිසා අන්ධයෙක් වාගේ මේ දේශපාලන ගමන යන්න එපා. මම ඔබතුමාට ගරු කරන නිසායි, මේ ගැන කථා කරන්නේ. තමන්ගේ මනසින් හිතන්න, කාලය අනුව. පිලිප් ගුණවර්ධන මැතිතුමා අන්තිමේදී සිටියේ කොහේද? එක්සත් ජාතික පක්ෂයේ නේ. ජීවිතය මරණයකි. නායකයෝ ඔක්කෝම මේ පක්ෂයෙන්නේ, ගියේ. අපි අවංකව හිතනවා. රනිල් වික්‍රමසිංහ කියන්නේ කෙළින් අවංකව කටයුතු කරන කෙනෙක්. හොරෙක් කියා ඔහුට ඇඟිල්ල දිගු කරන්න බැහැ. මෛත්‍රීපාල සිරිසේන කියන්නේ ඔබතුමන්ලාගේ හිටපු මහ ලේකම්තුමා. එතුමා දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත ගෙනාවා. ඒකට අපිත් සියයට සියයකින් සහයෝගය දුන්නා. දුම්වැටි භාවිතය ශරීරයට අහිතකර බව දැක්වෙන රූපමය අවවාද සියයට අසූවකින් සිගරට් පැකට්වල ප්‍රදර්ශනය කිරීමට පියවර ගත්තා. එතුමා කැබිනට් එකේදී කඳුළු සලමින් කිව්වේ මොකක්ද? එතුමාට දවසක් Temple Treesවලට එන්න කිව්වාලු. එසේ එන්නය කියා Ceylon Tobacco Company PLC එකේ නිලධාරීන් ඉදිරියේ තබා ගෙන එතුමාට අපහාස කරලා කිව්වාලු, "අරක අයින් කරනවා" කියා. රූපමය අවවාද සියයට 60කින් සිගරට් පැකට්වල ගහන්න කිව්වාලු. එතකොට එතුමා කිව්වාලු, "සර්, පනතට අනුව පාර්ලිමේන්තුවේ ඔක්කෝම එයට අනුමැතිය දුන්නා"ය කියා. "මම කියන දේ කරනවා" කියා එතකොට කිව්වාලු. ඒ වාගේ දෙක-තුනක් වුණා. එකක්, බෙහෙත්වලට වුණු දෙය. ඒ වාගේ අවංක අයට අපි ආරාධනා කරනවා. අපි මේ රට හදමු. මම කථා කරන එකේ - [බාධා කිරීමක්]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ආරාධනාව කවුරුහරි පිළිගත්තොත්, ඒකෙන් ඔහුගේ අවංකකම නැති වෙනවා. අවංකකම තිබෙන්නේ ප්‍රතිපත්තිවලයි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ඒකද එන්නේ නැත්තේ? බොරු නේ, කියන්නේ. අනේ! ඒ බොළඳ න්‍යාය දමන්න එපා. ඒත් කමක් නැහැ. දෙවියනේ! අපි මේ රට අවුරුදු හතර-පහකින් හදමු. තේරුණාද? අපි මේ රට හදමු. තමුන්නාන්සේ ඔය කුණු ගොඩට ගිහිල්ලා පැහෙන්න එපා. මෙතැන මගේ මිත්‍ර රණතුංග මැතිතුමාත් ඉන්නවා. එතුමාගේ තාත්තා බොහොම හොඳ කෙනෙක්. ගරු ගජදීර මැතිතුමනි, ඔබතුමාත් තව කල්පනා කරන්න. කාලය ඔබතුමාට ඳානය පහළ කරාවි; අපි යන ගමන නිවැරදිය කියාවි. හැබැයි වැරදි කළොත් මේ පැත්තේත්, ඔය පැත්තේත් කාටත් නීතිය එකයි. මම එතැනයි ඉන්නේ. මගේ දේශපාලන ජීවිතයෙන් මම අයින් වෙන්නේ මෙන්න මේක ක්‍රියාත්මක කරලායි. මම ඒ කථාව හැමදාම කියපු කෙනෙක්. ඔය පැත්තේ ඉඳලාත් කිව්වා. මොකක්ද කළේ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා?

මේ රටේ දෙවියෝ ඉන්නවා. බුදුන්ගේ ධර්මය හා රට ආරක්ෂා කරනවා. කැබිලිත්තේ දේවාලයට ගිහිල්ලා මොකක්ද කළේ, නරක වෙලාවේදී? අර නිලධාරියෙක් හිටියා, Park Warden වශයෙන්. කතරගම දෙවියන්ගේ, ගණ දෙවියන්ගේ සියලුම පින්තූර පොහොර බෑග්වලට දාලා ගෙනිච්චා. මම මේ පාර්ලිමේන්තුවේදී ඒ ගැන කිව්වා. එතකොට විජයමුනි සොයිසා, විෂය භාර ඇමති. ඔය කරපු ශාපය වදිනවාය කියායි මම මේ සභාවේදීයි කිව්වේ. මාස තුනයි යන්නේ කියලා මම කිව්වා. කවුරුත් හිතුවේ නැහැ, ආණ්ඩුව පෙරළෙයි කියලා. "නැහැ. නැහැ. අපි නෙවෙයි, එය කළේ නිලධාරින්" කියලා එතුමා කිව්වා. මම කිව්වා, "නැහැ, එය කළේ ඉහළින්"ය කියා. හිටපු ජනාධිපතිතුමා ගිහින් කැබිලිත්තේ අතරමං වුණා, පාලම් කඩාගෙන ගියා. චොපර් එකේ යන්න වුණා.

මේ රටේ තිබෙනවා, යම් බලවේගයක්. ඒක අපි කවුරුත් දැන ගන්නට ඕනෑ. මේ රටේ එහෙම නටන්නට බැහැ. මේ රට එවැනි තැනක්. අපි මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් කියන්නේ, ඥානය පහළ කර ගෙන, බොරුවට මේ වැඩ කරන්නේ නැතිව, අතරමං වෙන්නේ නැතිව ඉන්න; විමල් උන්නැහෙටයි තව එක්කෙනෙකුට දෙන්නෙකුටයි ඕනෑ විධියට මේ වැඩ කරන්නේ නැතිව ඉන්න කියායි. ඇයි මේ විධියේ වැඩ කරන්නේ? අපි ඔක්කොම එක්කාසු වෙලා මේ රට හදන එකයි කරන්න තියෙන්නේ. කුණුහරුප කියන්න නොවෙයි අපි මෙතැනට එන්නේ. ගහ ගන්න නොවෙයි අපි මෙතැනට එන්නේ. මම ඒවාට විරුද්ධයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විනාඩි 22ක කාලයක් ගත්තා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
කරීකයෝ නැහැ නේ. මම මෙතැන ඉඳගෙන ඔහේ බෙරය ගහනවා. විපක්ෂයේ කවුරුත් නැහැ. ධර්මදේශනාවක් කරනවා වාගේ අවවාද කරනවා, ඥානය පහළ වෙන්න. බුදුන් වහන්සේ, ජේසුස් වහන්සේ, මුහම්මත් නබිතුමා කියා තිබෙනවා වාගේ. ඒකයි මම කළේ. මේ අවස්ථාවේ අනෙක් අයත් මේ ගරු සභා ගැබේ සිටියා නම් හොඳයි. [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සංශෝධනය ගැන කියන්න මට අමතක වුණා. තනි පුද්ගලයකුට ලියා පදිංචි ගාස්තුව අඩක් කරන්න සංශෝධනය කරන ලෙස ඉල්ලීමක් කළා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මම ගරු ඇමතිතුමාට කියන්නම්. අපේ නිලධාරිනුත් අහගෙන ඉන්නවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒක සාකච්ඡා කරලා කරන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මම අදාළ ඇමතිතුමා නොවෙයි නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
එම නිසා තමයි මතක් කිරීම කළේ. ඔබතුමා තමයි ඇමතිතුමා වෙනුවෙන් පිළිතුරු කථාව දැන් කර ගහලා කළේ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හරි හරි. සුළු සුළු දේවල් ගැන නේ ඔබතුමා කථා කරන්නේ. ඔය බොරු දේවල් කථා කරන්න එපා. මම කිව්ව දේවල් ගැන කල්පනා කරලා, ගජදීර මැතිතුමන්ලා ඥානය පාවිච්චි කර අපි එක්ක කටයුතු කරන්න එන්න. අපි රට හදමු. බොරුවට ඒ දේවල් කරන්න යන්න එපා. වර්ජනය කිරීම් නොවෙයි කළ යුත්තේ. අපි එක්ක යන්න මේ මාර්ගයට එන්න. එසේ නම් ඉතින් කාලය ප්‍රශ්නයක් නේ. ඒ නිසා මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ඊළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මහතා.

[අ.භා. 4.17]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට අපේක්ෂිත සංවර්ධන ඉලක්ක කරා ගෙන යද්දී ඉතා වැදගත් කාර්ය භාරයක් පැවරී තිබෙන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මෙහෙය වන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත යටතේ වන නියෝග ගැනයි අපි අද කථා කරන්නේ. 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනත තුළිනුයි මේ කාර්යය පටන් ගත්තේ. මේ පනත යටතේ වන නියෝගවල තිබෙන ගාස්තු අය කිරීම හා සංශෝධනය කිරීම ගැනයි අපි අද කථා කරන්නේ.

මීට කලින් මේ පනත සංශෝධනය කර තිබෙන්නේ 2007 වර්ෂයේදීයි. අද වෙනකොට එය විශාල සංශෝධනයකට ලක් වෙනවා. සමහර ඒවා - items සුළු ගණනක් - සියයට 300ක් 400ක් වාගේ ගුණයකින් සංශෝධනයට ලක් වෙනවා. මොකද, අවුරුදු ගණනකින් සංශෝධනය කර නොතිබුණු නිසා. මේ සඳහා අවධානය යොමු කිරීම ගැන ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

මේ කාරණය දෙස බැලුවාම අපට පෙනෙනවා, දඩ මුදල් අය කිරීම සම්බන්ධයෙන් ගාස්තුත් සංශෝධනය කරන්නට ඕනෑ බව. මොකද, ඒවාත් බොහොම කාලයකින් සංශෝධනය වෙලා නැහැ. වැරදි කරන අයගෙන් දඩ වශයෙන් අය කරන්නේ බොහොම සුළු ගණන් නිසා මේ කටයුත්ත ඒ තරම් ඵලදායී නොවන තත්ත්වයකට පත් වෙච්ච අවස්ථා තිබෙනවා. උදාහරණයක් වශයෙන් පිටකොටුවේ තිබෙන මිදි වෙළඳාම ගැන බැලුවොත්, බොහෝ වෙලාවට තාවකාලික ප්ලාස්ටික් තරාදිවලින් තමයි කිර-

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

කිරා පාරිභෝගිකයාට දෙන්නේ. මිනුම් ඒකක හා ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවෙන් ඒ තරාදිය අරගෙන ගිහින් සීල් තබා නඩු දැම්මාට ඊළඟ දවසේත් ප්‍රමිතිය නැති ප්ලාස්ටික් තරාදියකින් කිරලා බඩු විකුණන්නට පටන් ගන්නවා. මොකද, මේ සඳහා වන දඩය සහ දඬුවම ඉතාමත්ම සුළු නිසා. මොකද, පාරිභෝගිකයාට සාධාරණ වශයෙන් බඩු ලබා දීම සඳහා රටේ යහ පාලනයට අවශ්‍ය වන දෙපාර්තමේන්තුවක් තමයි මේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව. අද ඉදිරිපත් කරන නියෝග තුළින් දඩ මුදල් ගැන වාගේම ලබා දෙන දඬුවම් ගැනත් පොඩි සංශෝධනයක් වෙනවා නම් හොඳයි කියලා මම හිතනවා. ඒ කාරණයත් ගරු ඇමතිතුමාගේ අවධානයට මා විශේෂයෙන්ම යොමු කරනවා.

මේ දෙපාර්තමේන්තුවෙන් අපේ රටට කරන්න පුළුවන් දෙයින් සියයට 50ක්වත් තවම කෙරෙන්නේ නැහැ කියලා මම හිතනවා. ඒ නිසා මේ දෙපාර්තමේන්තුව තව ශක්තිමත් කරන්න අපට එකතු වෙන්න වෙනවා. මේ දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම තුළින් අපට විදේශ විනිමය ඉතුරු කර ගන්න පුළුවන්. අපේ රටේ සල්ලි විවිධ ප්‍රමිතිකරණ කටයුතු සඳහා පිට රටට ඇදී යනවා. ඒ වාගේම අපේ රටේ තිබෙන නිෂ්පාදන පහසුවෙන් කර ගන්න පුළුවන් වන විධියට මේ දෙපාර්තමේන්තුව ශක්තිමත් කළ යුතුයි. මොකද, ඉදිරියේදී ජාත්‍යන්තර වෙළෙඳ පොළට අවශ්‍ය වන විධියට අපේ රටේ නිෂ්පාදන ඉදිරිපත් කරන්නත් අපි බලාපොරොත්තු වනවා.

විශේෂයෙන්ම ගරු අග්‍රාමාත්‍යතුමාගේ ආර්ථික සැලැස්ම යටතේ විදේශ ආයෝජකයන් මේ රටට ගෙනැල්ලා, විවිධ රටවල් එක්ක විවිධ ගිවිසුම් ඇති කර ගෙන, ඒ ඒ රටවලට අවශ්‍ය නිෂ්පාදන ලබා දෙන්න බලනවා. අපේ රටේ නිෂ්පාදන විදේශ රටවලට ලබා දීමේදී මිනුම් සඳහා ජාත්‍යන්තර පිළිගැනීමේ සහතික ලබා ගන්න පුළුවන් ආයතනයක් තිබීම වැදගත් වනවා. ඒ නිසා මේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව ශක්තිමත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ පිළිගත් ප්‍රමිතිය යටතේ ජාත්‍යන්තර පිළිගැනීමක් ඇතිව උෂ්ණත්වය, පරිමාව, දිග, පීඩනය, විද්‍යුත් ධාරාව, විද්‍යුත් ශක්තිය සහ බලය මැනීම සම්බන්ධයෙන් මේ දෙපාර්තමේන්තුවට සහතික ලබා දෙන්න පුළුවන්. පාරිභෝගිකයා පාවිච්චි කරන විදුලි ඒකක ප්‍රමාණය සඳහන්වන මීටර් පරීක්ෂා කරන ප්‍රමිතිකරණ උපකරණ සාමාන්‍යයෙන් අවුරුද්දකට වතාවක් වෙන රටකට යවලා ප්‍රමිතිය සකස් කර ගන්න ඕනෑ. ලංකා විදුලිබල මණ්ඩලය මේ කාර්යය සඳහා අවුරුද්දකට රුපියල් ලක්ෂ 30ක විතර මුදලක් විදේශ රටවලට යවපු බව අපි පසු ගිය දවස්වල දැක්කා. නමුත් වර්තමානය වනකොට අපේ ආයතනයට හැකියාව ලැබිලා තිබෙනවා, මේ උපකරණ පිට රට යවන්නේ නැතිව, අපේ ශ්‍රී ලංකාවේ තිබෙන මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියට අවශ්‍ය සහතිකය ලබා දෙන්න. ඒ නිසා අපේ රටේ සල්ලි ඉතුරුවෙලා තිබෙනවා. ඒ වාගේම අපිට කරන්න බැරි දේවලුත් තිබෙනවා.

අද අපි කොන්ක්‍රීට්වල ශක්තිය ගැන කථා කරනවා; විවිධ බලයන් ගැන කථා කරනවා. බලය මනින්නේ නිවුටන් මඟින්. නමුත් බලය වාගේ දේවල් මැනලා, ඒවාට ජාත්‍යන්තර සහතිකය ලබා දීමේ හැකියාව මේ දෙපාර්තමේන්තුවට නැහැ. මොරටුව විශ්වවිද්‍යාලයේ බලය මැනීමේ උපකරණ තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශයේ බලය මැනීමේ උපකරණ තිබෙනවා. නමුත් ජාත්‍යන්තර සහතික ලබා දීමේ හැකියාව අපේ මේ දෙපාර්තමේන්තුවට නැහැ. මම විශේෂයෙන්ම මේ කාරණයත් ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. විදේශ වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීම සඳහා අපේ රටේ ජනතාව විසින් නිෂ්පාදන නිර්මාණය කරන අවස්ථාවේදීත්, රටේ සංවර්ධන ක්‍රියාමාර්ගවලදී වාගේම, පරිසරය සුරැකීම සඳහා අවශ්‍ය මිනුම් වන ආලෝකයේ තීව්‍රතාව, චුම්බක තීව්‍රතාව, කම්පනය, අධිවෝල්ටීයතාව, ද්‍රව ගලා යෑම, වාහනයක වේගය, ආර්ද්‍රතාව නැත්නම් තෙතමනය වාගේ දේවල් මැනීම සම්බන්ධයෙනුත් ජාත්‍යන්තර නියෝජිතයා වශයෙන්, එම සහතික ලබා දීමේ පහසුකම් ඇති කිරීමට අපේ දෙපාර්තමේන්තුව ශක්තිමත් කරන්න ඕනෑ.

අද සෞඛ්‍යය පිළිබඳ ප්‍රශ්න ගොඩාක් අපට පැන නැඟිලා තිබෙනවා. ආහාරවල තිබෙන විෂ රසායන ද්‍රව්‍ය ගණනය කරන්න පුළුවන් වන විධියට එහි ප්‍රමිතිය ජාත්‍යන්තර මට්ටමින් හදන්නත්, ජලයේ තිබෙන විෂ රසායන ද්‍රව්‍ය මැනලා, ලෝකය පිළිගන්නා විධියේ ජාත්‍යන්තර සහතිකයක් දෙන්න පුළුවන් වන විධියටත් මේ දෙපාර්තමේන්තුව ශක්තිමත් කරන්න ඕනෑ. ඒ වාගේම රසායන විද්‍යාවේ තිබෙන මවුලිකතාව ආදිය ජාත්‍යන්තරව පිළිගන්න පුළුවන් විධියට මනින්න පුළුවන් ක්‍රමය පිළිබඳ සහතිකය දෙන්න අපට හැකියාව තිබෙනවා නම් හොඳයි. මා හිතනවා, අප ඒ හැකියාව හදාගන්න ඕනෑ කියා. එය අද අප ළඟ නැහැ. ඒ නිසා ඒ පහසුකම් නිර්මාණය කිරීම සඳහා ඉදිරියේදී ආයෝජනය කරන්න අපට සිදු වෙනවා. ඒ ආයෝජනය වරදක් වන්නේ නැහැ. ඒ ආයෝජනය කැලේ යන එකක් නොවෙයි. අපි දැන් හම්බන්තොට වරාය දියුණු කරන්න හදනවා, ඒ ආශ්‍රිතව කර්මාන්ත නිර්මාණය කරලා. නමුත් ඒ කර්මාන්ත නිර්මාණය වන කොට යටිතල පහසුකමක් වශයෙන් විශේෂයෙන් ඒ පහසුකම් ගැන සඳහන් කරන්න සිද්ධ වෙනවා. නිහඬව කරන සේවයක් වුණාට එය මේ රටේ සංවර්ධනය හා සමගාමීව යා යුතු දෙයක් වෙනවා. මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම, ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම විශේෂයෙන් කළ යුතුයි. නිහඬව කරන ඒ සේවය සඳහා වැඩි රාජ්‍ය අනුග්‍රහයක් ලබා දිය යුතුයි. මොකද, ඒ සේවාව බොරුවට සද්දය දාලා කරන එකක් නොවෙයි. පාරිභෝගිකයා සමඟ වැඩි වශයෙන් ගැටෙන එකකුත් නොවෙයි, ඒ ආයතනය. නමුත් ඒ ආයතනය නිහඬව ලොකු සේවයක්, ලොකු මෙහෙවරක්, ජාතික මෙහෙවරක් සිදු කරනවා. ඒ නිසා එයට ලොකු ශක්තියක් ලබා දීම පිළිබඳව අප අලුතින් හිතන්න ඕනෑ කාලය ඇවිත් තිබෙනවා කියා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතනයේ ප්‍රධාන කාර්යාලය දැනට පිහිටුවා තිබෙන්නේ හෝමාගම, පිටිපන, මාහේනවත්ත කියන පරිශ්‍රයේයි. ඒ ප්‍රධාන කාර්යාලය සහ පරීක්ෂණාගාරය -lab එක- හදන්න රුපියල් කෝටි 150ක් - රුපියල් මිලියන 1,500ක්- පමණ වියදම් කරලා බෙහෙවින් අංග සම්පූර්ණ ගොඩනැඟිල්ලක් විධියට නිර්මාණය කර තිබෙනවා. අනෙක් ගොඩනැඟිලිවල air conditioning වාගේ නොව, විද්‍යාගාර ගොඩනැඟිලි තුළ තිබිය යුතු air conditioningවල ප්‍රමිතියක් තිබෙන්න ඕනෑ. උෂ්ණත්වය වෙනස් වෙන්න බැහැ. මොකද, උෂ්ණත්වය වෙනස් වන කොට මිනුම් උපකරණ, පරීක්ෂණ උපකරණ, පරීක්ෂණාගාරයේ කටයුතු වෙනස් වෙන්න පුළුවන්. ඒ නිසා, එය ජාත්‍යන්තර ප්‍රමිතියක් අනුව තිබෙන්න ඕනෑ. ඒ විද්‍යාගාරය ජාත්‍යන්තර තත්ත්වයට තිබෙන්න ඕනෑ. ඒ පරිසරය එක විධියට පවත්වාගෙන යන්න ඕනෑ. එය, ජාත්‍යන්තර ප්‍රමිතිය පිළිබඳ ශ්‍රී ලංකා නියෝජිතයා වාගේ හැසිරෙන්න ඕනෑ එකක්. ඒ හින්දා රුපියල් මිලියන 500ක් පමණ වියදම් කරලා එහි වායු සමීකරණ පද්ධතිය හරි ගස්වන්න ටෙන්ඩර් කර තිබෙනවා. හැබැයි, දැන් අවුරුද්දක් විතර වෙනවා. Lab එක එහෙමම තිබෙනවා. වායු සමීකරණ ටෙන්ඩර් එක දිගන්න විධියක් නැහැ. නඩුවක් පවරා තිබෙනවා, ඒ ටෙන්ඩරය පිරිනැමීම පිළිබඳව. මෙය, යහ පාලන ක්‍රමවේදයේ තිබෙන ප්‍රශ්නයක්.

අපි දැන් දකිනවා මේ යහ පාලනය ඇති වුණාට පසුව බොහෝ සෙයින් නඩු කියන තත්ත්වයක්. "වැට" එක දැම්මත් දැන් නඩු කියනවා. මෙතෙක් කල් අවුරුදු ගණනක් බොහෝ සෙයින් පනත්

කෙටුම්පත් සම්මත වුණා, කිසිම ක්‍රමයක් නැතිව. අලුත් ආණ්ඩුව ආ ගමන් යහ පාලනය ගැන කථා කරන කොට, මෙතෙක් කල් කරපු ක්‍රමය නොව මෙය තමයි නීතිමය ක්‍රමය කියා නඩු පැවරීම නිසා ප්‍රශ්න ඇති වෙනවා. අපි ඒකට ඇඟිලි ගහන්න යන්නේ නැහැ. මොකද, රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරනවා, යහ පාලනය ඇති කරනවා කියා තමයි අපි ආණ්ඩුව අරගෙන තිබෙන්නේ. එසේ නඩු පැවරීමක් මේ ආයතනය සම්බන්ධයෙනුත් සිදු වෙලා තිබෙනවා. දැන් ඒ නඩුව පවතිනවා. ගොඩනැඟිල්ල හදා අවුරුද්දක් කිස්සේ පවතිනවා. පිරිස පදිංචි වෙලා ඉන්නවා. ආයතනය කටයුතු ආරම්භ කර තිබෙනවා. නමුත් අවශ්‍ය ප්‍රධාන මූලිකාංගය වන, ඒ lab එක ඇතුළේ තිබෙන වායු සම්කරණ පද්ධතිය ක්‍රියාත්මක කරගැනීමේ හැකියාවක් නැහැ, නඩුවක් තිබෙන හින්දා. ඒ නිසා මා කියනවා, රටේ සල්ලි වියදම් කරලා, ජනතාවගේ සල්ලි වියදම් කරලා ජාතික වැදගත්කමක් ඇති මේ ආදී රාජ්‍ය ආයතනවල මේ වාගේ ප්‍රශ්න එන විට විශේෂ අධිකරණ පද්ධතියක් සහිතව ඒ ප්‍රශ්න කඩිනමින් විසඳා උත්තරයක් දෙන්න ඕනෑ කියා. නඩු දමන්න ඕනෑම කෙනෙකුට අයිතිය තිබෙනවා. ඒ අයිතිය තමයි අපි ආරක්ෂා කර දුන්නේ.

අද අධිකරණය ගැන ජනතාවට විශ්වාසයක් තිබෙන හින්දා තමයි නඩු දමන්න පටන් ගෙන තිබෙන්නේ. ඉස්සර නඩු දමන්න පුළුවන්කමක් තිබුණේ නැහැ නේ. මොකද, ඒ කාලයේ නඩුත් හාමුදුරුවන්ගේ; බඩුත් හාමුදුරුවන්ගේ. නඩු කිව්වාට වැඩක් නැහැ. නමුත් අද අධිකරණය කෙරේ විශ්වාසය ජනතාවට ඇති කර තිබෙනවා. එය ජාතික වැදගත්කමක් ඇති ආයතනයක්. එහි වායු සම්කරණ පද්ධතිය සඳහා යොදවපු රුපියල් කෝටි 50 -රුපියල් මිලියන 500- කියන්නේ ජනතා මුදල්. අනෙක් අතට, එය අපේ රටේ සංවර්ධනයට සෘජුව ඉවහල් වන දෙයක්. ඒ නිසා එවැනි නඩු ඉක්මන් කරගැනීමේ ක්‍රමවේදයක් ගැන අප සැලකිලිමත් විය යුතුය කියන එක මම මේ ගරු සභාවට අවධාරණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම එහි කාර්ය මණ්ඩලය ගැනත් අප කථා කරන්න ඕනෑ. එහි සිටින කාර්ය මණ්ඩලයත් ප්‍රමාණවත් නැහැ. අද මේ සභාව දිහා බැලුවත් මේ කාරණය ගැන කථා කරන්න මන්ත්‍රීවරුත් නැහැ. මොකක්ද, ඒකට හේතුව? හේතුව, නිහඬව කරන සේවයක් හින්දා මෙය එච්චර ඇහට දැනෙන්නේ නැති වීමයි. කිරුම් මිනුම් ඒකකය කිව්වාට ඇහට දැනෙන්නේ නැහැ. ඇහට දැනෙන්නේ නැති වුණාට එය රටේ ආර්ථිකයට දැඩි ලෙස දැනෙන දෙයක්. ඒ හින්දා එහි කාර්ය මණ්ඩලය කෙරේ විශේෂ අවධානය යොමු කරන්න කියාත් මම කියනවා. විශේෂයෙන් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා එහි දිස්ත්‍රික්ක මට්ටමේ ශාඛා කාර්යාල පිහිටුවා තිබෙනවා. මිනුම් කටයුතු කරන උපකරණ වසරකට සැරයක් පරීක්ෂා කරන එක තමයි දිස්ත්‍රික්ක මට්ටමින් තිබෙන කාර්යාලවල ප්‍රධාන කාර්ය භාරය හැටියට සිද්ධ වන්නේ. නමුත්, මම කලින් කිව්වා වාගේ මේ දේවල් කරන්නේ රටේ යහ පාලනයටයි. මොකද, පාරිභෝගිකයාට හරි ප්‍රමාණය දෙනවා කියලා වග කීමකින් පොරොන්දුවක් වෙන්න නම්, ඒ විශ්වාසය රජය තුළ ඇති වන්න ඕනෑ.

1995දී රට පුරා කිරුම් මිනුම් උපකරණවල මෙහෙයුම් කටයුතු කිරීම සඳහා "මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක නිලධාරී" කියලා තනතුරක් අනුමත කරලා තිබෙනවා. එහි cadre එක 91ක්. ඒ 1995දී. අදත් මේ cadre එක 91ම තමයි තිබෙන්නේ; වෙනස් වෙලා නැහැ. අද තත්ත්වය බැලුවාම අඩුම ගණනේ එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක නිලධාරියෙකු බැගින්වත් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඉන්න ඕනෑ. නමුත්, එහෙම නැහැ. ලංකාවටම මෙවැනි නිලධාරීන් අනුමත කරලා තිබෙන්නේ 91යි. නමුත්, මේකෙන් field එකේ ඉන්නේ 54යි. දැනට තව 20ක් train වනවා. එතකොට මුළු නිලධාරී සංඛ්‍යාව 74ක් වෙයි. අඩු ගණනේ මේ 91වත් සම්පූර්ණ වෙලා නැහැ. මේ සංඛ්‍යාව සම්පූර්ණ කරන එක රජයට ආර්ථික වශයෙන් බරක් නොවෙයි. මොකද, දිස්ත්‍රික්ක මට්ටමින් තිබෙන මෙම විෂයයට සම්බන්ධ රාජ්‍ය කාර්යාලවලින් 2013 වර්ෂයේදී රජයට රුපියල් මිලියන 171ක ආදායමක් ලබා දීලා තිබෙනවා. 2014 වර්ෂයේදී රුපියල් මිලියන 181ක ආදායමක් ලබා දීලා තිබෙනවා. 2015 වර්ෂයේදී රුපියල් මිලියන 32ක ආදායමක් ලබා දීලා තිබෙනවා. මේ වන කොටත් මෙම රජයේ කාර්යාලවලින් ලබා දී තිබෙන ආදායම රුපියල් මිලියන 200 ඉක්මවා තිබෙනවා. එහෙම නම්, මේ තනතුරට නිලධාරීන් බඳවා ගත්තාම එක් පැත්තකින් යහ පාලනය ක්‍රියාත්මක වනවා; අනෙක් පැත්තෙන් මේ රටේ ජනතාවට විශ්වාසවන්ත විධියට කිරුම් මිනුම් ක්‍රියාත්මක වනවාය කියන විශ්වාසය ඇති කරන්න පුළුවන් වනවා.

අනික් එක, රැකී රක්ෂා ප්‍රශ්නයත් විසඳෙනවා. ඒ නිසා මේ ගැන වැඩි අවධානයක් යොමු කරලා මේ cadre එක වෙනස් කරන්න ඕනෑ. දැන් 54ක් හිටියාට, cadre එකේ 91ක් තිබෙනවා. නමුත්, 91ත් මදි. අඩුම ගණනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක නිලධාරියෙකු බැගින්වත් පත් කරන්න අවස්ථාව නිර්මාණය කරන්න කටයුතු කරන්න කියන කරුණ මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි මෙහි ප්‍රධාන කාර්යාලයේ විද්‍යාගාරයක් තිබෙනවා කියන එක. එතැන මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධාරීන් 80ක් පමණ සේවය කළ යුතු වනවා. මම කලින් කිව්ව air conditioner එක හරියට හදා ගන්න බැරි වෙලා නඩු කිය කියා ඉන්න laboratory එකෙන් තමයි ලෝකයේ තිබෙන මිනුම් ප්‍රමිතිය, වෙලාව කීයද කියන ප්‍රමිතිය දෙන්නේ. ලංකාවේ වෙලාව මේක තමයි කියලා standard time එක තිබෙන ඔරලෝසුව තිබෙන්නේ එතැන.

කිලෝග්‍රෑම් එකේ නිවැරදිම පඩිය තිබෙන්නේත් එතැන. මුළු ලෝකයටම ගැළපෙන පඩිය තිබෙන්නේත් එතැන. ඒ සඳහා විවිධ පර්යේෂණ කටයුතු කරන්න නිලධාරීන් 80ක් පමණ අවශ්‍ය වනවා. නමුත්, දැනට ඉන්නේ 8දෙනායි. 80 වෙනුවට ඉන්නේ 8දෙනායි. මේක රජයේ වැරැද්දකුත් නොවෙයි. රජය විසින් මෙම නිලධාරීන් බඳවා ගැනීමේ කටයුතු කරනවා. ඇමතිතුමා බඳවා ගැනීමේ කටයුතු සඳහා විවිධ කටයුතු කරනවා. නමුත්, උපාධිධාරීන් මේ තනතුර සඳහා එන්නේ නැහැ. භෞතික විද්‍යා විෂයය සම්බන්ධ උපාධිධාරීන් තමයි මේ තනතුරට එන්න ඕනෑ. මේ අය එන්නේ නැහැ. මොකද හේතුව, පසු ගිය ආණ්ඩුව කාලයේ "සංවර්ධන නිලධාරී" කියලා උපාධිධාරී නිලධාරීන්ව කුණුකොල්ලෙට දමා වැඩ ගත්තා. පොඩි පඩියක් අරගෙන ගම්වලට වෙලා -ගෙදරට වෙලා- ඉන්න පුළුවන් වන විධියට රැකියා කරන්න දැන් උපාධිධාරිනුත් ලැහැස්ති වෙලා ඉන්නවා. ඒ නිසා මේ තනතුරට බඳවා ගන්නවා නම්, විශේෂ පඩියක් - salary එකක් - දමා බඳවා ගන්න දැන් අපට සිද්ධ වෙලා තිබෙනවා. මොකද, මේක විද්‍යාඥයන්ගේ රාජකාරියක්. විශේෂ පඩියක් දමා, විශේෂ ආකර්ෂණ දීමනාවක් දමා මේ ආයතනය මේ නිලධාරීන්ගෙන් ශක්තිමත් කරන්න ඕනෑ වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම විශේෂයෙන්ම තව කරුණක් කියනවා. මේ තනතුර සඳහා පළමුවෙනියටම භෞතික විද්‍යා උපාධිධාරීන් බඳවා ගත්තාට ඒකේ දෙවෙනියට තිබෙනවා, දෙවන කාර්යක්ෂමතා කඩ ඉම කියලා. අවුරුදු හයක් ඇතුළත මේ බඳවා ගන්නා නිලධාරීන් මිනුම් විද්‍යාව පිළිබඳව, උපකරණ නිර්මාණ විද්‍යාව හා භෞතික රාශීන් මැන බැලීම පිළිබඳව පශ්චාත් උපාධියක් ගන්න ඕනෑ. නැත්නම් increments හම්බ වන්නේ නැහැ. මෙලෙස බඳවා ගත් නිලධාරීන් අවුරුදු හයක් ඇතුළත මේ පශ්චාත් උපාධිය ගන්න ඕනෑ. නමුත්, ලංකාවේ මේ

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

පශ්චාත් උපාධිය ගන්න ආයතන නැහැ; ඒ අධ්‍යාපනය දෙන ආයතන ලංකාවේ නැහැ. ඒවා වෙන වෙන රටවල තිබෙන්නේ. චීනයේ තිබෙනවා, කොරියාවේ තිබෙනවා, ජපානයේ තිබෙනවා, ඇමෙරිකාවේ තිබෙනවා. යුරෝපීය රටවල තමයි මෙහෙම විශ්වවිද්‍යාල වැඩිපුරම තිබෙන්නේ. එතකොට මේ බඳවා ගන්නා පුද්ගලයා මේ විශ්වවිද්‍යාලයකට යන්නේ කොහොමද? තමුන්ගේ සල්ලිවලින්ද, ශිෂ්‍යත්වයකින්ද? එහෙම බැලුවාම බඳවා ගත් ඒ නිලධාරියා තමුන්ගේ සල්ලිවලින් විශ්වවිද්‍යාලයට යන්න නම්, ඒ නිලධාරියාට රුපියල් කෝටි ගණනක් අතේ තිබෙන්න ඕනෑ.

මේ ආයතනයේ ඉන්න නිලධාරි මහත්මයෙක් මට හම්බ වුණා. ඒ නිලධාරියාගේ නම එස්.ඩී.අයි. ඩයස්. මේ විෂයයට තිබෙන දැඩි කැපවීම නිසා ඒ නිලධාරියා රජයත් එක්ක කථා කරලා අවුරුදු හයකින් සම්පූර්ණ කරන්න ඕනෑ පශ්චාත් උපාධිය ගන්න පිට රට ගිහිල්ලා තිබෙනවා. මේ සඳහා රජය රුපියල් ලක්ෂ 6ක් දීලා තිබෙනවා. මේ පුද්ගලයා ආයතනයට තවත් රුපියල් ලක්ෂ 11ක් ණය වෙලා මේ උපාධිය ගන්න පිට රට ගිහිල්ලා තිබෙනවා. දැන් ඔහුට සිද්ධ වෙලා තිබෙනවා ආයතනයට ණය ගෙවන්න. ඒ පාඨමාලාවේ ගාස්තුව ලක්ෂ 17ක්. මා හිතන විධියට ඔහු දැන් මාසයට රුපියල් දහදාහක් හෝ එකොළොස්දහසක් ආයතනය වෙනුවෙන් ගෙවනවා මේ පාඨමාලාව ඉගෙන ගත්තාට. හැබැයි, ඔහු ඒ අධ්‍යාපන දැනුම අරගෙන ඒ රාජ්‍ය ආයතනය තුළ "රසායන මිනුම් විද්‍යාව පිළිබඳ හඳුන්වා දීම" කියන පාඨමාලාව උගන්වනවා, විද්‍යාගාර තත්ත්ව කළමනාකරණ පාඨමාලාව උගන්වනවා, පෞද්ගලික අයට. මිනුම් අවිනිශ්චිතභාවය පිළිබඳ පාඨමාලාව කරවනවා. මේවා කරන්නේ ඔහු ලබාගත් දැනුම තුළින්. ජාත්‍යන්තරව පිළිගන්නා සහතිකයක් මේ ආයතනය තුළින් අද ශ්‍රී ලාංකිකයන්ට ලබා දෙනවා. ඒ ලබා දීම තුළ, අවුරුද්දකට ලක්ෂ 10ක් විතර ආදායමකුත් ඔහු මේ ආයතනයට ලබා දෙනවා. නමුත්, තිබෙන බෙදනීය තත්ත්වය මෙකයි. මේ පාඨමාලාව කරලා ලබා ගත්තු දැනුමෙන් මේ රටට, රජයට ලක්ෂ 10ක් අවුරුද්දකට ලබා දුන්නත් ඔහු තවම ආයතනයට ණය කාරයෙක්, ඒ විෂයය ඉගෙන ගැනීම වෙනුවෙන්. ඒ ණය ගෙවන්න කෙනෙක් නැහැ.

දැන් බලන්න, අපේ රටට ශිෂ්‍යත්ව එනවා ඕනෑ තරම්. ඊයේ පෙරේදාත් ජපානයෙන් ශිෂ්‍යත්ව 150ක් ආවා. නමුත්, මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව ගැන රටේ - දැන් මේ සභාව වාගේ තමයි- සැලකිල්ලක් නැහැ. මේ ශිෂ්‍යත්ව එකක්වත් අවශ්‍ය නිලධාරින්ට ලැබෙන්නේ නැහැ. ඒ නිසා මා විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා, මේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට අඩු ගණනේ වර්ෂයකට එක ශිෂ්‍යත්වයක් හෝ දීලා විද්‍යාඥයන් - scientists- නිර්මාණය කරන වැඩ පිළිවෙළකට යා යුතු බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි වෛද්‍ය උපාධියක් දීලා වෛද්‍යවරයෙකු නිර්මාණය කරනවා. ඉංජිනේරු උපාධියක් දීලා ඉංජිනේරුවෙකු නිර්මාණය කරනවා. Accountancy පැත්තෙන් ගණකාධිකාරීවරුන් නිර්මාණය කරනවා. ඒ වාගේම නීතිඥ උපාධියක් දීලා නීතිඥවරුන් නිර්මාණය කරනවා. මිනින්දෝරුවරු වුණත් උපාධියක් දීලා නිර්මාණය කරනවා. නමුත්, වෘත්තියෙන් උපාධියක් ලැබිය යුතු, මිනුම් සහ ප්‍රමිති සේවා උපාධියක් අපේ ලංකාවේ නැහැ.

විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත් ප්‍රමුඛ රජය උත්සාහ කරන්නේ උගත්කමින් මේ රට ශක්තිමත් කරන්නයි; දැනුමින් ශක්තිමත් සමාජයක් නිර්මාණය කරන්නයි. උගතකු නිර්මාණය කළොත් ඔහුට යුරෝපය ඇතුළු දියුණු රටකට ගිහිල්ලා ලොකු මුදලක්, එහෙම නැත්නම් කාන්තාවන් සියයක් මැදපෙරදිග ගිහින් දුක් විඳලා ගෙනෙන මුදල ලංකාවට ගෙන එයි. ඒ නිසා අපි මේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරින්ට අවශ්‍ය දැනුම ලබා ගන්න ශිෂ්‍යත්ව දීලා, ඒ අයට උගන්වලා උපාධියක් ලබා දිය යුතුයි. ඒ අය අවුරුදු 6ක් තුළ පශ්චාත් උපාධිය සමත් විය යුතුයි. ඒ අයට ඒ අධ්‍යාපනය ලබා දෙන්න අවධානය යොමු කරනවා වාගේම, අපේ ලංකාවෙත් මේ පාඨමාලාව හඳුන්වා දීම කළ යුතුයි. මොකද, මේක ලෝකයට අවශ්‍ය දෙයක්. ඒ නිසා ඒ පාඨමාලාව හඳුන්වා දීලා උගත්කමින් රට ශක්තිමත් කරන්න, අපේ රටේ ජනතාවට ලෝකය පිළිගන්නා සහතිකයක් දෙන්න, අපේ රටේ ජනතාවට ලෝකය පිළිගන්නා වෘත්තියකට යන්න පුළුවන් සහතිකයක් දෙන්න අවස්ථාවක් උදාකර ගන්න අවශ්‍ය වනවා. එතකොට අපි හිතන රටකට අපට යන්න පුළුවන්.

අපි දන්නවා, අපේ හෙද නිලධාරිනියන් පිට රටවල හොඳ සේවයක් කරනවා. අපේ රටේ ගුරුවරු හොඳ සේවයක් කරනවා. ලෝකයේ ඉස්තරම් ගුරුවරු ඉන්නේ අපි ළඟ; ඉස්තරම් හෙද නිලධාරින් ඉන්නේ අපි ළඟ. නමුත්, ලෝකය පිළිගන්න සහතිකයක් ඔවුන්ට දීමේ නොහැකියාව නිසා, අවුරුදු දෙකක හෝ නිවාඩුවක් අරගෙන වෙන රටකට ගිහිල්ලා nurse කෙනෙක් විධියට වැඩ කරලා විදේශ විනිමය අරගෙන අපේ රටට එන ක්‍රමවේදයක්, ගුරුවරයකුට නම් වෙන රටකට ගිහිල්ලා අවුරුදු දෙකක් උගන්වා විදේශ විනිමය අරගෙන අපේ රටට එන ක්‍රමවේදයක් අපේ උගතුන්ට නැති වෙලා තිබෙනවා. ඒ නිසා මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අවධානය යොමු කර කටයුතු කළොත්, මිනුම් සහ ප්‍රමිති සේවා උපාධිය, පශ්චාත් උපාධිය ලබා දීම විතරක් නොවෙයි, technically-qualified අය පවා නිර්මාණය කරන්න අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් මෙම ආයතනය තුළම පිහිටුවන්න පුළුවන් කියන එකත් විශේෂයෙන් සඳහන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව අපට ඉතාම නිහඬ සේවයක්, මහා බැරුම් සේවයක්, මහා වගකිව යුතු සේවයක් කරනවා. දවසේ වෙලාව වෙනස් වෙනවා නම්, වෙලාවල් දෙකක් ගැන argument එකක් ආවොත් ඒ වගකීම ගන්න පුළුවන්, ඒ වාගේම කිලෝග්‍රෑම් එක ගැන එක් කෙනකු එක පඩියකුත්, තව කෙනකු තව පඩියකුත් අරගෙන කථා කරන කොට මේකයි කිලෝග්‍රෑම් එක කියලා කියන්න පුළුවන්, මීටරයේ දිග හරියටම මේකයි කියලා ලෝකයට ගැළපෙන විධියට කියන්න පුළුවන් මේ ආයතනය තව ශක්තිමත් කරලා, ජාත්‍යන්තර මට්ටමින් අපේ ආර්ථිකය ශක්තිමත් කරන්නටත් උපයෝගී කර ගන්නට වැඩි අවධානයක් යොමු කළ යුතුයි. මේ ආයතනය තුළ සේවය කරන නිලධාරින්ට අවශ්‍ය උගත්කම සහ දැනුම සම්පූර්ණ කර ගැනීම සඳහා අවකාශය රජයේ යම් මැදිහත්වීමක් තුළ නිර්මාණය කරදීමට කටයුතු කිරීම තුළින් අපේ ඉලක්කය සම්පූර්ණ කරගත හැකියි කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.39]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ මිනුම් ඒකක, ප්‍රමිති සේවා පනත යටතේ ගෙනෙන නියෝග පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට හැකිවීම පිළිබඳව මම ඉතා සතුටු වෙනවා. විශේෂයෙන්ම ව්‍යාපාරික ආංශික කාරක සභාවෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක් වූ මෙම කරුණු හරහා අපට වැදගත් කාර්යයන් රැසක් ඉටු වෙනවා. විශේෂයෙන්ම මේ නියෝග තුළින් එක පැත්තකින් ව්‍යාපාරිකයන්ටත්, අනෙක් පැත්තෙන්

පාරිභෝගිකයන්ටත්, විශාල වශයෙන් සේවාවක් සිදු වෙනවා. මෙහි වැදගත්කම ගැන කථා කරන කොට, පාරිභෝගිකයන්ට සාධාරණයක් ඉටු වෙන්න නම්, ඔවුන් ලබා ගන්නා භාණ්ඩය නියම ප්‍රමිතියකින් යුක්ත විය යුතුයි. ඒ වාගේම ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාරික උපකරණ නැවතත් licence කරන්න වන අවස්ථාවලදී මේ ආයතනයේ සේවය කරන නිලධාරීන් හරහා වැදගත් කර්තව්‍යයක් සිදු වෙනවා. මේ නිලධාරි මහත්වරුන් එක්ක සාකච්ඡා කරන කොට අපි දැක්ක ප්‍රධානම කාරණාවක් තමයි, නිලධාරීන්ගේ භීතියක් තිබෙන බව. සෑම දිස්ත්‍රික්කයකම දිසාපති කාර්යාලවල මේ නිලධාරීන් සේවය කරනවා. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයක් තුළ තිබෙන නගර ගත්තොත්, නගර තුන හතරක් තිබෙනවා. ඒ එක නගරයක ව්‍යාපාරික මධ්‍යස්ථාන අඩුම ගණනේ සියයක් විතර තිබෙනවා. ඒ නිසා මේ නිලධාරීන් දිස්ත්‍රික් කාර්යාලයට සීමා නොවී අඩුම වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් කිහිප දෙනෙක්වත් ඇතුළත් විය යුතුමයි. මම හිතන විධියට මේ නිලධාරීන්ගේ තිබෙන cadre එක මීට දශක කිහිපයකට කලින් අනුමැතිය ලැබිච්ච එකක්. එම නිසා මේ කාල වකවානුවට සරිලන ආකාරයට ඒ cadre එක වැඩි වෙන්න ඕනෑ. ඒ තුළින්ද එක පැත්තකින් පාරිභෝගිකයන්ට සාධාරණයක් ඉටු වෙනවා. ඒ වාගේම ව්‍යාපාරිකයන් මුදලක් ගෙවලා ලබාගන්න සේවාවටත් සාධාරණයක් ඉෂ්ට වෙනවා.

ව්‍යාපාරිකයන් මුදලක් ගෙවා මේ සේවාව ලබා ගන්නා විට ඒ මුදලට සරිලන පහසු ආකාරයෙන් සේවාවක් ලබා දෙන්නත් අපි කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා අපට වැඩි නිලධාරීන් ප්‍රමාණයක් අත්‍යවශ්‍යයි. ඒ නිලධාරීන් සංඛ්‍යාව වැඩිවීමේදී ව්‍යාපාරිකයන්ගෙන් අය කරනු ලබන මුදලේ යම් වැඩිවීමක් තිබෙනවා නම්, ඒ වැඩි වන මුදල නොවෙයි මෙතැන තිබෙන ගැටලුව. ඒ නිලධාරීන් තුළින් සාධාරණ, ක්ෂණික සේවාවක් ව්‍යාපාරිකයන්ට ඉටු විය යුතුයි. ව්‍යාපාරික ප්‍රජාව සමඟ අපි මේ සම්බන්ධයෙන් කථා කරන කොට ඔවුන් කියන දේ තමයි, මේ කටයුත්ත මුදල් ගෙවා කර ගන්නත් සමඟර වෙලාවට දින කිහිපයක්ම ගත වෙනවා කියන එක. සාමාන්‍යයෙන් ගමේ පොළේ වෙළඳාම් කරන වෙළෙන්දෙකුට මේ කටයුතු සිදු කර ගන්න දින කිහිපයක්ම යන්න වුණොත්, ඒ වෙළෙන්දාට ජීවත් වෙන්නත් අමාරු තත්ත්වයක් උදා වෙනවා. ඒක එක පැත්තක්. අනෙක් පැත්තෙන් පාරිභෝගිකයාත් අපහසුතාවට පත් වෙනවා.

ඇත්තටම පාරිභෝගිකයන්ගේ පැත්තෙන් කථා කරනවා නම්, පොළකට යන කෙනෙක් තමන් සාධාරණව බොහොම අමාරුවෙන් උපයා ගත් යම් මුදලක් වැය කරලා භාණ්ඩයක් ලබා ගන්න කොට ඒ තැනැත්තාට සාධාරණයක් ඉටු විය යුතුයි. විශේෂයෙන්ම ඉන්ධන පිරවුම් මධ්‍යස්ථානවලදී අපි ලොකු ගැටලු සහගත තත්ත්වයකට පත් වෙනවා, එම මධ්‍යස්ථානවල පිහිටුවා තිබෙන මිනුම් උපකරණ නිවැරදි ආකාරයෙන් ක්‍රියාත්මක වෙනවාද කියලා. අපි රුපියල් 1000ක ඉන්ධන ගහන්න කියනවා; රුපියල් 2000ක ගහන්න කියනවා. නමුත් ඒ රුපියල් 1000ක හෝ 2000ක මුදලට සරිලන ඉන්ධන ප්‍රමාණය ලැබෙනවාද කියන එක ගැන අපට ලොකු සැකයක් තිබෙනවා. ඒ නිසා මිනුම් කටයුතු පරීක්ෂා මෙම වැදගත් ආයතනය පිළිබඳව මීට වඩා රජයේ අවධානය යොමු කළ යුතුයි.

අධ්‍යාපනය තුළින්; උගත්කම තුළින් මේ රට ඉදිරියට ගෙන යන්න කටයුතු කිරීම නව රජයෙන් අපි බලාපොරොත්තු වන දෙයක් බව මේ අවස්ථාවේ දී මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. දැන් මේ රටේ භයානකම තත්ත්වය බවට පත් වෙලා තිබෙන්නේ බුද්ධි ගලනයයි. තරුණ තරුණියන් වැඩි වශයෙන්ම බලන්නේ රැකියාවක් ලබා ගැනීම සඳහා එක්කෝ කොරියාවට යන්න, එක්කෝ මැලේසියාවට යන්න, කාන්තාවක් නම් සවුදි අරාබියට යන්නයි. මෙන්න මේ වාගේ අවාසනාවන්ත තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. සමඟර වෙලාවට උපරිම කැප කිරීම කරන්නේ මේ රටින් පිට වන්නයි. ඒ නිසා රටක් හැටියට ගත්තාම මේ බුද්ධි ගලනය අපට ලොකු ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ සඳහා අපි දෙයාකාරයකින් මුහුණ දෙන්න ඕනෑ.

ප්‍රධාන කාරණය තමයි, තමන් කරන රැකියාවට සරිලන වැටුපක් ලබා දීම. අද අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් ඒ ගැන ප්‍රකාශ කළා. විශේෂයෙන්ම කාන්තාවන් සවුදි අරාබිකරයේ රැකියාවලට යන්නේ මහ ලොකු මුදලකට නොවෙයි. ඩොලර් 300ක් වාගේ මුදලකටයි. මේ රටේ සේවාවක් කරලා; මේ රටේ රැකියාවක් කරලා ඒ මුදල් ප්‍රමාණය ලබා ගන්න පුළුවන් නම් මේ තරුණ ජවය, මේ දැනුම මේ රටේ නතර වෙනවා. මම කියන්නේ අපේ කම්කරුවන්ගේ මට්ටමින් නොවෙයි. අපි ඉංජිනේරුවන් ගත්තොත්, ඉංජිනේරුවන් විශාල ප්‍රමාණයක් පිට රටවල සේවය කරනවා. විශේෂයෙන්ම ඕස්ට්‍රේලියාවේ අපේ ඉංජිනේරුවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. වෛද්‍යවරු පිළිබඳව ගත්තොත්, වෛද්‍යවරුන් විශාල ප්‍රමාණයක් පිට රටවලට යනවා. හෙදියන් ගත්තොත්, ඉංග්‍රීසි භාෂාව කථා කරන්න පුළුවන් නම් විශාල ප්‍රමාණයක් පිට රටවලට යනවා. කම්කරුවන් ගත්තත්, අද අපට ලොකුම ඉල්ලුම තිබෙන්නේ කොරියාවෙන්. එහෙම නැත්නම් ඊශ්‍රායලයෙන්. එහෙමත් නැත්නම් මැලේසියාවෙන්. මේ තුළින් එක පැත්තකින් අපේ තරුණ ජවය, අනෙක් පැත්තෙන් අපේ දැනුම මේ රටින් එහා පිට රටකට යනවා. එය රටක සංවර්ධනයට, විශේෂයෙන්ම අපේ ලංකාව වාගේ සංවර්ධනය වෙමින් පවතින රටක සංවර්ධනයට විශාලතම බාධාවක් හැටියට මම දකිනවා. බුද්ධි ගලනය රටක සංවර්ධනයට ලොකුම බාධාවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ සඳහා අපි රට තුළ නිෂ්පාදනයන් වැඩි කරලා, රට තුළ කර්මාන්තශාලා වැඩි කරලා වැටුප් වැඩි කිරීම අත්‍යවශ්‍යයි. ඒ තුළින් තමයි රැකියා කරන පිරිසට, මේ රටට සාධාරණයක් කළ හැක්කේ.

මේ විවාදයේදී විශේෂයෙන්ම අපි සඳහන් කළ යුතු දෙයක් තමයි සේවාවන් ලබා ගන්නා අයට සාධාරණයක් විය යුතුයි කියන කාරණය. සේවාවන් ලබා ගන්නා අයට ඉතා පහසුවෙන් ඒ සේවාව ලබා ගැනීමට හැකි ක්‍රමවේදයක් ඇති කළ යුතුයි. විශේෂයෙන්ම ආසන මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කාර්යාල ලබා දීලා අවශ්‍ය පහසුකම් ලබා දිය යුතුයි. විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් කියන්නේ විශාල භූමි ප්‍රමාණයක්. ඒ භූමි ප්‍රමාණය අනුව කල්පනා කර බලන කොට එක දිස්ත්‍රික්කයකට නිලධාරීන් හය හත් දෙනෙක් තමයි ඉන්නේ. මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ නිලධාරීන් පස්දෙනෙක් හෝ හයදෙනෙක් තමයි ඉන්නේ. ගම්පහ දිස්ත්‍රික්කය තුළ මැතිවරණ කොට්ඨාස 13ක් තිබෙනවා. මේ මැතිවරණ කොට්ඨාසයකට හරියන එක නිලධාරියකුවත් නැහැ. එවැනි අපහසු කාර්යයක් කිරීමේදී, එක පැත්තකින් පාරිභෝගිකයන්ටත්, තවත් පැත්තකින් ව්‍යාපාරිකයන්ටත්, විශේෂයෙන්ම ආයතනවල වැඩ කරන නිලධාරීන්ටත් විශාල ගැටලුවකට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා. ඒ කෙරෙහි රජයේ අවධානය විශාල වශයෙන් යොමු කරන්න ඕනෑය කියා මා හිතනවා.

ඒ විතරක් නොවෙයි. මේ නව රජය දූෂණ විරෝධී, දූෂණය අවම කරන, දූෂණයට පිටුපාන රජයක්. ඒ සඳහා සුදුසු වාතාවරණය කුඩා බිම් මට්ටමේ ව්‍යාපාරවලත් අපි දකින්නට ඕනෑ. අපි දන්නවා, රුපියල් කෝටි, ප්‍රකෝටි ගණන්වලින් සිදුවන විශාල වංචාවන් සමඟර විට එකවර සිදුවන වංචාවන් නොවුණාට, බිම් මට්ටමේ ජීවත්වන දුප්පත්, අහිංසක ජනතාවට මේවායින් අසාධාරණකම් සිදුවන බව. ඒ අසාධාරණකම්වලින් තොර සාධාරණ සමාජයක් බිහි කරන්න තමයි මේ රජය පත් වුණේ. එයට හොඳ ශක්තියක් අපේ පිරිසිදු නායකයන් දෙදෙනාගෙන්

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

ලැබෙනවා. එක පැත්තකින් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නායකත්වය ලබාදීම තුළිනුත්, අනෙක් පැත්තෙන් ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා එක්සත් ජාතික පක්ෂයට නායකත්වය ලබාදීම තුළිනුත් මේ රට පිරිසිදු, දූෂණයෙන් තොර රටක් බවට පත් කරන්න ඒ දෙදෙනා හොඳ පූර්වාදර්ශයක් ලබා දෙනවා. තව කෙටි කාලයකින්, මා හිතන හැටියට තව සතියක පමණ කාලයකින් මේ යහ පාලන රජය බිහි කරලා අවුරුද්දක කාලයක් සම්පූර්ණ වනවා. මේ අවුරුද්දක කාලය තුළදී සෑම පැත්තකින්ම විශාල වෙනසක් ඇති කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. මේ හැම දෙයකටම අධිකරණයේ ස්වාධීනත්වය වැදගත් වනවා. ඒ නිසාම තමයි අද ජනතාවට අධිකරණය කෙරෙහි විශාල විශ්වාසයක් ඇතිවෙලා තිබෙන්නේ. ජනතාවට අධිකරණය කෙරෙහි විශාල විශ්වාසයක් තිබෙන නිසා තමයි අද අධිකරණවල පවතින නඩු ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම මේ රජයට විරුද්ධව වුණත් අධිකරණය ස්වාධීනව කටයුතු කරනවා. මේ යහ පාලනය තුළින් අපි අපටම වළ කපා ගන්නවාද කියලා සමහර වෙලාවට හිතෙනවා. ඒ වුණාට අපි රටක් හැටියටයි මේ වැදගත් තීන්දු තීරණ ගන්නේ. මොකද, අධිකරණයේ ස්වාධීනත්වය රටකට අත්‍යවශ්‍යයි. එක පැත්තකින් ආයෝජකයන් සම්බන්ධයෙන් ගත්තොත්, ආයෝජකයන් විශාල වශයෙන් මේ රටට පැමිණෙන්න බලපාන ප්‍රධාන කාරණාවක් වනවා, අධිකරණයේ ස්වාධීනත්වය. පසු ගිය කාලයේ අපේ රටට ආයෝජකයන් නොපැමිණීමට ප්‍රධානතම හේතුවක් වුණා, අධිකරණයේ ස්වාධීනත්වය නොමැතිකම. මොකද, එය ව්‍යාපාරිකයන්ට වුණත් බලපාන ප්‍රධාන සාධකයක්. ඔවුන්ට මොකක් හෝ අසාධාරණයක් වුණා නම් අධිකරණයට යන්න පුළුවන් අවස්ථාවක් තිබිය යුතුයි. ඒ ව්‍යාපාරිකයන්ට අධිකරණයට යන්න ස්වාධීන වාතාවරණයක් තිබුණේ නැත්නම්, ඔවුන්ට සාධාරණයක් ඉටු වන්නේ කොහෙන්ද කියන එක පිළිබඳව ඒ අයට විශාල සැකයක් තිබෙනවා. වැඩි කාලයක් නොවෙයි, වසර දෙකකට කලින් මේ රට තිබුණේ එවැනි තත්ත්වයකයි.

තව සතියකින් මේ යහ පාලන රජය බිහි කරලා අවුරුද්දක් සම්පූර්ණ වනවා. යහ පාලන රජයක් බිහි කරලා අවුරුද්දක් ගතවන මේ මොහොතේ රටේ සෑම අංශයක් කෙරෙහිම රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා. එක පැත්තකින් අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරනවා නම්, විශේෂයෙන්ම උපාධි, පශ්චාත් උපාධි ලබාදීම සඳහා මේ නව රජය වැඩි අවධානයක් යොමු කරලා තිබෙනවා. ඇත්තටම කියන්න සතුටුයි, මා නියෝජනය කරන දොම්පේ මැතිවරණ කොට්ඨාසයේ පාසල් 30ක් සංවර්ධනය කරන්න රුපියල් ලක්ෂ 3,000කට ආසන්න මුදලක් ලැබී තිබෙන බව. මේ ඉතිහාසයේ වැඩිම මුදල් ප්‍රමාණය එම මැතිවරණ කොට්ඨාසයට මේ වසරේ ලබා දුන්නා. මේ ආකාරයෙන් සෑම මැතිවරණ කොට්ඨාසයකම අධ්‍යාපනයට වැඩි අවධානයක් යොමු කර තිබෙනවා. ඒ වාගේම සෞඛ්‍යයට වැඩි අවධානයක් යොමු කර තිබෙනවා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ඒ නිදහස වෙනුවෙන් තමයි අපේ රටේ ජනතාව 2015 ජනවාරි 8වැනි දා ඒ සහයෝගය ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ලබා දුන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂයෙන්ම මාධ්‍යවේදීන්ට තර්ජන ගර්ජන නැතිව, සුදු වැන් සංස්කෘතියෙන් ඈත් වෙලා, කිසිම බයක් සැකක් නැතිව තමන්ට ඕනෑ අදහසක් ප්‍රකාශ කිරීමේ ඒ ස්වාධීන අයිතිය තහවුරු වෙලා තිබෙනවා. පසු ගිය කාල සීමාවේදී මාධ්‍යවේදීන් ඝාතනය කරපු ආකාරය අප දැක්කා. මාධ්‍ය ආයතනවලට ප්‍රහාර එල්ල කළ ආකාරය අප දැක්කා. මාධ්‍යවේදීන්ට මේ රට අත්හැර දමා යන්න සිදු වුණු අවස්ථා තිබුණා. මෙන්න මේ වාගේ අවාසනාවන්ත යුගයක් අවසන් කළ යහ පාලන ආණ්ඩුවට දැන් වසරක් ගත වෙලා තිබෙනවා. ඒ වසරක් ගත වුණු වෙලාවේ අපට ඊළඟට කරන්න තිබෙන්නේ මොකක්ද? මේ රටේ ආයෝජනය වැඩි කරලා, සේවකයන්ට හොඳ ආදායමක් ලැබෙන පරිසරයක් ඇති කිරීමයි. ඉදිරි වසර තුන හතර තුළ අප උපරිම කැප කිරීම කරන්නේ ආර්ථික වශයෙන් ශක්තියක් ලබාදෙන්න පුළුවන් ව්‍යාපාරිකයන්, ආයෝජකයන් වැඩි පිරිසක් මේ රටට ගෙන්වා ගන්නයි. එසේ ගෙන්වා ගන්නා ආයෝජකයන්ට මේ රට දිහා ඇස් ඇරලා බලන්න පුළුවන් විධියේ වාතාවරණය මේ වෙන කොට හැදිලා තිබෙනවා. අද රටේ නීතිගරුක සමාජ ක්‍රමයක් බිහි වෙලා තිබෙනවා. අධිකරණයේ ස්වාධීනත්වය, මාධ්‍ය නිදහස කියන ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංගවලින් පිරිපුන් රටක් අද බිහි වෙලා තිබෙනවා. ඒ තුළින් තමයි අප මේ රට තවත් ඉදිරියට ගෙන යන්න බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට වඩා දීර්ඝව කථා කරන්න අදහස් කරන්නේ නැහැ. මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනත යටතේ මේ නියෝග ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේ ගාමිණී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමාටත්, රිසාඩ් බදියුදීන් අමාත්‍යතුමාටත් මා නැවත වරක් ස්තුතිවන්ත වෙනවා. මෙතැනින් එහාට, මේ සේවකයන්ට තිබෙන අඩු පාඩුකම්, ඒ අයගේ අධ්‍යාපනය වෙනුවෙන් ලබා දෙන්න ඕනෑ ඒ පහසුකම් ආදියත් ලබාදීලා, පාරිභෝගිකයන්ටත් සාධාරණයක් ඉටු කරන්න පුළුවන් කර්තව්‍යයක් ඉටු කරන්න ඔබතුමන්ලාට ශක්තිය ලැබේවා!යි කියා ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair and* THE HON. VELU KUMAR *took the Chair.*

[අ.භා. 4.57]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතට අදාළව ආහාර සුරක්ෂිතතාව අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග සම්බන්ධයෙන් යම් අදහස් දැක්වීමක් කරන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා.

විශේෂයෙන්ම මේ විෂයට අදාළ මිනුම් ඒකක පිළිබඳව අවධානය යොමු කරන විට කිව යුතු කරුණු, කාරණා බොහොමයක් තිබෙනවා. අප මීට වසර දහස් ගණනකට පෙර සිට මෙවැනි යම් ඒකක ක්‍රමයක් පවත්වාගෙන ආ රටක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදුල්ල නගරය තුළ සෙනරත් පරණවිතාන අනුස්මරණ පුස්තකාලය තිබෙනවා. ඒ පුස්තකාලය අසල අඩි 8ක් පමණ උස ශිලා ලේඛනයක් -ශිලා කුලුනක්- තිබෙනවා. ඒ කුලුනේ පේළි 203කින් ඉතාම කුඩා අක්ෂර 2,000කින් පමණ මේ මිනුම් ඒකක පිළිබඳ සඳහන් වෙනවා. ක්‍රිස්තු වර්ෂ 950දී පමණ අනුරාධපුර රාජධානියේ අවසාන කාලයේදී රජකම් කරන ලද හතරවන උදය රජතුමා සොරබොර ප්‍රදේශයට -දැන් "මහියංගණය" කියා හඳුන්වන ප්‍රදේශයට- ආපු වෙලාවක ඒ ප්‍රදේශයේ ජනතාව යම් පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා. සොරබොර ආශ්‍රිතව ඒ කාලයේ වෙළෙඳ මධ්‍යස්ථානයක් තිබිලා තියෙනවා. ඒ වෙළෙඳ මධ්‍යස්ථානය භාරව හිටපු රජයේ නිලධාරීන් වෙළෙඳාමේදී සිදු කරන ලද යම් අකටයුතුකම්, වංචා හා දූෂණ පිළිබඳව ඒ ජනතාව රජතුමාට පැමිණිලි කළාට පස්සේ, රජතුමා යම් නියෝග ප්‍රමාණයක් නිකුත් කර තිබෙනවා ඒ වෙළෙඳාම සාධාරණව කිරීම සඳහා. ඒ අනුව ක්‍රිස්තු වර්ෂ 950දී පමණ පිහිටුවන ලද සොරබොර ටැම් ලිපියෙනුත් මේ මිනුම් ඒකකවල ඉතිහාසය අපට බලා ගන්න පුළුවන්.

ඊට පස්සේ බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී ඔවුන් අපට වෙනත් ඒකක ක්‍රමයක් -රාත්තල්, අඩි වාගේ ඒකක ක්‍රමයක්- හඳුන්වා දුන්නා. 70 දශකයෙන් පස්සේ නව ලෝකයට ගැළපෙන ආකාරයට අපි SI ඒකක ක්‍රමයට අනුවර්තනය, පරිවර්තනය වුණා. මේ පිළිබඳව කථා බහ කරන කොට මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. ඒ තමයි, මට කලින් කථා කළ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයා සඳහන් කළා, "තව සතියක්, දෙකක් ගියාට පස්සේ යහ පාලන ආණ්ඩුවට අවුරුද්දක් පිරෙනවා" කියලා. ජනතාව යහ පාලනය වෙනුවෙන් ඡන්දය දුන්නේ, විශේෂයෙන්ම හොරකම්, වංචා හා දූෂණ අවම කරන්න; හොරු දූෂිතයන් හෙළිදරවු කරන්න; කොල්ල කන ලද රජයේ දේපළ නැවත පවරා ගෙන ඒවා ජනතා සුභසාධනය සඳහා යොදවන්න. කෙසේ නමුත්, වසරක් ගත වන කොටත් හොරකම්, වංචා හා දූෂණ සම්බන්ධයෙන් ආපස්ස හැරිලා බලන කොට, නටපු තොවිලයකුත් නැති - බෙරේ පළුවකුත් නැති තත්ත්වයට පත් වෙලායි තිබෙන්නේ. මහා පරිමාණ වංචා හා දූෂණ රටේ සිදු වෙලා තිබෙද්දි අද අපි සාකච්ඡා කරනවා, "ගමේ කඩේ වෙළෙන්දාගේ කිලෝ එකේ පඩියේ, ග්‍රෑම් 100 පඩියේ හොරකමක් වෙයිද, ඒක වළක්වන්නේ කොහොමද?" කියලා. ඊට වඩා මහා පරිමාණ වංචා හා දූෂණ ඇස් පනා පිට සිද්ධ වෙලා තිබෙනවා.

ඊයේ දවසේදී ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙක් මාධ්‍ය සාකච්ඡාවක් තියලා කිව්වා, දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව භාරව තමන්ට කලින් හිටපු ඇමතිවරයාට වංචාවක් සම්බන්ධයෙන් එල්ල වෙලා තිබෙන චෝදනාවේදී, "FCID එකට තමයි වැරදිලා තිබෙන්නේ" කියලා. දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට මීලඟට ගත්ත GI පයිප්ප සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවතුණා. රජයේ වග කිව යුතු කැබිනට් ඇමතිවරයෙක් දැන් ඒ සම්බන්ධයෙන් කියනවා, "FCID එකට තමයි වැරදිලා තිබෙන්නේ" කියලා. එතකොට පැහැදිලි පැමිණිල්ලක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ පැමිණිල්ලේදී හෙළිදරවු වුණා, "GI පයිප්ප බෙදා හැරීම දිවි නැගුමට කිසිම සම්බන්ධයක් නැහැ. මැතිවරණ කටයුතු සඳහා තමයි ඒ බට බෙදා හැරලා තිබෙන්නේ" කියලා. ප්‍රශ්නය තමයි, ඒ කාලයේ එම හොරකම් වන කොට ඒ ආණ්ඩුව නියෝජනය කරපු ඇමතිවරයෙක්ම අද හවුල් ආණ්ඩුවට එකතු වෙලා ඒ වරද FCID එක පිට පැටවීමයි. ඒ කියපු කෙනාට මට මතකයි තිබෙනවා, කොළඹ විශ්වවිද්‍යාලයේ කාන්තා නේවාසිකාගාරයක තිබුණු පැරණි කවිච්චි, ඇඳ, පුටු අරගෙන යෑම පිළිබඳ චෝදනාවක්. ඉතින්, එකිනෙකාගේ පිට කසා ගන්නවාද කියන ප්‍රශ්නයක් තිබෙනවා.

කෙසේ නමුත්, දැන් අපට මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීමට අවශ්‍ය වන්නේ, අපේ රටේ ජනතාව ආරක්ෂා කරන්නයි. ජනතාව ගැන හිතන ආණ්ඩුවකට මෙවැනි ආරක්ෂණකාරී දැලක් -ජාලයක්- අවශ්‍ය කරනවා.

1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත යටතේ පිහිටුවලා තිබෙනවා, ජාතික මිනුම් පර්යේෂණාගාරයක්. ඇත්තටම රටේ ජනතාව මේ ආයතනයේ කාර්ය භාරය අර වෙළෙන්දාගේ පඩියට සීමා කළාට, එතැනින් එහාට ගියපු කර්මාන්ත, විද්‍යා, සෞඛ්‍ය, ආරක්ෂක හා පාරිසරික සුරක්ෂිතතාව කියන පුළුල් ක්ෂේත්‍රයක මේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පැවරිලා තිබෙනවා. ඒ නිසා, මෙය හුදෙක් වෙළෙඳාම හා සම්බන්ධ කාරණයක් විතරක් නොවෙයි. සමස්තයක් වශයෙන් සෞඛ්‍ය, ආරක්ෂාව, පරිසරය ඇතුළු ජනතාවගේ ජීවිතයට බලපාන සියලු කාරණාවලට අදාළ මැදිහත්වීමක් කළ හැකි ආයතනයක්. ඒ අදහස අනුව තමයි ජාතික මිනුම් පර්යේෂණාගාරය ආරම්භ කළේ. ඒ පර්යේෂණාගාරය තුළ ස්කන්ධ විද්‍යාගාරයක්, පරිමාණ මිනුම් විද්‍යාගාරයක්, විදුලි මිනුම් විද්‍යාගාරයක්, කාල හා සංඛ්‍යාත මිනුම් විද්‍යාගාරයක්, උෂ්ණත්ව මිටීක මිනුම් විද්‍යාගාරයක්, දීප්ත මාපක මිනුම් විද්‍යාගාරයක්, විකිරණ මාපක මිනුම් විද්‍යාගාරයක් වශයෙන් විද්‍යාගාර සේවාවන් පවත්වාගෙන යනවා. අපි හිතනවා, ඇත්තටම ඉදිරිය බලලා මෙවැනි සැලසුමක් සකස් කිරීම හොඳයි කියලා. සැලසුම සකස් කළාට ඒ සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා වුණු පුළුල් වපසරියක් සඳහා වන කාර්ය මණ්ඩලයක් නැහැ.

මේකේ තිබෙන ප්‍රධාන ගැටලුව තමයි, මෙන්න මේ විද්‍යාගාර පද්ධතිය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරන විශේෂඥභාවය සහිත කාර්ය මණ්ඩලයක් නොමැතිකම. ඒ නිසා එක්තරා අවස්ථාවකදී පුරප්පාඩු පිරවීම සඳහා කොන්ත්‍රාත් පදනමෙන් බඳවා ගෙන තිබුණාට ඒ තනතුරු සඳහා බඳවා ගැනීමට නිශ්චිත ක්‍රමවේදයක් නැහැ. ඒ වාගේම මේ ආයතනයේ නිලධාරීන්ට විටින් විට -විශේෂයෙන් එහි සහකාර අධ්‍යක්ෂවරුන්ට විටින් විට- විදේශ පුහුණුවීම් ලබා දීලා තිබුණාට ඒ පුහුණු වීම් මේ කාර්ය විධිමත් කිරීම සඳහා එහෙම නැත්නම් මේ කාර්යාවලිය කාර්යක්ෂම කිරීම සඳහා යොදවන්නේ කොහොමද කියන එක පිළිබඳ ප්‍රශ්නයක් මතු වෙනවා. මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ කාර්ය මණ්ඩලය දිගටම නහන චෝදනාවක් තමයි ඔවුන්ගේ වැඩ රාජකාරි ලැයිස්තුව පිළිබඳව තිබෙන ගැටලුව. ඒ නිසා සැලසුම හොඳ වුණාට සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මහ පෙන්වීමත්, පසුවිපරමත්, ඒ සඳහා අවශ්‍ය කරන මානව සම්පත වෙන් කිරීමත් පසු ගිය කාලයේම සිදු වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත මඟින් අපේක්ෂා කරපු -ආරම්භ කරපු- අලුත් ක්ෂේත්‍රයක් තමයි, පාරිසරික සුරැකුම් ක්ෂේත්‍රය. ඒ අනුව තමයි ඔවුන් වාහනවල වායු විමෝචන ක්‍රියාවලියට සම්බන්ධ වෙලා තිබෙන්නේ. අඩු පාඩුකම් මැද වුණත්, පසු ගිය ආණ්ඩු කාලයේදී එය රජයට ලාභයක් ලැබෙන විධියට නොව පෞද්ගලික ව්‍යාපාරිකයන් දෙදෙනෙකුට ලාභයක් ලැබෙන විධියට පවත්වාගෙන ගියත්, මේ නිලධාරීන්ගේ මැදිහත් වීම යම්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

සාධනීය මට්ටමක තිබෙනවා. ඒ වාගේම මේ කාර්ය පුළුල් කිරීමේදී ඔවුන් මුහුණ දෙන ගැටලුවක් තිබෙනවා. කලින් නම් කඩේකට පැනලා ඒ ඒ බඩුවල බර තිබෙනවාද කියලා පරීක්ෂා කරන්න පුළුවන්. නමුත් දැන් තිබෙන ප්‍රශ්නය මොකක්ද? කර්මාන්තශාලාවල මහා පරිමාණ පැකට් කිරීම් කෙරෙනවා. පැකට් එකෙන්, පැකට් එක බලන්න හැකියාවක් නැහැ. ඒ නිසා ඒ පෙර ඇසුරුම් ක්‍රියාවලිය අධීක්ෂණය සඳහා වූ නිලධාරීන්ගේ අඩුවත්, ඔවුන්ගේ පුහුණුවේ අඩුවත් පිළිබඳව සාකච්ඡාවක් තිබෙනවා. ඒ වාගේම මේ ආයතනයට අයිති තවත් කාර්ය භාරයක් තිබෙනවා.

අපේ රටේ රථ වාහන පොලීසිය තැන් තැන්වල ගස් අස්සේ, ගල් අස්සේ, ටෙලිෆෝන් කණු අස්සේ හැංගිලා ඉඳලා අර වේග මාපකයත් එක්ක වාහනවලට පනිනවා නේ. ඒ වේග මාපකය පොලීසිය ඉදිරිපත් කළාට පස්සේදී කියන දේ පිළිගන්න තමයි ජනතාවට සිදු වෙලා තිබෙන්නේ. 80යි කිව්වොත් එහෙමයි. 100යි කිව්වොත් එහෙමයි. අපි කොච්චර තර්ක කරන්න ගියත් වැඩක් නැහැ. නමුත් මෙන්න මේ වේග මාපකවල ක්‍රමාංකණය නිවැරැදිද කියලා පරීක්ෂා කිරීමේ බලයත් මොවුන්ට තිබෙනවා. එහෙම නැත්නම් වැඩි වේග කියන්න ගිහිල්ලා ඇත්තටම පොලිස් නිලධාරී මහත්වරුන් හැල්ලුවට ලක් වෙනවා.

රාජකාරි කිරීමේදී මේ නිලධාරීන්ට තිබෙන ප්‍රශ්නය මොකක්ද? මේ රාජකාරිය ඔවුන්ට තිබුණාට ඒ සඳහා මැදිහත් වීමේ ක්‍රමවේදයක් නැතිකම පිළිබඳ ප්‍රශ්නය එක පැත්තකින් තිබෙනවා. මිනුම් ක්‍රමාංකණය සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා යොමු වෙලා තිබෙනවා කියලා මම කිව්වා. සමහරු ඇවිල්ලා අපට කියනවා, "සමහර පුද්ගලයන් නිශ්චිත කාලයක් තුළදී වෛද්‍යවරු කිහිප දෙනෙක් ළඟට ගිහිල්ලා රුධිර පීඩනය බැලුවාම සමහර තැන්වල අදහා ගන්න බැරි විධියට වෙනස් වෙලා තිබෙනවා" කියලා. මේ උපකරණවල වුණත් ප්‍රමිතිය පිළිබඳව පරීක්ෂා කිරීමේ හැකියාවක් මේ නිලධාරීන්ට තිබෙනවා. නමුත් ඔවුන්ට තිබෙන ප්‍රශ්නය මොකක්ද? ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා වූ පුළුල් පරාසයක මොවුන් වැඩ කළ යුතු වුණත් ඔවුන්ගේ වැඩ රාජකාරී ප්‍රමාණය, ඔවුන්ට ලැබෙන පුහුණුව සහ ඔවුන්ට ලැබිලා තිබෙන අවස්ථාවන්වල සීමා සහිතභාවයක් තිබෙනවා කියලා ඔවුන්ම සඳහන් කරනවා.

මම කලින් කිව්වා වාගේම අපි නව ජාතික මිනුම් පර්යේෂණාගාරයක් ඇති කළාට ඒ පර්යේෂණාගාරයේ ඉදිරි සංවර්ධනය පිළිබඳව අවධානයක් යොමු කරලා නැහැ. ඒ නිසාම දැනුත් පර්යේෂණාගාරය තුළ විද්‍යාගාර 60කට අවශ්‍ය කරන නිලධාරීන් නොමැතිකම නිසා එය අයාලේ යන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අපි මේ අලුත් ක්ෂේත්‍ර -විශේෂයෙන් මිනුම් විද්‍යා ක්ෂේත්‍රය සහ කර්මාන්ත මිනුම් ක්ෂේත්‍රය- පිළිබඳව අවධානය යොමු කරමින් ඉදිරියට යන වේලාවේදී මෙන්න මේ මානව සම්පත පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්න කියලා ඇමතිවරයාගෙන් ඉල්ලනවා. ඒ වාගේම මේ නිලධාරීන් පරිපාලන ගැටලු රාශියකට මුහුණ දීලා තිබෙනවා. ඔවුන්ගේ උසස්වීම් පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. ඔවුන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. ඔවුන්ට ලැබෙන විදේශීය පුහුණුවීම් පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. ඔවුන්ට ලැබෙන ස්ථාන මාරු පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. මෙවැනි හේතු නිසා, ඉතා විශාල කාර්ය භාරයක් කළ හැකි නිලධාරීන් ප්‍රමාණයක් යම් කිසි ආකාරයකට මන්දෝත්සාහීව, තමන්ගේ රාජකාරිය හරි හැටි කර ගත නොහැකි වීමේ අර්බුදයකින් පීඩාවට පත්වී තිබෙනවා.

රජය -ආණ්ඩුව- මැදිහත් වෙන්නේ පාරිභෝගිකයන් හෙවත් ජනතාව ආරක්ෂා කිරීමට නම්, මේ ආයතනය මීට වඩා විධිමත් කළ යුතුයි. මේ සඳහා බඳවා ගත හැකි; මේ සඳහා පුහුණුව ලබා දිය හැකි විද්‍යා උපාධිධාරීන් රාශියක් අපේ රටේ ඉන්නවා. ඒ විද්‍යා උපාධිධාරීන් සාමාන්‍ය උපාධි සහ විශේෂවේදී උපාධි ලබා ගෙන එළියට ඇවිල්ලා කරන්න දෙයක් නැතිව ඉන්නවා. ඒ වාගේම, ඒ විද්‍යා උපාධිධාරීන් තමන්ට නොගැළපෙන රැකියාවල නිරත වෙලා ඉන්නවා. මෙවැනි අය බඳවා ගෙන, ඔවුන්ට නිසි පුහුණුවක් ලබා දීලා, ඔවුන් මේ කාර්යයට අන්තර්ග්‍රහණය කර ගත්තොත්, රටක් හැටියට ඉදිරියට යන්නට අපට මහඟු අවස්ථාවක් ලැබේවි. ඒ නිසා සැලසුමේ ප්‍රශ්නයකට වඩා, මේ පිළිබඳව දක්වන අවධානය පිළිබඳව ප්‍රශ්නයකුයි මෙහි තිබෙන්නේ. ඒ අනුව කඩේක තිබෙන පඩියක ප්‍රමාණය පිළිබඳ ප්‍රශ්නයක්ම නොවෙයි. ඊට වඩා ජනතාවගේ සෞඛ්‍යය, පරිසරය, කර්මාන්ත, වෙළෙඳාම ආදී ක්ෂේත්‍ර ගණනාවක් පුරා විසිරී, පැතිරිය යුතු ක්ෂේත්‍රයක්. ලෝකය මේ සම්බන්ධයෙන් ඉතා විශාල වශයෙන් ඉදිරියට ගොස් තිබියදී, ඔබතුමාට පැවරී තිබෙන දෙපාර්තමේන්තුවේ කටයුතු මීට වඩා ක්‍රමවත් කරන්න, නවීකරණය කරන්න මැදිහත් වෙන්නටය කියා ඇමතිවරයාගේ අවධානයට යොමු කරන්නට කැමැතියි.

මාහේන, පිටිපන පිහිටුවා තිබෙන විද්‍යාගාරයට රුපියල් මිලියන 500ක් වියදම් කිරීම පිළිබඳව ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරයෙක් කියනවා මම අහගෙන හිටියා. ඇත්ත. ඒකට වියදම් කළ ගණන පිළිබඳව නිසි තක්සේරුවක් නැහැ කියා තමයි ආරංචිය තිබෙන්නේ. එහි තිබුණු උපකරණ පිළිබඳවත්, ඒ උපකරණ සවි කිරීම පිළිබඳවත් නිසි ක්‍රමවේදයක් නැති බවයි සඳහන් වෙන්නේ. මෙවැනි අඩු පාඩුකම් රාශියක් මැද්දේයි මේ කටයුතු කරමින් යන්නේ.

ඒ කෙසේ වුණත්, ලෝකය පියවර ගණනාවක් ඉදිරියට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් අලුත් දැනුමක් එකතු කර ගෙන තිබියදී, අපත් ඒ දැනුම එකතු කර ගනිමු. ඒ නිසා කුඩා කුඩා වංචා දූෂණ අවම කර ගන්න මෙවැනි ආකාරයේ මැදිහත් වීමක් කරන අතරම, ජනතාවට පොරොන්දු වුණු ආකාරයට, ඡන්ද ලබා ගත් ආකාරයට ක්‍රියා කළ යුතුයි. රජයට වසරක් පිරෙනවා. තව වසර හතරයි ආණ්ඩුවට තිබෙන්නේ. මහජන දේපොළ කෝටි- ප්‍රකෝටි ගණනින් වංචා කරන ලද අයට දඬුවම් කිරීම පිළිබඳවත්, ඒ කාර්යාවලිය කාර්යක්ෂමව, විධිමත්ව සහ වේගවත්ව ඉදිරියට ගෙන යාම පිළිබඳවත් ආණ්ඩුවට නැවත මතක් කරමින්, මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[පි.ප. 5.12]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அளவீட்டு அலகுகள் மற்றும் சேவைகள் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான இன்றைய விவாதத்திலே கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு முதலில் நான் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இன்று இவ்விவாதத்தை ஆரம்பித்துவைத்து உரையாற்றிய கௌரவ அமைச்சர் றிஸாட் பதியுதீன் அவர்களின் உரையிலும் இன்னும் பல உறுப்பினர்களினது உரையிலும் நுகர்வோரைப் பாதுகாப்பதை இலக்காகக் கொண்டு எவ்வாறு அளவை நிர்ணயத்தைச் சரிப்படுத்துவது? என்பதற்கான கருத்துக்கள் உட்பொதிந்திருந்ததை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருந்தது. எனக்கு முன்பு உரையாற்றிய மக்கள் விடுதலை முன்னணி உறுப்பினர் கௌரவ வைத்திய கலாநிதி நளிந்த ஜயதிஸ்ஸ அவர்கள், "அளவை நிர்ணயத்தில் சிறிய அளவிலே அளவீட்டைச் செய்யும்போது, அதில் ஏற்படும் குறைபாடுகளை நாங்கள் பெரிதாகப் பேசுகின்றோம்; ஆனால், பெரிய அளவிலே அளவீட்டைச் செய்யும்போது அதில் இடம்பெறுகின்ற குறைபாடுகள் பற்றி நாங்கள் பேசுவது குறைவு" எனச் சுட்டிக்

காட்டினார். அதேபோல, அமைச்சர் அவர்கள் தனதுரையிலே பல்வேறு அளவைகள் பற்றிக் கூறினார். வெப்பமானி, அமுக்கமானி, முச்சக்கரவண்டிகளில் பொருத்தப்படுகின்ற மானி ஆகியவற்றின் அளவீடுகள் உட்பட நேர அளவீடுகள் என்பன எவ்வாறெல்லாம் எங்கெங்கெல்லாம் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன என்பது பற்றிக் குறிப்பிட்டார்.

பொதுவாக அளவீடு என்றவுடன் எங்கள் அனைவரது கண்முன்னாலும் விரைவாகத் தோன்றுவது தராசு. நாங்கள் பெரும்பாலும் தராசின் அளவீடுகளைத்தான் கவனத்தில் எடுக்கின்றோம். பொதுவாகவும் பரவலாகவும் எண்ணிக்கை அடிப்படையிலும் பார்க்கும்போது அதுதான் அதிகளவில் காணப்படுகின்றது. நேரடியாகப் பார்க்கின்றபோது, இந்தத் தராசு வாடிக்கையாளர்களுக்கு சரியான அளவீட்டில் பொருட்களை அளந்துகொடுக்கும் ஒரு சாதனமாகப் பார்க்கப் பட்டபோதிலும், மரபுரீதியாக உலகளாவிய ரீதியில் - சர்வதேச ரீதியில் - அது ஒரு விடய விதானத்தின் சின்னமாக இருக்கின்றது. அதுதான் நீதியின் சின்னம்! இந்த நீதியின் சின்னமான தராசு எவ்வளவுதூரம் இந்த உலகத்தில் - மனித சமூகத்தில் - நீதியாகப் பயன்படுத்தப்படுகின்றது என்பதே எங்களுக்கு முன்னால் இருக்கின்ற கேள்வியாகும். தராசு என்கின்ற நீதியின் சின்னம் எவ்வாறு நீதிக்காகப் பயன்படுத்தப்படுகின்றது என்பதை அவதானிக்கின்றபொழுது, பொதுவாக நுகர்வோருக்கு சரியான நிறுவை அளவுகளுடன் பொருட்கள் வழங்கப்படவேண்டும் என்பதில் கவனம் செலுத்துகின்ற அளவுக்கு, உற்பத்திகளைப் பொறுத்தவரை எவ்வளவுதூரம் இந்த அளவை நிறுவைகள் கையாளப் படுகின்றன என்பதில் கவனம் செலுத்தப்படுவதாகத் தெரியவில்லை.

அந்த வகையில் இந்த விவாதத்தின்போது மிக முக்கியமான ஒரு விடயத்தை இச்சபையில் முன்வைக்கலாமென நான் நினைக்கின்றேன். அதாவது, இந்த நாட்டில் ஒவ்வொரு இரண்டு வருடத்துக்கு ஒரு முறையும் தோட்டத் தொழிலாளர்களின் சம்பள விவகாரம் கொழுந்துவிட்டு எரிகின்ற பிரச்சினையாகப் பேசப்படுகின்றது. இன்றும்கூட அந்தச் சம்பளம் நாட்கணக்கிலே தீர்மானிக்கப்பட்டு மாத முடிவிலே முழுமையாக வழங்கப்படுகின்றது. அதனைத் தீர்மானிக்கின்ற ஒரு முறையான 'கூட்டு ஒப்பந்தம்' எனப்படுகின்ற ஒரு முறைமையின்கீழ் அது முன்வைக்கப்படுகின்றது. இந்தக் கூட்டு ஒப்பந்தமுறை மூலமாகத் தோட்டத் தொழிலாளர்களின் சம்பளம் தீர்மானிக்கப்படுகின்றபொழுது அதிலுள்ள நுட்பங்களைப் பெரிதாக யாரும் வெளியே சொல்வதில்லை. குறிப்பாக அடிப்படைச் சம்பளம், வரவுக் கொடுப்பனவு என்பதாக அந்த வாய்ப்பாடு அமைந்திருந்தபோதும், தோட்டத் தொழிலாளர்களின் நாட்சம்பளத்தை அல்லது அவர்களது மாத வருமானத்தைத் தீர்மானிக்கின்ற மிக முக்கியமான காரணிகளில் இன்னொரு விடயமும் தங்கியிருக்கின்றது. அதாவது, நாளாந்தம் குறிப்பிட்ட அடிப்படைச் சம்பளத்தைப் பெறுவதற்காக அவர்கள் எவ்வளவு கொழுந்தைப் பறிக்க வேண்டும், அதற்கு மேலதிகமாகப் பறிக்கப்படுகின்ற ஒவ்வொரு கிலோ தேயிலைக் கொழுந்துக்கும் அவர்களுக்கு எவ்வளவு கொடுப்பனவு வழங்கப்படுகின்றது என்பதிலேயே அவர்களது வருமானம் தங்கியிருக்கின்றது. இது இப்போதைக்கு இருக்கின்ற நிலைமை!

இந்தக் கூட்டு ஒப்பந்த முறையில் பல்வேறு குறைபாடுகள் காணப்படுகின்றன என்பதைக் காரணம் காட்டி, ஏற்கெனவே இருக்கின்ற JEDB, SPC, Elkaduwa Plantations போன்ற அரச முகாமைத்துவத்துக்குக் கீழுள்ள நிறுவனங்களிலும் அதேபோல பெருந்தோட்டப் பிராந்தியக் கம்பனிகளிலும் அறிமுகப்படுத்தப் படவிருக்கும் hybrid எனப்படுகின்ற புதிய நுட்பத்திலே அளவை அடிப்படையிலும் நாட்சம்பள அடிப்படையிலும் சரிபாதியான அளவுக்கு சம்பளத்தைத் தீர்மானிக்கின்ற ஒரு புதிய முறைமையை நோக்கிய ஒரு பேச்சுவார்த்தை தற்பொழுது நடைபெற்றுக் கொண்டிருக்கின்றது. இப்பொழுது இந்தப் புதிய முன்மொழிவுகளின்படி அல்லது ஏற்கெனவே நான் குறிப்பிட்டதுபோல குறிப்பிட்டுச் சொல்லக்கூடிய சில தோட்டங்களிலே நடைமுறையில் இருக்கின்ற இந்தச் சம்பள அளவீட்டு முறை சரிபாதியான அளவுக்குத் தீர்மானிக்கப் படுகின்றது. அதாவது, ஒரு மாதத்தில் 10 அல்லது 12 நாட்களுக்கு நாட்கூலி அடிப்படையிலும் எஞ்சிய 13 நாட்களில் அவர்கள் எவ்வளவு கொழுந்து பறிக்கின்றார்கள் என்பதை அளவிட்டு அந்தக் கிலோவின் அடிப்படையில் - ஒரு கிலோவுக்கு இவ்வளவு பெறுமதி என்பதன் அடிப்படையில் அந்தச் சம்பளம் தீர்மானிக்கப்படுவதாக இருக்கின்றது.

දැන් බලන්න, අපේ ගරු රවුෆ් හකීම් ඇමතිතුමනි, මේ අය පාද යාත්‍රා යනවා. නමුත් එතුමන්ලාට යන්න අහස් යාත්‍රායි සොයා ගන්න වෙන්නේ. අභිංසක මිනිසුන්ගේ ගම්වලට ගියාම, "තොපි මොනවාද කළේ?" කියලා අහයි. ඔය කියන කටවලින්ම අහයි, "උඹලා මොනවාද පසු ගිය අවුරුදු දෙක තුළ කළේ? " කියලා. "එක්සත් ජාතික පක්ෂය මේ වාගේ වැඩ කරන විට උඹලා මොනවාද කළේ?" කියලා මිනිස්සු අහයි මළ ගෙදරට මහුල් ගෙදරට ගියාම. එදාට මළ ගෙදරකටවත්, මහුල් ගෙදරකටවත් එන්නේ නැහැ. කොහේ හරි යනවා නම් මහින්ද රාජපක්ෂ මහත්මයාට තව සල්ලි ටිකක් හම්බ කර ගන්නට වෙයි. මොකද, උඩින් යන්න, අහස් යාත්‍රාවලින් යන්න. කතරගම යන විට, එහෙම නැත්නම් සෝමාවතියට යන විට යන්න වෙන්නේ හෙලිකොප්ටරයෙන්, චොපර් එකෙන්. සමහර විට ඒකටත් අපේ ගරු අගමැතිතුමාගේ පිහිට ඉල්ලයි, "මට දැන් පාරේ යන්න බැහැ" කියලා. [බාධා කිරීමක්] මොකද, තමන් හරියට වැඩ කළා නම් ජනාධිපතිතුමා ගෙදර යන විට යන්න පුළුවන් නේ වාහනයකින්. පාරේ යන්න පුළුවන්නේ සෙනඟ ඉන්නවා නම්. මොකද, choppers දෙකක් ගෙන්වාගෙන ගියේ, choppers දෙකක් ගෙන්වාගෙන ගියේ මොකද? රනිල් වික්‍රමසිංහ මහත්මයා එක සැරයක-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ලබා දී තිබූ කාලය අවසානයි. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මට තව විනාඩියක් දෙන්න. මේ කාරණය කියන්නටම ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කාරණය හැන්සාඩ්ගත වෙන්නට කියන්නට ඕනෑ, කවුරු අහගෙන නොසිටියත්. [බාධා කිරීමක්] මන්ත්‍රීතුමනි, වැඩක් ඇති දෙයක් නොවෙයි. මම කිව්වේ ඒකයි. දෝතින් වැඳ පුදාගෙන ඉන්න ජනාධිපතිවරයා ගෙදර යන විට ගියේ ආරක්ෂාව ඇතිව අහස් යාත්‍රාවෙන්. මම එහෙම නම් මේ පාද යාත්‍රාවට ආව මිනිස්සු ටිකක් අරගෙන පෙළපාළියෙන් තමයි මැදමුලනට යන්නේ. නමුත් එතුමා choppers දෙකක් ඉල්ලාගෙනයි ගියේ. ඒ තරමට පාරට බහින්න බැරි වුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ලබා දී තිබූ කාලය අවසානයි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
සමා වෙන්න. මම හදිසියේයි මේ කථාව කළේ. නමුත් මම සතුටු වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැදගත් අවස්ථාවේදී මේ කාරණා ටික පැහැදිලි කරන්නට අවස්ථාව ලබාදීම සම්බන්ධව. ඒ ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා ඉතාමත්ම හොඳ ඇමතිවරයෙක්. ඔබතුමාට ලොකු කාර්ය භාරයක් තිබෙනවා, මේ ආණ්ඩුව තුළ. ඔබතුමා අතේ තමයි මේ සියල්ල තිබෙන්නේ. මේ ආණ්ඩුව ඉදිරියට ගෙන යාමේදී අභිංසක දුප්පත් මිනිසුන්ගේ ආහාර වේල පිළිබඳව, හැම දේම පිළිබඳව වගකීමක් ඇතිව මේ යහ පාලන ආණ්ඩුව ඉදිරියට ගෙන යන්නට ඔබතුමාට ශක්තියක් තිබෙනවා. එම නිසා අපි විශ්වාස කරනවා, ඔබතුමාට ඒ කටයුත්ත කරන්නට ලැබෙයි කියලා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රවුෆ් හකීම් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.22]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම විවාදයට සහභාගිවීමට අවස්ථාව ලබාදීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු රිසාඩ් බදියුදීන් අමාත්‍යතුමා අද දින ගෙනැවිත් තිබෙන මෙම නියෝගය පිළිබඳව වචන කිහිපයක් ඉංග්‍රීසි භාෂාවෙන් කථා කිරීමට මම බලාපොරොත්තු වෙනවා.

The Hon. Minister has introduced a new fees structure for various services that is to be provided by the Department of Measurement Units, Standards and Services. This Department has a very long history of serving the consumers in this country, particularly relating to calibration services, measurement units and standards. This is a matter of routine that needs to be passed by this House. In the meantime, I would like to deal with certain issues relating to the Consumer Protection Authority since that matter comes within the overall purview of this Ministry.

Sir, one particular issue I would like to deal with is the recent announcement by the Ministry of Health where they have introduced colour coding for soft drinks in order to prevent excessive sugar consumption by consumers in this country, which results in the increase of diabetic patients. In order to control this spread or this non-communicable disease, the Ministry of Health has taken a very welcome move to introduce this colour coding for soft drinks which I believe is an initial measure. I am sure they will follow the same pattern to other consumable items which can contain excessive sugar in their production.

I would like to ask the Ministry of Industry and Commerce to support the Ministry of Health in this initiative by preparing an enforcement mechanism. I am sure that there has been some objections by certain manufacturers regarding the new measure that the Ministry of Health has introduced. While welcoming that measure, I think the Consumer Protection Authority, which comes under the Hon. Minister's Ministry, must support by having an enforcement mechanism to ensure that the colour coding regulations are followed and those violators are punished; otherwise, this may not work.

While saying this I must also say that our country has a per capita sugar consumption of almost 31 kilos per person, which is very high considering the regional standards and even world standards. We are a country,

[ගරු රවුෆ් හකීම් මහතා]

which imports almost 92 per cent of our sugar and we are only producing locally about 8 per cent of the sugar. The Hon. Minister and I are quite aware about the difficulties that the sugarcane farmers are faced with, in areas where sugarcane farming is going on.

I would like to say a few words in Tamil regarding that because that must get recorded, so that, tomorrow at least these matters will be reported.

தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ அமைச்சரும் நானும் நிதியமைச்சருடைய அலுவலகத்தில் குறிப்பாக ஹிங்குரான பிரதேசத்திலிருக்கின்ற கரும்புச் செய்கையாளர்களினுடைய பிரச்சினை சம்பந்தமாக நிதியமைச்சரோடு 3 - 4 தடவைகள் பேச்சுவார்த்தை நடத்தி யிருக்கின்றோம். நாளை மறுநாள் அம்பாறையிலே இது சம்பந்தமான ஒரு பேச்சுவார்த்தைக்காக நான் மாவட்ட அரச அதிபர் அலுவலகத்திற்குப் போவதற்குத் தீர்மானித்திருந்தேன். ஆனால், நாளை மறுநாள் இங்கு ஒரு வாக்களிப்பிற்கு நாங்கள் இருக்கவேண்டிய அவசியமிருக்கின்ற காரணத்தினால் அந்தப் பேச்சுவார்த்தையை ஒருசில நாட்கள் தள்ளி நடத்தலா மென்றிருக்கின்றோம். எனினும் ஹிங்குரான சீனிக் கம்பனி யினுடைய நடவடிக்கைகள் தொடர்பாக, குறிப்பாகக் கரும்பு உற்பத்தி செய்கின்ற அப்பாவி விவசாயிகளுடைய கரும்புக் கான கொள்வனவு விலையில் மாற்றம் செய்யவேண்டுமென்ற கோரிக்கையை நாங்கள் பல நாட்களாக விடுத்துக்கொண்டு வருகின்றோம். இல்லையென்றால் அவர்களைப் பாரம்பரிய மாக அவர்கள் செய்துவருகின்ற நெற்செய்கைக்கு அனுமதிக்க வேண்டும்; அந்தக் குறிப்பிட்ட காணிகளை நெற்செய்கைக்காக விடுவிக்கவேண்டும் என்கின்ற கோரிக்கை சம்பந்தமாகத்தான் நாங்கள் நீண்டகாலமாகப் பேச்சுவார்த்தை நடத்தி வருகின்றோம். எனவே, இந்த விஷயம் சம்பந்தமாக அவையின் கவனத்தைக் கோரவிரும்புகின்றேன். மிக விரைவிலே இந்தக் கம்பனியினர் இதற்குச் சாதகமான ஒரு பதிலைத் தராது விட்டால் நாங்கள் மாற்று நடவடிக்கைகளில் தீவிரமாக இறங்கவேண்டிவரும். இந்த விடயத்திலே எனக்கு அமைச்சர் தருகின்ற ஆதரவு குறித்து அவருக்கு நான் நன்றி கூறிக்கொள்ள விரும்புகின்றேன். இந்த விஷயம் சம்பந்தமாக இந்தச் சந்தர்ப்பத்திலே இந்த அவையின் கவனத்திற்குக் கொண்டுவரக் கிடைத்தமையிட்டு நான் உங்களுக்கு நன்றி கூறி, அமர்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු ඒ.ඩී. ප්‍රේමදාස රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

[අ.භා. 6.27]

ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.டி. பிரேமதாச - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. A.D. Premadasa - State Minister of Industry and Commerce Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින් මේ ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද නියෝග සම්බන්ධයෙන් මටත් වවන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

කිරුම් මිනුම් පිළිබඳව අපේ රටේ විශාල ලෙස අක්‍රමිකතා සිදු වෙමින් පවතිනවා. මේ නිසා පාරිභෝගිකයාට මහත් සේ අසාධාරණකම් සිදු වෙනවා. එසේ සිදුවන්නේ පැරණි කිරුම් මිනුම් ක්‍රම භාවිත කරන නිසායි. ඒ සඳහා අප නව ක්‍රම වෙත යා යුතුව තිබෙනවා. ඒ කියන්නේ, electronic තරාදි ආදිය භාවිතයට ගැනීම වාගේ කටයුතු ප්‍රචලිත කළ යුතු වනවා. අද මිනුම් උපකරණ විදේශ රටවලින් ආනයනය කරනවා. ඒ සඳහා විශාල විදේශ විනිමයක් අපේ රටින් පිට රටට ඇදී යනවා. ඒ සඳහා වැය වන විදේශ විනිමය ප්‍රමාණය මේ රටේ ඉතුරු කර ගැනීමට නම් එම උපකරණ මෙරට නිෂ්පාදනය කළ යුතු වෙනවා. ඒ වාගේම මේ කටයුතු කිරීම සඳහා විශාල නිලධාරි හිඟයක් පවතිනවා. ඒ වෙනුවෙන්,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසානයි.

ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා
(மாண்புமிகு ஏ.டி. பிரேமதாச)
(The Hon. A.D. Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් මම මගේ කථාව අවසන් කරන්නම්. විශේෂයෙන්ම කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාටත්, ඒ වාගේම අනෙකුත් ගරු අමාත්‍යතුමන්ලාටත්, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් මම ස්තුතිවන්ත වෙනවා. ඒ සියලු දෙනාම මෙතැනදී ඉදිරිපත් කළ සියලුම යෝජනා, අදහස් සම්බන්ධයෙන් අපේ අමාත්‍යාංශය ඉදිරි කාලයේදී කටයුතු කරනවාය කියන පණිවුඩය මම දෙනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.30ට, 2016 මාර්තු 08 දින සභා සම්මතිය අනුව, 2016 අගෝස්තු මස 11 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේය.

අතන්පටි පි.ප. 6.30 මණික්කුප් පාරාළුමන්ත්‍රම්, අතනුඩ 2016 මාර්ච් 08ආන් තේතිය තීර්මානත්තිර්කිණංක, 2016 ඔකස්ට් 11, වියාළක්කිළමෙ මු.ප. 10.30 මණිවරෙ ඔත්තිවෛක්කප්පට්ටතු.

Parliament adjourned accordingly at 6.30 p.m. until 10.30 a.m. on Thursday, 11th August, 2016 pursuant to the Resolution of Parliament of 08th March, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

245 වන කාණ්ඩය - 9 වන කලාපය
தொகுதி 245 - இல. 9
Volume 245 - No. 9

2016 අගෝස්තු 11 වන බ්‍රහස්පතින්දා
2016 ஓகஸ்ட் 11, வியாழக்கிழமை
Thursday, 11th August, 2016

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
නිම කරන ලද ව්‍යාපෘති සඳහා ගෙවීම් නොකිරීම
පුනරින් වැව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත් රැඳවියන් නිදහස් කිරීම:
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත:
දෙ වන වර සහ තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
முடிவுறுத்தப்பட்ட கருத்திட்டங்களுக்கான கொடுப்பனவுகளை வழங்காமை
பூநகரிக்குளத் திட்டத்தை நடைமுறைப்படுத்தல்

பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டோரை விடுதலை செய்தல்:
சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்து மத அலுவல்கள் அமைச்சரினது கூற்று

காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகம் (தாபித்தலும், நிருவகித்தலும், பணிகளை நிறைவேற்றுதலும்) சட்டமூலம் :
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Non-payment for Completed Projects
Implementation of Pooneryn Lake Project

RELEASE OF DETAINEES ARRESTED UNDER PREVENTION OF TERRORISM ACT:
Statement by Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs

OFFICE ON MISSING PERSONS (ESTABLISHMENT, ADMINISTRATION AND DISCHARGE OF FUNCTIONS) BILL:
Read a Second, and the Third time, and passed as amended

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 අගෝස්තු 11 වන බ්‍රහස්පතින්දා
2016 ඔගස්ட் 11, வியாழக்கிழமை
Thursday, 11th August, 2016

පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரும் காணி அமைச்சரும்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs and Minister of Lands)

Hon. Speaker, I present the Annual Performance Report of the Department of Christian Religious Affairs for the year 2015 and move that this Report be referred to the Sectoral Oversight Committee on Youth, Sports, Arts and Heritage.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

Order made by the Minister of Higher Education and Highways under Section 25A of the Universities Act, No. 16 of 1978 recognizing the "KAATSU-Highly Advanced Medical Technology Training Centre (Pvt.) Limited (KIU)" as a Degree Awarding Institute and published in the Gazette Extraordinary No. 1961/34 of 08th April 2016;

Order, made by the Minister of Higher Education and Highways under Section 25A of the Universities Act, No. 16 of 1978 amending the Order published in the Gazette Extraordinary No. 1944/3 of 07th December 2015 recognizing the "Horizon College of Business and Technology (Private) Limited" as a Degree Awarding Institute, which was published in the Gazette Extraordinary No. 1975/47 of 14th July 2016; and

Order, made by the Minister of Higher Education and Highways under Section 25A of the Universities Act, No. 16 of 1978 amending the Order published in the Gazette Extraordinary No. 1950/27 of 19th January 2016 recognizing the "National School of Business Management Limited" as a Degree Awarding Institute, which was published in the Gazette Extraordinary No. 1975/48 of 14th July 2016.
[Hon. Lakshman Kiriella]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, 2015 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා ගිණුම් වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්; සහ

(ii) 2015 වර්ෂය සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්.

එම වාර්තා ව්‍යාපාර සහ වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යාතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, 2011 වර්ෂය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාතුමා)
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development)

ගරු කථානායකතුමනි, මම උණවටුන, මැටරඹ, දිවෙල්වත්ත යන ලිපිනයෙහි පදිංචි එම්.එල්. සරත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යාතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Public Administration and Management)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කුරුවිට, කිරගල, බෝපත් ඇල්ල යන ලිපිනයෙහි පදිංචි ජේ.එන්. බැසිල් රණවීර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) රත්නපුරය, හල්පෙ, දොඩම්පෙ යන ස්ථානයෙහි පදිංචි එච්.ජී. ගුණපාල ගමගේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) ත්‍රිකුණාමලය, ආන්දමිකුලම, නුවර පාර, අංක 86/සී දරන ස්ථානයෙහි පදිංචි පී.කේ. නිලංකා ශ්‍රීමාලි මෙනවියගෙන් ලැබුණු පෙත්සම.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යාතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Public Enterprise Development)

ගරු කථානායකතුමනි, මොරටුව, ලක්ෂපතිය, අපෝන්සු මාවත, අංක 46/2 දරන ස්ථානයෙහි පදිංචි එච්.එස්. දාබරේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු කථානායකතුමනි, පාදුක්ක, වටරැක, ගම්මාන පාර, අංක 408 ඩී දරන ස්ථානයෙහි පදිංචි චන්ද්‍රසිරි වෙත්තසිංහ ලියනගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) කොළඹ 08, කෝට්ටේ පාර, අංක 101 දරන ස්ථානයෙහි පදිංචි ආරියරත්න මාටින් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) පන්නිපිටිය, මාලපල්ල, දුම්රිය පොළ පාර, අංක 112/5 දරන ස්ථානයෙහි පදිංචි ඩී.ඒ. කරුණාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) ලංකා බැංකුවේ අක්වෙරළ ශාඛාව හි සේවය කරන ජී.පී. ශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) පාදුක්ක, මලගල, අංක 322/බී දරන ස්ථානයෙහි පදිංචි එස්. සෝමලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) වාද්දුව, මාවල දකුණ, කොරොස්දුව පන්සල අසල පදිංචි ජී. නිවිටන් ගමගේ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කළුතර උතුර, විලේගොඩ, ජාවත්ත පාර, අංක 438/2 දරන ස්ථානයෙහි පදිංචි එම්.ටී.කේ. මොරිස් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) පාදුක්ක, කොටිගම්ගොඩ, අංක 49 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ලියනගේ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු කථානායකතුමනි, කහව රේල් ගේට්ටුව අසල පදිංචි ඩබ්ලිව්.පී. සමන්තා විජයවර්ධන මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) කඹුරුපිටිය, උල්ලල, දිවෙල්වත්ත යන ලිපිනයෙහි පදිංචි ආනන්ද හේවාවිදාන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කඹුරුපිටිය, නාරන්දෙනිය, හැල්පොත වත්ත යන ලිපිනයෙහි පදිංචි එච්.ඒ. පියදාස මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) තිහගොඩ, කෝමංගොඩ, බතලහේන යන ලිපිනයෙහි පදිංචි එච්.පී. නෝමිස් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) දෙනිපිටිය, වරකපිටිය, ගල්පොත්තවිල යන ලිපිනයෙහි පදිංචි එල්.පී. රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) යටියන, කණුකැටිගොඩ, වටගෙදරවත්ත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඩබ්ලිව්.ඒ. පියසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්දිම ගමගේ මහතා - පැමිණ නැත.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) කඩුවෙල, "පද්ම මහල්" අංක 59/8 දරන ස්ථානයෙහි පදිංචි කේ.ඩී. පද්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මුංවත්ත, ඉලුක්පැලැස්ස, පල්ලේගෙදර යන ලිපිනයෙහි පදිංචි කේ.එම්. ගුණතිලක බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) කළුතර - උතුර, ශ්‍රී සුමංගල පාර - දකුණ, අංක 47 දරන ස්ථානයෙහි පදිංචි නිහාල් වීරසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) නුගේගොඩ, විජේවර්ධනාරාම පාර, අංක 03 දරන ස්ථානයෙහි පදිංචි පී.කේ.ඩී. ප්‍රැන්සිස් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) අළුබෝමුල්ල, පමුණුගම, බණ්ඩාරනායක මාවත, අංක 210 - සී දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඩී.ජී.එස්. ප්‍රියදර්ශනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, කපුගොඩ, ගිරිදර හන්දිය, අංක 132/4 දරන ස්ථානයෙහි පදිංචි අනුර සේනාරත්න බාලසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, ලග්ගල, පල්ලේගම, රාවනාගම, අංක 42 දරන ස්ථානයෙහි පදිංචි ටී.ජී. විජේබණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 - 375/'15-(3), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු මංගල සමරවීර මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Foreign Affairs)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට ලබා දිය යුතු පිළිතුර මා හට ලැබී තිබුණත්, මෙම පිළිතුර අංග සම්පූර්ණ නැති නිසා අංග සම්පූර්ණ පිළිතුරක් ලබා දීම සඳහා මාසයක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම 2005 සිට 2015 දක්වා වසරවල එක්සත් ජාතීන්ගේ මහ සමුළුවට සහභාගී වූ අයගේ නාම ලේඛන ඉල්ලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශයේ තිබෙන ලිපි ගොනුත් මා පරීක්ෂා කර බැලුවා. ඒවායේ සැබෑ තොරතුරු නැහැ. උදාහරණයක් හැටියට 2006 මා විදේශ කටයුතු ඇමතිවරයා හැටියට සිටි කාලයේත් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ පළමුවැනි සංචාරයට 142 දෙනෙකු විතර සහභාගී වුණා මට මතකයි. නමුත්, අපේ අමාත්‍යාංශයේ සටහන් වෙලා තිබෙන්නේ 71දෙනෙකුගේ නම් පමණයි. අපට ලැබුණු තොරතුරු අනුව, සමහර ලිපිගොනු අතුරුදහන් වෙලා තිබෙනවා. සමහර ලිපිගොනු ජනාධිපති ලේකම් කාර්යාලයේ තිබෙනවා. සමහර ලිපිගොනු ආරක්ෂක අමාත්‍යාංශයේ තිබෙනවා. ඒ සියල්ල අපි දැන් පරීක්ෂා කරගෙන යනවා. ඒ වාගේම සමහර ලිපිගොනු ඇමෙරිකා එක්සත් ජනපදයේ තානාපති කාර්යාලයේ තිබෙනවා. තානාපති කාර්යාලය තිබෙන නිව්යෝර්ක්වල වෙන් කරපු කාමර ගණන - සැබෑ ගණන - හොයා ගන්න අපි දැන් කටයුතු කරගෙන යනවා. මෙය සරලව උත්තරයක් ලබා දෙන්නට පුළුවන් ප්‍රශ්නයක් වුණත්, දැන් මහා ප්‍රශ්නයක් බවට පත් වෙලා විතරක් නොවෙයි මේ සම්බන්ධයෙන් ලොකු පරීක්ෂණයක් සිදු වෙමින් පවතිනවා.

ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ඇසීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, එවකට හිටපු රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයකු සංචාරවල මුවාවෙන් නිව්යෝර්ක් නගරයේ ඩොලර් ලක්ෂයකට වඩා වැඩි මුදලක් වංචා කිරීම සම්බන්ධයෙන් තොරතුරුත් මේ පරීක්ෂණ කරගෙන යද්දී දැන් ලැබෙමින් පවතිනවා. ඒ සියල්ල සමඟ අංග සම්පූර්ණ පිළිතුරක් ලබා දෙන්න මම මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු විදේශ ඇමතිතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි. මේ කාරණය පිළිබඳවත් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

කරවන්න කැමැතියි. මම මේ ප්‍රශ්නය තුන්වැනි වරටයි අද දින අහලා තිබෙන්නේ. මේ ප්‍රශ්නයේ බරපතළකම තේරෙනවා. කෙසේ නමුත් රටේ ජනතාවගේ මුදල් තමයි මේ සඳහා වියදම් කරලා තිබෙන්නේ. ඒ නිසා ඉතාම කෙටි කාලයකින් මේ ප්‍රශ්නයට පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමාට අවශ්‍ය නම් විදේශ කටයුතු අමාත්‍යාංශය තුළ තිබෙන තොරතුරු විතරක් දැනට මට සභාගත කරන්න පුළුවන්. වැඩි විස්තර ඉදිරියේ දී මම ඔබතුමාට ලබා දෙන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු විදේශ ඇමතිතුමනි, නිලධාරීන් එම තොරතුරු දෙන්නේ නැහැ කියලා කිව්වා නේ. ඒ නිලධාරීන් තවමත් ඒ තනතුරුවල ඉන්නවාද?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නිලධාරීන් තොරතුරු නොදී ඉන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම ඒ නිලධාරීන් තිබෙන විස්තර අපිට හොයලා දෙනවා. නමුත් සමහර විස්තර ඇතුළත් ලිපි ගොනු නැති බවක් අපිට පේනවා. ඒ නිසා ඒ පිළිබඳව අපි තවම සොයනවා. මෙතැන තිබෙන්නේ නිලධාරීන්ගේ ප්‍රශ්නයක් නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා මේ ප්‍රශ්නයට විස්තරාත්මක පිළිතුරක් මාසයකින් ලබා දෙන්නම් කියලා කිව්වා නේ, ගරු මන්ත්‍රීතුමා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 - 387/' 15-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්: මහනුවර දිස්ත්‍රික්කය
காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகள்: கண்டி மாவட்டம்
LAND BELONG TO LAND REFORMS COMMISSION: KANDY DISTRICT

592/'16

5. ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත්ව තිබී 1994.12.31 දින සිට මේ දක්වා කාලය තුළ විවිධ පුද්ගලයන්ට සහ ආයතනවලට ලබා දී ඇති මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ලබා දී ඇති පුද්ගලයින් සහ ආයතන, පිහිටි ස්ථාන, ප්‍රමාණයන් සහ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් ලබා දීමෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ලැබී ඇති මුළු ආදායම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඉඩම්වලින්, මේ වන විට සංවර්ධනය කර හා නොකර ඇති ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා දිය හැකි එහෙත් නිසි සංවර්ධනයක් සිදු කර නොමැති ඉඩම් නැවත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

காணி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணி மறுசீரமைப்பு ஆணைக்குழுவிற்கு சொந்தமாக இருந்து 1994.12.31ஆம் திகதி தொடக்கம் இன்று வரையிலான காலத்தினுள் பல்வேறு ஆட்களுக்கும் மற்றும் நிறுவனங்களுக்கும் வழங்கப்பட்டுள்ள கண்டி மாவட்டத்தில் அமைந்துள்ள காணிகளின் அளவு எவ்வளவென்பதையும்;

(ii) மேற்படி காணிகள் வழங்கப்பட்டுள்ள ஆட்கள் மற்றும் நிறுவனங்கள்; அமைந்துள்ள இடங்கள்; அளவுகள் மற்றும் பெறுமதி வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி காணிகளை வழங்கியதன் மூலம் காணி மறுசீரமைப்பு ஆணைக்குழுவிற்கு கிடைத்துள்ள முழு வருமானம் எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி காணிகளில் இன்றளவில் அபிவிருத்தி செய்யப்பட்டுள்ள மற்றும் அபிவிருத்தி செய்யப்படாத காணிகளின் அளவு வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(ii) தேசிய பொருளாதாரத்துக்கு பங்களிப்புச் செய்யக்கூடிய நிலையில் இருந்தும் உரிய அபிவிருத்தி மேற்கொள்ளப்படாத காணிகளை மீள காணி சீர்திருத்த ஆணைக்குழுவினால் சுவீகரிப்பதற்கு நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(iii) ஆமெனில், அத் திகதி யாதென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Lands:

(a) Will he inform this House-

(i) the extent of land in the Kandy District which belonged to the Land Reforms Commission and was given to various individuals and institutions from 31.12.1994 up to date;

(ii) the individuals and institutions to which those lands have been granted and their locations, extent and value separately; and

(iii) the total revenue received by the Land Reforms Commission through the provision of those lands?

(b) Will he also inform this House-

(i) of those lands, the extent of lands that have been developed and not developed separately;

(ii) whether arrangements will be made to reclaim those lands which can be of contribution to the national economy, but have not been properly developed, by the Land Reforms Commission; and

(iii) if so, the date it will be done?

(c) If not, why?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුර සූදානම්. එය දීර්ඝ උත්තරයක්. මෙය කියවන්නේ නැතිව සභාගත කරන්න මා ඔබතුමාගේ අවසරය පතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අපට කාල සීමාවන් තිබෙන නිසා ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට එයට එකඟ වන්න පුළුවන් නම් එය විශාල පහසුවක් වනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මේ ප්‍රශ්නයෙන් ඉල්ලා තිබෙනවා, ඉඩම් පරිහරණය කරන අයගේ අවුරුදු ගණනාවක විස්තර. ඒවා සියල්ලම උත්තරයේ අඩංගු කරලා තිබෙනවා. එම නිසා මා මේ උත්තරය සභාගත කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා එකඟ වනවාද?

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
හොඳයි. බොහොම ස්තුතියි.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අක්කර 1157 රූඩ් 00 පර්. 25.59

(අක්කර එක්දහස් එකසිය පනස්හතයි, රූඩ් නැත, පර්චස් විසිපහයි දශම පහයි නවයයි)

(ii) 2011 වර්ෂය දක්වා බෙදාදීම් කරන ලද සියලු ඉඩම්ලාභීන් පිළිබඳ විස්තර ලේඛනගත වී නොමැති අතර 2011 වර්ෂයේ සිට බෙදා දී ඇති ඉඩම්ලාභී විස්තර ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරමි. (ඇමුණුම පුස්තකාලයේ තබා ඇත.)

(iii) රුපියල් 707,10,568 (හත්සියහත්ලක්ෂ දහදහස් පන්සිය හැටඅටයි)

(ආ) (i) මෙම ඉඩම් නුවර දිස්ත්‍රික්කය පුරා විවිධ ව්‍යාපෘති සඳහා ලබාදීමට කටයුතු කර ඇති අතර සංවර්ධනය කළ හා නොකළ ඉඩම් පිළිබඳව මේ වන විටත් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරමින් පවතී. එම වාර්තාව ලැබුණු පසුව මාස දෙකක් වැනි කාලයක් තුළ නිශ්චිතව කරුණු කිව හැක.

(ii) බදු ගිවිසුමේ ඇතුළත් කොන්දේසි ප්‍රකාරව කටයුතු කිරීම බදු ගැනුම්කරු විසින් සිදුකර නොමැත්තේ නම් පූර්ව ක්ෂේත්‍ර පරීක්ෂණයකින් පසුව අදාළ ඉඩම් නැවත පවරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(iii) අංක 1හි සඳහන් පරිදි ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසුව සංවර්ධනය නොකරන ලද ඉඩම් පිළිබඳව අවශ්‍ය කටයුතු කළ හැකි වේ. මෙම ක්‍රියාවලිය සඳහා මාස 03ක පමණ කාලයක් ගතවිය හැක.

(ඇ) අදාළ නැත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ආයතන: පාඨමාලා

திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி அமைச்சின் கீழ் உள்ள நிறுவனங்கள்: பாடநெறிகள்

INSTITUTIONS UNDER MINISTRY OF SKILLS DEVELOPMENT AND VOCATIONAL TRAINING: COURSES

620/'16

7. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි,

(i) නොමිලේ පවත්වන පාඨමාලා සංඛ්‍යාව කොපමණද; එම පාඨමාලා කවරේද;

(ii) මුදල් අයකර පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව කොපමණද; එම පාඨමාලා කවරේද;

(iii) ඉල්ලුම් කරන සුදුසුකම් ඇති සියලු සිසුන් පාඨමාලා සඳහා ඇතුළත්කර ගන්නේද;

(iv) පහසුකම් ප්‍රමාණවත් නොවන පාඨමාලා කවරේද;

(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පහසුකම් වැඩි කළහොත් බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය වැඩිවන බව පිළිගන්නේද;

(ii) සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතා සපුරාලීම සඳහා පහසුකම් වැඩි කරනු ලබන දිනය කවරේද;

(iii) "මෘදු කුසලතාවයන්ගේ සංවර්ධන අවශ්‍යතාව හඳුනාගෙන එම අවශ්‍යතා සපුරාලීම සඳහා කටයුතු කරමින් පවතී" යන්නෙන් අදහස් කරන භෞතික ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி அமைச்சின் கீழ் உள்ள நிறுவனங்களில்,

(i) இலவசமாக நடத்தப்படும் பாடநெறிகளின் எண்ணிக்கை எவ்வளவு; மற்றும் அந்தப் பாடநெறிகள் யாவை என்பதையும்;

(ii) பணம் அறவிட்டு நடத்தப்படும் பாடநெறிகளின் எண்ணிக்கை எவ்வளவு; மற்றும் அந்தப் பாடநெறிகள் யாவை என்பதையும்;

(iii) விண்ணப்பிக்கும் தகைமையுள்ள அனைத்து மாணவர்களும் பாடநெறிகளுக்கு சேர்த்துக் கொள்ளப்படுகின்றார்களா என்பதையும்;

(iv) வசதிகள் போதியளவில் இல்லாத பாடநெறிகள் யாவை என்பதையும்;

(v) அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) வசதிகள் அதிகரிக்கப்படுமெனில், சேர்த்துக் கொள்ளப்படும் மாணவர்களின் எண்ணிக்கை அதிகரிக்கும் என்பதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) அபிவிருத்தித் தேவைகளை இனங்கண்டு அந்த தேவைகளை பூர்த்தி செய்வதற்காக வசதிகள் அதிகரிக்கப்படும் திகதி யாதென்பதையும்;

(iii) "மென் திறமைகளின் அபிவிருத்தித் தேவைகளை இனங்கண்டு அந்தத் தேவைகளை நிவர்த்தி செய்வதற்காக நடவடிக்கை எடுக்கப்பட்டு வருகின்றது" என்பதன்மூலம் கருதப்படும் பௌதீக முன்னேற்றம் யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Skills Development and Vocational Training:

(a) Will he inform this House with regard to the institutions coming under the purview of the Ministry of Skills Development and Vocational Training -

(i) the number of courses conducted free of charge; what those courses are;

(ii) the number of courses conducted charging money ; what those courses are;

(iii) whether all the students who possess the required qualifications asked for are enrolled for the courses;

(iv) the courses for which sufficient facilities are not available; and

(v) the steps that would be taken in that regard?

(b) Will he also inform this House -

(i) whether he admits the fact that the number of students that are enrolled will increase, if the facilities are enhanced;

(ii) the date on which the facilities will be enhanced to fulfil the development needs after identifying the aforesaid needs; and

(iii) the physical progress meant by the statement "action is being taken to identify the need of developing soft skills and fulfill the aforesaid needs"?

(c) If not, why ?

ගරු මහින්ද සමරසිංහ මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில்பயிற்சி அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Skills Development and Vocational Training)

(අ) (i) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මඟින් පහත දැක්වෙන පාඨමාලා නොමිලයේ පවත්වනු ලබයි.

	ආයතනය	පාඨමාලා ගණන	ඇමුණුම**
1	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව	86	01
2	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය	213	02
3	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය	36	03
4	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය	30	04
5	ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය	10	05
	පාඨමාලා එකතුව	375	

(ii) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මඟින් පහත දැක්වෙන පාඨමාලා මුදල් අයකර පවත්වනු ලබයි.

	ආයතනය	**පාඨමාලා ගණන**	**ඇමුණුම****
1.	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව*	20	06
2.	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය*	22	07
3.	ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය*	38	08
4.	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය	45	09
5.	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය	18	10
6.	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය*	13	11
7.	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය*	18	12
8.	ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය	39	13
	පාඨමාලා එකතුව	213	

* මෙම පාඨමාලා සතියේ දිනවල සවස්වරුවේ සහ සති අන්තයේ පවත්වනු ලැබේ.

සතියේ දිනවල සවස්වරුවේ සහ සති අන්තයේ පවත්වනු ලබන පාඨමාලා පිළිබඳවත් අපි සඳහන් කරලා තිබෙනවා. මොකද, වැඩි හරියක්ම මුදල් අය කරලා පවත්වාගෙන පාඨමාලා තමයි තිබෙන්නේ. දැනට industry එකේ, නැත්නම් ක්ෂේත්‍රයේ වැඩ කරන අය ඇවිල්ලා සවස්වරුවේ හෝ සති අන්තයේ - සෙනසුරාදා සහ ඉරිදා - පාඨමාලාවලට සහභාගි වන නිසා ඒ විස්තරත් අපි ලබාදීලා තිබෙනවා.

(iii) නැත.

ආයතනවල පවතින ශාලා පහසුකම් හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා පවතින පහසුකම් සැලකිල්ලට ගෙන උපරිම සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(iv)

	ආයතනය	පාඨමාලා ගණන	ඇමුණුම**
1.	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව	07	14
2.	ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය	06	
3.	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය	06	
4.	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය	01	
5.	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය	02	
6.	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය	01	
	එකතුව	**23**	

ඇමුණුම් සියල්ල **සභාගත**** කරමි.

(v)

Ø භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ආයතන වෙත ලැබෙන ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් ඇතුළත් කර ගන්නා සිසුන් ප්‍රමාණය වැඩිකරලීමට අවශ්‍ය යටිතල පහසුකම් හා භෞතික සම්පත් වැඩිකරලීමට කටයුතු කිරීම.

Ø විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් හරහා ලබා දෙන ප්‍රතිපාදන මඟින් පාඨමාලා වැඩිදියුණු කිරීමට පියවර ගැනීම.

(ආ) (i) ඔව්.

(ii) නිශ්චිත දිනයක් කිව නොහැක.

අවශ්‍යතාවන් හඳුනාගෙන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පාඨමාලා වැඩිදියුණු කිරීමට අවශ්‍ය පසුබිම දැනටමත් සකස් කර ඇත. එනම්, පාඨමාලා යාවත්කාලීන කිරීම, නව විෂයමාලා සකස් කිරීම, මානව සම්පත එනම්, ගුරුවරුන් පුහුණු කිරීම හා ආයතනයන්හි පාඨමාලා හදාරනු ලබන ශිෂ්‍යයින් සඳහා විෂයානුබද්ධ පොත් සකස් කර බෙදා හැරීම සිදු කර ඇත.

(iii) Ø ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 1 හා 2 මට්ටමේ සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂා කුසලතා ඔප් නැංවීම සඳහා කටයුතු සැලසීම.

Ø ආධුනිකයන්ගේ ඉංග්‍රීසි දැනුම වැඩි කිරීම සඳහා නව ඉංග්‍රීසි උපදේශකවරුන් බඳවාගෙන දිස්ත්‍රික් මට්ටමින් ඉගැන්වීමේ කටයුතු සඳහා පුහුණු කර අනුයුක්ත කිරීම.

Ø පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

Ø ආයතන වෙත බඳවා ගනු ලබන ආධුනික සිසුන් සඳහා පරිගණක ශිල්පය හා ක්‍රීඩා කුසලතාවන් දියුණු කරලීමට කටයුතු කිරීම.

***** පුස්තකාලයේ තබා ඇත.***

** *නාල් නිලෙයත්තිල් වෛක්කප්පට්ටුල්ළතු.*

** * Placed in the Library.*

***** පුස්තකාලයේ තබා ඇත.***

** *නාල් නිලෙයත්තිල් වෛක්කප්පට්ටුල්ළතු.*

** * Placed in the Library.*

[ගරු මහින්ද සමරසිංහ මහතා]

Ø ව්‍යවසාය සංවර්ධනය, නායකත්ව පුහුණුව, සන්නිවේදන කුසලතාවය දියුණු කිරීම, කණ්ඩායම් හැඟීම් වර්ධනය කිරීම යනාදී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.

ඒ අනුව මෙම ක්‍රමවේදයන් ඉදිරියට ගෙන යාම සඳහා ඉංග්‍රීසි හා මෘදු කුසලතා සඳහා විෂයමාලා සකස් කර ගුරුවරුන් 70ක් මේ වන විට බඳවාගෙන පුහුණු කර ඇත. ශිෂ්‍යයන් සඳහා අවශ්‍ය විෂයානුබද්ධ පොත් සකස් කර මේ වන විටත් බෙදා හැර ඇත.

(ඈ) අදාළ නොවේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු ඇමතිතුමනි, ප්‍රගතිය ගැන මම කළ විමසීමේදී ඔබතුමා ගුරුවරුන් 70ක් බඳවා ගැනීම සහ පොත් සකස් කර යැවීම ගැන සඳහන් කළා. ප්‍රගතිය ඉදිරිපත් කරන විට අපි අත්පත් කර ගත යුතු කාර්යයන් මොනවාද කියලා ඔබතුමා කලින් සඳහන් කළා. අත්පත් කර ගත යුතු කාර්යන්ගෙන් මේ ඇති කර ගෙන තිබෙන ප්‍රගතිය ප්‍රතිශතයක් හැටියට කොපමණද, කොපමණ කාලයක් තුළ සියයට කොපමණ ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට පුළුවන් වුණාද සහ ඉතිරි ප්‍රගතිය අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වන කාල රාමුව කුමක්ද කියලා ඇතුළත් කරලා කිව්වොත් තමයි ප්‍රගතිය ගැන ඔබතුමා දෙන වාර්තාව අර්ථවත් වෙන්නේ.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

ගරු මන්ත්‍රීතුමා, මම මාස 10ක පමණ කාලයක සිට තමයි මේ අමාත්‍යාංශය භාරව කටයුතු කරගෙන ගිහින් තිබෙන්නේ. මේ කාලය තුළදී අප ඒ අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ අරගෙන තිබෙනවා. මම ඔබතුමාට උදාහරණයක් කියන්නම්. නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කිරීමේ පරමාර්ථය පදනම් කරගෙන ඒ අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණය අරගෙන මේ වෙන කොට යුනිවෝටෙක් විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යායතන පහේම නොමිලේ පාඨමාලා පවත්වන්න මම කටයුතු කර තිබෙනවා. මේ නිසාම අප්‍රේල් මාසයේ,- [බාධා කිරීමක්] ඔබතුමා පොඩ්ඩක් ඉන්න. මම උත්තරයට එන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඔබතුමන්ලාගේ ප්‍රගතිය ගැනයි පිළිතුරක් මම බලාපොරොත්තු වන්නේ.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි ප්‍රගතිය වන්නේ. නිදහස් අධ්‍යාපනය පැත්තට අප යොමු වුණු නිසාම විද්‍යායතන පහේ ශිෂ්‍ය සංඛ්‍යාව අප්‍රේල් මාසයේදී තුන් ගුණයකින් වැඩි කරන්න අපට හැකියාව ලැබුණා. ඒකෙන් තේරෙන්නේ මොකක්ද? රුපියල් 60,000ක් ගෙවලා මේ පාඨමාලාවලට සහභාගි වෙලා NVQ 5, 6 වාගේ දෙයක් අරගෙන, ඉන් පසුව උපාධියක් ගන්න ඉදිරිපත් වෙන්න ඇත්ත වශයෙන්ම ගමේ ඉන්න දූ දරුවන් හුඟදෙනෙකුට වත්කමක් නැහැ. මේ සංඛ්‍යා ලේඛන පදනම් කරගෙන භාණ්ඩාගාරය සමඟත් සාකච්ඡා කරලා, මේ වෙන කොට අප ප්‍රතිපත්තිමය තීරණයට ඇවිත් තිබෙනවා, ඊළඟ අය වැයෙන් මේ සඳහා වූ ප්‍රතිපාදන ලබා ගන්න. දැනට ක්ෂේත්‍රයෙන් ඇවිත් ඉගෙනුම ලබා ගන්න අයගෙන් නම් අපට මුදලක් අය කරගන්න වෙනවා. හැබැයි, පූර්ණකාලීනව -full time- එන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නිදහස් අධ්‍යාපනය පදනම් කරගෙන ඒ පාඨමාලාවලට සහභාගි වෙලා ඒ සුදුසුකම් ලබා ගන්න අවශ්‍ය ප්‍රතිපාදන 2017 වසරට නියමිත අය වැයෙන් ලබාගන්න අප බලාපොරොත්තු වෙනවා.

මම හිතන හැටියට ඒකෙන් විශාල ඉල්ලුමක් ඇති වෙනවා. අපට දැන් ඔය තිබෙන හිඩස හුඟක් දුරට පුරවන්නත් පුළුවන්. අපේ මුදල් ඇමතිතුමාට මම ස්තුතිවන්ත වනවා. එතුමා මෙවර අය වැයෙන් අපට විශාල මුදලක් ලබා දුන්නා. අපි දැන් ඒ මුදල යොදවන්න කටයුතු කරගෙන යනවා. මම සියලුම ආයතන සමඟ කාර්තුවක් පාසා ප්‍රගති සමාලෝචන රැස්වීමක් පවත්වනවා. ඇත්ත වශයෙන්ම මේ වන කොට අපි හොඳ ප්‍රගතියක් දකිනවා. හැබැයි, ලබා දීලා තිබෙන විශාල මුදල වර්ෂය අවසාන වන්න ඉස්සෙල්ලා වියදම් කිරීමේ ලොකු අභියෝගයක් අපට තිබෙනවා. ඒ නිසා නිරන්තරයෙන් පසුවිපරමේ ඉඳලා, ඒ සමාලෝචනයට මමම සහභාගි වෙලා, කාල වේලාව අරගෙන අපි බලාපොරොත්තු වනවා ඒ ලබා දීලා තිබෙන මුදල පදනම් කරගෙන අවශ්‍ය පහසුකම් සලසා දීලා, මීට වඩා ප්‍රගතියක් ලබා ගන්න.

ගරු මන්ත්‍රීතුමනි, මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා, එදා ඓතිහාසික තීරණයක් කැබිනට් මණ්ඩලයෙන් ගත්තා. ඒ අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකමක් හැටියට NVQ 3 සහ 4 සමාන කරන්න GCE (O/L) වලටයි, GCE (A/L) වලටයි. ඒ ගත්ත ප්‍රතිපත්තිමය තීරණය නිසාම ඊළඟ වර්ෂයේ අපි බලාපොරොත්තු වනවා විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් මේ පාඨමාලාවලට ඇතුළු වෙලා, ඒ තාක්ෂණ දැනුම ලබා ගෙන රටේ තිරසාර සංවර්ධන ගමනට ඒ පැත්තෙන් විශාල රුකුලක් ලබා දෙයි කියලා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඒ ඒ පාඨමාලාවලට වුවමනා කරන පහසුකම් සැපයිලා නැහැ; පහසුකම්වල තව විශාල අඩුවක් තිබෙනවා කියා ඔබතුමා පිළිගත්තා. පහසුකම් සැපයීමට වුවමනා ප්‍රතිපාදන ලබා දීමට රජය මේ වන කොට ක්‍රියාත්මක වී තිබෙන්නේ කුමන ප්‍රමාණයකින්ද? ඒ සඳහා ප්‍රතිපාදන සොයාගන්න ඔබතුමා බලාපොරොත්තු වන්නේ ශිෂ්‍යයන්ගෙන් අය කරන මුදල්වලින්ද?

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

ඇත්තටම කිව්වොත්, කලින් සඳහන් කළ කාරණයමයි නැවතත් කියන්න තිබෙන්නේ. භාණ්ඩාගාරය පැත්තෙන් අපට විශාල මුදලක් ලබා දීලා තිබෙනවා. ඒ මුදල භාවිත කිරීමේ අඩු පාඩුවක් අපේ ආයතනවල අදත් තිබෙනවා. ඒක හරිගස්සා ගන්න තමයි මම මේ උනන්දු වෙන්නේ. මොකද, ඒ දීලා තිබෙන මුදලවත් මේ වර්ෂයේදී අපට වියදම් කරන්න බැරි නම්, එතකොට භාණ්ඩාගාරයට හොඳ තර්කයක් තිබෙනවා, අපට ඊළඟ වර්ෂයේ අය වැයෙන් ඒ තරම් මුදලක් ලබා දෙන්න වුවමනාවක් නැහැ කියලා කියන්න. ඉතින් මේක භාණ්ඩාගාරය පැත්තෙන් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි; අපේ ප්‍රශ්නයක්. අපි ඇත්ත වශයෙන්ම මීට වඩා කාර්යක්ෂම අන්දමින් මේ ලබා දීලා තිබෙන මුදල් භාවිත කරන්න හැඩ ගැසෙන්න ඕනෑ කියන ස්ථාවරයේ තමයි මම ඉන්නේ. නිරන්තරයෙන්ම ඒ සඳහා නායකත්වය දෙන්නත් මම ඉදිරිපත් වෙලා තියෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නිදහස් අධ්‍යාපනයට අනුකූල වන ලෙස මේ නිපුණතා පාඨමාලා සම්පාත කරන්න ඔබතුමා බලාපොරොත්තු වෙන බව කිව්වා. ඉතින් මේ මුදල් අය කරන පාඨමාලා ගැන ඔබතුමා සඳහන් කළා. Annexe එකෙත් තිබෙනවා කිව්වා. මෙපමණ මුදල් අය කරන පාඨමාලා, මුදල් අය නොකරන පාඨමාලා බවට පරිවර්තනය කරන්න ඔබතුමාගේ සැලසුම කුමක්ද? ක්ෂේත්‍රවලින් එන අයගේ නොවෙයි. මොකද, ඔබතුමා නිදහස් අධ්‍යාපනය ගැන හුහක් කථා කළ නිසයි අහන්නේ.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)

ගරු මන්ත්‍රීතුමා, ඒක තමයි මගෙත් පරමාර්ථය. ඒ නිසා තමයි මම කිව්වේ. මේ වනකොටත් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කරලා, යම්කිසි එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. අපට භාණ්ඩාගාරයෙන් ලැබිලා තිබෙන මුදලට සාපේක්ෂව බැලුවාම බොහොම සුළු මුදලක් තමයි පාඨමාලාවලට ගාස්තු අය කරලා අපි ලබා ගන්නේ. ඒ, රුපියල් මිලියන 150ක විතර මුදලක්. මහා භාණ්ඩාගාරය ඇත්ත වශයෙන්ම සූදානම්, 2017 වසරේදී අපට ඒ මුදල ලබා දෙන්න. සම්පූර්ණයෙන්ම නිදහස් අධ්‍යාපනයක් ඇති කරලා ගමේ ළමයින්ටත් ඒ අවස්ථාව ලබා දුන් විට රටේ ආර්ථික සංවර්ධනයටත් මීට වඩා විශාල ප්‍රගතියක් එකතු කර ගන්න පුළුවන් වෙයි කියා මා හිතනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මාගේ ඊළඟ අතුරු ප්‍රශ්නය -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න තුනයි නේ අහන්න පුළුවන්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මට තව එක අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්න තුනම අහලා අවසන්. ගරු ඇමතිතුමා කැමැති නම් ඔබතුමාට අවස්ථාවක් ලබා දෙන්න පුළුවන්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අහපු අතුරු ප්‍රශ්න තුනට අදාළවමයි.

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
කමක් නැහැ, ගරු කථානායකතුමනි. එතුමාට ප්‍රශ්නය අහන්න දෙන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු ඇමතිතුමනි, දැනට අවුරුදු විස්සකට පමණ පෙර ඇහැලියගොඩ නගරයට කිට්ටුව එල්ලාවල කියන ගමේ ව්‍යක්තිය පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කළා. එහි කටයුතු ඉතා හොඳින් සිදු වුණා, එය ආරම්භ කරපු කාලයේදී. ඒක අත් හැරලා දැමලා, අද වල් බිහි වෙලා තිබෙනවා; නෂ්ටාවශේෂයක් බවට පත් වෙලා තිබෙනවා. ඔබතුමා ඒ ගැන බලනවාද?

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ)
(The Hon. Mahinda Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ගැන සොයා බලා ඔබතුමාට දන්වන්නම්.

ඌව පළාත් ප්‍රධාන අමාත්‍යාවරයා: උපදේශකයන්
ஊவா மாகாண முதலமைச்சர்: ஆலோசகர்கள்
CHIEF MINISTER OF UVA PROVINCE: ADVISERS

621/'16

8. ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) වංචා හා දූෂණ චෝදනා රාශියක් සම්බන්ධයෙන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යාවරයාට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට පැමිණිලි කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ප්‍රධාන අමාත්‍යාවරයා විසින් උපදේශකයන් බඳවා ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවර බලතල යටතේද;

(iii) බඳවා ගෙන ඇති උපදේශකවරයන්/ උපදේශකවරියන්ගේ නම් හා ඔවුන්ට ගෙවන දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පුද්ගලයන් නීතිවිරෝධීව බඳවා ගෙන තිබේ නම්, ඔවුන් ඉවත් කිරීමට හා ඒ සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යාවරයාට එරෙහිව නීත්‍යානුකූල පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) பல மோசடி மற்றும் ஊழல் குற்றச்சாட்டுகள் தொடர்பாக ஊவா மாகாண சபையின் முதலமைச்சருக்கு எதிராக நிதிசார் குற்றப் புலனாய்வுப் பிரிவிற்கு முறைபாடுகள் செய்யப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா என்பதையும்;

(ஆ) (i) முதலமைச்சர் ஆலோசகர்களை ஆட்சேர்த் துள்ளாரா என்பதையும்;

(ii) ஆமெனில், அது எத்தகைய அதிகாரங்களின் கீழ் என்பதையும்;

[ගරු වමින්ද විජේසිරි මහතා]

(iii) ஆட்சேர்க்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் மற்றும் அவர்களுக்குச் செலுத்துகின்ற கொடுப்பனவுகள் தனித்தனியாக யாவையென் பதையும்;

(iv) மேற்படி ஆட்கள் சட்டவிரோதமான முறையில் ஆட்சேர்க்கப்பட்டிருப்பின், அவர்களை அகற் றுவதற்கும், அது தொடர்பாக முதலமைச்சருக்கு எதிராகச் சட்ட ரீதியாகச் செயலாற்றுவதற்கும் நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils and Local Government:

(a) Is he aware that complaints have been lodged with the Financial Crimes Investigation Division against the Chief Minister of the Uva Province regarding a number of allegations of fraud and corruption?

(b) Will he inform this House -

(i) whether the aforesaid Chief Minister has recruited advisers;

(ii) if so, under what authority has he made such recruitments;

(iii) separately the names of the advisers that have thus been recruited and the allowances paid to them; and

(iv) if such advisers have been recruited illegally, whether action will be taken to remove them and to take legal action against the Chief Minister for making such recruitments?

(c) If not, why?

ගරු පියංකර ජයරත්න මහතා (පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு பியங்கர ஜயரத்ன - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி இராஜாங்க அமைச்சர்)

(The Hon. Piyankara Jayaratne - State Minister of Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) නොදනිමි.

මෙම ප්‍රශ්නය මෙම අමාත්‍යාංශයට යොමු නොකළ යුතු ප්‍රශ්නයක් බව සඳහන් කරමි.

ගරු මන්ත්‍රීතුමනි, එය යොමු කළ යුත්තේ නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයටයි.

(ආ) (i) අතීතයේ පළාත් සභා හා ප්‍රධාන අමාත්‍යවරු සිදු කළ ආකාරයටම කටයුතු කර ඇති අතර ඌව පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නිර්දේශය අනුව ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත උපදේශකයින් බඳවා ගෙන තිබේ.

(ii) ඌව පළාත් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත.

(iii)

උපදේශක වරයාගේ නම	තනතුර	වැඩ භාරගත් දිනය	මාසික දීමනාව	ඉන්ධන දීමනාව	මුළු දීමනා එකතුව
පාලිත ආරියවංශ මහතා	උපදේශක (මාධ්‍ය)	2015.09.23	20,000	15,000	35,000
අසිත් උපුල් රණවීර මහතා	උපදේශක (සංවර්ධන)	2015.09.23	20,000	15,000	35,000
එස්.ඒ.ආර්. ගන්දසේන මහතා	උපදේශක (වාරිමාර්ග)	2015.09.23	20,000	15,000	35,000
විජිත මල්ලැහැව මහතා	උපදේශක (නීති)	2015.09.23	20,000	15,000	35,000
සුජීව ජයසිංහ මහතා	උපදේශක (අධ්‍යාපන)	2015.09.23	20,000	15,000	35,000
සී. ඉලේපෙරුම මහතා	ප්‍රධාන අමාත්‍ය උපදේශක	2015.09.21	20,000	15,000	35,000
එම්.එච්.එම්. අශෝක ගුණතිලක මහතා	උපදේශක (මුද්‍රණාලය)	2015.10.30	20,000	15,000	35,000
ආර්.එම්.සී. රත්නායක මහතා	උපදේශක (මහජන සම්බන්ධතා)	2015.09.23	20,000	15,000	35,000

(iv) අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රධාන ලේකම්වරුන් වෙත යැවීමට පෙර ඌව පළාත් සභාව විසින් මෙම පත්වීම් සිදු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට රාජ්‍ය ඇමතිතුමාගෙන් ඇසීමට අතුරු ප්‍රශ්න තිබෙනවාද?

ගරු වමින්ද විජේසිරි මහතා

(மாண்புமிகு சமிந்த விஜேசிறி)

(The Hon. Chaminda Wijesiri)

තිබෙනවා, ගරු කථානායකතුමනි. මම ඇසූ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම පිළිබඳව පළමුවෙන්ම මා ගරු රාජ්‍ය ඇමතිතුමාට මගේ ස්තුතිය පළ කරනවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ප්‍රධාන අමාත්‍යවරුන්ට සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ට කොපමණ උපදේශකවරුන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට හැකිද කියන කාරණය සම්බන්ධව 2015.09.16 වැනි දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීන්දුවක් ගෙන තිබෙනවා. ඒ අනුව ප්‍රධාන අමාත්‍යවරුන් සඳහා එක් උපදේශකවරයෙකු බඳවා ගැනීමට හැකිය කියන කාරණය ගැන මා දැනුවත් වී සිටිනවා. පරණ ක්‍රමවේදයට අනුව බඳවා ගැනීමක් කරනවාය කියන කාරණය ඔබතුමාගේ පිළිතුරෙහි සඳහන් වෙනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අමාත්‍ය මණ්ඩල තීන්දුව ගන්නේ, 2015 වර්ෂයේ මෙම ආණ්ඩුව පිහිටෙව්වාට පසුව පළාත් සභා විසින් අනුගමනය කළ යුතු වැඩ පිළිවෙළක් පිළිබඳවයි.

මා දන්නා හැටියට, ඒ යවන ලිපිය අනුව අනිවාර්යෙන්ම ඒ ගත්ත තීන්දුව තමයි ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. ඔබතුමා දැන් උපදේශකවරු 7දෙනෙකුගේ හෝ 8දෙනෙකුගේ නම් කිව්වා. දැන්

බඳවා ගෙන තිබෙනවා. අමාත්‍ය මණ්ඩල තීන්දුව ක්‍රියාත්මක නොවීම පිළිබඳව ඉදිරියේදී ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද?

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු කථානායකතුමනි, 2015.09.16වැනි දින අමාත්‍ය මණ්ඩලය තීරණයක් අරගෙන තිබෙනවා. පළාත් ආණ්ඩුකාරවරුන්ට යවලා තිබෙනවා, කිසිම උපදේශකවරයෙක් බඳවා ගන්න බැහැ කියලා. නමුත් අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කාරණයට අදාළව පත්වීම් කර තිබෙන්නේ ඊට පෙරයි. නමුත් අපි ඒ යෝජනාව යවලා තිබෙනවා, 2015.10.08වැනි දා. ඉන් පසු පත් කරන එක අහෝසි කරලා තිබෙනවා. ඊට පෙරත් පත් කරද්දී ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත්ව පත් කරන එක පූර්වාදර්ශයක් බවට පත් වෙලා තිබෙනවා. දැන් ඒ පත්වීම අවලංගු වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු අමාත්‍යතුමනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න අවශ්‍යයි. ඔබතුමා කියන්නේ මේ ලිපිය එන්නට කලින් තමයි බඳවා ගැනීම කරලා තිබෙන්නේ කියලා. ලිපිය ආවාට පස්සේ එම පත්වීම් අහෝසි විය යුතු නැද්ද?

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
අහෝසි වෙලා තිබෙනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
තවම පඩි ගෙවනවා නේ. තවමත් මේ උපදේශකවරු ඉන්නවා.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු මන්ත්‍රීතුමනි, අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව බඳවා ගැනීම් නවත්වලා තිබෙනවා. උපදේශකයන් ඉන්නවා නම්, අපි ඉදිරියට බඳවා ගන්න කොහොමවත්ම අවසර දෙන්නේ නැහැ. දැනට ඒ අයට පඩි ගෙවනවා නම් ඒ පිළිබඳව අපි වාර්තාවක් කැඳවලා ඔබතුමාට දැනුම් දෙන්නම්.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. මම අතුරු ප්‍රශ්න එකයි ඇහුවේ. තව මට අතුරු ප්‍රශ්න දෙකක් අහන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කමක් නැහැ, අහන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට තව එක අතුරු ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මට අහන්න බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

මෙතැන එක උපදේශකවරයෙක් පළාත් සභාවෙන් පඩි දෙකක් ලබා ගන්නවා. ඒ, සුජීව ජයසිංහ මහතා. උපදේශකවරයෙක් හැටියට එතුමාට වෙනම දීමනා සහ වරප්‍රසාද ලැබෙන අතරම, ඌව පළාත් සභාවේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් පත් කර තිබෙනවා. ඒ සඳහා එතුමාට වෙනම දීමනාවක් දෙනවා ගරු රාජ්‍ය අමාත්‍යතුමනි. එම නිසා ඒ පිළිබඳවත් සලකා බලන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මීළඟට ප්‍රශ්න අංක 9.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
තුන්වන අතුරු ප්‍රශ්නය මම අහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
නැහැ. දෙකයි ඇහුවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කර ගැනීමක් තිබෙනවා කියලා එකක් ඇහුවා. පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා කැමැතිද පිළිතුර ලබා දෙනවාද?

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු කථානායකතුමනි, චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා. කමක් නැහැ, නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්නය අහන්න. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා පළමුවන අතුරු ප්‍රශ්නය ඇහුවා; දෙවැනි එක පැහැදිලි කර ගැනීමක්; තුන්වැනි අතුරු ප්‍රශ්නය ඇහුවා. නමුත් නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා අහන අතුරු ප්‍රශ්නයටත් ඔබතුමා පිළිතුර දෙන්න.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු වොක්ෂෝල් වීදියේ ගබඩා සංකීර්ණ : බදු දීම

மக்கள் தோட்ட அபிவிருத்திச் சபையின் வொக்ஷோல் வீதி களஞ்சியசாலைகள் : குத்தகைக்கு வழங்கல்

WAREHOUSE COMPLEX OF JANATHA ESTATE DEVELOPMENT BOARD IN VAUXHALL STREET: LEASE OUT

630/'16

10.ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) වර්ෂ 2001 - 2004 දක්වා පැවති එක්සත් ජාතික පක්ෂ රජය විසින් දීර්ඝ කාලීන බදු පදනම මත පෞද්ගලික සමාගම් හෝ පුද්ගලයන් වෙත ලබා දී ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් කොළඹ, වොක්ෂෝල් වීදියේ පිහිටි, ගබඩා සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;

(ii) බදු දී ඇති ගබඩාවේ නම, වර්ග අඩි ප්‍රමාණය, බදු දුන් මුදල සහ බදු දුන් සමාගම හෝ පුද්ගලයාගේ නම, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ගබඩා බදු දී ඇත්තේ අමාත්‍ය මණ්ඩල අනුමතියකට, විවෘත ටෙන්ඩර් පටිපාටියකට හෝ රජයේ තක්සේරුවකට යටත්වද;

(ii) එවැනි කොන්දේසි කිසිවක් නොමැතිව මෙම ගබඩා බදු දී ඇත්නම්, ඒවා නැවත රජයට පවරා ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2001 - 2004 ஆம் ஆண்டு வரை ஆட்சியிலிருந்த ஐக்கிய தேசியக் கட்சி அரசாங்கத்தினால் நீண்டகால குத்தகை அடிப்படையில் தனியார் கம்பனி அல்லது நபர்களுக்கு வழங்கியுள்ள மக்கள் தோட்ட அபிவிருத்திச் சபைக்குச் சொந்தமான கொழும்பு வொக்ஷோல் வீதியில் அமைந்துள்ள களஞ்சியசாலைகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) குத்தகைக்கு வழங்கியுள்ள களஞ்சியசாலையின் பெயர், சதுர அடி, குத்தகைத் தொகை மற்றும் குத்தகைக்கு வழங்கிய கம்பனி அல்லது நபரின் பெயர் வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி களஞ்சியசாலைகள் அமைச்சரவை அங்கீகாரத்திற்கு அல்லது பகிரங்க கேள்விப் பத்திர நடைமுறைக்கு அல்லது அரசாங்க விலை மதிப்பீட்டிற்கு உட்பட்டதாக குத்தகைக்கு வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) மேற்படி நிபந்தனைகள் எதுவுமின்றி இந்த களஞ்சியசாலைகள் குத்தகைக்கு வழங்கப் பட்டிருப்பின், அவை மீண்டும் அரசாங்கத்தினால் சுவீகரிக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise Development:

(a) Will he inform this House-

(i) the number of warehouse complexes at Vauxhall Street belonging to the Janatha Estate Development Board given on long-term lease basis to private companies or individuals by the United National Party Government that was in power from the year 2001-2004; and

(ii) separately, the name of the warehouse leased out, area in square feet, leased amount and the company or individuals to whom it was leased?

(b) Will he also inform this House-

(i) whether those warehouses have been leased out subject to the approval of the Cabinet of Ministers, an open tender procedure or a government valuation; and

(ii) if they have been leased out without any such condition, whether they will be taken back by the government?

(c) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ගබඩා සංකීර්ණ 01 (ගබඩා ගොඩනැඟිලි 08)

(ii)

ගබඩාවේ නම	වර්ග අඩි ප්‍රමාණය	බදු දුන් මුදල රු.	බදු දුන් සමාගම හෝ පුද්ගලයාගේ නම
කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 175 දරන ස්ථානය			
A ගොඩනැඟිල්ල	760	10,260/=	ශාන්ත කුමාර ජයසිංහ මහතා
	5000	67,500/=	සමර්විල් (පුද්ගලික) සමාගම
B ගොඩනැඟිල්ල	5322	71,847/=	කැන්ඩි ටයර් හවුස් (පුද්ගලික) සමාගම
C ගොඩනැඟිල්ල	4536	58,968/=	ග්ලෝබල් ටී බෑග්ස් සමාගම
	2227	30,065/=	ග්ලෝබල් ටී බෑග්ස් සමාගම

ගබඩාවේ නම	වර්ග අඩි ප්‍රමාණය	බදු දුන් මුදල රු.	බදු දුන් සමාගම හෝ පුද්ගලයාගේ නම
D ගොඩනැඟිල්ල	8000	108,000/=	ඇරිනා ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම
E ගොඩනැඟිල්ල	5010	67,635/=	ඊ. ඩබ්ලිව්.ඉන්ෆෝමේෂන් (පුද්ගලික) සමාගම
F ගොඩනැඟිල්ල	5079	66,027/=	සමර්විල් (පුද්ගලික) සමාගම
G ගොඩනැඟිල්ල	4825	65,137.50	අශෝක ග්ලාස් ඇන්ඩ් මිරර් සමාගම

(ආ) (i) නැත.

(ii) බදු කාල සීමාව අවසන් වී ඇති ගබඩා ගොඩනැඟිලි නැවත ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම ඔබතුමාගෙන් ඇහුවේ, 2001 සිට 2004 දක්වා පැවැති එක්සත් ජාතික පක්ෂ රජය යටතේ කොළඹ නගරයේ තිබෙන ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ඉතාම වටිනා ගබඩා සංකීර්ණ බදු දීම පිළිබඳ ප්‍රශ්නයක්. ඔබතුමා මට දෙන උත්තරේ තමයි මේ ගබඩා සංකීර්ණ සියල්ල බදු දීලා තිබෙන්නේ ටෙන්ඩර් පදනම මත නොවෙයි, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත නොවෙයි කියලා. ඊළඟ කරුණ තමයි ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වොක්ෂෝල් වීදියේ මේ ගබඩා සංකීර්ණයේ ගබඩා බදු දීලා තිබෙන්නේ වර්ග අඩියක් රුපියල් 10කටයි. ගරු මලික් සමරවික්‍රම අමාත්‍යතුමනි, Vauxhall Street එකේ වර්ග අඩියක් රුපියල් 10කට බදු දුන්නා කියන්නේ එය දීලා තිබෙන්නේ කොහොමද කියලා ඔබතුමාට තේරුම් ගන්න පුළුවන්. ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය අමාත්‍යතුමනි, කොළඹ නගරයේ තිබෙන වාණිජමය වටිනාකමින් යුක්ත රජයේ දේපලක් වන මෙම ගබඩා සංකීර්ණයේ වර්ග අඩියක් රුපියල් 10ක් වාගේ තුට්ටු දෙකකට රජයේ තක්සේරුවක් නොමැතිව, ටෙන්ඩර් පටිපාටියක් නොමැතිව, කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් නොමැතිව ලබා දීමක් ඔබතුමා අනුමත කරන්නේද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

අවුරුදු 33කට අඩු කාලයකට බදු දුන්නොත් කැබිනට් අනුමැතියක් අවශ්‍ය නොමැති බව මම මුලින්ම සඳහන් කරන්න ඕනෑ. මෙතැන සඳහන් කරලා තිබෙන සියල්ලක්ම අවුරුදු 33කට වැඩිය අඩු කාලයකටයි බදු දීලා තිබෙන්නේ. ඔබතුමා මිල ගැන සඳහන් කළා. අවුරුදු 13කට උඩදී මිල තක්සේරු කිරීමක් කරලා තමයි ඒකට පිළිතුරක් දෙන්න පුළුවන් වන්නේ. මේ බදුවලට දුන්න ඉඩම්වලට අමතරව 2004 වසරේ ඉඳලා 2015 වසර වෙනකනුත් ගබඩාවන් 21ක් මේ සමාගමෙන්ම බදු දීලා තිබෙනවා. බදු ගිවිසුම් 21ක් තිබෙනවා. මේ A,D,E,F ගබඩා ගොඩනැඟිලි බැලුවොත් "මිස්ටර් පේන්ට්" පෞද්ගලික සමාගමට වාහන නැවැත්වීමට දීලා තිබෙනවා. ඒ සඳහා රජයේ තක්සේරුවක් ලබලා නැහැ.

නීතිමය තත්ත්වය අනුව බදු ගිවිසුම් අවසන් වූ පසු ආපසු බාර ගැනීමට කටයුතු කරලාත් නැහැ. මේ ගබඩා සංකීර්ණය 2001 - 2004 දක්වා බදු දීලා තිබුණා. ඊට පසුවත් මේ ගබඩා නැවත ලබා ගන්න තිබුණා. නමුත් ලබාගෙන නැහැ.

ඒ විතරක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, A, D ගබඩා ගොඩනැඟිලි 2003 අවුරුද්දේ රුපියල් 185,760කට තමයි බදු දීලා තිබුණේ. 2004 අවුරුද්දෙන් පසුව ඒ ගොඩනැඟිලිම රුපියල් 150,000කට බදු දීලා තිබෙනවා. කලින් දුන්නු ප්‍රමාණයටත් වැඩිය අඩු ප්‍රමාණයකට පසු ගිය රජය - පොදුජන එක්සත් පෙරමුණු රජය - ඒවා බදු දීලා තිබෙනවාය කියලාත් කියන්න අවශ්‍යයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු ඇමතිතුමා, මම අහපු පළමුවැනි අතුරු ප්‍රශ්නයෙන් ඔබතුමා පැනලා ගියා. මගේ ප්‍රශ්නයෙන් මම අහලා තිබෙන්නේ 2001 - 2004 දක්වා කාල සීමාව ගැනයි. මගේ ප්‍රශ්නයෙන් මම අහලා තිබෙන්නේ 2004 - 2015 කාල සීමාව පිළිබඳව නොවෙයි. මම ඒකට වෙනම ප්‍රශ්නයක් අහන්නම්. 2001 - 2004 දක්වා පැවති ආණ්ඩුව යටතේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් කොළඹ නගරයේ යුනියන් පෙදෙස, වොක්ෂෝල් වීදියේ පිහිටා තිබෙන ඉතාම වටිනා වාණිජමය වටිනාකමකින් යුක්ත ගොඩනැඟිලි බදු දීලා තිබෙනවා. ඒවා දීලා තිබෙන්නේ කැබිනට් අනුමැතිය මත නොවෙයි කියලා ඔබතුමා කියනවා. හැබැයි, ඔබතුමා කියන්නේ නැහැ ටෙන්ඩර් කළේ නැහැ කියලා. ටෙන්ඩර් පටිපාටියකින් බැහැරව, රජයේ තක්සේරුවකින් බැහැරව Union Place එකේ වර්ග අඩියක් - square foot - රුපියල් 10කට ගන්න පුළුවන්ද කියලා ඔබතුමා මට කියන්න. මේක අතිශූෂ්ත ගනුදෙනුවක් කියලා ඔබතුමා පිළිගන්නේ නැද්ද? 2004 අවුරුද්දේ ඉඳලා වැරැදි කරලා තිබෙන නිසානේ අපි ගෙදර යැව්වේ. ඔබතුමන්ලා බලයට ඇවිල්ලා මේ වනකොට අවුරුදු එකහමාරක් ගතවෙලා තිබෙනවානේ. පසු ගිය කාලයේ ඒවාට විරුද්ධව නඩු දැම්මා. මගේ ප්‍රශ්නය මෙයයි ගරු ඇමතිතුමා. මේ නිසා ලොකු අසාධාරණයක් සිදු වෙනවා. අඩු ගණනේ ඔබතුමා දැන් හෝ මේවා පවරා ගන්න. මේ ගබඩා සංකීර්ණ ඇයි පවරා ගන්නේ නැත්තේ?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි කියමනක් තිබෙනවා, "වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහන්න එපා" කියලා. නමුත් සමහර අයගේ ගෙවල්වල වීදුරු කැඩිලා. වීදුරු කැඩිලා තිබෙනකොට ගල් ගහන එක එච්චර අපහසු දෙයක් නොවෙයි.

ගරු කථානායකතුමනි, මිල ගැන අහපු ප්‍රශ්නය පිළිබඳවත් මම කියන්නම්. එදා වර්ග අඩියක් බදු දීලා තිබුණා නම්, මේ තිබෙන විස්තර අනුව 2004 අවුරුද්දෙන් පස්සේ ඒ ඉඩමම ඊට වඩා අඩු මිලකට දීලා තිබෙනවා කියලා මම සඳහන් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහනවා කියලා ඔබතුමා කියපු එක ඔබතුමා ඔබතුමාගෙන්ම අහගත්තා නම් හොඳයි.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා දැන් කිව්වා, 2004 අවුරුද්දෙන් පස්සේ වර්ග අඩියක් රුපියල් 10කට වඩා අඩුවෙන් බදු දීලා තිබෙනවාය කියලා. කොළඹ යුනියන් පෙදෙසේ, වොක්ෂෝල් වීදියේ පිහිටි ගබඩා සංකීර්ණයේ square foot එකක් රුපියල් 10කට වඩා අඩුවෙන් එක ආයතනයකට හරි බදු දීලා තිබෙනවා නම් ඒ ආයතනයේ නම කියන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන ගැටලුව වර්ග අඩියේ මිල විතරක් නොවෙයි. මෙතුමන්ලාගේ රජය වසර දහයක් තිබුණා. එහෙම වැරදි වුණා නම්, ඇයි අධිකරණයට ඒවා ගෙන ගියේ නැත්තේ? අධිකරණයට ගෙන ගියේ නැත්තේ අධිකරණයට ඉදිරිපත් කරන්න කරුණු නැති නිසා කියලා මේ අවස්ථාවේ මම කියන්න ඕනෑ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේදී රටේ ප්‍රශ්නයක් පිළිබඳව ඇහුවාම, ගරු අමාත්‍යවරයා දෙන උත්තරය මූලාසනයේ සිටින ඔබතුමා දකිනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා බොහොම උගත් ඇමතිවරයෙක්. මම හූහක් ගරු කරන ඇමතිවරයෙක්. අපි දෙන්නා එකම ඉස්කෝලේ. ගරු ඇමතිතුමනි, වැරැද්දක් වෙලා තිබෙනවා නම්, ඒක පිළිගන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මීට කලින් මේ ප්‍රශ්නය අහපු දවසේ අසනීප වූ නිසා මට එන්න බැරි වුණා. ගරු ඇමතිතුමනි, ජනතා වතු සංවර්ධන මණ්ඩලය මේ ආකාරයටම වතු 22ක් විකුණා තිබෙනවා. ඒ වතුවල ප්‍රමාණය අක්කර 1,000යි, 1,500යි, 2,000යි. ටෙන්ඩර් කරන්නේ නැතිව, ශත පහක බද්දක් ගන්නේ නැතිව මේ වතු විකුණා තිබෙනවා. මගේ ආසනයේ තිබෙන මොන්ට්ක්‍රිස්ටෝ වත්ත, මවුන්ට්ජීන් වත්ත වික්කේ ශත පහක් අය කරන්නේ නැතිව. ඒ වතු නිකම් දුන්නා. ඒවා දෙන්න ටෙන්ඩර් කළේ නැහැ; කැබිනට් මණ්ඩලයට දැම්මේ නැහැ. ඒ සියල්ල කළේ නැහැ. මතක තබා ගන්න. මේ ඔක්කෝම ගනු-දෙනු කළේ මේ ඉන්න ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිවරයා. එතුමා තමයි එදා වැවිලි කර්මාන්ත ඇමතිතුමා. එතුමාගේ කාලයේදී තමයි මේ සියලු ගනු-දෙනු සිදු වුණේ. ඒ නිසා කරුණාකරලා ඔබතුමා මේ සියල්ල නැවත පවරා ගන්න. කොළඹ නගරයේ ඉතාම වටිනා ඉඩම් සම්බන්ධ ගනු-දෙනු, කොළඹ නගරය ඇතුළේ යුනියන් පෙදෙසේ, වොක්ෂෝල් වීදියේ ඉතාම වටිනා-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න තුනම අවසානයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඉන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාටත් අවස්ථාවක් දෙන්න ඕනෑ. අතුරු ප්‍රශ්න තුන අවසානයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම කිව්වේ ඒක කිරිඇල්ල ඇමතිතුමාගේ කාලයේ සිදු වුණු ගනු-දෙනු කියලායි. එතුමා තොප්පිය දමා ගන්න ඕනෑ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කොහොම නමුත්, එතුමාත් පිළිතුරක් දෙන්න ඕනෑ නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Hon. Kiriella, it happened during your time. ඒවා කිරිඇල්ල ඇමතිතුමාගේ කාලයේ සිදු වූ ගනු-දෙනු කියලායි මම කිව්වේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, බොහොම ස්තුතියි. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ் சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්] නැහැ, නැහැ. එහෙම කරන්න බැහැ, මෙතැන. වාඩිවෙන්න.

ගරු කථානායකතුමනි, 2004න් පස්සේ අවුරුදු 10ක් මේ ගොල්ලෝ ආණ්ඩු කෙරුවා. 2004න් පස්සේ ආණ්ඩු කෙරුවා නේ?

ගරු කථානායකතුමනි, මේ කියන විධියට වැරදි වෙලා නැහැ. මේ ගොල්ලන් 2004න් පස්සේ අවුරුදු 10ක් රට පාලනය කළා. බුදියාගෙනද හිටියේ? අවුරුදු 10ක් බුදියාගෙනද හිටියේ? [බාධා කිරීම්] කියන්න දෙයක් නැතිවාට අවුරුදු 15කට කලින් වෙච්ච දෙයක් ගැන අද කථා කරනවා. මේ ගොල්ලන් අවුරුදු 10ක් රට පාලනය කෙරුවා. දැන් මට පෙනෙනවා- [බාධා කිරීම්] අවුරුදු 10ක් බුදියාගෙනද හිටියේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Your point is taken. දැන් අපි ඊළඟ ප්‍රශ්නයට යමු. ඊළඟ ප්‍රශ්නය ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] Now it is over. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්න තුනක් ඇහුවා. මම ගණන් කළා. ඒක පිළිගන්න ගරු මන්ත්‍රීතුමනි. ඊට වඩා අවස්ථාව දෙන්න බැහැ. ඇමතිතුමා කැමැති නම් අවස්ථාව දෙන්න පුළුවන්. ඔබතුමා ප්‍රශ්න තුනක් ඇහුවා. මම ගණන් කළා. තර්ජනය කරන්න එපා.

මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවම නියමවූවන්: විස්තර

மரண அல்லது ஆயுள் தண்டனைக்குள்ளான கைதிகள் : விபரம்

PERSONS SENTENCED TO DEATH OR LIFE IMPRISONMENT: DETAILS

633/'16

11. ගරු ජයන්ත සමරවීර මහතා

(மாண்புமிகு ஜயந்த சமரவீர,)

(The Hon. Jayantha Samaraweera)

අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වර්ෂ 1948 පෙබරවාරි 04 දින සිට 2016 මාර්තු 24 දක්වා කාලය තුළ මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම වූ පුද්ගලයන් සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මරණීය දණ්ඩනයට හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම වූ සිරකරුවන්ගේ නම, ලිපිනය හා එවැනි දඬුවමක් නියම කිරීමට එකී සිරකරුවන් සිදුකළ වරද කුමක්ද යන්න එක් එක් සිරකරුවා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) මරණ දඬුවම හෝ ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලබා සිටි සිරකරුවන් සඳහා විශේෂ සමාවක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, විශේෂ සමාව ප්‍රදානය කරනු ලැබුවේ කවුරුන් විසින් කවර දිනයකදී, කවර දඬුවමකට ලක්ව සිටි, කවර සිරකරුවන්ටද යන්න වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நீதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1948 பெப்ரவரி 04 ஆம் திகதி தொடக்கம் 2016 மார்ச் 24 ஆம் திகதி வரையான காலத்தினுள் மரண தண்டனை அல்லது ஆயுள் தண்டனை விதிக்கப்பட்டவர்களின் எண்ணிக்கை, ஆண்டு அடிப்படையில் தனித்தனியே எவ்வளவென் பதையும்;

(ii) மரண தண்டனை அல்லது ஆயுள் தண்டனை விதிக்கப்பட்ட கைதிகளின் பெயர், முகவரி மற்றும் இத்தகைய தண்டனை விதிக்கப் படுவதற்கு இவர்கள் செய்த குற்றம் ஒவ்வொரு கைதியின் அடிப்படையில் தனித்தனியே யாதென்பதையும்;

அவர் இச்சபையில் சமர்ப்பிப்பாரா?

(ஆ) (i) மரண தண்டனை அல்லது ஆயுள் தண்டனை விதிக்கப்பட்டிருந்த சிறைக் கைதிகளுக்கு விஷேட மன்னிப்பு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனின், விஷேட மன்னிப்பானது யாரால்; எத்திகதியில்; எத்தகைய தண்டனைக்கு உள்ளாகியிருந்த எந்த சிறைக் கைதிகளுக்கு அளிக்கப்பட்டதென்பதை தனித்தனியே சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice :

(a) Will he table -

(i) separately on per year basis from 04th February 1948 to 24th March 2016 the number of persons who have received death sentence or a life sentence; and

(ii) separately the name and address of each of the prisoners who have received death sentence or a life sentence and the nature of the offence each of them had committed for receiving such sentence?

(b) Will he inform this House-

(i) whether a special pardon has been offered to prisoners who had received death sentence or a life sentence; and

(ii) if so, separately of the names of the persons who offered such pardon to those prisoners, the dates on which such pardon was offered, and the nature of the crimes that had been committed by the recipients of such pardon?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධිකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්. වර්ෂ 1948.02.04 දින සිට 2016.03.24 දින දක්වා මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් නියම වූ මුළු පුද්ගලයන් සංඛ්‍යාව ලබා ගත හැකි වාර්තා අනුව 1557 දෙනෙකු වන අතර, වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් විස්තර **ඇමුණුම 1** මඟින් දක්වා ඇත.

(ii) ඔව්. මරණීය දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම වූ සිරකරුවන්ගේ නම, ලිපිනය හා එවැනි දඬුවමක් නියම කිරීමට හේතුව **ඇමුණුම 2** මඟින් දක්වා ඇත.

ඇමුණුම් සභාගත* කරමි.

(ආ) (i) ඔව්.

(ii) ඔව්. 2013.09.26 දින වන විට සියලු නඩු හා අභියාචනා අවසන්ව මරණීය දණ්ඩනය නියමවූ සිරකරුවන් සම්බන්ධයෙන් සලකා බලා ඔවුන් වෙත පනවා ඇති මරණීය දණ්ඩනය ජීවිතාන්ත සිර දඬුවම් බවට පත් කිරීමට අධිකරණ අමාත්‍යතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරුතුමකුගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් පත් කරන ලදී.

මෙම කමිටුවේ නිර්දේශ අධිකරණ අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරන ලදුව අධිකරණ අමාත්‍යතුමා

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

විසින් ජනාධිපතිතුමා වෙත මරණීය දණ්ඩනය නියම වූවන් අතරින් ජීවිත සමාව ප්‍රදානය කළ සිරකරුවන් පිළිබඳ නිර්දේශ වාර තුනකදී ඉදිරිපත් කර ඇත. අතිගරු ජනාධිපතිතුමා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34වන ව්‍යවස්ථාව මඟින් පවරා ඇති බලතල මත මරණ දඬුවම නියමව සිටි සිරකරුවන්ට පහත පරිදි වාර තුනකදී ජීවිත සමාව ලබාදී ඇත.

හැබැයි, මේ තොරතුරු සම්පූර්ණයෙන්ම ලබා ගත නොහැකි වෙලා තිබෙනවා. මොකද, සමහර බන්ධනාගාරවල තොරතුරු සම්පූර්ණයෙන් නිවැරදිව නැති නිසා. ලැබිලා තිබෙන තොරතුරු අනුව මම කියන්නම්.

දිනය	සිරකරුවන් ගණන
2015.12.11	34
2016.04.20	83
2016.05.20	70
එකතුව	**187**

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ලබා ගැනීම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මොකද, වැලිකඩ බන්ධනාගාරයේ පසුගිය දවස්වල ඇති වුණු කැරැල්ලේදී 1996 වර්ෂය දක්වා තොරතුරු ඇතුළත් ලේඛන විනාශයට පත් වෙලා තිබෙනවා. කුරුවිට බන්ධනාගාරයට සිරකරුවන් ඇතුළත් කිරීම 1999 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණත්, වෙයන් කෑම නිසා ලිපි ලේඛන විනාශ වීම හේතුවෙන් 2003 වර්ෂයේ සිට තිබෙන තොරතුරු පමණයි ලබාගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. බෝගම්බර බන්ධනාගාරයෙන් 1990 වර්ෂයේ සිට තිබෙන ලේඛන සොයා ගත හැකි බව බන්ධනාගාර මූලස්ථානය දන්වලා තිබෙනවා. ඒ වාගේම පසුගිය කාලයේ යුද්මය වාතාවරණය හේතුවෙන් යාපනය සහ මඩකලපුව බන්ධනාගාරවල ලේඛනවලටත් යම් යම් ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. මේ ලැබී තිබෙන තොරතුරු අනුව තමයි ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම වූ පුද්ගලයන් සංඛ්‍යාව 1,557ක් කියලා සඳහන් කර තිබෙන්නේ.

(ඇ) පැන නොනඟී.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(*மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல*)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග යටතේ මන්ත්‍රීවරයෙකුට චෝදනාවක් එල්ල කරනවා නම්, ඒ සඳහා වෙනම යෝජනාවක් ගෙනෙන්න ඕනෑ. මීට ඉහත ප්‍රශ්නය අහපු අවස්ථාවේදී මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කිසිම වැදගත්කමක් නැති ආකාරයෙන් මගේ නම සඳහන් කළා. එම කොටස හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු ජයන්ත සමරවීර මහතා
(*மாண்புமிகு ஜயந்த சமரவீர,*)
(The Hon. Jayantha Samaraweera)

ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්න ඇහුවේ නැහැ.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා සඳහන් කළේ ඔබතුමා අහපු ප්‍රශ්නය ගැන නොවෙයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(*மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே*)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, මම ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාගේ නම කිව්වේ නැහැ. මම කිව්වේ, ශ්‍යාමීන් කිරිඇල්ල මහතාගේ නමයි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමනි, ඔබතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න. [බාධා කිරීම්]

ගරු ජයන්ත සමරවීර මහතා
(*மாண்புமிகு ஜயந்த சமரவீர,*)
(The Hon. Jayantha Samaraweera)

ගරු අමාත්‍යතුමා වෙනුවෙන් ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා පිළිතුරු ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වනවා. මරණීය දණ්ඩනය නියම වූ සහ ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලැබූ සිරකරුවන් 187දෙනකුට - පිළිවෙළින් 34දෙනකුට, 83දෙනකුට සහ 70දෙනකුට - පොදු සමාව ලැබී තිබෙන බව තමයි මේ තොරතුරු අනුව පෙනී යන්නේ. ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඉකුත් සමයේ බෞද්ධවාදී කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමේ සටනේදී සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරපු දිගුදුර විහිදුම් බලකායේ සේවය කළ සුනිල් රත්නායක නම් රණ විරුවාට මොකක් හෝ අභාග්‍යයකට මරණීය දණ්ඩනය නියම වෙලා, මේ වන විට අවුරුද්දක පමණ කාලයක් වැලිකඩ බන්ධනාගාරයේ සිටිනවා. එක අවස්ථාවක 34දෙනකුටත්, තව අවස්ථාවක 83දෙනකුටත්, තවත් අවස්ථාවක 70දෙනකුටත් ජනාධිපතිතුමා විසින් විවිධාකාරයෙන් සමාව ලබාදීලා තිබෙනවා. මා ඔබතුමා මඟින් ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, විවිධ වැරදි සඳහා දඬුවම් ලැබූ 187දෙනකුට පොදු සමාව ලබාදීලා තිබෙනවා නම්, අපේ රට කොටි ත්‍රස්තවාදීන්ගෙන් මුදා ගැනීමේ සටනේදී ජීවිත පූජා කිරීමේ කැමැත්තෙන් වැඩ කරපු විශේෂ බලකායක් වුණු දිගුදුර විහිදුම් බලකායේ සේවය කළ, මරණීය දණ්ඩනය නියම වෙලා දැනට අවුරුද්දක පමණ කාලයක් සිරගත වෙලා සිටින කෝප්‍රල් සුනිල් රත්නායක නමැති රණ විරුවාටත් ඒ ආකාරයෙන්ම පොදු සමාවක් ලබා දීලා කරුණාකර ඒ රණ විරුවාට නිදහස ලබා දෙන්න කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ යෝජනාව ජනාධිපතිතුමාට ඉදිරිපත් කරනවාද කියා මා දැනගන්න කැමැතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(*மாண்புமிகு கயந்த கருணாதிலக்க*)
(The Hon. Gayantha Karunatileka)

එයට ක්‍රමවේදයක් තිබෙනවා. අදාළ සිරකරුට පුළුවන් අභියාචනයක් ඉදිරිපත් කරන්න. ඒ අනුව සලකා බලන්න පුළුවන්.

ගරු ජයන්ත සමරවීර මහතා
(*மாண்புமிகு ஜயந்த சமரவீர,*)
(The Hon. Jayantha Samaraweera)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මෙහිදී ගරු ඇමතිතුමා පිළිතුරු දුන්නා, අධිකරණ අමාත්‍යවරයා

විශේෂ විනිසුරුවරයකු පත්කරලා, චාර්තාවක් සකස් කරලා, ඒ චාර්තාව ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරලා, අවස්ථා තුනකදී එනම්, එක අවස්ථාවකදී 34දෙනකු, තව අවස්ථාවකදී 83දෙනකු, තවත් අවස්ථාවකදී 70දෙනකු වශයෙන් 187දෙනකුට සමාව දීලා තිබෙනවාය කියලා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අධිකරණ ඇමතිතුමාට ඉදිරිපත් කරන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ඔව්. මා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ ගරු අධිකරණ ඇමතිතුමාට. අධිකරණ ඇමතිතුමා නියෝජනය කරමින් නේ අද ඔබතුමා මේ ප්‍රශ්නයට පිළිතුර දෙන්නේ. එතුමා ප්‍රමාද වෙලා පැමිණෙනවාය කියා කිව්වා. මා සතුටු වනවා, එතුමා මේ ගරු සභාවේ සිටියා නම්. එතුමා වෙනුවෙන් ඔබතුමා මේ පිළිතුර ඉදිරිපත් කරන නිසායි මා ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්නේ. ජනාධිපති සමාව ලැබූ මේ 187දෙනා ගත්තොත්, ඔවුන් සමහර විට මීනී මැරුම් චෝදනා, බලාපරාධ චෝදනා වැනි විවිධ චෝදනාවලට ලක් වුණු අයයි. හැබැයි මේ ප්‍රශ්නය මතු කරන්නේ, මරණීය දණ්ඩනයට නියම වෙලා අවුරුද්දක් තිස්සේ වැලිකඩ බන්ධනාගාරයේ ඉන්න, ඉකුත් යුද සමයේ කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමේ සටනේදී ජීවිතය පවා පූජා කිරීමට කැමැත්තෙන් දිගුදුර මෙහෙයුම් බලකායේ සේවය කළ රණ විරුවකු වෙනුවෙනුයි. ගරු අධිකරණ ඇමතිතුමා විශේෂ විනිසුරුවරයකු පත් කරලා, ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කරලා මේ රණ විරුවාට පොදු සමාව ලබා දීමට කටයුතු කරන්නය කියන ඉල්ලීම අධිකරණ ඇමතිතුමා වෙනුවෙන් ඔබතුමා ගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කරනවාද කියලායි මා අහන්නේ. ඒක අපි කාටත් එකඟ වෙන්න පුළුවන් කාරණයක්. ඒ නිසා මම නැවත වතාවක් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ජනාධිපතිතුමාගෙන් මේ ඉල්ලීම කරලා මරණීය දණ්ඩනය අභියස සිටින සුනිල් රත්නායක නමැති වීරෝදාර රණවිරුවාට සමාව ලබා දෙන්න කටයුතු කරන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අවධානය යොමු වුණා.

2016 වර්ෂයේ සමස්ත විදේශ විනිමය: ලැබීම් සහ ගෙවීම්

2016இல் ஒட்டுமொத்த வெளிநாட்டுச் செலாவணி : பெறுகை மற்றும் கொடுப்பனவு

TOTAL FOREIGN EXCHANGE IN 2016: EARNINGS AND PAYMENTS

641/'16

12.ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රජයේ පුරෝකථනයන් අනුව 2016 වර්ෂයේ සමස්ත විදේශ විනිමය ලැබීම් සහ ගෙවීම් කොපමණද;

(ii) 2016 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද ගෙවුම් ශේෂ හිඟය කොපමණද;

(iii) එම ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීම සඳහා රජය විසින් ගැනීමට අපේක්ෂා කරන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

නිති අමෙච්සරෙක් කේට්ට වීනා:

(අ) (i) අරසාඞ්කත්තින් එතිර්වුකූරලින්පඩි 2016ආම් ආණ්ඩිල් ඔට්ටුමොත්ත වෙළිනාට්ටුච් චෙලාවණිප් පෙරුකෙ මර්රුම් කොටුප්පනවු යාතෙන්බතෙයුම්;

(ii) 2016ආම් ආණ්ඩුක්කෙන එතිර්වුකූරප්පට්ට චෙන්මති නිලුවෛප් පර්රාක්කුරෙ යාතෙන්බතෙයුම්;

(iii) මේර්පඩි චෙන්මති නිලුවෛප් පර්රාක්කුරෙයෛ චෙලුත්තිත් තීර්ප්පතර්කු අරසාඞ්කම් එටුක්ක එතිර්පාර්ත්තුළ්ළ නටවඩික්කෛ යාතෙන්බතෙයුම්

අවර් ඉච්චපෛයිල් අර්විප්පාරා?

(ஆ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Finance:

(a) Will he inform this House -

(i) the values of the total foreign exchange earnings and payments as per the forecasts of the government for year 2016;

(ii) the value of the deficit in the balance of payment that has been forecasted for year 2016; and

(iii) of the steps that the government plans to take in order to settle that deficit in the balance of payment?

(b) If not, why?

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2016 වර්ෂයේ පුරෝකථනය කර ඇති සමස්ත විදේශ විනිමය ලැබීම් ඇමෙරිකානු ඩොලර් මිලියන 11,374ක් පමණ වේ.

2016 වර්ෂයේ පුරෝකථනය කර ඇති සමස්ත විදේශ විනිමය ගෙවීම් ඇමෙරිකානු ඩොලර් මිලියන 10,703ක් පමණ වේ.

(ii) 2016 වර්ෂය සඳහා ගෙවුම් ශේෂ හිඟයක් පුරෝකථනය නොකරන අතර, 2016 වර්ෂයේ පුරෝකථනය කර ඇති ගෙවුම් ශේෂ අතිරික්තය ඇමෙරිකානු ඩොලර් මිලියන 671ක් පමණ වේ.

(iii) 2016 වර්ෂයේ ගෙවුම් ශේෂ හිඟයක් පුරෝකථනය කර නොමැති වුවත්, තව දුරටත් ගෙවුම් ශේෂය

[ගරු රවි කරුණානායක මහතා]

ශක්තිමත් කර ගැනීම සඳහා රජය විසින් පහත පියවරයන් ගෙන ඇත.

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමඟ අවුරුදු තුනක් සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක විස්තීරණ ණය පහසුකමකට ගිවිසුම්ගත වීම. මේ යටතේ පළමු වන අදියර ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියන 169ක් 2016 ජුනි මස ලැබීම.
- ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක් වූ ඒකාබද්ධ ණය පහසුකම (syndicated loan facility) තුළින් ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක අරමුදල් 2016 ජූලි මාසයේදී ලැබීම.
- 2016 ජූලි මාසයේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 1.0ක් (වසර 10කින් කල් පිරීමට නියමිත) සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක් (වසර 5.5කින් කල් පිරීමට නියමිත) වශයෙන් ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම.
- 2016 මාර්තු මාසයේදී හුවමාරු පහසුකම් (SWAP facilities) දෙකකට ඇතුළු වීම.
  - සාර්ක් මූල්‍යයන (SAARC Finance) මුදල් හුවමාරු ගිවිසුම යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක් සහ;
  - ඉන්දියානු මහ බැංකුව (RBI) යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 700ක් (මෙම මුදල 2016 ජූනි මස පියවන ලදී.)
- 2016 සැප්තැම්බර් මස සිට විනිමය අනුපාතය පුළුල් ලෙස වෙළෙඳ පොළ බලවේග මත තීරණය වීමට ඉඩ හැරීම.

ඒ වාගේම අපි ගිය සුමානේ තව පියවරක් ගත්තා. අපි ණය ගන්නේ නැතිව, ආයෝජනය කරන්න පුළුවන් හැකියාව ඇති වන පරිදි විශේෂ ගිණුමකට - US Dollars මිලියන 300ක් ගත්තොත්, යම් කාල පරිච්ඡේදයක් සඳහා ඒවා රට තුළ තබා ගැනීමේ අවශ්‍යතාව අනුව ඒ තුළින් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක් පමණ සොයා ගන්න ඇස්තමේන්තු කරලා තිබෙනවා. මේ තුළින් මේ කථා කරන මොහොත වන විට යූඑස් ඩොලර් බිලියන 6.9ක් දක්වා සංචිත වැඩි වෙලා තිබෙනවා. හැම මාසයකම ශීඝ්‍රයෙන් ඩොලර් මිලියන 150 බැගින් වැඩි වෙන්න පටන් අරගෙන තිබෙනවා.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පළමුවන අතුරු ප්‍රශ්නය.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා දීර්ඝ පසු බිම් වාර්තාවක් ඉදිරිපත් කළ නිසා, මම අහන්න බලාපොරොත්තු වුණු යම් යම් අතුරු ප්‍රශ්නවලටත් පිළිතුරු ලැබුණා.

ගරු අමාත්‍යතුමනි, මා ඔබතුමාගෙන් මෙම ප්‍රශ්නය අහන්නට කැමැතියි. ඔබතුමාගේ මේ වාර්තාව අනුව, තවදුරටත් මහ බැංකු බැඳුම්කර නිකුතුවකින් තොරව අපට මේ වසරේ ගෙවීමට තිබෙන සියලුම විදේශ ණය ගෙවීමට හැකි තත්ත්වයක් තිබෙන බවද, ඔබතුමා පවසන්නේ?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමනි, කනගාටුයි. මට එය ඇහුණේ නැහැ. නැවත ප්‍රශ්නය අහන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් ගෙවුම් ශේෂය පිළිබඳ තොරතුරු සහ පසුබිම් වාර්තාව අනුව, මේ වසර තුළ තවදුරටත් ඩොලර් බැඳුම්කර නිකුත් කිරීමකින් තොරව මේ වසර තුළ ගෙවීමට තිබෙන ණය ගෙවීමේ හැකියාවක් ආණ්ඩුවට තිබෙන බවද, ඔබතුමා පවසන්නේ?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා අහන්නේ බොහොම ප්‍රාථමික ප්‍රශ්නයක්. ණය ගෙවීම තුළින් අලුත් ඒවා නිකුත් වෙනවා. ඒක සාමාන්‍ය සිද්ධාන්තයක් වෙලා තිබෙනවා. 2005 සිට 2015 ජනවාරි මාසයේ 8වැනිදා දක්වා ණය අරගෙන තිබෙනවා. මේවා ගෙවීමෙන් පසුව නැවත එය issue කරනවා. ඒක තමයි මහබැංකුවේ සාමාන්‍යයෙන් සිදු වෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
වැඩිපුර බැඳුම්කර නිකුත් කිරීමක් සිදු වන්නේ නැතිද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමනි, එහෙම අවශ්‍යතාවක් නැහැ. මොකද, අපේ සංචිත වැඩි වීගෙන යනවා. අපි අලුත් ක්‍රම උපයෝගී කර ගෙන යනවා. ඊට අමතරව, තව මාසයකින් විතර ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ඇතිව Colombo International Financial Centre එක පාර්ලිමේන්තුව තුළින් අපි සම්මත කරනවා. ඒ තුළින් අපේ සංචිත වැඩි වෙන්න පටන් ගන්නවා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
හොඳයි ඇමතිතුමනි, මම අහන්න බලාපොරොත්තුවෙන් හිටිය අතුරු ප්‍රශ්න බොහොමයකට ඔබතුමාගේ පසුබිම් වාර්තාවෙන් පිළිතුරු ලැබුණා. පිළිතුරට බොහොම පිං.

ධාන්‍යවලින් ස්ප්‍රිත්තු පෙරීමේ බලපත්‍ර : විස්තර
தானியங்களிலிருந்து மதுசாரம் வடிப்பதற்கான உரிமப்பத்திரம் : விபரம்
PERMITS FOR DISTILLATION OF SPIRITS FROM CEREAL: DETAILS

700/'16

13.ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ 3, ඇල්ප්‍රඩ් හවුස් ගාර්ඩන්හි, අංක 10, ප්‍රින්ස් ඇල්ප්‍රඩ් ටවර් යන ලිපිනයෙහි, පදිංචි අර්ජුන ජෝශප් ඇලොසියස් මහතා, ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් අරක්කු නිෂ්පාදන සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු වශයෙන්, ධාන්‍ය මඟින් ස්ප්‍රිත්තු පෙරීමේ බලපත්‍රයක් (එතනෝල් බලපත්‍රය) දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම්කර තිබේද;

(ii) එසේ නොවේ නම්, ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් සහ සමාගම විසින් එවැනි බලපත්‍රයක් ඉල්ලුම් කර තිබේද;

(iii) ඩබ්ලිව්. එම්. මෙන්ඩිස් සහ සමාගමෙහි අධ්‍යක්ෂවරුන් කවරේද;

(iv) 2015.01.08 දිනයෙන් පසු මේ දක්වා ධාන්‍ය මඟින් ස්ප්‍රිත්තු පෙරීමේ බලපත්‍ර (එතනෝල් බලපත්‍ර) කොපමණ ප්‍රමාණයක් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබේද, ඒ කවර පුද්ගලයන් / ආයතන වෙනුවෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

නිති අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) கொழும்பு 03, அல்பிரட் ஹவுஸ் கார்டின், இல 10, பிரின்ஸ் அல்பிரட் டவர் முகவரியில் வசிக்கும் திரு. அர்ஜூன ஜோஸப் அலோசியஸ், டபிள்யு. எம். மென்டிஸ் மதுபான உற்பத்தி நிறுவனத்தின் பணிப்பாளர் என்ற வகையில், தானியங்களிலிருந்து மதுசாரம் வடிகட்டுவதற்கான உரிமப்பத்திரமொன்றை (எத்தனோல் உரிமப்பத்திரம்) மதுவரி திணைக்களத்திலிருந்து பெறுவதற்கு விண்ணப்பித்துள்ளாரா என்பதையும்;

(ii) இன்றேல், டபிள்யு.எம். மென்டிஸ் அன்ட் கம்பனி அவ்வாறானதொரு உரிமப்பத்திரத்துக்கு விண்ணப்பித்துள்ளதா என்பதையும்;

(iii) டபிள்யு. எம் மென்டிஸ் அன்ட் கம்பனியின் பணிப்பாளர்கள் யாவர் என்பதையும்;

(iv) 2015.01.08ஆம் திகதிக்கு பின்னர் இதுவரை தானியங்களிலிருந்து மதுசாரம் வடிகட்டுவதற்கான எத்தனை உரிமப்பத்திரங்கள் (எத்தனோல் உரிமப்பத்திரம்) மதுவரித் திணைக்களத்தினால் வழங்கப்பட்டுள்ளன என்பதையும், அது யாருக்கு/ எந்த நிறுவனங்களுக்கு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House -

(i) whether Mr. Arjuna Joseph Aloysius, resident of No.10, Prince Albert Tower, Alfred House Gardens, of Colombo 03, in his capacity as a Director of a company producing arrack, known as W.M. Mendis and Company, has applied for a permit from the Excise Department to distil spirit from cereal (an ethanol permit)?

(ii) if not, whether W.M. Mendis and Company has applied for such a permit;

(iii) the names of the Board of Directors of W.M.Mendis and Company; and

(iv) the number of permits (ethanol permits) issued by the Excise Department to distil spirit from cereal from 08.01.2015 to date; and the names of such persons/institutions?

(b) If not, why?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) ඩබ්.එම්. මෙන්ඩිස් සමාගම පැරණි සමාගමකි. එය සතුව ස්කාගාර බලපත්‍රයක් ඇත. බේරුවල මොරගොල්ල එම බලපත්‍රය ක්‍රියාත්මක වන ස්ථානයයි. මෙම සමාගමට අයත් 2000 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොවූ නිෂ්පාදන බලපත්‍රයක් 2013 ජනවාරි මස සිට එම සමාගම නමින් නිකුත් කර ඇත.

(iii) 2014.01.27 දිනැතිව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද ලිපිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වේ.

* වෝල්ටර් මහින්ද මෙන්ඩිස් මහතා
* ජෙෆ්රි ජෝෂප් ඇලෝසියස් මහතා
* අර්ජුන් ජෝෂප් ඇලෝසියස් මහතා
* මුතුරාජ් සුරේන්ද්‍රන් මහතා

(iv) නැත.

එහෙත් පහත සඳහන් සමාගම්වලට පසු ගිය රජයෙන් බලපත්‍ර නිකුත් කර ඇත.

2011.01.20 හිඟුරාන ඩිස්ටිලරිස් සමාගම, කොරාඹේ ස්කාගාරය

2013.05.30 නිපෝන් ලංකා ඩිස්ටිලරිස් සමාගම, හංවැල්ල, පාදුක්ක

2007.09.07 ඇක්මී ලංකා සමාගම, දුම්මලසූරිය

2012.08.27 සිනර්ජි නිෂ්පාදනාගාරය, පයාගල

2010.02.01 වී.ඒ. නිෂ්පාදනාගාරය, හංවැල්ල

2012 වයඹ ඩිස්ටිලරිස් සමාගම, කුරුණෑගල, (වසා තිබූ නිෂ්පාදන සමාගමට 2012 වර්ෂයේ බලපත්‍ර ලබා දී ඇත.)

(ආ) අදාළ නොවේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. 2015.01.08වෙනි දිනෙන් පසු කිසිම නව බලපත්‍රයක් ඔබතුමාගේ අමාත්‍යාංශය විසින් නිකුත් කර නැද්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
(iv) වෙනි කොටසට දුන්න පිළිතුර ඇහුණේ නැද්ද? අහලා තිබුණු ප්‍රශ්නයට උත්තරය දුන්නා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔව්, මම දැන් නැවත අහන්නේ, ඔබතුමා මුදල් අමාත්‍ය ධුරය භාර ගැනීමෙන් පසු අලුතෙන් කිසිම ආයතනයකට එවැනි එතනෝල් බලපත්‍රයක් නිකුත් කර නැද්ද කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දෙවෙනි වතාවටත් කියන්නේ, එම ප්‍රශ්නයට උත්තර දීලා තිබෙනවා. දැන් තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, නැහැ. තුන්වෙනි අතුරු ප්‍රශ්නය නොවෙයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාට තේරෙන්නේ නැද්ද? ප්‍රශ්නය මඟින් අන්තර්ගතය අහලා තිබෙනවා. ඒකට මම උත්තර දුන්නාට පසුව ඒක නැවතත් පරිවර්තනය කරලා අහන්න ඕනෑද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මෙන්ඩිස් සමාගම පැරණි සමාගමක් කියලා, අර්ජුන ඇලෝසියස් ඒ සමාගමේ අධ්‍යක්ෂවරයෙක් කියලා අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛනයේ තිබූ නම ඔබතුමා දැන් ගරු සභාවට දැනුම් දුන්නා. මෙන්ඩිස් සමාගම පරණ සමාගමක් බව ඇත්ත. අර්ජුන ඇලෝසියස් කියන්නේ මහා විවාදයට තුඩු දුන් මහ බැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන්ගේ බෑණනුවන්. ඔහු තමයි අලුතෙන් මේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වෙලා තිබෙන්නේ.

මගේ අතුරු ප්‍රශ්නය මෙයයි. එසේ පත්වීමෙන් පසු කළුතර දිස්ත්‍රික්කයේ සුරාබදු දෙපාර්තමේන්තුවේ දෙදෙනෙක් සහ එස්ටීඑෆ් එකේ 25 දෙනෙකුගෙන් සමන්විත වෙනම විශේෂිත ඒකකයක් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ පිහිටුවලා තිබෙනවාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ විශේෂ ඒකකයක් නැහැ. නමුත් ජනාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ එස්ටීඑෆ් එක, යුද හමුදාව, පොලීසිය ඇතුළු සියලු කණ්ඩායම් පාවිච්චි කරනවා, රටේ ආදායම වැඩි කරන්නට. ඒ ක්‍රියාවලිය තුළ නීත්‍යානුකූලව පොලීසිය සහ සුරාබදු දෙපාර්තමේන්තුව ඉල්ලීමක් කරනවා ඒගොල්ලන්ගේ සහාය ලබාගන්නට කියලා. එවැනි කටයුත්තක් කරගෙන යනවා. ඒ තුළින් තමයි මෑතකදී හෙරෝයින් ඇල්ලුවේ, ගිය සුමානයේ දුරකථන 680ක් ඇල්ලුවේ සහ විස්කි කන්ටේනර් දෙක තුනක් අත් අඩංගුවට ගත්තේ. මේවා කරගෙන යනවා. ඒ වාගේම තමයි, 2014දී සුරාබදු ආදායම රුපියල් මිලියන 2,100ක් තිබුණු එක අද වන විට මිලියන 11,900කට වැඩි වෙලා තිබෙන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
අපේ ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමාත් දන්නවා, - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක ඇමතිතුමනි, ඔබතුමා කැමැති නම් එතුමා අහන ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. එතුමා අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, නැහැ. අතුරු ප්‍රශ්න තුනම ඇහුවේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න කීයක් ඇහුවාද කියලා මම මූලාසනයේ ඉඳගෙන ගණන් කරනවා. එකම ප්‍රශ්නය දෙසැරයක්, තුන් සැරයක් ඇහුවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒකට පිළිතුරු දෙනවා නම් දෙන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මට ප්‍රශ්නයක් තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ සුරාබදු- [බාධා කිරීමක්] අය වැය අවස්ථාවේදී මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මෙතැනදී චෝදනාවක් කළා, මෙතුමාගේ අලුතින් තිබෙන නිවාස සංකීර්ණයේ කුලිය පවා ගෙවන්නේ එතුමාය කියලා. මසකට ඩොලර් 10,000ක් ගෙවනවා. ඒ වාගේ දේවල් තියෙද්දි මේ ප්‍රශ්න අහලා, ඒ අහන ප්‍රශ්නයට උත්තර ගන්න තියෙන්න ඕනෑ නේ, ගරු කථානායකතුමනි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අප එතුමන්ලා වාගේ කරත්තකාරයෝ නොවෙයි. අප ව්‍යාත්තීය පදනමක් තිබෙන, ආදායම් බදු ගෙවන අයයි. අපට අපේ කකුල් දෙකෙන් හිටගන්න පුළුවන් ශක්තියක් තිබෙනවා. වෙන අයගේ අත්උදව්වු අපට අවශ්‍ය නැහැ. මේ වාගේ විළිලජ්ජාවක් නැති අය තමයි අවුරුදු 11ක් මේ රට පාලනය කර තිබෙන්නේ. ඊයේ පෙනුණා නේ, මිලියන 153ක් තිබුණේ කොහේද කියා. ගම්පහ දිස්ත්‍රික්කයේ අක්කර 28ක් අයිතිව තිබුණේ කාටද? මාතර ඉඩම අයිතිව තිබුණේ කාටද? ඔබතුමන්ලා කරපු දේවල් අපත් කරනවා කියා හිතන්න එපා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් ඕක නවත්වමු. එතුමා අහපු ප්‍රශ්නයට පිළිතුරක් තිබෙනවාද, ගරු ඇමතිතුමනි?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මෙන්ඩිස් ආයතනයට 2013දී මහින්ද රාජපක්ෂගේ කාලයේ තමයි මේ බලපත්‍රය දීලා තිබෙන්නේ. අපෙන් ඒ ගැන අහන්නේ මොකද? ඒ විතරක් නොවෙයි, මෙතුමා අර්ජුන ඇලෝසියස් ගැන අහනවා. අර්ජුන ඇලෝසියස් තමයි නිවාඩ් කබ්‍රාල් එක්ක වැඩ කර තිබෙන්නේ. මෙතුමන්ලා නිකම් බොරුවට දහල දහලා ඉන්නවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පාද යාත්‍රාවට ඔක්කොම සැපයුවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විළිලජ්ජාවක් නැතිව නිකරුණේ ප්‍රශ්න කරන්න හදලා තමන්ගේ නිරුවත්භාවය තමයි පෙන්නුම් කරන්නේ. වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහන්න එපා කියලා නොවෙයි මේවාට කියන්න වන්නේ. වීදුරු ගෙවල්වල ඇඳුම් නැතිව ඉඳගෙනයි මෙතුමන්ලා කටයුතු කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා. [බාධා කිරීමක්] අපි දැන් ඔය කාරණය මෙතැනින් නවත්වමු. දැන් ප්‍රශ්න ගොඩක් ඇහුවා නේ. ඒවාට පිළිතුරු දුන්නා. එතැනින් එහාට මට තවත් කාලය දෙන්න බැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම ඇහුවේ මේකයි. මේ අර්ජුන ඇලෝසියන් කියන තැනැත්තාට මෙන්ඩිස් සමාගම දීමෙන් කළුතර දිස්ත්‍රික්කය තුළ රා නිෂ්පාදනය සම්බන්ධව විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා. එහෙම වෙන කොට, මුදල් අමාත්‍යාංශය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙක් සහ "එස්ටීඑෆ්" එකේ 25ක් අරගෙන වෙනම ඒකකයක් පිහිටුවලා තිබෙනවා. පෞද්ගලික න්‍යාය පත්‍රවලට මේක මෙහෙය වන එක වැරැදියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔය වාදය අපි මෙතැනින් නවත්වමු.
ගරු මුදල් අමාත්‍යතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මෙතුමා වට රවුමක් ගිහින් අහන දෙයට කියන්න තිබෙන එකම පිළිතුර තමයි, "මේ බලපත්‍රය දුන්නේ අපි ද?" කියන එකයි. මෙය අපේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හා රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට පෙර පැවැති මහින්ද රාජපක්ෂ පාලනය යටතේ දීපු බලපත්‍රයක්. ඉතින්, අපෙන් අහන්න එපා, "කොහොමද දුන්නේ?" කියලා. ඒ විතරක් නොවෙයි. අර්ජුන ජෝශප් ඇලෝසියස් ගැන කථා කරනවා. මත්තල ගුවන් තොටුපොළට duty-free licence එක දුන්නේ කවුද? මහින්ද රාජපක්ෂලා. දැන් අපෙන් අහනවා, "අර්ජුන ජෝශප් ඇලෝසියස් කියන්නේ කවුද?" කියලා. මෙතුමන්ලා ඔහු පස්සේ දුවලා ගිහින්, දැන් ආදායම නැති වුණාම ප්‍රශ්න කරනවා. [බාධා කිරීම්] අපි පිරිසිදු පාලනයක් ගෙන යන කොට නිකම් බොරුවට චරිත ඝාතනය කරන්න එපා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඒ ප්‍රශ්නය අවසානයි.

ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්ගේ විරැකියා ගැටලුව: පියවර

ஆயுர்வேத மருத்துவ பட்டதாரிகளின் தொழிலின்மைப் பிரச்சினை: நடவடிக்கை

UNEMPLOYMENT PROBLEM OF AURVEDA MEDICAL DEGREE HOLDERS: STEPS TAKEN

388/'15

15.ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ආයුර්වේද උපාධිය සම්පූර්ණ කළ දහසකට අධික පිරිසක් රැකියා විරහිතව සිටින බවත්;

(ii) ඔවුන්ට රැකියා ලබා දීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් මෙතෙක් ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය අංශයේ දැනට ආයුර්වේද වෛද්‍ය පුරප්පාඩු තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්ගේ විරැකියා ගැටලුව විසඳීමට එතුමා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஆயுர்வேதப் பட்டத்தை பூர்த்திசெய்த ஆயிரத்துக்கும் அதிகமானவர்கள் தொழிலின்றி உள்ளார்கள் என்பதையும்;

(ii) இவர்களுக்கு தொழில்வாய்ப்புக்களை வழங்குவதற்கான முறைசார்ந்த ஒரு வேலைத்திட்டம் இதுவரையில் நடைமுறைப்படுத்தப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அரசாங்கத் துறையில் தற்போது ஆயுர்வேத மருத்துவர்களுக்கான வெற்றிடங்கள் காணப்படுகின்றனவா என்பதையும்;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) ஆமெனில், அந்த எண்ணிக்கை யாது என்பதையும்;

(iii) ஆயுர்வேத மருத்துவ பட்டதாரிகளின் தொழிலின்மைப் பிரச்சினையைத் தீர்ப்பதற்கு அவர் நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(iv) ஆமெனில், அது எவ்வாறு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Is he aware that-

(i) over thousand individuals who completed the Ayurveda Degree are unemployed; and

(ii) a systematic programme to provide them with jobs has not been implemented yet?

(b) Will he inform this House-

(i) whether there are Ayurveda Medical Doctor vacancies in the public sector;

(ii) if so, of the number of such vacancies;

(iii) whether he will take action to resolve the unemployment issue of the Ayurveda Medical Degree holders; and

(iv) if so, how?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2016.06.30වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියා පදිංචි පත්වීම් ලබා නොමැති වෛද්‍යවරු සංඛ්‍යාව හයසිය හතළිස් හයකි. (646ක්)

(ii) ක්‍රමවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වේ.

(ආ) (i) ඔව්.

(ii) පුරප්පාඩු එකසිය හතක් (107ක්) පවතී.

(iii) ඔව්.

(iv) * 2015 වර්ෂය සඳහා පැවැති පුරප්පාඩු එකසිය හත (107) සඳහා නව ආයුර්වේද වෛද්‍යවරුන් බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ 2016 අගෝස්තු මස පැවැත්වීමට නියමිතය.

* මධ්‍යම රජය යටතේ ඇති රෝහල් සඳහා නව තනතුරු නවසිය තිස් නවයක් (939) අනුමත කර ගැනීමෙන් අනතුරුව එම තනතුරු සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් බඳවා ගැනීමට නියමිතය.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ආයුර්වේද වෛද්‍ය උපාධිය ගම්පහ, යක්කල ආයුර්වේද වෛද්‍ය පීඨයත්, රාජගිරිය දේශීය වෛද්‍ය පීඨයත් හරහා තමයි ලබා දෙන්නේ. දැන් කාලයක් තිස්සේ එම උපාධිය ලබාගත් උපාධිධාරීන්ට පත්වීම ලබා ගැනීමට නොහැකි වෙලා තිබෙනවා. හැබැයි, ඔබතුමාත් මමත් දන්නවා බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ වෛද්‍ය පීඨවලින් සමුගන්න වෛද්‍ය ශිෂ්‍යයන්ට එහෙම ගැටලුවක් තවම පැන නැඟිලා නැති බව. ඒ නිසා ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්ටත් පත්වීම ලබා ගන්න එවැනි ඉතා සුමට ක්‍රමවේදයක් ඔබතුමාගේ කාලයේ සකස් කරන්න පුළුවන්කමක් තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ ක්‍රමවේදයක් කිසිම රජයකින් සකස් කළේ නැහැ. අලුතින් ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් 939දෙනෙකු බඳවා ගැනීම 2015 මැයි මාසයේ 27වන දා පළමුවැනි වරට කැබිනට් මණ්ඩලය අනුමත කළා. මෙය තමයි ලංකාවේ රජයක් පළමුවැනි වරට සියලු වෛද්‍ය උපාධිධාරීන්ට පත්වීම් ලබා දීමට ගත් තීන්දුව. එතෙක් කවදාවත් එය අනුමත කළේ නැහැ. රැකියා නොමැතිව ආයුර්වේද වෛද්‍යවරු 649දෙනෙක් සිටිනවා. තවත් 300ක් විතර ඉතිරිත් වෙනවා, එළඹෙන අවුරුද්දටත් රැකියා දෙන්න. එකී බඳවාගැනීම්වලට අදාළ කටයුතු කිරීමට දැන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා තිබෙනවා. ඒ පත්වීම්වලින් 94යි මධ්‍යම රජයට ලැබෙන්නේ. අනෙක් ඔක්කෝම පත්වීම් ලබා දෙන්නේ පළාත් සභාවලටයි. මේ පිළිබඳ තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමේදී පළාත් සභාවල සුවිශාල ප්‍රමාදයක් තිබෙනවා. ඒ නිසා මා පසු ගිය දවසක සියලු පළාත් සභා සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ගෙනැල්ලා ප්‍රමාදය නැති කර ගන්න වෙනම සාකච්ඡාවක් කළා.

මා කරුණු සොයා බලන විට දැනගත්තා උතුර පළාත් සභාව ඒ අයගේ වාර්තා එවා තිබුණේ සති දෙකකට පමණ ඉස්සර වෙලායි කියා. උතුර පළාතේ තමයි වැඩි තනතුරු සංඛ්‍යාවක් තිබෙන්නේ. මධ්‍යම රජයට සහ එක් එක් පළාතට තිබෙන තනතුරු එකින් එකට මා කියන්නම්. මධ්‍යම රජයට තිබෙන්නේ තනතුරු 111යි. මධ්‍යම පළාතට තනතුරු 83යි. උතුර මැද පළාතට තනතුරු 140යි. සබරගමුව පළාතට තනතුරු 89යි. ඌව පළාතට තනතුරු 74යි. දකුණ පළාතට තනතුරු 69යි. වයඹ පළාතට තනතුරු 49යි. බස්නාහිර පළාතට තනතුරු 80යි. උතුර පළාතට තනතුරු 158යි. වැඩිම ගණන තිබෙන්නේ උතුර පළාතටයි. නැගෙනහිර පළාතට තනතුරු 86යි. මේ විධියට තමයි තනතුරු 939 තිබෙන්නේ. මෙහිදී ප්‍රමාදය තිබෙන්නේ පළාත් සභා සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතිනුයි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කියන්නේ, ප්‍රමාදය පළාත් සභාවල කියලායි. මම කිව්වා, "මාසයක් ඇතුළත මේ කටයුතු ටික අවසන් කරලා වහාම මේ පත්වීම් ටික ලබා දෙන්න" කියා. මොකද, ඒ උපාධිධාරීන් අතරින් අවුරුදු 6ක් තිස්සේ විරැකියාවෙන් සිටින අය ඉන්නවා. ඒ නිසා ඒ කටයුතු අවසන් වූ හැටියේ තවත් ඉතාම සුළු කාල පරිච්ඡේදයකදී දිවයින පුරා ආයුර්වේද පත්වීම් සියල්ල ලබා දීලා සියලු උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි. දැනට සිටින උපාධිය ලබපු ආයුර්වේද වෛද්‍යවරුන්ට රැකියා ලැබුණාම තවත් 300ක් විතර ඉතිරි වනවා කියා ගරු ඇමතිතුමා කිව්වා. මා හිතන විධියට එවිට තවත් වසර දෙකක් විතර යන කල් මේ ගැටලුව ඇති වන්නේ නැහැ. හැබැයි එතැනින් පසුව අනාගතයේදීත් ආපසු වතාවක් මේ ගැටලුව ඇති නොවන්න කටයුතු කළ යුතුයි. අපි දන්නවා පාර්ලිමේන්තුව තුළ බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් වාගේම ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයකුත් තිබෙන බව. ගුවන් හමුදාවේ, නාවික හමුදාවේ, යුද හමුදාවේ, පොලීසියේ බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ රෝහල් තිබෙනවා. ඉදිරියේදී සංචාරක ක්ෂේත්‍රයේ ඇති වන දැවැන්ත ප්‍රසාරණයත් සමඟ සංචාරකයන් වඩාත්ම ගැවසෙන ප්‍රදේශවල ආයුර්වේද රෝහල් පළාත් සභාව සමඟ ඒකාබද්ධව ස්ථාපනය කිරීමේ හැකියාව අමාත්‍යාංශයට තිබෙනවා. ඒ නිසා අවුරුදු දෙකකට පසුව රටේ ආයුර්වේද ක්ෂේත්‍රය, සංචාරක ක්ෂේත්‍රය සහ අනෙකුත් ක්ෂේත්‍රවල ඇති වන ප්‍රසාරණය ගැන සලකා එවැනි දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් පිළිබඳව අමාත්‍යාංශයට දැක්මක් තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

අපේ බටහිර වෛද්‍යවරු සිටින පොලිස් රෝහල, ත්‍රිවිධ හමුදා රෝහල් ඇතුළු සියලුම ආයතනවලට අවශ්‍ය ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ප්‍රමාණය කොපමණද කියා දන්වන ලෙසට ඒ ආයතනවලට අපි දැනුම් දී තිබෙනවා. ඒ ගොල්ලන් අපට ඒ පිළිබඳ දන්වා තිබෙනවා. සමහර ආයතන කියා තිබෙනවා, "අවශ්‍ය නැහැ" කියලා. සමහර ආයතනවලින් ආයුර්වේද වෛද්‍යවරු අවශ්‍ය බව කියා තිබෙනවා. ඒ ඔක්කෝම දැනුවත් කරලා තිබෙනවා. ඒ එක්කම, ආයුර්වේද ස්පා මධ්‍යස්ථාන, ආයුර්වේද හෝටල්වලට අඩුම ගණනේ සුදුසුකම් සහිත එක් ආයුර්වේද වෛද්‍යවරයෙක් හෝ සිටිය යුතු බවට අපි ඉදිරියේදී නීතියක් ගේනවා. ඊට පසුව ඒ හෝටලයේ තිබෙන ඇඳන් ප්‍රමාණය අනුව වෛද්‍යවරු ගණන වැඩි වෙන්නට ඕනෑ. ඒ නීතිය අපි ඉදිරියේදී ගෙනැල්ලා සියලුම සංචාරක හෝටල් සඳහා එය ක්‍රියාත්මක කරනවා. එතකොට අවුරුදු දෙකක් යනකොට මේ ක්ෂේත්‍රයේ තව පුරප්පාඩු එනවා. ඒ අනුව තව අවුරුදු ගණනාවක් යන්න, අපට පුළුවන්. නමුත් බටහිර වෛද්‍යවරුන්ටත් හැමදාම රජයේ රැකියාවන්ම දෙන්න බැහැ. ඒ වාගේම මේ පිළිබඳව තීන්දුවක් ගන්නට අනාගතයේදී දවසක් උදාවේවි. අපේ ආයුර්වේද වෛද්‍යවරුනුත් පිටරට යවන්නට නොයෙකුත් ක්‍රමවේද හදන්න ඕනෑ. දැනට ප්‍රශ්නය විසඳා ගැනීමට ගත යුතු සියලු ක්‍රියාමාර්ග අපි අරගෙන තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙසේයි.

ආයුර්වේද ක්ෂේත්‍රයට අදාළ වන පනත ගරු ඇමතිතුමනි, 1960 දශකයේ මැද භාගයේ ඇති වූ බොහොම යල්පැන ගිය පනතක්. එය යළි අලුත් කළ යුතු පනතක්. මේ පනත වෙනුවට නව පනත් කෙටුම්පතක් හඳුන්වා දීමේ කටයුතු දැන් අවුරුදු 5ක් 6ක් තිස්සේ ඉබාගාතේ යනවා. අනික් පැත්තෙන් NATA Act එක යටතේ දුම්කොළ සහ මද්‍යසාර සම්බන්ධයෙන් ඊයේ පෙරේදා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ යෝජනා සම්බන්ධයෙන් නැවත සැරයක් riverse gear වැටුණු බවට සමාජ අදහස් පළ වෙමින් තිබෙනවා. දුම්කොළ භාවිතය සම්බන්ධවත් ඔබතුමා රූපමය අවවාද හරහා විප්ලවීය පියවරක් ගත්තා. ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී තවත් පියවර කිහිපයක් ගන්නට නියමිතව තිබෙනවා. ඒ කටයුත්ත මන්දගාමී වෙන්න ආයුර්වේද පනතත්, NATA Act එකත් යටතේ යම්කිසි මට්ටමක බලපෑමක් සිද්ධ වෙනවාද කියා දැන ගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මම ජනාධිපතිතුමාත් සමඟ සාකච්ඡා කරලා ඒකාබද්ධ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. එහි අපි සඳහන් කරලා තිබෙනවා, දුම්කොළවලට සියයට 90ක් වනතුරු බදු පනවන්න සහ සියයට 15ක වැට් එකක් පනවන්න කියලා. මෙයින් අපි බලාපොරොත්තු වන්නේ සෑම වැඩිවීමකදීම සියයට 4කටත්, සියයට 5කටත් අතර පිරිසක් දුම්බීමෙන් වළක්වා ගන්නයි. ඒ බවට අපට සංඛ්‍යා ලේඛන තිබෙනවා. ඒ නිසා අපේ රජය දුම්කොළ සහ මද්‍යසාර මර්දනය කිරීම සඳහා දිගින් දිගටම පියවර ගන්නවා. අපි කිසිම බලපෑමකට යටත් වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දැන් දෙවන වටය.

සුනාමි ව්‍යසනයෙන් අවතැන්වූ පවුල්: ස්ථිර නිවාස
சுனாமி அனர்த்தத்தினால் இடம்பெயர்ந்தோர்: நிரந்தர வீடுகள்
FAMILIES DISPLACED BY TSUNAMI DISASTER: PERMANENT HOUSES

509/'16

3. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා වෙනුවට)
(මාණ්පුමිකු පුත්තික පතිරණ -மாண்புமிகு எம்.எச்.எம். சல்மான் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. M.H.M. Salman)

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) සුනාමි ව්‍යසනය නිසා දිවයිනේ විවිධ පළාත්වල නිවාස හා දේපළ අහිමි වූ පවුල් ගණනාවක් මේ වනවිටත් අසරණභාවයෙන් පසු වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නිවාස අහිමිවී සිටින පුද්ගලයන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගෙන ඔවුන්ට ස්ථිර නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

(ii) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ නිවාස හා ඉදි කිරීම් අමාත්‍යාංශය ඒකාබද්ධව එම වැඩ පිළිවෙළ ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) சுனாமி அனர்த்தம் காரணமாக நாட்டின் பல்வேறு பகுதிகளிலும் வீடுகள் மற்றும் சொத்துக்களை இழந்த பல குடும்பங்கள் தற்போதுகூட அநாதரவாக உள்ளனர் என்பதை அவர் அறிவாரா?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ஆ) (i) அவ்வாறு வீடுகளை இழந்துள்ளவர்களை பிரதேச செயலாளர் பிரிவு மட்டத்தில் தெரிவு செய்து இவர்களுக்கு நிரந்தர வீடுகளை வழங்கும் வேலைத்திட்டமொன்றை செயற்படுத்த நடவடிக்கை மேற்கொள்வாரா;

(ii) அனர்த்த முகாமைத்துவ அமைச்சும் வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சும் ஒன்றி ணைந்து இவ்வேலைத்திட்டத்தை செயற் படுத்துவது தொடர்பில் கவனம் செலுத்தப் படுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing and Construction:

(a) Is he aware that a number of families who lost their houses and property due to Tsunami disaster are rendered helpless even by now in various parts of the country?

(b) Will he inform this House-

(i) whether steps will be taken to implement a programme by selecting people at Divisional Secretary's Division level to provide permanent houses for the people who lost their houses; and

(ii) whether attention will be paid to implement that jointly with the Ministry of Disaster Management and the Ministry of Housing and Construction?

(c) If not, why?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை பிரதி அமைச்சர்)

(The Hon. Indika Bandaranayake - Deputy Minister of Housing and Construction)

ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) ඔව්.

(ආ) (i) සුනාමි නිවාස ක්‍රමය ක්‍රියාත්මක වී ඇත්තේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ නොවේ.

(ii) සුනාමි ව්‍යසනයෙන් අවතැන්වූවන් සඳහා නිවාස ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේ නම් නිවාස ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ හැක.

(ඇ) අදාළ නොවේ.

එන්. ජී. සුනිල් ශාන්ත මහතා : "තැපැල් සේවා නිලධාරි" තනතුරට බඳවා ගැනීම

திரு. என்.ஜீ. சுனில் சாந்த : "தபால் சேவை உத்தியோகத்தர்" பதவிக்கு ஆட்சேர்ப்பு

MR. N. G. SUNIL SHANTHA : RECRUITMENT AS "POSTAL SERVICES OFFICER"

554/'16

4. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பதிரண - (மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா சார்பகா)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Seyed Ali Zahir Moulana)

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2011 වර්ෂයේදී තැපැල් දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ තැපැල් සේවයේ, "ආ" කාණ්ඩයේ 1 "ආ" ශ්‍රේණියේ, "තැපැල් සේවා නිලධාරි" තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වූ තරග විභාගයට පෙනී සිටි (විභාග අංකය - PS/C/05264) දෙහිඅත්තකණ්ඩිය, රන්හෙලගම, අංක 159 දරන ලිපිනයේ පදිංචි, එන්. ජී. සුනිල් ශාන්ත මහතා එම විභාගයෙන් සමත් වී ඇති බවත්;

(ii) එසේ වුවද, ඔහු මේ වනතෙක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) තරග විභාගයෙන් ලබා ගෙන ඇති ලකුණු සැලකිල්ලට ගෙන, ඔහු එම තනතුරට පත් කිරීම සඳහා සලකා බලන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011ஆம் ஆண்டில் தபால் திணைக்களத்தில், ஒன்றிணைந்த தபால் சேவையில், "ஆ" பிரிவில் 1 "ஆ" தரத்தில், "தபால் சேவை உத்தியோகத்தர்" பதவிக்கான ஆட்சேர்ப்புக்காக நடத்தப்பட்ட போட்டிப் பரீட்சைக்குத் தோற்றிய (பரீட்சை இலக்கம் - PS/C/05264) தெஹியத்தகண்டிய, ரன்ஹெலகம, 159ஆம் இலக்க முகவரியில் வசிக்கும், திரு. என். ஜீ. சுனில் சாந்த இப் பரீட்சையில் சித்தியடைந்துள்ளார் என்பதையும்;

(ii) எனினும், இவர் இதுவரை நேர்முகப்பரீட்சைக்கு அழைக்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) போட்டிப் பரீட்சையில் பெற்றுக்கொண்டுள்ள புள்ளி களைக் கவனத்திற்கொண்டு, இவரை இப்பதவிக்கு நியமிப்பதற்கு ஆராய்ந்து பார்ப்பாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Post, Postal Services and Muslim Religious Affairs:

(a) Is he aware that-

(i) Mr. N.G. Sunil Shantha of No.159, Ranhelagama, Dehiattakandiya sat for the

competitive examination to recruit persons to the post of "Postal Services Officer" of Grade 1 B of Category "B" of the Combined Postal Service of the Department of Postal Services in the year 2011 under Index Number PS/C/05264 and got through it; and

(ii) however, he has not been called for the interview so far?

(b) Will he state whether he will be considered to be recruited to that post based on the marks he has scored at the competitive examination?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සමත් වී ඇත.

(ii) කුසලතා අංක 2631 යටතේ 2012.12.29 දින සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අංක 03 ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ඇත. (පැමිණීමේ ලේඛනයේ පිටපතක්* යා කර ඇත.)

(ආ) නැවත සලකා බැලීමට හැකියාවක් නොමැත.

(ඇ) අදාළ තනතුරට බඳවා ගැනීම සඳහා වන විභාග නිවේදනයේ අංක 06 හා 08-ii අනුව, වෘත්තීය සුදුසුකම් යටතේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක සාක්ෂරතාව පිළිබඳව පැය 720කට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කිරීම යන සුදුසුකම සපුරා ඇති බව සනාථ කිරීමට නොහැකි වීම. (විභාග නිවේදනයේ හා පරිගණක සහතිකයේ පිටපත්* යා කර ඇත.)

වැඩ බැලීමේ පදනම මත පත් කළ විදුහල්පතිවරුන්: සේවය ස්ථිර කිරීම

පදිත්කඩමෙ අඩිප්පඩෙයිල් නියමික්කප්පට්ට අදිපර්කළ්: සේවෙයිල් නිරන්දරමාක්කල්
PRINCIPALS APPOINTED ON ACTING BASIS: CONFIRMATION IN SERVICE

613/'16

6. ගරු ඉෂාක් රහුමාන් මහතා
(මාණ්පුමිකු இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වර්ෂ 2008 සිට 2015 දක්වා කාලය තුළ පළාත් පාසල්වල වැඩ බැලීමේ පදනම් මත පත් කරනු ලැබූ විදුහල්පතිවරුන් 4000ක් පමණ පාසල්වල මූල්‍ය කටයුතු සහ පරිපාලන කටයුතු පිළිබඳව දැනුම හා පුහුණුවීම් ලබාගෙන ඇති බවත්;

(ii) විදුහල්පති සේවයට බඳවා ගැනීමේ තරග විභාගය වර්ෂ 2005න් පසුව 3 වන ශ්‍රේණිය සඳහා පමණක් 2015 දී පවත්වා ඇති බවත්;

(iii) එම විභාගයට පෙනී සිටීම සඳහා අවුරුදු 50 ඉක්මවූවන්ට අවස්ථාව ලබා දී නොමැති අතර 3 වන ශ්‍රේණියේ විදුහල්පති තනතුරට වඩා ඉහළ වැටුප් තලයක සිටි ගුරුවරුන් බොහෝ දෙනෙකු ඉදිරිපත්ව නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව, අවුරුදු 03කට වඩා කාලසීමාවක් එම පදනම මත සේවය කළ අය සම්මුඛ පරීක්ෂණ මඟින් පත්කළ යුතු වුවත්, මේ වනතුරු රජයේ පාසල්වල වැඩ බලන විදුහල්පතිවරුන්ගේ සේවය ස්ථිර නොකිරීමට හේතුව කවරේද;

(ii) තරග විභාගයට හෝ පෙනී සිටීමට අවස්ථාව නොලද අවුරුදු 50 ඉක්ම වූ වැඩ බලන විදුහල්පතිවරුන්ගේ සේවය ස්ථිර කිරීමට පියවර ගන්නේද;

(iii) පසුගිය රජය සමයේ දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන් සඳහා සහන සලසන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) (i) 2008ஆம் ஆண்டு தொடக்கம் 2015ஆம் ஆண்டு வரையான காலப்பகுதிக்குள் மாகாண பாட சாலைகளில் பதிற்கடமை அடிப்படையில் நியமிக்கப்பட்ட ஏறக்குறைய 4000 அதிபர்கள் பாடசாலைகளின் நிதிசார் அலுவல்கள் மற்றும் நிர்வாக அலுவல்கள் பற்றிய அறிவையும் பயிற்சியையும் பெற்றுள்ளனர் என்பதையும்;

(ii) அதிபர் சேவைக்கு ஆட்சேர்ப்பதற்கான போட்டிப் பரீட்சை 2005ஆம் ஆண்டுக்குப் பின்னர் 3ஆம் தரத்திற்காக மாத்திரம் 2015இல் நடத்தப்பட்டுள்ளதென்பதையும்;

(iii) அப்பரீட்சையில் தோற்றுவதற்கு 50 வயதைத் தாண்டியவர்களுக்கு வாய்ப்பு வழங்கப் படவில்லை என்பதோடு, 3ஆம் தர அதிபர் பதவியைவிட உயர்வான சம்பளப் படிநிலையில் இருந்த பெரும்பாலான ஆசிரியர்கள் தோற்ற வில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) அதிபர் சேவைப் பிரமாணத்திற்கிணங்க 03 வருடங்களுக்கு மேற்பட்ட காலம் மேற்படி அடிப் படையில் சேவையாற்றியவர்கள் நேர்முகப் பரீட்சை ஊடாக நியமிக்கப்பட வேண்டியதாக இருப்பினும் இற்றைவரை அரசாங்கப் பாடசாலைகளில் பதிற்கடமையாற்றும் அதிபர்களின் சேவை நிரந்தரமாக்கப்படாமைக் கான காரணம் யாது;

(ii) போட்டிப் பரீட்சைக்கேனும் தோற்றுவதற்கான வாய்ப்பினை இழந்த 50 வயதைத் தாண்டிய பதிற்கடமையாற்றும் அதிபர்களின் சேவையை நிரந்தரமாக்க நடவடிக்கை மேற்கொள்வாரா;

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

(iii) கடந்த அரசாங்கக் காலத்தில் அரசியல் பழிவாங்கலுக்கு இலக்காகியவர்களுக்கு நிவாரணம் வழங்குவாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) around 4,000 principals who were appointed on acting basis to Provincial Council Schools during the period from year 2008 to 2015 have gained knowledge and training in financial affairs and administration of schools;

(ii) after the year 2005, the competitive examination for the recruitment of Principals was held in the year 2015 and it was held only for the recruitment of Principals to Grade III of the Principals' Service; and

(iii) those who were above 50 years of age were not eligible to apply for the aforesaid examination while most of the teachers who were placed on the salary step that is higher than that of Grade III of the Principals' Service did not apply for that examination?

(b) Will he inform this House -

(i) the reason as to why the service of the acting principals of government schools has not been confirmed to date despite the fact that those who have completed 03 years of service as acting principals should be appointed as principals through interviews in terms of the Minutes of the Principals' Service;

(ii) whether action will be taken to confirm the service of the acting principals who were not even eligible to apply for the aforesaid competitive examination as they were above 50 years of age; and

(iii) whether relief will be provided to those who were subjected to political victimization during the previous regime?

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2016.06.30 දිනට විදුහල්පති ශ්‍රේණිධාරී තනතුරුවල රාජකාරී ආවරණය/වැඩබැලීමේ පදනම මත ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් 3,270ක් සේවයේ යෙදී සිටියි.

(ii) 2005 වර්ෂයේ විදුහල්පති සේවයට බඳවා ගැනීමේ විභාග ප්‍රතිඵල මත 2009, 2010 හා 2012 වර්ෂවලදී පත්වීම් ලබා දී ඇති අතර, ඉන්පසු නැවත සීමිත තරග විභාගයක් පවත්වන ලද්දේ 2015 වර්ෂයේදීය. එම විභාගය පවත්වා ඇත්තේ 2008.07.01 දින සිට ක්‍රියාත්මක නව විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුකූලව වන අතර එම සේවා ව්‍යවස්ථාවේ 7.2.1 වගන්තිය අනුව බඳවා ගැනීම් සිදු කළ හැක්කේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පන්තියට පමණි.

(iii) ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවේ 7.2.3 වගන්තිය අනුව විදුහල්පති සීමිත තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබන්නේ අවුරුදු 50ට අඩු ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් පමණි.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 සිට 6/2006 (XII) දක්වා වූ චක්‍රලේඛ මඟින් සියලුම රජයේ නිලධාරීන්ගේ වැටුප් පරිමාණය තීරණය කර ඇති අතර දැනට රජයේ නිලධාරීන්ගේ වැටුප් ගෙවනු ලබන්නේ එම වැටුප් පරිමාණ අනුව වේ. කෙසේ වුවද, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන්ගේ වැටුප් ගැටලු පිළිබඳව ක්‍රියා කිරීම සඳහා නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුව මඟින් මේ වන විට අදාළ ගැටලු සම්බන්ධයෙන් අධ්‍යයනය කරමින් පවතී.

(ආ) (i) දැනට ක්‍රියාත්මක (2008.07.01 දින සිට) ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව, විදුහල්පති සේවයට ඇතුළත්වීම සඳහා සේවා ව්‍යවස්ථානුකූලව අදාළ අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කිරීමත් බඳවා ගැනීමේ සීමිත තරග විභාගයෙන් සමත්වීමත් අනිවාර්ය වන අතර වැඩබැලීමේ පදනම මත සේවය කිරීම විදුහල්පති සේවාවට ඇතුළත්වීම සඳහා සුදුසුකමක් ලෙස ව්‍යවස්ථාවේ විධිවිධාන පනවා නැත.

(ii) මේ වනවිට ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් මඟින් මෙම වැඩබලන විදුහල්පතිවරුන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරමින් පවතී.

(iii) දේශපාලන පළිගැනීම් කමිටු මඟින් නිර්දේශිත සහන ඉදිරි කටයුතු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

2012 අය වැය යෝජනා : බදු ගෙවන්නන්ට සහන
வரவு செலவுத்திட்ட முன்மொழிவுகள் 2012 : வரி செலுத்துவோருக்கான சலுகை
BUDGET PROPOSALS 2012: RELIEF TO TAX PAYERS

626/'16

9. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. S.M. Marikkar)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2012 අය වැය යෝජනා යටතේ බදු ගෙවන්නන් දිරි ගැන්වීම සඳහා අඛණ්ඩව වසර 10ක් අවම වශයෙන් වසරකට රුපියල් 250,000/-ක බදු ගෙවා ඇති පුද්ගලයින් විසින් වාහනයක් මිලදී ගැනීමේදී ඒ සඳහා අය කරන බද්දෙන් සියයට 25ක බදු සහනයක් ලබා දී ඇති බවත්;

(ii) එම බදු සහනය අහෝසි කරන මෙන් 2015 සැප්තැම්බර් මාසයේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපියකින් දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වරප්‍රසාදය අහිමි කිරීමට හේතු කවරේද;

(ii) එම වරප්‍රසාදය අහෝසි කරන අවස්ථාව වනවිටත් වාහන ගෙන්වීම සඳහා ණයවර ලිපි ආරම්භ කර අපහසුතාවයට ලක්වී සිටින පුද්ගලයන්ට ලබා දෙන සහනය කවරේද;

(iii) මෙම බදු සහනය ලබා දීම පිණිස පවතින නිර්ණායක සමාලෝචනය කර ඉදිරි කාලයේදී එය නැවත ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳව සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

නිති අමෙච්සරෙක් කේට්ට විනා:

(අ) (i) 2012 වරවු සෙලවු තිට්ටත්තින් කීව් වරි සෙලුත්තුපවර්කළෙ ඌක්කුවිප්පතර්කාක ඉටෙය රාමල් 10 වරුටංකළ් කුරෙන්තපට්චම් වරුටත් තිර්කු රූපා 2,50,000/- වරි සෙලුත්තියුන්ල ආට්කළාල් වාකනම් කොළ්වනවු සෙය්යප් පුම්පෝදු අතර්කාක අරවිටප්පුකිණ්ර වරියිල් 25% වරිච්සලුකෙ වළංකප්පට්ටුන්ල තෙන්පතෙයුම්;

(ii) මේර්පටි වරිච් සලුකෙයෙ ඉරත්තුච් සෙය්යුමාරු 2015 සෙප්රෙම්පර් මාතත්තිල් නිති අමෙච්සරින් සෙයලාළරිනාල් උන්නාට්ටු ඉරෙවරිත් තිණෙක්කළත්තිර්කු කටිතම් මූලම් අරිවික්කප් පට්ටුන්ළතෙන්පතෙයුම්;

අවර් අරිවාරා?

(ආ) (i) මේර්පටි සිරප්පුරිමෙ ඉරත්තුච් සෙය්යප්පට්ට මෙක්කාන කාරණම් යාතෙන්පතෙයුම්;

(ii) මේර්පටි සිරප්පුරිමෙ ඉරත්තුච් සෙය්යප්පුකින්ර සන්තර්ප්පත්තිල් වාකනංකළෙ ඉරක්කුමති සෙය්ව තර්කාක නාණයක් කටිතම් ඒර්පාටු සෙය්තු අසෞකරියත්තිර්කු උන්ළාකියුන්ළවර්කළුක්කු වළංකප්පුම් නිවාරණම් යාතෙන්පතෙයුම්;

(iii) ඉන්ත වරිච් සලුකෙයෙ වළංකුම්පොරුට්ටු, නටෙමුරෙයිලුන්ල අළවුකෝල්කළෙ මීළාය්වු සෙය්තු එතිර්වරුම් කාලත්තිල් අතනෙ මීළ වළංකුවතර්කු නටවටික්කෙ එටුප්පාරා එන්ප තෙයුම්;

(iv) ආමෙනිල්, අතු සම්පන්තමාක විපරමාන අරික්කෙයොන්රෙච් සමර්ප්පිප්පාරා එන්පතෙයුම්;

අවර් ඉච්සපෙක්කු අරිවිප්පාරා?

(ආ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Finance:

(a) Is he aware that -

(i) Under Budget Proposals 2012, in view of encouraging tax payers, when a vehicle is purchased, a 25 per cent tax relief on total tax, has been given to the individuals who has paid, at least Rs. 250,000 as tax per year continuously for 10 years; and

(ii) In September 2015, the Secretary to the Ministry of Finance has informed the Inland Revenue Department, in writing, to terminate the aforesaid tax relief ?

(b) Will he inform this House -

(i) the reasons, led to terminate the aforesaid tax relief;

(ii) the relief provided to the individuals who had opened Letters of Credit to import vehicles, by the time that aforesaid tax relief was terminated;

(iii) whether measures will be taken to provide the tax relief again, reviewing the existing criteria in providing the tax relief ; and

(iv) if so, whether a detailed report will be submitted?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2012 අය වැය යෝජනා යටතේ බදු ගෙවන්නන් සඳහා මෙවැනි සහනයක් ලබා දී නොමැත. කෙසේ වුවත්, 2006 අය වැය යෝජනා යටතේ මෙවැනි බදු සහනයක් ලබා දෙන ලදී. ඒ අනුව, 2006 අංක 11 දරන මුදල් පනතේ 2(1)ආ (ii) වගන්තියට අනුව අබණ්ඩව වසර 05ක් වසරකට රුපියල් 250,000/- බැගින් ආදායම් බදු ගෙවන ලද පුද්ගලයෙකුට මෝටර් රථයක් ආනයනයේදී ගෙවිය යුතු ආනයන බදු, නිෂ්පාදන බදු සහ එකතු කළ අගය මත බදුවල මුළු එකතුවෙන් සියයට 75ක් ලෙස මෝටර් වාහන අනුග්‍රාහක බද්ද ගෙවිය යුතු විය.

(ii) ඔව්.

(ආ) (i) එම වරප්‍රසාදය අහිමි කිරීමට පහත සඳහන් කරුණු හේතු විය.

1. අවුරුදු පහක් බදු ගෙවන ලද බදු ගෙවන්නන් විසින් ගෙවන ලද බදු ප්‍රමාණය ලබා දෙන බදු සහනයට සාපේක්ෂව අඩුවීම.
2. රජයේ ආදායම අහිමි වීම අඩු කිරීම සඳහා මෙම බලපත්‍ර නිකුත් කිරීම නතර කිරීම.
3. 2016 අය වැය යෝජනා මගින් රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස සියලුම සහනදායී බලපත්‍ර අහෝසි කිරීම.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) 2015.09.11 දින හෝ ඊට පෙර ණයවර ලිපි විවෘත කරන ලද පුද්ගලයන් සඳහා මෙම බලපත්‍ර අවලංගු කිරීමට පෙර පැවැති නිෂ්පාදන බදු ගෙවීමින් වාහන නිදහස් කර ගැනීමට ඉඩ සලසමින් අංක 1949/29 දරන 2016.01.12 දිනැති ගැසට් නිවේදනය පරිදි බදු සහනයක් ලබා දෙන ලදී.

(iii) නැත.

(iv) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

ගම්පහ දිස්ත්‍රික්කයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්: යතුරුපැදි නොලැබීම

கம்பஹா மாவட்ட குடும்ப சுகாதார சேவை உத்தியோகத்தர்கள் : மோட்டார் சைக்கிள் வழங்காமை

FAMILY HEALTH OFFICERS IN GAMPAHA DISTRICT: NON - PROVISION OF MOTOR CYCLES

702/'16

14. **ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු විජිත හේරත් මහතා වෙනුවට)**
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති -මාණ්පුමිකු විජිත හේරත් சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. Vijitha Herath)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රජයේ සේවකයන් සඳහා යතුරුපැදි ලබා දීමේ වැඩ පිළිවෙළට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් ඇතුළත් බවත්;

(ii) ක්ෂේත්‍ර සහ රෝහල් රාජකාරියේ යෙදී සිටින දෙපිරිසටම මෙම පහසුකම හිමි බවත්;

(iii) යම් පළාත්වල යතුරුපැදි ලබා දීම නිසි පරිදි සිදුවී ඇතත්, පළාත් කිහිපයක එය නිසි පරිදි ක්‍රියාත්මක වී නොමැති බවත්;

(iv) විශේෂයෙන් ගම්පහ රෝහලේ සේවයේ නියුතු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් සඳහා මේ වන තුරුත් යතුරුපැදි ලබා දීම සිදුවී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගම්පහ ඇතුළු දිවයින පුරා එම යතුරුපැදි නොලද සෑමට යතුරුපැදි ලබා දීම සඳහා පියවර ගන්නේද;

(ii) ඒ සඳහා ගත විය හැකි කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

නිති අමෙච්චරෙක් කේට්ට වීනා:

(අ) (i) අරසාඟක ඌලියර්කලුක්කාන මෝට්ටාර් සයික්කිල් වලංගුම් තිට්ටත්තිල් කුටුම්ප සුකාතාර සේවෙ උත්තියෝකත්තර්කළුම් උළ්ළඩක්කප් පට්ටුල්ළාර්කළ් එන්පතෙයුම්;

(ii) කළ මට්රුම් මරුත්තුවමනෙ කඩමෙකළිල් ඊටුපට්ටුල්ළ ඉරු චාරාරුක්කුම් මේර්පඩි මෝට්ටාර් සයික්කිළ් උරිත්තාකුමෙන්පතෙයුම්;

(iii) චිල මාකාණඞ්කළිල් මෝට්ටාර් සයික්කිළ් වලංකුම් නඩවඩික්කෙ උරිය මුරෙයිල් මේර් කොළ්ළප්පට්ටුල්ළපෝතිලුම්, චිල මාකාණඞ්කළිල් අදු උරිය මුරෙයිල් චෙයර්පඩුත්තප් පඩවිල්ලෙ එන්පතෙයුම්;

(iv) කුරිප්පාක, කම්පහා මරුත්තුවමනෙයිල් කඩමෙ යාර්රුකින්ර කුටුම්ප සුකාතාර සේවෙ උත්තියෝකත්තර්කළුක්කු ඉදුවරෙ මෝට්ටාර් සයික්කිළ්කළෙ වලංකුවතර්කු නඩෙපෙරවිල්ලෙ එන්පතෙයුම්;

අවර් අරිවාරා?

(ஆ) (i) කම්පහා උට්පඩ නාටු මුළුවතිලුම් මේර්පඩි මෝට්ටාර් සයික්කිළ් කිටෙක්කාත අනෙවරුක්කුම් මෝට්ටාර් සයික්කිළ්කළෙ වලංකුවතර්කු නඩවඩික්කෙ මේර්කොළ්වාරා එන්පතෙයුම්;

(ii) අතර්කු එව්වළවු කාලම් එටුක්කුමෙන්පතෙයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(இ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Finance:

(a) Is he aware that-

(i) Family Health Officers too are included in the scheme for providing motorcycles to Public Servants;

(ii) the officers on field duty as well as the officers on duty in hospitals are entitled to this facility;

(iii) although provision of motorcycles has taken place in proper manner in certain areas, it has not been implemented properly in a few areas; and

(iv) especially, the Family Health Officers employed at the Gampaha Hospital have not been provided with motorcycles yet?

(b) Will he inform this House -

(i) whether steps will be taken to provide motorcycles to those who have not received motorcycles in Gampaha and in other areas of the island so far; and

(ii) the period of time it may take to achieve this?

(c) If not, why?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රජයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා යතුරුපැදි ලබා දීමේ වැඩ පිළිවෙළට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් ඇතුළත් විය.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය නිර්දේශ කරන ලද හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කරන ලද තනතුරු හිමි සියලු නිලධාරීන්ට යතුරුපැදි ලබා දෙන ලදී.

(iii) එක් එක් දිස්ත්‍රික්කවල යතුරුපැදි ලබා දීම සම්බන්ධයෙන් කටයුතු කරනුයේ අදාළ දිස්ත්‍රික් ලේකම්ය. 2016 අය වැය යෝජනා අනුව යතුරුපැදි ලබා ගැනීමට ගෙවිය යුතු මූලික ගාස්තුව 2015.11.20 දිනට පෙර ගෙවා ඇති බවට දිස්ත්‍රික් ලේකම් විසින් සනාථ කර ඇති සුදුසුකම් ලැබූ සියලු නිලධාරීන්ට යතුරුපැදි ලබා දීමට කටයුතු කර ඇත.

(iv) 2015.11.20 දින වන විට ගෙවීම් සිදුකර අවසන් වූ හා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සනාථ කරන ලද සියලුම නිලධාරීන්ට යතුරුපැදි ලබා දීමට කටයුතු කරන ලදී.

(ආ) (i) සියලුම නිලධාරීන්ට යතුරුපැදි ලබා දිය නොහැක. එහෙත්, 2015.11.20 දිනට පෙර මුදල් ගෙවා අවසන් කර ඇති බවට දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සනාථ කරනු ලබන, එහෙත් තවම යතුරුපැදි නොලත් නිලධාරීන් සිටී නම්, ඒ අය සඳහා පමණක් යතුරුපැදි ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(ii) අදාළ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් මුදල් ගෙවා ඇති බවට සනාථ කර මුදල් අමාත්‍යාංශය වෙත දන්වා, වාහන ආනයනයට ගතවන කාලය ද සැලකිල්ලට ගෙන මාස තුනක් ඇතුළත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) 2015.11.20 දිනට මෙම ව්‍යාපෘතිය සීමා කරන ලදී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න, ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

නිම කරන ලද ව්‍යාපෘති සඳහා ගෙවීම් නොකිරීම
முடிவுறுத்தப்பட்ட கருத்திட்டங்களுக்கான கொடுப்பனவுகளை வழங்காமை
NON-PAYMENT FOR COMPLETED PROJECTS

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මා මෙම ප්‍රශ්නය අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙත යොමු කරනවා.

වසර 2014දී අය වැය ලේඛනයෙන් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සියල්ලට අවම වශයෙන් රුපියල් මිලියන 30ක් ලැබෙන පරිදි හා එම -මාර්ග ආදී- ව්‍යාපෘති සඳහා අනුමත වී ලබා දෙන ලද මුදල් ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් අදාළ බලධාරී ආයතන හරහා ක්‍රියාත්මක කරන ලදී.

1. මෙම ව්‍යාපෘති සඳහා අනුමත වූ මුදල් අදාළ අමාත්‍යාංශ හා ආයතන සඳහා ලබා දී ව්‍යාපෘති ආරම්භ කරන ලද බව පිළිගන්නේද?

2. ඉහත ව්‍යාපෘති ආරම්භ කොට නිමකර මෙම ආයතන මඟින් භාර ගන්නා ලදී. 2014 හා 2015 වසරවලදී ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ඇත්තවශයෙන්ම, රුපියල් බිලියන 4,400ක් ඉක්මවා ඇත. ගරු කථානායකතුමනි, රුපියල් බිලියන ගණනාවක මුදල් ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම පළාත් පාලන ආයතන මඟින් නිමකොට ඇති ව්‍යාපෘති සඳහා අදාළ කොන්ත්‍රාත්කරුවන්ට තවම ලබා දී නොමැති බව දන්නෙහිද?

3. අදාළ ආයතන මඟින් කොන්ත්‍රාත්කරුවන් ලබා ගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ලබා ගත් බැංකු ණය ලබා ගනිමින් එම ව්‍යාපෘති නිම කළද, ඔවුන් සඳහා දීර්ඝ කාලයක් මුදල් නොගෙවීම නිසා කොන්ත්‍රාත්කරුවන් මුදල් ලැබෙන තෙක් බලා සිටින බව සෑම දිස්ත්‍රික්කයකින්ම වාර්තා වී ඇති බව දන්නෙහිද?

4. ගරු අගමැතිතුමනි, මුදල් අනුමත කරන ලද නිම කරන ලද ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු මුදල් පළාත් පාලන ආයතන මඟින් ගෙවීම සඳහා එම ආයතන වෙත ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් නියෝග කොට ඉටු කළ ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු මුදල් ලබා දීමට කටයුතු කරනවාද? එසේ නම් ඒ කවදාද?

ගරු කථානායකතුමනි, මම මේ ඉදිරිපත් කරන ප්‍රශ්නයට අදාළව තිබෙන මෙම සියල්ල කියවන්නට උත්සාහ දරන්නේ නැහැ. මේ හැම දිස්ත්‍රික්කයක් සඳහාම ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා ලබා දී ඇති මුදල සම්බන්ධව විස්තරාත්මකව තිබෙනවා. අනුමත වී මුදල් නිකුත් කොට මුදල් ඒ ඒ ආයතන හා අමාත්‍යාංශ ලබා ගෙන අදාළ පළාත් පාලන ආයතනවලට යැවීමට නියෝග කළත්, එය ඉෂ්ට වෙලා නැති නිසා කොළඹ දිස්ත්‍රික්කයේ පමණක් ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා ලබා දී ඇති මුදල රුපියල් දසලක්ෂ 390ක්. කොළඹ දිස්ත්‍රික්කයේ සිට ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකටම අදාළ මුදල් විස්තර ඇතුළත් වන මෙම ලේඛනය මම මේ අවස්ථාවේදී ගරු අගමැතිතුමාගේ දැන ගැනීම සඳහා **සභාගත*** කරනවා.

රුපියල් මිලියන 4,400ක් පමණ වන මෙම මුදල් නීති උල්ලංඝනය කිරීම නිවැරදි කිරීම සඳහා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් මේ අවස්ථාවේදී මෙම ප්‍රශ්නය යොමු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මෙම ප්‍රශ්නයට අද පිළිතුරු ලබා දෙනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා පිළිතුරු ලබා දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා පිළිතුරු ලබා දෙන්න.

**** ප්‍රශ්නකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණා 4ක් සම්බන්ධව පිළිතුරු මෙසේය.

01. ඔව්.

02. ඔව්.

03. ඔව්.

04. ඔව්.

මෙම ව්‍යාපෘතිවලට අදාළ ප්‍රතිපාදන ලබා ගැනීම පිණිස අනුමැතිය ලබා ගැනීමට ගරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2016.01.19 දිනැති අංක CP/2015/31 දරන අමාත්‍ය මණ්ඩල සටහන අනුව මෙම ගෙවීම්වලට අදාළ නිර්දේශ ලබා දීම සඳහා විශ්‍රාමලත් ලේකම්වරුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත. ඊට අදාළව ඇමුණුම් අංක 01 **සභාගත*** කරමි

තවද, මෙම ගෙවීම් කිරීමට අදාළ ක්‍රියාවලිය ඉතා කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය විකල්ප ක්‍රමවේදයන් සඳහා අනුමැතිය ඉල්ලා ගරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2016.06.17 හා අංක CP/2016/17 දරන අමාත්‍ය මණ්ඩල සටහන අනුව ක්‍රියාත්මක කර අවසන් කර ඇති ව්‍යාපෘති වටිනාකමින් සියයට 25කට සමාන මුදලක් පළාත් පාලන ප්‍රධාන ලේකම්වරුන් වෙත 2016 වර්ෂය තුළදී මුදා හැරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත. එයට අදාළව ඇමුණුම් 02 **සභාගත*** කරමි

ඒ අනුව 2014.12.31 වන දින වන විට වැඩ අවසන් ව්‍යාපෘතිවලට අදාළව, මේ වන විට සියලු පළාත්වලින් ඉදිරිපත් කර ඇති තොරතුරු ඇතුළත් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2016/03හි සඳහන් A ආකෘති පත්‍ර පරීක්ෂා කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතින අතර, ඒ ඒ පළාත් සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදන ඉල්ලීම් කරන ලිපිය ජාතික අය වැය දෙපාර්තමේන්තුවට ලබන සතිය ඇතුළත ඉදිරිපත් කිරීමට නියමිතය. ඒ අනුව, අදාළ ප්‍රතිපාදන ලද වහාම අදාළ ගෙවීම් කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඉදිරිපත් කරන ලද කරුණු සියල්ල මම පිළිගත්තා. ඒ කියන්නේ මේ ව්‍යාපෘති අනුමත කළා, මේ ව්‍යාපෘතිවලට මුදල් වෙන් කළා, මෙම ව්‍යාපෘති නිම කරලා තිබෙනවා, මෙම ව්‍යාපෘති නිම කිරීමෙන් පසුව කොන්ත්‍රාත්කරුවන්ගෙන් භාරගෙන තිබෙනවා. මේ වන විට මුදල් නැතිව බැංකුවලට ණය වී දිස්ත්‍රික්ක විසිපහේම දහස් ගණනක් කොන්ත්‍රාත්කරුවන් ඉන්නවා. මම අහන්නේ ගෙවන්නේ කවදාද කියලා. ඒකට පමණක් ඔබතුමා උත්තරයක් දුන්නේ නැහැ. චක්‍රලේඛ තිබෙන බව අපි දන්නවා, කැබිනට් පත්‍රිකා අපි දන්නවා, මුදල් අනුමතවෙලා තිබෙනවා, මුදල් අමාත්‍යාංශයෙන් ලබා දී තිබෙනවා. එසේ නම්, මුදල් ගෙවන්නේ නැත්තේ ඇයි?

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රතිපාදන ඉල්ලීම් ලිපිය ජාතික අය වැය දෙපාර්තමේන්තුවට යවා තිබෙනවා. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
2014 වර්ෂයේ වැඩ ඉවර කරපු ඒවාට ඇයි ගෙවන්නේ නැතිව ඉන්නේ?

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු මන්ත්‍රීතුමනි, මේක මටත් අදාළ ප්‍රශ්නයක්. මුදල් ලැබුණු විගස අපි ගෙවන්නට කටයුතු කරනවා. මේ සම්බන්ධව නිරන්තරයෙන් අප විමසීම් කරනවා, මොකද, මටත් මේ ප්‍රශ්නය තිබෙන නිසා. මේ අවුරුද්දේ ප්‍රතිපාදන ඉල්ලා තිබෙනවා. කැබිනට් පත්‍රිකාවක් දමන්න ඉල්ලා තිබෙනවා. [බාධා කිරීමක්] අවුරුද්ද ඇතුළත මන්තීතුමා. [බාධා කිරීමක්] මේක මේ තත්ත්වයටවත් ආපු එක ලොකු දෙයක්. නැත්නම් මේක නැතුව තිබුණේ. මේ තත්ත්වයට ආපු එක ලොකු දෙයක්, මුදල් ගෙවන්න. [බාධා කිරීමක්]මම දන්නවා. මේ ප්‍රශ්නය මටත් අදාළයි. මටත් මේ ප්‍රශ්නය තිබෙනවා, මන්ත්‍රීතුමා.[බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ආණ්ඩුව මුදල් නිදහස් කරනවා, -[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා, මේ ගැන පියවර ගන්න.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු මන්ත්‍රීතුමනි, මේ වර්ෂය තුළ ගෙවන්න කටයුතු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ඊළඟට, ගරු ඩග්ලස් දේවානන්ද මහතා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

II

පුනරින් වැව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම
பூநகரிக் குளத் திட்டத்தை நடைமுறைப்படுத்தல்
IMPLEMENTATION OF POONERYN LAKE PROJECT

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 23 (2)இன்கீழ் நீர்ப்பாசன மற்றும் நீர் வளமூல முகாமைத்துவ அமைச்சர் அவர்களிடம் எனது கேள்விகளைக் கேட்க அனுமதித்ததற்கு நன்றி.

வடக்கு மாகாணத்திலுள்ள கிளிநொச்சி மாவட்டமானது 1,237.11 சதுர கிலோ மீற்றர் பரப்பளவைக் கொண்டுள்ளதுடன், 443.3 சதுர கிலோ மீற்றர் நீர்ப் பரப்பையும் கொண்டதாகும். இதில் 448.7 சதுர கிலோ மீற்றர் நிலப்பரப்பைக் கொண்டிருக்கும் பூநகரிப் பிரதேசமானது, விவசாயம் மற்றும் குடிநீர்ப் பிரச்சினைகளுக்குப் பாரியளவில் முகங்கொடுக்கின்றது. இப்பிரதேசமானது 19 கிராம சேவையாளர் பிரிவுகளையும் சுமார் இருபத்துநான்காயிரம் பேரைக்கொண்ட சனத்தொகையையும் உள்ளடக்கியதாகும். இது 85.69 சதுர கிலோ மீற்றர் நீர்ப் பரப்பைக் கொண்டிருக்கிறது. இங்குள்ள நிலப்பரப்பில் 35 சதவீதமானவை விவசாயக் காணிகளாகும். இதில் 35 சதவீதமான நிலப்பரப்பில் நெற்செய்கை மேற்கொள்ளப்படுகின்றது. இங்கு சராசரி மழை வீழ்ச்சி 1,100 மில்லி மீற்றர் ஆகும். வருடத்தில் செப்ரெம்பர் மாதம் முதல் ஜனவரி மாதம் வரையில் இந்த மழை வீழ்ச்சியை எதிர்பார்க்க முடியும். இதனால் பெரும்போகத்தில் சுமார் 500 ஏக்கர் காணிகளில் நெற்செய்கையையும் சுமார் 100 ஏக்கர் காணிகளில் சிறு தானியப் பயிர்ச்செய்கையையும் மேற்கொள்ள முடிகின்றது. இப்பகுதியில் நிலையான நீர்நிலைகள் இல்லாதிருந்தாலும், சுமார் 200க்கும் மேற்பட்ட சிறு குளங்களும் இரு பெரிய குளங்களும் காணப்படுகின்றன. தற்போது இக்குளங்களில் காணப்படுகின்ற ஓரளவு நீரைக்கொண்டு அதனை அண்டிய பகுதி நிலங்களில் பயிர்ச்செய்கைகள் மேற்கொள்ளப்பட்டு வருவதுடன், கால்நடைகளும் ஓரளவு பயனைப் பெறுகின்றன.

மேலும், இப்பிரதேசத்தின் தரைத்தோற்றமானது தட்டையான தாழ்நிலப்பரப்பைக் கொண்டிருப்பதால் அதிகளவு மழை வீழ்ச்சியைப் பெற்றபோதிலும் கடல் நீரானது கரையோரங்களில் உட்புகுவதன்மூலம் நிலத்தடி நீர் உவர்த்தன்மை கொண்டதாகவே காணப்படுகின்றது. வரட்சிக் காலங்களில் இப்பிரதேச மக்களுக்கான குடிநீரானது 25 கிலோ மீற்றர் தொலைவிலிருந்து பவுஸர்கள் மூலம் கொண்டுவரப்படுகின்றது. தற்போது பூநகரிப் பிரதேசத்தில் காணப்படும் கொக்குடையான், மாளாப்பு ஆகிய குளங்களை இணைத்து பாரிய நிலப்பரப்பில் நீரைத் தேக்குவதன்மூலம் இவற்றுக்குத் தீர்வு காணலாம். மேலும், குடிநீர் மற்றும் நிலத்தடி நீரை மேம்படுத்தி நூற்றுக்கும் மேற்பட்ட சிறிய குளங்களைக் கோடை காலங்களில் வற்றாது பேண முடியும். ஆனால், தற்போது இந்தக் குளங்கள் உரிய முறையில் புனரமைப்புச் செய்யப்படாத நிலையிலேயே உள்ளன. குடாமுறிப்பு ஆறு, மண்டக்கல்லாறு ஆகியவற்றுக்கிடையில் அணைகூடக் கட்டப்படவில்லை. அத்துடன், உவர்நீர்த் தடுப்பு அணைகளும் புனரமைக்கப்படாத நிலையிலேயே உள்ளன.

மண்டக்கல்லாறானது 300 சதுர கிலோ மீற்றர் நீரேந்து பரப்பைக்கொண்ட பாரிய ஆறாகும். இதில் 35.82 சதவீதமான நீரே நீர்ப்பாசனத்துக்காகப் பயன்படுத்தப்படுகின்றது. இந்த மண்டக்கல்லாற்றை செம்மண்குன்றில் மறித்து அணை கட்டுவதன் மூலம் பூநகரி குளத்திற்கு நீரைக் கொண்டுவர முடியும். மேலும், குடமுறுட்டி, மண்டக்கல்லாறு ஆகிய ஆறுகளை மறித்து உவர்நீர்த் தடுப்பு அணைகளைக் கட்டுவதன் மூலமும் பரிந்துரைக்கப்பட்ட பூநகரிக் குளத்திற்குத் தேவையான நீரைப் பெறக்கூடியதாக இருக்கும். குடமுறுட்டி ஆற்றை மறித்து உவர்நீர்த் தடுப்பு அணையைக் கட்டுவதனால் பூநகரிக்குள நீரை நன்னீராகப் பேண முடியும். பூநகரிக் குளத்தைப் புனரமைப்பதனூடாக அப்பகுதியில் குடிநீர்ப் பிரச்சினை தீர்க்கப்படுவதுடன், விவசாயச் செய்கை, கால்நடை வளர்ப்பு, மற்றும் மேய்ச்சல் தரைகளுக்குத் தேவையான நீரையும் பெற்றுக்கொள்ளலாம். அதன்மூலம் இப்பகுதியை அண்டிய கிளிநொச்சி, பளை, யாழ்ப்பாணம் போன்ற பகுதிகளுக்கும் ஓரளவு குடிநீரை வழங்க முடியும். அத்துடன் நிலத்தடி நீரும் நன்னீராக மாற்றப்படும். இத்திட்டம் மேற்கொள்ளப்பட்டால் இப்பகுதியானது பொருளாதார ரீதியில் மேலும் வளர்ச்சி பெறும். அதனூடாக தேசிய பொருளாதாரத்திற்கும் பாரிய பங்களிப்பைச் செய்ய முடியும். ஆகவே, -

- **இத்திட்டத்தை முன்னெடுக்கக்கூடிய சாத்தியப்பாடுகள் உண்டா?**
- **இல்லையெனில், அதற்கான காரணங்களையும் உண்டெனில், இத்திட்டத்தை ஆரம்பிக்கக்கூடிய காலகட்டம் குறித்தும் கூற முடியுமா?**

எனது இந்தக் கேள்விகளுக்கு கௌரவ அமைச்சர் விஜித் விஜயமுனி சொய்சா அவர்களிடமிருந்து பதிலை எதிர்பார்க்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Gamini Wijith Wijayamuni Zoysa, please.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම කල් ඉල්ලනවා. පසු අවස්ථාවක, හැකි ඉක්මනින් එයට පිළිතුරු ලබා දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හෙට පිළිතුරු දෙන්න අපහසුද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඊළඟ පාර්ලිමේන්තු සතියේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ඊළඟට අමාත්‍යාංශ නිවේදන - බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගත් රැඳවියන් නිදහස් කිරීම: බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டோரை விடுதலை செய்தல்: சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரினது கூற்று

RELEASE OF DETAINEES ARRESTED UNDER PREVENTION OF TERRORISM ACT: STATEMENT BY MINISTER OF PRISON REFORMS, REHABILITATION, RESETTLEMENT AND HINDU RELIGIOUS AFFAIRS

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)

(The Hon. D.M. Swaminathan - Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs)

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு டக்ளஸ் தேவானந்தா அவர்கள் நிலையியற் கட்டளை 23/2 இன்கீழ் 10.06.2016ஆம் திகதி எழுப்பிய வினாக்களுக்கான விடைகளை வழங்குகின்றேன்.

முதலாவது கேள்விக்குரிய விடை:

குறிப்பிட முடியும். குற்றஞ்சாட்டப்பட்டு சந்தேகத்தின்பேரில் சிறையிடப்பட்டுள்ள கைதிகளின் வழக்கு அலுவல்களைத் துரிதப்படுத்துவதற்கு தற்போது சட்டமா அதிபர் திணைக்களத்துடன் ஒருங்கிணைந்து அவசிய நடவடிக்கை மேற்கொள்ளப்படுகிறது. இது சம்பந்தமாக சட்ட மாஅதிபர் திணைக்களத்தினால் தனிவேறான அரச தரப்பு வழக்குரைஞர் ஒருவர் நியமிக்கப்பட்டுள்ளதுடன், அவருடன் சிறந்ததொரு தொடர்பைப் பேணி அவசியமான ஆவணங்களையும் அறிக்கைகளையும் துரிதமாகப் பெற்று, முறைப்படியான நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்றன.

இத்தருணத்தில் நான் கூறவிரும்புவது என்னவென்றால், நேற்று நான் சட்ட மாஅதிபரைச் சந்தித்தேன். அங்கு அமைச்சர்களான விஜயதாஸ ராஜபக்ஷ, அதுர பிரியதர்ஷன யாப்பா, றவுப் ஹகீம் ஆகியோர் இருந்தார்கள். நான் சட்ட மாஅதிபரிடம், சிறைச்சாலைகளில் PTA இன்கீழ் தடுத்துவைக்கப்பட்டிருக்கின்ற 90க்கும் மேற்பட்டோரின் வழக்குகளை விசாரணை செய்வதற்கு அவசியமான நடவடிக்கைகளை எடுக்கும்படி கேட்டுக்கொண்டேன். அதற்கு அவர் இணங்கியதோடு, செப்ரெம்பர் மாதம் 15ஆம் திகதிக்கு முதல் எங்களுக்கு அந்த அறிக்கையை கொடுக்கும்படியும் அதன் மூலமாக இன்று இருக்கும் சட்டத்தின்படி அவர்களது charge sheet இல் - குற்றச்சாட்டில் இயலக்கூடிய அளவு சலுகை செய்வதாகக் கூறினார். இச்சலுகை ஒருசிலருக்கு மாத்திரம்தான்.

சில மாதங்களுக்கு முன்பும் இப்படியான ஒரு தகவலை சட்ட மாஅதிபர் வழங்கியிருந்தார். ஆனால், அன்று அவர்களுடைய வழக்கறிஞர்கள் courtக்குச் சென்று அதை ஏற்றுக்கொள்ளவில்லை. ஆகையால், தயவுசெய்து இந்த முறையாவது வழக்கறிஞர்கள் இப்படிக் கூறாமல், சட்ட மாஅதிபர் அவர்களுடைய ஆலோசனைப்படி charge sheetஐக் குறைத்தால், அதனை ஏற்றுக்கொண்டு அதற்கு ஏற்றாற்போல் அவர்களுடைய வழக்கறிஞர்கள் நடவடிக்கைகளை எடுக்கவேண்டும் என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා

(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)

(The Hon. Douglas Devananda)

அவர்களைப் பொதுமன்னிப்பின் அடிப்படையில் விடுதலை செய்வதற்கு நடவடிக்கை எடுக்க முடியுமா?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා

(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)

(The Hon. D.M. Swaminathan)

ஐயா! அவர்களைப் பொதுமன்னிப்பின் அடிப்படையில் விடுதலை செய்வதாக இருந்தால், அதற்கு மேதகு ஜனாதிபதி அவர்கள்தான் நடவடிக்கை எடுக்கவேண்டும். இந்நடவடிக்கையை உடனடியாக எடுக்கமுடியாது. இன்னும் ஒருவருட காலத்துக்குள் அவர்களை வெளியேகொண்டு வரலாம். நாங்கள் அவர்களுடைய charge sheet ஐக் குறைத்து, அவர்களுக்கு rehabilitation என்று சொல்லப்படுகின்ற புனர்வாழ்வளிப்பை வழங்கலாம்.

இரண்டாவது கேள்விக்குரிய விடை:

இது சம்பந்தமாக மேதகு ஜனாதிபதி அவர்களால், இலங்கை அரசியலமைப்பின் உறுப்புரை 34(1) இன்கீழ் விடயங்களைக் கருத்திற்கொண்டு தீர்மானம் மேற்கொள்ள முடியும்.

மூன்றாவது கேள்விக்குரிய விடை:

பொதுமன்னிப்பு வழங்கும் அதிகாரம் மேதகு ஜனாதிபதி அவர்களுக்கு இருப்பதால், இலங்கையின் அரசியலமைப்பின் உறுப்புரை 34(1) இன்கீழ் அது தொடர்பாக நடவடிக்கை எடுப்பதற்கான ஆற்றல் மேதகையீருக்கே உள்ளது.

நான்காவது கேள்விக்குரிய விடை:

பொதுமன்னிப்பு வழங்கும் அதிகாரம் மேதகு ஜனாதிபதி அவர்களுக்கு இருப்பதால், இலங்கையின் அரசியலமைப்பின் உறுப்புரை 34(1) இன்கீழ் அது தொடர்பாக நடவடிக்கை எடுப்பதற்கான ஆற்றல் மேதகையீருக்கே உள்ளது.

எனினும், இப்படியானதொரு சூழ்நிலை இருக்கும்பொழுது, ஜனாதிபதியிடம் செல்லாமல், Attorney-General இன் ஆலோசனையைப் பெற்று, அதற்கு ஏற்றவிதத்திலே ஒரு வழிமுறையைக் கையாளுவதற்குத்தான் நான் ஏற்பாடு செய்திருக்கின்றேன். அது எப்படி நடைபெறும் என்பதை நான் உங்களுக்கு செப்ரெம்பர் மாதம் 15ஆம் திகதிக்கு முன்னர் அறிவிக்கின்றேன்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා

(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)

(The Hon. Douglas Devananda)

என்னுடைய கோரிக்கை என்னவென்றால், இது அரசியலோடு சம்பந்தப்பட்ட விடயம் என்றபடியால், அரசியல்

ரீதியாக அணுகுவது நல்லது. அடுத்து, கடந்த காலங்களில் இந்த நாட்டில் ஏற்பட்ட பல பிரச்சினைகளுடன் சம்பந்தப்பட்டவர்கள் மனிதநேயத்தோடு, பொது மன்னிப்பு அடிப்படையில் விடுதலை செய்யப்பட்டிருக்கின்றார்கள். அந்த வகையில் இதைக் கருத்திலெடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
நான் அதை ஏற்றுக்கொள்கின்றேன். நீங்கள் கூறுவது சரி. அதற்கு ஏற்றாற்போல் நீங்கள் ஒரு மனுவை சனாதிபதிக்குக் கொடுத்தால் நல்லது.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நன்றி.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ அமைச்சர் அவர்களே, உங்களிடம் ஒரு வேண்டுகோள்!

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
சரி, கேளுங்கள்!

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ அமைச்சர் அவர்களே, பயங்கரவாதத் தடைச்சட்டத்தின்கீழ் கைது செய்யப்பட்டிருக்கின்ற கைதிகளிலே 12 பேருக்குரிய வழக்குகள் தற்போது அனுராதபுரம் நீதிமன்றத்திலே நடைபெற்று வருகின்றன. அங்கு நடைபெறுகின்ற அந்த வழக்குகளை வவுனியா High Court க்கு மாற்றுவதற்கு உங்களுடைய முயற்சி தேவை. அந்த 12 பேருக்குமுரிய வழக்குகளை வவுனியா நீதிமன்றத்துக்கு மாற்ற வேண்டும் என்பதற்கான காரணம், இப்பொழுது அனுராதபுரம் சிறையிலே இருக்கின்ற அந்த அரசியல் கைதிகள் பண பலம் அற்றவர்கள். அதனால் அவர்களிடம் காசு பெறாமல்தான் சட்டத்தரணிகள் வாதிடுகின்றார்கள். ஆனபடியால் வவுனியாவில் இருக்கின்ற சட்டத்தரணிகள் அனுராதபுரத்தக்கு வந்து அவர்களுக்காக வாதாடுவதற்கு முயற்சி செய்வதில்லை. ஆகையால் அனுராதபுர நீதிமன்றத்தில் இருக்கின்ற அந்த 12 வழக்குகளையும் வவுனியா மேல் நீதிமன்றத்துக்கு மாற்றுமாறு கௌரவ அமைச்சராகிய உங்களிடம் நான் பணிவான வேண்டுகோள் ஒன்றை விடுக்கின்றேன்.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
அந்த வழக்குகளை இடம்மாற்றுவதற்கான உரிமை என்னிடம் இல்லை. கௌரவ விஜயதாச ராஜபக்ஷ அவர்களிடம்தான் அது சம்பந்தமாகக் கேட்க வேண்டும். நீங்கள் அது சம்பந்தமான ஒரு காகிதத்தை என்னிடம் கொடுத்தால் நான் அவரோடு கதைத்து அதனைச் செய்வேன்.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
இன்னொரு விடயம் பற்றியும் நான் குறிப்பிட்டிருந்தேன். அதாவது அனுராதபுரம் சிறைச்சாலையில் உள்ள ஓர் அரசியல் கைதி கடந்த மூன்று மாதங்களுக்கு முன்பு உண்ணாவிரதமிருந்தவர். இன்று அவரது மனநிலை முற்றிலும் பாதிக்கப்பட்டிருக்கின்றது. எனவே, அவரைச் சிறைக்கு வெளியிலே கொண்டு வந்து சிகிச்சை செய்வதற்கு உங்களால் உதவி செய்ய முடியுமா?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
செய்யலாம்! தயவுசெய்து அது சம்பந்தமாகவும் ஒரு காகிதத்தை என்னிடம் கொடுத்தால் உடனடியாக அதற்கான நடவடிக்கையை எடுப்பேன்.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
நான் உங்களுக்குக் கடிதம் அனுப்பினால் அதனைக் கவனமாகப் பார்க்கின்றீர்களா?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
நான் நன்றாகப் பார்க்கின்றேன் ஐயா! நீங்கள் அனுப்புகின்ற கடிதத்தைத்தான் மிகவும் நன்றாகப் பார்க்கின்றேன். *[இடையீடு]* நீங்கள் எனக்கு எப்போது காகிதம் அனுப்பினீர்கள்?

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
நான் எத்தனையோ கடிதங்கள் அனுப்பினேன். பதில் வரவில்லையே ஐயா!

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
காகிதங்கள் அனுப்பிய எல்லாருக்கும் பதில் வந்திருக்கின்றது. நன்றாகப் பார்க்கின்றேன். நன்றி.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Anyway, will you take action Hon. Minister?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
Yes, Sir.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2016 අගෝස්තු මස12 වැනි සිකුරාදා දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා.9.30 සිට අ.භා.12.30 දක්වා ද අ.භා. 1.30 සිට අ.භා 6.30 දක්වා ද විය යුතුය. පූ.භා.11.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතුය. අ.භා.6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතුය."

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා, 2016 අගෝස්තු මස 12 වැනි සිකුරාදා දින රැස්වීම් පැවැත්වෙන කාලවේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා හා අ.භා.1.30 සිට අ.භා. 6.30 දක්වා විය යුතුයි, පූ.භා.11.00ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතුයි කියලා. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අංක 7(5) යටතේ කියන්නේ, "ඒ අවස්ථාවේ සැලකිල්ලට භාජනවෙමින් පවතින යම් කටයුත්තක් පිළිබඳ වැඩ කටයුතු අත්හිටුවිය යුතුය" කියලා. පෙරවරු 11.00ට පාර්ලිමේන්තුවේ කටයුතු අත්හිටුවා, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) නමැති, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අභියෝගය කරන පනත් කෙටුම්පතක් සම්මත කර ගැනීමට සූදානම්වන නිසා, ඒ පිළිබඳව අපේ අදහස් දැක්වීමට කාලවේලාව දෙන්න කියා අපි ගරු ජනාධිපතිතුමාගෙනුත්, ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කළා.

පළමු දින පක්ෂ නායක සාකච්ඡාවේදී අපි තීරණය කළේ, තුන්වන සතියේ රැස්වීම් දිනවල මේ විවාදය ගන්නයි. ඊට පස්සේ, දැනට දවස් දෙකකට පෙර පැවැති පක්ෂ නායක රැස්වීමේදී යළිත් මම මේ පිළිබඳව ඉල්ලීමක් කළා. ඒ අවස්ථාවේදී ඒකාබද්ධ විපක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත්, සිකුරාදා දිනයේ මේ විවාදයට ගන්නවාට දැඩි සේ විරුද්ධ වුණා. ඒ අනුව බ්‍රහස්පතින්දා දිනයේ විවාද කොට, අගෝස්තු මාසයේ තුන්වන සතියේ දිනක ඡන්දය විමසීම සඳහා විවාදය කල් තැබීමට එකඟ වුණා. නමුත් ඊයේ හදිසියේ පක්ෂ නායක කමිටුවක් රැස්වී, පෙරේදා ගත් තීරණය ආපසු හරවා, අද දිනයේ පනත් කෙටුම්පත විවාදයට ගැනීමටත් හෙට දිනයේ පෙර වරු 11. 30 ට ඒ ගැන ඡන්ද විමසීමටත් ආණ්ඩුව තීරණය කළා. අපේ රණවිරුවන් දඩයම් කරන මේ භයානක, අනතුරුදායක පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට හෙට දිනයේ පෙර වරු 11.00ට විවාදය නවත්වන්න හදන බවයි පෙනී යන්නේ. ඒක තමයි දැන් ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා යෝජනා කළේ.

අපේ මන්ත්‍රීවරු රාශියක්, දේශපාලන පක්ෂ ගණනාවක්, රණවිරුවන්, ජනතාව අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් අදහස් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සිටින බව ඔබතුමා දන්නවා.

මම ඔබතුමාගෙන් සහ ආණ්ඩුවෙන් විශේෂ ඉල්ලීමක් කරන්නේ. මේ විධියට හැසිරෙන්න එපා.

දැන් බලන්න, ඊයේ අධීක්ෂණ කමිටුවේ සභාපති-

The Chairman of the Sectoral Oversight Committee on Economic Development, the Hon. Tilak Marapana presented its report, which has only two Amendments. We appreciate what he has done, though we do not agree. He has presented the report. That was presented yesterday. There were only two amendments in it. Now, the Government has come up with seventeen Amendments. This morning only they have been laid before us on the table.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Those are Committee Stage Amendments.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Yes, but you are not giving a Committee Stage. That is my argument. You are not giving a Committee Stage, by way of what you are trying to get approval now. Then, from the TNA, the Hon. M.A. Sumanthiran, who is a member of the Sectoral Oversight Committee, has just now presented a series of Amendments. Only now. Then, Janatha Vimukthi Peramuna has also presented some Amendments, just now.

ගරු කථානායකතුමනි, මේක බරපතළම පනත් කෙටුම්පතක්. එම නිසා ආණ්ඩුවත්, ඔබතුමාත් මෙය ඉදිරිපත් කිරීම පිළිබඳව ප්‍රතිපත්තිමය වශයෙන් අපි විරුද්ධයි. ඒ බව අපි සඳහන් කළා; පක්ෂ නායක රැස්වීමේදීත් සඳහන් කළා. හෙට දිනයේ පෙර වරු 11.00ට මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා දැන් කරන ඉල්ලීමට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු හැටියට අපට එකඟ වන්න බැහැ. මේක, මෙවැනි බරපතළ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ විවාද කිරීමේ අයිතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීමක්. මම පසුව ඔබතුමාට ඒ ගැන කරුණු කියන්න උත්සාහ දරනවා. නමුත් දැන් කරුණු ඉදිරිපත් කරන්නේ හෙට දිනයේ වෙලාව ගැනයි. අපි ඒකට එකඟ නැහැ. හෙට දවසම පාර්ලිමේන්තු රැස්වීම තිබෙද්දී ඔබතුමන්ලා හිතුවක්කාර ලෙස 11.00ට දොර වහන්න හදන්නේ ඇයි? මොනවාද හංගන්න තිබෙන්නේ 11.00ට දොර වහලා? මේ මන්ත්‍රීතුමන්ලාට හෙට දවස පුරාම පාර්ලිමේන්තුව රැස්වෙන්න පුළුවන්, ගරු කථානායකතුමනි. ඊට පස්සේ තුන්වැනි සතියේ රැස්වීම ගැන මම දැන් මොහොතකට කලින් විපක්ෂ නායකතුමාටත් කිව්වා. එතුමාත් අපේ ඉල්ලීමට සවන් දුන්නා. කරුණු කියන්න ඕනෑ නම් කරුණු කියන්න ඉඩ දෙන්න ඕනෑ කිව්වා. නමුත් ආණ්ඩුව මර්දනකාරී ලෙසයි කටයුතු කරන්නේ. අපේ අදහස් ඉදිරිපත් කිරීමට, සංශෝධන ඉදිරිපත් කිරීමට, අපේ කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ දීලා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පාර්ලිමේන්තුවට ගරු කරන්නේ නැත්තේ ඇයි?

ඒ නිසා ගරු කථානායකතුමනි, ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, දැන් හරි පක්ෂ නායක රැස්වීම කැඳවලා හෙට 11.00ට ඡන්දය විමසන්න කරන ඉල්ලීම වෙනස් කරන්න කියලා. විරුද්ධ පක්ෂයේ අප සියලු දෙනාම මේ පිළිබඳව කරුණු කියන්න බලාපොරොත්තු වෙනවා. විපක්ෂයේ පක්ෂ තුනම, ඒකාබද්ධ විපක්ෂය, TNA එක-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒකාබද්ධ විපක්ෂය කියලා එකක් නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා දන්නේ නැහැ කියන්නේ මොකක්ද කියලා. ඒකයි ප්‍රශ්නය. [බාධා කිරීම්] මම කියන්නේ ජනතා විමුක්ති පෙරමුණ, TNA එක සහ ඒකාබද්ධ විපක්ෂය කියන පක්ෂ තුනම විරුද්ධ පක්ෂය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන බවයි. ඒ සඳහා වෙලාව දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ මැයි මාසයේ 22වැනි දා. ඊට පස්සේ ඒක ගැසට් කළා මැයි මාසයේ 27වැනි දා. අවශ්‍ය තරම් කාලය තිබුණා. [බාධා කිරීම්] අනෙක - [*Interruption.*] Please, let me speak.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ අය අධිකරණයට යන්න බොහොම දක්ෂයි. නමුත් මේ පනත් කෙටුම්පතට විරුද්ධව අධිකරණයට ගියේත් නැහැ. If they have any reason to go before courts, they should have gone. අධිකරණයට ගියේත් නැහැ. ඔබතුමා දන්නවා අපි මේ පාර්ලිමේන්තුවේ වැඩ හිතුවක්කාර ලෙස සකස් කරන්නේ නැහැ කියලා. අපි ඒ ගැන පක්ෂ නායක රැස්වීමේදී සාකච්ඡා කරනවා. ඊයේ අපි සාකච්ඡා කරලා මේ ගැන එකඟතාවට ආවා. ඒත්, අද උදේ පාන්දර කුරහන් සාටකය අයින් කරලා කලු සාටකයක් දමා ගෙන ඉන්නේ මොකද කියලා මම දන්නේ නැහැ .

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මේ ආණ්ඩුව කලින් ආණ්ඩුව වාගේ නොවන බවයි. කලින් ආණ්ඩුව ජාත්‍යන්තරයක් එක්ක රණ්ඩු වෙලා, අවුරුදු තුනක් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ අපට විරුද්ධව යෝජනා සම්මත වුණා. [බාධා කිරීම්] හරි, හරි. පොඩ්ඩක් ඉන්න. අපේ යහ පාලන ආණ්ඩුවට ජාත්‍යන්තරයත් එක්ක ඉතාම හොඳ සම්බන්ධතාවක් තිබෙනවා. අපි ආඩම්බර වෙනවා ඒ ගැන. [බාධා කිරීම්] මේ ගොල්ලන්ට නැහැ. එම නිසා - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. මම කරුණු පැහැදිලි කළාට පසුව අවස්ථාව දෙන්නම්. මට කරුණු පැහැදිලි කරන්න ඕනෑ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
-මේ විවාදය කොහොමටවත් කල් දමන්න අපට බැහැ. අපි ඊයේ පක්ෂ නායක රැස්වීමේදී එකඟතාවකට ආවා. ඒ එකඟතාව අනුව කටයුතු කරමු කියලා මම ඉතාම ඕනෑකමින් මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම මේ අවස්ථාවේදී ගරු සභාව දැනුවත් කරන්න ඕනෑ. ඊයේත්, පෙරේදාත් අපි මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කළා. රජයේ ස්ථාවරය වුණේ, මෙය ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් වන නිසා කල් දමන්නේ නැතුව මේ සතියේම විවාද කිරීම අවශ්‍ය බවයි. අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මේ සඳහා කල් ඉල්ලුවා. නමුත් ගරු විපක්ෂ නායකතුමාත්, ජනතා විමුක්ති පෙරමුණත් එකඟ වුණා, හෙට පෙර වරු11.00ට ඡන්දය අරගෙන මේ විවාදය අවසන් කරන්න. ඒක තමයි අවසාන තත්ත්වය. [බාධා කිරීම්] ඊයේ තත්ත්වයයි මම මේ කියන්නේ. There was an agreement. එතැනදී ඒකාබද්ධ විපක්ෂය පමණයි විරුද්ධ වුණේ. විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන පක්ෂ දෙකක් ඊයේ මේ සඳහා එකඟ වුණා. ඒ අනුව තමයි මේ තීරණය ගත්තේ. එතකොට, එතැනින් එහාට රජය කියනවා නම් - [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි. ජිනීවා මානව හිමිකම් කොමිසමට ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශ කටයුතු අමාත්‍යවරයා එකඟ වුණු කාරණා අනුව තමයි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ. [බාධා කිරීම්]

ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)
මොනවාද, මේ කියන්නේ? මේක point of Order එකක්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, that is not a point of Order. So, that cannot be allowed.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කරුණාකරලා, මට මේක කියන්න දෙන්න. [බාධා කිරීම්]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order? - [*Interruption.*] No, that is not a point of Order.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කථා කරන්න අවස්ථාව දෙන්නම්. මොකක් ගැනද මේ පැහැදිලි කරන්නේ? දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා දැන් පැහැදිලි කරලා දුන්නා නේ. මේ ගැන දිගට වාද විවාද කරන්න අමාරුයි. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග ගැන මම පැහැදිලි කරන්නම්. මම කියන්නේ මේ පනත් කෙටුම්පත ඉතාම ජාතික වැදගත්කමකින් යුක්ත පනත් කෙටුම්පතක් කියලායි. [බාධා කිරීම්] මේක මේ රටේ හමුදාව බිල්ලට දෙන පනත් කෙටුම්පතක්. [බාධා කිරීම්] ජිනීවාවලදී ඇති වුණු එකඟතාවක්. [බාධා කිරීම්] ඩයස්පෝරාවට දීපු පොරොන්දුවක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ගැන වාද විවාද කරන්න නේ ඕනෑ. අපි ඒක කරමු. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
තුන්වන සතියේදී මේ පනත් කෙටුම්පත විවාදයට ගන්න දෙන්න. කරුණාකර ඒ අයිතිය දෙන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේලා ලෝකේ වටේ ගිහිල්ලා බටහිර රටවල සපත්තු ලෙවකාලා ඇවිල්ලා, රණවිරුවන් පාවා දෙන්න ගෙනාපු පනත් කෙටුම්පතක් මේක. ජේවීපී එක ඊයේ එකඟ වුණා නම්, ඒක සහගහන අපරාධයක්. ඒ ගොල්ලන්ගේ ජොබ් එක ඒක. ඒ නිසා කරුණාකරලා මේකට කල් දෙන්න. [බාධා කිරීම්]

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු කථානායකතුමනි, හැම එක් කෙනාම මේ ගැන කථා කරලා විවාද කරන්න දෙයක් නැහැ. ස්ථාවර නියෝගවලට අදාළව පමණක් කථා කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] මේ විධියට අපටත් අදහස් දක්වන්න පුළුවන්. [බාධා කිරීම්] අපටත් අදහස් දක්වන්න වෙලාව තිබෙනවා. එක්කෙනෙකුට විතරක් අදහස් දක්වන්න අවස්ථාව දෙන්නේ කොහොමද? ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මේ පිළිබඳව අදහස් ඉදිරිපත් කළා. [බාධා කිරීම්] එහා පැත්තෙන් එක්කෙනෙක් නැඟිටිනවා, කථා කරනවා. ආයෙත් තව එක්කෙනක් නැඟිටිනවා, කථා කරනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊයේ පක්ෂ නායකයන් ගත් තීරණය අනුව මට මෙතැනින් එහාට වෙනසක් කරන්න බැහැ. ඊයේ පක්ෂ නායකයන් බහුතරයක් එකඟ වෙලායි මේ තීරණය ගත්තේ. ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් එකඟ වෙලා ගත් තීරණය වෙනස් කරන්න මට දැන් අයිතියක් නැහැ. දැන් මේ පනත් කෙටුම්පත විවාදයට ගත යුතුයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද ඔබතුමාගේ point of Order එක? මොන ස්ථාවර නියෝගය යටතේද ඔබතුමා ප්‍රශ්නය අහන්නේ?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කියන්නේ, අපේ කාරක සභාවට-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ගත්තු තීරණය වෙනස් කරන්න බැහැ. පක්ෂ නායකයන් ගත්තු තීරණය වෙනස් කිරීමේ අයිතියක් මට නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම මේ කියන්න හදන්නේ වෙනත් කාරණයක් ගැනයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතිබහුතර මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් -මන්ත්‍රීවරුන් 175ක්- නියෝජනය කරමින් පක්ෂ නායකයන් මේ තීරණය ගත්තා.

මන්ත්‍රීවරුන් 50ක් නියෝජනය කරන ඒකාබද්ධ විපක්ෂය මෙයට විරුද්ධ වුණා. ඒ අනුව අද වෙනස් කිරීමක් කරන්න මට අමාරුයි. මොකද රජය මේ පනත් කෙටුම්පත ගෙන ඒම හදිසි කටයුත්තක් ලෙස සලකා තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මගේ මේ රීති ප්‍රශ්නය-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ඒක වෙනස් කරන්න අමාරුයි. ඒ තීරණය අපි පිළිගන්නවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මගේ රීති ප්‍රශ්නය මතු කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. මගේ රීති ප්‍රශ්නය මතු කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] මගේ රීති ප්‍රශ්නය මතු කරන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. [බාධා කිරීම්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, යෝජනා අංක 1 ඉදිරිපත් කරනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Aye! [ඝෝෂා කිරීම්]

[මේ අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙකු සභා ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට ඵූහ.]
[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷமெழுப்பினார்கள்]
[At this stage, some Members of the Opposition walked into the Well of the House and created an uproar.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර සභාව මැදට එන්න එපා. [ඝෝෂා කිරීම්] සභාව මැදට එන්න එපා. [ඝෝෂා කිරීම්] මම ඉල්ලීමක් කරනවා. බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, සභාව මැදට එන්න එපා. අපි තීරණයක් අරගෙනයි තිබෙන්නේ. කරුණාකරලා ආපසු යන්න. කරුණාකරලා තමන්ගේ ස්ථානයට ආපසු යන්න. [ඝෝෂා කිරීම්] මම තුන්වැනි වරටත් කියනවා, කරුණාකරලා තමන්ගේ ස්ථානයට ආපසු යන්න. [ඝෝෂා කිරීම්] ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, තමන්ගේ ස්ථානයට ආපසු යන්න. ඔබතුමා තමයි ඉස්සරහින් සිටින්නේ. ගිය සැරේත් මේක වුණා. මට මේ කටයුතු කරගෙන යන්න අවස්ථාව දෙන්න. තර්ජනයෙන් කරන්න බැහැ. මේක පාර්ලිමේන්තුව විධියට අපි කටයුතු කරමු. [ඝෝෂා කිරීම්]

මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා. පක්ෂ නායක රැස්වීමක් කැඳවා තීරණයක් ගන්නවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා.1.30ට නැවත පවත්වන ලදී.
அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.
Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා - පාර්ලිමේන්තුවේ ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move Item No. I

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I will have to read it.

ගරු කථානායකතුමනි, පහත සඳහන් නව යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ තීරණය අනුව, අද දින රැස්වීම පැවැත්වෙන කාලවේලාව අ.භා. 9.30 දක්වා විය යුතුය. අ.භා.9.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතුය. "

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
නැහැ, විරුද්ධයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඹී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේදී ඉතා පැහැදිලිව තීරණයකට පැමිණියා. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා යෝජනා අංක 1 හැටියට, හෙට දින පූ.භා. 11.30ට මේ විවාදය නැවැත්වීමට යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ ගැන විවාදය කරමින් සිටින අවස්ථාවේදී තමයි ඔබතුමා සභාව කල් තැබුවේ. දැන් ගරු සභානායකතුමා පැමිණ තවත් යෝජනාවක් ගේනවා. එහෙම යෝජනාවක් ගේන්න බැහැ. [බාධා කිරීමක්] මම කථා කර ඉවර වුණාට පසුව කැමති දෙයක් කියන්න. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙතුමාට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව දෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ස්ථාවර නියෝග යටතේ ආණ්ඩුවෙන් යෝජනා දෙකක් ගෙනැවිත් තිබෙනවා. පළමුවැනි යෝජනාව සභාව හමුවේ තිබෙනවා. ඒ යෝජනාව ආණ්ඩුව ඉල්ලා අස් කර ගන්නවාද, නැත්ද කියන කාරණය ආණ්ඩුවේ වගකීමක් මිස අපිට අයිති දෙයක් නොවෙයි. අපි ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින්නේ, සියලු බාධාවන් දැන් ඉවත් වී තිබෙන නිසා පූ.භා. 11.30ට විවාදය නැවැත්වීමට කළ තීරණය වෙනස් කරන ලෙසයි. එසේ නොවන්නේ නම්, අපි යළිත් පත් වෙන්නේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද දැඩි ලෙස උල්ලංඝනය කිරීමට හා මර්දනයටයි.

මා කියපු කථාවන් යළිත් කියන්නට උත්සාහ දරන්නේ නැහැ. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාට, ගරු විමල් වීරවංශ මැතිතුමාට කලින් රීති ප්‍රශ්න නැඟීමට තිබුණු අවස්ථාවට ඉඩ ලැබුණේ නැහැ. අපි මේ විවාදය කිරීමට හවුල් වෙනවා. නමුත් හවුල් වෙන්නේ අපේ අදහස් අනුවයි කියන එකයි අපි කිව්වේ. අපේ අදහස්වලට පාර්ලිමේන්තුවේ ඉඩක් ලැබෙන්නේ නැත්නම් සාධාරණ ක්‍රියාදාමයකට නොවෙයි, පාර්ලිමේන්තුව ගමන් කරන්නේ. හෙට දින පූ.භා. 11.30ට විවාදය අවසන් කරන්නට ඕනෑ; ඡන්දය විමසන්නට ඕනෑය කියන එක කිසි ලෙසකින් පිළිගන්නට බැහැ. හෙට අ.භා. 6.30 ට පාර්ලිමේන්තුව කල් තබනවා කියනවා. ගරු සභානායකතුමනි, මේ යෝජනාව කියවන්න. මේ යෝජනාව ඉදිරිපත් කළේ ආණ්ඩු පක්ෂයේ සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා. පාර්ලිමේන්තුව හෙට අ.භා. 6.30ට කල් තබන්න. ඒ යෝජනාවේ කියනවා, පූ.භා. 11.30ට විවාදය නවත්වා ඡන්දය විමසන්නය කියා. එහෙම කරන්න නොවෙයි අපි කියන්නේ. ඒක වැරදියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ තර්කයට පදනම් වුණේ අදහස් දක්වන්නට වෙලාව නැහැ කියන එකයි. අපි අද අ.භා. 6.30 කල් දමන්න තිබුණු පාර්ලිමේන්තුව අ.භා. 9.30 දක්වා දීර්ඝ කළා. [බාධා කිරීමක්] පොඩ්ඩක් අහගෙන ඉන්න. වෙලාව ඕනෑ නැද්ද? අද අ.භා. 6.30ට සභාව කල් තබන්නේ නැතිව අ.භා. 9.30 දක්වා විවාදය පවත්වනවා. පැය 3න්, පැය දෙකක් ඒගොල්ලන්ට දෙනවාය කිව්වා. [බාධා කිරීමක්]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු කථානායකතුමනි. ඊයේ සහ අද දවස් දෙක කලින් යොදා ගෙන තිබුණේ, එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ විවාද කරන්න. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම,පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත දෙවන වර කියවීම යොදා ගෙන තිබුණේ මේ මාසයේ තුන්වෙනි සතියේදීයි. පෙරේදා පැවැති පක්ෂ නායක රැස්වීමේදී ඉතා පැහැදිලිව අපි කිව්වා, "තුන්වෙනි සතියට යොදා ගෙන තිබෙන එක මේ සතියට ගේන්න එපා" කියා. අද හදිසියේ මේ පනත් කෙටුම්පත දෙවනවර කියවීමට ගෙන එන එකට ඇත්තටම අපි විරුද්ධ වුණා. නමුත් ආණ්ඩුව පැත්තෙන් දිගින් දිගටම කිව්වා, "ජාතික වැදගත්කමක් ඇති පනතක් සේ සලකා මේ පනත් කෙටුම්පත ඉක්මනට ගේන්නට ඕනෑ" කියා. ඒ අනුව තමයි ඊට පස්සේ අපි කිව්වේ, "අඩුම ගණනේ අද විවාද කර ඡන්ද විමසීමවත් වෙන දවසකට දාන්න" කියා. ඒ අනුව තමයි අවසානයේ තීරණය වුණේ, අද විවාද කරලා හෙට ඡන්ද විමසීමට යන්න. නමුත් අද පැවැති පක්ෂ නායක රැස්වීමේදී අපි පැහැදිලිව කිව්වේ, "ජනතා විමුක්ති පෙරමුණ හෙට දවසට ඉදිරිපත් කරන කල් තැබීමේ යෝජනාව පස්සට ගන්නට සූදානම්ය, මේ පනත් කෙටුම්පත සම්බන්ධ විවාදය අද සහ හෙට පවත්වා, හෙට අ.භා. 6.00 ඡන්ද විමසීමකට යන්න අපි සූදානම්ය" කියායි. මොකද, ආණ්ඩුව පැත්තෙන් ඒකට තිබෙන බාධා පිළිබඳව නැවත කරුණු ඉදිරිපත් වෙනවා.

ඇත්තටම ගරු කථානායකතුමනි, එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත ගේන්න තිබුණා නම් හදිසියේ කොහොමද අපි මේකත් කරන්නේ?

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව මේ ගරු සභාවේ සාකච්ඡා -විවාද- කරන්න අවස්ථාව නැති වුණු නිසා තමයි ආණ්ඩුව පැත්තෙන් මේ පනත් කෙටුම්පත හදිසියේ ගෙනාවේ. ඒ නිසා මේ පනත් කෙටුම්පත පිළිබඳව අදත් විවාද කරලා, හෙට හැන්දෑ වන තුරුත් විවාද කරලා, හෙට හවස ඡන්ද විමසීමට යන්න තවමත් අපිට ඉඩ තිබෙනවා. "ආසියානු නීතිඥ සංගමයේ රැස්වීමක් තිබෙනවා. ඒ පිළිබඳව ගැටලුවක් තිබෙනවා" කියලා ඔබතුමන්ලා කියනවා නම් අපේ කල් තැබීමේ යෝජනාව ඉවත් කරගෙන, හෙට හවස 3.00ට ඡන්ද විමසීමට යන්න අපි සූදානම්. මේ විවාදය අද රාත්‍රිය දක්වා කරගෙන යනවාට වඩා, නියමිත පරිදි අද දවසේ කාලය අරගෙන, හෙට හවස 3.00ට ඡන්දයට යාම සඳහා අපි සූදානම්. ඒ සම්බන්ධයෙන් කිසිදු විවාදයක් නැහැ. ඒක තමයි අපේ ස්ථාවරය වන්නේ. ඒ නිසා මම ඒ පැහැදිලි කිරීමත් මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ අවස්ථාවේදී මගේ යුතුකමක් තිබෙනවා, -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා මට කථා කරන්න අවස්ථාව දෙන්න. පසු ගිය දින තුනක් තිස්සේ අපි මේ ගැන සාකච්ඡා කළා. ඒ අනුව රජයේ ස්ථාවරය වුණේ මෙය ජාතික වැදගත්කමකින් යුතු පනත් කෙටුම්පතක් නිසා මේ සතියේ මෙහි වැඩ කටයුතු අවසාන කළ යුතුයි කියලායි. ඒ අනුව තමයි අවසානයේදී හෙට උදෑසන 11.30 වන තුරු එකඟ වුණේ. ඊයේ සහ අද මේ කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කරනකොට ඒකාබද්ධ විපක්ෂය හැර අනික් පක්ෂ සියල්ලම හෙට උදෑසන 11.30 වන තුරු කරන විධියට එකඟ වුණා. මේ ඉල්ලීම ජනතා විමුක්ති පෙරමුණ කළාට ඒකාබද්ධ විපක්ෂය හැර අනික් පක්ෂ සියල්ලම මීට එකඟවෙලා තිබෙනවා. නමුත් මම මේ කාරණය සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය දැනගන්න කැමැතියි. ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, පළමුවෙන්ම මම මේ කාරණය කියන්න කැමැතියි. අපි මේ සතියේත්, ඊළඟ රැස්වීම් සතියේදීත් විවාද කරන්න වැදගත් පනත් කෙටුම්පත් ඉදිරිපත් කරලා තිබුණා. එයින් එක් පනත් කෙටුම්පතක් තමයි, එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත. මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරද්දි ඒ සම්බන්ධව පාර්ශ්වයන් උසාවියට ගිහිල්ලා තිබුණා. උසාවියේ නිත්‍යනුව අනුව අපි ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කිරීමේ කටයුතු කල් දැම්මා. ඊළඟට, වැදගත් පනත් කෙටුම්පත හැටියට තිබුණේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පතයි. මේ පනත් කෙටුම්පත සම්බන්ධව කවුරුවත් උසාවියට ගිහිල්ලා තිබුණේ නැහැ. මේ පනත් කෙටුම්පතට උසාවියෙන් බාධාවක් නොතිබුණු නිසා මේ සතියේ විවාද කරන්න කටයුතු කළා. එතකොට තවත් වැදගත් පනතක් ගෙනෙන්න අපට පුළුවන්. මොකද, අපි නොවැම්බර් මාසයේ මුල් කාලය වනකොට අය වැය යෝජනාවට යන්න ඕනෑ. ඊට ඉස්සෙල්ලා තමයි අපිට එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කරන්න ටික වෙලාවක් හෝ තිබෙන්නේ. මේ අනුව අපේ කාල සටහන වෙනස් කරන්න අපිට සිදු වුණා. ඒ අනුව මේ ගරු සභාවේ සියලුම පිළිගත් පක්ෂ එකඟවෙලා තිබෙනවා, මේ පනත් කෙටුම්පත පිළිබඳව අදයි, හෙටයි විවාද කරන්න. ජනතා විමුක්ති පෙරමුණෙන් කියන්නේ හැන්දෑ වරුවේ ඡන්දය ගන්න කියලායි.

මූලික වශයෙන් පක්ෂ හතරම -මෙතැන ඉන්න පක්ෂ සියල්ලම - මේ පනත් කෙටුම්පත හෙට ගන්නා එකට එකඟයි. දැන් ඒ ගැන තවත් කෑ ගහන්න වුවමනා නැහැ නේ. ඕනෑ නම් වෙලාව ගැන බලා ගන්න. ඇත්ත වශයෙන්ම අපිට තිබෙන ප්‍රශ්නය මේකයි. LAWASIA Conference එකේ අග්‍රවිනිශ්චයකාරවරු ගණනාවක් ලංකාවට පැමිණිලා ඉන්නවා. මට ඒ සමුළුවට යන්න තිබෙනවා. ඒ සමුළුවේ වැඩ කටයුතු සඳහා අතිගරු ජනාධිපතිතුමාට, අධිකරණ ඇමතිතුමාට එතැනට යන්න සිදු වෙනවා. අද රාත්‍රී 11.00 වන තුරු විවාදය කරගෙන යන්න තීරණය කළත්, ඇත්ත වශයෙන්ම කාලය වෙනස් කර ගන්න ඕනෑ නම් අපිට ඒ ගැනත් ටිකක් කථා කරන්න පුළුවන්. එහෙනම් අපි හෙට හවස 2.00ට ඡන්දය අරගෙන, 4.00ට වැඩ කටයුතු අවසන් කරමු. ඒකට මට කමක් නැහැ. වෙලාව වෙනස් කරනවා නම් අපි පොඩ්ඩක් ඒ ගැන කථා කරමු. අපි හෙට හවස 2.00ට ඡන්දය පවත්වමු. නමුත් මිනිත්තු 15ක්, 20ක් ප්‍රමාද වේවි. අපිට LAWASIA Conference එකට යන්න තිබෙනවා. අපි ඒ අවස්ථාවේදී අවශ්‍ය නම් වෙලාව වෙනස් කර ගනිමු. මෙතැන සියලුම පක්ෂ ඊට එකඟ වෙලා තිබෙනවා නම් ඊට පස්සේ විරුද්ධත්වයක් ඇති වෙන්නේ කොහොමද? පක්ෂ හතරම මේ කාරණයට එකඟවෙලා තිබෙනවා. අපි දැන් දවස් දෙකක් විවාද කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. අද මුළු රාත්‍රියේම මේ සම්බන්ධයෙන් විවාද කරන්න පුළුවන්. අද රාත්‍රී 9.30 වනතුරු විවාද කරනවාද කියන කාරණයට අපි ඉස්සෙල්ලාම එකඟ වෙමු. [බාධා කිරීම්] ඒ කාරණයට එකඟ වුණාට පස්සේ අපට ඊළඟ කාරණය ගැන බලන්න පුළුවන්. මේ අවස්ථාවේ තිබෙන මූලික කාරණය තමයි, අද සහ හෙට මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කිරීම. අදයි, හෙටයි විවාද කරන එකට අපි ඔක්කොම එකඟයි. ඒ ගැන විරුද්ධත්වයක් නැහැනේ; ඒ ගැන විරුද්ධත්වයක් නැහැනේ. ඒ ගැන විරුද්ධත්වයක් නැහැ. අපි ඒ අනුව වැඩ කටයුතු කරමු. අද රාත්‍රී 9.30, 10.00 වන තුරු විවාද කිරීම සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි ඉස්සෙල්ලා ඒ යෝජනාව සම්මත කර ගනිමු. ඕනෑ නම් හෙට හවස 2.00ට ඡන්දය පවත්වමු. එතකොට හෙට හවස 4.00, 4.30 වනකොට අපිට ඒ වැඩ කටයුතු අවසන් කරන්න පුළුවන්නේ. ඊට පස්සේ අපි ඒ සමුළුවට යන්නම් කියන තීරණය මම මේ අවස්ථාවේදී ලබා දෙනවා.

මුස්ලිම් පල්ලි ගිය අයටත් ඡන්දයට සහභාගි වීමට පස් වරු 2.00ට එන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නොවෙයි. ඊට වඩා විය යුතු දෙයක් ගැන මම දන්නේ නැහැ. පක්ෂ නායකයන් ඔක්කෝම එකඟ වුණා නම්, අපි ඒ අනුව ක්‍රියා කරමු. එච්චරයි මම මෙතැන කියන්නේ. තවත් කාලය ඕනෑ නම් රෑ 12.00 වන කල් හෝ දෙන්න. රෑ 12.00 වන කල් කාලය දෙන්න. ඒකට කමක් නැහැ. [බාධා කිරීම්] ඔබතුමන්ලා ජීනීවා ගිහින් කියපු ඔක්කෝම කතා ටික කියන්න. ඒ කාලයේ කියපු ඒවා ඔක්කෝම කියන්න. සරත් ෆොන්සේකාට නඩු දැමූ හැටි කියන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන්, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මම-

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

Sir, I would like to mention that there is an Adjournment Motion standing in my name, which is due to be taken up at 6.30 p.m. this evening. But, at the Committee on Parliamentary Business, there was a suggestion that today's Debate goes on till much later in the evening, till 9.30 p.m. Consequently, I agreed to my Adjournment Motion being postponed for a date in a coming Sitting of Parliament. I was prepared to make that concession to enable this Debate to go on till 9.30 p.m though the matter that I have referred to in my Adjournment Motion is also a matter of some considerable importance. In regard to tomorrow, subject to the Government's convenience, I would suggest that we try to accommodate the Opposition as much as we can.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

We can ask the LAWASIA Conference to be delayed by about a half-an-hour and in the meantime, we can finish the vote. Actually, the Minister of Justice and I have to be there.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Prime Minister, will the vote be taken at 2 o' clock?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

We will take the vote at 2 o' clock.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

Because the Hon. Prime Minister is prepared to accommodate, Sir, in regard to even tomorrow, then I think, we should all agree and commence the Debate. -[*Interruption.*]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Do justice to the Opposition. -[*Interruption.*]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

Yes, I am doing justice to the Opposition. I am doing justice even to the media by trying to find out what happened to Ekneligoda. -[*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මෙම කෙටුම්පත සලකා බලනු ලැබූ කාරක සභාවේ සාමාජිකයෙක්, මම. මෙම කෙටුම්පත සලකා බැලූ කාරක සභාව ඔබතුමා වෙතත්, පාර්ලිමේන්තුවටත් වාර්තාවක් එවා තිබෙනවා. එය ඔබතුමා දන්නවා. ඒ වාර්තාවේ සංශෝධන තුනක් නිර්දේශ කර තිබෙනවා. අද උදේ ආ විට අපි දුටුවා, වගන්ති 17ක සංශෝධන මාලාවක් අප ඉදිරියේ තිබෙනවා කියා. මේ ගැන සාකච්ඡා කිරීමට අපේ කාරක සභාවට අවස්ථාවක් තිබුණේ නැහැ. මේවා කාරක සභාවේ සංශෝධන නොවෙයි. මේවා ආණ්ඩුවේ සංශෝධන. ආණ්ඩුවේ සංශෝධන කෙටුම්පතේ කොටසක්. එහෙම නම්, ඒ කෙටුම්පත සාකච්ඡා කරන අවස්ථාවේ ඒ සංශෝධන- අහම්බෙන් එන සංශෝධනයක්, දෙකක් නම් කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කරන්න ආණ්ඩුවට අයිතියක් තිබෙනවා. නමුත් සංශෝධන 17ක් මේ විධියට ඉදිරිපත් කළාම ඒවා අපේ කාරක සභාවේ සාකච්ඡාවට අවස්ථාවක් නොලැබුණු හෙයින් එය රීති ප්‍රශ්නයක් හැටියට මතු වෙනවා. මේ සංශෝධන 17 කාරක සභාවේ සාකච්ඡා වීමෙන් අනතුරුව මේ ගරු සභාවේ විවාදයට ගත යුතුය කියා මම කියනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, මේ කාරක සභාවේ යෝජනා අපි පිළිගෙන තිබෙනවා. ඒවා ඇතුළත් වෙලා තිබෙනවා. ඊට අමතරව පක්ෂ නායකයන් දුන් යෝජනා කීපයකුත් සාකච්ඡා කරලා ඒවාත් ඇතුළත් කර තිබෙනවා. කාරක සභාවට අමතරව අපට හැකියාව තිබෙන්න ඕනෑ, මේ සභාවේදී ඕනෑ නම් ඕනෑම වෙලාවක පක්ෂ නායකයන්ට එකතු වෙලා සංශෝධන ඉදිරිපත් කරන්න. මේ සංශෝධන ඇතුළත් කළා, පක්ෂ නායකයන්ගේ සංශෝධනත් ඇතුළත් කළා. තුන්වන එක වශයෙන් තිබෙන්නේ මොකක්ද? ගරු කථානායකතුමනි, සමහර සිංහල වචන ඇතුළත් වී නැහැ. That is an editing job. ඔබතුමාට අපි ඒක පෙන්වන්නම්, ගරු කථානායකතුමනි. මෙය ඇතුළු නොකළොත් edit කරන කොට අපට බලය දෙන්න පුළුවන්, මෙය ඇතුළත් කරන්න කියලා. එය කොටස් දෙකකට බෙදා, editing කරන්න තිබෙන සියල්ල අපි ඔබතුමාට දෙන්නම්, ගරු කථානායකතුමනි. ඔබතුමා ඒ ගැන දැනගෙන ඒක කොහොමද කරන්නේ කියා ඔබතුමා කියන්න. එය අපේ දෙයක් නොවෙයි. නීති කෙටුම්පතෙන්ම කියා තිබෙනවා, මෙහි පොඩි පොඩි දෝෂ කීපයක් තිබෙනවා කියා. එයට කියන්නේ ශුද්ධ කිරීමක් කියායි. ඒ ශුද්ධ කිරීම කළ යුතු ඒවා බලා ඔබතුමා ගන්න, ගරු කථානායකතුමනි. ඒවාට අමතරව තිබෙන

ඉතිරි ඒවා එක් එක් පක්ෂ නායකයන් දී තිබෙන ඒවායි. මෙතුමා කියන්නේ පක්ෂ නායකයන් දෙන ඒවා පිළිගන්න එපා කියලායි. [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ස්ථාවර නියෝග අනුව - [බාධා කිරීමක්] කාරක සභාවකට යොමු කරන්න ඕනෑ. [බාධා කිරීමක්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, එතුමා කිව්වා, පක්ෂ නායකයන් ඉදිරිපත් කළ කරුණු පිළිගන්න කියලා. ඒ වාගේම එතුමා පිළිගන්න ඕනෑ, පක්ෂ නායකයන් එකතු වුණාම, මේ වෙලාවට තමයි මේ ගැන වාද කරලා ඡන්ද ගන්නේ කියලාත්. අතැනදී පක්ෂ නායකයන් එපා කියලා මෙතැනදී- [බාධා කිරීමක්] පක්ෂ නායකයන් එකතු වෙලා ඉදිරිපත් කළ කරුණු ගැන අපි ඔබතුමන්ලා දැනුවත් කරන්නම්. තවත් කරුණු දෙකක් තිබෙනවා. ඒවා සකස් කිරීමේ කටයුතු අවසන් කළාම අපි ඒවා ලබා දෙන්නම්. පක්ෂ නායකයන්ගේ යෝජනා- [බාධා කිරීමක්] ඊට අමතරව ඔබතුමන්ලා දුන් යෝජනා තුනත් ඇතුළත් වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] ඊට අමතරව, මා සභානායකතුමාට වෙනම කියන්නම්, ශුද්ධ කිරීම් හැටියට කළ යුතු ඒවා වුවමනාද නැද්ද කියා බලන්න ඔබතුමාටම භාර දෙන්න කියලා. එච්චරයි කරන්න තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
Editing නොව, සංශෝධනයි තිබෙන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ඔබතුමා තීරණයක් දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
Editing නොවෙයි. Editing නම් තිබෙන්නේ, මගේ කථාව අයින් කරගන්නම්.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
කථාව අයින් කර ගන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, මේ අනුව අපි යෝජනා කරන්නේ මොකක්ද? තව යෝජනා දෙකක් ඉතිරි වෙලා තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
We will continue the Debate and the vote will be taken at 2 o' clock tomorrow.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
The vote will be taken at 2 o' clock tomorrow.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
හෙට සවස දෙකට ඡන්දය ගන්නවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හෙට සවස දෙකට ඡන්දය ගන්නවා.
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උறුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මහතා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මේ සභාවට ගෙන එන ලද සෑම පනත් කෙටුම්පතක් පිළිබඳවම අපි මේ විධියේ ඉල්ලීම් කරලා නැහැ. මේ ඉල්ලීම කරන්නේ මේ පනත් කෙටුම්පත මේ රට කෙරෙහි ඉතා තදින් බලපාන එකක් වන නිසායි. මේ තිබෙන හදිස්සිය මොකක්ද? හෙට දවල් එකොළහයි, සවස දෙකයි අතර ලොකු වෙනසක් නැහැ. අපි කියන්නේ මේ පනත් කෙටුම්පත පිළිබඳ විවාදය තුන්වෙනි සතියට දමන්න කියලා. ඡන්ද විමසීම ගන්න එක ඒ දවසකට දමන්න. ඒක කරන්නේ නැතිව තමුන්නාන්සේලාට ඒකාධිපති විධියකට මෙතැන කටයුතු ගෙන යන්න බැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
රජය දැන් මේ සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගත්තා. අද පැවැති පක්ෂ නායකයින්ගේ රැස්වීමේදී ගත් තීරණයට බහුතරයක් එකඟ වුණා. දැන් මෙතැනදි ඒ තීරණය වෙනස් කරන්න බැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, ඡන්දය ගැනීම පිළිබඳව බහුතරයක් එකඟ වුණා. No Member challenged it. The House has moved it and that is over now. [බාධා කිරීම්] දැන් වෙන ඕනෑ එකක් කරන්න. Hon. Mangala Samaraweera, you move the Bill.- [*Interruption.*] දැන් ඒ කථාව ඉවරයි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

[මේ අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට වූහ.]
[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் சபா மண்டபத்தின் மத்திக்கு வந்து கோஷமெழுப்பினார்கள்]
[At this stage, some Members of the Opposition walked into the Well of the House and created an uproar.]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් මෙතැනදි එකඟත්වයකට ආවා. [ඝෝෂා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
දැන් අපි එකඟත්වයකට ආවා. දැන් කථාව ඉවරයි. [ඝෝෂා කිරීම්] ඉවරයි, ඉවරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We have given you time till 2 o' clock tomorrow. මේ සම්බන්ධයෙන් විවාද කරන්න අද රාත්‍රී 9.30 වන තෙක් වෙලාව දීලා තිබෙනවා. රජයට මේක අවශ්‍යයි කියලා තියෙනවා නම්, දැන් මට එතැනින් එහාට මේක වෙනස් කරන්න අමාරුයි. [ඝෝෂා කිරීම්]

Hon. Leader of the House to move Item, [*Interruption.*]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පහත සඳහන් නව යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2016 අගෝස්තු මස 12 වැනි සිකුරාදා දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. හා. 9.30 සිට අ. හා. 12.30 දක්වා ද, අ. හා. 1.30 සිට අ. හා. 6.30 දක්වා ද විය යුතු ය. පූ. හා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය. අ. හා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2016 අගෝස්තු මස 12 වැනි සිකුරාදා පූ. හා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මංගල සමරවීර ඇමතිතුමා පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය ආරම්භ කරනවා ඇත. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මංගල සමරවීර ඇමතිතුමා. [ඝෝෂා කිරීම්]

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත

காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகம் (தாபித்தலும், நிருவகித்தலும், பணிகளை நிறைவேற்றுதலும்) சட்டமூலம்

OFFICE ON MISSING PERSONS (ESTABLISHMENT, ADMINISTRATION AND DISCHARGE OF FUNCTIONS) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 1.50]

ගරු මංගල සමරවීර මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Foreign Affairs)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, මෑත කාලයේදී අප විසින් ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් අතරින් ඉතාමත්ම ඓතිහාසික පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්නට අවස්ථාවක් ලැබීම ගැන මම ඉතාමත්ම සතුටු වනවා. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සම්බන්ධයෙන් අපි තීරණයක් දුන්නා. [ඝෝෂා කිරීම්] ගරු මන්ත්‍රීතුමන්ලාට දන්වා සිටිනවා, සෙංකෝලයට යම් දෙයක් කිරීමක් හෝ අනවශ්‍ය ලෙස හැසිරීමක් සිදු වුණොත් අපට ඊට

එරෙහිව ක්‍රියා මාර්ග ගන්න වන බව. ඒ නිසා එසේ නොකරන ලෙස මා ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. අති බහුතරයකගේ මතය අනුව -පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන්ගෙන් මන්ත්‍රීවරු 175කගේ එකඟත්වය ඇතුව- මේ තීරණය ගත්තේ. [ඝෝෂා කිරීම්] ඔබතුමන්ලාගේ පැත්තේ 50 දෙනෙකු සිටියත් 175කගේ මතය අනුව අපි තීරණය ගත්තේ. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ බහුතර මතය අනුව ක්‍රියා කිරීම. ඒ අනුව තමයි මම බහුතරයකගේ එකඟත්වයට ඉඩ දුන්නේ.

මංගල සමරවීර මැතිතුමා.[ඝෝෂා කිරීම්]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

Mr. Speaker, the Office on Missing Persons (Establishment, Administration and Discharge of Functions) Bill, which we will be debating today in this House, I believe, will herald, hopefully, a new beginning, a new era of peace and reconciliation for our long suffering country. - [*Uproar*.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභා ගර්භයේ මැද සිටින මන්ත්‍රීවරුන්ගෙන් මම නැවත වරක් ඉල්ලා සිටිනවා, තමන්ට නියමිත අසුන්වලට යන්න කියා.[ඝෝෂා කිරීම්] You have to go back to your seats. - [*Uproar*.]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

Sixty years after Independence or, to speak, two youth insurrections and a 26 year-old war later, Sri Lanka is now ready to commence the healing process of our wounded and fractured nation, coming to terms with the tragedies of our past so that we could harness the potential of our great nation and its people to pave the way for the future our country truly deserves. - [*Uproar*.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු බලපෑම්වලින්, තර්ජනය කිරීම්වලින් නවත්වන්න බැහැ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

The Prime Minister of Singapore Lee Kuan Yew wrote in his memoirs, "From Third World to First", I quote: - [*Uproar*.]

> "Ceylon was British model Commonwealth country. It had been carefully prepared for independence. After the War, it was a good middle-size country with fewer than 10 million people. It had a relatively good standard of education, with 2 universities of high quality,..." - [*Uproar*.]

ඇහෙන්න නම් අහ ගන්න. ගිහිල්ලා වාඩි වෙලා අහ ගන්නවා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

- [ඝෝෂා කිරීම්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කියන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

තමයි. [ඝෝෂා කිරීම්]

He further wrote, I quote:

> "... a civil service largely of locals, and experience in representative government starting with city council elections in the 1930s.
>
> When Ceylon gained independence in 1948, it was the classic model of gradual evolution to independence.
>
> Alas it did not work out. During my visits over the years, I watched a promising country go to waste.
>
> It is sad that the country whose ancient name Serendib has given the English language the word “Serendipity” is now the epitome of conflict, pain, sorrow and hopelessness.”

ගරු කථානායකතුමනි, - [ඝෝෂා කිරීම්] 1948 අපි නිදහස ලබා ගන්න කොට ලංකාව ආසියාවේ දියුණුම රටක් හැටියටයි තිබුණේ. [ඝෝෂා කිරීම්] නිදහස ලබා ගත්ත දවසේ එංගලන්තයේ "The Times" පුවත් පත මොකක්ද? [ඝෝෂා කිරීම්] ලංකාව කියන්නේ වැඩි කලක් නොගොස් ආසියාවේ වැඩියෙන්ම දියුණු වන රට කියලායි. [ඝෝෂා කිරීම්] ඒ වාගේ විශාල බලාපොරොත්තුවක් තිබුණා. [ඝෝෂා කිරීම්] නමුත්, නිදහස ලබා ගත්ත දවසේ ඉඳලා මේ රටේ අන්තවාදීන්, -මෙන්න මෙවැනි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

පිරිසක්- ඒ කාලයේත් බාධා කළා; පක්ෂ, ආගම්, ජාති වශයෙන් බෙදී වෙන් වුණා. ජාතිවාදය, අන්තවාදය මේ රටට හඳුන්වා දීපු මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

මුත්තාලා, සීයාලා නිසා මේ රටේ ඒ කලින් තිබුණු තත්ත්වය අහිමි වුණා. අද ඒ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

මුනුබුරන් යළි වතාවක් මේ රටේ සුළු ජනතාවගේ ලේවල පීනන්න හදනවා. [ඝෝෂා කිරීම්] මේ රටේ අම්මාලාගේ කඳුළුවල පීනන්න හදනවා. [ඝෝෂා කිරීම්] ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහ එක්සත්

[ගරු මංගල සමරවීර මහතා]

ජාතික පක්ෂයේ අපේ ආණ්ඩුව

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

අනාගතයේදී ඉඩ තියන්නේ නැත. [ඝෝෂා කිරීම්] බොහොම හොඳයි, බොහොම හොඳයි. සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට ශ්‍රී ලාංකිකයන් හැටියට, ශ්‍රී ලාංකීය ජාතියක් හැටියට ඉදිරියට යාමේ පළමුවැනි පියවර අද මෙන්න මේ පනත් කෙටුම්පතින් අපි තියනවායි කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි, ගරු කථානායකතුමනි. [ඝෝෂා කිරීම්] මා මුලින් කිව්වා වාගේ ඒ තරම් දියුණු වෙන්න පුළුවන් රටක්,- [ඝෝෂා කිරීම්] විශේෂයෙන් දේශපාලන අවස්ථාවාදීන් අතළොස්සකගේ, සිංහල අන්තවාදීන්ගේ, දෙමළ අන්තවාදීන්ගේ මේ සියල්ලන්ගේ තිබෙන අන්තවාදී ක්‍රියා නිසා අවසානයේදී අප බලාපොරොත්තු වුණු ඉලක්කයට යන්න බැරිව අද ආසියාවේ දුප්පත්ම රට බවට පත් වෙන්න තරම් අපි අවාසනාවන්ත වුණා. [ඝෝෂා කිරීම්] නමුත්, දැන් යළි වතාවක් ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වයෙන්, ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ නායකත්වයෙන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහ එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයෙන් මෙන්න මේ පනත් කෙටුම්පත අපි ඉදිරිපත් කරමින් ඉතිහාසය පුරා සිදු වූ ඒ වැරදි නිවැරදි කරන්න ඕනෑ. [ඝෝෂා කිරීම්] ඇතැම් අය කියනවා, මේක හමුදාවේ අය පාවා දීමක්ය කියලා. නමුත්, අපි ත්‍රිවිධ හමුදාවේ අය ආරක්ෂා කරගෙන, යළි වතාවක් ත්‍රිවිධ හමුදාවේ කීර්ති නාමය ගොඩ නංවන්නට, ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලාංකිකයන්ගේ කීර්ති නාමය ගොඩ නංවන්නට කටයුතු කරනවා. [ඝෝෂා කිරීම්]

මෙන්න මේ අදහස් අහගන්න බැරි මේ වාගේ අන්තවාදී පිරිස් එක්ක අපට යන්න බැරි වුණත්, මේ කියන කොන්දේසි එකින් එක -[ඝෝෂා කිරීම්] රට පාවා දෙනවායි කියන මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

තමයි- [ඝෝෂා කිරීම්] අවුරුදු 10ක් තිස්සේ මේ රටේ ධනය හොරකම් කරන කොට, සම්පත් කොල්ලකන කොට, රාජපක්ෂලා හමුදාවේ කොල්ලෝ ලවා සපත්තු ලේස් දා ගන්න කොට, බැසිල් රාජපක්ෂලා හමුදාව ලවා දාඩිය පිහිදා ගන්න කොට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කොහෙද හිටියේ කියලා මා අහන්න කැමැතියි. [ඝෝෂා කිරීම්]

දැන් අපි යළි වතාවක් හමුදාවට ජාත්‍යන්තරයට යන්න පුළුවන් විධියට, සාම සාධක හමුදාවලට ගිහිල්ලා ලක්ෂ ගණන් වියදම් කරන්න පුළුවන් විධියට අපි ඒ තත්ත්වය යථා තත්ත්වයට ගේනවා. [ඝෝෂා කිරීම්] ගරු කථානායකතුමනි, මට මෙන්න මේ කළු පටි බැඳගත්ත

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ටික දැක්කාම මතක් වෙන්නේ මොනවාදෝ කරලා කළු පටියක් දමාගත් ගිරවා ගැනයි. [ඝෝෂා කිරීම්] ඒ ගිරවාගේ කථාව ගැනයි මට මතක් වෙන්නේ. [ඝෝෂා කිරීම්] මොනවාදෝ කරලා කළු පටි බැඳපු ගිරව් වාගේ මෙන්න මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

පිරිසත් මට පේන්නේ. [ඝෝෂා කිරීම්] මෙතැන ඉන්න

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

දහදෙනෙක් මම එක ඇඟිල්ලෙන් පෙන්වන්නම්. [ඝෝෂා කිරීම්] මෙන්න

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

රංචුව. [ඝෝෂා කිරීම්] එකයි, දෙකයි, තුනයි, හතරයි, පහයි, හයයි, හතයි, අටයි, නවයයි, දහයයි. [ඝෝෂා කිරීම්] පසු ගිය කාලයේ මේ රටේ සම්පත් සොරකම් කරපු, මිනී මරපු, සුදු වැන්වලින් පැහැර ගනිපු, රත්රන් වේන් කඩපු, ඉඩම් සොරකම් කරපු අය

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කෑ ගහනවා. [ඝෝෂා කිරීම්] ගරු කථානායකතුමනි, මගේ කතාවේ ඉතිරි කොටස මම **සභාගත*** කරනවා. [ඝෝෂා කිරීම්] එසේ සභාගත කරන කථාවේ ඉතිරි කොටසම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියලා ඉල්ලා සිටිනවා. [ඝෝෂා කිරීම්] මෙම විවාදය ඉදිරියට ගිහිල්ලා අවශ්‍ය නම් ඡන්දය ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. [ඝෝෂා කිරීම්]

සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:
சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி:
Rest of the speech tabled:

Today, however, seven years after the end of the brutal war and the defeat and the demise of LTTE terror, Sri Lanka is now ready to win the peace and heal the scars of conflict, sorrow and pain: this Bill is the first step in healing our own nation and its people so that we could face the challenges of the future as a united nation; unity in diversity!

Hon. Speaker, this is a very special day for all of us in this House, irrespective of the political parties, the colours, symbols and the ideologies that we represent. Today is a day that seeks to unite as human beings, a day for each of us in this House to pause for a moment, reach deep within our hearts, speak to our conscience and demonstrate through action that we are guided by peace, compassion, empathy and brotherhood, noble principles, which the four main religions in our country - Buddhism, Hinduism, Christianity and Islam - teach us.

Hon. Speaker, as you know, there is no corner of this blessed and beloved country of ours that has not been drenched by the tears of mothers, fathers, sisters, brothers and children who have wept and continue to weep, not knowing where their loved ones are or what happened to them. They only know that they are missing. They do not know whether they are dead or alive.

Tears and pain have no ethnicity, no religion, no race, no caste: the tears of a mother or father in the South who cries not knowing what happened to their soldier son; the tears of a wife who cries not knowing what happened to her husband in the Police; the tears of a mother whose son was forcibly recruited to fight for the LTE; the pain of a mother whose child went missing during the Southern insurrection; the anguish of a child who still waits for his or her father to return after the end of the conflict; the tears of parents and loved ones waiting for those who were held as prisoners by the LTTE and who have still not returned. All their tears are the same. The grief they feel, their anguish, their pain is personal, but the same. Their suffering cannot be explained in words. Everyday, there are people in this country who go to sleep at night, praying that their loved ones will return. There are mothers who are paralyzed with grief; they are lost in time, unable to continue with their day-to-day lives, worrying whether their sons, wherever they may be, have enough food to eat, or whether they are being treated all right, wondering how much they may have grown, or how much they may have changed since they last saw them. These people torn between hope and despair are unable to live meaningful lives.

Hon. Speaker, when one sees a dead body, no matter how unbearable the pain of loss may be, there is closure, because there is knowledge that one's loved one is no more. But, how can one find closure, and how can one be expected to find closure when there is no knowledge of what has happened to someone?

Hon. Speaker, there is probably no district, and certainly no province in this country which has been untouched by the phenomena of someone going missing - either in the 1970s, the 80s, the 90s or later. In my electorate in Matara, there are mothers who still go from astrologer to astrologer trying to find out what happened to their children who went missing in the 80s and 90s, and some even as far back as the 70s. They still live in hope. There are mothers and sisters of soldiers who still shed tears urging us to at least find a bone fragment of their sons and brothers who went missing during the years of conflict, if they are to come to terms with what they have been told - that these soldiers are no more. Without that, they say they cannot come to terms that their loved ones are no more. They have only heard, they say, that a camp was overrun, but received no further details. They have received no evidence that their loved ones are dead. So, they wait and they wait forever, without carrying out the last rites, without giving alms to confer merit on the departed. Is this what the families of our soldiers deserve?

Hon. Speaker, as a responsible State, can we continue to ignore their tears and their pleas? Can we just say to them that we do not know what happened to their loved ones, and ask them to accept that they are dead? Can we expect them to take whatever few thousand rupees given to them as compensation and lead normal lives? Can we, as a responsible State, just tell them that all the people who are missing - and this includes soldiers, policemen, and other security forces personnel - have all probably gone overseas and are now leading new lives under new identities, and so, they are best forgotten? Can we, as a responsible State, say that no country in Asia or no country in NATO has established an Office to ascertain the fate of those who have gone missing and, therefore, we also should not make any attempt to find out what happened to the missing in our country, to provide answers to families or loved ones?

Hon. Speaker, these are our citizens: those who went missing are our citizens; those who grieve are also our citizens. Don't we, as a responsible State, have a duty to try to alleviate their agony, try to at least help them find an answer or try to help them find closure? If this is not the compassion that Gautama Buddha has taught us, then, what is it? It certainly cannot be the symbolic chanting of gathas or offering of flowers or building new statues and temples. We have to be able to reach out to our fellow citizens who are suffering; who have been suffering for years and years, and alleviate their pain. If the loved ones they seek are no more, we have to be able to help them find the truth; we have to help them to come to terms with the truth; we must assist them in their process of healing; we must help them continue with their lives in a meaningful way and be productive citizens of our country. How can we say that we are guardians of the noble teachings of the Budha, if we do not practise His teachings? Can we, as a compassionate nation, claim to shut out the grief of a large number of our mothers, our fathers, our brothers, our sisters, and our children, and be deaf and blind to their pain, their wailing, their silent agony, their psychological trauma and their tears?

Hon. Speaker, for long years, this nation has suffered the phenomena of our citizens going missing from all parts of our country. Today, we have before us a Bill to establish a Permanent Office on Missing persons. This is an opportunity for all of us, as elected Representatives, to show that we care about our citizens' grief and that we uphold their basic human right to know what happened to their loved ones. This is a humanitarian exercise. This is an opportunity for our nation to unite in our empathy towards our own citizens, an opportunity for us, as a nation, to set an example to the whole world that we care about our citizens and that we are a nation that is capable of compassion, even after two insurrections in the South and a prolonged conflict in the North. It is also an opportunity for us to make a pledge to our own citizens and future generations that, as a responsible State, we will take measures at all times to ensure that no citizen of our country, whether Sinhala, Tamil or Muslim, will have to go missing ever again. It is also an opportunity for us as Parliamentarians to lead by example so that our citizens will also take the responsibility to play their part in the process of healing and reconciliation so that at least the future generations in this country will be spared from the pain and anguish of their loved ones going missing.

As you are aware, Hon. Speaker, the LLRC as well as previous Commissions, have all recommended that a special mechanism must be established to address the issues pertaining to missing persons and deter future occurrences. Hon. Speaker, for some, this emotive and heart-wrenching issue is a mere numbers game. They argue and argue until they turn blue, and keep writing newspaper report after report stating that the number claimed by some agency or individual is wrong and the number indicated by some government entity is the correct one. They try to justify the numbers by saying such and such a number are overseas and start accusing countries for not sharing information. This is not the way to approach this issue. It is not a matter of numbers. It is a matter of individuals; it is a matter of human beings; it is a matter concerning our citizens and it is a matter of creating mechanisms that are credible, which enable people to share information, even by those countries in which some who are reported as missing may be leading new lives under new identities. I am sure there is duplication and errors in the various records maintained by various different entities. With the setting up of this Office by an Act of Parliament, we will finally have a credible mechanism that will be in a position to centralize data at national level, integrating all information with regard to missing persons currently being maintained by different agencies as recommended by the LLRC way back in 2011.

Hon. Speaker, questions are raised as to why we propose to establish an Office on Missing Persons by an Act of Parliament: we do so because in the past Commissions that have looked into missing persons have been ad hoc arrangements; they were constrained by time durations; they were dependent on extensions; their mandates were restricted by geography and timeframes. They faced funding constrains which made it difficult for them to get the best technical and forensic expertise to identify remains and find the kinds of answers that will help the families find closure or psychological and psychosocial support required. They did not have the necessary means to protect victims or witnesses. They did not have the necessary legal mandate or personality to seek assistance to trace the whereabouts of people from other institutions and from other countries.

This Office will be different. It will not be constrained by time. It will be open-ended with no start or end, date or restrictions based

[ගරු මංගල සමරවීර මහතා]

on geographic areas. Anyone from the South or the North or the East or West or the Centre of the country can take a complaint to this Office, and the Office will try to find answers. They will have the freedom to provide individual answers to the families who seek answers. Unlike previous Commissions, this Office will be answerable to this House and to the people of our country. This Office should be in a position to consolidate the lists existing elsewhere, including the data of the past Commissions, find people who may even be overseas, and provide accurate figures of how many may be actually missing. If a person who is alleged to be missing is found to be alive, then that person will most certainly be taken off the list of persons who are missing. This is clearly stated in Clause 13. The fact that a person has been found will be disclosed, it is only the location of the person found alive that may be withheld from the public, but that too, in limited circumstances. But, the provisions of the Bill do not prevent a court from requiring the Office to disclose the location of such a person.

The main functions of this Office outlined in Clause 10 of the Bill will be:

(i) searching and tracing of missing persons

(අතුරුදන් වූවන් පිළිබඳ සොයා බැලීම හා ඔවුන් පිළිබඳව ලේඛනගත කිරීම)

(ii) clarifying the circumstances in which such persons went missing and their fate-making recommendations to relevant authorities in order to reduce incident of missing and disappeared persons

(පුද්ගලයින් අතුරුදන්වීම පිළිබඳ පසුබිම සොයා බැලීම හා ඔවුනට සිදුවූ දේ පිළිබඳ වාර්තා කිරීම.)

(iii) making recommendations to relevant authorities in order to reduce incidents of missing and disappeared persons

(අතුරුදන්වීම් හා අතුරුදන් කිරීම් අවම කරගැනීම සඳහා බලධාරීන් වෙත යෝජනා ලබා දීම.)

(iv) identifying proper avenues of redress

(අතුරුදන්වීම්වලට ලක්වී ඇති අයගේ පවුල්වලට සහන ලබා දීමේ ක්‍රමවේදයක් හඳුනා ගැනීම.)

මෙම කාර්යාලය කිසි ආකාරයකින් නීතිමය හෝ අධිකරණමය වගකීම් සහිත ආයතනයක් නොවෙයි. මෙය සම්පූර්ණයෙන්ම සත්‍ය සොයා බැලීමේ පරීක්ෂණ ආයතනයක් පමණයි.

මෙම කාර්යාලය, දැනට පවතින අල්ලස් හා දූෂණ කොමිසම, මානව හිමිකම් කොමිසම වැනි සමාජයේ හඳුනාගත් ප්‍රශ්න පිළිබඳව ප්‍රතිචාර දක්වන තවත් ආයතනයක් ලෙසයි පිහිටුවනු ලබන්නේ.

(*) සමහරු චෝදනා නගන ආකාරයට මෙම කාර්යාලයේ සොයාගැනීම් කිසිසේත් අපරාධ හෝ සිවිල් නීති ක්‍රියාදාමයන්ට අදාළ කර ගන්නේ නැහැ.

(*) අනෙකුත් ස්වාධීන කොමිසම්වල මෙන්, මෙම කාර්යාලයටද සාමාජිකයන් පත් කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කවුන්සිලය මඟින්.

(*) අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන්, නිලධාරීන් හා කාර්ය මණ්ඩලය සලකනු ලබනුයේ, රජයේ සේවකයින් ලෙසයි.

(*) අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයින්ගේ වැටුප් පිළිබඳ තීරණය කරනු ලබන්නේ පාර්ලිමේන්තුව විසින් වන අතර, ඔවුන්ට ප්‍රතිපාදන ලබා දෙන්නේ ඒකාබද්ධ අරමුදලෙන්.

(*) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154වන ව්‍යවස්ථාව යටතේ පැවරෙන බලතල අනුව, මෙම කාර්යාලයේ විගණන කටයුතු විගණකාධිපති විසින් සිදු කරනු ලබනවා.

(*) මෙම කාර්යාලය විසින් වාර්ෂිකව පාර්ලිමේන්තුව වෙත වාර්තා සැපයිය යුතු අතර, එම වාර්තා මහජනතාවගේ දැනගැනීම සඳහා එළි දැක්විය යුතු වෙනවා.

සමහරු කියනවා, මේ පනත අනුමත කිරීමෙන් හමුදාව පාවා දෙනවා කියලා.

Ø හමුදාව පාවාදීමක් හෝ හමුදාවට කිසිම විධියකින් අනතුරක් මේ පනත මඟින් සිදුවෙන්නේ නැහැ. නමුත් හමුදාවේ, පොලීසියේ, නාවික හමුදාවේ, ගුවන් හමුදාවේ අතුරුදන්වූවන්ගේ දෙමව්පියන්ට, දූ දරුවන්ට මේ කාර්යාලය මඟින්, ඔවුන්ට සිදුවූයේ කුමක්ද කියා සොයා ගැනීමේ හැකියාව ලබාදී තිබෙනවා.

Ø අපේ වාර්තාවලට අනුව ආරක්ෂක අංශවල නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් 4,000කට අධික සංඛ්‍යාවක් අතුරුදන් වූ පුද්ගලයින් ලෙස වාර්තා වෙනවා. මොවුන්ට සිදුවූයේ කුමක්ද කියා සොයා බැලීමට අපට වගකීමක් තිබෙනවා.

Ø මෙම කාර්යාලයට දෙමළ, සිංහල, මුස්ලිම් භේදයක් නැහැ. ආගම්, කුල භේදයක් නැහැ. මේ රටේ හැමෝටම සාධාරණයක් ඉටු කරන්න හැකියාව තිබෙන, මීන් ඉදිරියට මෙවැනි අතුරුදහන් සිදු නොවීමට අවශ්‍ය කරන පණිවුඩය ජනතාවට ලබා දෙන කාර්යාලයක් ලෙස මෙය පිහිටුවීමයි අපේ අදහස.

මෙම කාර්යාලය දැනට පවතින අල්ලස් හා දූෂණ කොමිසම, මානව හිමිකම් කොමිසම වැනි සමාජයේ හඳුනා ගත් ප්‍රශ්න පිළිබඳව ප්‍රතිචාර දක්වන තවත් ආයතනයක් ලෙසයි පිහිටුවනු ලබන්නේ.

Ø මතභේදයන් පිළිබඳ විනිශ්චයන් ලබාදීම එයට සිදු කළ නොහැකියි.

Ø යෝජිත පනත් කෙටුම්පතේ දැක්වෙන පරිදි අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලය විසින් හෙළිදරව් කරන කරුණු, අපරාධ හෝ සිවිල් නඩු ගොනු කිරීමට හේතු සාධක වෙන්නේ නැහැ.

Ø ආයතනයේ මූලික කටයුත්ත වන්නේ යම් අතුරුදන් වූ පුද්ගලයෙකු මිය ගොස් ඇත්ද? නැතිනම් ජීවතුන් අතර ඇත්ද? යන්න සොයා බලා, මිය ගොස් ඇත්නම් එය කවදා, කුමන ස්ථානයකදී කෙසේ සිදුවී ඇත්දැයි සොයා බැලීමයි.

Ø මානව හිමිකම් කොමිසම, පාර්ලිමේන්තුවේ පෙත්සම් කාරක සභාව වැනි ආයතනයන්ට දැනටමත් ඇති බලතල හා නීතිමය වරප්‍රසාදයන් මෙම අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලය වෙත ලබාදීමට යෝජනා කරලා තිබෙනවා.

Ø එසේම සහයෝගය ලබා නොදීම හා නිග්‍රහශීලී ලෙස ක්‍රියා කිරීම වෙනුවෙන් යම් යම් ක්‍රියාමාර්ග ගැනීම අනික් ආයතනවලටත් පොදුයි. උදාහරණයක් වශයෙන් පාර්ලිමේන්තු පෙත්සම් පිළිබඳ කාරක සභාවේ බලතල අනුව ඕනෑම පුද්ගලයෙකු එය ඉදිරියට ගෙන ඒමට, ඕනෑම පුවත් පතක්, පොතක් හෝ වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කිරීමට, ඉල්ලා සිටීමට, හා දේපළවලට ඇතුළුවීමට අවසර තිබෙනවා. මෙම බලතලවලට අතිරේකව, මෙම මානව හිමිකම් කොමිෂන් සභාවට, ඕනෑම අවස්ථාවකදී, ඕනෑම රැඳවුම් ස්ථානයකට, පොලිස් ස්ථානයකට, බන්ධනාගාරයකට හෝ අධිකරණ නියෝගයක් මත හෝ වෙනත් ආකාරයකින් යම් පුද්ගලයෙකු රඳවා ගෙන ඇති වෙනත් ඕනෑම ස්ථානයකට ඇතුළුවීමට ද, අවශ්‍ය වෙතොත් එහි රඳවාගෙන ඇති පුද්ගලයන්ගේ රඳවා ගැනීමේ තත්ත්වයන් පිළිබඳව නිශ්චිත වශයෙන් දැන ගැනීමට ද එහි පරීක්ෂණ කටයුතු සිදු කිරීමට හෝ එහිදී හමුවන ඕනෑම පුද්ගලයෙකුගෙන් ප්‍රශ්න කිරීමට ද බලය ලබාදී තිබෙනවා.

Ø මේ ආකාරයටම, අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයට රඳවා ගැනීමේ ස්ථාන වෙත ඇතුළුවීමට අවසර තිබෙනවා. මහෙස්ත්‍රාත් උසාවියකින් ලත් අවසර මත පොලීසියට හෝ අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයට අදාළ පරීක්ෂණ සඳහා සම්බන්ධ යැයි සැක කෙරෙන පරිශ්‍රයක් වෙත ඇතුළුවීමට අවසර තිබෙනවා.

අපිට චෝදනා නහනවා, පනත් කෙටුම්පතට අනුව, අතුරුදන්වූවන්ගේ කාර්යාලයේ සාමාජිකයින් හත්දෙනාට විමර්ශන පැවැත්වීම පිළිබඳ අත් දැකීම් මෙන්ම මානව අයිතීන් නීතිය හා ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳව දැනුමක් ද තිබිය යුතු බව කියවෙන නිසා, එහි සාමාජිකයින් විමට සුදුසුකම් ලබන්නේ බටහිර මුදල්වලින් නඩත්තු වන රාජ්‍ය නොවන සංවිධානවල සාමාජිකයින් සහ බටහිර අනුග්‍රහය යටතේ පවත්වා ගෙන යන ජාත්‍යන්තර යුද අපරාධ අධිකරණවල සේවය කළ අයට පමණයි කියලා.

Ø ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කවුන්සිලය මඟින් පත් කරනු ලබන අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයින්, මානව හිමිකම් පිළිබඳ පළපුරුදු අත් දැකීම් සහිත අය විය යුතුයි. නමුත් මෙවැනි චෝදනා ජනතාව බියගන්වන්න කරන චෝදනා විතරයි.

Ø යෝජිත කෙටුම්පත පැහැදිලිව සකස් කර නිබෙන්නේ අනවශ්‍ය පුද්ගලයින්ට ඇතුළත්වීමට බැරි ආකාරයටයි. පනත් කෙටුම්පතට අනුව අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයෙකු පත්

කරන්නේ කථානායකවරයාගේ කැමැත්ත අනුව, අගමැති විසින් කරන නිර්දේශයක් මත, ජනාධිපතිවරයාගේ අනුමැතිය යටතේයි.

Ø එහිදී පුද්ගලික න්‍යාය පත්‍රයක් සහිත මධ්‍යස්ථ නොවන පුද්ගලයින් පත්වීමට ඉඩ ප්‍රස්තා නැහැ.

Ø එවැනි අයෙකු පත්වුවත්, ඉවත් කිරීමට ජනාධිපතිවරයාට බලය තිබෙනවා. සුදුසුකම් ලත්, ගැළපෙන පුද්ගලයින් පමණක් පත් කිරීමට අවශ්‍ය කරන නීතිමය පියවර මෙම පනත් කෙටුම්පතේ අඩංගුයි.

පනත් කෙටුම්පතේ 21වන වගන්තියට අනුව ඕනෑම විදේශීය පුද්ගලයෙකුගෙන් හෝ ආයතනයකින් සෘජුවම අරමුදල් ලබා ගැනීමට අතුරුදන්වූවන්ගේ කාර්යාලයට බලය පැවරෙන නිසා, මේ සම්බන්ධව නොයෙකුත් කට කථා පතුරුවමින් ජනතාව සහ රණවිරුවන් බියගැන්වීමට උත්සාහ කරනවා.

Ø යෝජිත පනතට අනුව "රජය විසින් අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලය වෙත තම කටයුතු පනතට අනුව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන ප්‍රමාණවත් අරමුදල් රජය විසින් ලබා දිය යුතු වෙනවා. එම අරමුදල් රජයේ ඒකාබද්ධ අරමුදලින් ලබා දිය යුතුයි."

Ø ඉතා අපරික්ෂාකාරී ලෙස සිදු කළ ආර්ථික කළමනාකරණයන්, ඉහිර කර ඇති ණය කන්දරාවත් නිසා මේ අපේ දුකින් තැවෙන අම්මලාට, තාත්තලාට අවශ්‍ය කරන සහන ලබාදීමටත්, සත්‍ය සොයාදීමටත්, මානසික සහන ලබාදීමටත්, අවශ්‍ය කරන වෛද්‍ය ආධාර ලබාදීමටත්, රජයට තනිවම දරා ගත හැකි මූල්‍ය පහසුකම් නැති වෙන්න පුළුවන්. එසේ අවශ්‍ය මූල්‍ය ශක්තිය නැහැ කියලා, ඒක නිදහසට කාරණාවක් කරගෙන අපේ ජනතාවට අවශ්‍ය ආධාර, පහසුකම් ලබා නොදී අපේ වගකීම් පැහැර හරින්න අපි ලැහැස්ති නැහැ.

Ø එම නිසා අනෙකුත් රාජ්‍ය ආයතන සිදු කරන පරිදි. අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයට ද විදේශීය තාක්ෂණය හා අරමුදල් ලබා ගැනීමට සිදුවනවා.

Ø ලැබෙන සියලු අරමුදල් විනිවිදභාවයකින් යුතුව පරිහරණය කිරීමට අදාළ රෙගුලාසි මෙහි අඩංගුයි. අරමුදල් පරිහරණය සම්පූර්ණයෙන්ම විගණකාධිපතිවරයා විසින් විගණනයට ලක් කරනු ලැබෙනවා.

ආයතනයේ රාජකාරී කටයුතු සම්බන්ධයෙන් අතුරුදන්වූවන්ගේ කාර්යාලයට ඕනෑම විදේශීය පුද්ගලයෙකු හෝ සංවිධානයක් සමඟ ගිවිසුම්වලට එළඹීමට හැකියාව ලබාදීම ගැන චෝදනා නඟනවා.

Ø විදේශීය පාර්ශ්ව සමඟ ගිවිසුම්වලට එළඹීමට සංස්ථාපිත ආයතනවලට හැකියාව තිබෙන නමුත්, මෙම සියලුම ගිවිසුම් ශ්‍රී ලාංකික නීතියට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් වෙනවා.

Ø අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයට ශ්‍රී ලංකාවෙන් ලබා ගත නොහැකි විශේෂඥ දැනුම හා තාක්ෂණය, විදේශ රටවලින් ලබා ගැනීමට අවශ්‍ය කරන බව පැහැදිලියි. මීට පෙර පැවති ආණ්ඩුව ඇතුළු ඊට කලින් පැවති ආණ්ඩු, විදේශීය විමර්ශකයන් හා ස්කොට්ලන්ත අධිකරණ විශේෂඥයින් ද (Scotland Yard), ඩෙස්මන්ඩ් ද සිල්වා (Desmond de Silva), ජෙෆ්රි නයිස් (Geoffrey Nice) හා ඩේවිඩ් ක්‍රේන් (David Crane) වැනි නීති විශාරදයින් ද විනිසුරු P.N. Bhagwati, Darusman ඇතුළු විදේශ රටවලින් යෝජනා කරන ලද විදේශිකයින්ගෙන් යුත් ජාත්‍යන්තර ස්වාධීන අද්විතීයයන් කණ්ඩායමක් (IIGEP: International Independent Group of Eminent Persons) පත් කළා.

Ø අපි යෝජනා කරන මෙම කාර්යාලයට සම්පූර්ණ පත් කිරීම් කරනු ලබන්නේ අප විසින් පමණයි. ඒ වාගේම විදේශයෙන් ලබා ගන්නවා නම් ලබා ගන්නේ තාක්ෂණික සහාය පමණයි.

Ø මෙතැනදී මා අහන්න කැමැතියි, ලොව පවතින විශිෂ්ටතම දැනුම, තාක්ෂණය ලබා නොගැනීමෙන් පාඩු වන්නේ අපගේම ජනතාවට නොවෙයිද කියලා.

Ø විදේශීය තාක්ෂණික සහාය ලබා ගැනීමෙන් දීර්ඝ කාලීන වශයෙන් ප්‍රතිලාභ ලබන්නේ අපේම දේශීය ආයතනයි. අපේ දේශීය දැනුම අපට දියුණු කර ගැනීමට අපට ලැබෙන සුවිශේෂ අවස්ථාවක් හැටියට මෙය හඳුන්වන්න පුළුවන්. වැඩිකල් නොගොස් ලෝකයේ වෙන රටවල්වලට අපේ ලාංකිකයන්ගේ අත් දැකීම් සුවිශේෂ හැකියාවන් මේ ක්ෂේත්‍රවල ලබාදීමටත් අපට හැකියාව ලැබෙන බව අනිවාර්යයි.

Ø ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයේ සංයුතිය සැලකීමේදී ශ්‍රී ලාංකික සමාජයේ බහුවිධ ස්වභාවය නියෝජනය වන බව තහවුරු කිරීමට පනත මඟින් බැඳී සිටිනවා. එසේ හෙයින් අවශ්‍ය පරිදි හා අවශ්‍ය අවස්ථාවලදී දේශීය විශේෂඥයින්ගේ සේවය ලබා ගැනීමේ හැකියාව සහිත, ඒ වාගේම අවශ්‍ය කරන විදේශීය තාක්ෂණික සහාය ලබා ගත හැකි ශ්‍රී ලාංකික ක්‍රමවේදයක් හඳුන්වාදීම පනත් කෙටුම්පතෙහි අරමුණ වන බව මම පැහැදිලිව කියා සිටීමට කැමැතියි.

මෙම කාර්යාලයට අතුරුදන්වූවන්ගේ ඥාතීන්ගෙන් හා මිතුරන්ගෙන් මෙන්ම වෙනත් ඕනෑම දේශීය හෝ විදේශීය පුද්ගලයෙකුගෙන් හෝ සංවිධානයකින් වුවද පැමිණිලි බාරගත හැකි බව සමහරු විවේචනයට ලක් කරනවා.

Ø ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකු අතුරුදන්වීම ශෝචනීය සිදුවීමක්.

Ø එවැනි අතුරුදන් වූ පුද්ගලයින් සම්බන්ධයෙන් විමර්ශනය කර ඔවුන්ට අත්වූ ඉරණම පිළිබඳ සොයා බැලීම රජයේ වැදගත් වගකීමක්.

Ø අපගේ ජනතාවගේ ආරක්ෂාව හා සුභසිද්ධිය සඳහා අප සියල්ලන් වෙත වගකීමක් පැවරී තිබෙනවා.

Ø රජයේ මූලික වගකීම වන්නේ එයයි. රටේ පුරවැසියන් අතුරුදන් වන්නේ නම් අප විසින් ඔවුන් සොයා ගත යුතුයි. එසේ සොයා ගත නොහැකි නම්, ඔවුන්ට සිදු වූයේ කුමක්දැයි යන්න සොයා බැලිය යුතුයි.

Ø සමහරු චෝදනා නඟන පරිදි මේ අතුරුදන්වූවන් පිට රට සැඟවිලා ඉන්නවා නම්, මේක ඉතාමත් බරපතළ ප්‍රශ්නයක්. මේ පිළිබඳව අපි පත්තරවලට ලියමින්, වෙන රටවල්වලට චෝදනා නඟමින් සිටින්නේ නැතිව, යම්කිසි ක්‍රියා මාර්ග ගත යුතුයි.

Ø එම නිසා ලාංකික පුරවැසියෙකුගේ අතුරුදන්වීමකට අදාළ ඕනෑම කරුණක් හෝ ඔවුන්ට සිදු වූයේ කුමක්ද යන්න සොයා බැලීමට උපකාරී විය හැකි ඕනෑම තොරතුරක් ලබා දෙන්නේ නම්, ඒවා අපි පිළිගැනීමට ලැහැස්තියි.

ත්‍රිවිධ හමුදා හා බුද්ධි අංශ ඇතුළු සියලුම ආණ්ඩුවේ ආයතන මෙකී අතුරුදන්වූවන්ගේ කාර්යාලයට සම්පූර්ණ සහයෝගය ලබාදීමට බැඳී සිටින බව සහ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතට **(RTI)** මෙය පටහැනි බව කියා සිටින අයට මට කියන්න තිබෙන්නේ මෙයයි.

Ø අල්ලස් කොමිසම, මානව හිමිකම් කොමිෂන් සභාව, ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව, පාර්ලිමේන්තු කමිටු හා වෙනත් බොහෝ ආයතනවලට අදාළව ද මෙයාකාරයෙන් විධිවිධාන හා බලතල පවතිනවා.

Ø එය අලුත් හෝ අසාමාන්‍ය දෙයක් නොවෙයි.

Ø අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලය වෙත පවරා ඇත්තේ සිය වගකීම් ඉටු කිරීම සඳහා ඊට අවශ්‍ය වන බලතල පමණයි.

Ø ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(අ) ව්‍යවස්ථාවට පරිදි රහස්‍යභාවයෙන් දැනුම් දුන් තොරතුරුවලට, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ විධිවිධාන අදාළ වෙන්නේ නැහැ. නමුත් විශ්වාසනීයභාවයෙන් යුතුව සන්නිවේදනය කරන තොරතුරු හැර, අනෙකුත් තොරතුරු ද සියල්ලම තොරතුරු දැනගැනීමේ පනතට යටත් වෙනවා.

අතුරුදන්වූවන්ගේ කාර්යාලය පිළිබඳ පනත් කෙටුම්පතේ 12(ඇ) (III) වගන්තියට අනුව සාක්ෂි ආඥාපනතේ නියමයන් නොසලකා හරිමින් ද ඕනෑම ප්‍රකාශයක් හෝ භාණ්ඩයක් "සාක්ෂි" ලෙසට පිළිගැනීමට මෙම කාර්යාලයට බලය පැවරෙන්නේ ඇයි?

Ø සාක්ෂි ආඥාපනතේ අරමුණ වෙන්නේ අධිකරණ කටයුතුවලදී නීතිය හැසිරවීමයි.

Ø අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලය අධිකරණ ව්‍යුහයක් නොවෙයි.

Ø එමඟින් සිවිල් හෝ සාපරාධී ක්‍රියා සම්බන්ධයෙන් මත ප්‍රකාශ කිරීමක් අපේක්ෂා කරන්නේ නැහැ.

Ø එමඟින් අපේක්ෂා කරන කාර්යය තමයි අතුරුදන්වූ පුද්ගලයින් සොයා ගැනීම හෝ හඳුනා ගැනීම, එසේත් නැතහොත් ඔවුන් මිය ගොස් ඇත්නම් ඒ පිළිබඳ කරුණු අනාවරණය කරගැනීම.

Ø අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයේ කාර්ය භාරය සත්‍ය සෙවීමයි. මේ කාර්යයට අවශ්‍ය තරම් සපයා ගත හැකි තොරතුරු එය සතු විය යුතුයි.

Ø නමුත් විනිශ්චය කිරීම හා දඬුවම් නියම කිරීම ආදී කටයුතු සිදු කරන උසාවිවල ක්‍රියා පටිපාටිය මෙන් එහි වැඩ පිළිවෙළ භාරදුර නොවිය යුතුයි.

[ගරු මංගල සමරවීර මහතා]

I have seen some people who are slaves to causing hatred and division and driving fear into people's minds as a tactic to gain votes, stating that the legislation of this Office has not been drafted by Sri Lankans but by foreigners. They say that this Office has been imposed on us. Hon. Speaker, this is an insult to the intelligence and competence of our officials. It is equally an insult to the long-suffering people all over this country who bear the pain of their loved ones having gone missing. It is indeed the best legal minds that we have in this country and dedicated, competent and compassionate individuals of this country, who feel for the pain of their fellow citizens, and who yearn to find solutions to their problems, who studied the positives and negatives of the previous Commissions that we have had, that came up with this piece of legislation which is best suited to find solutions and forms of relief for the citizens of this country.

This has been designed for our local needs, using local expertise. Nothing will ever be imposed on us by any foreign entity, if we find solutions to our own problems. It is when we fail to find solutions to our own problems, and when we fail to provide redress that the problems of our citizens become the problems of others, and others are then compelled to seek to try to force us to find solutions. But yes, there will be many who will be willing to help us, if we are honest about what we set out to achieve. What we are trying to deal with today is a very human problem, one of basic humanity and compassion, helping someone to find the whereabouts of their loved ones. But, some see conspiracies behind the noblest of human deeds, which indeed is sad.

There are other countries in this world that have set up institutions of this nature to trace the whereabouts of their missing. Such countries include South Africa, Chile, Argentina, Bolivia, Uruguay, El Salvador, Peru, Ghana, Guatemala, Uganda and Timor L'este (East Timor).

This Office will be a responsible institution reporting to this House. The allegations levelled that it will accept reams and reams of false evidence manufactured overseas, against our soldiers, have absolutely no basis. Hon. Speaker, this will be an Office that will be accountable and answerable to this House, and it will conduct itself with the utmost care in evaluating the information and evidence it receives. There is absolutely no space for false evidence being accepted or admitted as claimed by certain fear-mongers.

Information in the possession of this Office will not, under any circumstances, be sent overseas or shared with any foreign organization or entity. This organization is only answerable and accountable to Sri Lankan processes - this House, the legal entities of this country and the public of this country. Where appropriate, the Office will determine the need for the issuance of a Certificate of Absence or a Certificate of Death, if it is determined that a person who had been reported as missing is, in fact, dead.

Hon. Speaker, the establishment of the Office on Missing Persons will help alleviate the pain and agony that the people of our country have suffered for long years. Approving this Bill is an act of compassion towards those who are helpless, vulnerable and traumatized. Passage of this legislation will demonstrate to our citizens our conviction to assist them and our commitment to care for them.

It will also stand as an affirmation of our determination to ensure that no citizen of our country will ever go missing again and that our mothers, our fathers, brothers, sisters and children will not have to bear the trauma of their loved ones disappearing or being reported as missing in the future.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, මීළඟට ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා කථා කරන්න. කරුණාකරලා සියලුම මන්ත්‍රීවරුන් තමන්ගේ අසුන්වල වාඩි වෙන්න.

[1.58 p.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Hon. Speaker, for the opportunity given to me to speak on the Bill titled "Office on Missing Persons (Establishment, Administration and Discharge of Functions)". - [*Uproar.*] This is an important step that the Government has taken. - [*Uproar.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Please allow the Hon. Sumanthiran to speak. - [*Uproar.*] Hon. Sumanthiran, you go ahead with your speech.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

We congratulate the Government for taking this first baby step in the process of reconciliation in the country. The Hon. Members of Parliament of this august Assembly will agree that whatever steps that are taken for reconciliation must be founded upon the truth. - [*Uproar.*] There cannot be reconciliation without ascertainment of the truth, and in this process, the most important issue that this country has faced is the issue of missing persons, persons who have been made to disappear during the course of a protracted war in this country.- [*Uproar.*]

Over these last several years, there have been many instances when people just disappeared. - [*Uproar.*] "White vanning" has now entered the dictionary as a verb; "being white vanned" is now a common phrase. To that extent, steps were taken by those in power extra-judicially to deal with anyone who dared to dissent from the country.

Today, after a change in the Government, a step has been taken only to ascertain the truth; nothing more - truth with respect to missing persons. - [*Uproar.*]

It is a terrible bane in this country that persons go missing. This has happened over a long period of time and when it happened in the late 80s, it was the Hon. Foreign Minister, who moved the Bill today, the Hon. Vasudeva Nanayakkara and the Hon. Mahinda Rajapaksa, who actually fought on behalf of those persons who were disappeared and the families. They

took some bold steps during a time when the Government of the day was employing extra-judicial methods to deal with dissent in the country. And in that, the Hon. Mahinda Rajapaksa gave a great example; he led by example.

What he did has been recorded in the official Law Reports of this country. I would like to read from Page 223 of the 2nd Volume in the Sri Lanka Law Reports-1992. This is the case when the Hon. Mahinda Rajapaksa - then also a Member of Parliament from the Hambantota District - along with his erstwhile friend, the Hon. Vasudeva Nanayakkara, went to report to the UN Working Group on Enforced or Involuntary Disappearances. This is what the Law Report say, I quote:

"In September 1990, the petitioner.."

- Hon. Mahinda Rajapaksa -

"..went to Katunayake Airport to board an aircraft bound for Geneva"..

-[*interruption.*] Yes, with the Hon. Vasudeva Nanayakkara -

"..where the 31st Session of the Working Group on Enforced or Involuntary Disappearances was being held from 10 - 14 September. At the Airport, the first respondent.."

- Kudahetty -

"..disclosing the fact that he was an Assistant Superintendent of Police informed the petitioner.."

- Mahinda Rajapaksa-

"..that he wished to examine his baggage for fabricated documents which were likely to be prejudicial to the interests of the national security, and which were likely to promote feelings of hatred or contempt to the Government, an offence under Regulation 33 of the Emergency Regulations.

The petitioner-"

- Mahinda Rajapaksa-

"-refused to permit the search and wanted to contact a lawyer. The first respondent did not object to this. The petitioner then spoke on the telephone to Mrs. Sirimavo Bandaranaike, the Leader of the Opposition and thereafter threw the bags at the first respondent and asked him to examine them. The first respondent examined the bags and recovered 533 documents containing information about missing persons and 19 pages of photographs and issued a receipt for them which was countersigned by the petitioner. The petitioner however, refused to make a statement to the police."

This is what the Hon. Mahinda Rajapaksa did in 1990 when there was a large-scale disappearances in the South of the country - in his own constituency; and that conduct of his gave the example, paved the way for persons in this country, when they could not obtain justice to go to international fora.

Unfortunately, the Hon. Vasudeva Nanayakkara who is now protesting the establishment of this Office, was also a leader, who led from the front; who did many things for the Sinhala youth who disappeared in this country. For a long number of years, he has masqueraded to the country as a Leftist and he has tried to show himself as a person who surpasses ethnic boundaries. But very unfortunately, today he is demonstrating to the country that he is only concerned about the Sinhala youth, that he is not concerned about the large-scale disappearances of the Tamil youth. That is the state that an aged Hon. Vasudeva Nanayakkara has come to.

When Mahinda Rajapaksa went to Geneva in September, 1990 - as I read to you from the Law Report - he complained to the international community that the Government in Sri Lanka was incapable of dealing with the question of enforced and involuntary disappearances and he showed the way that that is how we must deal with impunity; that is how we must deal with extra-judicial efforts that were taken by the Government of that day.

It is on those lines, steps were in fact taken to complain to the UN Human Rights Council, which inquired into this matter and even the Government's own Commissions - it is not only the report of the UN Human Rights Council, the Lessons Learnt and Reconciliation Commission appointed by the Hon. Mahinda Rajapaksa, and the Paranagama Commission appointed by the Hon. Mahinda Rajapaksa when he was the Executive President of this country - have reported that there are tens of thousands of enforced and involuntary disappearances which have not been inquired into. This is not a matter that somebody else has brought to light, this is not something that others are accusing him of, it is he who has appointed Commissions by warrant under his own hand. Those Commissions' Reports which have been placed in this House have revealed that no justice has been meted out to several thousands. If there are tens of thousands of persons who have disappeared, there are hundreds of thousands of dependents of those persons who are to this day, looking for their loved ones. They are still on the streets. Their only appeal to any Minister, or even to an Opposition Member of Parliament who passes by, is to find the person whom they have handed over to the authorities and whom they cannot find today. There were others also who have gone without trace.

It is creditable that the Government led by His Excellency Maithripala Sirisena, who is the leader of the Sri Lanka Freedom Party, and the United National Party led by the Prime Minister - a Government that is composed of two major parties of this country - has taken this responsible step and said that if we are to achieve meaningful reconciliation that the truth must be ascertained. - [*Uproar.*]

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

Again, it is unfortunate that the Hon. Vasudeva Nanayakkara leads this chant unashamedly as I make this speech holding himself out to be a human rights activist. - [*Uproar.*]Obviously, for the Hon. Vasudeva Nanayakkara, today, human rights means only human rights of Sinhala youth. That is the depth to which he has fallen. He participated in the Committee and raised various issues. - [*Uproar.*]

Therefore, I urge the Government to enact this Bill into law without any further delay. This has been seriously debated and agreed to at the Committee where the Hon. Vasudeva Nanayakkara also participated. So, I urge the Government to pass the Bill into law.

Thank you.

[අ.භා. 2.12]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත පිළිබඳව විවාද කරන මෙම අවස්ථාවේ දී ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් මේ පනත් කෙටුම්පත පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. [සෝෂා කිරීම්] ගරු කථානායකතුමනි, මේ රටේ 1971 අවුරුද්දේදීත්, 1983 කළු ජූලියේදීත්, 1987 - 1990 යුගයේ දීත්, යුද්ධයේ අවසාන වසර කිහිපය තුළ දීත්, ඒ වාගේම 2009න් පසු 2015 දක්වා කාල සීමාව තුළ දීත් - [සෝෂා කිරීම්] විශේෂයෙන්ම විවිධ ජන කණ්ඩායම්, විවිධ දේශපාලන සංවිධාන, විවිධ පුද්ගලයන්, විවිධ සමාජ ක්‍රියාකාරීන්, විවිධ දේශපාලන ක්‍රියාකාරීන්, විවිධ මාධ්‍යවේදීන්, විවිධ කලාකරුවන් පැහැර ගැනීමට, අතුරුදහන් කිරීමට, ඝාතනය කිරීමට ලක්වුණාය කියන එක අමුතු කාරණයක් නොවෙයි. [සෝෂා කිරීම්] අපි මැරිලා ඉපදුණේ නැත්නම් ඒ බව අපි කවුරුත් දන්නවා. [සෝෂා කිරීම්]

1971 සිට අද දක්වා අවුරුදු 45කට ආසන්න ඉතිහාසය තුළ මේ රටේ සිද්ධ වුණු ලක්ෂ සංඛ්‍යාත අතුරුදහන් වූවන් සම්බන්ධව අවුරුදු ගණන්, දශක ගණන් පහු වෙලා ඒ ඒ ආණ්ඩුවලින් වරින්-වර යම් ආකාරයක කොමිෂන් සභා සහ අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි ලබා ගන්නා ආයතන ස්ථාපිත කළත්, ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි දන්නා දේ තමයි, ස්ථාවර ආයතනයක්, ඒ පිළිබඳව වග කීමකින් සොයා බැලීමට අදාළ කරන ආයතනයක් මේ රටේ ස්ථාපිත වුණේ නැහැයි කියන එක. [සෝෂා කිරීම්] ගරු කථානායකතුමනි, එයට හොඳම උදාහරණය තමයි 1987 - 1990 කාලය තුළදී විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණෙන්, ඒ වාගේම මේ රටේ ශිෂ්‍ය ව්‍යාපාරයේත්, මේ රටේ පොදු සමාජ ක්‍රියාධරයනුත් දසදහස් ගණනක් මරා දැමූ අවස්ථාවේ දී ඊට පසුව බලයට පැමිණි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ආණ්ඩුව අතුරුදහන් වූවන් පිළිබඳ කොමිසමක් පත්කිරීම. [සෝෂා කිරීම්] ඒ කොමිසමට අතුරුදහන් වූවන් පිළිබඳව 33,000ක් පැමිණිලි ලැබුණා. දකුණේ අම්මලා, තාත්තලා ඒ කොමිෂන් සභාවලට ගිහිල්ලා සාක්ෂි දුන්නා. [සෝෂා කිරීම්] මිනී වළවල් ගොඩ දැම්මා. [සෝෂා කිරීම්] එදා සූරියකන්දේ මිනී වළවල් ගොඩ දමන්න ආපු කට්ටියම ඊට අවුරුදු කිහිපයකට පස්සේ සූරියකන්දේ මිනී මරුවන්ව තමන්ගේ පක්ෂයේ සංවිධායකයන් බවට, තමන්ගේ පක්ෂයේ ආණ්ඩුකාරවරුන් බවට පත්කර ගැනීම ගැන අපි කනගාටු වනවා. ගරු කථානායකතුමනි, අතුරුදහන් වූවන් පිළිබඳ කොමිෂන් සභාවක් ක්‍රියාත්මක වෙලා, 1989 - 1994 කාලය තුළදී පැමිණිලි 33,000ක් ලැබී තිබුණත් ඒවාට අදාළ කරන යුක්තිය ඉෂ්ට වුණේ නැහැ.

2006 - 2009 යුද්ධය කාලයේදී ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාව පැත්තෙනුත්, එල්ටීටීඊ සංවිධානය පැත්තෙනුත්, ඒ වාගේම පවත්වාගෙන ගිය ආරක්ෂක අංශවලිනුත්, එල්ටීටීඊ සංවිධානයෙන් පවත්වාගෙන ගිය විවිධකාර කණ්ඩායම්වලිනුත් අතිවිශාල අතුරුදහන්වීම් ප්‍රමාණයක් සිදු කළාය කියන එක අපි දන්නවා. [සෝෂා කිරීම්] මගේ දැනීමේ හැටියට 2006 - 2009 කාලයේදී ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවේ විතරක් 5,100ක් පමණ සොල්දාදුවන් අතුරුදහන් වී තිබෙනවා. ඒ වාගේම එල්ටීටීඊ සංවිධානය විසින් පසු ගිය කාලයේ පැහැර ගෙන ගිහින් අතුරුදහන්වීම්වලට ලක් වුණු සිංහල, මුස්ලිම් සහ දෙමළ සිවිල් ජනතාව සැලකිය යුතු ප්‍රමාණයක් ඉන්නවා. [සෝෂා කිරීම්]

ඒ වාගේම එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධ සාමාජිකයන්, ක්‍රියාධරයන්, එයට සම්බන්ධ නැති ශ්‍රී ලංකා රජයට විරුද්ධව දේශපාලන කටයුතු කළ පුද්ගලයිනුත් දහස් ගණනින් මේ අතුරුදහන් කරවීමට ලක් වෙලා තිබෙනවා. [සෝෂා කිරීම්] ඒ නිසා අපි පැහැදිලිවම පිළිගන්නවා, අපේ රටට අතුරුදහන් වූවන් පිළිබඳව නිශ්චිත රාජ්‍ය ආයතනයක් අත්‍යවශ්‍ය වන බව. මොකද, අපි කාටවත් ප්‍රතික්ෂේප කරන්න බැහැ, 1971 ඉඳලා 2015 දක්වා ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් අතුරුදහන් වුණු බව. ඒ මිනිසුන්ගේ අම්මලාට මුහුණ දෙන්න බැහැ; ඒ තාත්තලාට මුහුණ දෙන්න බැහැ.[සෝෂා කිරීම්] අපේ පක්ෂයේ ඉඳලා අතුරුදහන් වුණු දරුවන්ගේ අම්මලා ඉන්නවා, අදත් තමන්ගේ පුතාගේ උපන් දිනයට ගෙදර ඉස්සරහ තිබෙන පිව්ව ගහේ පඬුරු ගැටගහන. එහෙම අය උතුරේත් ඉන්නවා; දකුණේත් ඉන්නවා.

ගරු කථානායකතුමනි, අපට අවශ්‍ය කුමක්ද? අපට අවශ්‍යයි සංහිඳියාව. උතුරේ දෙමළ අම්මලා තාත්තලාගේ දරුවන්ට වුණු දේ මොකක්ද කියන එක වාගේම, දකුණේ සිංහල අම්මලා තාත්තාලගේ දරුවන්ට වුණේ මොකක්ද කියන එකත් මේ දෙකම එක හා සමාන යුක්තිය පිළිබඳ ප්‍රශ්නයක්. මේ කාර්යාල පිහිටෙව්වා කියලා 1971දී අතුරුදහන් වුණු අයටත්, 1989දී අතුරුදහන් වුණු අයටත්, මෑතකදී අතුරුදහන් වුණු අයටත් හරියාකාරව යුක්තිය ඉෂ්ට වන්නේ නැහැයි කියලා අපි හොඳටම දන්නවා. නමුත් අනාගතයේදී රාජ්‍ය මට්ටමින් හරි වෙනත් පැත්තකින් හරි මෙවැනි ආයතනයක් පටන් ගත්තොත් එය වැදගත් කියලා අපි විශ්වාස කරනවා. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා මම නියෝජනය කරන මගේ පක්ෂයේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා 1989 නොවැම්බර් මාසයේ 12වැනිදා අත් අඩංගුවට ගත් බව. අත් අඩංගුවට ගත්තාට පසුව ඔහු අත් අඩංගුවට ගත් බව රජය රූපවාහිනිය මඟින් නිවේදනය කළා.[සෝෂා කිරීම්] රජයේ රූපවාහිනිය තුළින් ඔහු කථා කළා. නමුත් අද වන තෙක් ඔහුගේ මළ සිරුර අපි දැකලා නැහැ; ඔහුගේ දරුවෝ දැකලා නැහැ. රෝහණ විජේවීර සහෝදරයා අත් අඩංගුවට අරගෙන රජයේ රූපවාහිනිය තුළින් පෙන්නුවා. ඔහු කථාවකුත් කළා. ඒ කියන්නේ ඔහු රජය භාරයේ ඉන්න බව රජය පිළිගත්තා. හැබැයි, අද වන තෙක් රෝහණ විජේවීර සහෝදරයාගේ මළ සිරුර මේ රට දැකලා නැහැ. පශ්චාත් මරණ පරීක්ෂණ සිදු වෙලා නැහැ. අපේ පක්ෂයට වාගේම, ඔහුගේ දරුවන්ටත් තමන්ගේ තාත්තාට වුණේ මොකක්ද කියලා දැන ගන්න අවශ්‍යයි. [සෝෂා කිරීම්] ඒ වාගේම තමයි උපතිස්ස ගමනායක.

ගරු කථානායකතුමනි, අපි කියන්න කැමැතියි සූරියකන්දේ ඇට කටු ගොඩ දමලා ඒ ඇට කටුවලින් දේශපාලනය කරන තක්කඩියෝ වාගේ නොවෙයි අපි. සූරියකන්දේ මිනීමරුවා තමන්ගේ ආරක්ෂකයා කර ගත් මන්ත්‍රීවරියන්ට විලි ලැජ්ජා නැති වුණාට අපිට සදාචාරය තිබෙනවා. අපි මිනී විකුණා ගෙන කන්නේ නැහැ. [ඝෝෂා කිරීම්] ඒ නිසා අපි ඉතාම පැහැදිලිව කියන්න කැමැතියි, අපේ පක්ෂයේ නායක රෝහණ විජේවීර සහෝදරයාගේ මරණය අතුරුදහන් වීමක් බව. ඒ වාගේම උපතිස්ස ගමනායක සහෝදරයාගේ මරණය අතුරුදහන් වීමක්. ශාන්ත බණ්ඩාර සහෝදරයාගේ මරණය අතුරුදහන් වීමක්. ඒ නිසා අපි නැවත කියන්නේ මේවා පිළිබඳව යුක්තිය ඉෂ්ට වීම අවශ්‍යයි කියලායි.

අපේ පක්ෂයේ ක්‍රියාධරයන් වශයෙන් ඉඳලා අපේ පක්ෂයෙන් ඉවත් වෙනවාත් සමඟම ලලිත් සහ කුගන් කියන සහෝදරවරු දෙදෙනා ඉතා මෑතකදී අතුරුදහන් කළා. අපි දන්නා තරමින් ඔවුන් අපේ පක්ෂයේ කටයුතු කළ නිසා තමයි අතුරුදහන් වීමට ලක් වුණේ. [ඝෝෂා කිරීම්] ඒ නිසා අපි පැහැදිලිව කියන්න කැමැතියි, ඒ යුක්තිය මේ රටට අත්‍යවශ්‍යයි කියලා. මොකද, රටේ ඉන්න මිනීමරුවෝ- [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමනි, අපට මේ සභාව දිහා බැලුවාම සමූහ මිනීවලවල්වල අයිතිකාරයෝ හැම පැත්තෙන්ම පෙනෙනවා. පෞද්ගලික වධකාගාරවල අයිතිකාරයෝ හැම පැත්තෙන්ම පෙනෙනවා. 1971 දී පෞද්ගලික වධකාගාර හඳුනා කට්ටිය, 1989 දී පෞද්ගලික වධකාගාර හඳුනා කට්ටිය, දෙදහස් ගණන්වල පෞද්ගලික වධකාගාර හඳුනා කට්ටිය අපට පෙනෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා අපට මේ දිහා ඉතාම මධ්‍යස්ථව බලන්න පුළුවන්. මේක දිහා ඉතාම සාධාරණව බලන්න පුළුවන්. ඒ වාගේම තමයි උතුරේ දෙමළ අම්මලාගේ ප්‍රශ්නය. ටීඑන්ඒ සංවිධානයේ මන්ත්‍රීතුමාටත් වඩා හොඳට ඒක අපට තේරෙනවා. මොකද, අපේ පක්ෂයේ වර්තමාන නායක අනුර දිසානායක සහෝදරයාගේ පවුලේ ඥාතීන් පවා අතුරුදහන් වූවන්ගේ ලැයිස්තුවල ඉන්නවා. [ඝෝෂා කිරීම්] අපේ පක්ෂයේ ප්‍රධානීන් ගණනාවකගේ ඥාතීන් අදත් ඉන්නේ අතුරුදහන් වුවන්ගේ ලැයිස්තුවල. ඒ නිසා උතුරේත් දකුණේත් මේ ප්‍රශ්නය අපට හොඳින්ම තේරෙනවා. ඒ නිසා අපි ඔබතුමාට කියන්නේ, අතුරුදහන් වූවන් පිළිබඳ පරීක්ෂණ සභාව අනිවාර්යයෙන්ම ස්ථාපිත කරන්න ඕනෑ කියන එකයි. ඒක 2006-2009 යුද්ධය කාලයට පමණක් සීමා විය යුතු නැහැ. 1987-1990 කාලයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් සිද්ධ වුණු ඝාතනවලට අපි යුක්තිය බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි දන්නවා, ඔවුන්ට යුක්තිය ඉටු කරන්න බැහැ කියලා. නමුත් මේ ආයතනය අද ආරම්භ කළාම අනාගතය දක්වාම යනවා.

ගරු කථානායකතුමනි, ඒ නිසා උතුරේ වේවා, දකුණේ වේවා අතුරුදහන් වුණු සිවිල් පුද්ගලයන්ට, හමුදාවේ නිලධාරීන්ට, ඒ වාගේම එල්ටීටීඊ සංවිධානයේ සාමාජිකයන්ට, දේශපාලන ක්‍රියාදරයන්ට, අතුරුදහන් වීමට ලක්වුණු සෑම කෙනාටම, සාමාන්‍ය අහිංසක මිනිස්සු කාටත් යුක්තිය ඉටුවීම අත්‍යවශ්‍ය වෙනවා. ඒ නිසා අපි එම කාරණය වෙනුවෙන් පෙනී ඉන්නවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ සිදු වුණු ඝාතන, අපේ රටේ සිදු වුණු අතුරුදහන්වීම්, අපේ රටේ සිදු වුණු යුද්ධ පිළිබඳ ප්‍රශ්න අප විසින් විසඳාගත යුතු දේවල් මිස, මෙය අධිරාජ්‍යවාදී රටවලට, ලෝකය පුරාම යුද්ධ අවුළුවමින් යන විවිධ සංවිධානවලට, ඒ වාගේම යුද්ධයේ කඳුළුත්, සාමයේ කඳුළුත් විකුණාගෙන තමන්ගේ මඩිය තර කර ගන්න හදන NGO වලටත් මේක ඉල්ලමක් නොවිය යුතුයි කියා අපි විශ්වාස කරනවා. එම නිසා අතුරුදහන් වූවන් පිළිබඳ ප්‍රශ්නය ශ්‍රී ලංකාව ඇතුළේ, ශ්‍රී ලංකා රාජ්‍යයේ නීති පද්ධතිය ඇතුළේ, ශ්‍රී ලංකා රාජ්‍යයේ ස්වෛරීභාවය ඇතුළේ විසඳා ගත යුතු ප්‍රශ්නයක් ලෙස අපි දකිනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා අපි මේ පනත් කෙටුම්පතේ දකින ගැටලු කිහිපයක් සඳහා සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරනවා. අපි ඒ සංශෝධන ආණ්ඩු පක්ෂ කාර්යාලයටත්, විපක්ෂ නායක කාර්යාලයටත් ලබාදී තිබෙනවා. එහි පළමුවැනි සංශෝධනය මම කියන්නම්.

මෙම පනත් කෙටුම්පතේ 8වැනි පිටුවේ, 21වැනි පේළියේ සිට තිබෙනවා, "දේශීය වශයෙන් හෝ විදේශීය සහ සංස්ථාගත කරන ලදුව හෝ එසේ නොමැති සංවිධානයක් හෝ යම් තැනැත්තෙකු සමඟ අවශ්‍ය යයි" කියලා. එය ඉවත් විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

එම නිසා "ගිවිසුම්වලට ඇතුළත් වීම ඇතුළුව දේශීය වශයෙන් හෝ විදේශීය සහ සංස්ථාගත කරන ලදුව එසේ නොමැති සංවිධානයක් හෝ යම් තැනැත්තෙකු සමඟ අවශ්‍ය යයි ඕ.එම්.පී. ට පෙනී යන අවස්ථාවල දී ගිවිසුම්වලට ඇතුළත් වීම;" යන කොටස ඉවත් කළ යුතුයි යන පළමුවැනි සංශෝධනය අපි ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, අපි ඉදිරිපත් කරන දෙවැනි සංශෝධනය මෙයයි. මෙහි 11වැනි පිටුවේ (ඊ) ඡේදයේ අවසානයට තිබෙනවා, "අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයට වරෙන්තුවකින් තොරව සමහර රාජ්‍ය ආයතන පරීක්ෂා කළ හැකියි" කියලා. අතුරුදහන් වූවන් පිළිබඳ සොයන කාර්යාලයකට එවැනි අයිතියක් තිබිය යුතුයි කියලා අපි දකිනවා. හැබැයි, එය අධිකරණයට යටත් විය යුතුයි. ඒ නිසා අපි සංශෝධනයක් යෝජනා කරනවා.

"එසේ වරෙන්තුවකින් තොරව පරීක්ෂා කිරීමෙන් පසු පැය 24ක් ඇතුළතදී අතුරුදහන් වූවන්ගේ කාර්යාලය අනිවාර්යයෙන්ම එය පොලිස්පතිවරයාට වාර්තා කළ යුතුයි. ඊට පස්සේ පොලිස්පතිවරයාගේ පැත්තෙන් අධිකරණ ක්‍රියාමාර්ගවලට යා යුතුයි" කියලා අපි යෝජනා කරනවා.

අපි තුන්වැනි සංශෝධනයත් ඉදිරිපත් කරනවා. මෙහි 19වැනි පිටුවේ 22වැනි පේළියේ තිබෙනවා, "ඒවාට සීමා නොවන පරිදි ඕ.එම්.පී. හි අරමුණු ඉටු කර ගැනීම සඳහා අරමුදල් උපයා ගැනීමට ඕ.එම්.පී. ට බලය තිබිය යුතු ය" කියලා. එම කොටස ඉවත් කළ යුතුයි කියලා අපි කියනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා අපි මේ සංශෝධන ආණ්ඩුවට ඉදිරිපත් කරනවා. මේ ප්‍රශ්නය අනවශ්‍ය ජාත්‍යන්තරීකරණයකට ලක් කිරීම වළක්වන්න මේ සංශෝධන අත්‍යවශ්‍යයි.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මෙම කාරණයත් කියන්න ඕනෑ. 2009 දී යුද්ධය අවසන් වුණු වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණ විධියට අපේ මාතෘ භූමිය වෙනුවෙන් මේ ප්‍රශ්නය විසඳීම සම්බන්ධව අපි ඉදිරිපත් කළ යෝජනාවලියක් තිබෙනවා. මම එය **සභාගත*** කරනවා.

අපි 2009 මැයි 27වැනි දිනත් මේක ඉදිරිපත් කරන්න අපට ධෛර්යය තිබුණා. මොකක්ද? අපි කිව්වා, සත්‍ය ප්‍රතිසංධාන

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

කොමිසමක් පිහිටුවන්න කියලා. ඒක පිහිටුවලා ඉවර වෙලා එයින් පැනනහින කරුණුවලට පිළිතුරු දෙන්න කියලා කිව්වා. මොකද, මේ රටේ අතුරුදහන් වූවන්ගේ දෙමව්පියන්ට කියන්න ලොකු කථාවක් තිබෙනවා. LLRC වාර්තාවේත් එම කරුණම තිබෙනවා. මම මේ වාර්තාව උපුටා දක්වන්න උත්සාහ කරන්නේ නැහැ. අතුරුදහන් වූවන් පිළිබඳ ප්‍රශ්නයට පැහැදිලි හා නිශ්චිත රාජ්‍යමය ක්‍රියාමාර්ග ගත යුතුයි කියලා ඒකෙනුත් පිළිගෙන තිබෙනවා.

ඒ නිසා ගරු කථානායකතුමනි, දේශපාලන වශයෙන් බංකොළාත් වුණු, වෙන කියාගන්න දෙයක් නැති කණ්ඩායමක් කරන විවේචනය ඉතාම බරපතළ වැරැද්දක් විධියට අපි දකිනවා. මේ රටේ අනාගතය වෙනුවෙන්, ඒවා නැවත වැළැක්වීම සඳහායි මේ පනත් කෙටුම්පත වැදගත් වන්නේ. අපි දන්නවා මෙවැනි පනත් කෙටුම්පත් කොපමණ සම්මත කළත්, මියගිය අයට සාධාරණය ඉෂ්ට වන්නේ නැහැ කියා. එය දැනගෙනයි අප මෙය සම්මත කරන්න දායක වන්නේ. ඒ නිසා මම අවසාන වශයෙන් කියනවා, ජනතා විමුක්ති පෙරමුණ සංශෝධනවලට යටත්ව මේ පනත් කෙටුම්පත වෙනුවෙන් අපේ සහයෝගය ලබා දෙන බව. අපි ආණ්ඩුවට බලකර කියා සිටිනවා, මේ සංශෝධන ගෙනෙන්න කියලා.

ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. Order, please! ආණ්ඩු පක්ෂයෙන් මේ ගැන කථා කරන්නේ නැහැ. [බාධා කිරීම්] ඒකාබද්ධ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට කථා කරන්න අවශ්‍ය නම්, කරුණාකරලා තමන්ගේ seats වලට යන්න. එවිට ඒ අවස්ථාව ලබා දෙන්න පුළුවන්.[බාධා කිරීම්] ඒකාබද්ධ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කරන්නේ නැද්ද? [බාධා කිරීම්] සියල්ලන්ම ආපහු seatsවලට යන්න. Seatsවල ඉඳගන්න. ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් ඉන් පස්සේ කථා කරන්න අවස්ථාව ලබා දෙන්නම්. සභාගැබේ ඉඳගෙන බැහැ, සියලු දෙනාම වාඩි වෙන්න.[බාධා කිරීම්] ඒකාබද්ධ විපක්ෂයෙන් කථා කරනවා නම්, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.[බාධා කිරීම්] ඒකාබද්ධ විපක්ෂය කථා කරන්න අවශ්‍ය නම්, වාඩි වෙන්න. [බාධා කිරීම්] වැඩ කටයුතු කරන්න පහසු වෙන්න වාඩි වෙන්න.[බාධා කිරීම්] ඒකාබද්ධ විපක්ෂය කථා කරන්නේ නැත්නම්,- [බාධා කිරීම්]

ගරු සභානායකතුමා. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Points of Order ඉදිරිපත් කරන්න බැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමන්ට කථා කරන්න අවස්ථාව දෙන්න පුළුවන්. [බාධා කිරීම්] තමුන්නාන්සේලා සියලු දෙනාම තමන්ගේ අසුන්වලට යන්න. [බාධා කිරීම්] කොටසක් මට බාධා කරන කොට, ඔබතුමාගේ point of Order එකට මට ඉඩ දෙන්න බැහැ.[බාධා කිරීම්]

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." --[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Lakshman Kiriella.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[THE HON. SPEAKER in the Chair.]

1 සිට 10 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1ஆம் வாசகத்திலிருந்து 10ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 1 to 10 ordered to stand part of the Bill.

11 වන වගන්තිය.- (ඕ.එම්.පී. හි සාමාන්‍ය බලතල.)
வாசகம் 11.- (காஆஅ வின் பொதுவான தத்துவங்கள்.)
CLAUSE 11. - *(General Powers of the OMP.)*

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella
Sir, I move,

"In page 7, leave out all words in lines 21 to 29 (both inclusive) and insert:

'(a) to enter into all such agreements as are necessary to achieve the mandate of the OMP, with any person or organization;' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනක් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 11, as amended, ordered to stand part of the Bill.

12 වන වගන්තිය.- (විමර්ශනය කිරීමේ බලතල.)

வாசகம் 12.- (புலனாய்வுத் தத்துவங்கள்.)

CLAUSE 12. - *(Powers of Investigation.)*

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

Sir, I move,

"In page 10, leave out all words in lines 13 to 23 (both inclusive) and insert:

' (i) to authorize in writing a specified officer of the OMP to enter at any time, any place of detention, police station, prison or any other place in which any person is suspected to be detained, or is suspected to have previously been detained in, and make such examinations therein or make such inquiries from any person found therein, and retain any documents or objects, as may be necessary

(ii) the Minister in charge of the subject of Justice shall make guidelines as to the manner in which a search in terms of this sub-section should be conducted. Such guidelines shall be placed before Parliament within a reasonable time not exceeding three (3) months

(iii) in the event of the OMP conducting a search in terms of this sub-section, the OMP shall within 48 hours inform the Inspector General of Police of such fact

EXISTING PROVISION IN SECTION 28(2) OF THE HUMAN RIGHTS COMMISSION ACT

Any person authorized by the Commission in writing may enter at any time, any place of detention, police station, prison or any other place in which any person is detained by a judicial order or otherwise, and make such examinations therein or make such inquiries from any person found therein, as may be necessary to ascertain the conditions of detention of the persons detained therein.'"

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

ගරු සභාපතිතුමා

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු බිමල් රත්නායක මැතිතුමා. එකොළහ.

ගරු බිමල් රත්නායක මහතා

(மாண்புமிகு பிமல் ரத்நாயக்க)

(The Hon. Bimal Rathnayake)

ගරු සභාපතිතුමනි, මට හරියට ඇහුණේ නැහැ. 8 වැනි පිටුවද, 11 වැනි පිටුවද?

11 වැනි පිටුවේ නම්, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"11 පිටුවේ, (ඊ) ඡේදය අවසානයට 'එසේ වරෙන්තුවකින් තොරව පරීක්ෂා කිරීමෙන් පසු පැය 24ක් ඇතුළත පොලිස්පති වෙත වාර්තා කළ යුතුය.' කොටස ඇතුළත් කළ යුතුවේ."

ගරු සභාපතිතුමා

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා, එය පිළිගන්නවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

පිළිගන්නවා, ගරු සභාපතිතුමනි.

12 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනක් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

12ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 12, as amended, ordered to stand part of the Bill.

13 සිට 20 තෙක් වගන්ති පනක් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

13ஆம் வாசகத்திலிருந்து 20ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 13 to 20 ordered to stand part of the Bill.

21 වන වගන්තිය.- (ඕ.එම්.පී. ය අරමුදල් උපයා ගැනීම.)

வாசகம் 21.- (காஆஅ நிதி திரட்டலாம்.)

CLAUSE 21. - *(OMP to raise fund.)*

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)

(The Hon. Lakshman Kiriella)

Sir, I move the following amendment,

"In page 18, leave out all words in lines 5 to 8 (both inclusive) and insert:

'(1) The OMP shall have the power:

(a) to raise funds in order to achieve its mandate, including but not limited to obtaining any grants, gifts or endowments from within Sri Lanka; and

(b) to raise funds in order to achieve its mandate, as grants, gifts or endowments from outside Sri Lanka.

Provided that in the event that the OMP raises funds in terms of sub section (b) of this section, such funds shall be channeled through the external resources department' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

21වෙනි වගන්තියෙහි යට කොටසෙහි ඇති, "එහෙත් ඒවාට සීමා නොවන පරිදි ඕ.එම්.පී. හි අරමුණු ඉටු කර ගැනීම සඳහා අරමුදල් උපයා ගැනීමට" යන කොටස ඉවත් කළ යුතුයි.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා,

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එකඟයි.

21 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

21ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 21, as amended, ordered to stand part of the Bill.

22 සිට 28 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

22ஆம் வாசகத்திலிருந்து 28ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 22 to 28 ordered to stand part of the Bill.

පූර්විකාව පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

முன்னுரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Preamble ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කිය විය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 2.35ට, අද දින සභා සම්මතිය අනුව, 2016 අගෝස්තු 12 වන සිකුරාදා පු.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 2.35 க்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்துக்கிணங்க 2016 ஓகஸ்ட் 12, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 2.35 p.m. until 9.30 a.m. on Friday, 12 August, 2016 pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

245 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 245 - இல. 10
Volume 245 - No. 10

2016 අගෝස්තු 12 වන සිකුරාදා
2016 ஓகஸ்ட் 12, வெள்ளிக்கிழமை
Friday, 12th August, 2016

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිත පිහිටා ඇති තෙල් ටැංකි සම්බන්ධයෙන් මතුව ඇති ගැටලුකාරී තත්ත්වය:
ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ගරු රිසාඩ් බදියුදීන් මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම

කල් තැබීමේ යෝජනාව :
විදේශගත ශ්‍රී ලාංකික රැකියා නියුක්තිකයන් මුහුණ දෙන ගැටලු

பிரதான உள்ளடக்கம்

திருமலைத் துறைமுக எண்ணெய்த் தாங்கி தொடர்பில் எழுந்துள்ள பிரச்சினை :
பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சரினது கூற்று.

மாண்புமிகு றிஸாட் பதியுதீன் அவர்களது சொந்த விளக்கம்

ஒத்திவைப்புப் பிரேரணை:
வெளிநாடுகளில் தொழில்புரியும் இலங்கையர் எதிர்நோக்கும் பிரச்சினைகள்

PRINCIPAL CONTENTS

PROBLEMATIC SITUATION WITH REGARD TO OIL TANK FRAM CLOSE TO TRINCOMALEE HARBOUR :
Statement by Minister of Petroleum Resources Development

PERSONAL EXPLANATION BY HON. RISAD BADHIUTHEEN

ADJOURNMENT MOTION:
Problems faced by Sri Lankans Employed Abroad

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 අගෝස්තු 12 වන සිකුරාදා
2016 ஓகஸ்ட் 12, வெள்ளிக்கிழமை
Friday, 12th August, 2016

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 930 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

Annual Performance Report and the Statement of Accounts of the Finance Commission for the year 2014. - [The Hon. Lakshman Kiriella on behalf of the Prime Minister, Minister of National Policies and Economic Affairs]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

Hon. Speaker, on behalf of the Minister of Tourism Development and Christian Religious Affairs and Minister of Lands, I present the Annual Report of the Sri Lanka Convention Bureau for the year 2013 and move that this Report be referred to the Sectoral Oversight Committee on International Relations.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Science, Technology and Research, I present the Annual Report of the Sri Lanka Accreditation Board for Conformity Assessment for the year 2014 and move that this Report be referred to the Sectoral Oversight Committee on Education and Human Resources Development.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Home Affairs, I present the Performance Report and Accounts of the District Secretariat, Kurunegala for the year 2015 and move that this Report be referred to the Sectoral Oversight Committee on Internal Administration and Public Management.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Health, Nutrition and Indigenous Medicine, I present the Annual Report of the Wijaya Kumaratunga Memorial Hospital, Seeduwa for the year 2013 and move that this Report be referred to the Sectoral Oversight Committee on Health and Human Welfare, Social Empowerment.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Provincial Councils and Local Government, I present the Annual Report and Accounts of Local Loans and Development Fund for the year 2012 and move that this Report be referred to the Sectoral Oversight Committee on Internal Administration and Public Management.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය කටයුතු පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව, එම කාරක සභාවේ සභාපති ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් පිළිගැන්වීම. - එතුමා පැමිණ නැත.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු එස්.බී. නාවින්න මහතා (අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன - உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. S.B. Nawinne - Minister of Internal Affairs, Wayamba Development and Cultural Affairs)

ගරු කථානායකතුමනි, මම අවුලේගම, ඉහුරුගමුව, අංක 259 දරන ස්ථානයෙහි පදිංචි අයි.බී.ඒ.කේ. ජයතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දුමින්ද දිසානායක මහතා - පැමිණ නැත.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා - පැමිණ නැත.

ගරු චන්දිම වීරක්කොඩි මහතා (බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Chandima Weerakkody - Minister of Petroleum Resources Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බටපොල, ඊරියගහදොල යන ලිපිනයෙහි පදිංචි බින්දුහේවා සුමනදාස මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගාල්ල, හිරිඹුර, ජාතික නිවාස, අංක 17 දරන ස්ථානයෙහි පදිංචි තිලක් එදිරිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මහතා - පැමිණ නැත.

ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මම බෙලිඅත්ත, මිහිඳු මාවත, අංක 281/1 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ජී. ජගත් ප්‍රසන්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කේ.කේ. පියදාස මහතා - පැමිණ නැත.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) අකුරැස්ස, ඉහළ මලිදුව, වගුරුඹිවිට "සඳුනි නිවස" යන ලිපිනයෙහි පදිංචි ඒ.පී. ලලිතා මාලිනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතර, ශ්‍රී රතනපාල මාවත අංක 57/10 දරන ස්ථානයෙහි පදිංචි ඩී. ආරච්චිගේ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) උණුගමුව, දන්දෙනිය, මිහිර II යන ලිපිනයෙහි පදිංචි ගුණදාස සමරසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) මාතර, කොටුව, ධර්මාරාම මාවත, අංක 119/1 දරන ස්ථානයෙහි පදිංචි කේ.එච්.පී. සිල්වා මහාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්දිම ගමගේ මහතා - පැමිණ නැත.

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ගරු කථානායකතුමනි, මම ඉඹුල්ගස්දෙනිය, කෑගල්ල පාර, අංක 141/5 දරන ස්ථානයෙහි පදිංචි කේ.එච්.එම්.පී.යූ. අබේවික්‍රම මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, අමාත්‍යාංශ නිවේදන. අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා.[බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධ ප්‍රශ්නයක්ද? වෙනත් ප්‍රශ්නයක් නම් අපි එය ප්‍රධාන කටයුතු ආරම්භයයේදී ගනිමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න සම්බන්ධ ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නයක්. ගරු සභානායකතුමා ඒකට එකඟද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමා, අද උත්තරයක් දෙන්න නම් බැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඊයේ අපට දැනුම් දුන්නේ මේ ප්‍රශ්න ගන්නේ නැහැ කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය ගන්නේ නැහැ. කැමැති නම් පමණක් ඊයේ ප්‍රශ්නයක් පිළිබඳ පැහැදිලි කිරීමක් එතුමා ඉල්ලුවේ.[බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සාමාන්‍යයෙන් ගන්නේ නැහැ. නමුත් මේ ප්‍රශ්නය ගන්නේ සහයෝගයෙන්. මෙතුමා අද ප්‍රශ්නය අහනවා. අපි අද උත්තර දෙන්නේ නැහැ; පසුව උත්තර දෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මගේ අයිතිය දුන්නේ නැහැ. මම මහ ලේකම්තුමා මුණ ගැසුණා. එතැනදීත් කිව්වා දෙන්නේ නැහැ කියලා. මට අද ගන්න තිබුණේ, වෙනත් ප්‍රශ්නයක්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න ගන්නේ නැහැ. අද ඉල්ලුවේ ඊයේ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක්. නමුත් වෙන දවසකයි උත්තර දෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වෙන දවසක ගනිමු. මේකට වාදයක් අවශ්‍ය වෙන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අප කාටවත් විශේෂයක් කරන්න එපා. මෙතැන ඇති වුණ ප්‍රශ්නය මේකයි. මා ඊයේ පක්ෂ නායක රැස්වීමට සහභාගි වූයේ නැහැ. මා විසින් ඊට පෙර මේ ස්ථාවර නියෝග 23(2) ප්‍රශ්නය ලබා දී තිබුණා. ඒ පිළිබඳව මම අදාළ අමාත්‍යවරයාත් දැනුවත් කළා. ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සඳහා හෙට අවස්ථාව දෙන්න කියලා මම එතුමාගෙනුත් ඉල්ලීමක් කළා. මෙතැන මේ වෙන games තිබෙනවා. ඒ අය ගැනත් මම කියන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඔබතුමා අදාළ ගැටලුව ගැන කියන්න කෝ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ games තිබෙන්නේ කා අතරද, එකිනෙකා නිදහස් කර ගන්න මැදිහත් වුණු ආකාරය, passports සම්බන්ධයෙන් අගමැතිතුමාට කථා කළ ආකාරය ආදී මේ ඔක්කෝම ගැන ඕනෑ නම් අපි කියන්නම්. Games තිබෙන්නේ කාගේ ළඟද කියා අපි කියන්නම්. මම ඉතා සරල ප්‍රශ්නයක් ඇසුවේ. මම ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබුණා. ඒ සම්බන්ධයෙන් අමාත්‍යතුමාවත් දැනුවත් කර තිබුණා. ඊයේ පැවැති පක්ෂ නායක රැස්වීමට පෙර තමයි, මම එය ඉදිරිපත් කර තිබුණේ. අද දිනයේ ප්‍රශ්න ගන්නේ නැහැ කියන තීරණය ගන්නට පෙර අවස්ථාවේ තමයි, මා මෙය ඉදිරිපත් කර තිබුණේ. මෙම ප්‍රශ්නය අද සාකච්ඡාවට ගැනීමට නොහැකියි කියා ලේකම්තුමා මා දැනුවත් කළා. එතුමා සාධාරණයි. හැබැයි, මම සභානායකතුමාගෙන් විමසා සිටියා, මෙය සාකච්ඡා කිරීමට අවස්ථාව දෙනවාද කියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කලින් ඉදිරිපත් කර තිබෙන නිසා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, කලින් ඉදිරිපත් කර තිබෙන නිසා. මට වෙන වෙන ඒවා අවශ්‍ය නැහැ. ගරු කථානායකතුමනි, ඒ ගොල්ලන්ට එහෙම වෙන වෙන ප්‍රශ්න තිබෙනවා නම් අද මට මෙය ඉදිරිපත් කරන්න ඕනෑත් නැහැ. සුදු ඇඳුම ඇඳගෙන ඒ වාගේ තුට්ටු දෙකේ වැඩ කරන්න එපාය කියන එකයි මම ඒ මහත්වරුන්ට කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය, ගරු චන්දිම වීරක්කොඩි මහතා.

ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිත පිහිටා ඇති තෙල් ටැංකි සම්බන්ධයෙන් මතුව ඇති ගැටලුකාරී තත්ත්වය : බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

திருமலைத் துறைமுக எண்ணெய்த் தாங்கி தொடர்பில் எழுந்துள்ள பிரச்சினை : பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சரினது கூற்று

PROBLEMATIC SITUATION WITH REGARD TO OIL TANK FARM CLOSE TO TRINCOMALEE HARBOUR: STATEMENT BY MINISTER OF PETROLEUM RESOURCES DEVELOPMENT

ගරු චන්දිම වීරක්කොඩි මහතා (බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Chandima Weerakkody - Minister of Petroleum Resources Development)
ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් 2016.07.08 දින ස්ථාවර නියෝග 23(2) යටතේ අසන ලද

[ගරු වන්දිමවීරක්කොඩි මහතා]

ප්‍රශ්නයට මා පිළිතුරු ලබා දෙනවා. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, පසු ගිය දවසක මෙම ප්‍රශ්නයට උත්තර දෙන්න බැරි වුණේ, අපේ ගරු ඇමතිවරයකුගේ ආදරණීය මෑණියන්ගේ අවමංගල්‍යයට සහභාගි වීම නිසා ගරු සභාවට පැමිණීමට නොහැකි වූ නිසායි. ගරු අනුර දිසානායක මැතිතුමා බොරුවට කෑ ගහන්න අවශ්‍ය නැහැ, මම පිළිතුරු ලබා දෙන්නම්.

එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

01. ඔව්.

02. (i) ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉංජිනේරුවන් විසින් සකස් කරන ලද තාක්ෂණික වාර්තාවෙන් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

ඉන්ධන ගබඩා ටැංකි අංක: 37 සිට 41 දක්වා සහ ඉන්ධන ගබඩා ටැංකි අංක: 73 සිට 76 දක්වා ඉතා සුළු අලුත්වැඩියා කිරීම්වලින් පසුව භාවිත කළ හැකි තත්ත්වයේ පවතී.

- වරාය ජැටියේ සිට දුම්රිය ඉන්ධන ටැංකිවලට ඉන්ධන පුරවන ස්ථානය දක්වා කිලෝමීටර් 2ක දුර ප්‍රමාණයකට අලුතින් නළ පද්ධතියක් ඉදිකිරීම සහ ඊට අදාළව දුම්රිය ඉන්ධන ටැංකි සහ ඉන්ධන බවුසර් පුරවන ගැන්ට්‍රි ඉදිකිරීම.

- දැනට ප්‍රීමා ආයතනය සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් භාවිත කරන අංක: 36,42,43,44 වන ටැංකිවල ඉන්ධන ගබඩා කිරීම හෝ ගිනි නිවීම සඳහා ජලය රැස් කිරීමට භාවිත කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලීම සඳහා එළඹ ඇති ගිවිසුම් නැවත සමාලෝචනය කිරීම.

- සියලුම ප්‍රවේශයන්හි සහ ටැංකි සංකීර්ණයේ ඉහළ කොටස ඇතුළත ආරක්ෂක මුර කුටි පිහිටුවීම. තවද, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හා ශ්‍රී ලංකා නාවික හමුදාවට ඉහළ ටැංකි කොටසෙහි මුර සංචාරය කරන ලෙසට ඉල්ලීමක් කිරීම.

- ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි තෙල් ටැංකි 41, 40, 39 සහ 48 ටැංකිවල සිට දුම්රිය ඉන්ධන ටැංකිවලට තෙල් පුරවන ස්ථානය දක්වා පොළොව මතුපිට තෙල් නළ 2ක් පිහිටා ඇති බැවින්, ඉතා කෙටි කලක් තුළදී අංක: 37, 38, 41, 73, 76 දරන තෙල් ටැංකි නළ පද්ධති මඟින් සම්බන්ධ කිරීම. මේ අනුව තෙල් ගබඩා කළ හැකි ප්‍රමාණය මෙට්‍රික් ටොන් 90,000 දක්වා වර්ධනය කළ හැකිය. ඒ අනුව සංස්ථාවේ අදහස වන්නේ ලෝක වෙළෙඳ පොළේ අඩු වූ ඉන්ධන මිල ගණන්වල වාසිය ලබා ගැනීමටත්, සංස්ථාවෙහි ත්‍රිකුණාමලය තෙල් ගබඩා ටැංකි සංකීර්ණයේ කෙරෙන තෙල් මෙහෙයුම් කටයුතු ප්‍රසාරණය කිරීමට හැකි වන සේ පුනරුත්ථාපනය කිරීමටය.

- පරීක්ෂණ කණ්ඩායමේ අදහස වන්නේ ත්‍රිකුණාමලයේ තෙල් ගබඩා ටැංකි සංකීර්ණය සතුව පවතින මෙට්‍රික් ටොන් 840,000ක් ධාරිතාවය (ලීටර් මිලියන 1,000කට වැඩි) සංවර්ධනය කර භාවිත කිරීමටය. එය දැනට රටෙහි පවතින ඉන්ධන ගබඩා ධාරිතාවෙන් 1.5ක ගුණයක් වේ.

(ii) එම වාර්තාව සභාවට ඉදිරිපත් කරමි.

03. ඔව්.

04. ඔව්. 2016.05.24 දින

05. ඔව්.

06. ගරු අගමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහනට අනුව, 2016.06.07 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඉහත තීරණය අවලංගු කර ටැංකි 84කින් සමන්විත, ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ ඉහළ කොටසේ මෙහෙයුම් කටයුතු, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් පිහිටවනු ලබන හවුල් ව්‍යාපාරය වෙත භාර දීම සහ කාලරාමුවක් මත පදනම් වූ ක්‍රියාකාරී සැලැස්මකට අනුව, එක් වරකට ටැංකි 30 බැගින් සංවර්ධනය කිරීමට තීරණය කර ඇත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Personal Explanation by Hon. Risad Badhiutheen.

ගරු රිසාඩ් බදියුදීන් මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම

மாண்புமிகு றிஸாட் பதியுதீன் அவர்களது சொந்த விளக்கம்

PERSONAL EXPLANATION BY HON. RISAD BADHIUTHEEN

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ சபாநாயகர் அவர்களே, நேற்று முன்தினம் அதாவது, 10.08.2016 புதன்கிழமை பாராளுமன்றத்தில் கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களிடத்தில் கேள்வி கேட்கும் சந்தர்ப்பத்தின்போது, வன்னி மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ சாள்ஸ் நிர்மலநாதன் அவர்கள், நான் சபையில் பிரசன்னமாக இல்லாத நிலையில், பாராளுமன்ற நிலையியற் கட்டளைகள் தொடர்பான என்னுடைய சிறப்புரிமைகளை மீறி என்மீது பல்வேறு அவதூறான விடயங்களைத் தெரிவித்து, இந்த உயரிய சபையைப் பிழையாக வழிநடத்தியுள்ளார் என்பதை மிகவும் வேதனையுடன் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன்.

இவர் திட்டமிட்ட அடிப்படையில் தொடர்ச்சியாக இவ்வாறான விடயங்களை இந்த உயர் சபையில் கூறிவருகின்றமையானது ஜனநாயகத்தின் அடிப்படை விழுமியங்களை மீறுகின்ற ஒரு செயல் என்பதை நான் ஆரம்பத்திலேயே கூறிவைக்க விரும்புகின்றேன்.

பாராளுமன்ற நிலையியற் கட்டளைகள் சட்டத்தின் 84ஆம் பிரிவின் பல உப பிரிவுகளை இவர் பகிரங்கமாகவே மீறி, இந்தச் சபையில் என்னை அவமதித்தமையானது, என்னையும் எனது கட்சியின் ஆதரவாளர்கள் பல இலட்சக்

கணக்கானோரின் மனதையும் புண்படுத்திய மிகவும் மோசமான ஒரு செயற்பாடாகும். இவர் தனது உரையில், மஹிந்த ராஜபக்ஷவின் ஆட்சிக்காலத்தில் நான், அவரது மகன் எனக் கூறித் திரிந்ததாக என்மீது ஓர் அபாண்டத்தைக் கூறியிருக்கின்றார். என்னுடைய தந்தையின் பெயர் அப்துல் ரஹ்மான் பதியுதீன் என்பதை அவருக்கும் இந்தச் சபைக்கும் நான் கூறிக்கொள்வதோடு, இவருடைய இந்தக் கூற்றின் தாற்பரியத்தைப் புரிந்துகொள்ளுமாறும் வேண்டுகோள் விடுக்கின்றேன்.

மேலும், என்னை "நீதிமன்றத்துக்குக் கல்லெறிந்தவர்" எனக் கூறி, ஓர் அப்பட்டமான அவதூறின்மூலம் இந்தச் சபையினையும் நாட்டு மக்களையும் பிழையாக வழிநடத்த இவர் முயற்சித்துள்ளார். இந்த விடயம் தொடர்பாக எந்தக் குற்றச்சாட்டும் இந்த நாட்டின் எந்தவொரு பொலிஸ் நிலையத்திலும் என்மீது சுமத்தப்படவில்லை; இவர் சாடியிருந்த குற்றச்சாட்டுத் தொடர்பாக எந்தவொரு நீதிமன்றத்திலும் எனக்கெதிராக யாரும் வழக்குத் தொடரவுமில்லை என்பதை இந்த உயர் சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். ஆகவே, ஓர் அப்பட்டமான பொய்யை அவர் இங்கு உரைத்திருக்கின்றார் என்பதை உங்களுக்குச் சொல்லிவைக்க விரும்புகின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, இவர் மேலும் தனது உரையில், "ஊழல் மோசடியில் ஈடுபட்டதாகக் குற்றஞ் சாட்டப்பட்டு, நிதி மோசடிக் குற்றப்புலனாய்வுப் பிரிவில் முறைப்பாடு செய்யப்பட்டவர்" என்று எனது பெயரைக் குறிப்பிட்டுக் கூறியுள்ளார். ஏறத்தாழ இரண்டு கோடியே பத்து இலட்சம் மக்கள் வாழும் இந்த நாட்டில் எனது தனிப்பட்ட வேகமான அரசியல் வளர்ச்சி மற்றும் மூவின மக்கள் மத்தியிலும் எனது கட்சி பெற்றுவருகின்ற அமோக வரவேற்பு என்பவற்றைச் சகித்துக்கொள்ள முடியாமல் ஒரு சிறுபான்மைக் கட்சியில் தோல்வியுற்ற வேட்பாளர் ஒருவர் காழ்ப்புணர்ச்சியுடன் என்மீது முன்வைத்திருந்த பல குற்றச்சாட்டுகளை - இதுவரை யாரும் நிரூபிக்காத அல்லது எந்தவொரு விசாரணையும் மேற்கொள்ளப்பட்டு என்மீது குற்றம் சாட்டப்படாத நிலையில் - இங்கு மீண்டும் இவர் சுட்டிக்காட்டிப் பேசியிருப்பது, இச்சபையின் சம்பிரதாயங்களை மீறி என்னை அவமதிக்கின்ற ஒரு செயலாகவே உள்ளது.

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்றத்தில் அவர் தெரிவித்த இவ்வாறான பொய்யான கருத்துக்கள் நேற்றைய தினம் தமிழ் அச்சு ஊடகங்கள், இலத்திரனியல், மற்றும் பதிவு செய்யப்பட்ட சில இணையத்தளங்களில் மிகவும் முன்னுரிமை கொடுக்கப்பட்டுத் தலைப்புச் செய்திகளாகவும் கொட்டை எழுத்துக்களிலும் பிரசுரிக்கப்பட்டமையை மிகவும் வேதனையுடன் இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். அவர் இந்த உயர் சபையிலே மீண்டும் மீண்டும் என்னைப் பற்றிப் பிழையான தகவல்களை வெளிப்படுத்தி வருகின்றார். இதற்கு ஆதாரமாகப் பின்வரும் *ஹன்சாட்* அறிக்கைகளில் குறிப்பிட்டவற்றை உங்களின் கவனத்திற்குக் கொண்டுவருகின்றேன்:

2016 மார்ச் 23, புதன்கிழமை வெளிவந்த *ஹன்சாட்* அறிக்கையின் 756ஆவது பக்கத்தில் காணப்படும் அவருடைய உரையில், என்னுடைய பெயரைக் குறிப்பிட்டு மிகவும் மோசமாக என்னைக் கேவலப்படுத்திப் பேசியிருக்கின்றார். அத்துடன், மன்னார் மாவட்டத்தில் எங்களுடைய கட்சியில் போட்டியிட்டவரும் பெரிய கிராமமான வங்காலை வாழ் கத்தோலிக்கருமான ஒரு வேட்பாளரை என்னுடைய அமைச்சிலே இணைப்பாளராக நான் சேர்த்திருப்பதை இங்கே குறிப்பிட்டு எனது சிறப்புரிமையை மீறியிருக்கின்றார்.

அதுமாத்திரமல்ல, 2016 ஏப்பிரல் 07, வியாழக்கிழமை நடைபெற்ற பாராளுமன்ற அமர்வின்போது என்னைப்பற்றிப் பல பொய்களைக் கூறியிருக்கிறார்; அதுவும் *'ஹன்சாட்'* இல் பதியப்பட்டுள்ளது. கௌரவ உறுப்பினர் சார்ள்ஸ் நிர்மலநாதன் அவர்கள் என்னைப்பற்றி இவ்வாறான இட்டுக்கட்டப்பட்ட பொய்யான கூற்றுக்களைத் திரும்பத் திரும்பக் கூறி, எனது கௌரவத்துக்கும் நற்பெயருக்கும் அபகீர்த்தி விளைவித்து வருவதை நான் இங்கு உங்களின் மேலான கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் பாராளுமன்றத்தில் உரையாற்றும் ஓர் உறுப்பினர், நிலையியல் கட்டளைகள் 84இன் உப பிரிவுகள் (v), (vi), (vii), (viii) என்பவற்றைக் கவனத்திற்கொள்ள வேண்டும் என்று கூறப்பட்டிருக்கின்றது. அவர் அதை முற்றாக மீறியிருக்கின்றார் என்பதனை நான் உங்களுக்குச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

மேலும், பாராளுமன்றத்தின் நிலையியல் கட்டளைகள் 77 (1) இல் இவ்வாறு குறிப்பிடப்பட்டுள்ளது:

> "எவரேனும் உறுப்பினர், விவாதத்தின்போது, ஒழுங்கற்ற அல்லது மாமன்றப் பண்பிற்கு ஒவ்வாதனவான தகாத வார்த்தைகளை உபயோகித்திருந்து அல்லது விவாதத்தின்போது, 78ஆம் நிலையியற் கட்டளையையோ அல்லது 84இன் உப பிரிவு (vi) அல்லது (vii)ஆம் இலக்க நிலையியற் கட்டளையையோ மீறி ஏதேனும் குறிப்பிட்டிருந்து அவ்வாறு உபயோகித்ததற்கு அவ்வுறுப்பினர் பாராளுமன்றம் திருப்தியுறும் வகையில் விளக்கம் தராமலும் அல்லது தவறென அதை விலக்கிக்கொள்ளாமலும் அல்லது மன்னிப்புக்கோராமலும் இருந்தாரெனில் அல்லது இக்கட்டளைகளில் குறித்துரைக்கப்படாத கட்டளையை மீறியுள்ளாரெனில் பாராளுமன்றம் தகுந்ததெனக் கருதும் முறையில் அவ்வுறுப்பினருக்கெதிராக நடவடிக்கை எடுக்கலாம் என்பதோடு, இக்கட்டளைகளில் குறித்துரைக்கப்பட்ட விதத்திலல்லாது வேறெந்தவிதத்திலும் இக்கட்டளைகளில் குறித்துரைக்கப்பட்டுள்ள கட்டளையை மீறுகின்றமைக்காக எவரேனும் உறுப்பினருக்கெதிராக நடவடிக்கை எடுப்பதிலிருந்து பாராளுமன்றத்தை இக்கட்டளைகளில் எதுவும், இடையிட்டு நிறுத்த முடியாது"

அத்துடன், நிலையியற் கட்டளை 77(2) (i) -

> (அ) "ஒழுங்கற்ற அல்லது மாமன்றப் பண்பிற்கு ஒவ்வாதனவான தகாத வார்த்தைகள் விவாதத்தின்போது உபயோகிக்கப்பட்டிருப்பதாக, அல்லது
>
> (ஆ) விவாதத்தின்போது, 78ஆம் இலக்க நிலையியற் கட்டளையை அல்லது 84இன் உப பிரிவு (vi) அல்லது உப பிரிவு (viii) ஆம் நிலையியற் கட்டளையை மீறி ஏதேனும் குறிப்பிட்டிருப்பதாகச் சபாநாயகர் கருதினால், அவரது தற்றுணிபில் அவர் அச்சொற்களை அல்லது அக்கூற்றுக்களைப் பாராளுமன்ற விவாதங்களின் அதிகார அறிக்கையிலிருந்து (ஹன்சாட்) அகற்றுவதற்குக் கட்டளையிடலாம் என்பதோடு, அவ்வார்த்தைகள் அல்லது கூற்றுக்கள் சொல்லப்படாத சொற்களாகக் கருதப்படுதலும் வேண்டும்"

எனக் கூறுகின்றது.

கௌரவ சபாநாயகர் அவர்களே, மேற்கூறிய அடிப்படையில் குறிப்பிட்ட உறுப்பினர் இந்த உயரிய சபையிலே தொடர்ந்தேர்ச்சியாக என்னை அவமானப்படுத்துகின்றார். நான் இலட்சக்கணக்கான ஆதரவாளர்களைக் கொண்ட ஒரு கட்சியின் தலைவராக இருக்கின்றேன். இந்த உறுப்பினர் இதன்மூலம் எனது

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

කෞරවත්තෙ මාත්තිරමින්නි, இலட்சக்கணக்கான எனது ஆதரவாளர்களின் மானம் மரியாதையையும் கௌரவத்தையும் கேள்விக்குறியாக்கும் வகையில் இங்கு நடந்துகொள்கின்றார். எனவே, முதலில் எனது பாராளுமன்றச் சிறப்புரிமையை மீறி இவர் ஆற்றியுள்ள இந்த உரையை 'ஹன்சாட்'இல் இருந்து நீக்குமாறும், இரண்டாவதாக அவர் இந்த உரையினை ஆற்றியமைக்காக இந்தச் சபையிலே மன்னிப்புக் கோரவேண்டுமெனவும், இல்லையெனில் அதற்குத் தகுந்தவாறான நடவடிக்கையைக் கௌரவ சபாநாயகரான நீங்கள் எடுக்கவேண்டுமெனவும் கேட்டுக்கொள்கின்றேன்.

அதேபோல் இதற்கு முக்கியத்துவம் வழங்கிய இலத்திரனியல் மற்றும் அச்சு ஊடகங்கள் இந்தப் பொய்யான செய்தியினைப் பரப்புவதற்கு எவ்வளவு முக்கியத்துவத்தைக் கொடுத்தார்களோ, அதேபோல், அதற்குச் சமனாக இந்தச் செய்தியினை வாபஸ் பெறுவதற்கும் முக்கியத்துவத்தை வழங்கி நடவடிக்கை எடுப்பதற்கு நீங்கள் உத்தரவிட வேண்டுமெனவும் மிகவும் தாழ்மையாகக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් මම අවධානය යොමු කරන්නම්. ඒ වාගේම අදාළ මන්ත්‍රීතුමා සමඟ කථා කරලා අවශ්‍ය පියවර ගන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතක් සම්මත කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුව සිදු විය යුතුයි කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිව තිබෙනවා. විශේෂයෙන්ම 78 (2) ව්‍යවස්ථාවේ මේ සම්බන්ධයෙන් ඉතා පැහැදිලිවත්, තවත් ව්‍යවස්ථා රාශියකත් මේ පිළිබඳව තිබෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්නේ නම්, තුනෙන් දෙකක ඡන්දයක් අවශ්‍ය බව ඉතාම පැහැදිලියි. එසේ නැත්නම් ජන මත විචාරණයක් පවත්වන්න ඕනෑ.

ඊයේ සම්මත වූ බවට ප්‍රකාශ කරන, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අනුව හරියාකාරව ඡන්ද විමසීමක් පැවැත්වුණේ නැහැ. සියලු දෙනා සභා ගර්භයේ කිසිම ස්ථානයක නොසිටි අවස්ථාවක ඡන්දය විමසූ බව ප්‍රකාශ කරමින් ඡන්දයක් ප්‍රකාශයට පත් කර තිබෙනවා. මහ ලේකම්තුමා ඔබතුමාට වැරදි උපදෙසක් දීම මත ඡන්දය ප්‍රකාශ කළ බව මේ අවස්ථාවේ සඳහන් කරන්නේ ඉතාම කනගාටුවෙන්. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත ඊයේ සම්මත කළා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට මෙහි සාමාජිකයන් පත් කිරීමට පවරා ඇති වගකීම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු ආයතනවලට අයත් වන්නේ නැහැ. ඒ නිසා මෙය ආණ්ඩුක්‍රමය උල්ලංඝනය කිරීමක් ලෙසත්, ජනාධිපතිතුමාගේ බලතල උදුරා ගැනීමක් ලෙසත් සඳහන් කරනවා. එය කිසි ලෙසකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව සම්මත වන්නේ නැත්නම් වලංගු වන්නේ නැහැ. ගරු කථානායකතුමනි, විරුද්ධ පක්ෂයට කුමන අයිතිවාසිකම් නොමැතිව ගියත්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව කටයුතු කරන ලෙසත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව කටයුතු කරන ලෙසත් යළිත් ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ, ඊයේ සම්මත වූ පනත් කෙටුම්පත වලංගු නැති නිසා, යළි එය පරීක්ෂණ කොට සලකා බැලීම සඳහා කටයුතු කළ යුතුය කියන බරපතළ කාරණය ඉදිරිපත් කරමිනුයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවස්ථාව තිබෙන්නේ ගරු සභානායකතුමාට. ඊට පස්සේ ඔබතුමාට අවස්ථාව දෙන්නම්. [බාධා කිරීමක්] නැහැ, ගරු සභානායකතුමායි ඉස්සෙල්ලා නැඟිට්ටේ. ගරු සභානායකතුමනි, ඔබතුමා කථා කරන්න. [බාධා කිරීමක්] මා අවස්ථාව දෙන්නම්, ඉඳ ගන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Member, you can speak after me.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මම අවස්ථාව දුන්නා. ඒක පිළිගන්න.

ඊයේත් මම ඔබතුමාට මෙතැනට එන්න එපා කියන විට කඩා බිඳ ගෙන ආවා. දැන් එතුමාට අවස්ථාව දෙන්න. This is an order, please. Yes, Hon. Leader of the House. - [බාධා කිරීමක්] ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඉඳගන්න. බාධා කරන්න එපා. Hon. Leader of the House, you may go ahead.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ඊයේ සම්මත වුණු පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නම් කාට හරි අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරන්න තිබුණා. මම ඊයේත් ඒක කිව්වා. කවුරුවත් අධිකරණයට ගියේ නැහැ. මැයි මාසයේ

22වැනිදා තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. විපක්ෂයට ඕනෑ තරම් කල් තිබුණා, අධිකරණයට ගිහිල්ලා මේ පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධයි කියලා ප්‍රකාශයක් ලබා ගන්න. නමුත් ඒක ඊයේ දවසින් ඉවරයි. අපේ බුදුන් වහන්සේත් දේශනා කර තිබෙනවා වර්තමානයේ ජීවත් වෙන්න කියලා. මේ කටයුත්ත ඊයේ දවසින් ඉවරයි. අද අලුත් දවසක්.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරු සභාව මැදට ආවාම ඔබතුමා මොනවා කරන්නද? ඒ මන්ත්‍රීවරුන්ට ආසනවලට යන්න කියලා ඔබතුමා කිහිප වරක් කිව්වා. එතුමන්ලා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු. ඒ අය ආසනවලට ගියේ නැහැ. සෙංකෝලය උදුරා ගන්න ආවා. ඇත්ත වශයෙන්ම ඊයේ හොඳ විවාදයක් පවත්වන්න තිබුණා. අපි පනත් කෙටුම්පත සම්මත කළාට පාර්ලිමේන්තුව පරාදයි. Though the Bill was passed, Parliament lost. ඒ ගැන මම පෞද්ගලිකව කනගාටු වෙනවා.

මේ වාගේ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට එන්නේ ප්‍රථම වතාවටයි. ඒ නිසා ඇත්ත වශයෙන්ම අපට හොඳ විවාදයක් කරන්න තිබුණා. මම ඔබතුමාට කියනවා, ඊයේ ගෙනා පනත් කෙටුම්පත පදනම් කර ගෙන කිසිම කෙනකුට නඩුවක් දමන්න බැහැ කියා. There is no criminal liability. මම කියන්නේ මේකයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි වෙලාව ඉල්ලුවාම වෙලාව දෙන්න අගමැතිතුමා එකඟ වුණා. ඔබතුමා තමයි බැහැ කිව්වේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම බැහැ කිව්වේ නැහැ. [බාධා කිරීමක්] මම පැය දෙකක් වැඩියෙන් දෙන්නම් කිව්වා, ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්]

I agreed to give two more hours. 1971 සිද්ධීන්, 1989 සිද්ධීන්, උතුරු නැහෙනහිර යුද්ධය යනාදී සියල්ල ගැනම කථා කරලා මේ ප්‍රශ්නය අවසානයක් කර ගන්න තිබුණා. මවුවරු, පියවරු තමන්ගේ දරුවන් එන කල් තවම බලාගෙන ඉන්නවා. They want to see an end to this. ඊයේ ඉදිරිපත් වුණු පනත් කෙටුම්පත එයට බෙහෙවින් උපකාරී වුණා. මා පෞද්ගලිකව කනගාටු වුණා, අපට මේ කරුණු ඉදිරිපත් කරන්න බැරිවීම ගැන.

අනික් කාරණය අතුරුදහන් වූවන්ට වන්දි ගෙවීමයි. 1971දී වේවා, 1989දී වේවා, උතුරු නැහෙනහිර යුද්ධයේදී වේවා අතුරුදහන් වූවන්ට වන්දි ගෙවීම අපි කළ යුත්තක්. මට මතකයි, 1994දී මා පොදුජන එක්සත් පෙරමුණු රජයේ ඉන්නකොට මහනුවර දිස්ත්‍රික්කයේ එකසිය ගණනක් අතුරුදහන් වුණා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතකොට ආණ්ඩුව කවුද? එතකොට ආණ්ඩුව යූඑන්පී ආණ්ඩුව.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒකයි මා කියන්නේ. එදා මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කළ ඇමතිවරයකු හැටියට මා මහින්ද විජේසේකර මැතිතුමා ගෙන්වා එකසිය ගණනකට වන්දි දුන්නා. [බාධා කිරීම්] උතුරු නැහෙනහිර යුද්ධයේදී අතුරුදහන් වුණු අයටත් යම්කිසි වන්දියක් අපි ගෙවන්න ඕනෑ. මේ කරුණු සියල්ල ගැනම ඊයේ අපි සාකච්ඡා කරන්න හිටියේ. නමුත් කියන්න කනගාටුයි, විපක්ෂය ඒ විවාදය විනාශ කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, ස්ථාවර නියෝග 133 කෙරෙහි. 133 ස්ථාවර නියෝගයේ අවසාන කොටස පමණක් මා ඉදිරිපත් කරනවා.

ස්ථාවර නියෝග 133හි අවසාන කොටසේ මෙසේ සඳහන් වනවා:

> "..... එම ඇමතිවරයා එම යෝජනාවට පනත් කෙටුම්පතට හෝ සංශෝධනයට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වි යුතු ය."

මේ ඉදිරිපත් කර තිබෙන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතේ 19වන වගන්තියේ මෙසේ සඳහන් වී තිබෙනවා:

> "මේ පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ඕ.එම්.සී.ට පැවරී ඇති කර්තව්‍ය ඉටු කිරීම සඳහා එම කාර්යාලයට හැකිවන පරිදි ප්‍රමාණවත් අරමුදල් රජය විසින් එම කාර්යාලයට ලබා දිය යුතු ය."

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒවා ගැන අපට ඊයේ වාද විවාද කරන්න තිබුණා නේ ගරු මන්ත්‍රීතුමා. ඇයි අද ගන්නේ, ඒක? ඊයේ වාද කරන්න තිබුණා නේ. ඇයි ඔබතුමන්ලා ඊයේ වාද කළේ නැත්තේ? අද වෙන subject එකක් ගැන නේ කථා කරන්නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ කථා කරනකල්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක ගැන වාද කරන්න ඊයේ අවස්ථාව තිබුණා. අද පළමුව ඒවා ගැන කථා කරන්න බැහැ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම කියන්නේ පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියන එකයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, මම අවධානය යොමු කරන්නම්. මම අවධානයට ගන්නම්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේක බල රහිත පනතක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, දැන් වාඩි වෙන්න. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා, ඒ වාගේම මම අහනවා, පාර්ලිමේන්තු සභා ගර්භය මැදින් මෙහාට එන්නත් අවසරය තිබෙනවාද කියලා. ස්ථාවර නියෝගවල එහෙම තිබෙනවාද? ඒකට කවුද වග කියන්න ඕනෑ?

මීළඟට, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ රටේ අතුරුදන් වූවන්ගේ දෙමව්පියන්ට සාධාරණ අයිතියක් තිබෙනවා, තමන්ගේ දරුවන්ට මොකක්ද වුණේ කියලා දැනගන්න. ඒ සහෝදරවරුන්ට අයිතියක් තිබෙනවා, තමන්ගේ සොහොයුරාට මොකක්ද වුණේ කියලා දැනගන්න. ඒ මිතුරන්ට අයිතියක් තිබෙනවා, තමන්ගේ මිතුරන්ට මොකද වුණේ කියලා දැනගන්න. ගරු කථානායකතුමනි, ඒ නිසා කිසිදු පාලකයෙක් සහ පාලනයක් අපේ රටේ පුරවැසියන් අතුරුදන් කොට තමන්ගේ බලය පවත්වාගන්නත්, බලය ලබා ගැනීම සඳහාත් දරන ප්‍රයත්න අපි නතර කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම අපි මේ පනත මඟින් සියල්ල සම්පූර්ණ වෙයි කියා අපේක්ෂා කරන්නේ නැහැ. ගරු කථානායකතුමනි, නමුත් 1988-1989 කාල වකවානුව තුළ මේ රටේ විශාල පිරිසක් අතුරුදන් වීමට භාජන වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඊට ඉහතදීත් අතුරුදන් වීමට භාජන වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ කරුණු බොහොම සැකෙවින් ඉදිරිපත් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඒ වාගේම යුද්ධය වකවානුවේදීත් එහෙමයි, යුද්ධයෙන් පසුවත් එහෙමයි. ලලිත්, කුගන් වැනි තරුණයින් අතුරුදහන් වුණේ ගරු කථානායකතුමනි, යුද්ධයෙන් පස්සේ. ඒ දෙමව්පියන්ට සාධාරණ අයිතියක් තිබෙනවා, තමන්ගේ දරුවන්ට මොකක්ද වුණේ කියලා දැනගන්න. ඒ සඳහා වැදගත් පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. ඒකේ සමහර ඒවාට අපි සංශෝධන ඉදිරිපත් කළා. ගරු කථානායකතුමනි, මීට පෙරත් මේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළ වේලාවේ මේ කණ්ඩායම මේ සභා ගැබ මැදට බැස්සා. වැදගත් සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරන්න අපට තිබුණා. ඒ සංශෝධනවත් ඉදිරිපත් කර ගන්න බැරිවයි එදා ඒ පනත් කෙටුම්පත සම්මත වුණේ. ගරු කථානායකතුමනි, වගකීමකින් යුතුව ඒ පනත් කෙටුම්පතට අපේ සංශෝධන ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. ඒ නිසායි ඒ සංශෝධන ඉදිරිපත් කරමින්, ඒ පනත් කෙටුම්පත සංශෝධනය කිරීම සඳහා අපේ දායකත්වය ලබා දුන්නේ. වැදගත්ම දේ තමයි ගරු කථානායකතුමනි, එහිදී මේ අය සභා ගර්භය මැදට බැහැලා කෑ ගහන්න ඇති. හැබැයි, අපට තිබුණා, අදහස් දැක්වීමේ අවස්ථාවක්. ඒ අයිතියත් එතුමන්ලා උදුරා ගත්තා. ඒකයි සිද්ධ වුණේ. [බාධා කිරීම්]සභා ගර්භය මැදට බැහැලා කෑ ගහලා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අපට තිබුණා, ඒ පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මා එය පිළිගන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
විවාදයට අරගෙන, අපට අදහස් ඉදිරිපත් කරන්න තිබුණා. [බාධා කිරීම්] ඒ කිසිවකට ඉඩ නොදී කඩාකප්පල්කාරී කණ්ඩායමක් ලෙස මෙතැන හැසිරුණා. පනත් කෙටුම්පතේ සංශෝධන, පනත් කෙටුම්පතේ සමහර වගන්ති නිරාකරණය කර ගත යුතුව තිබුණා. පනත් කෙටුම්පතේ තිබුණු සමහර කරුණු නිරාකරණය කර ගත යුතුව තිබුණා. පනත් කෙටුම්පතේ තිබුණු සමහර කරුණු පිළිබඳව අවධානය යොමු කර ගත යුතුව තිබුණා. පනත් කෙටුම්පතේ සමහර කරුණුවලට සංශෝධන ඉදිරිපත් කළ යුතුව තිබුණා. ඒ කිසිවකට ඉඩ නොදී කණ්ඩායමක් සභා ගර්භය මැදට ආවාම කොහොමද කථා කරන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාටයි අවස්ථාව ලබා දෙන්නේ.[බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු අනුර කුමාර දිසානායක මහතා තවම කථා කරනවා. ඔබතුමා කියන ඒවා අහන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාටයි අවස්ථාව දෙන්නේ. දැන් හරි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි,-

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, මාව මරන්නත් හැදුවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා ඉඳගන්න. [බාධා කිරීමක්] ඉඳගන්න. ඔබතුමාට කථා කරන්න වුවමනා නම් අවස්ථාව ලබා දෙන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, -[බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
අපටත් අයිතිය තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අයිතිය තිබෙනවා, අයිතිය තිබෙනවා. ඒ අයිතිය කිසිම විධියකින් මම ඉවත් කරන්නේ නැහැ. මම ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරනවා. [බාධා කිරීම්] ඒ අයිතිය කාටත් තිබෙනවා. [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
කෝ! ඉතින් අපට කථා කරන්න දෙන්නේ නැහැ.[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, කථා කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, කථා කරන්න බැහැ නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
කථා කරන්න දෙන්නේ නැහැ නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. අනුර දිසානායක මන්ත්‍රීතුමා වාඩි වෙන්න. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයටත් ඕනෑ වුණේ පනත් කෙටුම්පත ගැන සාකච්ඡාවට ඉඩ නොදී, වැදගත් කරුණු අවධානයට ලක් කිරීමට ඉඩ නොදී කටයුතු කරන්නයි. ඒකාබද්ධ විපක්ෂයේ මෙතුමන්ලා ඒ වුවමනාව ඉටු කළා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඉන්න. මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්. [බාධා කිරීම්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා කියන ඒවා අහන්නේ නැහැ, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා එතුමාට ඕනෑ විධියට -[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, දැන් මේක ඉවරයක් කරන්න. ඔබතුමාට දිගටම කථා කරන්නට අවස්ථාව දෙන්න බැහැ. [බාධා කිරීම්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඊයේ සම්මත කර ගත්තේ වැදගත් පනත් කෙටුම්පතක්. පාර්ලිමේන්තුව තුළදී ඒ පනත් කෙටුම්පතේ සමහර වැදගත් වගන්ති පිළිබඳව අපට අමාත්‍යතුමාගෙන් පැහැදිලි කර ගත යුතුව තිබුණා. සමහර වගන්තිවලට සංශෝධන ඉදිරිපත් කළ යුතුව තිබුණා. සමහර වගන්තිවලට අපේ විරෝධය සඳහන් කළ යුතුව තිබුණා. ගරු කථානායකතුමනි, ඒ පනත් කෙටුම්පත පිළිබඳව අපට උරුමයක් තිබෙනවා. මොකද, අපේ පක්ෂයේ විශාල සාමාජිකයන් ප්‍රමාණයක් අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව වැදගත් සාකච්ඡාවක් සිදු කිරීමට අප ඉඩ දුන්නා. හැබැයි, අපි දන්නවා, ආණ්ඩුවේ වුවමනාව වී තිබුණේ ඒ පනත් කෙටුම්පත පුළුල් සාකච්ඡාවකට බඳුන් නොකර හිතුවක්කාරී, තක්කඩි ලෙස සම්මත කර ගැනීමයි කියලා. ආණ්ඩුවේ ඒ වුවමනාව ඉටු කර ගන්නට තමුන්නාන්සේලා අවස්ථාව ලබා දුන්නා. තමුන්නාන්සේලා සභාව මැදට ඇවිල්ලා සාකච්ඡාවකින් තොරව ඒ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අවස්ථාව ලබා දුන්නා. අන්තිමට සිද්ධ වුණු දේ තමයි ආණ්ඩුවේ වුවමනාවයි, මේ ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායමේ වුවමනාවයි සමපාතවීම. ඒ අනුව තමයි ඒ පනත් කෙටුම්පත සම්මත වුණේ. මීට වඩා වැදගත් සාකච්ඡාවක් මේ පාර්ලිමේන්තුවේදී කරන්න තිබුණා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාගෙන් පසුව ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ඊයේ මේ සභාවේ උද්ගත වූ තත්ත්වය ගැන අපි කවුරුත් අද කනගාටුවෙන් ඉන්නේ. [බාධා කිරීම්] මම ඒ බව පළමුවෙන්ම කියන්නට ඕනෑ. එවැනි තත්ත්වයක් මේ ගරු සභාවේ ඇතිවිය යුතු නැහැ. ඊයේ අපට විවාදය කරගන්න බැරි වුණාය කියා අපේ සභානායකතුමා කිව්වා. එම විවාදය කර ගන්න බැරි වුණේ, අප අතර එකඟත්වයකින් සභාවේ කටයුතු ගෙන නොයෑම නිසායි. ගරු කථානායකතුමනි, ඔබතුමා නිතරම උත්සාහ කරන්නේ එකඟත්වයකින් යුතුව, සභාවේ වේලාවන් නියම කරගෙන අප සියලු දෙනාම එකට එකතු වෙලා වැඩ කර ගෙන යන්නයි. විවාදයේදී අපේ මත එකිනෙකාට විරුද්ධව ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ අනුව ඒ ඒ දේවල් සම්මත කර ගන්නත් පුළුවන්.

ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්නේ මේකයි. මේ ආරාවුල ඇති වෙලා, මේ තත්ත්වය උද්ගත වුණේ මේ විවාදයට තව එක දවසක් ලබා ගැනීම සඳහා එකඟතාවක් ඇති නොවීම නිසායි. එහෙම නැතිව, විවාද කරන්න බැහැ කියා නොවෙයි. මේ විවාදයට තව එක දවසක් මේ මාසය තුළම ලබාදීමට ආණ්ඩුව එකඟ නොවූ නිසායි. ආණ්ඩුව එසේ ඇට්ටර විධියට ක්‍රියා කිරීම නිසා උද්ගත වුණු තත්ත්වය ගැන ඔබතුමාටවත්, අපටවත් කරන්න දෙයක් නැහැ. නමුත්, ඒ නිසා අපේ සභාවත්, සභාවේ විවාදයත් ඉතාම බාල මට්ටමකට වැටුණා. අනාගත විචාරකයෝ කියාවි, මේ ගරු සභාවේ ඊයේ සම්මත වූ පනතට තිබෙන්නා වූ වටිනාකම ඉතාම අඩු බව. එවැනි තත්ත්වයකට පත් වුණේ ආණ්ඩුවේ ඇට්ටරකම නිසායි. ආණ්ඩුවේ ඇට්ටරකමට අප යට කර ගන්න බැහැ; රූකඩ විපක්ෂය යට කරගන්න පුළුවන්. ගරු කථානායකතුමනි, අප 51දෙනෙකුගේ වුවමනාව නොසලකා ඔබතුමාට මේ සභාව කර ගෙන යන්න බැරි බව ඊයේ හොඳාකාරවම ඔප්පු වුණා. ඒක ඉදිරියේදීත් ඔප්පු වේවි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි,-

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Point of Order එකක්ද?

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
නැහැ, නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ කාටත් මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න අයිතිය තිබෙනවා. එම නිසා එතුමාටත් ඒ අයිතිය දෙන්න. මොකද, අපිත් ඒ අයිතිය ගැන හුඟක් කථා කරපු අයයි.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
එහෙම අයිතියක් නැත්නම් අනික් අයටත් ඒ අයිතිය දෙන්න විධියක් නැහැ. කථා කරන්න මට අයිතියක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවස්ථාව දුන්නා. දැන් කථා කරන්න.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, ඉතිහාසයේ මෙතෙක් නොවූ විරූ පනත් කෙටුම්පතක් තමයි ඊයේ සම්මත කළේ. ඒකට ඒ තරම් හදිසියක් තිබෙන්නේ මොකද කියන කාරණය තමයි අප ප්‍රශ්න කරමින් සිටියේ. 23වැනි දා ඡන්දය විමසන දිනයේදී මේක සාකච්ඡාවට ගන්නයි තිබුණේ. ඊට කලින් සාකච්ඡාවට ගත්තා නම් මොකක්ද කරන්න තිබුණේ? විපක්ෂය විධියට අප 51දෙනෙක් මේ ගරු සභාවේ ඉන්නවා, ගරු කථානායකතුමනි. ඒ 51දෙනා ලක්ෂ ගණනක් ඡන්ද දායකයන් නියෝජනය කරනවා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
එක්කෙනෙක් airport එකේ. [බාධා කිරීම්]

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
පොඩ්ඩක් ඉන්න කෝ මහත්තයෝ, හැම එකටම බාධා කරන්නේ නැතිව. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, එතුමාට අවස්ථාව දෙන්න. ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමනි, I am warning you. එතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, අසූචි වළට පැනපු සූකරයෙක් වාගේ එතුමාට පාර්ලිමේන්තුව ඇතුළේ හැසිරෙන්න එපා කියන්න. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හැකරැල්ලෙක් වාගෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් එතුමාට කථා කරන්න දෙන්න.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මැදහත් කථාවක් මම මේ කරන්නේ. මෙම පනත මේ ඉතිහාසයේ වැදගත්ම පනතක් නම් ඒකට විපක්ෂයට ඉඩ දෙන්න ඕනෑ යුතුකමක් ඔබතුමාට තිබුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තිබුණා. ඒ යුතුකම මම පිළිගත්තා. ඒ යුතුකම අනුව තමයි ක්‍රියා කළේ. මම ඒ ගැන පැහැදිලි කරන්නම්.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
නමුත්, ඔබතුමන්ලා ඉක්මන්කාරී ලෙස ක්‍රියා කරපු නිසායි මේ ප්‍රශ්නය මතු වුණේ. අපේ ගරු සභානායකතුමා කියනවා පාර්ලිමේන්තුව "loss" කියලා. මේ තත්ත්වය තුළ පාර්ලිමේන්තුව "loss" තමයි. 51දෙනෙක් නියෝජනය කරන, ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ මතය නියෝජනය කරන මිනිසුන්ගේ අයිතියට ගරු කරන්නේ නැත්නම් ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව "loss" තමයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඒ කාරණය පිළිගත්තා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ඒක තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, හරි. පිළිගත්තා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, මට කථා කරන්න පොඩ්ඩක් ඉඩ දෙන්න. මේ රටේ තිබුණු ඓතිහාසික යුද්ධය පිළිබඳ කාරණයත් මෙතැනට ගෙනැත් තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා අද මෙහෙම කථා කරනවා. මම එතුමන්ලාට පෞද්ගලිකව ගරු කරනවා. මම ඒකත් කියන්න ඕනෑ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. සෑම මන්ත්‍රීවරයෙකුටම කථා කිරීමට අවස්ථාව ලබා දෙන්න මට අයිතියක් තිබෙනවා. මේ අයිතිය ලබා ගැනීමට විපක්ෂයේ සිටින කාලයේත් අප කථා කළා. අප ඒ වෙනුවෙන් පීඩා වින්දා. ඒ නිසා එතුමාට අවස්ථාව දෙන්න.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
එහෙම අයිතියක් නැත්නම් අපිත් ඒ විධියට දිගටම හැසිරෙනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒකට අපි එහෙම බය නැහැ. ඒකත් මතක තියාගන්න ඕනෑ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ නිසා තමයි ඊයේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගත්තේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ඉන්න මම පිළිතුරු දෙන්නම්.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ඉතිහාසයේ එක්තරා යුගයක මේ රටේ ඡන්දය ඉල්ලන මිනිස්සුත් මැරුවා. ඡන්දය දෙන මිනිස්සුත් මැරුවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එච්චරයිද ඔබතුමාට කියන්න තිබෙන්නේ? ගරු සභානායකතුමනි, පොඩ්ඩක් ඉන්න. Let him finish, Hon. Lakshman Kiriella. Everybody has a right to speak.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු සභානායකතුමනි, මම පොඩි මිනිහෙක් නේ. ඔබතුමා කියනවා නේ මම කථා කරනවාට කැමැතියි කියලා. පොඩ්ඩක් මට ඉඩ දෙන්න කෝ.

ඒ ඉතිහාසය පියමං කරලායි අප මෙතැනට ආවේ. මේ පනත් කෙටුම්පත ගෙන ඒමේ සැබෑ වුවමනාව ඉතිහාසයට යෑම නොවෙයි. මේක ජාත්‍යන්තර වුවමනාව. ජාත්‍යන්තර වුවමනාවටයි මේක කළේ. ඔබතුමාගේ හෘදය සාක්ෂිය ඒක දන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔවා ඊයේ දිනයේ කථා කරන්න තිබුණා නේ. ඊයේ එච්චර අවස්ථාව දීලාත් කථා කළේ නැහැ. මන්ත්‍රීවරු 6දෙනෙක් හිටියා. ඒ අයට අවස්ථාව දුන්නා නේ. අද මේ දේවල් කථා කරන්නේ ඇයි?

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මේ පනත් කෙටුම්පත හදිසියේ ගෙනාපු නිසා තමයි අප විරුද්ධ වුණේ. ජනතාව ලක්ෂ 47ක් නියෝජනය කරන අපට,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊයේ ඔය දේවල් කථා කරන්න තිබුණා නේ. [බාධා කිරීම්] ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපේ හිත මිත්‍ර වාසුදේව නානායක්කාර මැතිතුමා තමයි එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක ජිනීවා ගියේ. මෙතුමා තමයි ජිනීවා ගියේ. ජිනීවා යෑම ගැන අපට ඉගැන්වූයේ මෙතුමා. [බාධා කිරීම්] මෙතුමා අතුරුදන් වූ අයගේ නම් 400 ගණනක ලැයිස්තුවක් අරගෙන ජිනීවා ගියා. ඒ අය ගැන ඊයේ කථා කරන්න තිබුණා. [බාධා කිරීම්] ඔබතුමා මේ "වළට" බැස්සාම කොහොමද කථා කරන්නේ? [බාධා කිරීම්] කනගාටුයි. ලජ්ජයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි අද මෙතැනින් ඒ කාරණය ගැන කථා කරන එක නවත්වන්න ඕනෑ.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය ඔබතුමියගේ අදහස මොකක්ද?

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, මට කාරණා දෙකක් කථා කරන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කරුණ ගැනත් එක්කද?

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ඔව්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හැබැයි, ඔබතුමියට මේ කරුණ ගැන ඊයේත් කථා කරන්න තිබුණා. කමක් නැහැ, දැන් කියන්න.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද සම්බන්ධයෙන් මට - [බාධා කිරීම්] කථා කරන්න ඉඩ දෙන්න. මේ ගරු සභාවේදී කාන්තා අයිතිය නැති කිරීමක් ගැන තමයි මට කථා කරන්න තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වනවා. ඊට කලින් කිව යුතුයි, විශේෂයෙන්ම ඊයේ දිනයේ ඇති වුණු සිද්ධිය ගැන අපි බොහොම කනගාටු වන බව.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක හොඳයි.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ඔබතුමා විනිශ්චයකාරවරයෙක් වාගේ දෙපාර්ශ්වයටම සවන් දිය යුතු අවස්ථාවක් ඊයේ තිබුණේ. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ. කෙසේ වෙතත්. මම ඒ ගැන තවදුරටත් කථා කරන්න යන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
පෙරේදා විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා මේ පාර්ලිමේන්තුවේ කථා කරද්දී - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ රාජ්‍ය අමාත්‍යතුමනි, ගරු මන්ත්‍රීතුමියට පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා පෙරේදා පැවැති විවාදයේදී මගේ නම කියලා, කාන්තා මන්ත්‍රීවරියකට හිංසනයක් ඇති වන ආකාරයට, පීඩාවක් ඇති වන ආකාරයට අපහාසාත්මක විධියට කථා කර තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ වචන ටික මම මේ සභා ගර්භයේ ආපහු කියන්න යන්නේ නැහැ. ඒකෙන් මට හානියක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, ඒ කාරණය මට ලිඛිතව දැනුම් දෙන්න. අපි අවශ්‍ය පියවර ගන්නම්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමිය සඳහන් කළ කාරණයක් සම්බන්ධයෙන් මට අදහසක් ප්‍රකාශ කරන්න තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා ඉතාම සමබරව ඊයේ ඒ වැඩ කටයුත්ත කළ බව අපි කවුරුත් දැක්කා. පක්ෂ නායක රැස්වීම්, වාර ගණනාවක් පැවැත්වුවා. ඔබතුමා ඊයේ හැම පක්ෂයකටම ආරාධනා කළා කථා කරන්න. නමුත් ඒ අය විනයක් නැතුව සභාව මැදට ආවා. තමන්ගේ නායකයන් රටේ නැති නිසාත්, සමහරුන්ට airport යන්න තිබුණ නිසාත් මේ සභාවේ වැඩ කටයුතු කඩාකප්පල් කරන්න හැදුවා. [බාධා කිරීම්] ඊයේ ඒ විවාදය පවත්වන්න නොදී, අද ජනතා වෛරය මතුවෙනකොට මෙතැනට ඇවිල්ලා ජනතාවට පෙනෙන්න නිකම් රඟපානවා. [බාධා කිරීම්]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා.

අද අපට තිබෙන වේලාව හුඟක් අඩුයි. මේ කාරණය ගැන දිගටම කථා කරන්න ගියොත් අවසන් වෙන්නේ නැහැ. ඒ නිසා මෙතැනින් අවසාන කරමු. මටත් තිබෙනවා කරුණු පැහැදිලි කරන්න. අපි ඊට පස්සේ ප්‍රධාන කටයුතුවලට යනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා කථා කරන්න.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු කථානායකතුමනි, ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ කාරණාව ගැන අපේ විශේෂ අවධානයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම එතුමියට අපහාස වන විධියට ක්‍රියා කිරීම ගැන අපි කනගාටු වෙනවා.

ගරු කථානායකතුමනි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත ගැන අපටත් අපේ අදහස් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව ඊයේ තිබුණා. මම මේ ස්ථානයේ ඉඳගෙන අත උස්සලා ඔබතුමාගෙන් අවස්ථාව ඉල්ලුවා. නමුත් ඔබතුමා ඒකට ඉඩ දුන්නේ නැහැ. අපටත් ස්වාධීන,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, මම ඊයේ කිව්වා, විපක්ෂයේ ඕනෑම මන්ත්‍රීවරයෙකුට කථා කරන්න ඕනෑ නම්, කරුණාකරලා තමන්ගේ ආසනවලට යන්න, මම වේලාව දෙන්නම් කියලා. ආණ්ඩු පක්ෂයේ වෙනත් මන්ත්‍රීවරු කථා කළේත් නැහැ. ඕනෑම මන්ත්‍රීවරයෙකුට අවස්ථාව දෙන්න මම සූදානම් වෙලා සිටියා. හැබැයි, ගරු මන්ත්‍රීතුමන්ලාට සභා ගර්භය මැද සිටගෙන කථා කිරීමට අවස්ථාවක් දෙන්න මට බැහැ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු කථානායකතුමනි, මම මගේ ආසනයට ආවා. මම මගේ ආසනයට ඇවිල්ලා තමයි point of Order එක ඉල්ලුවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා විතරයි ආසනයේ හිටියේ. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් අසුන්වල වාඩි වුණා නම් ඔබතුමාට අවස්ථාවක් දෙන්න තිබුණා. [බාධා කිරීම්]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු කථානායකතුමනි, මගේ අයිතිය පැහැර ගැනීම ගැන මම කනගාටු වෙනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ පනත් කෙටුම්පත සම්මත වෙච්ච ආකාරයත් නීති විරෝධියි. සභාව මැද සිටගෙන තමයි අත උස්සලා පනත් කෙටුම්පත සම්මත කළේ. [බාධා කිරීම්] ඒක පාර්ලිමේන්තු සම්ප්‍රදායට පටහැනියි. ඒක ස්ථාවර නියෝගවලට පටහැනියි. මට තිබුණු ස්වාධීන අදහස් සහ සංශෝධන ඉදිරිපත් කරන්න බැරි වීම ගැන මම කනගාටු වෙනවා. ඒ පිළිබඳ මම ඊට වඩා යමක් කියන්න යන්නේ නැහැ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Mr. Speaker -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හරි. අපි මේ කාරණය දැන් නවත්වමු. I said, "This is the last one". Please, allow me to continue with the work. The Hon. Leader of the House also expects an opinion. So, let me go into the details of that matter.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි ඔබතුමා කිව්වා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ගෞරවය පිළිබඳ විශාල තැකීමක්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමනි, මම ඒ කාරණය ගැන කථා කරනවා. [බාධා කිරීම්]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මෙතැනදී ගරු විදේශ කටයුතු ඇමති මංගල සමරවීර මැතිතුමා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා මම ඒ කාරණය ගැන කථා කරනවා. [බාධා කිරීම්]

ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපට දැන් ප්‍රධාන කටයුතුවලට යොමු වෙන්න තිබෙනවා. මෙම ප්‍රශ්නය ගැන නම් තවත් කථා කරන්න අවස්ථාවක් නැහැ. ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරන්නේත් ප්‍රධාන කටයුත්තක් සම්බන්ධයි. අපත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්. ඔබතුමා හැම වේලාවේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය ගැන කථා කරනවා. මේ සභා ගර්භය මැදට බහින එක -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද මම ඒ ගැන කථා කරනවා. මම ඒ ගැන සඳහන් කරනවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් ඔබතුමා අනිවාර්යයෙන්ම අපට යම් මතයක් ප්‍රකාශ කරන්න ඕනෑ. විනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන සඳහන් කරනවා. මම ඒ පියවර ගන්නවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මෙතැනදී කාන්තා හිංසනය ගැන කථා කරනවා. ඒ වුණාට සාරි උස්සාගෙන ඇවිත් මේ සභා ගර්භය මැද ඉන්නේ. "වළ" ඇතුළේ ඉන්නේ. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

කථානායකවරයා වශයෙන් මමත් මගේ ස්ථාවරය පැහැදිලි කරන්න ඕනෑ. මෙම පනත් කෙටුම්පත මුලින්ම ඉදිරිපත් වුණේ මැයි මාසයේ. ඒ නිසා ඕනෑ තරම් කල් තිබුණා අවශ්‍ය පියවරක් ගන්න. ඊට පසුව අපි අවස්ථා තුනකදී -පක්ෂ නායක රැස්වීම්වලදී- මේ ගැන කථා කළා. ආණ්ඩුවේ ස්ථාවරය වූයේ ඉතාම හදිසි ජාතික කටයුත්තක් නිසා මේ පනත් කෙටුම්පතේ කටයුතු මේ සතියේ අවසන් කළ යුතුයි කියන එක. ඒ නිසා මම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් සහ සභානායකතුමාගෙන් ඉල්ලීමක් කළා, විපක්ෂයේ අයිතිවාසිකම් ලබා දීලා ඔවුන්ට කථා කරන්න අවස්ථාව දෙන්න කියලා. ඒ අනුව විපක්ෂයට තවත් පැය දෙකක කාලයක් දෙන්න සූදානම් වුණා. ඊට පසුව, ඊයේ සවස දෙක වෙන තුරු තවත් කාලය ලබා දෙන්න ගරු අග්‍රාමාත්‍යතුමා එකඟ වුණා.

ඒකාබද්ධ විපක්ෂය, විපක්ෂයක් වශයෙන් පිළිගැනීමට මට අයිතියක් නැති වුණත්, මා පසු ගිය මාස කිහිපය තුළ ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අපගේ සාකච්ඡාවලට සම්බන්ධ කර ගත්තා; එතුමාගේ හඬට කන් දුන්නා. ඒ වාගේම මට මතකයි, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පතට එතුමාගේ යෝජනාවක් ඇතුළත් කිරීමට කාලය දීම නිසා දවස් තුන-හතරක් එය කල් ගිය බවත්. අපි සෑම විටම ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් අයිතීන් ආරක්ෂා කරනවා.

විශේෂයෙන්ම මම සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත මා විසින් ඉදිරිපත් කළ අවස්ථාවේදී දිනේෂ් ගුණවර්ධන මැතිතුමා තමයි එදා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක වශයෙන් සිටියේ. ඒ අවස්ථාවේදී එතුමා මට නැඟිටින්නවත් දුන්නේ නැහැ. ඒක ප්‍රතික්ෂේප කළා. [සෝෂා කිරීම්] අපි ඒවායෙන් පීඩා විඳපු අය. අපි එහෙම පීඩා වින්ද නිසා තමයි විපක්ෂයේ අයට කන් දීමට මම පුළුවන් තරම් උත්සාහ කරන්නේ. මම කියන්න ඕනෑ,- [සෝෂා කිරීම්] පොඩ්ඩක් ඉන්න. ඒකාබද්ධ විපක්ෂයට කථා කරන්න අවශ්‍ය තරම් වේලාව දෙන්න කිව්වාට පස්සේ, පසු ගිය මාස හතර-පහ තිස්සේ අඩුම වශයෙන් සියයට 50ක කාලයක් ඒ අයට වෙන් කර තිබුණා. මම ඊයේත් ඒ ගැන සොයා බැලුවා. හරියටම සියයට 50ක කාලයක් ඒ අයට කථා කරන්න වෙන් කර තිබුණා. සමහර දවස්වල සියයට 58ක කාලයක් වෙන් කර තිබුණා.

මෙම පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කළ අවස්ථාවේදී මත දෙකක් ඉදිරිපත් වුණා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 174 දෙනෙකු නියෝජනය කරන දේශපාලන පක්ෂ මේ පනත් කෙටුම්පත විවාදයට ගන්න එකඟ වුණා. මන්ත්‍රීවරුන් 51ක් නියෝජනය කරන තමුන්නාන්සේලා -ඒකාබද්ධ විපක්ෂය- විරුද්ධ වුණා. ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරනවා නම්, මට බහුතර මතයට කන් දෙන්න වෙනවා. මම සෑම විටම සාධාරණව කටයුතු කරනවා.

ඒ වාගේම ඊයේ සිද්ධිය සම්බන්ධවත් මම බොහොම කනගාටුවෙන් සඳහන් කරනවා. මාධ්‍යයෙන් එයට විශාල ප්‍රසිද්ධියක් ලැබුණා. ඒ සම්බන්ධයෙන් එක මාධ්‍යයක සඳහන් වී තිබුණු ආකාරය මම කියන්නම්.

"පාර්ලිමේන්තුව ඇතුළේ සිංදු කියයි; බජව් නටයි; කුණුහරුපත් කියයි."

මේක දැකලා මට හරි වේදනාවක්, ලජ්ජාවක් ඇති වුණා. මොකද, පාර්ලිමේන්තුව තමයි මේ රටේ තිබෙන උත්තරීතරම ස්ථානය. ඒ වාගේම මම ඊයේ ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට කිව්වා, සභා ගර්භය මැදට එන්න එපා කියලා. සභා ගර්භය මැදට එන්න එපා කියලා මා එතුමාට ආයාචනය කළා. එතුමා ඒ ආකාරයෙන් හැසිරුණු දෙවැනි අවස්ථාවයි මේ. මීට කලිනුත් එතුමා ඒ ආකාරයෙන්ම සභා ගර්භය මැදට පැමිණ තිබෙනවා. ඒ අවස්ථාවේදීත් සභාවේ අනවශ්‍ය සිද්ධියක් වුණා.

ඒ අවස්ථාවේ සභා ගර්භය මැදට ඉස්සෙල්ලාම ආවේ ගම්මන්පිල මන්ත්‍රීතුමායි. එවැනි ආකාරයට හැසිරුණේ ඉතා බුද්ධිමත්, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්. යම් ආදර්ශයක් රටට ලැබෙන්න ඕනෑ මෙතැනින්. නමුත්, මේ උත්තරීතර ස්ථානයේ මෙවැනි දේවල් සිදු වෙනවා නම්, අපි සියලු දෙනාම ලජ්ජා වෙන්නට ඕනෑ. ඊයේ සිදු වූ සිද්ධිය සම්බන්ධයෙන් මම ලජ්ජා වෙනවා. ඒ වාගේම දෙපාර්ශ්වයේ සිටින තමුන්නාන්සේලා සියලු දෙනාමත් ඒ ගැන ලජ්ජා වෙන්න ඕනෑ. මොකද, ඊයේ සිදුවීම මිලියන ගණනක් ජනතාව දැකලා තිබෙනවා. එම නිසා මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ මේ ගරු සභාවේ ගෞරවනීය විධියට හැසිරෙන්න කියලායි. දේශපාලනයේදී විප්ලවවාදී විධියට හැසිරෙන්න ඕනෑ. එහෙම හැසිරෙන්න ඕනෑ නම්, ඒකට ලිප්ටන් වටරවුම තිබෙනවා. එහෙම නැත්නම් කොටුව station එක ඉදිරිපිට පුළුවන්; මරදාන station එක ඉදිරිපිට පුළුවන්. එහෙම නැත්නම් හයිඩ් පාර්ක් එක තිබෙනවා. නමුත් මේ සභාවේදී එහෙම හැසිරෙන්න බැහැ. මා සිංහල භාෂාවෙන්ම කියනවා නම්, වැසිකිළියේ කරන දේ කෑම කාමරයේ කරනවා නම්, ඒක වැරැදියි. ඒ නිසා මා ගෞරවයෙන් ආයාචනය කරනවා, "ගරු මන්ත්‍රීවරුන්" කියන ආමන්ත්‍රණය ලබන්න පුළුවන් විධියට මේ ගරු සභාවේ කටයුතු කරන්න කියලා.

ඊළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා, ගරු සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ රැස්වීම
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of the motions agreed to by Parliament on 08.03.2016 and 11.08.2016, the hours of sitting this day shall be 9.30 a.m. to 12.30 p.m. and 1.30 p.m. to 6.30 p.m.. At 9.30 a.m. Standing Order No. 7(5) of the Parliament shall operate. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா வினவப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කල් තැබීමේ යෝජනාව, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SPEAKER left the Chair, *and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

විදේශගත රැකියා නියුක්තිකයන් මුහුණ දෙන ගැටලු
வெளிநாடுகளில் தொழில்புரியும் இலங்கையர் எதிர்நோக்கும் பிரச்சினைகள்
PROBLEMS FACED BY SRI LANKANS EMPLOYED ABROAD

[ප.භා. 10.18]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාව අද ඉදිරිපත් කරන්න ලැබෙන්නේ ඊයේ මේ සභාවේදී ඇති වෙච්ච තත්ත්වය නිසායි. මොකද, ඊයේ පැවැති විවාදය අද දිනය පුරාම කරන්න ලැබෙනවා නම්, අද දිනට නියමිත අපේ යෝජනාව ඉල්ලා අස් කර ගන්න වුණත් අපි සූදානම් කියලා ඊයේ අපේ පාර්ශ්වයෙන් අපි එකඟතාවකට පත් වුණා. ඊයේ මේ පාර්ලිමේන්තුවේ වළට බැහැලා කරන ලද ක්‍රියාවල ප්‍රතිඵල හේතුකොට ගෙන තමයි අද අපිට මේ යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබිලා තිබෙන්නේ. ඒ නිසා එතුමන්ලාටත් ටිකක් ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"විදේශගත රැකියා කරන ශ්‍රී ලාංකිකයින් ලංකාවට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් එවනු ලැබුවද, ඔවුන් මුහුණ දෙන විශාල ගැටලු ප්‍රමාණයක් විසඳුම් නොමැතිව අර්බුදකාරී තත්ත්වයක පවතී.

ඒ යටතේ,

1. බොහෝ මැද පෙරදිග රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයින් අත්තනෝමතික ලෙස රැකියාවලින් ඉවත් කිරීමේ තර්ජනය;
2. විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයින්ගේ දරුවන් ලංකාවේ පාසල්වලට ඇතුළත් කිරීමේදී ඇති වන ගැටලු;
3. ශ්‍රී ලාංකිකයින්ට විදේශ රැකියාවකදී ලැබෙන අවම වැටුප ලංකාවේ ජීවන වියදම අනුව ප්‍රමාණවත් නොවීම සහ ඒ වෙනුවෙන් වන මැදිහත්වීම;
4. විදේශ රැකියා නියුක්තිකයින්ට හඳුන්වා දී ඇති රක්ෂණ ක්‍රමවල ගැටලු;
5. විදේශගත වීමේදී අය කරනු ලබන විවිධ ගාස්තු අය කිරීම සාධාරණ නොවීම;

[ගරු අනුර දිසානායක මහතා]

6. විදේශ රැකියා නියුක්තිකයින් ලංකාවට එවනු ලබන විදේශ විනිමය ප්‍රමාණය සැලකිල්ලට ගෙන ඔවුන්ට තීරු බදු සහිත හෝ සහන සහිත වාහනයක් ලබා ගැනීමට ඇති අපහසුතාව;

7. මැද පෙරදිග සේවය කරන කාන්තාවන්ගේ අනාරක්ෂාව හා ඔවුන්ට ඇති පහසුකම් පිළිබඳව තානාපති කාර්යාල මට්ටමින් මැදිහත්වීමවල ඇති ගැටලු;

මෙම ගැටලු පුළුල් ලෙස සාකච්ඡා කරන ලෙසත්, එම ගැටලු විසඳීම සඳහා මැදිහත් වන ලෙසත්, මේ ගරු පාර්ලිමේන්තුව මඟින් රජයට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථිකමය වශයෙන් බැලුවත්, සමාජමය වශයෙන් බැලුවත් විදෙස් රැකියාවල නියුතු වූවන්ගේ කාර්ය භාරය අපේ රටට ඉතාම වැදගත් වෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා, අද අපේ රටේ ආර්ථිකයේ වැදගත්ම සාධකය බවට පත් වී තිබෙන්නේ විදෙස්ගත රැකියා නියුක්තිකයන් විසින් එවනු ලබන මුදල් ප්‍රමණය බව. මම ඒ ගැන පැහැදිලි කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තේ, රබර්, පොල්, කුළුබඩු, එළවලු, සකස් නොකළ දුම්කොළ වර්ග, සුළු කෘෂිකාර්මික අපනයන හා මුහුදු ආහාර ඇතුළු අපේ කෘෂිකාර්මික අපනයන ආදායමෙහි මුළු එකතුව 2015 වසරේදී ඇමෙරිකානු ඩොලර් 1,002,481යි. ඊළඟට, රෙදි පිළි, ඇඟලුම්, රබර් නිෂ්පාදන, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරන නිෂ්පාදන, ආහාර පාන හා දුම්කොළ, යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන, ප්‍රවාහන උපකරණ, සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන්, පිහන් මැටි නිෂ්පාදන, අනෙකුත් කාර්මික අපනයන ඇතුළු අපේ කාර්මික අපනයන ආදායමෙහි එකතුව ඇමෙරිකානු ඩොලර් 1,007,975යි.

ඊළඟට, 2015 අවුරුද්දේ අපේ රටේ ඛනිජ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් 28යි. වර්ග නොකළ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් 19.5යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 වසරේ මුළු අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් 1,010,504යි. හැබැයි 2015 වසරේදී විදෙස්ගත සේවාවල නියුතු අයගෙන් ලැබුණු ආදායම ඇමෙරිකානු ඩොලර් 1,006,980යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කියන්නේ කාර්මික අපනයන ආදායම, කෘෂිකාර්මික අපනයන ආදායම, ඛනිජ අපනයන ආදායම හා අනෙකුත් අපනයන ආදායම් ඇතුළු ලංකාවේ මුළු අපනයන ආදායමෙන් සියයට 66කට ආසන්න ප්‍රමාණයක් විදෙස් සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් ලබා දෙනවා කියන එකයි. ඒ කියන්නේ අපේ රටට ඩොලර් ගලා ගෙන ඒමේදී, අපේ රටට විදෙස් මුදල් ගලා ගෙන ඒමේදී ප්‍රධාන ප්‍රභවය බවට පත් වෙලා තිබෙන්නේ එම ක්ෂේත්‍රය කියන එකයි. ඒ ක්ෂේත්‍රය ප්‍රධාන ප්‍රභවය බවට පත් වුණාට, අනෙක් හැම ක්ෂේත්‍රයකටම ලබා දෙන පහසුකම් අපි එම ක්ෂේත්‍රයට ලබා දී තිබෙනවාද?

හෝටල් කර්මාන්තය දියුණු කිරීම වෙනුවෙන් අපි යටිතල පහසුකම් සකස් කරලා දෙනවා. විදුලිය ලබා දෙනවා; ජලය ලබා දෙනවා; මංමාවත් හදා දෙනවා. ඒ ක්ෂේත්‍රවල දියුණුව සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් රාජ්‍ය භාණ්ඩාගාරයෙන් මුදල් වැය කරනවා. ඒ විතරක් නොවෙයි, එම ක්ෂේත්‍ර වර්ධනය කිරීම වෙනුවෙන් භාණ්ඩාගාරයට ලැබිය යුතු විශාල බදු මුදල් ප්‍රමාණයක් අපි අත් හරිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එක පැත්තකින් ඒ ක්ෂේත්‍රවල වර්ධනය වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙනවා. අනෙක් පැත්තෙන් ඒ ක්ෂේත්‍රවලින් ලැබිය යුතු බදු මුදල් ප්‍රමාණයක් කපා හරිනවා. ඒ හැම ක්ෂේත්‍රයකටම ඒ ආදායම් ප්‍රමාණය අත් පත් කර ගන්න හැකි වෙලා තිබෙන්නේ, රාජ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා දීලා, රජයට ලබා දිය යුතු බදු ප්‍රමාණයක් කපා හැරීම හරහායි. හැබැයි විදේශ රැකියා ක්ෂේත්‍රය එහෙම නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ක්ෂේත්‍රය හරහා ඇමෙරිකානු ඩොලර් 1,006,980ක ආදායමක් උපයන්න ආණ්ඩුවක් හැටියට දරලා තිබෙන වියදම මොකක්ද? ආණ්ඩුව කිසිම වියදමක් දරලා නැහැ. වියදමක් දරන්නේ නැතිව, ආණ්ඩුව ඔවුන්ගෙන් යමක් උපයා ගන්නා තැනට පත් වෙලා තිබෙනවා.

අද දෙවැනි වතාවට කොරියාවේ යන අයගෙන් කටුනායක ගුවන් තොටුපොළේදී රුපියල් 17,000කට වැඩි මුදලක් අය කරනවා. තමන්ගේ නිවාඩු කාලයට අමතරව යම් කාලයක් ඉඳලා ගියොත් තවත් මුදලක් අය කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවක් ලෙස කල්පනා කරලා එම ක්ෂේත්‍රය වර්ධනය කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් යම් මුදල් ප්‍රතිපාදනයක් වෙන් කරනවා වෙනුවට භාණ්ඩාගාරයට මුදල් එක් රැස් කර ගැනීමේ මාධ්‍යයක් බවට අද එම ක්ෂේත්‍රය පත් කර ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි ඒ විතරක් නොවෙයි, මේ ක්ෂේත්‍රය අපේ රටේ රැකියා වෙළෙඳ පොළේ මොනතරම් අවස්ථා නිර්මාණය කරලා තිබෙනවාද? ආසන්න වශයෙන් ගත්තොත්, අපේ රටේ අවුරුද්දකට රැකියා වෙළෙඳ පොළට ප්‍රවිෂ්ට වෙන්නේ 320,000ක් පමණයි. අපේ රටේ සාමාන්‍ය පෙළ, උසස් පෙළ විභාගයන් සමත්වූවන් සහ අසමත්වූවන් ලෙස -මේ සියල්ල ගත්තොත්- වසරකට අපේ රටේ රැකියා අවශ්‍යතා ලෙස හැදෙන්නේ 320,000යි. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2014 වසරේ අපේ රටෙන් විදේශ රැකියා සඳහා 300,433ක් වාගේ ප්‍රමාණයක් පිටත්ව ගිහින් තිබෙනවා. ඒ කියන්නේ රැකියා අවස්ථා 320,000ක් නිර්මාණය වෙනකොට, ලක්ෂ 3කට ආසන්න ප්‍රමාණයක් මෙරට අත්හැර විදේශ රැකියාවලට පෙලඹිමින් තිබෙනවා. එහෙම නම් වසරකට රැකියා ලක්ෂ 3ක් උත්පාදනය කරන්නේ මොන ක්ෂේත්‍රයේද? අපේ කාර්මික ක්ෂේත්‍රයේ වසරකට රැකියා ලක්ෂ 3ක් උත්පාදනය කරන්නේ නැහැ. EPF එකේ ලියා පදිංචි දායක ප්‍රමාණය බලපුවාම ඒක අපට බලාගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගිය අවුරුද්දේ 50,000කට ආසන්න ප්‍රමාණයක්වත් EPF එකේ අලුතින් ලියා පදිංචි වෙලා නැහැ. එයින් පෙන්නුම් කරන්නේ කාර්මික ක්ෂේත්‍රයේ රැකියාවන් 50,000ක්වත් උත්පාදනය වෙන්නේ නැති බව. කෘෂිකාර්මික ක්ෂේත්‍රය දෙස බැලුවොත්, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියාවල නියුතුව සිටි බොහෝ අය කෘෂිකර්ම ක්ෂේත්‍රය අත්හරිමින් තිබෙනවා. අනෙක් හැම ක්ෂේත්‍රයක්මත් එහෙමයි. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම තිබියදීත් අපේ රටේ වසරකට ලක්ෂ 3කට ආසන්න ප්‍රමාණයක් රැකියා හොයා ගෙන විදේශගත වෙනවා. ඒ අනුව අපේ රටේ රැකියා වෙළෙඳ පොළේ ඇති වී තිබෙන අර්බුදයේ ප්‍රධානම උත්තරය බවට පත් වී තිබෙන්නේ, විදේශ රැකියාවන්වලට පිටත්වීමයි. ඒ පැත්තෙන් ගත්තත් මේ ක්ෂේත්‍රය වැදගත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආසන්න වශයෙන් ගත්තොත් අපේ රටේ පවුල් ලක්ෂ 50යි ඉන්නේ කියලා අපි දන්නවා. මේ පවුල් ලක්ෂ 50න් ගොවි ක්ෂේත්‍රයට සම්බන්ධ පවුල් ඉන්නේ කීයද, රජයේ රැකියාවලට සම්බන්ධ පවුල් ඉන්නේ කීයද, පෞද්ගලික අංශයේ රැකියාවලට සම්බන්ධ පවුල් ඉන්නේ කීයද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විවිධ ක්ෂේත්‍රයන් තුළ නියැලී සිටින ඔක්කෝම පවුල් සංසන්දනය කරලා බැලුවාම, ඒ හැම ක්ෂේත්‍රයකම සිටින පවුල් සංඛ්‍යාවට වඩා වැඩි පවුල් සංඛ්‍යාවක් විදේශගත සේවා නියුක්තිකයන්ගෙන් යැපෙන පවුල් බවට පත් වෙලා තිබෙනවා.

උදාහරණයක් වශයෙන් ගත්තොත්, මීට පෙර හිටපු මුදල් අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අය වැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේදී කිව්වා,"මිලියන 3ක් විදේශගත රැකියාවන්වල නියුතුව සිටිනවා" කියලා. එතුමා මෙම පාර්ලිමේන්තුවේ අය වැය අවස්ථාවේදි කිව්ව කථාව සත්‍ය තොරතුරක්ද කියලා මම දන්නේ නැහැ. ඒ කියන්නේ ලක්ෂ 30ක්. මම හිතන්නේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය සතුව හෝ විදේශ කටයුතු අමාත්‍යාංශය සතුව හෝ ලංකාවෙන් කොපමණ ප්‍රමාණයක් විදේශගත රැකියාවල නිරත වෙනවාද කියලා තවමත් සංඛ්‍යා දත්ත නැහැ. හිටපු මුදල් අමාත්‍යතුමා කිව්වා, විදේශගත රැකියාවන්වල නියුතුව සිටින්නේ ලක්ෂ 30යි කියලා. මා දන්නේ නැහැ ඒක සත්‍යයක්ද කියලා. කොහොම වුණත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මිලියන 3ක් කිව්වේ-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ. පුරවැසියන්. පුද්ගලයන් ලක්ෂ 30ක් විදේශගතව රැකියාවන්වල නිරත වෙනවා. මම දන්නේ නැහැ, විදේශගත රැකියාවන්වල නිරත වෙලා ඉන්න පුද්ගල සංඛ්‍යාව ගරු අමාත්‍යතුමිය කීයක් කියලා කියයිද කියලා. ගරු තලතා අතුකෝරල අමාත්‍යතුමියනි, ඔබතුමියට මතක නම් ඔබතුමිය ළඟ තොරතුරු තිබෙනවා නම් කොතරම් ප්‍රමාණයක් විදේශගත රැකියාවන්වල නියුක්ත වෙනවාද කියලා කියන්න. අපි ගොවි පවුල් ප්‍රමාණය දන්නවා, පෞද්ගලික අංශයේ රැකියා ප්‍රමාණය දන්නවා, රාජ්‍ය අංශයේ රැකියා ප්‍රමාණය දන්නවා. ගරු ඇමතිතුමියනි, විදේශගතව රැකියාවන්වල නිරත වෙනවා යැයි කියන පිරිස කොපමණ ප්‍රමාණයක්දැයි ඔබතුමිය ළඟ සංඛ්‍යා ලේඛනයක් තිබෙනවාද කියා මම අහන්න කැමැතියි. එහෙම එකක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකෙන් තේරෙන්නේ මේක අත්හැරපු රැකියා ක්ෂේත්‍රයක් කියලා. මේ ක්ෂේත්‍රය රටේ රැකියා වෙළෙඳ පොළේ විශාල පංගුවක් ඇති කරනවා. අපේ රටේ වසරකට භාණ්ඩ ආනයනය කිරීම වෙනුවෙන් අපට ඩොලර් බිලියන 20කට ආසන්න ප්‍රමාණයක් වැය වෙනවා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, භාණ්ඩ අපනයනය කරලා අපට ලැබෙන්නේ ඩොලර් බිලියන දහයහමාරක්, එකොළහක් වාගේ ප්‍රමාණයක්. ආසන්න වශයෙන් ගත්තොත්, අපේ රට ඩොලර් බිලියන 9ක වෙළෙඳ ශේෂයක්-වෙළෙඳ හිඟයක්- තිබෙන රටක්. ඒ වෙළෙඳ හිඟය සම්පූර්ණ කරලා තිබෙන්නේ, ඩොලර් බිලියන 7කට ආසන්න ප්‍රමාණයක් අපට සපයන විදේශගත සේවා නියුක්තිකයන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ක්ෂේත්‍රය එක මාසයක් කඩා වැටිලා විදේශගත සේවයේ නියුක්තිකයන් පඩි එව්වේ නැත්නම් ආණ්ඩුව කඩා වැටෙනවා; වෙළෙඳ පොළ කඩා වැටෙනවා. ඒ නිසා අපේ රටේ ආර්ථිකයේ බලවත් වූ පංගුවක් මේ ක්ෂේත්‍රය නියෝජනය කරනවා. ඒ නිසා ඔවුන්ට අපි මීට වඩා අවධානය යොමු කළ යුතු නැද්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

හැබැයි, අද ඇති වී තිබෙන තත්ත්වය තමයි එය මුළුමනින්ම අත්හරින ලද ක්ෂේත්‍රයක් බවට පත්වීම. මොකද, එය තමන්ගේ පෞද්ගලික කාර්යයක් ලෙස සැලකීම. ඒ අනුව විදේශගතවීම තමන්ගේ පෞද්ගලික කාර්යයක්, රැකියාවක් හොයා ගැනීම තමන්ගේ පෞද්ගලික කාර්යයක්, ආදායම් උපයා ගැනීම තමන්ගේ පෞද්ගලික කාර්යයක් බවට පත් වී තිබෙනවා. ඊට වඩා රාජ්‍ය මැදිහත්වීමක් හරහා මෙම පුරවැසියන්ගේ ජීවිත සුරක්ෂිත කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ විදේශගත වූවන් මොන ක්ෂේත්‍රය සඳහාද විදේශගත වෙලා තිබෙන්නේ? 2014 වසරේදී අපේ රටේ පුද්ගලයන් 300,433ක් විදේශගත වෙලා තිබෙනවා කියලා මම කිව්වා. ඒ පුද්ගලයන් 300,433න් වෘත්තීමය රැකියාවන් සඳහා විදේශගතව තිබෙන්නේ 5,372යි. ඒ කියන්නේ සියයට 1.7යි. අනෙක් ඒවා එක්කෝ මධ්‍යම රැකියා, එක්කෝ ලිපිකරු, එක්කෝ පුහුණු ශ්‍රමික, එක්කෝ අර්ධ පුහුණු ශ්‍රමික, එක්කෝ නුපුහුණු ශ්‍රමික, එක්කෝ ගෘහ සේවිකා.

වර්තමානය වන විට අපේ රටෙන් විදේශ සේවය සඳහා වසරකට පිටත්ව යන අයගෙන් සියයට 40කට ආසන්න ප්‍රමාණයක් ගෘහ සේවිකාවන් බවට පත් වී තිබෙනවා. මේ අයගේ බලාපොරොත්තුව බවට පත් වී තිබෙන්නේ මොකක්ද? මහා ආර්ථික සුබ විහරණයන් සහිත ජීවිත ගත කිරීමට නොවෙයි ඔවුන් අපේක්ෂා කර තිබෙන්නේ. එක පැත්තකින් තමන්ගේ දරුවන්ට උගන්වන්නට අපේක්ෂා කරනවා. අනෙක් පැත්තෙන් තමන්ට නිවාසයක් සකස් කර ගැනීමේ අපේක්ෂාව තිබෙනවා. අනෙක් පැත්තෙන් කුඩා වාහනයක් මිලදී ගැනීම පිළිබඳ අපේක්ෂාවක් තිබෙනවා. යම් මුදලක් උපයාගෙන ඇවිත් තමන්ගේම වූ ආදායම් මාර්ගයක් උත්පාදනය කර ගැනීම සඳහා ස්වයං රැකියාවක්, වෙළඳ ව්‍යාපාරයක්, මේ කවර හෝ දෙයක් කිරීමේ අරමුණයි තිබෙන්නේ. අනෙක් පැත්තෙන් ගත්තොත් ඔවුන් විශාල ණය කන්දක හිරවෙලා තිබෙනවා නම් ඒ ණය ගෙවා ගැනීමේ අපේක්ෂාවයි තිබෙන්නේ. එම නිසා මේවා සුබ විහරණයක් සහිත ජීවිත ගත කර ගැනීම වෙනුවෙන් කරන කැප කිරීම් නොවෙයි; එහෙම කරන රැකියාවන් නොවෙයි. ගෙදරදොර ණය පියවා ගන්න, තමන්ගේ දරුවන්ට උගන්වන්න, තමන්ට ගෙයක් හදාගන්න, ස්වයං රැකියාවක් ආරම්භ කරන්න, තමන්ගේ පවුල නඩත්තු කර ගන්න වාගේ මිනිසකුට අවශ්‍ය ඉතා කුඩා මූලික අවශ්‍යතාවන් සපුරා ගැනීමේ අරමුණෙන් තමයි මේ අය විදෙස් ගත වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අයට ඒ අවස්ථාව ලංකාව තුළ නිර්මාණය වෙනවා නම්; ලංකාවේ රැකියාවක් ලබා දෙන්න පුළුවන් නම්, තමන්ගේ පවුල නඩත්තු කිරීමට ආදයම් මාර්ගයක් සකස් කර දෙන්නට පුළුවන් නම් මේ අයගෙන් බොහෝ පිරිසක් මේ ඉතාම දුෂ්කර රැකියාවලට පිටත්ව යන්නේ නැහැ. එම නිසා අපට ඒ පිළිබඳව වෙනම ගැටලුවක් තිබෙනවා. විදෙස් ශ්‍රම වෙළෙඳ පොළේ ලංකාව අත් පත් කර ගන්නේ මේ පංගුවද කියන එක පිළිබඳව අපට ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය අද සමාජ ප්‍රශ්නයක් බවටත් පත් වෙලා තිබෙනවා.

අපි දන්නවා, "ආසියාවේ පවුල" කියන්නේ මොකක්ද කියන එක. මේක "යුරෝපා පවුල" නොවෙයි. ආසියාවේ පවුල තුළ ඊට වඩා බැඳීම් තිබෙනවා. ස්වාමියාගේ රැකවරණය බිරිඳට ඕනෑ. බිරිඳගේ ලෙන්ගතුකම ස්වාමියාට ඕනෑ. දෙන්නාගේම රැකවරණය දරුවන්ට ඕනෑ. ඒක තමයි අපේ රටේ පවුල. අපේ රටේ පවුල විසිරිච්ච පවුලක් නොවෙයි. ස්වාමියා එක තැනක, බිරිඳ එක තැනක, දරුවන් එක තැනක ඉන්න පවුලක් නොවෙයි අපේ රටේ තිබෙන්නේ. අපේ රටේ ඉතිහාසයේ පටන්ම ගොඩ නැඟී තිබෙන්නේ එකට ජීවත්වෙන පවුලක්. ස්වාමියා, බිරිඳ, දරුවා, ස්වාමියාගේ අම්මා-තාත්තා, බිරිඳගේ අම්මා-තාත්තා මේ ඔක්කොටම එකට ජීවත් වෙන පවුල් ඒකකයක් අපට තිබෙනවා. ඒ පවුල් ඒකකය ඇතුළේ තමයි මේ අයගේ සුරක්ෂිත භාවය, ආරක්ෂාව සහ මානසික සුවය රඳා පවතින්නේ. අවුරුදු ගණනාවක්

[ගරු අනුර දිසානායක මහතා]

තිස්සේ තමන්ගේ බිරිඳ නැති ස්වාමියෙකුට, තමන්ගේ මව නැති දරුවන්ට ඇති මානසික තත්ත්වය කුමක්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? එම නිසා සමාජ ප්‍රශ්න විශාල ප්‍රමාණයක් මෙම ක්ෂේත්‍රය තුළ මතුවෙලා තිබෙනවා. එම නිසා මේ ක්ෂේත්‍රය තවදුරටත් වර්ධනය කළ යුතු නැද්ද? ගරු ඇමතිතුමිය මීට අදාළව කැබිනට් පත්‍රිකාවක් දාලා තිබුණායය කියා වාර්තා කර තිබුණා මම දැක්කා, විදේශ ගත වන කාන්තාවන්ගේ වයස් ප්‍රමාණය දැනට අවුරුදු 25යි; අවුරුදු 25 අවුරුදු 22 දක්වා අඩු කරන්නට ඕනෑය කියා. ඒ පිළිබඳව අදහස් දක්වනවිට එතුමිය කිව්වා, "අපිට එහෙම තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ ඒ අය විදේශවලට යන්නට අවස්ථාව ඉල්ලනවා; ඒ වාගේම අපේ රටේ විදෙස් විනිමයේ විශාල ගැටලුවක් ඇති වී තිබෙනවා; එම නිසා මේ අය පැටවීම හරහා තමයි අපට මේ ඇති වී තිබෙන විදෙස් විනිමය ගැටලුවට පිළිතුරු සොයා ගන්න ඕනෑ" කියා. අද ආණ්ඩුවට එතැනටයි එන්න සිද්ධ වී තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය පිට රට රැකියා සඳහා පිටත් වීමක් නොවෙයි. මේ තිබෙන්නේ, ලොරියකට පොල් පටවනවා වාගේ, ට්‍රැක්ටරයකට ගල් පටවනවා වාගේ විදෙස් ගත වෙන්න මිනිස්සු පටවන එක. මොකටද? තමන්ගේ ජීවනෝපාය සකස් කර ගැනීමේ අරමුණෙන්; තමන්ගේ පවුල නඩත්තු කර ගැනීමේ අරමුණෙන්. එම නිසා විශාල සමාජ ව්‍යසනයක් ඇති වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වාමියා සහ බිරිඳ- විවාහ වෙච්ච ජෝඩුවක් - අවුරුදු තුන හතරක් එකට ජීවත්වෙන්නේ නැහැ කියන්නේ, එතැන ජීව විද්‍යාත්මක සාධකයක් තිබෙනවා. ඒ කාන්තාව යමකට පෙළඹෙනවා නම්, ඒ ස්වාමියා යමකට පෙළඹෙනවා නම් එතැන අවිචාරවත්භාවය වනවරකම කියා කාටද කියන්නට පුළුවන් වන්නේ? නැහැ. එතැන තිබෙන්නේ ස්වාභාවික ජීව අවශ්‍යතා. ඒ අවශ්‍යතා අහිමි කරන ලද කණ්ඩායමක් මේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන් පිළිබඳ දක්වන ආකල්පය, ඔවුන් පිළිබඳ දක්වන සැලකිල්ල ඉතාම පහත් අඩියකට පත් වී තිබෙනවා. ඇයි එහෙම සිදු වී තිබෙන්නේ? අනෙක් හැම ක්ෂේත්‍රයකටම සටන් කර තමන්ගේ අයිතිවාසිකම් දිනා ගන්නට පුළුවන්කම තිබෙනවා. වෛද්‍යවරුන්ට පුළුවන්කම තිබෙනවා, වැඩ වර්ජනයක් හරහා ආණ්ඩුවට බලපෑමක් කරන්න. ඒ වාගේම තවත් වෘත්තිකයන්ට පුළුවන්කම තිබෙනවා, විවිධ ක්‍රියාමාර්ග හරහා බලපෑම් කර තමන්ගේ අයිතිවාසිකම් ලබා ගන්න. මේ කණ්ඩායමට එහෙම හැකියාවක් නැහැ. එම නිසා තමුන්නාන්සේලාගෙන් යමක් දිනා ගන්නට පුළුවන්වෙලා තිබෙන්නේම සටන් කර, බලපෑම් කර ආණ්ඩුව හිර කරලා විතරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයට කරන්නට තිබෙන එකම දෙය තමයි, මාසයක් ලංකාවට සල්ලි එවන්නේ නැතිව ඉන්න එක. නමුත් ඔවුන්ට ඒක කරන්නට බැහැ. ඒක කළොත් ආණ්ඩුව විතරක් නොවෙයි අපහසුතාවට පත් වන්නේ, තමන්ගේ ගෙදර දොර අයත් අපහසුතාවට පත් වෙනවා. එම නිසා ඔවුන්ට එවැනි ක්‍රියාමාර්ගයකට යන්න බැහැ. එම නිසා ආණ්ඩුවත් එක්ක ගැටෙන්න වෘත්තීයමය සටන් ඒ අයට නැහැ. ඉල්ලීම් සඳහා කරන අරගලයක් නැහැ. එම නිසා අද මොකද වෙලා තිබෙන්නේ? අරගල කරන්නේ නැත්නම්, ඉල්ලන්නේ නැත්නම්, වෘත්තීය සටන් නැත්නම් ඒ මිනිස්සු ගැන නොසලකන ආණ්ඩුද මේවා? එහෙමනේ මේ ආණ්ඩු. ඒ අය ඉල්ලන්න ඕනෑ; සටන් කරන්න ඕනෑ. ආණ්ඩුව හිර කරන්න ඕනෑ. හිර කළොත් සාකච්ඡාවට එන්න කියනවා, යමක් දෙනවා කියා. ඒකයි මේ ආණ්ඩුවල ප්‍රතිපත්තිය බවට පත්වෙලා තිබෙන්නේ. මොවුන් අපේ පුරවැසියන්. අපේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් සපයනවා. අපේ රටේ විශාල පවුල් ප්‍රමාණයක් නඩත්තු වෙනවා. අපේ රටේ රැකියා වෙළඳ පොළේ විශාල අර්බුදයට උත්තර සපයා තිබෙනවා. මේ සියල්ල සැලකිල්ලට ලක් කරලා රටේ වැදගත්ම ප්‍රජාවක්, වැදගත්ම ක්ෂේත්‍රයක් නියෝජනය කරන පිරිසකගේ මේ ප්‍රශ්නය දෙස අවධානය යොමු කළ යුතුව තිබෙනවා. නමුත් මා දන්නා පරිදි තවමත් ඒ හැඟීමෙන් යුතුව මේ කණ්ඩායම් දෙස බලන ස්වභාවයක් පැවති පාලනය වාගේම පවතින පාලනයේත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොඩනැඟිලා නැහැ.

අපි මේ කණ්ඩායම් මුණ ගැහෙන අවස්ථාවලදී ඔවුන්ට අපට ඉදිරිපත් කරන කරුණු, ඔවුන් අපට එවන ලිපි ගොනුවල තිබෙන කරුණු සම්පිණ්ඩනය කරලා ඔක්කෝම ගත්තේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අඩුම තරමේ මේ අවශ්‍යතා ටිකවත් අපි සපුරන්න සමත් වුණොත් ඒ ක්ෂේත්‍රයට යම් සැලකිල්ලක්, යම් අවධානයක්, ඔවුන්ගේ ගැටලුවලට යම් සහනදායී පියවරක් අපි ගත්තා යැයි කියලා අපට සෑහීමකට පත් වෙන්න පුළුවන්. ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එකින් එක මේ ගැන කියන්නේ.

අපේ හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා අපේ පක්ෂය වෙනුවෙන් ඒ ක්ෂේත්‍රයේ වැඩ කටයුතු භාර අරගෙන ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ නිසා එතුමා වඩාත් සවිස්තරාත්මකව කරුණු දක්වනවා ඇති. ගරු ඇමතිතුමියනි, මේ අයගේ සාධාරණ දුක්ගැනවිල්ල ගැන මා කෙටියෙන් කරුණු කිහිපයක් ඔබතුමියට ඉදිරිපත් කරන්නම්. විදෙස්ගතව සිටින ශ්‍රී ලාංකිකයන්ගේ දරුවන් ලංකාවේ පාසල්වලට ඇතුළත් කිරීමේදී ඇතිවන ගැටලුව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සිදු වී තිබෙන්නේ මොකක්ද? මීට පෙරත් මේ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කළා. ඉතාලිය වැනි රටක ජීවත් වෙන පවුලක් බැලුවොත්, ජපානය වැනි රටක ජීවත් වෙන පවුලක් බැලුවොත්, ප්‍රංශය වැනි රටක ජීවත් වෙන පවුලක් බැලුවොත්, මැද පෙරදිග ජීවත් වෙන පවුලක් බැලුවොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන් දරුවා පාසලට ඇතුළත් වීමේ වයස් සීමාවට එන කොට කල්පනා කරනවා ඉතාලියේ ඉන්නවාද, ඉතාලිය අත් හැරලා ලංකාවට එනවාද කියලා. අඩු මිලට, පහසු මිලට අධ්‍යාපනය ලබාගත හැකි ප්‍රධාන භාෂාවන් තිබෙන්නේ එම රටේ මව් භාෂාවෙන්. එහෙම නැත්නම් ඉංග්‍රීසි භාෂාවෙන් ඔවුන්ට ඉගෙන ගන්න සිදු වෙනවා නම් ඒ සඳහා පාසල්වලට විශාල මුදලක් ගෙවිය යුතුව තිබෙනවා. ඒ නිසා සමහර දරුවන්ට සිදු වෙලා තිබෙනවා, අධ්‍යාපනය හැදෑරීමට ලංකාවට එන්න.

සමහර අය පවුල් ඒකකයක් හැටියට හිටියාට පාසලට ඇතුළත් කිරීමේ අරමුණ සඳහාම දරුවා අරගෙන ආපහු ලංකාවට එනවා. නමුත් පාසලට ඇතුළත් වීමේදී අවුරුදු පහක් සම්පූර්ණ වීම බලනවා. ඔවුන් අවුරුදු පහ සම්පූර්ණ වෙලා තිබෙන්නේ මීලානෝවල. මෙහේ පාසල්වලට ඇතුළත් වීමේදී ඔවුන්ට ඔක්කෝම කැපිලා කැපිලා පාසලක් නැති වෙනවා. ඔවුන්ට ස්ථිර පදිංචියක් හොයා ගන්න බැහැ. ඔවුන් කියන්නද, "මම මීලානෝවල ඉඳන් ආවේ. එතැන ඉඳන් හම්බ වෙන පාසල්වලට ලකුණු කපාගෙන ආවා" කියලා? එහෙම වුණොත් ලකුණු කීයක් හරි ඉස්කෝලෙට දීලා එන්න වෙයි. එහෙම තත්ත්වයකුයි ඇති වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැකලා තිබෙනවා සමහර දරුවන් එම පාසල්වල අවුරුද්දක්, දෙකක් දක්වා

අධ්‍යාපනය හදාරන බව. හැබැයි, විවිධ ගැටලු මතු වෙනවා. ඒ ගොල්ලන් ඉතාලි භාෂාවෙන් හෝ, ප්‍රංශ භාෂාවෙන් හෝ, වෙනත් භාෂාවකින් හෝ අධ්‍යාපනය හදාරලා තිබෙනවා. විශේෂයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය හදාරපු නැති දරුවන්ට මුහුණ දෙන්න වෙන ගැටලුව ගැන බලන්න. ඔවුන්ට අතරමැදි දරුවා අරගෙන එන්න සිදු වෙනවා. අතරමැදි දරුවා අරගෙන ආවාම මොකද වෙන්නේ? මේ පාසලේ කොකැනටද ඇතුළත් කරන්නේ? අඩුම තරමේ මේ ප්‍රජාව ගැන කල්පනා කරලා මේ අයට ඇතුළත් වෙන්න පුළුවන් පහසුකම් සහිත ලෝකයේ ප්‍රධාන භාෂාවලින් සමන්විත එක පාසලක්වත් ගොඩ නහන්න.

ඒ දරුවන් අරගෙන ආවාට පස්සේ එයා ඉගෙන ගත්තේ ඉතාලි භාෂාවෙන් නම් ඉතාලි භාෂාවෙන් ඉගෙන ගන්න පාසලක් තිබෙන්න ඕනෑ. එවැනි එක පාසලක් හෝ ගොඩනහන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇයි, එහෙම කරන්න බැරි? ආර්ථිකයේ වැදගත් ක්ෂේත්‍රයක් නියෝජනය කරන ඒ ගොල්ලන්ගේ දරුවෝ, දරුවෝ නොවෙයිද? ඒ ගොල්ලන්ගේ දරුවන්ට මොකක් හෝ භාෂාවකින් එක දිගට අධ්‍යාපනය හැදෑරීමේ අයිතියක් නැද්ද? ඒ අයිතිය ආණ්ඩුවකින් තහවුරු කළ යුතු නැද්ද? ඒ නිසා ඒ අයිතිය තහවුරු කළ යුතුව තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ දරුවන්ට පාසලකට ඇතුළත්වීමේ ගැටලුව තිබෙනවා. අනෙක් එක ඇතුළත් වී ඉන්න දරුවන් නැවත ලංකාවට ගෙන ඒමේ ගැටලුව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර දෙමව්පියන් ඒ දරුවන්ට යමක් කමක් තේරෙන්න පටන් ගන්න කොට ඔවුන් ඒ රටේ තියාගෙන ඉන්න කැමති නැහැ. ඒ සංස්කෘතිය, ඒ සාම්ප්‍රදායන් අපට ඒ තරම් කිට්ටු නැහැ. ඒ නිසා ඒ දෙමව්පියන් උත්සාහ කරනවා, තමන්ගේ දරුවන් මෙහාට අරගෙන එන්න. ඒ අයගේ දරුවන් වෙන් වෙනවා. බිරිඳ වෙන් වෙනවා. ස්වාමියා වෙන් වෙනවා. මොකක්ද මේ සිදු වෙලා තිබෙන්නේ? ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂ අවධානයක් යොමු කොට විසඳිය යුතු හැටියට පාසල් පිළිබඳ ගැටලුව මතු වෙලා තිබෙනවා. ඔවුන්ට අපේ රටේ ගොඩනැඟිලා තිබෙන ජාත්‍යන්තර පාසැල්වලට යන්න සල්ලිත් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ දරුවන්ට භාෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. අනෙක් කාරණය පන්තියට ඇතුළත් කර ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ ගැටලු දෙකටම අවධානය යොමු කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සාමාන්‍යයෙන් රජයේ සේවකයන්ට එවැනි අවස්ථාවක් තිබෙනවා නේ. මේ දරුවන්ටත් ඒ වාගේ විශේෂ අවස්ථාවක් දෙන්න ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
විශේෂ අවස්ථාවක් ඒ දරුවන්ට ලබා දිය යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හමුදාවේ ක්‍රියාන්විත රාජකාරියේ යෙදෙන අයට විශේෂ අවස්ථාවක් තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හමුදා සේවයේ අයට තිබෙනවා. සමහර රාජ්‍ය නිලධාරින්ට තිබෙනවා. ඒ වාගේම මේ ක්ෂේත්‍රයත් අත් හරින්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක තමයි අද අපේ රටේ තිබෙන වැදගත්ම ප්‍රභවය. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න ඕනෑකම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදෙස් රැකියා නියුක්තිකයන්ට හඳුන්වා දී ඇති රක්ෂණ ක්‍රමවල ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. මීට පෙර තිබුණු සෑම මැතිවරණ ප්‍රකාශයකම අදහසක් ඇතුළත් කරනවා, ඒ අය විදේශයන්හි රැකියාවක් කරලා අපේ රටට ආවාට පසුව ඔවුන්ට විශ්‍රාම වැටුපක් ලබා දෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන් කරන්නේ සමාජ කාර්යයක්. මෑද පෙරදිග ගිහිල්ලා කවුරුන් හෝ කෙනෙකු රස්සාව කරන්නේ ඔහුගේ පවුල නඩත්තු කර ගන්න කියලා කෙනෙකුට හිතෙන්න පුළුවන්. බැලූ බැල්මට එහෙම තමයි පෙනෙන්නේ. කොරියාවට ගිහිල්ලා තරුණයෙකු වැඩ කරනවා. ඒ, ඒ අයගේ පවුල නඩත්තු කර ගන්නයි. බැලූ බැල්මට ඒක පෞද්ගලික කාර්යයක් තමයි. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම පෞද්ගලික කාර්යය විසින් තමයි මේ සමාජ කාර්යය සම්පූර්ණ වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි අපේ විදෙස් විනිමය අවශ්‍යතාවයෙන් විශාල පංගුවක් ඒ ක්ෂේත්‍රය නියෝජනය කරන්නේ. කාර්යය පෞද්ගලිකයි. පඩිය එන්නේ තමන්ගේ පවුලට වෙන්න පුළුවන්.

හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන් සමාජ කාර්යයක් නියෝජනය කරලා තිබෙනවා. වැඩ කරන්න බැරි තත්ත්වයක් ඇති වුණාට පස්සේ ඒ පුරවැසියන් බලා ගැනීම සමාජ වගකීමක් වනවා. ඒක සමාජ කාර්ය භාරයක්. අන්න ඒ තර්කය මත තමයි ඔවුන්ට විශ්‍රාම වැටුපක් ලබා දිය යුතුයි කියන යෝජනාව කාලයක් තිස්සේ මතු වෙමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන්ට විශ්‍රාම වැටුපක් ලබා දීම වෙනුවෙන් දරන ලද හැම අවස්ථාවකදීම අදහස වුණේ භාණ්ඩාගාරය පුරවා ගැනීම වෙනුවෙන් මේ අයගෙන් යම් මුදල් ප්‍රමාණයක් අත් පත් කර ගන්නේ කොහොමද කියන එකයි. ඒ ගැන තමයි සැලකිල්ලට ලක් කළේ. පෞද්ගලික අංශයේ සේවකයින්ට වාගේම විදෙස්ගත සේවකයින්ට විශ්‍රාම වැටුපක් ලබා දීමේ අරමුණ බවට පත් වී තිබුණේ අවුරුදු 60 පිරෙන තුරු ඒගොල්ලන්ගෙන් යම් මුදල් ප්‍රමාණයක් අත් පත් කර ගැනීමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආණ්ඩුව පවත්වාගෙන යන්න සල්ලි නැත්නම් ඒ වෙනුවෙන් ඒගොල්ලන්ගේ යම් මුදල් ප්‍රමාණයක් අත් පත් කර ගැනීමයි අරමුණ බවට පත් වී තිබුණේ. ඔවුන්ට අවුරුදු 60 පිරුණාට පස්සේ වෙන්නේ මොකක්ද කියලාවත් බැලුවේ නැහැ. සමහර රක්ෂණ ක්‍රම වාගේම විශ්‍රාම වැටුප් පිළිබඳව ඉදිරිපත්වෙලා තිබෙන යෝජනාවත් යථාර්ථවාදී යෝජනාවක් බවට පත් කළ යුතුයි. රක්ෂණ ක්‍රම සම්බන්ධයෙන් ඇතිවෙලා තිබෙන ගැටලු පිළිබඳව මීට වඩා අවධානය යොමුකොට සාධාරණයක් ඉටු කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොවුන් අපේ රටේ පුරවැසියන්. මේ අය එවන ධනයෙන් තමයි පවුල් ලක්ෂ 20කට වඩා වැඩි ප්‍රමාණයක් අද සෘජුව නඩත්තු වෙන්නේ. අද ගොවි පවුල්

[ගරු අනුර දිසානායක මහතා]

ලක්ෂ 20කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. රාජ්‍ය අංශයේ පවුල් එච්චර ප්‍රමාණයක් නැහැ. නමුත් මේ අය එවන මුදල්වලින් තමයි පවුල් ලක්ෂ 20කට ආසන්න ප්‍රමාණයක් අද නඩත්තු වෙමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන්ට අපේ රටේ පාලකයින් තෝරා පත් කර ගැනීමේ අයිතිය තිබෙන්න ඕනෑ. ඔවුන් ආර්ථිකයෙන් විශාල පංගුවක් නියෝජනය කරනවා වුණත්, සමාජ කාර්යයේදී විශාල පංගුවක් නියෝජනය කරනවා වුණත් ඔවුන් කිසිසේත්ම දායක නොවන ආණ්ඩුවක් හැදෙනවා. ඔවුන් කරන කාර්යයට අනුකූල වන පරිදි මේ රටේ පාලනය තෝරා පත් කර ගැනීමට ඔවුන්ට සාධාරණ අයිතියක් තිබෙනවා. ඒ අයිතිය තහවුරු කළ යුතුව තිබෙනවා.

විශේෂයෙන්ම විදෙස්ගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්ද අයිතිය ලබා දීම සම්බන්ධයෙන් තේරීම් කාරක සභාවක් අපි යෝජනා කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තේරීම් කාරක සභාව සම්බන්ධයෙන් දැන් මතුවෙලා තිබෙන ගැටලුව මොකක්ද? තේරීම් කාරක සභාවට සෑම පක්ෂයකින්ම නම් ඉල්ලනවා. හැබැයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් තවම නම් එවලා නැහැ. මම දන්නා විධියට කණ්ඩායම් නායකයා වශයෙන් කටයුතු කරන දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීවරයාට ලේකම් කාර්යාලය අවස්ථා ගණනාවකදී - දිගින් දිගටම - කියලා තිබෙනවා, මේ අය පත් කරලා එවන්න කියලා. නමුත් පත් කරන්නේ නැහැ. අඩුම තරමින් ආණ්ඩුවට ඒකට විසඳුමක් හොයා ගන්න බැරි නම්, පාර්ලිමේන්තුව හැටියට ඒ පිළිබඳව සාකච්ඡා කරලා, තේරීම් කාරක සභාවක් ගොඩ නඟලා, තේරීම් කාරක සභාව හරහා ඡන්ද අයිතිය තහවුරු කරන්නේ කොහොමද කියලා අපි කල්පනා කරලා බලන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපි සෘජු මැදිහත් වීමක් කරලා තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ අය ඒ වුවමනාව අත් හැර තිබෙන නිසා අද ඒ තේරීම් කාරක සභාව පත් කර ගැනීමට නොහැකි වීමේ අර්බුදයකට මුහුණ දී සිටිනවා. ඒ නිසා ඔවුන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීමේ වැඩසටහනට අපි අවතීර්ණ විය යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන්ට යම් සහනදායී මිලකට වාහනයක් ගැනීමට අවස්ථාව ලබා දෙන්න කියන එක තමයි ඔවුන්ගේ දිගටම තිබෙන ඉල්ලීම වන්නේ. මා ඒවාට විරුද්ධව නොවෙයි මේ කාරණා කියන්නේ. නමුත් අවුරුදු පහෙන් පහට සහනදායී මිලකට වාහනයක් ලබා ගන්න සමහර රාජ්‍ය සේවකයින්ට අවස්ථාව තිබෙනවා. දැන් ආණ්ඩුව කියනවා, "ජීවිත කාලයටම වාහන දෙකක්" කියලා. ඔවුන් ඉල්ලන්නේ ජීවිත කාලයටම එක වාහනයක්. අපි කියන්නේ විදෙස්ගත වුණු හැම කෙනාටම සහනදායී මිලකට වාහනයක් ලබා දෙන්න කියලා නොවෙයි. තමන් විදෙස්ගතවෙලා මෙරටට එවන ලද මුදල් ප්‍රමාණය එහිදී සැලකිල්ලට ගන්න. ඔවුන් කොච්චර මුදල් ප්‍රමාණයක් එවලා තිබෙනවාද කියන කාරණය නිර්ණායකයක් හැටියට ගන්න. මොකද, ඔවුන්ගේ මුදල් briefcaseවල දාගෙන එන ඒවා නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම සල්ලි අරගෙන එන අය ගොඩක් ඉන්නවා. හැබැයි, මේගොල්ලන් එහෙම නොවෙයි. පවුල නඩත්තු කිරීම වෙනුවෙන්, තමන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන්, පවුලේ කෙනෙකුට ලෙඩක් දුකක් හැදුණාම ඒ වෙනුවෙන් නිවස හදා ගැනීම වෙනුවෙන් මාස් පතා ඔවුන් මුදල් එවනවා. ඒ මුදල් සියල්ලම එන්නේ අපේ රටේ බැංකු පද්ධතිය හරහායි. ඒ නිසා ඒ පිළිබඳව විමර්ශනය කරන්න අපහසු නැහැ. හැම කෙනෙක්ම කොච්චර මුදල් ප්‍රමාණයක් එව්වාද කියලා දැනගන්න පුළුවන්. ඒ නිසා ඔවුන් මේ රටට උපයලා තිබෙන විදෙස් විනිමයට අනුපාත වන පරිදි සහනදායී මිලකට ඔවුන්ට වාහනයක් මිල දී ගත හැකි විය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කියන්නේ සුඛෝපභෝගී වාහනයක් පිළිබඳව නොවෙයි. ඩොලර් 5,000 වෙන්න පුළුවන්, ඩොලර් 10,000 වෙන්න පුළුවන්. වසරකට අපිට අවශ්‍ය වෙන්නේ කොච්චර ප්‍රමාණයක්ද කියලා සාකච්ඡා කරලා තීරණය කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනික් කාරණය මෙයයි. ඒගොල්ලන් ඒ රටවල වාහන පාවිච්චි කරනවා. එංගලන්තයේ, මැදපෙරදිග බොහෝ රටවල යම් වැදගත් රැකියාවල නිරත වන බොහෝ පිරිසක් වාහන පාවිච්චි කරන බව අපි දන්නවා. අඩු තරමින් ඔවුන් පාවිච්චි කරන වාහනයවත් ලංකාවට ගෙනෙන්න දෙන්නේ නැහැ. එරටදී වාහනය පාවිච්චි කරලා, අඩු මිලට විකුණලා එන්න ඔවුන්ට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා මේ වාහන පිළිබඳව මතු වෙලා තිබෙන ගැටලුව කෙරෙහි මීට වඩා අවධානය යොමු කළ යුතුව තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඔවුන්ගේ නිවාස පිළිබඳ ප්‍රශ්නය ගනිමු. ගම්වල සිට විදෙස්ගත වන බොහෝ අයගේ බලාපොරොත්තුව ගෙයක් හදා ගැනීම බව අපි දන්නවා. ගේ හදා ගන්න ඕනෑ කියලා අවුරුදු දෙකකට රට යනවා. හැබැයි, අවුරුදු දෙකකට රට ගිහිල්ලා එනකොට අත්තිවාරම විතරයි දාලා අවසානවෙලා තිබෙන්නේ. තව අවුරුදු දෙකකට රට යනවා, ගෙයි බිත්ති නංවනවා කියලා. තව අවුරුදු දෙකකට රට යනවා, වහල ගහනවා කියලා. ඒ අනුව ඔවුන්ට නිවසක් හදා ගන්න වසර දහයකට වඩා වැඩි කාලයක් ගත වෙනවා. ගම්වල සිට විදෙස්ගත වන අයගේ ප්‍රධාන පරමාර්ථය නිවාසයක් ගොඩ නඟා ගැනීමයි. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාසයක් ගොඩ නඟා ගැනීම වෙනුවෙන් ඔවුන් දරන වෙහෙස, ඔවුන් දරන මහන්සිය කොතෙක්ද? ඔවුන්ගේ ජීවිත අවුල් වෙලා තිබෙනවා. සමහර විට ගෙය හදා ගනිද්දී ඔවුන්ගේ පවුල නැති වෙලා තිබෙනවා. සමහරවිට ගේ හදා ගන්නා විට දරුවා අපචාර ක්‍රියාවලට යොමු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමන්ගේ පවුලත්, තමන්ගේ දරුවනුත් විශාල විනාශයකට ඇද දමමින්, ගෙයක් වෙනුවෙන් විශාල ප්‍රයත්නයක් දරන්න ඔවුන්ට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා ඔවුන් නිවසක් ඉදි කරගැනීම පිළිබඳ ගැටලුවකට මුහුණ දෙන කොට, අනෙක් අයට පනවන බදු ප්‍රමාණයෙන්ම නොව යම් සහතිකයක් ලබා දීලා, ආණ්ඩුවේ මිලදී ගැනීම් ආයතන හරහා යම් සහනදායී ක්‍රමයකට භාණ්ඩ මිලදී ගැනීමටත් ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න ඕනෑ. ගෙය හදන්නේ ඔවුන්ගේම ඉඩමේ නම්, එය ඔවුන්ගේම ගෙය නම් ඔවුන්ගේ ඉඩම පිළිබඳ සහතිකයක් ගන්න පුළුවන්; ඔවුන් විසින් එවන ලද මුදල් ප්‍රමාණවල සහතිකයක් ගන්න පුළුවන්. ආණ්ඩුවේ සතොස හෝ භාණ්ඩ විකුණන වෙනත් කුමක් හෝ තැනකට ගිහින් සහනදායී ලෙස තමන්ගේ නිවස ඉදි කරගැනීම වෙනුවෙන් යම් භාණ්ඩ ප්‍රමාණයක් ගැනීමට අවස්ථාව ලබා දිය යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මෙම ක්ෂේත්‍රය වැදගත් ක්ෂේත්‍රයක් ලෙස සලකා මෙම ක්ෂේත්‍රයේ මතු වී තිබෙන ගැටලුවලට කඩිනම් විසඳුම් ලබා දිය යුතුයි. මේ පාර්ලිමේන්තුවේ අවස්ථා ගණනාවකදී -අය වැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේදීත්, ඉන් පසුත් බොහෝ අවස්ථාවලදීත්- මේ ගැන සාකච්ඡා කර තිබෙනවා. හැබැයි එසේ විසඳුම් ලබා දෙනවා වෙනුවට විදේශ සේවා නියුක්ති කාර්යාංශය මොකක්ද කර තිබුණේ? ඒ අයගෙන් එකතු කරගත් ධනය -ඒ මුදල්- උපයෝගි කරගෙන තිබුණා, ඡන්ද ව්‍යාපාරවලට. ගරු අමාත්‍යතුමියනි, ඒ ඔබතුමිය නොවෙයි. ඔබතුමියගේ වාර්තා තවම හම්බ වුණේ නැහැ. ඒ වාර්තා හම්බ වුණොත් එවැනි දේ තිබෙන්නත් පුළුවන්; නැති වෙන්නත් පුළුවන්. දැනට නම් එවැන්නක් ගැන මා දන්නේ නැහැ. නමුත්, තිබෙන වාර්තා අනුවයි අප මේ කියන්නේ. ඒ මුදල්

බැනර් දමන්න යොදා තිබෙනවා. ඒ සල්ලි ඡන්ද කාලයේ එක් එක් අයට කන්න දෙන්න යොදාගෙන තිබෙනවා.

ගරු අමාත්‍යතුමියනි, 2015 නොවැම්බර් මාසයේ 23වන දා ඔබතුමියගෙන් අහපු ප්‍රශ්නයට ඔබතුමියම දීපු උත්තරයක් එදින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 636 සහ 637 හි පළ වී තිබෙනවා. ඔබතුමියම පිළිතුරු දුන්නා, ඒ මුදල්වල අරමුණු, ඒ මුදල්වලට සිදු වෙලා තිබෙන දේ මොකක්ද කියා. නාය යෑමෙන් විපතට පත් රට විරු පවුල්වලට සහන සැලසීම සඳහා ගෙවා තිබෙන ඒවා ගැන සඳහන් වනවා. රට විරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනට ආහාර පාන ලබා ගන්න රුපියල් 6,61,000ක් පමණ ගෙවා තිබෙනවා. කෑම අරගෙන තිබෙන්නේ එකම කඩෙන්. අරමුණු/පරමාර්ථවලට පටහැනිව කරන ලද වියදම් රුපියල් මිලියන 14ක් වෙනවා. මට මතකයි, ඔබතුමිය අමාත්‍යාංශයට ගිහින් වාඩි වූ වෙලාවේම කිව්වා, "මෙහි මහා චංචා, දූෂණ සිදු වෙලා තිබෙනවා. මම එන්න කලින් නම් මේක සිතුවේ නැහැ. ආවාට පසුව තමයි මේකේ හොරකම් දැනෙන්නේ" කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපිත් කල්පනා කළා, 'චණ්ඩි රැජින වාගේ ඇමතිතුමියක් වාඩි වෙලා ඉන්නවා. වැඩේ දෙන්න තමයි හදන්නේ' කියා. හැබැයි කිසිවක් වුණේ නැහැ. FCID යනවා කිව්වා, මේවා කරනවා කිව්වා. නමුත් කිසිවක් වුණේ නැහැ. දැන් ඔබතුමියට පොඩි අනුකම්පාවකුත් ඇති වෙමින් එනවා වාගේ තමයි මට දැනෙමින් තිබෙන්නේ. මා දන්නේ නැහැ, එය හරිද කියා. මේක තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මුදල් -විදෙස්ගත සේවා නියුක්තිකයන්ගෙන් එක් රැස් කරගන්නා ලද ධනය- විවිධ අපහරණයන්ට ලක් කර තිබෙනවා. ඒක කිසිසේත් අනුමත කළ යුතු නැහැ. ඔවුන්ගේ සුබ විහරණය වෙනුවෙන්, ඔවුන්ගේ සමාජ ජීවිතය වෙනුවෙන් වියදම් කිරීම සඳහා කපා ගන්නා ලද, එක් රැස් කරන ලද මුදල් පවා අවභාවිතාවේ යොදවා තිබෙනවා. ඒ නිසා ඒ අයට අලුතින් යමක් ලබා දෙනවා නොව, තිබෙන දේත්, ඔවුන්ට හිමි දේත් විනාශ කිරීමට තමයි පැවැති පාලනයන් කටයුතු කර තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳ අවධානය යොමු කොට ඒ ජනතාවගේ ගැටලුවලට ඉක්මන් විසඳුම් ලබා දීම කෙරෙහි ආණ්ඩුවේ අවධානය යොමු කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, සාකච්ඡා කොට යම් යම් විසඳුම් ලබාගත යුතු නම් ඒ සාකච්ඡාවටත් අපි සූදානම් කියන එක ප්‍රකාශ කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මෙය ඉතාම වැදගත් මාතෘකාවක්. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ස්ථිර කරනවා ඇති.

ගරු අමාත්‍යතුමියගේ අවධානය සඳහා මාත් මේ අවස්ථාවේදී මේ සම්බන්ධයෙන් කාරණයක් කියන්න ඕනෑ. ඉස්සර නම් ලංකාවට එන කොට ඒ අයට තිබුණා, allowance එකක්. ඒ allowance එකට airport එකෙන් එනකොටම බඩු ගන්නේ නැතිව, ලංකාවට ඇවිල්ලා, නිවසට ගොස් අවශ්‍ය දේ ගැන සොයා බලා, මාස දෙකක් තුළ ඒ අවශ්‍ය බඩු ගන්න ඒ අයට පුළුවන් වුණා. නමුත් දැන් එළියේ duty-free සාප්පු නැහැ. ඒ නිසා ගුවන් තොටු පොළ ඇතුළේදීම බඩු ගන්න ඕනෑ. අවුරුදු ගණනක් වැඩ කරලා ලැබෙන allowance එක පාවිච්චි කරන්නත් හොඳටම අමාරුයි. ඒ කාරණයත් අවධානයට ගන්න ඕනෑ.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉතාම වැදගත් දෙයක් ගැනයි කථා කළේ. එම යෝජනාව ස්ථිර කිරීම සඳහා ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[ප.භා. 10.47]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[ප.භා. 10.48]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eran Wickramaratne - Deputy Minister of Public Enterprise Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේදී ගෙන ආ මේ යෝජනාව ගැන කථා කරන්න මටත් අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. අද ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණුවලට ගරු ඇමතිතුමිය පිළිතුරු දේවි කියා මම විශ්වාස කරනවා. නමුත් මේ ගරු සභාවේදී වාද විවාද කිරීම සඳහාත්, අනාගතයේ තීරණ ගැනීම සඳහාත් මීට අදාළ කරුණු කීපයක් මා මතු කිරීමට යනවා.

I want to bring in a few points to the attention of the House that I think we need to be discussing, so that we could look at adopting these in the future. We are talking about Sri Lankans employed abroad. But, we also need to remember that we have no moral right to talk about Sri Lankans employed abroad particularly in domestic situations, until we talk about Sri Lankans employed in domestic situations in our own country. We cannot take the high moral ground until we make sure as a Parliament that they also have rights.

There are international conventions like the ILO Convention on Domestic Workers, which is known as the “C189” that must be signed by Sri Lanka. Today, I am asking Parliament to consider signing and ratification of the C189 that would protect domestic workers in our own country; domestic workers who work in our own homes. I think we should first look at protecting them. If we can protect them, then we have every right to speak about other governments in other countries protecting our workers.

The C189 was adopted by the ILO in June, 2011 and there were two points of intervention. One was the vulnerability and the dependency faced by individual domestic workers and the fact that this was not regarded as a profession - it was under professionalized. So, the key elements that are needed in this is the payment of wages. Every household decides what they could afford

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

rather than what the domestic worker actually demands - the payment of wages. There is no social security for those who work; maternity benefits are not there; hours of work are not stipulated; their living conditions are not like that of the other workers; the personal security is sometimes threatened and there are no dispute resolution methods. If a domestic worker gets into a dispute with the lady or may be the man in the house, the domestic worker will basically be sent home. So, this is the real situation. Therefore, we need to look at protecting these workers if we are going to expect other countries to protect our workers in these domestic situations.

Now, the Sri Lanka Labour Force Survey conducted in 2007 stated that there were about 90,000 domestic workers in the country of which about 60,000 were female domestic workers. There is a current study underway in 2016 and therefore we might get more information and we might get more information on child domestic workers too. So, we must address these issues.

There is one other point I would like to make and that is about the problems that our citizens employed overseas face. These relate to two Conventions; they are the Vienna Convention on Consular Relations and the associated Optional Protocol to the Vienna Convention on Consular Relations. This is on the compulsory settlement of disputes. If we sign the Vienna Convention on Consular Relations, Article 36 of the Treaty - I am suggesting that this is widely debated in Parliament by all sides of the House because there are other consequences that could arise as well - would allow the Sri Lankans arrested abroad to have a full consular access to the Sri Lankan Embassy or High Commission, if they request. This is a right that they will get, if they request it. So, they will be mandatorily given a right, if they are arrested abroad. The Optional Protocol allows disputes regarding the application of the Vienna Convention on Consular Relations to be adjudicated by the International Court of Justice.

Those are the issues that we need to understand; those are the issues that we need to discuss, if we really want to protect our citizens overseas.

According to the Protocol, "disputes arising out of the interpretation or application of the Convention shall lie within the compulsory jurisdiction of the International Court of Justice." Therefore, I think, this needs to be widely debated as I said. But, if we want to really protect our citizens overseas like some other countries do, then we have to become part of these processes.

Although Sri Lanka is a signatory to the 1961 Vienna Convention on Diplomatic Relations and the Optional Protocol to it on Dispute Settlements, that only protects Sri Lankan diplomats who are working abroad. It does not protect a Sri Lankan citizen abroad. Ordinary Sri Lankan citizens are not covered by that Convention and therefore are at risk of receiving inadequate legal representation if arrested. I urge the Parliamentarians, who are here today, to consider these vital international conventions, which will eventually represent the difference between life and death of some citizens.

අද මේ විවාදය තුළදී මම විශේෂයෙන්ම කරුණු දෙකක් එකතු කරන්න කැමැතියි. එකක්, අපේම රටේ නිවාසවල සේවය කරන අයගේ අයිතිවාසිකම් ගැනත් අපි සිතිය යුතුයි කියන කාරණය. මොකද, පිට රට නිවාසවල වැඩ කරන අපේ අය ආරක්ෂා කිරීම ගැන අපි සාකච්ඡා කරන අවස්ථාවේදී අපේම රටේ අපේම නිවාසවල වැඩ කරන සේවකයින්ට අයිතිවාසිකම් නැහැ කියන එකත් මතක් කරන්න ඕනෑ. 2011 ජූනි මාසයේදී ILO සංවිධානයේ C 189 කියන ඒ Convention එක සාකච්ඡා කරන අවස්ථාවේදීත් ඔවුන් විශේෂයෙන්ම සාකච්ඡා කළේ ගෘහ සේවක සේවිකාවන් ගැනයි; ඒ අයගේ අයිතිවාසිකම් ගැනයි. විශේෂයෙන්ම ඒ අයගේ ගෙවීම් පිළිබඳවයි. මොකද, ඒ අයට කරන ගෙවීම් එක එක නිවසේ එක එක් කෙනාට ඕනෑ ඕනෑ විධියට කරනවා. ඒ ගෙවීම් අඩු වැඩි කරනවා. ඒ අයට සමාජ ආරක්ෂාවක් - social security එකක්- නැහැ. ඒ වාගේම කාන්තාවකට දරුවෙකු ලැබෙන්න යනවා නම්, ඒ අයට නිවාඩු දීමක් කියලා එකක් නැහැ. එවැනි අයිතිවාසිකමක් නැහැ. එවැනි අවස්ථාවලදී බොහෝ වෙලාවට ඒ අයව ගෙදර එවනවා. ඒ කාලයට වැටුපක් ලැබෙන්නේත් නැහැ. ඒ කාන්තාවට දරුවා ලැබුණාම තමයි නැවතත් රැකියාවට එන්න පුළුවන් වන්නේ.

වැඩ කරන කාල ප්‍රමාණය වන පැය 8ක රැකියාවක්ද, පැය 18ක රැකියාවක්ද කරන්නේ කියන එකේත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම වැඩ කරන ස්ථානයේ තිබෙන පහසුකම් පිළිබඳවත්, පෞද්ගලික ආරක්ෂාව පිළිබඳවත් ප්‍රශ්න තිබෙනවා. මොකද, මේ හුහක් සේවකයින්ට එක එක පීඩා හිංසන තිබෙනවා. ඒවාට නීතිමය ආරක්ෂාවකුත් නැහැ. ඒ නිසා ගෘහ සේවක සේවිකාවන් ගැන අපි කථා කරන කොට අපේ ගෘහ සේවක සේවිකාවන් පිට රටවලදී ආරක්ෂා කිරීම පිළිබඳව වාගේම මේ ප්‍රශ්නයත් මෙතැනදී මතු කිරීම අවශ්‍යයි කියලා මම හිතනවා.

ඊළඟට, දෙවෙනි කරුණ මම කියන්නම්. 1961දී වියානා ගිවිසුමට අපි අත්සන් තැබුවා. මේක අදාළ වන්නේ රටවල් අතර සම්බන්ධතාව; තානාපති සම්බන්ධතාව පිළිබඳවයි. අපි ඒ ගිවිසුමට අත්සන් තැබුවාම ඒකෙන් ආරක්ෂා වුණේ ශ්‍රී ලාංකික තානාපතිවරු, තානාපති කාර්යාලවල වැඩ කරන අය. ඒ අය පිට රටවල වැඩ කරන කොට ඒ අයට නීතිමය ආරක්ෂාවක් මේකෙන් ලැබෙනවා. නමුත්, ලාංකිකයෙක් පිට රටක වැඩ කරන කොට මොකක් හරි හේතුවක් නිසා ඒ ලාංකිකයාව අත් අඩංගුවට ගත්තොත්, ඒ ලාංකිකයාට නීතිමය ආරක්ෂාවක් නැහැ. ඒ අයට නීතිමය ආරක්ෂාවක් දෙන්න පුළුවන්ද, බැරිද කියන එක අපි කථා කරලා බලන්න ඕනෑ. දැන් මම මේ ප්‍රශ්නය මතු කරන්නේ මේ සභාව තුළ මේ දේවල් සාකච්ඡා වන්න ඕනෑ නිසායි. මොකද, Vienna Convention on Consular Relationsහි 36වන වගන්තියේ සඳහන් කරනවා, ලාංකිකයෙක් පිට රටකදී අත් අඩංගුවට ගත්තොත් අපි මේකට අත්සන් තැබුවා නම්, ඒ ලාංකිකයාට ලංකාවේ තානාපති කාර්යාලයක් හරහා නීතිමය ආරක්ෂාව ලබා ගන්න පුළුවන් කියන එක. නමුත්, අපි මේකට අත්සන් තැබුවත්, අපට ඒ ප්‍රශ්නය International Court of Justice - ICJ- එකට අරගෙන යන්න සිදුවනවා. ICJ එකට ගිහිල්ලා ICJ එකෙන් තමයි තීරණය වන්නේ ඒකේ හරි වැරැද්ද. එතකොට ඒ ප්‍රශ්නය අධිකරණ මාර්ගයකින් තීරණය වනවා. එතකොට ඒකෙන් සිදු වෙන ප්‍රතිවිපාක ඇති වන්න පුළුවන්. අපි ඒක ගැනත් සාකච්ඡා කරන්න ඕනෑ. වාද විවාද කරන්න ඕනෑ.

අපි දන්නවා, සමහර රටවල පුරවැසියන් පිට රටවල ඉන්න කොට ඒ අය අත් අඩංගුවට ගත්තොත්, ඒ අයගේ රටවල තානාපති කාර්යාල හරහා ඒ අයව ආරක්ෂා කරන්න නීතිමය ආවරණයක් තිබෙන බව. අපේ රටේ ඉන්න හුඟක් විදේශිකයින්ටත් ඒ ආරක්ෂාව තිබෙනවා. නමුත්, අපට පිට රටවල එහෙම එකක් නැහැ. අපි මේ ගැන හුඟක් කල්පනා කරන්න ඕනෑ. මොකද, හැම වාද විවාදයකටම පැහිකඩ කිහිපයක් තිබෙනවා. සමහර වෙලාවට ස්වල්ප දෙනෙකු පමණක් ආරක්ෂා කරන්න මේ වාගේ ගිවිසුම් අත්සන් කරන්න අපි අකැමැතියි. නමුත්, වැඩි ප්‍රමාණයක්, -මිලියන ගණනක්- පිට රටවල වැඩ කරන නිසා මේ ගැන සාකච්ඡා කරලා, කථා කරලා තීරණයක් ගන්න වෙලාව ඇවිල්ලා තිබෙනවා කියා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1977 ජේ.ආර්. ජයවර්ධන හිටපු අගමැතිතුමා ශ්‍රී ලංකාවේ ආර්ථිකය විවෘත කළා. එසේ විවෘත කළ නිසා තමයි සාමාන්‍ය පුද්ගලයකුට වුණත් කටුනායක ගුවන් තොටුපොළ හරහා පිට රටකට ගිහිල්ලා ඒ අයගේ ශක්තිය, රැකියාව කරන්න අවස්ථාවක් ලැබුණේ. එදා වන තුරු සාමාන්‍යයෙන් ප්‍රභූ පන්තියේ අයට තමයි පිට රටවල ගිහිල්ලා රැකියාවක් කරන්න අවස්ථාව ලැබුණේ. 1977න් පස්සේ ඒ අවස්ථාව හැමෝටම ලැබුණා. එක අතකින් බැලුවොත් ඒක විශාල පිම්මක්. තවත් අතකින් අපට වාද විවාද කර කියන්න පුළුවන්, "අපේ ආර්ථිකය හැදිලා තිබෙන්නේ විදේශ ආර්ථිකයට ගැති වෙලා. ඒ නිසා තවමත් විශාල ප්‍රමාණයක් -අද සඳහන් කළා වාගේ වසරකට ලක්ෂ තුනකට වඩා ප්‍රමාණයක්- පිට රටවලට ගිහිල්ලා රැකියා සොයනවා" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතකොට අපට තිබෙන ප්‍රශ්නය මොකක්ද? අපට තිබෙන ආර්ථික ප්‍රශ්නය තමයි මේ රටේ ඒ අයට අවශ්‍ය ප්‍රමාණයේ පඩිපතක් ලබා ගන්නට බැරි වීම. දැන් අපේ නව රජයට තිබෙන වැදගත්ම කාර්ය භාරය වන්නේ, රැකියා නිර්මාණය කිරීම විතරක් නොවෙයි, මේ රැකියා නිර්මාණය කරන කොට ඉහළ ආදායම් ලබා ගැනීමේ රැකියා නිර්මාණය කිරීමයි. මේක කරන්න අනිවාර්යයෙන්ම අපට ආයෝජනයත් අවශ්‍යයි; ඉහළ මට්ටමේ තාක්ෂණයත් අපි ලබා ගත යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපේ රජය තීරණය කර තිබෙනවා, හැම දරුවකුටම අවුරුදු 13ක අධ්‍යාපනයක් ලබා දෙන්න. ඒ කියන්නේ මේ අරමුණ තිබෙන නිසා අපොස (සාමාන්‍ය පෙළ), අපොස (උසස් පෙළ) අධ්‍යාපනය පමණක් නොවෙයි, තාක්ෂණික හෝ කාර්මික ශක්තිය අධ්‍යාපනයක් ලබා දෙන්නත් තීරණය කර තිබෙනවා. මේ වෙනස් වීම අපි මේ අවුරුදු දෙක තුළ කරන්න බලාපොරොත්තු වනවා. ඒ ගැන අධ්‍යයනය කරගෙන යනවා. ඒක අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා.

අවසාන වශයෙන් මා කැමැතියි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්ව කරුණක් නැවත කියන්න. පිට රටවල වැඩ කිරීමෙන් ලංකාවේ ආර්ථිකයට යම් කිසි ශක්තියක් ලැබුණත්, එයින් අපට ඇති වන විශාලම ගැටලුවක්, විශාලම ප්‍රශ්නයක් තිබෙනවා. මේ අය පිට රටවල වැඩ කරන්නට යාම තුළින් අපේ රටේ පවුල් ජීවිත සම්පූර්ණයෙන්ම අවුල් කරන ආර්ථික ක්‍රම වේදයක් තමයි ඇති වෙලා තිබෙන්නේ. ඒක ඒ අයගේ වරද නොවෙයි. ඒ, අපි සියලු දෙනාගේම ප්‍රශ්නයක්. මොකද, අපේ ආර්ථිකය හැඩ ගැසී තිබෙන විධියට පවුලක් දීර්ඝ කාලයක් වෙන් වෙලා ඉන්න කොට අපි විශාල සමාජයීය මිලක් ගෙවනවා. ඒ නිසා අපට මේ ක්‍රමවේදය වෙනස් කරන්න පුළුවන් වෙයි කියලා අප සියලු දෙනාම ප්‍රාර්ථනා කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[மு.ப. 11.01]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வெளிநாடுகளுக்கு வேலைவாய்ப்புத் தேடிச் செல்லும் இலங்கையர்கள் எதிர்கொள்ளும் பிரச்சினை தொடர்பான இந்த ஒத்திவைப்பு விவாதத்திலே கலந்துகொள்வதற்கு எனக்கும் சந்தர்ப்பம் தந்தமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இன்றைய நவீன உலகின் தொழில்நுட்பப் புரட்சியானது எமது மக்களின் வாழ்வின் தேவைகளை அதிகரித்துள்ளது. இத்தத் தேவைகளின் காரணமாகச் சகலரும் பணத்தை முதன்மைக் காரணமாகக் கொண்டு பல்வேறு விதமான தொழில் முயற்சிகளில் ஈடுபட வேண்டியதொரு நிர்ப்பந்தம் உருவாகியுள்ளது. இந்த நிர்ப்பந்தத்தின் காரணமாகப் பணம் உழைக்க வேண்டியுள்ளது.

இலங்கையிலே போதுமான வருமானம் அற்றவர்களாகத் தங்களைக் கருதிக்கொள்பவர்கள் பணம் உழைப்பதை நோக்கமாகக்கொண்டு வெளிநாடுகளுக்குச் செல்கின்றனர். இவ்வாறு வெளிநாடுகளுக்குச் செல்கின்றவர்களில் பலர், குறிப்பாக முன்னனுபவமற்ற பெண்கள், அங்கு பல்வேறு விதமான இன்னல்களை எதிர்கொள்வதை நாம் அன்றாடம் பல்வேறு விதங்களில் ஊடகங்களின் மூலமாகவும் நேரடியாகவும் கண்கூடாகக் காணக்கூடியதாக இருக்கின்றது. இலங்கையிலே தொடர்ச்சியாக ஏற்பட்ட யுத்தம், இயற்கை அனர்த்தமான சுனாமி, மற்றும் முறையான வேலைத்திட்டங்கள் இன்மை போன்ற பல்வேறு காரணங்களினால் இவ்வாறு வெளிநாடுகளுக்கு வேலை வாய்ப்பைத் தேடிச்செல்வது சர்வசாதாரணமான ஒரு நிகழ்வாக மாறிவிட்டது. இதனால் அந்நியச்செலாவணியை எமது நாடு உழைத்தாலும் அங்கு செல்பவர்கள் எதிர்கொள்கின்ற பிரச்சினைகள் மட்டுமல்லாது, இங்கு அவர்களைப் பிரிந்து இருக்கின்ற குடும்பங்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகளும் இந்த வருமானத்தினால் ஏற்படும் நன்மைகளைவிட மேலோங்கி இருப்பது இங்கு ஈண்டு குறிப்பிடத்தக்கது.

2013ஆம் ஆண்டின் புள்ளிவிபரப்படி இலங்கையிலே 14 வீதமானவர்கள் வறுமைக் கோட்டின்கீழ் வாழ்ந்துகொண்டிருக் கின்றார்கள் என்பது தெரியவந்துள்ளது. இவ்வாறு வறுமைக் கோட்டின்கீழ் வாழ்கின்றவர்களுக்குச் சரியான வேலைத் திட்டங்கள் அமைத்துக் கொடுக்கப்படாமையால் அவர்கள் வெளிநாடுகளுக்கு வேலைவாய்ப்புத் தேடிச் செல்கின்ற நிர்ப்பந்தத்துக்கு உள்ளாகின்றார்கள். அதுமட்டுமல்ல 2014ஆம் ஆண்டின் புள்ளிவிபரப்படி தினமும் 400 விவாகரத்துக்கள் இடம்பெறுகின்றன. இவ்வாறு குடும்பங்கள் பிரிவதனால் பெண்கள் தலைமைத்துவம் அதிகரித்துச் செல்வதும் இரட்டைச் சுமைகளைப் பெண்கள் சுமக்க வேண்டிய தேவை இருப்பதும் வெளிநாடுகளுக்குச் செல்வதை ஊக்குவிக்கின்ற காரணிகளாகக் காணப்படுகின்றன.

இலங்கை பூராவும் 1,043 பதிவுசெய்யப்பட்ட வேலை வாய்ப்பு முகவர்கள் காணப்படுகின்றனர். இந்த முகவர்களால் சட்டபூர்வமாகவும் சட்டபூர்வமற்ற முறையிலும் பல பெண்கள் வெளிநாடுகளுக்கு வேலைவாய்ப்புக்காக அனுப்பப் படுகின்றார்கள். இவ்வாறு வெளிநாடு செல்கின்ற பெண்களிலே 0.14 வீதத்தினர் தொழில்வாண்மை உள்ளவர்களாகவும் 0.65 வீதத்தினர் நடுத்தரத் தொழில்வாண்மை மிக்கவர்களாகவும் 4.9 வீதத்தினர் தொழிற்றிறன் மிக்கவர்களாகவும் 94 வீதத்தினர்

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය]

எதுவிதத்திலும் தொழிற்றிறன் அற்றவர்களாகவும் இருக்கின்றார்கள். இவ்வாறு தொழிற்றிறன் அற்றவர்களாகச் செல்கின்ற எமது பெண்கள் அங்கு பல்வேறு விதமான இன்னல்களுக்கு ஆளாகின்றார்கள்.

இவ்வாறு பெண்களை வேலைக்கு அமர்த்துகின்ற நாடுகளில் சவூதி அரேபியா, குவைத், கட்டார், ஜோர்தான், ஓமான் போன்ற நாடுகள் முன்னணி வகிக்கின்றன. அங்கு செல்கின்ற பெண்கள் மொழிப் பிரச்சினையை எதிர்கொள்வது, அங்குள்ள நவீனத்துவமான வாழ்க்கை முறைக்கு ஏற்ற வகையிலே தமது தொழிலை ஆற்ற முடியாதிருப்பது, அவர்களது கலாசாரப் பண்பாடுகளுக்கு ஏற்ற முறையிலே செயற்பட முடியாதிருப்பது, சரியான ஊதியங்கள் கிடைக்காமலிருப்பது போன்ற பல்வேறு இன்னல்களை எதிர்கொள்கின்றனர். தமது பிள்ளைகள் மற்றும் குடும்பம் சீராக வாழ வேண்டும் என்பதற்காகப் பணத்தை உழைக்கும் நோக்கத்தில் செல்கின்றவர்களில் பலர் அந்த நோக்கத்தை அடைய முடியாமல், உடல், உள ரீதியான பல்வேறு இன்னல்களுக்கு ஆளாகின்றார்கள்.

அதுமட்டுமல்லாமல், நீண்ட காலமாக அவர்களைப் பிரிந்து இங்கே இருக்கின்ற அவர்களது கணவன்மார் பல்வேறு விதமான அநாகரிகமான செயல்களில் ஈடுபடுகின்றனர். அதாவது மதுபோதைக்கு அடிமையாவது, தகாத உறவுகளை ஏற்படுத்திக்கொள்ளல் போன்ற பல்வேறு செயல்களில் ஈடுபடுகின்றனர். இவ்வாறானவர்களின் பிள்ளைகள் தாய், தந்தையின் அரவணைப்பின்றிப் பிழையான வழிகளில் செல்வதும் சர்வசாதாரணமான ஒரு நிகழ்வாகப் போய்விட்டது. இந்தச் சீரழிவானது தொடர்ந்து இடம்பெறுவதை நாம் அனுமதிக்க முடியாது.

இந்த நிலையில் எமது நாட்டிலே சுயதொழில் வாய்ப்புக்கள், சிறு கைத்தொழில் நிலையங்கள் போன்றவற்றை உருவாக்குவது மட்டுமல்லாது, இங்குள்ள மூலப்பொருட்களைப் பயன்படுத்தி முடிவுப்பொருட்களை ஆக்கக்கூடிய சந்தர்ப்பங்களை ஏற்படுத்திக் கொடுக்கவேண்டும். குறிப்பாக வடக்கு, கிழக்கிலே யுத்தத்தின்போது கைவிடப்பட்ட தொழிற்சாலைகள் மீள இயக்கப்படுவது மிகவும் முக்கியமான ஒரு தேவையாகக் காணப்படுகின்றது. உதாரணமாக முல்லைத்தீவு மாவட்டத்திலே ஒட்டுசுட்டான் பகுதியில் அமைந்துள்ள ஓட்டுத் தொழிற்சாலை யுத்தம் முடிவடைந்து 7 வருடங்களாகியும் இதுவரை மீண்டும் ஆரம்பிக்கப்படவில்லை. ஆனால், முல்லைத்தீவு மாவட்டத்தில் மீள்குடியேற்றத்தின் பின்பு கட்டப்பட்ட பல்லாயிரக்கணக்கான வீடுகளுக்குப் பொருத்தப்பட்ட கூரை ஓடுகள் அனைத்தும் தென் பகுதியிலிருந்து கொண்டுவரப்பட்டவை. எனவே, இந்த ஓட்டுத் தொழிற்சாலை மீள ஆரம்பிக்கப்பட்டிருக்குமேயானால், பல்லாயிரக்கணக்கான வீடுகளின் தேவைகள் உள்ளூரிலேயே பூர்த்தி செய்யப்பட்டிருக்கும்; பலருக்கு வேலை வாய்ப்புக்கள் வழங்கப்பட்டிருக்கும்; வருமானம் அதிகரித்திருக்கும்; வாழ்க்கைத் தரமும் உயர்ந்திருக்கும். இவ்வாறான சிறு விடயங்களிலாவது உடனடிக் கவனம் செலுத்துமா, இந்த அரசு? இந்த நிலைமை நீடித்துக்கொண்டிருக்குமேயானால் வெளிநாடுகளுக்கு வேலைவாய்ப்புத் தேடிச்செல்கின்றவர்களின் எண்ணிக்கை அதிகரித்துச் செல்வதோடு எமது நாட்டின் பண்பாடு, பாரம்பரியம், கலாசாரம் என்பன தொடர்ந்தும் அழிந்துகொண்டு வருவதற்கு நாமே வழிசமைத்தவர்களாகவும் மாறிவிடுவோம். எனவே, இந்தப் பிரச்சினை தொடர்பாக எமது மக்களுக்கு விழிப்புணர்வை ஏற்படுத்தவேண்டிய கட்டாயத்தில் நாம் இருக்கின்றோம்.

இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தின் புள்ளிவிபரங்களின் பிரகாரம் 2009ஆம் ஆண்டு 1,13,678 பேரும், 2010ஆம் ஆண்டு 1,12,752 பேரும், 2011ஆம் ஆண்டு 1,07,491 பேரும், 2012ஆம் ஆண்டு 1,19,011 பேரும், 2013ஆம் ஆண்டு 96,600 பேரும் மத்திய கிழக்கு நாடுகளுக்குப் பணிப்பெண்களாகப் பணிபுரியச் சென்றிருக்கிறார்கள். ஆயினும், குறிப்பாக 2014ஆம் ஆண்டு பணிப்பெண்களாகச் சென்றுள்ளவர்களின் எண்ணிக்கை 88,661 ஆகக் குறைந்திருக்கிறது. இவ்வாறு பெண்கள் தொடர்ந்தும் வெளிநாடுகளுக்குப் பணிபுரியச் செல்வதனால் இங்குள்ள அவர்களது பிள்ளைகளது எதிர்காலம் மற்றும் கல்வி என்பன பாதிக்கப்படுகின்றன. தாயின் அரவணைப்பற்ற நிலையிலே அவர்கள் ஒழுக்கமற்றவர்களாக வாழ்ந்துகொண்டு வருவதனால்தான் இன்று மதுப்பாவனை அதிகரித்துச் செல்கின்ற ஒரு சமூகத்தையும் குழப்பகரமான வேலைகளில் ஈடுபடுகின்ற இளைஞர் கும்பலையும் எம்மால் காணக்கூடியதாக இருக்கின்றது. எமது நாட்டின் கலாசாரத்தின்படி தாய், தந்தையரின் அரவணைப்பில் பிள்ளைகள் வளர்கின்றபோதுதான் ஒரு சிறந்த சமூகத்தைக் கட்டியெழுப்ப முடியும். இதற்கு மாறாகப் பணம் உழைக்கும் நோக்கத்தில் தாய்மார் வெளிநாடு செல்கின்றபொழுது இங்கு குழப்பமான சூழ்நிலை உருவாகின்றது. எமது பண்பாடுகள் சீரழிக்கப்படுகின்றன. ஆகவே, அந்நியச்செலாவணியை மட்டும் கருத்திற்கொண்டு செயற்படும் இந்த நிலை மாற வேண்டும். சுற்றுலாத்துறை வசதிகளை அதிகரிக்கின்ற அதேவேளையிலே வேலைவாய்ப்பைக் கொடுக்கக்கூடிய வகையில் இங்குள்ளவர்களுக்கு சந்தர்ப்பங்களை ஏற்படுத்திக் கொடுக்க வேண்டும்.

குறிப்பாக வடக்கு, கிழக்கில் யுத்தத்திலே அனைத்தையும் இழந்து, தமது உறவுகளைக்கூட இழந்து வெறுங்கையோடு நிற்கின்ற எமது மக்களுக்கு முறையான வேலைவாய்ப்பை வழங்குகின்ற திட்டங்கள் இதுவரை வகுக்கப்படவில்லை. அரச, அரச சார்பற்ற நிறுவனங்களால் கொடுக்கப்படும் உதவிகளால் அவர்களது அடிப்படைத் தேவைகளைக்கூட பூர்த்தி செய்ய முடியாத நிலையே காணப்படுகின்றது. பத்து கோழிக் குஞ்சுகளையோ அல்லது ஒரு பசு மாட்டையோ அல்லது முப்பத்தையாயிரம் ரூபாய் பெறுமதியான நீர் இறைக்கும் இயந்திரமொன்றையோ கொடுப்பதனூடாக வெறுங்கையோடு வந்த எமது மக்களது வாழ்வாதாரத்தைக் கட்டியெழுப்ப முடியாது. மீள்குடியேற்றத்தின் பின்பு அங்கு அதிகளவில் உற்பத்தி செய்யப்படுகின்ற நெல், பால் போன்ற மூலப்பொருட்கள், மூலப்பொருட்களாகவே தென்பகுதிக்குச் செல்கின்றமை மிகவும் வேதனைக்குரிய ஒரு விடயமாகும். யுத்த காலத்திலே போக்குவரத்து சீரற்றிருந்தது; மின்சார வசதியற்றிருந்தது. மேலும், தொழில்நுட்ப அறிவுள்ளவர்கள் இல்லாதிருந்த காரணத்தினால் அங்கு தொழிற்சாலைகள் அமைக்கப்படவில்லை. இந்த நல்லிணக்க ஆட்சி மலர்ந்ததன் பின்பும்கூட எமது பகுதியிலே மிகவும் முக்கியமான விவசாய உற்பத்திகளான அந்த மூலப்பொருட்களை முடிவுப் பொருளாக்கக்கூடிய தொழில்நுட்ப வசதிகள் பொருந்திய கைத்தொழிற்சாலைகள் இதுவரை அமைக்கப்படவில்லை.

நெல்லுற்பத்தியில் ஈடுபட்டு வருகின்ற எமது மக்கள் விலங்குத் தாக்கங்கள், பூச்சித் தாக்கங்கள் போன்ற பல்வேறு விதமான இன்னல்களுக்கு தொடர்ந்தும் ஆளாகி வருகின்றார்கள். அவர்கள் உற்பத்தி செய்கின்ற நெல்லானது ஒரேநாளில் தென்பகுதிக்குக் கொண்டுசெல்லப்படுகின்றது. பின்னர் அந்த நெல் அரிசியாக்கப்பட்டு எமது மக்களின் பாவனைக்கே மீண்டும் வருகின்றது. இந்த நிலை மாறவேண்டும். அதேபோல், மீள்குடியேற்றத்தின் பின்பு வட

පකුතියිලේ පාල් උත්පත්තියානතු මිකවුම් මුක්කියමාන ඔර් උත්පත්තියාක මාතියුළ්ළතු. ආනාල්, අන්තප් පාලෙ මුතිවුප්පොරුළාක මාත්රුම් තොළිත්චාලෙකළ් අංකු අමෙක්කප්පටුමානාල්, අංකුළ්ළ මක්කළුක්කු පල්වේරුවිතමාන වේලෙවාය්ප්පුක්කළෙ වළංක මුතියුම්. ඉන්නිලෙ උරුවාවතර්කුච් චාතකමාන චෙයල්කළ් එතුවුම් ඉතුවරෙ නතෙපෙරවිල්ලෙ.

ඉතුමට්ටුමල්ල, චිරුකෙත්තොළිල්කළෙ මෙයමාකක් කොණ්ට කෙත්තොළිත්චාලෙකළ් උරුවාක්කප්පටවේණ්ටුම්. අරච චාර්පර්ර නිරුවනංකළින් වරුටාන්ත ඔතුක්කීටුකළ්, අවර්රින් නිති උතවිකළ් එන්පන එමතු මක්කළතු අන්රාට අතිප්පතෙත් තේවෙකළෙප් පූර්ත්තිචෙය්යමුතියාත අළවුක්කුත්තාන් වළංකප්පටුකින්රන. ඉතනාල්තාන්, කුරිප්පාක මුල්ලෙත්තීවු මාවට්ටම් ඒළ්මෙයාන මාවට්ටමාක තොටර්න්තුම් කාණප්පටුකින්රතු. එනවේ, නාන් ඉංකු ඒර්කෙනවේ කුරිප්පිට්ටවාරු යුත්ත කාලත්තිල් මූටප්පට්ට තොළිර්චාලෙකළෙ, කුරිප්පාක ඉරචායනත් තොළිර්චාලෙ, ඕට්ටුත් තොළිර්චාලෙ පෝන්රවර්රෙ මීළ ඉයක්කුවතන් මූලම් අංකු වේලෙවාය්ප්පුක්කළෙ අතිකරික්කමුතියුම්.

මේලුම්, යුත්තත්තිලේ තනතු කණවනෙ ඉළන්තු, චකෝතරනෙ ඉළන්තු, තාය්, තන්තෙයරෙ ඉළන්තු වාළුකින්ර පෙණ්කළ් ඉරට්ටෙච් චුමෙකළෙච් චුමන්තු, තමතු වාළ්වාතාරත්තෙක් කොණ්ටුනටත්ත මුතියාමල් පල ඉන්නල්කළුක්කු ආළාකින්රාර්කළ්. ඉතන් කාරණමාකත්තාන් අවර්කළ් වේලෙවාය්ප්පුත් තේටි වෙළිනාටු චෙල්ල මුනෙකින්රනර්. ඉච්චන්තර්ප්පත්තිල් අවර්කළ් පල ඉටෙත් තරකර්කළ්මූලම් තංකළතු පණත්තෙක් කොටුත්තු ඒමාර්ර්රමටෙවතෝටු, කටනාළිකළාකවුම් මාරුකින්රාර්කළ්. ඉතනාල්, ඉවර්කළ් වෙළිනාටු චෙල්ලවුම් මුතියාමල්, ඉංකුම් වාළ්වතර්කු ඒර්ර්ර වළිමුරෙකළ් ඉල්ලාමල් නිර්ක්කතියාක නිර්කින්ර නිලෙයෙ නාම් අවතානික්ක මුතිකින්රතු. ආකවේ, ඉන්ත තුන්පමයමාන නිකළ්වුකළ් මාරවේණ්ටුම් එන්රාල්, ඉන්තච් චූළල් මාරවේණ්ටුමෙන්රාල්, එමතු මක්කළ් නල්ලිණක්කත්තෝටු නල්වාළ්වු වාළවේණ්ටුමෙන්රාල්, චට්ටපූර්වමර්ර මුරෙයිලේ පෙණ්කළ් වෙළිනාටු චෙල්වතෙත් තටුක්කවේණ්ටුම්. පෙණ්කළෙ වෙළිනාටුකළුක්කු අනුප්පුකින්රපොළුතු නිර්වාක රීතියාන පල්වේරුවිතමාන වරෙයර්රකළෙ - ඔළුඞ්කුමුරෙකළෙප් පින්පර්ර වේණ්ටුම්. අතාවතු කිරාම අලුවලරින් අනුමති, පෙණ් අපිවිරුත්ති උත්තියෝකත්තරින් අනුමති, පිරතේච චෙයලාළරින් අනුමති එන්පන පෙරප්පටවේණ්ටුම්. අතර්කු මාරාක, චට්ටපූර්වමර්ර මුරෙකළිල් පෙණ්කළ් ඒර්රුමති චෙය්යප්පටුකින්රාර්කළ්. ඉව්වාරු ඒර්රුමති චෙය්යප්පටුකින්ර පෙණ්කළ් අංකුම්පෝය් පල උටල්, උළ උපාතෙකළුක්කු උළ්ළාකි නිර්ක්කතියාන නිලෙයිල්, වෙරුඞ්කෙයෝටු තිරුම්පි වරුකින්රාර්කළ්. ඉන්ත නිලෙ තොටරක්කූටාතු. ඉතනෙ නිරුත්තුවතර්කු ඒර්රවකෙයිල්, අරචාඞ්කම් ආක්කපූර්වමාන නටවටික්කෙකළිල් ඊටුපට්ටාල්තාන් අවර්කළුක්කුච් චුපිට්චමාන, නල්ලිණක්කමාන වාළ්වෙ ඒර්පටුත්ත මුතියුම්; අතනූටාක එමතු මක්කළතු වාළ්වාතාරත්තෙ මේම්පටුත්ති, ඉන්ත නාට්ටෙයුම් චුපිට්චමටෙයච් චෙය්යමුතියුම් එන්රු කූරි, විටෙපෙරුකින්රේන්. නන්රි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
මීළහට, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා

[පූ.භා. 11.17]

ගරු ජේ. සී. අලවතුවල මහතා
(මාණ්පුමිකු ජේ.සී. අලවත්තුවල)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ මේ වැදගත් යෝජනාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්නට ලැබීම භාග්‍යයක් කොට මා සලකනවා.

අද අපි විදේශ රැකියා සම්බන්ධයෙන් කථා කළොත් එක පැත්තකින් අපට සතුටු වෙන්න පුළුවන්. තව පැත්තකින් කනගාටුදායක අවස්ථා අපට තිබෙනවා. විදේශ රැකියා ක්ෂේත්‍රය ගැන අපි කොහොම කථා කළත්, අපේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම අද වන විට ලක්ෂ 15ක් පමණ විශේෂයෙන්ම මැද පෙරදිග රැකියා ක්ෂේත්‍රයේ නිරත වෙනවා. එක පැත්තකින් මේ විදේශ රැකියා කරන උදවිය විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අපේ රටට ලබා දෙනවා. අපට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ලැබුණත්, විශේෂයෙන්ම කාන්තාවන් විදේශ රටවල ගෘහ සේවිකාවන් ලෙස සේවයේ යෙදවීම නිසා ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා ඉතා පරෙස්සමින් අපි මේ වැඩ පිළිවෙළ තුළ කටයුතු කරන්න ඕනෑ කියන එක පැහැදිලිවම තේරුම් ගත යුතුයි.

විශේෂයෙන්ම වර්තමාන විදේශ රැකියා අමාත්‍ය ගරු තලතා අතුකෝරල මැතිනිය කාන්තාවන් සම්බන්ධයෙන් හොඳින් අවධානය යොමු කරලා, ඉතාම උනන්දුවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කරනවාය කියන එක අපට පැහැදිලියි. එතුමිය මෙම අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ ක්‍රියාත්මක කර තිබෙන වැඩ පිළිවෙළ දෙස බැලුවාම ගෘහ සේවිකාවන් විධියට යන අයගේ ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් අඩු කරලා, අපේ පිරිමි පක්ෂය විදේශ රැකියාවලට යොමු කිරීම සඳහා විශාල උත්සාහක් ගෙන තිබෙන බව පෙනෙනවා.

මේ සංඛ්‍යා ලේඛන තුළින් අපට එය පැහැදිලි වනවා. විශේෂයෙන්ම 2016 වර්ෂයේ පළමුවන කාර්තුවේ -ජනවාරි මාසයේ සිට ජූලි මාසය දක්වා- විදේශගත වී සිටින ලැයිස්තුව ගත්තාම අපට පෙනෙනවා, කාන්තාවන් 15,705ක් සහ පිරිමින් 21,000ක් සෞදි අරාබියට යවා තිබෙන බව. ඒ වාගේම අනෙක් සියලුම රටවල එකතුව ගත්තාම පැහැදිලිවම පෙනෙනවා, මේ මාස 6 තුළ විදේශ රැකියා නියුක්ති කාර්යාංශය හරහා ලියා පදිංචි වෙලා විදේශගත වෙලා සිටින ප්‍රමාණය 1,39,788ක් බව. මේ ප්‍රමාණයෙන් පිරිමි පාර්ශ්වය 92,191ක් සහ කාන්තා පාර්ශ්වය 47,597ක් තමයි මේ මාස 6 තුළ විදේශගත වෙලා තිබෙන්නේ. සියයට ප්‍රමාණය බැලුවත් පෙනෙනවා, මේ අවුරුද්දේ මේ මාස 6 තුළ සියයට 70කට ආසන්න ප්‍රමාණයක් විදේශගත වෙලා තිබෙන්නේ පිරිමි පාර්ශ්වය බව. එහෙම නම්, ගරු තලතා අතුකෝරල මැතිනිය විදේශ රැකියා ඇමතිතුමිය වශයෙන් පත්වුණාට පස්සේ කාන්තාවන් ගෘහ සේවිකාවන් වශයෙන් විදේශගත වීම අඩුවෙලා තිබීම සතුටට කරුණක්. විදේශ රැකියාවලින් තමයි අපට විශාල ආදායමක් ලැබෙන්නේ. නමුත් අපට ආදායම් ලැබෙනවාය කියලා අපේ රටේ කාන්තාවන් තවදුරටත් උනන්දු කරවමින් ගෘහ සේවිකාවන් හැටියට විදේශ රටවලට යවන්න අපේ රජය බලාපොරොත්තු වන්නේ නැහැයි කියන එක එතුමිය පැහැදිලිව ඔප්පු කරලා තිබෙනවා.

විශේෂයෙන්ම අවුරුදු ගණනාවක සංඛ්‍යා ලේඛන බැලුවාම අපට පෙනෙනවා, අපේ රටට විශාල විදේශ විනිමයක් මේ ක්ෂේත්‍රයෙන් ලැබී තිබෙනවාය කියලා. අපි ඒක අමතක කරන්න

[ගරු ජේ. සී. අලවතුවල මහතා]

නරකයි. අපේ ගම් ප්‍රදේශවල ජීවත්වන අහිංසක, අසරණ අම්මලා, තාත්තලා විදේශගත වෙලා, නොයෙකුත් දුක් ගැහැට, කරදර රාශියක් විඳගෙන, ඒ එවන මුදල් ප්‍රමාණය මා හිතන හැටියට විශාල වශයෙන් අපේ රටේ සංවර්ධන කටයුතුවලට යොදවා තිබෙනවා. නමුත් පසු ගිය අවුරුදු 10ක, 15ක කාලය තුළ - පසු ගිය රජය පැවැති කාලයේ - විදේශ ගෘහ සේවය සඳහා සහ අනෙකුත් සේවාවන් සඳහා මේ තරම් ප්‍රමාණයක් යොමුවෙලා තිබීම කනගාටුවට කරුණක්. අපේ රටේ හොඳ රැකියා, හොඳ ආදායම් මාර්ග පසු ගිය රජය හදලා තිබුණා නම් ගෘහ සේවිකාවන්, එහෙම නැත්නම් කාන්තාවන්, ඒ වාගේම කම්කරුවන් හැටියට, එහෙමත් නැත්නම් වෙනත් ආදායම් මාර්ග සඳහා අපේ රටෙන් මේ තරම් ප්‍රමාණයක් විදේශගත වන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

අපේ රජයේ බලාපොරොත්තුව මොකක්ද කියලා ගරු අගමැතිතුමා එදා පැහැදිලි කළා. අපේ රජයේ බලාපොරොත්තුව ඉතාම කෙටි කාලයක් තුළ අපේ රට තුළ දැවැන්ත සංවර්ධනයක් ඇති කිරීමයි. අපේ රටේ පුරවැසියන්ට අපේ රට තුළම රැකියා අවස්ථා ලැබෙනවා නම් තමන්ගේ දරු මල්ලෝ ගෙදර තියලා දුර බැහැර විදේශ රටකට ගිහිල්ලා රැකියාවක් කරන්න අවශ්‍ය නැහැ. තමන්ගේ දරු මල්ලෝ ගෙදර තියලා දුර බැහැර විදේශ රටකට යන්න කවුරුත් කැමති නැහැ. නමුත් පසු ගිය රජය ගෙන ගිය වැඩ පිළිවෙළ තුළ ඒ අයට රැකියා නොමැති නිසා, ආදායම් මාර්ග නැති නිසා තමයි මේ තරම් ප්‍රමාණයකට විදේශගත වෙලා රැකියා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

වර්තමාන රජයේ විදේශ රැකියා අමාත්‍යාතුමිය අපේ තරුණයන් විශේෂයෙන්ම කොරියාව වගේ දියුණු රටවලට පුහුණු ශ්‍රමිකයන් හැටියට යවන්න විශාල උත්සාහයක් ගන්නවා අපි දකිනවා. ඒක තමයි ඉතාම වැදගත් වෙන්නේ. නුපුහුණු කම්කරුවන්, එහෙම නැත්නම් ගෘහ සේවිකාවන් හැටියට අපේ ශ්‍රමිකයන් විදේශ රටවලට යොමු කරනවාට වඩා; ඒ සඳහා උනන්දු කරනවාට වඩා පුහුණු ශ්‍රමිකයන් හැටියට යැවීම වඩාත් ඵලදායී වනවා. කාන්තාවන්ගේ පැත්තෙන් ගත්තොත්, හෙදි සේවය සඳහා අද ලෝකයේ විශාල ඉල්ලුමක් තිබෙනවා. මෙවැනි සේවාවන් සඳහා වැඩිපුර කණ්ඩායම් යවන්න පුළුවන් නම්, ඒ අයට විශාල පඩියක්, එහෙම නැත්නම් විශාල ආදායමක් ලබා ගන්න පුළුවන් වනවා.

මම හිතන විධියට සාමාන්‍යයෙන් ගෘහ සේවිකාවන් 10දෙනෙක් ගන්න පඩිය හෙදියකට ලබා ගන්න පුළුවන්. ඒ වාගේම අනෙකුත් ක්ෂේත්‍ර සඳහාත් තරුණයන් පුහුණු කරලා පුහුණු ශ්‍රමිකයන් හැටියට ඒ අය විදේශගත කරන්න පුළුවන් නම් එය විදේශගත වන පුද්ගලයාටත්, රටටත් විශාල වාසිසහගත තත්ත්වයක් වෙනවා. ගරු ඇමතිතුමිය ඒ සඳහා ගන්නා දැඩි උත්සාහය අපි අගය කරනවා. අපේ රටේ තරුණයන්, ඒ වාගේම කාන්තාවන් පුහුණු ශ්‍රමිකයන් හැටියට විදේශගත කරන්න එතුමිය රටවල් ගණනාවක් සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. එතුමිය ඒ සඳහා ගන්නා වූ උත්සාහය වෙනුවෙන් අපි එතුමියට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම මා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කය ඇතුළු වයඹ පළාතේ අද විශාල ප්‍රමාණයක් විදේශ රැකියාවල නිරත වෙනවා. අපි විදේශ රැකියා ගැන කථා කරන කොට විදේශ රැකියා ඒජන්සිකරුවන් සම්බන්ධයෙනුත් කථා කරන්න ඕනෑ.

මෙහිදී අපි දකිනවා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචි වෙලා සිටින, විදේශ රැකියා ඒජන්සි පවත්වාගෙන යන නියෝජිතයන්ගෙන්, අපේ රට වෙනුවෙන් ඉතාමත් විශිෂ්ට සේවාවක් ක්‍රියාත්මක කරන බොහෝ දෙනෙක් සිටින බව. ඒත් එක්කම මේ ව්‍යාපාරය, එහෙම නැත්නම් විදේශ සේවය අපකීර්තියට පත් කරන සමහර කණ්ඩායම් ඉන්නවා. අපේ ඇමතිතුමිය නීතිය ක්‍රියාත්මක කරලා ඒ අයට නිසි දඬුවම් ලබා දීමට කටයුතු කරනවා. විශේෂයෙන්ම විදේශගත වන සේවක සේවිකාවන්ගේ පැත්තෙන් බලා එතුමිය කටයුතු කිරීම ඉතාම සතුටට කරුණක්. ඒ වාගේම, මේ ගැන හොඳ අවබෝධයකින් එතුමිය කටයුතු කරන බව මා හිතනවා.

විශේෂයෙන්ම, 1985 වැනි කාලවල ඉතාම කුඩා සංඛ්‍යාවක් තමයි විදේශ ගත වෙලා තිබෙන්නේ. විදේශ රැකියා සම්බන්ධයෙන් සම්මත කර තිබෙන පනත සකස් කරලා, -අදට ගැළපෙන විධියට සකස් කරලා- මේ සම්බන්ධව කටයුතු කරනවා නම් ඉතාම වැදගත් කියන කරුණත් මේ අවස්ථාවේදී මතක් කරනවා.

මේ සම්බන්ධයෙන් කථා කරන විට යම් යම් අවස්ථාවලදී අපි මාධ්‍ය තුළින් දකිනවා, විදේශ සේවයේ නියුතුව සිටින සමහර අයට නොයෙකුත් කරදර, හිරිහැර රාශියකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන බව. ඒවා අවම කර ගන්න අද මේ අමාත්‍යාංශය හරහා කටයුතු කිරීම ඉතාම වැදගත් කියන කාරණයත් මා මතක් කරනවා.

විශේෂයෙන්ම අරාබිකරයේ රටවලටත්, අපේ රටේ අය විශාල ප්‍රමාණයක් වැඩ කරන වෙනත් ස්ථානවලටත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන් පත් කර, ඒ ශ්‍රමිකයන්ගේ දුක-සැප සොයා බලා, ඒවාට ක්ෂණිකව විසඳුම් ලබා දෙන වැඩ පිළිවෙළක් මේ වන විට ආරම්භ කර තිබීම පිළිබඳව එතුමියට ස්තුතිවන්ත වනවා.

විදේශ සේවාව ගැන අපි පුළුල් ලෙස අධ්‍යයනය කළ යුතුයි. මෙයින් ලැබෙන ඵල ප්‍රයෝජන වාගේම, මේ තුළින් විශාල ප්‍රමාණයකට ලැබෙන සහනය වාගේම, යම් යම් අයට සිදුවී තිබෙන අසාධාරණකම් සම්බන්ධයෙනුත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තවදුරටත් මීටත් වඩා කාර්යක්ෂමව කටයුතු කරනවා නම් ඉතාම වැදගත්ය කියන කාරණය මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා. 11.27]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට කරවන්නට මුදල් හොයා දෙන්නට කටයුතු කරන, විදේශ රැකියා නියුක්තිකයන් සම්බන්ධයෙන් පැවැත්වෙන මේ වැදගත් විවාදයේදී කථා කරන්නට අවස්ථාව ලැබීම මා ඉතාම අගය කොට සලකනවා.

විශේෂයෙන්ම, අද අපට ආදායමක් වශයෙන් වැඩි විශ්වාසයක් තබාගෙන රට ඉදිරියට ගෙන යන්නට සහ අය වැය ගැන කථා කරන විට රටේ අය වැය පරතරය පියවන්නට විශාලම ශක්තිය ලබා දෙන්නේ මේ විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන විදේශ විනිමයයි. වසරකට ඇමෙරිකානු ඩොලර් බිලියන 9ත් - 10ත් අතර ප්‍රමාණයක ආදායමක් සොයා දෙන්නට මේ අය කටයුතු කරනවා. පිට රට රැකියාවලට යන migrant workersලා අපේ රට වෙනුවෙන් පිට රටවලට ගිහින් දුක් විඳලා මුදල් සොයා ගෙනත් දෙනවා. නමුත් ආණ්ඩුවක් විධියට, රජයක් විධියට මේ අයට දෙන්න පුළුවන් ආරක්ෂාව, රැකවරණය ගැන සෑහීමකට

පත්වන්නට අපට බැහැ. විශේෂයෙන්ම පසු ගිය කාල සීමාව තුළ අපි දැක්කා, මැද පෙරදිග රටවලට රැකියා සඳහා යන සේවකයින්ගේ ජීවිත හානි පවා සිද්ධ වෙනවා. නමුත්, ජාත්‍යන්තර වශයෙන් එළැඹෙන්නට තිබුණු ගිවිසුම්වලට අපි එළැඹුනාද?

ගරු ඉරාන් වික්‍රමරත්න නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා වියානා සම්මුතිය ගැන. එතුමා ආණ්ඩුවේ අදහස ප්‍රකාශ කළේ, සත්‍ය නොවන පැමිණිල්ලක් ඉදිරිපත් කරන අවස්ථාවකදී අපට පාඩුවක් වෙනවා කියලා. නමුත් ඇත්ත වශයෙන්ම හානියක් වන සේවකයෙකුට පිහිටක් වෙන්න නම්, ඒ නීතිය තිබෙන්නට ඕනෑ. ජාත්‍යන්තර කම්කරු සංවිධානය - ILO - විසින් migrant workersලාගේ අයිතිවාසිකම් වෙනුවෙන් නිර්ණායක ඉදිරිපත් කරලා, ප්‍රඥප්ති හඳුන්වා දී තිබෙනවා. අපි ඒ ප්‍රඥප්තිවලට අත්සන් තබලා, ලංකාව තුළ සහ විදේශීය රටවල් සමඟ යම් යම් ගිවිසුම්වලට එළඹෙන්නට ඕනෑ. ඒ කරුණු කාරණා අපේ රටෙන් ඉටු වෙන්නේ නැහැ. ඒ නිසා එම සේවකයන්ගේ ජීවිතවලට හානි සිදු වනවා. හැබැයි, අපේ ආණ්ඩුව කවදාවත් ඒවාට වග කියන්නෙත් නැහැ. නමුත්, රජයක් විසින් වග කියන්නට ඕනෑ. අපේ රජයේ වග කීමක් නැහැ වාගේම, මැද පෙරදිග රටවල් සමඟ ගිවිසුම්වලට එළඹිලා කම්කරු නීති තහවුරු කරලා, ශක්තිමත් කරලා නැහැ. සමහර විට ඒ නීති රාමු තුළින් මේ අයට ගැලවෙන්නට වෙන්නටත් ඇති. අපට ඒ රටවල්වලට කියන්නට ශක්තිය තිබෙන්නට ඕනෑ, "තමුසෙලා මේ නීතිය පනවන්නේ නැත්නම්, අපි සේවකයෝ දෙන්නේ නැහැ" කියන එක. අපේ රටට ඒක කියන්න බැරි වෙලා තිබෙනවා. මොන ආණ්ඩුව තිබුණත්, කවුරු ආණ්ඩු කළත් ඒක කියන්න බැරි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ලෝකයේ ශ්‍රේෂ්ඨ සම්පන්න මිනිසුන් එකතු වෙලා සේවක අයිතිවාසිකම් ආරක්ෂා කරන්නට ජාත්‍යන්තර වශයෙන් හදලා තිබෙනවා ප්‍රඥප්ති රාශියක්. අපි ඒ ප්‍රඥප්ති එක්ක එකඟ වෙලා, ඒ නීති සම්මත කරලා, එම සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නට කටයුතු කරන්නට ඕනෑ. විශේෂයෙන් මා මේ මොහොතේ ගරු සභාවේ අවධානය යොමු කරනවා, මැද පෙරදිග රටවල්වලින් 2011 - 2014 අතර ලැබිලා තිබෙන පැමිණිලි සම්බන්ධව. විශාල වශයෙන්ම පැමිණිලි ලැබිලා තිබෙන්නේ, 2014 වර්ෂයේ. 2014 වර්ෂයේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ලැබිලා තිබෙන මුළු පැමිණිලි ප්‍රමාණය 9,373යි. එයින් 9,074ක්ම මැද පෙරදිග රටවලින් තමයි වාර්තා වෙලා තිබෙන්නේ. කුවේට්, සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ලෙබනනය, දෝහා කටාර්, බහරේන්, ඕමාන්, ජෝර්දානය කියන මෙන්න මේ රටවල්වලින්.

විශේෂයෙන්ම මැද පෙරදිග රටවල්වල සේවක හිංසනය වාගේම, ජීවිත විශාල සංඛ්‍යාවක් අහිමි වනවා. මැද පෙරදිග රටවලට වැඩියෙන් යන්නේ, ගෘහ සේවයට. ඒ සේවිකාවන්ගේ ජීවිතය අහිමි වන අවස්ථා තිබෙනවා. ඒ වාගේම හාමිපුතුන්ගේ ලිංගික අතවරයන්ට ලක් වෙනවා. වැටුප් ලැබෙන්නේ නැහැ. සමහර රටවලින් වැටුප් ගෙවන්නේ නැහැ. සමහර අයට පුච්චලා, හූරලා තුවාල කිරීම් හා ලිංගික හිංසන සිදු කර තිබෙනවා. ඒ වාගේ බරපතළ වූ හිංසනයන්ට අද මැද පෙරදිග රටවලට යන සේවක සේවිකාවන් ලක් වෙලා තිබෙනවා. මෙවැනි හිංසනයන්ට වැඩි වශයෙන්ම මැද පෙරදිග රටවල සේවය කරන අය ලක්වන බව විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ.

මැද පෙරදිග රටවල් වාගේම ජපානය, ඉතාලිය, කොරියාව, මැලේසියාව, හොංකොං, සිංගප්පූරුව, ග්‍රීසිය, ප්‍රංශය හා අනෙකුත් යුරෝපීය රටවල් අපේ රටට රැකියා අවස්ථා ලබා දෙනවා. ඒ රටවල සේවය කරන සේවකයින් අපේ රටට මුදල් උපයා දෙන්න විශාල කැප කිරීමක් කරනවා. ඔවුන් යන්නේ තම පවුල වෙනුවෙන් තමයි. හැබැයි, මේ රටට විදේශ විනිමය ගෙනැල්ලා දෙන්නේ ඒ සේවකයෝයි. ඒ නිසා අපි විශේෂයෙන් බැලිය යුතු කාරණයක් තිබෙනවා. ඒ තමයි, මේ රටට විදේශ විනිමය ගෙනැල්ලා දීමට විදේශගත වන අයගේ පවුලේ තත්ත්වය. රටක් විධියට, රජයක් විධියට -ආණ්ඩුවක් විධියට- අපට පුළුවන්කමක් තිබෙන්නට ඕනෑ, ඒ අය ගැන විපරම් කරලා, සොයා බලන්නට.

උදාහරණයක් විධියට ගත්තොත්, මවක් විදේශගත වුණාම ඒ පවුලේ සිටින දරුවන් වෙන්න තිබෙන හැම අපරාධයකටම, අපචාරයටම ලක්වෙලා, පවුල් සංස්ථාව කඩා වැටිලා වාගේම ස්වාමිපුරුෂයා වෙනත් විවාහයක් කර ගෙන. එවැනි තත්ත්වයන්ට මුහුණ දෙන්නට සිදුවෙනවා නම් කාන්තාවක් පිටරට ගිහින් සල්ලි හම්බ කරගෙන ආවාට වැඩක් නැහැ. ඒ අයට ලැබෙන output එකක් නැහැ; ප්‍රතිඵලයක් නැහැ. ඒ නිසා විදේශගතවීමෙන් ආර්ථිකයට ලැබෙන දායකත්වය විතරක් නොවෙයි, අපේ රටට ලැබෙන සමාජීය ප්‍රතිඵලවල වටිනාකමත් අපි ගණනය කරන්නට ඕනෑ. ඒවායේ වටිනාකමත් ගණනය කරලා, කොච්චර පිරිසක් විදේශගතවීම තුළ මෙසේ ප්‍රතිඵලයක් ලබලා තිබෙනවාද කියා අපි මේ රටේ research එකක් කරන්න ඕනෑ. ඒ අනුව විදේශ රැකියා සම්බන්ධයෙන් අපි කොහොමද කටයුතු කරන්නේ කියන කාරණා ගැන විශේෂයෙන් බලන්නට ඕනෑ. නුපුහුණු ශ්‍රමය පිට රට යැවීම පුළුවන් තරම් මේ රටේ අඩු කරන්නට ඕනෑ බව මම සඳහන් කරන්නට කැමැතියි.

අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලසීමාව තුළ වෘත්තීය පුහුණු අධිකාරිය සහ වෘත්තීය පුහුණුව ලබාදෙන ආයතන වැඩි වශයෙන් සංවර්ධනය කරමින් වැඩිපුර පුහුණු ශ්‍රමය විදේශගත කරන්නට හැකිවන ආකාරයේ වැඩ පිළිවෙළක් දියත් කළා. ඒ වාගේම අධ්‍යාපනයට තාක්ෂණික විෂය එකතු කරලා, උසස් පෙළ දරුවන් තාක්ෂණ විෂය හදාරා ඒ ලෝකය ජය ගන්නට පුළුවන් මංමාවත් විවර කරන්නට කටයුතු කළා. මේ රටට විදේශ විනිමය හොයන මංමාවත් පුහුණු ශ්‍රමය සැපයීමෙන් සොයාගන්නට අවශ්‍ය කරන ඒ වැඩ පිළිවෙළ සකස් කළා. හැබැයි, ඒ සියල්ල කඩා වට්ටන්නට, පහත හෙළන්නට මේ ආණ්ඩුව කටයුතු කරලා තිබෙනවා. ඒ ගැන අපට කනගාටුයි. හොඳ දේවල් ඉදිරියට ගෙන යන්න ඕනෑ. නරක දෙයක් තිබෙනවා නම් ඉවත් කළාට කමක් නැහැ. ඒ නිසා රටක් ජාතියක් විධියට විශේෂයෙන් විදේශ සේවයට යවන සේවකයන් සම්බන්ධයෙන් අපි පුහුණු ශ්‍රමය ඉලක්ක කර ගත යුතුයි. විදේශ රැකියා නියුක්තිය සම්බන්ධයෙන් මේ වාගේ කරුණු කාරණා පිළිබඳව අවධානය යොමු කරන්නට තිබෙනවා.

අපට අද දැන ගන්නට ලැබුණා, විදේශ රැකියාවලට යන අය බඳු මිලදී ගන්නා Angelo Textiles, Keyzer Street, Colombo 11; Romex Textiles; Asian Textiles කියන ආයතන කිහිපයක් පසු ගිය දවස්වල VAT එකට විරුද්ධව කටයුතු කළ බව. මේ ව්‍යාපාරික ආයතන තුනම ද්‍රව්‍ය ව්‍යාපාරිකයන්ට අයත් ආයතන. ඒ අය ඇමතිවරයා එක්ක මේ වැට් එකට විරුද්ධව කථා කිරීමේ වරදට ඒ ආයතන තුන අද සීල් කරලා තිබෙනවා. මේක සහජීවනයටත් ලජ්ජාවක්. මොකද, සහජීවනය ගැන නිතරම මේ ආණ්ඩුව කථා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැට් එකට එරෙහිව කටයුතු කරපු අනුරාධපුර වෙළඳ ප්‍රජාවේ ප්‍රධාන නිලධාරියා අද තර්ජනයකට ලක්වෙලා කියලා මේ දැන් අනුරාධපුරයෙන් පණිවුඩය හම්බ වුණා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විධියට මම කියනවා, "එවැනි පැමිණිලි තිබෙනවා නම් එය ලිඛිතව ඉදිරිපත් කරන්න" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය ඒවා ඉදිරිපත් කරන්න කෝ.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
පැහැදිලිවම අනුරාධපුරයේ වෙළෙඳ ව්‍යාපාරික මහත්මයෙක් ඉන්නේ. එහෙම තර්ජනයක් නැහැ. තර්ජනයක් තිබෙනවා නම් අප ඒ සම්බන්ධව ක්‍රියා කරනවා. ඔබතුමිය ඔය අසත්‍යයක් කියන්නේ.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ඒ කාරණා වැඩිදුරටත් හොයා බලා කටයුතු කරන එක ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු සතු වගකීමක්.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ඒ වගකීම මම ඉෂ්ට කළා.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටට නිෂ්පාදනය සපයන ආයතන ගැනයි මේ කථා කරන්නේ. අපේ ආණ්ඩුව තියෙද්දිත් අප වැරදි දේවල්වලට විරුද්ධව කථා කළා. වැරදි දෙයට වැරදියි කිව්වා. ඒ නිසා හැම දේම ආරක්ෂා කරන්නේ නැතිව, වැරදි දේට වැරදියි කියන්න පුරුදු වෙන්න කියා මම ඉල්ලීමක් කරනවා.

විදේශගත රැකියා කරන ශ්‍රී ලාංකිකයන්ට සහන දෙන්න කියා අනුර දිසානායක මන්ත්‍රීතුමා මේ යෝජනාවේ සඳහන් කර තිබුණා. වාහනයක් duty free ගැනීම වැනි දේවල් දෙනවා නම් හොඳයි කියා තිබෙනවා. එවැනි යෝජනා හොඳයි. අපේ රටට ආදායම උපයා ගන්න, විදේශ විනිමය උපයා ගන්න මේ අය කරන කැප කිරීම් වෙනුවෙන් ඔවුන්ට සහන දෙන්න ඕනෑ. ඒක හොඳ යෝජනාවක්. අඩු පොලියේ සහන ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම වැනි දේවල් රජයකට කරන්න පුළුවන් ඒවායි. ඒ වාගේම ඒ දරු පවුල ගැන සොයා බැලීම කරන්න පුළුවන්. අද එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ගත්තාම, රජයේ සේවකයෝ කීපදෙනෙක් ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස සේවය කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමියට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විදේශගත වන මේ සේවකයන්ගේ දරු පවුල් සම්බන්ධව හොයා බලන කාරණයේදී විශේෂයෙන්ම මේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහාය ලබාගන්න පුළුවන්කමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව එක කාරණයක් සඳහන් කරන්න කැමැතියි. විදේශ රටවල රැකියාවලට ගිහින් විපතට පත් වුණු අය වෙනුවෙන් කටයුතු කරන්න යම්කිසි ආයතනයක් තිබෙනවාද? ලංකාව තුළ නම් කම්කරු සේවකයන් වෙනුවෙන් කම්කරු විනිශ්චය සභා පිහිටුවලා තිබෙනවා. ඒ අය වෙනුවෙනුත් එක්කෝ කම්කරු විනිශ්චය සභාවලට තිබෙන බලය වැඩි කරන්න ඕනෑ. එහෙම නැත්නම්, අප මේ විදේශගත ගිවිසුම් එක්ක arbitration කරන්න පුළුවන් ආයතනයක් පිහිටුවන්න ඕනෑ. ගරු ඇමතිතුමියනි, ඉමක් කොණක් නැති අසාධාරණයක් මේ සේවකයන්ට සිද්ධ වන නිසා arbitration කරන්න පුළුවන් මධ්‍යස්ථානයක් හැකි ඉක්මනින් පිහිටුවීම ඉතාම වැදගත් බව සඳහන් කරමින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා.

එතුමාගේ කථාව ආරම්භ කිරීමට ප්‍රථමයෙන් කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු තලතා අතුකෝරල මහත්මිය (විදේශ රැකියා අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - வெளிநாட்டுத் தொழில்வாய்ப்பு அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Foreign Employment)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු මුජිපුර් රහූමාන් අවර්කළ් තලైමై වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

[පූ.භා. 11.44]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලීන වශයෙන් ඉතා වැදගත් මේ විවාදයට ඉදිරිපත් වෙද්දි මම මුලින්ම ගරු තලතා අතුකෝරල ඇමතිතුමියට ස්තුතිවන්ත වෙනවා. මේ මාතෘකාව සාකච්ඡා කරද්දි, ඒ මාතෘකාවට, විෂයට සාධාරණය ඉෂ්ට කිරීම වෙනුවෙන් විෂයය භාර ඇමතිතුමිය හැටියට එතුමිය සභාවේ දිගටම රැඳී සිටීම මා අගය කරනවා.

විශේෂයෙන්ම කරුණු ගණනාවක් අඩංගු වුණු සභාව කල් තබන අවස්ථාවේ විවාදයක් හැටියට තමයි විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා මේ කාරණාව ඉදිරිපත් කළේ. ඒකට මුලින්ම මම මේ කාරණය ඉදිරිපත් කරන්න කැමැතියි. මෙම මාතෘකාව අද මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා වන බව මාධ්‍ය මඟින් වාර්තා වුණු නිසා අපට ලිපියක් ලැබුණා. ගරු ඇමතිතුමියනි, ඒ ලිපියට මම ඔබතුමියගේ අවධානය යොමු කරවනවා.

අංක 234/ඒ, නෙරතල්දෙනිය පාර, ඇඹිලිගම, පිළිමතලාව යන ලිපිනයෙන් යුතුව කේ.ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්.ටී.එන්.කේ. වැකඩපොල නමැති එක්සත් අරාබි එමීර් රාජ්‍යයට ගිය වීරප්පෙරුම කීර්තිකුමාර යන අයගේ බිරිඳ විසිනුයි මේ ලිපිය එවා තිබෙන්නේ. ඒ, වීරප්පෙරුම කීර්ති කුමාර යන අය මිය ගිහින් තිබෙනවා. ඔහු මිය ගිහින් තිබෙන්නේ 2016 ජූලි මාසයේ 27වැනි දා. ඒ කියන්නේ පසු ගිය 27වැනි දා. ඔහු එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ආරක්ෂක නිලධාරියෙක් හැටියට තමයි කටයුතු කරලා තිබෙන්නේ. අවුරුදු 12ක් ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවය කරලා, නීත්‍යානුකූලව යුද හමුදාවෙන් ඉවත් වෙලා තමයි එම සේවයට බැඳිලා තිබෙන්නේ. ඔහු ඒ ආයතනයේ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයකට ඉදිරිපත් වෙමින් සිටි වෙලාවක -රාජකාරී කටයුතුවලදීම- තමයි මිය ගිහින් තිබෙන්නේ. විදේශ රැකියා අමාත්‍යතුමියනි, ඔහුගේ බිරිඳ විසින් ඉදිරිපත් කරන ලද මෙම ලිපියේ සඳහන් කරුණු කිහිපයක් මම ඔබතුමියගේ අවධානයට යොමු කරවන්න කැමැතියි. "නීත්‍යානුකූලව ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයකට සහභාගි වීමට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයක් සිදු කර යෝග්‍යතාව තහවුරු කළ යුතු වුවත්, ආයතනය මඟින් ඔහු එවන් පරීක්ෂණයකට ඉදිරිපත් කර නැත. රාජකාරී කාලය තුළදී නිල ඇඳුමින් සැරසී සිදු කර ඇති මෙම පරීක්ෂණය අතරතුරදී ඇති වූ යම් තත්ත්වයක් නිසා ඔහුගේ මරණය සිදු වී ඇත. කිසිදු රෝගී තත්ත්වයක් නොපෙන්වූ මාගේ ස්වාමී පුරුෂයාගේ අකල් මරණයට මෙම යෝග්‍යතා පරීක්ෂණයේ බලපෑමක් ඇති බව මාගේ විශ්වාසයයි. එම නිසා ඔහුගේ මරණය පිළිබඳව සේවා ආයතනය වග කිව යුතු බව ප්‍රකාශ කරමි. තවද මරණය සිදු වී දින පහක් යනතුරුත් ඒ පිළිබඳව ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට දැනුම් දී නොතිබීමත්, මරණය පිළිබඳව මා හට දැනුම් නොදෙන ලෙස ඔහු හා සේවයේ නියුතුව සිටි අනෙකුත් සේවකයින්ට බලපෑම් කර තිබීමත්, මරණ පරීක්ෂණයකින් තොරව දේහය භාර ගන්නා ලෙස බාහිර පාර්ශ්ව හරහා බලපෑම් කරමින් සිටීමත් මාගේ සැකය තහවුරු කිරීමට හේතු වේ." යනුවෙන් ඇය සඳහන් කර තිබෙනවා.

ප්‍රධාන කාරණාව, දැනටත් එවැනි බලපෑම් සිදු වෙනවා කියලා ඇය කියනවා, ගරු ඇමතිතුමියනි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මරණ පරීක්ෂණයකින් තොරව ඔහුගේ body එක භාර ගන්න කියනවා. ඉතින් මේක බරපතළ ප්‍රශ්නයක්. මෙවැනි කාරණා ගණනාවක් තිබෙනවා. මේක එක උදාහරණයක් පමණයි. ඇයට අවුරුදු 17ක සහ 15ක දරුවෝ දෙදෙනෙක් ඉන්නවා. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ කම්කරු නීතියට අනුව ඒ ආයතනයට බැඳීමක් තිබෙනවා, අනිවාර්යයෙන්ම මේ පාර්ශ්වවලට වන්දි ගෙවීමක් කරන්න. මරණය සිද්ධ වුණාට පස්සේ ඔවුන් කල්පනා කරන දේ තමයි, "සේවය කරපු කෙනා මිය ගියා. ඔහු ඒ රටේ පුරවැසියෙක් නොවෙයි. දැන් මළ සිරුර ඉවත් කරන්නයි ඕනෑ" කියලා. එහිදී ඔවුන් නීතිය ගැන සොයන්නේ මිය ගිය අයට සාධාරණය ඉෂ්ට කරන්නවත්, මිය ගිය අයගේ පවුල්වල අයට සාධාරණය ඉෂ්ට කරන්නවත් නොවෙයි. ඔවුන් උත්සාහ කරන්නේ මරණ පරීක්ෂණයකින් තොරව මළ සිරුර භාර දීලා, අඩු වන්දියක් දීලා, ඔවුන්ගේ වගකීමෙන් නිදහස් වෙන්නයි. අන්න එතැනදී තමයි විදේශ සේවා නියුක්ති කාර්යාංශයට බැඳීමක් තිබෙන්නේ, විදේශගත වෙලා ශ්‍රී ලංකාවට විදේශ විනිමය එවන අය සම්බන්ධයෙන් රජයක් හැටියට අවශ්‍ය කටයුතු කිරීමට.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාවේ ඉතා පැහැදිලිව සඳහන් වුණු දෙයක් තමයි ඔවුන් විදේශගත වීම ඔවුන්ගේ පෞද්ගලික කටයුත්තක් වුණත්, ඒ සඳහා ඔවුන් ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ මොහොතේ සිට ඔවුන් අපේ රටේ විදේශ විනිමය ඉපයීමේ සමාජ කාර්යයේ කොටස්කරුවන් බවට පත් වනවා කියන එක. එතකොට ඒක සමාජමය කාරණයක්. විදේශ විනිමය ඉපයීමේ සමාජමය කාර්යයට දායක වන මේ වීරප්පෙරුම කීර්ති කුමාර වැනි අපේ රටේ පුරවැසියන් වෙනුවෙන් අපි ඉෂ්ට කරන සාධාරණය, යුක්තිය මොකක්ද? ඒ සඳහා අපට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? ගරු ඇමතිතුමියනි, මේ මිය ගිය පුද්ගලයාගේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් තිබෙන සියලු ලිපි ලේඛන මම අමාත්‍යතුමියට ඉදිරිපත් කරන්නම්.

මේක තමයි බරපතළ කාරණාව. මෙවැනි කරුණු ගණනාවක් තිබෙනවා. අපි පිළිගන්න ඕනෑ, ඔවුන් විදෙස්ගත වන්නේ වහල් සේවයට නොවන බව. මේ යටත් විජිත යුගය නොවෙයි. යටත් විජිත යුගයේදී නම් අපේ රට යටත් කර ගෙන, අපේ රට යටත් කර ගත්ත අය අපේ රටෙන් වහලුන් හැටියට ඒ රටවලට මිනිසුන් අර ගෙන ගියා. එතකොට ඔවුන් ඒ අය මිනිසුන් හැටියට සැලකුවේ නැහැ. එතකොට උපකරණ! මිය ගියාට පසුව ඉවත් කරන උපකරණ හැටියට තමයි සැලකුවේ. අද එහෙම නොවෙයි. අද මේ විදේශගත වන ශ්‍රී ලාංකිකයින් යෙදෙන්නේ වහල් සේවයේ නොවෙයි. ඔවුන්ගේ පෞද්ගලික ජීවිතයේ අරමුණු වෙනුවෙන් තමයි නීත්‍යානුකූලව විදේශගත වන්නේ. ඒ අරමුණු ඉතාම සාධාරණ අරමුණු. ජීවත් වෙන්න නිවාසයක් සාදා ගැනීම, තමන්ගේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීම, වාහනයක් මිලදී ගැනීම, නැවත ඉතා ඉක්මනින් ලංකාවට ඇවිල්ලා යහපත් ජීවිතයක් ගත කිරීම ආදිය තමයි ඔවුන්ගේ අරමුණු වන්නේ. ඔවුන් ඊට වඩා ලොකු දෙයක් ඉල්ලන්නේ නැහැ. ඔවුන් ඊට වඩා ලොකු දේවල් බලාපොරොත්තු වෙන්නේ නැහැ. හැම වර්ෂයකම ලංකාවෙන් රැකියා සඳහා විදේශගත වෙන පිරිස ලක්ෂ තුනක් පමණ වෙනවා. තවම ගණන් හදා නැති වුණත් එසේ විදේශගත වී සිටින, ආසන්න වශයෙන් විසි ලක්ෂයක් පමණ වන පිරිසෙන් සියයට 99ක්ම නැවත ලංකාවට එන්න කැමැතියි. අපි ඒ ගැන දන්නවා. ඔවුන්ගේ මව් බිම මේ ශ්‍රී ලංකාවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපිට ඒ සම්බන්ධව ඕනෑ තරම් අද්දැකීම් තිබෙනවා. එසේ විදේශගත වී සිටින ඔවුන් ඔවුන්ගේ දරුවන්ට අපේ රටේ සංස්කෘතියේ බොහෝ අංග උගන්වනවා; ඒ අයගේ ආගම් අනුව අපේ රටේ සිරිත්-විරිත් උගන්වනවා; අපේ රටේ පවතින කලාව, සාහිත්‍ය කියා දෙනවා; අපේ භාෂාව කියා දෙනවා. එසේ විදේශගතව ජීවත් වන හුඟාක් ශ්‍රී ලාංකික දරුවන්ගේ යහළුවන් ඒ රටවල සිටින දරුවන් නොවෙයි. මේ රටේ යහළුවන් තමයි ස්කයිප් තාක්ෂණය වැනි අන්තර්ජාල පහසුකම් හරහා හෝ ඒ අයට සිටින්නේ.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මම එවැනි එක ගෙදරකට ගියාම ඒ ගෙදර සිටින දරුවන් ඔවුන්ගේ යහළුවන්ගේ නම් වශයෙන් කිව්වේ අපේ රටේ රූපවාහිනී නාලිකාවක විකාශනය වන ළමා වැඩසහනක - *'සෙල්ලම් ගෙදර'*- ළමයින්ගේ නම්. ඒ අයගේ යහළුවන් වශයෙන් හඳුන්වා දුන්නේ ඒ අයයි. ඔවුන්ට ඒ තරම් සමීපතාවක්, බැඳීමක් ලංකාවත් එක්ක තිබෙනවා. ඒ වාගේම විදේශගත වී රැකියා කරන සමහර අය අපේ රටේ ප්‍රවෘත්ති අපට කලින් දැන ගෙන සිටිනවා. අපිට කථා කරන වේලාවට ඔවුන් ඒ ගැන සඳහන් කරනවා. මොකද, රැකියා කරන කාලයෙන් පසුව ඔවුන්ට ලංකාවත් එක්ක තමයි බැඳීම තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අසන ප්‍රශ්නය මෙයයි. ලංකාවත් එක්ක ඒ තරම් සජීවී බැඳීමක් තිබෙන, මේ මාතෘභූමියට ඒ තරම් ආදරයක්, ඇල්මක්, කැමැත්තක් තිබෙන ඒ මිනිසුන් වෙනුවෙන් රජයක් හැටියට, රටක් හැටියට, ආණ්ඩුවක් හැටියට අප ඉටු කරන යුතුකම ගැන අප සෑහීමකට පත් වෙනවාද? අපි රටක් හැටියට ඉටු කරන යුතුකම් පිළිබඳව විදේශ සේවා නියුක්ති කාර්යාංශය, කැබිනට් මණ්ඩලය සෑහීමකට පත් වෙනවාද? ශ්‍රී ලංකාව භාණ්ඩ අපනයනයෙන් ඩොලර් මිලියන 10,000ක් ලබනකොට, විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ඩොලර් මිලියන 6,000ක් ලංකාවට උපයා දෙනවා. විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ දායකත්වය නැත්නම් අද වෙළෙඳ ශේෂ පරතරය, භාණ්ඩාගාර අර්බුද කියන මේ ඔක්කෝටම මොකද වෙන්නේ? අද ඒ දායකත්වයට සාධාරණයක් ඉෂ්ට වෙනවාද? එසේ ලබා දෙන දායකත්වය සඳහා අනිත් පැත්තට ඔවුන්ට සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙවැනි ගැටලු ගණනාවක් තමයි තිබෙන්නේ. එම ගැටලු කිහිපය කරුණු හැටියට ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු ඇමතිතුමියනි, එහි ප්‍රධාන ගැටලුවක් තමයි එම රටවල් සමඟ අප ඇති කරගෙන තිබෙන අවම වැටුප් ගිවිසුම්. දැනටමත් අපේ ශ්‍රමිකයන් විදේශගත වී සිටින රටවල් සමඟ ඇති කර ගත් අවම වැටුප් ගිවිසුම් තිබෙනවා. ලංකාවක් හැටියට අපි එම රටවල් සමඟ ඇති කර ගෙන තිබෙන ඒ අවම වැටුප් ගිවිසුම්වලින් කොපමණ සංඛ්‍යාවක් අලුත් කරගෙන තිබෙනවාද? විදේශගත වී සිටින අපේ ශ්‍රී ලාංකිකයන්ගේ අවම වැටුප හැදෙන්න ඕනෑකම තිබෙන්නේ අපේ රටේ ජීවන වියදමට අනුවයි. අපේ රටේ ජීවන වියදමටයි, ඔවුන් මුහුණ දෙන්නේ. අපේ රටේ බඩු මිලටයි, ඔවුන් මුහුණ දෙන්නේ. අපේ රටේ අධ්‍යාපන වියදම්වලටයි, ඔවුන් මුහුණ දෙන්නේ. සැමියා විදේශගත වී සිටිනවා නම් බිරිඳ ලැයිස්තුව කියනවා, "පන්ති ගාස්තු මෙපමණ ප්‍රමාණයකින් වැඩි වුණා, වැට් එක මෙපමණ ප්‍රමාණයකින් වැඩි වී තිබෙනවා, tests කරන ඒවාට මෙපමණ ප්‍රමාණයකින් බදු වැඩි වී තිබෙනවා, සෞඛ්‍ය ගාස්තු මෙපමණ ප්‍රමාණයකින් වැඩි වී තිබෙනවා, නාත්තා ලෙඩ වී සිටිනවා, බෙහෙත්වල මිල මෙපමණ ප්‍රමාණයකින් වැඩි වී තිබෙනවා" කියා. එතකොට ඔහු සේවය කරන ආයතනයට ගිහින් ඔහුට කියන්න බැහැ, "අපේ රටේ ජීවන වියදම වැඩි වෙලා, අපේ රටේ බඩු මිල වැඩි වෙලා, අපේ රටේ අධ්‍යාපන ගාස්තු වැඩි වෙලා. ඒ නිසා මගේ පඩි වැඩි කරන්න" කියා. එහෙම නම් එම කටයුත්ත කරලා දිය යුත්තේ කවුද? ලංකාවේ ජීවන වියදමට ගැළපෙන ආකාරයට අවම වැටුප් වැඩි කිරීම පිළිබඳව සාකච්ඡා කළ යුත්තේ කවුද? ඒ සාකච්ඡාව කළ යුත්තේ ලංකාවේ රජයයි; රජය වෙනුවෙන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයයි; එම විෂය භාර ඇමතිතුමියයි. වෙන කවුරුවත් නොවෙයි. අපි එම රටවල් එක්ක අවම වැටුප් ගිවිසුම් ඇතිකර ගන්න ඕනෑ. සාමාන්‍යයෙන් කටාර්වල අවම වැටුප රියාල් 1,100යි, පිලිපීනයේ පේසෝ 1,500යි, ඩුබායිවල ඩිරාම් 825යි, මේ ආදි වශයෙන් අවම වැටුප් තිබෙනවා. ලංකාවේ අපිට? ලංකාවේ අපටත් අවම වැටුප් තිබෙනවා, නමුත් අලුත් කරලා නැහැ. ඒ වාගේම අවම වැටුප් අපට ගෙවනවාද? ගරු ඇමතිතුමියනි, අපගේ පර්යේෂණ අංශය ඔබතුමියගේ අමාත්‍යාංශයෙන් ලබා ගත් වාර්තා තිබෙනවා. ඒ අනුව ඔබතුමියට බලන්න පුළුවන්, 2015 අවුරුද්දේ එකඟ වුණු වැටුප් agreement කඩපු අවස්ථා කොපමණ තිබෙනවාද කියා. එසේ වැටුප් ගෙවන්න එකඟ වුණු ගිවිසුම් කඩපු අවස්ථා 1,005ක් තිබෙනවා. ඒකෙන් 595ක්ම housemaidsලා සම්බන්ධවයි තිබෙන්නේ. 2016 අවුරුද්දේ ජනවාරි මාසයේ සිට ජූලි මාසය වෙනකොට එසේ වැටුප් ගිවිසුම් කඩපු අවස්ථා 641ක් තිබෙනවා. එයින් 367ක් housemaidsලා සම්බන්ධවයි තිබෙන්නේ. අනිත් අවුරුදුවල සිදු වෙලා තිබෙන්නේත් එහෙම තමයි.

2013 අවුරුද්දේ වැටුප් ගිවිසුම් කඩපු අවස්ථා 2,014ක් තිබෙන කොට එයින් 1,425ක් තිබෙන්නේ housemaidsලා සම්බන්ධවයි. ඒ අයට වැටුප් ගෙවනවා කියලා එකඟ වුණු ඒවා -ඒ වැටුප් ගිවිසුම් - උල්ලංඝනය කරලා තිබෙනවා. ඒ උල්ලංඝනය කිරීම් වෙනුවෙන් අපේ මැදිහත් වීමක් අවශ්‍යයි. රටක් වශයෙන් අපේ මැදිහත්වීමක් අවශ්‍යයි. අවම වැටුප් වැඩි කර ගැනීම වෙනුවෙන් මැදිහත් වීමක් අවශ්‍යයි. ඒක සිද්ධ වන්නේ නැහැ.

ඊළඟට, ඒ අය මුහුණ දෙන ප්‍රධානතම ප්‍රශ්නයක් තිබෙනවා. යුරෝපයේත් මේ ප්‍රශ්නය තිබෙනවා. මම මීට කලින් මේ පාර්ලිමේන්තුවේදීත් මේ ප්‍රශ්නය ගැන කියලා තිබෙනවා. සයිප්‍රස්වලත් මේ ප්‍රශ්නය තිබෙනවා. ප්‍රංශයට අදාළව මේ ප්‍රශ්නය තිබෙනවා. ඒ රටවල යම් අරමුදල් තිබෙනවා. ශ්‍රී ලාංකිකයන් ඒ අරමුදල්වලට දායක වෙලා තිබෙනවා. සේවාදායකයින් විසින්, සේවායෝජකයන් විසින් දායක වුණු අරමුදල් තිබෙනවා. ඒ අරමුදල්වල ඔවුන්ට අයිති මුදල ඒ අය ලංකාවට එන විට ලබා ගන්න අයිතියක් තිබෙන්න ඕනෑ.

යුරෝපයේ ප්‍රශ්නයක් තිබෙනවා. නැවත ඒ මුදල ලබා ගන්න නම් ඔවුන් නැවත යුරෝපයට යන්න ඕනෑ. සේවාව අවසන් කරලා ලංකාවට ආවාට ඒ මුදල ලංකාවේදී ලබා ගන්න ක්‍රමයක් නැහැ. ලංකාවේදී ඒ මුදල ලබා ගැනීම සඳහා ඒ අවශ්‍ය ගිවිසුම් රජයන් අතරේ නීත්‍යානුකූලව ඇති කර ගන්න ඕනෑ. ඔබතුමිය දන්නවා, ඒ ගිවිසුම කවදා හරි ලංකාවේ රජය ඇති කරයි කියලා බලාපොරොත්තුවෙන් ඒ රටවල වීසා නැතුව පවා සමහර අය ඉන්නවා. සයිප්‍රස්වල එහෙම ඉන්නවා, අවුරුදු 19ක්. ඒ අය ඉන්නේ ඒ ගිවිසුම ඇති කර ගත්තොත් එහේ ඒ අය ලබන පඩියට වඩා ලැබෙන සමාජ ප්‍රතිලාභ - social benefits - අරමුදලෙන් ලැබෙන මුදල වැඩි නිසායි. ඒ අරමුදල අරගෙන ලංකාවට එන්න ඕනෑ. ඒ අරමුදල නැත්නම් ඔවුන් ලංකාවට ඇවිල්ලා වැඩක් නැහැ.

ප්‍රංශයේ එහෙම ඉන්න අය ඉන්නවා. ප්‍රංශයේ ඉන්න අය ආවොත් ඒ අරමුදල ගන්න ඒ රටට යන්න ඕනෑ. හැබැයි ඒක එහෙම නොවෙයි වෙන්න ඕනෑ. ඔවුන් සේවය අවසන් කරලා ලංකාවට ආවා නම් ඔවුන්ගේ සේවා කාලයට අදාළ ඒ තිබෙන සමාජ ප්‍රතිලාභ අරමුදල් ලංකාවේදී ලබා ගන්න පුළුවන් විධියට නීතිය සංශෝධනය වෙන්න ඕනෑ; වෙනස් වෙන්න ඕනෑ. ඒකට රජයන් අතර ගිවිසුම් ඇති කර ගන්න ඕනෑ. පිලිපීනය වාගේ රටවල් පවා ඒ ගිවිසුම් ඇති කරගෙන තිබෙනවා. ඇයි, අපි එහෙම නොකරන්නේ? මොකද ඒක අපේ රටේ අභ්‍යන්තර ප්‍රශ්නයක් නොවෙයි. ඒක අපේ රටේ ආණ්ඩුවට අවාසියක් වෙන එකක් නොවෙයි. ඒක අපේ දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. ඒක යූඑන්පී, ශ්‍රීලංකා, ජේවීපී ප්‍රශ්නයක් නොවෙයි. ඒ ප්‍රශ්නයට රජයට මැදිහත් වෙන්න පුළුවන්. ඒ රටවල් එක්ක සාකච්ඡා කරලා, විදේශ කටයුතු අමාත්‍යාංශය මැදිහත් කරගෙන ඒ ගිවිසුම් ඇති කර ගන්න පුළුවන්. ඇයි, ඒවා ඇති කර ගන්න ප්‍රමාද වෙන්නේ කියන ප්‍රශ්නය අපට නම් හිතා ගන්නත් බැහැ. මොකද එක පැත්තකින් ඒක අපේ රටට ලැබෙන ආදායමක්; අපට විදේශ විනිමය ලැබීමක්; අපේ ජනතාවට ලැබීමක්. ඒක ගැන ඔබතුමියගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඊළඟට, අපේ විදේශ රැකියා අවදානමක් ඇති වෙලා තිබෙන බව ඔබතුමිය දන්නවා. විශේෂයෙන් පසු ගිය දවස්වල වාර්තා වුණා, සවුදි අරාබියේ යම් කර්මාන්තශාලාවකින් පිරිසක් ඉවත් වුණු බව. නැවත ඔවුන්ට රැකියාවට යන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. මැද පෙරදිග එක පැත්තක ඇති වෙලා තිබෙන දේශපාලන වාතාවරණය නිසා ඒ රැකියා අවස්ථා සම්බන්ධ අර්බුදයක් තිබෙනවා. අනෙක් පැත්තෙන් යුද්ධමය තත්ත්වයක් නිසා මේ වන විට යුරෝපයට සරණාගතයන් විශාල වශයෙන් එනවා. ඒ නිසා ඒ රැකියාවල ජීවිතය අතිශය සංකීර්ණ වෙලා තිබෙනවා; අතිශය කටුක වෙලා තිබෙනවා. මොකද ඒ අයට දැන් රැකියාවෙන් ගැලවෙන්න බැහැ. මොකද ඒ රටවලට වෙනත් රටවලින් සංක්‍රමණිකයින් ඇවිල්ලා රැකියා වෙළෙඳ පොළවල් පිරිලා තිබෙන්නේ. අපේ රැකියා කරන අයගේ තත්ත්වය එන්න එන්න බරපතළ විධියට අයහපත් වෙමින් තිබෙනවා. හැබැයි අපට පෙනෙන්න තිබෙන දේ මොකක්ද? ගරු ඇමතිතුමියනි, ඒ රටවල තානාපති කාර්යාලවල අපේ රට නියෝජනය කරන තානාපතිවරුයි ඉන්නේ; අපේ ශ්‍රමිකයා වෙනුවෙන් පෙනී ඉන්න ඕනෑ අයයි ඉන්නේ. මේක ඔබතුමියගේ ප්‍රශ්නයක් නොවෙයි.

ගරු තලතා අතුකෝරල මහත්මිය

(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)

(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න. මම ඔබතුමාට disturb කරන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් නම් මේ වෙලාවේ කියන්න ඕනෑ. මොකද මම මේ කාරණය ගැන කියන වෙලාවට මේ සභාවේ ඔබතුමා ඉඳීවිද, නැද්ද දන්නේ නැහැ. කෙසේ වෙතත් මේ වන විට ඒ සියලුම ශ්‍රමිකයන් ගැන වගකීම අපි භාර අරගෙන තිබෙනවා. සෑම ශ්‍රමිකයෙකුටම දවසකට අවශ්‍ය ආහාර ලබා දෙන්න පමණක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ඩොලර් 50ක මුදලක් වෙන් කරලා දැන් එහේ තානාපති කාර්යාලයට යවලාත් ඉවරයි. දැනට අපට වාර්තා වෙලා තිබෙනවා, ශ්‍රී ලාංකිකයන් හැටියට රැකියා ආයතන තුනක සේවය කරපු 100ක්, 102ක් වාගේ ප්‍රමාණයක් එහෙම ඉන්නවා කියලා. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම අපේ රට වෙනුවෙන් ඉන්න සවුදි තානාපතිතුමාගේ මැදිහත් වීමෙන් ඒ වැඩ කටයුතු කරගෙන යනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)

(The Hon. Sunil Handunnetti)

ඇත්තටම ඔබතුමියටත් මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වර්තමාන සභාපතිතුමා -ඔබේසේකර මහත්මයා- එවැනි කටයුතු සම්බන්ධයෙන් අපට දක්වන ප්‍රතිචාරය පවා අපි අගය කරනවා. ඒක මම කියන්න ඕනෑ. සමහර අවස්ථාවල අපි එතුමාගේ දුරකථනයට message එකක් යැවිවත්, ඒ message එකට පවා එතුමා ප්‍රතිචාර දක්වලා තිබෙනවා. ඒක අපි කියන්න ඕනෑ. නමුත් මේක පොදු ප්‍රශ්නයක්, ගරු ඇමතිතුමියනි. මේක යම් සිද්ධියක ප්‍රශ්නයක් නොවෙයි; පොදු ප්‍රශ්නයක්. මොකද, අපේ රටේ විදේශ විනිමය සොයන ප්‍රධාන මාර්ගයක් හැටියට අද මේ විදේශගත ශ්‍රී ලාංකිකයින් තෝරාගෙන තිබෙනවා නම්, ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව, ඔවුන්ට ඊළඟට වෙන්න පුළුවන් දේ පිළිබඳව, ඔවුන්ට සිද්ධ වෙන්න පුළුවන් අකරතැබ්බයන් පිළිබඳව පූර්ව අදහසක් අපට තිබෙන්න ඕනෑ. අපේ රටේ වෘත්තීය සමිති තිබෙනවා. අපේ රටේ එක එක වෘත්තීන්ට වෘත්තීය සමිති තිබෙනවා. රැකියාවට අනුව වෘත්තීය සමිති තිබෙනවා. වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති තිබෙනවා. හෙද ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති තිබෙනවා. ගුරුවරුන්ට වෘත්තීය සමිති තිබෙනවා. විදුහල්පතිවරුන්ට වෘත්තීය සමිති තිබෙනවා. හැබැයි, විදේශගත ශ්‍රී ලාංකිකයින්ට වෘත්තීය සමිති නැහැ. ඔවුන්ට සංවිධානය වෙන්න ක්‍රමයක් නැහැ. ඔවුන් රට රටවල ඉන්නේ. සමහර විට ඔවුන් ඉන්නේ ඒ රටේ කන්ටේනරයක් ඇතුළේ.

කොරියාව වාගේ රටක අපේ විදේශගත ශ්‍රී ලාංකිකයන් ගත කරන්නේ සැපවත් ජීවිත නොවෙයි. ඊයේ-පෙරේදා අපි දැක්කා, කොරියාවේ රැකියාවලට එන්න අයදුම් පත් එවන්න කියලා කිව්වාට පස්සේ අයදුම් පතක් ගන්න ගේට්ටු කඩාගෙන එල්ලෙන හැටි. හැබැයි, කොරියාවේ රැකියාවලට යන අපේ අයට සැමසුන් ආයතනයේ රැකියා හම්බ වෙන්නේ නැහැ. වෙනත් මහා පරිමාණ බහුජාතික සමාගම්වල රැකියා හම්බ වෙන්නේ නැහැ. ඔබතුමිය දන්නවා, කොරියාවේදී අපේ අයට ලැබෙන්නේ ඉතාම දුෂ්කර රැකියා බව. කොරියාවේදී අපේ අයට මස් කපන රැකියා හම්බවෙනවා; අධික සීතලේ කුකුළන් මරන රැකියා හම්බවෙනවා; යකඩ කම්හල්වල රැකියා හම්බවෙනවා; ගැරේජ්වල රැකියා හම්බවෙනවා; රසායනික ද්‍රව්‍ය, ඩයි වර්ග පාවිච්චි කරන කර්මාන්තශාලාවල රැකියා හම්බවෙනවා. සෝල් නගරයේදී මට එක තරුණයෙක් හම්බ වුණා. ඔහුගේ රැකියාව කුකුළන් මරන එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුකුළන් මරන්න යන්ත්‍ර සූත්‍ර පාවිච්චි කරනවා තමයි. නමුත් ඔබතුමා හිතන්න, දවසකට මරන කුකුළන්ගේ දහසකගේ විතර කෑ ගැහිල්ල රෑට මතක් වෙවී ඇහුණොත් කොහොමද කියලා. දවස ගාණේ ඒ ශබ්දය ඇහෙනවා නම් මොකද කරන්නේ? අදත් ඇහෙනවා, හෙටත් ඇහෙනවා නම් මොකද කරන්නේ? ඒ තරුණයා කියනවා, මරන්න හදන කුකුළන්ගේ ශබ්දය මතක් වෙවී ඇහෙන කොට රෑට නින්ද යන්නේ නැහැ කියලා. එතකොට ඔහු කරන්නේ හොඳටම බොන එකයි. ඔහු හොඳටම බීලා තමයි නිදාගන්නේ. මේක තමයි ඇත්ත යථාර්ථය. එවැනි අතිශය දුෂ්කර රැකියාවන් තමයි අපේ අයට ලැබිලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, ඒවා වෙනුවෙන් කථා කරන්නේ කවුද? ඒවා වෙනුවෙන් කථා කරන්න වෘත්තීය සමිති නැහැ. ඒ රටවල්වල වෘත්තීය සමිති හදන්නත් බැහැ. අයිතිවාසිකම් ගැන කථා කරන්න කෙනෙක් නැහැ. ඒ ඔක්කෝටම ඉන්නේ තානාපති කාර්යාලයයි; අපේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයයි.

ගරු ඇමතිතුමියගේ විශේෂ අවධානයට මම ලේඛනයක් යොමු කරනවා. ඔබතුමිය අපිත් සමඟ මීට පෙර අවස්ථා ගණනාවකදී මේ වෙනුවෙන් සාකච්ඡා කරලා තිබෙන නිසා ඔබතුමිය මේ පිළිබඳව දන්නවා. විදේශගත ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් "එතෙර අපි" කියලා සංවිධානයක් අපි පවත්වා ගෙන යනවා. ඒ සංවිධානයේ සභාපතිවරයා හැටියටයි මමයි කටයුතු කරන්නේ. මේ ලේඛනයේ තිබෙන්නේ කටාර් රාජ්‍යයේ විතරක් මේ ප්‍රශ්නය පිළිබඳව 4,339 දෙනෙකුගේ අත්සන් සහිත පෙත්සමක්. මේ ආකාරයටම ඕමානය, අබුඩාබි, සවුදි අරාබිය, කුවේට් යන රටවල විතරක් නොවෙයි, යුරෝපීය රටවල්වල පවා සිටින අයගේ දුක්ගැනවිලි තිබෙනවා. මම ඔබතුමියට මේ ලේඛනය මේ වේලාවේදීම පිළිගන්වනවා. ඔබතුමිය මේ ලේඛනය බාරගෙන, මේ අයගේ තිබෙන ගැටලු ගැන සොයා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා. අපි කටාර් රාජ්‍යයේ රාජ්‍ය බලය අල්ලන්න හදනවා නොවෙයි. නමුත් ඒ අයගේ මේ දුක්ගැනවිල්ල පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයන් හැටියට අපි සාකච්ඡා කරන්න ඕනෑ. මේ දුක්ගැනවිල්ලට අපි ඇහුම් කන් දෙන්න ඕනෑ. ඒක හරි සංවේදී ප්‍රශ්නයක්. ඒ වාගේම ඔබතුමිය විශ්වාස කරන්න, මේ ගොල්ලන් පෞද්ගලික ජීවිත ගත කරන්න ඒ රටවලට ගියාට ලංකාවේ සිද්ධ වෙන අකරතැබ්බයකදී, සමාජ උවදුරකදී, කරදරයකදී ඒ වෙනුවෙන් මේ හැමෝම මැදිහත් වෙනවා.

පසු ගිය කාලයේ අරණායක ප්‍රදේශයේ නාය යෑම් සිද්ධ වුණු අවස්ථාවේදී, ඒ වාගේම කඩුවෙල, කොලොන්නාව ප්‍රදේශ ගංවතුරෙන් යට වුණු අවස්ථාවේදී මේ ගොල්ලන් උදවු කරන්න මැදිහත් වුණා. ඒ අය මෙහේ අනාථ වුණු අයගේ ගෙවල් හදාදෙන්න මැදිහත් වෙනවා. ඒ අයට උදවු කරන්න මැදිහත් වෙනවා. වකුගඩු රෝගීන්ට ආධාර කරන්න මැදිහත් වෙනවා. මේ

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

අය තමන්ගේ රට ගැන පුදුමාකාර විධියේ සංවේදීතාවක් තිබෙන අයයි. ඒ, කවුරුවත් කියලා නොවෙයි. කවුරුවත් කථා කරලා නොවෙයි. අපේ රටේ යම් විපතකදී මේ හැම රටකම ඉන්න අය මැදිහත් වෙලා උදව් කරන්න ලැහැස්ති වෙනවා. ඔවුන් අවංකව ඒ කටයුතුවලට දායක වෙන්න සූදානමක් තිබෙන අයයි. ඒ නිසා තමයි ගරු ඇමතිතුමියනි, අපි කියන්නේ මේ අය වෙනුවෙන් අපි යමක් කළ යුතුයි කියලා. මේක තමයි තිබෙන ප්‍රශ්නය. ඔබතුමියට කියන්න කාරණා ගොඩාක් තිබෙනවා. ඒවා කෙටියෙන් හෝ කියන්න ඕනෑ.

විශේෂයෙන්ම කොරියාවට යන අයගේ tickets හදලා දෙන්නේ, විදේශ සේවා නියුක්ති කාර්යාංශය මැදිහත් වෙලායි. ඔවුන් ඇත්තටම එක ගමනක් නේ යන්නේ. ඔවුන් අපේ රටේ ඉඳලා අවුරුදු තුනකට වෙන්න පුළුවන්, දෙකකට වෙන්න පුළුවන්, එක ගමනක් යන්නේ. ඒ රටට යන්න තමයි ටිකට් එක ඕනෑ. හැබැයි, යන්නයි, එන්නයි ගමන් දෙකටම අදාළ ගාස්තුව අය කරගෙන තමයි ටිකට් එක හදලා දෙන්නේ. ඒ අයගේ passport එක one-day service යටතේ කරලා දෙනවා. මේ ඔක්කොම එකතු කරලා පැකේජ් එකක් හැටියට ටිකට් එකේ ගණන කියනවා. සමහර අයට ඒක විශාල ගණනක්. ඒ ගැන ඔබතුමිය හොයලා බලන්න. ඒ අයගේ දුක්ගැනවිලි තමයි මම මේ කියන්නේ. සමහරුන්ට රුපියල් එක්ලක්ෂ අසූදාහක පමණ මුදලක් හැදෙනවා එතැනදී. ඒ විධියේ විශාල ගණන් හැදෙනවා. ඒක බරපතළ තත්ත්වයක්. ඊළඟට, ඒ අය පුහුණු කරන්න තිබෙන අපේ පුහුණු මධ්‍යස්ථානය ගැන ඔබතුමිය දන්නවා. පුහුණු මධ්‍යස්ථානයක් ඔබතුමියගේ අමාත්‍යාංශයේ තිබෙනවා. ඔබතුමිය ඒ කටයුතු දියුණු කරන්න උත්සාහ කරනවා. අපි ඒක නැහැ කියන්නේ නැහැ. ඒත් තව ඒ පහසුකම් වැඩි කරන්න ඕනෑ. භාෂා පුහුණු කිරීමේ පහසුකම් තව වැඩි කරන්න ඕනෑ.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

කොරියාවට යන අයට කියලා වෙනම පුහුණු මධ්‍යස්ථානයක් තවම නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අපි ලබන වර්ෂය වෙනකොට බණ්ඩාරවෙල, කහගොල්ල ප්‍රදේශයේ එවැනි මධ්‍යස්ථානයක් හදන්න සියලුම කටයුතු කරලායි තිබෙන්නේ. අපි දැනටත් තරුණ සේවා සභාවේ බටන්ගලත්, බගවන්තලාවෙත්, වැවිලි කර්මාන්ත ආයතයට අයත් අතුරුගිරියේ පුහුණු මධ්‍යස්ථානයේත් වීසා ලැබෙන ප්‍රමාණයේ හැටියට, ඒ මධ්‍යස්ථාවලට යොදවන්න පුළුවන් ප්‍රමාණයේ හැටියට, කොරියාවට යවන අය පුහුණු කරගෙන යනවා. අපි ඉක්මනින් අපේ පුහුණු මධ්‍යස්ථානය ගොඩ නගන්නයි බලාපොරොත්තුව.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

බොහොම ස්තුතියි. විශේෂයෙන් අපි සඳහන් කළේ අතුරුගිරියේ පුහුණු මධ්‍යස්ථානයේ තිබෙන තත්ත්වය ගැනයි. ඔබතුමිය ඒ උත්සාහය දරන්න. ඒක හොඳ දෙයක්. දැන් ටියුෂන් පන්ති වාගේ කොරියානු භාෂාව උගන්වන තැන් තිබෙනවා. පාරේ යනවිට අපට පෙනෙනවා. ටියුෂන් පන්ති සඳහා තිබෙන දැන්වීම් වාගේම දැන් කොරියානු භාෂාව උගන්වන පන්තිවලටත් අදාළ දැන්වීම් තිබෙනවා. ලංකාවේ හැම තැනම -ප්‍රධාන නගරවල- දැන් ඒ පන්ති පවත්වන බව දකින්න ලැබෙනවා. කොරියානු භාෂාව ඉගෙන ගන්නේ මේ රටේ භාවිත කරන්න නොවෙයි නේ. කොරියානු භාෂාව පිළිබඳ ටියුෂන් පන්ති තිබෙන්නේ ඒ භාෂාව මේ රටේ භාවිත කරන්න නොවෙයි, ඒ රටට ගිහින් භාවිත කරන්නයි. හැබැයි, කොරියානු භාෂා විභාගයට යන අය සඳහා කොරියානු භාෂා පන්ති හැම තැනම තිබෙනවා. නමුත් ඒවා අවශ්‍ය වන්නේ කාටද? අවශ්‍ය වන්නේ-

ගරු තලතා අතුකෝරල මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට මෙව්වර උත්තර දෙන්නේ වෙන මොකුත් නිසා නොවෙයි. ඇත්තටම එතුමා "එතෙර අපි" වැඩසටහනේදී මාත් එක්ක ගොඩක් සම්බන්ධවෙලා වැඩ කරන නිසායි. නැත්නම් මෙහෙම උත්තර දෙන්න යන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, කොරියානු පන්තිවලයි, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ තිබෙන කොරියානු අංශයේයි කිසිම සම්බන්ධතාවක් නැහැ. කොරියාවේ සේවය කරලා එන අය මේ රටේ පන්ති පටන් ගන්නවා. ඒ විතරක් නොවෙයි. ඊයේ-පෙරේදා ලොකුවට උත්සව එහෙම ලෑස්ති කරපු, අනවසරයෙන් ඒ රටට ගිහින් පදිංචි වෙලා ඉන්න සමහර අය, ඒ රටේ ඉඳගෙන මේ රටේ කොරියානු පන්ති පවත්වනවා. ඒවා අපට කිසි අදාළත්වයක් නැහැ. අපි, අපේ පුහුණුව දෙන්නේ දවස් 10ට. කොරියානු ගිවිසුම අත්සන් කරලා ඉවර වුණ අයට, සියලුම දේ සූදානම් අයට විතරයි ඒ දවස් දහයේ පුහුණුව දෙන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම කියන්නේත් ඔබතුමිය කියන දේම තමයි. ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, ඒ කරුණු තවත් තහවුරු කරන එක සම්බන්ධයෙන්. මම කියන්නේ මෙකයි. කොරියානු පන්ති ජාවාරමකට අපේ සාමාන්‍ය ජනතාව අහුවෙන්න ඕනෑ නැහැ, ඒ භාෂා පුහුණු මධ්‍යස්ථානය රජය යටතේම තිබෙනවා නම්. ඉදිරි අය වැයේ යෝජනාවක් හැටියට ඔබතුමියගේ අමාත්‍යාංශයට තව ප්‍රතිපාදන වෙන් කරලා, ප්‍රමාණවත් ආකාරයට පහසුකම් සහිතව ඒ කටයුත්ත ඔබතුමියගේ අමාත්‍යාංශය යටතේම කරනවා නම්, ඒ ප්‍රමාණාත්මක පුහුණුව, ඒ දැනුම ලැබෙන්නේ එතැනින් නම්, ඒක තමයි වෙන්න ඕනෑ. සියදෙනෙක් මේ භාෂාව දැනගෙන වැඩක් නැහැ නේ, දහදෙනා නම් කොරියාවේ සේවයට යන්නේ.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාට මම ආයෙත් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. එහෙම පන්ති පටන් ගන්න අපට පුළුවන්කමක් නැහැ. එහෙන් දෙන රැකියා අවස්ථාවලට පමණයි අපි පිරිස යොමු කරන්නේ. එතකොට, ඒ දවස් දහය තුළ භාෂාව පිළිබඳ අවශ්‍යම දැනුම හා අවබෝධය ඒ අයට ලබා දෙනවා. අමාත්‍යාංශය යටතේ පන්ති දාලා, ඒ ඔක්කෝම අය කොරියාවට යවන්න බැරි වුණොත් මටක් වෙන්නේ මොකක්ද? ඒ නිසා එහෙම කරන්නේ බැහැ ගරු මන්ත්‍රීතුමනි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමියනි, අපි කියන්නේ මෙකයි. තෝරා ගන්නා පිරිසට සෑහීමකට පත්වන්න පුළුවන් දැනුමක්, අවබෝධයක් ඔබතුමියගේ අමාත්‍යාංශයෙන් ලැබෙනවා නම්, ඒ අයට විශ්වාසය තිබෙනවා වෙනත් පුහුණුවක් අවශ්‍ය නැහැ කියලා. එකයි මට අවධාරණය කරන්න ඕනෑ වුණේ.

ඊළඟට තවත් වැදගත් දෙයක් තිබෙනවා. ඇත්තටම මේක ඔබතුමියගේ අමාත්‍යාංශයෙන් කළ යුතු දෙයක්. මේ ගමන් බලපත්‍රයට වෙන දේ ඔබතුමිය දන්නවා. ගමන් බලපත්‍රය කියන්නේ, identity card එකක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ගැන හිතන්න. මගේ identity card එක කවුරු හෝ කෙනෙක් උදුරා ගත්තොත්, මගේ identity card එක වෙන කෙනෙකුගේ අතේ තිබෙනවා නම් ඒකේ තේරුම මොකක්ද? මගේ identity card එක වෙන කෙනෙකුගේ අතේ තිබෙනවාය කියන්නේ, මගේ පුරවැසිභාවය වෙන කෙනෙක් අත්පත් කරගෙන කියන එකයි. හැබැයි, ලංකාවෙන් විදේශ ගතවෙන ශ්‍රී ලාංකිකයාගේ ගමන් බලපත්‍රය කොහේද තියෙන්නේ? යුරෝපයේදී මේ ප්‍රශ්නය මතුවෙන්නේ නැහැ. හැබැයි, මැද පෙරදිගට යනකොට ඒජන්සිකරුවා ගමන් බලපත්‍රය ගන්නවා.

අපි ඒජන්සිකරුවාගේ අත් අඩංගුවේයි ඉන්නේ. අපේ ගමන් බලපත්‍රය අත් පත් කර ගන්න ඒජන්සිකරුවන්ට තිබෙන අයිතිය මොකක්ද? ඒක සාධාරණීකරණය කරන්න පුළුවන් ලෝක සම්මත මොන නීතියෙන්ද? පුරවැසියෙකුගේ ගමන් බලපත්‍රය අන්සතු කර ගන්න පුළුවන් කියලා ජාත්‍යන්තරව පිළිගත් නීතියක් කොහේ හරි තිබෙනවාද? ඒ තත්ත්වය ඇති වන හේතුව මේකයි. ඒ ඒජන්සිකරුවන් හිතනවා මේ අය වහලුන් කියලා. ඔවුන්ට මිනිසුන් හැටියට නොවෙයි සලකන්නේ. මම කියන්නේ මෙන්න මේ තත්ත්වය වළක්වා ගන්න වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ කියලායි. ගමන් බලපත්‍රය පිළිබඳව ලොකු අවබෝධයක්, දැනුමක් නොලබපු එහි වටිනාකමක් නොදන්නා අපේ අහිංසක අම්මලා, අක්කලා ගම්වල ඉන්නවා. ඒ අය හිතනවා, එයාර්පෝට් එකෙන් බැහැලා, වීසා ගහලා ඒ කටයුතු අවසන් කළාට පස්සේ, ගමන් බලපත්‍රය ඒජන්සිකරුවාට දෙන්න ඕනෑ කියලා. ඒජන්සිකරුවා ඒ ගමන් බලපත්‍රය ගැනීමේ තේරුම මොකක්ද? ඒ වුවමනාව මොකක්ද? ඒ හරහා ඔහුට ඕනෑම වෙලාවක පුළුවන් අර කාන්තාවන් වහල් සේවයේ යෙදැවීම සඳහා පාවිච්චි කරන්න; ලිංගික අල්ලස් ලබා ගන්න පුළුවන්; විවිධ බලපෑම් කරන්න පුළුවන්; සේවා කරන තැන්වලින් එහෙට මෙහෙට මාරු කරන්න පුළුවන්; ගිවිසුම කඩලා ඕනෑම අඩු වැටුපකට හෝ වැටුප් නැතිව හෝ සේවයේ යොදවන්න පුළුවන්. ගරු ඇමතිතුමියනි, ඒ සඳහා නීත්‍යානුකූල වශයෙන් අයිතිය ලබා ගැනීමේ කටයුත්තක් තමයි ගමන් බලපත්‍රය අත් පත් කර ගැනීම හරහා ඒජන්සිකරුවා කරන්නේ. මේක වැළැක්විය යුතුද, නැද්ද? අපි ඒ ක්‍රියාව නතර කරන්න ඕනෑ. ගමන් බලපත්‍රය පුරවැසියෙකුගේ අයිතියක්. ශ්‍රී ලංකාවෙන් පිට වුණාට පසුව තමන්ගේ ලාංකිකභාවය වෙනුවෙන් තිබෙන අනන්‍යතාව තමයි ගමන් බලපත්‍රය. සමහර වෙලාවට ගමන් බලපත්‍රය ඒ වැඩ කරන තැන අයිතිකරුවන් ගන්නවා. එහෙම නැත්නම් ඒක ඒජන්සිකරුවන් භාරයේ තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමියනි, මේ ගමන් බලපත්‍රය ඒජන්සිකරුවන් අත රඳවා ගැනීමෙන් වළක්වන්න අපි මේ රටේ නීතියේ යම් ප්‍රතිපාදනයක් ඇති කරන්න ඕනෑ. ඒ සඳහා නීති - රීති සකස් වෙන්න ඕනෑ. අපේ රටට අදාළව තමයි ඒ ප්‍රශ්නය තිබෙන්නේ.

මම කලින් කිව්වා වාගේ, යම් කිසි පුරවැසියෙක් ඒ රටකදී මිය ගියාට පසුව, ඒ මිය ගිය පුරවැසියාගේ දේහය ලංකාවට ගෙන්වා ගන්න වෙනවා. මම මේ කරුණ කියන්නේ ඒ ඒ රටවල තිබෙන සියලුම නීති - රීතිවලට යටත්වයි. සාමාන්‍යයෙන් අපට ඒ නීති - රීතිවලට මැදිහත්වෙන්න අමාරුයි. මම දන්නවා ඒක. පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම සඳහා ඒ රටවල්වල තිබෙන මූලික නීති - රීතිවලට අපි යටත් වෙනවා. ඒක මැද පෙරදිග රටවලදී විශේෂයෙන්ම බලපානවා. ඒ ඔක්කෝම ඇත්ත. හැබැයි, රජය හැටියට අපට ඒ සඳහා ලබා දෙන්න පුළුවන් දායකත්වයක් නැද්ද? ඔවුන් විදේශගත වුණේ ඔවුන්ගේ පුද්ගලික අභිලාෂයක් වෙනුවෙන් කියලා හිතනවාට වඩා, රටට විදේශ විනිමය හොයන්න ගිය අය සේ අපි ඔවුන් ගැන හිතන්න ඕනෑ.

ලංකාවේ ජීවත් වෙන්න පුළුවන් විධියේ හොඳ පරිසරයක්, ආදායම් උපයන මාර්ගයක් තිබුණා නම් ඔවුන් ලංකාව තුළම ජීවත් වෙනවා. එහෙම බැරි නිසා තමයි ඔවුන් ඒ රටවල සේවයට යන්නේ. එහෙම නම්, රජයේ වියදමෙන්, රජයේ ගුවන් සේවය පාවිච්චි කරලා ඒ දේහය ලංකාවට ගෙනැල්ලා දෙන්න බැරිකමක් තිබෙන්නේ ඇයි? කොරියාව වැනි රටවලට ගියොත් දේහය ගෙනෙන්නත් බැහැ. ඒ ගැන මම දන්නා අනන්ත තොරතුරු තිබෙනවා. ඉතාලියේදී නම්, ඉතාලියේ ඉන්න ශ්‍රී ලාංකිකයන් එකතු වෙලා යම් කිසි මුදලක් එකතු කරලා තමයි ඒ රටවල දේහය මිහිදන් කරන්නේ, අවසන් කටයුතු කරන්නේ. එතකොට ඒ දේහය ලංකාවේ ජීවත්වන දරුවන්ට දකින්නත් නැහැ. අවුරුදු ගණනක් කිස්සේ විදේශ විනිමය හොයලා දුන්නු තාත්තාගේ දේහය දකින්න දරුවන්ට අවස්ථාවක් නැහැ; අම්මාට අවස්ථාවක් නැහැ. එය මොන තරම් අමානුෂිකද? ගරු ඇමතිතුමියනි, ඒ නිසා අපි ඔබතුමියට යෝජනා කරන්නේ මේ සම්බන්ධයෙන් රජයට යෝජනාවක් ඉදිරිපත් කරන්න, කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න කියලායි.

ලංකාවේ ගුවන් සේවය බංකොලොත් බව අපි දන්නවා. හැබැයි, ලංකාවේ ගුවන් සේවය බංකොලොත්වෙලා තිබෙන්නේ විදෙස්ගත වුණු අයගේ දේහයන් ලංකාවට ගෙනැල්ලා නොවෙයි; පිට රට රැකියා සඳහා ගිය අයගේ දේහයන් ලංකාවට ගෙනෙන්න අනුග්‍රහ දක්වලා නොවෙයි. සමහර සභාපතිවරුන්ට සංචාර යන්න, තමන්ගේ නියම සහ අනියම් බිරින්දෑවරුන් එක්ක විදේශගත වෙන්න පහසුකම් සලසලා තමයි ලංකාවේ ගුවන් සේවය බංකොලොත්වෙලා තිබෙන්නේ. ශ්‍රී ලංකා ගුවන් සේවයට එහෙම පහසුකම් සලසන්න පුළුවන් නම්, විදේශගත වුණු ශ්‍රී ලාංකිකයෙක් අවුරුදු ගණනක් වැඩ කරලා, දුක් විඳලා, ලංකාවට එන්න බැරි වෙලා, එහේදී මිය ගියාට පස්සේ රජයේ අනුග්‍රහයෙන් ඒ දේහය ලංකාවට ගෙනැල්ලා දෙන්න බැරි ඇයි? ඒ වෙනුවෙන් යන වියදම දරන්න බැරි ඇයි? ඒ වියදම පවුලේ අය දරන්න ඕනෑද? ඒක රජයෙන් කරන්න ඕනෑ දෙයක්. ඒ කටයුත්ත රජය බාර ගත යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

ඔබතුමිය වාගේම අපත් දිගටම සාකච්ඡා කරන මාතෘකාවක් තමයි, මේ අය වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් හැදීම පිළිබඳව කාරණය. ඔවුන්ට විශ්‍රාම වැටුපක් ඕනෑ වෙන්නේ ඇයි? රජයේ සේවකයන්ට විශ්‍රාම වැටුපක් තිබෙනවා. පෞද්ගලික අංශයේ සේවකයන්ට අර්ථ සාධක අරමුදල් තිබෙනවා. හැබැයි, අවුරුදු ගණනක් ජීවිතය කඹුරලා, ලංකාවට ආවාට පස්සේ නැවත අලුතින් ජීවිතය පටන් ගන්න ඔවුන්ට තිබෙන දායක අරමුදල මොකක්ද? ඔවුන්ට තිබෙන මුදල මොකක්ද? හුහාක් අය රට යනවාය කියලා අපි හිතුවාට රට ගිය අය ගොඩාක් යුතුකම් ඉෂ්ට කරලා තමයි අවසානයේ ලංකාවට එන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තමන්ගේ දරු පවුල විතරක් නොවෙයි, ඔවුන් තමන්ගේ නෑදෑයිනුත් බලා ගන්න ඕනෑ; යාළු මිත්‍රයිනුත් බලා ගන්න ඕනෑ; ඔවුන්ටත් උදව් කරන්න ඕනෑ. මේ ඔක්කොම කරනකොට ඔවුන්ට මාසයේ පඩිය ජීවත් වෙන්නත් මදි. විශේෂයෙන්ම යුරෝපයේ මේ වනකොට අර්බුදයක් තිබෙනවා. යුරෝපයේ ඉන්න අයගේ වැටුපෙන් භාගයක් විවිධ බදු හැටියට ඒ රජය ගන්නවා. ඔවුන්ට ජීවත්වීම සඳහා පමණයි වැටුපක් ලබා දෙන්නේ. ඔවුන්ට වෙනත් සිහින මාළිගා නැහැ. ඒවා synthetic සිහින. ඒවා බිහි කරන්න බැහැ.

මගේ අත් දැකීමක් පිළිබඳව ඔබතුමියගේ අවධානය යොමු කර වන්නම්. මගේ මිත්‍රයකු අවුරුදු 21ක් තිස්සේ ප්‍රංශයේ ජීවත් වෙනවා. ඔහුට තවම ලංකාවේ තමන්ගේ ගෙදර කපරාරු කර ගන්න විධියක් නැතිව ඉන්නවා. අගෝස්තු නිවාඩුවට ඔහු ලංකාවට

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ඇවිල්ලා ඉන්නවා. ඔහුට තවම ලංකාවේ ගෙදර කපරාරු කර ගන්න විධියක් නැහැ. මා දන්නා තවත් පවුලක් ඉන්නවා. ඔවුන් ලංකාවේ අර ගත් ඉඩමක් විකුණලා යන්න ලංකාවට ඇවිල්ලා ඉන්නවා. ඒ, මොකටද? එහේ ගෙවල් කුලී ගෙවා ගන්න. තවත් පවුලක් එහේ ගෙවල් කුලී ගෙවන්න ලංකාවේ ඉඩමක් විකුණලා යන්න ඇවිල්ලා ඉන්නවා. මොකද, ලංකාවේ ඉඩම විකුණලා යන්න ඕනෑ, එහේ ගෙවල් කුලී ගෙවා ගන්න. මේක තමයි යථාර්ථය. දැන් විදේශ සේවයේ රැකියා කරන අයට තිබෙන අර්බුදය මෙයයි. රජයේ දායකත්ව අරමුදලක් සහිතව - ඔවුන්ගෙනුත් යම් දායකත්වයක් සහිතව - විශ්‍රාම වැටුප් අරමුදලක් හදන එක යෝග්‍ය කාරණාවක් විධියට සලකන්න කියලා මම ඔබතුමියට යෝජනා කරනවා.

ඔබතුමියගේ අමාත්‍යාංශය යටතේ තිබෙන විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචි අය වෙනුවෙන් "සහන රක්ෂණ ක්‍රමය" කියලා රක්ෂණ ක්‍රමයක් තිබෙනවා. ඒ වාගේම එම රටවල්වල සේවා යෝජකයින් විසින් පවත්වාගෙන යන විවිධ රක්ෂණ ක්‍රම තිබෙනවා. ඒ රක්ෂණ ක්‍රමවලට අමතරව ඔබතුමන්ලා ජනවාරි මාසයේ ඉඳලා ක්‍රියාත්මක වන පරිදි අලුත් රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දී තිබෙනවා, සාමාන්‍යයෙන් ඒ රටවල වටිනාකමින් ඩොලර් 100කට සමාන මුදලක් අය කරලා. දැන් පැහැදිලි කර ගන්න ඕනෑ කාරණය මෙයයි. ඔබතුමියගෙන් ඇත්තටම සහතිකයක් - තහවුරුවක් - අවශ්‍ය කාරණා හැටියට තිබෙන්නේ, මේ රක්ෂණ ක්‍රමය හදන්නේ කවුද, මේ රක්ෂණ ක්‍රමයට දායක වන්නේ කවුද කියන කාරණායි. ඒ අයට රක්ෂණ ක්‍රම හදලා දෙනවා නම් හොඳයි. වැඩ කරන අයට රක්ෂණ ක්‍රම හදන්න ඕනෑ. නමුත් ඒකට ඒ අය දායක කර ගන්න ඕනෑ නැහැ. ඒ අය දායක වන රක්ෂණ ක්‍රම ඇති තරම් තිබෙනවා.

මේ කාරණය කෙරෙහිත් මා ඔබතුමියගේ අවධානය යොමු කරවන්න කැමැතියි. දෝහා කටාර්වල සම්බන්ධීකරණ කමිටුව හැටියට ඒ අය හඳුන්වන සුබසාධක සංගමය, ව්‍යාපාරික සංගමය, ශ්‍රී ලයන්ස් දෝහා, ශ්‍රී ලංකා මිතුරු සමාජය, ලංකා ලයන්ස් ක්‍රීඩා සමාජය, ශ්‍රී ලංකා මුස්ලිම් මජ්ලිස්, ආනන්දීය ආදී ශිෂ්‍ය සංගමය, සිල්වෙස්ටර් ආදී ශිෂ්‍ය සංගමය, සිංහල ක්‍රීඩා සමාජය, මුස්ලිම් විධායක සංසදය, වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ සංගමය ආදී දෝහා කටාර්වල කටයුතු කරන සියලුම සංවිධාන - අපේ සංවිධානයත් ඇතුළුව - ලියවිල්ලක් අත්සන් කරලා අතිගරු ජනාධිපතිතුමාටත් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අයගේ ඉල්ලීම වන්නේ මේකයි. ඒ රටේ තිබෙන මුදල්වල වටිනාකමේ හැටියට ඩොලර් 100ක් වටිනා මුදල් ප්‍රමාණයක් නැවත වැඩ කරන අයගෙන්ම අය කරනවා නම්, ඒ අයත් එක්ක ඒ ගැන සාකච්ඡා කරන්න ඕනෑ; ඒ අයත් එක්ක කථා බහ කරන්න ඕනෑ; ඒ අයත් එක්ක එකඟතාවක් ඇති වෙන්න ඕනෑ කියන එකයි. එහෙම නැත්නම් කවුරු හරි පිටස්තර කෙනෙකු මේ සඳහා දායක වන්න ඕනෑ.

ගරු අමාත්‍යතුමියනි, ඔබතුමියගේ ආයතනයෙන් හඳුන්වා දී තිබෙන මේ රක්ෂණ ක්‍රමය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන හැටියට මා ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා. මෙයින් බලාපොරොත්තු වන්නේ මොකක්ද? තිබෙන රක්ෂණ ක්‍රමවලට අමතරව මෙවැනි රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දුන්නේ ඇයි? ඒ වාගේම මේ රක්ෂණ ක්‍රමයට දායක කරගන්නා රක්ෂණ සමාගම් තෝරාගත් පදනම මොකක්ද? තෝරා ගත්තේ කොයි ආකාරයෙන්ද? එම වරප්‍රසාද සහිතව ඊට වඩා අඩු මුදලකට දායක කර ගන්න පුළුවන් තවත් සාධාරණ රක්ෂණ සමාගම් තිබෙනවාද? බරපතළම ප්‍රශ්නය වී තිබෙන්නේ, සේවය කරන අය මෙයට දායක විය යුතුද, නැද්ද කියන එකයි. ඒ පිළිබඳව සැකයක් ඇතිවී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන හැටියට මම ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා, ගරු අමාත්‍යතුමියනි.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමාගෙන් මට පොඩි ඉල්ලීමක් කරන්න තිබෙනවා. එම ඉල්ලීම මා දැන් කරන්නේ ගරු මන්ත්‍රීතුමා නැති වේවි කියා හිතලායි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ, නැහැ. මා නැති වන්නේ නැහැ.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
හැන්දෑවට. ඒ කියන්නේ මේ විවාදය අවසානයේ මා පිළිතුරු කථාව කරනවිට ඔබතුමා සභාවේ නොසිටීවි කියලායි. සේවකයාගේ දායකත්වයක් නැති රක්ෂණ ක්‍රමයක් කොහේ හෝ තිබෙනවා නම් මට ඒ තොරතුරු කෙසේ හෝ ලබා දෙන්න කියා ගරු මන්ත්‍රීතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. අපිත් ඒ අනුව ක්‍රියා කරන්න කටයුතු කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අන්න හරි. ඔන්න, ඔබතුමිය දැන් හොඳ තැනකට ආවා. සහන රක්ෂණ ක්‍රමය තිබෙද්දී, ඒ ඒ ආයතනවල සේවා යෝජකයන් ක්‍රියාත්මක කරන තවත් විවිධ රක්ෂණ ක්‍රම තිබෙද්දී, සේවකයන්ගේම පඩියෙන් දායක කර ගන්නා තවත් රක්ෂණ ක්‍රමයක් සේවකයන්ට හඳුන්වා දෙන්නේ ඇයි?

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව මම හැන්දෑවට හොඳින් පැහැදිලි කරන්නම්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ වෙලාවට ගරු සභාවට එන්න. මම පැහැදිලි කරන්නම්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු අමාත්‍යතුමියනි, රක්ෂණ ක්‍රම ගොඩක් අරගෙන අවුරුදු දෙකකට විදේශයට ගිහින් සිටින කෙනෙකුට අනතුරක් වන්නේත් නැහැ කියලාත්, ප්‍රශ්නයක් වන්නේ නැහැ කියලාත් අපි හිතමු. හැබැයි ඒ අය කොණ්ඩය කපන්න මාසිකව ගෙවන ගාස්තුව වාගේ තමන්ගේ පඩියෙන් ඩොලර් සියය සියය ගෙවා අත හෝදාගෙන ලංකාවට එන්න වුණොත් මොකද වෙන්නේ? කල්පනා කර බලන්න. එහෙම නම් අප වෙනත් රටක රක්ෂණ සමාගමක් නේ පොහොසත් කර තිබෙන්නේ. දැනටත් ක්‍රියාත්මක වන රක්ෂණ ක්‍රම තිබෙනවා. ඒ සේවකයන් කියනවා, "අපට මේ තිබෙන රක්ෂණ ක්‍රම ඇති" කියලා. වැඩ කරන තැනට ගියාම, වැඩ කරන තැන සේවකයන්ට රක්ෂණ ක්‍රමයක් තිබෙනවා නම්, එතැනදී කුමක් හෝ අනතුරක් වුනොත්, ආපදාවක් වුණොත් ඒ රක්ෂණ ආයතනයෙන් ගෙවනවා නම්, පාරේ දී accident එකක් වුණොත්, ඒ සඳහා ආවරණය සලසන රක්ෂණ ක්‍රමයක් තිබෙනවා නම්, විදේශ සේවා නියුක්ති කාර්යාංශය හඳුන්වා දී තිබෙන රක්ෂණ ක්‍රමයක් තිබෙනවා නම්, තවත් ඒවා මොකටද? මා කියන්නේ

මෙකයි. රක්ෂණ ක්‍රමයක් හැදුවාට කමක් නැහැ. හැබැයි, සේවකයන් කියනවා නම්, "මේ තිබෙන රක්ෂණ ක්‍රම අපට ඇති" කියලා, තවත් කරදරයක් ඒ සේවකයන්ට දෙන්නේ මොකටද? මොකද, ඒ අය රක්ෂණ ක්‍රමයට දායක වන්නත් උපයන්න ඕනෑ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සල්ලි සොයන්න ඕනෑ. ඒ වෙනුවෙන් එක පැයක් හෝ කඹුරන්න ඕනෑ; වැඩ කරන්න ඕනෑ. අපට මෙහේ ඉඳගෙන චක්‍රලේඛයක් යවා ඩොලර් 100ක් දෙන්න කියා කියන්න පුළුවන්. හැබැයි ඒකට ඒ අයගේ දායකත්වය අවශ්‍යයි. එයට දායක වන්න නම් ඒ අය වැඩ කරන්න ඕනෑ. තිබෙන රක්ෂණ ක්‍රමවලට අමතරව රක්ෂණ ක්‍රමයක් හදුන්වා දෙන්න තිබෙන ආසාව ගැන මා කැමැති වෙනවා; එකඟ වෙනවා. හැබැයි ඒකට සේවකයන්ගෙන් දායක කරගන්න එකේ තේරුමක් තිබෙනවාද කියන ප්‍රශ්නයයි තිබෙන්නේ. අඩු ගණනේ එය අනිවාර්ය කරන්නේ නැතිව - "අනිවාර්ය" කියන වචනය පාවිච්චි කරන්නේ නැතිව - "අපි රක්ෂණ ක්‍රමයක් හදුන්වා දෙනවා. කැමැති නම් ගන්න " කියා කියනවා නම් ප්‍රශ්නයක් නැහැ, ගරු අමාත්‍යතුමියනි. නමුත් මෙහිදී එහෙම නොවෙයි නේ සිදු වන්නේ. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අභවල් රක්ෂණ ක්‍රමය අනිවාර්යයයි කියා, ශ්‍රමිකයන් රට යවන කොටම ඔබතුමිය කොන්දේසියක් ඉදිරිපත් කරනවා නම්, එහෙම නැත්නම්, විදේශයන්හි දැනට වැඩ කරන සියලු ශ්‍රී ලාංකිකයන්ට ඔබතුමියගේ නිලධාරියා ගිහින් "මෙන්න මේ රක්ෂණ ක්‍රමය අනිවාර්යයි" කියලා කියනවා නම් එතැන ගැටලුවක් තිබෙනවා. අපි බලන්න ඕනෑ එය නොවෙයි. අප සිතා බලන්න ඕනෑ, මෙහිදී ඒ රටෙන් වැඩිපුර ගණනක් සොයා ගන්නේ කොහොමද, ඒ රටේ සිටින සේවා යෝජකයාගෙන් කීයක් හෝ වැඩිපුර ගන්නේ කොහොමද කියන එකයි. අපේ සේවකයාගෙන් ගන්නා ගණන ගැන නොවෙයි අප කල්පනා කරන්න ඕනෑකම තිබෙන්නේ. ගරු අමාත්‍යතුමියනි, ඔබතුමිය ඒ ගැන පැහැදිලි කිරීමක් කරනවා ඇති. නමුත් මගේ අදහසයි මා ඉදිරිපත් කළේ. ඒ ගැන සැලකිලිමත් වෙන්න කියා මා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ ප්‍රශ්නය මෙකයි. ගරු අමාත්‍යතුමියනි, මෙය ඔබතුමියගේ ප්‍රශ්නයක් විතරක් නොවෙයි. හැබැයි, ඔබතුමිය තමයි විදේශගත ශ්‍රී ලාංකිකයන් සම්බන්ධීකරණය සඳහා මේ පාර්ලිමේන්තුවේ සිටින තානාපතිතුමිය. ඒ විතරක් නොවෙයි, විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, රජය, භාණ්ඩාගාරය, කැබිනට් මණ්ඩලය ආදිය සම්බන්ධීකරණය කරන පාර්ලිමේන්තුවේ තානාපතිතුමිය ඔබතුමියයි. ඒ නිසා තමයි විදේශගත ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් පෙනී සිටින අප ඔබතුමියට මේ දුග් ගැනවිල්ල කියන්නේ. ඒ තමයි තානාපති කාර්යාලවලින් අය කරන ගාස්තු පිළිබඳව. අපේ දුග් ගැනවිල්ලක් කියන්න ගියත් ඒ රටවල තිබෙන අපේ තානාපති කාර්යාලවලින් ගාස්තුවක් ඉල්ලනවා. ගරු අමාත්‍යතුමියනි, ඔබතුමිය විශ්වාස කරන්න, සමහර අය දිවුරුම් ප්‍රකාශයක් සහතික කරන්නත් ගාස්තු අය කරනවා. එවැනි ගාස්තු ගෙවපු කෙනෙක් මට දුන් රිසිට් පතක් මා ළඟ තිබුණා. මම ඊයේ රෑ එළි වන කල් ඒ රිසිට් පත හෙව්වා. ගරු අමාත්‍යතුමියට එම රිසිට්පතේ පිටපතක් අරගෙන මම එවන්නම්.

ඉතාලියේ ජීවත් වන අම්මා කෙනෙක් තමන්ගේ දරුවාගේ උප්පැන්නය සහතික කර ගන්න ගියාම ඒ අම්මාගෙන් යූරෝ 34ක් අය කර ගෙන තිබෙනවා. ඒ මොකටද? ඒ සහතික කිරීම තානාපති කාර්යාලයේ ඉන්න අපේ ශ්‍රී ලාංකික නිලධාරියා විසින් කරලා දෙනවාට. රිසිට් එකකුත් කඩලා. ඒ පුද්ගලයා තානාපති කාර්යාලයේ රැකියාව කරන්නේ මේකට නේ. ඒ පුද්ගලයා රැකියාව කරන්නේම ශ්‍රී ලාංකිකයින්ට ඒ පහසුකම් ලබා දෙන්න. ඒකට යූරෝ 34ක් අය කරලා හරියන්නේ නැහැ. එහෙම නම්, ඒ නිලධාරියාට රැකියාවට වැටුපක් ලැබෙන්නේ මොකටද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමියනි, විශේෂයෙන්ම ඔබතුමියගේ අවධානය මා ඒ කාරණය කෙරෙහි යොමු කරනවා. ගරු ඇමතිතුමියනි, ඒ පිළිබඳව සැලකිලිමත් වන්න. විදේශ සේවා නියුක්ති කාර්යාංශය කැබිනට් මණ්ඩලය හරහා තානාපති කාර්යාලවලට බලපාන පරිදි චක්‍රලේඛයක් නිකුත් කර ඒ කටයුතු මෙහෙය වන්න ඕනෑ. යම් මුදලක් අය කරනවා නම්, ඔවුන්ට ඒ මුදල අය කළ හැක්කේ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ මොන මොන ගැටලු සඳහා ද කියලා විදේශ සේවා නියුක්ති කාර්යාංශය චක්‍රලේඛයක් මඟින් ඒ කටයුතු මෙහෙය වන්න ඕනෑ, මෙන්න මේ කාරණා සඳහා පමණයි මුදල් අය කළ හැක්කේ කියලා. ඒ සේවා සැපයීම වෙනුවෙන් යම් මුදලක් අය කරනවා නම් පමණයි. මොකද, ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලයක් ඕනෑම රටක තිබෙන්නේ සේවා සපයන්නයි. වෙන මොකටද? ඒ අයට ගිහිල්ලා ඒ අයගේ ළමයින්ට උගන්වන්න, සැප විඳින්න නොවෙයි. තමන්ගේ රාජකාරිය කරලා සැප විඳින්දාට කමක් නැහැ. තානාපති කාර්යාලවල තමන්ගේ රාජකාරිය කරන බොහෝ අයත් ඉන්නවා. එලෙස බොහොම මහන්සි වන අයත් මේ අතර ඉන්නවා. හැබැයි, මේ අතරේ තානාපති කාර්යාලයට එන ඒ රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයෝ වදකාරයෝ හැටියට සලකන අයත් ඉන්නවා. ශ්‍රී ලංකාව නියෝජනය කරන සමහර තානාපති කාර්යාලවලින් ඒ රටවල වැඩ කරන ශ්‍රී ලාංකිකයෙකු ගියාම "මොකටද ආවේ?" කියලා අහනවා. හැම එකකින්ම නොවෙයි; හැම නිලධාරියෙකුමත් නොවෙයි. මම ඒ කරුණත් අවධාරණය කරන්න ඕනෑ. හැබැයි, එහෙම ඉන්න අය ඉන්නවා.

වර්තමානය මම දන්නේ නැහැ, අපේ විදේශ කටයුතු ඇමතිතුමා මේ සම්බන්ධයෙන් යම් තීරණයක් ගත්තාද කියලා. කටාර්වල ඉන්න තානාපතිවරයාට ලංකාවේ වැඩ කරන මිනිස්සු වහ කදුරු වාගේයි. එහෙම නම්, මොකටද එතුමා ඉන්නේ? ලංකාවේ වැඩ කරන මිනිස්සු; ලංකාවේ සේවකයෝ ඒ අයගේ දුක්ගැනවිලි, ප්‍රශ්න කියන්න යන්නේ එතැනට. මීට කලින් නම්, එහෙම නැහැ. මීට කලින් වැඩ කරන අය ඒ තානාපති කාර්යාලයත් එක්ක හොඳ සහයෝගයකින් වැඩ කටයුතු කළා. එහෙමම වන්න ඕනෑය කියලා මම කියන්නේ නැහැ. ශ්‍රී ලංකාවේ තානාපතිවරයා ඉන්නේ ඒ රටේ වැඩ කරන අය වෙනුවෙන්. එහෙම හොඳ නිලධාරි අනන්ත ඉන්නවා. හැබැයි, ඒ අතරේ ඒ රටේ රජ්ජුරුවන්ට වැඩිය තමන් රජයි කියලා හිතන අයත් ඉන්නවා කියලා අපි දන්නවා. ඒ රටේ රජ්ජුරුවන්ට වඩා තමන් රජ්ජුරුවෝ කියලා හිතාගෙන ඉන්න අය ඉන්නවා. ඒ නිසා ඔබතුමිය ඒ ගැනත් සැලකිලිමත් වන්න. මම විශේෂයෙන් කටාර් රාජ්‍යය සම්බන්ධයෙන් දන්නා නිසායි කියන්නේ. ඒ සංවිධාන සමඟ, ඒ රටවල ඉන්න අනිකුත් අය සමඟ හොඳ සහයෝගයෙන් වැඩ කරපු තානාපතිවරු ඉන්නවා. හැබැයි, අද තත්ත්වය ටිකෙන් ටික වෙනස් වෙමින් තිබෙනවා. මම ඒ ගැන ඇත්තටම පෞද්ගලිකවම අපේ විදේශ කටයුතු අමාත්‍යතුමාගේ අවධානයත් යොමු කළා. ගරු ඇමතිතුමියනි, විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ පාර්ලිමේන්තුවේ ඉන්න තානාපතිතුමිය ඔබතුමියයි. ඒ නිසායි අපි ඔබතුමියට මේ කාරණය ඉදිරිපත් කරන්නේ.

විශේෂයෙන්ම කැබිනට් මණ්ඩලය හරහා චක්‍රලේඛ අවශ්‍ය වෙලා තිබෙනවා, නිර්දේශ අවශ්‍ය වෙලා තිබෙනවා, මොන මොන

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ගාස්තු ද අය කළ හැක්කේ, නැත්නම් මොනවාද බැරි, මොනවාද තානාපති කාර්යාලයකින් විදේශගත ශ්‍රී ලාංකිකයින්ට සපයන සේවාවන් කියලා. ගරු ඇමතිතුමියනි, ඒවා රටේ ප්‍රසිද්ධ වන්න ඕනෑ. ඔබතුමිය මේ පාර්ලිමේන්තුවේ අද බැරි නම්,-

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

අපේ මන්ත්‍රීතුමාට වචනයක් මට කියන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, විදේශ කටයුතු අමාත්‍යාංශය මේ ඊයේ-පෙරේදා පටන් ගත් එකක්යැ? මේ රටට නිදහස ලැබුණු දවසේ සිට ඒ අමාත්‍යාංශය තිබෙනවා. ඔවා ඔක්කෝම එදා සිටම කෙරෙනවා. උප්පැන්නයක් register කරන්න, මරණයක් සම්බන්ධයෙන් කටයුතු කරන්න ඒ ගොල්ලන් මුදල් අය කරනවා සහ ඒවා විය යුතු දේවල්. විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් කෙරෙන වැඩ අද ඊයේ අමුතුවෙන් එකතු වුණු දේවල් නොවෙයි. විදේශ කටයුතු ඇමතිතුමා මේ අවස්ථාවේදී මෙතැන නැහැ. ඔබතුමා දිගින් දිගටම විදේශ කටයුතු අමාත්‍යාංශයකුත් මෙතැනට ඇද ගෙන තිබෙන නිසා මම කියන්නේ. විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් කෙරෙන වැඩ ටික අලුතෙන් එකතු කරන්න දෙයක් නැහැ. ඒ කෙරෙන්න තිබෙන වැඩ, හැම දාම එක විධියටම ඒ වගකීම විදේශයන්හි ජීවත් වන ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් කරන්න ඕනෑ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම මේ ඔබතුමියට කියන්නේ හැම දාම කෙරෙන වැඩ සම්බන්ධයෙන් නොවෙයි. මම මේ කියන්නේ අලුතෙන් කෙරෙන වැඩ සම්බන්ධයෙනුයි. අලුතෙන් දමා තිබෙන යෝජනා, අලුතෙන් දමා තිබෙන වැඩ. ඒවායෙන් සේවකයන්ට, වැඩ කරන අයට, ඒ රටේ සිටින ශ්‍රී ලාංකිකයින්ට බලපෑමක් වනවා නම්, අපි ඒක කථා නොකළ යුතුද? ඒක අපි කථා කරන්න ඕනෑ. ඒවා හොඳද, නරකද, ඒවා ගැළපෙනවාද, නැද්ද කියන එක ඔබතුමියලා සාකච්ඡා කරන්න. ඒ අය කරන ගාස්තු ගැළපෙනවාද, ඒවා හරිද, ඒවා දරා ගන්න පුළුවන්ද කියන එක ඔබතුමියලාගේ වැඩක්. ඒකයි මම කියන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, මන්ත්‍රීතුමා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අවසාන වශයෙන්, අපේ ගරු නියෝජ්‍ය කථානායකතුමා මතු කරපු කාරණාව ගැනත් යමක් කියන්න ඕනෑ. විදේශගත වුණු ශ්‍රී ලාංකිකයකු ලංකාවට එන කොට - අපි හිතමු, විශේෂයෙන් මෑද පෙරදිග කියලා - බඩු ගොඩක් උස්සාගෙනයි එන්නේ. අත් දෙකේ බෑග් දෙකයි, පුළුවන් නම් කකුලෙන් එකක් එල්ලා ගන්නවා, පිටෙත් එකක් එල්ලා ගන්නවා. මොකද, මොනවා හෝ ලංකාවට ගෙනෙන්නයි බලන්නේ. මුළු ජීවිත කාලයටම හරි යන්න අර අවුරුදු දෙක-තුන තුළ එකතු කර ගත්ත දේවල් අරගෙන එන්නයි උත්සාහ කරන්නේ. ඒ එන කොට මෙහේ ගුවන් තොටුපොළේ duty-free එකට ගිහිල්ලා, duty-free concession එකෙන් ලැබෙන වරප්‍රසාදයෙන් ප්‍රයෝජන ගන්න ඒ වෙලාවේ බැහැ. ඒ වෙලාවේ බඩු ගන්න බැහැනේ ඇත්තටම. ඒ නිසා ඒ අයට තිබෙන තීරු බදු රහිත - duty-free - භාණ්ඩ ලබා ගැනීමේ වරප්‍රසාදය ලංකාවට ඇවිල්ලා දවස් කිහිපයක් යන තුරු ලංකාවේ ප්‍රධාන නගරවල තිබෙන ආයතනවලින්, ඒ බඩු සපයන ආයතනවලින් ලබා ගන්න ක්‍රමවේදයක් හදන්න පුළුවන්. ඔබතුමිය ඒක හොඳ යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්න. නැත්නම් passport එකේ seal එක ගහලා මේ අය එළියට දැම්මාට පස්සේ. ආයෙත් ගිහිල්ලා බඩු මුට්ටු ගන්න ක්‍රමයක් නැහැ. ඒ නිසා ඉහත ඉදිරිපත් කළ කාරණය ඇත්තටම වරප්‍රසාදයක්, අයිතියක් හැටියට සලකා ඔබතුමිය ඒකට මැදිහත් වෙන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ඔබතුමියගේ පැහැදිලි කිරීම් නැති සමහර කාරණා මා හිතුවා ඔබතුමිය මා එක්ක එකඟ කාරණයි කියලා. ඒ කාරණා සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම අපි මේ ඉදිරිපත් කරන කාරණා ප්‍රමාණය පමණක් නොවෙයි, තවත් කරුණු තිබෙනවා ඉදිරිපත් කරන්න. ඒවා මීට වඩා හරවත් සාකච්ඡාවක් බවට පත් කර ගනිමු. විශේෂයෙන් ඉදිරි අය වැයට යෝජනා ගෙනැල්ලා, "අපි ඒ අය රට විරුවන් හැටියට සලකනවා. ඒ අය අච්චර, මෙච්චර දෙනවා" කියනවාට වඩා දැන් මේ කාරණා සම්බන්ධයෙන් යම් කිසි අවධියක් ඇති වුණොත් පාර්ලිමේන්තුව හරහා, ඔබතුමියගේ ඒ ඇමති ධුරය හරහා ඒ අයට යම් සාධාරණයක් ඉෂ්ට කළා කියලා අපට දැනෙනවා. ඒ සඳහායි අපි මේ යෝජනාව ඉදිරිපත් කළේ. එහෙම නැතිව ඔබතුමිය හෝ අමාත්‍යාංශය මට්ටමින් අඩුවක් දකින්න නොවෙයි. මා ඒක අවංකව කියන්න ඕනෑ. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඉන්න සභාපතිතුමාත්, ඔබතුමියත් දරන උත්සාහයක් තිබෙනවා. ඒ උත්සාහය ප්‍රතිඵලදායක කිරීම සඳහායි අපි මේ යෝජනා ඉදිරිපත් කළේ. ඒ නිසා අපි ලැහැස්තියි ඕනෑ වෙලාවක සාකච්ඡා කරන්න. ඔබතුමියත් ලැහැස්තියි අපිත් එක්ක සාකච්ඡා කරන්න. හැබැයි, සාකච්ඡාවල ප්‍රතිඵලයක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ ප්‍රතිඵලයක් ලබා ගැනීම සඳහායි මේ යෝජනාව මේ සභාවට ඉදිරිපත් කළේ. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

දිවා භෝජනය සඳහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු තාවකාලිකව අත් හිටුවනවා. නැවත පස් වරු 1.30ට රැස් වෙනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා.1.30ට නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

සහකාර මහ ලේකම්
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)
කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීතුමෙකුගේ නමක් යෝජනා කරන්න.

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
"ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු ඒ. ඒ. විජේතුංග මහතා
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன்படி, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

[අ.භා. 1.30]

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා වැදගත් විවාදයක් සඳහා සහභාගි වන්නට අවස්ථාව සලසා දෙමින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර දිසානායක මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම සභාව කල් තැබීමේ යෝජනාව මා පළමුකොට අගය ගැටලු.

විෂයභාර ඇමතිතුමිය වන ගරු තලතා අතුකෝරල මැතිනිය විදේශ රැකියා ක්ෂේත්‍රයේ රැකියාලාභී ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කරනු ලබන මෙහෙය අගය කිරීමටත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා. කුමන හෝ අවස්ථාවක විදේශගතව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයෙක් ගැටලුවකට, අනතුරකට පත් වී ඇති බව අපට දැන ගන්න ලැබුණු විටක අප ඒ පිළිබඳව දැනුම් දුන් සෑම මොහොතකම එතුමියත්, එතුමියගේ කාර්ය මණ්ඩලයත් ඉතාම කාර්යක්ෂම සහ අඛණ්ඩව මෙම කාරණා පිළිබඳව මැදිහත් වන බව එතුමියටත් විශේෂයෙන්ම එතුමියගේ කාර්ය මණ්ඩලයටත් ගෞරව කිරීමක් වශයෙන් සඳහන් කිරීමට අවශ්‍යයි. නමුත්, මෙම විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධ ගැටලු එතැනින් එහාට ගිය, එතැනින් එහාට පැතිරුණු ගැඹුරු ප්‍රශ්න ගණනාවක් නිසා මතු වී තිබෙන කාරණයි.

විදේශගත ශ්‍රමිකයන් ලෙස කටයුතු කරන ශ්‍රී ලාංකිකයන් දීර්ඝ කාලයක් තිස්සේ අපේ රටට වසරකට ඩොලර් බිලියන 7කටත් වඩා විශාල විදේශ විනිමයක් ගෙන එන බව සත්‍යයි. යුද්ධය තිබෙන කාලයේදී යුද්ධය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වන විදේශ විනිමය හිඟයක් ඇති වීම වළක්වනු ලැබුවේ මෙම ශ්‍රී ලාංකික ප්‍රජාව විසිනුයි. ඒ වාගේම මේ රට තුළ පැවැති විවිධ අර්බුදකාරී අවස්ථාවල, මේ රටේ ආර්ථිකය පිළිබඳ විවිධ ගැටලු මතු වෙලා, රැකියා වියුක්තිය පිළිබඳව ප්‍රශ්න මතු වුණු සෑම වෙලාවකම විකල්පය ලෙස විදේශගත රැකියා තෝරා ගන්නට අපේ පුරවැසියන්ට සිදු වුණා. ඒ නිසා තමන්ගේ පවුලේ සාමාජිකයන්; අම්මා, තාත්තා, බිරිඳ, දරුවෝ අතහැරලා; තම ස්වාමි පුරුෂයා; සහෝදර සහෝදරියන් අතහැරලා; තමන්ගේ පුරුදු ගම; නිවස අතහැරලා ඈත දුරු කතර ගෙවා ගෙන රැකියාවලට කිසිවෙක් යන්නේ කැමැත්තෙන් නොවෙයි කියන කාරණය විශේෂයෙන්ම කියන්න අවශ්‍ය වෙනවා. එවැනි දුෂ්කර තත්ත්වයන් තුළ කටයුතු කරන ශ්‍රී ලාංකික ප්‍රජාව පිළිබඳව මතු වෙලා තිබෙන මේ සුවිශේෂ ප්‍රශ්න අතරින් ඉතාම වැදගත් ප්‍රශ්නයක් තමයි මැද පෙරදිග සේවයේ නියුතු ගෘහ සේවිකාවන් පිළිබඳ ප්‍රශ්නය. එයිනුත් විශේෂයෙන්ම සවුදි අරාබියේ සේවය කරන ගෘහ සේවිකාවන් පිළිබඳ ප්‍රශ්නය. ඒ ගෘහ සේවිකාවන් මුහුණ දෙන ගැටලු රටින් රටට වෙනස්. හැබැයි, සමස්තයක් විධියට මැද පෙරදිග සේවය කරන ගෘහ සේවිකාවන් ඉතා බරපතළ සේවා කොන්දේසි උල්ලංඝනය වීම්වලට, ආත්ම ගරුත්වය පිළිබඳව අභියෝගවලට ලක් වෙනවා. ආඩම්බර රාජ්‍යයක් විධියට සමස්තයක් ලෙස නුපුහුණු ගෘහ සේවිකාවන් හැටියට අපේ අම්මලා, සහෝදරියන් පිට රට යැවීම අනුමත කළ නොහැකියි. ඒ වාගේම එය දිගින් දිගටම සිදු නොවිය යුතුයි. මා මේ කථා කරන්නේ නුපුහුණු ගෘහ සේවිකාවන් හැටියට කාන්තාවන් පිට රට යැවීම ගැනයි. පුහුණු වෘත්තිකයන් ලෙස කාන්තාවන් රට තුළ හෝ රටින් පිටත රැකියා කිරීම ගැන කිසිම ගැටලුවක් නැහැ. බොහෝ විට ඒ ලබන වෘත්තියමය පුහුණුව තුළ ඔවුන්ට ඒ අභියෝගයන්ට ශක්තිමත්ව මුහුණ දීමට හැකියාව තිබෙනවා. නමුත් නුපුහුණු ගෘහ සේවිකාවන් ලෙස කටයුතු කරන අපේ අහිංසක කාන්තාවන් ඒ ඇති වන අභියෝගයන්වලට මුහුණ දීමේදී ඉතාම අසීරු තත්ත්වයට පත් වෙනවා.

මැද පෙරදිග ගෘහ සේවිකා රැකියා සඳහා කාන්තාවන් යවන ලද රාජ්‍යයන් බොහොමයක් මේ වන විට තම රටේ පුරවැසියන් ගෘහ සේවිකාවන් ලෙස විදේශගත කිරීම සම්පූර්ණයෙන්ම නතර කර තිබෙනවා. එසේ නොකර සිටීමට අපට කිසිම හේතුවක් නැහැ. මම මීට කලිනුත් මේ කාරණය පිළිබඳව දිගින් දිගට අදහස් ප්‍රකාශ කර තිබෙනවා. ගෘහ සේවිකාවන් ලෙස අපේ රටේ මව්වරුන් විදේශගත වීම පිළිබඳව යම් සීමා පනවා තිබෙනවා. මම ඒක අගය කරනවා. ඒක තාවකාලික පියවරක්. නමුත් සමස්තයක් විධියට ගෘහ සේවිකාවන් ලෙස අරාබියේ සේවය කරමින් ආත්මගරුත්වය පිළිබඳ අභියෝගවලට ලක් වන්නා වූ සංඛ්‍යාව සහ පොදුවේ ඒ රැකියාවේ ස්වභාවය පිළිබඳව සලකන විට, මෙම ගෘහ සේවිකාවන් පිට රටවලට; අඩුම වශයෙන් මැද පෙරදිග රටවලට යැවීම නතර කිරීම සඳහා රාජ්‍යයක් විධියට අපට සැලසුමක් තිබිය යුතුයි. ඒ සඳහා වූ පස් වසරක වැඩ පිළිවෙළක් සකස් කර ගෙන විදේශගත කිරීම් ක්‍රමානුකූලව සීමා කිරීම හරහා රටේ ආර්ථිකයට ඇති වන බලපෑම අවම කර ගන්න පුළුවන්. ඒ වාගේම එම රැකියා මත රඳා පවතින අනෙකුත් රැකියා ක්ෂේත්‍රවලට ඇති වන බලපෑම අවම කර ගන්නත් පුළුවන්.

ඒ නිසා මොන කොන්දේසි දැම්මත්, මොන තරම් කිව්වත්, ගෘහ සේවිකාවන් ලෙස මැද පෙරදිගට කාන්තාවන් යැවීම නතර කළ යුතුයි. එය වහාම නතර කළ නොහැකි නම් වසර 5ක් තුළ ක්‍රමානුකූලව නතර කිරීම සඳහා වූ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීම අපේ රජයේ වග කීමක්. එයට වෙන විකල්පයක් නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නය දෙස ආඩම්බරකාර ජාතියක් විධියට, මැදි ආදායම් ලබන රාජ්‍යයක් හැටියට, ශ්‍රේෂ්ඨ ඉතිහාසයකට උරුමකම් කියන රාජ්‍යයක් හැටියට, කාන්තාවන්ගේ, මවුවරුන්ගේ, සහෝදරියන්ගේ ගරුත්වය පිළිබඳ, ඒ උතුම් බව පිළිබඳ කථා කරන, ඒවා රකින ජාතියක් හැටියට අපට වග කීමක් තිබෙනවා. ඒ නිසා අපේ රජයේ වගකීම විය යුත්තේ වැඩිපුර ගෘහ සේවිකාවන් පිට රට යැවීම නොව, අඛණ්ඩව ඉදිරියටත් මෙය කරගෙන යෑම නොව ගෘහ සේවිකාවන් මැද පෙරදිගට යැවීම අවසන් කිරීමයි. ඒ සඳහා වැඩ පිළිවෙළක් අපේ ආණ්ඩුවට තිබිය යුතුයි.

ජනතා විමුක්ති පෙරමුණේ කථිකයන් සඳහන් කළ වැදගත් කරුණක් ගැන මා විශේෂයෙන්ම කියන්න අවශ්‍යයි. ඒ තමයි, දැනට විදේශගත වී සිටින ගෘහ සේවිකාවන්ගේ දරුවන්ගේ ප්‍රශ්නය. එහි පැති කිහිපයක් තිබෙනවා. සමහර විට පවුල් ඒකකය විධියට ම, තාත්තා රියැදුරු වශයෙනුත්, අම්මා ගෘහ සේවිකාව වශයෙනුත් සේවය කරලා, දරුවනුත් අරාබියේ ඉඳලා, ඔවුන් ආපසු ලංකාවට ආවාම ඒ දරුවන්ව පාසලකට ඇතුළත් කර ගැනීමට ඇති

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

නොහැකියාව නිසා ඒ දෙමවුපියෝ ඉතාමත් අසරණ වන බව අපි දැකලා තිබෙනවා. රටේ පවතින වර්තමාන රෙගුලාසි අනුව ඔවුන් ඉතාම අසරණ තත්ත්වයට පත් වනවා.

එපමණක් නොවෙයි. ඇත්ත වශයෙන්ම පවුලක අම්මා විදේශගත වුණාම ඒ දරුවාගේ අධ්‍යාපනයට විශාල අභියෝගයක් එල්ල වනවා. අම්මා කෙනෙක් දරුවකු වෙනුවෙන් කරන දෙයට තාත්තා විකල්පයක් නොවෙයි. මමත් දරුවන් තුන්දෙනකුගේ තාත්තා කෙනෙක්. නමුත් අම්මා කෙනෙක් දරුවන් වෙනුවෙන් කරන දෙයට තාත්තා විකල්පයක් නොවෙයි. ලෝකයේ හොඳම තාත්තාට වුණත් සීමාවන් තිබෙනවා, දරුවන් හදන එක ගැන; දරුවන්ගේ අධ්‍යාපනය ගැන; දරුවන්ගේ චරිතය ගොඩ නැඟීම ගැන. ඒ නිසා ඒ දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව මතුවන ප්‍රශ්නවලට අපි යම් විකල්පයක් යෙදිය යුතුයි. ඒ වාගේම විදේශගත ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා නිශ්චිතව වෙන්වුණු quota එකක් පාසල්වලට ලබා දීමට කටයුතු කළ යුතුයි කියා මා යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෘහ සේවිකාවන් පමණක් නොවෙයි, අපේ ශ්‍රී ලාංකිකයන් විදේශගත කිරීමේදී ඒ ශ්‍රමිකයන්ට උපරිම වැටුපක් ලබා ගන්න, ඉහළම පහසුකම් ලබා ගන්න, ඉහළම රැකවරණය ලබා ගන්න අපි පියවර ගත යුතුයි. ගරු ඇමතිතුමියනි, අද තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, ලංකාවේදී අත්සන් කරන ගිවිසුම නොවෙයි ඔවුන්ට අදාළව මැද පෙරදිගදී ක්‍රියාත්මක වන්නේ. නාම මාත්‍ර වශයෙන් ලංකාවේදී ගිවිසුමක් අත්සන් කරනවා. කලින් එහෙම දෙයක් තිබුණේත් නැහැ. නමුත් අද යම් මට්ටමකට එය වර්ධනය වෙලා තිබෙනවා. හැබැයි, ඔවුන්ට අවසානයේදී රැකියාව කරන්න සිද්ධ වන්නේ ලංකාවේදී අත්සන් කරන සේවා ගිවිසුම මත නොවෙයි. මෙන්න මේ ප්‍රශ්නවලට - එකඟ වුණු වැටුප, පහසුකම්, සෞඛ්‍ය පහසුකම්, නිවාඩු යන කාරණා පිළිබඳව- ඒ සේවකයාගේ වරප්‍රසාද නිශ්චිතව ආරක්ෂා වන කොන්දේසි සහිත ගිවිසුම්වලට එළඹීමත්, එම ගිවිසුමම සේවා කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ කාලය තුළ ක්‍රියාත්මක වීමත් තහවුරු කරන සුපරීක්ෂාකාරී වැඩ පිළිවෙළක් අපේ රජය ආරම්භ කළ යුතුව තිබෙනවා. මා යෝජනා කරනවා, මේ පිළිබඳව අදාළ රටවල තානාපති කාර්යාල තවදුරටත් ශක්තිමත් කරලා, ඒ රටවල කම්කරු සබඳතා අංශය තවදුරටත් ශක්තිමත් කරලා, විදේශ රටවල සිටින සෑම සේවකයන් සම්බන්ධවම මාස 6කට වරක්වත් එම සේවා ස්ථානයට ගිහින් ඔවුන් පරීක්ෂා කර බලා, අදාළ සේවා ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ඒ තැනැත්තන් රැකියාවේ යෙදවීමට හැකියාව තිබෙනවාද කියන කාරණය බලන්න අවශ්‍යයි කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් එක කාරණයක් කියන්න අවශ්‍යයි. වෘත්තීය පුහුණුව පිළිබඳ කාරණය වැදගත් එකක්. විදේශ රැකියා ක්ෂේත්‍රයට යොමුවීමට හැකි වන පරිදි අපේ රටේ වෘත්තීය පුහුණුව දියුණුවීම පිළිබඳව අපි දිගින් දිගට කථා කරලා තිබෙනවා. ඒ වාගේම සැලකිය යුතු වර්ධනයකුත් සිදුවෙලා තිබෙනවා. වර්තමාන රජය යටතේ ඒ සඳහා විශාල ආයෝජනයකුත් කරලා තිබෙනවා. හැබැයි, එක කාරණයක් පිළිබඳව මම කියන්නට ඕනෑ. විදේශගත ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව පිළිබඳව බරපතළ සැකසංකා තිබෙනවා. විදේශගත ශ්‍රමිකයන් පිළිබඳව සාකච්ඡා කිරීමේදී ඔවුන් පිළිබඳව විවිධ තොරතුරු ඉදිරිපත් වෙනවා. විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා හැටියට (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා සවුදි අරාබියේ සංචාරය කළ අවස්ථාවේදී එතුමා සතුව තිබුණු සංඛ්‍යා සහ සවුදි අරාබියේ බලධාරීන් සතුව තිබුණු සංඛ්‍යා අතර අතිවිශාල පරස්පරයක් තිබුණා. එම නිසා සත්‍ය වශයෙන්ම ශ්‍රී ලාංකික පුරවැසියන් කොපමණ ප්‍රමාණයක් විදේශගතව රැකියා කරනවාද යන කාරණය ගැන ඕනෑම මොහොතක අදාළ අමාත්‍යාංශයට සහ ආයතනවලට සොයාගත හැකි යම් ආකාරයක පරිගණකගත වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. නීති විරෝධීව සේවා ස්ථානයෙන් බැහැරවීම්, ඒ වාගේම රට තුළ අස්ථානගතවීම්, අතුරුදහන්වීම්, රටින් රට අනීතිකව මාරුවීම් වැනි ක්‍රියාදාමවලදී වඩාත් නිවැරදි තොරතුරු ඒ හරහා ලබා ගැනීමට හැකියාව තිබෙනවා. ගරු ඇමතිතුමියනි, ඔබතුමියගේ විෂය ක්ෂේත්‍රය ඉතා පුළුල් එකක්, ඉතාම වැදගත් එකක්. ඔබතුමිය ඉතාම සානුකම්පිතව සහ ඉතාම සංවේදීව, දක්ෂ ලෙස ඒ කටයුතුවල යෙදෙනවා. නමුත් මේ ක්ෂේත්‍රය තුළ ඇති වටිනාකමත්, විදේශගතව සේවය කරන අතිවිශාල ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ සංඛ්‍යාවත්, ඔවුන්ගෙන් ලැබෙන ආදායමත්, ඒ සියලුම කාරණා සලකන විට ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපේ රාජ්‍ය මේ පුරවැසියන්ගේ ආරක්ෂාව වෙනුවෙන්, සුබසාධනය වෙනුවෙන් වඩා දියුණු වැඩ පිළිවෙළක් සහ වඩා වැඩි ආයෝජනයක් කළ යුතුයි කියන කාරණය යෝජනා කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු චන්ද්‍රසිරි කජදීර)
(The Hon. Chandrasiri Gajadeera)
මට කොපමණ කාලයක් තිබෙනවාද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.43]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු චන්ද්‍රසිරි කජදීර)
(The Hon. Chandrasiri Gajadeera)
බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මාතෘකාව ලෙස ගත් විදේශ රැකියා කරන සංක්‍රමිකයන්ගේ ප්‍රශ්නය සහ ඒ හා බැඳුණු විවිධ ප්‍රශ්න හා ගැටලු පිළිබඳව මෙතැනදී දීර්ඝ වශයෙන් කථා කළා. ඒ නිසා මම ඒ කරුණු නැවත වරක් කථා කරන්නේ නැහැ.

ඇත්ත වශයෙන්ම 1977න් පස්සේ විවෘත ආර්ථික ක්‍රමය ආරම්භ වීමත් සමඟ විදේශ විනිමය ඉපැයීමේ මාර්ගයක් වාගේම රැකියා සුලභ කිරීමේ මාර්ගයක් විධියට විදේශ රැකියා සඳහා සංක්‍රමණික ප්‍රශ්නය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළා.

ඒ අනුව මේ දක්වා ගත්තොත් අපට පෙනෙනවා, අපේ රටේ සියයට 96ක් විතර යන්නේ මැද පෙරදිග රටවලට බව. මැද පෙරදිග රටවල් අතරිනුත් සවුදි අරාබියට තමයි දැනට වැඩි සංඛ්‍යාවක් යන්නේ. අද අපි මුහුණ දෙන ප්‍රශ්නය දෙස බැලුවොත්, ග්‍රාමීය දිළිඳුකමත් සමඟ මේ ගැටලුව සමාජගත වෙලා තිබෙන බව පෙනෙනවා. ගමේ සංවර්ධනයක් තිබෙනවා නම්, ගමේ හොඳින් ජීවත් වීමේ හැකියාවක් තිබෙනවා නම්, ගමේ ආර්ථික පදනමක් තිබෙනවා නම් කිසිවෙක් මේ රට අත හැරලා ශ්‍රමය විකුණන්න යන්නේ නැහැ. අද ගමේ තිබෙන දිළිඳුකමත් එක්ක ග්‍රාමීය දරිද්‍රතාව මතු වුණු නිසා ශ්‍රම වෙළෙඳ පොළ තුළ, තරගයට ශ්‍රමය විකුණන තත්ත්වයක් මතුවෙලා තිබෙනවා. විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, ඒ ශ්‍රමය විකුණන තරගය වාගේම, ඒ ශ්‍රමය සූරාකෑම වාගේම, විදේශ රටවල රැකියා සඳහා යන බොහෝ අය, විශේෂයෙන්ම මැද පෙරදිග රටවලට යන බොහෝ කාන්තාවන් ලිංගික සූරාකෑමටත් ලක්වෙන බව.

පසු ගිය කාලය ඇතුළත ඒ පිළිබඳව පැමිණිලි විශාල ප්‍රමාණයක් වාර්තා වී තිබෙන බව විදේශ සේවා නියුක්ති කාර්යාංශය සකස් කළ වාර්තාවක සඳහන් වන බව මම ගරු ඇමතිතුමියට කියන්න කැමැතියි. විශේෂයෙන්ම 2014 වර්ෂයේ පැමිණිලි 9,373ක් ලැබී තිබුණාය, එයින් වැඩි සංඛ්‍යාවක්, ඒ කියන්නේ 5,539ක් වාර්තා වෙලා තිබෙන්නේ සවුදි අරාබියෙන් කියලා එහි සඳහන් වෙනවා. ඇත්ත වශයෙන්ම මේ පැමිණිලි කවර විධියේ පැමිණිලිද කියා මේ වාර්තාවේ තවදුරටත් පුළුල්ව සඳහන් වුණා නම් හොඳයි. එම පැමිණිලි වැටුප් පිළිබඳ, අතවර පිළිබඳ, ලිංගික සූරාකෑම් පිළිබඳ වැනි ආකාරයට වෙන්ව තිබුණා නම්, අපට යම් කිසි නිගමනවලට එන්න තිබුණා. කෙසේ වෙතත්, මෙයින් පැහැදිලි වෙනවා, නොයෙක් විධියේ දුෂ්කරතා මැද්දේ, නොයෙක් විධියේ කටුක ප්‍රශ්න මැද තමයි අපේ රටේ කාන්තාවන් විදේශ රටවල රැකියාවල යෙදෙන්නේ කියන කාරණය.

මේ අයගේ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න ගරු ඇමතිතුමියට විශාල, බරපතළ වගකීමක් තිබෙනවා වාගේම, අලුත් ප්‍රශ්නයක් අද මතු වෙලා තිබෙනවා. ඒක තමයි, මැද පෙරදිග තිබෙන අස්ථාවරභාවය. මැද පෙරදිග තිබෙන බරපතළ ප්‍රශ්නය තමයි සරණාගත ප්‍රශ්නය. අද මුළු ලෝකය පුරාම යුද්ධය හේතු නිසා, ආක්‍රමණික හේතු නිසා මේ සරණාගත ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. ඒ නිසා සමහරවිට අපි බලාපොරොත්තු වන ඉලක්ක කරා ඉදිරි කාලයේ අපට යන්න බැරි වෙනවා. දැනට ඒ ගොල්ලන්ගේ තිබෙන ප්‍රශ්න විසඳන්න, එක් අයෙක් වෙනුවෙන් ඩොලර් යම් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවාය කියා ගරු ඇමතිතුමිය කිව්වා. ඒ නිසා මේ මැද පෙරදිග සරණාගත ප්‍රශ්නයත් එක්ක, දැන් අපට ඉපයීමට වඩා වැයවීමක් සිදු වෙලා තිබෙනවා. ඒ නිසා අපට මැද පෙරදිගින් ඔබ්බට හිතන්නට සිදු වෙලා තිබෙනවා. කොහොමද අපේ රටේ මේ රැකියා ප්‍රශ්නයට මුහුණ දෙන්නේ, විදේශ විනිමය ඉපයීමේ මාර්ගයක් විධියට වාගේම, අපේ ග්‍රාමීය දිළිඳු ජනතාවගේ පවුල් ඒකක ශක්තිමත් කරන්න මොන විධියේ සැලසුමක් ඉදිරි කාලයේ ක්‍රියාත්මක කරනේ කියන ගැඹුරු ප්‍රශ්නයකට අපි මුහුණ දෙමින් සිටිනවා.

වර්තමානයේ අපේ රටේ සමහර රැකියාවල යෙදෙන්න පුළුවන් කාන්තාවන්ට ඒ වරප්‍රසාදය හිමි වෙලා නැහැ. අධිවේගී මාර්ගවල - highwaysවල- යන විට අපට පෙනෙනවා, ටිකටිපත නිකුත් කරන තැන හොඳ හැඩ දැඩි තරුණයෙක් වාඩි වෙලා ඉන්නවා කියලා. ඇත්තවශයෙන්ම ඔහු ටිකට්ටුව දෙන්න පුටුවෙන් නැඟිටින්නේත් නැහැ. යුරෝපය අරගෙන බැලුවාම අපට පෙනෙනවා, මෙවැනි සමහර රැකියා කරන්නේ ජොෂ්ඨ පුරවැසි කාන්තාවන්, එහෙම නැත්නම් කාන්තාවන් බව. සමහර රැකියා අවස්ථා ලබා දීමේදී, කාන්තාවන්ගේ හිමිකම් ගැන හිතපු තත්ත්වයක් සමහර අවස්ථාවල අපට පෙනෙන්නේ නැහැ. අපේ තරග විභාගවලදී රැකියා ක්ෂේත්‍රවල තිබෙන කාන්තාවන්ගේ සංඛ්‍යාව සාපේක්ෂව ගත්තොත් වැඩි බව ඇත්ත. නමුත්, එතරම් අධ්‍යාපනයක් නොලැබූ අයට දිය හැකි රැකියාවලට තිබෙන ඉඩ කඩ සීමාසහිතයි.

අපේ ප්‍රදේශයේ ඉන්නවා, කාන්තාවක්. ඇය තමයි, හොඳම රියැදුරුවරිය. ඇය අධිවේගී මාර්ගයේ බස් රථයක් පදවනවා. ඇයට එක්තරා අවස්ථාවක් අහිමි වුණාය කියා මහා කුලුනකටත් නැග්ගා. ඒ ප්‍රවෘත්තියට පුවත් පත්වල ලොකු ප්‍රසිද්ධියක් දුන්නා. ඒ නිසා කාන්තාවන් යෙදවිය හැකි සමහර අවස්ථා තිබෙනවා. ලොකු උගත්කමක් ඒවාට අවශ්‍ය නැහැ. නමුත් ඒ අවස්ථා අපි පුළුල් කරලා නැහැ.

නිදහසෙන් පස්සේ රට තුළ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරන්න ගෙන ගිය කාර්මීකරණ වැඩ පිළිවෙළත්, ආර්ථික ක්‍රමයේ ව්‍යුහාත්මක වෙනසත් ඇති නොවීමේ ප්‍රතිඵල මත ඇති වුණු දිළිඳුකමේ එක ප්‍රතිඵලයක් තමයි, මේ සූරාකෑමට ලක් වීම. ශ්‍රම සූරාකෑම විතරක් නොවෙයි, මේ කාන්තාවන් බරපතළ විධියේ ලිංගික සූරාකෑමකටත් මුහුණ දෙනවා.

මේ රටේ පොහොසත්ම අය සියයට 20ක් වන අතර, ජාතික ආදායමෙන් සියයට 52.6ක්ම ලබන්නේ ඔවුන්. එතකොට දුප්පත්ම සියයට 20ට යන්නේ ජාතික ආදායමෙන් සියයට 5.1යි. කොයි තරම් ඇති නැති පරතරයක් තිබෙනවාද? මැද පෙරදිග කලාපයේ ඇති වුණු සංකීර්ණ ප්‍රශ්නත් සමඟ මැද පෙරදිග කලාප දහයක් තිබුණත් මේ ප්‍රශ්නයට උත්තර සොයන්නට බැහැ. එම නිසා මේ ප්‍රශ්නයට දේශීය වශයෙන් උත්තරයක් සොයන්නට ඕනෑ. අපේ රටේ රැකියා උත්පාදන අවස්ථා සම්පූර්ණ කරන ජාතික සැලැස්මක් අපට තිබෙන්නට ඕනෑ. අපි වෙනත් රටක් දිහා බලලා ඒ රටට අපේ ශ්‍රමිකයන් යවන්නට උත්සාහ කරන්නට ඕනෑ. ඒ විධියට ශ්‍රමිකයන් යැව්වාම විදේශ විනිමය ලැබෙන පැත්තකුත් තිබෙනවා. මෙවැනි අර්බුදකාරී තත්ත්වයන් සමඟ, අද ලෝකයේ ඇති වෙන අලුත් තත්ත්ව සමඟ, ලෝකය පුරා අද මතු වෙමින් තිබෙන අලුත් ත්‍රස්තවාදය සමඟ, සම්පත් සූරාකෑමේ ධනේශ්වර මං කොල්ලයත් සමඟ, අධිරාජ්‍යවාදී කොල්ලකාරිත්වයත් සමඟ ඇති විය හැකි නොසන්සුන්කම්වලදී ඇත්ත වශයෙන්ම අපට ස්ථිරසාර වැඩ පිළිවෙළක් නොතිබුණොත්, අප බලාපොරොත්තු වන සැලසුම් පුහු සැලසුම් බවට පත් වෙනවා. මම ඒකෙන් කියන්නේ නැහැ, අපේ ඇමතිතුමියට තිබෙන කාර්ය භාරයෙන් ඉවත් වෙන්න කියලා. ඇත්ත වශයෙන්ම අපට වගකීමක් තිබෙනවා, පවතින තත්ත්ව යටතේ ඒ ශ්‍රමිකයන් ආරක්ෂා කර ගන්නට; ඒ ශ්‍රමිකයන්ගේ ජීවිත සුරක්ෂිත කරන්නට; ඔවුන්ගේ පවුල්වලට රැකවරණය දෙන්නට.

මේ සම්බන්ධ වැඩ පිළිවෙළක් ගැන අපට පසු ගිය කාලයේ අහන්නට ලැබුණා, "රට විරුවෝ" කියලා. මම දන්නේ නැහැ දැන් ඒ වැඩ පිළිවෙළ තිබෙනවාද කියලා. ඒක තිබෙනවාද ගරු ඇමතිතුමිය?

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
දැන් නැහැ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
එක ඇමතිවරයෙක් ඉන්න විට ඇති කළ රට විරු සංකල්පය මේ ඇමතිතුමිය ආවාට පස්සේ නැහැ. මේකෙන්ම පේනවා ජාතික සැලැස්මක් නැහැ කියලා. එක් එක් ඇමතිවරුන්ට ඕනෑ විධියේ සංකල්ප හදාගෙන සැලසුම් සහගත වැඩ පිළිවෙළකින් තොරව කරන සමහර නිර්මාණවලට, -රට විරු සංකල්පය දැන් ඉස්සරහාට

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

යන්නේ නැත්තේත් එවැනි කරුණක් නිසා වෙන්න ඇති කියලා මම හිතනවා- ඉස්සරහාට යන්න බැහැ. හැම ප්‍රශ්නයකටම ජාතික සැලැස්මක් තිබෙන්නට ඕනෑ. අපි දිගු කාලීනව ඇති වන තත්ත්වයන්ට මුහුණ දෙන්නේ කොහොමද, ඔවුන්ගේ පවුල් සුරක්ෂිත කරන්නේ කොහොමද, ඔවුන්ගේ රැකියාවල ස්ථාවර භාවය ආරක්ෂා කරන්නේ කොහොමද, ඔවුන් ඒ රටවලදී මුහුණ දෙන ගැටලුවලට අපේ පැත්තෙන් මැදිහත් වෙන්නේ කොහොමද කියන ප්‍රශ්නවලට ජාතික සැලැස්මක් තිබෙන්නට ඕනෑ.

අද මේ ගරු සභාවේදී ප්‍රකාශ වුණා, කවර ගිවිසුම් තිබුණත් ඒ ගිවිසුම් අනුව ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා. මීට කලින් කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමියක් යෝජනාවක් ගෙනාවා, බෙරුම්කාර ක්‍රමවේදයක් හදලා, ඒ රටවල් ඇතුළේ තිබෙන පීඩනයෙන් ඔවුන් මුදවා ගන්නට, ඒ තුළින් ඇති වෙන ගැටලු විසඳා ගැනීමේ මාර්ගවලට අපි යන්නට ඕනෑ කියලා.

විශේෂයෙන්ම කාන්තාවන් විදේශ රැකියාවලට යොමු වන අවස්ථාවලදී අපි කවුරුත් කථා කළා වාගේ, ඒජන්සිකාරයා ළඟ ඉඳලා, ගුවන් තොටේ ඉඳලා, ඒ රටට යාමේ ඉඳලා සහ රැකියාව කරන අවස්ථාව දක්වා පීඩනයට පත් වෙනවා. ඒ වාගේ විවිධ ගැටලුවලට ඒ අය මුහුණ දෙනවා. ඒක ඉතාම අමානුෂිකයි. මම ගරු ඇමතිතුමියට කියන්නට කැමැතියි, මම විදේශ ගමනක් ගිහින් එන විට එක්තරා ගුවන් තොටුපොළකදී දුටු සිදුවීමක්. විදේශ රැකියා සඳහා යොමු කළ ලාංකීය කාන්තාවන් විශාල ප්‍රමාණයක් එහි සිටියා. මේ අයව භාර ගන්න කෙනෙක් නැතිව එතැන විශාල කලබැගෑනියක් තිබුණා. භාර ගන්න කෙනෙක් නැතිව මේ අය ගුවන් තොටුපොළේ රැඳී ඉන්නවා. යන්නේ කොහේටද, යන්නේ කොහොමද, සම්බන්ධ වෙන්නේ කවුද, ගෙනියන්නේ කවුද කියලා ඒ අය බරපතළ ප්‍රශ්නයකට මුහුණ දීලා තිබුණා. මමවත් කථා කරන්නට ගියේ නැහැ, මටත් බැණුම් අහන්නට වෙන නිසා. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. ඒවා තාවකාලිකව ඒ අවස්ථාවේ විසඳන්නට පුළුවන් ප්‍රශ්න නොවෙයි. එම නිසා ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ඔස්සේ මෙතෙක් ගෙන ගිය වැඩ පිළිවෙළ වඩා නිවැරදි පදනමකට යොමු කරමින් මේ ප්‍රශ්නයට ප්‍රවේශවීමේ අවශ්‍යතාවක් තිබෙනවා. මා හිතන විධියට ඒ වෙනුවෙන් ඔබතුමිය යම් උත්සාහයක් අරගෙන තිබෙනවා. ඒ ලේකම්තුමාද තවම අමාත්‍යාංශයේ ඉන්නේ කියා මා දන්නේ නැහැ.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
විතානගේ මහත්මයා ඉන්නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ආ, එතුමා නේ තවම ඉන්නේ.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඔව්.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
එතුමා හොඳ පළපුරුදු ලේකම්වරයෙක්. හැකියාවන්, දක්ෂතා තිබෙන කෙනෙක්. ගරු ඇමතිතුමියනි, ඒ නිසා ඔබතුමියට එතුමා සමඟ එකතු වෙලා යම් වැඩ කොටසක් කරන්න පුළුවන් වේවි.

මූලික වශයෙන්ම විදේශ රැකියාවල යෙදී සිටින කාන්තාවන් මුහුණ දෙන ප්‍රශ්න ගැන අප සොයා බලන්න ඕනෑ. මේ දේවල් ගැන අත් දැකීම් නැතිව මේක මෙන්න මෙහෙම වෙන්න ඕනෑය කියා අපට කියන්න බැහැ. ඒකට සංවාදයක් ඕනෑ. මේ යෝජනාව ගෙනා ජනතා විමුක්ති පෙරමුණේම මන්ත්‍රීවරු කිව්වා වාගේ, ඒ ප්‍රදේශවල ගොඩනැඟිලා තිබෙන සංවිධානත් එක්ක, ලාංකීය සංවිධානත් එක්ක ඒ ගැන සාකච්ඡා කරන්න ඕනෑ. ඊට අමතරව මේ සඳහා අපේ අමාත්‍යාංශය විසින් යොමු කරපු හුඟදෙනෙක් තමන්ගේ කාර්ය භාරය හරියට කරන්නේ නැහැ. මා දැකපු විධියට එහෙම හැඟීමක් තිබෙන අය නොවෙයි ඉන්නේ. ඒවා සමහර විට වෙන හිතවත් පත්වීම්. මේ කාර්යය කරන්න ඕනෑය කියන හැඟීම ඒ අයගේ ඇහේ නැහැ. ඒ නිසා මේ කටයුත්ත සඳහා තෝරා ගන්න කොට, ඒ සම්බන්ධතා ගොඩනඟන්න තෝරා ගන්න කොට යම් නියදීන් මත, මේ වාගේ කටයුතුවලට යොදා ගන්න පුළුවන් අය හඳුනා ගනිමින් සහ ඒ අය පුහුණු කරමින් මේ කටයුතුවලට යොදවන්න ඕනෑ. ගෘහ සේවිකාවන් පුහුණු කරන එක පිළිබඳවයි, විදේශ රටවලට යන එක පුහුණු කරන එක පිළිබඳවයි විතරක් නොවෙයි ඔවුන් පුහුණු කළ යුත්තේ. මේ මෙහෙයුම්කරුවන් හරි හැඟීමක් ඇති, මානව ගුණයෙන් පිරුණු මිනිස්සු වෙන්න ඕනෑ. අපේ සමාජයේ නැතිම එක ඔකයි. මානව ගුණය නැහැ. ඔහුත් බලන්නේ එතැනින් කීයක් හරි හොයන්නයි. එහෙම නැත්නම් අතවරයකට ලක් වෙලා ආවොත්, ලිංගික අල්ලසක් ගන්නයි. මේක තමයි ඇත්ත. මේක තමයි අප මුහුණ දෙන ගැඹුරු ප්‍රශ්නය. මේ තත්ත්වය නිසා මේ ප්‍රශ්නයේ උඩයි, යටයි පැති දෙකම එක විධියට හදන්න ඕනෑ.

ගරු ඇමතිතුමියනි, මේ වාගේ ප්‍රශ්නයකදී ජාත්‍යන්තර වශයෙන් ගිහින් හුදකලා වෙලා ඉන්න අයගේ ප්‍රශ්න අප ගැඹුරු විධියට විසඳනවා නම් සමස්ත යාන්ත්‍රණයම සකස් කිරීමේ ක්‍රමවේදය -පිරමිඩාකාරව කොහොමද කියන එක- ගැන බලන්න ඕනෑ. අමාත්‍යාංශයක වාඩි වුණාම, අර කරපු පරණ පිල්ලේම කැල්ලෙන් කැල්ල, කැල්ලෙන් කැල්ල යන එක නොවෙයි කළ යුත්තේ. මේකට ජාතික සැලැස්ම හදන්නේ කොහොමද කියා බලන්න ඕනෑ. ඒකට සංවාදයක් ඕනෑ. ඒකට අප වැඩ පිළිවෙළක් හදන්නේ කොහොමද? ගරු ඇමතිතුමියනි, අඩු ගණනේ ඒකට උනන්දුව තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කැඳවලා, විද්වතුන් කැඳවලා මේ ප්‍රශ්නයට සැලැසුමක් හදාගැනීමේ වගකීම ඔබතුමියට තිබෙනවා. මා දන්නේ නැහැ, එහෙම දෙයක් කළාද කියා. එතකොට අත් දැකීම් තිබෙන මේ මන්ත්‍රීවරු හුඟක් කරුණු කියයි. එතකොට අලුත් අදහස් ලැබෙයි. ඒ අනුව යම් වැඩ පිළිවෙළක් හදලා, ඒ අදාළ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනත් සම්බන්ධ කරගෙන, පොඩි workshop එකක් වාගේ දෙයක් කරන එක හොඳයි. මොකද, "මම තමයි ඔක්කොම දන්නා කෙළිකාරයා" කියා හිතුවොත්, මොකුත් කරන්න ලැබෙන්නේ නැහැ. එහෙම සැලැස්මක් හැදුවොත් ඊළඟ ඇමතිවරයාටවත් ඒක වෙනස් කරන්න වන්නේ නැහැ. කවුරු ඇමති වුණත්, මේ වැඩ පිළිවෙළට මහ පෙන්වන ක්‍රමවේදයක් තමයි අපට තියෙන්න ඕනෑ. ඒ නිසා මම ඔබතුමියට යෝජනා කරනවා මේ ප්‍රශ්නය පිළිබඳ උනන්දුවක් දක්වන මේ පාර්ලිමේන්තුවේ ඉන්න මැති ඇමතිවරු, ඒ වාගේම මේ සම්බන්ධයෙන් අත් දැකීම් තිබෙන විද්වත් කොටස්, වෙනත් රටවල මේ ප්‍රශ්නවලට මුහුණ දෙන විවිධ සංවිධානවල කොටස් එක්ක කථා කරලා මේ ගැන යම් වැඩ පිළිවෙළක් හදන්න කියා. මේ එක එක වෘත්තීන්ට තිබෙන ප්‍රශ්නවල වෙනස්කම් තිබෙනවා. අප මේ වැඩ පිළිවෙළ හදන්නේ කොහොමද?

මෙතුමන්ලා පුහුණු මධ්‍යස්ථානයක් හැදීම ගැන යෝජනාවක් කළා. ඒක හොඳයි. නමුත්, ඔබතුමියට රටේ ඉන්න ඔක්කොටම කොරියානු භාෂාව උගන්වන්න බැහැ. ගොඩක් අය ඉතාලියටත් යනවා. ඒ ඔක්කොටම ඉතාලි භාෂාව උගන්වන්නත් බැහැ නේ.

එහෙම ඒ භාෂා උගන්වනවා නම් ඒ ඔක්කොටම ඒ රටවල රැකියා දෙන්න බලාගෙන උගන්වන්න ඕනෑ. යම් කොටසක් තෝරා ගෙන, ඒ යන පිරිසට තමයි අප ඒ දැනුම ලබාදෙන්න ඕනෑ. නමුත්, ක්‍රමික විකාශයක් ඇතිවන විධියට ඒ සමස්ත පද්ධතියම අප සැලසුම් කරන්න ඕනෑ. ඒ නිසා මම ඔබතුමියගෙන් ඉල්ලා සිටින්නේ මේකයි. මේ ගැන හොඳ, පුළුල් සංවාදයක් හදන්න. අපි දකින හැටියට හුහක් වෙලාවට පැරණි වටිටෝරුව ඇතුළේම මේ කටයුතු කෙරෙනවා. දැන් අපි, අමාත්‍යාංශවලින් මුද්‍රණය කරන හුහක් ලේඛන අරගෙන බැලුවොත් -පත්‍රිකා අරගෙන බැලුවොත්- සංඛ්‍යා ලේඛනවල වෙනසක් විතරයි ඒවායේ තිබෙන්නේ. අලුත් අරමුණක්, අලුත් මඟ පෙන්වීමක්, අනාගතය දෙස අලුත් දැක්මක්, ඊළඟට මතු වන අර්බුද පිළිබඳ අදහසක් ඒවායේ නැහැ. ඒවා තිබෙන්න ඕනෑ. මේ ප්‍රශ්නය ආවොත්, ඒකට කොහොමද මුහුණ දෙන්නේ කියලා දුර දැක්මක් තිබෙන්න ඕනෑ. එවැනි දේවල් තිබෙන බව දැන් අපට පෙනෙන්න ඕනෑ.

අපි ඊළඟට මුහුණ දෙන ගැඹුරු ප්‍රශ්නය තමයි, මැද පෙරදිග අර්බුදය. ඒ අද අපි අත්දකින දේ. ලෝකයේ තිබෙන විශාලම ප්‍රශ්නයක් තමයි, සරණාගත ප්‍රශ්නය. ලෝකය පුරාම එය බරපතළ ලෙස තිබෙනවා. මැද පෙරදිග තමයි අද සරණාගතයෝ වැඩියෙන්ම ඉන්නේ.

මම හිතන හැටියට මට නියමිත කාල සීමාව අවසන්. ඒ නිසා, මම කථාව නවත්වන්නම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ලබා දී තිබුණු කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඇත්ත වශයෙන්ම "කෝප්" කාරක සභාවට යන්නයි මම සූදානමින් හිටියේ. කාලය තිබෙන නිසා මට හිතුණා මේ ගැන වචන කීපයක් කථා කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ඉල්ලීමට අවසර දෙමින්, කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ගරු ඇමතිතුමියනි, මේ කටයුතු සම්බන්ධයෙන් ඔබතුමිය සාර්ථක වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරයි කියලා අපි බලාපොරොත්තු වනවා. දැනට ගෙන යන වැඩ පිළිවෙළත් වඩා පුළුල් ලෙස ඉදිරියට ගෙන යයි කියන බලාපොරොත්තුවෙන්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Gnanamuthu Srineshan. You have 15 minutes.

[பி.ப. 2.04]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உங்களுக்கு வணக்கத்தைத் தெரிவித்துக்கொண்டு இன்றைய தலைப்புக்கு வருகின்றேன். இன்றைய ஒத்திவைப்பு விவாதம் JVP பாராளுமன்ற உறுப்பினர் கௌரவ அநுரகுமார திஸாநாயக்க அவர்களால், வெளிநாட்டில் தொழில் புரிகின்ற இலங்கையர் எதிர்நோக்குகின்ற பிரச்சினைகள் தொடர்பாக முன்வைக்கப்பட்டிருக்கின்றது. அந்த வகையில் வெளிநாட்டில் தொழில்புரிகின்ற இலங்கையர்கள் எப்படியான துன்பங்களை அனுபவிக்கின்றார்கள், எப்படியான பிரச்சினைகளுக்கு முகங் கொடுக்கின்றார்கள் என்பது பற்றி நாங்கள் இன்று கருத்தாடிக் கொண்டிருக்கின்றோம். காலத்துக்குத் தேவையான, காலத்துக்குகந்த இந்தத் தலைப்பையொட்டி நானும் சில கருத்துக்களை முன்வைப்பதில் மகிழ்ச்சியடைகின்றேன்.

வெளிநாட்டுத் தொழில் வாய்ப்புக்காக எப்படியானவர்கள் செல்கின்றார்கள்? ஏன் செல்கின்றார்கள்? என்பதை முதலில் நாங்கள் நினைவில் நிறுத்திக்கொள்ள வேண்டிய தேவை இருக்கின்றது. வெளிநாட்டுக்குத் தொழில்வாய்ப்புக்காகச் செல்கின்றவர்கள் உள்நாட்டில் போதியளவு வேலை வாய்ப்புக்கள் கிடைக்காத காரணத்தினால் வெளிநாடுகளை நாடி தொழில்தேடி அலைந்து கொண்டிருக்கின்றார்கள் என்பது எங்களுக்குத் தெரியும். இன்னுமொரு வகையினர் இந்த நாட்டில் உழைப்பதைவிட அங்கு உழைத்தால் கூடுதலான வருவாயினைப் பெறலாம் என்ற எண்ணத்தில் வெளி நாடுகளுக்குச் செல்கின்றார்கள். அதைவிட இன்னுமொரு பிரிவினர் எமது நாட்டில் ஏற்பட்ட உள்நாட்டுப் போர் காரணமாக அல்லது வகுப்புவாத அடிப்படையிலான அரசியல் காரணமாக இந்த நாட்டில் தொழிலைப் பெற்றுக்கொள்ள முடியாமல் சமத்துவமான, சம வாய்ப்பான தொழில் உரிமை மறுக்கப்படுகின்றபடியால் உயிர் அச்சுறுத்தல் காரணமாகவும் வெளிநாடுகளுக்குச் செல்லவேண்டிய தேவை இருந்தது. இப்படியான நிலைமைகளினால் வெளிநாடு செல்கின்ற எமது நாட்டவர்கள் வெளிநாடுகளில் எப்படியான பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள் என்பதைப்பற்றி நாங்கள் பார்ப்போம்.

பொதுவாக ஐந்து வகையான முக்கிய வளங்கள் காணப்படுகின்றன என்பது எங்களுக்குத் தெரியும். மனித வளம், பௌதிக வளம், நிதி வளம், கால வளம், தகவல் வளம் என்றவாறு இந்த வளங்களை நாங்கள் வகைப்படுத்திப் பார்க்க முடியும். இந்த வளங்களிலே ஒரு தலையாய வளமாக, தலைசிறந்த வளமாக, தலைநிறைந்த வளமாக, ஒரு மூளை வளமாக இருப்பது மனித வளம். இந்த மனித வளத்தின் மகத்துவத்தினை அறிந்துகொண்டவர்கள், அதனது மாண்பினை அறிந்துகொண்டவர்கள் அந்த மனித வளத்தினைக் கூறுபோடாமல் முறையாக இந்நாட்டுக்குப் பயன்படுத்தினார்கள்; நாட்டை வளர்த்தெடுத்தார்கள். அந்த வகையில், ஆக்கவழியில் சென்று நாட்டினை அபிவிருத்தி செய்த தலைவர்களை நாங்கள் எண்ணிப் பார்க்கவேண்டும். குறிப்பாக, சிங்கப்பூரின் தந்தை எனக் கூறப்படுகின்ற லீ குவான் யூ, மலேசியாவின் தந்தையெனப் போற்றப்படுகின்ற மஹதீர் முஹம்மத் மற்றும் ஆபிரகாம் லிங்கன், மார்ஷல் டீட்டோ, நெல்சன் மண்டேலா போன்ற தலைவர்கள் தமது நாட்டினை அபிவிருத்திப் பாதையில் கொண்டுசென்றார்கள். அவர்கள் மனித வளங்களைப் பிரித்துப் பார்க்கவில்லை; கூறுபோடவில்லை; பக்கச்சார்பாக - பாரபட்சமாக நடக்கவில்லை; அனைத்து மக்களையும் தமது நாட்டு மக்களாகக் கருதினார்கள்; திறமைகளுக்கு முன்னுரிமை கொடுத்தார்கள்; ஆக்கவழியில் சிந்தித்தார்கள். அதன் காரணமாக அந்த நாடுகள் அபிவிருத்தியடைந்தன.

இன்னுமொரு வகையான தலைவர்கள் அழிவுப் பாதைக்குள் நாட்டினை இட்டுச்சென்றிருக்கிறார்கள். அந்த வரிசையில் ஹிட்லர், முசோலினி, இடியமீன், பொல்பொட் போன்ற தலைவர்களைக் குறிப்பிட்டுக் கூறமுடியும். எமது நாட்டில் ஆக்கவழிக்குக் கொண்டுசென்ற, பாரபட்சமற்ற - பக்கச்சார்பில்லாத, சமத்துவமான தலைவர்கள்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

இருந்திருக்கின்றார்களா என்பதைப் பற்றி நாங்கள் ஆராய வேண்டிய தேவையிருக்கின்றது. அந்த ஆராய்ச்சிக்கு முன்பாக, இனிவரும் காலத்திலாவது மனித வளங்கள் அனைத்தையும் ஒன்று திரட்டி, நாட்டினை அபிவிருத்திப் பாதையில் முன்னெடுத்துச் செல்லக்கூடிய, திறமைகளுக்கு முன்னுரிமை கொடுக்கக்கூடிய, ஆற்றல்களுக்கு முன்னுரிமை கொடுக்கக் கூடிய தலைவர்கள் இருப்பார்களா என்கின்ற ஏக்கம் எங்களுக்குள் இருக்கின்றது. இந்த நல்லாட்சி அரசாங்கத்தை நிர்வகிக்கும் மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களும் மாண்புமிகு பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்க அவர்களும் இணைந்தாவது இந்த நாட்டில் நிலவுகின்ற தேசியப் பிரச்சினையைத் தீர்த்துவைத்து, சகல மனித வளங்களையும் ஒருங்கே கூட்டி அதன் பயனைப் பெறக்கூடிய விதத்தில் செயற்படுவார்களாயின், எதிர்காலத்தில் பாரபட்சம் - பக்கச்சார்பு இல்லாத, சமநீதி கொண்ட தலைவர்களாக, ஆக்கத் தலைவர்களாக, மக்களால் மறக்கமுடியாத தலைவர்களாக வரலாற்றில் இடம்பிடிப்பார்கள். இல்லையேல், எமது எதிர்கால வரலாறும் முதற்கண்ட வரலாறாகத்தான் இருக்க முடியும்.

எமது மக்கள் உள்நாட்டில் வேலைவாய்ப்புகள் கிடைக்காத நிலையில், வெளிநாடுகளுக்கு வேலைதேடிச் சென்றிருக் கிறார்கள். இவ்வாறு சென்றவர்கள் மேலைத்தேய நாடு களுக்கும் சென்றிருக்கிறார்கள்; மத்திய கிழக்கு நாடுகளுக்கும் சென்றிருக்கிறார்கள். மேலைத்தேய நாடுகளுக்குச் சென்றவர்களது தொழில் உரிமைகள் அங்கிருக்கின்ற ஜனநாயக பாரம்பரிய விழுமியங்கள் காரணமாக ஓரளவுக்குப் பாதுகாக்கப்பட்டிருக்கின்றன. அதனால் அவர்கள் வசதியாக வரக்கூடிய ஒரு நிலைமையும் ஏற்பட்டிருக்கின்றது. ஆனால், 2000ஆம் ஆண்டுக்குப் பிற்பட்ட காலத்தில் மேற்குலக நாடுகளிலும் தொழிலுக்காகச் சென்றவர்களது தொழில் வாய்ப்புகள் மறுக்கப்படுகின்றன. இன்றைய நிலையில், சுவிற்சர்லாந்திலுள்ள அகதி முகாம்களில் 2000 தொழிலாளர்கள் - அகதிகள் மீண்டும் தாய்நாட்டுக்குத் திருப்பியனுப்பப்படக்கூடிய ஒரு சூழ்நிலையில் காணப் படுகிறார்கள் என்பது ஓர் இணையத்தளத்தினூடாகக் கிடைத்த தகவலாகும்.

மேலும், வெளிநாடுகளுக்குச் சென்ற தொழிலாளர்களில் மிக முக்கியமாக மத்திய கிழக்கு நாடுகளில் பணியாற்றுகின்றவர்கள், அதிலும் குறிப்பாகப் பணிப் பெண்களாகச் சென்றவர்கள் துன்புறுத்தப்படுகின்றார்கள். இந்த நாட்டிலிருந்து அவர்கள் புறப்படுகின்றபோது பணிப்பெண்களாகச் செல்கிறார்கள். நாடு திரும்பும்போது அவர்களில் சிலர் பிணிப் பெண்களாக - நோயுற்ற பெண்களாகத் திரும்புகின்றார்கள். அதுபோல், அங்கு உயிருள்ள உடலைத் தாங்கிச் செல்லுகின்ற தொழிலாளர்கள் சிலர் மீண்டும் எமது நாட்டுக்குச் சடலங்களாக அனுப்பிவைக்கப்படுகின்றார்கள். மத்திய கிழக்கு நாடுகளில் தொழில் உரிமை, தொழில் பாதுகாப்பு என்பன போதியளவு இருப்பதில்லை. அவர்களுக்குக் கிடைக்கின்ற சம்பளம்கூட அரைகுறையாகத்தான் கிடைக்கின்றது. இந்த வகையில், மத்திய கிழக்கு நாடுகளில் பணிபுரிகின்ற பணிப்பெண்கள் ஏறத்தாழ 95 - 100 அமெரிக்க டொலர் வரையில்தான் வேதனத்தைப் பெறுகின்றார்கள். அது எமது நாட்டின் நாணயத்தின்படி, 10,000 - 13,000 ரூபாய் ஆகும். இப்படியிருந்தும் ஏன், இந்தப் பெண்கள் அந்த நாடுகளை நாடிச்செல்கிறார்கள் என்றால், அவர்களுக்குரிய தொழில்வாய்ப்புகள் இந்த நாட்டில் கிடைக்காததன் காரணமாகத்தான். எங்களுடைய நாடுகளில் தொழில் வாய்ப்புகளை அவர்கள் பெற்றுக்கொள்ளக்கூடிய வசதி வாய்ப்புகள் எதுவும் இருக்கவில்லை.

கடந்த 30 ஆண்டுகளாகச் சகல விடயங்களும் யுத்தத்தை நோக்கியதாகவும் அழிவுப் பாதையை நோக்கியதாகவும் அமைக்கப்பட்டிருந்தன. இதன் காரணத்தால் அல்லலுறும் பெண்கள் தொழில்வாய்ப்புக்காக வெளிநாடுகளை நாடவேண்டிய ஒரு தேவை இருந்தது. வெளிநாட்டுக்குச் செல்கின்ற பணிப்பெண்கள் அனுபவிக்கின்ற அவஸ்தைகளை, நரக வேதனைகளை வார்த்தைகளால் கூறமுடியாது. பணிப்பெண்கள் சிலர், சுவையற்ற உணவைத் தயாரித்தார்கள் என்ற குற்றச்சாட்டுக்காக சூட்டுக்கோலினால் சுடப்படுவதும் சோம்பேறித்தனமாக இருந்தார்கள் என்பதற்காக அவர்களைக் கொலை செய்வதும் நாய்க்கும் பூனைக்கும் கொடுக்கின்ற உணவுகளை அவர்கள் உண்ண வேண்டுமென்று நிர்ப்பந்திக்கப்படுவதுமான விடயங்கள் மத்திய கிழக்கு நாடுகளில் நடைபெற்றிருக்கின்றன. இவை தொடர்பான செய்திகளை எமது பத்திரிகைகளின்மூலம் அறியக்கூடியதாக இருக்கின்றது. எமது நாட்டிலிருந்து வெளிநாடுகளுக்குச் சென்ற பணிப்பெண்கள் இவ்வளவு கொடுமைகளையும் தாங்கிக்கொண்டுதான் பணியாற்றுகிறார்கள் என்ற செய்தியினை அறிகின்றபோது வேதனையாக இருக்கின்றது. இன்னுமொரு வகையில் பார்க்கும்போது, இந்தப் பணிப்பெண்களில் 25 வீதமானவர்கள் தங்களுடைய வாழ்க்கையை வளப்படுத்திக் கொள்வதையும் 75 வீதமானவர்கள் வெறுங்கையோடு அல்லது குறைந்தளவு பணத்தோடு நாட்டுக்கு வருவதையும் காணக்கூடியதாக இருக்கின்றது. இவர்கள் தொடர்ந்தும் ஏழைகளாகத்தான் வாழ்ந்துகொண்டிருக்கின்றார்கள்.

எமது தொழிலாளர்கள் வெளிநாடுகளில் சென்று தங்களை வருத்தி உழைத்தாலும் எங்கள் நாட்டுக்கென்று அந்நியச் செலாவணியைப் பெற்றுத் தருகின்றார்கள்; வருவாயைப் பெற்றுத் தருகின்றார்கள். எமது தேசிய வருமானத்தில் ஏறத்தாழ 9 வீதமான வருவாயை இவர்கள் ஈட்டித்தருகின்றார்கள். அவர்கள்மூலம் ஈட்டப்படுகின்ற அந்தப் பணத்தினால் பெருமையடைகின்ற எமது நாடு, அவர்கள் படுகின்ற கஷ்டத்தைப் பார்த்து வேதனைப்படுகின்ற தன்மை குறைவாக இருக்கின்றது. தற்போது வெளிநாட்டுத் தொழில்வாய்ப்பு அமைச்சராக இருக்கின்ற கௌரவ தலதா அத்துக்கோரல அம்மணி அவர்கள் இனவாதமற்றவர் அல்லது பக்கச்சார்பற்ற முறையில் செயற்படக்கூடிய ஒருவர் என்று நினைக்கின்றேன். எனவே, வெளிநாடுகளில் பணியாற்றுகின்ற பணியாளர்களும் பணிப்பெண்களும் எதிர் நோக்குகின்ற பிரச்சினைகளைத் தீர்த்துக்கொள்வதற்கு கௌரவ அமைச்சர் அவர்கள் தங்களின் தலைமைத்துவத்தின் கீழ் ஆவன செய்யவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

அதேவேளை, எமது நாட்டில் கடந்தகால புள்ளிவிபரங்களின்படி இனக்குரோதங்கள், இனத்துவேசங்கள் இல்லாத காலத்தில் திறமையின் அடிப்படையில் பணியாற்றியவர்கள் என்று பார்க்கின்றபோது, 1956ஆம் ஆண்டு காலப்பகுதியில் நிர்வாக சேவையில் ஏறத்தாழ 30 வீதமான தமிழர்கள் இருந்திருக்கின்றார்கள். அது 1965ஆம் ஆண்டில் 20 வீதமாகக் குறைக்கப்பட்டிருக்கின்றது. 1970களில் தமிழர்கள் நிர்வாக சேவையில் ஈடுபடுகின்ற அளவு 5 வீதமாகக் குறைக்கப்பட்டிருக்கின்றது. அதேபோன்று உயர் பதவிகளான doctors, engineers, lecturers என்று பார்க்கின்றபோது, 1956களில் 50 வீதமானவர்கள்

தமிழர்களாக இருந்திருக்கின்றார்கள். 1965களில் அது 30 வீதமாகக் குறைந்து 1970க்குப் பிற்பட்ட காலத்தில் 5 வீதமாகச் சுருங்கியிருக்கின்றது. அவ்வாறேதான் படைத்தரப்பில் 1956களில் 40 வீதமான தமிழர்கள் பணியாற்றியிருக் கின்றார்கள். 1965களில் அது 20 வீதமாக இருந்து 1970க்குப் பிற்பட்ட காலப்பகுதியில் அது 1 வீதமாகச் சுருங்கி யிருக்கின்றது.

இந்தப் புள்ளிவிபரங்களை எடுத்துப் பார்க்கின்றபோது இந்த நாட்டிலே அந்தக் காலத்தில் திறமை அடிப்படையில் வேலை வாய்ப்புகளைப் பெற்றுக்கொண்ட எங்களது தமிழ்ச் சகோதரர்கள், பின்னர் படிப்படியாக ஒதுக்கப் பட்டிருக்கின்றார்கள்; ஒடுக்கப்பட்டிருக்கின்றார்கள். இதன் காரணமாக இந்த நாட்டில் பணியாற்றுவதைவிட அந்நிய தேசங்களுக்குச் சென்று தங்களுடைய சேவைகளை வழங்கலாமென்ற அடிப்படையில் அவர்கள் நாட்டைவிட்டு வெளிநாடுகளுக்குச் சென்று சேவகம் செய்யக்கூடிய நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றார்கள். அந்த வகையில் பார்க்கின்றபோது உள்நாட்டில் சேவை செய்யவேண்டிய, உள்நாட்டு உற்பத்தியில் ஈடுபடவேண்டிய புத்திஜீவிகள்கூடச் சொந்த நாட்டை மறந்து அந்நிய நாடுகளில் சேவகம் செய்யக்கூடிய நிலைமைக்குத் தள்ளப்பட்டிருக் கின்றார்களென்றால், எமது மனிதவள முகாமைத்துவம் என்பது ஒரு மலினமான முறையில் மேற்கொள்ளப்பட்டு, அது இனவாத ரீதியாக நோக்கப்பட்டிருக்கின்றது என்ற செய்தி புலப்படுகின்றது. இது ஒரு கசப்பான உண்மையாக இருந்தாலும் அதனை ஏற்றுக்கொள்ளவேண்டிய தேவையிருக்கின்றது. இப்போது காலம் கடந்துவிட்டது. ஆயினும், இனிமேலாவது வெளிநாடுகளில் அரைகுறையான தொழில்களைச் செய்துகொண்டிருக்கின்றவர்கள், அடிமை போன்று தொழில் செய்துகொண்டிருக்கின்றவர்கள் மீண்டும் எமது நாட்டுக்கு வந்து அவர்களது சேவையை வழங்குவதற்கு, அவர்களது புத்திசாலித் தன்மையை இந்த நாட்டில் பயன்படுத்துவதற்கு ஏற்றவிதத்தில் இன்றிருக்கின்ற தலைவர்கள் அதற்குரிய வாய்ப்பினை - வசதியினை ஏற்படுத்திக் கொடுக்கவேண்டும்.

குறிப்பாக அமைச்சர்களை நாங்கள் வகைப்படுத்திப் பார்க்கின்றபோது சில அமைச்சர்கள் இனத்துவேசம் காட்டாமல், பாரபட்சம் காட்டாமல், சமத்துவமாக, சம வாய்ப்புடன் சகல மக்களையும் அணுகவேண்டுமென்ற சிந்தனையுடன் செயற்படுகின்றபோதிலும், சிலரது செயற்பாடுகள் எங்களை மிகவும் வேதனைக்குட் படுத்துவனவாக இருக்கின்றன. குறிப்பாகச் சில அமைச்சர்கள் அவர்கள் தேசிய அமைச்சர்களா? ஒரு குறிப்பிட்ட ஊருக்குரிய அமைச்சர்களா? ஒரு குறிப்பிட்ட இனத்திற்குரிய அமைச்சர்களா? ஒரு குறிப்பிட்ட தொகுதிக்குரிய அமைச்சர்களா? என்றெல்லாம் எங்களைச் சிந்திக்க வைக்கின்ற வகையில் செயல்பட்டு, குறிப்பிட்ட தொகுதிகளுக்கு, குறிப்பிட்ட ஊர்களுக்கு, குறிப்பிட்ட மாவட்டத்திற்கு மட்டும் பணியாற்றுகின்ற அமைச்சர்கள்போல் தங்களுடைய தேசிய அமைச்சுப் பதவியினைச் சுருக்கிக்கொள்கின்றார்கள். ஆனால், கௌரவ அமைச்சர் தலதா அத்துக்கோரல அம்மணி அவர்கள் பாரபட்சமில்லாது சமத்துவமாகத் தன்னுடைய செயற்பாடுகளை முன்னெடுப்பதையிட்டு நாங்கள் பெருமைப்படுகின்றோம்.

இன்னுமொரு விடயத்தை நான் இங்கு சுட்டிக்காட்ட வேண்டும். எனக்கு நடிகர் எம்.ஜி.ஆர். நடித்த 'விவசாயி' என்ற திரைப்படத்தில் இடம்பெற்ற ஒரு பாடல் நினைவுக்கு வருகின்றது. அந்தப் பாடலில் அடங்கியுள்ள

"என்ன வளம் இல்லை இந்தத் திருநாட்டில்
ஏன் கையை ஏந்த வேண்டும் வெளிநாட்டில்
ஒழுங்காய் பாடுபடு வயல் காட்டில்
உயரும் உன் மதிப்பு அயல்நாட்டில்"

என்ற வரிகள் கருத்துப் பொதிந்தவை. அதிர்ஷ்டவசமாக எமது நாடு பல வளங்களைக் கொண்டிருக்கின்றது. அவ்வாறு இருந்தபோதிலும் அந்த வளங்களைப் பயன்படுத்துகின்ற தன்மை குறைந்துவிட்டது. இனவாத, மதவாதச் சிந்தனைகளினால் போட்டாபோட்டிகள் உள்ளக ரீதியாக உருவாகி, முரண்பாடுகளும் மோதல்களும் பிரிவினைகளும் ஏற்பட்டமையே அதற்கான காரணம்.

முக்கியமாக ஒன்றைக் குறிப்பிட்டுக் கூறலாம் என்று விரும்புகின்றேன். அதாவது, பிரதம அமைச்சர் அவர்கள் ஒரு தடவை எமது நாட்டிலுள்ள அரச சேவையின் வினைத்திறனைப் பற்றிக் குறிப்பிடுகின்றபோது, "30 வீதமான வினைத்திறனுடன்தான் எமது அரச சேவையாளர்கள் பணியாற்றுகின்றார்கள்" என்று குறிப்பிட்டிருந்தார். அதன் மறுபக்கத்தில் 70 வீதமான வினைத்திறன் கிடைக்கவில்லை என்பது தெளிவாகிறது. எனவே, எமது நாட்டிலுள்ள இந்தப் பணியாளர்கள் சரியான முறையில் முழுமையாகச் செயற்படுவதற்கேற்ற விதத்தில் எங்களுடைய தலைவர்கள் பாரபட்சம்-பக்கச்சார்பு இல்லாதவாறு தொழிற்படவேண்டும். அப்போதுதான் வெளிநாட்டு மோகத்துடன் வெளி நாடுகளுக்குச் செல்கின்ற தொழிலாளர்கள் இந்த நாட்டிலேயே தமது ஆற்றல்களை, திறமைகளை வெளிப்படுத்தக்கூடிய ஒரு நிலைமை ஏற்படும்.

இன்னுமொரு புள்ளிவிபரத்தைக் குறிப்பிடலாம் என்று விரும்புகின்றேன். குறிப்பாக, 1958களில் தென்கிழக்கு ஆசியாவிலேயே புகழ்பூத்த ஓர் ஆராய்ச்சியாளன் கந்தளாய் சீனித் தொழிற்சாலையில் காணப்பட்டார். மிகவும் திறமைசாலியான அவரின் பெயர் குணரட்னம். அவர் 1958இல் இடம்பெற்ற இனக் கலவரத்தின்போது படுகொலை செய்யப்பட்டார். இப்படிப்பட்ட புத்திஜீவிகளின் படுகொலைக்குப் பின்னர் எமது தமிழ்ச் சமுதாயத்தினர் தமக்கு இந்த நாட்டில் தொழில் புரிகின்ற உரிமை மறுக்கப்பட்டதாக உணர்ந்தார்கள். 1983களில் சுமார் 11 ஆயிரம் அரச தமிழ் பணியாளர்கள் தொழிலிருந்து விலகிச்சென்றார்கள். 30 வீதமானவர்கள் மீண்டும் தொழிலுக்குச் சேரமுடியாத நிலையில், நாட்டை விட்டு வெளியேறக்கூடிய அல்லது ஓய்வூதியம் பெற்றுச் செல்லக்கூடிய ஒரு நிலைமை ஏற்பட்டது. இப்படியான துயரமான பதிவுகள்தான் எமது நாட்டில் அபிவிருத்தியைப் பின்தள்ளக்கூடிய விதத்திலும் இளைஞர்கள் ஆயுதத்தை ஏந்தக்கூடிய விதத்திலும் மிகவும் இரத்தம் கசிந்த, வடிந்த ஒரு வரலாற்றினை உருவாக்கக்கூடிய விதத்திலும் அமைந்திருந்தன. எனவே, விட்ட தவறுகளை எமது தலைவர்கள் மீண்டும் மீண்டும் விட்டுக்கொண்டு தப்புக்காரர்களாக இருக்காமல், இந்த நாடு செழிப்பதற்கும் வளம் பெறுவதற்கும் ஏற்றவிதத்தில் கடந்த காலத்தினை சுயவிமர்சனம் செய்துகொண்டே நாட்டைக் கட்டியெழுப்பு வதற்கு மிகவும் திராணியுடனும் துணிவுடனும் செயற்பட வேண்டும். இந்த நாட்டில் மீண்டும் மீண்டும் குழப்பங்களையும் மிக மோசமான சூழ்நிலையையும் உருவாக்கி அதன் மூலமாக அதிகாரத்தைக் கைப்பற்றுகின்ற கைங்கரியம் தொடருமாக இருந்தால், எமது நாடு முன்னேற்றம் அடையக்கூடிய வாய்ப்பு இல்லையென்றுதான் கூறுவேன்.

நான் மீண்டும் இங்கு கேட்டுக்கொள்கின்ற விடயம் என்னவென்றால், எமது நாடு செழிக்க வேண்டும்; எமது மக்கள்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

සන්තෝසමාක වාෆ වේණ්ඩුම්; එමදු මනිත වළංකළ් පාදුකාක්කප්පට වේණ්ඩුම්; වෙළිනාඩුකළිල් එමදු තොෆිලාළර්කළ් කෞරවමාක මදික්කප්පට වේණ්ඩුම්; අවර්කළ් පෝදියළවු වරුවායිනෙප් පෙරක්කූඩියදාක ඉරුක්කවේණ්ඩුම්. අදර්කේර්ර විදත්දිල් නල්ලාට්චි අරසු චෙයර්පට්ටු අදනදු චෙයර්පාඩුකළෙ මුන්නෙටුක්ක වේණ්ඩුම් එන්පදෙත්දාන්. අන්ද වකෙයිල් වෙළිනාට්ටුත් තොෆිල් වාය්ප්පුක්කළෙ වළංකුකින්ර විටයත්දිල් ආළුංකට්චි, එදිර්ක්කට්චි එන්ර පේදම් ඉල්ලාමල් අල්ලදු අන්ද චමූකම්, ඉන්ද චමූකම්, අන්ද ඉනම්, ඉන්ද ඉනම් එන්රු පාරපට්චම් කාට්ටාමල් අදර්කුරිය ඒර්පාඩුකළෙ එංකළුටෙය කෞරව අමෙච්චර් අවර්කළ් චෙය්වාරෙන්ර නම්පික්කෙයෝටු විටෙපෙරුකින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඕළහට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම මූලාසනය සඳහා ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේදී ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය."යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව එච්චඩ ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. EDWARD GUNASEKARA left the Chair and THE HON. BIMAL RATHNAYAKE took the Chair.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 2.23]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ රැකියාවල නියුක්ත වූවන්ට අදාළ කරුණු ගණනාවක් සම්බන්ධව සභාව කල් තබන අවස්ථාවේදී ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා. විදේශ රැකියා ගැන කථා කරන කොට ක්ෂේත්‍ර කිහිපයක් ගැන කථා කරන්න අපට සිදු වෙනවා. පුහුණු ශ්‍රමිකයින්, තාක්ෂණවේදීන් විදේශ රටවලට ගිහිල්ලා රැකියා කිරීම සම්බන්ධයෙන් රටක් විධියට අපි එකඟ වෙනවා. හැබැයි අද සමාජය දිහා බලන විට තවදුරටත් අපේ කාන්තාවන්, මව්වරුන්, සහෝදරියන් ගෘහ සේවිකාවන් විධියට විදේශගත වීම පිළිබඳව බරපතළ ලෙස සාකච්ඡා කරන්න අපට සිදු වෙනවා. මේ හේතුව නිසා අද පවුල් සංස්ථා ගණනාවක් බිඳ වැටිලා තිබෙනවා. මව් කෙනෙක්, සහෝදරියක් විදේශ රටකට යවලා සොච්චම් මුදලක් ලබා ගන්නවාට වඩා හානියක් ඒ තුළින් අද සමාජයට සිදු වෙලා තිබෙනවා. මම හිතන විධියට අපේ අගමැතිතුමාගේත්, විදේශ රැකියා ඇමතිතුමියගේත් ඉලක්කය වන්නේ තවදුරටත් මේ නුපුහුණු ශ්‍රමිකයින්, විශේෂයෙන්ම කාන්තාවන් විදේශගත කිරීම නොකළ යුතුයි කියන එකයි. මේ රටේ ඩොලර් 300ක ආදායමක් උපදවන්න පුළුවන් ආර්ථිකයක් හදන්න පුළුවන් වුණොත්, කාන්තාවන්ට මේ රට තුළ හොඳ ආර්ථිකයක් සහ රැකියා අවස්ථා ඇති කරන්න පුළුවන් කියන කාරණයයි අගමැතිතුමාත් කිව්වේ. පසු ගිය වසර පහ-හය ඇතුළත අපේ රටට වැඩිම විදේශ විනිමය ප්‍රමාණයක් ලැබුණේ විදේශ ශ්‍රමිකයින්ගෙන්.

මහින්ද රාජපක්ෂ පාලන සමයේදී අපේ රටේ ප්‍රධාන ආදායම විදේශ ශ්‍රමිකයින්ගෙන් ඉපයීම ගැන අපි කනගාටු වෙන්න ඕනෑ. ඇයි, එහෙම වුණේ? එහෙම වුණේ, රටේ ආර්ථිකය ශක්තිමත් වුණේ නැති නිසයි; රට තුළ රැකියා උත්පාදනය වුණේ නැති නිසයි; ගෘහ ආර්ථිකය ශක්තිමත් වුණේ නැති නිසයි. ඒ නිසා තමයි පවුලේ අම්මාට රට යන්න වුණේ; ඒ නිසා තමයි පවුලේ සොහොයුරියට රට යන්න වුණේ. අපි මේ තත්ත්වය නතර කරන්න ඕනෑ කාලය දැන් එළඹිලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම හිතන විධියට අපි මේ සම්බන්ධයෙන් රටක් විධියට ප්‍රතිපත්තිමය තීරණයක් ගන්න ඕනෑ. අගමැතිතුමා, ඒ වාගේම විදේශ රැකියා ඇමතිතුමිය මේ සම්බන්ධව තදින්ම ඉන්නා බව මම දන්නවා.

අපි තවදුරටත් අපේ රටේ විදේශ විනිමය ජනනය කරන ප්‍රධාන ක්ෂේත්‍රය බවට විදේශ රැකියා ක්ෂේත්‍රය පත් වෙන්න ඉඩ හරිනවාද, එහෙම නැත්නම් ඒකට තිතක් කෙසේ වෙතත් කොමාවක් තියන්න කටයුතු කරනවාද කියලා හිතන්න ඕනෑ. පුහුණු ශ්‍රමිකයින් යවන එකේ ප්‍රශ්නයක් නැහැ. පුහුණු තාක්ෂණවේදීන් යවන එකේ ප්‍රශ්නයක් නැහැ. විශේෂඥ දැනුම සහිත පුද්ගලයන් යවන එකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි මව්වරු, කාන්තාවන් නුපුහුණු ශ්‍රමිකයින් සහ ගෘහ සේවිකාවන් විධියට විදේශගත වන එක නතර කළ යුතු වෙනවා.

අපට මතකයි, රණසිංහ ප්‍රේමදාස මහත්මයාගේ, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේදී තමයි විදේශ රැකියාවලට යන එක ආරම්භ වුණේ. හැබැයි ඒ වාගේම අපි විශාල කර්මාන්තශාලා ප්‍රමාණයක් අපේ රට තුළ ඇති කළා. ඇඟලුම් කර්මාන්තය තුළින් අපේ රට විශාල ආදායමක් ඉපයුවා. ප්‍රධාන ආදායම් ලබන අපනයන භෝග විධියට අපි තේ, පොල් සහ රබර් පිළිබඳව කාලයක් තිස්සේ කථා කළා. හැබැයි එය අභිබවා ඇඟලුම් කර්මාන්තයෙන් අපට ලැබුණු විදේශ විනිමය ප්‍රමාණය ඉහළට ආවා, එක්සත් ජාතික පක්ෂ පාලන කාලයේදී. හැබැයි පසු ගිය කාලයේ පැවැති වැරදි ආර්ථික කළමනාකරණය නිසා, වැරදි විදේශ ප්‍රතිපත්ති නිසා අපට GSP Plus සහනය නැති වුණා. ඒ හරහා විශාල රැකියා ප්‍රමාණයක් ජනිත කරපු කර්මාන්තශාලා රාශියක් වැසී ගියා. ඒ ඉඩකඩ ඇහිරුණාට පසුව ඒ තැන්වල රැකියා කරපු තරුණ තරුණියන්ට තමයි විදේශගත වෙන්න සිදු වුණේ. එහි ප්‍රතිඵලයක් විධියට තමයි පසු ගිය අවුරුදු හය-හත ඇතුළත නුපුහුණු ශ්‍රමිකයින් විශාල ප්‍රමාණයක් විදේශගත වෙලා, විදේශ ශ්‍රමිකයින්ගෙන් ලබන ආදායම අපේ රටේ ප්‍රධාන ආදායම බවට පත් වුණේ. එම නිසා අපි හිතනවා, ගරු අගමැතිතුමාගේ හා ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති තුළින් රටේ "ආර්ථික මොඩලය" ක්‍රියාත්මක වීමෙන් ඉදිරියේදී අපේ රට තුළ ඩොලර් 300ක් උපයන්න පුළුවන් රැකියා ඇති වීම, සුලභ වීම තුළින්, අපේ මව්වරු, අපේ සහෝදරවරු විදේශගත වීම නතර වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ ශ්‍රමිකයන්ට තවත් ගැටලු ගණනාවක් තිබෙනවා. මේ ක්ෂේත්‍රයේ විශාල ශ්‍රමිකයන් ප්‍රමාණයක් තවත් රටවල් ගණනාවක සේවය කරනවා. කොරියාවේ පුහුණු ශ්‍රමිකයන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. යුරෝපා රටවලත් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයගේ ඡන්ද අයිතිය ගැන අපි පසු ගිය කාලයේ ඉතා දරුණු විධියට කථා කළා. ඇත්තටම ඒ සඳහා ක්‍රමවේදයක් හදන්න පුළුවන් නම් හොඳයි. ඒ අය ඇත්තටම රටට ආදරය කරන පිරිසක්; විශාල වශයෙන් රටට ශක්තියක් ලබා දෙන පිරිසක්. ඒ අයටත් අවශ්‍යයි, අපේ රටේ ජන මතයට ඇතුළු වන්න. ඒ අයටත් අවශ්‍යයි, ඒ අයගේ මතය නියෝජනය කරන්න. ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන් නම් මම හිතන හැටියට ඒක ලොකු දෙයක්.

අපට පෙනෙනවා මේ රට අද කොයි දිශාවටද ගමන් කරමින් යන්නේ කියලා. ලෝකය පිළිගන්නා රටක් බවට අපි අද ලංකාව පත් කර තිබෙනවා. අපට මතකයි 2015 ජනවාරි 08වැනි දාට කලින් අපේ රට කොහේද තිබුණේ කියලා. අපේ රට පාලනය කළ ඒ දේශපාලන නායකයින්ගේ අදූරදර්ශී ක්‍රියා පටිපාටිය නිසා අපි ලෝකයෙන් කොන් වෙලායි හිටියේ. ලෝකයෙන් කොන් වෙලා හිටපු ඒ රට ලෝකය තුළ පිළිගැනීමකට ලක් වූ රටක් බවට පත් කර ගන්නට පුළුවන් වුණා, පසු ගිය අවුරුද්දේ ජනවාරි 08වැනි දා මේ රටේ බුද්ධිමත් ජනතාව දුන්නු ජන වරමත් එක්ක. හැබැයි, අද වෙනකොට ජන වරමට පයින් ගහලා, ජන වරමට පිටුපාලා මේ රට අස්ථාවර කරන්න සුළුතර කල්ලියක් උත්සාහ කරනවා. නමුත් ඒ ගොල්ලන් කරන සියලුම උත්සාහයන් අසාර්ථක වෙනවා. හොඳම උදාහරණය තමයි ඊයේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ දක්වපු නාඩගම. ජනවරම තුළින් සහ මේ ව්‍යවස්ථාව තුළින් නාඩගම් නටන නාඩගම්කාරයින්ට, jokersලාට පාර්ලිමේන්තු එන්න පුළුවන්. මොකද, එහෙම ඉඩකඩක් තිබෙනවා. ඡන්දය දුන්නොත්, එන්න පුළුවන්. හැබැයි, මේ ගරු පාර්ලිමේන්තුව ඇතුළේ නාඩගම් නටන්න දෙන්න බැහැ. මේ පාර්ලිමේන්තුව කෝලම් මඩුවක් කර ගන්න දෙන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දැක්කා, සුළුතරයක් ඒ තත්ත්වයට පාර්ලිමේන්තුව පත් කර ගන්න පසු ගිය කාලයේ උත්සාහ දරපු බව. ඒ තත්ත්වයෙන් මුදවා ගන්න අපි කටයුතු කරන්න ඕනෑ.

ඊයේ ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් තමයි ගෙනාවේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පතයි ගෙනාවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුණට අපි ගරු කරනවා. මොකද, මේ පනත් කෙටුම්පතට ඔබතුමන්ලා සාධනීය සංශෝධන ඉදිරිපත් කළා. මේ පිළිබඳව විවාද කළා. ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පතට සහය ලබා දුන්නා. අන්න ඒකයි මේ පාර්ලිමේන්තුව ඇතුළත වෙන්න ඕනෑ. එය හරවත් විවාදයක් බවට පත් වෙන්න ඕනෑ. එහෙම නැතුව, මේ සභා ගර්භය මැදට සරම උස්සාගෙන, සාරිය උස්සාගෙන ඇවිල්ලා කෝලම් නටන කෝලම් මඩුවක් බවට පත් කරගෙන මේ පාර්ලිමේන්තුව හැල්ලුවට ලක් කරන්න උත්සාහ කරනවා නම්, බලයේ සිටින පක්ෂය විධියට ඒකට කොහොමටවත් අපි ඉඩ දෙන්නේ නැහැ කියන කාරණය මතක් කරන්න ඕනෑ. මම හිතනවා, මේ කල්ලි, කණ්ඩායම් දැන්වත් තේරුම් ගනීවි කියා ඔවුන්ගේ න්‍යාය, ඔවුන්ගේ ක්‍රමවේද මේ රට තුළ පිළිගන්නේ නැහැ කියන කාරණය.

මහා දැවැන්ත පෙළපාළියක් එනවා කියලා දවස් ගණනක් අණබෙර ගැහුවා. ලිප්ටන් වටරවුමට එනකොට අන්තිමේදී ලැබුණු ප්‍රතිඵලයක් නැහැ. මේ ගොල්ලෝ මහ ලොකුවට කිව්වේ, "ජනතාව මිලියනයක් කොළඹට ගේනවා" කියා. ඉල්ලුවේ හයිඩ් පිටිය. හයිඩ් පිටියට රැස්කරන්න පුළුවන් 12,000යි. අපට මතකයි, අපි විපක්ෂයේ සිටියදී අපේ ඡන්ද මධ්‍යස්ථාන 12,000ක නායකයන් 12,000ක් ගෙනැත් රැස්වීමක් පැවැත්වුවා. හරියටම පිටිය පිරෙන්න ඒ 12,000 හිටියා. මේ ක්‍රීඩා පිටියට 12,000ක පමණ පිරිසක් තමයි රැස්කර ගන්න පුළුවන්. තවත් ඕනෑ නම් එළියේ පාරවල් එක්ක 15000, 18,000, 20,000ක විතර පිරිසක් එකතු කර ගන්න පුළුවන්. ඒ ප්‍රමාණය ඇතුළු කිරීමට සැලසුම් කරලා හයිඩ් පිටිය ඉල්ලලා, පසුව කියනවා, "ලක්ෂ 10ක ජනතාවක් අපි ගේනවා" කියලා.

මම ඊයේ පෙරේදා දවසක මිනින්දෝරු දෙපාර්තමේන්තුවත් සමඟ සාකච්ඡා කර ලිප්ටන් වටරවුමේ වර්ග අඩි ප්‍රමාණය බැලුවා. එහි පස් පැත්තටම තිබෙන පාරවල්වලට මීටර 50, 50 ඇතට දැම්මත් තිබෙන්නේ වර්ග අඩි 74,000ක පමණ ප්‍රමාණයක්. මම බැලුවා, වර්ග අඩි 10ක සාමාන්‍යයෙන් කී දෙනෙකුට ඉන්න පුළුවන් ද කියලා. සාමාන්‍යයෙන් අපේ ප්‍රමාණයේ 8 දෙනෙකුට විතර ඉන්න පුළුවන්. ඒ අනුව ගණන් හදලා බැලුවාම හොඳට pack කරලා දැම්මත් 48,000කට, 50,000කට තමයි සාමාන්‍යයෙන් එතැන ඉන්න පුළුවන් වන්නේ. ඒ ලිප්ටන් වට රවුමේ පස් පැත්තටම තිබෙන පාරවල්වලත් මීටර් 50ක් දුරට ගියාමයි. නමුත් මේගොල්ලන් කියනවා, "මිලියනයක් ගෙනාවා" කියලා. මේ වාගේ අසත්‍ය කියන්න පුළුවන්. මොකද, සමහර අසත්‍ය පිළිගන්න කණ්ඩායමක්, මෝඩයෝ ටිකකුත් මේ රටේ ඇති. හැබැයි, බුද්ධිමත් ජනතාවට නම් මේ අසත්‍ය කියන්න බැහැ. මේවා අහගෙන ඉන්නත් අද ඒකාබද්ධ කල්ලියේ කවුරුත් නැහැ. අද මෙතැනට එන්න බැරි නිසා තමයි ඊයේ පාර්ලිමේන්තුව කඩාකප්පල් කෙරුවේ. මොකද, කොරියාවේ ගිහිල්ලා එන පරාධීන කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ මහතා පිළිගන්න කටුනායක යන්න ඕනෑ නිසා, අද පාර්ලිමේන්තුව නවත්වාගැනීමේ වුවමනාවට ඊයේ පාර්ලිමේන්තුවේ ජෝගි නැටුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නැතුව, ඊයේ ගෙනෙන ලද පනත් කෙටුම්පතට විරෝධය පළ කරන්නවත්, පනත් කෙටුම්පත පිළිබඳ අවබෝධයකින්වත්, පනත් කෙටුම්පත පිළිබඳ අධ්‍යයනයක් කරලාවත් නොවෙයි එසේ කළේ. ඕකයි ඇත්ත තත්ත්වය වන්නේ. ඒ නිසා මේ කඩාකප්පල්කාරීන්ට අපි ඉතාම අවධානයෙන් යුතුව කියනවා, අවුරුදු හතරහමාරක් යනතුරු මේ ආණ්ඩුව පෙරළන්න උත්සාහ කරන්න එපා කියලා. පෙරළන්නත් බැහැ; පෙරළන්න දෙන්නෙත් නැහැ කියන කාරණය මතක් කරනවා. ඒ නිසා මාස 8කින් අලුත් රටක් හදන එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තියට, මේ යහ පාලන ප්‍රතිපත්තියට, මේ මෛත්‍රීපාල-රනිල් ප්‍රතිපත්තියට ඉඩ දෙන්න. එහෙම ඉඩදීලා, මේ රට ඉදිරියට ගෙන යන මේ උත්සාහයට ශක්තිය දෙන්න. අපි දන්නවා, අපේ ගරු තලතා අතුකෝරල ඇමතිතුමිය විදේශ රැකියා අමාත්‍යාංශය කොහොමද කරන්නේ කියන කාරණය.

පසු ගිය කාලයේ අපි දැක්කා, "Rataviru Talent Star" කිය කියා කෝටි ගණන් මුදල් නාස්ති කෙරුව බව. කෝටි ගණන් හොරකම් කෙරුවා. රණවිරුවා විතරක් නොවෙයි, රට විරුවාත් විකුණුවා. රට විරුවාත් විකුණා හම්බ කරපු කල්ලියක් තමයි කලින් රට පාලනය කෙරුවේ. අද ඇමතිතුමියක් විධියට කාන්තාවක් විදේශ රැකියා අමාත්‍යාංශයට පත්වෙලා තිබෙනවා. මව්තුමියක් විධියට, කාන්තාවක් විධියට මව්වරුන්ගේ, කාන්තාවන්ගේ, දියණියන්ගේ, සහෝදරියන්ගේ හදවතේ තිබෙන කැක්කුම දන්නා කෙනෙක් තමයි අද මේ අමාත්‍යාංශය කරන්නේ. එතුමියගේ ඉලක්කය වන්නේ, විශේෂයෙන්ම නුපුහුණු ශ්‍රමිකයන් ලෙස රට හැර යන කාන්තාවන්, අපේ මව්වරුන් -අපේ මව් සම්පත- ආරක්ෂා කර ගැනීමයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන් වී ගෙන යනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව සුළු වේලාවක් ලබා දෙන්න. ඒ නිසා ඉතාම හොඳින්, ඉතාම කාර්යක්ෂමව, අමාත්‍යාංශයේ සේවාව ලැබිය යුතු අයට එම සේවාව ලබා දෙමින් ගරු තලතා අතුකෝරල ඇමතිතුමිය එතුමියගේ අමාත්‍යාංශය මඟින් සිදු කරන සේවයට ස්තුතිවන්ත වෙමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු මනුෂ නානායක්කාර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 24ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.35]

ගරු මනුෂ නානායක්කාර මහතා (විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - வெளிநாட்டுத் தொழில்வாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara - Deputy Minister of Foreign Employment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාවෙන් වැඩි අවධානය යොමු කර තිබෙන්නේ, විශේෂයෙන්ම මැද පෙරදිග රැකියා කරන කාන්තාවන් මුහුණ දෙන ගැටලු සම්බන්ධයයි. මෙම යෝජනාව සම්බන්ධව අද දිනයේ මේ ගරු සභාවේදී කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාගේම වැඩිමනත් අදහස් ඉදිරිපත් වුණේත්, එසේ විදේශ ගත වී රැකියා කරන කාන්තාවන් මුහුණ දෙන ගැටලු සම්බන්ධවයි. පළමුවෙන්ම මා සඳහන් කරන්න කැමැතියි, වසරකට දෙලක්ෂ අසූදහසක්-තුන්ලක්ෂයක් අතර ප්‍රමාණයක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචි වී විදේශ ගත වෙන බව. මෙහෙම ගත්තාම, නිශ්චිත සටහන් නැතත් දැනට දළ වශයෙන් මිලියන දෙකකට අධික සංඛ්‍යාවකින් යුත් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් පිරිසක් විදේශගත වී සිටිනවා. මෙසේ මිලියන දෙකකට අධික ප්‍රමාණයකින් විදේශගත සිටින අයගෙන් වසරකට ලැබෙන සාමාන්‍ය පැමිණිලි ප්‍රමාණය ගත්තාම, 2015 අවුරුද්දේ පැමිණිලි 10,503ක් ලැබී තිබෙනවා. මීට ආසන්නව නවදහස් ගණනින් වාගේ තමයි පැමිණිලි ලැබෙන්නේ. මෙය ප්‍රතිශතයක් විධියට ගත්තාම, දශම පහක් වාගේයි වෙන්නේ. අද අපි මහා විශාල ප්‍රශ්නයක් විධියට මෙක දැක්කාට ලක්ෂ විස්සකට ආසන්න ප්‍රමාණයකින් ශ්‍රමිකයන් විදේශගත වී සිටිනා රටකට එසේ ලැබෙන සියලුම පැමිණිලිවල එකතුව ගත්තාම, දශම පහක විතර ප්‍රතිශතයකින් තමයි අපට පැමිණිලි ලැබෙන්නේ.

කාන්තාවන් රට රැකියා සඳහා යන එකට අපි විරුද්ධයි. ඒ සම්බන්ධයෙන් සමාජයේ පවතින කතිකාවත අප දන්නවා. සමාජයේ ප්‍රශ්න ඇති වෙන එක අප බැහැර කරන්නේ නැහැ. නමුත් මේ කථා කරන තරම් මේ ප්‍රශ්නයේ මහා ලොකු ගැඹුරක් තිබෙනවාය කියා මා විශ්වාස කරන්නේ නැහැ. මොකද, සියයට දශම පහක ප්‍රමාණයකින් විතරයි, සියලුම පැමිණිලි ලැබෙන්නේ. මෙසේ ලැබෙන සියලුම පැමිණිලිවලින් සමහර ඒවා වැටුප් නොලැබීම් සම්බන්ධව දමපු ඒවා වෙන්න පුළුවන්, එහෙම නැත්නම් රට රක්ෂාවකට ගිහින් ටික දවසක් ගියාම ගෙදර මතක් වෙලා ඉන්න බැරුව නැවත ලංකාවට එන්න ඕනෑ නිසා දමපු පැමිණිලි වෙන්න පුළුවන්.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයට දවසකට ලැබෙන පැමිණිලිවලින් බහුතරයක් සැබෑ ප්‍රශ්න තිබෙන ඒවා නොවෙයි. සමහරු තමන්ගේ ඥාතිවරයා ගෙන්වා ගැනීම සඳහා පැමිණිලි කරනවා. විදේශ රටකට ගිහිල්ලා සේවය කිරීමට අවුරුදු දෙකක ගිවිසුම් අත්සන් කර යන තමන්ගේ ඥාතිවරයාට එසේ ගිවිසුම් අත්සන් කළ කාලය ගත කර ගැනීමට නොහැකි වුණාම මාසයෙන්, මාස දෙකෙන්, තුනෙන්, හයෙන් නැවත ගෙන්වා ගැනීම සඳහා ඉල්ලීම් කරනවා. මෙසේ ඉල්ලීම් කරන්නේ පැමිණිල්ලක් විධියටයි. මෙවැනි ඒවාත් එකතු වෙලා තමයි, මේ සියලු පැමිණිලි සංඛ්‍යාව සෑදී තිබෙන්නේ. ඒ නිසා මම මුලින්ම සඳහන් කරන්න ඕනෑ, සමහර වේලාවට -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මූලාසනය විධියට මම යමක් දැන ගන්න කැමැතියි. රටට වැදගත් වන කරුණක් සම්බන්ධයෙන් ඔබතුමා යම් පැහැදිලි කිරීමක් කළොත් හොඳයි කියා මා විශ්වාස කරනවා. අදාළ කොන්ත්‍රාත් කාලය අවසන් කරන්නට පෙර ලංකාවට ඒමට එසේ ඉල්ලුම් කරන පුද්ගලයෙකුට ඒ සඳහා තිබෙන ක්‍රමවේදය මොකක්ද? එසේ ඉල්ලීමක් කළාට පසුව ඔබතුමන්ලාගේ පැත්තෙන් ඒ සඳහා ලබා දෙන උපදෙස මොකක්ද? එසේ අදාළ කාලය අවසන්වීමට කලින් පැමිණෙනවා නම් යම් ගෙවීමක් කළ යුතුද යනාදී වශයෙන් යම් ක්‍රමවේදයක් තිබෙනවාද? ගරු ඇමතිතුමිය පිළිතුරු ලබා දුන්නත් කමක් නැහැ.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එසේ පැමිණීමට අවශ්‍යතාවක් තිබෙනවා නම් ඉස්සෙල්ලාම කළ යුත්තේ, අපේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පැමිණ පැමිණිල්ලක් කිරීමයි. එසේ පැමිණිලි කළ පසු සමහර වේලාවට එම පුද්ගලයා ඉන්නා රටේ හැටියට, ඉන්නා දුර ප්‍රමාණයේ හැටියට අපට -විදේශ සේවා නියුක්ති කාර්යාංශයට- එම පැමිණිල්ල පිළිබඳව කරුණු සොයා බලා එම පුද්ගලයා සොයා ගැනීමට මාසයක විතර කාලයක් ගත වෙනවා. එහෙම නේද, නියෝජ්‍ය ඇමතිතුමනි? විශේෂයෙන්ම එම පුද්ගලයා විදේශ රටකට යැවූ නියෝජිත ආයතනය අප දැනුවත් කරන්න ඕනෑ. ඒ ගොල්ලන් ගෙන්වා කරුණු විමසන්න ඕනෑ. එසේ විමසීමක් කළ පසුව තමයි ඒ පැමිණිල්ලේ සාධාරණ, අසාධාරණභාවය අපට ඔප්පු කරන්න පුළුවන් වෙන්නේ.

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

මෙතැනදී පැහැදිලි වශයෙන්ම සඳහන් කරන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. අපි මෙතැන යථාර්ථය කථා කරන්නට ඕනෑ. බොහෝ කාන්තාවන් විදේශගත වෙද්දී නීත්‍යානුකූල නොවුණාට ඒ ඒජන්ත ආයතනවලින් යම් කිසි මුදල් ප්‍රමාණයක් අරගෙන විදේශ ගතවීම් සිදු වෙනවා. ඒජන්ත ආයතන විසින් නීත්‍යානුකූල නොවන ආකාරයට මේ කාන්තාවන්ට යම් මුදල් ගෙවීමක් සිදු කරනවා. සමහර වෙලාවට මේ කාන්තාවන්ට රුපියල් ලක්ෂයක්, දෙකක්, දෙකහමාරක්, තුනක් වාගේ නොයෙක් මට්ටමේ මුදල් ගෙවීම් සිදු කරනවා. මාස දෙක තුනක් ගිහිල්ලා නැවත වතාවක් ආපසු ඒමේ යම් කිසි ආකාරයක ව්‍යාපාරයක් - business එකක්- අපේ කාන්තාවන් කරන්න පටන් අරගෙන තිබෙනවා.

ආණ්ඩුවේ සල්ලිවලින් නැවත වතාවක් ගෙන්වා ගන්න පුළුවන් නම් ගෙන්වා ගන්න උත්සාහ කරලා, ලංකාවට ඇවිල්ලා නැවත වතාවක් තවත් ඒජන්තවරයෙක් හරහා පිට රට යනවා, අර

මුලින් හම්බ වෙච්ච අත්තිකාරම් මුදලේ ප්‍රශ්නය නිසා. මේ වාගේ, මේ කථාබහ කරන කාරණාවලට එපිටින් ගිය විශාල කරුණු කාරණා රැසක් මේ වැඩ පිළිවෙළත් එක්ක බද්ධ වෙලා තිබෙනවාය කියන කාරණාව මම මේ වෙලාවේ පැහැදිලි කරන්න ඕනෑ.

විශේෂයෙන් කාන්තාවන් විදේශගත වීම පිළිබඳව කථා කරද්දී අපේ ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මේකට නැවතීමේ තිත තියන්න ඕනෑ; මේ සංඛ්‍යාව අඩු කරන්න ඕනෑ කියලා. පැහැදිලි වශයෙන්ම, 2015 අවුරුද්දේ වෙන කොට සියයට 36කට අඩු වුණු කාන්තාවන් රට යැවීමේ ප්‍රතිශතය අපේ ඇමතිතුමියගේ උපදේශකත්වය මත මේ අවුරුද්ද වෙන කොට සියයට 27 දක්වා අඩු කර ගන්නට පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේක රටක් විධියට සමාජයීය වශයෙන් අපි ලබපු මහා විශාල ජයග්‍රහණයක්. මේක බිංදුව දක්වා ගෙන එන්න, එහෙම නැත්නම් අවම මට්ටමට ගෙන එන්න අවශ්‍ය නීතිරීති සියල්ල සම්පාදනය කරලා තිබෙනවා වාගේම ඒ සඳහා ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් ඉස්සරහට යනවා කියන එකත් මේ වෙලාවේ මා සඳහන් කරන්න ඕනෑ.

අපේ මන්ත්‍රීතුමෙක් කිව්වා, "නිවැරැදි දත්ත නැහැ. මේ සම්බන්ධයෙන් අප ළඟ තිබෙන දත්ත පිළිබඳව යම් යම් පරස්පරතාවන් තිබෙනවා" කියලා. ඇත්තම කාරණාව මෙයයි. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචි වෙලා යන සෑම විදේශගත ශ්‍රමිකයකුම පිළිබඳ තොරතුරු විදේශ සේවා නියුක්ති කාර්යාංශය සතුයි. හැබැයි නීති විරෝධී ක්‍රම හරහා විදේශගත වීම් තවමත් සිද්ධ වෙනවා. සමහර වෙලාවට වන්දනාවේ යන විධියට විදේශගත වෙන අවස්ථා තිබෙනවා; සංචාරක වීසා පත් මඟින් විදේශගත වීම් තිබෙනවා. එහෙම නැත්නම් ගුවන් තොටු පොළේ ඉන්න ඇතැම් නිලධාරීන්, ආරක්ෂක අංශ සම්බන්ධ කරගෙන මුදල් ගෙවලා විදේශගත වන ක්‍රම තිබෙනවා. ඒ හරහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචියක් සිද්ධ වන්නේ නැහැ. ඒ වාගේ විශාල සංඛ්‍යාවක් මසකට විදේශගත වුණාම ඒකත් එක්ක සංඛ්‍යා ලේඛනවල යම් පරස්පරතාවක් තිබෙනවා. ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා කියපු කාරණාවට අදාළව පැහැදිලිව මේ සංඛ්‍යා ලේඛනවල පරස්පරතාව තිබෙන්නේ නීත්‍යානුකූල නොවන මාර්ගවලින් විදේශගත වීම නිසායි. මේ ගැටලු පිළිබඳ අපි කථා කරමු. මම කියූ මේ සියයට 0.5ක ගැටලු ප්‍රමාණයටත් වැඩි බහුතරයක් මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන්නේ එහෙම නැත්නම් ප්‍රශ්නවලට මුහුණ දීලා දැනට අපේ ආරක්ෂිත නිවස්නවලට ඇවිල්ලා තිබෙන්නේ නිවැරැදි ආකාරයෙන් ලියා පදිංචි නොවී විදේශගත වුණු අය; බොහෝ වෙලාවට ගුවන් තොටු පොළ හරහා ගමන් කරපු අය.

මැද පෙරදිග රැකියාවලින් ඉවත් කිරීමේ තර්ජනයක් ඇති වෙලා තිබෙනවාය කියන කාරණාව ගරු අනුර දිසානායක මැතිතුමා මතු කරලා තිබුණා. ඇත්තටම මැද පෙරදිග කලාපයේ ඒ ආර්ථික අස්ථාවරත්වය ඇති වීමත් එක්ක එහෙම තර්ජනයක් තිබෙනවා. අපේ ඇමතිතුමිය සඳහන් කළා වාගේ, ඒ රැකියා අහිමි වෙන පිරිසට අවශ්‍ය කරන ආරක්ෂාව ලබා දීම සඳහා කටයුතු කර තිබෙනවා. සවුදි අරාබි රජයේ සලමන් රජතුමා කම්කරු අයිතිවාසිකම් සුරැකීම සඳහා ස්ථිර පොරොන්දුවක් ලබා දීලා තිබෙනවා කියන එකත් අපි මේ වෙලාවේ සඳහන් කරන්න ඕනෑ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් භීතිකාවක් ඇති කර ගැනීමේ අවශ්‍යතාවක් ඇති වෙන්නේ නැහැ.

ඊට අමතරව විදේශ රැකියාවල නියුතු අයගේ පාසල් දරුවන් පාසල්වලට ඇතුළත් කර ගැනීමේ කාරණාව ගැන කථා කළා. ඒ දරුවන් පාසල්වලට ගැනීමේ චක්‍ර ලේඛයට ඇතුළත් කළ යුතුයි කියලා නියෝජ්‍ය ඇමතිතුමා මතක් කළා. මම මේ කාරණය මේ වෙලාවේදී කියන්න කැමැතියි. දැනට පවතින පාසල් චක්‍ර ලේඛයේ -එක වසරට දරුවන් ඇතුළත් කර ගැනීමේ චක්‍ර ලේඛයේ- විදේශගත පවුල්වල දරුවන් සඳහා වෙනම කොටසක් වෙන් කරලා තිබෙනවා; සියයට දශම එකක් හෝ දෙකක් වෙන් කරලා තිබෙනවා. මට හරියටම ප්‍රතිශතය මතක නැහැ. හැබැයි සියයට ගණනක් විදේශගත පවුල්වල දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා ක්‍රමවේදයක් ඇති කරලා තිබෙනවා කියන කාරණය ගැන මම මේ සභාව දැනුවත් කරන්න කැමැතියි.

අවම වැටුප පිළිබඳව කථා කළා. අවම වැටුප පිළිබඳව කථා කරද්දී අපේ රටේ විදේශගත වන සියලුම ශ්‍රමිකයන් සඳහා විශේෂයෙන් කාන්තාවන්ට ඩොලර් 300ක අවම මාසික වැටුපක් නිර්දේශ කරලා තිබෙනවා. එහෙම අවම වැටුපක් ලැබෙන්නේ නැහැ කියලා මෙතැනදී සාකච්ඡා වුණා. හැබැයි එවැනි අවම වැටුපක් ලැබෙන්නේ නැත්නම්, ඒ පිළිබඳව පැමිණිලි කරලා, ඒ අවම වැටුප ලබා ගන්නට අවශ්‍ය වැඩ කටයුතු සූදානම් කරලා තිබෙනවා.

ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය සඳහන් කළා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ, සමථ අංශය හරහා ලැබෙන පැමිණිලි ගැන සලකා බලා, මේ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා වෙනම ආයතනයක් පිහිටුවිය යුතුයි කියලා. මම හිතන්නේ, විදේශ සේවා නියුක්ති කාර්යාංශය විධියට මේ ගැටලු නිරාකරණය කිරීම සඳහා දැනටමත් අවශ්‍ය කාරණ ඉෂ්ට කරමින් පවතිනවා කියලායි. මේ වාගේ ගිවිසුම් කඩවීම් -රාජ්‍යයක්, රාජ්‍යයක් අතර ඇති වෙන ගිවිසුම් නොවෙයි- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ ආයතන විධියට ඇති කර ගන්නා ගිවිසුම් නිවැරදි ආකාරයකට ක්‍රියාත්මක නොවන අවස්ථාවලදී, නියමිත වැටුප නොගෙවන අවස්ථාවලදී ඒවා විසඳීමට ලංකාව ඇතුළේම කටයුතු කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා ඉතා වැදගත් ප්‍රකාශයක් කරපු නිසා මම නැවත මැදිහත් වෙන්න හිතුවා. ඔබතුමා කිව්වා, "විශේෂයෙන්ම කාන්තාවන්ට ඩොලර් 300ක අවම මාසික වැටුපක් නිර්දේශ කරලා තිබෙනවා" කියලා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අපි දැකලා තිබෙනවා, රැකියා නියෝජිත ආයතන මඟින් සමහර පුවත් පත්වල දැන්වීම් පළ කර තිබෙනවා. සාමාන්‍යයෙන් රුපියල් 45,000කට වැඩි අවම වැටුපක් විදේශ රැකියාවක නියුතු කාන්තාවකට ලැබිය යුතුයි නේද?

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ඔව්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
රුපියල් 35,000ක අවම වැටුපක් ලැබෙන බව කියා සමහර ඒජන්සිවලින් පළ කරන දැන්වීම් පවා පත්තරවල තිබෙනවා අපට පෙනෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒවා වළක්වන්නේ කෙසේදැයි සඳහන් කරලා ඒ සම්බන්ධව යම් කිසි පැහැදිලි ප්‍රකාශයක් කරන්න ඔබතුමාට පුළුවන්ද?

ගරු මනුෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
අවම වැටුප ඩොලර් 300ට අඩු කිසිම ගිවිසුමකට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනුමැතිය ලබා දෙන්නේ

[ගරු මනුෂ නානායක්කාර මහතා]

නැහැ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනුමැතිය ලබා නොදුන් කිසිදු දැන්වීමක් පත්තරයක පළ කරන්න බැහැ. මම හිතන්නේ එතැනදී යම් කිසි නීති විරෝධී ආකාරයක සිදුවීමක් සිදු වෙලා තිබෙනවා. දැනට එවැනි ආකාරයක දෙයක් තිබෙන්නට බැහැ.

මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, අවම මාසික වැටුප ඩොලර් 300ට වඩා අඩු නම්, ඒ අය සඳහා අවශ්‍ය කරන රැකියා බලපත්‍රය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලබා නොදෙන බව. ඒ අයට වෙළෙඳ දැන්වීමක් පත්තරේක පළ කරන්න අනුමැතිය ලැබෙන්නේ, එම රැකියා බලපත්‍රය ලබා ගත්තායින් පසුවයි. රුපියල් 35,000කට වඩා අඩු අවම වැටුපක් කියා දැන්වීමක් තිබෙනවා නම්, ඒක ක්‍රියාත්මක වෙන්න විධියක් නැහැ. ඒකේ යම් කිසි වැරදීමක් සිදු වී තිබෙනවා වෙන්න ඕනෑ.

රක්ෂණ ක්‍රමය පිළිබඳව සාකච්ඡා වුණා. මේ පිළිබඳව කථා කරද්දී, මීට කලින් තිබුණු රක්ෂණ ක්‍රමයට වඩා මේ රක්ෂණ ක්‍රමය හරහා විශාල මුදල් ප්‍රමාණයක් අපට ලබා ගන්න පුළුවන්කම ලැබුණා. පසු ගිය කාලයේදී රට ගිහිපු අයව නැවත ගෙන්වා ගැනීමේදීත්, වන්දි ගෙවීමේදීත් විශාල ප්‍රමාදයක් සිද්ධ වුණා; විශාල වශයෙන් ඒ සඳහා කාලය ගත වුණා. ඒ වාගේම ලැබෙන වන්දි මුදල්වල ප්‍රමාණය ඉතාමත්ම අවම මට්ටමකයි තිබුණේ. අද වන විට පවා -මේ ගත වෙච්ච මාස කිහිපය ඇතුළත පවා- දැනෙන, විශාල වශයෙන් වන්දි ගෙවීම් සිද්ධ කරලා තිබෙනවා කියන එකත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ.

'විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල් සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවාද?' කියන කාරණාව ගැන සාකච්ඡාවට ගැනුණා. අතිගරු ජනාධිපතිතුමන්ගේ "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" නැමැති ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් ශ්‍රමික සුරැකුම සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තිබෙනවා. දැනටමත් ශ්‍රමික සුරැකුම හරහා විදේශගත ශ්‍රමිකයින්ට විශ්‍රාම වැටුපක් ලබා දීම සම්බන්ධව වැඩ පිළිවෙළක් අමාත්‍යාංශ මට්ටමෙන් ක්‍රියාත්මක කරගෙන යනවා. ඊට අමතරව, විදේශගත වූ අයගේ පවුල්වල දරුවන්ට ශිෂ්‍යත්ව වැඩසටහන් ආරම්භ කර ශුභසාධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. අපේ හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම විදේශ රැකියා අමාත්‍යාංශයේ නිලධාරීන් තුන් දෙනා ගණනේ සේවය කරනවා. විදේශගත වන පවුල්වල අයගේ ශුභසාධනය පිළිබඳ කටයුතු මේ නිලධාරීන් කරනවා. ඒ අයට දැනට නිශ්චිත වශයෙන් පැවැරිලා තිබෙන රාජකාරිය වන්නේ, පවුල් පසු බිම් වාර්තාව සකස් කර එම පවුල් පසු බිම් වාර්තාව අනුව රට යෑම සුදුසුද නුසුදුසුද කියලා නිර්දේශ කරන එකයි. තවද, ඔවුන්ට විශේෂ රාජකාරියක් පැවැරී තිබෙනවා. ඒ තමයි තමන්ගේ බල ප්‍රදේශයේ රට රැකියා සඳහා ගිහිල්ලා ඉන්න පවුල්වල තත්ත්වය මොකක්ද, ශුභසාධනය මොකක්ද, ඒ අයගේ පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන මට්ටම කොහොමද, ඒ දරුවන් අධ්‍යාපන කටයුතු කරගෙන යනවාද, රට ඉඳලා එවන මුදල් ගෙදර ඉන්න ඥාතිවරු නිසියාකාරව කළමනාකරණය කරනවාද යන්න පිළිබඳව සොයා බැලීම. ඒ අනුව, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයටම විදේශ රැකියා අමාත්‍යාංශයේ නිලධාරීන් තුන් දෙනා ගණනේ ඉන්නවා. ඒ හරහා ඉතාමත්ම පුළුල් වශයෙන් ලොකු සේවයක් කරන්න එම නිලධාරීන්ට හැකියාව ලැබිලා තිබෙනවා.

මේ රටවල් සමඟ යම්කිසි එකඟතා හදා ගැනීම පිළිබඳව සාකච්ඡා කළා. විශේෂයෙන් රටවල් සමඟ මේ සම්බන්ධයෙන් එකඟතා හැදෙනවාද, මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්වෙනවාද කියන එක ගැන මේ මාසයේ 24වැනි දා සහ 25වැනි දා "Colombo Process Meeting" නමින් රටවල් සමඟ කරන සාකච්ඡාව ලංකාවෙහි පැවැත්වෙනවා. එහි සභාපතිත්වය දරන්නේ අපේ අමාත්‍යාතුමියයි. ඒ වාගේම Abu Dhabi Dialogue සංවිධානය ආදී විවිධ සංවිධාන, සම්මේලන හරහා කම්කරුවන් යවන රටවල් සහ කම්කරුවන් ලබා ගන්නා රටවල් අතර හොඳ සංහිඳියාවක් ඇතිව සාකච්ඡාවක් මේ අවස්ථාවේදී කර ගෙන යනවාය කියන කාරණයත් මම මතක් කරන්නට ඕනෑ. එම නිසා අපි නිකම්ම නිකම් කම්කරුවන් යවනවා නොවෙයි. ඉන් එහාට ප්‍රතිපත්තිමය වශයෙන් අනාගතය දෙස බලා, දුර දිග බලා රටේ ඉදිරියට කර ගෙන යන්න ඕනෑ ක්‍රමවේදය මොකක්ද, අපේ කාන්තාවන් මැද පෙරදිග ගෘහසේවයට යැවීම අඩු කර ගන්නේ කොහොමද, ඒ වාගේම පුහුණු ශ්‍රමිකයන් යවන්නේ කොයි විධියටද කියන එක පිළිබඳව පුළුල් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවාය කියන එක මම මේ මොහොතේදී සඳහන් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විශේෂයෙන් මේ කාරණය සඳහන් කරන්නට ඕනෑ. අප කථා කරන මේ ගැටලු වාගේම, රිසානා නාෆික්ගේ ප්‍රශ්නය වාගේ මානුෂීය ප්‍රශ්න ගැන අප කථා කරනවා වාගේම මෙහි අනෙක් පැත්ත ගැනත් කථා කරන්නට ඕනෑ. සියයට 0.5ක් වුණ මේ පැමිණිලි ප්‍රතිශතය වාගේම විදේශ ගතවීමෙන් ජීවිතවලට කොයි තරම් නම් සාර්ථකත්වයක් ලැබී තිබෙනවා ද කියන එක ගැනත් කොතරම් කරුණු කාරණා කියන්නට තිබෙනවාද? විදේශගතවීම් නිසා පවුල් කොච්චර නම් ප්‍රමාණයක් තමන්ගේ ජීවන මට්ටම වර්ධනය කර ගෙන තිබෙනවාද? සියයට අනූනවයක් මිනිස්සු රට ගිහිල්ලා ප්‍රශ්න ඇති කර ගන්නේ නැහැ. විදේශගත වුණ මිනිසුන්ගෙන් සියයට 99.5ක්ම ප්‍රශ්න ඇති කර ගෙන නැහැ. හැබැයි, අද සියයට .5ක් වුණ මේ පැමිණිලි ප්‍රතිශතයෙනුත් ඉතාමත් අල්පයක්, දුරාචාරයේ එකක් දෙකක් ප්‍රශ්න තමයි ඇත්තටම තිබෙන්නේ. මානුෂීය වශයෙන් අප විවේචනය කරන, ඇණ ගහපු ප්‍රශ්න වාගේ බරපතළ සිද්ධීන් කිහිපයක් තිබුණාට ඒ සිද්ධීන් සංඛ්‍යාව සාපේක්ෂව ගණන් හදා බැලුවාම ඉතාම අල්ප ප්‍රමාණයක්. හැබැයි, රටේ මාධ්‍ය අවධානය යොමු වන්නේ, ඒ වාගේම කතාබහට ලක් වන්නේ විදේශගත ශ්‍රමිකයන්ට, විදේශගත කාන්තාවන්ට සිදුවන අඩන්තේට්ටම් පිළිබඳව පමණයි. හැබැයි, විදේශගත ශ්‍රමිකයා විදේශගතවෙලා සොයන මුදල නිසා තමන්ගේ පවුල් සංස්ථාව ගොඩනඟා ගැනීම පිළිබඳව, ඒ ජීවිතවල සාර්ථකත්වය පිළිබඳව සමාජයේ කථිකාවක් ඇති නොවන බව අපි පැහැදිලිවම සඳහන් කරන්නට ඕනෑ. ලංකාවට දැනට වැඩිම විදේශ විනිමය ලැබෙන ආදායම් මාර්ගය මෙය වීම නිසා රටට යම්කිසි සහනයක් වාගේම රට වෙනුවෙන් මහා විශාල සේවාවක් කර ලංකාවට එන මේ අයගේ ජීවන මට්ටම ඉහළ නංවාගැනීම් පිළිබඳවත් අපි කථිකාවතක් ඇති කළ යුතුය කියන එක මම මේ මොහොතේ සඳහන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ ප්‍රශ්න ඇති වෙද්දී, අපේම කාන්තාවන්ගේ පැත්තෙනුත් යම්කිසි ආකාරයක ප්‍රශ්න හදාගෙන ඉන්නවා. මා කිව්වා වාගේ මුදල් ලබා ගැනීම් සඳහා නැවත නැවත විදේශ ගතවෙලා නැවත නැවත ඒම, එසේ නැත්නම් තමන් රැකියාව සඳහා යන ස්ථානයෙන් ටික දවසක් යද්දී වෙනත් ස්ථානකට යන අවස්ථා, එසේ නැත්නම් තමන් වැඩ කරන ස්ථානයේ නියමිත පරිදි රාජකාරී නොකර එතැනින් පැනලා embassy එකටත් පැමිණෙන අවස්ථා වාගේ අපේ කාන්තාවන්ගේ පැත්තෙනුත් ඇති වන ප්‍රශ්න යම් ප්‍රමාණයකට තිබෙනවාය කියන එක අපි මේ මොහොතේදී සඳහන් කරන්නට ඕනෑ. ඒ වාගේ අවස්ථාවලදී අපට තානාපති කාර්යාල හරහා ඉතාම

හොඳ විශාල සහයෝගයක් ලැබෙනවා වාගේම අපේ ඇතැම් විදේශගත ශ්‍රමිකයන්ගෙන් ලැබෙන පැමිණිලි අනුව, යම් යම් තානාපති කාර්යාලවලදී තානාපති සේවයේ යම් යම් නිලධාරීන්ගෙන් මේ කම්කරුවන් පිළිබඳව ඉතාමත් හොඳ සොයා බැලීමක් සිද්ධ නොවන අවස්ථාද අපට වාර්තා වෙලා තිබෙනවා.

විශේෂයෙන් යම් යම් රටවලදී ඒ අහිංසක කාන්තාවන්ගේ, ශ්‍රමිකයන්ගේ ගැටලු පිළිබඳව ඇහුම්කන් නොදෙන අපේ තානාපති සේවයේ ඇතැම් නිලධාරීන් පිළිබඳවත් අපට තොරතුරු වාර්තා වෙනවාය කියන එක අපි පැහැදිලිව සඳහන් කරන්නට ඕනෑ. අපේ බලාපොරොත්තුව, මේ විදේශගත වෙන ශ්‍රමික පිරිසගෙන් කාන්තාවන්ගේ ප්‍රමාණය අඩු කර ගැනීම වාගේම පුහුණු ශ්‍රමිකයන් වැඩි කර ගැනීම බව අමාත්‍යතුමිය පැහැදිලිව සඳහන් කර තිබෙනවා.

අද වෙනකොට අලුත් වෙළෙඳ පොළ සොයා ගෙන යාම හරහා ඊශ්‍රායලය, සයිප්‍රසය වාගේම යුරෝපයේ රටවල, රුසියානු කලාපයේ රටවල රැකියා වෙළෙඳ පොළ සොයා ගෙන යාම සඳහා දැන් අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඇමතිතුමිය ඒ සම්බන්ධයෙන් දිගින් දිගටම ක්‍රියා කරනවා. අප මැද පෙරදිගට විතරක් සීමා වෙලා මැද පෙරදිගින්ම විතරක් යැපෙන්නේ නැතිව අනෙකුත් රටවලට පුහුණු ශ්‍රමිකයන් යැවීම සඳහා වුවමනා කරන වැඩ පිළිවෙළක් මේ වෙලාවේ ක්‍රියාත්මක කරනවාය කියන එකත් මම මේ මොහොතේදී සඳහන් කරන්නට ඕනෑ.

ඒත් එක්කම අපේ තානාපති කාර්යාල හරහා වැඩ කටයුතු සිද්ධ වෙද්දි ආරක්ෂිත නිවෙස්නවලට පැමිණෙන ගෘහ සේවිකාවන්ට -කාන්තාවන්ට- වෙවා වෙනත් ඕනෑම කෙනෙකුට අවශ්‍ය කරන සියලුම පහසුකම් නිසියාකාරව ලබා දෙනවාය කියන එකත් මම මේ වෙලාවේදී සඳහන් කරන්න ඕනෑ. ඒ අය පිළිබඳව නිසි සොයා බැලීමක් සිද්ධ වෙන්නේ නැහැ කියලා ඇතැම් තැනකදී කියවුණා. අපි එය තරයේ ප්‍රතික්ෂේප කරනවා. ආරක්ෂාව පතා පැමිණෙන සෑම කෙනෙක් පිළිබඳවම අපි සොයා බලනවා. ශ්‍රී ලාංකිකයෙක් නම් ඒ ශ්‍රී ලාංකිකයා ලියා පදිංචි වෙලා ආවාද, ලියා පදිංචි නොවී ආවාද කියන දේ බලන්නේ නැතිව "ශ්‍රී ලාංකිකයෙක්" කියන පදනම අරගෙන ඒ අය සඳහා අවශ්‍ය උදවු උපකාර සියල්ලම සිද්ධ කරනවා කියන කාරණයත් මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

විශේෂයෙන්ම වර්තමාන රජය යටතේ ආර්ථික සංවර්ධනයක් රට ඇතුළේ ඇති කරගෙන, නිෂ්පාදන ආර්ථිකයක් රට ඇතුළේ වර්ධනය කර ගනිද්දි, ඒ නිෂ්පාදන ආර්ථිකය හරහා රට ඇතුළේ රැකියා සුලබ කිරීම සිද්ධ කරනවා. ඒ තුළින් පස් අවුරුද්දක් යනකොට මේ කාන්තාවන් රට යැවීම තවදුරටත් අඩු කර ගන්නට හැකියාව ලැබෙනවා වාගේම ශ්‍රමිකයින් විදේශගත වීමත් විශාල වශයෙන් අඩු කර ගන්නට හැකියාව ලැබේවි කියලා මම හිතනවා. අද මට කතා කරන්න මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාඞ්කුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

The next speaker is the Hon. Mylvaganam Thilakarajah. You have eights minutes. If you want more time, you can get it from the time allotted to the Hon. Members of your Party.

[பி.ப. 2.56]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
Thank you very much, Hon. Presiding Member.

இன்று மக்கள் விடுதலை முன்னணி உறுப்பினரால் சபையில் முன்வைக்கப்பட்டிருக்கும் வெளிநாட்டு வேலைவாய்ப்பு பெற்றுச் செல்லும் தொழிலாளர்கள் சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கும் எனக்கு ஒதுக்கப்பட்ட நேரத்துக்கு மேலதிகமாக நேரத்தை எடுத்துக்கொள்வதற்கும் வாய்ப்பளித்தமைக்காக உங்களுக்கு முதலில் நன்றி தெரிவித்துக்கொள்ளக் கடமைப்பட்டிருக்கிறேன்.

இன்று பேசப்படுகின்ற விடயம் ஒரு தேசியப் பிரச்சினையாகும். இந்த நாட்டில் இனம், மதம், மொழி கடந்து அனைத்து தரப்பினரும் எதிர்நோக்குகின்ற ஒரு பிரச்சினையாக வெளிநாட்டு வேலை சம்பந்தப்பட்ட இந்தப் பிரச்சினை திகழ்கின்றது. வறுமைக்குட்பட்டிருக்கும் சமூகங்கள் - சிங்கள மொழி பேசும் சமூகமாக இருக்கட்டும், முஸ்லிம் சமூகமாக இருக்கட்டும், தமிழ் சமூகமாக இருக்கட்டும் - தங்களை வறுமையிலிருந்து விடுவித்துக்கொள்வதற்குரிய ஒரேயொரு தெரிவாக இந்த வெளிநாட்டு வேலைவாய்ப்பை அடையாளம் கண்டிருப்பது இந்த நாடு கண்டிருக்கும் மிகவும் துரதிருஷ்டமான ஒரு நிலைமையாகும். குறிப்பாக, இதனால் பெண்கள் எந்தளவுக்குப் பாதிப்புக்குள்ளாகிறார்கள் என்ற விடயம் இன்று சபையில் உரையாற்றிய பல அங்கத்தினர்களாலும் சுட்டிக்காட்டப்பட்டது. குடும்பங்களை விட்டு விலகி வெளிநாடுகளில் வசிப்பதால் தங்களது பிள்ளைகளை ஒழுங்காக வளர்க்க முடியாமல் இருத்தல், வெளிநாடுகளிலே வேலைசெய்யும் இடங்களிலே பல்வேறு சுரண்டல்களுக்கு உள்ளாகுதல் போன்ற இன்னோரன்ன சிக்கலான நிலைமைகளுக்கு அவர்கள் முகங்கொடுத்து வருகின்றார்கள்.

அந்த வகையில், இந்த நாட்டில் குறிப்பிடத்தக்கதோர் உழைக்கும் வர்க்கமான மலையகப் பெருந்தோட்டத் தொழிலாளர்கள் மத்தியில் இந்தப் பிரச்சினை இன்னும் ஒரு கட்டத்தைத் தாண்டிச் சென்றிருக்கிறது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அங்கே பெண் தொழிலாளர்கள்தான் அதிகமென்பது உங்களுக்குத் தெரியும். இந்தப் பெருந்தோட்டத் துறையென்பது இன்று எமது நாட்டில் வீழ்ச்சியடைந்து சென்றுகொண்டிருக்கின்ற ஒரு துறையாக மாறியிருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙකු ගරු එඩිවඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩිවඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. BIMAL RATHNAYAKE left the Chair and THE HON. EDWARD GUNASEKARA took the Chair.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)

(The Hon. Mylvaganam Thilakarajah)

இந்தப் பெருந்தோட்டத்துறை வீழ்ச்சியின் காரணமாகப் பெருமளவான தொழிலாளர்கள் பெருந்தோட்டத்துறையில் தங்கியிருக்காது வேறு தொழில் துறைகளை நாடிச் செல்கின்ற நிலைமை காணப்பட்டது. இந்த நிலையில், 1990களில் சுமார் ஐந்து இலட்சமாக இருந்த தோட்டத் தொழிலாளர்களின் எண்ணிக்கை தற்பொழுது ஓரிலட்சத்து அறுபதாயிரமளவில் குறைந்திருக்கின்றது. அதிலும் குறிப்பாகப் பெண் தொழிலாளர்கள் அதிகமாக வேலைசெய்கின்ற இந்தத் துறையில் வேலைவாய்ப்புக்கள் குறைவடைந்தவுடன் அவர்களுக்கு ஒரே மாற்றுத் தெரிவாக இருப்பது வெளி நாடுகளுக்குச் செல்வதுதான். அப்படி வெளிநாடுகளுக்குச் செல்கின்றபொழுது இங்கே குடும்பம் தாயற்ற - பெண் தலைமைத்துவமற்ற குடும்பமாக மாறி ஒட்டுமொத்தமாக அவர்கள் பல்வேறு இன்னல்களைச் சந்திக்கின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. தங்களது குடும்பத்தினரின் சுபிட்சமான வாழ்வுக்காக இங்கே நிதியினை அனுப்பி குடும்பத்தைக் கட்டியெழுப்பலாமென அவர்கள் எண்ணினாலும்கூட அங்கே சென்றவர்களுக்கு நடக்கின்ற பல்வேறு இன்னல்கள் சொல்லிலடங்காதவை.

வெளிநாடுகளிலுள்ள சட்டங்களின் பிரகாரம் நமது தாய்மார், தங்கையர், சகோதரிகள் மரண தண்டனைவரையான பல்வேறு விதமான தண்டனைகளுக்கு உள்ளாகி வந்ததையும், உடம்பில் ஆணி - ஊசி ஏற்றி இந்த நாட்டுக்கு அனுப்பி வைக்கப்பட்டதையும் கடந்த காலங்களில் நாங்கள் அவதானித்தோம். அந்த வகையில், மிகவும் கொடூரமான நிலைமைகளுக்கு அவர்கள் உள்ளாகி வருகின்ற நிலைமை காணப்படுகின்றது. இது பெருந்தோட்டப் பெண்கள் மத்தியிலும் தொழிலாளர்கள் மத்தியிலும் காணப்படுகின்ற ஒரு பிரச்சினையாகும். இது அவர்களைச் சமூக சீர்குலைவுக்குள் தள்ளிவிடுவதோடு சமூக - குடும்பக் கட்டமைப்பையும் மாற்றியமைக்கின்றது. அந்த வகையில், இந்த விடயம் சார்ந்த பல்வேறு பிரச்சினைகள் பெருந்தோட்டத்துறையில் காணப்படுகின்றன. நான் நுவரெலியா மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில், இந்தத் துறையின் ஒழுங்கமைப்பைப்பற்றி அல்லது நுவரெலியா மாவட்டத்தில் வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகம் சார்ந்த செயற்பாடுகளில் இருக்கின்ற பிரச்சினைகளைப் பற்றி இந்தச் சபையின் கவனத்துக்குக் கொண்டுவருவதோடு, சம்பந்தப்பட்ட அமைச்சர் அவர்களும் பிரசன்னமாகவிருக்கின்ற இந்த வேளையில் அதில் நிலவக்கூடிய பல்வேறு குறைபாடுகளைத் தீர்ப்பதற்கும் எத்தனிக்கலாமென நினைக்கிறேன்.

நான் ஏற்கெனவே குறிப்பிட்டதைப்போல, பெருந்தோட்டத்துறை சார்ந்த மாவட்டங்களில் நுவரெலியா மாவட்டத்திலிருந்துதான் அதிகமான தொழிலாளர்கள் வெளிநாட்டு வேலைவாய்ப்புக்காகச் செல்கிறார்கள். அவ்வாறு செல்லுகின்றபோது வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தினூடாக முறையான அனுமதியோடு செல்லுகின்ற அளவினைவிட, முறையற்ற வகையில் உரிய visa நடைமுறையின்றி முகவர்களினால் ஏமாற்றப்பட்டு அல்லது வேறுவகையான visa க்களில் போய் அந்த நாடுகளில் அகப்பட்டு மீளவும் இந்த நாட்டுக்குத் திருப்பியனுப்பப்பட்டு பல இன்னல்களுக்குள்ளாகின்ற, கைது செய்யப்படுகின்ற நிலைமைகள் அவர்களுக்கு உருவாகின்றன. இதனைப் பிரதி அமைச்சர் அவர்களும் சுட்டிக்காட்டினார். இவ்வாறான பிரச்சினைகள் நுவரெலியா மாவட்டத்திலிருந்து செல்கின்ற அநேகமானோருக்கு ஏற்பட்டுள்ளது. இதனை நிவர்த்தி செய்வதற்கு வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தின் கிளையொன்று அங்கு இல்லாத குறை பற்றிப் பல்வேறு சந்தர்ப்பங்களில் சுட்டிக்காட்டப்பட்டுள்ளது. அவர்கள் தங்களது பிரச்சினைகளைச் சொல்வதற்காக கண்டி அல்லது பதுளை போன்ற அடுத்த மாவட்டங்களிலுள்ள காரியாலயங்களுக்குச் செல்லவேண்டியிருக்கின்றது. எனவே, இதனைத் தாபிப்பது தொடர்பாக இந்த அமைச்சின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். இதில் கொள்கை ரீதியான ஏதேனும் பிரச்சினைகள் இருக்கின்றதா? அல்லது மாவட்டங்கள் தோறும் இது அமைய வேண்டுமா? என்று நாங்கள் ஆராய வேண்டியுள்ளது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகப் பிரச்சினை மாத்திரமல்ல, அங்கு வைத்தியசாலை நிலைமைகூட இவ்வாறுதான் காணப்படுகின்றது. கண்டி மாவட்ட வைத்திய சாலைகளுக்கும் பதுளை மாவட்ட வைத்தியசாலைகளுக்கும் தான் நுவரெலியா மாவட்ட மக்கள் செல்லவேண்டிய நிலைமையுள்ளது. இதுபற்றியும் நாங்கள் விரிவாகப் பேச வேண்டியிருக்கின்றது.

மேலும், இத்தொழிலாளர்கள் தங்களுக்கென ஒரு வீட்டை உருவாக்கிக் கொள்வதற்காகவும் தங்களது குடும்பத்தைச் சரியாகக் கட்டமைத்துக் கொள்வதற்காகவுமே வெளிநாடுகளுக்குச் செல்கின்றனர். பெருந்தோட்டத் தொழிலாளர்களுக்கு வீடுகளைப் பெற்றுக்கொடுப்பது என்ற தேசிய ரீதியான ஒரு கொள்கையை இன்று நாங்கள் வகுத்திருக்கின்றோம். ஆனால், வெளிநாட்டுக்கு வேலைக்குச் சென்று வருவோருக்கு உரிய காணிகளைப் பெற்றுக் கொடுப்பதற்கு முறையான திட்டம் இல்லை. முகாமைத்துவத்திடமிருந்து, அவர்கள் எந்தவித எதிர்ப்பும் இல்லை - "No Objection" எனக் கடிதம் கொடுத்தால் அவர்களுக்கான கடனைப் பெற்றுக்கொடுக்கின்ற வழிமுறை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தில் இருக்கிறது என்பது எங்களுக்குத் தெரியும். ஆனால், அதனைப் பெற்றுக்கொடுப்பதற்கான சரியான முறைமை அங்கு காணப்படவில்லை. எனவே, அதனை நிவர்த்திசெய்ய வேண்டியிருக்கின்றது.

வெளிநாட்டுக்கு வேலைக்குச் செல்வோரில் ஓரளவு தொழில்ரீதியாகத் தொழில்வாண்மை மிகுந்தவர்களாக 1.78 சதவீதம் சென்றால், unskilled என்று சொல்லப்படுகின்ற, பயிற்றுவிக்கப்படாத வேலைகளுக்கு 26.4 சத வீதமானவர்களும் வீட்டுப் பணியாளர்களாக 29.5 சத வீதமானவர்களும் செல்கிறார்கள். இவ்வாறு செல்பவர்கள் கல்வி அறிவு மட்டத்தில் ஓரளவு குறைந்தவர்களாகத்தான் இருக்கிறார்கள். அவர்களுக்குப் பிரச்சினைகள் வருகின்ற வேளையில் அவர்கள் அது தொடர்பாக முறைப்பாடுகளைத் தெரிவிக்கின்றபொழுது அவற்றைத் தீர்க்கின்ற உரிய நடைமுறை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தில் இல்லை. குறிப்பாக, மொழிசார்ந்து அதனை முன்னெடுப்பதில் பல்வேறு சிக்கல்கள் இருப்பதை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. எனவே, அந்த முறைமையிலுள்ள குறைபாடுகளை நீக்குவதற்கும் நடவடிக்கையெடுக்க வேண்டுமென்று இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அதேபோல, வெளிநாட்டு வேலைக்குச் சென்று திரும்புகின்ற அல்லது வேலைக்குச் செல்வோர் அனுபவிக்கின்ற பிரச்சினைகளை அவர்கள் எடுத்துச் சொல்வதற்கு அல்லது அவர்களுக்கு இயலாத சந்தர்ப்பத்தில் அவர்கள் சார்ந்த ஒரு பிரதிநிதியை நியமித்து அந்தப் பிரதிநிதியினூடாக அந்த விடயங்களை முன்வைப்பதற்கான வாய்ப்புகள் அவர்களுக்கு ஏற்படுத்திக்கொடுக்கப்பட வேண்டும். இவ்வாறான நடைமுறைகள் இல்லாததன் காரணமாக வெளிநாட்டு வேலைவாய்ப்பைப் பெற்ற தொழிலாளர்கள் மிகவும் பாதிக்கப்பட்டவர்களாக இருக்கிறார்கள்; அவர்களது குடும்பத்தவர்கள் இங்கே பாதிக்கப்பட்டவர்களாக இருக்கிறார்கள். இப்போதும்கூட இவ்வாறான தகவல்களைப் பெற்றுக்கொள்வதற்கு இந்தப் பணியகச் செயற்பாடுகள் முழுமையாக இல்லாததன் காரணமாக அவர்களது மாவட்டத்தில் இயங்குகின்ற தன்னார்வத் தொண்டு நிறுவனங்கள்தான் அந்த உதவிகளைச் செய்து வருகின்றன. எனக்குத் தெரிந்தவரையிலே, 'பிரிடோ' எனப்படுகின்ற தொண்டு நிறுவனத்தின் தலைவர் மைக்கல் ஜோக்கின், அதன் இணைப்பாளர் எஸ்.கே. சந்திரசேகரன் போன்ற தன்னார்வலர்கள் இந்த வேலைத்திட்டத்தை முன்கொண்டுசெல்வதற்கும் அவர்களுக்கு உதவி செய்வதற்கும் சுயேச்சையாக இயங்கிவருவதை நான் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. எனவே, அத்தகைய தன்னார்வச் செயற்பாட்டாளர்களுக்கு இந்த சபையிலே நான் நன்றி தெரிவிக்கின்ற அதேவேளை, அத்தகைய வேலைத் திட்டங்களை முன்னெடுத்துச் செல்கின்றவர்களுக்குப் பணியகம் முழுமையான உதவிகளைப் பெற்றுக்கொடுக்க வேண்டுமென்றும் கேட்டுக்கொள்கின்றேன்.

குறிப்பாக, வெளிநாட்டுக்கு வேலைக்குச் சென்றுவருவோர் இந்த நாட்டுக்கு அந்நியச்செலாவணியை அதிகமாக கொண்டுவருபவர்களாக இருக்கிறார்கள். அவர்கள் அதனைக் கொண்டுவருகின்றபொழுது அதன் பெறுமதி, அவை எவ்வாறு கொண்டுவரப்படலாம் என்ற விளக்கங்களைப் பெற்றுக்கொள்வதற்குப் போதிய மொழியறிவுகொண்ட உத்தியோகத்தர்கள் உரிய காரியாலயங்களில் - இந்தப் பணியகங்களில் செயற்பட வேண்டுமெனவும் வேண்டுகோள் விடுகின்றேன். ஏனென்றால், மலையகப் பெருந் தோட்டங்களைச் சேர்ந்தவர்களாக இருக்கட்டும், வடக்கு, கிழக்கிலுள்ள தமிழ், முஸ்லிம் சகோதர, சகோதரிகளாக இருக்கட்டும், இவர்களில் பெரும்பாலானவர்கள் தமிழ் பேசுகின்றவர்களாக இருப்பதனால், அவர்கள் இந்த நாட்டுக்கு அந்நியச்செலாவணியைக் கொண்டுவருகின்ற சந்தர்ப்பத்திலும் சரி, அல்லது பணியகங்களோடு தொடர்புகளை வைத்துக்கொள்கின்ற சந்தர்ப்பங்களிலும் சரி, பல்வேறு சிக்கல்களை எதிர்கொள்கின்றார்கள் என்பதை நாங்கள் இந்தத் தன்னார்வத் தொண்டு நிறுவனங்களினூடாக அறிந்து கொண்டோம். எனவே, இந்த விடயங்களைக் கவனத்தில் எடுத்து, அவற்றை நிவர்த்தி செய்வதற்குரிய நடவடிக்கைகளை இந்த அமைச்சு எடுக்கவேண்டுமென்று நான் இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன். நான் இந்த விடயங்களை உள்ளடக்கிச் சிறியதோர் அறிக்கை யொன்றைத் தயாரித்திருக்கின்றேன். அதனை ஹன்சாட் பதிவுக்காகவும் அமைச்சின் தேவைகளுக்காகவும் சபையில் *சமர்ப்பிக்கின்றேன்.

Hon. Presiding Member, I would like to speak a few words in English since the Minister of Foreign Employment, the Hon. (Mrs.) Thalatha Atukorale is also present in the House. I urge her very kindly to take into consideration all the important points made by the Hon. Members today during the course of the Debate on this Adjournment Motion.

The number of women migrant workers in the plantation areas, especially in the Nuwara Eliya District, has increased. So, we need some arrangements made by the Bureau to attend to their issues. I would like to **table*** a document which lists out the shortcomings we are facing at the moment in the district, so that it will be useful for the Ministry to take necessary action.

Thank you very much.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale

Hon. Presiding Member, I would like to tell the Hon. Thilakarajah that we do not maintain offices of the Bureau district-wise. We have one office for a province and also three officers from the Ministry at every Divisional Secretariat to look into the interests of the migrant workers. So, I am sorry to say that we are not going to maintain any office of the Bureau district-wise. For you, the Central Province office is located in Kandy.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

Thank you very much, Madam, for the reply. But, I do not know how far it will be effective language-wise because there are a lot of Tamil-speaking people who are migrating from the Nuwara Eliya District. So, I just want to know whether there is any Tamil-speaking officer appointed at the Divisional Secretariat.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

Hon. Member, that, of course, I cannot tell you right now. But I will direct my Secretary to see to it and ensure that there are Tamil-speaking officers as well.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 3.08]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කාලීනව බලපා තිබෙන විශාල ප්‍රශ්නයක් ගැනයි අද මේ ගරු සභාවේ සාකච්ඡා කරන්නේ. 1977 ආර්ථික විප්ලවයෙන් පස්සේ සූරසේනලා ඩුබායි රටට ගිහිල්ලා කීයක් හෝ හම්බ කරපු යුගයක් තිබුණු බව අපට මතකයි. ඒ සම්බන්ධයෙන් ටෙලි නාට්‍ය පවා බිහි වුණා. මම හිතන්නේ පළිහු මැණිකේලාගෙන්, සූරසේනලාගෙන් තමයි මේ කටයුත්ත පටන් ගත්තේ.

එදා ගොයම් හිටවපු, ගොයම් කපපු, විවිධ කර්මාන්තවල නියැලුණු, පොල් අතු වියමින් කීයක් හෝ හොයා ගත් අපේ ගම්වල තරුණ තරුණියන් අලුත් ඇඳුම් ඇදලා, මොඩ්වෙලා, ඇඟලුම් කම්හල්වල සේවයට යන්න පටන් ගත්තා. තවත් අය විදේශ රටවල රැකියාවක් කරලා කීයක් හෝ හොයා ගෙන එන්න පටන් ගත්තා. එහෙම ආරම්භ කරපු ඒ ගමන අද ඉතාමත්ම සංකීර්ණ තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. අපේ ඉතිහාසය ගත්තාම, අපි වැඩිම විදේශ විනිමයක් ලබපු වැවිලි ආර්ථිකයෙන් ඔබ්බට ගිහිල්ලා, ඇඟලුම් ක්ෂේත්‍රය තුළින් අපේ විදේශ විනිමය පෝෂණය වුණා. මැද පෙරදිග රටවල් ඇතුළු විදේශ රටවල රැකියාවන්වල යෙදිලා ලබන විනිමය ආදායම් මාර්ගවලට කොටු වන තැන දක්වා වූ දීර්ඝ ගමනක් අපි අද වනකොට ඇවිල්ලා සිටිනවා. දැන් අපට මේ කරුණු කාරණා සම්බන්ධයෙන් ආපසු හිතන්න සිදු වෙලා තිබෙනවා.

විදේශගත වන අයගේ ජීවිත පිටු පස තිබෙන සැබෑ සමාජ විද්‍යාත්මක කතන්දරය අද මෙතැනදී විවිධ ආකාරයෙන් අපේ මන්ත්‍රීවරු අතින් කියැවුණා. විශේෂයෙන්ම ගෘහ සේවයට යන කාන්තාවන් පිටු පස ගොඩ නැඟී තිබෙන ඒ බරපතළ සමාජ ප්‍රශ්න පිළිබඳව අද අපට හිතන්න සිදු වෙලා තිබෙනවා. නිවසේ සිටි මව විදේශගත වුණාම, මෙතෙක් කාලයක් පවුලේ ආර්ථිකය වෙනුවෙන් විශාල ඉපැයීම් කරපු ස්වාමි පුරුෂයා ඒ කාන්තාවගෙන් යැපෙන මට්ටමට පත් වෙනවා. එවැනි අවස්ථා අපි බොහෝ විට ගම්වල දැකලා තිබෙනවා. මේ හේතුව නිසා ස්වාමි පුරුෂයන් මත් පැන් පානයට ඇබ්බැහි වෙනවා. පවුලේ දරුවන් නන්නත්තාර වෙනවා. කුඩා දරුවන් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු අතර මහ නවත්වනවා. තරුණ දුවරුන් අපචාරයන්ට ගොදුරු වෙනවා; පියවරුන්ගේ, සමීප ඥාතීන්ගේ, වැඩිහිටියන්ගේ ගොදුරු බවට ඔවුන් පත් වෙනවා. ඒ වාගේ සමාජ ප්‍රශ්න රාශියක් අද අපේ සමාජය තුළ උද්ගතවෙලා තිබෙනවා කියලා මම හිතනවා. ඒ නිසා අපිට මේ පිළිබඳව ආපසු අලුතෙන් හිතන්න සිදු වෙලා තිබෙනවා.

විදේශගත අපේ ශ්‍රමිකයන්ට ඇති වෙලා තිබෙන ප්‍රශ්න හා සම්බන්ධ කරුණු කාරණා, ඔවුන්ගෙන් අපේ රටට ලැබෙන ආදායම, ඒ වටිනාකම, ඒ මිල සමඟ සංසන්දනය කරන්න පුළුවන්ද කියන කාරණය ගැනයි අප මේ කථා කරන්නේ. ඔවුන් අපේ රටට උපයාගෙන එන විදේශ විනිමයෙහි වටිනාකම අපේ සමාජයේ දැවෙන, පිච්චෙන ස්වභාවයට, රෝගාතුර ස්වභාවයට හිලවු කළ හැකිද කියන කාරණය ගැන අපට ආපසු සිතන්න වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් කියන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. ඉලක්කමෙන් දසලක්ෂ තිස්නව දහසක් ත්‍රීවිලර් අපේ රටේ තිබෙනවා. ඒ දසලක්ෂ තිස්නව දහසේ ප්‍රමාණයෙන් සියයට 75ක් වූ ත්‍රීවිලර්වල ඉදගෙන ඉන්නේ, පාසල් අත හැර ගිය අපේ කොල්ලෝ ටික. අපොස (සාමාන්‍ය පෙළ) මහ හැරුණු, අපොස (උසස් පෙළ) මහ හැරුණු තරුණ ගැටවු ටිකක් තමයි ඒ දසලක්ෂ තිස්නව දාහෙන් සියයට 75ක් වූ ත්‍රීවිලර්වල ඉඳගෙන ඉන්නේ. ත්‍රීවිලර් එක, එම දරුවන්ට නීත්‍යානුකූලව රස්තියාදු ගැසීම සඳහා දෙන ලයිසන් එකක් බවට පත් වෙලා තිබෙනවා. ඔවුන් කොහොම හරි අම්මාට, තාත්තාට බල කරලා, කෑ ගහලා ත්‍රීවිලර් එකක් අරගෙන හන්දියට, නගරයට යනවා. ඒ තැන්වලදී විවිධ අපචාරවලට, විවිධ සමාජ විරෝධී ක්‍රියාවලට, විවිධ කටයුතුවලට අපේ තරුණයෝ යොමු වෙලා ඉන්නවා. අද තිබෙන සමාජ තත්ත්වය ඒකයි. එසේ වන්නේ, රැකියා විරහිතභාවය, කරන්න දෙයක් නැතිකම නිසායි. විශේෂයෙන් කාන්තාවන් සඳහා රැකියා අවස්ථා නොමැති වීම, තරුණ තරුණියන්ට, පාසල් හැර යන්නන්ට රැකියා ලබා දීම සඳහා නිසි වැඩසටහනක් නොමැති වීම කියන කාරණයත් අපේ රට අත් හැර විදේශ සේවා සඳහා යෑම කෙරේ බලපානවා. අපේ රටේ පවුල් වටා දැවටී තිබෙන දරිද්‍රතාව, රැකියා විරහිතභාවය ආදී කාරණාත් එයට විශේෂයෙන් බලපානවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන අන්තිම මන්ත්‍රීතුමාත් දැන් මේ ගරු සභාවෙන් ඉවත්ව ගියා. අඩුම තරමින් එතුමාවත් මේ ගරු සභාවේ සිටියා නම් මා සන්තෝෂ වෙනවා. එතුමන්ලා මේ විවාදවලට සම්බන්ධ වන්නේ නැහැ. ගිනි කියන්න පුළුවන් නම්, නටවන්න පුළුවන් නම් ඒවාට බොහොම උජාරුවට සම්බන්ධ වෙනවා. මේ වාගේ වැදගත් කරුණු වෙනුවෙන් ඒකාබද්ධ විපක්ෂය සම්බන්ධ වන්නේ නැහැ. මේ පිළිබඳව ජන මාධ්‍යයේත් අවධානය යොමු වන්න ඕනෑ කියලා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සංඛ්‍යා ලේඛන කිහිපයක් ඉදිරිපත් කරන්නම්. 2009දී විදේශගත වෙලා තිබෙනවා, 247,126දෙනෙක්. 2010දී 267,000 ගණනක්, 2011දී 266,000 ගණනක්, 2012දී 282,000 ගණනක්, 2013දී 293,000 ගණනක්, 2014දී තුන්ලක්ෂ ගණනක් විදේශගත වෙලා තිබෙනවා. 2015දී එම සංඛ්‍යාව ආපසු බහිනවා, දෙලක්ෂ හැටතුන්දහස් ගණනකට. තව්තිසා දිව්‍ය ලෝකය කළා යැයි, සුරම්‍ය රටක් බවට පත් කළා යැයි කියන මේ රටෙන් තමයි විදේශ රැකියා සඳහා දවස ගණනේ පිටත් වෙලා තිබෙන ප්‍රමාණය එසේ වසරින් වසර වැඩි වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කාන්තා ශ්‍රමිකයන්ගේ විදේශගත වීම ප්‍රතිශතයක් හැටියට ගෙන බැලුවොත්, 2009දී සියයට 48.31යි. 2012දී සියයට 51යි. 2013දී සියයට 59යි. 2014දී සියයට 63යි. 2015දී සියයට 65යි. එම ප්‍රමාණය දැන් ආපසු අඩු වෙමින් යන ප්‍රවණතාවකට අපි පැමිණෙමින් සිටිනවා. මේ රට නිසි පරිදි සංවර්ධනය කළා නම්, කාන්තාවන්ගේ දරිද්‍රතා ප්‍රශ්නය විසඳුවා නම්, පසු ගිය රජය පුරාජේරු ගහපු වැඩසටහන් - දිළිඳු සහන වැඩසටහන් යනාදිය - බලාපොරොත්තු වූ ආකාරයට ක්‍රියාත්මක වුණා නම්, අපේ රටේ කාන්තාවන් මේ ආකාරයට මේ රට හැර යන ප්‍රතිශතය වැඩි වන්නේත් නැහැ; අපේ රට තුළ බරපතළ දරිද්‍රතාවක් ඇති වීමක් හෝ ඒ පිටුපසින් සමාජ ප්‍රශ්න ගොනු වීමක් හෝ සිදු වන්නේත් නැහැ. ඒ ප්‍රශ්න විසඳිලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ප්‍රශ්න විසඳිලා නැති නිසා තමයි අපේ රටින් විදේශගත වන්නන්ගේ සංඛ්‍යාව මේ ආකාරයට වැඩි වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ රජය අලුතෙන් කල්පනා කරනවා, සමහර රටවල ගෘහ සේවය සඳහා කාන්තාවන් යැවීම නවත්වා තිබෙනවා වාගේ අපේ රටිනුත් ගෘහ සේවය සඳහා කාන්තාවන් යැවීම නවත්වනවාද, නැද්ද කියලා. දැන් ඒ ගැන

සලකා බලමින් ඉන්නවා. අපේ ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුගෙන්ම කියැවුණා, මේ රට තුළ කාන්තාවන්ට, ශ්‍රමිකයන්ට ඩොලර් 300ක ආදායමක් උපයා ගැනීමේ අවස්ථාවක් හදා දෙන්න අපට පුළුවන් නම්, ඒ ගොල්ලන්ගේ පවුල්වල ආර්ථික සුරක්ෂිතභාවය ඇති කර දෙන්න පුළුවන් නම්, අර අපි කථා කරපු රැකියා දස ලක්ෂයේ වැඩසටහන යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන් නම්, රට හැර යන අපේ කාන්තාවන්ගේ ඒ ගමන නවතිනවා කියලා.

මේ ළඟදී මා සංචාරයක් සඳහා ගිය වෙලාවේ කුවේට් තානාපති කාර්යාලයට පොඩ්ඩක් ගොඩ වැදුණා. මා යන කොට තානාපතිවරයා එළියට ගිහිල්ලා. මොනවාටද එළියට ගියේ කියලා ඇහුවාම, පළමුවැනි ලේකම්වරයා කියනවා රැකියා හොයන්න ගිහිල්ලායි කියලා. ඊට පස්සේ තානාපතිවරයා ආවා. මා තානාපතිපතුමා එක්ක කථා කළා. ඒ තානාපති පුටුවේ වෙනදා හිටියේ, පුටුව රත් කර කර, තමන්ගේ සුඛ විහරණය වෙනුවෙන් වැජඹුණු තානාපතිවරුන්. අහන්නත් සන්තෝෂයි, මේ රජය යටතේ දැන් එහි සිටින තානාපතිවරයා එළියේ මාර්කට් එකට බැහැලා විවිධ ආයතන, විවිධ රැකියා ලබා දෙන ස්ථාන කරා යනවා, පුහුණු ශ්‍රමිකයන් සඳහා හොඳ මිලක්, හොඳ රැකියා අවස්ථා ලබා ගන්න. ස්ථාන ගණනාවකට ගියාම ඒ ආයතනවල සිටි ප්‍රධානීන්ගෙන් ලැබුණු ප්‍රතිචාර ගැන එම තානාපතිතුමා මා සමඟ කිව්වා. සමහර ආයතනවල සිටින ප්‍රධානීන් කිව්වාලු, "මම කුඩා කාලයේ නැළවිලා තිබෙන්නෙත් ලංකාවේ අම්මා කෙනකුගේ උකුලේ"යි කියලා. සමහර රටවල සිටින ධන කුවේරයින්, සමහර රජවරු, සමහර කුමාරවරු බහුතරයක් කුඩා කාලයේ නැළවිලා තිබෙන්නේ අපේ සිංහල අම්මලාගේ උකුලේ. ඒ ව්‍යාපාරිකයන් බහුතරයක් පෝෂණය වෙලා තිබෙන්නේ අපේ සිංහල අම්මලාගේ සේවයෙන්. ඒ ගෞරවය තිබෙනවා. විශේෂයෙන් ලංකාවෙන් පිට රටවලට යන අය පිළිබඳව තිබෙන ලිංගික, වහල් ආකල්ප පැත්තකට දමලා, මානෘත්වය පැත්තෙන් එම ආකල්ප හොඳ පැත්තකට යොමු කර ගන්න පුළුවන් නම් විශේෂයෙන්ම අපට සන්තෝෂ වෙන්නට පුළුවන්.

මා කලිනුත් සඳහන් කළ පරිදි, මෙය අත්‍යවශ්‍ය, ඉතාම වැඩදායී යෝජනාවක් විවාද වන අවස්ථාවක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට තව විනාඩි දෙකක් තිබෙනවා නේ.

අපි ඊයේ දැක්කා, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් පාත්ත පැටවුන් පෝලිමක් වාගේ කර පටි ටිකක් දාගෙන ඉන්න ආකාරය. ගරු වාසුදේව නානායක්කාර මහත්මයා නම් ඒ කර පටිය කෙළින් දාගෙන හිටියා. සමහර තරුණ ගරු මන්ත්‍රීවරු ඒ කර පටිය ගැට ගසා ගෙන හිටියා. කරපටි සංස්කෘතියෙන් අපේ රට මුදවා ගෙන ආපසු හොඳ සංස්කෘතියක් කරා ගමන් කරන කොට, ආයෙත් කරපටි සංස්කෘතියකට මහ පෙන්වූ කණ්ඩායමක් අපි ඊයේ දැක්කා. මේ ගොල්ලන්ට මේ අවශ්‍ය වෙලා තිබෙන්නේ මොනවාද? මේ ගොල්ලන් ඊයේ කරපටි වන්නමක් නැටුවා. මීට සතියකට දෙකකට ඉස්සර වෙලා මහනුවර ඉඳලා පයින් ඇවිල්ලා අරක්කු බීගෙන විවිධ නැටුම් නටා ගෙන -

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඩෙහා නැටුම්.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඔව්, ඩෙහා නැටුම් නැටුවා. ඉතින් මේ ගොල්ලන් සතියකට වතාවක් නටනවා, ගම්වල ජනතාවට විෂ පොවනවා. වැදගත් කාරණයක් සාකච්ඡා වන අද දවසේත් ඒ අය මේ සභාවේ නැහැ. ඒ වාගේම ඊයේත් අපි ඉතා වැදගත් කාරණයක් වෙනුවෙන් පනත් කෙටුම්පතක් සම්මත කරද්දී, ඒකටත් විරුද්ධත්වය පළ කරමින් සිටියා. මේ ගොල්ලන් සතියක් සතියක් ගානේ නටන නැටුම් බලලා දැන් ජනතාවට එපා වෙලායි තිබෙන්නේ. අර නිතර දකින කුකුළාගේ කරමල සුදුයි කියනවා වාගේ සතියකට වතාවක් මේ අයගේ නැටුම් බලලා එපා වෙලායි තිබෙන්නේ.

ඊයේ-පෙරේදා මහනුවර ඉඳලා පෙරහැරක් ආවා. ඒකේ අලි හිටියේ නැහැ. සාමාන්‍යයෙන් මහනුවර ඉඳලා එන පෙරහැරවල අලි ඉන්නවා. නමුත්, එම පෙරහැරේ අලි හිටියේ නැහැ. ඒකේ හිටියේ අම්බරුවන්. ඒ අයට කෑමක් ලැහැස්ති කර තිබුණා, කිරිබත්ගොඩ. අපරාදේ කියන්න බැහැ, ඒ ආපු පෙළපාළිය ගියාට පස්සේ, තැන් තැන්වල ලයිට් කණුවල එල්ලා තිබුණු තණකොළ මීට ටිකටත් වෙච්ච දෙයක් නැහැ. ඒවා ඉතින් කවුරුවත් බැග්වල දාගෙන අරගෙන යනවායැ? අනිවාර්යෙන්ම ඒ තණකොළ මීට ටික පරිභෝජනය කරලා තිබෙනවා. මේ වාගේ විකාර කරමින් ඒකාබද්ධ විපක්ෂය හැම තිස්සේම උත්සාහ කරන්නේ ගම්වල ඉන්න ජනතාවට නැති විසක් කවලා, ජනතාවගේ ඔළුව අවුල් කරලා තමන් වටා කැරකෙන බූමරංගයන්ගෙන් බේරෙන්න, තමන් වටා කැරකෙන චෝදනාවලින් බේරෙන්න මහා ජනතා පවුරක් හදා ගන්නයි. ඒ සඳහා දරන උත්සාහයක් තමයි මේ තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, වෙලාව ඉවරයි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඒ නිසා ඒ පිළිබඳවත් මගේ කනගාටුව ප්‍රකාශ කරමින් මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

[අ.භා. 3.22]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, විශේෂයෙන්ම සභාව කල් තැබීමේ මේ විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. මෙම විවාදයේදී සියලුම මන්ත්‍රීවරු විදේශ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

සේවයේ නියුතුව සිටින සියලු දෙනාගේම ප්‍රශ්න, ඔවුන් මුහුණ දෙන ගැටලු ගැන සාකච්ඡා කළා. කාලයෙන් කාලයට මේ ප්‍රශ්න ගැන පාර්ලිමේන්තුව තුළත් මාධ්‍ය තුළිනුත් අපි කථා කරනවා. විශේෂයෙන්ම විදේශ සේවය කිව්වාම මැද පෙරදිග රටවල සේවය කරන අපේ කාන්තාවන්ගේ හා පිරිමින්ගේ ප්‍රශ්න තමයි හැමදාම කථා කරන්න ලැබෙන්නේ. මොකද, මැද පෙරදිග රටවලට ලංකාවෙන් යන ශ්‍රමිකයන්ගේ ප්‍රමාණය ඉතා විශාලයි. ලක්ෂ 10කට අධික ප්‍රමාණයක් ඒ රටවල වැඩ කරන නිසා නිරන්තරයෙන්ම ඔවුන් මුහුණ දෙන ගැටලු හා ප්‍රශ්න තමයි මාධ්‍ය තුළිනුත් අද පාර්ලිමේන්තුවේ කෙරෙන සාකච්ඡාව තුළත් පොදුවේ සියලුම ගරු මන්ත්‍රීවරු කථා කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමියත් මෙතැන සිටින නිසා විශේෂයෙන්ම ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න, ගැටලු කිහිපයක් ගැන අවධානය යොමු කරවන්න මමත් බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මැද පෙරදිග රැකියා වෙළෙඳ පොළ ගත්තාම දවසින් දවස ක්‍රම ක්‍රමයෙන් ලංකාවෙන් යන ශ්‍රමිකයන්ගේ - ගෘහ සේවිකාවන්ගේ- ප්‍රමාණයේ අඩු වීමක් තිබෙනවා. මොකද, අද මැද පෙරදිග රටවලට ලංකාවෙන් විතරක් නොවෙයි අනෙකුත් රටවලින්; අග්නි දිග ආසියානු රටවලිනුත් ශ්‍රමිකයන් එනවා. ඒ එන ප්‍රමාණය හා ඔවුන්ට ගෙවන වැටුප් ප්‍රමාණය අනුව, ලංකාවෙන් යන ගෘහ සේවිකාවන්ගේ පැත්තෙන් බැලුවත්, කම්කරුවන්ගේ පැත්තෙන් බැලුවත් දවසින් දවස යන ප්‍රමාණයේ අඩු වීමක් දකින්න ලැබෙනවා. මොකද, අද ලෝකයේ රටවල, විශේෂයෙන්ම ආසියානු රටවල දුප්පත්ම රටවලින් හුඟාක් දෙනෙක් අඩු වැටුපකට පිට රටවලට ගිහිල්ලා වැඩ කරන්න ලැහැස්ති වෙලා ඉන්නවා. අපේ ගෘහ සේවිකාවකට අඩුම වේතනය ඩොලර් 300ක් කියලා අපි තීරණය කරලා ඉන්න කොට බංග්ලාදේශය වාගේ රටවල කාන්තාවන් ඩොලර් 185ක වේතනයකට ගෘහ සේවිකාවන් හැටියට මැද පෙරදිග රටවලට යන්න ලැහැස්තියි. විශේෂයෙන්ම පසු ගිය සති කිහිපය තුළ බංග්ලාදේශය තමන්ගේ රටින් ගෘහ සේවිකාවන් යවන්න සවුදි අරාබිය වාගේ රටවල් එක්ක එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. ඩොලර් 185ක වැටුපකට බංග්ලාදේශයෙන් ගිහිල්ලා ඒ රටවල වැඩ කරන්න ඔවුන් ලැහැස්ති වෙලා ඉන්නවා. ඒ වාගේම බංග්ලාදේශයේ කම්කරුවෝ මැද පෙරදිග රටවල ඩොලර් 160ක වැටුපකට වැඩ කරන්න ලැහැස්ති වෙලා ඉන්නවා. මොකද, බංග්ලාදේශය කියන්නේ විශාල ජනගහනයක් තිබෙන රටක්. ඒ වාගේම ඒ රට තුළ තිබෙන රැකියා ප්‍රමාණය ඉතාම අඩුයි. ඒ රැකියා අඩු නිසා බංග්ලාදේශයේ ඉන්න කම්කරුවෝ මැද පෙරදිග විතරක් නොවෙයි ලෝකයේ අනෙකුත් රටවලත් සේවය කරනවා.

අපි යුරෝපා රටවලට ගිහිල්ලා බැලුවත් -ඇමෙරිකාව, යුරෝපය- වාගේ රටවලත් ලංකාවේ අය පැයකට ඩොලර් 10කට වැඩ කරන කොට බංග්ලාදේශයේ කම්කරුවන් ඩොලර් 5කට වැඩ කරන්න ලැහැස්ති වෙලා ඉන්නවා. ඒ කියන්නේ ඇමෙරිකාව, කැනඩාව, යුරෝපය වාගේ රටවලට ගිහිල්ලා සියයට 50කට අඩු වැටුපකට වැඩ කරන්න සූදානමින් ඉන්නවා. ඒ අනුව මැද පෙරදිග විතරක් නොවෙයි, යුරෝපය, ඇමෙරිකාව, කැනඩාව වාගේ රටවලදී බංග්ලාදේශ ජාතිකයින් ඉතාම අඩු වැටුපකට වැඩ කිරීමට කැමැති නිසා හුඟාක් ශ්‍රී ලාංකිකයන්ගේ රැකියාවලට විශාල අනතුරක් ඇති වෙලා තිබෙනවා. නමුත් අපට තිබෙන එක වාසනාවක් තමයි බංග්ලාදේශයේ කාන්තාවන්ට වඩා තවම ලංකාවේ ගෘහ සේවිකාවන්ට මැද පෙරදිග ඉල්ලුමක් තිබෙන්නේ ශ්‍රී ලාංකික කාන්තාවන්ට තිබෙන බුද්ධිමත්භාවය නිසායි. සාක්ෂරතාව, අධ්‍යාපන මට්ටම, යමක් වටහා ගැනීමේ ශක්තිය, ඉගෙන ගැනීමේ හැකියාව ඔවුන්ට තිබෙනවා. ඔවුන් ඉතා ඉක්මනින් ඉගෙන ගන්නවා. බංග්ලාදේශයේ කාන්තාවන්ගේ සාක්ෂරතාව තිබෙන්නේ ඉතාම අඩු මට්ටමකයි. බුද්ධිමත්භාවය, අධ්‍යාපන මට්ටම ආදී සියලු දේවල්වලින් බොහෝ පහළ මට්ටමක ඔවුන් සිටින නිසා ඔවුන් ඩොලර් 185ක වැටුපකට රැකියාවට යන්න ලෑස්ති වුණත්, මැද පෙරදිග ඉන්න බොහෝ අරාබි ඒජන්සිකරුවෝ, ඒ වාගේම එහි ඉන්න බොහෝ නියෝජිතයෝ බංග්ලාදේශ කාන්තාවන් ගෙන්වා ගන්න කැමැති නැහැ. ලංකාවේ ගෘහ සේවිකාවන්ට යම් ප්‍රමාණයකට ඉල්ලුම තිබෙන්නේ, විශේෂයෙන්ම ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම, සාක්ෂරතාව බංග්ලාදේශයට වඩා ඉහළින් තිබෙන නිසායි.

දැන් ඇති වී තිබෙන ගැටලු ගැන කියන්න ඕනෑ. බංග්ලාදේශය ඉස්සර ගෘහ සේවිකාවන් හැටියට කාන්තාවන් මැද පෙරදිග රටවලට යැව්වේ නැහැ. ඔවුන් ඒක නවත්වලායි තිබුණේ. අද එය විවෘත කිරීම නිසා ලංකාවේ රැකියා වෙළෙඳ පොළට අනිවාර්යයෙන්ම යම් තර්ජනයක් එල්ල වෙනවා. ඩොලර් 185ක් වැනි අඩු වැටුපකට වැඩ කිරීමට ඔවුන් ලෑස්ති නිසා ඔවුන්ට තිබෙන market එක ඉහළ යන එක ස්වාභාවිකයි. ඉදිරියේදී අනිවාර්යයෙන්ම අපට මැද පෙරදිග රටවලට හා ලෝකයේ අනිකුත් රටවලට රැකියා සඳහා තිබෙන ඉල්ලුමත්, ඒ රැකියාවල තත්ත්වයත් බැලුවාම යම් අනතුරුදායක තත්ත්වයක් තිබෙන බව පෙනෙනවා. ඒ අනතුරුදායක තත්ත්වයට මුහුණ දෙන්න නම් මා හිතන හැටියට අපි යම්කිසි වැඩ පිළිවෙළකට ලෑස්ති වෙන්න ඕනෑ. අපි ඒකට යම් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපේ වෘත්තීය තත්ත්වය ගුණාත්මකභාවයෙන් ඉහළ මට්ටමකට ගෙනෙන්න පුළුවන් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුයි. ඒ තුළින් ඒ සේවක සේවිකාවෝ වෘත්තීය මට්ටමින් ඉහළ තැනකට ගෙන යා හැකියි. විශේෂයෙන්ම පාකිස්තානය ගෘහ සේවිකාවන් යවන්නේ නැහැ, ඉන්දියාව ගෘහ සේවිකාවන් යවන්නේත් නැහැ, නේපාලය ගෘහ සේවිකාවන් යවන්නේත් නැහැ. නමුත් අනාගතයේදී ඒ රටවලුත් ගෘහ සේවිකාවන් යවන්න පටන් ගත්තොත් සහ අද බංග්ලාදේශය වැනි රටවල් වෙළෙඳ පොළට ඇතුළත් වීම නිසාත් මා හිතන හැටියට මීට වඩා වෙළෙඳ පොළ තුළ විශාල තරගකාරිත්වයක් ඇති වන්න පුළුවන්. මොකද, ඉන්දියාව, නේපාලනය වැනි රටවල් ගත්තොත්, ඔවුනුත් ඩොලර් 185ක්, ඩොලර් 200ක් වැනි වැටුපකට විදේශ රැකියාවලට යන්න පටන් ගත්තොත්, අපට ඒ තරගකාරිත්වයට මුහුණ දෙන්න වෙනවා. ඒ තරගකාරිත්වයට මුහුණ දෙන්න නම් අනිවාර්යයෙන්ම වෘත්තීය මට්ටමේ සේවකයන්, සේවිකාවන් නිර්මාණය කරන්න වෙනවා. ඒ සඳහා යම් වැඩසටහනක් අපි ක්‍රියාත්මක කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව කාරණයක් මා පැහැදිලි කරන්න ඕනෑ. මැද පෙරදිග රැකියාවලට ගිය ගෘහ සේවිකාවන්ට සිදුවන අසාධාරණකම්, ඒ වාගේම ඔවුන්ට එල්ලවන තාඩන පීඩන, ඔවුන්ගෙන් ගන්නා අයුතු ප්‍රයෝජන, ඒ වාගේම කාල සීමාවක් නොමැතිව ඔවුන්ගෙන් වැඩ ගැනීම වැනි ගැටලු රාශියක් හැම දාම තිබෙනවා. ඉන්දුනීසියාව ගත්තොත්, මැද පෙරදිගට වැඩියෙන්ම ගෘහ සේවිකාවන් යවන රටක් තමයි ඉන්දුනීසියාව. පසු ගිය කාලයේ ඉන්දුනීසියාව වැනි රටවල ගෘහ සේවිකාවනුත් මැද පෙරදිග රටවල සේවය කරන කොට ඒ වාගේ යම් යම් තාඩන පීඩනවලට මුහුණ දීම නිසා ඒවා අඩු කරගන්න ඒ රටවල් යම් යම් ක්‍රමවේද ක්‍රියාත්මක කළා. මා හිතන හැටියට ඉන්දුනීසියාව අදාළ රටවල තානාපති කාර්යාල හරහා ඒ රැකියා නියෝජිතයා සමඟ ගිවිසුමක් අත්සන් කරනවා. ඒ ගිවිසුම අත්සන් කිරීම තුළින් ඔවුන් යවන ගෘහ සේවිකාවයි, ගෙන්වන තැනැත්තායි පිළිබඳව ඉන්දුනීසියානු තානාපති කාර්යාල ඒ රටේ තිබෙන ආයතනත් එක්ක සම්බන්ධ වෙලා යම් විමර්ශනයක් කරනවා. ඉන්දුනීසියානු කාන්තාවන් මැද පෙරදිග රටවල රැකියාවලට යන්න කලින්, ඔවුන්ව ගෙන්වන sponsor , එහෙම නැත්නම් ඔවුන්ව ගෙන්වන තැනැත්තා, ඒ අය මීට කලින් blacklist වෙලා තිබෙනවාද, ඔවුන්

යම් යම් දේවල්වලට සම්බන්ධවෙලා ඉන්නවාද, ඔවුන් යම් යම් වැරැදිකරුවන් හැටියට නීතිය හමුවට ඉදිරිපත්කර තිබෙනවාද, ඔවුන්ගේ ගෙවල්වල මීට කලින් රැකියා කරපු ගෘහ සේවිකාවන් යම් යම් අපහසුතාවන්වලට, යම් යම් අඩන්තේට්ටම්වලට ලක් වෙලා තිබෙනවාද කියලා විමර්ශනය කරනවා. අපි හැම දාම කරන්නේ මේ රටේ ඒජන්තවරයායි, සෞදි අරාබියේ හෝ මැද පෙරදිග රටේ ඉන්න ඒජන්තවරයායි අතර ගිවිසුමක් ඇති කර ගැනීමයි. මා හිතන හැටියට ඒ සාම්ප්‍රදායික ක්‍රමයට එහා ගිය යම්කිසි වැඩ පිළිවෙළකට අපත් යා යුතුයි. එහෙම වුණොත් තමයි අපට යම් විමර්ශනයක් කරලා, අපේ ගෘහ සේවිකාවන් සේවය කරන්න යන ස්ථානය ආරක්ෂිත තැනක්ද කියන එක ඔවුන් ඒ රටවලට යන්න කලින් අපට හරිහැටි හඳුනා ගන්න පුළුවන් වෙන්නේ. මෙන්න මේ වාගේ දේවල් අපට ඉදිරියේදී කරන්න වනවා. ඒ වාගේ සැලසුම් සකස් කරන්න වෙනවා.

අවසාන වශයෙන් මම තව එක කරුණක් මතක් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමියත් මේ අවස්ථාවේ මෙතැන ඉන්නවා. විශේෂයෙන්ම ගෘහපාලිකාවක් -housemaid- විධියට යන කාන්තාවට නිශ්චිත වැඩක් නැහැ. ඇය මුළු ගෙදරම තිබෙන සම්පූර්ණ වැඩ කරන්න ඕනෑ. රිසානා නාෆික්ගේ මරණය ගැන අපි කථා කළත්, රිසානා නාෆික් ගියේ housemaid කෙනෙක් හැටියට කියලා අපි දන්නවා. නමුත්, ඇය ගිහිල්ලා කළේ ළමයි බලා ගන්නා වැඩය; ඇය babysitter කෙනෙකුගේ වැඩය කළේ. නමුත්, ඇයට වීසා එක හම්බ වුණේ housemaid කෙනෙකු හැටියටයි. Babysitter කියලා කියන්නේ වෘත්තීයමය රැකියාවක්. ළමයි බලා ගැනීමේ වැඩයට යම් පුහුණුවක් ඕනෑ, යම් දැනුමක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම අත් දැකීම් තිබෙන්නත් ඕනෑ. ඒ කිසිම දෙයක් නැතුව housemaid වීසා එකට ගිය ඇයට වෙනම රැකියාවක් කරන්න දුන්නා. ඒ, babysitter රැකියාව. ඒ babysitter රැකියාව කරන්න ගිහිල්ලා තමයි ඇයගේ අතින් ළමයකුගේ ජීවිතය නැති වුණා කියලා ඇයගේත් ජීවිතය නැති වුණේ.

විශේෂයෙන්ම මැද පෙරදිග රටවලට ගෘහ සේවක සේවිකාවන් යවන කොට අපි මේ සම්බන්ධයෙනුත් යම් වර්ගීකරණයකට යා යුතුයි. මොකද, යම් කෙනෙකු housemaid රැකියාවට ගියා නම්, ඔහු හෝ ඇය housemaid වැඩය පමණයි කරන්න ඕනෑ. ඔහු හෝ ඇය babysitter වැඩය කරන්න සම්බන්ධ කර ගන්න බැහැ. ළමයි බලන්න යවනවා නම්, ඒ ළමයි බලන වැඩයට babysittersලා යවන්න ඕනෑ. වීසා ලබා දීමේදීත් අනිවාර්යෙන්ම ඒ වර්ගීකරණය අවශ්‍යයි. අපට ඉදිරියේදී මෙන්න මේ වාගේ යම් යම් දේවල් ඉදිරිපත් කරලා යම් යම් නීති රාමු හදා ගන්න වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම තව කරුණක් කියනවා. ගරු ඇමතිතුමියනි, මේ සම්බන්ධයෙන් අපට අලුතෙන් හිතන්න වනවා. මොකද, ලෝකය දැන් වෙනස් වෙලායි තිබෙන්නේ. ඉදිරියේදීත් ලෝකය හුහක් දුරට වෙනස් වනවා. දැන් යුරෝපා ආර්ථිකය අවපාතයකට යන්නේ කියලා අපි දන්නවා. යුරෝපයේ ඉන්න යුරෝපීයන්ට රස්සා නැහැ. ඇමෙරිකානුවන්ට එහේ රස්සා නැහැ. ඒ නිසා අද පිට රටවලින් ඇවිල්ලා ඉන්න මිනිසුන්ව ඒ රටවලින් යවන්න උත්සාහ කරනවා. මොකද, ඔවුන්ගේ රටේ ඉන්න මිනිසුන්ටත් අද රස්සා නැති හින්දා. ත්‍රස්තවාදී ප්‍රශ්න උඩ විශේෂයෙන්ම අද මැද පෙරදිග රටවල ආර්ථිකයේත් කඩා වැටීමක් තිබෙනවා. තෙල් මිල පහත වැටිලා තිබෙනවා. සවුදි අරාබියේ ආර්ථිකයත් යම් අවපාතයකයි ගමන් කරන්නේ. ඉදිරියේදී සම්ප්‍රදායෙන් බැහැරව අලුත් අදහසක්, අලුත් දැක්මක් උඩ අපට මේ ගමන යන්න වනවා. එහෙම ගියොත් තමයි අපට අලුත් රැකියා, අලුත් වෙළෙඳ පොළවල් හොයා ගන්න පුළුවන් වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තූතියි.

මීළඟට, ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා.

[අ.භා. 3.34]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම කාලෝචිත මාතෘකාවට මටත් කාලය වෙන් කිරීම ගැන ඔබතුමාට ස්තූතිවන්ත වනවා.

"ගෙදර බුදුන් අම්මා" කියන අපේ ආදරණීය මව්වරු, අපේ ආදරණීය සහෝදර සහෝදරියන් තමයි අපි ගෘහ සේවක සේවිකාවන් හැටියට මැද පෙරදිගට සහ වෙනත් රටවලට යවන්නේ. එහිදී ඔවුන්ට වන හිංසා පීඩන, අඩන්තේට්ටම් ගැන අප සියලු දෙනා හොඳ අවබෝධයකින් ඉන්නවා කියන කාරණයත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. සියයට 60ක්, 70ක් වැනි ප්‍රමාණයක් අද මේ රට අත් හැරලා කීයක් හරි හම්බ කර ගැනීමේ චේතනාවෙන් පිට රටවලට යනවා. එලෙස යන බොහෝ දෙනා කාන්තාවන්. එයිනුත් වැඩි දෙනෙකු අද ගෘහ සේවිකාවන් හැටියටයි යන්නේ. ප්‍රතිශතයක් හැටියට ගත්තොත් අද වනකොට සියයට 63ක් වැනි ප්‍රමාණයක් තමයි පුරුෂයන් මැද පෙරදිගට යන්නේ. ඒ වාගේම ස්ත්‍රීයන් සියයට 36කට වැඩි ප්‍රමාණයක් අද අපේ රට අත් හැරලා මැද පෙරදිගට යනවා.

ඉස්සර තිබුණු ආණ්ඩුව බොහොම උජාරුවෙන් හැම වෙලාවේම කියපු දෙයක් තමයි, මොවුන් "රට විරුවෝ" කියලා. අද වනකොට රට විරුවන්ට අත් වෙලා තිබෙන ඉරණම අප සියලු දෙනාම දන්නා කාරණයක්. 2014 වර්ෂය වනකොට සියයට 36.7ක් වැනි ප්‍රමාණයක් ලංකාවෙන් විදේශ රැකියා සඳහා - විශේෂයෙන්ම ගෘහ සේවය සඳහා- ගිහිල්ලා තිබෙනවා. නමුත්, 2015 වර්ෂය වෙද්දි ඒ ප්‍රමාණය අඩු කර ගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේකට හේතුවක් තිබෙනවා. අපේ රටේ සිටින ආදරණීය මව්වරු, සහෝදර සහෝදරියන් විදේශ රටවලට යවා මේ රටට සල්ලි ගේන්න ආණ්ඩුවක් හැටියට අද අපි බලාපොරොත්තු වන්නේ නැහැ. ඔවුන් විදේශ රටවලට යවා ඔවුන්ගේ ජීවිත, ඔවුන්ගේ අනාගතය සහ ඔවුන්ගේ පවුල් අවදානමට ලක් කරලා ඔවුන් අපහසුතාවට ලක් කරන්න අපි බලාපොරොත්තු වන්නේ නැහැ. ඒක නිසා මේ සංඛ්‍යාව අඩු කර ගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

ගෘහ සේවිකාවන් ලෙස 2014 වර්ෂයේදී 88,626ක් මේ රටින් ගිහිල්ලා තිබෙනවා. නමුත්, 2015 වර්ෂය වෙද්දි මේ ප්‍රමාණය 73,278කට අඩු කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ ප්‍රමාණයෙනුත් සියයට 96කට වැඩි ප්‍රමාණයක් මැද පෙරදිග රටවලට තමයි ගිහිල්ලා තිබෙන්නේ. මම මේක දකින්නේ දේශීය රැකියාවලට ප්‍රවණතාවක් හැටියටයි. අපි දන්නවා, මොවුන් agency එකේ ඉඳලා, ගුවන් තොටුපළේ ඉඳලා වැඩ කරන නිවස දක්වා ගිහිල්ලා, නැවත වතාවක් agency එකට එනකල් හිංසාවට, පීඩාවට ලක්වෙන බව. ඔවුන් හිංසාවට, පීඩාවට ලක්වෙන්නේ කොහොමද? ඔවුන්ට ගහනවා, ඔවුන්ට ඇණ ගහනවා, ඔවුන්ව පුච්චනවා, සමහර අයට පඩි ගෙවන්නේ නැහැ, ඒ වාගේම සමහර අය දූෂණයට ලක්වෙනවා, සමහර අය මරණයට පවා පත්වෙනවා. 2010 සිට 2015 දක්වා කාලය ගත්තාම මරණ 17කට වැඩි ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙනවා. සිදු වුණු හිරිහැර ගත්තාම,

[ගරු (වෛද්ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

2010දී හිරිහැර සිදුවීම් 11,945ක්, 2013දී 11,125ක් වශයෙන් වාර්තා වුණා. නමුත් 2015 වෙන කොට 8,054ක් දක්වා එහි අඩු වීමක් තිබෙනවා. ගරු ඇමතිතුමියගේ තිබෙන දක්ෂතාව, එතුමියගේ තිබෙන කැපවීම, ඒ වාගේම එතුමියගේ කාර්ය මණ්ඩලයේ තිබෙන කැපවීමත් එක්ක ඒ හිරිහැරයට ලක්වන ප්‍රමාණය අඩු කරගන්න පුළුවන් වෙලා තිබෙනවා. 2013දී එම ප්‍රමාණය 11,125ක්ව තිබුණා. එය, 2015 වෙන කොට 8,054 දක්වා අඩු කරගන්න පුළුවන් වෙලා තිබෙනවා. මේක තමයි අද යහ පාලනයත් එක්ක ඇති වුණු වෙනස. හොඳ කාර්ය මණ්ඩලයකුත්, ඒ වාගේම එම කාර්ය මණ්ඩලයට නායකත්වය දෙන්න පුළුවන් ඇමතිවරියකුත් පත් වෙලා තිබෙන නිසා අද සැබෑ "රට විරුවා"ට පිට රට ගොස් මේ රට වෙනුවෙන් වැඩ කරන්න පුළුවන් වෙලා තිබෙනවා. එදා නමට පමණයි "රට විරුවා" කියන නම ඔවුන්ට ලබා දුන්නේ. නමුත් සැබෑ රට විරුවා වෙනුවෙන්, හිංසාවට, පීඩාවට ලක්වන රට විරුවන් වෙනුවෙන් ඉදිරිපත් වෙන්න පුළුවන් ඇමතිවරියක් අද පත්වෙලා ඉන්නවා. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා.

2013 වෙද්දී සවුදි අරාබිය තුළ හිංසාවට, පීඩාවට ලක් වුණු ප්‍රමාණය ලෙස 6,378ක් වාර්තා වෙලා තිබෙනවා. නමුත් 2015 වෙද්දී එම ප්‍රමාණයෙන් 2,000කට වැඩි සංඛ්‍යාවක් අඩු වෙලා තිබෙනවා. එය 2015දී 4,504 දක්වා අඩුවීමක් අපට දකින්නට පුළුවන්. අපේ රජය කරගෙන යන වැඩ පිළිවෙළත් එක්ක, තිබෙන ජාත්‍යන්තර සම්බන්ධතාත් එක්ක අද ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටිනවා කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

අභිංසක මව්වරු, විශේෂයෙන්ම නැගණියන් මැද පෙරදිගට ගිහිල්ලා දුක් කම් කටුලු විඳිනවා විතරක් නොවෙයි, ඔවුන්ගේ පවුල් ඒකක කඩාගෙන වැටෙනවා. අපි ඒක දකිනවා.

මැද පෙරදිග ශ්‍රමිකයන් පිළිබඳව කථා කරද්දී අපට අමතක කරන්න බැරි කාරණයක් තිබෙනවා. ඒ තමයි රිසානා නාෆික් නැගණිය. 2013 ජනවාරි 9වැනිදා එතුමිය අපෙන් සමු ගත්තා. එහි සම්පූර්ණ වගකීම එවකට තිබුණු ආණ්ඩුවට ගන්න සිද්ධ වෙනවා. එවකට තිබුණු ආණ්ඩුවට එතුමියව බේරාගන්න පුළුවන්කම තිබුණා. නමුත් එතුමිය අපෙන් වෙන්වීම තුළින් එවකට තිබුණු රජයේ අපොහොසත්කම, ඔවුන් තුළ තිබුණු අදක්ෂකම පෙන්වා දුන්නා. මට මතකයි, මගේ පියා -දිවංගත දොස්තර ජයලත් ජයවර්ධන මැතිතුමා- මෙම උත්තරීතර සභාවේදීම රිසානා ගැන කථා කරද්දී කිව්වා, "ගෘහ සේවිකාවන් හැටියට යන අභිංසක මවුවරු, පියවරු සහ සහෝදර සහෝදරියන් අපි දකින්නේ 'modern day human slavery' හැටියට" බව. ඉස්සර අප්‍රිකාවෙන් ඇමෙරිකාවට ගිය කලු ජාතිකයන් පීඩාවට ලක්වන හැටි අපි දැක්කා. අද සමහර රටවලදී ලාංකිකයනුත් එවැනි ප්‍රමාණයක් පීඩාවට ලක්වෙනවා. ඒක නිසා තමයි "modern day human slavery" කියලා එතුමා කිව්වේ. නමුත් "International Convention on the Protection of the Rights of all Migrant Workers and Members of their Families" කියන ප්‍රඥප්තියට අත්සන් කළේ එක්සත් ජාතික පක්ෂය කියන එකත් අපි මතක් කරන්න ඕනෑ. අභිංසක ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් පක්ෂයක් හැටියටත්, ආණ්ඩුවක් හැටියටත් එක්සත් ජාතික පක්ෂය ඉදිරිපත් වෙලා තිබෙනවාය කියන කාරණයත් අපි මතක් කරන්න කැමැතියි.

රට වෙනුවෙන් මේ තරම් වැඩ කරන, මේ රට වෙනුවෙන් ඉදිරිපත් වන අම්මලා මේ රටේ සිටින අභිංසක ළමයින්ගේ අධ්‍යාපනය සඳහා, ඔවුන්ගේ සෞඛ්‍ය සඳහා, ඔවුන්ගේ පැවැත්ම සඳහා ගිහිල්ලා වැඩ කරනවා. ඔවුන් මේ රටට මොන තරම් මුදල් කන්දරාවක් ගේනවාද කියලා කිව්වොත්, 2009දී ඇමෙරිකානු ඩොලර් මිලියන 3,330ක් ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම 2010දී ඇමෙරිකානු ඩොලර් මිලියන 4,116ක් ගෙනැල්ලා තිබෙනවා. 2014දී ඇමෙරිකානු ඩොලර් මිලියන 7,018ක් ගෙනැල්ලා තිබෙනවා. මේ රටේ සංවර්ධනයටත්, මේ රටේ පැවැත්මටත්, ඔවුන්ගේ පවුල්වල නඩත්තුවට සහ පැවැත්මටත් ඒ අභිංසක මවුවරු ඔවුන්ගේ ජීවිත පරදුවට තබලා වැඩ කරලා තිබෙනවා. ඒ නිසා තමයි ඔවුන් මේ තරම් විශාල මුදල් ප්‍රමාණයක් අපේ රටට එවලා තිබෙන්නේ.

ඉදිරි අනාගතයේදී මේ රටේ ඉන්න අභිංසක මව්වරු, ඒ වාගේම දුවා දරුවන් ගෘහ සේවිකාවන් හැටියට, නුපුහුණු ශ්‍රමිකයන් හැටියට මේ රටින් යවන්නට මේ යහ පාලන ආණ්ඩුව බලාපොරොත්තු නොවෙන බව විශේෂයෙන්ම ජාතික යොවුන් පෙරමුණේ සභාපතිවරයා හැටියට මම කියා සිටින්නට ඕනෑ. ඒ යවන සංඛ්‍යාව කෙසේ වෙතත්, ඔවුන් ආරක්ෂා කරන්න අපි ආණ්ඩුවක් හැටියට සැදී පැහැදී ඉන්නවා. ඒ සඳහා අපට ඉතාමත් හොඳ කාර්ය මණ්ඩලයක්, නිලධාරී මණ්ඩලයක් සහ ඇමතිතුමියක් ඉන්නවා. ආණ්ඩුවට ඒ සඳහා අවශ්‍ය ශක්තිය ඇමතිතුමිය ලබා දෙනවා යන කාරණයත් කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 3.42]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයට එක් වන්නට අවස්ථාව මට ලබාදීම පිළිබඳව ඉතාමත්ම සතුටු වනවා.

ගරු අනුර කුමාර දිසානායක අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉතාමත් හොඳ යෝජනාවක් අද ගෙනාවා. යෝජනාවට කරුණු දක්වලා, එතුමන්ලා කිසිවෙක් මේ වේලාවේ මේ ගරු සභා ගැබේ නැහැ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මම ඉන්නවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ඉන්නවාද? මට සමාවන්න. ඔබතුමා එහෙම හිටිය එක හොඳයි. ඔබතුමන්ලාගේ අදහස් හොඳයි. මේ විවාදය අවසානයේදී කරුණු සමාලෝචනය කරන වේලාවේ, අඩු ගණනේ අපේ ඇමතිතුමියගෙන් හරස් ප්‍රශ්නවත් අහන්න. එතකොට තමයි මේ සංවාදය එන්නේ. ඔබතුමා සභා ගැබේ රැඳී සිටීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. මොකද, මම මීට පෙර බැලුවාම ඔබතුමන්ලා සභාවේ හිටියේ නැහැ.

අපි දන්නවා, හොඳ අමාත්‍යතුමියක් මේ අමාත්‍යාංශයට ඉන්නා බව. මව් සෙනෙහස පිළිබඳව දන්නා, කාන්තා අයිතිවාසිකම් පිළිබඳව අත් දැකීම් ලබපු ඇමතිතුමියක්. සමහර වේලාවට යම් යම් දේශපාලන වැඩවලදී එතුමිය කාන්තා හිංසනයටත් ලක් වෙන්නත් ඇති. ඒ නිසා එතුමියට මේ ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. මේ අවුරුද්ද ඇතුළත එතුමිය මේ කාරණය සම්බන්ධයෙන් හොඳ අධ්‍යයනයක් කරලා තිබෙනවා. ඒ වාගේම විශාල වැඩ කොටසක් මේ අවුරුද්දේ ක්‍රියාත්මක කරලා තිබෙනවා. නමුත් ඒවා ඇහැට පෙනෙන දේවල් නොවෙයි.

මේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට ප්‍රමාද වෙලා හෝ අපේ සහෝදර මන්ත්‍රීවරයෙක් ගාල්ල දිස්ත්‍රික්කයෙන් පත්වීම පිළිබඳව අපි සතුටු වෙනවා. කාලයක් තිස්සේ තිබුණු මේ ප්‍රශ්න පිළිබඳව ඉතාම සානුකම්පිතව, සංවේදීව හිතලා, මෙතුන්ලා ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාවේ කරුණු කාරණා සම්බන්ධයෙන් කටයුතු කරන්නට ඒ දෙපළට අවකාශ ලැබෙයි කියා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණයත් සඳහන් කරන්නට ඕනෑ. අද උදැසන සභාව ආරම්භ කරන වේලාවේ මම සභා ගර්භයේ හිටියේ නැහැ. අපේ ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය එතුමියගේ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක් මෙතැනදී කථා කරලා තිබුණා. ඒ වරප්‍රසාද ප්‍රශ්නයෙන් කියලා තිබුණේ, එතුමියට අපහාස වෙන විධියට, කාන්තා හිංසනයක්, පීඩාවක් ඇති වන ආකාරයට මම යම් කිසි කථාවක් පෙරේදා මේ පාර්ලිමේන්තුවේදී කළා කියලායි. මම ඉල්ලීමක් කරනවා, කරුණාකර මේ පිළිබඳ අදාළ හඬ පටිය නැවත අහන්න කියලා. එහෙම ඇහුවාම, මගෙන් යම් කිසි වරදක් වෙලා තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් ඕනෑම දඬුවමකට යටත් වන්න මම ලැහැස්තියි.

මම මව් සෙනෙහසට ඉතාමත්ම ආදරය කෙනෙක්. කාන්තා හිංසනයක් පිළිබඳව නොවෙයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට මම ලංකාවේ කොහේදීවත් කාන්තාවකට බැණ වැදීමක්වත් සිද්ධ කර නැහැ. එතුමිය එවැනි ප්‍රකාශයක් කරන විට මම සභාවේ හිටියා නම් උත්තර දෙනවා. පෙරේදා මම ප්‍රකාශය පාර්ලිමේන්තුවේ කරද්දී එතුමිය විතරයි මෙතැන හිටියේ. තමන්ගේ නම කියන අවස්ථාවේ එතුමියට නැඟී සිට ඒ ගැන කථා කරන්න තිබුණා. වෙනත් වෙනත් ක්‍රමවලින් අද කියනවා, එතුමියට අපහාස වන විධියට කථා කළා කියා. මම එදා කිව්වේ මොකක්ද? "ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියත් පාද යාත්‍රාවේ ගිහිල්ලා හිටියා. ඇවිදලා ඇවිදලා දැන් එතුමියට බොහොම අමාරුයි. දැන් කකුල්, හන්දි පණ නැති වුණාම තෙල් ටිකක් ගාගන්න තමයි වෙන්නේ" කියලායි මම කිව්වේ. ඒක සිංහල දේශීය වෛද්‍ය ක්‍රමයේ එන දෙයක්. එතුමිය නීතිඥවරියක් වුණාට, දේශීය වෛද්‍ය ක්‍රමය ගැන දන්නේ නැහැ. අපි ගම් දනව්වල නම්, හතර හන්දි ටිකක් පණ නැති වෙන කොට, එක්කෝ තෙල් ටිකක් ගාලා අත ගානවා; එහෙම නැත්නම් තවනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක එතුමියට තේරුම් ගන්න බැරි නම්, මේක කාන්තා හිංසනයක් කියලා එතුමිය කථා කරනවා නම් මොනවා කරන්නද? නමුත්, එතුමිය මේ සභාවට ඇවිල්ලා ඊයේ-පෙරේදා කථා කළ හැටි අපි දැක්කා. නායකයන්ට කථා කරන හැටි, අගමැතිතුමාට කථා කරන හැටි, මංගල ඇමතිතුමාට කථා කරපු හැටි මම ළඟ ඉඳන් අහගෙනයි හිටියේ. දැන් ඒවා ගැන කථා කරන්න ඕනෑ නැහැ. දැන් හිතේ අමාරුවට මෙහෙම කියනවා.

පාද යාත්‍රාවට ගිහිල්ලා දැන් අමාරුවේ වැටිලා. දැන් ඒකෙන් කවුරුවත් එන්නේත් නැහැ.මේ මන්ත්‍රීතුමිය දැන් තනි වෙලා. හිතේ අමාරුවට කියන දේවල් නිසා අපට ප්‍රශ්නයක් නැහැ. හිත ටිකක් වෙනස් කර ගෙන ඇවිල්ලා, පුළුවන් නම් ඔබතුමියත් ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එක්ක එකතු වෙලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක්ක එකට එකතු වෙන්න කියලා අපි කියනවා. එවිට මෙවැනි කාන්තා ප්‍රශ්න, විවිධ ව්‍යක්තීය ප්‍රශ්න පිළිබඳව ආණ්ඩු පක්ෂය හැටියට කථා කරලා, අපේ ඇමතිතුමිය එක්කත්, නියෝජ්‍ය ඇමතිතුමා එක්කත් එකට එකතු වෙලා කටයුතු කරන්න ඉදිරි කාලයේදී පුළුවන්කමක් ලැබෙයි කියා මා හිතනවා.

විදේශ රැකියා සඳහා යන අයගේ වැටුප් පිළිබඳවත් මම සඳහන් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඒ ගැන කථා කරලා තිබුණා. ඇත්ත වශයෙන්ම අපි එකඟ වෙන්නේ නැහැ, විදේශ රටකට ගිහින් ලබන මේ වැටුප ගැන. ස්වාමි පුරුෂයෙක් හැටියට මම දන්නවා, බිරිඳකගේ කාර්ය භාරය ගැන. ගෘහණියක් හැටියට, මවක් හැටියට ඇයගෙන් කෙරෙන කාර්ය භාරය පිළිබඳව අපි දන්නවා; අපට අත් දැකීම් තිබෙනවා. අපි කාටවත් ඒවා සල්ලිවලට, මිල මුදල්වලට ගන්නට බැහැ. එම නිසා කාන්තාවන් පිට රට රැකියා සඳහා යනවාට පෞද්ගලිකව මම නම් සම්පූර්ණයෙන් විරුද්ධයි. මොකද, කාන්තාවන් පිට රට රැකියාවලට යාම තුළ ඇති වෙන සමාජ ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්නට ඔබතුමියට පුළුවන්කමක් නැහැ ගරු ඇමතිතුමියනි. සමහර වෙලාවට කුලී ගෙදරක ඉන්න නිසා ගේ හදා ගන්නට, දරුවන්ට කන්න අඳින්නට දෙන්නට, දරුවෝ පාසලට යවන්නට කාන්තාවෝ විදේශ රැකියාවලට යනවා. එහෙම යන විට සමහර බ්‍රෝකර්වරුන් රුපියල් ලක්ෂ එකහමාර, දෙක ගන්නවා. අපටත් කියනවා, "ඔබතුමාටත් ලක්ෂයක් දෙන්න පුළුවන්, විදේශ රැකියාවලට යවන්නට කාන්තාවන් ටිකක් දෙන්න" කියලා. මේක මිනිස් දඩයමක්, කාන්තා දඩයමක්. මතක තියා ගන්න මේක මේ රටේ ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක් බව. සමහර අවස්ථාවලදී බ්‍රෝකර්වරුන් සල්ලි කලින් දෙනවා. මම දන්නේ නැහැ, ඒ මුදල් කොහොම අය කරනවාද කියලා. කාන්තාවක් ගෘහ සේවිකාවක් විධියට යවන විට මුදල් දෙන ආයතන තිබෙනවා. මේක සම්පූර්ණයෙන්ම නතර කරන්නට ඕනෑ. අපට විදේශ විනිමය නාවත් මේ ක්‍රමය සම්පූර්ණයෙන් නතර කරන්නට ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි, විදේශගත වන අයට ලැබෙන වැටුප් ප්‍රමාණවත් නැහැ. ගෙදර ඉඳලා දරුවෝ ටික බලාගෙන, දරුවෝ පාසලට යවලා, හැන්දෑවට ගෙදර ගිහින් අතුපතු ගාගෙන, ඒ කටයුතු කරලාත් අඩුම තරමින් රුපියල් 21,000 - 25,000ක් අතර පඩියකට අපේ ප්‍රදේශවල ඇහලුම් කර්මාන්තශාලාවක සේවයට යන්න පුළුවන්කමක් තිබෙනවා. අද විදේශ රැකියා කරන සමහරුන්ගේ වැටුප රුපියල් 20,000යි, රුපියල් 18,000යි. ඒ නිසා අපි මේ වැටුප ගැන හිතලා අපේ ආකල්ප වෙනස් කරගන්නටත් උත්සාහ කරන්නට ඕනෑ. පවුල් පසු බිම් ගැන වාර්තාවක් ගන්නවා, ඔබතුමියගේ අමාත්‍යාංශයෙන්. නමුත්, විදේශගතවීම මත ඉතාම අවාසනාවන්ත තත්ත්වයට පත් වුණු සමහර අය ඉන්නවා. එම නිසා මේ සඳහා රජයක් හැටියට මැදිහත් වෙන්නට ඕනෑ.

පසු ගිය කාලවල සමහර විදේශ රැකියා ඇමතිවරු විදේශ රටවල රවුම් ගැහුවාට අවසානයේ ඒවායේ ප්‍රතිඵලය ලංකාවට ගෙනාවේ නැහැ. මට හිතෙනවා, ගරු ඇමතිතුමිය ඒ ගැන දන්නවා කියලා. විදේශගත වුණු ශ්‍රමිකයින් හම්බ වුණාම ඒ අය කියනවා, තමන්ගේ තානාපති කාර්යාලවලින් ඒ අයට සලකන ආකාරය ගැන. ඒ අයට කුඩම්මාගේ සැලකිල්ල තිබෙන්නේ. හදිසියක් වුණොත් ඒ අයට සරණක් වෙන්නේ නැහැ. සමහරුන් jailsවල දාලා තිබෙන තත්ත්වයකට පත් වෙලා. තානාපති කාර්යාලයේ කිසිම නිලධාරියෙක් ගිහින් ඒ අයට රැකවරණයක් දෙන්නට උත්සාහ කරන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි, අද සමහර වෙලාවට සමහරු අපට කියනවා, - ඒ අය නීති විරෝධී විධියට යනවාද, ලියා පදිංචි ඒජන්සියකින් යනවාද, කොහොම යනවාද දන්නේ නැහැ. ගියාට පසුව ඇවිත් කියනවා.- "අනේ! මගේ බිරිඳගේ තත්ත්වය ඉතාමත්ම දුක්ඛිතයි" කියලා. සමහරු අපේ ළඟට ඇවිල්ලා අඬනවා. අඬලා කියනවා, එයා ගෙන්වන්න කියලා. අපි එතකොට විදේශ රැකියා ඇමතිතුමියට ලියුමක් යවනවා. පසු ගිය කාලයේ ඒවාට ඉතාම සාධාරණ විසඳුම් අපට ලැබිලා තිබුණා.

ඒ විතරක් නොවෙයි, අපට තවත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි පාසල් ප්‍රශ්නය. පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේදී වෛද්‍යවරුන්ට, ඉංජිනේරු මහත්වරුන්ට, රාජ්‍ය පරිපාලන සේවයේ ඉහළ නිලධාරීන්ට විදේශයක ඉඳලා ආවත්, මේ රටේ

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

හිටියත් හොඳ වරප්‍රසාද ලැබෙනවා. සමහර වෙලාවට quota එකක් තිබෙනවා. නමුත් අද කාන්තාවක් ගෘහ සේවිකාවක් වශයෙන් විදේශ රැකියාවකට ගියාම අවසානයේ ඒ අයගේ දරුවන්ට යන කල දසාව මොකක්ද? ඒ දරුවන්ට පාසලක් දෙන්න පුළුවන්කමක් තිබෙනවාද? සාමාන්‍යයෙන් ගමේ ගොඩේ ළමයි 25ක් 30ක් ඉන්න පාසලකට ඇතුළත් කරනවා.

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ගිණුම් කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් මම සිටියදී, අපි හම්බන්තොට වාගේ දිස්ත්‍රික්කවල පාසල්වල යම් යම් ක්ෂේත්‍ර පරීක්ෂණ කළා. ඉතාම කනගාටුයි. එම පාසල්වල ඉන්න ළමුන් සංඛ්‍යාව නාම ලේඛනයේ සිටින ළමුන් සංඛ්‍යාව නොවෙයි. නාම ලේඛනයේ ළමුන් 40ක් හිටියොත්, ඒකෙන් 10ක් පාසලට එන්නේ නැහැ. මොකද, මේ ප්‍රදේශවල එක්කෝ අම්මා, තාත්තාව අත් හැරලා ගිහින්, එහෙම නැත්නම් තාත්තා විතරයි ගෙදර ඉන්නේ. සමහර වෙලාවට අම්මා ගෘහ සේවිකාවක් විධියට විදේශ රැකියාවකට ගිහින්. එම නිසා දරුවෝ පාසලට එන්නේ නැහැ. එම නිසා අපි කියනවා, පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේදී අලුත් ක්‍රමයක් ඇති කළ යුතුයි කියලා. අනෙක් අයට quota එකක් දෙනවා නම් කරුණා කරලා විදේශගත ගෘහ සේවිකාවන්ගේ දරුවන් වෙනුවෙනුත්, -ඒක බරපතළ ප්‍රශ්නයක් වෙයි.- අඩුම තරමින් සාධාරණ නිර්ණායකයක් හරහා අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. මේ වාගේ සමාජ ප්‍රශ්න ගණනාවක් අද තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී නොයෙක් වැඩ පිළිවෙළවල් සිදු වෙයි. විශ්‍රාම වැටුප්, රක්ෂණ ආවරණ යෝජනා ක්‍රම වාගේ ඒවා ඇති වෙයි.

පසු ගිය කාලය තුළ විශාල වන්දි ප්‍රමාණයක් ගෙවලා තිබුණා, විදේශගතව සිට අතුරු දහන් වුණු, මිය ගිය සහ නොයෙකුත් කරදරවලට මුහුණ දුන් අය වෙනුවෙන්.

අද තිබෙන අනික් ප්‍රශ්නය මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විදේශගත වුණු අය ගැන පසු ගිය කාලයේ අහන්න ලැබුණු කරුණු, කාරණා දිහා බැලුවාම අපට පෙනෙනවා, ඒ සමහර ඒවා ඉතාම බරපතළ බව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
හොඳයි. මට තව විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අවසන් කරන්න කියා කියන කොටම කථාව අවසන් කරන්න අමාරුයි. එක පාරටම කාරණය කියලා අවසන් කරන්න වෙනවා නේ. ඒ ගැන සමාවන්න.

විදේශගත වුණු අය අතරේ විශේෂයෙන්ම දරුණු බෙදවාචකයන්ට ලක් වන පිරිස් ඉන්නවා. පහරදීම් සහ වෙනත් නොයෙක් හිංසන කරලා අවසානයේ ලෙඩුන්, අබ්බගාතයන් බවට පත් වෙලා එන අයත් ඉන්නවා. Agencies මාර්ගයෙන් පිට රටවලට යවනවා නම් ඒ අයට යම් රැකවරණයක් සලසා දිය යුතුයි. ඒ අයට හදිසියේ තමන්ගේ අයට කථා කරන්න විධියක් නැහැ. දුරකථන පණිවුඩයක් දෙන්න සමහර විට ඒ ගෙහිමියන් ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා කථා කරන්න විධියක් නැහැ. හොරෙන් ලියුමක් එවලා, ලංකාවට ආවාට පසුව තමයි යම් යම් දේවලට සහන ලැබෙන්නේ; ක්‍රියාමාර්ග ගන්නේ. ඒ නිසා ඒ සඳහා යම් ක්‍රමවේදයක් හදන්න කියා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමියනි, අද කොරියාව වැනි රටවල ගොඩක් දුක් විඳලා, මහන්සි වෙලා වැඩ කරන අය ඉන්නවා. එයින් ඔවුන්ට රුපියල් ලක්ෂ දෙකක් තුනක් මාසයකට හම්බකරන්න පුළුවන්. නමුත්, අප එහේ ගියාම ඒ අය කළ ඉල්ලීමක් තමයි, "අපටත් අඩු ගණනේ වාහන permit එකක්වත් දෙන්න, අවුරුදු ගණනක් දුක් විඳලා වැඩ කරලා ඇවිත් වාහනයක් ගන්නත් ලොකු මුදලක් දෙන්න වෙනවා, ඒ නිසා අඩු ගණනේ යම්කිසි සියයට ගණනකවත් සහනයක් සැලසෙන වාහන බලපත්‍රයක් අපට දෙන්න" කියන එක. "අප සල්ලි හම්බ කරනවා, ගෙවල් හදනවා, නමුත් ලංකාවට ගිහින් අප වාහනයක් ගත්තොත් අවුරුදු ගණනක් තිස්සේ ඉතිරි කළ මුදල ඒකට වියදම් කරන්න සිද්ධ වෙනවා" කියාත් ඒ අය අපට කිව්වා.

අවසාන වශයෙන් අපේ ගරු අමාත්‍යතුමියටත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටත් මගේ ස්තුතිය පුද කර සිටිනවා. විදේශ රැකියා දෙන කොට අපටත් එකක් දෙකක් බෙදා දෙන්න කියාත් මා ඉල්ලා සිටිනවා. මොකද, යම් යම් දේවල් සඳහා විදේශ රැකියා අවස්ථා එනවා. අප දන්නේත් නැහැ. සමහර තැන්වලින් ඒ සඳහා ශ්‍රමිකයන් යවනවා. මේ රටේ හොඳ රැකියා සඳහා අවශ්‍ය වටපිටාවක් හදන්න කියා මම ඉල්ලීමක් කරනවා. අපේ ශ්‍රමිකයන් ජපානය, කොරියාව වැනි රටවලට යවන්න පුළුවන් පහසුකම් තව වැඩිදියුණු කරන්න. ඒ වාගේම සාක්ෂරතාව වැඩි නිසා විශේෂයෙන්ම ලංකාවේ අය බඳවා ගන්න කැමැති විවිධ රටවල් අද තිබෙනවා. එවැනි වැඩ පිළිවෙළකට ගිහින් මේ ක්ෂේත්‍රය දියුණු කරන්න. මේ වන විට මේ රටේ විදේශ ආදායම අප ඉහළ මට්ටමකට ගෙනැවිත් තිබෙනවා. තේ, රබර්, පොල් මත යැපුණු අපේ රටේ ආර්ථිකය අද ඇහලුම් සහ විදේශ රැකියාවලින් ලැබෙන ආදායම භුක්ති විඳින තත්ත්වයට පත්කර ගන්න ඉවහල් වුණු මේ වැඩ පිළිවෙළ සාර්ථක කරගන්න, මේ අඩු පාඩුකම් ටික සම්පූර්ණ කරගෙන කටයුතු කරන්න ඉදිරියේදී අපට පුළුවන්කමක් ලැබෙයි කියා මා විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය පුද කරමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 3.53]

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම සම්බන්ධව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. විදේශ රැකියා නියුක්තිකයන් මුහුණ දෙන ගැටලු සම්බන්ධව විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගැන වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා.

අපේ ගරු තලතා අතුකෝරල ඇමතිතුමියගේ නායකත්වයෙන්, මනුෂ නානායක්කාර නියෝජ්‍ය ඇමතිතුමාත් මැතකදී එකතු වෙලා මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු ඉතාම හොඳින් කරගෙන යනවා. අපේ විදේශගත ශ්‍රමිකයන් ගැටලුවලට මුහුණ දෙන කරුණු, කාරණා ගැන අද ගොඩක් වාද විවාද වුණා. ඔවුන්ගේ ප්‍රශ්න ගැන කථා කළා. මේ ප්‍රශ්න අද ඊයේ ඇති වූ ප්‍රශ්න නොවෙයි. මේවා කාලාන්තරයක් මුළුල්ලේ ඇති වුණු ප්‍රශ්නයි. මේවා ක්‍රම ක්‍රමයෙන් දැන් ගොඩක් දුරට අඩු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කළ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ පක්ෂයේම ඉන්න විජිත හේරත් මැතිතුමා සමඟ මමත් මේ කරුණු සම්බන්ධව සොයා බලන්න 2002 වසරේ රටවල් කීපයකට ගියා. අප මෙහේ කම්කරු අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව නියෝජනය කරමින්

ගිහින් තමයි මේ ගැන සොයා බැලුවේ. ඒ රටවල ශ්‍රමිකයන් වශයෙන් සේවය කරන අපේ රටේ කාන්තාවන් මුහුණ දෙන්නා වූ දුක් ගැහැට සම්බන්ධව අප සොයා බැලුවා. අප ලෙබනන් රටට ගියා; ජෝර්දානයට ගියා; සවුදි අරාබියට ගියා. ඒ විධියට අප රටවල් රාශියකට ගියා. ඒ සමහර රටවල නොයෙකුත් පීඩාවලට ලක් වුණු අපේ රටේ කාන්තාවන් විශාල සංඛ්‍යාවක් හිටියා. ඒ අය වෙනුවෙන් තිබුණු safe houses කියන ඒවා තිබුණේ පාරවල් යටයි. ඒවායේ සිටි සමහර අයගේ අත්, කකුල් කැඩිලා, සමහර අය එක එක වධ හිංසාවලට ලක් වෙලා තිබුණු ආකාරය අපට දකින්න ලැබුණා. අප ඒ සියල්ලම මෙහාට වාර්තා කළා. ඒ කාලයේ විදේශගත වන කාන්තාවන්ට, නැත්නම් කවුරු හෝ ඇවිත් රට යන්න උදව්වක් ඉල්ලුවොත් මට පුළුවන් ආකාරයෙන් උදවු උපකාර කළා. නමුත්, එදායින් පසුව මා තීරණය කළා කාන්තාවක් විදේශගත වෙන්න උපකාර ඉල්ලුවොත් මම නම් කිසිම දවසක එය කරන්නේ නැහැ කියා. දැනට අවුරුදු දහයක් පමණ වෙනවා. මේ වන තෙක් මම එවැනි කෙනෙකුට ඒ කිසිම උදවුවක් කළේ නැහැ. අපේ කාන්තාවන් විදේශගත වන එකට මම නම් තදින්ම විරුද්ධයි කියන එක විශේෂයෙන්ම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. ඒ දුක් වේදනා ගැන මම විශේෂයෙන්ම දන්නවා.

අනික් කාරණය මේකයි. මේ විදේශගත වුණු අය අද ගැටලු රාශියකට මුහුණ පානවා. සමහර අය, කඳවුරුගත වෙලා ඉන්නවා; සමාජ විරෝධී ක්‍රියාවන්ට යොමු වෙලා ඉන්නවා; රැකියා අහිමිවීම් සම්බන්ධ ප්‍රශ්න ඇති කර ගෙන තිබෙනවා; සිය දිවි හානිකර ගන්නවා; ව්‍යාජ රැකියා නියෝජිතයන්ට හසු වෙලා නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙනවා; ඒවායින් බේරෙන්න කනකර, ගෙවල්, ඉඩකඩම් උගස් තියලා රටේ නැති ප්‍රශ්නවලට මැදි වෙලා ඉන්නවා; නොයෙකුත් රෝගවලට ගොදුරු වීමේ ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙනවා. සමහර අයට වැටුප් නොලැබීමේ ප්‍රශ්න තිබෙනවා. වැටුප් නොලැබීම තුළින් පවුලේ අය අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඇතැම් අය විවිධ වද හිංසාවලට ලක් වනවා. සමහර තැන්වල තම පවුලේ ඥාතීන් සමඟ කිසි සම්බන්ධතාවක් තබා ගැනීමට හාම්පුතුන් ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා සමහර පවුල් ඒකක සම්පූර්ණයෙන් විනාශ වෙලා තිබෙනවා. දරුවන්ට මව අහිමිවීම්, ස්වාමියාට බිරිඳ අහිමි වීම්, කුඩා අවධියේම ළමුන් අපචාරවලට ගොදුරු වීම් හා දූෂණයට ලක් වීම යන කාරණා නිසා විදේශගත වන කාන්තාවන්ගේ ජන ජීවිතය සම්පූර්ණයෙන්ම අඩාළ වෙලා තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමියනි, ඉදිරියේදී මේ ප්‍රශ්නවලට විසඳුම් වශයෙන් යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. පසු ගිය දිනක ඔබතුමිය ප්‍රකාශයට පත් කර තිබුණා, "ඉදිරියේදී සවුදියේ රැකී රක්ෂා අහිමිවන තත්ත්වයකට ඉඩ තිබෙනවා" කියලා. මම දැක්කා පත්තරේක තිබෙනවා. එම නිසා මේ සඳහා විකල්ප වැඩ පිළිවෙළක් අපි දේශීය වශයෙන් ඇති කර ගත යුතුයි.

රැකියා අහිමි වූ දොළොස්දෙනෙකු ලංකාවට දැන් එවලා තිබෙනවා. තව 100දෙනෙක් රැකියා අහිමිවීම පිළිබඳ ගැටලුවට මුහුණ දීලා තිබෙනවා කියලාත් ප්‍රකාශ කර තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබෙන නිසා මා යෝජනාවක් හැටියට මේ කාරණය ඉදිරිපත් කරනවා. අපේ රටේ සමහර පළාත්වල විශාල මුඩු ඉඩම් තිබෙනවා. ඒ මුඩු ඉඩම් අපට ප්‍රයෝජනයට ගන්න පුළුවන්. දැන් කෘත්‍රිම මල් වර්ග, කෘත්‍රිම භාණ්ඩ වර්ග විශාල ප්‍රමාණයක් මේ රටට ගෙන්වනවා. අපේ රටේ මල් වර්ග වගා කරන්න පුළුවන් හොඳ භූමි තිබෙනවා. ඒ ප්‍රදේශ තෝරා ගෙන, සංවිධානාත්මක වැඩ පිළිවෙළක් ඇති කරලා, අදාළ අමාත්‍යාංශවලට වැඩ කොටස් භාර දුන්නා නම්, අපට රැකියා අවස්ථා බිහි කරන්න පුළුවන්. එමඟින් කාන්තාවන්ගේ රැකියා ප්‍රශ්නයටත් යම්කිසි විසඳුමක් ලබා දෙන්න පුළුවන්.

දැන් බලන්න, එක් ග්‍රාම නිලධාරි වසමකට රජයෙන් පත් කරලා තිබෙනවා නිලධාරීන් හත්දෙනෙක්. ග්‍රාම නිලධාරි, සමෘද්ධි නිලධාරි, ගොවි නියාමක, සංවර්ධන නිලධාරි, පවුල් සෞඛ්‍ය සේවිකාව හා පොලිස් නිලධාරීන් දෙදෙනෙක්. ඔක්කෝම හත්දෙනෙක් ඉන්නවා, එක වසමක. ඒ හත්දෙනාට රජයෙන් කොපමණ වැටුප් ගෙවනවාද? සාමාන්‍යයෙන් එක වසමක තිබෙන්නේ පවුල් 600ක් හෝ 700ක්. ජනගහනය 2,500ක් විතර ඇති. භූමි ප්‍රමාණය පොඩියි. මේ රටේ ග්‍රාම නිලධාරී වසම් 12,000ක් හෝ 13,000ක් විතර තිබෙන්නේ. ඒ අයට වැටුප් වශයෙන් මෙච්චර විශාල මුදලක් ගෙවද්දීත්, සංවිධානය වෙලා මේ ටික ගොඩ නහන්න පුළුවන් තත්ත්වයක් තිබෙද්දී, ඇයි යම්කිසි වැඩ පිළිවෙළක් යොදන්න මේ අමාත්‍යාංශ කටයුතු නොකරන්නේ? මේවාට අමතරව පාසල්, රෝහල් වැනි ආයතන ගොඩ නහන්න රජයෙන් විශාල වශයෙන් මුදල් වෙන් කරනවා. මහාමාර්ග දියුණු කරන්න උදවු උපකාර කරනවා. රට ඒ තත්ත්වයට ගෙනෙන්න ආණ්ඩුවෙන් කටයුතු කරනවා නම්, ඒ අයට මේ වැඩ පිළිවෙළ යොදන්න බැරි ඇයි? එක එක අමාත්‍යාංශ යටතේ ඉන්න අය තමයි මේ සේවකයෝ. අපි එක අවුරුද්දක් හෝ දෙකක් යම්කිසි මහන්සියක් ගත්තොත් මේ රට බලා ඉන්දැද්දි ගොඩ නහන්න පුළුවන් -උඩට ගන්න පුළුවන්- තත්ත්වයක් ඇති වනවා. අපේ රට ඉතාම හොඳ රටක්. මේ රට වැඩි කාලයක් යන්න මත්තෙන් ඉදිරියට ගෙනෙන්න පුළුවන් බව මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

නුපුහුණු අයට පුහුණුව ලබා දෙන්න දැන් රජයෙන් විවිධ ආයතන ඇති කර තිබෙනවා. තරුණ තරුණියන් වෙනුවෙන් ජාතික යොවුන් සේනාංකය වාගේම ව්‍යාත්තීය පුහුණු මධ්‍යස්ථාන ඇති කරලා තිබෙනවා. ඒ වාගේ නොයෙකුත් ආයතන ඇති කරලා තිබෙනවා. ඒ ආයතන ඇති කරලා තිබෙන්නේ, පුහුණුව ලබා දීලා අවබෝධයක් ලබා දෙන්න ඕනෑ නිසායි. අපි පිට රට ගිය වෙලාවේ අපි ගිහින් එක නිවසක් බැලුවා. ඒක තට්ටු හතරක නිවසක්. ඒ නිවසේ උඩ තට්ටුවට ගෑස් සිලින්ඩරය උස්සාගෙන යන්න ඕනෑ, මේ විදේශගත වන කාන්තාවන්. Lifts එහෙම නැහැ. ඒවා අපි දැක්කා. විදේශගත වන කාන්තාවක් හොඳ ලස්සනට මෙහෙන් යන්න ඕනෑ කියලා දැන් ප්‍රමිතියෙන් උසස් බෑග් එකක් දෙනවා. ඉස්සර එහෙම නොවෙයි. පොලිතින් බෑග් එකක මොනවා හෝ ටිකක් දා ගන්නවා; ඒක අර ගන්නවා; යනවා. ඒ විධියට තමයි විදේශගත වුණේ. කිසිම වැඩ පිළිවෙළක් ඇතිව නොවෙයි අපේ රටේ කාන්තාවන් එදා විදේශගත වුණේ. ඉතින් ඒ නිසා තමයි මේ තත්ත්වයෙන් අපේ කාන්තාවන් පිළිගන්නේ.

අපේ රටේ කථාවක් තිබෙනවා කාන්තා පක්ෂය වැඩියි කියලා. මම කාන්තාවන් ගැන අභිතකින් මේ කාරණය කියනවා නොවෙයි. අපේ රටේ සියයට 53ක් වන කාන්තාවන් වෙනුවෙන් විශේෂ වැඩසටහන් රාශියක් ඇති කරලා, මේ රට දියුණුව කරා ගෙනයන්න පුළුවන් කියන විශ්වාසය මා තුළ තිබෙනවා. අපි ගමේ ඉපදිලා, ගමේ හැදීවැඩී මෙතැනට ආපු අය. ගමක ඉඳලා ආපු මන්ත්‍රීවරයකු හැටියට මම කියන්න ඕනෑ, ගම දියුණු කරගෙන ඉදිරියට යන්න පුළුවන් වුණොත් අපට ඒ ගැන සතුටු වෙන්න පුළුවන් කියන කාරණය.

වතුකරය ගත්තාම, වතුකරයේත් මේ වාගේ ප්‍රශ්න රාශියක් තිබෙනවා. ඉස්සර වාගේ දැන් වතුකරයේ වැඩ නැහැ. තේ දලු සම්බන්ධයෙන් වතුකරයේ බොහොම භයානක තත්ත්වයක් තිබෙන්නේ. දැන් නම් තේ දලු මිල ටිකක් හොඳ තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. දැන් වතුකරයේ තරුණ තරුණියන් විශාල පිරිසක් නගරයට ඇවිල්ලා යම් යම් වැඩ කටයුතු කරනවා. ඒ වාගේම විදේශගත වෙලා ඉන්නවා. ඒ සමහර අයගේ අම්මා, අප්පා නැහැ; සමහර අයගේ බිරිඳ නැහැ; සමහර අයගේ සැමියා නැහැ. ඒ වාගේ නොයෙකුත් ප්‍රශ්න රාශියකට වතුකරය මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා වතුකරයේ ජනතාවටත් මේ ප්‍රශ්නය තදින්ම බලපා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් විශේෂ වැඩ

[ගරු කේ.කේ. පියදාස මහතා]

පිළිවෙළක් යොදන්න ඕනෑ. ඒ නිසා රැකීරක්ෂා සඳහා විදේශගතවන ශ්‍රමිකයන් සඳහා මීට වඩා ක්‍රමවත් වැඩ පිළිවෙළක් ගෙනයයි කියලා මා විශ්වාස කරනවා.

ගරු ඇමතිතුමිය දක්ෂ අන්දමින් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා, ඒ ශ්‍රමිකයන්ට මේ රටට ඇවිල්ලා අභිමානයෙන්, හොඳින් ජීවත්වෙන්න පුළුවන් තත්ත්වයක් ඇති කරයි කියන විශ්වාසය තිබෙනවා. අපේ මේ ආණ්ඩුවේ කාල සීමාව අවසන් වෙන්න ප්‍රථම අපේ රටේ කාන්තාවන් රැකියා සඳහා විදේශගතවීම වළක්වා ගැනීමට කටයුතු කරන්න ඕනෑ. ඒ අය මේ රටේම රඳවාගැනීමට ඵලදායී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට ඔබතුමියට ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරන අතර, ඔබතුමියට සුබපතමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළහට අ. අරවින්ද් කුමාර් මන්ත්‍රීතුමා.

[පි.ප. 4.03]

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(මාණ්පුමිකු අ. අරවින්ද් කුමාර්)
(The Hon. A. Aravindh Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று வெளிநாடுகளில் தொழில்புரிவோர் எதிர்நோக்கும் பிரச்சினைகள் தொடர்பாகக் கொண்டுவரப்பட்ட ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் எனது கருத்தையும் கூறுவதற்கு வாய்ப்பளித்த உங்களுக்கு முதற்கண் நன்றி கூறக் கடமைப்பட்டிருக்கின்றேன்.

இன்று எமது நாட்டிலிருந்து இலட்சக்கணக்கான ஆண்களும் பெண்களும் வெளிநாட்டு வேலை வாய்ப்பைப் பெற்றுச் செல்கின்றார்கள். இதில் மத்திய கிழக்கு நாடுகளுக்குச் செல்லும் ஆண்களும் பெண்களும் பல்வேறு பிரச்சினைகளுக்கு முகங்கொடுப்பதை நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. விசேடமாகப் பெண்கள் முகங்கொடுக்கும் பிரச்சினைகள் மிகவும் மோசமாக இருப்பதை நாங்கள் அன்றாடம் தெரிந்துகொள்ளக் கூடியதாக இருக்கின்றது. மக்கள் பிரதிநிதிகள் என்ற வகையிலே அவர்கள் முகங்கொடுக்கும் பிரச்சினைகள் தொடர்பாக அவர்களது குடும்ப அங்கத்தவர்கள் எம்மை வந்து சந்திப்பதன் மூலமும் பத்திரிகைகளிலே வருகின்ற செய்திகளைப் படிப்பதன் மூலமும் நாம் அறிந்துகொள்கின்றோம். இன்று இந்த விடயம் ஒரு சர்வசாதாரண விடயமாக நடைபெற்றுக்கொண்டிருக்கின்றது.

விசேடமாக இங்கிருந்து மத்தியகிழக்கு நாடுகளுக்கு வேலை வாய்ப்பைப் பெற்றுச் செல்பவர்கள் போவதற்கு முன்னர் ஓர் ஒப்பந்தத்தைச் செய்கின்றார்கள். அந்த ஒப்பந்தத்திலே பல்வேறு விடயங்கள் குறிப்பிடப் பட்டிருக்கின்றன. அதாவது, அவர்கள் தொழில் செய்யும் இடம், அவர்களது தொழில் தருநரின் பெயர், விலாசம், அந்த வீட்டின் தொலைபேசி இலக்கம், அவர்களுக்கு எவ்வளவு சம்பளம் போன்ற விடயங்கள் அதில் குறிப்பிடப்பட்டிருக்கின்றன. அந்த ஒப்பந்தத்தின் அடிப்படையிலேதான் இவ்வாறு வெளிநாட்டு வேலைவாய்ப்பைப் பெற்றுச் செல்கின்றார்கள். ஆனால், அங்கே போனபிறகு என்ன நடக்கின்றது என்று பார்த்தால், அந்த ஒப்பந்தத்திலே குறிப்பிடப்பட்டிருக்கும் எந்த ஒரு விடயமும் அங்கே அமுல்படுத்தப்படுவதில்லை. தொழில் செய்யும் விலாசம் வித்தியாசமாக இருக்கும். தொழில் தருநர் அதாவது எஜமானர் வேறு ஒருவராக இருப்பார். குறிப்பிடப்பட்ட சம்பளம் கொடுக்கப்படுவதில்லை. இவ்வாறு பல்வேறு பிரச்சினைகளுக்கு இவர்கள் முகங் கொடுக்கின்றார்கள். அந்த எஜமானரோடு ஏதோ ஒரு காரணத்திற்காக இவர்கள் வாக்குவாதப்பட்டால் அல்லது தங்களது எதிர்ப்பைக் காட்டினால், இவர்கள் பல்வேறு விதமான பிரச்சினைகளுக்கு முகங்கொடுக்கவேண்டிய துர்ப்பாக்கிய நிலை ஏற்படுகின்றது. விசேடமாகப் பெண்கள் பல்வேறு தொல்லைகளுக்கு முகங்கொடுக்கின்றார்கள். பாலியல் ரீதியான தொல்லை, ஒவ்வொரு நாளும் மிக நீண்ட நேரம் வேலை செய்யவேண்டிய நிலைமை, அடிமைகள்போல் நடத்தப்படும் நிலைமை, மனிதநேயம் இல்லாமல் நடத்தப்படும் நிலைமை என்று பல்வேறு பிரச்சினைகளுக்கு அவர்கள் முகம்கொடுக்கின்றார்கள். அதுமாத்திரமல்ல, அங்கு செல்கின்ற ஆண்களும் இவ்வாறான பிரச்சினைகளுக்கு முகம்கொடுக்கின்றார்கள். ஆகவே, நாங்கள் இந்த விடயத்தில் மிகக் கரிசனையோடு செயற்படவேண்டிய தேவை எற்பட்டிருக்கின்றது.

விசேடமாக பெண்களைப் பொறுத்தளவிலே, அவர்கள் மனிதநேயமின்றி நடத்தப்படுகின்றார்கள். பொதுவாக நான், பெண்கள் வீட்டுப் பணிப்பெண்களாக வேலைவாய்ப்பைப் பெற்றுச்செல்வதை முழுமையான எதிர்ப்பவன். எனக்கு அதிலே உடன்பாடு கிடையாது. பெண்கள் அவ்வாறு போகவேண்டிய அவசியம் இல்லை. ஏனெனில், ஆண்களைப்போல எதிலும் எதிர்த்துநிற்கக்கூடிய சக்தி அவர்களுக்கு இல்லை. மனதளவிலே மிகவும் மென்மையானவர்கள் பெண்கள். இவ்வாறானவர்கள் வெளிநாட்டுக்குப் போகும்போது, இதற்கு முன்பு அறியாத, தெரியாத இடத்துக்குச் செல்கின்றார்கள். அங்கு அவர்கள் பல்வேறு தொல்லைகளுக்கு முகம்கொடுக்கவேண்டி யிருக்கின்றது. அவ்வாறான சந்தர்ப்பத்தில் அவர்களைக் காப்பாற்றுவதற்குக் கடவுளால் மாத்திரமே முடியும் என்ற நிலைமை இருக்கின்றது. எங்களுடைய பெண்கள் வேலைவாய்ப்புக்காக வெளிநாடுகளுக்குப் போவதற்குக் காரணம், வீட்டிலுள்ள பொருளாதார நிலைமை. வீட்டிலுள்ள பொருளாதாரச் சுமையைக் குறைத்து, தங்களது குடும்பத்தை உயர்த்தவேண்டும் அல்லது பொருளாதாரச் சுமையிலிருந்து தனது குடும்பம் மீளவேண்டும் என்ற ஒரே நோக்கத்துக்காகவே அவர்கள் வெளிநாட்டுக்குப் போகின்றார்கள். அவர்கள் வெளிநாடுகளுக்குச் செல்வதைத் தடுக்கவேண்டுமென்றால் - அவர்கள் வெளிநாட்டு வேலைவாய்ப்பைப் பெற்றுச்செல்வதை நிறுத்தவேண்டுமென்றால், அதற்கு நிகரான வருமானத்தைப் பெறக்கூடிய வகையில், நாங்கள் இங்கே அவர்களுக்குத் தொழில் வாய்ப்புக்களை ஏற்படுத்திக் கொடுக்கவேண்டும். அவ்வாறு வாய்ப்புக்களை ஏற்படுத்திக்கொடுத்தால் மாத்திரமே, பெண்கள் வெளிநாட்டுக்குச் செல்வதை எங்களால் தடுக்கமுடியும்; கட்டுப்படுத்த முடியும்.

தோட்டப்புறப் பெண்கள் இந்த நாட்டிலே சுதந்திரமாக, நல்ல வருமானத்தைப் பெற்று வாழக்கூடிய ஒரு சூழலை உருவாக்கவேண்டும்; அதற்கான திட்டங்களை வகுக்க வேண்டும். இன்று எமது நாட்டிலே வெளிநாட்டு வேலைவாய்ப்புக்குப் பொறுப்பான அமைச்சராக இருப்பவர் கௌரவ தலதா அத்துகோரல என்ற பெண்மணிதான். அதேபோல், மகளிர் மற்றும் சிறுவர் அலுவல்களுக்குப் பொறுப்பாக இன்னுமொரு பெண்மணி அமைச்சராக இருக்கின்றார். இவர்கள் இருவரும் இணைந்து, இலங்கையிலிருந்து வெளிநாடுகளுக்குச் செல்லும் வீட்டுப்

பணிப்பெண்கள் முகங்கொடுக்கின்ற துன்பதுயரங்களைத் தடுப்பதற்கு நல்ல திட்டங்களைத் தயாரித்து அமுல் படுத்தினால், இவ்வாறான பிரச்சினைகளைக் குறைக்கமுடியும்.

அதுமாத்திரமல்ல, தற்போது வெளிநாட்டு வேலை வாய்ப்பைப் பெற்றுச்செல்ல விரும்பும் தோட்டப்புறப் பெண்மணிகளுக்கு ஓர் இக்கட்டான நிலைமை ஏற்பட்டிருக்கின்றது. தோட்டப்புறப் பெண்மணிகள் வெளிநாட்டு வேலைவாய்ப்பைப் பெற்றுச்செல்ல வேண்டும் என்ற நிலைப்பாட்டை எடுத்தால் அல்லது விரும்பினால், அவர்கள் தோட்ட அதிகாரிகளின் ஒப்புதலை - அனுமதியைப் பெறவேண்டும். தோட்ட அதிகாரி அனுமதித்தால் மாத்திரமே, பெண்கள் வெளிநாடுகளுக்குப் போகமுடியும். இப்படியான சந்தர்ப்பங்களில், தோட்ட நிர்வாகிகள் - தோட்ட அதிகாரிகள் தோட்டத்தில் கொழுந்து பறிப்பதற்கு பெண்கள் தேவை என்ற காரணத்துக்காக ஒப்புதல் கொடுப்பதில்லை. நான் இதனை ஓர் அப்பட்டமான மனித உரிமை மீறலாகப் பார்க்கின்றேன். ஒருவரது அடிப்படை உரிமையை மீறும் ஒரு செயலாகப் பார்க்கின்றேன். ஒரு பெண்மணிக்கு வெளிநாட்டு வேலைவாய்ப்பைப் பெற்றுச்செல்வதற்கான வாய்ப்பும் உரிமையும் இருக்கவேண்டும். அதனை எவராலும் தடுக்கமுடியாது. ஆனால், தோட்ட அதிகாரிகள் அவ்வாறு தடுக்கின்றார்கள். வெளிநாட்டு வேலைவாய்ப்பைப் பெற்றுசெல்ல விரும்பும் அவ்வாறான பெண்மணிகள் எங்களிடம் வந்து, தோட்ட அதிகாரிகளிடம் பேசித் தங்களுக்கு அனுமதியைப் பெற்றுத்தருமாறு கெஞ்சிநிற்கும் நிலைமை மலையகத்திலே இருக்கின்றது. இதனைத் தடுக்கவேண்டும்.

நான் இது சம்பந்தமாக இதற்குப் பொறுப்பாக இருக்கின்ற கௌரவ அமைச்சர் தலதா அத்துகோரல அவர்களிடம் கேட்டேன். அதற்கு அவர், "இது சம்பந்தமாக ஒரு சுற்றறிக்கை தோட்டங்களுக்கும் மாவட்டச் செயலாளருக்கும் பிரதேச செயலாளருக்கும் அனுப்பப்பட்டிருக்கின்றது; தோட்டப்புறப் பெண்மணிகள் வெளிநாட்டு வேலை வாய்ப்பைப்பெற்று வெளிநாடு செல்லவேண்டுமென்றால் அவர்கள் தோட்ட அதிகாரியின் ஒப்புதலைப் பெறவேண்டும்" என்று அந்தச் சுற்றறிக்கையிலே சொல்லப்பட்டிருப்பதாக என்னிடம் சொன்னார். இதை நான் ஏற்றுக்கொள்வதற்குத் தயாராக இல்லை. ஒவ்வொருவரும் வெளிநாட்டுக்குச் செல்வதற்குப் பல்வேறு கட்டுப்பாடுகள் இருக்கின்றன; பல்வேறு நிபந்தனைகள் இருக்கின்றன. அவற்றுக்குட்பட்டுத்தான் அவர்கள் போகவேண்டும்; அதில் மாற்றுக் கருத்திற்கிடமில்லை. ஆனால், "தோட்ட அதிகாரியின் ஒப்புதல் பெறவேண்டும்" என்று சொல்வதை நான் எந்த வகையிலும் ஏற்றுக்கொள்வதற்குத் தயாராக இல்லை என்பதை இந்த உயரிய சபையிலே கூறிக்கொள்ள விரும்புகின்றேன். ஏனெனில், தனிமனித சுதந்திரம் இருக்கவேண்டும். வெளிநாட்டு வேலை வாய்ப்பைப் பெற்றுச் செல்வதற்குரிய உரிமை அந்தப் பெண்களுக்கு இருக்கவேண்டும். எனவே, இந்த நிபந்தனையை நீக்குவதற்கான நடவடிக்கையை அல்லது அந்தச் சுற்றறிக்கையினை வாபஸ் வாங்கும் செயற்பாட்டைக் கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ள வேண்டுமென்று இந்த இடத்திலே விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

அதுமாத்திரமல்ல, சில காலத்திற்கு முன்பு - Some time back, I attended the ILO Conference held in Geneva, Switzerland. At that Conference when the topic on migrant labour was taken for discussion, I tabled a document stating our grievances. I told them as to how our women are ill-treated and how they are sexually harassed in the Middle-East countries. The Labour Minister of Lebanon who was present there was very angry over my statement. He stood up and said very angrily, "Ah, you are from the housemaids' country." That is how he started. In a very sarcastic manner, he said that I am from the housemaids' country. I just kept quite and allowed him to go ahead with his remarks. Then he said, "Our men need not go after the dirty Sri Lankan women." This is how he stated in that open forum. Then, I said, "It is not your young men, but the culprits are your old men who are in the houses. They are the ones who abuse our women in your houses. You have no backbone to stop their misconduct; you have no backbone to question them. Your old men are the culprits." Then, he was very much ashamed. After the Conference, we met at the tea break. He had a cup of tea in his hand. I wanted to tell him something else also. I went closer to him and said, "Look here! You said that I am from the housemaids' country. I am not from the housemaids' country. I am from the country which produces the best tea in the world which is known as "Ceylon Tea" and that is what you are having right now." He was very much ashamed over my remarks.

This is how they treat us. They think that Sri Lankans women are going there to make money, but it is not the fact. It is a win-win matter. Our service is rendered to them and they pay us. But they do not accept that fact. They think that because of our poverty we go and work there as slaves. This should be stopped. This nonsense has to be stopped; this should come to an end. I am sure the lady Minister who is in charge of the Ministry of Foreign Employment will take appropriate measures to stop this to save our women from these culprits.

Thank you.

[අ.භා. 4.14]

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලාංකික විදේශගත සේවා නියුක්තිකයන් මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් අද දින මේ විවාදයට එක් වීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම කාන්තාවක් මේ අමාත්‍යාංශයේ අමාත්‍ය ධුරය දැරීම පිළිබඳව කාන්තාවන් විධියට ඇත්තටම අපි ආඩම්බර වෙනවා. මොකද, මවක් විධියට, සහෝදරියක් විධියට කාන්තාවගේ දුක ගැන එතුමියට හොඳ අවබෝධයක් තිබෙන නිසා. ශ්‍රී ලාංකිකයන් විදේශගත වීම ගැන කථා කරන මේ අවස්ථාවේදී කාන්තාවන් විදේශගත වීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න මම කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුහුණු ශ්‍රමිකයන්ට වඩා නුපුහුණු ශ්‍රමිකයන් විදේශගත වීම තුළ අද මේ රට භයානක තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා. පුහුණු ශ්‍රමිකයන් විධියට විදේශගත වන ශ්‍රී ලාංකිකයන්ට ඔවුන්ගේ එම වෘත්තාකමට සරිලන වැටුපක් ලැබුණත්, නුපුහුණු ශ්‍රමිකයන් විධියට විදේශගත වන අපේ ශ්‍රමිකයන්ට සරිලන වැටුපක් ලැබෙන්නේ නැහැ.

[ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය]

අපේ සංස්කෘතියට අනුව පීතෘත්වය තමයි හැම වෙලාවේම පවුලකට නායකත්වය දෙන්නේ. ආදරණීය අම්මා කෙනෙක් විධියට මවක් තමයි තම දරුවන්ට සෙනෙහස, රැකවරණය, උණුසුම ලබා දෙන්නේ. නමුත් පීතෘත්වයට අයත් මුදල් ඉපයීමේ කාර්ය භාරය මාතෘත්වය කරට ගැනීම නිසා අද අපේ ලාංකීය සමාජය විශාල ලෙස ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ කාන්තාවන් ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වීම තුළින් ලැබෙන කෙටි කාලීන ආර්ථික සහනයට වඩා දිගු කාලීනව බලන විට භයානක තත්ත්වයක් ඇති වී තිබෙන බව පෙනෙනවා. එහි හානිදායක තත්ත්වය වැඩියි. කාන්තාවක් විදේශගත වීමේදී පවුල තුළ ඇති වන ව්‍යාකුල තත්ත්වය පිළිබඳව අපි කවුරුත් දන්නවා. පවුල තුළ තිබෙන ආර්ථිකය හොඳටම අසරණ තත්ත්වයට පත් වුණාම තමයි කාන්තාවක් විදේශගත වන්නේ. නමුත් අවසානයේදී ඒ කාන්තාව නැවත ලංකාවට එන විට තිබුණු තත්ත්වයට වඩා ප්‍රපාතයට යාමක් තමයි ඒ පවුල් ඒකක තුළින් අපට දකින්නට ලැබෙන්නේ.

විදේශගත වන කාන්තාවන්ට ඒ රැකියා ආයතනවලින් මුදල් ලබා දෙනවා. නමුත් සමහර වෙලාවට ඔවුන්ට ලැබිය යුතු නියමිත මුදලවත් ලැබෙන්නේ නැති අවස්ථා අපට දකින්නට ලැබෙනවා. සමහර වෙලාවට අතරමැදියන් ඒ ගසාකෑම සිදු කරනවා. ගරු අමාත්‍යතුමියනි, කාන්තාවන් විදේශගත වන විට වෛද්‍ය පරීක්ෂණවලට යොමු කරන බව කාන්තාවක් විධියට මම දන්නවා. වෛද්‍ය පරීක්ෂණවලට යොමු වුණාම සමහර වෙලාවට එම කාන්තාවන්ගේ විවාහක, අවිවාහක බවවත්, වයස ගැනවත් නොසලකා උපත් පාලන එන්නත් පවා ලබා දෙනවා. ඒ පිළිබඳව ඔබතුමියත් දන්නවා ඇති. ඔබතුමියගේ අවධානය යොමු වීම නිසා දැන් ඒ තත්ත්වය යම්තාක් දුරකට සංශෝධනය වෙලා තිබුණත්, පසු ගිය කාල වකවානුව තුළ රට යන කාන්තාවන්ට මාස තුනක කාලයක් සඳහා Depo-Provera එන්නත්ලබා දුන්නා. පළමු වන මාස තුන ඇතුළත විදේශගත වන එම කාන්තාව ගැබ් ගත්තොත්, ඇය මෙරටට ගෙන්වා ගැනීමේ වගකීම ඒ රැකියා ඒජන්සියට තිබෙනවා. එය ආවරණය කර ගැනීම තමයි ඒ මඟින් ඔවුන් බලාපොරොත්තු වුණේ. ඒ නිසා එම වගකීමෙන් බේරෙන්න තමයි ඔවුන් එම කාන්තාවන්ගේ කැමැත්ත, අකමැත්ත ආදි කිසි දෙයක් විමසන්නේත් නැතුව එම උපත් පාලන එන්නත විදීම අනිවාර්යයෙන් කළ යුතු බවට තීරණය කරලා තිබෙන්නේ. ගරු තලතා අතුකෝරල මැතිනියනි, කාන්තාවක් විධියට ඔබතුමියටත් මෙම ගැටලුව පිළිබඳව තේරෙනවා; ඒ පිළිබඳව අවබෝධ වෙලා තිබෙනවා. ඒ නිසා මම ඒ ගැනත් ඔබතුමියගේ විශේෂ අවධානය යොමු කරනවා.

ගරු ඇමතිතුමියනි, ඒ වාගේම විදේශගත වන කාන්තාවන් ඒ රටවලදී විවිධ ශාරීරික පීඩාවලට, අඩන්තේට්ටම්වලට ලක් වෙනවා. මමත් වෛද්‍යවරියක් විධියට එවැනි සිදුවීම් දැක තිබෙනවා. සීරීම්, තැලීම් තුවාල සහිතව ශාරීරික වදහිංසාවලට ලක් වුණු රෝග ලක්ෂණත් එක්කයි ඔවුන් මෙරටට එන්නේ. නමුත් සමහර වේලාවට ඔවුන් නිසි වෛද්‍ය පරීක්ෂණ තොරතුරු ඇතුළත් වාර්තා නැතුව මෙරටට පැමිණෙන නිසා ඔබතුමියගේ අමාත්‍යාංශය මඟින් ලබා දෙන රක්ෂණාවරණයවත් ලබා ගන්න බැරි තත්ත්වක් ඇති වෙලා තිබෙනවා. මොකද, නිසි ආකාරයට, නිසි ක්‍රමයට එම වාර්තා සටහන් වෙලා තිබුණේ නැත්නම් ඔබතුමිය ඇතුළු ඔබතුමියගේ අමාත්‍යාංශයත් අපහසුතාවට පත් වෙනවා. ඒ නිසා එවැනි අසාධාරණයන්ට ලක් වෙන, එවැනි හිරිහැරවලට ලක් වෙන කාන්තාවන් සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් සැකසීම පිළිබඳව ඔබතුමියගේ අමාත්‍යාංශය යටතේ අවධානය යොමු කර විශේෂ සැලකිල්ලක් දක්වන්නය කියා මා ඉල්ලා සිටිනවා.

අපි පසු ගිය කාල වකවානුවේ දැකපු දෙයක් තමයි, මෙරටින් නුපුහුණු ශ්‍රමිකයන් විදේශ රටවලට යැවීම. නමුත් අද වෙනකොට අපේ අග්‍රාමාත්‍යතුමාගේ සංකල්පය අනුව කාන්තාවන් විදේශ රටවලට යවනවාට වඩා මෙරටටම සරිලන පුහුණු ශ්‍රමිකයන් විධියට ඔවුන්ට අවශ්‍ය දැනුම සහ තාක්ෂණය ලබා දීලා මෙරට තුළම පෞද්ගලික අංශයේ කර්මාන්ත දියුණු කර එම කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය මෙරටටම ලබා දෙන ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කර තිබෙනවා. මම දකින විධියට මේ වෙනකොට ඔබතුමියගේත් අවධානය මේ සඳහා යොමු වෙලා තිබෙනවා. මේ වෙනකොට එවැනි ශ්‍රමිකයන්ට අවශ්‍ය පුහුණුව ලබා දීම සඳහා තාක්ෂණයෙන් හා දැනුමෙන් සමන්විත හොඳ, දියුණු වුණු ආයතන, පුහුණු මධ්‍යස්ථාන ගැන ඔබතුමිය විශේෂයෙන්ම අවධානය යොමු කර තිබෙනවා. ගරු ඇමතිතුමියනි, ඔබතුමියගේ අමාත්‍යාංශය මඟින් අපේ රටට, අපේ ආර්ථිකයට ලොකු ශක්තියක් ලබා දෙනවා. ඔබතුමිය කාන්තාවක් විධියට කාන්තාවන්ගේ දුක, වේදනාව තේරුම් ගෙන කටයුතු කරනවා. ඒ නිසා ඔබතුමියට මෙම අමාත්‍යාංශයේ කටයුතු කරගෙන යෑමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය ලැබෙන්නය කියා මා ප්‍රාර්ථනා කරනවා.

මම මේ අවස්ථාවේදී ඔබතුමියට මතක් කළ යුතු විශේෂ කාරණයක් තිබෙනවා. ගරු ඇමතිතුමියනි, විදේශගත වෙන අපේ කාන්තාවන් බොහෝ විට එසේ විදේශ ගත වෙන්නේ නිවසක්වත් හදා ගන්න බැරි තත්ත්වයක ඉන්නා නිසායි. නමුත් එසේ විදේශගත වෙන කාන්තාවන්ට සමහර වේලාවට ලැබෙන්න තිබෙන වැටුපවත් නිසියාකාරයෙන් ලැබෙන්නේ නැහැ. සමහර අවස්ථාවලදී ඔවුන්ට වැටුප් නැතුවම ලංකාවට එන්න සිදු වෙනවා. ඒ වාගේම එසේ විදේශගත වීම නිසා මේ රජයෙන් ලබා දෙන සමහර සහනාධාරත් ඔවුන්ට නැති වී තිබෙනවා. සමෘද්ධි සහනාධාරය, නිවාස ආධාර ආදිය ලබා දෙන වැඩසටහන්වලට ඔවුන් ඇතුළත් කර ගැනීමට නොහැකි වී තිබෙනවා. ඒ නිසා ඔබතුමියගේ අමාත්‍යාංශය මඟින් ඒ සම්බන්ධව යම් කිසි ක්‍රමවේදයක් සකස් කර පසු විපරමක් කරනවා නම් හොඳයි කියා මා හිතනවා. ඔබතුමිය කිව්වා, එක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ඔබතුමියගේ අමාත්‍යාංශයට සමාන්තරව නිලධාරීන් තුන්දෙනෙකු සිටිනවාය කියා. ඒ නිසා එසේ විදේශගත වෙන මව්වරුන්ගේ පවුල් ගැන එම නිලධාරීන් තුන්දෙනා මඟින් හෝ අධීක්ෂණයක් සිදු කොට ඔවුන්ට ලබා දිය හැකි සහනය සලසා දෙන්නය කියා මා මේ අවස්ථාවේදී ඔබතුමියට විශේෂයෙන්ම මතක් කරනවා. ඒ වාගේම මෙම කටයුතු ඉදිරියට කර ගෙන යෑමේදී ඔබතුමිය ඇතුළු ඔබතුමියගේ කාර්ය මණ්ඩලයට ලබා දෙන්න පුළුවන් ශක්තිය, ධෛර්යය කාන්තාවන් විධියට නොඅඩුව අප ලබා දෙනවාය කියා ප්‍රකාශ කරමින් ඔබතුමියගේ මෙම වැඩ පිළිවෙළ සාර්ථක වේවායි! මා ප්‍රාර්ථනා කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මොහොමඩ් නවවි මන්ත්‍රීතුමා.

[4.24 p.m.]

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Thank you very much, Mr. Presiding Member, for giving me the opportunity to take part in this Debate.

I represent the Puttalam Electorate where, I think, almost every family has one member working either in the Middle East or in Italy. Over the last so many years, there have been many problems faced by the migrant workers working in those countries. I must thank the Hon. Minister, because after taking charge of this Ministry, most of the problems faced by these workers have been amicably settled very quickly by the Hon. Minister herself, the Hon. Deputy Minister and the staff.

The Hon. Minister is doing a very good job. I can give two examples for that, which happened in my electorate about six months back. One was a death in Saudi Arabia and the officials of the Ministry, probably on the advice of the Hon. Minister, did their utmost in collaboration with the Ministry of Foreign Affairs to get down the body. They were able to get it down within ten days, which we could not do earlier. Also recently, a person was injured very badly in Jeddah and he is still warded at a hospital. I requested for a relative of his to be sent from here to see him and Madam, when he had gone to your officials, they had helped him. The person who went there had asked the officials, "ඇයි මෙහෙම අපට උදව් කරන්නේ?" The exact words they have used were; ”Your relative is earning foreign currency, which is good for the country and that is why we are helping.” I must thank them because their attitude has completely changed under the new Minister.

I think now one of the most important foreign exchange earners is foreign employment. The Hon. Minister has been doing a lot. However, still there are problems and I would like to point out a few. This is the information I receive from my electorate. First and foremost, there are so many job agents who are not registered, creating a lot of problems in this industry. The Hon. Minister should take note of this fact and somehow get those people registered. Unregistered job agents should not be allowed to send people abroad for jobs. But, they are doing it even now. I know that. So, somehow, they must be brought to book.

Also, the registration fee must be increased to such a level that only people who can afford and those who have the financial capability will then go into this business as there are so many problems. Now, what is happening is, those job agents come to these areas, collect people, somehow send them out of the country for jobs and wash their hands off. After one or two months, if there is a problem and if they go to the agents, it would be of no use. This is what is happening. But, of course, the registered job agents somehow manage to help them. Fifty per cent of the job agents who are not registered wash their hands off and the migrant workers and their families face many problems.

Hon. Minister, you said that there are three to four offices in each and every AGA Division. Actually, it is only after you mentioned that fact that I came to know about it. As I have come to know about this, hereafter, I will contact them. Those officers must go to the people who want to work as migrant workers. So, these officers should know about the people who are leaving the country from that particular AGA division. That is what I am saying.

The other biggest problem that we are facing today is lack of job opportunities. That is why they go abroad. The reasons why they go abroad include poverty, low salary payment, lack of job opportunities, et cetera. If a member of a family leaves the country and works abroad for years - maybe, the wife is working abroad, the husband is here or otherwise - what will happen on their return? Either the husband or the wife who is staying in this country may misuse money. So, when they come back even after working abroad for five - six years, they will become empty-handed. This is one of the problems that we are facing today. Not only that, if the wife is working abroad, her husband who is here will be in tow with another woman or incidents like that may happen. Even there are instances where fathers who are supposed to look after the children have abused their children. This is also a major problem that we are facing today. So, we will have to put a stop to these problems. I feel that these persons who go abroad must be looked after properly by the respective officials.

As I mentioned, the person who is working abroad may waste his hard-earned money. So, Madam, I would like to request that you introduce a system for persons going abroad for employment to open a NRFC account - which they do not do today - and deposit at least 50 per cent of the money earned. That must be followed by these officers. If these officers in the AGA divisions can have a record of these people who are going abroad monthly, then, it is easy for them to go on checking. It must be a rule or law to say at least 50 per cent to 60 per cent of the money they earn is deposited so that when they come back, they will have some money to improve their future. This must be done. If this could be done, I think, the purpose of their going abroad will be fulfilled.

Further, I would like to say that the Hon. Mylvaganam Thilakarajah, Member of Parliament, and myself attended the Asian Parliamentary Assembly in Pakistan where we met a lot of MPs from the Middle East countries. When they knew that we are from Sri Lanka, a few of them met us and said, “Almost every job agent from your county is cheating us.” These were the very words they used. They were asking, “Why do you not send us some good agents? We do just not take them for free and it is you who earn foreign exchange.” Therefore, we will have to get proper job agents who could look after them. I know that it is a difficult task, but, as they said, we are earning foreign exchange by sending these workers abroad.

Now, the Hon. Minister, as you know, the other major problem is, before these people go abroad these job

[ගරු මොහොමඩ් නවවි මහතා]

agents will somehow falsify their documents and send them. Once they go there, what will happen? The promised job is not given and the promised salary is not received. So, because of these reasons, the person who goes there will somehow get out of that place and work somewhere else. After that he will have to stay with some persons who are known to him and who are working there. Also, he is not in a position to send here whatever he earns. Finally, what happens is, he will get caught to the police and will be deported after six or seven months' time.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු මොහොමඩ් නවවි
(மாண்புமிகு முஹமட் நவஹி)
(The Hon. Mohamed Navavi)
Sir, please give me two more minutes.

So, I think we have to look into such cases. The embassy will have to play a role to ensure that such things do not happen in future. If such things happen, we have to make arrangements either to get them deported or to re-employ them somewhere else. So, these are the problems that we are facing today.

Sir, the other matter is this. Most of the people who are sent from this country, about 75 per cent to 80 per cent, go abroad either as drivers or cleaners or room boys. Even the educated youth from poor families go for such jobs. I know that you travel to countries asking for more employment opportunities. Hon. Minister, you must make it a point to get employment opportunities for educated people, like engineers also. If we can find more and more employment opportunities for educated people, then those who are qualified can get suitable jobs. By doing so, we will get more money coming into this country.

Finally I must say again that the Hon. Minister is doing a wonderful job. We all know, Sir, foreign employment is one of the main foreign exchange earning sources. Therefore, we must take steps to solve these problems. I am sure the Hon. Minister is able to do that. Then, I think, all those who are working abroad will be able to lead a good life and we also will be benefited as a country.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you. මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.34]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත්ම වටිනා මේ කාලීන යෝජනාව සම්බන්ධයෙන් ගරු ඇමතිතුමියගේ විශේෂ අවධානයට අපේ අනුර දිසානායක සොයුරාත්, ඒ වාගේම සුනිල් හඳුන්නෙත්ති සොයුරාත් ඇති තරම් කරුණු පැහැදිලි කළා කියලා මා විශ්වාස කරනවා. මට පෙරාතුව කථා කළා, බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අරවින්ද් කුමාර් මැතිතුමා. ඔබතුමිය අහගෙන ඉන්න ඇති එතුමා කිව්වා. ඔහු ගිහිපු යම් කටයුත්තකදී ලෙබනන් රටේ කම්කරු අමාත්‍යවරයා - Minister of Labour - රැස්වීමකදී ඇහුවා, "උඹ ආවේ කාන්තාවන් මෙහෙකාරියන් විධියට එවන රටකින්ද?" කියලා. එතුමා කිව්වා, "එතුමාට ඒ වෙලාවේදී ලොකු වේදනාවක් ඇති වුණා" කියලා.

ඊට පස්සේ එතුමා ඔහුට කිව්වා, "උඹ එහෙම හිතන්න එපා. අපේ රට තමයි ලෝක ප්‍රසිද්ධ තේ නිෂ්පාදනය කරන සහ එවන රට වෙලා තිබෙන්නේ" කියලා. එළියේදී මට දැන් එතුමා හම්බ වුණා. මම කිව්වා, "ඇත්ත කථාව ඒක නොවෙයි. ඒ කානාපතිවරයා කියාපු කථාව සම්පූර්ණ සත්‍යයක්" කියලා. ඔබතුමිය ඒ ගැන කල්පනා කරලා බලන්න. වසර 68ක පාර්ලිමේන්තු ඉතිහාසය තුළ මේ රටේ විවිධ පාලකයෝ -විවිධ මැති ඇමතිවරු, ජනාධිපතිවරු, ජනාධිපතිවරියන්, අගමැතිවරු, අගමැතිවරියන් මේ සෑම කෙනෙකුම- මේ රට පාලනය කළා. ඔබතුමිය මේ ටිකක් කල්පනා කරලා බලන්න. ඇමෙරිකාව වාගේ රටක් ලෝකයේ ප්‍රසිද්ධ වෙලා තිබෙන්නේ මුළු ලෝකයටම අවි ආයුධ සපයන රටක් විධියට. නරක වුණත් ප්‍රසිද්ධ වෙලා තිබෙන්නේ එහෙමයි.

ජපානය ප්‍රසිද්ධ වෙලා තිබෙනවා, ලෝකයට ඉතාම ප්‍රශස්ත විධියට මෝටර් රථ නිෂ්පාදනය කරන රටක් විධියට. අප්‍රිකාව ප්‍රසිද්ධ වෙලා තිබෙනවා, ලෝකයට රත්රන් ලබා දෙන රටක් විධියට. ඒ වාගේම චීනය ප්‍රසිද්ධ වෙලා තිබෙනවා, ඉදි කටුවේ සිට අල්පෙනෙන්තේ සිට අභ්‍යවකාශ යානා දක්වා ඉතාම ප්‍රශස්ත නිෂ්පාදන ලෝකයට හඳුන්වා දෙන රටක් විධියට. නමුත් ගරු මැතිනියනි, කල්පනා කර බලන්න ලංකාව ප්‍රසිද්ධ වෙලා තිබෙන්නේ මොකකටවත් නොවෙයි. ලෙබනන් රටේ Minister of Labour කියපු කථාව සියයට සියයක් සත්‍යයි. ඔහු දැන ගෙන තිබෙන විධියට ලංකාව ප්‍රසිද්ධ වෙලා තිබෙන්නේ වෙන මොකකටවත් නොවෙයි, කාන්තාවන් වහල් මෙහෙයට; මස් වෙළෙඳාමට පිට රට යවන රට විධියට. නමුත් ලෝකයෙන් උතුම් රට ලංකාව !

එතකොට මේකේ වැරැදිකාරයා ඔහු නොවෙයි. මේකේ වැරැදිකාරයා මෙතෙක් කල් මේ රට පාලනය කරපු පාලකයන්. ඒ වාගේම මේ වග කීම භාරගෙන මෙතෙක් කටයුතු කරපු හැම ඇමතිවරයෙක්ම, ඇමතිවරියක්ම වාගේම නිලධාරීන් මේකට අනිවාර්යෙන්ම වගකිව යුතුයි කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඒ නිසා යථාර්ථයට පිටුපාන්න අපි කාටවත් බැහැ. අපි ලජ්ජා වෙන්න ඕනෑ, ගරු ඇමතිතුමියනි. ඒ නිසා ඔබතුමියට තිබෙනවා, ලොකු වග කීමක්. කාන්තාවක් විධියට, මාතාවක් විධියට මීට වඩා වැඩි වග කීමකින් මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි කියන එක මා අවධාරණය කරනවා.

පොඩ්ඩක් කල්පනා කරලා බලන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ කාන්තාවෝ ජනගහනයෙන් සියයට 53ක් විතර ඉන්නවා. ලෝකයේ ප්‍රථම අගමැතිනිය වශයෙන් ප්‍රසිද්ධ වුණේ අපේ රටේ කාන්තාවක්. ලෝකයේ ප්‍රථම

ජනාධිපතිවරිය වෙලා හිටියේත් අපේ රටේ කාන්තාවක්. තවත් බොහෝ හැකියාවන්, දක්ෂතාවලින් අපේ කාන්තාවෝ ඉහළට ගිහිල්ලා තිබෙනවා. නමුත් කල්පනා කර බලන්න අද අපේ රටේ ගම්බිම්වල ඉන්න කාන්තාවන් වැඩි ප්‍රමාණයකට මොකද වෙලා තිබෙන්නේ කියලා. සෑම රජයකම ප්‍රතිපත්තියක්, වැඩ පිළිවෙළක්, ක්‍රියාමාර්ගයක් නැතිකම නිසාම අපේ මාතෘත්වය කෙලසන ආකාරයට කටයුතු සිදු වෙලා තිබෙනවා.

අපි අපේ නංගිලා, අක්කලා, අම්මලා ඉසුරු සොයාගෙන එන්න කියලා පිට රට යවනවා, අපේ මඩිය තර කර ගන්න. අපි මහ ලොකුවට පම්පෝරි ගහනවා; උදම් අනනවා, "රට විරුවෝ, අර විරුවෝ, මේ විරුවෝ" කියලා. නමුත් මේ සිදුවීම් අද මහා බෙදවාචකයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමිය මේ ගැන කල්පනා කරලා, අපේ රටේ ඉන්න කාන්තාවට තමන්ගේ ශ්‍රමය තමන්ගේ රට වෙනුවෙන් යොදවලා මෙරට නිෂ්පාදන ක්‍රියාවලියට මැදිහත් වෙන්න අවස්ථාවක් නිර්මාණය කරලා දෙන්න. ගොවිතැන වේවා, කර්මාන්ත වේවා, මොනම හෝ ආකාරයකින් නිෂ්පාදන කාර්යයකට සම්බන්ධ වෙන්න ගම් මට්ටමේ, බිම් මට්ටමේ කාන්තාවන්ට අවස්ථාවක් නැති නිසා තමයි ගරු ඇමතිතුමියනි, මේ වාගේ ක්‍රියා මාර්ගවලට මේ අභිංසක කාන්තාවන්ට පෙළඹෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අපි මේ ප්‍රශ්නයේ පතුලට බැහැලා බැලුවොත් යථාර්ථය විධියට පෙනෙයි, පවුල්වල තිබෙන අගහිඟකම්, ආර්ථික අමාරුකම්, ජීවත් වෙන්න තිබෙන අපහසුකම් නිසා අපේ කාන්තාවන් පිට රට සේවයට යන බව. තිබුණු ආණ්ඩුවලින්, පවතින ආණ්ඩුවෙන් අන්න ඒකට විකල්පයක් නැති නිසා මේ අයට සිද්ධ වෙලා තිබෙනවා, අකැමැත්තෙන් හෝ තමන්ගේ ශ්‍රමය අඩු මිලට පිට රටවලට විකුණලා වහල් සේවයක් කරලා තමන්ගේ බඩ වියත රැකගන්න. ඒකයි මේකේ යථාර්ථය. දැන් ගරු ඇමතිතුමියගේ අමාත්‍යාංශයට අදාළ කාන්තා කාර්යාංශයෙන් ගෘහ සේවයට යන කාන්තාවන්ට ප්‍රාදේශීය වශයෙන් පිහිටුවා තිබෙන මධ්‍යස්ථානවලින් පුහුණුවක් දෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තලතා අතුකෝරල ඇමතිතුමිය කථා කරන්න.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු මන්ත්‍රීතුමනි, කාන්තා කාර්යාංශය තිබෙන්නේ මගේ යටතේ නොවෙයි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
නැද්ද?

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
නැහැ. ඒක තිබෙන්නේ කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේයි. අපේ තිබෙන්නේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ පුහුණු මධ්‍යස්ථානයි. කාන්තා කාර්යාංශය නොවෙයි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු ඇමතිතුමියනි, මට පොඩි වැරදීමක් වුණේ. කාන්තා කාර්යාංශය ගැන නොවෙයි, මම කිව්වේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය ගැනයි. අන්න ඒ යටතේ පිහිටුවා තිබෙන කාන්තා කාර්යාංශ තිබෙනවා නේ. මම හිතන විධියට ඒ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල පුහුණුවට යන කාන්තාවන්ට මාස දෙකක්, දෙකහමාරක් විතර පුහුණුවක් ලබා දෙනවා නේ. ගරු ඇමතිතුමියනි, මම ළඟදී දැනගත් විධියට මේ පුහුණුව සඳහා ඒ ගොල්ලන්ට රුපියල් 30,000ක් විතර වැය වෙනවා. මම දන්න විධියට, මීට ඉස්සෙල්ලා නම් එහෙම මුදල් ගත්තේ නැහැ. ඔබතුමියගේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය වියදම් කරලා ඒ පුහුණුව ලබා දුන්නා. නමුත් දැන් එහෙම නොවෙයි. දැන් මේ පුහුණුව වෙනුවෙන් විශාල මුදලක් ගන්නවා. ඒක නිසා අපි විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා, අපේ රටට විදේශ විනිමය ලබාදෙන, ශ්‍රමය කැප කරලා කටයුතු කරන මේ අයට මීට වඩා සහනයක් සලසන්න කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්නම්, මට තව විනාඩි දෙකක් ලබා දෙන්න.

ගරු ඇමතිතුමියනි, මේ ඒජන්සිකරුවන් ගැනත් කියන්න ඕනෑ. මේ ඒජන්සිකරුවන් ඔබතුමියගේ අමාත්‍යාංශය මුළුමනින්ම නොමහ යවමින් කපටි ව්‍යාපාරයක නිරත වෙලා සිටිනවා; දැවැන්ත පරිමාණයේ සොරකම්වල නිරත වෙනවා; අපරාධවල නිරත වෙනවා. සමහර පිරිමි අය විදේශගත වෙන්න සම්බන්ධ වෙනකොට විවිධ රටවලින් ඒ අය ගන්න ගිවිසුම් ගහනවා. ගිවිසුම් ගහලා කියනවා, ඒ අයට තිබෙන වැටුප මෙන්න මෙච්චරයි කියලා. ඔහුට මාසිකව දෙන්න එකඟ වූ වැටුප රුපියල් 50,000ක් කියලා හිතමු. නමුත් ඒ පුද්ගලයා අවසානයේදී වීසා හදාගෙන ඔක්කෝම වැඩ කරගත්තාට පස්සේ ඔහුට කියනවා, "නැහැ, මාසික වැටුප රුපියල් 30,000යි" කියලා. දැන් වීසාත් අරගෙන ඉවරයි. ගිවිසුම් පවා අත්සන් කරලායි තිබෙන්නේ. අන්තිමට අර පුද්ගලයා බරපතළ විධියේ අමාරුවක වැටෙනවා. ඒ වාගේම මේ ඒජන්සිකරුවන් කරන තවත් දෙයක් තමයි, රට රැකියාවට යන පුද්ගලයාගේ passport එක, ගමන් බලපත්‍රය ඔහුට දෙන්නේ නැතිව ඒක ඇපයට තියාගෙන ඉන්න එක. මේක මානව හිමිකම් උල්ලංඝනය කිරීමක්. "ගල්ෆ් එයාර්" කියන ඒ වාගේ ඒජන්සියකට මම අද කථා කළා. කථා කරලා මම කිව්වා, "මේ වාගේ තක්කඩි වැඩ කරන්න එපා, මම මේ පිළිබඳව විෂය භාර ඇමතිතුමිය දැනුවත් කරලා, ඔබලාගේ අවසර පත්‍රය cancel කරන්න කටයුතු කරනවා" කියලා.

මෙන්න මේ වාගේ බරපතළ විධියේ ගැටලු තිබෙනවා. ඒ නිසා ඔබතුමිය මේ සම්බන්ධයෙන් මීට වඩා වගකීමකින් යුතුව කටයුතු

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

කරන්න ඕනෑ වනවා. ඒ වාගේම මේ හොර ඒජන්සිකරුවන්ට, උප ඒජන්සිකරුවන්ට, ඒ රටවල ඉන්න මෙහේ ඒජන්සිකරුවන්ගේ කැවර්ලාට මීට වඩා බලපෑමක් කරලා, පිට රට යවන කාන්තාවන් වේවා, පිරිමින් වේවා ඒ අයගේ ජීවිත සුරක්ෂිත කරන්න මීට වඩා වගකීමකින් යුතුව කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු තලතා අතුකෝරල අමාත්‍යතුමිය පිළිතුරු කථාව කරන්න.

[අ.භා. 4.44]

ගරු තලතා අතුකෝරල මහත්මිය (විදේශ රැකියා අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - வெளிநாட்டுத் தொழில்வாய்ப்பு அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Foreign Employment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මම හිතන්නේ මට කථා කරන්න දීර්ඝ වේලාවක් තියෙයි කියලායි.

විදේශගත ශ්‍රමිකයන් පිළිබඳව ඉතාම වැදගත් මෙම යෝජනාව ඉතාම වුවමනාවෙන් ඉදිරිපත් කරමින් ඒ සම්බන්ධයෙන් කරුණු කාරණා ඉදිරිපත් කිරීම ගැන, අපේ ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාට විෂය භාර ඇමතිවරිය හැටියට මමත්, මගේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිතුමා වෙනුවෙනුත් ස්තුතිය පුද කරන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමියගේ හිතේ තියෙන අදහස් සියල්ල ප්‍රකාශ කරන්න අවස්ථාව තිබෙනවා.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

විදේශ රැකියා අමාත්‍යාංශය භාර ගන්නකොට මට ඒ තරම් අවබෝධයක් තිබුණේ නැහැ. 2014 මාර්තු 08 වෙනිදා කාන්තා දිනය සමරන තෙක්ම මම නිතරම කිව්වේ, අපේ කාන්තාවන් ගැන ඉතාම ආඩම්බර වෙනවා කියලායි. මොකද, අපට වැඩියෙන්ම ආදායම සපයන්නේ විදේශගත ශ්‍රමිකයන් හැටියට අපේ කාන්තාවන් නිසා ඒ වාගේම ලංකාවේ කෘෂි කර්මාන්තයේ යෙදී සිටින කාන්තාවන් සහ ඇහලුම් ක්ෂේත්‍රයේ ඉන්න කාන්තාවන්ද ඒ සඳහා දායක වනවා. නමුත්, මෙම විදේශ රැකියා අමාත්‍යාංශය භාර ගත්තාට පසුව මම ඒ කථාව කීම නැවැත්තුවා. මොකද, ඒ ගැන මගේ හිතට එකඟව කථා කරන්න බැරි නිසා. මේ සම්බන්ධව අද දින අදහස් දැක්වූ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වනවා. ඒ වාගේම ඒ අදහස්වලින් කියවුණු බොහෝ කරුණු මම පිළිගන්නවා.

සමහර මන්ත්‍රීතුමන්ලා කථා කළේ කාන්තාව පිට රට යවන එකට විරුද්ධවයි. ඒ නිසා ඒ අය ඉල්ලීමක් කළා, කාන්තාවන් පිට රට යවන එක නවත්වන්න කියලා. අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා කථා කරනකොට කිව්වා, මේ වන කොට කාන්තාවන් පිටරට යන සංඛ්‍යාව සියයට 27 දක්වා අඩු වෙලා තිබෙනවා කියලා. ඉතින්, ඒ ගැනත් මම ඉතාම සන්තෝෂ වෙනවා.

මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, අපි කරුණු කාරණා ගණනාවක් සැලකිල්ලට අරගෙන, හොඳ ක්‍රමවේදයකට සහ හොඳ ප්‍රතිපත්තියකින් යුත් කාන්තාවන් පිට රට යන තත්ත්වයකට පත් කිරීමට අප සියලු දෙනාම කටයුතු කරනවා. ඒ සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිතුමා ඇතුළු එහි කාර්ය මණ්ඩලයත් අපි සියලු දෙනාමත් මහන්සි වෙනවා. මේකට හේතුව තමයි අපි අර කිව්ව කාරණය.

ගරු අ. අරවින්ද් කුමාර් මන්ත්‍රීතුමා කිව්වා, ලෙබනනයේ ඇමතිතුමෙක් කිව්ව කථාවක්. ඒ කාරණය නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාත් කිව්වා, මමත් කියනවා. ඒ ගැන කිව්වාට ඇත්තටම අපි එක්ක තරහා වෙන්නේ නැහැ. මොකද, පසු ගිය සතියේ පාද යාත්‍රා ගිහිල්ලා ලොකුවට කෑ ගහලා රීයේ මේ ගරු සභාව තුළදී ලොකු නාඩගමක් කරලා, මේ උත්තරීතර සභාවේ ගරුත්වය සම්පූර්ණයෙන්ම බිඳ දැමූ සමහර අය කථා කළේ, මේ සියල්ලම යහ පාලන ආණ්ඩුවෙන් වෙලා තිබෙනවා වාගේයි. ඒ වාගේම ගරු ජනාධිපතිතුමාගේ, ගරු අගමැතිතුමාගේ වැඩ කටයුතු නිසා මේ සියල්ලම වෙලා තිබෙනවා කියලා වාගේ තමයි කථා කළේ. ඒ ගොල්ලන්ට මතක නැහැ, මේ රටේ වැඩිම ආදායම ගෙනෙන විදේශගත ශ්‍රමිකයා කාන්තාව බවට පත් කළේ කවුද කියලා. ඇයට මේ විධියට යන්න සිදු වුණේ ඇයි කියන එක ගැන ඒ ගොල්ලන් කවුරුත් කථා කළේ නැහැ. ඉතින්, ඒවා ගැන කථා කරන්න අපත් කොහෙත්ම සූදානම් නැහැ. මොකද, අපි ඒ ගැන කිය කියා, මේ තත්ත්වය තවත් ඉස්සරහට අරගෙන යන්න නොවෙයි හදන්නේ. මේ තත්ත්වය වෙනස් කරන්න අපි සියලු දෙනාම කැප වෙලා ඉන්නවා. මේ වෙනුවෙන් ගත් තීන්දු තීරණ ගණනාවක් තියෙනවා.

පළමුවෙන්ම කියන්න ඕනෑ, ගරු ජනාධිපතිතුමාගේත් ගරු අගමැතිතුමාගේත් මූලිකම අවශ්‍යතාව වුණේ, නුපුහුණු ශ්‍රමිකයන් හැටියට, කම්කරුවන් හැටියට යන අය වැඩි කරන්න නොවෙයි; යම්කිසි වෘත්තියක් හැටියට යම් සුදුසුකම් ලැබූ අයගේ, පුහුණු ශ්‍රමිකයන් හැටියට විදේශගත වන අයගේ සංඛ්‍යාව වැඩි කරන්නයි. ඒ සඳහා තමයි, ගරු මහින්ද සමරසිංහ ඇමතිතුමාගේ නායකත්වයෙන් වෘත්තිය පුහුණු අමාත්‍යාංශය ඇති කර, ඒ පුහුණුව ඇති කිරීමේ කාර්යභාරය ඒ අයට භාර දී තිබෙන්නේ. ඊට අමතරව අපි කාර්යාංශය හැටියට විශේෂයෙන් විදේශගතවන කාන්තාවක් ගෘහ සේවිකාවක් හැටියට යනවා නම්, සාත්තු සේවිකාවක් හැටියට යනවා නම් ඒ අයගේ පුහුණුව විධිමත් කරන්න කටයුතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දින 20කට තිබුණු පුහුණුව අපි දින 40 දක්වා වැඩි කර තිබෙනවා. අපේ ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා කථා කරනකොට කිව්වා, රුපියල් 30,000ක් වාගේ මුදලක් මේ අයගෙන් අය කරනවාය කියා. එහෙම අය කරන්නේ නැහැ. මේක නේවාසික පුහුණුවක්. දින 40ක් ඒ පුහුණු මධ්‍යස්ථානයේ ඉන්න ඕනෑ. අපි ඒ අයට කෑම දෙන්න ඕනෑ. ඒ අයගේ අවශ්‍යතාවන් ඉෂ්ට කරන්න ඕනෑ. ඒ පුහුණු මධ්‍යස්ථානවල ලයිට් බිල්, වතුර බිල් අපි ගෙවන්න ඕනෑ. ඒ වෙනුවෙන් පුහුණුව ලබන හැම කෙනෙකුගෙන්ම රුපියල් 17,500ක් අපි අය කරනවා. ඒක එදාත් අය කළා. අදත් මැද පෙරදිග සේවය සඳහා විදෙස් ගතවන ශ්‍රමිකයන්ට දින හතළිහේ පුහුණුව සඳහා එවැනි මුදලක් අය කරනවා. ඒ කියන විධියේ මුදලක් නොවෙයි. රුපියල් 17,500ක මුදලක් අපි අය කරනවා. [බාධා කිරීමක්]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු ඇමතිතුමියනි, පුහුණුව ලබා දුන්නායින් පසුව ඒ අය විදේශ සේවයට යනවානේ. ඒ ගොල්ලන් පිටරට සේවයට ගියාම අවුරුදු දෙකක් හෝ තුනක් ඉඳලා, ඒ හම්බ කරන සල්ලි ඔක්කොම ලැබෙන්නේ අපටනේ; රජයට නේ. ඒකයි මම කිව්වේ, ඒකට උපහාරයක් විධියට ඒ ගොල්ලන්ගේ පුහුණුවට ඔබතුමියලාගේ කාර්යාංශයෙන් යම්කිසි ආකාරයක සහනයක් සැලසෙනවා නම් හොඳයි කියලා. මොකද, ඒ ගොල්ලන් ගිහින් සේවය කරලා මුදල් එවන්නේ මෙහේට නේ. ඒකයි මම කිව්වේ.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු මන්ත්‍රීතුමනි, සමා වන්නට ඕනෑ. අපේ විදේශ සේවා කාර්යාංශයට කොහෙන්වත් මුදල් ලැබෙන්නේ නැහැ. අපට මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබෙන්නේත් නැහැ. මේ සියලුම කටයුතු කරන්නේ ලියා පදිංචියේදී අය කරන මුදල සහ පුහුණු මධ්‍යස්ථාන පවත්වා ගෙන යාමෙන් ලබන මුදලින්. ඒ හැරෙන්නට අපට වෙන කිසිම මුදලක් අය වෙන්නේ නැහැ. ලියා පදිංචියේදී අය කර ගන්නා රුපියල් 17,500 මුදලින් සියයට 70ක් නැවතත් ඒ නියෝජිතායතනයට අපි ගෙවනවා. විදේශ රැකියා කාර්යාංශයට එන්නේ බොහොම සුළු මුදලක්. අපි මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබෙන තුරු බලාගෙන ඉන්නේත් නැහැ. අපේ වැඩ කටයුතු අපි කර ගෙන යනවා.

ඔවුන්ට ලබා දෙන පුහුණුව ගැන මම මීට වඩා විස්තර කරන්න යන්නේ නැහැ. දින හතළිහක් තුළ ලබා දෙන පුහුණුවට ආචාරශීලිභාවය, පිරිසිදුකම, ඒ රටවල නීති-රීති මේ හැම එකක්ම ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම නියෝජිතායතන සම්බන්ධයෙනුත්, මේ හැම එකක් සම්බන්ධයෙනුත්, ඒ රටවලට ගියාම ඒ ගොල්ලන් මුහුණ දෙන ප්‍රශ්න සම්බන්ධයෙනුත් අපි ඒ අය දැනුවත් කරලායි තිබෙන්නේ.

දෙවැනි කාරණය තමයි පසු ගිය අය වැයේදී අපේ මුදල් ඇමතිතුමා විදේශගත ශ්‍රමිකයන් ලැබිය හැකි අවම වැටුප ඩොලර් 300ක් ලෙස නියම කළා. ඩොලර් 300ක් නියම කළත්, අපි ඒක ක්‍රියත්මක කරන්න බලාපොරොත්තු වුණේ ජනවාරි මාසයේ 1වැනි දා සිටයි. මේ වෙනකොට තවමත් සමහර තැන්වලදී අපට ඒකට මුහුණ දෙන්නට සිද්ධ වෙනවා. සමහර වෙලාවට කාලයක් තිස්සේ අපත් එක්ක ගනු දෙනු කරපු, ඒ වාගේම ඒ රටවල ඉල්ලුම්වල හැටියට ඒ ඩොලර් 300 හෝ ඊටත් වැඩි ප්‍රමාණයක් දක්වා වැටුප් ප්‍රමාණය ලැබෙනවා නම් අපි ඒ අයට ඒ අවස්ථාව ලබා දී තිබෙනවා.

අද දිනයේදී දිගින් දිගටම කියැවුණු දෙයක් තමයි මේ නියෝජිතායතන කොමිස් මුදල් අය කිරීම ගැන. ඒ සම්බන්ධයෙන් ඔබ සියලු දෙනාම දන්නවා. විශේෂයෙන් මේ නියෝජිතායතන ගෙනියන ව්‍යාපාරයක් තිබෙනවා. මුලින්ම පවුලේ අයට කොමිස් මුදලක් ගෙවනවා. කොමිස් මුදල ගෙවා ඊට පස්සේ කාන්තාව හෝ දියණිය හෝ පිටරට යවන්න එකඟතාව ඇති කර ගන්නවා. හැබැයි, දෙපාර්ශ්වයම දිහා බලනකොට ඒ සම්බන්ධයෙන් අසාධාරණ තත්ත්වයක් ඇති වුණු නිසා අපි ඒ කොමිස් මුදල් ලබා දීම මාර්තු මාසයේ පළමුවැනි දා ඉඳලා අනිවාර්යයෙන්ම තහනම් කළා. "කොමිස් මුදල් ලබා දුන්නා, කොමිස් මුදල් අරගෙන තමයි රට යැව්වේ" කියලා දෙපැත්තේම සිටින කිසිම කෙනෙකුට අපට ඇවිල්ලා කියන්න බැහැ. ඒජන්සිකරුවන්ට ඇවිල්ලා කියන්න බැහැ, "මේ මුදල ගෙවන්න කියන්න" කියලා. අපි ඒගොල්ලන්ට ඒ කටයුත්ත තහනම් කරලා තිබෙන්නේ. "අපි කොමිස් මුදල් මෙච්චර ප්‍රමාණයක් ගත්තා" කියලා අනික් පැත්තේ අයට කියන්නත් බැහැ. ඒක දැන් නීතියෙන් තහනම් කරලා තිබෙන්නේ.

අනික් කාරණය තමයි, උප ඒජන්තවරු සම්බන්ධ කාරණය. අපි උප ඒජන්තවරුත් තහනම් කරලා තිබෙනවා. මේ සිද්ධ වන සියලුම වංචා, දූෂිත ක්‍රියා සම්බන්ධයෙන් සෙවීමට අපේ විමර්ශන ඒකකයක් තිබෙනවා. ඒ විමර්ශන ඒකකයේ නිලධාරීන් 14 දෙනෙකු විතර තමයි හිටියේ. අපි නැවතත් ඒ සම්බන්ධයෙන් ඉල්ලීම් කරලා නිලධාරීන් 25 දෙනෙකු දක්වා වැඩි කළා. සිදු වන සියලුම දූෂිත ගනු දෙනු සම්බන්ධයෙන් උපඒජන්තවරු ක්‍රියාත්මක වනවාය කියලා කවුරුන් හෝ කිව්වොත් ඒගොල්ලන් අත් අඩංගුවට ගන්න, ඒ සම්බන්ධයෙන් විමර්ශන පවත්වන්න තමයි එහෙම නිලධාරීන් 25 දෙනෙකු දක්වා වැඩි කළේ.

අපේ ගරු මොහොමඩ් නවාවි මන්ත්‍රීතුමා කිව්වා, පුත්තලම පැත්තේ නීති විරෝධී විධියට පවත්වාගෙන යන නියෝජිත ආයතන ගොඩාක් තිබෙනවාය කියලා. ඒ පිළිබඳව අපට තොරතුරු ලබා දෙනවා නම් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචි නොවුණු ඕනෑම නියෝජිත ආයතනයක් තත්ත්වයක්, තරාතිරමක් නොබලා අත් අඩංගුවට ගන්න අපි ඕනෑම වෙලාවක සූදානම්. විශේෂයෙන්ම මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම නියෝජිත මහත්වරුන්ගෙන් සහ මහත්මීන්ගෙන් මම ඉල්ලීමක් කරනවා, ඒ වාගේ විස්තර ලැබුණොත් අපට ලබා දෙන්න කියලා. සහකාර පොලිස් අධිකාරිවරයෙක් යටතේ අපේ විමර්ශන ඒකකයක් තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගන්නවා. ඒ වාගේම වංචා සහගත විධියට හොරෙන් කටුනායකින් පිටත් වීම ඇත්තටම අපිටත් මුහුණ දෙන්න බැරි බරපතළ ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා.

අද ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාද කොහේද ඇහුවා, පිට රට රැකියා කරන ප්‍රමාණය සම්බන්ධයෙන් නිශ්චිත ගණනක් තිබෙනවාද කියලා. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචිවෙලා ගිය අය ගැන නම් අපට නිශ්චිත ගණන කියන්න පුළුවන්. ඒ හැර අපට නිශ්චිත ගණනක් කියන්න අමාරුයි. මොකද, සමහර අය කන්‍යා සොහොයුරියන් හැටියට විදේශ රටවලට යනවා ඔබතුමන්ලා පසු ගිය දවස්වල මාධ්‍ය හරහා දකින්න ඇති. සමහර අය සංචාරක වීසා මත යනවා. සමහර අය කොළඹට ඇවිල්ලා, ධනවත් කාන්තාවන් වාගේ ඇඳුම් මාරු කරගෙන, රත්රන් පුරවාගෙන යනවා. කටුනායක ගුවන් තොටු පොළේ ආරක්ෂක අංශයේ සමහර නිලධාරීන්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සමහර නිලධාරීන් එකතු වුණු ලොකු මාෆියාවක් මේ තුළ ක්‍රියාත්මක වෙමින් තිබුණු බව ඇත්තටම මම කියන්න ඕනෑ. අපට ඒවා යම්තාක් දුරකට අඩු කරන්න පුළුවන්වෙලා තිබෙනවා. සමහර වෙලාවට හරියටම රාජකාරි වැඩ කටයුතු කරන නිලධාරීන්ට පුදුම විධියේ තර්ජන ආවා. මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න බාරව ඉන්න අපේ ප්‍රධාන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිතුමියට මරණ තර්ජන එල්ල වුණා. මේ හැම ප්‍රශ්නයකටම මුහුණ දෙමින් අපි පුළුවන් තරම් මේ කටයුතු කළා. 25 දෙනෙකුගෙන් යුක්ත නිලධාරීන් කණ්ඩායමක් තමයි කටුනායක ගුවන් තොටු පොළේ හිටියේ. ඒ නිලධාරීන් ප්‍රමාණය 75 දෙනෙකු දක්වා වැඩි කරලා, shift ක්‍රමයට ඒගොල්ලන්ගෙන් හොඳ රාජකාරියක් ලබා ගන්න පුළුවන් මට්ටමට ඒ කටයුතු කරන්න අපට පුළුවන් වුණා.

මේ හැම කටයුත්තක්ම කරන අතරවාරයේ රටවල් ගණනාවක රජයන් එක්ක අපි ගිවිසුම්වලටත් මේ වනකොට ඇවිල්ලා සිටිනවා. සමහර අය සංචාරක වීසා මත ඩුබායි රටට ගිහිල්ලා, එතැනින් දේශ සීමා තරණය කරලා වෙන රටවලට ගිහිල්ලා ඔවුන් ඒ රටවල රැකියා කරනවා. ඕමානයේ අපේ විෂයය බාර ඇමතිතුමාත් එක්ක අපි මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. සංචාරක වීසා මත එන අයට රැකියා දෙන්න එපා කියලා කිව්වාම, ඒ අය විශේෂයෙන්ම ඒ ගැන අවධානය යොමු කරලා, දැන් ඒ රටේ සංචාරක වීසා මත යන අයට රැකී රක්ෂා අවස්ථා ලබා දීම තහනම් කරලා තිබෙනවා.

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

විශේෂයෙන්ම ඒ රටවල සිද්ධ වන මරණ සම්බන්ධයෙන් සහ වෙනත් දේවල් සම්බන්ධයෙන් මේ ගරු සභාවේදී තවත් තොරතුරු කියැවුණා. පිට රට සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයකුගේ මරණය සිද්ධ වුණොත් ඒ දේහය ගෙන්වාගැනීම කෙරෙන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් වුණත්, ඊට අවශ්‍ය කටයුතු සියල්ල අපේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඒ රටෙහි තානාපති කාර්යාලයේ සිටින නිලධාරීන්ගේ මැදිහත් වීම මත කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. මෙහිදී හැම කෙනෙකුම අවබෝධ කරගත යුතු දෙයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හැම තිස්සේම අපට බලපානවා ඒ ඒ රටවල නීති. ඒ ඒ රටවල නීති අනුව කටයුතු කරන විට සමහර වෙලාවට දුංවි කාලයක් ගත වනවා. සමහර අය එක මොහොතකවත් ඇවිල්ලා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දැනුවත් කරන්නේ නැතිව, "අපේ නෑදෑයාගේ මිනිය ගෙන්වා ගන්න බැරි වුණා, මාස ගණනක් එහේ තිබෙනවා" කියලා දිගින් දිගට මාධ්‍යයට කියනවා. මාධ්‍යයට කොච්චර කිව්වත් වැඩක් නැහැ. කිව යුතු තැනට කියන්න ඕනෑ. ඒවා ගැන විදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කරන්න ඕනෑ; අප දැනුවත් කරන්න ඕනෑ. අපේ කාර්යාංශයේ ලියා පදිංචි වෙලා ගිය කෙනෙකු නම් අපි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සියලු කටයුතු කරලා දෙනවා. අපට දැනුම් දීමක් කෙරුණොත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සියලු ක්‍රියා මාර්ග අපි ගන්නවා.

පසු ගිය කාලයේ වාගේ නොවෙයි, දැන් අපට ඒ රටවලින් යහපත් ප්‍රතිචාර ලැබෙන බව මා සන්තෝෂයෙන් කියන්න ඕනෑ. මැද පෙරදිග විතරක් නොවෙයි, මා මේ ළඟදී ඊශ්‍රායලය සහ සයිප්‍රසය කියන රටවලට ගියා, රැකියා අවස්ථා ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන්. ඉතාම හොඳ ප්‍රවණතාවක් සහ මේ රට ගැන අලුත් පිළිගැනීමක් ලෝකයේ රටවල් අතර දැන් ඇති වෙමින් පවතිනවා. ඒ නිසා රැකී රක්ෂා අවස්ථා ලබා ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. පසු ගිය මුළු අවුරුද්දටම කොරියාවට ගියේ 4,992යි. මේ අවුරුද්දේ මේ වන කොට 5,225කට වැඩි පිරිසක් කොරියාවට ගිහින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙරට කාන්තාවන් විදේශ රැකියාවලට යෑම එක පාරට නවත්වන්න පුළුවන් නම්, "කාන්තාවන් විදේශගත වෙන්න එපා" කියලා ඒ නතර කිරීම ඉස්සර වෙලාම කරන කෙනෙක් තමයි, මම. හැබැයි කාන්තාව ගැන කථා කරන, කාන්තාවන් විදේශ රැකියාවලට යන එකෙන් මේ මේ වාගේ දේවල් සිද්ධ වනවා කියන බොහෝ අයට නොතේරුණු දෙයක් තමයි, පසු ගිය කාලයේ කටයුතු සිද්ධ වූ ආකාරය නිසා අපේ රටේ සියලු අපනයන, සියලු ආදායම් මාර්ග අපට නැතිව ගිහින්, අපේ රටට ආදායම ගෙනෙන එකම මාර්ගය බවට විදේශ සේවා නියුක්තිය පත් වී තිබෙනවා කියන එක. එවැනි තත්ත්වයක් තිබියදීත් තමයි අප ක්‍රමක්‍රමයෙන් මේ අය පිටරට රැකියාවලට යැවීම අඩු කිරීම කරගෙන යන්නේ. අප බලාපොරොත්තු වන්නේ, අපේ ගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත් මේ කාලය තුළදී විශේෂයෙන් බලාපොරොත්තු වන්නේත් එයයි. මොකද, කාන්තාවක් පිට රට යැවීම, පවුල් ඒකකය සම්පූර්ණයෙන් කඩා වැටිලා සමාජමය ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවාය කියන එක උතුරු මැද පළාතෙන් හොඳටම අවබෝධ කරගත් කෙනෙක් තමයි, ගරු ජනාධිපතිතුමා. ඒ අවබෝධ කරගැනීම නිසා තමයි එතුමාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයට -මෛත්‍රී පාලනයක් සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රකාශනයට- පිට රට සිටින ශ්‍රමිකයන්ගේ පවුල් සඳහා සුබසාධන ක්‍රමයක් ආරම්භ කරනවාය කියන එක ඇතුළත් කළේ. මා සන්තෝෂයෙන් කියන්න ඕනෑ, ඒ වෙනුවෙන් අපි "ශ්‍රමික සුරැකුම" නමින් අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා යටතේ සහ අතිරේක ලේකම්තුමිය යටතේ විශේෂ ඒකකයක් පිහිටුවා ඇති බව. එතුමිය යටතේ කටයුතු කරන නිලධාරීන් 1,000කට ආසන්න පිරිසක් හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම දෙදෙනෙකු හෝ තුන්දෙනෙකු බැගින් ඉන්නවා. අපේ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ඒකකය ජනවාරි 8වන දා ඉඳලා ජනවාරි 14වන දා වන කල් -සතියක්ම- දැනුවත් කළා, තමා පදිංචි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට -ළඟම තැනට ගිහින්- ලියා පදිංචි වෙන්න කියලා. ඒකට විරුද්ධව ලොකු මඩ ප්‍රචාරයක් ගියා, 'සමෘද්ධිය කපන්නයි, පිට රට රැකියා කරන අයගෙන් බදු අය කරන්නයි මේ දත්ත එකතු කරන්නේ. ඒ නිසා ඔය ගොල්ලෝ ලියා පදිංචි වෙන්න එපා.' කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශ්වාස කරනවා ලක්ෂ 14ක් විතර පිට රට රැකියා කරනවා කියලා. ඒ අතරින් 96,000යි පළමුවැනි වටයේදී -ජනවාරි 14වන දා වන විට- ලියා පදිංචි වුණේ. දැන් දින නියමයක් නැතිව අපි එය දීර්ඝ කර තිබෙනවා. මේ දවස්වල ලක්ෂ දෙක පැනලා ලියා පදිංචි වෙලා තිබෙනවා. අපි ඒ පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය තත්ත්වය, ඒ රටේ ඉඳලා බිරිඳ හෝ ස්වාමියා මේ රටේ සිටින කෙනාට එවන මුදල් පරිහරණය කරන්නේ කොහොමද කියන කරුණු සොයා බලනවා. ඒ හැම පවුලක් වෙනුවෙන්ම -හැම කෙනෙකු වෙනුවෙන්ම- ෆයිල් එකක් විවෘත කරලා ඒ අය පිළිබඳව හොඳ අධීක්ෂණයක් ඇතිව අපි මේ වැඩ කටයුතු කරගෙන යනවා. මා කියන්නේ නැහැ ඒ කටයුතු සියයට සියයක්ම කෙරෙනවා කියලා. තවම ඒ කටයුතු පටන්ගත්තා විතරයි. ලබන අවුරුද්දේ මේ කාලය වන විට සමහර වෙලාවට ඒ කටයුතු සියයට සියයක්ම ඉටු කරන්න පුළුවන් වේවි. ඒ විතරක් නොවෙයි. ඒ දරුවන්ගේ දහම් අධ්‍යාපනය පිළිබඳව, මානසික මට්ටම පිළිබඳව -මේ හැම එකක් පිළිබඳවම- සොයා බැලීමක් කරනවා, විශේෂයෙන්ම අම්මා නැත්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කවුරුත් දන්නා විධියට, අපේ හෘදය සාක්ෂිය දන්නා විධියට මොකක් හෝ අපරාධයක් සම්බන්ධ සිද්ධි ගැන සොයා බැලුවාම, ඒ පවුල් ගැන සොයා බැලුවාම, ඒ හැම පවුලකම අම්මා හෝ තාත්තා විදේශගත වෙලා. අපි ඒක නැහැ කියලා කියන්නේ නැහැ. ඒ වගකීම මේ අවුරුද්දේ මට භාරගන්න බැහැ. 2018 විතර වන කොට එහෙම එකක් වෙලා තිබෙනවා කිව්වොත්, එතකොට අපි ඒ වගකීම භාර ගන්නම්. හැබැයි, පසු ගිය කාලයේ වුණු දේවල් නිවැරදි කරන්න අපට පොඩි කාලයක් යනවා.

මේ වෙලාවේ අපේ අනුර කුමාර දිසානායක මැතිතුමාගේ යෝජනාවේ සඳහන් කරුණු කීපයක් ගැන කථා කරන්න මම බලාපොරොත්තු වනවා. එතුමා කිව්වා, මැද පෙරදිග රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයන් අත්තනෝමතික ලෙස රැකියාවලින් ඉවත් කිරීමේ තර්ජනයක් තිබෙනවා කියලා. අපට තවම එවැනි කිසිම දෙයක් වාර්තා වෙලා නැහැ. නමුත්, අපි අලුත් රැකියා වෙළෙඳ පොළවල් සොයමින් ඉන්නවා. අලුත් වෙළෙඳ පොළවල් සොයමින් ඉන්නේ අපේ රටට ගැළපෙන සමාජයීය, දේශගුණික පසු බිම් තිබෙන රටවලට ශ්‍රී ලාංකිකයන් රැකියාවලට යවන්නයි. එහෙම යනවා නම්, ඒක ගොඩක් හොඳයි. ඒක හැම දෙනෙකුටම ශුභදායකයි. පසු ගිය කාලයේ වෙළෙඳ පොළේ තෙල් මිල වැටෙනවාත් එක්කම ඒ රැකියා වෙළෙඳ පොළේත් අඩු වීමක් තිබුණා. කවුරුත් පිළිගත් සත්‍ය ඒකයි. ඊශ්‍රායේ-පෙරේදා වනකොට සවුදි අරාබියේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. නමුත්, මොනම රටක හරි සේවයෙන් ඉවත් කිරීමක් ගැන ප්‍රශ්නයක් වුණොත්, විදේශ සේවා නියුක්ති කාර්යාංශය අපේ නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් අනිවාර්යයෙන්ම ඒ ප්‍රශ්නය විසඳනවා. ඒ සඳහා උපරිම වශයෙන් සති දෙකක් යයි. හැබැයි, ඒවා අපට පැමිණිලි වශයෙන් ලැබෙන්න ඕනෑ. අපේ තානාපති කාර්යාල, අපේ නිලධාරීන් ඒ සම්බන්ධයෙන් දැනුවත් වන්න ඕනෑ.

මේ වනකොට සවුදි අරාබියේ සේවය කරන ශ්‍රී ලාංකිකයන් සියයකගේ පමණ රැකියා අහිමි වෙලා තිබෙන බවට අපට වාර්තා වෙලා තිබෙනවා. අපේ කාර්යාංශයේ සභාපතිතුමාගේ මැදිහත්වීමෙන් ඒ හැම කෙනෙකුගේම දෛනික ආහාර සඳහා ඩොලර් 50 බැගින් හැම දාම අපේ තානාපති කාර්යාලයට බැර කරමින් ඉන්නවා. නමුත්, මේ වනකොට ඒ රජතුමා මේ ප්‍රශ්නය විසඳන්න මැදිහත් වෙලා තිබෙනවා. ඉන්දියාවේ 10,000කට ආසන්න පිරිසකගේ රැකියා නැති වෙලා තිබෙනවා. නමුත්, සවුදි අරාබියේ ලියා පදිංචි වී සහ ලියා පදිංචි නොවී සිටින ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණය ලක්ෂ දෙකක් පමණ කියලා අපි විශ්වාස කරනවා. ඒ ප්‍රමාණයෙන් සිය දෙනෙකුගේ පමණ රැකියා අහිමි වීමේ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ කර්මාන්ත ශාලා දෙකක් වැසී යෑම හේතුවෙන්. හැබැයි, මේ වනතෙක් මොනම හේතුවකටවත් මැද පෙරදිග රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයන් අත්තනෝමතික ලෙස රැකියාවලින් ඉවත් කිරීමේ තර්ජනයක් ඇති වෙලා නැහැ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවසරය ඇතුව ගරු ඇමතිතුමියගෙන් ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලි කර ගැනීමක් කර ගන්න පුළුවන්.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මම පැහැදිලි කර ගැනීමක් කර ගන්නයි බලාපොරොත්තු වන්නේ. ගරු ඇමතිතුමියනි, ඔබතුමිය මේ ක්ෂේත්‍රය සඳහා ප්‍රමුඛ කාර්ය භාරයක් කරනවා කියලා අපි දන්නවා. ඒත් එක්කම අපිත් අමතක කළාද කියලා තමයි මේ ප්‍රශ්නය අහන්න වන්නේ. විශේෂයෙන්ම වෘත්තිකයෝ. වෘත්තිකයන් කියලා මම මේ වෙලාවේ කථා කරන්නේ ඉන්ජිනේරුවරු, ප්‍රමාණ සමීක්ෂකයන්, කළමනාකරණ ශිල්පීන්, ආචාර්යවරු, මහාචාර්යවරු ආදී ක්ෂේත්‍රවල රැකියාවල නිරතවන්නන්. ලෝකයේ බොහෝ රටවල මේ ක්ෂේත්‍රවලත් රැකියාවල නිරත වෙලා සිටින ශ්‍රී ලාංකිකයන් ඉන්නවා. මේ පිරිස වෙනුවෙනුත් යම් කිසි වැඩ පිළිවෙළක් අවශ්‍යයි. විශේෂයෙන් මේ අයගේ සේවය නැවත ලබා ගන්න ඔබතුමියගේ අමාත්‍යාංශය හරහා යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වනවාද කියන එක මම දැනගන්න කැමැතියි. අද මම මේ සම්බන්ධයෙන් කථා කරන්නත් බලාපොරොත්තු වුණා. ඒ සඳහා අපි හදපු යෝජනාවලියක් තිබෙනවා. එය ඔබතුමියට භාර දෙන්න අපි කැමැතියි. ඒ වාගේම මේ අවස්ථාවේදී මම ඒ යෝජනාවලිය **සභාගත*** කරනවා.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
බොහොම ස්තුතියි.

හැබැයි, අපට කවුරු ගැනත් වග කියන්න පුළුවන් වන්නේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචි වෙලා තිබෙනවා නම් පමණයි. සමහර අය එහේ ඉගෙන ගෙන එහේම රස්සා කරනවා. සමහර අය ලියා පදිංචි නොවී ගිහිල්ලා එහේ රස්සා කරනවා. ඒ අය ගැන දැනුවත් කිරීමක් අවශ්‍ය වනවා. එතකොට අපට මැදිහත්වීමක් වන්න පුළුවන්.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

අපි බලාපොරොත්තු වුණේ ඒ ගොල්ලන් ලියා පදිංචි කරන ක්‍රමවේදයක් තුළින් ඔබතුමියගේ අමාත්‍යාංශයේ network එකට ඇතුළත් කරන්නයි.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමියනි, මටත් මෙතැනදී පැහැදිලි කර ගන්න කරුණක් තිබෙනවා. ඒ කියන්නේ ඉගෙන ගත්ත අය ලියා පදිංචි නොවීද පිට රට යන්නේ? සාමාන්‍ය දුප්පත් අයද ලියා පදිංචි වන්නේ?

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
නැහැ, නැහැ, එහෙම එකක් නැහැ. කවුරුත් ලියා පදිංචි වන්න ඕනෑ. නමුත්, මේකනේ තිබෙන වැඩේ. ඔය කියන විධියේ වෘත්තික මට්ටමේ සිටින සමහර අය ඒ රටවල ඉගෙන ගෙන, ඒ රටවලම පදිංචි වෙලා, එහේම රැකියා කර ගෙන ඉන්නවා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මම අවුරුදු 17ක්ම වෙන රටක සිටියා. නමුත්, මම කවදාවත් ලියා පදිංචි වෙලා නැහැ. හේතුව, ලියා පදිංචි වීම ගැන අපේ දැක්ම සහ අපේ මතය තිබෙන්නේ මේ ලියා පදිංචි කරන්නේ විදේශගත වන ගෘහ සේවිකාවන් වැනි රැකියා කරන අය පමණයි කියලායි. ගොඩක් අය දන්නේ නැහැ, අනෙක් වෘත්තිකයින්ටත් ලියා පදිංචි විය හැකියි කියලා. මේ පිළිබඳව දැනුවත් කිරීමේ වගකීම ඔබතුමියන්ලාට සහ අමාත්‍යාංශයට තිබෙනවා.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ඔය යෝජනාව භාර දෙන්න කෝ.

ඊළඟට, අපේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා තවත් ඉල්ලීමක් කළා, ශ්‍රී ලාංකික දරුවන් ලංකාවේ පාසල්වලට ඇතුළත් කිරීමේදී ඇති වන ගැටලු සම්බන්ධයෙන්. සාමාන්‍යයෙන් මෙවැනි ඉල්ලීම්වලදි අපට පුංචි මැදිහත් වීමක් වෙන්න පුළුවන්. එතුමා කථා කළේ ඉතාලියේ පදිංචි අය ගැනයි. ඉතාලියේ ඉපදුණු සහ ඉතාලියේ පදිංචි වෙලා හිටපු අයට අධ්‍යාපනය ලබන්න වෙන්නේ ජාත්‍යන්තර පාසල්වලින්. ඊට අමතරව, මැද පෙරදිග රටවල ඉඳලා ආපු, එහෙම නැත්නම් එහේදි ඉපදුණු දරුවන් මෙහෙ ඇවිල්ලා ඉස්කෝලවලට යන සිද්ධීන් ගැන නම් අපට වාර්තා වෙලා නැහැ. එතුමා කියපු ආකාරයට ඉතාලියේ පදිංචි වෙලා ඉඳලා ආපු අය ගැන කථාව තමයි මමත් දන්නේ.

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

එතුමා ඇහුවා, ශ්‍රී ලාංකිකයන්ට විදේශ රැකියාවලදී ලැබෙන අවම වැටුප මේ රටේ ආර්ථික තත්ත්වයට සරිලනවාද කියලා. මේ තාක් කාලයක් අවම වැටුපක් තිබුණේ නැහැ. අද ලැබෙන අවම වැටුප බලන කොට ඩොලර් 300ක් කියන්නේ රුපියල් 45,000ක මුදලක්. එවැනි අවම වැටුපක් ලබා දීම හෝ ක්‍රියාත්මක වුණේ මේ රජයේ ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ අවසරයෙන් අපේ මුදල් ඇමතිතුමා ඒ අවශ්‍ය කටයුතු කරපු නිසායි.

විශේෂයෙන්ම ආර්ථිකය වැඩි දියුණු කිරීම සඳහා සහ මීට වැඩි වැටුපක් ලබා ගන්න පුළුවන් ආකාරයට අපේ ශ්‍රමිකයන්ට විධිමත් පුහුණුවක් ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. සමහර වෙලාවට අපේ රටින් විදේශගත වන කාන්තාවන්ට පොඩි බලපෑමක් තිබෙනවා. මොකද, ඒ අයගේ ප්‍රමිතිය පිළිබඳව පුංචි ගැටලුවක් තිබෙනවා. ඒක නැහැයි කියලා මම කියන්නේ නැහැ. ඒ වාගේම අපේ කාන්තාවන්ට තිබෙන තවත් ප්‍රශ්නයක් තමයි භාෂාව පිළිබඳ අවබෝධයක් නැතිකම. දැන් පිලිපීනයේ අය අපි ගන්නවාට වැඩිය ඩොලර් 100ක් හෝ වැඩිපුර ගන්නවා. ඒකට හේතුව ඒ අයට හොඳ භාෂා දැනුමක් තිබීම සහ ඒ රට ලබා දෙන පුහුණුවයි. අපිත් ඒ මට්ටමට පුහුණුවක් ලබා දෙන්න කල්පනා කරනවා. හැබැයි, අපි නැවත නැවතත් කියන්න ඕනෑ, කාන්තාවන් පිට රට යැවීම දිගින් දිගටම කරගෙන යාම අපේ රජයේ ප්‍රතිපත්තියක් නොවන බව. තව අවුරුදු කිහිපයක් තුළ එම කටයුත්ත අවම මට්ටමකට ගෙනෙන්නයි අපි බලාපොරොත්තු වන්නේ.

විශ්‍රාම වැටුප ගැනත් කථා කළා. විදේශගත ශ්‍රමිකයන්ට විශ්‍රාම වැටුපක් අපේ ජනාධිපතිතුමා යෝජනා කළා. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු විශේෂයෙන්ම අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් මේ වෙන කොට කරගෙන යනවා. ඒ වාගේම විදේශ ගත වූවන්ගේ ඡන්ද අයිතිය ගැනත් කථා කළා. අපි කවදාවත් විදේශ ගත වූවන්ගේ ඡන්ද අයිතියක් ගැන කථා කරලා නැහැ. මොනම හේතුවකටවත් විදෙස්ගත ශ්‍රමිකයන්ට ඡන්ද අයිතිය ලබා දීමේ පුළුවන්කමක් අපට නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් මා ඔබතුමාට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. මේ රටේ සාධාරණ ඡන්දයක් පැවතුණේ 2015 අගෝස්තු 17වැනිදායි. මෙහෙ පදිංචිව සිටින අයගේ ඡන්දය පාවිච්චි කිරීමවත් හරියට සිදු වන්නේ නැති තත්ත්වයක් තිබෙනකොට, ඇහැට පෙනෙන්න නැතිව සිටින අයට -විදේශවල පදිංචිව සිටින අයට - ඡන්ද අයිතිය දුන්නොත්, ඒ ඡන්දය පාවිච්චි කිරීම කොහොම සිදු වෙයිද? ඒ නිසා අපේ එහෙම කිසිම අදහසක් නැති බව මා මේ අවස්ථාවේ දී කියන්න ඕනෑ.

ඊළඟට, තීරු බදු රහිතව වාහනයක් ලබා ගැනීමේ පහසුකම ගැන කථා කළා. එක එක මට්ටම් අනුවයි අපට ඒ පහසුකම සලසන්න පුළුවන් වෙන්නේ. විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, තීරු බදු පහසුකම කටුනායක විතරක් දෙන නිසා, අනෙක් තැන්වල ඒ පහසුකම දෙන්නේ නැති නිසා ඒ අයට අපහසුතාවක් ඇති වෙනවා කියලා. නමුත්, මේ අවස්ථාවේ ඔබතුමාට මතක් කරන්න ඕනෑ, අනෙක් තැන්වලිනුත් ඒ සහනය ලබා ගන්න අවස්ථාව දුන්නොත් ඒක ව්‍යාපාරයක් බවට පත් වෙන බව. ඒ නිසයි කටුනායකට විතරක් මේක සීමා කරලා තිබෙන්නේ.

ඒ වාගේම ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා අපි භාර ගන්න කොට නම්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කටුනායක තිබෙන්නේ මත් පැන් නේද? කටුනායක duty-free shopsවල තිබෙන්නේ මත් පැන්.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ඒ ඔබතුමාට පෙනෙන දේ විතරයි. අනෙක් දේවලුත් තිබෙනවා. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා අනිවාර්යයෙන්ම වංචා දූෂණ ගැන සොයලා කටයුතු කරනවාය කියලා. සෙව්වේත්, කටයුතු කළේත් මගේ අවශ්‍යතාවට. මොකද, අපි සොයා ගෙන බලා ගෙන ඕනෑ ඒවා අවම කරන්න. ඒ වාගේම මම භාර ගන්න කොට රජයේ විගණකාධිපතිවරයා විසින් කරන ලද විධිමත් පරීක්ෂණයේ වාර්තාව මට භාර දුන්නා. ඒ වාර්තාව සම්බන්ධයෙන් කටයුතු කරන්න මම මූල්‍ය අපරාධ කොට්ඨාසයට භාර දී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් බලය සහ අයිතිය නැති නිසා එතැනින් එහාට කටයුතු කරන්න මට පුළුවන්කමක් නැහැ. FCID එක කරන දේ අනුව තමයි මට මොනවා හරි කරන්න පුළුවන් වන්නේ.

කටුනායක ගුවන් තොටුපොළෙන් යන අයගෙන් ලියා පදිංචි මුදලක් අය කර ගන්න එක ගැනත් ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා. අනිවාර්යයෙන්ම අපි ඒ මුදල අය කර ගන්න ඕනෑ. ඒකෙන් සියයට 70ක් තමයි ඒජන්තවරුන්ට යන්නේ. ඒ වාගේම වයස් සීමාව අවුරුදු 22 දක්වා අඩු කිරීම පිළිබඳවත් එතුමා කිව්වා. ඒ වාගේ තමයි රිසානා නෂික්ලා වගේ අය ගියේ. ඊයේ පෙරේදා ක්‍රිෂාන්ති කියලා කෙනෙක් ගැනත් සිද්ධියක් වුණා. මම හිතන්නේ ඒවා ගන කවුරුවත් කථා කරන්නේවත් නැහැ. මොකද, ඒවා ඒ කාලයේ වුණු දේවල් වෙන්න ඇති. ක්‍රිෂාන්ති කියලා අවුරුදු 17ක ළමයෙක් හොර සහතික හදලා යවලා, ඒ ළමයා සිය දිවි නසා ගෙන තිබුණා. අපි ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ ඇයගේ මිනිය ලංකාවට ගෙන්වුවා. මේ විධියේ කාරණා කිහිපයක් තිබෙනවා. ඒ නිසා යම් මට්ටමක; එකම වයස් සීමාවක හිටියොත් අපට මේ කාර්ය පහසු වෙනවා. අවුරුදු පහට අඩු දරුවන් සිටින කාන්තාවන්ට යන්න දෙන්නේ නැහැයි කියලා නීතියක් තිබෙනවා. දැන් අවුරුදු 17, 18 දරුවන් සඳහා හොර සහතික හදලා ඒ මඟින් පිට රටවලට යවනවා නම්, ඒ වයස් සීමාව අවුරුදු 22 සීමාවට ගෙනෙන එක වරදක් හැටියට මම දකින්නේ නැහැ. කෙසේ වෙතත් මම යෝජනා කළ පරිදිම ඉදිරියේදී වයස අවුරුදු පහට අඩු දරුවන් සිටින කාන්තාවන් පිට රට යැවීම සම්බන්ධයෙනුත් කමිටුවක් මඟින් තීරණයක් ගෙන තිබෙනවා. කමිටුවක් හරහා ඒ යෝජනාව ක්‍රියාත්මක කරනවා. ඒ හැම එකක්ම අපට පුළුවන් උපරිම මට්ටමකින් කරනවාය කියන එකත් මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ.

ඊ ළඟට මතක් කළ යුතු තවත් විශේෂ කරුණක් තිබෙනවා. සමහර අය වැටුප් නැතිව එවනවා කියලා අපේ ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය සඳහන් කළා. එහෙම සිද්ධීන් වෙනවා. අපි රජයන් අතර ගිවිසුම් ඇති කර ගෙන කටයුතු කළත්, මොන එකඟතාව තිබුණත් සමහර වෙලාවට ඒ යන රැකියා ස්ථානයේ ස්වභාවය සහ පරිසරය අනුව අවුරුදු ගණන් වැටුප් නොලබා ඉඳලා, පසුව තානාපති කාර්යාලවලට ඇවිල්ලා තමන්ට හිමි වැටුපත් අරගෙන ආපු අය ඉන්නවා. මේ කාලය තුළ විතරක් වාර්තා වුණු එවැනි අයගේ ගණන ඉතාමත් වැඩියි. එක කාන්තාවකට ලංකාවට එන කොට කථා කරන්නත් බැහැ. ඇය ධනවතී මහත්මිය. අපේ තානාපති කාර්යාලයේ නිලධාරින්ගේත් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරින්ගේත් මැදිහත් වීමෙන් එතුමියට රුපියල් ලක්ෂ 21ක් අර ගෙන දුන්නා. තවත් කෙනකුට රුපියල් ලක්ෂ 15ක්, තවත් කෙනකුට රුපියල් ලක්ෂ 18ක්, තවත් කෙනකුට ලක්ෂ 26ක්, තවත් කෙනකුට ලක්ෂ 12ක්, තවත් කෙනකුට රුපියල් ලක්ෂ 10ක් අර ගෙන දුන්නා. අපේ නිලධාරිනුත් උපරිම මට්ටමින් වැඩ කරලා එසේ වැටුප් නොලබා සිටි අයට ඒ විධියට මුදල් ලබා දෙන්න කටයුතු කළා.

විදේශගත වීමකදී වෙනත් කිසිම මුදලක් අය කරන්නේ නැහැ. විශේෂයෙන්ම විදේශ සේවා නියුක්ති කාර්යාංශය හැටියට අපි

ඕනෑම නියෝජිතායතනයකට අය කරන්න අවසර දී තිබෙන මුදල් ප්‍රමාණයක් තිබෙනවා. ඇඟලුම් කාර්මාන්තයේ රැකියාවකට පිට රට යන කෙනකුගෙන් දැනට අය කරන්න පුළුවන් රුපියල් 35,000යි. ඒක රුපියල් 50,000 දක්වා වැඩි කරන්න ඉන්නවා. ඒ වාගේම ඊශ්‍රායලයට යන සාත්තු සේවිකාවකගෙන් අය කරන්න පුළුවන් රුපියල් ලක්ෂ 3යි. ඒ රටවලින් නොයෙකුත් තැරැව්කරුවන්ට දෙන්න තිබෙන ප්‍රමාණය අනුව ඒකත් අපි රුපියල් ලක්ෂ 6 දක්වා වැඩි කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. සිංගප්පූරුවට යන අයගෙන් රුපියල් 25,000යි අයකරන්නේ. මැද පෙරදිග රටවල්, සිංගප්පූරුව, මැලේසියාව සහ ඊශ්‍රායලය හැර අනික් ඕනෑම රටක සේවය කරන්න යන ගෘහ සේවිකාවන් සඳහා අයකරන මුදල් ප්‍රමාණය රුපියල් ලක්ෂ 3යි. ගෘහ සේවිකාවන් වශයෙන් මැද පෙරදිග රටවලට, මැලේසියාවට සහ මාලදිවයිනට යන අයගෙන් මුදල් අයකිරීමක් නැතුව තමයි ඒ ගොල්ලන්ට යන්න අවසර දීලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ රටවල passport එක තබා ගැනීම ගැන මේ ගරු සභාවේ කථා කළා. ඒ සම්බන්ධයෙන් පාලනයක් කරන්න අමාරුයි. මේ රටේ ඉන්න නියෝජිතායතනවල agentsලාට රැකියා ගිවිසුම් එවන්නේ, පිට රට ඒජන්සිකරුවන් අපේ තානාපති කාර්යාලයේ ලියා පදිංචි වුණාට පස්සේ ඒවා ගැන සොයා බැලීමෙන් පසුයි. එම රටවලින් අනුමැතිය දුන්නේ නැත්නම් මේ රටට ඒ ගිවිසුම් එවන්න බැහැ.

ඒ විතරක් නොවෙයි. මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ, විශේෂයෙන්ම අතිංසක මිනිසුන්ගෙන් මුදල් අය කරන එක අවම කරන්න හැම පැත්තකින්ම අපි පුළුවන් තරම් උපරිම ආකාරයකින් කටයුතු කර තිබෙනවාය කියලා. කවුරුන් හෝ වැඩි මුදලක් අය කර තිබෙනවා නම්, දෙනවාය කියපු රක්ෂාව නොදී වෙනත් රක්ෂාවක් දීලා තිබෙනවා නම්, පොරොන්දු වූ වැටුපට වඩා අඩු වැටුපක් ගෙවනවා නම් මේ හැම එකක් සම්බන්ධයෙන්ම පැමිණිලි කරන්න ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සමථ අංශය කියා පැමිණිලි අංශයක් වෙනම තිබෙනවා. ඒකට ඇවිල්ලා පැමිණිල්ලක් කළාට පස්සේ කිසිම තත්ත්වයක්, තරාතිරමක් ගැන අපි බලන්නේ නැහැ.

Gulf Agency එක ගැන දැන් මේ සභාවේ කථා කළා. මා ඒ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අපට ඒ සම්බන්ධයෙන් විස්තර දෙන්න කියලා. ඒ විස්තර අපට දුන්නොත් අපි ඒ නියෝජිතායතන ගෙන්වා ඒ කටයුතු කරනවා. සමහර නියෝජිතායතනවලට මාසයක් කල් දෙනවා, සමහර නියෝජිතායතනවලට සති 2ක් කල් දෙනවා. ඒ කාලය තුළ ඒ කටයුත්ත කළේ නැත්නම්, ඒ කටයුත්ත කරලා ඉවර වන කල්ම තාවකාලික තහනමක් - suspension එකක් - කරනවා, මන්ත්‍රීතුමනි.

මෙවැනි සිද්ධීන් අවම කිරීමේ බලාපොරොත්තුවෙන් ජනවාරි 01වන දා සිට අලුත් නියෝජිතායතන ලියා පදිංචි කරන්න දෙන්නේ නැහැ. අපේ හිතවත් ගරු මොහොමඩ් නවවි මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා, to register people who are acting as job agents and who have not been registered yet. But, I am sorry to say, we have stopped registering new recruitment agencies from 1st January, 2016. එහෙම කළේ වෙනත් කිසිම හේතුවක් නිසා නොවෙයි. අපට අවශ්‍ය වෙලා තිබෙනවා, ඉතා අවංකව කටයුතු කරන, තමන් අත්සන් කරන ගිවිසුම්වලට අනුකූලව වැඩ කරන හොඳ ප්‍රමිතියක් ඇති නියෝජිතායතන පවත්වාගෙන යන්න. ඒ නිසා අලුතින් නියෝජිතායතන ලියා පදිංචි කරන්න දැන් අවසර දෙන්නේ නැහැ. ඒ වාගේම නියෝජිතායතනයේ ඉතිහාසය, කල්ක්‍රියාව හොඳ නම් ඒ තත්ත්වය හොඳින් පවත්වාගෙන යන්න අවශ්‍ය සහයෝගයත් අපි ලබා දෙනවා.

මේ සියලුම කටයුතු සම්බන්ධයෙන් සන්තෝෂයෙන් කියන්න ඕනෑ, විදේශ රැකියා සඳහා යවන අය සහ ඔවුන්ගේ සේවය ලබන රටවල් අතර එකඟතා කිහිපයක් තිබෙන බව. Colombo Process සහ ඇමතිතුමා කිව්වා වාගේ Abu Dhabi Dialogue යන ආයතන දෙකේම දැන් සභාපතිත්වය දරන්නේ ශ්‍රී ලංකාවයි. මෙහිදී ලැබෙන කථිටයත් ප්‍රශ්න තිබෙනවා, අපටත් ප්‍රශ්න තිබෙනවා. ඒවා හැම එකක් ගැනම සාකච්ඡා කරලා, පොදු එකඟතාවලට එළඹීලා කටයුතු කිරීම සඳහා මේ වනකොට අපි හැම දෙයක්ම කරලා තිබෙනවා.

විගමණික ශ්‍රමිකයන් පිළිබඳ වැඩ පිළිවෙළ සංවිධානය කරන රටවල් අතරින් ඉතා හොඳම ගණයේ, විශිෂ්ට ගණයේ ප්‍රඥප්තියක් තිබෙන රටක් හැටියට ශ්‍රී ලංකාව පිළිගෙන තිබෙනවා. අපට තිබෙන ගැටලුවක් තමයි, සමහර තැන්වලදී සමහර අය කටයුතු කරන ආකාරය සාධාරණ නොවීම. මම අකමැත්තෙන් වුණත් මේ කාරණය කියන්නට ඕනෑ. රිසානා නෆීක් ගැන කථා කරන ගොඩක් අය පසු ගිය දෙසැම්බර් 21වැනිදා සවුදියේදී ගල් ගහලා මරන්න නියම වුණු කාන්තාව බේරා ගත් හැටි ගැන කථා කරන්නේ නැහැ. මේ යහ පාලන රජයේ මැදිහත් වීමෙන්; ජනාධිපතිතුමාගේත් අගමැතිතුමාගේත් මැදිහත් වීමෙන් වාගේම, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, අධිකරණයේ ස්වාධීනත්වය, මාධ්‍ය නිදහස, මේ හැම එකක්ම හොඳ තැනකට ඇවිල්ලා, ලෝකය පිළිගන්නා රටක් බවට අපේ රට පත් වුණු නිසා තමයි සවුදි අරාබි රාජ්‍යය ඒ ගොල්ලෝ ක්‍රියාත්මක කරන්න හිටිය දඬුවම අපේ විදේශ කටයුතු ඇමතිතුමාගේ මැදිහත්වීමෙන් නවත්වා ගන්න පුළුවන් වුණේ. මේවා තමයි අපි අද කථා කරන්න ඕනෑ දේවල්. පාද යාත්‍රා යන ගමන් මෙතැනට ඇවිල්ලා නිකම් මඩ ටිකක් ගහලා යනවා. මේවා ගැන කථා කරන්නේ නැහැ.

මේ අවස්ථාවේ අරවින්ද් කුමාර් මන්ත්‍රීතුමා මෙතැන නැහැ. ඇත්තටම ලෙබනන් රටේ ඇමතිතුමා කියපු කාරණය ගැන මමත් එකඟ වෙනවා. මොන වගේ දඬුවමක් ලැබෙයිද කියලා මට මේ වෙලාවේ කියන්න බැහැ. අපේ රටේ කාන්තාවෝ දෙදෙනෙක් ලෙබනන් රටේ පිරිමි දෙදෙනෙක් එක්ක එකතු වෙලා ඒ රටේ අවුරුදු 89ක පිරිමියෙක් සහ ඔහුව බලා ගත්ත අවුරුදු 57ක විතර කාන්තාවක් මැරුවා. ඒවා අපට විසඳන්න පුළුවන්ද? ඒ නඩුව මේ දවස්වල ඒ රටේ අහනවා. ඒවා එක එක පුද්ගලයෝ කරන දේවල්.

අපේ මිනිස්සු ලක්ෂ 14ක් ලෝකයේ හැම තැනම ඉන්නවා නම්, අපි රටක් හැටියට ඒ ගොල්ලෝ කරන දේවල් අවම කරන්න තමයි උපරිම මට්ටමකින් ඒ අය සඳහා වන පුහුණුව දීර්ඝ කළේ. මේක පෙරේදා වුණු සිදුවීමක්. ඊශ්‍රායල් කාන්තාවක් මේ රටේ හදන passport එකකින් ඊශ්‍රායලයට ගිහින් ගොඩ බහිනවා. එතකොට අපේ තානාපති කාර්යාලයේ අපේ නිලධාරින්ව කැඳවලා, ඒ ගොල්ලෝ කරුණු හොයලා බලන කොට ඒ passport එක ගැන පොඩි සැකයක් ඇති වෙලා තිබෙනවා. ඒ passport එක ලබා ගන්න දීපු උප්පැන්නයේ ලංකාවේ ඉන්න කාන්තාගේ නම තිබෙනවා. හැබැයි, ඊට ඉස්සර වෙලා ඒ කාන්තාවටත් දරුවාටත් ඉල්ලපු passport එක වෙනුවෙන් New Delhiවල තිබෙන ඊශ්‍රායල් තානාපති කාර්යාලයට යොමු කළ එකේ කාන්තාගේ නම නැහැ. බොහොම සන්තෝෂයෙන් කියන්නට ඕනෑ, ඒ රටේ කෘෂිකර්මාන්තය සඳහා seasonal workersලා, ඒ කියන්නේ මාස හයක, අටක කාලයකට පිරිමි ශ්‍රමිකයන් ගන්නේ අපේ රටෙන් විතරයි. අවම වශයෙන් එක ළමයෙක් අනිවාර්යයෙන්ම මාසයකට ලක්ෂයක් ගෙදරට එවනවා. අපට මේ අවුරුද්දේ ඒ සඳහා 350දෙනෙකුට අවස්ථාව ලැබුණා. මේ දවස්වල ඒවා ඔක්කෝම කෙරෙනවා. ඒවා කෙරෙන කොට, මෙහෙම සිද්ධියක් වුණාම ඒ රටවල් අපි ගැන විශ්වාස කරයිද? ඇත්තටම අපි ඒ ගැන කනගාටු වෙනවා. මම කිව්වේ, හොඳ දෙයක් වුණාම මෙතැන ඒ ගැන කථා කරන්නේ නැහැ කියලායි.

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

ගල් ගහලා මරන්න යන එක බේරා ගත්තාම, මේ අය කියන විධියට ඒක වුණේ අපේ ජනාධිපතිතුමා, අගමැතිතුමා පිළිගන්න නිසා නොවෙයි. මේවා අපි හොඳට අවබෝධයකින් කරන්නේ. නිකම් මෙතැනට ඇවිල්ලා මඩ ටිකක් ගහලා, කියවලා යන එක හරි ලෙහෙසියි.

ඇත්තටම මම අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට දහස් වාරයක් ස්තුතිවන්ත වෙනවා. එතුමා රක්ෂණ ක්‍රමයක් අල්ලාගෙන පසු ගිය කාලයේම මට ඇති වෙන්න මඩ ගැහුවා. ඒ පිළිබඳ කරුණු මේ උත්තරීතර සභාවේ කියලා, මෙතැන වාර්තාගත කරලා, ඒ සම්බන්ධයෙන් ඕනෑම පැමිණිල්ලක් කරලා, ඕනෑම විභාගයක් කරන්න ඕනෑම කෙනෙකුට පුළුවන්කමක් තිබෙනවා. මට කිසිම ප්‍රශ්නයක් නැහැ. මොකක්ද මේ රක්ෂණ ක්‍රමය? මේක සහන රක්ෂණ ක්‍රමයක්. අපේ තිබෙන රක්ෂණ ක්‍රමයේ හැටියට මරණයට පත් වුණොත් හෝ පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වුණොත් හෝ ඇවිල්ලා මාස තුනක් ඇතුළත මැරුණොත්, ඒ ඕනෑම ශ්‍රමිකයෙකුට රුපියල් ලක්ෂ හතරක් ලබා දෙනවා. අපි මේක හොඳින් අධ්‍යයනය කළා. ඒ රටට ගියාම එක ඒජන්සියකින් ගෘහ සේවිකාවන්ට group policy කියලා එකක් දානවා. ඒ රටේදී මොකක් හරි කරදරයක් වෙලා මෙහාට ආවාට පස්සේ කිසිම දෙයක් නැහැ. ඔය සම්බන්ධයෙන් පසු ගිය දවස්වල, අපේ පළාත් සභාවේ ඉන්න නියෝජිතයෙක් රූපවාහිනිය හරහා මා සම්බන්ධයෙන්, මේ රක්ෂණය ගැන නොයෙක් ආකාරයේ මඩ ප්‍රචාරය කළා. ඔහුගේ නම මට මතක නැහැ. නමුත්, ඔහුගේ මව කුවේට්වල ඉඳලා ගෙන්වලා දුන්නේත් අපියි. ඒවා ගැන කථා කරන්නේ නැහැ.

අපි මේ කාරණ වලදී බොහොම විනිවිදභාවයකින් වැඩ කරලා තිබෙනවා. අනුර කුමාර දිසානායක මහත්මයා මගෙන් ඒ වේලාවේ ඇහුවා, "රක්ෂණ ක්‍රමය හඳුන්වා දුන්නේ කවුද?" කියලා. ඒක හඳුන්වා දුන්නේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසිනුයි. විදේශගතව ඉන්න සියලු දෙනාටම ලැබෙන රුපියල් ලක්ෂ හතර විතරක් මදි. පිටරටවල දමන policy දිහා බැලුවාම, සමහර වේලාවට මෙහාට ආවට පස්සේ ඒ ගොල්ලන්ට කිසිම දෙයක් ලැබෙන්නේ නැහැ. අපි බොහොම අමාරුවෙන් තමයි මිනිය ගෙන්වා ගන්නේ. ඒ නිසා මේවා ගැන හොඳ අධ්‍යයනයක් කරලා, අපි මේ කටයුත්ත කිරීමේ සම්පූර්ණ වගකීම භාර දුන්නා. ඒ ගැන කෑ ගහන අය කිහිප දෙනෙක් හිටියා. ඒ ගොල්ලන් මෙතැන හිටියා නම් මම හරි කැමැතියි. අපි ඒ වගකීම සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට භාර දුන්නා. ඒ අය විසින් අපට ලබා දෙන ලද සමාගම්වලට තමයි ඒ රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කරන්න භාර දුන්නේ. නොයෙක් දෙනා නොයෙකුත් විධියේ කථා කියනවා. මෙහෙන් යන ශ්‍රමිකයා ඒ මුදල ගෙවනවාලු. කවුද මේක ගෙවන්නේ කියලා හරියට දන්නවාද කියා මම ඇහුවේ ඒ නිසායි. අපේ මේ ගිවිසුමේ තිබෙන අදාළ මුදල -ඔය කියන ඩොලර් සියය- අනිවාර්යෙන්ම ගෙවන්නට ඕනෑ, විදේශගතවන පුද්ගලයාව ගෙන යන නියෝජිත -agent - සහ sponsor විසිනුයි. මොනම හේතුවකින්වත් අපේ සේවකයා ඒ මුදල ගෙවන්න ඕනෑ නැහැ. ඩොලර් සියය ගෙවන එක සහ මේ රක්ෂණ ආවරණය ලබා දුන්නේ මගේ කාටවත්, එහෙම නැත්නම් අපේ කාර්යාංශයේ කිසිම කෙනෙකුටවත්, දන්නා කියන සමාගම්වලට සම්බන්ධයක් තිබෙන අයටවත් නොවෙයි. අපි ඒක කෙළින්ම ලබා දුන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නිර්දේශ කරන ලද ආයතනවලට පමණයි. ඒ ගැන තවත් විස්තර ඕනෑම වෙලාවක ලබා දෙන්න අපට පුළුවන්.

මේ වන විට කුවේට්, ඩුබායි සහ කටාර් කියන රාජ්‍යයන් තුනේ මෙය ක්‍රියාත්මකයි. කුවේට්වල තිබෙන policy එකේ හැටියට, ඕනෑම වෙලාවක සිදුවන මරණයකදී රුපියල් 956,000/-ක් ඒ අය ගෙවන බව මම මේ වෙලාවේ මතක් කරන්නට ඕනෑ. හදිසි අනතුරකදී දැරීමට සිදුවන වෛද්‍ය වියදම් වෙනුවෙන්, බාහිර සහ නේවාසික රෝගියෙකු රෝහලකින් ලබා ගත් ප්‍රතිකාර සඳහා එක් පුද්ගලයෙකුට අවුරුද්දකට -මෙය අවුරුදු දෙකකටයි ගිවිසුම්ගත කර තිබෙන්නේ- රුපියල් 717,000/-ක් ගෙවනවා. මෘතදේහය ගෙන්වීමට හෝ ස්ථිර අකර්මණ්‍යතාවකදී රක්ෂිතයා සිය රටට පිටත් කර යැවීමට ලංකාවේ මුදලින් රුපියල් 191,000/-ක් ගෙවනවා. සේවකයා සිය රටට පිටමං කර යැවීමට රුපියල් 358,000/-ක් ගෙවනවා. සේවා යෝජකයාගේ නිවසින් පැන යාම, වෙනත් ගෘහ සේවිකාවක් සොයා ගැනීම සහ නීතිමය ආරාවුලකදී ඒ සඳහා යන නීතිමය සහ නැවත පිටත් කිරීමේ වියදම රුපියල් 478,000/-ක් ගෙවනවා. මේ සඳහා සම්පූර්ණයෙන්ම විදේශ නියෝජිත ආයතනය හෝ රැකියාව දෙන පුද්ගලයා -employer - එහෙම නැත්නම් sponsor කරන පුද්ගලයා ගෙවන්න ඕනෑ ඩිනාර් 30යි. රුපියල්වලින් නම් 14,340/-යි. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සහ කටාර් රාජ්‍යයේත් ඒ විධියටම ක්‍රියාත්මකයි. ඒ රටවලදී ඕනෑම අවස්ථාවක් යටතේ සිදු වන මරණයකදී ඇමෙරිකානු ඩොලර් 7,000ක් - රුපියල් 1,015,000ක්- ගෙවනවා. ගිය මාර්තු මාසයේ ගිහින්, මේ insurance cover එක අරගෙන දවස් 48ක් ඇතුළත මැරුණු රියදුරෙකු වෙනුවෙන් මගේ අතින්ම ඔහුගේ ස්වාමි දියණියට සහ දරුවන් දෙදෙනාට රුපියල් 1,015,000ක් ලබා දුන්නා. මරණය කියන කාරණයට අදාළව සියදිවි නසා ගැනීමටත් ගෙවනවා.

කරුණු කාරණා නොදන්නා අය විධියට කථා කරන විට ලෝකයේ කොයි රටේද එහෙම ලැබෙන්නේ කියලා මම අහන්නට කැමැතියි. ඇමෙරිකානු ඩොලර් 100යි කියන්නේ රුපියල් 14,700යි. විශේෂයෙන්ම මට මේ වේදිකාව හදලා දුන් නිසා, මට නැවත නැවතත් කියන්නට තිබෙන්නේ මේ උත්තරීතර සභාව නොමහ අරින්නට කිසිම අවශ්‍යතාවක් නැති බවයි. ඕනෑම වේලාවක ඉදිරිපත් කරන්න ඒ සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් අපට ලබා දුන් නිර්දේශ අපි ළඟ තිබෙනවා. ඉදිරියේදී අපි මේ රක්ෂණ ක්‍රමය අනෙක් රටවලටත් ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වෙනවා. මෙහිදී ඉතාම හොඳ විනිවිදභාවයක් ඇතිව තමයි අපි කටයුතු කළේ.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

ගරු ඇමතිතුමියනි, මම අනුරාධපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් විධියට දැන ගත යුතු කාරණයක් තිබෙනවා. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථානයක් සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉඩමක් වෙන් කරලා තිබුණා. පසුගිය ආණ්ඩුවේ දඹුල්ල ප්‍රදේශයේ සිටි ඇමතිවරයෙක් ඒ ඉඩම පෞද්ගලික ව්‍යාපාරිකයකුට ලබා දුන්නා. ඉදිරියේදී ඔබතුමියගේ නායකත්වය යටතේ අනුරාධපුරයේ පුහුණු මධ්‍යස්ථානය ඉදි කරන්නට සැලසුමක් තිබෙනවාද, ඒක ක්‍රියාත්මක වෙනවාද?

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු මන්ත්‍රීතුමා ඒ ගැනත් මට පොඩ්ඩක් කියන්නට ඕනෑ. අපේ ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමාත් කලින් කිව්වා, "නුවර එළියට පුහුණු මධ්‍යස්ථානයක් නැහැයි" කියලා. දැන් අපි ගෙන යන වැඩ පිළිවෙළ අනුව පළාත් මට්ටමින් තමයි සියලුම දේවල් කරන්නේ. අපි මේ අවුරුද්දේ අම්පාරේ සහ කුරුණෑගල පුහුණු මධ්‍යස්ථානය සහ පළාත් කාර්යාලය කියන සියල්ල ගොඩ නඟන්නට අවශ්‍ය කටයුතු කරනවා. දකුණු පළාතට තංගල්ල මධ්‍යස්ථානය තිබෙනවා. දැනට බස්නාහිර පළාත සඳහා මතුගම එකක් තිබෙනවා. නමුත් අපි බස්නාහිරට තව එකක් හදනවා. අපට ඒ සඳහා අක්කර 6ක භූමි භාගයක් පනාගොඩ තිබෙනවා. අපි

බලාපොරොත්තු වුණේ, අපට අවශ්‍ය වෙලා තිබුණේ උතුරු මැද පළාතේ පුහුණු මධ්‍යස්ථානය හැදීම ඉක්මනින් පටන් ගන්නයි. නමුත්, ඔබතුමා කියූ කාරණය ඇත්ත ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමනි. ඒ වාගේ සිදුවීමක් වෙලා තිබෙනවා. අපි දැන් ඒ ගැටලුව විසඳන්නට ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්තුමාට මැදිහත් වෙන්න කියලා දැනුම් දීලා තිබෙනවා. මොකද, අපි විශාල මුදලක් ගෙවලා තිබෙනවා. ඒ නිසා අපට ඒ ඉඩමේ සන්තකය දෙන්න කියලා තිබෙනවා. ඔය කියන පෞද්ගලික ව්‍යාපාරිකයා මා හමු වෙන්නත් ආවා, මේ ඉඩම කොහොම හරි ඔහුට දෙන්න කියන්න. අපි දෙන්නේ නැහැ මොනම විධියකින්වත්. ඒ ඉඩම ගැන බලාපොරොත්තුවක් තියාගෙන තමයි අපි ඉන්නේ.

අපි මේ වන විට කතරගම ප්‍රදේශයේ විදෙස්ගත ශ්‍රමිකයින්ගේ පවුල්වලට, අපේ ආයතනවල සිටින නිලධාරීන් ඇතුළු රජයේ නිලධාරීන්ට සහ ඔබ ඇතුළු සියලු දෙනාටම ඉන්න පුළුවන් විධියේ නිවාඩු නිකේතනයකුත් හදනවා. අපි ඒ හැම දෙයක්ම කරගෙන යනවා. මේක ලෙහෙසි නැහැ. මම කලින් කිව්ව විධියට අපට කොරියාවේ යන අය සඳහා පුහුණු මධ්‍යස්ථානයක් නැහැ. නමුත් අපි බණ්ඩාරවෙල කහගොල්ලේ ඉඩමක ඒ පුහුණු මධ්‍යස්ථානය හැදීම මේ අවුරුද්දේම පටන් ගන්නට බලාපොරොත්තු වෙනවා. ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමනි, එම නිසා විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ ඔය වාගේ පුංචි පුංචි දේවල් තිබෙන බව. 2014දී පටන් ගත් රත්නපුරයේ සහ බදුල්ලේ පුහුණු මධ්‍යස්ථාන හෙට අනිද්දා අපි විවෘත කරනවා.

අපි ඇත්ත කියන්නට ඕනෑ. අපි ගොඩක් ලොකුවට මේක කරන්නට බලාපොරොත්තු නොවෙන්නේ අපේ රජයේ ප්‍රතිපත්තිය අනුව ඉදිරියේදී විදෙස්ගත ශ්‍රමිකයින් පුහුණු ශ්‍රමිකයින් හැටියට යවන්නට බලාපොරොත්තු වෙන නිසායි. විශේෂයෙන්ම පිරිමි අයට පමණක් විදෙස් රැකියාවල යෙදීමේ අවස්ථාව පවත්වාගෙන යන්නටත්, නුපුහුණු කාන්තාවන් ගෘහ සේවිකාවන් වශයෙන් යැවීම අඩු කිරීමටත් අපි බලාපොරොත්තුවෙන් සිටිනවා. මැද පෙරදිග සේවයට යන ශ්‍රමිකයන්ගේ මේ ප්‍රශ්නයට විසඳුම් විතරක් නොවෙයි, අප කොහොමත් මේ අය වෙනුවෙන් වෙනම රැකියා වෙළෙඳ පොළවල් සොයමිනුයි සිටියේ. මේ වෙන කොට අපට ඒ පැත්තෙන් ටිකක් හොඳ ප්‍රවණතා ඇති වෙලා තිබෙනවා. ඉදිරියේදීත් ඒ සම්බන්ධයෙන් උපරිම උත්සාහයක් දරලා කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. කිව යුතු කරුණු, කාරණා සියල්ල මා අතින් කියැවුණාය කියා මා හිතනවා. අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමාට තමයි මම උත්තර දෙන්න ඕනෑ. ඒ වාගේම අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාත් කරුණු කීපයක් ඉදිරිපත් කළා. සයිප්‍රස් රටේ ක්‍රියාත්මක වන විශ්‍රාම වැටුප ගැන එතුමා කිව්වා. මම පෞද්ගලිකවත් මැදිහත් වෙලා ඒ කටයුත්ත කරන්න උත්සාහ කළා. සයිප්‍රස් රට අයිති වන්නේ යුරෝපා සංගමයටයි. ඒ සඳහා සුදුසුකම් ලබන්න සයිප්‍රසය හෝ යුරෝපා සංගමයේ රටක අවුරුදු 12ක් නොකඩවා රැකියාව කර තිබීම සහ ආපසු මෙරටට පැමිණියාට පසුව අවුරුදු 68 ඉක්මවා තිබෙන්න ඕනෑ. ඊට පසුව තමයි ඒ අයිතිය ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණා ටික තමයි මට ඇත්තටම කියන්න තිබෙන්නේ. අද දිනයේ පැවැති මේ සංවාදය නිසා අප සියලුදෙනාටම ගොඩක් කරුණු, කාරණා අවබෝධ කරගන්න පුළුවන් වුණා. මට පෙනෙනවා, අපේ මහජන නියෝජිතයන් විශාල පිරිසක් කාන්තාවන් පිට රට යැවීම පිළිබඳව ඒ තරම් සුබවාදීව කල්පනා කරන්නේ නැති බව. ඒ අදහස මගේ හිතෙත් හැම තිස්සේම තිබෙනවා. හැබැයි, යම් යම් දේවල් කිරීමේදී අපට පුංචි කාලයක් ගත වෙනවා. අපේ ගරු අමාත්‍යාවරයෙක් කිව්වා වාගේ, ලෙබනන් රටේ සිදු වුණා වාගේ දේවල් ඉදිරියේදී නොවෙන්න අප කටයුතු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප මහා ලොකු දේවල් ඔළුව උඩ තියාගෙන කටයුතු කළාට වැඩක් නැහැ.

පසු ගිය කාලයේ සමහර අය නටපු නැටිලි ඔබතුමාටත් මතක ඇති. "අපි තමයි ලෝකයේ ලොකුම අය" කියලා සමහර අය මිනිසුන්ගේ ඔළුවලට ලොකු මානසික මට්ටමක් ඇතුළු කළා. හැබැයි, අපේ තානාපතිවරු නිතර කියන දෙයක් තිබෙනවා. ඔවුන් තානාපතිවරුන්ගේ රැස්වීමකට හෝ සාදයකට හෝ එකතු වුණාම, යුරෝපය වැනි හොඳ දියුණු රටවලින් ඇවිත් ඉන්න තානාපතිවරු ඔවුන් සමඟ කථා කළොත් පවා කියන්නේ, "Can I get a good maid from Sri Lanka? " - "හොඳ ගෘහ සේවිකාවක් මට දෙන්න"- කියලාලු. අන්න ඒකයි අපේ රට ගැන ඔවුන් තුළ තිබෙන ප්‍රතිරූපය.

සමහර අය යුද්ධය ගැන කථා කළා. ඔය ඔක්කොම කථා කරලා, ලජ්ජා නැතිව තව පාද යාත්‍රා යනවා. මේ රටේ අභිංසක මිනිසුන් මුළා කරලා, රටේ අභිමානය විනාශ කර දමලා, මහා ලොකු දෙයක් කරනවා වාගේ තවත් උත්සාහ කරන්නේ බලයට ඇවිත් පවුල රැකෙන්නේ කොහොමද කියායි. ඒ නිසා එවැනි දේවලට තවත් ඉඩකඩ නොතබා, ගරු ජනාධිපතිතුමාගේත්, ගරු අගමැතිතුමාගේත් උත්සාහය මත, විදෙස්ගත ශ්‍රමිකයන්ගේ දියුණුව පමණක් නොවෙයි, මේ රටට ආයෝජකයන් ඇවිත්, මේ රටේ කර්මාන්තශාලාවල පවා රැකියාව කරන හැම සේවකයෙකුටම -අනුර දිසානායක මහත්තයා කියුවා වාගේ මෙහේ ආර්ථිකයට ගැළපෙන පරිදි - රුපියල් 40,000කවත් අවම වැටුපක් ලබාගන්න පුළුවන් තත්ත්වයකට පත් වෙයි කියා මා විශ්වාස කරනවා.

මේ විවාදයට සහභාගි වෙලා අදහස් ප්‍රකාශ කළ සියලුම මැති ඇමතිවරුන්ටත්, ඒ වෙනුවෙන් මට සහයෝගය දක්වපු අපේ නියෝජ්‍ය ඇමතිතුමාටත්, අපේ කාර්යාංශයේ සභාපතිතුමාටත්, ක්‍රියාකාරී අධ්‍යක්ෂතුමා ඇතුළු සියලුම නිලධාරී මහත්වරුන්ටත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබාදුන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

දීර්ඝ පිළිතුරු කථාවක් කිරීම ගැන ගරු ඇමතිතුමියට මා බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.45ට, 2016 අගෝස්තු 23 වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 5.45க்கு பாராளுமன்றம், 2016 ஓகஸ்ட் 23, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 5.45 p.m. until 1.00 p.m. on Tuesday, 23rd August, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

245 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 245 - இல. 11
Volume 245 - No. 11

2016 අගෝස්තු 23වන අඟහරුවාදා
2016 ஓகஸ்ட் 23, செவ்வாய்க்கிழமை
Tuesday, 23rd August, 2016

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
කථානායකතුමාගේ සහතිකය

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :
ඔලුවිල් වරාය ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙන දැවැන්ත ප්‍රශ්න
සමුද්‍රාරක්ෂක නිලධාරින්ගේ ගෙවීම් සම්බන්ධයෙන් ඇති ගැටලුකාරී තත්ත්වය

යාපනය දිස්ත්‍රික්කයේ භූගත ජලය දූෂණය වීම :
වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගේ ප්‍රකාශය

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
සැමට සරණ සහන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු එස්.සී. මුතුකුමාරණ මහතා]– පළමුවන වර කියවන ලදි.
සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) -[ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] - පළමුවන වර කියවන ලදි.

සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත :
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි.

කල්තැබීමේ යෝජනාව:
ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා සිටින දෙමළ ජාතික සිරකරුවන්

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சபாநாயகரது சான்றுரை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
ஒலுவில் துறைமுகப் பிரதேச மக்கள் எதிர்நோக்கும் பாரிய பிரச்சினைகள்
கடற்பாதுகாப்பு உத்தியோகத்தர்களின் கொடுப்பனவு சம்பந்தமான சிக்கல் நிலைமை

யாழ். மாவட்டத்தில் நிலத்தடி நீர் மாசடைவு:
நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சரின் கூற்று

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
செமட்ட சரண சஹண சேவா மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு எஸ்.சீ. முத்துக் குமாரண] - முதன்முறை மதிப்பிடப்பட்டது
சத்திய ஸ்ரீ கணபதி பக்தி ஜன சேவா மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] - முதன்முறை மதிப்பிடப்பட்டது

விலங்குத் தீனி (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் தடுத்து வைக்கப்பட்டுள்ள தமிழ்க் கைதிகள்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Serious Problems Faced by People in Oluvil Port Area
Problematic Situation Regarding Payments of Maritime Security Officers

GROUNDWATER CONTAMINATION IN JAFFNA DISTRICT :
Statement by Minister of Irrigation and Water Resources Management

PRIVATE MEMBERS' BILLS:
Samata Sarana Sahana Sewa Foundation (Incorporation) - [The Hon. S.C. Mutukumarana] - Read the First time
Sathya Sri Ghanapathy Bhakthi Jana Sewa Foundation (Incorporation) -[The Hon. J.M. Ananda Kumarasiri] - Read the First time

ANIMAL FEED (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

ADJOURNMENT MOTION:
Tamil Prisoners Detained Under Prevention of Terrorism Act

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 අගෝස්තු 23වන අඟහරුවාදා
2016 ඔගස්ட் 23, செவ்வாய்க்கிழமை
Tuesday, 23rd August, 2016

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2016 අගෝස්තු මස 23 වැනි දින මවිසින් පහත සඳහන් පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම)

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන)

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Parliamentary Reforms and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුබසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Minister of Buddhasasana)

ගරු කථානායකතුමනි, 2012, 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා මම ඉදිරිපත් කරමි.

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

එම වාර්තා නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තා
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கைகள்
PUBLIC FINANCE COMMITTEE REPORTS

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Deputy Speaker, I present the Report of the Committee on Public Finance on the matters relating to "Eight Orders under the Special Commodity Levy Act", "Resolution under the Customs Ordinance" and "Four Orders under the Excise (Special Provisions) Act" referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரும் காணி அமைச்சரும்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs and Minister of Lands)

Hon. Speaker, I present a petition from Mr. N. Samaraweera of No. 333/6, Ridiyagama Road, Gallaalithota, Ambalanthota.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.බී. දිසානායක මහතා - පැමිණ නැත.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Science, Technology and Research)

ගරු කථානායකතුමනි, මම අංගොඩ, ගොතටුව, නින්දහේන, අංක 561 දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ.එස්.ඩී. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මම මාතලේ, යටවත්ත, වැලිකන්ද නිවස, අංක 1/56 ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්.බී. රංජනී නිවිබණ්ඩාර මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පාලිත තෙවරප්පෙරුම මහතා - පැමිණ නැත.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මම කඩවත, සූරියපාළුව, ශ්‍රී සීලවංශ නාහිමි මාවත, අංක 65/කේ දරන ස්ථානයෙහි පදිංචි එස්. නිහාල් ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම කොළඹ - 10, මාලිගාවත්ත ජාතික මහල් නිවාස, අංක සී 3/20 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඩී.එන්. විනෝදනී මෙනවියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)

Hon. Speaker, I present a petition from Mr. A. Kandasamy of Mahasivam, Neervely West, Neervely.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) බත්තරමුල්ල, කෙළින් වීදිය, අංක 102/1 දරන ස්ථානයෙහි පදිංචි ජී.එල්.ඒ. කොලොන්නෙ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) යටියන, පුහුල්හේන, වල්බුලුගහහේන, දොලගාවහේන යන ලිපිනයෙහි පදිංචි එච්.ඒ. ඉන්ද්‍රානි මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) කඹුරුපිටිය, කහගල, යොවුන්ගම, අංක 40 දරන ස්ථානයෙහි පදිංචි කේ.එච්. සුනිල් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු කථානායකතුමනි, බුස්ස, හෑගොඩ, මහගොඩ යන ලිපිනයෙහි පදිංචි ජී.එච්.ජී. ප්‍රසාද් චමින්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, මාරවිල, නාත්තන්ඩිය පාර, පරගහවත්ත පාර, "කුසුම්" යන ලිපිනයෙහි පදිංචි එන්. බර්නාඩ් කොස්මන් ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

ගරු කථානායකතුමනි, අනුරාධපුර, කහටගස්දිගිලිය, මීමින්නාවල, අඹගහවැව - 213 (තුලාන) අංක 83 දරන ස්ථානයෙහි පදිංචි එම්.එම්. රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු කථානායකතුමනි, කොළඹ, 04, දුම්රියපල පාර, ඕෂන් වීව් ටවර් ගොඩනැඟිල්ල, සී/7 දරන ස්ථානයෙහි පදිංචි තිලංගනී හේරත් මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, ඇඹිලිපිටිය, පැරණි කඳවුර, එස්.ඕ.එම්. - 1 (7-8) දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ.ඩී. වික්‍රමසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) වස්කඩුව, මහවස්කඩුව, ශ්‍රී ධීරානන්ද මාවත, "අරුණ" දරන ස්ථානයෙහි පදිංචි ඒ. දර්ශන ෆොන්සේකා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) බොරලැස්ගමුව, බොරලැස්ගමුව මහා විද්‍යාලය යන ලිපිනයෙහි පදිංචි නිමල් වික්‍රමආරච්චි මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කාල සීමාව ඉක්මවූ වාහන ආනයනය : විස්තර
கால எல்லை கடந்த வாகனங்களின் இறக்குமதி: விபரம்
IMPORT OF OVERAGE VEHICLES : DETAILS

493/'16

1. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2015 වර්ෂය තුළ දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ලියා පදිංචි කර ඇති, ආනයන සහ අපනයන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද බලපත්‍ර මත ගෙන්වන ලද, කාල සීමාව ඉක්මවූ (overage) වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන ලියා පදිංචි කර ඇති පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් සහ ලියා පදිංචි කළ අංකයන් වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டில் மோட்டார் வாகன போக்குவரத்துத் திணைக்களத்தினால் பதிவு செய்யப்பட்டுள்ள, ஏற்றுமதி மற்றும் இறக்குமதித் திணைக்களத்தின் மூலம் விநியோகிக்கப்பட்டுள்ள அனுமதிப்பத்திரத்தின் மீது இறக்குமதி செய்யப்பட்ட கால எல்லையைக் கடந்துள்ள (overage)வாகனங் களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) அந்த வாகனங்களைப் பதிவுசெய்துள்ள ஆட்களின் பெயர்கள், முகவரிகள் மற்றும் பதிவு செய்யப்பட்டுள்ள இலக்கங்கள் என்பவற்றைத் தனித்தனியாகக் குறிப்பிடுவாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House-

(i) the number of overage vehicles imported under the permits issued by the Department of Imports and Exports and registered by the Department of Motor Traffic in the year 2015; and

(ii) the names of the persons who registered those vehicles along with their addresses and the registered numbers separately?

(b) If not, why?

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) වාහන සංඛ්‍යාව 5,694යි.

(ii) ඔව්. ලියා පදිංචි කර ඇති පුද්ගලයින්ගේ නම්, ලිපිනයන් සහ ලියා පදිංචි කළ අංක පිළිබඳ තොරතුරු මේට අමුණා ඇත. ඇමුණුම අංක 01 බලන්න.

ඇමුණුම සභාගත* කරමි.

(ආ) පැන නොනඟී.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරන්න යන්නේ හදිසි කරුණක් නොවෙයි නම් ප්‍රධාන කටයුතු ආරම්භයේදී ඔබතුමාට ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න පුළුවන්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා විසින් ඉදිරිපත් කරන ලද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව සම්බන්ධව ඔබතුමා මේ ගරු සභාවට පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි කියා මා හිතනවා. එයට හේතුව මෙයයි. ගරු අග්‍රාමාත්‍යතුමා පැහැදිලි කළා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ රැස්වීම් අදාළ අමාත්‍යවරයාත් නොමැතිව නිලධාරීන් සමඟ පවත්වා වඩාත් ඵලදායී අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමෙන් මේ කමිටුව තුළින් පාර්ලිමේන්තුවට වැඩි බලයක් ලැබෙනවාය කියලා. නමුත් අපි කමිටුව වශයෙන් රැස්වෙලා සමහර තීන්දු-තීරණ ගෙන ඒවා ක්‍රියාත්මක කරන්නය කියා කිව්වත්, ඒ කිසිවක් අමාත්‍යවරයා පිළිගන්නේ නැති තත්ත්වයක් තිබෙනවා.

මම ඊයේ දිනයේදී ඒ ගැන ගරු සභාපතිතුමාට දැනුම් දුන්නා. ඇත්ත වශයෙන්ම මේ කාරක සභාවට මුදල් පිළිබඳව තිබෙන බලතල මොනවාද, අපට ඒ සඳහා මැදිහත් වන්නට පුළුවන් කොයි ප්‍රමාණයකටද, ඒ මැදිහත්වීමේ ඵලදායීතාවක් තිබෙනවාද, නැද්ද යන කාරණා පිළිබඳව එතුමාටත්, අපටත් පැහැදිලි කරලා දෙන්න. මේ කාරක සභාවට කරන්න පුළුවන් දේ මොකක්ද, කරන්න බැරි දේ මොකක්ද, කියන එක පිළිබඳව ඔබතුමා මැදිහත් වෙලා අපට පැහැදිලි කරලා දෙන්න. මෙම කාරක සභා ක්‍රමය අලුතෙන්ම ඇති වෙච්ච දෙයක් නිසා අපට ඒ පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දෙන්න කියලා මා ඔබතුමාගෙන් බොහොම කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
ගරු කථානායකතුමනි, මේ කාරක සභා ක්‍රමය විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක කරන අලුත් සංකල්පයක්. "Oversight Committees" තිබෙන්නේ අමාත්‍යාංශය වෙනුවට තීරණ ගන්න නොවෙයි. එහෙත් අමාත්‍යාංශය නියම තීරණ ගන්නවාද, අමාත්‍යාංශය ආණ්ඩුවේ ප්‍රතිපත්ති අනුව, නීතිය අනුව ක්‍රියාත්මක වෙනවාද කියලා ඒ තුළින් බලන්න පුළුවන්. ඉංග්‍රීසියෙන් කියන්නේ, "Execution of the laws passed by Parliament". කියලා. ඒ අනුව පාර්ලිමේන්තුවටත් කොටසක් තිබෙනවා; ඇමතිවරුන්ටත් කොටසක් තිබෙනවා. We want to implement the execution of the laws passed by Parliament and we must see whether it is being done correctly. විශේෂයෙන්ම ඒ වගකීම තමයි අපට මේ කාරක සභා හරහා ක්‍රියාත්මක කරන්න තිබෙන්නේ.

දෙවනුව, මේ කාරණය ගැනත් කියන්න ඕනෑ. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් යුතු Committee on Public Finance එකෙන් ක්‍රියා කරන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවට අනුව "Parliament shall have full control over public finance." යන කාරණයට අදාළවයි. මුදල් අමාත්‍යාංශයත්, මගේ අමාත්‍යාංශය ඇතුළු සියලු අමාත්‍යාංශත් ක්‍රියා කළ යුතුව තිබෙන්නේ මේ සභාවේ තිබෙන පරීක්ෂාකාරිභාවයට යටත්වයි. වැරැද්දක් තිබෙනවා නම්, මෙතැනට චාර්තා කරන්න පුළුවන්කම තිබෙනවා.

මේවා ආරම්භ කරද්දී අපි බලාපොරොත්තු වුණේ, ගරු කථානායකතුමාත්, ඇමතිවරුත්, සභාපතිවරුත් එකට මුණ ගැහිලා සාකච්ඡා කරන්නයි. ගරු කථානායකතුමනි, පසු ගිය කාලයේ ඔබතුමා අසනීපයෙන් හිටපු නිසා මම අපේ සභානායකතුමා එක්කත් සාකච්ඡා කරලා තීරණය කළා, මුලින්ම අපි මේ කොමිටි ක්‍රියාත්මක කරන්න ඉඩ දෙමු කියලා. මම හිතන විධියට ඊළඟ පාර්ලිමේන්තු සතියේදී අපේ ඇමතිවරු කණ්ඩායමකටයි, සභාපතිවරුන්ටයි මුණ ගැහිලා සාකච්ඡා කරන්න පුළුවන්, ඊළඟට වැඩ කටයුතු කරන්නේ කොහොමද කියලා.

දැන් මෙතැනදී මතු වූ ප්‍රශ්න කීපයක් තිබෙනවා. එකක් තමයි, "ඇමතිවරු නැතිව මේක කරන්න බැහැ, මොකක්ද සිදු විය යුත්තේ කියලා ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය ගැනත් අහන්න ඕනෑ" කියලා. අපට මේක තනියම කරගෙන යන්න බැහැ. දෙවැනි කාරණය ලෙස අපි විශේෂයෙන්ම සාකච්ඡා කළ යුතු දෙයක් තිබෙනවා. රාජ්‍ය නිලධාරීන් ගණනාවක් මේ කොමිටිවල ඉන්නවා අපි දැකලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ කොමිටිවලට නිලධාරීන් ගියාම අපේ අමාත්‍යාංශවල වැඩ කටයුතු කර ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. පසු ගිය දවසක මගේ අමාත්‍යාංශයේ නිලධාරීන් 10ක්, 12ක් විතර සංඛ්‍යාවක් මේ කොමිටිවල සිටියා මා දැක්කා. [බාධා කිරීමක්] Yes, the Head of the Department should be there. But their deputies, assistants and a whole lot were there. අමාත්‍යාංශය මොකක්ද කරන්නේ කියලා මේ කොමිටිය දන්නේ නැහැ. සමහර නිලධාරීන් මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ කොහොමද කියලා දන්නේ නැහැ. ඒ කාලයේ දී එම නිලධාරීන් අතින් යම්කිසි සොරකම් සිදු වුණාද කියන එක පිළිබඳව අපි දැන් විභාග කරගෙන යනවා. නමුත් ඔවුන් මෙතැනට ඇවිල්ලා තවත් එකක් කියනවා. ආණ්ඩුවේ නිල ප්‍රතිපත්තිය දන්නේ පහළ සිටින නිලධාරීන් නොවෙයි, ඉහළ සිටින දෙපාර්තමේන්තු ප්‍රධානියායි. එම නිසා ඇමතිවරු එක්ක තිබෙන සම්බන්ධය කුමක්ද කියලා දැන ගන්න ඒ අයත් එක්ක වැඩ කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අපි එන සතියේදී දිනයක් යොදා ගෙන මුණගැසිලා සාකච්ඡා කරමු. මේ ක්‍රමය සාර්ථකයි.

මම ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාටත්, ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමාටත් ඒ ගැන කිව්වා. දැන් අපට ඕනෑ වන්නේ, මේ අයට වුවමනා අනෙක් සහයෝගය ලබා දෙන්නයි. මොකද, විශේෂයෙන්ම මේ කොමිටිවලට අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා වෙනම විශේෂ නිලධාරීන් අරගන්න ඕනෑ. මොකද, මේ පාර්ලිමේන්තුවේ නිලධාරීන් හැටියට ඉන්නේ මහලේකම්තුමායි මේ අයයි විතරයි. වෙන කවුරුවත් නැහැ. සමහර රටවල නීතිපතිත් මෙවැනි කොමිටිවලට සම්බන්ධ වනවා. අද නීතිපතිත් එයට නැහැ. නීතිපති විධායක නිලධාරියෙක්. එංගලන්තයේ නීතිපති විධායක නිලධාරියෙක්. එහි නීති උපදේශකවරයෙක් වෙනම ඉන්නවා. සමහර රටවල විගණකාධිපති පාර්ලිමේන්තුවේ නිලධාරියෙක්. අපේ විධායකය යටතේ ඉන්න නිලධාරියෙක් වන ඔම්බුඩ්ස්මන්ට පාර්ලිමේන්තුවට වාර්තා කරන්න පුළුවන්. ඒ සඳහා යුතුකමක් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම COPE එකට, Public Finance Committe එකට, Committee on Public Accounts වාගේ කමිටුවලට වුවමනා කණ්ඩායම් අරගන්න මම එම කමිටුවල සභාපතිවරු දෙතුන් දෙනා එක්කත් සාකච්ඡා කරන්නයි ඉන්නේ.

Parliamentary Budget Office එක නීතියෙන් ආරම්භ කරන්න පනත් කෙටුම්පතක් ගෙනෙන්න ඕනෑ, Australia සහ New Zealand වැනි රටවල කළා වාගේ.

ගරු කථානායකතුමනි, ඒ ගැන ඔබතුමාත් සමඟ මට සාකච්ඡා කරන්න ඕනෑ. විරුද්ධ පක්ෂයේ නායකතුමා එක්ක එකතුවෙලා අපි යෝජනා කිහිපයක් ඉදිරිපත් කරනවා. ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය විශේෂඥයන්ට ඉන්න පුළුවන් විධියට සකස් කළාම අපට ලබන අවුරුද්දේ වැඩ කටයුතු කර ගෙන යන්න පුළුවන්. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අලුත් ගොඩනැඟිල්ලට මෙම කමිටු ගෙන යන්න තිබෙනවා. අපි ඒක අනුමත කරගෙන තිබෙනවා. දැනට එහි ප්‍රමාදයක් වෙලා තිබෙනවා. ඒ ප්‍රමාදය නිසා අපට මේ විශේෂඥයන් කවුරුවත් තියා ගන්න තැනක් නැහැ. ඒ වැඩ කටයුතු ගෙන යන්න කියලා සම්පූර්ණ මුදල් බලය අපි දැන් ගරු ඇමතිතුමාට ලබා දී තිබෙනවා. එම නිසා ගරු කථානායකතුමනි, ඔබතුමාත්, මෙම කමිටුවල සභාපතිවරුත්, අපත් මුණ ගැසෙන එක වැදගත් කියලා මම හිතනවා. සියලු දෙනාම මුණ ගැහිලා මේ පිළිබඳව සාකච්ඡා කරන්න අපි ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් සතියේදී දිනයක් යොදා ගනිමු.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමනි, ඔබතුමාත්, සභාපතිතුමාත් එකඟ වනවා නම් අපට ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් සතියේදී මේ කාරණය පිළිබඳව සාකච්ඡා කරන්න පුළුවන්.

ඒ වාගේම J.R. Jayewardene Centre එකේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරලා, ඒ වැඩ කටයුතු ඉතා ඉක්මනින් අවසන් කරන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ 110 වැනි ජන්ම දින සංවත්සරය සැප්තැම්බර් මාසයට යෙදී තිබෙනවා. ඒ වැඩ කටයුතු අවසන් කළාට පස්සේ අලුත් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරමු කියලා මම කිව්වා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ජර්මන් ආධාර ඇතිවයි ඒ කටයුතු කරන්නේ.

ගරු එම්.ඒ. සුමන්තිරන් මැතිතුමා.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(මාණ්පුමිකු එම්.ඒ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, on the issue of the Parliamentary Budget Office and the J.R. Jayewardene Centre, I have looked at the draft Bills. We will not be able to establish the Parliamentary Budget Office before this Budget and this Committee -

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
We have no room because of the other issues.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(මාණ්පුමිකු එම්.ඒ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
That is right. This Committee cannot properly function without a Parliamentary Budget Office, which will feed the necessary information. So, I am just informing the House that we will not be able to fulfill some of the responsibilities given to us by the Resolution at this year's Budget in November.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
But, Hon. Member, there is one thing that we can do. We can sit down with the Chairman of the COPE and others and decide on the draft Legislation.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(මාණ්පුමිකු එම්.ඒ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Yes.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
We will have it gazetted and get it passed during the Budget, so that in the year 2017, you will be in a position to monitor the Budget and then, we also want to have discussions with the IMF on getting additional technical support and staff for you all.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
මා පමණක් නොවෙයි, දැනට මේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාම, පාර්ලිමේන්තුවට තිබෙන මුදල් බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා එක්ක සාකච්ඡා කරන්න සූදානම්. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ඇත්ත වශයෙන්ම අපි මේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන් එයට සම්බන්ධ කරන්න ඕනෑ. එහි විධායකය කියන එකට පාර්ලිමේන්තුවත් ඇතුළත් වන්න ඕනෑ. අප ගන්නා තීරණ නීතියට අනුව හරිද, නීතියට පිට යනවාද කියන එක පාර්ලිමේන්තුව මඟින් පරීක්ෂා කරන්න ඕනෑ. ඒ නිසා, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කළ මේ කාරණයට අප එකඟයි කියා මා විශේෂයෙන් කියන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, පළමුවැනි ප්‍රශ්නයේ අතුරු ප්‍රශ්න අසන්න තිබෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා උත්තරය විතරයි දුන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන ප්‍රශ්නය නේද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පළමුවන ප්‍රශ්නයේ අතුරු ප්‍රශ්න අසන්න තිබෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා පිළිතුර පමණයි දුන්නේ. එතුමාගේ පිළිතුරේදී පැහැදිලි වුණා, 2015 අවුරුද්ද තුළ පමණක් කල් ඉකුත් වූ -කාල සීමාව ඉකුත් වූ- වාහන 5,694ක් ගෙන්වා තිබෙනවා කියා. එතුමා ළඟ සභාගත කළ ලැයිස්තුව තිබෙනවා, අදාළ පුද්ගලයන් කවුරුන්ද, ලිපින මොනවාද කියන තොරතුරු ඇතුළත්. ගරු කථානායකතුමනි, මගේ මතකයේ හැටියට කල් ඉකුත් වූ වාහන ගෙන්වීම සීමා කිරීම පිළිබඳව යම් යම් ප්‍රතිපත්තිමය තීරණ ගෙන තිබෙනවා. එසේ සීමා කරන්න ප්‍රතිපත්තිමය තීරණ ගෙන තිබියදීත් මෙතරම් ප්‍රමාණයක් ගෙනාවේ කුමන අවශ්‍යතාවටද? ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ඒවා අනුමත කරනු ලැබුවේ ඇයි? මොකද, ඒ කටයුතුවලදී විවිධ අක්‍රමිකතා සිදු වනවා; මුදල් අය කරනවා, ඒවා අනුමත කර දෙන්න විවිධ මිල ගණන් අය කරගන්නවා කියන චෝදනා තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, එවැනි අනුමත කරවාගැනීම් සඳහා වූ අවශ්‍යතාවන් මොනවාද යන්න ඔබතුමාගේ ලේඛනයේ තිබෙනවාද කියා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු මන්ත්‍රීතුමනි, මීට ඉස්සර වෙලාත් මේ පිළිබඳව ප්‍රශ්නයක් අසා තිබුණා, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම මැතිතුමාගෙන්. එතුමා ඒ වෙලාවේ සභාගත කළා මෝටර් රථ 445ක පමණ ප්‍රමාණයක තොරතුරු.

ප්‍රවාහන අමාත්‍යාංශයෙන් ප්‍රශ්නය අහලා තිබෙන්නේ එම වාහන ලියා පදිංචි කිරීම ගැන පමණයි. ඒ නිසා අපට උත්තර දෙන්න පුළුවන් වන්නේත් එම වාහන ලියා පදිංචි කිරීම ගැන පමණයි. වාහන බලපත්‍රයත්, අනික් ලිය කියවිලිත් තිබෙනවා නම්, අපි එම වාහනය ලියා පදිංචි කරනවා. ඒ විධියට ලිය කියවිලි ගෙන ආ වාහන ලියා පදිංචි කිරීමක් තමයි මෙතැනදි අපි කර තිබෙන්නේ. ආනයන අපනයන පාලකතුමා අයිති වන්නේ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයට. ගරු මන්ත්‍රීතුමනි, විදේශ වෙළඳාම පිළිබඳව ඔබතුමාට ගැටලුවක් තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් වෙනම ප්‍රශ්නයක් ඇමතිතුමාගෙන් අසා විස්තර දැනගන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන කොට තිබුණු තත්ත්වයට වඩා දැන් වෙනසක් තිබෙනවා. මම ඒක දන්නවා. ඒ ගැන දැනගෙනම මම මේ ප්‍රශ්නය අහනවා.

බරවා රෝගය මර්දනය: රජයේ දායකත්වය
யானைக்கால் நோய்த் தடுப்பு : அரசின் பங்களிப்பு
CONTROL OF FILARIASIS: GOVERNMENT CONTRIBUTION

514/'16

2. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකාව තුළ බරවා රෝගය ශීඝ්‍රයෙන් පැතිර යන බවත්;

(ii) දැනට මෙම රෝගයට සැලකිය යුතු පිරිසක් ගොදුරු වී ඇති බවත්;

(iii) රෝග මර්දනයට රජයේ දායකත්වය ප්‍රමාණවත් නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පසු ගිය වසර පහක කාලය තුළ ශ්‍රී ලංකාව තුළ වාර්තා වී ඇති බරවා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් රෝගීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் யானைக்கால் நோய் வேகமாகப் பரவுகின்றதென்பதையும்;

(ii) தற்போது மேற்படி நோய்க்கு கணிசமான அளவினர் பாதிக்கப்பட்டுள்ளனர் என்பதையும்;

(iii) நோய்த் தடுப்புக்கு அரசாங்கத்தின் பங்களிப்பு போதுமானதல்ல என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) கடந்த ஐந்தாண்டு காலத்தினுள் இலங்கையில் அறிக்கையிடப்பட்டுள்ள யானைக்கால் நோயாளிகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி (i) இல் குறிப்பிடப்பட்டுள்ள நோயாளிகளின் எண்ணிக்கை, ஒவ்வொரு மாவட்ட ரீதியாக தனித்தனியாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he admit that-

(i) filariasis is rapidly spreading throughout Sri Lanka;

(ii) a considerable number of people are affected by this disease; and

(iii) the contribution from the government is not sufficient to suppress the spread of the disease?

(b) Will he inform this House-

(i) the number of filarial patients reported in Sri Lanka during the period of the last five years; and

(ii) the number of patients mentioned in above (i) in respect of each district separately?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) නැත.

(ii) නැත.

(iii) නැත. බරවා රෝගය මර්දනය සඳහා රජය ලබා දෙන දායකත්වය හා පහසුකම් ප්‍රමාණවත් වේ. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් තව දුරටත් මහජන සෞඛ්‍ය ප්‍රශ්නයක් නොවන බරවා රෝගය තුරන් කිරීමේ සහතිකය ලබා දී ඇත.

(ආ) (i) 661කි. (හයසිය හැට්එකකි)

(ii)

2011-2015 දක්වා	
දිස්ත්‍රික්කය	සංඛ්‍යාව
කුරුණෑගල	51
පුත්තලම	15
ගාල්ල	359
හම්බන්තොට	04
මාතර	58
කොළඹ	48
ගම්පහ	66
කළුතර	60
එකතුව	661

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තා අනුව බරවා රෝගයෙන් සහ මැලේරියා රෝගයෙන් නිදහස් රටක් විධියට ලංකාවට සහතික ලැබිලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, අපට මේ තත්ත්වය ඩෙංගු රෝගය සම්බන්ධයෙනුත් අත් කර ගැනීම සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයට දිගු කාලීන වැඩ පිළිවෙළක් තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
වැඩ පිළිවෙළක් තිබෙනවා. තව අවුරුදු 3ක් යනකොට ඩෙංගු රෝගයත් අඩු වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. අපේ දත්ත අනුව මෙවර ඩෙංගු රෝගීන් සංඛ්‍යාව ඉතාමත් අඩු තත්ත්වයකටයි පැමිණෙමින් තිබුණේ. මෙවර පැවති ගංවතුර උවදුරත් එක්ක තමයි, තාවකාලික වැඩි වීමක් වෙලා තිබෙන්නේ. එයත් දැන් මර්දනය කර ගෙන තිබෙනවා. අවුරුදු 3කින් විතර ඩෙංගු රෝගයෙනුත් මිදෙන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ තමයි වාර්තාගත බරවා රෝගීන් පිරිසක් පිළිබඳව වාර්තා වුණේ. මැලේරියා රෝගයෙන් සහ බරවා රෝගයෙන් නිදහස් රටක් විධියට අපි සහතිකය ලබද්දී, එවැනි මදුරුවන් යළි හිස එසවීම්, එහෙම නැත්නම් වෙනත් මදුරු විශේෂ මේ සඳහා අනුවර්තනය වීම් ආදිය පිළිබඳව දිගින් දිගටම පර්යේෂණ කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අවධානය යොමු කර තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අමාත්‍යාංශය කොහොමත් ඒ කටයුතු කරනවා. ඩෙංගු රෝගයට විතරක් නොවෙයි, මැලේරියා රෝගය පිළිබඳවත් කටයුතු කරනවා. මැලේරියා රෝගය දැන් සම්පූර්ණයෙන්ම තුරන් වෙලා තිබෙනවා. එහෙම වුණත් අපි ඒ කටයුතු සිදු කිරීම අත්හරින්නේ නැහැ. තව අවුරුදු 4ක් යනතුරු දිගටම පරීක්ෂණ කර ගෙන යනවා. බරවා රෝගයටත් එහෙමයි. 2014, 2015 වර්ෂවල ගාල්ල දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස 14ක් ආවරණය වෙන්න බරවා සමූහ ප්‍රතිකාර වැඩසටහන් ක්‍රියාත්මක කළා. ඒ වාගේම එම දිස්ත්‍රික්කයේ දැඩි අවදානම් ප්‍රදේශවල රාත්‍රී රුධිර පටල පරීක්ෂාව තවමත් ක්‍රියාත්මක වනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා දෙවන අතුරු ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් සඳහන් කළා, රාත්‍රී රුධිර පටල පරීක්ෂා කිරීමේ කාරණය. මාතර දිස්ත්‍රික්කයේ බරවා රෝගය බහුලවම තිබෙන්නේ මාතර නගර සභා බල ප්‍රදේශයේයි. එයට හේතුව, තොටමුණ, පරමුල්ල වාගේ ප්‍රදේශවල විශේෂයෙන්ම පොල් ලෙලි කර්මාන්තයට සහ ලණු ඇඹරීමේ කර්මාන්තයට අදාළව කරන ක්‍රියාවනුයි. මට උදාහරණයක් කියන්න පුළුවන්. බරවා රෝග මර්දන ව්‍යාපාරයේ මාතර කාර්යාලයත්, මගේ නිවසත් තිබෙන්නේ එකම මාර්ගයේයි.

මීට අවුරුදු 10කට විතර කලින් තත්ත්වය ගත්තොත් අපට තිබෙන අත් දැකීම් අනුව නිතරම රාත්‍රී රුධිර පටල පරීක්ෂා කිරීම සිද්ධ වුණා. අපේ ගෙදරට එන්නේ නැතුව අනෙක් තැන්වලට යනවාද කියන එක ගැන මම සොයලා බැලුවා. හැබැයි, අහඹු ලෙස ගත්තොත් රුධිර පටල පරීක්ෂාව සිද්ධ වන ප්‍රමාණයේ අඩුවක් තිබෙනවා. ඒකට හේතුව රෝගීන් ප්‍රමාණය අඩුවීම නිසා ඒ පිළිබඳව තිබෙන අවධානය අඩු කිරීමද, නැත්නම්,-

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

දැනට රුධිර පටල පරීක්ෂණය සිදු කරන්නේ ඉතාමත්ම අවදානම් ප්‍රදේශවල පමණයි. මේ වන විට අනෙක් ප්‍රදේශවල රෝගීන්ගේ ප්‍රමාණය අවම මට්ටමකට ඇවිල්ලායි තිබෙන්නේ. මාතර රෝගීන් 58ක් ඉන්නවා කිව්වාට, දැන් ඒ ප්‍රමාණයම නැහැ. එයින් සුළු ප්‍රමාණයයි දැන් සිටින්නේ. නමුත් අවදානම් ප්‍රදේශවල අපි තවමත් රාත්‍රී රුධිර පටල පරීක්ෂණය කරනවා.

තාක්ෂණික විද්‍යාගාර සඳහා උපකරණ මිල දී ගැනීම: ප්‍රසම්පාදන ක්‍රියාවලිය

தொழில்நுட்ப ஆய்வுகூடங்களுக்கு உபகரணங்கள் கொள்வனவு : பெறுகை நடைமுறை

PROVISION OF EQUIPMENT FOR TECHNOLOGICAL LABORATORIES: PROCUREMENT PROCEDURE

596/'16

3. ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ පාසල් දහසක් සඳහා තාක්ෂණික විද්‍යාගාර ලබා දීමේ වැඩ පිළිවෙළ යටතේ මේ වන විට විවෘත කර ඇති තාක්ෂණික විද්‍යාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම විද්‍යාගාර සඳහා පරිගණක හා උපාංග මිල දී ගැනීමට වැය කර ඇති මුළු මුදල කොපමණද;

(iii) එම මිල දී ගැනීම් සිදු කර ඇත්තේ ක්‍රමවත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේද;

(iv) එසේ නම්, ඒවා අනුමත කර ඇත්තේ කවුරුන් විසින්ද; යන්න එතුමා සඳහන් කරන්නෙහි ද?

(ආ) (i) මෙම මිල දී ගැනීම් සිදු කිරීමේදී නියමිත ප්‍රමිතියෙන් තොර උපකරණ මිල දී ගෙන ඇති බවත්, මූල්‍ය අක්‍රමිකතාවන් සිදු වී ඇති බවත් පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන් කවුරුන්ද;

(iii) එමඟින් රජයට සිදු වී ඇති අලාභය කොපමණද;

(iv) මේ සඳහා වගකිවයුතු පුද්ගලයන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කඩිනමින් සිදු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் ஆயிரம் பாடசாலைகளுக்கு தொழில்நுட்ப ஆய்வுகூடங்களை வழங்கும் நிகழ்ச்சித்திட்டத்தின்கீழ் இற்றைவரை திறந்து வைக்கப்பட்டுள்ள தொழில்நுட்ப ஆய்வுகூடங் களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) இந்த ஆய்வுகூடங்களுக்கு கணனிகளையும் துணைப்பாகங்களையும் கொள்வனவு செய்வ தற்கு செலவிடப்பட்டுள்ள மொத்தப் பணத் தொகை எவ்வளவென்பதையும்;

(iii) இந்தக் கொள்வனவுகள் முறைசார்ந்த பெறு கைகள் நடைமுறையின்கீழ் நடைபெற்றுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அவற்றை அங்கீகரித்தவர்கள் யாவரென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) இந்தக் கொள்வனவுகளை மேற்கொள்கின்ற போது உரிய தரத்தைக் கொண்டிராத உபகர ணங்கள் கொள்வனவு செய்யப்பட்டுள்ளதென் பதையும் நிதி முறைகேடுகள் இடம்பெற்றுள்ள தென்பதையும் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கு பொறுப்புக் கூறவேண்டிய வர்கள் யாவரென்பதையும்;

(iii) இதன் விளைவாக அரசாங்கத்திற்கு ஏற்பட்டுள்ள நட்டம் எவ்வளவென்பதையும்;

(iv) இதற்கு பொறுப்புக் கூறவேண்டியவர்கள் சம்பந்தமாக முறைசார்ந்த விசாரணையைத் துரிதமாக மேற்கொள்வாரா என்பதையும்;

(v) ஆமெனில், அத்தேதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state -

(i) the number of technological laboratories that have been inaugurated under the programme to provide technological laboratories to one thousand schools in Sri Lanka;

(ii) the total amount of money that has been spent for purchasing computers and accessories for those laboratories;

(iii) whether purchasing has been done under a proper procurement process; and

(iv) if so, who has approved them?

(b) Will he inform the House-

(i) whether he admits that substandard equipment have been purchased and financial irregularities have occurred in the purchasing of these instruments;

(ii) if so, who are the persons responsible for it;

(iii) the loss caused to the Government by it;

(iv) whether a formal inquiry will be conducted early regarding the persons responsible for it; and

(v) if so, on what date?

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) තාක්ෂණික විද්‍යාගාර 913ක් මේ වන විට සිසුන්ගේ භාවිතයට යොදාගෙන ඇත. (ඇමුණුම 01 මඟින් දක්වා ඇත.)

(ii) රුපියල් මිලියන 7.2කි. (ඇමුණුම 02 මඟින් දක්වා ඇත.)

ඇමුණුම් **සභාගත*** කරමි.

(iii) පළමු අදියරේ තාක්ෂණ විද්‍යාගාර 100ක් සඳහා අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව විවෘත මිල ගණන් කැඳවීමක් මඟින් තාක්ෂණ කමිටු නිර්දේශ, ස්ථාවර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අනුව ඇණවුම් ප්‍රදානය කර ඇත.

ඉතිරි තාක්ෂණ විද්‍යාගාර 708ක් සඳහා ඇණවුම් ප්‍රදානය කර ඇත්තේ E-Wis ආයතනය පළමු විද්‍යාගාර 100 සඳහා ලබාදුන් මිල ගණන් අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් අනුමැතිය අනුවයි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ඇණවුම් ප්‍රදානය කර ඇත.

(iv) තාක්ෂණ විද්‍යාගාර 808ක් සඳහා E-Wis ආයතනය වෙත ඇණවුම් ප්‍රදානය කර ඇත්තේ අමාත්‍ය මණ්ඩලය ලබාදුන් අනුමැතිය අනුවයි. ඊට අදාළව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කළ අමාත්‍ය මණ්ඩල සංදේශ තොරතුරු හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදුන් දින පිළිබඳ විස්තර පහත වගුවෙන් දැක්වේ.

	ඇණවුම	මුදල	අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංකය	දිනය	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදුන් දිනය
1	විද්‍යාගාර 100	708,990,916.00	2013/ED/E/N/33	2013.12.03	2013.12.16
2	විද්‍යාගාර 200	1,414,000,000.00	2014/ED/E/N/01	2014.01.02	2014.01.13
3	විද්‍යාගාර 100	707,000,000.00	2014/ED/E/N/06	2014.03.13	2014.03.20
4	විද්‍යාගාර 408	2,961,400,000.00	2014/ED/E/N/14	2014.07.30	2014.08.14

(ආ) (i) නැත.

ගරු මන්ත්‍රීතුමනි, file එක අනුව නම්, "නැත" කියලා තිබෙන්නේ. ඇත්තවශයෙන්ම ඒකට පිළිතුර "නැත" කියලා කියන්නත් බැහැ.

තාක්ෂණ විද්‍යාගාර සඳහා පරිගණක උපකරණ මිලදී ගැනීම් සිදු කර ඇත්තේ එක් එක් උපකරණයන් සඳහා පිරිවිතර සකස් කිරීමකින් අනතුරුවයි. එම පිරිවිතර සකස් කිරීම කර ඇත්තේ විශේෂඥ තාක්ෂණ කමිටුවක් විසිනි. එම පිරිවිතර අනුව පරිගණක උපකරණ සපයා ඇත. ඒ බවට තත්ත්ව පරීක්ෂණ කමිටුව වාර්තා කර ඇත.

තවද, සපයා ඇති පරිගණක උපකරණ සඳහා වසර 03ක වගකීම් කාලයක් හා එම වගකීම් කාලය අවසන් වීමෙන් පසුව උක්ත ආයතනය සමඟ තවත් වසර 03ක් සඳහා නඩත්තු කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමට නියමිතය. තවද, සැපයූ පරිගණක උපකරණ වෙනුවෙන් E-Wis ආයතනය වෙත අදාළ ගෙවීම් සිදු කර ඇත්තේ අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් අනුමත මුදල් සීමාවන් තුළය. ඒ අනුව මූල්‍ය අක්‍රමිකතාවක් සිදුව නැත.

"නැත" කියලා පිළිතුර සපයා තිබෙනවා. ඒ කරපු නිලධාරීන්ම තමයි මේ වාර්තාව සකස් කර දීලා තිබෙන්නේ.

(ii) අමාත්‍ය මණ්ඩල අනුමැතීන් හා දැනුම්දීම ප්‍රකාරව කටයුතු කර ඇත.

(iii) ස්ථාවර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින්, පුවත් පත් දැන්වීමක් මඟින් කළ ජාතික තරගකාරී ලංසු කැඳවීම් අනුව E-Wis ආයතනය ලබා දුන් මිල ගණන් යටතේම අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ප්‍රකාරව ඉතිරි තාක්ෂණ විද්‍යාගාර 708 සඳහාද අදාළ ආයතනය වෙත ඇණවුම් ප්‍රදානය කර ඇත.

මෙම ප්‍රසම්පාදන කාර්යය සම්බන්ධ අලාභයක් පිළිබඳ වාර්තා වී නැත කියලායි සඳහන්ව තිබෙන්නේ.

(iv) තාක්ෂණ විද්‍යාගාර 808ක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතීන් ප්‍රකාරව E-Wis ආයතනය මඟින් පරිගණක උපකරණ මිලදී ගැනීම හා ජාලගත කිරීම් පිළිබඳ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවත්, FCID ආයතනයත් විසින් පරීක්ෂණයන් සිදු කරනු ලබයි. මෙතෙක් ඔවුන්ගේ අවසන් පරීක්ෂණ වාර්තා අමාත්‍යාංශය වෙත ලබා දී නැත.

එසේම මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ හිඟ කොන්ත්‍රාත් වගකීම් නිරවුල් කිරීමේ කමිටුව විසින් පරීක්ෂා කර වාර්තාවක් අමාත්‍යාංශය වෙත ලබා දී ඇති අතර, එම වාර්තාවේ නිර්දේශ පදනම් කොටගෙන E-Wis ආයතනය වෙත අත්හිටුවා තිබූ ගෙවීම්ද නිරවුල් කර ඇත.

(v) පරිගණක උපකරණ මිලදී ගැනීම හා ජාලගත කිරීම් පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවත්, FCID ආයතනයත් විසින් සිදු කරනු ලබන පරීක්ෂණ වාර්තා ලබා දෙන දිනයක් මෙතෙක් දන්වා නැත.

(ඇ) අදාළ නොවේ.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් ඇසීමට අවසර ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, අහන්න.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු අමාත්‍යතුමනි, තාක්ෂණික විද්‍යාගාර ඇති කරලා තිබුණත් මේ තාක්ෂණික විද්‍යාගාර සඳහා අවශ්‍ය තාක්ෂණික ගුරුවරුන් නොමැතිකම නිසා මෙම විද්‍යාගාර නිසියාකාරව ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා ඔබතුමා පිළිගන්නවාද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය තිබුණා. දැන් අපි ඒ ප්‍රශ්නය විසඳීම සඳහා තාක්ෂණික ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරලා තිබෙනවා. මේ මස 26වෙනි දා ඒ ගුරුවරුන්ට පත්වීම් ලබා දෙනවා. ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ කාර්ය කිරීමේදී ප්‍රධාන වශයෙන්ම අනුගමනය කර තිබෙන ක්‍රමවේදයක් තිබෙනවා. මේ කාරණය ගරු පාර්ලිමේන්තුව දැන ගන්නට ඕනෑ. මේ තාක්ෂණික විද්‍යාගාර හදන්නට කියලා තිබෙන්නේ පාරවල් අයිනේ. ඊට අමතරව තාක්ෂණික විද්‍යාගාරවලට අවශ්‍ය උපකරණ මිලදී ගෙන තිබෙනවා, ගොඩනැඟිලි හදන්නට ඉස්සෙල්ලා. දැන් ඒ සමහර උපකරණවල කාලය ඉක්මවා ගිහිල්ලාත් තිබෙනවා. එවැනි ක්‍රමවේදයක් තමයි අනුගමනය කරලා තිබෙන්නේ. ඒ වාගේම හරියාකාරව මේ ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරලා තිබුණේත් නැහැ. ඒ ක්‍රියාවලියේම බොහෝ දෝෂ සහිත තැන් තිබෙනවා. දැන් අපි ඒවා නිවැරදි කරගෙන යනවා.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම විද්‍යාගාර ඇති කිරීමේදී ප්‍රාථමික කොටස සහ උසස් පෙළ දක්වා වන කොටස විධියට පාසල දෙකට කැඩීම තුළ මම හිතන විධියට පරිපාලන ගැටලු පැන නැඟිලා තිබෙනවා. එම නිසා මෙම විද්‍යාලය නැවත එක විද්‍යාලයක් බවට පත් කරන්න කටයුතු කරන්න ඔබතුමාට පුළුවන්ද කියා මා දැනගන්න කැමැතියි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, මේ පාසල දෙකට කඩලා කියා ඔබතුමා කියන්නේ, ද්විතීයික පාසල් සහ පෝෂිත පාසල් ගැනද?

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ඔව්, ගරු ඇමතිතුමනි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, ද්විතීයික පාසල් සහ පෝෂිත පාසල් කියා වැඩ පිළිවෙළක් අපේ ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා අධ්‍යාපන අමාත්‍ය ධුරය දරන කාලයේ ආරම්භ වෙලා තිබෙනවා. ප්‍රශ්නය මේකයි. මේක එතුමාගේ වැරැද්දක් නොවෙයි. මා හිතන විධියට එතුමාටත් ඒ වැඩ පිළිවෙළ කරන්න ඉඩ දීලා නැහැ. ඒ විධියට පාසල් කැඩීමේදී දේශපාලනඥයන්ගේ අත පෙවීම් නිසා එක එක මැති ඇමතිවරු තමන්ට ඕනෑ ඕනෑ විධියට ඒ පාසල් කඩලා තිබෙනවා. මම මේ මතකයෙන්ම කියන්නේ, ගරු කථානායකතුමනි. මේ නිසා පාසල් තුන්සිය ගණනක් වැසී යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ වෙනුවෙන් කටයුතු කරන්න දැන් අප ව්‍යුහ කමිටු පිහිටුවලා තිබෙනවා. පළාත් ව්‍යුහ කමිටුව සහ අපේ අමාත්‍යාංශයේ ව්‍යුහ කමිටුව මඟින් හරි ක්‍රමවේද සහ නිර්ණායක මත ඒ ගැටලුවලින් සෑහෙන ප්‍රමාණයක් දැනට නිවැරදි කර තිබෙනවා. මේ දේවල් නිසා අප අමාත්‍යාංශය භාරගන්න කොට විශාල අවුලක් වෙලා තිබුණා, ගරු කථානායකතුමනි.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගරු කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය අපේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා විසින් අසනු ලබනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, තුන්වැනි අතුරු ප්‍රශ්නය මම අහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා එයට පිළිතුරු දෙන්න සූදානම්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මම සූදානම්, ගරු කථානායකතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, තාක්ෂණ විෂය ධාරාවක් උසස් පෙළ විෂය පථය තුළට පසු ගිය වකවානුවේ එකතු වුණා. ඒ විෂය ධාරාව එකතු වුණු පාසල්වලට අමතරව තවත් පාසල්වලට මේ තාක්ෂණ විෂය පථය ඇති කරන්න ඉඩ දෙන්න මොන වාගේ වැඩ පිළිවෙළක්ද, මොන වාගේ දැක්මක්ද අමාත්‍යාංශය විසින් ඉදිරියට ගෙන යන්නේ?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, තාක්ෂණික විෂය පථය අප අවශ්‍ය ප්‍රමාණයට ඒ ඒ පාසල්වලට ඇතුළු කර තිබෙනවා. මනා අධ්‍යයනයකින් පසුව තමයි, තාක්ෂණික විෂය ධාරාව කොතරම් ප්‍රමාණයක් ඇතුළු කළ යුතුද කියා තීරණය කර තිබෙන්නේ. ඒ අනුව අප එය ලබාදීලා තිබෙනවා. "අපටත් තාක්ෂණික විද්‍යාගාර දෙන්න" කියා පාසල් ගණනාවකින් ඉල්ලීම් ගොඩක් තිබෙනවා. නමුත්, ඒ නිර්ණායක මත තමයි අපට ඒවා ලබා දෙන්න පුළුවන්කම තිබෙන්නේ. ගරු කථානායකතුමනි, නැත්නම් අර කලා විෂයයන් වැඩි වුණා වාගේම තාක්ෂණික විෂය ධාරා ප්‍රමාණයත් වැඩි වුණොත්, අපේ රටේ ශ්‍රම ඉල්ලුමට ගැළපෙන පරිදි එය නොවුණොත්, එයින් අප තවත් ගැටලුවකට මුහුණ දෙන නිසා අවශ්‍යතාව අනුව අපි එය ක්‍රමානුකූලව සිදු කරමින් යනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. අප මේ අවුරුද්ද අවසානයේදී විශ්වවිද්‍යාල පහක තාක්ෂණික පීඨ ආරම්භ කරනවා. ඒ සඳහා ළමයින් 1,800ක් අපි බඳවා ගන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

CSN නාළිකාව සඳහා බදු දී ඇති ඉඩම: විස්තර
CSN அலைவரிசைக்கு குத்தகைக்கு விடப்பட்ட காணி: விபரம்
LAND LEASED OUT TO CSN CHANNEL: DETAILS

612/'16

4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) CSN නාළිකාව පවත්වාගෙන යන ගොඩනැඟිල්ල පිහිටි අංක 236/01, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල ලිපිනයේ ඇති ඉඩම,
- (i) රජයට අයත්ව තිබූ ඉඩමක්ද;
- (ii) එය බදු දුන් දිනය කවරේද;
- (iii) බදු දී ඇත්තේ කවර පාර්ශ්වයකටද;
- (iv) බදු කාලය සහ බදු මුදල කොපමණද;
- (v) බදු දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබාගෙන තිබේද;
- (vi) එසේ නම්, එම දිනය කවරේද;
- (vii) එම බදු ගිවිසුම සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඉඩමේ පෞද්ගලික රූපවාහිනි හා ගුවන් විදුලි නාළිකා සහිත වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට බදු කොන්දේසිවලින් ඉඩ සලසා තිබේද;
- (ii) බදු කොන්දේසි කඩකර තිබේනම්, අදාළ පාර්ශ්වයන්ට එරෙහිව ගනු ලබන නීතිමය ක්‍රියාමාර්ග කවරේද;
- (iii) බදු ගත් පාර්ශ්වය පදනමක් හෝ සංවිධානයක් නම්, එහි සාමාජිකයන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மாநகர மற்றும் மேல்மாகாண அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) CSN அலைவரிசை இயங்கும் கட்டிடம் அமைந்துள்ள இலக்கம் 236/01, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல என்ற முகவரியிலுள்ள காணி,
- (i) அரசாங்கத்திற்கு சொந்தமானதாக காணப் பட்டதா;
- (ii) குத்தகைக்கு விடப்படப்பட்ட திகதி யாது;
- (iii) எத்தரப்பினருக்கு குத்தகைக்கு விட்டப் பட்டுள்ளது;
- (iv) குத்தகைக் காலம் மற்றும் குத்தகைத் தொகை எவ்வளவு;
- (v) குத்தகைக்கு விடுவதற்கு அமைச்சரவை அங்கீ காரம் கிடைத்துள்ளதா;
- (vi) ஆமெனின், அத்திகதி யாது;
- (vii) அந்தக் குத்தகை உடன்படிக்கையினைச் சமர்ப் பிப்பாரா;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி காணியில் தனியார் தொலைக்காட்சி மற்றும் வானொலி அலைவரிசைகளுடன் கூடிய தொழில்முயற்சியொன்றைக் கொண்டுநடத்து வதற்கு குத்தகை நிபந்தனைகள்மூலம் வசதி செய்யப்பட்டுள்ளதா என்பதையும்;
- (ii) குத்தகை நிபந்தனைகள் மீறப்பட்டிருப்பின், குறித்த தரப்பினருக்கு எதிராக எடுக்கப்படும் சட்டரீதியான நடவடிக்கைகள் யாவை என்பதையும்;
- (iii) குத்தகை பெற்ற தரப்பினர் ஒரு மன்றமாக அல்லது அமைப்பாக இருப்பின், அதன் உறுப்பினர்கள் அல்லது பணிப்பாளர் சபையினர் யார் என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Megapolis and Western Development:

(a) Will he inform this House in relation to the land located at No. 236/01, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, where the building in which operations of CSN Channel are carried out is situated -
- (i) whether the land belonged to the State;
- (ii) the date on which the land was leased;
- (iii) the party to whom the land has been leased;
- (iv) the duration of the lease and the lease value;
- (v) whether approval of the Cabinet of Ministers has been obtained for leasing that land;
- (vi) if so, the date on which such approval was obtained; and
- (vii) whether the relevant lease agreement will be tabled?

(b) Will he also inform this House -
- (i) whether the lease agreement provides for the operation of a business firm, which runs private television and radio channels, in that land;
- (ii) if the conditions set out in the lease agreement have been breached, the nature of action that will be taken against the responsible parties; and
- (iii) if the party which had obtained the land on lease is some foundation or organization, the names of the members or the board of directors of such foundation or organization?

(c) If not, why?

ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත. නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගත් ඉඩම් කොටසකි.
(ii) බදු දුන් දිනය 2006.11.06
(iii) බදු දී ඇත්තේ රාජපක්ෂ අනුස්මරණ, අධ්‍යාපන, සංස්කෘතික හා සමාජ සේවා පදනම වෙතය.
(iv) බදු කාල සීමාව අවුරුදු 30කි. වාර්ෂික බදු මුදල රුපියල් 163,125ක් (රුපියල් එක් ලක්ෂ හැටතුන්දහස් එකසිය විසි පහක්) වන අතර, රජයේ බදු මුදල් ද සමඟ මෙම මුදල වාර්ෂිකව ගෙවිය යුතු වේ.
(v) නැත. අක්කර 1කට වැඩි භූමි ප්‍රමාණයක් සහිත ඉඩම් සඳහා පමණක් අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගනී. මෙම ඉඩම පර්චස් 27.87ක් (විසි හතයි දශම අසූ හතක්) වන අතර, විෂයභාර අමාත්‍යවරයාගේ හා නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ අනුමතිය ඒ සඳහා ලබා ගෙන ඇත.
(vi) අදාළ නැත.
(vii) ඔව්. බදු ගිවිසුමේ පිටපතක් **සභාගත*** කරමි.

(ආ) (i) නැත.
(ii) බදු කොන්දේසි කඩකර ඇති නිසා බදු ගිවිසුම අවලංගු කිරීම සඳහා මූලික පියවර ගෙන ඇත. ඉදිරි නීති කටයුතු සඳහා උපදෙස් පතා තිබේ.
(iii) ඔව්. නිලධාරි මණ්ඩලයේ හා සාමාජිකයන්ගේ නම් සඳහන් ඇමුණුම **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මම අහන්නේ, බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 236/1 දරන ස්ථානයේ තිබෙන CSN නාළිකාව පවත්වාගෙන යන ඉඩම සම්බන්ධවයි. දැන් ඔබතුමා කිව්වා, පෞද්ගලික රූපවාහිනී නාළිකා හෝ ගුවන් විදුලි නාළිකා ආරම්භ කිරීමේ අවසරය පිළිබඳ කාරණා මේ ඉඩම බදු දීමේදී ඇති කර ගත් කොන්දේසිවල සඳහන් වන්නේ නැහැ කියලා. එතකොට කවුරු හෝ බදු කොන්දේසිවලට අදාළ නැති විධියට ආයතනයක් පවත්වාගෙන ගිහින් තිබෙනවා නම්, එම පාර්ශ්වයන්ට ගන්න ක්‍රියා මාර්ගය මොකක්ද?

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මම ඔබතුමාට ප්‍රකාශ කළා, ඒ ගොඩනැඟිල්ල ලබා ගෙන තිබෙන්නේ සමාජ සේවා හා සංස්කෘතික කටයුත්තක් අරභයා; වාණිජ්‍ය කටයුත්තක් අරභයා නොවන බව. එම නිසා ඒ සම්බන්ධයෙන් ගත යුතු නීතිමය ක්‍රියා මාර්ග තිබෙනවා. පළමුව, අපි ඒ බදු ගිවිසුම අහෝසි කර තිබෙනවා. දෙවැනුව, ගත යුතු ක්‍රියා මාර්ග ගැනීම සඳහා අපි නීති උපදෙස් පතලා, ඒ අනුව ක්‍රියා කරගෙන යනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කිව්වා මේ සඳහා වාර්ෂික බදු මුදල රුපියල් 163,125යි කියලා. ඒක නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක්. ඒ මොහොත වන කොට එවැනි ප්‍රදේශයක මෙවැනි ඉඩමක් බදු දීලා තිබෙන්නේ රජයේ තක්සේරුවට අනුවද?

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ඒක මෙහෙමයි, ගරු මන්ත්‍රීතුමනි. ඉඩමේ භාවිතය අනුව තමයි බදු මුදල තීරණය වෙන්නේ. වාණිජ පදනමින් කෙරෙන ක්‍රියාවලියක් නම්, එක විධියක්. සමාජ සේවාවකට නම්, තව විධියක්. රාජ්‍යමය වශයෙන්, අපි හිතමු ගංවතුර පාලනයකට හෝ වෙනත් පොදු යහපත සඳහා කටයුතු කරනවා නම්, තවත් විධියක්. අපට බදු ගිවිසුමේ දැනුම් දීලා තිබෙන්නේ, ඒ ආයතනය පිහිටුවලා තිබෙන්නේ සංස්කෘතික හා අධ්‍යාපන කටයුත්තක් සඳහා කියලායි. ඒ අනුව තමයි බදු මුදල තීරණය කර තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මා අහනවා.

ගරු ඇමතිතුමනි, එම ඉඩම බදු ගන්නා ලද ආයතනය අදාළ කාර්යය වෙනුවෙන් නොවෙයි යොදවලා තිබෙන්නේ, වෙනත් කාර්යයක් වෙනුවෙන් කියලා ඔබතුමා ප්‍රකාශ කළා. ඒ වාගේම ඔබතුමා විසින් පෙන්වා දෙනු ලැබුවා, වෙනත් කාර්යයක් වෙනුවෙන් යොදාගෙන තිබෙන නිසා එම බදු ගිවිසුම අහෝසි කර තිබෙනවා කියලා. මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, බදු ගිවිසුම අහෝසි කළා නම් එම ඉඩමත්, ඊට පසුව එම ඉඩම තුළ ගොඩ නඟා තිබෙන දේපළත් යළි පවරා ගැනීම සඳහා ඔබතුමන්ලා කටයුතු කර තිබෙනවාද කියලා.

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
අපි ඒ සම්බන්ධයෙන් නීති උපදෙස් පතලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් කිව්වොත්- මේ කාරණය සම්බන්ධයෙන් නොවෙයි- මෙවැනි වෙනත් සිදුවීම් සම්බන්ධයෙන් ඇතැම් විට දඩ මුදල් පනවනවා. ඇතැම් විට එම ස්ථානයේ නීති විරෝධී ඉදිකිරීමක් තිබෙනවා නම්, ඒවා කඩා බිඳ දමන්න කටයුතු කරනවා. එහෙම නැත්නම්, වාණිජමය පදනමින් ඒ අයගෙන් මුදල් අය කරන්න කටයුතු කරනවා. එවැනි විකල්ප ගණනාවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි නීති උපදෙස් පතලා තිබෙනවා. ඒ අනුව ක්‍රියා කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

රුපියල අවප්‍රමාණයවීම හා විදේශ ණය: විස්තර
ரூபாயின் பெறுமதி வீழ்ச்சியும் வெளிநாட்டுப் படுகடனும் : விபரம்
DEPRECIATION OF RUPEE AND FOREIGN DEBT: DETAILS

654/'16

6. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2014 දෙසැම්බර් 31 දිනට සහ 2016 මැයි 31 දිනට ශ්‍රී ලංකා රජයේ විදේශ ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2014 දෙසැම්බර් 31 දින සිට 2016 මැයි 31 දිනට ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව, ශ්‍රී ලංකා රුපියල පිරිහී ඇති ප්‍රමාණය කොපමණද;

(iii) රුපියලේ විනිමය අනුපාතය පිරිහීම හේතුවෙන් ශ්‍රී ලංකා රජයේ විදේශ ණය ප්‍රමාණය ඉහළ ගොස් ඇති ප්‍රමාණය රුපියල්වලින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2014 டிசம்பர் 31ஆம் திகதி உள்ளவாறு மற்றும் 2016 மே 31ஆம் திகதி உள்ளவாறு இலங்கை அரசாங்கத்தின் வெளிநாட்டுப் படுகடன் தொகை ஐக்கிய அமெரிக்க டொலரிலும் இலங்கை ரூபாயிலும் தனித்தனியாக எவ்வளவென் பதையும்;

(ii) 2014 டிசம்பர் 31ஆம் திகதி தொடக்கம் 2016 மே 31ஆம் திகதி வரை அமெரிக்க டொலருக்கு ஒப்பீட்டளவில் இலங்கையின் ரூபாய் வீழ்ச்சி யடைந்துள்ள அளவு தனித்தனியாக எவ்வள வென்பதையும்;

(iii) ரூபாயின் செலாவணி வீதம் வீழ்ச்சியடைந்ததன் காரணமாக இலங்கை அரசாங்கத்தின் வெளி நாட்டுப் படுகடன் தொகை உயர்வடைந்துள்ள அளவு ரூபாய்களில் எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House-

(i) separately, the foreign debt of the Government of Sri Lanka as at 31st December 2014 and as at 31st May 2016 in US Dollars and in rupees;

(ii) separately, the amount of depreciation of Sri Lankan Rupee in comparison to US Dollar from 31st December 2014 to 31st May 2016; and

(iii) the increase of foreign debt of the Government of Sri Lanka in Sri Lankan rupees due to the depreciation of the exchange rate of rupee; and

(b) If not, why?

ගරු රවී කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

දිනය	විදේශ ණය (ඇ.ඩො. මිලියන)	විදේශ ණය (රු. මිලියන)
2014.12.31 දිනට	23,755	3,113,116
2016.05.31 දිනට	24,594	3,584,617

ලබා ගත් ණය ප්‍රමාණය බොහොම සුළු ගණනකින් තමයි වැඩි වෙලා තිබෙන්නේ.

(ii) 2014.12.31 දින සිට 2016.05.31 දිනට ඇමෙරිකන් ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය පිරිහී ඇති ප්‍රමාණය සියයට 6.9කි.

නමුත් අද වන විට එය සියයට 6.5යි.

(iii) 2014.12.31 දින සිට 2016.05.31 දින දක්වා කාලය තුළ ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව, රුපියලේ අගය අවප්‍රමාණ වීම හේතුවෙන් ශ්‍රී ලංකා රජයේ විදේශ ණය ප්‍රමාණය රුපියල් මිලියන 506,974න් ඉහළ ගොස් ඇත.

(ආ) පැන නොනඟී.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මුදල් ඇමතිතුමා දැන් පෙන්වා දුන්නා, අපේ විදේශ ණය ප්‍රමාණය දැවැන්ත ලෙස වැඩිවීමට ණය ගැනීම වාගේම රුපියල පිරිහීමත් බලපා තිබෙන බව. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු විධියට පසු ගිය කාලයේ සියයට 6.9කින් රුපියල පිරිහීමට බලපෑ හේතු මොනවාද?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නයට මම පිළිතුරක් දෙන්නම්. 2005 ජනවාරි මාසය වන විට තිබුණු බිලියන 1,784ක ණය ප්‍රමාණය 9,900 දක්වා වැඩි වෙලා තිබෙනවා. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ අපේ අලුත් ආණ්ඩුව මේ රට භාර ගන්නා විට පසු ගිය ආණ්ඩුව නොගෙවපු ණය වශයෙන් රුපියල් බිලියන 1,300ක් තිබුණා. ඒ නිසා ණය ලබා දෙන යම් යම් ආයතන අප දෙස බැලුවේ වපර ඇසින්. තිබෙන ණය ප්‍රමාණය මෙච්චරයි කියා අප විශ්වාස කළාට, රුපියල් බිලියන 1,300ක් ගෙවා තිබුණේ නැති නිසා, ඒක රුපියලේ අගයට බලපෑමක් වුණා. චීනයේ මුදල් ඒකකය සියයට 10.1න් අවප්‍රමාණ වෙලා, ඉන්දියාවේ මුදල් ඒකකය සියයට 15න් අවප්‍රමාණ වෙද්දී, මේ පුංචි ලංකාවේ රුපියල සියයට 6.5න් තමයි අවප්‍රමාණ වෙලා තිබෙන්නේ.

මීට පෙර අවුරුදුවල, 2013 වර්ෂයේ, රුපියලේ අගය අවප්‍රමාණ වීමෙන් මිලියන 750ක් විතර අලාභ වුණා. නමුත් මේ වන විට එම තත්ත්වය අඩු වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීමා කියන කරුණ රටට බරක් තමයි. ඒ නිසා දැන් අපි බලන්නේ රුපියල ශක්තිමත් කරලා මීට පෙර ගත්ත ණය ප්‍රමාණය අඩු කර ගැනීමටයි.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා ලබා දුන් පිළිතුර මට පැහැදිලි මදි. ගරු ඇමතිතුමනි, සමහර රාජ්‍ය ආයතනවල ණය ආණ්ඩුවේ ණයක් විධියට දක්වන්නේ නැහැ. සංස්ථාවක් ණයක් අරගෙන තිබුණොත්, එය ආණ්ඩුවේ ණයක් විධියට දක්වන්නේ නැහැ. ලංකා බැංකුව ගත්ත ණය රාජ්‍ය ණයට අයිති වෙන්නේ නැහැ. කෙසේ වෙතත්, අවසානයේ මේ ඔක්කෝම ණය ගෙවන්නේ ඩොලර්වලින්. සංස්ථාවල ණය විධියට දක්වා තිබුණු ඒවා රාජ්‍ය ණය විධියට හඳුනා ගැනීමක් කළාය කියන එකෙන් කොහොමද විනිමය අනුපාතයට බලපෑමක් ඇති වෙන්නේ?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා ඒ ප්‍රශ්නය ඇසුවාට ස්තුතියි. පසු ගිය ආණ්ඩුව, රජයට සල්ලි නැති වුණාම ජාතික ඉතිරි කිරීමේ බැංකුවට කිව්වා, US Dollars මිලියන දාහක් ගන්න කියලා. ඒ ණය ගත්තේ 2014දී. සාමාන්‍යයෙන් සියයට හතරේ-පහේ පොලියට ගන්න පුළුවන් ඒ ණය ගත්තේ සියයට 8.75ක පොලියට. තවම එයින් US Dollars මිලියන 380ක් වියදම් කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. [බාධා කිරීම්] අද අපට පුළුවන් වෙලා තිබෙනවා, කිසිම බැංකුවක රජයේ - [බාධා කිරීමක්]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු ඇමතිතුමනි, මම ඉදිරිපත් කළ අතුරු ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඕනෑ විධියකට ප්‍රශ්නය අහන්න පුළුවන්. නමුත් මම සමස්තයක් වශයෙන් උත්තර දෙන්නේ. ඔබතුමාගේ ප්‍රශ්නයේ කොටසකට උත්තර දුන්නාට හරි යන්නේ නැහැ. [බාධා කිරීමක්] අපට පෙන්වන්න අවශ්‍ය වන්නේ, කොතරම් දූෂිත ආණ්ඩුවක් යටතේ පැවැති රටක්ද අපට භාර දුන්නේ කියන එකයි.

ඒ ණය ගැනීම නිසා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මුදල් තැන්පත් කරන අහිංසක තැන්පත්කරුවන්ට ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එවැනි භයංකර තත්ත්වයක් මහ හැර ගෙන යන ගමනක් තමයි දැන් තිබෙන්නේ. එසේ ලබා ගත් ණයවලින් US Dollars මිලියන 330ක් තවම පාවිච්චි කරලා නැහැ. මොකද, සියයට 8.75ක පොලියට ණය අරගෙන ව්‍යාපෘතිවලට වියදම් කරන්න බැහැ. අද අපි රජයක් වශයෙන් සියයට 2.4 පොලියට ණය ගන්නවා. ඉතුරු සියයට භය කොහේටද ගියේ? කාටද ගියේ?

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය අහන්න කලින් මේ කාරණයට මා ඔබතුමාගේ අවධානය යොමු කරනවා. අපි නිරන්තරයෙන්ම මේ ප්‍රශ්නය මතු කර තිබෙනවා. ගරු කථානායකතුමනි, විපක්ෂයේ සිටින සුළුතර මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂකයා විධියට මේ සභාවේ ඉන්නේ ඔබතුමායි. අපි අහන ප්‍රශ්නයට නොවෙයි ඇමතිතුමා හැම දාම උත්තර දෙන්නේ. "යන්නේ කොහේද ඇහුවාම මල්ලෙ පොල් කීවා" වාගේ උත්තර තමයි දෙන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා ඔබතුමා මේ ඇමතිතුමන්ලාගේ - [බාධා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඒක ඔබේ උරුමයේ තිබෙන කරුමයක්.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මට පොඩ්ඩක් අවසර දෙන්න. මම ගරු කථානායකතුමාටයි අමතන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා නොවෙයි කථානායක. ගරු කථානායකතුමනි, මා ඉදිරිපත් කරන කරුණට ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු මන්ත්‍රීතුමනි, මෙතෙක් කල් ඔබතුමන්ලා කටයුතු කළේ කොහොමද? මේ අතුරු ප්‍රශ්නය ඔබතුමාගේ ප්‍රධාන ප්‍රශ්නයට කිසිම අදාළත්වයක් නැහැ නේ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මොකක්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දැන් ඔබතුමා කිව්වා නේ, "කොහේද යන්නේ - මල්ලේ පොල්" කියලා. ඔබතුමාගේ තුන්වන අතුරු ප්‍රශ්නයත් අන්න ඒ වාගේමයි.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු ඇමතිතුමනි, මම ඉතා පැහැදිලිව ඉදිරිපත් කරන ප්‍රශ්නය ඔබතුමාට තේරෙන්නේ නැහැ. ඒක වෙනම කාරණයක්. මම අහපු ප්‍රශ්නයට නොවෙයි ඔබතුමා උත්තර දුන්නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඔක්කෝටම වඩා ප්‍රශ්නය අහන කෙනාට තේරෙන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අපට විතරයි තේරෙන්නේ නැත්තේ. මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා තේරුම් ගත්ත නිසා තමයි, මේ වාගේ ආර්ථිකයක් අපට භාර දුන්නේ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මගේ ප්‍රශ්නය අහන්නේ මට තේරෙන ප්‍රමාණයට නේ. මගේ ප්‍රශ්නය දන්නේ මම නේ. ඔබතුමා වැටි බදු පනත් කෙටුම්පත ගෙනාපු විධියට මේ දිහා බලන්න එපා.

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙනවාද? නැත්නම් ඔබතුමා ඔය කාරණය අපේ අවධානයට යොමු කරනවාද?

ගරු රවි කරුණානායක මහතා
(මාණ්ඩුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
කථානායකතුමාටත් තේරෙනවා, ඔබතුමා කොයි වාගේ වට රවුමක් යන්න හදනවාද කියලා.

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමාට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(මාණ්ඩුමිකු උදය පිරභාත් කම්මන්පිල)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මට ප්‍රශ්නය අහන්න ගරු මුදල් ඇමතිතුමා නිහඬ කරලා දෙනවාද?

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. රුපියලේ ස්ථායිතාව ඇති කර ගැනීමට ඔබතුමන්ලා ගැනීමට බලාපොරොත්තු වන ඉදිරි පියවර මොනවාද?

ගරු රවි කරුණානායක මහතා
(මාණ්ඩුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
අපේ අගමැතිතුමා නොවැම්බර් මාසයේ 05වැනි දා අවුරුදු පහේ සැලැස්ම ඉදිරිපත් කළා. තව සුමාන දෙකකින් විතර ඉදිරිපත් කරාවි, දවස් 1,500 වැඩ පිළිවෙළ. ඒ තුළින් අපි Colombo International Financial Centre - Port (Financial) City - එක ඉදි කරන මාර්ගය පෙන්වලා තිබෙනවා. ඒ වාගේම අද අපට සතුටින් කියන්න පුළුවන්, අපේ විදේශ සංචිත ප්‍රමාණය - reserve - යූඑස් ඩොලර් මිලියන 6,900කට විතර වැඩි වෙලා තිබෙන බව. ඒ වාගේම මේ වන විට අපේ රටට සුමානයකට යූඑස් ඩොලර් මිලියන 125ක් විතර එනවා. ඒ තුළින් රුපියල නැවත ශක්තිමත් වෙනවාය කියන එක පෙන්නුම් කරලා තිබෙනවා. සෘජු ආයෝජන මේ රටට ගලාගෙන එන එක පටන් අරගෙන තිබෙනවා. මේ සියලු දේම නිසා රුපියලේ වටිනාකම වැඩි තැනකට ගමන් කරාවි. ඒ තුළින් ඩොලර් එකට සාපේක්ෂව රුපියලේ අගයට තිබෙන බරපතළ හානිය අඩු වන බව තමයි අපට සතුටින් ප්‍රකාශ කරන්න පුළුවන්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නයත් අහලා ඉවරයි, ගරු මන්ත්‍රීතුමනි.

මුස්ලිම් විවාහ හා දික්කසාද පනත: උපදේශක සභාව පිහිටුවීම

முஸ்லிம் திருமண மற்றும் மணநீக்கச் சட்டம்: ஆலோசனைச் சபையை நியமித்தல்

MUSLIM MARRIAGES AND DIVORCE ACT: APPOINTMENT OF ADVISORY COUNCIL

659/'16

7. ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(මාණ්ඩුමිකු එම්.එච්.එම්. සල්මාන්)
(The Hon. M.H.M. Salman)
ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 4 වන වගන්තිය ප්‍රකාර, උපදේශක සභාවක් පත්කර තිබේද;

(ii) එසේ නම්, එම සභාව පත් කළ දිනය කවරේද;

(iii) එම උපදේශක සභාවේ සාමාජිකයන්ගේ නම්, ඔවුන්ගේ අධ්‍යාපන හා වෘත්තීයමය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ ඇතැම් කරුණු ක්‍රියාත්මක කිරීමට බාධාවක්ව පවතින, එකී උපදේශක සභාව නොපමාව පත්කිරීම සඳහා එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முஸ்லிம் திருமண மற்றும் மணநீக்கச் சட்டத்தின்கீழ் 4வது பிரிவின் பிரகாரம் ஆலோசனைச் சபையொன்று நியமிக்கப் பட்டுள்ளதா;

(ii) ஆமெனில் அச்சபை நியமிக்கப்பட்ட திகதி யாது;

(iii) மேற்படி ஆலோசனைச் சபை உறுப்பினர்களின் பெயர்கள், அவர்களின் கல்வி மற்றும் தொழில்சார் தகைமைகள் தனித்தனியாக யாவை;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், முஸ்லிம் திருமண மற்றும் மணநீக்கச் சட்டத்தின் ஒருசில விடயங்களை அமுலாக்குவதில் தடையேற்பட்டுள்ளதால், மேற்படி ஆலோசனை சபையை தாமதமின்றி நியமிக்க அவர் நடவடிக்கை எடுப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House-

(i) whether an Advisory Council, in terms of Section 4 of the Muslim Marriages and Divorce Act, has been appointed;

(ii) if so, the date on which it was appointed; and

(iii) the names of the members of that Advisory Council, their educational qualifications and professional qualifications separately?

(b) Will he take steps to appoint that Advisory Council the absence of which impedes the enforcement of certain sections of the Muslim Marriages and Divorce Act without delay, if the council is not operational?

(c) If not, why?

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට අදාළ පිළිතුර මෙසේය.

[ගරු වජිර අබේවර්ධන මහතා]

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ආ) ඔව්. දැනටමත් මූලික කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ පත් කරන උපදේශක සභාව ඉතා වැදගත් ආයතනයක්. මට ආරංචි වෙලා තිබෙන අන්දමට අවුරුදු හතරක කාලයක් මේ සභාව පත් කරලා නැහැ. මුස්ලිම් විවාහ හා දික්කසාද කියන විෂයය පාලනය වන්නේ විවිධ විධියට. මුස්ලිම් අයගේ විවාහ හා දික්කසාද මේ පනත යටතේ පාලනය වුණත්, අධිකරණ සේවා කොමිෂන් සේවාවෙන් පත් කරන කාති විනිශ්චයකාරවරුන් තමයි ඒවා ක්‍රියාත්මක කරන්නේ. ඒ වාගේම රෙජිස්ට්‍රාර් ජනරාල් තමයි විවාහ ලියා පදිංචි කිරීම කරන්නේ. එයට අදාළ විශේෂ නීති ක්‍රමයක් තිබෙනවා. මෙම උපදේශක සභාවෙන් කෙරෙන්නේ ඊට අදාළ උපදෙස් ඒ අයට ලබා දීමයි. එම නිසා මම කරුණාකර ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් හැකි ඉක්මනින් උපදේශක සභාවක් පත් කරන්න කියලා.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 4, 5, 6, 7 කියන වගන්ති අනුව නව දෙනෙකුට අඩු සංඛ්‍යාවකින් යුතු උපදේශක සභාවක් පත් කරන්න පුළුවන්. ඒ සංඛ්‍යාවට අනුව අදාළ අය පත් කිරීම් සිදු කරමින් පවතිනවා. අපට තව සති කීපයක් ඇතුළත මේ කටයුත්ත සම්පූර්ණයෙන්ම අවසන් කරන්න පුළුවන්.

"පෝට් සිටි" ව්‍යාපෘතිය ආශ්‍රිත විශේෂ චීන කර්මාන්ත කලාපය: ගිවිසුම

'போட் சிட்டி' கருத்திட்டம் சார்ந்த விசேட சீன கைத்தொழில் வலயம்: உடன்படிக்கை

"PORT CITY" PROJECT RELATED SPECIAL CHINESE INDUSTRIAL ZONE: ACCORD

666/'16

8. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රජය මහින් ප්‍රකාශ කර ඇති පරිදි අග්‍රාමාත්‍යවරයාගේ චීන සංචාරයේ දී එකඟ වූ බවට සඳහන් කරන "පෝට් සිටි" (Port City) ව්‍යාපෘතිය ආශ්‍රිත විශේෂ චීන කර්මාන්ත කලාපය පිළිබඳ චීන රජය සමඟ එළැඹී ඇති ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද;

(ii) එසේනම්, එම ලියවිල්ල සභාගත කරන්නේද;

(iii) එම විශේෂ චීන කර්මාන්ත කලාපය පිහිටුවීමේ මූලික කොන්දේසි හා කළමනාකරණය සිදු වන ආකාරය පිළිබඳව පැහැදිලි කරන්නේද;

(iv) එම කර්මාන්ත කලාපය සඳහා හඳුනාගෙන ඇති භූමියේ සිතියමක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்தினால் பிரகடனப்படுத்தப்பட்டுள்ள வாறு பிரதம அமைச்சரின் சீன விஜயத்தின்போது இணக்கம் தெரிவிக்கப் பட்டதாகக் குறிப்பிடப்படும் 'போட் சிட்டி' (Port City) கருத்திட்டம் சார்ந்த விசேட சீன கைத்தொழில் வலயம் தொடர்பாக சீன அரசாங்கத்துடன் ஏற்படுத்திக்கொள்ளப்பட் டுள்ள உடன்படிக்கை ஒன்று அல்லது இணக்கப்பாட்டு ஆவணமொன்று உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அந்த ஆவணத்தை சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) மேற்படி விசேட சீன கைத்தொழில் வலயத்தை தாபித்தலுடன் தொடர்புடைய அடிப்படை நிபந்தனைகளையும் முகாமைத்துவம் நடை பெறும் விதத்தையும் பற்றி தெளிவுபடுத் துவாரா என்பதையும்;

(iv) மேற்படி கைத்தொழில் வலயத்திற்காக இனங் காணப்பட்டுள்ள காணியின் வரைபடத்தை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) whether there is an agreement or accord entered into with the Government of China with regard to the "Port City" project related Special Chinese Industrial Zone which is said to have been agreed to by the Prime Minister in his visit to China, as stated by the Government;

(ii) if so, whether that document will be tabled;

(iii) whether he will make a clarification of the preliminary conditions of establishing that Special Chinese Industrial Zone and the manner it is managed; and

(iv) whether a map of the land earmarked for that industrial zone will be presented?

(b) If not, why?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.
(ii) අදාළ නොවේ.
(iii) අදාළ නොවේ.
(iv) අදාළ නොවේ.

(ආ) වරාය නගරය හා බැඳි විශේෂ කලාපය මූල්‍ය හා වාණිජ නගරයක් ලෙස සැලසුම් කරනු ලබයි. අපි මීට කලින් බලාපොරොත්තු වුණේ එම මූල්‍ය හා වාණිජ නගරය වෙනත් ස්ථානයක ඉදි කරන්නයි. නමුත් දැන් මේ වරාය නගරය කියන ප්‍රදේශය ඉදිරියට කරගෙන යන්න තීරණය කර තිබෙන නිසා විශේෂයෙන්ම එතැන තමයි ඒක ඉදිකරන්න සැලසුම් කරන්නේ. කර්මාන්ත කලාප කිසිවක් ඒකට සම්බන්ධ වෙලා නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමාට යොමු කරන මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. "පෝට් සිටි (Port City) ව්‍යාපෘතිය ආශ්‍රිත විශේෂ චීන කර්මාන්ත කලාපය පිළිබඳ චීන රජය සමඟ එළැඹී ඇති ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද; එසේ නම්, එම ලියවිල්ල සභාගත කරන්නේද;" කියලා මම අහලා තිබෙන ප්‍රශ්නයට ඔබතුමා පිළිතුරු දුන්නේ "අදාළ නොවේ" කියලායි. කුමන පදනමින්ද ඒක අදාළ වෙන්නේ නැත්තේ කියලා මම දැනගන්න කැමැතියි. මොකද, ප්‍රශ්නය ඉදිරිපත් කරන අවස්ථාවේදී මේක තිබුණා. ඔබතුමාගේ චීන සංචාරයෙන් පසුව පුවත් පත්වල පළ වුණා, මේ ව්‍යාපෘතිය සම්බන්ධව එකඟතාවන්ට පැමිණියා කියලා. මේ ප්‍රශ්නය ඉදිරිපත් කළාට පසුව තමයි එය මූල්‍ය නගරයක් කියන එක ඇති වුණේ, ගරු අගමැතිතුමනි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපි කිසි විටෙක එතැන කර්මාන්ත කලාපයක් ඇති කරන්න සාකච්ඡා කළේ නැහැ. ඒත් ඔබතුමා කියනවා නම් මෙතැන චීන කර්මාන්ත කලාපයක් ඇති කරන්න යනවා කියලා, චීන කර්මාන්ත කලාපයක් කොළඹ නගරයේ ඇති කරන්න අපේ බලාපොරොත්තුවක් නැති බව මම ඔබතුමාට කියන්න ඕනෑ. අපේ බලාපොරොත්තුව එය මූල්‍ය නගරයක් බවට පත් කරන්නයි. ඊට ඉස්සෙල්ලා තිබුණු ව්‍යාපෘතියේ නම් කර්මාන්ත තිබුණේ නැහැ. නමුත් night racingවලටයි, කැසිනෝවලටයි ඉඩ තිබුණා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු අගමැතිතුමනි, finance කියන්නේත් industry එකක්. Sports කියන්නේත් industry එකක්. අපි ඒ වවන හරඹයට යන්නේ නැතිව, ඔබතුමා හඳුන්න යන මූල්‍ය නගරය සම්බන්ධයෙන් එළැඹී ලියවිල්ලක් තිබෙනවාද කියලා කියන්න පුළුවන්ද? එවැන්නක් තිබෙනවා නම් ඔබතුමාට එය සභාගත කරන්න පුළුවන්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
එවැන්නක් නැහැ. මේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා අපේ ඇමතිතුමාගේ අමාත්‍යාංශයයි, චීන ආණ්ඩුව එක්කයි මූලික ගිවිසුම අත්සන් කළා. අපි මූල්‍ය නගරයේ සංකල්පය ගැන වාර්තා සකස් කළාම මෙම ගරු සභාවටත් දැනුම් දෙන්නම්. දැනට ඒ ගැන සාකච්ඡා කරමින් පවතිනවා. ඉදි කිරීමට යෝජිත එම මූල්‍ය නගරය පිළිබඳව වාර්තා තවම සකස් කරලා නැහැ. එම වාර්තා සකස් කළාම අපි මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නම්. ඒ වාගේම චීන ආණ්ඩුව එක්කත් මේ ගැන සාකච්ඡා කරන්න බලාපොරොත්තු වනවා.

අපි මේ පියවර ගන්නා නිසා දැන් චීනයේ Renminbi මුදල්, ඩොලර් වාගේම ගනු-දෙනු කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. චීනය ප්‍රකාශ කරලා තිබෙනවා, මහජන චීන බැංකුවේ දකුණු ආසියාවේ ශාඛාව ලංකාවේ -කොළඹ- ඇති කරනවා කියලා. මෙම මූල්‍ය නගරය ඇති කළායින් පසුව එම චීන බැංකු ශාඛාව එතැන ඇති කිරීම පමණයි දැනට අරගෙන තිබෙන එකම තීරණය. එවැනි සංකල්ප ඇති කරන එක අපේ වැඩ කොටසක්. අපි එවැනි සංකල්පයන් ඇති කරලා, මෙම ගරු සභාව එක්කත් ඒ ගැන සාකච්ඡා කරලා, ඊට පසුව ඉදිරියට කටයුතු කරගෙන යනවා. දැනට ඒ පිළිබඳව වාර්තා සකස් කරමින් පවතිනවා පමණයි. සමහර විට මේ අවුරුද්ද අවසන් වන විට මෙම ගරු සභාවට එම වාර්තා ඉදිරිපත් කරන්න අපට හැකි වෙයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමනි, ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු අගමැතිතුමනි, මූල්‍ය නගරය වෙනත් ස්ථානයක ඉදි කිරීමටයි ඔබතුමන්ලාගේ බලාපොරොත්තුව තිබුණේ කියලා ඔබතුමා පිළිතුරු ලබා දෙනකොට ප්‍රකාශ කළා. නමුත් දැන් මෙතැන මුහුදු ගොඩ කිරීම නිසා එම ස්ථානයේ මූල්‍ය නගරය ඉදි කිරීමට තමුන්නාන්සේලා සැලසුම් කළා කියලා තමයි දැන් කියන්නේ. ගරු අගමැතිතුමනි, දැන් තිබෙන ප්‍රශ්නය වන්නේ මෙයයි. මූල්‍ය නගරය ඉදි කිරීමට වෙනත් ස්ථානයක් තිබියදී මුහුදු ගොඩ කරන ලද ස්ථානයක් නැවත තෝරා ගන්නේ ඇයි? මෙතැන හෙක්ටයාර 269ක්, ඒ කියන්නේ අක්කර 675කට ආසන්න භූමියක් තිබෙන බව ඔබතුමා දන්නවා. ඒ ඉඩම් උඩින් අක්කර 675ක් නම්, අඩුම තරමේ පාදම අක්කර 1000ක්වත් විය යුතුව තිබෙනවා. ඔබතුමා එදා ලබා දුන් පිළිතුර අනුව, මෙම ප්‍රදේශයේ මුහුදු ගොඩ කිරීම වෙනුවෙන් වැලි සන මීටර ලක්ෂ 650ක් ඕනෑ වනවා. කළු ගල් සන මීටර ලක්ෂ තිස්හතරහමාරක් ඕනෑ වනවා. ඒ සඳහා තමුන්නාන්සේලා හංවැල්ල, පාදුක්ක, කඩුවෙල, දිවුලපිටිය යන ප්‍රදේශවල තිබෙන ගල් වලවල් එකොළහකින් ගල් සොයා ගැනීමට සැලසුම් කරලා තිබෙනවා කියලා කිව්වා. සාමාන්‍යයෙන් ඒ ගල් වලවල් කුඩා යන්ත්‍රානුසාරයෙන් කඩන ගල්වලවල්. නමුත්, මෙම ගොඩ කිරීම සඳහා ගැඹුරට බෝර විදින ලද ලොකු ගල් අවශ්‍ය වනවා. එතකොට, ඒ පිළිබඳව පරිසර අධ්‍යයනයක් සිදු කරලා නැහැ.

ගරු කථානායකතුමනි, දැනට සිදු කරලා තිබෙන පරිසර අධ්‍යයන වාර්තාවේම සඳහන් වනවා, ධීවර පවුල් 5,000ක් පමණ තමයි තර්ජනයට ලක් වෙන්නේ කියලා. ඒ සඳහා රුපියල් මිලියන 900ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව එක පවුලකට රුපියල් 55,000ක් තමයි වන්දි මුදල් වශයෙන් ලැබෙන්නේ. එම වන්දි ගෙවීමත් කිසිසේත්ම සාධාරණ නැහැ.

[ගරු අනුර දිසානායක මහතා]

අපේ මීගමුව කළපුවට සමාන්තර මුහුදු තීරයෙන් තමයි මේ වැලි ටික ගන්නේ. ඒ ප්‍රදේශයේ වැලි ඝන මීටර් ලක්ෂ 1,200ක විතර ප්‍රමාණයක් තමයි තිබෙන්නේ. එම ඝනමීටර් ලක්ෂ 1,200ක් පමණ වූ වැලි ප්‍රමාණයෙන් තමයි ලක්ෂ 650ක් තමුන්නාන්සේලා ගන්නේ. එම වැලි ප්‍රමාණය නැවත පිරෙන්න කැලණි ගඟේ මෝය කටෙන් යන වැලි ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ නිසා මීගමුව කළපුවත් විශාල අනතුරකට මුහුණ දෙනවා. මුහුදු ක්ෂීරපායින් විශාල ප්‍රමාණයක් බෝවන ස්ථානයක් බවට මේ ප්‍රදේශය පත්වෙලා තිබෙන බව ඔබතුමාත් දන්නවා ඇති, ගරු අගමැතිතුමනි. තල්මසුන්, ඩොල්ෆින් වැනි මුහුදු ක්ෂීරපායී සත්ව වර්ග 15ක ප්‍රධාන භූමිය බවට පත් වෙලා තිබෙන්නේ මේ ප්‍රදේශයයි. මෙලෙස වැලි ගැනීම හරහා මුළු ප්‍රදේශයම විනාශයට ලක් වෙනවා. මූල්‍ය නගරයක් ඉදිකිරීමට වෙන ස්ථානයක් තිබියදී - තමුන්නාන්සේ විසින්ම මේ පාර්ලිමේන්තුවේදී මේ කටයුත්ත නතර කරනවාය කියලා ප්‍රකාශ කරලා තිබුණා. ඒ වාගේම ආණ්ඩුව බලයට ආවාට පස්සේ එය නතර කර තිබුණා. නමුත් නැවතත් මේ පාරිසරික විනාශය මේ ආකාරයටම සිදු වන තත්ත්වයක් ඇතුළේ මේ ප්‍රදේශයට මූල්‍ය නගරය මාරු කරන්න හේතු කවරේද කියලා මා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

"මූල්‍ය නගරය" කියන සංකල්පයක් ගැන අපි විපක්ෂයේ සිටියදී සාකච්ඡා කළා. ඉස්සෙල්ලාම යෝජනා කරලා තිබුණේ වැලිකඩ බන්ධනාගාරය ඉවත් කරලා එතැනට මූල්‍ය නගරය ගෙන යන්නයි. එහෙම නැත්නම් රත්මලානට මූල්‍ය නගරය ගෙන යන්න තමයි කලින් යෝජනා කරලා තිබුණේ. ඇත්ත වශයෙන්ම වැලිකඩ බන්ධනාගාරය තිබෙන ඉඩමට වඩා විශාල භූමි ප්‍රමාණයක් මේ ප්‍රදේශයේ තිබුණා. මේ ප්‍රදේශයෙන් සම්පූර්ණ ප්‍රයෝජන අරගෙන විශාල නගරයක් බවට දියුණු කරන්න තමයි යෝජනා කරලා තිබුණේ. කෙසේ නමුත් පරිසර වාර්තාව ලැබුණාට පසුව පරිසර වාර්තාව මඟින් අනුමත කරනවා නම් ඒ කටයුත්ත ඉදිරියට ගෙන යන්නත්, පරිසර වාර්තාව මඟින් අනුමත කරන්නේ නැත්නම් ඒ වැඩ කටයුතු නවත්වන්නත් අපි මූලිකව එකඟ වෙලා තිබුණා. නමුත් වැඩ කටයුතු ඉදිරියට කරගෙන යන්න කියලා පරිසර වාර්තාව මඟින් අනුමත කළා.

දෙවැනි කාරණය හැටියට තිබුණේ සින්නක්කර ඉඩම් ලබා දීම සම්බන්ධයයි. සින්නක්කර ඉඩම් තෝරා ගන්නේ නැහැ කියන එකට චීන සමාගමත් එකඟ වුණා. අනෙක් කාරණා සියල්ලම පරිසර වාර්තාව අනුව ක්‍රියාත්මක කරනවා.

ධීවරයන්ගේ ප්‍රශ්නය පිළිබඳවත් අපේ අවධානය යොමුවෙලා තිබෙනවා. අපේ ගරු ජෝන් අමරතුංග ඇමතිතුමා, ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා ඇතුළු සියලු දෙනාම මේ සම්බන්ධයෙන් ක්‍රියා කරගෙන යනවා. විශේෂයෙන්ම ධීවරයන් සම්බන්ධයෙන් මතුවෙලා තිබෙන ප්‍රශ්නයට අපේ අවධානය යොමුවෙලා තිබෙනවා. මීට වඩා ඒ වෙනුවෙන් පියවර ගන්න වුවමනා නම් ඒ සම්බන්ධයෙනුත් පියවර ගන්න අපි ලෑස්තියි. කෙසේ හෝ මේ කටයුත්ත හේතුවෙන් පරිසර හානියක් සිදු වුණොත් අපේ Megapolis අමාත්‍යාංශය මාර්ගයෙන් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එහෙත් අපි ඉස්සෙල්ලා මූල්‍ය නගරය පිහිටුවන්න යෝජනා කරලා තිබුණු ප්‍රදේශයට වඩා විශාල භූමි භාගයක් අපට මේ ප්‍රදේශයෙන් ලැබෙනවා.

ඒ වාගේම, දැන් සැලැස්ම අනුව "වැලිකඩ" ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක් -වෙළඳ සංකීර්ණයක්- බවට පත් වෙනවා. රාජගිරිය, දෙමටගොඩ, කොළඹ, පෑලියගොඩ ආදි සියලු ප්‍රදේශවලින් එතැනට එන්න පුළුවන් විධියට තමයි ඒ සැලැස්ම හදා තිබෙන්නේ. ඒ සැලැස්මෙහි සංශෝධන තිබුණා. එහෙත් ඊට වඩා විශාල භූමි භාගයක් ලැබෙන නිසා තමයි අපි අර ප්‍රදේශය තෝරාගත්තේ.

විශ්‍රාම ගැන්වූ ආබාධිත රණ විරුවන්: වැටුප් සහ දීමනා
ஓய்வுறச்செய்யப்பட்ட அங்கவீனமுற்ற படைவீரர்கள்: ஓய்வூதியம் மற்றும் கொடுப்பனவு
RETIRED DISABLED WAR HEROES: PENSION AND ALLOWANCES

678/'16

9. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රාජ්‍ය ආරක්ෂක සේවයට අයත් යුද හමුදාව, ගුවන් හමුදාව, නාවික හමුදාව, පොලිසිය සහ සිවිල් ආරක්ෂක බලකායන්හි ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී, වෛද්‍ය හේතූන් මත ආබාධිත රණ විරුවන් ලෙස විශ්‍රාම ගැන්වූ වයස අවුරුදු 55ට වැඩි රණ විරු සාමාජික සාමාජිකාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී නිලධාරීන් සඳහා ගෙවනු ලබන දීමනා සහ එක් එක් දීමනාවේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) හි සඳහන් නිලධාරීන් සඳහා ආබාධිත රණ විරුවන් සඳහා ගෙවනු ලබන දුබලතා විශ්‍රාම වැටුප ගෙවන්නේද;

(ii) වයස අවුරුදු 55 සම්පූර්ණවීමෙන් පසු දුබලතා විශ්‍රාම වැටුප නවතා සාමාන්‍ය රජයේ සේවකයකු ලෙස සලකා ලබා දෙන දීමනාව කොපමණද;

(iii) පූර්ණ ආබාධිත තත්ත්වයේ පසු වන අයෙකු සඳහා ඉහත (ii) හි එලෙස ලබා දෙන දීමනාව සාධාරණද;

(iv) වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට ප්‍රථම ආබාධිත රණ විරුවකු මිය ගියහොත්, ඔහුගේ යැපෙන්නන් සඳහා දීමනාවක් ලබා දෙන්නේද;

(v) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அரச பாதுகாப்புச் சேவைக்குரிய இராணுவப் படை, விமானப்படை, கடற்படை, பொலிஸார் மற்றும் சிவில் பாதுகாப்பு படை ஆகியவற்றில் நடவடிக்கைக் கடமையில் ஈடுபட்டிருக்கையில் மருத்துவக் காரணங்களின் கீழ், அங்கவீனமுற்ற படைவீரர்களென ஓய்வு பெறச்செய்யப்பட்ட 55 வயதுக்கு மேற்பட்ட படைவீரர்களான அங்கத்தவர்களின் எண்ணிக்கை யாது;

(ii) இவ்வுத்தியோகத்தர்களுக்கு வழங்கப்படும் கொடுப்பனவுகள் மற்றும் ஒவ்வொரு கொடுப்பனவின் பெறுமதி வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேலே அ(i)இல் குறிப்பிடப்பட்டுள்ள உத்தியோகத்தர்களுக்கு அங்கவீன படைவீரர் களுக்கு வழங்கப்படும் இயலாமைக்கான ஓய்வூதியம் வழங்கப்படுகின்றதா;

(ii) 55 வயது பூர்த்தியான பின்னர் இயலாமைக்கான ஓய்வூதியத்தை நிறுத்திவிட்டு சாதாரண அரச ஊழியரெனக் கருதி வழங்கப்படும் கொடுப்பனவு எவ்வளவு;

(iii) முழு அங்கவீன நிலையிலுள்ள ஒருவருக்கு மேலே (ii) இன் படி வழங்கப்படும் கொடுப்பனவு நியாயமானதா;

(iv) 55 வயது பூர்த்தியாவதற்கு முன்னர் அங்கவீனமுற்ற படை வீரர் ஒருவர் மரணித்தால், அவரில் தங்கிவாழ்வோருக்கு கொடுப்பன வொன்று வழங்கப்படுகின்றதா;

(v) ஆமெனில், அது பற்றிய முறைமை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) the number of war heroes over 55 years of age who were sent on retirement as disabled war heroes on medical grounds while on active duty in the Army, the Air force, the Navy, the Police and the Civil Security Force which belong to the State Security Service; and

(ii) the allowances paid to the said officers and the value of each of the allowances?

(b) Will he also inform this House -

(i) whether the disability pension paid to disabled war heroes is paid to officers mentioned in (a)(i) above;

(ii) the allowance paid to them treating them as ordinary public servants, after the suspension of the disability pension upon the completion of 55 years;

(iii) whether the allowance paid as indicated in (ii) above for a totally disabled person is reasonable;

(iv) if a disabled soldier died before completing 55 years of age, whether an allowance is paid to his dependents; and

(v) if so, the method used in this regard?

(c) If not, why?

ගරු රුවන් විජයවර්ධන මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு ருவன் விஜயவர்தன - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)

(The Hon. Ruwan Wijayawardene - State Minister of Defence)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) යුද හමුදාව - 257

නාවික හමුදාව - 24

2016 ජූලි වන විට ගුවන් හමුදාව - 19

<u>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව</u>

පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වී ඇති බවට වෛද්‍ය මණ්ඩලය විසින් නිර්දේශ කිරීම හේතුවෙන් සේවයෙන් නිදහස් කළ සිවිල් ආරක්ෂක භටයන්ගෙන් දෙදෙනෙකු (02) මේ වන විට වයස අවුරුදු 55 ඉක්මවා ඇත.

(ii) ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී වෛද්‍ය හේතූන් මත ආබාධිත රණ විරුවන් ලෙස විශ්‍රාම ගැන්වූ වයස අවුරුදු 55ට වැඩි ත්‍රිවිධ හමුදා රණ විරුවන්ට, ඔවුන්ගේ වයස අවුරුදු 55 සැපිරුණු අවස්ථාවේදී ලබමින් සිටි වැටුප මත පදනම්ව සියයට 85ක සේවා විශ්‍රාම වැටුපක් හිමි **වේ.** මෙම සේවා විශ්‍රාම වැටුප සැකසීමේදී නිලධාරීන් සඳහා සලාක දීමනාව, සුදුසුතා වැටුපද ඇතුළත් කර ගන්නා අතර, සෙසු නිලයන් සඳහා සලාක දීමනාව, සුදුසුතා වැටුප, යහපත් පැවැත්මේ දීමනාව සහ නැවත බැඳීමේ දීමනාවද ඇතුළත් කරනු ලැබේ. පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වී ඇති බවට වෛද්‍ය මණ්ඩලය විසින් නිර්දේශ කිරීම හේතුවෙන් සේවයෙන් නිදහස් කළ වයස අවුරුදු 55ට වැඩි සිවිල් ආරක්ෂක භටයන්ට කිසිදු දීමනාවක් නොගෙවයි.

(ආ) (i) නැත.

(ii) ත්‍රිවිධ හමුදා රණ විරුවන්ට වයස අවුරුදු 55දී ලැබෙන වැටුප මත පදනම්ව සියයට 85ක සේවා විශ්‍රාම වැටුප ගෙවනු ලබයි. සිවිල් ආරක්ෂක භටයන්ට කිසිදු දීමනාවක් මේ දක්වා ගෙවා නැත.

(iii) වැටුප් හා දීමනා ලබා දීමේදී පවතින නීති හා රජයේ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇත.

(iv) ඔව්.

(v) ත්‍රිවිධ හමුදා රණ විරුවන්ට 1981 සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව යැපෙන්නන්ගේ දීමනාව ලබා දේ.

එම දීමනාව හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලබා දේ.

සිවිල් ආරක්ෂක භටයෙකු මිය යන අවස්ථාවේදී ලබමින් සිටි වැටුප හා දීමනා, ඔහුට වයස අවුරුදු 55 සම්පූර්ණ වන දිනය දක්වා ඔහුගෙන් යැපෙන්නන් වෙත ගෙවනු ලබයි.

(ඇ) අදාළ නොවේ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)

(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාට යොමු කරන මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

ගරු ඇමතිතුමනි, අවුරුදු 55 සම්පූර්ණ වීමත් සමඟ ආබාධිත රණ විරුවන් ද විශ්‍රාම වැටුප සඳහා සුදුසුකම් ලබනවා. නමුත්, ඔවුන්ට වයස අවුරුදු 55 සම්පූර්ණ වන දිනයත්, විශ්‍රාම වැටුප ලැබෙන දිනයත් අතර වන කාල සීමාවේ විශාල පරතරයක් තිබෙනවා. මෙය වසරක් හෝ දෙකක් විය හැකියි. ඒ කාලය තුළ මේ ආබාධිත රණ විරුවන් දැඩි ලෙස අසරණභාවයට පත් වනවා. ගරු ඇමතිතුමනි, මේ සඳහා ගත වන කාල සීමාව අඩු කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන්ද? එවැනි ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසුයි කියන යෝජනාව සහ ප්‍රශ්නය මම ඔබතුමාට යොමු කරනවා.

ගරු රුවන් විජයවර්ධන මහතා
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardhana)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්තෙන්ම ඒක හොඳ යෝජනාවක්. එවැනි ප්‍රශ්නයක් තිබෙනවා නම්, අනිවාර්යයෙන්ම අපි ඒ ගැන සොයා බලා පුළුවන් තරම් ඉක්මනින් ඒ අයට ඒ විශ්‍රාම වැටුප ලබා දෙන්න සැලසුම් කරන්නම්. මුදල් ලබා දීම සඳහා යම් කාලයක් ගත වීමේ ප්‍රශ්නයක් හමුදාව ඇතුළේ තිබෙන නිසා තමයි මම හිතන හැටියට ඔය ප්‍රශ්නය පැන නැඟී තිබෙන්නේ. නමුත්, අපේ ත්‍රිවිධ හමුදාපතිවරු සමඟ සාකච්ඡා කර පුළුවන් තරම් ඉක්මනින් ඒ අයට විශ්‍රාම වැටුප ලබා දෙන්න සලස්වන්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන්ම මටත් අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාට අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

ගරු රුවන් විජයවර්ධන මහතා
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardhana)
කමක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ඉදිරිපත් කරන ලද ගැටලුවක් සම්බන්ධ ලේඛනයක් මා සතුව තිබෙනවා. ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයටම මේ ප්‍රශ්නයත් සම්බන්ධයි. මට ගැටලුව ඉදිරිපත් කළ පුද්ගලයා ආබාධිතයෙක්. දැනට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දී තිබෙනවා ලු, අවුරුදු 55න් පසු හිමිවන විශ්‍රාම වැටුප එවැනි ආබාධිත පුද්ගලයන්ට පමණක් ලබා නොදීමට තීරණය කරලා තිබෙනවා කියලා.

යුද්ධයේදී සිදු වූ ප්‍රහාරයකින් 2007.08.08 වෙනි දා පාදයක් අහිමි වෙලා සිටින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පුද්ගලයෙක් තමයි මට මේ ගැටලුව ඉදිරිපත් කළේ. ඔහුට අවුරුදු 55න් පස්සේ හිමිවන විශ්‍රාම වැටුප ලබා නොදීමට තීන්දුවක් අරගෙන තිබෙනවාය කියලා කියනවා. එහෙම තීන්දුවක් අරගෙන තිබෙනවාද, එහෙම තීන්දුවක් අරගෙන තිබෙනවා නම්, ඔබතුමා එය වෙනස් කරන්න කටයුතු කරනවාද කියලා අපි දැනගන්න කැමැතියි. මේ ප්‍රශ්නය ඒ පුද්ගලයාට අදාළ ප්‍රශ්නයක් පමණක් නොවෙයි, පොදු ප්‍රශ්නයක්.

ගරු රුවන් විජයවර්ධන මහතා
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardhana)
ඒ ගැන මම දැනුවත් වෙලා නැහැ. නමුත්, මට ඒ විස්තර ටික ලබා දුන්නොත්, මම අනිවාර්යයෙන්ම ඒ දිහා බලා එතුමාට පුළුවන් උපකාරයක් කරන්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
වවුනියාවේ, ජයන්ත කුමාර කියලා පුද්ගලයෙක්.

ගරු රුවන් විජයවර්ධන මහතා
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardhana)
හොඳයි, මට විස්තර ටික ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 -731/'16- (1), ගරු රෝහිත අබේගුණවර්ධන මහතා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සංචාරක ව්‍යාපාරයේ යෙදෙන්නන් අතර පැතිර ඇති HIV ආසාදනය : වැළැක්වීමේ පියවර
சுற்றுலாத்துறையில் உள்ளோரிடையேயான HIV தொற்று: தடுப்பு நடவடிக்கை
HIV INFECTION AMONG PERSONS ENGAGED IN TOURISM INDUSTRY: PREVENTIVE STEPS

515/'16

11.ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ ඇතැම් වෘත්තීන්හි යෙදෙන්නන් අතර HIV හෝ වෙනත් සමාජ රෝග පැතිර ඇති බවත්;

(ii) මෙය සංචාරක කර්මාන්තයට සෘජුවම බලපාන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) උක්ත පිරිස අතර HIV ආසාදිතයන් සිටී ද යන්න පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) අ(i) හි සඳහන් පිරිස අතර HIV ව්‍යාප්තිය වැළැක්වීම සඳහා රජය පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

සුකාදාරම්, පෝසණෙ මර්‍රුම් සුදේස මරුත්තුව අමෛච්සරෛක් කේට්ට විනා:

(அ) (i) இலங்கையில் சுற்றுலாத்துறையுடன் சம்பந்தப் பட்ட சில தொழில்களில் ஈடுபடுகின்றவர்களுக்கு மத்தியில் HIV அல்லது வேறு மேகநோய்கள் பரவியுள்ளதென்பதையும்;

(ii) இது சுற்றுலாத்துறையில் நேரடியாகவே தாக்கத்தை ஏற்படுத்துகின்றது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) மேற்படி ஆட்களுக்கு மத்தியில் HIV தொற்றியுள்ளவர்கள் உள்ளனரா என்பதைப் பற்றி மதிப்பீடொன்று மேற்கொள்ளப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வெண்ணிக்கை யாதென் பதையும்;

(iii) மேலே (அ)(i) இல் குறிப்பிட்டுள்ளவர்களுக்கு மத்தியில் HIV பரவுவதைத் தடுப்பதற்கு அரசாங்கம் நடவடிக்கை எடுத்துள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அந்த நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he admit that -

(i) HIV or other socially transmitted diseases are prevalent among the persons who are engaged in professions related to the tourism sector in Sri Lanka; and

(ii) this directly affects the tourism industry?

(b) Will he inform this House -

(i) whether a survey has been conducted to find out whether there are HIV infected persons among the above group;

(ii) if so, the number of such persons;

(iii) whether the government has taken steps to prevent the spread of HIV among those persons mentioned in (a)(i) above; and

(iv) if so, the steps that have been taken?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) 20කි. (විස්සකි)

(iii) ඔව්.

(iv) * සංගණනයක් මඟින් හඳුනාගත් සංචාරක මහ පෙන්වන්නන් සඳහා HIV රෝගය පිළිබඳ දැනුවත් කිරීම;

* HIV රුධිර පරීක්ෂණ සඳහා ලිංගාශ්‍රිත රෝග සායනවලට යොමු කිරීම;

* ඔවුන්හට කොන්ඩම් ලබා දීම;

* පසු විපරම් කරමින් රෝගය ව්‍යාප්ත වීම අවම කිරීමට කටයුතු කිරීම.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. අපි දන්නවා, බොහෝ විට ලංකාවේ නැහෙනහිර සහ බටහිර වෙරළ අතර සංචාරක ව්‍යාපාරය මාසිකව, වාර්ෂිකව හුවමාරු වෙමින් යන්නේ කියලා. ලංකාවේ සංචාරකයන් සමඟ ගැවසෙන වෙරළාශ්‍රිත සංචාරකයන්ට මහ පෙන්වන්නන් ඇතුළු ඒ සේවා සපයන උදව්යත් සංචාරකයන් වශයෙන්ම තමයි වැඩ කරන්නේ. ඒ කියන්නේ, නැහෙනහිර වෙරළේ කාලයක් වැඩ කරනවා, ඊට පස්සේ නැවත වරක් බටහිර වෙරළ, ගිනිකොණ සහ නිරිත දිග ප්‍රදේශවලට එනවා. මේ පිරිස අඛණ්ඩව ලිංගාශ්‍රිත රෝග සායනවලට යොමු කිරීම සඳහා අමාත්‍යාංශය database එකක් හදා තිබෙනවාද? එහෙම නැත්නම් ඒ සම්බන්ධයෙන් ගෙන යන වැඩ පිළිවෙළ මොකක්ද කියා ගරු ඇමතිතුමාගෙන් මා දැන ගන්නට කැමැතියි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ අයව හඳුනා ගෙන, ඒ පිළිබඳව සම්පූර්ණ survey එකක් කරලා තිබෙනවා. මෙහි තිබෙනවා, අපි හඳුනා ගත් ප්‍රමාණයන් කීයද කියලා. අපි ඒ අයව clinicsවල register කරලායි තිබෙන්නේ. අපි ඔවුන්ට දිගටම ප්‍රතිකාර කරනවා, ඔවුන්ට අවශ්‍ය දේවල් කරනවා. ඒ එක්කම HIV ව්‍යාපෘතිය මඟින් වෙරළාශ්‍රිත සංචාරකයන්ට මහ පෙන්වන්නන්ගෙන් ඉතුරු අය සම්බන්ධයෙන් අලුතින් check කරනවා. එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියත්මක කරනවා. ඒ එක්කම ඒ අයට සායන පහසුකම් ලබා දෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ඔබතුමා දැන් සඳහන් කළා, HIV ආසාදිතයන් 20ක් පමණ හඳුනාගෙන තිබෙනවා කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
"20ක් පමණ" නොවෙයි, 20දෙනෙක් හඳුනාගෙන තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
20දෙනෙක් හඳුනාගෙන තිබෙනවා. හොඳයි. ඒ පිරිස හැරුණාම, තර්ජිත තත්ත්වයේ සිටින අනෙකුත් පිරිස ලියා පදිංචි කරලා ඒ අයව දිගින් දිගටම ලිංගාශ්‍රිත රෝග සායන වෙත; රුධිර පටල පරීක්ෂා කිරීමේ වැඩ පිළිවෙළකට, නැත්නම් රුධිරය පරීක්ෂා කිරීමේ කටයුත්තකට යොමු කරන වැඩ පිළිවෙළකුත් තිබෙනවාද? රෝගය ආසාදිත අය නොවෙයි, අනෙක් අයව යොමු කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පැහැදිලිවම තිබෙනවා. මේ 20දෙනා හඳුනාගෙන තිබෙන්නේ මෙහෙමයි. 2014 දී 7දෙනායි, 2015 දී 5දෙනායි, 2016 දී 8දෙනායි. මෙම වැඩ පිළිවෙළ තවමත් දිගටම ක්‍රියාත්මක කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. HIV ආසාදිත පිරිස එක පිරිසක්. ඒ වාගේම HIV ආසාදිතයන් අතරින් ඒඩිස් රෝගයට ගොදුරු වූ සහ ගොදුරු වී මැරුණු සංඛ්‍යාව කොපමණද කියා හඳුනාගෙන තිබෙනවාද? එම ප්‍රමාණය කොපමණද කියලා වාර්තා වෙලා තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ සංඛ්‍යා ලේඛන නම් නැහැ. ඔබතුමා අහලා නැති නිසා මට ඒ පිළිබඳ සංඛ්‍යා ලේඛන ලබාදී නැහැ. මම පහතින් සඳහන් කරන ක්‍රියාමාර්ග තමයි HIV රෝගය ව්‍යාප්ත වීම වළක්වාලීම සඳහා අරගෙන තිබෙන්නේ:

1. රැකියා සඳහා විදේශගත වන්නන් සඳහා HIV රෝගය පිළිබඳ සහ එම රෝගය බෝවීමෙන් වැළකෙන ආකාරය ඇතුළත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. මෙම වැඩසටහන් 2005 වසරේ සිට ලෝක බැංකු ව්‍යාපෘතියක් ලෙස ජාතික ලිංගාශ්‍රිත රෝග එඩිස් මර්දන ව්‍යාපාරය හා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සමඟ එක්ව ක්‍රියාත්මක කළ අතර, දිස්ත්‍රික්ක මට්ටමින්ද වර්තමානයේදී ක්‍රියාත්මක වේ.
2. ගෝලීය අරමුදල් භාවිත කරමින් සංචාරක මහපෙන්වන්නන් පිළිබඳ සංගණනයක් පැවැත්වූ අතර, එම දත්ත උපයෝගී කරගෙන ඔවුන් සඳහා HIV රෝගය පිළිබඳව දැනුවත් කිරීම, HIV රුධිර පරීක්ෂණ සඳහා ලිංගාශ්‍රිත රෝග සායනවලට යොමු කිරීම ආදිය සිදු කෙරේ. අවශ්‍ය අය සඳහා රහසිගතව HIV රුධිර පරීක්ෂණ කරගැනීමටද අවස්ථාව සලසා ඇත.
3. ගෝලීය අරමුදල යටතේ ප්‍රධාන ප්‍රතිග්‍රාහක දෙකක් - principal recipients වශයෙන් ක්‍රියා කරන - ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයත්, ජාතික ලිංගාශ්‍රිත රෝග ඒඩිස් මර්දන ව්‍යාපාරය හා එක්ව 2011 වර්ෂයේ සිට සංචාරක මහපෙන්වන්නන් ලිංගාශ්‍රිත රෝග සායන වෙත යොමු කිරීම, HIV පිළිබඳව ඔවුන් නිරන්තර දැනුවත් කිරීම හා කොන්ඩම් ලබාදීම ආදිය සිදු කරන අතර, පසු විපරම් කරමින් HIV රෝග ව්‍යාප්තිය අවම කිරීමට කටයුතු කරනු ලැබේ.

උඩුනුවර මැතිවරණ කොට්ඨාසය : "බිම් සවිය" වැඩසටහන
உடுநுவர தேர்தல் தொகுதி: 'பிம் சவிய' நிகழ்ச்சித்திட்டம்
UDUNUWARA ELECTORAL DIVISION: BIMSAVIYA PROGRAMME

601/'16

12. ගරු ලකී ජයවර්ධන මහතා
(මාණ්පුමිකු ලක්කි ජයවර්තන)
(The Hon. Lucky Jayawardana)
ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):
(අ) (i) ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් උඩුනුවර මැතිවරණ කොට්ඨාසයේ, ඉඩම් හිමිකම් ලියා පදිංචි කිරීම සඳහා බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කර තිබෙන බව දන්නේද;
(ii) බිම් සවිය මඟින් උඩුනුවර කොට්ඨාසයේ ලියා පදිංචි කිරීමට ඇස්තමේන්තු කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;
(iii) මේ වනවිට ලියා පදිංචි කර ඇති ඉඩම් ප්‍රමාණය සහ ලියා පදිංචිය අවසන් කර නොමැති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iv) මෙම කොට්ඨාසයේ ඉඩම් හිමිකම් ලියා පදිංචි කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට පියවර ගන්නේද;
යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?
(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කාණි අමෙච්චරෙක් කේට්ට වින්නා:
(அ) (i) காணி நிர்ணயத் திணைக்களத்தினால் உடுநுவர தேர்தல் தொகுதியில் காணி உரிமை பதிவிற்காக 'பிம் சவிய' நிகழ்ச்சித் திட்டம் நடைமுறைப்படுத்தப்பட்டுள்ளதென்பதையும்;
(ii) 'பிம் சவிய' ஊடாக உடுநுவர தொகுதியில் பதிவு செய்வதற்கு மதிப்பீடு செய்யப்பட்டுள்ள மொத்த காணிகளின் அளவு எவ்வளவு என்பதையும்;
(iii) இற்றைவரை பதிவு செய்யப்பட்டுள்ள காணிகளின் அளவு மற்றும் பதிவு செய்தல் நிறைவு செய்யப்படாத காணிகளின் அளவு தனித்தனியே எவ்வளவென்பதையும்;

(iv) மேற்படி தொகுதியில் காணி உரிமைப் பதிவு நடவடிக்கைகளை விரைவாக நிறைவு செய்வதற்கு நடவடிக்கை எடுப்பாரா என்ப தையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Lands:

(a) Will he inform this House -

(i) whether he is aware that the 'Bimsaviya' Programme has been implemented in the Udunuwara Electorate by the Department of Land Settlement in order to register land titles in that electorate;

(ii) the total number of lands in the Udunuwara Electorate that have been estimated to register under 'Bimsaviya' programme;

(iii) separately, the number of lands that have been registered as at present and the number of lands of which the registration has not been completed to date; and

(iv) whether steps will be taken to complete the registration of land titles in the aforesaid electorate speedily?

(b) If not, why?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඉඩම් කැබලි 80,000යි. (අසූ දහසයි)

(iii) ලියා පදිංචි කර ඇති ඉඩම් කැබලි ප්‍රමාණය - 21,646 (විසිඑක්දහස් හයසිය හතළිස්හයයි)
ලියා පදිංචිය අවසන් කර නොමැති ඉඩම් කැබලි ප්‍රමාණය - 20,617 (විසිදහස් හයසිය දහහතයි)

(iv) ඔව්.

(ආ) අදාළ නැත.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ වන විට උඩුනුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ලබා දී ඇති ඉඩම් හිමිකම් සහතික පත්‍ර ප්‍රමාණය කොපමණද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු මන්ත්‍රීතුමා අසා තිබෙන ප්‍රශ්නයට අදාළ සංඛ්‍යා ලේඛන තමයි මම ඉදිරිපත් කළේ.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගරු ඇමතිතුමනි, දැනට නිකුත් කර ඇති සහතික පත්‍ර ප්‍රමාණය කොපමණද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මෙතැන කියා තිබෙනවා,"ලියා පදිංචි කර ඇති ඉඩම් කැබලි ප්‍රමාණය 21,646යි" කියා.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
මේ වන විට ඒ සියලු දෙනාටම සහතික පත්‍ර ලබා දීලා නැහැ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
"සහතික පත්‍ර" ගැන ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අසා නැහැ නේද?

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ඒ ගැන ප්‍රශ්නයක් අසා නැතත්, අතුරු ප්‍රශ්නයක් විධියටයි මම අහන්නේ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒ ගැන විස්තර මට දැන් ලබා දෙන්න බැහැ. මොකද, මම ඒකට සූදානම් වී පැමිණ නැහැ.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
පසුව එයට පිළිතුරු ලබා දෙන්න.

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ වන විට මහනුවර දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කොපමණ ප්‍රමාණයක මේ ක්‍රමය ක්‍රියාත්මක වන්නේද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ප්‍රමාණය ගැන පිළිතුරු ලබා දෙන්න පුළුවන්. ග්‍රාම නිලධාරි වසම් 124යි.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගරු ඇමතිතුමා සඳහන් කරන්නේ උඩුනුවර ප්‍රදේශය ගැන. මම අහන්නේ, මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් "බිම් සවිය" වැඩසටහන කොපමණ ප්‍රමාණයක ක්‍රියාත්මක වන්නේද කියායි?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු මන්ත්‍රීතුමනි, ඒ විස්තර මට මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න අමාරුයි. මම දෙවනුව ඔබතුමාට ඒ විස්තර ලබා දෙන්නම්.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
හොඳයි. ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, රාජ්‍ය ඉඩම්වල දීර්ඝ කාලයක් ජීවත් වන මිනිසුන්ට ඔප්පු ලබා දීමට ඔබතුමා කටයුතු සලසන්නේද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔව්. දැනට ගරු අගමැතිතුමාගේ යෝජනාවක් අනුව, එතුමාගේ මහ පෙන්වීම යටතේ, බලපත්‍රලාභීන්ට "ජයභූමි", "ස්වර්ණභූමි" සින්නක්කර ඔප්පු ලබා දෙන්නට පනත් කෙටුම්පතක් පිළියෙල කර ගෙන යනවා. ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කළාම, බලපත්‍ර නොවෙයි, සින්නක්කර ඔප්පු ලබා ගන්නට පුළුවන්.

සේවක අර්ථ සාධක අරමුදල් ගුවන් සමාගමක ආයෝජනය: ප්‍රතිලාභ

ஊழியர் சேமலாப நிதி விமானக் கம்பனியில் முதலீடு: நன்மைகள்

INVESTMENT OF EPF FUNDS IN AN AIRLINE COMPANY: BENEFITS DERIVED

646/'16

13. **ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1):

(අ) (i) සේවක අර්ථ සාධක අරමුදල්, කිසියම් ගුවන් සමාගමක ආයෝජනය කර තිබේද;

(ii) එසේ නම්, එම ගුවන් සමාගම, ආයෝජනය කරන ලද මුදල සහ ආයෝජනය කරන ලද දිනය කවරේද;

(iii) ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ, මුදල් මණ්ඩලයේ අනුමතිය ලැබී තිබේද;

(iv) 2015.12.31 දිනට එම ආයෝජනය මඟින් සේවක අර්ථසාධක අරමුදලට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

(v) කිසියම් ප්‍රතිලාභයක් නොලැබුණි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊழியர் சேமலாப நிதி ஏதேனும் விமானக் கம்பனியில் முதலீடு செய்யப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், குறித்த விமானக் கம்பனி; முதலீடு செய்யப்பட்ட நிதித் தொகை மற்றும் முதலீடு செய்யப்பட்ட திகதி யாது;

(iii) இதற்காக இலங்கை மத்திய வங்கியின், நிதிச் சபையின் அங்கீகாரம் கிடைத்துள்ளதா;

(iv) 2015.12.31ஆம் திகதி உள்ளவாறு, குறித்த முதலீட்டின் மூலம் ஊழியர் சேமலாப நிதியத்துக்கு கிடைக்கப்பெற்ற நன்மைகள் யாவை;

(v) எந்தவித நன்மையும் கிடைக்கப்பெறவில்லை எனில், இதற்கான காரணம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Trade Unions Relations:

(a) Will he inform this House-

(i) whether the funds of the Employees' Provident Fund have been invested in a certain airline company;

(ii) if so, the name of the airline company, the amount invested, and the date of investment;

(iii) whether the approval of the Monetary Board of the Central Bank of Sri Lanka has been obtained in this regard;

(iv) the benefits derived by the Employees' Provident Fund as at 31.12.2015 through this investment; and

(v) if no benefits were derived, the reason for same?

(b) If not, why?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා)
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Labour and Trade Unions Relations)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ගුවන් සමාගම - ශ්‍රීලන්කන් ගුවන් සමාගම.

ආයෝජනය කරන ලද මුදල - රුපියල් මිලියන 500.

ආයෝජනය කරන ලද දිනය - 2010.07.13.

(iii) ඔව්.

(iv) ආයෝජනය කරන ලද දින සිට 2015.12.31 දින වන විට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොමැත.

(v) ඔව්.

ශ්‍රීලන්කන් ගුවන් සමාගම මෙම ආයෝජනය කළ කාල වකවානුවේ සිට මේ දක්වා තම කොටස් හිමියන්ට කිසිදු ලාභාංශ ගෙවීමක් සිදු කර නොමැති නිසා.

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. සේවක අර්ථ සධක අරමුදලෙන් රුපියල් මිලියන 500ක් ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ආයෝජනය කර තිබෙනවා. අවුරුදු පහක් යනතුරුත් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නැත්නම්, මුදල් මණ්ඩලය ඒ ආයෝජනය සිදු කරන්නට තීන්දුව ගත්තේ ඇයි?

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

මුදල් මණ්ඩලය ආයෝජනය කිරීමට පෙරාතුව අවසර දීලා තිබෙනවා, -තීන්දුව අරගෙන තිබෙනවා- මේ මුදල ආයෝජනය කරන්නට. අපි කවුරුත් දන්නවා ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ඊට පසුව ඇති වුණු තත්ත්වය. ඒ තත්ත්වය යටතේ කිසිම ලාභයක් ලැබුණේ නැහැ. ලාභයක් ලැබුණේ නැති නිසා මේ අයට ඒ ලාභයෙන් කොටසක් ලැබුණේ නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමා, ශ්‍රීලන්කන් ගුවන් සමාගම පාඩු ලබන්නට ගත්තේ 2010න් පසුව නොවෙයි. පාඩු ලබමින් තිබුණු සමාගමක තමයි වැඩ කරන සේවකයන්ගේ සේවක අර්ථ සාධක අරමුදල් ආයෝජනය කරන්නේ. ඒ අවදානම අරගෙන තමයි මෙතරම් මුදලක් ආයෝජනය කරලා තිබෙන්නේ. ඒකයි මම ඇහුවේ, "පාඩු ලබමින් තිබූ ආයතනයකට මෙතරම් මුදල් ප්‍රමාණයක් යොදවලා තිබෙන්නේ ඇයි?" කියලා.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ඇත්ත වශයෙන්ම මේ මුදල ආයෝජනය කළේ මූල්‍ය මණ්ඩලය සහ සේවක අර්ථ සාධක අරමුදල් ආයෝජන කමිටුවේ අනුමතිය මත පමණක් නොවෙයි, කැබිනට් මණ්ඩලයේත් අනුමතිය ඇතිවයි. කැබිනට් මණ්ඩලය භාණ්ඩාගාරයට උපදෙස් දීලා තිබෙනවා, මේ සඳහා ලංකා බැංකුවට අවසර දෙන්න කියලා. ඒ අවස්ථාවේ තමයි සේවක අර්ථ සාධක අරමුදලේ ආයෝජන කමිටුවට ඉදිරිපත් කරලා ඒ අනුමැතිය ගෙන තිබෙන්නේ. මූල්‍ය මණ්ඩලයේ අනුමැතියත් ලබාගෙන තිබෙනවා. මේ සියලුම ආයතන මේ කරුණ සම්බන්ධව විශ්ලේෂණය කරලා තමයි අනුමැතිය දීලා තිබෙන්නේ.

මූල්‍ය මණ්ඩලය මෙම ආයෝජනය සඳහා අනුමැතිය දුන්නේ ඇයි කියන ප්‍රශ්නයට මට පිළිතුරු දිය හැක්කේ, අනාගතයේදී ශ්‍රීලන්කන් ගුවන් සමාගම යම් කිසි ලාභයක් උපදවයි කියන බලාපොරොත්තුව ඇතිව මේ මුදල ආයෝජනය කරන්නට ඉඩ දුන්නා වෙන්නට ඇති කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

තුන්වෙනි අතුරු ප්‍රශ්නය, ගරු අනුරු කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, අපි දන්නා පරිදි ශ්‍රීලන්කන් ගුවන් සමාගම කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත සමාගමක් නොවෙයි. එහෙම නේ. ඒ අනුව මේක කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත සමාගමකින් කොටස් මිල දී ගන්නා ආකාරයෙන් කරන ලද ආයෝජනයක් නොවෙයි. ශ්‍රීලන්කන් ගුවන් සමාගම වෙනම තිබෙනවා. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ කොටස් මිල දී ගත හැකි ද, නැද්ද කියලා දන්නේවත් නැහැ. මොකද, ඒ සමාගම කොටස් වෙළෙඳ පොළේ නැති නිසා. එහෙම නම් මේ ගනු-දෙනුව සිදු වෙලා තිබෙන්නේ ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ කියන සුපිරිසිදු භාවයෙන් නොවෙයි.

ගරු කථානායකතුමනි, කොටස් වෙළෙඳ පොළේ මෙය ආයතනයක් හැටියට තිබෙනවා නම්, කොටස් වෙළෙඳ පොළේ කොටස් යම් ප්‍රමාණයක් මිල දී ගෙන එයාර්ලංකා ආයතනයේ සමාගම තුළ ආයෝජනයක් සිදු කරන්න මුදල් මණ්ඩලයට තීරණයක් ගන්න පුළුවන්. හැබැයි, මෙතැන සිදුවී තිබෙන්නේ එහෙම එකක් නොවෙයි. එයාර්ලංකා ආයතනය වෙනම තිබෙනවා. EPF එක වෙනම තිබෙනවා. එයාර්ලංකා ආයතනයේ වෙන කවුරුවත් ආයෝජනය කරලාත් නැහැ. මේ කර තිබෙන දෙය තමයි, මේ කඩා වැටෙමින් තිබෙන, බංකොලොත් වෙමින් තිබෙන එයාර්ලංකා ආයතනයේ ඒ මකර කටට, මේ රටේ වැඩ කරන සේවක සේවිකාවන්ගේ අර්ථ සාධක අරමුදල් ගිල ගැනීම සඳහා අවස්ථාවක් සකස් කර දීම. එයාර්ලංකා ආයතනයෙන් කියනවා, "අපට සල්ලි දෙන්න" කියා. මුදල් මණ්ඩලය "හා" කියලා, EPF එකෙන් ඒ මුදල් දෙනවා. ඊට පසුව තවත් රැකවරණයක් වෙනුවෙන් තමයි කැබිනට් මණ්ඩලයට යන්නේ. ඒ නිසා ගරු ඇමතිතුමනි, මෙතැන සිද්ධ වෙලා තිබෙන්නේ තමුන්නාන්සේ කියන විධියට EPF එක තමන්ට ලාභාංශ උපයා ගැනීම සඳහා සද්භාවයෙන් කරන ක්‍රියාවක් නොවෙයි. සද්භාවයෙන් ක්‍රියාවක් කරන්න එයාර්ලංකා ආයතනය කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත සමාගමක් නොවෙයි. එහෙම නම් මේක එයාර්ලංකා සමාගම සහ ආණ්ඩුවේ බලවතුන් අතර වෙන ලද එකඟතාවක ප්‍රතිඵලයක්. එම ආයතනය බංකොලොත් වෙමින් තිබෙනවා. ඒකට මුදල් සපයා ගන්න භාණ්ඩාගාරය අසමත් වී තිබෙනවා. ඒ මුදල් සපයා ගැනීම වෙනුවෙන් EPF එක උපයෝගි කරගෙන තිබෙනවා. මේකයි ඇත්ත කථාව. ඒ නිසා ගරු කථානායකතුමනි, මෙතැන සිද්ධ වෙලා තිබෙන දෙය මේකයි. සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයන්ට තමන්ගේ අරමුදල්වල ආයෝජනයන් හරහා ලබාගත හැකි නිවැරැදි ප්‍රතිලාභ ලැබී නැහැ. නිවැරැදි ප්‍රතිලාභ ලැබිලා නැහැ විතරක් නොවෙයි ගරු ඇමතිතුමනි, අනිවාර්යෙන්ම තමුන්නාන්සේට ඔය රුපියල් මිලියන 500 ලැබෙන්නෙත් නැහැ. ඔය රුපියල් මිලියන 500 එයාර්ලංකා ආයතනය ආපසු ලබා දෙන්නේ කොහොමද?

ගරු කථානායකතුමනි, සේවක අර්ථ සාධක අරමුදල අවභාවිතයේ යෙදවීම පිළිබඳ බරපතළ ගණුයේ ප්‍රශ්නයක් මෙතැන තිබෙනවා. ගරු ඇමතිතුමනි, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ඇමතිවරයා විධියට තමුන්නාන්සේ තමයි කම්කරුවන් වෙනුවෙන් මේ අරමුදලේ ආරක්ෂකයා වන්නේ. අරමුදල ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ඒ ගන්නා ලද ක්‍රියාමාර්ගය වෙනුවෙන්, නැවත ඒ මුදල් සහ ප්‍රතිලාභ ලබා ගැනීම වෙනුවෙන් තමුන්නාන්සේ කටයුතු කරන්නේ කොහොමද කියා මා දැනගන්න කැමැතියි.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු කථානායකතුමනි, රුපියල් මිලියන 500ක මුදල භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව තමයි ගෙවලා තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එහෙම තමයි වෙලා තිබෙන්නේ.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

එම නිසා මේ මුදල සම්බන්ධයෙන් කටයුතු කරන්න භාණ්ඩාගාරය බැඳිලා ඉන්නවා. මේ මුදල ගෙවන්න කියා EPF එකට උපදෙස් දීලා තිබෙන්නේ භාණ්ඩාගාරයයි. EPF එක ඊට පසුව තමයි මූල්‍ය කළමනාකරණ මණ්ඩලයට යොමු කරලා මේ මුදල ගන්නේ. අර්ථ සාධක අරමුදලේ මුදල් පමණක් නොවෙයි, මෙම ආයතනයේ ආයෝජනය කර තිබෙන්නේ. ලංකා බැංකුව රුපියල් මිලියන 1,477ක් මෙහි ආයෝජනය කර තිබෙනවා. ඒ වාගේම මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවත් මෙම ආයතනයේ මුදල් ආයෝජනය කර තිබෙනවා. සේවක අර්ථ සාධක අරමුදලින් තමයි රුපියල් මිලියන 500ක් වැනි අඩුම ගණනක් මේ ආයතනයේ ආයෝජනය කර තිබෙන්නේ. රුපියල් මිලියන 500 ආයෝජනය කළේ භාණ්ඩාගාරයේ උපදෙස් අනුවයි. ඒ නිසා මේ කාරණය ගැන කටයුතු කරන්න භාණ්ඩාගාරය බැඳිලා ඉන්නවා. [බාධා කිරීමක්] නැහැ, මම කිව්වෙ මේකයි ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි. මේ අනුව EPF එකට පාඩුවක් වන්නේ නැහැ. භාණ්ඩාගාරය ඊට වග කියන්න ඕනෑ.

හම්බන්තොට වරාය ආශ්‍රිත විශේෂ චීන කර්මාන්ත කලාපය: ගිවිසුම

அம்பாந்தோட்டை துறைமுகம் சார்ந்த விசேட சீனக் கைத்தொழில் வலயம்: உடன்படிக்கை

HAMBANTOTA PORT RELATED SPECIAL CHINESE INDUSTRIAL ZONE: AGREEMENT

668/'16

14. **ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රජය මහින් ප්‍රකාශ කර ඇති පරිදි අග්‍රාමාත්‍යවරයාගේ චීන සංචාරයේ දී එකඟ වූ බවට සඳහන් කරන හම්බන්තොට වරාය ආශ්‍රිත විශේෂ චීන කර්මාන්ත කලාපය පිළිබඳ චීන රජය සමඟ එළැඹී ඇති ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද;

(ii) එසේ නම්, එම ලියවිල්ල සභාගත කරන්නේද;

(iii) එම විශේෂ චීන කර්මාන්ත කලාපය පිහිටුවීමේ මූලික කොන්දේසි හා කළමනාකරණය සිදු වන ආකාරය පැහැදිලි කරන්නේද;

(iv) එම කර්මාන්ත කලාපය සඳහා හඳුනාගෙන ඇති භූමියේ සිතියමක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

පිරතම අමෙච්චරුම්, තේසිය කොල්කෙකළ් මර්රුම් පොරුළාතාර අළුවල්කළ් අමෙච්චරුමානවරෙක් කේට්ට විනා:

(අ) (i) අරසාංගත්තිනාල් පිරකටනප්පටුත්තප්පට්ටුළ්ළ වාරු පිරතම අමෙච්චරින් චීන විජයත්තින් පෝතු ඉණක්කම් තෙරිවික්කප්පට්ටතාකක් කුරිප්පිටප්පටුකින්ර අම්පාන්තෝට්ටෙ තුරෙ මුකත්තෙ අණ්ඩියතාන විසේට සීනක් කෙත්තොළිල් වලයම් තොටර්පාක සීන අරසාංගත්තුටන් ඒර්පටුත්තික්කොළ්ළප් පට්ටුළ්ළ ඕර් උටන්පටික්කෙ අල්ලතු උටන්පාට්ටු ආවණම් උළ්ළතා එන්පතෙයුම්;

(ii) ආමෙනිල්, අන්ත ආවණත්තෛච් චපෙයිල් චමර්ප්පිප්පාරා එන්පතෙයුම්;

(iii) මේර්පටි චීනක් කෛත්තොළිල් වලයත්තිනෛත් තාපිප්පතර්කාන අටිප්පටෛ නිපන්තනෛකළ් මර්රුම් මුකාමෛත්තුවම් නටෛපෙරුම් විතත්තෛත් තෙළිවුපටුත්තුවාරා එන්පතෙයුම්;

(iv) මේර්පටි කෛත්තොළිල් වලයත්තින් පොරුට්ටු ඉනංකාණප්පට්ටුළ්ළ නිලත්තින් වරෛපටමොන්ර්ෛච් චමර්ප්පිප්පාරා එන්පතෙයුම්;

අවර් ඉච්චපෛක්කු අර්විප්පාරා?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) whether there is an agreement or a letter of understanding with the Government of China regarding a Special Chinese Industrial Zone linked to the Hambantota Port said to have been agreed upon during the Prime Minister's visit to China as declared by the Government;

(ii) if so, whether that document will be tabled;

(iii) the preliminary conditions of the establishment of the said Special Chinese Industrial Zone and as to how it is managed; and

(iv) whether he submits a map of the land identified for the said industrial zone?

(b) If not, why?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය හා චීන රජයේ වාණිජ කටයුතු අමාත්‍යාංශය අතර ආර්ථික හා තාක්ෂණික ආයෝජන පිළිබඳ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.

ඒ අනුව, Hambantota Port - Industrial Park, ඒ කියන්නේ හම්බන්තොට වරාය ආශ්‍රිතව කර්මාන්ත කලාපයක් ආරම්භ කරන බවට සඳහන් වෙලා තිබෙනවා. ඒ කාරණයට එකඟවෙලා තිබෙනවා.

(ii) ඔව්. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) මූලික කොන්දේසි හා කළමනාකරණය සිදු වන ආකාරය අදාළ අවබෝධතා ගිවිසුම තුළ අන්තර්ගතව ඇත.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම එය කියවන්නම්: "The Sri Lankan party agrees to establish a special multi-sector coordination and decision-making apparatus to promote the implementation of Projects listed in Paragraph 5."

ඒ අනුව, රුහුණු ප්‍රදේශයේ සංවර්ධන වැඩ කටයුතු කර ගෙන යෑම සඳහා වෙනම ආයතනයක් ආරම්භ කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. දැනට සාකච්ඡා කරන පරිදි, මේ කර්මාන්ත කලාප ආරම්භ කිරීමේ කටයුත්ත ඒ පිහිටුවන සංස්ථාවට කරන්න පුළුවන්. රජයට අයත් ඉඩම අපි ආයෝජකයන්ට දෙන්නම්. කර්මාන්ත සඳහා අවශ්‍ය කරන යටිතල පහසුකම් ආරම්භ කරන සමාගම් තිබෙනවා. විදේශීය ආයෝජකයන්ට අපි ඉඩම ලබා දෙන්නම්. එතකොට කර්මාන්ත කලාප ආම්භ කරලා, ඒ කටයුතු ඉදිරියට ගෙන යන්න පුළුවන් වනවා. දැනට මේ කාරණය පිළිබඳ චීන හා තායි සමාගම්වලින් මූලික වශයෙන් විපරම් කරලා තිබෙනවා. නමුත් යන්ත්‍රණය ඇති කරලා, නීති සම්පාදනය කර ගන්නාතුරු මේ කටයුතු අවසන් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

(iv) නිශ්චිතව භූමියක් හඳුනාගෙන නොමැත.

ඉස්සෙල්ලා ඒ අය බලාපොරොත්තු වෙලා තිබුණේ හම්බන්තොට වරාය අවට සම්පූර්ණ ප්‍රදේශයම චීනයෙන් එන කර්මාන්තවලටත්, අනෙක් කර්මාන්තවලටත් කර්මාන්ත කලාපයක් බවට පත් කරන්නයි. ඒත් අපට දැන් පෙනෙන හැටියට ලංකාවේ ආණ්ඩුව පැත්තෙන් එහෙම සැලැස්මක් තිබිලා නැහැ. ඒ නිසා හම්බන්තොට වටේට තිබෙන උපරිම භූමි ප්‍රමාණය අපි මේ සඳහා ලබා ගන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපි ඇහුවා, හම්බන්තොට නගරය අලුතෙන් සකස් කරලා දෙන්න අපට උදවු කරන්න කියලා? ඒ වාගේම, කර්මාන්ත කලාප හැටියට මත්තල, කුඩාඔය වාගේ හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් අනෙක් ප්‍රදේශවලත් භූමිය වෙන්කර ගන්න අපට සිදු වෙනවා. ඒ වැඩ කටයුත්ත තමයි දැන් කරගෙන යන්නේ. වෙනත් රටවල ආයෝජකයන් කර්මාන්ත සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දෙන්න කැමැති නම්, ඒ ආයෝජකයන්ට අවස්ථාව දෙනවා. දැන් ක්‍රියාත්මක කරන්නේ ඒ සඳහා වුවමනා කරන ඉඩම් මේ දිස්ත්‍රික්ක දෙකෙන් සහ මාතර, ඇඹිලිපිටිය කියන ප්‍රදේශවලින් ලබාගැනීමේ කටයුත්තයි.

(ආ) අදාළ නොවේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මාගේ පළමු අතුරු ප්‍රශ්නය අහන්න පෙර මට පැහැදිලි කර ගන්න අවශ්‍යයි, ගරු අගමැතිතුමා ලියවිල්ල සභාගත කරනවා කියලාද කිව්වේ කියා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඔව්, මම සභාගත කළා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, තුන්වන ප්‍රශ්නයට අදාළවයි මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය තිබෙන්නේ. දැනට BOI ආයතනය මඟින් කර්මාන්ත කලාප පවත්වාගෙන යනවා. මම අහන්න කැමැතියි, මේ ඇති කරන්න බලාපොරොත්තු වන කර්මාන්ත කලාපයත් ඒ ආයතනය යටතට පත්වන එකක් ද, නැත්නම් ඔබතුමන්ලා මේ සඳහා වෙනම සංස්ථාවක් පිහිටුවනවාද කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

වෙනම ආයතනයක් ඇති කරලා, ඒ ආයතනය යටතේ පවත්වාගෙන යයි. BOI ආයතනයත් ඒකට සම්බන්ධ වෙනවා. අලුතෙන් ඇති කරන සංවර්ධන අධිකාරියේ කළමනාකාරතුමාත් ඒකට ඇතුළු කරන්නයි අපි බලාපොරොත්තු වෙන්නේ. එතැන තිබෙන්නේ විශාල ව්‍යාපෘතියක්. ක්ෂේත්‍ර ගණනාවක් එයට අයත් වනවා. මොකද, විශේෂයෙන්ම ඒ ප්‍රදේශයේ සංචාරක අංශය දියුණු කරන්න, ඒ වාගේම නිවාස අංශය දියුණු කරන්න අපට තිබෙනවා. අපේ ගිවිසුම යටතේ අපි එය කියලා තිබෙනවා. "The Sri Lankan party agrees to establish a special multi-sector coordination and decision-making apparatus to promote the implementation of Projects listed in Paragraph 5."

මොකද, පස් වන ඡේදය යටතේ තමයි, Hambantota Industrial Park එක සහ හම්බන්තොට කරන වැඩ කටයුතු ගැන සඳහන් වෙන්නේ. මෙහි නොයෙක් ක්ෂේත්‍ර තිබෙන නිසා මේ සඳහා එක ආයතනයක් වුවමනායි. නැත්නම් මේ කටයුත්ත කරන්න විශාල කාලයක් යනවා. ඒ කටයුතු සඳහා අනුමැතිය ලබා දෙන්නත් ඕනෑ. මම හිතන්නේ දැනට ඉන්දියාවේ කර්ණාටක ප්‍රාන්තයේ සහ ආන්ද්‍රා ප්‍රාන්තයේ මේ වාගේ ඇති කරන ලද ආයතන තිබෙනවා. ඒ වාගේ ආයතනයක් තමයි අපි මේ ප්‍රදේශයටත් ඇති කරන්න බලාපොරොත්තු වන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මාගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි.

ඔබතුමා කිව්වා, තවම ප්‍රදේශය හඳුනාගෙන නැහැ; අවශ්‍ය කරන දේවල් සැලසුම් කරලා නැහැ කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

දැනට සොයාගෙන යනවා; සාකච්ඡා කර ගෙන යනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, රැකියා ලක්ෂ 5ක් දෙනවා කියනවා වාගේ අදහස් නම් අපට ඇහෙනවා. රැකියා ලබා දුන්නාට නම් කමක් නැහැ.

ගරු අගමැතිතුමනි, ඔබතුමා කිව්වා දිස්ත්‍රික්ක හතරකට අයත් අතිවිශාල ඉඩම් ප්‍රමාණයක් විදේශීය සමාගම්වලට -චීන හෝ තායි හෝ කුමන හෝ සමාගමකට- ලබා දෙනවා කියලා. ඒවා යම් ආකාරයකට සින්නක්කර බලය ලැබෙන පරිදි ලබා දෙන්න බලාපොරොත්තු වනවාද, නැත්නම් තවම එය තීන්දු කරලා නැද්ද කියලා දැන ගන්න මා කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඉඩම් සින්නක්කරව ලබා දෙනවා කියලා එකක් නැහැ. ඉඩම් බදු දෙන්නේ. දීර්ඝ කාලීනව බදු දෙන්න පුළුවන් නේ. අපේ BOI

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

එකේ වෙළෙඳ කලාපයේත් දැනට ඉඩම් දෙන්නේ ඒ අන්දමින් නේ. අන්තිමට බදු දෙන එකයි කරන්නේ. තවම කිසිම කෙනෙකුට මෙවැනි ඉඩම් සින්නක්කරව දීලා නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මා තුන්වන අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු අගමැතිතුමනි, ඔබතුමා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්ට දැනුම් දී තිබෙනවා, මෙවැනි කර්මාන්ත 100ක් වෙනුවෙන් හම්බන්තොට ප්‍රදේශයෙන් අක්කර 15,000ක් හොයලා දෙන්න කියලා. ගරු කථානායකතුමනි, එච්චර භූමි ප්‍රමාණයක් අවශ්‍ය වෙන්නේ මොකටද කියලා මා දන්නේ නැහැ. දැනට හොයාගෙන තිබෙන්නේ, අක්කර 3,000කට ආසන්න භූමි ප්‍රමාණයක්. ඒ භූමි ප්‍රමාණයෙනුත් යම් භූමි ප්‍රමාණයක්, දැනට ගැසට් කර නැතත්, වනජීවී ආරක්ෂිත කලාපයක් ලෙස නම් කරලා තිබෙන ප්‍රදේශයක්. එම නිසා ගරු අගමැතිතුමනි, ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, මෙම කර්මාන්ත කලාපය වෙනුවෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් කොච්චර ඉඩම් ප්‍රමාණයක් තමුන්නාන්සේ අපේක්ෂා කරනවාද කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
චීන කර්මාන්තවලට විතරක් අක්කර 15,000ක් ඉල්ලා තිබෙනවා. ඒ වාගේම අනෙක් රටවල ආයෝජකයෝත් එම ප්‍රදේශවලට පැමිණෙනවා. ඊට වඩා විශාල ප්‍රමාණයක්-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අවම වශයෙන් කීයක්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
දන්නේ නැහැ. විශාල කර්මාන්ත නම්-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
දැනට දැනුම් දීලා තිබෙන්නේ 100ක් විතර.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
නැහැ, නැහැ. 100කට වැඩියි. චීනයේ තිබෙනවා, සේවකයන් 2,000ක්, 3,000ක්, 4,000ක් හෝ 5,000ක් වැඩ කරන අක්කර 25ක්-30ක් විශාල කර්මාන්තශාලා. ඒ වාගේම අපි මේ සැරේ චීනයට ගිය විට දැක්කා, මධ්‍ය පරිමාණයේ කර්මාන්තශාලා. ඒවා විශාල නැහැ. චීනයේ තට්ටු ගොඩනැඟිලිවල තමයි මධ්‍ය පරිමාණයේ කර්මාන්ත තිබෙන්නේ. ඒ ඉඩම් සම්පූර්ණයෙන්ම හොයාගෙන යන්නේ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයෙන්. ඒත් වනජීවී ආරක්ෂිත කලාප ගැන අප විශේෂයෙන්ම අවධානය යොමු කරලා තිබෙනවා, වනජීවී ආරක්ෂිත කලාපයට අයත් භූමි මෙම කර්මාන්ත කලාපවලට ඇතුළත් නොකරන්න. එතැන ඉන්න අලි ඇතුන් ගැනත් අපි විශේෂයෙන්ම බලන්න ඕනෑ. ඒ අය සඳහාත් වෙනම corridor එකක් සකස් කරන්න තමයි අප තීරණය කර තිබෙන්නේ. විශේෂයෙන්ම වනජීවී කලාපය ආරක්ෂා කරන්න වුවමනායි කියලා අපි කිව්වාම චීන පාර්ශ්වය ඒකට එකඟ වෙලා තිබෙනවා. ඒත්, අවශ්‍ය භූමි ප්‍රමාණය අපට හොයන්න සිද්ධ වනවා. අපි විතරක් නොවෙයි, හම්බන්තොට, මොනරාගල, මාතර දිස්ත්‍රික්ක නියෝජනය කරන ඇමතිවරුත්, රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ඇමතිතුමියත් ඒ වැඩ කටයුතු කරන්න දැනට ඉඩම් හොයාගෙන යනවා. මම හිතන හැටියට කුඩා ඔය පැත්තෙන්ම අක්කර 2,000ක් හෝ 3,000ක් හොයා ගන්න පුළුවන් වෙයි. එහෙම නේද? සමහර විට හම්බන්තොටට වඩා මේකේ වාසිය එන්නේ මොනරාගල දිස්ත්‍රික්කයට වෙන්න පුළුවන්. ඒක මම දන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ලංකා මැරයින් සර්විසස් සමාගම: වත්කම් අක්‍රමික ලෙස විකිණීම

லங்கா மெரயின் சேர்விசஸ் கம்பனி: சொத்துக்களின் முறைகேடான விற்பனை

LANKA MARINE SERVICES COMPANY: IRREGULAR SALE OF ASSETS

652/'16

5. **ගරු විමල් වීරවංශ මහතා (ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවට)**
(மாண்புமிகு விமல் வீரவங்ச - மாண்புமிகு வாசுதேவ நாணாயக்கார சார்பாக)
(The Hon. Wimal Weerawansa on behalf of the Hon. Vasudeva Nanayakkara)
අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ලංකා මැරයින් සර්විසස් සමාගමේ (LMSL) වත්කම්, අක්‍රමික ලෙස විකිණීම පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SEFR209/2007 නඩු තීන්දුව අනුව, එම වංචනික ගනුදෙනුවට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව අපරාධ නඩු පැවරීම කළ යුතු බව එම නඩු තීන්දුවෙන් ප්‍රකාශයට පත් කර තිබූ බවත්;

(ii) එම නඩු තීන්දුවෙන් වසර 10ක් ගතවී ඇතත්, නඩු පැවරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙතෙක් ක්‍රියාකර නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම පුද්ගලයන්ට එරෙහිව අපරාධ නඩු පැවරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

(ii) එම පුද්ගලයන්ට එරෙහිව අපරාධ නඩු පැවරීම කඩිනම් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நீதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) லங்கா மெரயின் சேர்விசஸ் கம்பனியின் (LMSL) சொத்துக்களை முறைகேடான வகையில் விற்பனை செய்தமை சம்பந்தமாக உயர்நீதிமன்றத்தின் SEFR209/2007 வழக்குத் தீர்ப்பின் பிரகாரம், மேற்படி மோசடியான கொடுக்கல் வாங்கல்களுடன் தொடர்புடைய ஆட்களுக்கு எதிராக குற்றவியல் வழக்கு தொடரப்பட வேண்டுமென, வழக்குத் தீர்ப்பில் குறிப்பிடப்பட்டுள்ளதென்பதையும்;

(ii) மேற்படி வழக்குத் தீர்ப்பு வழங்கப்பட்டு 10 ஆண்டுகள் கழிந்துள்ளதெனினும், வழக்குத் தொடர்வதற்கு குற்றப் புலனாய்வுத் திணைக்களம் இற்றைவரை நடவடிக்கை மேற்கொள்ளவில்லையென்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) மேற்படி ஆட்களுக்கு எதிராக குற்றவியல் வழக்குத் தொடரப்படுதல் தாமதமாவதற்கான காரணம் யாதென்பதையும்;

(ii) மேற்படி ஆட்களுக்கு எதிராக குற்றவியல் வழக்குத் தொடர்வதை தீவிரப்படுத்துவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice :

(a) Will he admit that-

(i) as per Supreme Court Determination No.SEFR209/2007 on the irregular sale of the assets of Lanka Marine Services Company (LMSL), it has been stated that criminal proceedings should be instituted against the individuals involved in that fraudulent transaction; and

(ii) the Criminal Investigation Department has not taken measures to institute criminal proceedings up to now, even though 10 years have lapsed since the issuance of that determination?

(b) Will he inform this House-

(i) the reasons for the delay in instituting criminal proceedings against those individuals; and

(ii) whether steps will be taken to expedite the instituting of criminal proceedings against those individuals?

(c) If not, why?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධිකරණ ඇමතිතුමනි, පිළිතුර සභාගත කරන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, සභාගත කරන්න අවශ්‍ය නැහැ. කෙටි උත්තරයක් තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර table කරන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, පිළිතුර ලිඛිතව ගෙනැල්ලා නැහැ. කෙටි උත්තරයක් තිබෙන්නේ. පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) 2007 වසරේ ඉදිරිපත් කළ COPE වාර්තාව අනුව, පෞද්ගලීකරණය කර තිබූ වරායේ ඉඩම්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ ඇපලෝ රෝහල, නැවත රජයට පවරා ගන්නා ලෙසට නිර්දේශය එවකට රජය ක්‍රියාත්මක නොකිරීම නිසා, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා සහ තවත් අය ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු දෙකක් පවරන්නට යෙදුණි. එම නඩු දෙකේදී එම නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසට පෙත්සම්කරුවන් අයැද සිටියත්, එවකට නීතිපතිවරයා වශයෙන් කටයුතු කළ මොහාන් පීරිස් මැතිතුමා ඊට එරෙහිව එම නඩු දෙක හබයට පත් කරන ලදි. අවසානයේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නඩු තීන්දු දෙකක් ලබා දෙමින් එම දේපළ නැවතත් රජයට ලබා ගන්නා ලෙසට නියෝග කරන ලදි.
එම නඩුවලදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් නියෝගයක් අනුව ඊට වග කිව යුත්තන් පිළිබඳව පරීක්ෂණ කටයුතු මෙහෙයවන්නට යෙදුණු අතර 55දෙනෙකුගෙන් කට උත්තර ලබා ගෙන ඇතත්, ඒ පිළිබඳව පැවැති රජය කාලයේ කිසිදු පියවරක් ගෙන නොමැත. මෑතකදී එම කාරණය පිළිබඳව සී.ආර්.අයි./159/2016 දරන අංකය යටතේ ලිපි ගොනුවක් ආරම්භ කරන ලදී. දැනට 55දෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කර ගෙන ඇතත්, තවත් කිහිපදෙනෙකුගේ සටහන් ලබා ගැනීමට ඇති අතර එම සටහන් ලබා ගැනීමෙන් අනතුරුව නීතිමය පියවර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව අවශ්‍ය කටයුතු කරමින් සිටියි.

(ii) වැඩිමනත් විමර්ශන අවසන් වූ පසු සහ තොරතුරු පොතේ උධෘත ලැබුණුවිට මෙම කාරණය සම්බන්ධව සම්පූර්ණයෙන් සලකා බලා ඉදිරි පියවර ගන්නා බවට නීතිපතිවරයා විසින් දන්වා ඇත.

(ඇ) පැන නොනඟී.

රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප්: අය වැය පොරොන්දුව
அரசாங்க ஊழியர்களின் ஓய்வூதியம்: வரவு செலவுத்திட்ட வாக்குறுதி
GOVERNMENT SERVANTS' PENSION: BUDGET PLEDGE

712/'16

15.**ගරු විමල් වීරවංශ මහතා (ගරු වාසුදේව නානායක්කාර මහතා වෙනුවට)**
(மாண்புமிகு விமல் வீரவங்ச - மாண்புமிகு வாசுதேவ நாணாயக்கார சார்பாக)
(The Hon. Wimal Weerawansa on behalf of the Hon.Vasudeva Nanayakkara)

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වර්තමානයේ විශ්‍රාම යන රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී රු.10,000/- දීමනාව වැටුපට එකතු කර ගණනය කිරීමට අවශ්‍ය විධිවිධාන සලස්වන බවට රජය පසු ගිය අය වැය අවස්ථාවේදී කළ ප්‍රකාශය පරිදි ඊට අවශ්‍ය

[ගරු විමල් වීරවංශ මහතා]

විධිවිධාන වර්තමානයේ ක්‍රියාත්මක නොකිරීමට හේතුව කවරේද;

(ii) එකී පොරොන්දුව ක්‍රියාත්මක කරන්නේ කවර දිනයක සිටද;

(iii) එය තවත් එක් පොරොන්දු කඩකිරීමක් බවට පත්කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக மற்றும் முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஓய்வு பெறுகின்ற அரசாங்க ஊழியர்களின் ஓய்வூதியத்தைக் கணிப்பிடும்போது ரூபா 10,000/- கொடுப்பனவைச் சம்பளத்துடன் சேர்த்து கணிப்பிடத் தேவையான ஏற்பாடுகளைச் செய்வதாக அரசாங்கம் கடந்த வரவு செலவுத்திட்டத்தின்போது தெரிவித்துள்ளவாறு அதற்குத் தேவையான நடவடிக்கைகளை தற்போது அமுல்படுத்தாமைக்கான காரணம் யாது என்பதையும்;

(ii) மேற்படி வாக்குறுதி அமுல்படுத்தப்படுவது எத்திகதி முதல் என்பதையும்;

(iii) இது இன்னுமொரு வாக்குறுதி மீறலாக மாறுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Management:

(a) Will he inform this House -

(i) the reason that led not to take measures to calculate the Rs. 10,000 allowance with the salary in the process of computing the pension of the government employees retiring presently, in keeping with the statement made by the Government in the previous Budget to that effect;

(ii) the date from which the aforesaid pledge will be implemented; and

(iii) whether it is going to be another breach of promise?

(b) If not, why?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා)

(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சர்)

(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) මේ වනවිට ඊට අදාළ කටයුතු සිදුකර ඇත.

(ii) 2016.01.01 දින සිට ක්‍රියාත්මක වන අතර 2020.01.01 දිනයේදී සම්පූර්ණ මුදල ගෙවීමට නියමිතව ඇත.

(iii) නැත.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ඊළඟට, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න. ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය

தனி அறிவித்தல் மூல வினா

QUESTION BY PRIVATE NOTICE

I

ඔලුවිල් වරාය ප්‍රදේශයේ ජනතාව මුහුණ දෙන දැවැන්ත ප්‍රශ්න

ஒலுவில் துறைமுகப் பிரதேச மக்கள் எதிர்நோக்கும் பாரிய பிரச்சினைகள்

SERIOUS PROBLEMS FACED BY PEOPLE IN OLUVIL PORT AREA

ගරු ඩග්ලස් දේවානන්දා මහතා

(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)

(The Hon. Douglas Devananda)

நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே! அம்பாறை மாவட்டத்தில், அட்டாளைச்சேனைப் பிரதேசச் செயலாளர் பிரிவின்கீழுள்ள ஒலுவில் கிராமத்தில் விவசாயம் மற்றும் கடற்றொழிலை ஜீவனோபாயமாகக் கொண்ட மக்கள் வாழ்ந்து வருகின்றனர். கிராமியப் பொருளாதார முறையின் பாரம் பரியத்தைக் கொண்டுள்ள இக்கிராமமானது தென்னை வளச் செய்கையிலும் சிறந்து விளங்குகின்றது. இந்த நிலையில் இப்பகுதியில் துறைமுகம் ஒன்றினை அமைப்பதற்கான ஆரம்பப் பணிகள் முன்னாள் அமைச்சர் மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரஃப் அவர்களால் 1998களில் ஆரம்பிக்கப்பட்டது. பின்னர் டென்மார்க் அரசின் 46.1 மில்லியன் யூரோ வட்டியில்லாக் கடனைக் கொண்டு நிர்மாணப் பணிகள் மேற்கொள்ளப்பட்டு, 2013ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 01ஆம் திகதி அது திறந்து வைக்கப்பட்டது. மறைந்த முன்னாள் அமைச்சர் அஷ்ரஃப் அவர்கள் அப்பகுதி மக்களுக்கு ஆற்றியுள்ள மகத்தான சேவைகளை நான் இங்கு ஞாபகப்படுத்த விரும்புகின்றேன். இத்துறைமுகத்தை ஏற்றுமதித் துறைமுகமாக விருத்தி செய்வதன்மூலம் 1,000 பேருக்கு நேரடி வேலைவாய்ப்பினை வழங்க முடியுமென்றும் 2015ஆம் ஆண்டாகும்போது சுமார் 10,000 பேருக்கு வேலைவாய்ப்பு வழங்க முடியுமென்றும் அப்போது கூறப்பட்டது. எனினும் இத்துறைமுகமானது இதுவரையில் பயன்படுத்தப்படாமல் இருப்பதால் அப்பகுதி மக்கள் பாரிய பிரச்சினைகளுக்குட்பட்டு வருவதாகத் தெரிய வருகின்றது.

துறைமுகப் பணிகளுக்காகக் கடல் நீரேந்து பரப்பைப் பாரிய பாறாங்கற்களைக்கொண்டு மூடியதன் காரணமாக ஏற்பட்ட கடலலை நகர்வுகள் துறைமுகத்தை அண்டியதான பகுதிகளை ஆட்கொண்டுள்ளதாகவும் இந்தத் தொடர் கடலலை அரிப்பு விளைவுகளால் சுமார் 600 மீற்றர் நிலப் பரப்பினையும் அதனை அண்டிய தென்னை நிலங்களையும் கடல் உட்கொண்டுள்ளதாகவும் விவசாயக் கால்வாய்களைக் கடல் நீர் ஆக்கிரமித்ததன் காரணமாகப் பயிர் நிலங்கள் அனைத்தும் உவர்த்தன்மையினை அடைந்துள்ளதாகவும் தெரிய வருகின்றது. இதன் தாக்கத்தைத் தடுக்கும் வகையில்

2011ஆம் ஆண்டில் இலங்கைத் துறைமுக அதிகாரசபையினால் 150 மீற்றர் நிலப்பரப்புக்குத் தடுப்பு அணை அமைக்கப் பட்டபோதிலும் கடலரிப்பினை நிறுத்த இயலாதிருப்பதாகவே மேலும் தெரிய வருகின்றது. இந்த நிலையில், துறைமுகம் அமைக்கப்படுவதற்கான முன்னாய்வு அறிக்கை, சுற்றாடல் தாக்க அறிக்கை என்பன சரியான முறையில் பின்பற்றப்படாத நிலையிலேயே இத்துறைமுகப் பணிகள் மேற்கொள்ளப் பட்டுள்ளதாகவும் கூறப்படுகின்றது. ஆகவே,

கடலரிப்பிலிருந்து ஒலுவில் கிராமத்தைக் காப்பாற்றக் கூடிய வகையிலும் உவர் நீர் உட்புகுவதைத் தடுக்கும் வகையிலும் ஏதேனும் நடவடிக்கைகள் முன்னெடுக்கப் படுகின்றனவா என்பது பற்றி அறியத்தர முடியுமா?

ஒலுவில் துறைமுகம் ஏற்றுமதித் துறைமுகமாக மாறக் கூடிய வாய்ப்புக்கள் உள்ளனவா என்பது பற்றி அறியத்தர முடியுமா?

2008ஆம் ஆண்டளவில் 48 பேரினது தனியார் காணிகள் இத்துறைமுகப் பணிகளுக்காக அரசாங்கத்தால் சுவீகரிக்கப் பட்டதாகவும் இதில் 32 பேருடைய காணிகள் 2009ஆம் ஆண்டில் அரச விலை மதிப்பீட்டுத் திணைக்களத்தால் விலை மதிப்பீடு செய்யப்பட்டதாகவும் இதில் 19 பேருக்கு ஒரு பேர்ச் காணிக்கு 30,000 ரூபாய் வீதம் நட்டஈடு வழங்கப்பட்டதாகவும் ஏனைய 16 பேருடைய காணிகள் தொடர்பில் இதுவரை விலை மதிப்பீடு செய்யப்படவில்லை எனவும் விலை மதிப்பீடு செய்யப்பட்டவர்களில் 13 பேருக்கு இன்னமும் நட்டஈடுகள் வழங்கப்படவில்லை என்றும் கூறப்படுகின்றது. எனவே, -

தங்கள் காணிகளை இழந்து அதற்கான உரிய நட்டஈட்டினைப் பெற இயலாமல் பாதிக்கப்பட்டுள்ள மேற்படி நபர்களுக்கான நட்டஈட்டினை உடன் வழங்கக்கூடிய சாத்தியங்கள் உள்ளனவா? இல்லையெனில், அதற்கான தடைகள் பற்றிக் கூற முடியுமா?

மேற்படி, எனது கேள்விகளுக்கான பதில்களையும் எடுக்கப் படக்கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் கௌரவ அமைச்சர் அர்ஜுன ரணதுங்க அவர்கள் வழங்குவாரென எதிர்பார்க்கின்றேன்.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, that Question will be answered tomorrow.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මැතිතුමා.

II

සමුද්‍රාරක්ෂක නිලධාරීන්ගේ ගෙවීම් සම්බන්ධ ගැටලුකාරී තත්ත්වය

கடற்பாதுகாப்பு உத்தியோகத்தர்களின் கொடுப்பனவு சம்பந்தமான சிக்கல் நிலை

PROBLEMATIC SITUATION REGARDING PAYMENTS OF MARITIME SECURITY OFFICERS

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

සමුද්‍රාරක්ෂක සේවයේ නියුතු ආරක්ෂක නිලධාරීන්ගේ ගෙවීම් සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

සමුද්‍රාරක්ෂක සේවාවන් සැපයීම මෑත කාලයේ මහත් ආන්දෝලනයට තුඩුදුන් කරුණක් වුණා. ඒ, මෙම ක්ෂේත්‍රයේ සේවා සැපයීමෙන් විශාල ලෙස ආදායම් ඉපයීමට හැකිවීම නිසායි. එම නිසාම පසු ගිය පාලනයේ දේශපාලන අනුග්‍රහය ඇතිව ජාවාරම්කාර සමාගමක් පසු ගිය කාලයේ කූට ලෙස අතිවිශාල ආදායම් උපයා ගත්තා.

2010 වසරේ සිට ශ්‍රී ලංකා සන්නද්ධ සේවාවන්හි සේවය කර නීත්‍යානුකූලව ඉවත්වූ හා නීත්‍යානුකූලව විශ්‍රාම ලැබූ ශ්‍රී ලාංකික සෙබළුන්ගෙ මුහුදු ආරක්ෂකයින් ලෙස එම රැකියාවලට ඇතුළත් වීමට අවස්ථාව ලැබුණා. මේ වෙනුවෙන් ඔවුන් හට විදේශීය නෞකා ආරක්ෂක සමාගම් විසින් ඉහළ වැටුප් ගෙවනු ලැබුවා. එම සමාගම්වල රැකියා කොන්දේසි අනුව මෙම සාගර ආරක්ෂක නිලධාරීන්ගේ සියලු වියදම් විදෙස් ආයතනයන් විසින් දැරූ අතර, ඉහළ වටිනාකමක් ඇති රක්ෂණාවරණයක්, සෞඛ්‍යාවරණයක් සහ හදිසි අනතුරු දීමනා ආදී වශයෙන් ජාත්‍යන්තර නාවික ක්ෂේත්‍රයේ සාගර ආරක්ෂක නිලධාරියෙකු හට හිමි සියලු වරප්‍රසාද පහසුකම් ඔවුනට හිමි වුණා. එහෙත් 2013 වසරේ සිට ආරක්ෂක අමාත්‍යාංශයේ රක්නා ලංකා සමාගම සහ ඇවන්ට් ගාර්ඩ් පෞද්ගලික සමාගම අතර අත්සන් තබනලද ගිවිසුමක් අනුව ලංකාවේ සමුද්‍රාරක්ෂක නිලධාරීන්ගේ සේවය අවශ්‍ය නැව් සමාගම් එම නිලධාරීන් රක්නා ලංකා සමාගම මඟින් ලබා ගත යුතු වුණා. එසේම මෙහිදී සමුද්‍රාරක්ෂක නිලධාරීන්ට ගෙවනු ලැබුවේ සාපේක්ෂව අඩු වැටුපක්. ඊට අමතරව මේ තත්ත්වය තුළ විදෙස් නැව් සමාගම් මෙරටින් සේවා ලබාගැනීම අත්හැර දැමීම නිසා දේශීය නැව් නියෝජිතයින් මඟින් මෙරට සමුද්‍රාරක්ෂක නිලධාරීන්ට ලැබුණු රැකියා අවස්ථා ගණනාවක් අහිමි වුණා.

හටගෙන තිබූ ආන්දෝලනාත්මක වාතාවරණය තුළ වත්මන් ආණ්ඩුව බලයට පැමිණීමෙන් පසුව මෙම සේවා සැපයීමෙහි යම් වෙනස්කම් ඇති වී තිබුණද සමුද්‍රාරක්ෂක නිලධාරීන්ගේ ගැටලු ගණනාවක් මෙතෙක් නොවිසඳී තිබෙනවා. මේ වන විට සමුද්‍රාරක්ෂක සේවා සපයන නියෝජිත ආයතන කිහිපයකට රක්නා ආරක්ෂක ලංකා සමාගම හරහා සේවා සැපයීම සඳහා අවස්ථාව ලබා දී තිබෙනවා. එහෙත් මේ වසරේ මැයි මාසයේ සිට සමුද්‍රාරක්ෂක රැකියා ක්ෂේත්‍රයට නොගැළපෙන අයුරින් වැටුප් සීමාවන් පැනවීමට රක්නා ආරක්ෂක ලංකා සමාගම කටයුතු කර තිබෙනවා. එමඟින් මෙම ක්ෂේත්‍රයේ ඉහළ වැටුප් අඩු කර විදේශීය සමාගම්වලට අසාධාරණ ලෙස ශ්‍රමය සූරාකෑමට ඉඩ පාදා දී තිබෙනවා. රක්නා ආරක්ෂක ලංකා සමාගමේ 2016 මැයි 18 දින නිවේදනය අනුව 2014 වනවිට ඩොලර් 1500ක තිබූ කණ්ඩායම් නායක වැටුප ඩොලර් 1100 දක්වාද එම කාලයේ ඩොලර් 1000ක් වූ ආරක්ෂක නිලධාරි වැටුප ඩොලර් 800 දක්වාද පහත හෙළා තිබෙනවා. ඊට හේතු වශයෙන් දක්වා ඇත්තේ සමුද්‍රාරක්ෂක සේවා ලබා ගැනීම සඳහා ලංකාවට පවතින ඉල්ලුම අඩු වෙමින් තිබීම නිසා හා අවට රටවල් අඩු වැටුපකට සේවය සැපයීමට ඉදිරිපත් වී තිබීම යන කරුණුයි. එහෙත් එම රටවල මෙම අඩු වැටුප් සහිත සේවා ප්‍රමිතියෙන් තොර අඩු ගුණාත්මකභාවයෙන් යුතු ඒවා බව ක්ෂේත්‍රයේ පිළිගැනීමයි. එබැවින් උසස් තත්ත්වයෙන් යුතු නැව් සමාගම් එම සේවාවන් ප්‍රතික්ෂේප කරනවා. ගුණාත්මක මට්ටමේ ශ්‍රී ලංකා සමුද්‍රාරක්ෂක නිලධාරීන්ද අඩු වැටුප් මට්ටමේ සේවාවකට ඇද දැමීමක් මෙමඟින් සිදුවී ඇති බවටත්, මෙම සේවාවන් වෙනුවෙන් ලංකාවට තිබූ පිළිගැනීම බිඳ දමන අදූරදර්ශී තීරණයක් බවටත් ඔවුන් බලවත් චෝදනාවක් එල්ල කරනවා. ඒ අනුව මෙම අත්තනෝමතික තීරණය නිසා පළපුරුදු විශ්‍රාමලත් ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට නැව් නියෝජිතයන් මඟින් ඉහළ

[ගරු අනුර දිසානායක මහතා]

වැටුපකට සේවය ලබා දීමට තිබූ අවස්ථාව අහිමි වී තිබෙනවා. එසේම එය රටට ලැබෙන විශාල විදේශ විනිමය ප්‍රමාණයක්ද අහිමි කර දමා තිබෙනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු ගරු අමාත්‍යවරයා විසින් ලබාදෙනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

01. තම සුදුසුකම් මත සමුද්‍රාරක්ෂක නිලධාරීන් විසින් ඉහළ වැටුප් සහිත රැකියා පෞද්ගලිකව සොයා ගැනීම රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් වළක්වනු ලැබුවේ ඇයි?

ගරු කථානායකතුමනි, මීට කලින් මේ රක්නා ආරක්ෂක ලංකා සමාගම හරහාම යන්න ඕනෑ නැහැ. ඒ ගොල්ලෝ නැව් සමාගම් හරහා ඒ නියෝජිතයින් හරහා රැකියා සොයා ගත්තාට පස්සේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් පිළිගත් සහතිකයක් ලබා දුන්නාම -ඔවුන්ට වරදවල් නැහැ. නීත්‍යානුකූලව ඉවත්වී තිබෙනවා. මෙවැනි කරුණු ලබා දුන්නාම- ඔවුන් බඳවා ගන්නවා. එතකොට රැකියා වෙළඳපොළ විවෘතව තිබුණා. දැන් එහෙම නැහැ.

02. සමුද්‍රාරක්ෂක සේවා ලබාගැනීම සඳහා ලංකාවට පවතින ඉල්ලුම අඩු වෙමින් යන්නේ යැයි නිගමනය කළේ කෙසේද? එහෙම අඩු වනවාය කියන්නේ කොහොමද?

03. සමුද්‍රාරක්ෂක සේවයේ වැටුප් තීරණය කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ සංයුතිය කවරේද? එම කමිටුවේ නිර්දේශ සභාගත කරන්නේද?

04. සමුද්‍රාරක්ෂක සේවා සැපයීම සඳහා නියෝජිත ආයතන තෝරා ගෙන ඇත්තේ කෙසේද? ඒවා කිහිපයකට පමණ සීමා කිරීමක් කර තිබේද?

05. විදේශීය සමුද්‍රාරක්ෂක සේවා සමාගම්වල සේවය කිරීමටත්, ඒවායින් වැටුප් ලැබීමටත් සමුද්‍රාරක්ෂක නිලධාරීන්ට ඇති අවස්ථාව අහිමි කර ඇත්තේ කවර හේතුවක් නිසාද? එම අවස්ථාව නැවත ඔවුන්ට ලබා දෙන්න කටයුතු කරනවාද කියා ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු රුවන් විජයවර්ධන මහතා
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardene)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01. ශ්‍රී ලාංකික සමුද්‍ර ආරක්ෂක නිලධාරීන්ට තම අභිමතය පරිදි සමුද්‍ර ආරක්ෂක රාජකාරිවල නියැලීමට නොහැකි අතර, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පනවා ඇති නියෝග අනුව රටේ ජාතික ආරක්ෂාව, ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවට එල්ල විය හැකි බලපෑම් හා සමුද්‍ර ආරක්ෂක නිලධාරීන්ට රාජකාරියේදී මුහුණපෑමට සිදු වන අපහසුතා මහඟුරවීම සඳහා ශ්‍රී ලාංකික සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් නැවිගත වීම රක්නා ආරක්ෂක ලංකා සමාගම හරහා සිදු වේ.

මෙම සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් රාජකාරියේ යෙදීමට ප්‍රථම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.

අ. නීත්‍යානුකූලව ත්‍රිවිධ හමුදා හෝ පොලිස් සේවයෙන් අස් වූ අය විය යුතුය.

ආ. ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ සේවා කාලය අඛණ්ඩව වසර 10ක් විය යුතුය.

ඇ. ලියා පදිංචි වීමට පැමිණෙන දිනට වයස අවුරුදු 45ක් හෝ ඊට අඩු විය යුතුය.

ඈ. ලියා පදිංචි වීමේදී රජයේ හෝ රජයේ අනුමත වෛද්‍ය ආයතනයකින් ලබා ගත් වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කිරීම. (අක්ෂි, කර්ණ හා මානසික යෝග්‍යතා පරීක්ෂණය ද ඇතුළත්ව හා ඒඩිස් පිළිබඳ සහතිකය)

ඉ. ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේදී දැනුමක් ලබා තිබීම.

ඊ. වලංගු විදෙස් ගමන් බලපත්‍රයක් තිබීම.

උ. අඛණ්ඩ මුදා හැරීමේ සහතිකය (Continuous Discharge Certificate) තිබීම.

ඌ. පොලිස් වාර්තාව තිබීම

තවද, සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් සඳහා අය කරන ගාස්තු සමුද්‍ර ආරක්ෂක සමාගම් සහ ඔවුන්ගේ දේශීය නියෝජිතයන් සමඟ සාකච්ඡා කර එම අවස්ථාවේ පවතින තත්ත්වය අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජනයක් සහිත මණ්ඩලයක් මඟින් තීරණය කරන අතර ඔවුන්ගේ වැටුප් ද එම මණ්ඩලය මඟින් තීරණය කරනු ලබයි.

රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් මේ අවස්ථාවේ සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් සඳහා ගෙවනු ලබන වැටුප් විස්තරය පහත පරිදි වේ.

<u>රක්නා ආරක්ෂක ලංකා අවි සහිතව :</u>

කණ්ඩායම් නායකයකු සඳහා මසකට ඇ.ඩො. 1200ක්.

සමුද්‍ර ආරක්ෂක නිලධාරියකු සඳහා මසකට ඇ.ඩො. 840ක්.

<u>රක්නා ආරක්ෂක ලංකා අවි රහිතව:</u>

කණ්ඩායම් නායකයකු සඳහා මසකට ඇ.ඩො. 1110ක්.

සමුද්‍ර ආරක්ෂක නිලධරියකු සඳහා මසකට ඇ.ඩො. 810ක්.

(ආරක්ෂක අමාත්‍යාංශය විසින් ස්වාධීන නැවිගත වීම සඳහා අවසරය ලබා දී ඇති කණ්ඩායම් හැර)

02. ඉන්දියන් සාගරයේ රතු මුහුදු හා Gulf of Oman කලාපය ආශ්‍රිතව සෝමාලියානු මුහුදු කොල්ලකරුවන්ගේ බලපෑම් 2014 වර්ෂයේ සිට ඉතා ශීඝ්‍ර ලෙස අඩු වී ඇති නිසා සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් සඳහා ඇති ඉල්ලුම ශ්‍රී ලංකාවේ පමණක් නොව ජාත්‍යන්තර වශයෙන්ද ශීඝ්‍ර ලෙස අඩු වෙමින් පවතී.

තවද, ආසියානු රටවල සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් විශේෂයෙන් ගාලු වරායෙන් අඩු මුදලකට නැවිගත වීම නිසා ශ්‍රී ලාංකික සමුද්‍ර ආරක්ෂක නිලධාරීන්ට ඇති ඉල්ලුම අඩු වෙමින් පවතී.

03. අ. `එන්.ජී. පණ්ඩිතරත්න - අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂක හා සංවර්ධන) - ආරක්ෂක අමාත්‍යාංශය.

ආ. එයාර් වයිස් මාර්ෂල් (විශ්‍රාමික) පී.බී. ප්‍රේමචන්ද්‍ර - සාමාන්‍යාධිකාරී (පාලන හා පුහුණු) - රක්නා ආරක්ෂක ලංකා සමාගම.

ඇ. කොමදෝරු ඩී.එස්.ඒ.ඒ.පී. සමරසිංහ- සාමාන්‍යාධිකාරී (සමුද්‍ර ආරක්ෂක) - රක්නා ආරක්ෂක ලංකා සමාගම.

ඈ. කොමදෝරු ඒ.කේ.එම්. ජිනදාස - අධ්‍යක්ෂ (නාවික මෙහෙයුම්) - ශ්‍රී ලංකා නාවික හමුදාව

ඉ. ඩබ්ලිව්.එල්.කේ.ඩබ්ලිව්. අබේරත්න - නීති නිලධාරී - රක්නා ආරක්ෂක ලංකා සමාගම.

ඊ. ඩී.ටී.ජී.පී. වික්‍රමනායක - ගණකාධිකාරී (සමුද්‍ර මෙහෙයුම්) - රක්නා ආරක්ෂක ලංකා සමාගම.

04. සමුද්‍ර ආරක්ෂක සේවා සැපයීම සඳහා රක්නා ආරක්ෂක ලංකා ආයතනය සමඟ දේශීය හෝ විදේශීය පෞද්ගලික සමුද්‍ර ආරක්ෂක සමාගම් හෝ ඒවායේ දේශීය නියෝජිතයන් ගිවිසුමගත විය යුතු අතර, එම ගිවිසුම්ගත වීම සඳහා අවශ්‍ය ලියකියවිලි නිසි ලෙස සම්පූර්ණ කොට එම සමාගම් විසින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය. ආරක්ෂක අමාත්‍යාංශ අනුමැතිය මත රක්නා ආරක්ෂක ලංකා සමාගම එම සමාගම් සමඟ සාමාන්‍ය සේවා ගිවිසුම අත්සන් කරනු ලබයි. එම නිසා මෙය සමුද්‍ර ආරක්ෂක සමාගම් කිහිපයකට පමණක් සීමා කොට නොමැත.

05. මෙම සමුද්‍ර ආරක්ෂක නිලධාරීන් විදේශීය සමුද්‍ර ආරක්ෂක සමාගම්වල සේවය කරනු ලබන අතර ඔවුන්ගේ වැටුප් ගෙවීම රක්නා ආරක්ෂක ලංකා සමාගම මඟින් සිදු කරනු ලබයි.

(ආරක්ෂක අමාත්‍යාංශය විසින් ස්වාධීන නැවගත වීම සඳහා අවසරය ලබාදී ඇති කණ්ඩායම් හැර)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන. වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු විජිත් විජයමුණි සොයිසා මැතිතුමා.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Irrigation and Water Resources Management)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) ප්‍රශ්නයකට අදාළ පිළිතුරු දෙන්නයි තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, නැහැ. "අමාත්‍යාංශ නිවේදන" කියලායි අද දින වැඩ සටහනේ සඳහන් වෙලා තිබෙන්නේ.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

ගරු කථානායකතුමනි, අපේ-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊයේ ගරු සභානායකතුමා කිව්වා, "හෙට පිළිතුරු දෙනවා" කියලා. මේක වෙනත් එකක්ද?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

නැහැ, නැහැ. ස්ථාවර නියෝග 23(2) යටතේ අහපු ප්‍රශ්නයකට පිළිතුරක්.

යාපනය දිස්ත්‍රික්කයේ භූගත ජලය දූෂණය වීම: වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගේ ප්‍රකාශය

யாழ். மாவட்டத்தில் நிலத்தடி நீர் மாசடைவு: நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சரின் கூற்று

GROUNDWATER CONTAMINATION IN JAFFNA DISTRICT: STATEMENT BY MINISTER OF IRRIGATION AND WATER RESOURCES MANAGEMENT

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

ගරු කථානායකතුමනි, අපි යාපනය දිස්ත්‍රික්කයේ ජලසම්පත් මණ්ඩලයේ කාර්යාලයක් විවෘත කරලා යාපනය කච්චේරියේ රැස්වීමක් පැවැත්වුවා. ඒ රැස්වීමට සහභාගි වූ උතුරු පළාතේ ආණ්ඩුකාරතුමාටත්, පාර්ලිමේන්තු මන්ත්‍රී අංගජන් මන්ත්‍රීතුමාටත්, ටීඑන්ඒ එකේ පළාත් කෘෂිකර්ම වාරිමාර්ග අමාත්‍ය පී. අයින්ගරනේෂන් මැතිතුමාටත්, ටීඑන්ඒ එකේ පාර්ලිමේන්තු මන්ත්‍රී සිද්ධාර්ථන් මැතිතුමාටත්, ඊපීඩීපී එකේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී කුගන් මැතිතුමාටත්, වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කාදර් මස්තාන් මැතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා.

යාපනය දිස්ත්‍රික්කයේ භූගත සහ මතු පිට තිබෙන ජල ප්‍රශ්නය පිළිබඳව අපි එදා දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. අපි එතැනදී හඳුනා ගත්ත කරුණක් තමයි, කෘෂි කර්මාන්තය සඳහා භූගත ජලය වැඩියෙන් උකහා ගැනීම හේතුවෙන් ජලය දූෂණ වී ඇති බව. පරීක්ෂණ මඟින් එය සහතික වෙලා තිබෙනවා. ඒ වාගේම යාපනය දිස්ත්‍රික්කයේ මලාපවහනය නිසි පරිදි කළමනාකරණය නොකිරීමත් භූගත ජලය අපවිත්‍රකරණයට බලපා තිබෙනවා. ඒ හන්දා ජනතාවට පිරිසිදු, ආරක්ෂිත ජලය ලබා දෙන්න ජලසම්පත් මණ්ඩලය යාපනය පළාත් කාර්යාලය මඟින් ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කරලා තිබෙනවා.

ඒවා මෙසේයි.

1. යාපනය දිස්ත්‍රික් භූගත ජල අධ්‍යයනය.

මෙම අධ්‍යනය යටතේ යාපනය දිස්ත්‍රික්කයේ භූගත ජලයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මකභාව අධ්‍යයනය කිරීමට භූගත ජල විද්‍යාත්මක පර්යේෂණ සිදු කරනවා. යාපනය දිස්ත්‍රික්කයේ සියලු ජලධර සම්බන්ධයෙන් අධ්‍යයනය කර ඒවායේ ධාරිතා හා ජලය රැස්වෙන ප්‍රමාණ පිළිබඳ දත්ත රැස් කිරීම අපි දැනටමත් සිදු කරමින් පවතිනවා.

02. යාපනය දිස්ත්‍රිකයේ චුන්නක්කම් ප්‍රදේශයේ ස්ථාපිත විදුලි බලාගාරය නිසා භූගත ජලය දූෂණයවීම සම්බන්ධයෙන් අධ්‍යයනය කරනවා.

ගරු කථානායකතුමනි, චුන්නක්කම් ප්‍රදේශයේ පවතින ජලධරය ග්‍රීස් හා තෙල් කාන්දුවීම නිසා දූෂණයට ලක් වී ඇති බව වාර්තා වුණා. මෙම දූෂණය සම්බන්ධයෙන් කරුණු අනාවරණ කර ගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරමින් පවතිනවා. පරීක්ෂණ නළ ළිං මඟින් භූගත ජලය ගලා යෑමේ දිශාව සොයා ගැනීම සඳහා

[ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා]

මෙමඟින් කටයුතු කරන අතර, එහි ප්‍රතිඵල අනුව මෙම ශ්‍රීස් සහ තෙල්ධරය හරහා විකාශනය වී ඇති අන්දම පිළිබඳව කරුණු අනාවරණ කර ගැනීමට බලාපොරොත්තු වෙනවා.

03. ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය

ලෝක බැංකු ආධාර යටතේ වේලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය යටතේ යාපනය දිස්ත්‍රික්කයේ භූගත ජල නිමාන පද්ධති ස්ථාපිත කිරීම හා එහි අධ්‍යයන කටයුතු පවත්වාගෙන යෑම සිදු කරනවා.

04. පොකුණු ප්‍රතිසංස්කරණය කර හඳුනා ගත් ජල මූලාශ්‍ර තුළින් ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

යාපනය නාගරික බල ප්‍රදේශය තුළ පවතින පොකුණු පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ එම පොකුණුවල තැන්පත් වී ඇති රොන්මඩ තට්ටුවල ගැඹුර නිර්ණය කොට, ආරක්ෂිතව ඉවත් කළ යුතු රොන්මඩ තට්ටුවේ ඝනත්වය නිර්දේශ කිරීමට බලාපොරොත්තු වෙනවා.

05. දීර්ඝ කාලීනව ජලයේ ගුණාත්මකභාවය වෙනස්වීම අධ්‍යයනය කිරීම.

පොකුණු ආශ්‍රිතව ගැඹුරු පර්යේෂණ ළිං ඉදිකිරීමට බලාපොරොත්තු වෙනවා. යාපනයේ ජලසම්පත් මණ්ඩලයේ පළාත් කාර්යාලය 2016 වර්ෂයේ නව ස්ථානයක ස්ථාපනය කරනු ලැබුවා. මෙම කාර්යාල ජල පර්යේෂණ කටයුතු සඳහා රසායනාගාරයක් පිහිටුවා තිබෙනවා.

පෙර සඳහන් කළ විශේෂ ව්‍යාපෘතිවලට අමතරව යාපනය පළාත් කාර්යාලය මඟින් ප්‍රදේශයේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන මෙන්ම ජනතාව විසින් සිදු කරනු ලබන ඉල්ලීම්, භූගත ජල සමීක්ෂණ සිදු කිරීම, නළ ළිං ඉදිකිරීම, ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම, ජල සාම්පල්වල රසායනික ක්ෂුද්‍ර ජීවීන් සහ බැරලෝහ විශ්ලේෂණය සිදු කිරීම, අත්පොම්ප සවි කිරීම, සම්මත මිම්මකට අනුව නළ ළිංවල ජල මට්ටම මැනීම ආදී වාණිජමය කාර්යයන් සිදු කරනවා.

ඕමන්තෙයි සහ පල්ලෙයිවල නව ජලසම්පත් මණ්ඩල වැඩ ඒකක ස්ථාපිත කිරීමට නියමිත අතර ඒ සඳහා අවශ්‍ය මූලික පියවර ගනිමින් පවතිනවා. මුලතිවු ගුරුකන්ද විහාරයේ පානීය ජල ගැටලුව සඳහාද අප අවශ්‍ය විසඳුම් ලබා දී තිබෙනවා. ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමනි, ඔබතුමාට ඉදිරියේ දී මේ පිළිබඳව යම් ගැටලුවක් ඇති වුණොත් සාකච්ඡා කර එය විසඳා දීමට අප බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

සැමට සරණ සහන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
செமட்ட சரண சஹண சேவா மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
SAMATA SARANA SAHANA SEWA FOUNDATION (INCORPORATION) BILL

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සැමට සරණ සහන සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත රීට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Empowerment and Welfare for report.

සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
சத்திய ஸ்ரீ கணபதி பக்தி ஜன சேவா மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
SATHYA SRI GHANAPATHI BHAKTHI JANA SEWA FOUNDATION (INCORPORATION) BILL

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Empowerment and Welfare for report.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම, ගරු කේ. කාදර් මස්තාන් මහතා - පැමිණ නැත.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා උදේ වරුවේදී ප්‍රකාශ කළා, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පතට අත්සන් කළාය කියා. එම පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවේ සම්මත කළ අවස්ථාවේ දී පාර්ලිමේන්තුවේ සාමාන්‍ය තත්ත්වයක් නොතිබුණු බව අප කවුරුත් පිළිගන්නවා. ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත සම්බන්ධව අපි ඉතාම වැදගත් සංශෝධන තුනක් ආණ්ඩුවට භාර දෙනු ලැබුවා. ආණ්ඩුව එම සංශෝධන පිළිගත්තා. ගරු කථානායකතුමනි, එම සංශෝධන කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දිය යුතුව තිබුණා.

එම පනත් කෙටුම්පත සම්මත කරන ලද 2016 අගෝස්තු 11 වැනි දින හැන්සාඩ් වාර්තාවේ 1337 තීරුව කෙරෙහි මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එහි සඳහන් වන ආකාරයට සභාපතිතුමා වශයෙන් ඔබතුමා, "ගරු බිමල් රත්නායක මැතිතුමා. එකොළහ." යනුවෙන් ප්‍රකාශ කර තිබෙනවා. ඒ අවස්ථාවේදී ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා මෙසේ ප්‍රකාශ කර තිබෙනවා.

"ගරු සභාපතිතුමනි, මට භරියට ඇහුණේ නැහැ. 8 වැනි පිටුවද, 11 වැනි පිටුවද?

11 වැනි පිටුවේ නම්, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:"

ඒ අනුව 11 වැනි පිටුවට සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා; ඊළඟට අනෙක් සංශෝධනත් ඉදිරිපත් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, නමුත් ඒ අවස්ථාවේදී 8 වැනි පිටුවට අදාළ වැදගත් වූ සංශෝධනය ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලැබී නැහැ. සමහර විට ඔබතුමා මුලසුනේ ඉඳගෙන 8 වැනි පිටුවට සංශෝධන ඉදිරිපත් කරන්නය කියලා කියන්න ඇති.

නමුත් ඒක ඇහිලා නැහැ වෙන්න ඇති. එක්කෝ ඔබතුමාටත් ඒක මඟ හැරෙන්න ඇති. කොහොම වුණත් ඒ වැදගත් සංශෝධනය ඉදිරිපත් කිරීමේ අවස්ථාව මඟ හැරිලා තිබෙනවා. '"ගිවිසුම්වලට ඇතුළත් වීම ඇතුළුව දේශීය වශයෙන් හෝ විදේශීය සහ සංස්ථාගත කරන ලදුව හෝ එසේ නොමැති සංවිධානයක් හෝ යම් තැනැත්තෙකු සමඟ අවශ්‍ය යයි ඕ.එම්.පී. ට පෙනී යන අවස්ථාවල දී ගිවිසුම්වලට ඇතුළත් වීම' යන කොටස ඉවත් කළ යුතු වේ" කියන සංශෝධනය තමයි අපි ඉදිරිපත් කරන්න සිටියේ. මම හිතන විධියට සභානායකතුමා විසින් ඒ සංශෝධනය පිළිගෙන තිබුණා. හැබැයි ඒ අවස්ථාවේදී සංශෝධන ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලැබී නැහැ. සභාපතිතුමා ඒක ඉදිරිපත් කරන්න කියා කිව්වාද කියලා අපි දන්නේ නැහැ. මොකද, අපට ඒක ඇහුණේ නැති නිසා. ඔබතුමා ඒක ඉදිරිපත් කරන්න කියලා කියපු බවක් හැන්සාඩ් වාර්තාවේත් නැහැ. බිමල් රත්නායක මන්ත්‍රීතුමාට සංශෝධනය ඉදිරිපත් කරන්න කියලා කිව්වාම, මොන පිටුවද කියලා එතුමා අහලා තිබෙනවා. "8 වැනි පිටුවද, 11 වැනි පිටුවද?" කියලා එතුමා අසා තිබෙනවා. එතකොට ඔබතුමා කියලා තිබෙනවා, "11 වැනි පිටුව" කියලා. එතකොට 8 වැනි පිටුව මඟ හැරිලා තිබෙනවා. ඒක තමයි සිදු වෙලා තිබෙන්නේ. ඒ නිසා එම පනතට යළිත් මේ සංශෝධනය ගෙනෙන්න ඔබතුමන්ලා සූදානම්ද කියලා මම දැන ගන්න කැමැතියි. මොකද, මේ වැදගත් සංශෝධනවලට යටත්ව තමයි අපි මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා අපේ පැත්තෙන් සහාය ලබා දෙන්න තීරණය කළේ. ඒ වාගේම එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනත් ගණනාවක් තිබුණා. ඒවාත් රජය විසින් පිළිගනු ලැබුවා. නමුත් ඒ සංශෝධනත් මේ පනතට ඇතුළත් වෙලා නැහැ.

දැන් පනත අත්සන් කොට තිබෙනවා. පනත් කෙටුම්පත සහතික කරන්නේ පාර්ලිමේන්තුවේ ක්‍රියා පටිපාටියට අනුව සංශෝධනය කරන ලද වගන්ති අනුවයි. නමුත් මේ වැදගත් සංශෝධන මඟ හැරිලා තිබෙනවා. එම සංශෝධන ඇතුළත් කිරීම සඳහා ආණ්ඩුව පැත්තෙන් මේ පනතට නැවත සංශෝධනයක් ගෙනෙන්න ඔබතුමන්ලා සූදානම්ද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා අද උදෙන් මේ ගැන සාකච්ඡා කළා. [බාධා කිරීමක්] -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න. ඊට පසුව පිළිතුරු ලබා දීම සඳහා අවස්ථාව ලබා දෙන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පසු ගිය 11 වන දා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා වූ අවස්ථාවේදී තිබුණු තත්ත්වය අනුව එවැනි අවස්ථාවක පනතක් සම්මත කර ගැනීමට බැරි බව ස්ථාවර නියෝගවල ඉතා පැහැදිලිව සඳහන් වී තිබෙනවා. ඒ ගැන අපි ඔබතුමාටත් කරුණු ඉදිරිපත් කළා. නමුත්, ඔබතුමා අද උදේ මේ පනත් කෙටුම්පත නීත්‍යානුකූලව සම්මත වූ බව ප්‍රකාශ කළා.

පසු ගිය 11 වන දා හැන්සාඩ් වාර්තාව අද දින අප ඉදිරියේ තිබෙනවා. එම හැන්සාඩ් වාර්තාව අනුව එදා මේ සභාවේ තිබුණු තත්ත්වය සම්පූර්ණයෙන් පැහැදිලි වෙනවා. කිසිම නිශ්චිතභාවයකින් සභාව පැවතිලා නැති බව ඒ අනුව පැහැදිලි වෙනවා. ඉතින් එවැනි තත්ත්වයක් යටතේ මෙවැනි පනතක් සම්මත කිරීමට හැකියාවක් නොමැති බව මා සඳහන් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ඊට අතිරේකව මේ පනතේ 27 වන වගන්තියේ (iii) වන උප වගන්තියට "ජාත්‍යන්තර සම්මුතියේ" කියන වචන ඇතුළත් කර තිබෙනවා. That is an international convention. An international convention has to be approved by the Cabinet, signed by the Minister, ratified, brought in to Parliament and passed. Until then, an international convention will not apply under our Constitution. But, Hon. Speaker, you have announced that you have endorsed the certificate on this Bill, which is not in accordance with the Constitution and the Standing Orders of Parliament. Parliament has to approve that. මේ ජාත්‍යන්තර සම්මුතිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාද කියලා අපි දැන ගන්න කැමැතියි. එහෙම නම් ඒ කවදාද, එය සම්මත වුණාද කියලා අපි දැන ගන්න කැමැතියි. එහෙම නැත්නම් කොහොමද, "බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ..." කියන උප වගන්තියක් මෙම පනතට ඇතුළත් කර තිබෙන්නේ? එවැනි බරපතළ තත්ත්ව ඇති වීම ගැන පාර්ලිමේන්තුවට කරුණු කියන්න තමයි අපි වෙලාව ඉල්ලුවේ. ගරු කථානායකතුමනි, නමුත් අපට ඒ සඳහා වෙලාව ලැබුණේ නැහැ. එම නිසා මෙහි වලංගුභාවයක් නැති බව මම යළිත් ප්‍රකාශ කරන්න කැමැතියි. අප ඒ සඳහා නැවත අවස්ථාවක් ඇති කර ගැනීමයි කළ යුත්තේ.

පසු ගිය දා පරිපූරක මුදල සම්මත කර ගත් අවස්ථාවේත් අපට මේ විධියටම කිව්වා. අපි පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට චෝදනා කළා, තර්ජනය කළා කිව්වා. නමුත් ඔබතුමාම පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරලා සොයා ගත්තා, ඡන්ද ප්‍රතිඵලය වැරැදියි කියලා. අපි එදා ඔබතුමන්ලාගෙන් චෝදනා ලැබුවාට, අපි පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කරමින් කිව්වා, වැරදි ඡන්ද ප්‍රතිඵලයක් දෙන්න බැරි බව. ගරු සභානායකතුමා පාර්ලිමේන්තුවට වෙනම යෝජනාවක් ගෙනැල්ලා සිදු වුණු වැරැද්ද නිවැරදි කිරීමට අවසර ඉල්ලා පාර්ලිමේන්තුවේදී එය නිවැරදි කළා.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාත් දැන් මේ ගැන සඳහන් කළා. අපි ඔබතුමාට කියා සිටින්න ඕනෑ, සංශෝධන 31ක් මේ සභාවට ඉදිරිපත් කරලා තිබුණු බව. මේවාට සිදු වුණේ මොකක්ද කියලා කවුරුවත් දන්නේ නැහැ. ඒ නිසා ගරු කථානායකතුමාගේ අවධානය අපේ මේ අදහසට යොමු කරන්න කියලා විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මේ සමහම මම තවත් කාරණයක් මතු කරන්න කැමැතියි. අද දින න්‍යාය පත්‍රයේ අංක 29 අයිතමය යටතේ, වැට් බද්ද පිළිබඳ සංශෝධන පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමේ යෝජනාව තවමත් තිබෙනවා. ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙය බලශූන්‍ය බවට පත්කර ඇති බවට ඔබතුමා මේ පාර්ලිමේන්තුවට දැනුම් දුන්නා. එහෙම නම්, තවමත් න්‍යාය පත්‍රයේ මේ පනත් කෙටුම්පත තිබෙන්නේ කොහොමද? It is there under Item No. 29 of the Order Paper as, "Value Added Tax (Amendment) Bill - Second Reading." It should have either been struck out of the Order Paper by the Hon. Speaker or withdrawn by the Hon. Leader of the House in respect of the Supreme Court Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you. ගරු සභානායකතුමනි, ඔබතුමා මෙය න්‍යාය පත්‍රයෙන් ඉවත් කිරීමට කටයුතු කරනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අයින් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You will have to take that out. වෙනත් කරුණු තිබෙනවාද පැහැදිලි කරන්න? සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කතා කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, පසු ගිය 11වැනි බ්‍රහස්පතින්දා දිනයේදී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමේ පනත් කෙටුම්පත විවාදයට ගන්නා අවස්ථාවේදී, මම මේ ආසනයට ඇවිල්ලා දිගින් දිගටම ඔබතුමාගෙන් බෙදීමක් ඉල්ලා සිටියා. නමුත් ඒ වේලාවේ තිබුණු වාතාවරණය අනුව ඔබතුමාට ඒක ඇසෙන්නට නැතුවා වෙන්න පුළුවන්. අද එම හැන්සාඩ් වාර්තාවට අවධානය යොමු කරලා බැලුවමත් සනාථ වෙනවා, එදා බෙදීමක් ඉල්ලද්දී බෙදීමක් ලබා නොදී, ඡන්දයක් ලැබීමට අවශ්‍ය ඒ සංඥාව දල්වන්නේ නැතිව, සංඥාව නිකුත් කරන්නේ නැතිව ඉතා අත්තනෝමතික ආකාරයකින් ඒ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමේ ක්‍රියාවලිය දියත් කළ බව. එහෙම කරපු නිසා තමයි ආණ්ඩුවම ඉදිරිපත් කරලා තිබුණු සංශෝධනත්, වෙනත් පාර්ශ්ව ඉදිරිපත් කරපු සංශෝධන බොහොමයකුත් ඇතුළත් වෙලා නැත්තේ. ඒක මනා ලෙස සනාථ වෙනවා, මේ හැන්සාඩ් වාර්තාව කියවලා බැලුවාම. ඒ නිසා ගරු කථානායකතුමනි, එක පැත්තකින් ආණ්ඩුව අපේක්ෂා කළා නම් මේ පනත් කෙටුම්පතට තවත් සංශෝධන ප්‍රමාණයක් ඇතුළත් විය යුතුයි කියලා, ඒක වෙලත් නැහැ.

එයට සහාය දුන් අනෙකුත් විපක්ෂ කණ්ඩායම් දී තිබෙන සංශෝධනත් මුළුමනින්ම ඇතුළත් වෙලා නැහැ. අපි නම් ඒකට සහාය දුන්නේ නැහැ. අපි සහාය නොදුන්න නිසා අපේ සංශෝධන ඇතුළත් වෙලාද, නැද්ද කියලා අපට අදාළ නැහැ. හැබැයි, ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ඊට ඡන්දය දෙන අවස්ථාවේදී ඊට පක්ෂව ඡන්දය දුන් පාර්ශ්ව බලාපොරොත්තු වෙලා, විශ්වාස කරලා තිබෙනවා, තමන්ගේ සංශෝධන මෙයට ඇතුළත් වෙන්නට ඇති කියලා. දැන් ඔවුන්ගේ විශ්වාසය භංග වෙලා තිබෙනවා. එතකොට ඒ ගොල්ලන් අපේක්ෂා භංගත්වයට පත් වුණාම ඒ අයගෙන් ගත්ත ඡන්දය සාධාරණීකරණය කරන්න නම්, නැවත ආණ්ඩුවට වගකීමක් තිබෙනවා, එම පනත පාර්ලිමේන්තුවට ගේන්න. එහෙම ගෙනැල්ලා තමන් අපේක්ෂා කරන අදාළ සංශෝධනත්, තමන්ට පක්ෂව ඡන්දය දුන් සියලු දෙනාගේ සංශෝධනත් ඇතුළත් කරන්න. එහෙම සදාචාරාත්මක වගකීමක් ආණ්ඩුවට තිබෙනවා. ගරු සභානායකතුමාට අපි ඉතා ඕනෑකමින් කියනවා, අපේ රටේ ආරක්ෂක හමුදාවන්ට එරෙහිව ව්‍යාජ පැමිණිලි නිර්මාණය කරන කාර්යාලයක් මේ පිහිටුවන්නේ කියලා. අද තමුන්නාන්සේලා "එහෙම නැහැ" කියලා කිව්වාට හෙට දවසේ මේක ඇස් පනාපිට ඔප්පු වෙන්න පටන් ගන්නවා. මේක 87-89 කාලයේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව සොයන කාර්යාලයක් නොවෙයි. මේක තනිකරම යුද්ධයේදී ආරක්ෂක හමුදාව කරපු කැපවීම අනෙක් පැත්තට හරවන කාර්යාලයක්; චෝදනා නිර්මාණය කරන ෆැක්ටරියක්. ඒ නිසා කරුණාකරලා මෙබඳු පනතක් ඒ ආකාරයට සම්මත වුවා යැයි සලකන්නේ නැතිව තමුන්නාන්සේලාට සහාය දුන්න පාර්ශ්ව කෙරෙහිවත් අඩුම ගණනේ සලකා බලා අපේ ඉල්ලීම කෙසේ වෙතත්, ඒ පාර්ශ්වයන්ගේ ඉල්ලීමවත් සලකා බලා කරුණාකරලා එම පනත නැවත පාර්ලිමේන්තුවට ගේන්න කටයුතු කරන්න කියලා අපි ඉතාම ඕනෑකමින් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, ගරු මන්ත්‍රීතුමා. ගරු සභානායකතුමා කථා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මම කීප සැරයක්ම කිව්වා, විශේෂයෙන්ම 71, 89 සහ උතුරු - නැඟෙනහිර යුද්ධය පවතින කාලය තුළ ජීවත් වෙච්ච අය මේ විවාදය එනතෙක් බලාගෙන හිටියා කියලා. ඇත්ත වශයෙන්ම මමත් 1971දී නීති ශිෂ්‍යයෙක්. 1989දී තමයි මම Parliament එකට ආවේ. උතුරු - නැඟෙනහිර යුද්ධය පැවති කාලයේ අපි ජීවත් වුණා. මේ විවාදය පවත්වන්න මමත් විශාල උනන්දුවකින් හිටියේ. නමුත් ඒ විවාදය නැවැත්වූයේ කවුද? අපි නොවෙයි නේ ඒ විවාදය නැවැත්වූයේ? අපි නොවෙයි ඒ විවාදය නැවැත්වූයේ. මේගොල්ලන් කියන විධියට මේ පනත වැදගත් පනතක් නම් ඇත්ත වශයෙන්ම මේගොල්ලන් තමන්ගේ පුටුවලට ගිහිල්ලා කරුණු ඉදිරිපත් කරන්න තිබුණා, මේ "වළට" එන්නේ නැතිව.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

අපි එදා මේ ගැන කිව්වා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පාර්ලිමේන්තුවට එන්නේ කථා කරන්න, "වළට" එන්න නොවෙයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

මට එදා විනාඩි 12යි කථා කරන්න ලැබිලා තිබුණේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

හැම දාම "වළට" එනවා. [බාධා කිරීම්] 2016 ජූනි මාසයේ 22වැනිදා තමයි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ, ගරු කථානායකතුමනි. කවුරුවත් මේ පනත් කෙටුම්පතට විරුද්ධව අධිකරණයට ගියේත් නැහැ; no one went to Court.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

අහන ප්‍රශ්නයට උත්තර ලබා දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අහන ප්‍රශ්නයට උත්තර ලබා දෙන්නම්. පසු ගිය ආණ්ඩු කාලයේ රිවර්ඩ් පතිරණ හිටපු ඇමතිතුමා පනත් කෙටුම්පත් 13ක් එක දවසේ සම්මත කළා මට මතකයි. [බාධා කිරීම්] පනත් කෙටුම්පත් 13ක් එක දවසේ සම්මත කළා.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

පනත් කෙටුම්පත් 26ක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

කීයද, ගණන?

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

පනත් කෙටුම්පත් 26ක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමා කියනවා, එක දවසේ පනත් කෙටුම්පත් 26ක් සම්මත කළාය කියලා. බලන්න!

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඒ පනත් කෙටුම්පත් මේ වාගේ පනත් කෙටුම්පත් නොවෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කෙසේ වෙතත් දැන් පරක්කු වැඩියි. ගරු කථානායකතුමනි, ඔබතුමා මේ පනත් කෙටුම්පත සම්මත කරලා දැන් අත්සන් කරලායි තිබෙන්නේ. You cannot reverse the process. ප්‍රමාද වැඩියි. [බාධා කිරීමක්] මොන යාළුවාද? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මේ පිළිබඳව හොයලා බලමු. දැන් ජනතා විමුක්ති පෙරමුණෙන්, -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, සංශෝධන කියෙව්වා නම් ඒ සංශෝධන සියල්ල හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙනවා. ඒ ගාල ගෝට්ටිය මැද්දේ හෝ මම සංශෝධන ටික කියෙව්වා. මම දන්නේ නැහැ, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා සංශෝධන තුනම කියෙව්වාද කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිබඳව සොයා බලා ඒකට විසඳුමක් ලබා දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙහෙමයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake
ගරු කථානායකතුමනි, කාරක සභාවේ සභාපතිවරයා හැටියට ඔබතුමා කියන්න ඕනෑ, "මේ වගන්තිය දැන් තිබෙනවා. දැන් සංශෝධන ඉදිරිපත් කරන්න" කියලා. හැන්සාඩ් වාර්තාව බැලුවාම පෙනෙනවා, කථානායකතුමා කිසිම තැනක එහෙම ප්‍රකාශයක් කරලා නැති බව. අවස්ථා දෙකකදී සංශෝධන ඉදිරිපත් කරන්න කියලා ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ අවස්ථා දෙකේදීම සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. පනත් කෙටුම්පතේ 8වැනි පිටුවේ ඇතුළත්, ඒ අදාළ වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීමේ අවස්ථාව මඟ හැරිලා තිබෙනවා. ඒ නිසා තමයි අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ ඒ සංශෝධනය නැවත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දිය යුතුයි කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපට ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න පුළුවන්. We are prepared to discuss it; අපි ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න සූදානම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
"සාකච්ඡා" කරනවා කියන්නේ මොකක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
"සාකච්ඡා" කරනවා කියන්නේ ඔබතුමාට, -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමන්ලා එකඟ වුණු සංශෝධනය මේ. එකඟතාවට පත් කරපු සංශෝධනය මෙතැන "වළට" බැහැලා දහලපු පිරිසක් නිසා ඉදිරිපත් කරන්න නොහැකි වුණා. ඒගොල්ලන්ට මේ පනත වුවමනා වුණේ නැහැ. ඒගොල්ලන්ට ඕනෑ වුණා වෙන වෙන සෙල්ලම්. මේ මහත්වරු "වළට" බැහැලා අපේ අයිතිය උදුරා ගත්තා. [බාධා කිරීම්] අපට ඒ පනත ඕනෑ වුණා. අපට ඕනෑ වුණු දේ ගැන තමයි මම මේ කියන්නේ. ඔබතුමන්ලාට ඕනෑ වුණු දේ ගැන නොවෙයි නේ මේ කියන්නේ. මට ඕනෑ වුණු දේ ගැන තමයි මම මේ කියන්නේ. ඔබතුමන්ලාට ඕනෑ වුණු දේ ගැන "වළට" බැහැලා කියා ගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සම්බන්ධයෙන් පිළිතුරක් ලබා දෙන්න පුළුවන්ද, ගරු සභානායකතුමා?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ සංශෝධනය ඉදිරිපත් කර ගන්න අපට වුවමනා වුණා. ඒක අපේ අවස්ථාව. ඒක තමයි අපිට වුවමනා වුණේ. වෙන වෙන අයට වෙනත් දේවල් ඕනෑ වුණාට මට කරන්න දෙයක් නැහැ. ඔබතුමන්ලා මේ "වළට" බැහැලා දහලන්න. බඩ පිනුම් ගැහුවත් කමක් නැහැ, ගෙදර ගිහිල්ලා.

ගරු කථානායකතුමනි, අවශ්‍යතාව තිබුණේ මේකයි. ඉතා පැහැදිලි ලෙස සංශෝධන ඉදිරිපත් කර ගන්න අපට අවස්ථාව තිබුණා. මෙතැන දැහලිල්ලක් නිසා ඒ අවස්ථාව කියන්න ඔබතුමාටත් මඟ හැරිලා තිබෙනවා. ඒ නිසා තමයි මම කියන්නේ මේ පනත නැවත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, මේ සංශෝධනය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දිය යුතුයි කියලා. ඒක තමයි අපගේ යෝජනාව.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, normally when an Amendment is brought in, it has to be read out. But, I do not know whether the Hon. Bimal Rathnayake or any other Hon. Member read out the Amendments.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම ඉතා වගකීමෙන් මේ කාරණය කියන්න කැමතියි. මගේ පක්ෂය වශයෙන් මේ පනතට අදාළ කරන සංශෝධන තුනක් සකස් කරලා, අපි ඒ සංශෝධන උදේ වරුවේදී විදේශ කටයුතු අමාත්‍යතුමාට - එතුමා තමයි මේක ඉදිරිපත් කළේ. - ඉදිරිපත් කළා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, ඔබතුමාගේ කාර්යාලයට අපි ඒ සංශෝධන ඇතුළත් පිටපතක් එව්වා. මේ සම්බන්ධව කටයුතු කරන කථානායකතුමාගේ නිලධාරී මහත්වරුන්ටත් සේවක මහත්වරු හරහා මේ සංශෝධන ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, 2016 අගෝස්තු මස 11 වැනි දින හැන්සාඩ් වාර්තාවේ 1333 සහ 1334 තීරු අංක යටතේ ඇතුළත් මගේ කථාවේ මා ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා, අපි ඉදිරිපත් කරපු සංශෝධන තුන කුමක්ද කියලා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා සංශෝධන තුනම කියවා තිබෙනවාද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු සභානායකතුමනි, 2016 අගෝස්තු මස 11 වැනි දින හැන්සාඩ් වාර්තාවේ සඳහන් වන මගේ කථාවේ ඒ සංශෝධන තුනම තිබෙනවා.

ඒ අනුව එදින හැන්සාඩ් වාර්තාවේ 1333 තීරුවේ මෙසේ සඳහන් වනවා:

> ".... 8වැනි පිටුවේ, 21වැනි ඡේළියේ සිට තිබෙනවා, 'දේශීය වශයෙන් හෝ විදේශීය සහ සංස්ථාගත කරන ලදුව හෝ එසේ නොමැති සංවිධානයක් හෝ යම් තැනැත්තෙකු සමඟ අවශ්‍ය යයි' කියලා. .."

ඒ කියන්නේ "ඒ ගිවිසුම්වලට එළඹීමට තිබෙන අයිතිය ඉවත් කරන්න" කියන සංශෝධනය අර ගාල ගෝට්ටි මැද්දේ පිස්සු නටද්දි මගේ කථාවේදී ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු කථානායකතුමා සඳහන් කළ පරිදි වැසිකිළියේ කරන්න ඕනෑ දේවල් මෙතැන කර කර සිටි කට්ටිය මම කථාව ඉදිරිපත් කරන කොටත් ඒ දේවල් කළා.

මම ඒ සංශෝධන මගේ කථාවේදී ඉදිරිපත් කරලා තිබෙනවා; ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාට කලින් ලබා දීලා තිබෙනවා; පනත ඉදිරිපත් කරපු ගරු ඇමතිතුමාට ලබා දීලා තිබෙනවා. එතුමා අපේ සංශෝධනයට එකඟ වුණා. ගරු කථානායකතුමාගේ නිලධාරී මණ්ඩලයටත් ඒ සංශෝධන අපි ලබා දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාටත් මෙය පැහැදිලි ඇති. ගරු කථානායකතුමනි, 2016 අගෝස්තු 11 දින හැන්සාඩ් වාර්තාවේ 1336 තීරුව බැලුවොත් ඔබතුමාටත් මෙය තේරෙනවා. ඔබතුමා "1 සිට 10 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී" කියලා 1 සිට 10 දක්වා වූ වගන්ති එකට ගන්නවා. එතකොට ගරු කථානායකතුමනි, මෙතැන වැසිකිළියේ වැඩය කර කර සිටි කට්ටිය නිසා -අදත් දහලන- ඒක ඔබතුමාට ඇහෙන්නේත් නැහැ, මට ඇහෙන්නේත් නැහැ. ඔබතුමා සංශෝධන ඉදිරිපත් කරන්න කියලා කිව්වාද කියලා මම දන්නේත් නැහැ. ඔබතුමාට මගේ අවංකභාවය ඔප්පු කරන්න අවශ්‍ය නිසායි මම මේ කරුණු කියන්නේ. ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කරුණු ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී කිව්වා වාගේම 2016 අගෝස්තු 11වැනි දින හැන්සාඩ් වාර්තාවේ 1337 තීරුවේ සඳහන් වන ආකාරයට සංශෝධන ඉදිරිපත් කරන්න කියලා ඔබතුමා මට කිව්වාම මම අහනවා, "... 11 වැනි පිටුවද?" කියලා. ඒ අවස්ථාවේදී මම ඔබතුමාට කියනවා, "ගරු සභාපතිතුමනි, මට හරියට ඇහුණේ නැහැ. 8 වැනි පිටුවද, ..." කියලා. ඒ නිසා ගරු කථානායකතුමනි, ඒ අවස්ථාවේ ඔබතුමා සඳහන් කළ දේවල් මට ඇහිලා නැහැ. ඔබතුමා සමහර විට මට සංශෝධන ඉදිරිපත් කරන්න කියලා කියන්නත් ඇති. මෙතැන ගාල ගෝට්ටි කරපු; පාර්ලිමේන්තුවට සුදුසු නැති වචන භාවිත කරපු කණ්ඩායමක් නිසා තමයි මට සහ මගේ පක්ෂයට මේ අවස්ථාව නැති වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්] කරුණාකරලා ඔබතුමන්ලා කට වහගෙන ඉන්න.

ගරු කථානායකතුමනි, මේ සංශෝධනය අපට ඒ අවස්ථාවේදී ඉදිරිපත් කරන්න බැරි වන්නේ අපට ඒක අනවශ්‍ය නිසා නොවෙයි. මීට කලින් අපි ඒ සංශෝධන හැම විධියකටම ඉදිරිපත් කළා. නමුත්, මේ සභාවේ ඒ වෙලාවේ ඇති වූ තත්ත්වය නිසායි අපට ඒ සංශෝධන ඉදිරිපත් කරන්න නොහැකි වුණේ. ගරු ඇමතිතුමනි, 2016 අගෝස්තු 11 හැන්සාඩ් වාර්තාවේ මම කථාව අවසන් කරන්නේත් "...සංශෝධනවලට යටත්ව මේ පනත් කෙටුම්පත වෙනුවෙන් අපේ සහයෝගය ලබා දෙන බව. අපි ආණ්ඩුවට බලකර කියා සිටිනවා, ..." කියලායි. ඒ නිසා අපේ අයිතිය තමයි මෙහිදී නැති කරලා තිබෙන්නේ. අපේ අයිතිය නැති කළේ ගරු කථානායකතුමා නොවෙයි. අපේ අයිතිය නැති කළේ සුළු කල්ලියක්. දේශපාලන සදාචාරය අනුව හා එකඟ වූ පරිදි අප ලබා දුන් සංශෝධනය ඉතා වැදගත් සංශෝධනයක්. ගරු කථානායකතුමනි, ඒ නිසා එම සංශෝධනය පිළිගෙන එය නැවත මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට දැන් එකඟ වන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. එහෙම නැතිව මේ සම්බන්ධයෙන් නැවත නැවත සාකච්ඡා කරන්න දෙයක් නැහැ. ඔබතුමන්ලා මේ සංශෝධනයට එකඟ වෙලායි සිටියේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මේ වන විට පනත් කෙටුම්පත සම්මත වෙලා අවසන්. [බාධා කිරීම්] ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කියන සංශෝධනය ගේන්න නම්, පනත නැවත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. We will have to bring it as an amendment to the Office on Missing Persons (Establishment, Administration and Discharge of Functions) Act. එදා සම්මත වූ පනතට සංශෝධනයක් හැටියට නැවත මේ සංශෝධනය ගේන්න ඕනෑ. මෙතුමා කියන දේ මම පිළිගන්නවා. හැබැයි, මම විෂයය භාර ඇමතිතුමා එක්ක සාකච්ඡා කරලා ඉතාමත් ඉක්මනින් මේ සම්බන්ධයෙන් පිළිතුරක් දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒකට විසඳුමක් ලබා දුන්නොත් හොඳයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

වැරැද්දක් වෙලා තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I will have to consult the Minister.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, it is better that you consult the Minister concerned. ඒකට සාධාරණයක් ඉෂ්ට කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන එක මම පිළිගන්නවා. But I will have to consult the relevant Minister.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව රෙගුලාසි සකස් කරන්න කියලා මේ පනතටම අදාළව අධිකරණ ඇමතිතුමාට යම් කිසි බලතල ප්‍රමාණයක් පවරා තිබෙනවා. ඒ වාගේම විදේශ කටයුතු අමාත්‍යාංශයටත් මේ සම්බන්ධව රෙගුලාසි සකස් කරන්න කියලා තිබෙනවා. ඒකට මාස තුනක කාලයකුත් ලබා දීලා තිබෙනවා. ඒ අනුව මේ ආයතනය ස්ථාපිත වෙලා ක්‍රියාත්මක වන්නේ ස්ථිරවම තව මාස තුනකට පස්සේයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් ආණ්ඩුවට ඕනෑ තරම් කල් තිබෙනවා. ගරු කථානායකතුමනි, අය වැයට කලින් මේ පනතට සංශෝධන ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, එතකොට පනත ක්‍රියාත්මකවීමට බාධාවක් නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා කියන එක මම පිළිගන්නවා. ඔබතුමන්ලා සංශෝධන තුනක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වූ බවත් මම දන්නවා. එම නිසා මම විෂයය භාර ඇමතිතුමා එක්ක කථා කරලා අය වැයට කලින් මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ප්‍රශ්නය අවසානයක් කරමු. මේක සාධාරණ ඉල්ලීමක්.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු කථානායකතුමනි, මේ පනත ඉදිරිපත් කරපු වෙලාවේ එක දවසේ 13ක්, 26ක් කියන කථාව- [බාධා කිරීම්] I am repeating that; I am not disputing that. ඒ සම්බන්ධව මෙතැනට අදාළ වන්නේ නැහැ. මොකද, මේ පනත අපි දකින විධියට අතිශයින්ම වැදගත් පනතක්. ඒ වාගේම එය ශ්‍රී ලංකාව සහ ඇමෙරිකාව එකට එකතු වෙලා එක්සත් ජාතීන්ගේ සංවිධානයට දුන් යෝජනාවේ හතරවැනි වගන්තියේ පැහැදිලිව තිබෙන commitment එකක්. එහෙම නැත්නම් ශ්‍රී ලංකා රජය භාර ගෙන තිබෙන වැඩ කොටසක්. ඒ නිසා මේ පනත ඒ සම්බන්ධයෙන් අතිශයින් වැදගත් වන තීන්දුවක් හැටියට අපි සලකනවා.

ගරු කථානායකතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා හැම වෙලාවේම කියන කථාවක් තමයි අපි උසාවි නොගිය එක. ඒ එක්කම ගරු අගමැතිතුමා ඊට පසුවදා LAWASIA Conference එකේදී කළ කථාවේදී මෙහෙම කියනවා:

"I am surprised why the Opposition did not go to courts on this matter." So, obviously and consciously, he knew that there were some contentious issues. He himself mentioned that in his speech at the LAWASIA Conference.

ගරු කථානායකතුමනි, මේ සිදුවීම් සියල්ල අතර, -අපි නොවෙයි.- විවිධ පක්ෂ විසින් එම පනත් කෙටුම්පතට අදාළව සංශෝධන 31ක් මේ ගරු සභාවට ගෙනැල්ලා තිබුණා. මෙතුමන්ලා 17ක්, ජනාධිපතිතුමාගේ කියලා මහින්ද සමරසිංහ මැතිතුමා සංශෝධන 4ක්, ජනතා විමුක්ති පෙරමුණෙන් 3ක්, සුමන්තිරන් මන්ත්‍රීතුමා 7ක් ආදී වශයෙන් සංශෝධන 31ක් ගෙනැල්ලා තිබුණා. ගරු කථානායකතුමනි, ඔබතුමා හොඳටම දන්නවා, කාරක සභා කාල පරිච්ඡේදය තුළ අහවල් වගන්තියේ අහවල් පේළියේ සිට අහවල් පේළිය දක්වා කියලා ඒ සංශෝධන 31කට සභාවේ අනුමැතිය ගන්න ඕනෑය කියන එක. එතකොට සභාව "Aye" කිව්වාම ඔබතුමා ඒ සංශෝධනය ඇතුළත් කරලා ස්ථිර කරනවා. එදා එවැනි සිදුවීමක් වුණේ නැහැ. එයට නිදහසට කරුණක් හැටියට ඉදිරිපත් කරන, වළට බැහැලා කළ ක්‍රියාවලිය සම්බන්ධ කාරණාවෙන් අපි ඉවත් වන්නේ නැහැ. ඒ වූ දේ සත්‍යයක්. ඒක කවුරුත් දැක්කා.

We are not withdrawing from that situation. But that does not mean, when such a situation takes place, that you can completely do away with the normal procedure of the Parliamentary activities. That is what has happened in this whole issue. I, as one of the Members of Parliament who was in the Well of the House, accept that that has created a serious concern. But, at the same time, that does not mean that you should do away with all the procedures and traditions of Parliament, which has taken place. Hon. Speaker, you are aware of it and certainly, you were aware that the Hansard Department was also finding it difficult to report.

To my knowledge, out of the 31 amendments, there were only two that were moved. Therefore, this matter needs reconsideration to see as to how we could make these errors right and get it passed. As the Hon. Speaker said, the Government has 171 Members. Therefore, obviously it will go through. But in fairness to the Parliamentary procedures and traditions, I think it is best that you give an opportunity after consultation with the Minister concerned, and the Hon. Leader of the House could certainly consider it.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මට කියන්න තිබෙන්නේ, people who complain must come with clean hands.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු කථානායකතුමනි, ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ඕනෑ විධියට විවාද කරන්න අවස්ථාව දීලා තිබුණා. ඕනෑ තරම් සාකච්ඡා කරලා ඒක සම්මත කරන්න තිබුණා. මෙතැන මී හරක් ටික පැන්නා වාගේ කටයුතු කළාම ගරු කථානායකතුමනි, අපේ ආත්ම ගරුත්වයත් නැති වෙනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීවරුනි, විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් මැති ඇමතිවරුන් මේ කාරණය ගැන පැහැදිලි කළා. විශේෂයෙන්ම අද විපක්ෂය බොහොම සාමකාමීව, බොහොම ගරුත්වයෙන් කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී මගේ ගෞරවය පුද කරනවා. ඒ වාගේම එදා ගරු මන්ත්‍රීවරු බොහෝ දෙනකුට කථා කරන්න අවස්ථාව ලැබුණේ නැහැ. ඒ ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. ගරු විමල් වීරවංශ මැතිතුමාගේ, ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමාගේ, ගරු විපක්ෂ නායකතුමාගේ, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ ගණනකගේ, විපක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ ගණනකගේ, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ කණ්ඩායමේ බොහෝ දෙනකුගේ නම් කථික ලැයිස්තුවේ තිබුණා. ඒ වාගේම තමයි එදා වෙලාව වෙන් කර තිබුණු ආකාරය. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ වෙලාවෙන් හරියටම සියයට 50ක් ඔබතුමාගේ පක්ෂයට වෙන් කර තිබුණා. මෙතැනදී ඔබතුමන්ලා දැන ගන්න ඕනෑ, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත රටක ප්‍රධාන ලක්ෂණය රජයේ හදිසි කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දීමයි කියන එක. ඒ අනුව මෙම පනත් කෙටුම්පත විවාදයට ගැනීම හදිසි කටයුත්තක් කියලා රජය තීරණය කළා. කථානායකවරයා වශයෙන් මට පක්ෂග්‍රාහී වෙන්න බැහැ. කථානායකවරයා වශයෙන් මට බහුතර මතය අනුව ක්‍රියා කරන්න වෙනවා. එදා පක්ෂ නායක රැස්වීමේදී පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 173 දෙනෙක් නියෝජනය කරන දේශපාලන පක්ෂ නායකයින් මෙම පනත් කෙටුම්පත විවාදයට ගැනීමේ අවස්ථාව ගැන කථා කළා. ඒ අනුව රෑ 10 වන තෙක් හෝ 12 වන තෙක් හෝ විවාදය පවත්වන්න පුළුවන් බව අපේ ඒකාබද්ධ විපක්ෂයේ නායකතුමාට සඳහන් කළා.

නමුත් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී මේ බාධාව සිද්ධ වුණේ ඇයි? මම ආයාචනා කළා, "කරුණාකරලා මේ සභා ගැබට එන්න එපා, අපි මේක කථා කරලා විසඳා ගනිමු." කියලා. නමුත් සභා ගැබට ආවා. මුලදී මම කථා කරන්න අවස්ථාව ලබා දුන්නා. ඊට පස්සේ මැද හරියට එන කොට කථා කරන්නත් බැරි තත්ත්වයට ආවා. බජව් දමන්න පටන් ගත්තා. "හූ" කියන්න පටන් ගත්තා. කොහොමවත් පාලනය කරන්න බැරි වුණා. ඒ නිසා තමයි කථා කරන්න අවස්ථාව දෙන්න ලැබුණේ නැත්තේ. අවසානයේදී කථා කිරීමේ අවස්ථාව ලබා දීම සඳහා මා සියලු දෙනාටම ආයාචනයක් කළා. මොකද, මට මතකයි, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමාත්, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාත් කථා කරන්න අවස්ථාව ඉල්ලුවාය කියලා. එතුමන්ලාට කථා කිරීමේ අවස්ථාව දෙන්න, කරුණාකරලා සභා ගැබ මැද සිටි මන්ත්‍රීතුමන්ලාට ආපසු තමන්ගේ ආසනවලට යන්න කියලා කිව්වා. කවුරුත් ඒක කළේ නැහැ. මෙතැනදී වැරැදි කවුද කියන එක මම කියන්නේ නැහැ. ඒ වැරැද්ද වුණේ කාගෙන්ද කියලා තේරුම් ගන්න ගරු සභාවට අයිතිය තිබෙනවා.

ඒ පනතේ වලංගුභාවය සම්බන්ධයෙන් කථා කරද්දී මා මෙය සඳහන් කරන්න ඕනෑ. ඒ පනතට කැබිනට් අනුමැතිය ලැබී තිබෙනවා. නීතිපතිතුමාගේ අනුමැතිය ලැබී තිබෙනවා, පනත් කෙටුම්පතත්, කාරක සභා අවස්ථාවටත්. ඒ වාගේම මා ක්‍රියා කළේ පැරණි ක්‍රියාදාමයන් අනුවයි. පාර්ලිමේන්තුව පැවැත්වෙන දවසක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 45ක් වියදම් කරනවා. ඒ මුදල් නාස්ති කරලා, මේ පාර්ලිමේන්තුව නිකම් අයාලේ යවන්න මට බැහැ. මෙවැනි සිද්ධි ඉතිහාසය තුළ සිදු වෙලා තිබෙනවා. මගේ හෘදය සාක්ෂිය අනුව මා දන්නවා, අවස්ථානුකූලව මා කළේ නිවැරැදි දේයි කියලා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ගැන අපට argue කරන්න පුළුවන්. නමුත් මේකයි මතය. [බාධා කිරීම්] එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ ප්‍රකාශයට මා ඉතා සාවධානව ඇහුම්කන් දුන්නා. ඔබතුමා කිව්වා, ඉතාම වැදගත් කරුණක්. මමත්, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමාත් ඒ අවස්ථාවේදී කථා කරන්න අවස්ථාවක් ඉල්ලුවාය, කථා කරන්න අවස්ථාව දෙන්න නම් සභා ගැබ මැද හිටපු මන්ත්‍රීවරුන්ට තමන්ගේ ආසනවල වාඩි වෙන්න කියලා ඔබතුමා ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කළාය, ඒක ඉටු වුණේ නැහැයි කියලා ඔබතුමා කිව්වා. ගරු කථානායකතුමනි, මේ සභාවේ 225දෙනාගෙන් එක් කෙනකු හැටියට මට එතැනදී ප්‍රශ්නයක් මතු වෙනවා, කිසියම් මන්ත්‍රීවරුන් පිරිසක් සභා ගැබ මැද සිටීම, කෑ කෝ ගැසීම මගේ කථාව පමණක් ලබා නොදීමට කොන්දේසියක් කර ගන්න එක සාධාරණද කියලා. එහෙම කොන්දේසියක් වෙන්න බැහැ, ගරු කථානායකතුමනි. ඒක මගේ අයිතිය. කවුරුන් කෑ ගැහුවත්, කවුරුන් සභා ගැබ මැද සිටියත්, කථාව කරන්න අවස්ථාව මා ඉල්ලනවා නම්, මා කියපු දේ ඔබතුමාට ඇහුණා නම් - ඔබතුමාට ඇහුණු බව ඔප්පු වුණා, දැන් ඔබතුමා කියපු කථාව අනුව. මා මෙතෙක් වේලා හිතාගෙන සිටියේ ඇත්තටම ඔබතුමාට ඒක ඇහෙන්න නැතුව ඇති කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ඇහුණේ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා මීට කලින් කළ ප්‍රකාශයේදී කිව්වා, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමාත්, මමත් කථා කරන්න අවස්ථාවක් ඉල්ලුවාය, නමුත් සභා ගැබ මැද හිටපු අය - [බාධා කිරීමක්] අන්න අර මන්ත්‍රීතුමාට ඇමති තනතුරක් ඉල්ලා දෙන්න, ගරු කථානායකතුමනි. මේක හරි කරදරයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එය මට අයිති දෙයක් නොවෙයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
පව් පොඩි එකා!

ගරු කථානායකතුමනි, මා අහන්නේ, - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
සභා ගැබ මැද ඉන්න මන්ත්‍රීවරුන් ආසනවල වාඩි කරවීමේ කොන්දේසියට යටත්ව මට කථාවක් කරන්න දෙනවාය කියන එක වැරැදියි නේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. ඔබතුමාට පමණක් නොවෙයි, විපක්ෂ නායකතුමාටත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් කථා කරන්න තිබුණා. නමුත් ඒ අවස්ථාවේ කථා කිරීමට සුදුසු වාතාවරණයක් තිබුණේ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ අවස්ථාවේදී කථා කරන්න අවස්ථාව ඉල්ලුවේ අපි දෙදෙනායි. කථා කරන්න අවස්ථාව ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා ඉල්ලුවා; මම ඉල්ලුවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අවස්ථාවේදී කථා කරන්න සුදුසු වාතාවරණයක් නොවෙයි තිබුණේ. ඒක නිසයි මම එවැනි තීරණයක් ගත්තේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එහෙම නම්, කථා කරන්න නුසුදුසු වාතාවරණයක් තුළ ගරු මංගල සමරවීර විදේශ කටයුතු ඇමතිතුමා කථා කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම කියන එක වැරදියි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කථා කරන්න නුසුදුසු වාතාවරණයක් තුළ -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මුලදී එවැනි තත්ත්වයක් තිබුණේ නැහැ. ඊට පස්සේ තමයි බජව්ව පටන් ගත්තේ; "හූ" කියන්න පටන් ගත්තේ. ඒකයි කථා කරන්න අවස්ථාව දෙන්න බැරි වුණේ. අපට argue කරන්න පුළුවන්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නැහැ, නැහැ. ගරු කථානායකතුමනි, ඒ අවස්ථාවේදී ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා කථා කළා; ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් කථා කළා. ඒ අවස්ථාවේදීත් සභා ගැබේ ඔය කියන නොඇසුන්සුන්තාව තිබුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. ඒ අවස්ථාවේදී බජව් දමන තත්ත්වයට ඇවිල්ලා තිබුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා ඒක පිළිගන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
බජව් නම් දැම්මේ නැහැ. මා හිතන හැටියට ඔබතුමා ඒ පැත්තට පොඩි අවලාදයක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහි වරද කාගේද කියන එක මේ ගරු සභාවට තීරණය කරන්න කියලා මම කියනවා. මම කාටවත් ඇහිල්ල දික් කරන්නේ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මා කියන්නේ, මගේ අයිතිය ඔබතුමා පැහැර ගෙන තිබෙනවාය කියලායි. මම කථා කරන්න අවස්ථාව ඉල්ලද්දී ඔබතුමා කොන්දේසියක් දමලා තිබෙනවා, "මේ මන්ත්‍රීවරුන් වාඩි වුණා නම් කථා කරන්න අවස්ථාව දෙන්නම්" කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කථා කරන්න අවස්ථාව දෙන්න සුදුසු වාතාවරණයක් තිබුණේ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒක මගේ වරප්‍රසාද උල්ලංඝනය වීමක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරන්න දෙයක් නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මගේ වරප්‍රසාද ඔබතුමා ම උල්ලංඝනය කරනවා නම් කාට කියමිද, මේ නඩුව?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම කිව්වේ ඒකයි. ඔබතුමාට පමණක් නොවෙයි, විපක්ෂ නායකතුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් කිහිපදෙනකුට කථා කරන්න අවස්ථාව නොලැබුණු නිසා තමයි මම ඒ ගැන කනගාටුවත් ප්‍රකාශ කළේ. ඒකට වග කිව යුත්තේ මම නොවෙයි. ඒකයි මම කිව්වේ, ගරු සභාවට ඒක තීරණය කරන්නය කියලා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කරුණට අදාළ දෙයක් නම් කියන්න, මන්ත්‍රීතුමනි. දැන් ඒ කාරණය අවසාන කරන්නයි හදන්නේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, එදා තිබුණේ රටට ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳව සාකච්ඡා කරන්නයි. ඒ සඳහා දවස් දෙක-තුනක් ලැහැස්ති වෙලා, මමත් කථා කරන්නයි බලාපොරොත්තුවෙන් සිටියේ. මමත් කථා කරන්න අවස්ථාව ඉල්ලුවා. මටත් අවස්ථාව ලබා ගන්න බැරි වුණා. සභා ගැබ මැදට ඇවිල්ලා මෙය කෝලම් මඩුවක් කර ගත්තේ අපි නොවෙයි. මේ මන්ත්‍රීතුමන්ලා තමයි එදා මේ සභාව කෝලම් මඩුවක් කර ගත්තේ. මේ සභාව මැද අසූචි පුරවලා, සරම් උස්සා ගෙන, සාරි උස්සා ගෙන නැටුවේ අපි නොවෙයි, එතුමන්ලායි. එය අපේ වරදක් නොවෙයි. අපටත් කථා කරන්න බැරි වුණේ ඔබතුමන්ලාගේ කෝලම් මඩුව නිසායි. ඔබතුමන්ලාට විතරක් නොවෙයි, අපටත් එදා විවාදයට කථා කරන්න බැරි වුණා. එදා තිබුණේ වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳව සාකච්ඡා කරන්නයි. එදා රටට වැදගත් පණිවුඩයක් දෙන්න තිබුණු දවසක්. ඒ පණිවුඩය දෙන්න බැරිව ගියා. ඔබතුමන්ලාට කථා කරන්න කරුණු නැති නිසා ඔබතුමන්ලා මේ සභාව කෝලම් මඩුවක් කර ගත්තා. ඒකයි වුණේ. ඇත්ත කථා කරන්න. දැන් බොරුවට වෙලාව ඉල්ලනවා. ඒකයි ඇත්ත තත්ත්වය.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමා දැන් වාඩිවෙන්න, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා. එතුමාගේ අදහස් දැක්වීමෙන් පසුව අපි ප්‍රධාන කටයුතුවලට යනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, මම නියෝජනය කරන්නේ ඒකාබද්ධ විපක්ෂයේ වෙනම පක්ෂයක්. මගේ පක්ෂයේ අදහස ප්‍රකාශ කරන්න තමයි මම ඔබතුමාගෙන් එදා අවස්ථාව ඉල්ලුවේ.

ගරු කථානායකතුමනි, මා අත ඇති 2016 අගෝස්තු 12වන දා හැන්සාඩ් වාර්තාවෙහි තීරු අංක 1366 හි මා කියූ දෙය මෙලෙස සඳහන් වනවා: "ගරු කථානායකතුමනි, මම මගේ ආසනයට ඇවිල්ලා තමයි point of Order එක ඉල්ලුවේ."

ගරු කථානායකතුමනි, එවිට ඔබතුමා මෙලෙස කිව්වා: "ඔබතුමා විතරයි ආසනයේ හිටියේ. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුත් අසුන්වල වාඩි වුණා නම් ඔබතුමාට අවස්ථාවක් දෙන්න තිබුණා."

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. හරි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අනෙක් අය වාඩි වුණේ නැති නිසා මගේ අදහස ප්‍රකාශ කරන්න තිබෙන අයිතිය මට අහිමි වුණා. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන මන්ත්‍රීවරයකු හැටියට මම ගරු කථානායකතුමාගෙන් ඉතා ගෞරවයෙන් අහනවා, "ඒක සාධාරණද?" කියා සහ "අනෙක් අය අසුන්වල නොසිටි නිසා මගේ මතය ප්‍රකාශ කරන්න මට අවස්ථාවක් නොදීම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට ගැළපෙනවාද?" කියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් මට අහන්න තිබෙන්නේ, "එවැනි අවස්ථාවක බාධා කිරීමත් සම්ප්‍රදායට අනුකූලද?" කියන එකයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මම මගේ අසුනට ඇවිත්- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සියල්ලම කඩ කරමින්, සීලාචාර සමාජයක - [බාධා කිරීම්] - ඒකයි මා කනගාටුව ප්‍රකාශ කළේ, සියලුදෙනාට. එදා ගරු මන්ත්‍රීවරුන් විසිදෙනකුට විතර කථා කරන්න බැරි වුණා. ඒ තත්ත්වය තුළ කථා කිරීමේ හැකියාවක් තිබුණේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, we have Business of the day. දවසේ ඉදිරි වැඩ කටයුතු තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, එවැනි අසාධාරණයන් ඉදිරියටවත් නොකරන්න වග බලාගන්න කියා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එය දෙපාර්ශ්වයෙන්ම සිදු විය යුතු දෙයක්, ගරු මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අදහස්, විවේචන සහ සංශෝධන මේ පාර්ලිමේන්තුවේදී එකක්වත් අද මතු වුණේ නැහැ, ඒ පනත සම්බන්ධයෙන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද කටයුතු කළ විධියට ක්‍රියා කරනවා නම් කිසි ප්‍රශ්නයක් නැහැ. අද බොහොම ලස්සනට කටයුතු කෙරීගෙන ගියා. අද මම මගේ ආචාරය සියලුදෙනාට පුද කරනවා.

මීළඟට, යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මට යුක්තියක් ඉටු නොවීම ගැන මම කනගාටු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ අංක 1, සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවැනි වර කියවීම.

ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. P. Harrison to move Item No. I.

සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත
விலங்குத் தீனி (திருத்தம்) சட்டமூலம்
ANIMAL FEED (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 3.22]

ගරු පී. හැරිසන් මහතා (ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ஹரிசன் - கிராமியப் பொருளாதார அலுவல்கள் பற்றிய அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Rural Economic Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දීර්ඝ වේලාවකින් පසුව හෝ අපේ අමාත්‍යාංශයේ මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අද අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට මගේ ස්තුතිය පළමුවෙන්ම පිරිනමන්න කැමැතියි.

1986 අංක 15 දරන සත්ව ආහාර පනතට සංශෝධන ගෙන එමින් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න විශේෂ කාරණයක් තිබෙනවා. සත්ත්ව නිෂ්පාදන නැතිවම බැරි තත්ත්වයක් අද රටේ උදා වී තිබෙනවා. මනුෂ්‍ය පරිභෝජනයේදී යොදා ගන්නා සත්ත්ව ආහාර පිළිබඳ අණ පනත් විවිධ විධියට සම්මත කරන්න දශක ගණනාවක් තිස්සේ අවශ්‍ය වෙලා තිබුණත් ඒ හා සම්බන්ධ තෝරාගැනීම පිළිබඳව පැවැති යම් යම් ගැටලුකාරී තත්ත්වයන් නිසා ඒ කටයුත්ත ක්‍රමක්‍රමයෙන් ප්‍රමාද වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා තමුන්නාන්සේට මතක් කරන්න කැමැතියි, 1998දී සත්ව ආහාර පනත ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලැබුවත් විටින් විට කෙරුණු යම් යම් සංශෝධන සමඟ ඒ පනත ඉදිරියට යද්දී 2004දී අදාළ උපදේශක කාරක සභාවේදී යම් යම් ප්‍රශ්න මතු වූ නිසා, ඒ පනත අභියෝගයට ලක් කරමින් ගත් තීන්දු නිසා ඒ පනතට නැවත සංශෝධනයක් අවශ්‍ය බව අපි පිළිගෙන තිබෙන බව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සත්ත්ව ආහාර සම්බන්ධයෙන් කථා කරද්දී කිව යුතු කරුණක් තිබෙනවා. වසර 65ක කාලයක් තිස්සේ පැවැති තත්ත්වය මොකක්ද? ඒ කාලයේ මෙට්‍රික්ටොන් 7,500ක් වාගේ බොහොම පොඩි ප්‍රමාණයකින් තමයි රටේ සත්ත්ව ආහාර නිෂ්පාදනය කෙරුණේ. මාංස පරිභෝජනය කරන්න කලින් බොහෝ වෙලාවට ගෘහස්ථ කර්මාන්තයක් හැටියට තමයි මෙය ක්‍රියාත්මක වෙමින් තිබුණේ. එහෙත් අද තත්ත්වය ඊට වඩා හුඟක් වෙනස් වෙලා තිබෙනවා. අද වන විට වාර්ෂිකව මෙට්‍රික් ටොන් ලක්ෂ නවයකට ආසන්න ප්‍රමාණයක් සත්ව ආහාර නිෂ්පාදනය කිරීමට අපේ රටේ ජනතාව යොමු වී තිබෙනවා. එම නිසා මේ වැඩ පිළිවෙළ ක්‍රමවත් විධියට ගෙනයාම සඳහාත්, රටේ පොදු මහජනතාවට අවශ්‍ය පෝෂ්‍යදායී තත්ත්වය ලබා දීම සඳහාත් සත්ව ආහාර පනතට යම් යම් සංශෝධන එකතු කිරීම තුළින් අමාත්‍යාංශයක් හැටියට තීන්දු තීරණ ගන්න සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ සත්ව ආහාර කිව්වාම, බහුතරයක් කථා කරන්නේ කුකුළන් ඇති කිරීමේ කර්මාන්තය සම්බන්ධවයි; කිරිගව කර්මාන්තය සම්බන්ධවයි. ඊට අමතරව සත්ව කර්මාන්තය ගත්තාම, සූරතල් සතුන් ඇති කිරීමේ කර්මාන්තය, මත්ස්‍ය කර්මාන්තය වාගේ විවිධ අංශවලට මේ කාර්යය බෙදී යනවා. දේශීය වශයෙන් අද අපේ රටේ කුකුළු මස් පරිභෝජනය වැඩි වී තිබෙනවා. සාමාන්‍යයෙන් අපේ රටේ එක පුද්ගලයෙකුගේ වාර්ෂික කුකුළු මස් පාරිභෝජනය කිලෝ 8ක් විතර වෙනවා. සමස්තයක් හැටියට කිලෝ අටක ප්‍රමාණය තිබුණත් ඉදිරියේදී එය කිලෝ 10ක පමණ ප්‍රමාණයකට ළඟා වේය කියා අප බලාපොරොත්තු වෙනවා. එසේ නම් මේ කර්මාන්තය වෙනුවෙන් අපට වැඩි අවධානයක් යොමු කරන්නට සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම සත්ව ආහාර පනතට ප්‍රධාන වශයෙන් ගෙනෙන සංශෝධන හැටියට දක්වන්නට පුළුවන් කාරණයක් තමයි, දේශීය වෙළෙඳ පොළේ විකිණීමට නොමැති වුවද, සත්ව ආහාර නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සියලුම අමු ද්‍රව්‍ය සහ ආකලනයන් සඳහා නීති පැනවීම. එය අත්‍යවශ්‍ය වී තිබෙනවා. ඒ වාගේම ආනයනික සත්ව ආහාරද ඒ සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය සහ ආකලනයන් සඳහාද නීති පැනවීම පනතේ නියමයන්ට යටත්ව සංශෝධන වශයෙන් එකතු කිරීමට අවශ්‍ය වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම විවිධ සත්ව ආහාර හා සත්ව කාණ්ඩ නියෝජනය වන පරිදි පනතේ වගන්ති ප්‍රකාර පත්කරන ලද ජාතික සත්ව ආහාර උපදේශක කමිටුවේ සාමාජික සංඛ්‍යාව වැඩි කිරීම අවශ්‍ය වෙලා තිබෙනවා. මම තමුන්නාන්සේට මතක් කරන්නට ඕනෑ, මෙතෙක් කල් මේ උපදේශක කමිටුවේ සාමාජික සංඛ්‍යාව පස් දෙනෙකුට සීමා වෙලා තිබුණු බව. මේ සත්ව ආහාර නිෂ්පාදනය පුළුල් වෙනවාත් එක්කම -ව්‍යාප්ත වීමත් එක්කම- ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළව විශේෂ දක්ෂතා සහ හැකියාවන් තිබෙන අයගේ සේවාවන් ලබාගැනීමට අපට අවශ්‍ය වෙලා තිබෙනවා. එම නිසා උපදේශක කමිටුවේ සාමාජික සංඛ්‍යාව පස් දෙනාගේ සිට අට දෙනා දක්වා වැඩි කිරීමට සංශෝධන ඉදිරිපත් කිරීමටත් බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සත්ව ආහාර පනත යටතේ පත් කරන ලද බලයලත් නිලධාරීන්ගේ බලතල තවදුරටත් වැඩි කිරීම තුළින් පනත් කෙටුම්පතේ හා ඊට ආනුෂංගික කරුණු පිළිබඳ නීතිය ක්‍රියාත්මක කිරීම මඟින් සත්ව ආහාරවල සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීමට බලාපොරොත්තු වෙනවා. සත්ව ආහාර පනත අනුව ඒ නිලධාරීන්ට ලබා දී තිබුණු බලතල සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් ගැටලුවක් ඇතිවෙලා තිබෙනවා. ඒ අයට තමන්ගේ රාජකාරිය හරිහැටි ක්‍රියාත්මක කිරීමේදී විවිධ දුෂ්කරතාවලට ලක්වෙන්නට සිදු වුණු අවස්ථා තිබුණා. එම නිසා අප තීන්දු කළා, මේ අලුත් සංශෝධන තුළින් ඒ අයගේ බලතල වැඩි කරන්න. බලතල වැඩි කරනවා වාගේම ඒ අයට තමන්ගේ රාජකාරිය හරියාකාරව ඉටු කර ගැනීමටත් මෙයින් අවස්ථාවක් ඇති වී තිබෙනවාය කියන එක මම ඔබතුමාට මතක් කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම 1986 අංක 15 දරන සත්ව ආහාර පනතේ දඩ මුදල සම්බන්ධයෙන් අපට ගැටලුවක් -ප්‍රශ්නයක්- ඇති වී තිබුණා. පනතේ නියමයන් කඩ කරන්නන්ට එරෙහිව පනවා තිබුණේ රුපියල් දහසක දඩයක්. අද කාලයේ හැටියට එය ප්‍රමාණවත් නොවෙනවාය කියන එකයි අපේ හැඟීම. දැනට අවුරුදු විස්සකට තිහකට එහා ගත් තීන්දුවක් අද වෙනකොට වෙනස් විය යුතුව තිබෙනවා. මොකද, මේවා දැන් ගෘහස්ථ කර්මාන්තයකට එහා ගිය මහා පරිමාණ කර්මාන්ත බවට පත් වෙලා තිබෙනවා. හත්ලක්ෂ පණස් දාහකට වැඩි පිරිසක් වෘත්තීයමය වශයෙන් මේ ක්ෂේත්‍රයේ නියැලී සිටිනවා. ඒ වාගේම ආහාර නිෂ්පාදනය වෙනුවෙන් දැනට අපේ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ ප්‍රධාන වශයෙන් සත්ව ආහාර නිෂ්පාදන කර්මාන්තායතන හිමි පුද්ගලයන්ගේ සංඛ්‍යාව තිහකට හතළිකට ආසන්න වෙනවා. ඒ නිසා පුළුල් විධියට මේ කර්මාන්තය ව්‍යාප්ත වෙලා තිබෙනවා. එම නිසා මේ දඩ මුදල ප්‍රමාණවත් නොවෙනවාය කියන එකයි අපේ පෞද්ගලික හැඟීම. යම් කිසි කෙනෙක් නීති කඩ කරනවා නම්, එවැනි පුද්ගලයෙක් සඳහා රුපියල් 50,000කට නොඅඩු සහ රුපියල් 250,000 නොඉක්මවන දඩ මුදලක් නියම කිරීමට අපි මෙම සංශෝධන පනතින් බලාපොරොත්තු වෙනවාය කියන එකත් මම මේ අවස්ථාවේ මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ තීන්දු තීරණත් එක්ක සත්ව ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම රටේ ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාගන්න තිබෙන එකම මඟ හැටියට දේශීය වශයෙන් සත්ව ආහාර නිෂ්පාදනය අද අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කුකුළු මස් පරිභෝජනය, අපට ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරා ගැනීමට තිබෙන එක් ප්‍රධාන මාර්ගයක්. ශාක ආහාරවලින් ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරා ගන්න තිබෙන ඉඩකඩ ඉතාමත්ම අඩුයි. බොහෝ වෙලාවට අපට තිබෙන ලාභදායී ක්‍රමය නිසාත්, සත්ව ආහාර ලබා ගැනීමේ ඇති පහසුව නිසාත් ප්‍රෝටීන් ලබා ගැනීමේදී සත්ව ආහාර කෙරෙහි අපේ රටේ ජනතාවගේ අවධානය යොමුවෙලා තිබෙනවා. ඒ නිසා සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව යම් යම් කරුණු කාරණා ඉදිරිපත් කරනවා වාගේම මේ පනත් කෙටුම්පතට සංශෝධන එකතු කරන්නත් අප බලාපොරොත්තු වෙනවා. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විධියට විශේෂයෙන්ම එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට තමන්ගේ කාර්ය භාරය ඉතාම සාර්ථකව ඉදිරිපත් කරන්න පුළුවන් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි රටක් හැටියට ගත්තොත් අද අපේ රට කුකුළු මස්වලින් ස්වයංපෝෂිත වෙලා තිබෙනවා කියන එකත් මම තමුන්නාන්සේට කියන්න ඕනෑ. විශේෂයෙන්ම ඉදිරි වර්ෂවලදී කුකුළු මස් අපනයනය කිරීමට අප බලාපොරොත්තු වෙනවා. කුකුළු මස් අපනයනය කිරීම කර්මාන්තයක් හැටියට දියුණු කරන්න අවශ්‍ය පහසුකම් රජය මඟින් ලබා දෙන්න අප බලාපොරොත්තු වෙනවා. ඒ පිළිබඳව දැනටමත් සාකච්ඡා පවත්වමින් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒත් එක්කම අපට දැනටමත් කුකුළු පැටවුන් අපනයනය කිරීමට හැකියාව ලැබී තිබෙනවා. පෞද්ගලික අංශය දැනටමත් එම ව්‍යාපෘතියේ යෙදිලා ඉන්නවා. එයට විශාල හේතුවක් හැටියට අපි දකින්නේ, අපේ රටේ කුරුළු උණ රෝගය නොතිබීමයි. වාසනාවකට වාගේ අපේ රටේ කුරුළු උණ රෝගය නොතිබුණු නිසා ලෝකයේ අනෙක් රටවලින් අපේ රටේ කුකුළු මස්වලට ලොකු ඉල්ලුමක් තිබෙනවා. ඒ වාගේම අපේ කුකුළු පැටවුන් සඳහා ලොකු ඉල්ලුමක් තිබෙනවා. ඒක අපි ලැබූ භාග්‍යයක් හැටියටයි මම දකින්නේ.

විශේෂයෙන්ම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු සියලු නිලධාරීන්ගේ කැපවීම නිසායි අපට එම ජයග්‍රහණය ලබා ගැනීමට හැකි වුණේ. දකුණු ආසියාවේ රටවල එම රෝගී තත්ත්වය ප්‍රචලිත වුවත්, අප හැම අවස්ථාවකම අවදියෙන් සිටි නිසා ලංකාව ඒ තුළින් බේරාගැනීමට අපට පුළුවන්කම ලැබී තිබෙනවා. අපි රජයක් හැටියට විශේෂයෙන්ම එම දෙපාර්තමේන්තුවට සහ එහි සියලුම දෙනාට ස්තුති කරන්න ඕනෑ. ඒ ගොල්ලන්ගේ උත්සාහය හා කැපවීම නිසායි ඒ තත්ත්වය ඇති වුණේ.

[ගරු පී. හැරිසන් මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ලෝකයේ අනෙක් රටවල් එක්ක බැලුවාම මත්ස්‍ය පරිභෝජනය අතින් අපි ඉහළ තැනකට ඇවිල්ලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම තමුන්නාන්සේට මේ සම්බන්ධයෙන් රටවල් කිහිපයක තොරතුරු කියන්නම්. මේ අවස්ථාවේදී මම මේ කාරණය විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කුකුළු මස් කෑවාම ගැහැණු දරුවන් අඩු වයසින් වැඩි වියට පත්වෙනවා, නැත්නම් අධි වර්ධනයක් ඇති වෙනවා කියලා සමහර අය තුළ බොරු මතයක් පවතිනවා. මේ විධියට විවිධ මත පැතිරිලා තිබෙනවා. අපි ඒ මත සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. මොකද, මෙතැනදී සෞඛ්‍යයට අහිතකර දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. සමහර අය කියනවා, විවිධ එන්නත් වර්ග පාවිච්චි කරන නිසා, විවිධ හෝමෝන වර්ග පාවිච්චි කරන නිසා අධි වර්ධනයක් ඇති වෙනවා කියලා. එහෙම චෝදනාවක් තිබෙනවා. ඒ විධියේ කිසි දෙයක් සිදු වෙන්නේ නැහැ කියන එක විෂය භාර අමාත්‍යවරයා හැටියට මම බොහොම වග කීමෙන් රටට කියන්න කැමැතියි. පුළුවන් තරම් අපේ රටේ කුකුළු මස් පරිභෝජනය වැඩි කරන්නයි අපි බලන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදේශීය රටවල් ගත්තොත් ඔවුන් අපි වාගේ නොවෙයි. මැලේසියාවේ එක පුද්ගලයෙක් අවුරුද්දකට මස් කිලෝ 41ක් විතර පරිභෝජනය කරනවා. ඒ වාගේම නවසීලන්තයේ එක් පුද්ගලයෙක් අවුරුද්දකට කිලෝ 37ක් පරිභෝජනය කරනවා. වියට්නාමයේ එක් පුද්ගලයෙක් අවුරුද්දකට කිලෝ 14ක් පරිභෝජනය කරනවා. සමස්තයක් හැටියට බැලුවාම අපේ රටෙත් ඒක පුද්ගල මස් පරිභෝජනය ඉහළ ගිහින් තිබෙනවා. ඒ තුළින් ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සම්පූර්ණ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒක, එක සාධකයක් බවට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒත් එක්කම මම තමුන්නාන්සේට තව කාරණයක් කියන්න ඕනෑ. අපේ රටේ කිරි කර්මාන්තය දිහා බැලුවොත් අපි කිරි කර්මාන්තයෙන් ස්වයංපෝෂිත තත්ත්වයට පත්වෙලා නැති වුණත්, අපි ඒ සඳහා වැඩ පිළිවෙළවල් කිහිපයක් යොදා තිබෙනවා.

විශේෂයෙන්ම, පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ තිබෙන ගොවිපොළවලට හොඳ වර්ගයේ සතුන් ගෙනැල්ලා, ඒ ගොවිපොළවල සත්ව පාලනය වැඩිදියුණු කරන්නට ඕනෑ. ඒ වාගේම, පෞද්ගලික අංශයත් අද මේ ක්ෂේත්‍රයේ විශාල වශයෙන් නියැලී ඉන්නවා. ලාභදායී කර්මාන්තයක් හැටියට ඒ අයට ඉදිරියට යන්නට පුළුවන් ක්‍රමවේද අපි ඇති කරලා තිබෙනවා. රජය මඟින් අපි ඒ සඳහා විවිධ සහනාධාර, සහන පොලී මත ණය මුදල් ලබා දීම, නවීන තාක්ෂණ ක්‍රම හඳුන්වා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ඒ වාගේම, ඒ අයගේ වෙනත් පහසුකම් වැඩි කරලීම සඳහා අවශ්‍ය කටයුතු රජය ක්‍රම ක්‍රමයෙන් වැඩි කර ගෙන යනවා. එක පැත්තකින්, කුකුළු මස් නිෂ්පාදනය වැඩි කරන්නට අප බලාපොරොත්තු වනවා වාගේම, අනෙක් පැත්තෙන් රටේ කිරි නිෂ්පාදනය වැඩි කරන්නටත් බලාපොරොත්තු වනවා. අපේ ජාතික ආදායම විදේශීය රටවලට නොදී අපට ඉතිරි කර ගන්නට හැකි වන ආකාරයේ වැඩ පිළිවෙළක් අපේ අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කරගෙන යනවාය කියන එකත් තමුන්නාන්සේට මතක් කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සත්ව පාලනයේම අංගයක් හැටියට සුරතල් සතුන් ඇති කිරීමේ විශාල ප්‍රවණතාවක්ද අද ඇති වෙලා තිබෙනවා. නාගරික ප්‍රදේශවල වාගේම, ගම්බද ප්‍රදේශවලත් සුරතල් සතුන් ඇති කිරීම බොහෝ දුරට ව්‍යාප්ත වෙලා, වැඩි වෙලා තිබෙන බව අප දකිනවා. ඒ වාගේම, අපනයන කර්මාන්තයක් හැටියට ඉස්සන් කර්මාන්තය වේගයෙන් වර්ධනය වෙමින් පවතින කර්මාන්තයක් හැටියට අප දකිනවා. ඒ සඳහා සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන්න පුළුවන් ඉහළම සහයෝගය, දායකත්වය ලබා දෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කරුණු-කාරණා සම්බන්ධයෙන් අදහස් දක්වන්නට තවත් මන්ත්‍රීවරුන් කිහිප පොළක් සිටින නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. එතුමන්ලාට මතු වන ගැටලු සම්බන්ධයෙන් අවශ්‍ය පිළිතුරු දෙන්න අපි ලෑස්තියි.

මේ පනත් කෙටුම්පත සැකසීමේදී අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය, අතිරේක ලේකම්තුමන්ලා, සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ඇතුළු නිලධාරීන් විශාල කැපවීමක් කළා. මෙතෙක් පැවති හැම ආණ්ඩුවක්ම මේ කටයුත්ත කිරීමට උත්සාහ කර තිබෙනවා. මේ ගරු සභාවේ සී.බී. රත්නායක මැතිතුමා ඉන්නවා. එතුමාත් මේ අමාත්‍යාංශය භාර ඇමතිවරයෙකු හැටියට හිටියා. 2006 වර්ෂයේ සිට මේ පනත් කෙටුම්පතට සංශෝධන ඉදිරිපත් කරන්නට ගිය අවස්ථාවලදී දිගින් දිගටම විවිධ ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විවිධ සත්ව කාණ්ඩ සඳහා අවශ්‍ය තීන්දු-තීරණ ගන්නකොට ඒවා එකිනෙකට වෙනස් වූ අවස්ථා තිබෙනවා. ඒ නිසා මේ කටයුත්ත කිරීමට දීර්ඝ කාලයක් ගත වෙලා තිබෙනවා.

මේ රටේ ජනතාවගේ සෞඛ්‍යයට බලපාන, පෝෂණයට බලපාන කරුණු අඩංගු වන නිසා මේ පනත් කෙටුම්පත හරහා ඒ හැමෝටම වැඩි සේවාවක් ලබා දෙන්න අවස්ථාවක් ලැබෙනවාය කියන එක මම මතක් කරනවා. කුකුළු මස්වලින් ස්වයංපෝෂිත වනවා වාගේම, හැකි තරම් ඉක්මනට කිරිවලිනුත් ස්වයංපෝෂිත වෙන්නට අප බලාපොරොත්තු වනවා. ඒ අතුව, මේ රටේ සංවර්ධන ගමනට දායකත්වයක් දෙන්නට අපේ අමාත්‍යාංශයට හැකියාවක් තිබෙනවාය කියන එක මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
மாண்புமிகு சிவசக்தி ஆனந்தன் அவர்கள்.

[ப.ப. 3.38]

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் விலங்குத் தீனி (திருத்தம்) சட்டமூலம்

தொடர்பான விவாதத்திலே கலந்துகொண்டு, வடக்கு மாகாணத்தில் மாகாண கால்நடை உற்பத்திச் சுகாதாரத் திணைக்களமும் விலங்கு உணவுகளை விற்பனை செய்கின்றவர்களும் எதிர்நோக்குகின்ற சில பிரச்சினைகள் தொடர்பாக அமைச்சருடைய கவனத்துக்கும் சபையினுடைய கவனத்துக்கும் கொண்டுவர விரும்புகின்றேன்.

முக்கியமாக, வட மாகாணத்திலே கால்நடைகளுக்கான தீவன வகை விற்பனையில் நூற்றுக்கணக்கான வியாபாரிகள் ஈடுபடுகின்றார்கள். அவர்கள் தீவனப் பாத்திரங்கள் உள்ளிட்ட பல்வேறு பொருட்களையும் அதே விற்பனை நிலையத்தில் வைத்து விற்று வருகின்றனர். விற்பனை செய்யும் தீவன வகைகளின் தரம், காலாவதியாகும் திகதி, நிறை போன்ற விடயங்களைப் பரிசீலனை செய்து, தவறிழைப்பவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கைகளை மேற்கொள்ளும் அதிகாரம் தற்போது மத்திய கால்நடை உற்பத்திச் சுகாதார திணைக்களப் பணிப்பாளர் நாயகத்துக்கே வழங்கப்பட்டுள்ளது. இந்த நிலையில், மத்திய கால்நடை உற்பத்திச் சுகாதார திணைக்களத்தினால் இவ்வளவு பெருந்தொகையான வியாபார நிலையங்களைக் கண்காணிப்பதற்கும் பரிசோதனைகளை மேற்கொள்வதற்கும் வட மாகாணத்திலே போதிய அலுவலர்களோ, அலுவலகங்களோ கிடையாது. ஐந்து மாவட்டங்களுக்குமாக மத்திய கால்நடை உற்பத்திச் சுகாதார திணைக்களத்துக்கு கால்நடை நோய்ப் புலனாய்வு நிலையங்கள் 3 மட்டுமே காணப்படுவதுடன், கால்நடை வைத்தியர்கள் 3 பேர் மாத்திரம் அங்கு பணியாற்றி வருகின்றனர். ஆனால், மாகாண கால்நடை உற்பத்திச் சுகாதாரத் திணைக்களத்தின்வசம் 50 வரையிலான அலுவலகங்கள் இருப்பதோடு 80க்கும் மேற்பட்ட தகுதிவாய்ந்த கால்நடை வைத்தியர்களும் உள்ளனர்.

விலங்கு உணவுகள் தொடர்பாக எத்தனை சட்டங்கள் இயற்றப்பட்டாலும் பின்னர் அவை திருத்தப்பட்டாலும், இன்றுவரை அவற்றை முறையாக வடக்கில் அமுலாக்கம் செய்து அங்கு தவறிழைப்பவர்களை அடையாளம்கண்டு உரிய நடவடிக்கை மேற்கொள்ளப்படவில்லை. இதனால், விலங்குணவு வியாபாரத்திலே பல்வேறு முறைகேடுகள் ஏற்பட வாய்ப்புள்ளன. மேலும், தரமான கால்நடைத் தீவனங்கள் கிடைக்காத நிலையில், பண்ணைத் தொழிலில் ஈடுபடும் ஓரிலட்சம் வரையான பண்ணையாளர்கள் நட்டங்களை எதிர்நோக்கி வருகின்றனர். எனவே, கால்நடை தீவன உற்பத்தி மற்றும் வியாபார நடவடிக்கைகளை மேற்பார்வை செய்வதற்கும் தீவன வியாபாரத்தில் ஈடுபடும் முறைகேடுகள் மீதான நடவடிக்கைகளை மேற்கொள்வதற்கும் இந்த விலங்கு உணவுகளுக்கான சட்டத்திருத்தத்தினூடாக மாகாண கால்நடை உற்பத்திச் சுகாதாரத் திணைக்களத்துக்குப் போதிய அதிகாரங்களை வழங்குவதற்கு வகைசெய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், பண்ணையாளர்களுக்கு விநியோகிக்கப்படும் கால்நடை தீவன வகைகளின் தரம் தொடர்பாக உடன் ஆய்வுகூடப் பரிசோதனைகள் மேற்கொள்ளக்கூடிய வகையிலே, மத்திய கால்நடை உற்பத்திச் சுகாதார திணைக்களத்தின்கீழ் இயங்கும் கால்நடை நோய்ப் புலனாய்வு நிலையங்களை உடனடியாக ஐந்து மாவட்டங்களுக்கும் விஸ்தரிக்க நடவடிக்கை மேற்கொள்வதுடன், இந்த நிலையங்களூடாக விலங்குணவுப் பரிசோதனைகளையும் மேற்கொள்வதற்கு ஏதுவாகத் தேவையான இயந்திர சாதனங்களையும் நிறுவ வேண்டுமெனக் கேட்டுக் கொள்கிறேன்.

இன்னுமொரு முக்கியமான விடயத்தை நான் இங்கு எடுத்துச் சொல்லவேண்டியிருக்கின்றது. கடந்த ஜூன் மாதம் 8ஆம் திகதி நான் இச்சபையிலே மாண்புமிகு பிரதம மந்திரி அவர்களிடம் முக்கியமான ஒரு கேள்வியைக் கேட்டேன். அதாவது, வடக்கிலும் கிழக்கிலும் யுத்தத்தினால் பாதிக்கப்பட்டிருக்கின்ற சிறுவர்கள், பெரியவர்களென பொதுமக்கள் அதிகமானோர் குண்டுச் சன்னங்கள், shell pieces போன்றவற்றைக் கடந்த 7 வருட காலமாகத் தமது உடல்களில் சுமந்துகொண்டிருக்கிறார்கள். அவை இன்றுவரை அகற்றப்படாமையால் அவர்கள் மிகவும் அவஸ்தைப் படுகின்றார்கள். ஆகவே, அவர்களுடைய உடல்களில் இருக்கின்ற குண்டுகள், 'ஷெல்' துகள்கள் மற்றும் சன்னங்களை அகற்றுவதற்கு நடவடிக்கை எடுக்க முடியுமாவென்று பிரதமர் அவர்களைக் கேட்டிருந்தேன். அது தொடர்பான விபரங்கள் தன்னிடம் இல்லையென்றும் அந்தப் பெயர்ப்பட்டியலைத் தந்தால் உரிய நடவடிக்கை எடுப்பதாகவும் அப்போது அவர் குறிப்பிட்டிருந்தார். தேவைப்படும் பட்சத்திலே பாதிக்கப் பட்டிருப்பவர்களுக்கு இலங்கைக்கு வெளியேயும் மேலதிக சிகிச்சை வழங்க முடியுமென்ற ஓர் உறுதிமொழியையும் பிரதமர் அவர்கள் வழங்கியிருந்தார். அதற்கமைவாக நான் கடந்த 65 நாட்களுக்கும் மேலாக இது தொடர்பான விபரங்களைச் சேகரித்து வருகின்றேன். வட மாகாணத்தி லிருக்கின்ற 5 மாவட்டங்களின் அரசாங்க அதிபர்களிடமும் அதேபோல் வட மாகாண கல்வி அமைச்சு மற்றும் அதனுடைய செயலாளரிடமும் அந்தத் தகவல்களை - பெயர் விபரங்களைக் கேட்டிருந்தேன். ஆனால், அவை முழுமையாகக் கிடைக்க வில்லை. அந்த விபரங்களை எங்களுக்குத் தந்துதவுவதற்கு மாவட்ட அரசாங்க அதிபர்கள் பயப்படுகின்ற சூழ்நிலையே அதற்குக் காரணமாக இருக்கின்றது. இந்தப் புதிய ஆட்சி மாற்றத்திலும் மக்களுடைய பிரதிநிதிகளாக இருக்கின்ற எங்களுக்கு போரினால் பாதிக்கப்பட்டுள்ள மக்களுடைய உயிரைக் காக்கின்ற மனிதாபிமானப் பணியைக்கூடச் செய்ய முடியவில்லை. மிகுந்த கஷ்டத்துக்கு மத்தியில் 410 பேருடைய பெயர் விபரங்களை நான் எடுத்திருக்கிறேன். அதை இன்றைய தினம் இந்தச் சபையில் சமர்ப்பிக்கின்றேன்.

இந்த 410 பேரிலே 8 முதல் 18 வயது வரையுள்ள பெரும்பாலான மாணவர்களும் உள்ளடங்குகின்றார்கள். இவர்களில் பலரின் தலை, மார்பு, முள்ளந்தண்டு போன்ற பகுதிகளிலே காணப்படும் குண்டு, 'ஷெல்' துகள்கள் மற்றும் சன்னங்கள் அகற்றப்படாத நிலையில் அவர்கள் கடந்த 7 வருட காலமாக பெரும் அவஸ்தைக்குள்ளாகி வருகின்றார்கள். நான் இங்கு ஒப்படைக்கின்ற 410 பேரின் பெயர் விபரங்கள் வவுனியா, யாழ்ப்பாணம் ஆகிய இரண்டு மாவட்டங்களைச் சேர்ந்தவர்களுடையதாகும். பிரதம மந்திரி அவர்கள் வாக்குறுதியளித்ததன்படி இவர்களுள் இலங்கையில் சிகிச்சையளிக்க முடியுமானவர்களுக்கு இலங்கையில் சிகிச்சை அளிக்கலாம். இங்கு சிகிச்சையளிக்க முடியாதவர்களுக்குச் சென்னை போன்ற நகரங்களிலே அந்த சிகிச்சையை அளிக்க முடியுமென்று அவர் வழங்கிய உறுதிமொழிக்கமைவாக பிரதமர், சுகாதார அமைச்சர், மீள்குடியேற்ற அமைச்சர் ஆகியோருக்கு இந்தப் பெயர்ப்பட்டியல் கிடைக்கக்கூடிய வகையிலே அதைச் சபாபீடத்தில் *சமர்ப்பிப்பதோடு, இது ஹன்சாட் அறிக்கையிலும் இடம்பெற வேண்டுமென்று கேட்டுக்கொள்கிறேன்.

இன்னுமொரு முக்கியமான விடயத்தையும் தெரிவிக்க வேண்டும். அதாவது, 2012ஆம் ஆண்டு முன்னாள் ஜனாதிபதி

** පුස්තකාලයේ තබා ඇත.*

** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய ஆட்சிக்காலத்தின்போது அப்போதிருந்த சுகாதார அமைச்சரிடம் இதேபோன்றதொரு பெயர்ப்பட்டியலை நான் சமர்ப்பித்திருந்தேன். ஆனால், இன்றுவரைக்கும் அது தொடர்பான எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை. எங்கள் மக்களுடைய மனிதாபிமானப் பிரச்சினை தொடக்கம் பல்வேறுபட்ட பிரச்சினைகளையும் இந்த உயர்ந்த சபையின் கவனத்துக் கொண்டுவருகின்றோம். அப்படிக் கொண்டுவரப்படும் எந்த விடயமுமே கருத்திலே - கவனத்திலே எடுக்கப்படாத ஓர் அலட்சியப் போக்குத்தான் தொடர்ச்சியாக இருந்து வருகின்றது. அந்த வகையில், 2012ஆம் ஆண்டிலே என்னால் ஒப்படைக்கப்பட்ட அந்த பெயர்ப்பட்டியலுக்கு நடந்ததுபோல் இப்பட்டியலுக்கும் நடக்கக்கூடாது. இந்த 410 பேரும் தினமும் மிகுந்த கஷ்டங்களுக்கு மத்தியிலே வாழ்ந்து வருகின்றார்கள். ஆகவே, எங்களுக்கு இந்த உயர்ந்த சபையிலே தரப்பட்ட வாக்குறுதிக்கு அமைவாக ஜனாதிபதி, பிரதமர், சுகாதார அமைச்சர், மீள்குடியேற்ற அமைச்சர் ஆகியோர் உடனடியாக அவர்கள் அத்தனை பேருக்கும் வைத்திய சிகிச்சை வழங்கும் இந்த மனிதாபிமான உதவியைச் செய்வதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

மேலும், மன்னார் மாவட்டத்திலுள்ள பள்ளிமுனையிலே 25 வீடுகள் உள்ளடங்கிய காணியைச் சுவீகரிப்பதற்குரிய நடவடிக்கையைக் கடற்படையினர் மேற்கொண்டு வருகின்றனர். பள்ளிமுனை மக்களின் எதிர்ப்பினால் அந்தச் சுவீகரிப்புப் பணிகள் இடைநிறுத்தப்பட்டிருக்கின்றன. பள்ளிமுனை கிராம மக்களுக்கு இந்த 25 வீடுகளும் காணியும் முன்னாள் ஜனாதிபதியாக இருந்த ஆர். பிரேமதாச அவர்களினால் 1985ஆம் ஆண்டு வழங்கப்பட்டது. ஆனால், கடற்படையினர் அந்தக் காணியைக் கடந்த 26 வருட காலமாகத் தங்களுடைய கட்டுப்பாட்டுக்குள் வைத்திருந்தது மட்டுமல்லாமல், அதனைச் சுவீகரிப்பதற்குரிய நடவடிக்கையையும் மேற்கொண்டிருக்கின்றார்கள். அந்த மக்களுக்குச் சொந்தமான - 25 குடும்பங்களுக்குச் சொந்தமான அந்த இரண்டு ஏக்கர் காணியைச் சுவீகரிப்பதற்கு இரண்டாவது தடவை எடுத்த முயற்சியே இன்றைய தினம் இந்த மக்களால் தடுத்து நிறுத்தப்பட்டிருக்கின்றது. முன்னாள் ஜனாதிபதியினால் வழங்கப்பட்ட காணியை அல்லது ஒரு வீட்டுத் திட்டத்தைக் கடற்படையினருக்கோ அல்லது பொலிஸாருக்கோ சுவீகரிக்கின்ற அதிகாரம் இருக்கின்றதா? என்பதை நான் இந்தச் சபையிலே கேட்க விரும்புகின்றேன். ஏனென்றால் இதுபோன்ற சம்பவங்கள் வடக்கிலும் கிழக்கிலும் தொடர்ச்சியாக இடம்பெற்றுக்கொண்டிருக்கின்றன. யுத்தம் முடிவடைந்து ஏழு வருடங்கள் கடந்தும்கூட, இந்த ஆட்சி மாற்றத்திற்குப் பிற்பாடுகூட இன்றைக்கு எங்களுடைய மக்கள் தமது சொந்தக் காணிகளிலே மீளக் குடியேற முடியாத ஒரு நிலைமைதான் தொடர்ந்துகொண்டிருக்கின்றது. எந்த இடமாக இருந்தாலும் அந்த மக்களுக்குச் சொந்தமான காணிகளை - அது கேப்பாப்பிலவாகவோ அல்லது சம்பூராகவோ அல்லது வலிகாமம் போன்ற இடங்களாகவோ இருக்கலாம்- கடற்படையினரோ, பொலிஸாரோ யாராக இருந்தாலும் அவர்களிடம் திருப்பி ஒப்படைக்க வேண்டிய ஒரு பொறுப்பு இருக்கின்றது. அதிலும் இந்தக் காணி சம்பந்தமாக மன்னார் மாவட்ட நீதிமன்றத்திலே வழக்கொன்று நடைபெற்று வருகின்றது; பொதுமக்கள் 19 பேர் தமக்குச் சொந்தமான காணியைத் தரும்படி வழக்குத் தொடர்ந்திருக்கின்றார்கள். அத்துடன், இது முன்னாள் ஜனாதிபதி ஒருவரால் வழங்கப்பட்ட காணியும்கூட. இந்த இரண்டு அம்சங்களையும் மீறி இன்று சுவீகரிப்பு விடயம் தலைதூக்கியிருக்கின்றது. ஆகவே, இந்த இரண்டு விடயங்களும் இருக்கும்போது நீதிமன்றத்தையும் அவமதித்து முன்னாள் ஜனாதிபதியையும் அவமதித்து இதனைக் கைப்பற்றுகின்ற சர்வாதிகாரம் கடற்படையினருக்கு இருக்கின்றதா? என்பதை இந்த நேரத்திலே நான் கேட்க விரும்புகின்றேன்.

மேலும், நாங்கள் இந்தச் சபையிலே கொண்டுவருகின்ற எந்த ஒரு விடயத்தினையும் இந்த அரசாங்கம் கவனத்திலெடுக்காத நிலை தொடர்ந்துகொண்டிருக்கின்றது. இங்கே காணாமற்போனோர் தொடர்பான அலுவலகம் அமைத்தல் தொடர்பான சட்டம்கூட நிறைவேற்றப் பட்டுள்ளது. ஆனால், இந்தச் சட்டம் நிறைவேற்றப்பட்டதற்குப் பிற்பாடு ஜனாதிபதியும் இந்த அரசில் அங்கம் வகிக்கின்ற சில முக்கியமானவர்களும் "இந்தச் சட்டத்தினால் இந்த நாட்டின் பொலிசாரோ, இராணுவத்தினரோ தண்டிக்கப்பட மாட்டார்கள்" எனக் கூறுகின்றார்கள். அத்துடன், யாரும் விசாரணைக்குட்படுத்தப்பட மாட்டார்கள் என்றும் பகிரங்கமாகக் கூறப்படுகின்றது. அப்படியாக இருந்தால், காணாமற்போனோர் தொடர்பான இந்த அலுவலகம் உண்மையாகக் காணாமற்போனோர் தொடர்பான அலுவலகமா அல்லது காணாமல் ஆக்கப்பட்டோர் தொடர்பான அலுவலகமா என்பது தெளிவுபடுத்தப்பட வேண்டியிருக்கின்றது. எனவே, காணாமற்போனவர்கள் தொடர்பாக இந்த அலுவலகத்திலே முறையிடுவதனூடாக இராணுவத்தினரால் கைது செய்யப்பட்டவர்களுக்கான அல்லது இராணுவத்தினரிடம் ஒப்படைக்கப்பட்டவர்களுக்கான நீதி எப்படிக் கிடைக்கும்? என்பதை இந்த இடத்திலே நான் கேட்க விரும்புகின்றேன்.

மேதகு ஜனாதிபதி அவர்கள், முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷவினால் புதிய கட்சி ஆரம்பிக்கப்பட்டால் தன்னிடமிருக்கின்ற முக்கியமான இரகசியங்களை வெளியிடுவதாகக் குறிப்பிட்டிருக்கின்றார். போர்க்காலத்திலே முன்னாள் ஜனாதிபதியும் முன்னாள் பாதுகாப்புச் செயலாளரும் இராணுவத்தின்மூலம் இந்த மக்களின்மேல் இழைத்திருக்கின்ற பல்வேறுபட்ட மனித உரிமை மீறல்களையும் போர்க்குற்றங்களையும் மறைத்து வைத்துள்ள இந்த நல்லாட்சி அரசாங்கம், ஐ.நா. சபைக்கும் மனித உரிமைகள் ஆணையகத்திற்கும் வழங்கியிருக்கின்ற வாக்குறுதிகளை எவ்வாறு நிறைவேற்றப்போகின்றது? என்ற கேள்வியும் சந்தேகங்களும் எழுகின்றன. ஆகவே, உண்மையிலேயே தமிழ் மக்களுடைய பேராதரவோடுதான் இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்ததென்ற வகையில், அது இந்தச் சபையிலே எங்களால் எடுத்துரைக்கப்படுகின்ற எமது மக்களின் பிரச்சினைகளுக்குத் தீர்வைக் காணவேண்டும் என்பதையே நாங்கள் விரும்புகின்றோம் என்பதைக்கூறி, விடைபெறுகிறேன்.

[අ.භා. 3.51]

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සත්ත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව විවාද කෙරෙන මේ අවස්ථාවේදී, 2005දී ආරම්භ කළ ක්‍රියාවලිය මල් පල ගැන්වීම පිළිබඳව ගරු පී. හැරිසන් අමාත්‍යතුමාටත්, ඒ වාගේම ගරු අමීර් අලි සිහාබ්දීන් නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු එහි කාර්ය මණ්ඩලයටත් හිටපු පශු සම්පත් සංවර්ධන අමාත්‍යවරයකු විධියට මාගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරන්නට ඕනෑ.

මිනිසුන් හැටියට අපි පරිභෝජනය කරන ආහාර සෞඛ්‍ය සම්පන්න ලෙස ලබා දිය යුතු වෙනවා. ඒ වාගේම මිනිසුන් හැටියට අපේ ජීවිතය ගොඩ නහා ගැනීම සඳහා එදා අපි මේ දේශය බත බුලතින් සෞභාග්‍යමත් කරනකොට, පේදුරුතුඩුවේ සිට දෙවුන්දරතුඩුව දක්වාම ගෘහ කර්මාන්තයක් ලෙස සත්ව පාලනයත් ආරම්භ කළා. ගෘහ කර්මාන්තයක් ලෙස සත්ව පාලනය ආරම්භ කරලා, එදා කුඹුරු ගොවිතැන සඳහා සතුන් යොදා ගැනීමට අවස්ථාව සලසා ගත්තා. ඒ නිසා කුඹුරු හිමියන් වාගේම සත්ව හිමියනුත් ඉතිහාසය තුළ යම් ස්ථාවරත්වයක් ගොඩ නහාගෙන හිටියා. ඒ වාගේම, ගෘහය තුළම පස් ගෝ රස සකස් කර ගැනීමේ අවස්ථාව ඇති කර ගත්තා. එදා මත්ස්‍ය ආහාර වාගේම කුකුළු මස් පරිභෝජනයට ගත්තේ අල්ප වශයෙනුයි. නමුත් අද සමාජය එම ආහාර සඳහා ගිජු භාවයකින් යුතුව ක්‍රියා කරමින් ඒවා පරිභෝජනය පුළුල් කර ගෙන තිබෙනවා.

1948 ඉඳලා සම්මත වුණු සමහර පනත් සංශෝධනය කරද්දී, ගැබ්බර වූ ගවයින් ඝාතනය කිරීම වරදක් හැටියට සලකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ ලබා දිය හැකි දඩය රුපියල් 50ක් වුණා. එම නිසා කාලානුරූපව, කාලෝචිත ආකාරයට ක්‍රියාත්මක වෙන්නත්, ඒ වාගේම පැටවුන් බිහි කිරීමට සිටින ගව දෙනුන් ඝාතනය කිරීම සම්පූර්ණයෙන් තහනම් කරන්නත් අපට පුළුවන්කම ලැබුණා. නමුත්, අද අපි මනුෂ්‍යත්වයේ නාමයෙන් ඒ නීතිය ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ වාගේම තමන්ගේ චින්දනය, තමන්ගේ තෘප්තිය සඳහා සුරතල් සතුන් ඇති කරන විට ඔවුන් සඳහාත් ආහාර නිෂ්පාදනය කිරීම අවශ්‍ය වෙනවා.

ගරු අමීර් අලි සිහාබ්දීන් නියෝජ්‍ය අමාත්‍යතුමනි, - අමාත්‍යතුමා සභාවේ නැති නිසා- අපි මේ පනත් සංශෝධනය කරනවා වාගේම, නීති කෙටුම්පත් සම්මත කරගෙන ක්‍රියා කරනවා වාගේම, ඒ සත්ව ආහාර නිෂ්පාදනය හරියාකාරව සිදු කරනවාද, නැද්ද කියලාත් සොයා බැලිය යුතු වෙනවා. ඒ වාගේම ගෘහ කර්මාන්තයක් වශයෙන් සත්ව පාලනය කරගෙන යාමට අවශ්‍ය කරන සත්ව ආහාර නිෂ්පාදනය සඳහා දේශීය ආයෝජකයන්ට අවශ්‍ය පසු බිම සකසා දිය යුතු වෙනවා.

2004දී මේ රටේ කිරි නිෂ්පාදනය සියයට 13ක්ව පැවතුනත්, කිරි නිෂ්පාදනය වැඩි කරන්නට අවශ්‍ය පසුබිම සකස් කරලා මම අමාත්‍යාංශය භාර දෙන අවස්ථාව වන විට එය සියයට 48 දක්වා ඉහළට ගෙන ඒමට කටයුතු කළා. ගරු අමීර් අලි සිහාබ්දීන් නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාටත් මතක ඇති අපි එදා මඩකළපුවේ, උතුරේ, දකුණේ හැම අස්සක් මුල්ලක් නෑරම ගිහිල්ලා ඒ සත්ව පාලන කටයුතු සඳහා උපකාර කළ ආකාරය.

ලංකා ආණ්ඩුවේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයත් එක්ක පළාත් සභාවලට විෂයයන් බෙදුණු නිසා ඒ සඳහා ක්‍රියාත්මක කරන අණපනත් සමහර තැන්වලදී ක්‍රියාත්මක නොවන තත්ත්වයට ආවා. හැබැයි, මම මේ විෂයය සම්බන්ධ ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමන්ලා, අධ්‍යක්ෂතුමියලා, පළාත් අමාත්‍යවරු සහ පළාත් ලේකම්වරු කියන සියලුදෙනාම කැඳවලා, එක මෙසයක ඉඳගෙන ඔවුන් සමඟ සාකච්ඡා කළ නිසා මේ සම්බන්ධයෙන් එක තීන්දුවක් ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ නිසා කිරි නිෂ්පාදනය වාගේම බිත්තර නිෂ්පාදනයත්, කුකුළු මස් නිෂ්පාදනයත් වැඩි කරගන්න, සත්ව ආහාර ප්‍රමිතියට අනුකූලව සකස් කරන්න අවශ්‍ය පසු බිම සකස් කර ගන්නත් අපට පුළුවන්කම ලැබුණා. එසේ කටයුතු නොකරන ස්ථාන වටලන්න අප ක්‍රියා කළා. ඒ වාගේම ආනයනය කරන සතුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමේ කටයුතු අපේ නිරෝධායන ආයතනය මඟින් නිවැරදි ලෙස කළා. මෙම කටයුතු තවත් ශක්තිමත් කරමින්, ඒ වෙළෙඳ භාණ්ඩ සුදුසු ලෙස වෙළෙඳ පොළට යැවීම සඳහා නීති, අණපනත් සංශෝධනය කරමින් සලසා දීමත් අප කළා. මොකද, මේ දේවල් පරිභෝජනය කිරීමේදී ශරීරයට වස විෂ ඇතුළු නොවී මිනිසා ජීවත් කරවීමට අප උත්සාහ ගන්නවා නම් ඒ සඳහා නිවැරදි තාක්ෂණය ලබාදිය යුතු වෙනවා. ප්‍රමිතියට අනුව මේ දේවල් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසු බිම සකස් කරගැනීම අපේ වග කීමක් වෙනවා. මේ වගකීම අප දැරිය යුතුයි. නමුත්, ඒ වගකීම ගෘහ කර්මාන්තය කඩා වැටීමට හේතුවක් කර නොගත යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නුවරඑළිය කියන්නේ බහුවාර්ගික ජනතාවක් ජීවත් වන දිස්ත්‍රික්කයක්. මේ ජනතාවගෙන් වැඩි ප්‍රමාණයක් වතු ආශ්‍රිතව ජීවත් වන අයයි. ඔවුන් කිරි, කුකුළු මස්, බිත්තර නිෂ්පාදන කර්මාන්තයේත් යෙදී සිටිනවා. හැබැයි, දැන් ඔවුන් ක්‍රම ක්‍රමයෙන් ඒ කටයුතුවලින් ඈතට යන්න සූදානම් වෙනවා. ඔවුන් එසේ ඈතට යන්න සූදානම් වෙලා තිබෙන්නේ කාලානුරූපව අපේ කළමනාකරණය හරියාකාරව ක්‍රියාත්මක කර නැති නිසායි කියා මා විශ්වාස කරනවා. එදා ඒ කිරි ගොවියා ගැන අප ලොකු අභිමානයකින් කථා කළා. ඒ කාලයේ කිරි ගොවියා කිරි කෑන් එක කරේ තියාගෙන, කඳු පල්ලම් බැහැලා කිරි අළෙවි කරන්න ආපු ආකාරය මා දැක තිබෙනවා. "කිරිකාරයා ආවා" කියා අප අනික් අයටත් කථා කළා. ඒ තත්ත්වය කාලානුරූපව වෙනස් වන්න ඕනෑය කියන එකයි මම කියන්නේ. ගොම ගාගෙන ඒ කටයුතු කරන්න ඔවුන් අද සූදානම් නැහැ. භද්‍ර යෞවනයේ ඉන්න ඒ තරුණයෝ අද තාක්ෂණයත් එක්ක බද්ධ වෙලා තිබෙනවා. ඒ තාක්ෂණයත් එක්ක, නව ලෝකයත් එක්ක බද්ධ වෙලා ඉන්න ඔවුන්ට එම කර්මාන්තය කරන්න අවශ්‍ය පසු බිම අප සකස් කර දිය යුතුයි. එහි එක් පියවරක් ලෙස නව ගාල් ක්‍රමය හඳුන්වා දෙන්න පුළුවන්. ඒ වාගේම තමන්ගේ අවශ්‍යතාව අනුව පානීය ජලය ලබා ගන්න ඒ සතාව හුරු කරවන්න අපට පුළුවන්. ඒ වාගේම එම ගාල් පිරිසිදු කරගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කර ගත යුතුයි. ඒ සඳහා අවශ්‍ය ආම්පන්න, අත් වැසුම්, පා වැසුම්, හිස් වැසුම් වැනි දේවල් එහි සේවකයන්ට ලබා දිය යුතුයි. ඒ වාගේම ඒ අයට දිරි දීමනාවක් ලබා දෙන්නත් පුළුවන්. එවැනි කටයුතු ඔස්සේ මේ කර්මාන්තය තවත් වැඩිදියුණු කරන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා.

ඒ කාලයේ මේ කර්මාන්තයේ යම්කිසි සැලැස්මක් තිබුණා. සැලැස්මක් තිබුණත්, දකුණේ සහ උතුරේ සිටි සතුන් අයාලෙ ගියා. අයාලෙ යන සතුන්ගෙන් කිරි දොවන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ නිසා ලංකාවේ සතර දිග් භාගයේම අප ඒ කිරි නිෂ්පාදනය- [බාධා කිරීමක්] පියංකර ජයරත්න මැතිතුමා අයාලෙ යනවා වාගේ නොවෙයි. මේ සතුන් අයාලෙ යනවා. සතුන් අයාලෙ ගිය නිසා ඔවුන්ගෙන් කිරි ටික ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ.

කිරි අළෙවිය වැඩිදියුණු කිරීම සඳහා අප කොළඹ නගරය තුළත්, යම් යම් ආයතනවලත් කිරි අළෙවි සැල් ආරම්භ කළා. නොයෙක් තැන්වල අළෙවි කරන රසකාරක පෙවූ බීම වර්ග වෙනුවට ජනතාව කිරි පරිභෝජනයට හුරු කරන්නයි අප එසේ කළේ. එහිදී අපට චෝදනා, අපවාද, අවලාද ආවා. ඒ කොයි හැටි වෙතත් ලංකාවේ සතර දිග් භාගයේම තිබෙන අපේ අළෙවි සැල්වලින් කිරි විශාල වශයෙන් අළෙවි කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ නිසා කිරි කර්මාන්තය දියුණු කිරීමට කාර්යක්ෂමව කටයුතු කරන්න අපට පුළුවන් වුණා. මේ කටයුතුවලදී පශු වෛද්‍යවරුන්ගේ සේවාව අතිවිශාල වශයෙන් ලබා ගන්න අපට පුළුවන්කම ලැබුණා. මේ රටේ ජාතික ධනයට, ආර්ථිකයට දායකත්වය ලබාදීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ගැනීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමඟ අත්වැල් බැඳගෙන යන මේ ගමනේදී පශු වෛද්‍යවරුන්ගෙන් සැලසෙන සේවාවත් අතිවිශාලයි. ඔවුන් ලැබූ දැනුම් සම්භාරයට

[ගරු සී.බී. රත්නායක මහතා]

සරිලන විධියට ඔවුන්ගේ සේවය මේ රටට ලබා ගන්න නම් ඊට සරිලන වැටුපක් ඔවුන්ට ලබා දිය යුතුයි. බටහිර රටවල, යුරෝපා රටවල ඔවුන්ට විශාල ඉල්ලුමක් තිබෙනවා. ඒ නිසා ඔවුන් රට අතහැර යනවා. ඒක නතර කරගන්න නම්, ඔවුන්ට සරිලන වැටුප සම්පාදනය කළ යුතුය කියන එකයි මම විශ්වාස කරන්නේ. එතැනට අපි ගියේ නැත්නම්, අපි මේ මොන අණපනත් සකස් කෙරුවත් අපේ නිෂ්පාදනය හරියාකාරව ක්‍රියාත්මක කරගෙන යන්න අපට බැරි වෙනවා. ඒ නිසා ඔවුන් ධෛර්යවත් කරමින් ඔවුන්ගේ දැනුම් සම්භාරය මේ දේශය තුළ ක්‍රියාත්මක කරවා ගැනීමට අවශ්‍ය පසුබිම සකස්කර ගැනීම අවශ්‍ය වෙනවා. ඔවුන් සේවයට බඳවා නොගැනීම නිසා සහ ඔවුන් සේවයට බඳවා ගත්තද, ඔවුන්ගේ කාලය අපතේ හැරීම නිසාත් ඔවුන් සතු දැනුම් සම්භාරය ලබා නොගැනීම මේ දේශයේ ඉන්න උගත් බුද්ධිමත් ජන කොටසට කරන විශාල අපරාධයක් හැටියට අපි දකිනවා. ඒ නිසා මේ සියලු දේ බද්ධ කරගෙන ක්‍රියාත්මක කරගෙන යා යුතුයි. පාඩු ලබන ගොවිපොළවලට සක්‍රීය දායකත්වය ලබා දෙමින් ක්‍රියාත්මක කර ගෙන යා යුතු වෙනවා. මොකද, සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ කටයුත්ත සඳහා ගොවිපොළවල් පරිහරණය කිරීමට අවශ්‍ය වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය කාල වකවානුවලදී අපි දැකපු දෙයක් තිබෙනවා. ඒ දේ ඔබතුමාත් දකින්න ඇති. එනම්, පසු ගිය කාල වකවානුවලදී බඩ ඉරිහු සිංගප්පූරුවෙන් පවා අපේ රටට ගෙනාවා. වැලි ටික, වතුර බෝතලය අපි පිට රට යවනකොට, අපි සත්ත්ව ආහාර සඳහා බඩ ඉරිහු සිංගප්පූරුවෙන් -සිංගප්පූරුවත් ඒවා වෙනත් රටකින් ලබා ගත්තේ.- ආනයනය කළ කාලවකවානුවක් තිබුණා. අපි ඒකට නැවතීමේ ලකුණ -නිත- තියන්න පටන් ගත්තා.ඒ නිත තියන්න පුළුවන්කම ලැබුණේ මහ බැංකුවේ ආධාරයත් ඇතිවයි. මහ බැංකුවේ ආධාරයත් එක්ක අපි ගොවියාට බීජ බඩ ඉරිහු ලබා දුන්නා. ඒ බීජ බඩ ඉරිහු ලබා දීලා, අපි ගොවියා රක්ෂණය කළා. අලි පාළුව, නියං පාළුව ඇති වුණොත්, ඒ අක්කර දෙක සඳහා අපි යම් දීමනාවක් ගෙවන්න කටයුතු කළා. ඒ වාගේම අපි පොහොර ටික දුන්නා. ඒ ගත්ත ණය මුදලින් ඔවුන්ට ඒ බිම සකස් කර ගැනීමට අවස්ථාව ලබා දුන්නා. හැබැයි, ඒ අස්වැන්න අපි බාරගත්තා. අස්වැන්න බාරගෙන අපි ඒ මුදල බැංකුවට දැම්මා. ඒ මුදල ලබා දෙමින් ඔවුන් දිරිමත් කෙරුවා.

අපට පුළුවන් කම ලැබුණා, අක්කර 1,000ක විතර බඩ ඉරිහු වගා කිරීමෙන් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරලා ඒ තුළින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරන්න. ඒ ග්‍රාමීය ආර්ථිකය ඉතා ඉහළට යනකොට ඒ හේතුවෙන් කුකුළු කර්මාන්තය දියුණු කර ගන්නත් පුළුවන්කම ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ දේශගුණය වෙනස් වෙනකොට තෘණ වගාවන්වලත් ගැටලු මතුවෙනවා. තෘණ වගාවේදී එක් එක් ප්‍රදේශයට විවිධ තෘණ ප්‍රභේදයන් අවශ්‍ය වෙනවා. ඒ ප්‍රභේදවල අවශ්‍යතාව හඳුනාගෙන ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මම දන්නවා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ බෝපත්තලාව වාගේ ප්‍රදේශවල ගොවිපළවලට මීදුම ලැබෙනකොට තෘණ වගාවත් සාර්ථකව සිදු වන බව. ඒ වාගේ අධිපෝෂිත තෘණ වගාවන් තිබෙනවා. ඒවා පිළිබඳ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පර්යේෂණ කරලා තිබෙනවා. ඒ පර්යේෂණ තුළින් විශාල වැඩ කොටසක් ඔවුන් ක්‍රියාත්මක කර තිබෙනවා. පළාත් සභා සමඟ සම්බන්ධ වෙලා ඒ පිළිබඳ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපි අවස්ථාව සලසා දුන්නා.

වර්ෂා කාලවලදී සමහර වෙලාවට සතුන්ට අවශ්‍ය ආහාර සපයා ගන්න බැරි වෙනවා. මිල්කෝ ආයතනය සමඟ සම්බන්ධවෙලා ගණ කැටයක් වශයෙන් සත්ව ආහාර නිෂ්පාදනය කරගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒවා ප්‍රමිතියට අනුකූලවයි ලබා දීලා තිබෙන්නේ. සමහර වෙලාවට නිෂ්පාදනය වැඩි කරගෙන යන කොට, මේ කටයුතු ලියා පදිංචි නොවූ කාර්යයක් නිසා තහංචි දමනවා නම්, අපේ ගෘහ කර්මාන්තය පිළිබඳ නැවත අපට හිතන්න වෙලා තිබෙනවා. එහෙම නොසිතා මේ කර්මාන්තය අපට ඉස්සරහට ගෙන යන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. මේ කර්මාන්තය ශක්තිමත් කරගෙන ඉස්සරහට යා යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනගහනය වැඩි කොළඹ නගරය තුළ ඉඩ පහසුකම් අඩුයි. නවත් සමහර නගර තුළ ඉඩ පහසුකම් අඩුයි. නමුත් බල්ලන්, බළලුන්, පක්ෂීන් වැනි සතුන් සුරතලයට ඇති කරනවා. ඒ සුරතලයට ඇති කරන බල්ලාට අවශ්‍ය ආහාර ටික ගෙදරදී සකස් කර දෙන්න දැන් සූදානම් නැහැ. දැන් පුරුදු වෙලා තිබෙනවා, ගෙදර යන ගමන් කඩෙන් අරගෙන ගිහින් මේ සතුන්ට dog food නැත්නම්, pet food දෙන්න. ඒ නිසා ඒවා නිෂ්පාදනය කරනවා. මිලදී ගැනීමේදී ප්‍රමිතිය අනුව එම සත්ව ආහාර නිෂ්පාදනය කර තිබෙනවාද කියා තහවුරු කර ගැනීමට අවශ්‍ය පසු බිම සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් සකස් කිරීම පිළිබඳව මම ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් පමණයි තිබෙන්නේ.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ඔබතුමා දැන් මගේ යාළුවෙක් නොවන නිසා, විනාඩි දෙකෙන් මා කථාව අවසන් කරන්නම්. මම මෙච්චර කල් ඔබතුමා මිත්‍රයෙක් හැටියටයි හිතුවේ. නමුත්, මිත්‍රයෙක් නොවන බව මට තේරෙනවා.

ගරු ඇමතිතුමනි, මන්නාරම පැත්තේ කුකුළු ගොවි පොළවල් තිබෙනවා. ඔබතුමා ගිහින් නැතුව ඇති ඒවා බලන්න. කිකිළියන් බිත්තර දානවා. ඒ කොටුවල බිත්තර ආරක්ෂා කරන්නේ කොහොමද කියලා ගිහින් බලන්න. කුකුළු ගොවි පොළවල් යායට තිබෙනවා. ඒ යායට තිබෙන භූමි භාග පිළිබඳව සත්ව නිෂ්පාදන ගැන කථා කරන මේ අවස්ථාවේ අපි කථා කරමු. ඔබතුමා කථා කළේ වෙන මොකක්වත් නෙවෙයි. ඒ ප්‍රදේශයේ මිනිසුන්ට වන අසාධාරණ පිළිබඳව. ඒ ගැන කථා කරන්න ඕනෑ. හැබැයි, සත්ව නිෂ්පාදන පිළිබඳව කථා කරද්දි අපි බලන්න ඕනෑ ඒ කටයුතු ක්‍රියාත්මක කරන්නේ කොයි ආකාරයටද කියන එක ගැන. එය ගෘහ කර්මාන්තයක් හැටියට දියුණු කරමින්, ඒක පුද්ගල ආදායම ඉහළ නැංවීමට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න මහජන නියෝජිතයන් හැටියට අප කැප වෙන්න ඕනෑ.

අපි ප්‍රදේශයක් තෝරාගෙන ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන කොට ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව සිංහලද, දෙමළද, මුස්ලිම්ද කියලා වර්ග කිරීමකින් තොරව, සියලුදෙනා ශ්‍රී ලාංකිකයන් හැටියට සලකා කටයුතු කළ යුතු වනවා. ජාතිකත්වය අනුව බෙදා වෙන් කරන්න, කොන් කරන්න, ඈත් කරන්න අපට අවශ්‍ය නැහැ. ශ්‍රී ලාංකික ජනතාවක් හැටියට අපට ඉස්සරහට යන්න පුළුවන් නම්, එයයි අපට අවශ්‍ය වෙන්නේ. Cricket match එකක් ගහන කොට අපි සාමූහිකව එකතු වෙලා ක්‍රියාත්මක වෙනවා. මුත්තයියා මුරලිදරන් බෝලය දමන කොට අපි අභිමානයෙන් කථා කරනවා, "ශ්‍රී ලාංකිකයෙක් නේද?" කියලා. මහරුන් බෝලය දමන කොට අපි බලනවා,

"ශ්‍රී ලාංකිකයෙක් නේද?" කියලා. සනත් ජයසූරිය හයේ පාරවල් ගහන කොට අපි බලනවා, "ශ්‍රී ලාංකිකයෙක් නේද?" කියලා. හැබැයි, අපි රට තුළ බෙදිලා වෙන් වෙලා ඉන්නවා. අරයාගේ කණ්ඩායම, මෙයාගේ කණ්ඩායම කියලා බෙදිලා යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. නමුත්, ඊට එහා ගිය දෙයක් තිබෙනවා.

බලන්න, සිංහල භාෂාවෙන් ගායනා කරන සමහර සිංදු. ඒවා නිර්මාණය කරලා තිබෙන්නේ කවුද? කරුණාරත්න මැතිතුමා සිංදුව ලියනවා. රොක්සාමි සංගීතය සපයනවා. මොහිදීන් බෙග් සිංදුව කියනවා. සිංදුව ලියලා, රටට ඇහෙන්න කියන කොට, අපි අත්පුඩි ගහලා නටනවා. මේ වාගේ තැනක ඉඳලා, බෙදලා වෙන් කරන්න, කොන් කරන්න, ඈත් කරන්න සූදානම් වෙන්න එපා. අපට අවශ්‍ය වෙන්නේ ශ්‍රී ලාංකික ජාතියක් හැටියට ගොඩ නැහෙන්න. මොන මොන ප්‍රශ්න තිබුණත් කතිකාවකට ඇවිල්ලා ක්‍රියා කරන්න පුළුවන්. ඒකයි අපට අවශ්‍ය වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up. Your time is over now.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මේ කාරණය කියලා මම කථාව අවසන් කරන්නම්.

ගරු ඇමතිතුමනි, මන්නාරම පැත්තේ තිබෙන කුකුළු ගොවි පොළවල්, ගව ගොවි පොළවල්, කුඹුරු ගොවිතැනත් එක්ක එකතු කර ගන්න. ඒ අනුව පස් ගෝ රස නිෂ්පාදනය කරන්න අවශ්‍ය පසු බිම සකස් කරන්න කියලා මම ඉල්ලනවා. නැවත වරක් මම පී. හැරිසන් ඇමතිතුමාට, නියෝජ්‍ය ඇමතිතුමාට, ඒ වාගේම ලේකම්තුමිය ඇතුළු අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයටත්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු එම කාර්ය මණ්ඩලයටත් මගේ ස්තුතිය පුද කරන අතර, ග්‍රාමීය ආර්ථිකය ගොඩනැඟීම සඳහා ඍජු දායකත්වය ලබා දෙන්න කියලා ආයාචනා කරනවා. ස්තුතියි.

[අ.භා. 4.10]

ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය (ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (டாக்டர்) (திருமதி) அனோமா கமகே - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Anoma Gamage - Deputy Minister of Petroleum Resources Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1986 අංක 15 දරන සත්ව ආහාර පනත් කෙටුම්පත සංශෝධනය කිරීමේ විවාදයට සම්බන්ධ වීමට අවස්ථාවක් ලබා දීම ගැන මම ඔබතුමාට පළමුවෙන්ම මගේ කෘතඥතාව පිරිනමනවා.

වර්තමානයේ මම පූර්ණ කාලීනව දේශපාලනයට යොමු වී සිටියත් මාගේ මූලික අධ්‍යාපනය වූ පශු වෛද්‍ය විද්‍යාවට අනුබද්ධිත විෂයයක් පිළිබඳව අද කථා කිරීමට අවස්ථාවක් ලැබීම මට ඉතාමත් සතුටට කාරණාවක්. ඒ වාගේම විශ්වවිද්‍යාලයේ මා සමඟ සමකාලීනව අධ්‍යාපනය ලබපු සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ සියලුම විධායක නිලධාරිතුමන්ලා- විධායක නිලධාරිතුමියන්ලා එකතු වෙලා 1986 හදපු පනතට සංශෝධනයක් ඉදිරිපත් කරන්න දායක වීම ගැනත් මට ඉතාමත් සතුටකුත්, ආඩම්බරයකුත් දැනෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සත්ව ආහාර පනතේ සංශෝධන ගැන කථා කිරීමට පෙර සත්ව ආහාර පිළිබඳව වැදගත් කරුණු කිහිපයක් මේ ගරු සභාවට ඉදිරිපත් කළ යුතුයි කියලා මම හිතනවා. කෘෂි කාර්මික රටක් වන අපේ රටේ කෘෂිකර්මය හා සත්ව පාලනය යන ක්ෂේත්‍ර දෙකම එකිනෙකට බැඳී පවතිනවා. මනුෂ්‍ය ශරීරයට අවශ්‍ය ප්‍රෝටීන් ලබා ගැනීමේ ප්‍රධාන විභවය වශයෙන් අපි මාංශ, කිරි, බිත්තර ආදී සත්වමය ආහාර පාවිච්චි කරනවා. ඒ ආහාර සඳහා වෙළෙඳ පොළෙන් වැදගත් ස්ථානයක් හිමි වී තිබෙනවා. දියුණු රටවල ගොවිපොළවල ඇති කරන ගවයින්, එළදෙනුන් වැනි සතුන් නවීන තාක්ෂණ ක්‍රම මඟින් රැක බලා ගෙන, ඒ මඟින් ඔවුන්ගේ නිෂ්පාදනය වැඩි කර ගෙන ලොකු ආදායමක් ලබා ගන්නවා. "Look after your animal and they will look after you" යනුවෙන් කියමනක් තිබෙනවා. අපි ආහාරයට ගන්නා මස්-මාංශ, කිරි, බිත්තරවල වැඩියෙන්ම අඩංගු වන්නේ ප්‍රෝටීන්. ඊට අමතරව මේදය, විටමින් සහ ලවණ වර්ගත් අඩංගු වෙනවා. සත්ව ප්‍රෝටීන්වලට පවතින ඉල්ලුම 2050 වර්ෂය වන විට සියයට 60කින් පමණ වැඩි විය හැකි බව එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය ප්‍රකාශ කර තිබෙනවා.

සත්ව ප්‍රෝටීන්වල සංයුතියට ඍජුවම බලපාන්නේ සතුන්ට ලබා දෙන ආහාරවල ප්‍රමිතියයි. සත්ව ආහාර නිෂ්පාදනය කිරීමේදී යොදා ගන්නා අමුද්‍රව්‍ය, එම අමුද්‍රව්‍යවල සංයුතිය, නිෂ්පාදන ක්‍රියාවලිය ආදී කරුණු සත්ව ප්‍රෝටීන්වල සංයුතියට බලපානවා. ලංකාවේ බොහෝ සත්ව ගොවිපොළ හිමියන් සත්ව ආහාර නිෂ්පාදනය කරනවා. එතැනදී වැඩියෙන්ම වැදගත් වන්නේ එම ආහාරවල ගුණාත්මකභාවය පරීක්ෂා කරන්නේ කෙසේද, ඒවා පරීක්ෂා කරන්නේ කවුද, ඒවායේ ප්‍රමිතිය පිළිබඳ සහතිකයක් තිබෙනවාද යන්නයි. යම් කිසි ප්‍රශ්නයක් ඇති වූ විට ඒ ගැන සොයා බැලීම පමණයි දැනට තිබෙන ක්‍රමවේදය වන්නේ. ඒ වාගේම ගවයින්, එළුවන්, කුකුළන් වැනි මනුෂ්‍ය ආහාරයට ගන්නා සත්වයින්ට ලබා දෙන ආහාර විශ්ලේෂණය ඉතාමත් වැදගත් වන්නේ, සත්ව ආහාරවලින් මනුෂ්‍ය ශරීරයට බලපෑම් ඇති වෙන්න පුළුවන් නිසයි. සතුන්ට ලබා දෙන සෑම ආහාර වේලක්ම සමතුලිත නොවුණොත්, ඒවායේ විෂකාරක ද්‍රව්‍ය අඩංගු වුණොත්, ඒ මඟින් මනුෂ්‍ය ශරීරයටත් බලපෑම් ඇති වෙනවා.

අපි දන්නවා, සත්ව ආහාරවල ප්‍රතිජීවක ඖෂධ වර්ග හා හෝමෝන වර්ග අඩංගු වන බව. මේවායේ ප්‍රධාන අරමුණ වන්නේ නිෂ්පාදන වේගය වැඩි කිරීමයි. ඒ රසායනික ද්‍රව්‍ය සත්වයන්ගේ මාංශපේෂිවල තැන්පත් වෙනවා. එම සත්වයින් ආහාරයට ගත් විට ඒ රසායනික ද්‍රව්‍ය මනුෂ්‍ය ශරීරයට ඇතුළත් වෙනවා. රසායනික පොහොර භාවිතය නිසාත් දැන් අපේ රටේ වකුගඩු රෝගය ව්‍යාප්ත වීමෙන් විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන බව අපි දන්නවා. ඒ නිසා සත්ව ආහාරවලත් සමතුලිතභාවයක් තිබුණේ නැත්නම් අපි නොදැනුවත්වම යම් යම් විෂ සහිත දේවල් මනුෂ්‍ය ශරීරයට ඇතුළු වෙන්න පුළුවන්. මේ හේතුව නිසා සත්ව ආහාර නිෂ්පාදනයේදී යොදා ගන්නා අමුද්‍රව්‍යවල ප්‍රමිතිය පිළිබඳව සැලකිලිමත් වීම ඉතාම වැදගත් වෙනවා. නමුත් ඒවා විශ්ලේෂණය කිරීම සඳහා අපේ රටේ රසායනාගාර පහසුකම් තිබෙනවාද කියන එක ප්‍රශ්නයක්. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ ගැනත් සලකා බලන්න කියලා. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තිබෙන පහසුකම් එක්ක සත්ව ආහාරවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම ගැන අපට වැඩි අවධානයක් යොමු කරන්න වෙයි. ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සත්වයාගේ ජීවන රටාව, සෞඛ්‍යය, නිෂ්පාදන වේගය යන හැම දෙයක්ම සත්ව ආහාරවල සංයුතිය මත රඳා පවතිනවා. ඒ වාගේම සත්ව ආහාර මඟින් ඒ සතාගේ ශරීරයට ක්ෂුද්‍ර ජීවීන්

[ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය]

ඇතුළු වෙන්න පුළුවන්; අවසානයේදී සතුන් හරහා මනුෂ්‍ය ශරීරයටත් එම ක්ෂුද්‍ර ජීවීන් ඇතුළු වෙන්න පුළුවන්. ඊ-කෝලයි, සැල්මොනෙල්ලා වැනි බැක්ටීරියා වර්ග සහ බැර ලෝහ, වල් නාශක වැනි විෂ ද්‍රව්‍ය සහිත සත්ව ආහාර සතුන් අනුභව කිරීම නිසා ඒවා මනුෂ්‍ය ශරීරයටත් ඇතුළු වෙලා මනුෂ්‍යයින්ගේ සෞඛ්‍යයටත් ඍජුවම බලපෑම් ඇති කරන්න පුළුවන්. සමහර රෝග හැදුණොත් ඒ මුළු ගොවිපොළම විනාශ කරන්න වෙන බව අපි දන්නවා. පිටරට ගොවිපොළවල සිටින සමහර ගවයින්ට වැලඳෙන රෝග නිසා ඒ මුළු ගොවිපොළම විනාශ කර, ඒ රෝගයෙන් සතුන් බේරා ගන්න සිදු වෙන අවස්ථා තිබෙනවා. අපේ රටේ නම් තවම එහෙම ලොකු ප්‍රශ්නයක් ඇති වුණේ නැහැ. ඒ නිසා සත්ව ආහාරත්, ඒවායේ ප්‍රමිතියත්, සතුන්ගේ සෞඛ්‍යයත් ඉතාම වැදගත් දේවල් ලෙස අප සැලකිය යුතු කාරණය කියා මා හිතනවා. එමඟින් ආර්ථිකයටත් විශාල බලපෑමක් සිදු වෙනවා.

කාබන්, නයිට්‍රජන් හා පොස්පරස් තමයි සත්ව ආහාරවල වැඩියෙන්ම අඩංගු වන්නේ. මේවා ජීර්ණය වුණාට පසුව අපද්‍රව්‍ය වශයෙන් පරිසරයට එකතු වෙනවා. සතුන්ට සමතුලිත ආහාර වේලක් ලබා දුන්නේ නැත්නම් ඔවුන් මලපහ වශයෙන් බැහැර කරන දේවලින් පවා පරිසර හානියක් සිද්ධ වෙන්න පුළුවන්. සතුන්ගේ ජීව බර වැඩි වෙන නිසා ප්‍රතිජීවක ඖෂධ වර්ගත් සත්ව ආහාර සමඟ මිශ්‍ර කිරීම සිදු කරනවා. ඒ නිසා අපි ඒ සම්බන්ධවත් අවධානය යොමු කර ක්‍රියාත්මක විය යුතුයි.

සත්ව ආහාර වේලක මිල ගත්තොත්, ඒ මිලෙන් සියයට 70ක් විතර වැය වෙන්නේ අමුද්‍රව්‍යවලටයි. අද අපේ ඇමතිතුමා කිව්වා වාගේ අපේ රටේ වාර්ෂිකව සත්ව ආහාර මෙට්‍රික් ටොන් ලක්ෂ නවයක් පමණ නිෂ්පාදනය වෙනවා. එයින් සියයට 95ක් විතර කුකුළු කෑම. නමුත් කුකුළු කෑමවලට අවශ්‍ය වෙන බඩ ඉරිහු අපට අවශ්‍ය ප්‍රමාණයෙන් අපේ රටේ නැහැ. ඒ නිසා බඩ ඉරිහු අවශ්‍යතාවෙන් සියයට 50ක් පමණ අපි ආනයනය කරනවා. මෙසේ ආනයනය කිරීමේදී අපට ඒ සඳහා ලොකු මුදලක් වැය වෙනවා. ඒ නිසා අපි බඩ ඉරිහු නිෂ්පාදනය වැඩි කරනවා වාගේම ලෝක වෙළෙඳ පොළේ බඩ ඉරිහු මිල අඩු කාලවලදී ඒවා ආනයනය කිරීමටත් පියවර ගන්න ඕනෑය කියා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතෙහි ප්‍රධාන අරමුණ වන්නේ, දේශීය වෙළෙඳ පොළේ විකිණීමට ඇති සත්ව ආහාරවල ප්‍රමිතිය සුරක්ෂිත කිරීමයි. ඒ මඟින් ප්‍රමිතියෙන් තොරව සත්ව ආහාර නිෂ්පාදනය කරන අයට නීති, රෙගුලාසි පනවනවා. එක එක සත්ව වර්ගයින්ට දෙන ආහාර වර්ග වෙනස්. ගවයින්, එළදෙනුන් කන ආහාර නොවෙයි, කුකුළන්ට දෙන්නේ. ඌරන්ට දෙන්නේ වෙන ආහාර වර්ගයක්. අශ්වයින්ට දෙන්නේ වෙන ආහාර වර්ගයක්. ඒ නිසා මේවායේ තිබෙන සංඝටක ගොඩක් විවිධයි. ඒ විවිධත්වය, සංකීර්ණතාව නිසා තමයි, 1986 වර්ෂයේ සත්ව ආහාර පනත සම්මත වුණත්, එය හරියාකාරව ක්‍රියාත්මක වුණේ නැත්තේ. එහි වෙනස්කම් ඇති කරන්නත් මෙපමණ කාලයක් ගියේ ඒකයි.

සත්ව නිෂ්පාදන ක්‍රියාවලියේදී සත්ව ආහාරවල වැදගත්කම සලකා බලා තමයි සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශය මේ පනත සංශෝධනය කළ යුතුයි කියා තීරණය කර තිබෙන්නේ. සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත පනතක් ලෙස සම්මතවීමෙන් පසු ඒ මඟින් සියලුම අමුද්‍රව්‍ය සඳහා නීති පැනවෙනවා. ඒ වාගේම ආනයනික සත්ව ආහාර සඳහාත් නීති පැනවෙනවා. මෙම (සංශෝධන) පනත් කෙටුම්පත පනතක් ලෙස සම්මත වීමෙන් පසු එම නීති ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වෙන නිලධාරීන්ටත් බලතල වැඩි වෙනවා. එසේම පනත් නියමයක් කඩ කළොත්, දඩුවම් වශයෙන් කලින් පනවා තිබුණු රුපියල් දහස, රුපියල් පනස්දහසක් දක්වා වැඩි කරන්නත් මෙම සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පතින් අනුමැතිය ඉල්ලා තිබෙනවා.

අපේ රට කෘෂි කාර්මික රටක්. ඒ නිසා මෙම පනත් කෙටුම්පත පනතක් විධියට සම්මතවීමෙන් පසුව අපේ රටට විශාල ප්‍රයෝජනයක් ඇති වෙයි කියා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Deputy Minister, please wind up.

ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (டாக்டர்) ((திருமதி) அனோமா கமகே)
(The Hon. (Dr) (Mrs.) Anoma Gamage)
Sir, please give me half a minute. අපි සත්ව ආහාර සම්බන්ධයෙන් පාලනයක් ඇති කළොත් එය මනුෂ්‍යයාටත් බලපානවා. ඒ තුළින් නොදැනුවත්වම රටටත් ලොකු සේවාවක් ඉෂ්ට වෙනවාය කියා මා හිතනවා. ඒ නිසා සත්ව ආහාර පනත සංශෝධනය කරන්න දායක වුණු ගරු ඇමතිතුමාටත්, අමාත්‍යාංශ නිලධාරීන්ටත්, ඒ වාගේම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු සියලු දෙනාටත් මගේ කෘතඥතාව පළ කරනවා. බොහොම ස්තුතියි.

[ප.ව. 4.21]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 1986ஆம் ஆண்டின் 15ஆம் இலக்க, விலங்குத் தீனிச் சட்டத்தைத் திருத்துகின்ற இந்தச் சட்டமூலம் தொடர்பாக எனது கருத்துக்களை முன்வைப்பதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி தெரிவித்துக்கொள்கின்றேன். கால்நடை வேளாண்மை என்பது வட பகுதியிலே மிகவும் முக்கியமான ஒரு தொழிலாக அமைந்திருக்கின்றது. மக்களுக்கு வருமானத்தை ஈட்டிக்கொடுக்கக்கூடிய வகையிலே, அவர்களது வாழ்க்கைத் தரத்தை மேம்படுத்தக்கூடிய வகையிலே, இந்த விலங்கு வேளாண்மைத் தொழில் அமைந்திருக்கின்றது. நீண்டகால யுத்தத்தின்பொழுது அனைத்தையும் இழந்து வெறுங்கையோடு மீள்குடியேறிய எமது மக்களுக்கு அரச மற்றும் அரச சார்பற்ற நிறுவனங்களால் விலங்கு வேளாண்மையை மீளவும் ஆரம்பிப்பதற்காகப் பல்வேறு விதமான திட்டங்கள் முன்வைக்கப்பட்டிருந்தாலும், இன்றும் எமது வட பகுதியிலே ஏழ்மைநிலை மேலோங்கியிருக்கின்றது. காரணம், அடையாளம் காணப்பட்டவர்களுக்கு நிகழ்ந்த தவறுகளால்தான் அவர்களது வாழ்வாதாரத்தை மேம்படுத்த முடியாமல் இருக்கின்றதென்பது இங்கு ஈண்டு குறிப்பிடத்தக்கது.

கடந்த அரசினால் 'வடக்கின் வசந்தம்', 'கிழக்கின் உதயம்' என்ற பெயர்களில் பாரியளவிலான அபிவிருத்தித் திட்டங்கள் முன்னெடுக்கப்பட்டன. 'சுண்டங்காய் கால் பணம்; சுமை கூலி முக்கால் பணம்' என்ற வகையில்தான் அத்திட்டங்கள் முன்வைக்கப்பட்டன. அந்த வகையிலே, எமது மக்கள் தமது அடிப்படைத் தேவையான வாழ்வாதாரத்தை மேம்படுத்த முடியாத ஒரு நிலையிலே தொடர்ந்தும் வாழ்ந்து வருகின்றமை மிகவும் வேதனைக்குரிய ஒரு விடயமாகும். கடந்த 7 வருடங்களாக நடைபெற்று வந்த இந்த மீள்குடியேற்ற நிகழ்வு

இப்பொழுது முடிவடைந்திருக்கிறது. வாழ்வாதாரத்தை மேம்படுத்துகின்ற வகையில் பல்வேறு தொழிலில் எமது மக்கள் ஈடுபட்டுக்கொண்டிருக்கின்றார்கள்.

முல்லைத்தீவு மாவட்டத்தைப் பொறுத்தவரையில், அங்கு அறுபத்தொன்பதாயிரத்துக்கும் மேற்பட்ட கலப்பின உள்ளூரின மாடுகள், பதினோராயிரத்து ஐம்பதுக்கும் மேற்பட்ட எருமை மாடுகள் போன்றவற்றால் நாளொன்றுக்கு 12,000 லீற்றர் பால் உற்பத்தி செய்யப்படுகின்றது. இவ்வாறாக கால்நடை வளர்ப்பு மேற்கொள்ளப்படுகின்ற அதேவேளையிலே, வட பகுதியிலே விவசாயத் தொழிலும் ஒரு முக்கிய தொழிலாகக் காணப்படுகின்றது. ஆயினும், இந்தக் கால்நடைகளைப் பொருத்தமான முறையிலே பராமரிப்பதற்கு அதாவது அவற்றை மேய்ப்பதற்கும் அவற்றுக்குரிய தீவனத்தை வழங்குவதற்குமுரிய திட்டங்கள் அங்கு வகுக்கப்படவில்லை. அங்குள்ள 11,000 ஏக்கர் காணி மேய்ச்சல் தரையாக அமைப்பதற்கென அடையாளங்காணப்பட்டாலும் அதனை மேய்ச்சல் தரையாக அமைக்க வனவளப் பாதுகாப்புப் பிரிவினர் அனுமதி வழங்கவில்லை. அதனால் அங்கு வாழ்கின்ற மீள்குடியேறிய மக்கள் தமது கால்நடைகளுக்குரிய தீவனத்தை வழங்குவதில் மிகவும் இன்னல்களை எதிர்கொள்கின்றார்கள். மேய்ச்சல் தரை இல்லாத சந்தர்ப்பத்திலே நல்லினப் புல் வளர்ப்பில் ஈடுபடுகின்றவர்களுக்கான ஊக்குவிப்புக்கள் வழங்கப்பட்ட போதும், அந்தப் புற்களை வளர்ப்பதற்கான பண வசதியோ, வேலிகளை அமைப்பதற்கான பண வசதியோ அல்லது நீர்ப்பாசனத்திற்குரிய வசதிகளோ மக்களுக்குச் செய்து கொடுக்கப்படாமையால், கால்நடைகளுக்குத் தீவனம் வழங்குவதென்பது மக்களுக்குத் தொடர்ந்தும் பிரச்சினையாகவே இருந்துவருகின்றது.

அதுமட்டுமல்ல, அங்கு விற்பனை செய்யப்படுகின்ற செயற்கைத் தீவனங்களது தரம், அவற்றினது உற்பத்தித் திகதி, மற்றும் காலாவதியாகும் திகதி என்பவற்றை ஆய்வு செய்வதற்குரிய எந்தவிதமான நடவடிக்கைகளும் மேற்கொள்ளப்படுவதில்லை.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. J.M. Ananda Kumarasiri to take the Chair?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

Sir, I propose that the Hon. J.M. Ananda Kumarasiri do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, please continue with your speech.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාජා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)

இவ்வாறாகத் தமது வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்காகப் பல்வேறு இன்னல்களின் மத்தியிலும் எமது மக்களால் உற்பத்தி செய்யப்படுகின்ற விலங்கின உற்பத்திகளைச் சந்தைப்படுத்துவதற்கும் அங்கு ஏற்பாடுகள் மேற்கொள்ளப்படாதிருப்பது கவலைக்குரிய விடயமாகும். உதாரணமாக இன்று வட பகுதியிலே பால் உற்பத்தி அதிகமாக இருந்தாலும், பால் என்பது மூலப்பொருளாகவே தென்பகுதிக்கு எடுத்துச் செல்லப்படுவது ஈண்டு குறிப்பிடத்தக்க ஒரு விடயமாக இருக்கின்றது. இந்த மூலப்பொருளை முடிவுப்பொருளாக்கக்கூடிய ஒரு கைத்தொழிற்சாலை அந்தப் பகுதியில் இதுவரை அமைக்கப்படாமை மிகவும் வேதனைக்குரிய விடயமாகும். யுத்தம் முடிவடைந்ததன் பின்பு கைத்தொழிற்சாலைகளை அமைக்கக்கூடிய வகையிலே போக்குவரத்து, மின்சாரம், அதற்குரிய ஆளணி, அதற்குரிய இடவசதிகள் - நில வசதிகள் இருந்தும் அங்கு உற்பத்தி செய்யப்படுகின்ற மூலப்பொருட்களை முடிவுப்பொருட்களாக மாற்றக்கூடிய வாய்ப்புக்கள் - சந்தர்ப்பங்கள் ஏற்படாமையினால் எமது மக்கள் தொடர்ந்தும் கூலியாட்களாகவும் மாடு மேய்ப்பவர்களாகவும் தோட்டம் செய்பவர்களாகவும் இருக்கின்றார்களே தவிர, அவர்கள் தங்களது வருமானத்தை அதிகரித்து முதலாளிகளாக மாறக்கூடிய சந்தர்ப்பம் ஏற்படவில்லை.

அதுமட்டுமல்ல, பாலைக் கொள்வனவு செய்வதற்கெனத் தென்பகுதியிலிருந்து வருகின்ற கம்பனிகளாலே பாலினது தரம், அதனது அடர்த்தி என்பவை ஒழுங்காகப் பரிசீலனை செய்யப்படுவதில்லை. எனவே, பால் மாதிரிகள் பரிசீலிக்கப்பட்டு, கொள்வனவு செய்யப்படுகின்ற பால் பற்றிய பதிவுகள் கணினி மயப்படுத்தப்பட்டு அந்த மக்களால் - உற்பத்தியாளர்களால் சந்தைப்படுத்தப்படுகின்ற பாலுக்கான பணத்தை உடனடியாகக் கொடுக்கின்ற வகையில் நடவடிக்கை மேற்கொள்ளப்பட வேண்டும்.

மேலும், மீள்குடியேற்றத்தின் பின்னர் அரச சார்பற்ற நிறுவனங்களாலும் அரச நிறுவனங்களாலும் வழங்கப்பட்ட மாடுகளில் பல்வேறுவிதமான குறைபாடுகள் இருப்பதால், அவற்றின்மூலமாக எமது மக்கள் முழுமையான வருமானத்தைப் பெறமுடியாத ஒரு நிலைமை இருக்கின்றது. அத்துடன், விலங்கு வேளாண்மையில் ஆளணிப் பற்றாக்குறையும் ஒரு பின்னடைவை ஏற்படுத்தியிருக்கின்றது. சட்டங்களிலும் சுற்றுநிருபங்களிலும் 300 பண்ணையாளர்களுக்கு ஒரு வைத்தியர், 150 குடும்பங்களுக்கு ஒரு கால்நடை அபிவிருத்திப் போதனாசிரியர் என்று எழுத்துமூலம் இருந்தாலும், முல்லைத்தீவைப் பொறுத்தவரையில் அங்கு 11 வைத்தியர்களும் 7 போதனாசிரியர்களுமே உள்ளனர். இலங்கையில் 3 சதவீதமான நிலப்பரப்பை முல்லைத்தீவு மாவட்டம் கொண்டிருக்கின்றது. இவ்வாறான ஒரு பரந்த மாவட்டத்திலே களரீதியான சேவைகளை வழங்குவதற்கு அங்கு சேவையாற்றும் உத்தியோகத்தர்களுக்கான வாகன வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்படாமையும் இந்தக் கால்நடை அபிவிருத்தியின் பின்னடைவுக்கு ஒரு காரணமாகும். அத்துடன், எமது மீள்குடியேற்றப் பகுதிகளிலே

[ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය]

නඩමාඩුම් සේවෙ තොකුතිකල් ඒර්පඩුත්තප්පඩ වේණ්ඩියතුම් ඔර් අවසිය තේවෙයාකක් කාණප්පඩුකින්රතු. මේලුම්, පණ්ණෙයාළර්කළුක්කාන පයිර්සිකළ් වළංකප්පඩුවතෝටු, අන්තප් පයිර්සිකළින් පින්පු අවර්කළ් අතනෙ එව්වාරු මේර්කොළ්කිරාර්කළ් එන්ර තොටර් කණ්කාණිප්පුකළෙ මේර්කොළ්ළ වේණ්ඩියතුම් අවසියමාකුම්.

ඉතර්කුම් මේලාක, තෙන්පකුතියිලිරුන්තු 'පට්ටා' පෝන්ර වාකනංකළිල් කොණ්ඩුවරප්පඩුකින්ර කෝළික්කුඤ්සුකළ් එමතු මක්කළෙ ඒමාර්රි විර්කප්පඩුකින්රන. අවෙ තරමාන කුඤ්සුකළාක ඉල්ලාතතාල් අතාවතු, අවර්රුක්කුරිය තටුප්පූසිකළ් වළංකප්පටාමෙ, සරියාන මුරෙයිල් උර්පත්ති සෙය්යප්පටාමෙ පෝන්ර කාරණංකළාල්, ඉටෙයිල් ඉරන්තුපෝකින්රන. ඉවර්රෙක් කණ්කාණිප්පතර්කෙනච් සරියාන මුරෙයිලේ ආළණිකළ් උරුවාක්කප්පටාවිටින් තොටර්න්තුම් එමතු මක්කළෙ ඒල්මෙ නිලෙයිලිරුන්තු මුන්නේර්ර මුටියාත ඔරු නිලෙතාන් ඒර්පටුම්.

අටුත්තතාක, කාල්නටෙ අපිවිරුත්තිත් තිණෙක්කළත්ති නූටාක අමුල්පටුත්තප්පට්ටිරුක්කින්ර සුර්රුනිරුපංකළ් ඉළෙඤර්, යුවතිකළෙ උළ්වාංකක්කූටිය වකෙයිල් මාර්රියමෙක්කප්පට වේණ්ඩියතු මිකවුම් මුක්කියමාකුම්. කාල්නටෙ අපිවිරුත්තිප් පෝතනාසිරියර්කළුක්කු ටිප්ලෝමා කර්කෙ නෙරියුම් ක.පොර.ත. උයර් තරත්තිල් 3 පාටංකළිල් සිත්තියුම් තකෙමෙකළාක ඉරුක්ක වේණ්ටුමෙන්ර සුර්රුනිරුපත්තිනාල්, සාතාරණමාක ඉළෙඤර්, යුවතිකළෙ ඉන්ත කාල්නටෙ වෛත්තියත්තුරෙයිලේ උළ්වාංකමුටියාත ඔරු නිලෙ ඉරුක්කින්රතු. කුරෙන්තතු ක.පොර.ත. සාතාරණ තරම් අල්ලතු ක.පොර.ත. උයර්තරච් සිත්තියෝටු ඉන්ත වෙළික්කළප් පෝතනාසිරියර්කළෙ උළ්වාංකුකින්ර ඔරු සුර්රුනිරුපම් වෙළියිටප්පටුමානාල්, අංකිරුක්කින්ර ආළණිප් පර්රාක්කුරෙයෙ නාම් නීක්කුවතෝටු, ඉන්ත විලංකු වේළාණ්මෙයිල් ඊටුපට්ටිරුප්පවර්කළුක්කු සරියාන සේවෙයෙ වළංකක්කූටියතාකවුම් ඉරුක්කුම්. විලංකු වේළාණ්මෙයිල් මට්ටුමල්ල, මීන් වළර්ප්පිලුම් ඉව්වාරාන කුරෙකළ් තොටර්න්තුකොණ්ටිරුක්කින්රන.

අංකුළ්ළ පතවි වෙර්රිටංකළෙ නිරප්පුකින්රපොළුතු, අංකු තොටර්න්තු වාළ්කින්ර තකුතියානවර්කළෙ විටුත්තු වෙළි මාවට්ටංකළෙච් සේර්න්තවර්කළෙක්කොණ්ටු අවර්රෙ නිරප්පිවිටුකිරාර්කළ්. පින්පු අවර්කළ් ආරු මාතංකළිල් අල්ලතු ඔරු වරුටත්තිල් තංකළතු සෙල්වාක්කෙප් පයන්පටුත්তි තමතු මාවට්ටංකළුක්කු මාර්රලාකිච් සෙල්වතනාල්, තොටර්න්තුම් එමතු තිණෙක්කළංකළිල් වෙර්රිටංකළ් ඉරුන්තුකොණ්ටේ ඉරුක්කින්රන.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, you have only two more minutes.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) චාන්ති ශ්‍රීස්කන්දරාචා)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
ඉන්නිලෙ මාරුකින්රපොළුතුතාන්, මීල්කුටියේරිය මක්කළෙ මීණ්ටුම් - *[ඉටෙයීටු]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු පී. හැරිසන් ඇමතිතුමා.

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. ඉහරිචන්)
(The Hon. P. Harrison)
ගරු මන්ත්‍රීතුමියනි, පශු සම්පත් අමාත්‍යාංශයේ මේ විෂයය සියයට අනූවක්ම බෙදලා දීලා තිබෙන්නේ පළාත් සභාවටයි. අපි කරන්නේ පශු වෛද්‍යවරුන් බඳවා ගෙන යවන එක විතරයි. අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල බඳවා ගැනීම් කරන්නේ, ඒ වාගේම ඒ ප්‍රදේශයේ අනෙක් පහසුකම් සම්පූර්ණයෙන්ම සපයන්නේ පළාත් සභාවයි. මේක පළාත් සභාවේ විෂය පථයට අයිති දෙයක්. මධ්‍යම ආණ්ඩුවෙන් කරන්නේ අවශ්‍ය නිලධාරීන් පත් කරලා යවන එක විතරයි. එසේ පත් කිරීම් කරන්නේත් පශු වෛද්‍යවරුන් පමණයි. ඒ වාගේම ඒ ගොල්ලන්ට අවශ්‍ය පහසුකම් සැපයීමත් අපෙන් සිද්ධ වෙනවා. එම නිසා පශු වෛද්‍යවරුන්ගේ අඩුවක් තිබෙනවා නම්, අපට පුළුවන් ඉදිරියේදී ඔවුන් බඳවා ගන්නා අවස්ථාවලදී උතුරු ප්‍රදේශවලට යවන්න. අනෙක් සියලු පහසුකම් කටයුතු සිද්ධ වෙන්නේ පළාත් සභාව මඟින්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, you may continue.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) චාන්ති ශ්‍රීස්කන්දරාචා)
(The Hon. (Mrs) Shanthi Sriskandarasa)
ආකවේ, එමතු මක්කළතු වාළ්වාතාරත්තෙ උයර්ත්ති - වරුමානත්තෙ උයර්ත්ති ඒළ්මෙ නිලෙයෙ මාර්රවේණ්ටුම් එන්රාල්, විලංකු වේළාණ්මෙ තොටර්පාක - විලංකු තීවනම් තොටර්පාක නිරෛවේර්රප්පටුම් චට්ටත් තිරුත්තංකළ් වෙරුමනේ එළුත්තිල් මට්ටුම් ඉරුක්කාමල්, අවෙ සරියාන මුරෙයිල් නටෛමුරෛප්පටුත්තප්පට වේණ්ටුම්. අන්තවකෙයිල්, වටක්කු, කිළක්කු මක්කළතු වාළ්විල් සුපිට්චම් ඒර්පටුවතර්කු, එම්මාල් මුන්වෛක්කප්පටුකින්ර පිරච්සිනෛකළෛත් තීර්ප්පතෝටු, අන්තන්තත් තුරෛයෝටු චාර්න්ත ඒනෙය පිරච්සිනෛකළෛයුම් කරුත්තිල් එටුත්තු, අවර්රෛච් සරියාන මුරෙයිල් චෙයර්පටුත්ත වේණ්ටුම් එන්රු කේට්ටු, එනතු උරෛයෛ නිරෛවුචෙය්කින්රේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළහට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.34]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා වැදගත් මාතෘකාවක් සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. විශේෂයෙන්ම මා නියෝජනය කරන බිංගිරිය ආසනයේ සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අවට ආසනවල කුකුළු මස් ව්‍යාපාරය සහ බිත්තර නිෂ්පාදනය ඉතා වැඩි වශයෙන් සිදු වනවා.

රටේ බිත්තර නිෂ්පාදනයෙන් සියයට 60ක්, 70ක් වාගේ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්. එයිනුත් මම නියෝජනය කරන බිංගිරිය ආසනයේ තමයි වැඩි නිෂ්පාදකයන් පිරිසක් ඉන්නේ. ඇත්තම කියනවා නම්, පසු ගිය කාලයේ බිත්තර සහ කුකුළු මස් හොඳ මිලකට අලෙවි වුණා. මේ

ව්‍යාපාරය අද හොඳ තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. නමුත් අපට මේ ව්‍යාපාරය ඉස්සරහට ගෙනියන්න අපේ ගරු ඇමතිතුමාගෙන් උදව් කීපයක් අවශ්‍ය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කුකුළු කෑම නිෂ්පාදනයේදී සියයට 50කට ආසන්න අමුද්‍රව්‍ය ප්‍රමාණයක් දේශීය වශයෙන් අපි ලබා ගන්නේ බඩ ඉරිඟු, සහල් කුඩු - rice polish - සහ සුන් සහල්වලින්.

ඊට අමතරව විදේශ රටවලින් සෝයා, මාළු කුඩු, ඖෂධ සහ අනෙකුත් දේවල් ගෙන්වනවා. හැබැයි, සත්ව ආහාරවල, විශේෂයෙන්ම කුකුළු කෑමවල බහුතරයක් අඩංගු වෙන්නේ බඩ ඉරිඟු, rice polish සහ සුන් සහල් කියන දේශීය ආහාර ද්‍රව්‍යයි. නමුත් අද අපට තිබෙන ප්‍රශ්නය තමයි, ඒ ආහාර නිෂ්පාදන වියදම ඉතාම වැඩි වෙලා තිබෙන එක. නිෂ්පාදන වියදම වැඩි වෙන්න හේතුවෙලා තිබෙන්නේ මේ මූලික අමුද්‍රව්‍යවල මිල වැඩිවීමයි. අද බඩ ඉරිඟු කිලෝග්‍රෑම් එකක් රුපියල් 52ක් වෙනවා. Rice polish කිලෝග්‍රෑම් එකක් රුපියල් 40ක් විතර වෙනවා. සුන් සහල් කිලෝග්‍රෑම් එකක් රුපියල් 46ක් විතර වෙනවා. ඇත්තටම මේක අධික මිලක්. සුන් සහල් කිලෝග්‍රෑම් එකක් රුපියල් 46යි. හැබැයි, සහල් කිලෝග්‍රෑම් එකකුත් ගන්න පුළුවන් රුපියල් 46ට වඩා අඩුවෙන්. Rice polish කිලෝග්‍රෑම් එකක් රුපියල් 40යි. සහල් කිලෝග්‍රෑම් එකත් ඒ මිලටම ගන්න පුළුවන්. ඒ මිල වැඩිවීම මේ නිෂ්පාදකයන්ට දරාගන්න අමාරු තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. මෙතැනදී තිබෙන අවාසිය තමයි, බිත්තර අපනයන කිරීමේදී බරපතළ ගැටලුවකට අපට මුහුණ දෙන්න සිදු වන එක. මේ ආහාර නිෂ්පාදන මිල ඉහළ යෑමත් එක්ක අපට ලෝක වෙළෙඳ පොළේ මිලත් එක්ක තරග කරන්න බැහැ.

අපට බිත්තරයක නිෂ්පාදන වියදම රුපියල් 8කට කර ගන්න පුළුවන් වුණොත්, රුපියල් එකයි පනහක්, දෙකක් විතර අපනයන වියදම වශයෙන් වැය වුණොත්, අපනයනකරුවාට සත 50ක පමණ ලාභයක් තියාගෙන රුපියල් 10කට, 10.50කට බිත්තරයක් ලෝක වෙළෙඳ පොළට දෙන්න පුළුවන්. නමුත් අද තිබෙන නිෂ්පාදන මිලත් එක්ක අපට ඒක කරන්න බැහැ. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා, ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා.

විශේෂයෙන්ම අපනයනය කරන ද්‍රව්‍යවල බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ අවධානය යොමු කරලා, මේ නිෂ්පාදන මිල අඩු කර ගත්තොත්, ඒක අපේ අපනයනයටත්, ඒ වාගේම බිත්තර සහ කුකුළු මස් පරිභෝජනය කරන අපේ පාරිභෝගික ජනතාවටත් සහනයක් වෙනවා. මේ ක්ෂේත්‍රය පැත්තෙන් ආසියාවේ හොඳ තත්ත්වයක අද අපි ඉන්නවා. 2016 වර්ෂයේදී අපේ වාර්ෂික ඒක පුද්ගල බිත්තර පරිභෝජනය බිත්තර 110ක්. වාර්ෂික ඒක පුද්ගල කුකුළු මස් පරිභෝජනය කිලෝග්‍රෑම් අටක්. නිෂ්පාදන වියදම අඩු කරලා පාරිභෝගිකයාට අඩු මිලකට කුකුළු මස් දෙන්න පුළුවන් වුණොත් අපට මේ පරිභෝජන ප්‍රමාණය තවත් වැඩි කර ගන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, බඩ ඉරිඟු ආනයනය කිරීමේදී ඒ සඳහා අවසර පත්‍ර දීලා තිබෙන්නේ feed millersලාට; මහා පරිමාණයෙන් ගෙන්වන අයට. සමස්ත ලංකා බිත්තර නිෂ්පාදකයන්ගේ සංගමයටත්, ඒ වාගේම සමස්ත ලංකා කුකුළු ව්‍යාපාරිකයන්ගේ සංගමයටත් මීට කලින් මෙම අවසර පත්‍ර දීලා තිබෙනවා. අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ, මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට විතරක් ඒ අවසරය දෙන්න එපා කියලායි. බිත්තර නිෂ්පාදනය කරන අය අතරත් කුකුළු ආහාර ටික හදා ගන්නා මධ්‍යම පරිමාණයේ නිෂ්පාදකයන් ඉන්නවා. ඔබතුමා ඒ අය ගැනත් හිතලා ඒ අයටත් ඒ අවස්ථාව උදාකර දෙන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක්. ඔබතුමා මේ ක්ෂේත්‍රය දියුණු කරන්න දක්වන උනන්දුව ගැන අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පසු ගිය කාලයේ බඩ ඉරිඟු මිල වැඩි නිසා,-

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාව දෙන්න.

ඔබතුමා කිව්වා, මහා පරිමාණයේ feed millersලාට විතරයි මේ permits issue කරලා තිබෙන්නේ කියලා. නමුත් අපි එහෙම කරලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි අයට තමයි පසු ගිය වර්ෂවලදී බඩ ඉරිඟු බලපත්‍ර නිකුත් කරලා තිබෙන්නේ. එහෙම ලියා පදිංචි වීමක් වෙලා නැත්නම් අපේ දෙපාර්තමේන්තුව හැටියට අපට මැදිහත් වීමක් වෙන්න බැහැ, ඒ ගොල්ලන් නිෂ්පාදනය කරන කෑම වර්ග සම්බන්ධව. ඒ ගැන දැනට අරගෙන තිබෙන තීන්දුව ඒකයි කියන එක මා ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා තීන්දුවක් ගෙන තිබෙනවා, සතොසට බඩ ඉරිඟු අරගෙන, සමස්ත ලංකා බිත්තර නිෂ්පාදකයන්ගේ සංගමයටත්, සමස්ත ලංකා කුකුළු ව්‍යාපාරිකයන්ගේ සංගමයටත් රුපියල් 45 ගණනේ ලබා දෙන්න. ඒ පිළිබඳව යම් යම් ගැටලු තිබෙනවා. මේ සංගම්වලට කොච්චර ප්‍රමාණයක්ද ලබා දෙන්නේ සහ ඒ ක්‍රමවේදය පිළිබඳව තවම මේ සංගම් හරියට දැනුවත් වෙලා නැහැ. ඔබතුමා ඒ වරදත් නිවැරැදි කරන්න කටයුතු කරන්න යම් යම් දුර්මත සමාජයේ තිබෙන නිසා. සතොස ආයතනය ඒ නියමිත ක්‍රියා පටිපාටියෙන් බැහැරව රුපියල් 45 ගණනේ දෙනවාය කියන කාරණය ගැන සමාජයේ කථා බහක් තිබෙනවා. නමුත් මම දන්නේ නැහැ ඒකේ ඇත්ත නැත්ත. මම ඔබතුමාට අවධාරණය කර සිටිනවා ඒ ගැනත් සොයා බලන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, rice polish ගත්තාම ඒවායේ ප්‍රමිතිය පිළිබඳව බරපතළ ගැටලුවක් තිබෙනවා. දැන් රුපියල් 40යි rice polish කිලෝ එක. හැබැයි, අපි දන්නවා සමහර rice polish වල ප්‍රමිතිය පිළිබඳව බරපතළ ප්‍රශ්න තිබෙන බව. කලවම් කරපු ඒවා තිබෙනවා. තම්බපු හාල්වල rice polish එක්ක ඊට වඩා ප්‍රමිතියෙන් අඩු ඒවාත් කලවම් කරලා තිබෙනවා. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හෝ යොදාගෙන ඒවායේ ප්‍රමිතිය පිළිබඳව පරීක්ෂා කරන්න පුළුවන් ක්‍රමවේදයක් ඔබතුමන්ලාට හදා ගන්න පුළුවන් වුණොත් ඒ ගැටලුවත් නිරාකරණය කර ගන්න පුළුවන් වෙයි. මොකද ඒ ප්‍රමිතිය අඩු වුණාම සත්ව ආහාරවල ප්‍රමිතියත් අඩු වෙනවා. මේ වාගේ ගැටලු මේ ක්ෂේත්‍රයේ තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මේ ව්‍යාපාරයේ සුළු පරිමාණ ගොවීන් විශාල ප්‍රමාණයක් හිටියා. ඇත්තටම දැන් තිබෙන තරගකාරිත්වයත් එක්ක සුළු පරිමාණ ගොවීන් විශාල පිරිසක් මේ ක්ෂේත්‍රයෙන් ඉවත් වෙලා තිබෙනවා. දැන් අලුත් තාක්ෂණයක් ඇවිල්ලා තිබෙනවා, battery cage ක්‍රමය කියලා. මහා පරිමාණයෙන් මේ ව්‍යාපාරයේ නියැලෙන අය ඒ සඳහා විශාල ආයෝජනයක් කරනවා. අලුත් තාක්ෂණයත් අපට එන්න ඕනෑ. හැබැයි, කුකුළන් 500ක්, 1000ක්

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

අරගෙන තමන්ම ඒ වැඩ කරගෙන ව්‍යාපාරයක් කර ගෙන ගිය අයට ඒ තාක්ෂණයත් එක්ක තරග කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙනුත් ඔබතුමා යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න. සුළු පරිමාණ බිත්තර නිෂ්පාදකයන්ට සහනයක් සලසන්න පුළුවන් වුණොත් අපට ස්වයං රැකියා විශාල ප්‍රමාණයක් බිහි කරන්න පුළුවන්. තමන්ගේ ගෘහ ඒකකය තුළ ඒ වාගේ ගොවිපොළවල් හදලා ඒ අයගේ ජීවිත සාර්ථක කර ගන්න කටයුතු කරන්න පුළුවන්. මීට වසර 10කට, 15කට කලින් තිබුණු ඒ සුළු ව්‍යාපාර දැන් ක්‍රමක්‍රමයෙන් මහා පරිමාණ ව්‍යාපාරිකයන් අතට පත් වෙමින් යනවා. ඒ නිසා සුළු පරිමාණයේ ව්‍යාපාරිකයන් යම් කිසි අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා ඔබතුමාගේ අවධානය යොමු කරවමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ ව්‍යාපාරය සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශය දක්වන සහයෝගය පිළිබඳව. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.42]

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම සන්තෝෂ වෙනවා, මේ අමාත්‍යාංශය යටතේ වවන කීපයක් කථා කරන්න ලැබීම ගැන. අද මේ පනත් කෙටුම්පත ගැන බොහෝ කාරණා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කථා කළා. ගරු ඇමතිතුමාගෙන් මේ කාරණය ගැන විශේෂයෙන් අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. ගරු ඇමතිතුමනි, මම මේ සම්බන්ධ ආංශික අධීක්ෂණ කාරක සභාවක සභාපති ධුරය දරනවා. එහිදී මතු වූ එක කාරණයක් කියන්න ඕනෑ. සත්ව ආහාරවල ප්‍රමිතිය නැත්නම් ඒවායේ තත්ත්වය බලන්නේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන්. ඒ කියන්නේ PHI මහත්වරුන්. ඒ නිසා මෙහි වගකීම ඔබතුමා ගන්න කියලා අපි කියන එක වැරැදියි. නමුත්, අපේ ගම්වල; අපේ ප්‍රදේශවල PHI මහත්වරුන්ට එහි වගකීම හරියට දීලා නැති බවටයි ඔවුන්ගෙන් තොරතුරු අනාවරණය වන්නේ. ගරු අනෝමා ගමගේ නියෝජ්‍ය ඇමතිතුමිය කිව්වා වාගේ අපි කන කුකුළු මස්වල තත්ත්වය රැක ගන්න නොයෙකුත් හෝමෝන වර්ග, additives දාලා තිබෙනවා. ආහාරය පිණිස ඇති කරන කුකුළන් වර්ධනය කර ගැනීම සඳහා නොයෙකුත් හෝමෝන වර්ග පාවිච්චි කරනවා. එම මස්වල හෝමෝන වර්ග කොයි තරම් ප්‍රමාණයක් අඩංගුව තිබෙනවාද, ඒ හෝමෝන ශරීරයට සුදුසුද, යොදා ගනු ලබන එම හෝමෝන ප්‍රමාණයන් නිවැරදිද කියා මැන බැලීමේ වගකීම තිබෙන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයටයි. නමුත් ඒ කාර්ය සඳහා යොමු කර තිබෙන PHI මහත්වරුන්ව ඒ සඳහා පුරුදු පුහුණු කරලා නැහැ කියන එකයි සෞඛ්‍ය ක්ෂේත්‍රයෙන් දැන ගන්නට තිබෙන්නේ. අද මේ රටේ ජනතාව වැඩි වශයෙන් කුකුළු මස් පරිභෝජනය කරනවා. සාමාන්‍යයෙන් එක් පුද්ගලයකුගේ වාර්ෂික කුකුළු මස් පරිභෝජනය කිලෝ අටක් පමණ වනවා කියලා ඇමතිතුමා කිව්වා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය අවසර දෙනවා නම් මම පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි. ඇත්තටම ඔබතුමිය කියන කාරණය සම්බන්ධයෙන් මම එකඟ වෙනවා. ඒ සඳහා තමයි මෙම "සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත" යටතේ එම බලයලත් නිලධාරීන්ගේ බලතල වැඩි කරන්නේ. මොකද, ඔය ගැටලුව පසු ගිය පනත් කෙටුම්පත ඉදිරිපත් කරන විටදීත් මතුවුණා. සත්ව ආහාර ගබඩා කරන ස්ථාන සහ ඒවා අළෙවි කරන ස්ථාන සම්පූර්ණ පරීක්ෂාවට ලක් කරන්නත්, ඒ සඳහා අදාළ නිලධාරීන්ගේ බලතල වැඩි කරන්නත් මෙම සංශෝධන පනත් කෙටුම්පත සම්මත කර ගැනීම තුළින් කටයුතු කරනවා.

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු ඇමතිතුමනි, එවැනි කටයුත්තක් කිරීමට සත්ව ආහාර පනතට මෙවැනි සංශෝධනයක් ගෙන ඒම ගැන අපි ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වනවා. මස්වල තිබෙන තත්ත්වය ඉහළ නංවන්න දැන් නොයෙකුත් additives පාවිච්චි කරනවා. සමහර වෙලාවට ඉක්මනින්ම සතා ලොකු කර ගන්න නිසා අවශ්‍ය ප්‍රමාණයට වඩා හෝමෝන වර්ග ලබා දෙනවා ඇති. ඒ සතුන්ට නොයෙකුත් වර්ගයේ හෝමෝන inject කරනවා. එතකොට ආහාරය පිණිස ගන්නා මස්වලත් එම හෝමෝන යම් ප්‍රමාණයක් රැඳී තිබෙනවා. අපි ඒ මාංශ කෑවාම අපේ ඇඟටත් ඒ හෝමෝන ඇතුළු වෙනවා. එම මස් වර්ග කුණු වෙලාද; නරක් වෙලාද කියලා පරීක්ෂා කර බලනවා වාගේම එම මස්වල අඩංගුවෙලා තිබෙන හෝමෝන ප්‍රමාණය check කිරීම සඳහා labsවල තත්ත්වය - quality එක- වැඩි කරනවා නම් හොඳයි. ඒ සඳහා ක්‍රමයක් සකස් කිරීමේ වගකීමත් බර වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තටයි. ඔබතුමා අමාත්‍යාංශ දෙකේම නිලධාරීන් එකවර ගෙන්වලා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න කියලා ඉල්ලනවා.

ඊළඟ කාරණය හැටියට, ලෝක වෙළෙඳ පොළේ බඩ ඉරිඟු මිල ලාභ කාලයට මෙතෙක් අප රටට බඩ ඉරිඟු ගෙන්වලා නැහැ කියලා තමයි කියැවෙන්නේ. සමහර වෙලාවට එවැනි ප්‍රශ්නත් තිබෙනවා. ඒ නිසා ලෝක වෙළෙඳ පොළේ බඩ ඉරිඟු ලාභ කාලයට අප රටට බඩ ඉරිඟු ගෙන්වීමට අමාත්‍යාංශ මට්ටමෙන් අවසර දීම සිදු කළොත් හොඳයි කියන කාරණයත් මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Sectoral Oversight Committee එකේදී මතු වුණු කාරණා වශයෙන් මේ කාරණා දෙක තමයි විශේෂයෙන්ම මට මතක් කරන්න තිබෙන්නේ.

මීට වඩා වැඩි කාලයක් මේ සඳහා ගන්න මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය එක්ක මමත් දීර්ඝ කාලයක් වැඩ කර තිබෙනවා. එතුමිය ඉතාම දක්ෂ, ඕනෑම ඇමතිවරයකු සමඟ බොහොම සහයෝගයෙන් වැඩ කරන ලේකම්තුමියක්. ඔබතුමාටත්, අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු අධ්‍යක්ෂ ජනරාල්තුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.47]

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි. දේශීය වෙළෙඳ පොළේ විකිණීමට

ඇති සත්ව ආහාරවල ප්‍රමිතිය සුරක්ෂිත කිරීම සහ ව්‍යාජ සත්ව ආහාර සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන මෙම අවස්ථාවේ විශේෂයෙන්ම මතක් කළ යුතු කරුණක් තිබෙනවා. මගේ ප්‍රදේශය වන කුරුණෑගල දිස්ත්‍රික්කයත්, ඒ වාගේම පුත්තලම දිස්ත්‍රික්කයත් ඇතුළු සමස්ත ලංකාවම ගත් කළ කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදනය ඉතාමත්ම ඉහළ මට්ටමක පවතිනවා. මෙහිදී මම කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. මේ පනත් කෙටුම්පත ඉතාමත්ම කාලෝචිතයි කියන එක මතක් කරන ගමන්ම සත්ව ආහාර නිෂ්පාදකයන්ට තිබෙන යම් යම් ගැටලු සම්බන්ධයෙනුත් වචන ස්වල්පයක් මේ අවස්ථාවේදී කථා කරන්නට මා බලාපෙරොත්තු වෙනවා. මේ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ගැනම කථා කරන්නට තිබෙනවා. එක කාරණයක් තමයි, සත්ව ආහාර නිෂ්පාදනයේදී යම් යම් අමු ද්‍රව්‍ය යොදා ගැනීම.

විශේෂයෙන් කුකුළු කෑම සඳහා යම් යම් අමු ද්‍රව්‍ය භාවිත කරනවා. ඒ භාවිත කරන අමු ද්‍රව්‍යවල මිල ගණන් සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන තත්ත්වය ගැනත් කථා කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම සත්ව ආහාර නිෂ්පාදනය සඳහා සියයට හතළිහක් විතර බඩ ඉරිඟු ප්‍රයෝජනයට ගන්නවා. මෙහිදී බඩ ඉරිඟු නිෂ්පාදකයාගෙන් බඩ ඉරිඟු කිලෝ එකක් රුපියල් විසි දෙකක්, විසි අටක් වාගේ මුදලකට මිලදී ගැනීමට සිදු වී තිබෙනවා. පසුගිය අවුරුද්දේත් මෙක සිද්ධ වුණා අපි දැක්කා. සමහර අවස්ථාවල රුපියල් පණහෙන් උඩ රුපියල් හැටපහ දක්වා මිලක් මේ බඩ ඉරිඟු කිලෝවකට ගෙවන්නට සිද්ධ වෙනවා. මෙතැන ඒකාධිකාරයක් පවතින නිසා තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. මේ ගැනත් අවධානය යොමු කරන්නටය කියා අපි ගරු ඇමතිතුමාට මතක් කරනවා. එතුමා මේ සම්බන්ධයෙන් ඉතාමත් උනන්දුවෙන් කටයුතු කරන ඇමතිවරයකු හැටියට මේ පිළිබඳව හොඳ දැනුමක් එතුමා ලබා ගෙන තිබෙනවා. සත්ව නිෂ්පාදන මිල විශාල වශයෙන් ඉහළ යෑමට ප්‍රධාන හේතුවක් තමයි සත්ව ආහාරවල මිල ඉහළ යාම. අපට මෙය පාලනය කර ගන්නට පුළුවන් හැකියාව තිබෙනවා. නමුත් ඒකාධිකාරයක් පවත්වා ගෙන යාම නිසා තමයි මේ තත්ත්වය පාලනය කරන්නට බැරි වෙලා තිබෙන්නේ කියන එකත් මම සඳහන් කරන්න කැමැතියි. බොහෝ විට සුළු පරිමාණයේ නිෂ්පාදකයන්ගේ අදහස් අනුව තමයි අපි මේ කරුණු ඉදිරිපත් කරන්නේ.

මේ ක්ෂේත්‍රය දිහා බැලුවාම අද විශාල ප්‍රමාණයක් මේ ක්ෂේත්‍රය තුළින් යැපෙනවා. රැකියා වශයෙන් ගත්තත්, අට ලක්ෂ පණස් දාහක් පමණ මේ ක්ෂේත්‍රයේ සෘජු හා වක්‍ර රැකියාවල නියැලී ඉන්නවා. ඒ කියන්නේ විශාල ප්‍රමාණයක්. විශාල සංඛ්‍යාවකට ආදායම් මාර්ගයක් වන හැටියට අද මේ ක්ෂේත්‍රය පුළුල් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බිත්තර නිෂ්පාදනය ගැන කථා කරනකොට විශේෂයෙන්ම මේ කාරණය ගැනත් මතක් කරන්නට ඕනෑ. බිත්තරවල මිල තීරණය කිරීමත් අද එක් පුද්ගලයකු හරහා සිදු වීම තුළිනුත් ගොවියාට විශාල අසාධාරණයක් සිදු වී තිබෙනවා. මා හිතන විධියට මෙය ගරු ඇමතිතුමාත් දන්නා කාරණයක්. සමස්ත ලංකා බිත්තර නිෂ්පාදකයන්ගේ සංගමයක් තිබෙනවා. මේ සංගමයට බිත්තර නිෂ්පාදකයන් 850ක් විතර සම්බන්ධ වෙලා ඉන්නවා. මෙවැනි විශාල පිරිසක් එකතු වී ඇති කර ගෙන තිබෙන සංගමයකට මේ සඳහා අවස්ථාව ලබා දෙනවා නම්, එම තත්ත්වය තුළ බිත්තර නිෂ්පාදකයාට වාගේම පාරිභෝගිකයාටත් සාධාරණයක් ඉෂ්ට වේය කියා අපට හිතන්නට පුළුවන්. මේ ක්ෂේත්‍රයේ හැම අංශයකම ඒකාධිකාරයක් පවතිනවා. සත්ව ආහාර නිෂ්පාදනය කිරීමේදීත්, ඒ ආහාරවලට අවශ්‍ය අමු ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේදීත් හැම අංශයකම ඒකාධිකාරයක් වශයෙන් පැවතීම නිසා තමයි මේවායේ මිල මේ තරම් වැඩි වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුකුළු පැටවි සම්බන්ධයෙන් කථා කරනවා නම්, කුකුළු පැටවි විකිණීමට ප්‍රීමා ආයතනය වැනි ආයතන ගණනාවක් තිබෙනවා. රුපියල් 120ක්, රුපියල් 180ක් වැනි මිලකට තමයි එම ආයතනවලින් කුකුළු පැටවි එළියට ලබා දෙන්නේ. නමුත් අතරමැදියන් කණ්ඩායමක් මේ ආයතනවල ලියා පදිංචි වෙලා සිටිනවා. විශාල වශයෙන් බිත්තර නිෂ්පාදනය කරන ගොවියා නොවෙයි, සාමාන්‍ය වශයෙන් මේ ක්ෂේත්‍රයේ නියැලී සිටින ගොවියකු කුකුළු පැටවුන් ලබා ගැනීමේදී කුකුළු පැටවකුගේ මිල රුපියල් 250 සිට රුපියල් 300 දක්වා වැඩි වී තිබෙනවා. විශාල අසාධාරණයක් මේ තුළින් සිද්ධ වෙනවා. බිත්තර නිෂ්පාදන වියදම වැඩි වෙන්නටත් මේ කාරණා සියල්ලම බලපා තිබෙනවා. සත්ව ආහාර මිලදී ගැනීම, කුකුළු පැටවුන් මිලදී ගැනීම යන අවස්ථාවන්වල පවතින ඒකාධිකාරී තත්ත්වය නිසා නිෂ්පාදකයන්ට අද විශාල වැය බරක් උසුලන්නට සිද්ධ වෙලා තිබෙනවා. පාරිභෝගිකයන්ට අධික මිලක් දරන්නට සිදු වීම කෙරෙහිත් මේ කාරණය බල පා තිබෙනවා. මේ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර, මේ සඳහා යම් සහන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළොත් එයින් නිෂ්පාදකයන්ට විශාල වාසියක් ලැබෙනවා වාගේම පාරිභෝගිකයාටත් මීට වඩා හොඳ මිලකට බිත්තර හා කුකුළු මස් නිෂ්පාදන ලබා ගැනීමේ අවස්ථාව ලැබෙනවා.

1980 ගණන්වල සත්ව ආහාර සම්බන්ධයෙන් වූ පළමුවැනි පනත ගෙනෙන අවස්ථාවේ අවශ්‍යව තිබුණු සත්ව ආහාර නිෂ්පාදන ප්‍රමාණයත්, අද වනකොට අපට අවශ්‍ය සත්ව ආහාර නිෂ්පාදන ප්‍රමාණයත් අතර ලොකු වෙනසක් තිබෙනවා. ඒ නිසා සත්ව ආහාර පනත සංශෝධනය කිරීම ඉතා වැදගත් වන බව මා මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. මේ වනකොට බොහෝ ගොවි මහත්වරුන් නහන මැසිවිල්ලක් තිබෙනවා. ඒ මැසිවිල්ල තමයි, ආහාර නිෂ්පාදනය කරන සමාගම් මුල් අවස්ථාවේ ආහාර නිෂ්පාදනය කරලා ඉදිරිපත් කරන කොට හොඳ ප්‍රමිතියකට ඒ ආහාර ලබා දුන්නත්, - ගොවි මහත්වරුන් ලබා ගන්නා සත්ව ආහාර නිතරම පරීක්ෂා කර බලන්න ඒ අයට අවස්ථාවක් නැහැ.- මාසයක් දෙකක් ගත වනකොට ඒවායේ quality එක ඉතාම පහළ මට්ටමකට ගෙනෙන බව. එතකොට නිෂ්පාදනයත් ඉතාම අඩු වෙනවා. එවැනි අවස්ථාවලදී ගොවි මහත්වරුන් යම් යම් ප්‍රශ්න ඉදිරිපත් කරනකොට තමයි මේ සත්ව ආහාර නිෂ්පාදනය කරන සමාගම් ආපසු නියමිත ප්‍රමිතියට මේ ආහාර සකස් කරලා දෙන්නේ. මේ කාරණය ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, ගරු ඇමතිතුමනි. මේ වෙනුවෙන් වෙනම ආයතනයක් හෝ ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන ගිහිල්ලා, ඒ ආයතනය තුළින් යම් යම් පරීක්ෂණ කරලා, නියම ප්‍රමිතියට අදාළව මේ සත්ව ආහාර නිෂ්පාදනය කරලා ගොවි මහත්වරුන්ට ලබා දෙන්න පුළුවන් නම් මේ කර්මාන්තය ඉතා දියුණු මට්ටමේ කර්මාන්තයක් බවට පත් කර ගන්න පුළුවන් වනවා.

මේ අවස්ථාවේදී අපි ඔබතුමාගෙන් තවත් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ කර්මාන්තය දැන් ඉතා දියුණු මට්ටමකට පත්වෙලා තිබෙන කර්මාන්තයක් නිසා විශේෂයෙන්ම බිත්තර, මස් වාගේම අනෙකුත් සත්ව නිෂ්පාදන ලංකාව තුළ පමණක් නොවෙයි, විදේශ රටවලටත් විකිණීම සඳහා අවශ්‍ය වටපිටාවක් - වැඩ පිළිවෙළක් - සකස් කරන්න පියවර ගන්න කියලා ඉල්ලනවා. මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතත් ඒ සඳහා ඉතා වැදගත් වනවාය කියලා මම හිතනවා. සියලුම සත්ව ආහාර ප්‍රමිතියකට අනුව ලබා දුන්නොත් තමයි අපට ඒ අවස්ථාව ලැබෙන්නේ. ඉදිරි කාලයේ දී අපේ රට තුළ විතරක් නොවෙයි, අපේ රටින් එහාට ගිහිල්ලා විදේශ රටවලටත් මේ සත්ව ආහාර නිෂ්පාදන අපනයනය කරන මට්ටමට ගෙනෙන්න අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්නත් මේ පනත් කෙටුම්පත ඉතාම වැදගත් වන බව මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

[ගරු ජේ. සී. අලවතුවල මහතා]

මා මීට කලිනුත් මතක් කළා වාගේ අටලක්ෂ පනස්දාහක විතර ප්‍රමාණයක් මේ කර්මාන්තය තුළින් තමන්ගේ ආර්ථිකය සකස් කරගෙන තිබෙනවා. මේ කාරණා සම්බන්ධයෙනුත් ඔබතුමා විශේෂ අවධානය යොමු කරන්න. ඒ වාගේම මම ඉදිරිපත් කරපු ගැටලුවලටත් ඔබතුමා යම් විසඳුමක් ලබා දෙනවා නම් එය ඉතා වැදගත් වන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. E. Saravanapavan. You have ten minutes.

[பி.ப. 4.56]

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறும் விலங்குத் தீனி (திருத்தம்) சட்டமூலம் சம்பந்தமான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். மனிதர்களைப் போலவே விலங்குகளுக்குக் கொடுக்கப்படும் தீனியும் சுத்தமாக இருக்க வேண்டும். ஆனால், இன்று விலங்குகளுக்குக் கழிவுகள் கொடுக்கப்படுவது வழக்கமாக இருக்கின்றது. விலங்குகளுக்குத் தொற்றுநோய் ஏற்படும்போது அவை ஒட்டுமொத்தமாக நோய்த் தாக்கத்துக்குள்ளாகின்றன. இவற்றை எல்லாம் கண்காணித்துச் செயற்பட வேண்டியது PHI - பொதுச் சுகாதாரப் பரிசோதகர்கள். ஆனால் எங்களுடைய வட மாகாணத்தில் இது மிகவும் குறைவு. அங்கு பயிற்சியற்ற சுகாதாரப் பரிசோதகர்கள்மூலம் பலவிதமான இன்னல்கள் ஏற்பட்டுக்கொண்டிருக்கின்றன. தேவையான அளவில் சுகாதாரப் பரிசோதகர்கள்கூட அங்கு இல்லை. அவர்களுக்குரிய cadre இருக்கின்றது. ஆனால் அவற்றில் சில நிரப்பப்பட்டாலும் அவர்களுக்குரிய வேலைகள் இன்னமும் சரியாகக் கொடுக்கப்படவில்லை.

மிருகங்கள் வதைக்கப்படக்கூடாது எனவும் அவை உரிய முறையில் பாதுகாக்கப்பட வேண்டும் எனவும் ஜீவகாருண்ய அமைப்புக்கள் தொடர்ந்து வலியுறுத்தி வருகின்றன. இந்த விடயம் தொடர்பாக நானும் அவர்களுடன் உடன்படுகின்றேன். அதேவேளையில் "மிருகங்களின் பாதுகாப்பு" எனக் கூறப்பட்டு எடுக்கப்படும் நடவடிக்கைகள் மனிதர்களின் பாதுகாப்புக்கு ஆபத்தாக அமைந்துவிடக்கூடாது என்பதையும் நான் இங்கு சுட்டிக்காட்ட வேண்டியவனாக உள்ளேன். முன்பு வீதியில் கட்டாக்காலியாகத் திரியும் நாய்கள் உள்ளூராட்சிச் சபையினரால் பிடித்துச் செல்லப்பட்டு அழிக்கப்பட்டன. ஆனால், கடந்த ஆட்சிக்காலத்தில் அந்த முறை தடைசெய்யப்பட்டது. அதன் பலன் இன்று வீதிகளில் கட்டாக்காலி நாய்களின் தொகை அதிகரித்துவிட்டது. அவை வெறிபிடித்து மனிதர்களைக் கடிப்பதால் இறப்பு உட்படப் பல அசௌகரியங்கள் மனிதர்களுக்கு ஏற்படுகின்றன. நாய்கள் கட்டி வளர்க்கப்பட வேண்டும் என்பதே சட்டம். ஆனால் அதைப் பலர் பின்பற்றுவதில்லை. அப்படியான முறையில் சட்டம் நடைமுறைப்படுத்தப்படாவிட்டால் அடுத்த நடவடிக்கை என்ன என்பதற்குப் பதில் இல்லை.

அதேபோன்று யானைகள் விளைநிலங்களிலும் குடியிருப்புக்களிலும் புகுந்து சேதங்களை விளைவிக்கின்றன; மனித உயிர்களைப் பறிக்கின்றன. அதேநேரம் தொடரூந்து களிலும் கனரக வாகனங்களிலும் மோதுண்டு பலியாகும் யானைகளைப் பாதுகாக்க வேண்டும் என நாம் கூக்குரலிடுகின்றோம். ஆனால், யானைகளால் பாதிக்கப்படும் மனிதர்களைப் பாதுகாக்க உரிய நடவடிக்கை எடுக்கப்படாத அவல நிலையும் நிலவுகின்றது. நாய்கள் மற்றும் யானைகள் போன்ற மிருகங்கள் பாதுகாக்கப்பட வேண்டும் என்பதில் நாம் மாற்றுக் கருத்துக் கொண்டவர்கள் அல்லர். ஆனால், மனிதர்களின் பாதுகாப்பைப் புறமொதுக்கிவிட்டு மிருகங்களின் பாதுகாப்புப் பற்றிப் பேசுவது அபத்தமான தெனவே நான் நம்புகின்றேன். இப்படியான, மனித உயிர்கள்மீதும் மனித உணர்வுகள் தொடர்பாகவும் அக்கறை காட்டாத போக்கானது, தமிழ் மக்கள்மீதும் அவர்கள் தேவைகள்மீதும் காட்டப்படும் அலட்சியப் போக்கின் தொடர்ச்சியோ என எம்மை ஐயுற வைக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று தமிழ் மக்கள் செறிவாக வாழும் பகுதிகளில் புத்தர் சிலைகளும் விகாரைகளும் அமைக்கும் முயற்சிகள் இடம்பெற்று வருகின்றன. இது தொடர்பாகத் தமிழ் மக்கள் மத்தியில் பெரும் எதிர்ப்புக்கள் எழுந்துள்ளமையை நீங்கள் அறிவீர்கள். வட மாகாண ஆளுநர் உட்படப் பல அரசியல்வாதிகள் இந்த எதிர்ப்புக்கள் இனவாத அடிப்படையிலானவை எனக் கண்டனம் செய்து வருகின்றனர். ஓர் இடத்தில் மக்கள் வழிபாட்டுக்கென ஓர் ஆலயம் அமைக்கப்பட்டால் அது நியாயமானது. அதை எதிர்ப்பது இனவாதம்தான். ஆனால், பௌத்த மதத்தவர் ஒருவர்கூட வாழாத ஓர் இடத்தில் ஒரு விகாரை அமைக்கப்பட்டால் நிச்சயம் அது வழிபாட்டுக்காக அமைக்கப்பட்டதல்ல. அது ஆக்கிரமிப்பு நோக்கம் கொண்ட, இன்னொரு மத மக்கள்மீது தமது மதத்தைத் திணிக்கும் மேலாதிக்க நோக்கம் கொண்ட முறைகேடான ஒரு நடவடிக்கையாகும். இது தமிழர்களின் உணர்வை மதிக்காத ஓர் ஆதிக்கப் போக்காகும். ஒரு சாரார் இன்னொரு சாராரை ஒடுக்கும்போது ஒடுக்கப்படுவதை எதிர்ப்பது இனவாதமா? கிறிஸ்தவ மக்களோ முஸ்லிம் மக்களோ ஒருவர்கூட வாழாத ஒரு பகுதியில் ஒரு தேவாலயத்தையோ மசூதியையோ அமைக்க சிங்கள பௌத்த மக்கள் அனுமதிப்பார்களா? கடந்த அரசின் காலத்தில் மதத் தலங்களும் தேவாலயங்களும் தாக்கப்பட்டதை மறந்துவிட முடியுமா? மக்கள் தாங்கள் வாழும் பகுதிகளில் தங்களது வழிபாட்டு மையங்களைக் கொண்டிருந்தபோதும் அவை தாக்கப்பட்டன. அதில் சம்பந்தப்பட்டவர்கள்மீது எவ்வித நடவடிக்கையும் எடுக்கப்பட வில்லை என்பதை மறுக்க முடியுமா? அப்படி இருக்கும்போது, ஒரு பௌத்தன்கூட குடியிருக்காத இடங்களில் இந்துக் கோயில்களுக்கு அருகில் விகாரைகளை அமைப்பது இனங்களுக்கிடையே முறுகலையும் மோதலையும் ஏற்படுத்த மேற்கொள்ளப்படும் சதியென்று நம்பாமல் இருக்கமுடியுமா?

யாழ். குடாநாட்டில் விடுவிக்கப்பட்ட பகுதிகளில் பொதுமக்களுக்குச் சொந்தமான 63 ஏக்கர் காணிகளைப் பொலீஸார் தம்வசப்படுத்த முயற்சியெடுத்தனர். அவற்றை மீளப்பெற மக்கள் எடுத்த முயற்சிகள் யாவும் நிராகரிக்கப் பட்டன - முறியடிக்கப்பட்டன. அண்மையில் சந்திரிக்கா அம்மையார் அங்கு விஜயம் செய்தபோது, நான் அவரிடம் இந்த விடயம் தொடர்பில் தெளிவுபடுத்தினேன். அவர் எமது நியாயங்களை ஏற்றுக்கொண்டதுடன், உரிய நடவடிக்கை எடுப்பதாகவும் வாக்களித்தார். அதன்படி, அவர்மூலம்தான் இவை விடுவிக்கப்பட்டிருக்கலாமென எனக்கு ஓர் ஐயம் இருக்கின்றது. ஆனால், எமது எதிர்க்கட்சித் தலைவர் இது தொடர்பாக பொலிஸ்மா அதிபரிடம் தெரிவித்தபோது, அவர் இரண்டு வாரங்களில் நடவடிக்கை எடுப்பதாகக் கூறினார்.

ஆனால், இரண்டு மாதங்களாகியும் எதுவும் நடக்கவில்லை. இந்த நாட்டில் ஓர் எதிர்க்கட்சித் தலைவருக்கு வழங்கும் கௌரவம் இதுதானா? அப்படியானால், பொலிஸ் மாஅதிபருக்கும் மீள்குடியேற்ற அமைச்சருக்கும் கட்டுப்படாத ஒரு பொலிஸ் அதிகாரபீடம் இயங்குகிறதா? என்பதை நான் இந்தச் சபையில் கேட்டுவைக்க விரும்புகின்றேன்.

பௌத்த மக்கள் வாழாத பகுதிகளில் புத்தர் சிலைகளையும் விகாரைகளையும் அமைத்தல், தமிழ் மக்களின் காணிகளை விடுவிப்பதாக அறிவித்துவிட்டு தொடர்ந்தும் அவற்றை ஆக்கிரமித்துவைத்தல், மீள்குடியேற்றச் செயலணியில் வட மாகாண சபையையும் வடக்கு நாடாளுமன்ற உறுப்பினர்களையும் இணைக்க மறுத்தல் போன்ற விடயங்கள்மூலம் ஒருபுறம் "நல்லிணக்கம்" என்ற போர்வையில் தமிழ் மக்களுக்கு அநீதி இழைக்கப்படுகின்றது; அந்த அநீதிகளைத் தமிழ் மக்கள் எதிர்க்கும்போது, நாம் இனவாதம் பேசுகின்றோம் என்ற தோற்றப்பாடு சர்வதேசத்தின்முன் வைக்கப்படுகின்றது. அப்படியான நடவடிக்கைகள் நல்லிணக்கத்துக்கு உதவப்போவதில்லை. எனவே, மிருகங்களின் பாதுகாப்புத் தொடர்பாக அக்கறைப்படும் ஆட்சியாளர்கள், தமிழ் மக்களின் பாதுகாப்புத் தொடர்பாகவும் அக்கறை காட்டவேண்டும்.

The Hon. Presiding Member, I would like to draw your attention to the fact that this is not going to be conducive action towards reconciliation. The Leader of the Opposition spoke to the IGP and he promised that he will look into the matter within two weeks. In other words, what he meant was that the problems would be solved within two weeks. But he did not attend to the matter. I think, subsequently, it was attended to by the former President Chandrika Bandaranaike Kumaratunga.

In whatever work that is taking place in the North or the East, the officers there are not cooperating. Even His Excellency the President made statements to the effect that everything will be done and that everything will be handed over within a few months time; but that did not happen. The heads of sections or those in charge are not cooperating with the politicians. Under such circumstances, how can reconciliation start as we expect? His Excellency the President, the former President Chandrika Bandaranaike Kumaratunga, the Leader of the Opposition and every one are together working towards reconciliation; but it looks like it is going to be a difficult task or rather a Herculean task to achieve.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවට නියමිත කාලය විනාඩි අටයි.

[අ.භා. 5.05]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1986 අංක 15 දරන සත්ව ආහාර පනතට සංශෝධනයක් එකතු කරමින් අද දින ඉදිරිපත් කරන ලද මෙම පනත් කෙටුම්පත දෙවන වර කියැවීමේ විවාදයට කරුණු ඉදිරිපත් කරන්න ලැබීම ගැන සතුටට පත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි අන්තර්ගත ප්‍රධාන කරුණු පහක් තිබෙනවා. අද දේශීය වෙළෙඳ පොළේ විකිණීමට නොමැති වුණත් සත්ව ආහාර නිෂ්පාදන සඳහා යොදා ගන්නා සියලු අමු ද්‍රව්‍ය සහ ආකලන සඳහා නීති පැනවීම මෙයින් අදහස් කෙරෙනවා. ඒ වාගේම, ආනයනික සත්ව ආහාරද ඒ සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය සහ ආකලනද නියමයන්ට යටත් කරවීම, සත්ව ආහාර උපදේශක කමිටුවේ සාමාජික සංඛ්‍යාව වැඩි කිරීම, බලය ලත් නිලධාරීන්ගේ බල තල වැඩි කිරීම සහ පනතේ නියමයන් කඩ කිරීමට එරෙහිව නියම කරන දඩ මුදල් අද යුගයට ගැළපෙන පරිදි සංශෝධනය කිරීම මෙහි අරමුණු හැටියට අපට සලකන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, -ගරු ඇමතිතුමාගේ ප්‍රකාශයේත් සඳහන් වුණා; එතුමාගේ කථාවේදීත් කියැවුණා- කුකුළු මස්වලින් අපේ රට අද ස්වයං පෝෂිත වී තිබෙනවා කියා. ඒ වාගේම, අපට හැකියාව තිබෙනවා කුකුළු පැටවුන් අපනයනය කරන්න. ඒ සඳහා ලෝකයේ හොඳ ඉල්ලුමකුත් අපේ රටට තිබෙනවා. එයට විශේෂ හේතුවක් ලෙස දක්වන්න පුළුවන්, -මින් පෙරත් ඒ කාරණය ඇසුණා- කුරුලු උණ නැති රටක් හැටියට අපේ රට විශේෂයෙන් හඳුනාගෙන තිබීම. ඒ නිසා සත්ව ආහාර නිෂ්පාදනය කිරීම සඳහා හොඳ අවස්ථාවක් - විශේෂ අවස්ථාවක්- අපට ලැබී තිබෙනවා. නමුත් එක් පැත්තකින් කල්පනා කර බලන විට, සත්ව ආහාර සඳහා අවශ්‍ය කරන බඩ ඉරිඟු ආදි ද්‍රව්‍යයන් ආනයනය කරපු ප්‍රමාණය ගෙන බැලුවාම, රටක් හැටියට අපේ රටට සතුටු වන්න බැහැ කියන එකයි මගේ විශ්වාසය වන්නේ. මොකද, අපේ රට, කෘෂි කාර්මික රටක්. කෘෂි කාර්මික රටක් හැටියට ආනයනය කරන එක සාපේක්ෂව අපේ රටට ලාභ වන්න පුළුවන්. නමුත් අප උත්සාහ කරන්න ඕනෑ අපේ රටේ බඩ ඉරිඟු නිෂ්පාදනය වැඩි කරගන්නයි. එහෙම වැඩි කරගෙන රැකියා උත්පාදනයට වැඩි අවකාශයක් සලසන්නත්, විශේෂයෙන් අපේ ගොවීන් අතට මුදල් ගලා යන ක්‍රමවේදයක් සකස් කරන්නත් අවධානය යොමු කරන්න ඕනෑ කියායි මා කල්පනා කරන්නේ. අපි ඒ කෙරේ වැඩියෙන් අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගම්වල සිටින කුඩා සත්ව නිෂ්පාදකයන්ට එකී නිෂ්පාදන කාර්යය යම්කිසි සහනදායී සහ විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව කිරීමට අවශ්‍ය පුහුණුව ආදිය ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය කියා මම කල්පනා කරනවා. මා මේ වෙලාවේ සඳහන් කරන්න ඕනෑ, "පශු සම්පත්" කියන විෂයය පළාත් සභාවට විමධ්‍යගත වූ විෂයයක් බව. ඒ අනුව පශු සම්පත් සංවර්ධන නිලධාරීන් ක්‍රියාත්මක වන්නේ පළාත් සභාවේ අමාත්‍යාංශය හරහායි. නමුත් අපට වගකීමක් තිබෙනවා, කිසියම් සම්බන්ධීකරණයක් ඇති කරලා පශු සම්පත් සංවර්ධන නිලධාරීන් ඒ ඒ කොට්ඨාසවල කටයුතු කරන්නේ කොහොමද කියන එක පිළිබඳව සොයා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට එහෙම කියන්න සිතුණු හේතුවක් තිබෙනවා. පසු ගිය දවසක වැලිවිටිය-දිවිතුර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට සහභාගි වූ වෙලාවේ මම විමසීමක් කර බැලුවා, "පශු සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් පියවර ගෙන තිබෙන්නේ කොහොමද? ඒ කර්මාන්තයේ යෙදෙන අය හඳුනාගෙන තිබෙන්නේ කොහොමද? ඒ අයට දීපු සහයෝගයන් මොනවාද?" ආදිය ගැන. එසේ සොයා බැලුවාට පසුව එතැන සිටි නිලධාරීන් දුන් පිළිතුර ගැන මට සෑහීමකට පත් වන්න බැරි වුණා. තවමත් ඇතැම් නිලධාරීන්, ගමට ගිහින් මේ කර්මාන්තයේ යෙදී සිටින ගොවීන් මුණ ගැසී ඔවුන්ගේ ප්‍රශ්න සාකච්ඡා කර ඒවාට විසඳුම් සෙවීම සඳහා මැදිහත් වන්නේ අඩුවෙන්; ඇතැම් වෙලාවට

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

මැදිහත් වන්නේම නැහැ. ඒ නිසා ඒ අය බොහෝ වෙලාවට කාර්යාලයේ සහ තැන් තැන්වල ඉඳගෙන යම් යම් ලිපි ලේඛන පුරවන බවක් තමයි මට පෙනෙන්න තිබෙන්නේ. මෙය පළාත් සභාවට තමයි හුඟක් දුරට අදාළ වන්නේ. ඒ නිසා මේ කාරණා පිළිබඳ ගැඹුරු සොයා බැලීමක් අවශ්‍යයි; පුළුල් සොයා බැලීමක් අවශ්‍යයි. එසේ සොයා බලා අපේ ගම්වල සිටින සත්ව ආහාර නිෂ්පාදකයන්ට අවශ්‍ය ධෛර්ය දෙන්න, ඔවුන්ට කිසියම් මහ පෙන්වීමක් කරන්න මැදිහත් විය යුතුයි කියන එක මම මේ වෙලාවේ ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවනවා.

සුරතල් මසුන් සම්බන්ධයෙන් අද මෙතැනදී කියැවුණා. නමුත්, ඒ සම්බන්ධයෙන් කියැවුණේ බොහොම අඩුවෙන්. ගරු ඇමතිතුමාගේ කථාවේදීත් ඒ සම්බන්ධයෙන් කියැවුණා. නමුත්, ඒ කාරණය සාකච්ඡාවට ගියේ නැහැ. කර්මාන්තයක් හැටියට සුරතල් මසුන් ඇති කරන එක ධෛර්යවත් කරන්න ඕනෑය කියන කරුණ මේ අවස්ථාවේදීම අපි ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවනවා. ඒ කර්මාන්තය ජාත්‍යන්තර වෙළෙඳ පොළේත්, දේශීය වෙළෙඳ පොළේත් විශාල ඉල්ලුමක් තිබෙන කර්මාන්තයක්. ඒ සඳහා අපේ තරුණ පිරිස් ධෛර්යවත් කරලා ඔවුන්ට මහ පෙන්විය හැකියි. ඒ කරුණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා.

දකුණු පළාත සංචාරක පුරවරයක් හැටියට දියුණු කරන්න අපේ රජය ඉදිරි කාලයේදී කටයුතු කරයි කියලා දකුණු පළාත නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු හැටියට මම හිතනවා. විශේෂයෙන් බෙන්තරින් පටන් ගෙන ගොවියාපාන වන තෙක් ගාල්ල නගරයත් ආශ්‍රය කර ගෙන සංචාරක පුරවරයක් හැටියට දකුණු පළාත දියුණු කරන්න අවධානය යොමු කර දැනටමත් ඒ සම්බන්ධයෙන් මූලික සාකච්ඡා පවත්වා අවශ්‍ය කටයුතු සිදු කර ගෙන යනවා. සංචාරක කර්මාන්තය දියුණු වනකොට වැඩි වශයෙන් මෙම කර්මාන්තයට අත දෙන එක; දිරිගන්වන එක සහ ඒ වෙනුවෙන් කිසියම් ආයෝජනයක් කරන එක ඵලදායී කාර්යයක් හැටියට අපට සලකන්න පුළුවන්. ඒකට අපි යම් කිසි බර පැනක් දැරුවාට අපරාධයක් වන එකක් නැහැ. මොකද, ඊට වඩා වැඩි ප්‍රතිලාභ තව වසර ගණනාවක් යනකොට රටක් හැටියට අපට බුක්ති විඳීමේ අවස්ථාව ලැබෙනවා.

1986 අංක 15 දරන සත්ව ආහාර පනත් කෙටුම්පතට අද කරන සංශෝධන අපි සම්මත කරලා දුන්නාම මේ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වුවමනාවක්, හැකියාවක්, කැපවීමක් තිබෙන, ඒ වෙනුවෙන් හොඳ අවබෝධයකින් ක්‍රියා කරන්න පුළුවන් ඇමතිවරයෙකු විධියට ගරු පී. හැරිසන් ඇමතිතුමාට මේ වෙනුවෙන් වැඩි බලයක් ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරුන්ට කුකුළු මස් සම්බන්ධයෙන් හුඹස් බියක් තිබෙනවා. මේ සභාවේත් ඒ ප්‍රශ්නය මතු වුණා. කුකුළු මස් නිෂ්පාදනය කිරීමේදී සතුන්ට දෙන ආහාරවල තිබෙන විවිධ හෝමෝන වර්ග මිනිස් ශරීරයට අහිතකරයි කියලා යම් කිසි බියක් තිබෙනවා. ඒක ගරු ඇමතිතුමාගේ කථාවේදීත් සඳහන් වුණා. ඒකට පිළිතුරක් හම්බ වුණා. නමුත්, එහෙම තත්ත්වයක් තිබෙනවාද කියන කාරණය මේ සභාවේ නැවත මතු වුණා. සත්ව ආහාර පනත් කෙටුම්පතට අද ගෙනෙන සංශෝධන සම්මත වීම තුළින් මේ කටයුතුවල නියැලෙන නිලධාරීන්ට ඒ බලතල ලැබුණාම ඒ සම්බන්ධයෙන් හොඳ පරීක්ෂාවක් කරන්න පුළුවන් වෙයි. ඒ අනුව මේ සම්බන්ධයෙන් ජනතාවට සහතිකයක් දෙන්න පුළුවන් වෙයි. ඒ වාගේම මේ තුළින් ජනතාව තුළ තිබෙන හුඹස් බිය දුරු කරන්නත් පුළුවන්කම ලැබේවි. ඇත්ත වශයෙන්ම හෝමෝන තුළින් මිනිස් ශරීරයට අහිතකර දෙයක් වනවාද, එහෙම නැත්නම්, කුකුළු මස් ආදියේ ඒ කියන විධියේ තත්ත්වයකට වඩා ප්‍රෝටීන ලැබෙන මිනිස් ශරීරයට හිතකර මට්ටමේ නිෂ්පාදන ද තිබෙන්නේ කියන එක සම්බන්ධයෙන් සහතිකයක් දෙන්න පුළුවන්කම ලැබේවි. මේ සංශෝධනවලින් සිදුවන කාර්යයන් අතර ඒ කාර්යයත් ඉතාම වැදගත් කාර්යයක් කියලා මම හිතනවා.

ගාල්ල දිස්ත්‍රික්කය කියන්නේ එක් පැත්තකින් මත්ස්‍ය නිෂ්පාදනයටත්, අනෙක් පැත්තෙන් කුකුළු මස් නිෂ්පාදනය වැනි කර්මාන්තවලටත් වැඩි අවධානයක් දිනා ගනිපු; අවධානයක් ලබා ගනිපු වාගේම ඒ කර්මාන්තවල විශාල පිරිසක් නියැලෙන දිස්ත්‍රික්කයක්. මේ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් දකුණු පළාතේ දිස්ත්‍රික්කවලට වැඩි අවධානයක් යොමු කරන්න කියලා අපි ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ලබුදුව ගොවිපොළ වැනි ස්ථානවලට වැඩි අවධානයක් යොමු කරලා ඒ ස්ථාන ශක්තිමත් කරන්න ඕනෑ.

"හයිලන්ඩ්" නිෂ්පාදන වාගේ ඉහළ තත්ත්වයෙන් යුතු නිෂ්පාදන කරන තැනක් වශයෙන් ලබුදුව ගොවිපොළ හඳුන්වන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, මේ කර්මාන්තය දියුණු කර ගන්න ඔබතුමාගේ අමාත්‍යාංශයේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මේ අවස්ථාවේදී මම කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලබා දුන් කාලය ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ඊළඟට, ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා. ඊට පෙර, ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මේ අවස්ථාවේදී "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය."යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. J.M. ANANDA KUMARASIRI *left the Chair and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 5.14]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කර තිබෙන සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුට ප්‍රකාශ කරනවා. ඒකට හේතුව තමයි ගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ජ්‍යෙෂ්ඨතම කෙනකු වන අපේ ගරු පී. හැරිසන් මැතිතුමාට මෙම අමාත්‍යාංශය භාර දී තිබීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ උතුරු මැද පළාතේ හිටපු මහ ඇමති බර්ට්ි ප්‍රේමලාල් දිසානායක මැතිතුමා ගැනත් සිහිපත් කරන්න ඕනෑ. අපි සියලු දෙනාම දන්නා කරුණක් තමයි, පසු ගිය කාලයේ එතුමා ලංකාවට පිට රටින් බඩ ඉරිහු ගෙන්වීම නවත්වලා, සමස්ත ලංකාවම බඩ ඉරිහුවලින් ස්වයංපෝෂිත කළ බව. එවැනි විශ්වාසයක් ඇතිව තමයි, ලංකාවේ ආර්ථිකය වැඩිදියුණු කරන්නට ගරු පී. හැරිසන් ඇමතිතුමාටත් මෙම අමාත්‍යාංශය භාර දී තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, පසු ගිය රජය යටතේ ගරු බර්ට්ි ප්‍රේමලාල් දිසානායක මැතිතුමා ලංකාවට බඩ ඉරිහු ගෙන්වන්නේ නැතිව ලංකාවේම බඩ ඉරිහු නිෂ්පාදනය වැඩි දියුණු කළා. ඔබතුමාත් ඒ වාගේ බොහොම දක්ෂ ඇමති කෙනෙක්. අපි නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔබතුමාගේ ආසනයේ තමයි වැඩිපුරම බඩ ඉරිහු නිෂ්පාදනය කරන්නේ. තවදුරටත් ඒ නිෂ්පාදන වැඩි දියුණු කරලා ලංකාවට පිට රටින් බඩ ඉරිහු ගෙන්වන එක නවත්වන්න කටයුතු කරන්න ඕනෑ. මේ අවුරුද්දේ ගෙන්වූ එක ඉවරයි. ඔබතුමාත් බඩ ඉරිහු ගෙන්වනවා කියලා මෙතැන ප්‍රකාශ වුණා. ලබන අවුරුදුවලදී බඩ ඉරිහු පිට රටින් ගෙන්වන්නේ නැතිව, ලංකාවේ බඩ ඉරිහු නිෂ්පාදනය වැඩිදියුණු කරලා, GDP එකත් වැඩි කරලා, ඔබතුමා ආර්ථික සංවර්ධනය ශක්තිමත් කරයි කියලා මම විශ්වාස කරනවා.

ඒ විතරක් නොවෙයි ගරු ඇමතිතුමනි, අපේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩ ඉරිහු නිෂ්පාදනය ආශ්‍රිත කර්මාන්ත ඇති කරන්නත් පුළුවන්. ඔබතුමාට ඒ සඳහා දක්ෂතාව තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කරන භූමි ප්‍රමාණය එහි තිබෙනවා. ඒ නිසා ඒ තුළින් විශාල කර්මාන්ත ඇති කරලා තරුණයන්ට රැකියා ලබා දීමේ වැඩ පිළිවෙළක් හදලා දෙයි කියලා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුකුළු මස් නිෂ්පාදනය ගැන කථා කරන කොට ඇමතිතුමා කිව්වා, පිට රටවලට යවන්න පුළුවන් තරමට අපේ රටේ කුකළු මස් නිෂ්පාදනය වැඩි දියුණු වෙලා තිබෙනවාය කියලා. ඒ සඳහා අද ලෝකයේ රටවල ලොකු ඉල්ලුමක් තිබෙනවා. ඒ නිසා අපේ රටට ආදායමක් ලබා ගන්න පුළුවන් විධියට ඒ නිෂ්පාදනයත් වැඩි කරන්න පුළුවන්. මැද පෙරදිග රටවල අපේ නිෂ්පාදනවලට හලාල් කියලා mark එකක් තිබෙනවා. ඒ හලාල් ලකුණ යටතේ ආරබි රටවලට කුකුළු මස් යැවීම තුළින් විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්. ඉදිරි වසර තුළ ඔබතුමා ඒ වැඩ පිළිවෙළත් ශක්තිමත් කරයි කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම දැනට බිත්තරවලට විශාල මිලක් දීලා තිබෙනවා. පසු ගිය රජය කාලයේ බිත්තර විකුණා ගන්න බැරිව මහා විශාල ප්‍රශ්නයක් ඇති වෙලා, ඒ කර්මාන්තකරුවන් විශාල ණයකරුවන් බවට පත් වුණා. ඒ වාගේ කරන්නේ නැතිව ඔබතුමා දැන් කර ගෙන යන වැඩ පිළිවෙළ තුළින් ඉදිරි වසරවලදී ඒ නිෂ්පාදන පිටරටවලට යවලා රටට ලැබෙන ආදායම වැඩි කරයි කියලා මම හිතනවා.

උතුරු නැහෙනහිර ගැන මම දෙමළ භාෂාවෙන් කථා කරන්නම්.

கௌரவ அமைச்சர் அவர்களே, வடக்கு, கிழக்கு மாகாணங்கள் உங்களது மாவட்டத்திற்குப் பக்கத்திலிருக் கின்றன. வடக்கு, கிழக்கிலுள்ள இளைஞர் யுவதிகள் இன்று வேலையற்றவர்களாக இருக்கின்றார்கள். அத்துடன் கௌரவ பிரதி அமைச்சர் அமீர் அலி அவர்களின் பிராந்தியமான கிழக்கு மாகாணத்தில் அனைத்து இன மக்களும் வாழ்கின்றார்கள். ஆகவே, வடக்கு, கிழக்கிலுள்ள வேலையற்ற இளைஞர் யுவதிகளுக்கு இவற்றிலிருந்து வேலைவாய்ப்பைப் பெறுவதற்கான ஓர் ஏற்பாட்டை நீங்கள் செய்துகொடுக்க வேண்டும். தற்போது இங்கு பேசியவர்களின் உரைகளிலிருந்து அங்கு பாரிய நிலப்பரப்புக்கள் இருக்கின்றன என்று நாங்கள் விளங்கிக்கொண்டோம். எனவே, அங்கு இறுங்கு மற்றும் புல் உற்பத்தியை ஏற்படுத்தலாம். மரங்களிலிருந்து விழுகின்ற இலைகுழைகளைப் பெற்று அவற்றிலிருந்து விலங்குணவை உற்பத்தி செய்யக்கூடிய வகையில் ஒரு பெரிய தொழிற் சாலையை அமைத்து அங்குள்ள இளைஞர் யுவதிகளுக்குத் தொழில்வாய்ப்பைப் பெற்றுக்கொடுக்குமாறு கௌரவ அமைச்சர் அவர்களிடமும் கௌரவ பிரதி அமைச்சர் அவர்களிடமும் கேட்டுக்கொள்கின்றேன். காய்ந்த இலைகளும் தண்டு வகைகளும் வழங்குகின்ற CA Protein, phosphorus என்பவை விலங்குகளின் சமநிலையைப் பேணுவதால், அவற்றை உள்ளடக்கிய விலங்குணவின்மூலம் இந்த உயிரினங்களின் சமநிலையை ஏற்படுத்திக்கொள்ள முடியும்.

அதுமட்டுமல்ல, மத்திய மலைநாட்டுப் பகுதியில் வாழ்கின்றவர்களும் தொழில்வாய்ப்பற்றவர்களாக இருக்கின் றார்கள். பல வருட காலமாகப் பண்ணைகளை அமைத்துப் பெயரளவிலே பால் உற்பத்தி, இறைச்சி உற்பத்தி என்று சொல்லிக்கொள்ளும் நாம், இன்றும் வெளிநாடுகளிலிருந்து அவற்றை இறக்குமதி செய்து எங்களுடைய பணத்தினை வெளிநாடுகளுக்கு அனுப்பிக்கொண்டிருக்கின்றோம். எனவே, கௌரவ அமைச்சர் அவர்களே, வெளிநாடுகளிலிருந்து பால் உற்பத்திப் பொருட்கள் இறக்குமதி செய்யப்படுவதை நிறுத்தவும் எமது நாட்டின் இறைச்சி ஏற்றுமதியை அதிகரிக்கவும் நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டும். அதன்மூலம் இந்த நாட்டிற்கு அந்நியச் செலாவணியைப் பெற்றுக்கொடுப்பதுடன், பல்லாயிரக்கணக்கான எமது இளைஞர் யுவதிகளுக்கு வேலை வாய்ப்புகளையும் ஏற்படுத்திக் கொடுக்க நடவடிக்கை எடுக்க வேண்டும். அதனை நீங்கள் சரிவரச் செய்வீர்கள் என்பதில் எந்தவித சந்தேகமும் இல்லை. உங்கள் மீதும் பிரதி அமைச்சர் அவர்கள் மீதும் மிகவும் நம்பிக்கை கொண்டதன் காரணமாகத்தான் மேதகு ஜனாதிபதி அவர்களும் கௌரவ பிரதமர் அவர்களும் இந்தப் பாரிய அமைச்சுப் பொறுப்பை உங்களிடம் கையளித்துள்ளனர்.

அதேவேளை மீன் உற்பத்தி தொடர்பாக ஒரு தொழிற்சாலை அமைக்கப்படவேண்டுமென்று நீங்கள் சொன்னீர்கள். அதனையும் நீங்கள் சரியாகச் செய்யவேண்டு மென்று நான் இந்தச் சபையில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். அந்த வகையில், நீங்கள் அதற்கு முக்கியத்துவம் கொடுக்க வேண்டுமென்பதைத்தான் நான் சபையில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இந்த நாட்டிலே பாரிய அபிவிருந்தி வேலைகள் செய்யப்பட வேண்டியிருக்கிறது. இந்த நாடு தற்பொழுது பாரியதொரு அபிவிருத்திப் புரட்சிக்கு முகங்கொடுக்க வேண்டியிருக்கிறது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

இறக்குமதி, இறக்குமதியென்று சொல்லி எங்களுடைய நாட்டின் பணத்தை நாங்கள் வெளியே அனுப்பாமல், எங்களுடைய நாட்டின் வருமானத்தை அதிகரிப்பதற்காக அனைத்து இறக்குமதிகளையும் நிறுத்திவிட்டு, இந்த நாட்டிலே உற்பத்தி செய்யப்படும் பொருட்களை ஏற்றுமதி செய்வதுதான் எங்களுடைய கடமைப்பாடாக இருக்கின்றது. அதனை எங்களுடைய கௌரவ அமைச்சர் அவர்கள் நிச்சயமாகச் செய்வாரென்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. அதேநேரம் பிரதி அமைச்சர் அவர்கள் அவருக்கு உதவியாக இருப்பாரெனவும் நம்புகின்றேன். நீங்கள் இன்னும் 5 வருட காலம் பதவியில் இருக்கலாம். அந்த 5 வருட காலத்திற்குள் இந்த நாட்டிலே ஒரு பாரிய புரட்சியை நீங்கள் ஏற்படுத்தவேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன்.

[අ.භා. 5.23]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1986 අංක 15 දරන සත්ව ආහාර පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පත විෂයය භාර අමාත්‍යවරයා විධියට ගරු පී. හැරිසන් අමාත්‍යතුමා විසින්, අද දින දෙවන වර කියවා විවාදය පිණිස මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. මේ විවාදයේදී, සත්ව ආහාර නිපදවන්නන්ට සහ ඒ කර්මාන්තයේ යෙදෙන්නන්ට ඇති විය හැකි සහ බලපෑ හැකි කරුණු සම්බන්ධයෙන් කථා කිරීමට මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අද කථා කරපු ආණ්ඩු පක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු විශේෂයෙන්ම ඉල්ලා හිටියා, මේ වාගේ අණපනත් පාර්ලිමේන්තුවට ගෙනෙනවා වාගේම ග්‍රාමීය කර්මාන්ත විධියට මේ කර්මාන්ත දියුණු කරන්න අමාත්‍යාංශය තුළින් කටයුතු කරලා දෙන්න කියලා. ඇත්තෙන්ම ඒ කථා අහගෙන සිටියදී අපට සියුම් සතුටක් දැනෙනනවා. මොකද, Port City එක එපා කියලා පසු ගිය කාලයේ කෑ ගැහුවා. නමුත් ඒ අයටම අද Port City එක ආපසු ඕනෑවෙලා තිබෙනවා. ඒ ගැන අපට සන්තෝෂයි. වෙනත් කරුණු කාරණා ගැන කථා කළොත්, අද රජය, හිටපු රජය කටයුතු කළ තැනට ආපසු ගිහිල්ලා, ඒ රජය කරපු දේවල් සාධාරණීකරණය කරන්න හදනවා වාගේම, ඒ කළ දේවල් නැවත අවශ්‍යයි කියන තැනටත් ඇවිල්ලා තිබෙනවා.

පසු ගිය 2012, 2013, 2014 වසරවලදී කුකුළු කර්මාන්තය ගෘහ කර්මාන්තයක් විධියට සාර්ථකව දියුණුවෙන් දියුණුවට පත්වෙලා, බිත්තර මිල අඩු වෙලා තිබෙනවා. අපට මතකයි, කුඩා කර්මාන්ත දියුණු කිරීම සඳහා ලංකාව පුරා කුකුළු පැටවුන් ලක්ෂ ගණනක් බෙදා හැරිය බව. ඒ එක්කම ගව පාලනය වැඩිදියුණු කළා. දිවුලපිටිය ආසනයේ -මගේ මැතිවරණ කොට්ඨාසයේ- අක්කර 1,000ක පමණ විශාල ගොවිපොළක මිල්කෝ සමාගම ෆැක්ටරියක් ඇති කරලා, එහි විශාල වැඩ කොටසක් කර ගෙන යනවා. අපි දන්නවා, අපේ රජය කාලයේ තොන්ඩමන් ඇමතිතුමා මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළ සකස් කර තිබුණු බව. ඒ කාලයේ එය කර ගන්න බැරි වුණත්, ගරු ඇමතිතුමා එයට මූලිකත්වය දීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වනවා. එය කාලෝචිත ක්‍රියාවක්.

ගරු ඇමතිතුමනි, මේ වන කොට කාගිල්ස් සමාගම අපේ ගම්වලට ඇවිල්ලා විශාල වශයෙන් කිරි එකතු කරනවා; නෙස්ලේ සමාගම විශාල වශයෙන් කිරි එකතු කරනවා; තවත් සමාගම් විශාල වශයෙන් කිරි එකතු කරනවා. හැබැයි රජය විසින් - අමාත්‍යාංශය විසින්- මේ ගොවිපොළ අවට ප්‍රදේශවල සහ දිවුලපිටිය හා ගම්පහ දිස්ත්‍රික්කවල ගොවීන්ට කිරි ලබා ගන්න පුළුවන් සතුන් බෙදා හැරීමේ වැඩ පිළිවෙළක් තවම ක්‍රියාත්මක කරලා නැහැ. එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම තමයි, ග්‍රාමීය ජනතාව බලාපොරොත්තු වන්නේ. අපේ රජය කාලයේ අපි ඒක කළා. දිවුලපිටිය කේන්ද්‍ර කර ගෙන මේ කර්මාන්ත ශාලාව ගොඩ නැඟෙද්දී, මේ රටේ වයඹ පළාතේ සහ බස්නාහිර පළාතේ කෙළවර පිහිටි ගම්පහ දිස්ත්‍රික්කයේ කිරි නිෂ්පාදනය වැඩි කරන්න යම්කිසි වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්, ඉදිරි කාලයේදීවත් මේ කර්මාන්ත ශාලාවට අවශ්‍ය කරන කිරි ටික ලබා ගැනීම සඳහා කිරි ගොවියා ශක්තිමත් කරන වැඩ පිළිවෙළකට අපට යන්න පුළුවන් වෙයි.

ඊයේ-පෙරේදා සිට අපට ඇහිලා තිබෙනවා, කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ගොඩනැඟිල්ලක් ලබා ගෙන තිබෙනවාය, මාස 6ක්, මාස 7ක් ගත වුණත් තවම එහි පදිංචි වෙලා නැහැයි කියලා. හෙට-අනිද්දා වනකොට ඒ ගොඩනැඟිල්ල ලබාගෙන අවුරුද්දක් ගතවුණත් තවම ඒ ගොඩනැඟිල්ලට අමාත්‍යවරයා ගිහිල්ලාත් නැහැ. ඒ ගොඩනැඟිල්ලට රුපියල් කෝටි ගණනක් විනාශ වෙනවා. ඩෙන්මාර්ක් සමාගමක් සමඟ එකතු වෙලා, මා කලින් කිව්ව කර්මාන්ත ශාලාව දැන් දිනෙන්-දින කඩිනමින් ගොඩ නැඟෙනවා. මේ කර්මාන්ත ශාලාව විවෘත කරන දවසේම කිරි එකතු කරන්න ලැබෙන්නේ නැහැ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට විනාඩියක් දෙනවා නම්, ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න පුළුවන්.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

හැබැයි, මට විනාඩි 10යි තිබෙන්නේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මා විනාඩි භාගයකින් ඉවර කරන්නම්.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

හොඳයි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ආසනයේ ඒ කර්මාන්ත ශාලාව හදනවාත් එක්කම, මිල්කෝ සමාගමත්, අපේ අමාත්‍යාංශයත් දැනටමත් වැඩසටහනක් ක්‍රියාත්මක කරලා තිබෙනවා, ඒ ප්‍රදේශයේ සත්ව පාලනය වැඩිදියුණු කරන්නත්, ඒ එකතු වන කිරි ටික මිල දී ගන්නත්, ගම්පහ දිස්ත්‍රික්කයෙන් ලබා ගන්නා කිරිවලින්ම ඒ කර්මාන්ත ශාලාව පවත්වා ගෙන යන්නත්.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

බොහොම හොඳයි. බොහොමත්ම ස්තුතියි.

පක්ෂ-පාට භේදයක් නැතිව කාට හෝ හොඳක් වෙනවා නම් අපි කැමැතියි. ඒ කටයුත්ත කඩිනමින් සිද්ධ වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු ඇමතිතුමනි. දැන් හොඳ සෙල්ලමක් පටන් ගෙන තිබෙනවා. දැන් කථා කළ මන්ත්‍රීවරයකු කිව්වා, බර්ටි ප්‍රේමලාල් දිසානායක මැතිතුමා සිටියදී බඩ ඉරිහුවලින් රට ස්වයංපෝෂිත වුණාය කියලා. ඒ තුළින් රජ රට ප්‍රදේශයේ දැවැන්ත සංවර්ධනයක් සිද්ධ වුණා. සියයට 168කින් බඩ ඉරිහු වගාව වර්ධනය වුණා. මා හිතන හැටියට බඩ ඉරිහු මෙට්‍රික් ටොන් 10,000කට වැඩි ප්‍රමාණයක් පිට රටවලට, එනම් විශේෂයෙන්ම කැනඩාවට හා තායිවානයට යවන්න අපට පුළුවන් වුණා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? ඊයේ-පෙරේදා මුදල් ඇමතිවරයා කිව්වා, සතොසට පිට රටින් කිලෝව රුපියල් 52 බැගින් හෝ රුපියල් 55 බැගින් බඩ ඉරිහු ගෙන්වා ගෙන, සත්ව ආහාර නිෂ්පාදනය කරන පුද්ගලයින්ට කිලෝව රුපියල් තිස් ගණනකට දෙන්න පුළුවන්ය කියලා. දැන් ඔබතුමන්ලා වී කිලෝව රුපියල් හතළිස් ගණනකට, රුපියල් පනස් ගණනකට මිලදී ගන්නවා. ඊට ටික කාලයකට පස්සේ ගබඩාවලින් කිලෝව රුපියල් 30 බැගින් හෝ රුපියල් 35 බැගින් වී ටික දෙනවා. මේක පොඩි ළමයකුට වුණත් තේරෙන ශාස්ත්‍රයක්. රජයේ මුදල් නාස්ති වෙනවා. රජයට මුදල් නැහැයි කියනවා. සංවර්ධනය කරන්න වැඩ පිළිවෙළක් නැහැයි කියනවා. නමුත් වැඩි මිලට -

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඒ ප්‍රශ්නයටත් උත්තරයක් දෙන්න පුළුවන්.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මා කියන එක වැරැදි නම්, ඔබතුමාගේ කථාවේදී එය නිවැරැදි කරන්න. මා මේ කියන්නේ, පසු ගිය වකවානුවේ මගේ මැතිවරණ කොට්ඨාසයේ මරදගහමුල වී ගබඩාවේ තිබුණු රුපියල් ලක්ෂ ගණනක් වටිනා වී තොගය, කිලෝව රුපියල් 31.80 බැගින් දීම ගැනයි. මගේ ආසනයේ හිටපු මගේ ගොවීන්, මගේ මෝල් හිමියන් ඒ වෙලාවේ වී මිලදී ගත්තේ කිලෝව රුපියල් 34කට හෝ රුපියල් 35කටයි. ආර්ථික සංවර්ධන ඇමතිතුමාට කියලා අපි මේ ගබඩා සංකීර්ණය හදාගත්ත වෙලාවේ, ගොවීන්, මෝල් හිමියන් ඔවුන්ගේ විශාල වී තොග ගබඩා කළා. ඔබ තමුන්නාන්සේලා දන්නවා, බොහෝ වෙලාවට මරදගහමුල හාල්වල මිල අනුව තමයි රටේ සහල්වල මිල තීරණය වෙන්නේ කියලා.

අද මරදගහමුල මෝල් හිමියා බලාගෙන සිටියදී රුපියල් 31.80ට වී ටික විකුණනවා. අපි කථා කරලා ඉල්ලනවා, "මේක කරන්න එපා, ඒවා අපට දෙන්න" කියලා. ප්‍රාදේශීය ලේකම්ට, දිසාපතිට කථා කළාට වැඩක් නැහැ. පුවත් පත් දැන්වීම් දැම්මා, ඩෙන්ඩර් දැම්මා, ඒ නිසා දුන්නා කියලා කියනවා. කිලෝමීටර් 100ක්, 150ක් ගිහින් පොළොන්නරුවට හෝ අනුරාධපුරයට හෝ එහෙම නැත්නම් නිකවැරටියට ඒ වී ටික ගෙනියනවා. ඊට පස්සේ එහේ සිටින අපේ මෝල් හිමියෝ රුපියල් 33ට, 34ට ඒ වී ටික අරගෙන ආපහු එහේ ඉඳලා මරදගහමුලට එනවා. කරුණාකරලා මෙන්න මේ ක්‍රමය වෙනස් කරලා දෙන්න. මේ ක්‍රමයට තමුන්නාන්සේලා පසු ගිය රජයන්ට අත දිගු කළා; ඇඟිල්ල දිගු කළා. අපි මේ රජයෙනුත් ඒකම කරයි කියලා බලාපොරොත්තු වෙන්නේ නැහැ. රාජ්‍ය දේපළ, රජයේ මුදල් මේ විධියට අවභාවිත කරලා මේ විධියට කටයුතු කරනවා. එහෙම නැත්නම් ටික කාලයක් ගිහිල්ලා සත්ව ආහාර වෙනුවෙන් කියලා රුපියල් 20ට, 22ට දෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මේක අපි කවුරුවත් බලාපොරොත්තු වන ක්‍රමයක් නොවෙයි. එම නිසා මා ගරු ඇමතිතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා. එම ව්‍යාපාරිකයන් සහ ගම්වල සිටින ජනතාව නහා සිටුවන්න පුළුවන් අමාත්‍යාංශයක් තමයි ඔබතුමාට ලැබිලා තිබෙන්නේ. ඔබතුමා විපක්ෂයේ ඉන්න කොට බොහොම කට සැරට කථා කරලා ආණ්ඩු පක්ෂය විවේචනය කළා. ඒ විවේචන සමහර උදවියට අහගෙන ඉන්නත් බැරි වුණා. විපක්ෂයේ සිටින උදවියගේ විවේචන අද ඔබතුමාට අහන්න වෙලා තිබෙනවා. එම නිසා ඒ විවේචනවලට භාජන වෙන්න එපා.

පසු ගිය කාලයේ අපි දැක්කා, හාල් ටික විකුණාගන්න බැරුව, වී ටික විකුණා ගන්න බැරුව ඉන්න කොට තව ඇමතිවරයෙක් ගිහිල්ලා පොන්නි සම්බා මෙට්‍රික් ටොන් ලක්ෂ ගණනක් පිට රටින් ගෙනැල්ලා තිබුණා. ඔන්න දැන් ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වෙනවා; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට යනවා. රජයක් විධියට මේ වගකීම ඔබ තමුන්නාන්සේලා අරගෙන, ඒ තුළින් ගරු ඇමතිතුමා කිව්ව දේ ඊළඟ වසරේ හෝ ක්‍රියාත්මක කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා. කිරි ගොවීන්ට අවශ්‍ය කරන,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කාලය අවසානයි.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මට තත්ත්පරයක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට කිරි ගොවීන්ට, ඒ වාගේම සත්ව නිෂ්පාදන කරන උදවියට ඒ අවස්ථාව ලැබෙයි. ඒ වාගේම සහල් නිෂ්පාදනය කරන ගොවීන්ටත්, ව්‍යාපාරිකයන්ටත් ඒ සාධාරණය ඉටු කරන්න. ඒ ගබඩාවල තිබෙන වී දිසාපතිවරයා හරහා පිටට දෙන්න එපා කියන එකයි විශේෂයෙන් ඉල්ලන්නේ. ඔබතුමන්ලා නියම කරන මිලට අපේ ව්‍යාපාරිකයන් ඒ වී ගන්න සැදී පැහැදී ඉන්නවා. ඒ නිසා එහේ සිටින ආසන සංවිධායකවරු, එහේ සිටින දිසාපතිවරු, එහේ සිටින සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු එක්ක සාකච්ඡා කරලා ඒ අවස්ථාව ලබාදෙන්න කියන ඉල්ලීම කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[பி.ப. 5.33]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற விலங்குத் தீனி (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் பேசக் கிடைத்ததையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். இங்கு சிலரால் பேசப்பட்ட அல்லது முன்வைக்கப்பட்ட கருத்துக்கள் ஒன்றுக்கொன்று முரணானவை. உற்பத்தியை அதிகரிக்க வேண்டுமானால்,

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

මූලප්පොருட்களின் தட்டுப்பாட்டை நிவர்த்தி செய்தல் வேண்டும்; நுகர்வோருக்கு திருப்திகரமான சேவையைச் செய்தல் வேண்டும்; ஏற்றுமதிக்கான முன்னெடுப்புகள் மேற்கொள்ளப்பட வேண்டும். இறக்குமதிக்கும் ஏற்றுமதிக்கு மிடையில் இருக்கின்ற முரண்பாடுகள் தீர்க்கப்பட வேண்டும்.

இந்த நாட்டில் யுத்தம் முடிவடைந்து இன்று 7 வருட காலம் கடந்துவிட்டது. கடந்த 30 வருடங்களுக்கு முன்னர் தெற்கிலுள்ளவர்களுக்குத் தேவையான சோளம், கஜூ, வெங்காயம் போன்றவற்றை வடக்கு, கிழக்கில் உள்ளவர்கள் தாராளமாகவே உற்பத்தி செய்து அனுப்பிவைத்தார்கள். யுத்தம் முடிவடைந்ததன் பிறகு முன்னைய அரசாங்கம் அதனது யுத்த வெற்றியைக் கொண்டாடி, உற்பத்தியாளரின் திறனை ஊக்குவிக்கின்ற நிலைமையிலிருந்து பின்சென்றது. இந்த நல்லாட்சி அரசாங்கம் ஆட்சிக்கு வந்து தற்போது ஒரு வருடத்தைப் பூர்த்தி செய்திருக்கின்ற நிலைமையிலும் எமது மக்கள் தமது உற்பத்திகளைச் செய்யக்கூடிய காணிகள் இன்னமும் விடுவிக்கப்படவில்லை. இரண்டு நாட்களுக்கு முன்னர் கிழக்கிலே 64 முகாம்கள் அகற்றப்பட்டுள்ளன என்று கூறியபோதும், அவை அகற்றப்படவில்லையென்று மறுநாள் கூறப்படுகின்றது.

அண்மையிலே சர்வதேச மாநாடொன்றில் பேசிய கமத்தொழில் அமைச்சர் அவர்கள், அநுராதபுர மாவட்டத்தில் ஓரிலட்சத்துக்கும் மேற்பட்ட ஏக்கர் நிலத்தைச் சோளம் உற்பத்திக்கு ஒதுக்குவதாகக் கூறினார். வன்னிப் பெருநிலப்பரப்பிலும் கிழக்கிலே அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை போன்ற மாவட்டங்களிலும் பல இலட்சக்கணக்கான ஏக்கர் நிலங்களில் இந்த உற்பத்தியை அதிகரிப்பதற்கான வாய்ப்புகள் இருந்தும்கூட, அங்கிருக்கின்ற சிறு உற்பத்தியாளர்கள், 'மெகா' உற்பத்தியாளர்களுக்கு அந்த வாய்ப்புக் கிடைக்கவில்லை.

எங்களுடைய உற்பத்திகளில் ஒன்றான கோழிக்குஞ்சுகளை வெளிநாடுகளிலே விரும்பி வாங்கக்கூடிய வாய்ப்பிருக்கின்றது. இதற்குக் காரணம், அயல் நாடான இந்தியா, சிங்கப்பூர், மலேசியா போன்ற நாடுகளில் பறவைக் காய்ச்சல் என்கின்ற ஒரு நோய் ஏற்பட்டது. கோழிகளுக்கு அல்லது கால்நடைகளுக்கு ஏற்பட்ட அந்த நோய்கள் காரணமாக அவுஸ்ரேலியா, அமெரிக்காவில் அலெஸ்கா போன்ற பிராந்தியங்களில் இலட்சக்கணக்கான கால்நடைகளை அவர்கள் கொன்றார்கள் என்பது உங்களுக்குத் தெரியும். ஆனால், எங்களுடைய நாடு இந்த நோய்களுக்கெல்லாம் அப்பாற்பட்டதாக இருக்கின்றது.

எமது நாட்டில் poultry farm க்கு வருடமொன்றுக்கு 400,000 - 450,000 மெற்றிக்தொன் வரை சோளம் தேவைப்படுகின்றது. இந்நிலையில், ஒவ்வொரு வருடமும் 250,000 மெற்றிக்தொன் சோளம் இறக்குமதி செய்யப்படுகின்றது. உத்தியோகபூர்வமாக 30 - 40 இறக்குமதியாளர்களூடாக அது இறக்குமதி செய்யப்படுகின்றது. எங்கள் மண்ணிலேயே இலட்சக் கணக்கான தொன் சோளத்தை உற்பத்தி செய்யக்கூடிய வாய்ப்பிருப்பதால் வெளிநாடுகளிலிருந்து அதனை இறக்குமதி செய்யவேண்டிய அவசியமில்லை. இதன்மூலம் அவற்றுக்குப் பாவிக்கப்படுகின்ற இரசாயனப் பொருட்களில் - chemicals இல் இருக்கின்ற நச்சுக்களையும் இறக்குமதி செய்கின்ற கோழிக்குஞ்சுகளின் மூலமாக வரும் நோய்களையுமே நாங்கள் இந்த மண்ணுக்கு இறக்குமதி செய்கின்றோம். எங்களுடைய அமைச்சர் அவர்கள் இன்று அவற்றைத் தவிர்ப்பதற்காக இந்தத் திருத்தச் சட்டமூலத்தைக் கொண்டுவந்திருக்கின்றார். இங்கு கவனிக்கவேண்டிய பல விடயங்கள் இருக்கின்றன. இவற்றின் நடைமுறைப்படுத்தலுக்கு அதிகாரப் பரவலாக்கம் என்கின்ற வகையிலே மத்திய அரசு மாகாண சபையிலே இருக்கின்ற அதிகாரிகளைப் பயன்படுத்திக்கொள்ளமுடியும்.

திருகோணமலை மாவட்டத்திலே படுகாடு, சின்னப் படுகாடு, சுண்டியாறு, சாவாறு, வாழைமடு போன்ற பிரதேசங்களில் பல்லாயிரக்கணக்கான ஏக்கர் நிலங்கள் இருக்கின்றன. அதேபோன்று பொலன்னறுவை, மட்டக்களப்பு போன்ற பிரதேசங்களிலே பல இலட்சக்கணக்கான ஏக்கர் நிலங்கள் இருக்கின்றன. எனவே, சோள உற்பத்திக்கு மக்களை ஊக்குவிக்கின்றபோது நாங்கள் வருடாந்தம் இரண்டரை இலட்சம் மெற்றிக் தொன் சோளத்தை இறக்குமதி செய்யவேண்டிய அவசியமிராது. நான் முன்னர் குறிப்பிட்டதுபோல, இறக்குமதியென்ற போர்வையிலே வெளிநாடுகளிலே இருக்கின்ற நோய்களை நாங்கள் இறக்குமதி செய்கின்றோம். இது எங்களுடைய மண்ணுக்கு - எங்களுடைய மாவட்டத்துக்கு இருக்கின்ற நற்பெயருக்கு மாத்திரமன்றி எங்களுடைய நாட்டின் நற்பெயருக்கும் கேடு விளைவிப்பதாகவே இருக்கும்.

இன்று நாங்கள் முக்கியமான ஒரு சட்டமூலத்தைக் கொண்டுவந்திருக்கின்றோம். அதன்படி எங்களுடைய உற்பத்தியை அதிகரிக்கவேண்டும்; ஏற்றுமதி செய்யவேண்டும் என்று கூறுகிறோம். ஆனால், எங்களிடையேயுள்ள சிறு உற்பத்தியாளர்கள் புறக்கணிக்கப்படுகின்றார்கள். எனவே, அவர்களுக்குச் சிறு கைத்தொழிலாக அல்லது பெரும் கைத்தொழிலாக அதனைச் செய்வதற்கு உதவவேண்டும். 2012 - 2013 காலப்பகுதிகளிலே முன்னைய அரசாங்கத்தினால் பல காணிகள் காடுகளாக அல்லது அரச சொத்துக்களாகப் பிரகடனப்படுத்தப்பட்டு Gazette அறிவித்தல் வெளியிடப்பட்டிருக்கின்றது. 30 - 40 வருடங்களல்ல, 60 - 70 வருடங்களுக்கு மேலாக உற்பத்திகளைச் செய்தவர்கள் - வடக்கு, கிழக்கிலிருந்து தெற்குக்கு பல்வேறுபட்ட உற்பத்திகளை அனுப்பியவர்கள் இன்று தங்களுடைய சொந்த நிலங்களிலே அவற்றை உற்பத்தி செய்யமுடியாதவர்களாக இருக்கின்றார்கள். இவ்வாறான முரண்பாடுகள் இருக்கின்றன. விவசாய அமைச்சு, சிறு கைத்தொழில் அமைச்சு, பாதுகாப்பு அமைச்சு என்பன மேதகு ஜனாதிபதி அவர்களுடனும் மாண்புமிகு பிரதம மந்திரி அவர்களுடனும் ஒருங்கிணைந்து செயற்பட்டால், இம்மாவட்டங்களிலே இருக்கின்ற உற்பத்தியாளர்களை ஊக்குவிக்கக்கூடியதாக இருக்கும். இதன்மூலமாக poultry - கோழிப் பண்ணைகள், முட்டை உற்பத்தியை மட்டுமல்ல, ஏனைய கால்நடைகளான ஆடு, மாடு வளர்ப்பைக்கூட ஊக்குவித்து, உற்பத்தியை அதிகரிக்கச் செய்யமுடியும். அதனூடாக பல இலட்சக் கணக்கானோருக்கு வேலைவாய்ப்புக்களை வழங்க முடியும். எமது மக்கள் ஏற்கெனவே உற்பத்திகளைச் செய்த காணிகளை விடுவித்துக் கொடுத்தால் அவற்றில் சோளம், சோயா மற்றும் ஏனைய உற்பத்திகளை அதிகரிக்கலாம். அதனால் கோழித் தீனியையோ, சோளத்தையோ இறக்குமதி செய்யவேண்டிய அவசியம் ஏற்படாது; எங்களுடைய பண்ணைகளுக்காக கோழிக் குஞ்சுகளையும் இறக்குமதி செய்யவேண்டிய அவசியமில்லை.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)

எங்களுடைய உற்பத்திகள் அதிகரிக்கின்றபோது, நாங்கள் ஏற்றுமதியை அதிகரிக்க முடியும். இவற்றுக்கு எமது அமைச்சர் அவர்கள் பூரண ஒத்துழைப்பை வழங்குவதோடு, ஏனைய அமைச்சர்களோடு கதைத்து எங்களுடைய விவசாயிகளுக்கு இருக்கின்ற தடைகளையும் நீக்கித் தரவேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

[பி.ப. 5.42]

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - புனர்வாழ்வளிப்பு மற்றும் மீள்குடியேற்ற இராஜாங்க அமைச்சர்)
(The Hon. M.L.A.M. Hizbullah - State Minister of Rehabilitation and Resettlement)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கிராமியப் பொருளாதார அலுவல்கள் பற்றிய அமைச்சர் அவர்கள் முன்வைத்திருக்கின்ற விலங்குத் தீன் உற்பத்தி செய்தல், விற்பனை செய்தல், விற்பனைக்காக இறக்குமதி செய்தல், விநியோகித்தல், பதனிடுகை, பயன்படுத்துதல் போன்ற விடயங்களை முன்னிறுத்தி, சட்டத்திலே திருத்தத்தைக் கொண்டுவருவதற்காக முன்வைத்திருக்கின்ற இந்தச் சட்டமூலத்தை வரவேற்பதுடன், அதற்காக கௌரவ அமைச்சர் அவர்களையும் பாராட்டுகின்றேன்.

கடந்த காலங்களிலிருந்தே விலங்குகளின் உணவுப் பொருட்கள், குறிப்பாக, கோழி போன்ற விலங்குகளின் உணவுப் பொருட்களை விநியோகித்தல், உற்பத்தி செய்தல் போன்ற விடயங்களிலே பல்வேறுபட்ட பிரச்சினைகள் இருந்து வருகின்றன. கௌரவ அமைச்சர் அவர்கள் சட்டமூலத்தைக் கொண்டுவந்து, நிறைவேற்றுவதனூடாக மாத்திரம் இந்தப் பிரச்சினைகளுக்குத் தீர்வு காணமுடியாது. அந்த அமைச்சின் பிரதி அமைச்சரான கௌரவ அமீர் அலி அவர்களும் இங்கு இருக்கிறார்கள். அவருக்கும் இந்த விடயம் நன்றாகத் தெரியும். நாங்கள் கோழித் தீனை உற்பத்தி செய்வதற்காக அதிகளவு சோளத்தை வெளிநாடுகளிலிருந்து இன்னமும் இறக்குமதி செய்கின்றோம். நமது நாட்டிலே சோள உற்பத்தியைச் செய்வதற்குச் சகல வளங்களும் வசதிகளும் - நீர், நிலம், அதற்குத் தேவையான சுவாத்தியமான காலநிலை போன்றவை - இருக்கின்றபோது நாம் தொடர்ந்தும் அதிகளவு சோளத்தை வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்துகொண்டிருக் கின்றோம். ஆகவே, கௌரவ அமைச்சர் ஹரிசன் அவர்களின் இந்த முயற்சியினூடாக எதிர்காலத்திலே விவசாய அமைச்சு மாகாண விவசாய அமைச்சுடன் இணைந்து, சோள உற்பத்தியை அதிகரிப்பதற்கு நடவடிக்கை எடுக்கவேண்டும்.

(The Hon. Mohamed Navavi)
ගරු කථානායකතුමනි, පුත්තලම, 2වන හරස් වීදිය, අංක 13 දරන ස්ථානයෙහි පදිංචි එම්.එස්.එම්. තවිෆික් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, කොළඹ 03, ගාලු පාර, අංක 146, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙහි සේවය කරන ආර්.එම්. විමලරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා - පැමිණ නැත.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர்.எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, බිබිල, දියකොබල, හෑපොල යන ලිපිනයෙහි පදිංචි එච්.එම්.ආර්.ජී.බී. අබේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2-446/'16-(3), ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ලංකා මැරයින් සර්විසස් සමාගම: වත්කම් අක්‍රමික ලෙස විකිණීම
லங்கா மரைன் சேவிசஸ் கம்பனி: சொத்துக்களின் முறைகேடான விற்பனை
LANKA MARINE SERVICES COMPANY: IRREGULAR SALE OF ASSETS

504/'16

3. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) Lanka Marine Services Ltd. (LMSL) සමාගමේ වත්කම් අක්‍රමික ලෙස විකිණීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SEFR209/2007 යටතේ ගොනු කර ඇති පෙත්සමට අදාළව ලබාදී ඇති නඩු තීන්දුවෙන් මතු කරනු ලැබූ කරුණු ගැන විමර්ශනයක් ආරම්භ කරන ලෙසට 2007.07.21 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත නියෝග කර තිබෙන බවත්;

(ii) එම විමර්ශන කටයුතු සිදු කර එහි උද්ධෘත නීති උපදෙස් සඳහා 2008.12.08 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත්, මෙතෙක් ඊට අදාළ උපදෙස් ලැබී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම උපදෙස් ලබාගැනීමට පියවර ගන්නේද;

(ii) එම තොරතුරු කවරේද යන්න මෙම සභාවට දැනුම් දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நீதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) Lanka Marine Services Ltd. (LMSL) கம்பனியின் சொத்துக்கள் முறைகேடான விதத்தில் விற்பனை செய்யப்பட்டமை தொடர்பில் உயர் நீதிமன்றத்தில் SEFR209/2007 ஆம் இலக்கத்தின் கீழ் தொடுக்கப்பட்டுள்ள மனு தொடர்பாக வழங்கப்பட்டுள்ள வழக்குத் தீர்ப்பின்மூலம் எழுப்பப்பட்டுள்ள விடயங்கள் குறித்து புலனாய்வொன்றை ஆரம்பிக்குமாறு 2007.07.21ஆந் திகதி குற்றப் புலனாய்வுத் திணைக்களத்துக்கு கட்டளை பிறப்பிக்கப்பட்டுள்ளது என்பதையும்;

(ii) மேற்படி புலனாய்வு நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு, அதன் பிரித்தெடுக்கப்பட்ட பகுதிகள் சட்ட ஆலோசனைக்காக 2008.12.08ஆந் திகதி சட்ட மாஅதிபர் திணைக்களத்துக்கு அனுப்பிவைக்கப்பட்டுள்ள போதிலும், இதுவரையில் இது தொடர்பிலான ஆலோசனைகள் கிடைக்கப்பெறவில்லை என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) ஆமெனில், மேற்படி ஆலோசனைகளை பெற்றுக்கொள்வதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) குறிப்பிட்ட தரவுகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice:

(a) Will he admit that-

(i) an order has been issued to the Criminal Investigations Department on 21.07.2007 to start an investigation on the matters raised by the ruling given in relation to the petition filed at the Supreme Court under No. SEFR 209/2007 regarding the irregular sale of the assets of Lanka Marine Services Ltd. (LMSL); and

(ii) the advice in that regard has not been received up to now, even though the investigations were carried out and the relevant extracts were referred to the Department of the Attorney General for legal advice on 08.12.2008?

(b) Will he inform this House-

(i) if so, whether action will be taken to obtain such advices; and

(ii) whether such information would be intimated to this House?

(c) If not, why?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Minister of Buddhasasana)

ගරු කථානායකතුමනි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ඊයේ දිනයේත් මේ හා බොහෝ සෙයින් සමාන ප්‍රශ්නයකුයි අසා තිබුණේ. එයට උත්තරය දුන්නා. ඊට සමානම උත්තරයක් තමයි මේ ප්‍රශ්නයටත් අදාළව තිබෙන්නේ. එම පිළිතුර මෙසේයි:

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) 2007 වසරේ ජනවාරි මස පාර්ලිමේන්තු පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභා වාර්තාව මහින් පෞද්ගලීකරණයට ලක් කර තිබුණු වරාය ඉඩම්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ඇපලෝ රෝහල

ඇතුළු තවත් දේපොළ රජයට පවරා ගන්නා ලෙසට කරන ලද නිර්දේශ රජය විසින් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා සහ තවත් අය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සම් කීපයක් ඉදිරිපත් කරන්නට යෙදුණි. එම වත්කම් නැවත රජයට පවරා ගැනීමට විරෝධය පාමින් එවකට නීතිපතිවරයා වූ ගරු මොහාන් පීරිස් මහතා එම නඩු හබ කරන්නට යෙදෙන ලදී. එහෙත් ශ්‍රේෂ්ඨාධිකරණය එම විරෝධතා නොසලකා එකී වත්කම් නැවතත් රජයට ලබා ගන්නා ලෙසට නියෝග කරන්නට යෙදුණි. නඩු අංක FR/209/2007 නඩු තීන්දුව අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂණයක් පවත්වන ලෙසට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කරන ලද අතර, 55 දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කර ගෙන නීතිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. එහෙත් එවකට නීතිපතිවරයා විසින් කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණු අතර, මෑතකදී CIR/159/2016 යටතේ ලිපිගොනුවක් විවෘත කර ඇත. එකී පරීක්ෂණ සම්පූර්ණ කර ගැනීම සඳහා තවත් කිහිප දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කර ගන්නා ලෙසට නීතිපතිවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දන්වා ඇත. එම තොරතුරු ලබා ගැනීමෙන් පසු ඉදිරි පියවර ගැනීමේ කටයුතු කරනු ලබන බව නීතිපතිවරයා දන්වා සිටී.

(ඇ) පැන නොනඟී.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මගේ පළමු වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. නීතිපතිවරයා කවුරු වුණත්, මේ කරුණ යොමු කළ පසු අවුරුද්දකට වැඩි කාලයක් යන තෙක් මෙය නොසලකා පැත්තකට දමා තිබීමෙන් උද්ගත වූ ප්‍රශ්නයක් බවයි ඔබතුමා කියන්නේ. නීතිපතිවරයා ලෙස ක්‍රියා කළ පුද්ගලයා මේ කරුණ එසේ නොසලකා හැරීම ගැන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු යොමු කිරීමක් කළ හැකිව තිබුණත්, එසේ නොකිරීම පිළිබඳව අධිකරණ ඇමතිතුමා හැටියට ඔබතුමා අද දක්වන්නා වූ අදහස කුමක්ද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, මගේ අදහස මෙයයි. ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් ලබා දුන්නාම, එය ක්‍රියාත්මක කිරීමේ වගකීම නීතිපතිවරයා වෙත තිබුණා; පොලීසිය වෙත තිබුණා. නමුත් එවකට එම කටයුතු කළ හිටපු නීතිපතිවරයා එය පැහැර හැරීමත්, අනතුරුව දිගින් දිගටම එය පැහැර හැරීමත් තුළ නීතියේ ආධිපත්‍යයේ බිඳ වැටීමක් අපි දකිනවා. මා ස්තුතිවන්ත වනවා, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාට, මේ අවස්ථාවේදී හෝ මෙය ඉදිරිපත් කිරීම පිළිබඳව. වර්තමාන නීතිපතිතුමා පියවර ගෙන තිබෙනවා, එම නියෝගය අනුව කටයුතු කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. නීතිපතිවරයෙක් තමන් විසින් ඉටු කළ යුතු කටයුතු ඉටු නොකර මෙසේ පැහැර හැරීමක් කර තිබෙන අවස්ථාවක, ඒ පිළිබඳව වර්තමාන නීතිපතිවරයාට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කර, ඒ පැහැර හරිනු ලැබූ පුද්ගලයාට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නොතිසි නිකුත් කර, ඔහුව ගෙන්වා ගෙන, එය පැහැර හැරියේ කුමක් නිසාදැයි ඔහුගෙන් විමසීම සඳහා වර්තමාන නීතිපතිවරයා යම් මැදිහත් වීමක් කිරීම සුදුසුයි කියා ඔබතුමා සලකන්නේ නැද්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, නීතිපතිවරයා විධියට වර්තමාන නීතිපතිවරයා, එවකට කනිෂ්ඨ නිලධාරියකු විධියට සේවය කළ ආයතනයෙන් එවැනි ඉල්ලීමක් සිදු කිරීම යුක්ති සහගත යයි මා කල්පනා කරන්නේ නැහැ. නමුත් මෙම නඩුවේ පාර්ශ්වයන් විසින්, පෙත්සම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක් ලබා දී තිබෙන නිසා, අවශ්‍ය නම් එම පාර්ශ්වකරුවන්ට එවැනි ඉල්ලීමක් කිරීමේ හැකියාවක් ඇති බව මා පිළිගන්නවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ශ්‍රේෂ්ඨාධිකරණය වෙතට කරුණු සැල කිරීමක් කරන්නට වර්තමාන නීතිපතිවරයාට වග කීමක් තිබෙනවා නේද? එසේ නම්, එකල ඔහු කනිෂ්ඨද, එදා හිටපු නීතිපතිවරයා ජ්‍යෙෂ්ඨද කියන එක නොසලකා එතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු සැලකිරීමක් කළ යුතුයි කියා මා යෝජනා කරනවා. ඔබතුමා ඒක සලකා බලනවාද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඒක අපි ඉදිරියේදී සලකා බලන්නම්, ගරු මන්ත්‍රීතුමා.

වෙරළාශ්‍රිත සංචාරක මහපෙන්වන්නන් : විස්තර
கடற்கரைசார் சுற்றுலாத்துறை வழிகாட்டிகள்: விபரம்
COASTAL TOUR GUIDES: DETAILS

516/'16

4. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිත සංචාරක මහපෙන්වන්නන් කොපමණ සිටීද යන්න පිළිබඳ සංගණනයක් කර තිබේද;

(ii) එසේ නම්, වෙරළාශ්‍රිත සංචාරක මහපෙන්වන්නන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත මහපෙන්වන්නන් ලියා පදිංචි කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) මෙම මහපෙන්වන්නන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මැදිහත් වන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රජය ලබා දෙන්නේද;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(v) වෙරළාශ්‍රිත සංචාරක මහපෙන්වන්නන්ගේ සුබසාධනය වෙනුවෙන් ගන්නා වෙනත් ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

සුර්‍රුලාත්තුරෙ අපිවිරුත්ති මර්‍රුම් කිරිස්තව සමය අලුවල්කළ් අමෙච්චරෛක් කේට්ට විනා:

(අ) (i) இலங்கையில் கடற்கரைசார் சுற்றுலாத்துறை வழிகாட்டிகள் எத்தனை பேர் உள்ளனர் என்பதைப் பற்றி தொகை மதிப்பீடொன்று மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், கடற்கரைசார் சுற்றுலாத்துறை வழிகாட்டிகளின் எண்ணிக்கை யாதென்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வழிகாட்டிகளைப் பதிவுசெய்ய நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அத்திகதி யாதென்பதையும்;

(iii) மேற்படி வழிகாட்டிகளுக்கான பயிற்சி நிகழ்ச்சித் திட்டங்களை நடைமுறைப்படுத்த தலையிடு வாரா என்பதையும்;

(iv) ஆமெனில், அதற்குத் தேவையான நிதி ஏற்பாடு களை அரசாங்கம் பெற்றுத் தருமா என்பதையும்;

(v) கடற்கரைசார்ந்த சுற்றுலாத்துறை வழிகாட்டி களின் நலன்புரிக்காக மேற்கொள்ளப்படும் வேறு நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Tourism Development and Christian Religious Affairs:

(a) Will he inform this House -

(i) whether a census has been carried out to ascertain the number of Coastal Tour Guides in Sri Lanka; and

(ii) if so, the number of Coastal Tour Guides?

(b) Will he also inform this House -

(i) whether action will be taken to register the above tour guides;

(ii) if so, date on which it will be done;

(iii) whether the Ministry intervenes to implement training programmes for these guides;

(iv) if so, whether the Government will allocate the provisions required for this purpose; and

(v) what other measures will be taken for the welfare of Coastal Tour Guides?

(c) If not, why?

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரும் காணி அமைச்சரும்)

(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs and Minister of Lands)

Hon. Speaker, the answer for the Question is as follows:

(a) (i) No. There is no such category as Coastal Tour Guides. The Tour Guides in Sri Lanka can be divided into four categories.

(1) National Tour Guides - 1623,

(2) Chauffer Guides - 1474,

(3) Area Guides - 1327,

(4) Site Guides - 150.

(ii) Not applicable.

(b) (i) Not applicable.

(ii) Not applicable.

(iii) Not applicable.

(iv) Not applicable.

(v) Not applicable.

(c) Not applicable.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම විෂය භාර අමාත්‍යතුමාගෙන් අහනවා. සමස්තයක් විධියට සංචාරක මහපෙන්වන්නන්ට හැඳුනුම් පතක් ලබා දීම සමහර අවස්ථාවලදී ඉතාම ප්‍රමාද වෙනවා. එම නිසා විවිධ අකටයුතුකම් කරන සමහර අයට එය අයුතු වාසියක් බවට පත්වෙනවා. ඒ නිසා ඒ අය ලියා පදිංචි කරන වහාම, හැඳුනුම් පත් ලබාදීමේ ක්‍රියාදාමය කඩිනම් කරන්න අමාත්‍යාංශය මොනවාගේ මැදිහත් වීමක්ද කරන්නේ?

ගරු ජෝන් අමරතුංග මහතා

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, ඒ පාඨමාලා හදාරා සුදුසුකම් ලැබූ අයට ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට හැඳුනුම් පත්‍රය ලැබීමට ප්‍රමාද වෙලා තිබෙනවා නම්, කරුණාකර මා ළඟට එවන්න. එවිට ඒවා වහාම ලබා දෙන්න මා පියවර ගන්නවා.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

සංචාරක මහපෙන්වන්නන් ලියා පදිංචි කිරීම සහ හැඳුනුම්පත් ලබා දීමක් පළාත් සභා මඟිනුත් සිද්ධ කරනවා. සමහර වේලාවලදී පළාත් සභාවේ සහ අමාත්‍යාංශයේ නිර්ණායක වෙනස් වන අවස්ථා තිබෙනවා. එහෙත්, ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම රේඛීය

අමාත්‍යාංශයේ වගකීමක් වන නිසා, සියලු පළාත් සභාවල නියෝජිතයන් සමඟ අමාත්‍යාංශයේ නිලධාරින් සාකච්ඡා කරලා, සංචාරක මඟපෙන්වන්නන් සඳහා අවම සුදුසුකම්, නිර්ණායක සහ හැඳුනුම්පත් ලබා දීම ආදී කටයුතු එකම විධියේ ක්‍රමවේදයක් අනුව සිදු කිරීමට අමාත්‍යාංශයට පුළුවන්කම තිබෙනවාද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

එවැනි ප්‍රශ්න පිළිබඳව අපේ අමාත්‍යාංශයේ ලේකම් අදාළ පළාත් පාලන ආයතනවල ලේකම්වරුන් සමඟ සාකච්ඡා කර ගෙන යනවා. යථා කාලයේදී ඒ පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සකස් කරන්නට අපට පුළුවන් වෙයි කියා කල්පනා කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් වැඩි කිරීම වර්තමාන රජයේ ඉලක්කයක්. සංචාරක ව්‍යාපාරයට වැඩි බරක් තියලා, සංචාරක ව්‍යාපාරය හරහා අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම අපේ ප්‍රධාන ඉලක්කයක්. ඒ තත්ත්වය තුළ, සංචාරක මඟපෙන්වන්නන් සඳහා සාමාන්‍ය පාඨමාලාවලින් ඔබ්බට ගිහිල්ලා, අපේ තිබෙන තෘතීයික අධ්‍යාපන ආයතන තුළ, ඒ වාගේම දැනට විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක වන යම් මට්ටමේ පාඨමාලා වර්තමානයට ගැළපෙන විධියට වෙනස්කම් කිරීමේදී, අමාත්‍යාංශය කුමන ආකාරයේ සක්‍රිය දායකත්වයක්ද ලබා දෙන්නේ කියා ගරු ඇමතිතුමාගෙන් දැනගන්නට කැමැතියි.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

අපේ නිලධාරින් කලින් කලට අවශ්‍යතාව අනුව තමයි ඒ පාඨමාලා පවත්වලා සංචාරක මඟ පෙන්වන්නන් සඳහා සහතික නිකුත් කරන්නේ.

වට්ටක්කච්චි කෘෂිකාර්මික ගොවිපොළ: විස්තර
வட்டக்கச்சி கமத்தொழில் பண்ணை : விபரம்
AGRICULTURAL FARM IN WATTAKACHCHI: DETAILS

560/'16

5. ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) වට්ටක්කච්චි ප්‍රදේශයේ රජයේ කෘෂිකාර්මික ගොවිපළක් සහ කෘෂිකාර්මික විද්‍යාලයක් පිහිටා ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ගොවිපළෙහි විශාලත්වය කොපමණද; ගොඩ ඉඩම් හා මඩ ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් අක්කර කොපමණද;

(iii) මේ වනවිට එම ගොවිපළ පාලනය කරන්නේ කවුරුන් විසින්ද; එය පරිහරණය කරන්නේ කවුරුන්ද;

(iv) අදාළ දෙපාර්තමේන්තුව යටතට එම ගොවිපොළ පවරා දෙන්නේද;

(v) නැවතත් එහි කම්කරුවන්ට රැකියා අවස්ථා ලබාදී එය ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වට්ටක්කච්චි කෘෂිකාර්මික ගොවිපොළ සමඟ ඇති කෘෂිකාර්මික විද්‍යාලය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(ii) වවුනියාව සහ කුණ්ඩසාලේ ඇති කෘෂි විද්‍යාලවලට සමාන අයුරින් මෙය ක්‍රියාත්මක වූ බව එතුමා දන්නේද;

(iii) යළිත් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නේද;

(iv) එය අදාළ දෙපාර්තමේන්තුවට පවරා දී ක්‍රියාත්මක කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வட்டக்கச்சி பிரதேசத்தில் அரச கமத்தொழில் பண்ணை மற்றும் கமத்தொழில் கல்லூரி ஒன்று அமைந்துள்ளதை அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அந்தப் பண்ணையின் மேட்டுநிலம் மற்றும் வயல் நிலத்தின் பரப்பளவு ஏக்கரில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) தற்போது அந்தப் பண்ணை எவரால் நிர்வகிக்கப் படுகின்றது; அதனைப் பயன்படுத்துபவர்கள் யாவர் என்பதையும்;

(iv) உரிய திணைக்களத்திற்கு அந்த பண்ணையை ஒப்படைப்பாரா என்பதையும்;

(v) மீண்டும் அதில் தொழிலாளர்களுக்கு தொழில் வாய்ப்புக்கள் வழங்கப்பட்டு அதனை இயங்கச் செய்யும் நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) வட்டக்கச்சி கமத்தொழில் பண்ணையுடன் உள்ள கமத்தொழில் கல்லூரியை இயங்க வைக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) வவுனியா மற்றும் குண்டசாலையில் உள்ள கமத் தொழில் கல்லூரிகளுக்கு நிகரான வகையில் இது இயங்கியது என்பதையும்;

(iii) மீண்டும் அதே போன்று இயங்கவைக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) திணைக்களத்துக்கு ஒப்படைத்து அதனை இயங்கவைப்பதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House-

(i) whether he is aware that there is a State-owned agricultural farm and an agricultural school in Wattakachchi area;

(ii) if so, the extent of that farm in respect of the acreage of land and mud lands separately;

(iii) who administers this farm at present and who makes use of this farm;

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

(iv) whether this farm will be transferred to the relevant department; and

(v) whether steps will be taken to provide employment opportunities to its labourers and make it functional again?

(b) Will he also inform this House-

(i) whether action will be taken to transform the agricultural school attached to the Wattakkachchi agricultural farm into a functional state;

(ii) whether he is aware that this school functioned in the same manner that the agricultural schools in Vavuniya and Kundasale were functioned;

(iii) whether action will be taken to make it functional again in that manner; and

(iv) the time period that will be needed to transfer this to the relevant department and make it functional?

(c) If not, why?

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) වට්ටක්කච්චි ප්‍රදේශයේ උතුරු පළාත් සභාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් රජයේ බීජ නිෂ්පාදන ගොවි පොළක් සහ දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත. එහි කෘෂි කාර්මික විද්‍යාලයක් ස්ථාපිත කර නොමැත.

(ii) උතුරු පළාත් සභා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පිහිටි එම ගොවි පොළෙහි විශාලත්වය අක්කර 441කි. එම ඉඩමේ ගොඩ ඉඩම් අක්කර 135ක් හා කුඹුරු ඉඩම් අක්කර 306ක් ඇත.

(iii) ඒ අනුව උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු තොරතුරු පදනම් කරගෙන පහත පිළිතුරු ඉදිරිපත් කරමි.

ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් ගොඩ ඉඩම් අක්කර 7ක්ද, උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගොඩ ඉඩම් අක්කර 25ක් සහ කුඹුරු ඉඩම් අක්කර 06ක්ද, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ගොඩ ඉඩම් අක්කර 103ක් සහ කුඹුරු ඉඩම් අක්කර 300ක්ද, පරිහරණය කරනු ලබයි.

(iv) අදාළ නොවේ.

(v) ඔව්.

ඉදිරියේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර අවශ්‍ය කාර්ය මණ්ඩලය නිශ්චය කර ගත හැකි වේ. ඉන් පසුව අනුමත ක්‍රමවේදයට අනුව බඳවා ගැනීම් සිදු කළ හැකි වේ.

(ආ) (i) අදාළ නොවේ.

(ii) කෘෂි විද්‍යාලයක් වශයෙන් ක්‍රියාත්මක වී නොමැත.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, எனது முதலாவது மேலதிக வினா, நீங்கள் இந்த விவசாயக் காணியை வடக்கு மாகாண விவசாயத் திணைக்களத்திடம் ஒப்படைப்பீர்களா? அல்லது இராணுவத்திடம்தான் அது இருக்குமா?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ගරු මන්ත්‍රීතුමනි, මෙම ඉඩම් පළාත් සභාවට අයිති නිසා පළාත් සභාවත් එක්ක තමයි මේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමා සමඟ සාකච්ඡා කරන්න කියා අප පළාත් අධ්‍යක්ෂතුමා දැනුවත් කරන්නම්. ඔබතුමා අසා තිබෙන සියලුම ප්‍රශ්න ටික පළාත් සභාව යටතේයි එන්නේ. ඒ නිසා ඒ ලේකම්තුමා සමඟ සාකච්ඡා කරලා, ඒ කෙරෙහි අවධානය යොමු කරන්න අපට පුළුවන්.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

இப்பொழுது இராணுவத்தினர் அந்தக் காணியைத் தங்கள்வசம் வைத்திருக்கின்றார்கள். CSD-Civil Security Department ஐச் சேர்ந்த இராணுவத்தினர் அந்தக் காணியிலே வயல் செய்கின்றார்கள்; தோட்டம் செய்கின்றார்கள். அங்கு இராணுவ முகாமும் இருக்கின்றது. இராணுவத்தை அகற்றி இதனை வட மாகாண விவசாயத் திணைக்களத்திடம் ஒப்ப டைக்கும் பொறுப்பு உங்களைச் சார்ந்தது. அதனை நீங்கள் எப்போது செய்வீர்கள்?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

අපට ඒ හමුදා කඳවුර ඉවත් කරන්න බැහැ. මොකද, දැනට ඒක එතැනින් ඉවත් කරනවාද, නැද්ද කියන එක ගැන පළාත් සභාවේ ප්‍රධාන ඇමතිතුමා සහ කෘෂිකර්ම විෂයය භාර ඇමතිතුමා සමඟ සාකච්ඡා කරන්න ඕනෑ.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

அது இராணுவ முகாமல்ல. அது ஒரு விவசாயப் பண்ணை. ஏற்கெனவே அங்கு ஒரு விவசாயப் பாடசாலை இருந்தது. அங்கு மாணவர்களுக்கு ஆரம்ப விவசாயக் கற்பித்தல் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டன. வடக்கு மாகாண விவசாய அமைச்சினாலும் அந்தக் காணியைத் தங்களிடம் ஒப்படைக்குமாறு உங்களுக்குக் கடிதங்கள் அனுப்பப்பட்டிருக் கின்றன. ஆனால், இராணுவத்தினர் அதனை வடக்கு மாகாண விவசாய அமைச்சிடம் ஒப்படைக்கத் தயாரில்லை. அது பொருளாதாரத்தைக் கட்டி வளர்க்கின்ற, ஆயிரம் தொழிலாளர் களுக்கு வேலை கொடுக்கின்ற மிகமிக முக்கியமான ஒரு பண்ணை. அந்த விவசாயப் பண்ணையை ஏன், விடுவிக்க முடியாது? என்பதுதான் எங்களுடைய கேள்வி.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය හරි. ඒක කෘෂිකාර්මික ගොවිපොළක්. නමුත් මේ ගොවිපොළ අයත් වන්නේ පළාත් සභාවට නිසා, පළාත් සභාවේ විෂය භාර ඇමතිතුමා සමඟ අපි මේ කාරණය සාකච්ඡා කරන්න ඕනෑ. විෂය භාර ඇමතිතුමා සමඟ සාකච්ඡා කරලා, ඊට පසුව ඔබතුමා දැනුවත් කරන්නම්.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

නීතිගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය හරි. ඒක කෘෂිකාර්මික ගොවිපොළක්. නමුත් මේ ගොවිපොළ අයත් වන්නේ පළාත් සභාවට නිසා, පළාත් සභාවේ විෂය භාර ඇමතිතුමා සමඟ අපි මේ කාරණය සාකච්ඡා කරන්න ඕනෑ. විෂය භාර ඇමතිතුමා සමඟ සාකච්ඡා කරලා, ඊට පසුව ඔබතුමා දැනුවත් කරන්නම්.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ගරු මන්ත්‍රීතුමනි, මම ඉස්සෙල්ලා කිව්ව විධියට මේක පළාත් සභාව යටතේ තිබෙන ගොවිපොළක් නිසා, මම පළාත් අධ්‍යක්ෂතුමා සහ පළාත් සභාවේ කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරලා, මේ පිළිබඳව සති දෙකක් ඇතුළත ඔබතුමා දැනුවත් කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 - 602/'16 - (1), ගරු ලකී ජයවර්ධන මහතා.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 - 617/'16 - (2), ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 - 647/'16 - (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ත්‍රිකුණාමල වරාය ආශ්‍රිත විශේෂ ඉන්දීය ආර්ථික කලාපය: විස්තර
திருகோணமலைத் துறைமுகத்தை அண்டிய இந்திய விசேட பொருளாதார வலயம் : விபரம்
SPECIAL INDIAN ECONOMIC ZONE LINKED TO TRINCOMALEE HARBOUR: DETAILS

669/'16

10. **ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ත්‍රිකුණාමල වරාය ආශ්‍රිතව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ විශේෂ ඉන්දීය ආර්ථික හෝ කර්මාන්ත කලාපයක් සඳහා රජය අවසර දී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අනුමතිය ලබා දුන් කැබිනට් පත්‍රිකාව හෝ නිරීක්ෂණ සහිත ලියවිලි ඉදිරිපත් කරන්නේද;

(iii) එම විශේෂ ඉන්දීය ආර්ථික කලාපය පිහිටු වීමේ මූලික කොන්දේසි හා කළමනාකරණය සිදු වන ආකාරය පැහැදිලි කරන්නේද;

(iv) එම විශේෂ ඉන්දීය ආර්ථික කලාපය සඳහා හඳුනාගෙන ඇති භූමියේ සිතියමක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු බිමල් රත්නායක මහතා]

பிரதம அமைச்சரும், தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) திருகோணமலை துறைமுகத்தை அண்டியதாக திருகோணமலை மாவட்டத்தில் இந்தியாவின் விசேட பொருளாதார அல்லது கைத்தொழில் வலயமொன்றை அமைப்பதற்கு அரசாங்கம் அனுமதியளித்துள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கு அனுமதியளித்த அமைச்சரவை நிருபம் அல்லது அவதானிப்புகள் அடங்கிய ஆவணங்களைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) மேற்படி இந்தியாவின் விசேட பொருளாதார வலயம் அமைக்கப்படுவதன் அடிப்படை நிபந்தனைகள் மற்றும் முகாமைத்துவம் செய்யப்படும் விதத்தை தெளிபடுத்துவாரா என்பதையும்;

(iv) மேற்படி இந்தியாவின் விசேட பொருளாதார வலயத்திற்கென இனம்காணப்பட்டுள்ள நிலப் பிரதேசத்தின் வரைபடமொன்றைச் சமர்ப்பிப் பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) whether the Government has granted permission for a Special Indian Economic or Industrial Zone linked to the Trincomalee Harbour in the Trincomalee District;

(ii) if so, whether he will submit the Cabinet Paper or the documents containing observations that granted permission for same;

(iii) the preliminary conditions of the establishment of the said Special Indian Economic Zone and as to how it is managed; and

(iv) whether he submits a map of the land identified for the said Indian Economic Zone?

(b) If not, why?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු මන්ත්‍රීතුමනි, "ඉන්දියන් කර්මාන්ත සඳහා වෙනම කර්මාන්ත කලාපයක් වෙන් කළ යුතුයි, ඒකට ත්‍රිකුණාමලය සුදුසුයි" කියලා ඉන්දියන් ආයෝජකයන් කීප දෙනෙක් සාකච්ඡා කර තිබෙනවා. හැබැයි, අවසාන තීරණයක් නැහැ. සමහරු හිතනවා, එම කර්මාන්ත කලාපය කුරුණෑගල පැත්තේ පිහිටුවන එක වඩා ප්‍රයෝජනවත් වෙයි කියලා. ඒ සාකච්ඡා කොහොමද කෙරෙන්නේ කියලා අපි දන්නේ නැහැ. කර්මාන්ත කලාපය පවත්වන්න යන්නේ ලාංකික සමාගමක් ඇති කරලා, යටිතල පහසුකම් සපයන සමාගමකින්ද, නැත්නම් ඉන්දියන් සමාගමකින්ද කියන එක ගැන තවම අන්තිම වචනයක් ලැබිලා නැහැ. මම දන්නා විධියට ඒ ගැන උනන්දුවක් තිබෙනවා; සාකච්ඡාවක් පැවැත්වෙනවා. නමුත්, අවසාන තීරණයක් අරගෙන නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අගමැතිතුමා මේ සම්බන්ධව පසු බිම ඉදිරිපත් කිරීම ගැන මා ස්තුතිවන්ත වනවා.

ගරු අගමැතිතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට මම දැන ගන්න කැමැතියි, ත්‍රිකුණාමල වරාය ආශ්‍රිත ප්‍රදේශයේ, ඉන්දියානු නොවුණත් වෙනත් ආර්ථික කලාපයක් සඳහා භූමි හඳුනා ගැනීමක් කර තිබෙනවාද කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
නැහැ. දැනට ත්‍රිකුණාමලය ප්‍රදේශය පිළිබඳ සිංගප්පූරුවේ සබඳතා සමාගම මඟින් සැලසුම් සකස් කරගෙන යනවා. ඒ සඳහා ත්‍රිකුණාමලයත්, පොලොන්නරු ප්‍රදේශයත් සුදුසු ද කියා සොයා බලනවා. ඒ අනුව එතැන වරාය කටයුතුවලට, නැව්වලට, සංචාරක ව්‍යාපාරවලට කලාප වෙන් කරන්න තිබෙනවා. කර්මාන්තවලටත් කලාප කිහිපයක් වෙන් කරන්න කියලා යෝජනා කරලා තිබෙනවා. වුවමනා නම්, තෙල් පිරිපහදුවක් පවත්වන්නත් යෝජනා කරලා තිබෙනවා. අන්න ඒ විධියට සැලසුම් ආරම්භ කරලා තිබෙනවා විතරයි. තවම ඒවායේ සැලසුම් වැඩ කටයුතු අවසන් කරලා නැහැ.

නාවික හමුදාවට ලැබිය යුතු කොටස එසේම තියාගන්නත්, ගුවන් හමුදාවට ලැබිය යුතු ප්‍රදේශ එසේම තියාගන්නත් තමයි සැලසුම් කරගෙන යන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු අගමැතිතුමනි, ඔබතුමන්ලා ඒ වෙනුවෙන් ඉඩම් හඳුනාගෙන තිබෙනවාද? මොකද, ඒ සමාගම වාර්තා හදනවා නම්, ඒ භූමි ප්‍රදේශ සම්බන්ධයෙන් යම්කිසි අදහසක් තිබෙන්න ඕනෑ නේ. එතකොට ඒ සිංගප්පූරු සමාගමට හෝ වෙනත් සමාගම්වලට "මෙන්න මේ ප්‍රදේශ" කියලා, හඳුනා ගත් ඉඩම් පිළිබඳ අදහසක් ආණ්ඩුවෙන් ඉදිරිපත් කරලා තිබෙනවාද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
අදාළ නිලධාරීන් එක්ක සාකච්ඡා කරගෙන යනවා. ලංකාවේ සිටින මීට අදාළ නිලධාරීන් එක්ක සිංගප්පූරු සමාගම අද සාකච්ඡා කරනවා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු අගමැතිතුමනි, කවුරුන්ද ඒ නිලධාරීන් කියලා දළ වශයෙන් තනතුරු එක්ක නම් කියන්න පුළුවන්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
දැනට 'මෙගාපොලිස්' වැඩ කටයුත්තේ ප්‍රධාන සැලසුම් භාර නිලධාරියා විධියට කටයුතු කරන අජිත ද කොස්තා මැතිතුමා ඉන්නවා. මම හිතන විධියට එක එක අංශවලින් තවත් නිලධාරීන් එකතු කරගෙනයි තිබෙන්නේ. ඔබතුමාට ඕනෑ නම්, ඒ පිළිබඳව ලැයිස්තුවක් ලබා දෙන්න මට පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ස්තුතියි, ගරු අගමැතිතුමනි, මට එය ලබා දෙන්න.

`දම්පෙ වත්ත' ඉඩම කැබලි කිරීම: පරිසරයට සිදුවන හානිය

‘தம்பே வத்த’ காணியைத் துண்டாடுதல் : சுற்றாடல் பாதிப்பு

FRAGMENTATION OF "DAMPE WATTA" LAND : ENVIRONMENTAL DEGRADATION

717/’16

11. **ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව නගර සභා බලප්‍රදේශයේ, පිළියන්දල දම්පෙ ගමෙහි අක්කර 79, රූඩ් 03, පර්චස් 21.74ක විශාලත්වයෙන් යුත් `දම්පෙ වත්ත' නමැති පොල් ඉඩම කැබලි කිරීම සඳහා තේ, රබර් හා පොල් වතු පාලනය කිරීමේ හා කැබලි කිරීමේ පාලන මණ්ඩලය වෙත අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවත්;

(ii) එකී ඉඩම් කැබලි කරන්නේ නම්, පොල් වගාවට මහත් හානියක් සිදුවන බවත්, රටේ පොල් පලදාවට බලපෑමක් සිදුවන බවත්, එබැවින් අදාළ ඉඩම කැබලි කිරීමට නිර්දේශ නොකරන බව සඳහන් කොට ප්‍රාදේශීය කළමනාකරු, පොල් වගා කිරීමේ මණ්ඩලය, කළුතර ප්‍රාදේශීය කාර්යාලය විසින් සභාපති, පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත දන්වා ඇති බවත්;

(iii) ආර්ථිකයට හා පරිසරයට සිදුවන හානිය පිළිබඳව අවධානය යොමු කර ඉඩම කැබලි කිරීමට එරෙහිව මහජන විරෝධතාවක්ද ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වාර්තා නොසලකා, ඉඩම කැබලි කිරීම නිර්දේශ කිරීමට පියවර ගත්තේද;

(ii) නොඑසේ නම්, ඒ පිළිබඳව ගත්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு மாவட்டத்தில், கெஸ்பேவ நகர சபை ஆளுகைப் பிரதேசத்தில், பிலியந்தல, தம்பே கிராமத்தில் 79 ஏக்கர், 03 ரூட், 21.74 பர்சஸ் விஸ்தீரணத்தைக் கொண்ட ‘தம்பே வத்த’ எனும் தென்னந்தோட்டத்தைத் துண்டாடுவதற்காக தேயிலை, இறப்பர் மற்றும் தென்னந்தோட் டங்களை நிருவகிக்கும் மற்றும் துண்டாடும் நிருவாக சபைக்கு விண்ணப்பம் சமர்ப்பிக்கப் பட்டுள்ளது என்பதையும்;

(ii) மேற்படி காணியைத் துண்டாடும் பட்சத்தில், தெங்குப் பயிர்ச்செய்கைக்கு பெரும் பாதிப்பு ஏற்படும் என்றும், நாட்டின் தென்னை விளைச்சலுக்கு பாதிப்பு ஏற்படும் என்றும், எனவே குறித்த காணியைத் துண்டாடுவதற்கு சிபாரிசு செய்வதில்லை எனக் குறிப்பிட்டு, தெங்குப் பயிர்ச்செய்கைச் சபை, களுத்துறை பிராந்திய அலுவலகத்தின் பிராந்திய முகாமை யாளரினால், தெங்குப் பயிர்ச் செய்கைச் சபையின் தவிசாளருக்கு அறிவிக்கப்பட்டுள்ளது என்பதையும்;

(iii) பொருளாதாரத்துக்கும், சுற்றாடலுக்கும் ஏற்படு கின்ற பாதிப்பு தொடர்பாக கவனம் செலுத்தி காணியைத் துண்டாடுவதற்கு எதிராக மக்களின் எதிர்ப்பு எழுந்துள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி அறிக்கைகளைப் பொருட்படுத்தாது காணியைத் துண்டாடுவதற்குச் சிபாரிசு செய்ய நடவடிக்கை மேற்கொள்வாரா என்பதையும்;

(ii) இன்றேல், இது தொடர்பாக மேற்கொள்ளப் படும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Is he aware that -

(i) applications have been made to Tea, Rubber and Coconut Control and Fragmentation Board, for the fragmentation of the coconut estate, “Dampe Watta’’ that is in the extent of 79 acres, 03 roods and 21.74 perches, situated in Dampe, Piliyandala, in Kesbeva Municipality of Colombo District;

(ii) Regional Manager, Coconut Cultivation Board, Kalutara Regional Office, has

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

informed the Chairman of Coconut Cultivation Board that he does not recommend the fragmentation of the estate concerned, as it affects the coconut cultivation and the coconut harvest of the country; and

(iii) there is also a public objection with regard to the fragmentation of the land in view of the harms caused to the economy and the environment?

(b) Will he inform this House -

(i) whether measures will be taken to recommend the fragmentation of the aforesaid land irrespective of aforesaid reports; and

(ii) if not, of the action taken in that regard?

(c) If not, why?

ගරු නවීන් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ගරු මන්ත්‍රීතුමනි, ඉඩම වෙන් කිරීමට තීරණයක් අරගෙන තිබෙනවා.

(ii) එතැන ප්‍රාදේශීය කළමනාකරුගේ වාර්තාව අපිට ලැබිලා තිබෙනවා. නමුත් මේ වාර්තාවේ අඩු පාඩුවක් තිබෙනවා. විශේෂයෙන්ම මෙම ව්‍යාපෘතියෙන් ලැබෙන ආර්ථික වාසිය ගැන එම නිලධාරියා සැලකිල්ලට අරගෙන නැහැ. එම නිසා ඒකත් සැලකිල්ලට අරගෙන සභාපතිතුමා මෙම ඉඩම ලබා දීමට කටයුතු කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, මෙම ඉඩම ඉතාමත් අඩු පොල් අස්වැන්නක් ලබා දෙන ඉඩමක්. මෙම ඉඩම පියතුමෙකුටයි අයිති වෙන්නේ. මෙම පියතුමා මෙම ඉඩමේ අස්වැන්නෙන් එතුමාගේ සමාජ සේවා ආයතනය පවත්වාගෙන යාමට උත්සාහ කළත් එය අසාර්ථක වූ බව පැහැදිලිව කිව යුතුයි. එම නිසා මෙම ඉඩම විකිණීමට ඒ පියතුමා තීරණයක් අරගෙන තිබෙනවා.

(iii) මහජන විරෝධතාවක් මෙතෙක් වාර්තා වී නොමැත.

(ආ) (i) මෙම ඉඩම සම්බන්ධයෙන් පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ වාර්තාව පදනම් කර ගනිමින් පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව තනි ඒකකයක් ලෙස පැවරීමට පමණක් අනුමැතිය ලබා දී ඇත.

'තනි ඒකකයක්' ලෙස කියන්නේ කැබැලි කිරීමකට නොවෙයි, තනි ව්‍යාපෘතියක් හැටියට කියන එකයි. විශේෂයෙන්ම නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් හැටියට ලබා දීමට තමයි අපි කොන්දේසි යොදා තිබෙන්නේ. ඒ කොන්දේසි නම්,

තනි ඒකකයක් ලෙස පැවැරීම සිදු කළ යුතුය.

අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති නිවාස ව්‍යාපෘති වාර්තාව අනුවම අදාළ නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අනුමත කරන අතර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් ආයතනවල අනුමැතිය ලබා ගත යුතුය. -නාගරික සංවර්ධන අධිකාරිය -ජාතික නිවාස සංවර්ධන අධිකාරිය -මධ්‍යම පරිසර අධිකාරිය - අදාළ පළාත් පාලන ආයතන අනුමැතිය.

පොල් වගාවට අවම හානියක් වන සේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මාගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමාගේ පැහැදිලි කිරීමේ දෙවන කොටසේ සඳහන් වුණා, "පොල් වගා කිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකරු මෙහි ආර්ථික වටිනාකම පිළිබඳව දැකලා තිබුණේ නැහැ" කියලා. පොල් වගා කිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකරු දකින්නේ පොල් වගා කිරීමේ ප්‍රගතිය ගැනයි. ඒ ඉඩම කැබලි කරලා එහි නිවාස ව්‍යාපෘතියක් හදන එකෙන් ලැබෙන ආර්ථික ප්‍රගතිය ගැන දකින්න එතුමාට බැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ වාර්තාව හොඳින් අධ්‍යයනය කළා නම් දකින්න ඇති, ඉදිරියේදී ඒ අක්කර 79 ඉඩමෙන් පොල් ගෙඩි ලක්ෂ 10ක පමණ ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන් බව එතුමාගේ වාර්තාවේ සඳහන් කරලා තිබුණු බව. ඒ ඉඩම කොළඹ දිස්ත්‍රික්කයේ පොල් වගා කරලා තිබෙන අක්කර 79ක තනි ඉඩමක්. යම් යම් රෝග නිසා අපේ රටේ -විශේෂයෙන්ම දකුණු පළාතේ- පොල් ගස් කපා ඉවත් කරද්දී, පිට රටින් පොල් ගෙන්වීම සඳහා පවා යෝජනා ඉදිරිපත් වෙලා තිබෙද්දී, ඒ ඉඩම පොල් වත්තක් හැටියටම තිබුණොත් තමයි ආර්ථික වශයෙන් වටිනාකමක් තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් විරෝධතාවක් නැහැ කියලා කිව්වාට, කැස්බෑව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදීත් ඒ සඳහා විරෝධයක් මතු වෙලා, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් දැන් එම ව්‍යාපෘතිය නතර කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය මොකක්ද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ප්‍රශ්නය මොකක්ද කියලා තමයි මම මේ පැහැදිලි කරන්නේ.

ගරු නවීන් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ප්‍රශ්නය මොකක්ද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පොල් වගා කිරීමේ මණ්ඩලයේ වාර්තාවේ ඒ පොල් ඉඩම කැබලි කිරීම සුදුසු නැත කියලා තිබුණු බව වැවිලි කර්මාන්ත ඇමතිතුමා හැටියට ඔබතුමා දැක්කේ නැද්ද කියන එක තමයි මාගේ ප්‍රශ්නය.

ගරු නවින් දිසානායක මහතා
(මාණ්පුමිකු நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
පොල් ගහක්වත් අඩු කරන්න එපා, නැති කරන්න එපා කියන එක තමයි සාමාන්‍යයෙන් පොල් වගා කිරීමේ මණ්ඩලයේ regional managersලා එවන පිළිතුර. නමුත් ව්‍යාපෘතියක් ලැබෙන කොට අපි ඒ ව්‍යාපෘතියේ economic net value එක ගැන බලන්න අවශ්‍යයි. එක ගහකින් පොල් ගෙඩි 20ක් පමණ බැගින් තමයි එම පොල් ඉඩමෙන් පොල් අස්වැන්න ලැබෙන්නේ. සාමාන්‍යයෙන් එක ගහකින් පොල් ගෙඩි 80ක්-100ක් අතර ප්‍රමාණයක් ලැබිය යුතුයි. එය පෞද්ගලික ඉඩමක්. රජයේ ඉඩමක් නොවෙයි. ඒ ඉඩම අයත් වන්නේ පියතුමෙකුට. ඒ පියතුමාට එම ඉඩමෙන් ලැබෙන ආදායමෙන් ඔහුගේ සමාජ සේවා ආයතනය පවත්වා ගෙන යන්න බැරි තත්ත්වයකුයි තිබෙන්නේ. ඒ සියලු සාධක සලකා බලා තමයි අපි මෙම විකිණීමට අවසර ලබා දුන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මාගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි. කතෝලික සභාවට අදාළව ඒ පියතුමා එම ඉඩම විකුණනවා නම් තනි ඒකකයක් හැටියට එය පොල් සංවර්ධන මණ්ඩලය යටතට අර ගෙන වගා කටයුත්තක් හැටියට සංවර්ධනය කිරීම පිළිබඳව ඔබතුමන්ලා විකල්ප අධ්‍යයනයක් සිදු කරලා තිබෙනවාද?

ගරු නවින් දිසානායක මහතා
(මාණ්පුමිකු நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය තිබෙන්නේ කැබලි කරනවාද, විකුණනවාද, නැද්ද කියන එක ගැන තීරණයක් ගන්නයි. එතැනින් අවසර දුන්නොත් අයිතිකරුට පුළුවන්, යම් යම් කොන්දේසි මත එම ඉඩම විකිණීමට. එතැනට තමයි අපි දැන් ඇවිල්ලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, ඔබතුමා වැවිලි කර්මාන්ත ඇමතිතුමා නිසාම, පොල්වලට අදාළ නැතත් තේ කර්මාන්තයට අදාළ ප්‍රශ්නයක් අහන්න මා කැමැතියි. තේ කර්මාන්තය ප්‍රවර්ධනයට තිබෙන අරමුදලින් රුපියල් බිලියන ගණනක් මුදල් අමාත්‍යාංශය විසින් ලබා ගන්න යන නිසා එය ලබා ගත්තොත්, විෂය භාර ඇමතිතුමා හැටියට එම වගකීම දැරීම පිළිබඳව සිතා බලනවාය කියා පසු ගිය දවස්වල ඔබතුමා තේ කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රකාශයක් සිදු කර තිබුණා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙම අතුරු ප්‍රශ්නය ප්‍රධාන ප්‍රශ්නයට අදාළ වන්නේ නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමා කැමැති නම් පමණක් පිළිතුර ලබා දෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, අදාළ අතුරු ප්‍රශ්නය අසන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට සහාය පළ කරන්නත් එක්කයි මම මේ ගැන කියන්නේ. මගේ අවබෝධයේ තරමට, අපි දන්නා තරමට තේ කර්මාන්තය සඳහා එම අරමුදල ආරක්ෂා කළ යුතුයි. ඒ පිළිබඳව ඔබතුමාගේ ගැටලුව දැන් නිරාකරණය වෙලාද කියා ගරු ඇමතිතුමාගෙන් දැන ගැනීමට කැමැතියි.

ගරු නවින් දිසානායක මහතා
(මාණ්පුමිකු நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ගැන මගෙන් වෙනම අසන්න. එතකොට මම පිළිතුර ලබා දෙන්නම්. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
බෑණාට කලින් මාමා -[බාධා කිරීමක්] බෑණා ඉල්ලා අස් වුණොත් එහෙම.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. මෙතැන එහෙම එකක් නැහැ. මාමා, බෑනා සම්බන්ධයක් මෙතැන නැහැ. අදාළ ප්‍රශ්නය සම්බන්ධවයි කථා කළ යුත්තේ.

ප්‍රශ්න අංක 12-520/'16-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13-604/'16-(1), ගරු ලකී ජයවර්ධන මහතා.

ගරු ලකී ජයවර්ධන මහතා
(මාණ්පුමිකු லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14-670/'16-(1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා - මින්වලු මට්රුම් පුදුප්පික්කත්තක්ක සක්ති පිරිදි අමෙච්චර්)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරක් ලැබී තිබෙනවා. නමුත් එම පිළිතුර සම්පූර්ණ නැති බවයි මගේ හැඟීම වන්නේ. ඒ නිසා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට වඩාත් සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

අධිකරණ අමාත්‍ය සහ බුද්ධ ශාසන අමාත්‍යවරයාගේ විදේශ සංචාර : විස්තර

நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சருமானவரின் வெளிநாட்டு விஜயங்கள்: விபரம்
FOREIGN VISITS OF MINISTER OF JUSTICE AND MINISTER OF BUDDHASASANA: DETAILS

706/'16

15.ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2015 ජනවාරි 08වැනි දින සිට මේ දක්වා අධිකරණ අමාත්‍යවරයා සහ බුද්ධ ශාසන අමාත්‍යවරයා වශයෙන් සිදුකළ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් සංචාරය,

(i) සිදු කළ කාලවකවානුව;

(ii) අරමුණු;

(iii) වියදම් කළ මුදල;

(iv) රටට ලැබුණු ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நீதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2015 சனவரி 08ஆம் திகதி முதல் இதுவரை நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சருமானவர் மேற் கொண்டுள்ள வெளிநாட்டு விஜயங்களின் எண்ணிக்கை யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) மேற்படி ஒவ்வொரு விஜயமும்,

(i) மேற்கொள்ளப்பட்ட காலஎல்லை;

(ii) நோக்கங்கள்;

(iii) செலவிடப்பட்ட பணத்தொகை;

(iv) நாட்டுக்குக் கிடைத்த பயன்கள்;

தனித்தனியே யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice:

(a) Will he inform this House how many foreign visits were made by the Minister of Justice and the Minister of Buddhasasana from 8th January, 2015 up to now?

(b) Will he also inform this House, separately -

(i) the period within which each such visit was made;

(ii) objectives;

(iii) amount spent; and

(iv) benefits accrued to the country?

(c) If not, why?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිදි) විජයදාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමනි, පිටු පහක පමණ දීර්ඝ පිළිතුරක් තිබෙන නිසා මම එය සභාගත කරන්නද, නැත්නම් මේ අවස්ථාවේදී කියවන්නද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, මෙම ප්‍රශ්නයේ (අ) කොටසට පිළිතුර ලබා දෙන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිදි) විජයදාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එම කොටසට පිළිතුර මෙසේයි.

(අ) ඔව්. 2015 ජනවාරි 08 දින සිට මේ දක්වා අධිකරණ අමාත්‍යවරයා වශයෙන් විදේශ සංචාර දොළහක් (12) සිදු කර ඇති අතර බුද්ධ ශාසන අමාත්‍යවරයා වශයෙන් විදේශ සංචාර හතරක් (4) සිදු කර ඇත.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, ඒ සඳහා වැය වූ මුදල කොපමණද කියා ඔබතුමාට කියන්න පුළුවන්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, ඒ සඳහා වැය වූ මුළු මුදල රුපියල් 5,143,602.00යි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළේ සංචාර 16ටම ගිය වියදම්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔව්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි. ගරු ඇමතිතුමනි, පිළිතුරෙහි ඉතුරු කොටස සභාගත කරන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, මම එම පිළිතුරෙහි ඉතුරු කොටස **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුරෙහි ඉතුරු කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி :*
** Rest of the Answer tabled:*

(ආ) ඔව්. අධිකරණ අමාත්‍යවරයා වශයෙන් සිදු කළ විදේශ සංචාර - ඇමුණුම 01** මඟින් දක්වා ඇත.

(i) කාල වකවානුව - 1 තීරුව මඟින් දක්වා ඇත.

(ii) අරමුණ - 2 තීරුව මඟින් දක්වා ඇත.

(iii) වියදම් කළ මුදල - 3 තීරුව මඟින් දක්වා ඇත.

(iv) විදේශ සංචාර මඟින් රටට ලැබුණු ප්‍රතිලාභ - 4 තීරුව මඟින් දක්වා ඇත.

බුද්ධ ශාසන අමාත්‍යවරයා වශයෙන් සිදු කළ විදේශ සංචාර ඇමුණුම 02* මඟින් දක්වා ඇත.

(i) කාල වකවානුව - 1 තීරුව මඟින් දක්වා ඇත.

(ii) අරමුණ - 2 තීරුව මඟින් දක්වා ඇත.

(iii) වියදම් කළ මුදල - 3 තීරුව මඟින් දක්වා ඇත.

(iv) විදේශ සංචාර මඟින් රටට ලැබුණු ප්‍රතිලාභ - 4 තීරුව මඟින් දක්වා ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

**** * පුස්තකාලයේ තබා ඇත.***
நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
Placed in the Library.

නිවාස සංවර්ධන වැඩසටහන: ප්‍රතිලාභීන්
வீடமைப்பு அபிவிருத்தி வேலைத்திட்டம் : நலன்பெறுநர்கள்
HOUSING DEVELOPMENT PROGRAMME : BENEFICIARIES

440/'16

1. **ගරු චමල් රාජපක්ෂ මහතා (ගරු ඩී.වී. චානක මහතා වෙනුවට)**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ - மாண்புமிகு டி.வீ. சானக சார்பாக)
(The Hon. Chamal Rajapaksaa on behalf of the Hon. D. V. Chanaka)
නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාස සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් 250,000 ක වටිනාකමින් යුත් නිවාස වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබුවේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

(ii) එම ඉඩම් ලබාදීමේදී දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව මඟින් අදාළ ඉඩම් කැබලි හඳුනාගැනීම සිදුකර තිබේද;

(iii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ප්‍රතිලාභීන්ගේ නම්, ලිපිනය සහ ඔවුන් තෝරාගත් ක්‍රමවේදය කවරේද;

(v) ප්‍රතිලාභීන් තෝරාගැනීමට සහභාගි වූ රාජ්‍ය නිලධාරීන්ගේ නම් කවරේද;

(vi) තෝරාගත් ප්‍රතිලාභීන් ඉඩම් හිමිකමක් ලැබීමට නියම සුදුස්සන් බවට සෑහීමට පත්විය හැකිද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

වීඩමෙප්පු මර්රුම් නිර්මාණත්තුරෙ අමෙච්චරෙක් කේට්ට වින්නා:

(அ) தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையினால் வீடமைப்பு அபிவிருத்தி வேலைத்திட்டத்தின்கீழ் ரூபா 2,50,000/- பெறுமதியான வீடமைப்பு வேலைத் திட்டமொன்று செயற்படுத்தப்பட்டதா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வேலைத்திட்டம் செயற்படுத்தப்படுகின்ற பிரதேச செயலகப் பிரிவுகள் மற்றும் காணிகள் அமைந்துள்ள இடங்கள் யாவை யென்பதையும்;

(ii) மேற்படி காணிகள் வழங்கப்படும்போது மாவட்ட காணி பயன்பாட்டுக் குழுவினால் குறிப்பிட்ட காணித் துண்டுகள் அடையாளம் காணப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவுரீதியாகத் தெரிவுசெய்யப்பட்ட பயனாளிகளின் எண்ணிக்கை தனித்தனியாக யாதென்பதையும்;

(iv) மேற்படி பயனாளிகளின் பெயர்கள், முகவரிகள் மற்றும் தெரிவுசெய்யப்பட்ட முறைமை யாதென்பதையும்;

[ගරු චමල් රාජපක්ෂ මහතා]

(v) பயனாளர்களைத் தெரிவுசெய்வதில் பங்கேற்ற அரச உத்தியோகத்தர்களின் பெயர்கள் யாவை யென்பதையும்;

(vi) தெரிவுசெய்யப்பட்ட பயனாளர்கள், காணி உரித்தைப் பெறுவதற்கான உரிய தகைமை களைக் கொண்டவர்களெனத் திருப்தியடைய முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing and Construction:

(a) Will he inform this House whether a housing programme that costs Rs. 250,000/- was implemented under the Housing Development Programme by the National Housing Development Authority?

(b) Will he also inform this House-

(i) the names of the Divisional Secretaries' Divisions and the locations of the lands in which the aforesaid Programme is being implemented;

(ii) whether the relevant plots of land have been identified by the District Land Use Committee when those lands were distributed;

(iii) separately, the number of beneficiaries selected based on each Divisional Secretary's Division;

(iv) the names and addresses of those beneficiaries and the methodology adopted to select them;

(v) the names of the public officers who participated to select the beneficiaries; and

(vi) whether the qualifications of the beneficiaries who were selected to own a land are at a satisfactory level?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට අදාළ පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්. දිවයිනේ දිස්ත්‍රික්ක 13ක නිවාස ව්‍යාපෘති 38ක් සඳහා එක් ප්‍රතිලාභියෙකු වෙත රුපියල් 250,000.00 බැගින් ණය ප්‍රදානය කර ඇත.

(ආ) (i) ඇමුණුම* අංක 01 වශයෙන් ඉදිරිපත් කර ඇත.

(ii) ඔව්.

(iii) ඇමුණුම* අංක 02 වශයෙන් ඉදිරිපත් කර ඇත.

(iv) ප්‍රාදේශීය ලේකම් ප්‍රධානත්වයෙන් තෝරාගත් කමිටුවක් මඟින් ඉඩම් කච්චේරි පවත්වා ප්‍රතිලාභීන් තෝරාගෙන ඇත. (ඇමුණුම* අංක 03 වශයෙන් ඉදිරිපත් කර ඇත.)

(v) ප්‍රාදේශීය ලේකම්, පළාත් ඉඩම් කොමසාරිස්, ග්‍රාම නිලධාරි, අපදා කළමනාකරණ නිලධාරි, මහවැලි අධිකාරියේ කොට්ඨාස කළමනාකරු, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරි.

(vi) ඔව්.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 - 606/'16(2), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

අරණායක නාය යෑමෙන් අවතැන්වූවන්ට ස්ථිර නිවාස
அரநாயக்க மண்சரிவால் இடம்பெயர்ந்தோருக்கு நிரந்தர வீடுகள்
PERMANENT HOUSES FOR THE DISPLACED IN ARANAYAKE LANDSLIDE

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ ගරු අග්‍රාමාත්‍යතුමා වෙතටයි.

පසු ගිය මැයි මාසයේ ඇති වූ අධික වර්ෂාව නිසා සිදු වූ දරුණු නාය යෑමෙන් අරණායක ප්‍රදේශයේ ජීවිත සියයකට වැඩි

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ප්‍රමාණයක් නැති වූ බවත්, පවුල් 3,000ක පමණ ප්‍රමාණයකට උන්හිටිතැන් නැතිවී, තාවකාලික ස්ථාන කරා යොමු කළ බවත් පාර්ලිමේන්තුවේදීද කිහිප වරක් සාකච්ඡාවට ලක් විය.

අදටද, 420ට වැඩි පවුල් ප්‍රමාණයක් කඳවුරුවලද, පවුල් 162ක් පමණ තාවකාලික මඩුවලද ජීවත් වේ. මුලින්ම පවුල් 620ක් අයි අවදානම් ස්ථානවල පදිංචිව සිටින බව රජය ප්‍රකාශයට පත් කළේය. අයි අවදානම් කලාප, අර්ධ අවදානම් කලාප සහ සාමාන්‍ය කලාප හඳුනාගෙන ගෙවල් සාදා දෙන බවට රජය ප්‍රකාශ කළේය. දැනටද පවුල් 300කට අධික ප්‍රමාණයක් ඒ කිසිදු විසඳුමක් නැතිව සිටින අතර, විපතට පත් වූ අයට ස්ථාවර විසඳුමක් -නිවසක්- ලබා දීම ප්‍රමාද වී තිබේ. ඒ අනුව පැන නඟින පහත ප්‍රශ්න සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙමි.

1. රජය සාදන ගෙවල් ප්‍රමාණය 100ක් බවට ප්‍රකාශ වී ඇත. ගෙවල් 60ක් පෞද්ගලික අංශයෙන් ඉදිකරන බව ගරු අගමැතිතුමා පිළිගන්නේද?

2. නාය යෑමට පත් වූ හා නාය යන බවට සැක ඇති ප්‍රදේශවලද යළි පදිංචි කිරීමේ භයානක තත්ත්වයක් මතුවී තිබෙන බවත්, පෙරේදා ඇතිවූ අධික වර්ෂාව නිසා, බලධාරීන් දී ඇති උපදෙස් පරිදි විපතට පත් බොහෝ දෙනා යළි පන්සල්වලට පැමිණ තිබෙන බවත් ගරු අග්‍රාමාත්‍යතුමා දන්නේද?

3. මෙම විපත සිදු වී මාස තුන හමාරකට වැඩි කාලයක් ගත වී ඇති හෙයින් ඒ ජනතාවට වහාම විසඳුම් ලබා දීමට කටයුතු කරනවාද? එම දින සීමාව ප්‍රකාශයට පත් කරනවාද?

4. ඒ දිනවලදීම ඇති වූ ගංවතුර නිසා විපතට පත් වූ ජනතාවට රුපියල් 10,000ක මුදලක් ගෙවීමට තීරණය කළත්, කොළඹ දිස්ත්‍රික්කයේ කැලණි ගං ඉවුර ආශ්‍රිතව ජීවත්වන ජනතාවට හා අනෙක් ප්‍රදේශවල ජනතාවට එම මුදල ලබා දී නොමැති හෙයින් - තුන් මාසයක් ගත වී ඇතත් - ඒ මුදල් ලබා දෙන්නේ කවදාද?

   ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මේ අය ගියාම කියනවා, "මුදල් නැහැ" කියලා. "මුදල් ගෙව්වා" කියලා ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරනවා. විපතට පත් වූ ඒ අය බංකොලොත් තත්ත්වයට පත්වෙලා ඉන්නවා. [බාධා කිරීමක්] වත්තල ගැන මම කියන්නේ නැහැ. ඒ නිසා ගරු ජෝන් අමරතුංග ඇමතිතුමා පොඩ්ඩක් නිශ්ශබ්දව ඉන්න. [බාධා කිරීමක්] කැලණි ගඟේ මෙහා ඉවුර ගැනයි මම කථා කරන්නේ, එහා ඉවුර ගැන නොවෙයි. There are natural and man-made disasters. ඒ වර්ග දෙකක්.

5. එලෙසම ස්වභාවික නොවන ආකාරයෙන් යුද හමුදාවේ අවි ගබඩාව පිපිර යෑමෙන් කොස්ගම සාලාව ප්‍රදේශයේ සම්පූර්ණයෙන් විනාශ වූ සහ අර්ධ වශයෙන් විනාශ වූ නිවාස, ව්‍යාපාර ස්ථාන සඳහා වන්දි ගෙවීමේදී, හමුදාවට ගිය වියදම් එම වන්දි මුදලින් මුදල් අඩු කිරීමේ වැරැදි අත්තනෝමතික ක්‍රියාමාර්ගයක් සිදු වෙමින් පවතින බව අගමැතිතුමා දන්නවාද?

6. විනාශ වූ නිවසකට ලබා දීම සඳහා තක්සේරු කරන ලද මුදල්වලින් හමුදාවට වියදම් වූ මුදල් අඩු නොකර භාණ්ඩාගාරයෙන් ලබා ගන්න කටයුතු කරන්නේද සහ ජනතාවට ගෙවීමට නියමිත මුදල් ප්‍රමාණය කිසිම අඩු කිරීමකින් තොරව ගෙවීමට කටයුතු කරන්නේද?

සාලාව යුද හමුදා කඳවුරේ අවි ගබඩාවේ ඇති වූ මේ විනාශය නිසා විපතට පත් වූ ජනතාවගේ වන්දි මුදල් කපා හැරීම කිසි ලෙසකින්වත් නීත්‍යානුකූල හෝ සාධාරණ නොවන බව මම සඳහන් කරන්න කැමැතියි.

ඒ වාගේම මම අගමැතිතුමාගෙන් මේ කාරණයත් අහන්න කැමැතියි. සාලාව යුද හමුදා කඳවුරේ බෝම්බ පිපිරී යෑම සම්බන්ධයෙන් හමුදාපතිතුමා මාර්ගයෙන් කමිටුවක් පත් කරලා පරීක්ෂණයක් කරනවාය කියලා පාර්ලිමේන්තුවේදී කිව්වා. අද වන තුරු ඒ පරීක්ෂණ වාර්තාව එළිදරව් කර නැහැ. ඒ කියන්නේ, හමුදාපතිතුමා වාර්තාවක් දීගන්න බැරිව ඉන්නවා කියන එකද? ඒ ගැන මේ ගරු සභාව -අපි- දැනගත යුතුයි. මොකද, විශාල දේපොළ විනාශයක් ඒ හමුදා කඳවුර පිපිරී යෑමෙන් සිදු වුණ නිසා. සාලාව නගරය යළි ගොඩ නඟන බවට දුන් ප්‍රතිඥාව ඉටු කිරීමට කටයුතු කරනවාද?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒකාබද්ධ විපක්ෂය වග කියන්න ඕනෑ.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා (ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு துனேஷ் கங்கந்த - அனர்த்த முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Dunesh Gankanda - Deputy Minister of Disaster Management)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින්, ස්ථාවර නියෝග 23(2) යටතේ නඟන ලද ප්‍රශ්නයට මා ගරු අග්‍රාමාත්‍යතුමා වෙනුවෙන් පිළිතුර දෙනවා. ඒ පිළිතුර මෙසේයි.

1. කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉදි කිරීමට බලාපොරොත්තු වන නිවාස සංඛ්‍යාව - 1,682කි. ඊට අදාළ තොරතුරු ඇමුණුම 01හි සඳහන් වනවා. ඇමුණුම 01 **සභාගත*** කරනවා.

   (සූර්ණ හානි වූ නිවාස 230යි. දැඩි අවදානම් සහිත නිවාස 1,452යි.)

   පෞද්ගලික අංශය පහත සඳහන් පරිදි නිවාස 145ක් ඉදි කිරීමට දැනට එකඟතාව පළ කර තිබෙනවා.

හැබිටාඩ් ආයතනය	-	නිවාස 90
ඩයලොග් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	-	නිවාස 35
රයිනෝ ආයතනය	-	නිවාස 20
එකතුව	-	**නිවාස 145**

2. අධික වර්ෂා අවස්ථාවලදී නාය යෑම් අවදානම් කලාපවල සිටින ජනතාවට ආරක්ෂිත ස්ථාන කරා යොමු වන ලෙස උපදෙස් ලබා දී ඇති බැවින්, එවැනි අවස්ථාවලදී ඔවුන් ආරක්ෂිත ස්ථාන කරා පැමිණෙන අතර, එම අවස්ථාවලදී ඔවුන්ට අදාළ පහසුකම් ලබා දීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර තිබෙනවා.

   2016.08.23වන දිනට තාවකාලික කඳවුරු පහක, පවුල් 113ක සාමාජිකයන් 345ක් වූ සංඛ්‍යාවක් රැඳී සිටිනවා.

   තාවකාලික කූඩාරම් 800ක, පවුල් 788ක සාමාජිකයන් 2,845ක් වූ සංඛ්‍යාවක් රැඳී සිටිනවා.

3. ඔව්.

   අමාත්‍ය මණ්ඩල තීරණ අංක. අමප/16/1457/715/012 හා 2016 ජූලි 26 වන දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රජය විසින් පහත සඳහන් ක්‍රියා මාර්ග ගෙන ඇත.

   i නව නිවාස 1682 ක සංඛ්‍යාවක් ඉදි කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල වන රුපියල් මිලියන

**** ප්‍රස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු දුනේෂ් ගන්කන්ද මහතා]

2018.4ක (රක්ෂණාවරණයන් ආවරණය වන මුදල අනුව මෙම මුදල අඩු විය හැක) මුදලක් හා ස්ථිර නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් එළිපෙහෙලි කිරීම සඳහා රුපියල් මිලියන 61.8ක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ලබා දීමටත්, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා යුද හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් නිවාස ඉදි කිරීම සිදු කිරීමටත්,

ii. තම පෞද්ගලික ඉඩම්වල නිවාස ඉදිකිරීමට යොමුවන නිවාසලාභීන්ට රුපියල් මිලියන 0.4 බැගින් දළ වශයෙන් නිවාස ලාභීන් 500ක් සඳහා රුපියල් මිලියන 200ක මුදලක් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ලබා දීමටත්,

iii. නායයෑමට ලක් වූ හා අධි අවදානම් ස්ථාන ලෙස හඳුනාගත් ප්‍රදේශවලින් ජනතාව ඉවත් කළ පසු එම ස්ථාන පදිංචි වීම සඳහා තහනම් කලාප ලෙස නම් කිරීමටත්, ඉන් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය අනුමැතිය ලබා දෙන ඉඩම්වලට පමණක් කාෂිකාර්මික කටයුතු සඳහා පරිහරණය කිරීමට අයිතිය ලබා දීමටත්,

iv. නිවාස ඉදිකිරීම සඳහා භූමිය පරීක්ෂා කර යෝග්‍යතාව තීරණය කිරීම හා නිවාස ඉදි කිරීම්වලට අදාළ ආරක්ෂිත විධිවිධාන පිළිබඳ උපදෙස් ලබා දීම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය වෙත පැවරීමටත්, ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් මෙම ආපදාව වෙනුවෙන් දරන ලද වියදම් පිළිබඳ තොරතුරු ඇමුණුම 02 මඟින් දැක්වේ.

4. කොළඹ දිස්ත්‍රික්කයේ හානියට පත් නිවාස හිමියන් වෙත රුපියල් 10,000ක අත්තිකාරම් මුදල් ලබා දීම පිළිබඳව ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් ලබා දෙන ලද මුදල් පිළිබඳ විස්තරය මෙහි ඇමුණුම 03 මඟින් දක්වා ඇත.

5. වන්දි ගෙවීමේදී යුද්ධ හමුදාවට ගිය මුළු වියදම ලෙස වන්දි මුදලින් අඩු කිරීමේ වැරැදි ක්‍රියා මාර්ගයක් සිදු නොවන අතර, අංක අමප/16//1409/715/011-1 හා 2016.07.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව හානියට පත් නිවාස අතුරින් සැලකිය යුතු සංඛ්‍යාවක අලුත්වැඩියාවන් යුද හමුදාව මඟින් සිදු කර ඇති අතර, එක් එක් නිවාස සඳහා වූ අමුද්‍රව්‍ය වියදම සම්බන්ධ විස්තර යුද හමුදාව වෙතින් ලබා ගෙන එම මුදල අදාළ වන්දි මුදලෙන් අඩු කර දිස්ත්‍රික් ලේකම් /ප්‍රාදේශීය ලේකම් විසින් යුද හමුදාව වෙත ලබා දීම සඳහා අනුමැතිය ලැබී ඇති පරිදි අඩු කරනු ලබන්නේ නිවාස ඉදි කිරීම සඳහා යුද හමුදාවේ මුදලින් අමුද්‍රව්‍ය සඳහා වැය වී ඇති මුදල පමණි. ඇමුණුම 04 බලන්න. ඇමුණුම් **සභාගත*** කරමි.

6. හමුදාවේ ශ්‍රම දායකත්වය නිවාස ඉදි කිරීම් සඳහා ලබා දෙන අතර, නිවාස ඉදිකිරීම සඳහා ශ්‍රමය වෙනුවෙන් වැය වන මුදල අඩුවීමක් සිදු වේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානයට තවත් කරුණක් මා යොමු කරන්න කැමැතියි. ගරු අගමැතිතුමා සහ ජනාධිපතිතුමා මේ සිද්ධිය සම්බන්ධයෙන් සාකච්ඡා දෙකක් පැවැත්වූවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස මමත් ඒ සාකච්ඡාවලට සහභාගි වුණා.

එම හමුදා කඳවුර ඇතුළේ තිබුණු බෝම්බ හා වෙනත් පුපුරණ ද්‍රව්‍ය පුපුරා යාම නිසා තමයි ඒ ප්‍රදේශයේ ගෙවල් දොරවල් නැති වුණේ. ඒ නිසා ගෙවල් දොරවල් නැති වුණු එකට ගෙවන වන්දියෙන් "හමුදාවට වන්දි" කියලා යම් කිසි මුදලක් ගන්න බැහැ. ඇත්ත වශයෙන්ම ඒ පළාතේ ජනතාවට හමුදාව විශාල වන්දියක් ගෙවන්න ඕනෑ. ගරු නියෝජ්‍ය ඇමතිතුමා දැන් කියෙව්වේ චක්‍රලේඛයක්. ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් සාධාරණයක් කරනවා කියලා ජනාධිපතිතුමාත් අපට පොරොන්දු වුණා; අගමැතිතුමාත් පොරොන්දු වුණා. හමුදා කඳවුර ඇතුළේ සිදු වූ පුපුරා යෑම නිසා එම ප්‍රදේශයේ විනාශයක් සිදු වෙලා තිබෙනවා. ඒ ගැන වාර්තාවක් නැතිවීම වෙන එකක්. - අපේ ෆීල්ඩ් මාර්ෂල්තුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ සිටිනවා. - හමුදා කඳවුර ඇතුළේ සිදු වූ පුපුරා යෑම නිසා ඒ ප්‍රදේශයේ ගෙවල් දොරවල් විනාශ වුණා. It is a man-made disaster.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ගෙවල්වල වහලවල් හදන්න, වැසිකිළි හදන්න හමුදාව යම් කිසි මුදලක් වියදම් කරලා තිබෙනවා කියලා දැන් ඔබතුමා කිව්වා. ඒ වියදම් වූ මුදල් මහ ජනයාට දෙන වන්දියෙන් අඩු කර ගන්න අයිතියක් තිබෙනවාය කියලා කියන එක සාධාරණ වෙන්නේ කොහොමද? භාණ්ඩාගාරයේ මුදල් තිබෙනවා, හමුදාවට වියදම් වුණු මුදලක් තිබෙනවා නම් ඒ මුදල භාණ්ඩාගාරයෙන් ඉල්ලා ගන්න. මහ ජනයාට සිදු වූ විපත වෙනුවෙන් ගෙවන වන්දිය සම්පූර්ණයෙන් ගෙවන්න. මේක තමයි මිනිස්කමේ සාධාරණත්වය. මේ සම්බන්ධයෙන් කිසිම පුරවැසියකු උසාවි ගියේ නැහැ. උසාවි ගියා නම් හමුදාවට මීට වැඩි මුදලක් ගෙවන්න සිදු වෙනවා. මා එය ඉතා ඕනෑකමින් කියනවා. මොකද, හමුදා කඳවුර ඇතුළේ සිදු වූ පුපුරා යාම නිසා නේ මේ විපත සිදු වුණේ. ගරු කථානායකතුමනි, පැය දොළ හමාරක් තිස්සේ බෝම්බ, වෙඩි උණ්ඩ, අහස් වෙඩි ඔක්කෝම පුපුරා ගියා. දැන් නියෝජ්‍ය ඇමතිතුමා ඇවිල්ලා කියනවා, හමුදාවට වියදම් වුණු මුදල් මිනිස්සුන්ට ගෙවන වන්දියෙන් අඩු කර ගන්න ඕනෑය කියලා. ඒකේ කිසිම සාධාරණයක් නැහැ.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
ඔබතුමාගේ ප්‍රශ්නයට අපි සාධාරණ විසඳුමක් ලබා දෙන්නම්.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා (ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා)
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா - பிரதேச அபிவிருத்தி அமைச்சர்)
(Field Marshal Hon. Sarath Fonseka - Minister of Regional Development)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා හමුදාව ගැන ප්‍රකාශ කරද්දී මගේ නමත් සඳහන් සඳහන් කළ නිසා මේ අවස්ථාවේදී එයට පිළිතුරු දීමට මට යුතුකමක් තිබෙනවාය කියලා මා

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

හිතනවා. එතැනදි එම පුද්ගලයන්ට සිදු වුණු හානියට වන්දි ගෙවීමක් සිදු වෙනවා. උදාහරණයක් විධියට යම් ගෙයක් විනාශ වුණා නම්, ඒ විනාශ වුණු ගෙය සඳහා වන්දියක් ගෙවනවා. නමුත්, හමුදාව එම ගෙදර කොටසක් හෝ හදා දෙනවා නම්, එතකොට ඒ මුදල හමුදාව අය කර ගන්න ඕනෑ. හමුදාවේ මුදල්වලින් ගෙයක් හෝ කොටසක් හදන්න හමුදාවට බැහැ. ඒකයි එතැනදි සිද්ධ වන්නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් සමඟ කළ සාකච්ඡාවකදී අගමැතිතුමා අපට කිව්වා, විපතට පත්වූවන් සඳහා වන සියලුම වන්දි මුදල් ගෙවනවා කියලා. ඒ සඳහා සම්පූර්ණ වන්දි මුදල් ලබාදෙන බවට පොරොන්දු වුණා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

හොඳයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, මෙය ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානයට යොමු කරවන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

හමුදාවට අයත් ආයුධ පුපුරායාම නිසා ගෙවල් කැඩුණාම, ඒ මිනිස්සුන්ගේ සල්ලිවලින් ඒ ගෙවල් හදාගන්න කියලා කියන්නේ කොහොමද? මහා භාණ්ඩාගාරයේ සල්ලිවලින් ඒවා හදා දෙන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

So, we will refer it to the Hon. Prime Minister.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

මහා භාණ්ඩාගාරයේ සල්ලි හමුදාවට ලබා දෙන්න පුළුවන්. ජනතාවට ලබා දෙන වන්දි මුදල අඩු කරන්න එපාය කියන එකයි අපි කියන්නේ. ඒ වන්දි මුදල් අඩු කරන්න කිසිම නීත්‍යානුකූල අයිතියක් නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති බෝපාල්වල සිදු වූ භෙදවාචකය පිළිබඳව. එම සිද්ධියට අදාළව ප්‍රසිද්ධ නඩු තීන්දුවක් තිබෙනවා. I do not want to quote from that.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

The Hon. Deputy Minister will refer it to the Hon. Prime Minister.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)

Thank you, Sir.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

හොඳයි. ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා අමාත්‍යතුමා ඒ ගැන පැහැදිලි කිරීමක් කළේ. තිරණයක් ගැනීම සඳහා අපි අගමැතිතුමාට පවරමු.

මීළඟට, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා.

II

වන්නේරිකුලමේ සංචාරක මධ්‍යස්ථානයක් පිහිටුවීම
வன்னேரிக்குளத்தில் சுற்றுலா மையமொன்றை அமைத்தல்
ESTABLISHMENT OF A TOURIST CENTRE AT VANNERIKKULAM

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ටක්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரும் காணி அமைச்சருமான கௌரவ ஜோன் அமரதுங்க அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி!

கிளிநொச்சி மாவட்டத்தில் கரைச்சி பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள வன்னேரிக்குளம் கிராமமானது கிளிநொச்சியிலிருந்து 24 கிலோமீற்றர் தொலைவில் அமைந்துள்ளது. இது இயற்கை எழில் நிறைந்த ஒரு விவசாயக் கிராமமாக விளங்குகின்றது. பலவகையான பறவைகள், யானைகள் உள்ளிட்ட பல்வேறு விலங்குகள் மற்றும் பல்வகை மரங்கள் உள்ள இயற்கைக் காடுகள், அழகிய குளக்கரை என்பன இங்கு காணப்படுகின்றன. அந்தவகையில், சுற்றுலாப் பயணிகளை வெகுவாகக் கவரக்கூடிய இக்கிராமத்தில் சுற்றுலா மையமொன்று இதுவரையில் அமைக்கப்படாத நிலை காணப்படுகின்றது.

2015ஆம் ஆண்டு மாகாண குறித்தொதுக்கப்பட்ட நிதியிலிருந்து இக்கிராமத்தில் சுற்றுலா மையமொன்றை அமைப்பதற்கென 6 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப் பட்டிருந்தும் அதனை அமைப்பதற்கான காணி இனங்காணப் படாமையினால் அந்த நிதி திரும்பிச் சென்றுவிட்டதாக அறிய முடிகிறது. இப்பகுதியில் சுற்றுலாத்துறை மையமொன்றை அமைத்தால் அது சுற்றுலாப் பயணிகளை வெகுவாகக் கவரக் கூடியதாக அமையும் என்பது குறிப்பிடத்தக்கது. அத்துடன், இதனூடாக கிராமியப் பொருளாதாரத்தை மேலும் அதிகரிப்பதன்மூலம் தேசிய பொருளாதார வளர்ச்சிக்கு பாரிய பங்களிப்பினையும் வழங்க முடியும். ஆகவே, -

* வன்னேரிக்குளம் கிராமத்தில் சகல வசதிகளையும் கொண்டதான சுற்றுலா மையமொன்றை அமைக்க நடவடிக்கை எடுக்க முடியுமா?

மேற்படி எனது கேள்விக்கான பதிலை கௌரவ அமைச்சர் அவர்கள் வழங்குவாரென எதிர்பார்க்கின்றேன்.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

Yes, Hon. John Amaratunga.

ගරු ජෝන් අමරතුංග මහතා
(මාණ්පුමිකු ජෝන් අමරතුංක)
(The Hon. John Amaratunga)

Hon. Member, I am extremely thankful to you for inviting our attention to a wonderful place, which is ideal for a tourist centre. I was not aware of that. As you have brought it to our notice now, I will inform our officials to make an immediate inspection and find out as to how it can be developed as a resort and then infrastructure can

[ගරු ජෝන් අමරතුංග මහතා]

be added. But developing places like hotels and other things comes under the private sector. So, certainly we will try to invite some of the investors to go and have a look and put up a hotel there. I do not want to interfere with whatever the Provincial Council is doing. The Hon. Douglas Devananda, the Chief Minister is a good friend of you. So, why do you not ask him to invest Rs. 6 million and then make the infrastructure? - [*Interruption.*] Yes, you have elected him. - [*Interruption*]. So, the problem is there. Sometimes, whatever we try to do, the Chief Minister does not like. He did even not attend the Investment Forum that was set up in Jaffna. This problem is there. You all should get together and persuade him not to have a tug of war, but to join hands with the Government and develop the Jaffna District. That is what is required today. We are ready to do anything for you.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කථා කරන්නේත් ඒ කරුණ ගැනමද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒ කරුණ ගැනම නොවෙයි, අද පත්‍රයේ පළ වුණු වෙනත් කාරණාවක් ගැනයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක අවසානයේ කියන්න.

ඊළඟට, ගරු අනුර දිසානායක මැතිතුමා.

III

අලි ඇතුන් ලියාපදිංචි කිරීමේදී සහ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේදී සිදු වී ඇති දූෂණ හා අක්‍රමිකතා

யானைகளின் பதிவிலும் வருடாந்த உரிமம் வழங்கலிலுமான ஊழல் மற்றும் முறைகேடுகள்

CORRUPTION AND IRREGULARITIES IN ISSUING ANNUAL LICENCES AND REGISTRATION OF ELEPHANTS AND TUSKERS

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

අලි ඇතුන් ලියා පදිංචි කිරීමේදී සහ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේදී සිදු වී ඇති දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධයෙන් මෙම සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

මව් ඇතින්න මරා දමා හෝ නිර්වින්දනය කර පැටවුන් අල්ලා ගැනීමට ද, පුනරුත්ථාපනය කර වනයට මුදා හරින ලද අලි පැටවුල් නැවත අල්ලා ගැනීමට ද, එම සතුන් නීති විරෝධී ලෙස ලියා පදිංචි කිරීමට ද, විකිණීමට ද කටයුතු කළ සංවිධානාත්මක අලි ජාවාරමක් 2011 - 2014 කාලයේ වේගයෙන් ව්‍යාප්ත වුණා.

නීති විරෝධී ලෙස අත්පත් කර ගන්නා ලද අලි පැටවුන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඇතැම් දූෂිත නිලධාරීන්ගේ අනුදැනුම හා සහයෝගය ඇතිව ව්‍යාජ තොරතුරු මත ලියාපදිංචි කිරීමේ සංවිධානාත්මක ව්‍යාපාරයක් පිළිබඳව ද පසු ගිය කාලයේ අනාවරණය වුණා.

අලි ඇතුන් ලියා පදිංචි කිරීමේදී සහ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේදී බරපතළ දූෂණ හා අක්‍රමිකතා සිදු වී ඇති බවටත්, මෙම සිදුවීම්වලට දූෂිත දේශපාලකයන්, ව්‍යාපාරිකයන් හා වෘත්තිකයන් සම්බන්ධ බවටත් තොරතුරු හෙළිදරවු වී තිබුණා. එසේම මෙම සභාව තුළ ද මේ පිළිබඳව තොරතුරු රැසක් අනාවරණය වුණා. පසු ගිය ආණ්ඩු සමයේ මේ පිළිබඳව මවිසින් නඟන ලද ප්‍රශ්නයකට පිළිතුරු දුන් එවකට වනජීවී අමාත්‍ය විජිත් විජයමුණි සොයිසා මහතා මේ පිළිබඳව පත් කරන ලද කමිටු වාර්තාව එවකට ජනාධිපතිවරයා වෙත භාර දීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව ප්‍රකාශ කළා. නමුත් ඒ ආණ්ඩුව නැති වන තෙක් එවැනි වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණේ නැහැ.

මේ පිළිබඳව ඇති වූ මහත් ආන්දෝලනාත්මක තත්ත්වයක් තුළ අලි ඇතුන් ලියා පදිංචි කිරීමේදී සහ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේදී සිදු වී ඇති දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා 2015 දෙසැම්බර් මාසයේ වනජීවී සංරක්ෂණ අමාත්‍යවරයා විසින් විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු නිමල් එඩිවඩ් දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් ඒක පුද්ගල විමර්ශන කමිටුවක් පත් කරනු ලැබුවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා තමයි පත් කළේ. එම කමිටුව විසින් පුවත්පත් දැන්වීම් පළ කර මහජනතාවගෙන් සාක්ෂි කැඳවා 2016 ජනවාරි මාසයේ සිට විමර්ශන කටයුතු ආරම්භ කර තිබුණා.

දැන ගන්නට ලැබී ඇති අන්දමට මෙම විමර්ශන කමිටුවේ අවසන් වාර්තාව අමාත්‍යවරයා වෙත ලබා දී තිබෙනවා. එම වාර්තාවේ නීති විරෝධී අලි ඇත් ජාවාරම සම්බන්ධ අතිශය වැදගත් තොරතුරු රැසක් අනාවරණය කර තිබෙනවා. වනජීවී දෙපාර්තමේන්තුවේ ලිපි ගොනු 54ක සටහන් බ්ලේඩ්වලින් සුරා හෝ ටිපෙක්ස් යොදා මකා දමා හෝ වෙනත් සටහන් යොදා ඇති බවටත්, අලි පැටවුන්ගේ ඡායාරූප ඉරා වෙනත් ඒවා අලවා ඇති බවටත්, වංචනික තොරතුරු මත අලි පැටවුන් ලියා පදිංචි කර ඇති බවටත්, ව්‍යාජ ගොනු පවත්වා ගෙන ගොස් ඇති බවටත්, ඇතැම් දූෂිත නිලධාරීන්ගේ නිවෙස්වල ව්‍යාජ ලේඛන සකස් කරමින් තිබූ බවටත්, දෙපාර්තමේන්තු ලිපිගොනු සඟවා තිබූ බවටත්, මේ දූෂණ හා අක්‍රමිකතාවලට වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සය දෙනකු සම්බන්ධ බවටත් මෙම වාර්තාව විසින් අනාවරණය කොට තිබෙනවා. මම හිතන විධියට ගරු අමාත්‍යතුමා ළඟ එම වාර්තාව ඇති.

එහෙත් ලංකාවේ අලි හා ඇත් සම්පත බේරා ගැනීමට අදාළ පියවර ගැනීම සඳහා වූ වටිනා තොරතුරු හෙළි කරන මෙම වාර්තාව සම්බන්ධයෙන් ආණ්ඩුව පාර්ශ්වයෙන් මෙතෙක් පියවරක් ගෙන තිබෙන බව පෙනෙන්න නැහැ. ගරු කථානායකතුමනි, මොකක් හරි ආන්දෝලනයට ලක් වුණාම හැමදාමත් කමිටුවක් පත් කරනවා. කමිටු වාර්තාවක් මෙතැනට ලැබෙන්නේ නැහැ. ගොඩාක් අලි කථා කියනවා. හැබැයි, අන්තිමට කිසිවක් සිදු නොවී තමයි ඒවා කෙළවර වෙන්නේ. ගරු කථානායකතුමනි, මා ළඟ එම වාර්තාව තිබෙනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණී ජූයවික්රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
එහෙම නම් හොරකම් කරලා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්නායක්ක)
(The Hon. Anura Dissanayake)
මෙම වාර්තාව අලි ඇතුන් ලියා පදිංචි කිරීමේදී සහ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේදී වන සත්ව හා වෘක්ෂලතා ආඥාපනතේ ප්‍රතිපදානවලට පටහැනිව කටයුතු කිරීම පිළිබඳ කමිටු වාර්තාවයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එහෙම නම් ගරු අමාත්‍යතුමා පිළිතුරු දෙන්න.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්නායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම ප්‍රශ්න ටික අහන්නම්. මෙම වාර්තාවේ ඉතා පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා, අලි පොත පවා සමහර නිවෙස්වල සඟවා ගෙන තිබුණ බව. වනජීවී නිලධාරීන් පරීක්ෂා කරන්න යන අවස්ථාව වන විටත් එක්තරා පුද්ගලයකුගේ ගෙදර අලි පස් හය දෙනකුට වඩා රඳවා ගෙන සිටි බව වාර්තා වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, වැදගත් සාක්ෂි මේ වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. මා දන්නේ නැහැ, මේ වාර්තාව ඒකමද කියලා. මා විශ්වාස කරනවා, ඒක තමයි මේ වාර්තාව කියලා. මේ පොත ඇමතිතුමාට දෙන්නම්, මෙකද කියා දැන ගන්න.

අලි-ඇතුන් ලියා පදිංචි කිරීමේදී සහ වාර්ෂික බලපත් නිකුත් කිරීමේදී සිදු වී ඇති දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා පත් කරන ලද විමර්ශන කමිටුවේ අවසන් වාර්තාව ආණ්ඩුවට ලැබී තිබෙනවාද? මා ඉදිරිපත් කරන ලද ඔය වාර්තාව ආණ්ඩුවට ලැබී තිබෙනවාද? ඒ කවර දිනයේද? ඔය වාර්තාව ඔබතුමාගේ අතට ලැබුණේ කවදාද? ඔක නේද ඒ වාර්තාව?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න ටික අහන්න කෝ. ඇමතිතුමා පිළිතුරු දෙයි.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්නායක්ක)
(The Hon. Anura Dissanayake)
ඔක නේ වාර්තාව?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා)
(මාණ්පුමිකු කාමිණී ජූයවික්රම පෙරේරා - වලුවාතාර අපිවිරුත්ති මත්‍රුම් වනසීවරාසිකළ් අමෛච්චර්)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)
මා උත්තර දෙන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්නායක්ක)
(The Hon. Anura Dissanayake)
එමඟින් සිදු කර ඇති නිර්දේශ කවරේද? එම කමිටු වාර්තාව සහ නිර්දේශ සභාගත කරන්නේද? ඔබතුමා නිල වශයෙන් ඒ වාර්තාව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද? මගේ අතේ තිබුණාට වැඩක් නැහැ නේ. ගරු ඇමතිතුමා එය සභාගත කරනවාද?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණී ජූයවික්රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
අවශ්‍ය නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්නායක්ක)
(The Hon. Anura Dissanayake)
මට විතරක් නොවෙයි. සියලු දෙනාටම දැන ගන්න සභාගත කරනවාද?

එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව විසින් ගනු ලැබ ඇති පියවර කවරේද? දූෂණ, අක්‍රමිකතාවලට සම්බන්ධ පුද්ගලයන්ට හා නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගනු ලබන්නේද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි.

ඊළඟට, ගරු අමාත්‍යතුමා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණී ජූයවික්රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
අලි හොරු විතරක් නොවෙයි, පොත් හොරුත් ඉන්නවා, ගරු කථානායකතුමනි. අලි හොරු හිටියාට කමක් නැහැ. පොත් හොරුන්ගෙන් බේරෙන්න බැරුවයි ඉන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, පිළිතුරු දෙන්න, ගරු ඇමතිතුමනි. [බාධා කිරීමක්]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණී ජූයවික්රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
හොරුන්ගේ ශබ්දය ඇහෙනවා නේද? හොරු කැලේ ඉඳලා - [බාධා කිරීමක්] ඔය ඇහෙන්නේ. අර ඉන්නේ - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මෙය පාර්ලිමේන්තුවක්. පාසල් දරුවන් ගැලරියේ ඉන්න බව මතක තබා ගන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණී ජූයවික්රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, පිළිතුර මෙසේයි.

01. ඔව්. 2016.05.25 දින.

02. එම කමිටු වාර්තාව සහ නිර්දේශ **සභාගත*** කරමි.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

කමිටුවේ නිර්දේශ පහත දැක්වේ.

(i) මෙම වාර්තාවේ නිගමනයන් අනුව අපරාධ චෝදනා ලැබිය හැකි බවට දක්වා ඇති වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා අනෙකුත් පුද්ගලයන්ට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමඟ කියැවෙන වනසත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ චෝදනා ඉදිරිපත් කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා ගරු නීතිපතිවරයා සමඟ කටයුතු කිරීම. දැනට මෙය යවා තිබෙනවා.

(ii) ඊට අමතරව චෝදනා ලැබිය හැකි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ II වෙළුම යටතේ දෙපාර්තමේන්තු මට්ටමෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය වී චෝදනා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

(iii) අලි ඇතුන් ලියා පදිංචියට අදාළව ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අවසන්. ඒ පිළිබඳව කැබිනට් මණ්ඩලයටත් දැනුම් දී තිබෙනවා.

(iv) වන සත්ව හා වෘක්ෂලතා ආඥාපනත සහ අංක 662/4 සහ 1991.05.04 දින දරන නියෝග සංශෝධනය කිරීම.

මේ සඳහා මා දැනටමත් කමිටුවක් පත් කර තිබෙනවා. මේ ආඥා පනත අවුරුදු 25ක්, 30ක් පැරණියි. ඒ නිසා එය සංශෝධනය කිරීමට දැනට කමිටුවක් පත් කර තිබෙනවා. ඒ කමිටුවට නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගන්නවා. මා දන්නා නීතීඥවරයෙක් එහි සභාපති විධියට කටයුතු කරනවා. ඔහු අපක්ෂපාතී කෙනෙක්. ජ්‍යෙෂ්ඨ, පළපුරුදු ස්වේච්ඡා සංවිධානත් ඇතුළත් ඒ කමිටුව මඟින් සම්පූර්ණයෙන් සංශෝධනය කර, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණු පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ක්‍රියා කරනවා.

(v) වන සත්ව හා වෘක්ෂලතා ආඥාපනතේ ඇති ප්‍රතිපාදන වැරදි ලෙස භාවිත කිරීම වැළැක්වීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

(vi) වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කරන ක්‍රමවේදයන් සංශෝධනය කිරීම.

(vii) අමාත්‍යාංශය මඟින් යම් යම් සේවාවන් සඳහා අය කරන මුදල් සංශෝධනය කිරීම.

මේ ගැන කියන්නට ඕනෑ, ගරු කථානායකතුමනි,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ආදායම.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මම මේ පිළිතුර කියවලා ඊට පසුව ආදායම පැහැදිලි කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊට පසුව පැහැදිලි කරන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
"කබලෙන් ලිපට" වාගේ, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා පනිනවා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, පිළිතුරු දෙන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
පිළිතුරු දෙන්නම්. එතුමාගේ සංශෝධනවලට පිළිතුරු දුන්නාම, සතුට බුක්ති විඳින්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්න. ඊට පසුව පැහැදිලි කර ගැනීම් කරන්න පුළුවන්.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

(viii) වඳවීමේ තර්ජනයට ලක්වූ සතුන්ගේ හා පැළැටි පිළිබඳ අන්තර්ජාතික වෙළෙඳාම පිළිබඳ සම්මුතිය (CITES) ක්‍රියාත්මක කිරීමට අදාළ නිර්දේශ.

ගරු කථානායකතුමනි, අපි ලබන සතියේ සංශෝධන එකක්, දෙකක් කරනවා. CITES සමුළුව දකුණු අප්‍රිකාවේ, ජොහැන්නස්බර්ග් නුවර තිබෙනවා. අපි ලබන සතියේ කැබිනට් මණ්ඩලයට යොමු කරලා, පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

ඊයේ කැබිනට් මණ්ඩලයේදී තීරණයක් ගත්තා. CITES සංවිධානය කියන්නේ, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ආයතනයක්; ගඟකොළ, සකා, වායු ගෝලය, මත්ස්‍ය සම්පත ගැන සම්පූර්ණයෙන් සොයා බලන සංවිධානයක්. පසු ගිය දා අපි ඇත් දළ විනාශ කළ අවස්ථාවේදී John E. Scanlon ආවා.

ගරු කථානායකතුමනි, මෙම සංවිධානයේ මෙවර සමුළුව සැප්තැම්බර් මාසයේ 22 වෙනි දින ඉඳලා ජොහැන්නස්බර්ග් නුවරදී පැවැත්වෙනවා. එම සංවිධානයේ ඊළඟ සමුළුව ලංකාවේ පැවැත්වීමට අවස්ථාව ලබා දෙන්නය කියා මම යෝජනා කළා. එයට එම සංවිධානයෙන් ඉතා සතුටින් පිළිතුරු එවා තිබෙනවා. මම ඊයේ කැබිනට් මණ්ඩලයට එය ඉදිරිපත් කළාම, ගරු ජෝන් අමරතුංග මැතිතුමා ඇතුළු සැමොම එය එකහෙළා අනුමත කළා. එම සමුළුවට රටවල් 163කින් නියෝජිතයන් 2,000ක් එනවා. ඉතිහාසයේ කිසි දිනක සිදු නොවුණු ආකාරයට, 2019 වර්ෂයේදී ඒ සමුළුව ලංකාවේදීයි පැවැත්වෙන්නේ. ඒ සඳහා තවත් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා. එයට ජනාධිපතිතුමා සහ අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් task force එකක් පත් කරනවා.

එම සමුළුවට රාජ්‍ය නායකයෝ 2,000ක් එනවා. නොබැඳි ජාතීන්ගේ සමුළුවට වඩා රාජ්‍ය නායකයෝ එනවා. එයින් ලංකාවට විශාල කීර්තියක්, ගෞරවයක් ලැබෙනවා. ඒ අය කෙළින්ම අපට පණිවුඩය එවලා තිබෙනවා, "ලංකාවේ 2,000ක් සඳහා පහසුකම් සැපයිය හැකි ශාලා තිබෙනවා නම් සමුළුව ලංකාවේ පවත්වන්නට ඒ අය සතුටුයි" කියලා. ඒ තත්ත්වයට අපි

රට ගෙනැත් තිබෙනවා. ඒක අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ ප්‍රතිපත්ති තුළින් ආව එකක්. [බාධා කිරීමක්] ඒක කියන්නට ඕනෑ නේ, ඔබතුමා CITES එක ගැන ඇහුවා නේ. [බාධා කිරීමක්] අහපු ප්‍රශ්නයට මම උත්තර දෙන්න ඕනෑ නේ. මේ කෙටි කාලය තුළ අපේ ආණ්ඩුව ලබා ගත් ජයග්‍රහණ ගැන අපි කියන්නට ඕනෑ නේ. [බාධා කිරීමක්] මම වාගේ. හැබැයි, ඔබතුමා වාගේ අය හිටියොත් ඉවරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, පිළිතුර දෙන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

03. (i) එම විමර්ශන වාර්තාවේ දණ්ඩ නීති සංග්‍රහය සහ වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ චෝදනා ඉදිරිපත් කිරීමට නිර්දේශ කර ඇති අය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා විමර්ශන වාර්තාවේ සහතික කරන ලද පිටපතක් ගරු නීතිපතිතුමා වෙත 2016.07.13 දින යොමු කොට ඇත.

(ii) එම වාර්තාවේ සඳහන් නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරන ලෙස 2016.06.13 දින රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වෙත නිර්දේශ කර යවා ඇත. ඊට අමතරව එම ලිපියේ පිටපතක් විමර්ශන වාර්තාව සමඟ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කොට ඇත. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය අතර කටයුතු කෙරෙමින් පවතී.

(iii) අලි ඇතුන් ලියා පදිංචියට අදාළව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ඒ සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2016.07.12 දින ලබා දී ඇත. ඒ අනුව එම කමිටුව විසින් දැනට ජාතික ප්‍රතිපත්තිය සකස් කරමින් පවතී.

(iv) වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනත සංශෝධනය කිරීම පිළිබඳ නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කර ඇත.

මම එන සතියේ ඒ කමිටුවේ අය මුණ ගැසෙනවා. ඒක ඉතාම බැරෑරුම් කාර්යක්. මොකද, ඒක වචනයෙන් වචනයට සංශෝධනය කිරීමක්. ඒ සඳහා ටික දවසක් ගත වේවි.

(v) ඉහත කමිටුව මඟින්ම වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනතේ ඇති ප්‍රතිපාදන වැරදි ලෙස භාවිත කිරීම වැළක්වීම සඳහා නිර්දේශ ලබා දෙනු ඇත.

(vi) දෙපාර්තමේන්තුවේ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මහාචාර්ය සරත් කොටගම මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටුව මඟින් වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කරන ක්‍රමවේදයන් සංශෝධනය කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරනු ඇත.

ඒ කියන්නේ ඉන්නා අලින්ටත් බලපත්‍ර දෙනවා. ඒ වාගේම අලියාට සාත්තු කරනවාද කියලාත් බලනවා. වාහන නඩත්තු නොකරන විට දුර්වල වෙනවා නේ. ඒ වාගේ, අලියාට සාත්තු කරන්නේ නැත්නම් අලියාගේ බලපත්‍රය අහෝසි කරලා පවරා ගැනීමට පවා අපි ක්‍රියා කරනවා.

පෙරහැරවලට ගෙන යන අලින්ට අසනීප තිබෙනවාද කියා බලන්නත් අප පරීක්ෂණයක් කරනවා. අපට එක පාරටම අසනීපයක් හැදුණොත් වෛද්‍ය පරීක්ෂණයකට අරගෙන යන කොට සමහර වෙලාවට මැරෙනවා නේ. වෛද්‍ය පරීක්ෂණය නියමිත දවසට කෙරෙනවා නම් එවැනි දේවල් වැළකෙනවා. Prevention is better than cure. ඒ නිසා අප මානුෂික හදවතකින් බලලායි මේ කටයුතු කරන්නේ. ඒ සතා වෙනුවෙන් අප ඒ විධියට නීති ගේනවා. ඒ වාගේම ඒ නීති ක්‍රියාත්මක කරනවා.

ඊළඟට, අප විහාරස්ථානවල interview එකක් කරලා තමයි ඒ අලින් භාර දෙන්නේ. මම මේ දේවල් තීරණය කරන්නේ නැහැ. කැබිනට් මණ්ඩලයට මේ යෝජනා ඉදිරිපත් කරනවා. කැබිනට් මණ්ඩලයෙන් ඒවා අනුමත වෙන්න ඕනෑ. වැදගත්, පාරම්පරික හොඳ පුද්ගලයන් ඉන්නවා. ඒ අයවත් අප interview කරලා බලලා කැබිනට් මණ්ඩලයට ඒ යෝජනා ඉදිරිපත් කරලා අනුමත කරගෙන තමයි අලියෙක් දෙනවා නම් දෙන්නේ. ඒ එක්කම කැබිනට් මණ්ඩලය මෙහෙම යෝජනාවකුත් අනුමත කළා. දුප්පත් පන්සල්වලට අද අලියෙක් ගන්න බැහැ. අද අපේ ගමේ අලියෙක් රුපියල් ලක්ෂ 5ක් විතර වෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, පින්නවල නොවෙයි, වෙන තැනක අලි 35දෙනෙක් පුහුණු කරනවා. අලි භාරකරුවන්ටත් උගන්වන්න ඕනෑ. සමහර අය හෙණ්ඩුව අමානුෂික විධියට පාවිච්චි කරනවා. හොඳට අලි බලාගන්න අයට අප සහතික දෙනවා. වෙනම අලි 35දෙනෙක් පුහුණු කරනවා. එතකොට දුප්පත් ගමක කෝවිලක වෙන්න පුළුවන්, පන්සලක වෙන්න පුළුවන් ඒ ගමේ සංස්කෘතික උත්සවයකට අපට ඒ අලින්ව දෙන්න පුළුවන්. ඒක ආදායම් ලබන සේවාවක් විධියට අප කරනවා. ආණ්ඩුවට බරක් වෙන්න ඉඩ තියන්නේ නැහැ.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ආදායම ගැන මම දැන් කියන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, මා හිතන විධියට ඔබතුමා එතුමා අහපු ප්‍රශ්න හතරටම පැහැදිලි උත්තර දීලා තිබෙනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

(vii) දෙපාර්තමේන්තුව විසින් අය කරන ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු වී ඇති අතර මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට ඉදිරි පියවර ගනු ලැබේ.

ගරු කථානායකතුමනි, අද සමහරු ලංකාවට එන අයගෙන් පික්පොකට් ගහනවා. ඒ කොහොමද? Guideලා කියා පිරිසක් ජීප්වල එහෙම ඉන්නවා නේ. ඒ අය ඩොලර් ටික, Deutsche Mark ටික අරගෙන සාක්කුවලට දමාගෙන gate එකේදී රුපියල්වලින් tickets ගන්නේ. එතකොට අප භාණ්ඩාගාරයට විදේශ විනිමය දෙන්නේ නැහැ. මේ ගැන අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. මම ඒ ගැන කටයුතු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු ඇමතිතුමනි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණී ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, මගේ උත්තරය දීලා ඉවර නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම හිතුවේ ඔබතුමා කරුණු හතරටම හොඳට උත්තර දුන්නා කියායි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණී ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)

(viii) වඳවීමේ තර්ජනයට ලක් වූ සතුන්ගේ හා පැළෑටි පිළිබඳ අන්තර්ජාතික වෙළෙඳාම පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීමට අදාළ රෙගුලාසි සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේද එකහත්වය ලැබී ඇති අතර, ඉදිරියේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, පූර්ණ පැහැදිලි කිරීමක් ඔබතුමා කරන්නේ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණී ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
04. දූෂණ අක්‍රමිකතාවලට සම්බන්ධ පුද්ගලයින්ට හා නිලධාරීන්ට එරෙහිව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග ඉහත සඳහන් කර ඇත.

මම තව එක කාරණයයි කියන්නේ, ගරු කථානායකතුමනි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ආදායම් ගැන ඇහුවා. ඒ ගැන මම කියන්න ඕනෑ. අපේ අමාත්‍යාංශයේ පැය විසිහතරම වැඩ කරන සේවකයෝ තමයි ඉන්නේ. වෙන කිසිම රාජ්‍ය සේවකයෙක් එහෙම වැඩ කරන්නේ නැහැ. ඒ ගැන මම කියන්න ඕනෑ. එක නිලධාරියෙකුට කම්බි වැටවල් අස්සෙන් කිලෝමීටර 300ක් විතර යන්න වෙලා තිබෙනවා. මම ඉල්ලා තිබෙනවා cadre එක වැඩි කර දෙන්න කියලා.

මම දැන් ආදායම ගැන කියනවා. අපේ වනජීවී දෙපාර්තමේන්තුව, zoological, botanical කියන තුනම එකතු කරලා ගත්තාම මෙහෙමයි. මුහුදු අංශයේ සේවකයෝ දමන්නේ මට සේවකයන් නැති නිසායි. කියන්න සන්තෝෂයි, 2016 අගෝස්තු 1වැනි දා ඉඳලා,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්න හතරේ ආදායම් ගැන අහලා නැහැ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණී ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඒ ගැන අතුරු ප්‍රශ්නයක් ඇහුවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
වෙනම ඇහුවාද? මේ ප්‍රශ්න හතරේ නම් ඒ ගැන අසා නැහැ. [බාධා කිරීමක්]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණී ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
එතුමා ඇහුවා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට පිළිතුර එපා නම් කමක් නැහැ. ඒකට උත්තරය ඕනෑද?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඒකට පිළිතුර එපා, ගරු ඇමතිතුමනි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණී ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
එහෙම නම් කමක් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, වැදගත්ම ප්‍රශ්නය හැටියට අපි මතු කළේ 2011 සිට 2014 දක්වා විශාල අලි ජාවාරමක් සිදුවී ඇති බවයි. ඒ ජාවාරමට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ වෙලා තිබෙනවා; දේශපාලනඥයන් සම්බන්ධ වෙලා තිබෙනවා; සමහර බලවත් පුද්ගලයන් සම්බන්ධ වෙලා තිබෙනවා. මේ වාර්තාවේ ඉතා පැහැදිලිව නම්, ගම්, තනතුරු එක්ක ඒ කරුණු සියල්ලම වගකීම් සහිතව හෙළිදරවු කරලා තිබෙනවා. ඒ නිසා අමාත්‍යාංශයට තිබෙන්නේ මෙම වාර්තාව ඉදිරිපත් කරලා, එතැනින් නතර නොවී කටයුතු කිරීමයි. එක හේතුවක් තමයි මෙවැනි තත්ත්වයක් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍යයි. ඒ කාරණය මෙතුමා පැහැදිලි කළා. ගරු ඇමතිතුමනි, අලි ජාවාරමේ යෙදුණු අය සම්බන්ධව තමුන්නාන්සේගේ අමාත්‍යාංශය පැත්තෙන් ක්‍රියාමාර්ගයක් ගත යුතුව තිබෙනවා. ඒ වාගේම අප දන්නවා; ඔබතුමාත් දන්නවා, තවමත් ස්ථාන ගණනාවක හොරෙන් අල්ලා ගන්නා ලද අලි ඉන්නා බව. ඒ කාරණය නිලධාරිනුත් දන්නවා; ඔබතුමාත් දන්නවා. හැබැයි, ඔබතුමාටවත්, නිලධාරීන්ටවත් ඇතුළු වෙන්න බැරි සමහර බලවත් තැන්වලත් මේ අලි තවමත් ඉන්නවා. ඔබතුමාට දැන ගැනීමට අවශ්‍ය නම්, මම ඒ අලි ඉන්නේ කොතැනද කියා පසුව කියන්නම්. ඒ නිසා ගරු කථානායකතුමනි, අපේ රටේ මෑත කාලයේ සිද්ධ වෙලා තිබෙන ජාවාරම් අතර ඉතාමත් අමානුෂික ජාවාරමක් මේ. ගරු කථානායකතුමනි, සමහර අලි පැටව් පැහැරගෙන ඇවිල්ලා තිබෙන්නේ අලි අම්මා මරා දමලායි. ඒ නිසා අමානුෂික ජාවාරමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ පිළිබඳව ඉතා වැදගත් කරුණු වාර්තාව මඟින් හෙළිදරවු කරලා තිබෙනවා. එකී වාර්තාව හමස් පෙට්ටියට යන්න ඉඩ නොදී ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා කටයුතු කරන්න කියන එකයි අපගේ ඉල්ලීම වන්නේ.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණී ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, මම දැන් මෙතුමාට පිළිතුරු දුන්නා. අපි මේ පිළිබඳව නීතිපතිතුමාට යොමු කරලා තිබෙනවා; CID එකට යොමු කරලා තිබෙනවා. රාජ්‍ය සේවා කොමිසමට යොමු කරලා තිබෙනවා. ඒ ඔක්කෝම කිව්වා. අපි කිසිම දෙයක් හංගන්නේ නැහැ. මම නොදන්නා යම් තැනක එවැනි අලි පැටව් රහසිගතව සඟවාගෙන ඉන්නවා නම්, ඔබතුමා ඒ පිළිබඳ තොරතුරු කරුණාකර ලබා දෙන්න. මෙතුමා වාර්තාව සභාගත කරන්න කියලා කිව්වා. ගරු කථානායකතුමනි, කලින් මම වාර්තාව සභාගත කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කාරණය හරිද, ගරු මන්ත්‍රීතුමා?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හරි ගරු කථානායකතුමනි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමාට පසුව අවස්ථාව ලබා දෙන්නම්.

ඕළඟට, අමාත්‍යාංශ නිවේදන. සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම මහතා.

2016 අගෝස්තු 21 දින "ද සන්ඩේ ටයිම්ස්" වාර්තාව: සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමාගේ ප්‍රකාශය

2016 ஓகஸ்ட் 21ஆந் தேதிய "சன்டே ரைம்ஸ்" அறிக்கை : அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சரினது கூற்று

"THE SUNDAY TIMES" REPORT OF 21ST AUGUST, 2016: STATEMENT BY MINISTER OF DEVELOPMENT STRATEGIES AND INTERNATIONAL TRADE

ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)

Hon. Speaker, I would like to make the following statement on the article which appeared under the heading "Malik hires another US firm to lobby for Lanka", which is based on incorrect and misleading information in "The Sunday Times" on 21st August, 2016.

It appears that the mere intention of the article is to unjustifiably make a comparison of previous Government retaining different lobbying firms in the US as an image building exercise of the country with the recent agreement with Sandler, Travis and Rosenberg. This agreement with ST&R is purely made on an economic rationale to obtain expert assistance to the Ministry of Development Strategies and International Trade to pursue the objective of maximizing Sri Lanka's access to the United States market at a juncture the country needs enhanced opportunities for trade.

Sir, the scope of engagement as per the agreement signed after obtaining Attorney General's approval is as follows:

"The party represents the Ministry of Development Strategies and International Trade in connection with representation of Sri Lanka in Washington DC before government agencies and the US Congress focusing efforts on educating about the peace process in Sri Lanka: exploring options for greater economic and commercial ties between the US and Sri Lanka; identifying and expanding options for market access of Sri Lankan goods to the US; expanding the Sri Lanka caucus and building a friends of Sri Lanka caucus in the Congress; assisting in visiting delegation agenda development; promptly notifying Sri Lanka of any congressional or administrative action of importance to Sri Lanka; preparing brief analyses of developments in Congress and the Executive Branch on particular issues of concern to Sri Lanka; interacting with the interested US stakeholders and advising Sri Lanka on its free trade negotiations with other partner countries and possibly the Unites States."

Sir, the said article in "The Sunday Times" refers to an engagement of a firm for "nonexistent peace process part of the deal." Therefore, it is clear that this statement in the article is incorrect and totally misleading. The scope of engagement includes lobbying of US Congress with a view to introducing and passing a bill to have conflict-affected areas and lagging areas of our country as "qualified industrial zones" and thereby obtaining preferential market access to goods produced in these industrial zones.

Sir, this contract with the US firm ST&R has been entered into in the fullest transparent manner. The proposals have been evaluated by the Sri Lankan Embassy in Washington and their recommendations have been obtained. The proposal to enter into a contract with this firm was endorsed by the Cabinet Subcommittee on Economic Management - CCEM - on 25th May, 2016 and subsequently approved by the Cabinet of Ministers on 14th June, 2016 after submitting a comprehensive memorandum which gave all details of the objectives, output of the contract, type of engagement with a comparison of costs among the offers. It is untrue to say that the Foreign Ministry is unaware of the engagement, as it has been presented to the Cabinet of Ministers and the decision approving the recommendations of the Cabinet Memorandum has been sent to relevant Secretaries including the Secretary to the Ministry of Foreign Affairs. The Attorney General's approval has been obtained for the Agreement before signing.

[ගරු මලික් සමරවික්‍රම මහතා]

Hon. Speaker, funds for this contract is to be obtained from the National Budget from the allocations with Parliamentary sanction for the Ministry unlike in the case previously where such lobbying firms have been paid through the Central Bank costing the country around Rs. 1.6 billion which is approximately US Dollars 11.3 million. The total cost of this Agreement with ST&R is US Dollars 630,000 which is approximately Rs. 91.3 million.

Services of well-connected professional advocates, often lawyers who have the access to various powerful networks are hired, to argue for specific legislation in decision-making bodies like the United States Congress and that is the standard practice in the United States of America. ST&R being a prominent trade services provider with multifaceted experience in engaging in assisting governments to pursue economic growth through enhancing opportunities of trade has been properly assessed by the Sri Lankan Embassy in the USA. The previous engagement of the firm ST&R is considered an added qualification.

In view of the above facts, I inform Parliament that the baseless interpretation given in the above newspaper article is false and such information seriously misleads the public.

Hon. Speaker, I am also a strong advocate of media freedom. However, media should not abuse that freedom. Before allegations are made against politicians - whichever side they are on - or public officers or even the businessmen, media should obtain their explanations and clarifications before publishing incorrect articles.

Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම් දීම, ගරු මුදල් ඇමතිතුමා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත
துறைமுக, விமான நிலைய அபிவிருத்தி அறவீடு (திருத்தம்) சட்டமூலம்
PORTS AND AIRPORTS DEVELOPMENT LEVY (AMENDMENT) BILL

"2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මහතා විසිනි.

2016 සැප්තැම්බර් 06 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

නිති අමෙච්චර් මාණ්පුමිකු රවි කරුණානායක්ක අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2016 செப்ரெம்பர் 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Ravi Karunanayake, Minister of Finance; to be read a Second time upon Tuesday, 06th September, 2016 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්න මම පොරොන්දු වුණා. දැන් කථා කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අද දින "ලංකාදීප", "දිනමිණ", "ලක්බිම" සහ "ඩෙලිමිරර්" යන පුවත් පත් හතරේම පළ වෙලා තිබෙනවා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සම්බන්ධ ප්‍රවෘත්තියක්. "ලක්බිම" පුවත් පතේ සඳහන් වෙන්නේ, " 'බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් මහ බැංකු නිලධාරීන්ගේ සාක්ෂි පරස්පරයි' කියා සභානායක අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා ප්‍රකාශ කළා" කියලායි. ඒ වාර්තාවේ වැඩිදුරටත් තිබෙනවා, "පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හමුවේ මහ බැංකුවේ ඉහළම නිලධාරීන් දුන් සාක්ෂි බරපතළ පරස්පරතාවකින් පවතින බව සභානායක ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ප්‍රකාශ කළේය" කියලාත්, ඒ වාගේම, "පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාක්ෂි විභාගයට අදාළ ලේකම් වාර්තාවල ඒ පිළිබඳ කරුණු දක්වා ඇති බව ලක්ෂ්මන් කිරිඇල්ල මහතා වැඩිදුරටත් පැවසීය" කියලාත්.

ගරු කථානායකතුමනි, ලක්ෂ්මන් කිරිඇල්ල සභානායකතුමා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සමාජිකයකු නොවෙයි. ඒ නිසා එතුමාට කිසිසේත්ම ඒ ලේකම් වාර්තා පරිශීලනය කිරීමේ අවශ්‍යතාවක් හෝ හැකියාවක් ඇත්තේ නැහැ. මෙවැනි දෙයක් මාධ්‍යවල පළ කිරීම තුළින් දැනට විමර්ශන කටයුතු සිද්ධ කරමින් යන පරීක්ෂණයකට විශාල බාධාවක් සිද්ධ වනවා. අනෙක් පැත්තෙන් ඒ පරීක්ෂණයට අදාළ විමර්ශන කටයුතුවලට සාක්ෂි සපයන නිලධාරීන්ට යම්කිසි බලපෑමකුත් සිද්ධ වනවා. මට මතක විධියට මෙවැනි ප්‍රකාශ සිදු නොකිරීම පිළිබඳව ඔබතුමාම මේ ගරු සභාවේදී මීට කලින් කියලා තිබෙනවා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වර්තමානයේ සිදු වන විමර්ශනයක් පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කලින් කරුණු ඉදිරිපත් කිරීම පිළිබඳව. එහෙම තිබෙද්දි මට තේරෙන්නේ නැහැ, ආණ්ඩුව හැටියට මෙතුමාගේම ප්‍රකාශයක් ඇයි මේ විධියට කළේ කියලා. එහෙම කළාම අපේ පරීක්ෂණයට බරපතළ බලපෑමක්. අද දින සියලු පුවත් පත්වල ඒ ගැන පළ වෙලා තිබෙනවා. අද "ලංකාදීප" පුවත් පතේ මෙසේ පළ වෙලා තිබෙනවා:

"බැඳුම්කර සිද්ධිය: මහ බැංකු නිලධාරීන්ගේ සාක්කි පරස්පරයි. ඇමති ලක්ෂ්මන් කිරිඇල්ල කියයි."

අද "දිනමිණ" පුවත් පතේ මෙසේ පළ වෙලා තිබෙනවා:

"බැදුම්කර ගැන කෝප් කමිටුවට දුන් සාක්කි පරස්පරයි. ඇමති කිරිඇල්ල කියයි."

අද "ලක්බිම" පුවත් පතේ මෙසේ පළ වෙලා තිබෙනවා:

"බැදුම්කර පරීක්ෂණ නවතින හැඩ"

ඊළඟට, තවත් පුවත් පතක "Bond issue: Conflicting evidence given by CB officials, says COPE" කියලා සඳහන් වෙනවා. COPE කිව්වාම, අපි -පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - කිව්වා කියලායි කියන්නේ.

ගරු කථානායකතුමනි, ඊයේ දවසෙත් අපි රැස් වෙලා මේ පිළිබඳව මාර්ග සිතියමක් සකස් කළා. මේ බැදුම්කර සිද්ධිය පිළිබඳව ඔබතුමා විසින්, මේ පාර්ලිමේන්තුව විසින් අපට පවරපු වගකීම ඉෂ්ට කරලා අපේ කාරක සභාවේ වාර්තාව ඔක්තෝබර් මාසයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා. ඒ පිළිබඳව කාරක සභාවේ අපි කවුරුත් එකඟතාවකිනුයි කටයුතු කරන්නේ. විවිධ අදහස් තිබෙන්න පුළුවන්, වෙනස් මත තිබෙන්න පුළුවන්, වෙනස් අදහස් දැක්වීම් තිබෙන්න පුළුවන්. හැබැයි, ඒ සියලුම අදහස් දක්වන්න තිබෙන්නේ, කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පසුවයි.

ගරු කථානායකතුමනි, එහෙම තිබියදී පාර්ලිමේන්තුවේ සභානායකතුමා හැටියට, ආණ්ඩු පක්ෂයේ ප්‍රධානියා හැටියට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා මාධ්‍යවලට මෙවැනි ප්‍රකාශයක් කරනවා නම්, එය ඇත්තටම කාරක සභාවට කරන අනිසි බලපෑමක්. ඒක නිලධාරීන්ටත් ස්වාධීනව අදහස් ඉදිරිපත් කරන්න බාධාවක් වනවා වාගේම, සභික මන්ත්‍රීවරුන්ටත් එයින් යම් කිසි බාධාවක් ඇති වනවා. කාරක සභාවේ එවැනි තත්ත්වයක් තිබෙනවාය කියලා මාධ්‍යවල පළ වුණු එකත් බරපතළ කාරණයක්. එම නිසා මේ සම්බන්ධව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මේ පිළිබඳව මන්ත්‍රීවරුන් අදහස් දක්වනවා නම්, වගකීමෙන් ඒ කටයුත්ත සිද්ධ වෙන්න ඕනෑ. එය කළ හැක්කේත් වාර්තාව ඉදිරිපත් කළාට පස්සේ කාරක සභාවට පමණයි. එම නිසා මේ පිළිබඳ මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මෙය කාරක සභාවටත් යම් බාධාවක් වාගේම ඒ අදාළ නිලධාරීන්ගේ ස්වාධීනත්වයටත් කරපු බලපෑමක් හැටියට මම සලකනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා ඒ ගැන පැහැදිලි කිරීමක් කරනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, මම මීට කලින් පාර්ලිමේන්තුවේ ප්‍රසිද්ධියේ කිව්වා,"COPE කමිටුවට මාධ්‍ය කැඳවන්න" කියලා. COPE කමිටුවේ කටයුතු වාර්තා කරන්න මාධ්‍යවේදීන් කැඳවන්න කියලා මම මේ පාර්ලිමේන්තුවේදී ඉල්ලීමක් කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග සංශෝධනයේදී අපි එය ඇතුළත් කරන්න බලාපොරොත්තු වනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මොකද, මම ඒක කෙරුවේ අවංකවයි. COPE කමිටුවේ වෙන දේවල් විවිධාකාරයට මාධ්‍යවල වාර්තා වනවා. මම ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට එක ස්ථාවර නියෝගයක් පෙන්නුවා. අද තිබෙන ස්ථාවර නියෝග අනුවත්, මාධ්‍යවේදීන් කැඳවන්න පුළුවන් ස්ථාවර නියෝගයක් තිබෙනවා. I showed it to you, Hon. Handunnetti.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉතා ඉක්මනින් ඒ වෙනස්වීම් ඇති වෙනවා. අපි ඒක එතකොට බලමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ. නැහැ. වෙනස් කරන්න ඕනෑ නැහැ. අද තිබෙන ස්ථාවර නියෝග අනුව COPE එකේ සභාපතිතුමාට පුළුවන්, අවශ්‍ය පුද්ගලයන්ට ආරාධනා කරන්න. මම ඒ මතයේ ඉන්න කෙනෙක්. ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා පරස්පර විරෝධතාවන් ගැන කිව්වා. ඔබතුමා අගෝස්තු මාසයේ වාර්තා පරීක්ෂා කරලා තීරණයක් ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, පරස්පර විරෝධතාවක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි හොයලා බලන්නම් ඒක.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා පරීක්ෂා කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන කථා කරන්නම්. කථා කරන්න පුළුවන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා පරීක්ෂා කරලා තීන්දුවක් දෙන්න කෝ. මම කියන එක හරියි කියලා පිළිගන්න එපා. ඔබතුමා ඒ ගැන තීන්දුවක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඇත්තටම මට තේරෙන්නේ නැහැ මෙම වාර්තා පරීක්ෂා කිරීමට ඔබතුමාට තිබෙන බලය මොකක්ද කියලා. සාමාන්‍යයෙන් විගණකාධිපතිතුමා විසින් වාර්තාව ලබා දෙන්නේ COPE කාරක සභාවටයි. හැබැයි, ඔබතුමාට වාර්තාවක්

[ගරු අනුර දිසානායක මහතා]

ලබා දෙන්න හේතු සාධක වුණේ, එහි යම් රහස්‍ය කරුණු තිබෙනවාය කියලා මහ බැංකුව පැත්තෙන් පෙන්වා දීපු නිසායි. ඒ වාර්තාව කියවා බලා එහි කරුණු හරිද, වැරදිද කියලා නිරීක්ෂණය කරන්න ඔබතුමාට බලයක් නැහැ. ඔබතුමාට පුළුවන්කම තිබෙන්නේ, ඒ වාර්තාවට මොකද කරන්නේ කියන එක පිළිබඳව තීරණයක් ගැනීමටයි. ඒ වාර්තාව ඔබතුමා ළඟ පමණක් තියා ගන්නවාද? එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද? එය පාර්ලිමේන්තු පුස්තකාලයේ තබනවාද? ඒ වාගේ තීරණයක් ගැනීමට තමයි ඔබතුමාට ඒ වාර්තාව සම්බන්ධයෙන් බලය තිබෙන්නේ.

එම වාර්තාව පදනම් කර ගෙන COPE වාර්තාව සකස් කිරීමේ බලය තිබෙන්නේ COPE සභාවටයි. ඒ නිසා එය එතුමාට පැවරෙන බලයක් නොවෙයි. එම බලය පැවරී තිබෙන්නේ COPE සභාවටයි. දැන් COPE සභාවේ එවැනි පරීක්ෂණයක් සිදු වෙමින් තිබෙනවා. මහ බැංකු ගනුදෙනුව පිළිබඳව වෙන කථා කියන්න පුළුවන්. ඒක "හරියි" කියා හෝ "වැරදියි" කියා ඔබතුමන්ලාට තර්ක කරන්න පුළුවන්, ගරු රවි කරුණානායක මැතිතුමනි. අපට පුළුවන් එය "වැරදියි" කියා කියන්න. ඒ වාගේම ඔබතුමන්ලාට පුළුවන්, ඒක "හරියි" කියා තර්ක කරන්න. හැබැයි, ගරු කථානායකතුමනි, "COPE සභාවේ සිදුවෙන ක්‍රියාවලියේ පරස්පරතා තිබෙනවා. සාක්ෂි පරස්පරයි" වැනි කරුණු ගැන කියනකොට එය COPE සභාවේ ක්‍රියාවලියට අනිවාර්යයෙන්ම කෙරෙන අනියම් බලපෑමක් වෙනවා. විශේෂයෙන්ම සභානායකතුමා තමයි එහෙම කියන්නේ. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමනි, කරුණාකර එම මාධ්‍ය වාර්තාව නිවැරදි කරන්නය කියා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඒකයි. එහෙම පරස්පරතා තිබෙනවාය කියා පසෙක ඉඳන් කියන්න ඔබතුමාට අයිතියක් නැහැ කියන එක තමයි අපේ අදහස වන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එය පරස්පර විරෝධී නැහැ කියා COPE කමිටුවේ සභාපතිතුමා කියනවා නම් මම ඒක පිළිගන්නවා. හැබැයි, මට ලැබුණු තොරතුරු අනුව එවැනි තත්ත්වයක් නැහැ. පසු ගිය අවස්ථා දෙකෙහි වාර්තා ගෙනැවිත් බැලුවොත් ඒක පැහැදිලි වෙනවා කියා මම ඔබතුමාට කිව්වේ ඒකයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක COPE කමිටුවෙන්මයි එන්න ඕනෑ. ගරු මුදල් ඇමතිතුමා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් අවුරුදු 22ක් තිටපු නිසා මමත් ඒ ගැන කථා කරන්න කැමැතියි. එම කාරක සභාවේ සභාපතිතුමා අලුත් ආකාරයකට එම කාරක සභාවේ කටයුතු කර ගෙන යනවා. අපි එම කටයුතු අගය කරනවා. නමුත් මෙම ප්‍රකාශය සිදු කිරීමත් එක්ක එක දෙයක් කිව යුතුයි. එම කාරක සභාවේ තොරතුරු පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට පෙර පත්තරවල තිබෙන බව අපට පෙනෙනවා. ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමනි, ඔබතුමාත්, අපත් සහභාගි වුණු එම කාරක සභාවලදී ඒ ගැන කිව්වාම එවකට හිටපු අය ඇසුවේ, "එහෙම ආවේ කොහොමද?" කියායි. එහෙම නම් ඒකත් නැති කරන්න ඕනෑ. අද පුවත් පත්වල තිබුණු ප්‍රකාශයක් නිසා ඔබතුමා විසින් ඔය ප්‍රකාශය කරනවා. ඒ අතරතුරදී නොයෙක් නොයෙක් ඒවා කියනවා. එක්කෝ මෙය සම්පූර්ණයෙන් ප්‍රසිද්ධ කරන්න ඕනෑ. නැත්නම් මොකුත් නොකර ඉන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි ඒ අඩු පාඩුකම් ටික හදා ගනිමු.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඒ නිසා තමයි මේ අවස්ථාවේදී - [බාධා කිරීමක්] එතුමා පිළිගත් සමහර ඒවා තිබෙනවා. සමහර ඒවා තිබෙනවා - [බාධා කිරීමක්] හැබැයි, ඒවා සම්බන්ධයෙන් හරියට අල්ලා ගන්න කෙනෙක් නැහැ. දැන් නිශ්චිත වශයෙන් සභානායකතුමා අල්ලා ගන්න පුළුවන්. මොකද, එතුමා මේ ගැන කියා තිබෙනවා. ඊට කලින් තිබුණේ, "ආරංචි මාර්ග, පැවසුවා, ආරංචි වුණා" වාගේ දේවල්. නමුත් දැන් හරියටම අල්ලා ගන්න පුළුවන්. බඩු සමඟ හොරු අපි ඉදිරිපිට කෙලින්ම ඉන්නවා. ඒකයි තිබෙන ප්‍රශ්නය.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මාධ්‍ය කැඳවන්නය කියා මම මුල ඉඳලාම කිව්වේ, එසේ වැරදි වාර්තා යන එක වළක්වන්න තමයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි ඉක්මන් පියවරක් ගනිමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමා මාධ්‍ය කැඳවන්නේ නැත්තේ ඇයි?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මාධ්‍ය කැඳෙව්වා නම් මෙවැනි වැරදි ප්‍රචාර යන්නේ නැහැ. මාධ්‍ය කැඳවන්නය කියා මම ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාට කිව්වා. මාධ්‍ය කැඳවන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මට කථා කිරීමට අවස්ථාවක් ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, සභානායකතුමාගේ ස්ථාවරයට මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා. එතුමා ඉන්නේ ඒ ස්ථාවරය මත නම්, එසේ මාධ්‍ය කැඳෙව්වාට පසුව එතුමා මාධ්‍යවලට කියන්න ඕනෑ වෙන්නේත් නැහැ. දැන් තිබෙන ප්‍රශ්නය වන්නේ දැනට තිබෙන ස්ථාවර නියෝගවලින් ඒකට යම් බාධාවක් තිබෙන එකයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
බාධාවක් නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, එය පැහැදිලි විය යුතුයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බාධාවක් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග පිළිබඳ කමිටුව කැඳවා එය සංශෝධනය කර අපට අවස්ථාව ලබා දෙන්න. මේ බැඳුම්කර ගනු - දෙනුව සම්බන්ධයෙන් වුණත් -

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මේ ස්ථාවර නියෝග අනුව පුළුවන් කියා කියනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
දැනට තිබෙන ස්ථාවර නියෝග අනුව පුළුවන් නම් අපි මාධ්‍ය කැඳවමු. බැඳුම්කර ගනු - දෙනුව පිළිබඳ පරීක්ෂණයටත් අපි මාධ්‍ය කැඳවමු. මම එසේ යෝජනා කරනවා. ගරු සභානායකතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරලා, බැඳුම්කර ගනු - දෙනුව සම්බන්ධ පරීක්ෂණයට වුණත් අපි මාධ්‍ය කැඳවමු කියා මා මේ අවස්ථාවේදී කියා සිටිනවා. ඒකට කමක් නැහැ. ඒක ප්‍රශ්නයක් නොවෙයි. අපි ඒකට බොහොම කැමැතියි. ගරු සභානායකතුමනි, එතකොට ඔබතුමාට තැනින් තැන සිටිමින් ඒ ගැන මාධ්‍යයට කියන්න ඕනෑ වෙන්නේත් නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මැතිතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි දැන් හොඳ තැනකට පැමිණියාය කියා මා හිතනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා ළඟට සිටින පාර්ලිමේන්තුවේ ප්‍රධානියා වශයෙන් ගරු සභානායකතුමා කියනවා නම් "මේක කරන්න පුළුවන්" කියා, මමත් COPE කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් කියනවා, -බැඳුම්කර සිද්ධිය සම්බන්ධව නොවෙයි- COPE කාරක සභාවේ සෑම දෙයකටම මාධ්‍ය කැඳවන්න අද සිට අපට අවසර ලබා දෙන්නය කියා. පාර්ලිමේන්තුවට "Aye" කියන්න පුළුවන් නම් අපට ඒක දැන් කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මුදල් අමාත්‍යතුමා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම මෙයට පොඩි එකතු කිරීමක් කරන්න කැමැතියි. මොකද, මෙවැනි කටයුතු පෝෂණය කරන්න අවශ්‍යයි. මෙතෙක් දුර මාස ගණනාවක් තිස්සේ කථා කරලා, කරන දේ නිවැරදිව සිදු කරලා යන ගමනක් තමයි, ආණ්ඩුව පැත්තෙන් පෙනෙන්න තිබෙන්නේ. නමුත් අපි මූලිකව මේ රටට අලාභයක් සිදු වුණු Greek Bond scandal එක සම්බන්ධයෙන් වාගේම ඊට පෙර ඒවා සම්බන්ධයෙන් පවා විවෘත කිරීමක් සිදු කරන්න ඕනෑ. මේ එක කොටසක් අල්ලා ගෙන ඒ වටේ දහලමින් ඉන්නවා. හෙජින් සූදුව සම්බන්ධයෙන් බිලියන 64ක් -කෝටි 6,400ක්-

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එම වාර්තාව ඇවිත් තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
වාර්තාව ඇවිල්ලා නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
වාර්තාව ආවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
කොහේටද ඇවිත් තිබෙන්නේ?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මට පොඩ්ඩක් අවසර දෙන්න. COPE කමිටුවේ ක්‍රියාකාරිකයෙකු හැටියට ගරු රවි කරුණානායක මැතිතුමා වැඩ කටයුතු කර තිබෙනවා. මේ දවස්වල මුදල් අමාත්‍යාංශයේ බොහෝ වැඩ කටයුතු තිබෙන නිසා වෙන්න ඇති, එතුමා COPE වාර්තාව කියවා නැහැ වාගේ පෙනෙන්නේ. පසු ගිය දා මේ පාර්ලිමේන්තුවට අතුරු වාර්තාවක් ඉදිරිපත් කළා. එම අතුරු වාර්තාව මුද්‍රණය කර සභාගත කරන්නය කියා ඉදිරිපත් කර තිබෙනවා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ඒ ගැන කියන්නම්. හෙජින් සූදුව නිසා ඇති වී තිබෙන පාඩුව කෝටි

[ගරු අනුර දිසානායක මහතා]

1,020යි. ඒක ඒ වාර්තාවේ සඳහන් වී තිබෙනවා. ඒ වාගේම, හෙජින් සූදුවේ පරීක්ෂණ කටයුතු වෙනුවෙන් අරගෙන තිබෙන නඩු ගාස්තු කෝටි 97යි. ඒ කරුණු සියල්ල මේ අතුරු වාර්තාවෙන් ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ඒක, පාර්ලිමේන්තුවට මීට පෙර යොමු කරලා තිබෙන කරුණක්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
නැහැ, නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
රුපියල් 25,000ක වංචාවකට රජයේ සේවකයෙකු හිර ගෙදරට යවන්න පුළුවන් නම්, මේ විධියට කෝටි 6,900ක් නැති වෙලා තිබෙන අවස්ථාවක එක ලිපිකරුවෙක් හිරේ යවලා තිබෙනවාද? ඒවා තමයි ඔබතුමන්ලා පරීක්ෂා කළ යුත්තේ. ඒ කරුණු සියල්ලම පසු විපරමකින් බලන දේවල්. එන හැම වාර්තාවක්ම කියවන නිසායි මම මේ අගය කිරීම කරන්නේ. අපේ පක්ෂයේ මන්ත්‍රීවරුත් COPE එකේ ඉන්නවා. මේක මේ එක්කෙනෙකුගේ රහපෑමක් විතරක් නොවෙයි නේ. සියලු දෙනාම එකතු වෙලා තමයි ඒ කමිටුවේ කටයුතු කරන්නේ. අවුරුදු 22ක් විතර අපිත් මහන්සියෙන් වැඩ කරලා COPE එක පෝෂණය කරලා තිබෙනවා. මම ඔබතුමාට කාරුණිකව කියන්නේ අනෙක් දේවල් ගැනත් පෙන්වලා දෙන්න කියලායි. මෙතැන ණය ගැන ප්‍රශ්න අහනවා. ණය ගැන ප්‍රශ්න අහන්න වෙන්නේ අවුරුදු 11ක් කරපු වැරැදි ක්‍රියා නිසායි. නමුත් ඒවා ගැන කථා කරන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම ඒ ගැන අවධානය යොමු කරන්න කැමැතියි. ගරු සභානායකතුමාට පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, ස්ථාවර නියෝග 130අ (i) වගන්තිය වෙත. එහි තිබෙනවා, "...කථානායකවරයාගේ අනුමැතිය ඇතිව ආගන්තුක පුද්ගලයන් ගෙන්වා ගැනීමේ බලය තිබිය යුතුය...." කියලා. So, with your consent, ඔබතුමාගේ කැමැත්ත අනුව, මාධ්‍යවේදීන්ට ආරාධනා කරන්න පුළුවන්. මේක අදහසක් විතරයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මට ඒ ගැන පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න. මේ ගැන සාකච්ඡා කරන්න ගිය සඳුදා දවස පුරාම අපි රැස්වුණා. නැවත සිකුරාදා රැස් වෙනවා. දැන් ඒ කටයුතුවලින් සියයට 75ක්, 80ක් විතර ඉවරයි. මෙතැනදී එක බාධාවක් තිබෙනවා, ගරු සභානායකතුමනි. පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 9වැනි වගන්තිය යටතේ යම් කිසි conflict එකක් තිබෙනවා. අපි ඒකත් හදා ගනිමු. ඒ නිසා සභානායකතුමනි, තව ටික දවසක් ඉවසන්න. සැප්තැම්බර් මාසය වෙන කොට මේ කටයුතු අවසන් කරන්න පුළුවන් වෙයි. එතකොට media කැඳවන්න පුළුවන්. ඒ මතයට මම එකඟයි. මම සභානායකතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ රැස්වීමේදීත් කිව්වා, සභානායකතුමාත් මේකට කැමති වුණාය කියලා. ඒ නිසා හෙට මාධ්‍ය කැඳවන්න එපා. අපි මේවා හදා ගත්තාට පස්සේ කැඳවමු.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙතැන ප්‍රශ්නයක් පැන නැඟුණා. සභානායකතුමා ප්‍රකාශ කරපු විධියට, "මාධ්‍ය කැඳවන්න අවස්ථාව තිබියදී කැඳවන්නේ නැහැ" වාගේ අදහසක් තමයි හැඟී ගියේ. කථානායකතුමාගේ ප්‍රකාශයෙන් ඒක නිරවුල් වුණා, "ඒක එහෙම නොවෙයි" කියලා. මම මේ කියන්න හැදුවේ, මුදල් අමාත්‍යතුමා කරපු ප්‍රකාශය ගැනයි. දැන් කෝප් කමිටුවේ අතුරු වාර්තාව ඇවිල්ලා තිබෙනවා. ඒ අතුරු වාර්තාවේ ඉතා පැහැදිලිව, එයාර් ලංකා ගුවන් සමාගමේ පාඩුව කෝටි 10,200යි කියලා සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම හෙජින් එකේ පාඩුව කෝටි 1,020යි කියලා සඳහන් කරලා තිබෙනවා. හෙජින් ගනු-දෙනුවට අදාළ නඩුව වෙනුවෙන් වියදම් කළ මුදල කෝටි 97යි කියලා සඳහන් වෙලා තිබෙනවා.

"ලංකාපුත්‍ර" බැංකුව සාමාන්‍ය සුළු ව්‍යාපාරිකයාට ණය ලබා දීම සඳහා පිහිටවපු ආයතනයක්. රුපියල් මිලියන 20කට වඩා ණය ලබා නොදිය යුතුයි කියන කොන්දේසියක් තිබුණා. හැබැයි රුපියල් මිලියන 20ට වඩා, රුපියල් මිලියන 400, රුපියල් මිලියන 500 පවා "ලංකාපුත්‍ර" බැංකුවෙන් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම, "ලංකාපුත්‍ර" බැංකුවේ වර්තමාන සභාපතිවරයා පිළිබඳවත් කරුණු සඳහන් කරලා තිබෙනවා. ඒ නිසා වාර්තාවෙන් ඔබ්බට ක්‍රියාත්මක කිරීමේ බලය තිබෙන්නේ, ඔබතුමාත් නියෝජනය කරන කැබිනට් මණ්ඩලයටයි. ඒ බලය තිබෙන්නේ කෝප් කමිටුවට නොවෙයි.

ගරු කථානායකතුමනි, පෙරේදා රැස්වුණු පක්ෂ නායක රැස්වීමේදී මවිසින් කරුණු ඉදිරිපත් කළා, දැනට ඉදිරිපත් කර ඇති කෝප් අතුරු වාර්තාව පිළිබඳව සැප්තැම්බර් දෙවැනි සතියේ දවස් දෙකක විවාදයක් ලබා දෙන්න කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි ඒ ගැන සාකච්ඡා කරලා තීරණයක් ගනිමු.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා "ලංකාපුත්‍ර" බැංකුව සම්බන්ධයෙන් කියපු නිසායි මම මේ කාරණය කියන්නේ. කෝප් වාර්තාවෙන් කියන්නේ පසුවිපරමක් පිළිබඳවයි. ඒ කියන්නේ post-audit එකක්. ඒ නිසා දැන් වෙන දේ ගැන ක්‍රියාත්මක වෙන්න අවසරයක් නැහැ. නමුත් ඒ පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. ඔන්න, ඕක තමයි වෙලා තිබෙන්නේ. අපට දීලා තිබෙන බලතල අනුව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී කථා කරන්න පුළුවන් වන්නේ, විගණකාධිපතිතුමා ඉදිරිපත් කරලා තිබෙන අවුරුද්දක හෝ දෙකක කරුණු ගැන. හැබැයි, ඉදිරිපත් කරලා නැති දේවල් ගැනත් වාර්තා කරලා තිබෙනවා. මම මෙතැන පෙන්වන්න හදන්නේ, මෙවැනි දේවල් තමයි දැන් කරන්නේ කියන එක. COPE එකේ සභාපතිකම විපක්ෂයට දුන්නු නිසා, ඒක පාවිච්චි කරලා විනිවිදභාවයෙන් කරන දේවල් පවා නිකරුණේ විවේචනය කරන්න එපා. එහෙම කරන එක තමයි අසාධාරණ. [බාධා කිරීමක්] එහෙම වෙන්න ඉඩ දෙන්නේත් නැහැ නේ. "ලංකාපුත්‍ර" බැංකුවේ සභාපති ගැන දැන් ප්‍රකාශ කළා. ඒක මේ අවුරුද්දට බලපාන්නේ නැහැ නේ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ඒක ගිය අවුරුද්දේ එකක්.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
ගිය අවුරුද්දේ ඒවා වුණත් තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ නේ? ඉතින් කොහොමද එහෙම කරන්නේ?

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
පාර්ලිමේන්තුවට දැනුම් දීලා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට තවම ඉදිරිපත් කරලා නැහැ, 2015 වර්ෂයේ ගිණුම්. ඒ නිසා ඒ සම්බන්ධයෙන් පසුවිපරමක් කරන්න බැහැ. අපට ප්‍රශ්නයක් නැහැ. අපට තොරතුරු, -[බාධා කිරීමක්] ඔබතුමන්ලාට විතරක් නොවෙයි නේ කථා කරන්න අයිතියක් තියෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා, අපි මේ කාරණය ගැන කථා කිරීම අවසන් කරමු.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
වර්තමාන කාර්ය සාධනය පරීක්ෂා කිරීමේ බලයක් කෝප් කමිටුවට තිබෙනවා. ඒ වාගේම සමහර පත්වීම් පිළිබඳවත්, විශේෂයෙන් කෝප් කමිටුව විසින් තීරණයක් ගන්නා- [බාධා කිරීමක්] මාත් එහි සාමාජිකයෙක්.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන්ගෙන් තුන් දෙනෙක්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ඉන්නවා. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක)
(The Hon. Anura Dissanayake)
ඔව්. ඔබතුමන්ලාගේ පහළොවක්ද කොහේද ඉන්නවා. ඔබතුමා දන්නේ නැද්ද ඒක?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, දැන් දිනට නියමිත කටයුතුවලට යමු. නැත්නම් මේ කාරණය පැය ගණනක් දිගට යන්න පුළුවන්. ඇති නේ දැන්?

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටතු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, කුළුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ් [මාණ්පුමිකු සෙල්වම් අඩෙක්කලනාදන්] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත: නියමය
விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம் : கட்டளை
SPECIAL COMMODITY LEVY ACT: ORDER

[අ.භා. 2.41]

ගරු රවි කරුණානායක මහතා (මුදල් අමාත්‍යතුමා)
(මාණ්පුමිකු රවි කරුණානායක - நிதி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Finance)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජනවාරි 20 දිනැති අංක 1950/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම මා අගය කරනවා. විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ තමයි මා මේ නියමය ඉදිරිපත් කරන්නේ.

මේ කාරණා මාස තුනකට වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අවශ්‍ය වනවා. රටේ තිබෙන භාණ්ඩවල මිල උච්චාවචනය වීම නිසා සහ දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කරන්න තිබෙන නිසා යම් වැඩ පිළිවෙළක් ගෙන යන්න අවශ්‍යයි. එවැනි භාණ්ඩ සම්බන්ධයෙන් මාස තුනකට අදාළ කරුණු තමයි මේ ගැසට් කර තිබෙන්නේ.

අපි අර්තාපල් සම්බන්ධයෙන් මිලක් වැඩි කර තිබෙනවා; ලූනු සම්බන්ධයෙන් මිලක් වැඩි කර තිබෙනවා. ඒ වාගේම පොල් තෙල් කර්මාන්තය ආරක්ෂා කරන්නට තිබෙන නිසා ආනයනික පොල් තෙල්වලට අදාළ මිල වැඩිකර තිබෙනවාය කියන එකත් පාර්ලිමේන්තුවට දැන් කියන එක සුදුසුයි කියා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාව උපයෝගි කර ගෙන මම කියන්න බලන්නේ අපි හැම අවස්ථාවේම කෘෂි ආර්ථිකය දියුණු කරන්න කටයුතු කර තිබෙන බවයි. එහි ප්‍රතිඵල ඒ ආකාරයෙන්ම සාර්ථකව ලැබී තිබෙනවාද කියන කරුණ සලකා බැලීමේදී, ඊට පෙර තිබුණු තත්ත්වය ගැනත් කථා කරන්න අවශ්‍යයි.

හාල්වලින් දැන් අපේ රට ස්වයංපෝෂිත වෙලා තිබෙනවා. මේ රටට අපි ප්‍රධාන භාණ්ඩ පහක් ආනයනය කරනවා. අල, ලූනු, සෝයා, බඩ ඉරිහු සහ මිරිස් යන මේ භාණ්ඩ පහ සඳහා අපි

[ගරු රවි කරුණානායක මහතා]

රුපියල් බිලියන හැත්තෑපහක් විතර රටින් පිටට යවනවා. මේ ද්‍රව්‍ය මේ රටේම නිෂ්පාදනය කරන්න පුළුවන් නම්, රටටත්, අපේ පාරිභෝගිකයාටත් ලොකු සේවයක් කරන්න පුළුවන්. අද පිට රටකින් ලංකාවේ වරායට අල කිලෝ එකක් රුපියල් 30ට ගෙනෙන්න පුළුවන් අවස්ථාව තිබුණත්, මේ රටේ විකුණන්නේ රුපියල් 110ට, රුපියල් 115ට. වැලිමඩ වාගේ ප්‍රදේශවල ඉන්න අපේ දේශීය අල නිෂ්පාදකයාට නිෂ්පාදන වියදම වශයෙන් අල කිලෝවකට රුපියල් 75ක් විතර යනවා. අපේ නිෂ්පාදන වියදම රුපියල් 75ක් වෙනකොට, විදේශීය අල කිලෝව රුපියල් 110ට රුපියල් 115ට විකිණීමෙන් අසාධාරණයක් සිද්ධ වෙන බව පෙනෙන්න තිබෙනවා. අපේ නිෂ්පාදනයේ ඵලදායිතාවට මොනවාද වෙලා තිබෙන්නේ? මේ සම්බන්ධයෙන් අපේ කෘෂිකර්ම ඇමතිතුමා උන්නදුවකින් කටයුතු කරනවා. මා මේ කාරණය එක නිදසුනක් වශයෙන් ගත්තේ මේ තිබෙන පරස්පරය පෙන්වා දෙන්නයි.

ලූනු සම්බන්ධයෙනුත් ඒ දේමයි කියන්න තිබෙන්නේ. ඉතින් අපි කොහෙමද මේ භාණ්ඩ මිල අඩු කරලා දේශීය නිෂ්පාදකයාත් ආරක්ෂා කරන්නේ? සමහර ද්‍රව්‍යවල මිල වැඩි වුණත් අපි දේශීය ගොවියා ආරක්ෂා කිරීමට කටයුතු කර තිබෙනවාය කියන එක මේ අවස්ථාවේදී මතක් කරනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ තිබෙන සහනාධාර ගැනත් කියන්න ඕනෑ. මේ සහනාධාර ඵලදායි ලෙස, target එකක් සහිතව යොදවනවාද කියන කාරණය ලොකු ප්‍රශ්නයක් ලෙස තිබෙනවා. ඒ කාරණය තමයි මට පාර්ලිමේන්තුවට හෙළිදරවු කරන්න අවශ්‍ය වෙන්නේ. තිබෙන දූෂණ අඩු කරන්න නොවෙයි, තිබෙන දූෂණ නැත්තටම නැති කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න කියලා මේ අවස්ථාවේ අපි ඔබ සියලු දෙනාගෙන්ම කාරුණිකව ඉල්ලා සිටිනවා. නමාශීලී ආණ්ඩුවක් වශයෙන් අපි මෙවැනි කටයුතුවලට ඉඩ දීලා තිබෙනවාය කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

අද දින න්‍යාය පත්‍රයේ යෝජනා අංක 1 සිට 13 දක්වා මම ඉදිරිපත් කරනවා. මගේ කථාව ආරම්භයේදීම ඒ පිළිබඳව සඳහන් කිරීමට නොහැකි වුණු නිසා මම ඒ නිවැරැදි කිරීම කරනවා.

අපි දේශීය ගොවියා ආරක්ෂා කරනවා. යම් යම් අය බොහෝ අවස්ථාවල පෙන්වන්න උත්සාහ කරනවා, අපි දේශීය ගොවියා නැති කරලා තිබෙනවාය කියලා. අපි මේ කථා කරන 2016 අවුරුද්දේදී තමයි මේ රටේ ආනයනය සියයට හත අටකින් විතර අඩු වෙලා තිබෙන්නේ. අපේ රටේ කෘෂි නිෂ්පාදනය වැඩි වෙලා තිබෙන නිසා, කෘෂි නිෂ්පාදන ආනයනය සියයට හතක් දක්වා අඩුවෙලා තිබෙනවා. කෘෂි නිෂ්පාදන සම්බන්ධයෙන් ස්ථිරසාර වැඩ පිළිවෙළක් ඇති කරලා තිබෙන නිසායි මේ තත්ත්වය ඇතිවෙලා තිබෙන්නේ කියන කාරණය මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. අපි සියල්ලම දන්නවාය කියලා අපි හිතන්නේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලාගේ අදහස් අපට ඉදිරිපත් කරන්න කියලා මම පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. It can be even from the Northern area. Please forward your ideas, especially agricultural-oriented ideas, to us. Then, we will be looking forward to take them in.

ගරු අගමැතිතුමාත්, අතිගරු ජනාධිපතිතුමාත් හැම අවස්ථාවේදීම අපට කියලා තිබෙන්නේ, සියලු දෙනා එක්ක සාකච්ඡා කරලා, සියලු දෙනාටම පිළිගන්න පුළුවන් අංගසම්පූර්ණ අය වැයක් ඉදිරිපත් කරමු කියලායි. ඒ ආකාරයට කටයුතු කරන්න කියලා එතුමන්ලා අපව දැනුවත් කරලා තිබෙනවා. ඒ නිසා මම ඔබ සියලු දෙනාටම කාරුණිකව විවෘත ආරාධනාවක් කරනවා, ඔබතුමන්ලාගේ අදහස් අපට ඉදිරිපත් කරන්න කියලා.

දැනට කරන භාණ්ඩ ආනයනය තවත් අඩු කරලා, දේශීය මට්ටමෙන් අපේ නිෂ්පාදන වැඩි කරන්න පුළුවන් කොහොමද කියන කාරණය පිළිබඳව අපි දැන් සොයා බලනවා. රටට ආනයනය කරන වැඩිම භාණ්ඩ 25 මොනවාද, ඒ භාණ්ඩ 25 වෙනුවට අපේ රටේ නිෂ්පාදන ආදේශ කරන්න පුළුවන් කොහොමද කියන එකයි අප දැන් ඉලක්ක කර තිබෙන්නේ. ඒ තුළින් තමයි පුළුවන් තරම් රටේ ආර්ථිකය ප්‍රචලිත කරන්න අපි බලාපොරොත්තු වෙන්නේ.

ඊළඟට, රේගු ආඥාපනත යටතේ යෝජනාවකුත් අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. රේගු ආඥාපනත අනුව 2016 අවුරුද්දේ අය වැය තුළින් යම් බදු ලිහිල් කිරීමක් ලබා දුන්නා. එහි නෛතික භාවය ඇති කරන්න එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අවශ්‍යයි. මීන් පසුව කිසිසේත්ම ඒ බදු සහනය පාවිච්චි කරන්නේ නැහැ කියලා අපි කියනවා. මොකද, ඒ සඳහා පාර්ලිමේන්තුවේ අවසරය අවශ්‍යයි. රජය ඉදිරිපත් කරලා තිබෙන බදු අනුව, තවත් බදු එකතු කිරීමක් මිසක්, ඒ වෙනුවෙන් කිසි සහනයක් ලබා දෙන්න අපේ ආණ්ඩුව ඉදිරියට කටයුතු කරන්නේ නැහැ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. මේ තුළින් 2014 අවුරුද්දේ රුපියල් බිලියන 38ක් - රුපියල් කෝටි 3,800ක්- නැතිවෙලා තිබෙනවා. 2015 අවුරුද්දේ මේ ප්‍රමාණය රුපියල් බිලියන දෙකකට අඩුවෙලා තිබෙනවා. මේ අවුරුද්ද වෙනුවෙන් තවම සංඛ්‍යා දත්ත ඉදිරිපත් කරලා නැහැ. මම හිතන විධියට ආදායම අද වනකොට වැඩි වෙලා තිබෙන්නේ මෙන්න මේ වාගේ කටයුතු නිසයි.

අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් බදු රහිත කාර් දෙකක් ගෙන ඒම සඳහා පාර්ලිමේන්තුවෙන්ම අපි අවසර ලබා දීලා තිබෙනවා. කැබිනට් තීන්දුවක් තුළින් තමයි මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. මොකද, පසු ගිය දිනවල පාර්ලිමේන්තුවේ ලොකු ශබ්දයක් කරලා තිබුණා, අගමැතිතුමාට ලබා දෙන්න යන කාර් එක වෙනුවෙන් බදු විරාමයක් - duty-free - ලබා දෙන්න රුපියල් මිලියන 644ක් වියදම් කරලා තිබුණාය කියලා. නමුත් ඉන් සියයට 88ක් එකතු කරලා තිබුණේ බදු. නිකරුණේ මෙතුමන්ලා ප්‍රශ්න ඇති කරනවා. අලුත් ආකාරයකට ගණනය කරනවා; ගිණුම් හදනවා. අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ දැනුවත් වීම සඳහා පාර්ලිමේන්තුවට මේ සම්බන්ධයෙනුත් කරුණු ඉදිරිපත් කරන්න අවශ්‍යයි කියලා මම හිතුවා. මෙය පාර්ලිමේන්තුවේ ලොකු ආන්දෝලනයකට ලක්වෙලා තිබුණු කරුණක්.

අටවැනි පාර්ලිමේන්තුවේ ඉන්න කිසිම මන්ත්‍රීවරයෙකුට permit එක ලැබෙන්නේ නැහැ කියලා කලින් අපි කියලා තිබුණා. නමුත් අන්තිම වතාවට අටවැනි පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන්ටත් එක permit එකක් ලබා ගන්න අවස්ථාව දීලා තිබෙනවා. ඒ පිළිබඳව ඉදිරියට කටයුතු කරන ආකාරය ගැනත් අපි කල්පනා කරලා බලනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කාර් එකක් අවශ්‍යයි. එතුමන්ලාට කාර් එකක් අවශ්‍ය නැහැයි කියලා අපි කියන්නේ නැහැ. නමුත් එය ලබා දෙන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් රටේ ලොකු පිළිකුල්භාවයක් ඇතිවෙලා තිබෙනවා. එය නිවැරැදි කිරීමත් අපි ඉදිරියේදී කරනවා. නමුත් මේ අවස්ථාවේදී වැඩි බහුතරයකගේ ඉල්ලීම පරිදි එය සංශෝධනය කරලා තිබෙනවා. ඒ අනුව තමයි දැන් කටයුතු කරගෙන යන්නේ. රජයේ සේවකයන්ටත් vehicle permit එක ලබා දෙන්න දැන් ක්‍රමානුකූලව විධිමත්භාවයකින්

යුතුව කටයුතු කරගෙන යනවා. ඒ සඳහා අයදුම් කරන්න මේ වන විට ඉඩ කඩ විවෘත කර තිබෙනවා. සුදුසුකම් තිබෙන රජයේ සේවකයන්ට තමන්ගේ ජීවිත කාලය තුළ අවස්ථා දෙකකකදී vehicle permit එක ලබා ගන්න පුළුවන්. ඊට වැඩි වාරයක් ලබා ගන්න කිසිසේත්ම අයිතියක් නැහැ. මොකද, රටේ ආදායම ශීඝ්‍රයෙන් අඩු වේගෙන ගිහින් තිබෙනවා. ඒ නිසා තමයි අපි විධිමත් වැඩ පිළිවෙළක් ඔස්සේ ඉදිරියට කටයුතු කරමින් සිටින්නේ.

මේ අවස්ථාවේ දී පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන් මා ඉල්ලීමක් කරන්න කැමැතියි. අපි මේ රටේ ජාතික ආර්ථිකය හදාගෙන යන මේ අවස්ථාවේ දී ඔබතුමන්ලා සියලුදෙනාගේම අදහස් අපට ලබා දෙන්න. ඒ අනුව අපි ඉදිරියට කටයුතු කර ගෙන යන්න බලාපොරොත්තු වෙනවා. ඔබතුමන්ලාට පෙනෙනවා, අප අනිසි වියදම් සම්පූර්ණයෙන් නැති කර තිබෙන බව. නමුත් ප්‍රාග්ධන වියදම්වලින් තඹ ශතයක්වත් කොහෙන් හෝ අඩු කරලා නැහැ. ප්‍රාග්ධන වියදම් හා සම්බන්ධ කටයුතු ඒ ආකාරයෙන්ම කරගෙන යනවා. ඒ විතරක් නොවෙයි. පුනරාවර්තන වියදම රටේ සමස්ත ආදායම තුළින් සොයා ගන්නත් කටයුතු කර තිබෙනවා. ආදායමෙහි අතිරික්තයක් තිබෙන නිසා ණය ගෙවන්නත් පුළුවන් වාතාවරණයක් දැන් ඇති වී තිබෙනවා. මීට පෙර, 2014 වර්ෂයේ අග වන තෙක් හැම පුනරාවර්තන වියදමක්ම සිදු කළේ ලැබුණු ආදායමෙන් සහ ඊට අමතරව ණය ගැනීමෙනුයි. නමුත් 2015 වර්ෂයේ සිට පුනරාවර්තන වියදම් දැරීමට රටේ ආදායම සහ එහි අතිරික්තයක් තිබුණා. මූල්‍ය විනයක් ඇති කරගෙන දැන් යන මේ ගමන තුළින් ඒ වෙනස පෙනෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ පිළිබඳව වැඩි දුරටත් කරුණු සඳහන් කිරීමට මා මේ අවස්ථාව උපයෝගි කරගන්නේ නැහැ. නමුත් මා පෙන්වන්න හදන්නේ රටේ ජාතික ආර්ථිකය තුළ වැඩ කටයුතු කරගෙන යන ආකාරය ගැනයි.

කෘෂිකර්මය පදනම් කොට ගත් කාර්මිකකරණයක් ඇති කරගෙන යන ගමන තමයි රටට ශුභවාදී වන්නේ. ලංකාවේ දේශීය නිෂ්පාදන ආරක්ෂා කරන අතරම අපි ඒ අයට කියනවා, "නැඟිටින්න, දැන් වෙලාව ඇවිල්ලායි තිබෙන්නේ" කියලා. "අපි දේශීය කර්මාන්ත රකිනවා" කියලා බල බලා, සිත සිතා සිටියොත් හරි යන්නේ නැහැ. එම සංකල්ප ඉදිරියට ගෙන යාම සඳහා අප කටයුතු කළ යුතුයි. එහෙම නොකළොත් වැඩි කල් යන්නට ඉස්සර වෙලා ආර්ථිකයේ යම් ඇණ හිටීමක් සිදු වන්නට පුළුවන්. අපි එහි තරගකාරී තත්ත්වයක් ඇති කර තිබෙනවා. අපි දේශීය නිෂ්පාදන වැඩි කරන්න, තහවුරු කරන්න, මීට වඩා ඉදිරියට ගෙන යන්න අවස්ථාව දුන්නා. නමුත් මේ ජාතික ප්‍රතිපත්තිවල පොඩි අඩු පාඩුවක් ඇති වුණොත් විදේශ ආයෝජන මේ රටට ගෙන එන්න අවස්ථාව අපි විවෘත කරනවා. මීට පෙරත් ඒ අවස්ථාව ලාංකිකයන්ට දී තිබෙන නිසා එයින් කිසිම අසාධාරණයක් ඇති වෙලා නැහැ කියලා මා සිතනවා.

ඍජු ආයෝජන ගණනාවක් මේ රටට එන්න පටන් ගෙන තිබෙන බව අපට පෙනෙනවා. අද අපේ විදේශ විනිමය සම්පත ශීඝ්‍රයෙන් වැඩි වෙමින් තිබෙනවා. US Dollar බිලියන 5.3ක්ව පැවැති රටේ සංචිත ප්‍රමාණය අද US Dollar මිලියන 6,400 දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ කථා කරන මොහොතේ තවත් මිලියන 400ක් ආවොත් මිලියන 6,800 දක්වා එම සංඛ්‍යාව වැඩි වේවි කියා මා හිතනවා. එයින් පෙනෙන්නේ අපේ රුපියලේ ශක්තිය දැන් අධිප්‍රමාණය වේගෙන යන බවයි. ඒ වාගේම, ලෝකය අපේ රට ගැන විශ්වාසයක් ඇති කරගෙන තිබෙනවා. මීට පෙර මේ රටින් එළියට ගිය ඩොලර් ප්‍රමාණය ආයෙත් රට තුළට එන්න පටන් ගෙන තිබෙනවා.

විවේචනය කරමින් හෝ නොකරමින් තමුන්නාන්සේලා සියලු දෙනාම කියන දේවල් අපි අගය කරනවා. අපි රටේ ආර්ථිකයත් එක්ක සෙල්ලම් නොකර නිසියාකාරව කටයුතු කළ යුතුයි. මොකද, සියයට 1කින්, 2කින් හෝ ප්‍රතිශතයන් වෙනස් වුණොත්, ඒ වෙනස්වීම් නිසා රුපියලෙහි වන අවප්‍රමාණය හේතුවෙන් රුපියල් බිලියන 40ක වෙනසක් අය වැයට බලපානවා. ඒ වාගේම, වැඩි වන හැම සියයට එකකටම අදාළ පොලී අනුපාතය හේතුවෙන් රුපියල් බිලියන 35ක වෙනසක් අය වැයට බලපානවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ කාර්මික අංශයේ ශීඝ්‍ර සංවර්ධනයක් දැන් සිදු වෙමින් පවතිනවා. ඇඟලුම් කර්මාන්තයේ යම් අඩුවක් ඇති වුණත් වෙනත් ක්ෂේත්‍රවල වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. කෘෂි බෝග සම්බන්ධයෙන් ගත් විට අපට පෙනෙන්න තිබෙන්නේ, තේ සහ රබර්වල අපනයන මට්ටම වැඩි වෙමින් යන බවයි. අප තාවකාලිකව ලබා දුන් සහනාධාර තුළින් එම සාර්ථකත්වය ඇතිවෙලා තිබෙනවාය කියන එක මතක් කර දෙන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මීට වඩා වෙලාව ගන්නේ නැහැ. ඔබ සියලු දෙනාට සැබෑ තත්ත්වය පෙන්වා දීම තමයි මගේ අරමුණ වුණේ. අපේ ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, අපේ ගරු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් මේ යන සුසංයෝගි ගමන තුළින් ලංකාව ශීඝ්‍රයෙන් ලෝකයට එකතු කිරීමට හැකියාව ලැබී තිබෙනවා. ඒ විතරක් නොවෙයි. එදා අපේ රටට ණය ලබා ගත්තේ සියයට 7ක, 8ක පොලියටයි. නමුත් අද එම අගයන් සියයට 3ක්, 2ක් දක්වා අඩු වෙලා තිබෙනවා කියන එක වාර්තා වෙලා තිබෙනවා. මේ අවස්ථාවේදී එම කරුණු මා මතක් කරන්නේ තමුන්නාන්සේලා දැනුවත් කිරීම සඳහායි. මොකද, විවාදයට යොමු වුණාට පසුව, සැබෑ ආරම්භය මොකක්ද කියන එක යම් යම් අයට අමතක වෙනවා.

2013 දෙසැම්බර් මාසයේ දී ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් රුපියල් මිලියන 1,000ක ණයක් අරගෙන තිබෙනවා. එසේ ගත්තේ රටට අවශ්‍ය වෙලා තිබුණු සංචිත ප්‍රමාණය වැඩි කරගන්න ලු. එය ලබාගෙන තිබෙන්නේ ආණ්ඩුවට බරක් වන විධියට නොවෙයි. එය ලබාගෙන තිබෙන්නේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ රැකවරණයක් දෙන ගිණුමක් හරහායි. එහි අවදානම සම්පූර්ණයෙන් තිබෙන්නේ ජාතික ඉතිරි කිරීමේ බැංකුවටයි. මිලියන 1,000කින්, මිලියන 350ක් ඒ ගොල්ලන් දේශපාලන අරමුණකට පාවිච්චි කළා. දේශපාලන අරමුණකට පාවිච්චි කළාය කියන්නේ පාරවල් හැදීම සඳහායි. ඒ ණය කිසිසේත්ම පාවිච්චි කරලා තිබෙන්නේ ණය ගත් අරමුණ ඉටු කිරීම සඳහා නොවෙයි. ඒ වාගේම සියයට 8.64ක පොලියකට ලබා ගත් තවත් මිලියන 700ක ණයකුත් තිබෙනවා. අද කිසි කෙනෙකු එවැනි පොලියකට ණයක් ගන්න කැමැති නැහැ. ඒ මොකද, අද සියයට 3.5 පොලියට, සියයට 4 පොලියට ණය ගන්න පුළුවන්. අද මහජන බැංකුව සහ ලංකා බැංකුව මැද පෙරදිග රටවලින් සියයට 2 පොලියට ණය ගන්නවා. මේ වාගේ සියයට 8.4ක පොලියකට ණයක් ගන්නවා කියන්නේ මේ අනවශ්‍ය වියදම දරා ගන්න වන්නේ බදු ගෙවන්නන්ටයි. මේවා හෙළිදරවු කිරීමෙන් මම මේ අවස්ථාවේදී ප්‍රසිද්ධ කරන එකම දෙය තමයි, "මේ දේවල් තමයි සිදු වුණේ" කියන කාරණය. පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන හැම දිනයකම වාගේ පළමුවෙන්ම අපෙන් ප්‍රශ්න කරනවා, "මෙන්න මෙහෙම ණය වැඩි වෙලා තිබෙනවා නේද?" කියලා. ණය වැඩි වෙලා තිබෙන්නේ ඇයි? අවුරුදු 11ක් තිස්සේ කරපු අපරාධය නිසා තමයි ණය වැඩි වෙලා තිබෙන්නේ. ඒවා අපි මතක් කළේ නැත්නම් මේ අය හිතන්නේ ඒක අපේ දුර්වලතාව කියලා. නමුත්, අපි විනිවිදභාවයක් තුළින් ගමන් කරන නිසා ඔබ සියලු දෙනාගෙන්ම ඉල්ලන්නේ යථා තත්ත්වය දැනගෙන ශක්තිමත් දේශීය ආර්ථිකයක් හදන්න අප සියලු දෙනාම ඒක රාශි වන්න ඕනෑය කියන එකයි. ඒ කරුණ මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

[ගරු රවි කරුණානායක මහතා]

ඔබතුමන්ලාගේ අදහස්වලට නැවත උත්තර දෙන්න මම බැඳී සිටිනවා. ඒ සඳහා මම ඕනෑම වෙලාවක සූදානම්. අද සවස 5.30, 5.45 වනකොට ඔබතුමන්ලාගේ සියලුම තර්කවලට ප්‍රතිඋත්තරයක් ලබා දෙන්න මා සූදානමින් සිටිනවා කියලා මතක් කිරීමෙන් මගේ කථාව අවසන් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එලුත්තියම්පප්පෙරුම.
Question proposed.

[අ.භා. 2.56]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ වන නියමයන් 8ක් සම්බන්ධයෙන්, ඒ වාගේම රේගු ආඥාපනත යටතේ වන යෝජනාවක් සම්බන්ධයෙන් සහ 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ වන නියමයන් 4ක් සම්බන්ධයෙන් වන මේ විවාදයට සහභාගි වන්න ලැබීම ගැන මා සතුටු වනවා.

අපි සාකච්ඡා කරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2007 අංක 48 දරන පනත මඟින් සම්මත වෙලා තිබෙනවා. මේ ගැසට් නිවේදනය නිකුත් කරන්නේ තෝරා ගත් අත්‍යවශ්‍ය භාණ්ඩ කීපයක මිල පාලනය කිරීම සඳහා කියලායි ආණ්ඩුව පැත්තෙන් ප්‍රකාශයට පත් වන්නේ. මේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද හදුන්වා දීමේදී පැවැති ආණ්ඩුත්, වර්තමාන ආණ්ඩුවත්, ඒ වාගේම කොයි මුදල් ඇමතිවරයාත් රටට කියන ප්‍රකාශිත අරමුණු දෙකක් තිබුණා. මම කලින් කිව්වා වාගේම ඒ අරමුණු වන්නේ, සෙස් බදු, අය බදු, තීරු බදු වෙනුවට තනි බද්දක් තෝරා ගත් අත්‍යවශ්‍ය භාණ්ඩ මත පනවා යම් මිල පාලනයක් පවත්වා ගැනීම සහ දේශීය ගොවියා ආරක්ෂා කිරීමයි. ඒ නිසා අල, ලූනුවලට, රතු ලූනුවලට බද්ද ගැහුවාට පස්සේ ඔය කොයි මුදල් ඇමතිවරයාත් කියපු දේ තමයි, "දේශීය ගොවියා ආරක්ෂා කිරීම තමයි ඒකේ අරමුණ" කියලා. ඒක ප්‍රකාශ කරන පුද්ගලයා පමණයි වෙනස් වුණේ. නමුත්, මේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ක්‍රියාත්මක කරන්න පටන් ගෙන 2008 සිට 2016 දක්වා ගත වූ වසර 9 තුළ මේ ආණ්ඩුව කියන අරමුණු දෙක ඉෂ්ට වෙලා තිබෙනවාද?

ඉදිරිපත් කරලා තිබෙන ගැසට් නිවේදන අනුව උම්බලකඩ කිලෝ එකක් සඳහා රුපියල් 102ක්, කරවල සඳහා රුපියල් 102ක්, උදු කිලෝවක් සඳහා රුපියල් 60ක්, උදු පිටි කිලෝවක් සඳහා රුපියල් 200ක්, අබ සඳහා රුපියල් 62ක්, කහ සඳහා රුපියල් 102ක්, සූදුරු සඳහා රුපියල් 162ක්, මහදුරු සඳහා රුපියල් 52ක්, මිරිස් කුඩු සඳහා රුපියල් 125ක්, අර්තාපල් සඳහා රුපියල් 35ක්, බී ලූනු සඳහා රුපියල් 25ක් වශයෙන් මේ ගැසට් නිවේදනයේ සඳහන් වෙනවා. නමුත් දැන් රුපියල් 40ක්, රතු ලූනු සඳහා රුපියල් 25ක්, සුදු ලූනු සඳහා රුපියල් 40ක්, සීනිවලට රුපියල් 30ක්, යෝගට් කිලෝ එකට රුපියල් 625ක්, මාජරින්වලට රුපියල් 175ක්, දොඩම් කිලෝ එකකට රුපියල් 65ක්, මිදිවලට රුපියල් 130ක්, ඇපල්වලට රුපියල් 45ක්, රට ඉදිවලට රුපියල් 60ක් ආදී වශයෙන් බදු පනවා තිබෙනවා. අත්‍යවශ්‍ය බඩුවල මිල පාලනය කිරීම සඳහා තමයි මේ බද්ද ගෙනාවේ කියලා අපට කියනවා. නමුත්, පාරිභෝගිකයාට ඒ වාසිය අත් වෙලා නැහැ. දැන් මේ බදු හදුන්වා දුන්නේ මිල පාලනයට නම්, මේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් එකතු වන ආදායම විශාල ප්‍රමාණයකින් වැඩි වන්න හේතුවක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංඛ්‍යා ලේඛන බැලුවොත් සමස්ත රේගු බදු ආදායමෙන් සියයට 10ක් - 11ක් අතර ප්‍රමාණයක් මේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ආණ්ඩුව අය කර ගන්නවා. 2013 නම් එය සමස්ත රේගු බදුවලින් සියයට 11ක් වන අතර, 2014 එය සියයට 10.3ක් වනවා. ඒ වාගේම රජයේ බදු ආදායමේ ප්‍රතිශතයක් විධියට මේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු එන්න එන්නම වැඩි වෙමිනුයි තිබෙන්නේ. 2010 අවුරුද්දේ රජයේ බදු ආදායමේ ප්‍රතිශතයක් විධියට සියයට 1.4ක් වෙලා තිබෙද්දී, 2014 වන විට එය සියයට 4.6 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ විශේෂ වෙළෙඳ භාණ්ඩ මත ගහන මේ බද්ද එන්න එන්නම වැඩි කර ගෙන එය ආණ්ඩුවේ ප්‍රධාන ආදායමක් බවට පත් කර ගනිමින් යනවා. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගත්තත් 2010 වසරේ සියයට දශම 2ක්ව තිබුණු බද්ද, දැන් සියයට දශම 5 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ මේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඇත්තටම මිල පාලනය කිරීම සඳහා හෝ දේශීය ගොවියා ආරක්ෂා කිරීම සඳහා කියලා ප්‍රකාශ කළාට, එය ආණ්ඩුවට බදු ලැබෙන, භාණ්ඩාගාරය පුරවන ප්‍රධාන මාර්ගයක් බවට පත් වෙමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මේ සංඛ්‍යා ලේඛන දිහා බැලුවාම විශේෂයෙන් පෙනෙනවා, මැතිවරණ කාලවල - මැතිවරණ පවත්වන අවුරුදුවල- මේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද අඩු බව. මැතිවරණ නැති කාලයේදී ඇස්තමේන්තුගත බදු ආදායමටත් වඩා එකතු කර ගන්නා බදු ප්‍රමාණය වැඩියි. උදාහරණයක් විධියට කිව්වොත් 2010 ඇස්තමේන්තුගත බදු ආදායම රුපියල් බිලියන 24.8යි. හැබැයි, එකතු කර ගන්න පුළුවන්කම ලැබී තිබෙන්නේ රුපියල් බිලියන 10.1යි. 2010 මැතිවරණ කාලයක් කියලා අපි දන්නවා. ඊට පසුව ගත වුණු අවුරුදු තුනම ගත්තොත්; 2011, 2012, 2013 වර්ෂවලදී අපේක්ෂිත ආදායමට වඩා වැඩි ප්‍රමාණයක් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද එකතු කර ගෙන තිබෙනවා. 2011 අවුරුද්දේ රුපියල් බිලියන 15ක් අපේක්ෂා කළා. ලැබුණා රුපියල් බිලියන 15.6ක්. 2012 අපේක්ෂා කළා, රුපියල් බිලියන 28.4ක්. ලැබුණා රුපියල් බිලියන 36.6ක්. 2013 අපේක්ෂා කළා, රුපියල් බිලියන 43.11ක්. ලැබුණා, රුපියල් බිලියන 46.7ක්. මේ විධියට මැතිවරණ කාලයට අඩු වන, මැතිවරණ නැති කාලවලදී ඉහළ යන බදු ආදායමක් බවට මෙය පත් වී තිබෙනවා. ඒ අනුවම 2015 අවුරුද්දේ අපේක්ෂා කළා, රුපියල් බිලියන 56ක්. ලැබුණේ රුපියල් බිලියන 52යි. මෙයින් පෙනෙන්නේ මැතිවරණ කාලයට ජනතාවට කැරට් අලයක් ලෙසට පෙන්වලා, මේ බද්ද අඩු කරලා ඡන්ද ලබා ගන්නා අතර, මැතිවරණ නැති කාලයට අර එක් වරක් ජෝන් අමරතුංග ඇමතිතුමා හදුන්වපු "අනවශ්‍ය මිනිස්සු" මත -පොදු ජනතාව මත- බදු ගහලා ආණ්ඩුවේ බදු ආදායම ඉහළ දමා ගන්නා දෙයක් බවට මේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පත් කර ගෙන තිබෙන බවයි. ඒ නිසා මේ ආර්ථිකය පවත්වා ගෙන යාමේදී කාටත් තිබෙන "තුන් සූත්‍රය" වන "ණය, බදු සහ සහන කැපීම" කියන පොදු සූත්‍රය හැර මෙහි වෙනත් විශේෂයක් නැහැ.

අනෙක් පැත්තෙන් දේශීය නිෂ්පාදකයා දිරි ගන්වනවාය, දේශීය නිෂ්පාදනය වැඩි කරනවාය, එහෙම නැත්නම් දේශීය ගොවියා නහාසිටුවනවාය කියන එක මෙහි ප්‍රකාශිත අරමුණක් විධියට තිබුණාට ඒකක් වෙලා නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ බද්ද පනවන්න කලින් අවුරුද්දේ අපේ රටේ අල මෙට්‍රික් ටොන් 77,400ක් නිෂ්පාදනය කර තිබෙනවා. බද්ද පනවලා අවුරුදු හයක් ගත වෙන කොට, ඒ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 78,800යි. එම ප්‍රමාණයමයි. බද්ද පනවන්න කලින් අවුරුද්දේ ලොකු ලූනු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 92,200යි. අවුරුදු හයක් ගත වෙන කොට ලොකු ලූනු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 69,600 දක්වා අඩු වෙලායි තිබෙන්නේ. බද්ද පනවන්න කලින් අවුරුද්දේ රතු ලූනු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 57,000යි. අවුරුදු හයක් ගත වන විට එය මෙට්‍රික් ටොන් 55,600 දක්වා අඩු වෙලායි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංඛ්‍යා ලේඛන ගත්තත් ඇත්තටම මිල පාලනයකට හෝ දේශීය ගොවියා ආරක්ෂා කිරීමකට මේ බද්ද යෙදවෙනවා වෙනුවට, ආණ්ඩුවට තව තවත් ආදායම් උපයන බද්දක් බවට තමයි ඒක පත් වෙලා තිබෙන්නේ. දැන් තමුන්නාන්සේලා අපට කිව්වා, සවස 6.00 විතර වන තෙක් දේශීය නිෂ්පාදනය, කෘෂිකර්මාන්තය නහාසිටුවීම සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කරන්න කියලා. ඇත්තටම අපි යෝජනා ඉදිරිපත් කරනවාට වඩා, මීට අවුරුද්දකට කලින් ඔබතුමන්ලා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය දිහා බැලුවා නම්, ඒ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන දේවල් ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා නම් අඩු තරමේ කෘෂිකර්මාන්තය මීට වඩා ඉදිරියට ගෙන යන්න තිබුණා. අලුත් රටක් හදන පංචවිධ ක්‍රියාවලියේ මාස 60න් මාස 12ක් ඉවරයි. තව තිබෙන්නේ මාස 48යි. එම පංචවිධ ක්‍රියාවලියේ අංක 01 යටතේ ආර්ථිකය දියුණු කිරීමේ ක්‍රියාවලියට ප්‍රමුඛතාව දීලා තිබෙනවා. "ගෝලීය ගෙවත්ත" නමින් ශ්‍රී ලංකාව නම් කරලා කෘෂි කාර්මික සංවර්ධන අධිකලාප 23ක් හදනවා කියලා තිබෙනවා. මම අහනවා, මේ අවුරුද්ද ඇතුළත පටන් ගත්ත අධිකලාප ස්ථාපිත කර තිබෙන්නේ කොහේද කියලා. ධීවර ආර්ථික සංවර්ධන අධිකලාප 10ක් හදනවා කියලා තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමනි, මම පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි. මම මේ ඒ ගැන මතක් කරමිනුයි ඉන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවීම මා අගය කොට සලකනවා. 2016 වර්ෂය සඳහා 2015 වර්ෂයේදී අපි ඉදිරිපත් කළ අය වැය ලේඛනය මඟින් ඒ සඳහා මුදල් වෙන් කළා. ඒ විතරක් නොවෙයි, කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක මහතා ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා දැන් ස්ථාන හයක විතර එම කටයුතු පටන් අර ගෙන තිබෙනවා. තවමත් අවශ්‍ය ඉලක්කයට අපි ගිහිල්ලා නැහැ. නමුත් සියයට හතකින් දේශීය නිෂ්පාදනය වැඩි වෙලා තිබෙන නිසා ආනයනය අඩු වෙලා තිබෙනවා. ඔබතුමා දැන් ඔය ඉදිරිපත් කළ කාරණය අපි ක්‍රියාත්මක කර ගෙන යනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි. මම ඉතුරු ටිකත් කියන්නම්.

"ගමට රටක්" යටතේ තමුන්නාන්සේලා කියා තිබෙනවා, පොකුරු ගම්මාන 2,500ක් හදනවා කියලා. පොකුරු ගම්මාන 2,500ට කෘෂි සායන 2,500ක් පිහිටුවනවා කියලා කියා තිබෙනවා. ඒ වාගේම ගොවීන්ට අයිති කෘෂි ව්‍යාපාර මුල් කර ගෙන සමුපකාර ක්‍රමයට විශාල කෘෂි ව්‍යාපාර සමාගම් ආරම්භ කරන බව කියා තිබෙනවා. මහා පරිමාණ කෘෂි ව්‍යාපාර වන අයර්ලන්තයේ "ද ඩෙරි ගෝල්ඩ් කෝප් සමාගම", උතුරු අයර්ලන්තයේ "යුනයිටඩ් ඩෙරි ෆාමර්ස් සමාගම", කැලිෆෝනියාවේ "තක්කාලි ගොවි සංගමය", "මිසෝරි ගොවි සංගමය" සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ "ඇග්වේ" වැනි සමුපකාරික පදනමක් සහිත ගොවි සමාගම් ඒ සඳහා උදාහරණ වශයෙන් දක්වා තිබෙනවා. ඒ විධියේ මහා කෘෂි ව්‍යාපාර ආරම්භ කරනවා කියලා කියා තිබෙනවා.

ඇත්තටම මේ වචනවල තිබෙන සුන්දරත්වය ක්‍රියාවට නැඟුණා නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෘෂි කර්මාන්තය පියවරකින්-දෙකකින් ඉදිරියට යනවා වාගේම එය අපට දැක ගන්නත් පුළුවන්කම තිබුණා. හැබැයි, මෑත කාලයේ අපේ රටේ කෘෂි කර්මාන්තයට සිදු වුණේ මොකක්ද? කෘෂිකර්ම අමාත්‍යාංශයට තිබුණු ගොඩනැඟිල්ල අත් හැරලා රුපියල් මිලියන 180කට building එකක් අර ගෙන දැන් මාස පහක් තිස්සේ රුපියල් මිලියන 21 ගණනේ ගෙව ගෙවා ඉන්නවා හැර කෘෂිකර්ම අමාත්‍යාංශය මේ රටේ ගොවියාට දැනෙන්න කරලා තිබෙන්නේ මොකක්ද? මාස පහක් තිස්සේ වහලා තිබෙන building එකකට රුපියල් මිලියන 105ක් ගෙවීම, ටෙන්ඩර් කැඳවන්නෙත් නැතිව රුපියල් මිලියන 180කට ඒ building එක මිලදී ගැනීම, එහි කාර්යාල කටයුතු සඳහා තවත් රුපියල් මිලියන 40ක්-50ක් වියදම් කිරීම හැර තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන කාරණාවලින් හෝ රටේ ජනතාවට දීපු පොරොන්දුවලින් ඉටු කරලා තිබෙන්නේ මොනවාද කියලා අපි අහන්න කැමැතියි.

මේ බද්ද පනවන කොට දැන් මේ පැත්තේ වාඩි වෙලා ඉන්න, කලින් ආණ්ඩුවේ හිටපු මුදල් ඇමතිවරු වාගේම ඔබතුමන්ලාගේ වර්තමාන ආණ්ඩුවේ ඉන්න මුදල් ඇමතිවරයා ඇතුළු ඔය කොයි කවුරුත් කියපු ආකාරයට දේශීය ගොවියා නහා සිටුවීමේ කාර්යය ඉටු වෙලා නැහැ කියන එක මම කියන්න කැමැතියි. ඒ වාගේම ජනතාව මත බදු ගහමින් ජනතාව පෙළමින් සීනි ටිකට, අල ටිකට, ලූනු ටිකට, සූදුරු ටිකට, මාදුරු ටිකට බදු වැඩි කරන්න වෙලා තිබෙන්නේ ඇයි? මේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් නොමැතිකම නිසයි. මේ රටේ කෘෂි කාර්මික, කාර්මික, සේවා ආර්ථිකයකට පණ පෙවීම සඳහා ආණ්ඩුව කටයුතු නොකරන නිසයි. ඒ විතරක් නොවෙයි. පනවා තිබෙන බදු යටතේ වුණත් රජයට ලැබිය යුතු ආදායම් මාර්ග තහවුරු කර ගැනීමට, සාක්ෂාත් කර ගැනීමට ආණ්ඩුවට වුවමනාවක් නැහැ. එවැනි ආදායම් පැහැර හරින්න කොයි ආණ්ඩුත් තමන්ගේ දේශපාලන බලය, නිල බලය භාවිත කරලා තිබෙනවා. මම උදාහරණ දෙකක් කියන්නම්.

ඊයේ මම අහපු ප්‍රශ්නයකට ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා උත්තරයක් දුන්නා. බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 236/01 දරන ස්ථානයේ තිබෙන CSN නාලිකාව පවත්වා ගෙන යන ඉඩම සම්බන්ධයෙන් මම ප්‍රශ්නයක් ඇහුවා. නාගරික සංවර්ධන අධිකාරියට අයත්ව තිබුණු එම ඉඩම 2006 නොවැම්බර් 6 වනදා රාජපක්ෂ අනුස්මරණ අධ්‍යාපන සංස්කෘතික හා සමාජ සේවා පදනමෙන් තිස් අවුරුද්දක් සඳහා බදු පදනම මත ලබා ගෙන තිබෙනවා. තිස් අවුරුද්ද සඳහා වාර්ෂික බදු මුදල රුපියල් 163,125යි. රාජපක්ෂ අනුස්මරණ අධ්‍යාපන සංස්කෘතික හා සමාජ සේවා පදනමෙන් යම් සමාජ සේවා කටයුත්තක් සඳහා කියලා, ව්‍යක්තිය පුහුණුව ආරම්භ කරන්න කියලා නාගරික සංවර්ධන අධිකාරිය සතුව තිබුණු ඉඩමක් බදු පදනම මත පර්චසයක් රුපියල් 5,800කට ලබා ගෙන තිබෙනවා.

බත්තරමුල්ලේ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ ඉඩමක් පර්චස් එකක් රුපියල් 5,800 බැගින් අරගෙන, එහි වාණිජ අරමුණක් සහිත ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්න ඉඩ දෙනවා නම්, මේ රටේ කොයි කවුරුත් ඒ ඉඩම ගනියි. පර්චස් එකක් රුපියල් 5,800යි. මේ පදනමේ ඉන්නේ කවුද? මේ පදනමට අදාළ ලේඛනයේ ඒ නම් සඳහන් කර තිබෙනවා. පදනමේ පාලක සභාව යටතේ, සභාපති - චමල් රාජපක්ෂ මහතා, උප සභාපති - මහින්ද රාජපක්ෂ මහතා, භාණ්ඩාගාරික - ලලිත් වන්ද්‍රදාස මහතා, ලේකම් - යූ. විජේසිංහ මහතා යන නම් සඳහන් කර තිබෙනවා. ආරම්භක සාමාජිකයින් විධියට 32දෙනෙක් ඉන්නවා. එයින් නම් කිහිපයක් මා කියවන්නම්. බැසිල් රාජපක්ෂ මහතා, ගෝඨාභය රාජපක්ෂ මහතා, ඩඩ්ලි රාජපක්ෂ මහතා, ප්‍රීති රාජපක්ෂ මහත්මිය, විවිත්‍රා රාජපක්ෂ මහත්මිය, තුසිත රණවක මහතා, ඩීවී ගුණසේකර මහතා, ශිරන්ති වික්‍රමසිංහ මහත්මිය, රම්‍යා හෙට්ටිආරච්චි

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මහත්මිය, අයෝමා පීරිස් මහත්මිය, පුෂ්පා වික්‍රමසිංහ මහත්මිය, යතීන්ද්‍ර පෙරේරා මහත්මිය, ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා, චමින්ද්‍ර රාජපක්ෂ මහතා, නිමල් හෙට්ටිආරච්චි මහතා, රංගනී හෙට්ටිආරච්චි මෙනෙවිය, කේ.ජේ. රාජපක්ෂ මෙනෙවිය, උදයංග වීරතුංග මහතා, දුලාරි දිසානායක මෙනෙවිය, ජාලිය වික්‍රමසිංහ මහතා, අරුණ ගුණරත්න මහතා ඇතුළු 32දෙනෙකුගේ නම් තිබෙනවා. මේ නම් සඳහන් සමහර අය දැන් FCID එකෙන් සොයනවා. මේ පදනම වාණිජ අරමුණක් වෙනුවෙන් CSN නාළිකාව ආරම්භ කර තිබෙනවා. හැබැයි, බදු ගැනීමේදී ඉදිරිපත් කර තිබෙන්නේ, සමාජ සේවා අරමුණක් සඳහා යොදා ගන්නවාය කියලායි. ඒ නිසා තමයි ඊයේ ඇමතිතුමා කියපු විධියට මෙතරම් අඩු මුදලකට ඒ ඉඩම බදු දෙන්නේ. මේවා භාණ්ඩාගාරයට ලැබිය යුතු මුදල්. නාගරික සංවර්ධන අධිකාරිය මේ ඉඩම වෙනත් ටීවී නාළිකාවකට බදු දුන්නා නම්, අවුරුද්දකට කොපමණ වාර්ෂික බදු මුදලක් ගන්න තිබුණාද? ඒ වෙනුවට තමන්ගේ දේශපාලන බලය පාවිච්චි කරලා කරපු මෙවැනි ගනු-දෙනු ඕනෑ තරම් තිබෙනවා. රජයට ලැබිය යුතු මෙවැනි මුදල් අය කර ගැනීම වැළැක්වීමේ ප්‍රතිඵලයක් විධියට තමයි, "භාණ්ඩාගාරය හිස්. කර ගන්න විධියක් නැහැ. ආර්ථිකය වැටිලා."යි කියා දැන් මුදල් ඇමතිතුමා කියන්නේ. දේශපාලන බලය පාවිච්චි කරලා එවැනි තත්ත්වයක් උදා කර ගත්තාට, අපි අහන්නේ අනාගතයේ මෙවැනි සිදු වීම් වැළැක්වීම සඳහා කරන්නේ මොනවාද කියලායි. රාජපක්ෂ පදනමේ අය දැනුවත්ව මෙවැනි වංචාවක් කර තිබියදී, අනාගතයේදී මෙවැනි දේවල් සිදු වීම වැළැක්වීම සඳහා ගන්නා නීතිමය ක්‍රියාමාර්ගය මොකක්ද? CSN නාළිකාවෙන් රුපියල් මිලියන 157.5ක් ආණ්ඩුවට ලැබුණාය කියලා, ඒක අතහැරලා දමන්න අයිතියක් නැහැ. ඒ විතරක් නොවෙයි. දැන් මේවා තමයි ඉදිරියට යන්නේ. කලින් සිද්ධිවලට දඬුවම් නොකරන කොට මේ ආණ්ඩුවත් අනුගමනය කරන්නේ ඒ ක්‍රියාමාර්ගයම තමයි.

සමහර ආනයනකරුවන් යම් භාණ්ඩ ප්‍රමාණයක් මෙරටට ගෙන්වූවාට පස්සේ, ඔවුන් ඒවා එකවර නිදහස් කර ගන්නේ නැහැ. සමහර විට විටින්-විට බදු ගෙවා කොටස් වශයෙන් ඒ භාණ්ඩ නිදහස් කර ගන්නවා. එතකොට ඒ ගෙන්වන භාණ්ඩ ගබඩා කර ගැනීම සඳහා ගුදම් අවශ්‍ය කරනවා. එවැනි ගුදම් 2ක් රජය විසින් පවත්වා ගෙන යනවා. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කොළඹ වරාය පරිශ්‍රයේ එක ගුදමකුත්, ගුවන් සේවා සමාගම විසින් කටුනායක ගුවන් තොටුපොළේ තවත් ගුදමකුත් පවත්වාගෙන යනවා. ඒවා පවත්වා ගෙන යන්නේ, ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණය යටතේයි. එතකොට ඕනෑම ආනයනකරුවකට තමන්ගේ භාණ්ඩ යම් කාලයක් ගුදමේ තබා ගෙන, කොටස් වශයෙන් බදු ගෙවලා විටින්-විට නිදහස් කර ගන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි. රේගු ආඥා පනතෙන් අවසර දීලා තිබෙනවා, පෞද්ගලික ගුදම් පවත්වා ගෙන යන්න. යම්කිසි ආනයනකරුවකු යම් භාණ්ඩ ප්‍රමාණයක් ආනයනය කරනවා නම්, ශ්‍රී ලංකා රේගුවට දැනුම් දීලා ඒ භාණ්ඩ පෞද්ගලික ගුදමේ තබා ගන්න පුළුවන්. ඒක තමයි, මෙපමණ කාලයක් තිබුණු සාමාන්‍ය සම්ප්‍රදාය වන්නේ. නමුත් පසු ගිය දවසක අංක 790/17, ලියනගේමුල්ල, සීදුව යන ලිපිනයේ තිබෙන Global Transportation Logistics (Pvt.) Limited කියන ආයතනය, රජය විසින් පවත්වා ගෙන යනු ලබන ආකාරයේ පොදු ගුදමක් බවට තමන්ගේ පෞද්ගලික ගුදම පත් කර ගෙන තිබෙනවා. අපි අහන්නේ, පොදු ගුදම්වල ගබඩා කර තබන්න පුළුවන් භාණ්ඩ, පෞද්ගලික ගුදම්වල ගබඩා කරන්න අවසරයක් දෙන්න පුළුවන් කියලා ආණ්ඩුව මෑත කාලයේ ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්තාද කියලායි. එහෙම තීන්දුවක් ගත්තා නම්, එය Global Transportation Logistics Private Limited එකට විතරක් නොවෙයි, අනෙක් අයටත් ඒ අවස්ථාව ලබා දීම සඳහා පුවත් පත්වල, මාධ්‍යවල ප්‍රසිද්ධ දැන්වීම් දාලා ඉඩ කඩ හදලා දුන්නාද? සාමාන්‍යයෙන් පෞද්ගලික ගුදමක භාණ්ඩ තැන්පත් කිරීමේදී ඇපකරය සියයට 100ක් තිබෙන්න ඕනෑ. හැබැයි, මේ Global Transportation Logistics Private Limited ආයතනය රුපියල් මිලියන 400ක පෞද්ගලික ඇපයක් විතරක් තියලා ඒ අවස්ථාව අරගෙන තිබෙනවා. එතකොට මේ ආයතනයේ අයිතිය තිබෙන්නේ කාටද? ඒකයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

CSN නාළිකාව ආරම්භ කරන්න ඉඩම ගන්න කොට දේශපාලන බලය පාවිච්චි කළා. ඒකට කිව්වේ "මහින්ද චින්තනය" කියලායි. දැන් කියනවා, "යහ පාලනය" කියලා. ඒ යහ පාලනය යටතේත් ඒ දේම සිද්ධ වෙනවා නේ. ජනාධිපතිවරණය ඉවර වෙලා දවස් හතරක් යනතෙක් - ඒ කියන්නේ 2015 ජනවාරි 12වැනි දා වෙනතෙක් - මේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හිටපු කෙනෙක් තමයි රවි කරුණානායක ඇමතිතුමා. එතුමා මේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හිටියා. 2015 ජනවාරි 12වැනිදා තමයි එතුමා ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස් වුණේ. එතුමාගේ නෝනාත් මේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්නවා. එතුමා මේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අස් වුණාට පස්සේ එතුමාගේ දුව අධ්‍යක්ෂ මණ්ඩලයට ආවා. එහෙම තමන්ගේ අයම අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්න ගුදමකට රජයේ ගුදමක් හැටියට ඒ අයිතිය භාවිත කරන්න අවසර ලැබුණේ කොහොමද? මේකේ ලස්සන සෙල්ලම තමයි, මුදල් ඇමතිවරයා රටේ නැති වෙලාවක මේකට අවසර දීලා තිබෙන්නේ, අනුමැතිය දීලා තිබෙන්නේ මුදල් රාජ්‍ය අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා වීම. කොහොමද වැඩේ? තමන්ට ඒක කෙළින්ම කර ගන්න එක කැතයි වාගේ නිසා මුදල් රාජ්‍ය අමාත්‍යවරයා ලවා අත්සන ගහලා තමයි වැඩේ කරලා තිබෙන්නේ. ඊට පස්සේ මුදල් රාජ්‍ය ඇමතිවරයා පුවත් පතකට කියනවා, "මම දන්නේ නැහැ, කාගේද කියලා. ඒ නිසා මම අත්සන් කළා" කියලා. රවි කරුණානායක මුදල් ඇමතිතුමා නම් දෙකක් දාලා කියනවා, "අහවල් ව්‍යාපාරිකයන්ට පුළුවන් නම්, ඇයි මට බැරි?" කියලා. ඔව්, පුළුවන්. ඇයි බැරි? එතකොට මගේ අතේ තිබෙන මේ පුවත් පතේ සඳහන්ව තිබෙන්නේ මොකක්ද? රජය මොන ප්‍රතිපත්තිමය තීන්දුවක්ද ගත්තේ එහෙම පොදු ගුදම්වල තිබෙන අයිතිය පුද්ගලික අංශයකට බාර දෙන්න? අපි අහන්නේ ඒකයි. එහෙම බලන කොට තිබුණු ආණ්ඩුවයි, මේ ආණ්ඩුවයි දෙකම එකයි නේ. ඒ ගොල්ලන් ඒ කාලයේ කරගෙන ගියපු වැඩේ මේ ගොල්ලන් දැන් වෙනත් ආකාරයකට කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ සිදුවීම් එකයි-දෙකයි කිව්වේ. මේ ආකාරයට රජයේ භාණ්ඩාගාරයට ලැබිය යුතු මුදල් දේශපාලන බලය පාවිච්චි කරලා, එසේ ලැබීම වළක්වලා, භාණ්ඩාගාරය පුරවන්න හදන්නේ ජනතාව කන බොන එකට ගහන බද්දෙන්. මේ බද්දෙන් දේශීය ගොවියා නහා සිටුවන්නෙත් නැහැ; බඩු මිල අඩු වෙන්නෙත් නැහැ. ඒ නිසා මෙවැනි ආකාරයට ජනතාව පෙළන, බදු ගහන, ඒ වාගේම රටේ ආර්ථිකය හැදීම සඳහා දැක්මක් නැති ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තියට විරෝධය පළ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.17]

ගරු කබීර් හාෂිම් මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு கபீர் ஹாஷீம் - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Kabir Hashim - Minister of Public Enterprise Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රී (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා අදහස් කිහිපයක් ප්‍රකාශ කළා. එතුමා විශේෂයෙන්ම මේ බදු අය කිරීම

ගැන කථා කරන කොට මම පුදුම වුණා. බදු ලැයිස්තුව අරගෙන, ඇපල්වලටයි, මිදිවලටයි ගහන බදු ගැන කථා කළා. විශේෂයෙන්ම පැපොල්වලට පුරුදු වෙච්ච අය ඇපල් කන්න පටන් ගත්තාම, ඇපල්වලට බදු ගහන කොටත් ඒ අයට ඒක ප්‍රශ්නයක් වෙනවා.

අපි මේ රටේ වෙනස් කරන්න ඕනෑ සමහර දේවල් තිබෙනවා. අපි එක ප්‍රතිපත්තියක හිරවෙන්නේ නැහැ. අපි තීරණ ගන්නේ එක එක කාල වකවානුවල එක එක පුද්ගලයන්ට ඕනෑ විධියට, එක එක පුද්ගලයන්ගේ භාණ්ඩ මේ රටට ගෙනෙන අනන්‍යතාව මත බදු පැනවීමේ කටයුත්තක් අනුව නොවෙයි. මේ සඳහා ජීවන වියදම් කමිටුවක් පත් කරලා තිබෙනවා. ජීවන වියදම් කමිටුව හරහා න්‍යායාත්මකව, ප්‍රතිපත්තිමය වශයෙන් ගන්නා තීන්දු තීරණයි අපි ක්‍රියාත්මක කරන්නේ. ඒවා විනිවිදභාවයෙන් යුතුව ගන්නා තීරණයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ එක කාලයක සුනඛයන්ට කෑම ගෙනාවේත් පිටරටින්, බදු රහිතවයි. Racing cars පදින කොට, racing carsවලට බදු අයින් කළා. එවැනි කාලයක් තිබුණා. ඒ නිසා තමයි, මේ රටේ බදු ආදායම නැත්තටම නැති වුණේ. ඒවා වෙනස් කරමින් දැන් අවශ්‍යතාව මත, පිළිවෙළකට බදු අය කරනවා. ඒ නිසා අනුර කුමාර දිසානායක මැතිතුමනි, දැන් ඔබතුමන්ලාගේ පක්ෂයත් පැපොල්වලින්, ඇපල්වලට යන කොට ඔබතුමන්ලාටත් මේක ප්‍රශ්නයක් වෙන්න පුළුවන්.

අද ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය වර්ෂයකට ඩොලර් බිලියන 85යි. නමුත් දළ දේශීය නිෂ්පාදනය ඩොලර් බිලියන 85ක් වෙද්දී, අපේ රාජ්‍ය ණය ප්‍රමාණය ඩොලර් බිලියන 82යි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Bimal Rathnayake to the Chair?

ගරු දයා ගමගේ මහතා (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு தயா கமகே - ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Primary Industries)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු පිමල් රත්නායක අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කබීර් හාෂිම් ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ අනුව දළ දේශීය නිෂ්පාදනය හා රාජ්‍ය ණය ප්‍රමාණය අතර තිබෙන පරතරය පෙනෙනවා. අපේ රාජ්‍ය ණයයි, දළ දේශීය නිෂ්පාදනයේ වටිනාකමයි සම වෙලා තිබෙනවා. ඒ මුළු ණය ප්‍රමාණයෙන් විදේශ ණය විතරක් ඩොලර් බිලියන 55කට ආසන්න ප්‍රමාණයක් වෙලා තිබෙනවා. ඒ කියන්නේ, අපේ අපනයන ආදායමෙන් සියයට 34ක්ම වැය වෙන්නේ ණය වාරික ගෙවන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලංකාව මුහුණ දීලා තිබෙන මූල්‍ය ගැටලු පිළිබඳව කවුරුත් පිළිගන්නවා ඇති. රාජපක්ෂ රෙජීමය කාලයේ ඇති වුණු ඒ අවිධිමත් වැඩ පිළිවෙළ නිසා එසේ වුණාය කියන එක කවුරුත් අවිවාදයෙන් පිළිගන්නවා ඇති. මේක තමයි තිබෙන ප්‍රධානම ප්‍රශ්නය. අපි නිකම් මේ සභාව ඇතුළේ පොඩි, පොඩි දේවල් කථා කළාට, මේ රටේ ඕනෑම පක්ෂයක, ඕනෑම පැත්තක, ඕනෑම පාටක ඉන්න කෙනෙක් තේරුම් ගන්නට ඕනෑ, ඒ කාරණය මුළු ජාතියටම, මේ රටටම තිබෙන ප්‍රධාන ගැටලුවක්ය කියන එක.

2009 වර්ෂයේ අපේ විදේශ ණය ප්‍රමාණය - 2009 යුද්ධය අවසන් වෙන කාලයේ- ඩොලර් බිලියන 21යි. ඒක 2014, 2015 වන විට- ඩොලර් බිලියන 43ක් දක්වා වැඩි වුණා. ඒක සියයට 100ක වැඩි වීමක්. ඒ කාලය වන විට යුද්ධය අවසන් වෙලා තිබුණා. ඒ නිසා ඒ මුදල් යුද්ධයට නොවෙයි වියදම් වුණේ. ඒ මුදල් මොනවාටද ආයෝජනය කළේ? ඒකෙන් අපට ප්‍රතිඵල ලැබුණාද; ප්‍රතිලාභ ආවාද; ආදායමක් උපයන්න පුළුවන් වුණාද?

අපේ මුළු ණය සංචිතය ගත්තාම, 2005 රුපියල් බිලියන 2,222යි; 2014 වන විට රුපියල් බිලියන 7,391යි. ඒ වැඩිවීම් සියල්ලම වෙලා, ඒ හා සමානව අපි මොකක්ද කරලා තිබෙන්නේ? මේවා සංවර්ධනයටද, සංදර්ශනයටද වියදම් කළේ? ඔය ප්‍රශ්නය තමයි අපි මුලින්ම අහන්නට ඕනෑ. මම මේක පෙන්වා දෙන්නේ, අද තිබෙන අභියෝගය මොකක්ද කියලා හරියට තේරුම් ගන්නයි. මේ මුදල් ආයෝජනය කළේ, එක්කෝ මත්තල ගුවන් තොටුපොළට; එක්කෝ සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණයට; එහෙම නැත්නම්, හම්බන්තොට සම්මන්ත්‍රණ ශාලාවට; එහෙමත් නැත්නම්, හම්බන්තොට වරායට; නැතිනම්, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට. මේවායින් අද ජාතික නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවාද? මෙවැනි ආයෝජනවලින් ආදායමක් උපයා ගෙන, නැවත මේ ණය වාරික ගෙවන්න හැකි වෙලා තිබෙනවාද: රටේ නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවාද? එහෙම වෙලා නැහැ. ඒ මුදල් ආපහු ගෙවන්න තිබෙනවා. එතකොට මේක තමයි ප්‍රධාන ගැටලුව. ඒ මදිවට වොෂින්ටන්වල තිබෙන Global Financial Integrity ආයතනයෙන් කළ සමීක්ෂණයක් මත කියනවා, 2005 - 2014 අතර කාලය තුළ ලෝකයේ කළු සල්ලි වෙළෙඳාම තුළ ලංකාව ඉහළම මට්ටමේ තිබෙන රටක් කියන එක. මත් ද්‍රව්‍ය ව්‍යාපාරයේ කේන්ද්‍රස්ථානය වන කොලොම්බියාවට වඩා ලංකාව, කළු සල්ලි වෙළෙඳාම වැඩියෙන්ම සිද්ධ වෙන රටක් බවට පත් වෙලා තිබෙන බව වාර්තා වෙනවා. ඒ කියන්නේ රටවල් 149කින් 53වෙනි තැනට ලංකාව ඉන්නවා. මේ රටින් කෝටි ගණනක් ඩොලර්වලින් පිටට යනවා.

පසු ගිය කාල පරිච්ඡේදය තුළ -2005 සිට 2014 දක්වා- රුපියල් ට්‍රිලියන 2.8ක් මේ රටින් පිටතට ගිහින් තිබෙනවා, ඩොලර්වලින්. ඒක තවත් විධියකට කියනවා නම්, එක වර්ෂයකට ඇමෙරිකානු ඩොලර් බිලියන 2 ගණනේ මේ රටින් හොරෙන් සල්ලි යනවා, කළු ආර්ථිකයක් තුළින්. මේක රටට කොපමණ ලොකු පාඩුවක්ද?

[ගරු කබීර් හාෂිම් මහතා]

මේ අභියෝග මැද තමයි අද අපි මේ රට නැවත ගොඩ ගන්නට ඕනෑ. අපි යුද්ධය දිනුවාට ඊට වඩා ලොකු යුද්ධයක් තිබෙනවා, අපිට ආර්ථික වශයෙන් මුහුණ දෙන්නට.

මූල්‍ය ක්ෂේත්‍රය ඒ ආකාරයට වැටිලා තිබෙන විට අපි අනෙක් පැත්තෙන් අපේ නිෂ්පාදන ක්ෂේත්‍රය ගැන බලමු. නිෂ්පාදන ක්ෂේත්‍රය දියුණු වුණාද? 2015 වන විට දේශීය නිෂ්පාදන ක්ෂේත්‍රයේ කඩා වැටීමක් තිබුණා. 2004 වන විට, නැත්නම් 1994 වන විට ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයෙන් අපනයන ප්‍රතිශතය, සියයට 30යි. අපි කවුරුත් ඒක දන්නවා. නමුත් 2014 වන විට ඒක සියයට 15ට නොවෙයි, සියයට 12ට වැටිලා තිබුණා. අපනයනය වැටෙනවා කියන එකෙන් තේරුම් ගන්න පුළුවන් වෙන්නේ අපේ නිෂ්පාදනයත් ඒකත් සමහම වැටෙනවා කියන එකයි. දකුණු ආසියාවේ අඩුම අපනයන ප්‍රතිශතය තිබෙන්නේ ශ්‍රී ලංකාවේ. ඒ කියන්නේ බංග්ලාදේශයට වඩා, පාකිස්තානයට වඩා අපේ අපනයන ප්‍රතිශතය අඩුයි. අපනයනය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ගත්තාම වියට්නාමයේ 78යි; තායිලන්තයේ 67යි; සිංගප්පූරුවේ 90යි. සිංගප්පූරුව කියන්නේ කිසිම ස්වාභාවික සම්පතක් නැති රටක්. නමුත් අපේ අපනයනය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් ගත්තාම 12යි. මේක ප්‍රධාන මූල්‍ය ගැටලුවක්; මේ ව්‍යුහය තුළ තිබෙන ප්‍රශ්නයක්.

අපි විශේෂයෙන්ම දැක්කා, පසු ගිය කාල පරිච්ඡේදය තුළ මේ රටේ දේශීය නිෂ්පාදනය ගැන හිතුවේ නැති බව. ඉදිකට්ටයි, ගිනි පෙට්ටියයි, වෙසක් කූඩුවයි, වෙස් මුහුණයි හැම දෙයක්ම අපි පිට රටින් ගෙනාවා. මේ රටේ කුඩා කර්මාන්ත ගැන අපි හිතුවේ නැහැ.

කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයට ණය දීම ගැනත් අපි බලන්නට ඕනෑ. මම අහගෙන හිටියා, අපේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කලින් කිව්වා, කුඩා බැංකුවලින් ණය දෙන විට ධනය සහ බලය මත තමයි ණය දෙන්නේ කියලා. ඒක ඇත්ත. පොඩි මිනිහාට ණය දුන්නේ නැහැ. කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයට ණය දෙන්නේ නැතිව අපට දේශීය නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කරන්නට බැහැ. එම නිසා අපි මේකේ වෙනසක් ඇති කරන්නට හිතන්නට ඕනෑ. මේක ලෙහෙසි නැහැ. ඒ නිසාම තමයි අපි හිතන්නේ ජාතික ආර්ථිකයේ නිම් වළලු පුළුල් කිරීම සඳහා විශාල දායකත්වයක් ගමෙන් ලබා ගන්නා විධියට ජාතික ප්‍රතිපත්ති සකස් කළ යුතුයි කියලා. අපේ ගරු අගමැතිතුමා ඒ ගැන දිගටම සාකච්ඡා කරනවා. ඒ නිසා තමයි අපි ග්‍රාම රාජ්‍ය සංකල්පය ක්‍රියාත්මක කරන්නට උත්සාහ කරන්නේ. ඒ හරහා අපි බලාපොරොත්තු වෙන්නේ ගෝලීය වටිනාකම් ජාලයට කුඩා හා මධ්‍ය පරිමාණයේ දේශීය කර්මාන්තකරුවෝ සම්බන්ධ කර ගැනීමයි. මේක විශාල වෙනසක් ඇති කිරීමේ වැඩක්. මේක ශ්‍රී ලංකා ආර්ථිකය තුළ යම්කිසි ප්‍රමාණයකින් අපි කරන ප්‍රතිව්‍යුහගත කිරීමක්. ප්‍රතිව්‍යුහගත කිරීම කියන වචනය කියන විට සමහර අය කියනවා, මේක පෞද්ගලීකරණය කරන වැඩක් කියලා. විපර්යාසයක් කරන්න ගියාම හිතනවා, මේ රට විකුණන්න යනවා කියලා. සමහර අයට මේවා තේරෙන්නේ නැහැ. එහෙම දෙයක් නොවෙයි. උදාහරණයක් විධියට මම පොඩි කථාවක් කියන්නම්. බෙලි ගෙඩියක් තල් අත්තට වැටුණාම හාවා දුවගෙන ගියාලු, "ලෝකය පෙරළෙනවා, අහස කඩා වැටෙනවා" කියලා. ඒ අනුව අනෙක් සත්තුත් පස්සෙන් දුවගෙන ගියාලු. නමුත් පොඩ්ඩක් දුර දුවන විට තේරුණාලු, ලෝකය පෙරළෙන්නේ නැහැ, අහස කඩාගෙන වැටෙන්නේ නැහැ කියලා. එම නිසා විපක්ෂයේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලාට මම කියන්නේ, අපි යම්කිසි විපර්යාසයක් කළ යුතු බවයි. අපි 1948 ඉඳලා යම් දුරක් ඇවිල්ලා ආපහු වැටුණා. අපි දැන් එක එක රටවලින් තවත් පස්සට යනවා.

අපි ඇත්ත තත්ත්වය තේරුම් ගත්තේ නැත්නම්, -තව අවුරුදු 5කින් ආණ්ඩු වෙනස් වෙන්නට පුළුවන්. එක ආණ්ඩුවක්ම තිබෙන්නත් පුළුවන්.- ප්‍රශ්නය එහෙමම තිබෙනවා. තමන්ට හයිය තිබෙන්නට ඕනෑ, සමහර තැන්වලදී හරි දේ කරන්නට. මේ ආණ්ඩුවට පුළුවන්, ඒ හයිය තිබෙනවා. අපි ඒ හරි දේ වෙනුවෙන් පෙනී සිටිනවා. ඒක අමාරු වෙන්න පුළුවන්. මෙහිදී කැප කිරීමක් කරන්නට වෙනවා. මොකද, ඒ කැප කිරීම නැතිව ඒ වෙනස ඇති කරන්නට බැහැ. 2009දී මහින්ද රාජපක්ෂ මැතිතුමා යුද්ධය අවසන් කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කථාව තව විනාඩියකින් අවසන් කරන්න.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

යුද්ධය අවසන් කරලා මෙන්න මේ වෙනස කරන්න මහින්ද රාජපක්ෂ මහත්මයාට හයිය තිබුණා නම්, මේ රටේ ලොකු විපර්යාසයක් කරන්න තිබුණා. එතුමාට එය කරන්න තුනෙන් දෙකේ බලය තිබුණා. රටේ සම්පූර්ණ හයිය තිබුණා. ඒත් ඒ තීන්දු, තීරණ ගන්න එතුමාට හයිය තිබුණේ නැහැ. එතුමා අසාර්ථක වුණා.

මෙන්න මේ ගැන අප විශේෂයෙන්ම කියන්න ඕනෑ. පාද යාත්‍රා ගියා කියා මේ දේවල් හරියන්නේ නැහැ. පාද යාත්‍රාව කිව්වාට අන්තිමට ගියේ රෝද යාත්‍රාවක්. මොකද, ලොක්කෝ ගියේ වාහනවලයි. සාමාන්‍ය මිනිස්සු තමයි පාද යාත්‍රාවේ ගියේ. මගේ මැතිවරණ කොට්ඨාසයේ ඒ විරෝධතා පුවරු උස්සාගෙන යන්න මිනිස්සු මදි නිසා ඒ පුවරු ටික පාරේ දමලා ගිහින් තිබුණු ආකාරය මම දැක්කා. එක්කෙනෙක් මට ඒවා ගෙනැත් පෙන්නුවා. සාමාන්‍යයෙන් විරෝධතා පුවරුවක් ග්‍රෑම් පහක්වත් බර නැහැ. මොකද, ඒකේ බෝඩ් ලෑල්ල විතරයි නේ තිබෙන්නේ. නමුත්, මේ පුවරුවක් කිලෝග්‍රෑම් පහක් විතර බරයි. මොකද, ඒකට යකඩ ඉන්නක් දමලා ගහගන්න යනවා වාගෙයි අරගෙන ගියේ. එක මිනිහෙක් කිලෝග්‍රෑම් පහක් උස්සාගෙන යන්න ඕනෑ. සාමාන්‍ය මිනිස්සු ඒ පුවරු උස්සාගෙන ගියා. නායකයෝ ගියේ වාහනවලයි. විපක්ෂයේ අය ආණ්ඩුවේ ඉන්න කොටත් ඕක තමයි කළේ. නායකයෝ ටික බර ඉස්සුවේ නැහැ. සාමාන්‍ය මිනිසුන්ට බර පැටෙව්වා. විපක්ෂයේ ඉන්න කොටත් ඒකම තමයි කරන්නේ. මිනිස්සුන්ට බර පටවලා, බෝඩ් ලෑලි උස්සන්න කියලා නායකයෝ ටික යන්නේ වාහනවලයි. තමන් දැන ගන්න ඕනෑ තමන් විරුද්ධ වන්නේ මොකටද කියලා. අප ධනාත්මක වැඩක් කරනවා නම් ඒක හරි දේයි කියා හිතන්න ඕනෑ.

අවසාන වශයෙන්, මම මේ කාරණය කියන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා බදු ප්‍රතිපත්තිය ගැන කථා කළා. එතුමා කිව්වා, අප බදු අය කරන්නේ දේශීය නිෂ්පාදනය ආරක්ෂා කරන්නය කියා කිව්වාට එහෙම වන්නේ නැහැ කියා. මම එතුමාට මේ කාරණය කියන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව වෙලාව අවශ්‍ය නම් ගරු මන්ත්‍රීවරයෙකුගේ කාලයෙන් ඉල්ලා ගන්න.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මට එක විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අප දැනට කුකුළු මස්, පරිජ්පු, හාල් මැස්සන්, මුං ඇට, සැමන්, සීනි, කිරි පිටි, අල, ලූනු, වියළි මිරිස් සහ කරවල වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයක මිල පාලනයක් ඇති කර තිබෙනවා. ඒ නිසා අලවල බදු වැඩි වුණාය කියා මිල වැඩි කරන්න බැහැ. පාරිභෝගිකයා ආරක්ෂා වෙනවා. දේශීය නිෂ්පාදකයාත් ආරක්ෂා වෙනවා. මේක ජීවන වියදම් පිළිබඳ කමිටුවකින් අනුමත කරපු තීන්දුවක්. මේ දේවල් පුද්ගලයෙකුට ඕනෑ විධියට කරන ඒවා නොවෙයි. ඒවා මේ රට ගැන හිතලා හරියට ගන්න තීන්දු බව මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි. ස්තුතියි.

[අ.භා. 3.29]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ උගත් මිත්‍ර ගරු කබීර් හාෂිම් ඇමතිතුමා සඳහන් කළ කරුණු කීපයක් පිළිබඳව මුලින්ම මම වචනයක් දෙකක් සඳහන් කළ යුතු වෙනවා. මගේ උගත් මිත්‍රයා කිව්වා, අපේ රටේ දළ දේශීය නිෂ්පාදනය ඇමෙරිකානු ඩොලර් බිලියන 85ක් කියා. ඒක ඇත්තයි. මොකද, අපේ රටට නිදහස ලැබුණාට පසුව පුරා වර්ෂ තිහක් තිස්සේ මේ රටේ කිසිම රාජ්‍ය නායකයෙකුට විසඳන්න බැරි වුණු උතුරු නැඟෙනහිර යුද්ධය නිසා නිෂ්පාදන ධාරිතාව හැකිළුණා. නිෂ්පාදන හැකියා මායිම වමට විතැන් වුණා. මුහුදු වෙරළෙන් තුනෙන් දෙකක්, මහ පොළොවෙන් තුනෙන් එකක් කියන්නේ වර්ග කිලෝමීටර් 18,800ක්. අවුරුදු 30ක් තිස්සේ ඒ ප්‍රදේශයේ නිෂ්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන් කඩා වැටුණා. ඒ නිසා නිදහස ලැබුණු දවසේ සිට ඩී.එස්. සේනානායක මැතිතුමාගේ ආණ්ඩු තිබුණත්, ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ ආණ්ඩු තිබුණත්, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩු තිබුණත්, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ ආණ්ඩු තිබුණත්, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩු තිබුණත් -මේ ඕනෑම ආණ්ඩු කාලයක- 2009 වන තුරු ලංකාවේ ජාතික නිෂ්පාදනයේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 25ට වඩා අඩුයි. ඒ නිසා එයට "එක තැන ලැග සිටපු ආර්ථිකයක්" කියා කියනවා. නිදහස ලැබුණු දිනයේ සිට 2009 වන තුරු -1977 විවෘත වෙළෙඳ පොළ ආර්ථික ප්‍රතිපත්තිය අනුගමනය කළත්- මේ ආර්ථිකය එක තැන ලැග සිටියා. සුපිරි අධිවේගී මාර්ග හැදුණේ නැහැ; මංමාවත් හැදුණේ නැහැ; විදුලිය ලැබුණේ නැහැ. ඒ විධියට එක තැන ලැග සිටි ආර්ථිකයක් තමයි තිබුණේ. ඒක ලෝක ආර්ථික විද්‍යාඥයන් පවා පිළිගන්නා සත්‍යයක්. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා යුද්ධය නිම කළා. ඒ නිසා උතුරු නැඟෙනහිර සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සියලු මිනිසුන්ට ජාතික නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වෙන්න ඉඩ ලැබුණා. එහි ප්‍රතිඵලය තමයි 2014 වන විට ලංකාවේ ආර්ථිකයේ වටිනාකම වර්ෂයකට ඩොලර් බිලියන 80ක් දක්වා වැඩි වීම. නිදහස ලැබුණු දවසේ සිට ආර්ථික වටිනාකම බිලියන 25ට අඩු රටක්; 25ට තව 25ක් එකතු වුණොත් 50ක්; 50ට තව 25ක් එකතු වුණොත් 75ක්, 80 දක්වා වැඩි කිරීම කියන්නේ ලොකු දෙයක්. නොදියුණු රටක් ලෙස තිබුණු අපේ රට ලෝක වර්ගීකරණයේදී මැදි ආදායම් ලබන රටක් බවට පත් කිරීමේ මහා ආර්ථික පිම්ම එක පාරටම පැන්නුවේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවයි කියන කාරණය සංඛ්‍යා, දත්ත සහිතව ඔප්පු කර තිබෙන බව මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

ඊළඟට, අපේ උගත් මිත්‍රයා කිව්වා, ණය පිළිබඳ තිබෙන තත්ත්වය. එය සම්පූර්ණ ව්‍යාජයක්. එතුමා උගත් මිත්‍රයා නිසාත් ඒ වාගේම එතුමා විෂයානුබද්ධ අවබෝධයක් තිබෙන කෙනෙක් නිසාත් මගේ සරල කල්පනාව අනුව එතුමාට මුදල් අමාත්‍යාංශය බාර දුන්නා නම්, මීට වඩා යහපත් යමක් සිද්ධ වෙනවා කියා මම හිතනවා. නමුත් ණය පිළිබඳ සම්පූර්ණ විකෘති චිත්‍රයක් තමයි එතුමාගේ මනසේ තවම වැඩ කරන්නේ. මක් නිසාද යත් 1977 - 1994 කාලසීමාවේ ලංකාවේ රාජ්‍ය ණය බර වැඩිවීම ගත්තොත්, නොපියවූ රාජ්‍ය ණය සියයට 2,098ක් වනවා. 1995-2014 කාල සීමාවේ රාජ්‍ය ණය වැඩිවීම සියයට 1,070ක් වනවා. ඒ වාගේම 2005-2014 රාජ්‍ය ණය සියයට 228කින් වැඩිවෙලා තිබෙනවා. ඒ නිසා සංඛ්‍යා දත්ත හා රාජ්‍ය ණය අනුව ලංකාවේ රාජ්‍ය ණය බර වැඩිවීමේ අනුපාතය අඩුම වර්ෂ ලෙස තමයි මහින්ද රාජපක්ෂ යුගය සටහන් වන්නේ. නමුත් අද වන විට ඇති වෙලා තිබෙන තත්ත්වය, මහා ජාතික අර්බුදයක්.

පසු ගිය කාලයේ ඩොලරයේ වටිනාකම රුපියල් 130යි. රුපියල අවප්‍රමාණය වීම නිසා අද ඩොලරයට රුපියල් 147ක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. රුපියල බාල්දු වීම නිසා මේ රටේ තිබුණ නොපියවූ ණය බර පමණක් රුපියල් බිලියන 285කින් නිකම්ම වැඩිවෙලා තිබෙනවා. රුපියල කඩා වැටීම නිසා විතරක් රටට වෙලා තිබෙන පාඩුව - ජාතියේ ණය බර - රුපියල් බිලියන 285කින් වැඩිවෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 මහින්ද රාජපක්ෂ යුගයේදී විදේශ ව්‍යවහාර මුදලින් ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 20.4යි. 2015 වර්ෂයේදී විදේශ මුදලින් ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 222.4යි. නිදහසින් පසු සියයට 1,010කින් විදේශ ණය අරගෙන තිබෙන එකම ආණ්ඩුව මේ ආණ්ඩුව බවට ඓතිහාසික වාර්තාවක් පිහිටුවා තිබෙනවා. කාට හරි අකුරු තේරෙන කෙනෙකුට මේ ඓතිහාසික වාර්තාව බලාගන්න ඕනෑ නම්, 2015 මහ බැංකු වාර්තාවේ 199 පිටුව ගත්තාම හරි. 2014දී විදේශ ව්‍යවහාර මුදලින් ගත්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 20.4යි. එය 2015 වර්ෂයේදී රුපියල් බිලියන 222.4යි. ඒ අනුව සියයට 1,010කින් විදේශ වෙළඳ පොළෙන් ගිනි පොලියට ණය ගත් ආණ්ඩුවක් තිබෙනවා නම්, ඒ මේ ආණ්ඩුව විතරයි. එතකොට ඒ ණය අර්බුදය ගෙනියන්නේ නූපන් පරම්පරාවයි.

මේ රටේ මහ දවල් මහ බැංකුවේ සිද්ධ වෙච්ච මහා මුදල් මංකොල්ලය මහ බැංකු බැඳුම්කර වංචාවයි. ඒ බැඳුම්කර නිකුත් කළේ තව අවුරුදු 30කින් ගෙවන්නයි. මේ ආණ්ඩුව ගත් ඒ ණය, තව අවුරුදු 30කින් බලයට පත්වන ආණ්ඩුව විසින් මේ පාර්ලිමේන්තුවේ කථා කරන ආකාරය මේ සමහර අයට බලාගෙන ඉන්න වෙන්නේ වෙන ලෝකවල ඉඳගෙනයි.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට රට බාර දෙන කොට දළ ජාතික නිෂ්පාදනය 100 නම්, අද කබීර් හාෂිම් අමාත්‍යතුමා කියපු එක අනුව එදා ණය බර සියයට 103යි. පුළුවන් නම් ඒක නැහැයි කියලා කියන්න. එදා ණය බර සියයට 103යි. ඒ සියයට 103ක් වෙච්ච රාජ්‍ය ණය තමයි 2014 වෙනකොට සියයට 70.7ට අඩු කළේ. එක අවුරුද්දක් තුළ මේ ආණ්ඩුව එය සියයට 76ට වැඩි කළා. මේ බොරුව කියන්න එපා. ඒ කියන්නේ තමන්ගේ නොදැනුවත්කම ලෝකයේ ගණන් ඉලක්කම් දන්නා අයට කියන්න එපා. මොකද, ඒකට ශාස්ත්‍රීය විග්‍රහයක් තිබෙනවා.

ඊළඟට, බදු පිළිබඳ කොටසට එන්න ඕනෑ නිසා මම මේ කාරණය සඳහන් කරන්න කැමැතියි. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ මූලික අරමුණක් වෙන්නේ දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කිරීමයි. ඒ සඳහා දේශීය නිෂ්පාදනවල අස්වැන්න ලැබෙන කාලවලට ආනයන බද්ද වැඩි කරනවා. දේශීය නිෂ්පාදන නොමැති කාලයට බද්ද අඩු කරනවා. මේ බදු වෙනස කරනවා. වෙනස කරලා, ගැසට් නිවේදනය ඉදිරිපත් කරනවා. නමුත් ඒ ගැසට් නිවේදනය මේ පාර්ලිමේන්තුවේ අනුමත කරන්නේ හුඟක් කල් ගිහිල්ලායි. අද ඉදිරිපත් කරලා තිබෙන එක් නියමයක් ගැසට් කරලා තිබෙන්නේ 2016.01.20වන දිනයි. නමුත් අද තමයි අපි ඒ පිළිබඳ විවාද කරන්නේ. 2016 ජනවාරි මාසයේයි ඉදිරිපත් කරලා

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

තිබෙන්නේ. දැන් අපි ඉන්නේ 08වන මාසයේයි. මේ ගැසට් නිවේදනය නිකුත් කරලා මේච්චර කාලයක් ගත වුණාට පසුව විවාද කරලා කිසිම ප්‍රයෝජනයක් නැහැ. ඒ නිසා මම පළමුවෙනි යෝජනාව ලෙස කරන්න කැමැතියි, මේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ ගැසට් නිවේදනය නිකුත් කරලා "මාස 6ක් ඇතුළත අනුමත කළ යුතුය." යන්න වෙනුවට ගැසට් නිවේදනය නිකුත් කරලා "මාසයක් ඇතුළත මේ විවාදය පටන් ගත යුතුයි." කියලා වෙනස් කළ යුතු බවට. එහෙම වුණොත්, එතැනදී ඵලදායී මූල්‍ය හැසිරවීමක් කරන්න මේ ගරු සභාවට අවස්ථාව ලැබෙනවා.

පාර්ලිමේන්තුව අඩුම තරමින් මාසයකට වාර දෙකක් රැස් වෙනවා. මුදල් අනුකාරක සභාව පසු ගිය සතියේ රැස් වුණු වෙලාවේ, මේ ගැසට් නිවේදන මධ්‍යම රාත්‍රියේ නිකුත් කරන්න කියලා නීතිපති දෙපාර්තමේන්තුව පෙන්වලා දුන්නා. මොකද, ඒ කාලය අතර තුළත් විවිධ අයථා ක්‍රියා සිදු වන නිසා. ඒ නිසා මධ්‍යම රාත්‍රි 12ට ගැසට් නිවේදනය නිකුත් කරන්න. එහෙම නිකුත් කරලා මාසයක් ඇතුළත මේ ගරු සභාවට ඉදිරිපත් කරලා විවාද කරන්න කියන ඉල්ලීම මා ඉතාම ඕනෑකමින් කරනවා. මක්නිසාදයත්, ගැසට් නිවේදනයක් නිකුත් කරලා විවාද කරන්න හුඟක් කල් ගියාට පස්සේ වෙන දේ පිළිබඳව අපි දන්නවා. මම ඒ සඳහා සරල උදාහරණයක් දක්වන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට ආනයනය කරන සීනි කිලෝවකට රුපියල් 30ක බද්දක් තිබුණා. රුපියල් 30 බද්ද එක් වරම අඩු කළා, ශත 25ට. රුපියල් 30ක බද්දක් ශත 25කට අඩු කරපු, ලංකා ඉතිහාසයේ මම දන්න එකම මුදල් ඇමතිවරයා රවි කරුණානායක මුදල් ඇමතිවරයා කියලා තමයි මම හිතන්නේ. මම වැරදි නම් එතුමාට පුළුවන් ඊළඟ දවසේදී ඒක නිවැරදි කරන්න.

මම හිටපු වෙළෙඳ අමාත්‍යවරයෙක්. ලංකාවට ආනයනය කරන සීනි කිලෝවකට අය කළ බද්ද රුපියල් 30යි. සාමාන්‍යයෙන් පෞද්ගලික අංශය වර්ෂයකට සීනි මෙට්‍රික්ටොන් 55,000ක්-60,000ක් ආනයනය කරනවා. වර්ෂයකට සීනි මෙට්‍රික්ටොන් 55,000ක්-60,000ක් ආනයනය කරන කොට-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතා වැදගත් කරුණක් නිසා මම අපේ ඒකාබද්ධ විපක්ෂයේ වෙලාවෙන් විනාඩි පහක් ඉල්ලා ගන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා මොන කරීකයාට වෙන් කළ කාලයෙන්ද ගන්නේ?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
විනාඩි පහ අපේ ඒකාබද්ධ විපක්ෂයේ ඉතුරු කාලයෙන් බෙදලා දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා මෙතැන රැඳී ඉන්න ගරු මන්ත්‍රීවරුන්ගෙන්- [බාධා කිරීමක්] ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් දෙනවාද?

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් ගන්න.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 30ක ආනයන බද්ද ශත 25ට අඩු කළා. එතකොට සීනි ගෙනැල්ලා තිබෙන වෙළෙන්දන්ට රුපියල් 29.75ක් පාඩු වෙනවා. ව්‍යාපාරිකයන්ට හෝ ඒ stocks තිබෙන සියලු දෙනාට පාඩු වනවා. එතකොට ඒ ව්‍යාපාරිකයෝ ටික ව්‍යාපාර ක්ෂේත්‍රයෙන් අතු ගෑවිලා යනවා. ඊට පස්සේ ශත විසිපහේ බද්ද යටතේ තමයි සීනි ආනයනය කරන්නේ. අපට වර්ෂයකට සීනි මෙට්‍රික්ටොන් 55,000ක් පමණ ඕනෑ. සීනි නරක්වන ද්‍රව්‍යයක් නොවෙයි. එතකොට ව්‍යාපාරිකයෝ සීනි මෙට්‍රික්ටොන් ලක්ෂ 2ක් විතර ගෙනැල්ලා stock කරනවා. Stock කරගත්තාට පස්සේ ටික දවසකින් කියනවා, "රාජ්‍ය ආදායමට බරපතළ පාඩුවක් වෙලා" කියලා. කොච්චරක්ද වෙලා තිබෙන පාඩුව? රුපියල් බිලියන 20ක්. වර්ෂයක් ශත 25 ගණනේ බද්ද අය කළොත් රාජ්‍ය ආදායමේ පාඩුව රුපියල් බිලියන 20යි. මෙහෙම ටික දවසක් තිබෙනවා. දැන් ඔක්කෝම යාළුවෝ හෝ ගාලා සීනි ගෙනෙනවා. ගෙනැල්ලා stock කර ගත්ත ගන්නවා. මෙට්‍රික්ටොන් ලක්ෂ 2ක් විතර stock කර ගත්තාම, තව ටික දවසකින් කියනවා, දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කරන්න ඕනෑ, දේශීය නිෂ්පාදකයාට රැකවරණය දෙන්න ඕනෑ කියලා. එතකොට පැලවත්ත සීනි සමාගම ගැන මතක් වනවා; වැල්ලවාය ගැන මතක් වනවා. ඊට පස්සේ ඒ ආනයන බද්ද වැඩි කරනවා, රුපියල් 20ට. ආනයන බද්ද රුපියල් 20 දක්වා වැඩි කළාම, ගෙනැල්ලා තිබෙන සීනි කිලෝවකින් රුපියල් 19.75 ගණනේ විතර ලාභයක් ලැබුණාම, සාමාන්‍ය සනීපයක් දැනෙනවා නේ. මේක තමයි අද තිබෙන තත්ත්වය.

මේ වාගේම අද රේගු දෙපාර්තමේන්තුව ඇතුළේත් බදු ප්‍රතිපත්තිය පුද්ගලික න්‍යාය පත්‍ර අනුව ක්‍රියාත්මක වන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. රේගු ආඥා පනත හතර වරක් වෙනස් කරලා තිබෙනවා. අද රේගු දෙපාර්තමේන්තුව ඇතුළේ ඉතා විශාල කැලඹිල්ලක් ඇති වෙලා තිබෙනවා. සමහර අයට උසස්වීම්, මාරුවීම් දෙන ආකාරය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාට ශ්‍රී ලංකා නිදහස් වෘත්තීය සමිතිය ලිපියක් යවලා තිබෙනවා. "මෛත්‍රීපාල සිරිසේන අතිගරු ජනාධිපතිතුමා" යනුවෙන් ආමන්ත්‍රණය කරලා, "අපරාධ නඩුවක චූදිතයෙකු රේගු අධ්‍යක්ෂ ජනරාල් තනතුරට උසස් කිරීම" යනුවෙන් ලියලා තිබෙනවා.

මාර්ගයේ ගමන් කළ ත්‍රිරෝද රථයක් නවතා තලවතුගොඩ හේමාස් ගොඩනැඟිල්ලට ඇතුළත් වූ තුවාලකරුවකුගෙන් තලංගම පොලීසිය විසින් කටඋත්තරයක් ලබාගෙන, චූදිතයා අත් අඩංගුවට ගෙන බී2297/16 යටතේ 2016.02.11 වැනි දින කඩුවෙල මහෙස්ත්‍රාත් වෙත ඉදිරිපත් කරලා රිමාන්ඩ් කර තිබෙන වෙලාවේ තමයි මේ උසස්වීම ලැබෙන්නේ. අද ඔහු තමයි රජය වෙනුවෙන් රේගුව පාලනය කරන්නේ. පිස්තෝල සෙල්ලම් දාපු ඒ සැකකරු රක්ෂිත බන්ධනාගාරගත කර තිබෙන කොට; අපරාධ චෝදනා යටතේ බන්ධනාගාරගත කර තිබෙන කොට උසස්වීම

ලැබෙනවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පිටින්, අවුරුදු 60 පැන්න අයට ඔක්තෝබර් මාසයේදී සේවා දිගුවක් දෙන්න යනවා. මේ හදන්නේ පෞද්ගලික න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කරන්නයි. මෙවැන්නක් ලංකාවේ කවදාවත් ක්‍රියාත්මක කරලා නැහැ.

ගංවතුරට අහුවුණ ඒ අනාථයන්ට රුපියල් 10ක් දෙන්න බැහැ. බියගම තිබෙන බියර් කොම්පැනියෙන් - Ceylon Brewery - රුපියල් බිලියන 2කට ආසන්න බදු මුදලක් ලැබෙන නිසා, ඒ බදු මුදල ලැබෙන බියර් කොම්පැනියේ නිෂ්පාදනය නැති වුණ නිසා, පිට රටින් ආනයනය කරන බියර්වල බදු අතිවිශාල ලෙස අඩු කරලා ඒ සමාගමට පමණක් ආනයනය කරන්න ඉඩ දීලා තිබෙනවා. ඒකාධිකාරයක් දරන ඒ බියර් සමාගම ගැන මේ අයට පුදුම අනුකම්පාවක් ඉපදිලා තිබෙනවා. නමුත් සාලාවේ පිහන් භාණ්ඩ හදන කර්මාන්තශාලාව ඇතුළු මුළුමනින්ම විනාශ වුණු, පවුල් - පන්සල් පිටින්ම විනාශ වුණු ගෙවල් දොරවල්වලට වන්දි මුදල් දෙන්න බැහැ. හැබැයි, බියගම beer factory එක විනාශ වුණාම තීරුබදු අඩු කරලා බියර් ගේන්න අවසර දෙන්න පුළුවන්.

සුරාබදු දෙපාර්තමේන්තුවට තිබුණු වැටලීම් බලය වෙනුවට, STF එකේ 25දෙනෙක් හා සුරාබදු දෙපාර්තමේන්තුවේ කලුතර සිටින නිලධාරීන් දෙදෙනෙක් දාලා අද ලංකා ඉතිහාසයේ කවදාවත් නොවූ අයුරින් මුදල් අමාත්‍යාංශය ඇතුළේ වෙනම වැටලීම් ඒකකයක් හදලා තිබෙනවා. පානදුර ප්‍රදේශයේ, කලුතර දිස්ත්‍රික්කයේ කෘත්‍රිම රා සහ ස්වාභාවික රා අතර යුද්ධයක් ඇති වන විධියට, පෞද්ගලික සමාගමක් වන මෙන්ඩිස් සමාගමේ අරක්කු නිෂ්පාදනය පිළිබඳ විධිවිධාන හදලා තිබෙනවා. මේ වාගේ කරුණු සියදහස් ගණනක් නිසා අද රේගු දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව යන මේ හැම එකක්ම ගිනි අරගෙන තිබෙනවා. වැටි එකට විරුද්ධව උද්ඝෝෂණය කරපු පිටකොටුවේ වෙළෙන්දෝ, ගාල්ලේ වෙළෙන්දෝ, මහරගම වෙළෙන්දෝ Sri Lanka Customs එකට කියනවා, "ගිහිල්ලා පනින්න" කියලා.

අද භාණ්ඩ ආනයනය කරන්නේ නැහැ. අපනයනය කරන්නේ නැති තැන් මර්දනයට හා භයගැන්වීමට කටයුතු කරනවා. ලංකාවේ ආණ්ඩුවක් පෞද්ගලික අංශය භයගැන්වුවා නම්, වැඩිම ප්‍රමාණයකින් භයගන්වපු ආණ්ඩුව බවට මේ ආණ්ඩුව පරිවර්තනය වෙලා තිබෙනවා. මූල්‍ය අපරාධ කොට්ඨාසයට ව්‍යාපාරිකයන් සිය ගණනක් ගෙනයන අතර, අධ්‍යක්ෂ මණ්ඩලවල තීරණ ගැනීමට හිටපු මිනිස්සු අරගෙන ගිහිල්ලා රිමාන්ඩ් භාරයට පත් කරනවා. ඒ නිසා ලංකාවේ පෞද්ගලික අංශය ව්‍යාපාරයක් කරන්නේ නැහැ; නිෂ්පාදනයක් කරන්නේ නැහැ. නමුත් තමුන්නාන්සේලා නිෂ්පාදන ආර්ථික ගොඩනහන්න හදනවා. මෙහෙම හදන්නේ මොන නිෂ්පාදන ආර්ථිකද? නිෂ්පාදනය පිළිබඳ තීරණ ගන්න මිනිස්සු FCID එකෙන් අරගෙන ගිහිල්ලා හිරේට දාපුවාම, වැදගත් මිනිස්සු, සාධාරණ මිනිස්සු, අභිංසක මිනිස්සු අරගෙන ගිහිල්ලා, රජයේ සේවකයෝ, අමාත්‍යාංශවල ලේකම්වරු, සමාගම්වල අධ්‍යක්ෂවරු අරගෙන ගිහිල්ලා හිරේට දාපුවාම කොහොමද නිෂ්පාදනයක් කරන්නේ? ලංකාවේ කිසිම ආණ්ඩුවක් පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන්ට මෙතරම් ප්‍රමාණයකට හිරිහැර කරලා නැහැ. දැන් කඩවලට පැනලා වැටිවලට විරෝධය පළ කරපු අය භය කරනවා. එදා දිගම්බරම් අමාත්‍යතුමා, මනෝ ගනේසන් අමාත්‍යතුමා වැටි විරෝධය අවස්ථාවේ පිටකොටුවට ගිහිල්ලා කඩ අරින්න කිව්වා. දේශපාලන පක්ෂ පාට භේදයකින් තොරව වැටි බද්දට විරුද්ධ ජනයාගේ උද්ඝෝෂණ තමයි ඒ ව්‍යාපාර විසින් කළේ. මේ විධියේ පළිගැනීම් කරලා පෞද්ගලික න්‍යාය පත්‍රවලට අනුව මුදල් අමාත්‍යාංශය හැසිරවීමෙන් රටේ ආදායම වැඩි කරලා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කරන්න බැරි බව සඳහන් කරන අතර, මගේ අනෙක් සහෝදරවරුන්ගේ කාලය ඉතිරි කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද රටේ බදු පිළිබඳවයි සාකච්ඡා කරන්නේ. ගණන් කරලා බලන්න, තුනෙන් දෙකක් ඉන්නවාය කියන ආණ්ඩුව නියෝජනය කරමින් මන්ත්‍රීවරු 10දෙනෙක්වත් මෙතැන නැහැ. එක කැබිනට් ඇමතිතුමායි ඉන්නේ. මේ විවාදය ඉදිරියට ගෙන යන්න රජය මීට වඩා සහයෝගය දැක්වුවොත් හොඳයි කියා අපි විශ්වාස කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. ඒ පිළිබඳව රජයේ අවධානය යොමු කරවන්නම්. The next speaker is, the Hon. Gnanamuthu Srineshan. You have twenty minutes.

[பி.ப. 3.46]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத்தில் 3 விடயங்கள் இடம்பெற்றிருக் கின்றன. அவற்றில் எனது உரைக்கான தலைப்பு மதுவரி மற்றும் மதுச்சாலைகள் சம்பந்தமானதாக இருக்கப் போகின்றது. அந்த வகையில் மதுவரி பற்றியும் மதுச்சாலைகள் பற்றியும் கனதியான கருத்துக்கள் குறிப்பிடப்படவேண்டி இருக்கின்றன. மதுச்சாலைகள்மூலமாக அரசு அதிகமான வருவாயினைப் பெற்றுக்கொள்வதாகப் பேசப்படுகின்றது. அண்மையில் தினசரிப் பத்திரிகையொன்றில் மதுவரிமூலமாக 104 பில்லியன் ரூபாய் பெறப்படுவதாகவும் மதுவினால் ஏற்படுகின்ற நோய்களுக்குச் சிகிச்சையளிப்பதற்காக ஏறத்தாழ 140 பில்லியன் செலவு செய்யப்படுவதாகவும் குறிப்பிடப் பட்டிருந்தது. அதன்படி பார்க்கின்றபோது, மதுவினால் கிடைக்கும் வருமானத்தைவிட மதுவினால் ஏற்படுகின்ற நோய்களுக்காக 36 பில்லியன் ரூபாயை மேலதிகமாகச் செலவு செய்யவேண்டிய நிலைமை காணப்படுவது தெளிவாகின்றது. இந்த இடத்தில் மதுவின்மூலமாக அரசுக்குக் கூடுதலான வருமானம் கிடைப்பதாக நாங்கள் சிலாகித்துப் பேசிக்கொண்டாலும் மதுவினால் ஏற்படுகின்ற நோய்களைக் குணப்படுத்துவதற்காக அதைவிடவும் கூடுதலான நிதியினைச் செலவு செய்கின்றோம். குறுகிய காலத்தில் மதுவரி மூலமாக வருவாய் கிட்டினாலும் நீண்டகால விளைவாகப் பார்க்கின்றபோது அதன் வெளியீடாக மதுவினால் அநேகமானோர் நோயாளிகளாக்கப்படு கின்றார்கள். எனவே, இந்த வரி சம்பந்தமான விடயத்தில் கூடுதலான கரிசனை செலுத்துகின்ற நாங்கள், மதுவினால் கிடைக்கின்ற வருவாயினைவிட மதுவினால் நோயாளிகளா வோரின் செலவு ஆண்டுதோறும் 36 பில்லியன்களால் உயர்ந்து காணப்படு கின்றது என்ற உண்மையை மறந்துவிடக்கூடாது.

அதுமட்டுமல்லாமல், இன்றைய முதலாளித்துவ அரசுகளை இயக்கிச் செல்வதற்கு மதுவரி என்பது முக்கியமான ஒரு விடயமாக இருந்தாலும், இது எந்தளவுக்கு மனித வளத்தினைப் பாதிக்கின்றது என்பதைப்பற்றி நாங்கள் சிந்தித்துப் பார்க்க வேண்டும். வளங்களில் உயர்ந்த வளம் மனித வளம். இந்த வளத்தினைச் சரியாகப் பயன்படுத்திய நாடுகள் வளர்ச்சி யடைந்திருக்கின்றன; அபிவிருத்தி கண்டிருக்கின்றன.

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

ஆனால், அந்த வளத்தினைத் தவறான முறையில் பயன்படுத்திய நாடுகள் இன்னமும் அபிவிருத்தியடையாத நாடுகளாக இருக்கின்றன என்ற உண்மையை நாங்கள் விளங்கியும் விளங்காதவர்கள் போன்றிருக்கின்றோம். இந்த மதுவானது ஒவ்வொரு மனித வளத்தினையும் மழுங்கடிக் கின்றது அல்லது ஒரு வகையில் மனித வளத்திலிருந்து பெறக்கூடிய உச்ச அடைவினைப் பெறமுடியாமல் தடுக்கின்ற ஒரு பொருளாகக் காணப்படுகின்றது. கார்ல் மார்க்ஸின் தத்துவமானது, "எங்கெல்லாம் தொழிலாளர் வர்க்கம் அடக்கியொடுக்கப்படுகின்றதோ, அங்கெல்லாம் ஆளுகின்ற வர்க்கத்திற்கெதிராக, முதலாளித்துவ வர்க்கத்திற்கெதிராகத் தொழிலாளர் வர்க்கம் கிளர்ந்தெழுந்து வர்க்கப் போராட் டத்தினை நடத்தி ஆட்சியினைக் கைப்பற்றும்; அந்தப் பாட்டாளி வர்க்கப் போராட்டம் வெல்லும்" என்பதாகக் குறிப்பிடப்பட்டிருக்கின்றது. இதற்காக முதலாளித்துவச் சக்திகள் கண்டுபிடித்த ஒரு சூத்திரம் என்னவென்றால், தொழிலாளர்களை இலட்சியமற்றவர்களாக அல்லது மதுவுக்கு அடிமையானவர்களாக மாற்றிவிட்டால் இப்படியான போராட் டங்களிலிருந்து தப்பித்துக் கொள்ளலாம் என்பதாகும். எனவேதான் அந்நியர் ஆட்சிக்காலத்தில், குறிப்பாகப் பிரித்தானியர் ஆட்சிக்காலத்தில் தொழிலாளர்களை இந்தியா விலிருந்து கொண்டுவந்து தோட்டங்களில் அமர்த்திவிட்டு அவர்களைத் தொடர்ந்தும் கூலிகளாக வைத்திருக்கவேண்டும் அல்லது பரம்பரை பரம்பரையாக அவர்கள் தொழிலாளர்களாக இருக்கவேண்டும் என்பதற்காகத் தோட்டப்புறங்களில் மதுச் சாலைகள் அல்லது சாராயத் தவறணைகள் அறிமுகஞ்செய்யப் பட்டன. இதன் காரணமாகத் தொழிலாளர் வர்க்கம் மதுவுக்கு அடிமையாகித் அவர்களது இலட்சியங்கள் அல்லது அவர்களது எதிர்காலம் பற்றிச் சிந்திக்காமல் தொடர்ந்தும் தொழிற்படை யினராக அல்லது தொழிலாளர் வர்க்கமாக இருந்து கொண்டிருக்கின்றது என்பது மறுக்க முடியாத, மறைக்க முடியாத உண்மையாகும்.

இன்றைய காலகட்டத்தில் அநேகமாக மதுவினால் எமது மனிதகுலம் சீரழிந்துபோகின்றது. மதுவின்மூலம் சீரழிந்து போகின்ற இந்த மனித வளமானது நாட்டின் உற்பத்திக்கும் எழுச்சிக்கும் அதன் வளர்ச்சிக்கும் எந்தளவுக்கு உதவும் என்பதை நாங்கள் ஆக்கபூர்வமாகச் சிந்தித்துப் பார்க்க வேண்டியவர்களாக இருக்கின்றோம். ஒவ்வொரு மாவட் டத்திலும் மதுபானச் சாலைகளுக்கான அனுமதிப்பத்திரங்கள் மிகவும் இலகுவாக வழங்கப்படுகின்றன. இவ்வாறு அந்த அனுமதிப்பத்திரங்களைப் பெற்றுக்கொள்கின்றவர்கள் பொருளாதாரத்தில் வளர்ச்சியடைந்து - உயர்வடைந்து சென்றாலும், மதுவை நுகர்கின்ற ஏழைத் தொழிலாளர்கள், சாதாரண மக்கள் மிகவும் மோசமான வாழ்க்கையை நடத்திக்கொண்டிருக்கின்றார்கள்.

நமது நாட்டில் மதுவுக்கு அடிமையாகும் மனித வளங்கள் நடைப்பிணங்களாக உலாவிக்கொண்டிருக்கின்றனர். அது மட்டுமல்ல, அவர்களில் தங்கி வாழ்கின்ற குடும்பங்களிலே உள்ள குழந்தைகள் பாடசாலைக் கல்விக்கு இடையில் முழுக்குப் போட்டுவிடுகிறார்கள் அல்லது வறுமை காரணமாக இடைவிலகலுக்கு உள்ளாகிவிடுகிறார்கள். அதனைத்தான் ஆங்கிலத்தில் drop-outs என்று சொல்லுகின்றோம். ஆகவே, எதிர்காலச் சந்ததியினரான எமது மாணவர்கள் தமது கல்விக்கு முழுக்குப் போடுவதற்குக் காரணமான மது, அவர்கள் கற்றவர் களாக உயர்ந்து வருவதற்கும் தடையாக இருக்கின்றது.

பட்டிதொட்டிகளெல்லாம் மூலைமுடுக்குகளெல்லாம் மது வினைப் பெறக்கூடிய விதத்தில் இன்று மதுச்சாலைகள் கிரமமாகத் திறந்து வைக்கப்படுகின்றன. இதனால் முதியவர்கள் மட்டுமல்ல, இன்றைய இளைஞர்கள்கூட மதுப் பாவனைக்குட்பட்டு அதற்கு அடிமையாகிவிடுகின்றார்கள். இவ்வாறு மதுவுக்கு அடிமையானவர்கள் உற்பத்திக்கு எந்தளவுக்கு உதவுவார்கள் என்பதை நாங்கள் எண்ணிப் பார்க்க வேண்டும். மதுவின் மூலமாக வரி கிடைக்கின்றது; அரசுக்குக் கூடுதலான வருவாய் கிடைக்கின்றது என்பதற்காக எமது நாட்டைக் கட்டியெழுப்ப வேண்டிய, நாட்டுக்கு உதவவேண்டிய இந்த மனித வளங்கள் மதுவினால் அழிக்கப்படுகின்றபோது இந்த நாடு மதுவரியின் மூலமாக முன்னேற முடியாது என்பதை நாம் உணர்ந்துகொள்ள வேண்டும்.

எமது நாட்டில் குறிப்பாக கிழக்கு மாகாணத்தை எடுத்துக்கொண்டால், அங்கு 190க்கு மேற்பட்ட மது விற்பனை நிலையங்கள் காணப்படுகின்றன. அதிலும் குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்தில் 78 மது விற்பனை நிலையங்கள் உள்ளன. அதேபோல், ஏனைய மாவட்டங்களான அம்பாறையில் 50க்கு அதிகமாகவும் திருகோணமலையில் 60க்கு அதிகமாகவும் மதுபான விற்பனை நிலையங்கள் காணப்படுகின்றன. இவ்வாறு மது விற்பனை நிலையங்கள் அதிகரிக்க, அதிகரிக்க நாட்டுக்கு வருவாய் கிடைக்கும் என்று எண்ணிக்கொண்டாலும், அது வீட்டுக்கு வறுமையைக் கொடுக்கின்றது என்பதை மறந்துவிடக்கூடாது. "வரப்பு உயர நீர் உயரும்" என்ற ஔவையாரின் பாடல் வரிகளின்படி பார்த்தால், வீடுகளில் வருமானம் அதிகரிக்கின்றபோதுதான் நாட்டின் வருமானம் அதிகரிப்பதற்கும் வாய்ப்பிருக்கின்றது. அவ்வாறு இல்லாமல், மதுவின் மூலமாக வீடுகளில் வறுமையில் வாடுகின்ற ஒரு சமூகத்தை உருவாக்குகின்ற போது, நாடு எவ்வாறு வளர்ச்சிபெற முடியும்? எவ்வாறு எழுச்சிபெற முடியும்? எவ்வாறு அபிவிருத்தியடைய முடியும்? என்பதை நாங்கள் சிந்தித்துப் பார்க்கவேண்டும்.

இந்தியாவில் நரேந்திர மோடி அவர்கள் குஜராத்தின் முதலமைச்சராக இருந்தபோது, அங்கு மது விற்பனை நிலையங்களைக் குறைத்தார் என்று சொல்வதைவிட, அந்த மாநிலத்தின் வருவாய்க்காக மது விற்பனை நிலையங்களை அவர் எதிர்பார்த்திருக்கவில்லை என்று சொல்லலாம். அவ்வாறிருந்தும் குஜராத் மாநிலமானது அவரது ஆட்சிக் காலத்தில் வளர்ச்சியடைந்தது. ஆயின், மதுவின் மூலமாக வரிகளைப் பெற்றுத்தான் ஒரு நாட்டைக் கட்டியெழுப்ப முடியும் என்ற கருத்து அங்கு பொய்யாக்கப்பட்டுள்ளது. எனவே, மாவட்டங்கள்தோறும் மதுச்சாலைகளை, சாராயத் தவறணைகளைத் திறந்து அரசுக்கு வருமானத்தை ஈட்டிக்கொள்ளலாம் என்ற குறுகிய இலாப சிந்தனையானது, நீண்டகாலப்போக்கில் எமது நாட்டின் உற்பத்திக்குப் பயன்படக்கூடிய மனித வளத்தினை அழித்துவிடுகின்றது அல்லது அதன் உற்பத்திக்கான பங்களிப்பைக் குறைத்து விடுகின்றது என்பது நான் கூறும் முக்கிய விடயமாகும்.

அதிகமான குற்றச்செயல்களையும் குற்றவாளிகளையும் எடுத்துப்பார்த்தால், அவர்கள் மதுபோதையில்தான் அவ் வாறான குற்றச்செயல்களில் ஈடுபட்டிருக்கின்றார்கள் என்பதை அறியக்கூடியதாக இருக்கின்றது. நான் அண்மைக்காலத்தில் நிகழ்ந்த ஒரு நிகழ்வினை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். இரண்டு அல்லது மூன்று வாரங்களுக்கு முன்பு மட்டக்களப்பில் போரதீவுப்பற்று பிரதேச செயலாளர் பிரிவில் முக்கொலை நடைபெற்றது. அந்தச் சம்பவத்தின்போது, அவ்வீட்டின் தலைவராக இருந்தவர் தனது மனைவியையும் குழந்தையையும் மாமனாரையும் கோடரியால் அடித்துக் கொலைசெய்திருக்கின்றார். அவரைப் பொலிஸார்

கைதுசெய்தபோது, அவர் மதுபோதையில் இருந்ததாக அறியப் படுகின்றது. எனவே, குற்றவாளிகள் அதிகரிப்பதற்கும் குற்றச்செயல்கள் அதிகரிப்பதற்கும் மதுப்பாவனை என்பது முக்கியமானதொன்றாக இருக்கின்றது. இவ்வாறான நீண்ட கால விளைவுகளைப் பற்றிச் சிந்திக்காமல், மதுவின் மூலமாக வரியினைப் பெற்றுக்கொள்ளலாம். மதுவின் பெறுமதியை அதிகரித்துக்கொண்டு செல்கின்றபோது அரசுக்குக் கூடுதலான வருவாய் கிடைக்கும் என்றெல்லாம் கனவு காண்பது, நீண்ட காலப்போக்கில் மனித குலத்தை, மனித வளத்தை, மனிதர்கள் மூலமாகக் கிடைக்கக்கூடிய உற்பத்தியினை மழுங்கடிக்கின்ற ஒரு செயலாகத்தான் இருக்கமுடியும் என்பது எனது தாழ்மையான அபிப்பிராயமாகும். எனவே, அரசானது மதுவரி விடயத்தில் அல்லது மதுச்சாலைகளை அதிகரிக்கின்ற விடயத்தில் மிகவும் கவனமாக இருக்கவேண்டும்.

"வீட்டுக்கு வெளிச்சம் தருவதற்காக கூரையை எரிப்பாரோ?" என்று பாடலடியொன்று இருக்கின்றது. அதாவது, நாங்கள் வீட்டுக்கு வெளிச்சத்தைப் பெறுவதற்காக வீட்டுக் கூரையை எரிப்பது மதிகெட்ட செயலாகும். அது புத்திசாதுரியமான ஒரு விடயமாக அமையாது. அதே போன்றுதான் நாட்டில் மதுச்சாலைகளையும் அதனூடாக மது வரியினையும் அதிகரிப்பதன்மூலமாக நாட்டின் பொருளா தாரத்தைக் கட்டியெழுப்பலாம்; நாட்டில் அபிவிருத்தியை அடையலாம் என்றெல்லாம் நினைப்பது முதலாளித்துவ தந்திரோபாயமாகும். அவ்வாறு செய்வது ஏழை மக்களின் வயிற்றில் அடித்து அவர்களை நடைப்பிணங்களாக மாற்றி, ஏழைக் குழந்தைகளின் எதிர்காலத்தை மழுங்கடிக்கின்ற அல்லது பாழடிக்கின்ற ஒரு விடயமாக அமைந்துவிடும்.

நான் முன்பு குறிப்பிட்டதுபோல், மட்டக்களப்பில் மாத்திரம் 78 மது விற்பனை நிலையங்கள் உருவாக்கப்பட்டிருக்கின்றன. குறிப்பாக, இந்த மதுச்சாலைகள் மூலமாக இலட்சியமில்லாத, தூரநோக்கில்லாத, எதிர்காலத்தைப் பற்றிச் சிந்திக்காத ஒரு சமூகத்தை நாங்கள் மிகவும் வலிந்து உருவாக்கிக் கொள்கின்றோம். நாட்டுக்குப் பொருளாதாரத்தை ஈட்டித்தர வேண்டிய இவ்வாறான இளைஞர்கள் தினமும் மதுபோதைக்கு உட்பட்டு நாட்டுக்குச் சுமையாக மாறியிருப்பதை நாம் மறக்க முடியாது. எனவே, முற்போக்காகச் சிந்திக்கின்றவர்கள் அல்லது தூரதிருஷ்டியாகச் சிந்தித்து நாட்டினை வளப் படுத்தவேண்டுமென்று நினைக்கின்றவர்கள், நாட்டினை அபிவிருத்திப் பாதையில் கொண்டுசெல்லவேண்டுமென்று நினனைக்கின்றவர்கள் மது வரியில் தங்கியிருக்கின்ற தந்திரோபாயமான அந்தச் சூத்திரத்தைக் கைவிடவேண்டு மென்பதுதான் என்னுடைய கருத்தாகும்.

இந்த இடத்தில் நான் சுட்டிக்காட்ட வேண்டிய இன்னொரு விடயமும் இருக்கின்றது. ஒரு மாவட்டத்தில் மது விற்பனை அதிகரிக்க, அதிகரிக்க அந்த மாவட்டத்தில் வறுமை நிலையும் அதிகரிக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்தில் வறுமைநிலை அதிகரித்துக்கொண்டு செல்கின்றதென்றால், அதற்கு நேர் கணியமான திசையில் - நேர்விகித சமமாக அங்கு மதுச்சாலை களும் அதிகரித்துக்கொண்டு செல்வதைக் காணலாம். ஆகவே, முதலில் வறுமையைத் தணிக்க வேண்டுமாக இருந்தால் அல்லது மக்களின் வாழ்க்கையில் மறுமலர்ச்சியை, எழுச்சியை, சுபிட்சத்தினை ஏற்படுத்த வேண்டுமாக இருந்தால், மாவட் டங்கள்தோறும் மதுச்சாலைகளை விஸ்தரித்துக்கொண்டு செல்கின்ற அந்தத் தந்திரோபாயமான நடைமுறைகளை நிச்சயமாக கைவிட்டாக வேண்டும். இல்லாவிட்டால், நாங்கள் எதைச் செய்தாலும் ஒரு குறிப்பிட்ட எண்ணிக்கையிலான முதலாளித்துவ வர்க்கத்தினர் உயர்ந்துகொண்டு செல்ல, அவர்களில் தங்கி வாழுகின்ற அல்லது உழைத்து வாழுகின்ற, எண்ணிக்கையில் அதிகமான தொழிலாளர் வர்க்கத்தினர் ஏழ்மை நிலையில் - வறுமை நிலையில் வாடுகின்ற மிகவும் துரதிருஷ்டமான ஒரு நிலைமையினைத்தான் எங்களால் பார்க்கக்கூடியதாக இருக்கும்.

மாவட்டங்கள்தோறும் மதுச்சாலைகளை அதிகரிப்பதன் மூலம் இளைஞர் - யுவதிகள் முதலில் மதுவுக்குப் பழக்கப் படுகின்றனர். இன்று பெண்கள்கூட மது அருந்துமளவுக்கு எமது கலாசார கட்டுமானங்கள் சீர்குலைந்துபோயிருக்கின்ற ஒரு நிலைமையைப் பார்க்கின்றோம். ஆசிய நாடுகளிலே இலங்கையைப் பொறுத்தமட்டில் இலங்கை மக்களுக்கென்று தனித்துவமான, கட்டுக்கோப்பான ஒரு கலாசாரம் இருக்கின்றது. அந்தக் கலாசாரம் காற்றில் பறப்பதற்கும் கட்டுக்கோப்பான வாழ்க்கைக்கோலம் கலைந்துவிடுவதற்கும் இந்த மதுப்பாவனைதான் முக்கியமான காரணமாக அமைந்திருக்கிறது. மதுபான வரிகளை அதிகரித்து அதன்மூலமாக வருவாயினை ஈட்டிக்கொள்ளலாம் என்ற நப்பாசையினை அல்லது எதிர்கால இளைஞர்களை சூனியப் பாதையை நோக்கிக் கொண்டுசெல்கின்ற நிலைமையினைத் தவிர்த்துக்கொள்ள வேண்டுமென்று நான் இந்த நல்லாட்சி அரசாங்கத்தை விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

இன்று பாடசாலைச் சிறார்களின், பல்கலைக்கழக மாணவர்களின் களியாட்டத்துக்கு உதவுகின்ற ஒரு பொருளாக மதுசாரம் மாறியிருக்கின்றது. மிகவும் குறுகிய தூரத்துக்குச் சென்று, கஷ்டப்படாமல் பெற்றுக்கொள்ளக்கூடிய ஒரு திராவகமாக இது மாறியிருக்கின்றது. இவ்வாறு மதுச்சாலை களைத் திறந்துவிடுவது இன்றைய இளைஞர் - யுவதிகளை நாட்டுக்கு உதவாதவர்களாகவும் சுமையானவர்களாகவுமே மாற்றிவிடும். மதுபான வரிகளை அதிகரித்து குறுகிய காலவட்டத்தில் வருவாயினை ஈட்டிக்கொள்ளலாமேயொழிய, அதன் நீண்டகால விளைவு - outcome - எதிர்க்கணிய மாகத்தான் அமைய முடியும். அதற்காகத்தான் நான் அந்த உதாரணத்தைச் சொன்னேன். அதாவது, ஆண்டுதோறும் மதுவின்மூலமாகக் கிடைக்கும் வருவாய் 104 பில்லியன் ரூபாயாக இருந்தால், மதுவினால் ஏற்படக்கூடிய நோய்களைக் குணப்படுத்துவதற்கு 140 பில்லியன் ரூபாயினைச் செலவழிக்க வேண்டியிருக்கின்றது. ஆகவே, 36 பில்லியன் ரூபாயினை மதுவின் மூலமாக மறைகணியமான வருவாயாக ஈட்டிக் கொள்கின்றோம் என்ற உண்மையினை நாங்கள் உணர்ந்து கொள்ளவேண்டும். மேலோட்டமான சிந்தனைகள், நுனிப்புல் மேய்கின்ற போக்குகள் மூலமாக நாட்டில் நிலையான அபிவிருத்தியை ஏற்படுத்திக்கொள்ள முடியாது. நிலையான அபிவிருத்திக்கு மதுசாரம் பக்கபலமாக இருக்க முடியா தென்பதற்கான போதியளவு விளக்கத்தினைக் குற்றச் செயல் களிலிருந்தும் குற்றவாளிகளாக மாற்றப்பட்டவர்களிலிருந்தும் நாட்டில் சீரழிந்துபோகின்ற ஒரு சமூகத்திலிருந்தும் பெற்றுக்கொள்ளக்கூடியதாக இருக்கும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have one more minute.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
Okay, Sir.

இதனை மறந்து மென்மேலும் தவறுகளை-தப்புகளை விடுகின்றபோது, இதன்மூலமான வருமானம் என்பது நாட்டின் பொருளாதாரத்தில் ஒரு கானல் நீராக இருக்குமே ஒழிய,

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

නාට්ඩින් අපිවිරුත්දි නෝක්කිය නෙටුන්තූරමාන පයණත්තුක්කු අල්ලතු තොලෛනෝක්කුප් පාර්වෛයිල් එතිර්කාලත්තෛක් කට්ටියෙළුප්ප උතව මුටියාතු එන්ර සෙය්තියෛයුම් අරසුක්කු වරුමානම්-වරුවාය් වේණ්ටුම් එන්පතර්කාක ඉන්ත මතුසාරම් එන්ර කරුවියින් මූලමාකක් කිටෛක්කින්ර අන්ත වරුවායිනෛ නාංකළ් ඔරු පොරුළාකවෝ, ඔරු පණ අලකාකවෝ එටුත්තුක් කොළ්ළක්කූටාතු එන්ර සෙය්තියෛයුම් ඉංකු නාන් තෙරිවිත්තුක්කොල්කිරේන්. ඉන්තක් කරුත්තුක්කළ් සිල වේලෛකළිල් කසප්පාක ඉරුන්තාලුම් අවර්රිල් උණ්මෛ ඉරුක්කින්රතු එන්පතෛත් තෙරිවිත්තුක්කොල්වතෝටු, එතිර්කාලච් සන්ත්තියෛ වළමාකවුම් පලමාකවුම් ඔළුක්කසීලර් කළාකවුම් ආට්රල්මික්ක නල්ලතොරු සමූකමාකවුම් වළර්ත්තෙටුප්පතර්කු මතුසාරත්තින්මීතාන පෙරුක්කත්තෛක් කට්ටුප්පටුත්තුංකළ්! අතනෛක් කුරෛයුංකළ්! මාට්රු වළිකළින්මූලමාක නාට්ඩින් වරුවායිනෛ ඈට්ටික්කොළ්වතර්කුම් මනිත වළත්තෛ වලුප්පටුත්තික්කොළ්වතර්කුම් අතනෛ උච්චප්පටුත්තික් කොළ්ව තර්කුම් මුනෛයුංකළ්! එන්රු කූරි, විටෛපෙරුකින්රේන් නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Daya Gamage. You have ten minutes. Before that, will an Hon. Member propose the Hon. Shehan Semasinghe to the Chair?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)

Sir, I propose that the Hon. Shehan Semasinghe do now take the Chair.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(මාණ්පුමිකු හෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)

විසින් ස්ථිර කරන ලදී.
ආමෝතිත්තාර්.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

අනතුරුව ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.

අතන් පිරකු, මාණ්පුමිකු පිමල් රත්නායක්ක අවර්කළ් අක්කිරාසනත්තිලින්රු අකලවේ, මාණ්පුමිකු සෙහාන් සේමසිංහ අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. BIMAL RATHNAYAKE left the Chair, and THE HON. SHEHAN SEMASINGHE took the Chair.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කථා කරන්න.

[අ.භා. 4.07]

ගරු දයා ගමගේ මහතා (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)
(මාණ්පුමිකු තයා කමකේ - ආරම්පක් කෛත්තොළිල් අමෛච්චර්)
(The Hon. Daya Gamage - Minister of Primary Industries)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ඉදිරිපත් කරන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන්, රේගු ආඥා පනත යටතේ යෝජනාව සහ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්නයි අපි සූදානම් වන්නේ. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු සම්ප්‍රදායයක් හැටියට මාස හයකට වතාවක් අපි මේවා පාර්ලිමේන්තුවට ගෙනැල්ලා අනුමත කර ගන්න ඕනෑ. විශේෂයෙන්ම මේ මහින් අපි අර්තාපල්වලට රුපියල් විස්සක් සහ ලොකු ලූනුවලට -බොම්බයි ලූනුවලට- රුපියල් විස්සක් වශයෙන් බදු වැඩි කර තිබෙනවා. ඒ වාගේම එළවලු තෙල්වල බද්දත් රුපියල් විස්සකින් වැඩි කර තිබෙනවා. අපි එසේ කර තිබෙන්නේ විශේෂයෙන්ම අපේ දේශීය වගාකරුවන් ආරක්ෂා කර ගැනීමටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කොයි තරම් ආහාර ප්‍රමාණයක් අපේ රටට ආනයනය කරනවාද කියා ඔබතුමාත් දන්නවා. අපි රුපියල් බිලියන 300ක පමණ ආහාර ද්‍රව්‍ය ආනයනය කරනවා. ඒ නිසා තමයි විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා අපේ රටේ ආහාර නිෂ්පාදනය කිරීමට අවුරුදු තුනක වැඩසටහනක් ක්‍රියාත්මක කළේ. ඒ තුළින් එතුමා බලාපොරොත්තු වෙන්නේ අඩු වශයෙන් රුපියල් බිලියන 200කින්වත් ආනයන වියදම අඩු කර ගන්නයි. 2014 අවුරුද්දේ සීනි, කිරි පිටි, හාල්, ටින් මාළු, කරවල, තිරිඟු පිටි, අල, ලූනු, එළවලු කියන මෙන්න මේ භාණ්ඩ ටික ගෙන්වන්න විතරක් ඩොලර් මිලියන 1,464ක විදේශ විනිමයක් වියදම් කර තිබෙනවා. 2015 අවුරුද්දේ අපි ඩොලර් මිලියන 1,314ක් වියදම් කර තිබෙනවා. ඒ අනුව 2014 අවුරුද්දට සාපේක්ෂව 2015 අවුරුද්දේ අපට ඩොලර් මිලියන 150ක විදේශ විනිමය ප්‍රමාණයක් ඉතුරු කරන්න පුළුවන් වීම ගැන මම සතුටු වෙනවා. අපේ රට තුළ සිදු කරන නිෂ්පාදනයේ යම් කිසි ප්‍රගතියක් ඇති වී තිබෙනවාය කියන එක අපට ඒකෙන්ම පැහැදිලිව ඔප්පු කරන්න පුළුවන්. ඒ වාගේම රාජපක්ෂ ආණ්ඩුව අපට ඉතුරු කර ගියපු දායාදය තමයි, කෝටි නවලක්ෂයක ණය. මේ ණය කරපිට තබා ගෙන සිටියත්, උද්ධමනයේ සාමාන්‍ය අගය සියයට 3.1කට පවත්වා ගෙන යන්න අද අපට පුළුවන් වෙලා තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, "ඡන්දය කාලයේදී බදු අඩු වෙනවා; ඡන්දය නැති කාලයට බදු වැඩි වෙනවා" කියා. මම හිතන හැටියට එතුමා ප්‍රකාශ කළේ, රාජපක්ෂ ආණ්ඩුව කාලයේ තිබුණු ප්‍රතිපත්ති ගැනයි. මොකද, පසු ගිය කාලයේ අවුරුද්දෙන් අවුරුද්ද, කැලි කැලිවලට කඩා පළාත් සභා ඡන්ද තිබුණු ආකාරය අප දැක්කා. එදා මේ හැම ඡන්දයකදීම බැසිල් රාජපක්ෂ මැතිතුමා අපේ ප්‍රදේශවලට ඇවිල්ලා නත්තල් පප්පා තෑගි බෙදනවා වාගේ ඇට පැකට් බෙදලා ඡන්දය ගන්න මිනිසුන්ව රැවැට්ටුවා. නොයෙක් භාණ්ඩ මලු දුන්නා. නොයෙකුත් දේවල් දීලා මිනිසුන්ගේ ඡන්දය ගත්තා. නමුත්, අපට එහෙම කරන්න අවශ්‍යතාවක් නැහැ. එතුමන්ලා ඒ කළේ බොරුවක්, රැවටීමක් බව අපේ රටේ ජීවත් වෙන මිනිස්සු විශ්වාස කරපු නිසා තමයි, එදා රාජපක්ෂ ආණ්ඩුව පලවා හැරලා මිනිස්සු අපට බලය දුන්නේ. නැවතී තිබුණු සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න මේ වන විට අපි කටයුතු පටන් ගෙන තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කිව්වා, "කෘෂිකර්ම අධි කලාප 23ක්, ධීවර අධි කලාප 10ක්, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණා" කියලා. ඔව්, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඒවා සඳහන් කරලා තිබුණා. ඇත්තටම ඒ

subject එක බාර වෙලා තිබෙන්නේ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයටයි. අපි ඒ කෘෂිකර්ම අධි කලාප 23න් කෘෂිකර්ම අධි කලාප 7ක් මේ අවුරුද්දේ පටන් ගන්නවා. අම්පාර, කුරුණෑගල, ගාල්ල, මාතලේ ආදී වශයෙන් කෘෂිකර්ම අධි කලාප 7ක වැඩ කටයුතු මේ අවුරුද්දේම පටන් ගන්නවා. කෘෂිකර්ම අධි කලාප 7ක වැඩ කටයුතු පටන් ගත්තාම, අපේ රටට අවශ්‍ය කරන නිෂ්පාදන අපි හදන්න ඕනෑ. කවුරු හෝ ආයෝජකයෙක් ඇවිල්ලා කිව්වොත්, "කෘෂිකර්ම අධි කලාපයේ අගය දාමය වැඩි කරලා මොනවා හෝ දෙයක් නිෂ්පාදනය කරන්න" කියලා, ඔහුට අවශ්‍ය කරන අමු ද්‍රව්‍ය අපේ රටේ තිබෙන්න ඕනෑ.

අපේ රටට අවශ්‍ය කරන පලතුරු අපි තවමත් නිෂ්පාදනය කරන්නේ නැහැ. අපේ රටට අවශ්‍ය කරන එළවලුවලට වඩා, අපනයනය කරන්න අවශ්‍ය කරන එළවලු වෙනම අපි නිෂ්පාදනය කරන්න ඕනෑ. ඒ හරහා ඒවායේ ප්‍රමිතියත් හදන්න ඕනෑ. අද වන විට අපි නිෂ්පාදනය කරන එළවලු හා පලතුරුවලින් සියයට 40ක් විතර විනාශ වෙලා යනවා. එහෙම වෙන්නේ ඒවා ගබඩා කරන්න, ප්‍රවාහනය කරන්න අවශ්‍ය තාක්ෂණය නිවැරදි ආකාරයෙන් අපට නැති නිසායි. අපි ඒ තාක්ෂණය පිළිබඳවත්, අගය දාමය වැඩි කිරීමේ ක්‍රම පිළිබඳවත් අපේ නිෂ්පාදනකරුවන්ට, ගොවි ජනතාවට, වගාකරුවන්ට අපි කියලා දෙන්න ඕනෑ.

පසු ගිය අවුරුදු 10ක් තිස්සේ එක දිගට කරගෙන ගිය වැරදි ක්‍රියාදාමය අවුරුද්දකින් වෙනස් කරන්න අපට පුළුවන්කමක් නැහැ. නමුත් අපට පුළුවන් වෙලා තිබෙනවා, ඒක වෙනස් කිරීමට අවශ්‍ය නිවැරදි සැලැස්මක් සකස් කරන්න. අද වන විට මගේ අමාත්‍යාංශය කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විශාල ප්‍රගතියක් කරා ගමන් කරමින් තිබෙනවා. අපේ නිෂ්පාදන අපනයනය කරන්න පුළුවන් ආකාරයට සැලසුම් සකස් කරලා, ඒ වගාව ව්‍යාප්ත කරමින් යනවා. අපට අවශ්‍ය කරන පැළ සංඛ්‍යාව ගන්න අපි තවාන් 3,000ක් ඇති කරන්න දැනටමත් වැඩ පටන් අරගෙනයි තිබෙන්නේ. මේ වාගේ විශාල වැඩසටහනක් කරලා අපි බලාපොරොත්තු වෙනවා,- [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කියන්නට ඕනෑ, අපේ රටේ පොල් ගස් මිලියන 45ත් - 50ත් අතර ප්‍රමාණයක් තිබෙන බව. පොල් ගසක ගම්මිරිස් වැල් දෙකක් අපි වැව්වොත්, පොල්වලින් ගන්න ආදායමට සමාන ආදායමක් ගම්මිරිස්වලින් ගන්න අපට පුළුවන් වෙනවා. "කප්රුකට ගම්මිරිස්" කියන තේමාව යටතේ දැනටමත් අපි ඒ වැඩසටහන ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වාගේම "ධන සවිය" කියන වැඩසටහන තුළින් අපේ රටේ කාන්තාවන් දස ලක්ෂයක් වගාවට නැඹුරු කරන්න මම බලාපොරොත්තු වෙනවා. මේ වැඩසටහන තුළින් මම බලාපොරොත්තු වෙනවා, වගාවට එකතු කරන භූමි ප්‍රමාණය තවත් අක්කර 60,000කින් පමණ වැඩි කරන්න. ඒ තුළින් අපේ GDP එකට සියයට දෙකක් එකතු කරන්න අපට පුළුවන් වෙනවා. [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, "රුපියලේ අගය වැඩිවීම තුළින් රුපියල් බිලියන 3,500ක් රටට අහිමි වෙලා තිබෙනවා" කියලා. මට තේරෙන්නේ නැහැ, එතුමා මොන ගණන් ක්‍රමයක් අනුව එහෙම කිව්වාද කියලා. එතුමාත් හිටපු රාජපක්ෂ ආණ්ඩුව එදා ඩොලර්වලින් ණය අර ගෙන, ඩොලර් stock market එකට දමලා, ඩොලර් එකට රුපියල් 110ක් තැබීමේ ප්‍රතිඵලයක් හැටියට, අපේ දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 36ක්ව තිබුණු අපේ අපනයන ආදායම සියයට 14ක් දක්වා කඩා ගෙන වැටිලා අපව විනාශ කරලාම දැම්මා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කථාව අවසන් කරන්න.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

එදා එතුමාට ඒ ගැන කථා කරන්න තිබුණා. එතුමාට දැනුම තිබෙනවා. රාජපක්ෂ ආණ්ඩුව වැරදි තීරණ ගන්න කොට කථා කරලා ඒවා නිවැරදි කරන්න එතුමාට තිබුණා. එහෙම නිවැරදි නොකරපු හේතුව නිසා තමයි අද මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ. ඒ නිසා මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, ජනතාවගෙන් අය කරන බදු මුදල් කාගේවත් සාක්කුවට දමාගන්න අපි බලාපොරොත්තු නොවන බව. අපි අය කරන බදු මුදල් මේ රටේ සංවර්ධනය වෙනුවෙන් යොදවනවා. ඒ වාගේම මේ රජයෙන් වැඩි කළ වැටුප් ගෙවීම සඳහාත් අපට මේ අවුරුද්දේ රුපියල් බිලියන 140ක් අවශ්‍ය කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.17]

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ ගෙන එන නියම පිළිබඳව පැවැත්වෙන මේ විවාදයේදී මේ සභාව අමතා කථා කිරීමට අවස්ථාව ලැබීම සතුටක් බව මම සඳහන් කරන්න කැමැතියි.

මේ රජයේ ආර්ථික කටයුතු පිළිබඳව සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳව සිදු වන මේ විවාදයේදී මට කලින් කථා කළ ගරු දයා ගමගේ ඇමතිතුමා වරින් වර සඳහන් කළා, රාජපක්ෂවරු ණය ගත්තාය කියන කාරණය. ගරු ඇමතිතුමනි, 2014 වර්ෂය අවසන් වන විට රටේ සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 7,300යි කියලා තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පත් වුණාට පසුව නිකුත් කළ මහ බැංකු වාර්තාවේ සඳහන් වෙනවා. තමුන්නාන්සේලා අවුරුද්දක් ආණ්ඩු කරලා, 2015 වර්ෂය අවසන් වන විට ඒක රුපියල් බිලියන 8,400 දක්වා වැඩි වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ යහ පාලන ආණ්ඩුව මගින් වර්ෂයක කාලයක් ඇතුළත රුපියල් බිලියන 1,100ක ණය ප්‍රමාණයක් අර ගෙන තිබෙනවා. ණය ගත්තාට කමක් නැහැ. නමුත් තමුන්නාන්සේලා භූමියේ කරපු කරුණු කාරණා කවරක්ද, ප්‍රාග්ධනය වශයෙන් තමුන්නාන්සේලා වියදම් කරපු මුදල කොපමණද කියන බොහොම පැහැදිලි ගැටලුව අපි ඉදිරිපිට තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලාගේ ආර්ථික කළමනාකරණය පිළිබඳව බොහොම පැහැදිලි ගැටලුවක් මතු වෙලා තිබෙනවාය කියන කාරණය මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

මේ ආණ්ඩුව පටන් ගත්ත කාලයේ සිටම ණය ගැන කථා කරනවා වාගේම, ආණ්ඩුව විවේචනය කරන්නත් අපි කටයුතු

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

කළේ නැහැ. යම් කිසි සාධාරණ කාලයක් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට අවශ්‍යයි. තමුන්නාන්සේලාගේ මහ බැංකු වාර්තාවේ තිබෙන හොඳ කරුණක් පිළිබඳව මම සඳහන් කරනවා. ඒ තමයි, 2016 වර්ෂයේ පළමුවන කාර්තුවේදී 2015 වර්ෂයට සාපේක්ෂව කර්මාන්ත අංශයේ සහ සේවා අංශයේ යම් කිසි ප්‍රවර්ධනයක් තිබෙනවාය කියන එක. මොකද, 2015 වර්ෂයේදී ආර්ථික වශයෙන් මේ රටේ ඉතාම දුර්වල පින්තූරයක් මැවිලා තිබුණා. නමුත් 2016 වර්ෂයේ පළමුවන කාර්තුවේදී සංචාරක ක්ෂේත්‍රය සහ මූල්‍ය ක්ෂේත්‍රය ඇතුළු සේවා ක්ෂේත්‍රවල සුළු ඉදිරි ගමනක් දකින්නට තිබෙන බව මහ බැංකු වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. ඒක හොඳයි. අපි මොන පක්ෂයේ සිටියත්, -ආණ්ඩුවේ හිටියත්, විරුද්ධ පක්ෂයේ හිටියත්- හොඳ දෙය අපි අගය කරනවා. කර්මාන්ත අංශයේ සහ ඉදිකිරීම් අංශයේ සුළු ඉදිරි ගමනක් තිබෙන බව මහ බැංකු වාර්තාව සඳහන් කරනවා. නමුත් කර්මාන්ත අංශයේ හෝ සේවා අංශයේ තිබුණු ඒ සුළු ඉදිරි ගමන මේ රටේ ආර්ථිකයේ සමස්ත කඩා වැටීම කෙරෙහි ඇති කරන බලපෑමට ප්‍රමාණවත් උත්තේජනයක් සපයන්නේ නැහැයි කියන කාරණය බොහොම පැහැදිලිව මතක තබා ගන්නට අවශ්‍යයි.

ගරු දයා ගමගේ ඇමතිතුමා කෘෂි කර්මාන්තය පිළිබඳව සඳහන් කළා. එතුමා කිව්වා, තවාන් 3,000ක් දමන්න කටයුතු කරනවා කියලා. ඒක හොඳයි. නමුත් මේ රට සහලින්, -බතින්- ස්වයංපෝෂණය කරපු ගොවි ජනතාවට අද විඳින්න වෙලා තිබෙන දුක් ගැහැට පිළිබඳව තමුන්නාන්සේ දන්නේ නැතුව ඇති, ගරු ඇමතිතුමනි. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති ධුරය දරන ආණ්ඩුවකින් කෘෂි කර්මාන්තයට එවැනි මාරක ප්‍රහාරය එල්ල වෙයි කියලා අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ. මගේ තාත්තාගේ තාත්තා ගොවියෙක්; මගේ අම්මාගේ තාත්තා ගොවියෙක්. අපේ මුතුන්මිත්තෝ හරි ආඩම්බරයෙන් කිව්වා, "අපි ගොවියෝ" කියලා. නමුත් අද මොකක්ද, වෙලා තිබෙන්නේ?

පසු ගිය කාලයේ මේ රට සහලින් ස්වයංපෝෂණය වුණා. සහලින් ස්වයංපෝෂණය වුණු රටේ, අවාසනාවට, අද කෘෂිකර්ම ඇමතිතුමා කියනවා, දැන් මේ රටේ සහල් වැඩියි කියලා. හැබැයි තවමත් පිට රටින් සහල් ගෙන්වනවා. තිරිඟු පිටි මිල අඩු කරනවා. සහල් වැඩියි, හෙක්ටයාර ලක්ෂයක වී වගා කිරීම නවත්වන්න ඕනෑය කියලා කෘෂිකර්ම ඇමතිතුමා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොහොර සහනාධාරය නොලැබුණු ලක්ෂ සංඛ්‍යාත ගොවි මහත්වරු පිරිසක් ඉන්නවා. පොහොර මිල අධික ලෙස වැඩි වෙලා තිබෙනවා, හොණ්ඩරයක් රුපියල් 1,500 සිට රුපියල් 3,200 දක්වා. මේ වැඩි වීම නිසා පොහොර ගන්න බැරි වුණු විශාල පිරිසක් ඉන්නවා. භූමියේ සත්‍යය හෙක්ටයාර ලක්ෂයක් නොවෙයි. හෙක්ටයාර ලක්ෂ හතරක විතර කුඹුරු වගාව මේ කන්නයේ කෙරුණේ නැහැ. අද හාල් කිලෝ එකක් රුපියල් 60ට, 65ට ගන්නවා නම්, ලබන අවුරුද්දේ රුපියල් 85ට, 95ට අරගෙන කන්න ලංකාවේ ජනතාව ලැහැස්ති වෙන්න ඕනෑ. මේක තමයි එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික ප්‍රතිපත්තිය. එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික දැක්ම මොකක්ද? මේ රටේ කෘෂි කර්මාන්තය ලාභ නොලබන ව්‍යාපාරයක්ය කියන එකයි ඔවුන්ගේ ස්ථාවරය. කෘෂි කර්මාන්තයෙන් යැපෙන පිරිස පිළිබඳ හැඟීමක් නැහැ. "කෘෂි කර්මාන්තය ලාභ නොලබන තැනක තිබෙනවාය, එයට සහනාධාර දෙන්න වෙනවාය" කියන මතයේ ඉඳගෙන "පිට රටින් සහල් ගෙනැල්ලා මේ රටේ ජනතාවට කන්න දෙන තැනට පත් වුණොත් ආර්ථිකමය වශයෙන් ලාභයි" කියන ස්ථාවරය තමයි එක්සත් ජාතික පක්ෂයේ මතය. ඒ නිසා තමයි වී ගොවියා මේ තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ. අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා, අද වී ගොවියා මුහුණ දෙන අර්බුදයට සක්‍රියව මැදිහත් වෙන්න කියලා.

තේ වගාව පිළිබඳව තමුන්නාන්සේලා දන්නවා. තේ දළු කිලෝ එකක් රුපියල් 85ට, 90ට තිබුණා. අපි අතිශයෝක්තියෙන් නොවෙයි, කථා කරන්නේ. ගාල්ල දිස්ත්‍රික්කයේ ඉන්නවා, 80,000ක් විතර කුඩා තේ වතු හිමියන්. තේ දළු කිලෝ එකක මිල රුපියල් 85ට, 90ට ඉහළ ගියා. රුපියල් 92ට තේ දළු කිලෝ එකක් මිලදී ගත්තා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ආවාට පස්සේ ඒ මිල ක්‍රමානුකූලව පහත වැටුණා. තේ දළු කිලෝ එකක මිල රුපියල් 52ට වැටුණා. හැබැයි, දැන් තේ මිල නැවත වතාවක් රුපියල් 65ට - 70ට වැඩි වෙලා තිබෙනවා. මොකක්ද ඒකට හේතුව? තේ මිල නැවත වතාවක් සුළු වශයෙන් වැඩි වෙන්න හේතුව තමයි, නිෂ්පාදනය විශාල ලෙස අඩු වෙලා තිබීම. පොහොර ටික දා ගන්න විධියක් නැහැ, කප්පාදුව කරන්නේ නැහැ, නැවත වගාවක් නැහැ. මේ මිල ඉහළ යාම බොහොම තාවකාලික කාරණයක් පමණයි. අද නිෂ්පාදනය අඩු වෙලා තිබෙන නිසා -වෙළෙඳ පොළට එන තේ ප්‍රමාණය අඩු වෙලා තිබෙන නිසා- නැවත වතාවක් තේ කිලෝ එකක මිල රුපියල් 60ට, 70ට වැඩි වෙලා තිබෙනවා.

අපි කියනවා, මේ තේ වගාව ආරක්ෂා කර ගන්න කියලා. මොකද, තේ කර්මාන්තය කියන්නේ, දීර්ඝ කාලයක් තිස්සේ ලංකාවට ආදායමක් ගෙනාපු ව්‍යාපාරයක්. තේ ගොවියෝ කාටවත් අත පාන්නේ නැතුව ජීවත් වුණු පිරිසක්. තේ ගොවියෝ කවදාවත් දේශපාලකයෝ පස්සේ රස්සාවල් ඉල්ලාගෙන ගිය පිරිසක් නොවෙයි. තමන්ගේ තේ අක්කරය-දෙක, අක්කර කාල-භාගය නඩත්තු කරගෙන, තමන්ම ඒ ජීවිකාව කරගෙන රුපියල් විසිපන්දාහක්, තිස්දාහක්, හතළිස්දාහක්, පනස්දාහක් මාසයකට හොයාගත්තා. ඒ පිරිසට අද විශාල ප්‍රහාරයක් එල්ල වෙලා තිබෙනවාය කියන කාරණය බොහොම සත්‍යයක්.

අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා, ඔවුන්ව ආරක්ෂා කරන්න කියලා. මෙම සභා ගර්භයේ මේ අවස්ථාවේදී නැති වුණත් අපි වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙනුත් ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඔවුන්ට ස්ථාවර මිලක් ලබා දෙන්න කියලා. තමුන්නාන්සේලා පොරොන්දු වුණු, තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් වුණු, තේ කිලෝ එකකට ලබා දෙනවාය කියූ රුපියල් 75 හෝ 80 හෝ ඒ ස්ථාවර මිල ඔවුන්ට ලබා දෙන්න. ඒ මුදල බැරි නම් අඩුම ගණනේ තේ කිලෝ එකකට රුපියල් 70ක් බැගින්වත් අඛණ්ඩව ලබා දෙන්න කටයුතු කරන්න කියලා ඉල්ලනවා.

රබර් වගාව ගැන කථා කරන්න දෙයක් නැහැ. අද රබර් ගස් ටික, දරට ගන්නවත් පුළුවන්කමක් නැහැ. හැබැයි අපි සතුටු වෙනවා, කුරුඳුවල මිල යම් කිසි පමණකට ස්ථාවරව පැවතීම පිළිබඳව. ඒත් එක්කම ගම්මිරිස් වාගේ වගාවන් ප්‍රවර්ධනය කරන්න කටයුතු කිරීම යහපත් කාරණයක් ය කියන මතයේ අපි සිටිනවා. අපි බොහොම පැහැදිලිව තමුන්නාන්සේලාට කියනවා, " ඒ වගාවන් ප්‍රවර්ධනය කිරීම පුළුවන් තරම් උත්තේජනය කරන්න, පුළුවන් තරම් ඒකට ආධාර කරන්න" කියලා.

පසු ගිය කාලයේ අපි දැක්කා, "බදු ආදායම වැඩි වෙලා තිබෙනවා" කියලා මුදල් ඇමතිතුමා ප්‍රකාශ කරනවා. ආර්ථික කළමනාකරණය පිළිබඳව කථා කිරීමේදී ඒක හොඳ කාරණයක්. මේ රටේ බදු අය කිරීමේ ක්‍රමවේදයේ ගැටලුවක් තිබුණා නම්, සුළු පිරිසක් විතරක් නම් බදු ගෙව්වේ, බදු ගෙවන්න පුළුවන් තව පිරිසක් බදු ගෙවීම මහ හැරලා ඉන්නවා නම්, ඔවුන්ගෙන් බදු එකතු කර ගැනීම හොඳ කාරණයක්. හැබැයි, අපි ඒ කාරණය පිළිබඳව "හොඳයි" කියනවා වාගේම තමයි මේ සමස්ත ආර්ථිකය පිළිබඳ ගැටලුවේ ප්‍රමාණයත් ගැන කියන්න ඕනෑ. වැටි සම්බන්ධයෙන් ගෙනා එකතු කළ අගය මත බදු (සංශෝධන)

පනත් කෙටුම්පත මේ රටට ඉදිරිපත් වුණාම ඇමතිතුමාගේ තිබෙන දූරදර්ශිභාවය, කාර්යක්ෂමතාව, ආර්ථික කළමනාකරණයේ විශිෂ්ටත්වය අපි දැක්කා. එය බොහොම පැහැදිලිව ප්‍රකට වුණා. එතුමා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්නේ නැතුව, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැතුව ඒ පනත් කෙටුම්පත ගෙනැල්ලා සිදු වුණු අවුල පැහැදිලිව මේ රට දැක්කා.

අපි ස්තුතිවන්ත වෙනවා, මේ රටේ වෙළෙඳ ප්‍රජාවට. ඔවුන් මේ රටේ දේශපාලනඥයන්ට කලින්, සිවිල් සමාජයට කලින් නැඟී ඉඳලා මේ වැට එකෙහි තිබෙන අනතුර දැකලා ප්‍රකටව, ප්‍රබලව විරෝධය පළ කළා. ඔවුන් කියපු කරුණු බොහොම සරලයි. ඔවුන් කිව්වේ මොකක්ද? මේ සියයට 15ක බද්දක් ගහන කොට, පිරිවැටුම මාසයට ලක්ෂ 10 දක්වා අඩු කරලා දිනක පිරිවැටුම රුපියල් 33,000ක් වාගේ අඩු මුදලට ගෙනාවම, තමුන්ගේ ව්‍යාපාර කරගෙන යන්න බැහැ. මාසයකට ලක්ෂ 10ක පිරිවැටුමක් සහිත ව්‍යාපාරයකට සියයට 15ක බද්දක් ගැහුවාම ඒ ව්‍යාපාර කරගෙන යන්න බැහැ. ඒ ගැන තමයි ඔවුන්ගේ ඉල්ලීම වුණේ. ඊට අමතරව ඔවුන් කිව්වා, "නිෂ්පාදකයාගේ ඉඳලා, තොග වෙළෙන්දාගේ ඉඳලා, සිල්ලර වෙළෙන්දා දක්වා ස්ථාන තුනකදී හෝ හතරකදී භාණ්ඩයකට වැට් එක ගැහීම නවත්වලා නිෂ්පාදකයාට පමණක් මේ වැට් එක ගහන්න. එහෙම නැත්නම් ලංකාවට බඩු ගෙනෙන ආනයනකරුවන්ට පමණක් වැට් එක ගහන්න" කියලා. ඒ සරල ඉල්ලීම තමයි ඔවුන් කළේ. හැබැයි ඒ ඉල්ලීම් කරලා ඊට පස්සේ ඔවුන් පාරට බැහැලා තමුන්ගේ කඩ වහලා විරෝධය පළ කරන කොට ඒක මර්දනය කළේ කොහොමද? ඒ මර්දනය කරන්න භාවිත කළේ කුමක්ද? පළමුවැනි වතාවේ කැඳවලා කිව්වා, "විරෝධතා දක්වන්න එපා. අපි අපේ ක්‍රියාමාර්ග ගන්නවා" කියලා. මොකක්ද අරගත්තු ක්‍රියා මාර්ගය? දේශපාලන පක්ෂ භේදයක් නැතුව තමුන්ගේ දිස්ත්‍රික්කවල ඒ විරෝධය පළ කරපු මේ වෙළෙඳ ව්‍යාපාරිකයන්, කඩ හිමියන් මර්දනය කරන්න මොකක්ද පාවිච්චි කරපු ක්‍රමවේදය? මුදල් අමාත්‍යාංශය හරහා රේගුව එවලා මේ ව්‍යාපාර ඇතුළට ගිහිල්ලා සුළු වැරැදි හොයා ගෙන සීල් තබන්න කටයුතු කළා. ගාල්ලේ වෙළෙඳ ව්‍යාපාර සීල් තැබුවා, කොළඹ වෙළෙඳ ව්‍යාපාර සීල් තැබුවා, මහරගම වෙළෙඳ ව්‍යාපාර සීල් තැබුවා, අනුරාධපුරයේ වෙළෙඳ ව්‍යාපාර සීල් තැබුවා. ඒ ආකාරයෙන් වෙළෙඳ සැල් සීල් තියලා එම ව්‍යාපාරිකයන්ව බිය ගැන්වීමක් කළා. මේ තර්ජනයට ලක් වුණු ගාල්ලේ ව්‍යාපාරික මහත්වරු, VAT පනත ගෙනෙන්නට කලින් VAT ගෙවපු පුද්ගලයන් බව අපි දන්නවා. තමන්ගේ ව්‍යාපාර ඉදිරියට කරගෙන යාමට බැරි අපහසුතාව -තර්ජනය- දැකලා තමයි ඔවුන් ඒ විරෝධය පෑවේ. හැබැයි, ඔවුන්ව බිය ගැන්වීමක් කරලා, ඔවුන්ව පසුපසට කළා. මේ ක්‍රමවේදය හොඳ නැහැ. තමුන්නාන්සේලාගෙන් වුණු වැරැද්ද නිවැරදි කර ගන්න. ඒකට ව්‍යාපාරිකයන් පළි නැහැයි කියන කාරණය මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඉතිහාසයේ ඉතාම අඩු මුදලට තෙල් බැරලය තිබුණු අවස්ථාවේදී ආර්ථිකමය වශයෙන් එහි වාසිය තමුන්නාන්සේලා බොහොම පැහැදිලිව ලබා ගෙන තිබෙනවා. අපි, ඇමෙරිකානු ඩොලර් 120ට, 200ට ගත්ත තෙල් බැරලයක මිල අද ඩොලර් 28ට, 30ට බැහැලා තිබෙනවා. මේ රටේ වෙළෙඳ ප්‍රජාවට වාගේම සමස්ත ජනතාවට ඒ ආර්ථික වාසිය ලබා දෙන්න අවශ්‍ය පරිදි ආර්ථිකය මීට වඩා ශක්තිමත්ව කළමනාකරණය කර ගන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.27]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මුදල් ඇමතිතුමා විසින් විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් කිහිපයක් අනුමතිය සඳහා සභාවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේදී මෙම සභාව ඇමතීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සන්තෝෂ වනවා. අපේ රජයේ අරමුණ වන්නේ, ගොවියාගේ නිෂ්පාදන වෙළෙඳ පොළට පැමිණෙන අවස්ථාවේදී එම ගොවියා ආරක්ෂා කිරීමත්, ඒ නිෂ්පාදන පරිභෝජනය කරන පාරිභෝගිකයාට යම් සහනයක් සැලසීමත්ය. ඒ නිසා තමයි ගරු මුදල් ඇමතිතුමා විසින් ලූනු ගොවීන් අස්වැන්න නෙළන කාලයේදී පිටරටින් ලූනු ගෙන්වීම සඳහා වන බද්ද රුපියල් 20කින් වැඩි කර තිබෙන්නේ. අපේ රටේ ලූනු පරිභෝජනය මෙට්‍රික් ටොන් 152,000ක් වන අතර, අපේ රටේ ගොවීන් විසින් නිෂ්පාදනය කරන්නේ ලූනු මෙට්‍රික් ටොන් 89,000යි.

පසු ගිය වසරේ රුපියල් මිලියන 13,000ක -රුපියල් කෝටි 1300ක- මුදලක් ලූනු ගෙන්වීම සඳහා වියදම් කර තිබෙනවා. අපේ රටේ අල ගොවීන් අල අස්වැන්න නෙළන කාලය වන විට අල මෙට්‍රික් ටොන් 95,000ක පමණ අස්වැන්නක් එනවා. නමුත්, අපේ රටේ අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 127,000යි. එම නිසා පසු ගිය වසරේදී රුපියල් මිලියන 5,500ක අල අපට ගෙන්වන්න සිද්ධ වුණා. අල සඳහාත් ආනයන බද්ද රුපියල් 35 දක්වා රුපියල් 20කින් වැඩි කරලා තිබෙනවා. මෙසේ කරන්නේ අල ගොවියාගේ අස්වැන්න එන කාලයට එම ගොවියාව ආරක්ෂා කරන්නයි. මේක කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඇයි? මේ ගරු සභාවේදී විපක්ෂයේ මන්ත්‍රීවරුන් කථා කළා. ඔවුන් කථා කළේ මේ රට අවුරුදු 20ක් පාලනය කළේ කවුද කියලා හිතන්නේවත් නැතිවයි.

අපි 1977 කාලයේ රට පාලනය කරන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 24ක ආදායමක් තිබුණා. අපි රට භාර දෙන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20ක ආදායමක් තිබුණා. නමුත්, නැවතත් අපි මේ රට භාර ගන්නා විට ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10.5 දක්වා අඩු වෙලා තිබුණා. අපේ පාලන කාලයේදී කෘෂිකර්මයට දළ දේශීය නිෂ්පාදිතයේ ඇති දායකත්වය සියයට 20ට වඩා තිබුණා. නමුත්, කියන්න කනගාටුයි, අද වන විට එය සියයට 8 දක්වා අඩු වෙලා තිබෙනවා. එම නිසා ගොවියා ආරක්ෂා කරමින්, පාරිභෝගිකයා ආරක්ෂා කරමින් මේ රටේ ආදායම් වැඩි කිරීමේ වැඩ පිළිවෙළක් අපි ඇති කරන්න ඕනෑ. පසු ගිය අය වැයෙන් අපි ජනතාවට විශාල සහන ලබා දුන්නා. අපි රාජ්‍ය සේවකයන් 1,316,000කගේ වැටුප් රුපියල් 10,000කින් වැඩි කළා. අපි විශ්‍රාමිකයන්ගේ වැටුප් වැඩි කළා. සමෘද්ධි සහනාධාරය සියයට 200කින් වැඩි කළා. ගොවි ණය කපා හැරියා. විශේෂයෙන්ම එළවළු, පලතුරු ගොවීන් 58,000කගේ රුපියල් කෝටි 250ක ගොවි ණය කපා හැරියා. ඒ වාගේම ශිෂ්‍ය සහනාධාරය වැඩි කළා. වැඩිහිටි සහනාධාරය වැඩි කළා. ගර්භිණී මාතාවන්ට පෝෂණ මල්ලක් දෙන්න තීන්දු කළා. අපි පසු ගිය අය

[ගරු අශෝක් අබේසිංහ මහතා]

වැයෙන් මෙවැනි විශාල සහනාධාර තොගයක් දෙන්න තීන්දු කළා. ඒ වාගේම පසු ගිය අය වැයේ රුපියල් මිලියන දෙලක්ෂ පනස්දහස් තුන්සියයක වියදම් යෝජනා තිබුණා. මේ හේතුවෙන් අපේ රටේ වියදම් ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. පසු ගිය 2015 වර්ෂයේ පළමු මාස හතර තුළ රජයේ ආදායම තිබුණේ රුපියල් බිලියන 395යි. ඒ කියන්නේ රුපියල් කෝටි 39,500යි. එය සියයට 16. 9කින් වැඩි වෙලා, මේ වසරේ පළමුවැනි මාස 4 තුළ ආදායම රුපියල් බිලියන 473කින් -රුපියල් කෝටි 47,300කින්- වැඩි වෙලා තිබෙනවා. ආදායම වැඩි කර ගැනීම සඳහා අපට ක්‍රම දෙකයි කරන්නට තිබෙන්නේ. එකක්, අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීම. එය එක රැයකින් කරන්නට බැහැ. එසේ නම් අපට කරන්නට තිබෙන්නේ අපේ බදු ආදායම යම් කිසි ප්‍රමාණයකින් වැඩි කර ගැනීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ හිතවත් ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා VAT එක ගැන කිව්වා. 2006 වර්ෂයේ මේ VAT එක සියයට 20ක් තිබුණා. අපේ ආණ්ඩුවේ දින සියයේ වැඩ පිළිවෙළ ඇවිත් තමයි එය සියයට 11ට අඩු කළේ. ඒ සියයට 11ට තිබුණු එක තමයි නැවත සියයට 15ට වැඩි කළේ. VAT එක වැඩි කිරීමෙන් අප රුපියල් කෝටි 10,000ක ආදායමක් බලාපොරොත්තු වෙනවා. අපේ රටේ සුළු ව්‍යාපාර, සාමාන්‍ය ව්‍යාපාර ඇතුළුව වෙළඳ ව්‍යාපාර මිලියන 2.5කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. නමුත් අපේ රටේ ආදායම් බදු ගෙවන ලිපිගොනු කීයද තිබෙන්නේ? අපේ රටේ සමාගම් 4596යි ආදායම් බදු ගෙවන්නේ. පුද්ගලයන් 1,35,000යි ආදායම් බදු ගෙවන්නේ. උපයන විට බදු ගෙවන අය ඉන්නේ 4,26,000යි. VAT ලිපිගොනු තිබෙන්නේ 15,296යි. NBT ලිපිගොනු තිබෙන්නේ 21,700යි. Economic Service Charge - ESC - එක ගෙවන්නේ 4024යි. සමස්ත බදු ලිපිගොනු තිබෙන්නේ 6,90,045යි. මේ තත්ත්වය තුළ මිලියන 2.5කට - 25,00,000කට- වැඩි ව්‍යාපාරික ස්ථාන තිබෙද්දී මෙවැනි අඩු ලිපිගොනු තුළින් අප ආදායමක් ලබන්නේ කොහොමද? නමුත් විශේෂයෙන් අපේ ගරු මුදල් ඇමතිතුමා මේ රටේ ආදායම වැඩි කර ගන්න ගත් ක්‍රියාමාර්ග නිසා මෙවර ආදායම වැඩි වෙලා තිබෙනවා.

2015 වසරේ අපේ රටේ ආදායම තිබුණේ, රුපියල් කෝටි එක්ලක්ෂ හතළිස්පන්දහස් පන්සියයි. නමුත් වියදම රුපියල් කෝටි තුන් ලක්ෂයයි. රජයේ සේවකයන්ට පඩි ගෙවන්නට රුපියල් කෝටි 60,000ක් ඕනෑ. විශ්‍රාමික පන්ලක්ෂ හැත්තෑ දාහට විශ්‍රාම වැටුප් ගෙවන්න රුපියල් කෝටි 15,000ක් ඕනෑ. මෙවැනි තත්ත්වයක් තුළ මේ රට ඉදිරියට අරගෙන යන්නට නම් අප අනිවාර්යයෙන්ම නිෂ්පාදන ආර්ථිකයකට යන්නට ඕනෑ. චීන සමාගම්වලට හම්බන්තොට කර්මාන්ත ශාලා ආරම්භ කරන්න අක්කර 15,000ක් ඉල්ලා තිබෙනවා කියා අපේ අගමැතිතුමා කිව්වා. ඒ කර්මාන්තශාලා ආරම්භ කිරීම තුළින් අපේ රටේ ආදායම වැඩි කර ගන්න ඕනෑ. අපේ රටේ ආදායම වැඩි කර ගැනීම සුමානයකින් දෙකකින් කරන්නට බැහැ. මේ රජය පත් වෙලා පසු ගිය 17වෙනි දාට අවුරුද්දයි. අපේ ආණ්ඩුවට තව අවුරුදු හතරක කාලයක් තිබෙනවා. මේ කාලය තුළ අප විශාල වැඩ කොටසක් කරන්නට බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් පසු ගිය රජය කොළඹ වරාය නගරය - Port City එක - හදන්න පටන් ගත්තා. එහි තිබුණු දුර්වලතා, විශේෂයෙන් පරිසර අධ්‍යයනකින් තොරව කළ ඒවා, ඒ වාගේම අක්කර පණහක් සින්නක්කර දෙන්න තිබුණු නිසා අප ඒක නවත්වා චීනයට ඒ අක්කර පණහ සින්නක්කර නොදී විශේෂ වැඩ පිළිවෙළක් තුළින් සිංගප්පූරුව හා ඩුබායි අතර මූල්‍ය නගරයක් බවට එය පත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඊයේ අගමැතිතුමා පාර්ලිමේන්තුවේදී කිව්වා, චීනයේ මහජන බැංකුවේ දකුණු ආසියාවේ ශාඛාව එම මූල්‍ය නගරයේ ඉදි වෙනවා කියා. එතකොට චීනය විසින් අපේ රටට විශාල ආයෝජනයන් ගෙන එන්නට බලාපොරොත්තු වෙනවා. හැබැයි මේ සියල්ලම කරන්න අපේ රටේ ආදායම වැඩි කරන්න එක රැයෙන් කරන්න බැහැ. විශේෂයෙන් පසු ගිය රජය හම්බන්තොටට කර තිබෙන අතිවිශාල ආයෝජන නිසා මොකක්ද රටට වෙලා තිබෙන්නේ? කෝටි හැත්තෑ දාහක් හම්බන්තොටට ආයෝජනය කරලා තිබෙනවා. කිසිම ආදායමක් නැහැ. මත්තල ගුවන් තොටුපොළ අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන්නේ. අප මාසයකට රුපියල් කෝටි 20 ගණනේ අවුරුදු අටක් ණය ගෙවන්න ඕනෑ. අපට ලැබෙන ආදායම රුපියල් ලක්ෂ 30යි. මාසයකට වියදම රුපියල් ලක්ෂ 250යි. මත්තල ගුවන් තොටුපොළට රුපියල් කෝටි 5,000ක් වියදම් කර තිබෙනවා. හම්බන්තොට වරායට රුපියල් කෝටි 1, 44,100ක් - රුපියල් බිලියන 14,410ක්- වියදම් කර තිබෙනවා. කීයද ආදායම? ආදායමක් නැහැ. පසු ගිය වසරේ පාඩුව රුපියල් කෝටි 700යි. ආරම්භ කළ දවසේ සිට මේ දක්වා පාඩුව රුපියල් බිලියන 36,710යි -කෝටි 3671යි-. මේ තත්ත්වය තුළ කොහොමද රට ඉදිරියට යන්නේ? සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය හදන්න වරායට භාර දී තිබෙනවා. ඒ සඳහා වරාය අමාත්‍යාංශයට ගෙවන්න තිබෙනවා, රුපියල් මිලියන 5027ක්. -කෝටි 502ක්- ගෙවන්න තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
එවැනි තත්ත්වයක් තුළ විශාල ආයෝජන කරමින් ඒ ආයෝජනවලින් රටට ප්‍රතිඵල නොලැබෙන අවස්ථාවක අපට සිද්ධ වෙලා තිබෙනවා, මේ රටේ ආදායම වැඩි කිරීම සඳහා විශාල වැඩ කොටසක් කරන්න. ඒ සඳහා තමයි මේ ව්‍යාපෘති දැන් ආරම්භ කරමින් යන්නේ. අපේ වරාය මූල්‍ය නගරය ආරම්භ වුණාට පස්සේ මේ රටේ විශාල පිබිදීමක් ඇති වේවි. හැබැයි අපි එය කරන්නේ අපේ රට උගසට තියා නෙවෙයි. ෂැංග්‍රිලා හෝටලය හදද්දි කොළඹ, ගාලු මුවදොර අක්කර 7ක් සින්නක්කර දීලා තිබෙනවා. කවුරුවත් මේ ගැන කථා කරන්නේ නැහැ. ෂැංග්‍රි-ලා හෝටලයට අක්කර හතක් සින්නක්කරව ලියා දීලා තිබෙනවා. පසු ගිය කාලයේ යුද හමුදා මූලස්ථානයට අයිතිව තිබුණු අක්කර හතක ඒ භූමි ප්‍රමාණය දැන් අයිති චීනයට. නමුත් අපි අපේ රටට ආදරෙයි. ඒ නිසා තමයි අපේ රටේ එක බිම් අඟලක්වත් පිට රටියන්ට සින්නක්කරව ලියා නොදී, මේ වරාය මූල්‍ය නගරය ඉදිකිරීමේදී ඒ වෙනස කළේ.

අපි අද මේ නියම ඉදිරිපත් කරන්නේත් ගොවීන්ගේ නිෂ්පාදන වෙළෙඳ පොළට එන අවස්ථාවේදී ඔවුන් ආරක්ෂා කරන්නයි; අපේ කෘෂි කර්මාන්තය ඉහළ නංවන්නයි. මම මුලින් කිව්වා වාගේ අද වනකොට දළ දේශීය නිෂ්පාදනයෙන් කෘෂිකර්මයට තිබෙන දායකත්වය සියයට අට දක්වා අඩුවෙලා තිබෙනවා. අපි මේ ප්‍රමාණය වැඩි කරන්න ඕනෑ. අපි මේ රට බාර ගනිද්දී බදු අනුපාතය තිබුණේ සියයට 86:14ක් වශයෙන්. වක්‍ර බද්ද සියයට 86යි; සෘජු බද්ද සියයට 14යි. නමුත් අපේ මූල්‍ය කළමනාකරණය නිසා දැන් වක්‍ර බද්ද සියයට 80යි. සෘජු බද්ද සියයට 20යි. සෘජු බද්ද සියයට 20 දක්වා වැඩිවෙලා තිබෙනවා. මේ වසර පහ තුළ මේ සෘජු බද්ද අඩු තරමින් සියයට 25 දක්වාවත් වැඩි කරන්න අපි බලාපොරොත්තු වනවා. ලෝකයේ රටවල බදු අනුපාතය

තිබෙන්නේ සියයට 60 : 40 වශයෙන්. වක්‍ර බද්ද සියයට 60 දක්වා අඩු කරලා, සෘජු බද්ද සියයට 40 දක්වා වැඩි කරලා, මේ රටේ ආදායම වැඩි කරගෙන, මේ රට ඉදිරියට ගෙනයෑමේ වැඩ පිළිවෙළට මූලික දායකත්වය සැපයීම තමයි අපේ යුතුකම. විශේෂයෙන්ම මේ වසර පහ තුළ අපි ඒ යුතුකම ඉෂ්ට කරන බව මා ප්‍රකාශ කරනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

ඊට පෙර මූලාසනය සඳහා ගරු මුජිබුර් රහුමාන් මහතාගේ නම යෝජනා කරන්න.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)
"ගරු මුජිබුර් රහුමාන් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

අනතුරුව ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SHEHAN SEMASINGHE *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

[අ.භා. 4.38]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2007 වර්ෂයේ අය වැය යෝජනාවක් ලෙස විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත හඳුන්වා දෙනු ලැබුවා. ඇත්තටම මේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත හඳුන්වා දුන්නේ බදු අය කරගෙන රජයේ ආදායම වැඩි කර ගැනීමේ පරමාර්ථයෙන් නොවෙයි. මේ රටේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලට තමයි මේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පැනවුණේ. ලෝක වෙළෙඳ පොළේ මිල වෙනස් වනකොට මේ අත්‍යවශ්‍ය භාණ්ඩවලත් මිල වෙනස් වෙනවා. එතකොට ජීවන වියදමට විශාල ලෙස බලපෑම් ඇති වෙනවා. විදේශ වෙළෙඳ පොළින් පැමිණෙන අත්‍යවශ්‍ය භාණ්ඩවලට යම් බදු මුදලක් නියම කරලා, රටේ ඉන්න ජනතාවගේ ජීවන වියදම ස්ථාවරව පවත්වා ගැනීම තමයි මේ බද්ද පැනවීමේ එක් අරමුණක් වුණේ. මේ බද්ද සරල බද්දක්. අනෙක් සියලු බදු අයින් කරලා, ලේසියෙන් හා පහසුවෙන් පාලනය කරන්න හැකි බද්දක් වශයෙන් තමයි මේ බද්ද තිබුණේ. කොටින්ම කියනවා නම්, shock absorber එකක් වාගේ තමයි මේ බද්ද තිබුණේ. ලෝක වෙළෙඳ පොළේ මොනවා වුණත්, රටට නොදැනෙන විධියට මිල පාලනය කිරීම තමයි මෙහි එක අරමුණක් වුණේ.

අනික් කාරණය මෙයයි. ගොවියා අස්වැන්න නෙළන කාලයට, අල, ලූනු, මිරිස් වාගේ දේවල් සුලබ වනවා. ලෝකයේ ඉන්න ව්‍යාපාරිකයන්ට පුළුවන් අපේ වගාව සම්පූර්ණයෙන්ම විනාශ කරන්න. මොකද, අපේ අස්වැන්න නෙළන කාලයට ලංකාවට අඩු මුදලට ඒ නිෂ්පාදන එව්වොත් අපේ කෘෂි කර්මාන්තය කඩාගෙන වැටෙනවා. දේශීය ගොවියා රැක ගන්න, දේශීය කෘෂි නිෂ්පාදන ස්ථාවරව තබා ගන්න, එම නිෂ්පාදන රැක ගන්න, ඒවායේ මිල රැක ගන්න තමයි මේ බද්ද හඳුන්වා දුන්නේ. ඇත්තටම මේ බද්ද වක්‍ර බද්දක් විධියට පැනවුණත්, අපේ ආදායම වැඩි කර ගැනීමේ අරමුණකින් නොවෙයි මේ බද්ද පනවන්න පටන් ගත්තේ කියන එක මම නැවතත් කියනවා.

අපේ ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා වාගේ මේ රටේ මුදල් උපයන්නන්ගෙන් වැඩි කෙනෙකු බදු ගෙවන්නේ නැහැ. ඒක කාලයක සිට තිබෙන ප්‍රශ්නයක්. බදු ආදායමින් සියයට 20ක් තමයි මුදල් උපයන ධනවත් අයට බදු වශයෙන් ගෙවන්න පුළුවන්වෙලා තිබෙන්නේ. බදු ආදායමින් සියයට 80ක්ම රැස් කර ගන්නේ මුදල් උපයන අයගෙන් නොවෙයි. pick-pocket ගහනවා වාගේ බලහත්කාරකමින් හෝ නොදැනුවත්කමින් හෝ ගන්න මුදල්වලින් තමයි ඒ ආදායම රැස් කර ගන්නේ. ඒ විධියට තමයි සියයට 80ක් වන වක්‍ර බදු හැදෙන්නේ. ව්‍යාපාරිකයන්ට ආදායම උපයන්න අවස්ථාව දීලා, ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් ලබා දෙන්න වර්තමාන රජය උත්සාහ කරනවා. හැබැයි, ඒ සඳහා ගෙවිය යුතු බද්ද සාධාරණව රජයට ගෙවිය යුතුයි කියන තැන රජය ඉන්නවා. ඒ තුළින් සාමාන්‍ය පාරිභෝගිකයාගෙන් -ජනතාවගෙන් - අය කරන වක්‍ර බද්ද අඩු කරන්න බලාපොරොත්තු වනවා. දැනට සියයට 20ක් හැටියට තිබෙන සෘජු බද්ද සියයට 40 දක්වා හෝ වැඩි කරලා, සියයට 80ක් හැටියට තිබෙන වක්‍ර බද්ද සියයට 60 දක්වා අඩු කරන්න රජය බලාපොරොත්තු වනවා.

පසු ගිය ආණ්ඩුව කාලයේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පාවිච්චි කළේ ආදායමක් රැස් කර ගැනීමේ බද්දක් වශයෙන් බව අපි දන්නවා. 2010 අවුරුද්ද දිහා බැලුවොත්, 2010 අවුරුද්දේ එකතු කර ගත්ත මුළු බදු ආදායමින් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද හැටියට තිබුණේ සියයට 1.4යි. හැබැයි, 2013 සහ 2014 - පසු ගිය ආණ්ඩුවේ අග කාලය - වනකොට මේ බද්ද සමස්ත බදු ආදායමින් සියයට 4.6ක් දක්වා වැඩි කර ගත්තා. ඒ අනුව, බදු ආදායම වැඩිකර ගැනීමට තමයි පසු ගිය රජය මේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පාවිච්චි කළේ.

දැන් ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කොහොම කිව්වත්, අද කථා කරපු මන්ත්‍රීවරු කොහොම කිව්වත් වර්තමාන ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ මේ බද්ද අඩු කළා. එහි යථාර්ථයට ගියා. මේ බද්ද තිබෙන්නේ රටේ සාමාන්‍ය ජනතාව රැකගන්න සහ ගොවි ජනතාව රැකගන්නයි. ජීවන වියදම යම් තරමකට පාලනය කිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් ලෙස තමයි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පනවා තිබෙන්නේ. අප බලයට ආ ගමන්ම අත්‍යවශ්‍ය බඩුවල මිල අඩු කළා. වර්තමාන රජය බලයට ඒමත් සමඟම විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතට හසු වන අත්‍යවශ්‍ය භාණ්ඩ බොහොමයක මිල අඩු කිරීම නිසාම, විශේෂ වෙළඳ භාණ්ඩ බදු මඟින් අය වන බදු ප්‍රමාණය සමස්ත බදු ආදායමෙන් සියයට 3.8 දක්වා අඩු වුණා. අපි මේ බද්ද රටේ ආදායම වැඩි කරගන්න, රට කරවන ආදායමක් ලෙස උපයෝගි කරගන්න බලාපොරොත්තු වුණේ නැහැ. නමුත් පසු ගිය කාලයේ කටයුතු කරපු හැටි අපි දන්නවා. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පැනවූයේ අල ගොවියාට, ලූනු ගොවියාට, උක් ගොවියාට ඔවුන්ගේ ගොවිතැන ආරක්ෂා කර දීමත්, ඒ අයගේ නිෂ්පාදන ආරක්ෂා කර දීමත්, ජනතාවගේ වියදම පහත හෙළීමත් අරමුණු කොටගෙන බව අපි දන්නවා. නමුත් මා

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

කලින් කිව්වා වාගේ, 2010දී විශේෂ වෙළඳ භාණ්ඩ බදු මඟින් එක්කාසු කරගත් මුළු බදු මුදල් ප්‍රමාණය රුපියල් කෝටි 10,173යි. 2014දී විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මඟින් අය කරගත් බදු මුදල් ප්‍රමාණය රුපියල් කෝටි 40,953යි. එහෙම නම් අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල සියයට 400කින් වැඩි කර තිබෙනවා, ඒ අවුරුදු තුනක හතරක කාලය තුළ.

එදා ඒ බඩුවල මිල සියයට 400කින් වැඩි කළා! හැබැයි ප්‍රශ්නය තමයි ඔය කියන වෙළෙන්දන් එදා එළියට බැස්සේ නැති එකයි. දැන් ටිකකට කලින් කිව්වා නේ, "මේ බදු නිසා පාරිභෝගිකයාට රිදෙනවා. ඒ නිසා වෙළෙන්දන් එළියට බැස්සා" කියලා. නමුත් එදා අත්‍යාවශ්‍ය බඩුවල මිල සියයට 400කින් ඉහළ දැම්මාම -බදු ආදායම සියයට 400කින් වැඩි වුණාම- කිසිම කෙනෙක් උද්ඝෝෂණය කරන්න ආවේ නැහැ. එහෙම නම් දැන් මේ කරන උද්ඝෝෂණය මොකක්ද? මේ ආණ්ඩුව දීලා තිබෙන නිදහස අනවශ්‍ය විධියට පාවිච්චි කිරීමක් තමයි මේ උද්ඝෝෂණ තුළින් අපට පෙනෙන්නේ. එහෙම නොවෙයි නම්, සියයට 11ක තිබුණු VAT එක සියයට 15 වුණා කියලා අද උද්ඝෝෂණය කරනවාද? මේ රජය අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල පහතටම හෙළුවා. එම භාණ්ඩවලට බදු පනවා මුදල් අය කරන එක පැත්තකට දැම්මා, ගරු මුදල් අමාත්‍යතුමා මැදිහත් වෙලා. ඒ, ජීවන වියදම අඩු කරන්නයි. නමුත් එදා අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල සියයට 400කින් වැඩි වෙද්දී ඔය කියපු එක්කෙනෙක්වත් උද්ඝෝෂණ කරන්න ආවේ නැහැ. එහෙම නම් මොකක්ද, අද කරන උද්ඝෝෂණය? කාගේ වුවමනාවට කරන උද්ඝෝෂණයක්ද මේ? බඩු මිල සියයට 400කින් වැඩි වෙද්දී එදා උද්ඝෝෂණය කළේ නැහැ. නමුත් සියයට 11 බද්ද සියයට 15 වුණාම පාරට බැස්සා. ඒක තමයි මෙහි තිබෙන යථාර්ථය. වර්තමාන ආණ්ඩුව ගෙන යන විනිවිද දැකිය හැකි මේ ප්‍රතිපත්තිය, විනිවිද පෙනෙන මේ ප්‍රතිපත්තිය, හැමෝටම දන්වා වැඩ කිරීමේ ප්‍රතිපත්තිය නිසා තමයි මෙසේ උද්ඝෝෂණ රැල්ලක් ආවේ. පසු ගිය රජය අය කරපු බදු ප්‍රමාණය මේ රජය අය කරන්නේ නැහැ. එච්චර ලොකු බදු ප්‍රතිශතයකට අප ගිහින් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලුත් ආණ්ඩුව -යහ පාලන ආණ්ඩුව- ඇවිත් අවුරුදු එකහමාරක් වෙනවා. නමුත් අපි දන්නවා අත්‍යාවශ්‍ය බඩුවල මිල මීට අවුරුදු එකහමාරකට ඉස්සර වෙලා, එනම් 2014දී තිබුණාට වඩා අද අඩුයි කියලා. අපි උදාහරණ කීපයක් ගෙන බලමු. 2014දී කිරි පිටි කිලෝ එකක මිල රුපියල් 962යි. අද එය රුපියල් 810 දක්වා බැහැලා. දේශීය කිරි පිටි මිල තවත් බැහැලා; රුපියල් 735 දක්වා බැහැලා. එදා සුදු සීනි කිලෝ එකක මිල රුපියල් 116යි. අද එය රුපියල් 95 දක්වා බැහැලා. එදා රතු පරිප්පු කිලෝ එකක මිල රුපියල් 220යි; 240යි. අද එය රුපියල් 169ක් දක්වා බැහැලා. අවුරුදු එකහමාරක් තුළම බඩු මිල අඩු වෙලා තිබෙනවා. පාන් පිටි කිලෝ එකක මිල එදා රුපියල් 110යි. අද රුපියල් 87 දක්වා බැහැලා. ආණ්ඩුව ඇවිත් අවුරුදු එකහමාරක් ගත වෙලා තිබුණත් අත්‍යාවශ්‍ය බඩුවල මිල අඩු වෙලා තිබෙනවා.

එදා හාල් මැස්සන් කිලෝ එකක් රුපියල් 640යි. අද මිල රුපියල් 495යි. එදා අල කිලෝ එක රුපියල් 128යි. අද ඒක රුපියල් 120 දක්වා බැහැලා. එදා බී ලූනු කිලෝවක මිල රුපියල් 125යි. අද ඒක රුපියල් 78 දක්වා බැහැලා. එදා ග්‍රෑම් 480 ටින් මාළු රුපියල් 202යි. අද ඒක රුපියල් 140 දක්වා බැහැලා. එදා මුං ඇට කිලෝ එකක මිල රුපියල් 314යි. අද ඒක රුපියල් 220 දක්වා බැහැලා. එහෙම නම්, පසු ගිය ආණ්ඩුව කාලයේ පැවැති අත්‍යාවශ්‍ය බඩු මිලට වඩා අද මේ ආණ්ඩුව යටතේ බඩු මිල අඩු වෙලා තිබෙනවා. ජනතාවට අද ඒ සහනය සලස්වා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. පෙට්‍රල්, ඩීසල්, භූමි තෙල් මිල අඩු කර තිබෙනවා. ගෑස් මිල -LP ගෑස් මිල- ගෙන බැලුවත්, 2014ට වඩා අද මිල අඩුයි. නමුත් කවුරුවත් ඒවා ගැන කථා කරන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරද්දී කිව්වා, "ගොවියා ගැන සිතන්නේ නැහැ" කියලා. 2014 වර්ෂයේ පැවැති තත්ත්වය අපි දන්නවා. පසු ගිය ආණ්ඩුව කාලයේ -පසු ගිය අවුරුදු 10 තුළම- හැම දාම වාගේ වී ගොවියා අස්වැන්න විකුණාගන්න බැරිව උද්ඝෝෂණ කළා. නමුත් ආණ්ඩුව මොනවාද කළේ? හාල් ගෙන්නුවා. එක් පැත්තක, වී විකුණාගන්න බැහැ කියලා ගොවියෝ උද්ඝෝෂණය කළා. 2014 අවුරුද්දේ ගොවියා රැක ගන්න ගත්ත ක්‍රියා මාර්ගය මොකක්ද? හාල් මෙට්‍රික් ටොන් නව ලක්ෂයක් පිටරටින් ගෙන්වුවා. පසු ගිය ඉතිහාසය ගත්තාම, ගත වූ අවුරුදුවල පිටරටින් ගෙන්වලා තිබෙන්නේ මෙට්‍රික් ටොන් 20,000ක් - 40,000ක් අතර ප්‍රමාණයක්. නමුත් 2014 අවුරුද්දේ හාල් මෙට්‍රික් ටොන් නව ලක්ෂයක් ආනයනය කළා. වී ගොවියාට දෙවියන්ගේ පිහිටයි. අපි මේ බද්ද පාවිච්චි කරන්නේ මොකටද? ගොවියා ආරක්ෂා කරන්නයි. එදා කළ දේවල් මතක නැහැ. ඔය සිටින මන්ත්‍රීවරු තමයි එදා හිටපු ඇමතිවරු; කැබිනට් ඇමතිවරු. 2014 වර්ෂයේ හාල් මෙට්‍රික් ටොන් නව ලක්ෂයක් ආනයනය කරන්න හදන කොට, "වී ගොවියා රැක ගන්න ඕනෑ" කියලා කවුරුවත් කෑගැහුවාද? 2014 හාල් මෙට්‍රික් ටොන් භය ලක්ෂයක් මේ රටට ආනයනය කළා. 2014 ආනයනය කළ ප්‍රමාණයේ ඉතිරි කොටස විධියට මෙට්‍රික් ටොන් 2,85,600ක් 2015දී ආනයනය කළා. ඒ විධියට බලන කොට මේ රටේ තිබුණු ප්‍රතිපත්තිය මොකක්ද? අද අපි විනිවිද පෙනෙන ආකාරයට මේ රටේ ප්‍රතිපත්තිය සකස් කරන්න ගියාම සිදු වන්නේ මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලබා දුන් කාලය අවසන් වී ගෙන එනවා. මේ අවස්ථාවේ මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, "වියලි දණ්ඩක් වුණත් මේ රටේ පැළ වෙනවා"ය කියලා විරුදාවලියක් තිබුණු බව. නමුත් පසු ගිය කාලයේ මේ රටට රසායනික පොහොර ගෙනත් දමලා පොළොව විනාශ කළා. වියලි දණ්ඩක් පැළ වෙනවා තබා වතුර ටිකක් බොන්න බැරි තත්ත්වයක් මේ රටේ ඇති කළා. නමුත් අපට ඒ අභියෝගය ජය ගන්න සිද්ධ වෙනවා. 2015 වර්ෂය අර ගෙන බැලුවත්, ඊට පෙර පැවැති කාලය ගැන කල්පනා කර බැලුවත් එහෙමයි. මට අනෙක් ඒවා ගැන විග්‍රහ කරන්න වෙලාවක් නැහැ. අපේ රටේ අල නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 94,800යි. නමුත් මෙට්‍රික් ටොන් 1,42,200ක් ආනයනය කර තිබෙනවා. ඒ කියන්නේ අල ගෙන්වන්න විතරක් රුපියල් කෝටි 480ක් වියදම් කර තිබෙනවා. ලූනු නිෂ්පාදනය දිහා බැලුවත් එහෙමයි. නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 89,600යි. මෙට්‍රික් ටොන් 2,10,300ක් ආනයනය කර තිබෙනවා. රුපියල් කෝටි 1161ක ලූනු ආනයනය කර තිබෙනවා. මේ විධියට වියළි මිරිස් බැලුවත්, රතු ලූනු බැලුවත්, මුං ඇට බැලුවත් තත්ත්වය ඒකයි. ඒ නිසා මේ අභියෝගය ජය ගන්න නම් වගා කිරීම පිළිබඳවත්, නිෂ්පාදන කල් තබා ගැනීමේ ක්‍රමවේද පිළිබඳවත් අධ්‍යයනය කරමින් කටයුතු කරන්න ඕනෑ කියන කාරණයට ඔබතුමා හරහා කෘෂිකර්ම ඇමතිතුමාගේ අවධානයට යොමු කරවමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා.

[අ.භා. 4.49]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ නව රජය බලයට පත් වෙලා වසරක් පිරෙන්නට ආසන්න මේ මොහොතේ, එම වසරක, වසර එකහමාරක කාලය තුළ ජන ජීවිතයට අත්‍යවශ්‍ය වන පාරිභෝගික භාණ්ඩවල මිල ජනතාවට දැරිය හැකි, ඒකාකාරී මට්ටමකින් පවත්වා ගෙන යන්නට අපේ රජයට හැකියාව ලැබීම පිළිබඳව විශේෂයෙන්ම අපි සන්තෝෂ වනවා. මීට කලින් කථා කළ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීවරයා කළ කථාව අපි අහගෙන හිටියා. එතුමා කිව්වා "පාරිභෝගිකයාට සහනයක් නැහැ, කිසිම සුගතියක් නැහැ" කියලා. ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, රජයක් හැටියට අපි ලබා දුන් සහන ගැන. විශේෂයෙන්ම අධ්‍යාපනය සඳහා සියයට 6ක් වෙන් කිරීම, යෝධ නිවාස වැඩ සටහන්, ලක්ෂ 14ක් වන රජයේ සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කිරීම, සෑම කුඹුරු හිමියකුටම අක්කරයක් සඳහා රුපියල් 5,000ක පොහොර සහනාධාරය ලබා දීම වැනි දැවැන්ත වැඩ සටහන් සඳහා සෑම වියදමක්ම දරමින්, මහින්ද රාජපක්ෂ පාලන යුගයේ ගත් සියලුම ණය සඳහා වාරික ගෙවමින් මේ පවත්වා ගෙන යන සුභ සාධනයන් පිළිබඳව අපේ රජයට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

සමහර අය මේ පිළිබඳව මහා හඬක් නහමින් කථා කළා. මෙම බද්ද පවත්වා ගෙන යන්නේ මහජනයාට සහනයක් සැලසීම අරමුණු කර ගෙන නොවෙයි කියන අදහසක් ඒ අය මතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අපි නම් මේක පවත්වා ගෙන යන්නේ එහෙම නොවෙයි කියලා තමුන්නාන්සේට මම කියන්න ඕනෑ. 2006 සිට 2016 දක්වා විශේෂ වෙළෙඳ භාණ්ඩ මත බදු පැනවීම පිළිබඳව සංඛ්‍යාලේඛන මගේ ළඟ තිබෙනවා. එම සංඛ්‍යාලේඛන අනුව 2009දී මෙහි ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 20,720යි. ලැබුණ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ආදායම රුපියල් මිලියන 18,965යි.

ඊළඟට, 2010 මැතිවරණ වර්ෂය එනවා. 2010 වර්ෂය, මැතිවරණ වර්ෂයක්. 2010 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 24,889යි; ලබා ගත් ආදායම රුපියල් මිලියන 10,173යි. සම්පූර්ණයෙන් හරි අඩකටත් වැඩි ප්‍රමාණයක් මැතිවරණය වෙනුවෙන් දානය කරලා; ප්‍රදානය කරලා තිබෙනවා. 2011 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 15,000යි; උපයා ගත් ආදායම රුපියල් මිලියන 15,622යි.

ඊළඟට මැතිවරණය ඉවරයි; ජනතාවගේ ඡන්දය අරගෙන ඉවරයි; ජනාධිපති බවට පත් වෙලා ඉවරයි. නැවත සාධනයන්, ශුභ සාධනයන් කිසිවක් නැහැ. ඊට පස්සේ බදු අය කර ගත් ආකාරය අපට පෙනෙනවා. 2012 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 27,470යි; උපයා ගත් ආදායම රුපියල් මිලියන 36,608යි. දැන් පෙනෙනවා, මැතිවරණය නිසා 2010දී ඇස්තමේන්තුගත ආදායමෙන් හරි අඩක් අඩු කරලා භාගයක් තමයි අය කර ගත්තේ කියලා. ඒ ඡන්ද ලබා ගෙන අවුරුද්දක් ගත වුණාට පස්සේ කිසිම හිතක්, පපුවක් නැතුව ඇස්තමේන්තුගත ආදායම ම ලබා ගත්තා. ඊට පස්සේ අවුරුද්දේදී ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 27,470යි. නමුත් වර්ෂය අවසානයේ වරින්-වර, වරින්-වර බඩු මිල ඉහළ දමමින්-ඉහළ දමමින් රුපියල් මිලියන 36,608ක් අය කර ගෙන තිබෙනවා. එය ලස්සන චිත්‍රයක්. 2013 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 43,197යි; ලබා ගත් ආදායම රුපියල් මිලියන 46,705යි. ඒ වනකොට ඡන්ද ලබා ගෙන ඉවරයි. ඒ නිසා ජනතාවගෙන් සල්ලි ගත්තාට කමක් නැහැ. මෙන්න, ඒ කාලයේ ආණ්ඩුව මෙහෙයවපු හැටි.

මේ තත්ත්වය ආපසු වෙනස් වෙනවා, අපේ ආණ්ඩුව බලයට පත් වන විට. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති වශයෙන් පත් වන කොට ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 65,000යි; ලබා ගත් ආදායම රුපියල් මිලියන 47,953ක් දක්වා අඩු වනවා. 2015 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 56,000යි; ලබා ගත් ආදායම රුපියල් මිලියන 52,276යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාල පරිච්ඡේදය පුරා මේ බද්ද හසුරුවා තිබෙන්නේ මේ ආකාරයටයි කියන එක මම විශේෂයෙන්ම කියන්නට ඕනෑ.

ඊළඟට, මේ බදු පනවන්නේ මොනවාටද? සාමාන්‍ය ජනතාවගේ අත්‍යවශ්‍ය භාණ්ඩ සහ ශුභ සාධනයන් සඳහායි. මා ළඟ ලේඛනයක් තිබෙනවා. එහි සඳහන් ආකාරයට හාල්මැස්සන් සඳහා අය කළ බදු අනුපාතය 2012 වර්ෂයේ සියයට 10යි; 2013 වර්ෂයේ සියයට 26යි; 2014 වර්ෂයේ සියයට 26යි; 2015 වර්ෂයේ සියයට 11යි; 2016 වර්ෂයේ සියයට 11යි. සියයට 26ට තිබුණු බද්ද අපි සියයට 11 දක්වා අඩු කරලා තිබෙනවා. මෙය දීර්ඝ ලේඛනයක්. එය කියවන්න ගියොත් මට කාලය ගත වනවා. ඒ නිසා විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාතයන් සඳහන් මෙම ලේඛනය මා **සභාගත*** කරනවා. ජන ජීවිතයට අවශ්‍ය වන සියලු බඩු භාණ්ඩ සඳහා අය කළ බද්ද අපේ නව රජය තුළින් අඩු කළ නිසාද, ඒකාබද්ධ විපක්ෂය නිරන්තරයෙන්ම අපට මේ අවලාද නඟන්නේ කියන එක මා විශේෂයෙන්ම අහන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. වරින්-වර, වරින්-වර, සතියෙන්-සතිය, මාස දෙකෙන්-තුනෙන් මැතිවරණ පවත්වපු හැටි මෑත ඉතිහාසය තුළ අපි ඕනෑ තරම් දැක තිබෙනවා. අපේ වයඹ පළාත් සභාවේ මැතිවරණය පවත්වන කොට කුරුණෑගල අල කිලෝව රුපියල් 50යි, කෑගල්ලේ අල කිලෝව රුපියල් 100යි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලවිවේ පාලමෙන් මෙහා පැත්තේ කඩවල්වල අල කිලෝව රුපියල් 50යි, පාලමෙන් එහා පැත්තේ අල කිලෝව රුපියල් 100යි. එවැනි මැතිවරණ රටාවක් තුළ බඩු භාණ්ඩවල මිල වෙනස් කරපු හැටි අපි දැක්කා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ණය වැඩි වුණු කථාවක් කිව්වා. දෙවි හාමුදුරුවනේ! ණය වැඩි වෙලා තිබෙනවා තමයි. යුද්ධ කාලයේ ගත්ත ණය නම් පොඩ්ඩක් හෝ සාධාරණීකරණය කරන්න පුළුවන්. 2010දී, 2011දී, 2012දී, 2013දී ණය ගත්තේ අවුරුදු 4කින් ගෙවන්නම්, අවුරුදු 5කින් ගෙවන්නම්, අවුරුදු 6කින් ගෙවන්නම් කියලායි. ඒ ණය ගත්තේ නිකම් නොවෙයි. සියයට 1ක පොලියට, සියයට 2ක පොලියට නොවෙයි. සියයට 8ක, සියයට 9ක ගිනි පොලියටයි එම ණය ගත්තෙ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඒ ගත්ත ණය තමයි අපි මේ ගෙවන්නේ. තමුන්නාන්සේලා හැම දාම, මාසයෙන් - මාසයට අපට ගල් ගහනවා. හිතුවක්කාර කසාදයක් බැඳ ගත්තාම - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ කථාවත් කියන්නම්. ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හිතුවක්කාර කසාදයක් තමයි කර ගත්තේ. ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එක්සත් ජාතික පක්ෂය කසාද බැඳගත්තා. ඒක පෑහෙන්නෙ නැති කසාදයක්. පෑහෙන්නේ නැති ඒ කසාදය බැඳගෙන; විවාහ ප්‍රාප්ත වෙලා එතුමා මේ රටේ තාත්තා - පිතෘවරයා- බවට පත් වුණා. මේ කසාදය නිසා යහ පාලන ආණ්ඩුව කියන දරුවා පිළිසිඳ ගත්තා; ගැබ් ගත්තා. අපිත් දන්නවා, හිතුවක්කාර කසාද බැඳගත්තාම ගමේ ගොඩේ ආච්චිලා, කුඩම්මලා, නැන්දම්මලා ලැබෙන්න ඉන්න දරුවා ගබ්සා කරන්න එක එක අත්බෙහෙත් කරන බව. දරුවාව ගබ්සා කරන්නට, අපේ ගම්වල හිටපු නපුරු කුඩම්මලා, නපුරු ආච්චිලා ගම්වල වැටවල්වල තිබෙන වල් අන්නාසි ගෙඩි, වල් අන්නාසි ගැට, වල් අන්නාසි බොඩ, දිමි ගොටුවල බිත්තර, ඒ වගේ දේවල් දාලා විවිධාකාරයේ අත්බෙහෙත් කරනවා.

විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ ඇති වුණු විවාහය තුළින් බිහිවන "යහ පාලනය" කියන දරුවා ගබ්සා කරන්න මේ ආණ්ඩුව පටන් ගත් දා සිට මුන්නැහේලාත් ගල් ගහනවා, ගල් ගහනවා, ගල් ගහනවා. වල් අන්නාසි බොඩ, දිමි ගොටු, වල් අන්නාසි ගැට, විවිධ දේවල් කව-කවා, කව-කවා මේ දරුවා ගබ්සා කරන්න තමයි හදන්නේ. හැබැයි, කියන්න සන්තෝෂයි, ඒ දරුවා ඉපදෙන්නේ අවුරුදු 5කින් බව. ඒ කියන්නේ මාස 60කින්. ඒ උපද්දවන දරුවා අවුරුද්දක් තිස්සේ අපේ රට තුළ; මාතෘත්වය තුළ; ඒ කුස තුළ යහකින් වැඩෙන බව ප්‍රකාශ කරමින්, මොන වල් අන්නාසි ගැට කැව්වත්, මොන ගල්-මුල් ගැහුවත් ඒ දරුවා තවමත් ගබ්සා කරන්න බැරිවුණාය කියන එකත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 4.58]

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් සඳහා අදහස් කිහිපයක් ප්‍රකාශ කිරීමට ලැබීම මම මහත් භාග්‍යයක් සේ සලකනවා.

විශේෂයෙන්ම අද දේශීය ගොවියා නහා සිටුවීම සඳහා ලූනු සහ අල වෙනුවෙන් පනවපු බද්ද සම්බන්ධයෙන් රජයේ පාර්ශ්වයෙන් කරුණු ඉදිරිපත් වුණා. නිසි කාලයට බදු පැනවීම හොඳ කාරණයක් වුණත්, ලූනු සම්බන්ධයෙන් බදු පැනවීම කළේ ප්‍රමාද වෙලා කියලා අපි විශ්වාස කරනවා. ඒ හරහා ලූනු ගොවීන්ට ඔවුන්ගේ අස්වැන්න කුණු කොල්ලයට විකිණීමට සිද්ධ වුණා. ඒ එක්කම කෘෂි ආර්ථිකය නහා සිටුවීම ගැන රජය අදහස් ප්‍රකාශ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම රජරට නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම දකිනවා, අද ගොවි ජනතාවගෙන් සියයට 50ක් වී ගොවිතැනින් ඉවත් වෙලායි ඉන්නේ කියලා. මේ රජය කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් - වී ගොවිතැන සම්බන්ධයෙන් - ගෙනයන ප්‍රතිපත්තිය තුළ මේ කන්නය වෙනකොට ගොවීන්ගෙන් සියයට 50ක් වී ගොවිතැනින් ඉවත්වෙලා තිබෙනවා. මේ වෙනකොට අපේ ප්‍රදේශවල වී මිල රුපියල් 28යි. දැන් කුඹුරුවල ගොයම් කැපෙනවා. කුඹුරුවලින් බාගයක ගොයම් කැපිලා ඉවරයි. තව මාසයක් යද්දී සියලුම කුඹුරුවල ගොයම් කැපිලා ඉවර වෙනවා. හැබැයි, අද වෙනකල් රජය වී මිලදී ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරලා නැහැ. එක පැත්තකින් වී ටික කුණු කොල්ලයට - රුපියල් 28ට - විකිණෙනවා. රුපියල් 50 ගණනේ ගන්නවා කියපු වී ටික, රුපියල් 38 ගණනේ ගන්නවා කියලා රජය පොරොන්දු වුණාට මේ වෙනකල් කිසිම තැනක වී මිලදී ගැනීමේ යාන්ත්‍රණය වී අළෙවි මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරලා නැහැ. ඒක අපේ ගොවි ජනතාවට විශාල ප්‍රශ්නයක්.

අනෙක් පැත්තෙන් අද වෙනකොට නිෂ්පාදනය සඳහා යන වියදම අක්කරයකට රුපියල් 47,000ක් බවට පත්වෙලා තිබෙනවා. රුපියල් 28,000යි, රුපියල් 32,000යි අතර තිබුණු වියදම රුපියල් 47,000 දක්වා වැඩිවෙලා තිබෙනවා. එහෙම ගත්තාම, ගොවියෙකුගේ දිනක ආදායම රුපියල් 100 දක්වා පහළ වැටිලා තිබෙනවා. "මේකද, කෘෂි ආර්ථිකයක් ගොඩනැඟීම වෙනුවෙන් රජය ගෙනයන ප්‍රතිපත්තිය?" කියලා අපට රජයෙන් අහන්න සිදුවෙනවා. මේක ඉතාම ගැටලුකාරී තත්ත්වයක්. මේ තත්ත්වයට අද වෙනකල් සාධනීය විසඳුමක් ලබා දෙන්න රජයට පුළුවන් වෙලා නැහැ. ඒ නිසා ලබන කන්නය වෙද්දී මේ සම්බන්ධයෙන් වහාම අවධානය යොමු කරන්න. හැබැයි, රජයේ අවධානය යොමු වෙද්දී වී ගොවිතැනින් අපේ ගොවියා සම්පූර්ණයෙන්ම ඉවත් වෙලා තියේවි. මොකද, පොහොර මිටියක මිල රුපියල් 2,800යි.

අපේ රජය කාලයේ අපි ලබා දුන්නේ බාල පොහොර කියලා කිව්වා. හැබැයි, ගුණාත්මක භාවයෙන් ඉහළ හොඳ පොහොර ලබාදෙන්න ආපු ආණ්ඩුව කළේ, ගොවීන්ගෙන් සියයට 50ක් වී ගොවිතැනින් ඉවත් කිරීමයි. අනෙක් පැත්තෙන් නිසි කාලයට ජලය කළමනාකරණය නොකිරීම හරහා සිදු වුණේ අතිරේක භෝග සඳහා අපේ ගොවි ජනතාවට ලැබෙන ආදායමත් නැති වීමයි. ඒ නිසා මේ රටේ කෘෂි ආර්ථිකයක් නිර්මාණය කරන්නට පුළුවන් ගමනක් යාම මේ ආණ්ඩුව ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. මේ ආණ්ඩුව කෘෂි කර්මාන්තය බහු ජාතික සමාගම් විසින්

මෙහෙයවන තැනට අරගෙන ගිහින්, පසුගිය ආණ්ඩුවේ වැරදි කිය කියා මාස 18ක්, අවුරුදු දෙකකට ආසන්න කාලයක් ආවා වාගේ - කලින් කථා කළ මන්ත්‍රීතුමෙක් කිව්වා වාගේ- ඉදිරි අවුරුදු 4ක කාලයත් මේ ආකාරයට ගමන් කරයි කියන විශ්වාසය තමයි අපට තිබෙන්නේ. මේක ඉතාම ගැටලුකාරී තත්ත්වයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව මේ රට පාලනය කරන්නට බැහැ කියන්නේ පසු ගිය ආණ්ඩුවේ ණය ගැන සඳහන් කරමිනුයි. ඒ සම්බන්ධව තමයි නිතරම විවේචන එල්ල කරන්නේ. අපි ළඟ තොරතුරු තිබෙනවා, අපි ඒවා ලබා දෙන්නම්. මේවා යහ පාලන රජයේ මහ බැංකුව විසින් ලබා දෙන තොරතුරු. 2015 අවුරුද්දට පමණක් රුපියල් බිලියන 1,112ක මුදලක් යහ පාලන රජය ණයට අරගෙන තිබෙනවා. මේ රටේ සමස්ත ජනතාව අවුරුද්දක් ඇතුළත රුපියල් 100,000කින් ණය කරලා තිබෙනවා. නමුත් කථා කරන්නේ පසුගිය ආණ්ඩුවේ ණය ගැන. 2006 වන විට රුපියල් බිලියන 2,222ක්ව තිබූ ණය ප්‍රමාණය 2006 සිට 2009 වර්ෂය දක්වා, - පළමුවෙනි අවුරුදු 4ට- මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේදී රුපියල් බිලියන 4,160 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම 2010 සිට 2014 වර්ෂය දක්වා මේ රටේ ණය බර ප්‍රමාණය රුපියල් බිලියන 7,391 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව වසරකට වැඩි වීම රුපියල් බිලියන 646යි. වසරකට රුපියල් බිලියන 646ක වැඩි වීමක් තිබෙන විට මේ රටේ ජනතාව භෞතිකව දැක්කා, පසුගිය රජය කළ සංවර්ධනය ගැන. එහෙම කිසිම දෙයක් පෙනෙන්නට නැති, භෞතිකව ජනතාවට දකින්නට කිසිම දෙයක් නැති ආණ්ඩුව රුපියල් බිලියන 1,112ක මුදලක් ණයට අරගෙන සමස්ත ජනතාවගේ ණය බර රුපියල් ලක්ෂයකින් වැඩි කරලා, අද පසු ගිය ආණ්ඩුවේ ණය පිළිබඳව කථා කරනවා. මෙන්න මෙක තමයි මේ රටේ ජනතාවට තිබෙන ප්‍රශ්නය. මේ ප්‍රශ්නයට උත්තරය දෙන්නේ නැතිව, මේ රටේ නිවැරදි කළමනාකරණයක් කරන්නේ නැතිව, ආර්ථිකය සම්බන්ධයෙන් ඇති ගැටලුවලට නිවැරදි උත්තරයක් දෙන්නේ නැතිව මේ ආණ්ඩුව පසුගිය ආණ්ඩුවට බැණ බැණ මේ ආණ්ඩුවේ ඉදිරි කාලය ගෙන යන්නට කල්පනා කරගෙන ඉන්නවා.

අනෙක් පැත්තෙන් බැලුවොත් 2014ට වඩා 2015දී ආණ්ඩුවේ වියදම් සියයට 28කින් වැඩි වෙලා තිබෙනවා. සියයට 28කින් රජයේ වියදම් වැඩි වෙලා තිබෙනවා. ඒකට මූලිකම හේතුව වෙන්නේ එක පැත්තකින්, -එදා විවේචනය කළා වාගේ- විශාල කැබිනට් මණ්ඩලයක් පවත්වාගෙන යාම, දූෂණය සහ වංචාව. අපි මේ සම්බන්ධයෙන් කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. රජයේ වියදම් සියයට 28කින් වැඩි වීම සාධාරණීකරණය කරන්නේ කොහොමද? රජයේ පුනරාවර්තන වියදම් සියයට 28කින් වැඩි කරලා තමුන්නාන්සේලා කොහොමද සාමාන්‍ය ජනතාවට කියන්නේ බදු ගෙවන්න කියලා? සියයට 28ක පුනරාවර්තන වියදම් වැඩි වීම ගිණුම්ගත කරන්නට ඕනෑ නිසා තමයි කඩිමුඩියේ VAT සම්බන්ධ පනත අරගෙන ආවේ. මේ VAT සම්බන්ධ පනත නිවැරදි ආකාරයට පාර්ලිමේන්තුවට ගෙනාවේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා, අනෙක් පැත්තෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග උල්ලංඝනය කරලා කඩිමුඩියේ ගෙනාව ඒ පනත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය මතයක් ප්‍රකාශ කළාට පසුව, අද වන විට රජය අඩියෙන් අඩිය පහළට වැටිලා තිබෙනවා. එම නිසා මේකේ වගකීම මේ රටේ ජනතාව පිට පැටවීම වැරදියි. මේකේ වගකීම මේ ආණ්ඩුව භාර ගන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිතවත් මන්ත්‍රීවරයෙක් පෙර කථාවකදී කිව්වා, දරුවා ප්‍රසූත කරන්නට තව අවුරුදු 4ක කාලයක් යනවා කියලා. ගැබ් අරගෙන තවම අවුරුද්දයි, ඒ නිසා දරුවා ප්‍රසූත කරන්නට තව අවුරුදු 4ක කාලයක් දෙන්න කියලා කිව්වා. අවුරුදු 5ක් ගියාට පසුව තමයි දරුවා ප්‍රසූත කරන්නේ කියලා කිව්වා. ඒ කියන්නේ මේ ආණ්ඩුවේ විකෘති භාවයක් තිබෙනවා. විකෘති දරු උපතක් තමයි බලාපොරොත්තු වෙන්නේ. අපි දැකලා නැහැ දරුවෙක් මවු කුසේ අවුරුදු 5ක් ඉන්නවා. එහෙම අහලා නැහැ, වෛද්‍ය විද්‍යාවේ එහෙම කියලා නැහැ. ඒකෙන්ම පෙනෙනවා මේ රජය අංග විකල ආණ්ඩුවක් බව. මේ රජයට මේ රට ගෙන යන්නට බැහැ. මේක දවසින් දවස කඩා වැටෙනවා. මේ කඩා වැටීමට පිළිතුරු දෙන්න තමයි ආණ්ඩුව ඒකාබද්ධ විපක්ෂය දඬයම විධියට පාවිච්චි කරන්නේ. අපි විශ්වාස කරනවා මීට වඩා යහපත් මූල්‍ය කළමනාකරණයක් මේ රට තුළ සිදු විය යුතුයි කියලා. මේ රටේ ජනතාවට මීට වඩා සහන ලබා දෙන්නට අවශ්‍ය කටයුතු මේ ආණ්ඩුව කළ යුතුයි. ආණ්ඩුව රුපියල් කෝටි ගණන් වියදම් කරලා වෙළෙඳ දැන්වීම් දැම්මාට, අත්‍යවශ්‍ය භාණ්ඩ මිල අඩු වෙනවා කියලා කිව්වාට ජනතාවට ඔය කියන මිලට ගන්න නම් බඩු මේ රටේ නැහැ. මේ රටේ නම් ඔය කියන මිලට වෙළෙඳ පොළේ කිසිම භාණ්ඩයක් ගන්න නැහැ. එතැනදි සිදු වුණේ ඒ වෙළෙඳ දැන්වීම්වලට රජයේ මුදල් රුපියල් කෝටි ගණනක් වියදම් කිරීමයි. මෙන්න මේ තත්ත්වය ඉතාම පැහැදිලිව අගෝස්තු මුල් සතියේ පැවැති කොළඹ ආර්ථික සමුළුවේදී සියලුම ආර්ථික විශේෂඥයන් කිව්වා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මේ රටේ ආර්ථික කළමනාකරණය දුර්වලයි, මේ රටේ මිල පාලන ප්‍රතිපත්තිය ප්‍රායෝගික නැහැ, මේ ආර්ථික ප්‍රතිපත්තිය තව දුරටත් ඉදිරියට අරගෙන ගියොත්, මේ රටේ කඩා වැටීම අත ළඟයි කියන පණිවුඩය ජනාධිපතිතුමා, අගමැතිතුමා, මුදල් ඇමතිතුමා ඇතුළු මේ රජයට කොළඹ ආර්ථික සමුළුවේදී ආර්ථික විශේෂඥයන් කිව්වා. විශේෂයෙන්ම අගමැතිතුමාට උපදෙස් සපයන ආර්ථික විශේෂඥයෙකු වන මහාචාර්ය රසීන් සාලි මැතිතුමා මේ රජයේ මිල පාලන ප්‍රතිපත්තිය හැඳින්වූයේ "තකතීරු ක්‍රියාවක්" හැටියටයි. මේ, රජයට උපදෙස් දෙන අද සිටින කණ්ඩායමේ කෙනෙක්. මෙන්න මේ වාගේ අර්බුදයකට වත්මන් රජය පත් වෙලා තිබෙනවා. මේක අයහපත් කළමනාකරණයක්. මේ ආණ්ඩුව බොරුවෙන් බලයට ආ ආණ්ඩුවක්. මේ ආණ්ඩුව මේ රට බොරුවෙන් පාලනය කරන්න උත්සාහ කරන ආණ්ඩුවක්. බොරුවෙන් මේ රට පාලනය කරන්න බැරි වුණු තැන මේ රට මර්දනයෙන් පාලනය කිරීමේ උත්සාහයක් ආණ්ඩුව දරනවා. මේකේ වගකීම දරන්න ඕනෑ, මේකට වන්දි ගෙවන්න ඕනෑ මේ රටේ ජනතාව නොවෙයි. ඒ හින්දා මේ රටේ සංස්කෘතියත් එක්ක බැඳුණු වී ගොවියා ආරක්ෂා කරන්න, කෘෂිකර්මය ආරක්ෂා කරන්න කියලා ඉතාම කාරුණිකව මා මේ ආණ්ඩුවෙන් ඉල්ලනවා. එලෙස ආරක්ෂා කරන ගමන් අලුත් ක්‍රමවේදයන් හඳුන්වා දෙන්න ඕනෑ නම්, ඒ ක්‍රමවේදයන් හඳුන්වා දෙන්න. හැබැයි, මේ රටේ කෘෂි කර්මාන්තය විනාශ කරලා අලුත් ක්‍රමවේදයන් හඳුන්වා දෙන්න එපා කියන ඉල්ලීම අපි ඉතාම ගෞරවයෙන් ආණ්ඩුවෙන් ඉල්ලනවා.

මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මී ළඟට, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

[අ.භා. 5.09]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

විශේෂයෙන්ම මේ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ වන නියමයන් කීපයක් පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට හැකි වීම පිළිබඳව මම ඉතා සතුටු වනවා. මේ රටේ ජීවත් වන පාරිභෝගිකයින්ට, ඒ වාගේම අපේ ගොවි ජනතාවට සහනයක් ලබා දෙන්න, ඒ අයව ආරක්ෂා කර ගන්න මෙවැනි කටයුතු සෑම රජයක්ම සිදු කරනවා. මෙම නියමයන් නිසි වෙලාවට ඉදිරිපත් කිරීම වැදගත් වෙනවා. ඒ කටයුත්ත කිරීමෙන් තමයි අපේ රටේ ජීවත් වන පාරිභෝගිකයින්ව ආරක්ෂා කෙරෙන්නේත්, ඒ වාගේම ගොවි ජනතාව ආරක්ෂා කෙරෙන්නේත්. විශේෂයෙන්ම විපක්ෂයේ කල්ලිය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා අද මේ බදු පිළිබඳව කථා කරනවා. මම හිතන විධියට මේ අයට බදු ගහනවාට වඩා පුරුදු පසු ගිය කාලයේ කප්පම් අරගෙනයි. ඒ දවස්වල ආදායම් ගත්තේ බදු ගහලා නොවෙයි, කප්පම් තුළින්. දැන් තමයි නීත්‍යානුකූල ලෙස මේ රටේ ආදායම ගෙනියන්නේ. මේ රජයට කරන ලොකුම චෝදනාවක් හැටියට දැන් මේ අය කියනවා, "අපේ ආණ්ඩුව පසු ගිය ආණ්ඩුවලට වඩා වැඩියෙන් ණය අරගෙන" කියලා.

මම හිතන හැටියට මේක ගණිත ශාස්ත්‍රය අවබෝධය පිළිබඳ ප්‍රශ්නයක්. අපේ ඉතිහාසය දිහා බලා මේ රටට නිදහස ලබා ගත් කාල වකවානුවේ සිට මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව බලයට පත් වන තෙක් ගත් ණය ප්‍රමාණයත්, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව පාලනය කළ අවුරුදු 9ක කාලය තුළදී ගත් ණය ප්‍රමාණයත් සන්සන්දනය කරලා බලන්න ඕනෑ. ඒ අනුව, නිදහස ලබා ගත් දින සිට මහින්ද රාජපක්ෂ මහතා බලයට පත් වූ කාල වකවානුව දක්වා ගත් ඒ සියලු ණයවලට වඩා හත්-අට ගුණයක් වැඩි කරලා විශාල ණය ප්‍රමාණයක් මහින්ද රාජපක්ෂ යුගය තුළදී අරගෙන තිබෙනවා.

දැන් මෙතැන තිබෙන අනික් ගැටලුව තමයි, මේ නව යහ පාලන රජය යම් ණයක් ගත්තා නම්, අරගත්තේ පසු ගිය ආණ්ඩුව වාගේ ආයෝජන සඳහා නොවෙයි. හම්බන්තොට වරායට කොයි තරම් මුදලක් යට කළාද කියා අප දන්නවා. මත්තල ගුවන් තොටුපළට කොයි තරම් මුදලක් යට කළා ද කියාත් අප දන්නවා. මේ වාගේ අනවශ්‍ය ව්‍යාපෘති සඳහා තමයි පසු ගිය රජය ණය ගත්තේ. ඒ පව් තමයි අපට ගෙවන්න වෙලා තිබෙන්නේ. දැන් අපට ණය ගන්න වෙලා තිබෙන්නේ පසු ගිය ආණ්ඩුව ගත්ත ඒ ණය ගෙවන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. පසු ගිය ආණ්ඩුව කොළේ වහලායි ගැහුවේ. රජයේ ණයවලට මේවා පෙන්නුවේ නැහැ. ඒ ණය ගැන පාර්ලිමේන්තුව දැනුවත් වුණේ නැහැ. රජයේ ආයතන, ඒ ව්‍යවසාය ආයතන සෘජුවම ණය ගත්තා. ඒ අය ගත් ණය පිළිබඳ තොරතුරු අපට නිවැරදි කරන්න සිදු වුණා. එහෙම නිවැරදි කරලා තමයි දැන් මේ සත්‍ය ණය ප්‍රමාණය අපට දැනගන්න ලැබුණේ. නමුත්, මම මේ අවස්ථාවේ ඉතා පැහැදිලිව කියනවා මේ මොන පව් කරගහන්න වුණත්, මේ නව රජය ඒ එකින් එක, එකින් එක විසඳලා, මේ රටේ ඉන්න ජනතාවට සහනයක් ලබාදීලා, ආර්ථිකය ශක්තිමත් කරන බව. ආර්ථිකය ශක්තිමත් කිරීම තුළින් ඒ ප්‍රතිලාභ මේ රටේ ජනතාවට භුක්ති විඳින්න පුළුවන් වන කාල වකවානුවකට දැන් යටිතලය සකස් කර තිබෙනවා. අපේ රජයට වසරක් පිරෙන මේ කාල පරිච්ඡේදයේ රටක් හැටියට ඉදිරියට යන්න පුළුවන් වන යටිතලය හදාගන්න මේ වන විට අපට පුළුවන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ කොයි තරම් හොරකම්, කොයි තරම් වංචා, කොයි තරම් දූෂණ වෙලා තිබෙනවාද කියන එකට හොඳම උදාහරණය තමයි, ශ්‍රී ලංකා රේගුව එහෙම නැත්නම් SriLanka Customs එක. 2014 වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා කාලයේත්, 2015 වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා කාලයේත්, මේ අවුරුද්දේ -2016- ජනවාරි සිට ජූලි දක්වා වූ කාලයේත් ශ්‍රී ලංකා රේගුව ලැබූ ආදායම් ටික සන්සන්දනය කර බැලුවොත්, පසු ගිය කාලයේ කොයි තරම් හොරකමක්, කොයි තරම් දූෂණයක්, කොයි තරම් වංචාවක් සිදු වෙලාද කියන එක මැනවින් අවබෝධ වෙනවා. 2014 වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා කාල සීමාවේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම රුපියල් මිලියන 209,344යි. ඒ ප්‍රමාණය මේ අවුරුද්ද වෙන කොට 242,293ක් දක්වා -සියයට 27.8කින්- වැඩි වෙලා තිබෙනවා.

ශ්‍රී ලංකා රේගුවේ -SriLanka Customs එකේ- ආදායම රුපියල් මිලියන 266,830 සිට මිලියන 457,390ක් දක්වා නැවත සියයට 21.4කින් වැඩි වෙලා තිබෙනවා. සුරාබදු දෙපාර්තමේන්තුව ගත්තාම, 2014 ජනවාරි සිට ජූලි දක්වා වූ කාල සීමාවේ එහි ආදායම රුපියල් මිලියන 37,815යි. එය 2015 ජනවාරි සිට ජූලි දක්වා වූ කාල සීමාව තුළ රුපියල් මිලියන 57,255ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. එය නැවතත් 2016 ජනවාරි සිට ජූලි දක්වා කාල සීමාව තුළ රුපියල් මිලියන 69,305ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ප්‍රතිශතයක් ලෙස ගත්තොත්, සියයට 21ක වර්ධනයක් සිදුවෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ ආයතන තුනේ -දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව- ආදායම රුපියල් මිලියන 513,988 සිට 2014 ජනවාරි සිට ජූලි දක්වා වූ කාල සීමාව සහ 2016 ජනවාරි සිට ජූලි දක්වා වූ කාල සීමාව තුළ රුපියල් බිලියන 768,989ක් ලෙස සියයට 23කින් වැඩි වෙලා තිබෙනවා. පසු ගිය කාලයේ මේ ආදායම අපට අහිමි වුණේ කොහොමද? මේ ආදායම අහිමි වුණා කියන්නේ රවි කරුණානායක අමාත්‍යතුමාට ආදායමක් අහිමි වුණා කියන එක නොවෙයි. මේ රටේ ජනතාවටයි ඒ ආදායම අහිමි වුණේ. මේ රටේ ජනතාවට මෙවැනි ආදායමක් අහිමි වුණා නම්, ඒකට හේතුව වෙලා තිබුණේ මොකක්ද? ඒකට හේතුව වෙලා තිබුණේ පසු ගිය කාලයේ වුණු ඒ දූෂණයයි. පසු ගිය කාලයේ වුණු ඒ වංචාවයි. වෙන කිසිම දෙයක් නොවෙයි. මොකද, රජයට ඒ මුදල් ගෙවන්නේ නැතිව ඒ අය තමන්ගේ සාක්කු පුරවා ගත් තත්ත්වයක් තමයි ඒ දවස්වල තිබුණේ.

හැබැයි, ඒක දැන් නතර වෙලා තිබෙනවා. ඔන්න ඔය කාරණය තමයි නුවර ඉඳන් කොළඹට පාද යාත්‍රා යන්න ප්‍රධානතම හේතුව වෙලා තිබුණේ. වෙන කිසිම දෙයක් නොවෙයි. නුවර ඉඳන් කොළඹට පාද යාත්‍රා යන්න ප්‍රධානතම හේතුව, පසු ගිය කාලයේ වංචනික ලෙස උපයා ගත් ආදායම ඒ අයට අහිමිවීමයි. එහෙම නම්, මේ රටේ ජනතාවට හිමි ආදායම නැවතත් ජනතාවට ලබා දෙන ක්‍රමවේදයකට අපි දැන් ක්‍රම-ක්‍රමයෙන් ගිහින් තිබෙනවා. රේගු දෙපාර්තමේන්තුවෙන් ඒ වාගේම සුරා බදු දෙපාර්තමේන්තුවෙන් අපට ලබා ගන්න පුළුවන් මුදල් ලබා ගෙන, නැවතත් ජනතාවට සේවය කරන්න; ජනතාව වෙනුවෙන් ආයෝජනයක් කරන්න; අපේ ගොවි ජනතාව වෙනුවෙන් අවශ්‍ය සහනාධාරය ලබා දෙන්න අපි කටයුතු කරනවා.

මේ අය දැන් වී වගාව ගැන කථා කරනවා. එය කාලෝචිත ප්‍රශ්නයක්. නමුත් 2014 අපේ වී නිෂ්පාදනය වැඩි වශයෙන් තිබෙන කොට පසු ගිය ආණ්ඩුව සහල් ආනයනය කරන්න තීරණය කළා. සහල් ආනයනය කරන්න එදා තීන්දු තීරණ ගත්ත අය, අද වී ගොවිතැන ගැන කථා කරනවා. ඒ නිසා ඇත්තටම මේ රටේ ජනතාවට තීන්දුවක් ගන්න එළඹෙන හොඳම අවස්ථාව තමයි

ඉදිරියේදී එන පළාත් පාලන මැතිවරණය. ඒ පළාත් පාලන මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ අපේ කණ්ඩායම ජයග්‍රහණය කරවීම සඳහා නැවතත් ජනතාව තීන්දු කරයි කියා අපට ලොකු විශ්වාසයක් තිබෙනවා. ඒ ගැන කිසිම සැකයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත්, ගරු මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමාත් යන මේ සියලු දෙනා එකතු වෙලා ආර්ථික වශයෙන් මේ රට ඉදිරියට ගෙන යන්න අවශ්‍ය වැදගත් තීන්දු තීරණ නොබියව අරගෙන මේ රට සාරවත් රටක් වාගේම දූෂණයෙන් තොර රටක් බවටත් පත් කරන්න කටයුතු කරයි කියලා මා විශ්වාස කරනවා. ඒක නියතයි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා - නැත. ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා - නැත. ගරු රාජ්‍ය අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා - නැත.

මීළඟට ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා.

[අ.භා. 5.20]

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂය විසින් ඉදිරිපත් කරන ලද සමහර කාරණා පිළිබඳ අපි කථා කරන කොට අපි විශේෂයෙන් කල්පනා කරන්න අවශ්‍යයි, වර්තමාන රජය මොන වාගේ තත්ත්වයක් තුළ මේ ආණ්ඩුව බාර ගත්තාද කියන කාරණය. ජාත්‍යන්තර වශයෙන් කොන්වෙලා, ආර්ථික වශයෙන් කඩා වැටුණු ආණ්ඩුවක් තමයි අපි බාර ගත්තේ.

මෙහිදී අපි විශේෂයෙන් මතක කියා ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. එනම් මැතිවරණය පවත්වන්නට ඕනෑ තරම් කාල සීමාව තිබෙද්දී, යම් නායකයෙක් වසරකට එකහමාරකට කලින් මැතිවරණයක් පවත්වනවා නම්, එසේ පවත්වන්නේ තමන්ට ඒ ආණ්ඩුව පවත්වාගෙන යන්න බැරි නිසායි. එහෙම ආණ්ඩුවක් බාරගෙන, අපේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේත්, ඒ වාගේම අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේත් නායකත්වයෙන් අද රට හරි පැත්තට අපි ගෙන ගොස් තිබෙනවා. දැන් මේ රටට ජාත්‍යන්තර වශයෙන් දැවැන්ත පිළිගැනීමක් ලැබිලා තිබෙනවා. ප්‍රශ්න මැද මේ රට ඉස්සරහට ගෙනියන කොට සමහර වෙලාවට සමහර අයට මේ දිහා බලා ඉන්න බැරිව, චෝදනා කරන, උසුළු-විසුළු කරන අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ ගැන අපි කලබල වෙන්නේ නැහැ. අපි මේ ගමන ඉස්සරහට යනවා. ඒක කාටවත් නවත්වන්න බැහැ. මොකද, අතිගරු ජනාධිපතිතුමා විටින් විට කියන දෙයක් තමයි 2020 වෙනතුරු මේ ආණ්ඩුව කිසිම කෙනෙකුට පරාජය කරන්න; වට්ටන්න පුළුවන්කමක් නැහැයි කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අභියෝගය බාරගෙන යන ඒ ගමනේදී අපි තේරුම් ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ තමයි අපේ බහුතරයක් ජනතාව කෘෂි කර්මාන්තයෙන් යැපෙන පිරිසක් බව. කෘෂි කර්මාන්තයෙන් යැපෙන ඒ පිරිසට දෙන්න පුළුවන් හැම සහනයක්ම අපි දෙන්න ඕනෑ.

මේ කාලයේ උළු පළාතේ අර්තාපල් අස්වැන්න ලැබෙනවා. ඒවා දැන් වෙළඳ පොළට එනවා. එතකොට වෙළෙඳ පොළ ආරක්ෂා වෙන්න ඕනෑ. මොකද, ගොවි මහත්වරු තමන්ගේ වගාවන්වල නිරත වෙන්නේ ඒ වගාවට නැත්නම් තමන්ගේ නිෂ්පාදනයට හොඳ මිලක් තිබෙනවා නම් පමණයි. එහෙම නැත්නම් ඒ ගොවි මහත්වරු ඒ වගාවෙන් ඉවත් වෙනවා.

මේ ගරු සභාවේදී අර්තාපල් ගැන, මිරිස් ගැන සහ අනික් සියලු කාරණා ගැන කථා කළා. ඒ නිසා මම විශේෂයෙන්ම අපේ මොණරාගල දිස්ත්‍රික්කයේ කරන උක් වගාව පිළිබඳව කථා කරන්න ඕනෑ. ගරු අමාත්‍යතුමා සීනිවලට රුපියල් 30ක බද්දක් පනවා තිබෙනවා. ඒ බද්ද තුළින් අනිවාර්යයෙන්ම උක් වගාවේ යම්කිසි ප්‍රගමනයක් ඇති වෙයි කියලා මම විශ්වාස කරනවා. හැබැයි, විශේෂයෙන්ම අපි තේරුම් ගන්න ඕනෑ, අපේ පළාත්වල පරිසරයේ ඇති වන වෙනස් වීම් අනුව, සමහර විට වගාවේ සහ නිෂ්පාදනයේ අඩු වැඩි වීම් වෙන්න බොහෝ දුරට ඉඩ තිබෙන බව. උක් වගා කරන්නේ මොන දිස්ත්‍රික්කවලද, ආර්ථික වශයෙන් මොන විධියට බැට කාපු දිස්ත්‍රික්කවලද කියන එක අපි තේරුම් ගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විශ්වාස කරන්න, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා වාගේම, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා 1986 අවුරුද්දේ ආරම්භ කළ පැල්වත්ත සහ සෙවණගල කියන කර්මාන්තශාලා දෙකෙන් අද පවුල් 40,000ක් ජීවත් වනවා.

මොනරාගල දිස්ත්‍රික්කයේ 2012, 2013 වර්ෂවල දරිද්‍රතාව පිළිබඳ සංඛ්‍යා ලේඛන අරගෙන බැලුවොත්, මන්නාරමටත්, මුලතිව්වලටත් පිටි පස්සෙන් අපි ඉන්නේ. ඒ තරම් දුප්පත්කමේ පතුලේ ඉන්නේ අපේ ගොවි මහතුන් යම්කිසි විධියකින් ආරක්ෂා කෙරෙන වැඩ පිළිවෙළක් හැදෙන්න ඕනෑ. කෙනෙකුට කියන්න පුළුවන්, "මෙට්‍රික්ටොන් 600,000ක, 700,000ක වාගේ සීනි අවශ්‍යතාවක් මේ රටේ තිබෙනවා. ඒකෙන් සියයට 10යි අපි නිෂ්පාදනය කරන්නේ" කියලා. ඒක මම පිළිගන්නවා. නමුත්, මේ කාරණයේදී ආරක්ෂා කරන්නේ, වී කර්මාන්තයේ යෙදිලා ඉන්න ගොවි මහතුන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා හෝ ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා හෝ අද කිව්වා, වී වගාව පිළිබඳව. -මට මතක නැහැ හරියටම කවුද කිව්වේ කියලා.- ඇත්ත, වී වගාවේ දැවැන්ත ගැටලුවක් අපට තිබෙනවා. එකක්, වැරදි කාලවල සහල් ආනයනය කිරීම. පහු ගිය කාලයේ අපි දැක්කා, වී නිෂ්පාදනය වෙලා වෙළෙඳ පොළට එන කොට සහල් ආනයනය කරන අවස්ථා. ඒ, අපේ වී නිෂ්පාදනය ගැන කල්පනා කිරීමක්, නැත්නම් ඒ ගැන කිසිම සැලකිල්ලක් නොකර ගත්ත තීරණයි. ඒ වැරදි තීන්දු තීරණ නිසා ගොවි මහතුන් අසරණභාවයට පත් වනවා.

වී නිෂ්පාදනයේදී අපි තේරුම් ගත යුතු තවත් දෙයක් තිබෙනවා. ඒ තමයි, අපි තවදුරටත් වී නිෂ්පාදනය වැඩි කරගෙන, වැඩි කරගෙන ගිහිල්ලා අභිංසක ගොවි මහතුන්ට තම නිෂ්පාදන ට්‍රැක්ටර්වල ගොඩ ගහගෙන පෝලිම්වල, පාරවල්වල රස්තියාදු වෙන්න ඉඩ දෙනවාද, එහෙම නැත්නම් ඒ අයව වෙනත් විකල්ප වගා ක්‍රමවලට යොමු කරනවාද කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තීරණයක් අරගෙන තිබෙනවා, උමා ඔය ව්‍යාපාරය යටතේ අපේ දිස්ත්‍රික්කයේ විතරක් අලුතෙන් වැව් 95ක් හදන්න. ඒ වැව් අනුපහේම ජලය වී වගාවට යොදා ගත්තොත්, නැවත "වී අතිරික්තය" කියන ප්‍රශ්නයට ගොවි මහතුන් අනිවාර්යයෙන් මුහුණ දෙනවා. අපි සංඛ්‍යා ලේඛන අරගෙන බැලුවොත් මේ රටේ නිෂ්පාදනය කරන මුං ඇට, කුරක්කන් ඇතුළු හැම භෝගයක්ම පිට රටින් ගෙන්වනවා. ඒ යම් කිසි ප්‍රමාණයක්. වී වගාවටම විතරක් ගොවි මහතුන් යොදවන්නේ නැතුව අලුත් ක්‍රම සහ විද්‍යාත්මක ක්‍රම පාවිච්චි

[ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා]

කරලා, අස්වැන්න වැඩි කරලා අපි ආනයනය කරන අනෙකුත් භෝගවල ඒ අඩුව පුරවන්න පුළුවන් නම්, මම විශ්වාස කරනවා, ඒ ගොවි මහතුන්ට අනිවාර්යයෙන්ම යම්කිසි ලාභයක් ගන්න පුළුවන් වෙයි කියලා. අපි තවදුරටත් ගොවි මහතුන් වී වගාවට යොමු කරලා, ඒ අය වී වගාව තුළ සිර කරලා, පාඩු ලබන තත්ත්වයට පත් කරනවාද, එහෙම නැත්නම් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන්න වැඩ පිළිවෙළක් හදනවාද කියන එක ගැන අපි කල්පනා කරන්න අවශ්‍යයි.

කෙනෙකුට කියන්න පුළුවන්, "සීනි නිෂ්පාදනයට අපේ දායකත්වය සියයට 10යි. එහෙම නම් මොකටද, සීනි මිල මෙච්චරම වැඩි කරන්නේ" කියලා. මම හිතන හැටියට අපේ රට් කරුණානායක ගරු මුදල් ඇමතිතුමාත් කල්පනා කරනවා ඇති, "පාරිභෝගිකයෝ අතිවිශාල පිරිසක් ඉන්නවා. අපි සීනි මිල මේ විධියට පවත්වාගෙන යන්නේ මොකටද?" කියලා. එපමණ විශාල පිරිසක් ඉන්න කොට මොකටද මේ ගැටලුවට මුහුණ පාන්නේ කියලා එතුමා කල්පනා කරන්න පුළුවන්. නමුත්, අද ලෝකයේ ප්‍රවණතාව මොකක්ද? ලෝකයේ ප්‍රවණතාව, සීනි පරිභෝජනය පොඩ්ඩ පොඩ්ඩ හෝ අඩු කරන්න. අපි උදාහරණයකට මෙක්සිකෝව වාගේ රටක් ගනිමු. ඒ රටවල අද සීනි පාවිච්චි කරලා යම් යම් බීම වර්ග හදනවා නම් ඒවාට වෙනම බද්දක් පනවනවා. මොකද, සීනි පරිභෝජනය තුළින් බෝනොවන රෝග - non-communicable diseases, NCDs - වැඩි වීමක් වන නිසා. එහෙම නම් අපේ රටේ සීනි පරිභෝජනය වැඩි කරලා සෞඛ්‍ය ක්ෂේත්‍රයට වැඩි මුදලක් වියදම් කරනවාද, නැත්නම් ඒ වැය වන මුදල ඉතුරු කරනවාද කියලා අපි දැන් තීරණයක් ගන්න අවශ්‍යයි.

ලෝක සෞඛ්‍ය සංවිධානය නිශ්චිත කරලා තිබෙන පරිදි, දිනකට ගන්න ඕනෑ සීනි ප්‍රමාණයට වඩා දෙගුණයක් විතර අපේ රටේ පාවිච්චි කරනවා. සාමාන්‍යයෙන් ඒක ආසියානු කලාපයේම රටවල වන දෙයක්. අපි මේවා ගැන කල්පනා කරන්න ඕනෑ. තවදුරටත් සීනි පරිභෝජනය වැඩි කරන්න අපි උදවු කරනවාද, එහෙම නැත්නම් සීනි යම්කිසි ස්ථාවර මිලක පවත්වාගෙන ගිහිල්ලා, අපේ මොනරාගල දිස්ත්‍රික්කයේ උක් වගාවෙන් ජීවත් වන විශාල ගොවි පිරිස ආරක්ෂා කරනවාද කියන කාරණය අපි කල්පනා කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම විශ්වාස කරනවා, ගරු ඇමතිතුමා ඉදිරිපත් කරලා තිබෙන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ වූ නියමයන් තුළින් යම්කිසි විධියකින් අපේ ගොවි මහතුන් ආරක්ෂා වෙයි කියලා. ඒ ගොවි මහතුන් අපි ආරක්ෂා කරන්න ඕනෑ. මොකද, අතිවිශාල පිරිසක් මේ ක්‍රමය තුළ තමන්ගේ ජීවිකාව කරගන්නා නිසා.

වී නිෂ්පාදනය විතරක් නොවෙයි, මිරිස් නිෂ්පාදනය, අර්තාපල් නිෂ්පාදනය ආදී හැම දෙයක්ම අපි අනිවාර්යයෙන්ම ආරක්ෂා කරන්න අවශ්‍යයි. ගොවි මහත්වරුන්ට ඒ පහසුකම් ටික දෙනවා විතරක් නොවෙයි, අපි අනිවාර්යයෙන්ම මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යා යුතුයි. දැන් මේ ගරු සභාවේදී කියැවුණා, වී නිෂ්පාදනයේ අඩුවක් වෙනවාය කියා. පොහොර සහනාධාරය පිළිබඳව ගත්ත අලුත් වැඩ පිළිවෙළ ගොවි මහත්වරුන්ගේ පැත්තෙන් හරි කියා මා විශ්වාස කරනවා. ඒකට හේතුව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා වැරදි පොහොර, තමන්ට ඕනෑ විධියට, රජයට අවශ්‍ය විධියට ගෙනැල්ලා -ආනයනය කරලා- ගොවි මහත්වරුන්ට බෙදා දුන් නිසා, ඒ පොහොර පාවිච්චි කරනවා හැර, ඒ ගොවි මහත්වරුන්ට වෙනත් විකල්පයක් තිබුණේ නැහැ. නමුත්, අද ගොවි මහත්වරුන්ට තීරණය කරන්න පුළුවන්, තමන්ට ලැබෙන මුදලින් රසායනික පොහොර පාවිච්චි කරනවාද, එහෙම නැත්නම් කාබනික පොහොර පාවිච්චි කරලා මීට වඩා හොඳ, අලුත් ක්‍රමයකට කෘෂිකර්මාන්තය කර ගෙන යනවාද කියන එක. ඒ නිසා වී වගාවට විතරක් නොවෙයි, මේ සෑම දේකටම අද රජය ගත්ත තීරණ නිවැරැදියි කියා මම විශ්වාස කරනවා. ඒ සෑම ක්‍රියාදාමයකින්ම ගොවි මහත්වරුන්ට යම් කිසි සහනයක් සලසන වැඩ පිළිවෙළක් අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ නිසා, ඉදිරි අවුරුදු හතර තුළ අනිවාර්යයෙන්ම මෙහි ප්‍රතිඵල අපට දකින්නට ලැබෙයි කියා මා විශ්වාස කරනවා. මේ සම්බන්ධයෙන් ගරු අගමැතිතුමා, ගරු ජනාධිපතිතුමා ලොකු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා.

තමුන්නාන්සේලා දන්නවා, පසු ගිය කාලයේ මේ රටට ආයෝජකයින් ආවේ නැහැ කියා. ආයෝජකයින් ලංකාවට එනකොට ඉස්සෙල්ලාම අහන්නේ, තමන්ට ලැබෙන සියයට ගණන කීයද කියලායි. ඒ නිසා ආයෝජකයින්ගේ පැමිණීම එන්න එන්නම අඩු වුණා. ඒ නිසා තමයි, වියට්නාමය, බංග්ලාදේශය, ඉන්දියාව වාගේ රටවලට ආයෝජකයින් ගියේ. මොකද, මේ රටට වඩා ඒ රටවලදී ආයෝජකයින්ට තමන් කරන නිෂ්පාදනවලට අවශ්‍ය වාතාවරණය හැදුණා. එයින් අපට වුණු පාඩුව අති විශාලයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලුත් ආයෝජකයින්ට මේ රටට එන්න අවස්ථාව දැන් ලැබිලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු අගමැතිතුමා පසු ගියදා කිව්වා, මොණරාගල දිස්ත්‍රික්කයටත් අපි ඉඩම් ටික වෙන් කර ගෙන තිබෙනවා කියා. මෙවැනි ආකාරයට ආයෝජකයින් ඒම තුළින්, රටේ නිෂ්පාදනය වැඩි වනවා විතරක් නොවෙයි, රැකියා ප්‍රශ්නයටත් -විරැකියාවටත්- විසඳුමක් ලබා දෙන්න පුළුවන් කියන විශ්වාසය මට තිබෙනවා.

මේ රටේ නිවැරැදි ආර්ථික කළමනාකරණයක් කර, ඉදිරි කාලයේදී මීට වඩා සෞභාග්‍යමත් රටක් බිහි කරන්න අපේ මුදල් ඇමතිතුමාට හැකියාව ලැබෙවායි කියා ප්‍රාර්ථනා කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්තවෙමින්, මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජනවාරි 28 දිනැති අංක 1951/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 29 දිනැති අංක 1956/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

IV

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 මාර්තු 08 දිනැති අංක 1957/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

V

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 අප්‍රේල් 01 දිනැති අංක 1960/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

VI

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 මැයි 12 දිනැති අංක 1966/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

VII

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 මැයි 20 දිනැති අංක 1967/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

VIII

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 16 දිනැති අංක 1971/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රේගු ආඥා පනත: යෝජනාව
சுங்கக் கட்டளைச் சட்டம் : கட்டளை
CUSTOMS ORDINANCE : RESOLUTION

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(235 වැනි අධිකාරය වන) රේගු ආඥා පනතේ 10 වැනි වගන්තිය යටතේ තිරු ගාස්තු සම්බන්ධයෙන් 2016 ජූනි 16 දිනැති අංක 1971/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත: නියමය
உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்) சட்டம் : கட்டளை
EXCISE (SPECIAL PROVISIONS) ACT : ORDER

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 අප්‍රේල් 29 දිනැති අංක 1964/70 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මැයි 2 දිනැති අංක 1965/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මැයි 16 දිනැති අංක 1967/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

IV

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මැයි 19 දිනැති අංක 1967/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු මොහොමඩ් නවවි මන්ත්‍රීතුමා.

මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් ජාතික පාසල් සංඛ්‍යාව වැඩි කිරීම
தேர்தல் தொகுதிகள் தோறும் தேசியப் பாடசாலைகளை அதிகரித்தல்
INCREASE OF NATIONAL SCHOOLS ON ELECTORAL BASIS

[5.30p.m.]

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Mr. Presiding Member, I move the following Adjournment Motion:

" Almost all over the country, it is observed that many districts have a very few National Schools functioning under the Central Government. Majority of the existing schools belong to Provincial Councils and each electorate contains only three or four schools. Many schools operating under Provincial Councils are found to be short of teachers, equipment, building etc., which are the essential facilities for a smooth functioning of a school.

The existing National Schools having such facilities are not equally distributed even among such electorates and therefore, often children in rural areas are not provided with equal opportunities for education as enjoyed by those who are in close proximity to cities.

Therefore, the Hon. Minister of Education is requested to take over at least two schools that are functioning under Provincial Councils from each electorate in the island to the Central Government and convert them to be National Schools providing them with sufficient resources so that equal opportunities will be opened up for children in all over the country thus shedding off the presently existing differences for educational opportunities for them."

Sir, with this Motion, I wish to draw the attention of the Hon. Minister of Education to the educational problems in different electorates.

As you know, there are a very few National Schools, probably two or three, in each electorate. Out of 75-100 schools in an electorate, only about three or four schools are being managed by the Central Government. In those schools administered by the provincial councils, children are suffering because of lack of facilities and are undergoing a lot of difficulties. When parents find out that facilities are not available in such schools in their electorate, they send their children to better schools in other areas. Therefore, if we open two or three National Schools with facilities in each electorate, we can solve this problem. Through the establishment of two or more National Schools in each electorate and upgrading the level of education of the students, the standard of education in each electorate could be made parallel to that of the schools in big cities like Colombo and Kandy.

Further, we have to upgrade the education in girls' schools administered by the provincial councils. It is also a problem. If we upgrade the education in those schools to the level of the National Schools, it will pave the way for us to provide equal opportunities for female students in higher education and also future development.

Through providing more National Schools in each electorate we can uplift education level in rural areas so that the standard of education in those areas would be the same as that of the big cities. With the establishment of more National Schools, the competitive situation that prevails at times of school admission will ease. Generally, all parents would like their children to go to good schools. But, if you establish two or three National Schools in each electorate and provide all the facilities - teachers, labs and so on - this competitiveness will definitely ease. Through the establishment of National Schools in each electorate, the personality of students in those areas will develop immensely due to opportunities available to take part in competitions at national level in the fields of sports, education and culture.

Also, the transfer of teachers serving in these National Schools, which has not taken place for a long period, could be properly implemented. Progress in the field of education can be achieved by sharing human and physical resources available in each National School. Through the establishment of more National Schools, the educational standards could be uplifted and backward areas could be developed.

Sir, why I brought this Motion is because we come across these problems in every area, every electorate and in every district we go to. The Hon. Minister of Education is doing his level best to uplift the level of education. As you know, earlier, only 2 per cent of the GDP was allocated for education, but this time, it has gone up to 6 per cent. The Hon. Minister is trying to provide facilities to all the schools.

According to my point of view, if we increase the number of National Schools that come under the Central Government, we can improve the standard of those schools in the future. Then, the students in rural areas or backward areas need not go outside and they will get an opportunity to enter a National School. In the Puttalam Electorate, which I represent, there are a lot of students who always try to go to Kandy, Colombo or Chilaw for education. But, there are poor students who are unable to do this. My electorate has only three National Schools whereas there are about 200 provincial schools. So, Hon. State Minister of Education, according to my suggestion, if we make another two or three National Schools under the Central Government, the Central Government can provide all the facilities and bring those schools up to the level of leading schools in the country. Then, the poor students who are capable, who are unable to leave their electorates for education, will definitely go to those schools and they will have the same facilities in the

[ගරු මොහොමඩ් නවවි මහතා]

future and they will prosper like the students of big schools such as Royal College, Trinity College and so on.

In my electorate, I have personally seen these problems. Sometimes, the poor children are unable to carry on their education. I know, earlier the setup was entirely different. Now the Government is spending so much money. The allocation for education has been increased to 6 per cent. But, still, the provincial schools are not getting adequate facilities. There is a shortage of teachers. If we establish a few more National Schools and provide them with teachers and other facilities, the children will get that benefit. Therefore, I request the Hon. Minister of Education and the State Minister of Education to consider my Adjournment Motion, so that the poor students who are capable can study in the their area without going out to another area.

Thank you very much.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman
இந்தப் பிரேரணையை நான் ஆமோதிக்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 5.37]

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට මම ස්තුතිවන්ත වෙනවා, මෙම සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගැන වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව. පළමුවෙන්ම අපි, දැනට තිබෙන මේ අධ්‍යාපන ක්‍රමවේදය දිහා බලමු. අපි දන්නවා, අද ලංකාවේ ජාතික පාසල් සහ පළාත් සභා පාසල් තිබෙන බව. විශේෂයෙන්ම මේ පළාත් සභා පාසල් දිහා බලන විට අපි දකින දෙයක් තමයි, පසු ගිය ආණ්ඩුව පැවති කාල වකවානුවේ පළාත් සභා පාසල් ක්‍රමවේදය දේශපාලනීකරණය වෙලා, ඒ දේශපාලනීකරණය සෑම තැනකම ඔඩුදුවලා තිබුණු බව. ඒ බලධාරින්, එහෙම නැත්නම් පළාතේ මහ ඇමතිවරයා, නැත්නම් පළාත් අධ්‍යාපන ඇමතිවරයා, ඒ පාසල්වල උගන්වපු හොඳ ගුරුවරු දේශපාලන හේතු නිසා මාරු කරපු අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ වාගේම පළාත් සභා පාසල්වල වැඩ බලන විදුහල්පතිවරු බොහෝ දෙනෙක් සිටියා. එහෙම හිටියේ දේශපාලන හේතු මත. මම හිතන හැටියට, ඒ ආයතනවලින්, පළාත් සභාවට අයත් පාසල්වලින් දේශපාලනීකරණය අයින් වුණොත් අද අපේ ගරු මොහොමඩ් නවවි මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වෙයි. සබරගමුව පළාත පමණක් ගත්තොත්, අද ඒ පළාත් සභාවට අයත් පාසල් විශාල ප්‍රමාණයක් වැසී ගිහින් තිබෙනවා. මධ්‍යම ආණ්ඩුවේ රේඛීය අමාත්‍යාංශයෙන් මුදල් දුන්නත්, ඒ මුදල් ක්‍රමානුකූලව පාසල්වල සංවර්ධනය සඳහා වියදම් නොකිරීම නිසායි ඒ පාසල් වැසී ගිහින් තිබෙන්නේ.

අපේ අධ්‍යාපන අමාත්‍යාතුමාගේ සංකල්පයක් අනුව, "හොඳම පාසල ළඟම පාසල" කරන්න ආසනයකින් පළාක් සභා පාසල් දෙකක් තෝරා ගෙන, ඒ පාසල් දෙක දියුණු කරන්න වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ ඉතා යෝග්‍යයි කියන එක මම මේ වෙලාවේදී ප්‍රකාශ කරනවා. ඒ මන්ද, එම පාසල් ජාතික පාසල් මට්ටමටම ගෙන ඒමට කටයුතු කරගෙන යන නිසා. මම සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රීවරයකු විධියට ඉඳලා තමයි පාර්ලිමේන්තුවට ආවේ. සබරගමුව පළාත් සභාවේ ඉන්න අධ්‍යාපන ඇමතිතුමාට අවශ්‍ය විධියට ක්‍රියා කරන්න ප්‍රධාන අමාත්‍යාතුමා ඉඩ දෙන්නේ නැහැ. මේක තමයි ඇත්ත කථාව. එතුමාට ඕනෑ විධියට ගුරුවරු මාරු කරනවා; ලැයිස්තුවලට අනුව ළමයින් පාසල්වලට ගන්නවා. ඒ වාගේම සුදුසුකම් තිබෙන ළමයාට ඒ පළාත් සභාවල පාසල්වලට ඇතුළත් වෙන්න අවස්ථාවක් දෙන්නේ නැහැ. ඒ නිසා මේ ක්‍රමවේදය වෙනස් වෙන්න ඕනෑ. ඒක තමයි අපේ ගරු මොහොමඩ් නවවි මන්ත්‍රීතුමා මේ වේලාවේ කියා සිටියේ. අපි පාසලක් වසනවාට වඩා, පාසලක් විවෘත කරලා තබන එක තමයි වැදගත්.

ඈත ගම්වල ඉන්න දරුවන් අද නගරයේ තිබෙන පාසල්වලට යන්න හදනවා. ඒකට හේතුව අද ග්‍රාමීය පාසල වැසී ගිහින් තිබෙන එකයි. වෙනත් රටවල ළමයෙක් ග්‍රාමීය පාසලකට ගිහින්, ඊළඟට තමයි ජාතික පාසලකට හෝ වෙනත් පාසලකට යන්නේ. අද ග්‍රාමීය පාසලකට ගියාම උගන්වන්න අවශ්‍ය ගුරුවරු ඒ පාසලේ නැහැ. එහෙම නැත්නම් ඩෙස්, බංකු නැහැ; ළමයාට උගන්වන්න අවශ්‍ය කරන කළු ලෑල්ලක් නැහැ; ගොඩනැගිලිවල වහල නැහැ; වැසිකිළියක් නැහැ. මේ වාගේ විශාල ප්‍රශ්න තිබෙනවා. මේ වන විටත් පාසල්වල වැසිකිළි හදන්න ගරු අධ්‍යාපන ඇමතිතුමා මුදල් වෙන් කරලා තිබෙනවා. හැබැයි, ඒ මුදල්වලින් පළාත් සභා පාසල්වල වැසිකිළි හැදෙනවාද නැද්ද කියන එකත් අපි සොයා බලන්න ඕනෑ. මොකද, ඒවායිනුත් මුදල් ගසා කන මහ ඇමතිවරු තමයි අද ඉන්නේ. අපි අද "යහ පාලන" ආණ්ඩුවක් හදලායි තිබෙන්නේ. ඒ "යහ පාලනය" සෑම විටම පළාත් සභාවේත් සිදු විය යුතුයි කියන එක මා මේ වේලාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දුන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා.

[අ.භා. 5.43]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු එම්.එච්.එම්. නවවි මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ වටිනා යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එම යෝජනාව ගැන සාකච්ඡා කරන මේ වෙලාවේ දී එහි අන්තර්ගතය නොවුණත් අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහසින් පසු නැවත මේ රටේ අධ්‍යාපනයේ ඉතාමත් විප්ලවකාරී පියවරක් ඉදිරියට තබන්න සූදානම් වන වෙලාවක්, මේ. ඉතිහාසයේ ඉඳලා 2015 වනතෙක් ආපු ගමනේ දී පැවැති විවිධ රජයන්, විවිධ ඇමතිවරුන් නොයෙකුත් තීන්දු තීරණ ගෙන තිබෙනවා. මේ ගරු සභාවේ මින් පෙර කථා වුණා වාගේ, ගමේ පාසල වැහිලා නගරයේ පාසල් අතළොස්සකට තරගකාරිත්වයක් ඇති වුණා. දරුවාගේ අධ්‍යාපනය වෙනුවෙන් දෙමව්පියන්ට දවසේ වැඩි කාලයක් පාසල් ළඟ රස්තියාදු වෙන්න සිදු වෙන පෞද්ගලික පන්ති ක්‍රමයක් ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වුණු, මංකොල්ලකාරී තත්ත්වයකට පත් වුණු අධ්‍යාපන ක්‍රමවේදයක් තමයි අපට උරුම වෙලා තිබුණේ. මේ

ක්‍රමවේදයෙන් අපව මුදවා ගන්න; අපේ ජාතිය මුදවා ගන්න විවිධ ඇමතිවරු, විවිධ නායකයන්, විවිධ ආණ්ඩු විවිධ යෝජනා ඉදිරිපත් කළා.

පසු ගිය කාලයේ "ද්විතීයික පාසල් ක්‍රමය" කියලා වැඩසටහනක් ආවා. ඒ වාගේම, "පාසල් දහසේ ව්‍යාපෘතිය" යටතේ මුළු රටම එකවර එක වැඩ පිළිවෙළකට ඇතුළත් කරන්න ක්‍රියා කළා. සමහර ගම්වලට ගියාම මේ වැඩ පිළිවෙළේ අනිසි ප්‍රතිඵල අද අපට දකින්නට ලැබෙනවා. දීර්ඝ කාලීනව කරපු අධ්‍යයනයකින් තොරව, එක එක අයගේ පෞද්ගලික අවශ්‍යතාවන් මත ද්විතීයික පාසල් ක්‍රමය සඳහා හිතුමතේට පාසල් නම් කර ගෙන තිබෙන වට පිටාවක් අපේ දිස්ත්‍රික්කවල පෙනෙන්න තිබෙනවා.

මම නියෝජනය කරන දිස්ත්‍රික්කය ගත්තොත්, එයට හොඳම උදාහරණයක් තමයි කරන්දෙනිය මධ්‍ය මහා විද්‍යාලය. මුළු කරන්දෙනිය මැතිවරණ කොට්ඨාසයටම තිබුණු එකම සම්පත එම පාසලයි. කරන්දෙනිය මැතිවරණ කොට්ඨාසයේ ඈත එපිට කෙළවරක පිහිටි ගමේ පාසලේ ඉගෙන ගන්නා දරුවෙකුට ශිෂ්‍යත්ව විභාගය සමත් වෙලා එන්න තිබුණු පාසල, අද පාසල් හතක දරුවන් එන පාසලක් බවට පත් වෙලා තිබෙනවා. අද ඒ ප්‍රදේශයේ ජනතාව ඒ නිසා විශාල ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා.

කුඩා තැන ඉඳලා නැඟිටලා ආපු -කනිෂ්ඨ විද්‍යාලයේ ඉඳලා දියුණු කරගෙන මහා විද්‍යාලය දක්වා ඉහළට ආපු- ඇතැම් පාසල් 6 ශ්‍රේණිය වනතෙක් සීමා කිරීමෙන්-පෝෂිත පාසල් බවට පත් කිරීමෙන්- පාසලක අවශ්‍යතාව මත ක්‍රමක්‍රමයෙන් දියුණු වෙලා ආපු පාසල්වලට බරපතළ මරු පහරක් වැදිලා තිබෙනවා. එම ප්‍රදේශවල ජනතාවත් ඒ නිසා අද විශාල ආන්දෝලනාත්මක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා; නොයෙකුත් මැසිවිලි නඟනවා.

වර්තමාන රජය ඉදිරිපත් කරපු වැඩසටහනේ තිබෙන්නේ, "ළඟම පාසල - හොඳම පාසල" කියන සංකල්පය. මේ සංකල්පය අනුව ගමේ පාසලේ මෙතෙක් තිබුණු භෞතික සම්පත්වල අඩුව මුලින්ම පුරවන්න තීරණය කර තිබෙනවා. ඒ එක්කම මානව සම්පත්වල අඩුව -පුහුණු ගුරුවරුන්ගේ හිඟය- පුරවමින් ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි වාගේ වැදගත් විෂයන්වලට අදාළ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගැනීම, ඒ වාගේම තාක්ෂණික විෂයන්, ක්‍රීඩා විෂයන් දියුණු කර ගමේ දරුවන්ට එම විෂයන් පිළිබඳව අධ්‍යාපනයක් ලබා ගන්න පුළුවන් තත්ත්වයට ගෙන ඒම තුළින් "ගමේ පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය හොඳ සංකල්පයක් බවට පත්වෙලා තිබෙනවා. හැබැයි, මේ සඳහා බාධාවක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ඇතැම් පළාත් සභාවලින් මේ වැඩ පිළිවෙළේ තිබෙන මුඛ්‍ය පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් සහයෝගයක් නොලැබීම තමයි ඒ බාධාව. ඒක තමයි ඇත්ත. සමහර උදවිය තවමත් පරණ පාරේම තමයි යන්න හදන්නේ. අලුතෙන් හිතලා යම් දෙයක් කරන්න ඔවුන්ට වුවමනාවක් නැහැ. අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් ගන්නා ධනාත්මක පියවර ආපස්සට හරවන ඇතැම් පිරිස් පළාත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අපට දකින්නට ලැබෙනවා. ඒ නිසා අධ්‍යාපන විෂය සම්බන්ධයෙන් මධ්‍යම රජය සහ පළාත් සභා අතර ඉතා හොඳ සම්බන්ධතාවක් තවමත් ඇති වෙලා නැහැ කියන එකයි මට හිතෙන්නේ. එවැනි අඩුවක් අපට පෙනෙන්න තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාගේ පෞද්ගලික මතය නම් තමන්ගේ දරුවන් නගරයේ පාසලකටම යැවිය යුතුයි කියලා ගමේ මිනිසුන් තුළ තිබෙන ආකල්පයෙන් ඔවුන් මුදා ගන්න තිබෙන එකම විසඳුම තමයි අස්වීම් සහතිකය පාසලේ නමින් නිකුත් කිරීම නතර කිරීම. ගාල්ල දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස 10 තුළ කුමන පාසල හැදුවත්, ජාතික පාසල කියලා නම් කළත්, වෙනත් විධියකින් නම් කළත්, නගරයේ තිබෙන පාසල් හතරට-පහට තමයි ඉල්ලුම තිබෙන්නේ. එක්කෝ රිච්මන්ඩ් විද්‍යාලයට, එක්කෝ සංඝමිත්තා විද්‍යාලයට, එක්කෝ සවුත්ලන්ඩ්ස් විද්‍යාලයට, එක්කෝ මහින්ද විද්‍යාලයට තමයි ඉල්ලුම තිබෙන්නේ. ඈත ගමක ඉන්න ගොවියා, නැත්නම් ගෙවිලිය තමන්ගේ දරුවා අර ගෙන ඇවිල්ලා නගරයේ රස්කියාදු වෙනවා. ඒ නිසා ඔවුන්ගේ ගොවිතැන් කටයුතු කඩාකප්පල් වෙලා තිබෙනවා. ඇතැම් ස්ථානවල පෞද්ගලික ජීවිතත් කඩාකප්පල් වෙලා තිබෙනවා. මේ ගැටලුවට දෙන්න පුළුවන් හොඳම විසඳුම තමයි අපොස සාමාන්‍ය පෙළ විභාග හා අපොස උසස් පෙළ විභාග සහතික නිකුත් කරනවා වාගේම අස්වීම් සහතිකයත් පාසලේ නමින් නිකුත් කරන්නේ නැතුව අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කිරීම. එහෙම ක්‍රම වේදයක් හදන්න පුළුවන් නම්, මේ ආකල්පය පසු පස දිව යාම නතර කරන්න පුළුවන් කියලා මම පෞද්ගලිකව විශ්වාස කරනවා.

දරුවාගේ දක්ෂතාවන් හඳුනා ගන්නට ඕනෑ, පළමු වන-දෙවන ශ්‍රේණිවල ඉඳලායි. පහ වසර ශිෂ්‍යත්ව විභාගයට මම පෞද්ගලිකව මුළුමනින්ම විරුද්ධයි. පහ වසර ශිෂ්‍යත්ව විභාග ක්‍රමය නතර විය යුතුයි. දරුවාගේ දක්ෂතාව පැය තුනක ප්‍රශ්න පත්‍රයකින් මනින්න බැහැ. ඒ වෙනුවට දරුවාගේ දක්ෂතාව හඳුනා ගෙන, හැකියාව හඳුනා ගෙන, ඔවුන්ගේ කුසලතාව හඳුනා ගෙන කටයුතු කරන්න ඕනෑ. අපේ රජය අපොස සාමාන්‍ය පෙළ විභාගයෙන් දරුවන් අසමත් කරන්නේ නැතුව අපොස උසස් පෙළ විභාගය දක්වා අවුරුදු 13ක් පාසල් යන්න අවස්ථාව ලබා දෙන්න තීරණය කර තිබෙනවා. එක් එක් දරුවා ගැන වෙන වෙනම තොරතුරු ගබඩාවක් සකස් කරලා, එක් එක් දරුවාගේ හැකියාවන් හඳුනා ගෙන, එක් එක් දරුවා අපොස උසස් පෙළ විභාගය සඳහා තෝරා ගත යුත්තේ කුමන විෂයද කියලා තීරණය කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ අනුව ක්‍රීඩාවටද, කලාවටද, එහෙම නැත්නම් විද්‍යාවද, ගණිතයද දරුවා වඩාත්ම දක්ෂකම් දක්වන ක්ෂේත්‍රය කියලා හඳුනා ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ අනුව එම දරුවාට ඉදිරියට යන්න මාර්ගය හදලා දිය යුතුයි. අවසානයේදී අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් අස්වීම් සහතිකය නිකුත් විය යුතුයි කියන එක තමයි මාගේ විශ්වාසය වන්නේ. ඒ වාගේම ඊට සමගාමීව හැම දරුවෙකුටම සම සේ ක්‍රීඩා පහසුකම් ලැබෙන පරිදි අඩු ගණනේ අධ්‍යාපන කොට්ඨාස මට්ටමෙන්වත් ක්‍රීඩා සංචිත පිහිටුවිය යුතුයි. එතකොට ගමේ දරුවන් ක්‍රිකට් ගහන්න ඕනෑය කියලා නගරයේ පාසලට එන්නේ නැහැ. ගමේ දරුවන් මැරතන් එකට ලැහැස්ති වෙන්න ඕනෑය කියලා නගරයේ පාසලට එන්නේ නැහැ. ඒ වාගේම අධ්‍යාපන කොට්ඨාස මට්ටමෙන්වත් තාක්ෂණික විද්‍යාගාර ආදී පහසුකම් ලබා දිය යුතුයි. එහෙම ක්‍රමවේදයක් හැදුවොත් තමයි අද අපේ ගම්බද දෙමව්පියන් ඇලී ගැලී සිටින ආකල්පයෙන් ඔවුන් මුදා ගන්න පුළුවන් වන්නේ කියා මම විශ්වාස කරනවා.

ගරු මොහොමඩ් නවවි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවෙන් කියන්නේ හැම මැතිවරණ කොට්ඨාසයකටම සම සේ ජාතික පාසල් පිහිටුවිය යුතුයි කියලායි. එහෙම විෂමතාවක් අද රටේ තිබෙනවා. ඒක ඇත්ත. ඒ සම්බන්ධයෙන් පුළුල් කතිකාවතකට යා යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව මාගේත් එකඟතාව පළ කරනවා. තවත් කරුණු බොහොමයක් ගැන කථා කරන්න ඕනෑ වුණත් තවත් කරීකයන් බොහොමයක් ඉන්නා නිසා එය පසුවට කල් තබමින්, කාල වේලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මෙම යෝජනාව ඉදිරිපත් කිරීම ගැන ගරු මොහොමඩ් නවවි මන්ත්‍රීතුමාට මාගේ ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

[பி.ப. 5.53]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌர உறுப்பினர் நவவி அவர்களினால் முன்வைக்கப்பட்ட ஒத்தி வைப்புப் பிரேரணையின்மீது என்னுடைய கருத்துக்களையும் தெரிவிக்க விரும்புகின்றேன். அனுராதபுர மாவட்டத்திலே தமிழ்மொழிமூலமான தேசியப் பாடசாலை ஒன்றே ஒன்றுதான் இருக்கின்றது என்பதை நான் கல்வி இராஜாங்க அமைச்சரிடம் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். அந்த வகையில் சிறந்த முறையில் உயர்தரக் கல்வியைக் கற்பதற்கான தமிழ்மொழி மூலப் பாடசாலை ஒன்றுகூட இல்லாத நிலையில்தான் அந்த மாவட்டம் விளங்குகின்றது. அங்குள்ள 64 பாடசாலைகள் மாகாண சபைக்கு உரித்தானதாக இருக்கின்றன. சாஹிரா கல்லூரி என்ற ஒரேயொரு பாடசாலை மாத்திரமே மத்திய அரசின்கீழ் இயங்குகின்றது. அது கடந்த ஆட்சிக் காலத்தில் பல வருடங்களாக பெயரளவில்தான் தேசியப் பாடசாலையாக விளங்கியது. இதனால், என்னுடைய மாவட்டத்தில் குறைந்த பட்சம் ஐந்து பாடசாலைகளையாவது தேசியப் பாடசாலை களாகத் தரமுயர்த்துமாறு கௌரவ கல்வி இராஜாங்க அமைச்சரிடம் நான் பணிவன்புடன் கேட்டுக்கொள்கின்றேன்.

அதுமட்டுமல்ல, அங்கு Science, Maths போன்ற பிரிவுகளில் உயர் கல்வி கற்பிப்பதற்கான தரமான பாடசாலைகள்கூட இல்லை. அங்கு மிகக் கெட்டித்தனமான மாணவ மாணவிகள் இருக்கின்றார்கள். ஆனால், அவர்களுடைய கெட்டித்தனத்தை வெளிக்காட்டுவதற்கு அங்கு எந்தச் சந்தர்ப்பமும் அமைவ தில்லை. இப்படியானதொரு சூழ்நிலையில்தான் அனுராதபுர மாவட்டத்தின் கல்விநிலை இருக்கின்றது. இன்று நாங்கள் பரவலாக எடுத்துப் பார்த்தால் கொழும்பு, கண்டி போன்ற மாவட்டங்களில் கல்வியின் தரம் அதிகரித்துக் காணப்படுவதை அவதானிக்கலாம். அதேநேரம் தேசியப் பாடசாலை என்ற திட்டத்திலே பல பெரும் பாடசாலைகள் உள்வாங்கப்பட்டுள்ள போதிலும் எங்களுடைய பாடசாலைகளில் ஒரேயொரு பாடசாலை மட்டுந்தான் அந்தத் திட்டத்திலே உள்வாங்கப் பட்டுள்ளது. இதனைக் கவனத்திற்கொண்டு அங்குள்ள மாணவர்களும் உயர் கல்வியைத் தொடரவேண்டும்; தொழில்நுட்பரீதியில் முன்னேற்றம் காணவேண்டும்; கல்வியில் வெளியுலகோடு போட்டிபோட வேண்டும் என்ற அடிப்படையில் அதற்குரிய ஏற்பாடுகளைச் செய்து தருமாறு இந்தச் சபையினூடாக நான் கேட்டுக்கொள்கின்றேன்.

கல்வி என்பது இலங்கையில் மட்டுமல்ல, உலகிலேயே முக்கிய இடத்தை வகிப்பதனால் கௌரவ உறுப்பினர் நவவி அவர்கள் கல்வியின் முக்கியத்துவத்தைப் பற்றிய விடயங்களை இந்தச் சபையில் விரிவான முறையிலே முன்வைத்தார். அவருடைய முன்மொழிவையும் என்னுடைய முன்மொழி வையும் ஒரு பக்கத்தில் ஒதுக்கிப் போட்டுவிடாமல் அவற்றை நடைமுறைப்படுத்துவது தமிழ் மொழி பேசக்கூடிய கௌரவ கல்வி இராஜாங்க அமைச்சர் அவர்களின் கடமைப்பாடாகும்.

அனுராதபுர மாவட்டத்திலே விவேகானந்தா என்ற ஒரு மாபெரும் மனிதனின் பெயரில் உருவாக்கப்பட்ட கல்விச் சாலை ஒன்றிருக்கின்றது. விவேகானந்தர் அவர்கள் இலங்கை யில் மட்டுமல்ல முழு உலகத்திலும் பிரசித்தித்திபெற்ற ஒருவராக விளங்கியவர். ஆனால், இன்று அந்தப் பாடசாலை பெயரள வில்தான் இயங்குகின்றது. இன்று அந்தப் பாடசாலை இருக்கும் நிலையைக் கண்டிப்பாக நீங்கள் வந்து பார்க்க வேண்டும்; அதைப் பற்றிய விடயங்களை அறியவேண்டும். அந்தப் பாடசாலை பெயரளவில்தான் உயர்தரப் பாடசாலை யாக இருக்கின்றது. ஆனால், செயல் ரீதியில் அங்கு ஒன்றுமே யில்லை. அந்தப் பாடசாலை அமைந்திருக்கும் இடத்தைக்கூட மாகாண அரசு கைப்பற்றுவதற்குப் பல முயற்சிகள் செய்துவருகின்றது. அதனைப் பாதுகாக்க வேண்டியது கல்வி இராஜாங்க அமைச்சராகிய உங்களுடைய கடமையாக இருக்கின்றது.

இந்த நாட்டிலே மிகப் பொறுப்பான கல்வி அமைச்சை எங்களுடைய மேதகு ஜனாதிபதி அவர்களும் மாண்புமிகு பிரதமர் அவர்களும் கௌரவ அமைச்சர் அக்கில விராஜ் காரியவசம் அவர்களுக்குக் கொடுத்துள்ளார்கள். அவர் முக்கியமான, திறமைமிக்க ஓர் அமைச்சர். அவர் பொருத்த மான ரீதியில் அநுராதபுர மாவட்டத்திலுள்ள 64 பாடசாலை களில் ஆகக் குறைந்தது 34 பாடசாலைகளுக்கு இன, மத பாகுபாடின்றி 410 மில்லியன் ரூபாயை வழங்கியுள்ளார். கடந்த 20 வருட காலத்தில் இருந்த ஆட்சியாளர்கள் ஒரு போதும் அநுராதபுர மாவட்டத்தின் கல்விக்கு எந்தவகையிலும் உதவி செய்யவில்லை. ஆனால், கௌரவ அமைச்சர் அவர்கள் பதவிக்கு வந்தவுடனே 410 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்தார். அதுமட்டுமல்ல, அங்குள்ள தேசியப் பாடசாலை யான சாஹிரா கல்லூரிக்கு 110 மில்லியன் ரூபாயையும் அவர் ஒதுக்கியிருந்தார். இப்படியான ஒரு மகத்தான பணியை இந்த அரசு செய்துள்ளது. அந்தவகையில், மத்திய மாகாணத்தைப் போன்று அநுராதபுர மாவட்டத்தையும் உங்கள் உள்ளத்தி லெடுத்து, நாங்கள் முன்வைத்த முன்மொழிவுகளை நீங்கள் நிறைவேற்றவேண்டுமென்று மீண்டும் கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களிடம் தாழ்மையாகக் கேட்டுகொள்வதோடு, எனக்கு இங்கு பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியையும் கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 5.58]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දින ගරු මොහොමඩ් නවවි මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ගෙන ආ ජාතික පාසල් ප්‍රමාණය වැඩි කිරීම සහ එම පාසල්වලට අදාළ පහසුකම් වැඩි කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාව වෙනුවෙන් මටත් කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධව පළමුවෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඇත්තටම ජාතික පාසල් නොතිබුණා නම් අද වනවිට බොහෝ වේලාවට ග්‍රාමීය ප්‍රදේශවල තිබෙන පාසල්වල උසස් පෙළ අධ්‍යාපනය ක්‍රියාත්මක නොවෙන මට්ටමක් වෙන්න තිබුණා. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශ ගත්තාම, "ජාතික පාසල්" සංකල්පය නොතිබුණා නම් එම දරුවන්ට උසස් පෙළ අධ්‍යාපනය ලබන්නට ස්ථානයක් නැහැ. එම ජාතික පාසල්වල තිබෙන්නේත් උසස් පෙළ කලා විෂයයන් පමණයි. මේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අපි අද මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, ග්‍රාමීය ප්‍රදේශවල තිබෙන පාසල්වලට විද්‍යා, ගණිත, ඉංග්‍රීසි සහ තාක්ෂණික විෂයයන් සඳහා ගුරුවරුන් සොයා ගන්නට නොහැකිවීම. පත්වීම්

ලබා දීලා නගරයෙන් කොතරම් ගුරුවරු ප්‍රමාණයක් ග්‍රාමීය ප්‍රදේශවලට යැව්වත්, ඔවුන් ඉතා ඉක්මනින් ඒ පළාත්වලින් මාරුවීම් ලබා ගෙන එනවා.

අපි කොතරම් සොයා බැලුවත්, උසස් පෙළ විභාගයට පෙනී සිට විද්‍යා, ගණිත, ඉංග්‍රීසි සහ තාක්ෂණික විෂයයන්වලට අදාළව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා ගත් උපාධිධාරීන් සොයා ගැනීමට අපට හැකියාවක් නැහැ. අද වෙනකොට උතුරු-මැද පළාතේ උපාධිධාරි ගුරු පත්වීම් ලබා දෙන්න කටයුතු කරමින් පවතිනවා. විශේෂයෙන්ම විද්‍යා, ගණිත, ඉංග්‍රීසි සහ තාක්ෂණික විෂයයන්වලට අදාළව ප්‍රශ්න පත්‍ර දෙකකින් යුත් -එක ප්‍රශ්න පත්‍රයකට ලකුණු සියය බැගින් ලකුණු දෙසියයක් ලබා දෙන- විභාගයට පෙනී සිට එයින් ලකුණු 40ක්වත් ගන්න බැරි අපේක්ෂකයන්ට පවා ගුරු පත්වීම් ලබා දිය යුතු තැනට අද පත් වෙලා තිබෙනවා. මෙයට හේතුව තමයි, ජාතික පාසල ගත්තත් එම පාසල්වල උසස් පෙළ විද්‍යා, ගණිත හා ඉංග්‍රීසි වැනි විෂයයන් ඉගැන්වීම බොහොම අඩුවීම. උගන්වනවා අඩුයි. ඒ නිසා දරුවන් බොහෝ විට යොමු වෙන්නේ අදාළ පාසලේ තිබෙන විෂයයන්වලට විතරයි. දුර බැහැර යවා හෝ විද්‍යා, ගණිත, ඉංග්‍රීසි හා තාක්ෂණික විෂයයන්වලට අදාළ අධ්‍යාපනය ඒ දරුවන්ට ලබා දෙන්න තරම් ඔවුන්ගේ දෙමවුපියන්ට හැකියාවක් නැහැ. ආර්ථික පසුබිමක් නැහැ. ඒ නිසා මේ විශේෂිත වූ විෂයයන් සම්බන්ධයෙන් අද අපට බරපතළ වූ තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. අද වෙනකොට අධ්‍යාපන ක්ෂේත්‍රයේ බලධාරින් පෙලඹී තිබෙනවා, උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි දරුවන් එම විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගෙන උසස් පෙළ ගුරුවරුන් වශයෙන් පුහුණු කරන්නට. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා බිහි කළ නිදහස් අධ්‍යාපන සංකල්පය තුළ මධ්‍යම රජයෙන් ක්‍රියාත්මක වන ජාතික පාසල් ක්‍රමයක් තිබෙන අවස්ථාවකදී පවා අද අපේ රටේ අධ්‍යාපනය එවැනි මට්ටමකට පත් වෙලා තිබෙනවා.

මේ ජාතික පාසල් ප්‍රමාණයත් නොතිබුණා නම් මේ රටට වෙන්නේ මොකක්ද කියා ඒ අනුව අපට හිතා ගන්න පුළුවන්. ඒ නිසා පළාත් සභා පාසල්වලින් කිහිපයක් හෝ පවරා ගෙන ජාතික පාසල් මට්ටමට එම පාසල්වලටත් පහසුකම් ලබා දීලා ඉගැන්වීම සහ එම පාසල් මධ්‍යම ආණ්ඩුව මගින් ක්‍රියාත්මක වන, පාලනය වන පසු බිමක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් ගරු මොහොමඩ් නවවි මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව හොඳ අදහසක් වශයෙන් මම දකිනවා. මෙම ජාතික පාසල්වලටත් මම පෙර සඳහන් කළ විද්‍යා, ගණිත, ඉංග්‍රීසි සහ තාක්ෂණික විෂයයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් මට්ටමින් ගුරුවරුන් ලබා දිය යුතුයි කියා මා මේ අවස්ථාවේදී විශේෂයෙන් කියන්න කැමැතියි. ඒ වාගේම මේ ජාතික පාසල් තුළ ගුරුවරුන් මාරු කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවක් තිබෙනවා. ඒකට හේතුව තමයි ජාතික පාසල් ප්‍රමාණය සුලභ නොවීම. සුලභ ජාතික පාසල් ප්‍රමාණයක් තිබුණා නම් එසේ ගුරුවරුන්ගේ මාරුවීම් කරන්න හැකියාව තිබුණා. ඒ වුණාට තිබෙන ජාතික පාසල් ප්‍රමාණය බොහොම ස්වල්පයක් නිසා ඒ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නැහැ.

වර්තමාන රජයේ අධ්‍යාපන ඇමතිතුමා විසින්, "ළඟම පාසල - හොඳම පාසල" සංකල්පය යටතේ, මේ පාසල්වල තත්ත්වය ඉහළ නංවන්නට රුපියල් මිලියන 63,000ක් වෙන් කරලා තිබෙනවා. හැබැයි, ඒ මුදල් පළාත් සභා පාසල්වලට යොමු කරන නිසා, පළාත් සභාවලට ඒ මුදල් ලබා දෙන්නට සිද්ධ වුණා. අද වන විට ඒ පළාත්වල ඉන්න මහ ඇමතිවරුන්ගේ ක්‍රියා කලාපයත් එක්ක, ඒ මුදල්වලින් බලාපොරොත්තු වන ඉලක්කවලට යාමේ හැකියාව තිබෙනවාද, නැතිද කියන එක පිළිබඳව ගැටලුවක් මතු වෙනවා. ඒ වාගේම, මේ ජාතික පාසල්වල තත්ත්වය ඉහළ නංවන කොට, අධ්‍යාපනය සම්බන්ධයෙන් විතරක් බැලීම ප්‍රමාණවත් වන්නේ නැහැ. ඒ ඒ පාසල්වල ක්‍රීඩා, සුභසාධන කටයුතු, විශේෂයෙන්ම වැසිකිළි-කැසිකිළි පහසුකම් ගැන සොයා බැලිය යුතුයි. වැසිකිළි-කැසිකිළි පහසුකම් නොතිබුණු පාසල් සියයට 10ක පමණ ප්‍රමාණයක් පසු ගිය කාලයේ තිබුණා. ඒ සම්බන්ධයෙනුත් විශේෂයෙන් සැලකිල්ල යොමු කළ යුතුයි. ඒ වාගේම පසු ගිය රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ භෞතික සම්පත් දියුණු කරන්න පාසල්වලට මුදල් වෙන් කළා. ඒ මුදල්වලින් සිදු වුණේ, පාසල්වල සංවර්ධන කටයුතුවලට වැඩිය තමන්ගේ හිතවාදීන්ට කොන්ත්‍රාත් ලබා දීමේ කටයුතුයි. සමහර පාසල්වලට විද්‍යාගාර ලබා දුන්නා. මම දන්නා එක පාසලක් තිබෙනවා. ළමයින් 34දෙනෙකු ඉන්න ඒ පාසලට විද්‍යාගාරයක් ලබා දීලා තිබෙනවා. හැබැයි මධ්‍යම ආණ්ඩුවෙන් ක්‍රියාත්මක වන මධ්‍ය මහා විද්‍යාලයට ඒ විද්‍යාගාරය ලැබුණේ නැහැ.

අපි මනා සැලසුමකින් යුතුව ජාතික පාසල් නිර්මාණය සහ සංවර්ධනය කළොත් අධ්‍යාපන වශයෙන් අපට විශාල දියුණුවක් ලබා ගන්න හැකි වෙයි කියලා මා විශ්වාස කරනවා. ජාතික පාසල් වේවා, පළාත් පාසල් වේවා, දුෂ්කර පළාතක පාසලකට යන ගුරුවරයෙකුට අද මුහුණ දෙන්න සිදු වෙන්නේ අකිශයින්ම දුෂ්කර තත්ත්වයකටයි. සමහර වෙලාවට ඒ පාසලට විදුලිය නැහැ. සමහර පාසල්වලට ජල පහසුකම් නැහැ; ප්‍රවාහන පහසුකම් නැහැ. සමහර ගුරු නිවාසවල හරි හැටි වහලයක්වත් නැහැ. ඒ නිසා විශේෂයෙන්ම මේ පාසල් සංවර්ධනය කිරීමේ කාර්යභාරයේදී මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ.

ගුරුවරයෙක් වශයෙන් පත් කරලා පාසලකට යවන කොට විශේෂයෙන්ම දුෂ්කර ප්‍රදේශවල පාසලකට යවන කොට ඒ ගුරුවරයාට ඒ පළාතේ ජීවත් වෙන්න පුළුවන් පසුබිම නිර්මාණය වෙන්න ඕනෑ. ඒ ගුරුවරයාට දුෂ්කර පළාතට ගිහිල්ලා, ඉන්න ගුරු නිවාසය හරියට නැත්නම්, ඒ අවශ්‍ය කරන ජල පහසුකම්, විදුලිය පහසුකම් නැත්නම් ඒ ගුරුවරයා ඒ ස්ථානයේ ඉන්නේ නැහැ. ඒ වාගේම ආරක්ෂාව තිබෙන්න ඕනෑ.

විශේෂයෙන්ම උතුරුමැද වාගේ පළාත් ගත්තාම වල් අලි තර්ජනය අද බරපතළ ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. සමහර ගුරුවරුන් වල් අලි ප්‍රහාරවලින් මිය ගිහිල්ලා තිබෙනවා. ඒක නිසා මේ කටයුත්තේදී විශේෂයෙන්ම ඒ දුෂ්කර පළාත්වල සේවය කරන ගුරුවරුන්ගේ පහසුකම් නහා සිටුවීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතුයි කියලා ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා.

ඊට කලින්, ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා (ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன் - கிராமிய பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ameer Ali Shihabdeen - Deputy Minister of Rural Economic Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේ ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. MUJIBUR RAHUMAN *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

[பி.ப. 6.06]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

இன்று கௌரவ உறுப்பினர் முஹமட் நவவி அவர்களினால் கொண்டுவரப்பட்டிருக்கின்ற, தேசியப் பாடசாலைகளை அதிகரிக்கவேண்டும் என்ற பிரேரணை தொடர்பாகப் பேசுவதற்கு எனக்கும் சந்தர்ப்பம் வழங்கியமைக்காக நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். உண்மையிலே இது மிகவும் முக்கியமான ஒரு விடயமாக இருக்கின்றது. இன்று கிழக்கு மாகாணத்தில், குறிப்பாக திருகோணமலை மாவட்டமானது கல்வியில் பின்தங்கிய மாவட்டமென்று உச்சரிக்கப்படுகின்றது. எத்தனையோ பாடசாலைகள் அவற்றுக்கான அடிப்படை வசதிகளில்லாமல் இயங்கிக் கொண்டிருக்கின்ற ஓர் அவல நிலையைப் பார்க்கக்கூடிய ஓர் இடமாக எங்களுடைய மாவட்டம் இருக்கின்றது. அதாவது, ஒரே வகுப்பறையில் 3 அல்லது 4 வகுப்புக்கள் நடைபெறுகின்ற பாடசாலைகள், வெறும் பெயரளவிலே பாடசாலைகளாகப் பதிவு செய்யப்பட்ட பாடசாலைகள், 20 ஆசிரியர்கள் தேவைப்படுகின்ற பாடசாலைகளுக்கு வெறுமனே 8 அல்லது 7 ஆசிரியர்களைக் கொண்ட பாடசாலைகள் எனக் குறைகள் நிறைந்த பாடசாலைகளைக் கொண்ட ஒரு மாவட்டமாகவும் பாடசாலைக் கல்வி விடயத்திலே பின்தங்கிய மாவட்டமாகவும் அது இருக்கின்றது. ஆகையால், எங்களுடைய மாணவ மாணவிகள் மிகவும் திறமைசாலிகளாக இருந்தாலும் அவர்களுடைய திறமைகளை வெளிக்கொண்டுவர முடியாமல் முடக்கப்படுகின்ற நிலைதான் இன்று எங்களுடைய பிரதேசத்திலே நிலவுகின்றது.

மேலும், எத்தனையோ வருடங்களுக்குப் பின்னர் நாம் எதிர்பார்க்க முடியாத அளவுக்கு இன்று இந்த அரசாங்கத்தினால் கல்விக்காகப் பாரிய நிதி ஒதுக்கப்பட்டிருந்தாலும், அந்த ஒதுக்கீடுகள் சரியான முறையில் அந்தந்தப் பாடசாலைகளுக்கு அல்லது கல்வித் துறைக்குப் பயன்படுத்தப்படுகின்றனவா? என்பதைக் கண்காணிப்பதற்கும் நடவடிக்கை எடுக்கப்படவேண்டும் என்று கௌரவ அமைச்சர் அவர்களிடம் நான் வேண்டிக்கொள்கின்றேன். ஏனென்றால், இதற்குமுன் கல்விக்கென்று எத்தனையோ வேலைத்திட்டங்கள் முன்வைக்கப்பட்டாலும் எவ்வளவோ நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப்பட்டாலும் அவற்றை முழுமையாக அனுபவிக்க முடியாதவர்களாக எங்களுடைய பிரதேசத்திலுள்ளவர்கள் இருந்தார்கள். இன்று திருகோணமலை மாவட்டத்தில் மூதூர், கிண்ணியா போன்ற பகுதிகளில் திறமையான மாணவர்கள் இருந்தும் அவர்களுக்கு கணித, விஞ்ஞானப் பிரிவுகள் இல்லாத ஒரு நிலையே காணப்படுகின்றது. எனவே, எதிர்காலத்திலே சிறந்த மாணவர்களை உருவாக்க வேண்டுமென்றால், வெறுமனே ஒதுக்கீட்டிலும் பேச்சிலும் அவர்களின் கல்வியைப் பற்றிக் கதைத்துக்கொண்டிருப்பதை விடுத்து, இதற்கான தீர்வுகளை எட்டக்கூடிய விடயங்களை முன்னெடுக்க வேண்டும்.

குறிப்பாக என்னுடைய தொகுதியை எடுத்துக்கொண்டால், அங்கு இரண்டு பாடசாலைகள்தான் தேசியப் பாடசாலைகளாக இருக்கின்றன. அவற்றுடன் இன்னும் இரண்டு தேசியப் பாடசாலைகளை அமைப்பதற்கான வேண்டுகோளை நான் கௌரவ அமைச்சர் அவர்களிடம் ஏற்கெனவே விடுத்திருக்கின்றேன். எனவே, அதற்கான நடவடிக்கைகளையும் முயற்சியையும் கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ள வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

எமது மாகாணத்திலும் கல்வி விடயத்தில் இன்று ஏதோவொரு வகையிலே புறக்கணிப்புகள் நடந்துகொண்டிருக்கின்றன. திறமையான மாணவர்கள் இருந்தும் ஏதோவோர் அடிப்படையில் இன்று அவர்களுடைய திறமைகள் வெளிக்கொணரப்படாத செயற்பாடுகள் நிகழ்ந்துகொண்டிருக்கின்றன. எனவே, இவ்வாறான விடயங்களை விசேட கண்காணிப்பின்கீழ் எதிர்நோக்கி அதற்கான தீர்வுகளை கௌரவ அமைச்சர் அவர்கள் பெற்றுத்தர வேண்டுமென்றும் இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்பு கின்றேன்.

உண்மையிலே இந்தப் பிரேரணை மிகவும் முக்கியமான தொன்றாகும். இன்று நாங்கள் மாகாண சபையில் இருக்கின்ற அமைச்சர்களைக் குற்றஞ் சாட்டிக்கொண்டிருக்கின்றோமேயொழிய, அவர்களுக்கு நிதி எவ்வாறு கிடைக்கின்றது என்பதைப் பற்றிச் சிந்திப்பதில்லை. அவர்கள் மத்திய அரசிடமிருந்து நிதியைப் பெற்றே அந்தச் செயற்பாடுகளைச் செய்யக் காத்துக்கொண்டிருக்கிறார்கள். இன்று எத்தனையோ பாடசாலைகளில் அதிபர், ஆசிரியர்கள் பற்றாக்குறை இருந்துகொண்டிருக்கிறது. அதுமட்டுமல்ல, பாடசாலை ஊழியர் நியமனங்களைக்கூட மாகாண சபையினால் செய்யமுடியாத சூழ்நிலை காணப்படுகின்றது. எனவே, மாகாண சபையின் கீழான மிகவும் திறமையான சில பாடசாலைகளை இனங்கண்டு அந்தப் பாடசாலைகளைத் தேசியப் பாடசாலைகளாகத் தரமுயர்த்துவதற்கான நடவடிக்கையை கௌரவ அமைச்சர் அவர்கள் எடுக்க வேண்டுமென்று கேட்டுக்கொண்டு, இந்தப் பிரேரணையைக் கொண்டுவந்தமையையிட்டு கௌரவ நவவி அவர்களுக்கு மீண்டும் இந்த இடத்தில் நன்றியைக் கூறி, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

[பி.ப. 6.11]

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - புனர்வாழ்வளிப்பு மற்றும் மீள்குடியேற்ற இராஜாங்க அமைச்சர்)
(The Hon. M.L.A.M. Hizbullah - State Minister of Rehabilitation and Resettlement)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, குறிப்பாக மாகாண சபையின் கீழான பாடசாலைகளில் நிலவுகின்ற பற்றாக்குறைகளை நீக்கும்வகையில், ஒரு தொகுதியில்

ஆகக்குறைந்தது இரண்டு பாடசாலைகளையாவது மத்திய அரசின்கீழான தேசியப் பாடசாலைகளாக மாற்றுவதனூடாக அந்தப் பிரதேசத்தினுடைய கல்வி அபிவிருத்தியிலே ஒரு மாற்றத்தைக் கொண்டுவர முடியும் என்ற அடிப்படையில் இங்கு கௌரவ உறுப்பினர் நண்பர் நவவி அவர்கள் கொண்டுவந்திருக்கின்ற இந்தப் பிரேரணைமீது பேசுவதையிட்டு நான் மிகவும் சந்தோஷமடைகின்றேன்.

கல்வி இராஜாங்க அமைச்சர் அவர்கள் என்னுடைய நெருக்கமான நண்பர் ஆவார். அவர் அரசியலில் நீண்டகால அனுபவம் கொண்டவர். உண்மையில் தேசியப் பாடசாலைகள் பல்வேறுபட்ட வளங்களைக் கொண்டிருக்கின்றன; இந்த நாட்டினுடைய கல்வித் தேவையிலே முக்கியமான பங்களிப்பைச் செய்து வருகின்றன. மாகாண சபையின் கீழான பாடசாலைகளும் அவ்வாறு பங்களிப்புச் செய்கின்ற அதே நேரம், வளப்பற்றாக்குறை காரணமாக தேசியப் பாடசாலைகள் போன்ற ஒரு சிறப்பான கல்வியை வழங்க முடியாத நிலையில் இருப்பதை நாடு முழுவதிலும் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது.

இன்று பாடசாலைகளிலே குறிப்பாக கணித, விஞ்ஞான, தொழில்நுட்பப் பாடங்களுக்கான - Mathematics, Science, IT subjects க்கான - ஆசிரியர் பற்றாக்குறை காணப்படுகின்றது. குறிப்பாக வடக்கு, கிழக்கிலும் அதற்கு வெளியிலுமுள்ள அநேகமான தமிழ் மொழிமூலப் பாடசாலைகளில் விஞ்ஞான, கணித ஆசிரியர்கள் இல்லாத காரணத்தினால் GCE உயர்தர வகுப்புக்களில் Science, Mathematics பிரிவுகள் நிறுத்தப் பட்டிருக்கின்றன. இதனால் பெற்றோர் தமது பிள்ளைகளை Arts, Commerce பிரிவுகளில் மாத்திரம்தான் படிப்பிக்க வேண்டியிருக்கின்றது. காரணம், GCE உயர் தரத்தில் Mathematics, Science பிரிவுகளில் உள்ள ஆசிரியர் பற்றாக்குறை காரணமாக அந்தப் பாடங்களில் மாணவர்கள் சிறப்பான கல்வியைப் பெற்றுக்கொள்ள முடியாமையாகும். எதிர்கால விஞ்ஞான, கணினி யுகத்தில் இன்று நாங்கள் உருவாக்குகின்ற Arts and Commerce graduates இனால் எந்தப் பிரயோசனத்தையும் அடையமுடியாது. எப்பொழுதும் இவர்களுக்கு இந்த நாட்டு அரசாங்கத்தினால் மாத்திரம் தொழிலைக் கொடுக்கமுடியாது. வருடாந்தம் வெளியேறுகின்ற ஆயிரக்கணக்கான Arts and Commerce graduatesக்கு நாங்கள் தொழில் வழங்கிக்கொண்டு இருக்கமுடியாது. அதேநேரம், Mathematics and Science Graduatesக்கு அரசாங்கம் தொழில் வாய்ப்புக்களை வழங்கினாலும், அவர்களுக்கு வெளிநாட்டிலும் நிறைய தொழில் வாய்ப்புக்கள் இருக்கின்றன. ஆகவே, அதற்கு ஏற்ப எங்களுடைய மாணவர்களை நாங்கள் பயிற்றுவிக்க வேண்டுமாக இருந்தால், மத்திய அரசு இதற்கான விசேட ஏற்பாடுகளைச் செய்யவேண்டும். இந்த நாட்டிலே GCE உயர்தர வகுப்புக்களுக்கு Mathematics and Science teachers பற்றாக்குறையாக இருக்கின்ற பாடசாலைகளில் அவற்றைப் பூர்த்திசெய்வதுடன், ஏனைய பாடசாலைகளிலும் Mathematics and Bio-science பிரிவில் படிக்கக்கூடிய சூழ்நிலைகளை உருவாக்குவதற்கு கௌரவ அமைச்சர் அவர்கள் உரிய நடவடிக்கைகளை எடுக்கவேண்டுமென்று நான் இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மட்டக்களப்பு மெதடிஸ்ற் மத்திய கல்லூரி கிட்டத்தட்ட 150 வருடங்கள் பழைமைவாய்ந்ததும் முதன்மையானதுமான ஒரு பாடசாலை; மட்டக்களப்பு நகரில் இருக்கின்ற மிகச் சிறந்த, சகல சமூகங்களும் படிக்கின்ற ஒரு பாடசாலை; குறிப்பாக, யுத்த காலத்திலும்கூட மட்டக்களப்பிலே தமிழ், முஸ்லிம் மாணவர்கள் ஒன்றுசேர்ந்து படித்த பாடசாலை. எனினும், இப்பாடசாலை துரதிருஷ்டவசமாக தேசியப் பாடசாலையாக உள்வாங்கப்படவில்லை. மட்டக்களப்பில் இருக்கின்ற ஏனைய பாடசாலைகள் உள்வாங்கப்பட்டபோது, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one minute more.

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)
Sir, I will wind up in about two minutes' time.

அந்தப் பாடசாலை பல்வேறுபட்ட காரணங்களால் தேசிய பாடசாலைகளுக்குள் உள்வாங்கப்படவில்லை. அண்மையிலே மேதகு ஜனாதிபதி அவர்கள் அந்தப் பாடசாலைக்கு விஜயம் செய்தபோது, அவரிடம் அந்தப் பாடசாலையின் அதிபரும் பெற்றோரும் இந்தக் கோரிக்கையை முன்வைத்தார்கள். கௌரவ அமைச்சர் அவர்களே, இன்று நான் உங்களிடத்தில் ஒரு கோரிக்கையை மாத்திரம் முன்வைக்க விரும்புகின்றேன். அதாவது, நீங்கள் ஒரு விசேட அடிப்படையில், மட்டக்களப்பில் மிகப் பழமைவாய்ந்த இந்த Methodist Central Collegeஐ தயவுசெய்து தேசிய பாடசாலைகளுக்குள் உள்வாங்கச் செய்யுங்கள்! அதற்குத் தேவையான சகல உதவிகளையும் நாங்கள் செய்வதற்கு ஆயத்தமாக இருக்கின்றோம். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அந்த உதவியை எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தின் கல்வி வளர்ச்சிக்காகச் செய்துதர வேண்டும் என்று கேட்டு, உங்களுடைய பணிகளையும் சேவைகளையும் பாராட்டி, விடைபெறுகின்றேன். நன்றி!

[අ.භා. 6.17]

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරිසරයට බද්ධ වෙලා, අතීතයේ, -අපි පුංචි කාලයේ- ඉගෙන ගත්තු පාසල් ක්‍රමය වෙනස් වෙලා අද යාන්ත්‍රීකරණය වුණු අධ්‍යාපනයකට අපේ දරුවෝ එළැඹිලා ඉන්න යුගයක් උදාවෙලා තිබෙනවා. ජනතාව තුළ තිබෙන වැරැදි ආකල්ප නිසා අද නගරය තුළ තිබෙන පාසල්වලටම දරුවන් යවන්න උත්සාහ කිරීමෙන් ඒ පාසල්වල බොහොම තදබදයක් ඇති වෙලා තිබෙනවා.

ලංකාවේ ජාතික පාසල් 352කුත්, පළාත්බද පාසල් 9,792කුත් පවතිනවා. මේ ජාතික පාසල් 352න් එකකට තමන්ගේ දරුවා ඇතුළු කර වීම තමයි දෙමව්පියන්ගේ බලාපොරොත්තුව වෙලා තිබෙන්නේ. මේ ආකල්පය වෙනස් කිරීම ටිකක් අසීරුයි. එහෙම නම්, රජයක් හැටියට අපි මොකක්ද ගන්නා පියවර? මේ පාසල් විමධ්‍යගත වීම, ඒ කියන්නේ මේ ජාතික පාසල් පිහිටලා තිබෙන ස්වභාවය බැලුවාම අපට පෙනෙනවා, ඒ සියලුම ජාතික පාසල් නගරය තුළ ස්ථාපිත වෙලා තිබීම මත මේ ගම්වල ඉන්න ළමයින් නගරයට ගෙනෙන්න දෙමව්පියෝ උත්සාහ ගන්නා බව. ඒ හේතුව මත නගරය තුළ බොහෝ ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. මා දකින දෙයක් මෙහිදී කියන්න ඕනෑ. මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ නගරය තුළම ජාතික පාසල් හතරක් ස්ථාපිත වෙලා තිබෙනවා. මාතලේ දිස්ත්‍රික්කයෙන් හරි අඩක් භූමිය ගත්තාම -මගේ ආසනය තුළ- තිබෙන්නේ එක ජාතික පාසලයි. එතකොට තත්ත්වය කොහොමද කියන එක මේ ගරු සභාවට පැහැදිලි වෙනවා ඇති.

කොහොම වෙතත්, ළඟම පාසල තමයි හොඳම පාසල විය යුත්තේ. දරුවාගේ නිදහස, දරුවාගේ කාලය ගැන අපි

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහතා]

සැලකිලිමත් විය යුතුයි. දරුවා අධ්‍යාපන කාර්යයේ යෙදෙනවාට අමතරව, තම පරිසරය සමඟ බද්ධ විය යුතුයි. එයින් ඇත් වී දරුවා රොබෝ කෙනෙක් වීම තුළ අද සාරධර්ම පිරිහී, එය සමාජ ව්‍යසනයන් බොහොමයකට හේතු වෙනවා. අද දරුවා හරි අවිවේකියි; දරුවා තරගයකට දාලා. අද පවතින අධ්‍යාපන ක්‍රමයම වැරදියි කියා මම හිතනවා. දරුවා තරගයකටයි අප පුරුදු කරන්නේ. ඉපදුණු දවසේ ඉඳලා කොයි මොන්ටිසෝරියටද දා ගන්නේ, ඊට පස්සේ පළමුවන වසරට දා ගන්නේ කොතැනටද කියලායි කල්පනා කරන්නේ. ළමයාට ලෝකයේ තිබෙන බොරු ටික උගන්වනවා, පාසලේ interview එකේදි කියන්න. ඊට පස්සේ පහේ ශිෂ්‍යත්වයට පළමුවන වසරේ සිටම tuition යවනවා. මේ විධියට කටයුතු කරද්දී, තමන් ගැන පමණක් හිතන, බොහොම ආත්මාර්ථකාමී දරුවෙක් තමයි සමාජයට අප සකස් කරන්නේ. මා කියන්නේ මගේ දරුවනුත් ඇතුළුවයි. අපේ දරුවනුත් මේ තත්ත්වයට මුහුණ දී තිබෙනවා. එම නිසා ළඟම පාසල තමයි හොඳම පාසල විය යුත්තේ කියා මම හිතනවා. එම නිසා අඩුම තරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එක ජාතික පාසලක්වත් එකතු විය යුතුයි. මොකද, ආකල්පයක් තියෙනවා, "හොඳම පාසල ජාතික පාසල" කියා. නමුත් ඒ ආකල්පය වැරදියි. එකම විද්‍යා පීඨවල පුහුණුව ලැබූ ගුරුවරුන් උගන්වන එකම අධ්‍යාපන ක්‍රමයක්, එකම විෂය නිර්දේශයක් ජාතික පාසලේත්, පළාත් පාසලේත් තිබෙන්නේ. නමුත් ආකල්පයක් තියෙනවා, හොඳම පාසල ජාතික පාසලය කියා. මේ ආකල්පය වෙනස් කළ යුතුයි. ඒ සඳහා අවශ්‍ය ඉඩකඩ ලබා දිය යුතුයි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා. විනාඩි තුනයි ඔබතුමාට කථා කරන්නට තිබෙන්නේ.

[අ.භා. 6.20]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
අනේ! මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම කියන්න එපා.

මොහොමඩ් නවවි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව ඉතාමත්ම ඵලදායකයි. එතුමාගේ යෝජනාවෙන් කියා තිබෙනවා, "... දැනට තිබෙන අධ්‍යාපන අවස්ථාවන්හි විෂමතාවයන් දුරු කිරීම පිණිස, ... දිවයින පුරා සිටින සියලුම ළමයින්ට සමාන අධ්‍යාපනික අවස්ථා ලබා දිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටියි" කියා. ඇත්තටම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේක තමයි අද නැත්තේත්. ජාතික පාසල් ජාතක කරපු දවසේ සිට මේ දක්වාම - ඇත්තටම ගරු රෝහිණී කුමාරි මන්ත්‍රීතුමිය කිව්වා වාගේම- අපේ රටේ සිටින දරුවන්ට සාධාරණයක්, යුක්තියක් මේ පාසල් ස්ථාපිත කිරීම තුළින් සිදු වුණේ නැහැ. ඒකට හේතුව අධ්‍යාපන බලධාරීන් සහ ඒ වකවානුවල අධ්‍යාපන වග කීම දරපු මැති ඇමතිවරුන්ගේ තිබුණු ආකල්ප, ප්‍රතිපත්ති හා අවිධිමත් වැඩ පිළිවෙළයි. එම නිසා ජාතික පාසල් පිහිටුවීම ඉතාමත් අවිධිමත් ආකාරයෙන් තමයි සිද්ධ වී තිබෙන්නේ. කථා කළ සෑම මන්ත්‍රීවරයෙක්ම ඒ කාරණය පැහැදිලි කළා. උදාහරණයක් වශයෙන් කියනවා නම්, ජාතික පාසල් 352 පිහිටුවා තිබෙන්නේත් ඉතාමත් අවිධිමත් විධියටයි; යකාගේ කටේ දත් තිබෙන විධියටයි. ලංකාවේ ජාතික පාසල් වැඩිම සංඛ්‍යාවක් තිබෙන්නේ කොහේද කියා කිව්වොත් ඔබතුමන්ලා පුදුම වේවි. වි.ජ.මු. ලොකු බණ්ඩාර මැතිතුමා අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් ඉන්දැද්දී එතුමා බැකෝ එකෙන් ඒ පළාතට හොඳට බෙදා ගත්තා. එසේ බෙදා ගත් නිසා බදුලු දිස්ත්‍රික්කයේ තමයි ජාතික පාසල් වැඩිපුර සංඛ්‍යාවක් තිබෙන්නේ. ඒ විධියේ අවිධිමත් ආකාරයට තමයි මේ කටයුත්ත සිදු කළේ.

ජාතික පාසල්වල ඉන්න ගුරුවරුන්ට අමුතුම මානසිකත්වයක් -අධිමානසිකත්වයක්- ඇති කර තිබෙනවා. මේ ජාතික පාසල්වල ඉන්න ගුරුවරුන්ට ස්ථාන මාරුවීම් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් මොනම ආකාරයකින්වත් නැහැ. අධ්‍යාපන ඇමතිවරුන් රොත්තක් විතර හිටියා. සමගාමීව, කාටත් සාධාරණ වන ආකාරයට ගුරු මාරුවීම් සඳහා ජාතික ප්‍රතිපත්තියක් හදන්න කටයුතු කරන ලෙස මේ හැම ඇමතිවරයෙකුගෙන්ම අප ඉල්ලීමක් කළා. ගමේ ජාතික පාසලේ ඉන්න ගුරුවරයාට අලුත් අත්දැකීමක් ලබා ගන්න, නගරයේ තිබෙන ජාතික පාසලට එන්න, කොළඹට එන්න, ඒ අයගේ දරුවන්ට අලුත් අත්දැකීමක් ලබා ගන්න, අලුත් මානසිකත්වයක් ඇති කර ගන්න, ලෝකයට අලුත් විධියට හුරු වෙන්න අවශ්‍ය පදනම සකස් කර දීම පිණිස ඉතාම විනිවිද පෙනෙන ප්‍රතිපත්තියක් සකස් කරන්න කියලා අපි ඉල්ලීමක් කළා. නමුත් ඒවා නිකම්ම නිකම් පුස්සක් බවට පත් වුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම අද මේ ජාතික පාසල් නඩත්තු වෙන්නේ රජයේ සල්ලිවලින් නොවෙයි. අද මේ ජාතික පාසල් මුළුමනින්ම අම්මලා තාත්තලාට බර පටවලා, අම්මලා තාත්තලාගේ අරමුදල්වලින් තමයි ක්‍රියාත්මක වෙන්නේ. මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. බෙලිඅත්ත ආසනයේ ජාතික පාසලක් තිබෙනවා, "හුංගම විජයබා ජාතික පාසල" කියලා. මේ පාසලට ළමයින් ඇතුළත් කර ගන්නා විට අම්මලා තාත්තලාගෙන් රුපියල් දහස් ගණන්, ලක්ෂ ගණන් මුදල් අය කර ගන්නවා. මේ පාසල්වල රුපියල් කෝටි ගණනක funds තිබෙනවා. මේ විධියට තමයි ඒ කටයුතු අවිධිමත් ආකාරයෙන් සිද්ධ වෙන්නේ. සමහර ජාතික පාසල්වල අධ්‍යාපනය කඩා වැටිලා. සාධාරණ විධියට ඒ සම්පත් සමව බෙදී යන විධියට, එම දරුවන්ට සහ ගුරුවරුන්ට සාධාරණ සහ යුක්තිසහගත විධියට ඒවායේ ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන් වන විධියේ ක්‍රමයක් අද දවසින් පසුවවත් මේ මැති ඇමතිවරු සකස් කරයි කියන විශ්වාසයෙන් යුතුව මම ඒ සඳහා බල කිරීමක් කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.24]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආෂු මාරසිංහ)
(The Hon. (Prof.) Ashu Marasinghe)

බොහොම ස්තුතියි. ජාතික පාසල් ගැන කථා කරන කොට මම කියන්න කැමැතියි, මේ ජාතික පාසල් සංකල්පය මුලින්ම ලංකාවට ඉදිරිපත් කළේ එවකට අධ්‍යාපන ඇමතිවරයාව සිටි ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා බව. ගරු අගමැතිතුමා එවකට ඉදිරිපත් කරපු සංකල්පයට අනුව අවුරුද්දකට, එක දිස්ත්‍රික්කයකට ජාතික පාසල් දෙක බැගින් හදන්න තමයි යෝජනා වුණේ. මේ සංකල්පය යටතේ, අවුරුදු 25ක් තුළ - අද වන කොට -ජාතික පාසල් 1,200ක් හැදිලා තිබෙන්න ඕනෑ. නමුත් එහෙම වුණේ නැහැ. පසු ගිය කාලයේ මේ ජාතික පාසල් සංකල්පය වල් වැදිලා තිබුණා; කැලේට දාලා තිබුණා. ඒ නිසා ඒ කටයුත්ත සිදු වුණේ නැහැ.

ජාතික පාසල්වල දැනට ක්‍රියාත්මක වන ඒකාධිකාරය ගැනත් කල්පනා කළ යුතුයි. ගුරු මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක විය යුතුයි. අඩුම තරමින් අවුරුදු පහකට සැරයක්වත් මේ ජාතික පාසල්වල ගුරුවරු මාරු විය යුතු ආකාරයේ සංකල්පයක් ඇති විය යුතුයි.

උදාහරණයකට මම ඉගෙන ගත් ආනන්ද විද්‍යාලය ගත්තොත්, එහි විදුහල්පතිවරයා මාරු කරන්න කියලා අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නියෝග ඇවිල්ලා තිබෙනවා. නමුත් තවමත් එම විදුහල්පතිවරයා එහි කටයුතු කරමින් ඉන්නවා. පාසලේ ශිෂ්‍යයින් සහ ගුරුවරුන් උසි ගන්වමින්, වෙනත් විකල්ප ක්‍රියා මාර්ගවලට ගිහිල්ලා එතුමා තවමත් පාසලේ රැඳී සිටිනවා. මේ ඒකාධිකාරය වැළැක්වීම සඳහා ප්‍රතිපත්තියක් සැකසිය යුතුයි. "ළඟම පාසල හොඳම පාසල" කියන වැඩසටහන යටතේ අලුතින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන පාසල් මණ්ඩල හරහා මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ඇතැයි අපි බලාපොරොත්තු වනවා. ඒකාධිකාරියක් විධියට තබාගෙන ඉන්න ගුරුවරුන්ව අඩුම තරමින් අවුරුදු පහකට සැරයක්වත් මාරු කරලා, හැම පාසලකටම හොඳ ගුරුවරු ලබා දීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න මේ යටතේ අපට හැකියාව ලැබේවි කියලා බලාපොරොත්තු වෙමින් මම මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[ප.ව. 6.26]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(මාණ්පුමිකු අප්තුල්ලා මහ්රූප්)
(The Hon. Abdullah Mahrooff)

කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, නන්රි. කෞරව කල්වි අමෛච්චර් අවර්කළ් පොරුන්තික්කොණ්ටතන් පඩි තිරුකෝණමලෛ මාවට්ටත්තිලේ පුල්මෝට්ටෛ මත්තිය මහා විත්තියාලයත්තෛයුම් අල්-අක්ෂා මහා විත්තියාලයත්තෛයුම් තෝප්පූර් අල්-හම්ත්රා මහා විත්තියාලයත්තෛයුම් අල්-හිජ්රා මහා විත්තියාලයත්තෛයුම් කිණ්ණියාවිලේ ඉරුක්කින්ර මහළිර් මහා විත්තියාලයත්තෛයුම් තේසියප් පාටසාලෛකළාක ආක්කිත්තරවේණ්ටුම් එන්රු කේට්ටුක් කොළ්කිරේන්. ඉන්ත නාට්ටිලිරුක්කින්ර සකල zone කළිලුම් කිණ්ණියා මර්රුම් මූතූර් zone කළ් මට්ටුමේ කටෛසි නිලෛයිල් ඉරුක්කින්රන. තිරුකෝණමලෛ මාවට්ටත්තිල් ඉරුක්කින්ර 11 පාටසාලෛකළිලේ ඉන විකිතාසාර අටිප් පටෛයිල් ඉරණ්ටේයිරණ්ටු පාටසාලෛකළ්තාන් එංකළුටෛය සමූකත්තිර්කාක ඉරුක්කින්රන. එනවේ, එංකළුටෛය පිරතේසත්තිල් ඉරුක්කින්ර පාටසාලෛකළ් මත්තිය අරසින්කීළ් වරුකින්රපෝතු වළප්පර්රාක්කුරෛයෛ නීක්කික්කොළ්ළ මුටියුම් එන්ර කාරණත්තිනාල් නාන් ඉංකු කූරිය අනෛත්තුප් පාටසාලෛකළෛයුම් වරුකින්ර ජනවරියිලේ තේසියප් පාටසාලෛකළාක ආක්කිත්තරවේණ්ටුමෙන්රු කෞරව කල්වි අමෛච්චර් අවර්කළෛක් කේට්ටුක්කොළ්වතෝටු, එනක්කු කුරුකිය නේරමාවතු තන්ත්තර්කාක අවෛත් තලෛවර් අවර් කළුක්කු මීණ්ටුම් නන්රි කූරි විටෛපෙරුකින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. V.S. Radhakrishnan.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)

	2013	**2014**	**2015**
8-16	84	94	66
17-20	256	202	232
21-25	338	295	274
26-30	296	294	262
31-35	306	277	266
36-40	279	232	261
41-45	304	236	230
46-50	301	268	253
51-55	290	261	286
56-60	245	262	249
61-65	247	235	227
66-70	152	164	149
71න් ඉහළ	357	324	307

(iii) පොලිස් දෙපාර්තමේන්තුව විසින් පොලිස් කොට්ඨාස අනුව දත්ත රැස් කරනු ලබන අතර, දිස්ත්‍රික්ක අනුව හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව දත්ත රැස් නොකරයි. සිය දිවි නසා ගැනීමට තැත් කිරීම් සම්බන්ධයෙන් වන දත්ත සංඛ්‍යා ලේඛන කොට්ඨාසය මඟින් රැස්කිරීමක් සිදු නොකරන අතර, ඒ සම්බන්ධව පොලිස් ස්ථාන මට්ටමින් දත්ත එක්රැස් කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව, එසේ දත්ත විශ්ලේෂණයක් ලබාදීමට ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වේ.

(ඇ) (i) සිය දිවි නසාගැනීමට තැත් කිරීම සම්බන්ධයෙන් වන දත්ත පොලිස් ස්ථාන හා පොලිස් කොට්ඨාස අනුව රැස් කරනු ලබන අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව එම දත්ත රැස් නොකරයි. එසේ දත්ත විශ්ලේෂණයක් ලබාදීමට ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වේ. ඒ අනුව පොලිස් කොට්ඨාස අනුව වැඩිම සිය දිවි නසා ගැනීම් සංඛ්‍යාවක් වාර්තා වූ පොලිස් කොට්ඨාස 25, වර්ෂය අනුව පහත පරිදි වගුගත කර ඉදිරිපත් කරමි.

අනු අංකය	වර්ෂය අනුව වැඩිම සිය දිවි නසා ගැනීම් වාර්තා වූ පොලිස් කොට්ඨාස		
	2013	2014	2015
1	රත්නපුර	රත්නපුර	මහනුවර
2	අනුරාධපුර	කුරුණෑගල	අනුරාධපුර
3	කුරුණෑගල	අනුරාධපුර	රත්නපුර
4	මහනුවර	මහනුවර	කුලියාපිටිය
5	මාතර	මාතර	කුරුණෑගල
6	යාපනය	මඩකලපුව	ගාල්ල
7	මඩකලපුව	ගම්පහ	මඩකලපුව
8	කුලියාපිටිය	කුලියාපිටිය	ගම්පහ
9	තංගල්ල	කැලණිය	යාපනය
10	මොනරාගල	නුගේගොඩ	තංගල්ල
11	කෑගල්ල	කෑගල්ල	මාතර
12	නිකවැරටිය	යාපනය	හලාවත
13	නුගේගොඩ	තංගල්ල	කළුතර
14	පොළොන්නරුව	ගාල්ල	මොනරාගල
15	කැලණිය	නිකවැරටිය	කෑගල්ල
16	කළුතර	අම්පාර	නුගේගොඩ
17	ගම්පහ	මාතලේ	අම්පාර
18	අම්පාර	පුත්තලම	පුත්තලම
19	බදුල්ල	මොනරාගල	මාතලේ
20	මාතලේ	නුවරඑළිය	පානදුර
21	සීතාවකපුර	හලාවත	මීගමුව
22	බණ්ඩාරවෙල	පොළොන්නරුව	පොළොන්නරුව
23	හලාවත	කළුතර	නුවරඑළිය
24	ඇල්පිටිය	බදුල්ල	බදුල්ල
25	ගල්කිස්ස	සීතාවකපුර	නිකවැරටිය

(ii) පොලිස් දෙපාර්තමේන්තුව

(ඈ) පැන නොනඟී.

හන්දෙස්ස, මහ/අල්මනාර් ජාතික පාසල පිහිටි ස්ථානය නාය යෑම : ආරක්ෂිත පියවර

ஹன்தெஸ்ஸ, க/அல் மனார் தேசிய பாடசாலைச் சூழல் மண்சரிவுக்குள்ளாதல் : பாதுகாப்பு நடவடிக்கை

LANDSLIDE OCCURRED IN K/ALMANAR NATIONAL SCHOOL PREMISES IN HANDESSA: REMEDIAL MEASURES

725/'16

9. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு எம்.எச்.எம். சல்மான் சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. M.H.M. Salman)

ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, හන්දෙස්ස, මහ/අල්මනාර් ජාතික පාසලට අයත්, තෙමහල් ගොඩනැගිල්ල පිහිටා තිබෙන ස්ථානය පසු ගිය දා නාය යෑමට ලක්වූ බවත්;

(ii) ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අංක ED/7/99/9/1/31 හා 2015.12.14 දිනැති ලිපිය මඟින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂවරයා දැනුවත් කළද, මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අධික වර්ෂා සහිත කාලගුණ තත්ත්වයකදී, එකී පාසැල් ගොඩනැගිල්ල හා එහි අවට අවදානම් තත්ත්වයක පවතින හෙයින්, නාය යෑමට ලක් වූ පස් කන්දට ආසන්නව ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தின் ஹன்தெஸ்ஸ, க/அல்-மனார் தேசிய பாடசாலைக்குரிய மூன்றுமாடிக் கட்டிடம் அமைந்துள்ள இடம் அண்மையில் மண் சரிவுக்குள்ளானதென்பதையும்;

(ii) இது தொடர்பாக கல்வி அமைச்சின் செயலாளரினால் ED/7/99/9/1/31ஆம் இலக்க, 2015.12.14ஆம் திகதிய கடிதத்தின்மூலம் தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவனத்தின் பணிப்பாளர் விழிப்புணர்வூட்டப்பட்டபோதிலும் இதுவரை எதுவித நடவடிக்கையும் எடுக்கப்படவில்லை யென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) கடும் மழையுடன்கூடிய காலநிலையின்போது, மேற்படி பாடசாலைக் கட்டிடமும் அதனைச் சூழ்ந்துள்ள பிரதேசமும் ஆபத்தான நிலையில் உள்ளதால், மண் சரிவுக்குள்ளாகியுள்ள மண் குன்றுக்கு அருகாமையில் பாதுகாப்பு மதிலொன்றைக் கட்டுவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Disaster Management:

(a) Is he aware that -

(i) a landslide occurred recently in the premises in which the three storeyed building belonging to K/Almanar National School in Handessa in the Kandy District, is located; and

(ii) although the Secretary to the Ministry of Education has informed the Director of the National Building Research Organization by the letter No. ED/7/99/9/1/31 of 14.12.2015 in this regard, no step has been taken?

(b) Will he inform this House whether steps will be taken to construct a protection wall adjacent to the

[ගරු බුද්ධික පතිරණ මහතා]

mound of earth that was subjected to the landslide since the aforesaid school building and the adjacent area is at a risk in a condition of heavy rain?

(c) If not, why?

ගරු දුනේෂ් ගන්කන්ද මහතා (ආපදා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு துனேஷ் கங்கந்த - அனர்த்த முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Dunesh Gankanda - Deputy Minister of Disaster Management)

ගරු කථානායකතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මහ/අල්මනාර් ජාතික පාසල අසල නායයෑමක් වාර්තා වී නැත. නමුත් යාබද මහ/අල්නූර් ප්‍රාථමික විද්‍යාලයේ වූ කණ්ඩි කඩාවැටීම් තත්ත්වයක් වාර්තා වී ඇත.

(ii) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් එවන ලදැයි මෙහි සඳහන් ED/99/9/1/31 දරන 14.12.2015 දිනැති ලිපිය නොමැති බවත් KDS/UNU/5/1/7/NBRO දරන 27.05.2016 දිනැති ලිපිය මඟින් උඩුනුවර ප්‍රාදේශීය ලේකම් විසින් උඩුනුවර මහ/අල්නූර් ප්‍රාථමික පාසලෙහි ඇති වූ කණ්ඩි කඩාවැටීම් පිළිබඳ දැනුම්දීමක් කර ඇත. ඒ අනුව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ මහනුවර ශාඛාව විසින් මෙම පරීක්ෂණය සිදුකර වාර්තාවක් ලබාදී ඇත. එම වාර්තාවේ (NBRO/LRRMD/LI/KN/16/31/21703) පිටපතක් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම 06)**

සිදු කරන ලද පරීක්ෂණවලට අනුව සිදුවී ඇත්තේ නායයාමක් නොව අල්නූර් ප්‍රාථමික පාසලෙහි ඊ (E) සහ රාසික් (RAZIK) ගොඩනැඟිල්ල පිටුපස කණ්ඩිය අස්ථාවරවීමකි. එම වාර්තාවේම මේ සඳහා ගත යුතු දිගුකාලීන සහ කෙටිකාලීන ක්‍රියා මාර්ග සඳහන් කර ඇත.

NBRO එක විසින් පාසලේ විදුහල්පතියෙන් විමසූ ප්‍රශ්නයට උත්තරය:

අල්මනාර් ජාතික පාසල සහ අල්නූර් ප්‍රාථමික පාසල පිහිටා ඇත්තේ එකිනෙක යාබදව බවත්, මෙම ලිපිය ලද පසු තත්ත්වය පැහැදිලි කර ගැනීම සඳහා අල්මනාර් ජාතික පාසලේ විදුහල්පති සමඟ දුරකථනයෙන් (0812315807/0779577055) කළ විමසීමකදී ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ මහනුවර කාර්යාලයේ ස්ථාන භාර නිලධාරිට දැනුම් දී ඇත්තේ එම පාසලෙහි බැඳ ඇති බැම්මක ඉරි තැලීම් කිහිපයක් සිදුවී ඇතත් එම බැම්ම අස්ථාවරව කඩා වැටී නැති බවයි.

(ආ) ආරක්ෂිත බැමි බැඳීම් හා අදාළ සංවර්ධන කටයුතු පිළිබඳව මූලික සමීක්ෂණ වාර්තාව අනුව කටයුතු කළ යුතුය. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කර අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් පවතියි. මේ සම්බන්ධයෙන් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ තාක්ෂණික සහයෝගය ලබාදිය හැකිය.

(ඇ) පැන නොනඟී.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13-672/'16-(1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

කානාපතිවරු, මහ කොමසාරිස්වරු හා ආයතන ප්‍රධානීන් පත් කිරීම සඳහා පාර්ලිමේන්තු අනුමැතිය
தூதுவர்கள், உயர் ஸ்தானிகர்கள் மற்றும் நிறுவனத் தலைவர்களின் நியமனத்துக்கான பாராளுமன்ற அங்கீகாரம்
PARLIAMENTARY APPROVAL FOR APPOINTMENT OF AMBASSADORS, HIGH COMMISSIONERS AND HEADS OF INSTITUTIONS

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, 23(2) ස්ථාවර නියෝගය යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවසර දීම සම්බන්ධව මුලින්ම මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු අග්‍රාමාත්‍යතුමා වෙතයි මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ. විදේශ රටවල් නියෝජනය කරන ශ්‍රී ලංකා කානාපතිවරුන් සහ මහ කොමසාරිස්වරුන් මෙන්ම විවිධ අමාත්‍යාංශ යටතේ ඇති රාජ්‍ය සංස්ථා, ආයතන, අධිකාරි, කොමිෂන් සභා හා මණ්ඩලවල ප්‍රධානීන් ලෙස පත් වන සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල ගරු අග්‍රාමාත්‍යතුමාගේ අනුමැතිය ඇතිව පත්වේ.

ඉහත සඳහන් සියලු පත්වීම්,

1. පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු බව ඔබතුමා පිළිගන්නේද?

(අ) ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට පත් වන තානාපතිවරුන් සහ මහ කොමසාරිස්වරුන්;

(ආ) රාජ්‍ය සංස්ථා, ආයතන, අධිකාරි, කොමිෂන් සභා සහ මණ්ඩලවල ප්‍රධානීන් ලෙස පත්වන සභාපතිවරුන් 300කට අධික පිරිසක් සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ගත යුතුව ඇත.

2. වර්තමාන ආණ්ඩුව පිහිටුවා වසරක් ගතවී ඇතත්,

(අ) තානාපතිවරු, කොමසාරිස්වරු බොහෝ දෙනාද,

(ආ) රාජ්‍ය සංස්ථා, අධිකාරි සභාපතිවරු ඉතාමත් ස්වල්ප දෙනෙකුගේ පමණක් විස්තර පාර්ලිමේන්තුවට එවීමත්, පත්වීම් අනුමත කර ගැනීමත් සම්බන්ධයෙන් සිදු වී ඇති විශාල අඩු පාඩුව ගරු අග්‍රාමාත්‍යතුමා පිළිගන්නේද?

3. මෙම තත්ත්වය නිවැරදි කර අදාළ පත්වීම්වලට අනුමැතිය ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙසත්, පාර්ලිමේන්තු නීති - රීති අනුව පත්වීම් අනුමත කිරීමට අග්‍රාමාත්‍යතුමා පියවර ගන්නේද?

මෙය ඉතාම බරපතළ ප්‍රශ්නයක් ගරු කථානායකතුමනි. මම හිතන විධියට අගමැතිතුමා පත්වීම් අනුමත කරන්න ඇති. නමුත් පාර්ලිමේන්තුවේ අනුමැතිය ගැනීම පිළිබඳ කටයුතු අදාළ ලේකම්වරු හෝ අදාළ අමාත්‍යාංශ විසින් සිදුකර නැති බව පාර්ලිමේන්තු වාර්තාවලින් කියවෙනවා. මම දන්නා විධියට 300ක පමණ පිරිසකගේ නම් අනුමැතිය සඳහා උසස් නිලතල පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කර තිබෙනවා. The Committee on High Posts should approve these appointments and without that approval on the suitability of the persons who have been appointed, it is not fair for them to function. I think, the Government is committed to bring in good governance but, this is not good governance for the past one year.

විවිධ වියදම් දරනවා. විවිධ තීරණ ගන්නවා. ඊළඟට, සමහර අය අයින් වෙලා යනවා. සමහර අය අලුතෙන් එනවා. මම මීට වඩා මේ කාරණය ගැන කියන්න යන්නේ නැහැ. නමුත්, මේක බරපතළ ප්‍රශ්නයක් ලෙස ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානය යොමු කරලා, තීරණයක් දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, පත්වීම් අනුමත කර ගැනීම ප්‍රමාද වීමේ ප්‍රශ්නය තිබෙනවා. මීට කලිනුත් තිබුණා. මම හිතන හැටියට නීතියක් තිබෙන්න ඕනෑ, තනතුරකට නම් කළායින් පස්සේ සති දෙකක් - two weeks' time - තුළදී ලේකම්තුමා පාර්ලිමේන්තුවට නම එවන්න අවශ්‍යයි කියා. කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබිලා නම්, අනුමැතිය ඇතිව හෝ අනුමැතිය ලැබී නැත්නම්, අනුමැතිය නැතුව හෝ සති දෙකකින් එවන්න ඕනෑ. සති දෙකක් ඇතුළත පාර්ලිමේන්තුවට යැවුවායින් පස්සේ, තව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, වාර්තා ලබා ගැනීම. වර්තා ලබා ගැනීමේත් දැන් ප්‍රමාදයක් තිබෙනවා. වාර්තා ලබා ගැනීමේ ප්‍රශ්නයක් ඇති වනවා නම්, පක්ෂ නායකයින් සාකච්ඡා කරලා තීරණය කරන්න ඕනෑ, වාර්තාවට ඇතුළු කළ යුත්තේ මොනවාද කියලා. ඒ වාර්තා යවන්නත් කාල සීමා තීරණය කරන්න වෙයි. මොකද, සමහර විට ඒ ඒ අදාළ අංශවලින් මේවාට ප්‍රමුඛත්වයක් දෙන්නේ නැහැ. අනෙක් වැඩකටයුතු කරන ගමන් තමයි මේ කාර්යය කරන්නේ. ඒ නිසා මේ කාරණා දෙක ගැන පක්ෂ නායකයින් එක්ක සාකච්ඡා කරන්න තිබෙනවා.

ඊළඟ කාරණය මේකයි. අනුමැතිය ගත යුතු සංඛ්‍යාව බැලුවාම, සංඛ්‍යාව වැඩි වෙලායි තිබෙන්නේ. බාගවෙලාවට උසස් නිලතල පිළිබඳ කාරක සභාවට ස්ථාවර නියෝග සංශෝධනට ඉඩ දෙන්න ඕනෑ, වුවමනා නම්, සමහර ඒවා ගැන කාරක සභාවෙන් වාර්තාව ඉල්ලා ගන්න. There may be some small organizations. කාරක සභාවේ වාර්තාව ලබා ගෙන ඊට පස්සේ ඕනෑ නම්, ප්‍රශ්න දෙක-තුනක් අහන්න පුළුවන්. නැත්නම්, ඒකම අනුමත කරලා යවන්න. ඒ කාරණා තුන පක්ෂ නායකයන් සාකච්ඡා කර ගත්තොත් රජයෙන් දිය යුතු සහයෝගය අපි සම්පූර්ණයෙන් දෙන්නම්. මේ සඳහා දීර්ඝ කාලයක් ගතවන එක අප සියලු දෙනාටම විශාල ප්‍රශ්නයක්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මම මේ පිළිබඳව පැහැදිලි කළාට පස්සේ ඉතිරි ප්‍රශ්න අහන්න. මොකද, මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව වගකිව යුතු නිසා පැහැදිලි කරන්න දෙන්න. ගරු අගමැතිතුමනි, වර්තමාන තත්ත්වය අනුව උසස් පදවි සඳහා පත් කර ඇති උසස් නිලතල පිළිබඳ කාරක සභාව අවුරුදු පහක් හයක් නිස්සේ යම්කිසි ක්‍රමවේදයක් අනුගමනය කරමින් සිටිනවා. අලුත් ක්‍රමය තමයි එතැනදී මුහුණ බලලා එතැනින්ම යන්න කියන්නේ නැහැ. අපි විනාඩි 10ක්, 15ක් එක් අයෙකුගෙන් ප්‍රශ්න කරනවා. ඒ වාගේම අපි මේ සම්බන්ධයෙන් වාර්තා තුනක් ලබා ගන්නවා. පළමු වාර්තාව, පොලිස් වාර්තාව. දෙවන වාර්තාව, සෞඛ්‍ය වාර්තාව. තුන් වන වාර්තාව, ආදායම් බදු ගෙවීම පිළිබඳ වාර්තාව.

විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ, මීට ඉස්සෙල්ලා මේ ක්‍රමවේදය හරහා තානාපතිවරුන් පත් කිරීමේදී නුසුදුසු පුද්ගලයන් කිහිප දෙනෙක්ම පත් නොකිරීමට ඒ කමිටුවට හැකි වුණු බව. ඒ නිසා දැන් තිබෙන ක්‍රමවේදය අනුව තානාපතිවරයෙක් වේවා; ලේකම්වරයෙක් වේවා; සභාපතිවරයෙක් වේවා; ඒ කමිටුව හමුවට ඇවිල්ලා යම්කිසි විධියකට කරුණු ඉදිරිපත් කරලා තමන් කරන සැලැස්ම ඔක්කෝම පැහැදිලි කරන්න ඕනෑ. මේ ක්‍රමය තමයි ලෝකයේ බොහෝ රටවල සිද්ධ වෙන්නේ. මෙතැනදී පොලිස් වාර්තාව, ආදායම් බදු ගෙවීම පිළිබඳ වාර්තාව, සෞඛ්‍ය වාර්තාව පිළිබඳව සොයා බලනවා. මොකද, හුහාක් තැන්වල අපි දැකලා තිබෙනවා, තානාපතිවරු ගිහිල්ලා ගිය දවසේ ඉඳන් සෞඛ්‍ය හේතූන් මත ඉන්නේ ඉස්පිරිතාලයේ බව. ඒ නිසා මේ ක්‍රමවේදය ඉතාමත්ම ඵලදායී වශයෙන් සිදු වුණු බව මම සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම දැනට අපි තානාපතිවරුන් 14 දෙනෙකුත්, සභාපතිවරුන් 20 දෙනෙකුත් clear කරලා තිබෙනවා. තව අපට හමුවෙන්න තිබෙන්නේ 4 දෙනයි. පූර්ණ වාර්තා සහිතව ඒ 4දෙනා ඊළඟ කමිටුවට කැඳවා තිබෙනවා. ඒ වාගේම මම මේ අවස්ථාවේදී පොලීසියට උපදෙස් දීලා තිබෙනවා, පොලිස් වාර්තා ලැබීමේ ප්‍රමාදයක් තිබෙන නිසා ඒ පොලිස් වාර්තා ඉක්මනින් ලබා දෙන්න කියලා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, එහෙම බලද්දී තුන්සිය ගණනක් ඉතිරි වෙලා නැහැ. මට ලැබී තිබෙන වාර්තාවට අනුව ලේකම්වරු 37 දෙනෙකුත්, රාජ්‍ය ආයතන 97ක සභාපතිවරුත් තමයි ඉන්නේ. ඒ වාර්තා ආපු හැටියේම ඉතා ඉක්මනින් කරන්න අපි සැලසුම් කරලා තිබෙනවා.

මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මෙතැන අඩු පාඩුවක් සිදු වෙලා තිබෙනවා කියලා ගරු අගමැතිතුමාත් පිළිගන්නවා. යම් සංස්ථාවකට සභාපතිවරයෙක් පත් කළාම ලේකම්වරයා දන්නවා ඒ සභාපතිවරයා කවුද කියලා. ඒ ලේකම්වරයාට පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න යන්නේ වැඩිම වුණොත් පැය 24ක කාලයක්. ඒ පත්වුණු සභාපති දන්නවා, මේ කටයුත්ත කරන්න ඕනෑ කියලා. ඒ නිසා මෙය බරපතළ ප්‍රශ්නයක් නොවෙයි. පාර්ලිමේන්තුවේ අඩු පාඩුවක් තිබෙනවාද, නැද්ද කියන එක මම දන්නේ නැහැ. නමුත්, මෙයට පුවත් පත් දැන්වීමක් දාලා අපි ලොකු වන්දනාවක යන්නේ.

ගරු අගමැතිතුමනි, ඔබතුමා කියපු එක හරි. අපි ලොකු වන්දනාවක යනවා. අපි පොලීසියෙන් වාර්තාවක් ඉල්ලනවා, පොලීසිය කල් ගන්නවා; ආදායම් දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් ඉල්ලනවා, ආදායම් දෙපාර්තමේන්තුව කල් ගන්නවා. නමුත්, මෙම තනතුරුවලට අදාළව පත් වෙන නිලධාරීන් ඒ සියලුම වාර්තාවන් එවන්න බැඳී සිටිනවා. මම හිතන්නේ, මෙය අනුමත කරනවාද නැද්ද කියන එක මේ කොමිටියට බොහොම වේගයෙන් තීරණය කරන්න පුළුවන්. ගරු අගමැතිතුමනි, ඔබතුමා කියන විධියට, ඒ තැනැත්තාට වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා අලුත් ක්‍රමයක් පටන් ගෙන තිබෙනවා. පිටු දෙකක වාර්තාවක් ඉදිරිපත් කර ගන්න බැරි නම්, කිසිම කෙනෙක් ආයතන ප්‍රධානියෙක් වෙන්න ඕනෑ නැහැ. නමුත්, එම ආයතන ප්‍රධානියාට අධ්‍යාපන සුදුසුකමක් තිබෙනවාද? භාරදූර වගකීමක් ඉෂ්ට කළ හැකිද - මම වෙන කරුණු කියන්න යන්නේ නැහැ.- යන්න මේ පවතින රජයෙන් හෝ පාර්ලිමේන්තුවෙන් සොයන්න තිබෙන දේවල්. එම නිසා ගරු අගමැතිතුමනි, මේ බොහෝමයක් දේවල් ප්‍රමාද දෝෂයකින් සිදු වෙනවා නම්, ඒ ප්‍රමාද දෝෂය නිවැරදි කිරීම සඳහා අලුත් ක්‍රමවේදයක් කල්පනා නොකිරීම තමයි එයට හේතුව ලෙස මට කිව හැකි වන්නේ. ඒ වාගේම ගරු අගමැතිතුමනි, දැන් ඔබතුමා කියනවා අලුත් කමිටුවලින් වාර්තාවක් ලබා ගන්න කියලා. ඒ පිළිබඳව ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා නම්, අපට සාකච්ඡා කරලා තීරණයක් ගත හැකියි. නමුත්, මේ ස්ථාවර නියෝගය අනුව මේ පත් වෙන අය ලක්ෂ සංඛ්‍යාත, කෝටි සංඛ්‍යාත ධනය පරිහරණය කරන ආයතන ප්‍රධානීන්. මෙහි බරපතළකම ඒකයි. ඒ අය හිතනවා නම්, "අපි පාර්ලිමේන්තුවට යන්න ඕනෑ නැහැ. අපට අනුමැතිය ගන්න ඕනෑ නැහැ." කියා, ඒක වැරැදියි. ඇමෙරිකාව ආදි රටවල මේ සම්බන්ධයෙන් පවතින ක්‍රමය ගැන ගරු අග්‍රාමාත්‍යතුමා දන්නවා. ඔබතුමා ඒ ගැන අධ්‍යයනය කරලාත් තිබෙනවා, ගරු අග්‍රාමාත්‍යතුමනි. ලේකම්වරු, පත් වෙලා වැඩ භාරගන්න ඉස්සර වෙලා ඒ කමිටුවට යනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සමහරුන් දවසක් පුරා ප්‍රශ්න ඇසීමට යටත් වෙනවා. ඇමෙරිකාව ආදි රටවල දවසක්ම ප්‍රශ්න කෙරෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

පත් වෙලා අවුරුද්දක් ගත වී තිබියදීත් ආපු නැති අය ඉන්නවා. මා මේ ගැසට් පත්‍රය බලායි 300ක්ය කියා කිව්වේ. ගරු අග්‍රාමාත්‍යතුමාත් පිළිගන්නවා ඊටත් වඩා වැඩි ප්‍රමාණයක්ය කියා. තානාපති පත්වීම්, මහ කොමසාරිස් පත්වීම් අපි කෙසේ හෝ අනුමත කරනවා, එහෙන් එවන නිසා. අවුරුද්දක් ඇතුළත අනුමත වෙලා නම් යළිත් ගන්නේ නැහැ. මා හිතන විධියට මෙය පාර්ලිමේන්තු බලය පිළිබඳ ප්‍රශ්නයක්, ගරු අග්‍රාමාත්‍යතුමා. ඔබතුමා මේ ගැන විශේෂයෙන් අවධානය යොමු කළ යුතුයි. මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අඩු පාඩුවක් තිබෙනවා නම්, විශේෂයෙන් එය අවධානයට ගන්න කියා ගරු කථානායකතුමා අදාළ නිලධාරීන්ට කියන්න ඕනෑ. ස්ථාවර නියෝග අනුව අමාත්‍යාංශ ලේකම්වරයා පාර්ලිමේන්තුවට යටත්, ගරු අග්‍රාමාත්‍යතුමනි. ගරු කථානායකතුමාත් ඒ ගැන දන්නවා. ස්ථාවර නියෝගයක් තිබෙනවා, අමාත්‍යාංශ ලේකම් පාර්ලිමේන්තුවට යටත් කියා. අමාත්‍යාංශ ලේකම්වරයා පාර්ලිමේන්තුවට කැඳවා - ඔබතුමා ලේකම්වරුන් කැඳවා එක වාරයක් සාකච්ඡාවක් පැවැත්වුවා.- ඒ අයට කියන්න පුළුවන්, "මාසයක් කල් දෙන්නම්. කරුණාකර මෙය කරන්න" කියා. ලේකම්වරුන් හැටියට ආයතන 10ක 12ක- සමහර ඒවායේ ආයතන 14ක් තිබෙනවා.- කිසිම කෙනෙක් ඇවිල්ලා නැහැ. ඒ නිසා මා විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. ගරු අග්‍රාමාත්‍යතුමාටත් මා කියනවා, අය වැය ලේඛනයට කලින් මේ කටයුතු අවසන් කරනවා නම් හොඳයි කියා. සමහර විට යන අයත් ඉඳීවි. යන අය යාවි. ඉන්න පුළුවන් අය ඉඳීවි, පරීක්ෂණයට පෙනී ඉඳලා. ඒ නිසා එය ඉතාම වැදගත් කාර්යයක් බව මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවෙන් ඉටු කළ යුතු සියලු කටයුතු නිම කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, ඉහළ තනතුරුවලට පත් වන නිලධාරීන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වර්තා තුනක් ලබා ගන්නා බව ඔබතුමා කිව්වා. ඒක ඉතාමත් හොඳ දෙයක්. ඒ සඳහා තවත් යෝජනාවක් එකතු කරන්න මම කැමැතියි. ඒ තමයි ණය තොරතුරු කාර්යාංශයෙන් - CRIB - වාර්තාවක් ලබා ගැනීම. ගරු කථානායකතුමනි, බොහෝ වෙලාවට ඉහළ තනතුරුවලට පත් වන පුද්ගලයන් තමන්ගේ ණය ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ග ගැනීමේදී බැංකුවලට බලපෑම් කිරීමට ඒ ලැබෙන ඉහළ තනතුරුවල බලය පාවිච්චි කිරීමේ සිද්ධි වාර්තා වෙලා තිබෙනවා. ඒ නිසා ණය තොරතුරු කාර්යාංශයෙනුත් වාර්තාවක් ලබා ගන්නවා නම් ගොඩක් හොඳයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

උසස් නිලතල පිළිබඳ කාරක සභාවට එම යෝජනාව ඉදිරිපත් කරලා, අවශ්‍ය පරිදි තීරණයක් ගන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා වැදගත් කරුණක් මතු කිරීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා. මා කලින් සඳහන් කළ විධියට නිල වශයෙන් අපට තව හතර දෙනෙක් තමයි කැඳවන්න තිබෙන්නේ. එම කටයුතු ඉක්මන් කිරීම සඳහා විශේෂයෙන්ම පොලීසියටත් උපදෙස් දීලා තිබෙනවා, අවශ්‍ය වාර්තා ලබා දෙන ලෙස. ඒවා ලැබුණු විගස ඉක්මනින් ක්‍රියා කරන්න පුළුවන්. එකසිය ගණනයි කැඳවන්න තිබෙන්නේ. දවස පුරාම ඒ කටයුත්ත කළොත් අපට දවස් තුන-හතරකින් ඒක අවසන් කරන්න පුළුවන්. එම කාරක සභාවේ සියලුම සාමාජිකයින් බොහොම උනන්දුවෙන් කටයුතු කරනවා. බොහොම ස්තුතියි.

ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා- පැමිණ නැත.

ඊළඟට, යෝජනා පිළිබඳ දැනුම් දීම.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

බර්ටි දිසානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
பேர்ட்டி திஸாநாயக்க மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
BERTY DISSANAYAKE FOUNDATION (INCORPORATION) BILL

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ சபாநாயகர் அவர்களே,

"பேர்ட்டி திஸாநாயக்க மன்றத்தைக் கூட்டிணைப்பதற்கானதொரு சட்டமூலம் கொண்டுவர அனுமதி வழங்கப்படுமாக."

எனும் பிரேரணையை நான் சமர்ப்பிக்கின்றேன்.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Empowerment and Welfaree for report.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම ඉදිරිපත් කරන මෙම කාරණය පසු ගිය අහඹරුවාදාත් අප මේ පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කළා. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවේ සම්මත කරන අවස්ථාවේදී අප විසින් සංශෝධන තුනක් භාර දී තිබුණා. එම සංශෝධන පිළිබඳව අපි විදේශ කටයුතු අමාත්‍යතුමා එක්ක පුර්ව එකඟතාවකට ආවා. අපි එම සංශෝධන ගරු සභානායකතුමාට භාර දුන්නා; ලේකම් කාර්යාලයට භාර දුන්නා; ඒ වාගේම අප ළඟත් තිබුණා.

ගරු කථානායකතුමනි, මම එදා පැහැදිලි කළ පරිදිම එම පනත් කෙටුම්පත සම්බන්ධ විවාදය ආරම්භ කර, කාරක සභා අවස්ථාවේදී සංශෝධන එකතු කරන විට එහි 8 වැනි පිටුවට අදාළව සංශෝධන ඉදිරිපත් කරන්නය කියා ගරු කථානායකතුමාගේ පාර්ශ්වයෙන් අදාළ මන්ත්‍රීවරයා දැනුවත් කර නැහැ. මොකද, ගරු කථානායකතුමා විසින් මන්ත්‍රීවරයා දැනුවත් කළාට පසුව තමයි සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන්කම තිබෙන්නේ. ඒ නිසා එක සංශෝධනයක් ඉදිරිපත් කිරීමට තිබුණු අවස්ථාව ගිලිහී ගොස් තිබෙනවා. මම මේ ප්‍රශ්නය මතු කරන අවස්ථාවේදී කිරිඇල්ල මැතිතුමා එකඟතාවකට ආවා.

ගරු කිරිඇල්ල මැතිතුමනි, පක්ෂ නායක රැස්වීමේදී නම් ඔබතුමා කිව්වේ, එම සංශෝධන ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දෙනවාය කියායි. ඒ පිළිබඳව ඔබතුමාට මතක ඇති. [බාධා කිරීමක්] - මම කිව්වේ, පක්ෂ නායක රැස්වීමේදී කියපු එකයි. නමුත් ඔබතුමා පාර්ලිමේන්තුවේදී කිව්වා, විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් මේ ගැන විමසා පිළිතුරක් ලබා දෙන බව. දැන් විදේශ කටයුතු අමාත්‍යතුමාත් මේ ගරු සභාවට පැමිණියා, වෙලාවටම.

ගරු කථානායකතුමනි, දැන් මේකට වෙන්නේ මොකක්ද කියන එක මම දැන ගන්න කැමැතියි. මොකද, එම සංශෝධනය වැදගත් සංශෝධනයක්; ආණ්ඩුව එකඟ වුණු සංශෝධනයක්. නමුත් එම සංශෝධනය නැතුව තමයි මේ පනත් කෙටුම්පත සම්මත වෙලා තිබෙන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විශේෂයෙන්ම විදේශ කටයුතු ඇමතිතුමා එක්කත් සාකච්ඡා කරන්න. වෙනත් දෙයක් නැත්නම් ඒ පිළිබඳව සංශෝධන කෙටුම්පතක් පාර්ලිමේන්තුවට වහාම ඉදිරිපත් කරන්න ආණ්ඩුව ලැහැස්තියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක තමයි -

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපි ඒක කරන්න ලැහැස්තියි. ඔබතුමා විදේශ කටයුතු අමාත්‍යතුමා එක්ක කථා කර ගත්තායින් පසුව සභානායකතුමා එම පියවරට එකඟ නම් අපි ඒ වැඩ කටයුතු සිදු කරන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ඉල්ලීමක් කෙරුවා, ඒ අවශ්‍ය සංශෝධන ලබා දෙන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි කෙටුම්පත අරගෙන ඒ කටයුත්ත කරමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සාකච්ඡා කරලා අවශ්‍ය සංශෝධන කරමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order. ගරු අගමැතිතුමා මේ සභාවේ ඉන්න වෙලාවේ මා මේ කාරණය අහන්න අවශ්‍යයි. ඔබතුමාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරවන්න අපට වෙනත් ස්ථානයක් නැති නිසා මෙය මේ සභාවේදී සඳහන් කරන්න අවශ්‍යයි. Constitutional Council එක විසින් පත් කරන ලද Election Commission එකේ සාමාජිකයෙක් වන Prof. S. Ratnajeevan H. Hoole has written an article which appeared on the centre page of "The Island" newspaper on 23rd August, 2016 which is very critical of the Constitutional Council as well as the conduct of the Election Commission. Hon. Prime Minister, he refers to the Nineteenth Amendment and the relevant Articles that are not being implemented and some other Articles that are being violated. So, this is a serious issue because it is being raised by a member of the Election Commission.

එක කොටසකින් මෙහෙම කියනවා. I quote:

> "The Delimitation Committee says their report will be ready by 31 Aug. We have said we can hold elections 90 days thereafter. The relevant Minister and President say elections will be next year. It is easier for the government to prevent the Commission from holding elections when only one person is present at meetings."

Hon. Prime Minister, according to this article, apparently, it is only one person who is conducting the whole affairs of the Commission. Prof. Hoole says that he has no allowance to attend; he has no travelling allowance to attend. Another section states, it is interesting, I quote:

> "I understand that the Delimitation Commission was meeting at the home of a member with her making tea and serving lunch because there was no budget. Perhaps,....."

It goes on like this. It is a very critical section. Either the Parliament - Hon. Speaker is the Chairman of the Constitutional Council - must approve this budgetary provision. Of course, Prof. Hoole's argument is that there is no need for a Cabinet Paper as Parliament can approve it according to the Nineteenth Amendment. So, this is the position he has taken. We all know that he is a very respected person, irrespective of some of the other views he holds. So, I would like to bring to your attention that relevant Articles of the Constitution have been quoted by him. Therefore, it becomes a Constitutional issue where there has to be some comment or some explanation given by the Hon. Speaker or by the Constitutional Council.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Hon. Speaker,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Prime Minister.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
I have not seen this article. I will read it. But, I would ask the Hon. Speaker to go into it and then we can discuss the issues thereafter. There were some requests made about certain facilities for members, I think we have agreed for some. But, like providing housing was difficult because we already have a shortage of housing. So, I think the Hon. Speaker will inquire on those matters.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
An allowance and a travelling allowance are being paid. But, we are not paying for hotels. He is not living in Colombo. So, we will see what kind of a solution can be found.

Thank you very much for bringing up this matter.

මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත
இறப்புக்களின் பதிவு (தற்காலிக ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்
REGISTRATION OF DEATHS (TEMPORARY PROVISIONS) (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[ප.භ. 11.02]

ගරු නිමල් ලාන්සා මහතා (ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் லான்சா - உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Nimal Lanza - Deputy Minister of Home Affairs)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාව තුළ සිදුවන සාමාන්‍ය මරණ ලියාපදිංචි කිරීමට 1951 අංක 17 දරන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත මඟින් ප්‍රතිපාදන සලසා තිබෙනවා. ඊට අමතරව 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත මඟින් ජාතික මට්ටමේ බරපතළ ප්‍රතිවිපාක සහිත ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම්වල හෝ ජන කැලඹීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන් වී ඇති බවට වාර්තා කර ඇති තැනැත්තන්ගේද, ජාතික මට්ටමේ බරපතළ ප්‍රතිවිපාක සහිත ස්වාභාවික ව්‍යසනයක් හෝ විපත්තියක් මරණයට හේතුව වශයෙන් සෘජුවම ආරෝපණය කළ හැකි තැනැත්තන්ගේ ද, මළ සිරුර හමුවී නොමැති අවස්ථාවලදී වුවද එම මරණය ලියාපදිංචි කිරීමට ප්‍රතිපාදන සලසා තිබෙනවා. නමුත්, අද ඉදිරිපත් කරන පනත් කෙටුම්පත මඟින් යම් පුද්ගලයෙකු අතුරුදහන් වී හෝ ආ ගිය අතක් නැති හෝ ජීවත්ව සිටින බවක් පෙනෙන්නට නැති අවස්ථාවක හෝ අතුරුදහන් වූ පුද්ගලයා නිශ්චිත වශයෙන්ම මිය ගිය බවට පරීක්ෂණයක් මඟින් තහවුරු කර නොමැති අවස්ථාවල එම පුද්ගලයා සම්බන්ධයෙන් මරණ සහතිකයක් ලියාපදිංචි කිරීමට නීති ප්‍රතිපාදන දැනට නොමැත. ඒ නිසා මෙවැනි අවස්ථාවලදී මරණ සහතිකයක් ලියාපදිංචි කිරීමට හෝ ලබා ගැනීමට ඥාතීන්ද මැළිකමක් දක්වනවා.

ගරු කථානායකතුමනි, එබැවින්, එවැනි පුද්ගලයන් සම්බන්ධයෙන්, "දක්නට නොමැති බවට සහතිකයක්" නිකුත් කිරීමේ නීති ප්‍රතිපාදන සැලසීම යෝග්‍ය බව පෙනී ගිය නිසා තමයි අද මේ පනත් කෙටුම්පත මඟින් සංශෝධන ඉදිරිපත් කරන්නේ. විශේෂයෙන් මේ සංශෝධන ඉදිරිපත් කරන්නේ මරණ සහතිකයට ආදේශකයක් ලෙස නොවෙයි, විකල්පයක් ලෙසයි. මේ සංශෝධන මඟින් මේ සහතිකය අයදුම් කිරීමට අදාළ කර ගත හැකි කාරණා පිළිබඳවත් දැනුවත් කරලා තිබෙනවා. ඒ වාගේම සහතිකයේ භාවිතයන් සම්බන්ධයෙනුත් දැනුවත් කරලා තිබෙනවා.

ඒ අනුව, 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කර, උක්ත කාරණා සපුරා ගැනීමට හැකි වන සේ, "දක්නට නොමැති බවට සහතිකයක්" නිකුත් කිරීමට නව නීති ප්‍රතිපාදන සැලසීම තමයි මේ පනත් කෙටුම්පත මඟින් යෝජනා කරන්නේ. ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එඩුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

[11.04 a.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Mr. Speaker for the opportunity given to say a few words on the occasion of the Bill titled, “Registration of Deaths (Temporary Provisions) (Amendment)” is taken up.

This is an important piece of legislation that this Government is moving consequent to the Office on Missing Persons (Establishment, Administration and Discharge of Functions) Bill that was passed recently. This has been necessitated, as the Hon. Deputy Minister of Home Affairs said, due to certain types of deaths that have occurred for which there is no usual evidence as one would find in ordinary circumstances. This Act was brought in for different purposes at different times - after the tsunami a similar provision was brought in, and after a period of intense violence that this country had to face unfortunately where several thousands of its citizens died, it has become necessary to enable the surviving members of the families of those who met with such deaths to get on with their lives, to move forward, deal with property, deal with various other obligations and therefore, the ordinary law as to how certificates of death can be issued had to be amended.

Now, along with this, the issue of missing persons became a very serious problem. The Government through several means try to ascertain the fate of people who had gone missing. Initially in 2010, when the Lessons Learnt and Reconciliation Commission was appointed by the then Government, when that Commission held sittings in various parts of the country particularly, in the North and the East, thousands of complaints were forwarded to that Commission by the relatives of people who had gone missing during the conflict. Although the mandate of that Lessons Learnt and Reconciliation Commission was somewhat broader, I think more than 90 per cent of the complaints received by that Commission related to persons who went missing over a period of time, most notably, during the last stages from the middle of 2008 to the middle of 2009. The Lessons Learnt and Reconciliation Commission in its report has brought this out and made very important recommendations. Unfortunately, the Government of the day, which appointed the LLRC, did not think it appropriate to implement the recommendations of the LLRC and although several actions were taken to compel, to persuade the Government to implement those recommendations of the LLRC, most of those recommendations remain unimplemented. There were even Resolutions in the UN Human Rights Council and I think the country needs to know this - that the UN Human Rights Council did not in one move adopted the LLRC recommendations. It was specifically mentioned in the Resolution that was adopted in the year 2012. Thereafter, it was reminded again in 2013. However, as we all know, the Government was lethargic, if not totally unwilling, to put into practice what its own Commission had recommended.

Some of those important recommendations related to the case of missing persons. Thereafter, in order to show that this important aspect of the LLRC’s recommendation is being looked into, the then Government appointed a Commission headed by a former High Court Judge, Mr. Maxwell Paranagama. The LLRC recommended that an Investigative Commissioner be appointed with respect to the missing persons. But, what was done was yet another Commission which held sittings all over the country and forced - I am using the word “forced” although there was no physical force - people felt compelled to go before that Commission also all over again and make complaints with regard to their next of kin who had gone missing or who was forced to disappear.

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

These relatives have gone before several such fora. They complained to the ICRC, they complained to the nearest Human Rights Commission Office, they made complaints to the police station. Invariably, each of those families has a file full of these documents that they have forwarded to various different authorities who, they think, will assist them in some way to resolve this question of missing persons. So, they went before the Paranagama Commission also, repeated their stories. I, myself attended some of those hearings in Mannar, in Mullaitivu and so on. I have commented on this in this House as to how those hearings were far less than satisfactory that people sometimes were asked questions leading them to answer in a particular way and there were occasions when several mothers reacted to those leading questions. They were invariably asked about compensation, whether they have got chickens, whether they have got goats, and many a time mothers would scream at the Commissioners and say, “I want my son back. I do not want a goat. I do not want chickens. I want my sons back.” The conduct of that Commission was so unsatisfactory in everybody’s eyes that one of the Resolutions adopted in the UN Human Rights Council called for a termination of the proceedings of the Paranagama Commission. For some inexplicable reason, this Government too continued to extend the mandate of that Commission. But, I believe, it has now come to an end and some of those recommendations of that Commission are also being made public.

When that Commission started its sittings in the District of Kilinochchi, close to the place where the Commissioner sat, there was another tent put up and the son or "a son" of the former President was personally present there dolling out cash to people who were going to the Paranagama Commission to divert them to this other shed - giving them cash asking them to apply for a death certificate of their loved one. We raised that matter in this House even at that time. People were being bribed to admit that the persons who have gone missing and about which they were going to make complaints had actually died; and to accept such deaths. There was a huge reaction to this and then that practice of overtly coercing people to accept death certificates was done away with and people continued to make their complaints. Over 20,000 complaints have been made even to the Paranagama Commission, the conduct of which no one was satisfied about. So it is tens of thousands in numbers who have met with this fate.

In amending the Registration of Deaths (Temporary Provisions) Act, now, there is provision to issue a different kind of certificate and that is a certificate of absence. This is a most welcome move; one about which we would congratulate the Government because by this, firstly, there would be an acknowledgement that a person has gone missing - the person is absent - without forcing those families to accept that the person is dead.

There is "presumption of death" in our law, but that is only when there is a question as to whether a person is living or dead becomes an issue in a legal proceedings. Then, if those people who would otherwise have ordinarily heard of him have not heard or seen him - initially it was for a period of seven years; then, it was brought down to a period of one year - then, there is a "presumption of death". That is very different to saying that the person is dead. That presumption is a legal fiction for purposes of determining whether a person is alive or not in those legal proceedings - it is a very narrow compass that presumption exists. But, here, people refuse to accept that the person has died. Why? Because in most cases they themselves have handed over that person to authorities. And then, if the same authorities ask them to apply for a death certificate, naturally, they will not do that. When I say "authority", it is the Government, whoever the agency is. Their question is, “We handed him over to you. How dare you now tell us to obtain a death certificate? Tell us how he died, if he died. Tell us what happened. You have an obligation to answer. Without that answer being given, we will not accept a death certificate.” Here, now, there is another option: the certificate of absence. By that they do not have to accept that the person is dead. But it is accepting the actual state of affairs - the person is missing. In fact, he is missing. That is their complaint also. So, therefore, they get this certificate. I must say this to the relatives of those persons that there is a mischievous campaign being carried out telling them not to accept the certificate of absence.

இந்த வேளையிலே, காணாமல்போனவர்களின் உறவுகளுக்கு நாங்கள் சொல்லவேண்டிய முக்கியமான செய்தியொன்று உண்டு. அதாவது, "குறித்த நபர் காணாமல்போயிருக்கின்றார்" என்ற சான்றிதழைப் பெறவேண்டாம் என்றும் அதைப் பெற்றதற்குப் பிறகு அவர் மரணித்துவிட்டாரென்று அவர் குறித்த எந்தவித விசாரணைகளும் நடைபெறமாட்டாது என்றும் அவர்கள் மத்தியில் பொய்யான பிரசாரம் செய்யப்படுகின்றது. அது தவறானதொரு பிரசாரம். "காணாமல் போயிருக்கிறார்" என்று அவர்கள் சொல்லுகின்ற குற்றச்சாட்டை ஏற்றுக்கொள்கின்ற பத்திரம்தான் "குறித்த நபர் காணாமல்போயிருக்கிறார்" என்ற சான்றிதழ். அவர் பற்றிய விசாரணை அத்தோடு முடிவடைந்துவிடாது. இச்சான்றிதழ், "குறித்த நபர் காணாமல்போயிருக்கிறார்- காணாமல் ஆக்கப்பட்டிருக்கிறார்" என்பதை அரசு ஏற்றுக்கொண்டிருக்கின்றது என்பதற்கான அத்தாட்சி மட்டுமே! அதற்குப் பிற்பாடு, அவருக்கு என்ன நடந்திருக்கின்றது என்பது தொடர்பிலான விசாரணை நடைபெறவேண்டும்.

Initially, a certificate of absence can be given because that is a mere acknowledgment by the Government that in fact that person is not around. That is your complaint as well. That does not extinguish your right to have an inquiry into the fate of that person. There must be a determination at the end of it whether the person is dead or not or whether there is sufficient evidence to conclude that the person is dead. If there is sufficient evidence which the family can actually accept, and if you can tell

them “All right, this is what happened," then, whether it is right or wrong they will accept it and there can be a closure and they can move on in their lives.

The other implications of such a death can be dealt with differently but this amendment to the Act addresses the issue of the family knowing the fate of the missing person. If there is no evidence, if it is unascertainable as to what happened to that person, then you still have the certificate of absence, the legal incidence of which will enable you to continue to move forward in life; deal with property, marriage rights and you can deal with various other aspects. Although this is not the total answer to this huge humanitarian problem, this is something that can be done and that step has been taken so that there would be some solace for those people who have gone from pillar to post complaining for several years and not found any answers to their complaints up to now.

I have given notice to move an amendment at the Committee Stage and I wish to say a few words with regard to that. There was an incident that I spoke about where people were forced to accept death certificates. The information we have is that several people have taken those death certificates unwillingly on account of various coercion that was practiced on them. Now, there is a mechanism that is being put in place with respect to missing persons; now that a new law has been enacted; now that through this amendment, there is the option of accepting a certificate of absence instead of a certificate of death, even those persons who have already obtained death certificates must have the option to exchange it for a certificate of absence and have their cases also investigated. That is the amendment that I am proposing. I urge the Government to kindly consider this because this does not change anything. It only extends the relief that you are extending to the families of the disappeared and for those who have been doubly jeopardized by this coercive practice to have the right to have an investigation. At the end of the investigation, if it is found that the person is actually dead then they may be given a death certificate, but to have in the interim the right to withdraw the death certificate and instead be given a certificate of absence in that period of time.

When this Act is implemented we hope that this very important issue, the huge issue of people who were forced to disappear; who were made to disappear; who have gone missing primarily during the conflict in the North and the East, as it is defined here, but also otherwise, will have a remedy and it is our prayer that this scourge of missing persons will totally be eradicated from this land.

Whilst the Government takes steps with regard to non-recurrence, we will fully participate in that as we are now doing in the drafting of a new Constitution. One has to deal with these unfortunate people who had to face this issue. So, these are some measures that the Government has taken and we urge the House to pass this into law and I urge the House also to consider the amendments that I will move at the Committee Stage.

Thank you very much, Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Mangala Samaraweera.

[11.27 a.m.]

ගරු මංගල සමරවීර මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Foreign Affairs)

Mr. Speaker, at the very beginning of the speech, I would also like to echo the sentiments of the Hon. M.A. Sumanthiran when he said that this Bill along with the Office on Missing Persons (Establishment, Administration and Discharge of Functions) Bill will eradicate the question of missing persons forever and hopefully confine them into the pages of our history and the era of disappearances and white vans that we hope will never raise its ugly head again.

Mr. Speaker, we have before us in this House today, an important piece of legislation which has been presented by the Hon. Minister of Home Affairs. Like the Office on Missing Persons (Establishment, Administration and Discharge of Functions) Bill passed in this House on the 11th of this month, this too is a landmark legislation in our reconciliation process and also in our transitional justice scheme.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Please continue, Hon. Minister.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තවම මතකයි, මේ ගරු සභාවේදීම 1990 දී -මට මතක හැටියට ඔක්තෝබර් මාසයේ- මගේ මිත්‍ර මහින්ද රාජපක්ෂ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට කථාවක් කරමින් කිව්වා, "අම්මලාගේ කඳුළු වෙනුවෙන් මම ජිනීවා නුවරට නොවෙයි; එක්සත් ජාතීන්ගේ සංවිධානයට විතරක් නොවෙයි; අවශ්‍ය නම් අපායට වුණත් යන්න ලැහැස්තියි" කියලා. නමුත් අද අපේ රජය ජිනීවා නුවරට යන්නේත් නැතිව, අපායට යන්නේත් නැතිව අපේ අම්මලාගේ කඳුළු වෙනුවෙන් තවත් වැදගත් පනත් කෙටුම්පතක් අනුමත කරන්නට අපේ මේ ගෞරවනීය සභාවට ඉදිරිපත් කර තිබෙනවා.

Mr. Deputy Chairman of Committees, this Bill to amend the Registration of Deaths (Temporary Provisions) Act, No. 19 of 2010 which enables the issuance of Certificates of Absence addresses, as the Hon. M.A. Sumanthiran just mentioned, a long-felt need of this nation's grieving mothers and fathers, sisters and brothers and wives and husbands whose loved ones have gone missing.

In fact, according to the ICRC, in the past period, there are 16,008 persons missing. According to the Working Group on Enforced or Involuntary Disappearances, this number is about 12,000. In the Paranagama Report, they claimed that nearly 24,000 have gone missing and also we understand nearly 5,100 security personnel also reported to be missing.

Where any person is reported missing and has not been heard of for a period exceeding one year by those who would naturally have heard of him, had he been present and his disappearance is attributable to the conflict which took place in the Northern and the Eastern Provinces or its aftermath or political unrest or civil disturbances or enforced disappearances or is a member of the armed forces or police who is identified as missing in action, a relative of such person may apply in the manner referred to in the Bill, to register such person as missing and to have issued to him a Certificate of Absence in respect of such person.

Mr. Deputy Chairman of Committees, the legislation before us has been carefully crafted. Part IA details the process of registration of missing persons including the procedure for application, verification and supporting documentation required.

The Certificate of Absence will enable the family members of those who are missing to apply for benefits under social welfare schemes and temporarily manage under the supervision of the District Court, the property and assets of the missing person and act as a provisional guardian for dependent children of the missing person. Sir, some raise allegations that some of these people who are claimed to be missing are alive or may have died. Provision has been made in this Bill to deal with such situations. The Certificates are valid for two years. If the remains of the missing person are recovered or there is conclusive evidence regarding the death of the missing person, the Certificate will be annulled and a Certificate of Death will be issued in its place. Similarly, if a person is found to be alive, the Certificate will be cancelled. Moreover, after the initial two-year period, for which the Certificate is valid, the District Secretary is required to inquire from the relative who is issued with a Certificate of Absence of the status of the missing person and take action accordingly to either extend the period by another two years, direct the relative if willing to apply for a Certificate of Death or cancel the Certificate where the relative does not intend to extend its period.

Sir, the agony that families of those who are left behind when security forces personnel or others go missing or their children or husbands go missing, defies emotional comprehension. When one sees a corpse, no matter how traumatic death may be and how unbearable the pain of loss may be, there is closure, because there is knowledge that one's loved one is no more.

When a person is missing, however, it is certainly not the same. The fact of having a relative missing is a continuous source of pain, uncertainty and incomprehensible agony. The uncertainty of a person's fate makes one's alternate between hope and despair which never really goes away.

In fact, I know, Mr. Deputy Chairman of Committees, of several mothers who lost their loved ones in the South, in the late 80s' and early 90s' who still believe, after 30 odd years, that their sons are still alive and well, living somewhere. They will not admit to closure unless they know for sure what really happened to them.

While trying to cope with this tragic state of mind, these people have to also cope with many difficulties that they are bound to face relating to legal and administrative needs. For example, claiming social benefits, claims relating to family matters such as dissolution of marriage, guardianship, inheritance, obtaining legal documents and dealing with property. Most often the only alternative they have is to obtain a death certificate which leads to more mental agony because they obtain such death certificates without clear proof or information of the death of a person and many therefore, actually refuse to accept death certificates. Therefore, their psychological trauma is compounded and they suffer thereafter, feeling that they have betrayed the missing person whose actual fate they are unaware of by accepting a death certificate.

A Certificate of Absence acknowledges the fact that people are missing. For the families concerned, this is a form of official recognition that will also contribute to reconciliation efforts that our country requires.

Approval of this Bill by this House today - certainly, I hope that the Hon. Member will pass his amendment to

the Hon. Minister concerned and we will certainly consider that amendment this evening - will help in some small way to alleviate the pain and agony that the people of our country have suffered for long years. It will recognize a phenomenon that had been a part of our lives for the past 30 years or so and help ensure its non-recurrence so that at least in future, generations to come will be finally free of this curse that this nation has suffered many times since Independence - every few years, in fact, over and over again. The curse of this nation's children, from all walks of life and from all parts of the country going missing will hopefully cease once and for all as a result of our collective efforts today. As I said at the beginning of my speech itself, we hope that tragic phase of our history will be forever confined to the pages of our history books.

Mr. Deputy Chairman of Committees, this House, on the 11th August, approved the Bill to establish an Office on Missing Persons which you signed into law on the 23rd of this month. Regarding that also, as I have time, I would like to correct some common misconceptions which have been raised by various Members of the Opposition in the media.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය 11වැනිදා අපි මේ ගරු සභාවේදී සම්මත කරගත් "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත" සම්බන්ධයෙන් යම් යම් දේශපාලනඥයන් විසින් පුවත් පත් හරහා සහ අනෙකුත් මාධ්‍ය හරහා දිගින් දිගටම යම් යම් අසත්‍ය ප්‍රචාර කරන බව අපි දකිනවා. විශේෂයෙන්ම පොදුවේ කියන එකක් තමයි, "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත" රජය හදිසියේම සම්මත කර ගත්තාය කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෛත්‍රීපාල සිරිසේන ආණ්ඩුව හදිසි පනත් ගෙන ඒම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින්ම නැවැත්තුවා. අපට මතකයි, පසු ගිය රජය කාලයේ පැය 24ක් ඇතුළත බලහත්කාරයෙන් වගේ උසාවියෙන් තීන්දුවක් අරගෙන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටවත් ඒවා ගැන සලකා බලන්නට ඉඩ නොදී හදිසි පනත් ගෙනා බව.

2009 සැප්තැම්බර් මාසයේ 21වැනිදා මහින්ද රාජපක්ෂ ආණ්ඩුව දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනා බව අපට මතකයි. එදා කාටවත් කථා කරන්නවත්, උසාවි යන්නවත් ඉඩ නොදී, හදිසි පනතක් කියලා මේ රටේ ඒකාධිපති රාජ්‍යයක් පිහිටුවීමේ පිඹුරුපත තමයි ගෙනාවේ. ඒ තුළින් ජනාධිපති ධුරයේ තිබුණු වාර ගණන අසීමිත ලෙස දීර්ඝ වුණා. මැතිවරණ කොමසාරිස් කාර්යාලය, මානව හිමිකම් කොමිසම, ජාතික පොලිස් කොමිසම ආදී හැම දෙයක්ම විධායක ජනාධිපතිවරයාගේ අත කොළු බවට පත් වුණා. අන්න එවැනි යුගයක් තිබුණු නිසා තමයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා එවැනි හදිසි පනත් ගෙන ඒම නැවැත්තුවේ. ඒ අනුව අපි එක හදිසි පනතක්වත් ගෙනැල්ලා නැහැ.

ඒ විතරක් නොවෙයි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත ගෙනෙන කොටත් අපි සාමාන්‍ය විධියටයි ගෙනාවේ. මෙම පනත් කෙටුම්පත මැයි මාසයේ 24වැනිදා තමයි කැබිනට් මණ්ඩලයේ සම්මත වුණේ. එදින කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, ඒකමතිකව සම්මත වුණා. ඒ අනුව කැබිනට් මණ්ඩලය ගැසට් නිවේදනයක් මඟින් රජයේ මුද්‍රණාලයට උපදෙස් දුන්නා, එම පනත සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් මුද්‍රණය කරන්නය කියලා. මුද්‍රණය කළ ගැසට් නිවේදනය මැයි මාසයේ 27වැනිදා ප්‍රකාශයට පත් වුණා. ඉන් පසුව මෙම පනත ජූනි මාසයේ 22වැනිදා මේ ගරු සභාවේ සභාගත කළා. ඒ අනුව ජූලි 20වැනිදාත් අගෝස්තු 9වැනිදාත් Sectoral Oversight Committee දෙකකට එය ඉදිරිපත් කළා. අන්න ඒ Sectoral Oversight Committee දෙකෙනුත් අනුමත වුණාට පස්සේ විතරමයි පසු ගිය 11වැනිදා එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. ඒ අනුව මෙය හදිසියෙන් ගෙනා පනතක් කියලා කාට හෝ කියන්න පුළුවන්ද කියලා මම අහනවා.

ඇත්ත වශයෙන්ම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ "පොදු විපක්ෂය"කියලා පක්ෂයක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ එක්සත් ජාතික පක්ෂයෙන් ආපු අය ඉන්නවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ආපු අය ඉන්නවා. දෙමළ ජාතික සන්ධානයෙන් - ටීඑන්ඒ එකෙන්- ආපු අය ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණෙන් ආපු අය ඉන්නවා. ඊට අමතරව "පොදු විපක්ෂය" කියලා පක්ෂයක් නැහැ. හැබැයි ඉන්නවා නම් ඉන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඉහුරු කල්ලියක්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
EPDP.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

සමා වෙන්න, EPDP and SLMC පක්ෂ දෙක තිබෙනවා. SLMC එකේ බහුතරයක් ආවේ එක්සත් ජාතික පක්ෂයෙන්. මේ පක්ෂවලට අමතරව "පොදු විපක්ෂය" කියලා පක්ෂයක් නැහැ. ඒ නිසා මා ඔබතුමාගෙනුත් ඉල්ලන්නේ, "පොදු විපක්ෂය" කියන වචනය පාවිච්චි කරලා පාර්ලිමේන්තුව නොමඟ යවන්නේ නැතුව, අවශ්‍ය නම් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඉහුරු කල්ලියේ පුද්ගලයන්ට - this is the "ginger group" of the UPFA. That is all it is.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා මේ ඉහුරු කල්ලිය කිව්වා, ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කරන්න වෙලාව මදියි කියලා. ඊට පස්සේ අපි කිව්වා, "එහෙම නම් රාත්‍රී 12.00වන කල් විවාදයට ගනිමු"යි කියලා. ඊට පස්සේ දවසේ අපේ අගමැතිතුමාට නෝර්වේ අගමැතිනිය පිළිගන්න තිබුණත්, එතුමා කිව්වා, "අපි සිකුරාදා දවල් 2.00වන කල් මේ විවාදය ගෙන යමු. ඕනෑ තරම් කථා කරන්න"යි කියලා. මේ පනත් කෙටුම්පත වැරැදියි කියලා උසාවිය ඉදිරියේවත් අභියෝග කරන්න බැරි වුණු මේ ඉහුරු කල්ලිය, අන්තිමේදී ඒ අවස්ථාවත් මඟ හැරියා, එතුමන්ලාට මේ ගැන කියන්න දෙයක් නැති නිසා. අන්තිමට මේ සභාව මැදට ඇවිල්ලා ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න මට ඉඩ නොදී, සින්දු කිය-කියා සිටියා. අනේ, ඒ විපක්ෂයට ගිය කලක්!

මේ ඉහුරු කල්ලිය නම් බොහොම සන්තෝෂයෙන් ඉන්න බව ලෝකයේ හැමදෙනාම කියනවා. මේ ළඟදී පිට රටක විදේශ ඇමතිවරයකු මා හමු වුණාම එතුමා අහනවා, "ඔබතුමන්ලා කොහොමද ආණ්ඩු කරන්නේ? අද ආණ්ඩුව විතරක් නොවෙයි, විපක්ෂයේ අයත් බොහොම සන්තෝෂයෙන් ඉන්නවා නේද?" කියලා. මා ඇසුවා, "එහෙම කියන්නේ ඇයි?" කියලා. "මහින්ද රාජපක්ෂ කුරුණෑගල දිස්ත්‍රික් මන්ත්‍රීතුමායි, තවත් මන්ත්‍රීවරු පිරිසකුයි මහනුවර සිට කොළඹට ඇවිදගෙන එන්නේ සින්දු කිය-කියා, නට-නටා කියලා අපි websitesවල දැක්කා" කියලා එතුමා කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you have only two minutes more.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Okay.

ඉතින් සුද්දන් හිතන්නේ, අපේ විපක්ෂයත් ඉතා සන්තෝෂයෙන් ඉන්නවාය කියලායි. අද ඒකේ ගරුත්වයත් අපේ ආණ්ඩුවටයි දෙන්නේ. " ඔබලා රට විතරක් නොවෙයි, රටේ ආණ්ඩුව විතරක් නොවෙයි, විපක්ෂයටත් සතුටින් ඉන්න පුළුවන් රටක් හදලායි තිබෙන්නේ" කියලා එතුමා කිව්වා. මා මේ ඉහුරු කල්ලියෙන් ඉල්ලන්නේ, කරුණාකරලා අසත්‍ය ප්‍රකාශ කරලා ජනතාව නොමඟ යවන්න එපාය කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෙලාව නැති නිසා අවසාන වශයෙන් තව එක කාරණාවක් කියන්න මා කැමැතියි. හැම ආණ්ඩුවක්, ආණ්ඩුවක් ගණනේ දිව වෙනස් කරන කෙනෙක් තමයි අපේ හිටපු විදේශ ඇමති මා මිත්‍ර ජී.එල්. පීරිස් මහාචාර්යතුමා. 1994දී ඉඩම් බලතල විතරක් නොවෙයි; පොලිස් බලතල විතරක් නොවෙයි, එදා අපි හදපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉන්දියාවටත් වඩා බලතල බෙදා ගන්න කැමැතිව හිටපු මේ පුද්ගලයා, අද යළිත් වතාවක් එල්ලෙන්න වැලක් නැතිව, ජාතිවාදී අතුවල එල්ලිලා, ජනතාව නොමඟ යවනවා. ඔහු කියනවා, මේ පනත යටතේ, විදේශිකයන්ට ඇවිල්ලා මේවාට සම්බන්ධ වෙන්න පුළුවන්ලු. ඒක ඇත්ත. නමුත් මිත්‍රවරුනි, ඒක අලුත් දෙයක් නොවෙයි. ලංකා ඉතිහාසය පුරාම අපි දැක්කා, අපිට ඒ විශේෂඥ හැකියාව නැති අවස්ථාවලදී විදේශ විශේෂඥයන් ඇවිල්ලා අපට උදව් කළ අන්දම. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක හිටපු අගමැතිතුමාගේ සාතනයෙන් පසුව විදේශ විශේෂඥයන් ආවා, ලලිත් ඇතුලත්මුදලි හිටපු ඇමතිතුමාගේ සාතනයෙන් පසුව ආවා. ඒ විතරක් නොවෙයි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාම පත් කළ පරණගම කොමිසම ලබා දී ඇති වාර්තාවේ Acknowledgements පොඩ්ඩක් බලන්න. පළමුවැනි පිටුව කියවුවොත්, ජී.එල්. පීරිස් උන්නැහේලා හිටපු කාලයේ ලංකාවට ආපු විදේශිකයන් කවුද කියලා හොයා ගන්න පුළුවන්. එහි ඒ හැමෝටම ස්තුති කර තිබෙනවා.

It states, I quote:

"My colleagues and I owe a particular debt of gratitude to the Right Honourable Sir Desmond de Silva, QC. (UK) who was Chairman of the legal Advisory Council together with Professor Sir Geoffrey Nice QC. (UK), Professor David M. Crane (USA), all of whom contributed specific legal opinions that collectively became a legal bedrock of this Report. The final distillation of the law was that of the Chairman of the Advisory Council working together with the members of the Commission. The Advisory Council was ably supported by Mr. Rodney Dixon, QC. (UK/ South Africa), Professor Michael Newton (USA) Vanderbilt University who formerly served as the Senior Advisor to the United States Ambassador - at - Large for War Crimes…"

මේ යුද අපරාධ සම්බන්ධයෙනුත් විශේෂඥයන් ගෙන්වලා තිබෙනවා. ඒ ගෙන්නුවේ අපි නොවෙයි.

It further states, I quote:

"…. Commander William Fenrick (Canada), Professor Nina Jorgensen of Harvard and The Chinese University of Hong Kong, and Major General John Holmes, DSO, OBE, MC (UK) former Commanding Officer of the Special Air Service (SAS), for whose independent Military Report we are greatly indebted."

මේ තිබෙන්නේ, තොග පිටින්. ඒක හොඳයි. මම ඒ ගැන වරදක් කියන්නේ නැහැ. විදේශ විශේෂඥයන් ගෙනෙන්නට ඕනෑ. මේ දෙබිඩි පිළිවෙතයි අපි විරුද්ධ වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව මේ කාරණය ඉදිරිපත් කරමින් අවසන් කරනවා. මේ වාගේම 2007 වර්ෂයේදී කවුද International Independent Group of Eminent Persons එකට එන්න කිව්වේ? ඒ අපි නොවෙයි, මහින්ද රාජපක්ෂයි. They were, Justice P.N. Bhagwati, Chairman, India; Prof. Ivan Shearer, nominated by Australia; Prof. Bruce Matthews, nominated by Canada; අනෙක් කාරණය, මේ අය පිට රටින් ඒ ගොල්ලන්ම එවපු අය. ඒ අය එපා කියලා කියන්න අයිතියක් අපට තිබුණේත් නැහැ - Mr. Bernard Kouchner, France, nominated by the European Commission; Judge Jean-Pierre Cot, France, nominated by the European Commission; Prof. Sir Nigel Rodley, nominated by the UK; Prof. Yozo Yokota, nominated by Japan; Prof. Cees Fasseur, nominated by the Netherlands; Mr. Arthur E. "Gnene" Dewey, nominated by USA; Mr. Marzuki Darusman, nominated by the Inter-Parliamentary Union, Dr. Kamal Hossain, Bangladesh, nominated by OHCHR and Mr. Andreas Mavrommatis, Cyprus, nominated by GoSL.

මෙන්න මේ විධියට විදේශිකයින් විශාල සංඛ්‍යාවක් ගෙන්වලා, -ඒ අයත් වැඩ කළ වෙලාවක- අපි අවංකව යළි වතාවක් මේ රට සාමයේ මාර්ගයට ගෙනැල්ලා දියුණුව කරා ගෙන යන මොහොතක, දෙබිඩි පිළිවෙතක් නැතිව අපිත් සමඟ අත්වැල් බැඳගෙන මේ ගමනට එකතු වෙන්න කියලා විපක්ෂයේ ඉහුරු කල්ලියටත් මම ආරාධනා කරනවා. බොහොම ස්තුතියි.

[மு.ப. 11.51]

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இறப்புக்களின் பதிவு (தற்காலிக ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலத்தில் பேசுவதற்கு சந்தர்ப்பம் தந்ததற்கு உங்களுக்கு எனது நன்றிகளும் வணக்கங்களும் உரித்தாகுக! இந்த சட்டமூலத்தை வரையவேண்டிய நோக்கத்தைச் சற்று ஆராய்வோம்.

எமது நாட்டில் ஏற்பட்ட அரசியல் குழப்பங்கள், வலுக்கட்டாயமாக காணாமற்போகச் செய்தல், குடியியல் குழப்பங்கள், யுத்தச் செயற்பாடுகள், ஒட்டுமொத்தமாக வடக்கு, கிழக்கு மாகாணங்களில் இடம்பெற்ற மோதல்கள் என்பன இந்த நாட்டை உருக்குலைத்ததென்பதை நாங்கள் ஒவ்வொரு வரும் ஏற்றுக்கொள்ள வேண்டும். எனவே, தவறுகளிலிருந்து எம்மைத் திருத்திக்கொள்ள நாம் முன்வர வேண்டும். பாரிய, கொடிய உள்நாட்டு யுத்தத்திலிருந்து நாங்கள் கற்றுக்கொண்ட பாடங்களை ஏற்றுக்கொள்ள முன்வர வேண்டும். நடந்து முடிந்த கொலைக்கள யுத்தத்திற்குப் பொறுப்புக்கூற சம்பந்தப்பட்டவர்கள் தயாராக இருக்க வேண்டும். யுத்தக் குற்றம் புரிந்தவர்கள் அதற்கான தண்டனையை ஏற்றுக் கொள்ள ஊக்குவிக்கப்பட வேண்டும். சட்டத்துக்குப் புறம்பாகச் செய்யப்படும் கொலைகளை மன்னன் செய்தாலும் அது கொலைதான்! மன்னனின் சகோதரன் செய்தாலும் கொலைதான்! அவரது காவலன் செய்தாலும் கொலைதான்! ராஜபக்ஷ அரசால் செய்யப்பட்ட கொலைகள் ஒவ்வொன்றும் விசாரிக்கப்பட்டு அதற்குப் பொறுப்பானவர்கள் தண்டனைக் குட்படுத்தப்பட வேண்டும். இனவாதிகளாகச் செயற்படுபவர்

களுக்கு ராஜபக்ஷர்கள் மீட்பர்கள் என்றால், தமிழர்களுக்கு விடுதலைப் புலிகள் மீட்பர்கள்தான்! அது உங்கள் மக்களின் எண்ணமென்றால், இது தமிழ் மக்களின் எண்ணமாகும்.

காணாமற்போனவர்களின் பிரச்சினை இன்று நாட்டில் பூதாகரமாக உருவெடுத்துள்ளது. காணாமற்போனவர்கள் சம்பந்தமாக ஒரு சட்டமூலம் கொண்டுவர வேண்டியுள்ளது. காணாமற்போனவர்கள் பல வகைப்படுத்தல்கள்மூலம் காணாமல் செய்யப்பட்டவர்களாகின்றார்கள். அதில் முக்கிய மான ஒன்று, வலுக் கட்டாயமாகக் கடத்தப்பட்டுக் காணாமல் ஆக்கப்பட்டவர்கள்; வெள்ளை வான் கடத்தல்களும்கூட இதில் உள்ளடங்கும். இலங்கை அரசு சட்டத்துக்கு முரணாக மேற்படி செயற்பாட்டில் ஈடுபட்டது என்பது கறுப்பு அத்தியாயமாக உலக அரங்கில் பார்க்கப்படுகின்றது. படையினரால், பொலிஸாரால் அவர்களது உறவினர்கள் முன்னிலையில் சட்ட நடவடிக்கைகளுக்காக என்று கூறிக் கைது செய்யப்பட்ட பலர், பின் வலுக்கட்டாயமாகக் காணாமல் செய்யப்பட்டுள்ளார்கள். விசேடமாக தமிழர்கள் யுத்த காலத்தில் காணாமல் செய்யப் பட்டனர். சிங்கள இளைஞர்கள் ஜே.வி.பீ. புரட்சியின்போது இதேவகையில் காணாமல் செய்யப்பட்டனர்; சட்டத்துக்குப் புறம்பாகக் காணாமல் ஆக்கப்பட்டனர். ஆனால் ராஜபக்ஷ காலத்தில் சட்டத்துக்குப் புறம்பாகத் தமிழர்கள் காணாமல் செய்யப்பட்டபோது ஜே.வி.பீ. இனர் செயலிழந்திருந்தனர்; சிலர் அதற்குப் பாரிய ஆதரவையும் வழங்கினர் என்பது கவலைக்குரிய விடயமாகின்றது.

2009 யுத்த முடிவில் வெள்ளைக் கொடியேந்தி சர்வதேசத்துக்கு அறிவித்தல் கொடுத்துவிட்டுச் சரணடைந்த விடுதலைப் புலிகளின் அரசியல் பிரிவுத் தலைவரான திரு. நடேசன், சிங்களப் பெண்ணான அவரது மனைவி உட்பட நூற்றுக்கணக்கானவர்கள் கொடூரமாகக் கொலை செய்யப் பட்டுக் காணாமல் செய்யப்பட்டனர். இந்த விடயத்தில் அரச படையினர் முழுப் பொறுப்புக்குரியவர்களாக இருக்கின் றார்கள்; குற்றவாளிகளாக நிற்கின்றார்கள். திரு. நடேசனது மனைவி ஒரு சிங்களப் பெண் என்றுகூடப் பாராமல், உண்மை வெளிவந்துவிடக்கூடாது என்பதற்காக அவரைக் கொலை செய்தனர். எனவே, சிங்கள தேசத்தின் கோர முகத்தை இந்தக் கொலைகளும் காணாமல் செய்யப்படுதலும் சர்வதேசத்துக்குக் காட்டி நிற்கின்றன என்பதை மறைக்க முடியாது. அடுத்து, செட்டிக்குளம் அகதி முகாமில் வாழ்வுக்காகச் சரணடைந் தவர்கள்கூட நடுநிசியில் படையினரின் கையாட்களால், ஏவற்காரர்களால் கடத்தப்பட்டுக் காணாமல் செய்யப்பட்டனர் என்பது வரலாற்றில் இடம்பெற்ற உண்மை.

இவ்வாறு இறந்தவர்களுக்கான இறப்புச் சான்றிதழ் இன்று வழங்கப்படாமல் இருட்டடிப்புச் செய்யப்பட்டுள்ளது. அவர்கள் காணாமல் செய்யப்பட்டதால் ஏற்பட்ட அவலம் இது. அந்த உண்மைகளை மறைப்பதற்காகச் செய்யப்பட்ட பல விடயங்கள் இன்று வெளிவந்து கொண்டிருக்கின்றன. காணாமல் செய்யப்பட்டவர்களை எந்த விதத்தில் பதிவு செய்வது என்பதற்கு இந்தச் சட்டமூலம் வழிவகை செய்கின்றது. ஒருவர் காணாமல் செய்யப்பட்டிருந்தால் இரண்டு வருடங்களுக்குள் அவரைக் கண்டுபிடிக்கும்வரை காணாமல் செய்யப்பட்டதான ஒரு சான்றிதழை வழங்குவது சம்பந்தப்பட்டவர்களுக்குப் பல விடயங்களில் தேவையான ஒன்றாக இருக்கலாம். இந்தக் காலத்தில் அவரது இறப்பு உறுதி செய்யப்பட்டால், அவருக்கு இறப்புச் சான்றிதழ் வழங்க முடியும் என்பது இந்தச் சட்டமூலத்தில் உள்ளது. அதுமட்டு மல்ல, காணாமல் செய்யப்பட்டவர் சம்பந்தமான ஒரு முறைப்பாடு ஏற்றுக்கொள்ளப்படாவிட்டால், ஒரு மாவட்ட நீதிமன்றத்தில் முறையிட்டு அதற்கான நீதியைப் பெற்றுக் கொள்ள வழி செய்யப்பட்டுள்ளது. எனவே இந்தச் சட்டத் திருத்தம் பல விடயங்களில் எமக்கு உதவி செய்யக்கூடும்.

மேலும், ஒருவர் இறந்தால் அவருக்கான மரணச் சான்றிதழ் வழங்கப்பட வேண்டும் என்பது இலங்கை அரசியல் யாப்பில் உள்ள ஒரு விடயம். ஆனால், யுத்தத்தில் இறந்த போராளிகளை ஒட்டுமொத்தமாகத் தள்ளிப் புதைத்தது அரசு. அவர்களுக்கான இறப்புச் சான்றிதழ்களை வழங்காமல் செய்தது அரசு. புலிகளின் தலைவர் பிரபாகரன் இறந்ததாக அரசு கூறியது. ஆனால், அவருக்கான ஓர் இறப்புச் சான்றிதழ் அரசால் வழங்கப்படவில்லை என்பது முக்கியமான விடயம். அவரும் ஒரு போராளி என்பதால் அதனை மறைத்து டி.என்.ஏ. பரிசோதனை செய்ததாக அறிவித்த அரசு, அந்த டி.என்.ஏ. சான்றிதழைக்கூட வழங்கவில்லை. இந்திய அரசு பிரபாகரனின் இறப்புச் சான்றிதழைக் கோரிநின்றது. இவர்களால் அந்த இறப்புச் சான்றிதழை வழங்க முடிய வில்லை. DNA பரிசோதனைச் சான்றிதழைக்கூட வழங்க முடியவில்லை என்பது வெளிப்படையான ஓர் உண்மை. எனவே, பிரபாகரன் அவர்கள் இறந்திருந்தால், அதற்கான ஆதாரங்களை இந்தப் பாராளுமன்றத்தில் சமர்ப்பிக்குமாறு நான் கோருகிறேன்.

எனவே, இனவாதக் கருத்துக்களைப் பேசும் உறுப்பினர் களுக்கு நான் ஒரு வேண்டுகோளை முன்வைக்கின்றேன். தயவுசெய்து நீங்கள் உங்கள் பேரினவாதச் சிந்தனைகளை விட்டுவிடுங்கள்! யுத்தத்திலிருந்து பாடங்களைக் கற்றுக் கொள்ள முன்வாருங்கள்! வரலாற்றை மீண்டும் புரட்டிப்போட முயற்சிக்காதீர்கள்! சட்டத்தின்மூலம் நாங்கள் அனைவரும் ஒரு நாட்டு மக்கள் என்பதை ஏற்றுக்கொள்ள முன்வாருங்கள்! பாதிக்கப்பட்டவர்கள் தமிழர்கள் என்பதால் அவர்கள் ஏற்றுக்கொள்ளக்கூடிய ஓர் அரசியல் யாப்பு மாற்றத்தை நோக்கிச் சிந்திக்க முன்வாருங்கள்! அரசியல் யாப்புக்கள் குழப்பியடிக்கப்படலாம். அதன்மூலம் ஒரு சிலரின் நரித் தனங்கள் வெற்றிகொள்ளும் எனக் கனவு காணாதீர்கள்! வரலாறுகள் மீண்டும் தொடங்கும். நீங்கள் மீண்டும் பாடம் கற்கநேரிடும்! அடக்கப்பட்ட இனம் உலகெங்கும் அடங்கிப் போனதாக வரலாறு இல்லை; அடக்குமுறை எங்காவது வெற்றிபெற்றதாகவும் வரலாறு இல்லை. தமிழினம் அடங்கிப்போகும் இனமல்ல; அடக்குமுறைக்குப் பணிந்து போகின்றவனும் தமிழனல்ல.

இன்று ஓகஸ்ட் 25ஆம் நாள். வன்னி மன்னன் குலசேகரன் வைரமுத்து பண்டார வன்னியன் ஆங்கிலேயரின் முல்லைத்தீவுக் கோட்டையைச் சுக்குநூறாக்கி வெற்றி கொண்ட 211ஆவது ஆண்டு நினைவுநாள். இது வன்னி எங்கும் கொண்டாடப்படுகின்றது. 1805ஆம் ஆண்டு ஆவணி 25ஆம் நாள் அவன் பெற்றுக்கொண்ட யுத்தவெற்றி ஆங்கிலேயரை நிலைகுலையச் செய்தது. வெள்ளையனி டமிருந்து இலங்கை நாட்டை மீட்டெடுக்கப் போராடியவன்தான் தமிழன். மீட்டெடுத்த இலங்கை தமிழனுக்கும் சொந்தம். தனியான தமிழர் இராச்சியம் அமைத்து, வெள்ளையனுக்கு எதிராகப் போராடி வாழ்ந்தவன் தமிழன். வன்னி மண்ணை ஆண்டவன் தமிழ் மன்னன் குலசேகரன் வைரமுத்து பண்டார வன்னியன்.

இன்று நாம் சொல்லவருவது என்னவெனில், வடக்கு, கிழக்கு தமிழ் பேசும் மக்களின் பூர்வீகப் பிரதேசம். அதில் தமிழ் பேசும் சைவ, முஸ்லிம், கிறிஸ்தவ சமய கலாசாரத்தைக் கடைபிடிக்கும் மக்கள் அதிகப்படியாக வாழ்ந்து வருகிறார்கள். அந்த வரலாற்றை மாற்றிவிட முற்படாதீர்கள்! இலங்கை நாட்டில் தமிழ், சிங்களம் எனும் இரண்டு மொழிகள் மட்டுமே உள்ளன. இந்திய நாட்டில் பலநூறு மொழிகள் இருந்தும் மாநில சுயாட்சி மற்றும் கூட்டாட்சி நடக்கிறது. அவரவர்

[ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා]

පාතුකාප්පෙ අතර්කුරිය මානිලංකල් පාර්ත්තුක්කොළ්කින්රන. මානිලංකලින් ආට්සියුරිමෙ, මානිලප් පාතුකාප්පු, මානිල මණ්ණුරිමෙ, මානිලත්තුක්කුරිය සමූක වාළ්වුරිමෙ, අපිවිරුත්ති අනෙත්තෙයුම් අවර්කළේ පාර්ත්තුක් කොළ්කිරාර්කළ්. ඉතුපර්රි ඉංකේ විවාතික්ක එන්න ඉරුක්කිරතු? තමිළර්කළෙ, තමිළ් පේසුම් මක්කළෙත් තමිළර් කළාක වාළවිටුංකළ්!

මතවාතමානතු ඉන්ත නාට්ටුක්කු පේරළිවෛත් තරුම්. මතංකළ් එන්පන අමෙතියාන වාළ්වෛප් පෝතිප්පවෙ. ඒනෙය මතංකළෙ මනිත නේයත්තුටන් මතික්කප් පෝතිප්පවෙ. මතවාතිකළාල්තාන් ඉන්ත නාටු අළිවෙ නෝක්කිච් චෙල්ලුමෙන්රාල්, මතවාතිකළුක්කු මරණතණ්ටනෙ විතිප්පතර්කුච් චට්ටම් කොණ්ටුවරප්පට වේණ්ටුම්. අතුවුම් ඉන්තප් පාරාළුමන්රත්තිල් නිරෙවේර්රප්පටවේණ්ටුම්. අමෙතියාන චමයප් පෝතනෙකළෙච් චෙය්යාත, නර්චින්තනෙකළෙ මක්කළිටම් විතෛක්කාත, මත නල්ලිණක්කත්තෙ වළර්ක්කාත, චමයත් තලෙවර්කළ් මතකුරුමාර් අල්ලර්. අප්පටියාන ඔරු මතකුරු ඉන්ත නාට්ටිල් නච්චුප් පයිරාකප් පාර්ක්කප්පට වේණ්ටියවර්. අන්ත 'නච්චුච් චෙටි' විතෛ කොට්ටි වළරමුන් අතෙ අළිත්තුවිට අරසු චට්ටම් කොණ්ටුවර වේණ්ටුම්. තවරිනාල්, ඒනෙය මතංකළුක්කුම් පිළෙයාන උතාරණංකළ් පරවිවිටුම්.

මටුප් පිරතේචම් කිරිස්තවර්කළුක්කු පුනිත පිරතේච මෙන්රාල් තිරුක්කේතීස්වරම් ඉන්තුක්කළින් පුනිත පිරතේචම්! අනුරාතපුරම් පෞත්තර්කළින් පුනිත පිරතේචමෙන්රාල් කතිර්කාමම් ඉන්තුක්කළින් පුනිත පිරතේචම්! ඉන්තච් චමනිලෙකළෙ අනෙත්තු මතත් තලෙවර්කළුම් ඒර්රුක්කොළ්ළ මුන්වර වේණ්ටුම්. මන්නාරිල් නියායපූර්වමාන චමනිලෙකළෙක් කුලෙක්ක අංකුළ්ළ මතත්තලෙවර්කළ් මුර්පටක්කූටාතු. මත නල්ලිණක්කත්තුටන් අනෙවරුම් චෙයර්පට මුන්වරවේණ්ටු මෙන්රු කේට්ටුක්කොණ්ටු, එනතු ඉන්ත උරෙයෙය මුටිත්තුක්කොළ්කින්රේන්.

[අ.භා. 12.03]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න - අරස තොළිල්මුයර්චිකළ් අපිවිරුත්ති පිරති අමෙච්චර්)

(The Hon. Eran Wickramaratne - Deputy Minister of Public Enterprise Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සම්බන්ධයෙන් පවත්වන විවාදයට කරුණු එකතු කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ රජය, අද අලුත් රටක්; අලුත් ගමනක් ආරම්භ කරලා තිබෙනවා. පසු ගිය සතියේදී අපි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත සම්මත කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතුරුදහන් වූ තැනැත්තන්ට මරණ සහතිකයක් ලබා ගන්නට බැරි අවස්ථාවලදී, ඒ පවුලේ අයට මුහුණ පාන්න සිදු වෙන විශාල ප්‍රශ්න රාශියට පිළිතුරක් වශයෙන් තමයි මේ සංශෝධනය අද අපි ඉදිරිපත් කරන්නේ. මේ අය අතුරුදහන් වෙලා තිබෙන්නේ නොයෙකුත් හේතූන් නිසායි. ඒ, ත්‍රස්තවාදය නිසා වෙන්න පුළුවන්; රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් නිසා වෙන්න පුළුවන්; ජන කැලඹීම්වල ප්‍රතිඵලයක් වශයෙන් වෙන්නට පුළුවන්; නැත්නම් ස්වභාවික ව්‍යවසනයකට මුහුණදීම නිසා වෙන්නටත් පුළුවන්. කෙනෙකු අතුරුදහන් වුණාම, ඒ පිළිබඳ සාක්ෂියක් නැති නිසා සෑහෙන කාලයක් යනතුරු ඒ අයගේ පවුලේ උදවිය මේ අය මරණයට පත් වෙලා කියලා පිළිගන්නේ නැහැ. ඒ පවුලේ උදවිය ඒ කාරණය නොපිළිගැනීම ගැන කාටවත් වරදක් කියන්නත් බැහැ. මොකද, සාමාන්‍යයෙන් කෙනෙක් මරණයට පත් වුණාම තිබෙන සාක්ෂිය තමයි ඒ මෘතදේහය. නමුත් කෙනෙක් අතුරුදහන් වූ අවස්ථාවක මෘතදේහය නැති නිසා, ඒ පවුලේ අය ඒ තැනැත්තා මියගිය බව ප්‍රතික්ෂේප කරන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවුරුදු ගණනාවකට උඩදී උපාලි විජයවර්ධන නමැති ශ්‍රී ලාංකික සුප්‍රසිද්ධ ව්‍යාපාරිකයා පිට රට ඉඳලා ජෙට් යානාවකින් එනකොට ඒ ජෙට් යානය නැති වුණා කියා සඳහන් වුණු කාරණය මට මේ අවස්ථාවේ මතක් වෙනවා. නමුත් ඒ පවුලේ අය එදා පිළිගත්තේ නැහැ, එතුමා මරණයට පත් වුණා කියලා. මේ මෑතකදී මලයාසියානු ගුවන් යානාවකුත් නැති වුණා කියා සඳහන් වුණා. නමුත් ඒ පවුල්වල සිටින උදවියත් සමහර විට එකවරටම ඒක පිළිගන්නේ නැහැ. එතකොට ඒ අය වෙනුවෙන් මරණ සහතිකයක් ලබා ගන්නේ නැහැ. ඒ නිසා අතුරුදහන් වූ තැනැත්තාට බැංකු අයිරාවක් තිබෙනවා නම්, දේපළ තිබෙනවා නම් ඒ කිසිවක් ඒ පවුලේ අයට භාවිත කරන්නට බැහැ. ඒ ප්‍රශ්නවලට විසඳුමක් ලැබෙනවා අද අපි මේ ගෙනෙන සංශෝධනවලින්. පුද්ගලයෙක් අතුරුදහන් වුණාම, විශේෂයෙන්ම ඒ පවුලේ අය ගැන හිතලා, ඒ පවුලේ අය විඳින දුක තුනී කරන්නට ප්‍රායෝගික ලෙස කල්පනා කරලා තමයි මේ සංශෝධන අපේ රජය ඉදිරිපත් කරලා තිබෙන්නේ. එතකොට, ඒ පවුලේ අය ව්‍යාපාරයක් කරනවා නම් ඒ ව්‍යාපාරය සම්බන්ධ තීරණ ගැනීමේදී, ඒ අයගේ දේපොළ, ඉඩම් ගනු-දෙනු සම්බන්ධ තීරණ ගැනීමේදී ඒ සියල්ලටම මේ සංශෝධන උපකාර වෙනවා.

අපි දන්නවා, උතුරු - නැගෙනහිර ප්‍රදේශවල පුරවැසියන් දහස් ගණනින් අතුරුදහන් වෙලා තිබෙන බව. ඒ වාගේම හමුදාවේ අයත් අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ පවුල්වල අයත් හුඟක් වෙලාවට පිළිගන්නේ නැහැ ඒ අය මිය ගිහින් කියලා. මොකද, ඒ සඳහා සාක්ෂි නොමැති නිසා. ඒ වාගේම දකුණේත් කැරලි තිබුණා. ඒ කැරලිවලදී මර්දනය නිසා හුඟාක් තරුණ තරුණියන් මිය ගිහින් තිබෙනවා. අපි බොහොම සංවේදීව මේ අය ගැන හිතන්න ඕනෑ. ඒ සිද්ධි අපේ ඉතිහාසයේ කොටසක්. ඒ ඉතිහාසය මෙතැනින් සීමා වෙන්න ඕනෑය කියන පරමාර්ථයෙන් තමයි අපි මේ සංශෝධන ඉදිරිපත් කරන්නේ.

පසු ගිය දා අපි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත සම්මත කර ගත්තා. අවාසනාවකට මෙන් අපට ඒ පනත සම්බන්ධයෙන් සම්පූර්ණ විවාදයක් කිරීමේ අවස්ථාව අහිමි වුණා. නමුත් එහි මූලික පරමාර්ථය මෙයයි. පවුලක කෙනෙක් අතුරුදහන් වුණාම, ඒ ඕනෑම පවුලකට සත්‍යය දැන ගන්න අවශ්‍යයි. සත්‍යය කුමක්ද කියලා දැන ගැනීම අවශ්‍යයි. ඒ පනත හරහා පිහිටුවන කාර්යාලය දිගින් දිගටම පවතින කාර්යාලයක්. ඒක තාවකාලික දෙයක් නොවෙයි. පසු ගිය කාලයේ සිවිල් පුරවැසියන්, අපේ මාධ්‍යවේදීන් අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ අතුරුදහන් වීම් වෙලා තිබෙන්නේ යුද සමය නිසාම නොවෙයි. එහෙම වුණේ සමහර වෙලාවට එදා තිබුණු රජයට විරුද්ධ දේශපාලන මත දැරූ නිසා, ඒ ගැන ලියපු නිසා වෙන්න පුළුවන්. මම හිතන විධියට ඒ පවුල්වල සියලු දෙනාටම අපි ඉදිරිත් කරලා තිබෙන පනත් හරහා සහනයක් ලැබෙනවා.

මේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් විමර්ශනයක් තියනකොට, ඒ පවතින විමර්ශනය පිළිබඳව පවුලේ අයට තත්ත්ව වාර්තාවක් ලබා ගන්න පුළුවන්. මේ කාර්යාලය ස්ථාපිත වුණාම, අතුරුදහන් වූ පුද්ගලයා ජීවත්ව සිටින බව සොයා ගනු ලැබුවොත් ඔහුගේ කැමැත්ත ඇතිව, ඒ පිළිබඳ තොරතුරු ඔහුගේ ඥාතීන්ට හෝ වෙනත් පැමිණිලිකරුවෙකුට හෙළි කරන්නටත් පුළුවන්. විමර්ශනයක් අවසන් වුණාට පස්සේ, අතුරුදහන් වූ පුද්ගලයාට අත් වූ ඉරණම සහ ඔහු අතුරුදහන් වූ හේතු පිළිබඳව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ඔහුගේ ඥාතීන්ට දැනුම් දිය යුතුමයි. ඒ වාගේම අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඥාතීන්ට පරිපාලනමය හා සුබසාධන සේවා ලබා දෙන්නටත් මේ කාර්යාලය හරහා අපි බැඳී සිටිනවා. අතුරුදහන්වූවන්ගේ දත්ත ගබඩාවක් නිර්මාණය කරලා, ඒවා කළමනාකරණය කරන්නට අවශ්‍ය කරුණු අපි මේ පනතට ඇතුළත් කරලා තිබෙනවා. අතුරුදහන්වූවන් සම්බන්ධ හේතු, සිද්ධි හා ප්‍රතිඵල පිළිබඳව මහජනයා දැනුවත් කිරීමට පියවර ගත යුතුයි. රජයට ඒ පිළිබඳව දැන් වගකීමක් තිබෙනවා. අද මේ ගෙනෙන සංශෝධනයත්, එදා සම්මත කරපු ඒ පනතට ශක්තියක්වීම සඳහා සම්බන්ධ වන බව සඳහන් කරන්නට ඕනෑ. අවාසනාවකට, එදා ඒ පනතට විරුද්ධතාවක් ප්‍රකාශ කරපු නිසා, මෙතැන ඊට අදාළ විවාදය පවත්වන්න අවස්ථාවක් අපට ලැබුණේ නැහැ. මට මතක් වෙනවා, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා 1980 ගණන්වල මේ වාගේ අතුරුදහන්වූවන් ගැන කථා කළ හැටි. ඒ වෙලාවේ පාද යාත්‍රා ගියා. ජිනීවා නුවර එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගියා. එදා කරපු දේ වැරදියි කියලා සමහර විට අපේ පක්ෂයේ අයත් හිතුවාට, ඇත්තටම ඒවා මානව හිතවාදී ක්‍රියා හැටියට සඳහන් කරන්නට පුළුවන්. නමුත් අද තිබෙන්නේ ඒකේ අනෙක් පැත්ත.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you have only two more minutes.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අතුරුදහන් වීම්වලට විරුද්ධව එදා අදහස් දක්වපු අයගෙන් මම අහන්න කැමැතියි, නීතියට ගරු කිරීමක් හැටියට සාධාරණත්වයේ නාමයෙන් අද මේ පනත්වලට සම්පූර්ණ සහයෝගය ලබා දෙනවාද කියලා. සමහර වෙලාවට මවලා පෙන්වන්න හදනවා මේවා යුද හමුදාවට, පොලීසියට විරුද්ධව ගෙනෙන පනත් කියලා. එය සම්පූර්ණයෙන් අසත්‍යයක් බව සඳහන් කරන්න ඕනෑ. මොකද, හමුදාවේ, පොලීසියේ සේවයේ සිටියදී නැති වූ අයගේ පවුල්ද මේ පනත් හරහා ආරක්ෂා වෙනවා. අතුරුදහන් වූ අය ගැන කථා කරන විට දේශපාලන මතය, දේශපාලන පක්ෂය යනාදී කරුණු වැදගත් නැහැ. ජාතිය සිංහල ද, දෙමළ ද, මුවර් ද, බර්ගර් ද කියන එක වැදගත් නැහැ. ඒ අය ඉර, හඳ, ගල් අදහනවාද, ප්‍රසිද්ධ ආගමක් අදහනවාද කියන එක වැදගත් නැහැ. ආගමක් අදහන්නේ නැති කෙනෙකු වුණත් කමක් නැහැ, ඒ අයටත් මේ පනත්වල ආරක්ෂාව තිබෙනවා. ඒ සියලු දෙනාට මේ පනත් මඟින් ආරක්ෂාවක් ලැබෙනවා. ඒ වාගේම මෙහිදී ආර්ථික පන්තිය වැදගත් නැහැ. මෙය, සුදු වැන් සංස්කෘතිය අවසන් කරලා යන අලුත් ගමනක්; අලුත් සංස්කෘතියක්. සිවිල් පුරවැසියන්, මාධ්‍යවේදීන් එදා රජයේ හෝ අද රජයේ දේශපාලන මතයට විරුද්ධව ක්‍රියා කරනවා නම්, ඒ අයත් ආරක්ෂා වන පනත් තමයි මේවා. දේශපාලන පලි ගැනීම් සංස්කෘතියේ අවසානය, මරණය හා අතුරුදහන් වීමයි. අපි මෙය ඉතිහාසයට සීමා කරමු. ස්තුතියි.

[අ.භා. 12.13]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතුරුදහන් වූ පුද්ගලයන්ට මරණ සහතිකයක් වෙනුවට අතුරුදහන් වූ බවට සහතිකයක් නිකුත් කිරීම අරමුණු කරගත් මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව පැවැත්වෙන මේ විවාදයේදී අපි කථා කරන්නේ අතුරුදහන් වීම් පිළිබඳ අතිශයින් තීරණාත්මක දවසකයි. ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාත් මේ සබා ගැබේ සිටින නිසා එතුමාගේත් අවධානය මේ කාරණයට යොමු කරවන්න කැමැතියි. අද දිනය ශ්‍රී ලංකාවේ කීර්තිය අතුරුදහන් වූ දවසක්. මා ඒ ගැන කියන්න එක විනාඩියක් වැය කරලා මාතෘකාවට එන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේත්, අදත් ඕස්ට්‍රේලියාවේ මාධ්‍යවල ශ්‍රී ලංකාවේ කීර්තිය පලුදු වන ආකාරයේ ප්‍රවෘත්තියක් පළ වුණා. මා කථා කරන්නේ ඒ ප්‍රවෘත්තිය ගැන මිස ජනාධිපතිතුමා ගැන නොවෙයි. අපි ජනාධිපතිතුමාට ඡන්දය දුන්නේ නැති වුණත්, මේ රටේ සිටින ජනාධිපතිතුමා එතුමායි. මේ රාජ්‍යයේ සංකේතය එතුමායි. රාජ්‍ය නායකයාගේ කීර්තිය කියන්නේ රටේ කීර්තියයි.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීමක්]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Minister.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
He is making insinuations on the conduct of the President based on a newspaper report. He cannot do that. All those have to be expunged.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
I am not talking about the conduct of the President, Hon. Minister. I am not. What I am talking about is the conduct of the Australian media and the conduct of the Foreign Ministry. Let me talk about the Foreign Ministry.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
No. But he is making direct observations about his Excellency the President.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
I am talking about the preservation of the reputation of the President; reputation of this nation.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
All these have to be expunged, Sir.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You continue with your speech, Hon. Member.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මාගේ චෝදනාව ඒක නොවෙයි. මේ දක්වා අපේ මහ කොමසාරිස් කාර්යාලය ඒ පිළිබඳව නිවැරදි කිරීමක් කරලා නැහැ; පිළිතුරක් දීලා නැහැ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Sir, I rise to a point of Order. -[*Interruption.*]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is your point of Order, Hon. Eran Wickramaratne?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිතුමා අමාත්‍ය ධූරයක් දරපු කාලයේ යම් චෝදනාවක් තිබුණු බව උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා සඳහන් කළා. එවැනි චෝදනාවක් නැහැ. වෙන මොකක්ද ක්‍රියාවලියක් ගැන වාර්තාවක සඳහන් වෙලා තිබෙනවා. එම වාර්තාවේම සඳහන් කරලා තිබෙනවා, එවැනි දෙයක් සිදු වුණේ නැහැ කියලා. වෙනත් වාර්තාවක නොවෙයි, එම වාර්තාවේමයි සඳහන් කරලා තිබෙන්නේ. කරුණාකරලා ජනාධිපතිතුමාගේ හැසිරීම පිළිබඳව - [බාධා කිරීමක්] එවැනි චෝදනාවක් තිබුණු බවට කරන ප්‍රකාශය බොහොම අසාධාරණයි කියලායි මම හිතන්නේ. මොකද, එම වාර්තාවේම තිබෙනවා, එහෙම දෙයක් සිදු වුණේ නැහැ කියලා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනාධිපතිතුමාගේ හැසිරීම පිළිබඳව මම ප්‍රශ්න කළේ නැහැ. මම කිව්වේ රටේ කීර්තිනාමය රැක ගත යුතුයි, ජනාධිපතිතුමාගේ කීර්තිනාමය රැක ගත යුතුයි කියලායි. අපේ මහ කොමසාරිස්වරයා වහාම ඒ මාධ්‍යවලට පිළිතුරක් යැවිය යුතුයි කියන එකයි මම කිව්වේ. මේ වන තුරු ඒක සිදු වෙලා නැහැ, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමනි. ඒ ගැනයි මම කථා කළේ. ඒ ගැන කථා කිරීම මම මෙතැනින් නතර කරනවා. ඒ ගැන අපි සභා ගැබෙන් පිටතදී කථා කරමු. ජනාධිපතිතුමාගේ කටයුතු පිළිබඳව නොවෙයි, මම ප්‍රශ්න කළේ. මම ප්‍රශ්න කළේ, විදේශ කටයුතු අමාත්‍යාංශයේ කටයුතු පිළිබඳවයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම නැවතත් මාගේ මාතෘකාවට එන්නම්. කවුරු කළත්, කුමන අරමුණෙන් කළත්, ශීලාචාර සමාජයකට මේ අතුරුදහන් කිරීම් පිළිගන්න බැහැ. අපි හැමෝම ඒක හෙළා දැකිය යුතුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ නීතිය වුණේ, යම් පුද්ගලයකු වසර හතක් තිස්සේ අතුරුදහන් වෙලා සිටියා නම්, ඔහු මිය ගිය පුද්ගලයකු ලෙස උපකල්පනය කිරීමයි. නමුත් පසු කාලීනව එම කාල සීමාව වසරක් දක්වා අඩු කළා. උතුරේ වේවා, නැගෙනහිර වේවා, දකුණේ වේවා, ප්‍රදේශය ප්‍රශ්නයක් නැහැ, යම් කෙනෙක් වසරකට වැඩි කාලයක් අතුරුදහන් වෙලා සිටියා නම් නීතිමය කටයුතුවලදී ඒ පුද්ගලයා මිය ගිය කෙනෙකු විධියට සලකනවා. හොයන්න පුළුවන්, හම්බ වුණොත් ඉන්නවාය කියලා පිළිගන්න පුළුවන්, හැබැයි නීතිමය කාරණාවලදී ඔහු මිය ගිය තැනැත්තෙකු සේ සලකනවා. එවැනි නීතිමය ප්‍රතිපාදනයක් තිබියදී, මරණ සහතිකය වෙනුවට අතුරුදහන් වූ බවට සහතිකයක් නිකුත් කර ගැනීම තමයි මේ පනතේ අරමුණ වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උතුරේ කොටි සංවිධානයට බැඳෙන්න යම් තරුණයෙක් තීරණය කළොත් "අම්මේ - තාත්තේ, මම කොටි සංවිධානයට බැඳෙනවා" කියලා ගියේ නැහැ. ඒ අය ගියේ හොරෙන්. ඒ විතරක් නොවෙයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය පවා පිළිගෙන තිබෙනවා, කොටි සංවිධානය විසින් ළමයින් පැහැරගෙන ගිහිල්ලා දස දහස් ගණනක් ළමා සොල්දාදුවන් වශයෙන් කියාගෙන හිටියා කියලා. පාසල් ගිය ළමයා ආපහු ගෙදර ආවේ නැහැ. ඒ දරුවා අතුරුදහන්. කොටි සංවිධානය පැහැරගෙන ගිහිල්ලා. ඒ වාගේම කොටි සංවිධානයට කැමැත්තෙන් බැඳුණු අය පවා, කොටි සංවිධානයේ නායකයාගේ තීන්දු තීරණවලට එකඟ නොවුණාම ඔහු මරා දැමුවා.

අපි දන්නවා, කොටි සංවිධානයේ දෙවැනි නායකයා වූ "මහත්තයා" ගැන. "මහත්තයා"ට මොකද වුණේ? කොටි සංවිධානයේ දෙවැනියා වූ ගෝපාල් ස්වාමී මහේන්ද්‍ර රාජා වන එම අයව අතුරුදහන් කෙරෙව්වා, පළමුවැනියා විසින්. එතකොටත් එයා අතුරුදහන්. දෙමළ සන්නද්ධ කණ්ඩායම් අතර ගැටුම් ඇති වුණා. මේ සමහර පිරිස්වලට සිදු වුණේ මොකක්ද කියලා හොයා ගන්න නැහැ. ඒ සන්නද්ධ කණ්ඩායම්වල තිබුණු ප්‍රශ්නවල ප්‍රතිඵලයක් විධියට ඒ කණ්ඩායමෙන් හොයන නිසාම සමහර කට්ටිය විදේශ රටවලට පැනලා ස්වේච්ඡාවෙන්ම අතුරුදහන් වුණා. එතකොට මේ පුද්ගලයන් විවිධ හේතු මත අතුරුදහන් වෙලා තිබෙද්දී, අද ජාත්‍යන්තරය කොටි සංවිධානය විසින් කළ අතුරුදහන් කිරීම් ගැන කථා කරන්නේ නැහැ. අනෙක් කණ්ඩායම් අතර වෙච්ච අතුරුදහන් කිරීම්, පැහැර ගැනීම් ගැන කථා කරන්නේ නැහැ. අපේ රණවිරුවන්ගේ යුද ජයග්‍රහණයේ කීර්තිය පලුදු කිරීමේ දුෂ්ට අරමුණින් දෙමළ බෙදුම්වාදී බලවේග විසින් හමුදාවට ඇඟිල්ල දිගු කර තිබියදී, මරණ සහතිකයෙන් අවසන් කරන්න පුළුවන් විධියේ නීතිමය ප්‍රතිපාදන තිබෙන කාරණයක්, අතුරුදහන් වූවන්ගේ සහතිකයක් නිකුත් කර ඒ තුවාලය සදාකාලිකව පවත්වා ගැනීමේ දුෂ්ට අරමුණයි මේ පනත් කෙටුම්පතේ තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපි දන්නවා, පසු ගිය කාලයේ විවිධ හේතූන් මත අතුරුදහන් වීම් සිදු වුණු බව. උතුරේ බෙදුම්වාදී ත්‍රස්තවාදය නිසා අතුරුදහන් වීම් සිදු වුණා. 1988 -89 ජවිපෙ භීෂණය නිසා අතුරුදහන් වුණා. සුනාමිය නිසා අතුරුදහන් වුණා. සුනාමියෙන් අතුරුදහන් වීමයි, මේ අතුරුදහන් වීමයි වෙනස්. සුනාමියේ දී කාටවත් බැහැ,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! மேதகு ஜனாதிபதி அவர்கள் சம்பந்தமாக பேசப்பட்ட விடயங்கள் *ஹன்சாட்* அறிக்கையிலிருந்து நீக்கப்படும்.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සුනාමිය කවුරුවත් බලාපොරොත්තු වුණු දෙයක් නොවෙයි. එය අනපේක්ෂිතව එක පාරටම ආපු දෙයක්. සුනාමිය ක්ෂණිකයි. ආවෝ - ගියෝ. ඒ නිසා කාටවත් සැලසුම් සහගත වෙලා, ස්වේච්ඡාවෙන් අතුරුදහන් වෙන්න ඉඩක් නැහැ. හැබැයි උතුරේ යුද්ධය ආශිර්වාදයක් කරගෙන බටහිර රටවලට ගිහිල්ලා පුරවැසියන් වෙච්ච, සරණාගතයන් වෙච්ච විශාල පිරිසක් ඒ රටවල ඉන්නවා. මේ අය ඒ රටවල පුරවැසිකම් ලබා ගැනීම සඳහා ලංකාව පිළිබඳව කර තිබෙන අසත්‍ය ප්‍රකාශයන් තවදුරටත් එලෙසම පවත්වා ගෙන යාමට උත්සාහ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හමුදාවට ඇඟිල්ල දිගු කරමින් හමුදාව විසින් අතුරුදහන් කළ බවට චෝදනා කරපු සමහර කොටි නායකයන් පසු ගිය කාලයේ බටහිර රටවලින් මතු වුණා. හැබැයි, මේ අය ඇඟිල්ල දිගු කරලා තිබුණේ හමුදාවට. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතේ යම් විධිවිධානයක් ගැන මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි. මෙච්චර උත්සාහයක් දරලා, මහජන මුදල් වෙන් කරලා, අතුරුදහන් වූවන්ට වුණේ මොකක්ද කියලා දැන ගන්න ඔවුන්ගේ ඥාතීන්ට තිබෙන අයිතිය ගැන කථා කරලා මේ කාර්යාලය පිහිටුවලා තිබෙනවා. හැබැයි, මේ අතුරුදහන් වූ පුද්ගලයා කොහේදී හරි හම්බ වෙලා ඔහු කිව්වොත්, "අනේ! මම හැංගිලාම ඉන්නම්. මාව හම්බ වුණා කියලා කියන්න එපා" කියලා, ඔහු ගැන කථා කරන්නේ නැහැ. එතකොට ඇඟිල්ල දිගු කරලා තිබෙන්නේ රණ විරුවන්ට නම්, ඒ ඇඟිල්ල එලෙසම දිගු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම යුද සමයේ-

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඕවා, සුරංගනා කථා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ප්‍රගීත් එක්නැළිගොඩ නැමැති පුද්ගලයෙක් අතුරුදහන් කළ බවට චෝදනා නඟමින් හරියටම අදට වසරකට කලින් අපේ රණ විරුවන් අත් අඩංගුවට ගැනීමක් සිදු වුණා. වසරක් පිරිලත් අදටත් අටදෙනෙක් රක්ෂිත බන්ධනාගාරයේ ඉන්නවා. මිනී මැරුම් චෝදනා තිබෙන අයත් මීට වඩා අඩු කාලයෙන් ඇප ලබා ගෙන යනවා. හැබැයි, අර අය අදටත් රක්ෂිත බන්ධනාගාරයේ ඉන්නවා. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ නිලධාරින් ප්‍රංශයේදී හෝ කොහේදී හෝ ප්‍රගීත් එක්නැළිගොඩ පිළිබඳව සොයා ගෙන ඔහු කිව්වොත්, "අනේ! මම ඉන්නවා කියලා කියන්න එපා. මම ඒකට කැමැති නැහැ" කියලා අර රණ විරුවෝ දිගටම හිරේ ඉන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතෙන් කරන්නේ ඒක නම්, එවැනි පනතක් ක්‍රියාත්මක කිරීම සඳහා මහජන මුදල් වෙන් කිරීමේ ඇති ප්‍රයෝජනය කුමක්ද කියලා අපට ප්‍රශ්න කරන්න වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතුරුදහන් වූවන් ගැන හොයනවාට, වැරදිකරුවන්ට දඬුවම් කරනවාට අපි විරුද්ධයි කියලා වැරදි මතයක් හදනවා. ඒක පට්ටපල් බොරුවක්. මහින්ද රාජපක්ෂ මැතිතුමා විදේශගත වෙලා සිටියදී කරපු කථාවක් උපුටා දක්වමින් මේ කියන්නේ, "අපි දැන් හොයනවාට විරුද්ධයි" කියලා නේ. එහෙම නැහැ, අපි පක්ෂයි. හැබැයි මේ කරගෙන යන, රණ විරුවන්ට යුද අපරාධ චෝදනා නැගීමේ කුමන්ත්‍රණයේ කොටස්කරුවකු බවට මේ පාර්ලිමේන්තුව පත් වනවා දකින්න අපට කිසිසේත්ම වුවමනාවක් නැහැ. ඇයි, අපි එහෙම කියන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දකුණේ ප්‍රේමවතී මනම්පේරී හමුදාවෙන් දූෂණය කරලා මරා දැම්මා. හමුදාවේ එම පිරිස් සම්බන්ධයෙන් මේ රටේ නීතිය ක්‍රියාත්මක වුණා. ඒ වාගේම උතුරේ ක්‍රිෂාන්ති කුමාරස්වාමි දූෂණය කරලා මරා දැම්මා. මේ රටේ නීතිය ඔවුන්ට එරෙහිවත් ක්‍රියාත්මක වුණා. දකුණේ සූරියකන්ද සමූහ මිනී වළ වේවා, උතුරේ චෙම්මිනි සමූහ මිනී වළ වේවා, ඒවා පිළිබඳව මේ රටේ නීතිය ක්‍රියාත්මක වුණා. හොඳ නිති පද්ධතියක් අප සතුව තිබෙනවා. එහෙම නම් අද මේ උත්සාහ කරන්න හදන්නේ මොකක්ද? ඊට වඩා වෙනස් දෙයක්.

අපි දන්නවා, දරුස්මාන් වාර්තාව කියලා "සුරංගනා කථාවක්" කිව්වා. අපේ විදේශ කටයුතු ඇමතිතුමා ඉතාමත් නිවැරදි වචනයක් පාවිච්චි කළා. ඒ තමයි, "සුරංගනා කථා". දරුස්මාන් වාර්තාව තමයි ගරු ඇමතිතුමනි, සුරංගනා කථාව. ඒ සුරංගනා කථාව කිව්වේ කවුද කියලා සඳහනක් නැහැ. නිර්නාමික විද්‍යුත් ලිපි යනාදිය පාවිච්චි කරලා තමයි ඒ ප්‍රබන්ධය ගොඩනඟලා තිබෙන්නේ. දැන් මේ පනත් කෙටුම්පතේ හැටියට නම් ලංකාවේ අපරාධමය වරදක් මතු වෙන්නේ නැහැ. මේ පනත් කෙටුම්පතට එකතු කරන ලද තොරතුරුවලින් ලංකාවේ දඬුවම් කරන්න බැරි තත්ත්වයක් ඇති කරලා තිබෙනවා. ඒ නිසාම දඬුවම් කරන්න ඕනෑ පිට රට. මේ සැලැස්ම ඉතාම පැහැදිලියි. පසු ගිය සැප්තැම්බර් මාසයේ මානව හිමිකම් කොමසාරිස්වරයා මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කළ වාර්තාවේ නිර්දේශ 39ක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහි 36 වෙනි නිර්දේශයේ සඳහන් වන්නේ,"ලෝකයේ ඕනෑම රටකදී ශ්‍රී ලංකාවේ රණවිරුවන්ට එරෙහිව යුද අපරාධ චෝදනා නඟලා දඬුවම් දෙන්න පුළුවන් වෙන්න ඕනෑ" කියලායි. 39 වෙනි නිර්දේශයෙන් කියන්නේ,"අපේ රණවිරුවන්ට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය හරහා බිහි කළ හැකි යුද අපරාධ විනිශ්චය සභාවක් හරහා දඬුවම් කරන්න පුළුවන් විය යුතුයි" කියලායි. ගරු අගමැතිතුමා නිතරම ආඩම්බරයෙන් සිහිපත් කරනවා,"2003 වර්ෂයේදී එතුමා රෝම සම්මුතියට අත්සන් කළේ නැහැ" කියලා. එතුමා රෝම සම්මුතියට අත්සන් කරලා නැති බව ඇත්තයි. අන්තර් ජාතික යුද අපරාධ අධිකරණයට අපේ රණ විරුවන්ව අරගෙන යන්න බැරි බවත් ඇත්තයි. හැබැයි, යුද අපරාධ සම්බන්ධව ආරක්ෂක මණ්ඩලයට බිහි කළ හැකි විශේෂ විනිශ්චය සභාවකට අපේ රණ විරුවන්ව ගෙන යන්න කිසිම බාධාවක් නැහැ. එතකොට මෙම වාර්තාවේ 36 සහ 39 යන නිර්දේශයන් ක්‍රියාත්මක කරන්න ජාත්‍යන්තර මට්ටමේ සාක්ෂි තිබෙන්න ඕනෑ. ජාත්‍යන්තර මට්ටමේ සාක්ෂියකට තිබෙන්නේ, අර සුරංගනා කථාවක් වුණු දරුස්මාන් වාර්තාව විතරයි. එම වාර්තාවේ තොරතුරු නිර්ණාමිකවයි ඉදිරිපත් කර තිබෙන්නේ. දරුස්මාන් වාර්තාව සකස් කළ කිසිම සාමාජිකයෙක් ලංකාවට ඇවිල්ලා මේ ගැන පරීක්ෂණයක් කෙරුවේ නැහැ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය හරහා දැන් සිද්ධ කරන්න හදන්නේ, සම්ඵ ප්‍රලාප තිබෙන, ප්‍රබන්ධයන් තිබෙන දරුස්මාන් වාර්තාවට ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය ගහලා නිල පිළිගැනීමක් අරන් දෙන්නයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා විශේෂයෙන් කාලය අරගෙන අපි ගැන කාරණා කිහිපයක් කිව්වා. ඒවාට පිළිතුරු ලබා දෙන එක මගේ යුතුකමක් වනවා. එතුමා කිව්වා, "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත හදිසියේ සම්මත කර ගත්තේ නැහැ" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පත විවාදයට ගන්න තිබුණේ පසු ගිය 23 වෙනි අහහරුවාදා. එහෙමනම්, අද වන විට සම්මත වෙලා. ඊට එහා දිනයකට කල් දමන්න කියලා අපි ඉල්ලුවේ නැහැ. අපි විවාදය ඉල්ලුවේ 23 වෙනි අහහරුවාදා. මෙම පනත් කෙටුම්පත හදිසියේ විවාදයට ගත්තේ ඇයි කියලා අපට තවමත් තේරෙන්නේ නැහැ. එදායි මෙදායි තුළ මොනවාවත් වුණේත් නැහැ. හැබැයි, එදා කඩිමුඩියේ එම පනත් කෙටුම්පත විවාද කිරීමට තිබුණු අවශ්‍යතාව හරහා අපට සාධාරණ ප්‍රශ්නයක් පැන නැඟුණා. මොකද, එම පනත් කෙටුම්පත විවාදයට ගත් 11 වෙනි බ්‍රහස්පතින්දා ආණ්ඩුවේ සංශෝධන 17ක් ඉදිරිපත් කරලා තිබුණා. ජනතා විමුක්ති පෙරමුණේ සංශෝධන තුනක් ඉදිරිපත් කරලා තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Hon. Member, you have only two more minutes.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම පනත් කෙටුම්පත සම්බන්ධව කරුණු අධ්‍යයනය කරන්න අපි කාලයක් ඉල්ලුවා. එදා රෑ 12 වෙනකන් කාලය දුන්නා කියලාවත් අපට ඒ පිළිබඳව අධ්‍යයනය කරන්න බැහැ. මොකද, ජාතියේ ඉරණම තීරණය වන මෙවැනි පනතක බලපෑම කුමක්ද කියන එක තීරණය කර ගන්න විද්වතුන් එක්ක ඒ පිළිබඳව සාකච්ඡා කරන්න ඕනෑ. ඒ සඳහා අපට යම් කාලයක් අවශ්‍ය වුණා. අපට ඒ අවස්ථාව ලබා නොදුන්න නිසායි එම පනත් කෙටුම්පත හදිසියේ සම්මත කර ගත්තා කියලා අපි කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ විදේශ කටයුතු ඇමතිතුමා මේ ගරු සභාවට පට්ටපල් බොරුවක් කිව්වා," දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අධිකරණයට ගෙන යන්න දෙන්නෙත් නැතිවයි සම්මත කළේ" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපි අධිකරණයේ අභියෝගයකට ලක් කළා. තමුන්නාන්සේලා රැක ගන්න කටයුතු කරපු හිටපු අගවිනිසුරුතුමිය වන ශිරාණි බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් සමන්විත විනිසුරු මඩුල්ල තමයි දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එකඟයි කියලා තීරණය කළේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒ කාලයේ මෙතුමා "පළා බබෙක්" වෙලා හිටියේ. මෙතැන වෙච්ච දේවල් මෙතුමා දන්නේ නැහැ. ඒක ගෙනාවේ හදිසි පනත් කෙටුම්පතක් හැටියටයි. හදිසි පනත් කෙටුම්පතක් පැය 24ක් ඇතුළත උසාවියට යොමු කරලා, ඒ තීන්දුව අතට ගන්නවා. ඒ, හදිසි පනත් කෙටුම්පත තමයි අපි නැවැත්වූයේ. මෙතුමා දන්නේ නැති අතීතයක් ගැන කථා කරනවා, අනික් ඒවා ගැන වාගේම.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මංගල සමරවීර ඇමතිතුමාට විනාඩි 20ක් ලබා දීලා තිබුණා. එතුමා මගේ වේලාවත් ගන්නයි උත්සාහ කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමතියි. අපේ විදේශ කටයුතු ඇමතිතුමා කිව්වා, "පොදු විපක්ෂය පිළිගන්නේ නැහැ" කියලා. "පොදු විපක්ෂය" කියලා එකක් නම් පාර්ලිමේන්තුවේ නැහැ. අපි ඉන්නේ "ඒකාබද්ධ විපක්ෂයේ". "ඒකාබද්ධ විපක්ෂය" ඔබතුමා පිළිගන්නවාද, නැද්ද කියන එක වැඩක් නැහැ. මේ ගරු සභාවේ ප්‍රධානියා වන ගරු කථානායකතුමා "ඒකාබද්ධ විපක්ෂය" පිළි අරගෙන අවසානයි. එතුමා "ඒකාබද්ධ විපක්ෂය" කියලා අපව හඳුන්වනවා. අපේ නායකයාට ස්ථාවර නියෝග 23(2) යටතේ විශේෂ ප්‍රකාශ කරන්න ඉඩ ලබා දෙනවා. පක්ෂ නායකයින්ගේ රැස්වීමට එතුමාව ගෙන්වා ගන්නවා. එතුමා අපි පිළිගත්තත් නැතත්, ගරු කථානායකතුමා අපව පිළිගැනීම අපට හොඳටම ප්‍රමාණවත් කියන කාරණය මා එතුමාට සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනතේ අරමුණ දෘෂ්ටියි. තුවාලයක් සදාකාලිකව තබා ගැනීම තමුන්නාන්සේලා කථා කරන සංහිඳියාවද කියන ප්‍රශ්නය මේ ගරු සභාව හමුවේ තබමින් මම නිහඬ වනවා. සියලු දෙනාටම තෙරුවන් සරණයි!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Sitting is suspended till 1.30 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப.130 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

සහකාර මහ ලේකම්
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)
කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු මන්ත්‍රීතුමෙකුගේ නමක් යෝජනා කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)
"ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලක්කී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன்படி, மாண்புமிகு மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. LUCKY JAYAWARDANA took the Chair.

[අ.භා. 1.30]

ගරු අජිත් පී. පෙරේරා මහතා

(மாண்புமிகு அஜித் பீ. பெரேரா)

(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදය තුළ අපි සාකච්ඡා කරන කාරණා ඇත්ත වශයෙන්ම අපි මීට කලින් මේ ගරු පාර්ලිමේන්තුව තුළ සම්මත කරපු, ගරු කථානායකතුමා විසින් පිළිගෙන අත්සන් තබන ලද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත සහ ඒ හා මතු වෙන්නා වූ කාරණා සමඟ සෘජු සම්බන්ධයක් තිබෙනවා. ඒ නිසාමදෝ මෙම විවාදය බොහෝ දුරට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවට අභිමි වූ විවාදය වෙනුවට කරුණු දැක්වීම සඳහා භාවිත කරන බවක් මේ දක්වා පැවැති විවාදයේදී මතු වුණු කරුණු අනුව පෙනෙන්න තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ප්‍රශ්නය උතුරට පමණක් සීමා වුණු එකක් නොවෙයි. එය, 1971 වර්ෂයේදී දකුණේදීත්, 1980 දශකය අවසානයේ සම්පූර්ණයෙන්ම දකුණේත්, 1983 වර්ෂයේදී රට පුරාමත්, ඊට අමතරව උතුර හා නැඟෙනහිර ප්‍රදේශවල 2009 වර්ෂය වනතුරුත් මතු වුණු තත්ත්වයක්. අතුරුදහන්වීම පිළිබඳ බෙදවාචකය අපේ රට රටක් විධියට මුහුණ දෙන්නා වූ, ඉතිහාසයේ මුහුණ දුන්නා වූ සුවිශේෂ ආර්ථික හා දේශපාලන කරුණු සමඟ බැඳී පවතිනවා. යුක්තිය, සාධාරණය වෙනුවෙන් සටන් කරපු දකුණේ ජනතාවත්, තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරපු උතුරු හා නැඟෙනහිර ප්‍රදේශවල ජීවත් වුණු ජනතාවත් ඒ සටනට යොදා ගත් මාවත -සන්නද්ධ වීමේ මාර්ගය- අප අනුමත කරන්නේ නැහැ. නමුත් සමාජය තුළ දකුණේ මතු වෙලා තිබුණු තරුණ අසහනය පිළිබඳ කාරණය, සමාජ අසාධාරණත්වය පිළිබඳ කාරණය ජනතා විමුක්ති පෙරමුණ 1971 වර්ෂයේදීත්, 1989 වර්ෂයේදීත් විප්ලවයක් උදෙසා භාවිත කළා. ඒ වාගේම දෙමළ භාෂාව කථා කරන ජනතාවට ඇති වූ ප්‍රශ්න උතුරු හා නැඟෙනහිර පළාත්වල පැවැති දීර්ඝ කාලීන සිවිල් යුද්ධය සඳහා පදනම් වුණා. ඒ සටන් පරාජයට පත් කිරීම රජය සතු වගකීමක්.

රජයේ හමුදා 1971 වර්ෂයේදී, 1989 වර්ෂයේදී, 2009 වර්ෂයේදී ඒ වග කීම ඉටු කළා. නමුත් ඒ ක්‍රියාදාමයන් අතරේදී පීඩාවට පත් වෙච්ච, විපතට පත් වෙච්ච, මිය ගිය සියලු දෙනාම මේ රටේ පුරවැසියෝ. ඔවුන් සටන් කළ පරමාර්ථය හරි වුණත්, වැරදි වුණත්; ඒ සටන් කළ ක්‍රමය හරි වුණත්, වැරදි වුණත්; ඔවුන් අයිති සංවිධානය ජනතා විමුක්ති පෙරමුණ වුණත්, එල්ටීටීඊ සංවිධානය වුණත්, ඒ සෑම පුරවැසියෙකුගේම උරුමකරුවන්ට, ඔවුන්ගේ ඥාතීන්ට යුක්තිය ඉටු කිරීමට සිවිල් ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයක් විධියට අපට යුතුකමක් තිබෙනවා. ඉතිහාසයේ ඒ සිදු වූ කනගාටුදායක දෙය නොසිදුවිය යුතුව තිබුණා. දැන් අපි ඒ ඉතිහාසයෙන් එළියට යා යුතුයි. ඒ ඉතිහාසයෙන් අප එළියට යද්දී සියයට සියයක්ම කිසිවක් සිදු නොවුණා සේ ඉදිරියට යන්නට පුළුවන් කමක් නැහැ. අපේ රටේ පුරවැසියන්ගේ අයිතිවාසිකම්වලින් යමක් හෝ ඉතිරි වෙලා තිබෙනවා නම්, ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයක් හැටියට අපට යමක් කළ හැකි නම්, ඒ වෙනුවෙන් අපට ගත හැකි, ගත යුතු සියලුම පියවර නීතියේ සීමාව තුළ ගැනීමට අපට යුතුකමක් වග කීමක් තිබෙනවා. පවතින නීතිය තුළ ඒ පිළිබඳ ප්‍රතිපාදන නැති නම්, ඒ ප්‍රතිපාදන ඇති කර ගැනීම අපේ යුතුකමක්ව තිබෙනවා. එම නිසා තමයි අපි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත ගෙනාවේ. එම නිසා තමයි අද මේ විවාදයට ලක්වන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන එන්නේ.

බොහෝ දෙනෙක් අහනවා, "මොකක්ද, මේ පනතෙන් කෙරෙන්නේ?" කියා. අතුරුදහන් වූ තැනැත්තකු පිළිබඳ කාරණය ඉතාම සංකීර්ණ මානුෂික හා නීතිය පිළිබඳ ප්‍රශ්නයක්. එක පැත්තකින් ඒ අතුරුදහන් වූ තැනැත්තාගේ අම්මාට, තාත්තාට, බිරිඳට, සහෝදරයන්ට, දරුවන්ට, තමන්ගේ ඥාතියා, තමන්ගේ මිත්‍රයා, තමන්ගේ හිතවතා, සත්‍ය වශයෙන්ම අතුරුදහන් වූවාද, නැද්ද යන කාරණය පිළිබඳ ප්‍රශ්නය අවසානාත්මකව දැකීමට යම් නිශ්චිත තොරතුරක්, නිගමනයක් අවශ්‍ය වෙනවා. බොහෝ දෙනෙක් තමන්ගේ දරුවා නැවත කවදා හෝ ඒවිය කියා බලාපොරොත්තුවෙන් සිටිනවා; තමන්ගේ ස්වාමිපුරුෂයා නැවත ඒවිය කියන බලාපොරොත්තුවෙන් සිටිනවා. එම නිසාම දේපළ උරුමය පිළිබඳ අවිනිශ්චිතතා මතු වෙනවා; විවාහය, පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතා මතුවෙනවා; විශ්‍රාම වැටුප් පිළිබඳ අවිනිශ්චිතතා මතු වෙනවා. ඒ නිසාම EPF, ETF කියන රාජ්‍ය ප්‍රතිලාභ පිළිබඳ ප්‍රශ්න මතු වෙනවා. එක අතකින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතෙන් කරනු ලබන පරීක්ෂණයක් මඟින් අතුරුදහන් වූ තැනැත්තෙකු සම්බන්ධයෙන් වූ සහතිකයක් නිකුත් කරන අතරම, වැඩිමනත් තොරතුරු ඇත්නම් එය පසු කාලයක මරණ සහතිකයක් බවට රටේ සාමාන්‍ය නීතිය අනුව පත් කිරීමට හැකියාව ලැබෙනවා. මේ රාමුව අපට අලුත් එකක්. මේ රාමුව අප අලුතෙන් හඳුන්වා දෙනවා. එම නිසා තමයි අප මේ පනත් කෙටුම්පත ගෙනැවිත් තිබෙන්නේ. එම නිසා මෙම පනත් කෙටුම්පත පිළිබඳව විරුද්ධවීමට තරම් කාරණාවක් තිබෙනවාය කියා මම හිතන්නේ නැහැ. නමුත්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත සම්මතවීමෙන් පසු ඊළඟට සිදුවන්නේ කුමක්ද යන කාරණය පිළිබඳව සමාජය තුළ පවතින කුතුහලය ඉවත් කරන්න මම මේ වටිනා අවස්ථාව උපයෝගී කර ගන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත මේ වනවිට රටේ නීතිය බවට පත්වෙලා තිබෙනවා. කථානායකතුමා විසින් එයට අත්සන් කර තිබෙනවා. ඒ අනුව ඊළඟට ගත යුතු පියවර වන්නේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන් පත්කිරීමයි. සාමාජිකයන් ගණන 7යි. ඒ සාමාජිකයන් පත් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින්. එම කාර්යාලයේ සභාපතිවරයා හැටියට පත් කරන්නේත් අර සාමාජිකයන් හත්දෙනා අතරින් කෙනෙකුයි. එසේ පත් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාර්ය පටිපාටිය ගැළපෙන්නේ ස්වාධීන කොමිෂන් සභාවක සාමාජිකයන් පත් කිරීමේ කාර්ය පටිපාටියටයි. මානව හිමිකම් කොමිෂන් සභාවට සාමාජිකයින් පත් කරන ක්‍රියාදාමය ස්වාධීන, නිවැරැදි ක්‍රියාදාමයක් කියලා අප පිළිගන්නවා. එම ක්‍රමවේදයමයි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම සඳහාත් භාවිත කරනු ලබන්නේ. ඒ හරහා මේ රටේ පුරවැසියන්ව පත් කර ගැනීමට වාගේම කාගෙත් සම්භාවනාවට පත් වෙච්ච, ඒ පිළිබඳව සුදුසුකම් තිබෙන තැනැත්තන් පත් කර ගැනීමට අවකාශය

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ විපක්ෂය හා ආණ්ඩු පක්ෂය කියන පක්ෂ දෙකේම සාමාජිකයින් ඉන්නවා. කථානායකතුමා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති. අගමැතිතුමා, විපක්ෂ නායකතුමා ඉන්නවා. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු තමයි බහුතරයක් සිටින්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් මේ තනතුරු දරන්නට පුළුවන්, ස්වාධීනව කටයුතු ඉටු කරන්න පුළුවන් සාමාජිකයන් හත් දෙනෙකු සහ ඒ අතරින් කෙනෙකු සභාපතිවරයා වශයෙන් පත් කරනවා. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ස්වාධීනත්වය පිළිබඳව, එහි ක්‍රියා පිළිවෙත පිළිබඳව කාට හෝ යම් ආකාරයක සැකයක් තිබෙනවා නම් මම කියන්න කැමතියි, ස්වාධීන කොමිෂන් සභාවකට පත් කරන කාර්ය පටිපාටිය අනුව පත් කරන නිසා; නිවැරැදිම සුදුසුම පුද්ගලයන් පත් කර ගන්න පුළුවන්කම ලැබෙන නිසා; ජනාධිපතිවරයාගේ කැමැත්තෙන් පත් කරන නිසා; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කරන නිසා මෙම කාර්යාලය පිළිබඳව අනිසි බියක් ඇති කර ගැනීමට අවකාශ නැහැ කියා. එම සාමාජිකයන් හත් දෙනා පත් කළ පමණකින් ඒ කටයුතු අවසන් වෙන්නේ නැහැ. එම කාර්යාලය ක්‍රියාත්මක කිරීමට නම් ඊට අවශ්‍ය කරන කාර්ය පටිපාටි හා මාර්ගෝපදේශ සකස් කරන්න අවශ්‍යයි.

ඒ කාර්යාලයේ ක්‍රියාත්මක කරන බලතල, ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව මාර්ගෝපදේශ සහ සහ කාර්ය පටිපාටිය සකස් කරලා, ඒවා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ වගකීමකුත් තිබෙනවා. ඒවා හොරෙන් සිදු වන දේවල් නොවෙයි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත ගැන කවුරු හෝ කෙනෙක් අනිසි බියක් ඇති කර ගන්නවා නම්, එය එසේ නොවිය යුතුයි. ඒවා වැළැක්වීමට අවශ්‍ය කරන සියලුම ආරක්ෂක විධිවිධාන එම පනත තුළ අන්තර්ගත කර තිබෙනවා. බොහොම ස්තුතියි.

[පි.ප. 1.40]

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2010ஆம் ஆண்டின் 19ஆம் இலக்க இறப்புக்களின் பதிவு (தற்காலிக ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்திலே பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். காணாமற்போனவர்கள் தொடர்பாகவும் காணாமற் போனவர்களுக்கான தற்காலிகச் சான்றிதழ் வழங்குவது தொடர்பாகவும் இங்கே காலையிலிருந்து பலரும் தங்களுடைய கருத்துக்களை முன்வைத்த வண்ணம் இருக்கின்றார்கள். எங்களைப் பொறுத்தவரையில் இந்தச் சட்டமூலத்தை நடைமுறைப் படுத்துவதற்கு அப்பால் அல்லது இவர்களுக்கான சான்றிதழ் வழங்குவதற்கு அப்பால், குறிப்பாக வடக்கிலும் கிழக்கிலும் உள்ள காணாமற்போனோரின் குடும்பங்களுடன் கலந்துரை யாடல்களை நடத்தவேண்டுமென்று நாங்கள் கூறுகிறோம். பிள்ளைகளை அல்லது உறவினர்களை இராணுவத்தினரிடம் கையளித்தவர்களினதும் வெள்ளை வானில் கடத்தப்பட்டவர் களினதும் பல்லாயிரக்கணக்கான குடும்பங்கள் வடக்கு, கிழக்கில் இருக்கின்றன. எனவே, முதற்கட்டமாக வடக்கு, கிழக்கில் இருக்கின்ற காணாமற்போனவர்களது உறவினர் களோடு நேரடியான கலந்துரையாடல்களை மேற்கொள்ள வேண்டிய தேவையிருக்கின்றது. அவர்கள் மாவட்டந்தோறும் காணாமற்போனோருக்கான சங்கமொன்றை வைத்திருக் கின்றார்கள். வடக்கு, கிழக்கில் உள்ள 8 மாவட்டங்களிலும் மாவட்ட மட்டத்திலே காணாமற்போனோருக்கான சங்கம் இருக்கின்றது. அதேபோன்று வடக்கு - கிழக்கு இணைந்த காணாமற்போனோர் சங்கமும் இருக்கின்றது. எனவே, முதலாவதாக அவர்களோடு இந்தக் காணாமற்போனோர் தொடர்பான விடயங்களைக் கலந்துரையாட வேண்டியிருக் கின்றது. தற்காலிகமாக இரண்டு வருடங்களுக்குக் காணாமற் போனோர் என்று உறுதிப்படுத்திச் சான்றிதழ் வழங்கப் படுவதை அவர்கள் ஏற்றுக்கொள்கின்றார்களா? இல்லையா? அல்லது அவர்களுடைய உண்மையான பிரச்சினைகள் என்ன? என்பன தொடர்பில் ஆராயப்படவேண்டிய தேவையிருக் கின்றது.

காணாமற்போனவர்கள் வெறுமனே ஒரு திருவிழாவிலோ அல்லது அவர்கள் விமானத்தில் சென்றபோதோ காணாமற் போகவில்லை. இறுதிக்கட்டப் போரிலே இராணுவம் விடுத்த வேண்டுகோளை ஏற்றுக்கொண்டு, அதாவது இராணுவத்திடம் சரணடையுங்களென்று கூறியதற்கமைவாக ஓமந்தையிலும் முள்ளிவாய்க்கால் பகுதியிலுமே பல நூற்றுக்கணக்கானவர்கள் இராணுவத்தினரிடம் சரணடைந்தார்கள். முக்கியமாகத் தமிழீழ விடுதலைப் புலிகளது முக்கியஸ்தர் அல்லது 'ஈரோஸ்' அமைப்பினுடைய தலைவராக இருந்த திரு. பாலகுமார், அவருடைய மகன் உட்படப் பல நூற்றுக்கணக்கானவர்கள் அரசாங்கத்தினுடைய வேண்டுகோளை ஏற்றுத்தான் சரணடைந்தார்கள். ஆகவே, இவ்வாறு சரணடைந்தவர்கள் ஒவ்வொருவருடைய பெயர் விபரங்களும் அன்றைய காலகட்டத்திற்குப் பொறுப்பாக இருந்த இராணுவ அதிகாரிகளிடம் நிச்சயமாக இருந்திருக்க வேண்டும், அன்றைய காலகட்டத்திலே யார், யார் சரணடைந்தார்கள்? அவர்களுடைய பெயர், வயது, பால் போன்ற சகல விடயங்களையும் உள்ளடக்கிய விபரம் அதில் இருக்கும்.

இறுதிக்கட்டப் போரின்போது பொதுமக்கள் இராணுவக் கட்டுப்பாட்டுப் பகுதிக்குள் வரும்போது ஓமந்தையில் வைத்து இராணுவம் ஒலிபெருக்கியூடாக அழைத்து, தரம் பிரித்து, அதாவது அரசியல் துறை, நிதித்துறை எனப் பல்வேறுபட்ட துறை சார்ந்தவர்களைத் தரம் பிரித்து, பஸ் வண்டியில் ஏற்றினார்கள். இதற்கப்பால் 3 இலட்சம் பேர் தங்கவைக்கப் பட்டிருந்த செட்டிகுளம் 'மெனிக் பாம்' முகாமில் அன்றைய காலகட்டத்தில் மீள்குடியேற்ற அமைச்சராக இருந்த ரிசாட் பதியுதீன் அவர்களும் இராணுவத்தினருடன் இணைந்து ஒரு நாள் தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்தில் இணைந்து கொண்டவர்கள்கூடச் சரணடைய வேண்டுமெனக் குறிப் பிட்டார். அவ்வாறு சரணடையத் தவறும் பட்சத்தில் தங்களால் கண்டுபிடிக்கப்பட்டுக் கைது செய்யப்படும்போது கடுமையான முறையில் நடவடிக்கை எடுக்கப்படுமென்று ஒலிபெருக்கி யூடாக வேண்டுகோள் விடுத்தார்கள். அதனையடுத்து, 'மெனிக் பாம்' முகாமிலிருந்துகூடப் பலர் சரணடைந்தார்கள். இறுதிக்கட்டப் போரின்போது ஓமந்தை, செட்டிகுளம் 'மெனிக் பாம்' முகாம் உட்பட இந்த மக்கள் சென்ற சகல இடங்களிலுமே ஒன்றுக்குப் பத்துத் தடவைகள் பதிவுகள் மேற்கொள்ளப்பட்டன. நான் நினைக்கின்றேன், இறுதிக் கட்டப் போரில் சரணடைந்தவர்களுக்கு ஆகக்கூடியளவிலான பதிவுகளை மேற்கொண்ட நாடு தெற்காசியாவிலேயே இலங்கையாகத்தான் இருக்குமென்று. ஒருவர் 10 இடங் களுக்கு மேற்பட்ட இடங்களில் பதிவு செய்யப்பட்டார். அதாவது புலனாய்வுத்துறையினர், இராணுவத்தினர், கடற் படையினர் எனப் பலர் இந்தப் பதிவுகளை மேற்

கொண்டார்கள். அன்று இந்தப் பதிவுகளை மேற் கொண்டவர்கள், அதற்குப் பொறுப்பாக இருந்த இராணுவ அதிகாரிகள் இன்னமும் இங்கேதான் இருக்கின்றார்கள். ஆகவே, இராணுவத்தினரிடம் சரணடைந்தவர்களுடைய அல்லது இராணுவத்தினரிடம் ஒப்படைக்கப்பட்டவர்களுடைய பெயர் விபரங்கள் முழுவதும் இன்று இந்த அரசாங்கத்திடம் இருக்கின்றது. இதற்கு அப்பால் பரணகம ஆணைக்குழுவும் கூட இந்தக் காணாமற்போனோர் தொடர்பாக விசார ணையைச் செய்திருந்தது. எனவே, அங்கும் விபரம் இருக்கின்றது. இவ்வளவும் இருக்கத்தக்கதாக மீண்டும் காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகமொன்று அமைக்கப்படுமென இங்கே கூறப்படுகிறது.

காணாமற்போனோர் தாங்களாகவே காணாமல் போகவில்லை, அவர்கள் காணாமல் ஆக்கப்பட்டவர்கள். ஆகவே, இது உண்மையில் 'காணாமல்போன ஆட்கள் பற்றிய அலுவலகம்' என்றல்ல, 'காணாமல் ஆக்கப்பட்டோருக்கான அலுவலகம்' எனப் பெயர் மாற்றப்பட வேண்டும். இந்த அலுவலகம் தொடர்பாக இந்த நாட்டின் மேதகு ஜனாதிபதி அவர்கள், "காணாமல்போன ஆட்கள் பற்றிய அலுவலக மானது, வெறுமனே தகவலைத் திரட்டுகின்ற அல்லது பதிவுகளை மேற்கொள்வதற்கான ஓர் அலுவலகமே தவிர, இதன்மூலமாக இராணுவத்தினரையோ அல்லது இதுதொடர் பாகக் குற்றமிழைத்தவர்களையோ தண்டிக்கப்போவதில்லை" என்று கூறியுள்ளார். அப்படியானால் காணாமற்போனவர்கள் அல்லது காணாமல் ஆக்கப்பட்டவர்களுக்கான அலுவலகம் வெறுமனே ஐ.நா.வை ஏமாற்றுவதற்கான ஓர் அலுவலகமாக இருக்கப்போகிறதா? என்று நான் கேட்க விரும்புகின்றேன்.

இரண்டாவதாக, நான் ஏற்கெனவே குறிப்பிட்டதுபோல் இந்த அரசாங்கத்திடம் சரணடைந்தவர்கள், கைது செய்யப் பட்டவர்கள், வெள்ளை வானில் கடத்தப்பட்டவர்கள் போன்ற சகல விபரங்களும் பாதுகாப்பு அமைச்சிடம் இருக்க வேண்டும். வருடந்தோறும் பாதுகாப்பு அமைச்சுக்காக வரலாறுகாணாத அளவுக்குப் பெருந்தொகையான நிதி ஒதுக்கப்படுகின்றது; இந்த அமைச்சு இந்த நாட்டிலுள்ள ஒரு முக்கிய அமைச்சாகவும் இருக்கிறது. ஆனால், இந்த அமைச்சில் இருக்கின்ற முக்கியமான விடயங்கள் அடங்கிய ஆவணங்கள் காணாமற் போகின்ற நிலைமை காணப்படுகின்றது. உதாரணமாக, 'மிக்' விமானம் கொள்வனவு செய்யப்பட்ட ஆவணங்கள் காணாமற் போயுள்ளன; 'அவன்காட்' நிறுவனத்தின் ஆவணங்கள் காணாமற்போயுள்ளன; தாஜுடீன் கொலை வழக்கில் சம்பந்தப்பட்ட தொலைபேசி உரையாடல் பதிவு விபரங்கள் காணாமற்போயுள்ளன. இப்படி பாதுகாப்பு அமைச்சிடமிருக் கின்ற முக்கியமான தகவல்கள் - முக்கியமான விடயங்கள் காணாமற்போயுள்ளன. அத்துடன், இவ்வமைச்சின் பொறுப்பில் ஒப்படைக்கப்பட்டிருகின்ற பல நூற்றுக்கணக் கான மனிதர்கள் காணாமற்போயிருக்கிறார்கள். ஆகவே, இவை சாதாரணமான சிறிய விடயங்களல்ல. எனவே, பாதுகாப்பு அமைச்சு இன்று பலவீனமான ஒரு நிலையில் இருக்கிறதா? என்பதை நாங்கள் அறிய விரும்புகின்றோம்.

நான் ஏற்கெனவே குறிப்பிட்டதைப்போல் காணாமற் போனோருக்கான சான்றிதழ்கள் வழங்குவதற்கு முன்பதாக வடக்கு, கிழக்கில் இருக்கின்ற அவர்களின் உறவினர்களுடன் கலந்துரையாட வேண்டிய தேவையிருக்கின்றது. மேலும், இராணுவத்திடம் சரணடைந்தவர்களை, அவர்கள் குற்றவாளி களாக இருந்திருந்தால் நீதிமன்றத்தில் பாரப்படுத்தியிருக்க வேண்டும். அல்லது சுற்றவாளிகளாக இருந்திருந்தால் விடுவித்திருக்க வேண்டும். இதுவரை காலத்தில் இவை இரண்டுமே நடைபெறவில்லை. வெறுமனே சர்வதேச சமூகத்தை ஏமாற்றுவதற்காக காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகத்தைத் திறந்து பதிவுக்கு மேல் பதிவு செய்வதில் எந்தப் பயனுமில்லை.

கடந்த 7 வருட காலமாக தொடர்ச்சியாக காணாமற் போனோரின் குடும்பத்தினர் இலங்கையின் வடக்கிலும் தெற்கிலும் கிழக்கிலும் மேற்கிலும் ஏறி இறங்காத இராணுவ முகாம்களில்லை; கடற்படை முகாம்களில்லை; பொலிஸ் நிலையங்களில்லை. மேலும் செஞ்சிலுவைச் சங்கம், சர்வதேச செஞ்சிலுவைச் சங்கம், மனித உரிமை அமைப்புகள் என்று சகல இடங்களுக்கும் இந்தக் குடும்பத்தினர் ஏறியிறங்கி யிருக்கிறார்கள். அதற்கும் அப்பால், எத்தனையோ நூற்றுக்கணக்கான போராட்டங்களை நடத்தியிருக்கிறார்கள்; வீதியிலே விழுந்து புரண்டு கண்ணீர்விட்டு அழுதிருக் கிறார்கள். ஆனால், இன்றுவரைக்கும் அவர்களுக்கு உண்மையான ஒரு நீதியைப் பெற்றுக்கொடுக்க முடியாத நிலைமைதான் காணப்படுகின்றது. ஆகவே, கடந்தகாலப் போரினால் ஏற்பட்டிருக்கின்ற அழிவுகள், மனித உரிமை மீறல்கள் என்பவை பற்றிய உண்மைகளைக் கண்டறிய வேண்டும். எதிர்காலத்தில் இவ்வாறான பிரச்சினைகள் ஏற்படாமல் இருக்கவேண்டுமாக இருந்தால், இங்கு நடைபெற விருக்கின்ற விடயங்கள் உண்மையானவையாகவும் மக்களுக்கு நம்பிக்கை ஏற்படக்கூடிய வகையிலும் இருக்க வேண்டும்.

கடந்த காலத்தில் இந்த நாட்டை ஆட்சி செய்த தலைவர்கள் தமிழ்த் தலைவர்களையும் தமிழ் மக்களையும் ஏமாற்றியதன் ஒரு விளைவாகத்தான் இந்த நாடு பாரியதொரு யுத்தத்தையும் அழிவையும் சந்திக்க வேண்டியேற்பட்டது. நான்கூட 1983ஆம் ஆண்டு ஆயுதப் போராட்டத்தில் இணைந்துகொண்டேன். ஏனென்றால், இந்த நாட்டில் அவ்வளவுதூரம் அடக்குமுறை இருந்தது. அன்று மிதவாதத் தலைவர்களோடு இந்தப் பிரச்சினையைச் சுமுகமாகப் பேசித் தீர்த்திருந்தால், 30 வருட காலமாக இடம்பெற்ற யுத்தம் ஏற்பட்டிருக்காது. என்னைப் போன்ற ஆயிரக்கணக்கான இளைஞர்கள் ஆயுதம் தூக்க வேண்டிய நிலைமையும் ஏற்பட்டிருக்காது. ஆனால், ஆயுதம் தூக்கிய ஒரு போராளியாக இருந்த நான், இந்தப் பாராளு மன்றத்திற்கு வந்து 15 வருடங்களாகின்றன. இக்காலப் பகுதியில் இந்த உயர்ந்த சபையிலே நாங்கள் முன்வைத்த எந்த விடயங்களையும் அரசாங்கங்கள் கவனத்தில் எடுத்துக் கொண்டதாகத் தெரியவில்லை. பதிலாக அதற்கு எதிர்மாறான நிலைமைகள்தான் தோற்றுவிக்கப்படுகின்றன.

இந்த ஆட்சி மாற்றத்தின் பிறகும், இன்றைக்கும், கடந்த அரசாங்கத்தின் அரசியல் நிகழ்ச்சிநிரலையே - முக்கியமாக குடியேற்றம், காணிப் பறிப்புகள் போன்றவற்றையே - நீங்களும் நடைமுறைபடுத்தப் பார்க்கின்றீர்கள்! நீங்கள் இன்றைக்கு முல்லைத்தீவு மாவட்டத்திலே, வெலிஓயா பிரதேசத்திலே இருக்கின்ற 5 கிராம சேவையாளர் பிரிவுகளுக் குரிய கிராமங்களைச் சேர்ந்த 3,696 வாக்காளர்களை வவுனியா மாவட்டத்தில் வவுனியா வடக்கின் நெடுங்கேணிப் பிரதேசத் திலுள்ள பட்டிக்குடியிருப்புக் கிராமத்துக்குள்ளே கொண்டு வந்து இணைக்கின்றீர்கள். ஏற்கெனவே இருக்கின்ற பட்டிக்குடியிருப்புக் கிராமம் என்பது 245 தமிழ் வாக்காளர் களைக்கொண்ட ஒரு கிராம சேவையாளர் பிரிவாகும். நீங்கள் ஒரு மாவட்டத்தில் இருக்கின்றவர்களை இன்னுமொரு மாவட்டத்தின் வாக்காளர் இடாப்பிலே இரகசியமாகப் பதிவு செய்கின்றீர்கள். அவ்வாறு பதிவதன்மூலம் என்ன செய்ய நினைக்கின்றீர்கள்? நீங்கள் என்ன செய்ய யோசிக்கின்றீர்கள்? ஆகவே, தொடர்ந்தும் கடந்த அரசாங்கத்தின் நிகழ்ச்சி நிரலையே நீங்கள் நடைமுறைப்படுத்துவதற்குப் பார்க் கின்றீர்கள். வெலிஓயாவுக்குள் வருகின்ற கஜபாகு மொனராவெவ, கவியாணபுர கிராமம், எத்தாவெட்டுவ நுவவெவர, சம்பத்நுவர, நிக்வெவ என்ற ஐந்து கிராமங்களின் வாக்காளர்களையே நீங்கள் பட்டிக்குடியிருப்பு கிராம சேவையாளர் பிரிவுக்குள்ளே உள்வாங்க நினைக்கின்றீர்கள்!

நாங்கள் இவ்வளவு இழப்புக்கள் மற்றும் அழிவுகளைச் சந்தித்ததற்குப் பின்னரும்கூட நீங்கள் இன்னும் எங்கே

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

පෝය්ක්කොණ්ඩිරුක්කින්‍රීර්කළ්? එන්න සෙය්ය යෝසික්කින්‍රීර්කළ්? වෙරුමනේ සර්වදේසච් සමූකත්තෛ ඒමාර්රුවදර්ක් කාකත්තාන් ඉන්ත විඩයංකළෛක් කෛයාළුකින්‍රීර්කළා? අල්ලදු කාණාමර්පෝනවර්කළෛ උණ්මෛයාකක් කණ්ඩරිය වේණ්ඩුම්; පෝර්ක් කුර්රම් මර්රුම් මනිත උරිමෛ මීදල් පෝන්ර විඩයංකළිල් ඊදුපට්ටවර්කළුක්කුත් තණ්ඩනෛ වළුංක වේණ්ඩුම්; පාදික්කප්පට්ට ආට්කළුක්කු නීදියෛප් පෙර්රුක්කොදුක්ක වේණ්ඩුම් එන්ර වකෛයිල් ඉන්ත විඩයංකළෛක් කෛයාළුකින්‍රීර්කළා? අප්පඩියාක ඉරුන්දාල් අදර්කාන සෙයර්පාට්ටෛ ඉදයසුත්තියෝදු සෙය්යවේණ්ඩුම් එන්පදුදාන් එංකළුඩෛය විරුප්පම්. ආකවේ කුරිත්ත විඩයංකළ් තොඩර්පාක පාදික්කප්පට්ඩිරුක්කින්ර මක්කළෝදු නේරඩියාකප් පේසවේණ්ඩිය තේවෛ ඉරුක්කින්රදු; අවර්කළෝදු කලන්දුරෛයාඩල්කළෛ මේර්කොළ්ළවේණ්ඩි යිරුක්කින්රදු; අවර්කළුක්කු නම්පික්කෛයෛ ඒර්පඩුත්ත වේණ්ඩිය ඔරු තේවෛ ඉරුක්කින්රදු. අවර්රෛ විදුත්ත්, වෙරුමනේ ඉංකිරුන්දු එදුක්කප්පඩුකින්ර තීර්මානංකළ් මක්කළ් මත්තියිල් නම්පික්කෛයීනත්තෛත්තාන් ඒර්පඩුත්තුකින්රන එන්පතෛ නාන් ඉන්ත නේරත්තිලේ කූර්රික්කොළ්ළ විරුම්පුකින්රේන්.

ඉන්ත විවාතත්තිලේ ඉන්නුමොරු විඩයත්තෛයුම් මුක්කිය මාකක් කුරිප්පිඩ වේණ්ඩුම්. අතාවදු, ඉංකිරුන්දු ඉඩම්පෙයර්න්දු තමිල්නාදු සෙන්රිරුක්කින්ර පල්ලායිරක් කණක්කාන තමිල් මක්කළ් අංකේ පිරන්දිරුක්කින්ර තංකළින් කුළන්තෛකළුක්කාන පිරප්පුච් චාන්රිතළෛප් පෙර්රුක් කොළ්වතිලේ පල නෙරුක්කඩිකළෛච් චන්දික්කින්රාර්කළ්. අතර්කුප් පල මාතංකළ් සෙල්කින්රන; අතනෛප් පෙර්රුක් කොළ්වදු තොඩර්පාකප් පල ආවණංකළ් වේණ්ඩප්පඩු කින්රන. ආකවේ අවර්රෛ එදුත්තු අන්දප් පිරප්පුච් චාන්රිතළෛප් පෙර්රුක්කොළ්වතිලේ පල සිරමංකළ්, කෂ්ඩංකළ් ඉරුක්කින්රන. ආකවේ, තමිල්නාට්ටිලේ අකදි මුකාම්කළිල් පිරන්ද කුළන්තෛකළ් චාර්පිල් ඉලකුවාන මුරෛයිලේ පිරප්පුච් චාන්රිතළෛප් පෙර්රුක්කොළ්වතර්කුරිය නඩවඩික්කෛකළෛයුම් ඉන්දච් චට්ඨමූලත්තිනූඩාක එදුක්ක වේණ්ඩුමෙන්රු ඉන්ත නේරත්තිලේ නාන් කේට්ටුක් කොළ්කින්රේන්.

නාන් මීණ්ඩුම් ඉංකු වලියුරුත්ත විරුම්පුකින්ර විඩයම්, උණ්මෛයාකප් පාදික්කප්පට්ඩ මක්කළුක්කු නීදි කිඩෛක්ක වේණ්ඩුම් එන්පදාකුම්. ඉන්දප් පෝරිලේ පල්ලායිරක් කණක්කාන පොදුමක්කළ් උයිර් නීත්දිරුක්කින්රාර්කළ්. අවර්කළ් චාර්පාන ඔරු කොදුප්පනවු උරියවර්කළුක්කු උරිය මුරෛයිල් නීදියාක වළුංකප්පඩ වේණ්ඩුම්. උයිර්නීත්ත ඔව්වොරුවර් චාර්පිලුම් වෙරුමනේ ඕර් ඉලට්චම් - ඉම්පදායිරම් රූපාය් එන්රු ඉල්ලාමල් ච්ර්වදේස නියදිච් චට්ඩංකළුක්කු අමෛවාක අන්දක් කොදුප්පනවු වළුංකප්පඩ වේණ්ඩුම්. අදේනේරම් කාණාමර්පෝනවර්කළ් කාණාමල් ආක්කප්පට්ටදර්කුක් කාරණ මාක ඉරුන්දවර්කළුක්කුත් තණ්ඩනෛ වළුංකප්පඩවුම් නඩවඩික්කෛ එදුක්කප්පඩවේණ්ඩුම් එන්රු කූරි, එන්නුඩෛය උරෛයෛ මුදිත්තුක්කොළ්කින්රේන්. නන්රි.

[අ.භා. 1.54]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ යම් පුද්ගලයෙක් මරණයට පත් වූ පසු ඔහුගේ මළ සිරුර හමු වූ අවස්ථාවක පමණක් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ මරණ සහතිකයක් ලබා ගන්න පුළුවන්. ඒක ඔහු වෙනුවෙන් ලැබිය යුතු සුබ සාධක මුදලක්, නැත්නම් ආධාර මුදලක්, එහෙමත් නැත්නම් අදාළ දේපොළ නිරාකරණය කර ගැනීමක් පිණිස පාවිච්චි කරන්න පුළුවන්. නමුත් මිය ගියේ යයි හිතන අතුරුදහන් වූ පුද්ගලයකු වෙනුවෙන්, නැත්නම් මළ සිරුරක් දැක්කේ නැතිව, මිය ගියා යයි නිගමනය කරන්න බැරි කෙනෙක් සඳහා මේ නීතිය බල පවත්වන්නේ නැහැ. නමුත් කාලයක සිට අතුරුදහන් වී සිටින, මිය ගියා යයි සැක කරන, මළ සිරුර හමු නොවූ අය වෙනුවෙන් කිසි විටෙක මරණ සහතිකයක් ඔහුගේ යැපෙන්නන්ට ලබා ගත නොහැකි වෙලා තිබුණා. එවැනි අවස්ථාවක මිය ගියා යයි හිතන, නමුත් ඔහුගේ මෘත ශරීරය දැක්කේ නැත්නම් මිය ගිය අය වෙනුවෙන් වන්දි මුදලක්, එහෙම නැත්නම් සුබ සාධන මුදලක් ලබා ගැනීමට, ඔහුට අයත් දේපොළ නිරාකරණය කිරීමට අවස්ථාවක් ඔහුගෙන් යැපෙන්නන්ට තිබුණේ නැහැ. නමුත් සාක්ෂි ආඥා පනතේ 105 වගන්තිය අනුව අවුරුදු හතකට වැඩි කාලයක් ගියාට පසුව එම යැපෙන්නන්ට නැත්නම් භාරකරුවන්ට අධිකරණයට ගිහිල්ලා මිය ගිය බවට සැලකිය හැකි යයි අධිකරණයෙන් ප්‍රකාශනයක් ලබා ගන්න පුළුවන්කම තිබුණා. පසුව ඒක වෙනස් වුණා.

සාක්ෂි ආඥාපනතේ 108 වන්තිය යටතේ ඒක සංශෝධනය වෙලා අවුරුදු හත, අවුරුද්දක් බවට පත් වුණා. නමුත් ඒකෙන් විශාල පිටුවහලක් ලැබුණේ නැහැ. සමහර සුබ සාධන කටයුතුවලදී, වෙනත් මුදලක් ලබා ගැනීමකදී, එහෙම නැත්නම් දේපොළ නිරාකරණය කර ගැනීමේදී ඒක ඒ තරම් ප්‍රමාණවත් වුණේ නැහැ. ඒ කටයුතු කර ගන්න බැරි වුණු අවස්ථා තිබුණා. ත්‍රස්තවාදී ක්‍රියාවලින් විපතට පත් වුණු අවස්ථාවක, නැත්නම් ස්වාභාවික විපත් නිසා, එහෙමත් නැත්නම් විශේෂ ජනාධිපති කොමිෂන් සභාවකින් ලබා දෙන නිර්දේශය මත මරණ සහතිකයක් නිකුත් කිරීමට හැකි වන පරිදි -ඒ යැපෙන්නන්ට සාධාරණයක් ඉෂ්ට කරන්න හැකි වන විධියට- තමයි 1995 අංක 2 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත පැනවුණේ. 1998දී ඒ පනත බලරහිත වුණා. ඊට පස්සේ 1998 අංක 58 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත නැවත ස්ථාපිත වුණා. 2005දී ඒ පනතත් අවලංගු වෙලා 2005 අංක 17 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) කියලා පනතක් නැවත ස්ථාපිත වුණා. 2008 අවුරුද්දේ ඒ පනතත් බලරහිත වුණා. නැවතත් 2010 වන තෙක් එවැනි පනතක් තිබුණේ නැහැ. 2008 සිට 2010 වන තෙක් මේ අතුරුදහන් වූවන් වෙනුවෙන් නීතියක් සැකසිලා තිබුණේ නැහැ. ඊට පස්සේ තමයි දැන් අපි කථා කරන 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත සම්මත වුණේ. 2010 සිට ඒ පනත ක්‍රියාත්මක වුණා. එය අවුරුදු දෙකෙන් දෙකට දීර්ඝ කිරීම නිසා 2017 දක්වා වලංගු කාලය තිබෙනවා. දැනටත් වලංගුව තිබෙනවා. ඉදිරියටත් දීර්ඝ කර ගෙන යයි.

වර්තමාන රජයේ යහපාලනය ගැනයි අපි විශේෂයෙන්ම කථා කළේ. අපෙන් ජනතාව බලාපොරොත්තු වුණේ මේ රටේ යහපත් පාලනයක්. මොකද, පසු ගිය කාලයේ ජනතාව අසාධාරණය, ඒකාධිපතිවාදය, මූල්‍ය වංචා ආදියෙන් හෙම්බත් වෙලායි හිටියේ. ඒ නිසා තමයි යහපාලන රාජ්‍යයක අවශ්‍යතාව තිබුණේ. 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතට ඉදිරිපත් කරන සංශෝධන මඟින් අපි කථා කරන්නේ ජීවත් වන අයගේ යහපත සඳහා, සියලු දෙනාටම සාධාරණයක් ඉෂ්ට කිරීම සඳහා වැඩි බලයක් ලබා දීම ගැනයි.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා කිව්වා, හමුදාවල සේවය කළ අයට මේකෙන් අසාධාරණයක් සිදු වෙනවා කියලා. ඒගොල්ලන් හැමදාම හමුදාව වෙනුවෙන් කිඹුල් කඳුළු හෙළනවා. අද මේ පනතේ නාමය වෙනස් වෙලා තිබෙනවා. එදා පනතේ

පූර්විකාවේ තිබුණේ "රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් හා ජන කැළඹීම්" කියලායි. නමුත් අද වන විට අපි ඒක වෙනස් කර තිබෙනවා. අද දින අනුමතිය සඳහා ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතේ දීර්ඝ නාමයත් මේ විධියට වෙනස් කර තිබෙනවා:

"උතුරු හා නැඟෙනහිර පළාත්වල සිදු වූ ගැටුම් හෝ එම ගැටුම්වලට පසුව හෝ දේශපාලන නොසන්සුන්තාව හෝ සිවිල් කැරලි කෝලාහල හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන් වී ඇති බවට වාර්තා කර ඇති තැනැත්තන් හෝ ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ ලෙස හඳුනා ගෙන ඇති සන්නද්ධ හමුදාවල හෝ පොලීසියේ සාමාජිකයන් ලියාපදිංචි කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා"

මට කලින් කථා කළ උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා හමුදාව ගැන කථා කළා. හමුදාව ගැන කථා කරපු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාගේ එදා නායකයා, පාඨලී චම්පික රණවක ඇමතිතුමාත් මේ පනත් කෙටුම්පත සකස් කිරීම තුළ ඉන්නවා. ඒ වාගේම හමුදාපතිවරයාත් අපත් එක්ක එකතු වෙලා මේ පනත් කෙටුම්පත් නිවැරදිව සකස් කිරීමේ කාර්යය භාරයේ ඉන්නවා. එහෙම නම්, ඒ අයට වඩා වැඩි කැක්කුමක් උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාට තියෙන්න බැහැ. එදා හමුදා නිලධාරීන් කාණු සුද්ද කරන්න යොදවද්දී මේ අය කථා කළේ නැහැ. එදා සරත් ෆොන්සේකා වාගේ හමුදා නායකයන් අරගෙන ගිහිල්ලා හිරේ දමද්දී මේ අය කථා කළේ නැහැ. අඩු ගණනේ තමුන්නාන්සේලා 2010දී හදපු පනතේවත් හමුදා නිලධාරීන් පිළිබඳව සඳහන් කරලා තිබුණේ නැහැ. අද අපි තමයි මේ පනත් කෙටුම්පතින් හමුදා නිලධාරීන් පිළිබඳව සඳහන් කරන්නේ. මේ පනත් කෙටුම්පතේ දීර්ඝ නාමය අපි වෙනස් කළා.

අපි මෙම පනත් කෙටුම්පතේ දීර්ඝ නාමයේ මෙසේ දක්වනවා:

"... ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ ලෙස හඳුනාගෙන ඇති සන්නද්ධ හමුදාවල හෝ පොලීසියේ සාමාජිකයන් ලියාපදිංචි කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා"

එදා තමුන්නාන්සේලා මේ ගැන කථා කරද්දී හමුදාව ගැන කිසිම සඳහන් වීමක් තිබුණේ නැහැ. නමුත් අපි යහ පාලන රජයක් වශයෙන් සියලු වැසියන්ට යහපත් පාලනයක් නිර්මාණය කිරීමට දැන් කටයුතු කරනවා. මේ අයට දැන් තමයි හමුදාව මතක් වෙලා තිබෙන්නේ. එදා මතක් වුණේ නැහැ. අපි මේ නීති-රීති සකස් කරන්නේ ඒ සියලු දෙනා සඳහායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. අද අපි කොච්චර ප්‍රජාතන්ත්‍රවාදී විධියට කටයුතු කරලා තිබෙනවාද කියන කාරණය මේ පනත් කෙටුම්පත තුළින් පෙනෙනවා. දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා මරණ සහතිකය දෙන්නේ නැත්නම්, මේ පනත් කෙටුම්පත අනුව appeal කරලා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා දක්වා ඒ ඉල්ලුම්කරුට යන්න පුළුවන්. එතැනිනුත් බැරි නම්, දිසා අධිකරණයට ගිහිල්ලා හෝ තමන්ගේ අයිතිවාසිකම් ඉල්ලීමේ අයිතිය, බලය මේ රටේ ජනතාවට මේ පනත් කෙටුම්පත තුළින් ලබා දීලා තිබෙනවා.

මෑත කාලයේ මේ පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වැඩි ප්‍රමාණයක් සම්මත වුණේ ජනතා බලය වැඩි කිරීමට බව මම දැක්කා. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත වැනි පනත් මෑත කාලයේ හැදුවේ පාලකයාගේ බලය තහවුරු කර ගැනීමට නොවෙයි. යහ පාලන ආණ්ඩුවෙන් නීති-රීති, පනත් නිර්මාණය කළේ, වෙනස් කළේ ජනතාවගේ බලය ආරක්ෂා කිරීමටයි.

කොහොම වුණත්, පසු ගිය කාලයේ තිබුණු දරුණු පාලනය, ඒ වාගේම මුදල් ගසා කාපු, මුදල් වංචා කළ පාලනය දැන් ජනතාවගේ ඇට මිදුලුවලටම කා වැදිලා අවසන්. ඒ නිසා අද ජනතාවට ඒ තත්ත්වයෙන් බේරෙන්න බැරි තත්ත්වයක්, සිතුවිලි වෙනස් කර ගන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒක තමයි අපට අද තිබෙන ලොකුම අභියෝගය. මේ යහ පාලන රජයට අද තිබෙන ලොකුම අභියෝගය තමයි ජනතාවට කා වැදිලා තිබෙන ඒ සිතුවිලි වෙනස් කරන එක. [බාධා කිරීම්]

පසු ගිය කාලයේ පොහොර ගෙනාවේ කොහොමද කියලා අපි දන්නවා. එක ව්‍යාපාරිකයෙකු ලවා තමයි රසායනික පොහොර ගෙන්වූයේ. බාල පොහොර ගෙන්වා ගොවියාට දුන්නා. ගොවියා ඒවා ගන්න හතර අතේ රස්තියාදු වුණා. ගොවියා රස්තියාදු වෙලා පොහොර ටික අරගෙන ගියා. නමුත්, එදාට වැඩි මුදල් ප්‍රමාණයක් අද අපි ගොවියාගේ බැංකු ගිණුමට දමනවා. එහෙම දැම්මාට පස්සේත් ගොවියාට ඒ ගැන තේරුමක් නැතිව උද්ඝෝෂණය කළා. කාලයක් ගියාට පස්සේ තමයි ගොවියාට ඒ වෙනස තේරෙන්න පටන් ගත්තේ. [බාධා කිරීම්] ඒ වාගේම, එදා බාල රෙදි ගෙනැල්ලා පාසල් දරුවන්ට දෙනකොට දෙමව්පියන් පෝලිමේ ගිහිල්ලා මන්ත්‍රීතුමාගෙන් ඒවා ගත්තා. එක ව්‍යාපාරිකයෙකු ලවා තමයි ලංකාවටම බාල පාසල් රෙදි ගෙනැල්ලා දුන්නේ. නමුත්, වර්තමාන රජය දෙමව්පියන්ට සල්ලි දීලා කියනවා, "ගිහිල්ලා ඕනෑ වර්ගයක රෙද්දක් මිල දී ගන්න" කියලා. එහෙම කළාමත් මේ අය දෙමව්පියෝ ලවා පාරේ උද්ඝෝෂණ කෙරෙව්වා. [බාධා කිරීම්] මේ විධියට අපි යහ පාලනයකට යන්නේ කොහොමද?

අපි දැන් ලෝකයේ රටවල් එක්ක වෙළෙඳ ගිවිසුම් ගහලා ලෝකයේ තිබෙන අද්විතීය රාජ්‍යයක් විධියට ශ්‍රී ලංකාව නිර්මාණය කරන්න හදනවා. ලෝකයේ නොයෙක් රටවල් එක්ක විවිධ වෙළෙඳ ගිවිසුම් ගහලා අපේ රටත් සිංගප්පූරුව වාගේ දියුණු රටක් කරන්න උත්සාහ කරද්දී ඔබතුමන්ලා ඒවාට විරුද්ධව උද්ඝෝෂණ කරන්න පටන් ගන්නවා.

එතකොට අපි යහ පාලන ආර්ථිකය හදන්නේ කොහොමද? [බාධා කිරීම්] ඒ කාලයේ කරපු හොරකම්, ඒකාධිපති පාලනය අද ජනතාවගේ ඇට මිදුලුවලට කා වැදිලා ඉවරයි. ඒ තත්ත්වය වෙනස් කරනවා කියන එකත් ලේසි නැහැ. යහ පාලනයකට යන්න ඕනෑ, සාධාරණ පාලනයකට යන්න ඕනෑ කියලා ජනතාව කෑ ගැහුවාට ඒක වෙනස් කරන්න ගියාම සමහර විට ඒ ජනතාවම ඒකට අකැමැති වනවා. තමන් වෙනස් වෙන්න කැමැති නැති තත්ත්වයක් තිබෙන්නේ. [බාධා කිරීමක්]

මේ රටේ බදු ආදායමෙන් සියයට 80ක් මේ රටේ දුප්පත් මිනිසුන්ගෙන් තමයි අය කරන්නේ. බදු ආදායමෙන් සියයට 20යි ධනවතුන් ගෙවන්නේ. දුප්පත් මිනිසුන්ගෙන් අය කරන සියයට 80ක් වූ බදු ප්‍රමාණය අඩු කරන්න වැටි බද්ද හඳුන්වා දීලා අපි ක්‍රමවේදයක් නිර්මාණය කළා. ඒ ප්‍රමාණය සියයට 15 වෙන්න පුළුවන්, සියයට 10 වෙන්න පුළුවන්, සියයට 5 වෙන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඒ ක්‍රමවේදය ස්ථාපිත කරන්න ඕනෑකම තිබෙනවා. එතකොට මොකක්ද වෙන්නේ? ඒ ක්‍රමවේදය ස්ථාපිත වුණාම ධනවතුන් ගෙවන ආදායම් බදු ප්‍රමාණය වැඩි වෙනවා. [බාධා කිරීම්] නමුත් ඒකට ඔබතුමන්ලා විරුද්ධයි. [බාධා කිරීමක්]ඒ ගැන ජනතාවට බොරු බිල්ලන් මවනවා. හැම දෙයටම බිල්ලන් මවන්නේ.

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ජනතාවට අසත්‍ය ප්‍රකාශ කරලා, බිල්ලන් මවලා, ජනතාව භය ගන්වන ක්‍රමවේදය තමයි සිද්ධ වෙන්නේ. යහ පාලනයක් සඳහා අත් වැල් බැඳ ගන්න ක්‍රමවේදයක් සිද්ධ වන්නේ නැහැ. විශේෂයෙන්ම විපක්ෂයට අපි කියන්නේ - [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසානයි. [බාධා කිරීම්] එසේ කියමින් මගේ කතාව අවසාන කරනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අපි විපක්ෂයට පැහැදිලිව කියන්නේ, "අත් වැල් බැඳ ගෙන අපි මේ රට හදමු. දැන් මේ රට විනාශ කළා ඇති" කියන එකයි. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා.

[අ.භා. 2.05]

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ශ්‍රී ලංකාවේ මහා කවියා "මරණය සුන්දරයි" කියලා කිව්වා. ඔහු මරණය ගැන ගීත ලිව්වා; කවි ලිව්වා. හැබැයි අපි මරණය වළක්වා ගන්න, මරණය කල් දමා ගන්න රුපියල් කෝටි සංඛ්‍යාත මුදලක් වැය කරලා බෙහෙත් ගන්නවා. උතුරේ හෝ දකුණේ හෝ ලෝකයේ කොහේ හෝ මරණයක් වෙනවාද, ඒක වේදනාවට කාරණයක්. මරණය ලියා පදිංචි කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ, 1983න් පස්සේ සිදු වූ බොහෝ බේදනීය සිදු වීම් නිසායි. ඒ බේදනීය සිදු වීම් ආරම්භ කළේ අපි නම් නොවෙයි; 1983න් පසුවයි. මරණ සහතික නිකුත් කරන්න වැඩියෙන්ම හේතු වෙලා තිබෙන්නේ, එක පැත්තකින්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ උතුරේ යුද්ධය ආරම්භ කිරීම හා අනික් පැත්තෙන්, 1987, 1988, 1989 කාලයේ ශ්‍රී ලංකාවේ සිංහල, බෞද්ධ තරුණ-තරුණියන් 60,000ක් ඝාතනය කළ නිසායි. [බාධා කිරීම්] මළවුන් වෙනුවෙන් මරණ සහතිකයක් දීම පිළිබඳව - [බාධා කිරීම්] ඉන්න කෝ. [බාධා කිරීම්] මේ ලිච්ඡවී රජ දරුවෝ තප්පුලනවා නේ. මරණ සහතිකයක් දීම පිළිබඳව අපේ විරුද්ධත්වයක් නැහැ. [බාධා කිරීමක්] කවුරුන් හෝ හිතන්න එපා, අපි අන්තවාදියි කියලා. මම, දෙමළ අම්මාගේ කඳුළයි, සිංහල අම්මාගේ කඳුළයි හොඳට දැකපු මිනිහෙක්. මේ යුද්ධයත් එක්ක අවුරුදු 26ක් මරණයේ හීතල සෙවණැල්ල යට ජීවත් වුණු මිනිහෙක්, මම.

අද මේ කාරණය ගැන කථා කරද්දී වැඩිපුරම අවධාරණය කරන්නේ උතුරු-නැඟෙනහිර සම්බන්ධයෙන්. දෙමළ ජාතික සන්ධානයේ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කරපු ඒවා අපි අහගෙන සිටියා. එතුමන්ලා වැඩියෙන් අවධාරණය කරන්නේ, අවසන් යුද්ධයේදී දෙමළ ජනතාව අත් අඩංගුවට අරගෙන ඝාතනය කළාය; අතුරුදහන් කළාය කියලායි. හැබැයි අපේ ආණ්ඩුව යටතේ ආයුධත් එක්ක අත් අඩංගුවට ගත්ත, එහෙම නැත්නම් ඇවිල්ලා භාර වුණු 11,000ක් දෙමළ තරුණයන් පුනරුත්ථාපනය කරලා, සමාජගත කළා. ඔවුන්ට වෘත්තීය පුහුණුව දුන්නා; විභාගයට යන්න ඉඩ දුන්නා; වෘත්තීය පුහුණුව දීලා ආයුධ කට්ටලයක් දුන්නා. සමහර අය කසාද බන්දලාත් දුන්නා. ඔවුන්ට බැංකු ණය දුන්නා. අපි එහෙමයි කළේ. ඔවුන්ට ජීවත් වෙන්න රටක් තිබුණේ නැහැ. මේ සභාවේ සිටින හැම දෙනාටම මා කියන්න කැමැතියි, තමිළිනී ජෙයක්කුමාරන්ගේ "තියුණු අසිපතක සෙවණ යට" කියන පොත කියවන්න කියලා. ඒකේ මොනවාද තිබෙන්නේ කියලා බලන්න.

තමුන්නාන්සේලා මේ ඔක්කෝම පනත් කෙටුම්පත් ගෙනෙන්නේ අල් හුසේන් කුමාරයාට භයේ. ගිය සතියේ ඉන්දියාව මොකක්ද කිව්වේ? ජිනීවා මානව හිමිකම් කොමිසමෙන් ආවත් ඉන්දියාවට එන්න දෙන්නේ නැහැයි කිව්වා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න, මම කියනකල්. ජිනීවා මානව හිමිකම් කොමිසමෙන් ආවත් ඉන්දියාවට ඇතුළු වෙන්න දෙන්නේ නැහැ කියලා මෝදි කිව්වා. පිලිපීනයේ ජනාධිපතිතුමා කිව්වා, "ආවොත් ඔළුව පළනවා" කියලා. යටත්වැසියෝ වාගේ තමුන්නාන්සේලා red carpet දාලා තමයි ඒ අයව පිළිගන්නේ. තමුන්නාන්සේලාගේ ධවල ස්වාමිවරුන්ට යටත්වෙලා, දෙකට නැමිලා පිළිගන්නේ. තමුන්නාන්සේලා අද ඔය කරන දේ ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාටත් කරන්න තිබුණා නේ. “Yes, Sir; Yes, Madam” කියනවා, එතකොට හොඳයි.

ඊළඟට, ඇන්ජෙලා මර්කල් හම්බවෙන්න ගියාම, "හරි ෂෝක්" කියලා අතගානවා. ඒත් මොකුත් හම්බවෙන්නේ නැහැ. ඩේවිඩ් කැමරන් හම්බවෙන්න ගියාම ඩවිනින්ග් වීදියේ, අංක 10 ගෙදරටත් එක්කගෙන ගිහිල්ලා තේ එකක් දෙනවා. වෙන මොකුත් හම්බවෙන්නේ නැහැ. අන්තිමට තමුන්නාන්සේලා කොහේද ගියේ? මේ පෘතුවියේ, මේ මහ පොළොවේ තිබෙන භූ දේශපාලනයේ යථාර්ථය, තිත්ත කටුරු ඇත්ත තමයි මම මේ කියන්නේ. තමුන්නාන්සේලා චීනයට ගිහිල්ලා උදේ පාන්දර ජින්පින්ග් දොර අරින කොට පාත්තරේ තියාගෙන ඉන්නවා. ජින්පින්ග් හොයාගෙන ගියේ. තමුන්නාන්සේලාට අද අලුතෙන් මොකුත් කියන්න දෙයක් තිබෙනවාද? තමුන්නාන්සේලාට අලුතෙන් කියන්න කිසි දෙයක් නැහැ.

මට පැහැදිලි කරගන්න යමක් තිබෙනවා. ගරු රවුෆ් හකීම් ඇමතිතුමාට මේකට උත්තර දෙන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. සන්නද්ධ හමුදාව කිව්වාම, ඒ අර්ථය තුළ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ග්‍රාම ආරක්ෂක සේවයේ ඉඳලා දිවි පුදපු සහ අතුරුදහන් වුණු අය ගැන සෙවීමත් ඇතුළත් වෙනවාද කියලා මට පැහැදිලි කරලා දෙන්න. කවුරු හරි මට ඒකේ නිර්වචනය දෙන්න. එහෙම නැත්නම් ඔවුන්ට අසාධාරණයක් වෙනවා. ගම්වලට ආරක්ෂාව සලසපු, ගමේ ජනතාව වෙනුවෙන් පෙනී සිටි ඒ අහිංසක මිනිස්සු අතුරුදහන් වෙලා තිබෙනවා නම්, ඒ අය "සන්නද්ධ හමුදාව" කියන නිර්වචනය ඇතුළේ ඉන්නවාද කියලා කරුණාකරලා කියන්න.

තව එක් කාරණයක් පිළිබඳව මම කියන්නට ඕනෑ. මෙම සංශෝධන පනත් කෙටුම්පතට අනුව අභියාචනා සඳහා ලබාදී තිබෙන කාල සීමාව මාසයයි, එහෙම නැත්නම් දින 30යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට එම කාලය ප්‍රමාණවත් වෙන්නේ නැහැ. එහෙම අසාධාරණයකට ලක් වුණා නම් ඔවුන්ට සාධාරණයක් ඉෂ්ට විය යුතුයි. ඒ වාගේම 1988-89 කාලවල සිදුවීම් ගැන සොයන්නත් මේ පනත් කෙටුම්පත වලංගුද? එදා ප්‍රේමදාස උඩුගම්පලව අරගෙන ගිහිල්ලා ඇසිඩ් ටැංකියක දමලා ඇට කැල්ලක්වත් ඉතිරි කරන්නේ නැතිව විශ්වයට වාෂ්ප කළා. කොහොමද ඒ ගොල්ලන්ගේ තොරතුරු හොයාගන්නේ? මම මේවා උදාහරණ විධියටයි කියන්නේ. ඒ වාගේම උතුරු නැඟෙනහිර යුද්ධය කාලයේ මංගලගම නායක හාමුදුරුවෝ අරගෙන ගිහිල්ලා උණුවතුර බැරල් එකක දමලා, කැල්ලක්වත්

ඉතිරි කරන්නේ නැතුව ඉවර කළා. එතකොට, කවුද ඒ අතුරුදහන් වූවන් පිළිබඳව සහතික දෙන්නේ? කෑල්ලක්වත් තියෙනවාද?

මෙතැන තව ප්‍රශ්නයක් තිබෙනවා. එල්ටීටීඊ සංවිධානය විසින් යුද්ධය අවසන් මොහොතේදී ඝාතනය කරපු අය ගැන, මිනිස් පවුර බිඳගෙන ආපු දහස් ගණන් අහිංසක දෙමළ මිනිස්සුන්ට එල්ටීටීඊ සංවිධානය වෙඩි තබලා මැරුවා කියලා - මම නෙමෙයි කියන්නේ. එල්ටීටීඊ සංවිධානයේ දේශපාලන අංශයේ නායිකාව වන තමිලිනී ජයකුමාරන් කියන්නේ. මම නෙමෙයි කියන්නේ. කරුණාකරලා ඒ පොත ඔක්කෝම අය කියවලා බලන්න. එදා උතුරේ කොටුවෙලා හිටපු ජනතාව - නන්දිකඩාල් කලපුවේ හිටපු ජනතාව - බේරාගන්න අපේ ආරක්ෂක හමුදාව ඉතා උපායශීලීව, සැලසුම් සහගතව ක්‍රියා කළාය කියලා කියන්නේ එල්ටීටීඊ සංවිධානයේ දේශපාලන අංශයේ නායිකාව වන තමිලිනී. ඇය ජීවතුන් අතර නැති එක ගැන මම කනගාටු වෙනවා. ඒ අහිංසක ගැහැනිය ජීවත් වෙන්න උත්සාහ දරපු වෙලාවේ මියගියා. සිංහල මගේ හිතේ ඇය වෙනුවෙන් සදාකාලික කඳුලක් තිබෙනවා. ඇය ජීවිතය තේරුම් ගත්තා. යුද්ධයේ නිස්සාරත්වය තේරුම් ගත්තා. ලෝකයේ කොහේවත් හොඳ යුද්ධයක් නැහැ, නරක සාමයකුත් නැහැ. සැබෑ සාමයේ කුමරා මහින්ද රාජපක්ෂයි. ඒක අමතක කරන්න එපා.

තමුන්නාන්සේලාගේ නායකයකු වූ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාව 1,600ක් හමුදා භටයන් වට කරගෙන සිටියදී 1993 මැයි මාසයේ 1වැනිදා දහවල් 12.15ට කොළඹ ආමර් වීදියේ දී එල්ටීටීඊ සංවිධානය විසින් කැලිවලට කුඩු කළා. කෑල්ලක්වත් හොයාගන්න බැරිවුණා. පෙට්ටියට සීල් තියන්න සිද්ධ වුණා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ හිටපු රන්ජන් විජේරත්නව හැවිලොක් පාරෙදී මහ දවාලේ කාර් එක ඇතුළේ උණු කෙරුවා. එක්සත් ජාතික පක්ෂයේ මහා නායකයන් වන ගාමිණී දිසානායක, ලලිත් ඇතුළත්මුදලි, වීරසිංහ මල්ලිමාරච්චි, ජී.එම්. ප්‍රේමචන්ද්‍ර ඇතුළු නායකයන් 28දෙනෙක් ඝාතනය කෙරුවේ එල්ටීටීඊ සංවිධානයයි. සමහර විට 29වැනියා විධියට රනිල් වික්‍රමසිංහ මහත්මයා ඝාතනය වෙන්න ඉඩ තිබුණා. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ජීවිතයත් බේරුවේ මහින්ද රාජපක්ෂ බව අමතක කරන්න එපා. ඒක අමතක කරන්න එපා. විමලවීර දිසානායක - මම - මේ මහ පොළොවේ, මෙතැන හිටගෙන කථා කරන්නේ මහින්ද රාජපක්ෂ වගේ මිනිහෙක් මේ රටේ ජනාධිපති වුණු නිසයි. නැත්නම් මට මෙතැනට එන්න වෙන්නේ නැහැ. මරණයේ දේශයේ මළ මිනී කඳු තරණය කරපු, ලේ විල්වල ගිලුණු, කඳුළු ගංගාවල පීනපු අපි වාගේ මිනිස්සුන්ට ජීවිතය දුන්නේ, මේ මරණයේ දේශයට ජීවිතය දුන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමායි.

දැන් "සාමය" ගැන කථා කරනවා; "සුදු වැන්" ගැන කථා කරනවා. තමුන්නාන්ස්ේලා මේක අහගෙන ඉන්න. මේ "ලංකාදීප" පත්තරේ බලන්න. මේක අපේ පත්තරයක් නොවෙයි. 2016 මැයි මාසයේ 11 වැනි බදාදා "ලංකාදීප" පත්තරේ තිබෙනවා, "සුදු වැන්වලින් පැහැර ගැනීම නවත්වනු! අතුරුදන්වූවන්ගේ පවුල් එකතුව ආයතන 7කට පෙත්සම් භාරදෙයි" කියලා. 2016 මැයි මාසයේ කවුද මේ ආණ්ඩුව ගෙනිව්වේ? සුදු වැන් සංස්කෘතිය ගැනයි මේ කථා කරන්නේ. කවුද මේකට උත්තර දෙන්නේ? ඒක එහෙම කළාද, නැද්ද? කවුද මේ කියන්නේ? එක්කෙනෙක් තමයි "බ්‍රිටෝ". අපිත් එක්ක ඉන්න කෙනෙක් නොවෙයි, බ්‍රිටෝ කියන්නේ. යහ පාලනයේ හවුල්කාරයෙක්. ඒ නිසා සුදු වැන් සංස්කෘතිය ගැන අපේ ගමට ගිහින් කියලා වැඩක් නැහැ. මැයි මාසයේ 11 වැනිදා "ලංකාදීප" පත්තරේ අරගෙන බලන්න. ඒත්, පත්තර බලනවයැ! ඒ නිසා කරුණාකරලා - [බාධා කිරීම්]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
Sir, I rise to a point of Order.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මොකක්ද point of Order එක?

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා 2016 මැයි 11 වෙනිදා "ලංකාදීප" පත්තරේ පළවූ ලිපියක් ගැන කථා කරමින් "කවුද මේවා කළේ?" කියලා ඇහුවා. [බාධා කිරීම්] නැහැ, නැහැ, මේක කියන්නට ඕනෑ. මේවා කළේ කවුද? මේ කොයි කාලයේ වෙච්ච ඒවාද? කොයි කාලයේ වෙච්ච ඒවා ගැනද මේ කියන්නේ කියලා කියන්න? සුදු වැන් ගැන පත්තරේ කියන්නේ කොයි කාලයේ සිදු වුණු ඒවා ගැනද? [බාධා කිරීම්]

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
හොඳයි. මගේ හිතමිත්‍රයා, විජේපාල මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. දුකයි තමයි. [බාධා කිරීම්] ඕවා දුකට කියන කවි. අපි ඕවා ගණන් ගන්න ඕනෑ නැහැ. [බාධා කිරීම්] 2016 මැයි මාසයේ 11වැනිදා, - [බාධා කිරීම්] විජේපාල හෙට්ටිආරච්චි මහත්මයා, library එකට ගිහිල්ලා බලන්න. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාට බාධා කරන්න එපා. [බාධා කිරීම්]

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය මම ගන්නවා. එතුමාගේ කාලයෙන් අඩු කරන්න. [බාධා කිරීම්] හැමදාම ඔහොම තමයි.

අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කෝ? මේ දේවල් කරන හැටි කිව්වා. පසු ගිය කාලයේ ප්‍රමිතියෙන් බාල කෘෂි රසායන ද්‍රව්‍ය, පොහොර ගෙනාවා කිව්වා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
දැන් ගෙනැල්ලා තිබෙන්නේ ප්‍රමිතියෙන් ඉහළ ඒවාද? "අපේ පැත්තේ අක්කරයට වී බුසල් 600ක් විතර පැහෙනවා" කියලා කිව්වා. ඒවා පවට කෙබර. අම්පාරේ තමයි, ලංකාවේ ජාතික වී නිෂ්පාදනයෙන් පහෙන් එකක් නිෂ්පාදනය කරන්නේ. මම අතේ කරගැට තිබෙන ගොවීන්ගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවට ආපු මිනිහෙක්. වී ගබඩා 51ක් තිබෙනවා. නමුත්, එයින් එකක්වත් ඇරලා නැහැ. ඊයේ- පෙරේදා 51න් 11ක් ඇරියා. ගොවියාගේ වී ටික දෙන්න තැනක් නැහැ. කන කර උකස් තියලා, දහ දුක් විඳලා

[ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා]

වගා කරපු ගොවියාගේ වී ටික දෙන්න තැනක් නැහැ. පසු ගිය මාස එකහමාරක් තිස්සේ ගොයම් කැපුවා. පෞද්ගලික වෙළෙන්දන් ඇවිල්ලා වී ටික නිකම් තුට්ටු දෙකට අරගෙන ගියා. දැන් තමුන්නාන්සේලා පූචානම් කථා කියනවා, "වී මිලදී ගන්න මෙච්චර මුදලක් වෙන් කළා" කියලා. කාගේ වී ද ගන්නේ? මුදලාලිලාගේ වී ටික; ව්‍යාපාරිකයාගේ වී ටික ගන්නවා. ගොවියාගේ වී ටික තුට්ටු දෙකට ගන්න ඇරලා, සද්ද නැතිව ආණ්ඩුව බලාගෙන හිටියා.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද, මුදලාලි?

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(මාණ්පුමිකු டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
කෘෂිකර්මය ගැන කථා කරනවා. වී කිලෝව රුපියල් 50ට ගන්න හිටියේ. වී කිලෝ එක රුපියල් 26 ගණනේ මංකොල්ලකාගෙන යන තුරු ආණ්ඩුව නිදා ගෙන සිටියා. කථා කරන්නේ සාධාරණය, යුක්තිය ගැන. දැන් මොකද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලාගේ "මෙගාපොලිස්" නැහැ? අපි ගෙනාපු වරාය-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(මාණ්පුමිකු டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

වරාය නගරය තමයි තමුන්නාන්සේලා polish කරන්නේ. හම්බන්තොට නගරය, හම්බන්තොට වරාය ගැන කථා කෙරුවා. ඒ දවස්වල කිව්වේ, "වළ බලන්න එන්න" කියලයි. දැන් "වළ" නැත්නම් කථා කරන්න දෙයක් නැහැ. ජීන්පින්ග්ට ගිහිල්ලා කියන්න, "අක්කර 15,000ක් දෙන්නම්, හම්බන්තොට වරායක් තිබෙනවා" කියලා. අපි හදපු එක නැත්නම් බම්බු තමයි ගහන්න වෙන්නේ. ඊට පස්සේ, මත්තල ගුවන් තොටු පොළේ වී වේළුවා. අපි ඒක හැදුවේ මොනරුන්ට රහන්නද? හම්බන්තොට වරාය හැදුවේ මාළු අල්ලන්නද? නැහැ. කර්මාන්ත උද්‍යාන ඉදි කරන්න, කර්මාන්ත නගර, වාණිජ මධ්‍යස්ථාන හදන්නයි අපි සැලසුම් කළේ. ඉතිහාසයේ "බැද්දේගම" නවකතාවේ එන සිළිඳුගේ, බබුන්ගේ ඉඳලා-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාගේ කාලය අවසානයි. [බාධා කිරීමක්]

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(මාණ්පුමිකු கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්] විනාඩි 24ක කාලයක් තිබෙනවාද බලන්න?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීම්] එහෙම දෙන්න බැහැ. [බාධා කිරීම්]

මීළඟට, ගරු රවුෆ් හකීම් ඇමතිතුමා කථා කරන්න. [බාධා කිරීම්] ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමාට වෙන් කරලා තිබෙන්නේ විනාඩි 13යි. නමුත්, එතුමාට විනාඩි 15ක් ලබා දුන්නා. [බාධා කිරීම්]

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - புனர்வாழ்வளிப்பு மற்றும் மீள்குடியேற்ற இராஜாங்க அமைச்சர்)
(The Hon. M.L.A.M. Hizbullah - State Minister of Rehabilitation and Resettlement)
Sir, I will give him five minutes from the time allotted to me.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Okay. ගරු හිස්බුල්ලා රාජ්‍ය අමාත්‍යතුමාගේ කාලයෙන් විනාඩි පහක කාලයක් ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමාට ලබා දෙන බව දන්වා සිටිනවා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(මාණ්පුමිකු டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
හොඳයි. එහෙම නම්, බැද්දේගම නව කථාවේ චරිත වුණු සිළිඳුලා, බැබුන්ලා, හීන්මැණිකේලා වාගේ අහිංසක මිනිසුන් සිටි කන්න නැති, අඳින්න නැති, චතුර ටිකක් නැති අර්ධ ශිෂ්ඨාචාරයක් ඉතිහාසයේ තිබුණා. මාගම්පත්තුවේ මිනිහාගේ ජීවිතය ගොඩ නහන්නට හදපු වරාය, අපටත් එක්ක හැදුවේ. පොතුවිලට, අම්පාරට, මොනරාගලට, බදුල්ලට අපි සියලු දෙනාටම ඒ වරාය හැදුවේ. ඒකේ ප්‍රයෝජනය ගන්න බැරි වුණා. දැන් ලෝකයේ ලොකුම නැව එන්නේ හම්බන්තොටට.

දැන් කටුනායක ගුවන් තොටුපොළ මාස තුනකට වහන්න යනවා. කොහාටද ගුවන් යානා බාන්නේ? කොහේද ගුවන් යානා බාන්නේ, පාර්ලිමේන්තුව උඩටද? කොහාටද ගුවන් යානා බාන්නේ? මත්තලට යන්නට ඕනෑ. අනාගත දර්ශනයක් ඇතිව ලෝකයත් සමඟ ඉදිරියට යන්න හදපු දේ තොරොම්බල් කරන්න වෙලා තිබෙන්නේ තමුන්නාන්සේලාව. තමුන්නාන්සේලා කළ කෙංගෙඩියක් නැහැ. "ෆැක්ටරි" අරිනවා කිව්වා, නමුත් වහනවා. රබර් කර්මාන්තශාලා වහනවා, තේ කර්මාන්තශාලා වහනවා. ජීවත් වෙන්න මහක් නැහැ. තරුණයෝ ලක්ෂ සංඛ්‍යාත පිරිසක් රැකියා නැතිව පාරේ ඉන්නවා. උපාධිධාරීන් පෝලිමේ ඉන්නවා. නමුත් කයිවාරුවේ කෙළවරක් නැහැ. හදන හැටි කථා කරනවා, ගොඩනඟන හැටි කථා කරනවා, සංවර්ධනය කරන හැටි කථා කරනවා. හැම දාම උදේ ඉඳන් රෑ වෙනකම් කයිය විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ ආණ්ඩුවේ පිරිසත් අපි කරපුවාමයි කරන්නේ. අන්න, තිරුපති යනවා තරගයට. ඉන්දියාවේ තිරුපති කෝවිලට යනවා තරගයට.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
අපි යන කොට හොඳ නැහැ.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(මාණ්පුමිකු ඩී.ඊ.ටපිල්යු. විමලවීර දිසානායක්ක)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ඔව්, අපි යන කොට හොඳ නැහැ. දැන් ගිහින් කියන්නේ, "අනේ දෙවියනේ ආණ්ඩුව බේරලා දෙන්න" කියලා. ජනතාව නම් තමුන්නාන්සේලාත් එක්ක නැහැ. [බාධා කිරීම්] දෙවියෝ බැලුවොත් තමයි මේ ආණ්ඩුව බේරා ගන්න පුළුවන් වෙන්නේ. [බාධා කිරීම්] දෙවියෝ බැලුවොත් විතරයි මේ ආණ්ඩුව බේරා ගන්න පුළුවන් වෙන්නේ. හිටියොත් ඉන්නේ දෙවියෝ විතරයි.

දැන් ජාත්‍යන්තරයනේ හොඳයි කියන්නේ. [බාධා කිරීම්] ජාත්‍යන්තරය හරි හොඳයි කියනවා. ඔළුව අත ගාලා ඈ තිබෙනවාද කියලාත් බලන්න. තමුන්නාන්සේලාට බැරුක් ඔබාමාගේ, අල් හුසේන් කුමාරයාගේ, නරේන්ද්‍ර මෝඩිගේ ජන්ද තමයි ගන්න වෙන්නේ. ලංකාවේ මිනිස්සු තමුන්නාන්සේලාට ජන්දය දෙන්නේ නැහැ. මේ ආණ්ඩුවට ගොවියා විරුද්ධයි,-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
විදේශ කටයුතු ඇමතිතුමා හිනා වෙනවා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(මාණ්පුමිකු ඩී.ඊ.ටපිල්යු. විමලවීර දිසානායක්ක)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
කම්කරුවා විරුද්ධයි, වෘත්තිකයෝ විරුද්ධයි, දොස්තරලා විරුද්ධයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
විදේශ කටයුතු ඇමතිතුමා ඒවා කියන කොට හිනා වෙනවා. එතුමා පිළිගන්නවා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(මාණ්පුමිකු ඩී.ඊ.ටපිල්යු. විමලවීර දිසානායක්ක)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
අපේ හිතවත් ගරු මංගල සමරවීර ඇමතිතුමා ශ්‍රී ලංකා කුරුඳු පොලු සන්නද්ධ බලකායේ බ්‍රිගේඩියර්තුමා. [බාධා කිරීම්] අපේ හිතවතා, එතුමා මගේ යාළුවා. එතුමා එක්ක මගේ තරහක් නැහැ. මේ කයිවාරුවේ කෙළවරක් තිබෙන්න ඕනෑ. VAT පනත ගෙනාවා, අකුළා ගත්තා. දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවේ ඉන්න පිරිස කියනවා VAT එක "අරහෙම" හැදුවේ නැත්නම් අපි ජන්දය දෙන්නේ නැහැ කියලා. ඔළුව ජපන්, කඳ ජර්මන්, කකුල ඉතාලි. [බාධා කිරීම්] දැන් මේකයි වෙලා තිබෙන්නේ. කකුල් දෙක බැරුක් ඔබාමාගේ; කඳ හරිය ප්‍රංශයේ; ඔළුව හරිය එංගලන්තයේ. ඒ නිසා මේ ආණ්ඩුවට කොපමණ දුර යන්න පුළුවන්ද? [බාධා කිරීම්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි. අපේ සභානායකතුමා දැන් සභාවේ නැහැ. මේ ලිව්ඡවී රජ දරුවෝ තප්පුලනවා, "උම්බෑ" කියනවා. බොහොම ස්තුතියි.

[ප.ව. 2.22]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்தச் சபையில் இறப்புக்களின் பதிவு (தற்காலிக ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலத்தில் ஒருசில திருத்தங்கள் கொண்டுவரப் படவிருக்கின்றன. முக்கியமாக காணாமற்போனவர்கள் குறித்த ஒரு பெரிய சர்ச்சை சம்பந்தமான செய்திகளையே கடந்த ஒருசில நாட்களாக நாங்கள் பத்திரிகைகளிலே பார்த்து வருகின்றோம். அந்த வகையில் காணாமற்போனோர் சம்பந்தமான அலுவலகம் ஒன்றை ஸ்தாபிப்பது சம்பந்தமாக அண்மையில் இந்த அவையிலே நிறைவேற்றப்பட்ட சட்டமூலம் தொடர்பாகப் பலவிதமான கருத்துக்கள் தெரிவிக்கப்பட்டு வருகின்ற சூழலில், நாங்கள் இந்த இறப்புக்களின் பதிவுச் சட்டமூலத்தில் திருத்தங்களைக் கொண்டுவர விழைகின்றோம்.

இறப்புக்களின் பதிவு (தற்காலிக ஏற்பாடுகள்) (திருத்தம்) சட்டம் கடந்த 20 வருட காலத்தில் நான்காவது தடவையாகத் திருத்தப்படுகின்றது. முதலிலே 1995ஆம் ஆண்டு ஒரு திருத்தம் முன்மொழியப்பட்டது. அதன் பின்னர், இந்த நாட்டிலே நிகழ்ந்த மிகப் பெரிய இயற்கை அனர்த்தமான சுனாமியின் போது இறந்தவர்களுடைய பூதவுடல்களை - சடலங்களை உற்றார் உறவினர்கள் தேடிக் கண்டுபிடிக்க முடியாத நிலையில், இன்னமும் காணாமற்போனோர் பட்டியலில் இருக்கின்ற அவர்களுடைய இறப்புக்களைப் பதிவுசெய்து, அவர்களின் சொத்து சம்பந்தமான விவகாரங்களை முடிவுக்குக் கொண்டுவருவதற்கும் ஏனைய பலவிதமான தேவைப்பாடு களுக்குமான அவசியம் கருதி 2005ஆம் ஆண்டு இந்தச் சட்டம் திருத்தப்பட்டது.

இந்த நாட்டிலே முப்பது வருடங்களாக, குறிப்பாக 1980களிலிருந்து 2009வரை நீடித்த ஓர் உள்நாட்டு யுத்தத்தின் மிகக் கோரமான பல அவல நிகழ்வுகளின் பின்னணியிலே இருதரப்பிலும் ஆயுதம்தாங்கி உயிரிழந்தவர்களையும் அதாவது போராட்டத்திலே - யுத்தத்திலே ஈடுபட்டவர்களுடைய உயிரிழப்புக்களையும் மற்றும் காணாமற்போனவர்களையும் பற்றிய தகவல்களை முடிவுக்குக் கொண்டுவந்து அவர்கள் சார்பில் இறப்புச் சான்றிதழ் பெற்றுக்கொள்வதற்காகவும் காணாமற்போனவர்கள் என்ற பட்டியலில் இருக்கின்ற ஆயிரக் கணக்கான அப்பாவி மக்களுக்கு 'காணாமற் போயுள்ளார்' என்ற சான்றிதழ் வழங்குகின்ற நோக்கத்திலும் 2010ஆம் ஆண்டு மீண்டும் இந்தச் சட்டம் திருத்தப்பட்டது.

இந்த உயிரிழப்பு மற்றும் காணாமற்போதல் என்பன ஒரு சமூகத்தை மாத்திரம் பாதித்த விடயங்களல்ல. இந்த நாட்டிலே ஏராளமான தமிழர்கள் காணாமல் போயிருக்கிறார்கள்; உயிரிழந்திருக்கின்றார்கள். அதேபோல், முஸ்லிம்களும் யுத்தம் மற்றும் இயற்கை அனர்த்தங்களினால் தங்களது உயிர், உடைமைகளை நிறைய இழந்திருக்கின்றார்கள். சிங்கள சமூகமும் அதற்கு விதிவிலக்கல்ல. அதேநேரம், காணாமற் போன ஆட்கள் பற்றிய அலுவலகம் அமைப்பது தொடர்பான விவகாரம் என்பது, சர்வதேச சமூகத்தின் அனுசரணையோடு, ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையிலே எடுக்கப்பட்ட தீர்மானங்களை அனுசரித்து, இந்த நாட்டிலே நல்லிணக்கம் நிரந்தரமாகவே ஏற்படவேண்டும் என்ற நல்ல

[ගරු රවුෆ් හකීම් මහතා]

நோக்கத்தின் அடிப்படையில் நோக்கப்பட வேண்டும். இந்தச் சட்டமூலத்தின் வாயிலாக புதிய சில அலுவலகங்களை அமைப்பதன்மூலம் அவலங்களைச் சந்தித்த உறவினர், சுற்றத்தவர் தங்களுடைய பிரச்சினைகளுக்கு நிரந்தரத் தீர்வு களைக் காணமுடியாவிட்டாலும், குறைந்தபட்சம் அவர்கள் நிம்மதியடைவதற்கான ஒரு வழியையாவது ஏற்படுத்திக் கொடுக்கலாம் என்பதற்காகத்தான் காணாமற்போனோர் பற்றிய அலுவலகத்தை அமைக்கவேண்டிய தேவை அரசாங்கத்துக்கு ஏற்பட்டது. இது தொடர்பிலான சட்டமூலம் இந்த அவையில் கொண்டுவரப்பட்டபோது, பெரிய சர்ச்சை யாகி, மிகப் பெரிய விவாதமாகி, பலத்த கூச்சலுக்கு மத்தியில் தான் அது நிறைவேற்றப்பட்டது. எந்தச் சமூகத்துக்கும் யாருக்கும் அநீதி இழைக்கின்ற நோக்கமில்லாத, மிகச் சாதாரணமான இந்தச் சட்டமூலம் நிறைவேற்றப்படுவதை அரசியல்மயப்படுத்தி, அதிலே குளிர்காய நினைக்கின்ற சில சக்திகள் இருப்பதை நினைத்து நாங்கள் வேதனைப் படுகின்றோம்.

இந்த விவகாரத்தைப் போன்று இன்னோர் உதாரணத்தைச் சொல்லவேண்டும். யுத்தத்திலே விடுதலைப் புலிகளின் சார்பில் பெண்கள் அணியின் தலைவியாக இருந்த தமிழினி இறப்பதற்கு முன்பு, தன்னுடைய சுயசரிதையை "ஒரு கூர்வாளின் நிழலில்" என்ற தலைப்பிலே எழுதியிருந்தார். அது பின்னர் புத்தகமாக வெளியிடப்பட்டது. அந்தப் புத்தகத்திலே, போராட்டத்தில் ஈடுபட்ட போராளிகளின் தரப்பில் இருக்கின்ற நியாயங்கள், அவர்களின் அனுபவங்கள், அவற்றினுடைய பின்னணி, அது சம்பந்தமான பலவிதமான விவகாரங்களையும் எழுதியிருக்கின்றார். இது இந்த நாட்டின் ஆயுதப் படை யினரின், உளவுத் துறையினரின் தூண்டுதலால் எழுதப்பட்ட ஒரு புத்தகம் என்று கூறுகின்ற அளவுக்கு, தமிழர் தரப்பிலும் சில சக்திகள் மிகத் தீவிரப்போக்கோடு செயற்படுகின்றன. எழுதுபவரின் எழுத்திலே இருக்கின்ற உண்மைத்தன்மை சம்பந்தமான விடயத்துக்கு மாற்றமாக இரு தரப்பிலும் தீவிரவாதம் இருப்பதானது, மிக வேதனைக்குரிய விடய மாகும். இதற்கிடையேதான் காணாமல்போனோர் சம்பந்த மான அலுவலகம் அமைக்கும் முயற்சிகளும், இன்று இறப்புக்களின் பதிவுச் சட்டத்துக்கான திருத்தமும் கொண்டுவரப்படுகின்றது. எனக்கு முன்பு பேசிய உறுப்பினர் என்னிடம் சொன்னார், யுத்தத்திலே ஈடுபட்ட ஆயுதப் படையினரும் இழப்புக்களைச் சந்தித்திருந்தால், காணாமல் போயிருந்தால், அவற்றினையும் பதிவுசெய்ய முடியுமென்று இதில் மிகத் தெளிவாகக் குறிப்பிடப்பட்டிருக்கின்றது என்று.

Clause 2 of the Registration of Deaths (Temporary Provisions) (Amendment) Bill very clearly says, "....for the registration of persons reported missing as a result of the conflict which took place in the Northern and Eastern Provinces or its aftermath or political unrest or civil disturbances or enforced disappearances or of Members of the armed forces or police identified as missing in action:..."

இந்த நாட்டிலே ஆயுதப் படைகளைச் சேர்ந்த ஏராளமான வர்கள், பொலீஸைச் சேர்ந்தவர்கள் காணாமற்போயிருக் கின்றார்கள் என்ற விடயம் யாவரும் அறிந்த உண்மை. அதுமாத்திரமல்ல, - இங்கே நண்பர் ஹிஸ்புல்லாஹ் அவர்களும் இருக்கிறார் - 1990ஆம் ஆண்டு யூலை மாதம் காத்தான்குடியிலிருந்து ஹஜ் கடமைக்காகச் சென்ற நூற்றுக்கணக்கான ஹஜ்ஜாஜிகள் குருக்கள்மடத்தில் வைத்து கடத்திச் செல்லப்பட்டார்கள். அவர்களது ஜனாஸாக்கள் இன்றுவரை உறவினர்களுக்குக் கிடைக்கவில்லை. இப்படி யாக எல்லாச் சமூகங்களினதும் வீட்டுக் கதவுகளை இந்த அவலங்களுடைய விளைவுகளின் தாக்கம் தட்டுகின்ற நிலைவரம் இருக்கின்றது. அந்தக் குடும்பத்தினருக்கு அவர்களது உறவுகள் சம்பந்தமான விடயத்திலே குறைந்த பட்சம் நிம்மதியையாவது கொடுப்பதற்கு நாங்கள் முயன்று வருகின்றோம். அவர்களுடைய சொத்து விவகாரங்களிலே சில விடயங்களைச் சட்டரீதியாக முடிவுக்குக் கொண்டுவருவதற்கு இவ்வாறானதொரு சட்டமூலத்தை நிறைவேற்றவேண்டிய அவசியம் அரசாங்கத்திற்கு ஏற்பட்டது. அதைக்கூட குறுகிய அரசியல் நோக்கங்களுக்காகப் பாவிக்கின்றார்கள். "இந்த நாட்டிலே யுத்தத்திலீடுபட்ட இராணுவ வீரர்களைக் காட்டிக்கொடுப்பதற்கு அரசாங்கம் முயற்சிக்கின்றது" என்ற பாங்கிலே இதற்கு வித்தியாசமான வியாக்கியானம் கொடுக்கப்படுகின்றது. இது மிகவும் வேதனைக்குரிய விடயம் மாத்திரமல்ல, கண்டிக்கப்படவேண்டிய விடயமாகவும் இருக் கின்றது என்பதை நான் உங்களுக்குச் சொல்லியாக வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எத்தனையோ விசேட ஆணைக்குழுக்களை அமைத்திருக் கிறோம். ஒருசில ஆணைக்குழுக்களுடைய அறிக்கைகள் வெளிவந்தன; ஒருசில அறிக்கைகள் வெளிவரவே இல்லை. மேல்நீதிமன்ற நீதியரசர் மகாநாம திலகரத்ன அவர்களின் தலைமையிலே முன்னர் ஓர் ஆணைக்குழு இயங்கியது. இவ்வாறு நிறைய கமிஷன்கள்! ஜனாதிபதி ஆணைக்குழுவின் இறுதி அறிக்கை ஜனாதிபதியிடத்திலேதான் கையளிக் கப்படும். அப்படிக் கையளிக்கப்பட்டதன் பிற்பாடு அந்த அறிக்கையைக் குறைந்தபட்சம் இந்த பாராளுமன்றத்திலே சமர்ப்பிப்பதற்குக்கூட முயற்சிக்காத நிலைமை கடந்த காலங்களில் இருந்தது. அதற்கான பின்னணிக் காரணம், உண்மைகளை மறைப்பதா? என்று இறப்புக்களினால் - இழப்புக்களினால் வேதனையுற்ற மக்கள் கேள்வி கேட்டால் அதிலே எந்தப் பிழையும் இருக்க முடியாது. இந்த நாட்டின் உயர் சபையாகிய பாராளுமன்றத்தின் பரிசீலனைக்காக இத்தகைய கமிஷன்களின் அறிக்கைகளைச் சமர்ப்பிக்கின்ற கடமைப்பாடாவது அவ்வப்போது இருந்த அரசாங்கங்களுக்கு இருக்கவில்லை. இந்தப் பின்னணியிலேதான் சர்வதேச சமூகம் தலையிட்டது.

காணாமற்போனோர் சம்பந்தமான அலுவலகமொன்றை அமைப்பதன்மூலம் அரசாங்கத்தின் வெளிப்படைத்தன்மை யைக் காட்டலாம். ஜனநாயக நாடென்ற வகையிலே இதில் ஒளிவுமறைவுக்கு இடமில்லை. கடத்தப்பட்டவர்கள் மற்றும் காணாமற்போனவர்களின் ஒரு நீண்ட பட்டியல் இருக்கின்ற போது அது சம்பந்தமாக வெளிப்படைத் தன்மையைக் கொண்டுவருவதற்கான முயற்சியென்பது மனிதாபிமானத்தின் பாற்பட்ட விடயமாகும். அதை வலியுறுத்தி, ஜெனீவா பிரேரணையின் ஒரு பின்தொடர்ச்சியாக இவ்வாறான சட்ட மூலங்களை நிறைவேற்றுகின்ற கடமைப்பாடு எங்களுடைய அரசுக்கு இருந்தது. அதை நாங்கள் இன்று நிறைவேற்றி வருகின்றோம். இதுகூட தாமதமாகிவிட்டதென்றுதான் இதற்குச் சார்பானவர்கள் பேசுகின்றார்கள். இந்தப் பின்னணி யிலே இவ்வாறான விடயங்களைச் சர்ச்சைக்குரிய விடயங்களாகப் பார்க்கக்கூடாது. பாதிக்கப்பட்ட உறவினர்கள் மற்றும் உயிரிழந்தவர்களின் பெற்றோர், மனைவிமார், குழந்தைகள் ஆகியோருக்கு குறைந்தபட்சம் அந்த இழப்புக்களுக்கான இழப்பீடுகளைப் பெற்றுக் கொடுப்பதற்கான ஏற்பாடுகள் தொடர்பான எந்த விவகாரங்களைப் பற்றியும் நாங்கள் இன்னமும் கதைக்க ஆரம்பிக்கவில்லை. உழைத்துக் கொடுக்கவேண்டிய

வயதிலிருந்த ஆயிரக்கணக்கான இளைஞர்களை இந்த நாடு இழந்திருக்கிறது. வடக்கு, கிழக்கில் மாத்திரமல்ல, தெற்கிலே ஜே.வீ.பி. யினருடைய இரண்டு கிளர்ச்சிகளின்போதும் ஆயுதந்தாங்கிய பல்லாயிரக்கணக்கான இளைஞர்களை இழந்து தவிக்கின்ற சிங்களத் தாய்மார்கள் இருக்கின்றார்கள். அந்தத் தாய்மார்களுடைய அவலங்களையும் ஒருசேரத் தீர்க்கின்ற ஒரு விடயமாகத்தான் இந்தச் சட்டமூலம் கொண்டுவரப்பட்டிருக்கின்றது. இதனை இராணுவ வீரர்களைக் காட்டிக்கொடுக்கின்ற ஒரு முயற்சி என்று சொல்வதற்கு விழையக்கூடாது. சகல சமூகங்களிலும் இழப்புக்களைச் சந்தித்த குடும்பங்களுக்கு, அவர்களின் சந்ததியினருக்கு "பிச்சைக்காரனின் புண்ணைப்போல" இந்த விடயம் இருந்து விடாமல், அதை ஒரு முடிவுக்குக் கொண்டுவர வேண்டும்.

To bring a closure to the losses the people who have suffered is the objective of this piece of legislation, Mr. Presiding Member.

Therefore, I would like to finally say that we have to move several amendments to the Registration of Deaths (Temporary Provisions) (Amendment) Bill and I think, the appropriate term for this Act in my opinion should be, “Registration of Deaths and Missing Persons (Special Provisions) Act" because it also covers Certificates of Absence for those who are thought to be not among the living. Their families have not given up hope that they would one day return. You know there are certain families who live in eternal hope.

Sir, one of our Provincial Council Members, Mansoor, was abducted on the 30th of January, 1990. The LTTE came and abducted him. They shot him and took him away and he never returned. Up to now his old mother whenever I go there says, "என்ரை மகன் எங்கோ ஓர் இடத்தில் உயிரோடு இருக்கிறான்." That is what she keeps saying. So how do we bring a closure to the suffering of these hundreds and thousands of mothers in this country?

Then there was Mr. U.L. Dawood of Aligar Central College. He was a former principal. He was also abducted and he never came back. It was on the day of Haj Festival that he was abducted. So there are hundreds and thousands of people from different communities who have gone missing. So we have to bring a a closure to that pain of mind. Some of the families are desirous of at least doing the last rites for those people according to their own religious beliefs. That has been prevented. So, it was with such lofty intentions, a very innocent and ordinary piece of legislation such as this has been brought about and I believe, this should not become a political tool in the hands of those people who want to use emotions and unnecessarily rouse emotions when a responsible Government is trying to be transparent about its conduct in front of the international community. It is time for us to stand up and be counted as a responsible international citizen before the international community. And that is the objective of this legislation, Mr. Presiding Member and I conclude my comments with those remarks.

Thank you.

[பி.ப. 2.40]

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)

(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இறப்புக்களின் பதிவு (தற்காலிக ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்திலே கலந்துகொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு உங்களுக்கு நன்றி கூறிக்கொள்கின்றேன். இங்கு பேசிய பலருடைய பேச்சுக்களை நான் கேட்டுக்கொண்டிருந்தேன். இந்தச் சட்டமூலமானது ஓர் இனத்தவரின் அல்லது ஒரு மதத்தவரின் நலனுக்காகக் கொண்டுவரப்படுகின்ற விடயம் இல்லை என்பதை இந்த உயர் சபையைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற எல்லோரும் புரிந்து கொள்ள வேண்டும். குறிப்பாக தமிழ்த் தாய்மார், சகோதரர்கள், சிறுவர்கள், வயோதிபர்கள் காணாமல்போன தங்களது தந்தையை, தாயை, உறவுகளை, பிள்ளைகளைத் தேடி அலைகின்ற காட்சியை நாங்கள் கடந்த பல வருடங்களாகக் கண்டுவருகின்றோம். ஒவ்வொரு வருடமும் தங்களது உறவுகள் காணாமல்போன அந்தத் தினத்தில் அவர்கள் படுகின்ற வேதனைகளை ஊடகங்களினூடாகப் பார்க்கின்றபொழுது, மனிதாபிமானமுள்ள எவரும் அவர்களுக்கு எதிராகச் சிந்திக்க மாட்டார்கள் என்று நான் நம்புகின்றேன். எனவே, இந்த விடயத்திலே ஆளும் கட்சி, எதிர்க்கட்சி உட்பட எல்லாத் தரப்பும் ஒருமுகச் சிந்தனையோடு செயற்படவேண்டும்.

காணாமற்போனவர்கள் தமிழர்களாகவோ, முஸ்லிம்களாகவோ, சிங்களவர்களாகவோ இருக்கலாம் அல்லது விடுதலைப் புலிகள் இயக்கத்தில் இருந்தவர்களாகவோ, வேறு இயக்கங்களில் இருந்தவர்களாகவோ இருக்கலாம் அல்லது அரச பாதுகாப்புப் படைகளில் இருந்தவர்களாக இருக்கலாம். அவர்கள் யாராக இருந்தாலும் எல்லோருக்கும் நியாயம் வழங்குகின்ற அல்லது அவர்களது குடும்பத்தினருக்குச் சந்தர்ப்பம் வழங்குகின்ற ஒரு திருத்தமாகவே இது அமைந்திருக்கின்றது. அந்த வகையில், இதனைக் காலத்துக்குத் தேவையான ஒரு திருத்தமாகவே நான் பார்க்கின்றேன். அதேபோல், காணாமற்போனவர்கள் பற்றிய அலுவலகம் அமைப்பது சம்பந்தமான சட்டமூலம் இச்சபையில் கொண்டுவரப் பட்டபொழுது, எதிர்த்தரப்பிலிருந்து ஒருசிலர் இட்ட கூச்சலினால், சிறிதுநேர விவாதத்தின் பின்னர் வாக்கெடுப்புக்கு விடப்படாமலேயே அது நிறைவேற்றப்பட்டது. அதிலே, எங்களுடைய கருத்துக்களைச் சொல்லுவதற்கும் வாய்ப்புக் கிடைக்கவில்லை. இவ்வாறு ஏன், இந்த விடயங்களை எதிர்க்கிறார்கள்? என்று எனக்குத் தெரியவில்லை.

சந்திரிகா அம்மையார் அவர்களுடைய ஆட்சிக்காலத்திலே ஒரு தீர்வுத் திட்டத்தைக் கொண்டுவந்தபோது அன்று ஐக்கிய தேசியக் கட்சியினர் இந்தச் சபையிலே அதனை நெருப்பிலிட்டு எரித்த வரலாறு இருக்கின்றது. அதேபோல், ஐக்கிய தேசியக் கட்சியினர் எதையாவது கொண்டுவந்தால் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியினர் அல்லது அதைச் சார்ந்த கட்சியினர் அதனை எதிர்த்த வரலாறுகள் இருக்கின்றன.

இந்த நாட்டிலே சுதந்திரத்துக்குப் பிறகு பெரும்பான்மைச் சமூகமும் சிறுபான்மைச் சமூகமும் ஒற்றுமையாக வாழ்ந்த வரலாறு இல்லை. கடந்த யுத்த காலத்திலே தமிழ் இளைஞர்கள் பலரின் உயிர்கள் அழிக்கப்பட்டிருக்கின்றன. தமிழ்ச் சமூகம்

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

පල සොත්තුක්කළෙ, උරවුකළෙ, උඩෙමෙකළෙ ඉළන්දිරුක් කින්රදු; පල අළිවුකළෙච් සන්දිත්දිරුක්කින්රදු. අදේපෝල, ඔරේ මොළි පේසුකින්ර මුස්ලිම් සමූකත්දිනරුම් වඩක්කු, කිළක්කිලේ ආයුදදාරිකළාල් මිකවුම් පාදිප්පුක්කුළ්ළාක් කප්පට්ටිරුක්කිරාර්කළ්; වාළ්විඩංකළිලිරුන්දු වෙළියේර්රප් පට්ටිරුක්කිරාර්කළ්. කුරිප්පාක වඩක්කිලිරුන්දු වෙළියේර්රප් පට්ට මුස්ලිම්කළුඩෙය මීළ්කුඩියේර්ර විඩයත්දිලේ ඉලංකෛත් තමිළරසුක් කට්සියිනර් ඉන්නමුම් නියායමාක නඩන්දුකොළ්ළවිල්ලෛ. අණ්ණන් මාවෛ. සේනාදිරාජා, සම්පන්දන් ඉයා පෝන්ර නල්ලවර්කළ් අන්දක් කට්සියින් උයර් පදවිකළිල් ඉරුක් කිරාර්කළ්. ආනාල්, අන්දක් කට්සියිලිරුන්දු පාරාළුමන්රත්දුක්කු, මාකාණ සපෛක්කු අල්ලදු පිරදේස සපෛකළුක්කු උරුප්පුරිමෛකළෛප් පෙරුකින්රවර්කළ් ඉව්වාරාන නියායමාන විඩයංකළෛක්කූඩච් සෙය්ය මුන්වරුවදිල්ලෛ. අදාවදු, ඔරු දුණ්ඩුක් කාණියෛ අන්ද මක්කළුක්කුක් කොඩුත්දු අවර්කළ් කුඩියේරුවදර්කුක්කූඩ අනුමදියළික්කාදු දුවේස සින්දනෛයෝඩු සෙයර්පඩුවදෛ අවදානික්කක්කූඩියදාකවුළ්ළදු. වඩක්කිලිරුන්දු වෙළියේර් රප්පට්ටු අකදිකළාක වන්දවර්කළිල් නානුම් ඔරුවන් එන්ර වකෛයිලේ මනවේදනෛයෝඩු ඉංකු ඉදනෛච් සොල්ලික් කොළ්ළ විරුම්පුකින්රේන්. අදේවේළෛ, දමිළ්ච් සමූකත්දිලුළ්ළ කාණාමර්පෝන අප්පාවි ඉළෛඤර්, යුවදිකළින් උරවිනර් කළුක්කු නියායම් වේණ්ඩුම්; අදර්කෙන ඕර් අලුවලකම් අමෛක්කප්පඩුවදෛ නාන් වරවේර්කිරේන්; එනදු කට්සියුම් වරවේර්කින්රදු. එනවේ, අදු සම්පන්දමාක නියායමාකච් සින්දික්ක වේණ්ඩුමෙන්රු අදනෛ එදිර්ක්කින්රවර්කළිඩම් නාන් අන්පාක වේණ්ඩුකින්රේන්.

ඉන්ද නාට්ටිල් උළ්ළ ඉනප්පිරච්සිනෛක්කු ඔරු නිරන්දරමාන දීර්වෛක් කොණ්ඩුවරුවදර්කු ඉංකිරුක්කින්ර 225 උරුප්පිනර්කළුම් ඔන්රුපඩ වේණ්ඩුම්. දේර්දල් මුරෛයිල් මාර්රත්දෛක් කොණ්ඩුවන්දාල් පෝදුමෙන්රු ඔරු කට්සි ආසෛප්පඩුකින්රදු. ජනාදිපදි මුරෛයෛ මාර්රි පිරදමරුක්කු අදිකාරංකළෛ අදිකරිත්දාල් පෝදුමෙන්රු ඉන්නුමොරු පෙරිය කට්සි ආසෛප්පඩුකිරදු. ආනාල්, ඉන්ද නාට්ටින් යුත්දම් මුඩිවදෛන්ද නිලෛයිලේ, උලක නාඩුකළුම් පෝරාට්ටත්දිල් ඊඩුපට්ටවර්කළුම් වඩක්කු, කිළක්කිලේ පාදිප්පෛච් සුමන්දවර්කළුම් ඔරු නල්ල නිරන්දරමාන දීර්වු අමෛය වේණ්ඩුමෙන්රු කේට්කිරාර්කළ්. එංකළුඩෛය කට්සි සාර්පාක ඉන්ද මූන්රෛයුම් ඔන්රාකච් සෙය්යවේණ්ඩුමෙන්රු ඉන්ද නාට්ටින් මේදකු ජනාදිපදි අවර්කළිඩමුම් මාණ්පුමිකු පිරදමර් අවර්කළිඩමුම් නාම් සොල්ලියිරුක්කින්රෝම්. එනවේ, අව්වාරු සෙය්වදාය්න් කඩන්දකාල වරලාරුකළ් එංකළුක්කුච් සොල්ලිත්දන්දිරුකින්ර පාඩංකළෛ අඩිප්පඩෛ යාක වෛත්දු එදිර්කාලත්දිල් යාරෛයුම් පාදික්කාදවකෛයිල්, සකල ඉනත්දවරුම් ඒර්රුක්කොළ්ළක්කූඩිය නල්ල දීර්වු අමෛය වේණ්ඩුමෙන්රු නාංකළ් වේණ්ඩුකෝළ් විඩුක්කින්රෝම්.

මේලුම්, කාණාමර්පෝනවර්කළුඩෛය කුඩුම්පත්දිනර් එත්දනෛයෝ පේර් අනාදෛකළාක උළ්ළනර්. මන්නාර්, වවුනියා, මුල්ලෛත්දීවු ආකිය මාවට්ඩංකළෛප් පිරදිනිදිත් දුවප්පඩුත්දුකින්රවන් එන්ර වකෛයිලේ එත්දනෛයෝ විදවෛකළ් ඉන්රු කණවන්මාරින්රි පසියෝඩුම් පට්ටිනියෝඩුම් පිළ්ළෛකළෛප් පඩිප්පික්කමුඩියාමලුම් වාළ මුඩියාමල් අවදිප්පඩුවදෛ නාන් එනදු කණ්ණාල් කාණ්කින්රේන්. අත්දුඩන්, දිරුකෝණමලෛ, මට්ටක්කළප්පු, අම්පාරෛ, යාළ්ප්පාණම්, කිළිනොච්චි ආකිය මාවට්ඩංකළිලුම් ඉව්වාරාන කාට්සිකළෛ නාංකළ් කාණ්කින්රෝම්. එනවේ, කාණාමර්පෝනවර්කළුක්කාන අත්දාට්සිප් පත්දිරත්දෛ වළංකුවදෝඩු මාත්දිරමන්රි, අවර්කළදු වාළ්ක්කෛත් දරත්දෛ උයර්ත්දුවදර්කාකවුම් අවර්කළින් වාළ්වාදාරත්දුක්කාන දීර්වාක අමෛයුම්වකෛයිලුම් එදිර්කාලත්දිලේ නෂ්ඩඊට්ටෛ වළංකුකින්ර ඔරු වේලෛත්දිට්ටත්දෛක් කොණ්ඩුවන්දු අන්දක් කුඩුම්පංකළුක්කු කෛකොඩුත්දුදව වේණ්ඩුමෙන්රු ඉන්ද අරසාංකත්දිඩම් වේණ්ඩුකෝළ් විඩුක්කින්රේන්. අත්දුඩන්, තොඩර්න්දු ඉනවාදත්දෛයුම් මදවාදත්දෛයුම් මාරිමාරි විදෛත්දු, තත්දම් අරසියල් නලනුක්කාක ඉන්ද නාට්ටෛ ඉන්නුමෝර් අළිවුක්කුක් කොණ්ඩුසෙල්ල මුනෛපවර්කළුක්කුත් තුණෛපෝකාදීර්කළ්! එන්රු ඉන්ද උයර් සපෛයිලේ ඉරුක්කින්ර ඉරණ්ඩු පෙරිය කට්සිකළෛච් සේර්න්ද උරුප්පිනර්කළිඩමුම් මික අන්පාක වේණ්ඩි, විටෛපෙරුකින්රේන්. නන්රි.

[අ.භා. 2.47]

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතට සංශෝධන ඉදිරිපත් කර, විවාද කරන මේ අවස්ථාවේදී ඒ පිළිබඳව මුලින් කරුණු කීපයක් ඉදිරිපත් කරලා, මෙය අතුරුදහන් වූවන් සම්බන්ධවම වන සාකච්ඡාවක් නිසා ඊට අදාළ කරන යම් කරුණු ප්‍රමාණයක් පසුව ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වනවා. මොකද, එදා මෙතැන ඡෝගි නැටුව නිසා අපට අතුරුදහන් වූවන් සම්බන්ධව කථා කරන්න බැරි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මුලින්ම සඳහන් කළ යුතුයි මේ පනත් කෙටුම්පතේ අවශ්‍යතාව අප පිළිගනු ලබන බව. විශේෂයෙන්ම යුද්ධය සහ සිවිල් කැරලි කෝලාහල නිසාත්, ඒ වාගේම ස්වාභාවික ව්‍යසන නිසාත්, -අපට තිබෙන ලොකුම අද්දැකීම සුනාමිය තමයි- සිදු වන අතුරුදහන් වීම් සම්බන්ධව යාවත්කාලීන වීම් මරණ ලියා පදිංචි කිරීම්වල සිදු විය යුතුයි. අතුරුදහන් වූවන් සම්බන්ධ ප්‍රශ්නයේදී අපි කවුරුත් දන්නවා, -මෙතැන ඇති වෙන්න කථා කරලා තිබෙනවා- අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඥාතීන්, ඒ අම්මලා, දරුවෝ, තමන්ගේ තාත්තා හෝ ඥාතියා අතුරුදහන් වුණාට පස්සේ ඔහු මිය ගියා කියලා පිළිගන්න කැමැති නැහැ කියන කාරණය. ඒ නිසා එම පවුල්වල අයට ලැබිය යුතු අයිතිවාසිකම් ලැබෙන්නේ නැහැ. කාලයක් ගියාට පස්සේ ඒ පවුල්වල ආරවුල් බවට ඒවා හේතු වනවා. පළමුවැනි අවුරුද්ද හෝ දෙක තුළ නැති වුණාට, අවුරුදු හතක්-අටක් ගියාම ආරවුල් බවට පත් වනවා. ඉඩකඩම් ගැටලු එනවා. ඒ නිසා මරණ සහතිකයක් ගන්න අකැමැති අයට අතුරුදහන් වූ බවට වන සහතිකයක් - Certificate of Absence - ලබා දීම ගැන මීට කලිනුත් මේ ගරු සභාවේදී අපි සාකච්ඡා කළා. එය අවශ්‍යයි කියන එක අපි පිළිගනු ලබනවා. නමුත්, මේ පනතට ඉදිරිපත් කරලා තිබෙන සංශෝධන සම්බන්ධව අදාළ ඇමතිතුමාගේ සහ සභානායකතුමාගේ අවධානය යොමු කරවන්න මා කැමැතියි. දැන් මේ ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාවට ඔබතුමන්ලා මෙන්න මේ කොටස එකතු කරනවා:

" (1) "රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් හෝ ජන කැළඹීම්" යන වචන වෙනුවට, "රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම්, හෝ උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම් හෝ එම ගැටුම්වලට පසුව හෝ දේශපාලන නොසන්සුන්තා හෝ සිවිල් කැරලි කෝලාහල හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම්" යන වචන ආදේශ කිරීමෙන්,"

දැන් "රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම්" කියන කොටසට අදාළව ගත්තාම, මේකට "කාල සීමාවක් නැහැ" කියන එක තර්ක කරන්න පුළුවන්. නමුත්, ඒක සභානායකවරයා හෝ අගමැතිවරයා

පාර්ලිමේන්තුවට ප්‍රකාශ කරන්න ඕනෑ. නැත්නම්, මේකේ "උතුරු නැඟෙනහිර පළාත්වල ගැටුම් හෝ එම ගැටුම්වලට පසුව හෝ" කියන කොටසෙන් මතු වනවා, උතුරු නැඟෙනහිර ගැටුම්වලට පෙර, නැත්නම් උතුරු නැඟෙනහිර ප්‍රදේශවලින් පිට ප්‍රදේශවල සිදු වූ අතුරුදහන් වීම් සම්බන්ධව ප්‍රායෝගික වශයෙන් සහතිකයක් ලබා ගන්න පුළුවන්ද කියන ප්‍රශ්නය. ඒ නිසා අපි හිතන්නේ "උතුරු නැඟෙනහිර" කියන එක අනවශ්‍ය පරිදි අවධාරණය කරන්න ගිහින් තිබෙනවා කියලායි. මෑත කාලීනව වැඩිම අතුරුදහන් වීම් සිදු වුණේ උතුරු නැඟෙනහිර බව ඇත්ත. අපි ඒක දන්නවා. නමුත්, මේ සංශෝධනයේ ප්‍රතිඵලය රටටම හිමි විය යුතුයි.

සුනාමියක් වාගේ උවදුරක් නැවත ආවොත්? නැත්නම් එවැනි ස්වාභාවික ව්‍යසනයක් නැවත සිදු වුණොත්? නාය යෑමක් වුණත් එහෙමයි. අරණායක ප්‍රදේශයේ නාය යෑමක් වුණා. ඒකෙන් විශාල පිරිසක් අතුරුදහන් වෙලා ඉන්නවා නේ. දැන් මේ කාරණයට අනුව ප්‍රායෝගික වශයෙන් අනෙක් ප්‍රදේශ බලාත්මකද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා අපි රජයේ අවධානය ඒ කාරණය පිළිබඳව යොමු කරවනවා. මොකද, නැත්නම් නැවත මේ කාරණයට අදාළව සංශෝධනයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් එන්න පුළුවන්කම තිබෙනවා. "උතුරු නැඟෙනහිර ප්‍රදේශ" කියන එක තිබුණාට කමක් නැහැ. නමුත්, "උතුරු නැඟෙනහිර ප්‍රදේශ" කියන එක අනවශ්‍ය ලෙස අවධාරණය වීම විසින් වෙනත් යමක් ප්‍රායෝගික වශයෙන් ඇඟවෙනවා. ඒ නිසා පසු ගිය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනතේදීත් -OMP පනතේදීත්- ඒ කාරණය අල්ලාගෙන යම් යම් බංකොලොත් දේශපාලන කණ්ඩායම් හා පුද්ගලයන් විශාල ලෙස දැඟලුවා. ඒක එකක්. ඒ නිසා පිළිතුරු කථාවේදී අපි දැන ගන්න කැමැතියි, මේ සම්බන්ධව රජයේ ස්ථාවරය මොකක්ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මෙහි තිබෙන තවත් සංශෝධනයක් තමයි, දකින්නට නොමැති බවට වූ සහතිකය - Certificate of Absence - ලබා දෙන්නේ වසර දෙකක් සඳහා කියන කාරණය. ඒ අතර කාලයේදී ඔහුගේ ශරීර කොටස් හමු වුණොත් මරණය පිළිබඳව මරණ සහතිකයක් ගන්න පුළුවන්. ඊළඟට, අතුරුදහන් තැනැත්තෙක් සොයා ගත්තොත් ඒ සහතිකය අවලංගු කරන්න පුළුවන්. ඒක වෙන්නම ඕනෑ නේ. නමුත් ප්‍රශ්නය මේකයි. මේ පනත් කෙටුම්පතේ කරුණු ගැන මට තේරෙන පරිදි, අවුරුදු දෙකකට පස්සේ නැවත මේ සහතිකය අලුත් කර ගන්න ඕනෑ. පනත් කෙටුම්පතේ ඒක නිශ්චිතවත් තිබෙනවා. අම්මා කෙනෙක් ඉන්නවා, තමන්ගේ පුතා අතුරුදහන් වෙලා කියා සහතිකයක් ගන්නවා. හැබැයි, ඒ අම්මා අවුරුදු දෙකකට පස්සේ නැවත ඒ සහතිකය අලුත් කර ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කරන්නේ මොකක්ද? දරුවාගේ birthday එක ගන්නවා නොවෙයි නේ, මේ. ඒ අම්මා අවුරුදු දෙකකට සැරයක් ආයෙත් කච්චේරියට ගිහින් පෝලිමේ ඉඳලා දරුවා අතුරුදහන් කියන ඒ සහතිකය renew කර ගන්නවා. මේක හරි සංවේදී කාරණයක්. ඒ නිසා මේක එක්කෝ විවෘතව තියන්න, නැත්නම් සහතිකයේ කාල සීමාව දික් කරන්න ඕනෑය කියන අදහස තමයි මගේ යටි හිත කියන්නේ. මොකද, අපට විවෘතව කියන්න අමාරු වුණාට මේ අතුරුදහන් වූවන්ගෙන් කොපමණ පිරිසක්ද ජීවත්ව ඉන්නේ කියන එක පිළිබඳව අප කාටත් යම් හැඟීමක් තිබෙනවා; අවබෝධයක් තිබෙනවා. ඒ නිසා අවුරුදු දෙකෙන් දෙකට ඥාතීන් මේ සහතික අලුත් කරන්න ගියාම මොකක්ද තත්ත්වය?

මේ පොඩි ගණනක් නොවෙයි. 1988-90 කාලයේදී දකුණේ ප්‍රදේශවල තම දරුවන් අතුරුදහන් වෙලා ඉන්න දස දහස් ගණන් අම්මලා ගැන අප මේ කියන්නේ. ඒ අම්මලා තම දරුවා අතුරුදහන් වුණා කියන ඒ සහතිකය අලුත් කර ගන්න අවුරුදු දෙකකට සැරයක් පෝලිමේ ඉන්නවා. කිලිනොච්චි, මුලතිව් ප්‍රදේශ ගත්තත් ඒ සංඛ්‍යාව දස දහස් ගණනක් වනවා. ඒ නිසා මේක එක පැත්තකින් ඒ ඥාතීන්ට අනවශ්‍ය මානසික වේදනාවක් දීමක් කියා අප හිතනවා. ඒ වාගේම රජයට අනවශ්‍ය කරදරයක්. මේ වාගේ කාරණයකදීත් රජයේ නිලධාරීන්ගේ පැත්තෙන් නොසැලකිලිමත් හැසිරීමක් ලැබුණොත් -"අද කච්චේරියේ මහත්තයා නැහැ, හෙට එන්න" කිව්වොත්- මොකද වන්නේ? මේ යන්නේ ඔප්පුවට මොනවා හෝ කරගන්න, නැත්නම් බයිසිකල් එක license කර ගන්න නොවෙයි නේ. තමන්ගේ නැති වුණු දරුවාගේ සහතිකය අවුරුදු දෙකකට සැරයක් පිටසන් කරගත යුතුයි. ඒ නිසා අප රජයෙන් මේ ඉල්ලීම කරනවා. එක්කෝ මේ සහතිකය විවෘතව තියන්න. දුන්නාට පසුව එය වලංගුයි. නැවත මරණයක් වශයෙන් ලියා පදිංචි කරන තුරු හෝ අතුරුදහන් වූ පුද්ගලයා නැවත සොයා ගන්නා තාක් කල් එහෙම කරන්න. නැත්නම් මේ සහතිකය අවුරුදු දෙකෙන් දෙකට අලුත් කරනවා කියන්නේ මේ තුවාලය හැම වෙලාවේම පෑරෙනවා කියන එකයි. ඒ සහතිකය අලුත් කර ගන්න යන්නේ කවුද? අන්තිමට වන දෙය මොකක්ද? ඇත්තටම මේ මිනිසුන් ඔක්කොම මේ කාර්යයට යන්නේ නැහැ. අතුරුදහන් වුණා කියා ඒ දරුවාගේ සහතිකය ගත්තාට පසුව ඒ සහතිකය අරගෙන අම්මලා එහේ මෙහේ යන්නේ නැහැ. වෙන දෙය තමයි, අවුරුදු දෙකක් ගියාට පසුව මේ සහතික ඔක්කොම අවලංගු වන එක

ඊට පසුව නැවත යම්කිසි දෙයක් රජයෙන් කරගන්න ගියාට පසුව පරණ සහතික ලබා ගැනීම් වැනි කාරණාවලදී මහා විශාල අනවශ්‍ය පරිපාලන ප්‍රශ්නයක් හැදෙනවා කියන එකයි මගේ අදහස. ඒ නිසා මේක කාල සීමාවකින් තොරව විවෘතව තියන එක හොඳයි කියා මා හිතනවා. මොකද, පුද්ගලයා හමු වුණොත් මේ සහතිකය අවලංගු කරන්නත්, ශරීර කොටස් හමු වුණොත් මරණ සහතිකයක් නිකුත් කරන්නත් රජයට අවස්ථාවක් තිබෙනවා. මම දන්නේ නැහැ, රජය මෙහෙම අවුරුදු දෙකක් කල්පනා කරන්නේ ඇයි කියා. ගරු සභානායකතුමනි, ඔබතුමාගේ අදහසක් තිබෙනවාද, ඇයි මේ අවුරුදු දෙකේ කාල සීමාව දමලා තිබෙන්නේ කියලා? ඒ ගැන ඔබතුමා අදහසක් ඉදිරිපත් කරනවා නම් මගේ කාලයෙන් විනාඩියක් දෙන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමාගේ යෝජනාව මොකක්ද? අපේ යෝජනාව පනතේ තිබෙනවා නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මගේ යෝජනාව නම් මේක විවෘතව තියන්න කියන එකයි. "අවුරුදු දෙකකදී" කියා සීමාවක් පනවන්න එපා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

එතකොට මේ ප්‍රශ්නවල අවසානයක් වන්නේ නැහැ නේ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැහැ. ගරු ඇමතිතුමනි, එතකොට අතුරුදහන් වූවන් පිළිබඳව සහතිකයක් ලැබිලා තිබෙනවා. ඒක අවස්ථා දෙකකදී අවලංගු වෙනවා. එයින් එක අවස්ථාවක් තමයි, ශරීර කොටස් හම්බ වෙලා එයා මැරිලා කියා ඔප්පු වුණොත් එය අවලංගු වෙන එක.

[ගරු බිමල් රත්නායක මහතා]

එතකොට මරණ සහතිකයක් ලැබෙනවා. අනික් අවස්ථාව, ඔහු ඉන්නවා කියා ඔප්පු වුණත් ඒ සහතිකය අවලංගු වෙනවා. අතුරුදහන් වුණු පුද්ගලයෙකුට ඔය අවස්ථා දෙක නේ තියෙන්න පුළුවන්. එක්කෝ ඒ තැනැත්තා හම්බ වෙනවා. නැත්නම් මැරිලා කියා ඔප්පු වෙනවා. ඒ කාරණා දෙකම තිබෙනවා මේ පනතේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මේ ප්‍රශ්න දීර්ඝකාලීනව පවත්වාගෙන යාම ඒ තරම් හොඳ දෙයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. මේවා අවසාන කරන්නත් ඕනෑ. There has to be a time limit.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මේක විවෘත කළා කියලා ඒකට බාධාවක් වන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. ඔබතුමන්ලා දමලා තිබෙන රෙගුලාසි දෙකෙන් ඒ කාරණය ඉෂ්ට වෙනවා. ඒ තැනැත්තා මැරිලා කියා ඔප්පු වුණොත් මරණ සහතිකය ලැබෙනවා. එයා හොයා ගත්තොත් අතුරුදහන් වෙලා කියන සහතිකය ඉබේම අවලංගු වෙනවා. මේ පනතේ තිබෙන විධියට ඒ සහතිකය අවුරුදු දෙකෙන් දෙකට renew කරන්න ඕනෑ. ඒක හිත පාරන සිද්ධියක් සහ අනවශ්‍ය පරිපාලන ප්‍රශ්නයක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මම වජිර අබේවර්ධන ඇමතිතුමා එක්ක මේ ගැන කථා කරන්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමා ගරු ඇමතිතුමාගෙන් මේ ගැන විමසන්න. මොකද, මේක සංවේදී ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය නිසා තම දරුවා අතුරුදහන් වුණා කියා ඒ දෙමව්පියන්ට අවුරුදු දෙකකට සැරයක් කච්චේරි ගණනේ රස්තියාදු වෙන්න වෙනවා. මේ කාරණා දෙක තමයි මට මේ පනත පිළිබඳව ඉදිරිපත් කරන්න තිබෙන්නේ.

මේ කටයුත්ත කරන්න ගියාම රෙජිස්ට්‍රාර් ජෙනරාල්තුමාටත් වැඩ අධික වෙනවා. මෙන්න මේ කාරණය ගැනත් අපට පැහැදිලි අදහසක් තිබෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත වෙලා ඒ සහතික ලබාගන්න ගියාම කිලිනොච්චි, මුලතිව්, මන්නාරම, වවුනියාව, යාපනය වාගේ දිස්ත්‍රික්කවලින් සුවිශාල ඉල්ලුමක් එයි. යුද්ධය අවසන් වෙලා ඒ මිනිස්සු දැන් අවුරුදු හතක් ගත කරලා තිබෙනවා. මේ සහතිකය ගන්න ඔවුන්ට තව අවුරුදු දෙකක් බලා ඉන්න බැහැ, ගරු ඇමතිතුමනි. ඒ නිසා ඒ දිස්ත්‍රික් කාර්යාලවලට අවශ්‍ය අමතර නිලධාරීන් ලබාගැනීමටත් මේ සමඟම ප්‍රතිපාදන වෙන් කරන්න ඕනෑ. නැත්නම් මේ සහතික ගන්න ගිහිල්ලා මිනිසුන්ට විශාල වද වේදනා විඳින්න වෙනවා. අපි හිතනවා, රෙජිස්ට්‍රාර් ජනරාල්තුමා මේ ප්‍රශ්නයේදී ඉතාම මානුෂීය අයුරින් බලන්න තින්දු කරාවි කියලා. මොකද, මේ මිනිස්සු එන්නේ ඉඩමක් ලියාපදිංචි කර ගන්න නොවෙයි. මේ මිනිස්සු එන්නේ motorcycle එකේ licence එක දීර්ඝ කර ගන්න නොවෙයි. මේ මිනිස්සු එන්නේ, තමන්ගේ දරුවා ආරක්ෂා කරලා දෙන්න ශ්‍රී ලංකා රජය අසමත් වෙච්ච නිසා, ඒ දරුවා වෙනුවෙන් මේ සහතිකය ගන්නයි.

පසු ගිය රජය, මේ රජය ඇතුළු හැම රජයකටම ඒ කරුණ වලංගුයි. ඔවුන් එන්නේ තමන්ගේ දරුවා වෙනුවෙන් සහතිකයක් අරගෙන යන්නයි. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඒ ගැන මානුෂීය ආකාරයෙන් කටයුතු කරන්න ඒ නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න. උපදෙස් විතරක් ලබා දීලා හරි යන්නේත් නැහැ. මොකද, මේ කටයුතු සඳහා අවශ්‍ය කරන නිලධාරීන් පිරිසක් නොහිටියොත් සහ සිටින නිලධාරීන් මත බර පැටවුණොත්, අනිවාර්යයෙන්ම ඒ පුද්ගලයන්ගෙන් මානුෂීය ප්‍රවේශයක් බලාපොරොත්තු වෙන්න බැහැ. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ කටයුතු කිරීම සඳහා උසස් පෙළ සමත් දරුවන් contract basis එකෙන් හරි ග්‍රාමීය මට්ටමෙන් බඳවා ගන්න කියලායි. මොකද, සමහරුන්ට මේ form එක පුරවා ගන්න තේරෙන්නේත් නැහැ. මේ මෑතකදී අපි පුදුකුඩ්ඉරිප්පු ප්‍රදේශයේ සමීක්ෂණයක් කළා. ගරු ඇමතිතුමනි, ඒ හැම ගෙදරකම වාගේ කෙනෙක් අතුරුදහන් වෙලා. අම්බලම්පොක්කනෙයි කියන ගම්මානයේ අම්මලාගෙන් විමසුවාම, ඒ හැම ගෙදරකම වාගේ කෙනෙක් අතුරුදහන් වෙලා. ඒ අයට ඒ form එක පුරවන්න තේරෙන්නේත් නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමනි, රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාට මේ කටයුතු කරගන්න අවශ්‍ය බලය දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැම ගමකම ඉන්නවා උසස් පෙළ සමත් දරුවන්. උසස් පෙළ සමත් දරුවන් ගොඩක් ඉන්නවා. මේ කටයුත්ත ව්‍යාපෘතියක් වශයෙන් සලකා අවුරුද්දක කාලසීමාවකටවත් එක ග්‍රාම නිලධාරි වසමකින් අඩු ගණනේ ඒ එක දරුවෙක් ගන්න, ග්‍රාම නිලධාරියාට මේ කටයුත්ත සඳහා assist කරන්න. මේ වෙනුවෙන් පුරවන්න තිබෙන forms සංඛ්‍යාව දිහා බැලුවොත් ඇත්තටම මේ කටයුත්ත සංකීර්ණයි.

අනෙක් එක, ඒ ග්‍රාම නිලධාරි වසමක සමහර වෙලාවට ග්‍රාම නිලධාරි කෙනෙක් නැහැ. වසම් දෙකක වැඩ බලන ග්‍රාම නිලධාරි කෙනෙකුට ගෙවල් 1,000ක විතර මේ කටයුතු ආවරණය කරන්න වුණොත්, එතැන විශාල සංකීර්ණතාවක් ඇති වෙනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාට පරිපාලන වශයෙන් අවශ්‍ය කරන බලය, මුදල් මේ සඳහා ලබා දෙන්න කියායි. නැත්නම් මේ මිනිසුන්ට අනිවාර්යයෙන්ම මානුෂීය වශයෙන් පීඩනයකට ලක්වෙන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාද කරන කාරණයත් අතුරුදහන් වූ පුද්ගලයන්ට සම්බන්ධ ප්‍රශ්නයක් නිසා මම හිතුවා, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පාරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත ගැන එදා කරන්නට බලාපොරොත්තු වූ කථාවේ කොටසක් කියන්න ඕනෑ කියලා. මොකද, වර්තමානයේ ඒ පනත සම්මත වූ ආකාරය ගැන විශාල සංවාදයක් ඇති වෙලා තිබෙන නිසා. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පාරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි ඉදිරිපත් කළ සංශෝධනවලින් එකක් ගරු කථානායකතුමාට ඒ අවස්ථාවේ ලබා දෙන්න බැරි වුණා. ඒකට හේතුව එදා ඇතිවූ ගාලගෝඨිය වෙන්න පුළුවන්. ඒ නිසා ගරු අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී අද එකඟ වෙලා තිබුණා, නැවත ඒ සංශෝධන සහිතව පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවට. ඒ කාරණයට රජය එකඟ වෙලා තිබෙනවා.

මේ පනත සම්බන්ධයෙන් වර්තමානයේ මතු වී තිබෙන දේශපාලන තත්ත්වය ගත්තොත්, බරපතළ සැකයක් රටේ ජනතාව තුළ, ආරක්ෂක අංශ තුළ ඇති කර තිබෙනවා, මේ පනත "හමුදාව දඩයම් කිරීමට සකස් කරන ලද පනතක්ය. විදේශීය විනිසුරන් මේ සඳහා එන්න පුළුවන්ය. විදේශීය පුද්ගලයන්ට මේ ආයතනයේ තනතුරු ගන්න පුළුවන්ය" යනාදී වශයෙන්. එවැනි කරුණු සුවිශාල ප්‍රමාණයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පාරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත ලංකාවට එන්නේ ජිනීවා යෝජනාවක් හරහා බව මුලින්ම අපට කියන්න ඕනෑකම තිබෙනවා. ඒ ගැන අපට සැකයක් නැහැ.

නමුත් ඒ තත්ත්වයට අපේ රට පත් වුණේ 2009දී යුද්ධය අවසන් වුණාට පසුව හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා අවුරුදු 5ක් තිස්සේ සහ වර්තමාන ජනාධිපති සහ අග්‍රාමාත්‍යතුමා අවුරුදු එකහමාරක් තිස්සේ මේ අතුරුදහන් වූවන් සම්බන්ධව ඒ වාගේම මේ යුද්ධය තුළ සිදු වුණේ කුමක්ද කියන කාරණයේදී රටක් වශයෙන් කළ යුතුව තිබුණු මූලික දේවල් නොකිරීම නිසායි.

විශේෂයෙන්ම පසු ගිය රජය පැත්තෙන් ගත්තොත්, යුද්ධය පැවැති කාලය තුළ එල්ටීටීඊ සංවිධානය කරන ලද පැහැර ගැනීම්, ඝාතන, රටේ සිවිල් ප්‍රදේශවල කරන ලද සමූල ඝාතන යනාදී කිසිවක් පිළිබඳව සහ අනෙක් පැත්තෙන් යුද්ධයෙන් පීඩාවට පත් වූ ජනතාව සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පසු ගිය රජය අනුගමනය කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2009 වර්ෂයේදී යුද්ධය අවසන් වුණාට පස්සේ මාස 6ක්, අවුරුද්දක් පහුවෙලා හරි ශ්‍රී ලංකා රජය කළ යුතුව තිබුණු දේ තමයි, යුද්ධය නිසා සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ජනතාවට සිද්ධ වෙච්ච කරදර පිළිබඳව දන්වන්න, ඔවුන්ගේ දුක් ගැනවිලි ඉදිරිපත් කරන්න සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමක් පිහිටුවන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යුද්ධයේදී අපරාධ කළේ ආණ්ඩුවයි, එල්ටීටීඊ සංවිධානයයි පමණක් නොවෙයි. සාමාන්‍ය සිවිල් මිනිස්සු - මිනිස්සු අතරක් නොයෙක් අපරාධ වුණා. සිංහල ගම්වල මිනිස්සු ගිහිල්ලා දෙමළ මිනිස්සු මැරුවා. දෙමළ ගම්වල මිනිස්සු ඇවිල්ලා සිංහල මිනිස්සු මැරුවා. එහෙමත් වුණා. රජයේ කාර්යාලවල ජාතිවාදී ආකාරයෙන් හිරිහැර වුණා. ගැහුවා, බැන්නා විතරක් නොවෙයි, සමහර වෙලාවට මාරුවීම්, උසස්වීම් වාගේ ඒවාටත් ඒ කරුණු බලපෑවා. රටක දේශපාලන වශයෙන් දේශපාලන වනයක් ඇති වුණාම, දේශපාලන වශයෙන් ජාතිවාදී තත්ත්වයක් ඇති වුණාම ඒක හොඳ තත්ත්වයක් නොවෙයි. සාමාන්‍යයෙන් ඒවා රජයන් මුල් කරගෙන තමයි ව්‍යාප්ත වෙන්නේ. ඊට පස්සේ එල්ටීටීඊ සංවිධානයෙන් තවත් ජාතිවාදී ක්‍රියාකාරකම් ටිකක් කළා.

ඊළඟට, ජනතාවත් ඒවාට හවුල් වෙනවා. අන්තිමේදී ජනතාව ඒ තත්ත්වයේ ගොදුරක් වෙනවා. ජනතාවත් තමන්ගේ අසල්වැසියාට කරදර කරනවා. ඉතින් මේ සිද්ධි ඔක්කෝම නඩු අහලා ඉවර කරන්න බැහැ. මේ සියලුම ප්‍රශ්න නඩු අහලා ඉවර කරන්න බැහැ. ඒ නිසා ආණ්ඩුව පළමුවෙන්ම කළ යුතුව තිබුණු, නමුත් තවමත් කරලා නැති දේ තමයි, ජාතිවාදී යුද්ධය පැවති කාලය තුළ ඒ ජනතාවට වෙච්ච විවිධ අතපසුවීම්, වෙච්ච කරදර, ඔවුන්ගෙන් වෙච්ච වැරදි ගැන කියන්න ජාතික වේදිකාවක් හදලා නැති එක. එහෙම කළා නම්, සිංහල මිනිස්සු ගිහිල්ලා තමන්ට වෙච්ච කරදර ගැනත් කියයි. සමහර විට සිංහල මිනිස්සු ගිහිල්ලා කියයි, 83 කළු ජූලියේදී තමන්ගෙන් වෙච්ච වැරදි ගැනත්.

මම දන්නවා, 83 කළු ජූලියේදී තමන් මොනවාද කළේ කියලා ප්‍රසිද්ධ පුද්ගලයන් පසු කාලීනව කියලා තිබෙන බව. අපි දකුණු අප්‍රිකාවේ සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තා දිහා බැලුවාම පෙනෙනවා, සුදු පොලිස් නිලධාරීන්ගේ වර්ගවාදී හැසිරීම පිළිබඳව ඔවුන්ම ගිහිල්ලා පාපොච්චාරණය කරලා තිබෙන බව. එවැනි ක්‍රියාදාමයක් නැති නිසා අපේ රටේ ජනතාව අතර ඇති වෙලා තිබෙන අවිශ්වාසය තවමත් තිබෙනවා. ඒ නිසා තමයි අද උතුරේ ඉන්න විග්නේෂ්වරන් මහ ඇමතිවරයා ඇතුළු සුළු ජාතිවාදී කල්ලියකටත්, දකුණේ ඒ කටයුත්තම කරන සිංහල ජාතිවාදී සුළු කල්ලියකටත්, මුළු රටෙම සිංහල ජනතාවගේත් දෙමළ ජනතාවගේත් මනස් පාලනය කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි පිළිගන්න ඕනෑ මිනිසුන්ගේ සිත් තුළ තවමත් අවිශ්වාසය තිබෙන බව. නමුත් සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමක් ඇති වුණා නම්, මොනවාද වුණේ කියලා ඒ ජනතාවට තමන්ගේ දුක කියාගන්න යම් අවස්ථාවක් ලැබෙනවා. එහෙම නැතිව මේවා නඩු අහලා ඉවර කරන්න පුළුවන් ප්‍රශ්න නොවෙයි. මේක තොරතුරු හොයලා ඉවර කරන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මේ ප්‍රශ්න තවමත් මිනිසුන්ගෙන් සියයට හැට හැත්තෑවකගේ සිත්වල තිබෙනවා. ඒවා විමෝචනය කරන්න ක්‍රමවේදයක් හදන්න ඕනෑ. ඒක මහින්ද රාජපක්ෂ මැතිතුමා කළේ නැහැ. එතුමා කරපු ලොකුම වැරැද්ද ඒකයි. එතුමා අද සම්පූර්ණයෙන්ම සිංහල ජාතිවාදී ඡන්ද ඉලක්ක කර ගෙන වැඩ කරනවා, පසු ගිය ජනාධිපතිවරණයේදී යාපනය දිස්ත්‍රික්කයෙන් එතුමාට ඡන්ද 75,000ක් විතර ලැබුණු බව අමතක කරලා.

2015 ජනවාරි 8වැනි දා තිබුණු ජනාධිපතිවරණයේදී යාපනය දිස්ත්‍රික්කයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඡන්ද 75,000ක් විතර ලැබුණා. ඒ ලැබුණේ මොන ඡන්දද? ඒ ලැබුණේ සිංහල මිනිසුන්ගේ ඡන්ද නොවෙයි, දෙමළ මිනිසුන්ගේ ඡන්ද. යාපනය දිස්ත්‍රික්කයෙන් ඡන්ද 75,000ක් ලැබුණා කියන්නේ කොච්චර ලොකු ප්‍රමාණයක්ද? නමුත් අද අමු ජාතිවාදී විධියට කටයුතු කරමින් ඉන්නවා. මම හිතන්නේ උතුරේ විග්නේෂ්වරන් මහ ඇමතිවරයායි, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කණ්ඩායමයි එක කුස උපන් සහෝදරයන් කියලායි. විග්නේෂ්වරන් මහත්මයා පන්දුව ඔසවා දෙනවා. මේ අය ඒකට නියමෙට dash කරනවා. මොරගහකන්ද ව්‍යාපෘතිය හදනකොට ඒ වතුර විග්නේෂ්වරන් මහත්මයා ඉල්ලනවා. ඉතින් මේ අය ඒක නියමෙට උස්සලා දෙනවා. ඒවා වෙනුවෙන්ම පැල් බැඳගත්ත, ඒ වෙනුවෙන්ම කටයුතු කරන සමහර ජනමාධ්‍ය දෙක තුනකුත් ඒ ගොල්ලන්ට තිබෙනවා. ඒ හරහා අවිශ්වාසය වැපිරෙනවා. ඒ නිසා අංක එකට අපි කියන්න ඕනෑ, වර්තමාන රජයත්, පසු ගිය රජයත් දෙකම මේ සත්‍ය හා ප්‍රතිසන්ධාන කටයුත්ත කළේ නැහැ කියලා. ඒ කටයුත්ත කළේ නැතිව විවිධාකාර කොමිෂන් පත් කර කර හිටියා. මහින්ද රාජපක්ෂ මහත්මයා කොමිෂන් 4ක් දැම්මා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාව LLRC එක දැම්මේ ඇයි? ඇමරිකානු කොන්ග්‍රස් මණ්ඩලයේ මන්ත්‍රීවරු 38 දෙනෙක් යෝජනාවක් සම්මත කළා, ලංකාවට බලපෑම් කරන්න. ඊට පස්සේ තමයි මහින්ද රාජපක්ෂ මහත්මයා LLRC එකක් දැම්මේ. දැන් මේ මගේ ළඟ තිබෙන්නේ ඒ නිර්දේශ සහිත පොත. මේ පොතේ තිබෙන නිර්දේශවත් එතුමා ක්‍රියාත්මක කළේ නැහැ. මෙහෙම කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. "ලංකාව අපේ. අපි තමයි ලංකාවේ ආණ්ඩුව. අපට ඕනෑ නම් ලක්ෂයක් වුණත් ලංකාවේ මිනිසුන් මරණවා. ඇමෙරිකන්කාරයන්ට, එංගලන්තකාරයන්ට මේ ගැන කිසිම දෙයක් කියන්න අයිතියක් නැහැ" කියන එකද මේ කියන්නේ? ලෝකයේ වැඩියෙන්ම මිනී මරණ රට ඇමෙරිකා එක්සත් ජනපදය බව අපි දන්නවා. අපි සියැටල්ලා කියලා කියන ඇමෙරිකන් nativesලාව අවුරුදු එකසීය පනහක් ඇතුළත මිලියන සියයක් මරපු ඝාතන රාජ්‍යයක් තමයි ඇමෙරිකා එක්සත් ජනපදය. එවැනි පාලනයක් තිබුණු උපතින්ම ඝාතක රාජ්‍යයක් තමයි ඇමෙරිකා එක්සත් ජනපදය. අදත් ඇමෙරිකා එක්සත් ජනපදය ලෝකය පුරාම විවිධාකාරයේ ඝාතනයන් සිදු කරන්න උල්පන්දම් දෙනවා. නමුත් අපට කියන්න බැහැ, "උඹලා ඉරාකයේ ලක්ෂ ගණනක් මිනිසුන් මරණවා, ඒ නිසා අපිත් ඊට සාපේක්ෂව දහ දොළොස්දාහක් මිනිසුන් මරනවා. අපට මොනවාවත් කියන්න උඹලාට බැහැ" කියලා. අපට එහෙම කියන්න බැහැ. ඒක ගැම්මට හොඳ තර්කයක් තමයි. ඇමෙරිකාව, ලිබියාව, ඇෆ්ගනිස්ථානය මිනිසුන් මර මරා අපට මොනවාද කියන්න එන්නේ කියන එක. ඒකත් දේශපාලන සදාචාරය සම්බන්ධ ප්‍රශ්නයක් තමයි. අතුරුදහන් කරවීම්වලට එරෙහි ජාත්‍යන්තර ප්‍රඥප්තියට ශ්‍රී ලංකා ආණ්ඩුව මේ වසරේ මාර්තු මාසයේ අත්සන් තබා තිබෙනවා. හැබැයි, ඇමෙරිකා එක්සත් ජනපදය අත්සන් කරලා නැහැ. OMP Bill එක සම්මත වුණාට පසුව, ඇමෙරිකාවේ නිලධාරියෙකුගේ ප්‍රකාශයක් සමහර පුවත්පත්වල headlines විධියට පළ කරලා තිබෙනවා මම දැක්කා. හැබැයි, ඇමෙරිකා එක්සත් ජනපදය ඒ ප්‍රඥප්තියට අත්සන් කරලා නැහැ. මහා බ්‍රිතාන්‍යය අත්සන් කරලාත් නැහැ. අපට උපදෙස් දෙන්න එනවා. මේ රාජ්‍යයන් දෙකේ දූෂිත, මිනීමරු, ප්‍රතිපත්තිය

[ගරු බිමල් රත්නායක මහතා]

අපි දන්නවා. නමුත්, අපේ රටේ සිදු කරන ලද සාතන, අතුරුදහන්වීම් සම්බන්ධව කටයුතු නොකර ඉන්න ඒකෙන් අපට අයිතියක් ලැබෙනවාද? ශ්‍රී ලංකා රජයට කිසිම අයිතියක් ලැබෙන්නේ නැහැ, ඇමෙරිකාව කරන පව් නිසා තමන්ගේ පව් සුද්ද කර ගන්න. එදා රාජපක්ෂ මැතිතුමන්ලා කළේ ඒකයි. එතුමන්ලා ඇමෙරිකාව පෙන්ව පෙන්වා මෙහේ අවශ්‍ය කටයුතු කළේ නැහැ. අන්තිමට බෙල්ල මුලටම හිර වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ස්වෛරී රාජ්‍යයක් විධියට වර්තමාන අධිරාජ්‍යවාදී බලපෑමේ උගුලෙන් මිදෙන්න නම් කරන්න ඕනෑ මොකක්ද? තිබුණු ආණ්ඩුවලින් හරි, මේ පවතින ආණ්ඩුවෙන් හරි කළ යුතුව තිබෙන්නේ මොනවාද? රටේ ජනතාවට උපරිම ප්‍රජාතන්ත්‍රවාදය දෙන එකයි. රටේ ජනතාවට උපරිම ප්‍රජාතන්ත්‍රවාදය දීලා තමයි ලෝකයේ සාධාරණ රාජ්‍යයන්වලට අපේ නිවැරදි භාවය ඔප්පු කරන්න පුළුවන් වන්නේ. ඇමෙරිකාවට කවදාවත් අපේ නිවැරදි බව ඔප්පු කරන්න බැහැ. ඒ ගොල්ලන් හොරට නිදාගෙන ඉන්න කට්ටියක්. බ්‍රිතාන්‍ය ආණ්ඩුවට අපේ නිවැරදි බව ඔප්පු කරන්න බැහැ. බ්‍රිතාන්‍යයේ මිනිසුන්ට නොවෙයි; ඇමෙරිකාවේ මිනිසුන්ට නොවෙයි, ඇමෙරිකා ආණ්ඩුවට අපේ නිවැරදි බව ඔප්පු කරන්න බැහැ. ඒ ගොල්ලොන්ට යම් යම් න්‍යාය පත්‍ර තිබෙනවා. නමුත් ලෝකයේ සාධාරණ සාමාන්‍ය රාජ්‍ය තිබෙනවා. එතකොට ඒ සාධාරණ රාජ්‍යයන්ට අපේ නිවැරදිභාවය ඔප්පු කරන්න පුළුවන් වන්නේ කොහොමද? න්‍යාය පත්‍ර නැති රාජ්‍යයන්වලට අපට පෙන්වා දෙන්න පුළුවන්, "සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමක් අපි පිහිටුවලා තිබෙනවා. යුද්ධය පැවැති කාලයේදී වාගේ නොවෙයි, දැන් අපේ රටේ ජනතාවට අසාධාරණය සලකන්නේ නැහැ. අපි අතුරුදහන් වූවන් සම්බන්ධව පක්ෂ භේදයෙන්, ජාති භේදයෙන් තොරව හොයනවා. අපේ අධිකරණය ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා" කියලා. ඒ සම්බන්ධව අපි දකින තව දෙයක් තමයි, රාජපක්ෂ මහත්මයා එය දේශපාලන හේතු මත කළේ නැහැ; වර්තමාන ආණ්ඩුව නොසැලකිල්ල මත එය කළේ නැහැ. ඒ නිසා තමයි ජිනීවා අව්වුවක්; ජිනීවා යෝජනාවක් විධියටම මේ OMP Bill එකක් කරන්න වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු දෙකක්, තුනක් තිස්සේ සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමක් ක්‍රියාත්මක වුණා නම්, නම් එහි ප්‍රතිඵල විධියට ඉතාම ස්වාභාවිකව එන්නේ මොනවාද? එහෙනම් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව සොයන්න නිශ්චිත ආයතනයක් පිහිටුවිය යුතුයි කියලා යෝජනාවක් එනවා. ඒක තමයි මේ LLRC වාර්තාවේත් තිබෙන්නේ. LLRC වාර්තාවේ පිටු ගණනකම තිබෙන්නේ මොනවාද? LLRC වාර්තාවේ පිටු අංක 32,33,34,35ත් ඊළඟට පිටු අංක 62,63,64 පිටුවල සඳහන්ව තිබෙන්නේ මොනවාද? අතුරුදහන් වූවන් සම්බන්ධව රජය කළ යුතු දේවල්. 2013, 2014 කාලය තුළ එම දේවල් කළා නම්, ඇමෙරිකා එක්සත් ජනපදයට පුළුවන්කමක් නැහැ, අපට ඇඟිල්ල දිගු කරන්න.

අපි පැහැදිලිවම කියන්න කැමැතියි, ත්‍රිවිධ හමුදාව යවලා අද අපට මෙම යුද්ධය දිනන්න බැරි බව. මොකද, දැන් තිබෙන්නේ ජාත්‍යන්තර යුද්ධයක්. දැන් 57 වැනි බලකාය ජිනීවාවලට යවන්න බැහැ නේ. මෙය දිනන්න පුළුවන්කම තිබෙන්නේ ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය සහතික කිරීමෙනුයි. ඒකට විරුද්ධ වෙනවා කියලා කියන්නේ මොකක්ද? ඒකට විරුද්ධ වෙනවා කියලා කියන්නේ, අපට ජාතික ප්‍රශ්නය විසඳා ගන්න බැරි වන එකයි. ජාතික අසමඟිය ඇති වෙනවා. එතකොට විග්නේෂ්වරන්ලා එහෙන් කප්පිත්තෝ වෙනකොට, මෙහෙන් රාජපක්ෂලා කප්පිත්තෝ වෙනවා. ඊට පසුව වෙන්නේ මොකක්ද? නැවත ජාතිවාදය එනවා. ජාතිවාදය හැම විටම සාමාන්‍ය මිනිසුන්ට අවුල්, පාලකයන්ට හොඳයි.

දැන් බලන්න, මේ දවස්වල යුද්ධය තිබුණා නම් මොකද වෙන්නේ? මිනිසුන් VAT එක ගැන කථා කරනවාද? මිනිසුන් අය වැය ගැන කථා කරනවාද? දැන් මේ ආණ්ඩුව කොළඹ වරායේ නැඟෙනහිර පර්යන්තය අමු-අමුවේ පෞද්ගලීකරණය කරනවා. ලාභ ලබන්න පුළුවන්කම තිබෙද්දී දැන් තීන්දුවක් ගෙන තිබෙනවා, කොළඹ වරායේ නැඟෙනහිර terminal එක විකුණන්න. යුද්ධය තිබුණා නම්, මිනිස්සු ඒවා ගැන කථා කරනවාද? ඒවා කිසි දෙයක් ගැන කථා කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යුද්ධය තිබුණා නම්, මිනිස්සු බලාගෙන ඉන්නේ කොහේද? හමුදාව මොකද කරන්නේ කියන එක දිහායි මිනිස්සු බලාගෙන ඉන්නේ. ඒක තමයි පාලකයාට තිබෙන වාසිය. තිස් අවුරුද්දක් තිස්සේ පැවැති හැම ආණ්ඩුවක්ම මේ රටේ ජනතාවට අසත්‍ය කිව්වා, "රටේ ආර්ථිකය අවුල් වෙලා තිබෙන්නේ යුද්ධය නිසා"යි කියලා. මා එය තවත් සරල කර කියනවා නම්, එදා සිංහල මිනිසුන්ට කිව්වේ, "ප්‍රභාකරන් නැත්නම් මේ රට සිංගප්පූරුව ගානට ගොඩ නහන්න තිබුණා" කියලායි. උතුරේ දෙමළ බෞද්ධවාදී, ජාතිවාදී කණ්ඩායම් උතුරේ ජනතාවට කිව්වා, "දකුණ නියමෙට ගොඩ නහලායි තිබෙන්නේ. දකුණ නිකම් සිංගප්පූරුව වාගෙයි. රට බෙදා ගත්තොත් අපි ස්විට්සර්ලන්තය ගානට උතුර හදලා ගන්නවා" කියලා. දැන් යුද්ධය අවසන් වෙලා අවුරුදු හතක් ගත වෙනවා. ඒ අවුරුදු හත තුළ කරපු දේවල් පෙනෙනවා නේ. ගත වුණු අවුරුදු හත තුළ යුද්ධයක් තිබුණේ නැහැ. බෝම්බයක්වත් පිපිරිලා නැහැ. අපි ඒ ගැන සතුටු වෙනවා. දැන් පෙනෙනවා, පාලකයන්ගේ අසමත්කම. රාජපක්ෂගේ අසමත්කමත් පෙනෙනවා; වර්තමාන අයගේ අසමත්කමත් පෙනෙනවා. එක ආයතනයක්වත් ලාභ ලබන තත්ත්වයට පත් කරන්න බැරි වෙලා තිබෙනවා. අපි ඒ බව කැට කියලා කියා තිබෙනවා, මේ ආණ්ඩුවට. දැන් ජනතාවට තේරෙනවා මේ අසමත්කම. යුද්ධය තිබුණා නම්, යුද්ධයේ දුම්මාරය අස්සෙන් තමයි එය පෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුර පළාත් සභාවේ බලය ගත්තා, විග්නේෂ්වරන් මහත්මයා. එතුමා අඩුම ගණනේ, තමන්ට හම්බ වන සල්ලි ටිකවත් වියදම් කරනවාද? ඊට වඩා වැඩි බලතල ගන්න, ෆෙඩරල් ක්‍රමයක් ගන්න සටන් කරන එක වෙනම පැත්තක්. ඒක එතුමන්ලාගේ අයිතිය නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි. එතුමා තමන්ට ලැබෙන සල්ලි ටිකෙන් වැඩ කරනවාද? මිනිහෙකුගේ මළ ගෙදරකට, මඟුල් ගෙදරකට යනවාද? මනුෂ්‍යයකුගේ ඇත්ත ප්‍රශ්නයකට මැදිහත් වනවාද? එහෙම කරන්නේ නැහැ. ඒක තමයි ඇත්ත. ඒ නිසා අද උතුරේ ජනතාවටත් පෙනෙනවා, මහා බලතල ඉල්ලුවාට, තිබෙන බලතල ටිකෙන්වත් වැඩක් කරන්නේ නැහැ කියන එක. එහෙම නම් දැන් ජාතික සංහිඳියාව හදාගන්න ඕනෑ කාටද? ජාතික සංහිඳියාව හදාගන්න ඕනෑ මේ රටේ සාමාන්‍ය ජනතාවටයි. මේ පාලකයන්ට ඒක ඕනෑ නැහැ. පාලකයන්ට හරිම ලේසියි, ජාතිවාදී යුද්ධයක් ඇති වුණාම ඒක එහෙට මෙහෙට කළමනාකරණය කර කර ඉන්න. තනි තනි ඇමතිවරුන් ගැන නොවෙයි මා කියන්නේ. පාලක කණ්ඩායමක් හැටියට ගත්තාට පසුව යුද්ධය විතර, ජාතිවාදය විතර පහසුවෙන් කළමනාකරණය කළ හැකි වෙනත් දෙයක් නැහැ. ඒ නිසා තමයි අපි පැහැදිලිව කියන්නේ, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතට හමුදාව සම්බන්ධ කරලා ඉදිරිපත්

කරන මතය වැරැදියි කියා. හමුදාවක් නීතියට අනුව කටයුතු කර තිබුණා නම් ඒ හමුදාවට මේ පනතෙන් බාධාවක් නැහැ කියන එක අපි විශ්වාස කරනවා. අපට ඒක තේරෙනවා. නමුත් එය හමුදාවට විශාල ප්‍රශ්නයක් වශයෙන් සමහරු මතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජාතිවාදය මතු කරන හැම කණ්ඩායමකම උත්සාහය මොකක්ද? ඔවුන් ත්‍රිවිධ හමුදාවේ කොඩියට මුවා වෙලා තමන්ගේ හොරකම් ටික වසා ගන්නත්, තමන්ගේ ඊළඟ ජන්ද ව්‍යාපෘතිය ත්‍රිවිධ හමුදාව මුල් කරගෙන හදන්නත් පටන් ගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරේ ජාතිවාදයත්, දකුණේ ජාතිවාදයත් නිවුන් සහෝදරයන් වන බව අපි කියන්න කැමැතියි. දෙදෙනා කතා කරගෙන වැඩ කරනවා කියලායි අපට හිතෙන්නේ. රාජපක්ෂගේ පෙට්‍රල් ඉවර වන කොට විග්නේෂ්වරන් තෙල් ගහලා දෙනවා. විග්නේෂ්වරන්ගේ තෙල් ඉවර වන කොට රාජපක්ෂ තෙල් ගහලා දෙනවා. ඒ නිසා අපි ඉතා වගකීමෙන් කියනවා, මේ ජාතිවාදයන් දෙකම පරාජයට පත් කළ හැක්කේ සංහිඳියාව ඇති කිරීම සඳහා කරන්නා වූ ක්‍රියාකාරී මැදිහත් වීම මත බව. අපි ආණ්ඩුවට බල කර කියා සිටිනවා, ලංකාවේ අතුරුදහන් වීම් සම්බන්ධව සෙවීම ශ්‍රී ලංකා රාජ්‍යයේ වගකීමක් මිස, අඩු ගණනේ ලෝක සම්මුතියට හෝ අත්සන් කරපු නැති ඇමෙරිකන්කාරයන්ගේ, ඇමෙරිකන් ආණ්ඩුවේ හෝ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ වගකීමක් නොවෙයි කියලා. ඒ නිසා මේ ආයතනවලට කිසිම හේතුවක් නිසා විදේශිකයන් පත් කිරීම නොකළ යුතුයි. මොකද, ජනතාව තුළ බලවත් අවිශ්වාසයක් ඇති කර තිබෙනවා, මේ පනත පිළිබඳව දැන් ඇති වී තිබෙන සංවාදය හරහා.

මේ සංශෝධන නැවත ඉදිරිපත් කරන්න කියලා මා ඉල්ලා සිටින අතරම, උතුරේ ජාතිවාදය ප්‍රතික්ෂේප කරන ගමන් අද ත්‍රිවිධ හමුදා කොඩියෙන් තමන්ගේ වැරැදි ආවරණය කරගන්න හදන අය සම්බන්ධවත් කියන්න ඕනෑ. ඒ අය ඇත්තටම ඉන්නේ ත්‍රිවිධ හමුදාව එක්ක නොවෙයි. මා ඊයේ රූපවාහිනියේ පැවැති සාකච්ඡාවකට ගියා. රාජපක්ෂ මහත්මයාගේ කණ්ඩායමේ මන්ත්‍රීතුමෙක් එහිදී කිව්වා, ඒ අය ත්‍රිවිධ හමුදාවත් සමඟයි නැති සිටින්නේ කියලා. 2009දී ත්‍රිවිධ හමුදාව එක්ක සිටියේ නැති අය දැන් ත්‍රිවිධ හමුදාවත් එක්ක ඉන්න ඕනෑ කියලා කියනවා. අපි කියනවා, මේ අය ඉන්නේ ත්‍රිවිධ හමුදාවත් එක්ක නොවෙයි, ත්‍රිවිධ හමුදාව ලවා බල්ලන් නාවපු කට්ටියත් එක්කයි කියලා.

මා ළඟ තිබෙනවා, "රාවය" පුවත් පතේ පළ වූ "බැසිල්ගේ බල්ලන් නෑවූ, පුෂ්පාගේ සාරි කට්ට ගැසූ රණ විරුවන්ගේ කථාව" කියන ශීර්ෂය සහිත ලිපියක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ලිපිය පළ වූ පුවත් පත් පිටුව මම **සභාගත*** කරනවා.

මේ කියන අය -මේ සුළු කල්ලිය- ඇත්තටම ඉන්නේ ත්‍රිවිධ හමුදාවට ආදරයෙන්ද? රාජපක්ෂ මහත්මයා 2005දී ජන්දය දිනන්න එල්ටීටීඊ සංවිධානයට සල්ලි දුන්නේ නැද්ද? දුන්නා. බලය ලබා ගන්න ඕනෑ නිසා 2002 වසරේදී එල්ටීටීඊ එකත් එක්ක රනිල් වික්‍රමසිංහ මහත්මයා හොරෙන් ගිවිසුමක් ගැහුවේ නැද්ද? ගැහුවා. එහෙම තමයි මේ ගොල්ලන්. බලය ගන්න රට බෙදන්නයි ලැහැස්තිය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙකත් අහනවා. මොන පාලකයාද හමුදාව පාවා දෙන්න උත්සාහ කරන්නේ, තමන්ට බලය තිබෙන වෙලාවේ? හැම පාලකයාම තමන්ගේ අතට හමුදාව ගන්නවා. මේ ගොල්ලන් පාවා දෙන්නේ මොනවාද? පාවා දෙන්නේ රටේ ආර්ථිකය, රටේ ජනතාව. කවුරු හරි අද තර්කයක් ඉදිරිපත් කරනවා නම් හමුදාව පාවා දෙනවා කියලා, ඒක වැරදියි. හමුදාව පාවා දෙන්න මේ පාලකයන්ට වුවමනාවක් තිබෙනවා කියලා අපි නම් හිතන්නේ නැහැ. පාලකයන්ට එහෙම උවමනාවක් ඇති වන්නේ නැහැ.

ගරු මංගල සමරවීර විදේශ කටයුතු ඇමතිතුමා ගිහිල්ලා පැමිණිල්ලක් දැම්මා, 2015 ජනවාරි 08 වනදා හමුදා කුමන්ත්‍රණයක් සිදු වෙන්න තිබුණාය, ඒක පරීක්ෂා කරන්නය කියලා. පරීක්ෂා කරනවාද? අපි හොඳටම දන්නවා, fully fledged rehearsal කරපු හමුදා කුමන්ත්‍රණයක් 2015 ජනවාරි 08 වනදා ක්‍රියාත්මක වෙන්න තිබුණු බව. ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. ඒක වෙනම කාරණයක්. තමන්ගේ ජනාධිපති ධුරය වළක්වන්න හමුදා කුමන්ත්‍රණයක් සැලසුම් කරපු හමුදා නිලධාරීන් ගැන හොයන්නවත් උවමනාවක් නැති ජනාධිපති කෙනෙකුටයි, අගමැති කෙනෙකුටයි විශේෂයෙන් හමුදාවක් පාවා දීම සඳහා දැන් උවමනාවක් තිබෙවිද? අපි නම් එහෙම හිතන්නේ නැහැ. හමුදාව නොවෙයි මේ පාවා දෙන්නේ. මේ පාලකයෝ පාවා දුන්නොත් පාවා දෙන්නේ, මේ රටයි, රටේ ස්වෛරීත්වයයි, රටේ ජනතාවයි. "එටිකා ගිවිසුම" කියන්නේ රටේ ආර්ථික ස්වෛරීත්වය පාවා දීමක්. අවසානයේදී මිනිස්සු හමුදාව දිහා බලා ගෙන ඉඳීවි, පාලකයෝ වැටුපත් වැඩි කරලා දීලා හමුදාව තව ළං කර ගනීවි. එහෙම නැත්නම් රට නන්නත්තාර වෙලා තිබෙද්දී airforce එකට planes ගන්න යන්නේ මොකටද? ඉන්දියාවට ගහන්නද? මාලදිවයිනට ගහන්නද? ආරක්ෂක හමුදාවලට අවශ්‍ය කරන උපකරණ ගත්තාට කමක් නැහැ. Planes අටක් එක පාර ගන්න යනවා. රට නන්නත්තාර වෙලා, ණය ගෙවා ගන්න සල්ලි නැහැ.

මම අවසාන වශයෙන් මේ කාරණය කියන්න කැමැතියි. අපේ රටේ ජනතාවටයි සංහිඳියාවේ අවශ්‍යතාව තිබෙන්නේ. ඒ නිසා අපි ආණ්ඩුවට බලකර කියා සිටිනවා, සත්‍ය ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් ආරම්භ කරන්න, ඒ ක්‍රියාවලිය ඇතුළේ සිංහල වේවා, දෙමළ වේවා, ජාතිවාදය තුළින් තම තමන්ට සිදු වුණු හානි ගැන සද්භාවයෙන් කියන්න මිනිසුන්ට ඉඩ දෙන්න, එතකොට මේ ප්‍රශ්නය පිළිබඳව ජනතාවට අවබෝධයක් ලැබෙයි කියලා. ඒක තමයි අපි දකින විසඳුම, සංහිඳියාව ගොඩ නැඟීමේ යම් ආරම්භයක් විධියට. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

ඊට පෙර මූලාසනය සඳහා ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේදී ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 3.21]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

2016 ජූනි 10වන දින පළ කරන ලද ගැසට් පත්‍රයේ සඳහන් වන පරිදි උතුරු හා නැගෙනහිර පළාත්වල සිදු වූ ගැටුම් හෝ එම ගැටුම්වලට පසුව දේශපාලන නොසන්සුන්තාව හෝ සිවිල් කැරලි කෝලාහල හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන් වී ඇති බවට වාර්තා කර ඇති තැනැත්තන් හෝ ක්‍රියාන්විතයේ දී අතුරුදහන් වූ ලෙස හඳුනාගෙන ඇති සන්නද්ධ හමුදාවල හෝ පොලිසියේ සාමාජිකයන් හෝ ලියාපදිංචි කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලසීම තමයි මෙම පනත් කෙටුම්පතේ අරමුණ වන්නේ. පසු ගිය රජය සමයේ විවිධ රාජ්‍ය ත්‍රස්තවාදීන් විසින් අතුරුදහන් කරන්නට යෙදුණු මාධ්‍යවේදීන් ඇතුළු අදාළ පිරිස්වලටත් මෙයින් සාධාරණයක් ඉටු වන බව මාගේ පෞද්ගලික විශ්වාසයයි. අතුරුදහන් වූවන්ගේ මෙම ගැටලු සඳහා දීර්ඝ කාලයක් ජනතාව විසඳුම් ඉල්ලා සිටියා. 1995 වසරේදී ඒ සම්බන්ධයෙන් පළමුවන පනත ඉදිරිපත් වුණා. හැබැයි ඒ පනතෙන් ඉලක්කගත වූ විසඳුම් නොලැබීම තුළ 2010 වන විට ඉදිරිපත් වුණු පනත තවදුරටත් සංශෝධනය කරලා, ඒ පනතේ තිබුණු වැරදි නිවැරදි කිරීම සහ එම පනත ශක්තිමත් කිරීම මේ පනත් කෙටුම්පත සම්මත වීම තුළින් සිදු වෙනවා. අතුරුදහන් වූ අයෙක් සඳහා මරණ සහතිකයක් ලබා දීම යම් දිස්ත්‍රික් ලේකම්වරයෙකු ප්‍රතික්ෂේප කළොත්, මාසයක් ඇතුළත රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට අභියාචනයක් ඉදිරිපත් කර මරණ සහතිකය ලබා ගැනීමේ හැකියාව හෝ මරණ සහතිකය ලබා නොදීම සම්බන්ධයෙන් අධිකරණයට යොමු වීමේ හැකියාව මේ මඟින් අගතියට පත් වූ පාර්ශ්වයට ලැබෙනවා.

පුද්ගලයෙකු අතුරුදහන් වී වර්ෂයකට පසු "දක්නට නොමැති බවට වූ සහතිකය" ලබා ගැනීමට මේ තුළින් හැකි වනවා. එසේ "දක්නට නොමැති බවට වූ සහතිකය" ලබා දීමේදී විශේෂයෙන්ම ග්‍රාම නිලධාරිවරයාගේ වාර්තාවත් අවශ්‍ය වෙනවා. ග්‍රාම නිලධාරිවරයාගේ වාර්තාව පසු බිම් කරගෙන දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් "දක්නට නොමැති බවට වූ සහතිකය" ලබා දීමේදී ඊට පෙර සති දෙකක් ග්‍රාම නිලධාරිවරයාගේ වාර්තාව ප්‍රදර්ශනය කිරීමත් සිදු කළ යුතුයි. ඒ වාගේම මීට අමතරව එම "දක්නට නොමැති බවට වූ සහතිකය" නිකුත් කිරීම සම්බන්ධයෙන් යමෙකු විරෝධය පළ කරනවා නම් එසේ කිරීමටත් හැකියාව ලබා දෙනවා. එවැනි අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්වරයාට හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ඉල්ලුම් පාර්ශ්වය සහ විරෝධය පළ කරන පාර්ශ්වය කියන දෙපාර්ශ්වයම ගෙන්වා ඒ සම්බන්ධයෙන් විභාගයක් පවත්වා තීරණයක් ගැනීමේ අවකාශයත් මේ මඟින් සලසා දී තිබෙනවා. ඒ වාගේම දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමකදී ඒ සම්බන්ධයෙන් ඕනෑම කෙනෙකුට අධිකරණයට යෑමේ හැකියාවත් යහ පාලන ආණ්ඩුවෙන් ලබා දී තිබෙනවා. ඒ අනුව විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරනවා කියන එකත් මුළු ලෝකයටම තහවුරු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ මෙම විවාදයට සම්බන්ධ වුණු විවිධ පක්ෂවල මන්ත්‍රීවරුන් විවිධ අදහස් පළ කළා. සමහර අය විශේෂයෙන්ම අද මේ විවාදය සලකන්නේ, මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත දෙ වන වර කියැවීම සම්බන්ධයෙන් පවත්වන විවාදය වශයෙන් නොවෙයි, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ විවාදයක් වශයෙනුයි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත දෙ වන වර කියැවීමේ විවාද පසු ගිය දිනක පැවැත් වූවා. එදා මේ සභා ගැබේ වළට බැහැලා කෑ ගහලා, ඒ කාලය සම්පූර්ණයෙන් විනාශ කරපු අයට අද මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව විවාදය පැවැත්වෙන මේ මොහොතේ තමයි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත ගැන කථා කරන්න මතක් වෙලා තිබෙන්නේ. ඒකත් හොඳයි. තමුන් කරපු වැරදි දැන්වත් තේරෙනවා නම් හොඳයි. ඔවුන් හිතුවා, මෙතැන වළට බැහැලා කෑ ගැහුවාම පනත් කෙටුම්පත් සම්මත කරන එක නවත්වන්න පුළුවන් කියා. මෙතැනින් එහාටවත් ඒ ගොල්ලන් හැදෙනවා නම් හොඳයි.

අද පැවැත්වෙන මේ විවාදයට අදහස් දැක්වූ අම්පාර පැත්තේ එක් මන්ත්‍රීතුමෙක් ආර්ථිකය ගැන කිව්වා. ආර්ථිකය ගැන තමයි ඔවුන් කථා කරන්නේ. මොකද, ආර්ථිකය ගැන කථා කළාම, මේ විවාදයට එය අදාළ නොවුණත් ඒවාට උත්තර දෙන්න සිද්ධ වෙනවා. මේ ආර්ථිකය සම්බන්ධයෙන් ගැටලු තිබෙනවාලු; රැකියා නැති වෙලාලු; කර්මාන්ත වැසී ගිහින්ලු. අපි ඒ ගැන දන්නවා. ඒ නිසා තමයි විදේශීය වෙළෙඳ ගිවිසුම්වලට ගිහිල්ලා මේ රටට ආයෝජන ගෙනෙන්න හදන්නේ. මේ රටේ මුදල් නැති නිසා තමයි ආයෝජනය කරලා මේ රටේ දළ ජාතික නිෂ්පාදනය වැඩි කර ආදායම් ගෙනෙන්න හදන්නේ. රැකියා ලබා දෙන්න හදන්නේ ඒ හරහා තමයි. අහිමි වුණු GSP Plus ගෙනෙන්න හදන්නේ ඒ හරහා තමයි. ඒ වාගේම මත්ස්‍ය තහනම ඉවත් කර ගත්තේ ඒ අවශ්‍යතාව නිසා තමයි. යුරෝපා වෙළෙඳ පොළ වැටෙනකොට ආසියානු වෙළෙඳ පොළට අප යොමු වෙලා තිබෙන්නේ ඒ නිසා තමයි. ඒවා තේරුම් ගන්න හැකියාවක් තිබෙන්න ඕනෑ. හැම දාමත් කථා කළේ යුද්ධය ගැනයි. අන්තිමට යුද අපරාධ සම්බන්ධයෙන් මේ රටට එරෙහිව පනවා තිබුණු වාරණ ටික නවත්වා ගත්තේත් යහ පාලන ආණ්ඩුවෙන්. කලින් අය කළේ, කෑ ගහලා-කෑ ගහලා, වණ්ඩි පාට දාලා නියමිත කාලයටත් අවුරුදු දෙකකට කලින් ආණ්ඩුව විසුරුවා හැර ගෙදර ගිය එකයි. ආණ්ඩුව විසිරුවා හැරියොත් දිනන්න පුළුවන් වෙයි කියා හිතුවා. නමුත් ගෙදර යන්න වුණා. එහෙම තමයි වුණේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් මීට වඩා විවෘත මනසකින් යුතුව කථා කරනවා නම් හොඳයි කියා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී, ගරු බිමල් රත්නායක මහතා 2002 වර්ෂයේ අත්සන් කළ ගිවිසුමක් ගැන සඳහන් කළා. 2005 ජනාධිපතිවරණයේදී මුදල් දීපු එක ගැන අපි හැමෝම දන්නවා. හැබැයි, 2002 ගිවිසුම ගැන යම් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. එම අවබෝධතා ගිවිසුම අත්සන් කළා. ඒකෙන් පසුව මොකක්ද වුණේ? එල්ටීටීඊ සංවිධානය දෙකට කැඩුණා. කරුණා එල්ටීටීඊ සංවිධානයෙන් වෙන් වෙලා ආණ්ඩුවත් එක්ක එකතු වුණා. කරුණාගෙන් ලැබුණු සහයෝගයත් එක්ක තමයි එල්ටීටීඊ සංවිධානයට පහර දුන්නේ. ඒ පසුබිම තුළ සිටිමින් තමයි එදා ඇන්ටන් බාලසිංහම් එංගලන්තයට ගිහින් ප්‍රකාශයක් කළේ, "රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ගිවිසුමට අප රැවටුණා." කියා. ඉතින් මේවා හංගලා තවදුරටත් කථා කරනවා නම් එසේ කථා කරන්නේ කටින්ද, නැත්නම් වෙන කොහෙන්වත්ද කියා මා නම් දන්නේ නැහැ. ඒ සම්බන්ධව අප කනගාටු වෙනවා.

මේ වාගේ රටක් දියුණු කරන්න ඇහේ හයිය තිබුණාට මදි. කථා කරන්න හැකියාව තිබුණාට මදි. ඒ සඳහා තියුණු බුද්ධියක් තිබෙන්න ඕනෑ. ජාත්‍යන්තර ප්‍රශ්නයක් තුළට රිංගා ගන්න ඒ හැකියාව තිබෙන්න ඕනෑ. ජාත්‍යන්තර ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තියුණු ඇසකින් බලා ඒකට විකල්ප ක්‍රියාමාර්ග ගන්නා ක්‍රමවේද ගැන හිතන්න පුළුවන් වෙන්න ඕනෑ. එහෙම නැතුව කෑ ගැසුවාට වැඩක් නැහැ. අන්තිමට සුරුට්ටු කඩයක්වත් කර ගන්න බැරි තත්ත්වයට පත් වෙනවා. මරණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධ කල්ලියේ කට්ටිය අද බොහොම හිතේ අමාරුවෙනුයි කථා කරන්නේ. හැබැයි, මේ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පතින් සහන සැලසෙන්නේ යුද්ධය නිසා අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් විතරක් නොවෙයි.

සුනාමියෙන් අතුරුදහන් වූවන් සම්බන්ධයෙනුත් සහන සැලසෙනවා. එදා 2004 සුනාමිය ආවාට පස්සේ සුනාමියෙන් අතුරුදහන් වූවන් ගැන කිසිම හැඟීමක් තිබුණේ නැහැ. එදා හැඟීමක් තිබුණා, "Helping Hambantota" සල්ලි ගැන. එතකොට එහෙමයි. දැන් මෙහෙමයි. මේවා, අපි මතක් කරලා දෙන්න ඕනෑ. මෙච්චර කැක්කුමක් තිබුණා නම් "Helping Hambantota" සල්ලි ගැන නොවෙයි අවධානය යොමු කරන්න තිබුණේ, සුනාමියෙන් පස්සේ අතුරුදහන් වුණු මිනිස්සු ගැනයි. සුනාමියෙන් 50,000කට ආසන්න ප්‍රමාණයකගේ ජීවිත අහිමි වුණා. ඒ උදවිය ගැන හිතන්න තිබුණා. හැබැයි, එදා එහෙම හිතුවේ නැහැ. මොකක් හරි එකක එල්ලිලා ඡන්දය දිනන්න පුළුවන්ද, ආණ්ඩුව පෙරළන්න පුළුවන්ද කියලා බලනවා වාගේ, කකුල් ගෙවෙන කල් පාද යාත්‍රා ගියා වාගේ -අන්තිමට කාල යාත්‍රා තමයි කර ගත්තේ.- මේකෙත් එල්ලිලා මොකක් හරි කර ගන්න පුළුවන්ද කියලා බලනවා.

අපේ හිටපු නායකයෝ පසු ගිය කාලයේ විශේෂයෙන්ම හමුදාවේ අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් ප්‍රශ්න කළාම, විවිධ උත්තර දුන්නා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
සමහර අවස්ථාවලදී කිව්වා, "ගැනියෙක් එක්ක පැනලා යන්න ඇති" කියලා. මෙහෙම තමයි යුද්ධ කරන්න ගිය රණවිරුවෝ අතුරුදහන් වුණාම හමුදාව ගැන හදපත්ලෙන්ම කථා කරන නායකයන් උත්තර දුන්නේ. "ගැනියෙක් එක්ක පැනලා යන්න ඇති" කියලා කියනවා. ගැනුත් එක්ක පැනලා යන්න හමුදාවට යන්න ඕනෑ ද? ඔය ගැනුත් එක්ක පැනලා ගිය ඔක්කෝම කට්ටිය පැනලා ගියේ හමුදාවට ගිහිල්ලාද? ඒ කාලයේ ඒ වාගේ වැඩ කරපු අය ගැන අපි දන්නවා නේ. නම් කියලා කියන්න හොඳ නැති නිසා කියන්නේ නැහැ.

ගැනුත් එක්ක පැනලා ගිය කට්ටිය ගැන අපි දන්නවා. ඒ නිසා මේ වාගේ පහත් විධියට දේශපාලන වාසි ලබා ගන්න ත්‍රිවිධ හමුදාවට, සුනාමියෙන් අවතැන් වූවන්ට ඒ වාගේම විවිධ හේතූන් මත අතුරුදහන් වූවන්ට ගරහපු පාලනයකුයි මේ රටේ මීට කලින් තිබුණේ. ඒ සදාචාර නොවන පාලනය වෙනස් කරලා තමයි අපි ජනවාරි 8වැනි දා මේ රටට ජනාධිපතිවරයෙක් පත් කර ගත්තේ. ඊට පස්සේ තමයි අපි අගෝස්තු 17වැනි දා යහ පාලන ආණ්ඩුව ස්ථාපනය කළේ. ඒ නිසා මේ ආණ්ඩුවත් එක්ක ඉදිරියට යනවා විනා මේ රටේ වෙන කිසිම විකල්පයක් නැහැ කියන එක ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[பி.ப. 3.30]

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - புனர்வாழ்வளிப்பு மற்றும் மீள்குடியேற்ற இராஜாங்க அமைச்சர்)
(The Hon. M.L.A.M. Hizbullah - State Minister of Rehabilitation and Resettlement)

பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இறப்புக்களின் பதிவு (தற்காலிக ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம் மீதான விவாதத்திலே கலந்துகொள்வதில் நான் மிகவும் மகிழ்ச்சியடைகின்றேன். கௌரவ அமைச்சரும் எனது மரியாதைக்குரிய நண்பருமான மங்கள சமரவீர அவர்கள் காணாமற்போனவர்கள் தொடர்பிலே உறுதியான ஒரு தீர்மானம் எடுக்கப்பட வேண்டுமென்று எடுத்திருக்கின்ற இந்த முயற்சிக்கு அவரை நான் வெகுவாகப் பாராட்டுகின்றேன். கடந்த யுத்த காலங்களில் பல்லாயிரக்கணக்கானவர்கள் கடத்தப்பட்டிருக்கிறார்கள்; காணாமற்போயிருக்கிறார்கள். இதுவரையில் அவர்கள் தொடர்பில் எந்த விசாரணைகளும் மேற்கொள்ளப்படவில்லை; அதுபற்றிய எந்தவிதமான தீர்மானங்களும் எடுக்கப் படவில்லை; எதுவித நட்டஈடுகளோ, கொடுப்பனவுகளோ வழங்கப்படவில்லை. அவ்வாறான ஆயிரக்கணக்கான குடும்பங்களைச் சேர்ந்தவர்கள் தங்களுடைய சகோதரர்களை, கணவன்மாரை, மனைவிமாரை, தகப்பன்மாரை, தாய்மாரை, உறவினர்களை இழந்து, அவர் இன்று வருவார், நாளை வருவார் என்ற நம்பிக்கையோடுதான் இன்னமும் வாழ்ந்துகொண்டிருக்கிறார்கள்.

ஏறாவூர் அலிஹார் முஸ்லிம் வித்தியாலய principal யூ.எல். தாவூத் சேர் கடத்தப்படார்; ஓட்டமாவடி பிரதேச சபையின் Chairman புஹாரி விதானை கடத்தப்பட்டார்; புனிதமான ஹஜ் பயணத்தை முடித்துவிட்டு ஊருக்குத் திரும்பிய காத்தான்குடியைச் சேர்ந்த 150க்கு மேற்பட்டோர் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள குருக்கள்மடத்தில் வைத்துக் கடத்தப்பட்டார்கள். இன்னமும் அவர்கள் இருக்கின்றார்களா? அவர்களுக்கு என்ன நடந்தது? என்பன தொடர்பாக எந்தவிதமான ஆதாரங்களும் இல்லாமல் அவர்களின் குடும்பத்தினர் தவித்துக்கொண்டிருக்கிறார்கள். இதுபோன்று, வடக்கு, கிழக்கு மாகாணங்களிலும் அதற்கு வெளியிலும் சிங்கள, தமிழ், முஸ்லிம் ஆகிய மூன்று சமூகங்களைச் சேர்ந்த ஆயிரக்கணக்கானவர்கள் - தங்களுடைய பிள்ளைகளை எதிர்பார்த்துக்கொண்டு பெற்றோரும் கணவன்மாரை எதிர்பார்த்துக்கொண்டு மனைவிமாரும் தந்தையைப் பார்த்துக்கொண்டு குழந்தைகளும் - ஒவ்வொருநாளும் ஏங்கியேங்கி அழுகின்ற சூழ்நிலையிலே இருக்கிறார்கள். ஆகவே, இவர்கள் தொடர்பில் அரசாங்கம் உடனடியாக நடவடிக்கையெடுக்க வேண்டும். வெறுமனே சட்டமூலங் களையும் திருத்தங்களையும் மாத்திரம் கொண்டுவருவதன் மூலம் இந்தப் பிரச்சினைக்குத் தீர்வுகாண முடியாது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இவர்களுக்கான உரிய நட்டஈடுகள் உடனடியாக வழங்கப்பட வேண்டும். இது தொடர்பில் அரசாங்கம் உறுதியான தீர்மானங்களை எடுக்கவேண்டும். ஓர் உறுதியான தீர்மானத்தை எடுத்து இவர்களுக்கான மரணச் சான்றிதழ்களை வழங்க வேண்டும்; அல்லது அதற்கான அத்தாட்சிகளைக்

[ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා]

කොடுக்க வேண்டும். யுத்தத்திலே சொத்துக்களை இழந்த, யுத்தத்திலே மரணித்த பல்லாயிரக் கணக்கானவர்களுக்கான நட்டஈடுகள் இன்னமும் கொடுக்கப்படவில்லை. விதவைகளாக்கப்பட்ட பலர் பல்வேறுபட்ட துன்பதுயரங்களோடு வாழ்ந்துகொண்டிருக்கின்றார்கள். ஒரு குறுகிய காலத்திற்குள்ளே சட்டமூலத்தை நிறைவேற்றுவதன்மூலம் அல்லது திருத்தங்களைக் கொண்டுவருவதன்மூலம் பிரச்சினைகளுக்குத் தீர்வுகாண முடியாது. பிரச்சினைகளுக்கு நிரந்தரத்தீர்வு காணப்படவேண்டும். ஏனென்றால், இன்று வெளிநாட்டுப் பிரமுகர்கள் எவர் வந்தாலும் காணாமற் போனோரது குடும்பங்கள் வீதிகளிலே இறங்கி ஆர்ப்பாட்டங்களைச் செய்கின்ற வேதனையான காலம் தொடர்கின்றது. அவர்களுடைய வேதனைகளை, கண்ணீரைப் பார்க்கின்றபோது நாங்களும் கண்ணீர் விட்டழுகின்றோம். சகோதரர்களை, உறவினர்களை இழந்து தவிக்கின்ற அவ்வாறான ஏழைக் குடும்பங்களுக்குச் சரியான ஒரு நிவாரணத்தைக் கொடுக்கவேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகம் தொடர்பான சட்டமூலத்தின் பிரகாரம் இவர்களுக்கான காரியாலயம் அமைக்கப்படுகின்ற அதேநேரம், இந்தச் சட்டமூலமும் திருத்தப்படுகிறது. எனவே, அரசாங்கம் உரிய கவனம் செலுத்தி இவர்களுக்குரிய சான்றிதழ்களை உடனடியாக வழங்க வேண்டும். இதற்கென ஒரு குறிப்பிட்ட காலவரையறை இருத்தல் வேண்டும். இந்தத் திருத்தச் சட்டத்திலே அது குறிப்பிடப்படவில்லை. ஆகவே, வருடக்கணக்கிலே இதை இழுத்துக்கொண்டு போகமுடியாது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே, காணாமற்போனவர்கள், இடம் பெயர்ந்தவர்கள் மற்றும் மரணித்தவர்கள் தொடர்பிலே சான்றிதழ்கள் உரிய காலத்திற்குள் வழங்கப்படவேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
உங்களுக்கு இன்னும் ஒரு நிமிடமிருக்கின்றது.

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)
I will wind up within one minute, Sir.

ஆகவே, ஒரு குறிப்பிட்ட காலத்திற்குள் - யுத்தம் தொடங்கிய காலம் முதல் இதுவரையிலே - காணாமற்போன அத்தனை பேருக்கும் மரணச்சான்றிதழ் வழங்கப்படவேண்டும். அவர்களுக்குரிய நட்டஈடுகளை அரசாங்கம் உடனடியாக வழங்கவேண்டும். காணாமற்போனோரின் குடும்பங்களுக்கு வாழ்வாதாரத்துக்கான வசதி வாய்ப்புக்களைச் செய்யவேண்டும்; அவர்களுடைய குடும்பங்களுக்கு வீடுகளை அமைத்துக்கொடுக்கவேண்டும்; இவ்வாறான ஒரு விசேட வேலைத்திட்டத்தில் ஐக்கிய நாடுகள் சபை தலையிட்டிருக்கின்றது. இதற்குத் தேவையான நிதியை வழங்குவதற்கு ஐக்கிய நாடுகள் சபை முன்வந்திருக்கின்றது. எனவே, அந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்தி இந்தப் பிரச்சினைக்குத் தீர்வு காணப்பட வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

வஸ்ஸலாம்.

[பி.ப. 3.36]

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இறப்புக்களின் பதிவு (தற்காலிக ஏற்பாடுகள்) திருத்தச் சட்டம் தொடர்பான இன்றைய விவாதத்திலே கலந்துகொண்டு கருத்துக்களை முன்வைக்கும் வாய்ப்புக் கிடைத்திருக்கின்றது. கடந்த வாரம் நடைபெற்ற பாராளுமன்ற அமர்வின்போது காணாமற்போனோர் தொடர்பான அலுவலகம் அமைத்தல் சட்டமூலம் இங்கே கொண்டுவரப்பட்டுச் சட்டமாக்கப்பட்டது. காணாமற்போனோர் தொடர்பான அலுவலகம் அமைத்தல் சட்டமூலம் சம்பந்தமான விவாதத்திலே எங்களது கருத்துக்களை முன்வைக்க முடியாமற் போய்விட்டது. அதேவேளை இன்று கொண்டுவரப்பட்டுள்ள இந்தத் திருத்தச் சட்டமும் காணாமற்போனோர் தொடர்பான அலுவலகம் அமைத்தல் சட்டமும் பின்னிப்பிணைந்தவையாக இருக்கின்றன. அதன் காரணமாக நான் காணாமற்போனோர் தொடர்பான அலுவலகம் அமைத்தல் சட்டத்துக்குச் சில திருத்தங்களை இந்த உயரிய சபையிலே முன்வைத்து அவற்றை ஆவணப்படுத்த விரும்புகின்றேன். எனவே, நான் இங்கு முன்வைக்கும் திருத்தங்கள் அந்தச் சட்டத்திலே உள்ளடக்கப்படவேண்டுமென்று விநயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

அதில் முதலாவதாக, பலவந்தமாகக் காணாமலாக்கப்படுதல் ஒரு குற்றமெனச் சட்டத்தினால் உறுதிப்படுத்தப்படவேண்டும். "காணாமற்போனோர் தொடர்பான அலுவலகம்" என்பது "கடத்தல் மற்றும் காணாமற்போனோர் தொடர்பான அலுவலகம்" எனப் பெயர் மாற்றம் செய்யப்படவேண்டும். காணாமற்போனோர் தொடர்பான அலுவலகமானது, அதற்குக் கிடைக்கும் தகவல்களைப் பகிர்ந்துகொள்ளும் சூழல் ஏற்படுத்தப்பட வேண்டும். காணாமற்போனோரின் உறவினர்கள் மற்றும் குடும்பத்தினருக்குக் குறைந்தபட்சம் இரண்டு வருடத்திற்கொரு முறையாவது விசாரணைகளின் முன்னேற்றம் குறித்து அறிவிக்கப்பட வேண்டும். காணாமற்போனவர்கள் பற்றிய விசாரணைகள் பற்றிய அதிகபட்சத் தகவல்கள் அவர்களது குடும்பத்தினருக்குக் கிடைக்கக்கூடிய ஏற்பாடுகளைச் செய்ய வேண்டும். அரச மற்றும் அரச சார்பற்ற பயங்கரவாதங்களினால் காணாமல் ஆக்கப்பட்டோர் தொடர்பாகவும் குறித்த அலுவலகம் செயற்படல் வேண்டும்.

காணாமற்போனோர் அலுவலகம் புதிய விசாரணைகளை ஆரம்பிப்பதற்கு முன்பதாக தற்போது கிடைக்கப் பெற்றுள்ள ஆதாரங்களை ஆவணப்படுத்தல் வேண்டும்; காணாமற் போனோர் பற்றிய அலுவலகத்தில் அங்கத்தவர்களாகவோ அல்லது வேலையாட்களாகவோ யார் யார் இருக்கக்கூடாது என்பது தொடர்பான விளக்கம் அவசியம் வழங்கப்படல் வேண்டும். விசாரணைகளின் இரகசியத் தன்மை மற்றும் வெளிப்படைத் தன்மை பற்றித் தெளிவான விபரம் உள்வாங்கப்படல் வேண்டும். அரசியலமைப்புச் சபை பெற்றுக்கொண்ட மக்கள் கருத்தறியும் குழுவில் உள்வாங்கப்பட்ட பொறிமுறைகள் உள்வாங்கப்படல் வேண்டும். காணாமற்போனோரின் உறவினர்கள் மற்றும் குடும்பத்தினரின் கோரிக்கைகள் ஏற்றுக்கொள்ளப்படல் வேண்டும். உதாரணமாக அலுவலகம் அமைத்தல் தொடர்பாகக் கருத்தில் கொள்ளப்படல் வேண்டும். அலுவலகத்தின் செயற்பாடுகள் மும்மொழிகளிலும் இடம்பெறுவது உறுதிசெய்யப்படல் வேண்டும்.

பாதிக்கப்பட்டவர்களின் குடும்பம் விரும்பும் மொழியில் அவர்களது தகவல் கிடைக்குமாறு ஏற்பாடுகள் செய்யப்படல் வேண்டும். இந்த அலுவலகமானது, ஏற்கெனவே நீதிமன்றத்துக்குக் கொண்டுசெல்லப்பட்டு தீர்வு கிடைக்காத விடயங்கள் பற்றியும் விசாரணை நடத்தும் அதிகாரத்தைக் கொண்டதாக இருக்கவேண்டும். விசாரணையிலும் தகவல் சேகரிப்பதிலும் பால் மற்றும் இன அடிப்படை விடயங்கள் உள்வாங்கப்படல் வேண்டும். அலுவலகத்தின் உறுப்பினர்களின், பணியாளர்களின் செயற்பாடுகள் குறித்தொதுக்கப்பட்டதாக இருக்க வேண்டும்.

ஆகவே, இந்தச் சட்டமூலத்திலே நான் குறிப்பிட்ட திருத்தங்களை மேற்கொள்ள வேண்டும் என்று இந்த உயரிய சபையை விநயமாகக் கேட்டுக்கொள்கிறேன். அத்துடன், நான் முன்வைத்த கருத்துக்களை ஆவணப்படுத்தும்வகையில் அவற்றைச் சபாபீடத்தில் *சமர்ப்பித்து, சந்தர்ப்பம் அளித்த தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ඊළඟට, ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා.

[අ.භා. 3.41]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත දෙවනවර කියැවීමේ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ පක්ෂ, විපක්ෂ මන්ත්‍රීතුමන්ලා විසින් විවිධ අදහස් ගරු සභාව හමුවේ තබන්නට යෙදුණා. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතේ තවත් විකාශනයක් හැටියට මේ සංශෝධන පනත් කෙටුම්පත අප හඳුන්වනවා.

මෙතැනදී කථා කළ සමහර ගරු මන්ත්‍රීතුමන්ලා "ඒකාබද්ධ කල්ලිය" වැනි විවිධ නම් උපයෝගි කර ගනිමින් තමන්ට හුරු-පුරුදු පහත් භාෂාවෙන් කථා කරන්නට උත්සාහ කළා. "ඒකාබද්ධ කල්ලිය" කියා අපට අත දිගු කරන අයට අප කියන්නට ඕනෑ, අනෙක් පැත්තට "වික්‍රමසිංහ කල්ලිය" කියලාත් අපට කියන්නට වෙනවාය කියන එක. "යූඇන්පී කල්ලිය" කියාත් අප ලවා කියවා ගන්නට එපා. පාර්ලිමේන්තුව තුළ කථා කිරීමේදී දේශපාලන වේදිකාවේ භාවිත කරන වචන පාර්ලිමේන්තුව තුළත් භාවිත කිරීම ඒ තරම් හොඳ දෙයක් නොවෙයි. කොහොම නමුත්, මේ පනත ගෙන ඒම තුළ අතුරුදහන් වූ සිංහල තරුණයන්ට හෝ දෙමළ තරුණයන්ට හෝ මුස්ලිම් තරුණයන්ට- ජනතාවට- මරණ සහතිකයක් ලබා දීම පිළිබඳව කිසිම කෙනෙකුට විරුද්ධ වෙන්නට බැහැ. ඒ සඳහා අප විරුද්ධ වෙන්නේත් නැහැ. කෙනෙකුට තමන්ගේ දරුවා මැරුණාය කියා දැන ගත්තාම; තමන්ගේ ඥාතියා, පවුලේ සාමාජිකයා මැරුණාය කියා දැන ගත්තාම ඒ සම්බන්ධ මතකය කාලයක් යනකොට ඇත් වෙලා යන්නට පුළුවන්. "එයා මැරුණා, අපි අදහන ආගම අනුව ආගමික කටයුතු කළා, ඔහුගේ ඊළඟ ආත්මයවත් සුවපත් වේවා!" කියා හැම අවුරුද්දකම පින්කමක් කරන්නට පුළුවන්. හැබැයි, කෙනෙක් අතුරුදහන් වීම තුළ ඔහු ජීවතුන් අතර සිටිනවාය කියන මතය හැමදාම ඒ පවුලේ සාමාජිකයන් අතර තිබෙනවා. එම නිසා ඔවුන්ට මරණ සහතිකයක් ලබා දීම පිළිබඳව නැත්නම් අතුරුදහන් වුණාය කියා සහතිකයක් ලබා දීම ගැන අප කිසිම කෙනෙක් විරුද්ධ වෙන්නේ නැහැ. එම නිසා ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, මේ පිළිබඳව ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන අප දෙසට ඇඟිල්ල දික් කර ඒ සඳහා අප දැඩි ලෙස විරුද්ධ වෙනවාය කියන මතය සමාජගත කිරීමට අපි විරුද්ධයි කියන එක. එවන් අදහසක් අප තුළ කිසිසේත්ම නැහැ. හැබැයි, අද අපට ඇඟිලි දික් කරන අයට, දෙවැනි තරුණයෝ මැරුවාය, දෙවැනි ජනතාව අතුරුදහන් කළාය කියා චෝදනා කරන සමහර උදවියට, මේ රටේ දෙවැනි ත්‍රස්තවාදය නැත්නම් බෙදුම්වාදී යුද්ධය ඇති වීමට මුල් වූ, හේතුභූත වූ කරුණු අමතක වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මතකයි, 1978 වර්ෂයේ මේ රටේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට පත්වෙලා මුලින්ම කළේ මොකක්ද කියලා. අපේ නගරවල සිටි දුම්කොළ විකුණූ දෙවැනි ව්‍යාපාරිකයාව, බුලත් විකුණූ දෙවැනි ව්‍යාපාරිකයාව, යකඩ විකුණූ දෙවැනි ව්‍යාපාරිකයාව පමණක් නොවෙයි, පාරේ සිහමන් යැද්ද දෙවැනි යදින්නන් පවා එදා මරලා පුච්චලා දැම්මා. එදා ආණ්ඩුව නිහඬ වුණා.1982 වර්ෂයේදී සංවර්ධන සභා මැතිවරණය ආවා. ඒ සංවර්ධන සභා මැතිවරණ කාලසීමාව වෙනකොට - මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ සමහරෙකුගේ අනුදැනුම මත දකුණෙන් ගිහින් යාපනයේ පුස්තකාලය ගිනි තබා එනකොට දෙවැනි ජනතාවගේ හදවතට ගිනි තිබ්බා වාගේ වේදනාවක් ඒ අය තුළ ඇති වුණා. සංවර්ධන සභා මැතිවරණයේදී දකුණෙන් උතුරට මැරයෝ කෝච්චියේ නැඟලා ගිහින් සංවර්ධන සභා ඡන්ද පෙට්ටි අලියා ලකුණෙන් පිරෙව්වා. එහෙම කරලා සංවර්ධන සභා ඡන්දය මංකොල්ල කෑවා. දෙවැනි තරුණයන්ට ප්‍රජාතන්ත්‍රවාදය ගැන තිබුණු විශ්වාසය බිඳ වැටුණා. ඊට පස්සේ අසූතුනේ කළු ජූලිය ආවා. අසූ තුනේ කළු ජූලිය වෙලාවේ- අද මේ දෙවැනි ජනතාවට මරණ සහතික දෙන්න කථා කරන කට්ටිය, අප නියෝජනය කරන පළාත්වල-රත්නපුරය, කහවත්ත, ගොඩකවෙල, රක්වාන වාගේ පළාත්වල-නිරායුධ අහිංසක මිනිස්සු අල්ලා ගෙනැවිත් අමු අමුවේ ගිනි මැලවලට දා පුච්චනවා අපේ ඇස් දෙකෙන් දැක්කා. ඒ ගැන එදා කථා කරන්නේ නැතිව හිටපු ආණ්ඩුව අද දෙවෙයේ සරදමකට මුහුණ දීලා තිබෙන්නේ. එදා තමුන්ගේ ආණ්ඩුව කාලයේ මරා දමපු දකුණේ හිටපු අහිංසක දෙවැනි වතු කම්කරු මිනිසුන්ටත් මරණ සහතික දෙන්න කියලා අද කියනවා. මේක, දෙවෙයේ සරදමක්.

ඉන් අනතුරුව උතුරේ තරුණයින් තුළ මතයක් ඇති වුණා, "ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ මේ රජයට අපට අභියෝගයක් එල්ල කරන්න බැහැ" කියලා. ඒ හින්දා ඔවුන් ආයුධ සන්නද්ධ වෙන්න පටන් ගත්තා. සයවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා, එදා මේ රටේ හිටපු නිල විපක්ෂය දෙවැනි ජනතා එක්සත් විමුක්ති පෙරමුණේ අමිර්තලිංගම් මැතිතුමා ඇතුළු කණ්ඩායම පාර්ලිමේන්තුවෙනුත් පලවා හැරියා. ඒ කණ්ඩායම පාර්ලිමේන්තුවෙනුත් පලවා හැරලා, ඒකපාර්ශ්විකව රට පාලනය කරන්න උත්සාහ කළා. බුර-බුරා නැහෙන ගිනි දැල්වලට පෙට්‍රල් දමනවා වාගේ එම උත්සාහයේ ප්‍රතිඵලයක් හැටියට ඒ තුළින් ජාතිවාදී, බෙදුම්වාදී යුද්ධය ඇති වුණා. එහි අවසාන ප්‍රතිඵලය වුණේ විශාල බෙදජනක තත්ත්වයක් රට තුළ නිර්මාණය වීමයි. ඒ බෙදජනක තත්ත්වයත් සමඟ ආරක්ෂක හමුදාවේ 27,000ක් සිය ජීවිත අහිමි කර ගත්තා; දෙවැනි, මුස්ලිම් සහ සිංහල ජනතාව ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් සිය ජීවිත අහිමි කර ගත්තා; දේපළ සියල්ල විනාශ වුණා; මුළු රටම ගිනි බත් වුණා. ශ්‍රී ලංකාවේ හටගත් බෙදුම්වාදී යුද්ධය අවසානයේදී, ජාත්‍යන්තරය දක්වා ඇදිලා ගියා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

මේක තමයි, කතාන්තරය. මේ කතාන්තරය ගැන කිසිම දෙයක් නොදන්නා ආකාරයට කථා කරන, පසු ගිය කාල සීමාව තුළ මේ රටේ ද්‍රවිඩ තරුණයන් අතුරුදහන් කළාය කියලා ලොකුවට කථා බහ කරන උදවිය මෙන්න මේ කාරණා ටික ගැනත් පොඩ්ඩක් හිතන්න ඕනෑ.

ඒ සමඟින් සුදු වැන් සංස්කෘතියක් ගැන කථා කරනවා. සුදු වැන්වලින් ගිහිල්ලා තරුණයන් අතුරුදහන් කළාය කියලා කියනවා. අද උදේ ලංකාවේ සියලුම ප්‍රවෘත්ති පත්‍ර වාර්තා කළා, මේ රටේ සිටි මුස්ලිම් ජාතික ව්‍යාපාරිකයෙක් වූ මොහොමඩ් සුලෙයිමාන් නමැති ව්‍යාපාරිකයා පැහැරගෙන ගිහිල්ලා මරලා, ඔහුගේ මිනිය මාවනැල්ල ප්‍රදේශයෙන් හමු වුණාය කියලා. මේ කාල වකවානුව ව්‍යාපාරිකයන්ට අමාරු කාලයක්; බොහොම අනතුරුදායක කාලයක්. මහ දවල් ව්‍යාපාරිකයන්ට වෙඩි තියලා මරා දමනවා; ඔවුන්ව මං කොල්ල කනවා. හැබැයි, පාතාලය මර්දනය කළාය කියනවා; නීතිය ක්‍රියාත්මක වෙනවාය කියා කියනවා. නීතිය ක්‍රියාත්මක කරනවාය කියන අපේ රටේ පොලිස්පතිවරයා කියනවා, "නීතිය නමනවා; අපට ඕනෑ විධියට හැඩ ගස්වනවා"ය කියලා. පොලිස්පතිවරයා එහෙම කියන කාල වකවානුව තුළ අපි එතුමාට කියනවා, "එහෙනම්, මරා දමපු මුස්ලිම් ජාතික මොහොමඩ් සුලෙයිමාන් නමැති කෝටිපති ව්‍යාපාරික මහත්තයාගේ මරණය ගැනත්, නැවුණු නීතිය දිග හරවලා හෝ එය තමාට ඇති අභියෝගයක් සේ සලකා හෝ කටයුතු කළ යුතුයි" කියලා. ඔහු ඒ වෙනුවෙන් කටයුතු කළ යුතුයි. මෙන්න, මේ කාරණා පිළිබඳව නැවත නැවතත් අපි සිතා බැලිය යුතුයි.

"විශාල ආර්ථික ශක්තියක් තිබෙනවා"ය කියලා මේ ආණ්ඩුව මොන තරම් කයිවාරු ගැහුවත්, පම්පෝරි ගැහුවත්, මේ වන තුරු සබරගමුව විශ්වවිද්‍යාලයේ සේවය කරන නිලධාරීන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු වැටුප් සඳහා වූ මුදල බැංකුවට යවලා නැහැ. අපේ ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාගෙන් මේ කාරණයට පිළිතුරක් බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන)පනත් කෙටුම්පතට මේ කාරණය අදාළ වෙන්නේ නැහැ. නමුත් ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්න නිසායි මම මේ කාරණය එතුමාගෙන් ඇහුවේ. ගරු ඇමතිතුමනි, සබරගමුව විශ්වවිද්‍යාලයේ නිලධාරීන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු වැටුප් සඳහා වෙක්පත් අද දවල් 12.00 වන තුරු බැංකුවට ගිහිල්ලා තිබුණේ නැහැ. මේවා කවදාවත් අපේ රටේ සිදු වුණේ නැති දේවල්. රටේ සල්ලි තිබෙනවා නම්, පිට රටින් ආධාර උපකාර කරනවා නම්, කිසිම ප්‍රශ්නයක් නැත්නම්, වැට බදු ගහලා රජයේ බදු ආදායම ඉහළ ගිහිල්ලා තිබෙනවා කියලා පම්පෝරි ගහනවා නම්, රජයේ සේවකයින්ගේ වැටුප 25වැනිදාට ගෙවා ගන්න බැරි තරමට ආණ්ඩුවට ප්‍රශ්නයක්, ගැටලුවක් මතුවෙලා තිබෙන්නේ ඇයි කියලා අපට දැනගැනීමේ අයිතියක් තිබෙනවා. මෙන්න, මේකයි සැබෑ තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා කරපු කථා මම දිගටම අහගෙන හිටියා. අපට ද්‍රවිඩ භාෂාව තේරෙන්නේ නැහැ. නමුත් අපි සිංහල පරිවර්තනයට ඇහුම්කන් දුන්නා. "මේ පනත ගෙන ඒම තුළින් සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්ථාපිත කිරීම තුළින් රණ විරුවන්ට, හමුදාවේ අයට දඬුවම් පැමිණවීමක් සිදු වෙන්නේ නැහැයි කියලා රජයේ වගකිව යුතු අය දිගින් දිගටම කියනවා. ජාත්‍යන්තරය සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධානය රවටන්නද, මෙවැනි පනත් කෙටුම්පත් ගෙනෙන්නේ? එහෙනම් මේ අයට වහාම දඬුවම් කළ යුතුයි" කියලා ආණ්ඩුවේ පාර්ශ්වකරුවෙකු වුණු දෙමළ ජාතික සන්ධානයේ සිවශක්ති ආනන්දන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. "අවුරුදු 15ක් තිස්සේ මමත් අවි දරා ගත් සංවිධානයක සාමාජිකයෙක් හැටියට හිටියා. මේ ගැන කථා කරන්න අපට පුළුවන්" කියලා එතුමා කියනවා. මෙන්න, මේකයි මෙතැන තිබෙන භයානක තත්ත්වය. මේ පනත් කෙටුම්පත ගෙන ඒම තුළින් රජය බලාපොරොත්තු වෙන්නේ කුමක්ද? මේ පනත් කෙටුම්පත ගෙන ඒම තුළින් යම්කිසි දෙයක් බලාපොරොත්තු වන දෙමළ ජාතික සන්ධානය අද දවසේ ප්‍රකාශ කරන්නේ කුමක්ද කියන ප්‍රශ්නය අපට මතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විපක්ෂයක් හැටියට පාර්ලිමේන්තුව තුළින් බලාපොරොත්තු වන්නේ මේ දේවල් නොවෙයි. ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා එදා විපක්ෂ නායකවරයා විධියට ඉන්න කොට උතුරටත් ගියා; දකුණටත් ගියා; පන්සලටත් ගියා; පල්ලියටත් ගියා; කෝවිලටත් ගියා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් එහෙමයි. විපක්ෂයේ සිටි උදවිය හැම දාම මුළු රටම නියෝජනය කළා. හැබැයි, අද විපක්ෂය නියෝජනය කරන 'නිල විපක්ෂය' හැටියට නම් කර ගත් ද්‍රවිඩ ජාතික සන්ධානයෙන් ඒ කටයුත්ත රටේ ජනතාව සඳහා සිද්ධ වනවාද කියන ගැටලුව අපට තිබෙනවා. විපක්ෂය අද හැම තිස්සේම යුද්ධයේදී මැරුණු එල්ටීටීඊ සාමාජිකයන් ගැන, උතුරු නැහෙනහිර ප්‍රශ්නය ගැන, හමුදා කඳවුරු ඉවත් කිරීම ගැන, අධි ආරක්ෂිත කලාප ඉවත් කිරීම ගැන කථා කරනවා. ඒ හැරෙන්න දකුණේ ජනතාවට බලපාන කිසිම ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අද මේ රටේ නිල විපක්ෂය හඬක් නඟන්නේ නැහැ. මෙන්න මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ.

විපක්ෂය නියෝජනය කරන දකුණේ මන්ත්‍රීවරු හැටියට අපි දකුණේ ජනතාවගේ අයිතිවාසිකම් ගැන කථා කරන කොට අපට ඇඟිල්ල දිගු කරනවා, "ජාතිවාදින්" හැටියට. අවාසනාවකට ආණ්ඩු පක්ෂය පැත්තෙනුත් අපි "ජාතිවාදින්" හැටියට හංවඩු ගහනවා. සැබෑ ලෙසම තමන් නියෝජනය කරන ජාතිය ගැන පමණක් කථා කරමින්, මේ රටේ නීත්‍යානුකූලව බලයට පත් වූ ආණ්ඩුවක් පෙරළන්න උත්සාහ කළ ද්‍රවිඩ ත්‍රස්තවාදින්ට සිදුවූ අපරාධ යැයි හඳුන්වමින් ඒවා ගැන පමණක් කථා කරන එක විපක්ෂයට සුදුසුද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ද්‍රවිඩ ජාතික සන්ධානයෙන් අපි අහනවා, "තමුන්නාන්සේලා කරන්න හදන දේ මේකද?" කියලා. පාර්ලිමේන්තුව තුළ ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ මේකද? හැම තිස්සේම මේ අය නියෝජනය කරන්නේ උතුරේ මිය ගිය අය, රට බෙදීමට -කැලි කැඩීමට- උත්සාහ කරපු අය මිසක් රටේ සාමාන්‍ය ජනතාව නොවෙයි. සාමාන්‍ය ජනතාවගේ කිසිම ප්‍රශ්නයක් ගැන මේ අයගේ කථාවක් නැහැ. අද VAT එක ගැන ද්‍රවිඩ ජාතික සන්ධානය නිහඬයි. පොහොර සහනාධාරය අහිමි වීම ගැන ද්‍රවිඩ ජාතික සන්ධානය නිහඬයි. "දකුණට හෙණ ගැහුවත් කමක් නැහැ, උතුරට මොනවා හරි ලැබෙනවා නම්" කියන මතයේ ඉඳගෙන ආණ්ඩුවට මහා විශාල තෙරපුමක් දෙමින්, ආණ්ඩුව දැඩි පීඩනයට ලක් කරමින් තමන්ට එදා තුවක්කුවෙන් කර ගන්න බැරි වුණු දේ අද පාර්ලිමේන්තුව තුළින් ලබා ගැනීමේ උත්සාහයක ද්‍රවිඩ ජාතික සන්ධානය යෙදී ඉන්නවාය කියලා මම චෝදනා කරනවා. අපි බලාපොරොත්තු වන සැබෑ විපක්ෂය ඕක නොවෙයි. ගරු

ජනාධිපතිතුමා ඇතුළු රජය හෝ වෙන කවුරුන් හෝ බලාපොරොත්තු වන ආකාරයට සැබෑ සංහිඳියාවක් රට තුළ ඇති කරන්න අවශ්‍ය නම්, ද්‍රවිඩ ජාතික සන්ධානය ඔය සිටින ස්ථාවරයෙන් වහාම බැහැර විය යුතුයි. එහෙම නැතිව දකුණේ ප්‍රශ්න ගැන කථා කරන අප, මුස්ලිම්, දෙමළ, සිංහල කියන සියලු ජන කොටස්වල ප්‍රශ්න ගැන ගැන කථා කරන අප, විශේෂයෙන්ම 1988-89 කාලයේ මරා දමපු තරුණයන් ගැන කථා කරන අප "සිංහල ජාතිවාදීන්" ලෙස හංවඩු ගැසීමේ තත්ත්වය තුළ මේ සංහිඳියාව බොරුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ සංහිඳියාව කිසිම දවසක සාක්ෂාත් කර ගත නොහැකි දෙයක් බවට පාර්ලිමේන්තුව තුළින් පත් වෙලා තිබෙනවාය කියන එක අපි ප්‍රකාශ කරනවා.

අවසාන වශයෙන් මම මේ කාරණය කියනවා. අතුරුදහන් වූවන්ට යම් කිසි සහතිකයක් ලබා දීම පිළිබඳව වන සංශෝධනය ඇතුළත්ව අද විවාදයට ගන්නා මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පතට ඒකාබද්ධ විපක්ෂය හැටියට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. හැබැයි, මෙය සුවිශේෂී කරුණක් කළ නොහැකියි. මෙය උතුරු නැඟෙනහිරට පමණක් සීමා කළ නොහැකියි. මෙය ද්‍රවිඩ ජාතික සන්ධානයට දෙන කප්පමක් විය නොහැකියි. මුළු රටේම ජීවත් වන මිලියන 21ක් වන ජනතාවගේ පවුල්වල අතුරුදහන් වූවන් වෙනුවෙන් සැබෑ ලෙස කරන කටයුත්තක් බවට මේ කටයුත්ත පත් විය යුතුයි. එසේ නැතිව දිගින් දිගටම සැබෑ ලෙසම ශ්‍රී ලාංකීය ජාතිය ගැන කථා කරන අපට පමණක් "බෞද්ධවාදීන්, ජාතිවාදීන්, මිනී මරුවන්" ලෙස ඇඟිල්ල දිගු කිරීමෙන් ද්‍රවිඩ ජාතික සන්ධානයට හෝ රජයට කිසිදු වාසියක් සැලසෙන්නේ නැහැ. සැබෑ ලෙස සංහිඳියාව සාක්ෂාත් කර ගැනීමට නම්, ඊට වඩා එහා ගිය බරපතළ සාකච්ඡාවක් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 දෙනා අතර අවශ්‍යයි. ඒ වාගේම ඒ සාකච්ඡාව තුළින් ජාතීන්ට සැබෑ සාමයක් ගෙන ඒමේ උත්සාහයක් පවතින්නේ නම්, එයට සහයෝගය දීමට ඒකාබද්ධ විපක්ෂය ලෙස අපි සූදානම් බවත් ප්‍රකාශ කරමින්, මට කථා කරන්න ඉඩ කඩ ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. ඊළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා. ඊට කලින් කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු ලකී ජයවර්ධන මහතාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලකී ජයවර්ධන මහතා දැන් මූලාසනය ගත යුතු ය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

අතන් පිටකු, මාණ්පුමිකු මුජිපුර් රහූමාන් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු ලක්කි ජූයවර්තන අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. MUJIBUR RAHUMAN *left the Chair and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 3.55]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම ඉතාමත් සතුටු වෙනවා, ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන, දිස්ත්‍රික් නායක, ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කළ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන්නට ලැබීම ගැන. අද උදේ සිටම සාකච්ඡා කරන එම සංශෝධන පනත් කෙටුම්පත මීට කලින් මහින්ද රාජපක්ෂ පාලනය යටතේයි ඉදිරිපත් කරන්නට තිබුණේ. මම කථා කරන අවස්ථාවේ අපේ ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා මෙම ගරු සභාවේ සිටීම ගැනත් මම සතුටු වෙනවා. ගරු රංජිත් සොයිසා මැතිතුමාත් බොහෝ දේවල් කථා කළා.

පළමුවෙන්ම මතක් කරන්නට ඕනෑ, ඒකාබද්ධ විපක්ෂය - අපි "කල්ලිය" කියන වචනය පැත්තකට දමලා ශීලාචාර විධියට මේ සභාව තුළ ඔබතුමන්ලාට කථා කරන්නම්. හැබැයි, එළියට ගියාම නම් අපටත් ඔය "කල්ලි" ගැන කථා කරන්න වෙනවා.- තවමත් මේ හැම දෙයක් ගැනම බලන්නේ ජාතිවාදී මුවාවෙන්ය කියන එක. බලන්න, මෙතැන TNA එකත් අද ප්‍රජාතන්ත්‍රවාදීව පාර්ලිමේන්තුවට ඇවිල්ලා විපක්ෂනායකකම ලබන කොට, අනෙක් පැත්තෙන් ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක වෙනවා. [බාධා කිරීමක්] ඒක උදුරා ගත්තේ කාගේ වරදින්ද කියලා තමුන්නාන්සේලා කල්පනා කර බලන්න. [බාධා කිරීමක්] මට ඒකට උත්තර දෙන්න අවශ්‍ය නැහැ. මම මේ පනත් කෙටුම්පත ගැනයි කථා කරන්න ආවේ. කරුණාකරලා මාව අවුස්සා ගන්න එපා. කොහොමද ආවේ, විපක්ෂය වුණේ කොහොමද, මෙච්චර බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් තියා ගෙන කටයුතු කළේ කොහොමද කියලා කියන්න ගියොත් මට ඒ ගැන වෙනම කථා කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා අපි පනත් කෙටුම්පත ගැන කථා කරමු.

ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාවේ ආරම්භයේදීම, "මරණය සුන්දරයි" කියලා එතුමා කිව්වා. හැබැයි, මරණය සුන්දරයි කියන එකේ අනෙක් වචනය එතුමා කිව්වේ නැහැ. එතුමාට ඒකත් කියන්න තිබුණා. නන්දා මාලිනී ගෝකුලයන් ඇයගේ ගීතයක සඳහන් කරනවා"මරණය සුන්දරයි, හැබැයි සත්‍ය වෙත නැවුණොත්" කියලා. නොයෙක් විධියේ දේවලට අසත්‍ය වෙත නැවුණු මරණය සුන්දර වන්නේ නැහැ. එතුමා ඒක වහලායි කිව්වේ. හේතුව මොකක්ද කියලා මම දන්නේ නැහැ. අපි නම් අහලා තිබෙනවා, "ආදරය සුන්දර වරදකි" කියලා. ඒකත් ගීතයක කොටසක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමනි, මට ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමාගෙන් එක කාරණයක් අහන්න වෙනවා. අතුරුදහන් වූවන් පිළිබඳව කියන කොට උතුරේත්, දකුණේත්, නැඟෙනහිරත්, බස්නාහිරත්, මධ්‍යමත් කියන මුළු රටටම බලපානවා. ගරු රංජිත් සොයිසා මන්ත්‍රීතුමා කිව්වේ මේ පනත් කෙටුම්පත ගේන්නේ උතුරේ අය වෙනුවෙන් විතරක් කියලායි. නැහැ, දකුණේ අයටත් බලපානවා. ඔබතුමන්ලා ත්‍රස්තවාදය ගැන කථා කරන කොට ත්‍රස්තවාදය ආරම්භ වුණේ කොයි කාලයේද කියන එක ගැන කථා කරන්නේ නැත්තේ ඇයි? ත්‍රස්තවාදය ආරම්භ වුණේ සමගි

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

පෙරමුණු ආණ්ඩුවේ අවසාන කාලයේයි. යාපනය හිටපු නගරාධිපති ඇල්ප්‍රඩ් දොරෙයිඅප්පා මැරුවේ කොයි කාලයේද? ප්‍රභාකරන් ආයුධ සන්නද්ධව ගිහිල්ලා වෙඩි තියලා එතුමා මරපු වෙලාවේ මේ රටේ තිබුණේ සමගි පෙරමුණු ආණ්ඩුවයි. 1988-89 කාලයේ යම් යම් භීෂණ ක්‍රියාවන් ඇති වුණා. මේ අවස්ථාවේ අපේ ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා ඉන්නවාද මම දන්නේ නැහැ. ඒ කාලයේ "ප්‍රා" කල්ලිය කියලා එකක් තිබුණා. ගරු ඇමතිතුමනි, මම අහනවා, ඒ "ප්‍රා" කල්ලියෙන් අතුරුදහන් වුණු අයටත් මේ අණපනත් තුළින් කටයුතු කරනවාද කියලා. ඒකත් කෙරෙන්න ඕනෑ. එහෙම දවසට කාට කාටත් තමන්ගේ කිල්ලෝටවලත් හුණු තිබුණාය කියන එක පෙනෙයි. [බාධා කිරීමක්] අනේ! තමුන්නාන්සේ දන්නේ නැහැ, ඒ ගැන ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමාගෙන් අහන්න. [බාධා කිරීමක්] දෙපැත්තම එකයි. එතුමාගෙන් අහන්න කියලා අපි කියනවා. [බාධා කිරීම්] කණට කරලා ඒක හොඳටම අහන්න ඕනෑ විමලවීර දිසානායක මන්ත්‍රීතුමාගෙන්. එතුමාගෙන් අහන්න. විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා ඇති කළ තත්ත්වයන් මම හොඳට දන්නවා. මම ඉතිහාසයයි, භූගෝලයයි ඔක්කොම දන්නවා. විද්‍යාවත් දන්නවා. මතක තියා ගන්න, අපි දකුණෙන් ඇවිල්ලා තිබෙන්නේ ඔක්කොම දැන ගෙනයි. ඔබතුමන්ලාගේ නායකයා විතරක් නොවෙයි. මහ ලොකුවට නායකයෝ ළඟ ඉඳ ගෙන ලොකුකම ගන්න අද කථා කළා. මරණය සුන්දරයි කියලා එතුමා කථාව පටන් ගත්තා. නැවතත් වී ගැන කථා කළා. වී ගැන කථා කරලා ඊට පස්සේ තේ ගැන කථා කළා. අද විවාද කරන පනත් කෙටුම්පතේ තිබෙන්නේ වෙන දෙයක්. අද මේ එක්කෙනකුටවත් තේ ගැන කථා කරන්න බැහැ. තේ කිලෝව රුපියල් 78 - 80 දක්වා ගිහිල්ලා තිබෙනවා. කුරුඳු ගැන කථා කළත් එහෙමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හරියට කන්දක් විළි ලා ලා, විළි ලා ලා මී පැටියෙක් වැදුවා වාගේ තමයි. අනේ! මහින්ද රාජපක්ෂ මහත්තයාත් ඒ කථාව අහලා, මෙහෙම අයද මේ කණ්ඩායම තුළ ඉන්නේ කියලා හිතලා නැඟිටලා ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතේ වැදගත් කරුණු කාරණා රැසක් තිබෙන බව අපි කියන්න ඕනෑ. මේ පනත වැදගත් වන්නේ උතුරටත්, දකුණටත් විතරක් නොවෙයි; දෙමළ, සිංහල, මුස්ලිම් අයට විතරක් නොවෙයි. මේ රටේ ශ්‍රී ලාංකිකයන් හැටියට හැම කෙනකුටම මේ පනත වැදගත් වනවා. ඒක මතක තබා ගන්න. මේ පනත ගැන කථා කරනකොට එක්සත් ජාතික පක්ෂයටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත්, ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණටත් ඇහිල්ල දික් කරනවා. ජනතා විමුක්ති පෙරමුණට විතරක් මේකෙන් ගැලවෙන්න බැහැ. රජය කරන කොට, "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එකයි, යූඑන්පීයත් එකයි, රනිල් වික්‍රමසිංහත් එකයි, මහින්ද රාජපක්ෂත් එකයි" කියලා එතුමන්ලා දෙපැත්තටම බණිනවා. හැබැයි මා කියනවා, ජනතා විමුක්ති පෙරමුණේ විශේෂයෙන්ම ඒ කාලයේ හිටපු අයත්, මේ අයත් ඔක්කොම එකයි කියලා. ඒ ගැන කථා කරන කොට රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා මේ සභාවෙන් යනවා. එතුමා පසු ගිය දවස්වල කිව්වා, මේක ඉවරයි කියලා. එතුමා මේවා අහගෙන ඉන්න ඕනෑ. දැන් යනවා, තේ එකක් බොන්න. හොඳ රස තේ එකක් බීලා ආයෙත් සප්පායම් වෙන්න යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරුදහන් වූ හැම කෙනෙක් පිළිබඳවම සොයන්නයි මේ කොමිසම තිබෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණ අද හමුදා නිලධාරීන් ගැන මහ ලොකුවට ආදරෙන් කථා කරනවා. ගමට ආපු හමුදා නිලධාරියාගේ බෙල්ල කපලා වැටේ ගහපු යුගයක් තිබුණා. ඒවා ගැන අද කථා කරන්නේ නැහැ. මා දන්නේ නැහැ, දැන් මේ සභාවේ කවුද ඉන්නේ කියලා. එහෙම කාලයක් තිබුණා. "ප්‍රා" කල්ලියක් එහෙමයි. විශේෂයෙන්ම මේ ගැන කියන කොට අපට ඇත්තටම හිනා යනවා, මන්ත්‍රීතුමන්ලා කවුරුත් කිව්වා වාගේ කොහෙන්ද මේ කථා කරන්නේ කියලා.

මේ පනත් කෙටුම්පතේ තිබෙන අනෙක් දේවල් මොනවාද? දේපොළ තිබුණු, නොයෙක් වතු පිටි, ඉඩ කඩම් තිබුණු මිනිස්සු මැරිලා තිබෙනවා. සමහර විට ඒ මිනිසුන්ගේ දරුවන් විදේශගත වෙලායි ඉන්නේ; නොයෙක් රටවලයි ඉන්නේ. ඔවුන් නැවත ලංකාවට ආපු වෙලාවක ඔවුන්ට ඒ අයිතිය, ඒ උරුමය ලබා දෙන්න ඒ මිය ගිය අය වෙනුවෙන් මරණ සහතිකයක් නිකුත් කරන්න ඕනෑ. ඒ කරුණ මේ පනත් කෙටුම්පතේ තිබෙනවා.

සුනාමි බේදවාචකය නිසා මරණයට පත් වුණු අයගෙන්, මරණ සහතික ලැබුණේ නැති, ඒ නිසා සමහර අයගේ යැපෙන්නන්ට ඒ මැරුණු අයගේ විශ්‍රාම වැටුප පවා ගන්න බැරි වුණු, ඒ නිසා තමන්ගේ නොයෙක් විධියේ උරුමයන් ගන්න බැරි වුණු බොහෝ දෙනෙක් ඉන්නවා. ඒ අයට මේ පනතින් සහනයක් ලැබෙනවා.

මේ අවස්ථාවේදී ගීතා කුමාරසිංහ ගරු මන්ත්‍රීතුමියත් මේ සභාවෙන් යනවා. මේවා අහගෙන ඉන්න. [බාධා කිරීමක්] අනේ! ලජ්ජා නැතුව, කැත කථා කියන්නේ නැතුව යන්න. මේ සභාවේ තිරිසන් විධියට කථා කරනවා. මේ වාගේ අය පාර්ලිමේන්තුවට එවන අය, ඔය ඒකාබද්ධ කල්ලියේ ඉන්න අය ලජ්ජා වෙන්න ඕනෑ. මෙවැනි මන්ත්‍රීවරියන් තමයි ඔබතුමන්ලා යොදා ගෙන ඉන්නේ. සාරි ඇඳගෙනද, රෙදි ඇඳගෙනද ලජ්ජා නැතුව කථා කරන්නේ කියලා මා අහනවා. මේ වාගේ අයට ඡන්දය දීපු, අපේක්ෂකත්වය දීපු අයටයි අපි කියන්නේ. [බාධා කිරීමක්] අපට කේන්ති ගන්න ඕනෑ නැහැ. [බාධා කිරීමක්] කථා කරන කොට ශිෂ්ටකමක් තිබෙන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි. තමන්ගේ පොත්ත රතු වුණාය කියලා -[බාධා කිරීමක්] තමන්ගේ හදවතේ තිබෙන්නට ඕනෑ,- [බාධා කිරීමක්] එක එක තැන්වල නට-නටා, මල් වතුවල, අතැන මෙතැන නට-නටා ඉඳලා ඇවිල්ලා ඒ සෙල්ලම් පාර්ලිමේන්තුවේත් පෙන්වන තරම් ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට මේ පාර්ලිමේන්තුව පත් කරලා තිබෙනවා. ශිෂ්ට විධියට "මන්ත්‍රීතුමිය" කියා කථා කළාම,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියලා කථා කරනවා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාට තිබෙන්නේත් හිනා වෙන එක විතරයි. බලාගෙන ඉන්න. ලජ්ජා නැතුව හිනා වෙන එක විතරයි තමුන්නාන්සේලාටත් කරන්න තිබෙන්නේ. තමුන්නාන්සේලා උපහාසයෙන් හිනා වෙනවා. මා දැක්කා, එතුමිය පාද යාත්‍රාවේ යන කොට කථා කරපු හැටි. පාරේ යන මිනිස්සු අහගෙන හිටපු - [බාධා කිරීමක්] නැහැ, මට අයිතියක් තිබෙනවා නේ. [බාධා කිරීමක්] මා කිව්වේ, ගරු මන්ත්‍රීතුමිය කියලා -[බාධා කිරීමක්] නැහැ. ඔබතුමන්ලා පාඩුවේ ඉන්න. මට ඒකට කිසි ලජ්ජාවක් නැහැ. කියපු තැනැත්තියට තමයි ඒ ලජ්ජාව තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ශිෂ්ටකමක් තිබෙන්න ඕනෑ. ඒ වාගේ නින්දිත විධියට පාර්ලිමේන්තුවේදීයි කිව්වේ කියලා මා කියනවා. අසභ්‍ය විධියට, වනචර විධියට, නින්දිත විධියට කථා කරනවා. මා දන්නේ නැහැ, එතුමිය මවක්ද කියලා. එතුමිය මේ සභාවේ ඉඳලා නැඟිටලා යන කොටයි එහෙම කිව්වේ වරප්‍රසාදවලට යටත් වෙලා. මූලාසනාරූඪ

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියයි, එතුමිය නැඟිටලා යන අවස්ථාවේ කිව්ව නිසා ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා. මුඩුක්කුවල ඉන්න ගැහැනුන්ගේ තත්ත්වයට අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් පත් වෙලා තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුப්பினர் ஒருவர்)
(An Hon. Member)
ආයෙත් ආවොත් ප්‍රශ්නයක් වෙයි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මා ඒවාට භය නැහැ. මට උත්තර දෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත පිළිබඳව ශිෂ්ට විධියට කථා කරන්නයි මා ආවේ. මෙවැනි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ස්ත්‍රීන් ඒකාබද්ධ විපක්ෂය තුළ සිටීම පිළිබඳව අද තමුන්නාන්සේලා වග කියන්න ඕනෑ. තමුන්නාන්සේලා හිනා වෙලා විතරක් මදි. මේවාට දෙන්න ඕනෑ දඩුවම් මොනවාද කියලා අපි දන්නවා. බුදුරජාණන් වහන්සේගේ කාලයේ නම් හොඳ හොඳ දඩුවම් දුන්නා. ගණිකාවන්ට දෙන දඩුවම් තිබුණා. නමුත් අපට ඒවා මේ පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් නැහැ.

අපි පැහැදිලිව කියන්නට ඕනෑ, මේ පනත් කෙටුම්පතේ සංශෝධන නිසා බොහෝ දෙනෙක් තෘප්තියට පත් වෙන බව. අද ඊළඟ එකට මේ ගැන සැකයක් ඇතිවෙන්න ඕනෑ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කාලය අවසානයි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ දේවල් සිද්ධ වුණාට පස්සේ අපි මාතෘකාවෙන් බැහැරව යනවා. ඒ නිසා මගේ කථාව අවසාන කරන්න මට තව විනාඩියක කාලයක් ලබාදෙන්න.

ඒ විනාඩිය තුළ මම විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේ ගෙනෙන්න ඕනෑ අණ පනත් තමයි අපි අද ගෙනෙන්නේ කියන එක. මේ අණ පනත් ගෙනෙන්න අපට විශාල කාල පරිච්ඡේදයක් ගතවෙනවා. ඒ නිසා තමයි ආණ්ඩුව වැඩ කරන්න ඉස්සෙල්ලා අවශ්‍ය අණ පනත්, අවශ්‍ය සංශෝධන, අවශ්‍ය ප්‍රතිපත්ති, අවශ්‍ය සැලසුම් හදලා ඒ අවශ්‍යතා වෙනුවෙන් මුදල් ලබා ගන්නේ. මේ අය ආණ්ඩුව ගැන කියනවා.

ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමාට ලජ්ජා නැතුව තවමත් හිනාවෙනවා. ඒ වාගේ අය මෙතැන කියාගෙන ඉන්න අය ලජ්ජා වෙන්න ඕනෑ. ඒ අය ඔඩොක්කුවේ දමාගෙන ඉන්න අය ලජ්ජා වෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔඩොක්කුවේ තියාගෙන, හුරතල් කර-කර ඉන්න මේ වාගේ කණ්ඩායම් එක්ක කවදාවත් ඔය පක්ෂයට බලයට පත්වෙන්න බැහැයි කියන එක මම කියනවා. ඒ විතරක් නොවෙයි, මේ කරන නින්දිත ප්‍රකාශ වෙනුවෙන් ජීවිත පරිත්‍යාගය හෝ කරලා එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් එක්ක අපේ අතිගරු ජනාධිපතිතුමාත් ශක්තිමත් කරලා අපි මේ රජය 2020 දක්වා නොවෙයි, 2045 දක්වා ගෙනියන්න කටයුතු කරනවා. මේ වාගේ අයට අපි වේදිකාව තුළදී උත්තර දෙන්න ලෑස්තියි කියන එකත් මතක් කරනවා. බොහොම ස්තුතියි.

[ප.ප. 4.07]

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා
(මාණ්පුමිකු க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இறப்புக்களின் பதிவு - தற்காலிக ஏற்பாடுகள் திருத்தச் சட்டமூலத்தின் இரண்டாம் மதிப்பீட்டின்போது சில கருத்துக்களைக் கூறச் சந்தர்ப்பமளித்தமைக்காகத் தங்களுக்கு நன்றி கூறுகின்றேன். இது மிகவும் ஒரு முக்கியமான திருத்தச் சட்டமூலம் என நான் கருதுகின்றேன். காணாமற்போனவர்கள் தொடர்பான அலுவலகம் அமைத்தல் சட்டமூலம் நிறைவேற்றப்பட்டதன் பிற்பாடு இந்தத் திருத்தச் சட்டமூலம் இந்த உயரிய சபைக்குக் கொண்டுவரப் படுகின்றது. காணாமற் போனோர் தொடர்பான அலுவலகம் அமைத்தல் சட்டமூலம் இங்கு கொண்டுவரப்பட்டபோது ஒரு சில எதிர்ப்புக் களிருந்தாலும் அந்த எதிர்ப்புக்கள் சாதுரியமாக வென்றெடுக் கப்பட்டு அந்தச் சட்டமூலம் இந்தச் சபையிலே நிறைவேற்றப்பட்டிருக்கின்றது. அதேபோன்று இன்று இந்தத் திருத்தச் சட்டமூலம் தொடர்பில் கௌரவ அமைச்சர்கள், பாராளுமன்ற உறுப்பினர்கள் பலரும் பலவிதமான விடயங்களைக் கூறினர். இருந்தாலும், அதனை ஆதரித்த கருத்துக்கள் கூடுதலாக இருந்ததை இங்கு நாங்கள் பார்க்கக்கூடியதாக இருந்தது. அது மிகவும் சந்தோசத்தை அளிக்கின்றது. நாங்கள் பட்ட துன்ப துயரங்களுக்குப் பிற்பாடு இந்த 'நல்லாட்சி' மலர்ந்திருக்கின்ற இந்த வேளையிலே அரசாங்கம் ஒரு சரியான பாதையிலே பயணிக்கின்றது என்பதை இந்தத் திருத்தச் சட்டமூலம் எங்களுக்கு எடுத்துக்காட்டுகின்றது. இது வடக்கு, கிழக்கிற்கு மட்டுமல்ல, நாடு முழுவதற்குமே தேவையான ஒரு சட்டமூலமாகும்.

யுத்தத்தின்மூலம் போராளிகள் மட்டுமல்ல, பாதுகாப்புப் படையினர், பொதுமக்கள், சிறுவர்கள், குழந்தைகள் எனப் பலரும் உயிரிழந்திருக்கின்றார்கள். அத்தோடு இந்த நாட்டிலே ஏற்பட்ட யுத்தத்தின்போது இங்கு வாழ்வதற்குப் பயந்து அண்மையிலுள்ள இந்தியாவிற்குக் கடல் வழியாகச் சிறு படகுகள்மூலம் சென்ற எத்தனையோ குடும்பங்கள் கடலிலே அழிந்திருக்கின்றன. இதேபோன்று வேறு நாடுகளுக்குக் கடல் வழியாகச் சென்றவர்களும் கடலிலே மூழ்கிய சம்பவங்கள் நிறைய இருக்கின்றன. சுனாமித் தாக்கத்தினால் பலர் அழிந்திருக்கின்றார்கள்; பலர் காணாமற்போயிருக்கின்றார்கள். இப்படியான மிகவும் வேதனையான சம்பவங்களை நாங்கள் சுமந்து நிற்கின்றோம். இந்த வேளையில் இந்தச் சட்ட மூலத்தைக் கொண்டுவந்து அந்த மக்களுக்கு ஒரு நிவாரணமளிக்க இருப்பது மிகவும் வரவேற்கக்கூடியது. எனவே, இந்தச் சட்டமூலத்தை நான் முழு மனதோடு ஏற்றுக்கொண்டு, மேலும் சில கருத்துக்களை சொல்ல விழைகின்றேன்.

இப்பொழுது, எங்களுக்குப் பிறப்புச் சான்றிதழ் மிக முக்கியமானது. அதேபோன்று, எங்களுக்கு இறப்புச் சான்றிதழும் முக்கியமான தேவைகளுக்குப் பயன்படுகின்றது. அவ்வாறே, திருமணச் சான்றிதழ், தேசிய அடையாள அட்டை என்பனவும் முக்கியமானவை. இவைகளோடு, இன்று எங்களுடைய நாட்டிலே காணாமற்போனோர் சான்றிதழும் அறிமுகப்படுத்தப்படுகின்றது. இது இக்காலகட்டத்தில்

[ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා]

අත්‌යාවශ්‍යමානතොන්‌රු. ආනාල්, ඇන්‌තච් චාන්‌රිතළ් කළෙප් පෙරුවතිලේ මක්කළ් එතිර්නෝක්කුකින්‌ර කෂ්ටඩංකළෙ නාංකළ් තීර්ත්තුවෙක්ක වේණ්ටියතු මුක්කියමාකුම්. අප්පටියාන කරුත්තුක්කළ් ඉංකේ කූරප්පට්ටන. JVP උරුප්පිනර් කෙළරව පිමල් රත්නායක්ක අවර්කළ් උරෙයාර්‌ර් රුකෙයිල්, ඉච්චාන්‌රිතළ් මීණ්ටුම් ඉරණ්ටු වරුටඩංකළිල් පුතුප්පික්කප්පටුම්පෝතු මක්කළුක්කුළ්ළ කෂ්ටඩංකළෙ ඉංකේ කුරිප්පිට්ටාර්. අවර් කුරිප්පිට්ටවර්‌රෙ උණ්මෙයාන කෂ්ටඩංකළාකවේ නාංකළුම් කරුතුකින්‌රෝම්. එනවේ, ඉන්තච් චට්ටමූලත්තින් මූලමාක මක්කළ් පෙරුකින්‌ර වසති, වාය්ප්පුක්කළෙච් චරියාන මුරෙයිලේ නිරෙවේර්‌රුවතර්කු අරසු මිකවුම් උරුතුණෙයාක ඉරුක්කවේණ්ටුම්.

අත්තෝටු, පිරතේස චෙයලකඞ්කළ්, මාවට්ටච් චෙයලකඞ් කළිලේ ඉතු තොටර්පිල් විසේට පිරිවුකළ් අමෙක්කප්පට්ටු, ඉතු චම්පන්තමාක වරුකින්‌ර මක්කළෙ මිකවුම් අන්පෝටුම් ආතරවෝටුම් වරවේර්‌රු, අවර්කළුක්කු ඔරුචිල මණිත්තියාල යඞ්කළිල් තඞ්කළතු තේවෙකළෙ නිරෙවේර්‌රික් කොළ්ළක්කූටිය වකෙයිල්, ඔරු කාත්තිරමාන චෙයල් තිට්ටත්තෙ ඉලඞ්කෙ මුළුවතිලුම් පරවලාක්කවේණ්ටුම්. අව්වාරු පරවලාක්කප්පට වේණ්ටියතු ඔරු මුක්කියමාන තේවෙයෙන නාන් ඉංකු වලියුරුත්ත විරුම්පුකින්‌රේන්.

ඉන්‌රු ආට්චි මාර්‌රම් එර්පට්ටාලුම් අරස ඉයන්තිරඞ් කළිලේ පාරියළවු මාර්‌රම් එර්පටවිල්ලෙ එන්පතෙ වේතනෙයෝටු කූරවේණ්ටියිරුක්කින්‌රතු. කාරණම්, ඉන්‌රු තඞ්කළුටෙය තේවෙකළුක්කාක පිරතේස චෙයලකඞ්කළ්, මාවට්ට චෙයලකඞ්කළුක්කුච් චෙල්කින්‌ර මක්කළ්, ඔරු විටයත්තුක්කාකප් පලමුරෙ අලෙන්තුතිරින්තු අවර්‌රෙ මුටිත්තුක්කොළ්ළ වේණ්ටිය නිලෙප්පාටුම්, චිලවේළෙකළිල් අවර්‌රෙච් චෙය්තුමුටික්කාමලේ වීටුකළුක්කුත් තිරුම්පුකින්‌ර නිලෙප්පාටුම් තොටර්කින්‌රතු. කාණාමර්පෝනවර්කළුටෙය චාන්‌රිතළ්කළෙප් පෙරුකින්‌ර විටයත්තිලේ - ඇන්තප් පතිවුකළෙච් චෙය්වතිලේ - වේතනෙයෝටු, තුන්පඞ්කළෝටු ඉරුක්කින්‌ර මක්කළෙ මේලුම් තුන්පත්තුක්කුළ්ළාක්කාමල්, අවර්කළුටෙය මන වේතනෙයෙයිල් කුරෙක්කුම් වකෙයිල් එව්වළවු ඉලකුවාක අවර්‌රෙප් පෙර්‌රුක්කොළ්වතර්කු උතවි චෙය්ය මුටියුමෝ, අව්වළවුක්කු ඇතනෙ ඉලකුපටුත්තුවතිල්තාන් ඇන්තච් චට්ටමූලත්තිනුටෙය වෙර්‌රි තඞ්කියිරුක්කින්‌රතු. චට්ටඞ්කළ් එප්පොළුතුම් මක්කළුක්කාකවේ එන්පතෙ නාංකළ් උණර්න්තුකොළ්ළ වේණ්ටුම්. මක්කළුටෙය පාතුකාප්පු, චුතන්තිරම්, ඔළුඞ්කු, ජනනායකම් පෝන්‌රවෙකළ් අතිලේ පාතුකාක්කප්පට වේණ්ටුම්. අතු මික මුක්කියමානතු. අන්ත රීතියිලේ ඉතනුටෙය නෝක්කත්තෙයුම් අතන් මුක්කියමාන කරුත්තුක්කළෙයුම් මිකවුම් ආළමාකක් කවනත්තිලේ එටුත්තු, ඉන්තච් චට්ටමූලත්තෙ ඔළුඞ්කාකච් චෙයර්පටුත්තුවතර්කාන මුයර්චිකළිල් අරචාඞ්කම් මුනෙයිප් පුටන් චෙයර්පට වේණ්ටුම්. අතර්කාන කණ්කාණිප්පුක්කළුම් ඉතිලේ මිකවුම් කාත්තිරමාක අමෙය වේණ්ටුම්. අප්පොළුතුතාන් ඉතනාල් පිරයෝචනම් එර්පටුමෙන්‌රු නාංකළ් කරුතුකින්‌රෝම්.

ඉලඞ්කෙයිල් ඉනප් පිරච්චිනෙ ඉරුක්කින්‌රතු. අතු තීර්ත්තුවෙක්කප්පට වේණ්ටුමෙන්‌රු නාංකළ් එණ්ණිනාලුම් අතු උරිය කාලත්තිලේ තීර්ත්තුවෙක්කප්පටවිල්ලෙ. අතනාල් අතු පූතාකරමාක වෙටිත්තු පාරිය යුත්තම් ඉන්ත නාට්ටිලේ එර්පට්ටතු. නාංකළ් එඞ්කළ් නාට්ටින් වළර්ච්චි, පොරුළාතාරම් මර්‌රුම් එනෙය විටයඞ්කළෙක් කතෙක්කින්‌ර ඉන්ත නේරත්තිලේ කාණාමර්පෝනවර්කළුටෙය චාන්‌රිතළෙප් පෙරුකින්‌ර විටයම් පර්‌රියුම් කතෙක්කවේණ්ටිය ඔරු තුර්ප්පාක්කිය නිලෙ එර්පට්ටිරුක්කින්‌රතු. ඉතුපෝන්‌ර චම්පවඞ්කළ් ඉනිමේලුම් එඞ්කළුටෙය නාට්ටිලේ නටෙපෙරක් කූටාතු. අතර්කාන පාතුකාප්පෙ නාංකළ් තේටික්කොළ්ළ වේණ්ටුම්. නේරම්, කාලම්, චක්ති එන්පන මිකවුම් මුක්කිය මානවෙ. එනවේ, මක්කළාල් තෙරිවුචෙය්යප්පට්ට 225 පාරාළුමන්‌ර උරුප්පිනර්කළුම් අමෙච්චර්කළුම් ඉවෙකළෙක් කරුත්තිලේකොණ්ටු එතිර්කාලත්තිලේ ඉප්පටියාන පිරච් චිනෙකළෙ මක්කළ් එතිර්නෝක්කාමල් පාර්ත්තුක්කොළ්ළ වේණ්ටුම්. තේවෙයර්‌ර පිරච්චිනෙකළිල් එංකළුටෙය නේරත්තෙච් චෙලවළිත්තු කරුත්තුක්කළෙක් කූර්‌රාමල්, එංක ළුටෙය නේරත්තෙයුම් මක්කළුටෙය නේරත්තෙයුම් පාතුකාප් පතෝටු, අවර්කළුටෙය අපිවිරුත්තියෙ මළුඞ්කඩික්කච් චෙය්යාමල් ඉනිමේලාවතු ඉන්ත නාට්ටින් වළර්ච්චික්කු ඔරුමිත්තු කුරල්කොටුත්තුච් චෙයර්පට වේණ්ටුමෙන්‌රුම් කේට්ටු, විටෙපෙරුකින්‌රේන්. නන්‌රි.

[අ.භා. 4.15]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ආරම්භ කරන මේ අවස්ථාවේ දී, ධම්මපදයේ ඇති, ".....චක්ඛංව වහතෝ පදං" කියන ගාථාව මට මතක් වෙනවා. අද දින ඉදිරිපත් කර තිබෙන මෙම සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එක් වෙමින් සමහර උදවිය මේ පාර්ලිමේන්තුවේ අදහස් දක්වද්දී මට හිතුණේ, ගොනා පසුපස එන කරත්ත රෝදය වාගේ තමන් කරපු යම් යම් දේවල්වල ප්‍රතිඵල තමා පසුපස එන චිත්‍රයක් ඒ අයට මැවී පෙනෙනවාද කියලායි. මේ සංශෝධනවලට කවුරුවත් බිය වෙන්න ඕනෑ නැහැ. මේ සංශෝධන ගෙන එන්නේ, මෙතෙක් මරණ සහතිකයක් නැති මරණකරුවන්ගේ පවුල්වල අයට සාධාරණය ඉටු විය යුතුව තිබෙන නිසායි. ඒ වාගේම මිය ගිය බවට කිසිදු විධියකින් ඔප්පු කර ගත නොහැකි අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් කිසියම් විධියක සහතිකයක් ලබා දිය යුතු නිසායි. ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින ඊළඟ පරම්පරාවට, ඊළඟ අයිතිකරුවන්ට යම් සාධාරණයක් ඉටු විය යුතුව තිබෙන නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ දී මට එක්තරා කියමනක් මතක් වෙනවා. "ඔබ හැඟීම්වලට කථා කරන විට, සත්‍ය ගවු ගණනක් දුරට යනු ඇත. ඔබ බුද්ධියට කථා කරන්නේ නම්, සත්‍ය ඔබේ අත දුරට පැමිණෙනු ඇත" කියලා තිබෙනවා. එපමණක් නොවෙයි, මේ පාර්ලිමේන්තුවේ උද්වේගකර ආකාරයට හැසිරෙන සුළුතර කණ්ඩායමට මට කියන්නට තිබෙන්නේ, "ඔබ හැඟීම්වලට කථා කරන කාක් කල්, ජයග්‍රහණය ඔබෙන් ගවු ගණනක් දුරට යනු ඇත. ඔබ සත්‍ය යම් හෝ දුරකට දකින්න සමත් වන්නේ නම්, අඩුම තරමේ ඔබට ජයග්‍රහණයේ සේයාවක්වත් දැකීමට හැකියාව ලැබෙනු ඇත" කියලායි. ඒ අය හැඟීම් ඔස්සේ යන ගමනක් අපට දිගින් දිගටම දකින්නට ලැබුණා. පුංචි දරුවන්ට කේන්ති ආවාම තමන්ගේ අතට අහුවෙන අහුවෙන එකෙන් ගහනවා. සමහර වේලාවට කේන්ති ආවාම අම්මාට, තාත්තාට වුණත් ඇස්වල කඳුළු පුරවාගෙන සැර වැර වෙන අවස්ථා අපි දැක තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ එවැනි හැසිරීම් තමයි පසු ගිය කාලය පුරාම අපට දකින්නට ලැබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා පත් කරන අවස්ථාවේත්, ඇතැම් කණ්ඩායම් මේ රටේ ජාතිවාදය අවුස්සන්න උත්සාහ කළා. ඒකට යම් යම් බලවේග පොහොර දැම්මා. හැබැයි, මේ රටේ ජනතාව පසුගිය අවුරුද්දේ ජනවාරි 8වැනිදා දුන් තීන්දුවත්, ඒ වාගේම පසු ගිය

අවුරුද්දේ අගෝස්තු 17වැනිදා දුන් තීන්දුවත් පටු සීමාවලින් ඉවතට ගිහිල්ලා, බුද්ධියෙන් දීපු තීන්දුවක් කියන එකත් අමතක කරන්නට හොඳ නැහැ. ඒ බුද්ධිමත් තීන්දුව ජනතාව ගත්තේ, තමන්ගේ මුහුණ ඉදිරිපිට පෙනෙන්න තිබෙන මහා දැවැන්ත cut-outs, posters, ප්‍රචාරක යාන්ත්‍රණ මේ සියල්ලෙන්ම ඔබ්බට ගිහිල්ලායි. එදා විවිධ බලපෑම් කරන්න උත්සාහ කළා. රාජ්‍ය මාධ්‍ය භාවිතා කරලා මේ රටේ සෑම විරුද්ධ දේශපාලන නායකයකුටම පහර දුන්නා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තමන්ට විරුද්ධ දේශපාලන මත දරන්නන්ට එළව එළවා පහර දුන්නා. මාධ්‍යවේදීන්ට පමණක් නොවෙයි, සෑම දේශපාලන ව්‍යාපාරයකටම පහර දුන්නා. සෑම දේශපාලන ව්‍යාපාරයක්ම කඩා ඉහිරවා දැම්මා. ඒ සියල්ලට මුහුණ දෙමින් තමයි අද ඔය ආවේගයෙන්, උද්වේගයෙන් කථා කරන උදවිය පරාජය කරන්නට ජනතාව එදා ඒ තීන්දුව ගත්තේ.

අපට අහන්න ලැබුණා සමහර අවස්ථාවල මේ සභාවේදී කථා වෙනවා, දැන් ව්‍යාපාරිකයෝ ඇත් වෙලාය, ජනතාව ඇත් වෙලාය, වෘත්තිකයෝ ඇත් වෙලාය කියලා. ඒ වාගේ විවිධ කථා අපට අහන්නට ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ සාතිශය බහුතරයක් ජනතාව මේ හැම කාරණයක් දිහාම ඉවසීමෙන් බලාගෙන ඉන්නවා; සිහි නුවණින් බලාගෙන ඉන්නවා. සමහර සුළු පිරිසකගේ සිහි විකල් වෙලා තමන්ගේ ඇස් ඉදිරිපිට මායා චිත්‍ර මැවෙන්නට පුළුවන්. නමුත් රටේ ජනතාව බහුතරයක් සැබෑ ලෙස යථාර්ථය දකිනවා, සත්‍යය දකිනවා. හැඟීම්වලට කථා කරන්නට උත්සාහ කළත් ඒ හැඟීම් අබිබවා ගිහිල්ලා බුද්ධියෙන් ලෝකය දිහා බලන ජනතාවක් මේ රටේ ඉන්නවා.

ඩී.එස්. සේනානායක මැතිතුමාගෙන් පසුව මේ රටේ හොඳම අවස්ථාව ලැබුණේ මහින්ද රාජපක්ෂ මහත්මයාටයි. ඒ යුද්ධය අවසන් වුණාට පසුවයි. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අද මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා සිටින නිසා මේක එතුමාට මතක් කරලා දෙන්නට කැමැතියි. එතුමාට තමයි මේ රටේ හොඳම අවස්ථාව ලැබුණේ. උතුරේත් කැරලි නැති, දකුණේත් කැරලි නැති රටක් එතුමාට ලැබුණා. ඒ වාගේම විකෘති කරලා හෝ හදා ගත්ත මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් එතුමාට තිබුණා. පළාත් සභා සියල්ලම වාගේ පාලනය කිරීමේ බලය එතුමාට තිබුණා. පළාත් පාලන ආයතනවලින් සියයට 98ක් විතර එතුමාට තිබුණා. ඒ සියල්ලටම වඩා වැඩි දෙයක් එතුමාට තිබුණා. එක පැත්තකින් එතුමා විධායක බලතල තමන්ගේ අතේ තියාගෙන ඉන්න විට, මේ රටේ මිනිස්සු හොඳ මානසිකත්වයක හිටියා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. යුද්ධයෙන් පසුව නායකයා හරි පාරක ගියා නම්, සාධාරණ තීන්දුවක් ගත්තා නම්, රට ගොඩ ගන්නට කල්පනා කළා නම් ඒ මත පෙළ ගැසෙන්නට ඕනෑ, හිට ගන්නට ඕනෑ කියන හොඳ මානසිකත්වයක රටේ ජනතාව හිටියා. ඒකට ජාතියක් තිබුණේ නැහැ, ඒකට ආගමක් තිබුණේ නැහැ, ඒකට කුලයක් තිබුණේ නැහැ, ඒකට පන්තියක් තිබුණේ නැහැ. මේ රටේ හැම කෙනෙක්ම හිතුවා යුද්ධයෙන් පසුව මේ රට හරි පාරක ගෙන යනවා නම් රටේ නායකයා සමඟ අපි පෙළ ගැසෙන්නට ඕනෑ කියලා. හැබැයි, ඒ තිබුණු අවස්ථාවට පයින් ගහලා එතුමා මොනවාද කළේ? මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයකින් සම්මත කළ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කළා. ඒක අහෝසි කරලා දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා බලාපොරොත්තු වුණේ මොකක්ද? ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමද, යුක්තිය සාධාරණය ඉටු කිරීමද, එහෙම නැත්නම් යුද්ධයෙන් පසුව අගතියට පත් වුණු උතුරේත් දකුණේත් මිනිසුන්ගේ මානව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමද? නැහැ. ඒ දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මුළුමනින්ම ඉලක්ක කර ගත්තේ තමන්ගේ ඒකාධිපතිත්වය පුළුල් කිරීමට, විධායක ජනාධිපති ධුරයේ කාලය දීර්ඝ කර ගැනීමට; දෙවරක් පමණක් ජනාධිපති ධුරයේ ඉඳලා ගෙදර යන්න තිබුණු එක ජීවිතාන්තය දක්වා ජනාධිපති ධුරයේ රැඳී සිටීමට අවස්ථාව සාදා ගැනීමට. ඒ විතරක් නොවෙයි, ස්වාධීන කොමිෂන් සභා අහෝසි කිරීමට. එහෙම කරලා අවුරුදු දෙකකට කලින් ඡන්දයකට ගිහින් පරාද වුණා. අද ඒ කිසි දෙයක් නැතිව කුරුණෑගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් විධියට එතුමාට මේ අරමුණු ඉෂ්ට කරන්නට පුළුවන්ද කියන එක තමයි මට අහන්නට තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත විතරක් නොවෙයි, මේ රජය බලයට ආව දවසේ ඉඳලා පාර්ලිමේන්තුව තුළ ගත්ත බොහෝ ක්‍රියා මාර්ග මේ රටේ ප්‍රජාතාන්ත්‍රවාදය තහවුරු කරන්නට ගත්ත ක්‍රියා මාර්ග. බලය පතුරුවන්නට ගත්ත ක්‍රියා මාර්ග නොවෙයි, බලය විසුරුවන්නට ගත්ත ක්‍රියා මාර්ග. බලය බෙදා හරින්න ගත්ත ක්‍රියා මාර්ග; මානව අයිතිවාසිකම් තහවුරු කරන්නට ගත්ත ක්‍රියාමාර්ග. අද සිහි නුවණින් මේ පනත් කෙටුම්පත දිහා බලන ඕනෑම කෙනෙකුට පේන්නට පුළුවන්, ඕනෑම කෙනෙකුට හිතන්නට පුළුවන් මොකක්ද මෙහි අරමුණ කියලා.

තමන්ගේ සහෝදරයෙක් අතුරුදහන් වුණාම, තමන්ගේ සහෝදරයෙක් මිය ගියාම, තමන්ගේ දරුවෙක් අතුරුදහන් වුණාම ඒ කෙනා වෙනුවෙන් අඩුම තරමින් මරණ සහතිකයක් හෝ ලබා ගැනීමේ වුවමනාව තිබෙන්නේ ඒ වේදනාව තිබෙන, කැක්කුම තිබෙන දෙමවුපියන්ට, සහෝදර සහෝදරියන්ට සහ පවුලේ අයට. අද එක්නැලිගොඩගේ භාර්යාව දරුවෝ දෙන්නෙක් එක්ක උසාවි ගාව රස්තියාදු වෙන්නේ කොහොමද කියලා අපි දකිනවා. සමහර වෙලාවට ඔවුන්ගේ ඒ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී ඉන්න සහතිකයක් හෝ ඒ පවුලට නැහැ. මෙවැනි පවුල් දහස් ගණනක්, ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් මේ රටේ ඉන්නවා. කවුරු හෝ කියනවා නම්, මේක හමුදාව අපහසුතාවට පත්කරන්න, එහෙම නැත්නම් රණ විරුවෝ අපහසුතාවට පත්කරන්න, කවුරු හෝ දේශපාලන නායකයෙක් අපහසුතාවට පත්කරන්න ගත් ක්‍රියා මාර්ගයක් කියලා, ඒක බොළඳ සිතුවිල්ලක් කියලා මම කියනවා. මට මතකයි, මේ පාර්ලිමේන්තුවේ ඇතැම් නායකයෝ කිව්වා, තමන්ව විදුලි පුටුවට ගෙනියන්න හදනවා කියලා. පළාත් සභා මැතිවරණ ගණනාවකදී වෙදිකාවට ඇවිල්ලා කිව්වා, "මාව විදුලි පුටුවට ගෙනියන්න හදනවා" කියලා. මිනිස්සුන්ගේ හැඟීම්වලට කථා කරලා තමයි මැතිවරණ ජයග්‍රහණය කළේ. ඒ හැඟීමවලට කථා කරන්න, කථා කරන්න සත්‍යය යටපත් වෙනවා, සත්‍යය ඇතට යනවා; සත්‍යය විතරක් නොවෙයි, ජයග්‍රහණයක් ඇතට යනවා කියලා මම කිව්වා. ඒක තමයි වුණේ. විදුලි පුටුවට ගෙනියන්න හදන වටපිටාවක් තිබුණා නම්, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාටත්, රනිල් වික්‍රමසිංහ මහත්මයාටත් පින්සිද්ධ වෙන්න අද ඒ අවදානමෙන් ඔය කියපු පුද්ගලයෝ මුදාගෙන තිබෙනවා කියන එක මම මේ සභාවේදී කියන්න කැමැතියි. ඒක තමයි ලබාගත් ජයග්‍රහණය. මේ ආණ්ඩුව අවුරුද්දක් යනකොට රටට දීපු ජයග්‍රහණය ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හැම කාරණයකටම ජාතිවාදය අවුස්සාගන්නවා නම්, ඒක තමන්ගේ එකම ගැලවිජ්ජාව කරගන්න උත්සාහ කරනවා නම්, ඒ ගොල්ලෝ යන්නේ කොතැනටද කියන එක ගැන කාටවත් කථා කරන්න දෙයක් නැහැ කියන එක මම මේ වෙලාවේ කියන්න කැමැතියි. ධම්ම පදයේ එක ගාථාවක් මම කියන්නම්.

"අක්කොධෙන ජිනෙ කොධං - අසාධුං සාධුනා ජිනෙ
ජිනෙ කදරියං දානෙන - සච්චෙන අලිකවාදිනං"

එහි තේරුම, "ක්‍රෝධ කරන තැනැත්තා ක්‍රෝධ නොකිරීමෙන්

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

දිනිය යුතුය. අසත්පුරුෂයා සත්පුරුෂකමින් දිනිය යුතුය. මසුරු තැනැත්තා දන් දීමෙන් දිනිය යුතුය. බොරු කියන්නා සත්‍යයෙන් දිනිය යුතුය" යන්නයි. මේ ගාථාවේ තිබෙන කරුණු හතර මේ කියන දේශපාලනඥයනුත්, අද ඔය කෑ ගහන සුළුතර කණ්ඩායමත් සිහියට ගත්තොත් හොඳයි කියා මා හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.27]

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව අදහස් ප්‍රකාශ කරන්න මටත් අවස්ථාවක් ලබාදීම ගැන තමුන්නාන්සේට මගේ ගෞරවනීය ප්‍රණාමය පුද කර සිටිනවා.

මේ පනත් කෙටුම්පත මගේ අතට ආපු ගමන්ම මට හොඳ කවියක් මතක් වුණා. කලිල් ජිබ්‍රාන් කියා කවියෙක් හිටියා. ඒ කවියා සොබාදහමත් එක්ක කවි ලියපු මිනිහෙක්. එක අවස්ථාවකදී ඔහු මෙහෙම ලියනවා:

"ඉපදීම වරදකි
එයට දඬුවම මරණය
මරණයෙන් මිදුමට
දඬුවම් කළ යුතුය උපතට...."

ඉපදීම කියන්නේ වරදක් නම් ඒකට දෙන දඬුවම තමයි මරණය. මරණයෙන් මිදෙන්න නම් දඬුවම් දෙන්න ඕනෑ උපතට. මම ඊළඟට ඉදිරිපත් කරන්නේ මගේ ස්වාධීන අදහසක්. මේ පනතත් එක්ක අද මට දැනුණු දෙයක් තමයි, මේ ආණ්ඩුව ආපහු සැරයක් හදනවා එක පැත්තකින් මරණයකට ජීවිතය දෙන්න. අනික් පැත්තෙන් මේ කාරණය. මේ ආණ්ඩුවට තුනෙන් දෙකක් ඡන්ද හම්බ වෙන වෙලාවක ඒ ඡන්ද හම්බ වෙන ඔළු ගෙඩි ගණන ගණන් කරලා ඒ අයගෙන්, "උඹ ඉපදුණේ ඇයි?" කියන ප්‍රශ්නය ඇහුවොත්, ඒකට දෙන්න තිබෙන පොදු උත්තරය මොකක්ද කියා මා දන්නේ නැහැ. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍ය ජීවියෙක් බිහි වෙන්න පුරුෂයෙක් සහ ගැහැනියක් එකතු වෙන්න ඕනෑ.

පුරුෂයෙක් මතින් එක් වරකදී ශුක්‍රාණු මිලියන 500ක් විතර පිටවෙනවා. ඒ මිලියන 500න් එකම එක ශුක්‍රාණුවක් විතරයි මිනිහෙකුට ජීවිතය ලබන්න කලලයක් එක්ක ගැටෙන්නේ. එතකොටම තේරෙනවා මිලියන 500කින් එක්කෙනෙක් තමයි මේ මිනිහෙක් වෙන්න හදන්නේ කියා. ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත්, මේ කථා කරන නිරෝෂන් ප්‍රේමරත්න වන මමත් ඒ 500කින් එකක්. මිනිහෙක් වෙලා උපදින්න කල්ප ගණනක් ගත වෙනවා කියා බුදු හාමුදුරුවෝ කිව්වේ ඒකයි. ඒකට හේතු තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු නැහෙනහිර අතුරුදහන්වීම් සම්බන්ධයෙන් තමයි මේ පනත් කෙටුම්පතේ විශේෂයෙන්ම සඳහන් කර තිබෙන්නේ. මම මේ වෙලාවේ මෙන්න මේ කාරණය මතක් කරන්න ඕනෑ. 1983 අවුරුද්දේ එක දවසක මේ පාර්ලිමේන්තු සභා ගැබෙන් ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පිට වෙලා යනවා. ඒ අය පිට වෙලා යන්නේ ඇයි? රට බෙදන්නේ නැහැ කියන එකට දිවුරලා පොරොන්දු වෙන්න කිව්වාම ඒ අය නැහිටලා යනවා. ඒ එක අවස්ථාවක්. මේ ආණ්ඩුව දැන් කියනවා, "දෙමළ ජාතික සන්ධානය ඇතුළු කණ්ඩායම් දැන් ජාතිවාදී හැඟීම්වලින් එහාට ගිහින්" කියා. බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීවරයා කථා කරන කොට කිව්වා, "ඒකාබද්ධ විපක්ෂයේ ඉන්නේ ජාතිවාදියෝ" කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මා ගැන එක දෙයක් කියන්නම්. මම මාවරල මහා විද්‍යාලයේ ඉගෙන ගන්න කාලයේ සමහර දවස්වලට කෑවේ දළුග්ගල ලයිමේ නඩරාජා උයාගෙන එන හුලංකීරිය අලයි. ස්වාධීන රූපවාහිනියේ වැඩ කරන කාලයේ "වසන්තම්" නාලිකාවේ වැඩ කරපු මගේ සහෝදර මිත්‍රයෙක් ගේන කෑම එක කාපු මිනිහෙක් මම. ඒ නිසා මම ජාතිවාදියෙක් නොවෙයි කියන කාරණය මුලින්ම කියන්න ඕනෑ.

උතුරු නැහෙනහිර අතුරුදහන් වූවා යයි සැලකෙන අය වෙනුවෙන් ඒ සහතික නිකුත් කිරීම පිළිබඳවත් කථා කරන මේ වෙලාවේ මම තමුන්නාන්සේට මේ කාරණය මතක් කරන්නම්. මේක වන්නේ 1983 සිට පටන් ගෙන තිස් අවුරුදු යුද්ධයකින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට මතක ඇති, 1988-89 කාලයේ -අවුරුදු දෙකක් ඇතුළත- 60,000ක් තරුණයන් මියැදුණු හැටි. මියැදුණා නොවෙයි මැරුවා. සමහර තරුණයන්ගේ බෙල්ලට ටයර් එක දමලා, කටට පෙට්‍රල් වක්කරලා ගිනි තියලා මරලා දැම්මා. ඒ අම්මාට කිව්වේ, ගෙදරින් ගත්තේ ඒ දරුවා හෙට උදේට ගෙරදරට එවන්නම් කියායි. හැබැයි, ඒ හැම අම්මා කෙනෙක්ම බලාගෙන හිටියේ තමන්ගේ දරුවා ගෙදර එනතුරුයි.

අද ගිහින් බලන්න, මාතර මුලටියන කියා හන්දියක් තිබෙනවා. ඒ මුලටියන හන්දියේ අම්මා කෙනෙක් ඉන්නවා. ඇය අවුරුදු 75කට වැඩිය වයසයි. මම ඇය දකින්න වෙලා දැන් අවුරුදු 25කට වැඩියි. ඒ අම්මා ළඟ ගෝනි දෙකක් තිබෙනවා. එක ගෝනියක තිබෙන්නේ පරණ රෙදි; කොහේ හෝ මුල්ලකින් අහුලාගෙන ආපු රෙදි. අනික් මල්ලේ තිබෙන්නේ ගල්. තමන්ගේ දරුවා අරගෙන ගිහින්. ඔහු තවම හොයා ගන්න නැහැ. ඒ අම්මා තවමත් මුලටියන හන්දියේ ඉඳගෙන හිතට එන කථා කිය කියා ඉන්නවා. ඇය පිස්සු වැටිලා ඉන්නේ. ඔළුව අවුල් වෙලා. ඒ මම දැකපු දකුණේ ඉන්න එක අම්මා කෙනෙක් විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් මම තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ. දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරයෙක් කථා කරද්දී කිව්වා, "උතුරු නැහෙනහිර ඉන්න දෙමළ මිනිසුන්ට තමන්ගේ පාඩුවේ ඉන්න දෙන්න" කියලා. ඒකේ ඊට එහා ගිය අර්ථය නම්, ඔවුන්ට වෙනමම ඉන්න දෙන්න කියන ඉල්ලීමයි ඒ කළේ. මම මේ අවස්ථාවේ මතක් කරනවා, තිස් අවුරුදු යුද්ධය නිමා කරන්න මහින්ද රාජපක්ෂ මැතිතුමා දායක වුණා කියන කාරණය මම දන්නේ දෙවැනි කාරණය හැටියට බව. මහින්ද රාජපක්ෂ මැතිතුමා නොවෙයි, තිස් අවුරුදු යුද්ධය නිමා කළේ. මේ හැම දෙයක්ම සොබාදහම තමයි පාලනය කරන්නේ. මම විශ්වාස කරනවා, මේ පොළොව බෙදෙන්න එපා කියන පළමු පණිවිඩය දුන්නේ සොබාදහමයි කියන එක. සොබාදහමට අනුගත වෙලා යුද්ධය අවසන් කළා.

මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. උතුරේ සමහර පවුල්වලට ගිහිල්ලා, තමන්ගේ දරුවා තුරුළු කරගෙන ඉන්න ඒ අම්මාගේ ඇකයෙන් දරුවන් ගලවලා -අම්මා ඇතට විසිකරලා දමා- අරගෙන ඇවිල්ලා එල්ටීටීඊ සංවිධානයට බඳවා ගත්තා. තමන්ගේ දරුවා එනකම් ඒ අම්මා තවම බලාගෙන ඉන්නවා. සමහර විට ප්‍රේමදාස ජනාධිපතිවරයාට බෝම්බය බැඳගෙන පැනපු දරුවා, ඒ දරුවා වෙන්න පුළුවන්. පාසල්වලට පැනලා පාසල්වලින් සමහර දරුවන් අරගෙන ගියා. ජෙයරාජ්

ප්‍රනාන්දුපුල්ලේ හිටපු ඇමතිවරයාගේ කඳ දෙකඩ කරපු දරුවා, ඒ පැහැර ගෙන ගිය දරුවා වෙන්න පුළුවන්. අපි දන්නේ නැහැ. නමුත් ඒ අම්මා තමන්ගේ දරුවා ගෙදර එනකම් තවම බලාගෙන ඉන්නවා. ඒ අතුරුදහන්වීම් ඇතුළට ඒ දරුවාත් ඇතුළත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එල්ටීටීඊ සංවිධානය විසින් නැඟෙනහිරින් මුස්ලිම් ජනතාව එළවනකොට ඔරුවේ නැගලා සමහරු ආවා; සමහරු පුත්තලමට පයින් ආවා. ඔරුවේ අට දෙනෙකුට, දහ දෙනෙකුට විතරයි යන්න පුළුවන්. නමුත් විස්සක් තිහක් එක ඔරුවේ නැග්ගා. සමහර අම්මලා තමන්ගේ දරුවා ඇකයේ හොවාගෙන තද කරගෙන පැය ගණනක් ඔරුවේ ආවා. අත හිරිවැටිලා ඇයටත් නොදැනීම තමන්ගේ දරුවා මහ මුහුදට වැටුණා. ඉතින් යන එකේ තේරුමක් නැහැ කියලා ඒ අම්මත් මුහුදට පැන්නා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුස්ලිම් ජනතාවට අවසානයේ අමතක වුණා, ඒ මිනිසුන්ට ජීවිතය දුන්නේ මහින්ද රාජපක්ෂ කියලා. ඔවුන් ජනවාරි 8 වෙනිදා කතිරය ගැහුවේ අනික් පැත්තට. මොකක්ද, තත්ත්වය? ලෝකයේ සාමාන්‍ය ස්වභාවය, සාමාන්‍ය තත්ත්වය නායකයෙක් එළියට දමනවා නම් ඊට වඩා දක්ෂ නායකයෙක්, දක්ෂ මිනිහෙක් ගෙන ඒමයි. ඒක තමයි ලෝකයේ න්‍යාය වන්නේ. නැඟිටින රටවල විධිය ඒකයි. හැබැයි, අපේ රටේ මොකද වුණේ? අපේ රටේ වෙච්ච දේ තමුන්නාන්සේලා දන්නවා. හැබැයි, මේ එකින් එක පපුවලට තට්ටු කරලා වෙච්ච දේ මොකක්ද, කියලා බලන්න. ඔවුන් කියාවි සත්‍ය මොකක්ද, කියලා. එදා මේ ආණ්ඩුවට කොඩිවැල් දමපු ජනතා විමුක්ති පෙරමුණ අද ගල්වලින් ගහනවා. ඒ ගොල්ලෝ හැම දේකටම දොස්තරලා දන්නවා. හැබැයි, ඒ ගොල්ලෝ දැනගෙන හිටියේ නැහැ රට යන පැත්ත මේකයි කියලා. රටට හැදෙන ලෙඩේ මේකයි කියලා ජනතා විමුක්ති පෙරමුණ පෙන්වා දුන්නේ නැහැ. හැබැයි, ලක්ෂ හතරක්, පහක් රටේ තිබෙන ඡන්ද තවමත් තමන්ගේ ගොඩට එකතු කර ගන්න ඔවුන් උත්සාහ කරනවා. මොකද, ඔවුන් ගත් මහ නිවැරදියි කියා පෙන්වන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ තව කාරණයක් තිබෙනවා. ඒක තමුන්නාන්සේ දන්නවා. දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරයෙක් මෙතැනදී කිව්වා, "මට සැකයි මේ ආණ්ඩුව මේ කරන්න හදන්නේ අපිව රැවටීමක්ද? එහෙම නැත්නම් ජාත්‍යන්තරයට මේක නිකම් පෙන්වා දෙන්න කරන්න හදන දෙයක්ද?" කියලා. මම කියනවා, ඔව්. මේ කරන්නේ ඔබව රැවටීමක්. ඔබ විතරක් නොවෙයි, ජාත්‍යන්තරයත් රැවටීමක් මේ කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පොළවේ සැබෑ සංහිඳියාව හදනවා නම් කරන්න තිබෙන්නේ එක දෙයයි. ඒ මේ පොළොවේ සැබෑ ආදරය වැපිරීම විතරයි. එහෙම නැතිව ඔවුන්ට අවශ්‍ය දේ වෙන් වෙන්ව කඩලා දීලා ඉවර වෙලා දකුණේ සිටින ජනතාව උළුප්පන එකවත්, දකුණේ ජනතාවගේ අයිනිවාසිකම් නැති කරලා ආපසු සැරයක් මෙන්න අපේ අයිනිවාසිකම් ලැබුණා කියලා දෙමළ සහ මුස්ලිම් මිනිස්සු රවටවන එකවත් නොවෙයි. දලුග්ගල ලැයිමේ නඩරාජා හදාගෙන එන හුළංකීරිය අලය කන්න මට පුළුවන් වුණා නම්, මේ රටේ හැම කෙනෙකුටම පුළුවන් ඒ සංහිඳියාව හදා ගන්න. හැබැයි, වැඩේ වෙලා තිබෙන්නේ උතුරේ ඉන්න මිනිස්සු ටික බලාගෙන ඉන්නවා, මගේ මිනිසුන්ගේ ඡන්දය මට විතරක් හදා ගන්නේ කොහොමද? කියලා. එතකොට කියන්න තිබෙන්නේ, "මේ ජාතියට වෙනම රටක් ඕනෑ" කියලා. අන්න එතැනදී ඔවුන්ගේ ජාතීන් ටික එකට එකතු වෙනවා. නමුත් දකුණට ඇවිල්ලා, ආණ්ඩුව ඇතුළත ඉන්න සමහර පිරිස් කියනවා, "එහෙම ජාතිවාදයක් නැහැ" කියලා.

සිංහල මිනිහෙකුට ගහලා, පාගලා කාණුවේ දැම්මත් අද නැඟිටවන්න එක මිනිහෙක්වත් නැහැ. ඇයි? "ජාතිවාදියෙක්" වනවා. "ජාතිවාදියෙක්" කියනවා. මම කියන්නේ, ඒක නොවෙයි වෙන්න ඕනෑ. හැම මුස්ලිම් මන්ත්‍රීවරයෙක්ම, හැම දෙමළ මන්ත්‍රීවරයෙක්ම අපේ සහෝදරයෙක් විධියට පිළිගන්න අපට පුළුවන්කම තිබෙනවා නම්, ඒ විධියට මේ රටේම පිළිගන්න පුළුවන්කමක් නැත්තේ ඇයි? එය පෙන්වන්නේ නැහැ. මවලා තිබෙන මිථ්‍යාව ඇතුළේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සහෝදරත්වය පෙන්වන්න මේ ආණ්ඩුව උත්සාහ කරන්නේ නැහැ. මේ ආණ්ඩුව වැරදි ගමනක යනවා. ජාත්‍යන්තරයත් ගොනාට අන්දවමින්, රටේ මිනිස්සුත් ගොනාට අන්දවමින් මේ යන්නේ වැරදි මාර්ගයක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම මම මතක් කරන්න ඕනෑ 1982 අවුරුද්දේ පැවැතුණු සංවර්ධන සභා ඡන්දය. සංවර්ධන සභා ඡන්දය දිනවන්න එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බස්වලින් මිනිසුන් පටවා ගෙන, කෝච්චියේ මිනිසුන් පටවා ගෙනයි ගියේ යාපනයට. යාපනයට ගිහින් යාපනයේ පුස්තකාලය ගිනි තිබ්බා. යාපනය පුස්තකාලය ගිනි තිබ්බාට පස්සේ, ඒක බලාගෙන හිටපු මුරකරුවා දරාගෙන ඉන්න බැරිව ගිනි මැලයට පැනලා, පිව්විලා මැරෙනවා. යාපන පුස්තකාලයේ මුරකරු හැටියට හිටියේත් අතිශය සුන්දර මිනිහෙක්. අතිශය සුන්දර මිනිහෙක්; මනුස්සයෙක්. මනුෂ්‍යත්වයෙන් පිරිණු මිනිහෙක් යාපනයේ හිටියේ. හැබැයි, ඒක වෙන් කළේ දේශපාලනඥයා විසින්. මම කියන්නේ, දෙමළ, මුස්ලිම් හා සිංහල ජනතාව අතර සැබෑ සමඟිය ඇති කරන්න අදටත් පුළුවන්; වුවමනාව තිබෙනවා නම්, අදටත් පුළුවන්. හැබැයි මේ ගෙන යන්නේ, ඒකාබද්ධ විපක්ෂයේ ඉන්නේ "ජාතිවාදින්" කියලා පෙන්නන්නයි. අපි ජාතිවාදියෝ නොවෙයි. අපි කවදාවත් ජාතිවාදියෝ නොවෙයි. අපි කියනවා, "සැබෑවටම රනිල් වික්‍රමසිංහ මහත්මයාට වඩා අපි ජාතිකවාදියෝ සහ දෙමළ මුස්ලිම් මිනිසුන් ගැන හිතන මිනිස්සු" කියලා. ඒක තමයි ඇත්ත. 1982-1983 කාලයේදි වාගේ අපි කවදාවත් මහජන පුස්තකාලය පුච්චන්න ගියේ නැහැ. යාපනයේ මිනිසුන්ට හානියක් කළේ නැහැ.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අලුත්ගම සිද්ධිය?

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
මම අලුත්ගම සිද්ධියත් කියන්නම්.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඕනෑ නම් අලුත්ගම සිද්ධිය ගැන මම කියලා දෙන්නම්.

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
අලුත්ගම සිද්ධිය මම කියන්නම්. සහෝදර මන්ත්‍රීතුමා, මුස්ලිම් මන්ත්‍රීවරයෙක් ඔය කථාව මතු කිරීම ගැන මට සතුටුයි. මේ කථාව මම කලින් කිව්වා. නමුත්, තමුන්නාන්සේට මම මතක් කර දෙන්න ඕනෑ.

එදා එල්ටීටීඊ සංවිධානය නැඟෙනහිරෙන් මුස්ලිම් ජනතාව එළවනකොට සහෝදර මන්ත්‍රීතුමා, ඒ ජනතාව මහ මුහුදට පැන්නා. හැබැයි, තමුන්නාන්සේලා අද බේරිලා ඉන්නේත් ඒ නිසා. අපට කවදාවත් කවුරුත් උගන්වලා නැහැ. අපි ඉගෙන ගෙන තිබෙන්නේ බුදු දහමෙන්. අපේ බුදු හාමුදුරුවෝ තමයි අපිට ඉගැන්වූයේ, "කෘතගුණ දක්වන්න" කියන දේ. බුදු වෙන්න පිට දුන්න බෝ ගහ දිහා සතියක් මුළුල්ලේ බලාගෙන ඉඳලා බුදු හාමුදුරුවෝ අපට ඉගැන්වූවා, කළගුණ සලකන විධිය. තමුන්නාන්සේලා මහින්ද රාජපක්ෂට කළගුණ සලකන්න එපා.

[ගරු එස්. ප්‍රේමරත්න මහතා]

ජීවිතය බේරලා දුන්නාට කළගුණ සලකන්න එපා. හැබැයි, පසුවෙන් හිතන්න. "මහින්ද නොහිටියා නම්, මමත් මෙතැන ඉන්න විධියක් නැහැ" කියන එක විතරක් හිතන්න. මමත් ඉන්න විධියක් නැහැ කියන එක විතරක් හිතන්න. තමුන්නාන්සේලා හෘදය සාක්ෂියත් එක්ක ජීවත් වන්න කියන ගෞරවනීය ඉල්ලීම මා මේ වෙලාවේදී කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේදීත් කියනවා, මේ ආණ්ඩුව විවිධ පනත් ගෙනෙනවා. විවිධ පනත් ගෙනැල්ලා මේ ආණ්ඩුව හදන්නේ, බොයිලර් කුකුළු පැටියෙක්. ගරු මංගල සමරවීර අමාත්‍යතුමා මගේ දිස්ත්‍රික්කයේ එවකට හිටිය නායකතුමා; අදත් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් එම දිස්ත්‍රික්කයේ නායකතුමා. එතුමා කිව්වා, "මේ පනත් කෙටුම්පත ගෙනෙන්න කිසිම හදිසියක් තිබුණේ නැහැ" කියලා. කිසිම හදිසියක් තිබුණේ නැහැ කිව්වා. හැබැයි, මේ හැම දේම සෙප්පඩ විජ්ඡාවක්. මේකට කියන්නේ, "සෙප්පඩ විජ්ඡාව" කියලා. මේකට අපි සාමාන්‍යයෙන් ජන වහරේදී කියනවා, "වයර් මාරු වුණු බුදුරැස් වළල්ල" කියලා. වයර් මාරු වුණාට පස්සේ තැන් තැන්වලිනුයි පත්තු වෙන්නේ. අපට හොයා ගන්න බැහැ බුදු රැස් වළල්ල හරියට පත්තු කරන්නේ කොහොමද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ ආණ්ඩුවට වෙලා තිබෙන්නේත් ඒකයි. මේ ආණ්ඩුවට අද වෙලා තිබෙන්නේ, වයර් මාරු වුණු බුදු රැස් මාලාව වාගේ වැඩක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කලින් කිව්වා මිනිහෙක් ඉපදෙන විධිය. මිනිහෙක් ඉපදෙන්න ශුක්‍රාණු මිලියන 500කින් එකයි වැඩ කරන්නේ. ඒකෙන් තමයි මිනිහෙක් ඉපදෙන්නේ. ඒකෙන් ඉපදුණු මිනිහෙක් විධියට පාර්ලිමේන්තුවට ඇවිල්ලා මම මේ වෙලාවේ කියනවා, "රටට ඕනෑ විධියේ, ජනතාවට ඕනෑ විධියේ, මේ රටේ ජීවත් වන සැබෑ මිනිසුන්ට වුවමනා වන විධියේ ඇත්ත මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න" කියා. නිකම්ම නිකම් ශුක්‍රාණුවක් විධියට ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ වැඩ කිරීම නොවෙයි අපි කරන්න ඕනෑ. අපි කරන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සැබෑ මිනිසුන්ට ඕනෑ කරන, සැබෑ මිනිසුන්ගේ යහපත වෙනුවෙන් ඕනෑ කරන සත්‍ය මේ පොළොවේ වපුරණ එකයි. ඒකයි ඕනෑකම. හැබැයි, මේ වෙලාවේ අපට පෙනෙන්නේ "බුදු හිමියන්ටත් කලියුගයේ දෙවියන්ගේ පිහිටයි." කියලා. ඒක තමයි මේ වෙලා තිබෙන්නේ. සැබෑ ධර්මයක් කවුරුවත් රකින්නේ නැහැ. ඉස්ලාම් ආගමත් එහෙමයි. ක්‍රිස්තියානි ආගමත් එහෙමයි. බුද්ධාගමත් එහෙමයි. බෞද්ධයෝ නැහැ. කිතුණුවෝ නැහැ. ඉස්ලාම්වරු නැහැ. එක එක්කෙනා තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් තමයි ක්‍රියා කරන්නේ. කවුරුත් කියලා නැහැ, "ආගම රැකපන්." කියලා. බුදු හාමුදුරුවෝ කියලා නැහැ, "බුදු දහම රැකපන්" කියලා. හැබැයි, මිනිහෙක් බුද්ධාගමේ සැබෑ අර්ථය දන්නවා නම්, බුද්ධාගම රකිනවා. කිසිම ආගමකින් කියලා නැහැ, තමන්ගේ ආගම රැකපන් කියලා. බුදු හාමුදුරුවෝ කියලා තිබෙන්නෙත්, "බුදු දහම රදා පවතින්නේ, අවුරුදු 5,000යි." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට මේ කාරණය ගැනත් මතක් කරමින් මම කථාව අවසන් කරන්නම්. එතුමා කිව්වා, "අලුත් පක්ෂ හදන්න එපා. එහෙම හැදුවොත් එදාට ඒගොල්ලන්ට සිදු වන්නේ පාරේ ඇවිද ඇවිද සිටීම තමයි" කියා.

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)
හදන්න එපා කිව්වේ නැහැ.

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
හදන්න කියලා! හරි. මම මේ වෙලාවේ කියනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුදු හාමුදුරුවෝ කිව්වෙත්, "සියලු දේ නැසෙනවා" කියලායි. මම මේ වෙලාවේ ප්‍රාර්ථනා කරනවා, බුදු දහම පවතිනවාටත් වඩා අවුරුදු දස දහස් ගණනක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ පොළොවේ පවතීවා! කියලා.

හැබැයි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ පොළොවේ තියේවි. හැබැයි, 'එක රටක්' කියන එක මේ පොළොවේ නැති වේවි. තමුන්නාන්සේලා යන්න හදන්නේ එතැනටයි. අපි පක්ෂය හැදුවොත්, අන්න එදාට පාරේ කවුරු හරි ඇවිදගෙන යාවි. හැබැයි, මේ කෙනහිලිකම් රටට කරන මිනිසුන්ට පාරේ ඇවිදගෙන යන්න සත්‍ය අවබෝධ කර ගත්ත සිංහල මිනිස්සු, දෙමළ මිනිස්සු, මුස්ලිම් මිනිස්සු ඉඩ තියන එකක් නැහැ.

අවසාන වශයෙන් මම මේ දේත් කියන්න ඕනෑ. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, මට පසු ගිය දවසක මුස්ලිම් සහෝදරයෙක් හම්බවුණා. ඒ සහෝදරයාත් මට කිව්වේ, තමුන්නාන්සේ කිව්ව බේරුවල කතාන්දරයමයි. ඒ සහෝදරයා මට කිව්වේ, "මහත්තයෝ, පල්ලිය ගිනි තියනවා කියලා බොරුවට කවුරු හරි රැහුවත්, මේ ගොන් වැඩේ නම් ආපහු කරන්නේ නැහැ" කියලායි. පල්ලිය ගිනි තියනවා කියලා කිව්වත්, මේ ගොන් වැඩේ ආපහු කරන්නේ නැහැ කියලා ඒ සහෝදරයා කිව්වා. මේ තමයි සාමාන්‍ය මිනිසාට සත්‍ය අවබෝධ වන විධිය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමාට ගෞරවනීය ප්‍රණාමය පුද කරමින්, ඔබ සියලු දෙනාටම මගේ කථාව අසා සිටීම සම්බන්ධයෙන් ස්තුති කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 4.40]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් කථා කරපු විපක්ෂයේ ඒ කණ්ඩායමේ මන්ත්‍රීවරයාගේ අදෝනාව මම අහගෙන හිටියා. එතුමා ලොකු අදෝනාවක් කළා. සාමාන්‍යයෙන් එතුමන්ලාගේ කණ්ඩායමේ ඉන්න අනෙක් මන්ත්‍රීවරුන්ට වඩා එතුමා හෘදය සාක්ෂිය ගැන කථා කළා; අවංකභාවය ගැන කථා කළා. ඔය වාගේ කථා මම මීට කලින් අහලා තිබෙනවා. 88-89 කාලයේ සුනිල් මාධව කියලා මාධ්‍යවේදියෙක් හිටියා. ඒ මාධ්‍යවේදියාත් ඔය වාගේ තමයි කථා කරන්නේ. දැන් කථා කරපු ගරු මන්ත්‍රීතුමාත් මාධ්‍යවේදියෙක් වශයෙන් කටයුතු කරලා, මාධ්‍යයට සම්බන්ධයක් තිබෙන නිසා තමයි ඔය වාගේ මාධ්‍යයට සම්බන්ධ වචන පාවිච්චි කරලා කථා කරන්නේ. එතුමා කළේ ලොකු අදෝනාවක්. ඒ කථාවේ සාරාංශය ගත්තාම ඒ කණ්ඩායමේ ඉන්න සමහර මන්ත්‍රීවරුන්ගේ කථාවලට වඩා යම් යම් වෙනස්කම් තිබෙනවා. නමුත් අවසානයේදී එතුමා ආයෙත් එකම තැනටමයි එන්නේ.

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
ඒක නරකයි ද?

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි විශේෂයෙන්ම මේ අද අපි ඉදිරිපත් කරලා තිබෙන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව අද දවස පුරා පැවැත්වෙන විවාදයට අපි විශේෂයෙන්ම ආවේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතත් එක්ක මේ පනත් කෙටුම්පතේ සම්බන්ධයක් තිබෙන නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉස්සෙල්ලාම කියන්න ඕනෑ, මේ පනත් කෙටුම්පත ගැන විශාල විවාදයක් තිබුණු බව. 88-89දී මේ රටේ තිබුණු භීෂණයත් එක්ක එදා හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් හිටපු, අද කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කරන ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමායි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමායි අපේ රට තුළ Amnesty International සංවිධානයේ ශාඛාවක් පිහිටුවන්න ඕනෑ කියලා එදා උද්ඝෝෂණය කළා. මේ රට තුළ අතුරුදන් වූ අය සොයන්න ජාත්‍යන්තර Amnesty International සංවිධානයේ -ක්ෂමා සංවිධානයේ- ශාඛාවක් ලංකාවේ ස්ථාපිත කරන්න කියලා, අද කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා එදා හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා වෙලා සිටියදී ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා එක්ක එදා ජිනීවා නුවරට ගිහිල්ලා ඉල්ලීමක් කළා. එදා එහෙමයි ඒ ගොල්ලන් වැඩ කළේ. එදා ඒ ඉල්ලීම කරලා, අද නැවත වතාවක් අපිව ආපස්සට ගේන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවගේ පැත්තෙන් ගත්තාම මේක විශාල ජයග්‍රහණයක් බව අපි දන්නවා. මොකද, මේ රටේ අතුරුදන්වූවන් පිළිබඳ ප්‍රශ්නය දකුණට විතරක් නොවෙයි, උතුරට විතරක් නොවෙයි, නැඟෙනහිරට විතරක් නෙවෙයි, මේක රටේ සමස්තයක් විධියට බලපාන ප්‍රශ්නයක්. යම් යම් දේශපාලන කාරණා මත අතුරුදන් වුණ අය ඉන්නවා. ඒ වාගේම දේශපාලන කාරණාවන් නැතිව අතුරුදන් වුණ අය ඉන්නවා. යම් යම් පෞද්ගලික වුවමනාකම් මත අතුරුදන් වුණ අය ඉන්නවා. ඒ නිසා අපි දන්නවා, "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය" ජනතාව ලබා ගත් විශාල ජයග්‍රහණයක් බව. විශේෂයෙන්ම අපේ ආණ්ඩුව 2015දී ලබා ගත් ජයග්‍රහණයත් එක්ක මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, මේ රටේ තිබෙන සමාජ සාධාරණත්වය වෙනුවෙන් පසු ගිය කාලය පුරාම අපි යම් යම් ආයතන ස්ථාපිත කළා. අපි විශේෂයෙන්ම අධිකරණයේ ස්වාධීනත්වය, පොලිස් කොමිසම, රාජ්‍ය සේවා කොමිසම, අල්ලස් කොමිසම පිහිටුවලා, මේ රටේ රාජ්‍ය ආයතනවලට ස්වාධීනව වැඩ කරන්න පුළුවන් පරිසරය නිර්මාණය කළා. ඒක ස්ථාපිත කළා. පසු ගිය කාලයේ අපි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගෙනාවා. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරලා, ප්‍රජාතන්ත්‍රවාදය මේ රට තුළ ස්ථාපිත කරලා, ඒවා ජනතා ජයග්‍රහණ හැටියට තමයි අපි දකින්න ඕනෑ. මේ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත අපි ගෙනැල්ලා තිබෙන්නේත් ජනතාවගේ පැත්තෙන් ලබා ගත්ත විශාල ජයග්‍රහණයක් හැටියටයි. උතුරේ තරුණයන් වෙන්න පුළුවන්, දකුණේ තරුණයන් වෙන්න පුළුවන්, නැඟෙනහිර තරුණයන් වෙන්න පුළුවන්, මේ සියලු දෙනාම මේ රටේ ඉපදිච්ච තරුණයෝ; මේ රටේ අම්මලා, තාත්තලාට ඉපදිච්ච දුවා දරුවන්. ඒ නිසා ඒ කවුරුවත් අතුරුදහන් කරන්න කාටවත් අයිතියක් නැහැ. කවුරුන් හෝ අතුරුදහන් කරනවා කියලා කියන්නේ ඒක සාපරාධී ක්‍රියාවක්. එවැනි පුද්ගල අතුරුදහන් කිරීමක් කරන්න නීතියෙන් අයිතියක් කාටවත් ලබා දීලා නැහැ. යම් යම් දේවලට සම්බන්ධ වැරදිකාරයන් ඉන්නවා නම්, එවැනි අයට කටයුතු කරන්න මේ රටේ අධිකරණයක් තිබෙනවා. ඒ අධිකරණ ක්‍රියාවලියට අපි ඒ අයව සම්බන්ධ කරන්න ඕනෑ. එහෙම නැතිව, කිසියම් පුද්ගලයකුව අතුරුදහන් කිරීම සාපරාධී වරදක් ලෙස අද ජාත්‍යන්තරව පිළිගෙන තිබෙනවා. ඒ අනුව අපි දන්නා දෙයක් තමයි, එය අනිවාර්යෙන්ම දඬුවම් ලැබිය යුතු වරදක් කියන එක. ඒක මානව වර්ගයාගේ පැත්තෙන් බැලුවත් අපරාධයක් වනවා. ඒ නිසා මේ ආයතනය ස්ථාපිත කිරීමේ මූලික අරමුණු වූයේ, ඉදිරි කාලය තුළදී රට තුළ මෙවැනි දේවල් ක්‍රියාත්මක නොවීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ජනතාවගේ පැත්තෙන් බැලුවොත් විශාල ජයග්‍රහණයක් හැටියටයි අපි දකින්නේ. පසු ගිය මැතිවරණ කාලවලදී ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් යහ පාලන රජය විසින් ලබා දීපු ඒ පොරොන්දු එකින් එක අද අපි ඉෂ්ට කරගෙන ඉදිරියට යනවා. නැවතත් මේ රට ආපස්සට ගෙන යන්න නොදී, ලෝකයත් එක්ක -ජාත්‍යන්තරයත් එක්ක- එකතු වී මේ රට ඉදිරියට ගෙන යන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. 2015දී මානව හිමිකම් කොමිසමේ සියලුම රටවල සහයෝගය අපට ලබා ගන්න පුළුවන් වුණා. ඉන්දියාව, චීනය, රුසියාව යනාදී සියලු රටවල සහයෝගය ලබා ගන්න අපට පුළුවන් වුණා. අප රටට එරෙහි ජාත්‍යන්තර පරීක්ෂණය ගැන තිබුණු භය අපට නැති වෙලා තිබෙනවා. අපට මතකයි, මේ තිබුණු භය නිසා, පසු ගිය කාලයේ -මැතිවරණ කාලවලදී- සමහර අය එක එක තැන්වල එක එක දේවල් දොඩව-දොඩවා ගිය අන්දම. නමුත්, ඒ ගොල්ලන්ගේ දෙඩවීම, ඒ ගොල්ලන්ගේ කියවීම අපේ යහ පාලන ආණ්ඩුව යටතේ අද නවත්වා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. අද ජාත්‍යන්තරය අපිත් සමඟ මේ මේ ගමන යන්න එකතු වෙලා තිබෙනවා. ඒ සඳහා අද අපි ලැහැස්ති වෙලා සිටිනවා. ඒ වාගේ මොහොතක තමයි අපි අද මේ පනත් කෙටුම්පත ගැන කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ජාතික සංහිඳියාව ඇති කර ගත්ත මොහොතක්. මේක විශාල ජයග්‍රහණයක්. ඒ නිසා මේ ඒකාබද්ධ කණ්ඩායම නැවත මේ රටේ ජාතිවාදය අවුස්සන්න පුළුවන්ද කියලා බලනවා. ඒ අය මේකට කියන එක දෙයක් තිබෙනවා. ඒ තමයි, අපි හමුදාව බිල්ලට දෙන්න හදනවා; අපි හමුදාව පාවලා දෙන්න හදනවා කියන එක. මේ පනත් කෙටුම්පතේ කොහේවත් එහෙම එකක් සඳහන්ව නැහැ. දැන්, මේ දේශප්‍රේමී කණ්ඩායමම තමයි අපි හමුදාව පාවලා දෙන්න හදනවා; අපි හමුදාව බිල්ලට දෙන්න හදනවා කියලා ලෝකයට කියන්නේ. හමුදාවේ සොල්දාදුවෝ 5,100ක් අතුරුදහන් වෙලා තිබෙනවා. එතකොට ඒ හමුදා සොල්දාදුවන් 5,100ක් අතුරුදහන් කළේත් හමුදාවද කියලා මේ ඒකාබද්ධ කණ්ඩායමෙන් අපට අහන්න සිදු වනවා. මොකද, මේ අය කියන්නේ අපි අපේ හමුදාව පාවලා දෙන්න හදනවා කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම දෙයක් නැහැ. නමුත්, මේකේ පොඩි අවදානමක් තිබෙනවා. මොකක්ද, ඒ අවදානම? පසු ගිය කාලය පුරාම මේගොල්ලෝ මේ රටේ ජාතිවාදය අවුස්සන්න බොහෝ උත්සාහයන් කළා. නමුත්, එය කර ගැනීමට නොහැකිවීමෙන් ඇති වූ පරාජය තුළ ඔවුන්ගේ ඒ වියරුව නතර කළත්, නැවතත් එය පටන් ගෙන තිබෙනවා. මේ අය ත්‍රිවිධ හමුදාව ගැන කථා කරමින්, අපි එය බිල්ලට දෙන්න හදනවාය කියලා කියමින් ත්‍රිවිධ හමුදාව උසි ගන්වන්නයි මේ හදන්නේ. ඒ කියන්නේ, මෙවැනි දේ තුළින් හමුදාවට ආමන්ත්‍රණය කරනවා. ඒ ආකාරයට හමුදාවට ආමන්ත්‍රණය කිරීම තුළින් ඒගොල්ලෝ බලාපොරොත්තු වනවා ඇති, මේ රජයට විරුද්ධව හමුදාවේ කුමන්ත්‍රණයක්, හමුදාවේ කැරැලිකාරත්වයක් මතු කරන්න පුළුවන්ද කියලා. එවැනි උත්සාහයක් මේ කණ්ඩායම ඇතුළේ තිබෙනවාය කියන එක අපි මතක තියා ගන්න ඕනෑ. මොකද, මේගොල්ලෝ කථා කරන්නේ ත්‍රිවිධ හමුදාව ගැන.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි ක්‍රියාවන් තුළින් හමුදාව උසි ගන්වලා, හමුදාව භය කරවලා, හමුදාව පාරට ගෙනෙන්න පුළුවන්ද කියන සටන් පාඨයක් මේක ඇතුළේ තිබෙනවායි කියන එක ගැන අපේ අවධානයට ලක් කර ගන්න ඕනෑ. ඒ නිසා අපි මෙය ලෙහෙසියෙන් තකන්න හොඳ නැහැ. මෙවැනි සටන් පාඨයක් භාවිත කිරීම ඉතාම බරපතළ ප්‍රශ්නයක්. හමුදාව ගැන කථා කරලා දේශපාලනයට හමුදාව ඇඳා ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අය පරාජය වෙලා වියරු වැටිලායි ඉන්නේ. ඒ ගොල්ලන්ට නැවත බලය ලබා ගැනීම ගැන පේනතෙක් මානයක විශ්වාසයක් නැහැ. ඒ ගොල්ලන්ට බලය නැවත ලබා ගන්න පුළුවන් කියලාත් විශ්වාසයක් නැහැ. ඒ අයගේ හැම ක්‍රියාකාරිත්වයක් දෙසම බැලුවාම අපට පෙනී යන්නේ, ජනතාවගෙන් වියෝ වුණු, ජනතාවගෙන් ඈත් වුණු ක්‍රියාකාරිත්වයක් තමයි තිබෙන්නේ කියන එකයි.

පාද යාත්‍රාව ගැන අපි බැලුවා. පාද යාත්‍රාව අසාර්ථකයි. ඒ අය හැම දෙයකින්ම බැලුවේ පාර්ලිමේන්තුවේ කටයුතු කඩාකප්පල් කරන්න පුළුවන්ද කියලායි. හැමදාම පාර්ලිමේන්තු සැසිවාරයේ පළමුවෙනි පැය දෙක තුළදී ගරු සභාව මැදට පැනලා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය අවුල් කරන්න පුළුවන්ද කියලා බැලුවා. ඒක අසාර්ථකයි. පසු ගිය කාලයේ මේ යහ පාලනයට විරුද්ධව ගන්න උත්සාහ කරපු හැම දෙයක්ම -හැම වැඩසටහනක්ම, හැම වැඩ පිළිවෙළක්ම- අසාර්ථක වුණා. ඒ අසාර්ථක වීම නිසා නැවත ඒ අය බලනවා, කෙටි මාර්ගයකින් බලයට එන්න පුළුවන් ක්‍රමය මොකක්ද කියා. කෙටි මාර්ගයකින් බලය අල්ලන්න පුළුවන් ක්‍රමය මොකක්ද කියන එක ගැන මේ ඒකාබද්ධ කණ්ඩායම අද කල්පනා කරමින් ඉන්නවා. 'හමුදාවට ආමන්ත්‍රණය' කියන එක එහි එක ප්‍රතිඵලයක්; එක සටන් පාඨයක් බව අප මතක තියාගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි එයට මුහුණ දෙන්න ලැහැස්ති වන්න ඕනෑ. රජයක් හැටියට ඒ දේශපාලනික මතවාදය පරාජය කරන්න අපි ලැහැස්ති වන්න ඕනෑ. මොකද, මේ රටේ ජාතින් අතර සංහිඳියාව ඇති කරලා, මේ රටේ ජාතින් අතර එක්සත්කම හදලා, මේ රටේ යුද ගිනි දැල් අවුළන ඒ බලවේග පරාජය කරලා, එක්සත් රටක්, ශ්‍රී ලාංකිකයන් ලෙස අපට එකට වැඩ කරන්න පුළුවන් රටක්, එකට ගමනක් යන්න පුළුවන් රටක්, යහපත් අනාගතයක් ගැන සිතන්න පුළුවන් රටක් ලෙස මේ රට හදන්න තමයි අපි 2015 ජනවාරි මාසයේදී ඒ ජන වරම, යහ පාලනයේ ජයග්‍රහණය ලබා ගත්තේ. එහෙම නම්, ඒ ජන වරම ආරක්ෂා කිරීමේ වගකීම රජයක් හැටියට අපට තිබෙනවා. ඒ නිසා මේ රට ආපස්සට ගෙන යන්න, මේ රට නැවත ම්ලේච්ඡත්වය කරා ගෙන යන්න, ජාතිවාදය අවුස්සා මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජාතින් අතර භේද භින්නතා ඇති කරලා නැවත මේ රට විනාශ කරන්න කාටවත් ඉඩ දෙන්න අපට බැහැ. අප ලබාගත් ඒ ජයග්‍රහණ -මේ රටේ ජනතාවගේ ජයග්‍රහණ- ආරක්ෂා කිරීම වෙනුවෙන් අපි පෙනී සිටින්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ඇවිල්ලා සිටින මේ කාල පරිච්ඡේදය ඉතාම වැදගත් කාල පරිච්ඡේදයක්. මා විශ්වාස කරනවා, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය හැදීම ඉතාම ප්‍රජාතන්ත්‍රවාදි ජයග්‍රහණයක් කියා. මේ කාර්යාලය, උතුර, නැඟෙනහිර විතරක් නොව දකුණ, බස්නාහිර ඇතුළු සියලු ප්‍රදේශවල ජනතාවට, තමන්ගේ තාත්තා අහිමි වූ, තමන්ගේ ස්වාමිපුරුෂයා අහිමි වූ, තමන්ගේ භාර්යාව අහිමි වූ, තමන්ගේ සහෝදරයා අහිමි වූ සියලුදෙනාට මනුෂ්‍යත්වයේ නාමයෙන් සාධාරණත්වය ඉෂ්ට කිරීම වෙනුවෙන් හදපු කාර්යාලයක්. ඒ කාර්යාලය ජනතාවගේ පැත්තෙන් ජනතාව ලබාගත් ජයග්‍රහණයක්. ජනතාව ලබාගත් ඒ ජයග්‍රහණය ජාතිවාදයට, ආගම්වාදයට, ම්ලේච්ඡත්වයට යට කරන්න නැවත ඉඩ දෙන්න එපා කියන එක තමයි අපි රජයෙන් ඉල්ලන්නේ. රජයේ වගකීම හැටියට අප දකින්නේ එයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන්, තවත් කාරණයක් කියන්න මා කැමැතියි. පසු ගිය කාලය පුරා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම වෙනුවෙන් මේ යහ පාලන ආණ්ඩුව පියවර කීපයක් ගෙන තිබෙනවා. අපි ඒ පියවර කීපය සාර්ථකව ඉදිරියට ගෙන ගිහින් තිබෙනවා. අපි ඒ සාර්ථකත්වය ආරක්ෂා කරගන්න ඕනෑ. අපට දුර ගමනක් යන්න තිබෙනවා. මේ ලබාගත් ජයග්‍රහණ අප තවත් ඉදිරියට ගෙන යන්න ඕනෑ. ඒ ජයග්‍රහණය තවදුරටත් ආරක්ෂා කරගෙන ඉදිරියේදී කරන්න තවත් ලොකු දේවල් තිබෙනවා; සොයන්න තවත් දේවල් අපට තිබෙනවා. එක්නැළිගොඩට මොකද වුණේ කියන එක සොයන්න ඕනෑ. ලසන්ත වික්‍රමතුංගට මොකද වුණේ කියා සොයන්න ඕනෑ. තාජුඩීන්ගේ ඝාතනය ගැන සොයන්න ඕනෑ. එවැනි හුඟක් දේවල් සෙවීමේ කාර්යය ඉදිරියේදී අපට කරන්න තිබෙනවා. ඒවා සොයන්න නම්, ඒ වෙනුවෙන් සාධාරණත්වය ඉෂ්ට කරන්න නම් අප ලබාගත් මේ ජයග්‍රහණ ආරක්ෂා කරගෙන ඉස්සරහට යන්න ඕනෑ. මට කාලය ලබා දුන්නාට තමුන්නාන්සේට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා. එතුමාගේ කථාවට පෙර, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair and* THE HON. DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

[අ.භා. 4.53]

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අද මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත අපේ ගරු වජිර අබේවර්ධන අමාත්‍යතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන වෙලාවේ මටත් වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩ දීම ගැන නැවතත් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අතීතය දිහා බලන කොට අපි දැක්කා, පසු ගිය වකවානුවේ හිටපු පාලකයන් මේ රට පාලනය කළේ කොහොමද කියන එක. යුද්ධයෙන් පසුව -යුද ජයග්‍රහණයෙන් පසුව- එදා ඒ අය ජනතාවට දුන් පොරොන්දු මොනවාද? ඒ පොරොන්දු ඉටු කරගන්න බැරි වීම නිසා ඒ අය කෙරේ ජනතා ප්‍රසාදය, ජනතා විශ්වාසය නැති වුණා. නැති වූ විශ්වාසය යළි ඇති කරගන්න කොච්චර පොරොන්දු දුන්නත්, කොච්චර බොරු කිව්වත් ජනතාව එදා මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ප්‍රතික්ෂේප කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ කෙරෙන කටයුතුවල විනිවිදභාවයක් තිබෙන්න ඕනෑ. "රටේ සෑම ජාතින්ම එකමුතුව ජීවත් වන්න ඕනෑ, ජාතින් අතර සංහිඳියාවක් ඇති වන්න ඕනෑ" කියන අදහසින් තමයි මහ ජනතාව එළියට බැහැලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති වශයෙන් පත් කරන්න කටයුතු කළේ. ඒ තුළින් අපේ ආණ්ඩුවට හැකි වෙලා තිබෙනවා, මේ රටට අවශ්‍ය අණ පනත් සම්මත කර ගන්නත්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්නත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව සිදු වන විශාල කර්තව්‍යයක් තමයි මේ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කිරීම. මේ පනත් කෙටුම්පතේ වැදගත්කම වන්නේ අතුරුදහන් වූවන් සඳහා "දක්නට නොමැති බවට සහතිකයක්" ලබා ගැනීමට හැකි වීමයි. එදා අපේ රටේ අවුරුදු තිහක යුද්ධයක් තිබුණා. ඒ යුද්ධයෙන් මිනිස්සු අතුරුදහන් වුණා. උතුරු-නැහෙනහිර පමණක් නොවෙයි, දකුණේ ජනතාවටත් ඒක බලපෑවා. ඒ අතුරුදහන් වුණු පුද්ගලයන්ගේ අම්මලා, තාත්තලා, දරුවන්, ඥාතීන්, තමන්ගේ පුතා හෝ තාත්තා ගෙදර එනකල් බලා ගෙන ඉන්නවා. මේ පනත් කෙටුම්පත මඟින් ඒ අයට යම් කිසි සහතිකයක් ලබා දෙන්න පුළුවන්කම ලැබෙනවා. සමහර වෙලාවට ඒ අම්මලා, තාත්තලා, නැත්නම් සැමියා, බිරිඳ කර ගන්න දෙයක් නැති වුණාම ගිහිල්ලා මරණ සහතිකයක් ලබා ගන්නවා. මරණ සහතිකය ලබා ගන්නේ මොකද? මරණ සහතිකය ලබා ගත්තාම ඒ තුළින් සමෘද්ධි සහනාධාරය ලබා ගන්න පුළුවන්; බැංකුවකින් ණය මුදලක් ලබා ගන්න පුළුවන්; ඉඩම් අයිතිය ගැන කථා කරන්න පුළුවන් වන නිසායි. ඒ වුණාට අතුරුදහන් වුණු පුද්ගලයා මැරිලාද, නැද්ද කියලා දන්නේ නැහැ. අද ඉදිරිපත් කරලා තිබෙන මේ පනත් කෙටුම්පත අනුව දක්නට නොමැති බවට සහතිකයක් - Certificate of Absence - ලබා දීමට පුළුවන් වෙනවා. මම හිතන විධියට ඒක ඉතා වැදගත් දෙයක්. යම් පුද්ගලයෙක් තමන් හිටපු ස්ථානයට එන්නේ නැති වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඒ පුද්ගලයා කලින් සැරිසැරූ ප්‍රදේශයට එන්නේ නැති වෙන්න පුළුවන්. එහෙම එන්නේ නැති වෙන්න හේතු තිබෙනවා. යුද්ධය නිසා වෙන්න පුළුවන්, ස්වභාවික විපතක් නිසා වෙන්න පුළුවන්. එහෙම නැත්නම් බලහත්කාරයෙන් රැගෙන ගිය නිසා වෙන්නත් පුළුවන්, දේශපාලන ප්‍රශ්න නිසා. මේ පනත් කෙටුම්පත යටතේ ඒ අයගේ පවුල්වල අයට වගකීමක් ඇතුව කටයුතු කරන්න පුළුවන්කම ලැබෙනවා. යම් පුද්ගලයෙක් අතුරුදහන් වුණාට පසුව ඒ පවුලේ අයට ආර්ථික ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. මෙවැනි සහතිකයක් ලබා දීමෙන් ඔවුන් වෙනුවෙන් යම් සාධාරණයක් ඉටු වෙනවා.

මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, එදා ඒ පනත ක්‍රියාත්මක කරන්න කටයුතු කරන කොට හිටපු ජනාධිපතිතුමාගේ පුත්‍ර රත්නය ගිහිල්ලා වෙනම කූඩාරමක් ගහගෙන, එතැනට ඇවිල්ලා මරණ සහතිකය ලබා ගන්න, ඒ තුළින් විශාල මුදලක් ලබා දෙනවා කියලා බලපෑම් කරලා තිබුණා කියලා. මෙම පනත් කෙටුම්පත තුළින් එවැනි දෙයක් සිදු වන්නේ නැහැ. සෑම දෙනාටම සාධාරණය ඉටු වෙනවා. දකුණේ ජීවත් වෙන පුරවැසියන් හැටියට අපි දන්නවා, අපේ ගම්වල අතුරුදහන් වුණු රණවිරුවන්ගේ අම්මලා, තාත්තලා තමන්ගේ දරුවන් එයි කියලා තවම බලාපොරොත්තුවෙන් සිටින බව. ඒ අයගේ පවුල්වල අයට ළමයෙක් පාසලට ඇතුළත් කර ගන්න බැහැ; ආණ්ඩුවෙන් සහනයක් ලබා ගන්න බැහැ. මේ පනත් කෙටුම්පත අනුව ලබා දෙන Certificate of Absence තුළින් ඒ අයට යම් සාධාරණයක් ඉටු වෙනවා. ග්‍රාම නිලධාරිවරයාගේ නිර්දේශයෙන්, ප්‍රාදේශීය ලේකම්තුමාගේ නිර්දේශයෙන් ඒ අයට අවශ්‍ය සහන ලබා ගන්න පුළුවන් වන විධියට මෙයින් අවශ්‍ය විධිවිධාන යොදා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන විධියට මේ පනත් කෙටුම්පත තුළින් සමාජ සාධාරණය ඉටු වෙනවා. විපක්ෂයේ සිටින සමහර මන්ත්‍රීවරු හැම විටම ජාතිවාදය ඇති කරන්න හදනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලාංකිකයන් හැටියට අපි අපේ දේශපාලන අභිවෘද්ධියට ජාතිවාදය ඇදා ගන්නේ නැතුව, මේ රටේ ජනතාවගේ සුබ සිද්ධිය ගැන සිතා සෑම විටම කටයුතු කරන්න ඕනෑයි කියමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 5.01]

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)

(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත දෙ වැනි වර කියවා සම්මත කිරීමට නියමිත අද දිනයේදී ඒ පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. අද උදෑසන සිට පාර්ලිමේන්තුවේ කථා කළ ගරු ඇමතිතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමන්ලා මේ පිළිබඳව විවිධ මත හා අදහස් රාශියක් ඉදිරිපත් කළා. කෙසේ වෙතත්, මේ පාර්ලිමේන්තුවේ සිටින කිසිම මහජන නියෝජිතයෙකුට මේ පනත් කෙටුම්පතට විරුද්ධ වෙන්න පුළුවන්කමක් තිබෙනවාය කියලා මා විශ්වාස කරන්නේ නැහැ.

අපේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක්. ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය තිබෙන රටවල කැරලි කෝලාහල මතු වුණු විවිධ අවස්ථාවලදී, බහුතරයේ කැමැත්ත තිබෙන පාලන තන්ත්‍රය ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට පියවර ගත්තා. එසේ සිදු කිරීම රාජ්‍ය යන්ත්‍රයේම කොටසක්. උදාහරණයක් හැටියට ගත්තොත්, අපේ රටෙත් 1971 වර්ෂයේදී හා 1987-1989 වර්ෂවලදී ඇති වූ අවස්ථාවලදීත්, උතුරු හා නැහෙනහිර පළාත්වල විවිධ තත්ත්ව ඇති වුණු අවස්ථාවලදීත් ඒවා පාලනය කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී රටක් හැටියට අප පියවර ගත්තා. එවැනි තත්ත්ව පාලනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී රටක පාලකයන්ගේ යුතුකමක් වෙනවා; වගකීමක් වෙනවා. ඒ නිසා තමයි විවිධ කැරලි කෝලාහල ඇති වුණු අවස්ථා, එහෙම නැත්නම් වෙනත් දේශපාලන හේතු මත විවිධ තත්ත්ව ඇති වුණු අවස්ථා සියල්ලක්ම ආවරණය වන පරිදි මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

1951 උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත තුළිනුත්, 2010 වර්ෂයේ සම්මත කරගත් මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත තුළින් මේ රටේ සියලුම ජන කොටස්වලට අවශ්‍ය සහන යම් ප්‍රමාණයකින් ලැබී තිබෙනවා. ඒ වාගේම නොලැබුණු සහන විශාල ප්‍රමාණයකුත් තිබෙනවා. ලෝකයේම එහෙමයි. උදාහරණයක් වශයෙන් එසේ කැරලි කෝලාහල ඇති වුණු ආර්ජන්ටිනාව වාගේ රටක් ගත්තොත්, ඒ රටෙත් මෙවැනි පනත් කෙටුම්පතක් සම්මත කර ගැනීමෙන් පසු, ඒ කැරලි කෝලාහලවලට සම්බන්ධ වුණු සියලුදෙනාට ඒ තුළින් විශාල සහනයක් ලැබී තිබෙනවා. මරණ ලියාපදිංචි කිරීමේ පනතට 2010 වර්ෂයේදී ගෙන ආ සංශෝධන නිසා අපේ රටේ සුනාමි ව්‍යසනයට මුහුණ දුන් අයටත් යම් යම් සහන ලැබී තිබුණා. ඒ වාගේම වර්තමානයේදීත් විවිධ හේතු නිසා එසේ පීඩාවට පත් වුණු විශාල පිරිසක් සිටිනවාය කියා මා හිතනවා.

පසු ගිය කාලයේ පැවැති සියලුම පාලන කාල සීමා තුළ ඇති වුණු විවිධ තත්ත්ව මත, තම ඥාතියාගේ මෘත දේහය පවා ලබා ගත නොහැකිව, ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳව විශාල වශයෙන් ගැටලු ඇති වුණු අවස්ථා අපේ රටේ තිබෙනවා. අපේ ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ඒ සඳහා යෝජනාවක් ඉදිරිපත් කළා,

[ගරු වජිර අබේවර්ධන මහතා]

අතුරුදහන් වූ තැනැත්තන් වෙනුවෙන් ලබා දෙන සහතිකයේ කාල සීමාව වසර දෙකකට සීමා කරන්නේ නැතුව පුළුවන් නම් ඒ කාල සීමාව දිගු කරන්නය නැත්නම් විවෘතව තබන්න කියලා. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරගෙන යනකොට ඒ සඳහාත් අපට අවස්ථාව ලැබෙයි. එතකොට එවැනි පිරිස් අපහසුතාවකට පත් වෙන එකක් නැහැ කියලා මා හිතනවා.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ගත්තාම ප්‍රධාන කාර්යාලයක් තිබෙනවා; පළාත් කාර්යාල හතක් තිබෙනවා; උප කාර්යාල 45ක් තිබෙනවා; ප්‍රාදේශීය කාර්යාල 332ක් පමණ තිබෙනවා. ඒ නිසා උප්පැන්න, විවාහ හා මරණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට දැවැන්ත යාන්ත්‍රණයක් අපේ රට තුළ තිබෙනවා. ඒ සේවාව කඩිනම් කිරීම සඳහා සහ ඒ සේවාවේ තිබෙන අවශ්‍යතා ඉටු කිරීම සඳහා දැනට අපේ රජයත් මැදිහත් වෙලා වෙනස්කම් ගණනාවක් කරගෙන යනවා. ඒ නිසා එතුමා ඉදිරිපත් කළ යෝජනාව අනුව, කඩිනම් සේවාවක් සපයන ගමන්ම මේ ප්‍රශ්නවලට විසඳුම් හොයන්නේ කොහොමද කියලා අනාගතයේදී කල්පනා කර බලන්න අපට පුළුවන් වෙයි කියා මා හිතනවා.

කෙසේ වෙතත්, මේ පනත් කෙටුම්පත හරහා දේශපාලන කාරණා ගණනාවක් ඒ ඒ පක්ෂ අනුව, ඒ ඒ මත අනුව ඉදිරිපත් වුණා. මීට පෙර කථා කරපු අපේ තරුණ මන්ත්‍රීවරයා -නිරෝෂන් ප්‍රේමරත්න මන්ත්‍රීතුමා- කිව්වා, මාතර ඉන්න කාන්තාවක් සම්බන්ධයෙන්. ඒක ඇත්ත වෙන්න ඇති. මාතර ඉතිහාසය ගත්තොත්, මාතර ඉතිහාසයේ මූලික අයිතිවාසිකම් අභිමිවූවන් විශාල පිරිසක් ඉන්නවා. උදාහරණයක් මම කියන්නම්. මේ පාර්ලිමේන්තුවේ හිටපු ජිනදාස වීරසිංහ මන්ත්‍රීතුමා ඝාතනය වුණා. එතුමාගේ දේහය තිබුණු නිසා අපට එතුමා වෙනුවෙන් මරණ සහතිකයක් දෙන්න පුළුවන්කම ලැබුණා. හැබැයි, ඒ කැරලි කෝලාහලවලට සම්බන්ධ වෙච්ච සංවිධානවල අය මියැ ගිහිල්ලා තිබුණොත්, ඔවුන්ගේ දේහ හම්බ වෙලා නැත්නම් අපට මරණ සහතිකයක් දෙන්න පුළුවන්කමක් නැහැ. මාතර දිස්ත්‍රික්කයේ ඉන්න පුළුවන් ඒ අයිතිවාසිකම් ලබා ගන්නට නොහැකි වෙච්ච විශාල පිරිසක්. ඕනෑම ආගමක් අනුව, ඕනෑම ජාතියක් අනුව, ඕනෑම ජන වර්ගයක් අනුව මේ රටේ මූලික අයිතිවාසිකම් වැඩියෙන්ම ආරක්ෂා කරන්න පුළුවන් පනත් කෙටුම්පතක් හැටියට තමයි මේ පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඇත්ත වශයෙන්ම මේ පනත් කෙටුම්පත 2013 දෙසැම්බර් මාසයේ මහින්ද රාජපක්ෂ පාලන සමයේත් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වෙලා තිබෙනවා. 2014 වර්ෂයේත් මේ පනත් කෙටුම්පත ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා මාර්ගයෙන් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකට සංශෝධනත් ඇවිල්ලා තිබෙනවා. හැබැයි, ඒ වැඩ කටයුත්ත අවසන් කරගන්න අපොහොසත් වෙලා තිබෙනවා. ඒක තමයි මේ පනත් කෙටුම්පතේ ඉතිහාසය. වර්තමානයේ, ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේ අපි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. අපේ රවුල් හකීම් ඇමතිතුමා මේ සභාවේදී සඳහන් කරපු ආකාරයට නැවත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවා සම්පූර්ණ සංශෝධන සහිතව මේ පනත් කෙටුම්පත දැන් ඉදිරිපත් වෙලා තිබෙනවා. මේ පනත් කෙටුම්පතින් ගෙන එන සංශෝධනත් එක්ක මේ රටේ විශාල පිරිසකට, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වෙච්ච සියලුම ජන කොටස්වලට සහනයක් ලැබෙනවා. සියලුම ජන කොටස් කිව්වාම, ඒක පක්ෂවලට වෙන් කරන්න ඕනෑ නැහැ; ආගම්වලට වෙන් කරන්න ඕනෑ නැහැ; ජාතීන්වලට වෙන් කරන්න ඕනෑ නැහැ. ශ්‍රී ලාංකිකයන් හැටියට විශාල පිරිසක් ඉන්නවා, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වෙලා ඒ අයිතිවාසිකම් ලබා ගැනීමට නොහැකිව. අන්න, ඒ පිරිසට තමයි මේ පනත් කෙටුම්පත හරහා අයිතිවාසිකම් ලැබෙන්නේ.

මේ "නොදුටු සහතිකය" නිකුත් කළාට පස්සේ ඒ සහතිකයෙන් ප්‍රයෝජන ගැනීමට යැපෙන්නන්ට අවස්ථාවක් ලැබෙයි. ඒ අයගේ සුබසාධන අයිතිවාසිකම් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් තිබෙන ඉඩකඩම් සහ මූල්‍ය අවශ්‍යතා පිළිබඳ ප්‍රශ්න වෙන්න පුළුවන්, ඒ ප්‍රශ්න සියල්ලටම සම්පූර්ණ සහනයක් ලැබෙන හැටියටයි අපේ රජය මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම දැක්කා, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ අපේ රජය විවේචනය කළ හැටි. විවේචනය කළාට කමක් නැහැ. එහිදී සමහර අය කියන්න උත්සාහ කරනවා, "අපි තමයි ජාති හිතෛෂී. අනෙක් අය තමයි ජාති ද්‍රෝහියෝ" කියලා. එවැනි නොයෙක් අදහස් කියන්න උත්සාහ කරනවා. හැබැයි, මම දන්නා කරුණු කාරණා අනුව මේ පාර්ලිමේන්තුවේ අපේ පාලන යන්ත්‍ර සියල්ලක්ම ඉතාම ජාති හිතෛෂීවම කටයුතු කරලා තිබෙනවා. කිසිම පක්ෂයක්, කිසිම කණ්ඩායමක්, කිසිම පාලකයෙක් උත්සාහ කරන්නේ නැහැ ජාති ද්‍රෝහී විධියට කටයුතු කරන්න. විවිධ අයට විවිධ ප්‍රතිපත්ති තිබෙන්න පුළුවන්, ඒ ප්‍රතිපත්ති අනුව අදහස් ඉදිරිපත් වෙන්න පුළුවන්, ඒ ප්‍රතිපත්තිය අනුව පාලනය කරන්න පුළුවන්. ඒ අයට ප්‍රජාතන්ත්‍රවාදීව බලය දුන්නාම ඒ ප්‍රතිපත්ති අනුව රට පාලනය කරනවා.

ඒ සම්බන්ධයෙන් මතු කරපු සමහර කාරණාවලට මම පිළිතුරු දෙන්න යන්නේ නැහැ. මේ පනත් කෙටුම්පතින් ලැබෙන දැවැන්ත අයිතිවාසිකම් පිළිබඳව පමණයි මම කියන්නේ. කුමන හේතුවක් නිසා හෝ සිවිල් සමාජයේ කැරැල්ලක් ඇති වුණා නම්, ඒ සුළුතර කණ්ඩායම් සියල්ලටම මේ පනත් කෙටුම්පතින් සහනයක් ලැබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය අනුව බහුතරයකට කියන්න පුළුවන්, මේ සහන දෙන්න ඕනෑ නැහැ කියලා. ඇයි ඒ? සුළුතරයක් තමයි හැම වෙලාවේම කැරලි කෝලාහල කරන්නේ; සිවිල් නීති-රීති කඩන්නේ. ඒවා කඩපු අයට අයිතිවාසිකම් දිය යුතු නැහැ කියලා කියන්න පුළුවන්. හැබැයි රජයක් හැටියට, ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයක් හැටියට අපි විශ්වාස කරනවා, ඒ සුළු කොටස්වලටත් ඒ අයිතිවාසිකම් ලැබෙන්න ඕනෑය කියලා.

පොඩි උදාහරණයක් කියලා මගේ කථාව අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. මෙහිදී කොළඹ විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපතිතුමා ගැන කියන්න පුළුවන්. මේ රටේ හිටපු මහා වටිනා, උගත් මහාචාර්ය කෙනෙක් තමයි ස්ටැන්ලි විජේසුන්දර මැතිතුමා. වෙඩි තියලා එතුමා ඝාතනය වුණා. එතුමාගේ දේහය තිබුණු නිසා එතුමාගේ මරණ සහතිකය දෙන්න අපට පුළුවන් වුණා. ඒ වාගේම, මොරටුව විශ්වවිද්‍යාලයේ හිටපු මහා උගතෙක් වෙච්ච, පඬිවරයෙක් වෙච්ච මහාචාර්ය පටුවත් විතාන මහත්මයා විශ්වවිද්‍යාලයේ කාර්යාලයේ ඉන්න කොට වෙඩි තියලා මැරුවා. එය, සිවිල් සංවිධානවල කැරලිකෝලාහල අවස්ථාවක තමයි සිද්ධ වුණේ. උප කුලපතිතුමාගේ දේහය තිබුණු නිසා අපට මරණ සහතිකය දෙන්නට පුළුවන් වුණා. ඔහුගේ අයිතිවාසිකම් ලැබුණා. ඒ වෙඩි තියපු වෙඩික්කරු සමහර වෙලාවට රටේ පාලන යන්ත්‍රය ඇතුළේ තිබෙන බුද්ධි අංශයේ කටයුතු නිසා, ඔහු අතුරුදහන් වී සිටින්නට පුළුවන්. නමුත් ඔහුටත්, ඒ ඔහුගේ අයිතිවාසිකම් ලැබෙනවා. අර මියැ ගිය මහා උගතුන්ට ලැබෙන අයිතිවාසිකම් අනෙක් ක්ෂේත්‍රවල ඉන්න අයටත් ලැබෙන පනත් කෙටුම්පතක් මෙය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මේ පනත් කෙටුම්පත ගැන කිසිවෙකුටත් විරුද්ධත්වයක් දක්වන්නට පුළුවන්කමක් නැහැ කියලා මම හිතනවා. ප්‍රජාතන්ත්‍රවාදී බලවේග තිබෙන රටවල ප්‍රධාන කණ්ඩායමට ලැබෙන අයිතිවාසිකම්

සුළුතර කණ්ඩායමටත් ලැබෙන පනත් කෙටුම්පතක් මෙය. මේ රටේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වෙච්ච විශාල පිරිසක් ජීවත් වෙනවා. ඕනෑ නම් දිස්ත්‍රික්ක වශයෙන් අපට ඒ ගැන කියන්න පුළුවන්; අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් තේරුමක් නැහැ. හැබැයි, අද මේ පනත් කෙටුම්පත සම්මත වීමෙන් පස්සේ ඒ සියලුම ජන කොටස්වලට යහපතක් සිදු වෙනවා. එහි අඩුපාඩු තිබෙනවා නම් අනාගතයේ දී තවදුරටත් සංශෝධනය කර හදා ගනිමු.

ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සංශෝධනයත් අප භාර අරගෙන තිබෙනවා. අගමැතිතුමාත් ඒක බලලා කිව්වා, "වරදක් නැහැ, ඒක හොඳ යෝජනාවක් "කියලා. ඒකෙන් පැන නඟින කරුණුවලටත් අපට අනාගතයේදී අධිකරණය තුළින් විසඳුම් ලබා ගන්න පුළුවන්. මෙවැනි වටිනා පනත් කෙටුම්පතක් මේ රට තුළ ගෙන ඒමට මෙතරම් පමා වීම බරපතළ වරදක් කියලා මම හිතනවා. ඇත්ත වශයෙන්ම එය මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක්. එම අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථාව අදින් පසුව යම් ප්‍රමාණයකට අඩු වෙනවා. මේ දෙස බලා, සමහර අය අතුරුදහන්වූවන්ගේ කාර්යාලය හදන එකට කලබල වෙනවා; නොයෙක් කාරණාවලට කලබල වෙනවා, මට පෙනෙනවා. කලබල වෙන්න දෙයක් නැහැ. මේ රටේ අනෙක් සංවිධානවල සහ පුරවැසියන්ගේ, ශ්‍රී ලාංකික සියලුම ජන කොටස්වල අයිතිවාසිකම් සුරකින්න ගෙනාපු සංශෝධන පනත් කෙටුම්පතක් හැටියටයි මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ.

අද දින අදහස් දැක්වූ සියලුම මැති, ඇමතිවරුන්ට රජය හැටියට අප ස්තුතිවන්ත වෙනවා. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාගේ සංශෝධනයත් අප භාරගන්නා අතර, මේ සංශෝධන පනත් කෙටුම්පත මඟින් ශ්‍රී ලාංකික ජනතාවට යහපතක් සිදු වෙනවා කියන කාරණයත් සිහිපත් කරමින් මා නිහඬ වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

විනා විවාදයකින් තොරව, ඒකමතිකව පිළිගනු ලැබිණි.
අතුරු නියෝග කිසිවක් නොවීය.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය."- [ගරු වජිර අබේවර්ධන මහතා]

තීරණය කරන ලදී.
"සිවිල් නීතිය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට" [මාන්‍යශ්‍රී වජිර අබේවර්ධන මහතා]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Wajira Abeywardana]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

කමිටුවේ සාකච්ඡා කරන ලදී.
[මාන්‍යශ්‍රී නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

Considered in Committee.
[THE HON. DEPUTY SPEAKER in the Chair.]

1 වන වගන්තිය සිට 4 වන වගන්තිය තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1ආම් වාසගත්තිලිරුන්දු 4ආම් වාසගම් වරෙ සට්ටමූලත්තින් පකුදියාග ඉරුක්කවේණ්ඩුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.

Clauses 1 to 4 ordered to stand part of the Bill.

5 වන වගන්තිය.-(ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்தின் 1ஆம் பிரிவைத் திருத்துதல்.)

Clause 5.- *(Amendment of section 1 of the principal enactment)*

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Sumanthiran, are you moving an amendment to Clause 5?

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Yes. I am moving an amendment to Clause 5 (2) (b) in line 33 where the word “two” years is. This states that it has to be extended in every two years. Therefore, I am suggesting you to make it as “ten” years, because in two years, we will not be able to do anything with this.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට two years වලට තිබුණොත් අපට network එක හැදුවාට පස්සේ decision එකකට යන්න පුළුවන් නේ. Start එකේම "ten years" කියන්නේ නැතිව -

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Then, at least shall we make it "five years" because otherwise we cannot get it to work.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

Okay.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Then, I move,

> “In Page 2, Clause 5(2) (b) leave out the word “two” in line 33, and insert the word “five”.

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விவாதமின்றி ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

5ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 5, as amended, ordered to stand part of the Bill.

6 සිට 9 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

6ආම් වාසකත්තිලිරුන්තු 9ආම් වාසකම් වරෙ චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 6 to 9 ordered to stand part of the Bill.

10 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් Iඅ කොටස ඇතුළත් කිරීම.)

වාසකම් 10.- (මුතන්මෛච් චට්ටවාක්කත්තිල් Iඅ එන්නුම් පුතිය පාකත්තෙ උට්පුකුත්තුතල්.)

CLAUSE 10.- *(Insertion of new Part 1A in the principal enactment.)*

ගරු වජිර අබේවර්ධන මහතා
(මාණ්පුමිකු වජිර අපේවර්තන)
(The Hon. Wajira Abeywardana)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"12 වන පිටුවේ, (1) 19 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත';

(2) 21 වන පේළියේ සිට 25 වන පේළිය දක්වා ඇති පේළි (එම පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ආරවුල සම්බන්ධ කරුණු අදාළ ආයතන සමග සාකච්ඡා කිරීමෙන් පසු ඉල්ලීම ලැබී ලිත් මාසයක් ඇතුළත තීරණයක් දිය යුතු ය';

(3) 26 වන පේළියේ සිට 28 වන පේළිය දක්වා ඇති පේළි (එම පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ තීරණ ලිඛිතව දිය යුතු අතර ඒ සම්බන්ධව අවසානාත්මක ලෙස සැලකිය යුතු ය.' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටතු.

Amendments put, and agreed to.

10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

10ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 10, as amended, ordered to stand part of the Bill.

11 සහ 12 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

11ආම්, 12ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 11 and 12, ordered to stand part of the Bill.

13 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.)

වාසකම් 13.- (මුතන්මෛච් චට්ටවාක්කත්තින් 15ආම් පිරිවෛත් තිරුත්තුතල්.)

CLAUSE 13.- *(Amendment of section 15 of the principal enactment.)*

ගරු වජිර අබේවර්ධන මහතා
(මාණ්පුමිකු වජිර අපේවර්තන)
(The Hon. Wajira Abeywardana)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"15 වන පිටුවේ, 16 වන සහ 17 වන පේළි (එම පේළි දෙකද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

"කිරීමෙන්" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂ පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකයි මාස හයකට නොවැඩි කාලයක්. ' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටතු.

Amendment put, and agreed to.

13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

13ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 13, as amended, ordered to stand part of the Bill.

14 සිට 16 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

14 ආම් වාසකත්තිලිරුන්තු 16 ආම් වාසකම් වරෙ චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 14 to 16 ordered to stand part of the Bill.

අලුත් වගන්තිය

පුතිය වාසකම්
NEW CLAUSE

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(මාණ්පුමිකු එම්.ඒ. සුමන්තිරන්)
(The Hon. M.A. Sumanthiran)

Sir, the New Clause reads as follows:

I move,

"In Page 12, after line 28, add:

11. Section 13 of the principal enactment is hereby amended by the addition immediately after sub-section (4) thereof, of the following new sub-section;

(5) Notwithstanding anything contrary in the preceding provisions of this Act, where,

(a) pursuant to any person having made an application in terms of sections 2 or 8 of this Act, prior to the coming into force of this amendment,

(b) a death certificate has been issued in respect of a missing person, and

(c) an application is made by a relative of a missing person substantially in the manner specified in section 8G(1) of this Act

the Registrar-General shall forthwith cancel such a Certificate of Death and forthwith proceed to issue a Certificate of Absence in terms of Section 8G of this Act."

The provisions of Sections 8D and 8F shall *mutantis mutandis* apply to an application under this sub-section.

ඉදිරිපත් කරන ලදින්, පළමු වන වර කියවන ලදී.
කොණ්ඩුවරප්පට්ටු මුදන්මුරෙ මතිප්පිටප්පට්ටදු.
Brought up, and read the First time

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
I move,

"That the New Clause be read a Second time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විඩුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

වාසකම් චට්ටමූලත්තිර් චේර්ක්කප්පට වේණ්ටුමෙන වීනා විඩුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
පුතිය වාසකම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.

Question, that the Clause be added to the Bill, put and agreed to.
New Clause, ordered to stand part of the Bill.

පොදු සංශෝධනය
பொதுத் திருத்தம்
GENERAL AMENDMENT

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධනය මම ඉදිරිපත් කරනවා:

"මෙම පනත් කෙටුම්පතෙහි 'දක්නට නොමැති බවට වූ සහතිකය' යන යෙදුම සඳහන් වන සෑම අවස්ථාවකදීම ඒ වෙනුවට 'දක්නට නොමැති බවට වූ සහතිකය' යන යෙදුම ආදේශ කරන්න."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
තිරුත්තම් විඩුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Amendment put, and agreed to.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
චට්ටමාකු වාසකමුම් තලෛප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.
චට්ටමූලම් තිරුත්තංකළුටන් අරික්කෛ චෙය්යප්පට්ටදු.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අමාත්‍යතුමා.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කිය විය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.
වීනා විඩුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
අතන්පඩි, චට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්‍රාම්මුරෙයාක මතිප්පිටප්පට්ටු නිරෛවේර්ත්තප්පට්ටදු.
Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
වීනා එටුත්තියම්පප්පෙට්‍රදු.
Question proposed.

පළාත් පාලන මැතිවරණය කඩිනමින් පැවැත්වීම
உள்ளூராட்சி மன்றங்களுக்கான தேர்தலை விரைவில் நடத்துதல்
HOLDING OF LOCAL GOVERNMENT ELECTION PROMPTLY

[අ.භා. 5.21]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"අද වන විට, පළාත් පාලන ආයතනයන්හි මැතිවරණ පැවැත්වීම කල් දමා අවුරුදු එකයි, මාස තුනක්ද ඉක්මවා ඇති බැවින්ද; එය නීරෝගී ප්‍රජාතන්ත්‍රවාදයේ නිවැරදි පැවැත්මට බලවත් බාධාවක් හා තර්ජනයක් වන බැවින්ද; පළාත් පාලන ආයතනයන්හි පාලනය නිලධාරී පාලනයට යටත්

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

කිරීමෙන්, එම ආයතන මඟින් සේවය ලබා ගන්නා නිරායුධ අවිහිංසක ජනතාවට පීඩාකාරී බලපෑම් ඇතිවන බවට චෝදනා එල්ල වී ඇති බැවින්ද; මහජන නියෝජිතායතන අකර්මණ්‍යවීමෙන් පොදුවේ ගම් මට්ටමෙහි, බිම් මට්ටමෙහි ජනතාවට එදිනෙදා ලැබිය යුතු සේවාවන් නොලැබීමෙන් මහත් වූ දුෂ්කරතාවකට මුහුණ දී ඇති බැවින්ද; තවදුරටත් විවිධ හේතු දක්වමින් පළාත් පාලන ආයතනයන්හි මැතිවරණ පැවැත්වීම කල් නොදමා වහාම එකී මැතිවරණ පවත්වා ශ්‍රී ලාංකේය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කොට තහවුරු කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවේදී ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මෙම වැදගත් යෝජනාව ඉදිරිපත් කරන්නේ අපේ රටේ පළාත් පාලන මැතිවරණය දින නියමයකින් තොරව කල් දමා ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය අහිමි කරලා තිබෙන මොහොතකයි. මක් නිසාද යත්, ලංකාවේ පළාත් පාලන ආයතනවල නියමිත කාලයට පවත්වන්නට යෙදෙන මැතිවරණය කල් දමා දැනට වර්ෂ එකයි, මාස තුනක් ගත වෙලා තිබෙනවා. වර්ෂ එකයි, මාස තුනක කාල පරිච්ඡේදය තුළ ගම් මට්ටමේ; බිම් මට්ටමේ ජනතාවගේ මහජන නියෝජිතයන් ලවා ඒ අදාළ බල ප්‍රදේශවල ඔවුන්ට ලබා ගත යුතු පොදු සේවාවන් ලබා ගැනීම සඳහා තිබෙන ඉඩ ප්‍රස්ථා ඇහිරිලා තිබෙනවා. පළාත් පාලන ආයතන ගමේ ජනතාවගේ දෛනික අවශ්‍යතා ඉෂ්ට කර ගැනීම සඳහා ඉතා ඵලදායී ජාතික මෙහෙවරක නිරත වන බව තමුන්නාන්සේලා ඇතුළු අප කවුරුත් විශ්වාස කරනවා.

කුණුකසළ ඉවත් කිරීමේ සිට මදුරුවන්ගෙන් බෝවන ඩෙංගු ඇතුළු අනිකුත් රෝග පීඩා හා වෙනත් රෝග පීඩා වැළැක්වීම පිණිස මං මාවත්, ජල බස්නා, ජල ප්‍රවාහන ක්‍රම පිරිසිදු කිරීම වැනි එදිනෙදා කටයුතු රාශියක් සිද්ධ වන්නේ එම ආයතනවලින්. පළාත් පාලන ආයතන රෙගුලාසි අනුව තමන්ගේ නිවාසයක සැලැස්මක් අනුමත කර ගැනීම, බිම් කැබැල්ලක් අනුමත කර ගැනීම වැනි විවිධ කාර්ය භාරයන් රාශියක් ඒ ආයතන තුළින් කර ගන්න අප සියලු දෙනාටම සිද්ධ වනවා. ජනතාවගේ නියෝජිතයෙකු එම ස්ථානයේ ඉන්නවා නම්, ඒ පිළිබඳ සුවිශේෂ අවධානයක් යොමු කරලා ඒ කටයුත්ත සිද්ධ වනවා. කුමන දේශපාලන පක්ෂයක් නියෝජනය කළත්; මොන දේශපාලන මතය දැරුවත්, මේ ප්‍රජාතන්ත්‍රවාදී රටේ ගමේ ජනතාවට තමන්ගේ නියෝජිතයා පත් කර ගන්න නීත්‍යානුකූල අයිතියක් තිබෙනවා. අපේ විශ්වාසය අනුව නම්, රජය විසින් අද ඒ අයිතිය නැති කරලා පළි ගැනීමේ චේතනාවෙන් තමයි පළාත් පාලන මැතිවරණය කල් දැමීමේ. මොකද, මේ පළාත් පාලන ආයතන බහුතරයක බලය තිබුණේ "බුලත් කොළය" ලකුණ දරන එක්සත් ජනතා නිදහස් සන්ධානයටයි. එක්සත් ජාතික පක්ෂය සහ අනික් පක්ෂවලට පළාත් පාලන ආයතනවල බලය හිමි වෙලා තිබුණේ නැහැ. පළාත් පාලන මැතිවරණය පසු ගිය කාලය තුළදී පැවැත්වුවොත්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විසින් ජනාධිපතිවරණයට, ඒ වාගේම පාර්ලිමේන්තු මැතිවරණයට නායකත්වය දුන්නා සේම, මේ මැතිවරණයටත් නායකත්වය දුන්නාම මේ ආයතන සියල්ලගේ බලය අනිවාර්යයෙන්ම අහිමි වනවා කියලා රජයේ තක්සේරුවක් තිබුණා. ඒ නිසා පළාත් පාලන ආයතන විසුරුවා හැරියේ දේශපාලන පළිගැනීමක් වශයෙනුයි. එසේ පළාත් පාලන ආයතන විසුරුවා හැරලා "මැතිවරණ කොමිසමක්" පත් කළා. මැතිවරණ කොමිසමක් පත් කළේ වඩාත්ම සාධාරණ ලෙස, කාර්යක්ෂම ලෙස හා නියමිත ආකාරයට, නියමිත දින වකවානුවලට මැතිවරණය පවත්වන්නයි.

අද උදේ වරුවේ ඒකාබද්ධ විපක්ෂයේ නායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මැතිවරණ කොමිසම පිළිබඳව; මැතිවරණ කොමිසමේ සාමාජිකයන් විසින් මතු කර තිබෙන විවේචන පිළිබඳව ප්‍රශ්නයක් මතු කළා. මේ වන විට ස්වාධීන කොමිෂන් සභා පත් කරලා, ඒ ස්වාධීන කොමිෂන් සභා විහිළුවක් බවට පත් වෙලා, ස්වාධීන කොමිෂන් සභා නැති කාලයේ තිබුණ මැතිවරණ අයිතිය, ස්වාධීන කොමිෂන් සභා පිහිටෙව්වාට පස්සේ නැති වෙලා තිබෙනවා.

නිදහසින් පස්සේ බිම් මට්ටමේ ජනතා නියෝජිතයෝ තමන්ගේ ඡන්ද අයිතිය දිනා ගෙන තිබෙන්නේ ජීවිත පරිත්‍යාගයෙන්ය කියන එක අපි දන්නවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල සභානායකතුමාටත් මතක ඇති, එක්දහස්නවසිය අසූ ගණන්වල අපි පළමුවරට පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන අවස්ථාවේ, "මේ හොර පාර්ලිමේන්තුව වර්ජනය කරව," කියලා මැතිවරණය වර්ජනය කරන්න කිව්ව බව. මහජන නියෝජිතායතන කියන්නේ හොරු, වංචාකාරයෝ, දූෂිතයෝ විතරක් ඉන්න ආයතන, ඒ නිසා හොරකමින් රට පාලනය කරන ක්‍රමයක් ලෙස සලකා "මේ හොර පාර්ලිමේන්තුව ඇතුළු ගම් මට්ටමේ ආයතන වර්ජනය කරන්න, මහා ඡන්ද වර්ජනයක් කරන්න" කිව්වා. ඒ වර්ජනය කරන්න කිව්ව අය එසේ වර්ජනය කරන්නේ නැතිව, ඡන්දය දමන්න යනවා නම් පළමුවෙන් යන පස් දෙනාට දඬුවමක් නියම කළා. ඒ තමයි, මරණ දඬුවම. ඒ කිව්වා වාගේම ජනතා විමුක්ති පෙරමුණේ මානව හිතවාදීන් ඡන්දය දමන්න ගිය මිනිස්සුන්ට මරණ දඬුවම දුන්නා. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැනි නිරායුධ, අවිහිංසක ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල සාමාජිකයන්ට තමයි ප්‍රශ්නය තිබුණේ. මැර දේශපාලනය කරන, මිනීමරලා පුරුදු අයට මේ ආයතන තිබුණත් එකයි, නැතත් එකයි. තමන්ගේ මතයට විරුද්ධ මතයක් තිබෙනවා නම් ඒ අය ඝාතනය කර දමන එක වඩා ලෙහෙසියි. එහෙම නැතිව ප්‍රජාතන්ත්‍රවාදීව මත ගැටෙන්න තිබෙන ආයතනවලට ප්‍රජාතන්ත්‍රවාදී ලෙස කටයුතු කරන්න තිබෙන අයිතිය මෙලෙසින් වළක්වා තිබීම සම්පූර්ණයෙන් අසාධාරණයි. ඒ නිසා ඒකාබද්ධ විපක්ෂය ලෙස අපි කියන්නේ නිරෝගී ප්‍රජාතන්ත්‍රවාදය සඳහාත්, ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවීම සඳහාත්, මහජන නියෝජිතායතන ශක්තිමත් කිරීම සඳහාත්, අද ඒ සේවාව ලබා ගත නොහැකිව පීඩාවට පත්වෙලා සිටින පොදු ජනතාවට ඒ සේවාවන් ලබා ගැනීමට හැකි වන පරිදි මොන ක්‍රමයට හරි කමක් නැහැ, පුළුවන් තරම් ඉක්මනට පළාත් පාලන මැතිවරණය පවත්වන්න පුළුවන් දිනයක් නිශ්චිත වශයෙන් සඳහන් කරන්න කියායි. දැන් පළාත් පාලන ආයතන විසුරුවලා අවුරුදු එකයි මාස තුනක් ගත වෙලා තිබෙනවා. ඒ මහජන නියෝජිතායතනවලට තමන්ගේ නියෝජිතයන් තෝරා පත් කර ගැනීම සඳහා ඉතා ඉක්මනින් මේ මැතිවරණය පවත්වලා පළාත් පාලන ආයතන ව්‍යුහය සක්‍රීය ප්‍රජාතන්ත්‍රවාදී ආයතන බවට පත් කරන්න මැදිහත් වන්නය කියන යෝජනාව මම මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා.

[අ.භා. 5.27]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද "කඩිනමින් පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතුය" කියන යෝජනාව ස්ථිර කරමින් මම මේ විවාදයට එක් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කනගාටුවට කාරණාව නම්, මේ වැදගත් විවාදයේදී ගරු විෂය භාර ඇමතිතුමාවත්, විෂය භාර නියෝජ්‍ය ඇමතිතුමාවත්- රාජ්‍ය ඇමතිතුමාද නියෝජ්‍ය ඇමතිතුමාද මම දන්නේ නැහැ.- මේ විෂය භාර කිසිදු වගකිව යුතු දේශපාලනඥයෙක් මේ ගරු සභාව නියෝජනය කරන්න සභාව තුළ නොමැති වීමයි. ගරු සභානායකතුමා පැමිණ සිටින බව මට පෙනෙනවා. ඒ පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත් ගරු සභානායකතුමනි, ඔබතුමාත් මා සමඟ එකඟ වෙනවා ඇති, මෙවැනි වැදගත් විවාදයකදී විෂය භාර අමාත්‍යවරුන්ගේ නොපැමිණීම; පිළිතුරු දෙන්නට නොසිටීම මේ සභාව සහ ජනතාවගේ අයිතිය කොයි තරම් දුරට අවතක්සේරු කිරීමක්ද, හෑල්ලු කිරීමක්ද කියන එක ගැන.

කෙසේ වෙතත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් පැත්තෙන් මේ ගරු සභාව දිහා බැලුවාම පෙනෙනවා, මේ විවාදයට සහභාගි වෙලා ඉන්නේ මැති ඇමතිවරුන් 16ක 17ක පමණ පිරිසක් බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කඩිනමින් පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතුය කියන යෝජනාව සම්බන්ධයෙන් අද මෙම විවාදය පවත්වන වෙලාව වන විට ඒ මැතිවරණය කල් දමලා අවුරුද්දකුත් මාස තුනක කාලයක් ඉක්මවා ගොස් තිබෙනවා. යුද්ධය පවතින වකවානුවේ යම් හේතූන් නිසා උතුරු නැඟෙනහිර පළාත්වල සමහර පළාත් පාලන ආයතනවල කාලය දීර්ඝ වෙලා තිබුණත්, දේශපාලන හේතූන් නිසා මෙතරම් දීර්ඝ කාලයක් මේ විධියට දින නියමයක් නැතිව අන් පළාත්වල මැතිවරණ කල් දැමීමක් අපේ ජීවිත කාලය තුළ අපි දැකලා නැහැ. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ජනතා නියෝජිතයන් විධියට අතිගරු ජනාධිපතිතුමාට, ගරු අගමැතිතුමාට, විෂය භාර ඇමතිතුමාට විතරක් නොවෙයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මහා බලයක් තිබෙනවාය කියා අපි විශ්වාස කරපු මැතිවරණ කොමිසමේ සභාපතිතුමාට හෝ ජනාධිපතිතුමාගේ ඉඳලා කොමිසමේ සභාපතිතුමා දක්වා වූ මේ ශ්‍රේණියේ කිසිවකුට කියන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මැතිවරණය පවත්වන්නේ අහවල් දවසේයි කියලා. ජනාධිපතිතුමාගේ ඉඳලා මැතිවරණ කොමිසමේ අය දක්වා කිසිවකුට කියන්න පුළුවන්කමක් නැහැ, මැතිවරණය පවත්වන්නේ අහවල් දවසේයි කියලා. ඒකෙන්ම පෙනෙනවා, ජනතාවගේ ඡන්දය පිළිබඳව තිබෙන අයිතිය කොයි තරම් ලඝු කිරීමකට ලක් වෙලා තිබෙනවාද කියලා. එයට ප්‍රකාශිත හේතුව විධියට ඉදිරිපත් කරන්නේ, -අප්‍රකාශිත හේතූන් ගැන ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා.- සීමා නිර්ණය කොමිෂන් සභාවේ කටයුතු අවසන් නොවීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සීමා නිර්ණය කොමිෂන් සභාව පිළිබඳ ගැසට් නිවේදනය නිකුත් වෙලා තිබෙන්නේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ අත්සනින්. එතුමාගේ අත්සනින් තමයි ගැසට් නිවේදනය නිකුත් වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වන විට, 2015 අවුරුද්දේ මැද කාර්තුවේදී පළාත් පාලන විෂය භාර ඇමතිතුමා වශයෙන් සිටියේ පසු ගිය ආණ්ඩුවේ ඇමතිවරයෙක් නොව ඔබතුමාගේ ප්‍රධානියා වන ගරු කථානායක කරු ජයසූරිය මැතිතුමායි. එතකොට සදාචාරාත්මක බැඳීමකුත් තිබෙනවා. ජනතාවගේ ඡන්ද බලය මේ විධියට පැහැර ගන්න අපට අයිතියක් තිබෙනවාද? මෙය මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්. මෙම අවස්ථාවිදී මේ සභාවේ නැති, විෂය භාර ගරු ඇමතිතුමා, අපේ හිත මිත්‍ර ෆයිසර් මුස්තාපා මැතිතුමා කරන්නේ මහ ජනතාවගේ අනුලංඝනීය අයිතිය පැහැර ගැනීමක්. දැන් මේකේ කෙළවරක් පෙනෙන්නේ නැහැ.

අනික් පැත්තෙන්, මැතිවරණ කොමිසම මොකක්ද කියන්නේ? ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා අද පාර්ලිමේන්තුවේදී කිව්වා, පෙරේදා "The Island" පත්‍රයේ මැද පිටුවේ ප්‍රධාන ප්‍රවෘත්තිය පිළිබඳව. ගරු අගමැතිතුමා ඉතාම ගෞරවනීය විධියට එය පිළිගත්තා. ඒ පිළිබඳව අපිත් එක්ක සාකච්ඡා කරනවාය කියලා එතුමා කිව්වා. අපි ස්තුතිවන්ත වනවා, එතුමාට. ඒ මහාචාර්යතුමා, මැතිවරණ කොමිසමේ සාමාජික, ඒ විද්වතා මොකද කියන්නේ? එතුමා කියනවා, "Sri Lanka's Election Commission Undermined" කියලා. මැතිවරණ කොමිසමේ ගරු සාමාජිකයෙක් තමයි මෙහෙම කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි නොවෙයි කියන්නේ. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඒ පිළිබඳව විස්තරාත්මක ප්‍රකාශයක් කරපු නිසා මා විග්‍රහයකට යන්නේ නැහැ. මේකේ එක පරිච්ඡේදයක් මා උපුටා දක්වන්නම්. එතුමා මෙහෙම කියනවා:

> "The Delimitation Committee says their report will be ready by 31 Aug. We have said we can hold elections 90 days thereafter. The relevant Minister and President say elections will be next year. It is easier for the government to prevent the Commission from holding elections when only one person is present at meetings".

මෙහෙම කියන්නේ, වර්තමාන මැතිවරණ කොමිසමේ සාමාජිකයෙක් වන මහාචාර්ය රත්නජීවන් හූල් මහතා. දැන් මොකක්ද තත්ත්වය? මොකක්ද, අපට පෙනෙන්නේ? ඒ එක පැත්තක්. පළාත් පාලන ආයතනවල ඉඳලා මේ සභාවට තේරී පත් වුණු මන්ත්‍රීවරු මේ දෙපැත්තේම ඉන්නවා. ඒ මන්ත්‍රීවරු සියලු දෙනාටම අවශ්‍ය වෙලා තිබෙන්නේ, ඉක්මනින් මැතිවරණයක් පවත්වන්නයි. මේ පිළිබඳව පනත්වල මොනවාද තිබෙන්නේ? අපි දන්නවා, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත, හිටපු අතිගරු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේදී සම්මත වුණු පනතක් කියලා. ඒ පනතේ 5වන වගන්තියේ 2 (අ) සහ (ආ) උපවගන්තිවල මොනවාද තිබෙන්නේ?

ගරු සභානායකතුමනි, ඒ වගන්ති ඉතාම නිරවුල්. ඒ වගන්තිවල කියන්නේ, "එක් වරකදී හෝ වාර කිහිපයකදී උපරිම වශයෙන් කල් දමන්න පුළුවන් කාලසීමාව වසරක්" කියායි. 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ මොකක්ද කියන්නේ? එම පනතේ 25වැනි වගන්තියේ මැතිවරණය පවත්වන්න ඕනෑ විධිය මොකක්ද කියලා කියනවා. "සභිකයින්ගේ ධුර කාලය අවසාන වීමට පෙරාතුව මාස 6ක කාල සීමාවක් තුළ මැතිවරණය පැවැත්විය යුත්තේ ය" කියා. එතකොට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත, ප්‍රාදේශීය සභා පනත යනාදී ඒ සියල්ලම උල්ලංඝනය වෙලා තිබෙනවා. ඒ නිසා දැන් ආණ්ඩුවට වග කීමක් තිබෙනවා. "ඉතිහාසයේ අහවල් කාලයේ එහෙම වුණා, ඕට පෙරත් මැතිවරණ කල් දාලා තිබෙනවා" ආදී වශයෙන් ඉතිහාසයට ඇඟිල්ල දිගු කිරීම නොවෙයි ඔබතුමන්ලාගේ වගකීම. මැතිවරණයක් කඩිනමින් අවශ්‍ය වෙලා තිබෙනවා. මේ පනතේ කිසි තැනක නිලධාරීන්ට බලයක් දීලා නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජනතාවගේ බදු මුදල් පාලනය කරන්න, මෙහෙයවන්න නිලධාරීන්ට බලයක් ලබාදීලා නැහැ.

මුදල් සම්බන්ධයෙන් 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ පැහැදිලිවම තිබෙන්නේ, "ඡන්ද විමසීමකින් මුදල් යෙදවිය යුතු ආකාරය තීරණය කරන්නට ඕනෑ ය" කියායි. මේ පනත දිහා බැලුවත්, මැතිවරණ කොමිසම දිහා බැලුවත්, අපි දේශපාලන විද්‍යාත්මකව බැලුවත්, සමාජ විද්‍යාත්මකව බැලුවත්, මැතිවරණ ඉතිහාසයට අදාළව බැලුවත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ හෘදය සාක්ෂියට එකඟව බැලුවත් මේක බරපතළ විධියේ

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

උල්ලංඝනයක් වෙනවා. ඒ නිසා අපි මේ සභාවට යෝජනා කරනවා, මොන විධියකින් හෝ මේ ආකාරයටම තව අවුරුදු ගණනක් මැතිවරණය කියන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මහ මැතිවරණයටත් ආදේශ වෙන්න පුළුවන්. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආවොත්, පාර්ලිමේන්තු මැතිවරණය කොට්ඨාස ක්‍රමය යටතේ පවත්වන්න යෝජනා වෙනවා. ඒක හොඳ යෝජනාවක්. අපි එකඟයි. හැබැයි, ඒකටත් සීමා නීර්ණය කොමිසමක් පත්කරන්න වෙනවා. "සීමා නීර්ණය කොමිසමේ කටයුතු අවසන් නැහැ, ඒ නිසා පාර්ලිමේන්තු මැතිවරණය දැන්ම පවත්වන්න බැහැ" කියලා මේ හඬවල්, මේ කටවල්, මේ වචන ඒ අවස්ථාවේදීත් පාවිච්චි වුණොත් ප්‍රශ්නයක්. ඒ විධියේ අනතුරක සේයාවකුත් තිබෙනවා. ඒකාබද්ධ විපක්ෂය විධියට අපි අපේ උස් හඬ එකතු කරන්නේ කුමන ක්‍රමයක් යටතේ හෝ මැතිවරණය කඩිනමින් පවත්වන තීන්දුව ගන්නයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ගම්වල, නගරවල මිනිසුන්ගේ අයිතිය, අවුරුද්දකුත් මාස තුනක් තිස්සේ පැහැරගත් අයිතිය වහාම ලබා දෙන්නට මේ ආණ්ඩුව කටයුතු කළ යුතුයි කියා යෝජනා කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 5.38]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාව දැනුවත් කිරීම සඳහා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට අපි ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. ඒ මක් නිසාද? විශේෂයෙන්ම මේ රජය ප්‍රජාතන්ත්‍රවාදය අගයන රජයක් විධියට, පසු ගිය රජය විසින් ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කිරීම සඳහා ගෙනෙන ලද දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනස් කරලා ඉතාමත්ම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා, ඒ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ ව්‍යවස්ථාවේ අංගයක් බවට පත් කරලා, ඒ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අපට මේ පිළිබඳව කථා කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මම විශේෂයෙන් සන්තෝෂ වෙනවා.

මැතිවරණය කල්දමන්න හේතුව මොකක්ද කියන එක ගැන තමයි අපි මුලින්ම කථා කරන්න ඕනෑ. වර්තමානයේ මේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2016 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත අනුව මේ මැතිවරණය පැවැත්විය යුත්තේ කොට්ඨාස ක්‍රමය සහ අනුපාත මැතිවරණ ක්‍රමය මිශ්‍ර වූ ක්‍රමයක් මඟින්. එහෙම කරන්න නම් අනිවාර්යෙන්ම ඒ කොට්ඨාසවල සීමා නීර්ණය සිද්ධවෙලා තිබෙන්නට ඕනෑ. පසු ගිය රජය කාලයේ සීමා නීර්ණය සිද්ධ වුණේ කෙසේද කියලා මේ මුළු රටම දන්නවා, ඔය කථා කරන විපක්ෂයේ මන්ත්‍රීවරුත් දන්නවා. ඒ රජයේම හිටපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු, ඇමතිවරු අපට කියනවා, "ඒ කාලයේ සීමා නීර්ණය සිද්ධ වුණේ කොහොමද?" කියලා. ඒ ගැන අපටත් අත් දැකීම් තිබෙනවා. එවකට පැවති රජයේ ප්‍රබල ඇමතිවරයෙක් - බැසිල් රාජපක්ෂ හිටපු ඇමතිවරයා- එවකට හිටිය මැතිවරණ කොමසාරිස්තුමාවත් සම්බන්ධ කර නොගෙන, ඒ පක්ෂයට වාසි වන විධියට වෙනම සීමා නීර්ණය කොට්ඨාස වෙන් කරන්න තීන්දු කළා. ඒ සඳහා මම උදාහරණයක් කියන්නම්. මගේ ආසනයේ, - කුරුණෑගල ආසනයේ- මුස්ලිම්, දෙමළ, සිංහල ජනතාව සම සමව ඉන්න කොට්ඨාසයක් තිබෙනවා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයට වාසිදායක කොට්ඨාස බහු ආසන කොට්ඨාසයක් බවට පත් කරන්න තීන්දු කරලා, කිසිම දිනක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජයග්‍රහණය නොකළ කොට්ඨාස බහු ආසන බවට පත් කරලා, දමිළ, මුස්ලිම්, සිංහල සියලු දෙනාම එකට මිශ්‍ර වන කොට්ඨාස එහෙමම තියන තත්ත්වයකට පත් කරලා කොට්ඨාස සීමා නීර්ණයක් කළා. මේ සීමා නීර්ණය පිළිබඳව විශාල උද්ඝෝෂණයක්, ඒ වාගේම විරෝධයක් පැවතුණා. ඒ සීමා නීර්ණය තුළින් මැතිවරණය පැවැත්වුවා නම් කුමක්ද වෙන්නේ කියලා මුළු රටම දැන ගත්තා. ඒ නිසා තමයි ඒ පක්ෂයත් කිව්වේ, "මේ සීමා නීර්ණය වැරැදියි. ඒ නිසා නව සීමා නීර්ණයක් කරන්න ඕනෑ" කියායි. ඒ නිසා තමයි, අපේ රජය අලුත් සීමා නීර්ණ කොමිසමක් පිහිටුවලා, මේ විධියට සීමා නීර්ණය නැවත සකස් කරන්න පටන් ගත්තේ.

අද දින ගරු සභාවේදී ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා පුවත් පතක තිබෙනවාය කියලා, "අගෝස්තු 31වෙනිදා වෙද්දී සීමා නීර්ණ කොමිසමේ කටයුතු ඉවර වෙනවා, මාස තුනකට පස්සේ මැතිවරණය පවත්වන්න පුළුවන්" කියලා. අගෝස්තු 31වෙනිදා ඒ කොමිසමේ වැඩ කටයුතු අවසන් වුණා නම්, මාස තුනක් පසු වුණා කියන්නේ සැප්තැම්බර්, ඔක්තෝබර් පහු වුණාම, නොවැම්බර් මාසය. නොවැම්බර් මාසය කියන්නේ මේ රටේ අය වැය ඉදිරිපත් කරන මාසය. අය වැය තිබෙන කාලයක මැතිවරණයක් පවත්වන්න බැහැ. අය වැය අවසන් වෙන්නේ දෙසැම්බර් මාසයේ. ඒ නිසා තමයි ජනාධිපතිතුමා කිව්වේ, "අපි ලබන වසරේ පළාත් පාලන මැතිවරණය පවත්වනවා" කියලා. ජනවාරි මාසයේ මැතිවරණය පැවැත්වුවත්, එය "ලබන වසර" තමයි. එය තමයි මැතිවරණය පවත්වන්න නියම කාලය. අපිත් කැමැතියි; අපටත් අවශ්‍ය වෙලා තිබෙන්නේ මේ මැතිවරණය ඉක්මනින් පවත්වන්නයි. මේ අවස්ථාවේ මැතිවරණය පවත්වන එක අපට ඉතාම වාසියි. මේ කාරණය සම්බන්ධයෙන් විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට අධිකරණයට යන්න පුළුවන්. ඒ අය හැම එකකටම අධිකරණයට යනවා නේ. ඒත් මේ වෙනුවෙන් තවම කිසිවෙක් අධිකරණයට ගියේ නැහැ. [බාධා කිරීමක්]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

අපේ හිතමිත්‍ර නියෝජ්‍ය ඇමතිතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයට දැන් මේක යොමු වෙලා මාස හයක්. මේ සම්බන්ධව නඩු තුනක් තිබෙනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
නමුත්, තවම තීන්දුවක් ලබා දීලා නැහැ නේද?

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
තීන්දුව දෙන්නේ අපි නොවෙයි නේ.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ශ්‍රේෂ්ඨාධිකරණයට-

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා දැන් කිව්වේ, කිසිවෙක් අධිකරණයට ගියේ නැහැ කියලායි. [බාධා කිරීමක්] මට ඔබතුමා එක්ක පැටලෙන්න අවශ්‍ය නැහැ. [බාධා කිරීමක්]

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
නඩු ඉදිරිපත් කර තිබෙන බව මම පිළිගන්නවා. [බාධා කිරීමක්]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඔබතුමා එක්ක පැටලෙන්න නොවෙයි, මගේ වුවමනාව.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
නඩු පවරලා තිබෙනවා. ඒ නඩුවලට තවම තීන්දුවක් දීලා නැහැ. මැතිවරණය පවත්වන්න කියලා තීන්දුවක් ලබා දුන්නොත්, අපි මැතිවරණය පවත්වනවා. අපටත් අවශ්‍ය වෙලා තිබෙන්නේ මැතිවරණය පවත්වන්නයි. මේ වේලාවේ මැතිවරණය පැවැත්වුවොත්, අනිවාර්යයෙන්ම, මුළු ලංකාවේ තිබෙන සියලුම කොටඨාස එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරනවා. අපටත් ලොකු අවශ්‍යතාවක් වෙලා තිබෙන්නේ මේ වේලාවේ මැතිවරණය පවත්වන්න; අපේ අවශ්‍යතාව වෙලා තිබෙන්නේත්, හැකි තරම් ඉක්මනට මේ මැතිවරණය පවත්වන්න. පසු ගිය රජය කාලයේ, වේලාසන මැතිවරණ පවත්වා විපක්ෂයට අත් දැකීම් තිබෙනවා නේ. වේලාසන මැතිවරණය පවත්වලා මොකද වුණේ? මැතිවරණයක් පවත්වන්න තවම මේ ආණ්ඩුවට කාලය නොවෙයි. නමුත්, එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රජය කවදාවත් මැතිවරණ කල් දමන්නේ නැහැ. මේ කාලයේ මැතිවරණය පැවැත්වුවොත්, අපට ඉතා වාසිදායක තත්ත්වයක් වෙනවා. නමුත්, අපේ රටේ නීතියක් තිබෙනවා. පළාත් පාලන පනත් කෙටුම්පත සම්මත වෙලා තිබෙනවා. මේ පළාත් පාලන පනත අනුව පැරණි ක්‍රමයට කෙසේවත් මැතිවරණය පවත්වන්න බැහැ. අලුත් පනත අනුවයි දැන් මැතිවරණය පවත්වන්න පුළුවන් වන්නේ. අලුත් පනත අනුව මැතිවරණය පවත්වනවා නම්, කොටඨාස අනුව පවත්වන්නට ඕනෑ. ඒ නිසා, කොටඨාස ගණන සීමා නිර්ණය කිරීමක් කළ යුතු වෙනවා. ඒ සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ තීන්දුව ලැබීමට නියමිතව තිබෙනවා. ඒක තවම ලබා දීලා නැහැ. අගෝස්තු මාසය අවසාන වෙද්දී ඒක ලබා දෙන්න පුළුවන් වෙයි. ඒක ලබා දුන්නාට පසුව, මැතිවරණය පවත්වන්න මාස තුනකට වැඩි කාලයක් ගත වෙනවාය කියනවා. එහෙම වුණොත්, අනිවාර්යයෙන්ම අපට මැතිවරණය පවත්වන්න වෙන්නේ ලබන වසරේ ජනවාරි මාසයේ තමයි. අතිගරු ජනාධිපතිතුමා කියලා තිබෙනවා; ගරු අග්‍රාමාත්‍යතුමා කියලා තිබෙනවා, "අපි ලබන වසරේ මුල් මාස කිහිපය තුළ මැතිවරණය පවත්වනවා" කියලා. ඒ නිසා, අනිවාර්යයෙන්ම මේ මැතිවරණය අපි ලබන වසර මුලදී පවත්වනවා. ඒ පවත්වන්නේ නව මැතිවරණ ක්‍රමය අනුවයි. ඒ නිසා අපි කියනවා, අද දින ගෙනෙන ලද මේ යෝජනාව හොඳයි කියා. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේත් මේ මැතිවරණය පවත්වන්නයි. ඒ නිසා හැකි ඉක්මනින් මේ මැතිවරණය පවත්වන බව මම විශේෂයෙන් ප්‍රකාශ කරනවා.

[අ.භා. 5.44]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව සම්බන්ධයෙන් මම විශේෂයෙන්ම මේ කරුණු කියන්නට ඕනෑ. මැතිවරණ ක්‍රමය වෙනස් කරන්නට තිබෙන කතිකාව මේ සමාජයේ පිළිගත්ත දෙයක්. මොකද, "මනාප ක්‍රමය" කියන එකට විරුද්ධව සියලුම දේශපාලන පක්ෂ කිව්වා, "අලුත් මැතිවරණ ක්‍රමයක් ගෙනෙන්නට ඕනෑය" කියා. එහෙම නම්, මනාප ක්‍රමය අයින් කරලා, මනාප ක්‍රමය වෙනුවට අලුත් ක්‍රමයක් ගෙනෙන්නට ඕනෑය කියන එක පසු ගිය කාලය පුරාම, -දශකයකට අධික කාලයක්- මේ සමාජයේ කතිකාවකට ලක් වුණු කාරණාවක්. ඒ අනුව, දේශපාලන පක්ෂ හැටියට සියලු දෙනාම පිළිගත්තා, අලුත් ඡන්ද ක්‍රමයක් මේ රටට ගෙනෙන්නට ඕනෑය කියා. ඒකේ මූලික අදියර හැටියට තමයි පසුගිය ආණ්ඩුව, -මහින්ද රාජපක්ෂ මහත්මයා- මේක වෙනස් කරන්න ඕනෑ කියලා පාර්ලිමේන්තුවේ යෝජනාවක් ගෙනැල්ලා සම්මත කරලා ඡන්ද කොටඨාස ක්‍රමය ගෙනාවේ. කොටඨාස ක්‍රමයට ගේන විට ඒ කොටඨාසය වෙන් කිරීම පිළිබඳව අපට පසුගිය කාලයේ විශාල ප්‍රශ්න ගණනාවක් තිබුණා.

එදා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව තිබෙන විට ඒ කොටඨාස නිර්ණය කළේ, කොටඨාස තීරණය කළේ වෙන කොහේවත් නොවෙයි, බැසිල් රාජපක්ෂ මහත්මයාගේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරු ගෙන්වලා, ඒ සිතියම මේසය උඩ තියලායි. එහෙම තමයි කොටඨාස වෙන් කළේ. එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරු විධියට අපේ අදහස් ගත්තේ නැහැ, අපෙන් ඇහුවේත් නැහැ. කොහොමද කරන්නේ කියලාවත් ඇහුවේ නැහැ. අඩුම තරමින් මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සාකච්ඡාවක්වත් තිබුණේ නැහැ. සීමා නිර්ණය කොමිසමේ මේ පිළිබඳව සාකච්ඡාවක් තිබුණේත් නැහැ, මැතිවරණ කාර්යාලවල සාකච්ඡා තිබුණේත් නැහැ. කිසිම තැනක සාකච්ඡාවක් තිබුණේ නැහැ. සාකච්ඡා තිබුණු එකම තැන තමයි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය. බැසිල් රාජපක්ෂ මහත්මයාගේ නායකත්වය යටතේ තමයි මේ කොටඨාස නිර්ණය කළේ.

මැද කොළඹ ආසනයේ, මගේ ආසනයේ කොටඨාස නිර්ණය කිරීම ගැන කිව්වොත් තමුන්නාන්සේලා පුදුම වෙයි. මැද කොළඹ ආසනයේ කොටඨාස විසි ගණනක් ඒගොල්ලෝ වෙනස් කරලා තිබෙනවා. ඒ හැම කොටඨාසයෙන්ම, - බහු ආසන- මන්ත්‍රීවරු දෙන්නෙක් එන විධියට තමයි හදලා තිබෙන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මැද කොළඹ ආසනය දිනන්නේ නැහැ කියලා දන්නවා. මොකද, අපි ජනාධිපති මැතිවරණයේදී මැද කොළඹ ආසනයෙන් ඡන්ද 79,000ක් ගන්නා විට මහින්ද රාජපක්ෂ මහත්මයා ගත්තේ 17,000යි. පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී අපි ඡන්ද 80,000ක් ගන්නා විට ඔබතුමන්ලා ගත්තේ ඡන්ද 10,000යි. මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දිනන්නේ නැති කොටඨාසයක් නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් එන්න පුළුවන් විධියට හැම කොටඨාසයකටම මන්ත්‍රීවරුන් දෙන්නා ගණනේ දාලා තිබෙනවා. එතකොට බහු ආසන ක්‍රමය අනුව කොහොමත් එනවා.

ගරු සභානායකතුමනි, ඒ විතරක් නොවෙයි. කොටඨාස දෙකක් තිබෙනවා, ඒ කොටඨාස දෙකෙන් මන්ත්‍රීවරුන් තුන්දෙනෙක් එනවා. දෙකකට නොවෙයි තුනකටත් ගිහින්! මේ විධියට තමයි මේ කොටඨාස නිර්ණය කළේ, මහා පුදුම විධියකට. අපි දන්නෙත් නැහැ, මේවා කොහොමද වෙන් කළේ කියලා. ඒ වෙන් කළ සමහර කොටඨාස අතර භූගෝලීය වශයෙන් කිසිම

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

සම්බන්ධයක් නැහැ. භූගෝලීය වශයෙන් සම්බන්ධ නැති කොට්ඨාස වෙන් කරලා තිබෙනවා.

පසු ගිය කාලයේ මේ වාගේ ලොකු ආරවුලක් හැදුවේ තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා ඒ කාලයේ මේ කොට්ඨාස නිර්ණය හරියට කළා නම්, පක්ෂ භේදයකින් තොරව සියලු දෙනාගේම අදහස් අරගෙන කළා නම්, මේ වන විට අපට මේ මැතිවරණය තියලා අවසන් කරන්නට තිබුණා. මේ මැතිවරණය කල් ගියේ තමුන්නාන්සේලාගේ වරදින්. තමුන්නාන්සේලා කථා කරනවා ඡන්ද අයිතිය අහෝසි කිරීම ගැන.

තමුන්නාන්සේලාට මතකද, 2006දී කොළඹ නගර සභාවේ අපේ ලැයිස්තුව ප්‍රතික්ෂේප වුණාම, අපි කණ්ණාඩිය ලකුණෙන් තරග කරලා ජයග්‍රහණය කළා? නමුත්, මහින්ද රාජපක්ෂ මහත්මයා 2008දී ඒක විසුරුවා හැරලා, කොමසාරිස්වරයෙක්ව දාලා නගර සභාව කරගෙන ගියා. අවුරුදු තුනක් කොළඹ නගර සභාවේ ඡන්දය පැවැත්වූවේ නැහැ, ඡන්දය කල් දැම්මා. කොළඹ නගර සභාව එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරනවා කියලා විශේෂ කොමසාරිස්වරයෙක් යටතේ පාලනය කළා. අවුරුදු තුනක් ඡන්දය නොපවත්වා තමයි මහින්ද රාජපක්ෂ මහත්මයා කොළඹ නගර සභාව පවත්වාගෙන ගියේ. ගරු නියෝජ්‍ය කථානායකතුමාත් ඒ ගැන දන්නවා. මොකක්ද අද මේ කථා කරන්නේ, ඡන්ද අයිතිය අහෝසි කිරීම ගැන? තමුන්නාන්සේලාට කිසිම අයිතියක් නැහැ ඡන්ද අයිතිය ගැන කථා කරන්නට. ඡන්ද අයිතිය නැති කළේ ඔබතුමන්ලා. මේ නගරයේ ජනතාවගේ ඡන්ද අයිතිය එදා උදුරා ගත්තා. ඡන්දය නොපවත්වා විශේෂ කොමසාරිස්වරයෙක්ව දාලා අවුරුදු තුනක් කොළඹ නරග සභාවේ ඡන්දය කල් දැම්මා, තමුන්නාන්සේලාට දිනන්න බැහැයි කියලා. අද ඇවිත් කථා කරනවා, වෙනත් දේවල් ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපටත් ඕනෑ මැතිවරණය පවත්වන්න. අපි ආසයි, ඉක්මනට මේ පළාත් පාලන මැතිවරණය තියලා පළාත් පාලන ආයතනවල වැඩි බහුතරයක් දිනා ගන්න. ඒක අපට ජේනවා, අපට ජයග්‍රහණය කරන්න පුළුවන්. අද අපි ඉන්නේ දිනන තැනක. ඒක ගැන කිසිම විවාදයක් නැහැ. අපි කියන්නේත් ඉක්මනට මේක ඉවර කරලා දාලා මේ පළාත් පාලන මැතිවරණය පවත්වන්න කියලා. මොකද, අපටත් අවශ්‍ය වෙලා තිබෙනවා, මේ ඡන්දය ජයග්‍රහණය කරගෙන ඉස්සරහට යන්නට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාල වේලාව ලබාදීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

[අ.භා. 5.49]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී ඉතාමත් වැදගත් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, පළාත් පාලන මැතිවරණය කල් දැමීම සම්බන්ධව. දෙපැත්තෙන්ම මේ ගැන අදහස් ප්‍රකාශ කළා. මට පෙර කථා කළ ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියනවා, මන්ත්‍රීවරුන් තුන් දෙනෙක් තෝරන්න මැද කොළඹ ආසනයේ කොට්ඨාස වෙන් කරලා තිබෙනවා කියලා. ඒ අවශ්‍යතාව එහෙමයි. මැද කොළඹ ආසනයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙනුත් තුන් දෙනෙක් තේරුණා. ඉතිහාසයේ අපි දන්නා කාලයේ ඉඳලා තුන් දෙනෙක් තේරුණා. ඒකට හේතුවක් තිබුණා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විවිධ ජාතීන්, විවිධ ජන කොටස් නියෝජනය කරන ප්‍රදේශයක් මැද කොළඹ කියලා කියන්නේ. එම නිසා ඒ කාටත් නියෝජනයක් අවශ්‍යයි. එතුමන්ලා උත්සාහ කරන්නේ එතුමන්ලාට විතරක් නියෝජනයක් ලබාගන්න පුළුවන් ක්‍රමයක් හදන්නයි. එහෙම කරන්න බැහැ. මේ රටේ සියලුදෙනාම සාමකාමීව කටයුතු කරන්න ඕනෑ. දැන් සංහිඳියාවක් ගැන කථා කරනවා. එතුමන්ලා හදන්නේ එක කොටසකට විතරක් මේ බලය අල්ලා ගන්නයි. එහෙම කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා මේ කොට්ඨාස නිර්ණය කිරීම හදලා එදා ගරු කරු ජයසූරිය මැතිතුමා ඒ විෂයය භාර අමාත්‍යතුමා හැටියට එය අනුමත කළ බව. ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ 15වැනි දා ගැසට් පත්‍රයෙන් ඒක ප්‍රකාශ කළා. එතැන වැරැද්දක් තිබුණා නම් ඒ වෙලාවේ ඒවා මතු කර ගන්න ඕනෑ. දැන් මේ වෙලාවේ මොනවාද මේ කථා කරන්නේ? මේ කරන්නේ ඒක නොවෙයි. කොට්ඨාස නිර්ණයට මුවා වෙලා ඡන්දය කල් දැමීම සඳහා තමයි මේ කටයුතු කරන්නේ. මොකද, එතුමන්ලා දන්නවා මේ සැරේ ඡන්දයට ගියොත් හොඳ සබ්බුවක් හම්බ වෙනවා කියා. ඒ නිසා ඒකට බයේ තමයි ඡන්දය කල් දමන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගම් පළාත්වල මේ වැඩ පිළිවෙළ දැන් ඉතාම අසාර්ථකයි. දැන් ප්‍රාදේශීය සභාවකින්, නගර සභාවකින් සිදුවන සේවාව ජනතාවට ලැබෙන්නේ නැහැ. දැන් අවුරුද්දකුත් මාස තුනක් මේ සේවාව ලැබුණේ නැහැ. මේ ආයතන අයාලෙ යන්නේ. පාලනයක් නැහැ. පෙරේදා ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩ කරපු ලේකම්වරු සියලුදෙනාම මාරු කළා. ඒ අය මාරු කරලා දේශපාලන අවශ්‍යතාවට වුවමනා කරන නිලධාරීන් පත් කළා. මේ වෙනත් දේශපාලන ක්‍රියාවක් කරගෙන යන්නේ. ජනතාවගේ අයිතිය උදුරා ගන්නයි මේ හදන්නේ. මේ මැතිවරණය කල් දමන්න එපා. කොට්ඨාස ක්‍රමයට තියන්න බැරි නම් තිබුණු ක්‍රමයට හෝ මේ මැතිවරණය තියලා අවසන් කරන්න. මේ රටේ ජනතාවට ඡන්ද අයිතිය දෙන්න. ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය දෙන්න. මේක අද ඊයේ අවශ්‍යතාවක් නොවෙයි. ජනතාව හැම දාම මේ වෙනුවෙන් කටයුතු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියට ජනතාවට අසත්‍ය කියලා, ජනතාව රවටලා මේ ආණ්ඩුව මැතිවරණ කල් දමාගෙන යන්නේ ඔවුන්ට මහජනයාට මුහුණ දෙන්න බැරි නිසායි. [බාධා කිරීමක්] ඔවුන්ට මහජනයා අතරට යන්න බැහැ. ගියොත් මේ අයට හොඳට හම්බ වෙනවා. තමුන්නාන්සේලා එනතුරු ජනතාව ඉලපතකුත් තියාගෙන බලාගෙන ඉන්නේ. [බාධා කිරීම්] ඒකයි තමුන්නාන්සේලාට බය තිබෙන්නේ. VAT ගහලා, ජනතාවට දෙන්න පුළුවන් දස වධ සේරම දීලා තිබෙන මේ වෙලාවේ තමුන්නාන්සේලා මැතිවරණයකට නම් යන්නේ නැහැ. ඒක මට කියන්න පුළුවන්. තමුන්නාන්සේලා බයයි. මොන ප්‍රතිඵලය ආවත් කමක් නැහැ මේ පළාත් පාලන මැතිවරණය පවත්වන්න. මැතිවරණ කොමසාරිස්තුමා ඒ කාලයේ කිව්වා, " මැතිවරණය වෙලාවට ප්‍රශ්නයක් ආවොත් ඔළුවට වෙඩි තියලා හෝ මැතිවරණය තියන්න" කියා. ඒකයි එදා එතුමාට තිබුණු නිදහස. අද මැතිවරණ කොමිසමක් තිබෙනවා. මේ මැතිවරණ කොමිසම නිදහස්ද? මේක ස්වාධීන මැතිවරණ කොමිසමක්ද? ඒ ගැන ඒ කොමිසමේ සභාපතිවරයෙක්ම කියනවා. එතුමාම පුවත්පතකට ලියා කියනවා මේක කොමිසමක් නොවෙයි කියා. එහෙම නම් මේ ස්වාධීන කොමිෂන් සභා පිළිබඳ මේ ගරු සභාවේ තිබෙන සංකල්පය නිවැරදිද? තමුන්නාන්සේලා ස්වාධීන කොමිෂන් සභා හදලා ලෝකයට ආදර්ශයක් දෙනවාය කිව්වා. මේවා ස්වාධීන නැහැ. මේවා පන්දම් අල්ලන කොමිෂන් සභා බවට පත් වෙලා තිබෙන්නේ. අද මැතිවරණ කොමිසම ස්වාධීන කොමිසමක් නොවෙයි. ආණ්ඩුව කියන කියන හැටියට නටන, ආණ්ඩුවේ සුවච, කීකරු ගෝලයෙක් තමයි මැතිවරණ කොමිසම. එහෙම නම් මැතිවරණ කොමසාරිස්වරයා කියන්න ඕනෑ, "මගේ ඔළුවට

වෙඩි තිබ්බත් මම අහවල් දවසට මැතිවරණය තියනවා" කියා. ඒකයි ස්වාධීන මැතිවරණ ක්‍රමය කියා කියන්නේ. අද මේ මැතිවරණ කොමිසම ස්වාධීන නැහැ. මේ මැතිවරණ කොමිසමත් ආණ්ඩුවට පන්දම් අල්ලන, ආණ්ඩුවට සුවච, කීකරු ගෝලයෙක් වෙලා තිබෙනවා. එහෙම නම් අපට අනික් කොමිෂන් ගැන කථා කරන්න අවශ්‍ය නැහැ. අනික් කොමිෂන් ගැන අප කථා කරන්නේ නැහැ. ඒවාත් මේ විධියට තමයි ක්‍රියාත්මක වන්නේ. [බාධා කිරීම්] මේක තමයි යහ පාලනය. මේක තමයි අද හඳුන්වා දී තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය. මේ යහ පාලනය කියන්නේ ඡන්ද නැති පාලනයක්. ඡන්දවලට ඉඩ දෙන්නේ නැති යහ පාලනයක් මේ තිබෙන්නේ. ඡන්ද යටපත් කිරීමේ යහ පාලනයක් මේ තිබෙන්නේ. මේ රටේ ජනතාවගේ අවශ්‍යතාව ඉෂ්ට නොකරන, ඔවුන්ගේ අයිතිය ලබාදීම ප්‍රතික්ෂේප කරන ආණ්ඩුවක් මේ ආණ්ඩුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මෙය ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමාට කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(මාණ්පුමිකු මහින්ද යාප්පා අපේවර්තන)
(The Hon. Mahinda Yapa Abeywardena)
අපේ ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා වාගේ අනාගතයේදීත් පාර්ලිමේන්තු මැතිවරණවලට මේ අනතුරු ඇඟවීම තිබෙනවා. විවිධ කථා තිබෙනවා. විවිධ වැඩ පිළිවෙළවල් තිබෙනවා. විදේශීය බලවේග තමයි මේ වෙලාවේ අපේ රටේ ක්‍රියාත්මක වන්නේ. මැතිවරණවලට අතගහන මේ වෙලාවේ, මේ වැඩ පිළිවෙළ ඒ වැඩ පිළිවෙළේ තවත් එක පියවරක් කියායි අප කියන්නේ. ඒ නිසා මේ පළාත් පාලන මැතිවරණය වහාම පවත්වන්න කටයුතු කරන්න. මේක මේ රටේ ජනතාවගේ අවශ්‍යතාවක්. මේක මේ රටේ ජනතාව කාලයක් තිස්සේ බලාපොරොත්තු වුණු දෙයක්. කුමන හෝ ක්‍රමයකින් මේ මැතිවරණය තියලා ඉවර කරන්න. ජනතාවට ඒ අවස්ථාව ලබලා දෙන්න. ඒකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඉල්ලා සිටින්නේ. මැතිවරණයට යන්න මේ උදවිය බයයි. එහෙම නැතිව මේක කොටියාස -සීමා- නිර්ණය කිරීම සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. එහෙම එකක් දැන් නැහැ. අපි ඇහුවා, කොටියාස කීයක ද මේ ප්‍රශ්නය තිබෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුළු මාතර දිස්ත්‍රික්කයම ගත්තොත්, කොටියාස හතරකයි මේ විධියේ ප්‍රශ්න නිකම් හරි මතු කරලා තිබෙන්නේ. අනික් ඒවා සියල්ලම නිවැරදියි. කොටියාස හතරක විතරක් මේ ප්‍රශ්නය මතු කරලා තිබෙනවා. එකී කොටියාස හතර නිසා මුළු මාතර දිස්ත්‍රික්කයේම මැතිවරණය පවත්වන්නේ නැහැ. අනික් ඒවායේ කිසි ප්‍රශ්නයක් නැහැ. මෙහෙම තිබෙද්දී, ඇමතිතුමාගෙන් අපි ඇහුවා, මේ රටේ කොටියාස කීයක ගැටලු මතු වෙලා තිබෙනවාද කියලා. එතුමා ඒක කියන්නේ නැහැ. එතුමා දෙන උත්තරේ "තවම ඉවර නැහැ, තවම ඉවර නැහැ" කියන එකයි. මේ විධියට මේක කවදාද ඉවර වෙන්නේ? කවදා ඉවර කරලාද, මැතිවරණය තියන්නේ? ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මහා දේශපාලන කුමන්ත්‍රණයක් කියලායි මම කියන්නේ. මේ රජය ජනතාව ඉදිරියට යන්න තියෙන බයට, මේ රජය ජනතාව ඉදිරියේ පරදිනවාට තියෙන බයට කරන දේශපාලන කුමන්ත්‍රණයක එක පියවරක් මේක. ඒ නිසා ඒ පියවර අපි හෙළා දකිනවා. ඒ පියවර හෙළා දකිනවා විතරක් නොවෙයි, මේ ප්‍රජාතන්ත්‍රවිරෝධී වැඩ පිළිවෙළ වහාම නතර කරලා මේ රටේ ජනතාවට මේ අයිතිය ලබා දෙන්න කියලා ඉල්ලමින් මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා.

[ප.ව. 5.57]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(මාණ්පුමිකු අප්දුල්ලා මහ්රූප්)
(The Hon. Abdullah Mahrooff)
කෞරව ප්‍රතිච් සභානායකර් අවර්කළේ, ඉන්නෙය ඉන්ත මුක්කියමාන ඔත්තිවෛප්පුප් පිරේරණෙයානදු උණ්මෛක්කුප් පුරම්පානදුම් මනච්චාට්චික්කු විරෝතමානදුමාන ඔරු පිරේරණෙයාකුම්. 2008 - 2012ආම් ආණ්ටු කාලප්පකුතියිල් නාන් කිළක්කු මාකාණ සපෙයිලේ පිරතිනිතියාක ඉරුන්තපෝතු අන්ත මාකාණ සපෙක්කු ආට්රුප්පටුත්තප්පට්ට උළ්ළූරාට්චිච් සපෙකළ් (තිරුත්තම්) චට්ටමූලමානදු මුන්නාළ් මුතලමෛච්චර් පිළ්ළෙයාන් අවර්කළාල් 6 මුරෙ සපෙක්කුක් කොණ්ටුවරප්පට්ටදු. අතෙ නාංකළ් වන්මෙයාක එතිර්ත්තෝම්. අතන් කාරණමාක මාකාණ සපෙයින් අංගීකාරම් අතර්කුක් කිටෛක්කවිල්ලෛ. 1969ආම් ආණ්ටින් වට්ටාරමුරෛත් තේර්තලුක්කු ඔප්පාන අන්ත තේර්තල් මුරෙයෛ මුන්නෙය අරචාංකම් අවචර අවචරමාකක් කොණ්ටුවර මුනෛන්තදු. 1969ආම් ආණ්ටින් චට්ටත්තින්පටි තිරුකෝණමලෛ මාවට්ටත්තිලේ 21 සපෙකළුක්කු 149 උරුප්පිනර්කළ් ඉරුන්තාර්කළ්. ආනාල්, ඉන්රු උරුවාක්කප් පට්ටිරුක්කින්ර ඉන්ත මුරෛමෙයිල් 13 සපෙකළුක්කු 136 උරුප්පිනර්කළ් ඉරුක්කිරාර්කළ්. අන්ත මාවට්ටත්තිලිරුක්කින්ර ඉන විකිතාචාරත්තෛක් කණක්කිලෙටුක්කාමල් ඉදු මේර්කොළ්ළප්පට්ටදු.

අන්තප් පිරදේචත්තිලේ 41.77 චතවීත මුස්ලිම්කළුම් 31.38 චතවීත තමිළ් මක්කළුම් 26.32 චතවීත පෙරුම්පාන්මෛ ඉන මක්කළුම් ඉරුක්කින්රනර්. අංකුළ්ළ 13 සපෙකළිලේ 3 සපෙකළ්කූට 42 චතවීතමානවර්කළුක්කු ඉල්ලෛ. අතනාල් ඉන විකිතාචාරත්තෛ උරුතිප්පටුත්තාත එන්තත් තේර්තලුක්කුම් නාංකළ් මුකංකොටුක්ක මාට්ටෝමෙන්රුම් අන්ත තිරුත්තච් චට්ටමූලත්තුක්කු එංකළුටෛය අංගීකාරත්තෛත් තරමාට්ටෝමෙන්රුම් කූරිනෝම්. වට මාකාණ සපෙයෛත් තවිර 8 මාකාණ සපෙකළ් අන්රු නටෛමුරෛයිල් ඉරුන්තන. ඔරු මාතත්තිර්කිටෛයිල් 7 මාකාණ සපෙකළිලුම් අන්තච් චට්ටමූලත්තිර්කු අංගීකාරම් පෙරප්පට්ටදු. ආනාල්, කිළක්කු මාකාණ සපෙ 4 වරුටංකළාක අතනෛ ඉළුත්තටිත්තදු. අන්ත නේරත්තිලේ අන්රෙය මුතලමෛච්චරුක්කු මිකුන්ත නෙරුක්කටියෛක් කොටුත්තාර්කළ්. ආනාල්, මුතලමෛච්චර් අවර්කළ් අන්රු එංකළෝටු ඔත්තුෆෛත්තාර්. අන්ත තිරුත්තච් චට්ටමූලත්තෛ තිරුත්තංකළුටන් මුන්වෛත්තු නිරෛවේර්රුවෝමෙන්රු කූරිනාර්. කටෛචියාක අවරෝටු ඉරුන්තවර්කළ් කොළුම්පිලුම් මට්ටක්කළප්පිලුම් වෛත්තු කටත්තප්පට්ටාර්කළ්; පටුකොලෛ චෙය්යප්පට්ටාර්කළ්. අන්තප් පයත්තින් කාරණමාක අන්රු කිළක්කු මාකාණ සපෙයුම් ඉන්තත් තිරුත්තච් චට්ටමූලත්තිර්කාන අංගීකාරත්තෛ වළුංකියදු. අන්රු ඉන්තප් පිළෛයාන මුරෙ අවතියාක-අවචරමාකක් කොණ්ටුවරප්පට්ටදු.

කෞරව උරුප්පිනර් මුජිපුර් රහූමාන් කූරියතෛප්පෝන්රු, කොළුම්පු මාවට්ටත්තිල් කොළුම්පු මානකර සපෙත් තේර්තලිලේ 19 තොකුතිකළිල් ඉරට්ටෛ අංගත්තවර් තොකුතියාක, මූවර් අංගත්තවර් තොකුතියාකප් පෝට්ටියිටුවතර්කුක් කාරණම්, අංකුම් තංකළුටෛය උරුප්පිනර් වරවේණ්ටුම් එන්පතර්කාක ආකුම්.

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

திருகோணமலை மாவட்டத்தைப் பொறுத்தவரையில் இந்த 13 சபைகளை வைத்துக்கொண்டு எங்கள் இன விகிதாசாரப் பிரதிநிதித்துவத்தைப் பாதுகாக்க முடியாது. அன்று அசோக பீரிஸ் அவர்கள் கூறினார், நீங்கள் உறுப்பினர் தொகையை அதிகரிக்க முடியாது; உங்கள் பிரதிநிதித்துவத்தை ஒன்றை இரண்டாக மாற்றலாம், இரண்டை ஒன்றாக மாற்றலாமென்று. ஆனால், 136 உறுப்பினர்கள் தெரிவுமுறையிலும் 39 உறுப்பினர்கள் bonus முறையிலும் தெரிவுசெய்யப்பட வேண்டுமென்று எந்த அடிப்படையில் தீர்மானிக்கப்பட்டது? முன்னைய அரசாங்கம் இன விகிதாசாரத்தைக் கணக்கில் எடுக்கவில்லை. எமது சமூகத்தைப் பாதிக்கின்ற அளவுக்கு -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please wind up.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
Please give me one more minute, Sir.

நாங்கள் புல்மோட்டை, தோப்பூர், சம்பூர், கச்சக்கொடிதீவு, முள்ளிப்பொத்தானை, வான்எல, சாய்ந்தமருது ஆகிய பிரதேசங்களுக்கு 7 புதிய பிரதேச சபைகளை உருவாக்கித் தருமாறு கேட்டிருக்கின்றோம். மூதூர், கந்தளாய் போன்ற பிரதேச சபைகளை நகர சபைகளாகத் தரமுயர்த்தக் கேட்டிருக்கின்றோம். திருகோணமலையை Municipal Council ஆக்குமாறும் கேட்டிருக்கின்றோம். 15ஆம் திகதிக்கு முன்னர் objection ஐத் தெரிவிக்க முடியும். உங்களுடைய அரசாங்கம் வேண்டுமென்று செய்ததன் காரணமாக உடனடியாக தேர்தலை நடத்தமுடியாத சூழ்நிலை ஏற்பட்டுள்ளது. எமது அரசாங்கம் இரண்டுமுறை தேர்தலில் வென்றிருக்கின்றது. ஆகவே, உள்ளூராட்சித் தேர்தலை நடத்தினால் அதிலும் வெற்றிபெறும். இதில் எந்தவித சந்தேகமும் இல்லை. எனவே, கிழக்கு மாகாணத்திலுள்ள மூன்று மாவட்டங்களினதும் விகிதாசாரத்திற்கேற்ப வட்டாரங்களையும் புதிய சபைகளையும் அதிகரித்துவிட்டு, இந்த உள்ளூராட்சித் தேர்தலை நடத்துமாறு கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக்கொள்கின்றேன் . நன்றி.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.01]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙලාව නම් ප්‍රමාණවත් මදි. නමුත්, මම උත්සාහ කරනවා කරුණු කීපයක් මේ වෙලාව තුළ ඉදිරිපත් කරන්න.

අද සභාව කල් තැබීමේ යෝජනාව ගෙනා ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීමාගේත්, එම කණ්ඩායම නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේත් අදහස වුණේ, "පළාත් පාලන මැතිවරණය කල් දමන්නේ මේ ආණ්ඩුව ඡන්දවලට භය නිසාය" කියන එකයි. ඒ අය රටට කියන්න උත්සාහ කරන්නේ ඒක. ඇත්ත වශයෙන්ම පළාත් පාලන ඡන්දය කල් යන්න හේතුව මොකක්ද? කල් යන්න හේතුව අපේ මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ කථාවේ සඳහන් වුණා. ඒ තමයි, කොටියාස නිර්ණය කිරීමේදී ඇති වූ ගැටලු. දැන් මෙතුමන්ලා කියනවා, දිස්ත්‍රික්ක තුන-හතරක තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ කියලා.

එතුමන්ලාගේ අදහස ඒක නම්, අපි ගාල්ල දිස්ත්‍රික්කය උදාහරණයකට ගනිමු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාත් වසර 21 පළාත් සභාව නියෝජනය කළා. ඒ කාල සීමාව ඇතුළත අප කිසිම අවස්ථාවක කැඳෙව්වේ නැහැ, අපට කිසිම අවස්ථාවක් ලැබුණේ නැහැ, කොටියාස නිර්ණය පිළිබඳව අපේ අදහස් ලබා දෙන්න. අපේ අදහස් ලබා දෙන්න අවස්ථාව ලබා නොදුන්නා විතරක් නොවෙයි, අඩුම තරමින් සම්බන්ධීකරණ කමිටුවට අප කැඳෙව්වේත් නැහැ. මා නියෝජනය කරන ප්‍රාදේශීය ලේකම් කොටියාසයේ සම්බන්ධීකරණ කමිටුවට මා කැඳෙව්වේ නැහැ. එදා එවැනි තත්ත්වයක් තිබුණේ. එවැනි ප්‍රජාතන්ත්‍රවාදයක්, සුපිරි ප්‍රජාතන්ත්‍රවාදයක් තමයි පසු ගිය කාලයේ ක්‍රියාත්මක වුණේ. දැන් මෙතුමන්ලා කියනවා, පළාත් පාලන ඡන්දය පවත්වන්නේ නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන පනත සංශෝධනය කිරීමෙන් පසු සම්මත වුණු නව පනත අනුව, පළාත් පාලන ආයතනයක අය වැය පැරදුණාම සභාපතිවරයා ගෙදර යන්න ඕනෑ. අය වැය පැරදුණා නම් සභාපති ධුරය අහෝසි වනවා. නමුත් අය වැය පැරදුණු පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට ඉවත් වෙන්න දුන්නාද? නැහැ. කොයි තරම් චෝදනා තිබුණත්, තමන්ගේම කණ්ඩායමේ අය විසින් අය වැය පරාජය කළත්, තමන්ට හිතවත් සභාපතිවරුන්ට යන්න දුන්නේ නැහැ. ඔවුන් තියා ගත්තා. ඒ සඳහා ඒ පනතට සංශෝධනයක් ගෙනාවා. දූෂණ, හොරකම් කරපු අයට ඉඩකඩ දුන්නා. සභාපතිවරු කීදෙනෙකුට එවැනි චෝදනා තිබුණාද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? කවදාද විනය පරීක්ෂණයක් කියලා ඒ අයට දඬුවම් කරලා තිබෙන්නේ?

මාත් පළාත් පාලන ආයතනයකින් දේශපාලනයට ආපු කෙනෙක්. 1991දී ප්‍රාදේශීය සභාවට එන කොට, මගේ කිසිදු බලාපොරොත්තුවක් තිබුණේ නැහැ, කොන්ත්‍රාත් කරන්න. අපි පළාත් පාලන ආයතන නියෝජනය කළේ කොන්ත්‍රාත් කරන්න බලාගෙන නොවෙයි. ජනතාව තමයි අප පත් කළේ. අපට ආශාවක් තිබුණේ ගමේ මොනවා හෝ වැඩක් කරන්නයි. ගමේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා කොන්ත්‍රාත්කරුවෙක් කිරීමේ චෝදනාව මහින්ද රාජපක්ෂ මහත්මයා භාර ගන්න ඕනෑ. එතුමා තමයි කොන්ත්‍රාත් කරන්න ඉඩ දුන්නේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට. සභාපතිවරු, නියෝජ්‍ය සභාපතිවරු ගමේ පාර හැදීමේ කොන්ත්‍රාත් කළා. ඒ අය මහජන නියෝජිතයෝ නොවෙයි, කොන්ත්‍රාත්කාරයෝ බවට පත් වුණා. එහෙම කොන්ත්‍රාත්කාරයෝ බවට පත් වුණු නිසා තමයි ගමේ මිනිස්සු කිව්වේ, "අපට මේ මන්ත්‍රීවරුන්ගෙන් වැඩක් නැහැ. ගමට වග කියන මන්ත්‍රීවරයෙක් අපට ඕනෑ. ගම ගැන කැක්කුම තිබෙන, හැඟීම තිබෙන සැබෑ සමාජ සේවකයෙකුට පළාත් පාලන ආයතනයට එන්න අවස්ථාව දෙන්න ඕනෑ" කියලා. ඒ වෙනුවෙන් තමයි කොටියාස නියෝජන ක්‍රමය යෝජනා වුණේ. හැබැයි, බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කාමරයේ ඉඳගෙන එතුමාට ඕනෑ විධියට කොටියාස නිර්ණය කරපු නිසා ඒ කටයුත්ත කරන්න කාලයක් ගියා; ඒ කටයුත්ත ඇදෙන්න වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන ඡන්දය හෙට පවත්වනවා නම් අපි කැමැතියි. අපි ඒකට සූදානම් බව මම කියන්න කැමැතියි. හැබැයි, මේ ඡන්දයේදී ඇත්ත මහජන නියෝජිතයන් පත්වෙන්න ඕනෑ. ඇත්ත සමාජ සේවකයන්ට අවස්ථාව ලැබෙන්න ඕනෑ. ඒකට අවශ්‍ය කරන ක්‍රමවේදය සකස් වෙන්න ඕනෑ.

කියන්න කරුණු බොහොමයක් තිබුණත්, මම මගේ කථාව කෙටි කරනවා. මම අවසාන වශයෙන් අවස්ථාව ඉල්ලනවා එක කාරණයක් කියන්න. ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා සඳහන් කළා, දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම්වරු මාරු කර තිබෙනවා කියලා. නමුත් මාරු කර තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම්වරු නොවෙයි, ප්‍රාදේශීය සභාවල ලේකම්වරු. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුණත් මාත් මේ ගරු සභාවේදී කියනවා අත්තෝනෝමතික විධියට ඒ මාරුවීම් සිදු කර තිබෙන බව. ඒක කරලා තිබෙන්නේ පළාත් සභාවෙන්; පළාත් සභාවේ පළාත් පාලන ඇමතිවරයා. ඒ මාරුවීම් වැරදියි. ඒ නිසා අපි කියනවා, කරුණාකරලා ඒ මාරු වීම් වහාම අත්හිටුවන්න කියලා. වැඩ කරපු සභා ලේකම්වරු තමයි මාරු කරලා තිබෙන්නේ. ඒක වැරදියි කියලා අපිත් කියනවා. ඒ මහ ඇමතිවරයාත්, එතුමාගේ කණ්ඩායමේ මන්ත්‍රීවරු හා නියෝජිතයන් ඒ සිද්ධිය පිටු පස ඉන්නවා. ඒ නිසා ඒ ගැන සොයා බලන්න කියලා මම ඉල්ලනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලබා දුන් වෙලාව ප්‍රමාණවත් නොවුණත්, අදහස් දක්වන්න ඉඩකඩ ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 6.05]

ගරු චන්දිම ගමගේ මහතා
(මාණ්පුමිකු සන්දිම කමකේ)
(The Hon. Chandima Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ගෙනාපු, "කඩිනමින් පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතුය" කියන යෝජනාව ගැන අදහස් කීපයක් ප්‍රකාශ කරන්න මා බලාපොරොත්තු වෙනවා. ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියපු කරුණු නැවත මතක් කරන්න මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම බලාපොරොත්තු වෙන්නේ ඒ කරුණුවල අනෙක් පැත්ත කථා කරන්නයි.

දැන් එතුමන්ලා කථා කරනවා, පළාත් පාලන ඡන්දය පවත්වන්නේ නැහැ කියලා. එදා අවුරුදු ගණන් ප්‍රාදේශීය සභාවල කාලපරිච්ඡේද දික් කරමින් සිටියා, ඡන්දයක් තියන්නේ නැතිව. මේ දෙකම එකයි නේ. ඒ වාගේම, දැන් කියනවා පළාත් පාලන ආයතනවලින් මහජනතාවට සේවාවක් සිද්ධ වෙන්නේ නැහැ කියලා. මේ රටේ පළාත් තිබෙන්නේ නවයයි. ඒ පළාත් නවයෙන් උතුරු පළාත් සභාවේ බලය විතරයි එක්සත් ජනතා නිදහස් සන්ධානයට නැත්තේ. ඒ පළාත් සභාවල මහ ඇමතිවරු තමයි ඒ පළාත් පාලන ඇමතිවරු. දැන් මහජනතාවට සේවාවක් සිද්ධ වෙන්නේ නැත්නම්, ඒ පළාතේ මහ ඇමතිවරයා දැනගන්න ඕනෑ, ප්‍රාදේශීය සභාවල, නගර සභාවල සේවාව ජනතාවට සපයන්න. ඒ ගැන මෙතැනට ඇවිත් කියලා වැඩක් නැහැ. ඒක ගිහිල්ලා මහ ඇමතිවරුන්ට කියන්න. මහ ඇමතිවරු ඉන්නේ එතුමන්ලාගේ පක්ෂයේ නායකතුමා යටතේ. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සභාපතිකමෙත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිකමෙත් ඉන්නේ එකම නායකතුමායි. ඒ නිසා එතුමාටයි ඒ ගැන පැමිණිලි කරන්න ඕනෑ. එහෙම නැතිව මෙතැනට ඇවිල්ලා කෑ ගහලා වැඩක් නැහැ. නමුත් එතුමාට ඒක කියන්න යන්නේ නැහැ, බයයි. එතුමාට ළං වෙන්න බයයි. මොකද, ළං වෙනකොට පන්නනවා; සංවිධායකකම නැති වෙනවා. සමහර අයට දැන් සංවිධායකකම නැතිවෙලා තිබෙන්නේ. ඒ නිසා මෙතැනට ඇවිල්ලා බොරුවට කෑ ගහනවා.

එදා කිව්වා, පාද යාත්‍රාවට ලක්ෂ 10ක් ගෙනෙනවා කියලා. අන්තිමට මොකද වුණේ? 1,500ක්, 2,000ක් සෙනහ හිටියා. හැබැයි, කිව්වේ කෝටි දෙකක් සෙනහ ආවා කියලායි. ඒකෙන්ම තේරුම් ගත්තා, මේ මන්ත්‍රීවරුන්ගේ අධ්‍යාපන තත්ත්වය ගැන. විශේෂයෙන්ම ගණිතය සම්බන්ධයෙන් තිබෙන දැනුම ඒකෙන්ම තේරුම් ගත්තා. ඊට පස්සේ කියනවා, කෝටි දෙකක් නොවෙයි, මිලියන දෙකක් කියලා. මිලියන දෙකක් කියන්නේ ලක්ෂ 20ක්. එතැන කොහේද මිනිස්සු ලක්ෂ 20ක් හිටියේ? ඒ නිසා මෙහෙම විකාර දොඩවලා වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු චන්දිම ගමගේ මහතා
(මාණ්පුමිකු සන්දිම කමකේ)
(The Hon. Chandima Gamage)
මට තව ටික වේලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එතුමන්ලා කොච්චර කෑ ගැහුවත් ඉදිරියේදී ඡන්දයක් තිබුණොත් එතුමන්ලාට දිනන්න බැහැ. දින්නත්, පසු ගිය කාලයේ වාගේ කන්‍යාවන් 100ක් දූෂණය කරන ප්‍රාදේශීය සභා සභාපතිවරු, මන්ත්‍රීවරු, විදේශීය කාන්තාවන් දූෂණය කරන සභාපතිවරු, මන්ත්‍රීවරු නැවත පත් කරන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒ තනතුරු හිතින් ඉවත් කරගෙන තිබෙන විධියට වැඩ කරගෙන ඉන්න පුරුදුවෙන්න කියලා මම මේ අවස්ථාවේදී කියමින් මගේ කතාව අවසන් කරනවා.

[පි.ප. 6.08]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(මාණ්පුමිකු இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனக்கு பேசுவதற்கு சந்தர்ப்பமளித்தமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். நான் அநுராதபுர மாவட்டத்தைச் சேர்ந்தவன். இந்த மாவட்டத்திலே முதலில் இருந்த ஆட்சியாளர்களினால் உள்ளூராட்சிச் சபைகள் பிரிக்கப்பட்டுள்ள முறையானது முற்றுமுழுதாகப் பிழையென்றே நான் கூறிக்கொள்ள விரும்புகின்றேன். அதனைத் தொடர்ந்து தற்போது ஆட்சியிலுள்ளவர்களும் அதே முறையைக் கையாண்டு வருகின்றனர்.

அநுராதபுரம் மாவட்டத்திலே 40,000 - 50,000 முஸ்லிம் வாக்காளர்கள் இருக்கிறார்கள். பாராளுமன்றத்தில் அம்மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் முஸ்லிம் உறுப்பினராக நான் மட்டுமே இருக்கிறேன்; පළාත් සභා இல் இரண்டு உறுப்பினர்கள் இருக்கிறார்கள். உள்ளூராட்சி சபைத் தேர்தல் தொடர்பாக அங்கு எமது மக்களுக்கு ஒரு பிரதிநிதித்துவம் மட்டும் கிடைப்பதற்குரிய ஏற்பாடுகளே செய்யப்பட்டுள்ளன. அதனால் எங்களுடைய மாவட்டத்தில் எமது மக்களின் பிரதிநிதித்துவத்தை உதாசீனம் செய்யாமல், அங்குள்ள வாக்காளர் தொகைக்கேற்ற வகையில் அங்கு பிரதிநிதித்துவத்தைப் பெற அவர்களுக்குச் சந்தர்ப்பத்தை வழங்குமாறு மேதகு ஜனாதிபதி அவர்களிடமும் மாண்புமிகு பிரதமர் அவர்களிடமும் நான் வலியுறுத்திக் கேட்டுக்கொள்வதோடு, எனக்குச் சந்தர்ப்பமளித்தமைக்கு மீண்டும் ஒருமுறை பிரதிச் சபாநாயகர் அவர்களுக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා.

[අ.භා. 6.09]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් පළාත් පාලන ආයතනයන්හි මැතිවරණය පැවැත්වීම කල් දැමීම සම්බන්ධයෙන් අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළා. පසු ගිය වකවානුවේ පළාත් පාලන ආයතන නියෝජිතයකු විධියට කටයුතු කළ පුද්ගලයකු හැටියට අද එම ආයතනවලට අත්වෙලා තිබෙන බෙදාවාචකය ගැන මට කියන්නට සිදු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම පළාත් පාලන මැතිවරණය කල් දැමීමේ කාරණය ගැන, මැතිවරණයක් පවත්වන්නේ නැතිව ආයතන පවත්වාගෙන යන කාරණය ගැන අපේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් කථා කළා. ඒ මන්ත්‍රීවරු පැහැදිලිවම දැන ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. 1982 මැතිවරණය පවත්වන්නේ නැතුව ලාම්පු - කළගෙඩි සෙල්ලම නමින් හඳුන්වන ජනමත විචාරණයක් ගෙනැල්ලා, - නගර සභා, ප්‍රාදේශීය සභා වාගේ පොඩි ආයතන නොවෙයි - මේ පාර්ලිමේන්තුවම අකුළලා කටයුතු කරන්න ගියා නිසා තමයි උතුරේ ප්‍රභාකරන් කෙනෙක් ඇති වුණේ. ඒ වාගේම විජය කුමාරණතුංග වැනි පුද්ගලයන් අද අපට නැති වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ මැතිවරණ පවත්වන එක පරක්කු කෙරුවේ මහින්ද රාජපක්ෂ කියලා කියන එක විහිළුවක්. අපි උතුරටත් ගිහින් මැතිවරණ තිබ්බා.

තමුන්නාන්සේලා බලන්න, මෙතැන වැඩි දෙනෙක් ඉන්නේ පළාත් පාලන ආයතන නියෝජනය කරලා ආපු උදවියයි. පළාත් පාලන ආයතනවලට අයත් සම්පත් අද විනාශ වෙලා තිබෙනවා. මහ ඇමතිවරුන්ට චෝදනා කරමින් මහ ඇමතිවරු ගැන අද කථා කළා. නමුත් ආණ්ඩුව තමයි මහ ඇමතිවරු මෙහෙය වන්නේ. අපි ඒ ගැන දන්නවා. ඒ නිසා පළාත් සභාවක් තුළින් කෙරෙන්න ඕනෑ දේ කෙරෙද්දී, ප්‍රාදේශීය සභාව ඒකට ඇඳා ගන්න එක සුදුසු නැහැ. එම කථාව කරපු මන්ත්‍රීතුමා දැන ගන්න ඕනෑ, පළාත් සභාව කියන්නේ මොකක්ද, පළාත් පාලන ආයතනය කියන්නේ මොකක්ද කියලා. එතුමා ඒකේ වුවමනාව දන්නේ නැහැ. එතුමා වැඩි හරියක් දන්නේ අගමැතිතුමා කථා කරද්දී පිටුපසට ගිහිල්ලා ඉඳගෙන ඉන්න විතරයි. ඒ කාලයේ පළාත් පාලන ආයතනවල හිටපු අය යම් යම් දූෂණ, හොරකම් කළා නම්, ඒ ආයතනවල ඉඳලා එක පාරටම මේ පාර්ලිමේන්තුවට අපට එන්න බැහැ. අපි ඒ ආයතනවල සිටි කාලයේ මිනිස්සුන්ට ඒ ආයතන හරහා පහසුකම් ලබා දුන් නිසා තමයි, එකපාරටම ඒ මිනිස්සු අපව පාර්ලිමේන්තුවට එව්වේ. අද මේ පළාත් පාලන මැතිවරණ පවත්වන්න ආණ්ඩුව භය වෙලායි සිටින්නේ කියලා අපි කියනවා. එහෙම නැතිව වෙනත් දෙයක් හින්දා නොවෙයි, පළාත් පාලන මැතිවරණ පවත්වන්නේ නැතිව ඉන්නේ. පළාත් පාලන ආයතන 336ක් අද අකර්මණ්‍ය කරලා තිබෙනවා. ඊයේ-පෙරේදා නුවර පෙරහැර ගිහිල්ලා ඉවර වෙද්දී කුණු ටික අස් කර ගන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. එහෙම තත්ත්වයකට අද රට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ මැතිවරණය කුමන ක්‍රමයකින් හරි පවත්වන්න කියලායි අපි ඉල්ලන්නේ. මොකද, 2015 අගෝස්තු මාසයේදී තමයි මේක ගැසට් කළේ.

2015 අගෝස්තු මාසයේදී මේක ගැසට් කළා නම්, අවුරුද්දක් ඉක්ම යන තුරු මේ සීමා නිර්ණය ගන්න බැරිව ගියා කියන්නේ විෂය භාර අමාත්‍යාවරයා ලජ්ජා විය යුතු කාරණයක්. අද මහ ඉහළින් රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. මේක නිකම් කුණු කූඩයට දමනවා කියලා කියනවා වාගේ, විෂය භාර ඇමතිතුමාවත්, නියෝජ්‍ය ඇමතිතුමාවත්, කවුරුවත් අද මෙතැන නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන හවුල් ආණ්ඩුව ගැන අපි කනගාටු වෙනවා. අපිට මේ සම්බන්ධයෙන් ලොකු දුකක්, වේදනාවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තප්පරයක් දෙන්න. මේ රාජ්‍ය ආයතන අද නිලධාරීන් අතට පත්වීම තුළින් පාරවල් ටික හැදෙන්නේ නැතිව, වීදි ලාම්පු ටික හැදෙන්නේ නැතිව, මේ රටේ සියලු දේ අකර්මණ්‍ය වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අපි කියන්නේ, මේ මොන දේ කිව්වත් රාජ්‍ය නිලධාරීන්ට මේ ආණ්ඩුව ගැන විශ්වාසයක් නැහැ කියලා. ආණ්ඩුව මේ පළාත් පාලන මැතිවරණය පවත්වන්නේ නැතිව මේ තත්ත්වය තවත් දිගින් දිගට ගෙනියන්නේ ඇයි? රටේ සමහර ප්‍රදේශ ගංවතුරට යට වුණා. සාලාව ප්‍රදේශය පුපුරා යාමක් නිසා විනාශ වුණා. ඒ ජනතාවට අවශ්‍ය පහසුකම් දෙන්න බැරිව ඉඳගෙන, මේ පළාත් පාලන මැතිවරණය පවත්වන්නේ නැතිව දිගින් දිගටම මේ තත්ත්වය ගෙන යන්නේ වෙන දෙයක් හින්දා නොවෙයි, රටට දෙයක් කියන්න මේ ආණ්ඩුවට හැකියාවක් නැති නිසා; ඡන්දය තිබ්බොත් මේ ආණ්ඩුව පරාද වෙන බව දන්නා නිසා බව කියමින් මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා.

[අ.භා. 6.14]

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - State Minister of Finance)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගරු ඩලස් අලහප්පරුම මන්ත්‍රීතුමා ස්ථිර කළා. මම හිතන විධියට පළාත් පාලන ආයතනයන්හි මැතිවරණ පැවැත්වීම පිළිබඳව අප කාටවත් ගැටලුවක් තිබෙන්න බැහැ. මිනිසුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය දවසකින් හෝ කල් දමනවා නම්, එම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ආරක්ෂා කර දීම මහජන නියෝජිතයන්ගේ යුතුකමක් වනවා. නමුත්, පළාත් පාලන ආයතනයන්හී ඡන්ද විමසීම ප්‍රමාද වුණේ ඇයි කියන එක පිළිබඳව අප සියලු දෙනාම සාධාරණ විධියට සිතා බැලිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පළමුවෙන්ම සඳහන් කළ යුතු දෙයක් තිබෙනවා. මේ අවස්ථාවේ දී විෂය භාර ඇමතිතුමා විදේශගත වෙලායි සිටින්නේ. ඒ වාගේම රාජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ දී රෝහල්ගත වෙලා ප්‍රතිකාර ලබමින් සිටිනවා. මේ යෝජනාව පිළිබඳ විවාදයට එතුමන්ලාට

සහභාගී වෙන්න බැරි වුණේ ඒ හේතුව නිසායි කියලා මේ ගරු සභාවට දන්වන එක මගේ යුතුකමක් කියලා මම හිතනවා. නමුත්, මේ යෝජනාව සම්බන්ධයෙන් විවාදයේ දී මතු වුණු යම් යම් කරුණු පිළිබඳව වැරැදි අර්ථකථනයන් ලබා දීමක් මේ ගරු සභාවේදී සිදු වුණා. ඒ කියන්නේ, මේ සීමා නිර්ණයන් පිළිබඳව ගැසට් කළාට පසුව පළමුවෙනි වතාවට මේ පාර්ලිමේන්තුවට පොතක් ලැබුණා. ඉන් පසුව 2016.02.20 දින වන විට මතයක් ඇති වුණා, මේ සීමා නිර්ණයන්වල යම් යම් අඩු-පාඩුකම් තිබෙනවා කියලා. ඒකට හොඳම උදාහරණයක් ලෙස මා ලිපියක් පෙන්වන්නම්.

වාසුදේව නානායක්කාර මැතිතුමාගේ ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණෙන් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා, "රත්නපුර දිස්ත්‍රික්කයට ඉතාම අසාධාරණ ලෙස සීමා නිර්ණයන් සිදු වූ නිසා, ඒ සීමා නිර්ණයන් සම්බන්ධයෙන් අපි යෝජනා ඉදිරිපත් කරනවා. ඒ අනුව අපට අවස්ථාවක් ලබා දිය යුතුයි" කියලා. ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ සබරගමු පළාත් සභා මන්ත්‍රී නමින්ද දේශප්‍රිය මැතිතුමා ඒ අවස්ථාවට ගිහිල්ලා ස්තුති කළා, "අපට මේ වාගේ අදහස් ප්‍රකාශ කරන්න ඉඩ දීලා, අපේ කරුණු අහගෙන හිටපු පළමුවෙනි අවස්ථාව මේකයි. කොට්ඨාස මැතිවරණ ක්‍රමය ක්‍රියාත්මක වන එක ගැන අපි සියයට සියයක් කැමැතියි. නමුත්, මේ වාගේ වෙනස්වීමක් ගැන අපේ අදහස් ප්‍රකාශ කරන්න මීට පෙර අපට ඉඩක් ලැබුණේ නැහැ"යි කියලා. ඒ යෝජනාවලට අනුව එකක්, දෙකක් නොවෙයි වෙනස් වෙලා තිබෙන්නේ. ඒවා මම ඉදිරිපත් කරන්නම්.

එක එක දිස්ත්‍රික්කය ගත්තොත්, දැනට කොට්ඨාස 1953කින් සංශෝධන ඉදිරිපත් වෙලා තිබෙනවා. පැමිණිලි 974ක් ඉදිරිපත් වෙලා තිබෙනවා. අභියාචනා 1,035ක් යොමු වෙලා තිබෙනවා. අලුතෙන් කොට්ඨාස වෙන් කළාට පසුව කොළඹ කොට්ඨාසයේ වෙනස්වීම් 132ක් තිබෙනවා. සංශෝධනය වුණාට පසුව ගම්පහ දිස්ත්‍රික්කයේ කලින් තිබුණු කොට්ඨාස 187, දැන් 209ක් වෙලා තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ කොට්ඨාස 69, දැන් 93ක් වෙලා තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ කොට්ඨාස 106, දැන් 175ක් වෙලා තිබෙනවා. මාතලේ දිස්ත්‍රික්කයේ කොට්ඨාස 39, දැන් 95ක් වෙලා තිබෙනවා. මේ විධියට ගත්තාම පැමිණිලි 1,035ට අනුව සංශෝධනය වන කොට්ඨාසත් එක්ක කලින් කොට්ඨාස සංසන්දනය කළාම, 1953 ඉඳලා අවසානය වන විට කොට්ඨාස 2022ක් දක්වා දැනට වෙනස් වෙලා තිබෙනවා. ඒ වාගේම ගම්පහ, කළුතර, නුවරඑළිය, මාතර, හම්බන්තොට, ගාල්ල, මාතලේ, මොනරාගල, පුත්තලම, කෑගල්ල, බදුල්ල, අනුරාධපුරය, පොළොන්නරුව, වව්නියාව, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, යාපනේ, කිලිනොච්චි, මුලතිව්, මන්නාරම යන සියලුම ප්‍රදේශවල මේ සියල්ලන්ගේම සීමා නිර්ණයන් සම්පූර්ණයෙන් අවසන් කර වාර්තා එවා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කොළඹ දිස්ත්‍රික්කයට අදාළව පමණයි නැත්තේ?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඇගයීම් දැනට අවසන් කර නැති දිස්ත්‍රික්ක හතරක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ දිස්ත්‍රික්ක හතර මොනවාද?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
කොළඹ, මහනුවර, කුරුණෑගල, රත්නපුර යන දිස්ත්‍රික්කයන්හී තවම ඇගයීම් කරලා අවසන් නැහැ. සිතියම් හා මායිම් උපලේඛන සකස් කිරීම සඳහා -සිතියම් නිර්මාණය කිරීම සඳහා- දිස්ත්‍රික්ක නවයක ඒවා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යවා අවසන් කර තිබෙනවා. සිතියම් නිර්මාණය අවසන් වෙලා දිස්ත්‍රික්ක පහකට අදාළව උපලේඛන කෙටුම්පත් කිරීම අවසන් කර තිබෙනවා. සිංහල මාධ්‍ය, ඉංග්‍රීසි මාධ්‍ය, දෙමළ මාධ්‍ය පරිවර්තන කටයුතු අවසන් කර තිබෙනවා. පරිවර්තන කටයුතු සඳහා තවත් දිස්ත්‍රික්ක පහක ඒවා දැනට යවා තිබෙනවා. ගම්පහ, කෑගල්ල, පොළොන්නරුව, බදුල්ල, මොනරාගල යන දිස්ත්‍රික්කවලට අදාළ ඒවා යවා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාරණා දෙකක් නිසා තමයි මැතිවරණය කල් ගිහින් තිබෙන්නේ. සීමා නිර්ණයන් කළ යුතුවා සේම ඒ කටයුතු කර අවසන් වුණාම පාර්ලිමේන්තුවේ අනුකාරක සභාවට එවන්න ඕනෑ. නීතිපති දෙපාර්තමේන්තුව කෙටුම්පත් කරලා සංශෝධන 57ක් පාර්ලිමේන්තු අනුකාරක සභාවට දැන් එවා තිබෙනවා. නීතිපති එකඟතාව ලබාගැනීමෙන් අනතුරුව නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඉවර වෙලා අවසාන කෙටුම්පත සලකා බැලීම සඳහා පාර්ලිමේන්තු අනුකාරක සභාවට එවන්න ඕනෑ. එහෙම නම් එය පාර්ලිමේන්තු අනුකාරක සභාවට එන්න ඕනෑ. එසේ ආවාම පාර්ලිමේන්තු අනුකාරක සභාව අනුමත කළාට පසුව තමයි නැවත "ගැසට්" එකට යන්න ඕනෑ. "ගැසට්" කරලා පාර්ලිමේන්තුවට එන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රධාන වශයෙන් මේ සංශෝධනයට -කොට්ඨාස ක්‍රමයට- එන්න අපි සියලුදෙනා කැමැති වුණා. මෙතැන සිටින එකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හෝ -කිසිම කෙනෙක්- කොට්ඨාස ක්‍රමය එන එකට විරුද්ධ වුණේ නැහැ. සියලුදෙනා කොට්ඨාස ක්‍රමය එන එකට කැමැති වුණා. ඒකමතිකවයි එය සම්මත වුණේ. එය සම්මත කරගත් වෙලාවේ අඩු ගණනේ එකම මන්ත්‍රීවරයෙක් හෝ එයට විරුද්ධ වුණේ නැහැ. සියලුදෙනා පාහේ කොට්ඨාස ක්‍රමයට කැමැති වුණා. එහෙම කැමැති වෙලා "දිනේෂ් ගුණවර්ධන කමිටුව" දීර්ඝ කාලයක් කථා කරපු දේවල් සියල්ල -පාර්ලිමේන්තු ක්‍රමය වෙනස් කිරීම, පළාත් පාලන ක්‍රමය වෙනස් කිරීම, මැතිවරණ ක්‍රමය සම්පූර්ණයෙන් වෙනස් කිරීම ආදි සියල්ල- ගැන එහිදී සාකච්ඡා කරලා අපි සියලුදෙනා එකඟ වෙලා තිබෙනවා. ස්ථීර වශයෙන්ම, කුමන හේතුවක් නිසා හෝ කොට්ඨාස ක්‍රමයෙන් බැහැරව මැතිවරණය පවත්වන්න ජනාධිපතිතුමාගෙන් ඉඩක් ලැබෙන්නේ නැහැ. එතුමා පැහැදිලිවම කිව්වා, කොට්ඨාස ක්‍රමය හැර වෙනත් කිසිම ක්‍රමයකට මැතිවරණය පවත්වන්නේ නැහැ කියා. සීමා නිර්ණයන් ආදි සියලු දේ කරලා අවසාන කරලා පාර්ලිමේන්තුවට ආවාට පසුව කොට්ඨාස ක්‍රමයට මැතිවරණය කඩිනමින් පවත්වන්න ඕනෑ. ඒ පිළිබඳ කිසිම ගැටලුවක් නැහැ. මැතිවරණය පවත්වන කාල සීමාව ගැන කියද්දී, ලබන අවුරුද්දේ මුල් භාගය වන කොට ඒ මැතිවරණය අනිවාර්යයෙන් පවත්වන්න ඕනෑ. මොකද, ජනාධිපතිතුමාත් පැහැදිලිව එය ප්‍රකාශ කර තිබෙනවා. අගෝස්තු මාසයේ 15වන දා වන විට අදාළ කටයුතු අවසන් කරන්න නියම කර තිබුණා. මා ඉහත කී ගැළපීම් සිදු නොකළ දිස්ත්‍රික්ක හතරට -කොළඹ, මහනුවර, කුරුණෑගල, රත්නපුරය යන දිස්ත්‍රික්ක හතරට- අදාළ කටයුතු කඩිනමින් අවසන් කරන්න කියා දැන් නියම කර තිබෙනවා. ඒ කටයුතු අවසන් කළාට පසුව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සිතියම් නිර්ණයටත්, ඊට පසුව පාර්ලිමේන්තු අනුකාරක සභාවටත්, ගැසට් කළාට පසුව නැවත පාර්ලිමේන්තුවටත් ඇවිත් අනුමත කළාට පසුව තමයි එය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු අප කරන්නේ.

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා හිතන්නේ නැහැ, අප කාටවත් මැතිවරණය කල් දමන්න අවශ්‍යතාවක් තිබෙනවා කියා. ජය පරාජය වෙනම දෙයක්. මේ කියන දේ ඇත්ත. පළාත් පාලන ආයතනවල මහ ජන නියෝජිතයන් නැතිව නිලධාරීන්ට එය කරන්න බැහැ. ඒ නිසා මහ ජන නියෝජිතයන්ට ඒ බලය දෙන්න ඕනෑ. හැබැයි, එය දෙන්න ඕනෑ කොහොමද? අපි මේ රටේ වෙනස් වීමක් -දූෂිත මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමක්- බලාපොරොත්තු වුණා. මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමේ කටයුත්ත පළමුවෙන්ම පටන් ගන්න තිබෙන හොඳම තැන තමයි, පහළම එක වන ගම්සභා මැතිවරණය. ගම් සභා ක්‍රමය ඇති වන විට ඒ ක්‍රමය තුළ ජනතාවට වග කියන නියෝජිතයා පැහැදිලිවම ගමේම ඉන්නවා. මේ ක්‍රමය ඇති කරන්න අප සියලුදෙනා කැමැතියි. මැතිවරණයක් කල් දැමීමේ අවශ්‍යතාවක් අපට නැහැ. නමුත් වැරදි ආකල්පයක් යනවා, මැතිවරණය කල් දමන්න දීර්ඝ වශයෙන් උත්සාහ කරනවා කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉතාම පැහැදිලිව එතුමාගේ මුල් අදහස් ප්‍රකාශ කිරීමේදී කියනවා, මේ කොටියාස ක්‍රමය පළාත් පාලන ආයතනවලට විතරක් නොව, පාර්ලිමේන්තුවටත් වහාම ගෙන යා යුතුය කියා; පාර්ලිමේන්තුවට ඒ ක්‍රමය ගෙනැල්ලා පාර්ලිමේන්තු ක්‍රමයේත් වෙනසක් ඇති කළ යුතුය කියා. ඒ නිසා මා හිතනවා, එතැනින් පටන් ගෙන මේ ක්‍රම දෙකම වෙනස් කරලා ජනතාවට ගැළපෙන මැතිවරණ ක්‍රමයක් ගෙන ඒමේ අඩි තාලම දමන්න ඕනෑ කියා. පළාත් සභාත් මෙය කරන්න ඕනෑ. මම හිතනවා, විෂය භාර ඇමතිතුමාට දොස් කියා වැඩක් නැහැ කියා. විෂයය භාර ඇමතිතුමාට බැහැ, සීමා නිර්ණයන් අවසන් කරන්න; මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වැඩ කරන්න. විෂය භාර ඇමතිතුමාට බැහැ, පාර්ලිමේන්තු අනුකාරක සභාවේ වැඩ කරන්න. අදාළ කටයුතු පිළිවෙළට කරගෙන ගියාට පසුව කඩිනමින් මැතිවරණයකට යා යුතුයි. මැතිවරණයකට යන කාල සීමාව දුරක නොයවා ලබන අවුරුද්දේ මුල් භාගය වන කොට පළාත් පාලන මැතිවරණය පවත්වන්න පුළුවන් වේවි කියා අපි හිතනවා.

වැරදි ආකල්පයක් ඇති වෙන්න පුළුවන්, රජය මැතිවරණයකට යන්න කැමැති නැහැ, නැත්නම් ජනාධිපතිතුමා මැතිවරණයකට යන්න කැමැති නැහැ කියලා. ජනාධිපතිතුමා මැතිවරණයකට යන්න අකමැති වෙන්න හේතුවක් නැහැ. මොකද, මේක පළාත් පාලන මැතිවරණය. තරග කරන සමහර අයත් හිතා ගෙන ඉන්නේ පළාත් පාලන මැතිවරණය පරණ විධියටම PR System එක යටතේ පවත්වනවා කියලායි. ගමක තිබෙන්නේ පක්ෂ තුනක්-හතරක් වෙන්න පුළුවන්. නමුත් ඊට වඩා ස්වාධීන අපේක්ෂකයන් ඉදිරිපත් වෙනවා. ඒ ස්වාධීන අපේක්ෂකයෙක් ඡන්ද පනහක්-හැටක් කඩනවා. ඡන්ද 3,000ක් පමණ තිබෙන සමහර තැන්වල ඒ ඡන්ද 3,000න් ඡන්ද 2,000ක් පමණ වැටෙනවා. ඒ වැටෙන ඡන්ද 2,000 පක්ෂ කිහිපයකට කැඩෙනවා. ස්වාධීනව ඉදිරිපත් වන ජනප්‍රිය පුද්ගලයන් පවුල් පනහක-හැටක ඡන්ද කඩා ගන්නවා. එතකොට හිතා ගෙන ඉන්න, බලාපොරොත්තු වන ප්‍රතිඵල සමහර තැන්වලින් ලැබෙන්නේ නැහැ. අමුතුම මිනිස්සු මතු වෙන්න පුළුවන්. ඒ නිසා මේක කාටවත් බය වෙන්න ඕනෑ මැතිවරණ ක්‍රමයක් නොවෙයි. සමහර විට අපි කවුරුවත් හිතන්නේ නැති පුද්ගලයන් ගම්සභා නියෝජිතයන් හැටියට පත් වෙන්න පුළුවන්, පළාත් පාලන නියෝජිතයන් හැටියට පත් වෙන්න පුළුවන්. තවමත් මේ රටේ ඉන්න සමහර උදවිය ඔළුවේ තබා ගෙන ඉන්නවා, පරණ ක්‍රමයට ඡන්ද ගන්න පුළුවන් කියලා. එහෙම එකක් වෙන්නේ නැහැ. මේක සහමුලින්ම වෙනස් ක්‍රමයක් වෙන්න පුළුවන්. හැබැයි රජයට යුතුකමක් තිබෙනවා, පුළුවන් තරම් ඒක ඉක්මන් කරන්න. හැබැයි නීති - රීති දමන්න බැරි සීමාවකයි අපි ඉන්නේ. සමහර දිස්ත්‍රික්කවලින් පැමිණිලි ලැබිලා තිබෙනවා. දැන් අලුතෙන් පැමිණිලි 974ක් ලැබිලා තිබෙනවා. ඒවා අර ගන්නේ නැතුව තමයි, ඒවායේ කාල සීමාව ඉවර වුණු නිසා තමයි එතැනින් ඉවර කරලා තිබෙන්නේ. කල් දමන්න වුවමනා වුණා නම් අර 974ත් ආපසු විභාග කරන්න ඕනෑය කියලා කියන්න තිබුණා.

තවත් පැමිණිලි 974ක් ලැබිලා තිබෙනවා, ඒ නිසා තව ටිකක් කල් ඕනෑ කියලා කියන්න තිබුණා. නමුත් එතැනින් ඒක ඉවර කරලා තිබෙනවා. ඉවර කරලා, මම සඳහන් කළ දිස්ත්‍රික්කවල වැඩ අවසන් කරලා, එය වැදගත් විධියට පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, අපි බලාපොරොත්තු වන වෙනස ඇති කරන්න කඩිනමින් කටයුතු කරලා, වහාම මැතිවරණයකට යා යුතුයි කියන එක අපි මේ සභාවේදී කියනවා, ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.30 ට, 2016 මාර්තු මස 08 දින සභා සම්මතිය අනුව, 2016 අගෝස්තු මස 26 වන සිකුරාදා ප්‍ර. භා. 10.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 6.30 மணிக்கு பாராளுமன்றம், அதனது 2016 மார்ச் 08ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2016 ஓகஸ்ட் 26, வெள்ளிக்கிழமை மு. ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.30 p.m. until 10.30 a.m. on Friday, 26th August, 2016, pursuant to the Resolution of Parliament of 08th March, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

245 වන කාණ්ඩය - 14 වන කලාපය
தொகுதி 245 - இல. 14
Volume 245 - No. 14

2016 අගෝස්තු 26 වන සිකුරාදා
2016 ஓகஸ்ட் 26, வெள்ளிக்கிழமை
Friday, 26th August, 2016

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
වන්නේරිකුලම් බැම්ම ප්‍රතිසංස්කරණය
2015 වර්ෂයේ වැටුප් සැකසීමේදී සිදු වී ඇති විෂමතා

ශෝක ප්‍රකාශය:
ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා

කල්තැබීමේ යෝජනාව:

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
வன்னேரிக்குள அணைக்கட்டைப் புனரமைத்தல்
2015இல் ஓய்வூதியக் கணிப்பீட்டின்போதான முரண்பாடுகள்

அனுதாபத் தீர்மானம்:
மாண்புமிகு எம்.கே.ஏ.டீ.எஸ். குணவர்தன

ஒத்திவைப்புப் பிரேரணை:
உயர்தரப் பரீட்சையில் நுவரெலியா மாவட்ட மாணவர்களுக்கு ஏற்பட்ட அநீதி

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Renovation of Vannerikulam Anicut
Anomalies Occurred in Calculation of Pensions in 2015

VOTE OF CONDOLENCE:
Hon. M.K.A.D.S. Gunawardana

ADJOURNMENT MOTION:
Injustice Caused to Students of Nuwara Eliya District at Advanced Level Examination

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2016 අගෝස්තු 26 වන සිකුරාදා
2016 ඔගස්ට් 26, வெள்ளிக்கிழமை
Friday, 26th August, 2016

පූ.භා.10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ගරු සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 63 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඊ) ඡේදය යටතේ 2013 ඉඩම් අත්පත් කර ගැනීමේ (වන්දි ගෙවීමේ) නියෝග සංශෝධනය සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 ජූලි 26 දිනැති අංක 1977/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ නියෝග මම ඉදිරිපත් කරමි.

එම නියෝග කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා සී/ස ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියෝග ඉදිරිපත් කරමි.

(i) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 ජූනි 13 දිනැති අංක 1971/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(ii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 ජූනි 13 දිනැති අංක 1971/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යවරයා විසින් සෙස් බදු සම්බන්ධයෙන් සාදන ලදුව 2016 ජූනි 28 දිනැති අංක 1973/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය; සහ

(iv) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය ප්‍රකාරව සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 ජූලි 12 දිනැති අංක 1975/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය.

එම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සහ ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

47(5) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තාව

நிலைக்கட்டளை இல. 47(5)இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்

REPORTS PRESENTED UNDER STANDING ORDER NO. 47(5)

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත

இலங்கை ஆளணி முகாமை நிறுவகம் (திருத்தம்) சட்டமூலம்

INSTITUTE OF PERSONNEL MANAGEMENT, SRI LANKA (AMENDMENT) BILL

"ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ වාර්තාව". - [ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

පනත් කෙටුම්පත 2016 සැප්තැම්බර් මස 06 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.

சட்டமூலம் 2016 செப்ரெம்பர் 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.

Bill ordered to be read a Second time upon Tuesday, 06th September, 2016.

පෙත්සම්

மனுக்கள்

PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පාඨලී චම්පික රණවක මහතා - පැමිණ නැත.

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම දෙක පිළිගන්වමි.

(1) හෙට්ටිපොල, හෙට්ටිගම යන ලිපිනයෙහි පදිංචි ආර්.වී.සී.සී. රහුපොල මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) රාගම, නාරංගොඩපාළුව, විහාර මාවත, අංක 775/එස් දරන ස්ථානයෙහි පදිංචි සංජීව සමරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර්අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දුලිප් විජේසේකර මහතා - පැමිණ නැත.

ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කන්කසන්තුරේ පොලිස් ස්ථානයේ සේවය කරන එන්.ජේ. එදිරිසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) රාගම වෛද්‍ය පීඨයේ, පීඨ කාර්යාලයේ සේවය කරන ආර්.එම්. අමරතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මහුලාගම, මහුලාගම යන ලිපිනයෙහි පදිංචි සී.එම්. අතුර ජයරත්න චන්ද්‍රසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කැලණිය, කිරිබත්ගොඩ, ප්‍රින්ස් ලේන්, අංක 54 දරන ස්ථානයෙහි පදිංචි ඩී. රණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) මාවතගම, මාරලන්ද, අංක 19 දරන ස්ථානයෙහි පදිංචි ජී.එම්. උදය කුමාර සිරිසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)
கௌரவ சபாநாயகர் அவர்களே, திருகோணமலை, ஓர்ஸ் ஹில், லோவர் ரோட், இலக்கம் 164/16 எனும் முகவரியில் வதியும் திரு. ரி. கமலநாதன் என்பவரிடமிருந்து கிடைத்த மனுவை நான் சமர்ப்பிக்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි - පැමිණ නැත.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා - පැමිණ නැත.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගාල්ල, බණ්ඩාරනායක පෙදෙස, අංක 181 දරන ස්ථානයෙහි පදිංචි ගුණපාල විතාරණ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගාල්ල, මීටියාගොඩ, මානම්පිට, "ජයන්කි" යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. රම්‍යශීලී ජයවර්ධන මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු චන්දිම වීරක්කොඩි මහතා (ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Chandima Weerakkody - Minister of Petroleum Resources Development)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ඉමදුව, දීගොඩ, සපුගහවත්ත, අංක 71 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එන්. ගල්හේනගේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පෝද්දල, නරාවල, පන්විල පාර, කැන්දගහවත්ත යන ලිපිනයෙහි පදිංචි පී.ඩී. සිරියාවති මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු ලසන්ත අලගියවන්න මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Megapolis and Western Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) මාතලේ, පලාපත්වල, උඩුගම, අංක 84/2 දරන ස්ථානයෙහි පදිංචි චරිනි දීප්ති නිරාගම මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) හෝකන්දර, හෝකන්දර උතුර, අනුර මාවත, අංක 490/2 දරන ස්ථානයෙහි පදිංචි එල්.එච්. චලනි තීක්ෂණා මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම;

(3) වල්ගම්මුල්ල, අලිවලපල්ල, අංක 131/1 දරන ස්ථානයෙහි පදිංචි එම්.කී.ආර්. සිරිවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) රාගම, බටුවත්ත, අංක 427 සී දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඒ. චන්ද්‍රසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

පයිනස් හා ඉයුකැලිප්ටස් වගා කිරීම: වාසි සහ අවාසි
பைனஸ் மற்றும் யூக்கலிப்டஸ் செய்கை : நன்மை, தீமை
AFFORESTATION OF PINES AND EUCALYPTUS: ADVANTAGES AND DISADVANTAGES

158/'15

1. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර තුළ පයිනස් හා ඉයුකැලිප්ටස් වගා කර ඇති අක්කර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම වගාව නිසා පරිසරයට ඇති වාසි හා අවාසි කවරේද;

(iii) පයිනස් හා ඉයුකැලිප්ටස් වගාව නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පයිනස් හා ඉයුකැලිප්ටස් වෙනුවට දේශීය ශාක වගා කිරීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම ශාක වර්ග මොනවාද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී දේශීය ශාක වගා කිරීමට පියවර ගන්නේද;

(iv) ඒ සඳහා සැලසුම් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) வனப் பாதுகாப்புத் திணைக்களத்திற்கு சொந்தமான காடுகளில் பைனஸ், மற்றும் யூக்கலிப்டஸ் செய்கை மேற்கொள்ளப்பட்டுள்ள காணியின் அளவு வெவ்வேறாக எத்தனை ஏக்கர்கள் என்பதையும்;

(ii) இச்செய்கை காரணமாக சூழலுக்கு ஏற்படும் நன்மைகள் மற்றும் தீமைகள் யாவை யென்பதையும்;

(iii) பைனஸ் மற்றும் யூக்கலிப்டஸ் செய்கையின் காரணமாக இலங்கையின் பொருளாதாரத்திற்கு கிடைக்கும் நன்மைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பைனஸ் மற்றும் யூக்கலிப்டஸ் தாவரங்களுக்குப் பதிலாக உள்நாட்டு தாவரங்களை பயிரிடு வதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அத்தாவர வகைகள் யாவை யென்பதையும்;

(iii) இன்றேல், எதிர்வரும் காலத்தில் உள்நாட்டுத் தாவரங்களைப் பயிரிடுவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(iv) அது தொடர்பாக திட்டங்கள் தயாரிக்கப் பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) separately, of the extent of acres in which pines and eucalyptus have been grown in the forests that come under the Department of Forest Conservation;

(ii) of the advantages and disadvantages that the environment experience owing to aforesaid afforestation; and

(iii) of the benefits that Sri Lankan economy achieve through pines and eucalyptus afforestation?

(b) Will he also inform this House-

(i) whether measures have been taken to grow a variety of local trees instead of pines and eucalyptus;

(ii) if so, of aforesaid types of trees;

(iii) if not, whether measures will be taken to grow local trees, in time to come; and

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iv) whether plans have been made to that effect?

(c) If not, why?

ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne- Deputy Minister of Mahaweli Development and Environment)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) පයිනස් වන වගා අක්කර 39,440 (හෙක්ටෙයාර් 15,776)

ඉයුකැලිප්ටස් වන වගා අක්කර 45,640 (හෙක්ටෙයාර් 18,256)

(ii) වන වගා හේතුවෙන් පාංශු බාදනය හා නාය යාම් අඩු වේ.

වායුගෝලීය කාබන්ඩයොක්සයිඩ් මෙම වන වගා මඟින් අවශෝෂණය කර ගැනීම නිසා ගෝලීය උණුසුම පාලනය වේ. මෙම වන වගාවන් සත්ත්වයින්ට වාසස්ථාන සපයයි. මේවා වන වගාවන් වන බැවින්, ස්වාභාවික වනාන්තර මෙන් ජෛව විවිධත්වය අතින් පොහොසත් නැත.

(iii) මෙම වන වගාවන් මඟින් ශ්‍රී ලංකාවේ දැව අවශ්‍යතාව සඳහා විශාල දායකත්වයක් සපයයි. දැව පාදක කර්මාන්තවල නියැලෙන විශාල පිරිසකගේ ජීවනෝපාය පවත්වා ගැනීම සඳහා මෙම වන වගාවන් උපකාරී වී ඇත. දුම්රිය මාර්ග සඳහා සිල්පර කොටන් සැපයීමට හා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය විදුලි කණු සැපයීමට ඉයුකැලිප්ටස් වන වගාවලින් ලබා ගන්නා දැව ප්‍රයෝජනයට ගනු ලබයි.

මෙම වන වගා හෙළීම් සිදු කර ලැබෙන දැව අලෙවි කිරීමෙන් හා රෙසින් නිස්සාරණය සඳහා පයිනස් වන වගා බදු දීම මඟින් රජයට ආදායමක් ලැබේ.

(ආ) (i) ඔව්.

(ii) වන වගාව පිහිටි ස්ථානවල ස්වාභාවිකව වැවෙන ශාක වර්ග සිටුවීමට කටයුතු කර ඇත.

උදා:- හොර, ගොරකා, පෙලන්, වල් දෙල්, කොස්, බෙරලිය, රඹුටන්.

(iii) දැනටමත් දේශීය ශාක වගා කෙරෙමින් පවතී.

(iv) සැලසුම් සකස් කර ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමු වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අතීතයේ දී සමහර දේශපාලනඥයන් සහ සමහර නිලධාරීන් ගත් තීන්දුවක ප්‍රතිඵලයක් විධියට තමයි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවත්, සමහර විටෙක වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් පයිනස් සහ ඉයුකැලිප්ටස් වගා කළේ. විශේෂයෙන්ම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව තමයි වැඩිම කොටසක් පයිනස් සහ ඉයුකැලිප්ටස් වගා කළේ. එහි යම් වාසි ප්‍රමාණයක් තිබුණත් ඒ වාසි අභිභවා ගිය අවාසි ප්‍රමාණය වැඩියි. විශේෂයෙන්ම ජෛව විවිධත්වයට වූ බරපතළ හානිය, භූගත ජල මට්ටම පහළ යාම වාගේ අවාසිදායක කාරණා සිදු වුණා. දැන් විකල්ප ශාක වගා කිරීමට කටයුතු කිරීමත් සමඟ ඉයුකැලිප්ටස් සහ පයිනස්වලින් ලබා ගත් වාසිදායක තත්ත්වයන් නැති වෙලා යමින් තිබෙනවා. ඒ වෙනුවට විකල්ප වැඩ පිළිවෙළක් අමාත්‍යාංශයට තිබෙනවාද?

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, අපේ මන්ත්‍රීතුමා කියපු කාරණාව හරි. පයිනස් හා ඉයුකැලිප්ටස්වලින් පරිසරයට වන හානි ප්‍රමාණය වැඩි නිසා ඒවා ඉවත් කරන්න කටයුතු කරලා තිබෙනවා. හැබැයි, ඒ හා සමානව මේ වාගේ හඳුනා ගත් ප්‍රදේශවල නැවත වන වගාවත් එක්ක පරිසරය ආරක්ෂා කරන වැඩ පිළිවෙළකුත් අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වනවා. මොකද, මේ පැළ වර්ග අපේ විවිධ වූ කාර්යයන් සඳහා යොදා ගැනීමට අවශ්‍ය කරන පැළ වර්ග බවටත් පත් වෙලා තිබෙනවා. උදාහරණයක් හැටියට සිල්පර කොටන් වාගේ දේවල් දිගින් දිගටම සැපයීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ නිසා ඒවාට අවශ්‍ය ප්‍රමාණයන් තබා ගෙන ඉතිරි ඉඩම් කොටස් පමණක් වෙනත් වන වගා සඳහා යොදවන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ වන වගාවත් සමඟම විශේෂයෙන්ම ගොවි ජනතාවත්, සාමාන්‍ය වශයෙන් බැලුවත් ගොවි ජනතාව නොවුණත්, ගෙවතු වගාව කරන අයටත් තිබෙන බරපතළ ප්‍රශ්නයක් තමයි, රිළවුන්, වඳුරන්, ඉත්තෑවන්, වල් ඌරන් ඒ වාගේම බොහෝ වෙලාවට මොනරුන්ගෙන් වන හානිය. මේකට එක් හේතුවක් තමයි, වනාන්තර ප්‍රමාණය අඩු වීම. වනාන්තර ප්‍රමාණය අඩු වීම නිසා වනාන්තරවල සිටින සතුන්ට ආහාර සපයා ගන්න තිබෙන හැකියාව අඩු වනවා. මොකද, මේ පයිනස්වලත්, ඉයුකැලිප්ටස්වලත් සතුන්ට කන්න පලතුරු නැහැ. ඒ නිසා පලතුරු හෝ වෙනත් ආහාර වර්ග සොයා ඒ සතුන් ගම්වලට එන්න පටන් ගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ සතුන් ගම් වදින එක නවත්වන්න පුළුවන්, වනාන්තර සහ ජනතාව ජීවත් වන ප්‍රදේශ අතර මැද buffer zone එකක පලතුරු සහ මේ සතුන්ට යම් මට්ටමකින් ආහාර සපයා ගත හැකි ශාක වර්ග වගා කළොත්. ඒ ගැන අමාත්‍යාංශයේ අවධානය යොමු වෙලා තිබෙනවාද?

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, 2010 වර්ෂයේ සිට මේ දක්වා කාලය ගත්තොත් හෙක්ටෙයාර 400කට එහා ගිය ප්‍රමාණයක පයිනස් හා ඉයුකැලිප්ටස් ගස් ඉවත් කරලා තිබෙනවා. නැවත සිටුවන්න අරගෙන තිබෙන පැළ වර්ග අතර පලතුරු පැළ වර්ගත් බොහොමයක් සිටුවා තිබෙනවා.

අනික් කාරණාව, මේ අක්කර ප්‍රමාණය වෙනත් කටයුතු සඳහා යොදවා නැහැ. වන වගාවන් සඳහා පමණයි නැවත වාරයක් මේ හෙක්ටයාර් 400ම යොදවා තිබෙන්නේ. ඒ නිසා මේ මන්ත්‍රීතුමා කියපු කාරණාව ඒ තුළින් පැහැදිලිවම ඉටු වනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. අලි වැට ඉදි කිරීම සඳහා අමාත්‍යාංශය සැලකිය යුතු මුදලක් වෙන් කරනවා. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ඉවත් කරන දුම්රිය පීලි -රේල් පීලි- මේ අලි වැට ඉදි කිරීමේ කටයුත්තට ලබා ගන්න පුළුවන් ක්‍රමවේදයක්, අමාත්‍යාංශ දෙක ඒකාබද්ධ වෙලා හැදුවොත්, අලි වැට ඉදි කිරීම සඳහා වැය වන මුදල් ප්‍රතිපාදනවලින් කොටසක් ඉතිරි කර ගන්නත්, අඩු පිරිවැයකින් කෙටි කාලයක් තුළ වැඩි වපසරියක අලි වැට නිර්මාණය කරන්නත් පුළුවන්කම ලැබෙනවා. ප්‍රවාහන ඇමතිතුමා මේ අවස්ථාවේත් මේ සභාවේ ඉන්නවා. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ ප්‍රවාහන අමාත්‍යාංශයත් එක්ක කථා කරලා, ඉවත් කරන රේල් පීලි මේ අලි වැට ඉදි කිරීමේ කටයුතුවලට ප්‍රයෝජනයට ගන්න ඔබතුමාගේ අමාත්‍යාංශයට හැකියාවක් නැත්තේ ඇයි?

ගරු අනුරාධ ජයරත්න මහතා
(මාණ්පුමිකු අනුරාත ජූයරත්න)
(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාත් කථා කළේ අමාත්‍යාංශ තුනක් එක්ක සම්බන්ධ වුණු කාරණාවක්. වනජීවී අමාත්‍යාංශය හරහා තමයි මූලික වශයෙන් අලි වැටවල් ඉදි කිරීමේ කටයුතු සිදු කෙරෙන්නේ. ඒ වාගේම, අපිත් එක්තරා විධියකට ඒ අලි වැටවල් ඉදි කිරීම් කළ යුතු ස්ථාන පිළිබඳව දැනුම් දීම් කරනවා. මහාමාර්ග අමාත්‍යාංශයත්, මේ අමාත්‍යාංශ තුනත් ඒකාබද්ධ වෙලා ඒ කටයුත්ත කිරීම ගැන සොයා බැලීමේ හැකියාව අපට තිබෙනවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කිරීමක් කර ගන්නයි තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා කැමැති නම් මට අවස්ථාව දෙන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඔබතුමා කැමැතිද, පැහැදිලි කිරීමක් කරන්න? ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය මේ ප්‍රශ්නයට අදාළද?

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
ඔව්, අදාළයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඉයුකැලිප්ටස් සහ පයිනස් වගාව තුළ යටි රෝපණ මොනම ආකාරයකින්වත් පැළ වෙන්නේ නැහැ. එහි යටි රෝපණ නැහැ. ඒ නිසා එම පත්‍ර සහ අතු බිමට වැටුණාට ඒවා කවදාවත් දිරන්නේ නැහැ. අනිත් එක තමයි, කඳුකර ප්‍රදේශවල මේවාට විශාල වශයෙන් ජලය උරාගැනීමක් සිද්ධ වෙනවා. ඒ නිසාම ජල උල්පත් සිඳියාම සිද්ධවෙලා තිබෙනවා. අපි ඉල්ලීමක් කරනවා, කරුණාකර ඉතිරි ටිකත් ඉතාම ඉක්මනින් ඉවත් කරලා වන වගාවට ගැලපෙන වෙනත් වගාවන් ආරම්භ කරන්න කියලා.

ගරු අනුරාධ ජයරත්න මහතා
(මාණ්පුමිකු අනුරාත ජූයරත්න)
(The Hon. Anuradha Jayaratne)
හොඳයි.

මිහිඳුපුර මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය : වර්තමාන තත්ත්වය

மிஹிந்துபுர மத்திய வர்க்கத்தினருக்கான வீடமைப்புத் திட்டம் : தற்போதைய நிலை

MIHINDUPURA MIDDLE-CLASS HOUSING PROJECT: CURRENT STATUS

459/'16

2. **ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(මාණ්පුමිකු (වෛද්‍ය) නළින්ද ජූයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වර්ෂ 2014 දී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් ආරම්භ කරන ලද කොළඹ 06, කිරුළපන, මිහිඳුපුර මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම නිවාස ව්‍යාපෘතිය අවසන් කරන ලද දිනය කවරේද;

(iii) ඉදිකිරීම් නිම කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් භාරව කටයුතු කළ දේශීය සමාගම, අක්කර 2ක් පමණ වූ එම රජයේ භූමි භාගය තම පෞද්ගලික බර වාහන ගාල්කිරීමට භාවිත කරන බව දන්නේද;

(ii) මෙම ඉඩම පාවිච්චි කිරීම වෙනුවෙන් එම සමාගම රජයට ගෙවනු ලබන මාසික බදු කුලිය කොපමණද;

(iii) බදු කුලී නොගෙවා ඉඩම පරිහරණය කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

වීඩමෙප්පු, නිර්මාණත්තුරෙ අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) 2014ආම් ආණ්ඩිල් තේසිය වීඩමෙප්පු අතිකාරසපෙයිනාල් නිර්මාණිප්පුකළ් ආරම්පික් කප්පට්ට කොළුම්පු 06, කිරුලප්පනෙ, මිහින්තු පුර මත්තිය වර්ක්කත්තිනරුක්කාන වීඩමෙප්පුත් තිට්ටත්තින් තර්පෝතෙය නිලෙ යාතෙන්පතෙයුම්;

(ii) මේර්පඩි වීඩමෙප්පුත් තිට්ටම් නිරෙවු සෙය්යප්පට්ට තිකති යාතෙන්පතෙයුම්;

(iii) නිර්මාණිප්පුකළ් නිරෙවු සෙය්යප්පට්ටුළ්ළ වීටුකළින් එණ්ණික්කෙ එව්වළවෙන්පතෙයුම්;

(iv) ඉතර්කාක තේසිය වීඩමෙප්පු අතිකාර සපෙයිනාල් සෙලවිටප්පට්ට පණත්තොකෙ එව්වළවෙන්පතෙයුම්;

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ஆ)(i) வீடமைப்புத் திட்டத்தின் நிர்மாணிப்புகளுக்குப் பொறுப்பாகச் செயற்பட்ட உள்நாட்டு நிறுவனம் சுமார் இரண்டு ஏக்கர்களான மேற்படி அரச காணியைத் அதனது தனிப்பட்ட கனரக வாகனங்களை நிறுத்தி வைப்பதற்காகப் பயன்படுத்துகின்றதென்பதை அறிவாரா;

(ii) மேற்படி காணியைப் பயன்படுத்துவதற்காக அந்நிறுவனம் அரசாங்கத்துக்குச் செலுத்தும் மாதாந்த குத்தகைத் தொகை எவ்வளவு;

(iii) குத்தகைத் தொகையைச் செலுத்தாது காணி பயன்படுத்தப்படுமெனில், அது தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing and Construction:

(a) Will he inform this House -

(i) of the current status of the Mihindupura Middle-class Housing Project of Kirulapone, Colombo - 06, which was launched by the National Housing Development Authority in the year 2014;

(ii) of the date on which the aforesaid housing project was completed;

(iii) of the number of houses of which construction work has been completed; and

(iv) of the amount of money spent by the National Housing Authority for this purpose?

(b) Will he also inform this House -

(i) whether he is aware of the fact that the local company which was in charge of the construction work of the housing project is using the aforesaid state-owned land of approximately two acres to park their private heavy vehicles;

(ii) of the monthly rental paid to the Government by the aforesaid company in lieu of using the said land; and

(iii) if the land is being utilized without making any payment, of the steps that will be taken in this regard?

(c) If not, why?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Housing and Construction)

ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2014.05.01 දින වැඩ ආරම්භ කොට බිම් ප්‍රමාණයේ ගැටලුවක් හේතුවෙන් 2014.07.31 වැඩ නතර කර ඇති මිහිඳුපුර නිවාස ව්‍යාපෘතිය 2016.05.09 දින සිට නැවත වැඩ ආරම්භ කර ඇති අතර, මේ වන විට ඉදිකිරීම් කෙරෙමින් පවතී.

(ii) ව්‍යාපෘතිය අවසන් කර නැත.

(iii) නිමකළ නිවාස නොමැත.

(iv) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉඩමේ භුක්තිය සංවර්ධනකරු වෙත ලබා දී ඇති බැවින් අදාළ සංවර්ධනකරු විසින් වියදම දරනු ලැබේ.

(ආ) (i) නැත.

මෙම ඉඩමේ ගාල්කර ඇත්තේ කොන්ත්‍රාත් සමාගමට අයත් ඉදිකිරීම් සඳහා භාවිත කරන පයිල් ගැසීමට යොදාගන්නා යන්ත්‍රෝපකරණ පමණි.

(ii) (ආ) (i) අනුව බදු කුලී ගෙවීමක් සිදු නොවේ.

(iii) (ආ) (i) අනුව බදු අය කරනු නොලැබේ.

(ඇ) අදාළ නොවේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම කොන්ත්‍රාත් සමාගම මොකක්ද?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු මන්ත්‍රීතුමනි, මෙහි කොන්ත්‍රාත් සමාගම වෙන්නේ, සී.ඩී.සී. ඉන්ඩස්ට්‍රියල් ඉන්ෆ්‍රා (ඉන්දියාව) පුද්ගලික සමාගම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන අතුරු ප්‍රශ්නය, ගරු විජිත හේරත් මැතිතුමා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මෙහි වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවාය කියා. නමුත්, තවම ඒ ආකාරයට වැඩ කිසිවක් සිද්ධ වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැනට ඔබතුමන්ලා වෙනත් ඉන්දියානු සමාගමක් එක්ක හවුල් ව්‍යාපාරයක් - joint venture එකක් - විධියට අත්සන් කර කටයුතු සිදු කරන්න සූදානමක් තිබෙනවාද?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු මන්ත්‍රීතුමනි, මෙහි බිම් ප්‍රමාණයේ ගැටලුවක් හේතුවෙන් වැඩ නතර වෙලා තිබුණා. නමුත්, මේ වෙන විට මෙහි වැඩ කටයුතු ආරම්භ කරලා, දැන් වැඩ කෙරී ගෙන යනවා. අපි සතිපතා මේ පිළිබඳව හොයා බලනවා. 2018 වර්ෂය වන විට මෙහි වැඩ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කිරීමට අප කටයුතු කරනවා. කිසියම් හේතුවකින් ඒ කොන්ත්‍රාත් සමාගම හරියාකාරව වැඩ කටයුතු කළේ නැතිනම්, නීත්‍යානුකූලව ඒ උදව්ය ඉවත් කරලා, වෙනත් කොන්ත්‍රාත් සමාගමකට එහි වැඩ කටයුතු භාර දීමට අප කටයුතු කරනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියපු-

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඇහුවේ, වෙනත් ඉන්දියානු සමාගමක් එක්ක හවුල් ව්‍යාපාරයක් - joint venture එකක් - විධියට ගිවිසුමක් අත්සන් කරන්න සූදානමක් තිබෙනවාද කියලායි.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු මන්ත්‍රීතුමනි, අපේ එහෙම ගිවිසුමක් දැනට නැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මැතිතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය මත මා අහනවා, මෙතැන -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙය අමතර ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න ඔබතුමා කැමැතිද?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, අමතර ප්‍රශ්නයක් නොවෙයි. නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා ඇහුවා වාගේම ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කමක් නැහැ, ප්‍රශ්නය අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
තුන්වැනි අතුරු ප්‍රශ්නය හැටියටයි අහන්නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන argue කරන්න ඕනෑ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු දෙන්න කැමැති නම්, තුන්වැනි අතුරු ප්‍රශ්නය හැටියට ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා දන්නා තරමට, මෙතැන මේ ගිවිසුම ශූන්‍ය වෙලා තිබෙන්නේ. මෙතැන වැඩ කරනවාය කියලා කලින් වැඩ කළ සමාගම බොරු මවාපෑමක් කරන්නේ. කලින් සමාගමට මේක කරන්න බැහැ. කලින් සමාගම ඩී.පී. ජයසිංහ ආයතනයටත් මූල්‍යමය වංචාවකුත් කරලයි ගිහින් තිබෙන්නේ. දැන් ඉතා පැහැදිලිව, වැඩ කිරීම මුවාවෙන්; වැඩ කරනවාය කියා පෙන්වමින් මෙතැන ලොකු වංචාවක් සිද්ධ වෙනවා.

ගරු ඉන්දික බණ්ඩාරනායක නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමායි, ගරු ඇමතිතුමායි බොහොම අමාරුවෙන් තමයි ඊයේ ජීවිත ගලවාගෙන තිබෙන්නේ. අද ආපු එක ගැන අපි සන්තෝෂ වෙනවා. එහෙම නොවුණා නම් අපට ශෝක ප්‍රකාශ කරන්නට සිදු වෙනවා. ඒක වෙනම කථාවක්.

මම ඉතා පැහැදිලිව කියනවා, ජාතික නිවාස සංවර්ධන අධිකාරියත් විවිධ කාරණා කියමින් මේක ප්‍රමාද කරන බව. අලුත් ගිවිසුමකට යන්න තමයි දැන් තීන්දු වෙලා තිබෙන්නේ. නමුත් එහෙම ගිවිසුමකට යන්නෙත් නැහැ. දැන් වැඩේ ඇනිලා තිබෙන්නේ. ඔය නිලධාරින්ම තමයි පසු ගිය කාලයේ ඔය තක්කඩි වැඩේ කරලා තිබෙන්නේ. ඔය නිලධාරින් දුන්නු පඩංගු මේ සභාවේ කියවන්නේ නැතිව, මේ ගැන සොයා බලලා යම්කිසි විධිමත් ක්‍රියාමාර්ගයකට යන්න කියලා ඔබතුමාගෙනුත්, ඇමතිතුමාගෙනුත් අපි ඉල්ලනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, නිවාස ව්‍යාපෘතිය අපට අවාසිදායක නිවාස ව්‍යාපෘතියක් නොවෙයි. ඒ නිසා මේ ගැන සොයා බලලා අපි මේක අවසන් කරන්න කටයුතු කරන්නම්.

උතුරු හා නැඟෙනහිර පළාත්වල සරණාගත කඳවුරු: විස්තර

வடக்கு, கிழக்கு மாகாண அகதி முகாம்கள் :விபரம்

REFUGEE CAMPS IN NORTHERN AND EASTERN PROVINCES : DETAILS

673/'16

4. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) උතුරු හා නැඟෙනහිර පළාත්වල රජය මඟින් සරණාගත කඳවුරු පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එම කඳවුරු පිහිටි ස්ථාන, ඒවායේ සිටින පුද්ගලයන් හා පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කඳවුරුවල සිටින ජනතාව සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණය එක් එක් කඳවුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

[ගරු බිමල් රත්නායක මහතා]

(iv) එක් පුද්ගලයකුට හා එක් පවුලකට මසකට ලබාදෙන ආධාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම සරණාගත පුද්ගලයන් සතු ඉඩම් හෝ නිවාස, රජය හෝ පෞද්ගලික ආයතන හෝ වෙනත් පුද්ගලයන් විසින් භුක්ති විඳින්නේ නම්, එම තොරතුරු සහ එම ඉඩම්/නිවාස සතු සරණාගත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම සරණාගතයන් අතරින් පදිංචිය සඳහා ඉඩමක් හෝ නිවසක් නොමැති පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් කඳවුර අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

සිරෙච්චාලෙකළ් මරුසීරමෙප්පු, පුනර්වාල්වළිප්පු, මීළ්කුඩියේර්රම් මර්රුම් ඉන්දුමත අළුවල්කළ් අමෙච්චරෙක් කේට්ට වින්නා:

(அ) (i) වඩක්කු, කිළක්කු මාකාණංකළිල් අරසාංකත් තිනාල් අකදි මුකාම්කළ් පේණිවරප් පඩුකින්රනවා;

(ii) ආමෙනිල්, ඉම්මුකාම්කළ් අමෙන්දුළ්ළ ඉඩංකළ්, අවර්රිල් උළ්ළ ආට්කළ් මර්රුම් කුඩුම්පංකළින් එණ්ණික්කෙ වෙව්වේරාක යාදු;

(iii) ඉම්මුකාම්කළිල් උළ්ළ මක්කළුක්කාක ඔදුක්කප් පට්ටුළ්ළ නිදිත්තොකෙ ඔව්වොරු මුකාමින්පඩි වෙව්වේරාක එව්වළවු;

(iv) ඔරු නපරුක්කු මර්රුම් ඔරු කුඩුම්පත්තුක්කු ඔරු මාදත්තුක්කු වළංකප්පඩුම් නිවාරණම් වෙව් වේරාක එව්වළවු;

එන්පතෙ අවර් ඉච්චපෙයිල් අදිවිප්පාරා?

(ஆ) (i) මේර්පඩි අකදිකළුක්කුච් චොන්දමාන කාණිකළ් අල්ලදු වීදුකළින් ආට්චියෙ, අරසු අල්ලදු තනියාර් නිරුවනංකළ් අල්ලදු වේරු නපර්කළ් අනුපවිප්පාර්කළාෙයින්, අත්තකවල්කළ් මර්රුම් ඉක්කාණිකළ් / වීදුකළ් චොන්දමාකවුළ්ළ අකදි කළින් එණ්ණික්කෙ යාදු;

(ii) ඉව්වකදිකළිල් කුඩියිරුප්පදර්කුක් කාණියෝ අල්ලදු වීටෝ ඉල්ලාද නපර්කළින් එණ්ණික්කෙ, ඔව්වොරු මුකාමින්පඩි වෙව්වේරාක එව්වළවු;

එන්පතෙයුම් අවර් ඉච්චපෙයිල් අදිවිප්පාරා?

(இ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Prisons Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs:

(a) Will he inform this House-

(i) whether refugee camps are maintained by the Government in the Northern and Eastern Provinces;

(ii) if so, separately, the locations of the said camps and the number of people and families housed in them;

(iii) separately, in respect of each camp, the amount of money allocated for the people in the said camps; and

(iv) separately, the assistance given to each of those individuals and families per month?

(b) Will he also inform this House-

(i) separately, if the lands or houses belonging to these refugees are occupied by the Government, private institutions or other individuals, details of same and the number of refugees to whom such houses / lands belong; and

(ii) separately, in respect of each camp, the number of persons amongst these refugees who do not have a land or a house for residence?

(c) If not, why?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)

(The Hon. D.M. Swaminathan - Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs)

Sir, the Answer is as follows:

(a) (i) Yes.

(ii) There are 31 welfare camps situated in seven Divisional Secretaries' Divisions of Jaffna District. Nine hundred and thirty six families consisting 3,260 members are living in these welfare camps.

S. No.	D.S. Division	No. of Welfare Centers	No. of Families	No. of Persons
1	Nallur	1	8	17
2	Sandilipay	3	16	57
4.	Uduvil	9	342	1,234
5.	Tellippalai	6	329	1,130
6.	Kopay	5	91	352
7	Karaveddy	1	11	37
8	Point Pedro	6	139	433
	Total	31	936	3,260

(iii) Ministry allocates funds annually to provide sanitation, electricity, drinking water and garbage cleaning facilities to the welfare camps and implements it through the Divisional Secretariats. To provide drinking water, sanitation and electricity facilities to welfare camps, Rs. 3,798,867 has been allocated in 2016. Details are as follows :

Tellippalai Welfare Centre -	1,415,000.00
Kopay Welfare Centre -	313,350.00
Uduvil Welfare Centre -	1,500,790.00
Point Pedro Welfare Centre -	531,752.00
Nallur Welfare Centre -	37,975.00

(iv) Provision of dry rations to these families who are living in welfare camps was stopped from 2011. A Cabinet Paper was submitted on 10.01.2016 by this Ministry for the provision of dry rations and approval was also obtained. But, instruction was received from the Treasury that only Recurrent Expenditure could be utilized for provision of dry rations. Dry rations were not provided because of the shortage of Recurrent Expenditure of the Ministry. However, some selected families were given livelihood assistance under the Ministry's Livelihood Support Programme after considering their poverty. Most of the families are now engaged in fishing and labour work as their livelihood.

So, really speaking, they are earning their living on their own by doing labour work.

(b) (i) Lands of 254 families out of 936 families who are living in the welfare camps have been occupied by State forces and these lands have not yet been released. The Annex consists of all those particulars. Sir, I **table*** the Annex.

(ii) Six hundred and eighty two families out of 936 do not own lands or houses. Actions are being taken to provide lands with housing facilities to those landless families in the welfare camps.

(c) Does not arise.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මාගේ පළමු වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා, "සරණාගත කඳවුරු 31ක 3,200 ගණනක පිරිසක් සිටිනවා. නමුත් ඔවුන්ට පසු ගිය කාලයේ සිට තවමත් වියළි ආහාර සම්පාදනය කෙරෙන්නේ නැහැ" කියා. මේ කඳවුරුවල සිටින යම් පිරිසක් වෘත්තීන්වල නිරත වන බව ඇත්ත. සමහරු අපට ලිපි ලේඛන ඉදිරිපත් කරලා තිබෙනවා, "ඔවුන් සරණාගත කඳවුරේ ජීවත් වෙනවා. ඔවුන්ට ඉඩමක් ඇත්තේ නැහැ. ඒ නිසා ඔවුන්ට ආහාර සඳහා ආධාරයක් නැතිව ජීවත්වීම ඉතාම දුෂ්කරයි." කියා. ඇමතිතුමාගේ පැත්තෙන් කැබිනට් අනුමැතිය ලැබී තිබෙනවා නම්, මේ ජනතාවට, අඩුම ගණනේ හදුනාගත් පිරිසටවත් වියළි ආහාර සලාක ලබා දෙන්න ඔබතුමන්ලාට බැරි ඇයි?

ඇමුණුම පුස්තකාලයේ තබා ඇත.
**இணைப்பு நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
**Annex placed in the Library.*

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Hon. Member, as I mentioned, livelihood provisions have been made to certain families who really live in poverty. That has been done. If there are any other facilities that they need, they should write to us and we will provide those accordingly. It is better for them to write to the Ministry so that we can look into the matter.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

But, in your Answer, you mentioned that you are not giving dry rations.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Yes, we are not. I gave you the explanation why dry rations were not given. It comes under Recurrent Expenditure and as such, I am unable to provide that with this year's allocation. But, if these welfare camps continue into the next year - I hope not because we are trying to get rid of all the welfare camps as soon as possible - I will make provisions to give them dry rations from the allocation given to my Ministry.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමා සඳහන් කළේ යාපන දිස්ත්‍රික්කයේ පිහිටි සරණාගත කඳවුරු ගැන පමණයි. අපි දැන ගන්න කැමැතියි, වවුනියා දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙන පූන්තෝට්ටම් කඳවුර ඔබතුමාට අදාළ වෙන්නේ නැද්ද කියලා. එහෙම නම්, ඒ කඳවුර කුමන ආයතනයකින්ද පරිපාලනය වෙන්නේ? ඔවුන්ගේ ප්‍රශ්න ගැන බලන්නේ කුමන අමාත්‍යාංශයෙන්ද ?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

But, in the Question you have asked, you have not specifically mentioned about the Poonthottam Camp. That is why I have not answered that question. If you specifically ask me another Question on another day, I can certainly reply to that.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහලා තිබෙන්නේ, "උතුරු හා නැඟෙනහිර පළාත්වල රජය මඟින් සරණාගත කඳවුරු පවත්වාගෙන යන්නේද?" කියලායි. එතකොට ඔබතුමා කිව්වේ, "යාපනයේ කඳවුරු 31ක් පවත්වාගෙන යනවා" කියලා.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Correct.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මේ කඳවුර තිබෙන්නේ යාපනයේ නොවෙයි, වවුනියාවේ. එතකොට ඔබතුමාගේ තිස් එකේ ලැයිස්තුවට ඒ කඳවුර ඇතුළත් වෙලා නැද්ද?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
This is only in respect of the DS Divisions of the Jaffna District, and as far as Vavuniya and Kilinochchi are concerned, I can certainly reply later. If you give me another week's time, I will reply to those issues.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පිටස්තර එකක් නේ අහන්නේ?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
I have clearly mentioned "North and East", not only in Jaffna.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you only referred to the North. So, maybe, you can clarify that later, if you do not have the data now.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
That is correct, Sir. I will clarify it and reply later.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Is that all right, Hon. Member?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
Shall I table that later or shall I clarify and give it to you, Hon. Member?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
You can table it at the next Sitting day without any questions from my side.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
Okay.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay. That is fine.

ප්‍රශ්න අංක 5 - 703/'16 - (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8-727/'16-(1), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යාංශයට අයත් ප්‍රශ්නයක්. අය වැය යෝජනාවක් සම්බන්ධයෙන් තමයි මම ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා මෙම ගරු සභාවේ සිටින නිසා මම යම් කරුණක් ගැන දැන කැමැතියි. අද දින "දිනමිණ" පුවත් පතේ මුල් පිටුවේ මෙසේ සඳහන්ව තිබෙනවා:

"අස් වූ නිලධාරීන්ට යළි රැකියා නෑ

අගමැතිගෙන් මුදල් ඇමතිට උපදෙස්"

මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් රාජ්‍ය ව්‍යවසාය හා රජයේ ව්‍යවසායවල තනතුරු දැරීම අත්හැරියා. ඒ අත්හැරීමෙන් රාජ්‍ය මූල්‍ය අයතනවල කටයුතුවලට සෘජු බලපෑමක් ඇති වනවා. ඒ වාගේම සමහර ගරු නිල හෝ විශේෂඥ උපදෙස් ගන්න පුද්ගලිකව පත් කරපු අයත් FCID එක අරගෙන ගිහිල්ලා බන්ධනාගාරගත කරලා තිබෙනවා. ඒ නිසා අද පුද්ගලික අංශයෙන් රජයට සේවය ලබා ගන්නත්, රාජ්‍ය සේවකයන්ගේ රාජ්‍ය සේවය ලබා ගන්නත් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ ක්‍රියාකලාපය බලපා තිබෙනවා. අපි කියන්නේ වැරැදිකරුවන්ට දඬුවම් දෙන්න කියලායි. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. නීති සම්මතය අනුව උසාවි දාන්න; නඩු දාන්න; දඬුවම් කරන්න. නමුත්, මෙලෙසින් රාජ්‍ය නිලධාරීන් හා පුද්ගලික අංශයේ වැදගත් අය මූල්‍ය අපරාධ කොට්ඨාසයට ගෙනියලා බන්ධනාගාරගත කිරීම සුදුසු නැහැ. මොකද, ගරු අගමැතිතුමා උපදෙස් දුන්නොත් මේ අයුරින් අස් වූ නිලධාරීන්ට යළි රැකියා නෑ කියලා, ඊට පසු ඇති වන තත්ත්වය පිළිබඳව මම ගරු අගමැතිතුමාගෙන් දැන ගන්න සතුටුයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

මේක මෙතැනට අදාළ ප්‍රශ්නයක්. කොහොම නමුත් මම එය පැහැදිලි කරන්නම්. එක් කාරණයක් තමයි, සමහර සංස්ථාවල භාණ්ඩාගාර නිලධාරීන් ඉන්නවා. ඒ නිලධාරීන් ඒ තනතුරෙන් ඉවත් වෙලා තිබෙනවා. ඉවත් වුණා නම්, ඊට පස්සේ දාලා වැඩක් නැහැ නේ. ඒ ගොල්ලෝ ඉවත් වෙන්න හේතු දීලා තිබෙනවා, ඒ ගොල්ලෝ භයයි කියලා. ඉතින් භය නම් ආපහු කොහොමත් යන්නේ නැහැ නේ.

භාණ්ඩාගාර නිලධාරියෙක් හිටියා, ශ්‍රීලංකන් ගුවන් සේවයේ. මොකක්ද ගරු මන්ත්‍රීතුමනි, අද ගුවන් සේවයට වෙලා තිබෙන්නේ? තවත් භාණ්ඩාගාර නිලධාරියෙක් හිටියා, වරාය අධිකාරියේ. මොකක්ද එතැන වුණේ? තවත් එක්කෙනෙක් හිටියා, Ceylon Petroleum Corporation එකේ. මේ තනතුරුවලට පත් වෙලා ඒ ආසනවල වාඩි වුණාට, මේ ආයතනවල අලාභ එකක්වත් නවත්වන්න බැරි වුණා. තව මොනවාද කථා කරන්නේ? මම නම් හිතන්නේ, මේ ගොල්ලන් හිටියා කියලා මේ ආයතනවල වෙනසක් වෙන්නේ නැහැ කියලායි. ඇත්ත වශයෙන්ම මේ අය නැතිව අපි විශේෂඥයන් පත් කරනවා නම්, ඒ ගැනත් අපි කථා කර ගෙන ඕනෑ නම් ඒ වෙනුවෙන් නීතියක් ගෙනෙන්නම්. ඒකයි සිදු වෙලා තිබෙන්නේ.

දෙවෙනි කාරණය, කවුරු හෝ වරදක් කරලා තිබෙනවා නම්, නීතිය ඉදිරියට යන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේ කාරණය මෙතැන කථා කරන්නම්, ඔබතුමාත් මේ කාරණය ගැන දන්නා නිසා. මටත් වඩා හොඳට ඔබතුමා මේ කාරණය දන්නවා. සංචාරක මණ්ඩලයේ හිටපු නිලධාරීන් මොනවාද කළේ? දැන් විභාග කරන සිද්ධියට අදාළව, සංචාරක මණ්ඩලයේ මේ රටේ අභ්‍යන්තර සංචාරක වැඩ කටයුතු කරන්න කියලා ඒ ගිවිසුම අත්සන් කළේ සංචාරක මණ්ඩලයේ සුභසාධක සේවක සංගමය එක්කයි. ගරු කථානායකතුමනි, අපේ රටේ පාර්ලිමේන්තුවේ ඉතිහාසය ලියන්න කියලා අපි ඒක පාර්ලිමේන්තුවේ සුභසාධක සංගමයට දුන්නොත් මොකක්ද සිද්ධ වෙන්නේ? ඒ වෙනුවෙන් වෙන් කළ මුදල් ටික එතැනට ගියේ නැහැ නේ. ඒ මුදල් සියල්ලම අරගෙන පාවිච්චි කළේ ඌව පළාත් සභා මැතිවරණයටයි. ඔබතුමා දන්නවා, පළාත් සභා මැතිවරණයේදී බදුල්ලට කරපු වියදම ගැන. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාත් දන්නවා. ඒ වාගේම මොනරාගලටත් ඒ මුදල් වියදම් කළා. ඒවා, ඡන්දයට පාවිච්චි කරපු මුදල්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බදුල්ලේ නිමල් සිරිපාල ඇමතිතුමාටත්-

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
එතුමාට හම්බ වුණේ නැහැ. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතකොට එතුමා අපේ පැත්තේයි සිටියේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔබතුමන්ලා බොහෝ දෙනෙක් අප වාගේ එක එක තැන්වලින්, ආධාරකරුවන්ගෙන් මුදල් එකතු කරගෙන ගිහින් වියදම් කළා. ගරු කථානායකතුමනි, සමහර පුද්ගලයන්ට ඒ මුදල් හම්බ වෙලා පස්සර ආසනය තුළ මොකක්ද කළේ කියා මට වඩා හොඳට ඔබතුමා දන්නවා. ඔබතුමායි මට ඇවිත් කිව්වේ. ඒ කාලයේ රජයේ මුදල් ඒ විධියට පාවිච්චි කළා. ඡන්දයට යන්න. ඡන්දය කරන්න. ඒකට ප්‍රශ්නයක් නැහැ. එහෙත් රජයේ මුදල් එහෙම යෙදවුවා නම්, ඒ ගැන අඩුම ගණනේ විභාගයක් හෝ කරන්න ඕනෑ. අප කියන්නේ කිසිම පක්ෂයක් රජයේ මුදල් පාවිච්චි කරන්න වුවමනා නැහැ කියලායි. ඒ කාලයේ ඌව ඡන්දයට එහෙම කරන්න ඇති. ඊට ඉස්සර කරපු ඒවාත් ඇති. ඒ කාලයේ නිමල් සිරිපාල සිල්වා ඇමතිතුමාත් අනෙක් පැත්තේයි සිටියේ. එතුමන්ලා තමන්ගේ මුදල් එකතු කරගෙන ගිහින් යෙදවුවා. ඒකට කවුරුවත් විරුද්ධ වන්නේ නැහැ. ඔබතුමන්ලා ගිහින් එක් එක් වැඩ කටයුතු කරන්න ඒ විධියට මුදල් වියදම් කළා නම්, ඒක වෙනම දෙයක්. ගිහින් වක්‍රව කරන තවත් දෙයක් තිබෙනවා. ගිහින් උදලු බෙදනවා වාගේ වැඩ කරනවා. කමක් නැහැ, ඒවාත් අමතක කර දමමු. ඒත් මේක දැනගත් හොරකමක්. කියනවාද, "රජයේ නිලධරින් එතැන වාඩි වෙලා සිටියේ ඒකටයි." කියලා? අපි කරන එක එක ඒවා තිබෙනවා, ඡන්දය දිනන්න. ගිහින් මැෂින් දෙනවා; අරවා දෙනවා; මේවා දෙනවා; විදුලිය දෙනවා. සමහර නීති අනුව කියාවි, "ඒවාත් වැරැදියි." කියලා. කොහොම වුණත්, අපි ඒවා ගැන කථා කරන්නේ නැහැ. එහෙත් අතැන රජයේ මුදල් අරගෙන විවෘතව බෙදුවා කිව්වාම, ඊට වඩා තවත් වරදක් තිබෙනවාද? ගමකට විදුලිය දෙන්න කියා යම් පුද්ගලයකු ගිහින් මුදල් වෙන් කළා නම්, අපි ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. ඒක දෙපැත්තම කරන දෙයක්. ගිහින් ටකරම් බෙදීම ආදිය නම් දෙපැත්තම කරන ඒවායි. ඒවා හොඳද නැද්ද කියන එක ගැන අලුත් ඡන්ද නීතිය මඟින් තීරණය කරන්න පුළුවන්. එහෙත් අතැනදී කළේ මොකක්ද? අතැනදී ඒ වැඩේ කළේ දැනගෙනයි. වෙන එකක් කියා අප ගිහින් මේ රටේ සංචාරක මණ්ඩලයේ සේවක සුභ සාධක සංගමයට දෙනවාද?

මේක අරගෙන ලොකුවට කෑ ගහලා වැඩට එන්නේ නැහැ කිව්වොත්, ඒ වැඩේ කරන්න තවත් කෙනකුට ඉඩ දෙන්න. එච්චරයි කරන්න තිබෙන්නේ. අනේ! අපේ පක්ෂයේ ඕනෑ තරම් මිනිස්සු ලැහැස්ති වේවි ඇබෑර්තු ටික පුරවන්න. මට ඊයේ පෙරේදා දෙකේම calls ආවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා කිව්ව කාරණාව කුමක් වුවද, පාර්ලිමේන්තුව අනුමත කරපු සංස්ථා, මණ්ඩල නීතිය තිබෙනවා. ඒ අනුව තමයි භාණ්ඩාගාරයෙන් නියෝජිතයෙක් පත් වෙන්නේ. භාණ්ඩාගාරයේ නියෝජිතතුමාට බැහැ, එතැන පාලනය කර ගන්න. එතුමා නොවෙයිනේ සභාපති. භාණ්ඩාගාරයේ නියෝජිත මහත්මයෙක් භාණ්ඩාගාරය පැත්තෙන් තමන්ගේ ස්වාධීන අදහස් ප්‍රකාශ කරලා ඒක තව දුරටත් කරන්න බැරි වුණාම, ඒ අයව වග කියන්න කැඳවීම නිසා තමන්ගේ සේවය කරන්න බැහැ කියන එකයි දැනුම් දීලා තිබෙන්නේ. ඉතින් ඒ අයව අස් කරලා දාන්න ඕනෑයි කියලා ප්‍රකාශයක් කිරීම, ස්ථාවරයක් ගැනීම සුදුසු දෙයක් නොවේ. ඒ අය රජයේ සේවකයන්. මොකද, මේ අය අසවල් කියා එක් පක්ෂයකට අයිති අය නොවේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපි අස් කළේ නැහැ. ඒ අය කැමැත්තෙන් අයින් වුණා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ වාගේම පෞද්ගලික අංශයේ අයවත් තමුන්නාන්සේලා අත් අඩංගුවට ගන්නවා. සංචාරක කර්මාන්තයේ දියුණුතම තීරණ

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ගන්න, පෞද්ගලික සංචාරක ව්‍යාපාරයේ ප්‍රධාන ආයතනයක ප්‍රධානියකු අත් අඩංගුවට අරගෙන තිබෙනවා. දැන් private sector එකේ අයත් අත් අඩංගුවට ගන්නවා. රජයේ නිලධාරීන්වත් අත් අඩංගුවට ගන්නවා. මොකක්ද මේකේ තේරුම කියන එකයි අපි අහන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, පළමුවන කාරණය මේකයි. ඒ නිලධාරියා ඒක වාර්තා කරලා මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට කියලා මුදල් ඇමතිතුමායි, ලේකම්තුමායි ඒ ගැන බැලුවා නම් ඒ අය කරදරේ වැටෙන්නේ නැහැ.

දෙවෙනි කාරණය, පෞද්ගලික අංශයේ මමත් දන්නා අය, මගෙත් මිත්‍රයෝ කිව්වා, "මේක අනුමත කරලා තිබෙනවා, ඒ නිසා අත්සන් කරමු කියලා ඒගොල්ලෝ අපට කිව්වා" කියා. ඒ ගොල්ලන් එතැන එහෙම කිව්වාට මේ ගොල්ලන් කියන්නේ නැහැ කවුද කියලා. පෞද්ගලික අංශයේ අය කියාවි කවුද හැදුවේ කියලා. අනෙක් සාමාජිකයන් අතර මගේ අමාත්‍යාංශයේත් එක් කෙනකු ඉන්නවා. අගමැති කාර්යාලයෙනුත් අහු වෙලා. එහෙනම් කවුද කිව්වේ මේක අනුමත කරන්නය කියලා? පෞද්ගලික අංශයේ අය කියන්නේ අපට කිව්වේ රජයේ ඉන්න නිලධාරීන් කියලායි. මේ අය මගේ මිත්‍රයෝ. මමත් බැලුවා ඒ අයට උදවු කරන්න. මේක අපේ තීරණයක් නොවෙයි. මේ තීරණය උසාවිය දුන්නු තීරණයක්. නීතිපති නියෝගයක් දුන්නාම මේ අය ගිහින් මේ ගැන ජනාධිපතිතුමාට දැනුම් දුන්නා, මේ ප්‍රශ්නය ඇති වෙවි කියලා. ජනාධිපතිතුමා කිව්වා මේ ගැන තවත් විපරම් කරලා බලන්න කියා. මේක ආණ්ඩුව කරපු එකක් නොවෙයි. ඒත් මහෙස්ත්‍රාත්තුමා ඇහුවා, ඇයි පියවර අරගෙන නැත්තේ කියලා. නීතිපතිතුමා නියෝගයක් දුන්නා නම් පොලීසියට කිව්වා ඇවිල්ලා කියන්න කියලා. පොලිසිය ගිහින් ඔය කරුණු කිව්වේ නැත්නම් පොලිස්පතිතුමාත් ඔය කටටිය එක්ක අද අත් අඩංගුවේ ඉන්නවා. ඒ නිසා ප්‍රශ්නයක් තිබෙනවා නම් ගරු කථානායකතුමනි, ඉස්සෙල්ලාම දාන්න ඕනෑ උසාවියටයි. මා කිව්වේ කවුරු හෝ ඉල්ලා අස් වෙනවා නම් තව කවුරු හරි අපට දමන්න පුළුවන් කියන එකයි. රජයෙන් දමන්න පුළුවන්; පිටින් දමන්න පුළුවන්. ගරු කථානායකතුමනි, ඔබතුමාගෙනුත් ඇවිල්ලා අහනවාද කියන්න මා දන්නේ නැහැ. පසු ගිය දවස් දෙකේම අපේ අය මට කථා කරලා අහනවා, "මේ තනතුරු තිබෙනවා. ඒවාට අප පත් කරන්නේ නැත්තේ ඇයි?" කියලා.

ඇත්ත වශයෙන්ම භාණ්ඩාගරයෙන් නියෝජිතයෙකු පත් කරන එකෙන් වැඩක් තිබෙනවාද, නැද්ද කියලා අපි ටිකක් බලන්න ඕනෑ. මම නම් කියන්නේ ඒ අය සිටියාට කිසිම ප්‍රයෝජනයක් වෙලා නැහැ කියන එකයි. වෙන එකක් නොවෙයි, Public Enterprises Division එකේවත් යමක් කරලා නැහැ. දැන් අපි අලුත් නීතියක් ගෙනෙනවා, එම අමාත්‍යාංශ යටතේ Public Enterprises Board එකක් ඇති කරලා පාර්ලිමේන්තුව යටතේ වැඩ කරන්නය කියලා. මෙතෙක් මොකුත් සිදු වුණේ නැහැ. අද ගිහින් ඒවායේ තත්ත්වය බැලුවොත් අපට කනගාටුයි, ඇයි මිනිස්සු මේවාට ගෙවන්නේ කියලා. ඒවා ගැන අඩන්නේ නැහැ. මේ ණය ගෙවන එකට, අපි VAT වැඩි කරන එකට -බදු වැඩි කරන එකට- කවුරුවත් අඬන්නේ නැහැ.මේකයි ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. මම ඒකයි කිව්වේ, -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

There was a key person from the private sector. He was virtually an honorary member of the committee.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

He was an honorary member by law. I must say in fairness, I know, that they were told to do this. When they came in, they said, “We had approved it”. So, they had gone along with it. I think that statement should suffice for his case. I regret what has happened to him. He is a friend of mine. But, that was a court order. The fact is, here, we are not talking about the private sector man. The Hon. Member is talking about the people who went in from the Treasury. So, I do not think this is a big issue in the country and they should not make it an issue. At some stage, the court order did it, not that we did these things. FCID කිව්වත් අන්තිමට පොලීසිය තමයි කිව්වේ. මහේස්ත්‍රාත්තුමා තමයි කිව්වේ මෙහෙම කරන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි හිඟය: දකුණු පළාත
குடும்ப சுகாதார சேவை உத்தியோகத்தர் பற்றாக்குறை :தென் மாகாணம்
SHORTAGE OF FAMILY HEALTH SERVICE OFFICERS : SOUTHERN PROVINCE

383/’15

9. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) දකුණු පළාත සඳහා අනුයුක්ත පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට සේවය කරන නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(iii) අවසාන වරට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් බඳවා ගත් දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පුහුණුව අවසන් කර මේ වනතෙක් බඳවා නොගත් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සිටිද;

(ii) එසේ නම්, එම නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් බඳවා ගැනීමට කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දකුණු පළාතේ, රජයට හා පළාත් සභාවට අයත් මහ රෝහල් තුළ පවුල් සෞඛ්‍ය සේවා

නිලධාරිනියන්ගේ හිඟයක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

සුකාදාර, පෝසණෙ මර්රුම් සුදේස මරුත්තුව අමෛච්සරෛක් කේට්ට විනා:

(අ) (i) තෙන් මාකාණත්තුක්කාන කුටුම්බ සුකාදාර සේවෛ උත්තියෝකත්තර්කළින් එණ්ණික්කෛ යාතෙන්පතෛයුම්;

(ii) තර්පෝතු පණියාර්රුම් උත්තියෝකත්තර්කළින් එණ්ණික්කෛ යාතෙන්පතෛයුම්;

(iii) ඉරුතියාක කුටුම්බ සුකාදාර සේවෛ උත්තියෝකත්තර්කළ් ආට්සේර්ප්පු සෙය්යප්පට්ට තිකති යාතෙන්පතෛයුම්;

අවර් කුරිප්පිටුවාරා?

(ආ) (i) පයිර්සියෛ පූර්ත්ති සෙය්තිරුන්තුම් ඉර්රෛවරෛ ආට්සේර්ක්කප්පටාතුළ්ළ කුටුම්බ සුකාදාර සේවෛ උත්තියෝකත්තර්කළ් උළ්ළාර්කළා එන්පතෛයුම්;

(ii) ආමෙනිල්, මේර්පඩි උත්තියෝකත්තර්කළින් එණ්ණික්කෛ යාතෙන්පතෛයුම්;

(iii) ඉවර්කළෛ ආට්සේර්ප්පු සෙය්ය නටවඩික්කෛ මේර්කොළ්ළප්පටුම් තිකති යාතෙන්පතෛයුම්;

අවර් ඉච්සපෛක්කු අරිවිප්පාරා?

(ඉ) (i) තෙන් මාකාණත්තිල් අරසාඞ්කත්තිර්කුම් මාකාණ සපෛක්කුම් සොන්තමාන පොතු වෛත්තියසාලෛ කළිල් කුටුම්ප සුකාදාර සේවෛ උත්තියෝකත්තර් පර්රාක්කුරෛ නිලවුකින්රතෙන්පතෛ අවර් අරිවාරා?

(ii) ආමෙනිල්, මේර්පඩි වෙර්රිටඞ්කළෛ නිරප්පුවතර්කු මේර්කොළ්ළප්පටුම් නටවඩික්කෛ යාතෙන්පතෛයුම්;

අවර් ඉච් සපෛක්කු අරිවිප්පාරා?

(ඊ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he state -

(i) the number of Family Health Service Officers deployed for the Southern Province;

(ii) the number of such officers who are serving at present; and

(iii) the date on which the Family Health Service Officers were recruited last time?

(b) Will he inform this House -

(i) whether there are Family Health Service Officers who were not recruited to the service after the completion of the training;

(ii) if so, the number of such officers; and

(iii) the date on which they will be recruited?

(c) Will he also inform this House -

(i) whether there is a dearth of Family Health Service Officers in the general hospitals in the Southern Province that come under the Central Government and the Provincial Council; and

(ii) if so, the steps that will be taken to fill those vacancies?

(d) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)

(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 1,225යි. (එක්දහස් දෙසියවිසිපහකි.)

(ii) 1,051යි. (එක්දහස් පනස්එකකි.)

(iii) 2015.12.27

(ආ) (i) ඔව්.

(ii) 11යි. (එකොළහකි.)

(iii) ඉතා ඉක්මනින් පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) (i) ඔව්.

(ii) නවක නිලධාරීන්ට පත්වීම් ලබා දීමෙන් සහ වයස අවුරුදු 65ට අඩු විශ්‍රාමික පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම මගින්.

(ඈ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, දැනටත් පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙනවා. ඒ සඳහා ඔබතුමා විකල්පයකුත් යෝජනා කරනවා. ඒ තමයි, අලුතින් බඳවා ගැනීම සහ අවුරුදු 65ට අඩු විශ්‍රාමික අය කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම. හැබැයි, 2015 වර්ෂයේ 12වැනි මාසයේ ඒ තනතුරුවලට බඳවා ගැනීමක් කරලා තිබෙනවා. ඇත්තටම බැලුවොත් මෑතකදී බඳවා ගෙන තිබෙනවා. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය තමයි ග්‍රාමීය මට්ටමේත්, රෝහල තුළත් සැලකිය යුතු වැඩ කොටසක් කරන්නේ. ඒ වාගේම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය කියන්නේ ක්ෂේත්‍රය තුළ ඉන්න -ග්‍රාමීය පදනමින් ඉන්න- වැදගත්ම නිලධාරිනිය. ඒ නිසා වාර්ෂිකව ඇතිවන පුරප්පාඩු පුරෝකථනය කරලා, ලබන අවුරුද්දේ ඇතිවන පුරප්පාඩුවලට මේ අවුරුද්දේ දෙසැම්බර් වෙන කොටවත් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන්ද? විශේෂයෙන්ම ග්‍රාමීය මට්ටමේ, ප්‍රාථමික මට්ටමේ - grass-roots level එකේ - සෞඛ්‍ය පැත්ත ගැන හිතන කොට, එවැනි ක්‍රියාවලියකට යන්න අමාත්‍යාංශයට ශක්‍යතාවක්, හැකියාවක් තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු මන්ත්‍රීතුමනි, විශාල ප්‍රශ්නයක් තිබුණා, මේ ගොල්ලන්ගේ උසස් පෙළ සුදුසුකම සම්බන්ධව. උසස් පෙළ විද්‍යා විෂයයන්

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

තුනකින් සමත්විය යුතුයි කියලා තමයි සුදුසුකම තිබුණේ. නමුත් ප්‍රශ්නය තිබුණේ එහෙම අය හිටියේ නැති එකයි. ඒ අනුව අවුරුදු තුනක් මේ බඳවා ගැනීම් කරලා තිබුණේ නැහැ. ඊට පස්සේ, මම සෞඛ්‍ය ඇමතිවරයා විධියට ආවාට පස්සේ ගිය අවුරුද්දේ තීන්දුවක් ගත්තා, ඕනෑම විෂයයන් තුනකින් සමත් අය බඳවා ගන්න කියලා. එහෙම බඳවා ගෙන, විද්‍යාව පිළිබඳ මාස හයක පුහුණුවක් කලින් ලබා දීලා ඒ අය යොමු කරනවා, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් පුහුණු කරන ආයතනයට. බඳවා ගැනීම ප්‍රමාද වීම නිසා පුරප්පාඩු අතර ලොකු gap එකක් ආවා. අපි මේ ඔක්කෝම තීන්දු තීරණ අරගෙන 2016 මැයි මාසයේ තමයි 1,200 දෙනෙක් බඳවා ගත්තේ, අභ්‍යාසලාභීන් විධියට පුහුණු කරන්න. ඉදිරියේදී ඒ 1,200 පුහුණු වෙලා ආවාට පස්සේ තමයි අපට මේ පුරප්පාඩු පුරවන්න පුළුවන් වෙන්නේ. අවුරුදු තුනක හිඩැසක් පිරවීමට සිදුවුණු නිසා තමයි මේ හිඟය වැඩි වුණේ. කොහොමත් හිඟයක් තිබුණා. ඒ අනුව තමයි මම තීන්දු කළේ, අවුරුදු 60 ඉඳලා 65 දක්වා අයත් කැඳවන්න. දැන් ඒ වයසේ ඉන්න සමහරුන් බැඳෙනවා. ඒ අයත් අපි සහභාගි කර ගන්නවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

දකුණු ආසියානු රටවල් එක්ක ගත්තාම අපේ රට සෞඛ්‍ය නිර්ණායකවලින් බොහොම ඉදිරියෙන් ඉන්න රටක්. ඒ තත්ත්වය තුළ අපේ ප්‍රාථමික සහ ග්‍රාමීය සෞඛ්‍ය ක්ෂේත්‍රය තව ප්‍රවර්ධනය කරන්න දායක වෙන පිරිසක් තමයි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය. ඇත්තටම ග්‍රාම නිලධාරි වසම් තුනක් - හතරක් - පහක් සහ ජනතාව විධියට සැලකුවොත් පන්දාහක් - හත්දාහක් අතර ප්‍රමාණයක් මේ එක නිලධාරිනියක් ආවරණය කරනවා. ඉතින් මේ බඳවා ගැනීම් වැඩි කර ගන්න භාණ්ඩාගාරය සහ ඒ අදාළ ආයතනවල අනුමැතිය ලබාගෙන වඩාත් වැඩි පිරිසකට සේවය සලසන යන්ත්‍රණයකට යන්න අමාත්‍යාංශයට වැඩ පිළිවෙළක් තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

මුදල් සම්බන්ධයෙන් නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. පුහුණු කිරීමේ පහසුකම් නොමැතිකමයි තිබෙන ප්‍රශ්නය. හැම තැනකම ඔවුන් පුහුණු කරන්න බැහැ. පුහුණු කිරීමේ පාසල්වල තිබෙන ඉඩකඩ අනුව තමයි, කණ්ඩායම් දෙකක් වශයෙන් අපි වසරකට 1,200 දෙනෙක් පුහුණු කරන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ ක්ෂේත්‍රය ගත්තාම, සමහර වෙලාවට පළාත් සභා තුළ බරපතළ ගැටලු තිබෙනවා. ඒ නිසා සියලුම පළාත් සභාවල අදාළ ලේකම්වරු සහ ඇමතිවරු එක්ක එකතුවෙලා මේ කටයුතු සම්බන්ධීකරණය කරන්න අමාත්‍යාංශයට පුළුවන්ද? උදාහරණයක් විධියට කිව්වොත් ගරු ඇමතිතුමනි, පළමුවැනි ශ්‍රේණියේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින්ගේ හිඟ වැටුප් ලබා දීම සිද්ධ වෙන්නේ නැහැ. දකුණු පළාතේ මහ රෝහල්වලට පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් අනුයුක්ත කිරීම සිද්ධ වෙන්නේ නැහැ. දකුණු පළාතට විශේෂ ශ්‍රේණියේ තනතුරු හතරක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරලා තිබුණත්, දකුණු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ තනතුරු සංඛ්‍යාව සම්පූර්ණ කිරීම සිද්ධ කරන්නේ නැහැ. රේඛීය අමාත්‍යාංශයේ ක්‍රියාවලිය එක්ක බලනකොට පළාත් සභා මට්ටමින් මෙන්න මේ වාගේ විෂමතා තිබෙනවා. ඒ වෙනුවෙන් යම්කිසි මැදිහත් වීමක් කරන්න පුළුවන්කමක් තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

දැනට අපි මාස තුනකට වරක් සියලුම පළාත් සභා අමාත්‍යවරු, පළාත් සභාවල ඒ ලේකම්වරු, පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරු සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු ගෙන්වලා, ඒගොල්ලන් එක්ක දීර්ඝ වේලාවක් සාකච්ඡා කරනවා. ඒ සාකච්ඡාවලින් පසුව දැන් අපි සියලුදෙනා එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා, මේ සියලුම කටයුතු එක තැනකින්, එක විධියකට සිදු කරන්න. ඔවුන් රේඛීය අමාත්‍යාංශයෙන් බඳවාගෙන පළාත් සභාවලට වුණත් ලබා දෙන්න එකඟතාව පළ කරලා තිබෙනවා. පළාත් සභාවල සේවය කරන අය රේඛීය අමාත්‍යාංශය යටතට යන්නත්, රේඛීය අමාත්‍යාංශය යටතේ සේවය කරන අය පළාත් සභාවලට යන්නත් -වෛද්‍යවරුන්ට දෙනවා වාගේ - ඉඩ ලැබෙන පරිදි කටයුතු කරනවා. ඒ නිසා එවැනි විෂමතාවක් ඉදිරියට හට ගන්නේ නැහැ. අපි සියලුම දෙනා එක්ක කථා කරලායි ඒ කටයුතු කරන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
පුහුණු පාසල් ඇති කිරීම කරන්නේ කොහොමද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ, සියලුම කටයුතු රේඛීය අමාත්‍යාංශයත් එක්ක බද්ධවෙලා තමයි කරන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ඔබතුමන්ලා මේ අය වෙනුවෙන් අලුතින් තව පුහුණු පාසල් ඇති කරන්න බලාපොරොත්තු වනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ සම්බන්ධයෙන් සොයා බලන්න ඕනෑ. මොකද, වැඩිපුර පුහුණු පාසල් ආරම්භ කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අවුරුදු තුනක බඳවා ගැනීමේ ප්‍රමාදයේ ප්‍රශ්නයක් තමයි මෙතැන තිබෙන්නේ. අපි දැන් 1,200 ගණනේ පුහුණු වීම් කරනවා. ඒ අය පුහුණු කරලා පිටත් කළාම, තව අවුරුදු දෙකක් විතර යනකොට මේ හිඟය නැති වෙලා යාවි.

රජයේ නිලධාරින්ගේ නිල නිවාස: විස්තර

அரச அதிகாரிகளுக்கான உத்தியோகபூர்வ விடுதிகள் : விபரம்

OFFICIAL RESIDENCES OF GOVERNMENT SERVANTS : DETAILS

674/'16

10. **ගරු බිමල් රත්නායක මහතා**
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා රාජ්‍ය සංස්ථා සහ සමාගම්වල සභාපතිවරුන් සඳහා කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ආයතනයට අයත් නිල නිවාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම නිල නිවාස දැනට භාවිත කරන පුද්ගලයන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iv) මෙම නිල නිවාස වෙන් කිරීම සඳහා අනුගමනය කරන රෙගුලාසි සඳහන් චක්‍රලේඛයක් හෝ ලේඛනයක් තිබේද;

(v) එසේ නම්, එය සභාගත කරන්නේද;

(vi) රෙගුලාසි ලේඛනයක් නොමැති නම්, නිවාස වෙන් කරනු ලබන පටිපාටිය කවරේද;

(vii) නිවාස වෙන් කරනු ලබන රෙගුලාසි හෝ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා නොමැතිව නිවාසවල රැඳී සිටින්නන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

පොදු නිර්වාක මට්‍රුම් මුකාමෙත්තුව අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) අමෙච්සුක්කළින් සෙයලාළර්කළ්, තිණෙක්කළත් තලෙවර්කළ් මට්‍රුම් අරස කූට්ටුත්තාපනංකළ් මට්‍රුම් කම්පනිකළින් තලෙවර්කළ් ආකියෝරුක්කාක කොළුම්පු මාවට්ටත්තිල් අමෙන්තුළ්ළ උත්තියෝකපූර්ව විටුතිකළින් එණ්ණික්කෙ එව්වළවු;

(ii) ඔව්වොරු නිරුවනත්තුක්කුම් සොන්තමාන උත්තියෝකපූර්ව විටුතිකළ් වෙව්වේරාක යාවෙ;

(iii) ඉව්වුත්තියෝකපූර්ව විටුතිකළෙ තට්පෝතු උපයෝකික්කුම් ආට්කළින් පෙයර්ප්පට්ටියලෙ සමර්ප්පිප්පාරා;

(iv) ඉව්වුත්තියෝකපූර්ව විටුතිකළෙ ඔතුක්කුවතට් කාකක් කටෙප්පිටික්කප්පටුම් ඔළුංකුවිතිකළ් අටංකිය සුට්රුනිරුපමෝ ආවණමෝ කාණප්පටුකින්රතා;

(v) ආමෙනිල් අතෙ සපෙයිල් සමර්ප්පිප්පාරා;

(vi) ඔළුංකුවිතිකළටංකිය ආවණම් ඒතුමින්නේල්, ඉව්විටුතිකළ් ඔතුක්කප්පටුම් නටෙමුරෙ යාතු;

(vii) විටුතිකළ් ඔතුක්කප්පටුම් ඔළුංකුවිතිකළ් අල්ලතු නටෙමුරෙයින්පි තකෙමෙපෙරාතු විටුති කළිල් තංකියිරුප්පෝරින් එණ්ණික්කෙ එව්වළවු;

එන්පතෙ අවර් ඉච්සපෙක්කු අරිවිප්පාරා?

(ඇ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Public Administration and Management:

(a) Will he inform this House-

(i) of the number of official residences located in the Colombo District for the Secretaries of Ministries, the Heads of Departments and the Chairmen of Government Corporations and Companies;

(ii) the number of official residences belonging to each institution;

(iii) whether he will submit a list of names of persons who currently occupy these residences;

(iv) whether there is a circular or a document setting out regulations to be adopted in the allocation of these official residences;

(v) if so, whether that can be tabled;

(vi) if there is no such circular regarding regulations, the procedure for allocating these residences; and

(vii) the number of persons occupying the said residences who have not met the eligibility criteria as per the regulations or the procedure for the allocation of residences?

(b) If not why?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சர்)
(The Hon. R.M. Ranjith Madduma Bandara - Minister of Public Administration and Management)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයට අයත් මුළු නිවාස අතුරින් නිවාස 16ක් එම තනතුරු සඳහා වෙන් කර ඇත.

බංගලා නිවාස	-	06
ලොරිස් පටුමහ නිවාස	-	04
සමුළු නිවාස	-	06

(ii) ඇමුණුම 01 මඟින් දැක්වේ.

(iii) ඔව්. ඇමුණුම 02 මඟින් දැක්වේ.

(iv) ඔව්.

(v) ඔව්. ඇමුණුම 03 මඟින් දැක්වේ. ඇමුණුම් සියල්ල **සභාගත*** කරමි.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා සඳහන් කළ විධියට එම නිවාසවල නිල කාලය අවුරුදු

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු විජිත හේරත් මහතා]

පහයි. ඒ අවුරුදු පහ ඉක්ම වූ සමහර විනිශ්චයකාරවරු පවා අවුරුදු පහළොව, විස්ස තවමත් ඒ නිවාසවල රැඳී ඉන්නවා. ඒ නිසා විශාල ප්‍රමාණයක් කනිෂ්ඨ පරිපාලන නිලධාරීන්ට ඒ ඉඩ පහසුකම් ලැබිලා නැහැ. ඒ පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
දැනටමත් ඒ සම්බන්ධයෙන් අපි නීතිමය ක්‍රියාමාර්ග අර ගෙන තිබෙනවා. ඒ අයට දන්වා තිබෙනවා. අධිකරණයට දන්වලා ඒ නිවාස පවරා ගන්න කටයුතු කරනවා.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ගරු කථානායකතුමනි, මාගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. අධිකරණ ක්‍රියාමාර්ගයක් ගන්නා විට තවත් අවුරුදු පහක්-හයක් ගත වෙනවා නේද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
නැහැ, අපි ඉතා ඉක්මනින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා. මම හිතන්නේ රජයේ නිලධාරීන් පමණක් නොවෙයි, සමහර හිටපු මැති ඇමතිවරුන් සම්බන්ධයෙනුත් අපි ඒ ක්‍රියාමාර්ග ගන්නවා.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ඒ නිවාස ලබා දෙන ක්‍රමවේදය මොකක්ද? ගරු ඇමතිතුමනි, ක්‍රමවේදය තමයි පැහැදිලි නැත්තේ. ඒ නිසා තමයි රාජ්‍ය පරිපාලන නිලධාරීන් විශාල අපහසුතාවකට පත් වෙලා තිබෙන්නේ. ඒ නිවාසයක් හිස් වන බව දැන ගන්න එකත් ලොකු ප්‍රශ්නයක්. ඒවා දැන ගන්නා ක්‍රමයක්; විනිවිද පෙනෙන ක්‍රමයක් සහ පොරොත්තු ලේඛනයකට අනුව ලබා දෙන ක්‍රමයක් දැනට නැහැ.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රමුඛතා ලේඛනයක් තිබෙනවා. විශේෂ අවස්ථාවක් හැරුණු විට ඒ ප්‍රමුඛතා ලේඛනය අනුව තමයි නිවාස දෙන්නේ. විශේෂ අවස්ථාවලදී සමහර අයට ලබා දෙන්න සිදු වෙනවා. සාමාන්‍යයෙන් අපි ඒ ප්‍රමුඛතා ලේඛනය අනුව තමයි ලබා දෙන්නේ.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ගරු ඇමතිතුමනි, ඔබතුමා නාම ලේඛනය කියෙව්වා නම් ඒ ප්‍රමුඛතා ලේඛනය හරිද, වැරදිද කියලා හරියට තේරුම් ගන්න පුළුවන්.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ප්‍රමුඛතා ලේඛනය දැන් මගේ ළඟ නැහැ. ඒක පසුව ඉදිරිපත් කරන්නම්. මේ ප්‍රශ්නයේ ඒ ගැන අහලා නැහැ.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
නිවාස ලබා දීලා තිබෙන අයගේ නාම ලේඛනය දැන් තිබෙනවාද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔව්, තිබෙනවා.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
නම් කියක් තිබෙනවාද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
නම් 16ක් තිබෙනවා.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ගරු ඇමතිතුමනි, ඒක කියවන්න. එතකොට ලෙහෙසියි.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Mr. J.J. Rathnasiri, Secretary, Ministry of Public Administration and Management; Mr. G.M.W.P. Jayathilaka, Secretary, Judicial Service Commission Secretariat; Mr. Wijith K. Malalgoda, Chairman, Court of Appeal of Sri Lanka; Mr. Karunasena Hettiarachchi, Secretary, Ministry of Defence; Mr. J.C. Jayasooriya, Attorney-General, Department of Attorney-General, Mr. L.A. Tissa Ekanayake, Ombudsman, Parliamentary Commissioner For Administration; Mr. D.M.R.B. Dissanayake, Secretary, Ministry of Sports; Mr. W.D. Somadasa, Director General (Establishment), Ministry of Public Administration; Mr. Chandrarathna Pallegama, Director General (Civil Security), Civil Security Department; Mr. A.P.G. Kithsiri, Secretary, State Ministry of Defence; Mr. H.M. Gamini Senevirathne, Secretary, Public Service Commission; Mrs. K.P.M.S. Gamage, Director General - Combined Service, Ministry of Public Administration; Mr. A.E.S.B. Ekanayaka, Secretary to the Prime Minister; Mr. H.M.N.C. Danasinghe, Commissioner General of Prisons; Mr. R.H.S. Samarathunga, Secretary, Ministry of Finance; Mrs. Dilrukshi Dias, Director General, Commission to Investigate Allegations of Bribery or Corruption.

ගරු විජිත හේරත් මහතා
(මාණ්පුමිකු විජිත හේරත්)
(The Hon. Vijitha Herath)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මම නම් සඳහන් කරන්නේ නැහැ. දැන් ඔබතුමා සඳහන් කරපු සමහර නම් අතර කොළඹ දිස්ත්‍රික්කය

ආශ්‍රිතවම නිවාස තිබෙන අයගේ නම් ප්‍රමාණයකුත් කියැවුණා. අමාත්‍යාංශ ලේකම්වරුන්ට අමතරව රාජ්‍ය පරිපාලනයේ අනෙකුත් නිලධාරීන්ට මේ නිවාස ලබා ගැනීමේදී විශාල අසීරුතාවක් ඇති වෙලා තිබෙනවා. රජයේ නිවාස ලබා දීමේදී ජනාධිපති ලේකම් කාර්යාලයට ප්‍රමුඛතාවක් ලබා දෙන ක්‍රමවේදයක් තිබෙනවාද; ඔබතුමා ඒ පිළිබඳව යම් කිසි ක්‍රමවේදයක් අනුගමනය කරනවාද?

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ජනාධිපති ලේකම් කාර්යාලයට එදා සිට වෙන් කළ නිවාස සංඛ්‍යාවක් තිබෙනවා. ඒ නිවාසවල ජනාධිපති ආරක්ෂක සේවාවේ නියැලෙන අය ඉන්නවා. මොකද, ජනාධිපතිතුමා ඉන්නේත් මේ නිල නිවාසයකමයි. ජනාධිපති නිල නිවාසයේ නොවෙයි. ඒ නිසා සමහර අවස්ථාවල ජනාධිපති ආරක්ෂක සේවාවේ නියැලෙන අයට ඒ නිවාස ටික අපි දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 11-704/'16-(1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 14-728/'16-(1), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ඉපලෝගම ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ ඒකකය : ස්ථිර රජයේ වෛද්‍යවරයෙකු අනුයුක්ත නොකිරීම

இபலோகம ஆரம்ப சுகாதாரப் பேணுகைப் பிரிவு: நிரந்தர அரச மருத்துவரை நியமிக்காமை

PRIMARY HEALTH CARE UNIT OF IPALOGAMA: NON-ATTACHMENT OF PERMANENT GOVERNMENT MEDICAL OFFICER

775/'16

15.ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ත්‍රිවිධ හමුදාවට අයත් පවුල් 1,235 ක් පමණ ස්ථිරව පදිංචිව සිටින අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, ඉපලෝගම, රණ්ඡයපුර ගම්මානයේ, ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ ඒකකයට රජයේ වෛද්‍ය නිලධාරියෙකු අනුයුක්ත කර නොමැති බවත්;

(ii) රජයේ වෛද්‍යවරයෙකු ස්ථිර ලෙස අනුයුක්ත කර නොමැතිවීම හේතුවෙන්, යුධ හමුදාව, නාවික හමුදාව හා ගුවන් හමුදාවට අයත් වෛද්‍ය නිලධාරීන් වරින් වර මෙම ඒකකයේ සේවය කරන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙම ගම්මානයේ ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ ඒකකයට ස්ථිර රජයේ වෛද්‍යවරයෙකු ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முப்படைகளைச் சார்ந்த சுமார் 1235 குடும்பங்கள் நிரந்தரமாக வதியும் அநுராதபுரம் மாவட்டத்தின் இபலோகம, ரணஜயபுர கிராமத்தின் ஆரம்ப சுகாதாரப் பேணுகைப் பிரிவுக்கு அரச மருத்துவ உத்தியோகத் தரொருவர் கடமையில் ஈடுபடுத்தப்படவில் லையென்பதையும்;

(ii) அரச மருத்துவரொருவர் நிரந்தரமாக கடமையில் ஈடுபடுத்தப்படாததால் தரைப்படை, கடற்படை மற்றும் விமானப் படையைச் சேர்ந்த மருத்துவ உத்தியோகத்தர்கள் அவ்வப்போது இப்பிரிவில் பணியாற்றுகின்றார்கள் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இக்கிராமத்தின் ஆரம்ப சுகாதாரப் பேணுகைப் பிரிவிற்கு நிரந்தர மருத்துவ உத்தியோகத் தரொருவரை நியமிப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) அதற்கு எவ்வளவு காலம் எடுக்குமென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Is he aware-

(i) that a government medical officer has not been attached to the Primary Health Care Unit of the Ranajayapura village of Ipalogama in the District of Anuradhapura where approximately 1,235 families belonging to the three armed forces permanently reside; and

(ii) that medical officers belonging to the Army, Navy and Air Force periodically serve in this unit as a consequence of not attaching a Government Medical Officer to this unit permanently?

(b) Will he inform this House-

(i) whether action will be taken to provide a permanent Government Medical Officer to the Primary Health Care Unit of this village; and

(ii) of the time that will be taken for the said purpose?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) අනුයුක්ත කර ඇත.

(ii) පැන නොනඟී.

(ආ) (i) 2016.07.28 දින සිට වෛද්‍ය නිලධාරියෙකු පත් කර ඇත.

(ii) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
බොහොම ස්තුතියි.

ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා මාස 4ක් පමණ වනවා. ජූලි මාසයේ 28වන දා ඉඳලා රජයේ වෛද්‍ය නිලධාරියකු අනුයුක්ත කර තිබෙනවා. ඒ කටයුත්ත එහෙම කෙරෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. පවුල් 1,000ක්, 1,200ක් පමණ පදිංචිව සිටින මෙවැනි ගම්මානවල ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ ඒකකවලට වෛද්‍යවරයකුත් ඕනෑ, ඒ වාගේම මූලික සෞඛ්‍ය පරීක්ෂණ කර ගන්න MLT කෙනකුත් ඕනෑ. ඔබතුමා දන්නවා ඇති, මේ ගම්මානයේත් MLT කෙනෙක් නැහැයි කියලා. බොහෝ තැන්වල MLTsලා නැහැ. ඒ නිසා එවැනි ස්ථානවලට MLTsලා අනුයුක්ත කරන්න ආණ්ඩුවේ තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඉස්සෙල්ලා බලන්න ඕනෑ, මෙම පර්යන්ත ඒකකවල රසායනාගාර පහසුකම් තිබෙනවාද කියලා. රසායනාගාර පහසුකම් තිබෙනවා නම් විතරයි අපි MLT කෙනෙක් අනුයුක්ත කරන්නේ. එවැනි හැම තැනකටම MLT කෙනෙක් අනුයුක්ත කරන්නේ නැහැ. ඒ ගැන මා සොයා බලන්නම්. මොකද, එය වෙනම විෂයක්. නමුත් මතක තබා ගන්න, මේ වාගේ ස්ථාන 37ක් තිබුණාය කියලා. වෛද්‍යවරු නැති නිසා ඔක්කොම පර්යන්ත ඒකක වහලා තිබුණා. ඒක තමයි පසු ගිය දවස්වල රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ තිබුණු අර්බුදය. අපි නේවාසික පත්වීම් ලබා දෙන්නේ අවසාන විභාගයේදී ලබා ගත් merit ලකුණු සංඛ්‍යාව අනුවයි. කාටවත් ඒකේ බලන්න දෙයක් නැහැ. ලකුණු අනුව තමයි නේවාසික පත්වීම් දෙන්නේ. කාට හෝ වැරැද්දක් වෙලා තිබෙනවා නම් complain කරන්න පුළුවන්. පශ්චාත් සීමාවේ එක කරන්නේත් ඒ විධියටයි. ඊට පස්සේ ඔවුන් පත් කරන්නේ කොතැනටද කියන එක අමාත්‍යාංශයේ තීන්දුවක්. පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන්ගෙන්, ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන්ගෙන්, රෝහල් අධ්‍යක්ෂවරුන්ගෙන් අහලා බලලා තමයි අමාත්‍යාංශය කරුණු ගන්නේ. නමුත් වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයත් මේකට සම්බන්ධ වෙනවා. මෙවැනි ක්‍රමවේදයකට නිලධාරීන් ඉඩ ඇරලා තිබෙනවා, අවුරුදු 4-5ක කාලයක ඉඳලා. මෙතැන වුණේ මොකක්ද? මා කිව්වා, "මට තිබෙන්නේ එකයි. කවුරු කොහේටද යන්නේ කියලා මට වැඩක් නැහැ. මේ පර්යන්ත ඒකක 37ම විවෘත කරන්න ඕනෑ"යි කියලා. මේ පර්යන්ත ඒකක 37 විවෘත කරන්න ගියාම මොකක්ද කිව්වේ? දේශපාලන ඇඟිලි ගැසීමක්ය කිව්වා.

ඊට පස්සේ මාධ්‍යවලින් වාගේම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු ඇතුළු නොයෙකුත් කට්ටිය කියන්න පටන් ගත්තා, මේක දේශපාලන ඇඟිලි ගැසීමක් කියලා. එතැන දේශපාලන ඇඟිලි ගැසීමක් සිද්ධ වුණේ නැහැ. මම කිව්වේ, stations ටික ඔක්කෝම විවෘත කරන්න කියන එකයි. නැත්නම් ඒක මහා අපරාධයක්. තමතමන්ගේ කට්ටියට පහසුකම් අවශ්‍ය ස්ථානවලට වෛද්‍යවරු යැවීම නොවෙයි ප්‍රතිපත්තිය විය යුත්තේ. ප්‍රතිපත්තිය විය යුත්තේ, අන්ත දුෂ්කරම ස්ථානවලට වෛද්‍යවරු සැපයීමයි. ඊට පස්සේ මාධ්‍යවලිනුයි, හැම කෙනාම ගහන්න පටන් ගත්තා. මම මොකටද නිකම් බොරුවට බැණුම් අහන්නේ කියලා මම කල්පනා කළා. මගේ රෝහලකට වෛද්‍යවරු යවන්න නොවෙයි නේ මම හදන්නේ. එම රෝහල්වලින් විශාල සංඛ්‍යාවක් තිබුණේ උතුරුකරයේ. මම ඒ කට්ටියට කථා කරලා කිව්වා, "මට කරන්න දෙයක් නැහැ, ඔබතුමන්ලා ඕනෑ විධියක් කරගන්න" කියලා. අන්තිමට වුණේ මොකක්ද? ඒ පර්යන්ත ඒකක 37 විවෘත වුණේ නැහැ. මම පොරොන්දු වුණා, විවෘත කරනවා කියලා. නමුත් විවෘත කරන්න හැකි වුණේ නැහැ. මේක තමයි තත්ත්වය. නමුත් කිසිම දෙයක් දන්නේ නැතුව, පත්තර ඇතුළු මාධ්‍ය මේ හැම ප්‍රශ්නයක් ගැනම ආණ්ඩු විරෝධී මනසකින් කථා කළාම, අන්තිමට ඕක තමයි සිද්ධ වෙන්නේ. මෙවර මට පොරොන්දු වෙලා තිබෙනවා, ඒ පර්යන්ත ඒකක 37ම කොහොම හරි පුරවනවා කියලා. ඉතින්, මේක තමයි තත්ත්වය ගරු මන්ත්‍රීතුමනි.

අමාත්‍යාංශය කාලයක්ම එක එක්කෙනාගේ බලපෑම්වලට නතු කරලා තිබුණු තැනක්. ඒ නිසා මට ඔක්කෝම ප්‍රශ්න මාස 4න්, 5න් විසඳන්න බැහැ. මේ අමාත්‍යාංශයට ඇමතිවරයෙක් හිටියා, නමුත් ඇමතිවරයාට උඩින් ලේකම්වරු පත් කරගෙන ඇමතිවරයාට විරුද්ධ කටයුතු කරමින් රජ ගෙදරින් සෞඛ්‍ය අමාත්‍යාංශය මෙහෙයවුවා. අත පය බැඳගෙනයි අමාත්‍යාංශයේ කටයුතු කරන්න සිද්ධ වෙලා තිබුණේ. අපි ඇවිල්ලා දැන් ඒවා නිදහස් කරන්න හදන කොට, මේ සියලු ප්‍රශ්න අපට දානවා. දාලා,

"දේශපාලනීකරණය කරනවා" කියලා කියනවා. අන්තිමට සිද්ධ වුණේ මොකක්ද? මේක තමයි සිදු වුණේ. අධ්‍යක්ෂ ජනරාල්වරයා පැහැදිලිව කිව්වා, "ඇමතිවරයා කිසිම එකකට අතදාලා නැහැ" කියලා. මම කියලා තිබුණේ එකම එකයි. ඒ තමයි, "මේ stations ටික විවෘත කරලා දෙන්න" කියන එක. ඒක මගේ ඉල්ලීම; මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම. දැන් තමුන්නාන්සේ ඉල්ලනවා වගේම, උතුරුකරයේ මන්ත්‍රීවරුත් විශාල පිරිසක් ඇවිල්ලා මගෙන් මේ ඉල්ලීම කළා. දුෂ්කර පළාත් නිදහස් වුණාට පස්සේ ඒ පළාත්වලට වෛද්‍යවරු එවන්න කියලා ඉල්ලනවා. මේක තමයි ස්ථාන මාරු සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය. මෙවරත් මම උත්සාහ කරනවා. සමහර වෙලාවට මෙවරත් මාධ්‍යයයි, තමුන්නාන්සේලාගේ කෑ ගැහිල්ලයි නිසා මොකක් වෙයිද කියලා මට තේරෙන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උறුප්පිනர් ஒருவர்)
(An Hon. Member)
පොදුවේ ඔක්කෝම නොවෙයි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
නෑ, මම ඇහිලි ගහනවා කියලා සමහර මන්ත්‍රීවරු පවා ප්‍රකාශ නිකුත් කළා නේ. මම ජීවිතේට ඇහිලි ගහන්නේ නැහැ. මම වෘත්තීය සමිති නායකයකු විධියට අවුරුදු 15ක් කටයුතු කළා. මම එදා කිසිම දේශපාලනඥයකුට ඇහිලි ගහන්න ඉඩ දුන්නේ නැහැ. ඒ ප්‍රතිපත්තියේම දැනුත් ඉන්නවා. මම කිසිම දේශපාලනඥයකුගේ ඉල්ලීමට ස්ථාන මාරුවක් ලබා දෙන්නේ නැහැ. මොකද, එකම වෛද්‍යවරයෙක්වත් යූඑන්පීයටත් නැහැ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් නැහැ කියලා මම දන්නවා. එකම කට්ටිය තමයි දේශපාලනඥයන් පසුපස යන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම ප්‍රශ්නය පටන් ගත්තේ MLTsලා සම්බන්ධයෙන්.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමාත් වෛද්‍යවරයෙක් වශයෙන්, මේ වෛද්‍ය සේවය යම් කිසි තැනකට ගෙනෙන්න උදවු කරන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි, හොඳයි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අපේ මතිමතාන්තර වෙනස් වෙන්න පුළුවන්. නමුත් වෛද්‍ය සේවය ගුණාත්මක තත්ත්වයකට පත් කරන්න මට වගේම සමාන අයිතියක් ඔබතුමාටත් තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මේ ප්‍රශ්නය මතු කරන්නෙත් ඒකයි. මම ඔබතුමාට කියන්නට කැමැතියි, ඇත්තටම ප්‍රාථමික සෞඛ්‍ය ඒකකවල පමණක් නොවෙයි, මූලික රෝහල්වලත් -පරීක්ෂණ කරන්නට පුළුවන් තැන්වලත්- MLTsලාගේ බරපතළ හිඟයක් තිබෙන බව. ඔබතුමා ඒ ගැන දන්නවා.

ඔබතුමාම GMOA එක සහ ආණ්ඩුව අතර තිබෙන ප්‍රශ්නය මතු කළ නිසාම මම අහන්නට කැමැති කාරණයක් තිබෙනවා. මේ ආණ්ඩුවට විශාල ජන වරමක් ලැබෙන විට ඒ සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවීම සහ ඖෂධවල මිල අඩු කිරීමත් බලපෑවා. දැන් එතැන බරපතළ ගැටුමක් මතු වෙලා තිබෙනවා. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපතිවරයා ඉල්ලා අස් වුණා. අපි පාර්ලිමේන්තුවේදී ඒ සම්බන්ධව ප්‍රශ්න කළා. නමුත් ඔබතුමා දන්නවා, ඖෂධවල මිල ජනතාවට දැනෙන මට්ටමකින් අඩු වෙලා නැති බව. ඕනෑම ඖෂධයක මිල මේ වන විට සියයට 30කින් 40කින් වැඩි වෙලා තිබෙනවා. පනත් කෙටුම්පතක් සම්මත කරලා අධිකාරියක් පිහිටුවලා අවුරුද්දකට වැඩි කාලයක් ගත වෙලා තිබුණත් ඇයි මේ ඖෂධ මිල පාලනය කර ගන්නට බැරි?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)
හොඳ ප්‍රශ්නයක්, ගරු මන්ත්‍රීතුමා. ඔතැනින්ම තමයි අර්බුදය ආරම්භ වුණේ. ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත මඟින් පොදු ජනතාව බලාපොරොත්තු වන එකම කාරණය ඖෂධ මිල අඩු වෙනවාද, නැද්ද කියන එකයි. ඒක තමයි මූලික වශයෙන්ම මහාචාර්ය සේනක බිබිලේ මහත්මයා බලාපොරොත්තු වුණේත්. ගුණාත්මක ඖෂධ සාධාරණ මිලකට ජනතාවට ලබාදීමයි එතුමා බලාපොරොත්තු වුණේ. ඖෂධ මිල අඩු කරන්නට පුළුවන්. මම ඒ සඳහා මුලින්ම ව්‍යූහ සූත්‍රයක් දුන්නා. ඒකට එකඟ වෙලා ගියා. නමුත් දැන් ඒගොල්ල වෙනම එකක් පටන් අරගෙන, ඖෂධයෙන් ඖෂධයට මිල නියම කරන ක්‍රමයක්. මම ඇහුවා, අපේ Flying Squad එක හෝ Food and Drug Inspector කෙනෙක් මේ ඖෂධ වර්ග හාර දහසම ඔළුවේ තියාගෙන හෝ කොළයක ලියාගෙන ගිහින් check කරන්නේ කොහොමද කියලා. ඒ සඳහා ක්‍රමවේදයක් තිබිය යුතුයි. අන්තිමට වෛද්‍ය පාලිත අබේකෝන් මැතිතුමා මේක පිළිගත්තා. එතුමා බොහොම ප්‍රායෝගික කෙනෙක්. මම එතුමාව තමයි මිල කමිටුවේ සභාපති ලෙස පත් කරලා තිබුණේ. එතුමා පිළිගෙන උපරිමය සියයට 85ක් කරන්නට එකඟ වුණා. මම හිටියේ සියයට 75 දක්වා අඩු කරන්නට ඕනෑ කියන තැන. ඖෂධ සමාගම්වල, Sri Lanka Chamber of the Pharmaceutical Industry එක හිටියේ ඊට වඩා වැඩි ගණනක. අපට මේ මිල එක ගණනකට ගෙනැල්ලා කොතැනින් හෝ මේක පටන් ගන්නට ඕනෑ වුණා. මෙතැනදී තමයි අර්බුදය ඇති වුණේ. මොකද, ඒ හිටපු කට්ටිය එකඟ වුණු පරිදි මිල අඩු කළේ නැහැ. දැන් ඒකෙන් වුණේ මොකක්ද? පසු ගිය දවස්වල මට බැන්නා.

තමුන්නාන්සේලාගේ පක්ෂයේ පත්තරයේත් එක එක ඒවා ලියවනවා. ඒකේ මොනවාද කියන්නේ? මේ ඖෂධ මාෆියාව කඩන්න හදපු නිසා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපතිතුමා අයින් කළාලු. දැන් අද ඖෂධ මාෆියාව කැඩෙනවා. පිළිකා රෝගය සඳහා ගෙන්වන බෙහෙත රුපියල් 280,000යි. බහු ජාතික සමාගමකින් මේක ගේන්නේ. මේ මාෆියාව කැඩීම සඳහා මම රුසියන් ඖෂධයක් ගෙනාවා. මොකද, මහාචාර්ය සේනක බිබිලේ එදා කිව්වේ ඖෂධවල මිල අඩු කරන්න නම් සමාජවාදී රටවලින් ඖෂධ ගේන්න කියලා. අද ඒ රටවල සමාජවාදය නැති වුණත් ඒ ඖෂධ හොඳ ප්‍රමිතියකට හෝ සාධාරණ මිලකට තිබෙනවා. අපි රුසියාවෙන් ඒ ඖෂධය ගෙනාවාම, -දැන් දවස් තුනකට ඉස්සෙල්ලා ටෙන්ඩර් එක තිබුණා- අපි මේ ඖෂධය තරගයට දැම්ම නිසා මොකක්ද වුණේ? ඒ ඖෂධයේ මිල ඒ අය රුපියල් 280,000 සිට රුපියල් 165,000 දක්වා අඩු කළා. නමුත් දෙවෙනි කෙනා ඉදිරිපත් කරන මිල රුපියල් 144,000යි. ඒ කියන්නේ, මිල බාගෙටම අඩු වුණා. මෙන්න මේක තමයි ඖෂධ මාෆියාව කඩනවා කියන්නේ. බොරුවට කයිවාරු ගහලා picket කරමින් boards ඇල්ලුවාට, articles ලිව්වාට මාෆියාවක් කැඩෙන්නේ නැහැ. අවුරුදු හතළිස් ගණනක් මෙහෙම තිබුණේ

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

නැහැ නේ. ඕස්ට්‍රේලියාවේ ඉඳලා ගෙනා එක එන්නතට රුපියල් 280,000යි. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, පිළිකාවට දෙන ඖෂධ මොනවාද කියා ඔබතුමා දන්නවා නේ.

තව බෙහෙතක් ආවා, එක බෙහෙත් පෙත්ත ඩොලර් 30යි. දෙවැනි එක්කෙනාව අප ඉදිරිපත් කළා. මේකට මාෆියාව කියන්නේ මොකද, එක ඖෂධයට එක සමාගමයි. ඒ අය කියන ගණනට අප ගන්නවා. ඕක තමයි තත්ත්වය. අප දෙවැනි එක්කෙනාව ඉදිරිපත් කළා. ඩොලර් 30ට quote කරපු එක්කෙනා දැන් මේ සැරේ කීයද දැම්මේ? ඒ බෙහෙතටම දැම්මේ ඩොලර් 3යි. ඩොලර් 3යි කියන්නේ, ඒකත් ලාභයක් ඇතිව නේ. මේක තමයි මාෆියාව. මේවා අප කැඩුවා. එකින් එක කඩනවා. ටෙන්ඩර් එකක් තිබුණා, එක සමාගමක් මේ ඖෂධයට මිලියනයයි ගණනක් ගන්න.

දෙවැනි එක මිලියන දෙකයි, ඊළඟ එක මිලියන තුනයි. හතරවැනි සමාගම මිලියන හැත්තෑඑකහමාරක් දමනවා. ඇයි? ඒකට විතරයි ලියා පදිංචිය. මම පුළුවන්තරම් කිව්වා ලියා පදිංචි වෙන්න කියා. නමුත්, ලියා පදිංචි වන්නේ නැහැ එක එක දේවල් කථා කරනවා. මම ටෙන්ඩර් එක නැවැත්තුවා. නවත්වලා MoU එක යටතේ බංග්ලාදේශයෙන් එම ඖෂධය ගෙනාවා. ඒකෙන් මම මිලියන 118ක් ඉතුරු කර ගත්තා. මේ බෙහෙත ගේන්න විතරක් ටෙන්ඩර් එකට රුපියල් මිලියන 1,200ක් දමලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. නමුත් මේ සැරේ වැය වන්නේ රුපියල් මිලියන 600යි. ඇයි? මේ මුදල හරියට භාගයකට අඩු වෙලා තිබෙනවා. දැන් මේවා කරන කොට කිසිම දෙයක් දන්නේ නැතිව, ප්‍රායෝගිකත්වයක් නැතිව ඔහේ ක්‍රියා කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් වෛද්‍යවරයෙක් නිසා ඔබතුමාට තේරෙනවා නේ, මේක කොහොමද කරන්නේ කියා.

අනෙක් කාරණය මේකයි. තව සතියකින් දෙකකින් අප ඖෂධ මිල අඩු කරනවා. ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරලා දැන් ක්‍රියාත්මක වෙනවා. අපේ Consumer Affairs Authority එක සමඟත් සාකච්ඡා කරගෙන අප කරන්නේ වෙන මොකක්වත් නොවෙයි, මේ අයට හොරකම් කරන්නේ නැතිව මේ දේවල් කරන්නයි අප කියන්නේ. CIF එකත් අප freeze කරනවා. ඒ තිබුණු CIF එක ඇරෙන්න ඒ අයට වැඩි CIF දමන්න බැහැ. මීට පසුව CIF වැඩි කරනවා නම් ඒ අය පෙන්වන්න ඕනෑ, ඒ රටේ බඩු මිල වැඩි වීමේ මෙන්න මෙහෙම ප්‍රවණතාවක් තිබෙනවා කියා. එහෙම නැත්නම් CIF දමන්න බැහැ. තව නොබෝ දිනකින් ලාභය එකතු කරලා ඉතාම අඩු මිලකට මේ රටේ අහිංසක ජනතාවට මුළු ඖෂධ ප්‍රමාණයම දෙන්න ලැහැස්ති කරනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඖෂධ කීපයක් සම්බන්ධයෙන් මිල පාලනය කිරීම සඳහා ගත්ත ප්‍රයත්නය ගැන ඔබතුමා සඳහන් කළ එක හොඳයි. නමුත්, මීට කලින් ඔය සියලු ජාවාරම් සිද්ධ වුණේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සැපයුම් අංශයත් සම්බන්ධ කරගෙනයි. දැන් යම් ඖෂධ ප්‍රමාණයක මිල අඩු කරලා රජයට යම් දෙයක් ඉතුරු කර දුන්නාට, මීට කලින් රජයේ මුදල්, ජනතාවගේ මුදල් තමයි මේ වංචාවට, දූෂණයට ලක් වෙලා තිබෙන්නේ. ඒ අයට විරුද්ධව අමාත්‍යාංශ මට්ටමින් අරගෙන තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය ඒවා සෙවීමේ ක්‍රමවේදයක් මොකුත් නැහැ, ඒවා සිදු වෙලා ඉවරයි. දැනට අප මේ ක්‍රමවේදය යටතේ මේ දේවල් නවත්වලා තිබෙනවා. හැම තැනකදීම විශේෂයෙන්ම රාජ්‍ය ඖෂධ සංස්ථාවේ අලුත් පාලනාධිකාරිය මේ පිළිබඳව ඉතාම අවබෝධයෙන් වැඩ කරලා ඒකෙදි අවශ්‍ය නියෝග මගෙන් ලබා ගනිමින් මේ තිබෙන සෙල්ලම නවත්වලා තිබෙනවා. මේකට විතරක් නොවෙයි, උපකරණ ගෙන්වීමේදීත් විශාල වංචා සිදුවෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දන්නවා, පිළිකා රෝගීන් සඳහා අවශ්‍ය linear accelerators සම්බන්ධව. ඒවා ගෙන්වීමදී වංචා සිදු කර තිබෙනවා. මට එහෙන් කථා කරලා කිව්වා "මේ ටෙන්ඩර් එකෙන් ඩොලර් මිලියන 4ක් අඩු කරන්නම්, මේවා තමයි අප දුන්න කොමිස් මුදල්" කියා. ඔවුන්ගෙන් කොමිස් මුදල් ගත්ත විශේෂඥ වෛද්‍යවරුන්ගේ නම් කියන කොට මට පුදුම හිතුණා. Project Managerගේ නමත් කිව්වා. ඒ Project Managerව මම අයින් කළා. ඒ අයම තමයි පුවත් පත්වලට කියන්නේ, "මේවා පුස් කනවා" කියා. ඒ අයට පුස් කන එක අමාරුයි. මොකද, එක මැෂින් එකට ඩොලර් 75,000 ගෙවා තිබෙනවා. මේවා එකින් එක අරගෙන අප මර්දනය කරන්න ඕනෑ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, ඒ වාගේ දෙවල් තව හෙළිදරවු කරන්න ඕනෑ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්, නම් ගම් නැතිව හෙළිදරවු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

දෙවැනි වටය. ප්‍රශ්න අංක 3-660/'16-(1), ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය.

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)
Sir, on behalf of the Hon. (Mrs.) Hirunika Premachandra, I ask that Question.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Mr. Speaker, on behalf of the Minister of Education, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளை யிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6-718/'16-(1), ගරු ඉෂාක් රහුමාන් මහතා.

ගරු (මහාචාර්ය) ආෂු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Mr. Speaker, on behalf of the Minister of Education, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7-722/'16-(1), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Mr. Speaker, on behalf of the Minister of Agriculture, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පානීය ජල ප්‍රශ්නය : විසඳුම්
அனுராதபுர மாவட்ட குடிநீர்ப் பிரச்சினை : தீர்வு
DRINKING WATER PROBLEM IN ANURADHAPURA DISTRICT: SOLUTIONS

719/'16

12. ගරු (මහාචාර්ය) ආෂු මාරසිංහ මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)
(The Hon. (Prof.) Ashu Marasinghe on behalf of the Hon. Ishak Rahuman)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශාල ගැටලුවක්ව පවතින පානීය ජල ප්‍රශ්නය විසඳීම සඳහා රජය මහා පරිමාණ පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කළද ඒවායින් ප්‍රමාණවත් ප්‍රයෝජනයක් නොලැබුණු බවත්;

(ii) මෙම දිස්ත්‍රික්කයේ 25,000කට අධික පිරිසක් වකුගඩු රෝගයෙන් පෙළෙන අතර ඒ අතරින් 11,000ක පිරිසක් මාරාන්තික තත්ත්වයෙන් තමන්ගේ ජීවිතය ගෙවන බවත්;

(iii) පානීය ජලයට කැඩ්මියම් වැනි රසායනික ද්‍රව්‍ය මිශ්‍ර වීම හේතුවෙන් මෙවැනි රෝග තත්ත්වයන් ඇතිවන බවත්;

(iv) වකුගඩු රෝගය වැළැක්වීමේ අරමුණින් මේ වනවිට සවිකර ඇති ජලය පිරිසිදු කරන යන්ත්‍ර ප්‍රමාණවත් නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පානීය ජල ප්‍රශ්නය පවතින ප්‍රදේශවලට පානීය ජලය ලබාදීමට නව වැඩසටහන් ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) රෝගීන් බහුල වශයෙන් ජීවත්වන ප්‍රදේශවලට ජලය පිරිසිදු කරන යන්ත්‍ර ලබාදෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அனுராதபுரம் மாவட்டத்தில் பெரும் பிரச்சினையாக காணப்படுகின்ற குடிநீர்ப் பிரச்சினையைத் தீர்ப்பதற்கு அரசாங்கம் பாரிய அளவிலான நீர் வழங்கும் திட்டங்களைச் செயற்படுத்திய போதிலும் அவற்றினால் போதியளவு பயன் கிடைக்கவில்லை என்பதையும்;

(ii) இம்மாவட்டத்தில் 25,000 க்கும் மேற்பட்டவர்கள் சிறுநீரக நோயினால் பாதிக்கப்பட்டுள்ளனர் என்பதுடன் இவர்களில் 11,000 பேர் மரணத்தை அண்மிய நிலையில் தமது வாழ்க்கையைக் கழித்து வருகின்றனர் என்பதையும்;

(iii) குடிநீரில் கட்மியம் போன்ற இரசாயனப் பொருட்கள் கலந்துள்ளமையால் இவ்வாறான நோய் நிலைமைகள் ஏற்படுகின்றன என்பதையும்;

(iv) சிறுநீரக நோயைத் தடுக்கும் நோக்கத்துடன் ஏற்கெனவே பொருத்தப்பட்டுள்ள நீர் சுத்திகரிக்கும் இயந்திரங்கள் போதியதாக இல்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) குடிநீர்ப் பிரச்சினை நிலவும் பிரதேசங்களுக்கு குடிநீர் வழங்குவதற்கான புதிய நிகழ்ச்சித் திட்டங்களை ஆரம்பிப்பாரா;

(ii) ஆமெனில், அது எத்திகதியில்;

(iii) நோயாளிகள் பரவலாக வாழும் பிரதேசங்களுக்கு நீர் சுத்திகரிக்கும் இயந்திரங்கள் வழங்கப்படும் திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

asked the Minister of City Planning and Water Supply:

(a) Is he aware that -

(i) although mass-scale drinking water supply projects have been implemented by the Government to solve the drinking water problem, one of the serious problems in the Anuradhapura District, those have not yielded the expected results;

(ii) over 25,000 people in this district suffer from chronic kidney disease and 11,000 of them lead their lives in fatal condition;

(iii) diseases of this type occur as a result of chemicals such as cadmium mixing with drinking water; and

(iv) the water purifiers installed at present with a view to combatting chronic kidney disease are not sufficient?

(b) Will he inform this House -

(i) whether a new programme would be implemented to provide drinking water to the areas affected by the drinking water problem;

(ii) if so, the date it will be implemented; and

(iii) the date when water purifiers would be provided to the areas where chronic kidney disease patients are found in abundance?

(c) If not, why?

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)

(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சர்)

(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

**Answer tabled:*

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සිදු කරන ලද පානීය ජල සම්පාදන ව්‍යාපෘතිද සමඟින් මේ වන විට අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ජල සම්පාදන සම්බන්ධතා 74,674ක පමණ ප්‍රමාණයක් ලබාදීමට හැකිවී ඇත. මේ මඟින් 373,370ක ජනගහනයකට පිරිසිදු පානීය ජලය ලබාදීමට හැකිවී ඇත.

(ii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ මේ වනවිට 14,637ක ප්‍රමාණයකට වකුගඩු රෝගී තත්ත්වය වැලඳී ඇති බව සෞඛ්‍ය අංශය මඟින් තහවුරු කරගෙන ඇත.

(iii) මෙවැනි හදුනා නොගත් වකුගඩු රෝගය සඳහා බොහෝ කරුණු බලපාන බවත් ඒ අතරින් පානීය ජලයට බැර ලෝහ මිශ්‍රවීම එක් කරුණක් වශයෙන් විශේෂඥ වෛද්‍යවරු හඳුන්වා දී ඇත. මෙයට අමතරව තවත් බොහෝ සෞඛ්‍යමය හා සමාජයීය කරුණු මෙම රෝගය සඳහා බලපානු ඇත.

(iv) වකුගඩු රෝගය පාලනය කිරීමේ අරමුණින් එම රෝගය ව්‍යාප්තව ඇති ප්‍රදේශවල නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය මඟින් 2013 වර්ෂයේ සිට ජල පිරිපහදු යන්ත්‍ර සවි කර ඇති අතර, මේ වනවිට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය මඟින් පමණක් ජල පිරිපහදු යන්ත්‍ර 34ක් සවි කර ඇත. එමෙන්ම 2016/2017 වර්ෂ තුළදී ජල පිරිපහදු යන්ත්‍ර 84ක් සවි කිරීමට නියමිතය. මීට අමතරව ජනාධිපති කාර්ය සාධක බලකාය උතුරුමැද පළාත් සභාව හා පෞද්ගලික අංශ මැදිහත්ව මේ වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ පමණක් ජල පිරිපහදු යන්ත්‍ර 70ක් සවි කර ඇත.

(ආ) (i) ඔව්.

(ii)

අංකය	ව්‍යාපෘතිය	ව්‍යාපෘති කාලය
01	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර I (JICA ආධාර යටතේ)	2016-2019
02	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර II (JICA ආධාර යටතේ)	2017-2021
03	අනුරාධපුර දකුණ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	2017-2012
04	විසල් අනුරාධපුර උතුර හා ත්‍රිකුණාමල ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය (Australian ආධාර යටතේ)	2017-2021
05	එප්පාවල, රාජාංගනය, නොච්චියාගම හා ගිරිබාව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	2017-2021
06	තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය (චීන ණය ආධාර යටතේ)	2017-2021

(iii)

අංක	ලබාදුන්/ලබාදෙන වර්ෂය	ලබාදුන් මුළු යන්ත්‍ර ප්‍රමාණය/ ජාජසම මඟින් පමණක් ලබාදෙන යන්ත්‍ර ප්‍රමාණය
01	2013	05
02	2014	06
03	2015	50
04	2016 මේ වන විට	62
05	2017	50

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ප්‍රශ්න අංක 13-723/'16 -(1), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා

(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)

(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු කථානායකතුමනි, ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)

(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න. ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

වන්නේරිකුලම් බැම්ම ප්‍රතිසංස්කරණය
வன்னேரிக்குள அணைக்கட்டைப் புனரமைத்தல்
RENOVATION OF VANNERIKULAM ANICUT

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ சபாநாயகர் அவர்களே, கிளிநொச்சி மாவட்டத்தில் கிளிநொச்சி நகரிலிருந்து 24 கிலோமீற்றர் தூரத்தில் வன்னேரிக்குளம் கிராமம் அமைந்துள்ளது. இங்கு வாழும் 458 குடும்பங்களைச் சேர்ந்த சுமார் 1,658 பேரில் பெரும்பாலானவர்கள் விவசாயத்தைத் தங்களது வாழ்வாதாரமாகக் கொண்டவர்கள். இங்கு மண்டைக்கல்லாற்றுப் படுக்கையின் கீழ் உருவாக்கப்பட்ட வன்னேரிக்குளம், தேவன்குளம் ஆகியவற்றை ஒன்றிணைத்துக் கட்டப்பட்ட 1,713 ஏக்கர் அடி நீரைக் கொள்ளளவாகக் கொண்ட வன்னேரிக்குளமானது, பிரதான நீர் வழங்கும் மூலமாகக் காணப்படுகிறது. இதன்கீழ் 120 பயனாளிகள் தலா மூன்று ஏக்கர் வீதம் 360 ஏக்கரில் நெற்பயிர்ச் செய்கையில் ஈடுபட்டு வருகின்றனர்.

மேற்படி குளத்தை உரிய வகையில் புனரமைப்புச் செய்யாமையாலும் உவர் நீர் உட்புகுவதாலும் பாரிய அளவிலான விவசாய நிலம் கைவிடப்பட்ட நிலையில் காணப்படுகின்றது. இந்நிலையில் வன்னேரிக்குளத்தின் அணைக்கட்டினைப் புனரமைப்புச் செய்து, இக்குளத்துக்கு நீரைக் கொண்டு செல்லும் வாய்க்கால்கள் மற்றும் நீர்க் கட்டமைப்பை அபிவிருத்தி செய்வதன்மூலமும் வன்னேரிக் குஞ்சுக்குளம், திக்காய்க்குளம் என்பவற்றைச் சூழப் பாரிய அளவிலான உவர்நீர்த் தடுப்பு அணையை அமைப்பதன்மூலமும் தற்போது கைவிடப்பட்டுள்ள 1,200 ஏக்கர் நிலத்தில் பயிர்ச்செய்கையை மேற்கொள்ளமுடியும். இதன்மூலம் இப்பகுதியில் விவசாயச் செய்கையை மேலும் அதிகரிப்பதனூடாகக் கிராமியப் பொருளாதாரத்தை வளர்ச்சியடையச் செய்யலாம். அதனூடாக தேசியப் பொருளாதாரத்துக்கும் சிறந்த பங்களிப்பினை வழங்கமுடியும் என்பதோடு, இப்பகுதியில் காணப்படும் நீர்ப் பிரச்சினையையும் தீர்க்கமுடியும். ஆகவே, -

வன்னேரிக் குளத்தின் அணைக்கட்டினைப் புனரமைப் புச்செய்து, இக்கிராமத்து நிலங்களில் உவர் நீர் உட்புகாதவாறு தடுப்பு அணையொன்றை அமைக்க நடவடிக்கை எடுக்கமுடியுமா?

கௌரவ சபாநாயகர் அவர்களே, மேற்படி எனது வினாவுக்கு விடையளிக்கச் சம்பந்தப்பட்ட அமைச்சர் இங்கு இருப்பதாகத் தெரியவில்லை. அரச தரப்பிலிருந்து -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the House, what do you plan to do regarding this Question?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We will answer that tomorrow, Sir.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Also with regard to a preveious Question I had raised, the Hon. Minister said that the Answer would be given the following day. But, no reply has been given.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Yes, I know that you have raised four Questions, which have to be answered.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Have those Questions been asked from the same Minister or from different Ministers?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
From different Ministers.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
So far, I have asked five or six Questions, which have not been answered.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Five Answers are to be given by five Hon. Ministers.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the House, kindly ensure that those Questions are replied with at the next Sitting week.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I will remind the relevant Ministers.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Otherwise, it is not fair by him.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I know, Sir.

II

2015 වර්ෂයේ විශ්‍රාම වැටුප් සැකසිමේදී සිදු වී ඇති විෂමතා

2015 இல் ஓய்வூதியக் கணிப்பீட்டின்போதான முரண்பாடுகள்

ANOMALIES OCCURRED IN CALCULATION OF PENSIONS IN 2015

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23 (2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ වැටුප් සංශෝධනය හේතුවෙන් 2015 වර්ෂය තුළ විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයින්ට විශ්‍රාම වැටුප් සැකසීමේදී සිදුවී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

වසර ගණනාවක් රජයේ හෝ පෞද්ගලික අංශයේ සේවය කොට විශ්‍රාම ලබා ජීවිතයේ සැඳෑ සුවය විඳින්නවුන් සමාජයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ලෙස බුහුමනට පාත්‍ර වෙනවා. ඒ, ඔවුන් විසින් මේ රටට තමන්ගේ ශක්ති පමණින් ඉටු කරන ලද සේවයට ඇගයීමක් ලෙසයි. මෙයින් රජයේ සේවකයන්ව සිට විශ්‍රාම ලැබූවන්ට රජය විසින් මාසිකව ලබා දෙන විශ්‍රාම වැටුප ඔවුන්ගේ ජීවිතයේ ප්‍රධාන සහ බොහෝ විට එකම ආදායම් මාර්ගයයි. එබැවින් ඔවුන් ඒ පිළිබඳව බොහෝ සෙයින් සැලකිලිමත් වෙනවා.

ආණ්ඩුව විසින් 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ වැටුප් සංශෝධන හේතුවෙන් 2015.01.01 දින සිට 2015.12.31 දක්වා කාලය තුළ විශ්‍රාම ලැබූ රාජ්‍ය සේවකයන් අසාධාරණයකට ලක් වී තිබෙනවා. මේ අනුව 2015 වර්ෂය තුළ ඔවුන් ලැබූ දීමනා සහිත වැටුප් වැඩිවීම 2016 වර්ෂයේ සිට ඔවුන් ලබන විශ්‍රාම වැටුපට අදාළ නොවීම හේතුවෙන් ඔවුන් බලවත් ආර්ථික පීඩාවකට ලක්ව සිටිනවා. මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු ගරු ඇමතිතුමා පිළිතුරු දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

(1) 24/2014 අංක දරන, 2014.11.12 දිනැති චක්‍රලේඛය සහ 24/2014(1) අංක දරන 2014.12.31 දිනැති චක්‍රලේඛය යන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් දක්වා ඇති පරිදි 2015 අය වැය මඟින් යෝජිත නව වැටුප් ව්‍යුහය 2015.01.01 දින සිට ක්‍රියාත්මක කළ යුතු බව දක්වා තිබෙනවා. චක්‍රලේඛයේ එහෙමයි තිබෙන්නේ.

2015 අය වැයෙන් යෝජිත පරිදි රාජ්‍ය සේවකයන්ගේ අවම මූලික වැටුප මසකට රුපියල් 15,000ක්ද, ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 10,000ක්ද ඇතුළත් වන නව වැටුප් චක්‍රලේඛය 2015.01.01 දින සිට ක්‍රියාත්මකවන පරිදි නිකුත් කෙරේ. මේ චක්‍රලේඛය 2015.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි නිකුත්කර තිබෙන්නේ. හැබැයි, ඔබතුමාත් දන්නවා. වැටුප් වැඩිවීම සිදු වුණේ පසුව. මෙහිම කියනවා, "එම නව වැටුප් චක්‍රලේඛයේ සඳහන් වැටුප් හා දීමනා මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා...." කියා. ක්‍රියාත්මක වන ආකාරයක් ගැන කියනවා. ඔබතුමා ඒක දැක්කා.

24/2014 අංක දරන 2014.11.12 දිනැති චක්‍රලේඛය සහ 24/2014(1) අංක දරන චක්‍රලේඛවල පැහැදිලිව සඳහන් කර තිබෙනවා.

එහෙත් 03/2016 අංක දරන 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් 2015ට අදාළ දීමනා ඇතුළත් නව වැටුප් ව්‍යුහය 2016.01.01 දින සිට ක්‍රියාත්මක වන බව ප්‍රකාශයට පත් කර තිබෙනවා. මා ළඟ එම චක්‍රලේඛය තිබෙනවා. කලින් චක්‍රලේඛයෙන් කියනවා, මෙම වැටුප් වැඩි වීම - ඒ අලුත් වැටුප් වර්ධනය- 2015.01.01 සිට ක්‍රියාත්මක වෙනවා. නමුත් එය සකස් කොට අවසන් වන තෙක් අන්තර් දීමනාවක් ලබා දෙනවා කියා. එතකොට ගරු කථානායකතුමනි, නව වැටුප් ව්‍යුහය වලංගු වෙන්නේ, 2015.01.01 සිට. චක්‍රලේඛය අනුව. නමුත් අලුත් චක්‍රලේඛයේ කියනවා මෙහෙම;

2016.06.23වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2016 සහ ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන යටතේ රාජ්‍ය සේවයේ තනතුරු සඳහා ක්‍රියාත්මකවන නව වැටුප් පරිමාණයන් වෙනුවට මෙම චක්‍රලේඛයේ උපලේඛන 1හි සඳහන් වැටුප් පරිමාණයන් 2016.01.01 සිට අදියර පහකින් ක්‍රියාත්මක වෙනවාය කියා. එතකොට පළමුවෙනි එකේදි කියනවා, මෙම වැටුප් වර්ධනය 2015.01.01 සිට වලංගුයි. නමුත් එදා වැටුප් වැඩි වෙන්නේ නැහැ. අන්තර් දීමනාවක් ලබා දෙනවා. නමුත් වැටුප් සංශෝධනය කර ඊට පසු චක්‍රලේඛයෙන් කියනවා, "වැටුප් වැඩිවීම් වලංගු වෙන්නේ 2016.01.01 දින සිට" කියා. ඒකෙන් සිද්ධ වන දේ තමයි ගරු ඇමතිතුමනි, ඒ කාලය තුළ අන්තර් දීමනාවන් වැටුප් වර්ධකය තුළ ඇතුළත් වෙලා නැති නිසා විශ්‍රාම වැටුප් ගණනයේදී 2015 දෙසැම්බර් 31 දින දක්වා විශ්‍රාම ගිය අය විශාල අසාධාරණයකට ලක් වෙලා තිබෙන එක. මෙමඟින් 2015.01.01 සිට 2015.12.31 දක්වා කාලය තුළ විශ්‍රාම ලැබූ රජයේ සේවකයන්ට අසාධාරණයක් සිදු වී ඇති බව ඔබතුමා පිළිගන්නවාද?

(2) 05/2015 අංක දරන 2015.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව 2015 වර්ෂයේදී රාජ්‍ය සේවයේ නිරතව සිටි, පසුව විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයින් සඳහා රුපියල් 10,000ක දීමනාවද, මූලික වැටුපෙන් සියයට 20ක දීමනාවද 2015 වසර තුළ දීමනා වශයෙන් ගෙවනු ලැබුවා. ඉහත සඳහන් කළ රුපියල් 10,000ක අන්තර් දීමනාව සහ සියයට 20ක දීමනාව පදනම් කර ගෙන 03/2016 නව වැටුප් ව්‍යුහය සකස් කොට තිබෙනවා. එබැවින් 2015 තුළ විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන්ටද එම වැටුප් ව්‍යුහයට අනුව විශ්‍රාම වැටුප් ගණනය කිරීමට කටයුතු කරන්නේද?

මොකද, 2015 තුළ ඔවුන්ට අන්තර් දීමනාවක් ලැබෙනවා, මෙය ක්‍රියාත්මක වන තෙක් කියලා. ඔවුන්ට ඒ දීමනාව නොලැබෙන තත්ත්වයක් තමයි දැන් මතු වෙලා තිබෙන්නේ.

(3) ඉහත කරුණු අනුව 2015 වර්ෂයේ රාජ්‍ය සේවක විශ්‍රාමිකයින් සඳහා හිමිකමක්ව පැවැති නමුත් ඔවුනට අහිමි වී ගිය වැටුප් සංශෝධනය හේතුවෙන් 2015 වර්ෂයේ විශ්‍රාමික රජයේ නිලධාරියකු ලබන විශ්‍රාම වැටුප හා ඔහුට හිමි විය යුතු විශ්‍රාම වැටුප අතර වෙනස රු.30,000/- සිට රු. 75,000/- දක්වා වූ පරාසයක් තුළ පවතිනවා ගරු ඇමතිතුමනි.

(4) 2015 වර්ෂය තුළ විශ්‍රාම ලැබූ රාජ්‍ය සේවකයන්ට ඉහත ආකාරයේ විශ්‍රාම වැටුප් විෂමතාවක් නිර්මාණය කරමින් බලවත් අසාධාරණයක් සිදු කළ 03/2016 චක්‍රලේඛය 2015 වර්ෂයේ විශ්‍රාම ලැබූවන්ද ඇතුළත් වන පරිදි බලාත්මක කිරීමට කටයුතු කරනවා ද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

(1) ගරු කථානායකතුමනි, 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/2014 සහ 2014.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2014 (1) නිකුත් කරන ලද්දේ පෙර පැවැති රජය විසිනි. 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අය වැය යෝජනා අනුවය. එහි සඳහන් පරිදි නව වැටුප් ව්‍යුහයක් 2015.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට හා එතෙක් සියලු රාජ්‍ය නිලධාරීන්ට රුපියල් 3000ක මාසික අන්තර් දීමනාවක් ලබා දීමට යෝජනා වුවද, - ඒ යෝජනාව කර තිබෙන්නේ 2014 එවකට තිබුණු ආණ්ඩුවයි.- පැවැති රජය 2015 ජනවාරි 08වැනි දින වෙනස් වීමෙන් පසුව ඉදිරිපත් කරන ලද අතුරු අය වැය යෝජනා අනුව මුලින් සඳහන් කළ පෙර රජයේ අය වැය යෝජනාවට වඩා වැඩි ප්‍රතිලාභයක් රාජ්‍ය නිලධාරීන්ට ලබා දීමට යෝජනා වූ අතර - රුපියල් 3,000 වෙනුවට රුපියල් 10,000ක්- එම අතුරු අය වැය යෝජනාව තුළ නව වැටුප් ව්‍යුහය ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද්දේ 2016.01.01 දින සිටය. ඒ කියන්නේ 2015 අපේ අලුත් ආණ්ඩුව දුන්න රුපියල් 10,000 දීමනාව වැටුපට ඇතුළත් කිරීම සඳහා 2016.01.01 දින තමයි තීරණය කර තිබෙන්නේ. ඒ අනුව 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 නිකුත් කරන ලද අතර එම චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ එහි සඳහන් යෝජනා රාජ්‍ය සේවයට අදාළ වූ අතර, ඊට පෙර පැවැති රජය විසින් ඉදිරිපත් කරන ලද රජයේ සේවක වැටුප් සම්බන්ධ අය වැය යෝජනාව සංශෝධනය විය. ගරු මන්ත්‍රීතුමනි, ඒකෙන් කියැවෙන්නේ 2014 නිකුත් කළ චක්‍රලේඛය වෙනුවට අපි මේ අලුත් චක්‍රලේඛය නිකුත් කර තිබෙන බවයි.

(2) රජයේ සේවයේ සෑම වැටුප් සංශෝධනයක්ම ක්‍රියාත්මක කිරීමේදී එය ක්‍රියාත්මක කරන දිනයක් තීරණය කරන අතර, එදිනට පෙර විශ්‍රාම ලැබූ රාජ්‍ය නිලධාරීන්ට එම සංශෝධනයේ ප්‍රතිලාභ හිමි නොවීම සාමාන්‍ය කරුණකි. ඒ කියන්නේ වැටුප් වැඩි වුණාම ඊට කලින් අවුරුද්දේ විශ්‍රාම යන අයට ඒක ලැබෙන්නේ නැහැ. එහෙත් සිදු කරන ලද සියලු විශ්‍රාම වැටුප් සංශෝධනවලදී එම තත්ත්වයන් යම් පමණක් ඉවත් කිරීම ක්‍රියාත්මක කිරීම කළා. උදාහරණයක් විධියට 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006හි සංශෝධනය අනුව සිදු කළ රජයේ සේවයේ විශ්‍රාම වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප් සංශෝධනයක් - 2006 සංශෝධනයට අදාළ සංශෝධනයක්- 2015.06.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2015 මඟින් සිදු කරන ලදී. එවකට රාජ්‍ය පරිපාලන ඇමතිවරයා වූයේ වර්තමාන ගරු කථානායකතුමා ය. නැවත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 මඟින් රජයේ නිලධාරීන්ගේ වැටුප් වැඩිවීමට අදාළව 2016.01.01 දිනට පෙර විශ්‍රාම ගත් නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමට අදාළව ඉදිරියේදී රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයක් මඟින් සිදු කළ හැක.

ඒකට අපට තිබෙනවා, පූර්වාදර්ශයක්. ඒක 2015දී කළා. තවද, 2016.01.01 දිනෙන් විශ්‍රාම ගන්නා නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප සැකසීමේදී, එම නිලධාරීන් 2015.12.31 දිනට ලබා ගත් වැටුපට 2011.12.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 31/2011 සහ 2012.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2012 අනුව ගෙවනු ලබන විශ්‍රාම වැටුප් රහිත විශේෂ දීමනාව - සියයට 20 දීමනාව - 2015.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2015 අනුව ගෙවනු ලබන රුපියල් 10,000ක අන්තර් දීමනාව ද සම්පූර්ණයෙන් අදාළ කර නොගැනේ. 2016.01.01 දිනෙන් පසුව සහ 2020.01.02 දින දක්වා විශ්‍රාම ගන්නා නිලධාරීන්ගේ වැටුපටද එම මුදල එකතු වන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2006හි දක්වා ඇති පරිදි අදියර 5ක් යටතේ ය. ගරු කථානායකතුමනි, 2016 සිට 2020 දක්වා අදියර 5කින් තමයි 2,500 අවමයේ සිට 10,000 දක්වා වූ දීමනාව එකතු වෙන්නේ. අනිත් ශ්‍රේණිවලට ඊට වඩා වෙනස් වනවා.

(3). රාජ්‍ය සේවයේ විශ්‍රාම ලබන ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප් ගණනය කරනු ලබන්නේ එම නිලධාරියා විසින් අවසන් වරට ලැබූ වැටුප සහ සේවය කර ඇති කාලය පදනම් කරගෙනය. නව රජය විසින් පූර්ව රජයේ අය වැය යෝජනා වෙනුවට නව යෝජනා 2016.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට තීරණය කිරීමත් සමඟ එම ක්‍රියාත්මක දිනට පෙර විශ්‍රාම ගිය සහ එම ක්‍රියාත්මක දිනට පසුව විශ්‍රාම ලබන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප අතර යම් වෙනසක් තිබිය හැක. එය සමස්ත රාජ්‍ය සේවයටම සිදු කරනවා නම්, වැටුප් සංශෝධනයකදී සිදුවන පොදු තත්ත්වයකි.

(4) රජයේ සේවයෙන් විශ්‍රාම ලබන ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුප් ගණනය කරනු ලබන්නේ, එම නිලධාරියා අවසන්වරට ලැබූ වැටුප සහ සේවය කර ඇති කාලය පදනම් කරගෙන ය. ඒ අනුව, යම් නිලධාරින් දෙදෙනෙකු වෙනස් දිනයන් දෙකකදී විශ්‍රාම ලැබීම නිසා විශ්‍රාම වැටුපේ යම් වෙනසක් ඇති වීම විශ්‍රාම වැටුප් විෂමතාවක් ලෙස සැලකිය නොහැක. ඒත් අතීතයේ සිට රජයේ සේවයේ වැටුප් සංශෝධන සිදු වූ සෑම අවස්ථාවකදීම රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත, පසු අවස්ථාවකදි එම විශ්‍රාමිකයන් සඳහාද යම් විශ්‍රාම වැටුප් ගැළපීමක් ලබා දී ඇත. ආසන්නතම උදාහරණය, 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 සහ එහි සංශෝධනය අනුව සිදු වූ, රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සංශෝධනයට අනුකූලව 2015.06.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2015 මඟින් සහනයක් ලබා දී ඇත. ඒ අපේ ගරු කථානායකතුමා රාජ්‍ය පරිපාලන ඇමතිවරයා විධියට සිටිද්දීයි.

එපරිදිම, 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව විශ්‍රාම වැටුප් ගැළපීමක් අනාගතයේදී රජයක් විසිනු ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයක් මත සිදු කළ හැක.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා නිවැරදියි. ඒ කියන්නේ, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි වීමක් සිද්ධ වුණාම අනිවාර්යයෙන්ම විශ්‍රාම වැටුපේ විෂමතාවක් හදනවා. 2006දීත් ඒක වුණා. 1996දී ගුරු සේවා ව්‍යවස්ථාව හදලා වැටුප් වර්ධනයක් ඇති වුණු අවස්ථාවේදීත් ඒක සිද්ධ වුණා. එම ඇති වන විෂමතාව අවම කිරීම

[ගරු අනුර දිසානායක මහතා]

සඳහා රජය යම් ප්‍රතිපත්තියක් අරගෙන, තීරණයක් ගත යුතුයි. ඔබතුමා කිව්වා, "2006 ඇති වුණු වැටුප් විෂමතාව 2015දී අවම කළා" කියලා.

දැන් මෙතැන තිබෙන්නේ ඊට වඩා විශේෂ තත්ත්වයක්. මම මේ කියන්නේ, 2014 විශ්‍රාම ගිය අය ගැන නොවෙයි; 2013 විශ්‍රාම ගිය අය ගැන නොවෙයි. ඔවුන්ට අර පොදු විෂමතාව හදනවා. හැබැයි, 2015 විශ්‍රාම ගිය අයට විශේෂත්වයක් වන්නේ මෙහෙමයි. -ආණ්ඩු මාරු වුණු එක ඇත්ත.- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරනවා, 2014.12.24 දිනැතිව චක්‍රලේඛය. ඒ චක්‍රලේඛයේ පැහැදිලි ලෙස කියනවා, "මේ වැටුප් වර්ධනය 2015.01.01 සිට බල පවත්වනවා. ඒ දක්වා අන්තර්කාලීන දීමනාවක් ලබා දෙනවා. නමුත්, මේක ගැළපුවාට පස්සේ මූලික වැටුපට එකතු වනවා" කියලා. ඒක තමයි පළමුවෙනි චක්‍රලේඛනය. ඔබතුමන්ලා නැවත අය වැය ලේඛනයක් ඉදිරිපත් කරලා කියනවා, වැටුප් වැඩිවීම වලංගු වන්නේ 2016.01.01 දින සිට කියලා. හැබැයි ගරු ඇමතිතුමනි, අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්ම එම දිනට පෙර චක්‍රලේඛය නිකුත් කර තිබෙනවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපි එහි වෙනස්වීම් කරලා තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඔබතුමන්ලා වැටුප් වර්ධනයේ සීමාවන් වෙනස් කළා. ඒ කියන්නේ දීමනාව, වැටුප් වර්ධනය වෙනස් කළා. ඒක ඇත්ත. හැබැයි, ඒක වෙනස් කළාට වැටුප් වර්ධනයක් සිදු වුණා. ඒ සිදුවීම 2015.01.01 දින සිට බලපවත්වන පරිදි කියා තමයි පළමුවෙනි ගැසට් නිවේදනයේ තිබෙන්නේ. මොකද, සමහර අයට මෙම දීමනාව අතට හම්බ වුණා. 2010න් පසුව විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන්ට මේ දීමනාව හම්බ වුණේ නැහැ. 2015න් පසුව විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන්ට මෙය දීමනාවක් ලෙස හම්බ වුණා. නමුත්, ඔබතුමන්ලා රාජ්‍ය සේවකයාගේ මූලික වැටුපට මෙම දීමනාව ගණනය කරන්නේ, 2016.01.01 දින සිට කියලා සඳහන් වෙනවා. රාජ්‍ය සේවකයාට දීමනාවක් ලෙස හම්බ වුණු, එහෙත් මූලික වැටුපට ඇතුළත් නොවුණු මෙම දීමනාව 2015.01.01 සිට මූලික වැටුපට එකතු කර ගණනය කිරීමක් කරනවා කියලා චක්‍රලේඛයක් නිකුත් කර තිබියදී තමයි මේ විශේෂ අවස්ථාව සකස් වෙලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මේ සිදු වෙලා තිබෙන්නේ පොදුවේ වැටුප් වර්ධනයක් ඇති වුණාම ඇති වන තත්ත්වය නොවෙයි. මෙතැන වසරක විශේෂ තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා පොදුවේ ඇති වෙන තත්ත්වය සමනය කිරීම සඳහා ඔබතුමන්ලා තීරණයක් අරගෙන රජයේ අය වැය ලේඛනයෙන් හෝ එය ඉදිරිපත් කරන්න. ඒක වෙනම කරුණක්. හැබැයි, මේ ඇති වෙලා තිබෙන විශේෂ තත්ත්වයට ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් මැදිහත් වී එම අයට යම් සාධාරණයක් ඉටු කිරීමේ හැකියාව තිබෙනවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, 24/2014 සහ 24/2014(I) කියන චක්‍රලේඛ දෙක අනුව 2014 අන්තිමට ඉදිරිපත් කරපු 2015 වර්ෂය සඳහා වූ අය වැය පදනම් කරගෙන තමයි එම රුපියල් 3,000 අන්තර් දීමනාව දුන්නේ. නමුත්, අපි 2015 ජනවාරි 08 වෙනිදා බලයට පත් වෙලා නැවත අතුරු අය වැයක් මඟින් එය සංශෝධනය කළා; රුපියල් 10,000ක් දුන්නා. එතකොට, 24/2014 චක්‍රලේඛය හා 24/2014(I) කියන චක්‍රලේඛය මෙයට අදාළ වන්නේ නැහැ. මොකද, අපේ අය වැයේ අලුත් සංශෝධනයත් එක්ක, -අතුරු අය වැයත් එක්ක- ඒක වෙනස් වුණා. මේක විතරක් නොවෙයි ගරු මන්ත්‍රීතුමනි, සියයට 20 දීමනාවත් -සියයට 5 බැගින් දෙවරකුත්, සියයට 10ක් ලෙසත්- වැඩි වුණා. ඒකත් වැටුප් වැඩිවීමට එකතු වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා 2014 සහ 2015 චක්‍රලේඛ සම්බන්ධයෙන් තර්කය ගෙන එනවා නම්, 2012 වර්ෂයේ සිටම මෙය වෙනස් වෙන්න ඕනෑ. එහෙම ප්‍රශ්නයකුත් තිබෙනවා. කොහොම නමුත් මෙතැන යම් විෂමතාවක් තිබෙනවා කියලා මම පැහැදිලිව පිළිගන්නවා. විශාල පරතරයක් තිබෙනවා. 30,000ක 75,000ක විතර පරතරයක් නැහැ. ඊට අඩු පරතරයක් තිබෙන්නේ.

මේ සම්බන්ධව අපෙනුත් ඉල්ලීම් කරනවා. මේ සම්බන්ධව යම් යම් තීරණ ගන්න රජයකට පුළුවන්. අපි මීට ඉස්සරවෙලා එවැනි තීරණ අරගෙන තිබෙනවා. අපි මේ ගැන සාකච්ඡා කරලා තීරණයක් ගනිමු.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට ඇත්තේ, ශෝක ප්‍රකාශ යෝජනා. මා කැමැතියි මේ සම්බන්ධව ගරු සභානායකතුමාගේත්, ගරු සභාවේත් අවධානය යොමු කරවන්න. අප මූලිකව සැලසුම් කර තිබුණේ පෙර වරු 11.30ත් පස් වරු 12.30ත් අතර ගරු ඩී.එම්. ගුණසේකර මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව ගැනීමට සහ ඊට පසුව පස් වරු 1.30 සිට ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව ගැනීමටයි. දැන් වේලාව පෙර වරු 11.57යි. මුස්ලිම් ජාතික ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා කීපදෙනෙකුත් සඳහන් කළා, ශෝක ප්‍රකාශ යෝජනාව හැන්දෑවට තිබේවි කියා බලාපොරොත්තු වූ නිසා එතුමන්ලා එන්නේ හැන්දෑවටයි කියා. ගරු සභාවේ කටයුතු දහවල් 12.00ට අත් හිටුවා පස් වරු 1.30ට යළි පටන් ගන්නවාට කැමැතිද? එහෙම නැත්නම්, අපි ගරු සභාවේ කටයුතු තවත් ටිකක් ඉස්සරහට ගෙන යනවාද? මා ගරු සභා නායකතුමාගේ අදහස ලබාගන්න කැමැතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, we can proceed without lunch.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, no. I think we must give time for those Hon. Members also to come. Therefore, we must have lunch, anyway.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
One-hour lunch break.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Okay, one-hour lunch break.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Then, we will have to go on till 12.30 p.m.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Yes. One-hour lunch break from 12.30 p.m. to 1.30 p.m. එහෙම හරි නේද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එහෙම නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නොවෙයි. දිවා ආහාර විවේකයෙන් පසුව ගරු සභාවේ කටයුතු පටන් ගන්න නියමිතව තිබුණේ පස් වරු 1.30ටයි. ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව පටන් ගන්න තිබුණේ, පස් වරු1.30ටයි. ඒ නිසා දැන් යෝජනාවක් ඉදිරිපත් වුණා, දහවල් 12.00ට ගරු සභාවේ කටයුතු අත් හිටුවා නැවත පස් වරු 1.30ට පටන් ගනිමු කියා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපට දැනගන්න ලැබුණා, අතිගරු ජනාධිපතිතුමා පස් වරු 2.00ට එනවා කියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. එතුමා එන්නේ, පස් වරු 2.00ට.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම නම්, අපි ගරු සභාවේ කටයුතු 1.30ට පටන් ගනිමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභාවේ කටයුතු දැන් අත් හිටුවා-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු අගමැතිතුමාටත් කථා කරන්න ඕනෑ කිව්වා. මා ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කළාට පසුව ගරු සභාවේ කටයුතු අත් හිටුවමු ද, ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම්, එහෙම කරමු ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මා ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කළාට පසුව ගරු සභාවේ කටයුතු අත් හිටුවමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නමුත්, යෝජනාව ඉදිරිපත් කරලා, පැය එකහමාරක් වාගේ ඇතට යනවා නම්, එය-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කොහොමත් මුලදී සැලසුම් කළේ, දිවා විවේකය දහවල් 12.30 සිට පස් වරු 1.30 වන කල් ගන්නයි. ශෝක ප්‍රකාශ යෝජනාවත් පස් වරු 1.30ට ඉදිරිපත් කරමු ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම හොඳයි ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ රැස්වීම දැන් අත් හිටුවනවා. නැවතත් පස් වරු 1.30ට ගරු සභාව රැස් වනු ඇති.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 1.30ට නියෝජ්‍ය කථානායකතුමා (ගරු කිලංග සුමතිපාල මහතා) ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *in the Chair.*

ශෝක ප්‍රකාශය :
ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
அனுதாபத் தீர்மானம் :
மாண்புமிகு எம்.கே.ஏ.டீ.எஸ். குணவர்தன
VOTE OF CONDOLENCE :
HON. M.K.A.D.S. GUNAWARDANA

[අ.භා. 1.35]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ජනතාව නියෝජනය කරමින් වසර ගණනාවක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටු කරමින් ජනතා හදවත් තුළ ආදරණීය මතකයන් සනිටුහන් කළ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මෙම අවස්ථාවේදී ගරු සභාවට මම ඉදිරිපත් කරනවා.

එම්.කේ.ඒ.ඩී. ජූලියස් ගුණවර්ධන මහතාගේත් කේ.ආර්.පී. ගුණවර්ධන මැතිනියගේත් සදාදර පුත්‍ර රත්නය ලෙස 1947 මාර්තු මස 06 වැනි දින ගම්පහ රෝහලේදී එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා ජන්ම ලාභය ලැබුවේය. දොරණගොඩ ප්‍රාථමික විදුහලෙන් සිප්සතර හැදෑරීම ආරම්භ කළ මෙතුමා රද්දොළුව පඤ්ඤාලෝක විද්‍යාලයෙහි සහ වීරඹුව රජයේ පාසලෙහි වැඩිදුර අධ්‍යාපන කටයුතුවල නියැලුණේය.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

තරුණ විය එළැඹීමත් සමඟම 1966 වසරේදී ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉඩම් ඕවර්සියර් තනතුරක් ලැබ රාජ්‍ය සේවයට බැඳුණු මෙතුමාගේ පළමු සේවා ස්ථානය ත්‍රිකුණාමල කච්චේරිය විය. එහිදී අලුතින්ම ඇරඹූ වාන්ඇල ජනපදයේ කටයුතු කිරීම මෙතුමාගේ මුල්ම රාජකාරිය වූ අතර, සිංහල, මුස්ලිම් සහ දෙමළ යන ජන කොටස් තුනම එහි පදිංචි කරවීමද සිදු කළ යුතුව තිබුණි. මෙම පදිංචි කිරීම්වලදී ඇති වූ නොයෙකුත් ප්‍රශ්න මැද තම රාජකාරිය නොපිරිහෙළා ඉටු කිරීමට මෙතුමා ගත් උත්සාහය මෙහිදී ඉතා අගය කොට සිහිපත් කළ යුතුය. පසු කලෙක මාලනී මැණිකේ රාජගුරු මෙනෙවිය සමඟින් යුග දිවි ගමන ඇරඹූ එතුමා නලින් මිල්රෝයි ගුණවර්ධන පුතණුවන් සහ නෙල්කා ගුණවර්ධන දියණිය මෙලොවට දායාද කළේය.

මෙතුමා 1968.10.01 වන දින 9013 නිල අංකය යටතේ පොලිස් කොස්තාපල්වරයෙකු ලෙස පොලිස් සේවයට එක් වී ඇත. 1974.08.20 වන දින උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස උසස්වීම් ලබා ඇති අතර, නොච්යාගම, කිලිනොච්චිය, පොළොන්නරුව යන පොලිස් ස්ථානවල පොලිස් ස්ථානාධිපතිවරයෙකු ලෙස සේවය කර ඇත. පොලිස් සේවයෙන් ඉවත් වීමෙන් පසු 1989දී සේරුවිල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක ලෙස පත් වී එම වසරේ පැවැති මහ මැතිවරණයේදී ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙන් තරග කර ඉන් ජයගෙන ප්‍රථම වරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමේ භාග්‍ය උදා කර ගත් අතර, මෙතුමා 2000 සහ 2001 වසරවල පැවැති මහ මැතිවරණවලින් ද ජය ලබා පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයකු ලෙස පත් වී ජනතාවට සේවය කළේය. නැවත 2008 වර්ෂයේ පැවැති පළාත් සභා මැතිවරණයෙන්ද ජය ගත් ගුණවර්ධන මැතිතුමා නැඟෙනහිර පළාත් සභාවට තේරී පත් වී පළාත් සභා මන්ත්‍රීවරයෙකුගෙන් තම ප්‍රදේශයට, ගමට, ජනතාවට ඉටු විය යුතු යුතුකම් හා වගකීම් නොපිරිහෙළා ඉටු කළ තැනැත්තෙකු ලෙස පෙන්වා දිය හැකිය. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් නැවත 2010 වසරේදී මහ මැතිවරණයට ඉදිරිපත් වූ ගුණවර්ධන මැතිතුමා එයින් ජයග්‍රහණය කර බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා ලෙස කටයුතු කළේය. එතැන් සිට 2014 වසර තෙක් අවුරුදු 4ක පමණ කාලයක් නියෝජ්‍ය ඇමති ධුරය දැරූ ගුණවර්ධන මැතිතුමා එහිදී ඉටු කළ සේවය ඇගයීමක් ලෙස බුද්ධ ශාසන ශ්‍රී දේශාභිමානී සම්මානයෙන්ද පිදුම් ලබන්නට තරම් භාග්‍යවන්ත පුද්ගලයෙකු විය.

පසු ගිය ජනාධිපතිවරණයෙන් පසු පත් වූ ආණ්ඩුවේ ඉඩම් ඇමති ධුරය දැරූ මෙතුමා 2015 මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට තේරී පත්ව නැවත ඉඩම් අමාත්‍ය ධුරය හොබවන ලදී. "සෑම පුරවැසියෙකුටම ඉඩමක්-සෑම ඉඩමකටම ඔප්පුවක්" යන පරමාදර්ශී අධිෂ්ඨානය පෙරදැරිව එතුමා ඉඩම් ඇමතිවරයා ලෙස කටයුතු කළ අතර, වයඹ පළාත් සභාවේ මූල්‍ය අනුග්‍රහය මත ගොවි පවුල් දහසක් ඉලක්ක කර ගනිමින්, වසවිසෙන් තොර ගෙවතු වගා ව්‍යාප්ත කිරීමේ වැඩ පිළිවෙළක් ද ක්‍රියාවට නංවා තිබේ. එසේම රැකියා විරහිත තරුණ-තරුණියන්හට රැකියා ලබා දීමටත්, උතුරු හා නැඟෙනහිර අවතැන්වූවන්හට ස්ථිර ඉඩම් ලබා දීමටත් ඔහු මහත් පරිශ්‍රමයක් දරමින් කටයුතු කරන ලදී.

එතුමා හදිසියේ ඇති වූ රෝගී තත්ත්වයක් හේතුවෙන් 2016 ජනවාරි මස 19 වැනි දින සැමට සෝ සුසුම් ගෙන දෙමින් ජීවිතයෙන් සමු ගන්නා විට 69 වැනි වියේ පසු විය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1989 වසරේ සිට 1994 වසර දක්වාත්, 2000 වසරේ සිට 2004 වසර දක්වාත් නැවත 2010 වසරේ සිට 2016 වසර දක්වාත් අවුරුදු 14කට වැඩි කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජනතාවට අගනා මෙහෙවරක් ඉටු කළ ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ අභාවය සම්බන්ධයෙන් මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර බිරිඳ, දරුවන් ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස යෝජනා කරමි.

[අ.භා. 1.35]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)

(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතාගේ අභාවය පිළිබඳව ශෝක ප්‍රකාශය සිදු කරන අද දිනයේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල සභානායකතුමා එම යෝජනාව ඉදිරිපත් කරමින් එතුමා පිළිබඳව කථා කළ නිසා මමත් එයටම එකතු වී මගේ ශෝකයත් ප්‍රකාශ කරනවා.

හිටපු අමාත්‍ය, ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා තමන්ගේ රැකියා ජීවිතය ආරම්භ කළේ, ඉඩම් අමාත්‍යාංශයෙන්. ඒ වාගේම අවසන් කළේත් ඉඩම් අමාත්‍යාංශයෙන්. එතුමා 1966 වසරේ ඩඩ්ලි සේනානායක ආණ්ඩුව පැවැති කාලයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉඩම් overseer කෙනෙකු වශයෙන් පත් වුණා. එසේ සේවය කළ එතුමා නැවතත් අවුරුදු 49කට පසුව ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට ආවේ, ඉඩම් අමාත්‍යාංශය භාර ඇමතිතුමා හැටියටයි. මම හිතන්නේ ඒකත් එතුමා ඇති කර තිබෙන වාර්තාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එතුමා හඳුනා ගත්තේ, 1989 වර්ෂයේදියි. ඒ වෙනකොට එතුමා පාර්ලිමේන්තුවට පැමිණ සිටියේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු හැටියටයි. ඊට ඉස්සෙල්ලා එතුමා පළාත් සභාවට තේරී පත්ව සිටියා. එදා ඉඳලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ විශේෂයෙන්ම එය ප්‍රතිසංවිධානය කරන්නත්, ඒ වාගේම එම මතවාද ඉදිරියට ගෙන යන්නත් ක්‍රියා කරපු මන්ත්‍රීවරයෙකු හැටියට මම එතුමාව පිළිගන්නවා. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඡන්ද පදනම ශක්තිමත් කරන්න කටයුතු කළ පුද්ගලයෙකු හැටියටත්, එම ප්‍රදේශයේ ජනතාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අමාරු කාලයක් පැවැති සමයේදී ඒ සම්බන්ධයෙන් හඬ නැඟූ පුද්ගලයෙකු හැටියටත් අප එතුමාව පිළිගන්න වුවමනායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වෙන්න කලින් ඉඩම් දෙපාර්තමේන්තුවෙන් ඉවත් වෙලා පොලිස් දෙපාර්තමේන්තුවට බැඳී සේවය කළ නිසා පාර්ලිමේන්තුව තුළදී පොලිස් කටයුතු ගැනත් විටින් විට කථා කළා. එතුමා පොලීසිය ගැන හුඟාක් කරුණු දැන ගෙන සිටියා. පාර්ලිමේන්තුවේදී පොලීසියට අදාළ ප්‍රශ්න සියල්ලම මතු කරන්නය කියා පොලිස් නිලධාරීන් පවා පැමිණ එතුමාව මුණ ගැසුණා. නමුත් මේ හැම එකකටම වඩා එතුමා නැඟෙනහිර පළාත වෙනුවෙන් කථා කළා; සේරුවිල ආසනය ගැන කථා කළා. ඒ වාගේම එම ප්‍රදේශයේ සිටින සිංහල ජනතාව ගැනත් විශේෂයෙන්ම අවධානය යොමු කර ඒ පිළිබඳව එතුමාගේ අදහස් ප්‍රකාශ කළා. සේරුවිල පමණක් නොවෙයි, වව්නියාවේ සිංහල ජනතාව ගැනත් එතුමා අදහස් ප්‍රකාශ කළා. ඒ විධියට අදහස් ප්‍රකාශ කරමින් පාර්ලිමේන්තුවේදී කථා කර වැඩ කටයුතු කළ දක්ෂ ඇමතිවරයෙකු හැටියට තමයි එතුමා ගැන මගේ මතකය රැඳී පවතින්නේ.

2014 වසරේදී එතුමා මේ රටේ විශාල විපර්යාසයක්, විප්ලවයක් කරන්න එකතු වුණා. ඒ තමයි, මේ යහ පාලනය ඇති කිරීම. එතුමාට එවකට තිබුණු පාලනය එක්ක ප්‍රශ්න ගණනාවක් තිබුණා. ඒ යන මාර්ගය ගැන ජනතාවගේ සහයෝගය නොමැති බව කිහිප වතාවක් එතුමා මට පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා. එහෙම කථා කළේ මේ Lobby එකේදී වෙන්නට පුළුවන්; නැත්නම් වෙනත් ස්ථානයකදී වෙන්නට පුළුවන්. "මෙය වෙනස් කරන්නට අපි ඔක්කෝම එකතු වෙන්න ඕනෑ. අපි එකතු වෙලා ආණ්ඩුවක් ගෙන යන්න ඕනෑ" යනුවෙන් එතුමා කිහිප වතාවක් ප්‍රකාශ කළා.

ඉන් පසුව මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂකයා බවට ප්‍රකාශ කළ අවස්ථාවේදී, එතුමා ළඟින්ම සිටගත් පුද්ගලයෙක් තමයි, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන හිටපු ඇමතිතුමා බව මම කියන්න කැමැතියි. රාජිත සේනාරත්න ඇමතිතුමාත්, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා වාගේම, ඒ මොහොතේ ඉඳලා කැප වෙලා, ඒ සටන ගෙන ගියා; එක එක රැස්වීම්වල හිටියා. මම ඕනෑම තැනක රැස්වීමකට ගියොත්, ගුණවර්ධන මැතිතුමාත් එහි ඉන්නවා. මම හාරිස්පත්තුවට ගියොත් එතැන ඉන්නවා, මම කුරුණෑගලට ගියොත් එතැන ඉන්නවා. මම ගිය සෑම රැස්වීමකටම එතුමාත් ගියා. මම දන්නේ නැහැ, එතුමා කොහොම සහභාගි වුණාද කියලා. කෙසේ හෝ බැහැලා ඒ වැඩ කටයුතු කරලා, එතුමා අපට විශාල ශක්තියක් බවට පත් වුණා.

අනතුරුව, එතුමා ඉඩම් අමාත්‍යාංශය භාර ගත්තා; එහි වැඩ කටයුතු කළා. මම එතුමාට ආරාධනා කළා, "වුවමනා නම් එක්සත් ජාතික පක්ෂය එක්ක ඇවිල්ලා, ජාතික ලැයිස්තුවෙන් එන්න. ඔබතුමා ඇවිල්ලා ඒ වැඩ කටයුතු කරන්න" කියලා. එහෙම කිව්වාට පස්සේ, එතුමා ඒක පිළිගත්තා පමණක් නොවෙයි, මම ඕනෑම පළාතක රැස්වීමකට ගියොත් එතැනට ආවා. මම හෙලිකොප්ටරයෙන් යන කොට, එතුමා වාහනයෙන් ඒ ස්ථානයට ආවා. මම සහභාගි වුණු රැස්වීම්වලින් එකකදී හෝ දෙකකදී පමණයි එතුමා ඇවිල්ලා කථා කර වේලාසනින් ගියේ. එවැනි කැපවීමක් එතුමා තුළ තිබුණා. ඒ කැපවීම තුළින් ආපහු මේ අමාත්‍යාංශය භාර ගත්තා. එතුමාට වුවමනා වුණේ, "මම කොහොමද මේ ප්‍රදේශයේ ජනතාවට සේවයක් කරන්නේ" කියලා හොයලා බලලා ඒ කටයුතු කරන්නයි. අන්න, ඒක එතුමාගේ හිතේ තිබුණා.

එතුමා ඉඩම් ඇමතිවරයා හැටියට කටයුතු කරන විට කථා කළ එක කාරණයක් තමයි, "සින්නක්කර ඔප්පු" ලබා දීම. එතුමා අද ජීවතුන් අතර නැති වුණත්, ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට දැනටමත් අප පියවර අරගෙනයි තිබෙන්නේ. එතුමා ත්‍රිකුණාමල ප්‍රදේශයේ දියුණුව ගැන කථා කළා. ඒ ගැන කථා කරන්නට දැන් එතුමා නොහිටියත්, ඒ සැලසුම් ටිකත් අපි හදා ගෙන යනවා. එතුමාට ක්ෂණිකව ඉෂ්ට කර ගන්නට අවශ්‍ය කාරණය වුණේ කන්තලේ සීනි කර්මාන්තශාලාව යළි ක්‍රියාත්මක කිරීමයි. ඒ අනුව, සීනි කර්මාන්තශාලාව ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමත් පසු ගිය සති දෙක තුළදී අත්සන් කර තිබෙනවා. "සීනි කර්මාන්තශාලාව වුවමනායි. නැත්නම් සේරුවිල ප්‍රදේශයේ ජනතාවට අපි කොහොමද රැකියා දෙන්නේ?" කියන විශාල ප්‍රශ්නයක් එතුමා තුළ එදා තිබුණා. ඒ අනුව, එතුමා බලාපොරොත්තු වුණු සමහර දේවල් දැන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. නමුත්, අද ඒවා ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා අවස්ථාවේදී එතුමා අප අතර නැහැ.

එතුමා මිය යන්නට දවස් කිහිපයකට පෙර මට එතුමා මුණ ගැහුණා. විශේෂයෙන්ම, ගන්නා පියවර කුමක්ද කියලා මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් දැනුවත් කිරීමේ විශේෂ රැස්වීමක්, ජනාධිපතිතුමාගේ සහභාගිත්වයෙන් තිබුණා. එදින එතුමා අසනීප තත්ත්වයෙනුයි ඇවිල්ලා හිටියේ. මම කිව්වා, "එම්.කේ.ඒ.ඩී.එස්, මට රට යන්න තිබෙනවා. ආව ගමන් අපි මුණ ගැහෙමු" කියලා. එතුමා කිව්වා, "ඔව්, ඔව් සර්" කියලා. එදා මම හිතුවේ නැහැ, එතුමා අප අතරින් මේ තරම් ඉක්මනින් සමු ගනීවි කියලා. මම රට යනගමන් මට පණිවිඩයක් ආවා, එතුමා නැති වුණා කියලා. ඒකයි ජීවිතයේ හැටි!

මේ අවස්ථාවේදී අපට විශේෂයෙන්ම තිබෙන්නේ එතුමා කළ සේවය ගැන මතක් කරන්න; එතුමා කරපු සේවය ගැන අපේ ස්තුතිය ප්‍රකාශ කරන්න. එතුමා නැතිවීම අපට පාඩුවක්. ඒ ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. එතුමාට නිවන් සැප ලැබේවා! කියලා අපි විශේෂයෙන්ම ප්‍රාර්ථනා කරන්න ඕනෑ. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් අපි සියලු දෙනාගේ කනගාටුව එතුමාගේ භාර්යාවටත්, පවුලේ සාමාජිකයන් සියලු දෙනාටමත් දැනුම් දෙන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා.

[අ.භා. 1.43]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)

(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කර සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ අතින් සංවිධායක ධුරය ලබා ගනිමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ධජය ඉහළින් ඔසවා තැබීම සඳහා විශේෂයෙන්ම නැහෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පොදු ජනතාව සමඟ සිංහල, ද්‍රවිඩ සහ මුස්ලිම් කියන සෑම ජන කොට්ඨාසයක් සමඟම ඉතාමත්ම ළඟින් ඇසුරු කරමින් ජනතා ආදරයට පත්ව, 1989 වර්ෂයේ මෙම පාර්ලිමේන්තු සභා ගර්භය සෝභාවත් කළ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳව අප තුළ තිබෙන්නේ දැඩි සංවේගයක්.

1989දී, මා සමඟ පාර්ලිමේන්තුවට තේරී පත් වූ එතුමා, අපේ සහෝදර මන්ත්‍රීවරයෙකු හැටියට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම තුළ, ඒ වාගේම මධ්‍යම කාරක සභාව තුළ සහ සමස්ත ලංකා හා විධායක කාරක සභාව තුළ කටයුතු කළේ තමන්ගේ අදහස් කිසිම බියකින් හා සැකයකින් තොරව ප්‍රකාශයට පත් කරපු මන්ත්‍රීවරයකු වශයෙන්. එපමණක් නොවෙයි, ඉතාම දුෂ්කර කාල පරිච්ඡේදයක් 1989 සිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මත පතිත වුණා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමේ කාර්යයේ පටන්, ඒ සිදු වුණු විවිධ දේශපාලන ක්‍රියාවලදී ඒ මැතිනිය සමඟ ඉතාම ළඟින් ඒ සටනේ සිටි සෙන්පතියකු හැටියටයි මම එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා දකින්නේ. මට තවමත් මතක් වෙනවා, එතුමාගේ නිල් සාටකය. එතුමා නිල් සාටකය දාගෙන තමයි පාර්ලිමේන්තුවට ආවේ; පාර්ලිමේන්තුවේ කාලය ගත කළේ.

එතුමාට ලැබුණේ ඉතා දුෂ්කර මැතිවරණ කොට්ඨාසයක්. විශේෂයෙන්ම එතුමා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සිටින සිංහල ජනතාවගේ ප්‍රශ්න ඉස්මතු කරමින් මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ කථා කළා. ඔවුන්ගේ සංවර්ධනය වෙනුවෙන්, ඔවුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් පමණක් නොවෙයි, සමස්ත සිංහල, ද්‍රවිඩ සහ මුස්ලිම් කියන මේ සෑම කොට්ඨාසයක්ම වෙනුවෙන්ම එතුමා කථා කළා; එතුමා වැඩ කටයුතු කළා. ඒ නිසාම 2000 සහ 2001 වර්ෂවලදී පැවති මහ මැතිවරණයෙන් ජයගෙන මෙම පාර්ලිමේන්තුවට පැමිණීමටත්, ඒ වාගේම 2008දී නැහෙනහිර පළාත් සභාවට ඇතුළත් වෙලා පළාත් සභාව තුළින් ඒ ප්‍රදේශවල ජනතාවට ලබා දෙන්න පුළුවන් සහන, උපකාර, සේවය ලබා දීම සඳහා කටයුතු කරන්නත් එතුමාට වරම් ලැබුණා.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

2010 වර්ෂයේදී එතුමා මේ පාර්ලිමේන්තුවට පත් වුණාට පස්සේ බුද්ධ ශාසන නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන්, මේ රටේ සෑම ප්‍රදේශයකම තිබුණු පන්සලක උත්සවයකට, ආගමික උත්සවයකට සහභාගි වුණා. බුද්ධ ශාසන අමාත්‍යාංශය භාරව තිබුණේ ජනාධිපතිවරයාටයි. නමුත් එතුමා තමයි ලංකාවේ හැම තැනකටම ගිහිල්ලා විශේෂයෙන් ගරුතර මහා සංඝරත්නය සමඟ ඉතාම කිට්ටු ළඟාදියාවක් හා සබඳියාවක් ඇති කර ගනිමින් ඒ ආගමික වැඩ කටයුතු රාශියක් කළේ. ඒ සඳහා එතුමා කැප වුණා කියන එක -කිසිම වෙහෙස මහන්සියක් නොබලා එතුමා කැප වුණා කියන එක- මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

අපේ අගමැතිතුමා කිව්වා වාගේම, එතුමාගේ අභාවය නිසා අපට ඉතා හිතවන්ත මිත්‍රයෙක් නැති වුණා; ළෙන්ගතු සගයෙක් අපට නැති වුණා; මේ රටේ ජනතාවට ආදරය කරපු කෙනෙක් නැති වුණා. අගමැතිතුමා කිව්වා වාගේම එතුමා පොලිස් සේවයේ යෙදී සිටි නිසා එතුමා පොලීසියේ දුග්ගන්නා රාල කෙනෙක් බවට පත් වෙලායි තිබුණේ. එතුමාගේ කථා බැලුවත් පෙනෙන්නේ පාර්ලිමේන්තුවේ ඉන්න පොලිස් නිලධාරීන්ගේ ප්‍රශ්න පිළිබඳව, පිට ඉන්න පොලිස් නිලධාරීන්ගේ ප්‍රශ්න පිළිබඳව -ඔවුන්ගේ වැටුප් හා දීමනා පිළිබඳව, ඔවුන්ට ලැබිය යුතු උසස්වීම් පිළිබඳව- හඬක් නඟපු ආකාරයයි. එතුමා තමන් රාජකාරි කළ එම ක්ෂේත්‍රය තුළ තමා ලබා ගත් අත්දැකීම් මෙන්ම, ඒ කටුක ජීවිතය පිළිබඳව කල්පනා කර එයින් වර්තමාන පොලිස් පරපුර මුදවා ගැනීම සඳහා විශාල හඬක් මේ මැති සබය තුළ නැඟුවාය කියන එක මේ වෙලාවේදී මම මතක් කරන්න කැමැතියි.

එතුමාගේ භාර්යාවත්, එතුමාගේ දරුවනුත් අපේ දේශපාලන ව්‍යාපාරය සඳහා එදා සිටම ඉතාම කැපවීමෙන් වැඩ කටයුතු කළා. එතුමාගේ පුත්‍රරත්නය -නලින් මිල්රෝයි ගුණවර්ධන මැතිතුමා- දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධායකවරයෙක් වශයෙන් අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබීම අපට සතුටක්. එතුමා එම ප්‍රදේශවල තම පියාගෙන් ගැලවුණු ධජය ඉහළින් ඔසවා තැබීම සඳහා වැඩ කටයුතු කරන බව අපි ඉතාම සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් අපි එතුමාගේ මේ වියෝව පිළිබඳව අපේ ශෝකය එම පවුලේ සියලු දෙනාටම ප්‍රකාශ කරන බව කියන්න කැමැතියි. එතුමාට නිවන් සැප ලැබේවා!යි මම ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 1.48]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)

(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින අපි සහභාගි වෙන්නේ දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේ ගත කරපු කීර්තිමත් මහජන නියෝජිතයෙක් වශයෙන් ක්‍රියා කරපු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාවටයි; එතුමා ගැන කථා කරන්නයි.

එතුමා මට මුලින්ම හමු වුණේ 1989දී එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙලා පැමිණියාට පසුවයි. එතුමා පොලිස් නිලධාරියෙක් ලෙස ක්‍රියා කරලා එතැනින් ඉවත් වෙලා දේශපාලන ක්ෂේත්‍රයට ගමන් කළා. පොලිසියේ ඉඳලා ආවත් එතුමා හොඳ දේශපාලනඥයකු බවට පත් වුණා.

1989 කාලයේදී එවකට තිබුණු එක්සත් ජාතික පක්ෂ රජයට එරෙහිව පැවතුණු විරෝධතා ව්‍යාපාරවලදී බොහෝ තැන්වලදී මුණ ගැහිලා අපි දෙදෙනා එකට ඒ විරෝධතා ව්‍යාපාරවල හිටියා. ඒ දවස්වල එතුමා ඉතාම කිට්ටුවෙන් හිටියේ, අනුර බණ්ඩාරනායක මැතිතුමා එක්කයි. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පිල් දෙකක් තිබුණු වෙලාවේ අනුර බණ්ඩාරනායක මැතිතුමා එක්ක එතුමා නොබියව හිටියා. එතුමාට බණ්ඩාරනායක පවුල ගැන මහා විශාල ආදරයක් තිබුණා. විශේෂයෙන් බණ්ඩාරනායක මැතිනියට, දිවංගත බණ්ඩාරනායක මැතිතුමාට මහා විශාල ආදරයක් තිබුණු, "නියම ශ්‍රී ලංකාකාරයෙක්" කියලා කියන්න පුළුවන් කෙනෙක් තමයි එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා.

බණ්ඩාරනායක පවුලක් එක්ක එතුමා ඉතාම කිට්ටුවෙන් හිටියා. අනුර බණ්ඩාරනායක මැතිතුමාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා කිරීම සඳහා විශාල කැපවීමෙන් යුතුව එදා එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා ක්‍රියා කළා. එතුමාගේ තිබුණු සුවිශේෂත්වය තමයි, එතුමා පාර්ලිමේන්තුවට පමණක් නොවෙයි, රජ ගෙදරට පවා ගියේ පාවහන් නොමැතිව වීම. ගමෙන් ආපු සාමාන්‍ය මහජන නියෝජිතයෙක් හැටියට පාවහන් පවා නොපැළඳගෙන තමයි ඒ මිනිසුන්ව නියෝජනය කරන්නට එතුමා කොහේ ගියත් ගමන් කළේ.

1989 කාලයේ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් පක්ෂ පහක සන්ධානයක් තිබුණා. ඒ එක පක්ෂයක නායකයෙකු වශයෙන් එතුමා ක්‍රියා කළා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ ප්‍රධානත්වයෙන් තිබුණු බහුජන නිදහස් පෙරමුණේ ලේකම්වරයා වශයෙන් එතුමා එදා කටයුතු කළා. මමත් ඒ පක්ෂය නියෝජනය කළා. දිවංගත රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ රජයට එරෙහිව එදා අපේ රට වටා දැවැන්ත දේශපාලන ව්‍යාපාරයක් තිබුණා. ප්‍රධාන කථිකයන් විධියට මමත්, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාත් එදා තිබුණු රජයට එරෙහිව බණ්ඩාරනායක මැතිනියත් එක්ක ලංකාව පුරා ගමන් කළා. එතුමා ඉතාම වේගවත්ව කථා කරන හොඳ කථිකයෙක්. මට මතක හැටියට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය හැරුණාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන වේදිකාවේ කථා කළේ දෙදෙනෙකු විතරයි. එයින් එක් කථිකයෙකු විධියට තෝරාගෙන තිබුණේ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමායි.

1988 පළාත් සභා මැතිවරණය වෙලාවේදී, පළාත් සභා ජයග්‍රහණය කර ගැනීම සඳහා අනුර බණ්ඩාරනායක මහත්මයාගේ ප්‍රධානත්වයෙන් කණ්ඩායමක්ම ලංකාව පුරා ගියා. ඒ අවස්ථාවේදීත් ප්‍රධාන කථිකයෙක් විධියට එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් අද්විතීය කාර්ය භාරයක් ඉටු කළා. මමත්, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාත්, ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමාත් පළාත් සභා මැතිවරණය වෙලාවේදී ප්‍රධාන කථිකයන් විධියට අනුර බණ්ඩාරනායක මැතිතුමාත් එක්ක ලංකාව පුරාම ගියා. මමයි, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමායි බොහෝ කාලයක් තිස්සේ ඉතාමත් කිට්ටුවෙන් ආශ්‍රය කළා. ඒ අතරතුර එතුමා තදබල ලෙස රෝගාතුර වුණා. එදා තමයි පළමුවෙන්ම හෘදය වස්තුව සම්බන්ධ රෝගයට එතුමා මුහුණ දුන්නේ. ඒ වනකොට මම ඒ දේශපාලනයෙන් ඉවත්වෙලා හිටියේ. එවකට මම ඩී.බී. විජේතුංග හිටපු ජනාධිපතිතුමා හමුවෙලා, එක්සත් ජාතික පක්ෂයට බැඳිලායි හිටියේ. එතුමා රෝගාතුරව සිටින බව මට ආරංචි වුණා. මම ඒ අවස්ථාවේදී එතුමාට උදව්වු කළා. එතුමා රෝගාතුරව සිටින බව මම දිවංගත ඩී.බී. විජේතුංග හිටපු ජනාධිපතිතුමාට කථා කර කිව්වා. අවශ්‍ය සියලුම දේවල්

අරගෙන, එතුමාගේ භාර්යාව එක්ක ඉන්දියාවේ ඇපලෝ රෝහලට එතුමාව ගෙනිහිල්ලා, එතුමාට අවශ්‍ය ප්‍රතිකාර කළා. දිවංගත ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා එදා එතුමා වෙනුවෙන් අවශ්‍ය සියලුම අවශ්‍යතාවන් ඉෂ්ට කළා. ප්‍රතිකාර ලබා ගෙන එතුමා නිරෝගී වෙලා ලංකාවට ආවාත්, පෞද්ගලික ප්‍රශ්න නිසා එතුමා, එතුමාගේ පක්ෂයෙන් ඉවත් වුණේ නැහැ. එතුමා තවදුරටත් ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙකු විධියට 1994 මැතිවරණයේදී ක්‍රියා කළා.

1994 අවුරුද්දේ පොදුජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කිරීම සඳහා එතුමා විශාල වැඩ කොටසක් ඉටු කළා. එතුමාට දේශපාලන වැඩ කටයුතු කරන්න තිබුණේ ඉතාම දුෂ්කර ප්‍රදේශයක් වුණු ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සේරුවිල ආසනයේයි. ඒ ප්‍රදේශය, සිංහල ජනතාව තුනෙන් එකක් පමණ ජීවත් වන ප්‍රදේශයක්. ඉතාම දුෂ්කර ජීවිතයක් ගත කරමින්, විශේෂයෙන්ම ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ -නැහෙනහිර පළාතේ- නිල් පාට ධජය ඉහළින්ම ඔසවා තබන්න එතුමා ක්‍රියා කළා. ඒ වාගේම එතුමා නියම සිංහල ජාතිවාදියෙකු විධියට තමයි හැම දාම ක්‍රියා කළේ. ඒ මත වෙනස් කරමින්, පසු කාලයක - 21වැනි ශත වර්ෂයේදී - එතුමා සංහිඳියාව වෙනුවෙන් අපත් එක්ක එකතුවෙලා විශාල වශයෙන් වැඩ කටයුතු කළා. තමන්ට කිය යුතු දේ බිය නැතිව ඕනෑම නායකයෙකු ඉදිරියේ එතුමා ප්‍රකාශ කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය ඉදිරියේ තමන්ගේ මත නොබියව ප්‍රකාශ කළ දේශපාලනඥයෙකු සහ මන්ත්‍රීවරයෙක් තමයි එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා.

2015 පෙරළියට කලින් මම එතුමාට එක දවසක් කථා කළා. එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාත් යම් කලකිරීමකින් ඉන්නවාය කියලා මට ආරංචි වුණා. මම එතුමාට කථා කර කිව්වා, "එම්කේඒඩීඑස්, මට ඔබතුමාව හම්බුවෙන්න ඕනෑ" කියා. එතකොට එතුමා කිව්වා, "ඩොක්ටර්, මම ඉන්නේ මන්ත්‍රී නිවස්නේ" කියා. මම කිව්වා, "මම බේරුවල ඉන්නේ. මම බේරුවල ඉඳලා මේ වෙලාව වෙනකොට එනවා. ඔබතුමා කොහේවත් යන්නේ නැතිව ඉන්න" කියා. එතුමා මගෙන් ඇහුවා, "මොකක්ද ප්‍රශ්නය?" කියා. මම කිව්වා, "නැහැ, එහෙම නොවෙයි. ඇවිල්ලාම කථා කරන්නම්. කොහේවත් යන්නේ නැතිව ඉන්න" කියා. මම ආවා. ඇවිල්ලා, මම එතුමාට කිව්වා, "මම ඇතුළට එන එක හොඳ නැහැ. ඔබතුමාගේ වාහනයෙන් එළියට එන්න" කියා. මාත් මගේ වාහනයෙන් ආවාම එතුමා මගේ වාහනයට නැග්ගා. මම හෙමින් වටින් ගොඩින් කථා කරලා එතුමාගෙන් ඇහුවා, "මේ ආණ්ඩුව මේ විධියටයි යන්නේ. මොකද ඔබතුමා ඒ ගැන හිතන්නේ? එම්කේඒඩීඑස්, මොකක්ද ඔබතුමා හිතන්නේ?" කියා. "මට එහා වෙලා තියෙන්නේ ඩොක්ටර්" කියා එතුමා කිව්වා. මම ඇහුවා, "අපි දේශපාලන තීන්දුවක් ගනිමුද?" කියා. "එහෙම එකක් තිබෙනවාද?" කියා එතුමා ඇහුවා. මම කිව්වා, "මම ලැහැස්තියි එළියට බහින්න" කියා. එතකොට එතුමා එකපාරට කිව්වේ, "මොනවාද ඩොක්ටර්, මම තව එකෙක් හොය හොයා හිටියේ. මට තනියට තව එකෙක් හොය හොයා හිටියේ. මම ලැහැස්තියි ඩොක්ටර්ට ඉස්සෙල්ලා එළියට බහින්න. හැබැයි, මට පාළුවට තව එකෙක් ඕනෑ. එච්චරයි" කියායි. එහෙමයි එතුමා කිව්වේ. එහෙම කියා ඒ වෙලාවේම කථා කර ගත්තා. එතුමා "කැමැතියි" කියා කිව්වා. එතුමා කිව්වා, "මම මේ දවස් ටිකේ පුදුම වේදනාවකින් හිටියේ" කියා. මොකද, එතුමා කිසිම දවසක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එළියට බහින්න, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, එදා එතුමා ඉතාමත් වීරෝදාර විධියට කිසිම පැකිළීමක් නැතිව තමන්ගේ නියෝජ්‍ය ඇමතිකම් දාලා යන්න උදාර තීන්දුවක් ගත්තා. මන්ත්‍රීකම් නැතිවෙනවාය කියා දැනගෙන කිසිදු බියක්, සැකක්, සැලීමක්, වැඩි දුර කල්පනා කරන්නේ නැතිව කිව්වා, "මම දැන් වහාම එළියට බහින්න ලැහැස්තියි ඩොක්ටර්" කියා. මම කිව්වා, "එහෙනම් දැන් මෙහෙමම යමු. කාටවත් එන්න එපාය කියන්න. ආරක්ෂකයන් අවශ්‍ය නැහැ" කියා.

[මෙම අවස්ථාවේදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]
[இச்சந்தர்ப்பத்தில் மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]
[At this stage, His Excellency President Maithripala Sirisena entered the Chamber.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජිත සේනාරත්න අමාත්‍යතුමා, කතා කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමනි, මා කථා කරමින් සිටියේ දිවංගත එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන නමැති අපේ සහෘදයා 2015 පෙරළියට සහභාගි වුණු ආකාරය ගැනයි. කිසිම තිගැස්මක්, කිසිම වකිතයක්, කිසිම සෙලවීමක් නැතිව, කිසිම දෙයක් ගැන නොසලකා උදාර අන්දමින් එදා එතුමා අපත් එක්ක සම්බන්ධ වුණා. එදා ඒ විධියට එතුමා මාත් එක්ක ඒ වාහනයේම නැඟලා ගිහින් චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ ගෙදරදී අපේ පොදු අපේක්ෂක, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව හමුවෙලා, එතැන ඉඳලා අපත් එක්ක ඒ සටනට බැස්සා. ඒ සටනට බැහැලාත් එතුමා නිකම් හිටියේ නැහැ. එතුමා එක්සත් ජාතික පෙරමුණෙන් තරග කළත් එතුමාගේ නිල් සාටකය එතුමා කවදාවත් ගැලවුයේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තියෙන භක්තියෙන් එතුමා කවදාවත් වෙනස් වුණේ නැහැ. එතුමා පැහැදිලි, පිරිසිදු ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක් විධියට මේ පෙරමුණේ සටනට පැමිණුනා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අප ඔක්කොම දන්නවා, එතුමා බොහොම සුන්දර මිත්‍රයෙක්; ඉතාම සුන්දර මනුෂ්‍යයෙක් බව. එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා, ජීවිතය පිළිබඳව ඉතාම සුන්දර විධියට සිතන, සුන්දර විධියට මිනිසුන් ආශ්‍රය කළ හොඳ මිත්‍රයෙක්. එතුමා අපේ දුකේදීත්, සැපේදීත් ඕනෑම වෙලාවක ඇවිත් අපත් එක්ක එකට ඒ දුක සැප බෙදාගත් අපේම

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

සහෘදයෙක්. එම නිසා එතුමාගේ අකල් මරණයෙන් අප බෙහෙවින් සැළුණා. එදා අපවත්වී වදාළ සෝභිත ස්වාමීන්ද්‍රයාණන් වහන්සේගෙන් පසුව අපේ දෙවෙනි සෙනෙවියෙක් වශයෙන් කඩාගෙන වැටුණේ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමායි. ඒ මහජන සටන මෙහෙය වූ දෙවෙනි සෙනෙවියා තමයි එතුමා. එක දිනයක් වෙනස් කර ගන්නේ නැතිව, මුළු මැතිවරණ ව්‍යාපාරය පුරාම කථා කරන්නට පුළුවන් රැස්වීම් ගණනාව කීයද, ඒ සියලුම රැස්වීම් උදේ සිට රෑ වෙන තුරු අමතමින් ජනතාව මෙහෙය වූවා. මේ වෙනසට හේතුව, මේ වෙනස කළ යුත්තේ මන්ද යන්න පැහැදිලි කරමින්, ඒ සඳහා ජනතාව පොළඹවමින්, ලංකාව පුරාම ජනතාවට නායකත්වය දෙමින්, එතුමා අපේ පොදු අපේක්ෂකයා වූ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මැතිවරණ ව්‍යාපාරයේ සටන් වැදුණා. ඒ වාගේම ඊට පසුව එළඹුණු පාර්ලිමේන්තු මැතිවරණයේදීත් වෙලාව බලන්නේ නැතිව, ඒ කැපවීම කරමින් ලංකාව පුරා ඒ වැඩ කටයුතු කළා. එසේ ඉන්දැද්දී එතුමා නැවත රෝගාතුර වෙලා, විදේශ ගතවෙලා, නැවත ලංකාවට ආවා. එතුමා විදේශවලදීත් කියා තිබුණේ, "මට මොනවා හෝ වෙනවා නම් වෙන්න ඕනෑ - මම මැරෙන්න ඕනෑ- ලංකාවේදියි. මට මෙහෙම ඉන්න බැහැ. මට පිට රට කෑම කාලා පුරුදු නැහැ. ලංකාවට ගිහින් බතුයි, පොල් සම්බෝලයි කාලා, මම මගේ අවසාන කාලය ලංකාවේ ඉන්න ඕනෑය" කියායි. වෛද්‍ය උපදෙස්වලට එරෙහිව - තමන්ගේ දුවණිය වෛද්‍යවරියක් වෙලාත්, ඒ දුවණියගේ උපදෙස්වලටත් එරෙහිව- අවසාන කාලය ගත කරන්නට එතුමා ආපසු තමන්ගේ මාතෘ භූමියට ආවා. අපේ ජීවිතයේ ඉතාම තීරණාත්මක යුගයක අප සමඟ කටයුතු කළ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා කවදාවත් අපට අමතක කරන්න බැහැ.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, සේරුවිල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයා වශයෙන් එතුමාගේ අතිජාත පුත්‍ර රත්නය අද එතුමාගේ සටන ඉදිරියට ගෙන යනවා. එතුමාගේ භාර්යාවත් හැම දාම එතුමා වෙනුවෙන් නොසැලී සිටිමින් එතුමාගේ දේශපාලන ගමනට විශාල ආධාරයක් වුණා. අපි ඒකත් සිහිපත් කරන්න ඕනෑ. අපි පිළිගන්නා වූ අපේ ධර්මය අනුව එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාට අජරාමර නිවන් සැප ලැබේවායි ප්‍රාර්ථනය කරන අතර, එතුමාගේ අභාවය වෙනුවෙන් එම පවුලේ සියලු දෙනාට අපේ ශෝකය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.00]

අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (ජනාධිපතිතුමා, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමා සහ ආරක්ෂක අමාත්‍යතුමා)

(மேதகு மைத்திரிபால சிறிசேன - ஜனாதிபதியும் மகாவலி அபிவிருத்தி, சுற்றாடல் அமைச்சரும் பாதுகாப்பு அமைச்சரும்)

(His Excellency Maithripala Sirisena - President, Minister of Mahaweli Development and Environment and Minister of Defence)

ගරු කථානායකතුමනි, ඉතා දීර්ඝ කාලීන මිත්‍රයෙක් වාගේම, මා ඥාතියෙක් වාගේ ඇසුරු කළ කෙනෙක් තමයි අභාවප්‍රාප්ත එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා. එතුමාගේ අභාවය වෙනුවෙන් මේ ගරු සභාවේ ශෝකය පළ කරන අවස්ථාවේ ස්ථිරවම යමක් ප්‍රකාශ කළ යුතුයි කියන අදහස ඇතුවයි අද මා මේ අවස්ථාවට සහභාගි වන්නේ.

එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහත්මයා ගම්පහ දිස්ත්‍රික්කයේ, මීනුවන්ගොඩ ප්‍රදේශයේ ඉපදුණු කෙනෙක්. එතුමාගේ මව වින්නඹු මාතාවක්. ඒ කියන්නේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක්. එතුමාගේ පියා කන්තලේ ගොවි ජනපද ව්‍යාපාරයේ ගොවියෙක්. 1977 වසරේදී පමණ එතුමා උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් පොළොන්නරුව පොලිසියේ සේවය කරන අවස්ථාවේ, එවකට පොළොන්නරුව දිසා ඇමතිව සිටි මාගේ හිත මිත්‍ර එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා වශයෙන් කටයුතු කරද්දී තමයි මට ඇසුරු කරන්න ලැබුණේ. එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහත්මයා පොලීසියේ සේවය කළත්, එච්.ජී.පී. නෙල්සන් මැතිතුමාගේ ආරක්ෂක නිලධාරියා වශයෙන් කටයුතු කළත්, එතුමාට දේශපාලන දර්ශනයක් තිබුණා. එතුමා පැහැදිලිවම ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක්. දිසා ඇමතිතුමාගේ ආරක්ෂක නිලධාරියා වශයෙන් සේවය කරද්දී ඒ කාර්ය මණ්ඩල තුළ ඇති වූ කථා බහේදී එතුමා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙකු විධියට පෙනී සිටීම නිසා, දේශපාලන දඬුවමක් විධියට එතුමාට කල්මුණේ පොලීසියට ස්ථාන මාරුවක් ලැබුණා. එතුමා ඒ ස්ථාන මාරුව භාරගෙන කල්මුණේට ගියේ නැහැ. ඒ ස්ථාන මාරුව ප්‍රතික්ෂේප කිරීමෙන් ටික කලක් යන විට එතුමාගේ සේවය තහනම් කළා. ඒ කාලය තුළ පොළොන්නරුව ප්‍රදේශයේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙකු ලෙස මා ක්‍රියාකාරීව වැඩ කළ නිසා, මා සමඟ ඉතාම මිත්‍රශීලීව, කුලුපගව කටයුතු කරමින් පොළොන්නරු ප්‍රදේශයේ දේශපාලන කටයුතුවලට එතුමා සම්බන්ධ වුණා. ඒ වාගේම එතුමාට අවශ්‍යතාවක් ඇති වුණා, සේරුවිල මැතිවරණ කොට්ඨාසයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආසන සංවිධායකවරයා වශයෙන් පත් වීමට. එතුමාත්, මමත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය හමු වෙලා ඒ අදහස කිව්වා. මට අද වාගේ මතකයි, ඒ වෙලාවේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඇහුවා, "ගුණවර්ධන, දැන් මේ තිබෙන එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට හයෙන් පහක බලයක් තිබෙනවා. මේ ආණ්ඩුව දීර්ඝ කාලයක් පවතිවි. රස්සාව දමලා ඇයි දේශපාලනයට එන්නේ?" කියලා. එතුමා ඒ වෙලාවේ බණ්ඩාරනායක මැතිනියට ප්‍රකාශ කළා, "මම නැවත පොලීසියේ සේවයට යන්නේ නැහැ, මම කැමැතියි, සේරුවිල මැතිවරණ කොට්ඨාසයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආසන සංවිධායකවරයා වශයෙන් කටයුතු කරන්න." කියලා. ඒ අනුව තමයි එතුමා සේරුවිල ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආසන සංවිධායකවරයා වශයෙන් පත් වුණේ. ඒ පත්වීම ලැබීමත් එක්කම එතුමා සමඟ මාත් කන්තලේ ප්‍රදේශයට ගියා. එතුමා සමඟ සේරුවිල මැතිවරණ කොට්ඨාසයේ ගමක් ගණනේ ගිහිල්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශාඛා සමිති හදලා, බලමණ්ඩලය හදලා, ඒ දේශපාලන කටයුතුවල පූර්ණ කාලීනව නියැලුණා.

1989 පෙබරවාරි මාසයේ 15වැනි දා පැවැති පාර්ලිමේන්තු මැතිවරණය ජයග්‍රහණය කොට එතුමා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් වන විට මමත් පළමු වරට පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට පත් වුණා. ඒ කාලයේ අපි විපක්ෂයේ මන්ත්‍රීවරු විධියට "ශ්‍රාවස්තියේ" තමයි හිටියේ. ශ්‍රාවස්තියේ ගත කරපු කාලය තුළ විපක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් අප කළ දේශපාලන සාකච්ඡාවල තිබුණු ගුණාත්මකභාවය වාගේම, අපේ ජීවිතවල බොහෝ රසවත් කථා සහ සිද්ධි ගණනාවක් සඳහන් කරන්න තිබෙනවා. එතුමාත්, මමත්, අනුරාධපුරය දිස්ත්‍රික්කය නියෝජනය කළ අභාවප්‍රාප්ත බර්ටි දිසානායක මැතිතුමාත් ශ්‍රාවස්තියේ එක ළඟ කාමරවලයි සිටියේ. දීර්ඝ කාලීනව අප ආ දේශපාලන ගමන් මගේ සම්බන්ධතාවත් සමඟ මා ඉතාම ළඟින් එතුමා ඇසුරු කළා. එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා සැබෑ ලෙසම නියෝජනය කළේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය විතරක් නොවෙයි. එතුමා නැහෙනහිර පළාතේම ජනතාවට තිබුණු ප්‍රශ්න පිළිබඳව දැඩි ඕනෑකමකින්, වුවමනාවකින්, කැපවීමකින් සහ හැඟීමකින් කටයුතු කළ දේශපාලනඥයෙක්. බොහොම අවංක හදවතක් එතුමාට තිබුණා. එතුමා මන්ත්‍රී ධුර, අමාත්‍ය ධුර හෙබවූවත්, පොලීසියේ සේවය කළත් හරි හම්බ කරපු දෙයක් නැහැ. එතුමා අභාවප්‍රාප්ත වන විටත් එතුමාගේ ආර්ථිකය කුමන ආකාරයෙන්ද තිබුණේ කියලා අපි දන්නවා.

ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ එතුමා කටයුතු කළා වාගේම, එතුමාට දේශපාලන ප්‍රතිපත්තියක් තිබුණා. 2015 වර්ෂයේ පැවැති ජනාධිපතිවරණයේදී මම පොදු අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් වන්න ආණ්ඩුවෙන් එළියට එනකොට, මා මිත්‍ර වෛද්‍ය රාජිත සේනාරත්න ඇමතිතුමා, ඒ වාගේම එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා, අර්ජුන රණතුංග ඇමතිතුමා, දුමින්ද දිසානායක ඇමතිතුමා වැනි අපේ සහෘදයින් සමඟ අපි එකටයි ආණ්ඩුවෙන් එළියට ආවේ. ඒ වාගේම ඒ ජනාධිපතිවරණයේදී මගේ ජයග්‍රහණය සඳහා එතුමා විශාල කැප වීමක් කරනු ලැබුවා.

ගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ 17වෙනි දා තිබුණු මැතිවරණය අවසන් වෙලා එතුමා එක්සත් ජාතික පෙරමුණ යටතේ ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත් වුණා. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන දේශපාලන පක්ෂය වශයෙන් ක්‍රියා කළේ එක්සත් ජාතික පෙරමුණයි. නමුත්, කරට දමන නිල් පාට සාටකය එතුමා ගැලෙව්වේ නැහැ. අපි ඇතැම් වෙලාවට විහිළු කළා, "එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තුවෙන් පත් වුණු මන්ත්‍රීවරයෙකු නිසා දැන් ඔය නිල් පාට සාටකය දමන්න පුළුවන්කමක් නැහැ" කියලා. නමුත්, එතුමා බොහොම පැහැදිලිව කිව්වා, "නැහැ, නැහැ, මම මේක ගලවන්නේ නැහැ. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෙනෙක්" කියලා. එවැනි අදහසක් තුළ තමයි එතුමා කටයුතු කළේ.

මේ පාර්ලිමේන්තුව තුළ කටයුතු කළ කාලය තුළත්, පාර්ලිමේන්තුවෙන් පිටතදීත් එතුමා සෙරෙප්පු දෙකක් පාවිච්චි කළේ නැහැ කියලා අපි දන්නවා. සෙරෙප්පු දෙක නැතිව තමයි එතුමා ඇවිද ගියේ. අපි බොහෝ අවස්ථාවල ඒ පිළිබඳව කථා කරන විටත් එතුමා ඒ ගැන නොයෙකුත් කරුණු කාරණා ඉදිරිපත් කළා.

එතුමා පාර්ලිමේන්තුවට ආ දවසේ ඉඳලා ගොවි ජනතාව ඇතුළු රටේ සාමාන්‍ය පොදු ජනතාව පිළිබඳව වාගේම, විශේෂයෙන් නැඟෙනහිර පළාතේ සිංහල ජනතාවගේ ප්‍රශ්න පිළිබඳවත් කථා කළ බව මට මතකයි. එතුමා මහ ජනතාවගේ ප්‍රශ්න කථා කළා වාගේම, පාර්ලිමේන්තුවට ඇවිල්ලා පොලීසියේ සේවය කරන පොඩි මිනිස්සු ගැනත් හුඟක් කථා කළා. විශේෂයෙන් පොලීසියේ රාළහාමිලා ගැන කථා කළා. දුක් විඳින්නේ පොලීසියේ ඉහළ නිලධාරීන් නොවෙයි, පහළ නිලධාරීන් කියලා එතුමා ඒ දුක් විඳින පහළ නිලධාරීන්ගේ ප්‍රශ්න මේවායි කියලා පාර්ලිමේන්තුවේ කථා කළා. එතුමා පොලීසිය භාර අමාත්‍යාංශයට අදාළ උපදේශක කාරක සභාවේදීත් පොලිස් නිලධාරීන්ගේ සුබසාධනය පිළිබඳව, සේවා පිළිබඳව, පහසුකම් පිළිබඳව කථා කරමින් ඒ සම්බන්ධයෙන් බොහෝ සටන් කළ බව මට මතකයි. ඒ නිසා එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන කියන්නේ සැම විටම, සැබෑ ලෙසම සාමාන්‍ය පොදු මහජනතාව නියෝජනය කළ කෙනෙක්.

එතුමාගේ දේශපාලන හෘද ස්පන්දනය සැම විටම තිබුණේ පොඩි මිනිසුන්ගේ හඬ අනුවයි. ඒ වාගේම, දේශපාලන ව්‍යාපාර තුළ උපවාස, උද්ඝෝෂණ, පිකටින්, සත්‍යාග්‍රහ, පෙළපාළි පැවැති සෑම අවස්ථාවකදීම පෙරමුණේ සිටි කෙනෙක් තමයි එම්.කේ.ඒ.ඩී.එස්. කියන්නේ. එතුමාට හොඳ හඬක් තිබුණා. එතුමාට හොඳ කථිකත්වයක් තිබුණා. එතුමාට හොඳ හදවතක් තිබුණා. එතුමා මන්ත්‍රීවරයකු වෙලා, ඇමතිවරයකු වෙලා කටයුතු කළ කාලය තුළ එතුමා ඇසුරු කළ පොඩි මිනිසුන් අමතක කළේ නැහැ. පොලීසියේ රාළහාමි කෙනෙක් දැක්කාම ළඟට ගිහින් කථා කරලා, "කොහොමද මල්ලී?" කියලා දුක-සැප කථා කරන ගති ලක්ෂණ නිලධාරියකු විධියට එතුමාට තිබුණා. රටේ නොයෙකුත් ප්‍රදේශවලට ගිහිල්ලා ඒ ජනතාවගේ තිබෙන ප්‍රශ්න ගැන සැබෑ ලෙසම අසමින්, ඒවාට සවන් දෙමින් -කන් දෙමින්- ඔවුන්ට කළ හැකි උදව් උපකාර කළ කෙනෙක් තමයි එතුමා. ඒ වාගේම තමයි දේශපාලන ව්‍යාපාර තුළ එතුමාගේ තිබුණු එඩිතරභාවයත්.

මා පොදු අපේක්ෂකයා විධියට පසු ගිය ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණු වෙලාවේ එතුමා බොහොම එඩිතර ලෙස ඇවිල්ලා එතුමාගේ ප්‍රතිපත්තිය ප්‍රකාශ කළා. එතුමා එවකට පැවැති රජයෙන් එළියට ආපු කාරණාව පැහැදිලි කරලා, මේ රටට අවශ්‍ය වෙනස පිළිබඳව එතුමාගේ අදහස් ඉදිරිපත් කළා. එතුමා තම දේශපාලන ජීවිතය තුළ පැහැදිලිවම වංචාව, දූෂණය, අක්‍රමිකතාවට විරුද්ධව කටයුතු කළ කෙනෙක්. සාධාරණ සමාජයක් සඳහා එතුමා සැම විටම කැප වුණා. ඒ වාගේම, නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, සාමාන්‍ය පොඩි මිනිසාගේ අයිතිය සහ වරප්‍රසාද පිළිබඳව අවංක හැඟීමකින් කටයුතු කළ කෙනෙක්. එම නිසා එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහත්මයාගේ අභාවය පිළිබඳව හිතවතකු විධියටත්, දේශපාලන මිත්‍රයකු විධියටත් මම පෞද්ගලිකවම දැඩි ලෙස සංවේගයට පත් වෙනවා.

එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන කියන්නේ ජීවිතයේ සැප විඳපු කෙනෙක් නොවෙයි. මුළු ජීවිත කාලය තුළම දුක් විඳපු කෙනෙක්. ඇමතිවරයකු විධියට කටයුතු කළ කාලය තුළ වුවත් එතුමා ඇමති වරප්‍රසාද පසු පස ගිය කෙනෙක් නොවෙයි. ප්‍රධාන වශයෙන්ම එතුමාගේ ජීවිතයේ තිබුණු මූලික චරිත ලක්ෂණ තුළ කටයුතු කළ කෙනෙක්. ජීවිතයේ සැප නොලබා ඉතාම දුෂ්කර ජීවිතයක් ගත කරමින් දේශපාලන ව්‍යාපාරයට කැප වුණු නිසා තමයි එතුමා රෝගාතුර වුණේ. එහි ප්‍රතිඵලයක් විධියට තමයි එතුමා අකාලයේ අභාවප්‍රාප්ත වුණේ.

එතුමාගේ අභාවය පිළිබඳව මම ඉතාම කනගාටු වෙනවා. ගුණවර්ධන මැතිනිය ඇතුළු එතුමාගේ පවුලේ දරුවන්, අපි දීර්ඝ කාලයක් තිස්සේ ඥාති සහෝදරයන්, මිත්‍රයන් විධියට තමයි ඇසුරු කරන්නේ. අපි එක ගෙදර, එක බත්පත කාපු අය. අපි හැම කෙනෙක්ම එකට ජීවත් වුණු අය. එතුමා පෞද්ගලිකව මගේ ඉතාම කිට්ටු මිත්‍රයෙක්.

ගරු කථානායකතුමනි, එතුමාගේ අභාවය පිළිබඳව මේ ගරු සභාවේ ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේ දී මගේ බලවත් ශෝකයත් එයට එක් කරන අතර, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිනියටත්, දරුවන්ටත් ඒ ශෝක පණිවුඩය දන්වා යවන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

එතුමා අභාවප්‍රාප්ත වුණත් අපේ වගකීමක් හා යුතුකමක් විධියට එම පවුලේ, විශේෂයෙන්ම ගුණවර්ධන මැතිනිය සහ දරුවන් ගැන අපගේ පෞද්ගලික අවධානය යොමු කරමින් කටයුතු කරන බවද ප්‍රකාශ කරමින් මගේ කෙටි ගුණකථනය -ශෝක ප්‍රකාශය- අවසන් කරනවා. ස්තුතියි.

[2.13 p.m.]

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)

(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

Mr. Speaker, I had the good fortune of knowing the late Hon. M. K. A. D. S. Gunawardana for a long time. He and I represented the Trincomalee District in Parliament and I had the good fortune of being able to develop a close relationship with him and to maintain close contact with him as co-Members of Parliament from the same District.

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

He was a simple person who maintained a close contact with the people in the District. He maintained a close contact not merely with the Sinhalese people who voted for him, but also maintained a close contact with the Tamil people, particularly the Tamil people who live in the Seruwila Electorate and there are a considerable number of Tamil people who live in the Seruwila Electorate. The late Hon. Gunawardana always made it a point to maintain a close contact with those people in different parts of the Seruwila Electorate in the Trincomalee District. He tried his very best to get along with the people. He sometimes talked tough, but he was basically and essentially a soft and simple person easy to get along with.

He was also a person who was guided in his political conduct by certain principles. He endeavoured to stand up for what was right. I think that was demonstrated when the Presidential Election in 2015 came about and when there was a split in the Sri Lanka Freedom Party and our present President became the joint opposition candidate and walked out of the SLFP Government led by President Mahinda Rajapaksa. The late Hon. Gunawardana was one of those Members of Parliament of the Sri Lanka Freedom Party who walked out with him and supported him at that election, which took place in 2015. I think the Hon. Gunawardana was guided by certain principles when he took that decision. There was no guarantee that the Hon. Maithripala Sirisena would be the winner. The Hon. Gunawardana was holding a position already as a Member of Parliament in the Sri Lanka Freedom Party under the former Government and there was an element of risk in that decision he took, but he nevertheless took that decision because I think he realized, as many of us did, that the country was moving towards a dictatorship, the country was ceasing to be a united country and people felt excluded. All the people who lived in this country did not feel included, part of an inclusive society and part of a country in which they had a place. There was inequality, there was injustice amongst the different people who lived in this country and it was in that background, I think, that the present President, His Excellency Maithripala Sirisena walked out of the Sri Lanka Freedom Party and became the joint opposition candidate. It was also in that background that Hon. Gunawardana himself took a bold decision to abandon his party, to leave his party and come out and oppose the candidate of the Sri Lanka Freedom Party at that point of time - His Excellency Mahinda Rajapaksa. That was a bold decision and a decision indicative of his character, his determination and his will to do the right thing. I remember, I met him at that time and he was very firm in regard to the decision he had taken.

Well, Sir, we are moving now in a different direction. It is our expectation that we will be able to complete this journey successfully, that we will be able to transform this country into a country in which all people who live in this country have a sense of equality, a feeling that justice is being done, that they are part and parcel of this country, that this country belongs to them, that they belongs to this country and that they can live in this country as equal citizens. I think the Hon. Gunawardana played a remarkable role in bringing about the situation where we commenced that journey.

Sir, I have many thoughts about the Hon. Gunawardana. He was a person who was generally very kind and though he sometimes appeared to be a tough person, he was essentially a very kind and simple person.

I join this House, Sir, in expressing our deepest condolences to Mrs. Gunawardana and the family members over this sad bereavement in their family and may I request that condolences of this House be conveyed to the family.

Thank you.

[අ.භා. 2.20]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

ගරු කථානායකතුමනි, අප අතරින් අකාලයේ වෙන් වුණු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමන් වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන මෙම අවස්ථාවේදී ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය නියෝජනය කරමින් වචන ස්වල්පයක් එකතු කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා. එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන නමැති පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ගේ, ඇමතිතුමන්ගේ නාමය මේ සභා ගර්භය තුළ විතරක් නොවෙයි, රට පුරා ම අමරණීය නාමයක් හැටියට සදාකල් ප්‍රචලිත වෙනවා. ඒ කීර්තිනාමය එතුමාට ලැබෙන්නේ, එවකට පැවති ආණ්ඩුවේ තනතුරක් දැරූ එතුමන්, විශේෂයෙන්ම මේ රටේ යහ පාලනයක් ඇති කිරීම සඳහා එඩිතරව අපගේ වර්තමාන ජනාධිපතිතුමන් සමඟ එකතු වීම නිසායි. අපි කවුරුත් එතුමන්ට සදාකල් ණය ගැතියි කියා මා කියනවා. ඒ ආණ්ඩුවෙන් මුලින් ම වෙන් වුණු කෙනෙක් තමයි එතුමන්; අන්තිමට වෙන් වුණු කෙනෙක් තමයි මම. එතුමාට තරම් එඩිතරකමක් මට තිබුණේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පැරණි සාමාජිකයකු හැටියට එතුමා මේ රටේ යහ පාලනය ඇති කිරීම සඳහා එතරම් භයානක අභියෝගාත්මක තීරණයක් ගත්තා. එතුමා ගත් ඒ තීරණය නිසා එතුමාගේ නාමය අමරණීය නාමයක් හැටියට සදාකල් ප්‍රචලිත වනවාය කියන එක අපි කවුරුත් පිළිගත යුතුයි.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තමයි මේ රටේ අඩු ම මන්ත්‍රී සංඛ්‍යාවක් නියෝජනය කරන දිස්ත්‍රික්කය. අපේ ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය වැනි පක්ෂ ගන්නා තීරණ මත සමහර විට එතුමන්ට ආසනය පවා අහිමි වෙලා තිබෙනවා. මොකද, දැනට තිබෙන ප්‍රසාද ආසන ක්‍රමය අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය දෙමළ ජනයා බහුතරයක් වෙසෙන දිස්ත්‍රික්කයක් නිසා දෙමළ ජාතික සන්ධානයට දෙමළ ජනතාවගේ නියෝජනය ලැබුණා නම්, සමහර විට සිංහල ජනතාවගේ නියෝජනය එක්සත් ජාතික

පක්ෂයට ලැබුණා නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නියෝජනයක් ලැබෙන්නේ නැහැ. පක්ෂ දෙකෙන්ම මන්ත්‍රීවරුන් පත් වනවාය කියන එක එතරම් ලේසි පහසු කාර්යයක් නොවෙයි. නමුත් එවැනි කාල සීමාවක එතුමා නියෝජනය කළ ජනතාව වෙනුවෙන් එතුමා කළ සේවාව, ඒ ජනතාව වෙනුවෙන් එතුමා කළ කැප වීම අපි කවුරුත් ඉතා ම හොඳට දන්නවා. එතුමා ඒ සේවාව කළේ සිංහල ජනතාව වෙනුවෙන් විතරක් නොවෙයි.

මට අද වාගේ මතකයි, මුතූර් ගම්මානය එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයට ලක් වූ 2006 වසරේ, එම ගම්මානයෙන් 50,000කට වැඩි ජනතාවකට කන්තලේ ප්‍රදේශය තුළ අවතැන් වෙන්නට සිදු වුණා. මාස 6ක කාලයක් අවතැන් වූවන් හැටියට විශාල ජන සංඛ්‍යාවක් කන්තලේ ප්‍රදේශයට පැමිණෙද්දී මේ රටේ සිංහල-බෞද්ධ ජනතාව තමන්ට හුරුපුරුදු තමන්ගේ ආගන්තුක සත්කාරය උසස් ලෙස, ඉතාම උත්තරීතර ලෙස පෙන්නුම් කළා වාගේම එම ප්‍රදේශය නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් හැටියට, සංවිධායකවරයෙක් හැටියට එතුමා අපට ලබා දුන් සහයෝගය මට කවදාවත් අමතක වෙන්නේ නැහැ. පන්සල් භූමිය විවෘත කරලා දුන්නා. සිංහල පාසල් හිස් කරලා ලබාදුන්නා. මොකද, එදා අපට සම්පත් බෙදා-හදා ගැනීමට සිදු වුණු අවදියක්. ඒ වෙලාවේ එතුමා අපට ලබාදුන් සහයෝගය පිළිබඳව විශේෂයෙන්ම මුස්ලිම් ජනතාව නියෝජනය කරන නායකයෙක් හැටියට, මන්ත්‍රීවරයෙක් හැටියට මම මතක් කළ යුතු වෙනවා.

ඒ විතරක් නොවෙයි, එතුමාගේ කථිකත්වය පිළිබඳව අපි කවුරුත් දන්නවා. අද මේ සභා ගර්භය තුළ එතුමාගේ හඬ අපට සම්පූර්ණයෙන්ම ඇසෙන්නට නොලැබුණත්, එහි ඉංකාරය මට අදත් දැනෙනවා. තමන් නියෝජනය කරන ගම්බද ජනතාවගේ වුවමනාවන් පිළිබඳව එතුමා ඉදිරිපත් කරන කරුණු ඒ තරම් ශක්තිමත් ලෙස මෙතැනදී ප්‍රකාශ වුණා. අගමැතිතුමා මෙතැනදී කියා සිටියා, ඒ වාගේම ජනාධිපතිතුමාත් මතක් කළා, තමන් නියෝජනය කරන ජනතාවගේ ආර්ථිකමය ප්‍රශ්න විසඳීමට දරපු උත්සාහය, විශේෂයෙන්ම කන්තලේ සීනි කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීම සඳහා එතුමා දරපු උත්සාහය පිළිබඳව. වෙනත් ඇමතිවරයෙක් කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළාම, කන්තලේ සීනි කර්මාන්තශාලාව මොනම ආකාරයෙන් හෝ නැවත පණගැන්වීම පිළිබඳ කාරණය එතුමා අමාත්‍ය මණ්ඩලය තුළ නිතරම මතු කළා. එතුමාගේ එම උත්සාහය සාර්ථක වීමට පෙර එතුමා අපෙන් වෙන් වුණත්, උක් කර්මාන්තය නැවත පිහිටුවලා, උක් ගොවීන් නැවත උක් කර්මාන්තයට අවතීර්ණ වුණා නම් ඒ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා නිසා බැවින් ඒ නාමය කවදත් අමතක නොකළ යුතුයි.

ඒ විතරක් නොවෙයි, කන්තලේ ජලාශය හා සම්බන්ධ ධීවරයන්ගේ ප්‍රශ්නය පිළිබඳව නොයෙකුත් ගැටලු මතු වුණු වෙලාවේ ඊට අදාළ සාකච්ඡාවලදී එම ධීවරයන් කුමන ජාතියකට අයත්ද යන පදනම බලන්නේ නැතුව ඔවුන්ගේ ගැටලු නිරාකරණය කිරීමට ඉදිරිපත් වෙලා ඒ සඳහා ලබාදුන් සහයෝගය අපට කවදාවත් අමතක වෙන්නේ නැහැ. විශේෂයෙන්ම පසු ගිය ආණ්ඩුවෙන් ඉවත් වෙලා මේ යහ පාලන ආණ්ඩුව ඇති කිරීම සඳහා, නැවත මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම සඳහා, ඒකාධිපතිත්වය කරා ගිය ගමන නතර කිරීම සඳහා එතුමන් තුළ තිබුණු කැපවීම කවදත් අමරණීයයි කියන එක නැවත වාරයක් මතක් කරමින්, එතුමන් අදහපු උතුම් බුදු දහමට අනුකූලව එතුමන්ට නිවන් සැප ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම එතුමාගේ අභාවය වෙනුවෙන් මෙම විවාදය වෙලාවේ පැමිණ සිටින එතුමන්ගේ ආදරණීය භාර්යාව, ඒ වාගේම නලීන් ගුණවර්ධන පුත්‍රරත්නය ඇතුළු පවුලේ අනෙකුත් සාමාජිකයන් වෙත අපගේ සංවේගය පළ කරමින් මම මගේ කථාව සමාප්ත කරනවා. ස්තූතියි.

[අ.භා. 2.30]

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சரும் காணி அமைச்சரும்)

(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs and Minister of Lands)

ගරු කථානායකතුමනි, අද මේ උත්තරීතර සභාව රැස් වුණේ, මේ රටේ ජීවත් වූ සුවිශේෂ දේශපාලනඥයෙකුගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරමින් එතුමා වෙනුවෙන් ගුණ කථන කිහිපයක් පිළිගන්වන්නයි. අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගෙන් සිදු වුණු සේවය පිළිබඳව මේ ගරු සභාවේදී දීර්ඝ ලෙස කරුණු - කාරණා ඉදිරිපත් කරන්නට යෙදුණා.

ගුණවර්ධන මැතිතුමා ගම්පහ දිස්ත්‍රික්කයේ උපත ලබා, අධ්‍යාපනය හදාරා, පළමුව ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉඩම් ඕවර්සියර් තනතුරට බැඳී සේවය කළ අතර, ඉන් පසුව පොලිස් සේවාවට අනුයුක්තව කටයුත්ත කළා. පසුව දේශපාලනඥයෙකු හැටියට - පළාත් සභා මන්ත්‍රීවරයෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක්, ඒ වාගේම අවසානයේ කැබිනට් ඇමතිවරයෙක් හැටියට- කටයුතු කළා. එතුමා ඉතාමත් ආදර්ශවත් දේශපාලනඥයෙක් කියන කාරණය මා මතක් කරන්නට ඕනෑ. කිසිම දවසක එතුමා, තමන්ට ලැබුණු තනතුර තුළින් තම බල මහිමය පෙන්වන්නට උත්සාහ කළේ නැහැ. සෑම වේලාවේම සාධාරණත්වය උදෙසා තම ජීවිතය කැප කළ දේශපාලනඥයෙකු බවයි, මගේ අදහස වන්නේ. නීතිය හා සාමය පිළිබඳ ඇමතිවරයා හැටියට පසු ගිය අවුරුද්දේ, මම එතුමා සමඟ බොහොම කිට්ටුවෙන්ම කටයුතු කළා. ඒ අවස්ථාවේදී, "කොහොමද පොලීසිය සම්බන්ධව ක්‍රියා කළ යුත්තේ?" කියා එතුමා මට බොහෝ උපදෙස් ලබා දුන්නා.

විශේෂයෙන්ම, අපේ ගරු අගමැතිතුමා සඳහන් කළ හැටියට, පොලීසියේ සුළු නිලධාරීන්ගේ අවශ්‍යතාවන් පිළිබඳව මට උපදෙස් දුන්නා. මා සමඟ පොලීසිය සම්බන්ධ සෑම උත්සවයකටම එතුමා සහභාගි වුණා. එහෙම සහභාගි වෙලා, "කොයි විධියටද පොලීසිය සමඟ කටයුතු කළ යුත්තේ?" කියන එක පිළිබඳව මට අනුශාසනා; උපදෙස් ලබා දුන්නා. මම ඒවා කිසිම දිනක අමතක කරන්නේ නැහැ. මේ සා විශාල සේවයක් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට, ඒ වාගේම එතුමා හෙබවූ අමාත්‍යාංශවලදී දැක්වූ සේවය අද මේ රටට නැතිවීම ගැන අප කනගාටු වනවා. මේ විධියේ ගති ගුණ ඇති, අවංක දේශපානඥයකුගේ අභාවය මේ රටට විශාල පාඩුවක් කියලා මම කල්පනා කරනවා. එතුමාගේ අභාවයට ප්‍රථමයෙන්, ඉඩම් අමාත්‍යාංශය භාර ඇමතිවරයා හැටියට එතුමා විශාල වැඩ කොටසක් සැලසුම් කර තිබුණා. ඒ සැලසුම් ක්‍රියාත්මක කරන්න සූදානම් වන අවස්ථාවේදී තමයි එතුමාට අවසන් ගමන් යන්න සිද්ධ වුණේ. ඒ වාගේම, එතුමාගේ දේශපාලන කටයුතුවලදී එතුමාගේ භාර්යාව, දු පුතුන් සියලු දෙනා එතුමාට පූර්ණ සහයෝගය ලබා දුන්නා. මෙතුමාගේ අභාවය පිළිබඳ ප්‍රවෘත්තිය ලැබුණාම, අප සියලු දෙනාම කනගාටු වුණා.

එතුමා දැරූ තනතුර වූ ඉඩම් ඇමති ධුරය ගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් පැවරුවේ මටයි. මම ඒ ධුරයේදී විශේෂයෙන්ම, "ගුණවර්ධන මැතිතුමා මොනවාද සැලසුම් කරලා තිබුණේ, මොනවාද එතුමා ඉදිරියට කර ගෙන යන්න බලාපොරොත්තු වුණේ?" කියන කාරණා පිළිබඳව ආපසු හැරී බැලුවා. අගමැතිතුමා

[ගරු ජෝන් අමරතුංග මහතා]

සඳහන් කළා, ඉඩම් ආඥාපනත සංශෝධනය කරලා, සින්නක්කර ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්නට කටයුතු කරන බව. දැන් ඒ පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුතු කර ගෙන යනවා. ඉදිරියේදී ඒ පනත් කෙටුම්පත සම්මත වුණාම බලපත්‍ර, ස්වර්ණභූමි, ජයභූමි ඔප්පු ලැබූ ඉඩම්ලාභීන්ට, සින්නක්කර ඔප්පු ලබා දෙන්නට අවස්ථාව සැලසෙනවා. ඒක බොහොම වැදගත් ප්‍රතිපත්තියක්. දහස් ගණනක් ඒ ක්‍රියාදාමය දෙස බලා ගෙන ඉන්නවා. එම නිසා, ගුණවර්ධන මැතිතුමා ආරම්භ කළ වැඩ පිළිවෙළ අප ඉදිරියට ගෙන යනවාය කියන එක මේ අවස්ථාවේ මේ ගරු සභාවේදී ප්‍රකාශ කරනවා.

මෙතුමාගේ අභාවය පිළිබඳව මේ ගරු සභාවේ මට පෙර කථා කළ ගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා, අනෙක් පක්ෂ නායකයන් වාගේම විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා, එතුමාගෙන් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට සිදු වුණු සේවාවත්, එතුමා දැරූ නිල තල තුළින් සිදු වුණු සේවාවන් පිළිබඳවත් සවිස්තරව කථා කළ නිසා, මම ඒ කරුණු නැවත වරක් මේ සභාවට ඉදිරිපත් කරන්නට යන්නේ නැහැ.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන අභාවය වෙනුවෙන් භාර්යාවටත්, පුත්‍ර රත්නයටත්, දියණිය ඇතුළු සියලුම ඥාතීන්ටත් මාගේ පෞද්ගලික කනගාටුව සහ අප පක්ෂයේ කනගාටුව පළ කරමින්, එතුමාට "නිවන් සුව අත් වේවා!" යි ප්‍රාර්ථනය කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.35]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, දීර්ඝ කාලයක් මෙම ගරු සභාව නියෝජනය කළ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳව ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් වචන කිහිපයක් එකතු කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගුණවර්ධන මැතිතුමා අපිත් සමඟ මේ ගරු සභාව නියෝජනය කරන්නට ප්‍රථම වතාවට පැමිණියේ 1989දීයි. ගරු කථානායකතුමනි, 1989 ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණය පැවති කාලය ප්‍රජාතන්ත්‍රවාදය ඉතාමත්ම බරපතළ අභියෝගයකට මුහුණ දුන් අවධියක්. දකුණ තුළ විශාල භීෂණයක් තිබුණා. ඒ කාලයේ, "හොර පාර්ලිමේන්තුව වර්ජනය කරව්", "පාර්ලිමේන්තු මැතිවරණයට ඡන්දය දෙන අයට දඩුවම මරණයයි", "පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස ඡන්දය ඉල්ලන සියලු දෙනාට දඩුවම මරණයයි" කියලා ජනතා විමුක්ති පෙරමුණ විසින් ගම් මට්ටමේ, බිම් මට්ටමේ විශාල ප්‍රජාතන්ත්‍ර විරෝධී මතවාදයක් ඉදිරිපත් කරලා තිබුණා. එම නිසා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය තුළ කුමන දේශපාලන පක්ෂයක සිටියත් අපි කවුරුත් ඒ පක්ෂවලින් නාම යෝජනා දුන්නේ මරණ සහතිකයක් ලැබෙන්නට පුළුවන් බවත් හිතාගෙනයි. එදා ඒ අභියෝගාත්මක මැතිවරණයෙන් ජයග්‍රහණය කරලා වර්තමාන ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාත්, අපේ ගරු සභානායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාත්, ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා ඇතුළු අපි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ විපක්ෂ නායකත්වයෙන් මේ පැත්තේ අසුන් ගෙන සිටියා. ඒ කාලයේ අපට විවිධ දේවල් සඳහා අරගළ කරන්නට සිදු වුණා. එවකට කථානායකතුමා වශයෙන් සිටියේ එම්.එච්. මොහොමඩ් මැතිතුමා. ඒ කාලයේ දුෂ්කර ප්‍රදේශවල මන්ත්‍රීවරුන්ට කොළඹ නවාතැන් ගැනීමට නිවාස තිබුණේ නැහැ. "ශ්‍රාවස්තිය" පමණයි තිබුණේ.

මට මතකයි ඇත එපිට පළාත්වල මේ ගරු සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට නිවාසයක් තිබිය යුතුයි කියන සටන කරන අවධියේ ඒ දුෂ්කර ප්‍රදේශවල සියලුම මන්ත්‍රීවරුන් වෙනුවෙන් එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා සමඟර දවස්වලට කොටිටයක් සහ පැදුරක් අරගෙන ආවා, "මන්ත්‍රීවරුන්ට නිවාස දෙන තෙක් මේ පාර්ලිමේන්තුවේ නිදා ගන්නවා" කියලා. එහි ප්‍රතිඵලයක් ලෙස එවකට නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති ලෙස සිටි ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා ප්‍රේමදාස ආණ්ඩුවේ නියමය මත මාදිවෙල නිවාස සංකීර්ණය ඇති කළා. එම නිසා, අද මන්ත්‍රීවරුන්ට නිවාස ලැබිලා තිබෙනවා නම්, අද ඇත එපිට පළාත්වල මන්ත්‍රීවරුන් මන්ත්‍රී නිවාසවල ඉන්නවා නම් ඒ ඉන්නා නිවාස ලබා දීමේ ගෞරවය දිවංගත එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාට හිමි විය යුතුයි කියලා මම හිතනවා.

ඒ අවධිය තුළදී පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ, නව සමසමාජ පක්ෂය සහ කොමියුනිට්ස් පක්ෂවල නියෝජනයක් තිබුණා. මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තුවට එන්නට සිදු වුණේ හියෙන් සහ සැකයෙන්. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා වැන් රථයකින් පැමිණියේ සොයා ගන්න බැරි වෙන විධියට විශාල යකඩ පුවරුවකින් ආවරණය කරගෙන බව මට මතකයි. තැන තැන මිනී දකින්නට තිබුණා. කොයි පැත්තෙන් කොයි මොහොතේ මරණය ලැබෙනවාද කියලා විශ්වාසයක් තිබුණේ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් විවිධ කණ්ඩායම්වලින් -කොයි කණ්ඩායමෙන් එනවාද දන්නේ නැහැ.- මරණීය තර්ජන තිබුණා. හැබැයි, එවකට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා ලෙස සිටි රන්ජන් විජේරත්න මැතිතුමා පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පූර්ණ ආරක්ෂාවක් ලබා දෙන්න කටයුතු කළා. ආරක්ෂක අමාත්‍යාංශය භාර අපේ ජෝන් අමරතුංග මැතිතුමාත් මන්ත්‍රීවරුන්ට එම ප්‍රශ්න තිබෙනවාද කියා බැලුවා. ඒ ගැනත් මම මතක් කරන්න ඕනෑ.

ඒ කාලයේදී එතුමා කන්තලේ වැනි දුෂ්කර ප්‍රදේශයක සිට මේ සභාව නියෝජනය කරමින්, එල්ටීටීඊ එකේ ත්‍රස්තවාදය ආරම්භ වීමෙන් පසුව හඬක් නහන්න බැරි, නිරායුධ, අවිහිංසක මිනිසුන් වෙනුවෙන් හඬ නහන්න මේ ගරු සභාව ඉතාම පුළුල් ලෙස භාවිත කළා. තර්ජිත ගම්මානවල අහිංසක මිනිස්සු දහස් ගණනින් මරා දමන කොට, ඒ වේදනාව, දුක බොහොම බරපතළ ලෙස උස් හඬින් මේ සභාවේ ඉදිරිපත් කළේ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මන්ත්‍රීතුමායි. එතුමා රන්ජන් විජේරත්න හිටපු ආරක්ෂක ඇමතිතුමා සමඟ ඉතාම උණුසුම් ලෙස වාද විවාදවලට පැටලුණා. මේ රට කඩන්නේ නැතිව, බෙදන්නේ නැතිව, උතුර නැඟෙනහිර ඒකාබද්ධ නොකොට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සියලු මිනිසුන් ත්‍රස්තවාදයෙන්, ආයුධවලින් තොරව ප්‍රශ්න විසඳාගත යුතුය කියන ස්ථාවරයේ එතුමා හිටියා. ඒ නිසා එතුමාට කරන ගෞරවයක් ලෙස මෙන්න මේ කාර්යය අපට කරන්න පුළුවන් නම් හොඳයි, ගරු කථානායකතුමනි.

1989 සිට 1994 දක්වා අප මේ සභාවේ කරපු සියලු කටයුතු - අද කියනවාට වඩා- හැම අකුරක් ගණනේම වාර්තා වෙලා, මුද්‍රණය කර තිබෙනවා. එතුමාගේ දේශපාලනයේ ස්වර්ණමය අවධිය ලෙස සැලකෙන නැඟෙනහිර පළාතේ ජනතාව වෙනුවෙන් එතුමා මේ ගරු සභාවේදී නඟපු හඬ පිළිබඳ හැන්සාඩ් වාර්තා එකතු කරලා පොඩි කෘතියක් මුද්‍රණය කරන්න පුළුවන් නම් එය දිවංගත එම්.කේ.ඩී.ඒ.එස්. ගුණවර්ධන මැතිතුමාට කරන උපහාරයක් ලෙස අපට සලකන්න පුළුවන්.

පසු කාලයේදී එතුමා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යටතේ බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙස මේ රටේ බුද්ධ ශාසනය වෙනුවෙන් විශාල සේවයක් ඉෂ්ට කළා. පසු කලකදී එතුමා රෝගාතුර වුණා. ඒ රෝගාතුර වුණු අවස්ථාවේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉතාම ළෙන්ගතු, හෘදයාංගම බවකින් එතුමාගේ රෝගය සුවපත් කිරීම සඳහා කරන්න පුළුවන් සියලු අනුග්‍රහයන් දක්වපු බව මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමැතියි. නමුත්, අප කාටත් පොදු ධර්මතාව අනුව එතුමාට වැලඳුණු ඒ රෝගයෙන් ගැලවෙන්න බැරි වුණා.

එතුමා අද දිනයේ සිටියා නම් අවශ්‍යයෙන්ම මේ වන විට එතුමා බලාපොරොත්තු වුණු බොහෝ දෙවල් කරලා අවසන් කර ගන්න තිබුණා. එතුමාගේ ලොකු ප්‍රාර්ථනාවක් තිබුණා, කන්තලේ සීනි කර්මාන්තය වැනි කර්මාන්ත ආරම්භ කරලා ඒ ප්‍රදේශයට වැඩි සේවයක් කරන්න. එහෙම නම් රුපියල් 30ක් වුණු සීනි කිලෝ එකක් සඳහා වූ බද්ද සත 25ට අඩු කළාම දේශීය උක් කර්මාන්තයේ නියුතු වන අය වෙනුවෙන් මේ ගරු සභාව ඇතුළේ එතුමාට විශාල හඬක් නඟන්න තිබුණා. උතුරු නැඟෙනහිර ඒකාබද්ධ කරන්න සූදානම් වෙන කොට එය කරන්න එපාය කියාත් විශාල හඬක් එතුමාට ඒ ප්‍රදේශය වෙනුවෙන් නඟන්න තිබුණා. එතුමා පොලිස් නිලධාරියෙක් ලෙස සේවය කළ නිසා කුරිරු ත්‍රස්තවාදයේ අනිටු ඵල එතුමා හොඳින්ම දැනගෙන හිටියා. ඒ වෙනුවෙන් කැප වුණු ත්‍රිවිධ හමුදාව හා පොලීසිය දඬයම් කිරීම නවත්වන්න කියාත් එතුමාට මේ පාර්ලිමේන්තුවේදී විශාල හඬක් නඟන්න තිබුණා. නමුත්, එතුමා නොමැති වීම නිසා ඒ අඩුව අපට දැනෙනවා.

ගරු කථානායකතුමනි, විශාල යුග මෙහෙවරක් කළ ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ ඒ සේවය අප සදාකාලිකව අගය කරනවා. විශේෂයෙන්ම දුෂ්කර පළාත්වල ඉන්න හඬක් නැඟිය නොහැකි ලක්ෂ සංඛ්‍යාත ගොවීන්, විවිධ ජන වර්ගයන්ට අයත් අහිංසක ජනතාව වෙනුවෙන් එතුමා කරන්න බලාපොරොත්තු වූ හා කළ කාර්යය පිළිබඳව එතුමාට අපේ ගෞරවයත් ස්තුතියත් පුද කර සිටිනවා. එතුමාගේ අභාවය වෙනුවෙන් විශේෂයෙන් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායමේත් ශෝකය එතුමාගේ බිරිඳට හා දරුවන්ටත්, පවුලේ සියලු ඥාතීන්ටත් පළ කරමින්, එතුමාට සදා නිසංසල නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණි ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමා.

[අ.භා. 2.45]

ගරු ගාමිණි ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)

ගරු කථානායකතුමනි, 1977 ඉඳලා දිසා ඇමතිවරයෙක් විධියට පාර්ලිමේන්තුවෙත්, ප්‍රධාන ඇමතිවරයා විධියට පළාත් සභාවේත් කටයුතු කළ කෙනෙක් වශයෙන් මට නොබියව කියන්න පුළුවන්, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා අද මේ පාර්ලිමේන්තුවේ සිටියා නම්, මේ ගරු සභාවේ සිටින කිසිම කෙනෙකුට එතුමාට ඇඟිල්ලක් දික් කරලා, "මෙයා දූෂිතයෙක්" කියලා කියන්න පුළුවන් කමක් නැති බව. එතුමා අවංකකම හිත ඇතුළේ විතරක් තියා ගන්නේ නැතුව, ඒ අනුව වැඩ කරපු මහා උතුම් දේශපාලකයෙක්. එතුමා හොඳ දේශ සේවකයෙක්. ගරු කථානායකතුමනි, මේ "දේශපාලකයා" සහ "දේශ සේවකයා" කියන වචන දෙක අතර වෙනසක් තිබෙනවා. මේ "දේශපාලකයා" කියන වචනය අපි වෙනස් කරන්න ඕනෑ. මොකද, අප පත් කරන්නේ මහ ජනතාවයි. මහ ජනයා පත් කරන කෙනෙක් විධියට අපි ජනතාවගේ සේවකයෙක් වනවා. ඒ අනුව එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා මම දැක්කේ දේශ සේවකයෙක් විධියටයි. ඒ නිසා එතුමා මහා උත්තම පුද්ගලයෙක් විධියටයි මම දැක්කේ. එතුමා තමන්ගේ සේවයේදී නිහතමානී වුණා. මට එතුමා කොතැනකදී හෝ හමු වුණා නම්, මා දැක්ක දෙයක් තමයි එතුමා එන්නේ කඩියා වාගේ කඩිසරව; පොළොවට තමන්ගේ දහඩිය සුවඳ දැනෙන විධියට බව. පොඩි ජනතාවගේ කෙනෙක් විධියට එතුමා කවදාවත් සෙරෙප්පුවක් දාගෙන එනවා මම දැක්කේ නැහැ. අතිගරු ජනාධිපතිතුමාත් ඒ කාරණය ගැන කිව්වා. සමහර අවස්ථාවල මම ඒ ගැන කථා කරද්දී, දහඩිය සුවඳ දන්නා ගොවි මහත්තයෙක් විධියට, ගැමි ජනතාවගේ කෙනෙක් විධියට එතුමා ඒකට කියන්නේ මොකක්ද? මේ කකුලේ දහඩිය පොළවට ගෑවෙන්න ඕනෑ; අපි පොළොවට ගෑවෙන්න ඕනෑ කියලායි.

මට මතකයි, මම 2001 වාරිමාර්ග සහ ජල කළමනාකරණ ඇමති විධියට හිටපු කාලයේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රදේශයේ සංවර්ධන වැඩවලට යද්දී, ඒ ගැන එතුමාට කියනවා. එතුමා ඇමති ද, මන්ත්‍රී ද, විපක්ෂයේ ද කියා මම බැලුවේ නැහැ. එතුමා කළ සේවය දෙස බැලුවාම මට එතුමා ගැන ගෞරවයක් තිබුණා. ඒ නිසා මම හැමදාම ත්‍රිකුණාමලයට යනවා නම්, මම ඒ පිළිබඳ එතුමාට දුරකථනයෙන් කියනවා. ඒ වාගේම මගේ කාර්ය මණ්ඩලයටත් මම කියනවා, එතුමා දැනුවත් කරන්න කියලා. ඉතින් මම ආඩම්බරයෙන් කියනවා, එතුමා අපේ අයට ඉස්සෙල්ලා කන්තලේ ජලාශයේ bund එකට කිලෝමීටරයක් විතර එහාට ඇවිල්ලා ගරු කථානායකතුමනි, එතුමා මා එක්ක මගේ වාහනයට නැගලා ඒ ප්‍රශ්න ගැන කථා කරමින් යන්න තරම් නිහතමානී ගුණාංගවලින් හෙබි කෙනෙක් බව. ඒ නිසායි මම එතුමාට ගරු කළේ.

පාර්ලිමේන්තුවට පැමිණීම දක්වා එතුමාගේ ජීවිත ගමන සහ එහි තිබූ කම්කටුලු ගැන සෑම කථික මන්ත්‍රීතුමෙක්ම කථා කළා. එතුමා ඒ කළ සේවය අගය කරන්න ඕනෑ. තමාගේ දුක්බිත ජීවිතයේ ඒ තිබිච්ච දේවල් එතුමා කාටවත් පෙන්වන්න ගියේ නැහැ. ආදාහන උත්සවයට ගියාම ඒ ගෙදර තිබූ තත්ත්වය අපි දැක්කා; ආර්ථික තත්ත්වය අපි දැක්කා. ඉතාමත්ම බෙදහීනය තත්ත්වයකයි එතුමා හිටියේ. තමාට ඒ දේවල් කර ගන්න ඕනෑකම තිබුණා නම්, ඕනෑ තරම් හම්බ කර ගන්න අවස්ථාව තිබුණා. නමුත් එතුමා ඒ දේවලට ගියේ නැහැ. එතුමා ඉතාමත් නිහතමානී පුද්ගලයෙක් විධියට තම ජීවිතය ගත කළා. එතුමාගේ ආදාහන උත්සවයට ගිහින් ඇවිල්ලා, එතුමා ගත කළ ඒ කටුක ජීවිතය ගැන මම රාජිත සේනාරත්න ඇමතිතුමා සමඟ කථා වුණා. එතුමා මේ රටට සේවයක් කළ පුද්ගලයෙක් විධියට, එතුමාගේ ඒ ආදරණීය බිරිඳ සහ දරුවන්ට ආර්ථික වශයෙන් හෝ යමක් අපි කළ යුතුයි කියන කාරණය සම්බන්ධයෙන් අපි අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් දැනුවත් කළා. ඒ තරම් නිහතමානීකමකින් තම ජීවිතය ගෙනගිය ඒ ප්‍රතිරූපය අපට අමතක කරන්න බැහැ.

වනජීවී ඇමති හැටියට මගෙන් එතුමා මීට මාස කිහිපයකට ඉස්සෙල්ලා ඉල්ලීමක් කළා, ගරු කථානායකතුමනි. ඒ ඉල්ලීම මොකක්ද? එතුමා වෙනුවෙන් නොවෙයි, ඒ ඉල්ලීම කළේ. එතුමා කිව්වා, වනජීවී එකට අයත් සේරුවිල රක්ෂිත ප්‍රදේශයත් එක්කම කන්තලේ ප්‍රදේශයෙන් වන රක්ෂිත උද්‍යානයක් හදන්න කියලා. එහෙම කළොත් වන්දනාවේ යන ජනතාවටත්, අනික් අයටත්,

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

සංචාරකයන්ටත් එය විශාල සේවයක් වෙයි කියලා කිව්වා. ඒ නිසා මම ප්‍රකාශ කළා, මම ඒ කටයුත්ත කරනවා කියලා. දැනටමත් මම ඒ ගැන මගේ නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර ගෙන යනවා. අපි බලනවා, එම උද්‍යානය විවෘත කිරීමේදී එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ නමින් එය විවෘත කිරීමටත්. අපි පිදිය යුත්තන්ට පුදන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, පින්නවල අලි අනාථාගාරය පටන් ගත්තේ පී.බී.ජී. කළුගල්ල මැතිතුමායි. අපි ඒවා අමතක කරන්න හොඳ නැහැ. අපි පක්ෂ, පාට, භේද අනුව නොවෙයි, අපේ ධර්මය අනුවයි කටයුතු කරන්න ඕනෑ. කෙනෙක් යම් වැඩක් කළා නම් අපි ගරු කරන්න ඕනෑ. ඒ උත්තමයා කළ සේවයට උපහාරයක් ලෙස මම තීරණය කළා පින්නවල අලි අනාථාගාරයේ කොටසක් පී.බී.ජී. කළුගල්ල මැතිතුමා නමින් නම් කරලා, විවෘත කරන්න. මම කිව්වා, එම ස්ථානයේ කළුගල්ල මැතිතුමාගේ රූපයක් හදන්න කියලාත්.

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාත් ජනතාවත් එක්කයි හිටියේ. මට මතකයි, මම පාර්ලිමේන්තුවෙන් අස් වෙලා ප්‍රධාන ඇමති විධියට වයඹට ගිහින් ඉන්න කාලයේ රටේ ත්‍රස්තවාදී භීෂණය තිබුණා. ඒ වෙලාවේ එතුමා සිංහල, දෙමළ කියලා නොවෙයි. ගම්මාන ආරක්ෂා කිරීම වෙනුවෙන් විශාල හඬක් නඟලා මේ පාර්ලිමේන්තුවේ කථා කළ ආකාරය මම දැක්කා. ඊළඟට, මට මතකයි ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරලා පැමිණි ඉන්දියන් හමුදාව ත්‍රිකුණාමලයෙන් ගියාට පස්සේ ඒ ප්‍රදේශයේ එවකට සිටි අණ දෙන නිලධාරි බ්‍රිගේඩියර් විජේරත්න මට ආරාධනාවක් කළා, "ත්‍රිකුණාමලයේ අනාථ වී සිටින සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාවට ගෙවල් හදලා දෙන්න" කියලා. මම වයඹ ප්‍රධාන ඇමතිවරයා හැටියට ඒ වෙලාවේ ගිහිල්ලා බලද්දි, මම ත්‍රිකුණාමල නගරයක් දැක්කේ නැහැ. මම දැක්කේ, පාළු වුණු ප්‍රදේශයක්. ත්‍රස්තවාදී භීෂණයට වඩා ඒ වෙලාවේ සිදු වූ සිද්ධීන් ගැන මම කථා කරන්න යන්නේ නැහැ. එදා විජේරත්න මහතා මට එසේ කියද්දි, ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතාත් ඇවිල්ලා මට කථා කළා. මම ගෙවල් සෑදීමේ කාර්ය කරන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් භාර දුන්නා. ස්වාමීන් වහන්සේලාත් වහළ උඩ නැඟගෙන වැඩ කළා. රූපවාහිනියෙන් ඇවිල්ලා ඒවා කැමරාගත කර ඔවුන් ප්‍රවෘත්ති නිෂ්පාදනය කළා. ගුණවර්ධන මැතිතුමාත් ආවා. මම දෙමළ ගම්මානවල, මුස්ලිම් ගම්මානවල, සිංහල ගම්මානවල ගෙවල් 300 ගණනක් හැදුවා. ඒ අවස්ථාවේ පරාල ඇණයක් ගන්න තැනක් ත්‍රිකුණාමල නගරයේ තිබුණේ නැහැ, ගරු කථානායකතුමනි. මට ඒ ඔක්කෝම මෙහෙන් ගෙන යන්න සිද්ධ වුණා.

ඊට පසුව ප්‍රේමදාස ජනාධිපතිතුමා වැඩ පිළිවෙළ සකස් කර ඒ පළාත සංවර්ධනය කෙරුවා. මට මතක් වනවා, එතැනදී ගුණවර්ධන මැතිතුමා ඇවිල්ලා මට සහාය දුන් ආකාරය; කථා කරපු ආකාරය. එහෙම උත්තමයෙක් එතුමා. ඒ උත්තමයාට අපි පුදන්න ඕනෑ; ගරු කරන්න ඕනෑ. මම ඒකයි කිව්වේ, කන්තලේදී එතුමා කළ අවසන් ඉල්ලීම අනුව මම උද්‍යානය පටන් ගන්නවා කියලා. ඒ කටයුත්ත සඳහා මට කාර්ය මණ්ඩලයේ අඩුවක් තිබෙනවා. මා එය සම්පූර්ණ කරන ලෙස ඉල්ලා තිබෙනවා. කාර්ය මණ්ඩලය ලැබුණු විගසම ඒ ප්‍රදේශයේ වන රක්ෂිත උද්‍යානය හදලා, එතුමාගේ නමින් නම් කිරීමටත් මම යෝජනා කර තිබෙනවා. ඒක සිදු කරනවා.

ගුණවර්ධන මැතිතුමා මහා උත්තමයෙක්. රට වෙනුවෙන් විශාල සේවයක් කළ එතුමාට අමා මහා නිවන් සුව අත්වේවා කියා අපි පතනවා. එතුමාගේ අභාවය වෙනුවෙන් වූ අපගේ ශෝකය එම මැතිනියට, දරුවන්ට ඥාතීන්ට සහ ඡන්ද දායක දායිකාවන්ටත් අපි පුද කරනවා.

[பி.ப. 2.53]

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)

கௌரவ சபாநாயகர் அவர்களே, எங்களைவிட்டு மறைந்த கௌரவ அமைச்சர் எம்.கே.ஏ.டீ.எஸ். குணவர்தன அவர்களுடைய அனுதாபத் தீர்மானத்தில் ஒருசில வார்த்தைகள் பகிர்வதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்காகத் தங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். அமரர் குணவர்தன அவர்கள் ஓர் அரசியல்வாதியாக இருந்தாலும், அவர் அதற்கு முன்னரே தமது பிரதேசத்தைச் சேர்ந்த கஷ்டப்பட்ட கிராம மக்களுடைய மனதிலே இடம்பிடித்தவர் என்பதை நாங்கள் மறந்துவிட முடியாது. இவர் 1947ஆம் ஆண்டு பிறந்து 2016ஆம் ஆண்டு 69ஆவது வயதிலே தனது வாழ்க்கை வட்டத்தை முடித்துக்கொண்டாலும், அவருடைய மரணம் எமக்கெல்லாம் ஒரு பேரிழப்பாகும். இவர் நோய்வாய்ப்பட்டுத் தன்னுடைய உயிரை இழக்கவேண்டிய ஒரு சூழ்நிலை ஏற்பட்டுவிட்டது.

இவர் தனது அரசியல் வாழ்வுக் காலகட்டத்திலே தன்னால் இயன்ற அத்தனை பணிகளையும் தான் பிரதிநிதித்துவப் படுத்தும் மாவட்டத்திற்கும் மாவட்டத்திலுள்ள ஒவ்வொரு குக்கிராமங்களுக்கும் அங்கு வாழ்கின்ற மக்களுக்கும் செய்திருக்கின்றார் என்பதை எவரும் மறுப்பதற்கில்லை. ஒரு மனிதன் பிறந்து வாழ்ந்த காலத்திலே அவன் மக்களுக்காக என்ன செய்தான்? என்ன சேவைகளை வழங்கியிருக்கின்றான்? என்பதுதான் மிக முக்கியம். இந்த வகையில் அமரர் குணவர்தன அவர்கள் மிகவும் பெறுமதியான சேவைகளை வழங்கிச் சென்றிருக்கின்றார்.

இங்கே ஆரம்பத்தில் உரையாற்றிய மாண்புமிகு பிரதம அமைச்சர் அவர்களும் மேதகு ஜனாதிபதி அவர்களும் அவர்களைத் தொடர்ந்து உரையாற்றிய சிரேஷ்ட அமைச்சர்களும் எதிர்க்கட்சித் தலைவர் அவர்களும் கட்சித் தலைவர்களும் ஏனைய உறுப்பினர்களும் அவருடைய சேவைகளைப் பற்றி இங்கே குறிப்பிட்டார்கள். அவரைப் பொறுத்தளவிலே, அவருடைய பணி திருகோணமலை மாவட்டத்தில் மிகவும் கஷ்டமான ஒரு தொகுதியில்தான் ஆரம்பித்தது. 1982ஆம் ஆண்டு போக்குவரத்து வசதிகளும் ஏனைய வசதிகளும் குறைந்த சேருவில தொகுதியிலேயே அவர் தன்னுடைய அரசியல் பணியைத் தொடங்கினார். இவர் அரசியல் பணியில் ஈடுபடுவதற்கு முன்பு ஆரம்பத்திலே காணி உத்தியோகத்தராக திருகோணமலைக் கச்சேரியில் நியமனம் பெற்றார். பின்னர் கந்தளாயிலுள்ள வானெல பிரதேசத்தில் அவருடைய சேவை தொடர்ந்தது என்பதை நாங்கள் அறிவோம். அங்கு அவர் பணியாற்றிய காலப்பகுதி யிலும் அவருடைய சேவைகள் மிகவும் அர்ப்பணிப்போடு நடந்தேறின என்பதை மறுப்பதற்கில்லை.

அதனைத் தொடர்ந்து அவர் பொலிஸ் சேவையில் ஒரு சாதாரண பொலிஸ் உத்தியோகத்தராகச் சேர்ந்துகொண்டார். அவருடைய நல்ல முயற்சியினாலும் சிறந்த சேவையினாலும் உதவிப் பொலிஸ் அத்தியட்சகர் வரையும் பதவியுயர்வுகளைப் பெற்றுக்கொண்டு சேவை செய்துள்ளார். அதன் பிற்பாடு அரசியலுக்கு வந்த இவர் அரசியலிலும் ஒரு நல்ல மதிப்பையும் கௌரவத்தையும் பெற்றிருக்கின்றார். அவருடன் கடமை யாற்றிய காணி உத்தியோகத்தர்களோடும் பொலிஸ் உத்தியோகத்தர்களோடும் அதேபோன்று அரசியலில் பாராளுமன்ற உறுப்பினர்களோடும் ஏனைய அமைச்சர் களோடும் அவர் பழகுகின்ற தன்மை ஒரு தனித்துவம் வாய்ந்தது. சிறு பிள்ளைகள் முதல் பெரியவர் வரை எந்தவித

பாகுபாடுமில்லாமல் இன்முகத்தோடு பழகுகின்ற ஒரு தன்மையை நாங்கள் அவரிடம் பார்த்திருக்கின்றோம். எவரையும் இலகுவாகக் கவர்ந்து காரியங்களைச் சாதிக்கக் கூடிய ஓர் ஆற்றலோடு அவர் இருந்திருக்கின்றார்.

நான் 2001ஆம் ஆண்டு அரசியலுக்கு வந்தபோது அவரை நான் முதல்முதலாகச் சந்தித்து என்னை அறிமுகப்படுத்திக் கொண்டேன். கடந்த காலங்களிலே அவரோடு நான் நெருங்கிப் பழகியிருக்கின்றேன். எந்தவோர் அரசியல் விடயத்திலும் நாங்கள் மனம்விட்டுப் பேசிக்கொள்வோம். எப்பொழுதும் நாங்கள் முரண்பாட்டைச் சந்திக்கவில்லை. அவர் மிகவும் நட்புறவோடும் பண்போடும் எங்களுடைய மக்களின் பிரச்சினைகளைத் தீர்த்த வரலாறுகள்தான் எனது ஞாபகத்திற்கு வருகின்றன. அவருடைய பூதவுடல் கம்பஹாவில் இருந்தபோது நான் 2 - 3 முறை அந்த வீட்டுக்குச் சென்றிருந்தேன். அங்கு இராப்பகலாகக் கூடியிருந்த மக்களைப் பார்க்கும்போது, அவர்மீது அந்த மக்கள் எவ்வளவு அன்பையும் ஆதரவையும் மதிப்பையும் வைத்திருந்தார்கள் என்பதை உணரக்கூடியதாக இருந்தது.

அன்று அவருடைய இறுதிக்கிரியைகளிலே எங்களுடைய எதிர்க்கட்சித் தலைவர் அவர்கள் கலந்துகொள்ள முடியாத நிலையில் "அந்த இறுதிக் கிரியைகளில் நீங்கள் கண்டிப்பாகக் கலந்துகொள்ள வேண்டும்" என்று கூறி, எனக்கு ஒரு செய்தியை அனுப்பியதுடன், அவருடைய அனுதாபச் செய்தியையும் அனுப்பியிருந்தார். அந்த இறுதிக்கிரியைகளிலே கலந்து கொள்ளக்கூடிய ஒரு சந்தர்ப்பம் எனக்குக் கிடைத்தது. அன்று அவருடைய இறுதிக்கிரியைகள் இடம்பெற்ற கந்தளாய் பொது விளையாட்டு மைதானம் மக்களால் நிரம்பி வழிந்தது. அந்தளவுக்கு மக்கள் அவருடைய இறுதிக்கிரியைகளில் கலந்துகொண்டார்கள். அப்பொழுது பாடசாலை மாணவர்கள், ஆசிரியர்கள், அரசாங்க உத்தியோகத்தர்கள், பொதுமக்கள் என்று பலதரப்பட்டவர்களும் அந்த மைதானத்தில் குழுமியிருந்து அழுத காட்சியை நான் இப்பொழுதும் எண்ணிப் பார்க்கின்றேன். பலரும் இங்கு குறிப்பிடப்பட்டபடி அனைவருடைய உள்ளங்களையும் அந்தளவுக்குத் தொட்ட ஓர் அரசியல் தலைவர் அவர்.

திருகோணமலையிலே 4 வது மைல் 'போஸ்ற்' இல் இருந்து கப்பற்றுறை மற்றும் கிண்ணியா துறை வரையிலும் உள்ள பல நிலங்கள் வர்த்தமானி அறிவித்தல்மூலம் இலங்கைத் துறைமுக அதிகாரசபைக்குப் பெற்றுக்கொள்ளப்பட்டதாகத் தெரிவிக்கப் பட்டது. துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர் அவர்களும் இங்கே இருக்கிறார்; அவருக்கும் இது தெரிந்திருக்கும். அவற்றில் பொதுமக்களுடைய பயன்பாட்டு நிலங்களை அவர்களுக்கு மீண்டும் பெற்றுக்கொடுக்க வேண்டும் என்பதற்காக அவர் பல முயற்சிகளைச் செய்தார். அந்த முயற்சிகள் ஓரளவு கைகூடிவருகின்ற நிலையிலே இப்பொழுது அவர் எங்கள் மத்தியிலே இல்லை. இருந்தாலும் அவருடைய முயற்சிகள் தொடரப்பட்டு அவருடைய எண்ணப்படி அந்த மக்களுக்கு அவை கொடுக்கப்பட வேண்டும் என்பது எங்களுடைய விருப்பமாகும். அதே போன்று இங்கு குறிப்பிட்டபடி கந்தளாய் சீனித் தொழிற்சாலை மீண்டும் காத்திரமாக இயங்கி அவருடைய கனவு நனவாக வேண்டும் என்றும் நாங்கள் விரும்புகின்றோம். அதற்காக அரசாங்கம் ஆன முயற்சிகளைச் செய்ய வேண்டும்.

கடந்த ஒரு பத்து வருடங்களுக்கு முன்பு கந்தளாய் பிரதேசத்திலே குடிநீர்ப் பிரச்சினை இருந்தபொழுது அவர் மிகவும் வேதனைப்பட்டார். அந்த மக்களின் பக்கத்திலே கந்தளாய் குளம் இருக்கின்றது. இந்தக் குளத்திலே உள்ள நீர் திருகோணமலைக்கு அப்பாலுள்ள கிராமங்களுக்குச் செல்கின்றவேளையிலே, அந்தக் குளத்துக்கு அண்மையிலே இருக்கின்ற மக்களுக்கு அது கிடைக்காமல் இருப்பதைப் பற்றி அவர் தனது ஆதங்கங்களை இந்தப் பாராளுமன்றத்திலே பலமுறை ஆக்ரோஷமாக வெளிப்படுத்திக் கூறியிருந்தார். அந்த மக்களுக்கு குடிநீர் கிடைக்க வேண்டும் என்று பல முயற்சிகளைச் செய்த ஓர் உத்தமரான அவர், இன்று எங்களைவிட்டு மறைந்துவிட்டார். நிச்சயமாக அவருடைய ஆத்மா சாந்தியடையும் என்பதில் எந்தவிதமான சந்தேகமு மில்லை. அவருடைய சேவைகள் மக்களுடைய உள்ளத்தி லிருந்து எப்பொழுதும் நீங்காது. அவர் எப்பொழுதும் எங்களுடைய மனங்களில் வாழ்ந்து கொண்டிருப்பார்.

இறுதியாக, அமரர் குணவர்தனவுடைய ஆத்மா சாந்தியடையப் பிரார்த்திப்பதோடு, அவருடைய பிரிவினால் வாடும் அன்புத் துணைவியார் திருமதி குணவர்தன, பிள்ளைகள் மற்றும் உற்றார் உறவினர்களுக்கு எங்களுடைய ஆழ்ந்த அனுதாபத்தையும் தெரிவித்துக்கொண்டு, அவர்களுக்கு நல்ல சுகத்தையும் பலத்தையும் உற்சாகத்தையும் கொடுக்க வேண்டும் என நாங்கள் அனைவரும் இறைவனை வேண்டிக்கொள்வோம் என்று கூறி, அமர்கின்றேன். நன்றி.

[අ.භා. 3.02]

ගරු අර්ජුන රණතුංග මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்)

(The Hon. Arjuna Ranatunga - Minister of Ports and Shipping)

ගරු කථානායකතුමනි, දිවංගත එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා වෙනුවෙන් ශෝක ප්‍රකාශ කරන මේ අවස්ථාවේ මටත් අවස්ථාවක් ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මට එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා මුලින්ම හමු වුණේ මීට අවුරුදු 25කට විතර ඉස්සර. ඒ, මගේ පියාගේ ගම්පහ, මීනුවන්ගොඩ, උඩුගම්පොළ නිවසේ සති අන්තයක අපි ඉන්නකොට එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා මගේ පියා මුණ හැහෙන්න ආපු වෙලාවේ. මගේ පියාත් එක්ක ඉතාම කිට්ටුවෙන් සුභදව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන උතුම් පක්ෂය ආරක්ෂා කරන්න මූලිකත්වය ගත්ත කෙනෙකු හැටියට මම එතුමා දැක්කා.

මම ක්‍රීඩා කරන අවධියේ එතුමා මට මුලින්ම මුණ ගැහුණ වෙලාවේත් මගෙන් ඇහුවේ ක්‍රිකට් ක්‍රීඩාව ගැන. මගේ කාන්තයි එතුමායි අතර ඉතාම කිට්ටු විශේෂ සම්බන්ධතාවක් තිබුණා. ඒකට මූලික හේතුව එතුමාත් මීනුවන්ගොඩ ප්‍රදේශයේ ඉපදිලා, ගම්පහ ප්‍රදේශයේ ජීවත් වෙච්ච කෙනෙකු නිසා වෙන්න ඇති. මීට කලින් මට එතුමා හමු වෙලා තිබුණාට, කිට්ටුවෙන් එතුමා ආශ්‍රය කළේ පසු ගිය අවුරුදු එකහමාරක පමණ කාලයක තුළ.

මේ යහ පාලන ආණ්ඩුව පිහිටුවන්න 2014 නොවැම්බර් 21වැනි දා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ආණ්ඩුවෙන් එළියට ඇවිල්ලා ජනාධිපති අපේක්ෂකත්වයට ඉදිරිපත් වුණ අවස්ථාවේ, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාත් ආණ්ඩුවෙන් එළියට ඇවිල්ලා ඒ කණ්ඩායමේ මූලිකත්වය ගත්තා. මම එදා ඉඳලා එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා ඉතා කිට්ටුවෙන් ආශ්‍රය කළා. එතුමා මට කථා කළේ, "මල්ලි" කියලා. මගේ කාන්තට කතා කළේ, "අයියේ" කියලා. ඒ ඥාති සම්බන්ධකම අද වන තුරුත් මට හොයා ගන්න බැරි දෙයක්.

එතුමා ඉඩම් නිලධාරියකු හැටියට විතරක් නොවෙයි, පොලිස් නිලධාරියකු හැටියටත් රජයේ සේවයේ ඉඳලා, ඉන් පසුව දේශපාලනයට ඇවිල්ලා බණ්ඩාරනායක ප්‍රතිපත්ති ත්‍රිකුණාමලය

[ගරු අර්ජුන රණතුංග මහතා]

ප්‍රදේශයට ගෙන ගියා. විශේෂයෙන්ම එතුමාට ඕනෑ වෙලා තිබුණේ, බණ්ඩාරනායක ප්‍රතිපත්ති සමඟ ඒ ප්‍රදේශයේ දේශපාලනය කරන්නයි. එතුමා හැම දාම බණ්ඩාරනායක පවුලත් එක්ක කිට්ටුවෙන් හිටපු කෙනෙක්. මට මතකයි, පසු ගිය ආණ්ඩුව තිබුණ කාලයේ බණ්ඩාරනායක ගුණ සමරුව තිබෙන අවස්ථාවලදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර අය එතැනට එන්නේ නැති වෙලාවේ මමත්, එතුමාත් අපට පුළුවන් හැම වෙලාවකම ඒ ගුණ සමරු උත්සවවලට සහභාගි වුණ හැටි. කවුරු මොනවා කිව්වත්, බණ්ඩාරනායක ගුණ සමරුවට එන්න එතුමා තුළ කිසිම බයක් තිබුණේ නැහැ.

මගේ සහෝදරයා, රුවන් අද මට එතුමා ගැන විශේෂ ප්‍රකාශයක් කළා. රුවන් මල්ලි මට කිව්වා, "මේ පාර්ලිමේන්තුවේ ඉන්න දේශපාලනඥයන්ට කියන්න, ගිහිල්ලා එතුමා හිටපු ගම්පහ නිවස බලන්න, එතුමා මිනිස්සු හම්බ කළා මිස, මුදල් හම්බ කළේ නැහැ" කියලා. අපි පසු ගිය කාලයේ දේශපාලනය කරද්දී විශේෂයෙන්ම සේරුවිල ආසනයට යන වෙලාවේ එතුමා හිටපු හැටි අපි දැක්කා. ඊයේ පළාත් පාලන ආයතන ගැන මේ ගරු සභාවේදී වූ කතිකාවේදී, පළාත් පාලන ආයතනවලින් පාර්ලිමේන්තුවට ආපු සමහර අය කථා කළ විධිය දැක්කාම මට කනගාටුවක් ඇති වුණා. අද අපි වෙනස් ක්‍රමයක් ඇති කර, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය දියත් කරලා, යහ පාලනය ඇති කළ වෙලාවේ ඒ සුවය විඳින්න එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාට අවස්ථාව ලැබුණේ නැහැ.

එතුමා ඉඩම් ඇමති වෙලා හිටියා. මම වරාය අමාත්‍යවරයා හැටියට වැඩ භාරගත්ත වෙලාවේ එතුමා ඇවිල්ලා මගෙන් එක ඉල්ලීමක් කළා. ත්‍රිකුණාමලය වරායට අයත් ඉඩම්වල විශාල වශයෙන් මහ ජනතාව පදිංචි වෙලා ඉන්නවා. මේක අද-ඊයේ වෙච්ච දෙයක් නොවෙයි. අවුරුදු ගණනාවක් පුරා සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාව ශ්‍රී ලංකා, යූඑන්පී, ජේවීපී යනාදී වශයෙන් පක්ෂ භේදයක් නැතිව මෙම ඉඩම්වල පදිංචි වෙලා ඉන්නවා. මම දන්නා හැටියට පවුල් 4,000ක් පමණ ඉන්නවා. මගෙන් එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා ඉල්ලීමක් කළා, මේ ඉඩම් ටික එහි ජීවත් වෙන මිනිසුන්ට ලබා දෙන්න කියලා. මේ ඉඩම් ටික ඒ මිනිසුන්ට ලබා දෙන්න පුළුවන් වන්නේ කොහොමද කියලා අපි අද වනකොටත් ඉතා ඕනෑකමකින් සොයා බලාගෙන යනවා.

අතිගරු ජනාධිපතිතුමා කිවුවා වාගේ, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා කවදාවත් එතුමාගේ නිල් සාටකය ගැලෙව්වේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා මේ උත්තරීතර සභාවට අද ආවේ එම්.කේ.ඒ.ඩී.එස් ගුණවර්ධන මැතිතුමා ගැන තිබුණු විශේෂ ආකල්පයක් නිසායි. එතුමා කෙරෙහි තිබෙන විශේෂ ගෞරවයක් නිසායි. කොතරම් වැඩ තිබුණත් ජනාධිපතිවරයකු විධියට අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා පිළිබඳව කළ ගුණ ප්‍රකාශය අහගෙන සිටිනකොට, අපි කවුරු කථා කළත්, එතුමාට මීටත් වඩා ඉහළින් පුද කරන ගෞරවයක් නැහැ කියලා මට හිතුණා.

එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා අසනීපව සිටි කාලයේ එතුමාගේ දියණිය එතුමාව එංගලන්තයට එක්ක ගියා. එතුමා එංගලන්තයේ සිටින විටත් අපි දුරකථනවලින් සම්බන්ධ වුණු හැම අවස්ථාවකම කිව්වේ, "අනේ මල්ලී මට මේ රටට ඉක්මනට එන්න ඕනෑ. මට මෙහේ ඉන්න බැහැ" කියලායි. එතුමා, එතුමාගේ සෞඛ්‍ය ගැනවත් අවධානය යොමු කළේ නැහැ. සමහර විට එහෙම කළා නම්, අදත් එතුමාට ජීවතුන් අතර ඉන්න තිබුණා. එතුමාට අවශ්‍ය වෙලා තිබුණේ, ලංකාවට ඇවිල්ලා ත්‍රිකුණාමලයට ගිහිල්ලා; සේරුවිලට ගිහිල්ලා මහ ජනතාව අතර ඉන්නයි.

ඒ විතරක් නොවෙයි, ඉඩම් ඔප්පු ලැබී නැති අයට ඉඩම් ඔප්පු ලබලා දෙන්නත් එතුමාට ඕනෑ කරලා තිබුණා. ගම්පහ දිස්ත්‍රික්කයේ පැවැති ඉඩම් ඔප්පු ලබා දෙන උත්සවයකට එතුමා මටත් ආරාධනා කළා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් විශාල පවුල් ප්‍රමාණයකට එම සින්නක්කර ඔප්පු ලබා දීමේ උත්සවයට යන්න මටත් අවස්ථාවක් ලැබුණා. එතුමාට පරම්පරාවක් තිබුණේ නැහැ. එතුමා හැම විටකම අලුතින් දේවල් ආරම්භ කළා. මට මතකයි, මම 2009 වසරේ එවකට තිබුණු ආණ්ඩුවෙන් ඉවත් වෙලා විපක්ෂයට ගිහිල්ලා වාඩි වෙලා ඉන්නකොට එතුමා හැම වෙලේම කිව්වේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැනයි. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන කථා කරන අය දෙස බලනකොට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරක්ෂා කරන්න, ඉදිරියට ගෙන යන්න එතුමාට තිබුණු ඕනෑකම අද ඉන්න කාටවත් තිබෙනවාද කියලා මට හිතෙනවා.

පසු ගිය කාලයේදී අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් එක්ක අපි එළියට බහිනකොට, එතුමා එම මැතිවරණ ව්‍යාපාරයට විශාල සේවයක් කළා. ඊට පසුව අපට තීරණයක් ගන්න සිදු වුණා. අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වය ලබා දුන්නාට පසුව, අපට මෙම පක්ෂය පිරිසිදු කිරීමේ අවශ්‍යතාවක් තිබුණා. ඒ වාගේම, පක්ෂය ගොඩ නඟන්නත්, හොඳ පුද්ගලයන්ව දේශපාලනයට ගෙනෙන්නත් අපට අවශ්‍ය වුණා. අපි මේ කතිකාවත පටන් ගන්නකොටම පසු ගිය මැතිවරණයේදී එක්සත් ජාතික පෙරමුණ හැටියට අපට මැතිවරණයට යන්න සිදු වුණේ ප්‍රශ්න ගොඩකට මුහුණ දීලායි. මම ගම්පහ දිස්ත්‍රික්කයේ අපේක්ෂකයකු හැටියට ඉදිරිපත් වන විට එතුමා මට විශාල සේවයක් ලබා දුන්නා. එතුමා මගේ රැස්වීම්වලට ඇවිල්ලා කථා කරලා, එක්සත් ජාතික පෙරමුණෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ දෙවැනි ස්ථානයට පත් කර මාව පාර්ලිමේන්තුවට එවන්න විශාල වශයෙන් කැපවුණා. පසු ගිය කාලයේ අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ පුතා වන නලින් ගුණවර්ධන මැතිතුමාට ඒ ආසනයේම සංවිධායකකම ලබා දුන්නා. තාත්තා කර ගෙන ගිය ක්‍රියාදාමය ඉදිරියට කර ගෙන යන්න ඒ පුත්‍ර රත්නයට අවස්ථාවක් තිබෙනවා. එය පුතාටත් ලැබුණු හොඳ අවස්ථාවක් කියලා මම හිතනවා. එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා මිනිස්සු අතර ජීවත් වුණු කෙනෙක්; මහ ජනතාව අතර හිටපු කෙනෙක්.

එතුමා හම්බ කළේ මහ ජනතාවයි. එතුමා මුදල් හම්බ කළේ නැහැ. පාර්ලිමේන්තුවේ වෙන්න පුළුවන්, පළාත් සභාවේ වෙන්න පුළුවන්, නගර සභාවල වෙන්න පුළුවන්, ප්‍රාදේශීය සභාවල වෙන්න පුළුවන්, දේශපාලනය කරන අප සියලු දෙනාට එතුමා හොඳම ආදර්ශයක් වෙනවා. එතුමා ජීවත් වූ හැටි අද වුණත් ගිහින් බලන්න. ඒ නිසා මා කියනවා, අන්න ඒ ක්‍රියා දාමය තමයි මේ රටට අවශ්‍ය වන්නේ කියලා. මුදල් හම්බ කරන දේශපාලනඥයන් නොවෙයි, මිනිසුන් හම්බ කරන දේශපාලනඥයන් තමයි අපට අවශ්‍ය වන්නේ. එවැනි දේශපාලනඥයකුට හොඳම උදාහරණය තමයි, ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා.

ගරු කථානායකතුමනි, එතුමාගේ අභාවය වෙනුවෙන් පාර්ලිමේන්තුවේ දී මගේ ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ දී ගරු සභාවේ නැති වුණත් ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාගේ ශෝකයත්, රුවන් රණතුංග හිටපු මන්ත්‍රීතුමා සහ මගේ මැණියන් ඇතුළු රණතුංග පවුලේ සියලු දෙනාගේ ශෝකය ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ භාර්යාව, පුතා සහ දියණියට ප්‍රකාශ කරන අතර, එතුමාට නිවන් සැප ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 3.13]

ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු කථානායකතුමනි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මොරවැව, ගෝමරන්කඩවල, මහ දිවුල් වැව, කන්තලේ වාං ඇළ, රජ ඇළ, සේරුවිල ආදි ප්‍රදේශවල ජීවත් වන, ධනය විධියට අතේ කර ගැට

ඇති, මහ පොළොව කොටන, මහ පොළොවට ඩහදිය හෙළන, හඬක් නැති ජනයාගේ හඬ මේ උත්තරීතර සභා ගර්භය තුළට ඉතාම සොඳුරු මිනිසෙකු විධියට අරගෙන ආපු අපේ ආදරණීය මිත්‍රයා වූ ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා, 1984 සිට 'හොන්ඩා-125' මොටෝ බයිසිකලයෙන් සේරුවිල, ත්‍රිකුණාමලයේ ගම් නියම් ගම් පුරා ඇවිද යමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩ නැඟූ කාලයේ ඉඳලාම මගේ මිත්‍රයෙක්. ඒ වියළි මහ පොළොවේ පාවහන් රහිතව පය තබා ඇවිදිමින් ඒ බිමේ මුල් ඇද ගත් මිනිසෙකු වූ එතුමා අග්‍රාජ ගැමියකු ලෙස කර ගැට පිරුණු ගොවීන්ගේ අත් අල්ලාගෙන ගමන් කරපු කෙනෙක්. පසු ගිය ඉතිහාසයේ අවුරුදු 26ක යුද භූමිය තුළ එම ප්‍රදේශයේ ජනතාව අත් නොහැර සිටි එතුමාව සාතනය කරන්න එල්ටීටීඊ සංවිධානය අවස්ථා දෙකකදී උත්සාහ කළා. එතුමාගේ නිවසට පහර දුන්නා. හැබැයි, එතුමා ලේ, කඳුළු මැද, ඒ අභියෝග සියල්ල මැද තමන්ගේ ජීවිතය නොතකා ඒ අහිංසක මිනිසුන්ගේ ජීවිත හා මිශ්‍රව සිටියා. එතුමා, අපූරු සුන්දර මිනිහෙක්. සැහැල්ලුව, සරලව ජීවත් වන්න උත්සාහ කළ කෙනෙක්.

ගරු කථානායකතුමනි, එතුමා 1989දී පාර්ලිමේන්තුවට ඇවිල්ලා, 2004 පැවැති පාර්ලිමේන්තු මැතිවරණයෙන් පරාජයට පත් වුණා. 2008දී පැවැත්වූ ප්‍රථම නැහෙනහිර පළාත් සභා මැතිවරණයේදී එතුමාත් මමත් -අප දෙදෙනාම- පළාත් සභාවට තේරී පත් වුණා. එතුමා දේශපාලනයෙන් මට වඩා ජ්‍යෙෂ්ඨ කෙනෙක්. නමුත් එතුමාට ඒ අවස්ථාවේ ලැබුණේ නියෝජ්‍ය සභාපතිකමයි. සිංහලයකුට ලැබෙන එකම අමාත්‍ය ධුරය වන, අධ්‍යාපන අමාත්‍ය ධුරය මට ලැබුණු වෙලාවේ එතුමා ජ්‍යෙෂ්ඨයකු විධියට මගේ ළඟට ඇවිත් කිව්වා, "මල්ලි, මගේ හිතේ කිසි කහටක් නැහැ, අපි එකට වැඩ කරමු" කියලා. එතුමා ඊළඟ වතාවේ පාර්ලිමේන්තුවට එන කල් අවුරුදු දෙකකට ආසන්න කාලයක් කිසිම දෙගිඩියාවකින් තොරව මා එක්ක ඉතා සුභදව වැඩ කළා. එතුමා ඒ ගම් බිම්වල ජනයාගේ -ඒ අහිංසක මිනිසුන්ගේ- ජීවිතය කියවන්න පුළුවන් වූ මිනිසෙක්. මොරවැව, පදවි ශ්‍රී පුර, රළු පරළු මහ පොළොවේ, රත් වූ වැලි පොළොවේ පාවහන් රහිතව පය තබන්න පුළුවන් වූ අපූරු මිනිසෙක්.

එතුමා පොලීසියේ රාජකාරිය කරමින් ඉඳලා එයින් එළියට ඇවිත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් කැප වූ, එම පක්ෂය කෙරේ හෘදයංගම බැඳීමක් තිබුණු, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට ඉතාම ළෙංගතුකමක් දක්වපු, උත්තුංග ගති පැවතුම් තිබුණු සුන්දර මනුෂ්‍යයෙක්. සේරුවිල, ගෝමරන්කඩවල, කන්තලේ, වාං ඇළ, රජ ඇළ, පදවි ශ්‍රී පුර, මොරවැව, මහ දිවුල් වැව මිනිසුන්ට කවදාවත් එතුමා අමතක වන්නේ නැහැ කියලා මම හිතනවා. "සේරුවිල" සහ "එම්.කේ.ඒ.ඩී.එස්." කියන නම් දෙක වෙන් කරන්න පුළුවන්කමක් නැහැ. එහෙත්, එතුමා ජීවතුන් අතර සිටිය යුතු අවස්ථාවක අවාසනාවකට වාගේ අකාලයේ අපෙන් වෙන්ව ගියා. අද එතුමා ගැන මොන විධියේ දේවල් කිව්වත්, එතුමා සත්‍ය ලෙසම මහ පොළොවට සහ එහි ජීවත් වූ මිනිසුන්ට ආදරය කළා. එතුමා අවසාන භාගයේ දේශපාලනමය වශයෙන් එක්තරා විධියක වෙනස් ප්‍රතිපත්තියක සිටියත් තම මූලික ප්‍රතිපත්තියෙන් ඉවත් වුණේ නැහැ කියන එකත් එතුමාට ගෞරවය පිණිස මා මේ මොහොතේ කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මා දිගින් දිගට කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මොරවැව, සේරුවිල ගොයම් පැහෙන ඒ වෙල් යායෙන් හමන හුළඟ සේරුවිල චෛත්‍යය උඩින් හමනා තෙක් එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධනයන් සේරුවිලටත්, ත්‍රිකුණාමලයටත් අමතක නොවනවා ඇති. ඒ ආදරණීය මිත්‍රයා වූ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධනයන්ට නිවන් සුව ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් එතුමාගේ අභාවය වෙනුවෙන් එම මැතිනියට සහ එම පවුලේ දරුවන්ට මගේ ශෝකය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

[பி.ப. 3.17]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)

கௌரவ சபாநாயகர் அவர்களே, திருமலை மாவட்டப் பாராளுமன்ற உறுப்பினரும் அமைச்சருமான மறைந்த சகோதரர் எம்.கே.ஏ.டீ.எஸ். குணவர்தன அவர்களோடு நான்கு சபைகளிலே நான்கு தடவைகள் உறுப்பினராக இருப்பதற்கு எனக்கு வாய்ப்புக் கிடைத்தமையானது, எங்களுடைய நட்புக்கு மிகவும் சான்றாக அமைந்திருந்தது. அந்த நாட்களை இன்று நினைவுகூருவதில் நான் பெருமைப்படுகின்றேன். அவர் பிறந்த 1947ஆம் ஆண்டிலே இந்த நாட்டில் ஒரு புதிய சகாப்தம் உருவாகியது. அதாவது, மக்களால் தெரிவு செய்யப்பட்ட முதலாவது பாராளுமன்றம் 1947ஆம் ஆண்டில்தான் அமையப் பெற்றது.

அவர் எமது மண்ணுக்கு இரண்டு வகையிலே சேவை புரிந்திருக்கின்றார், ஓர் அரச உத்தியோகத்தராக. முதலிலே இரண்டு வருடங்கள் Ministry of Lands இன்கீழ் கடமையாற்றியிருக்கிறார். ஐந்து வருடங்கள் பொலிஸ் கான்ஸ்டபிளாக இருந்த அவர், கந்தளாய் பொலிஸ் நிலையத்திலே பத்து வருடங்கள் SI ஆகவும் சேவையாற்றியிருக்கின்றார். இந்த அரச உத்தியோகத்தில் இருந்ததன் காரணமாக மக்களை அணுகுகின்ற சந்தர்ப்பம் அவருக்குக் கிடைத்தது. அந்த வகையில் அவர் கந்தளாய் பிரதேசத்திலே வாழ்ந்தபோது, அந்த மக்களுடைய காணிப் பிரச்சினைகள், வாழ்வாதார விடயங்களிலுள்ள பிரச்சினைகள் என்று அந்தப் பிரதேச மக்களுடைய பிரச்சினைகளை நன்கு அறிந்திருந்தார். சிலர் பொருளாதார ரீதியாக அரசியலுக்குக் கொண்டுவரப்பட்டவர்கள். ஆனால், இவர் அப்படியானவர் அல்லர். அங்கு சேருவிலயிலே பவுலிஸ், அல்விஸ், லீலாரத்ன போன்றவர்கள் எல்லாம் அரசியலுக்கு வந்தபோதும் அவர்கள் சாணக்கியமான ஓர் அரசியலை நடத்தவில்லை. ஆனால், அந்த மாவட்ட மக்களுக்கு நிறைவான சேவை செய்யக்கூடிய சந்தர்ப்பத்தை குணவர்தன அவர்கள் பெற்றிருந்தார்.

முன்னாள் பிரதம அமைச்சர் ஸ்ரீமாவோ பண்டாரநாயக்க அவர்களை அவர் சந்தித்தது பற்றியும் அவரிடம் அம்மையார் "ஏன் நீங்கள் அரச சேவையை விட்டு அரசியலுக்கு வருகின்றீர்கள்?" என்று கேட்டதற்கு அவர் அளித்த பதில் பற்றியும் எங்களுடைய ஜனாதிபதி அவர்களுடைய உரையிலே குறிப்பிடப்பட்டது. அதுபோல், "உங்களுடைய பெயரின் முன்னால் எம்.கே.ஏ.டி.எஸ். என்று நீண்ட initials இருக்கின்றதே!" என்று நான் அவரிடம் கேட்டபோது, "அது முனசிங்க காரியவசம் அப்புஹாமிலாகே தொன் சோமதாச" என்று முழுமையாகச் சொன்னார்.

அப்பொழுது, நாங்கள் அரசியலிலே ஐக்கிய தேசியக் கட்சி, ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி என்று இரண்டு கட்சிகளைச் சேர்ந்தவர்களாக இருந்தபோதிலும்கூட, சேருவிலையிலே அரசியலிலே கீழ்மட்டத்தில் பிரதேச மட்டத்தில் இருந்தவர்களுக்கிடையில் குழப்பங்கள் வருகின்றபோது அவர் என்னை அணுகுவார். அவ்வாறு நானும் அவரை அணுகி இருவரும் சுமுகமாக, பிரச்சினைகள் இல்லாமல் எமது மாவட்டத்திலே அரசியலை நடத்திக்கொண்டிருந்தோம். நான் nomination கொடுத்துவிட்டு வருகின்றபோது, அவர் நான்காம் கட்டையிலிருந்து எனக்கு "ஜயவேவா!" கோஷம் போடுவார். எனது கடைசித் தேர்தல் பிரசார மேடைக்கும் கிண்ணியாவில் இடம்பெற்ற ஆட்சி மாற்றம் உருவாகிய ஜனாதிபதித் தேர்தல் பிரசார மேடைக்கும் அவர் வந்தார். அப்போது, ஜனாதிபதி

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

වේට්පාළරාක ඉරුන්ත මෛත්තිරිපාල සිරිසේන අවර්කළ් ජනාතිපතිත් තේර්තල් පිරචාර මේටෛක්කු වරුවතර්කු මුන්නර්, නාංකළ් අංකු ඔරු කූට්ටත්තෛ ඒර්පාටුසෙය්තෝම්. අක්කූට්ටත්තිලේ අවර්, "ඉන්තක් කූට්ටම් එංකළුක්කු ඕර් ආට්සි මාර්රත්තෛ උරුතිසෙය්තුවිට්ටතු; නාංකළ් මෛත්තිරිපාල සිරිසේන අවර්කළෛ ජනාතිපතියාක ආක්කිවිටුවෝම්; අතර්කු ඉන්තක් කිණ්ණියා මණ් චාන්රු" එන්රු පකිරංකමාකවේ කූරිනාර්.

1947ආම් ආණ්ටු මුතලාවතු පාරාළුමන්රම් අමෛයප් පෙර්ර කාලත්තිල් පිරන්ත අවර්, 1982ආම් ආණ්ටු ඒප්පිරල් මාතම් 29ආම් තිකති තිරක්කප්පට්ට, නාංකළ් පේසික් කොණ්ටිරුක්කින්ර ඉප්පාරාළුමන්රත්තුක්කු 1989ආම් ආණ්ටු පෙප්රවරි මාතම් උරුප්පිනරාකත් තෙරිවුසෙය්යප්පට්ටු වරුවතර්කුච් චන්තර්ප්පම් කිටෛත්තතු. අවර්, කාණි අමෛච්චරාක, පුත්තචාසන පිරති අමෛච්චරාක ඉරුන්තපෝතු, කෙළරව විමලවීර තිසානායක්ක අවර්කළ් කූරියතුපෝල්, අන්රු නාංකළ් එමතු පිරතේචත්තිලේ එන්න චේවෛයෛච් චෙය්තාලුම්, විසේටමාක කන්තළායිලුළ්ළ මුස්ලිම්කළින් විරුප්පත්තුක්කුරියවරාක එම්.කේ.ඒ.ටි.එස් කුණවර්තන අවර්කළ් ඉරුන්තාර්. අවර් තනක්කුච් චන්තර්ප්පම් කිටෛත්ත පෝතෙල්ලාම් අන්තප් පිරතේචත්තිලේ ඉරුක්කින්ර ඉළෛඤර්කළුක්කු වේලෛවාය්ප්පුක්කළෛප් පෙර්රුක්කොටුත්තිරුක් කිරාරෙන නාන් නිනෛක්කින්රේන්. අරචියලිලේ අවරුක් කෙන්රු ඔරුපාණි ඉරුන්තාලුම්, මිකවුම් නාකරිකමාන මුරෛයිලුම් එන්තවිත තුවේචම් ඉල්ලාමලුම් එම්මිටත්තිල් නට්පුටන් පළකියවර්; අවර් උළ්ළත්තිල් ඔන්රෛයුම් උතට්ටිල් ඔන්රෛයුම් වෛත්තුක්කොණ්ටු පේසියවරල්ල - ඉයංකියවරල්ල. උළ්ළත්තිල් ඉරුප්පතෛත්තාන් අවර් පේසුවාර්.

අතුමට්ටුමල්ල, චිලර් මුන්නුක්කුප්පින් මුරණාක අරචියල් නටත්තිනාර්කළ්. අංකු තුවේචංකළෛයුම් ඉනක්කුරෝතම් කළෛයුම් වළර්ත්තාර්කළ්. ආනාල්, එම්.කේ.ඒ.ටි.එස්. කුණවර්තන අවර්කළ් එතෛච් චොන්නාලුම් මුකත්තුක්කු නේරාකච් චොල්වාර්; පින්නාල් කතෛප්පතිල්ලෛ. තනතු උළ්ළත්තිලේ ඉරුප්පතෛ අවර් චොල්ලුම්පෝතු, ඒතුම් තවරිරුප්පින් අතෛත් තිරුත්තික්කොළ්ළුමාරු නාංකළ් කූරිනාල්, උටනේ අතනෛත් තිරුත්තික්කොණ්ටු එංකළෝටු ඔත්තුළෛත්ත ඔරු පණ්පානවර්.

මේලුම්, අවර් මරණිත්තපෝතු, අවරුටෛය මකන් නලින් කුණවර්තන අවර්කළුක්කු උටනටියාක අවරුටෛය පාරාළුමන්රප් පිරතිනිතිත්තුවත්තෛ වළංකුමාරුම් චේරුවිල තොකුතියින් අමෛප්පාළරාක අවරෛ නියමික්කුමාරුම් ජනාතිපති අවර්කළුක්කුම් පිරතම මන්තිරි අවර්කළුක්කුම් කෝරික්කෛ විටුත්තේන්. ඒතෝ කාරණංකළුක්කාක අතු අවරුක්කුක් කොටුක්කප්පටාවිට්ටාලුම්, අන්තප් පතවි අවරුක්කුක් කිටෛක්කවේණ්ටුමෙන්රු මුතන්මුතලිලේ එළුත්තුමූලමාක පරින්තුරෛත්තවන් නාන්.

2000ආම් ආණ්ටු නාන් මුතලාවතු තටවෛයාකප් පාරාළුමන්රත්තුක්කු තෙරිවුසෙය්යප්පට්ටපෝතු අවරුම් අන්තප් පාරාළුමන්රත්තිලේ එන්නෝටු ඉරුන්තාර්. තුරතිරුෂ්ටවචමාක අප්පාරාළුමන්රම් ඔරු වරුටත්තිලේ කලෛක්කප්පට්ටතු. 2001ආම් ආණ්ටු නාන් මීණ්ටුම් පාරාළුමන්රත්තිර්කුත් තෙරිවුසෙය්යප්පට්ටපෝතු ඉරණ්ටු වරුටංකළුම් ඉරණ්ටු මාතංකළුම් අවර් එන්නෝටු පාරාළුමන්රත්තිලේ ඉරුන්තාර්. අතේපෝන්රු 2008ආම් ආණ්ටු නාන් මාකාණ චපෛක්කුත් තෙරිවු චෙය්යප්පට්ටපෝතු අවරුම් එන්නෝටු මාකාණ චපෛක්කුත් තෙරිවු චෙය්යප්පට්ටු චපෛ මුතල්වරාකප් පණියාර්රිනාර්. ඉරණ්ටු වරුටංකළ් එංකළෝටු මාකාණ චපෛයිල් පණියාර්රිය අමරර් එම්.කේ.ඒ.ටි.එස්. කුණවර්තන අවර්කළ් 2010ආම් ආණ්ටු පාරාළුමන්රත්තුක්කුත් තෙරිවුසෙය්යප්පට්ටාර්. 2010ආම් ආණ්ටිල් පුත්තචාසන, මත අලුවල්කළ් පිරති අමෛච්චරාකවුම් පණියාර්රිනාර්. අතර්කුප් පිරකු ඉන්තප් පාරාළුමන්රත්තිල් කාණි අමෛච්චුප් පතවියෛ එංකළුටෛය ජනාතිපති අවර්කළ් අවරුක්කු වළංකිනාර්. චුමාර් 6 මාතංකළ් අවර් අප්පතවියිලිරුන්තාලුම්, කූටුතලාන නියමනංකළෛ වළංකුවතර්කාන තුරිත මුන්නෙටුප්පුක්කළෛච් චෙය්තාර්. ඉරුන්තපෝතුම් තුරතිරුෂ්ටවචමාක අවර් එංකළෛ විට්ටුච් චෙන්රුවිට්ටාර්. ඉන්ත නේරත්තිලේ අවරුටෛය මනෛවි, මකන්, මකළ් උට්පට අවරුටෛය උරවිනර්කළුක්කු එන්නුටෛය අනුතාපංකළෛත් තෙරිවිප්පතෝටු, අවර්කළ් එතිර්කාලත්තිලේ අවර් විට්ටුච් චෙන්ර පණියෛත් තොටර වේණ්ටුමෙන්රු කේට්ටු, විටෛපෙරුකින්රේන්. නන්රි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු චපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මීළහට, ගරු අශෝක් අබේසිංහ මහතා.

[අ.හා. 3.26]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු අචෝක් අපේචිංක - පෝක්කුවරත්තු මර්රුම් චිවිල් විමානච් චේවෛකළ් පිරති අමෛච්චර්)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, හිටපු අමාත්‍ය ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ අභාවය සම්බන්ධව ශෝක ප්‍රකාශය සිදු කරන අද දිනයේ ඒ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්නට මා හටත් අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, ඉඩම් පරීක්ෂකවරයෙකු ලෙස තමන්ගේ වෘත්තීය දිවිය ආරම්භ කර, පසුව පොලිස් දෙපාර්තමේන්තුවට බැඳී උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් සේවය කරමින් සිටි එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා තමන් මුලින් වෘත්තීය දිවිය ආරම්භ කළ ක්ෂේත්‍රයට සම්බන්ධ ඉඩම් අමාත්‍යාංශයේ අමාත්‍ය ධුරය දැරීමට තරම් වාසනාවන්තවීම එතුමා ලබා ගත් භාග්‍යයක්. එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ, 1989 වර්ෂයේ මේ රටේ විශාල හිෂණයක් පැවැති අවස්ථාවකයි. එතැන් සිට වසර 14ක් වරින් වර පාර්ලිමේන්තුව නියෝජනය කළ එතුමා පසු ගිය රජය යටතේ බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ධුරයත්, මේ රජය යටතේ ඉඩම් අමාත්‍ය ධුරයත් දරනු ලැබුවා. මේ රටට ප්‍රජාතන්ත්‍රවාදය ඉතාම අවශ්‍ය වූ මොහොතක "දින 45 විප්ලවය" ලෙස අප හැඳින් වූ, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එවකට පැවැති රජයේ අමාත්‍යවරයෙකු ලෙස කටයුතු කර ඉවත් වුණු අවස්ථාවේ, "මේ රටට ප්‍රජාතන්ත්‍රවාදී වෙනසක් අවශ්‍යයි" කියන එඩිතර තීන්දුව මත සිටිමින් එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාත් පසු ගිය රජයෙන් එළියට ආවා.

ගරු කථානායකතුමනි, මම එතුමා ආශ්‍රය කරන්න පටන් ගත්තේ, මා පාර්ලිමේන්තුවට පැමිණි 2010 වසරේ සිටයි. මම පාර්ලිමේන්තුවට පැමිණියාට පසුව මට ලැබුණු මාදිවෙල නිල නිවාසය අසල පිහිටි නිල නිවාසය තමයි එතුමාට ලැබී තිබුණේ.

එතුමා ඉතාම වේගයෙන් කථා කළ කෙනෙක්. එතුමාගේ කට හඬේ ඉතා දැඩි ස්වරයක් තිබුණේ. ඒ දවස්වල හැම දාම උදේ වරුවේ එතුමාත්, මමත් එම නිල නිවාස දෙකේ ඉඳන් කථා-බහ කළ ආකාරය අදටත් මට මතක් වෙනවා. එතුමා ඉතාම සරල දිවි පෙවෙතක් ගත කළ සුහදශීලී මනුෂ්‍යයෙක්. අද දිනයේ එතුමාගේ අභාවය පිළිබඳව අපගේ ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේ මා එතුමා පිළිබඳව ගුණ කථනය කිරීමට බලාපොරොත්තු වුණේත් ඒ නිසායි. එසේ වසර පහක පමණ කාලයක් පාර්ලිමේන්තු පැමිණි ඒ දවස්වල එතුමාත්, මමත් හැම දාම දොඩමලු වුණා. එතුමා ආශ්‍රය කළ කාලය තුළ එතුමා තුළ තිබුණු සරල ජීවිතය මා දැක්කා.

එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා නියෝජනය කළේ, සේරුවිල ආසනයයි. අද කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධීක්ෂණ කාරක සභා අවස්ථාවේදී ගෝමරන්කඩවල, මොරවැව ප්‍රදේශයේ ගොවීන්ගේ අස්වැන්න පිළිබඳව සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදී මට මතක් වුණා, ඒ මොහොතේ එතුමා සිටියා නම් ඒ ප්‍රදේශයේ ජනතාවට එය කොපමණ ශක්තියක් වෙනවාද කියා. විශේෂයෙන්ම අපේ විපක්ෂ නායකතුමා පැවසුවා, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා සිංහල ජනතාවට වාගේම දමිළ ජනතාවටත් එකසේම ආදරය කළ නායකයෙකු බව. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සිංහල, දමිළ හා මුස්ලිම් කියන ජන වර්ග තුනම ජීවත් වෙනවා. ඒ සියලු දෙනා සමඟ ඉතාම සුහදව සිටිමින් මේ රටට විශාල සේවාවක් කිරීමට සිටි අවස්ථාවක තමයි, එතුමා අකාලයේ මිය ගියේ.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කයටත් එතුමාගේ විශාල සම්බන්ධයක් තිබුණා. මම එතුමා සමඟ සාකච්ඡා කළ සෑම අවස්ථාවකම අපට අවශ්‍ය දේ අප කියන එක වචනයකින්ම ඉෂ්ට කර දීමට තරම් එතුමා නිහතමානී වුණා. ඒ නිසා අද එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා සිහි කර එතුමාගේ ගුණ සමරන මේ අවස්ථාවේදී එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ ආදරණීය බිරිඳ, දරුවන් ඇතුළු සියලු දෙනාටම කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. එසේ ශෝකය ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව අත්වේවා!යි මා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තූතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මීළඟට, ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා.

[අ.භා. 3.31]

ගරු ලසන්ත අලගියවන්න මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Megapolis and Western Development)

ගරු කථානායකතුමනි, ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාවේදී, ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා ඇතුළු පක්ෂ නායකයන් දේශපාලනමය වශයෙන් එතුමාගෙන් සිදු වූ සේවාව පිළිබඳව සහ එතුමාගේ ව්‍යක්තිමය තත්ත්වයන් පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කළා. ඒ සියලුම කරුණු පෞද්ගලිකව අනුමත කරමිනුයි මමත් ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා පිළිබඳව සඳහන් කරන්නේ. ආදර්ශවත් දේශපාලනඥයකු විධියට අපට එතුමා හඳුන්වන්න පුළුවන්. විශේෂයෙන් පොදු ජනතාව නියෝජනය කරමින් සෑම අවස්ථාවකම සාධාරණය වෙනුවෙන් කටයුතු කළ, කුමන ආකාරයේ තනතුරු, වගකීම් ලැබුණත් අතීතය අමතක නොකරන, තමන්ට අත හිත දුන්නු අය අමතක නොකරන සරල ජීවිතයක් ගත කළ කෙනෙකු විධියටයි මා එතුමාව දකින්නේ.

ගම්පහ, මිනුවන්ගොඩ ප්‍රදේශයෙන් බිහි වූ එතුමා අධ්‍යාපනය ලැබීමෙන් පසු කන්තලේ ප්‍රදේශයේ දේශපාලන කටයුතු කර පළාත් සභාවට, පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. තේරී පත් වෙලා කන්තලේ ප්‍රදේශය වෙනුවෙන්, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් විශාල සේවයක් ඉටු කළායි කියන එක මේ සභාවේ ඉදිරිපත් කළ අදහස් යෝජනාවලින් අපට අවබෝධ වුණා වාගේම ප්‍රායෝගිකව එතුමා ඒ දිස්ත්‍රික්කයට පළාතට කළ සේවය පිළිබඳව අපි ඉතාමත් හොඳින් දන්නවා.

එතුමා ඒ ප්‍රදේශයේ දේශපාලන නියෝජිතයකු විධියට කටයුතු කළත් විශේෂයෙන් ගම්පහ, අත්තනගල්ල, මිනුවන්ගොඩ, දොම්පේ කියන ප්‍රදේශවල ජනතාවට එතුමා ආගන්තුකයකු නොවෙයි. අපි ඒ ප්‍රදේශ නියෝජනය කරමින් දේශපාලනඥයන්, මහජන නියෝජිතයන් විධියට කටයුතු කළත්, විශේෂයෙන් අපේ පක්ෂයට සම්බන්ධ අපි දන්නේ නැති, අපි හඳුනන්නේ නැති බොහෝ පුද්ගලයන් එතුමා දන්නවා. සාමාන්‍යයෙන් මහජන නියෝජිතයන් සේවය කරන්නේ, ජනතාවගේ මළ ගෙවල්වල, මඟුල් ගෙවල්වල යන්නේ තමන්ගේ ආසනයේ, තමන්ගේ දිස්ත්‍රික්කයේ පමණයි. නමුත්, එතුමා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයකු විධියට කටයුතු කළත්, ඒ හා සමානවම, අපිටත් වඩා ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවගේ අවශ්‍යතාවන් වෙනුවෙන් එතුමා සහභාගි වුණා, පෙනී සිටියා කියන එක අපි දන්නවා. සෑම සැප්තැම්බර් 26 දිනකම උදේ පාන්දරම මල් කළඹක් අරගෙන බණ්ඩාරනායක සමාධිය අසලට එන පළමුවැනි සාමාජිකයා විධියට අපට එතුමා හඳුන්වන්න පුළුවන්. මේ ක්‍රියාවන් තුළිනුත් එතුමාගේ ඒ අතීතය අමතක නොකරන චරිත ලක්ෂණය, මුලින් අත හිත දුන්නු පුද්ගලයන් අමතක නොකරන චරිත ලක්ෂණය ඉතා හොඳින් අපට අවබෝධ කර ගන්න පුළුවන්කම තිබෙනවා.

අවසාන භාගයේදී එතුමා ඒ ඇති වුණු දේශපාලනමය පෙරළියත් සමඟම ඒ තත්ත්වයට පත් වුණා. විශේෂයෙන්ම පක්ෂය හැර දාලා ගිය අවස්ථාවෙන් පසුවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මූලස්ථානයට එතුමා ආවා. පක්ෂ කාර්යාලයේ අයත්, අපත් විමතියට පත් වුණා. නමුත් එතුමා ඇවිල්ලා අපේ පක්ෂයේ නායකයන්ගේ ඡායා රූපවලට ගෞරව කර ගියා. මේ ගරු සභාවේ ඉදිරිපත් වුණු බොහෝ කථාවලදී එතුමාගේ නිල් පාට සාටකය පිළිබඳව අදහස් ඉදිරිපත් වුණා. ඒක තමයි එතුමාගේ හඳවත. එතුමාගේ හක්තිවන්තභාවය තිබුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටයි කියන එක අපි මොනම ආකාරයකටවත් අමතක කරන්නේ නැහැ. අපි ඒ ගරුත්වය එතුමාට ලබා දිය යුතුයි.

විශේෂයෙන්ම එතුමා ආසන සංවිධායකවරයා විධියට පත් වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු බලය තිබෙන කොට පමණක් නොවෙයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විපක්ෂයේ ඉන්න අවස්ථාවේයි. ගරු ජනාධිපතිතුමාගේ කථාවේදී ඒක පැහැදිලි කළා. දේශපාලන පක්ෂයක් ආණ්ඩු බලයේ ඉන්න කොට ආසන සංවිධායකකම් ඉල්ලනවා. එවැනි තත්ත්වයක් අපි ආණ්ඩු කරන කොටත් තිබුණා. නමුත් එතුමා ඒ වගකීම භාර ගත්තේ විපක්ෂයේ ඉන්න අවස්ථාවක. විශේෂයෙන්ම එවැනි අවස්ථාවන්වලදී, එවැනි අය කටයුතු කළ නිසා තමයි, පක්ෂයක් විධියට ඉතාමත් ශක්තිමත්භාවයකින් යුතුව අපේ පක්ෂය අද රට තුළ තිබෙන්නේ. එවැනි කැපකිරීම් කරපු අයට අපේ ගරුත්වය අපි සෑමදාම ලබා දිය යුතුව තිබෙනවා. අපි එතුමාට මෙවැනි සභාවන්වල මෙවැනි ගුණකථනයන් කර ගෞරව දක්වනවා වාගේම මම පෞද්ගලිකව දකින්නේ එතුමාට අපට දක්වන්න තිබෙන ගෞරවය තමයි,

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

එතුමාගේ අපේක්ෂාවන් බවට පත් වෙලා තිබුණු ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ අභිංසක ජනතාවට සේවය කිරීම. සියලුම වාදභේද අමතක කර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තව තවත් ශක්තිමත් කිරීමේ කාර්ය භාරය අපි කරලා තමයි, පක්ෂය වෙනුවෙන් දිවි පුදලා කටයුතු කළ අයට දක්වන්න පුළුවන් උපරිම ගෞරවය දක්වන්න පුළුවන් වන්නේ.

අපි මේ අවස්ථාවේදී එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලයේ ජනතාවගේ ශෝකය -කනගාටුව- විශේෂයෙන්ම එතුමාගේ ආදරණීය බිරිඳ, දූ පුතුන් ඇතුළු ඒ පවුලේ සියලු දෙනාට පළ කරමින් දිවංගත එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාට නිවන් සුව අත් වේවා!යි ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 3.39]

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය)

(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் பிரதி அமைச்சர்)

(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Deputy Minister of Sustainable Development and Wildlife)

ගරු කථානායකතුමනි, දිවංගත ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන හිටපු ඉඩම් අමාත්‍යතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී එතුමා පිළිබඳව වචන කිහිපයක් ඉදිරිපත් කරන්න ලැබීම එතුමාට සහ එතුමාගේ පවුලේ ආදරණීය බිරිඳ, දුව සහ පුතාට කරන ගෞරවයක් හැටියටත් මා විශේෂයෙන්ම දකිනවා. ඇත්තෙන්ම 1989 වර්ෂයේදී මමත්, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාත් අපේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඇතුළු කණ්ඩායමක් මේ පාර්ලිමේන්තුවට පත් වෙලා ආවා.

ඊටත් පෙර ඉඳලා එතුමා මගේ දිවංගත වුණු ස්වාමි පුරුෂයා සමඟ කුලුපගව ඇසුරු කළ මිත්‍රයෙක් හැටියටයි මම එතුමා හඳුනා ගත්තේ. එතුමා 1989ට වසර කිහිපයකට පෙර සිට ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් පැවතුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයෙක් හැටියට කටයුතු කළා. එතුමා පොලිස් දෙපාර්තමේන්තුවේ උපපොලිස් පරීක්ෂකවරයෙක් හැටියට කටයුතු කර ඉන් පසු දේශපාලනයට පිවිසුණා.

එතුමා සංවිධායකවරයෙකු හැටියට කටයුතු කරන අවධියේ මගේ ස්වාමිපුරුෂයාත් සමඟ ඉතාම මිත්‍රත්වයෙන් කටයුතු කළ කෙනෙක්. මට මතකයි, එතුමා මොනරාගල දිස්ත්‍රික්කය හරහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට ගමන් ගන්නා අවස්ථාවල බොහෝ දිනවල රෑ බෝ වුණාම මගේ ස්වාමිපුරුෂයා එතුමාට ඒ ප්‍රදේශ හරහා යන්න දුන්නේ නැති බව. මොකද, එවකට ඒ ප්‍රදේශවල ඇතිව තිබුණු එල්ටීටීඊ ත්‍රස්තවාදී ගැටුම් නිසා එතුමා මොනරාගල නතරවෙලා, පසු දින තමයි ගමන් ආරම්භ කරන්නේ. ඒ අවස්ථාවල එතුමා, මගේ ස්වාමිපුරුෂයාත් සමඟ සුහද කථාබහේ යෙදිලා- දේශපාලනය පිළිබඳව බොහෝ දේවල් කතා කළා. - ඊට පසු දින තමයි එතුමා අම්පාර දිස්ත්‍රික්කය හරහා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයට යන්නේ.

1989 වර්ෂයේදී මගේ ස්වාමි පුරුෂයා හදිසියේ වියෝ වුණායින් පසුව එතුමා ඒ අවසන් කටයුතුවලටත් සහභාගි වුණා. මාත් 1989 වර්ෂයේයි පාර්ලිමේන්තුවට පත් වෙලා ආවේ. ඒ අවස්ථාවේ සිට සහෝදරයෙකු මෙන් සෑම අවස්ථාවකම ඉතා සුහදතාවෙන් කටයුතු කළ කෙනකු හැටියටයි, බොහොම ආදරය කළ, බොහොම ගරු කළ සහෝදරයෙකු හැටියටයි අපි එතුමාව දකින්නේ. එතුමාගේ ආදරණීය බිරිඳ අප හඳුන්වන්නේ 'මාලි අක්කා' කියායි. එතුමාගේ ආදරණීය පුතණුවනුත්, දියණියත් අපත් එක්ක බොහොම කුලුපගයි; මිත්‍රයි. මිත්‍රයන් වුණත් ඒ දිනවල සිටම ඥාතීන් හැටියට තමයි අපි ඇසුරු කළේ.

එතුමා 1989 සිට 1994 දක්වා පැවති භීෂණ යුගයේ, -කවුරුත් මේ සභාවේ කථා කළා වාගේම- එතුමා නියෝජනය කළ සේරුවිල ආසනයේ සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් බොහොම හඬක් නැඟුව කෙනෙක්. ඒ වාගේම පාර්ලිමේන්තුවේ විපක්ෂ මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා සිටින කාලයේ සිටම ඒ ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් බොහෝ සෙයින්ම කටයුතු කළ කෙනෙක්. එතුමා පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කර ආපු කෙනකු හැටියට පොලීසියේ සාමාන්‍ය නිලධාරීන් වෙනුවෙන් ඒ අය විවිධ අවස්ථාවල පත්වෙන අපහසුතාවන්, වැටුප් වැඩිකිරීම්, උසස් වීම් ගැන විශේෂයෙන්ම කථා කළ කෙනෙක්; පොලිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළ කථා කරමින්, නායකයන්ගෙන් ලබා දිය යුතු සේවාවන් ඒ අයට ලබා දීමට කටයුතු කළ කෙනෙක්.

එතුමා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සමඟ, ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය සමඟ, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා -හිටපු ජනාධිපතිතුමා- සමඟ සුහදත්වයෙන් දේශපාලන කටයුතු කළා. 2014 වර්ෂයේ ඇති වුණු දේශපාලන පෙරළියත් සමඟ නව ජනාධිපතිවරයා හැටියට අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් සමඟ එකට එකතු වෙලා විශාල ගමනක් යන්න ආරම්භ කළා. ඒ අවස්ථාවේ එතුමාට ඉඩම් අමාත්‍ය ධුරය ලැබී රටට සේවය කරන්නට ගත් උත්සාහය මල් ඵල ගන්වන්නට නොහැකි වුණා. මොකද, හදිසියේම එතුමාගේ රෝගය උත්සන්න වීම නිසා, සැලසුම් සකස් කර තිබුණත්, ඒවා අවසන් කරන්නට, ජනතාවට ඒ සේවාව ලබා දෙන්න නොහැකි වුණා.

එතුමා සෑම වෙලාවේම කථා කළේ තමන්ගේ දිස්ත්‍රික්කයේත්, ඒ වාගේම අපේ රටේත් දුප්පත්, දුක් විඳින ජනතාව වෙනුවෙනුයි. එතුමා ඒ ආකාරයෙන් කටයුතු කර, රටට ජනතාවට සේවයක් කරන්නට ලැබුණු මෙවන් අවස්ථාවක මේ ආකාරයෙන් රෝගාතුර වෙලා අප සියලු දෙනා අතරින් සදහටම වියෝවීම කාටත් ලොකු පාඩුවක්; තමන්ගේ ආදරණීය බිරිඳට, දරු දෙදෙනාට, ඥාතීන්ට වාගේම රටටත් ලොකු පාඩුවක්. ඒ වාගේම පාර්ලිමේන්තුව නියෝජනය කරන අප සියලු දෙනාට සහෝදරයෙකු මෙන්ම කටයුතු කළ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ හදිසි අභාවය මුළු රටටම පාඩුවක්.

ඉතාම සුහදව, මිත්‍රත්වයෙන්, ඥාතීන් වාගේ ළඟින්ම ඇසුරු කළ එතුමාගේ ආදරණීය බිරිඳ වන මාලි අක්කාටත්, ආදරණීය දියණියටත්, පුතණුවන් ඇතුළු සියලු ඥාතීන්ටත් එතුමාගේ අභාවය ගැන මගේ කනගාටුව මේ අවස්ථාවේදී පළ කරමින්, ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන හිටපු අමාත්‍යතුමාට නිවන් සුව අත් වේවා! කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා.

[අ.භා. 3.46]

ගරු චතුර සංදීප සේනාරත්න මහතා

(மாண்புமிகு சத்துர சந்தீப சேனாரத்ன)

(The Hon. Chathura Sandeepa Senaratne)

ගරු කථානායකතුමනි, ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝක ප්‍රකාශය පළ කරන මේ අවස්ථාවේ ප්‍රථමයෙන්ම, එතුමාට අජරාමර නිවන් සුව අත් වේවා! යි කියලා මම ප්‍රාර්ථනා කරනවා. මේ රටේ යහ පාලන බලවේගයට ආදරය කළ නායකයෙකු හැටියට වාගේම සිංහල,

දමිළ සහ මුස්ලිම් ආදී සියලු ජාතීන් නියෝජනය කළ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ 'සිංහල ජන නායකයා' යයි විරුදාවලිය ලත් මා ආදරය කරන ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාට ජනතා ආචාරයත් සමඟ මගේත්, අපි සියලු දෙනාගේත් ශෝකය ප්‍රථමයෙන්ම පුද කරනවා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ඉතිහාසයේදී දැවැන්ත කැප කිරීමක් කරපු, සටන්කාමී නායකයෙකු වූ එතුමාගේ නම රන් අකුරින් ලියවෙවා!යි කියා මම ප්‍රාර්ථනා කරනවා.

මම අනුර බණ්ඩාරනායක මැතිතුමා හරහා එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා මුලින්ම දැන හඳුනා ගත්තේ 1990 දශකයේ මුල් භාගයේදීයි. දිනක් අනුර බණ්ඩාරනායක මැතිතුමා මෙතුමන්ව සහ ලයනල් රාජපක්ෂ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාව මට හඳුන්වා දුන්නා. අවසානයේදී අපි කොච්චර සමීප වුණාද කියලා කියනවා නම්, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් 1992 අවුරුද්දේදී පැවති පාද යාත්‍රාවේදී කොළඹ සිට කතරගම දක්වා දින 17ක් පුරාවට අපි එකට අත් වැල් බැඳගෙන ගමන් කළා. එදා බහුජන නිදහස් පෙරමුණේ ශිෂ්‍ය ව්‍යාපාරයේ නායකයා හැටියට මෙතුමන් අපිට ලබා දුන් ශක්තිය සහ ආදර්ශය අදටත් මේ රටේ දේශපාලනඥයන් වැඩිමනත් පිරිසකට ලබා දීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. එදා පාද යාත්‍රාවේදී දෙපයට මිරිවැඩි සඟළක් නැතිව ඇවිද්ද දෙදෙනෙකු හිටපු බව අපි දැක්කා. එක්කෙනෙක් තමයි, පදවිය ප්‍රාදේශීය සභාව නියෝජනය කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ විමලවන්ද්‍ර මන්ත්‍රීවරයා. අනික් පුද්ගලයා තමයි, ත්‍රිකුණාමලය නියෝජනය කරපු මුණසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන හෙවත් එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා.

එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන කියන ජන නායකයා මුළු රටටම වාගේම ලෝකයටම ආදර්ශයක් සපයමින්, මිරිවැඩි යුගලක් නැතිව, ගිනි මධ්‍යාහ්නයේ, අර්ධශුෂ්ක කලාපය හරහා, ගාලු පාර දිගේ දින 17ක් - සැතපුම් 187ක් - මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කොළඹ ඉඳලා කතරගමට පිය මැන්නා. එක්තරා දවසක් අපි ගිමන් හරිමින් ඉන්නකොට මම එතුමාගෙන් ඇහුවා, "සෙරෙප්පු දමන්නේ නැතිව මුළු ජීවිත කාලයම ඉන්නේ ඇයි?" කියලා. "එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට බෝම්බ ප්‍රහාරයක් එල්ල කරන අවස්ථාවේ එතුමියව ආරක්ෂා කරන්න ගිහිල්ලා මගේ පාවහන් යුගල නැති වුණා"ය කියලා එතුමා කිව්වා. එදා ඉඳලා අවසාන හුස්ම පොද හෙළන තුරු එතුමා මේ මාතෘ භූමිය ස්පර්ශ කළේ මිරිවැඩි සඟළක් නැතිවයි. එතුමාගේ දෙපා මේ මාතෘ භූමියේ ස්පර්ශය ලැබුවා. අන්න, ඒ ස්පර්ශයත් එක්ක තමයි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, ජනතා අයිතීන් වෙනුවෙන්, මේ රටේ අනාගතය වෙනුවෙන්, මේ රටේ උපන් නූපන් දරුවන් වෙනුවෙන් යහපත් ජන සමාජයක් බිහි කරන්න අවශ්‍ය කරන හැඟීම එතුමාට ලැබුණේ.

1977 වසරේදී ආසන අටකට සීමා වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බිඳ වැටීමෙන් පසුව දහහත් අවුරුදු ඉතිහාසය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩ නඟන්න, මේ රටේ වමේ බලවේගය ගොඩ නඟන්න, 1991 වර්ෂය වන විට මේ රටේ වමේ පොදු සන්ධානය ගොඩ නඟන්න චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියට පසුව, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට පසුව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් වැඩියෙන්ම දුක් විඳපු පුද්ගලයෙක් හිටියා නම්, ලේ, කඳුළු, දහඩිය පූජා කරපු, හිර බත් කාපු, තමන්ගේ රැකියාව නැති කර ගනිපු, තමන්ට කියලා තිබුණු සියලු දේ නැති කර ගනිපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායකයෙක් හිටියා නම් ඒ, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා කියලා මම මේ ගරු සභාවේදී බය නැතුව කියනවා. එවැනි සටන්කාමීත්වයක් තමයි එතුමාට තිබුණේ.

ඒකාධිපති වියරුවට එරෙහිව, ඒ පැවැති පාලන ක්‍රමයට එරෙහිව, නිල් පාට සාටකය දමා ගත්ත, කැපුවත් නිල් කියලා කියපු, බණ්ඩාරනායකවරුන්ට පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංකේතයක් බඳු වූ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා, 2014 නොවැම්බර් 21වැනි දා වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් සමඟ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එළියට බහියි කියලා අපි ජීවිතේට හිතුවේ නැහැ. ඒ කාල වකවානුව වන විට මේ පාර්ලිමේන්තුව ඉදිරිපිට නිවසක් අර ගෙනයි මම ජීවත් වුණේ. මම එතකොට මන්ත්‍රීවරයෙක් නොවෙයි. එතුමා නන්නාඳුනන වාහනයකින් මගේ නිවසට ආවා. ඇවිල්ලා කිව්වා, අපි කථා කරලා මැති ඇමතිවරු ටික සම්බන්ධීකරණය කරන්න ඕනෑය කියලා. මමත්, රතන හාමුදුරුවෝත් බොහොම රහසිගතව පාර්ලිමේන්තු සංකීර්ණයට ඇවිල්ලා, ඒ ඒ මැති ඇමතිවරුන් එක්ක කථා කරලා, අපේ අරගළය ගැන දැනුවත් කරන කොට, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා වාගේ කොන්ද පණ තිබෙන, කෙළින් හැප්පෙන්න පුළුවන් ඇමතිවරයෙක් සොයා ගන්න අපට බැරි වුණා. 2014 නොවැම්බර් 12 වන දා මුත්තයියා පිටියේ පැවැති ඒ ඓතිහාසික රැස්වීමේදී අපි මේ රටේ සියලු බලවේග ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙළ ගැස්වූවාට පස්සේ නොවැම්බර් 12වන දා 5.45 වන විට එතුමා මාගේ ගෙදරට ඇවිල්ලා, සියලු මැති-ඇමතිවරුත් එක්ක අපව සම්බන්ධ කරලා, ඒ අරගළය ආරම්භ කළා. එයින් දින පහකට පසුව නොවැම්බර් 17වන දා චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය දිවයිනට පැමිණියා. ඒ මොහොත වන විට එතුමියගේ ගෙදරට යන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කිසිම නායකයෙකුට කොන්දක් තිබුණේ නැහැ. නමුත් එතුමා, එතුමාගේ වාහනය මාදිවෙල දමලා, මගේ වාහනයට නැඟලා, මමත් එක්ක චන්ද්‍රිකා මැතිනියගේ ගෙදරට ගිහිල්ලා උදේ 5.45 වෙනකල් මැති-ඇමතිවරුන්ට දුරකථන ඇමතුම් දීලා, ඒ අරගළයට අවශ්‍ය නායකත්වය ලබා දුන්නා.

2014 නොවැම්බර් 21වන දා ඒ අරගළයේදී මගේ පියාවත් ඒ ආණ්ඩුවෙන් එළියට බහියි කියලා මම බලාපොරොත්තු වුණේ නැහැ. එවන් අවස්ථාවක එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා එළියට බැහැලා ඒ සටන ආරම්භ කළා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දමලා එන්න ලැහැස්තියි කියලා අපි දැන ගෙන හිටියා නම්, නොවැම්බර් 21වන දා සිදු වූ විප්ලවයේදී එතුමාත් එළියට බහිනවා කියලා අපි දැන ගෙන හිටියා නම්, එතුමා සමඟ එකතු වෙලා තවත් මැති-ඇමතිවරු 10ක්, 15ක් එළියට ගන්න අපට හැකියාව තිබුණා. නමුත් එතුමා නොවැම්බර් 12වන දා ඉඳලා නොවැම්බර් 21වන දා වෙනකල් එළිපිට ඒ සටන දියත් කළා. එදා පැවැති ඒකාධිපති වියරුව පරාජය කිරීම සඳහා එතුමා එතුමාගේ සියලු වගකීම්, යුතුකම් ඉටු කළා. ඒ වාගේම ඒ විප්ලවය පසුපසට හරවන්න 2015 ජනවාරි 8වන දා ප්‍රතිවිප්ලව බලවේග ක්‍රියාත්මක වන විට, 2015 අගෝස්තු 17වන දා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැවත ඒ ප්‍රෝඩාකාරී බලවේග අතට පත් වෙන්න යන කොට, එතුමා නැවතත් දේශපාලනික වශයෙන් අතික්‍රමණය කරලා මා නියෝජනය කරන ප්‍රජාතන්ත්‍රවාදී ජාතික ව්‍යාපාරයත් එක්ක ඒකාබද්ධ වෙලා, එක්සත් ජාතික පක්ෂයත් සමඟ අවබෝධතා ගිවිසුමකට යොමු වෙලා, ඒ අවබෝධතා ගිවිසුම යටතේ එක්සත් ජාතික පෙරමුණ ගොඩ නඟන්න මූලික වුණා; පුරෝගාමී වුණා.

එතුමා එදා දූරදර්ශීව දැකපු දේශපාලන විඥානය තුළින් අපට පසු ගිය පාර්ලිමේන්තු මැතිවරණය ජය ගෙන යහ පාලන බලවේගය ක්‍රියාත්මක කර මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැවතත් ස්ථාපිත කිරීමේ හැකියාව ලැබුණා. ඒ වාගේම එතුමා ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට තේරී පත්වන කොට මගේ පියා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කය අත් හැර මම එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා ඉපදුණු ගම්පහ දිස්ත්‍රික්කයට ගියා. මම ගම්පහට යනකොට නන්නාඳුනන ගම්පහ දිස්ත්‍රික්කයේ ගෙයක්, කාර්යාලයක් නැති, මගේ පියාවත් මගේ

[ගරු වතුර සංදීප සේනාරත්න මහතා]

මැතිවරණ ව්‍යාපාරයට නොපැමිණි මොහොතක ගම්පහ දිස්ත්‍රික්කයේ මට මගේ පියා වාගේ ආශිර්වාදයක් වුණේ; ශක්තියක් වුණේ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමායි කියලා මම මගේ මුළු ජීවිත කාලය පුරාවටම ප්‍රකාශ කරනවා.

එදා මට මවක් හැටියට මගේ මැතිවරණ ව්‍යාපාරයට අනේක විධ ශක්තියක් බවට පත් වුණේ මාලනී ගුණවර්ධන මැතිනියයි. එවකට පැවැති ජරාජීර්ණ දේශපාලන ක්‍රමවේදයේ මනාප පොරය යටතේ අපේම දේශපාලනඥයන් අපට කථාවක් පවා නොදෙන අන්ත පහත් තත්ත්වයකට වැටිලා තියෙද්දි එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන කියන කැබිනට් අමාත්‍යවරයා රැස්වීම්වල කථා අරගෙන මා කළ මෙහෙය ගැන කියලා මා වෙනුවෙන් දැක්වූ සහයෝගයට මම එතුමාට හිස නමා ආචාර කරනවා. ඒ වාගේම එතුමාට මම ණයගැති වනවා.

එතුමාගේ අවසාන කාලයේදී එතුමාගේ දියණියගේ ආදරය සෙනෙහස මැද එංගලන්තයේදී බොහෝදුරට එතුමා නිරෝගි සුවය ලැබුවා. නමුත්, එතුමා ලංකාවට පැමිණි පසු නැවත අසනීප වීම මත නවලෝක රෝහලට ඇතුළත් කළා. එම රෝහලට පැමිණි දවසේ සිට රෝහලේ ගත කළ අවසාන දවස දක්වා පාර්ලිමේන්තු සැසිවාරය පැවැත්වූ සෑම දිනකම පාර්ලිමේන්තු සැසිවාරය අවසන් වෙලාත්, අනිකුත් දවස්වලත් මම රෑ දෙගොඩ හරියේ රෝහලට ගිහිල්ලා, "දොස්තරවරු අපට බනීද?" කියලා අහමින් එළි වෙනකල් එතුමාත් සමඟ සතුටු සාමීචියේ යෙදුණා. එතුමා සමඟ පරණ දේවල් කථා කළා. පාද යාත්‍රා, ජන ඡෝෂා, මිනිස් දම්වැල්, රථ යාත්‍රා ආදිය ගැන ඒ අවස්ථාවලදී අපි කථා කළා. 1977දී, 1994දී එතුමා විඳි දුක් ගැන කථා කළා. අපි ඉතිහාසය ආවර්ජනය කළා. අනාගත ගමන් මාර්ගය ගැන අපි වාද විවාද කර ගත්තා. නමුත්, කලින් දවසේ රාත්‍රියේ හම්බ වුණාමවත් මම කිසිසේත්ම හිතුවේ නැහැ, තව අවරුදු විස්සක් යනතෙක්වත් මේ "එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන" කියන ප්‍රතාපවත් ජන නායකයා අප අතරින් වියෝ වෙයි කියලා.

එතුමා වියෝ වුණු වෙලාවේදී මට එක්තරා සිවිල් ව්‍යාපාරයක් නියෝජනය කරන පුද්ගලයෙකු කිව්වා,"එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතාගේ රූපයේ එතුමාගේ නම කොටා, නොවැම්බර් 23වන දා සිට මේ රටේ රජ ගෙවල්වල තෙල් කටාරම්වල දැමුවා" කියලා. ඒ නිර්ලජ්ජිත වැඩ කරපු අයගෙන් දැන් මට අහන්න තිබෙන්නේ එකයි. ඒ තමයි, "ඔබට සතුටුයිද, දැන්?" කියලායි.

එතුමාගේ වියෝව නිසා මේ රටට ජන නායකයෙකු නැති වුණා වාගේම; නැහෙනහිර ජනතාවට තමන්ගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටි ආදරණීය ලෙන්ගතු සහෘදයෙකු නැති වුණා; ගොවි ජනතාවගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටි නායකයෙකු ගොවි ජනතාවට නැති වුණා; සීනි කම්හලේ සේවකයන්ට තමන්ගේ සේවා සුරක්ෂිතතාව වෙනුවෙන් පෙනී සිට තමන්ගේ අනාගතය ආරක්ෂා කරන්න අනේක විධ සටන්වල නියැලුණු දේශපාලන නායකයෙකු නැති වුණා. ඒ වාගේම මාලනී ගුණවර්ධන මැතිනියට සදාදරණීය ස්වාමිපුරුෂයෙකු නැති වුණා. ඒ පුතණුවන්ට, දියණියන්ට ආදරණීය පියෙකු නැති වුණා. අපට පියෙකු හා සමාන ආදරණීය යුග පුරුෂයෙකු නැති වුණා.

එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා තුළ තිබුණු සටන්කාමීත්වය එදා, නොවැම්බර් 21වැනි දා මම දැක්කා. මේ රටේ තිබුණු ක්‍රමය වෙනස් කරලා, ඇති නැති පරතරය නැති කරන්න, පන්ති විරහිත සමාජයක් බිහි කරන්න එතුමා ඒ අරගළය කළා. පදවි තානාන්තර පසෙකට දමලා, එවකට ජුන්ථාවක් වාගේ තිබුණු ඒකාධිපති ව්‍යරුව පරාජය කරන්න මේ රටේ බොහෝ නායකයන්ට නොතිබුණු කොන්ද එතුමාට තිබුණා. ඒ අනුව ආණ්ඩුවෙන් එළියට බැහැලා, මේ රටේ ජනතාව නිවැරදි මාර්ගයට අරගෙන යන්න එතුමා තුළ තිබුණු සටන්කාමීත්වය නොවැම්බර් 21වැනි දා නව නගර ශාලාවේදී පෙන්වූවා. දැන් එතුමාගේ අඩි පාරේ යමින්, එතුමාගේ යෂ්ඨිය අතට අරගෙන තිබෙන නලින් ගුණවර්ධන මැතිතුමාට නැහෙනහිර සිංහල, දමිළ, මුස්ලිම් ජනතාවට නායකත්වය දෙන්නට හැකියාව ලැබේවා කියා මා අනේකවාරයක් ප්‍රාර්ථනා කරනවා. 2015 ජනවාරි 08 විප්ලවයේදී වාගේම ආයුධ අතින් නොගෙන, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මතවාදී අරගළය ඉදිරියට අරගෙන යන්න නලින් ගුණවර්ධන මැතිතුමාට මවගේ උණුසුමත් පියාගේ ආශිර්වාදයත් ලැබේවායි මම ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේ මාලි ගුණවර්ධන මැතිනිය, නෙල්කා ගුණවර්ධන දියණිය ඇතුළු ඒ පවුල්වල සියලු දෙනාටම එතුමාගේ අභාවය වෙනුවෙන් මෙම ගරු සභාවේ ශෝකය පුද කරනවා. ඔබ සියලුදෙනාට තමන්ගේ ඥාතියා නැති වුණා වාගේම, ප්‍රජාතන්ත්‍රවාදයට ආදරය කරන මේ රටේ ජනතාවට ප්‍රාතන්ත්‍රවාදී ජන නායකයෙක් නැති වුණාය කියලා මේ ගරු සභාවේදී නැවත නැවතත් මා ප්‍රකාශ කරනවා.

අපට පූර්වාදර්ශයක් සැපයූ එතුමා දේශපාලනයෙන් හරි හම්බ කර නොගත් කෙනෙක්. එතුමා මේ රටේ ජනතාවට තමන්ගේම නැසියෙක්, තමන්ගේම නායකයෙක් යැයි ප්‍රකාශ කරන්න පුළුවන් ආකාරයට කොන්ද කෙළින් තියා ගෙන කටයුතු කළ කෙනෙක්. මේ රටේ මල්වතු මහා නායක හිමියන්ගෙන්, අස්ගිරි මහා නායක හිමියන්ගෙන් අදත් ඇහුවොත් කියන්නේ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා වැනි බුද්ධ ශාසන ඇමතිවරයෙක් අපට දෙන්න කියලායි. මේ රටේ බෞද්ධ ජන සමාජයෙන් ඇහුවොත් කියන්නේ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා වාගේ බුද්ධ ශාසන අමාත්‍යවරයෙක් අද කාලයට අත්‍යවශ්‍ය බවයි.

ගරු කථානායකතුමනි, මේ රටේ දේශපාලන ඉතිහාසය තුළ බණ්ඩාරනායක මැතිනියගේ සෙවණැල්ල බවට පත් වෙමින්, චන්ද්‍රිකා මැතිනියගේ දැත් ශක්තිමත් කරමින්, අවසානයේදී නිල් සාටකයක් දමා ගෙන කොළ පාට, රතු පාට, කහ පාට වේදිකාවට නැඟපු දැවැන්ත දේශපාලනඥයකු වන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පරමාදර්ශී නායකයකු වන එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාට ජාතියේ උත්තමාචාරය පුද කරන අතර, එතුමාට නිවන් සුව අත්වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ප්‍රි.ප. 4.03]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ சபாநாயகர் அவர்களே, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டப் பாராளுமன்ற உறுப்பினராகவும் காணி அமைச்சருமாக விளங்கிய அமரர் எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன அவர்களுடைய மறைவு குறித்த அனுதாபப் பிரேரணைமீது பேசக்கிடைத்ததைப் பெரும் பாக்கியமாகக் கருதுகின்றேன். எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன அவர்கள் 1989ஆம் ஆண்டு பொதுத் தேர்தல் மூலம் முதன்முதலிலே பாராளுமன்றத்திற்கு தெரிவு செய்யப்பட்டார். அக்காலப் பகுதியிலே எனது தந்தை எம்.ஈ.எச். மஹ்ரூப் அவர்களும் அந்தத் தேர்தலிலே வெற்றி பெற்று பாராளுமன்றத்திற்கு தெரிவானார். அதன்மூலம் எனது தந்தையோடு நெருங்கிப் பழகுகின்ற வாய்ப்பு அவருக்கு

කිඩෙත්තු. මාවට්ටම් සම්පන්තප්පට්ට අපිවිරුත්ති විඩයඞ්කළිලේ නෙරුඞ්කි වේලෛසෙය්යක්කූඩිය වාය්ප්පුක්කළ් අවර්කළුක්කුක් කිට්ටියතු. අන්ත වකෛයිලේ, තනතු කඩමෛකළෛ මික නිරෛවාකච් චෙය්ත ඔරු පාරාළුමන්ර උරුප්පිනරාන ඉවර්, මුන්නර් පුත්තසාසන, සමය අලුවල්කළ් පිරති අමෛච්චරාකවුම් පණියාට්රිනාර්.

ඉලඞ්කෛ අරසියල් වරලාට්රිලේ තිරුකෝණමලෛ මාවට්ටත්තෛප් පොරුත්තවරෛ ඉතුවරෛ අඞ්කේ අමෛච්චරවෛ අන්තස්තුළ්ළ ඔරේ අමෛච්චරාක ඉරුන්තවර් අමරර් එම්.කේ.ඒ.ටි.එස්. කුණවර්තන අවර්කළ් එන්පතු පෙරුමෛක්කුරිය ඔරු විඩයමාකුම්. තනක්කු වාක්කළිත්ත පෙරුම්පාන්මෛච් චිඞ්කළ මක්කළුටන් මිකවුම් චිනේකපූර්වමාන උරවුකළෛප් පේණිය ඔරු මනිතරෙන්රාල් අතු මිකෛයාකාතු. තමිළ් මක්කළ් වාළ්කින්ර වෙරුකල් පිරතේච චෙයලකප් පිරිවිලේ ඔරුඞ්කිණෛප්පුක් කුළුත් තලෛවරාක නියමික්කප්පට්ටතන්මූලම් අඞ්කු තමිළ් මක්කළුක්කුත් තේවෛයාන අපිවිරුත්තිකළෛ මේර්කොණ්ට මර්රුම් අවර්කළුටෛය කරුත්තුක්කළෛ වෙළිප්පටුත්තිය ඔරුවරාක අවර් ඉරුන්තාර්. තන්නෝටු නෙරුක්කමාක ඉරුන්ත මුස්ලිම් මක්කළුක්කුත් තොළිල් වාය්ප්පුක්කළෛ වළඞ්කියුළ්ළාර්. මුස්ලිම් පකුතිකළින් අපිවිරුත්ති සම්පන්තමාකප් පල ඔදුක්කීටුකළෛයුම් ඉවර් චෙය්තිරුක්කිරාර්. අතිකාරිකළුටනුම් පොතුමක්කළුටනුම් නල්ලුරවෛප් පේණි වන්තවර්; නකෛච්චුවෛයාකප් පේසුකින්ර මනප්පාන්මෛ කොණ්ටවර්. කූට්ටඞ්කළිලේ නකෛච්චුවෛ යාකප් පේසි, අවර්රෛක් කලකලප්පාක නටත්තියවර් කාලඤ් චෙන්ර එම්.කේ.ඒ.ටෙ.එස්. කුණවර්තන අවර්කළ් එන්පතෛයුම් ඉන්ත ඉටත්තිලේ කූරවේණ්ටුම්.

ඉවර් 2012ආම් ආණ්ටු පුත්තසාසන පිරති අමෛච්චරාකප් පතවි වකිත්ත කාලප්පකුතියිල්, තේසිය මීලාත් විළාවෛ තිරුකෝණමලෛ මාවට්ටත්තිලුළ්ළ කිණ්ණියාවිල් නටත්තිය පෙරුමෛයුම් අන්තක් කාලප්පකුතියිලේ සර්වතේස මට්ටත්තිල් නටත්තප්පට්ට කුර්ආන් මනනප් පෝට්ටියිල් මුතලිටම් පෙට්රු, ඉලඞ්කෛක්කුප් පෙරුමෛ චේර්ත්ත මාණවනෛ අන්ත නිකළ්වුක්කු අළෛත්තුක් කෞරවිත්ත පෙරුමෛයුම් අවරෛච් චාරුම් එන්පතෛ නාන් ඉන්ත ඉටත්තිල් ඥාපකමූට්ට විරුම්පුකින්රේන්.

තාන් පිරතිනිතිත්තුවප්පටුත්තිය චේරුවිල තොකුතියිලේ මුක්කියමාන නකරමාකක් කරුතප්පටුම් කන්තළාය් පිරතේචම් පල්වේරු වළිකළිලුම් අපිවිරුත්තියටෛවතර්කාක අවරුටෛය කාලප්පකුතියිල් මුළුප් පඞ්කළිප්පෛයුම් ඉවර් චෙය්තිරුක්කින්රාර්. චිල මුක්කිය අලුවලකඞ්කළ් කන්තළායිල් අමෛයප්පෙර වේණ්ටුම් එන්ර අටිප්පටෛයිල් අතර්කාකප් පෝරාටියවර්. අතන් පිරකාරම්, කිළක්කු මාකාණත්තුක්කාන මත්තිය සුර්රාටල් අපිවිරුත්ති අලුවලකත්තෛක් කන්තළායිල් අමෛත්ත පෙරුමෛයෛයුම් අමරර් එම්.කේ.ඒ.ටෙ.එස්. කුණවර්තන අවර්කළ් පෙර්රිරුක්කින්රාර්.

මහින්ත රාජපක්ෂ අවර්කළින් අරාජක ආට්චියෛ මුටිවුක්කුක් කොණ්ටුවන්තු, නල්ලාට්චියෛ ඒර්පටුත්තුවතර්කාන මුතර්කට්ටප්පටියිල් අන්ත අණියිලිරුන්තු වෙළියේ වන්තවර්කළිල් එංකළුටෛය කුණවර්තන අවර්කළුම් මුක්කිය ඉටත්තෛ වකික්කින්රාර්. අවරුටෛය පංකළිප්පෛක් කෞරවප්පටුත්තුම් නෝක්කිල්, මේතකු ජනාතිපති මෛත්තිරිපාල චිරිචේන අවර්කළ් අවරෛ අමෛච්චරවෛ අන්තස්තුළ්ළ අමෛච්චරාක නියමිත්තාර්. අතන් කාරණමාක, අවර් එමතු මාවට්ටත්තුක්කු පෙරුමෛ තේටිත්තන්තිරුක්කින්රාර්. ඉවර් තොට්ටුච්චෙන්ර පණිකළෛත් තොටර්න්තු මුන්නෙටුක්කුම් තාර්මීකප් පොරුප්පෛ ඉවරුටෛය මකනාන නළින් කුණවර්තන අවර්කළ් ඒර්ට්රිරුක්කින්රාර්. තන්තෛයින් වළියිල් චෙන්රු අවරතු පෙයරෛ නිලෛනිරුත්ත වේණ්ටුමෙන්ර නෝක්කිල්, තනයන් අරසියලිල් කුතිත්තිරුක්කින්රාර්. අවරුක්කු නාන් ඉන්ත ඉටත්තිලේ එනතු වාළ්ත්තුක්කළෛත් තෙරිවිත්තුක්කොළ්කින්රේන්.

නල්ල පණ්පුකළ් පලවර්රෛත් තන්නකත්තේ කොණ්ටිරුන්ත ඔරු මූත්ත අරසියල්වාතියෛ නාම් ඉළන්තුළ්ළෝම්. එන්නෛප් පෝන්ර ඉළම් අරසියල්වාතිකළ් ඉවරතු අනුපවඞ්කළෛප් පකිර්න්තුකොළ්ළුම් වාය්ප්පෛ ඉළන්තුළ්ළෝම්. යාර් එන්න චොන්නාලුම්, අමරර් එම්.කේ.ඒ.ටෙ.එස්. කුණවර්තන අවර්කළින් ඉළප්පු නිරප්ප මුටියාත ඕර් ඉළප්පාකත්තාන් ඉරුක්කින්රතු. අන්නාරුටෛය ඉළප්පිනාල් කවලෛයෝටුළ්ළ කුටුම්පත්තිනරුක්කු එන්නුටෛය ආළ්න්ත අනුතාපඞ්කළෛත් තෙරිවිත්තුක්කොළ්වතෝටු, අවර් එඞ්කළුටෛය මාවට්ටත්තිල් එව්වාරු චෙයර්පට්ටාරෝ, අතේපෝන්රු අවර් විට්ටුච්චෙන්රිරුක්කින්ර පණිකළෛයුම් අරසියලෛයුම් අවරුටෛය මකන් නළින් කුණවර්තන අවර්කළ් තොටරවේණ්ටුමෙනවුම් අව්වාරේ අඞ්කිරුක්කින්ර මක්කළුක්කාකවුම් කුරල් කොටුක්කවේණ්ටුමෙනවුම් ඉන්ත ඉටත්තිලේ කේට්ටුක්කොණ්ටු, වාය්ප්පුක්කු නන්රිකූර්රි, එනතු උරෛයෛ මුටිත්තුක්කොළ්කින්රේන්. නන්රි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඕළඟට, ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මැතිතුමා

[අ.භා. 4.10]

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු (කලානිති) ජයම්පති විර්රමරත්න)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

ගරු කථානායකතුමනි, හිටපු අමාත්‍ය ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝක ප්‍රකාශ කරන මේ අවස්ථාවේ දී පෞද්ගලිකව මා වෙනුවෙන්, මා නියෝජනය කරන ලංකා සමසමාජ පක්ෂයේ බහුතර කණ්ඩායම වෙනුවෙනුත් වවන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා පළමුවෙන්ම පාර්ලිමේන්තුවට පැමිණියේ 1989 වර්ෂයේදීයි. එතුමා ඊට දීර්ඝ කාලයකට පෙර සිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් දේශපාලන කටයුතුවල යෙදුණු කෙනෙක්. එතුමාගේ දේශපාලන ජීවිතය පිළිබඳව සහෝදර මන්ත්‍රීවරුන් දීර්ඝ වශයෙන් කථා කළ නිසා මම ඒ කරුණු නැවතත් කියන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

මා එතුමන්ව හඳුනා ගත්තේ1994න් පසුවයි. මම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අමාත්‍යාංශයේ උපදේශකවරයකු හැටියට කටයුතු කළ කාලයේ, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සැකසීම සඳහා කටයුතු කරමින් සිටින අවස්ථාවේදී, නැහෙනහිර පළාත නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට විශේෂයෙන්ම ජාතික ගැටලුව ගැන, උතුර - නැහෙනහිර ප්‍රශ්නය පිළිබඳව එතුමා නොයෙකුත් අවස්ථාවල අපත් සමඟ සාකච්ඡා කළා. එතැනදී තමයි මට පළමුවෙන්ම එතුමා හඳුනා ගන්නට පුළුවන් වුණේ. එතුමා කෙටි කාලයක් පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. ඒ කාලයේ මට එතුමාව හමු වුණේ පළාත් සභාව විසින් සංවිධානය කරන ලද නැහෙනහිර පළාතේ වැඩමුළු කිහිපයකදීයි. සම්පත්දායකයකු හැටියට එම වැඩමුළුවලට මමත් සම්බන්ධ වුණා. නැවත මට එතුමාව හමු වුණේ එම කාලය තුළයි.

මට එතුමා සමඟ කිට්ටුවෙන් කටයුතු කරන්නට ලැබුණු ඊළඟ අවස්ථාව 2014 අවසාන භාගයයි. 2015 ජනවාරි 08වැනිදා මේ

[ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා]

රටේ සිදු කළ වෙනසට එතුමා දුන් දායකත්වය පිළිබඳව මේ ගරු සභාවේ දී දීර්ඝ වශයෙන් සාකච්ඡා වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් හැටියට සිටි වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2014 නොවැම්බර් මාසයේ 21වැනිදා ඒ අතීත තීරණය ගත් වෙලාවේ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාත් එතුමා සමඟ ඒ තීරණයට සම්බන්ධ වෙලා ආණ්ඩුවෙන් එළියට ආවා. ඊට මාස දෙකක් පමණ පෙර සිට එතුමා අපත් එක්ක ඒ වැඩේට සම්බන්ධ වුණා. අපි කණ්ඩායමක් විශේෂයෙන්ම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ මූලිකත්වයෙන් - මම හිතන විධියට සැප්තැම්බර් මාසයේ විතර සිට - ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ විවිධ දේශපාලනඥයන් සමඟ කටයුතු කරමින් සිටියා.

චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ උපදෙස් පරිදි මා කිහිප වතාවක්ම එතුමාව ඉතාමත් රහසිගතව හමු වුණා. එහිදී වෙනත් අයත් සිටියා, එතුමන්ලාත් හමු වුණා. එතුමන්ලාගෙන් සමහරු අන්තිමට ආවේ නැහැ; සමහරු ආවා. ඒ කාලය ඉතාමත් භයානක කාලයක්. හමුවීමට තබා දුරකථනයෙන්වත් කථා කරන්නට පුළුවන් කාලයක් නොවෙයි, එදා තිබුණේ. මොකද, අපේ දුරකථනවලට සවන් දෙන බව අපි දැනගෙන සිටියා. නමුත් මෛත්‍රීපාල සිරිසේන වර්තමාන ජනාධිපතිතුමා, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා, ඒ වෙනසට සහභාගි වෙලා පැවැති ආණ්ඩුවෙන් එළියට ආපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනෙක් මන්ත්‍රීතුමන්ලා, අපි සම්බන්ධකම් පවත්වන්නට වෙනත් ක්‍රම සහ විධි සොයා ගත්තා. එන්නේ කවුද, එන්න ඉඩ තිබෙන්නේ කවුද, කථා කරන්නේ කවුද කියලා අපි ලැයිස්තු හැදුවා. නමුත් අපි දැන ගෙන සිටියා, කථා කරන සියලු දෙනාම එන්නේ නැහැයි කියලා. මොකද, අපි දැනගෙන සිටියා, තිබුණු පීඩනය කුමක්ද කියා. ඒ වෙලාවේ ආණ්ඩුවෙන් එළියට එන එක ජීවිතය පරදුවට තබා කරන වැඩක්. අපි දිගටම ලැයිස්තු හදමින්, අරයා එයිද දන්නේ නැහැ, මෙයා එයිද දන්නේ නැහැයි කිය කියා tick කර-කර සිටියා. නමුත් චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය දිගටම කියපු දෙයක් තමයි, කවුරු ආවේ නැතත්, එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා එනවාමයි කියන එක. ඒ බලාපොරොත්තු වුණු ආකාරයටම 2014 නොවැම්බර් මාසයේ 21වන දා දවල් ආහාරය ගන්නට ඔන්න-මෙන්න කියලා තිබියදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් එක්ක එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ නිවසට ආපු බව මට හොඳට මතකයි. එදා හවස නව නගර ශාලාවේ පැවති සුප්‍රසිද්ධ පුවත් පත් සාකච්ඡාවට -මාධ්‍ය සාකච්ඡාවට- මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් සමඟ එතුමා සහභාගි වුණා. ඉන් පසුව මැතිවරණ කාලයේදී එතුමාත් සමඟ ඉතාමත් කිට්ටුවෙන් කටයුතු කරන්න මට අවස්ථාව ලැබුණා. එතුමාගේ දීර්ඝ දේශපාලන ඉතිහාසය ගැන කථා කරන කොට එතුමාගේ ජීවිතය පිළිබඳව රසවත් පරණ කථාන්දර කියපු ආකාරය මට මතකයි. එතුමා නිහතමානී, ප්‍රියමනාප පුද්ගලයෙක්. එතුමාගේ විස්තර එතුමා කියන්න පටන් ගත්තා. ඒ තුළින් අපි බොහෝ දේවල් ඉගෙන ගත්තා.

ඉන් පසුව පැවති ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජයග්‍රහණය කරවන්නට අප සියලු දෙනාම පණ එපාය කියලා වැඩ කළා. එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා ඒ සඳහා රට පුරා පැවති රැස්වීම්වලට, සාකච්ඡාවලට සහභාගි වුණා. ඒ තුළින් අපට පුළුවන් වුණා, ඒ වෙනස කරන්නට. එතුමා විසින් නැහෙනහිර පළාතටත්, රටටත් කරන ලද සේවය ඉතිහාසයට එකතු වන අතර එතුමා පිළිබඳව ඉතිහාසයේ ලියවෙනවා නම්, එතුමා පිළිබඳව රන් අකුරෙන් ලියවෙන්නේ ජනවාරි 08වන දා සිදු කළ වෙනසට එතුමා දුන්නු දායකත්වය පිළිබඳවයි. අපිත් එක්ක කලින් කථා කරන කොට වීරයන් වාගේ, "අපි නම් එනවාමයි" කියපු සමහරු නොයෙකුත් බලපෑම්වලට යටත් වුණා. තමන්ට ලැබුණු වෙනත් ද්‍රව්‍යමය හේතු නිසා සමහරු ආවේ නැහැ. නමුත් එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා එහෙම නොවෙයි. එතුමා ඒ අවස්ථාවේදී භය නැතුව ඒ අහිත පියවර ගත්තා. මේ රටේ දේශපාලනය ඉතිහාසය ගැන ලියවෙන කොට වැදගත්ම සාධකය වන්නේ, එතුමා භය නැතුව, ජීවිතය එපාය කියා ගත් ඒ පියවරයි.

ගරු කථානායකතුමනි, ජනවාරි 08වන දිනට කිට්ටු වනකොට අපේ ප්‍රයත්නය සාර්ථක වීම පිළිබඳව අපි දෙදෙනා තුළ සැකයක් තිබුණේ නැහැ. නමුත් එදා නොවැම්බර් මාසයේ එතුමා ආණ්ඩුවෙන් එළියට එන කොට ඒ විශ්වාසය එතුමාට නොතිබුණා වෙන්න පුළුවන්. විශ්වාසයක් තිබුණත්, නැතත්, එදා එතුමා නිවැරැදියි කියා හිතපු දේ කළා. ඉන් පසුව අපේ යහ පාලනය ආණ්ඩුව පිහිටුවා, පුළුවන් ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනස්කම් සිදු කරලා, අගෝස්තු මාසයේ මැතිවරණයක් පැවැත්වූවා.

අගෝස්තු මැතිවරණයට පෙර එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගෙයි, මගෙයි දෙදෙනාගේම නම් සඳහන් වෙලා තිබුණේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ජාතික ලැයිස්තුව තුළයි. නමුත් අපි දායක වෙලා වෙනස් කරපු පාලනය තුළ සිටි පුද්ගලයන් - ඉවත් කරපු පුද්ගලයන් - නැවත එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඡන්දය ඉල්ලන තත්ත්වයක් ඇති වුණාම, එතුමාටත්, අපටත් විශාල කනගාටුවක් ඇති වුණා. අප විසින් පරාජය කරන ලද ඒ පුද්ගලයන් සමඟ නැවත එකම මැතිවරණ ලැයිස්තුවක ඉන්නවා දැක්කාම අපට කනගාටුවක් දැනුණා. විශේෂයෙන්ම වාමාංශිකයෙක් හැටියට මුළු ජීවිත කාලයම ගතකරපු මට ප්‍රශ්නයක් ඇති වුණා, මේ වෙලාවේ මොකද කරන්නේ කියලා. මට මතකයි, ඒ වෙලාවේ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා මා මුණගැහිලා කිව්වා, "ජයම්පති, ඔබතුමා ඉස්කෝලේ යන කාලයේ ඉඳලා සමසමාජකාරයෙක් බව මම දන්නවා. ඒ වාගේම තමයි මමත්. පේන්නේ නැද්ද, මම නිල් සාටකය දමාගෙන ඉන්නේ. මෙතෙක් මගේ මුළු ජීවිත කාලයම ගත කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. දේශපාලන කන්‍යාභාවය ආරක්ෂා කරගෙන මෙතැන මේ වැඩේ කරන්න බැහැ මන්ත්‍රීතුමා" කියලා. එතුමා කිව්වේ ඒකයි. ඒ වාගේම, "දේශපාලන කන්‍යාභාවය ආරක්ෂා කරගෙන මේ වැඩේ කරන්න බැහැ. ජනවාරි 8වැනිදා අපි ලබාගත් ජයග්‍රහණය අගෝස්තු මාසයේදී සම්පූර්ණ කරන්න ඕනෑ. එම නිසා මේ තිත්ත බෙහෙත බොන්න වෙනවා." එතුමා "තිත්ත බෙහෙත" වශයෙන් අදහස් කළේ, අපේ මුළු ජීවිත කාලයම අපේ විරුද්ධවාදීන් හැටියට කටයුතු කරපු එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ එක්සත් ජාතික පෙරමුණේ සලකුණ යටතේ මැතිවරණයට ඉදිරිපත් වෙන්නට සිදුවීමයි.

අවසාන වශයෙන්, මගේ පක්ෂයත් තීන්දු කළා, ඒ විධියට කටයුතු කරන්න. එතුමා, අර්ජුන රණතුංග මැතිතුමා, රාජිත සේනාරත්න මැතිතුමා, වෙනත් නායකයින් මෙහා පැත්තට ඇවිල්ලා ඔවුන් සමඟ එකතු වෙලා ජනවාරි මාසයේ 8වැනිදා ඇති කළ වෙනස සම්පූර්ණ කරන්න අගෝස්තු මාසයේදී ඊට දායක වුණා. එතුමාට අලුත් ආණ්ඩුවේ ඉඩම් ඇමතිකම ලැබුණා. මීට කලින් කථා කළ සහෝදර මන්ත්‍රීවරයෙක් කිව්වා වගේ, ඉඩම් සංවර්ධන නිලධාරියෙක් හැටියට ජීවිතය පටන් ගත් එතුමා අවසන් හුස්ම හෙළුවේ මේ රටේ ඉඩම් ඇමතිවරයා හැටියටයි. අවසාන කාලයේ එතුමා අසනීප වෙලා සිටියා. ඊට පසු එතුමාට තරමක් හොඳ වුණා. පසුව අපි හිතුවා, එතුමා තවත් දීර්ඝ කාලයක් ජීවත් වෙයි කියලා. නමුත් අපේ අවාසනාවට එතුමා අපෙන් වෙන්ව ගියා.

දැන් එතුමාගේ අභාවය වෙනුවෙන් අප මෙසේ ශෝකය ප්‍රකාශ කරන අතර, එතුමා පෙනී සිටිමින් ජනවාරි 8වැනිදා ඇති කළ වෙනස, අගෝස්තු මාසයේ සම්පූර්ණ කරපු වෙනස; ඒ ඇති කරපු වෙනස දීර්ඝ කාලීනව පවත්වාගෙන යෑමට අපට යුතුකමක් තිබෙනවා. එතුමා භය නැතුව එළියට ඇවිල්ලා පරාජය කරපු බලවේගවලට නැවත මේ රටේ හිස ඔසවන්නට ඉඩ නොදී ඒ ජයග්‍රහණය සම්පූර්ණ කිරීමට අපට යුතුකමක් තිබෙනවා. අපට එතුමා වෙනුවෙන් කළ හැකි උතුම්ම කාර්ය වන්නේ එයයි.

ගරු කථානායකතුමනි, මම දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් මේ අවස්ථාවේ ලංකා සමසමාජ පක්ෂයේ බහුතරය වෙනුවෙනුත්, පෞද්ගලික වශයෙන් මගේත් ශෝකය ගුණවර්ධන මැතිනිය සහ එම පවුලේ සියලු දෙනා වෙත පුද කරන අතර, එතුමාගේ සේවය අහිමි වුණු, විශේෂයෙන්ම ත්‍රිකුණාමලයේ කන්තලේ ප්‍රදේශයේ ජනතාවට අපගේ ශෝකය ප්‍රකාශ කරමින්, එතුමාට නිවන් සැප ලැබෙවා කියා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[4.21 p.m.]

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)

Thank you, Hon. Speaker, for giving me this opportunity to take part in the Vote of Condolence on the demise of my dear Friend, the late Hon. M.K.A.D.S. Gunawardana.

In 1978, after the victory of the UNP, under the leadership of the late Hon. (Mrs.) Sirimavo Bandaranaike, he came into politics. We, the late Hon. M.K.A.D.S. Gunawardana and I, started our politics under the leadership of the late Hon. (Mrs.) Sirimavo Bandaranaike. Actually, it was a very difficult time, but without any fear, he started his political career. I too was with him.

In 1989, I remember, we contested and even though I lost by a few hundred votes, he was elected to Parliament. Till 1994, we built up the party; he was responsible for building up the party. Then onwards, he rose up, organized and helped the party and he was always there. Later on, I remember, due respect was given to him with a place in the Governments of Madam Sirimavo Bandaranaike and President Chandrika Bandaranaike Kumaratunga. Not only did he organize the party and form the Government, but also looked after the interests of the people in the party.

However, during the last SLFP Government, under the leadership of former President Mahinda Rajapaksa, due respect was not given to him. He was grumbling in frustration. That is why after being in that party for such a long period, for almost 25 to 30 years, I remember, that every time we met, he used to say, “I do not know the party that we organized and formed; we may have to leave.” Finally, due to the problems and frustrations, he left the party, for which he suffered for so long, along with His Excellency the President.

I went and helped him at the last Provincial Council Election. I was put to Kinniya. When I went to his electorate and to his house, I was shocked to see that he was living in a small house. I asked him, “*Amathithuma*, why is this?” He said, “I am a villager. I want to lead the life of a villager. That is why I am living in this village. Until I die, I will live in this village.” I can still remember that. We were friends right throughout. During that election, I was put to Kinniya and Mutur, both of which are Muslim areas. There were a lot of Muslims who were saying, "Definitely, our first *manape* will go to 'M.K.A.D.S'." The reason why they said that was because during the time of the war, Kinniya was facing a lot of problems created by the LTTE and every time the village was affected, whether he was a Minister or a Member of Parliament, he was one of the first Members of Parliament to go there. He helped not only the Muslims, but all communities living in that area. That was the attitude of this late gentleman, whom the people of Mutur and Kinniya will never forget.

I remember, when he was a Minister, I used to go to his Ministry. There, I could see many people from almost all over the country. Even then, he was sick. But, sometimes, he used to go for his lunch around 3.00 p.m. or 3.30 p.m. I also stayed with him. I used to ask him, “Why is this?" He said, "People come from places miles and miles away to meet me. So, my going out for lunch is not going to help them.” That was his attitude. Every time, he used to tell his officers, "I do not want to see these people coming back again with the same problem. So, try to solve their problems". That was one good characteristic I saw in him.

He also helped me with the political activities of my electorate. I can remember, during the last General Election, the Hon. Prime Minister came to Puttalam for an election meeting. The late Hon. M.K.A.D.S. Gunawardana was not scheduled to speak at that meeting, but he came to Puttalam and told me, “You have been a friend for a long period and have been together in politics. During the last two elections, you came to my electorate and helped me. Therefore, it is my duty to come and help my long-time friend.”

So, Sir, I not only lost a good friend, but also a good politician. Therefore, I take this opportunity, on behalf of my Party, the ACMC, and my Leader, the Hon. Risad Badhiutheen, to share our sorrow with the family of the late Hon. M.K.A.D.S. Gunawardana and express our sympathy to them.

Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එම කථාවත් සමඟ, ශෝක ප්‍රකාශ යෝජනාව මෙයින් අවසන් වෙනවා.

ගරු මන්ත්‍රීවරුනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ හිටපු ඉඩම් අමාත්‍ය, ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමාගේ අභාවය පිළිබඳ පාර්ලිමේන්තුවේදී දෙපාර්ශ්වයෙන්ම ඉදිරිපත් කරන ලද ශෝක යෝජනා අනුමත කරමින් මම ද ඒ සමඟ එකතු වීමට කැමැත්තෙමි. එතුමා ඉතාමත්ම කිට්ටුවෙන් ආශ්‍රය කිරීමේ අවස්ථාව මටත් ලැබුණා.

අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ, එනම් හැන්සාඩ් වාර්තාවේ පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට මම නියෝග කරමි.

සභාව කල් තැබීම, ගරු සභානායකතුමා.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
"මේ අවස්ථාවේ ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SPEAKER *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, කථා කරන්න.

උසස් පෙළ විභාගයේදි නුවර එළිය දිස්ත්‍රික්කයේ සිසුන්ට සිදු වූ අසාධාරණය
உயர்தரப் பரீட்சையில் நுவரெலியா மாவட்ட மாணவர்களுக்கு ஏற்பட்ட அநீதி
INJUSTICE CAUSED TO STUDENTS OF NUWARA ELIYA DISTRICT AT ADVANCED LEVEL EXAMINATION

[අ.භා. 4.29]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් පිටත දිස්ත්‍රික්කයන්හි අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් උසස් පෙළ විභාගය සඳහා එම දිස්ත්‍රික්කයෙන් අයදුම් කිරීම නිසා, සත්‍ය වශයෙන්ම එම දිස්ත්‍රික්කයෙන් අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශාල අසාධාරණයක් සිදුවී ඇත.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ පහත සඳහන් පාසල්වල මෙම අවිධිමත් ක්‍රියාව සිදුවී ඇති බවට චෝදනා එල්ලවී තිබේ.

1. හැටන් හයිලන්ඩස් විදුහල
2. තලවකැලේ දෙමළ විදුහල
3. හැටන් බොස්කෝ විදුහල
4. හපුගස්තලාව අල්මින් හාජ් විදුහල
5. පෙන්ටර් අනුස්මරණ විදුහල
6. ශුද්ධ වූ ත්‍රිත්ව විදුහල
7. ඩෙල්ටා ගැමුණු පුර විදුහල
8. ශාන්ත සේවියර් විදුහල
9. බොස්කෝ විදුහල
10. සරස්වති විදුහල

මේ සම්බන්ධව විභාග දෙපාර්තමේන්තුව සහ රහස් පොලීසිය එක්ව විධිමත් පරීක්ෂණයක් කර, සත්‍ය තත්ත්වය මෙම සභාවට දැන්වීමට කටයුතු කරන ලෙසත්,

එලෙස අවිධිමත් ක්‍රියා සිදුවී ඇත්නම්, වංචාවට සම්බන්ධ වී ඇති පුද්ගලයින්, නිලධාරීන් සම්බන්ධව කුමන ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන්නේද යන්නත්, මෙම හේතුව නිසා අසාධාරණයට ලක්වූ නුවරඑළිය දිස්ත්‍රික්කයේ සිසුන්ට සාධාරණයක් ඉටු කිරීමට ගනු ලබන ක්‍රියා මාර්ග මෙම සභාවට දන්වන ලෙසත් මෙම පාර්ලිමේන්තුවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම තත්ත්වය පිළිබඳව මම මීට කලිනුත් මේ පාර්ලිමේන්තුවේ යම් කරුණක් ගෙන හැර පෑවා. ඊට පසුව, අධ්‍යාපනය සම්බන්ධ රාජ්‍ය ඇමතිවරයා මාධ්‍ය සාකච්ඡාවකදී මේ ගැන අදහස් දක්වා තිබුණා. නමුත්, මේ ප්‍රශ්නය විසඳීමට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මේ වන විට ගෙන ඇති පියවර පිළිබඳව හරියාකාරව දැන ගත යුතුයි. විශේෂයෙන්ම, මේ පිළිබඳව බරපතළ නොසන්සුන්තාවක් මේ වන විට නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ තිබෙන නිසා, මේ ක්‍රියාවට එරෙහිව කටයුතු කළ යුතුයි. මෙයින් වැඩිපුර අසාධාරණයට ලක් වන්නේ, හීතලේ ගැහි ගැහී ඉගෙන ගන්නා දෙමළ දරුවන් වාගේම සිංහල සහ මුස්ලිම් දරුවන්. මෙවන් අතිශය දුෂ්කර තත්ත්වයන් යටතේ ඉගෙන ගනු ලබන මේ දරුවන්ගේ ප්‍රශ්නය ගැන උනන්දු වෙන්නට ඕනෑ. මේ සම්බන්ධව කටයුතු කරන නුවරඑළිය දිස්ත්‍රික්කයේ විවිධ සංවිධානවල තිබෙන උනන්දුව නිසා, මේ ප්‍රශ්නය නැවතත් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට මා කල්පනා කළා. ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ වෙනුවෙන් අද පාර්ලිමේන්තුවේ රැඳී ඉඳලා, මේ ප්‍රශ්නයට පිළිතුරු දීම සම්බන්ධයෙන් අප සතුටු වනවා. විශේෂයෙන්ම, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, "දරුවන්ගේ අධ්‍යාපන අයිතිය සුරැකීමේ සංවිධානය" ඇතුළු සංවිධාන කිහිපයක්, ඒ වාගේම, ගුරුවරු කිහිප දෙනෙක් සහ දෙමව්පියන් මේ පිළිබඳව අප දැනුවත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයේ ස්වභාවය පිළිබඳව යම් අවබෝධයක් ලබා ගැනීම සඳහා, මට ලැබී තිබෙන වෙලාව තුළ, මට ලැබී තිබෙන දිවුරුම් ප්‍රකාශ අතරින් එකක් ගරු සභාවට ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වනවා. මේ පිළිබඳව ඇමතිතුමාට අවබෝධයක් තිබෙන බව මා හොඳින්ම විශ්වාස කරනවා. නමුත්, පාර්ලිමේන්තුවක් වශයෙන් මෙය දැන ගත යුතුයි. එම දිවුරුම් ප්‍රකාශයේ මෙසේ සඳහන් වෙනවා:

දිවුරුම් ප්‍රකාශයයි.

අංක 22, බරොස්පාර, හාවාඑලිය, නුවරඑළිය හි පදිංචි ජයදේව සිසිල් ජාලියගොඩ (ජා.හැ.අ. 60351990 v) වන මම රෝමානු කතෝලිකයෙකු වශයෙන් අවංකවද, සත්‍ය ලෙසද, ගරු ගාම්භීරතා පූර්වකවද දිවුරා ප්‍රකාශ කර සිටින වග නම්,

01. ඉහත දිවුරුම් ප්‍රකාශකද පහත සිද්ධි ප්‍රකාශකද මම වන අතර, මා පහත ප්‍රකාශ කරන කරුණු මාගේ පුද්ගලික දැනුම අනුව ප්‍රකාශ කරන බව වගකීමෙන් ප්‍රකාශ කර සිටිමි.

02. මා නුවරඑළියේ ස්ථිර පදිංචිකරුවෙකු වන අතර නුවරඑළිය ශාන්ත සේවියර් විද්‍යාලයෙන් සහ නුවරඑළිය ගාමිණී මධ්‍ය මහා විද්‍යාලයෙන් (වර්තමානයේ ගාමිණී ජාතික පාසැල) අධ්‍යාපනය ලැබූ බව මා ප්‍රකාශ කර සිටිමි.

03. වර්ෂ 1991 මාර්තු 01 වන දින සිට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉංග්‍රීසි උප ගුරුවරයෙක් වශයෙන් පත්වීමක් ලැබූ පසුව පුහුණු ඉංග්‍රීසි ගුරුවරයෙකු වශයෙන් සේවය කරන බව මා ප්‍රකාශ කර සිටිමි.

04. මා නුවරඑළිය ශාන්ත සේවියර් විදුහලේ සහ නු/ ධර්මපාල විදුහලේ ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස සේවය කර ඇති බව මා ප්‍රකාශ කර සිටිමි.

05. වර්ෂ 2012 විදුහල්පති විභාගය සමත්වීමෙන් අනතුරුව ශාන්ත සේවියර් විදුහලට සහකාර විදුහල්පති ලෙස පත්වීමක් ලැබ එහි සිංහල අංශයේ උප විදුහල්පති ලෙස 2016-02-29 වන දින දක්වා සේවය කළ බව මා ප්‍රකාශ කර සිටිමි.

06. 2016-03-01 වන දින සිට නු/ධර්මපාල ප්‍රාථමික විදුහලේ විදුහල්පති ලෙස මා කටයුතු කරන බව වැඩි දුරටත් ප්‍රකාශ කර සිටිමි.

07. මා නුවරඑළිය ශාන්ත සේවියර් විදුහලේ සේවය කළ කාලය තුළ පහත කරුණු නිරීක්ෂණය කළ බව ප්‍රකාශ කර සිටිමි.

08. නුවරඑළිය ශාන්ත සේවියර් විදුහලේ උසස් පෙළ දෙමළ මාධ්‍යයේ විද්‍යා විෂය ධාරාවට පන්ති පැවැත්වීමට පන්ති කාමරයක් තිබුණද එහි කිසිදු ළමයෙකු 2014 සිට 2016 දක්වා නොසිටි අතර විටින් විට පැමිණි උසස් පෙළ විද්‍යා අංශ ගුරුවරුන්ට සේවය කිරීමට ළමුන් නොසිටි බවද මා ප්‍රකාශ කර සිටිමි.

09. ළමුන් කිසිවෙකුත් නොසිටි උසස් පෙළ විද්‍යා අංශයට විභාගය සඳහා ළමුන්ගේ නම් සටහන් කර විභාග දෙපාර්තමේන්තුවට යැවීමෙන් අනතුරුව ශාන්ත සේවියර් පාසලේ ළමුන් ලෙස එම විභාග මධ්‍යස්ථානයේ ළමුන් උසස් පෙළට විද්‍යා අංශයෙන් ලියා ඇති බවට තොරතුරු දැන ගැනීමට ලැබුණ බව මා ප්‍රකාශ කර සිටිමි.

10. ඒ අනුව මේ ගැන 2016 අවුරුද්දේ මා විශේෂ අවධානයක් යොමු කළ අතර එහිදී පහත කරුණුද මා නිරීක්ෂණය කළ බව වැඩි දුරටත් මා ප්‍රකාශ කර සිටිමි.

11. ස්ටෙෆානි නම් කොළඹ ප්‍රදේශයේ ළමයෙකු සහ අලවතුගොඩ කාර්සේල් මුදලාලිගේ ළමයෙකු ඇතුළු ළමුන් 05 දෙනෙකු පමණ නීත්‍යානුකූල නොවන අන්දමින් (නුවරඑළියේ කිසිදු පදිංචියක් නොමැතිව) පාසැලේ උසස් පෙළ අංශයට ඇතුළත්ව සිටි බවට පෙනී ගිය බව මා ප්‍රකාශ කර සිටිමි.

12. එයට අමතරව 2016-03-01වන දිනෙන් පසු මෙම විභාගය ලියන අවස්ථාව වන විට ඉහත කී ළමුන් 05 දෙනාට අමතරව තවත් විශාල පිරිසක් ශාන්ත සේවියර් විද්‍යාලයේ ළමුන් ලෙස උසස් පෙළ විද්‍යා අංශයෙන් විභාගයට පෙනී ඇති බවට මා හට දැන ගැනීමට ලැබී ඇත.

13. ... යන අය එකතු වී සෑදූ උසස් පෙළ පාසැල අයඳුම් නාම ලේඛනයට මාගේ අත්සනද ලබා ගත් බව මා ප්‍රකාශ කර සිටිමි.

14. නුවරඑළිය ශාන්ත සේවියර් විදුහලේ විදුහල්පතිවරයා සහ නාදන් යන අය ගෙන ගිය පරිපාලනය තුළ කිසිදු ප්‍රශ්න කිරීමක් හෝ සත්‍ය සොයා ගැනීමට මා හට අවස්ථාවක් නොතිබුණ අතර විභාග අයඳුම් නාමලේඛනයේ හිස්තැන් තබා තිබූ අතර මා අත්සන් කිරීමෙන් අනතුරුව එම හිස්තැන්වලට ළමුන්ගේ නම් විද්‍යා අංශයට ඇතුළත් කර ඇති බවට මා බොහෝ දුරට විශ්වාස කරමි.

15. ඒ අනුව මා අත්සන් කිරීමෙන් අනතුරුව විභාග අයඳුම්කරුවන්ගේ නම් ඇතුළත් කර ඇති බවට වැඩි දුරටත් මා ප්‍රකාශ කර සිටිමි.

16. 2014 සිට 2016 දක්වා උසස් පෙළ විද්‍යා පන්ති කිසිවක් නුවරඑළිය ශාන්ත සේවියර් විද්‍යාලයේ නොතිබූ බවද එලෙස විද්‍යා විෂය සඳහා සිසුන්ගේ නම් ඇතුළත් කර ඇත්නම් එය විශාල වංචනික ක්‍රියාවක් බවත් මා ප්‍රකාශ කර සිටිමි.

17. ඒ අනුව 2016 වසරේ මා හට ඇති වූ බලවත් සැකය මත මා විසින් ඡායාරූප ගැනීමක්ද ළමුන්ගේ කළ අතර එම ඡායාරූපද මා සතුව ඇති බව මා වැඩි දුරටත් ප්‍රකාශ කර සිටිමි.

18. මෙම වැරදි සහගත ක්‍රියාව පාලනය කිරීමට එම විදුහලේ සිංහල අංශය භාරව සිටි නියෝජ්‍ය විදුහල්පති වූ මාහට කිසිදු අවස්ථාවක් නොලැබෙන පරිදි සියලු කටයුතු නාදන් නැමැති ගුරුවරයා සමඟ විදුහල්පති කරනු ලැබූ බවද මා ප්‍රකාශ කර සිටිමි.

19. සත්‍ය වශයෙන් නුවරඑළියේ ඉහිද එහි දැඩි දුෂ්කරතා මැද අධ්‍යාපනය ලබන දරුවන්ට සිදු වී ඇති අසාධාරණය නිවැරදි කිරීම සඳහා ඕනෑම පරීක්ෂණයකදී සාක්ෂි ලබා දීමට මා සූදානම් බවද වගකීමෙන් ප්‍රකාශ කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහු මෙය 2016 අගෝස්තු මස 04වන දින දිවුරුම් කොමසාරිස්වරයෙක් මඟින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයක්. මේ කාරණය පිළිබඳව අගෝස්තු 24වෙනි දා "Daily Mirror" පුවත් පතේ මෙසේ සඳහන් වෙනවා.

"Investigations reveal that 305 outsiders sat GCE (A/L) at schools in Nuwara Eliya."

ෂෙල්ටන් හෙට්ටිආරච්චි කියන මාධ්‍යවේදියා තමයි එසේ වාර්තා කර තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉහතින් කියවන ලද 2016 අගෝස්තු මස 04 වන දින දරන දිවුරුම් ප්‍රකාශය සහ 2016 අගෝස්තු මස 24වෙනි දින "Daily Mirror" පුවත් පතේ මාධ්‍ය වාර්තාව **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම කරුණ පිළිබඳව නුවර එළිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී නුවර එළිය දිස්ත්‍රික් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා මේ ආකාරයට ප්‍රකාශ කරලා තිබෙනවා. This article states, I quote:

"Nuwara Eliya Zonal Director of Education Amarasiri Piyadasa informed the District Coordinating Committee that the ongoing investigations had revealed that 305 students from other districts had sat the GCE Advanced Level Examination this year from Nuwara Eliya schools and that this number could increase to at least 500 as the investigations continued."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නුවර එළිය දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයෙක් වශයෙන් කටයුතු කරන අධ්‍යාපනය පිළිබඳ රාජ්‍ය ඇමතිවරයාගේ ප්‍රකාශය ඒ වාර්තාවේ මෙසේ සඳහන් වෙනවා.

"State Minister of Education, the Hon. V.S. Radhakrishnan said, 'the Principals involved in the racket had taken up arms against him and that they even threatened legal action against him'. He said an organized group was preparing to stage a protest by raising black flags against the exposure of the racket, but he was determined to prevent such examination malpractices from taking place next year. He said he would streamline the procedure applicable to examination to prevent the recurrence of similar irregularities."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා කියනවා, "පරීක්ෂණ තවදුරටත් පැවැත්වුවහොත් මේ ප්‍රමාණය 500ක් විතර වේවි, දැනට 305ක් හඳුනාගෙන ඉන්නවා" කියා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී කළ ප්‍රකාශය අනුව අධ්‍යාපන රාජ්‍ය ඇමතිවරයා කියනවා, දැන් යම් යම් කණ්ඩායම්වලින් එතුමාට තර්ජනත් ඉදිරිපත් වෙනවා කියලා. මේ ප්‍රශ්නය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු වෙලා තිබුණු බවත් මා දන්නවා. නමුත්, මේ රාජ්‍ය ඇමතිවරයාම කියන පරිදි යම් බලපෑම් පවා තිබෙනවා නම්, මේ සම්බන්ධව නුවරඑළිය දිස්ත්‍රික්කය තුළින් මතුවිය හැකි, මතු විය යුතුව තිබෙන බරපතළ විරෝධය එක පිරිසකට පමණයි සීමා වෙලා තිබෙන්නේ කියා අපට පෙනෙනවා.

ගම්පහ දිස්ත්‍රික්කය වැනි තැනක, නැත්නම් කුරුණෑගල දිස්ත්‍රික්කය වැනි තැනක මෙවැනි අසාධාරණයක් වෙන බව දැනෙනවා නම් ළමයි 305ක් නොවෙයි, ළමයි 30ක් ලියනවා කියා දැනගත්තත්, මහා බරපතළ විරෝධයක් ඇති වෙයි කියා අප විශ්වාස කරනවා. නමුත්, දැනට අපට පෙනී යන ස්වභාවය තමයි, මේ විරෝධය එන්නේ බොහොම හෙමින් බව; මේ විරෝධය එන්නේ බොහොම පාලනය වෙලායි කියන එක.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூணிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, මේ පිළිබඳව දරුවන්ගේ පැත්තෙන් කටයුතු කරන නීතිඥ මහත්වරු ඉතාම වුවමනාවෙන් කටයුතු කරන බව. සමහර ගුරුවරුත් මේ ප්‍රශ්නය ගැන ඉතාම වුවමනාවෙන් කටයුතු කරනවා. මහනුවර ධර්මපාල ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිතුමා තමයි මේ දිවුරුම් ප්‍රකාශය දෙන්නේ. මේක එතුමාට ඇති විශේෂ කාරණයක් නොවෙයි. උනන්දුවෙන් කැපවී වැඩ කරන පිරිසක් ඉන්නවා. ඒ අයගේ දරුවන් මේ පාසලේ ඉගෙන ගන්නා නිසා නොවෙයි, මේ. ජනතාවගෙන් විතරක් නොවෙයි, නුවරඑළිය දිස්ත්‍රික් සංවිධායක මංජුල මහතා මහිනුත් මම තොරතුරු ලබා ගත්තා.

මේ කාරණය පිළිබඳව අපට නොපෙනෙන තත්ත්වයක් තිබෙනවා. දැන් මේ කාරණය අධ්‍යාපන අමාත්‍යාංශයට වාර්තා වෙලා, යම්කිසි හෙළිදරවුවීමක් වුණු නිසා මෙවැනි පුද්ගලයන් දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරපු නිසා යම් ප්‍රමාණයකට මේ ප්‍රශ්නය රටේ අවධානයට ලක් වුණා. සරලව ගත්තොත්, මේ සිද්ධියෙන් පසුව එන එක ළමයෙකුටවත් නුවරඑළියේ ඉන්න දෙන්න බැරි වෙන්න ඕනෑ නේ. මොකද, මේ ළමයි පිටින් ගිහින් මේ විභාගවලට ලියන්නේ නුවරඑළියේ හෝටල්වල ඉඳගෙනයි. ඒ ළමයි කොළඹ ඉඳලා, යාපනයේ ඉඳලා අම්මා තාත්තා එක්ක ගිහින් නුවරඑළියේ හෝටල්වල පදිංචි වෙලා තමයි මේ විභාගවලට ලියන්නේ. එතකොට ඒ පිටස්තර ළමයි එනකොට ඒ ප්‍රදේශයේ දෙමව්පියෝ, ගුරුවරු දන්නවා. මම එදා මෙතැනදී එක් වාර්තාවක් ඉදිරිපත් කළා. ඒක නුවරඑළියේ අධ්‍යාපන අයිතින් සුරැකීමේ සංවිධානයෙන්ම ඉදිරිපත් කළ ලිපියක්. මම අදත් එය ඉදිරිපත් කරන්නම්. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රධාන රාජ්‍ය නිලධාරිවරයාගේ දුවත් විභාගයට ලියනවා කියා මේ ලිපියේ සඳහන් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ලිපිය කියවන්නම්:

"විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව, කොළඹ. ගරු විභාග කොමසාරිස් ජනරාල්තුමනි, -

මේ ගැන මම සියයට 100ක් වගකීමක් ගන්න ඕනෑ නිසා මම මේ වෙලාවේ ඒ රාජ්‍ය නිලධාරිනියගේ තනතුර කියන්නේ නැහැ. මොකද, ඇය රටේ ඉන්න ප්‍රධාන නිලධාරිනියක්. නමුත්, ලිපියේ ඇයගේ තනතුර පැහැදිලිව තිබෙනවා. මම එම ලිපිය **සභාගත*** කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ලිපියේ ඉතුරු කොටස දැන් කියවන්නම්:

"නුවරඑළිය ...ගේ විභාග වංචාව. නුවරඑළිය... (ප්‍රධාන රාජ්‍ය නිලධාරිනිය) කොළඹ... (ප්‍රධාන පෙළේ කාන්තා විදුහලක නම සඳහන් වනවා) විද්‍යාලයට ගිය තම දියණිය උසස් පෙළ විද්‍යා අංශයෙන් නුවරඑළිය ශුද්ධ ත්‍රිත්ව විද්‍යාලයේ විභාග මධ්‍යස්ථානයේ රහසිගත විභාගයට පෙනී සිටීමට සලස්වා ඇත. විභාගය ආරම්භ වීමට මිනිත්තු කිහිපයකට පෙර නිළ රථයෙන් විභාග මධ්‍යස්ථානය තුළටම එම දරුවා ඇතුළත් කර නැවත රහසේම පිට කරයි.

මේ ගැන පරීක්ෂා කරන ලෙස ඔබතුමාගෙන් ....(එම තනතුර දාලා තිබෙනවා.).. කාර්යාලයේ සේවය කරන මේ කරුණු ගැන හොඳින්ම දන්නා අපි ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිමු. "

එම කාර්යාලයේ සේවක පිරිස විසින් තමයි මෙම ලිපිය එවලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නිසා තමයි මම ප්‍රශ්නය මතු කරන්නේ. මේ වාගේ තත්ත්වයක් ගම්පහ, කුරුණෑගල, ගාල්ල, මාතර, හෝ හම්බන්තොට වුණා නම්, මිනිස්සු විභාග මධ්‍යස්ථානය වට කරනවා. ඒ ප්‍රදේශවල මිනිස්සු ඒවාට ඉඩ දෙන්නේ නැහැ.

හම්බන්තොට කියන්නේ දුප්පත් දුෂ්කර ප්‍රදේශයක්. හම්බන්තොට තිබෙන විභාග මධ්‍යස්ථානයකට කොළඹින් හෝ මහනුවරින් හෝ ළමයි 5 දෙනෙක් යවලා බලන්න. අනිවාර්යයෙන්ම සුවිශාල බලපෑමක් වෙනවා. හැබැයි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඒ වාගේ තත්ත්වයක් ඇති වෙන්නේ නැහැ. ඇති වුණත් ඇති වන්නේ ඉතා සුළුවෙන්. විභාගයේ අවසාන ප්‍රශ්න පත්‍රය හෙට දිනයේ පැවැත්වීමට නියමිතයි. මෙම ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ මතු කරලා තිබෙද්දීත්, ඒ ළමයි විභාගයට ලියනවා. ඇමතිතුමා යම් ආකාරයක පරීක්ෂණ ප්‍රමාණයක් කරලා, යම් හඳුනාගැනීම් කරලා තිබෙන බව අපට වාර්තා වෙලා තිබෙනවා. නමුත් මම මේ කාරණය පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ අධ්‍යාපනය වෙනුවෙන් හරියාකාරව කටයුතු කරන අදාළ අධ්‍යාපන බලධාරීන්ට ශක්තියක් වෙන්න ඕනෑ නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එසේ පාර්ලිමේන්තුවේ කථා කරලා තිබෙද්දීත්, පරීක්ෂණය යද්දීත් වැඩේ යනවා. ඒකට හේතුව මේ racket එකේ ඉන්නේ බොහොම බලගතු පිරිසක් වීම. මේ කටයුත්තට ඒ ප්‍රදේශයේ සමහර දේශපාලනඥයන්ගේ ආශීර්වාදයත් ලැබෙන බව අපට මේ සංවිධාන කියලා තිබෙනවා. මම ඒ කාරණය නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු අ. අරවින්ද් කුමාර් මන්ත්‍රීතුමාටත් ප්‍රකාශ කළා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ඒ දේශපාලනඥයන් කුමන දේශපාලන පක්ෂයට අයත් ද කියලා ඔබතුමාට සඳහන් කරන්න පුළුවන්ද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ලැබී තිබෙන තොරතුරු අනුව ආණ්ඩු පක්ෂයේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔබතුමාට දැන් ඒ ගැන කියන්න පුළුවන්ද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම ඒ කාරණා ඔබතුමාට පුද්ගලිකව කියන්නම්. නම් වශයෙන් මට සඳහන් කරන්න පුළුවන්. නමුත් ඊට පසුව අමාත්‍යාංශය කරගෙන යද්දී, ඒක ඔබතුමාට බාධාවක් වෙන්න පුළුවන්. උදාහරණයක් වශයෙන් කිව්වොත්, මේ සංවිධාන මේ කාරණය පිළිබඳව අදාළ දිස්ත්‍රික්කයේ ප්‍රධාන පෙළේ දේශපාලන නායකයෙක් සමඟ සාකච්ඡා කරපු අවස්ථාවකදී ඒ දේශපාලන නායකයා ප්‍රකාශ කරලා තිබෙනවා, "කොහෙන් ඇවිල්ලා ලිව්වත් මේ අපේ ළමයි නේ" කියලා. ඒ, "අපේ" කියන එකටත් ගරු ඇමතිතුමනි, වෙනත් අර්ථ කථනයක් තිබෙනවා. මොකද, අපිත් කියනවා නේ ලංකාවෙම ළමයි, "අපේ ළමයි" කියලා. නමුත් මේ අර්ථ කථනය එහෙම අර්ථ කථනයකුත් නොවෙයි. මට මෙහි වෙනත් පැති මතු කරන්න අවශ්‍ය නැහැ. නමුත් එහිදී ඔවුන්ට වගකීමෙන් කියනවා, "මේ ප්‍රශ්නය ගැන එව්වර හොයන්න, බලන්න ඕනෑ නැහැ" කියලා. මට ඒ සංවිධානයෙන්ම වාර්තා කළා, "මේක මාධ්‍යවලත් එව්වර කියන්න ඕනෑ නැහැ" කියා

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සමහර මාධ්‍යවේදීන්ටත් කියා තිබෙන බව. ඉතින් ඒ නිසා මේ කාරණා ගැන සොයා බලන ලෙස අපි ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේක නුවරඑළියේ පමණක් නොවෙයි, පුත්තලමෙත් සිද්ධ වනවා. ඒ නිසා ඒ ගැන ඇමතිතුමාගේ පැත්තෙන් හොයලා බැලුවොත් හොඳයි. මොකද, තවත් දිස්ත්‍රික්කවල මේ තත්ත්වය තිබෙන්න පුළුවන්.

විශේෂයෙන්ම මේ දුෂ්කර කියන පදනම ගැන හිතන්න ඕනෑ. මොකද, මේවා අමාරුවෙන් තමයි රැකගෙන ඉන්නේ. මේ දුෂ්කර කියන කොන්දේසි ඉවත් වුණොත් මොණරාගල, මුලතිව්, කිලිනොච්චි වාගේ දිස්ත්‍රික්කවලින් දරුවෙක් විශ්වවිද්‍යාලයට එන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දරුවෙකුට ඉගෙන ගෙන විභාගය pass වුණොත්, campus එකට එන්න පුළුවන් කියලා යම් අදහසක් තිබෙනවා. නමුත් "දුෂ්කර පදනම" මේ වාගේ වංචනිකව පාවිච්චි කළාම වෙන දේ මොකක්ද? දුෂ්කර පදනම අහෝසි කළ යුතුයි කියා අද රටේ මතයක් හදාගෙන යනවා. ඒ මතය තහවුරු කර ගැනීමට මේ කාරණයත් උදවුවක් වෙනවා. ඒ නිසා නුවරඑළිය දිස්ත්‍රික් මන්ත්‍රීතුමන්ලාගෙන් අපි ඉතා නිහතමානීව ඉල්ලා සිටිනවා, මේ ගැන සොයා බලන්න කියා. එතුමන්ලා රාජකාරී හරියාකාරව කරන්නේ නැහැ කියන චෝදනාවක් මම ඉදිරිපත් කරන්නේ නැහැ. නමුත් මෙවැනි ප්‍රශ්නයකදී මේ පාර්ලිමේන්තුව මේ කාරණය ජාතික අවධානයට ගෙනැල්ලා, අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අගමැතිතුමාගේ අවධානයට ගෙනැල්ලා, මේ කාරණය ගැන මීට වඩා කටයුතු කළ යුතුයි කියන හැඟීම මට නම් දැනෙනවා.

කුරුණෑගල, ගම්පහ හෝ හම්බන්තොට මේ දේ වුණා නම්, එන විරෝධය අපට සිතිය හැකියි. නුවරඑළිය කියන්නේ ලංකාවේ දුෂ්කරම දිස්ත්‍රික්කය. ඒ දරුවන් හීතලේ ගැහි ගැහී ඉන්නේ හරි විධියට ටියුෂන් පන්තියක් නැහැ. මම දන්නවා, නුවරඑළිය හැටන් ප්‍රදේශයේ දරුවන් tuitionවලට එන්නේ කොළඹට කියලා. කොළඹ boarding placesවල ඉඳගෙන අනේකවිධ දුක්ඛ දෝමනස්සයන් විඳගෙන තමයි ඔවුන් ඉගෙන ගන්නේ. ඇයි? සමහර ප්‍රදේශවල හොඳ ගුරුවරු නැහැ. මෙහි වැඩිම අසාධාරණය සිද්ධ වන්නේ දෙමළ දරුවන්ටයි. මොකද, සිංහල දරුවන්ට සාපේක්ෂව දෙමළ දරුවන්ට තමයි නුවරඑළිය දිස්ත්‍රික්කයේ හරියාකාර පහසුකම් නැත්තේ. ඔවුන්ට තිබෙන අවස්ථායි මේ නැති වෙන්නේ. ඔවුන් වත්තෙම වළඳාන්න ද, මේ හදන්නේ? සමහර වතු තිබෙනවා, වත්ත පටන් අරගෙන අවුරුදු දෙසීයයි, නමුත් එහි ජීවත්වෙන එක්කෙනෙක්වත් තවම විශ්වවිද්‍යාලයට ගිහින් නැහැ. අවුරුදු දෙසීයටම ඒ වත්තෙන් එක්කෙනෙක්වත් විශ්වවිද්‍යාලයට ගිහින් නැහැ.

මම දන්නේ නැහැ, නුවරඑළිය ගැන කියන්න. මම කුරුණෑගල දිස්ත්‍රික්කය ගැන දන්න නිසා, මට මේ ගැන කියන්න පුළුවන්. ගරු ඇමතිතුමාත් ඒ ගැන දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොල්ගහවෙල නගරය ආසන්නයේ තිබෙනවා, පොල් සහ රබර් වත්තක්. ඒ වත්ත පටන් අරගෙන අවුරුදු 106කට පස්සේ, එනම් 2010 වර්ෂයේදී තමයි ඒ වත්තේ දරුවෙක් ශිෂ්‍යත්ව විභාගය පාස් වුණේ. වත්තේ ජනතාව 1,000ක් - 2,000ක් ඉන්නවා. ඒත් වත්ත පටන් අරගෙන අවුරුදු 106කට පස්සේ තමයි දරුවෙක් ශිෂ්‍යත්ව විභාගය pass වුණේ. ඒ වත්තේ එක දරුවෙක්වත් විශ්වවිද්‍යාලයට ගිහින් නැහැ. නුවරඑළියේ මීට වඩා ඇති. මම නුවරඑළියේ වතු ගැන කියන්න දන්නේ නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේ පිළිබඳව අනිවාර්යයෙන්ම පියවරක් ගන්න කියලායි. මේකට සම්බන්ධ දේශපාලනඥයන් ඉන්නවා නම්, අවශ්‍ය කටයුතු කරන්න. ස්ථිරවම මේකට සම්බන්ධව රජයේ නිලධාරීන් ඉන්නවා; විදුහල්පතිවරු ඉන්නවා; අධ්‍යාපන අධ්‍යක්ෂවරු ඉන්නවා; ගුරුවරු ඉන්නවා. ඒ විතරක් නොවෙයි, මේකට සම්බන්ධ දෙමව්පියොත් ඉන්නවා. මේකට සම්බන්ධ දරුවෝ ගැන කුමක් කළත්, මේකට උල්පන්දම් දෙන දෙමව්පියන්ටත් දඬුවම් කළ යුතුයි.

අපි ඇමතිතුමාත් එක්ක කථා කරන කොට, ඇමතිතුමා තමයි මේ අදහස කිව්වේ. "දරුවෝ වංචාවලට පුරුදු කරනවා නම්, Advanced Levelවලදීම මෙහෙම 'ගේමක්' ගහලා එන්න පුළුවන් නම්, ඒගොල්ලන් කොතැනටද යන්නේ?" කියලා එතුමා ඇහුවා. ඒක නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධව පැහැදිලිව, බරපතළ ලෙස වග කීමක් අරගෙන, අනාගතයේදී මේවා කරන්න හිතාගෙන ඉන්න අයටත් බලපෑමක් වන විධියට, විශේෂ පරීක්ෂණයක් ආරම්භ කරන්න. ඒකට අධ්‍යාපන අමාත්‍යාංශයට අමතරව, පුළුවන් නම් රජයේත්, පොලීසිවලත් අවශ්‍ය උදවු අරගෙන, මේකට දඬුවම් දෙන්න කියන ඉල්ලීමත් අපි කරනවා. ඒ වාගේම අනාගතයේදී මේ සිදුවීම නතර කිරීම සඳහාත් අවශ්‍ය පියවර ගන්න.

නුවරඑළියේ පමණක් නොවෙයි, පුත්තලම, මන්නාරම වාගේ හැම දිස්ත්‍රික්කයකම මේ සිද්ධිය සිදු වනවා වෙන්න පුළුවන්. මොනරාගලත් සිදු වනවා වෙන්න පුළුවන්. එම නිසා ඒ පිළිබඳව හොඳ වැඩසටහනක් හඳුන්වා දෙන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි.

යෝජනාව ස්ථිර කරමින් කථා කිරීමට, ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා.

[பி.ப. 4.49]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அண்மைக் காலத்தில் வெளிமாவட்ட மாணவர்கள் நுவரெலியா மாவட்டத்தினூடாக விண்ணப்பித்து க.பொ.த உயர்தரப் பரீட்சைக்குத் தோற்றுவதனால், அம்மாவட்ட மாணவர்களுக்கு ஏற்பட்டுள்ள அநீதி குறித்து, மக்கள் விடுதலை முன்னணி உறுப்பினர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் முன்வைத்திருக்கும் சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையை நான் வழிமொழிகின்றேன்.

முதலாவதாக இந்தப் பிரேரணையில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு நன்றி தெரிவிப்பதோடு, சகோதர உறுப்பினர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் நுவரெலியா மாவட்டப் பாராளுமன்ற உறுப்பினராக இல்லாதபோதும்கூட, அங்கு இடம்பெற்றிருக்கும் இத்தகைய ஒரு சூழ்நிலை குறித்து சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையொன்றை முன்வைத்தமைக்காக நான் அவருக்கும் நன்றி தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றேன். நுவரெலியா மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையிலும் இந்தப் பிரேரணையில் முன்வைக்கப்பட்டிருக்கின்ற பாடசாலைகளின் பெயர்ப் பட்டியலில் முதலாவதாக இருப்பது நான் கல்வி கற்ற பாடசாலை என்ற வகையிலும் இந்த விவாதத்தில் கலந்துகொண்டு இதன் வரலாற்றுப் பின்னணி பற்றி - ஏன் இவ்வாறான ஒரு நிலைமை நுவரெலியா மாவட்டத்துக்கு ஏற்பட்டது? நுவரெலியா மாவட்டத்துக்குப் பிற மாவட்ட மாணவர்கள் வருவதற்குக் காரணம், புள்ளிகள் குறைவு மட்டும்தானா? அல்லது வேறேதும் காரணங்கள் இருக்கின்றனவா? என்பன தொடர்பில் - இச்சபையில் எடுத்துரைப்பதற்கு இதனை ஒரு வாய்ப்பாகக் கருதுகின்றேன்.

[ගරු මයිල්වාගනම් තිලකරාජ මහතා]

இந்தப் பட்டியலில் தரப்பட்டிருக்கின்ற பத்துப் பாடசாலைகளில் ஒரு பாடசாலை இரண்டு தடவைகள் பெயரிடப்பட்டிருப்பதாக நான் நினைக்கின்றேன். மூன்றாவதாகக் குறிப்பிடப்பட்டிருக்கின்ற ஹற்றன் பொஸ்கோ வித்தியாலயமும் ஒன்பதாகக் குறிப்பிடப்பட்டிருக்கும் பொஸ்கோ வித்தியாலயமும் ஒரே பாடசாலையைக் குறிப்பதாகவே நான் நினைக்கின்றேன். நான் அறிந்த வகையிலே, பொஸ்கோ வித்தியாலயம் என்ற பாடசாலை ஹற்றனிலே இருக்கின்றது. அதைவிடுத்து, ஏனைய ஒன்பது பாடசாலைகளில் ஹற்றன் ஹைலன்ட்ஸ் கல்லூரி, ஹற்றன் பொஸ்கோ வித்தியாலயம், புனித திருத்துவக் கல்லூரி, புனித சேவியர் வித்தியாலயம், பென்ரர் ஞாபகார்த்த வித்தியாலயம் ஆகிய ஐந்து பாடசாலைகளில், ஹற்றன் ஹைலன்ட்ஸ் கல்லூரி, தற்பொழுது ஹைலன்ட்ஸ் கல்லூரி என அழைக்கப்பட்டாலும், முன்னர் மெதடிஸ்ற் கல்லூரியென அழைக்கப்பட்ட பாடசாலையாகும். ஹைலன்ட்ஸ் கல்லூரி, பொஸ்கோ வித்தியாலயம் என்பன நூற்றாண்டுகளைக் கடந்த பாடசாலைகள். இவை ஆரம்ப காலங்களில் மத நிறுவனங்கள் சார்ந்த பாடசாலைகளாக இருந்து, பின்னாளில் அரச பாடசாலைகளாக உருவான பாடசாலைகளாகும். இவைதான் இன்றைய நிலையில் முன்னணிப் பாடசாலைகளாக இருக்கின்றன. இவை தவிர்ந்த தலவாக்கலை தமிழ் வித்தியாலயம், சரஸ்வதி வித்தியாலயம் என்பன ஆரம்ப காலத்தில் தோட்டப் பாடசாலைகளாக இருந்து, பின்னர் அரச பாடசாலைகளாகத் தரம் உயர்த்தப்பட்டவை.

நான் இந்தச் சபையில் பதிவுசெய்யவேண்டிய விடயம் என்னவென்றால், நுவரெலியா மாவட்டப் பிரதேசங்களில் பாடசாலைகள் இல்லாத காரணத்தினால், அதற்குரிய கட்டிடங்கள் இல்லாத காரணத்தினால் நாங்கள் அவதானித்த காலம்வரை தலவாக்கலை தமிழ் வித்தியாலயம் என்பது தேயிலைத் தொழிற்சாலையொன்றில் இயங்கிய ஒரு பாடசாலை. இதுதான் அங்கேயுள்ள பாடசாலைகளின் நிலைமை. இவைதான் இந்தப் பாடசாலைகளின் பின்புலங்கள் என்பதைக் கருத்தில் வைத்துக்கொண்டு, இன்று எழுந்திருக்கின்ற பிரச்சினையைப் பார்க்கவேண்டும். கௌரவ உறுப்பினர் பிமல் ரத்நாயக்க அவர்கள் குறிப்பிட்டதுபோல, நுவரெலியா மாவட்டமானது, எந்த அடிப்படையில் பெரும்பாலான மாணவர்கள் இத்தகைய இலக்குவைத்து வருகின்ற மாவட்டமாக மாறியது? அங்கே புள்ளிகள் குறைவாக இருப்பது மட்டும்தான் காரணமா? அல்லது வேறு ஏதேனும் காரணங்கள் இருக்கின்றனவா? என்பது தொடர்பிலும் இந்த அமைச்சு உரிய ஆய்வுகளைச் செய்யவேண்டுமென நினைக்கின்றேன்.

இங்கு ஓர் உதாரணத்தை நான் சொல்ல விரும்புகின்றேன். இலங்கையின் பாடசாலைக் கல்வி வரலாற்றில், பெருந்தோட்டப் பாடசாலை என்ற ஒரு முறைமை இருந்தது. இலவசக் கல்வி முறை அறிமுகப்படுத்தப்பட்டு, பெருந்தோட்டப் பாடசாலைகள் இன்று கல்வியமைச்சின்கீழ் கொண்டுவரப்பட்ட பின்னரும்கூட plantation schools என்ற ஒரு முறைமையின்கீழ் நிதியொதுக்கியே அந்தப் பாடசாலைகள் அபிவிருத்தி செய்யப்படுகின்றன. அந்த வகையில் பெருந்தோட்டப் பாடசாலைகளில் அதிகளவான பாடசாலைகளைக் கொண்டிருக்கின்ற மாவட்டமாக நுவரெலியா மாவட்டம் அமைந்திருக்கின்றது. இந்நிலையில் இவ்வாறு வெளிமாவட்டங்களிலிருந்து மாணவர்கள் அங்கு வந்து சேர்வதற்கான காரணங்கள் இருந்தன. கண்டி, மாத்தளை, பதுளை, இரத்தினபுரி, கேகாலை, களுத்துறை போன்ற மாவட்டங்களில் இருக்கின்ற plantation schools எனப்படுகின்ற பெருந்தோட்டப் பாடசாலைகளில் கற்கின்ற மாணவர்களுக்குத் தமிழ்மொழி மூலம் உயர்தரம் படிப்பதற்கு வாய்ப்பில்லாத காலங்களில் அவர்கள் இலக்குவைத்து வருவது நுவரெலியா மாவட்டத்துக்கேயாகும். இன்றைய காலகட்டத்தில் அந்தப் பெருந்தோட்டப் பகுதிகளைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற அல்லது அங்கு பிறந்து வாழ்ந்த மாணவர்கள் பட்டதாரியாகும் அளவுக்கு உயர்ந்திருக்கிறார்களென்றால், அவர்கள் நுவரெலியா மாவட்டத்தை அடிப்படையாக வைத்துக்கொண்டு அங்கே வந்து பரீட்சை எழுதியது ஒரு காரணமாக இருக்கலாம். உதாரணமாக, கல்வியமைச்சிலே அதிகாரியாகக் கடமையாற்றுகின்ற களுத்துறை மாவட்டத்தைச் சேர்ந்த இரத்னஜோதி என்ற மாணவனை நான் இங்கு பதிவு செய்கின்றேன். அவர் என்னிடம் பொருளியலைக் கற்ற மாணவனும்கூட. அவர் களுத்துறை மாவட்டத்தில் தமிழ் மொழிமூலம் கற்றவர். அவர் இன்று பட்டதாரியாகக் கல்வியமைச்சிலே வேலை செய்கின்றார் என்றால், அதற்குக் காரணம் அவர் நுவரெலியா மாவட்டத்திற்கு வந்து உயர்தரப் பரீட்சையை எழுதியமைதான். இதுதான் இதன் பின்புலம்.

பெருந்தோட்ட மக்கள் வாழ்கின்ற பிரதேசத்தில் இந்தப் பெருந்தோட்டப் பாடசாலை என்ற ஒரு தனியான முறைமை- தமிழ் மொழி மூலம் கற்கின்ற மாணவர்களுக்காக ஒதுக்கீடு செய்யப்பட்ட ஒரு பாடசாலை முறைமை இருந்ததன் காரணமாக வரலாற்றிலே வெளிமாவட்ட மாணவர்கள் தொடர்ச்சியாக ஹற்றனை நோக்கியதாக, நுவரெலியாவை நோக்கியதாக வந்த வரலாறொன்று இருந்தது. அதுதான் இவ்வாறு நுவரெலியா மாவட்டம் இலக்கு வைக்கப்படுவதற்கான ஒரு காரணமாக அமைந்தது. ஆனால், இப்போது நடந்திருக்கின்ற விடயம் மிகவும் கண்டிக்கத்தக்கது. அந்த வகையில் கௌரவ பாராளுமன்ற உறுப்பினரின் பிரேரணையை நான் வரவேற்கின்றேன். அந்தக் கண்டிக்கத்தக்க விடயம் என்னவென்றால், இந்தப் பின்புலத்தில் வெளிமாவட்ட மாணவர்கள் நுவரெலியா மாவட்டத்திற்கு வருகை தருவதையும் குளிர் போன்ற காலநிலை காரணமாக அது பின்தங்கிய மாவட்டமாக அடையாளப்படுத்தப்பட்டு அங்கே குறைந்த புள்ளிகளின் அடிப்படையில் பல்கலைக்கழகத்திற்குத் தெரிவாகலாமென்ற காரணத்தையும் அடிப்படையாக வைத்துக்கொண்டு, தனியே பரீட்சையை மட்டும் இலக்காக வைத்து பரீட்சை விண்ணப்பத்தை மாத்திரம் பாடசாலை அதிபர்களுக்கூடாக அனுப்பி, அதனை ஒரு வாய்ப்பாகப் பயன்படுத்திப் பல்கலைக்கழகத்திற்குத் தெரிவாகிக்கொள்ளும் ஒரு தந்திரமான முறை கையாளப்பட்டிருப்பதுதான் மிக முக்கியமான பிரச்சினையாக இருக்கின்றது.

கௌரவ உறுப்பினர் சொன்னதுபோல் உல்லாச விடுதிகளிலிருந்தும் 'பஜிரோ' போன்ற வாகனங்களில் வந்திறங்கியும் பரீட்சைக்குத் தோற்றுவதன் மூலமாக, ஏற்கெனவே அந்த மாவட்டத்தில் மிகவும் பின்தங்கிய நிலையிலிருந்து கல்வி கற்றுவந்த ஏழைத் தமிழ் மாணவர்களின் வாய்ப்பு பறிக்கப்படுகிறது; அதேபோன்று வேறு மாவட்டங்களில் தோட்டத் தொழிலாளியின் பிள்ளையாக இருந்து பெருந்தோட்டப் பாடசாலைகள் என்ற முறைமையின் கீழ் இயங்குகின்ற பின்தங்கிய பாடசாலைகளிலிருந்து சாதாரண தரப் பரீட்சைக்குப் பின்னர் அங்கே நிலவும் ஆசிரியர் பற்றாக்குறையினைக் கவனத்திற்கொண்டு அதனை நிவர்த்தி செய்வதற்காக இரண்டு வருடங்களுக்கு முன்பாகவே வந்து நுவரெலியா மாவட்டத்தில் உயர்தரம் கற்பதற்காகத் தங்களது உறவினர்களது

வீடுகளிலும் நண்பர்களின் வீடுகளிலும் விடுதிகளிலும் தங்கி உயர்தரம் கற்றிருந்த தமிழ் மொழி மூல மாணவர்களின் உரிமைகளையும் பறிக்கின்ற ஒரு நிலைமையும் இன்று உருவாகியிருக்கின்றது. எனவே, இதுகுறித்து விசாரிக்கும்போது இந்த வெளிமாவட்ட மாணவர்கள் என்ற பட்டியலுக்குள் இந்த இரண்டு வகையான மாணவர்களும் வருகின்றார்கள் என்பதை மிக அவதானத்தோடு கையாளவேண்டியிருக்கின்றது. அந்த இரண்டு வகை மாணவர்களும் எந்த நிலையிலிருந்து வருகின்றார்கள் என்பதைப் பார்க்கவேண்டும். அவர்கள் வேறு மாவட்டங்களில் உள்ள அந்தப் பெருந்தோட்டப் பாடசாலைகள் என்று வகைப்படுத்தப்பட்ட அந்தப் பாடசாலைகளிலிருந்து வந்து பதிவு செய்யப்பட்ட மாணவர்களா? அல்லது இத்தகைய பரீட்சை நோக்கத்தோடு மட்டும் வந்து செயற்பட்ட மாணவர்களா? என்பதை அவதானமாகப் பிரிக்காத பட்சத்திலே இவ்வாறு ஒரு சமூகத்திலிருந்து பட்டதாரிகள் உருவாகக்கூடிய, உயர்தரம் சித்தியடையக்கூடிய வாய்ப்பு விலக்கப்படும். இதற்காக நான் நுவரெலியா மாவட்டத்தில் இதே நடைமுறையைத் தொடர்ச்சியாக வைத்திருங்கள் எனச் சொல்லப்போவதில்லை. இதற்கு மாறான ஒரு திட்டம் உண்மையாகவே கல்வியமைச்சின் கையில்தான் இருக்கின்றது.

பெருந்தோட்டப் பாடசாலைகள் என அடையாளப்படுத்தப் பட்ட பாடசாலைகள் எந்தெந்த மாவட்டங்களில் இருக்கின்றனவோ, அந்தந்த மாவட்டங்களிலிருந்து எல்லாம் அந்த மாணவர்கள் என்ன நோக்கத்திற்காக நுவரெலியாவிற்கு வந்தார்களோ, அந்த நோக்கத்திற்காக அவர்கள் நுவரெலியாவிற்கு வராதவண்ணம் அந்தந்த மாவட்டங்களில் குறைந்தபட்சம் ஒவ்வொரு தமிழ் மொழிமூலப் பாடசாலையாவது அவர்கள் உயர்தரத்தில் கலைப்பிரிவையோ அல்லது விஞ்ஞானப் பிரிவையோ அல்லது வர்த்தகப் பிரிவையோ கற்கக்கூடியதாகத் தரமுயர்த்தப்பட வேண்டும். அவ்வாறு தரமுயர்த்தப்படும்போது ஆரம்ப காலங்களில் இருந்துவந்த அந்தக் கலாசாரத்துக்காக - கல்வித் தேவைக்காக நுவரெலியாவுக்கு வருகின்றவர்களைத் தடுத்துநிறுத்த முடியும். அப்படித் தடுத்து நிறுத்துவதனூடாக உண்மையாகவே நுவரெலியா மாவட்டத்தில் வாழ்கின்ற தமிழ் மொழிமூல மாணவர்களின் உரிமை மாத்திரமல்ல, அந்த மாவட்டத்தைப் போன்ற அண்மித்திருக்கின்ற மாவட்டங்களைச் சேர்ந்த தமிழ் மொழிமூல மாணவர்களின் உரிமையும் நிலை நாட்டப்படும். அதேநேரத்தில் வெளியார் வந்து இவ்வாறான துஷ்பிரயோகங்களில் ஈடுபடுவதையும் தடுக்கமுடியுமெனக் கூறிக்கொள்வதுடன், இந்த விடயத்தில் கல்வியமைச்சு மிகவும் கவனமாகச் செயற்பட்டு உரிய நடவடிக்கைகளை எடுக்கவேண்டுமென்றும் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[பி.ப. 4.58]

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நுவரெலியா மாவட்டப் பாடசாலைகளில் க.பொ.த. உயர்தரப் பரீட்சை அனுமதியில் பாரிய சீர்கேடுகள் ஏற்பட்டிருப்பதாகவும் இதனால் அம்மாவட்ட மாணவர்களுக்கு அநீதி இழைக்கப்பட்டிருப்பதாகவும் கூறுவதுடன் இதில் சம்பந்தப்பட்ட அதிபர்கள்மீது சட்ட நடவடிக்கை எடுக்குமாறும் கோருகின்ற ஓர் ஒத்திவைப்புவேளைப் பிரேரணை இன்று கௌரவ உறுப்பினர் பிமல் ரத்நாயக்க அவர்களினால் இங்கு முன்வைக்கப்பட்டிருக்கின்றது. இதனை நான் முழுமையாக வரவேற்கின்றேன். ஏனெனில் குற்றமிழைக்கும் எவருமே தண்டிக்கப்படல் வேண்டும் என்பதிலே எவ்வித மாற்றுக்கருத்துக்கும் இடமில்லை. இதேவேளை அங்குள்ள க.பொ.த. உயர்தர விஞ்ஞான வகுப்புக்களுக்கு பதுளை மாவட்டத்திலிருந்து மிக நேர்மையாகவும் நீதியாகவும் விண்ணப்பிக்கின்ற தமிழ் மாணவர்களுக்கு ஒரு பாரிய அநீதி இழைக்கப்பட்டிருப்பதையும் நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். அது என்னவெனில், இவ்வருடம் நுவரெலியா மாவட்டத்திலுள்ள பாடசாலைகளில் தமிழ் மொழிமூல விஞ்ஞானப் பிரிவுக்கு பதுளை மாவட்ட மாணவர்களை அனுமதிப்பதில்லை என்ற ஒரு முடிவு எடுக்கப்பட்டிருக்கின்றமையாகும். இதனால் ஏற்கெனவே கூறப்பட்டதுபோல நேர்மையானவர்களுக்கும் அதேநேரம் நேர்மைக்குப் புறம்பாகச் செயற்படுகின்றவர்களுக்கும் ஒட்டுமொத்தமாக ஒரே தண்டனை வழங்கப்பட்டிருக்கின்ற ஒரு நிலைமையையே நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது.

பதுளை மாவட்டத்தில் க.பொ.த. சாதாரண தரப் பரீட்சையில் சிறந்த பெறுபேறுகளைப் பெற்ற மாணவர்கள் அம்மாவட்டத்திலேயே விஞ்ஞானப் பிரிவில் உயர்தரக் கல்வியை மேற்கொள்ள முடியாத ஒரு நிலைமை ஏற்படுவதற்குக் காரணம், அந்த மாவட்டத்திலே விஞ்ஞானப் பிரிவுள்ள முழுமையான ஒரு பாடசாலைகூட இல்லாமை யாகும். அங்கு ஆங்காங்கே ஒருசில பாடசாலைகளில் அரையும்குறையுமாக விஞ்ஞான வகுப்புக்கள் நடத்தப்படுகின்ற நிலைமையே இருக்கின்றது. பதுளை மாவட்டத்திலே விஞ்ஞானப் பாட ஆசிரியர்கள் இல்லாத காரணத்தினால்தான் இந்த நிலைமை தொடர்ந்து கொண்டிருக்கின்றது. இதனால் பதுளை மாவட்ட மாணவர்கள் விஞ்ஞானத் துறையில் தங்களது உயர்தரக் கல்வியை மேற்கொள்வதற்கு நுவரெலியா மாவட்டத்தையே முழுமையாக நம்பியிருக்கின்றனர். இதனால்தான் அவர்கள் தங்களது விண்ணப்பங்களை அந்த மாவட்டத்தில் முறையாகவும் நீதியாகவும் சமர்ப்பித்து நேர்முகத் தேர்விலும் தெரிவுசெய்யப்பட்டு வந்தனர். ஆனால், தற்போது அங்குள்ள ஒருசில பாடசாலை அதிபர்களின் முறைகேடுகள் காரணமாக ஏற்பட்ட நிலைமையினால் அங்கு பதுளை மாவட்ட மாணவர்களுக்கான அனுமதியும் முற்றாக மறுக்கப் பட்டிருக்கின்றது. இது அந்த மாணவர்களின் எதிர்காலக் கனவைத் தவிடுபொடியாக மாற்றியுள்ளது. இதனால் பெற்றோர் செய்வதறியாது இடிந்து போயுள்ளனர். இதை ஒரு பாரிய அநீதியாகவே பார்க்க வேண்டியுள்ளது. இதனால் வைத்தியராக, பொறியியலாளராக, விஞ்ஞானப் பட்டதாரியாக வரவேண்டும் என்ற அவர்களின் எதிர்பார்ப்பு காற்றில் பறந்துபோயுள்ளதை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருக்கின்றது.

தவறு செய்தவர்கள் தண்டிக்கப்படல் வேண்டும் என்பதில் மாற்றுக்கருத்துக்கு இடமில்லை. ஆனால், அப்பாவி பதுளை மாவட்ட மாணவர்களும் அதேபோல் ஏனைய மலையக மாணவர்களான இரத்தினபுரி, கேகாலை, களுத்துறை போன்ற மாவட்டங்களிலுள்ள அப்பாவித் தமிழ் மாணவர்களும் இதனால் பாதிப்புக்குள்ளாவதை நாங்கள் எந்த வகையிலும் நீதியாக ஏற்றுக்கொள்ள முடியாது; ஓர் அநீதியாகவே அதனைப் பார்க்கவேண்டியிருக்கின்றது. எனவே, பதுளை மாவட்ட மாணவர்களுக்கு நீதி வழங்கப்படல் வேண்டும்; பெருந்தோட்டத் துறையைச் சார்ந்த ஏனைய மாவட்டங்களைச் சேர்ந்த மாணவர்களுக்கும் நீதி வழங்கப்படல் வேண்டும். நுவரெலியா மாவட்டத்தில் க.பொ.த. உயர்தர விஞ்ஞானப்

[ගරු අ. අරවින්ද් කුමාර් මහතා]

පාඩංගල් කර්පික්කප්පටුම් පාඩසාලෙකළිල් නේර්මෙයාන විණ්ණප්පතාරිකළ් අනුමතික්කප්පඩල් වේණ්ඩුම්. කුරෙන්දතු ඉරණ්ඩු වරුඩංකළුක්කාවතු ඉන්ත අනුමති තොඩරප්පඩල් වේණ්ඩුම්. ඉව්වාරු සෙය්තාල්, අන්තක් කාලකට්ටත්තිල් පතුළෙ මාවට්ටත්තිල් ඔන්රු අල්ලතු ඉරණ්ඩු පාඩසාලෙකළෙයාවතු විඥ්ඤානප් පිරිවුඩන්කූඩිය පාඩසාලෙකළාග උරුවාක්කක්කූඩියතාග ඉරුක්කුම්.

ඉදුවරෙ කාලමුම්, පතුළෙ මාවට්ට මාණවර්කළුක්කු විඥ්ඤානප් පිරිවිල් කර්පතර්කු නුවරෙලියා මාවට්ටප් පාඩසාලෙකළිල් අනුමති කිටෙත්ත කාරණත්තිනාල්, පතුළෙ මාවට්ටත්තිල් විඥ්ඤානප් පිරිවුඩන්කූඩිය ඔරු පාඩසාලෙයෙ උරුවාක්කුවතර්කුත් තීවිර මුයර්චි එටුක්කප්පඩවිල්ලෙ. ඒනෙනිල්, පතුළෙ මාවට්ටත්තිල් ක.පොත. සාතාරණතරප් පරීට්සෙයිල් නල්ල පෙරුපේරුකළෙප් පෙර්ර මාණවර්කළ්, නුවරෙලියා මාවට්ටප් පාඩසාලෙකළුක්කු වන්දු විඥ්ඤානප් පිරිවිලේ කල්වි කර්පතර්කු වාය්ප්පු ඉරුන්තතු. නුවරෙලියා මාවට්ටමානතු, පතුළෙ මාවට්ටත්තින් එල්ලෙයිල් අමෙන්දිරුක්කිරතු. ඉරුන්තාලුම්, එතිර්කාලත්තිල් ඔරු කුරිප්පිට්ට කාලවරෙයරෙක්කුළ් ඉම්මුයර්චි වෙර්රිපෙර මුඩියුම්. ඒනෙනිල්, තොඩර්න්දු පතුළෙ මාවට්ට මාණවර්කළුක්කු නුවරෙලියා මාවට්ටප් පාඩසාලෙකළිල් විඥ්ඤානප් පිරිවිල් කල්වි කර්පතර්කු ඉඩම්කිටෙක්කාත නිලෙමෙ ඒර්පඩුම්පෝතු, පතුළෙ මාවට්ටත්තිලේ විඥ්ඤානප් පිරිවුඩන්කූඩිය පාඩසාලෙකළෙ උරුවාක්කුවතිල් අනෙවරිනතු කවනමුම් තිරුම්පුම්. අව්වාරු කවනම් තිරුම්පුම්පෝතු, එමතු පිළ්ළෙකළ් මුළුමෙයාග එමතු මාවට්ටත්තිලේ පඩික්කක්කූඩිය වාය්ප්පු ඒර්පඩුම්.

ආනාල්, තර්පෝතු එන්න නටන්තිරුක්කින්රතු එන්රාල්, එටුත්ත එටුප්පිලේයේ "වෙළිමාවට්ට මාණවර්කළුක්කු නුවරෙලියා මාවට්ටප් පාඩසාලෙකළිල් අනුමතියිල්ලෙ" එන්රු කෙවිරික්කප්පඩුකිරතු. අතනාල් නුවරෙලියා මාවට්ටත්තෙ නම්පියිරුන්ත පිළ්ළෙකළ් ඉන්රු සෙය්වතරියාතු තිකෙත්තුප්පෝයිරුක්කුම් ඔරු නිලෙමෙ ඒර්පට්ටිරුක්කින්රතු. එනවේ, තයවුසෙය්තු පතුළෙ මාවට්ට මාණවර්කළ්මීතු කරුණෙ කාට්ටවේණ්ඩුම්. ඒනෙය මාවට්ටඞ්කළිලුළ්ළ පෙරුන්තෝට්ටත්තුරෙයෙය්ච් චේර්න්ත මිකච් චොර්පමාන මාණවර්කළේ නුවරෙලියා මාවට්ටත්තුක්කු වරුකින්රාර්කළ්. ආනාල්, පතුළෙ මාවට්ටත්තිලිරුන්තු පෙරුමළවිලාන මාණවර්කළ් නුවරෙලියාවුක්කු වරුකින්රාර්කළ්. ආකවේ, ඉව්විඩයත්තිල් පිරතේසවාතත්තෙ ඔතුක්කිවෙත්තුවිට්ටු, නුවරෙලියා මාවට්ටත්තුක්කුළ් නේර්මෙයාන මුරෙයිල් උළ්ළේ නුළෙපවර්කළෙයුම් අනීතියාන මුරෙයිල් මුරෙකේටාග උළ්ළේ නුළෙපවර්කළෙයුම් ඔන්රාකප් පාර්ක්කාමල්, අවර්කළෙ ඔරේ තරාසින්මූලම් එටෙපෝටාමල්, නේර්මෙයානවර්කළුක්කු විසේට කරුණෙ කාට්ටි, අනෙවරුම් මලෙයග මණ්ණින් පිළ්ළෙකළ් එන්ර නිලෙප්පාට්ටෙ එටුත්තු, අවර්කළුක්කු විමෝසනම් වළුංකවේණ්ඩුමෙන නාන් විනයමාකක් කේට්ටුක්කොළ්කින්රේන්.

අත්තුටන්, "පිර මාවට්ට මාණවර්කළෙ නුවරෙලියා මාවට්ටප් පාඩසාලෙකළිල් අනුමතිප්පතිල්ලෙ" එන්ර අතිරටි මුටිවෙ, තාර්මීක අටිප්පටෙයිල් මීළ්පරිසීලනෙ සෙය්යවේණ්ඩුමෙනවුම් කල්වි අමෙච්චර් කෙළරව අක්කිල විරාජ් කාරියවසම් අවර්කළුම් ඉරාජාංක අමෙච්චර් කෙළරව ඉරාතාකිරුෂ්ණන් අවර්කළුම් ඉව්විඩයත්තිල් අක්කරෙ සෙලුත්ති, ඒර්පට්ටිරුක්කුම් පිරච්සිනෙක්කු ඔරු සිරන්ත තීර්වෙ මික විරෙවිල් පෙර්රුත්තර වේණ්ඩුමෙනවුම් තයවාකක් කේට්ටුක්කොළ්වතෝටු, සන්තර්ප්පම් වළුංකිය කෙළරව තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළුක්කු නන්රි කූරි, විටෙපෙරුකින්රේන්. වණක්කම්.

[අ.භා. 5.05]

ගරු (මහාචාර්ය) ආෂු මාරසිංහ මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආසු මාරසිංඝ)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් මාතෘකාවක් සම්බන්ධයෙන් කථා කිරීමට මටත් කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. අපේ ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ඉතාම කාලෝචිත ප්‍රශ්නයක් ගැන අද මේ ගරු සභාවේ අවධානය යොමු වෙලා තිබෙනවා.

පිටත දිස්ත්‍රික්කවලින් අධ්‍යාපනය ලබලා නුවරඑළිය වාගේ දිස්ත්‍රික්කයකට ඇවිල්ලා උසස් පෙළ විභාගයට පෙනී සිටීමෙන් විශ්වවිද්‍යාලවලට ඇතුළත්වන ක්‍රමයක් ඇති වෙලා තිබෙනවා. ඇත්තටම මේක මාඝියාවක්. මම මේ කථා කරන්නේ ඒ මාඝියාව ගැනයි. මේ මාඝියාව ගැන කථා කරන්නේ, මටත් මේ සම්බන්ධයෙන් අත් දැකීමක් තිබෙන නිසායි. මම කොළඹ ආනන්ද විද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේ සාමාන්‍ය පෙළ විභාගය වන තෙක් මාත් එක්ක ඉගෙන ගත්ත ශිෂ්‍යයෙක් උසස් පෙළ විභාගය ලියන්න නුවරඑළියට ගියා. ඇත්තටම ඔහු උසස් පෙළ විභාගය කරන්න නුවරඑළියට යන්න එකම හේතුව, ගණිත අංශයෙන් උසස් පෙළ විභාගය කරලා, මේ තිබෙන දිස්ත්‍රික් ක්‍රමවේදය තුළ engineering සඳහා විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමට ලේසියෙන්ම වරම් ලැබෙන නිසායි. ඔහුගේ උසස් පෙළ ප්‍රතිඵලය වුණේ 'සී' සාමාර්ථ දෙකයි, 'එස්' සාමාර්ථ දෙකයි. ඒ අවුරුද්දේම කොළඹින් උසස් පෙළ විභාගය කරපු මගේ ප්‍රතිඵලය වුණේ 'බී' සාමාර්ථ දෙකයි, 'සී' සාමාර්ථ දෙකයි. ඒ ප්‍රතිඵලය මත මට යන්න වුණේ විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා අංශයට. මේක තමයි ඇත්ත කථාව.

සාමාන්‍යයෙන් ගරු ඇමතිතුමනි, අපට නම් අපේ උසස් පෙළ ප්‍රතිඵලය මතකයි. දැන්, ගරු මයිල්වාගනම් කිලකරාජා මන්ත්‍රීතුමාගෙන් එතුමාගේ උසස් පෙළ ප්‍රතිඵලය මොකක්ද කියලා ඇහුවොත් එතුමා කියයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ උසස් පෙළ ප්‍රතිඵලය මොකක්ද?

ගරු මයිල්වාගනම් කිලකරාජා මහතා
(මාණ්පුමිකු මයිල්වාකනම් තිලකරාජා)
(The Hon. Mylvaganam Thilakarajah)
'ඒ' එකයි, 'බී' එකයි, 'සී' දෙකයි.

ගරු (මහාචාර්ය) ආෂු මාරසිංහ මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආසු මාරසිංඝ)
(The Hon. (Prof.) Ashu Marasinghe)

එතුමාගේ උසස් පෙළ ප්‍රතිඵලය 'ඒ' එකයි, 'බී' එකයි, 'සී' දෙකයි. දැන්, මම බිමල් රත්නායක මන්ත්‍රීතුමාගෙන් ඇහුවොත්, ඔබතුමාටත් ඒ ප්‍රතිඵලය මතකයි නේද?

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ඔව්.

ගරු (මහාචාර්ය) ආෂු මාරසිංහ මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආසු මාරසිංඝ)
(The Hon. (Prof.) Ashu Marasinghe)

අපේ අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමාගෙන් ඇහුවොත් එතුමාටත් මතකයි. අපි කොළඹ විශ්වවිද්‍යාලයේ සමකාලීනයන්.

දැන් මේ කියන ප්‍රශ්නයත් එක්ක දිවෙන තවත් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. සමහර අයට තමුන්ගේ උසස් පෙළ ප්‍රතිඵලය මතක නැහැ. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මාධ්‍ය ලේකම් නලින්ද හේරත් කියන දොස්තර මහත්තයාගෙන් "සිරස" නාලිකාවේ විකාශනය වන "සටන" වැඩසටහනේදී ප්‍රශ්නයක් ඇහුවා, "ඔබතුමාගේ උසස් පෙළ ප්‍රතිඵලය මොකක්ද?" කියලා. එතකොට එතුමා පිළිතුරු දුන්නේ,"මට ඒ ප්‍රතිඵලය මතක නැහැ" කියලායි. හරිම කථාවක් නේ! අපේ උසස් පෙළ ප්‍රතිඵල අමතක අපි කාටද? මේක, හරිම හතර බිහිරි කතාවක් නේ! ඉතින්, විශ්වවිද්‍යාලයට තේරුණ මෙන්න මේ වාගේ අය ගැනත් අපි කල්පනා කර බැලිය යුතු වනවා. තමන්ගේ උසස් පෙළ ප්‍රතිඵලය අමතකයි කියන මෙවැනි අය බිමල් රත්නායක මන්ත්‍රීතුමා කියන මාෆියාවේ කට්ටියද දන්නේත් නැහැ. එම නිසායි මම ඒ කරුණ මතක් කළේ. ලංකාවේ මෙවැනි නිලධාරීන් සහ වෛද්‍යවරු ඉන්නවා. ගරු ඇමතිතුමනි, සමහර වෙලාවට අපට බයයි ඒ වෛද්‍යවරුන්ගෙන් බෙහෙත් ගන්න. මොකද, බෙහෙත් ගන්න ගියාම,"හා! කලින් ඔයා මං ළඟට ආවාට මට මතක නැහැ මොනවාටද බෙහෙත් කළේ කියලා" කියයි. එතකොට මාර වැඩක් නේ වෙන්නේ. මතක නැහැ කියන දොස්තරවරු හිටියොත් අපට වෙනත් දොස්තරවරු හොයා ගන්න වෙනවා. ඉතින් මම හිතන හැටියට, මෙන්න මේ ප්‍රශ්නය තමයි බිමල් රත්නායක මැතිතුමා මතු කරන්නේ.

ඇත්තටම වතු පාසල් දියුණු කළ යුතුයි. අපි දන්නවා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතු පාසල් ගොඩක් තිබෙන බව. මේ වතු පාසල් දියුණු කළොත් තමයි මෙවැනි වංචාකරුවන්ට ඉඩ නොලැබෙන්නේ. ඒත් එක්කම මේ විභාග සඳහා දැඩි නීති-රීති ගෙන ආ යුතුයි. විශේෂයෙන් වෙනත් දිස්ත්‍රික්කයකින් සාමාන්‍ය පෙළ විභාගය කරලා උසස් පෙළ විභාගය කරන්න ඇයි නුවරඑළියට එන්නේ? අපි මේකට හේතුව හොයන්න ඕනෑ. උසස් පෙළ විභාගය කරන්න නුවරඑළියට එන්නේ ඇයි කියන්න සාධාරණ හේතුවක් තිබිය යුතුයි. එක්කෝ, තමන්ගේ මච්පියන්ට රැකියා මාරුවක් ලැබිලා නුවරඑළියට ආවාද, නැත්නම් නුවරඑළියට පදිංචිය වෙනස් කළාද යනාදී වශයෙන් හේතුව මොකක්ද කියලා සොයා බැලිය යුතු වනවා.

ගරු ඇමතිතුමනි, මෙන්න මේ කාරණයත් එක්ක ඉස්මතු වෙන කරුණක් තිබෙනවා. එය අපි සොයා බැලිය යුතු වැදගත් කාරණයක් වන බව මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිබෙන වතු පාසල් දියුණු කරලා, ඒවා හොඳම පාසල් බවට පත් කරලා ඒ පාසල්වල අඩුපාඩු සපුරලා, පහසුකම් නවීකරණය කරලා වැඩි වැඩියෙන් ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාලවලට යන්න අවස්ථාව හදන්න ඔබතුමාට හැකියාව ලැබෙනවා.

ඇත්තටම මේ දිස්ත්‍රික් ක්‍රමවේදය අපි හැමවිටම, දිගටම තබා ගත යුතුද කියන ප්‍රශ්නය මතු වනවා. මම ඒ ගැන කථා කරනකොට බිමල් මන්ත්‍රීතුමා මාත් එක්ක උරණ වෙලා එක පාරටම කියයි,"මේ යන්නේ වෙන ගේමකට. මේ යන්නේ දිස්ත්‍රික් ක්‍රමය නැති කරන්නයි" කියලා. නැහැ. එක පාරටම දිස්ත්‍රික් ක්‍රමය නැති කරන්න මාත් එකඟ නැහැ. මොකද, නුවරඑළිය,මොනරාගල වාගේ දිස්ත්‍රික්කවල තවම දුෂ්කර පාසල් තිබෙන නිසා. අපේ අලුත් ආණ්ඩුවේ සංකල්පත් එක්ක, ගරු ඇමතිතුමාගේ සංකල්පත් එක්ක ළඟම පාසල -හොඳම පාසල වුණාට පස්සේ ඒ පාසල් දියුණු වෙනවා. ඒ පාසල් දියුණු වුණාට පස්සේ අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණුවේ හිණි පෙත්තටම නඟින දවසක් එනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරියටම ගියාම මේ සංවර්ධන නවෝදයත් එක්ක මේ පළාත් දියුණු වෙනවාය කියලා අපි හිතනවා. ඒ දියුණුවීමත් එක්ක මේ දිස්ත්‍රික් ක්‍රමවේදය ගැන නැවත සිතා බැලිය යුතු වෙනවා.

ගරු ඇමතිතුමනි, 2014, 2015 වර්ෂවලදී ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා වරම් ලැබූ ගණන 149,572ක් කියලා ඔබතුමා දන්නවා ඇති. ඉතාමත් වැදගත් කාරණය තමයි ඒ අතර ශිෂ්‍යාවෝ ඉන්නවා 96,993ක්. ඒ කියන්නේ, තුනෙන් දෙකක් ශිෂ්‍යාවෝ. විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලැබූ ගණන තිබෙන්නේ 25,643යි. ඒ කියන්නේ, සියයට 17ක් තමයි සුදුසුකම් ලබන්නේ. සියයට 83ක් එළියේ. ගරු ඇමතිතුමනි, විෂයන් තුනටම "A" සාමාර්ථ ලබා ගත් අය මේ එළියේ ඉන්න අය අතර ඉන්නවා. එතකොට විෂයන් තුනටම A සාමාර්ථ ලබා ගත් ළමයින් අනෙක් පළාත්වල ඉන්න ගමන්ම, බිමල් රත්නායක මන්ත්‍රීතුමා මතු කරන මාෆියාවේ ඉන්න ළමයින් ටිකත් -A/L ප්‍රතිඵල අමතකයි කියන දොස්තර මහත්වරුත් ඇතුළුව- මේ වාගේ අයථා ක්‍රමවලින් විශ්වවිද්‍යාලවලට එනවා. මෙන්න මේක තමයි පැහැදිලිවම ප්‍රශ්නය.

අපි උදාහරණයක් ලෙස ජීව විද්‍යා අංශය ගත්තොත්, ජීව විද්‍යා අංශයෙන් 23,419ක් සමත් වන කොට 6,316යි විශ්වවිද්‍යාල වරම් ලබන්නේ. එයිනුත් 1,255ක් තමයි වෛද්‍ය විද්‍යාවට වරම් ලබන්නේ. එහෙම නම්, අපේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පැහැදිලි වෙනසක් ඇති කළ යුතු වනවා. ඒ සඳහා පාසල් දියුණු කරලා, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා තිබෙන ඉඩ ප්‍රස්ථාව වැඩි කළ යුතුයි. ඒ විතරක් නොවෙයි, අපි කල්පනා කළ යුතු තවත් වැදගත් කාරණයක් තිබෙනවා. ඒ තමයි, විශ්වවිද්‍යාල ප්‍රවේශය නොලබා හැලෙන සියයට 83ක ප්‍රමාණය. එම සියයට 83ක ප්‍රමාණය ගැන කථා කරන කොට අපේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අමතරව රාජ්‍ය හා බද්ධ වුණු පෞද්ගලික විශ්වවිද්‍යාල තිබෙනවා නම්, ඒ ගැනත් අපි කථා කළ යුතු වනවා.

මම SAITM එක ගැන කථා කරන්නේ නැහැ. බිමල් රත්නායක මන්ත්‍රීතුමා - [බාධා කිරීමක්] ඒක ගැන අපි වෙනම කථා කරමු. [බාධා කිරීමක්] අපි SAITM එක ගැන වෙනම දවසක කථා කරමු. නමුත්, මේ මානෘකාව ගැන කථා කරන කොට කිව යුතුයි, SAITM එක විතරක් නොවෙයි, රටේ සංවර්ධනය සඳහා අපට තවත් එවැනි විශ්වවිද්‍යාල අවශ්‍ය වන බව. එහෙම නැත්නම් කළ යුතු වන්නේ, විශ්වවිද්‍යාල ප්‍රවේශයෙන් හැලෙන සියයට 83ක් පමණ දරුවන්ව අප ලංකාවේ තියන්නේ නැතුව එළියට යවන එකද? ලංකාවේ දරුවන් 14,000ක් - 20,000ක් අතර ප්‍රමාණයක් උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වනවා. එසේ ඔවුන් විදේශගත වන්නේ මේ තිබෙන ක්‍රමවේදයේ වරද නිසායි. මේ ක්‍රමවේදය සාධාරණ නැහැ. දැන් 2016 වසරට ඇවිල්ලත් 1980 කාලයේ පටන් ගත් ක්‍රමවේදයක් තමයි අපි තවමත් ක්‍රියාත්මක කරමින් තිබෙන්නේ. ඒ නිසා 2020 වසර වන විට ගරු ඇමතිතුමාගේ අලුත්ම සංකල්පයත් එක්ක ක්‍රියා කරලා අපිට මේ ක්‍රමවේදය වෙනස් කරන්න හැකි වෙයි කියලා මම කල්පනා කරනවා. එහෙම වුණොත්, උසස් පෙළ විභාගයෙන් "A" තුනක් ගන්න ළමයින්ට විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙන්න වරම් ඇති වෙයි. එහෙම වුණොත් තමයි, මේ ප්‍රශ්නයට පිළිතුරක් ලැබෙන්නේ. එහෙම නොවුණොත් වෙන්නේ, කොළඹ, ගම්පහ, කළුතර, නුවර වාගේ දිස්ත්‍රික්කවල අපොස සාමාන්‍ය පෙළ හදාරන ශිෂ්‍යයන් මේ පහසු ක්‍රමවේදය, මේ සිදුර සොයාගෙන හැමදාම නුවරඑළිය, මොනරාගල, වගේ දිස්ත්‍රික්කවලට යන එකයි. මේ සිදුර සොයා ගෙන ගියාම කවුද තැළෙන්නේ?

ඇත්තටම නුවරඑළිය දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය හදාරන අභිංසක දුප්පත් දරුවෝ. මේ අභිංසක දුප්පත් දරුවන් වැඩියෙන්ම ඉන්නේ වතු පාසල්වලයි. අපේ ගරු තිලකරාජා මන්ත්‍රීතුමා නුවරඑළියෙන් ඉගෙනගෙන, නුවරඑළියෙන්ම O/L කරලා, A/L කරලා කොළඹ විශ්වවිද්‍යාලයට ආපු කෙනෙක් එතුමාට ඒ හැකියාව තිබුණා. ඒ හැකියාව දැන් පාසල්වල වර්ධනය වෙලා තිබෙනවා. අපි මේ පාසල් තව තවත් වැඩි දියුණු කළ යුතුයි. පසු

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

ගිය කාලයේ ලංකාව පුරා විද්‍යාගාර හදපු හැටි අපි දැක්කා. අනේ! ඒත් මේ දිස්ත්‍රික්කවල ඒ පහසුකම් වැඩි දියුණු වුණේ නැහැ. මේ ප්‍රදේශවල ඒ පහසුකම් වැඩිදියුණු කිරීමයි අපි කළ යුත්තේ. හැබැයි, මේ දිස්ත්‍රික්ක දියුණු වුණාට පස්සේ ඒ ක්‍රමවේදය ඉදිරියටත් තියා ගන්නවාද කියලා බලන්න ඕනෑ. සමහර පක්ෂවල අය මේ පාසල් දියුණු වෙනවාට කැමැති වෙයිද දන්නේ නැහැ. මොකද, එහෙම වුණොත් විශ්වවිද්‍යාලවල ගිහිල්ලා strike කරන කට්ටිය, පෙළපාළි යන කට්ටිය, ඒ වාගේ නිකම් කෑ ගහන කට්ටිය විශ්වවිද්‍යාලයේ නැති වෙනවා. ඒකත් ප්‍රශ්නයක් වෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි නම් එහෙම හිටියේ නැහැ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා භය වෙන්න එපා. මම ජනතා විමුක්ති පෙරමුණ ගැන නොවෙයි කිව්වේ. මම කිව්වේ පෙරටුගාමීන් ගැනයි. ඔබතුමා තොප්පිය දමා ගත්තා. මම කිව්වේ, මේ වාගේ ලංකාවේ ඉන්න සමහර ක්‍රීඩා කණ්ඩායම්වල අතකොළු බවට මේ අභිංසක දරුවන් පත් වෙන එක ගැනයි. මෙන්න මේ අභිංසක දරුවන් මේ අතකොළුවලින් බේරාගන්න ක්‍රමවේදයක් සැකසිය යුතුයි. නැත්නම් වෙන්නේ, උසස් පෙළ විභාගයෙන් "A" තුනක් ගත්ත ළමයි එළියේ සිටිද්දී මේ වාගේ අතකොළු ටිකක් විශ්වවිද්‍යාලයට යන එකයි. මේ ගොල්ලන්ව සමහර විට plant කරනවා. ගරු ඇමතිතුමනි, මේ පක්ෂවලින්ම plant කරනවා මම දැකලා තිබෙනවා. "නුවරඑළියට ගිහිල්ලා ඉගෙනගෙන campus එක ඇතුළට එන්න, ඊට පස්සේ පුළුවන් මේ කවල් ටික පටන් ගන්න" කියලා. මෙන්න මේ වාගේ ඒවාත් සිදු වෙනවා. ඒ නිසා මේ ගැනත් අපි සිතා බැලිය යුතුයි. මේ ගැන සිතා බලා නිසි ක්‍රමවේදයක් සකස් කළේ නැත්නම්, නුවරඑළියේ අපේ දුප්පත් අභිංසක දරුවන්ට විශ්වවිද්‍යාලයට යාමට තිබෙන ඉඩ කඩ නැති වෙනවා. ඒත් එක්කම මොනරාගල දිස්ත්‍රික්කයේ සිටින දුප්පත් දරුවන්ටත් විශ්වවිද්‍යාලයට යාමට තිබෙන ඉඩ කඩ නැති වෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමා මේ ගැන නිවැරදි අවබෝධය ලබා ගෙන කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, මම පැහැදිලිවම මේ ප්‍රශ්නයේදී ඔබතුමා සමඟ කෙළින් සිට ගන්නවා. [බාධා කිරීමක්] මේ ප්‍රශ්නයේදී මම ඔබතුමා සමඟ ඉන්නවා. ඒ නිසා මම කියා සිටිනවා, හරි ක්‍රමවේදය සොයා ගෙන ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු සෙවිය යුතුමයි කියලා. ඒ පිළිතුර අපි සොයා ගනිමු. ඒත් එක්කම "හොඳම පාසල, ළඟම පාසල" කියන ඔබතුමාගේ මේ සංකල්පය හරහා පාසල් පද්ධතිය සම්පූර්ණයෙන්ම දියුණු කරන්න පුළුවන්. මේ තුළින් වතු පාසලුත් දියුණු කරලා, මේ ප්‍රශ්නය විසඳන්න අපට පුළුවන් වෙනවා. ඒ තුළින් මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳාගත හැකියි කියලා උපකල්පනය කරන අතර, ඒ සඳහා අපට වරම් තිබෙන බවත් කිව යුතුයි. ඒ සඳහා අපේ ආශීර්වාදයත් ඔබතුමාට ලැබෙන බව ප්‍රකාශ කරමින් මා නවතිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට පිළිතුරු කථාව කිරීමට ගරු අකිල විරාජ් කාරියවසම් අමාත්‍යතුමා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු ඇමතිතුමනි, මම මේ කියන්නේ 1970ගණන්වල සිද්ධ වෙච්ච දෙයක් ගැනයි. මම O/L කරන කාලයේ දී ආනන්ද, නාලන්ද, රාජකීය විද්‍යාලවලින් සාමාන්‍ය පෙළ කරපු ළමයි උසස් පෙළ කරන්න මොනරාගල දිස්ත්‍රික්කයට ගියා. සමහර අය පළමුවැනි වතාවට විභාගය කරලා, දෙවැනි වතාවට උසස් පෙළ විභාගය කරන්න ඒ දිස්ත්‍රික්කයට ගියා. සමහර අය O/L pass වෙලා A/L කරන්න එහාට ගියා. හැබැයි, එහෙ ගිහින් A/L කළාට, ඒ කාලයේ විශ්වවිද්‍යාලයට ගන්න කොට බැලුවේ ඒ ළමයා O/L කරපු ඉස්කෝලය මොකක්ද කියලායි. ඒ නිසා ඒ අයට යම් ආකාරයක ගැටලුවක් මතු වුණා. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කියාපු විධියට දැන් ඒ ක්‍රමය වෙනස් කරලා, සුපිරි පාසල්වල දරුවන්ට අවස්ථාව සලසා දීලා තිබෙනවා. ඒක මහා බරපතළ විධියේ ගැටලුවක්. අන්න ඒක ගැනත් මා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා.

[අ.භා. 5.17]

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම චක්‍රලේඛය දැන් මා ළඟ තිබෙනවා. මට ඕනෑ නම් එම චක්‍රලේඛයේ අදාළ කොටස කියවන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ ප්‍රශ්නය මතු කිරීම පිළිබඳව. මොකද, මේ සම්බන්ධයෙන් මට කරුණු ගෙනහැර දක්වන්න හැකියාව ලැබුණේ ඒ නිසායි.

යම් යම් අවස්ථාවලදී, -මාධ්‍ය අසද්දීත්- අප මේවා ගැන කිව්වත්, පාර්ලිමේන්තුවේදී කිව්වාම එහි ශක්තිමත්භාවය වැඩියි. එම නිසා, මෙම ප්‍රශ්නය නැඟීම සම්බන්ධයෙන් මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මා ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් අපට දැනගන්න ලැබුණාම ඊට අදාළව තදින්ම ක්‍රියා කරන්න කටයුතු කළේ අපි; අපේ විභාග කොමසාරිස්වරයා, අධ්‍යාපන අමාත්‍යාංශය. මෙය ඉස්සර වෙලාම "ගොසිප්" එකක් විධියටයි අපට දැනගන්න ලැබුණේ. ඊට පසුව අප ඒ ගැන සොයා බලද්දී, ඒ ගැන හාරවුස්සන්න යන විට ඒ සම්බන්ධයෙන් පැමිණිලි ලැබෙන්න පටන්ගත්තා. ඊට පසුව තමයි අප තදින්ම සිටීමට තීරණය කළේ. ඒ අනුව විභාග කොමසාරිස්වරයාට මමත් උපදෙස් දුන්නා, එවැනි කටයුත්තක් සඳහා ඉඩ සලසා තිබෙන විදුහල්පතිවරුන්ට කිසිම බුරුලක් දෙන්නේ නැතිව, වැඩ තහනම් කිරීමෙන්ම අපි ඊට අදාළ නීති කටයුතු පටන් ගනිමු කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ කථාවේදී සඳහන් කළා, එයට දේශපාලනඥයන්

සම්බන්ධ වුණා කියා. ඒ ගැන මා දන්නේ නැහැ. සමහර විට පෞද්ගලිකව කථා කළාද යන්න පිළිබඳව මම දන්නේ නැහැ. හැබැයි, කිසිම කෙනෙකුගෙන් අබ මල් රේණුවකවත් බලපෑමක් වුණේ නැහැ. එහෙම වුණා නම්, මට කථා කරන්න ඕනෑ. සාමූහික ආණ්ඩුවක් කියන්නේ ජාතික ආණ්ඩුවක් වන නිසා එක්කෙනෙක්වත් කථා කළේ නැහැ. කථා කළත් නැතත්, අපි මේ වන විට ඊට විරුද්ධව නිවැරැදිව, සම්පූර්ණයෙන් කටයුතු කර තිබෙනවා. අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන තිබෙනවා. අදාළ අයගේ වැඩ තහනම් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමන්ලාට මේ පාර්ලිමේන්තුවේදී තවත් කාරණයක් මතක් කර දෙන්න ඕනෑ. 2014 විභාග අකටයුතුකම් පිළිබඳ -විභාග ප්‍රශ්න සම්බන්ධ- සිද්ධීන් -බරපතළ සිද්ධීන්ද සහිතව- 450කට ආසන්න ප්‍රමාණයක් වාර්තා වී තිබුණා. ඇත්ත වශයෙන්, මෙවර වාර්තා වෙලා තිබෙන්නේ සිද්ධීන් 52යි. ඒකෙන්ම පෙනෙනවා, අපේ නව රජය ආවාට පසු තත්ත්වය. ඉස්සර අපත් විපක්ෂයේ සිටිද්දී මේ ගැන කථා කර තිබෙනවා, "ප්‍රශ්න පත්‍ර පිටවෙනවා. එක එක ටියුෂන් පන්තිවල ප්‍රශ්න පත්‍ර සාකච්ඡාවට භාජන කරනවා." ආදී වශයෙන්. දැන් ඉතාම වේගයෙන් එම තත්ත්වය අවම වෙලා තිබෙනවා. 2014 වර්ෂයේදී සිද්ධීන් 450කට ආසන්න ප්‍රමාණයක් වාර්තා වී තිබුණත්, එම ප්‍රමාණය දැන් 52ක් දක්වා අඩු වෙලා තිබෙනවා. ඒවාත්, අපේ විභාග දෙපාර්තමේන්තුව හෝ ප්‍රධාන අයගේ ප්‍රශ්න නොවෙයි. ලක්ෂ ගණනක් විභාගවලට පෙනී සිටිනවා. ශාලාධිපතිවරුන් ද ඇතුළුව දසදහස් ගණනක් නිලධාරීන් විභාග කටයුතුවලට ඉදිරිපත් වෙනවා. ඒ වාගේ විශාල කාර්යයක් කරද්දී ඇති වන්නේ බොහොම සරල සහ පුංචි ගැටලු. 'පුංචි ගැටලු' කියන්නේ, එතරම් විශාල කටයුත්තකදී සාමාන්‍යයෙන් මේ වාගේ දේවල් වළක්වන්න බැරි තත්ත්වයක් පවතින නිසායි. නමුත්, ඒවාත් අවම කරන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම, විභාග සම්බන්ධයෙන් ඉදිරි කාලයේදීත් අවශ්‍ය වෙනස් කිරීම් ද ඉතාම බරපතළ විධියට කරන්න බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට අදාළ පිළිතුර ඉදිරිපත් කරන්න මා කැමැතියි. "අ.පො.ස. (උසස් පෙළ) - 2016 විභාගය" ආරම්භ වීමත් සමඟ නුවරඑළිය ශාන්ත සේවියර් විද්‍යාලයේ අපේක්ෂකයන් වශයෙන් වෙනත් දිස්ත්‍රික්කවල පදිංචිකරුවන් විභාගයට පෙනී සිටින බවට ලැබුණු පැමිණිලි මත වහාම මූලික පරීක්ෂණයක් පවත්වා තොරතුරු වාර්තා කරන ලෙස මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට සහ නුවරඑළිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට විභාග කොමසාරිස්වරයා විසින් දැනුම් දෙනු ලැබුවා. ඒ අනුව, මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් මූලික විමර්ශනයක් සිදු කරන ලද අතර, 2016.08.10 දාතමින් යුතු මූලික විමර්ශන අතුරු වාර්තාව ලබා ගත්තා. මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙම සිද්ධියට ඍජුවම වග කිව යුතු මප/නු/ ශාන්ත සේවියර් විද්‍යාලයේ විදුහල්පති බී.වී. ජෙබපාලන් මහතාගේ රාජකාරී කටයුතු තහනම් කරනු ලැබ තිබෙනවා. ඒ වාගේම, උක්ත විමර්ශන අතුරු වාර්තාවෙහි සඳහන් පරිදි, නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් බාහිර වෙනත් දිස්ත්‍රික්කවල පදිංචි සිසුන් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මප/නු/ ශාන්ත සේවියර් විදුහලෙන් අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීම පිණිස බඳවාගෙන ඇති බව එම පරීක්ෂණයේදී තහවුරු කරගෙන තිබෙනවා. ඒ වාගේම, උක්ත විමර්ශනයේ අතුරු වාර්තාවට අනුව අදාළ විදුහලේ විදුහල්පති බී.වී. ජෙබපාලන් මහතාට එරෙහිව විධිමත් විනය ක්‍රියා මාර්ග ගැනීමටත්, විෂමාචාර සිදු කිරීමට ආධාර, අනුබල දීම සම්බන්ධයෙන් එම විද්‍යාලයේ ගුරුවරයකු වන එන්.ටී. සරවනපවනාදන් මහතාට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගැනීමටත් නිර්දේශ කර තිබෙනවා. මෙම සිද්ධිය මාධ්‍යවල ප්‍රචාරය වීමත් සමඟම මප/නු/ ශාන්ත සේවියර් විද්‍යාලයට අමතරව එම දිස්ත්‍රික්කයේ තවත් පාසල් කීපයකම එවැනිම දේවල් සිදුව ඇති බව වාර්තා වුණා. ඒ අනුව එම සියලුම සිද්ධීන් පිළිබඳව පරීක්ෂණ පවත්වන ලෙසට 2016.08.05වන දින මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට දැනුම් දී තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් දැනට වාර්තා වී තිබෙන තොරතුරු අනුව එසේ වෙනත් දිස්ත්‍රික්කවලින් ඉදිරිපත් කර ඇති ශිෂ්‍ය සංඛ්‍යා මා ඔබතුමාට කියන්නම්. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොටගල දෙමළ මහා විද්‍යාලය ඉදිරිපත් කර ඇති, වෙනත් දිස්ත්‍රික්කවල ශිෂ්‍ය සංඛ්‍යාව 25යි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ මප/නු/ කේම්බ්‍රිජ් විද්‍යාලය, 17යි. ශාන්ත සේවියර් විදුහල 27යි, දියතිලක මධ්‍ය මහා විද්‍යාලය 11යි, දෙණිකේ මහ විදුහල 12යි, පොරමඩුල්ල ජාතික පාසල 53යි.

ඔබතුමන්ලාට තේරෙනවා, මේ තත්ත්වය. මේක අද ඊයේ ඇති වුණු තත්ත්වයක් නොවෙයි. දශක ගණනක් තිස්සේ ආපු එකක්. මේකට අපි ඉක්මනට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත්තා. ඒ නිසා තමයි මේක මතු වුණේ. සාමාන්‍යයෙන් මේ වාගේ දේවල්වලදි කරන්නේ ඔක්කෝම "ෂේප්" කරන එකනේ. නමුත්, අපේ ඒ "ෂේප්" න්‍යාය නැති නිසා මේ ඔක්කෝම පරීක්ෂණ කරගෙන යනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහිරා මුස්ලිම් මහ විදුහල 17යි, කහටගස්දිගිලිය මුස්ලිම් මහ විදුහල 22යි, අල්හීරා මුස්ලිම් මහ විදුහල 22යි, පුත්තලම බර්නඩෙත් දෙමළ මහ විදුහල 6යි, නස්රියා මුස්ලිම් විදුහල 4යි.

මේ සම්බන්ධයෙන් පවතින තත්ත්වය පැහැදිලි කර ඒ පිළිබඳ පුළුල් විමර්ශනයක් කිරීම සුදුසු යැයි යෝජනා කර 2016.08.22 දින අධ්‍යාපන ලේකම් වෙත යොමු කර තිබෙනවා, විභාග කොමසාරිස් වරයා විසින්. පුළුල් විමර්ශනයකින් පසුව මෙම විදුහල්වලින් -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඒ දරුවන්ට- [බාධා කිරීමක්]

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒ දිස්ත්‍රික්කවල ළමයින්ගේ කඩඉම් ලකුණු ගණනය කරන්නේ නැහැ. ඒ පිළිබඳව එන සතියේ දිනයක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා ඇතුළු නිලධාරීන් එක්කත්, අපේ අමාත්‍යාංශයේ සහ විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එක්කත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සාකච්ඡාවක් පවත්වනවා. දැන් මේක දිගටම ගන්නවා ද, කොතැන ඉඳලා ගන්නවා ද කියන එක අපට කථා කර ගන්න වෙනවා. මා ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා එක්කත් පෞද්ගලිකව මේ ගැන කථා කළා. විශ්වවිද්‍යාල ඇතුළෙත් ඉන්නවා මෙහෙම ගිය අය. එළියට ගිහිල්ලාත් ඉන්නවා මෙහෙම ගිය අය. මෙහෙම ගිය මන්ත්‍රීවරුනුත් ඉන්නවායි කියනවා. ඒ නිසා දැනට විශ්වවිද්‍යාලයට තෝරා ගෙන තිබෙනවා නම් ඒකත් නවත්වා එතැන ඉඳලා මෙහාට ගන්න වාගේ දෙයකට අපි යනවා ද කියලා සාකච්ඡා කරනවා. අපි ඔක්කෝම එක්ක මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සාකච්ඡා කරලා තීරණයක් ගන්නවා. ඒ වාගේම ඔබතුමන්ලාගේත් අදහස් දෙන්න මොකක්ද කරන්න ඕනෑ කියන එක සම්බන්ධයෙන්. අග ඉඳලා ගන්නත් පුළුවන්; මැද ඉඳලා ගන්නත් පුළුවන්; ඒ වාගේම දැන් තේරිලා ඉන්න අය අනුව ගන්නත් පුළුවන්. [බාධා කිරීමක්] අත්හරින්න නම් බැහැ. මොකද, මේක නියමිත ක්‍රමවේදයට පටහැනි දෙයක්.

පුළුල් විමර්ශනයකින් පසුව මෙම විද්‍යාලවලින් වංචනික ලෙස ඉදිරිපත් වී ඇති වෙනත් දිස්ත්‍රික්කවල සිසුන් වෙන් වෙන්

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

වශයෙන් හඳුනා ගෙන ඔවුන්ගේ නිවැරදි දිස්ත්‍රික්කය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒක ගැන අපි එන සතියේ සාකච්ඡාවක් තියනවා.

විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීමේදී අධ්‍යාපනිකව දුෂ්කර වශයෙන් හඳුනා ගත් පහත සඳහන් දිස්ත්‍රික්ක 16 සඳහා දුෂ්කර පදනම යටතේ ලබා දෙන පංගුව - quota එක - වංචනික ලෙස පැහැර ගැනීම සඳහා දුෂ්කර දිස්ත්‍රික්කවලින් ඉදිරිපත් වීමට සැලසුම් සහගත ලෙස සංවිධානගත වීමක් බව මූලික පරීක්ෂණවලදී අනාවරණය වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කාලය අවසන්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
තව පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අධ්‍යාපනික වශයෙන් දුෂ්කර ලෙස හඳුනා ගන්නා ලද දිස්ත්‍රික්ක මෙසේයි. නුවරඑළිය දිස්ත්‍රික්කය, හම්බන්තොට දිස්ත්‍රික්කය, යාපනය, කිලිනොච්චි, මන්නාරම, වවුනියාව, මුලතිව්, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල, රත්නපුර.

දැනට වාර්තා වී ඇති පාසල්වලට අමතරව උක්ත දිස්ත්‍රික්කවල පාසල්වල මෙවැනි සිදුවීම් සිදු වේද යන්න පිළිබඳව පුළුල් විමර්ශනයක් සිදු කර වංචනික ලෙසට වෙනත් දිස්ත්‍රික්කවලින් පෙනී සිටින සියලුම සිසුන් අනාවරණය කර ගැනීමටත් ඔවුන්ගේ නිවැරදි දිස්ත්‍රික්ක තහවුරු කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දැනුම් දීමටත් අපි කටයුතු කරනවා. මා කලින් කිව්වා වාගේ ඒ සඳහා අපි සාකච්ඡා කරනවා.

2015 වර්ෂයේදී මෙවැනි තත්ත්වයන් ඇති වී ඇත්නම් ඒ පිළිබඳව සොයා බලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට වාර්තා කිරීමටත් වංචනිකව අයදුම් පත්‍ර ඉදිරිපත් කර ඇත්නම් එම ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කවලට යොමු කිරීමටත් කටයුතු කරනවා.

අධ්‍යාපනික වශයෙන් දුෂ්කර දිස්ත්‍රික්කවල දරුවන් සඳහා ලබා දෙන සහනය වංචනික ලෙස පැහැර ගැනීම වැළැක්වීම සඳහා අපොස (උසස් පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්ගේ අවධානය දැඩි ලෙස යොමු කිරීමටත්, එම චක්‍රලේඛය උල්ලංඝනය කරන විදුහල්පතිවරුන්ට විරුද්ධව විනය ක්‍රියා මාර්ග ගැනීමටත්, විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේදී පාසල් අපේක්ෂකයින්ගේ තොරතුරු තහවුරු කර ගැනීමේ ක්‍රමවේදය වඩාත් ශක්තිමත් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දැන්වීමටත් බලාපොරොත්තු වෙනවා.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් සැලසුම් කිරීමට සාකච්ඡා කෙරෙමින් පවතිනවා. මෙම වංචනික ක්‍රියාවන්ට වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය මත අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පොලිස්පතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා. විභාගය පැවැත්වෙන අවස්ථාවේදී යම් ක්‍රියා මාර්ග ගැනීම මඟින් විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගේ මානසික තත්ත්වය පිළිබඳව සලකා බලා විභාගය අවසන් වූ වහාම මේ පිළිබඳව පුළුල්ව ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව ද කාරුණිකව දැනුම් දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මා මේ පිළිබඳව ප්‍රකාශ නොකළේත් ඒකයි. හෙට විභාගය අවසන් වෙනවා. අපි මේ ගැන ඕනෑවට වඩා මාධ්‍ය මඟින් ප්‍රචාරය කරන්න ගියොත් විභාගයට පෙනී සිටින අයට එය මානසික ප්‍රශ්නයක් වෙනවා, මොනවා වුණත් විභාගයක් ලියන නිසා. [බාධා කිරීමක්] විභාගය අවසන් වුණාට පසුව අපි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නවා. ඒ සම්බන්ධයෙන් කිසිම සැකයක් තබා ගන්න එපා. අපි ඒවා නිවැරදි කරනවා. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, බලා ගෙන ගියාම මේ දිස්ත්‍රික්කවලින් විභාගයට පෙනී සිටීමට ගොස් තිබෙන්නේ එම දිස්ත්‍රික්කවල අය නොවෙයි කියන එක ඔබතුමාටත් තේරෙනවා ඇති. පිට දිස්ත්‍රික්කවල අය තමයි ගිහින් තිබෙන්නේ. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මොකද, අපි කවර කාලයක හෝ -

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
ගරු ඇමතිතුමනි, චක්‍රලේඛයේ තිබෙන විධියට -

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මට කාලය දෙනවා නම් ඒ ගැන කියන්නම්.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
ගරු ඇමතිතුමනි, අවුරුදු තුනේ කථාව තවම තිබෙනවාද, නැත්නම් ඒක වෙනස් කළාද? ඒ අය O/L කළේ මොන දිස්ත්‍රික්කයෙන්ද කියා ගණනය කරනවාද, එහෙම නැත්නම් ආපසු ඒ අයට විභාගය පවත්වනවාද, නැද්ද කියන එක විතරයි දැන ගැනීමට අවශ්‍ය කරන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට මේ චක්‍රලේඛය දෙන්නද? මම මේ ලේඛන ටික සභාගත කරන්නද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාල වේලාවත් මදි නිසා මම මේ ලේඛන **සභාගත*** කරනවා. ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමනි, අපි මේ district quota ක්‍රමය ලබා දීලා තිබෙන්නේ සමහර දිස්ත්‍රික්කවල අධ්‍යාපන මට්ටම අඩු මට්ටමක පවතින නිසායි. ඒ ගැන ඔබතුමාත් දන්නවා. එය තුලනය කිරීමටයි, එවැනි ක්‍රමයක් දීලා තිබෙන්නේ. හැබැයි, අර ගරු මන්ත්‍රීවරයෙකු කිව්වා වාගේ, "ළඟම පාසල-හොඳම පාසල" වැඩසටහන යටතේ මේ බොහෝ දේවල්වලට විසඳුම් තිබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරයෙකු අදත් ප්‍රකාශ කළා, "අඩු පාඩුකම් තිබෙනවා" කියා. මම අධ්‍යාපන ඇමතිවරයා විධියට පත් වුණාට පසුව, අපේ නව ආණ්ඩුව බලයට පත් වුණාට පසුව

**** ප්‍රශ්නකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතු ප්‍රදේශවලට විතරක් ගුරු පත්වීම් 3,000ක් ලබා දීලා තිබෙනවා. අපි අද උදේ මහරගම ගුරු විද්‍යා පීඨයේදී ගුරුවරුන් නිහ විෂයන්වලට අදාළව ගුරු පත්වීම් 1,038ක් ලබා දුන්නා. ඒ වාගේම විද්‍යා පීඨවලින් පිට වෙන අයට හෙට-අනිද්දා වෙනකොට ගුරු පත්වීම් 3,500ක් ලබා දීමට කටයුතු කරනවා. ඊට අමතරව විද්‍යා පීඨවලට බඳවා ගන්නා ප්‍රමාණය 1,500කින් වැඩි කර තිබෙනවා. අපි ඒ ආකාරයට පියවරෙන් පියවර ඒ ඒ විෂයන්ට අනුව මේ සියලු ප්‍රශ්නවලට විසඳුම් සොයමින් තමයි පවතින්නේ. අපිට ටික කාලයක් දෙන්න; අපව විශ්වාස කරන්න. අපි ගෙන යන මේ වැඩ පිළිවෙළ අනුව මෙවැනි වූ ප්‍රශ්න ගොඩකට විසඳුම් ලබා දෙන්න අපට හැකි වෙයි කියා මට ලොකු විශ්වාසයක් තිබෙනවා. හරියටම ගත්තොත්, අපේ ආණ්ඩුව පත් වෙලා අවුරුද්දයි තවම ගත වෙලා තිබෙන්නේ. තව අවුරුදු හතරකට අපට ජනතා වරම දීලා තිබෙනවා. ඒ නිසා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ප්‍රශ්න රාශියකට විසඳුම් ලබා දෙමින් මේ තුළ විශාල වෙනසක් කරන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

ගරු ඇමතිතුමනි, ඒ ආකාරයට ගුරු පත්වීම් ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි. නමුත් එසේ පත්වීම් ලබා ගත් 200 දෙනෙකු තවම උඟව පළාතේ එම පත්වීම් භාර ගෙන නැහැ. ඔවුන් අතේ එම පත්වීම් ලිපිය තිබෙනවා. නමුත්, උඟව පළාතට පත්වීම් ලැබුණු අයට පාසල් ලබා දීලා නැහැ. අනිවාර්යෙන්ම ඒ ගැන අමාත්‍යාංශය බලන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, එයට හේතුව මොකක්ද?

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

මධ්‍යම රජයෙන් පත්වීම දෙනවා. එම පත්වීම් ලිපි අරගෙන පළාත් සභා යටතේ තිබෙන පාසල්වලට ගියාට එම අමාත්‍යාංශයෙන් ඒ අයට අදාළ පාසල් ලබා දෙන්නේ නැහැ. එතකොට ඔවුන් teachersලා හැටියට පත්වීම් ලැබුවත්, ඉස්කෝලයක් නැතුව එම ලිපි තබා ගෙන ගෙදරට වෙලා ඉන්නවා.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

ගරු ඇමතිතුමනි, මන්ත්‍රීවරයෙකු හැටියට මම ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නම්. බදුල්ල දිස්ත්‍රික්කයේ නම් ඒ අයට 30 වැනි දා පාසල් ලබා දෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

මොකක් හරි ගැටලුවක් තිබෙනවා නම් මිසක්, ඒක වෙන්න බැරි දෙයක්. අපි සමහර -

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන විධියට තව මොනවා හෝ අවුලක් තිබෙනවාද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, අපි පළාත් පාසල්වලට පත්වීම් දුන්නාට, ඔවුන් ස්ථානගත කිරීමේ වගකීම තිබෙන්නේ පළාත් සභාවටයි. ඒ නිසා අපි පත්වීම් ලබා දුන්නාට පසුව ඔවුන් ස්ථානගත කිරීම සඳහා පුරප්පාඩු තිබෙන තැන් පිළිබඳව සොයා බලා -

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු ඇමතිතුමනි, පළාත් පාසල්වලට අදාළව අධ්‍යාපන අමාත්‍යාවරයෙකු ඉන්නවා; අධ්‍යක්ෂවරයෙකු ඉන්නවා. ඒ වාගේම අධ්‍යාපන ලේකම්වරයෙකු ඉන්නවා. ඒ ගොල්ලන් දන්නවා, ඒ වසර තුළ ඒ දිස්ත්‍රික්කයේ තිබෙන, ඒ පළාතේ තිබෙන පුරප්පාඩු පිළිබඳව. දන්නේ නැත්තේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා පත්වීම් දුන්නාට පසුව සොයා බලන එක නොවෙයි, ඒ ගොල්ලන් කරන්නේ. අනිවාර්යෙන්ම පුරප්පාඩු තිබෙන බව ඒ ගොල්ලන් දන්නවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගැනත් නොකියා බැහැ. ඇත්ත වශයෙන්ම පසු ගිය කාලයේ හරියාකාරව පුරප්පාඩු සෙවීමක් සිද්ධ වෙලා නැහැ. මේ රටේ 60,000ක ගුරු හිඟයක් තිබෙනවා. 40,000ක ගුරු අතිරික්තයක් තිබෙනවා. එතකොට ඇත්ත වශයෙන්ම 20,000ක ගුරු හිඟයක් තමයි තිබෙන්නේ. ඒකෙන් තේරෙන්නේ මොකක්ද? මේ පිළිබඳව හරියටම දැන ගෙන කටයුතු කළා නම් මෙහෙම වෙන්නේ නැහැ නේ. ගුරු තුලනයක් කරලා නැහැ. ඒ වාගේම දේශපාලනඥයෝ එකතු කරලා විවිධ මාරුවීම් දීලා එක එක විධියට කටයුතු කර තිබෙනවා. තිබෙන පුරප්පාඩු ප්‍රමාණය කොපමණද කියා හරියාකාරව ගණනය කරගෙන ඒ අය එම කටයුතු සිදු කර නැහැ. අපි උදාහරණයක් ගනිමු. පසු ගිය ආණ්ඩුව කාලයේ මහරගම විද්‍යා පීඨයට වාණිජවේදී විෂයට අදාළව 400 දෙනෙකු අලුතින් අරගෙන තිබුණා. එතකොට මුළු ලංකාවේම වාණිජවේදී විෂයට පුරප්පාඩු 50යි තිබුණේ. ඊට අමතරව වාණිජවේදී උපාධිය ලබා විශ්වවිද්‍යාලවලින් පිට වුණු අයත් විශාල ප්‍රමාණයක් සිටියා. ඒ අනුව අපට පෙනී යනවා, කිසිම ගැළපීමක් නැති ආකාරයෙන් එම වැඩ කටයුතු සිදු කර තිබෙන බව. ඔය පළාත් සභාත් එකයි; මධ්‍යම ආණ්ඩුවත් එකයි.

දැන් අපි ඔක්කෝම පරිගණක ගත කරලා තිබෙනවා. මෙච්චර කල් ගත වෙන්නේ, සියලු විෂයන්වලට තිබෙන පුරප්පාඩු බලලා, ඒවා පුරවන්නට කටයුතු කරන නිසායි. අද දුන්නු පත්වීම් 1,038 පාසල් පාදක කරගෙනයි දුන්නේ. පාසලේ පුරප්පාඩුවටයි ගත්තේ. ඉස්සර ජාතික මට්ටමට ගන්නවා; දිස්ත්‍රික් මට්ටමට ගන්නවා. අන්තිමට සමහරු යන්නේත් නැහැ. පළාත් සභාවෙන් මාරුව හදා ගන්නවා. සමහර චෝදනා තිබෙනවා, දේශපාලන ලැයිස්තුවලට පත්වීම් දෙනවා කියලා. අද පත්වීම් 3,000ක් දුන්නා. එහි, දශමයකවත් දේශපාලනයක් නැහැ. විභාග ලිව්වා; සුදුසුකම් පරීක්ෂා කළා; පත්වීම් දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්ෂේත්‍රයේ හැදිය යුතු බොහෝ අංශ තිබෙනවා. හැබැයි, අපි පියවරෙන් පියවර ඒ කටයුතු කරනවා. උදේ ඉදලා ඇ 7, 8 වෙනකල් අමාත්‍යාංශයේ ඉඳිමින් නිලධාරීන් ගෙන්වා ගනිමින්, පළාත් අධ්‍යක්ෂවරුන්, පළාත් ලේකම්වරුන් කැඳවමින් මේ කාර්ය හරියටම අපි කරනවා. ඔබතුමන්ලාත් අපට ඒ සහයෝගය දෙන්න. පළාත් සභාවල ඉන්න සමහර අයගේ සහයෝගයේ පොඩ්ඩක් අඩු පාඩු තිබෙනවා.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

පළාත් සභාව ඒක දුන්නේ නැත්තේ, "පඩි දෙන්න බැහැ" කියලා. ඒ වුණාට පඩිය රුපියල් 6,000යි. ඒකත් මතක තියා ගන්න. වතුකරයේ පාසල්වල ගුරුවරුන්ට පත්වීම් ලබා දෙන්නේ රුපියල් 6,000ක පඩියට. ඒ පඩිය ගෙවන්නවත් පළාත් සභාවට මුදල් නැහැ කියලා තමයි ඒ ගොල්ලන් කියන්නේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, ගුරු ව්‍යවස්ථාව අනුව, වතුකරයේ පාසල්වලට ගුරුවරුන් බඳවා ගන්න බැහැ. මොකද, වතුකරයේ අය ඒ සුදුසුකම් මට්ටම සපුරලා තිබුණේ නැහැ. ඒ නිසා තමයි අපි "ගුරු සහායක" කියන අය බඳවා ගත්තේ.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

ඒක සම්පූර්ණ වැරැදියි. උසස් පෙළ සමත් අය තුන්දාහක් විතර ඉන්නවා. ඒ ගොල්ලන්ට call කරන්නේ නැතුව-

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

නැහැ. ඔබතුමා පොඩ්ඩක් ඉන්න. මම සංඛ්‍යා ලේඛන අනුව ඔක්කෝම පෙන්වන්නම්. මම ඒ ගැන හොඳටම දන්නවා. [බාධා කිරීමක්] ඉන්න කෝ මම කියන්න. අද අපි ගුරුවරුන් ලෙස බඳවා ගත්තා, 1,038දෙනෙක්. අද ඒ අයට පත්වීම් දුන්නා. මේ අතුරින් දෙමළ මාධ්‍ය ගුරුවරුන් බඳවා ගත්තේ 103යි. ඒකට හේතුව පුරප්පාඩු ගැසට් කළාම ඒකට ඉල්ලුම් කරලා නැති වීමයි. ගුරු ව්‍යවස්ථාව අනුව ගුරුවරයෙක් බඳවා ගැනීමේදී මූලික සුදුසුකම් ටිකක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම විභාගයෙන් pass වෙන්න ඕනෑ. විභාගයක් පැවැත්වූවාම, ඒ විභාගයෙන් pass වෙන්නේ නැහැ. ඊට පස්සේ තමයි, දෙවැනි පියවර විධියට අධ්‍යාපන සුදුසුකම් මට්ටම අඩු අය "ගුරු සහායක" විධියට අරගෙන පුහුණුවක් දෙන්නේ. එතකොට රුපියල් 6,000 තමයි දෙන්නේ.

අපි දැන් කැබිනට් පත්‍රිකාවකුත් ඉදිරිපත් කරලා තිබෙනවා, වතුකරයේ ගුරු සහායකයාට පමණක් අදාළ වෙන විධියට. මේක පටලවා ගන්න එපා. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාත් සඳහන් කරලා තිබුණා, "අපි ඒ ගොල්ලන්ගේ ජීවන වියදම් දීමනාව ගළපමු" කියලා. එතකොට ඒ ගොල්ලන්ට තව ගණනක් වැඩි වෙනවා. අඩුම තරමින් රුපියල් 10,000ක්වත් දෙමු කියලා අපි යෝජනා කරලා තිබෙනවා. වතුකරයේ ගුරු සහායක වුණත්, ඔහුට රුපියල් 6,000කින් අද ජීවත් වෙන්න පුළුවන් මට්ටමක් නැහැ. ඒ නිසා ඒ ගොල්ලන්ට පමණක් සීමාවෙන පරිදි අපි එය කැබිනට් මණ්ඩලයේ අනුමැතියට දාලා තිබෙනවා. සමහර අය අහනවා, "ගුරු සහායකයන්ටත් දෙනවාද?" කියලා.

අපි මේකෙන් පස්සේ ගුරු සහායකයන් එක්කෙනෙක්වත් බඳවා ගත්තේ නැහැ. විධිමත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් හෝ නැත්නම් විභාගයට පෙනී ඉඳලා ඒ දක්වන සුදුසුකම් මත විතරයි අරගෙන තිබෙන්නේ. සමහර විදුහල්පතිවරු එක එක විධියට ගුරු සහායකයන් ඉස්කෝලවලට අරගෙන තිබෙනවා. දේශපාලනයෙන් ගුරු සහායකයන් අරගෙන ඉන්නවා. අපට මේ ගොල්ලන්ට පත්වීම් දෙන්න බැහැ. මේ ගොල්ලන් ඔක්කෝටම පුළුවන් විභාගයක් පැවැත්වූවාම ඒකට ලියන්න. ඒ විභාගයට ලියලා ඒකෙන් pass වෙනවා නම් දෙන්න පුළුවන්. "දිවයින" පත්තරයේ වැරැදියට මේ ගැන වාර්තා කරලා තිබුණා. මම ඒක දැක්කා. ඒක කිසි විටෙකත් අපි කියපු එකක් නොවෙයි. ඒක නිසා ගුරු සහායකයන්ටත් අපි ඒ දීමනාව දීලා තිබෙන්නේ, "වතුකරයේ අයට පමණයි" කියන එකත් මතක් කරන්න ඕනෑ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු ඇමතිතුමනි, විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේදී කාලය හැටියට බලන්නේ අවුරුදු තුනද, හතරද? මොන දිස්ත්‍රික්කයෙන්ද කියලා නිර්ණය කරනකොට අවුරුදු තුනද, හතරද බලන්නේ?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒ කිව්වේ?

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

අපි හිතමු, නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් ළමයෙක් විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙනවා කියලා. එතකොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ අවුරුදු කීයක් අධ්‍යාපනය කළා කියලාද බලන්නේ?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒක දැනට අවුරුදු තුනක් කියලා තිබෙන්නේ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මම අහන්නේ, මේක අපට තවත් දික් කර ගන්න ක්‍රමයක් නැද්ද කියලායි. පහක්, හයක් වාගේ ගත්තොත්-

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, මේ අලුත් ප්‍රවණතාවන් එක්ක බලලා, ඒ චක්‍රලේඛ වෙනස් කරමු.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

උදාහරණයක් විධියට අවුරුදු පහක් විතර ගත්තොත් ඔය ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒ ගැන අපට බලන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 5.38ට, 2016 සැප්තැම්බර් මස 06 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 5.38க்கு பாராளுமன்றம், 2016 செப்ரெம்பர் 06, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 5.38 p.m. until 1.00 p.m on Tuesday, 06th September, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.